Thus, while delegated legislation is permissible in terms of Article 76, and while Parliament may empower the Minister to make subsidiary legislation, such power is subject to the limitation that the subsidiary legislation must be for a prescribed purpose, or in other words, the enabling law must prescribe the purpose for which subsidiary legislation can be made. We are of the view that Clause 48 does not contain a prescribed purpose within the contemplation of Article 76(3). The failure to prescribe the purpose leads to a situation beyond what is permissible under Article 76(3) and will result in the alienation of legislative power to the executive.

The question of placing before Parliament any steps taken by the Minister for legislative ratification will not arise as the delegation is not for a purpose which has been prescribed. If the purpose is prescribed, the question whether such purpose is vague or overbroad will have to be considered by the application of the test that we have referred to at the beginning of this Determination.

In these circumstances, we are of the view that Clause 48 is violative of Article 4(a) read together with Article 3 and hence, needs to be approved by the special majority of Parliament and by the People at a Referendum.

Expertise of those entrusted to manage the entities that are to established

We have already stated that the Bill provides for the establishment of the Power Sector Reform Secretariat which shall be responsible for the preparation of the Preliminary and Final Transfer Plan, the National Electricity Advisory Council which shall advise the Minister in formulating the National Electricity Policy including the National Tariff Policy, the National System Operator who shall be responsible for the preparation of the Annual Power Procurement Plan and the Long Term Power System Development Plan, and the National Transmission Network Service Provider who shall be responsible for the implementation of the functions of the Ceylon Electricity Board connected with the development, expansion and maintenance of the physical infrastructure of the National Grid of Sri Lanka and for the transmission of bulk electricity to distribution licensees.

Given the objects of the Bill, the impact that the 'unbundling' of the Ceylon Electricity Board would have on the Country and her People, and the fact that separate entities are being established and entrusted with the necessary tasks, it was correctly submitted by Mr. Kularatne that it is equally important that these entities are led and managed by experts and professionals with experience in the relevant disciplines, and that the criteria for appointment be laid down to prevent friends and family of the appointing authority from being appointed. The time is certainly ripe for this Court to insist that meritocracy be restored, respected and adhered to when appointments are made by a Minister or any governmental authority and we therefore take the view that any failure to do so would result in the fundamental rights of the People guaranteed by Article 12(1) being infringed.

The necessity to appoint duly qualified persons was addressed in the **Bureau of Rehabilitation Bill** [supra; at page 26], where referring to the Determination in **Petroleum Products (Special Provisions) (Amendment) Bill** [supra], this Court stated as follows:

> *"an argument was presented that even though the Energy Supply Committee established under the Energy Supply Act and tasked with the responsibility of recommending and advising the Minister with regard to the issuance of licenses comprised of representatives of the relevant stakeholders, so that necessary recommendations and advice could be tendered to the Minister taking into consideration the criteria as spelt out in the Petroleum Products (Special Provisions) Act, the Committee proposed under the Amendment Bill lacked such representation and that the change of composition of the Committee will result in the Minister exercising his powers arbitrarily without proper consultation with other stakeholders in violation of Article 12(1) of the Constitution.*
>
> *This Court agreed with the said submission and held as follows [at page 17]:*
>
> *The composition of the Committee must be such that all relevant criteria in the Petroleum Products Act will be considered in making recommendations or giving advice to the Minister. The composition of the Committee as presently envisaged in the Bill does not do so. Hence, Clause 3(2) of the Bill is inconsistent with Article 12(1) of the Constitution and may only be passed by the special majority required under the provisions of paragraph (2) of Article 84."*

The Court went on to state in the **Bureau of Rehabilitation Bill** Determination that:

> *"It would therefore be seen that this Court has time and again held that the ultimate decision maker under a particular law – in this case the Council – must have the necessary expertise and experience to carry out its core functions. Putting together a few officials of the State who may not have experience or expertise in the core functions of the Bureau, mixed with a few industry representatives, does not enable the Council to discharge its statutory duties and functions. We are of the view that the inconsistency in Clause 6 shall cease if the number of the appointed members are*

increased to five, and of whom two persons shall possess academic and professional qualifications and experience in rehabilitation, two persons shall possess academic and professional qualifications and experience in social integration, and for the other member to possess academic and professional qualifications and experience in law and order."

In terms of Clause 38, the Power Sector Reforms Secretariat has been entrusted with the power to direct and oversee the implementation of the reforms enumerated in the Bill and has been tasked with the following:

(a) Facilitate the preparation of the Transfer Plan;

(b) Coordinate the formulation of a comprehensive and efficient financial restructuring process which identifies methodology to be applied to the restructuring of the assets and liabilities of the Ceylon Electricity Board including the completion of the process of divesting the Ceylon Electricity Board of its activities as identified in the Transfer Plan;

(c) Initiate capacity building of the National System Operator in operating the reformed power sector and in the procurement of new generation capacity using competitive, transparent and accountable procedures.

The Transfer Plan no doubt plays an extremely critical role in the entire 'unbundling' exercise. Clause 38(2) provides that the Minister shall appoint **not more than three persons** with integrity, and with **not less than ten years of experience** in one or more of the following fields to be members of the Power Sector Reforms Secretariat: - (i) public administration; (ii) human resource management; (iii) State owned enterprise restructuring; (iv) law; (v) engineering; (vi) public private partnership; or (vii) finance. The said Clause provides further that the Minister shall appoint a person possessing experience in one or more of the above fields to be the Director General of the Secretariat.

It is certainly not a fanciful hypothesis and it would be fully compliant with Clause 38(2) as it currently reads, for three Attorneys-at-Law with ten years of experience to be appointed to the Secretariat and as the Director General. Given the absence of any provision to appoint other staff members to the Secretariat, the Secretariat would not have the benefit of any persons with experience in the field of power system planning and operation or an electrical engineer. Given the wide scope and ambit of the Transfer Plan, the Secretariat certainly needs persons with such experience and expertise, which expertise is part of the criteria when appointing persons to the National Electricity Advisory Council. We are therefore of the view that the criteria laid down in Clause 38(2) are insufficient to ensure that the persons who are to be appointed as members of the Secretariat and as Director General thereof shall have the experience and expertise that such persons should possess to implement the onerous task entrusted upon them by the Bill. For that reason Clause 38(2) of the Bill is inconsistent with Article 12(1) of the Constitution and may only be passed by the special majority required under the provisions of paragraph (2) of Article 84.

The learned Additional Solicitor General submitted that an amendment shall be moved at the Committee Stage of Parliament to amend Clause 38(2) in the following manner:

"(a) The Minister shall appoint not more than five persons with integrity, one of whom shall have not less than ten years experience in engineering, and the other four persons with not less than ten years of experience in one or more of the following fields to be members of the Power Sector Reforms Secretariat: -

(b) The Minister shall appoint a person possessing not less than ten years experience in one or more of the following fields to be the Director–General of the Power Sector Reforms Secretariat;"

The said amendment does not address the concerns that we have already expressed. However, the inconsistency shall cease and Clause 38(2) may be passed with a simple majority if Clause 38(2) is amended as follows:

"(a) The Minister shall appoint not more than five persons with integrity, one of whom shall have not less than ten years experience in electrical engineering, and the other four persons with not less than ten years of experience in one or more of the following fields to be members of the Power Sector Reforms Secretariat: - (i) power system planning and operation; (ii) human resource management; (iii) State owned enterprise restructuring; (iv) law; (v) public private partnership; or (vi) finance.

(b) The Minister shall appoint a person possessing not less than fifteen years experience in one or more of the following fields to be the Director–General of the Power Sector Reforms Secretariat; - (i) power system planning and operation; (ii) human resource management; (iii) State owned enterprise restructuring; (iv) electric engineering; (v) public private partnership; or (vi) finance."

A similar situation arises with regard to the Director General of the National Electricity Advisory Council and the Chief Executive Officer of the National System Operator who in terms of Clause 3(6)(a) and Clause 10(1)(c) respectively, are only required to have expertise, reached eminence and possess experience in administration. Both these clauses are vague and violative of Article 12(1).

The learned Additional Solicitor General submitted that an amendment would be moved at the Committee Stage of Parliament to amend Clause 10(1)(c) as follows:

"The Chief Executive Officer of the National System Operator shall be a person who has expertise, reached eminence and has at least twenty years of experience in electrical engineering and administration who shall be appointed by the Board with the approval of the Minister."

We are of the view that the aforementioned inconsistency shall cease if Clauses 3(6)(a) and 10(1)(c) are amended as proposed by the learned Additional Solicitor General. The said Clauses may thereafter be approved by the simple majority of Parliament.

There is one final matter that we wish to state with regard to those who are appointed by the Minister. Clause 3(9)(iii) of the Bill provides that a person shall be disqualified from being appointed to the National Electricity Advisory Council or from continuing to be a member of such Council if such person, *"is a connected person having any financial or other interest amounting to a conflict of interest directly or indirectly in any entity in the Electricity Industry or any matter performed by such person"*. While *'a connected person'* has not been defined, a similar provision is not available with regard to those appointed to the National System Operator, the National Transmission Network Service Provider and the Power Sector Reforms Secretariat. We are of the view that while similar provision must be included in respect of those appointed under the Bill by the Minister, it is important that the obligation be a positive act on the part of the Minister who shall prior to appointing a person as a member of any of the above entities satisfy himself that such person has no financial or other conflict of interest in the affairs of such entity, as is likely to affect adversely, the discharging of his functions as a member thereof.

Summary of the Determination

(1) The Bill as a whole is inconsistent with Article 12(1) of the Constitution and shall only be passed by the special majority of Parliament required under Article 84(2). This inconsistency shall however cease if Clause 1(2) and Clause 1(3) are amended as follows:

(a) Clause 1(2)

"The provisions of this Act other than the provisions of this section, Section 2, Section 3, Section 4, Section 9, Section 10(1), Section 10(2)(b), Section 10(3), Section 10(5), Section 14, Section 15, Section 17, Section 18, Section 38, Section 39 and the sections specified in subsection (4) of this section shall come into operation on such date as shall be appointed by the Minister by Order published in the Gazette (hereinafter referred to as the "appointed date"):

Provided that prior to making such Order, the Minister shall be satisfied that the Preliminary Transfer Plan, the National Electricity Policy including the National Tariff Policy, the Annual Power Procurement Plan and the Long Term Power System Development Plan have been prepared, approved and are in place in accordance with the provisions of this Act:

Provided further that if no appointed date is published in the Gazette as required by this subsection even though the Minister is satisfied that the requirements in the first proviso have been met, the provisions of this Act, other than the provisions of this

section, Section 2, Section 3, Section 4, Section 9, Section 10(1), Section 10(2)(b), Section 10(3), Section 10(5), Section 14, Section 15, Section 17, Section 18, Section 38, Section 39 and the sections specified in subsection (4) of this section, shall come into operation immediately upon the expiry of twelve months from the date on which the Bill becomes an Act of Parliament."

(b) Clause 1(3)

"The provisions of this section, Section 2, Section 3, Section 4, Section 9, Section 10(1), Section 10(2)(b), Section 10(3), Section 10(5), Section 14, Section 15, Section 17, Section 18, Section 38 and Section 39 shall come into operation on the date on which the Bill becomes an Act of Parliament."

(2) Clauses 3(6)(a) and 10(1)(c) are inconsistent with Article 12(1) of the Constitution and shall only be passed by the special majority required under Article 84(2). However, the inconsistency shall cease if Clauses 3(6)(a) and 10(1)(c) are amended as follows:

"The Chief Executive Officer of the National System Operator shall be a person who has expertise, reached eminence and has at least twenty years of experience in electrical engineering and administration who shall be appointed by the Board with the approval of the Minister."

(3) The first proviso to Clause 11(1) of the Bill is inconsistent with Article 12(1) of the Constitution and shall only be passed by the special majority of Parliament required under Article 84(2). However, the said inconsistency shall cease if the words, *"provided that the selection of the party to whom approval has been granted or the letter of award has been issued has been selected pursuant to a competitive and transparent procurement process."*, are inserted at the end of the first proviso.

(4) Clause 17 is inconsistent with Article 12(1) of the Constitution and shall only be passed by the special majority of Parliament required under Article 84(2). The said inconsistency shall however cease and Clause 17 may be passed by a simple majority if Clause 17 is amended as follows:

(a) By the insertion of the following new paragraph numbered as Clause 17(2)(b) –

"The Secretary to the Treasury shall be initially allotted hundred per centum of the shares in the successor companies incorporated under this section other than the companies referred to in item (a), (f) and (h) (ii) of Schedule I in which the Secretary to the Treasury shall be permanently allotted hundred per centum of the shares."

(b) By the insertion of the following new paragraph numbered as Clause 18(2)(c) –

"The Secretary to the Treasury may, with the prior approval of the Cabinet of Ministers, and having followed a transparent and competitive bidding process as stipulated by law dispose of any shares issued or allotted to him in any successor company other than the companies referred to in items (a), (f) and (h) (ii) of Schedule I or of any rights over such shares only after the publication of the final transfer plan in the Gazette in terms of paragraph (b):

Provided that, the Secretary to the Treasury shall, in disposing any shares as specified in paragraph (c) ensure that the Government holds more than fifty per centum of the shares of the company referred to in item (e) of Schedule I."

(c) By amending Clause 39(1)(b) to read as follows:

"preliminary allocation of all assets and preliminary valuation of such assets including land, building, plant and machinery and other movable assets to successor companies prior to the appointed date with such valuation being carried out by the Chief Valuer:

Provided that, the Chief Executive Officer of the residual company established under paragraph (e) of subsection (3) of section 18 shall be responsible for final asset allocation and final asset valuation to be included in the final transfer plan;

(d) By the insertion of a new paragraph under Clause 18(3) to read as follows: *"identify the share capital, the management structure and the source of funds for the entities to be established under Section 17(1);"*

(e) By amending Schedule I in accordance with Clause 17(2).

(5) Clause 18(3)(e)(ii) of the Bill is inconsistent with the provisions of Article 12(1) and shall only be passed by the special majority of Parliament required under Article 84(2). The said inconsistency shall however cease if Clause 18(3) is amended by the insertion of the words, *"and the monies required to meet the Provident Fund obligations of the employees of the Ceylon Electricity Board"* at the end of Clause 18(3)(e)(ii).

6) Clause 18(3)(f) of the Bill is inconsistent with Article 12(1) and Article 14(1)(g) of the Constitution and shall only be passed by the special majority of Parliament required under Article 84(2). However, the said inconsistency shall cease if Clause 18(3)(f) is amended as follows:

"The transfer plan prepared under subsection (1) shall ensure that all officers and servants of the Ceylon Electricity Board holding office in the Ceylon Electricity Board on the day preceding the appointed date shall be-

(i) duly identified by the Ceylon Electricity Board;

(ii) be notified by the Ceylon Electricity Board of their proposed assignation to the respective successor companies within four months of this section coming into operation; and"

(iii) be required to notify the Ceylon Electricity Board within two months of the receipt of the notice referred to in subparagraph (ii), whether they opt to be assigned to such respective successor companies or not,

and shall with effect from the date succeeding the appointed date shall be assigned to such successor companies under the preliminary transfer plan on terms and conditions not less favourable than those enjoyed by them on the day preceding the relevant date under their contract of employment with the Ceylon Electricity Board. Where an employee does not opt to be assigned to a successor company, such employee shall be entitled to a voluntary retirement scheme and the terms and conditions of such scheme shall be prescribed within four months of this section coming into operation."

(7) Clause 18(5)(b)(ii) is inconsistent with Article 12(1) of the Constitution and shall only be passed by the special majority of Parliament required under Article 84(2). The said inconsistency shall however cease if Clause 18(5)(b)(ii) is amended as follows:

"The successor companies and the officers and servants of the Ceylon Electricity Board who have become the employees of the successor companies on the date succeeding the appointed date shall make such contributions to the Provident Fund and Pension Fund as they are required to make by rules or regulations of the Provident Fund and Pension Fund, as the case may be, and the successor companies shall make all other statutory payments including gratuity to the employees of the Ceylon Electricity Board who have become the employees of the successor companies. The period that an employee served with the Ceylon Electricity Board shall be taken into consideration when calculating the statutory payments that are payable to such employees."

(8) Clauses 21 and 23 are inconsistent with Article 12(1) of the Constitution and shall only be passed by the special majority of Parliament required under Article 84(2). The said inconsistency shall however cease if the requirement in such Clauses to obtain the concurrence of the Minister is removed by the deletion of the words, *"with the concurrence of the Minister"*.

(9) Clause 38(2) of the Bill is inconsistent with Article 12(1) of the Constitution and shall only be passed by the special majority required under Article 84(2). The said inconsistency shall cease if Clause 38(2) is amended as follows:

"(a) The Minister shall appoint not more than five persons with integrity, one of whom shall have not less than ten years experience in electrical engineering, and

the other four persons with not less than ten years of experience in one or more of the following fields to be members of the Power Sector Reforms Secretariat: - (i) power system planning and operation; (ii) human resource management; (iii) State owned enterprise restructuring; (iv) law; (v) public private partnership; or (vi) finance.

(b) The Minister shall appoint a person possessing not less than fifteen years experience in one or more of the following fields to be the Director–General of the Power Sector Reforms Secretariat; - (i) power system planning and operation; (ii) human resource management; (iii) State owned enterprise restructuring; (iv) electric engineering; (v) public private partnership; or (vi) finance."

(10) Clause 48 is violative of Article 4(a) read together with Articles 3 and 76 and hence, needs to be passed by the special majority of Parliament and approved by the People at a Referendum.

(11) The definition of 'national grid' in Clause 53 of the Bill is inconsistent with Article 12(1) of the Constitution and shall be passed by the special majority of Parliament required under Article 84(2). However, the said inconsistency shall cease if the said definition is amended as follows:

(a) *"National Grid" means, the transmission network consisting of transmission assets and grid substations owned by the National Transmission Network Service Provider and additional transmission licensees."*

(b) By the insertion of the following new paragraphs numbered as Clause 10(14)(b) – (d):

"(b) power purchase agreements with generation licensees incorporated under the preliminary transfer plan specified in paragraph (a) of subsection (2) of section 18;

(c) power sales agreements with distribution licensees incorporated under the preliminary transfer plan specified in paragraph (a) of subsection (2) of section 18;

(d) a transmission service agreement with the National Transmission Network Service Provider incorporated under the preliminary transfer plan specified in paragraph (a) of subsection (2) of section 18 and as specified in subsection (12) of section 10."

We place on record our appreciation of the assistance given by the learned Additional Solicitor General who represented the Hon. Attorney-General, the learned President's Counsel and other learned Counsel who appeared for the Petitioners.

VIJITH K. MALALGODA, PC, J
JUDGE OF THE SUPREME COURT

A. L. SHIRAN GOONERATNE, J
JUDGE OF THE SUPREME COURT

ARJUNA OBEYESEKERE, J
JUDGE OF THE SUPREME COURT

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Lakshman Kiriella?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, පසුගිය පක්ෂ නායක රැස්වීමේදී අපි තීරණයක් ගත්තා, අද ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ආවායින් පසුව එය Sectoral Oversight Committee එකට යොමු කරන්න. ඔබතුමාට පෙනෙනවා ඇති, මේ පනත් කෙටුම්පතේ සංශෝධන ගණනාවක් සිදු කරන්න නිර්දේශ කර තිබෙන බව. ඒ නිසා මේක අද Sectoral Oversight Committee එකේ සැලකිල්ලට භාජන කර අවසන් කරන්න අමාරුයි, ගරු සභානායකතුමනි. ඒ නිසා හෙටත් මේ ගැන Sectoral Oversight Committee එකේ සැලකිල්ලට භාජන කරලා ආණ්ඩුවට තීරණයක් ගන්න පුළුවන්. මේක හදිසි කරන්න එපා. අනික් එක, ඒ Sectoral Oversight Committee එකේ සාමාජිකයින් නොවන මන්ත්‍රීවරු දෙදෙනෙක් Sectoral Oversight Committee එකට සහභාගි වෙන්න අවසර ඉල්ලා තිබෙනවා. එතුමන්ලාට ඒකට සහභාගි වීමට ඔබතුමා අවසර දෙනවාද? ඔබතුමා නේ කථානායක. ඔබතුමාට ඒ සඳහා බලය තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන මම සොයා බලා කියන්නම්.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමා හැම තිස්සේම කියනවා ඔබතුමාට බලයක් නැහැ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ඒ ගැන මම සොයා බලා කියන්නම්.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමාට බලය තිබෙනවා නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන විධියටම මට වැඩ කරන්න බැහැ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එතකොට,- *[බාධා කිරීමක්]* Let me finish, please! ප්‍රශ්න ගණනාවක් තිබෙනවා, මේ පනත් කෙටුම්පතේ. සේවකයින් 23,000ක් ඉන්නවා. ඒ අයට මොකක්ද වෙන්නේ? මේ ආයතනය කොටස් 12කට කඩනවා; විකුණනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ ගැන විවාදයේදී කියන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මේක විනිළුවක් නොවෙයි. Do not rush it. ඔබතුමා අහගෙන ඉන්න කැමැතිත් නැහැ නේ. මම නැඟිට්ටාම ඔබතුමා හැම තිස්සේම ෆයිල් එක දිහා බලනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එහෙම එකක් නැහැ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
සේවකයින් 23,000ක් ඉන්නවා. ඒ අයට මොකක්ද වෙන්නේ? මේ ආයතනය කොටස් 12කට කඩලා විකුණනවා. ඒකද ගිය මැතිවරණයේදී කිව්වේ? ඒ ආයතනය කොටස් 12කට කඩනවා කිව්වාද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒකට නේ විවාදයක් යොමු කරලා තිබෙන්නේ. ඒ විවාදයේදී ඔය කාරණය ගන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එතකොට මිල නියම කරන්නේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමෙන් නොවෙයි, ඒ සමාගම්; the pricing would be done by the private companies. කොටස් 12කට කඩා මේක ටෙන්ඩර් ක්‍රමයට දෙනවාද, නැත්නම් පස්ස දොරෙන් දෙනවාද කියලා අපි දැනගන්න කැමැතියි.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
හෙටත් Sectoral Oversight Committee එකේදි මේක ගන්නවාද? ඔබතුමා අවසර දෙන්න,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මේ සියල්ලම Sectoral Oversight Committee එකට යොමු කරලා තිබෙන්නේ. ඔබතුමා කියන විධියට එහිදී මන්ත්‍රීවරුන් කැමැති වෙනවාද, නැද්ද කියන එක, ඒ Sectoral Oversight Committee එක එකඟ වෙනවාද, නැද්ද කියන එක මම දන්නේ නැහැ. අපි කථා කරලා,- *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමා දන්නේ නැහැ කියන එක වැරැදියි නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙපැත්තම කථා කරලා,- *[බාධා කිරීමක්]* මම කොහොමද දන්නේ, Sectoral Oversight Committee එකේ මොනවා කරනවාද කියලා?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමාට ඕනෑ වුණාම දන්නවා, කරන්න ඕනෑ නැති වුණාම දන්නේ නැහැ කියනවා. ඒක වැරැදියි නේ. ඔබතුමා කථානායක. ඔබතුමාට පාර්ලිමේන්තුවේ බලතල තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කරුණාකරලා ඔබතුමාගේ ප්‍රශ්නය විවාදයේදී ගන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(මාණ්පුමිකු සජිත් පිරේමදාස - එදිර්ක්කට්සි මුදල්වර්)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, දැන් ඔබතුමා ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව සහ යෝජනා මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඔබතුමා අද පටන් ගත්තේම, ඒ තීන්දුව කියවීමෙන්. ඔබතුමාටම පෙනෙනවා ඇති, සමස්තයක් හැටියට ගත්තාම මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් බරපතළ ගැටලු තිබෙන බව.

ඒ නිසා තමයි කියන්නේ special majority එකකට, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයකට යා යුතුයි කියන එක. අපි හැමෝම දන්නවා, රජයට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් නැහැ කියලා. ඒක තමයි සත්‍ය කථාව.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට යෝජනාවක් කරනවා, මේ පනත් කෙටුම්පත කලබලයෙන් බ්‍රහස්පතින්දා දවසේම ගන්නේ නැතිව, එහි තිබෙන අඩුපාඩුකම් පිළිබඳවත්, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපත් කර තිබෙන යෝජනා පිළිබඳවත් තවදුරටත් විධිමත්ව පරිශීලනය කරලා, අපි ඉදිරි දිනකදී මේ පනත් කෙටුම්පත ගෙනෙන්න යහපත් විධියට මේ තීන්දුව ගනිමු කියලා. මේ පනත් කෙටුම්පත කලබලයෙන් බ්‍රහස්පතින්දාට ගෙනැල්ලා අවිචාරුවක් කරගන්නේ නැතිව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපත් කර තිබෙන observations සහ නිර්දේශ පරිශීලනය කරලා, එ්වා ගැන අවබෝධයක් ලබාගෙන මේ රටේ ජනතාවගෙන් විදුලි ඒකකයකට අඩුම මිලක් අය කරමින්, විදුලිබල ක්ෂේත්‍රය පාඩු නොලබා කාර්යක්ෂමව පවත්වාගෙන යා හැකි ප්‍රශස්ත ක්‍රමවේදයකට යන්නේ කොහොමද කියන එක ගැන සොයා බලමු කියන එකයි මගේ යෝජනාව. අපි පොඩි කාලයක් අරගෙන මේවා පරිශීලනය කරලා, අඩුපාඩුකම් හොයා බලලා ඒවා මහ හරවාගෙන මේ කටයුත්ත ඉදිරියට ගෙන යමු. *[බාධා කිරීම්]* ඒ නිසා මේ පනත් කෙටුම්පත බ්‍රහස්පතින්දාට ගෙනෙන එක නොවෙයි විය යුත්තේ. කරුණාකරලා එය තවදුරටත් පරිශීලනය කරලා, කරුණු-කාරණා අවබෝධ කරගෙන වැඩකටයුතු කරමු කියා මම යෝජනා කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමන්ලා ඒ ගැන කථා කරලා තීන්දු කරගන්න.

ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දුව විපක්ෂ නායකතුමා දැන් වැරැදි විධියට අර්ථ කථනය කරනවා. ඔබතුමා කියවපු, ශ්‍රේෂ්ඨාධිකරණය දුන් ඒ තීන්දුවේ තිබෙන්නේ ව්‍යවස්ථාවට අනුකූල නොවූවත් සංශෝධනය කිරීමෙන් එය පාර්ලිමේන්තුවේ සම්මත කරගන්න පුළුවන් කියලායි.

ඒ නිසා, ඔබතුමා සංශෝධන පිළිබඳව දන්නේත් නැහැ, ගරු විපක්ෂ නායකතුමනි. මීට වඩා සංශෝධන මේ පාර්ලිමේන්තුවේදී විවිධ පනත්වලට ගෙනැල්ලා තිබෙනවා. මට මතක විධියට ඔබතුමා කිව්වේ සංශෝධන 12ක් පිළිබඳවයි. සංශෝධනය කරන්න, ඔබතුමා කියපු විධියට ඒ සංශෝධන 12 තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි කියලා සඳහන් වුණු එක සංශෝධනයක්වත් තිබුණේ නැහැ. එම නිසා අද ඒ පිළිබඳව අධ්‍යයනය කරන්න බලශක්තිය පිළිබඳ කමිටුවට අවස්ථාව දෙන්න. ගරු කථානායකතුමනි, ඒ වාගේම නඩු අහපු අවස්ථාවේදී අපි විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට එකඟ වුණු සංශෝධන තිබෙනවා.

ඊළඟට, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා විකිණීමක් පිළිබඳව කියන්නේ කොහෙන් අරගෙනද කියලා මම දන්නේ නැහැ. විකිණීමක් කියන එක මේ පනතේ කොහේද තිබෙන්නේ කියලා එතුමාට පෙන්වන්න කියා මම කියනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ - සමගි ජන බලවේගයේ - "The Blueprint" එකේත් මේ කාරණා තමයි සඳහන් කරලා තිබෙන්නේ. ඔබතුමන්ලා ප්‍රතිපත්ති ප්‍රකාශනයක් මඟින් ඉදිරිපත් කරලා තිබෙනවා, ඊළඟ ජනාධිපතිවරණයෙන් පස්සේ මේක කරනවා කියලා. හැබැයි, ඒක අපි ඉදිරිපත් කරලා ඒ කටයුත්ත ක්‍රියාත්මක කරනකොට ඔබතුමන්ලා විරුද්ධ වෙනවා. මොකක්ද මේකේ තේරුම?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා පොඩ්ඩක් ඉන්න. සියලුදෙනාටම අවස්ථාව දෙන්නම්.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු කථානායකතුමනි, මේක කඩිනමින් ගෙනාපු කටයුත්තකුත් නොවෙයි. අවුරුදු එකහමාරක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේදී විවිධ ආයතන, අපේ පාර්ශ්වකරුවන් ඇතුළු විවිධ අය සමඟ සාකච්ඡා කරලා තමයි මේක ගෙනාවේ. අපි මීට සති තුනකට පෙර පාර්ලිමේන්තුවේ හැම මන්ත්‍රීවරයෙකුටම ආරාධනා කළා, මේ පිළිබඳව කටයුතු කරන්න එන්න කියලා. මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අධිකරණයේ නඩු කටයුතු 12ක් තිබුණා. ඒ සියලු දේ අවසන් කරලා දැන් නීත්‍යානුකූලව මේක ඇවිල්ලා තිබෙනවා. එම නිසා ඉදිරි කටයුතුත් නීත්‍යානුකූලව කරගෙන යන්න දෙන්න. 6වැනි දා මේ ගැන විවාද කිරීමට නියමිත වෙලා තිබෙනවා. 6වැනි දාට විවාදය ගන්නත්, ඊට අවශ්‍ය ඡන්දය ගන්නත් ආණ්ඩුව හැටියට අපි සූදානම්. *[බාධා කිරීම්]* ආණ්ඩුවේ ඡන්ද ප්‍රමාණය පිළිබඳව ඔබතුමන්ලා කලබල වෙන්න එපා. ඔබතුමන්ලා කොහොමත් විරුද්ධයි; විරුද්ධ කට්ටිය කොහොමත් විරුද්ධයි. ආණ්ඩු පක්ෂයේ ඡන්ද ප්‍රමාණය ගැන අපි බලාගන්නම්. ඔබතුමන්ලා විරුද්ධ වෙනවා නම් විරුද්ධ වෙන්න.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු කථානායකතුමනි,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම එක කාරණයක් පැහැදිලිව කියන්න කැමැතියි. "The Blueprint" එකේ කිසිම තැනක විකුණා දැමීම් ගැන සඳහන් කරලා නැහැ; ඒකේ එහෙම දෙයක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔය කාරණා විවාදයේදී ගන්නකෝ, ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

හැබැයි, අපි විශ්වාස කරනවා මේ රටේ විදුලි පාරිභෝගිකයාට අඩුම මිලකට, අඩුම පිරිවැයකට සාධාරණ ක්‍රමවේදයක් තුළ කාර්යක්ෂමව විදුලිය සැපයීමේ අයිතිය අපට තිබෙනවා කියලා. ඒකයි කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මම යෝජනා කරනවා මේ කඩිමුඩියේ, කලබලයට එන බ්‍රහස්පතින්දාට මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැතිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නිර්දේශ හා යෝජනා පරිශීලනය කරලා කටයුතු කරන්න කියලා. මොකද, එක එක්කෙනාට තිබෙන කඩි කුලප්පුවට මේ රටේ විදුලිබල ක්ෂේත්‍රය සංශෝධනය කරන්න දෙන්න බැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ කාරණාවට මැදිහත් වෙන්න කියලා. මැදිහත් වෙලා, අපි පොඩි කාලයක් අරගෙන මේ නිර්දේශ, යෝජනා පරිශීලනය කරලා මේ රටේ විදුලිබල ක්ෂේත්‍රය කුණු කොල්ලයට විකුණා දමන මේ කුමන්ත්‍රණය පරාජය කරනවා, අනිවාර්යයෙන්ම. ඒ නිසා මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා බ්‍රහස්පතින්දා මේ සම්බන්ධයෙන් සාකච්ඡාවට ගන්නේ නැතිව වෙනත් දිනයකට මේක යොදා ගනිමු කියලා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ඔය කාරණා පක්ෂ නායක රැස්වීමේ දී කථා කර ගන්න. දැන් ඔබතුමා ඒක කිව්වා නේ. *[බාධා කිරීමක්]* ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්ඩලික විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා ගරු ඇමතිතුමාට. ගරු ඇමතිතුමනි, මීට කලින් අවස්ථාවක ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටියා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ ගැන සාකච්ඡා කරන්න අවස්ථාවක් දෙන්න කියලා. ඔබතුමා ඒ අවස්ථාව දුන්නා. පළමුවෙන්ම ඒ සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. හැබැයි ගරු කථානායකතුමනි, මේ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ කියනවා මෙහි ඇතැම් කරුණු ජනමත විචාරණවලට යොමු විය යුතුයි කියලා. ගොඩාක් ඒවා විශේෂ බහුතරයට යොමු විය යුතුයි කියලා කියනවා. "ඒවා එසේ නොවෙන්න නම් මෙසේ සංශෝධනය විය යුතුයි" කියලා කියනවා. මම කියන්නේ මේකයි. මේ සාමාන්‍ය කාරණයක් පිළිබඳ පනතක් නොවෙයි, ගරු ඇමතිතුමා. මේක ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාව පිළිබඳ පනතක්.

මේක රටේ අනාගතයට බෙහෙවින් බලපාන පනතක්. වෙනත් පනතක් නම්, ඔබතුමා කියනවා වාගේ සංශෝධන 12යි තිබෙන්නේ, ඔය කියන විධියට කටයුතු කළ හැකියි. හැබැයි මෙහි අපි ඉතා වුවමනාවෙන් අධ්‍යයනය කළ යුතු වෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණය දීලා තිබෙන මහ පෙන්වීම ගැන. මොකද, මීට කලිනුත් මේ සභාවේ විවාදයට ලක් වුණා, ශ්‍රේෂ්ඨාධිකරණය දීපු මහ පෙන්වීම නිවැරදිව අනුගමනය නොකර ඇතැම් පනත් කෙටුම්පත් සම්මත කළා කියන කාරණය. එහෙම සම්මත කළා කියලා පස්සේ අපට ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න නීතිමය බලයකුත් නැහැ. ඉන්දියාවේ නම් ඒ බලය තිබෙනවා. ඉන්දියාවේ පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක් ශ්‍රේෂ්ඨාධිකරණයේ මහ පෙන්වීමට අනුකූල නොවන විධියට නම් සම්මත කරලා තිබෙන්නේ, රටවැසියාට අයිතියක් ලැබෙනවා නැවත ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න. අපට ඒ බලය නැහැ. ඒ නිසායි අපි මේ කියන්නේ, මෙතැනදී ශ්‍රේෂ්ඨාධිකරණය දීපු මහ පෙන්වීම නිසි පරිදි අනුගමනය කරලා මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න කියලා. එතකොට අපට ප්‍රශ්නයක් නැහැ. කරුණාකරලා ඒකට අවස්ථාව දෙන්න. මේ සතිය ඇතුළත ඔය කියන සම්මත කරන ක්‍රියාවලිය තුළින් නියමානුකූලව ඒක කරන්න වෙන්නේ නැහැ. නිවැරදිව අධ්‍යයනය කරලා, පරිශීලනය කරලා, ශ්‍රේෂ්ඨාධිකරණය දීපු මහ පෙන්වීම මොකක්ද, ඒක කෙසේද විය යුත්තේ කියන එක ගැන හොඳ අදහසකට ඇවිල්ලා ඒ විවාදය ගන්න. ඒකට අපි එකඟයි. හැබැයි මේ සතියේ ගන්නේ නැතිව මේක ඊළඟ සතියට කල් දමලා, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයයි, පනත් කෙටුම්පතයි දෙකම සංසන්දනය කරලා අධ්‍යයනය කරන්න අපට අවස්ථාව දෙන්න කියලා මහජන නියෝජිතයෝ හැටියට අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ඒක තමයි විපක්ෂ නායකතුමාත් ඉල්ලුවේ. දැන් ඔබතුමාත් එහෙම ඉල්ලනවා.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්ඩලික නීතිඥ චන්දිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා මොකක්ද කියන්නේ?

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්ඩලික නීතිඥ චන්දිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අපි ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා කලින් කිව්වා, ප්‍රශ්නයක් තිබෙනවා නම් ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න කියලා. ගරු කථානායකතුමනි, අද ඔබතුමා විසින් කියවන ලද ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ පැහැදිලිව තිබෙනවා, මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාවට පටහැනියි කියලා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් කියන්නේ සමානාත්මතාව ගැන. ඉතින්, මේ රටේ මහජනතාවගේ සමානාත්මතාවට පටහැනිව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා කියන එක දැන් පිළිගන්න වෙලා තිබෙනවා. ඒ වාගේ බැරෑරුම් ආකාරයක Determination එකක් සුප්‍රීම් උසාවිය මෑත කාලයේ ඉදිරිපත් කරලා නැහැ. ඒ නිසා තමයි අපි මේ කාරණය කියන්නේ. අපි මහජන නියෝජිතයෝ. කරුණාකරලා මහජනතාවගේ - පාරිභෝගිකයාගේ - අයිතීන් ආරක්ෂා කර ගැනීමට හැකි වන පරිදි මේ පනත සංශෝධනය කරන්න ඉඩ දෙන්න. අපිටත් ඕනෑ සංශෝධනය කරන්නයි. අපිත් ඒකට පක්ෂයි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමායි, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමායි දෙදෙනාම ඉල්ලන්නේ ඒක නේ. දැන් ඔබතුමාත් ඒක ඉල්ලනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්ඩලික දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියන්නේ මොකක්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්ඩලික දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම Sectoral Oversight Committee on Energy and Transportහි Member කෙනෙක් විධියට කථා කරන්නේ. අද දවල් 1.00ට එම කාරක සභාව රැස් වෙනවා. මේ පිළිබඳව බොහොම පැහැදිලිව දවස් කිහිපයක්ම විවිධ අය අපට කරුණු දැක්වුවා, මේ සම්බන්ධව consultation එකක්, නැත්නම් මත විමසුමක් - එක එක්කෙනාගේ අදහස් ගැනීමක් - පසුගිය කාලයේ සිද්ධ වෙලා නැහැ කියන එක පිළිබඳව. ඒ ගොල්ලන්ගේ විවිධ අර්බුද තිබෙනවා, ප්‍රශ්න තිබෙනවා. ගරු ඇමතිතුමාට තිබෙන හදිසිය අපට තේරුම් ගන්න පුළුවන්. නමුත්, ප්‍රශ්නය ඒක නොවෙයි.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධව අද අපිට සාකච්ඡා කරලා, ඉවර කරන්න පුළුවන් කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා අපි විශේෂයෙන් ගරු සභානායකතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. අපි මේ පනත් කෙටුම්පත සම්මත කරන්න කැමැතියි. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. හැබැයි, මේ තිබෙන

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ප්‍රශ්න ටික බේරා ගනිමු. අපි මේ පනත් කෙටුම්පතට විරුද්ධව කථා කරනවා නොවෙයි. ගරු කථානායකතුමනි, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේක රටේ බලශක්ති සුරක්ෂිතතාව පිළිබඳව පනතක්. මේක ආණ්ඩුවේ ප්‍රශ්නයක් හෝ අපේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. ඇමතිවරයාගේ ප්‍රශ්නයකුත් නොවෙයි. මේක රටේ අනාගත පරපුර වන දරුවන්ගේ ප්‍රශ්නයක්. මේකට අත් වෙන ඉරණම පිළිබඳව අපි සියලුදෙනාට වගකීමක් තිබෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, මම ඉල්ලන්නේ, මේ අයත් එක්ක සාකච්ඡා කරලා මේ කටයුත්ත නිවැරැදිව කරන්න අපට පොඩි කාල වකවානුවක් දෙන්න කියලායි. දවස් ගණන්, මාස ගණන් නොවෙයි. අපට මේ ගැන කථා කරලා ඉවර කරන්න දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
සියලු මන්ත්‍රීවරුන් එකහෙළා ඉල්ලන්නේ ඒක තමයි. එක එක්කෙනා වෙන වෙනම ඉල්ලන්න ඕනෑ නැහැ. දැන් ඒ කාරණය ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළා. ආණ්ඩු පක්ෂයත් එක්ක කථා කරලා ඒ ගැන තීන්දුවක් ගනිමු.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙඛින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔව්, ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙඛින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි, ඔබතුමා එක කාලයක් වනකල් පනත් කෙටුම්පත් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ අපට ලබා දුන්නා. මේ රටේ දැන් කඩදාසි ප්‍රශ්නයක් තිබෙනවාද මම දන්නේ නැහැ, පාර්ලිමේන්තුවේ බොහෝ දේවල් මුද්‍රණය කරද්දී මේ රටට වැදගත් පනත් කෙටුම්පතක් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මුද්‍රණය කරලා අප 225දෙනාට දෙන්න බැරි වෙලා තිබෙන්නේ. ඒක කරන්න බැරි නම්, එය ඉතාම කනගාටුදායක තත්ත්වයක්. දැන් ඔබතුමා කිව්වා ඒ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණ හැන්සාඩ් වාර්තාවේ පළ කරනවා කියලා. ගරු කථානායකතුමනි, මේ බලන්න, මේ තිබෙන්නේ එසේ පළ වුණු එකක්. මේක කණ්ණාඩි දාලාවත් කියවන්න පුළුවන්ද? මේ තිබෙන්නේ කලින් හැන්සාඩ් වාර්තාවක පළ වුණු එකක්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, පාර්ලිමේන්තු සම්ප්‍රදාය තේරුම් ගන්න. අද දවසේ තමයි ඔබතුමාට ඒක ලැබෙන්නේ.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙඛින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ලැබෙන්නේ නැහැ නේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමන්ලාට ඒක ලැබෙනවා.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙඛින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
කලින් දුන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාගේ ගෙදරට යවන්න ක්‍රමයක් තිබුණේ නැහැ නේ.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙඛින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
නැහැ, නැහැ, මෙතැනට දුන්නේ නැහැ. ඔබතුමා ඒක නැවැත්තුවා. එය ලබා දෙනවා නම් අපි කෘතඥ වෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නැහැ, නැහැ, නවත්වලා නැහැ. ඒක දෙනකල් ඉන්න. *[බාධා කිරීමක්]*

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙඛින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ඔබතුමා තත්පරයක් මේක අහන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක දෙනකල් ඉන්න. *[බාධා කිරීමක්]*

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙඛින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ඔබතුමා බලන්න, හැන්සාඩ් වාර්තාවේ පළ වන ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කියවන්න පුළුවන්ද කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමා වැඩක් නැති ප්‍රශ්නයක් අරගෙන වැඩක් නැති කථාවක් කියන්න එපා. *[බාධා කිරීමක්]* එහෙම නතර කිරීමක් කරලා නැහැ.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙඛින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
හැන්සාඩ් වාර්තාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ පළ කරන කොට කරුණාකර ඒවා කියවන්න පුළුවන් විධියට පළ කරන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එය අද දෙනවා. *[බාධා කිරීමක්]*

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙඛින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි, එය අද දීලා කොහොමද කාරක සභාව රැස් වෙන්නේ?

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමා, කියන්න. *[බාධා කිරීමක්]*

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමාට අවස්ථාව දීලා ඉන්න.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණය දුන් ඒ තීරණය අද ලබා දුන්නාම කාරක සභාව රැස් වෙන්නේ කොහොමද? ඒ ගැන කථා කරන්න ඕනෑ නැද්ද? මොකක්ද මේ වැඩේ? *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ සම්මත කරන ක්‍රමවේදය තමයි මේ පනත් කෙටුම්පතටත් අදාළ කරලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතක් සම්මත කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාවේ සඳහන් පරිදි, "පනත් කෙටුම්පත් පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කිරීම" යටතේ තමයි එය ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වෙන්නේ. ඕනෑම පනත් කෙටුම්පතක් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කළාම ශ්‍රේෂ්ඨාධිකරණය නිර්දේශ ලබා දෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා ඒ පනත් කෙටුම්පතේ සමහර වගන්ති සම්මත කරන්න ජනමත විචාරණයක් අවශ්‍යයි කියලා; සමහර වගන්ති සම්මත කරන්න තුනෙන් දෙකක විශේෂ බහුතර ඡන්දයක් අවශ්‍යයි කියලා.

එසේ මහ පෙන්වීමක් කරනවා. ඒ මහ පෙන්වීම කරන්නේ, අදාළ පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ද නැද්ද කියන කාරණය සම්බන්ධයෙන්. ඒ මහ පෙන්වීම අනුව කටයුතු කරන්න තමයි Sectoral Oversight Committee එක සූදානම් කරලා තිබෙන්නේ. Sectoral Oversight Committee එකට ගිහිල්ලා එතැනදී ගරු ඇමතිතුමා අපේක්ෂා කරන, ශ්‍රේෂ්ඨාධිකරණයේ මහ පෙන්වීම අනුව සංශෝධනය විය යුතු ආකාරයට, ඒ කියන්නේ විශේෂ බහුතරයක් අවශ්‍ය නොවන, සාමාන්‍ය බහුතරයකින් සම්මත කළ හැකි, ජනමත විචාරණයක් අවශ්‍ය නොවන ආකාරයට ඒ සංශෝධන ටික ඉදිරිපත් කරනවා. සංශෝධන ඉදිරිපත් කළාට පසුව ඒවාට අනුමැතිය ලබා ගෙන ඒ ටික තමයි කාරක සභා අවස්ථාවේ මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ. ඒ පිළිබඳව පැහැදිලිව සඳහන් කර තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (3) ව්‍යවස්ථාවේ. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මහ පෙන්වීමක් කළාම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (3) ව්‍යවස්ථාව අනුව, යෝජනා කරන සංශෝධන ඒ පනත් කෙටුම්පතේ හරයෙන් බැහැර වෙන්න බැහැ. අන්න ඒ කාරණය තමයි අද Sectoral Oversight Committee එකේදී සහ ඉන් අනතුරුව පැවැත්වෙන පාර්ලිමේන්තු විවාදයේදීත්, කාරක සභා අවස්ථාවේදීත් සලකා බලන්නේ. මේ procedure එකට යටත්ව තමයි අපි පක්ෂ නායක රැස්වීමේදී එකඟ වුණේ, මේ මස 6වන දාට -බ්‍රහස්පතින්දාට- මේ පනත් කෙටුම්පත විවාදයට ගන්න. ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ Determination එක ඔබතුමා විසින් අද කියවනු ලැබුවා. ඊට පසුව සෑම ගරු මන්ත්‍රීවරයෙකුටම එහි පිටපතක් ලබා ගන්න පුළුවන්. ඒ පිටපත අනුව මුල් පනත් කෙටුම්පතත් සමඟ සංසන්දනය කරමින්, ඒ වගන්තිවලට අදාළ සංශෝධන හරියාකාරව සිදු වුණාද නැද්ද කියන කාරණය දැන ගන්න පුළුවන්. ඒ පිළිබඳව Sectoral Oversight Committee එකේදී සාකච්ඡා කරලා කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරන්න කල් තිබෙනවා. අද අඟහරුවාදා; හෙට බදාදා; අනිද්දා බ්‍රහස්පතින්දා. ඒ ක්‍රමවේදය අනුගමනය කරන්නයි මේ ආකාරයට කටයුතු කරගෙන යන්නේ.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු සභානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අදාළව පිටු හැට ගණනක් තිබෙනවා. එතකොට ඔබතුමාට අද පුළුවන්ද,-

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒක ඔබතුමාගේ ප්‍රශ්නයක්.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
අපි දැක්කා නේ, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත ගෙනාපු වෙලාවේ මොකද වුණේ කියලා. දැන් මේක අද ලබා දුන්නාම අපි කොහොමද කමිටුවේදී මේ ගැන සාකච්ඡා කරන්නේ?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එක එක මන්ත්‍රීවරුන් තමන්ට පුළුවන් ආකාරයට ඒක කරනවා. ඒකේ වෙනසක් නැහැ.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
එහෙම නොවෙයි, ඔබතුමාට පුළුවන්ද කියලා කියන්න?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒක මට කරන්න පුළුවන්ද, බැරිද කියන එකවත්, ඔබතුමාට කරන්න පුළුවන්ද, බැරිද කියන එකවත් නොවෙයි, ප්‍රශ්නය. අපි නිසි ක්‍රමවේදයයි අනුගමනය කරන්නේ. අපි ඒකට අනුගත වෙන්න ඕනෑ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු කථානායකතුමනි, ඔබතුමා ඒක ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කරන්න. ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා කියන විධියට පිටු හැට ගණනක් තිබෙන්නේ නඩු තීන්දුව නොවෙයි. නඩු තීන්දුව තිබෙන්නේ පිටු තුනකයි. ඔබතුමාට කියවා ගන්න බැරි නම් කියන්න. පිටු හැට ගණනක ලියලා තිබෙන්නේ වෙච්ච සිද්ධිය; නඩුවේ කථා කරපු කරුණු. ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අහන අවස්ථාවේ නීතිපතිවරයා හරහා අපි එකඟ වුණු කාරණා ගණනාවක් තිබෙනවා. ගරු කථානායකතුමනි, සභානායක ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා කියපු ආකාරයට යම්කිසි දෙයක් පටහැනි නම් අපට ඒක කරන්න බැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දීපු නිගමනයක් තිබෙනවා. ඒ නිගමනය අනුව කටයුතු කරන්න තමයි, විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය හැටියට අපි කටයුතු කරන්නේ. ගරු කථානායකතුමනි, ඊට පිටතින් දෙයක් වෙනවා නම් ඒ කියන විධියට නැවත චෝදනාවක් අපි ඉදිරිපත් කරන්නම්. මේක බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කරන්න. ගරු කථානායකතුමනි, මෙයට විරුද්ධ අය කොහොමත් විරුද්ධයි. ලබන සතියේ ගෙනාවත් විරුද්ධයි; ලබන මාසයේ ගෙනාවත් විරුද්ධයි. ඒ විරුද්ධ අය කොහොමත් විරුද්ධයි, ගරු කථානායකතුමනි. මේ සතියේ - 06වැනි දාට- ආණ්ඩුවේ කටයුත්ත කර ගන්න ඉඩදෙන්න.

ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)

ගරු කථානායකතුමනි, ඔබතුමාට කවුරු හරි මන්ත්‍රීවරයෙක් චෝදනාවක් එල්ල කරනවා නම් ඔබතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව ඉදිරිපත් කරන්න ඉස්සෙල්ලා "අපේ මේසය උඩ ඒක තියන්න. අපට ඒක කියවන්න අවශ්‍යතාවක් තිබෙනවා" කියලා, ඒ මන්ත්‍රීතුමා එහෙම කියන්නේ පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳව නොදැනුවත්වයි.

ගරු කථානායකතුමනි, මේ රටේ ජනතාවගේ අවශ්‍යතාව අද මේ පවතින ක්‍රමවේදයේ වෙනසක් සිදු වීමයි. තරඟකාරීත්වය ඇති වෙලා, දැනට තිබෙන ඒකාධිකාරය තුළ ජනතාව මහත් පීඩාවට පත් වෙලා සිටිනවා.

මොකද, ඔවුන්ට අවශ්‍යයි අඩු පිරිවැයකින් මේක කරගන්න; ඔවුන්ගේ වියදම අඩු කර ගන්න. හැබැයි ගරු කථානායකතුමනි, මේ පවතින තත්ත්වය තුළ - *[බාධා කිරීම්]* ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. මම ඔබතුමාට බාධා කළේ නැහැ නේ. මට කථා කරන්න දෙන්න.

ගරු කථානායකතුමනි, ඔබතුමා බලන්න මේ සඳහා විරුද්ධව කථා කරන්නේ කවුද කියලා. මේ අවුරුදු දෙක තුළ අපි නීති රාශියක් ගෙනාවා. ඒ නීති රාශිය තුළ ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දීපු නිර්දේශ තිබෙනවා. අපි රජය හැටියට ඒ නිර්දේශවලින් පරිබාහිරව කටයුතු කළේ නැහැ. අපි හැම අවස්ථාවකදීම ශ්‍රේෂ්ඨාධිකරණයේ නිර්දේශයට අනුව තමයි පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් සම්මත කළේ.

ගරු කථානායකතුමනි, දේශපාලන අවශ්‍යතාවක් වෙනුවෙන් අපි මේ රටට විනාශයක් කරනවා ද, නැද්ද කියන එක තව වරක් තහවුරු කරන්න ඉස්සෙල්ලා, මම හිතන විධියට අපි නිවැරදි ක්‍රමය පිළිබඳව අවබෝධ කර ගන්න ඕනෑ. ලෝකයේ රටවල් යන ක්‍රමයට පරිබාහිරව ලංකාවට යන්න බැහැ. ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා කවදාවත් ගරු සභාවට ඇවිල්ලා වටිනා දෙයක් කිව්වේ නැහැ. ගරු කථානායකතුමනි, මෙතුමන්ලාට තිබෙනවා set framework එකක්. ඒකෙන් එහාට හිතන්න ඒ කට්ටිය කල්පනා කරන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මෙවැනි පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම කල් දමන්න බැහැ. මේවා අනිවාර්යයෙන්ම ගෙන ආ යුතුයි. කළ යුතු වෙනස්කම් මොනවාද කියලා බලලා, නීත්‍යානුකූලව අවශ්‍ය වෙනස්කම් කරලා, මේවා සම්මත කළ යුතුයි.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමා.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු කථානායකතුමනි, අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. *[බාධා කිරීමක්]* මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමනි. පොඩ්ඩක් නවත්වන්න කියන්නකෝ. කථා කරන්න දෙන්න කියන්නකෝ. මෙතැනට ඇවිල්ලා හැම තිස්සේම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමනි, අපේ ගරු සභානායකතුමා ඉතා පැහැදිලි කිව්වා, විපක්ෂය ඉල්ලන දේ දෙන්නම් කියලා. Sectoral Oversight Committee එකට එය යොමු කරන්නම් කිව්වා. ශ්‍රේෂ්ඨාධිකරණය දීලා තිබෙන මතය අනුව වැඩ කරන්නම් කියලා, ගරු ඇමතිතුමා කිව්වා. ගරු සභාවේ නීති රීති අනුව අද ඔබතුමා ඉදිරිපත් කළා පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය. එය හැන්සාඩ්ගත වෙලා ගරු මන්ත්‍රීවරුන්ට ලැබෙන්න සැලැස්වෙනවා. ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත සම්මත වුණාම මේ රටේ පාරිභෝගිකයන්ට තමයි වාසිය ලැබෙන්නේ. ඒ ලැබෙන වාසිය නවත්වන්න තමයි විපක්ෂය හදන්නේ. අපි ආණ්ඩුව විධියට එම පනත් කෙටුම්පත හැකි ඉක්මනින් සම්මත කරලා, තරඟකාරීත්වය තුළින් පාරිභෝගිකයන්ට සහන ලබා දෙන්න තමයි හදන්නේ. ඒ කටයුත්ත සඳහා අපට ඉඩ දෙන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මේක අසාධාරණ ඉල්ලීමක් නොවෙයි. ඊට කලින් මම මේ කාරණය කියන්න ඕනෑ. සමගි ජන බලවේගයේ "The Blueprint"හි, මේ අවශ්‍ය සංශෝධන කරන්න ඕනෑ කියලා අපි පිළිගෙන තිබෙනවා. ඒකේ දෙකක් නැහැ. අපි ළිං මැඩියෝ නොවෙයි; ගල් යුගයේ ජීවත් වෙන මිනිස්සු නොවෙයි. අපි දන්නවා අනාගතයට කොයි වාගේ ව්‍යුහයක්ද අවශ්‍ය වන්නේ කියලා. ගරු ඇමතිතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ යම් සංශෝධන ප්‍රමාණයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඇත්ත වශයෙන් කිව්වොත්, එහි මෙසේ සඳහන් වෙනවා:

"The Bill as a whole is inconsistent with Article 12(1) of the Constitution ...."

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

Can you read the rest of it, what is stated after that?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

I know. What I am saying is this. - *[Interruption.]* Listen to what we have to say, Hon. Minister. All what the Hon. Kiriella says is that let us have the Sectoral Oversight Committee consider the Bill for two days; let us consider it today and tomorrow. - *[Interruption.]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, all these problems could be settled amicably. There is no difficulty in doing that. If you want to have another day, have it and finish it off.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, that is what the Hon. Kiriella is asking for.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා දැන් කියපු කාරණය ඇත්ත. ඔබතුමන්ලාගේ "The Blueprint"හි, බලශක්තිය හැසිරවීම සම්බන්ධයෙන්, නීති ගෙන ඒම සම්බන්ධයෙන් ඔබතුමා කථා කරනවා. ඔබතුමා කියන එක හරි. ළිං මැඩි මානසිකත්වය තුළ මේ රටට ඉදිරියට යන්න බැහැ. හැබැයි, ඔබතුමා පිළිගත්තාට ඔබතුමාගේ නායකයා වෙච්ච විපක්ෂ නායකතුමා ඒක පිළිගත්තේ නැහැ, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි. අපි එකතු වෙලා දවස් දෙකක් සාකච්ඡා කරනවා නම් සාකච්ඡා කරලා මේ පනත් කෙටුම්පත 06වැනි දා විවාදයට අරගෙන සම්මත කර ගන්න අවශ්‍ය වැඩ කටයුතු ටික කරමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

තවත් ගැටුමකට යන්නේ නැතිව ඔය කාරණය දැන් අවසන් කරමු.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, අපේ පක්ෂයේ නායකතුමා - විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා - දැන් පොඩ්ඩකට කලින් නැහිටලා කිව්වා, මේ ක්ෂේත්‍රයේ නොයෙකුත් වෙනස්කම් සිද්ධ කළ යුතුයි කියලා.

අපි ඒක පිළිගන්නවා. නමුත් මේක කරන විධිය සම්බන්ධයෙන් ගැටලු තිබෙනවා. ඉතින්, අපිත් සංශෝධන ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මේක අපට සාර්ථකව ඉස්සරහට අරගෙන යන්න පුළුවන්. අපි විරුද්ධ වෙලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, you can go into those details at the Debate; let us take them up at the Debate.

ගරු ඇමතිතුමා, පැහැදිලි කිරීමක් කරනවාද?

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු කථානායකතුමනි, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා මේ Determination එකේ එක වචනයක් කියලා නැවැත්තුවා. ඒකෙන් මිනිස්සුන්ව mislead වෙනවා නේ. එහි මෙසේ සඳහන් වෙනවා:

"The Bill as a whole is inconsistent with Article 12(1) of the Constitution and shall only be passed by the special majority of Parliament required under Article 84(2). This inconsistency shall however cease if Clause 1(2) and Clause 1(3) are amended as follows:"

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Yes.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු කථානායකතුමනි, ඉතින් මේකේ ප්‍රශ්නයක් තිබෙනවාය කියලා මට නම් පෙනෙන්නේ නැහැ. මේ Supreme Court Determination එක පිළිගන්න අපි කැමැති නම්, ඒකෙන් ඒ inconsistency එක නැති වෙනවා නම් මොකක්ද තිබෙන ප්‍රශ්නය? *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, ජූනි 06වැනි දා මේ සම්බන්ධ විවාදය පැවැත්වීමට සූදානම් කරලා තිබෙනවා. මා දන්නා විධියට විපක්ෂ නායකතුමාටවත් අඩුම තරමේ 06වැනි දා වෙන වැඩක් නැහැ. නමුත්, 06වැනි දාට එතුමන්ලා ජේවීපී එකත් එක්ක විවාදය යොදා ගත්තාද කියලා මම දන්නේ නැහැ. ඒ විවාදය තිබෙනවා නම්, ඒකට සූදානම් වෙන්න කාලය ඉල්ලනවා නම් ඒක සාධාරණයි. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා සහ සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා අතර විවාදය 06වැනි දා පැවැත්වෙනවාද කියා කියන්න මම දන්නේ නැහැ. හැබැයි, මා දන්නා විධියට දැනට එදිනට යොදා ගෙන තිබෙන්නේ ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත සම්බන්ධ විවාදය විතරයි. මෙතුමන්ලා අර විවාදයෙනුත් මඟ හැරලා, ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත සම්බන්ධ විවාදයෙනුත් මඟ හැරලා තිබෙනවා; ජනාධිපතිවරණ විවාදයෙනුත් මඟ හැරලා තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, ඉක්මනින් කියන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
මම ඉතාම කෙටියෙන් කියන්නම්.

ගරු කථානායකතුමනි, මම පළමුවෙන්ම විරෝධය පළ කරනවා Parliamentary Business Committee එකට සහභාගි වෙන විපක්ෂයේ අයට. මොකද, මේ විවාදය සඳහා අඩු ගණනේ දවස් දෙකක්වත් ගත යුතුව තිබුණා.

මෙය ඉතා සංවේදී කාරණයක්. මොකද, මෙය රටේ බලශක්ති ඉරණම පිළිබඳ ප්‍රශ්නයක්. අපි පක්ෂ වුණත්, විපක්ෂ වුණත් මේ විවාදය සඳහා දින දෙකක්වත් ගතයුතුව තිබුණා. *[බාධා කිරීමක්]* ඒක තමයි. අපේ නියෝජනයක් එතැන නැහැ. මේ විවාදය තනි දවසකට ගත්තාම, අපේ මන්ත්‍රීවරු දහතුන්දෙනෙකුට විතර අන්තිමට හම්බ වෙන්නේ විනාඩි හතේ ඒවා දෙකයි. එතකොට, මේ වාගේ ප්‍රශ්නයක් ගැන අපට කථා කරන්න ප්‍රමාණවත් කාලයක් ලැබෙන්නේ නැහැ. ඒක, පළමුවැනි කාරණය.

ගරු ඇමතිතුමනි, දෙවැනි කාරණය මේකයි. ශ්‍රේෂ්ඨාධිකරණය දීපු නිගමනය ඔබතුමා සරලකොට තකනවා නම් ඒක සාධාරණ නැහැ කියලා මම හිතනවා. අපි දන්නවා, බලශක්තිය කියන්නේ රටක් පාලනය කරන tool එකක් බව. ඉන්දියාව, සිකිමය පාලනය කරන්නේ බලශක්තිය කියන tool එකෙන්. තවත් ඕනෑ තරම් උදාහරණ කියන්න පුළුවන්. අදානි සමාගම ඉන්දියාවට රුපියල් තුනයි ගණනට විකුණන සුනිත්‍ය බලශක්ති ඒකකය දැන් ලංකාවේ විකුණන්න එකඟ වෙලා තිබෙන්නේ රුපියල් දහතුනයි ගණනට. එතකොට පිරිවැය අඩු වෙනවාය කියන කථාව මිථ්‍යාවක්. ගරු කථානායකතුමනි, එතුමන්ලාගේ මතයත් අපේ මතයත් දෙකක්. ඒ නිසා, මේ සතියේ මෙම විවාදය පවත්වනවා නම් කරුණාකරලා අඩුම තරමේ අපට දින දෙකක් දෙන්න කියලා මම ඉල්ලනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඔබතුමන්ලා ඒක ඉල්ලන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
මේ සතියේ මේ ගැන විවාද කරනවා නම් අඩුම තරමින් අපට දින දෙකක විවාදයක් දෙන්න. ඒක සාධාරණ ඉල්ලීමක්. අපට දින දෙකක විවාදයක් දෙන්න, ගරු කථානායකතුමනි. අපට මේ ගැන කථා කරන්න අවශ්‍යයි. කථා කරන්න තිබෙන අයිතිය, නිදහස නැති කරන්න එපා. විනාඩි හතේ ඒවා දෙකකින් මේ වාගේ සංවේදී ප්‍රශ්නයක් ගැන අපේ මතය පළ කරන්න බැහැ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, දැන් මෙතැනදී විදුලිබල මණ්ඩලය සම්බන්ධව ගරු ඇමතිතුමාත්, මුදල් රාජ්‍ය ඇමතිතුමාත් අදහස් දැක්වුවා.

ගරු කථානායකතුමනි, ප්‍රධානම දේ තමයි, ජන මතය ලබා ගැනීම වෙනුවෙන් මෙතුමන්ලා ඉදිරිපත් කරපු "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ මෙවැනි දේවල් නැති එක. එම ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරලා ජන මතය ලබාගෙන බලයට ආපු උදවිය අද වෙන දෙයක් කරනවා. විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා ආණ්ඩුවට ලිපියක් යවලා කිව්වා, රජයේ දේපළ විකුණන්න යන මේ ප්‍රතිපත්තියට එතුමන්ලා එකඟ නැහැ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔය කථාව අදාළ විවාදයේදී ගන්න. දැන් ඒ සම්බන්ධ විවාදයක් නොවෙයි නේ යන්නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. පොහොට්ටුවේ ජාතික සංවිධායක නාමල් රාජපක්ෂ මැතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්නවා. මම එතුමාට කියනවා, එතුමාගේ මතය දැන් මෙතැනදී කියන්න කියලා. මේකට එකඟ ද, නැද්ද කියලා කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක විවාදයේදී ගන්න. ඒකට නේ විවාදයක් දීලා තිබෙන්නේ. දැන් විවාදයට දවස් දෙකක් තිබෙනවා නේ. ඔය දේවල් එම විවාදයේදී කථා කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අපි ඉල්ලන්නේ වෙන එකක් නොවෙයි. අපි දිගින් දිගටම ඔබතුමාගෙනුත් ඉල්ලුවා, විපක්ෂයේ ස්වාධීන වෙච්ච මන්ත්‍රීවරුන්ගෙන් එක්කෙනෙකුට, දෙන්නෙකුටවත් Parliamentary Business Committee එකට සහභාගි වෙන්න අවස්ථාව දෙන්න කියලා. අපි මේ කාටවත් වැරැද්දක් කියනවා නොවෙයි. විවාදයකදී අපට කථා කරන්න හම්බ වෙන්නේ විනාඩි තුනහතරයි නේ.

මුලින්ම අපි මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්න ගැන කථා කරමු. ගරු කථානායකතුමනි, දෙවනුව අපි මේ සම්බන්ධයෙන් නිවැරැදි විධියට විවාදයක් කරමු. මේ පනත් කෙටුම්පත ඉක්මනින් සම්මත කර ගන්න සමහර උදවියට වුවමනා වෙලා තිබෙනවා. මම මේ කියන්නේ මේ පනත් කෙටුම්පතට විරුද්ධ වෙනවා කියන එක නොවෙයි. නමුත්, මේ පනත් කෙටුම්පත සම්මත කරගන්නේ හෙට නම්, ඊට කලින් -අද රෑ හෝ- සුළං විදුලි බලාගාර හෝ වෙනත් දෙයක් සම්බන්ධව මොකක් හරි ගනුදෙනුවකට අදාළව තිබෙන ගිවිසුමක් අත්සන් කළාට පසු ඒවාට මේ පනත බලපාන්නේ නැහැ. හිතන්නකෝ, මේ අයට මේවායේ මොන තරම් වටිනාකමක් තිබෙනවා ද කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඔය කුණු අදින්නේ නැතිව ඔය දේවල් ඔක්කෝම අදාළ විවාදයේදී ගන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ වාගේ වැඩ තමයි මෙතැන තිබෙන්නේ. එම නිසා මේවා ගැන වෙනම කථා කරන්න ඕනෑ. ඒ නිසා අපට නිවැරැදිව කාලය ලබා දෙන්න, ඒ වෙනුවෙන් කථා කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කුණු නේ, ගේන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, ඔබතුමාට මම මීට කලිනුත් පෙන්වා දී තිබෙනවා, Parliamentary Business Committee එක පාර්ලිමේන්තු රැස්වීම් දිනයක කැඳවන්න කියලා. ඔබතුමා මේ වතාවේත් Parliamentary Business Committee එක කැඳෙව්වේ මැයි මාසයේ 28වැනි දා. එදිනත් පාර්ලිමේන්තු රැස්වීම් දිනයක් නොවෙයි. හදිසි අවශ්‍යතාවක් මත නම් එවැනි දෙයක් වෙන්න පුළුවන්. නමුත්, මැයි 28වැනි දා පාර්ලිමේන්තු රැස්වීම් දිනයක් නොවන නිසා අපි යොදා ගත් වෙනත් වැඩ කටයුතු තිබුණා. එම නිසා අපට එම රැස්වීමට සහභාගිවීමේ දුෂ්කරතාවක් තිබුණා. එම නිසා මැයි 28වැනි දා පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට මගේ සහභාගිත්වයක් වුණේ නැහැ. ගරු කථානායකතුමනි, මේක වැදගත් විවාදයක්. ඔබතුමාත් සාධාරණයි. මේ පනත් කෙටුම්පතේ ප්‍රමාණය බැලුවත්, නඩු තීන්දුවේ ප්‍රමාණය බැලුවත්, මේ පිළිබඳව යම් විධිමත් සාකච්ඡාවක් සිදු විය යුතුයි.

ගරු කථානායකතුමනි, ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යතුමා ළිං මැඩි මානසිකත්වයක් ගැන කිව්වා. එතුමා රාජපක්ෂ කඳවුරේ ඉන්නකොට ළිඳේ, රනිල්ගේ කඳවුරට එනකොට ළිඳෙන් ගොඩ වාගේ තමයි මට පේන්නේ. ගරු කථානායකතුමනි, කොහොම වුණත් මට කියන්න තිබෙන්නේ මේකයි. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ. ගරු කථානායකතුමනි, මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතත්, මේ නඩු තීන්දුවත් ඉතා හොඳින් ගළපා මේ පිළිබඳව අපි බලන්න ඕනෑ.

මොකද ඔබතුමාත් දන්නවා නේ, මීට කලින් Online Safety Bill එක සම්මත වුණා. එම පනත් කෙටුම්පත සම්මත වූ පසු විශාල ආන්දෝලනයක් ඇති වෙලා ඔබතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒම දක්වා ඒ තත්ත්වය වර්ධනය වුණා. මොකද, Online Safety Bill එක සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීරණය අනුව කළ යුතු සංශෝධන නිසි පරිදි එම පනතට ඇතුළත් වුණේ නැහැ. ඒ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාට පස්සේ පාර්ලිමේන්තුවේ කාර්යයට ශ්‍රේෂ්ඨාධිකරණයට මැදිහත් වීමට අයිතියක් නැහැ කිව්වා. ඒ නිසා පාර්ලිමේන්තුවේ තීන්දුව අවසන් තීන්දුව වුණා. ගරු කථානායකතුමනි, එහෙම නම් මේ බලශක්ති ක්ෂේත්‍රය විශාල වෙනස් කිරීමකට භාජන කරනවා නම් කළ යුතු වන්නේ මොකක්ද? මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ලැබිලා තිබුණේ නැත්නම් මේකට ලොකු ප්‍රශ්නයක් පැන නඟින්නේ නැහැ. මොකද, ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත අපි කියවා බලා තිබෙනවා. ඒ අනුව ඉදිරි කටයුතු කරගෙන යන්න පුළුවන්. හැබැයි, දැන් වැදගත් තීරණ ගණනාවක් ගත යුතුව තිබෙනවා. ඒ නිසා ඉදිරිපත් වෙලා තිබෙන Bill එකත්, මේ තීන්දුවත් අතර මනා ගැළපීමක් කරගන්න ඕනෑ. ඒ නිසා තමයි මේ සඳහා අපි යම් කාලයක් ඉල්ලන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක නේ මන්ත්‍රීතුමා දැන් කථා කර ගත්තේ. *[බාධා කිරීමක්]*

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ඒ නිසා අපට යම් කාලයක් ලබා දෙන්න. ඔබතුමා දැන් මේ සම්බන්ධව තීන්දුවක් දෙන්නේ නැහැ නේ. ඔබතුමා මේකට කාලය දෙනවා නම් මෙච්චර ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. එහෙම නම් මම නැඟිටින්නේත් නැහැ, වෙන කවුරුවත් නැඟිටින්නේත් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම කරුණ පක්ෂ නායක රැස්වීමට යොමු කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ඔබතුමා පක්ෂ නායක රැස්වීමක් කැඳවා මේ සම්බන්ධව තීන්දු කරන්න කියන්න. අඩුම තරමින් එහෙමවත් කරන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, 28වැනි දා Parliamentary Business Committee එකට මම සහභාගි වුණා. මම විතරයි එදා ආවේ. වෙන කවුරුවත් ආවේ නැහැ. මම සභානායකතුමාට කිව්වා, මේ විවාදය සඳහා තව දවසක් දෙන්න කියලා. මෙතුමන්ලා බැහැ කිව්වා. ඒක වැරදි වැඩක්.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, අනුර දිසානායක මන්ත්‍රීතුමා සුපුරුදු අපහාස කිරීම මේ සභාව තුළ කළාට මේ රටේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මම කියන්නේ මේකයි. වෙනස් විය යුතු නම් අපි වෙනස් විය යුතුයි. ඒ වාගේම අපි යම් යම් දේවල්වලින් පාඩම් ඉගෙන ගත යුතුයි. මේ ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ වෙනුවෙන් අපි පෙනී සිටියා. හැබැයි, මම එතුමාගෙන් අහනවා, එතුමා මේ පාර්ලිමේන්තුවේ කෑ ගහපු විධිය දැන් කෝ කියලා. ඉන්දියාවට ගිහිල්ලා දවස් ගණනාවක් ඉඳලා ආ පසු එතුමාගේ කටට මොකක්ද වුණේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදයක් තිබෙනවා නේ. ඒකෙදි කථා කරන්න, ගරු රාජ්‍ය ඇමතිතුමා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, නිවැරැදි දේ නිවැරැදි වෙලාවට අපි කරමු. නිවැරැදි දේ නිවැරැදි වෙලාවට නොකිරීමේ විපාක තමයි අපි අත්වින්දේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට න්‍යාය පත්‍රයේ කටයුතු ටික කරගෙන යන්න ඉඩ දෙන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ විධියට සභාව ගෙනයන්න බැහැ නේ. ඔබතුමා තවම නිවේදන ඉදිරිපත් කරලා ඉවරත් නැහැ. මේ ප්‍රශ්නයට වෙනම වෙලාවක් දෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මේක ඉතා වැදගත් කාරණයක්. රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක්ක එකතු වුණාම ටයි-කෝට් අඳින්නයි, මහින්ද රාජපක්ෂ මහත්මයාත් එක්ක ඉන්නකොට ජාතික ඇඳුම අඳින්නයි, ඒ වර්ගයේ අය නොවෙයි අපි. මම ඒක නොවෙයි කියන්නේ. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන point of Order එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* අපි නැවතත් නිවේදනවලට යොමුවෙමු.

II

ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
இலங்கைத் தொலைத்தொடர்பு (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
SRI LANKA TELECOMMUNICATIONS (AMENDMENT) BILL: PETITIONS TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත 2024.05.22 දින ඉදිරිපත් කරන ලද පෙත්සම් තුනක පිටපත් ද, 2024.05.27 දින ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් සහ 2024.05.28 දින ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා මේ කටයුතු ටික කරගෙන යන්න ඉඩ දෙන්න.

III

ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
பொருளாதார நிலைமாற்றம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
ECONOMIC TRANSFORMATION BILL: PETITIONS TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ආර්ථික පරිවර්තන" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් පහක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order. ගරු කථානායකතුමනි, කරුණාකරලා අපි ඉදිරිපත් කළ කාරණය පිළිබඳව තීන්දුවක් ගන්න. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, අපි මෙතැනදී යෝජනා දෙකක් කළා. එකක් තමයි, මේ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අධ්‍යයනය කරන්න කාලය දෙන්න කියන එක. ඒ කියන්නේ, ඊළඟ රැස්වීම් සතියේ මේ සම්බන්ධ විවාදය ගන්න කියන එක. ඒක කරන්න බැරි නම් අඩු ගණනේ සිකුරාදා දිනට නියමිතව තිබෙන රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත දෙවනවර කියවීමේ විවාදය ඊළඟ රැස්වීම් සතියට කල් දාලා මේ පිළිබඳව අපට දවස් දෙකක විවාදයක් දෙන්න. මෙක සාධාරණ ඉල්ලීමක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක පක්ෂ නායක රැස්වීමේදී තීන්දු කරන්න කියන්න. ඔබතුමා දැන් මෙතැන ඒ ගැන කථා කරන්න ඕනෑ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
එහෙම නම් දැන් සභාවේ කටයුතු අත්හිටුවලා පක්ෂ නායක රැස්වීමක් කැඳවන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඉස්සෙල්ලාම න්‍යාය පත්‍රයේ දිනට නියමිත කටයුතු ටික අවසන් කරලා ඔබතුමා මේ සම්බන්ධව තීන්දුවක් ගන්න. අපි ඉස්සෙල්ලාම මේ වැඩ කටයුතු ටික කරගෙන යමු. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ මොහොතේ තීන්දු කරන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි නේ, ඔය ප්‍රශ්නය. නැවත නිවේදන වලට යොමු වෙමු.

IV

වරප්‍රසාද: 2024.04.07 දින "ඉරිදා මව්බිම" පුවත් වාර්තාව
சிறப்புரிமை: 2024.04.07ஆம் திகதிய "இரிதா மவ்பிம" செய்தி அறிக்கை
PRIVILEGE: "IRIDA MAWBIMA" NEWS REPORT OF 07.04.2024

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා විසින් 2024 අප්‍රේල් 24 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

V

ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම
பாதுகாப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு: உறுப்பினர் நியமனம்
MINISTERIAL CONSULTATIVE COMMITTEE ON DEFENCE: NOMINATION OF MEMBER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112හි විධිවිධාන සහ 2024 පෙබරවාරි 09වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මුජිබුර් රහුමාන් මහතා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

VI

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම
வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு: உறுப்பினர் நியமனம்
MINISTERIAL CONSULTATIVE COMMITTEE ON TRADE, COMMERCE AND FOOD SECURITY: NOMINATION OF MEMBER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112හි විධිවිධාන සහ 2024 පෙබරවාරි 09වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මුජිබුර් රහුමාන් මහතා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

VII

ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම
பொருளாதார உறுதிப்படுத்தல் பற்றிய குழு: உறுப்பினர் நியமனம்
COMMITTEE ON ECONOMIC STABILIZATION: NOMINATION OF MEMBER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 123හි විධිවිධාන සහ 2024 පෙබරවාරි 09වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මුජිබුර් රහුමාන් මහතා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

VIII

විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ අංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම
வெளிப்படையான மற்றும் பொறுப்புக்கூறவேண்டிய அரசாங்கமொன்று பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் பதிலீடு
SECTORAL OVERSIGHT COMMITTEE ON AN OPEN AND ACCOUNTABLE GOVERNMENT: SUBSTITUTION OF MEMBER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චමින්ද විජේසිරි මහතා මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3)හි විධිවිධාන ප්‍රකාරව, 2024 මැයි 28වන දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වේලු කුමාර් මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

IX

ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම
சிறுவர்கள், பெண்கள் மற்றும் பாலினம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் பதிலீடு
SECTORAL OVERSIGHT COMMITTEE ON CHILDREN, WOMEN AND GENDER: SUBSTITUTION OF MEMBER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උද්දික ප්‍රේමරත්න මහතා මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3)හි විධිවිධාන ප්‍රකාරව, 2024 මැයි 28වන දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජගත් ප්‍රියංකර මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

X

සභාපති නාමාවලිය: සාමාජිකයකු නම් කිරීම
தவிசாளர் குழாம்: உறுப்பினர் நியமனம்
CHAIRMAN'S PANEL: NOMINATION OF MEMBER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 143 ප්‍රකාරව නවවන පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරය තුළ සේවය කිරීම පිණිස සභාපති නාමාවලියට දැනට නම් කරනු ලැබ තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට අමතරව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා ද මවිසින් නම් කරනු ලබන බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

XI

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
அரசியலமைப்பு அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம்
COMMITTEE ON CONSTITUTIONAL AFFAIRS: NOMINATION OF MEMBERS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 126(1)හි විධිවිධාන ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, කථානායකවරයා සභාපතිවරයා වූ ද, අග්‍රාමාත්‍යවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා සමඟ මතු සඳහන් මන්ත්‍රීවරයන් තිදෙනා මවිසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා

XII

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු, ප්‍රගතිය සහ ඉදිරි ක්‍රියාමාර්ග" සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් දැනුවත් කිරීම සඳහා තිරසර සංවර්ධන සභාව විසින් පවත්වනු ලබන දැනුවත් කිරීමේ සැසියක් 2024 ජූනි 05වන බදාදා අපර භාග 2.00ට කාරක සභා කාමර අංක 01හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන මෙන් ඒ සඳහා උනන්දුවක් දක්වන සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වෙත මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LVII කොටස;
- 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LIII කොටස සහ තෙවැනි කාණ්ඩයේ XXII කොටස; සහ
- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLIX කොටස මම ඉදිරිපත් කරමි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ප්‍රතිසන්ධානය සහ ජාතික සමගිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්ඩලික සට්ටම්පුලි (නීතිඥ) සුසිල් ප්‍රේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්ඩලික සට්ටම්පුලි (නීතිඥ) සුසිල් ප්‍රේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 9 වගන්තිය යටතේ සුබසාධක ප්‍රතිලාභ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 මැයි 17 දිනැති අංක 2384/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අස්වැසුම් සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය ඉදිරිපත් කරමි.

මෙම ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්ඩලික සට්ටම්පුලි (නීතිඥ) සුසිල් ප්‍රේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්ඩලික සට්ටම්පුලි (නීතිඥ) සුසිල් ප්‍රේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්ඩලික සට්ටම්පුලි (නීතිඥ) සුසිල් ප්‍රේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ධීවර අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්ඩලික සට්ටම්පුලි (නීතිඥ) සුසිල් ප්‍රේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්ඩලික සට්ටම්පුලි (නීතිඥ) සුසිල් ප්‍රේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2020/2021 වර්ෂය සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා ජාතික ව්‍යාත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 4(අ) සහ 16(4) වගන්ති සමඟ කියවිය යුතු 48 වගන්තිය යටතේ සහ 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 13(3) වගන්තිය සමඟ කියවිය යුතු 48 වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2024 මාර්තු 05 දිනැති අංක 2374/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Athukorala, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ අනුමැතිය ලබා දුන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේත් ඉල්ලීම මත එකී පනත් කෙටුම්පතේ සංශෝධන කිහිපයක් සිදු කිරීමටත් එක්කයි. ඒ නිසා පාර්ලිමේන්තුවේදී මේ පනත් කෙටුම්පතට සංශෝධන පහක් ඉදිරිපත් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

කෙටි, මධ්‍යම හා දිගු කාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනා ගැනීම සඳහා වූ ජාතික සභා අනුකාරක සභාවේ වාර්තාව

குறுகிய, நடுத்தர மற்றும் நீண்டகாலத் தேசிய கொள்கைகளை வகுப்பதில் முன்னுரிமைகளை அடையாளங்காணல் பற்றிய தேசியப் பேரவை உபகுழுவின் அறிக்கை

REPORT OF SUBCOMMITTEE OF NATIONAL COUNCIL ON IDENTIFYING PRIORITIES IN FORMULATION OF SHORT, MEDIUM AND LONG-TERM NATIONAL POLICIES

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කෙටි, මධ්‍යම හා දිගු කාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳව නවවැනි පාර්ලිමේන්තුවේ ජාතික සභා අනුකාරක සභාව විසින් සකස් කරන ලද ආහාර සුරක්ෂිතතාවය සඳහා වූ සංකල්පිත ප්‍රතිපත්ති රාමුව පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා, අනුකාරක සභාවේ ලේකම්තුමිය විධියට කටයුතු කරන අපේ මහ ලේකම්තුමිය වන කුෂානි රෝහණදීර මැතිනියටත්, ඒ වාගේම ජයසංඛනී වේලාරත්න මහත්මියටත්. අනුකාරක සභාව වෙනුවෙන් මේ කටයුත්තට මැදිහත් වුණේ, ගරු අසංක නවරත්න පාර්ලිමේන්තු මන්ත්‍රීතුමායි. ඒ නිසා මම ගරු කථානායකතුමාගෙන් අවසර ඉල්ලනවා, මෙම කෙටුම්පත පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් කිරීමට එතුමාට විනාඩියක කාලයකට අවසර දෙන්න කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත;

(ii) 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත යටතේ නියමය; සහ

(iii) 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ නියෝග

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, ඉතාම කෙටියෙන් කාරණා දෙකක් කියන්න තිබෙනවා. රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත අතිශයින් වැදගත් දෙයක්. මොකද, අපේ රට බංකොලොත් වෙලා තිබෙන්නේ ණය ගෙවා ගන්න බැරි නිසායි. ඒ නිසා ඇත්තවශයෙන්ම මේකෙන් සිද්ධ වෙන්නේ මධ්‍ය කාලීන ණය ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න Action Plan එකක්, Medium -Term Debt Management Strategy එකක් හදන එක. අපි නොයෙක් තැන්වලින් ණය ගන්නවා. මහ බැංකුවෙන් ගන්නවා, නොයෙක් පනත් යටතේ ගන්නවා, Treasury එකෙන් ගන්නවා. මේ සියල්ල එක තැනකට ගෙනෙන්න තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා ගැටලුවක් නැහැ. ඇත්තවශයෙන්ම එය ධනාත්මක දෙයක්. මොන පක්ෂය බලයේ හිටියත් ඒ ගන්නා ණය කළමනාකරණය කරන්න අපට එක තැනක් තිබිය යුතුයි.

ගරු මංගල සමරවීර මැතිතුමා මුදල් ඇමතිවරයා හැටියට කටයුතු කරද්දී Medium-Term Debt Management Strategy එකක් ඉදිරිපත් කර තිබුණා, 2019 වර්ෂයේ මැද භාගයේදී. ඒකෙන් කියා තිබෙන්නේ, බංකොලොත්භාවයකින් තොරව රට ඉස්සරහට ගෙන යන්නේ කොහොමද, ණය ගෙවන්න බැරි වෙන තත්ත්වයකට වැටෙන්නේ නැති වෙන්න කළමනාකරණය කරගන්නේ කොයි විධියටද කියන කරුණු. හැබැයි, මෙතැනදී කනගාටුවෙන් වුණත් කිව යුතු කාරණයක් තිබෙනවා. අවාසනාවකට, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ඒ සම්පූර්ණ වාර්තාවම කුණු බක්කියට දමලා තමයි මේ කටයුත්ත කරගෙන ගිහින් තිබෙන්නේ.

ඇත්තවශයෙන්ම අපේ කමිටුවට මෙය ඉදිරිපත් කළාම, අපි සියලුදෙනාම මේ සම්බන්ධයෙන් දීර්ඝව සාකච්ඡා කරලා, නොයෙක් අදහස් ලබා දුන්නා, මේක ඉස්සරහට ගෙන යන්නේ කොහොමද කියලා. මෙතැනදී තවත් මූලික කාරණයක් කිව යුතුව තිබෙනවා. ගරු කථානායකතුමනි, රජයේ ආයතනවලට, State-owned enterprisesවලට මීට පසුව ආණ්ඩුවෙන් guarantees දෙනවා නම්, ඒ දෙන්නේ මොන ආකාරයෙන්ද කියන එක පිළිබඳව ගැටලු දෙකක් තිබෙනවා. එකක් තමයි, ආර්ථික සංවර්ධනය කියන එක.

ආර්ථික සංවර්ධනය සඳහා ණය ගැනීමේදී guarantees ලබා දෙනවා. එහිදී අපි කිව්වා, ඒ තත්ත්වය පුළුල් වැඩියි කියලා. ඒ නිසා අපි මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලනවා, යම්කිසි සංශෝධනයක් ගෙනැල්ලා මේ "ආර්ථික සංවර්ධනය" කියන එක නිර්වචනය කරන්න කියලා. මොකද, නැත්නම් ආර්ථික සංවර්ධනය කිව්වාම, ඕනෑ දෙයකට ණය ගන්න ආණ්ඩුවට guarantee එකක් දෙන්න පුළුවන්. ඒක පළමුවන කාරණය.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

දෙවැනි කාරණය විධියට අපි කිව්වා, රජයේ ආයතන මූල්‍ය ගැටලුවක හිරවෙලා ඉන්නවා නම් ඔවුන්ට guarantee එකක් දෙන්න බැහැ කියලා. මූල්‍ය ගැටලුව කියන්නේ මොකක්ද? ඒක "Negative equity" කියලා ඉංග්‍රීසියෙන් කියලා තිබුණා. හැබැයි ගරු අගමැතිතුමනි, සමහර ආයතනවලට shares නැහැ. Shares තිබෙනවා නම් තමයි negative equity එකක් තිබෙන්නේ. එතකොට, shares නැති ආයතනවලට මේ negative equity එක බලපාන්නේ කොහොමද කියලා - මේවා technical කාරණා- සංශෝධන ටිකක් ගෙනෙන්න.

තවත් ලොකු ගැටලුවක් තිබුණා. රජය ණය ගන්න කොට ඒ සඳහා ප්‍රාථමික ගැනුම්කරුවෝ - primary dealersලා - ඉන්නවා. මේ primary dealersලා ගැන මාස ගණන්, අවුරුදු ගණන් නොයෙකුත් සාකච්ඡා සිද්ධ වෙලා තිබෙනවා. මේ primary dealersලා පත් කිරීමේදී මුදල් ඇමතිවරයාට බලය දෙනවා. අපි අපේ කාරක සභාවේදී දැඩිව කියා සිටියා, ඒක එහෙම කරන්න එපා, දැන් තිබෙන ක්‍රමය අනුගමනය කරන්න, ඒකේ විනිවිදභාවයක් තිබෙනවා කියලා. ඔන්න ඔය මූලික කාරණා තුන තමයි එතැනදී මට සඳහන් කරන්න ඕනෑ වුණේ.

ගරු කථානායකතුමනි, ඊළඟ අතිශය වැදගත් කාරණය තමයි සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ නියෝග. ඒ කියන්නේ "අස්වැසුම" සම්බන්ධයෙන්. එහිදී එක පැත්තකින් කරන්න යන්නේ, ප්‍රතිලාභ ගෙවීමේ නියෝග සංශෝධනය කිරීම සහ අභියාචනා කමිටුවල සංයුතියට ගැළපීම කරන එකයි. අපි එහි ලොකු අවුලක් දැක්කේ නැහැ. හැබැයි, දත්ත රැස් කිරීමේ ක්‍රම සහ විරෝධතා, හිමිකම් පෑමේ කාලසීමා යාවත්කාලීන කිරීම සම්බන්ධ ගැටලුවක් මතු වුණා. ඒ නිසා ගරු කථානායකතුමනි, මේ තෝරා ගැනීම හරි විධියට සිද්ධ වෙලා නැති බව මුදල් අමාත්‍යාංශය කාරක සභාවේදී පිළිගත්තා. බොහෝ තැන්වල තෝරා ගත යුතු පුද්ගලයන් තෝරා ගෙන නැහැ. තෝරා නොගත යුතු පුද්ගලයන් තෝරා ගෙන තිබෙනවා.

ගරු විපක්ෂ නායකතුමා දිගින් දිගටම කියපු කථාවක් තමයි, මේ පිළිබඳව හරියට සංගණනයක් කරලා, ඒ සංගණනය හරහා තමයි ඒ පුද්ගලයන් තෝරා ගත යුත්තේ කියන එක. ඔවුන් එක් සියයට 100ක් පිළිගත්තා. පිළිගෙන කිව්වා, "දැන් සංගණනයක් කරනවා, ඒ සංගණනයෙන් පස්සේ අපට මේක හරියට හදා ගන්න පුළුවන්" කියලා. හැබැයි මේ නීතියේම තිබෙනවා, යම්කිසි කෙනෙක් වැරැදි දත්ත දුන්නා නම්, ඒ දත්ත එකතු කරපු පුද්ගලයා සහ ඒ දත්ත ලබා දුන් පුද්ගලයා පිළිබඳව නෛතික ක්‍රියාමාර්ග ගන්න පුළුවන් කියලා. ගරු කථානායකතුමනි, අපි ඔවුන්ගෙන් ඇහුවා, ලක්ෂ ගණනක් එවැනි වැරැදි තිබෙන නිසා නිලධාරීන්ගෙන් කී දෙනෙකුට විරුද්ධව නෛතික ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා ද කියලා. එක් කෙනෙකුටවත් විරුද්ධව එකම නෛතික ක්‍රියා මාර්ගයක්වත් අරගෙන නැහැ. ඉතින්, නීතියක් හදන්නේ මොනවාටද? වරදිනවා නම්, වරද්දනවා නම්, ඕනෑකමින්ම ඒවා කරනවා නම් මේ නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ නේ.

වැරදි කරපු එක්කෙනෙකුටවත් විරුද්ධව නීතිය ක්‍රියාත්මක වෙලා නැත්නම් මේක බොරු නීතියක් බවට පත් වෙනවා. ඒ නිසා අපි ඔවුන්ට අවධාරණය කරලා කිව්වා, මේ නීති දැම්මාට වැඩක් නැහැ, ඒවා ක්‍රියාත්මක කරන්නේ නැත්නම් කියලා.

අවසාන වශයෙන් මෙතැන තිබෙන ගැටලුව තමයි, "electronic or manual" records තියාගන්න කියන එක. කාරක සභාව සම්පූර්ණයෙන්ම ඒකට විරුද්ධ වුණා. මොකද, එතැන තිබෙන ප්‍රශ්නය මේකයි. ඉලෙක්ට්‍රොනික විධියට තිබෙනවා නම් ඒක ගැටලුවක් නැහැ. නමුත් කොළවල ලියාගෙන තිබෙනවා නම් ඒක වෙනස් කරන්න පුළුවන්. දත්ත එකතු කර ගැනීමේදී ඉලෙක්ට්‍රොනික ක්‍රමයට හෝ කොළ කෑලිවල ලියා ගැනීම කරන්න පුළුවන්. හැබැයි දත්ත store කරනකොට ඒවා ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් පමණක් විය යුතුයි කියලා කාරක සභාව විසින් නිර්දේශයක් ලබා දුන්නා. ඒ නිසා මේ අවස්ථාවේ ඒ "electronic or.." කියන කොටස කපලා "data to be stored electronically" කියලා සංශෝධනයක් ගෙනෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව මෙහිදී නිර්දේශ කිහිපයක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා වාගේම, රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත අපේ රටේ ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්. ඒ සඳහා වන සංශෝධන කිහිපයක් කැබිනට් මණ්ඩලය විසිනුත් අනුමත කරලා තිබෙනවා. නීතිපතිතුමාගේත්, විශේෂයෙන්ම Legal Draftsmanගේත් කටයුතු කරලා අපි ඒවාත් නැවත ඉදිරිපත් කරන්න සූදානමින් ඉන්නවා.

ගරු කථානායකතුමනි, ඊළඟට, "අස්වැසුම" සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය ගැනත් මම කියන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම ගරු මන්ත්‍රීතුමනි, මේ දෙවැනි වටයට සහතික කිරීම ඉතාම වැදගත් වෙනවා. ඒ කියන්නේ ගරු කථානායකතුමනි, ජූනි මාසයේ 15වැනි දාට පස්සේ ආරම්භ කරන සහතික කිරීම ඉතාම වැදගත් වෙනවා. මොකද, අපි දශක තුනකට ආසන්න කාලයක් කරපු ක්‍රමය තමයි වෙනස් කළේ, ගරු කථානායකතුමනි. මේ වෙනස පිළිගැනීමට අකැමැති කණ්ඩායමකුත් ඉන්නවා. ඒ වාගේම පෙර තත්ත්වයෙන්ම කටයුතු කරලා, පෙර තිබුණු යම් යම් චෝදනාවලට ලක් වෙන්න පුළුවන් විධියේ ක්‍රමයකට නැවත යන්න කියලා යෝජනා කරන කණ්ඩායමකුත් ඉන්නවා.

ගරු කථානායකතුමනි, ඒ කෙසේ නමුත් මේ කටයුත්තේ යම් යම් අඩු පාඩු තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමා එක්ක එකඟ වෙනවා; යම් යම් අඩු පාඩු තිබෙනවා. අපි මේ කාලය තුළ ඒ අඩු පාඩු හඳුනා ගත්තා. හඳුනාගෙන, රාජ්‍ය නිලධාරීන් ඇතුළු සියලු කණ්ඩායම් එක්ක සාකච්ඡා කරලා තමයි මේ regulationsවලට වෙනසක් යෝජනා කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම පසුගිය දෙසැම්බර් මාසයේ 31වැනි දා ඉඳලා මේ වන තෙක් ප්‍රතිලාභ නොලබපු කණ්ඩායමකුත් ඉන්නවා. ඒ අය සඳහා වන ගැසට් නිවේදනයට මේ සතිය තුළ ප්‍රමුඛතාව ලබා දෙන්න ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ කමිටුවට කාලය තියේවි කියලා මම විශ්වාස කරනවා. ඔබතුමාගේ කමිටුව අනුමත කළොත්, අපට ඒ යෝජනාව සිකුරාදා දිනයේ පාර්ලිමේන්තුවේ විවාදයට අරගෙන සම්මත කරලා, සඳුදා දිනයේ ඉඳලාම ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි. මේ දක්වා කාණ්ඩ දෙකකට ගෙවීම් නැවතිලා තිබෙනවා. ඒ විධියට කටයුතු සිද්ධ වුණොත් ඒ කාණ්ඩවලට අය වැයෙන් අනුමත කරපු ආකාරයට ගෙවීම් කරලා ඉදිරියට යෑමේ හැකියාව තිබෙනවා.

ගරු කථානායකතුමනි, අලුත් ක්‍රමයක් එක්ක, අලුත් ආර්ථික රටාවක් එක්ක, අලුත් ආර්ථික රාමුවක් එක්ක අපි ගමන් කරද්දී අඩු පාඩු තිබෙන්න පුළුවන්. හැබැයි අපි ඒ වෙනසට භාජන විය යුතුයි. එතැන තිබෙන ඔක්කෝම හොඳ ටිකයි, නරක ටිකයි අරගෙන, යම් අඩුපාඩුවක් තිබෙනවා නම් ඒක නිවැරදි කරගෙන ඉදිරියට යෑම මිසක්, ඒ හොඳ ක්‍රමය සම්පූර්ණයෙන් ඉවත් කරන්න බැහැ. හැබැයි, අඩුපාඩු නිවැරදි කරන්න රජයක් හැටියට අපි කැප වී ඉන්නවාය කියන එකත් මම කියන්න ඕනෑ.

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
(මාණ්පුමිකු ජූකත් කුමාර සුමිත්‍රාරාරච්චි)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මන්ත්‍රීතුමනි, ඉක්මන් කරන්න.

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
(මාණ්පුමිකු ජූකත් කුමාර සුමිත්‍රාරාරච්චි)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
ගරු කථානායකතුමනි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා විධියට කියපු කාරණාවලට ගරු රාජ්‍ය ඇමතිතුමා උත්තර දුන්නා. මමත් මේ ගැන දිගින් දිගටම කිව්වා. අස්වැසුම ප්‍රතිලාභ වැඩසටහන පටන් ගන්නකොට ලක්ෂ සංඛ්‍යාත පිරිසකට අසාධාරණයක් වුණා. සහනාධාර ලැබිය යුතු, ඉතා සුදුසු විශාල පිරිසකගේ සහනාධාර අදටත් කැපිලා ඒ මිනිස්සුන්ට ජීවත් වෙන්න බැරි තරමට අපහසුතා රාශියකට ලක් වෙලා තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමා කිව්වාට දැනටත් ඒ අයට සාධාරණයක් වෙලා නැහැ.

ඒ වාගේම, මේ නිර්ණායක වැරදියි කියන කාරණාව අද කියැවුණා. ගරු කථානායකතුමනි, මම පටන් ගත්ත දවසේ ඉඳන්ම කිව්වා මේ නිර්ණායක වැරදියි කියලා. ඒ App එකේ තිබෙන සංකීර්ණ බව නිසා, ඒ ගිය කවුරු හෝ කණ්ඩායමකට ඒ කටයුත්ත හරියට කර ගන්න බැරි වුණා. ඒ නිසා නුසුදුස්සන් ලක්ෂ ගණනාවකට සහනාධාර ලැබිලා, සුදුස්සන් ලක්ෂ ගණනාවකට සහනාධාර අහිමි වෙලා තිබෙනවා. ඒවා නිවැරදි කිරීමේදීත් මට නම් තවම පෙනෙන්නේ නැහැ, හරියට ඒක නිවැරදි කරනවාය කියන කාරණාව. ඒ නිසා මේ වැරදි නිවැරදි කරන්න නම්, ඒ බිම ගැන දන්නා, බිමේ මිනිස්සු එක්කත් සහසම්බන්ධ වෙලා කටයුතු කළ යුතුයි. ක්‍රියාත්මක නොවෙන නීතියක් දාලා ක්ෂේත්‍ර නිලධාරීන් කාටවත් මේ කටයුතුවලට සම්බන්ධ වෙන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා ක්‍රියාත්මක නොවෙන නීතිය තාවකාලිකව හෝ අයින් කරලා ගම ගැන දන්නා, බිම ගැන දන්නා, ජනතාව ගැන දන්නා ක්ෂේත්‍ර නිලධාරීන් සම්බන්ධ කරන විධිමත් වැඩ පිළිවෙළක් හදලා මේ කාර්යය කළේ නැත්නම්, තවත් බිලියන ගණන් වියදම් කළත් අන්ත අසරණ අහිසංක මිනිස්සුන්ට මේ ප්‍රතිලාභය ලැබෙන්නේ නැහැ. ගම්වල විශාල පිරිසක් මේ සහනයට හූල්ල හූල්ලා මේ සියලුදෙනාට දොස් නහනවා. ඒ නිසා මේ ගැන විශේෂ අවධානය යොමු කරන්න කියලා මම ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් නැවතත් ඉල්ලා සිටිනවා.

ගරු ජගත් ප්‍රියංකර මහතා
(මාණ්පුමිකු ජූකත් පිරියඞ්කර)
(The Hon. Jagath Priyankara)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ජගත් ප්‍රියංකර මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමා කියන කාරණය?

ගරු ජගත් ප්‍රියංකර මහතා
(මාණ්පුමිකු ජූකත් පිරියඞ්කර)
(The Hon. Jagath Priyankara)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අස්වැසුම ප්‍රතිලාභ වැඩසටහන ගැන අපේ ගරු රාජ්‍ය අමාත්‍යතුමාත් කථා කළා; ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මන්ත්‍රීතුමාත් කථා කළා. මගේ අතේ තිබෙනවා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාවක්. ඇත්තටම අස්වැසුම ප්‍රතිලාභ වැඩසටහන ගෙනාවේ සමෘද්ධි වැඩසටහනට ආදේශකයක් විධියට. සමාජයේ විවේචනයක් තිබුණා, සමෘද්ධි සහනාධාරය සුදුසු අයට ලැබෙන්නේ නැහැ, නුසුදුසු පිරිසකටත් ලැබෙනවා, ඒ අයත් බුක්ති විඳිමින් ඉන්නවා කියලා. ඒකේ යම් සත්‍යතාවක් තිබුණා. අපි බලාපොරොත්තු වුණා එය නිවැරදි වෙයි කියලා. හැබැයි ගරු ඇමතිතුමනි, අද රටේ තිබෙන ඇත්ත තත්ත්වය මේකයි. මෙතැනදී ප්‍රායෝගික තලයේ ඇත්තටම සිදු වුණු දේ තමයි, -ඒක ඇමතිතුමා විධියට ඔබතුමාගේ වරදක්වත්, වෙනත් කාරණාවක්වත් නිසා වුණු දෙයක් නොවෙයි- වැරදි තොරතුරු මත පදනම් වෙච්ච නුසුදුසු බහුතර පිරිසකට මේ ප්‍රතිලාභය ලැබෙන එක. සහනාධාරය ලැබීම සුදුසු පිරිසකට අහිමි වෙලා, නුසුදුසු පිරිසකට එය ලැබුණා.

දත්ත එකතු කිරීමේ ඉලෙක්ට්‍රොනික ක්‍රමයක් ගැන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව අදහසක් ඉදිරිපත් කර තිබුණා. ඒ නිලධාරීන්ට දඬුවම් කිරීමට කටයුතු කිරීම පිළිබඳ වගන්තිය ගැනත් කරුණු දක්වා තිබුණා. ඒ වගන්තිය නිසා තමයි ගම් මට්ටමේ නිලධාරීන් මේ කටයුත්තෙන් ඉවත් වුණේ. මේ සමීක්ෂණ කටයුත්තේදී දඬුවම් දෙන්න පුළුවන් නිලධාරියෙක් ගම් මට්ටමේ හිටියේ නැහැ. මොකද, සමෘද්ධි සංවර්ධන නිලධාරියා මේ සමීක්ෂණය කළේ නැහැ; ග්‍රාම නිලධාරිවරයා කළේ නැහැ; ආර්ථික සංවර්ධන නිලධාරියා කළේ නැහැ. ඒ නිසා ප්‍රාදේශීය ලේකම්වරුන්ට සිද්ධ වුණා, විවිධ මට්ටම්වලින් තරුණ ළමයින් බඳවාගෙන මේ තොරතුරු ලබා ගන්න. ඒ තොරතුරු ටික ඉලෙක්ට්‍රොනික පද්ධතියට ඇතුළත් කළා. ඇතුළත් කළේ වැරදි තොරතුරු. ඒ නිසා ලැබුණේ වැරදි උත්තරයක්. අද එ් බෙදවාචකයට තමයි මේ අස්වැසුම ප්‍රතිලාභ වැඩසටහන මුහුණපාලා තිබෙන්නේ. අපේ රටේ සමෘද්ධි වැඩසටහන වෙනුවෙන් යම් මුදලක් වියදම් කළා නම්, ඒ මුදලට වඩා අතිවිශාල මුදලක් අද මේ අස්වැසුම වෙනුවෙන් වියදම් කරමින් ඉන්නවා. එතකොට එක පැත්තකින් වියදම වැඩියි. අනෙක් පැත්තෙන් අපේ අරමුණ ඉෂ්ට වෙලාත් නැහැ.

ඒ වාගේම සමෘද්ධි බැංකු පද්ධතියෙන් මේ සහනාධාර ක්‍රියාවලිය ඇත් වීමත් එක්ක, සමෘද්ධි බැංකු පද්ධතියටත් ලොකු බලපෑමක් එල්ලවෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමා දැන් කථාවක් නේ පවත්වන්නේ. ඒක පසුව කරන්න.

ගරු ජගත් ප්‍රියංකර මහතා
(මාණ්පුමිකු ජූකත් පිරියඞ්කර)
(The Hon. Jagath Priyankara)
ඒ නිසා මේ කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න කියලා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, මොකක්ද කාරණය?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව විශේෂයෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමාගෙත්, ගරු සභානායකතුමාගෙත් අවධානයට මේ කාරණය යොමු කරන්න කැමැතියි.

නිරිත දිග මෝසම ආරම්භයත් සමඟ ඇතිවෙලා තිබෙන අනපේක්ෂිත කාලගුණ තත්ත්වය තුළ මේ වන විට විශාල වශයෙන් ගංවතුර තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ අනුව ලක්ෂ සංඛ්‍යාත ජනතාව ආපදා රැසකට මුහුණ පා තිබෙනවා. මේ හදිසි අවස්ථාවේ ආපදාවලට ලක්වූවන් වෙනුවෙන් දිවා රෑ, වෙහෙස නොබලා සේවය කරන දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ට, රාජ්‍ය යන්ත්‍රණයට, පොලිසිය, ත්‍රිවිධ හමුදාව ඇතුළු ආරක්ෂක අංශවල සියලු දෙනාටම ඒ දරන උත්සාහය වෙනුවෙන් මාගේ ප්‍රණාමය පුදකර සිටිනවා.

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, මේ ආපදා තත්ත්වයට මුහුණ දී තිබෙන ලක්ෂ සංඛ්‍යාත ජනතාවට ප්‍රමාණවත් සහන ටික ඉතා කෙටි කාලීනව සපයන්න ඕනෑ බව. බොහෝදෙනකුට ආහාර, ඇඳුම්, නවාතැන් ඇතුළු සියලු දේ අහිමිවෙලා තිබෙනවා. මේ තත්ත්වය නිසා සහන සැලසීම සඳහා ඉතා විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපට ලැබී තිබෙන තොරතුරු අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට මේ වෙනුවෙන් අමතර ප්‍රතිපාදන හැටියට රුපියල් ලක්ෂ 10ක් ලබා දීලා තිබෙනවා. මම හිතනවා ඒ මුදල කිසිසේත්ම ප්‍රමාණවත් වන්නේ නැහැ කියලා.

මම විශේෂයෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි, මේ සහන ලබා දීමේදී ආපදා කළමනාකරණ විෂයභාර අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කර තිබෙන අවසාන චක්‍රලේඛය.

ඒ තමයි, 2022.05.16 චක්‍රලේඛය; විපතට පත් වූවන්ට සහන ලබා දෙන චක්‍රලේඛය. ඒ චක්‍රලේඛය නිකුත් වෙලා තිබෙන්නේ රට බංකොලොත්භාවයට පත් වුණු කාල වකාවනුව තුළ. හැබැයි ඔබතුමා දන්නවා, එයින් පසුව විශේෂයෙන් සිදු වී තිබෙන ආර්ථික කඩා වැටීම තුළ ජීවන වියදම, ජීවන බර, බඩු මිල ආදි ඔක්කොම වැඩි වෙලා තිබෙන බව. ගරු කථානායකතුමනි, මේ චක්‍රලේඛය අනුව පිසූ ආහාර සඳහා දවසකට එක පුද්ගලයෙකුට වෙන් කරන්නේ රුපියල් 450යි. වියළි සලාක සඳහා සතියකට වෙන් කරන්නේ එක පුද්ගලයෙකුට රුපියල් 1,350යි; සාමාජිකයන් දෙදෙනෙකුගෙන් යුත් පවුලකට රුපියල් 1,800යි; සාමාජිකයන් තුන්දෙනෙකුගෙන් යුත් පවුලකට රුපියල් 2,100යි; සාමාජිකයන් හතරදෙනෙකුගෙන් යුත් පවුලකට රුපියල් 2,400යි; සාමාජිකයන් පස්දෙනෙකුගෙන් යුත් පවුලකට රුපියල් 2,700යි. ගරු කථානායකතුමනි, ගණන් හදලා බැලුවොත්, සාමාජිකයන් දෙදෙනෙකු ඉන්න පවුලකට සතියකට එක පුද්ගලයෙකුට වෙන් වෙන්නේ රුපියල් 900යි. සාමාජිකයන් තුන්දෙනෙකු ඉන්න පවුලකට සතියටම එක පුද්ගලයෙකුට වෙන් වෙන්නේ රුපියල් 700යි. සාමාජිකයන් හතරදෙනෙකු ඉන්න පවුලකට සතියටම එක පුද්ගලයෙකුට වෙන් වෙන්නේ රුපියල් 600යි. සාමාජිකයන් පස්දෙනෙකු ඉන්න පවුලකට සතියටම එක පුද්ගලයෙකුට වෙන් වෙන්නේ රුපියල් 540යි. ගරු අග්‍රාමාත්‍යතුමනි, ගරු සභානායකතුමනි, මම විශ්වාස කරනවා, මේ චක්‍රලේඛය වහා වෙනස් වෙන්නට ඕනෑ කියලා. මේ චක්‍රලේඛයේ සඳහන් මුදල් ප්‍රමාණය කිසිසේත් ප්‍රමාණවත් නැහැ. මේ චක්‍රලේඛයේ සඳහන් වී තිබෙන මුදල් සොච්චමෙන්, විපතට පත් වුණු, ආපදාවට පත් වුණු ජනතාවට කන්න දෙන්න බැහැ. ඒ මුදලින් ඇත්ත වශයෙන්ම එක පුද්ගලයෙකුට එක වේලක්වත් කන්න බැහැ. එම නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මේ චක්‍රලේඛය බොහොම පැහැදිලිව වෙනස් කළ යුතුය කියන කාරණයට. මෙයට upward revision එකක්, ඒ කියන්නේ සහන ලබා දීමේ මුදල වැඩි කිරීමක් වහාම කරන්නට ඕනෑ.

මේ හදිසි ආපදා තත්ත්වය තුළ මම තවත් කාරණයක් සඳහන් කරන්නට කැමැතියි. ඒ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්නටත් කැමැතියි. අපේ රටට ලැබුණා, රේඩාර් පද්ධතියක්. මුලින්ම ඒ රේඩාර් පද්ධතිය ලැබුණේ සුනාමියෙන් පස්සේ. ඒකට කියනවා, "ඩොප්ලර් රේඩාර් පද්ධතිය" කියලා. දැන් අපට අහන්නට ලැබෙනවා, ඩොප්ලර් රේඩාර් පද්ධතියක් අලුතින්ම සවි කරන්නට තව මාස දෙකක් විතර ගත වෙනවා කියලා ආරක්ෂක අමාත්‍යාංශයෙන් නිවේදනයක් කරලා තිබෙන බව. මම මේ කථා කරන්නේ, සුනාමියෙන් පස්සේ ලැබුණු ඩොප්ලර් රේඩාර් පද්ධතිය ගැන.

එය සවි කිරීමට දෙනියාය, ගොන්ගල කන්ද මුදුනේ කුලුනක් ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව CECB එකට ලබා දුන්නත්, 2017 ජූනි 14වන දා වනකල්වත් මොකවත් වෙලා නැහැ. දරුණු සුනාමියක් ආවාට පසුව ලබා දුන් ඩොප්ලර් රේඩාර් පද්ධතියවත් සවි කර ගන්න බැරි රටක්, මේක. මොකක්ද ඒ පද්ධතියට වුණේ? ඒක ගැන ඔබතුමන්ලා විධිමත් පරීක්ෂණයක් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මම ඔබතුමාට යෝජනා කරනවා, මේ සහන ලබා දීමේ වැඩ පිළිවෙළ සහමුලින් වෙනස් කළ යුතුය කියලා. ඇත්ත වශයෙන්ම ක්‍රමවත් ආපදා කළමනාකරණ වැඩ පිළිවෙළක් තිබුණා නම් මේ මුදල් ප්‍රමාණ වාර්ෂිකව යාවත්කාලීන කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මොකද, මේ වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය කිසිසේත් ප්‍රමාණවත් නැහැ.

මම ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, විශේෂයෙන් artificial intelligence තුළින් ගංවතුර වැළැක්වීම සහ කළමනාකරණය වාගේම climate change mitigation යන කාරණා කෙරෙහි. මේ ආදි වශයෙන් ගංවතුර කේන්ද්‍රීය ප්‍රශ්නවලදී artificial intelligence උපයෝගි කරගෙන මීට වඩා ශක්තිමත් පෙර සූදානමක් ඇති කර ගන්න අපට ඇත්ත වශයෙන්ම පුළුවන්. විශේෂයෙන්ම අනාවැකි මාදිලි, තත්කාලීන විශ්ලේෂණ සහ කෙටි කාලීන කාලගුණ අනාවැකි, climate modeling, IBM අනුබද්ධ කාලගුණ සමාගම, ඇමෙරිකා එක්සත් ජනපදයේ NOAA හෙවත් ජාතික සමුද්‍රීය සහ වායුගෝලීය කළමනාකරණ නියෝජිතතාව, එක්සත් රාජධානියේ තිබෙන කාලගුණ විද්‍යා කාර්යාලය ක්‍රියාත්මක කරන NWP ආකෘතිය, ඒ algorithms, චීන කාලගුණ පරිපාලන ආයතනය - CMA - ක්‍රියාත්මක කරන වැඩසටහන්, ස්විට්සර්ලන්තයේ MeteoSwiss, දේශගුණ සංස්ථාව හෙවත් Climate Cooperation ආදි නවීන ක්‍රම සහ ආයතන ලෝකයේ තිබෙනවා, මේ වාගේ ආපදා තත්ත්ව මග හරවා ගන්න.

මම ගරු කථානායකතුමාට විශේෂයෙන් සඳහන් කරන්න කැමතියි, මට අද ලැබුණු වැදගත් තොරතුරක් ගැන. මාතර දිස්ත්‍රික්කයේත් ආපදා තත්ත්වය මේ මොහොත වනකොට බොහොම බරපතළයි. අද දවසේ warning එකකුක් දීලා

තිබෙනවා. නිල්වලා ගං දෝණියේ BR5 ගංවතුර ආරක්ෂණ බැම්ම, - "ගල් බන්ඩ්" එක - ජලය උතුරා යෑම නිසා අවදානමට ලක් වන බොහෝ ප්‍රදේශ තිබෙනවා. අත්තුඩාව ප්‍රදේශයේ පිහිටි BR5 ගල් බැම්ම - bund එක - මතින් ජලය උතුරා යෑම නිසා ඉදිරි පැය 48 ඇතුළත ගංවතුර අවදානමට ලක් විය හැකි ප්‍රදේශ හඳුනාගෙන තිබෙනවා. මම මේ කාරණය ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා.

මේ ප්‍රශ්නය නිසා ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් අද අනාථ වෙලා සිටිනවා. ඔවුන්ට සහන ලබා දෙන්න කටයුතු කරන සියලුදෙනාට අපේ ප්‍රශංසාව සහ ස්තුතිය මේ අවස්ථාවේ පුද කරනවා. ඒ වාගේම මම ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ යල් පැන ගිය චක්‍රලේඛවලට මුවා වෙලා කටයුතු කරන්න එපා කියලා. මිනිස්සු මොනවා කරන්නද, රුපියල් 450කින්? රුපියල් 450කින් එක වේලක්වත් කන්න දෙන්න පුළුවන්ද? මම මේ අවස්ථාවේදී ඉහත කී චක්‍රලේඛය **සභාගත*** කරනවා.

ගරු අගමැතිතුමා දන්නවාද දන්නේ නැහැ, මේ චක්‍රලේඛය ගැන. ගරු සභානායකතුමා දන්නවාද දන්නේ නැහැ, මේ චක්‍රලේඛය ගැන. ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු දන්නවාද දන්නේ නැහැ, මේ චක්‍රලේඛය ගැන. වහාම -අද දවසේම- මේ චක්‍රලේඛය යාවත්කාලීන කරන්න කටයුතු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න ගරු මන්ත්‍රීතුමා. මේ අවස්ථාවේ මන්ත්‍රීවරයෙක් නැතිවලා කථා කරනවා නේ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, කාලගුණය විකල් වීමෙන් මතු වෙච්ච ජාතික ආපදා තත්ත්වය පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා පැහැදිලි කිරීමක් කළා. ඒ පැහැදිලි කිරීමට මමත් එකඟ වෙනවා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ ඒ අදාළ අංශ නූතන තාක්ෂණයෙන් සන්නද්ධ කිරීමේ වැදගත්කම නැවත නැවතත් අවධාරණය වෙලා තිබෙනවා. මම ඒ පිළිබඳව විස්තරාත්මකව කියන්න යන්නේ නැහැ. ඒ ගැන ගරු විපක්ෂ නායකතුමා සඳහන් කළා. ඒ වාගේම මේ ජාතික ආපදා බෙදවාචකයට ගොදුරු වෙච්ච මේ රටේ හැම දිස්ත්‍රික්කයකම ඉන්න සියලු පවුල්වල සාමාජිකයන් වෙත, පුරවැසියන් වෙත සමස්ත පාර්ලිමේන්තුවේම කනගාටුව ප්‍රකාශ කරන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

විශේෂයෙන් මාතර ප්‍රදේශය ගැන ගරු විපක්ෂ නායකතුමාත් සඳහන් කළා. ගරු කථානායකතුමනි, මටත් පොඩි වෙලාවක් දෙන්න ඒ ගැන කියන්න. ඒ, ඔබතුමාත්, මමත් නියෝජනය කරන දිස්ත්‍රික්කය හින්දා නොවෙයි. ගරු කංචන විජේසේකර ඇමතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. ගරු අගමැතිතුමනි, මීට මාස 3කට වැඩි කාලයක් එක දිගට දැඩි ගංවතුර තත්ත්වයකට මුහුණ දීලා මාතර දිස්ත්‍රික්කය ඉතිහාසයේ බරපතළම බෙදවාචකය වාර්තා කළා. දැනට පවතින ගංවතුර තත්ත්වය මතු වන්නේ, මේ මාසයේ පළමුවැනි දා, දෙවැනි දා වාගෙයි. නමුත්, ඊට පෙර -මැයි මාසයේ 15වැනි දා- ඉඳලා දැඩි සුළං තත්ත්වයක් තිබුණා. සුළඟින් පමණක් නිවාස 680ක් ආපදාවට පත් වෙලා තිබෙනවා. ඒ, ගංවතුරට පෙර. ජූනි මාසයේ 02වැනි දා ඉඳලා අද වනකොට පවුල් 7,685ක සාමාජිකයන් 28,826ක් ආපදා තත්ත්වයට මුහුණ දී සිටිනවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15ක, පවුල් 334ක සාමාජිකයන් 1,430ක් සුරක්ෂා මධ්‍යස්ථානවල ඉන්නවා.

මේ ආපදාව ගැන කියනවා වාගේම, ගරු විපක්ෂ නායකතුමා මුදල් ගැනත් කිව්වා. ගරු කථානායකතුමනි, මම මේ කියන කාරණය කංචන විජේසේකර ඇමතිතුමාටත් කිව්වා. නාවික හමුදාවෙන් බෝට්ටු 15ක් ලැබිලා තිබෙනවා. බෝට්ටුවලින් යන්න පුළුවන් ප්‍රදේශ තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා නිහගොඩ ප්‍රදේශය ගැන දන්නවා. ඔබතුමාගේ ගම වන මාකඳුර ප්‍රදේශයේ අඩි අටක් විතර උසට විශාල ගංවතුරකින් තමයි පටන් ගත්තේ. ඒ සමහර තැන්වලට බෝට්ටුවලින් යන්න පුළුවන්. දැනට ඒ අවට දූපත් නිර්මාණය වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, සමහර තැන් තිබෙනවා, අඟුලක් නැතුව යන්න බැහැ. හැබැයි, ගරු ඇමතිතුමනි, මාතර දිස්ත්‍රික්කයට අඟුල් 19යි තිබෙන්නේ. ඔවුන් ඉල්ලා සිටිනවා, අවම වශයෙන් තව අඟුල් 21ක්වත් අවශ්‍යයි කියලා. ආපදාවට පත් වුණාට පස්සේ කොහෙන් හරි ගෙනෙන එක නොවෙයි කරන්න අවශ්‍ය වන්නේ. ඒ නිසා මම යෝජනාවක් කරනවා, ස්ථිර වශයෙන් ඒ අඟුල් 40ක අවශ්‍යතාව සම්පූර්ණ කරන්න කියලා. කිඹුලන් ගහනය වැඩි නිසා මිනිස්සු ඉතා පරිස්සමින් තමයි ගංවතුරේ ගමන් කරන්නේ. අපේ අවධානයට ලක් විය යුතු මෙන්න මේ වාගේ මූලික ගැටලු රාශියක් තිබෙනවා.

ගරු අගමැතිතුමනි, ඔබතුමා මීට පෙර සඳහන් කළා, කන්න පහේ හානියට පත් වුණු වී වගාවට, එහෙම නැත්නම් වගා හානි වෙනුවෙන් රුපියල් මිලියන 1,100ක මුදලක් තක්සේරු කරලා තිබුණා කියලා. හැබැයි, ඒ එක සතයක්වත් ලැබුණේ නැහැ. මේ වතාවේ හෙක්ටෙයාර දහස් ගණනක් පැළපත් ගොයම සහිත භූමිය වතුරට යට වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා දකින්නත් ඇති, මේ වන්දි ලබා දීමේ ක්‍රමයේදී භාණ්ඩාගාරය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර මොකක් දෝ කඹ ඇදිල්ලක් තිබෙන බව. මට ඒක තේරෙන්නේ නැහැ. ගරු අගමැතිතුමනි, තවත් ප්‍රමාද කරන්න එපා. වී ගොවියෝ, කිරි ගොවියෝ, කොරටු ගොවියෝ කියන මේ සියලුදෙනා බරපතළ අර්බුදයකට ලක් වෙලා ඉන්නේ. ඔබතුමාගේත්, පාර්ලිමේන්තුවේත්, ගරු අගමැතිතුමාගේත්, කැබිනට් මණ්ඩලයේත්, අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන කංචන විජේසේකර ඇමතිතුමාගේත් අවධානය කඩිනමින් ඒ කෙරෙහි යොමු කරන්න කියන එක තමයි අපේ ඉල්ලීම.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මැතිතුමාට ඒ කාරණයට අමතරව අමුතු දෙයක් කියන්න තිබෙනවාද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
අමුතු දෙයක් නොවෙයි. ගරු කථානායකතුමනි, කිරමආරෙන් පටන් ගත්ත මේ ව්‍යසනය මොරවක හරහා අකුරැස්ස, කඹුරුපිටියට ඇවිල්ලා නිල්වලා ගං මිටියාවතේ පහළ ජලාධාර ප්‍රදේශයට ඇවිල්ලා තිබෙනවා. වෙන විධියකට කිව්වොත්, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොටසක් වුණු අපරැක්ක, ඊළඟට තිහගොඩ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ඔබතුමාගේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යම් ප්‍රමාණයක් සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යම් ප්‍රමාණයක් ජලයෙන් යටවෙලා තිබෙනවා. දැනටත් පිසු ආහාර හෝ වතුර බෝතලයක්වත් නොලැබුණු පවුල් මාතර දිස්ත්‍රික්කයේ ඉන්නවා.

ගරු කථානායකතුමනි, 2003 අත්දැකීමත්, 2017 අත්දැකීමත් එක්ක, ගල් බන්ඩ් එකෙන් ආරක්ෂිත ප්‍රදේශවලට වතුර එනවා කියන්නේ අනතුරුදායකයි, ඒ ජලය නැවතත් ගඟට එකතු කරනවා නම් ආයේ බන්ඩ් එකක් කපලා තමයි එකතු කරන්න වෙන්නේ කියලා ඔබතුමාත් දන්නවා. එහෙම නොවුණොත්, ඒ ජලය එක තැන පල් වෙලා තව දවස් 4ක්, 5ක් ගත වනකොට දරුණු සෞඛ්‍ය අර්බුදයක් නිර්මාණය වනවා. දැන් මූලිකව පිසූ ආහාර, වියළි ආහාර හා ජල බෝතල් ලබා දීමේ ඌනතා පවතිනවා වාගේම, ඊළඟට සෞඛ්‍ය ප්‍රශ්නයක් ඇති වනවා. මම කියන්නේ නැහැ, දැනට ඒ වැඩ කරන නිලධාරීන් මෙහේට ගෙන්වන්න කියලා. මම කියන්නේ, ඒක නොවෙයි. ගරු කථානායකතුමනි, ගරු කංචන විජේසේකර ඇමතිතුමා හා රජය නියෝජනය කරන තවත් මන්ත්‍රීතුමන්ලාත්, අපි සියලුදෙනාත්, පුළුවන් නම් කොළඹ ඉන්න ප්‍රධාන නිලධාරිනුත් ඔබතුමාගේ කාර්යාලයට ගෙන්වලා ඔබතුමාගේ මූලිකත්වයෙන් වැඩ පිළිවෙළක් මේකට සකස් කරන්න. මේ මාතර සිද්ධි, මාධ්‍යවල එහෙම නැත්නම් කාර්යාලවල නිලධාරීන් කියන සුන්දරත්වය තවමත් ප්‍රායෝගිකව භූමියේ නැහැ. ඒකයි අමුතු දේ. ඔබතුමා මගෙන් ඇහුවා නේ, "අමුතු දෙයක් කියන්න තිබෙනවාද?" කියලා. ඔබතුමාට මම කියන්නේ මේකයි. කථානායකවරයා වශයෙන්, රටේ තුන්වන පුරවැසියා වශයෙන්, 1983 ඉඳලා වරින් වර මාතර දිස්ත්‍රික්කයෙන් පළාත් සභාවත්, පාර්ලිමේන්තුවත් නියෝජනය කරමින් දැනටත් ජනතා නියෝජිතයකු වශයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන ඔබතුමා මේ කටයුත්තට නායකත්වය අරගෙන, දැන්ම තීරණයක් අරගෙන අදම ක්‍රියාත්මක වන්න. මොකද, මෙදා ලැබුණු වර්ෂාපතනයේ සුවිශේෂ ලක්ෂණයක් තිබුණා. ඒ ලක්ෂණය අනුව, මාතර දිස්ත්‍රික්කයේ රේඛාවක් ඇන්දොත් නැහෙනහිර ප්‍රදේශයට තමයි වැඩි වැස්සක් ලැබුණේ. මීට කලින් අපට තිබෙන අත්දැකීම තමයි, දෙනියාය, කොටපොළ හා පිටබැද්දර පැත්තට වැඩි වැස්සක් ලැබුණු එක. එතකොට, නිල්වලා ගඟේ වැඩි ජල කඳක් කොටපොළආර හරහා තමයි ආවේ. මෙදා ඒක කිරමආර පැත්තට විතැන් වුණා. ඒක ඔබතුමා දන්නවා, අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. ඔබතුමාගේ ගම් ප්‍රදේශය යට කරගෙන තමයි ජල කඳ දැන් පහළට ඇවිත් තිබෙන්නේ. ඒ ජල කඳ තවමත් සම්පූර්ණයෙන්ම බැස යන තත්ත්වයක් නැහැ, මම සොයා බලා දැනගත් තත්ත්වය තුළ. ඒ නිසා පුළුවන් නම් ඔබතුමා අදම රැස්වීමක් කැඳවන්න. එය ඉතා වටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන රැස්වීම ගරු කංචන විජේසේකර ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගිය සෙනසුරාදා මාතර කච්චේරියේදී අපි පැවැත්වුවා. එයට සහභාගි වෙන්න ඔබතුමාට බැරි වෙන්න ඇති.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු කථානායකතුමනි, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමාත්, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාත් ඒ දක්වපු අදහස්වලට මා එකඟ වනවා. විශේෂයෙන්ම මාතර දිස්ත්‍රික්කයේ කොට්ඨාස ගණනාවක් පසුගිය කාලයේත් -මීට පෙරත්- ව්‍යසනයට ලක් වුණා. මේ මෑත කාලයේ ඇති වූ වර්ෂාපතනයත් එක්ක එ් ගොදුරු වීමට ලක් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා කියපු කාරණයට මම එකඟ වනවා. විශේෂයෙන්ම වර්ෂාපතනය වැඩි වන කාලයට, ගංවතුර ගැලීමත් එක්ක තමයි අපි අහුල් හොයා ගන්නේ. පසුගිය ගංවතුර කාලයේත් ඒ ආකාරයටම ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සම්බන්ධ වෙලා අපේ ධීවර තොටුපළවල තිබෙන අහුල් 40ක් පමණ යෙදෙව්වා, මාතර දිස්ත්‍රික්කයට.

හැබැයි, ගංවතුර කාලයට හැම තිස්සේම අහුල් ගෙනෙන එක අපහසුයි. ප්‍රවාහනය කරද්දී අහුල් කැඩෙනවා; හානි වෙනවා. එම නිසා සමහර වෙලාවට ධීවරයෝත් කැමති නැහැ අහුල් ලබා දෙන්න. අපි පසුගිය කාලයේ ඉල්ලීමක් කළා, අපේ සම්බන්ධීකරණ කමිටුවෙන් හෝ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් යම් මුදලක් වෙන් කරලා මේ සඳහා ස්ථිර විසඳුමක් ලබා දීමට කටයුතු කරන්න කියලා.

ගරු කථානායකතුමනි, මේ සඳහා පෙර සූදානමක් පිළිබඳ සාකච්ඡාවක් මීට සති දෙකකට පෙර තිබුණා. ඒ පිළිබඳ බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා දැනුවත් වෙලා සිටියාද කියන්න මම දන්නේ නැහැ. ආණ්ඩුකාරවරයාගේ සහ දිස්ත්‍රික් කමිටුවේ සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම පැවැත්වුණා. දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමෙන් පසුව මේ පිළිබඳව අවශ්‍ය පිළිවෙත් සකස් කරන්න කථා කළා.

ඒ වාගේම අපි පසුගිය ඉරිදා උදේත් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රැස් වුණා. රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමාත්, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල රත්නායක මැතිතුමාත්, හමුදාපතිවරුන් ඇතුළු ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්, මාතර දිස්ත්‍රික්කයේ සහ දකුණු පළාතේ සියලු නිලධාරීන් එම රැස්වීමට සහභාගි වුණා, ගරු කථානායකතුමනි. ඔබතුමාගේ නියෝජිතයනුත් - සම්බන්ධීකරණ නිලධාරීන් - එම රැස්වීමට සහභාගි වුණා. ඒ සියලුදෙනා එකතු වෙලා දැන් යම් සැලසුමක් සකස් කරගෙන ඒ කටයුතු කරගෙන යනවා.

මුදල්වල අඩු පාඩුවක් නැහැ, ගරු කථානායකතුමනි. මුදල් ඇති වෙන්න වෙන් කරලා තිබෙනවා. මුදල් භාවිත කරන්න අවශ්‍ය චක්‍රලේඛ නිකුත් කරලා තිබෙනවා. ප්‍රාදේශීය සභා ඇතුළු පළාත්

පාලන ආයතනවල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල තිබෙන අරමුදල් පාවිච්චි කරන්න කියලා තිබෙනවා.

විපක්ෂ නායකතුමා ඇහුවා, මේ චක්‍රලේඛ පිළිබඳ දැනුවත් නැද්ද කියලා. මට හිතුණා, ඔබතුමා ඊයේ අපේ කණ්ඩායම් රැස්වීමේ වාඩිවෙලා හිටියාද කියලා. මොකද, අපේ කැබිනට් මණ්ඩලයේත්, කණ්ඩායම් රැස්වීමේත් මේ පිළිබඳ සාකච්ඡා කරලා ජනාධිපතිතුමා මහ භාණ්ඩාගාරයට සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට උපදෙස් ලබා දීලා තිබෙනවා, මුදල් ප්‍රතිපාදන අඩුවකින් තොරව ලබා දෙන්න කියලා. ඒ වාගේම ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් ඊයේ දවසේ කොළඹ සහ කැලණියේ ස්ථාන කිහිපයක නිරීක්ෂණයකටත් එකතු වුණා. ඒ අනුව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, ඉඩම් ගොඩකිරීම වහාම නැවැත්වීමට සහ දැනට ආපදාවට ලක් වී සිටින සියලු පිරිස්වලට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න. ඒ සඳහා ක්‍රියාත්මක වෙනවා. නමුත් සමහර තැන්වලට ප්‍රවේශ වීමේ අපහසුතා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ලංකා විදුලිබල මණ්ඩලයෙන් සමහර ප්‍රදේශවල විදුලිය විසන්ධි කරලා තිබෙනවා. සමහර ස්ථානවල ඉහළ ජල මට්ටමක් තිබෙන නිසා විදුලිබලය පවත්වා ගෙන ගියොත් වෙනත් අනතුරක් සිදුවෙන්න පුළුවන්. විදුලිය වැදිලා වෙන අනතුරක් වුණොත්, මීට වඩා මරණ සංඛ්‍යාවක් වෙන්න පුළුවන්. ඒ නිසා සමහර ස්ථානවල - දකුණු පළාතේ අකුරැස්ස, මාතර, ගාල්ල, වැනි ප්‍රදේශවල - ට්‍රාන්ස්ෆෝමර් 98ක විදුලිය විසන්ධි කළා, පෙරේදා දවසේ. ඒවා එකින් එක තමයි connect කරගෙන යන්නේ, වතුර බැහැගෙන ගියාට පස්සේ. ඒ ක්‍රම දැනට ක්‍රියාත්මක වෙනවා.

ඒ එක්කම, අපි ආහාර ලබා දීමට සුරක්ෂිත මධ්‍යස්ථාන හදුනාගෙන තිබෙනවා. ඒවාට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. යුද හමුදාව ඇතුළු අනෙකුත් හමුදා ඒ කටයුතු භාරව ක්‍රියා කරන බවත් මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් රාජ්‍ය ඇමතිතුමා.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන් - පාදුකාප්පු ඉරාජාංග අමෙච්චර්)
(The Hon. Premitha Bandara Tennakoon - State Minister of Defence)
ගරු කථානායකතුමනි, රටේ පවතින සමස්ත තත්ත්වය පිළිබඳව දැනුවත් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(මාණ්පුමිකු කාමිණි වලෙපොඩ)
(The Hon. Gamini Waleboda)
ගරු කථානායකතුමනි, රටේ සමස්ත තත්ත්වය ගැන කථා කරන්න කලින් මේ ගැනත් කියන්න ඕනෑ. ඔබතුමා මාතර දිස්ත්‍රික්කයේ නිසා, මාතර ගැන කථා කරන්න අවස්ථාව දුන්නා. ලංකාව කිව්වාම මාතර විතරද? මාතර විතරද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමා පොඩ්ඩක් ඉන්න. අවස්ථාව දෙන්නම්. *[බාධා කිරීම්]*

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, දිස්ත්‍රික්ක 23ක - *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඇමතිතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්න.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
පළාත් ගත්තොත්, විශේෂයෙන් පළාත් 3ක පවුල් 33,422ක 130,021ක පිරිසක් මේ ආපදා තත්ත්වය නිසා පීඩාවට ලක් වෙලා තිබෙනවා. මේ පිරිස - *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමා,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඇමතිතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්න.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
ආපදා සහන මධ්‍යස්ථාන 116ක පවුල් 2,368ක් -

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් රාජ්‍ය ඇමතිතුමාට මම ඉතා ඕනෑකමින් කියනවා, ගංවතුර ගලලා තිබෙන්නේ මාතරට විතරක් නොවෙයි කියලා. රත්නපුරේ මේ ගරු මන්ත්‍රීතුමාටත්, කොළඹ දිස්ත්‍රික්කයේ අපටත්, කළුතර දිස්ත්‍රික්කයේ මෙතුමන්ලාටත් මේ ගැන කියන්න අදහස් තිබෙනවා. ඒක මේ වෙලාවේ ඉතා සංවේදී කාරණයක්. ඒ නිසා ඒ අදහස් ටික අපි කෙටියෙන් කියන්නම්. ඒ අදහස් ටිකට ඇහුම්කන් දීලා, ගරු රාජ්‍ය ඇමතිතුමා ඊට පසුව ප්‍රතිචාර දක්වන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, රත්නපුරත්, කළුතරත් ගංවතුර තත්ත්වයට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විශාල වැඩ පිළිවෙළක් කළා. ගාල්ල දිස්ත්‍රික්කයේ,- *[බාධා කිරීම්]* හරි, හරි, ඒක තමයි මමත් කියන්න හදන්නේ. ගරු කථානායකතුමනි, එතුමන්ලාටත් අවස්ථාව දීලා ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් රාජ්‍ය ඇමතිතුමාට උත්තර දෙන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔව්, ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

අරගළ කරන්න ඕනෑ, බුද්ධිය පහළ වෙන්න. ඔබතුමන්ලා හිතාගෙන ඉන්නේ ලංකාව කියන්නේ මාතර දිස්ත්‍රික්කය විතරයි කියලා. *[බාධා කිරීමක්]* එහෙම නොවෙයි. ඇයි අපේ මිනිස්සු, මිනිස්සු නොවෙයිද? කොහොම හරි අරගළ කරලා ප්‍රතිඵලයක් විධියට මේ අවස්ථාව ලබා ගත්තා. දැන් බලන්න, අපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18යි තිබෙන්නේ ගරු කථානායකතුමනි. ඉන් 14ක් ආපදාවට ලක් වෙලා තිබෙනවා. ග්‍රාම නිලධාරී වසම් 200ක් ආපදාවට ලක් වෙලා තිබෙනවා. ඒ වාගේම දැනට පීඩාවට පත් වෙලා තිබෙන පවුල් සංඛ්‍යාව 7,611ක්. විපතට පත් වෙලා තිබෙන සාමාජික සංඛ්‍යාව 28,552ක්. නිවාස 10කට වඩා කැඩිලා ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම 16 දෙනෙක් මේ වෙනකොට ගං වතුර තත්ත්වය නිසා මැරිලා තිබෙනවා. එයින් 8 දෙනෙකුට ආසන්න පිරිසක් රත්නපුර දිස්ත්‍රික්කයේ අය. සමාන්‍ය තත්ත්වය ගත්තොත්, රත්නපුර දිස්ත්‍රික්කය අවුරුද්දකට සැරයක් ගං වතුරට යට වෙනවා කියලා පිළිගැනීමක් තිබෙනවා. මෙය ප්‍රායෝගිකව සිද්ධ වෙන දෙයක්. නමුත් පැවති කිසි රජයකට හැකියාවක් ලැබිලා නැහැ, රත්නපුර දිස්ත්‍රික්කයට සිදුවන මේ කළු ගහ පිටාර ගැලීම නිසා ඇතිවන ගංවතුර ප්‍රශ්නයට විසඳුම් දෙන්න.

හැබැයි, අද පැන නැඟිලා තිබෙන තත්ත්වය ඊට වඩා වෙනස්. අද අයගම ප්‍රදේශයට තවම ළඟා වෙන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. ඒ ප්‍රදේශයේ තවම වතුර බහින්නේ නැහැ. ඒ වාගේම කිරිඇල්ල, නිවිතිගල, කුරුවිට, ඇහැලියගොඩ ප්‍රදේශ ආපදාවට ලක් වෙලා. ඇහැලියගොඩ ප්‍රදේශයේ සංඛ්‍යාව කොපමණද කියලා හොයා ගන්න බැරි තරම් පිරිසක් අවතැන් වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. මේක අපේ රත්නපුර දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි, මාතර දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි, ලංකාවේ හැම තැනටම බලපා තිබෙන ප්‍රශ්නයක්. මේ වෙනකොට රාජ්‍ය යන්ත්‍රණය යම් පමණකට ක්‍රියාත්මක වෙනවා තමයි. නමුත් ක්‍රියාත්මක වෙන්න පුළුවන් ප්‍රමාණයට වඩා, ක්‍රියාත්මක වෙන්න තිබෙන සම්පත් ප්‍රමාණයට වඩා වැඩි ධාරිතාවක කටයුතු එතුමන්ලාට පැවරිලා තිබෙනවා. එම ධාරිතාව සම්පූර්ණ කර ගන්න ඕනෑ කරන පහසුකම් රජය මැදිහත් වෙලා මේ වෙලාවේ ලබා නොදුන්නොත්, ඊට වඩා එහා ගිය අගතිදායක තත්ත්වයකට ඒ අහිංසක මිනිස්සු පත් වෙනවා.

එක ගෙදරක ළමයෙක් බේරාගෙන තිබෙන්නේ, පුටුවක් ඇඳ උඩ තියලා ඒක උඩ නැඟලා, ළමයා කරේ තියාගෙන කුඩයක් ඉහලාගෙන ඉඳලා. හැබැයි, ඊට අල්ලපු ගෙදර අයත් ඒ විධියට උඩ නැඟලා හිටියාට බේරා ගන්න කෙනෙක් ඇවිල්ලා නැහැ. ඔළුවට උඩින් වතුර ගිහිල්ලා කරේ තියාගෙන හිටපු ළමයි දෙන්නාත්, වැඩිහිටියන් දෙන්නාත් ගිලිලා මැරුණා. ඒ මිනිසුන්ගේ වේදනාව තමයි අපි මේ පිට කරන්නේ. ඒ මිනිස්සු, මිනිස්සු නොවෙයිද? ඒ නිසා, කරුණාකරලා ඒ සම්බන්ධවත් අවධානය යොමු කරන්න. සහන කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රවේශවීමක් අද වෙනකොටත් දකින්න ලැබෙන්නේ නැහැ. රාජ්‍ය යන්ත්‍රණයට, ඒ නිලධාරීන් කණ්ඩායමට විතරක් කටයුතු කරන්න අමාරුයි. ඒ අය කරන්නේ නැහැ කියලා නොවෙයි මේ කියන්නේ. ආහාර ටික බෙදන්න බෝට්ටු නැහැ. බෝට්ටු තිබුණත්, බෝට්ටු පදින අය නැහැ. දැනට පන්සල්වල, වෙහෙර විහාරවල, පල්ලිවල, කෝවිල්වල, දේවාලවල ආහාර උයලා දෙනවා. නමුත් ආහාර උයා ගන්න ඕනෑ කරන පහසුකම් නැහැ.

ඒ වාගේම ගංවතුරෙන් පස්සේ බරපතළ රෝග ව්‍යාප්තියකට අවස්ථාව සැලසෙනවා. ඒ පිළිබඳවත් රජයේ අවධානය යොමු කරලා, මේ කටයුතු කරන්න සිවිල් ආරක්ෂක සේවයේ නිලධාරීන් හරි යොදවන්න කියලා අපි කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, ගංවතුර ප්‍රශ්නය නිසා ගාලු දිස්ත්‍රික්කයේ ජනතාවත් අවුරුද්දට කිහිප වතාවක් පීඩාවට පත් වෙනවා. මෙවරත් දිනපතා ඇද හැලුණු ධාරානිපාත වර්ෂාවත් එක්ක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ ගණනාවක ජනතාව විපතට පත්වෙලා සිටිනවා. පිසූ ආහාර සඳහා මුදල් වෙන් කළාය කිව්වත්, තවමත් විධිමත්ව ඒවා ලැබිලා නැති ප්‍රදේශ තමයි වැඩි හරියක් තිබෙන්නේ.

මම අවසාන වශයෙන් මේ වෙලාවේ කියන්න කැමැතියි, ගංවතුර ප්‍රශ්නය ගැන අය වැය කථාවේ දී ජනාධිපතිතුමා සඳහන් කළ කාරණයක්. ගාලු දිස්ත්‍රික්කයේ ගංවතුර උවදුර නැති කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් සඳහා මුදල් වෙන් කළාය කියලා එතුමා සඳහන් කළා. ඉතින්, අද එම ජනතාව ගංවතුරෙන් විපතට පත්වෙලා සිටින වෙලාවේ මම ඒ පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානය යොමු කරවනවා. ඒකට මොකද වුණේ කියලා බලලා - *[බාධා කිරීමක්]* මිලියන 200ක්ද කොහේද. ඉතින් ඒකට වෙච්ච දෙයකුත් නැහැ. ඒවා කෙරෙයි කියලා අපි එදා සතුටු වුණා.

එම නිසා විපතට පත් වෙච්ච ප්‍රදේශවලට බෙදා හරින දේවල් කඩිනමින් ලබාදීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා ගාල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, මේ ගංවතුර තත්ත්වය නිසා ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දහතුනම වාගේ මේ වන විට ඉතාම දරුණු තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. ඊයේ දිනයේ දී මමත් පුළුවන් හැම තැනකටම යන්න උත්සාහ කළා. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. පෙරේදා උදේ තමයි ගංවතුර ගැලුවේ. නමුත්, ඊයේ හැන්දැව වෙනකොටත් හරියට උපදෙස් ටික ලබා දෙන්න ග්‍රාම නිලධාරීන්ට හැකිවෙලා තිබුණේ නැහැ. ඒ ග්‍රාම නිලධාරීන් ඇවිල්ලා ගොඩක් අයට කියලා තිබෙන්නේ, "කඳවුරු තිබුණොත් විතරයි අපට සහන ලබාදෙන්න පුළුවන් වෙන්නේ" කියන එකයි. ඒක ඊට පස්සේ වෙනස් වෙලා තිබෙනවා කියලාත් ප්‍රකාශ කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මේක හැමදාම වෙන දෙයක්. ගංවතුරක් ආවාට පස්සේ විපතට පත් වෙන හැමෝම කඳවුරුවලට යන්නේ නැහැ. හැමදාම කියනවා චක්‍රලේඛයක් තිබෙනවා කියලා, "කඳවුරු තිබුණොත් විතරයි මේ මුදල් දෙන්න පුළුවන්" කියලා. ඊට පස්සේ, ඒ රැස්වීම් පවත්වලා එතැනින් ඒක වෙනස් වෙනකම් ඒ අයට මොනවත් කරන්න බැහැ. ඒ නිසා අපි කාරුණිකව ඉල්ලීමක් කරනවා. ගංවතුරක් ආවාට පස්සේ වාඩිවෙලා රැස්වීම් පවත්වලා, මේ චක්‍රලේඛ වෙනස් කරනකම් ඉන්නේ නැතිව මේවා ඉක්මනින්ම වෙනස් කරන්න කියලා. ගරු කථානායකතුමනි, මම උදාහරණයක් කියන්නම්. මල්වාන ප්‍රදේශය හැමදාම ගංවතුරට යට වෙනවා. ඇත්තටම එවැනි අවස්ථාවලදී ඒ ප්‍රදේශවල සිටින ආගමික නායකයන් මැදිහත් වෙලා තමයි විපතට පත් ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් උපරිම සේවාව කරන්නේ. ගංවතුර පැමිණි හැම අවස්ථාවකදීම ඒගොල්ලන්ට බෝට්ටුවක් ලබා දෙන්න කියලා

ඉල්ලා සිටියා. මම මේ කියන්නේ සාමාන්‍ය දෙයක්. මේ වාගේ ප්‍රදේශ ගණනාවක් තිබෙනවා. සමනබැද්ද වෙන්න පුළුවන්, කැලණි මිටියාවත ආශ්‍රිත ප්‍රදේශවලට වෙන්න පුළුවන්, මේ ප්‍රදේශවල තිබෙන ආගමික මධ්‍යස්ථානවලට, පොදු තැන්වලට බෝට්ටු ටිකක් ලබා දෙන්න කියලා මේ ගොල්ලන් හැමදාම ඉල්ලනවා. මේ වාගේ ගංවතුර පැමිණි කාලයේ දී මේ සම්බන්ධයෙන් කථා වෙනවා. නමුත්, ගංවතුර බැස ගියාට පස්සේ ඒ ගැන කථාවක් නැහැ; ඒ දේවල් ක්‍රියාත්මක වෙන්නේත් නැහැ. එම නිසා කරුණාකරලා මේ ප්‍රදේශවලට අවශ්‍ය ඒ පහසුකම් ටික ලබා දෙන්න.

ඊළඟ ප්‍රධානම කාරණාව තමයි මේ ප්‍රදේශවල තිබෙන ළිං සම්බන්ධ ප්‍රශ්නය. අද වන විට යම් පිරිසකට නැවත තමන්ගේ නිවාසවලට යන්න පුළුවන් වෙලා තිබෙනවා. ඊළඟට තිබෙන ලොකුම ගැටලුව තමයි පානීය ජල ප්‍රශ්නය. ගංවතුර තත්ත්වයත් එක්ක මේ ළිං සියල්ලම දැන් මඩවෙලා, ඒ ළිංවල ජලය පානය කරන්න පුළුවන් තත්ත්වයේ නැහැ. එම නිසා කරුණාකරලා ඔබතුමන්ලා හැකි ඉක්මනින් ත්‍රිවිධ හමුදාව යොදවලා ඒ ළිං ශුද්ධ කරලා පානීය ජලය ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා මේ වෙලාවේදී අපි ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, දැන් තමයි කළුතර දිස්ත්‍රික්කය ජලයෙන් යට වෙන්නේ. රත්නපුරයේ ගංවතුර බහිනකොට කළුතර දිස්ත්‍රික්කය යට වෙනවා. මේ වන විට අපේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10ක ගංවතුර තර්ජනය එන්න එන්නම වැඩිවෙමින් තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයට සේම අපේ දිස්ත්‍රික්කයටත් ප්‍රමාණවත් අහුල් යාත්‍රා නැහැ. ඒ වාගේම, සහනාධාර බෙදාදීම සඳහා ප්‍රමාණවත් ද්‍රව්‍ය සහ ආධාරත් තවම ලැබිලා නැහැ. එම නිසා මම අනෙකුත් දිස්ත්‍රික්කවලට වාගේම කළුතර දිස්ත්‍රික්කයේත් පවතින මේ ගැටලුව පිළිබඳව මේ අවස්ථාවේ දී විශේෂ අවධානය යොමු කරවනවා. ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් කටයුතු කරන අමාත්‍යතුමාට මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා, ගංවතුර තර්ජනයට ලක් වෙච්ච දිස්ත්‍රික්කවල මහජන නියෝජිතයන්. ඒ දිස්ත්‍රික් නියෝජිතයන් ටික ඉක්මනින් කැඳවලා, දිස්ත්‍රික්කවල තිබෙන ගැටලු ටික වාර්තා කරගෙන ඒවා විසඳීම සඳහාත් වහාම ක්‍රියා මාර්ගයක් ගන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
ගරු මිලාන් ජයතිලක මන්ත්‍රීතුමා.

ගරු මිලාන් ජයතිලක මහතා
(මාණ්පුමිකු මිලාන් ජයතිලක)
(The Hon. Milan Jayathilake)
ගරු කථානායකතුමනි, මේ වන විට මල්වාන ප්‍රදේශය ඇතුළු ගම්පහ දිස්ත්‍රික්කයේ ගංවතුරට යට වෙච්ච හැම තැනකටම දිසාපතිතුමා සමඟ අපේ දිස්ත්‍රික් නායකතුමාත් සම්බන්ධ වෙලා කථා කරලා, සාකච්ඡා කරලා වැඩසටහනක් හදලා තිබෙනවා. අපේ විපක්ෂයේ සිටින ගරු මන්ත්‍රීවරු සියලු දෙනාත් කරුණාකරලා හැම කෙනෙකුම දැනුවත් කරන්න. ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, ගමේ සිටින ඔබේ නියෝජිතයන් හරහා අපව දැනුවත් කරන්න කියන්න. මොකද, සම්බන්ධීකරණ කමිටුව හරහා ඒ සියලු දෙනාට අවශ්‍ය පහසුකම් සලසන වැඩ කටයුතු සකස් කරලා තිබෙනවා. අපි මේ වන විට බෝට්ටුත් ප්‍රාදේශීය සභාවට යොමු කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ කටයුත්තේ දී නාවික හමුදාව වාගේ ස්ථානවලින් සම්බන්ධීකරණයක් ඇති කරලා තවදුරටත් මේ කටයුතු ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් වඩාත් හොඳයි කියලා අපිත් විශ්වාස කරනවා. මේ වන විට ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සකස් කර තිබෙනවා. මේ වන විට ළිඳක් ඉහින කටයුත්තේ ඉඳන් අපි සැලසුම් කරලා අවසන්. ඒ සඳහා අවශ්‍ය සහයෝගය මේ වන විට ලබා දෙනවා. සමහර විට අපට කිහිපයක් අත හැරෙන්න පුළුවන්. ඒ දේවලුත් සම්බන්ධීකරණය කරලා අවශ්‍ය කටයුතු කරන්න අපට සහාය ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභාපතිවරයා)
(The Hon. Speaker)
ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා. ඔබතුමාගේ කාරණයත් ඉක්මනින් කියන්න. ඔබතුමන්ලා සියලුදෙනාම එකම කාරණය නේ කියන්නේ.

ගරු ලලිත් එල්ලාවල මහතා
(මාණ්පුමිකු ලලිත් එල්ලාවල)
(The Hon. Lalith Ellawala)
ගරු කථානායකතුමනි, එකම කාරණය නොවෙයි මම කියන්නේ. අනෙක් මන්ත්‍රීතුමන්ලා කියපු දේවල් ගැන මම කථා කරන්නේ නැහැ. ගරු කථානායකතුමනි, ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා කිව්වා වාගේ කළුතර දිස්ත්‍රික්කය පිළිබඳව අපි දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. මොකද, රත්නපුර දිස්ත්‍රික්කයේ වතුර ටික බහිනකොට කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණනාවක්ම වතුරෙන් යට වෙලා තිබෙනවා. මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුවර, පාතකඩ යන කළු ගඟ අවට ප්‍රදේශයේ ඊයේට වඩා අද උදේ වනකොට ජල මට්ටම අඩි 3කට වැඩි ප්‍රමාණයක් ඉහළ ගිහිල්ලා. ඒ ජල මට්ටම තවත් ඉහළ යනවා. ඒකත් එක්කම තවමත් වතුර බෝතලයක්වත් නොලැබුණු, ගංවතුරට කොටු වෙච්ච මිනිස්සු ඉන්න ප්‍රදේශ තිබෙනවා. ඒ ප්‍රදේශවල ජනතාවට පානීය ජලයවත් නැහැ. ඒ නිසා මම ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ වෙනුවෙනුත් කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. දැන් ප්‍රාදේශීය සභා විසුරුවා තිබෙන නිසා ප්‍රාදේශීය සභාවල ජනතා නියෝජිතයෝ නැහැ. ඒ නිසා මේ වෙලාවේ සාමාන්‍ය ජනතාවට විශාල අපහසුතා ඇති වී තිබෙනවා. එම නිසා ඒ අයට රජයෙන් ලබාදෙන සහන ක්ෂණිකව ලබා දෙන්න.

ඊළඟට මම අධ්‍යාපන ඇමතිතුමාට මේ කාරණය යොමු කරන්න කැමැතියි. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමා කරන සේවය වෙනුවෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ එක්කම මම ඔබතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරන්න කැමැතියි. දැන් කළුතර දිස්ත්‍රික්කයේ සියලු පාසල් වසා දමා තිබෙන්නේ. දීර්ඝ කාලයක් ළමයින්ට අධ්‍යාපන කටයුතු කරගන්න නොලැබුණු නිසා මේ අවස්ථාවේදී මා යම් ඉල්ලීමක් කරනවා. උදාහරණයකට බණ්ඩාරගම කොට්ඨාසය සහ පානදුර කොට්ඨාසය ගත්තාම, ඒ කොහේවත් ගංවතුර ගැලීමක් වැනි ආපදාවක් සිද්ධ වෙලාත් නැහැ, ගුරුවරුන්ට එන්න අපහසුතාවකුත් නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, පාසල්වලට නිවාඩු දෙනකොට ඒ වාගේ දේවල් ද සැලකිල්ලට ගන්න කියලායි. වතුරෙන් යට වන ප්‍රදේශ සම්බන්ධයෙන් නම් ගැටලුවක් නැහැ. නමුත්, අර වාගේ කොට්ඨාසවල ගුරුවරුන්ටත් පාසල් එන්න පුළුවන්, ළමයින්ටත් පාසල් එන්න පුළුවන්. අන්න ඒ කාරණා ගැන අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මා කරනවා.

[ගරු ලලිත් එල්ලාවල මහතා]

ඒ වාගේම මම ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ ආපදා තත්ත්වය ගැන මීට වඩා අවධානය යොමු කර ජනතාවට අවශ්‍ය සහන කඩිනමින් සලසන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාම එකම කාරණය කියන්න එපා. *[බාධා කිරීම්]* ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமண வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

ගරු කථානායකතුමනි, ඔබතුමා කිව්වා වාගේම වඳුරෝ ගෙවල් හදනවා වාගේ වහිනකොට තමයි අපි ගංවතුර පාලනයයි, අඟුල් ගැනයි කථා කරන්නේ. ඒ සඳහා කිසිදු සාර්ථක වැඩ පිළිවෙළක් ලංකාවටම නැහැ. ඒක මාතර දිස්ත්‍රික්කයටත්, කළුතර දිස්ත්‍රික්කයටත්, රත්නපුර දිස්ත්‍රික්කයටත් එකයි. අපේ රටට මෙහෙම වෙලා තිබෙන්නේත් ඒ නිසායි. ඔබතුමාත්, මාත් පෞද්ගලිකව මේ අර්බුදය තුළ බරපතළ පීඩාවට පත් වෙනවා. අපට අසීමිත ගංවතුරක් ආවා. ඉතිහාසයේ සිදු වූ වැඩිම වර්ෂාපතනය හේතුවෙන් ඔබතුමා ඉන්න මාකඳුර ප්‍රදේශයටත්, මාතර පිටබැද්දර ප්‍රදේශයටත් මෑත කාලයේ විශාල ගංවතුරක් ඇති වුණා. ඒ නිසා දැන් මාතර දිස්ත්‍රික්කයේ විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. නමුත් මාතර දිස්ත්‍රික්කය ගැන විතරක් කථා කරන ප්‍රශ්නයක් නොවෙයි මේක. මේ කාරණාවට රජයේ මැදිහත් වීම වෙනදාට වඩා හොඳයි. ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මෙහිදී රාජ්‍ය නිලධාරිනුත් යම් මැදිහත්වීමක් කළා. විශේෂයෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් මේ අවස්ථාවේදී විශාල මැදිහත්වීමක් කරනවා. ඒක ඇත්ත. හැබැයි, ඔවුන්ට අවශ්‍ය පහසුකම් කිසි දෙයක් දෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඔවුන්ට අවශ්‍ය මැදිහත්වීමත් සිද්ධ වෙන්නේ නැහැ. දැන් මේ අඟුල් ගැන කථා කරන්නේ ගම් යට වුණාට පස්සේ. අපි අඟුල් ඉල්ලුවේ කොයි කාලයකට කලින් ද? අඟුලක්වත් දෙන්න බැරි නම් මේ තත්ත්වය හරි භයානක තත්ත්වයක්. ගරු කථානායකතුමනි, ඔබතුමාට 2003, 2017 වර්ෂවල ගංවතුර ආපු අවස්ථා මතක ඇති. ඒ ගංවතුර අවස්ථාවල සහ මේ ගංවතුර ආපු අවස්ථාවේ -මේ හැම ගංවතුරක්ම- මොකක්ද්ෝ කරුමයකට -මම මේක දේශපාලනීකරණය කරනවා නොවෙයි- රනිල් වික්‍රමසිංහ මහත්මයා තමයි මුල් පුටුවේ හිටියේ. මේ, "දේවෝ වස්සතු කාලේන, සස්ස සම්පත්ති හෝතු ච, පීතෝ භවතු ලෝකෝච, රාජා භවතු ධම්මිකෝ" ද කියලා ප්‍රශ්නයක් මතු වෙනවා.

මේ අවස්ථාවේ අපි කවුරුත් එකතු වෙන්න ඕනෑ. ගරු අගමැතිතුමාත් දැක්කා, මීට පෙර ඉතිහාසයේ කවදාවත් සීතාවක ප්‍රදේශයට මෙවැනි ක්ෂණික වතුර පාරක් ආවේ නැහැ කියලා. ඒ වාගේ තමයි මාතර, පිටබැද්දර, මාකඳුර, කඹුරුපිටිය ප්‍රදේශවලටත් ඇති වුණු ගංවතුර තත්ත්වය. ඒ නිසා මේ අවස්ථාව මේ රටට ඇති වූ ජාතික ආපදා තත්ත්වයක් විධියට සලකා මේකට ස්ථිර විසඳුමක් දෙන්න. පාර්ලිමේන්තුවේ කාරක සභා තිබෙනවා, රටේ අමාත්‍යාංශ තිබෙනවා, ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන තිබෙනවා.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ඔබතුමාත් පැහැදිලිව දන්නවා, මේ වනකොට ගාලු දිස්ත්‍රික්කයේ විශාල ප්‍රදේශයක් ගංවතුරට යට වෙලා තිබෙන බව. මේ වනකොටත් වැලිවිටිය ප්‍රදේශයේ ගංවතුර තත්ත්වය වැඩි වෙමින් පවතිනවා. මේ වාගේ තත්ත්වයකදී රජයේ නිලධාරිනුත් උදවු කළා. මේ අවස්ථාවේ යිවර කාර්මිකයන් ඔවුන්ගේ බෝට්ටු ගෙනිහිල්ලා කරන සේවයත් අපි අගය කරන්න ඕනෑ. ගාලු දිස්ත්‍රික්කයට ආපදාවක් තිබෙනවා. හැබැයි, මාසයක් තිස්සේ ගාල්ල දිස්ත්‍රික්කයට දිසාපතිවරයෙක් නැහැ. ඒ නිසා මේ කටයුතු කරගන්න අමාරුයි. ගාල්ල දිස්ත්‍රික්කයේ ඉන්න ඇමතිවරුෑ දිසාපති ධුරය සඳහා එක එක නම් ඉදිරිපත් කළාම ඒ නම්වලට පිරිසක් පක්ෂ වෙනවා, පිරිසක් විරුද්ධ වනවා. මෙහි ප්‍රතිඵලයක් විධියට ගාල්ල දිස්ත්‍රික්කයට අදටත් දිසාපතිවරයෙකු නැහැ. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, කරුණාකරලා ගාල්ල දිස්ත්‍රික්කයට දිසාපතිවරයෙක් පත් කරන්න කටයුතු කරන්න කියලා. ඒ වාගේම මේ අසීරු අවස්ථාවේ මේ කටයුතු කරන රජයේ සේවකයන්ට යම් දිරිගැන්වීමක් කරන්න. ඒ වාගේම මේ කටයුතුවලට ස්වේච්ඡාවෙන් සම්බන්ධ වෙච්ච බෝට්ටු හිමියන්ට යම් පිළිගැනීමක් ලබා දෙන්න. ඒ අයට රජය වෙනුවෙන් ස්තුතියක් කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, මම ඔබතුමාටත්, ගරු රාජ්‍ය ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා, අපේ ඉල්ලීමට ඇහුම්කන් දීලා මේ අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම ගැන.

මම ඉතාම කෙටියෙන් මේ කාරණය කියනවා. ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා ඇතුළු අපි කොළඹ දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයෝ. මීට පෙර කියවුණා වාගේ සීතාවකට එකවර කඩා වැටිච්ච ඒ මහා ගංවතුර වාහන පවා ගහගෙන යන මට්ටමේ ගංවතුරක්. ඒ නිසා ගෙවල් විශාල ප්‍රමාණයක් විනාශ වෙලා තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, කඩුවෙල ආසනයත් විශාල ගංවතුර පීඩනයකට ලක් වෙලා තිබෙනවා. එම නිසා ඒ ප්‍රදේශයේ මහජනතාවත් අවතැන් වෙලා තිබෙනවා. කලින් කිව්වා වාගේ ප්‍රාදේශීය සභාව කියන ආයතනය දැන් මහජන නියෝජිතයන්ගෙන් විරහිත ආයතනයක් නිසා මීට පෙර ගංවතුර ඇති වෙච්ච අවස්ථාවලදී ක්‍රියාත්මක වෙච්ච ආකාරයට මෙවර ක්‍රියාත්මක වෙන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා නිලධාරීන්ගෙන් සහ අනෙකුත් ආරක්ෂක අංශවලින් තමයි මේ කටයුතු පිරිමහගන්න වෙලා තිබෙන්නේ. හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු මෙතැනදී ඉතා අසරණ වෙලා තිබෙනවා. මොකද, මහජනයා ඔවුන් ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රීවරයෙකුද, ඉන්න මන්ත්‍රීවරයෙකුද කියන එක ගැන සැලකීමකින් තොරව ඔවුන්ගෙන් තමයි පිළිසරණ අපේක්ෂා කරන්නේ. ඒ නිසා ගරු අග්‍රාමාත්‍යතුමාගෙනුත්, ගරු කථානායකතුමාගෙනුත් මම ඉල්ලනවා, මේ ගංවතුර පාලනය පිළිබඳ ක්‍රියාවලියට පක්ෂ භේදයකින් තොරව හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුත් දායක කරගන්න කියලා. මේ කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම්, නාගරික කොමසාරිස් වැනි අය ඉන්න පුළුවන්. හැබැයි, හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට නියමිත කොට්ඨාස තිබෙනවා. ඒ කොට්ඨාසත් ගංවතුරට යට වෙලා තිබෙනවා. ඒ ප්‍රදේශවල ගංවතුරට ලක් වෙච්ච මිනිස්සු ඇවිල්ලා දුක්ගැනවිල්ල කියන්නේ ඒ අයට. ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් රාජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා මා ඉතා ඕනෑකමින් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට, නගර සභා මන්ත්‍රීවරුන්ට -ඒ අය මොන පක්ෂයේ වුණත් කමක් නැහැ. ඔවුන් හිටපු මන්ත්‍රීවරුන් වුණාට කමක් නැහැ- නියෝජනයක් දෙන්න, මේ ගැටලුව විසඳන්න ගන්න පියවරවලදී ඔවුන්ගේ අදහස් සැලකිල්ලට ගැනීමට.

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

ගරු කථානායකතුමනි, විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා වාගේ කඩුවෙල, මා නියෝජනය කරන පාදුක්ක, සීතාවක වාගේම කොළොන්නාව ඇතුළු කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රදේශ ගණනාවක් ගංවතුරින් යට වෙලා විතරක් නොවෙයි, නායයෑම්වලටත් ලක් වෙලා තිබෙනවා. ඒ වාගේම, ආයෙත් පදිංචි වෙන්න බැරි තරමටම ගෙවල් කිහිපයකුත් විනාශ වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ අයට ආහාරපාන ලැබීමේදීත් යම් ප්‍රශ්න තිබෙනවා. දැනටමත් ඒ සඳහා රජය යම් මැදිහත්වීමක් කරනවා. ගරු ජනාධිපතිතුමා ඊයේත් කොළොන්නාවට ගිහිල්ලා ඒ ගැන සොයා බැලුවා. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත්, මේ වෙලාවේ ඒ දේ පමණක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. කඩිනම් සහන සැලසීමකට යන්න ඕනෑ. බත් පැකට් එකක් දෙන්න රුපියල් 100ක් වාගේ මුදලක් වියදම් කිරීම නිසා ආපදාවට ලක් වූ මේ මිනිස්සුන්ට ඒ සහනය දෙන්න මැදිහත් වෙන නිලධාරිනුත් අපහසුතාවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ සහන සලසන්න යම් වැඩි මුදලක් යොදවන්න කියාත්, නිවාස ඇතුළු පදිංචියට යන්න අවශ්‍ය තැන් හදන්න යම් වැඩ පිළිවෙළක් හදන්න කියාත්, ගරු අගමැතිතුමා නියෝජනය කරන සීතාවක වාගේ ප්‍රදේශවල සහ අප නියෝජනය කරන පාදුක්ක වාගේ ප්‍රදේශවල ඒ නායයෑම් ආවදානම් තුළ තිබෙන ගැටලුසහගත තත්ත්වයට දීර්ඝ කාලීන විසඳුමක් දෙන්න කියාත් ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මා ඉල්ලනවා.

ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

ගරු කථානායකතුමනි, මේ ආපදා තත්ත්වය තුළ කුලියාපිටිය, නැහෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් වසම් 16ක් සුළි කුණාටුවට අහු වෙලා ගෙවල් 100කට අධික ප්‍රමාණයක් විනාශයට පත් වුණා. අපි ඒ වෙලාවේ ක්ෂණිකව ක්‍රියාත්මක වෙලා ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් රාජ්‍ය ඇමතිතුමාටත් කථා කරලා ඒ ජනතාවට සහන සැලසීමට හමුදාව යෙදෙව්වා. ගරු ජනාධිපතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමා, දිසාපතිතුමා ඇතුළු සියලු රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගය ඒ සඳහා ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, දැන් තිබෙන ප්‍රශ්නය තමයි, මේ නිවාස තක්සේරු කරන්න යෑමේදී තක්සේරු නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන්ගේ හිඟය. ඒ හින්දා මම ඉල්ලීමක් කරනවා, මේ තක්සේරු කටයුතු සඳහා අවශ්‍ය නිලධාරීන් ලබා දීලා මේ වැඩ පිළිවෙළ කඩිනම් කරන්න කියලා. ඒ අයට සහන ලබා දීමේ කටයුතුවලදී ජනාධිපතිතුමා ඇතුළු සියලු දේශපාලන අධිකාරීන් සහ රාජ්‍ය නිලධාරීන් දැවැන්ත සහයෝගයක්, ශක්තියක් ලබා දුන්නා. අපි ඒකට එතුමන්ලාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ ආපදා තත්ත්වය තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයිනුත් දැවැන්තම, අමාරුම කාර්යභාරයක් කරනවා කියලා මා හිතනවා. ඒ සියලුදෙනාටත් අවශ්‍ය පහසුකම් ලබා දෙන්න. ඒ වෙලාවේ හමුදාව ලබා දුන් සහයෝගය වෙනුවෙන් ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් රාජ්‍ය ඇමතිතුමාට ස්තුතිය පුද කරන්නත් මා මෙය අවස්ථාවක් කරගන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, උත්තරයක් දීලා මේ ප්‍රශ්නය අවසන් කරන්න.

ගරු ජානක වක්කුඹුර මහතා (පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜானக வக்கும்புர - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura - State Minister of Provincial Councils, Local Government and Environment)

ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කියන්න, ගරු ජානක වක්කුඹුර රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමා ජීවත් වන ප්‍රදේශයටත් ගංවතුර ගලලා නේද?

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු කථානායකතුමනි, මේ ව්‍යසනය වුණේ සෙනසුරාදා රෑ වහින්න පටන් ගත්තාට පස්සේ ඉරිදා වෙනකොට ගංවතුර ගැලුවා. මම ඉන්න ප්‍රදේශයට හැම දාම ගංවතුර ගලනවා. ඒකට ඉතිහාසයේ ඉඳලා අපේ පැතිවල මිනිස්සු කියනවා, දින හතළිස්පහේ ගංවතුර එනවා කියලා. අපේ කාලයේ විතරක් නොවෙයි, අපේ සීයලාටත් ඉස්සෙල්ලා කාලයේ ඉඳන් එහෙම කියනවා.

ඒක කවදාවත්, කාටවත් නවත්වන්න බැහැ. දින හතළිස්පහේ ගංවතුර එනවා කිව්වාම ඒ කියන දවසටම එනවා. ඒ වෙනුවෙන් පොඩි සූදානමක් තිබුණත් ගරු කථානායකතුමනි, අවුරුදු කිහිපයකට පස්සේ මේ වතාවේ ගංවතුර තත්ත්වය ටිකක් වැඩි වෙන බවක් පෙනෙන්න තිබෙනවා. මට හොඳට පීනන්නත් පුළුවන්. මම මීට ඉස්සර වෙලා ගංවතුරේ ගහගෙන ගිහිල්ලාත් තිබෙනවා. එදා පොඩි දරුවෙකුගේ මළගෙයක් තිබුණා. ඒ ගෙදරත් යට වෙලා තිබුණේ. එතකොට හරියටම පාන්දර 2.30යි. ඒ තරම් ගංවතුරේ බැහැලා ගිහිල්ලා, අපි ඒ මරණයත් වෙන තැනකට ගෙනැල්ලා දෙන්න කටයුතු කළා. ඒ වාගේම, රාජ්‍ය සේවකයන් රෑ එළි වෙනකල් ලොකු මහන්සියක් දැරුවා, ජීවිත බේරා ගන්න. මොකද, ගංවතුරට අහු වුණාට පස්සේ ජීවිත බේරා ගන්න ටිකක් අමාරුයි. ගුවනින් යන්නත් බැහැ කළුවරේ. පසුගිය දවස්වල ගුවන් යානයක් ඉහළට නග්ගන්නත් අපහසු වුණා. ඒත් ඔවුන් ලොකු කාර්යභාරයක් ඉටු කළා. ප්‍රමිත බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමා ඊට පහුවදාම රත්නපුරයට ඇවිල්ලා දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරීන් කැඳවලා, අවශ්‍ය කරන ඕනෑම කටයුත්තක් කරන්න කිව්වා, රජය මුදල් දෙනවා කියලා. ඒකට ආයෙත් නීති, රෙගුලාසි බලන්න එපා කිව්වා. මම ඒ වෙලාවේ එතුමාගෙන් ඉල්ලීමක් කළා. ඒ ගෙවල් යට වෙලා පමණක් නොවෙයි, අපේ පැත්තේ මිනිස්සු හැමෝම ගංවතුර නිසා කොටු වෙලා ඉන්නේ. ඔවුන්ට කඩේකටවත් යන්න බැහැ. සාමාන්‍යයෙන් ගංවතුර නිසා කොටු වුණු මනුස්සයාගේ ගෙදරට තමයි ගංවතුරෙන් යට වුණු ගෙවල්වල අයත් ගිහින් ඉන්නේ. එතකොට ඒ මනුස්සයා ඊටත් වඩා අමාරුවේ වැටෙනවා. මේ හැමෝටම අපි උදව් කරන්න ඕනෑ. වියළි සලාකයක් හෝ කෑම දෙනවා නම් ඒ හැමෝටම ලබා දෙන්න කියලා මම ඒ වෙලාවේ එතුමාගෙන් ඉල්ලා සිටියා. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා ඒ මොහොතේදීම එතුමා කිව්වා.

මම එදා රෑ කලවාන ප්‍රදේශයට ගියා. කුකුලේගම තමයි වැඩියෙන්ම ගංවතුර තිබුණේ. ඒ ගමේ මිනිස්සුන්ට කෑම ටික දෙන්න නාවික හමුදාව එක්ක යන්න හැදුවා. නාවික හමුදාවේ බෝට්ටුවත් ආපසු ආවා, සැඩ පහර නිසා. මොකද, සැඩ පහරේ බෝට්ටුවට යන්න බැහැ, ගරු කථානායකතුමනි. ඊට පසු අපි පැය දෙකහමාරක් හිටියා, ඒ මිනිස්සුන්ට කෑම ටික යවන්න. නමුත්

[ගරු ජානක වක්කුඹුර මහතා]

ගහේ සැඩ පහර වැඩි නිසා ගහෙන් එගොඩට යන්න බැහැ කියලා ඔවුන් ආපසු ආවා. මේ වාගේ ලොකු ප්‍රශ්න තිබෙන බව අපි දන්නවා. නාවික හමුදාවේත් ඉන්නේ මිනිස්සු. ඊට පසු අපි කිව්වා, එළිවෙනකල් හරි ඒ සැඩ පහර අඩු වෙනතුරු ඉඳලා ඒ අයට කන්න ගිහින් දෙමු කියලා. යමක් කරන්න පුළුවන් නම් මම හැම දාම ඒ දේවල් කරලා දෙනවා. මගේ ගෙයත් ගංවතුරට යට වෙනවා. ගංවතුරට අපි හැම දාම වාගේ මුහුණ දෙනවා. හැබැයි, ගංවතුරක් එන හැම අවස්ථාවකදීම වාගේ අපි මේ ගැන කථා කරනවා. 2003දීත් කථා කළා; 2017දීත් කථා කළා; අදත් කථා කරනවා. නමුත්, ප්‍රශ්නයට විසඳුමක් ලැබී නැහැ කියලා අපිත් කියනවා. ගංවතුර බැහැලා ගියාට පසුව වැඩ ඔක්කොම ඉවරයි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මමත් ගියා, 2017දී.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ඔව්, මෙතුමාත් ආවා ඒ වෙලාවේ. හැබැයි, ගරු කථානායකතුමනි, මෙවර නායයෑම්වලින් මියගිය ප්‍රමාණය ගොඩක් අඩුයි. එහෙම වුණේ මිනිස්සු ඒ ගැන දැනුවත් කරපු නිසායි. මීට ඉස්සර වෙලා මිනිස්සු විශාල ප්‍රමාණයක් නායයෑම් නිසා මිය ගියා. අපි පළාත් පාලන ආයතන සියල්ලටම දැනුම් දීලා තිබෙනවා, වතුර බෝතලයක් වුණත් දෙන්න, කාට හරි කන්න නැත්නම් කෑම ටික දෙන්න, ඕනෑම කටයුත්තක් කරන්න, ඒකට කිසිම බාධාවක් නැහැ කියලා.

ගරු කථානායකතුමනි, මමත් කියනවා අපි 225දෙනාම එකතු වෙලා ලංකාවේම ගංවතුර ප්‍රශ්නය විසඳන්න ස්ථිරසාර විසඳුමක් ගෙන එන්න කටයුතු කරමු කියලා. ගංවතුර ආපු දවසට විතරයි මේ ගැන කථා කරන්නේ. එහෙම නොකර මේ ගැන කටයුතු කරමු. හැබැයි, රජයක් හැටියට ගන්න පුළුවන් හැම පියවරක්ම අපි ගත්තා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් රාජ්‍ය ඇමතිතුමා උත්තර දෙන්න.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම පසුගිය දින කිහිපයේ ඇද හැලුණු ධාරානිපාත වර්ෂාව නිසා දිස්ත්‍රික්ක 23ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 262ක, පවුල් 33,422ක, පුද්ගලයන් 130,021ක් ආපදාවට ලක් වෙලා තිබෙනවා. මේ අය අතුරින් 26දෙනෙකු මිය ගිහින් තිබෙනවා. 41දෙනෙකු තුවාල ලබා තිබෙනවා. අද උදෑසන වනවිට සුරක්ෂිත මධ්‍යස්ථාන 116ක, පවුල් 2,368ක, සාමාජිකයන් 9,248ක් ඉන්නවා.

ගරු කථානායකතුමනි, මෙතැනදී කියවුණා අපේ සුදානමක් තිබුණේ නැහැ කියලා. ඒක අපට පිළිගන්න බැහැ. අපි ගිය සතියේ සඳුදාත් දිස්ත්‍රික් ලේකම්තුමන්ලා සමඟ මෙම තත්ත්වය පිළිබඳව සාකච්ඡා කළා. ඒ වාගේම දිස්ත්‍රික් ලේකම්තුමන්ලා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා විසින් ග්‍රාමීය කමිටු හදලා තිබෙන්නේ. මෙවැනි ප්‍රශ්නයක් ඇති වෙලාත්, මේ ප්‍රශ්නය මේ තරමින් හෝ අල්ලාගෙන යන්නේ එම සූදානම සහ ග්‍රාමීය කමිටුවල සහභාගිත්වය සහ ඒ අයගේ සහයෝගය නිසායි.

ගරු කථානායකතුමනි, මේ කටයුත්තේදී ත්‍රිවිධ හමුදාව අපට සුවිශේෂී සහයෝගයක් ලබා දෙනවා. අපෙන් ඉල්ලපු අහුල් ගණන කීයද, අපි ඒ ප්‍රමාණය දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට දීලා තිබෙනවා; බෝට්ටු කීයක් ඉල්ලුවාද, ඒ ඉල්ලපු බෝට්ටු ප්‍රමාණය දීලා තිබෙනවා; බෆල් රථ කීයක් ඉල්ලා තිබෙනවාද, ඒ ඉල්ලපු ප්‍රමාණය දීලා තිබෙනවා. ඒ වාගේම, WMZ සන්නද්ධ රථ කීයක් ඉල්ලා තිබෙනවාද, ඒ ඉල්ලපු ප්‍රමාණය අපි අඩුවකින් තොරව දීලා තිබෙනවා. හැබැයි, අපට හැමදෙනාගේම ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වන්න බැහැ. ඒකේත් පාලනයක් තිබෙන්න ඕනෑ. ඒ නිසා ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල කේන්ද්‍ර කරගත් ඉල්ලීම්වලට අපි ප්‍රමුඛත්වය, මූලිකත්වය ලබා දෙනවා.

ඒ වාගේම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 117 කියන හදිසි දුරකථන ඇමතුම් අංකයට එන ඉල්ලීම්වලට අපි ප්‍රමුඛතාව ලබා දෙනවා. ගරු කථානායකතුමනි, මෙම වැඩ පිළිවෙළේදී ප්‍රාදේශීය ලේකම්වරු, දිසාපතිවරු, ග්‍රාමීය කමිටු නිලධාරීන්, රාජ්‍ය සේවයේ නියුතුවූවන්, ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය, පොලීසිය යනාදී කී නොකී සියලුදෙනා ලබා දෙන සහයෝගයට අපි ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මම තව කාරණාවක් කියන්න ඕනෑ. මේ රටේ බහුතරයකට ගංවතුර මතක් වෙන්නේ, ගංවතුරක් ආපු වෙලාවට තමයි. අපි මේ දිස්ත්‍රික්කවල ගංවතුර අවම කිරීමේ - mitigation - වැඩ පිළිවෙළ කිහිපයක් හඳුනාගෙන තිබෙනවා. උදාහරණයක් විධියට රත්නපුර දිස්ත්‍රික්කයට solution එකක් හඳුනාගෙන තිබෙනවා. හැබැයි, ඒකට විරෝධයකුත් තිබෙනවා. ඒකට පරිසර සංවිධාන හා දේශපාලන අධිකාරියේ විවිධ හැලහැප්පීම් තිබෙනවා. නමුත් රජයක් විධියට වාගේම රටක් විධියට අපිට සිද්ධ වෙනවා, මොන බාධාව ආවත් තීන්දුවක් අරගෙන මේ ප්‍රශ්නය අවසන් කරන තැනට යන්න.

ගරු කථානායකතුමනි, අපි කුඩා සන්දියේ නිතරම අපට රූපවාහිනියෙන් දකින්න ලැබුණා, බංග්ලාදේශය ගංවතුරට යට වෙන ආකාරය. හැබැයි, බංග්ලාදේශය ඒ සඳහා solution එකක් සොයා ගත්තා. ඒ නිසා අවුරුදු 20කදී සැලකිය යුතු තරමේ ගංවතුරකින් බංග්ලාදේශයට හානියක් වෙලා නැති බවයි අපට නිරීක්ෂණය වෙන්නේ. අපි මොන දේ කරන්න ගියත්, මේ රටේ විරෝධතාවක් ඇති වෙන එක සාමාන්‍ය සම්ප්‍රදායය, ගරු කථානායකතුමනි. අද ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පතට ආවේත් ඒ විරෝධතාවම තමයි. කණ්ඩලම හෝටලය හදද්දීත් එවැනි විරෝධතාවක් ආවා. වැවක් හදද්දීත් එවැනි විරෝධතා එනවා. පාලමක් හදද්දීත් එවැනි විරෝධතා එනවා. බෝක්කුවක් හදද්දීත් එවැනි විරෝධතා එනවා. ඉතින් මේ ව්‍යාපෘතිවලටත් එහෙම විරෝධතා ඇවිල්ලා තිබෙනවා. හැබැයි, අපි විශ්වාස කරනවා, රජය ගත් වැඩ පිළිවෙළ යටතේ ඒ ඒ දිස්ත්‍රික්කවලට අදාළව ආපදා අවම කර ගැනීමේ - mitigation - ව්‍යාපෘති හඳුනාගෙන ඒවාට ප්‍රමුඛතාව ලබා දෙන්න පුළුවන් බව.

ගරු කථානායකතුමනි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ගැනත් මම සඳහන් කළ යුතුයි. මම පිළිගන්නවා, අපි තාක්ෂණය අතින් පසුගාමීයි කියන එක. තාක්ෂණය අතින් අපි අවුරුදු 10ක්, 15ක් පිටුපසින් ඉන්නේ. පසුගිය කාලයේ අපේ රටේ ආර්ථික අර්බුදයක් තිබුණා; අපි හැම ණය ව්‍යාපෘතියක්ම review කළා. අපි සමහර දේවල් අත්හැරියා. හැබැයි, එසේ තිබියදීත් අපි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නව්‍යාකරණයේ ව්‍යාපෘතිය, CResMPA වැඩසටහන යටතේ වන ව්‍යාපෘතිය අත්හැරියේ නැහැ. අපි එම කටයුත්ත ඒ ආකාරයෙන්ම සිද්ධ කරගෙන යන බව මේ

අවස්ථාවේදී සඳහන් කරනවා. ගරු මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලාගේ දිස්ත්‍රික්කවල යම්කිසි ගැටලුවක් තිබෙනවා නම්, ඒවා අවම කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය නොපිරිහෙළා ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවාය කියන එකත් මා මේ අවස්ථාවේදී කියනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් මා සඳහන් කළ යුතුයි. මේ ආපදා තත්ත්වය සැලකිල්ලට ගෙන ගරු ජනාධිපතිතුමා විසින් කැබිනට් මණ්ඩලයට සුවිශේෂී කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර, අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ අනුව ඊයේ අපි තීන්දුවක් ගත්තා. මේ ප්‍රතිපාදනවල අඩුවක් තිබෙනවා. දැන් අපි මුදල් වෙන් කරන්නේ කෑම වේල් තුනකට විතරයි. හැබැයි, ඒ තැන්වල අතදරුවෝ ඉන්නවා. ඒ දරුවන්ට අවශ්‍ය කිරි පිටි ගන්න මුදලක් වෙන් කර ගැනීමේ හැකියාව අපට පැරණි චක්‍රලේඛ අනුව තිබුණේ නැහැ. නමුත් අපි ඒ තත්ත්වය මේ වනවිට වෙනස් කර තිබෙනවා. ඒ වාගේම අද වනවිට අපි දිස්ත්‍රික් ලේකම්වරුන්ටත්, ප්‍රාදේශීය ලේකම්වරුන්ටත් වෙනම ඉන්ධන ප්‍රතිපාදනයක් ලබා දීලා තිබෙනවා, ඔවුන්ගේ වැඩ කටයුතු කරගන්නත්. අහුල්ද, පාරුද, බෝට්ටුද, බෆල් රථද අඩු කියලා මන්ත්‍රීතුමන්ලා කියන්න. අපි ඒ ඒ දිස්ත්‍රික්කවලට කිසිම අඩුවක් නැතුව අද මේ වෙනකම් ඒ අවශ්‍ය දේවල් ලබා දීලා තිබෙනවා. එහෙම තොරතුරක් ලබා දෙනවා නම්, ඒක සාධාරණ ඉල්ලීමක් නම් අපට ඒවා ලබා දෙන්න පුළුවන්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා දැන් කාලය කොච්චර ගත්තාද? තවත් කාලය නාස්ති කරන්න නේ කථා කරන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, අපේ අදාළ ඇමතිවරුන්ගෙන්. ප්‍රාදේශීය ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන්ම ඉල්ලීමක් කරනවා, පරණ චක්‍රලේඛයේ තිබෙන ගණන් හිලව් ටික වෙනස් කරන්න කියලා. මොකද, ඇත්ත වශයෙන්ම අද මේ මොහොතේදීත් ක්‍රියාත්මක වෙන්නේ මේ චක්‍රලේඛය. මේ චක්‍රලේඛය අනුව තනි පුද්ගලයෙකුට පිසූ ආහාර වෙනුවෙන් ලැබෙන්නේ රුපියල් 450යි. ඊළඟට, තනි පුද්ගලයෙකුට සතියකටම අවශ්‍ය වියළි සලාක වෙනුවෙන් හම්බ වෙන්නේ රුපියල් 1,350යි. සාමාජිකයන් දෙදෙනෙක් ඉන්න පවුලකට ලැබෙන්නේ රුපියල් 1,800යි. සාමාජිකයන් තුන්දෙනෙකු ඉන්න පවුලකට ලැබෙන්නේ රුපියල් 2,100යි. සාමාජිකයන් හතරදෙනෙකු ඉන්නා පවුලකට ලැබෙන්නේ රුපියල් 2,400යි. සාමාජිකයන් පස්දෙනෙකු ඉන්න පවුලකට ලැබෙන්නේ රුපියල් 2,700යි. සතියකටම වෙන් කර තිබෙන්නේ එහෙමයි. නමුත් ඒ මුදල ප්‍රමාණවත් නැහැ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, කරුණාකරලා එම මුදල ප්‍රමාණවත් ලෙස වැඩි කරන්න කටයුතු කරන්න කියලා. මොකද, මේ චක්‍රලේඛය යාවත්කාලීන වෙලා නැහැ.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු විපක්ෂ නායකතුමනි, ඒ තීන්දුව අපි අරගෙන ඉවරයි.

ඒක වෙනස් කරන්න අපි තීන්දු කරලා ඉවරයි. ගරු ජනාධිපතිතුමා ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් යොමු කරලා ඉවරයි. ගරු කථානායකතුමනි, පෙරේදා තමයි අපි මේ තීන්දුව ගත්තේ. අපි ඊයේ ඒක අනුමත කරගත්තා. ඒ නිසා මේක අදාළ නැහැ.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා නැවතත් කාලය නාස්ති කරන්න ද හදන්නේ? *[බාධා කිරීම්]* නැහැ, තවත් වෙලාව නැහැ. එච්චරයි.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් ප්‍රනාන්දු මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු උපුල් ගලප්පත්ති මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු නිමල් පියතිස්ස මහතා
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) හඟුරන්කෙත, පේරවංගුව, "ශාන්ත" යන ලිපිනයෙහි පදිංචි කේ.ඩී.බී. බස්නායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) උඩහිගුල්වල, අංක 102/1 දරන ස්ථානයෙහි පදිංචි එස්.එම්.ඒ.කේ. මොලගොඩ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)
ගරු කථානායකතුමනි, නාගොල්ලාගොඩ, ඇහැටුමුල්ල, අංක 316/1 දරන ස්ථානයෙහි පදිංචි එස්.එම්. මීසාර් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

2010 සිට වැසී ඇති රජයේ පාසල්: අනුරාධපුර දිස්ත්‍රික්කය
2010இலிருந்து மூடப்பட்டுள்ள பாடசாலைகள்: அநுராதபுர மாவட்டம்
GOVERNMENT SCHOOLS CLOSED DOWN SINCE 2010: ANURADHAPURA DISTRICT

510/2024

1. ගරු රෝහණ බණ්ඩාර මහතා
(මාණ්පුමිකු රෝහණ පණ්ඩාර)
(The Hon. Rohana Bandara)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැසී ගිය රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් වැසී යෑමට බලපාන ලද හේතු කවරේද;

(iv) එම පාසල් නැවත ආරම්භ කිරීමට හෝ එම පාසල් සතු සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டு தொடக்கம் இதுவரை அநுராதபுரம் மாவட்டத்தில் மூடப்பட்ட அரச பாடசாலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அப்பாடசாலைகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) அப்பாடசாலைகளை மூடுவதற்கு ஏதுவாக அமைந்த காரணங்கள் யாவை என்பதையும்;

(iv) அப்பாடசாலைகளை மீண்டும் ஆரம்பிப்பதற்கு அல்லது அப்பாடசாலைகளுக்குரிய வளங்களை உச்ச அளவில் பயன்படுத்துவதற்கு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of government schools that have been closed down so far in Anuradhapura District since 2010;

(ii) the names of the said schools;

(iii) the reasons for the aforementioned schools to be closed down; and

(iv) the measures that have been taken either to open them again or to take maximum use of the resources available in the said schools?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැසී ගිය රජයේ පාසල් සංඛ්‍යාව 15කි.

(ii) 1. උමැප/අනු/අනු/මනු/ උපතිස්සගම විදුහල, අනුරාධපුර
2. උමැප/අනු/අනු/රඹෑ/ කොටුපුලියන්කුලම මිහිදු විදුහල, රඹෑව
3. උමැප/අනු/අනු/නොව්/ හැළබෑව විදුහල, ගාලදිවුල්වැව, නොච්චියාගම
4. උමැප/අනු/අනු/නොව්/ ඉටිටිකුලම විදුහල, රනෝරාව
5. අ/ ඒරියාගම විදුහල
6. අ/ වල්පාලුගම නිකත්තේගම ප්‍රා.වි.
7. අ/ මැදවැව විදුහල
8. අ/ ඇටවීරවැව විදුහල
9. අ/ මහකණුමුල්ල විද්‍යාලය
10. අ/ හපිදියාගම විද්‍යාලය
11. අ/ වික්කන්පොතාන විද්‍යාලය
12. අ/ මොරගහවෙල විද්‍යාලය
13. අ/ විහාරහල්මිල්ලෑව විදුහල
14. අ/ කිරිකෙටුවැව විදුහල
15. අ/ කඩවත්රඹෑව විදුහල

(iii) ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් නොමැති වීම නිසා එම පාසල් වැසී ගොස් ඇත.

(iv) දැනට එවැනි වැසී ගිය සමහර රජයේ පාසල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සහ වෙනත් ජාතික ශිෂ්‍යභට බලකාය වැනි ආයතන වෙත ලබා දී ඇත.
යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රමය අනුව මෙම පාසල් පොකුරු පාසල් සංකල්පය යටතේ නැවත ආරම්භ කිරීමට ඇති හැකියාව විමසා බලන අතර, පෙර පාසල් අධ්‍යාපනය දිරි ගැන්වීම සඳහා මින් යම් පාසල් පන්ති කාමර යොදවා ගැනීමට ඉඩ කඩ සලසා ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමනි, මෙතැනදී විශාලම කාරණාවලින් එකක් තමයි, ග්‍රාමීය දරුවන්ට අධ්‍යාපනය ලබන්න තිබුණු ළඟම පාසල වැසී යෑම. ඒ සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා වාගේම, අනික් පැත්තෙන් මේ පාසල්වල තිබෙන සම්පත් කියන තරමින් ප්‍රයෝජනයට අරගෙන නැහැ. ඒ වාගේම ඔබතුමා නොකිව්ව ලැයිස්තුවේ තිබෙනවා, එප්පාවල කිට්ටුව තඹුත්තේගම අධ්‍යාපන කලාපයේ කඳුරුගස්වැව පාසල කියලා පාසලක්. ඒ පාසල මෑතකදී වැසීගොස් තිබෙනවා. නමුත් ගුරුවරු ටික තවම ඒ පාසලට එනවා. විදුහල්පතිතුමාත් එක්ක ගුරුවරු 12ක, 15ක විතර ප්‍රමාණයක් ඒ පාසලේ ඉන්නවා. හැබැයි පාසලේ එක ශිෂ්‍යයෙකුවත් නැහැ.

අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මේ ප්‍රශ්නයටම සමාන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි දෙදහස් ගණනක ගුරු හිඟයක් තිබෙන එක. තවමත් 2,898ක ගුරු හිඟයක් පවතිනවා. එහෙම ගුරු හිඟයක් තිබෙන වෙලාවක යම් පාසලක ගුරුවරුන් ප්‍රමාණයක් නිකම් ඉන්න එකත් ගැටලුවක්.

මම පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමාගෙන් අහන්නේ මෙයයි. 2023 නොවැම්බර් මාසයේ ගැසට් කරලා 2024 මාර්තු 9වැනි දා ගුරුවරු බඳවා ගැනීමේ විභාගය පැවැත්වුවා. අද වෙනකොට ඒ හරහා 1,210දෙනෙක් විතර ගුරු සේවයට බඳවාගෙනත් තිබෙනවා. මේ 30වැනි දාද කොහේද 255දෙනෙකු ගුරුවරුන් ලෙස බඳවා ගන්නවා කියලා කිව්වා. අපේ ගුරු පුරප්පාඩු තව 1,898ක් තිබෙනවා. හැබැයි, මේ වෙනකොට උපාධිධාරීන් සියලුදෙනාම කලබලයට පත් වී සිටිනවා. මම හිතන විධියට 5,000කට ආසන්න ප්‍රමාණයක් ගුරු විභාගයට ලිව්වා. ඔවුන්ගේ ලකුණු එළියට දැම්මේත් නැහැ. අනික් පැත්තෙන් 1,800ක්, 1,900ක් විතර ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳෙව්වා. ඒ ලකුණු එළියට දැම්මේත් නැහැ. ඒ නිසා මේ එක්දහස් දෙසියගණන විතරක් බඳවා ගත්තේ කොහොමද කියන ගැටලුව තිබෙනවා වාගේම, අනික් අයටත් සාධාරණය ඉෂ්ට කරලා දෙන්න. මොකද, තව 2,898ක ගුරු පුරප්පාඩු තිබෙනවා. ඒ වාගේම බලාපොරොත්තු වෙනවා, අඩුම තරමේ ඒ අයට ඔවුන්ගේ ලකුණු ටිකවත් දෙයි කියලා. ඔවුන් විභාගයට ඉදිරිපත් වෙලා තිබෙන නිසා, මේ බඳවා ගත්ත procedure එක හදා ගත්තේ කොහොමද කියන ගැටලුවට ඔවුන් මුහුණ දීලා ඉන්නවා.

විභාගය ලියලා ලකුණු ලබාගෙන, සම්මුඛ පරීක්ෂණයටත් ගිහිල්ලා තිබියදී එතැනින් පස්සේ තෝරාගත් ක්‍රමය මොකක්ද කියන ගැටලුව මේ උපාධිධාරීන්ට ඇති වෙලා තිබෙනවා. විනිවිදභාවයක් ඇතුව කටයුතු කළා නම්, මේ පිළිබඳව නැවත නැවත අපට කථා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ නිසා, මේ විධියට සහවාගෙන කටයුතු කළේ ඇයි?

ඒ වාගේම අනෙක් ගුරු පුරප්පාඩු ටික පුරවන්නත් ඔබතුමා මොකක් හෝ ක්‍රියා මාර්ගයක් ගන්නවාද කියන කාරණය තමයි මට දැන ගන්න අවශ්‍ය වෙන්නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(*மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த*)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පළාත් සභාවලට තිබෙන්නා වූ බලතල යටතේ කැබිනට් පත්‍රිකාවක් මඟින් අපි අනුමැතිය ලබා දුන්නා, නිශ්චිත දිනයක් දක්වා විශ්‍රාම ගිය, සේවය හැර ගිය සහ සේවයෙන් ඉවත් වූ අයගේ වැටුප තිබෙන නිසා ඒ පිරිස වෙනුවෙන් ගුරුවරු බඳවා ගන්න. ඒ අනුව ඒ උපාධිධාරීන් සඳහා විභාගය පැවැත්තුවා. පළාත් 9ක ඒ විභාගය පවත්වපු වෙලාවේ සමහරු උසාවි ගියා. ඒ නිසා ප්‍රමාදයක් ඇති වුණා. උසාවියේ නඩුව අවසන් කරලා විභාගයේ ලකුණු පදනම් කරගෙන තමයි සම්මුඛ පරීක්ෂණයට කැඳවන්නේ. සම්මුඛ පරීක්ෂණයේ ලකුණුත්, විභාගයේ ලකුණුත් එකතු කරලා තමයි පුරප්පාඩු ප්‍රමාණය අනුව පත්වීම් දෙන්නේ. උදාහරණයක් වශයෙන්, වාණිජ විෂය උගන්වන්න උපාධිධාරීන් 200ක් අවශ්‍ය නම්, 500ක් සමත් වෙලා තිබෙන්න පුළුවන්. හැබැයි, පත්වීම් දෙන්න වෙන්නේ වැඩිම ලකුණු ගත් 200දෙනාට. මොකද, වාණිජ විෂය උගන්වන ගුරුවරයෙක් භූගෝල විද්‍යාව උගන්වන්න, එහෙම නැත්නම් විද්‍යා විෂය උගන්වන්න දමන්න බැහැ නේ. එම නිසා විෂයය වර්ගය අනුව ඒ අයගේ උපාධි සහතිකයත් එක්ක transcript එක දෙනවා. Transcript එකේ තිබෙන විෂයයන්ගෙන් තුනෙන් එකක් පාසලේ උගන්වන විෂයයන්වලට අදාළ වෙන්න ඕනෑ. ඒ විධියට ගණන් බලා තමයි මුල් පත්වීම් ටික දුන්නේ. ඔබතුමා කියනවා වාගේ එතැනින් පස්සේ - අදාළ සංඛ්‍යාලේඛන දැන් මගේ ළඟ නිශ්චිතව නැහැ. පසු දිනයක ඒවා ලබා දෙන්න මට පුළුවන් - විභාගයට පෙනී සිටි ගණනින් අඩුම ගණනේ 2,500කට, 3,000කට ආසන්න පිරිසක් මුලින් විභාගය සමත්වෙලා තිබෙනවා. ඒ අය තමයි සම්මුඛ පරීක්ෂණයට කැඳවලා තිබෙන්නේ. ඒ වාගේම තව පුරප්පාඩුත් තිබෙන නිසා ආණ්ඩුකාරතුමා අපේ ලේකම්තුමියට දැනුම් දීලා තිබෙනවා, උතුරු මැද පළාතේ විතරක් නොවෙයි, පළාත් නවයේම පවත්වපු විභාගයේ ලකුණු මත සමත් වුණු අයගෙන් තවදුරටත් පත්වීම් ලබා දිය හැකි විෂයය වර්ගය අනුව සංගණනයක් කරන්න කියලා. අපි මේ සතියේ අමාත්‍ය මණ්ඩල සන්දේශය ඉදිරිපත් කරලා අනුමැතිය අරගෙන ඒක එවනවා. එතකොට තව පත්වීම් 1,000ක් විතර දෙන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

ඊට අමතරව මම සඳහන් කළ ක්‍රමය තමයි අපේ අමාත්‍යාංශය අනුගමනය කරන්නේ. විභාගයේ ලකුණුයි, සම්මුඛ පරීක්ෂණයේ ලකුණුයි, ඒවා එකතු වුණාම කීයද කියන එකයි, ඒ සියලු තොරතුරු website එකට දමන්න කියලා මම කියන්නම්. එතකොට ඔක්කෝටම දැනගන්න පුළුවන්.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(*மாண்புமிகு ரோஹண பண்டார*)
(The Hon. Rohana Bandara)

ඒක බොහොම හොඳයි, ගරු ඇමතිතුමනි. එහෙම නැති වුණොත් ඒ දරුවන්ට ප්‍රශ්නයක් වෙනවා. දූෂණයක් සිද්ධ වුණා, දේශපාලන බලපෑමක් වුණා කියන එක ගැන තමයි කථාව තිබෙන්නේ. ඒ නිසා එහෙම කරන එක ඔබතුමන්ලාටත් හොඳයි, කාටත් හොඳයි. *[බාධා කිරීම්]* එතකොට කාටත් හොඳයි නේ, ගරු ඇමතිතුමා. ඒ නිසා ඒ ලකුණු ටික අන්තර්ජාලයට දැම්මා නම් ප්‍රායෝගිකව කාටත් පහසුයි.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(*மாண்புமிகு ரோஹண பண்டார*)
(The Hon. Rohana Bandara)

ගරු ඇමතිතුමනි, අනෙක් කාරණය තමයි, උතුරු පළාතේයි, නැඟෙනහිර පළාතේයි, උතුරු මැද පළාතේයි පළාත් තුනේම පසුගිය යුද කාලයේ සිවිල් ආරක්ෂක අංශයේ නියැළුණු පිරිසක් ගුරු සේවයට අනුයුක්ත කරගෙන කටයුතු කරලා තිබෙනවා. ඔවුන් යුද්ධය වෙලාවේ ගුරුවරු නොගිය පාසල් ටික පවත්වාගෙන යන්න විශාල කාර්යභාරයක් ඉෂ්ට කරපු උදවිය. මෑතකදී උතුරේ සහ නැඟෙනහිර, කට්ටියටත් ඔබතුමා පත්වීම් දෙන්න කටයුතු කරලා තිබුණා. 2017.04.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත එම පත්වීම් ලබා දීලා තිබෙනවා. උතුරු මැද පළාතේ ගුරුවරු 108දෙනෙක් විතර දැනට ඉන්නවා, එම පත්වීම් හම්බවෙලා නැති. මම හිතන විධියට ගුරු සේවයට බඳවා ගැනීමට අවශ්‍ය ශාස්ත්‍රවේදී උපාධිය සම්පූර්ණ කරපු අයත් ඒ අතර ඉන්නවා. එම නිසා ඒ සඳහා වෙනම කැබිනට් සන්දේශයක් ඉදිරිපත් කරන්න අවශ්‍ය නැහැ. තිබෙන එක මතම උතුරු මැද පළාතේ සිටින ඒ 108දෙනාටත් සාධාරණයක් ඉෂ්ට කරලා දෙන්න පුළුවන්ද කියන කාරණය ඔබතුමාට යොමු කරන්න කැමැතියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(*மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த*)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, උතුරු මැද පළාත ඇතුළුව උතුරු පළාතේත්, නැඟෙනහිර පළාතේත් -පළාත් තුනේම- ඔය ආකාරයෙන් සේවයේ යොදවපු අය ඉන්නවා. ගුරු සේවා

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ව්‍යවස්ථාවේ මූලික සුදුසුකම් සපුරපු අය සම්බන්ධ තොරතුරු කැඳවා තිබෙනවා. එම තොරතුරු ලැබුණු වහාම මම අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරනවා. ඒ අයට වැටුප් සකස් කිරීමේදී ලොකු පරතරයක් ඇති වෙන්නේ නැහැ. මොකද, දැනට වැටුපක් ලැබෙනවා. නමුත් එම සේවයට බඳවා ගැනීමට තිබෙන සුදුසුකම් අනුව බඳවා ගැනීමට කටයුතු කරනවා. ඒ තොරතුරු කැඳවලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකම ඇහුවා නේ.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
පැහැදිලි කර ගැනීමක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක වෙනම කථා කරලා අහගන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි,-

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය ඉවර කරලා ඉන්නකෝ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා සභාවේ කාලය නේ මේ නාස්ති කරන්නේ.

ප්‍රශ්න අංක 2 -541/2024- (1), ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -564/2024- (1), ගරු සංජීව එදිරිමාන්න මන්ත්‍රීතුමා.

ගරු සංජීව එදිරිමාන්න මහතා
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. හැබැයි, පිළිතුර දෙන්න ගරු ඇමතිතුමා නැහැ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පළාත් පාලන ආයතනවල සාමාජිකයන් සහ කාර්ය මණ්ඩලය: මුළු වියදම
உள்ளூராட்சி நிறுவனங்களின் உறுப்பினர்கள் மற்றும் பணியாட்டொகுதியினர்: மொத்தச் செலவு
MEMBERS AND STAFF OF LOCAL GOVERNMENT BODIES: TOTAL EXPENDITURE

588/2024

4. ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම ආයතනවල සේවය කරනු ලබන මුළු සේවකයන් සංඛ්‍යාව කොපමණද ;

(iii) එම සේවකයන් නඩත්තු කිරීම සඳහා රජය විසින් වාර්ෂිකව වැය කරනු ලබන මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වනවිට ඉහත සඳහන් සියලු පළාත් පාලන ආයතනවල පවතින නගරාධිපති, සභාපති හා මන්ත්‍රී තනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට ගෙවනු ලබන මුළු මාසික දීමනාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පළාත්පාලන ආයතනවල සියලු මන්ත්‍රීවරුන් සඳහා රජය විසින් දරනු ලබන මුළු වියදම මාසිකව හා වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් ඇතුළු රජයේ ක්ෂේත්‍ර නිලධාරීන්ට තමා සේවය කරනු ලබන කොට්ඨාසය නියෝජනය කරමින් පළාත් පාලන ඡන්දයට ඉදිරිපත් වීමට තිබූ අවස්ථාව අහිමි කරමින් සිදු කරන ලද සංශෝධනය ඉවත් කිරීමට කඩිනමින් කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள மாநகர சபைகள், நகர சபைகள் மற்றும் பிரதேச சபைகளின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(ii) இன்றளவில் மேற்படி நிறுவனங்களில் பணியாற்றும் மொத்த ஊழியர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) மேற்படி ஊழியர்களின் பராமரிப்புக்காக அரசாங்கம் வருடாந்தம் செலவிடும் மொத்தத் தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இன்றளவில் மேற்கூறப்பட்ட சகல உள்ளூராட்சி மன்றங்களிலும் நிலவும் நகர பிதா, தவிசாளர் மற்றும் உறுப்பினர் பதவிகளின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(ii) மாநகர சபை, நகர சபை மற்றும் பிரதேச சபை உறுப்பினர் ஒருவருக்குச் செலுத்தப்படுகின்ற மொத்த மாதாந்தக் கொடுப்பனவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) உள்ளூராட்சி மன்றங்களின் சகல உறுப்பினர்களுக்காகவும் அரசாங்கத்தினால் மேற்கொள்ளப்படுகின்ற மொத்தச் செலவு மாதாந்த மற்றும் வருடாந்த அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்கள் மற்றும் விவசாய ஆராய்ச்சி மற்றும் உற்பத்தி உதவியாளர் உட்பட அரசாங்க வெளிக்கள உத்தியோகத்தர்களுக்கு தாம் பணியாற்றும் தொகுதியைப் பிரதிநிதித்துவம் செய்து, உள்ளூராட்சி மன்றத் தேர்தலில் போட்டியிடுவதற்கு இருந்த வாய்ப்பை இல்லாமலாக்கும் வகையில் மேற்கொள்ளப்பட்ட திருத்தத்தை அகற்றுவதற்குத் துரித நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he inform this House of the -

(i) number of Municipal Councils, Urban Councils and Pradeshiya Sabhas in Sri Lanka, separately;

(ii) the total number of employees serving in those institutions at present; and

(iii) the total amount of money spent by the Government to maintain those employees, annually?

(b) Will he also inform this House -

(i) the number of posts of Mayor, Chairman and Councillor in all of the above-mentioned local government bodies at present, separately;

(ii) the total monthly allowance paid to a councillor in a Municipal Council, Urban Council and Pradeshiya Sabha, separately;

(iii) the total expenditure incurred by the Government for all councillors of the local government bodies monthly and annually, separately; and

(iv) whether speedy action would be taken to repeal the amendment that deprived the field officers in the public sector including the Samurdhi Development Officers and Agriculture Research and Production Assistants of the opportunity they enjoyed of contesting the Local Government Elections representing the Division they served in?

(c) If not, why?

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මහ නගර සභා සංඛ්‍යාව - 24
නගර සභා සංඛ්‍යාව - 41
ප්‍රාදේශීය සභා සංඛ්‍යාව - 276

(ii) මුළු සේවකයන් සංඛ්‍යාව - 56,568

(iii) වාර්ෂිකව වැය කරනු ලබන මුළු මුදල (2023 වර්ෂයට අදාළව) - රුපියල් මිලියන 31,700.22

(ආ) (i) පහත වගුවෙහි දැක්වේ.

පළාත් පාලන ආයතනවල පවතින නගරාධිපති, සභාපති හා මන්ත්‍රී තනතුරු සංඛ්‍යාව 2022.12.31 දිනට

අනු අංකය	පළාත	නියෝජිත සංඛ්‍යාව		
		නගරාධිපති	සභාපති	මන්ත්‍රී
1	මධ්‍යම	4	43	1,186
2	නැගෙනහිර	3	42	834
3	උතුරු මැද	2	25	547
4	වයඹ	1	32	938
5	උතුර	1	33	727
6	සබරගමුව	1	28	762
7	දකුණ	3	46	1,089
8	ඌව	2	26	579
9	බස්නාහිර	7	42	1,713
	එකතුව	**24**	**317**	**8,375**
	මුළු එකතුව			**8,716**

[ගරු ජානක වක්කුඹුර මහතා]

(ii)

පළාත් පාලන ආයතනය	තනතුර	මාසික සභික දීමනාව
මහා නගර සභාව	නගරාධිපති	රු. 30,000.00
	උප නගරාධිපති	රු. 25,000.00
	සභික	රු. 20,000.00
නගර සභාව	සභාපති	රු. 25,000.00
	උප සභාපති	රු. 20,000.00
	සභික	රු. 15,000.00
ප්‍රාදේශීය සභාව	සභාපති	රු. 25,000.00
	උප සභාපති	රු. 20,000.00
	සභික	රු. 15,000.00

(iii) සියලු මන්ත්‍රීවරුන් සඳහා රජය විසින් මාසිකව දරනු ලබන මුළු වියදම - රුපියල් මිලියන 132.425

සියලු මන්ත්‍රීවරුන් සඳහා රජය විසින් දරනු ලබන වාර්ෂික මුළු වියදම - රුපියල් මිලියන 1,583.937

ඊට අදාළ විස්තර පහත දැක්වේ.

අනු අංකය	පළාත	සියලු නියෝජිතයින් සඳහා දැනට මාසිකව දැරීමට සිදු වන මුදල (රුපියල් මිලියන)	2022.01.01-2022.12.31 දක්වා සභික දීමනාව ලෙස වාර්ෂිකව දරන ලද මුදල (රුපියල් මිලියන)
01	මධ්‍යම	4.31	51.76
02	නැගෙනහිර	14.355	172.26
03	උතුරු මැද	9.215	110.58
04	වයඹ	15.465	185.58
05	උතුර	12.150	145.800
06	සබරගමුව	17.526	210.312
07	දකුණ	20.789	244.165
08	ඌව	9.765	117.180
09	බස්නාහිර	28.85	346.300
	එකතුව	**132.425**	**1,583.937**

(iv) මීට අදාළව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කර එහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ නීතිපතිගේ සහතිකය ලබා ගැනීමට ඉදිරිපත් කරන ලදී.

(ඇ) එකී පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) වන ව්‍යවස්ථාව, 3 වන හා 4 වන ව්‍යවස්ථා සමඟ ගැටෙන බව සහ එබැවින් මෙම පනත් කෙටුම්පත සම්මත කර ගත්තේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාව ප්‍රකාරව (පාර්ලිමේන්තුවේ 2/3ක බහුතරය සහ ජනමත විචාරණයකින්) සම්මත කරගත යුතු බවට නීතිපති උපදෙස් ලැබී ඇත.

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

ගරු කථානායකතුමනි, ගරු රාජ්‍ය අමාත්‍යතුමා ලබා දුන් පිළිතුරේ අවසාන කාරණාවත් එක්ක මගේ පළමු අතුරු ප්‍රශ්නය මම අහන්නම්.

සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් ඇතුළු රජයේ ක්ෂේත්‍ර නිලධාරීන් සියලුදෙනාට ඡන්ද බලය තිබෙනවා. ඒ අය දේශපාලන අයිතිවාසිකම් සීමා කරපු නිලධාරීන් නොව, දේශපාලන අයිතිවාසිකම් තිබෙන නිලධාරීන්. ඒ අයට ඡන්දය ඉල්ලන්න අයිතිය තිබුණා ඒ ඒ කොට්ඨාස මට්ටමින්. නමුත් ගෙනාපු සංශෝධනය නිසා ඒ අයට කොට්ඨාස මට්ටමින් ඡන්ද ඉල්ලන්න බැරි වුණා. ඒ අතර නගර සභා, ප්‍රාදේශීය සභා සභාපතිවරු විතරක් 100කට වැඩි ප්‍රමාණයක් හිටියා. මන්ත්‍රීවරු දහස් ගණනක් හිටියා. ඒ සංශෝධනය අනුව විශාල පිරිසකට ඒ අවස්ථාව අහිමි වුණා. අපි ඒ ගැන අදාළ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී කිහිප දවසක් සාකච්ඡා කළාට පස්සේ, ඔවුන් ඡන්දය ඉල්ලන පළාත් පාලන කොට්ඨාසයෙන් පිට අවස්ථාවක් දීලා තිබෙනවා. පළාත් පාලන ආයතන ඇතුළේ වැඩ කරන්න අවස්ථාවක් දෙන්න පුළුවන් ද කියලාත් අපි සාකච්ඡා කළා, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි. ඔහු ඡන්දය ඉල්ලන කොට්ඨාසය ඇතුළේ වැඩ කළොත් තමයි යම් දේශපාලන බලපෑමක් කරන්න පුළුවන් වන්නේ. නගර සභා බල ප්‍රදේශයක, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක තිබෙන්නේ ඉතා සීමිත ඉඩක්. ඒ අය ඒ ඉඩෙහි හිටියේ නැත්නම්, වෙනත් තැනක ඉඳලා ඒ කටයුත්ත කරන්න ඒ අයට බැහැ. එහෙම තත්ත්වයක් තිබියදී ඇයි පළාත් පාලන ආයතන ඇතුළේ ඡන්දය ඉල්ලන කොට්ඨාසයෙන් පිට අවස්ථාවක් දීලා මේ කටයුත්ත කරන්නේ නැත්තේ? මොකද, රජයක් විධියට පොදුජන පෙරමුණු රජය පසුගිය කාලයේ පොරොන්දු වුණා ඒ කාරණාව ඉටු කරනවා කියලා. ඒ නිසා ඒ අයට විශාල විශ්වාසයක් තිබුණා ඒ ගැන. නමුත්, දැන් ඒ අයට විශාල අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු කථානායකතුමනි, අපි නීතිපතිවරයාගේ සහතිකය ගන්න ගියාම, නීතිපතිතුමා තමයි මේ පනත වෙනස් කරන්න එතුමාගේ සහතිකය එව්වේ. ගරු මන්ත්‍රීතුමා කියන කාරණය පිළිබඳව අපි නැවත සොයා බලන්නම්. කිසියම් කෙනෙකු පළාත් පාලන ආයතන මැතිවරණයට ලැයිස්තුවෙන් ඡන්දය ඉල්ලුවා නම් ඔහු පළාත් පාලන ආයතනයටම වග කියනවා. කොට්ඨාසයකින් ඉල්ලනවා නම් ඒ කොට්ඨාසයට විතරයි වග කියන්නේ. අපි නැවත වරක් නීතිපතිතුමාගෙන් ඒ ගැන පැහැදිලි කිරීමක් ලිඛිතව ලබාගෙන දැනුම් දෙන්නම්.

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ දිනවල පවතින ගංවතුර තත්ත්වය, වැහි වතුර ඒක රාශි වීම ආදි සියල්ල නිසා ප්‍රදේශ ගණනාවක් විශාල ව්‍යසනයකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කඩුවෙල ප්‍රදේශයේ පවුල් තුන්දහස් ගණනක දොළොස් දහසකට වැඩි පිරිසක් අනාථ වෙලා, අසරණ වෙලා සිටිනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් එක්ක පළාත් පාලන ආයතනවල නිලධාරින් එකතු වෙලා තමයි ඒ ආපදාවට ලක් වූ අය වෙනුවෙන් සහන සැලසීමට මූලිකත්වය ගෙන, මැදිහත් වෙලා කටයුතු කරන්නේ. ප්‍රාදේශීය සභාවල, නගර සභාවල සේවය කරන විශාල පිරිසක් අවුරුදු ගණනාවක් තිස්සේ කැප වෙලා මේ වැඩ කරනවා. ගංවතුර ආවාට පසුව ඩෙංගු වාගේ උවදුරු ඇති වෙනවා, ගරු කථානායකතුමනි. කැළි කසළ පවා අදින්නේ ඒ ආයතනවල සුළු සේවකයන්. හැබැයි ඒ සුළු සේවකයන් ස්ථිර කරන්නේ නැතිව දීර්ඝ කාලයක් ගත වෙලා තිබෙනවා. අපි හැමදාම කියනවා, ඒක අද කරනවා, හෙට කරනවා කියලා. හැබැයි, ඒක හරියට බාලගිරි දෝෂය වාගෙයි. ඒ සුළු සේවකයන් ස්ථිර කරන්නේ නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමා ඒ සඳහා විශාල උත්සාහයක් දරන බව මම දන්නවා. නමුත් තවම ඒ කටයුත්ත සිදු වෙලා නැහැ, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඒ නිසා විශේෂයෙන් පළාත් පාලන ආයතන මට්ටමින් දීර්ඝ කාලයක් තිස්සේ සේවය කරන ස්ථිර නොකරපු සුළු සේවකයන් ස්ථිර කරන්න. මොකද, ඒ අයට තෘප්තිමත්භාවයකින් වැඩ කරන්න නම් ඔවුන්ගේ සේවා ස්ථිරත්වය අත්‍යවශ්‍යයි. ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරලා ඒ කටයුත්ත ඉක්මනින් සිදු කරනවාද කියා දැන ගන්න කැමැතියි.

ගරු ජානක වක්කුඹුර මහතා
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)

ගරු කථානායකතුමනි, ඊයේ සියලු පළාත් පාලන කොමසාරිස්වරුන්ට දැනුම් දුන්නා, අදින් පටන් ගෙන, 8,400ක් වුණු අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් පදනමේ ඉන්න ස්ථිර නොකරපු සේවකයන් සම්මුඛ පරීක්ෂණයකට භාජන කරලා ජ්‍යෙෂ්ඨත්වය අනුව ලේඛනයක් හදලා 15වැනිදාට ඉස්සෙල්ලා ලබා දෙන්න කියලා. ඊට පසුව අපි ඉක්මන් දිනයක් යොදා ගෙන ඒ ගොල්ලන්ට ස්ථිර පත්වීම් ලබා දෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -610/2024- (1), ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatilleka)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatilleka)

ගරු කථානායකතුමනි, තවම මේ යන්නේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න. අද කථික මන්ත්‍රීතුමන්ලාත් රාශියක් ඉන්නවා. ඒ නිසා අපි ගරු සභානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා දිවා ආහාර විවේකය සඳහා වෙන් කර තිබෙන කාලයත් සභාවේ කටයුතු සඳහා ලබා දෙන්න කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)

Aye.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -612/2024- 2, ගරු ජයන්ත සමරවීර මහතා.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර)
(The Hon. Jayantha Samaraweera)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)

ගරු කථානායකතුමනි, ඊට පෙර, මගෙන් අසන ලද ප්‍රශ්නයට - 5වන ප්‍රශ්නයට - පිළිතුර ලබා දෙන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගෙන් ප්‍රශ්නය අසා තිබෙන ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා absent.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි (කලානිති) විජයතාස ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු කථානායකතුමනි, මට අවස්ථාවක් දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමනි, ඔබතුමාගෙන් ප්‍රශ්නය අසා තිබෙන ගරු මන්ත්‍රීතුමා absent.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි (කලානිති) විජයතාස ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු කථානායකතුමනි, මා හිතන විධියට, මේ ප්‍රශ්නය තුන්වැනි වතාවට තමයි අද එන්නේ. මන්ත්‍රීතුමන්ලා ප්‍රශ්න ඉදිරිපත් කරනවා. ඒවාට උත්තර දෙන්න ඇමතිවරු මෙතැනට ඇවිල්ලා පැය ගණනක් රැඳී ඉන්නවා. නමුත්, මන්ත්‍රීතුමන්ලා ප්‍රශ්න අහන්න එන්නේ නැහැ. මම මේ උත්තරය අද ඉදිරිපත් කළේ නැත්නම්, ආපහු තව දවසක පාර්ලිමේන්තුවේ කාලය මේ ආකාරයටම නාස්ති කරන්න වෙනවා. ඒ නිසා මට මේ උත්තරය සභාගත කරන්න අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

දෙවන වටයේදී පිළිතුර සභාගත කරන්න ඔබතුමාට පුළුවන්.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
දෙවැනි වටය වෙලාවේදීත් එතුමා එන එකක් නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා ද, ගරු සභානායකතුමනි?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -635/2024- (2), ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 -1090/2024- (1), ගරු සමන්ප්‍රිය හේරත් මහතා.

ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -1126/2024- (1), ගරු ඩී. වීරසිංහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

උඩවලව ජලාශය: රොන්මඩ ඉවත් කිරීම
உடவளவை நீர்த்தேக்கம்: வண்டல் மண்ணகற்றல்
UDAWALAWE RESERVOIR: DESILTATION

1147/2024

10. ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
(மாண்புமிகு (திருமதி) முதிதா பிரிஸாந்தி)
(The Hon. (Mrs.) Muditha Prishanthi)
වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර, උඩවලව ජලාශය පසුගිය කාලයේ පැවති නියඟය හේතුවෙන් සිඳී ගිය බවත්;

(ii) ඒ හේතුවෙන් ප්‍රදේශයේ ගොවි ජනතාව හා වන සතුන් ජලය නොමැති වීමෙන් දැඩි පීඩාවකට පත් වූ බවත්;

(iii) රොන්මඩ හේතුවෙන් එම ජලාශය විශාල ලෙස ගොඩ වී ඇති බවත්;

එතුමිය දන්නේද?

(ආ) (i) උඩවලව ජලාශයේ පවතින රොන්මඩ ඉවත් කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) ඒ සඳහා වෙන් කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

නීර්ප්‍රාසන අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) கடந்த காலத்தில் நிலவிய வறட்சியின் காரணமாக இரத்தினபுரி, உடவளவை நீர்த்தேக்கம் வற்றிப்போனது என்பதையும்;

(ii) அதன் காரணமாக அப்பகுதி விவசாயிகள் மற்றும் வனவிலங்குகள் தண்ணீரின்றி கடுமையாகப் பாதிக்கப்பட்டன என்பதையும்;

(iii) வண்டல் மண் காரணமாக மேற்படி நீர்த்தேக்கம் பெருமளவில் நிரம்பியுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) உடவளவை நீர்த்தேக்கத்திலுள்ள வண்டல் மண்ணை அகற்ற நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(ii) அதற்கென ஒதுக்குவதற்கு எதிர்பார்க்கப்படும் நிதித் தொகை எவ்வளவு என்பதையும்;

(iii) வண்டல் மண்ணை அகற்றும் பணிகள் ஆரம்பிக்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation:

(a) Is she aware that -

(i) Ratnapura, Udawalawe Reservoir has dried up due to the recent drought;

(ii) the farmers and wild animals in the area suffered greatly due to lack of water, as a result; and

(iii) the said reservoir has been heavily overfilled due to siltation?

(b) Will she inform this House -

(i) whether steps are taken to remove the silt in the Udawalawe Reservoir;

(ii) the amount expected to be allocated for that; and

(iii) the date on which the desilting operations will commence?

(c) If not, why?

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (වනජීවී හා වන සම්පත් සංරක්ෂණ සහ වාරිමාර්ග අමාත්‍යතුමිය)
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரும் நீர்ப்பாசன அமைச்சரும்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law - Minister of Wildlife and Forest Resources Conservation and Minister of Irrigation)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2023 වර්ෂයේ මැයි සිට අගෝස්තු දක්වා පැවති දැඩි නියඟය හේතුවෙන් ජූලි සහ අගෝස්තු යන කාල වකවානුව තුළ උඩවලව ජලාශයෙන් වගා කටයුතු සඳහා ජලය නිකුත් කිරීමට අපහසු වන මට්ටමට ජල ධාරිතාව අඩු විය.

(ii) ජල ධාරිතාව අඩුවීම නිසා ප්‍රදේශයේ ජනතාව මෙන්ම සතා සිවුපාවුන් ද දැඩි පීඩනයට පත් වූ බැවින් ඉන් අත්මිදීමට විකල්පයක් ලෙස සමනලවැව ජලාශයෙන් ජලය ලබා ගැනීමට කටයුතු කරන ලදී.

(iii) උඩවලව ජලාශයේ ඉදි කිරීම් නිම කර දශක 6ක පමණ කාලයක් ගතව ඇති නිසා අවසාදිත රොන්මඩ තැන්පත්ව ජලාශයේ ධාරිතාව යම් ප්‍රමාණයකින් අඩු වී ඇති බව නිරීක්ෂණය වේ. නමුත්, තාක්ෂණික සමීක්ෂණයක් සිදු කර කොපමණ ප්‍රමාණයක් රොන්මඩ තැන්පත් වී ඇත්දැයි නිරීක්ෂණය කළ යුතු වේ.

(ආ) (i) උඩවලව ජලාශයේ තැන්පත් වී ඇති වැලි හා රොන්මඩ ඉවත් කිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීමේ ස්ථානීය පරීක්ෂාවක් හා ඒ පිළිබඳ සාකච්ඡාවක් 2023.08.31 දින ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරීන් සහ රේඛීය ආයතන වන, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය සමඟ ඒකාබද්ධව උඩවලවේදී පැවැත්විණි.

මෙම සාකච්ඡාවෙන් පසු රොන්මඩ කඩිනමින් ඉවත් කිරීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර 2023.10.03 වන දින නිර්දේශ ලබා ගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා නිර්දේශ ලබා ගැනීම සඳහා කටයුතු කරගෙන යනු ලැබේ.

(ii) මෙම රොන්මඩ ඉවත් කිරීම ආයෝජකයන් මඟින් අදියර වශයෙන් නිම කිරීමට අපේක්ෂා කරනු ලැබේ. පළමු අදියර වශයෙන් කියුබ් 141,343ක ප්‍රමාණයක් ඉවත් කිරීමට ඇස්තමේන්තු කර ඇත.

(iii) ව්‍යාපෘති වාර්තාව සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය අනුමැතිය 2024.05.08 වන දින අංක වජී/6/1/2/1065 දරන ලිපිය මඟින් ලබා දී ඇති අතර අනෙකුත් රාජ්‍ය ආයතන විසින් ලබා ගත යුතුව ඇති අනුමැතීන් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. කෙසේ වෙතත් මේ වන විට ජලාශයේ ජල මට්ටම වාන් මට්ටමේ පවතින අතර, සාමාන්‍ය යල කන්නයක් අවසානයේ අපේක්ෂිත ජල මට්ටමට වඩා ජල ප්‍රමාණයක් ජලාශය තුළ මෙවර, එනම් 2024 යල කන්නයේ ඉතිරි වන බැවින් රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු සමඟර විට මෙම වර්ෂයේ සිදු කිරීමට හැකියාවක් නොතිබේ.

(ඇ) (ආ) (iii) මඟින් පිළිතුරු ලබා දී ඇත.

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
(மாண்புமிகு (திருமதி) முதிதா பிரிஸாந்தி)
(The Hon. (Mrs.) Muditha Prishanthi)
ගරු ඇමතිතුමියනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. උඩවලව ජලාශයට ජලය සපයන ප්‍රධාන ගංගාව තමයි වළවේ ගඟ. ඒ වාගේම මෙම ජලාශයට ජලය සපයන ආරවල් තිබෙනවා. උදාහරණයක් ලෙස වැලිගෙපොල, කුඩා ඔය හඳුන්වන්න පුළුවන්. මෙම ජලාශයට ජලය සපයන ආරවල් වැලි හා රොන්මඩවලින් පිරිලා තිබෙනවා. ඒ හේතුවෙන් නිසි පරිදි ජලාශයට ජලය ගලා ඒමක් සිදු වන්නේ නැහැ. ඒ නිසා එම ආරවල පවතින වැලි හා රොන්මඩ ඉවත් කිරීමට යම් කිසි වැඩ පිළිවෙළක් යොදලා තිබෙනවාද කියලා දැන ගන්න කැමැතියි.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමියනි, ඒ යෝජනාව ඔබතුමිය ඉදිරිපත් කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. එවැනි තත්ත්වයක් පවතිනවා නම්, ඒ රොන්මඩ නීත්‍යානුකූලව ඉවත් කිරීමට හැකියාවක් තිබෙනවා නම්, ඒ කටයුත්ත ඉතා ඉක්මනින් ඉටු කරන බව මම ඔබතුමියට සඳහන් කරනවා.

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
(மாண்புமிகு (திருமதி) முதிதா பிரிஸாந்தி)
(The Hon. (Mrs.) Muditha Prishanthi)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමට ගරු අසංක නවරත්න මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

ගරු අසංක නවරත්න මහතා
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)
ස්තුතියි. ගරු අමාත්‍යතුමියනි, ඔබතුමිය සභාවේ ඉන්න වෙලාවේ මම මේ ප්‍රශ්නය අහන්නේ, ඔබතුමියට වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයත් භාරව තිබෙන නිසායි. බහුකාර්ය සංවර්ධන සහකාරවරුන් බඳවා ගෙන දැන් අවුරුදු හතරකට ආසන්න කාලයක් වෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලිවැට නඩත්තු කිරීමේ කටයුතු සඳහා ඒ උදවිය වැඩි ප්‍රමාණයක් යොදා ගෙන තිබෙනවා. ඒ ගොල්ලන්ගේ රැකියාව ස්ථීර කිරීම පිළිබඳ ගැටලුව ගැන මම පසුගිය සතියේත් පාර්ලිමේන්තුවේදී විමසීමක් කළා. ඒ අවස්ථාවේ ඔබතුමිය හිටියේ නැහැ. ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන්, එහෙම නැත්නම් වනජීවී අධ්‍යක්ෂ ජනරාල්තුමාගෙන් ඇහුවාම කියන්නේ, කඩිනමින් කැබිනට් පත්‍රිකාවක් යොමු කරලා ඒ කටයුතු කරනවා කියලායි.

[ගරු අසංක නවරත්න මහතා]

දැන් අලි වැට නඩත්තු කිරීමට ඉන්න නිලධාරීන් වෙන වෙන අමාත්‍යාංශවලට යනවා, ස්ථිර පත්වීම් ලබා ගන්න. ඒක විශාල ගැටලුවක් වෙලා තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඔබතුමියගේ මැදිහත් වීම තිබෙන්නේ කොයි ආකාරයෙන්ද කියලා මම දැනගන්න කැමතියි.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට බහුකාර්ය සංවර්ධන සහකාර නිලධාරීන් බඳවා ගන්න කටයුතු කරගෙන යන්නේ තිබෙන පුරප්පාඩුවලට නොවෙයි. අපි මුදල් අමාත්‍යාංශයෙන් අනුමත කරගෙන, කැබිනට් සංදේශ ගණනාවකින් අලුත් සේවක සංඛ්‍යාවක් ඇති කරගෙන තමයි ඒ බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරගෙන යනු ලැබුවේ.

ඒ සියල්ල කැබිනට් මණ්ඩලයෙනුත් අනුමත වුණාට පස්සේ සංචාරක මග පෙන්වන්නන් පිරිසක් - ඒ අයට කියන්නේ සංචාරක මග පෙන්වන්නන් කියලා - Supreme Court එකේ නඩුවක් දැම්මා, ඔවුන්ව සංචාරක මග පෙන්වන්නන් හැටියට බඳවා ගැනීමට කටයුතු කරන්න' කියලා. ඒ නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තාවකාලික තීන්දුවක් දීලා තිබෙනවා, 'මේ හාරදහස් ගණන බඳවා ගැනීම නතර කරන්න, සංචාරක මග පෙන්වන්නන් බඳවා ගන්නකම්' කියලා. සංචාරක මග පෙන්වන්නන් බඳවා ගන්න වෙන්නේ අපට තිබෙන සේවක සංඛ්‍යා පුරප්පාඩු ඇතුළත. ඒ සම්බන්ධව මම අපේ නිලධාරීන්ව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාවකට යැව්වා. ඒ වාගේම, මම පෞද්ගලිකව කරුණු පැහැදිලි කිරීමකුත් කළා, මේ කණ්ඩායම ඒ කණ්ඩායමට පටලවා ගන්න එපාය කියලා. හෙට දිනයේදී අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පවත්වනවා, පවතින සේවක සංඛ්‍යා ඇතුළත සේවකයින් බඳවා ගැනීම ගැන තීන්දුවක් ගන්න. ඒ කමිටුවට මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් පැමිණෙනවා. සංචාරක මග පෙන්වන්නන් අපේ තිබෙන සේවක සංඛ්‍යාව ඇතුළත ස්ථිර සේවයට ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ කමිටුවේ සභාපතිතුමාටත් මම කථා කළා. ඒ තීන්දුව අපට ලැබුණාට පස්සේ අපි ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දෙනවා, අපට ලැබුණු තීන්දුව මෙන්න මේකයි, බහුකාර්ය සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම අපි අලුතෙන් හදා ගත්ත cadre එකට කිසිම සම්බන්ධයක් නැහැ කියලා. සම්බන්ධයක් නැති වුණත් ඒ සම්බන්ධව දිගින් දිගටම ශ්‍රේෂ්ඨාධිකරණයට යාමේ තත්ත්වය තිබෙනවා. ඒ නිසා මම හිතනවා හෙට අපට අග්‍රාමාත්‍යතුමාගේ ලේකම්තුමාගේ කමිටුවෙන් අනුමැතිය ලබා දෙයි කියලා, සංචාරක මග පෙන්වන්නන් පවතින cadre එකට ස්ථිර කර ගන්න. ඒ අනුමැතිය ලැබුණාම අපි වහාම Supreme Court එකට මෝසමක් දාලා, ඒ තත්ත්වය පැහැදිලි කරලා දෙනවා. ඒ අනුව, ශ්‍රේෂ්ඨාධිකරණය අපේ දෙපාර්තමේන්තුවට බහුකාර්ය සංවර්ධන සහකාර නිලධාරීන් බඳවා ගැනීමට දමපු තහනම ඉතා ඉක්මනින් අයින් කර දෙයි කියලා අපි විශ්වාස කරනවා. අග්‍රාමාත්‍යතුමාගේ ලේකම්තුමාගේ කමිටුවේ තීන්දුව ලැබුණු වහාම අපි අධිකරණයට ගිහිල්ලා ඒ ප්‍රශ්නය විසඳා ගන්න කටයුතු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය: අලෙවිසල්
வாசனை சரக்கு மற்றும் அதுசார்ந்த உற்பத்திகள் சந்தைப்படுத்தல் சபை: விற்பனை நிலையங்கள்
SPICES AND ALLIED PRODUCTS MARKETING BOARD: SALES OUTLETS

541/2024

2. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. (Mrs.) Kokila Gunawardene)

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇති අලෙවිසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලෙවිසල් ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) ඉදිරියේදී නව අලෙවිසල් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, නව අලෙවිසල් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(v) මේ වනවිට මණ්ඩලයේ වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வாசனை சரக்கு மற்றும் அதுசார்ந்த உற்பத்திகள் சந்தைப்படுத்தல் சபையால் நிறுவப்பட்டுள்ள விற்பனை நிலையங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அத்தகைய விற்பனை நிலையங்கள் நிறுவப்பட்டுள்ள பிரதேசங்கள் யாவை என்பதையும்;

(iii) எதிர்காலத்தில் புதிய விற்பனை நிலையங்களை நிறுவுவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iv) ஆமெனில், புதிய விற்பனை நிலையங்களை நிறுவுவதற்கு எதிர்பார்க்கப்படும் பிரதேசங்கள் யாவை என்பதையும்;

(v) சபையின் தற்போதைய வருடாந்த வருமானம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Will he inform this House -

(i) the number of sales outlets set up by the Spices and Allied Products Marketing Board;

(ii) the areas where such sales outlets have been set up;

(iii) whether steps would be taken to set up new sales outlets in future;

(iv) if so, the areas where such new stalls are expected to be set up; and

(v) the annual income of the Board at present?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණී (කලානිති) සුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 25කි.

(ii)

බත්තරමුල්ල	කලවාන	නුගේගොඩ
මාදිවෙල	කොටාමුල්ල	නවනගරය - රත්නපුර
ඇහැළියගොඩ	පඹහින්න	කිරිඇල්ල
බලන්ගොඩ	පැල්මඩුල්ල	කුරුවිට
නිවිතිගල	අයගම	රත්නපුර
යක්කල	අතුරුගිරිය	හෝමාගම
කොරුල්ල	පාදුක්ක	

පදනම අලෙවිසැල - කොළඹ 07
පිටකොටුව අලෙවිසැල - කොළඹ 11
නවමී මාවත අලෙවිසැල - කොළඹ 02
මාකුඹුර අලෙවිසැල - කොට්ටාව
ගාල්ල අලෙවිසැල - පොද්දල (බද්දේගම)

(iii) ඔව්

(iv)

කිරිබත්ගොඩ	ජා ඇල	වත්තල
ගාල්ල	මාතර	හම්බන්තොට
කෑගල්ල	මාවනැල්ල	මහනුවර

(v) රුපියල් 464,479,060/- (2023 වර්ෂය)

(ආ) අදාළ නොවේ.

මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම: විස්තර
மரண தண்டனையை நடைமுறைப்படுத்தல்: விபரம்
IMPLEMENTATION OF DEATH PENALTY: DETAILS

610/2024

5. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Upul Mahendra Rajapaksa)

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයට අනුව පැනවිය හැකි උපරිම දඩුවම මරණ දඩුවම බවත්;

(ii) මරණ දඩුවම ක්‍රියාත්මක කිරීම මේ වනවිට සිදු නොවන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මරණ දඩුවම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ලණු ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය සම්පාදනය කර එල්ලුම් ගහ අලුත්වැඩියා කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) අලුගෝසු තනතුර සඳහා බඳවා ගැනීමට පියවර ගෙන තිබේද;

(iv) මරණ දඩුවම ක්‍රියාත්මක කිරීමට එරෙහිව බාධා තිබේද;

(v) එසේ නම්, එම බාධා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை தண்டனைச் சட்டக்கோவைக்கு அமைய விதிக்கப்படக் கூடிய அதிகபட்ச தண்டனை மரண தண்டனை என்பதையும்;

(ii) தற்போது மரண தண்டனை நிறைவேற்றப்படுவதில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மரண தண்டனையை நிறைவேற்றுவதற்குத் தேவையான கயிறு உட்பட ஏனைய சாதனங்கள் வழங்கப்பட்டு, தூக்குமேடை புதுப்பிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், அதற்கென செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;

(iii) அலுகோசு பதவிக்கான ஆட்சேர்ப்பை மேற் கொள்ள நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) மரண தண்டனையை நிறைவேற்றுவதற்கு எதிராக தடைகள் காணப்படுகின்றனவா என்பதையும்;

(v) அவ்வாறாயின், அத்தடைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice, Prison Affairs and Constitutional Reforms:

(a) Is he aware -

(i) that the maximum penalty that can be imposed under the Penal Code of Sri Lanka is the death penalty; and

(ii) that the death penalty is not currently implemented?

(b) Will he inform this House -

(i) whether the gallows have been repaired by providing the ropes and other materials necessary for execution;

(ii) if so, the amount of money spent thereon;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) whether steps have been taken to recruit persons for the post of executioner;

(iv) whether impediments are there against the implementation of execution; and

(v) if so, the aforesaid constraints;

(c) If not, why?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි (කලානිති) විජයතාස රාජූපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්

(ii) ඔව්

(ආ) (i) වැලිකඩ බන්ධනාගාරය තුළ පිහිටා ඇති එල්ලුම් ගහ අලුත්වැඩියා කර ඇත. ඊට අවශ්‍ය කඹය හා අනිකුත් ද්‍රව්‍ය බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පවතී.

(ii) වැලිකඩ එල්ලුම් ගහේ දිරාපත් වූ දැව අලුත්වැඩියාව සඳහා රුපියල් 137,595.00 මුදලක් වැය කර ඇත.

(iii) ඔව්, මේ වන විට දෙදෙනෙකු මෙම තනතුර සඳහා බඳවාගෙන ඇත.

(iv) බාධාවක් නොමැත.

අතිගරු ජනාධිපතිතුමා විසින් දිනයක් හා වේලාවක් නියම කරනු ලැබුවහොත් දණ්ඩනය ක්‍රියාත්මක කළ හැක.

(v) බාධාවක් නොමැත.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -635/2024- (2), බී.වයි.ජී. රත්නසේකර මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පත්තිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු බී.වයි.ජී. රත්නසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -1126/2024- (1), ගරු ඩී. වීරසිංහ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පත්තිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු ඩී. වීරසිංහ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, ඔබතුමා අවස්ථාවක් ඉල්ලුවා නේ. ඔබතුමාගේ කාරණය ඉක්මනින් ඉදිරිපත් කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, මම ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. මට මේ ප්‍රශ්න දෙක වෙන වෙනම අහන්න අවසර දෙන්න.

පළමුවෙනි ප්‍රශ්නය මේකයි. පසුගිය දිනවල, ඇතැම් වෘත්තීය සමිති මඟ හැරියත් මේ රටේ ගුරුවරු සැලකිය යුතු සංඛ්‍යාවක් සාධාරණ ඉල්ලීම් මුල්කොටගෙන වර්ජනයක නිරත වුණා. ගෝඨාභය රාජපක්ෂ පාලන කාලයේ වැටුප් විෂමතා පිළිබඳ ප්‍රශ්නය ආපු වෙලාවේ ඒක විසඳන්න පත් කරපු කමිටුවේ මමත් සාමාජිකයෙක් හැටියට හිටියා. අපි යෝජනා කළ විසඳුම අදියර කිහිපයකින් තමයි ක්‍රියාත්මක කරන්න තීරණය කළේ.

අපි ස්වාධීන කරපු මහ බැංකුව අත්තනෝමතික විධියට ඔවුන්ට වැටුප් වැඩිකර ගන්නකොට, ගුරුවරු වැනි අයටත් පොරොන්දු වෙච්ච පරිදි වැටුප් වැඩි කිරීමේ ඉතිරි කොටස ඉල්ලන්න සාධාරණ ආවේගයක් ඇති වෙනවා. ඒක වළක්වන්න අපට බැහැ. ඒ ප්‍රශ්නය ඔබතුමාට තනියෙන් විසඳන්න බැරි බව මම දන්නවා. ඒක ගැන නොවෙයි මම කියන්නේ. ගරු ඇමතිතුමනි, ගුරුවරුන්ට විවිධ කටයුතු -පාසල් කටයුතු, ලිපි ද්‍රව්‍ය, අන්තර්ජාල පහසුකම් වාගේ දේවල්- වෙනුවෙන් මුදල් වැය වෙනවා. දෛනික ඉගැන්වීම් කටයුතුවලදී ප්‍රශ්න පත්‍ර ඒ වාගේම, ඉගෙනුම් ආධාරක - whiteboards එහෙම නැත්නම් markers - ලබා ගැනීම සඳහාත් පෞද්ගලිකව වියදම් දරන්න වෙනවා. මොකද, අවශ්‍යතාවට සරිලන පරිදි ඔවුන්ට ඒවා ලැබෙන්නේ නැති නිසා. ඒ වාගේම තමයි අමතර ඉගැන්වීම් සඳහා, විවිධ සමිති සමාගම් සඳහා, ඒ කියන්නේ විෂය සමගාමී කටයුතු සඳහා, පරිපාලන කටයුතු සඳහා තමන්ගේ පෞද්ගලික දුරකථනය භාවිත කරන්නට සිදු වෙන අවස්ථාත් තිබෙනවා. ක්‍රීඩා සමිති සමාගම් සඳහාත්, දේශන ආදී කටයුතු සඳහාත් දුරුවන් රැගෙන යන්නත් සිද්ධ වෙනවා. එවැනි අවස්ථාවල බොහෝ ගුරුවරුන්ට පෞද්ගලිකව ගමන් වියදම් දරාගන්න සිද්ධ වෙනවා. විදුහල්පතිවරුන්ටත් එහෙමයි. ගරු ඇමතිතුමනි, ඒ නිසා අපි යෝජනා කරපු අදියර කිහිපයකින් වැටුප් වර්ධක ලබා දීමේ කාරණය ඉටු කිරීමට යටත්ව මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් දාලා හරි කමක් නැහැ, ගුරුවරුන්ට සහ

විදුහල්පතිවරුන්ට පෞද්ගලිකව දරන්නට සිද්ධ වෙලා තිබෙන මෙවැනි වියදම් සඳහා අඩුම ගණනේ රුපියල් 5,000ක අතිරේක දීමනාවක්වත් ලබා දීමට පියවර ගන්න. මහ බැංකුව සියයට 70කින් පඩි වැඩි කරගත්ත රටේ, ගුරුවරුන්ට එහෙම සාධාරණයක්වත් ඉටු කරන්න බැරිකමක් තිබෙන්න විධියක් නැහැ. ලිපි ද්‍රව්‍ය, ගමන් වියදම්, අන්තර්ජාල පහසුකම් පිළිබඳ දීමනාව කියලා හරි ඒක හඳුන්වලා අඩු ගණනේ රුපියල් 5,000ක දීමනාවක්වත් ඒ අයට ලබා දීමට පියවර ගන්න පුළුවන්ද කියන එක තමයි මගේ පළමුවෙනි ප්‍රශ්නය.

ඔබතුමා ඒ ප්‍රශ්නයට උත්තර දුන්නාට පසුව මගේ දෙවැනි ප්‍රශ්නය ඔබතුමාට යොමු කරන්නම්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගරු විමල් වීරවංශ මැතිතුමා ඇමතිවරයෙකු හැටියට සිටියදී, එදා ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතු අනුකමිටුවක් මඟින් කරන ලද නිර්දේශය අනුව ගුරු වැටුප් වැටුප් විෂමතාව නැති කිරීමේ එක් අදියරක් වශයෙන් ඔවුන්ට වැටුප් වැඩි කිරීමක් ලබා දුන්නා. ඒ අනුව 2022 ජනවාරි 01වැනි දා ඉඳලා එම වැටුප් වැඩි කිරීම ලබා දුන්නා. ඒ සඳහා රුපියල් බිලියන 32ක් එදා වැය වුණා. අද වෙනකොට ගුරුවරු 232,000ක් සක්‍රිය සේවයේ යෙදී සිටිනවා. විදුහල්පතිවරු 16,000ක් සේවයේ යෙදී සිටිනවා. මේ අවුරුද්දට ඒක ගණනය කළාම බිලියන 40ත්, 45ත් අතර මුදලක් අවශ්‍යයි. මේ අවුරුද්දේ සියලු රාජ්‍ය සේවකයන්ට රුපියල් 10,000ක දීමනාවක් ලබා දුන් නිසා ගුරුවරුන්ට මේ අවුරුද්දේ එම මුදල වෙන් කරලා නැහැ. මම ඉල්ලීමක් කළා. නමුත් වෙන් කළේ නැහැ. ඒ පිළිබඳව ගුරු වෘත්තීය සමිති සමඟ අපි සාකච්ඡා පවත්වනවා. අද දවාලේත්, ලබන සතියේත් සාකච්ඡා කිහිපයක් පවත්වන්න යොදාගෙන තිබෙනවා. ඒ අනුව තමයි අර අදියර යටතේ වන වැටුප් විෂමතාව විසඳන්න වෙන්නේ.

දෛනික දීමනා ගැන කථා කළොත්, පාසලක විෂය සමගාමී හා බාහිර ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වෙන ගුරුවරු ඉන්නවා. ඒ අතර ගුරුවරු දෙලක්ෂ තිස්දෙදහසම නැහැ. නමුත්, ඒ කටයුතුවල යෙදෙන ගුරුවරුන්ට සහ විදුහල්පතිවරුන්ට යම් දීමනාවක් ගෙවීමට අවධානය යොමු වෙලා තිබෙනවා. විදුහල්පතිවරුන්ගේ දීමනා සහ අධිශ්‍රේණිය ඇති කිරීම සඳහා වූ කමිටු වාර්තාවකට අනුව ඒ අයත් එකඟ වෙච්ච කරුණු පිළිබඳව මම දැනට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක තව සතියක් ඇතුළත නිරීක්ෂණ සමඟ ඇමති අනුකමිටුවට ලැබේවි. ඒ අනුව තමයි ඒකට විසඳුමක් ලබා දෙන්න වෙන්නේ. ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට දුරකථන, ලිපි ද්‍රව්‍ය වාගේ දෛනිකව මුදල් වැය වන කටයුතු පිළිබඳවත්, බාහිර ක්‍රියාකාරකම්වල යෙදෙන ගුරුවරු සම්බන්ධවත් අපි සාකච්ඡා කළා. ඒවා සම්බන්ධ විස්තර දැනට table කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් මට ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට යොමු කරන මගේ දෙවැනි ප්‍රශ්නය මෙයයි. මේ කාරණය පසුගිය දිනවල මාධ්‍ය මඟිනුත් අනාවරණ වුණා. අපේ රටේ බුද්ධි අංශත් වාර්තා කරලා තිබුණා. වතුකරයේ පාසල්වල ගුරු හිඟයක් තිබෙනවා, අපේ ගුරුවරුන්ගෙන් සම්පූර්ණ කරගන්න බැරි. ඒ හේතුව නිසා වෙන්න ඇති පසුගිය කාලයේ දී ඉන්දියාවෙන් ගුරුවරු 2,000කට වැඩි පිරිසක් ස්වේච්ඡාවෙන් ඇවිල්ලා වතුකරයේ පාසල්වල ඉගැන්වීම් කටයුතුවල නියැළුණේ. මේ ක්‍රමය ගුරු හිඟයට උත්තරයක් හැටියට අධ්‍යාපන අමාත්‍යාංශය සද්භාවයෙන් යොදා ගන්න ඇති. නමුත් දැන් බුද්ධි අංශ වාර්තාවලින් පෙන්වා දෙනවා, ඒ ඉන්දියානු ගුරුවරු වතුකරයේ පාසල් දරුවන්ට එක්තරා ආකාරයකට විස පෙවීමක් සිද්ධ කරනවා කියලා. ඒක මාධ්‍ය මඟිනුත් අනාවරණ කර තිබුණා.

ගුරු හිඟය පියවන්න අපේම ක්‍රමයකට යනවා මිසක් "ස්වේච්ඡාවෙන් ආවා" කියලා වෙනත් බාහිර පාර්ශ්වයක උදව් ගන්න ගියොත් මොකක්ද වෙන්නේ? ඒ බාහිර පාර්ශ්වය ස්වේච්ඡාවෙන් එහෙම එන්නේ අපට තිබෙන ආදරයට නොවෙයි. ඒක නිසා මම ඉතා ඕනෑකමින් මේ කාරණයට ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඒ බුද්ධි අංශ වාර්තා අධ්‍යාපන අමාත්‍යාංශයට ලැබුණාද? ඒ මාධ්‍යවල පළ වුණු වාර්තා කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු වුණාද? ඉන්දියානු ගුරුවරු 2,000ක් වතුකරයේ ඉගෙන ගන්නා දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්නට ආවා කියන පදනමින් ඇවිල්ලා වෙනත් ආකාරයේ මතවාදී විස පෙවීමක් කිරීම වළක්වාලීම සඳහා -ඒ ක්‍රියාදාමය වළක්වාලීම සඳහා- වහාම පියවර ගත යුතුයි නේද? ඒ සම්බන්ධයෙන් ඔබතුමා අවධානය යොමු කරලා තිබෙනවාද කියන එකයි මගේ ඊළඟ ප්‍රශ්නය, ගරු අමාත්‍යතුමනි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාටත් ඒ ගැන යමක් අහන්න තිබෙනවාද? *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමනි, මම මේ අමාත්‍යාංශය භාර ගත්තාට පසුව නම්, ඉන්දියාවෙන් එන ගුරුවරු දෙදාහකට ස්වේච්ඡාවෙන් වතුකරයේ සේවයේ යෙදෙන්න අවසර දීලා නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

මේක සිද්ධ වෙලා තිබෙන්නේ ඔබතුමාගේ අමාත්‍ය ධුර කාලයට පෙර.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඊට පෙර වෙන්න පුළුවන්. දැනට සති දෙකකට පෙර අපේ ගුරුවරුන් පුහුණු කිරීම සඳහා පුහුණුකරුවන් පිරිසක් සඳහා අවසර ඉල්ලා තිබෙනවා. විශේෂයෙන් ඉංග්‍රීසි භාෂාව සහ දමිළ භාෂාවෙන් විද්‍යාව, ගණිතය වැනි විෂයයන් ඉගැන්වීම සඳහා, 40ක, 50ක සීමිත පිරිසක් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයෙන් ලේඛන සකස් කරලා ඒ අය අරගෙන පුහුණුවීම් සඳහා අවසර ඉල්ලා තිබෙනවා. ඒක තමයි මම දන්නේ. නමුත් ඔය ප්‍රශ්න දෙකටම ස්ථිර විසඳුමක් ලබා දීම සඳහා මම විශාල වෙහෙසක් දරලා, මාස හයක් විතර සටන් කළා. වේලු කුමාර් මන්ත්‍රීතුමාත් මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. එතුමාත් මේ කරුණු දන්නවා. විද්‍යාපීඨවලින් ගුරුවරුන් ගන්න ගියාම, වතුකරයෙන් "Z" අගයට දමිළ මාධ්‍ය ගුරුවරුන් තේරෙන්නේ නැහැ. උපාධිධාරීන්ගෙන් ගත්තොත්, ඉතා සීමිත පිරිසක් ඉන්නේ. මධ්‍යම සහ ඌව පළාත් දෙකේම උපාධිධාරීන්ට පත්වීම් දෙන ගමන් වතුකරයේ දරුවන්ටත් පත්වීම් දෙන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, මම කැබිනට් පත්‍රිකා දාලා භාණ්ඩාගාර අනුමැතිය අරගෙන ගුරු සහායකයන් හැටියට, මූලික සුදුසුකම් තිබෙන වතු ආශ්‍රිතව සිටින දමිළ සහ මුස්ලිම් පාසල්වල අයට ගුරු සේවයට එන්න පුළුවන් වන ගැසට් නිවේදනය මේ සතියේ නිකුත් කරනවා. අපි සති දෙකක් ඇතුළත අයදුම්පත් කැඳවනවා.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

පරීක්ෂණයක් පවත්වලා ඒකෙන් සමත් වෙන අය ගුරු සහායකයන් හැටියට යොදවනවා, දීමනාවක් එක්ක. අවුරුදු තුනක් ඇතුළත, NIE එකෙන් ඒ අයට Postgraduate Diploma in Education දෙනවා. එහෙම දීලා පළාත් සභාවට පත්වීම් දෙන්න අවස්ථාව දෙනවා. දැනට තිබෙන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 2,535ක් කියලා අපි ගණනය කරලා තිබෙනවා.

විශේෂයෙන් මධ්‍යම පළාතේ දිස්ත්‍රික්ක තුනයි, ඌව පළාතේ දිස්ත්‍රික්ක දෙකයි, බස්නාහිරෙන් කළුතර දිස්ත්‍රික්කයත්, දකුණේ දෙනියාය සහ ගාල්ලේ වතුකරය තිබෙන ප්‍රදේශයේ සහ කුරුණෑගල ඉතා සීමිත ප්‍රමාණයක් වතු ආශ්‍රිත ප්‍රදේශ ලෙස හඳුනාගෙන තිබෙනවා. ඒවායින් අවශ්‍ය මුළු සංඛ්‍යාවම හඳුනාගෙන තිබෙනවා. ඒ නිසා මම හිතන විධියට වෙන කවුරුවත් ස්වේච්ඡාවෙන් එන්න අවශ්‍ය වෙන්නේ නැහැ. විභාගය පවත්වපු ගමන් ඊළඟ සති දෙක තුළ කැඳවලා, අපි ඒ අයව වතු පාසල්වලට යොදවනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වීරවංශ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය සංක්ෂිප්තව ඉදිරිපත් කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍ය ධුර කාලයේ ඒ දේ සිදු වුණා කියලා මම කියන්නේ නැහැ. ඒක ඊට පෙර වුණු දෙයක්. මාධ්‍ය වාර්තාව වැරැදියි නම් ඔබතුමන්ලා ඒක නිවැරැදි කරන්න. එම මාධ්‍ය වාර්තාවල පළ වුණේ, "ඉන්දියානු ගුරුවරුන් 2,000ක පිරිසක් ස්වේච්ඡාවෙන් වතුකරයේ පාසල්වල උගන්වනවා. ඒ අය යම් යම් මතවාදී වෙනත් විස පෙවීම් කරනවා. බුද්ධි අංශ ඒ පිළිබඳව අනතුරු අඟවලා තිබෙනවා" කියලා. ඒක නිසා එම වාර්තාව කෙරෙහි සැලකිල්ලක් දක්වලා අවශ්‍ය පියවර ගන්න කියලායි මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මම බුද්ධි අංශවලින් ඒ වාර්තාව ගෙන්වා ගන්නම්. ඒක ගෙන්වා ගෙන, මධ්‍යම සහ ඌව පළාත් දෙකේ අධ්‍යක්ෂවරුන්ට යවලා තොරතුරු ලබාගෙන ඔබතුමාට දැනුම් දෙන්නම්.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු ඇමතිතුමනි, ඒ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණය සම්පූර්ණයෙන්ම අසත්‍යයි. එහෙම කිසිම අවසරයක් දීලා නැහැ. 2,000ක පිරිසක් ඉන්දියාවෙන් ඇවිල්ලා පාසල්වල ඉගැන්වීමේ කටයුතුවල යොදවලා නැහැ. සම්පූර්ණ අසත්‍ය තොරතුරක් එ් පළ කරලා තිබෙන්නේ. මම මේ වගකීමෙන් කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් ගැටලු විසඳීම
பல்கலைக்கழக கல்விசாரா ஊழியர்களின் சம்பளப் பிரச்சினைகளைத் தீர்த்தல்
RESOLUTION OF SALARY ISSUES RELATING TO NON-ACADEMIC STAFF OF UNIVERSITIES

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ පහත සඳහන් ප්‍රශ්නය මම ඉදිරිපත් කරනවා.

මාසයකට ආසන්න කාලපරිච්ඡේදයක් පුරාවට ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්යමණ්ඩල සේවකයන්ගේ අඛණ්ඩ වෘත්තීය ක්‍රියා මාර්ගය නිසා රට පුරා සියලු විශ්වවිද්‍යාලවල අධ්‍යයන හා පරිපාලන කටයුතු අඩාළ වී ඇති බව වාර්තා වෙනවා. එබැවින්, මෙම ගැටලු නිරාකරණය කර විශ්වවිද්‍යාල කටයුතු සාමාන්‍ය පරිදි පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වාතාවරණය සකස් කර දීම අත්‍යවශ්‍ය වෙනවා.

මේ නිසා පහත සඳහන් ප්‍රශ්න ජාතික වැදගත්කමකින් යුතු ගැටලු වශයෙන් සලකා නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙනවා.

01. විශ්වවිද්‍යාලයීය අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයන් විසින් ගෙන ඇති අඛණ්ඩ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය හේතුවෙන් මෙරට සමස්ත විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු අඩාළ වී ඇති බව රජය පිළිගන්නේද? එසේ නම්, මෙම තත්ත්වය නිරාකරණය කිරීම සඳහා රජය කඩිනම් මැදිහත්වීමක් සිදු නොකරන්නේ මන්ද?

02. 4/2016(i) කළමනාකරණ සේවා චක්‍රලේඛය මඟින් හඳුන්වා දුන් වැටුප් සංශෝධනය හරහා විශ්වවිද්‍යාල පද්ධතියේ අභ්‍යන්තර වැටුප් විෂමතාවකට වඩා වැටුප් කප්පාදුවක් සිදු කර ඇති බව වෘත්තීය සමිති පෙන්වා දෙනවා. මේ සම්බන්ධව රජයේ ප්‍රතිචාරය කෙබඳුද? එසේ නම්, මේ පිළිබඳව රජය ගෙන ඇති ක්‍රියාමාර්ගවල වත්මන් ප්‍රගතිය කුමක්ද? තවදුරටත් කම්‌ටු පත් කරමින් නිශ්චිත විසඳුමක් ලබා දීම කල් යැවීම වෙනුවට මේ ගැටලුව නිශ්චිතව විසඳිය හැකි කාලවකවානුවක් සඳහන් කළ හැකිද?

03. විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවක වර්ජනයේ අනෙකුත් ප්‍රධාන ඉල්ලීම වන්නේ, 2015 වසරේ සිට ඔවුන් වෙත ලබා දෙන මාසික හිලව් දීමනාව - Monthly Compensation Allowance - සියයට 25කින් වැඩි කර දෙන ලෙසයි. මෙම දීමනාව වැඩි කර දෙන්නට කටයුතු කරන්නේද? ඒ කවදා සිටද?

04. අඛණ්ඩ වෘත්තීය සමිති වැඩ වර්ජනය හේතුවෙන් විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතුවලට අමතරව උපාධි ප්‍රදානය ප්‍රමාද වීම් නිසා විශේෂයෙන්ම රැකියා අපේක්ෂකයන්ට සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්ෂා කරන දරුවන්ට අගතියක් සිදුවීම සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු වී ඇත් ද? ඒ සඳහා ලබා දිය හැකි පිළියම් කවරේද?

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, මෙතැන බරපතළ අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා. 4/2016 (i) චක්‍රලේඛය හරහා සමස්ත රාජ්‍ය

සේවයේ වැටුප් හා දීමනා සියයට 107කින් වැඩි වනකොට ඇත්ත වශයෙන්ම විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවයේ සියයට 15ක පමණ වැටුප් කප්පාදුවක් සිදු වෙලා තිබෙනවා. ඒ අයට ලැබිලා තිබෙන්නේ සියයට 92ක වැඩි වීමක් පමණයි. ගරු අමාත්‍යතුමනි, මේ ප්‍රශ්නය අවබෝධ කර ගත්තාට පසු අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා එක්තරා අවස්ථාවක, ඒ වාගේම ගරු කබීර් හෂීම් මැතිතුමා තවත් අවස්ථාවක, ගරු රවුෆ් හකීම් මැතිතුමා තවත් අවස්ථාවක සහ අවසානයේ මුදල් අමාත්‍යවරයා හැටියට සිටියදී මංගල සමරවීර මැතිතුමාත් මේ පිළිබඳ අවශ්‍ය නිර්දේශ ක්‍රියාත්මක කරන්නට යෙදුණා. නමුත්, පැවති රජය වෙනස් වීම තුළ ඒ කර්තව්‍යය කර ගන්න, ඒ අඩු පාඩුව, ඒ වරද නිවැරැදි කර ගන්න බැරි වුණා.

ගරු අමාත්‍යතුමනි, සිදු වී තිබෙන මේ බරපතළ අසාධාරණය සහ මේ දුක්ගැනවිලි විසඳන්නට ඔබතුමා ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද? මේ සඳහා ඔබතුමා ලබා දෙන උත්තරය මොකක්ද? මේ සඳහා අපට මාර්ග සිතියමක් අවශ්‍යයි; කාල වකවානුත් අවශ්‍යයි කියන එක මා ඔබතුමාට කාරුණිකව දන්වා සිටිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාත් ඒ ගැනම තමයි ප්‍රශ්නය අහන්නේ. ප්‍රශ්න දෙක සඳහාම එකට උත්තර දෙනවාද, ගරු ඇමතිතුමනි?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් ප්‍රේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එතුමාටත් ප්‍රශ්නය අහන්න කියමු.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් වෙන්නේ කොහොමද කියලා මට පොඩ්ඩක් පැහැදිලි කරනවාද? කවුරු හෝ යම් කාරණයක් ගැන ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම නැවත එවැනි දෙයක් කරන්න අවස්ථාවක් දෙන්නේ නැහැ. කලින් කවුද ප්‍රශ්නය එවන්නේ, පසුව කවුද ප්‍රශ්නය එවන්නේ, කෝකද ගන්නේ කියන එක ගැන මට පැහැදිලි කිරීමක් කරන්න. එකම ප්‍රශ්නය කොහොමද මේ විධියට එන්නේ?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්න දෙකම විපක්ෂ නායක කාර්යාලයෙන් එවා තිබෙන්නේ. විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නය පෙරවරු 11.40ට එවලා තිබෙන්නේ. ඔබතුමාගේ ප්‍රශ්නය දහවල් සාමාන්‍යයෙන් ඒ ප්‍රශ්න දෙකේ අන්තර්ගත කරුණුවල සුළු වෙනස්කම් තිබෙන නිසා තමයි ප්‍රශ්න දෙකක් හැටියට දාලා තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, අපට ක්‍රමයක් නැද්ද, විපක්ෂ නායක කාර්යාලයට එවන්නේ නැතිව අපේ මේ ප්‍රශ්න යොමු කරන්න? ඇත්තටම මම ඒක දැනගන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාගේ අභිමතය අනුව අපට කෙළින්ම එව්වත් ප්‍රශ්නයක් නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayaka)
අපි විපක්ෂය නියෝජනය කරන නිසා සාමාන්‍යයෙන් විපක්ෂ නායක කාර්යාලය හරහා තමයි ඔබතුමාට මෙම ප්‍රශ්න ලැබෙන්න සලස්වන්නේ. ඔබතුමා මට කියනවා නම්, මම මීට පස්සේ කෙළින්ම මහ ලේකම්තුමියට මේ ප්‍රශ්න යොමු කරන්නම් මීට පස්සේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayaka)
ඒක වඩාත් හොඳ වෙයි කියලා මට හිතෙනවා. මොකද, මේක නිකම් අර ළදරු ගේම් එකක් වාගෙයි මට තේරෙන්නේ. අර cheap වැඩ තිබෙන්නේ. පව්, මානසිකත්වයට පව්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නැහැ, එහෙම නැහැ. අපේ ඇමතිතුමා උත්තර දුන්නාම ඒක එතැනින් ඉවරයි.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayaka)
මම ප්‍රශ්නය ඉදිරිපත් කරන්නම්, ගරු කථානායකතුමනි. මෙවැනි දේවල් තිබුණා, අපි ඉස්කෝලේ යන කාලයේ ගරු කථානායකතුමනි. බෝලය හංගනවා, අරයාට කලින් බැට් එක ගන්න ඕනෑ කියලා හිතනවා. කලින් කවුද බැට් කරන්නේ කියලා පොඩි පොඩි ගේම් තිබෙනවා. පව්, පව්.

II

විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ වැඩ වර්ජනය
பல்கலைக்கழக கல்விசாரா ஊழியர்களின் தொடர் வேலைநிறுத்தம்
CONTINUOUS STRIKE ACTION BY UNIVERSITY NON-ACADEMIC STAFF

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ වැඩ වර්ජනය පිළිබඳව සහ ඒ හේතුවෙන් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ මතු වී ඇති - මේවා නැවත නැවත කියන්නත් හරි අමාරුයි - ගැටලුසහගත තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

රාජ්‍ය විශ්වවිද්‍යාලවල සිටින 13,000කට ආසන්න අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් මැයි 02වැනි දින සිට මාසයකට ආසන්න කාලයක් අඛණ්ඩව වැඩ වර්ජනයක් පවත්වාගෙන යනු ලබනවා. ඔවුන්ගේ වැටුප් හා දීමනා සම්බන්ධ විෂමතා සහ ඒ ආශ්‍රිත ගැටලු, බදු ප්‍රතිපත්ති හේතුවෙන් උද්ගත වී ඇති ගැටලු ආදිය මේ වෘත්තීය ක්‍රියාමාර්ගයට හේතු වී තිබෙනවා. ඒ හේතුවෙන් අධ්‍යයන

[ගරු අනුර දිසානායක මහතා]

කටයුතු, විභාග කටයුතු මෙන්ම උපාධි ප්‍රදානෝත්සව කටයුතු ඇතුළු විශ්වවිද්‍යාල පද්ධතියේ සියලු කාර්යයන් මුළුමනින්ම අකර්මණ්‍ය වී තිබෙනවා. මේ වැඩ වර්ජනය හදිසියේ ඇතිවූවක් නොවෙයි. මාස 06කට වැඩි කාලයක සිට එම කාර්ය මණ්ඩලයේ සියලු වෘත්තීය සමිති නියෝජනය කරන විශ්වවිද්‍යාලීය ඒකාබද්ධ වෘත්තීය සමිති කමිටුව විසින් වෘත්තීය ගැටලු සම්බන්ධව සහ ඒවා නොවිසඳීම විසින් ඇති විය හැකි තත්ත්වය පිළිබඳව අමාත්‍යවරුන් සහ පරිපාලනය සමඟ ලිපි හුවමාරු කිරීම් මෙන්ම සාකච්ඡාද පවත්වා තිබුණා. කෙසේ වුවද, අවසානයේ විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලය වැඩ වර්ජනයකට තල්ලු වන තෙක්ම, මේ සඳහා ඔවුන්ට පිළිගත හැකි විසඳුමක් ලැබී නොමැති බව පෙනී යනවා.

විශ්වවිද්‍යාලයක මූලික අරමුණ ශිෂ්‍ය ප්‍රජාවගේ දැනුම් සම්පාදනයට අදාළ අධ්‍යයන ක්‍රියාවලිය වුවද, එයට අදාළ යටිතල පහසුකම්වල සහ ආශ්‍රිත සේවා සැපයීම්වල වගකීම පැවරී තිබෙන්නේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙතයි. විශ්වවිද්‍යාල පද්ධතිය යථාවත්ව පවත්වා ගෙන යෑම සඳහා මේ සියලුදෙනාගේ සහාය අත්‍යවශ්‍යයෙන්ම ලැබිය යුතුව තිබෙනවා. එබැවින් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව සහ ගුණාත්මකව පවත්වා ගෙන යෑම වෙනුවෙන් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගැටලු කඩිනමින් විසඳිය යුතුව ඇති බවට විවාදයක් නැහැ. විශේෂයෙන්ම සිසුන්ගේ අධ්‍යයන කටයුතු සහ විභාග කටයුතු ප්‍රමාදවීම මෙවන් ආර්ථික වශයෙන් දුෂ්කර සමයක අධ්‍යයන කටයුතුවල නිරත වී සිටින ඔවුන්ගේ ජීවිතවලට බලපෑම් ඇති කරනවා මෙන්ම දෙමව්පියන් මත පැටවෙන බරද ඉහළ නංවනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි මා අපේක්ෂා කරනවා.

01. වැඩ වර්ජන ක්‍රියාමාර්ගයට පෙර විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගැටලු විසඳීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබුවේද? ක්‍රියාමාර්ග ගනු ලැබුවේ නම් ඒවා විසඳුම් බවට පත් නොවූයේ මන්ද?

02. වැඩ වර්ජනය මාසයක කාලයක් පුරා දිග්ගැස්සීමෙන් සමස්ත සරසවි සිසු ජීවිතවලට සිදු වූ බලපෑම සම්බන්ධයෙන් ආණ්ඩුවට අවබෝධයක් තිබෙද?

03. පිළිගත හැකි විසඳුම් ලබා දී පවතින වැඩ වර්ජනය අවසන් කිරීමට අදාළව මේ වන විට කඩිනම් පියවර ගනු ලැබ තිබෙද? ඒ සඳහා වන කාල රාමුව කුමක්ද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නය මුලින්ම මතු කළා. ඒ වාගේම ගරු අනුර දිසානායක මැතිතුමාත් එතුමාගේ ප්‍රශ්නය මතු කළා. මේ ප්‍රශ්න දෙකම හරයාත්මකව සමානයි. නමුත්, මම ප්‍රශ්න දෙකටම වෙන වෙනම පිළිතුරු ලබා දෙන්නම්.

පළමු ප්‍රශ්නයට පිළිතුර විධියට මම කියනවා, "ඔව්" කියලා. බාධා පැමිණීමක් සිදු වී තිබෙනවා. ඊළඟ ප්‍රශ්නයටත් පිළිතුර, "ඔව්". දැනට විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල සේවයේ නියුක්තව සිටින නිසා online ක්‍රමයට ශිෂ්‍යයන්ගේ දේශන පවත්වමින් තිබෙනවා. නමුත් විභාග පැවැත්වීම, ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම, researchesවලට යෑම, convocations යන සියල්ලම දැනට ප්‍රමාද වෙලා තිබෙනවා.

විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනයට අදාළව ප්‍රධාන කරුණු දෙකක් තිබෙනවා, ගරු කථානායකතුමනි. පළමුවැනි කරුණ මෙයයි. ගරු විපක්ෂ නායකතුමා එතුමාගේ ප්‍රශ්නාවලියේම සඳහන් කරපු 4/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛය මඟින් හඳුන්වා දුන් වැටුප් සංශෝධනය අනුව, අධ්‍යයන කාර්ය මණ්ඩලවල මහාචාර්යවරුන්ගේ සහ ආචාර්යවරුන්ගේ වැටුප සියයට 108කින් වැඩිවීමක් වුණා.

ඒ අවස්ථාවේදී අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් වැඩිවීම් සිද්ධ වෙලා තිබෙන්නේ සියයට 92කින්. එතැන පරතරය තමයි සියයට 15ක් කියලා ආවේ. ඒ සියයට 15 පරතරය, 2016 සිට අවුරුදු 8ක් තිස්සේ අද වෙනතුරු තිබෙනවා. මේ ප්‍රශ්නය මම භාර අරගෙන, අරගළයෙන් පස්සේ මේ සම්බන්ධ සාකච්ඡා පටන් ගන්නාතුරු ඒ වෙනුවෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් අරගෙන තිබුණේ නැහැ. මම ඒ අයත් සමඟ සාකච්ඡා කළා. ඒක, එක ප්‍රශ්නයක්.

දෙවන ප්‍රශ්නය මතු වුණේ දැනට මාස දෙකකට, තුනකට කලින්. අධ්‍යයන කාර්ය මණ්ඩලවලට සියයට 25ක් වැටුප් වැඩි වුණාම සහ ඒ අයගේ ඒ මුළු අධ්‍යයන දීමනා සහ research allowance එකට Income Tax ගෙවනකොට ඒගොල්ලන්ට විශාල වශයෙන් බදු ගෙවන්න සිද්ධ වුණා. මේ හේතුව නිසා ඔවුන් ගෙදර ගෙනියන වැටුප ඉතාම අවම මට්ටමකට ආවා. ඒ නිසා 1,000කට ආසන්න විශ්වවිද්‍යාල මහාචාර්යවරු, කථිකාචාර්යවරු සේවය හැර ගියා. එම නිසා රජය විසින් වෙනත් වෘත්තිකයන්ට මෙන්ම අධ්‍යයන කාර්ය මණ්ඩලවලට සියයට 25කින් අධ්‍යයන දීමනාවක් දුන්නා. අධ්‍යයන දීමනාව වශයෙන් එතෙක් තිබුණු සියයට 150, මූලික වැටුපට ගණනය කළාම තව සියයට 38කින් එය වැඩි වුණා. ඒ අනුව මුල ඉඳලා ගත්තාම අධ්‍යයන කාර්ය මණ්ඩලවලට සියයට 188ක වැටුප් වැඩිවීමක් මේ වෙනකොට තිබෙනවා. ඒ කියන්නේ, තවත් සියයට 38කින් වැටුප් වැඩිවීමක් වුණා. ඉන් පසුව තමයි දෙවැනි ඉල්ලීම ආවේ. එතකොට මම ඒ ගැන සාකච්ඡාවේ යෙදිලා හිටියේ. දෙවන ඉල්ලීම ආවේ මාසික හිලව් දීමනාවක් වශයෙන් සියයට 25ක් ගෙවන්න කියලා. දැනට මාස තුනකට විතර කලින් පැවති සාකච්ඡාවේදී තමයි ඒ ඉල්ලීම ඉදිරිපත් වුණේ. ඒ සියයට 15 කියන මුල් කාරණය සම්බන්ධයෙන් කිරිඇල්ල මැතිතුමා ඇමතිවරයා වශයෙන් හිටපු කාලයේදීත්, ඊටපසු ඇමතිවරුන්ගේ කාලවලදීත්, නැවත ලොකුගේ මැතිතුමා පත් කළ ඇමති අනුකමිටුවකිනුත්, ඊට පසුව මම පත් කර ගත්ත භාණ්ඩාගාරය සහ අමාත්‍යාංශ නිලධාරීගෙන් සමන්විත කමිටුවකිනුත් කමිටු වාර්තා කිහිපයක් දීලා තිබෙනවා. ඒ වාර්තා එක්ක මම අමාත්‍ය මණ්ඩල සන්දේශය 2024.04.01වෙනි දින ඉදිරිපත් කළා. ඒ අමාත්‍ය මණ්ඩල සන්දේශය අනුව 2024.05.13 දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් සහ මහා භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමඟ මම සාකච්ඡා කළා. එහෙම සාකච්ඡා කරලා අමාත්‍ය මණ්ඩලයට වැඩිදුර කරුණු වාර්තා කිරීම සඳහා ස්ථායී කාරක සභාවක් එම අමාත්‍යාංශය විසින් පත් කළා. ඒ අනුව ඒ කරුණු කල් තැබුවා.

නැවත 2024.04.06 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශය, 2024.04.30 දිනැතිව මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සටහනක්ද යොමු කරමින් විසඳුමක් ලබා දීමට කටයුතු කළා. ඒ අනුව 2024.05.27වෙනි දින අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය අනුකමිටුවට මහා භාණ්ඩාගාරය වාර්තා කළා, -මහා භාණ්ඩාගාරයයි, DMS එකයි මේ සියලුදෙනා- මේ තිබෙන වැටුප් විෂමතාව වන සියයට 15 සලකා බැලීමේදී මේ හා සමානව තිබෙන්නා වූ සෙසු -ඒ එකම code එකේ තිබෙන- වෘත්තීන් එක්ක සලකා බලන්න ඕනෑ, නැත්නම් එතැන නැවත විෂමතාවක් එනවා කියලා. ඒ අනුව පත්‍රිකාව ප්‍රතික්ෂේප නොකර අමාත්‍ය මණ්ඩලය තීන්දු කළා, ඒ සියලු අංශවල මේ හා සමාන වන්නා වූ අය

සම්බන්ධයෙන් කරුණු විමසා අය වැයට පෙරාතුව කමිටු වාර්තාවක් ඉදිරිපත් කරන්න. ඒකයි පළමුවෙනි ප්‍රශ්නය පිළිබඳව අද තිබෙන තත්ත්වය.

හැබැයි, වෘත්තීය සමිති ඉල්ලුවේත් නැහැ, මේ සියයට 15 ක්ෂණිකව දෙන්න කියලා. ඒගොල්ලන් කිව්වේ මේක අය වැයකට ගෙනැල්ලා, ලබන අවුරුද්දේ ඉඳලා දෙන්න කියන එකයි. එවැනි පොදු එකඟතාවක් තිබුණා, මම කරපු සාකච්ඡා අතරතුරදී.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පැහැදිලි කිරීමක් කරගන්න කැමතියි. සියයට 15ද, සියයට 25ද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

සියයට 15ක පරතරයක් තේ තිබෙන්නේ. සියයට 92-107 අතර සියයට 15ක පරතරයක් තිබෙන්නේ. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

අපේ රජය කාලයේ අපි,-

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඒ වෙලාවේ ඇති වෙච්ච අඩුව තමයි මේ දිගටම එන්නේ. *[බාධා කිරීමක්]* නැහැ, ඒ ඔක්කොම දීලා අන්තිමට සියයට 107යි. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මහාචාර්ය, ආචාර්යවරුන්ට සියයට 107යි. අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට සියයට 92යි. එතකොට ඒ සියයට 92-107 අතර පරතරය තමයි සියයට 15 කියන්නේ. විපක්ෂ නායකතුමා කිව්ව පරතරය හරි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔබතුමා කියන කාරණය හරි. සියයට 92-107 අතර පරතරය තමයි සියයට 15. හැබැයි, මේ සියයට 25 කථාව මම ඔබතුමාට පැහැදිලි කරන්නට ඕනෑ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඒක ඊට පසුව එන්නේ. තවම පළමු කාරණය ගැන විතරයි මම කිව්වේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මාසික හිලව් දීමනාව - Monthly Compensation Allowance - සියයට 25කින් වැඩි කිරීම තමයි ඒ අයගේ අනික් ඉල්ලීම. නමුත්, ප්‍රධාන වශයෙන් මේ සියයට 15 gap එක විසඳන්නටයි එතුමන්ලා ඉල්ලීමක් කරන්නේ. ගරු ඇමතිතුමනි, ඒ කොටසක් අද ඇවිල්ලාත් ඉන්නවා. ඉස්සෙල්ලාම identify කරන්න ඕනෑ, මෙතැන අඩු පාඩුවක් වෙලා තිබෙනවා කියලා. ඇත්තටම අඩුපාඩුවක් වෙලා තිබෙනවා නේ. අඩුපාඩුවක් වෙලා තිබෙනවා. විෂමතාවක්, ඌනතාවක් තිබෙනවා. එය නිවැරදි කරන්නට වැඩ පිළිවෙළක් අවශ්‍යයි. කාල සටහනක් සහිතව, කාල වකවානු සහිතව මාර්ග සිතියමක් - road map - අවශ්‍යයි. ඒක ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

හොඳයි. පළමුවැනි කාරණය තමයි සියයට 15 gap එක. දෙවැනි කාරණය තමයි, MCA එක. ඒ කියන්නේ, මාසික හිලව් දීමනාව. මාසික හිලව් දීමනාවේ කාරණය වෘත්තීය සමිති මඟින් ගෙනාවේ, අධ්‍යයන කාර්ය මණ්ඩලවලට සියයට 25 වැඩි කිරීමෙන් පස්සේ. එතකොට දැන් මතයක් එන්න පුළුවන්, අධ්‍යයන කාර්ය මණ්ඩලවලට ඒ දීමනාව දුන් නිසා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල අයත් ඒ දීමනාව ඉල්ලනවාද කියලා. නැහැ, එහෙම නොවෙයි. ඒ දෙක අතර වෙනසක් තිබෙනවා. මාසික හිලව් දීමනාවේ ඉල්ලීම අතරමැද දී ආවාම, වෙන් කරලා තිබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත්ද කියන කාරණය මතු වුණා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කැඳවලා තිබෙන වෘත්තීය සමිතිවල නිලධාරීන් ඉන්නවා නම්, ඒ අයගෙන් මේ ගැන අහන්නකෝ. ඒ සියලුදෙනා මා එක්ක සාකච්ඡා කළා. මම තරම් ඒ ගැන කවුරුවත් සාකච්ඡා කරලා නැහැ. ජී.එල්. පීරිස් මැතිතුමාත් අවුරුදු දෙකහමාරක් ඇමතිතුමා හැටියට හිටියා නේ. අහන්නකෝ එතුමන්ලාගෙන්, මම තරම් කවුරුවත් මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කරලා තිබෙනවාද කියලා. එතුමන්ලා එක්ක සති දෙකෙන් දෙකට මම මේ ගැන සාකච්ඡා කරගෙන ගියා. එහෙම සාකච්ඡා කරගෙන යනකොට මහදී ආපු ඉල්ලීමට අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කරලා නැහැ. ඒ කැබිනට් පත්‍රිකාව දැම්මාම මම වරදකුත් පෙන්වලා දීලා, අපේ UGC එකේ නිලධාරීන්ට කිව්වා, ඔබතුමන්ලා මේ මුදල් හොයා ගන්නා හැටි කියලා නැහැ කියලා. ඒ අනුව ඒකට නැවත සටහනක් දැම්මා. එතුමන්ලා දන්නවා ඒක. මම සටහනකුත් දැම්මා. සටහනක් දමලා කිව්වා, වෙන් කරලා තිබෙන පුනරාවර්තන ප්‍රතිපාදනවලින් මේක සපුරා ගන්න පුළුවන්ද කියන කාරණයත් කියන්න කියලා. *[බාධා කිරීමක්]* ඔව්. හිලව් දීමනාවට තමයි ඒක කිව්වේ. ඒ නිසා දැන් මේ දෙකම සලකා බලා අමාත්‍ය මණ්ඩල අනුකමිටුවට මම මොනවා කිව්වත්, ඇමතිවරයා හැටියට මගේ ඕනෑකම තිබුණත්, භාණ්ඩාගාරයේ නිරීක්ෂණවලට යටත්ව තමයි මේ සියලු දේ කරන්න වෙන්නේ. භාණ්ඩාගාර නිරීක්ෂණවලින් කිව්වේ, ඒ සඳහා මුදල් අවශ්‍ය බවයි.

තත්ත්වය එසේ තිබියදී තමයි වෘත්තීය සමිති වර්ජනයකට ගියේ. ඉතින් එතුමන්ලාගේ පැත්තෙන් ඒ ඉල්ලීම් දිනා ගැනීමට එතුමන්ලා වෘත්තීය ක්‍රියා මාර්ගය ගත්තා. මගේ පැත්තෙන් මම මාස දෙකහමාරක්, තුනක් තිස්සේම මේ කාරණයේම යෙදිලා හිටියා; වරින් වර ඒ ගැන සාකච්ඡා කළා. මම එතුමන්ලා දෙවතාවක් භාණ්ඩාගාරයට එක්කගෙන ගියා, නිලධාරීන් එක්ක සාකච්ඡා කරන්න. සමහර නිලධාරීන් ඉන්නවා, ඒගොල්ලන්ට මේ ප්‍රශ්න විසඳන්න ඕනෑ නැහැ. ඒගොල්ලන්ට ඕනෑ, ප්‍රශ්න ඇදගෙන යන්න. මට එහෙම අවශ්‍ය නැහැ. ඒ නිසා මම එතැනට ගියා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. ඊයේ අපේ රාජ්‍ය ඇමතිතුමා එක්ක නැවත සාකච්ඡාවක් කළා. එතුමා අද නැත්තේ, ඒ සාකච්ඡාවකට ගිහිල්ලා සිටින නිසායි. ඒ නිසා මම සියලු වෘත්තීය සමිතිවලින් ඉල්ලීමක් කරනවා, අද යම් එකඟතාවක් ඇති වෙනවා නම් ඒ එකඟතාව තුළ තමුන්නාන්සේලා වැඩට යන්න කියලා. වැඩට යනවා නම්, මාසයක් වැඩ නොකළාය කියලා වැටුප් නොදී ඉන්න මම කිසිම ආකාරයකින් බලාපොරොත්තු වෙන්නේ නැහැ. මාස එකහමාරක් එතුමන්ලා ගෙදර හිටියා, අප්‍රේල් 10වැනි දා ඉඳලා. ඒ අයට දැන් මාස එකහමාරක් තිස්සේ වැටුප නැහැ; අතිකාල දීමනා නැහැ. අනෙක් පැත්තෙන් ශිෂ්‍යයන්ට ප්‍රශ්න තිබෙනවා. ඔවුන්ට හරියට lecturesවලට යන්න බැහැ: practicals කරන්න බැහැ; research කරන්න බැහැ. ඊළඟට, රසායනාගාර තුළ රෝහල්වලින් එවපු samples තිබෙනවා. එතුමන්ලා ඒ කටයුතුවලට බාධා කළේ නැහැ. ඒ ගැන මම එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. ඒ සියලු

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

කරුණු සැලකිල්ලට අරගෙන මම ඉල්ලීමක් කරනවා, අද සාකච්ඡාවේදී යම් එකඟතාවක් එයි, ඒ එකඟතාව අනුව කටයුතු කරන්න කියලා. වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති කරන්න මම ඉඩ තියන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඒ උත්තරය ප්‍රමාණවත් නැත්නම් අතිරේක ප්‍රශ්නයක් තිබෙනවා නම් අහන්න පුළුවන්. මම මේ ක්‍රියාදාමයේ දිගටම හිටියා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ඔබතුමා සාකච්ඡා කරලා තිබෙනවා. ඔබතුමා එම වෘත්තීය සමිති නිලධාරීන් එක්ක භාණ්ඩාගාරයට දෙතාවක් ගිහිල්ලා තිබෙනවා. හැබැයි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? තවම ප්‍රශ්නය විසඳිලා නැහැ නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ඒක නේ. අපි කරන්න ඕනෑ ප්‍රශ්නය විසඳන එක. ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, ඔවුන් වැඩට නොයෑම නිසා අධ්‍යයන කටයුතු අඩාළවීම විතරක් නොවෙයි වෙන්නේ කියන එක. ක්ෂේත්‍ර කිහිපයකට එය බලපානවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
උපාධි ප්‍රදානෝත්සව පවා,-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
උපාධි ප්‍රදානෝත්සව, විභාගවලට ඉදිරිපත් කිරීම, සහතික ලබා ගැනීම අඩාළවීම තුළ දරුවන්ගේ ජීවිත කාලය සැලකිය යුතු ප්‍රමාණයකින් ආපස්සට යනවා. ඒ නිසා ඔබතුමා අද කෙසේ හෝ මේ ප්‍රශ්නය විසඳන්න. නැත්නම්, ආණ්ඩුව සහ වෘත්තීය සමිති අතර තිබෙන ගැටුම නිසා අපේ රටේ දරු පරම්පරාවගේ ජීවිත පොඩි පට්ටම් වීම සාධාරණ නැහැ. ඒ නිසා ඔබතුමාගේ වගකීම අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට ඒ දරුවන්ගේ කාර්යයන් ආරක්ෂා කිරීම, වෘත්තීය සමිතිවල අයිතිවාසිකම් සුරක්ෂිත කර දීම. ඒ නිසා ඔබතුමා ඒ වෙනුවෙන් මැදිහත් වෙලා ඉක්මනින්ම ප්‍රශ්නය විසඳන්න. අද නම් මේ ප්‍රශ්නය විසඳිය යුතුයි කියලා තමයි අපි හිතන්නේ, ගරු කථානායකතුමනි. මේ ප්‍රශ්නය තවත් ඇදෙන්න දෙන්න එපා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම අපේ රාජ්‍ය ඇමතිතුමාටත් මේ ගැන කිව්වා. එතුමා මුදල් රාජ්‍ය ඇමතිතුමා එක්කත් කථා කරලා තමයි අද සාකච්ඡාවට යන්නේ. අපට දෙන්න පුළුවන් උපරිම මට්ටමින් අපේ සහයෝගය ලබා දෙනවා, මේ ප්‍රශ්නය අද විසඳා ගන්න.

ඒ වාගේම මම මේ සභාවේ දැනගැනීම සඳහා මේ කාරණයත් කියන්න ඕනෑ. විවිධ තැන්වල ශිෂ්‍ය උද්ඝෝෂණ තිබෙනවා, අධ්‍යාපනය පෞද්ගලීකරණය කරනවා කියලා. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට එක කාරණයක් කියන්නම්. මම ඉන්නකල් නම් එහෙම දෙයක් වෙන්නේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට පොඩි එකතු කිරීමක් කරන්න අවස්ථාව දෙන්න.

ගරු අමාත්‍යතුමනි, ඇත්තටම මේ කාරණාව පිළිබඳව දැන් සාකච්ඡා කළාට ප්‍රශ්නයක් නැහැ. බොහොම ස්තුතියි සාකච්ඡා කළාට. ඇත්තටම අවස්ථා ගණනාවකදී සිදු විය යුතු දේ, කළ යුතු දේ නිර්දේශ වෙලා හමාරයි. මම ගරු අමාත්‍යතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. ඔබතුමාට සාකච්ඡාවට තිබෙන නිදහස මම නතර කරන්න හදනවා නොවෙයි. නමුත්, දැන් මේ මාර්ග සිතියම මේ අනධ්‍යයන නිලධාරීන් බලාපොරොත්තුවෙන් ඉන්නවා. මොකද, මේක රවුන් හකීම් හිටපු ඇමතිතුමාගේ කාලයේ, අපේ ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු ඇමතිතුමාගේ කාලයේ, කබීර් හෂීම් මැතිතුමාගේ කාලයේ, ඊට පස්සේ මුදල් අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු මංගල සමරවීර මැතිතුමාගේ කාලයේ අවශ්‍ය නිර්දේශය දීලා හමාරයි. ඔබතුමාගේ සාකච්ඡාවට තිබෙන ඉඩ පරාසයට බාධා නොකරමින්, මම මේ කාරණය කියන්න කැමැතියි. ඇත්තම කථා කරනවා නම් ඇමතිතුමනි, සාකච්ඡා කරන්න දෙයක් නැහැ. ඒ ඔක්කෝම නිර්දේශ, ඔක්කෝම තීන්දු තීරණ අරගෙන ඉවරයි. ඇත්ත වශයෙන්ම මේ අය සාධාරණයි. ඒ උදවිය කියන්නේ මේක කෙරෙන මාර්ග සිතියම ලිඛිතව ලබාදීලා ප්‍රසිද්ධ කරන්න කියලායි. ඒක සාධාරණයි නේ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ. ඔබතුමාගේ මේ සාකච්ඡාවට තිබෙන නිදහස අහිමි කරන්න හදනවා නොවෙයි. ඔබතුමාට ඕනෑ නම් මේ නිර්දේශ සියල්ලත් මම එවන්නම්. මෙතැන මේ ඔක්කෝම තිබෙනවා. සියලු නිර්දේශ, සියලු සාකච්ඡා, සියලු වක්‍රලේඛ ඔක්කෝම මෙතැන තිබෙනවා. ඔබතුමාට ඕනෑ නම් මම මේ මිටියම ඔබතුමාට එවන්නම්. කරුණාකරලා මේ ගත්ත තීන්දු ටික ක්‍රියාත්මක කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මාර්ග සිතියම අනුව සියයට 15ක වෙනස කම්ටු දෙකකින් නිර්දේශ කරලා තිබෙනවා. නමුත්, ඒක භාණ්ඩාගාරය පිළිගන්න ඕනෑ. මොකද, සමස්ත රාජ්‍ය සේවයම නැවත මේකට පටලවා ගන්නේ නැතිව කිරීමට තමයි ඒ අය උත්සාහ කරන්නේ. මොකද, එහෙම නොවුණොත් ඒ අයටයි ප්‍රශ්නය එන්නේ. ඒක එකක්. මාර්ග සිතියම අනුව තිබෙන්නේ ඒක. අය වැයට ඉදිරිපත් කරලා ජනවාරි ඉඳලා ක්‍රියාත්මක කරන්න. ඒක පළමුවැනි කාරණාවට විසඳුම. දෙවැනි එකට විසඳුම වන්නේ, තිබෙන ප්‍රතිපාදනවලින් යම් ප්‍රමාණයක් තිබෙනවා නම් ඒ අනුව හිලව් දීමනාව සම්බන්ධයෙන් තීරණයකට එළැඹීම. ඔය දෙක පිළිබඳව අද එකඟතාවකට එයි කියලා මම හිතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත
இலங்கை கணிய அளவையாளர்களின் நிறுவனம் (கூட்டிணைத்தல்) (திருத்தம்) சட்டமூலம்
INSTITUTE OF QUANTITY SURVEYORS, SRI LANKA (INCORPORATION) (AMENDMENT) BILL

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"2007 අංක 20 දරන ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

වීසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම් සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙත පවරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Urban Development and Housing for report.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ඉදිරිපත් කිරීම.

කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත
பெண்களின் வலுவூட்டல் சட்டமூலம்
WOMEN EMPOWERMENT BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, අපි අද දිනයේ මේ පිළිබඳ ඡන්ද විමසීමට බලාපොරොත්තු වන්නේ නැහැ. කමිටු අවස්ථාවේදී සංශෝධන කිහිපයක් ඉදිරිපත් කිරීමට තිබෙන නිසා අපි මේ විවාදය ඊළඟ දිනයකට ගෙනයෑමට බලාපොරොත්තු වෙනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විවාදය ආරම්භ කිරීම, ගරු ගීතා සමන්මලී කුමාරසිංහ රාජ්‍ය ඇමතිතුමිය.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] took the Chair.

[අ.භා. 12.30]

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය (කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Geetha Samanmale Kumarasinghe - State Minister of Women and Child Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් අපි අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 22/1359/629/007 වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානතාව හා කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අනුමැතිය ලබා ගැනීම යන මැයෙන්, ගරු ජනාධිපතිතුමන් හා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ 2022.08.25වැනි දින සංදේශය සඳහා තීරණය මත මෙම පනත් කෙටුම්පත සකස් කරන ලදී.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාවන් සවිබලගැන්වීමේ පනත් කෙටුම්පතේ ප්‍රධාන සූර්විකාව ගත්තොත්, කාන්තාවන් සවිබලගැන්වීමට විධිවිධාන සැලැස්වීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානතාව හා කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම, කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යන්ත්‍රණ පිහිටුවීම හා අයිතිවාසිකම් උල්ලංඝනය වූ විට නඩු පැවරීම යන කරුණුවලට අවශ්‍ය විධිවිධාන මෙම පනත් කෙටුම්පත මඟින් සලස්වනවා.

මෙහිදී මම කියන්න ඕනෑ, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව කියන්නේ අතිශයින්ම වැදගත් කොමිෂන් සභාවක් බව. මම හිතන්නේ, මේක ඉතිහාසයේ පළමුවැනි වතාවට මේ රටේ ඇති වන දෙයක්. මේ සඳහා අපට අරමුණක් තිබෙනවා. මේ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අපි ඒ අරමුණට ගැනිව කටයුතු කරනවා. කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යන්ත්‍රණ හඳුන්වා දීම මඟින් කාන්තාවන්ගේ අභිවෘද්ධිය සහ සවිබලගැන්වීම සඳහා විධිවිධාන සැලැස්වීම, කාන්තාවන්ට එරෙහි

[ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය]

සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම පිළිබඳ සම්මුතියට අනුව, කාන්තාවන්ට අදාළව රජය විසින් භාරගෙන ඇති බැඳීම් බලාත්මක කිරීමේ යන්ත්‍රණය හඳුන්වා දීම, ස්ත්‍රී පුරුෂභාවය හා ලිංගික දිශානතිය මත පදනම්ව සිදු වන සියලු වෙනස්කොට සැලකීම්වලින් කාන්තාවන් ආරක්ෂා කිරීම, කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැලකීම් වළක්වා ගැනීමට හා ඔවුන් සවිබලගැන්වීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා නීති ප්‍රතිසංස්කරණය සඳහා නිර්දේශ සිදු කිරීම, යුක්තිය පසිඳලීමේ හා තීන්දු ගැනීමේ ව්‍යුහය තුළ රජයේ සියලු තරාතිරමකම තනතුරුවලට කාන්තා සම නියෝජනයක් හැකි පමණ තහවුරු කර දෙනවා.

කාන්තාවන් පිළිබඳව පිහිටුවන ජාතික කොමිෂන් සභාවේ සාමාජිකයන් සංඛ්‍යාව 7යි. කොමිසම ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබයි. මෙයින් සාමාජිකයන් පස්දෙනෙකු පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් සහ සාමාජිකයන් දෙදෙනෙකු පත් කිරීම සඳහා කථානායකවරයා විසින් පත් කරන ලද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදයෙන් නිර්දේශ ලබා ගත යුතුයි.

මේ අවස්ථාවේදී මම කියන්නට කැමැතියි, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදය මඟින් ඉදිරිපත් කළ යෝජනා සියල්ල මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න ඊයේ අපි තීරණය කළ බව. ඒ නිසාමයි දින කිහිපයක් පරක්කු වෙලා මෙහි ඡන්ද විමසීම් කටයුතු කරන්නට සූදානම් වන්නේ.

ඒ වාගේම කොමිෂන් සභාවේ බලතල, කාර්යය සහ කර්තව්‍ය මේ සමඟ මම ඉදිරිපත් කරන්නට කැමැතියි. කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ උල්ලංඝනයක් වීමට ආසන්න අවස්ථාවලදී ඒ පිළිබඳ පරීක්ෂා කිරීම, විමර්ශනය කිරීම හා පැමිණිලි භාර ගැනීම, යම් අධිකරණයක පවතින කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමකට අදාළ නඩුවලදී අධිකරණයේ අවසරය ඇතිව ඊට මැදිහත් වීම, කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමකදී නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් සිය මෙහෙයවීමෙන් නඩු පැවරීම, උපරිමාධිකරණය විසින් හෝ යම් අධිකරණයක් විසින් සඳහන් කරනු ලැබ ඇති කාන්තා අයිතිවාසිකම්වලට අදාළ කරුණක් සම්බන්ධයෙන් එම අධිකරණය විසින් විධානය කරනු ලැබිය හැකි පියවර ගැනීම, යම් කාර්යයක් ඉටු කිරීම සඳහා වෙනත් තැනැත්තෙකුගෙන් තොරතුරු හා වාර්තා ඉල්ලා සිටීම, පැමිණිලි පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම හා විමර්ශන සිදු කිරීම, කොමිෂන් සභාවේ ප්‍රාදේශීය සහ පළාත් කාර්යාල විවෘත කිරීම, කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මත පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා වැඩසටහන් සිදු කිරීම, කාන්තාවන් සමථකරණය වෙත යොමු කිරීම යනාදී කරුණු රාශියක් තව තිබෙනවා. මේ කරුණු සියල්ල සභාගත කරන මෙන් මම ඉල්ලනවා.

කාන්තාව ගැන කියද්දී මේ කාරණයත් කියන්න ඕනෑ. කාන්තාවන් හැටියට වෙස්වළාගත් සමහර පිරිමින් ඉන්නවා. ඒ ගොල්ලන්ට අපි වෙන විධියකට කථා කරනවා. නමුත් මේ පනත් කෙටුම්පතට අපි කාන්තාව යනු කවුද කියන එක ඇතුළත් කරන්නයි යන්නේ. මේ ගෙනෙන පනත තුළ ඒක විශේෂයි. ඉතිරි කරුණු සියල්ල මේ අවස්ථාවේ මම **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.36]

ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Athukorala, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

මම අද සතුටු වෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයත්, කාන්තා හා ළමා කටයුතු විෂය භාර අමාත්‍යවරයා හැටියට ගරු ජනාධිපතිතුමාත් එක්ව ලබා ගත් සියලු අදහස් අනුව සැහෙන කාලයකට පස්සේ කාන්තාවන් සම්බන්ධයෙන්, විශේෂයෙන් "කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත" සම්බන්ධයෙන් අද අපට පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කරන්න ලැබීම ගැන. කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීමත්, කාන්තාවන්ගේ අභිවෘද්ධිය සහ සවිබලගැන්වීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමත් මේ පනත් කෙටුම්පතේ මූලික අරමුණු දෙකක් වනවා.

කාන්තා දිනය ආවාම, එහෙම නැත්නම් ආර්ථිකය ගැන කථා කරන විට අද සමාජයේ කාන්තාව ගැන නිතර කථා කරනවා. නමුත් අපි දන්නවා, කාන්තාවගේ දුකක් කියන්න තැනක් තවම නැති බව. ඒ සඳහා ලොකු තැනක් හැදෙනවා, මේ කියන කොමිෂන් සභාව පත් කිරීමත් එක්ක. විශේෂයෙන් රැකියා ස්ථානයේදී -සේවා ස්ථානයේදී- සේවා අයිතිවාසිකම් සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ "මූලික අයිතිවාසිකම්" යටතේ වන 12වන ව්‍යවස්ථාවේ සඳහන් අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේදී වෙන්න පුළුවන්, යම්කිසි කඩ කිරීමක්, වරදක් කාන්තාවකට වෙනවා නම් ඒවා සම්බන්ධයෙන් පැහැදිලිව පැමිණිලි කරන්න අද තැනක් සකස් වෙමින් තිබෙනවා. ඒ වාගේම, එය බලාත්මක කරන්නට 1991 අපේ රටත් අත්සන් කරපු කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට අවශ්‍ය නීතිමය බල රාමුව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ඒ සඳහා CEDAW කියන ප්‍රඥප්තියට අත්සන් තබලා ඒ තුළින් මෙය තවත් ශක්තිමත් කිරීමේ පදනම දැමීමට කාන්තාවන් පිළිබඳ කොමිෂන් සභාවට බලය ලැබෙනවා. විශේෂයෙන් අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අපි ඉල්ලීමක් කළා, මේ CEDAW ප්‍රඥප්තිය මේ රටේ නීතියට ඇතුළත් කරන්න අවශ්‍ය කටයුතු හැකි ඉක්මනින් සිදු කරන්න කියා සහ ඒ සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබා දෙන්න කියලා. ඒ සඳහා අවශ්‍ය අවසරය ලබා දීලා තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ ගරු සභාපති, වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය මේ ගැන දීර්ඝ වශයෙන් කථා කරලා, සාකච්ඡා කරලා මෙහිදී ගෙන ආ යුතු යැයි අප ඉදිරිපත් කරපු තවත් සංශෝධන කිහිපයකුත් තිබෙනවා. ආබාධ සහිත කාන්තාවන්ට බලයක් ලබා දීමත්, ආබාධිත කාන්තාවන්ගේ අයිතිය තහවුරු කිරීමත් මේ පනත් කෙටුම්පත යටතේ කරන්න සිදු වෙනවා.

කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව ස්ථාපිත කිරීමේදී විශේෂයෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ අයිතිය මේ පනත් කෙටුම්පතින් කොමිෂන් සභාවට දීලා තිබුණත්, ඒක කොමිෂන් සභාවේ අයිතියත් හැටියට අපි සලකන්නේ නැහැ. ඒ නිසා විෂය භාර අමාත්‍යවරයා විසින් ඒ අවශ්‍ය ජාතික ප්‍රතිපත්තිය

සහ ඒ සඳහා අවශ්‍ය වන රෙගුලාසි සකස් කිරීම කළ යුතුයි කියන සශෝධනයත් කරන්න කියා අපි ඉල්ලා තිබෙනවා. ඒ වාගේම, කාන්තා අයිතිවාසිකම් සඳහා පාර්ලිමේන්තු කොමසාරිස්වරයා කොමිෂන් සභාවේ කෙනෙකු හැටියට නොව කාන්තා කටයුතු සඳහා පමණක් වන ස්වාධීන ඔම්බුඩ්ස්මන්වරයෙකු විය යුතුයි කියන එකත් අපි යෝජනා කර තිබෙනවා. මේ වාගේ යෝජනා 4ක්, 5ක් අපි ඉදිරිපත් කර තිබෙනවා.

මෙහි සඳහන් සමථකරණය සම්බන්ධයෙන් ද කිව යුතුයි. ඒ සමථකරණය අධිකරණය තුළ තිබෙන සමථ මණ්ඩල හා සමාන ද, එහෙම නැත්නම් එතැනින් එහාට ගිය කටයුත්තක් ද, ඒ අධිකරණ කටයුත්ත සඳහා කොමිෂන් සභාවෙන් යොමු කිරීමක් කළාම සමථකරණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන්නේ කොහොමද කියන එක අපට තවම පැහැදිලි නැහැ. මොකද, මේ කියන කොමිෂන් සභාව ස්ථාපිත කිරීමත් එක්කම ඒ සඳහා වූ වැඩ පිළිවෙළක් අධිකරණය මඟින් සකස් විය යුතුයි. මොකද, ඒක අධිකරණයේ සමථකරණයට යනවා නම් වැඩක් නැහැ.

කොමිෂන් සභාවට බලය තිබෙනවා, කාන්තාවන්ට වන හිංසනය හෝ අයිතිවාසිකම් කඩ කිරීම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ වෙනත් අධිකරණයකට කරුණු ඉදිරිපත් කරන්න. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා සම්බන්ධයෙන් ඉටු විය යුතු තවත් කාරණා කිහිපයක් තිබෙනවා. නමුත් කාන්තාවන් සම්බන්ධයෙන් මෙවැනි පියවරක් හෝ ගත්තු එක ගැන අපි සන්තෝෂ වෙනවා. අද පාර්ලිමේන්තුවේ අපි මෙය සාකච්ඡාවට ගන්න කටයුතු කළත් විෂය භාර අමාත්‍යවරයා හැටියට ගරු ජනාධිපතිතුමා මේ සම්බන්ධ ඉදිරි කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා.

අපි දන්නවා, මේ වනකොට වැඩ කරන, රාජකාරි කරන, සේවය කරන, රැකියා කරන බොහෝ කාන්තාවන්ට අවුරුදු 5ට අඩු දරුවන් ඉන්නවා නම්, ඒ දරුවන් රඳවා තබන්න තැනක් නැහැ කියලා. ඒ නිසා අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව හැටියට අපි ඒ ගැන යෝජනාවක් ඉදිරිපත් කළා, අඩු ගණනේ අවුරුදු 5ට අඩු දරුවන් ඉන්න අයට තත්ත්වයක්, තරාතිරමක් බලන්නේ නැතිව සේවා ස්ථානයේ පොඩි කාමරයක් හෝ ලබා දෙන්න කියලා. එය රජයේ ගොඩනැඟිල්ලක් වෙන්න පුළුවන්, පෞද්ගලික අංශයේ ගොඩනැඟිල්ලක් වෙන්නත් පුළුවන්. විෂය භාර අපේ ගරු රාජ්‍ය ඇමතිතුමියත් මේ ගරු සභාවේ ඉන්න වෙලාවේ ඒකට අවධානය යොමු කරන්න කියා අපි එතුමියගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි, රැකියා කරන අවස්ථාවලදී සමහර කාන්තාවන් නොයෙක් විට ලිංගික අල්ලස්වලට ගොදුරු වෙනවා. මේ කියන කොමිෂන් සභාව හරියාකාරව ක්‍රියාත්මක වීමත් එක්ක ඒ ප්‍රශ්න අවම කර ගන්න අපට පුළුවන්. මොකද, එවැන්නකට ගොදුරු වන අයට පැමිණිල්ලක් කරන්න තැනක් තිබෙන නිසා.

විශේෂයෙන් මෙහි සඳහන් කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම දේශපාලන අත පෙවීමක් නොමැතිව සිදු විය යුතුයි. එම කොමිෂන් සභාවේ සාමාජිකයන් 7 දෙනාගෙන් 5 දෙනෙකුම කාන්තා සාමාජිකයන් විය යුතුයි. ඒ වාගේම, කාන්තාවක් එහි සභාපති විය යුතුයි. කාන්තාව මූලික කරගෙන, ඒ සියලු තොරතුරුවල රහස්‍යභාවය රැකගෙන ඉදිරියට යා යුතුයි. දැනටත් ස්වාධීන කොමිෂන් සභා කිහිපයක් තිබෙනවා. හැබැයි අපි දන්නවා, ඒ සමහර ඒවායේ වැඩ කටයුතු සම්බන්ධයෙන් කිසිම විනිවිදභාවයක් නැති බව. ඒ පිළිබඳ යම් යම් ගැටලු තිබෙනවා.

මා කලින් කිව්වා වාගේ අපි අවුරුද්දේ එක දවසක් කාන්තාවන් ගැන කථා කරනවා; කාන්තා දිනය සමරනවා. ආර්ථිකය ගැන කථා කරන කොට අපට කාන්තාව ගැන කථා නොකරම බැරි වෙනවා. ඒ හැම තැනකදීම කාන්තාවගේ අයිතිය සහ කාන්තාව වෙනුවෙන් පෙනී සිටීම ඉතාම වැදගත් හැටියට සලකා මේ කොමිෂන් සභාවේ වැඩ කටයුතු ඉස්සරහට කරගෙන යන්න ඕනෑ කියා තමයි අපි විශ්වාස කරන්නේ.

ඒ වාගේම කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව සම්බන්ධයෙන් අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ ගරු සභාපති මන්ත්‍රීතුමිය යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. අපි මේ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් ගොඩක් කරුණු සොයා බලා සමහර තැන්වල තිබුණු අඩු පාඩුකම් පෙන්වා දුන්නේ නමට පමණක් නොවෙයි. එහෙම නැත්නම් වෙනත් අරමුණු සඳහා නොවෙයි. මේ මන්ත්‍රීවරියන් පක්ෂ භේදයකින් තොරව එකතු වෙලා මේ විධියට කටයුතු කරන කොට මෙහි සම්පූර්ණ වාසිය සමස්ත කාන්තා පරපුරට ලැබිය යුතුයි. එහෙම නැති වුණොත්, අපි මේ කොමිෂන් සභා පත් කළාට වැඩක් නැහැ. මෙහි සඳහන් ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමේ අයිතිය අපට මේ පනත් කෙටුම්පත මඟින් කොමිෂන් සභාවට දෙන්න විධියක් නැහැ. එහෙම වුණොත් ඒක conflict of interest එකක් වෙනවා. ඒ ප්‍රතිපත්තිය හදන්න අයිතිය තිබෙන්නේ විෂය භාර ඇමතිතුමාටයි.

විශේෂයෙන් කාන්තාවන් සම්බන්ධයෙන් වැඩ කටයුතු කරද්දී රැකියා ස්ථානය කෙරෙහිත් අවධානය යොමු කළ යුතුයි. දැන් අපට ආරංචියක් ලැබී තිබෙනවා, කාන්තා පොලිස් නිලධාරිනියන් උතුරු, නැඟෙනහිර ප්‍රදේශවල අනිවාර්ය සේවයේ යොදවන්න බලාපොරොත්තුවක් තිබෙනවා කියලා. ඒ වාගේම අපට ආරංචි ලැබී තිබෙනවා, ශ්‍රී ලංකා පොලිසිය මඟින් පොලිසියේ උසස් නිලතලවලට පත් වන කාන්තාවන් ප්‍රමාණය - quota එක - අවම කරන්න හදනවා කියලා. එහෙම වුණොත් ඉතින් අපි මේවා කරන එකේ තේරුමක් නැහැ.

මම හිතන විධියට 2002 වර්ෂයේදී වාගේ තමයි වනිතා කටයුතු අමාත්‍යාංශය මඟින් කාන්තාවන්ගේ ප්‍රශ්න වෙනුවෙන් හැම පොලිස් ස්ථානයකම Desk එකක් පටන් ගත්තේ. නමුත් එම කටයුත්ත ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මම මේ පොඩි උදාහරණයක් ගත්තේ.

ඒ වාගේම අපි දන්නවා, රාජ්‍ය සේවය කිව්වාම, පොලිස් සේවය කිව්වාම, ලංකාවේ ඕනෑම තැනක සේවය කරන්න ඕනෑ බව. හැබැයි, එතැනදී කාන්තාවට තිබෙන අයිතිය නැති කරලා, කාන්තාව පවුලෙන් බාහිරට යවලා තමයි එම කටයුත්ත සිද්ධ කරන්න වෙන්නේ. සමහර විට කාන්තාව දරුවාගෙන් ඈත් කරනවා. එතකොට ඒ තිබෙන පවුල් සංස්ථාව, ඇයගේ මානසිකත්වය කියන සියල්ල කඩාගෙන තමයි ඒගොල්ලන්ට ඒ වෙනුවෙන් යන්න වෙන්නේ. මේවා ගැනත් විශේෂයෙන්ම අවධානය යොමු කළ යුතුයි. ජාතික පොලිස් කොමිෂන් සභාව තිබුණත්, කාන්තාවන් සඳහා වන කොමිෂන් සභාවට මේ කාරණා යොමු කරන්න කියා අපි ඉල්ලීමක් කරනවා. මොකද, විශේෂයෙන්ම පොලීසියේ වුණත් ඉහළ තනතුරුවලට කාන්තාවන් පත් වෙනකොට, ඒක නවත්වන්න හදනවා නම් මේ කොමිෂන් සභාවලින් වැඩක් වෙන්නේ නැහැ. ඉතින් මේ ක්‍රම හැදුවාට -අද මේවා ඉදිරිපත් කරනවා වාගේම ඒ ඒ අවස්ථාවලදී- ඉදිරියේදී මේවා ක්‍රියාත්මක කරන්නත් අපට හැකියාව තිබිය යුතුයි. අපි ගරු රාජ්‍ය ඇමතිතුමියගෙන් ඒ පිළිබඳ ඉල්ලීමක් කරනවා. අපි මෙයට සංශෝධන පහක් ඉදිරිපත් කර තිබෙනවා. අද මේ පනතට ඡන්දයක් නොවිමසුවත්, ඡන්දය විමසන අවස්ථාවේදී ඒ සංශෝධන ඇතුළත් කරන්න කියා අපි ඉල්ලනවා. එම සංශෝධන පහම ඇතුව අපි මෙය අනුමත කරන්න සූදානම් කියා මා කියා සිටිනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) සරත් වීරසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.48]

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ගරු සභානායකතුමා විසින් ඉතාම වටිනා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. ගරු ගීතා කුමාරසිංහ රාජ්‍ය අමාත්‍යතුමියත් ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කළා. ඒ අනුව, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත විවාදයට ගන්නා අවස්ථාවයි, මේ. ඇත්ත වශයෙන්ම අපි සැම දෙනාම පිළිගන්නවා, කාන්තාවන්ට ගරු කළ යුතුයි කියන කාරණය. ඒ වාගේම රටක ජනතාවගේ විනය, සදාචාරය, හික්මීම කියන කාරණා බොහෝ දුරට පිළිබිඹු වන්නේ ඒ රටේ ජනතාව කාන්තාවන්ට ගරු කරන්නේ කෙසේද කියන කාරණය මතයි.

සංස්කෘතික ශ්ලෝකයක් තිබෙනවා, "ජනනී ජන්ම භූමිශ්ච - ස්වර්ගාදපි ගරීයසී" කියලා. ඒකෙන් කියැවෙන්නේ වැදූ මවත්, දිනූ බිමත් ස්වර්ගයටත් වඩා උතුම් කියන එකයි. ආදි කාලයේ කියා තිබෙන්නේ එහෙමයි. අපි දන්නවා, අපේ පෙරදිග ශිෂ්ටාචාරය කාන්තාව මත පදනම් වෙලා තිබෙන බව. ඒක නිසා තමයි ඉපදුණු භූමියටත් අපි මාතෘ භූමිය කියලා කියන්නේ. අපි එසේ "මව් බිම" කියා හඳුන්වන්නේ අපි ඉපදුණු භූමිය තරම් වටිනා දෙයක් අපට නැති නිසායි. අපේ මාතෘ භූමිය කියලා හඳුන්වන්නේ ඒ නිසායි. ඒ හා සමාන සුවිශේෂ තැනක් අපේ මව්වරුන් ඇතුළු කාන්තාවටත් අපි ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ රට කාන්තාවන්ට ගරු කරපු රටක්. අපි දන්නවා, තාත්තා තමයි පවුලට ආරක්ෂාව දෙන්නේ, කෑම බීම සපයා දෙන්නේ. නමුත් අම්මා තමයි ගෙදර පාලනය කරන්නේ. අපි අසා තිබෙනවා, මීට අවුරුදු 100කට, 150කට පමණ පෙර කාලයේ ඉතාම රුමත් කාන්තාවකට අතේ නිල් මැණිකක් තබාගෙන පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා නිරුපද්‍රිතව ගමන් කරන්න පුළුවන් වාතාවරණයක් අපේ රටේ තිබුණා කියලා. කිසිම අවදානමක් නැතුව, අනතුරක් නැතුව කාන්තාවකට එසේ යන්න පුළුවන් වුණා කියලා කථාවක් තිබෙනවා. ඒ වාගේ වාතාවරණයක් තමයි කාන්තාවට අපේ රටේ තිබුණේ. නමුත් අද වෙනකොට රාත්‍රී කාලයේ නොවෙයි, නිල් මැණිකක් අතේ තබාගෙනත් නොවෙයි, නිකම්වත් තරුණ කාන්තාවකට පාරේ බැහැලා යන්න බැරි තත්ත්වයක් තිබෙන එක ගැන ඇත්ත වශයෙන්ම අපි පුරවැසියන් හැටියට, රටට ආදරය කරන අය හැටියට ලජ්ජා වෙන්න ඕනෑ.

මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ, කාන්තාවන් ලිංගික හිංසනයට ලක් වෙනවා. බස් රථයක ගියත්, දුම්රියක ගියත්, කාර්යාලයට යනකොටත් කාන්තාවන් ඒ වාගේ හිංසාවට ලක් වන නිසා ඇත්ත වශයෙන්ම මේ වාගේ පනතක් ගෙන ඒමේ වැදගත්කම අපි දකිනවා. කාන්තාවන් සවිබලගැන්වීම, කාන්තාවන්ට සමාන අයිතිවාසිකම් ලබා දීම ගැන අපි සම්පූර්ණයෙන්ම එකඟයි. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මෙතැන යම් කිසි අඩු පාඩුවක් දකිනවා. මොකද, අපේ රටට ආවේණික සංස්කෘතියක් තිබෙනවා. අවුරුදු 2,500ක ලිඛිත ඉතිහාසයක් තිබෙන රටක්, මේක.

අපේ රටට ආවේණික සංස්කෘතියක් තිබෙනවා. ඒක තමයි අපේ අනන්‍යතාව. අපේ ජාතිය පවතින්නේ අන්න ඒ අනන්‍යතාව අපි ආරක්ෂා කළොත් පමණයි. නමුත්, මේ පනත් කෙටුම්පතේ "කාන්තාව" කියන වචනය නිර්වචනය කරලා නැහැ. ඇත්ත වශයෙන්ම කාන්තාව, ජීව විද්‍යාත්මකව උපන් තැනැත්තියක් - biological woman - හැටියට අනිවාර්යයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මොකද, එහෙම නැත්නම් අපි දන්නවා, බටහිර ලෝකයේ විලාසිතාවක්, trend එකක් තිබෙන බව පිරිමි ළමයා ගැහැනු ළමයා වෙන. තමාගේ අවයව කපාගෙන, ඒවා සවි කරගෙන ගැහැනු ළමයා පිරිමි ළමයා වෙනවා. මෙන්න මේක පිට රට සංස්කෘතියක් බවට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා කාන්තාව කියන වචනය හරියට නිර්වචනය කළේ නැත්නම්, අපි ඒ හැමෝටම සමාන අයිතිවාසිකම් දෙනවා කියන්නේ වක්‍රව අපි අන්න ඒ වෙනස්වීමේ ක්‍රියාවලියත් පිළිගන්නවා කියන එකයි. ඒ නිසා ඒ කාරණය මේ පනත් කෙටුම්පත තුළට ඇතුළත් කරන්න බැහැ. ඒක අපේ සංස්කෘතියට විරුද්ධයි. බටහිර ලෝකයේ තිබෙන හැම දෙයක්ම අපේ කරගන්න නරකයි. ඒ නිසා ඇත්ත වශයෙන්ම අපි ඒක වළක්වා ගන්න ඕනෑ.

දෙවැනි එක තමයි, මේ පනත් කෙටුම්පතේ කොහේවත් මව් පදවිය - motherhood - ගැන සඳහන් වෙලා නැහැ, ගර්භිණී මාතාව - pregnant women - ගැන සඳහන් වෙලා නැහැ, මව් කුසේ තිබෙන කලලය - fetus එක - ගැන සඳහන් වෙලා නැහැ. මෙන්න මේ තුනේ ආරක්ෂාවත් අපි ඇත්ත වශයෙන්ම බලන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතට ඒ කාරණාත් ඇතුළත් කරන්න ඕනෑ. නැත්නම් මේ තුළින් වෙන වෙන අනීතික බොහෝ දේවල් කෙරෙන්න පුළුවන්. එහෙම නම් අපට ගබ්සාව කියන එක වක්‍රව පිළිගන්න සිදු වෙනවා. එතකොට ගණිකා වෘත්තිය කියන එකත් වක්‍රව පිළිගන්න සිදු වෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පතේ මේ කරුණු ඉතා පැහැදිලිව සඳහන් වෙන්න ඕනෑ. එතකොට තමයි අපේ සංස්කෘතිය රැකෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, US taxpayer-funded programme කියලා එකක් තිබෙනවා. They teach Sri Lankan journalists to state gender pronouns and to avoid binary-gendered language. එහි තේරුම මොකක්ද? ඇමෙරිකාව විසින් මුදල් දීලා කරන වැඩසටහනක් තිබෙනවා. එහිදී අපේ ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන්ට කියනවා, "ඔහු" සහ "ඇය" කියන වචන පාවිච්චි කරන්න එපා, "it" and "they" කියලා පාවිච්චි කරන්න කියලා. "ඔහු" සහ "ඇය" කියන වචන පාවිච්චි කරන්න එපා කියනවා නම් මේ මොකාටද එන්න යන්නේ? අර LGBT එකට තමයි ඒ එන්න යන්නේ. ඒ නිසා අපි දැන්ම ඒක වළක්වා ගන්න ඕනෑ. මෙන්න මේ වාගේ දේවල් උගන්වන එක, මෙන්න මේ වාගේ වනවාරී, නැත්නම් පිට රට තිබෙන සංස්කෘතිය අපේ රටට ගෙනෙන්න ඉඩ දෙන එක අපි නවත්වන්න ඕනෑ. ඇමෙරිකාවේ ඕනෑ තරම් මුදල් - funds - තිබෙනවා. ඇමෙරිකාවට ඕනෑ විධියට ඒ මුදල් යොදවලා අපේ මාධ්‍යවේදීන්ගේ, අපේ දරුවන්ගේ සහ ජනතාවගේ හිස්, නැත්නම් මොළ සෝදන්න අපි ඉඩ දෙනවා ද කියන එකත් මා මේ අවස්ථාවේ අහනවා.

"ස්ත්‍රී පුරුෂභාවය සහ ලිංගික දිශානතිය මත පදනම්ව සිදුවන සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම්වලින් කාන්තාවන් ආරක්ෂා කිරීම;" කියලා මෙහි පනතේ අරමුණු (ඇ) යටතේ සඳහන් වෙනවා. ඒ වාගේම "…all rights and freedoms without distinction, including distinctions based on gender:" කියලා සඳහන් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. එහෙම අවශ්‍ය නැහැ. ස්ත්‍රීන්ට සම අයිතිවාසිකම් දෙනවා කියලා කිව්වා නම් ඒ ඇති. අර කිව්වා වාගේ මේ තුළින් කරන්නේ transgender, නැත්නම් ලිංගිකත්වය

ඕනෑකමින් වෙනස් කරපු අයටත් මේ අයිතිවාසිකම දෙනවා කියන එකයි. ඒ කියන්නේ අපි ඒ ක්‍රියාව චක්‍රව පිළිගන්න එකයි. ඒ නිසායි අපි කියන්නේ "කාන්තාව" කියන වචනය "ජීව විද්‍යාත්මක කාන්තාව" - biological woman - හැටියට නිර්වචනය කරන්න ඕනෑ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා රටට ආදරය කරන කෙනෙකු හැටියට ඔබතුමාත් දන්නවා, මමත් දන්නවා, අපේ රටේ ආක්‍රමණ 17ක් සිදු වූ බව. අවුරුදු 2,500ක ඉතිහාසය තුළ ඉන්දියාවෙන් ආක්‍රමණ 17ක් සහ බටහිරින් ආක්‍රමණ 3ක් වුණා. නමුත්, අපේ මුතුන් මිත්තෝ ඒ භෞතික ආක්‍රමණ සියල්ලම පරාජය කළා. නමුත්, දැන් මේ හදන්නේ අපේ රට සංස්කෘතික වශයෙන් ආක්‍රමණය කරන්නයි. රටක් සංස්කෘතික වශයෙන් ආක්‍රමණය කළොත් ඒ රටෙන් ගන්න දෙයක් නැහැ. අපි රට භෞතිකව ආරක්ෂා කළා නම් අපේ යුතුකම තමයි අපේ සංස්කෘතියත් ආරක්ෂා කිරීම. ඒ නිසා මේ සංස්කෘතික ආක්‍රමණය අපි කෙසේ හෝ වැළැක්විය යුතුයි. මේ පනත් කෙටුම්පත ඉතාම හොඳයි. ඒ නිසා මේ පනත් කෙටුම්පතට මේ සංශෝධනත් ගෙනෙන්න කියමින්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

[අ.භා. 12.55]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින කාන්තාවන් සවිබල ගැන්වීමේ අරමුණින් ඉතාම ප්‍රගතිශීලි වැඩ පිළිවෙළක් දියත් වෙන අවස්ථාවක මම කැමැතියි, කාන්තාවන්ගේ අභිවෘද්ධිය උදෙසා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ උත්සාහය ප්‍රශංසාවට ලක් කරන්න. කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම හරහා කාන්තාවන්ගේ අයිතිය සුරක්ෂා කිරීමේ හොඳ, ධනාත්මක වෑයමක් හැටියට හඳුන්වන්නට පුළුවන්.

මම විශේෂයෙන් සඳහන් කරන්නට කැමැතියි, ගරු තලතා අතුකෝරල මැතිනිය මේ ප්‍රගතිශීලි උත්සාහයට වැඩි දියුණු විය යුතු යෝජනා ගණනාවක් ඉදිරිපත් කළ බව. එතුමිය ඉදිරිපත් කරපු සංශෝධන හරහා කාන්තා අයිතිය ශක්තිමත් කරමින් මේ ගත් ප්‍රගතිශීලි උත්සාහය තව දුරටත් වැඩි දියුණු කර ගැනීමේ අවස්ථාව නිර්මාණය කර ගන්න අපට පුළුවන්කම ලැබෙනවා.

කාන්තාව, මාතෘත්වය, කාන්තාව සතු ගුණාංග සමාජයක දියුණුවට, ප්‍රගතියට බොහෝ සේ ඉවහල් වෙනවා කියලා අපි හැමෝම දන්නවා. විශේෂයෙන්ම ඵලදායීත්වය ගොඩනැංවීමට, දුප්පත්කම තුරන් කිරීමට, ශ්‍රම බලකායේ විවිධත්වය ක්‍රියාත්මක කිරීමට, රටේ සමස්ත සෞභාග්‍යයට උරදෙන වැදගත්ම කොටස්කාරයක් හැටියට අපේ ජන සමාජයේ සිටින කාන්තාව අපට හඳුන්වන්නට පුළුවන්.

විශේෂයෙන්ම මේ පනත හරහා කාන්තාවන්ගේ අයිතිවාසිකම් ශක්තිමත් කිරීමට ප්‍රගතිශීලි උත්සාහයක් ගත්තා වුවත්, ජන සමාජයේ අප මුහුණ දෙන, විශේෂයෙන්ම කාන්තාව මුහුණ දෙන බරපතළ අභියෝග රැසකට තවදුරටත් පිළියම් යොදන්නට අපි උනන්දු වෙන්නට ඕනෑ. විශේෂයෙන්ම ඒ කර්තව්‍යය කිරීමේ දී කාන්තා අයිතිය, කාන්තා අභිවෘද්ධිය, කාන්තා ප්‍රගතිය වෙනුවෙන් පෙනී සිටින පාර්ශ්වකරුවන් සමඟ පුළුල් සාකච්ඡාවකට, සංවාදයකට එළඹීමෙන් අනතුරුව මෙහි ඉදිරි පියවර ගැනීම වැදගත් යැයි මම විශ්වාස කරනවා.

විශේෂයෙන්ම කාන්තාවන් මුහුණ දෙන ගැටලු ගැන කථා කළාම, 2019 ජනාධිපතිවරණයේ දී කාන්තා අයිතිය සුරක්ෂා කිරීම උදෙසා, කාන්තාව වෙනුවෙන් අපි ප්‍රඥප්තියක් නිර්මාණය කළා. සමාජ සම්මුතියක් - social contract - ඉදිරිපත් කළා. ඉදිරියේ දී නිර්මාණය වන අපේ රජය තුළින් කාන්තාවන්ට මුහුණ දෙන්නට සිදු වන ආර්ථික, සමාජයීය, දේශපාලනික, ආගමික, සංස්කෘතික, අධ්‍යාපන, සෞඛ්‍ය වාගේ හැම අංශයකටම අදාළ ගැටලුවලදී ඒ ප්‍රඥප්තිය, ඒ සමාජ සම්මුතිය - social contract - හරහා විසඳුම් ලබා දෙන වැඩ පිළිවෙළකට ප්‍රවේශ වන්නට අපි අදහස් කරනවා. ආර්තව දරිද්‍රතාව - period poverty - කියන ප්‍රශ්නය අදටත් බරපතළ ගැටලුවක්. මේ රටේ කාන්තා පරපුරෙන් සියයට 50ක් ආර්තව දරිද්‍රතාවෙන් පෙළෙන තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා කියන එක විවිධ සමීක්ෂණ හරහා අද ඔප්පු කරලා තිබෙනවා. 2019 ජනාධිපතිවරණයේ දී අපි මේ කරුණු කාරණා ඉදිරිපත් කරනකොට අපට ගල් මුල් ප්‍රහාර, අභියෝග, නින්දා, විවේචන රැසකට මුහුණ දෙන්නට සිද්ධ වුණා. නමුත් අපි අපේ යෝජනාව ඉවත් කළේ නැහැ. වාර්ෂිකව මේ ආර්තව දරිද්‍රතාව වළක්වාලන්නට ස්කොට්ලන්තයට පුළුවන් නම්, නවසීලන්තයට පුළුවන් නම් අපේ රටට බැරි ඇයි? මෙය සාකච්ඡාවට භාජන නොවන, සමාජය තුළ පැත්තකට කොන් කරපු මාතෘකාවක් හැටියට පවත්වාගෙන යන්නේ ඇයි කියන තර්කය අපි ඉදිරිපත් කළාට පසු අපට බැණලා, බැණලා වසර හතරකට, පහකට පස්සේ දැන් ආණ්ඩු පාර්ශ්වයේ බොහෝ දෙනෙකුගේ ඇස් ඇරිලා තිබෙනවා. "ආර්තව දරිද්‍රතාව සමාජයීය ප්‍රශ්නයක්, මේ සමාජයීය ප්‍රශ්නයට එකම විසඳුම තමයි නොමිලයේ ඔවුන්ට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් ලබා දීමේ ක්‍රමය" කියලා දැන් කියනවා. ඒ පහසුකම සමස්ත කාන්තා පරපුරටම ලබා දෙන්න ස්කොට්ලන්තයට පුළුවන් නම්, අප්‍රිකානු රටවල් ගණනාවකට ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්න පුළුවන් නම්, ඒ වාගේම නවසීලන්තයේ හිටපු අග්‍රාමාත්‍යතුමිය වන ජෙසින්ඩා ආර්ඩන් මැතිනිය පාසල් දැරියන් කේන්ද්‍ර කරගෙන මේ ක්‍රියාව කළා නම්, අපේ මේ බංකොලොත් රටේ මේ බංකොලොත්භාවය තුළ හරි මේ රටේ සියයට 52ක් වූ කාන්තාවන් කෙරෙහි තවමත් සානුකම්පිතව අවධානය යොමු නොකරන්නේ මන්ද කියන එක බරපතළ ප්‍රශ්නයක්.

විශේෂයෙන්ම අපි දන්නවා කාන්තාව බොහෝ අවස්ථාවල නිවසේත්, වැඩ බිමේත්, නිවසේ සිට වැඩ බිමට යන එන අවස්ථාවලදීත්, වෙනත් බොහෝ ස්ථානවලදීත් විවිධ අඩන්තේට්ටම්වලට, හිරිහැර හා කරදරවලට මුහුණ දෙන පිරිසක් කියලා. එය එසේ සිදු විය යුතු නැහැ. අපි මේ රටේ ජන සමාජයේ සියයට 52ක් වූ කාන්තාව මීට වැඩිය ඉහළ මට්ටමක තබන්නට ඕනෑ. රුවන්ඩාව ගත්තොත්, රුවන්ඩාවට දැන් කියන්නේ "අප්‍රිකාවේ සිංගප්පූරුව" කියලා. අප්‍රිකාවේ සිංගප්පූරුව හැටියට දැන් හඳුන්වන රුවන්ඩාවේ කැබිනට් මණ්ඩලයේ හොඳ අධ්‍යාපනයක් ලබපු, උසස් අධ්‍යාපනය ලබපු කාන්තාවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ කාන්තාවන් තමයි රුවන්ඩාවේ රාජ්‍ය පාලනයේ බහුතර කාර්යභාරයක් ඉෂ්ට කරන්නේ. ඉතින් රුවන්ඩාවේ කාන්තාවන්ට ඒක කරන්න පුළුවන් නම්, අපේ රටේ අපට එසේ කිරීමට බැරි ඇයි?

වර්තමාන ජනාධිපතිවරයා පිළිබඳව මට තර්ක-විතර්ක වාගේම විවිධ මත කොපමණ තිබුණත්, ඇත්ත වශයෙන්ම මම

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ප්‍රශංසාවට ලක් කරන කාරණයක් තිබෙනවා. ඒ තමයි විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවල අනිවාර්යයෙන් සියයට 25ක ප්‍රතිශතයක් මන්ත්‍රීවරියන්ට වෙන් කිරීමක් - women-member reservation - එදා යහ පාලන රජය ක්‍රියාත්මක කිරීම. ඇත්ත වශයෙන්ම වර්තමාන ජනාධිපතිවරයාට ඒ සියල්ල පිළිබඳව මගේ ප්‍රශංසාව ලබා දෙනවා. මොකද, ප්‍රශංසාව ලබා දෙන්න ඕනෑ වෙලාවේ ප්‍රශංසාව ලබා දෙන්න ඕනෑ. අපි කාරක සභාවේත්, පාර්ලිමේන්තුවේත් ඒ ප්‍රගතිය යම් මට්ටමකින් හෝ ලබා ගන්නට අනිවාර්යයෙන්ම කටයුතු කරන්නට ඕනෑ.

විශේෂයෙන්ම අපේ රටේ ආහාර අනාරක්ෂිතභාවය - food insecurity - නිර්මාණය වෙලා තිබෙනවා. බහුවිධ දරිද්‍රතාව - multidimensional poverty - අද ජන සමාජයේ බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නවලට අනිවාර්යයෙන්ම කාන්තා කේන්ද්‍රීය වැඩසටහන් අවශ්‍යයි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජන සවිය තුළින් නිර්මාණය වුණු "ජන ශක්ති කාන්තා ව්‍යාපාරය" මෙයට හොඳ උදාහරණයක්. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයකු හැටියට ගරු අජිත් රාජපක්ෂ මැතිතුමාත් හොඳින්ම දන්නවා ඇති, ඒ ජන ශක්ති බැංකු ක්‍රමය හරහා කොයි තරම් විශිෂ්ට සේවාවක් එම කාන්තාවන්ගේම නායකත්වයෙන් ක්‍රියාත්මක වෙලා තිබෙනවාද කියලා.

අපේ ශ්‍රම බලකායේ සහභාගිත්වය දිහා බැලුවාම ඇත්ත වශයෙන්ම කාන්තා ක්ෂේත්‍රය ඉතා දුර්වල මට්ටමක තිබෙන්නේ. එතැන සියයට 32ත් සියයට 35ත් අතර ප්‍රමාණයක් සිටින්නේ. එය කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. අපි ඒක සියය 45 දක්වා වැඩි දියුණු කරන්නට කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම කාන්තා මූලික පවුල් අපේ රටේ 1,638,000ක් ඉන්නවා කියලා මේ පාර්ලිමේන්තුවේ දී ගීතා කුමාරසිංහ මැතිනිය ප්‍රශ්නයකට උත්තරයක් වශයෙන් දීලා තිබෙනවා. ලක්ෂ 16කට වැඩි කාන්තා මූලික පවුල් මේ තරම් ප්‍රමාණයක් සිටින රටක කාන්තා මූලික පවුල් වෙනුවෙන් වෙනමම ජාතික වැඩසටහනක්, ජාතික ප්‍රතිපත්තියක් අත්‍යවශ්‍යයි කියන එක අපි විශ්වාස කරනවා.

ඒ වාගේම පසුගිය කාලයේ රටේ සිදු වුණු ඒ බංකොලොත්භාවය තුළ ජන සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුකූලව කාන්තා කේන්ද්‍රීය ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර 11,700ක් තාවකාලිකව වැහිලා තිබෙනවා. ව්‍යාපාර 27,600ක් ස්ථිරවම වැහිලා තිබෙනවා. කාන්තා අයිතිය ගැන කථා කරන මේ මොහොතේ කාන්තා කේන්ද්‍රීය ව්‍යවසායකයන් වෙනුවෙන්, සමස්ත කාන්තා ප්‍රජාව වෙනුවෙන් විශේෂිත වැඩසටහනක් අපි ක්‍රියාත්මක කරන්නට ඕනෑ කියලා මම හිතනවා. එක් අතකින් ක්ෂුද්‍ර, මධ්‍යම සහ කුඩා පරිමාණයේ කර්මාන්තකරුවන් වෙනුවෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා සේම, කාන්තා කේන්ද්‍රීය ව්‍යවසායකයන් වෙනුවෙන් වෙනමම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට අපට දැන් අවස්ථාව එළැඹිලා තිබෙනවා. ඒ සඳහා විශේෂයෙන්ම කාන්තාවන් කේන්ද්‍රීය කර ගත් වැඩිහිටි අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපේ රටේ හැම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයකම කාන්තා නිලධාරීන් පත් කරලා තිබෙනවා. හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම, උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම - ඒවා 341ක් තිබෙනවා - කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන ආරම්භ කරලා "සුහුරු කාන්තාව" - "smart woman" - සංකල්පය හරහා වැඩිහිටි කාන්තාවන්ටත් තොරතුරු තාක්ෂණ දැනුම, පරිගණක විද්‍යා දැනුම, නව තාක්ෂණ දැනුම, artificial intelligence, ChatGPTවලින් අද ලෝකයේ ක්‍රියාත්මක වෙන මහා පරිවර්තනාත්මක යුගය ගැන දැනුම ලබා දීමේ අවශ්‍යතාවක් තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා.

හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, උප ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයකම කාන්තාව ඒ පිළිබඳව දැනුවත් කිරීම වාගේම ඒ පිළිබඳව අවබෝධය ලබා දීමටත්, කාන්තා කේන්ද්‍රීය වැඩිහිටි කාන්තා සංවර්ධන අධ්‍යාපනික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමෙත් අවශ්‍යතාවක් තිබෙනවා.

ඒ වාගේම මම විශ්වාස කරනවා, කාන්තාවන්ට මුහුණ දෙන්න සිදුවන විවිධ හිංසනවලට, විවිධ බාධාවලට, දුක් කම්කටුලුවලට දැඩි නීති රීති ගෙන එන්නට අපි රටක් හැටියට කටයුතු කරන්න ඕනෑ කියලා. මේ තිබෙන නීති රීති, නීති පොතේ තිබුණාට ඒවා ක්‍රියාත්මක වීමේදී අඩුපාඩුකම්, දුබලකම් සිදුවෙනවා වාගේම ඒවායේ ඌනතා සහ විෂමතා රැසක් තිබෙනවා.

විශේෂයෙන්ම කාන්තා සහභාගිත්වය ගැන කථා කරනකොට මම කලින් කිව්ව ආකාරයට අයිස්ලන්තය, ස්වීඩනය, රුවන්ඩාව, කැනඩාව වාගේ රටවල් කාන්තා සමානාත්මතාව නිර්මාණය කිරීමේදී, සමාජයේ සමානාත්මතාව කියන ප්‍රතිපත්තිය නිර්මාණය කිරීමේදී ඉතාම අගනා ආකාරයට එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරලා තිබෙනවා. කාන්තාවට සමානාත්මතාව ලබා දීම තුළ සහ ප්‍රතිපත්ති සම්පාදනය හරහා කාන්තා නායකත්වය, කාන්තා සහභාගිත්වය ඇති කරගනිමින් ඔවුන් එහි කොටස්කරුවන්, පෙරමඟ ගමන්කරුවන් බවට පත් කිරීමෙන් ඇත්ත වශයෙන්ම කාන්තාවන්ට වැඩි ශක්තියක් ලබා දෙන්නට හැකියාව ලැබෙනවා.

අවසාන වශයෙන් මම තවත් කාරණයක් කියන්න කැමැතියි. 2019දී පැවති ජනාධිපතිවරණයේදී අපි ඉදිරිපත් කරපු කාන්තා ප්‍රඥප්තියේ, කාන්තා සමාජ ගිවිසුමේ සඳහන් වුණු කාන්තාවන් වෙනුවෙන් වෙනමම කොමිෂන් සභාවක් පිහිටුවීමට වසර 5ක් පමණ ගත වුණත්, 2019දී අපි ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනය අද මහ පොළොවේ යථාර්ථයක්, නීති පොතේ යථාර්ථයක් බවට පත් වීම ගැන අපි ඇත්ත වශයෙන්ම සතුටු වෙනවා. ඒ වාගේම පෙර පාසල් අධ්‍යාපනයේ ඉඳලා තෘතීයික අධ්‍යාපනය දක්වා කාන්තාව ශක්තිමත් කරගෙන, ගර්භිණී මව්වරුන්ට ලබා දිය යුතු පහසුකමේ ඉඳලා කාන්තාවන්ට ලබා දිය යුතු සියලු පහසුකම් ලබා දෙමින් කාන්තා කේන්ද්‍රීයව ක්‍රියාත්මක විය යුතු ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරන්න ඕනෑ.

අද මේ වැදගත් පනත් කෙටුම්පත කිසිම කෙනෙකුගේ විරෝධතාවකින් තොරව, අපේ තලතා අතුකෝරල මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරන සංශෝධනත් සහිතව අනුමත වෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම මම විශ්වාස කරනවා, කාන්තාවන් වෙනුවෙන් commission එකක් නිර්මාණය වෙනවා සේම, කාන්තාව වෙනුවෙන් විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකායක් ද අත්‍යවශ්‍යයි කියලා. ඒ විශේෂ වූ කාන්තා කේන්ද්‍රීය ජනාධිපති කාර්ය සාධක බලකාය තුළින් අපට පුළුවන්කම ලැබෙනවා, කාන්තාවන් මුහුණ දෙන සකලවිධ අභියෝගවලට විසඳුම් ලබා දෙන්න. මේ පනත් කෙටුම්පතින් අභියෝග කිහිපයකට විසඳුම් ලැබෙයි. නමුත්, අද වනකොට කාන්තාවට බලපාන අභියෝග රැසක් තිබෙනවා. ඒ සියලු අභියෝගවලට විසඳුම් මේ පනත් කෙටුම්පතින් ලැබෙන්නේ නැහැ. ඒ නිසා කාන්තාවන් සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කිරීම තවමත් ප්‍රමාද නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා, කාන්තාව වෙනුවෙන් මේ අගනා පනත් කෙටුම්පත අද දවසේ සම්මත වීමත් සමඟ හෙට දිනයේ කාන්තාව කේන්ද්‍ර කරගත් ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කරන්න කියලා. කාන්තාවට නිසි වැදගත්කමක් ලබා දෙන්න, නිසි වටිනාකමක් ලබා දෙන්න, කාන්තා ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්න, කාන්තාව මුහුණ දෙන අභියෝගවලට අවශ්‍ය විසඳුම් දෙන්න ඒ කාර්ය සාධක බලකාය බොහෝ සේ ඉවහල් වෙයි කියා මා විශ්වාස කරනවා.

අපි බොහෝ විට මේ සභාව තුළදී විවිධ අඩුපාඩු පෙන්වා දෙනවා. අපි ඒ අඩුපාඩු පෙන්වා දෙන්නේ සද්භාවයෙන්. ඒ අඩුපාඩු පෙන්වා දෙන්නේ සත් ක්‍රියාවක් හැටියට. රටේ සියයට 52ක් පමණ වන කාන්තා පරපුරේ අභිවෘද්ධිය උදෙසා මේ ගෙනාපු පනත් කෙටුම්පත තලතා අතුකෝරල මන්ත්‍රීතුමියගේ සංශෝධනත් සමඟ අනුමත වුණොත්, එය වඩාත් ප්‍රශස්ත, වඩාත් ප්‍රබුද්ධ නීති රාමුවක් වෙයි.

මම හිතන විධියට අද දවස මේ විෂයයට අනුබද්ධව, අපේ රටේ කාන්තා පරපුරට සුබසිද්ධිය උදා කරපු දිනයක් හැටියට අපට විශ්වාස කරන්න පුළුවන්. ඒ නිසා මේ වැඩසටහනට සම්බන්ධ වුණු ජනාධිපතිවරයා, ඒ අමාත්‍යවරුන් ප්‍රමුඛ සියලුදෙනාට අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඉදිරිපත් කරපු සංශෝධන පිළිබඳව නම්‍යශීලිව සලකා බලා, ඒ සංශෝධනත් සහිතව මේ පනත අපේ කාන්තාවන්ට පූජා කරන්නැයි කියා මම ඉල්ලීමක් කරනවා.

ස්තුතියි.

ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය
(මාණ්පුමිකු சட்டத்தரணி (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Athukorala, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුංචි නිවැරැදි කිරීමක් කරන්න තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමාට ඉස්සෙල්ලා හිටපු අමාත්‍ය ගරු සරත් වීරසේකර මහත්මයා අදහස් ප්‍රකාශ කළා. එතුමා අද ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පනත් කෙටුම්පත - Gender Equality Bill - සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළා. සුප්‍රිම් උසාවියේ නඩු පවරා තිබෙන නිසා, ඒ පනත් කෙටුම්පත පිළිබඳව අද මෙතැනදී සාකච්ඡා වෙන්නේ නැහැ.

ඒ ගැන පොඩි දැනුම්දීමක් කරන්න තමයි මම ඒ කරුණ කිව්වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 18ක කාලයක් තිබෙනවා.

[ප.ව. 1.13]

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் உரையாற்றுகின்ற இந்த நேரத்தில் அரசாங்கத் தரப்பில் எந்தவோர் உறுப்பினரையும் காண முடியவில்லை; ஆசனங்கள் வெறுமையாக இருக்கின்றன. இன்றைய தினம் இச்சபையில் நடைபெறுகின்ற பெண்களின் வலுவூட்டல் சட்டமூலம் தொடர்பான விவாதத்தில் எனக்கும் பங்குகொள்வதற்கு வாய்ப்பு வழங்கியமைக்கு முதலில் உங்களுக்கு நன்றி சொல்லக் கடமைப்பட்டிருக்கின்றேன். நான் இந்த விடயம் தொடர்பில் பேசுவதற்கு முன்னர், யாழ்ப்பாண மாவட்டத்தின் காங்கேசன்துறையில் இடம்பெற்றிருக்கின்ற ஒரு விடயத்தை இந்த இடத்தில் உங்களுடைய அனுமதியோடு பதிவுசெய்ய விரும்புகின்றேன்.

யாழ்ப்பாணம், காங்கேசன்துறை, தையிட்டி வீதியிலுள்ள பாரம்பரிய சைவ சமய சத்திர நிலத்தை மீளப் பெற்றுத்தருமாறு ஆறுதிருமுருகன் உட்பட்ட சிவபூமி அறக்கட்டளை நிலையத்தைச் சேர்ந்தவர்கள் மாண்புமிகு ஜனாதிபதிக்குக் கடிதமொன்றை எழுதியிருக்கிறார்கள். அந்தக் கடிதத்தின் பிரதியொன்று எனக்கும் தரப்பட்டது. யாழ்ப்பாண மாவட்டத்தின் வலிகாமம் வடக்குப் பிரதேச செயலாளர் பிரிவிலுள்ள காங்கேசன்துறை மயிலிட்டி வீதியில் அமைந்துள்ள, தையிட்டி இறை மயிலிட்டி, J/234ஆம் இலக்க கிராம அலுவலர் பிரிவிலுள்ள காட்டுதனாக்கடை என்ற 105 பரப்புக் காணியை - சைவ சமயத்தவர்களின் சரித்திர வரலாற்றைக்கொண்ட சித்தர்கள் வாழ்ந்த, மடாலயம் அமைந்த நிலத்தை - மீளக் கையளித்து உதவுமாறு அவர்கள் மாண்புமிகு ஜனாதிபதியிடம் வேண்டுகோள் விடுத்திருக்கிறார்கள். பல சித்தர்கள், சாதுக்கள் தவம் செய்தும், தர்ம வியாக்கியானங்கள் செய்தும், வரலாற்றுச் சிறப்பு வாய்ந்த மாவிட்டபுரம் கந்தசுவாமி கோவில் மற்றும் நகுலேச்சரம் சிவன் கோயிலுக்கு வரும் யாத்திரிகர்கள் தங்கிச் சென்றதுமான இப்புனித நிலத்தில் போர் அனர்த்தம் காரணமாக கடந்த 30 ஆண்டுகளாக எவ்வித தர்ம காரியமும் நடைபெறவில்லை. இந்த நிலம் இராணுவக் கட்டுப்பாட்டுக்குள் இருந்தது. நற்பணியின் ஓர் அங்கமான இப்புனித சைவ சமய சத்திர நிலத்தை தமது அறக்கட்டளைக்கு மீளக் கையளிக்குமாறு அவர்கள் ஜனாதிபதியைக் கேட்டிருக் கிறார்கள்.

மீண்டும் அவ்விடத்தில் சிவனுக்குரிய வழிபாடுகளை ஆரம்பித்து, தமது பாரம்பரிய புண்ணிய பணிகளைத் தொடர்வதற்கு ஆவன செய்யுமாறு நன்றியோடு வேண்டுவதாகவும், காவன்ன திருவோண சுக்கிரவார சத்திரம் அறக்கட்டளையின் கடமைகளை சிவபூமி அறக்கட்டளை குறித்த நிலத்தில் தொடர்ந்து நிறைவேற்ற பூரண ஒத்துழைப்பை எதிர்பார்த்துக் காத்திருப்பதாகவும் அவர்கள் மேலும் அக்கடிதத்தில் குறிப் பிட்டிருக்கிறார்கள். இன்றுவரை இதுதொடர்பில் ஜனாதிபதி செயலகத்தால் எந்தவித நடவடிக்கையும் மேற்கொள்ளப்படவில்லை. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நேற்றும் நேற்று முன்தினமும் 105 பரப்புடைய குறித்த காணியில் இராணுவத்தினரால் கற்கள் பரப்பப்பட்டு, வேலி அமைக்கப்படுகின்ற செயற்பாடுகள் முன்னெடுக்கப்படுவதாக சிவபூமி அறக்கட்டளையைச் சார்ந்தவர்களும் அங்குள்ள மக்களும் என்னிடம் முறைப்பாடு செய்தார்கள். அவர்களால் எனக்கு அனுப்பப்பட்ட கடிதத்தை நான் சபாபீடத்தில் ***சமர்ப்பிக்கின்றேன்.**

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இப்பொழுது நாங்கள் இங்கு பெண்களின் உரிமை தொடர்பில் பேசிக்கொண்டு இருக்கின்றோம். அதேபோல், இந்த நாட்டில் ஜனாதிபதித் தேர்தல் பற்றிப் பேசப்படுகிறது. ஆனாலும், இந்த நாட்டில் இப்பொழுதும் கைதுகளும் விசாரணைகளும் தொடர்ந்த வண்ணமிருக்கின்றன. தமிழ் இளைஞர்களும் தமிழ் அரசியல் செயற்பாட்டாளர்களும் தொடர்ந்தும் விசாரணைக்கு உட்படுத்தப்படுகிறார்கள், அவர்கள் அச்சுறுத்தப்படுகிறார்கள் என்பதை நீங்கள் அறிந்திருப்பீர்களோ எனக்குத் தெரியாது. அதனால் நான் இங்கு ஒரு விடயத்தைப் பதிவுசெய்கிறேன். எமது நாட்டின் ஜனாதிபதி மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்களுக்கு என்னால் எழுதப்பட்ட கடிதத்தின் பிரதியை நான் சபாபீடத்தில் ***சமர்ப்பிக்கின்ற** அதேநேரம், அதிலுள்ள விடயங் களையும் குறிப்பிட விரும்புகின்றேன்.

வடக்கு, கிழக்கின் தமிழ்த் தேசியத் தளத்தில் இயங்கு நிலையிலுள்ள பலநிலைப்பட்ட ஆர்வலர்களது சமூக மற்றும் அரசியல் செயற்பாடுகளை முடக்கி, அவர்களை அச்சுறுத்தும் வகையிலான கைதுகளும், விசாரணைகளும் பரவலாக இடம் பெற்று வருகின்றமையானது, தங்கள் அரசின் மீதான எதிர்நிலைக் கருத்தியலை மக்கள் மத்தியில் ஏற்படுத்தியுள்ள நிலையில், சமகாலத்தில் நடைபெற்றுள்ள கீழ்வரும் விடயங்கள் மீது தங்களின் மேலான கவனத்தை நான் கோருகிறேன்.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

வவுனியா, தோணிக்கலை நிரந்தர வதிவிடமாகக்கொண்ட முன்னாள் போராளியும் சமூக செயற்பாட்டாளருமான திரு. செல்வநாயகம் ஆனந்தவர்ணன் (அரவிந்தன்) அவர்கள், 2024.03.26ஆம் திகதியன்று பயங்கரவாத குற்றத்தடுப்பு மற்றும் விசாரணைப் பிரிவினரால் கொழும்பில் வைத்துக் கைதுசெய்யப்பட்டு, தற்போது வெலிக்கடைச் சிறையில் தடுத்து வைக்கப்பட்டுள்ளார். இவர், 2009ஆம் ஆண்டு முதல் 2017ஆம் ஆண்டு வரையான எட்டரை ஆண்டுகள் தமிழ் அரசியல் கைதியாகச் சிறையில் அடைக்கப்பட்டு, பின்னர் விடுவிக்கப்பட்டிருந்தார். பல்வேறு சமூக இடர்பாடுகளை எதிர்நோக்கியுள்ள முன்னாள் போராளிகளினதும் அவர்களது குடும்பங்களினதும் கல்வி மற்றும் பொருளாதார நெருக்கீடுகளைத் தீர்க்கும் மனிதாபிமானச் செயற்பாடுகளில் ஈடுபட்டு வந்த இவர், 'விடுதலைப் புலிகளை மீளுருவாக்கும் செயற்பாடுகளில் ஈடுபட்டார்' என்ற குற்றச்சாட்டின் அடிப்படையில் வாக்குமூலம் பெறுவதற்காக கொழும்பிலுள்ள TID அலுவலகத்துக்கு அழைக்கப்பட்டு, அங்கு வைத்து கைது செய்யப்பட்டு, கடந்த இரண்டு மாதங்களாக வெலிக்கடைச் சிறைச்சாலையில் அடைக்கப்பட்டுள்ளார்.

2024.05.07ஆம் திகதி நானும் சக பாராளுமன்ற உறுப்பினர் கௌரவ செல்வராசா கஜேந்திரன் அவர்களும் வெலிக்கடைச் சிறைச்சாலைக்குச் சென்றிருந்தபோது, தன்னை விடுதலை செய்யுமாறுகோரி இரண்டு நாட்களாகச் சிறைக்குள் உண்ணாவிரதப் போராட்டத்தில் ஈடுபட்டிருந்த ஆனந்தவர்ணனின் உடல்நிலை அப்போதே தளர்வுற்றிருந்ததை நாம் நேரடியாக அவதானித்தோம். ஆனால், இதுவரை அவர் என்ன நிலையில் இருக்கிறார் என்பதை இந்த அரசாங்கமோ அல்லது சிறைச்சாலை நிர்வாகமோ வெளிப்படுத்தவில்லை. அதேவேளை, திருகோணமலை மாவட்டத்தின் மூதூர் பகுதியைச் சேர்ந்த திரு. எஸ். சுதாகரன் என்பவர் இந்தியாவிலிருந்து திரும்பும்போது கைது செய்யப்பட்டு, கடந்த ஒரு வருட காலமாக வெலிக்கடைச் சிறைச்சாலையில் தடுத்து வைக்கப்பட்டுள்ளார். இவரும் ஒரு முன்னாள் போராளியாவார். இவருடைய குடும்பத்தினர் நாளாந்த சீவியத்துக்கே மிகவும் கஷ்டப்படுகிறார்கள்.

இதுதவிர, கிளிநொச்சி மாவட்டத்தில் இலங்கைத் தமிழரசுக் கட்சியின் முதன்நிலைச் செயற்பாட்டாளர்களாகவுள்ள கீழ்வரும் ஆறு பேரும் வெவ்வேறு காரணங்களின் நிமித்தம் பயங்கரவாத குற்றத்தடுப்பு மற்றும் விசாரணைப் பிரிவினரால் அண்மையில் தனித்தனியே விசாரணைகளுக்கு உட்படுத்தப்பட்டுள்ளமையானது, கட்சியின் செயற்பாட்டாளர்கள் மற்றும் ஆதரவாளர்களிடையே பல்வேறு அதிர்வலைகளை ஏற்படுத்தியுள்ளது. இலங்கைத் தமிழரசுக் கட்சியின் கிளிநொச்சி மாவட்டக் கிளையின் செயலாளர் திரு. வீரவாகு விஜயகுமார், 2024.02.14 மற்றும் 2024.05.31ஆம் திகதிகளில் பயங்கரவாத குற்றத்தடுப்பு மற்றும் விசாரணைப் பிரிவினரால் கிளிநொச்சி, பரந்தனில் அமைந்துள்ள அவர்களது அலுவலகத்துக்கு அழைக்கப் பட்டு, நீண்ட நேரம் விசாரணைக்கு உட்படுத்தப்பட்டுள்ளார். இதனால் அவர் உளரீதியாகப் பாதிப்புக்கு உள்ளாகியிருக்கிறார் என்பதை நான் இந்த இடத்தில் பதிவு செய்கின்றேன்.

கரைச்சிப் பிரதேச சபையின் மேனாள் உறுப்பினரான திரு. சண்முகராஜா ஜீவராஜா, 2024.04.04ஆம் திகதி பயங்கரவாத குற்றத்தடுப்பு மற்றும் விசாரணைப் பிரிவினரால் கொழும்பில் அமைந்துள்ள அவர்களது அலுவலகத்துக்கு அழைக்கப்பட்டு, விசாரணைக்கு உட்படுத்தப்பட்டுள்ளார். ஈழத்து எழுத்தாளரும் எமது கட்சியின் செயற்பாட்டாளரும் கிளி/முருகானந்தா கல்லூரியின் ஆசிரியருமான தீபச்செல்வன் என அறியப்படும் திரு. பாலேந்திரம் பிரதீபன் அவர்கள் 2024.04.11ஆம் திகதி பயங்கரவாத குற்றத்தடுப்பு மற்றும் விசாரணைப் பிரிவினரால் கிளிநொச்சி, பரந்தனில் அமைந்துள்ள அவர்களது அலுவலகத்துக்கு அழைக்கப்பட்டு, விசாரணைக்கு உட்படுத்தப்பட்டுள்ளார். பூநகரி பிரதேச சபையின் மேனாள் தவிசாளரும் கிளி/முழங்காவில் மகா வித்தியாலயத்தின் ஆசிரியருமான திரு. சிவகுமாரன் ஸ்ரீரஞ்சன், 2024.04.20ஆம் திகதி பயங்கரவாத குற்றத்தடுப்பு மற்றும் விசாரணைப் பிரிவினரால் கிளிநொச்சி, பரந்தனில் அமைந்துள்ள அவர்களது அலுவலகத்துக்கு அழைக்கப்பட்டு, விசாரணைக்கு உட்படுத்தப்பட்டுள்ளார். கரைச்சிப் பிரதேச சபையின் மேனாள் தவிசாளர் திரு. அருணாசலம் வேழமாலிகிதன், 2024.04.26 பயங்கரவாத குற்றத்தடுப்பு மற்றும் விசாரணைப் பிரிவினரால் கிளிநொச்சி, பரந்தனில் அமைந்துள்ள அவர்களது அலுவலகத்துக்கு அழைக்கப்பட்டு, விசாரணைக்கு உட்படுத்தப்பட்டுள்ளார். பூநகரி பிரதேச சபையின் மேனாள் உறுப்பினர் திருமதி ஜெயச்சித்ரா தயானந்தன், 2024.05.27ஆம் திகதி பயங்கரவாத குற்றத்தடுப்பு மற்றும் விசாரணைப் பிரிவினரால் கொழும்பில் அமைந்துள்ள அவர்களது அலுவலகத்துக்கு அழைக்கப்பட்டு, விசாரணைக்கு உட்படுத்தப்பட்டுள்ளார்.

இலங்கைத் தமிழரசுக் கட்சியின் மத்திய செயற்குழு உறுப்பினரான திரு. கறுப்பையா ஜெயக்குமார் அவர்கள், இன்றைய தினம் - 2024.06.04ஆம் திகதி - பயங்கரவாத குற்றத்தடுப்பு மற்றும் விசாரணைப் பிரிவினரால் கிளிநொச்சி, பரந்தனில் அமைந்துள்ள அவர்களது அலுவலகத்துக்கு விசாரணைக்காக அழைக்கப்பட்டு, இப்பொழுது விசாரிக்கப் பட்டுக் கொண்டு இருக்கின்றார்.

மேற்குறித்த விடயங்கள்மீது உயரிய கரிசனைகொண்டு, தமிழ் அரசியல் கைதிகளாகத் தடுத்து வைக்கப்பட்டுள்ளோரின் விடுதலையை விரைவுபடுத்தும் சமநேரத்தில், எமது மக்களின் இயல்பு வாழ்வைச் சிதைக்கும் வகையில் திட்டமிட்டு மேற்கொள்ளப்படும் விசாரணைகள் மற்றும் அச்சுறுத்தல்களைத் தடுத்து நிறுத்துவதற்கும் ஆவன செய்யுமாறு நான் மாண்புமிகு ஜனாதிபதி அவர்களை தயவுடன் கேட்டுக் கொள்கின்றேன். நான் இந்த விடயத்தை இந்த உயர்ந்த சபையின் கவனத்துக்கும் கொண்டுவருகிறேன். ஏனெனில், இந்த நாட்டில் வாழுகின்ற தமிழர்கள் குறிப்பாக, வடக்கு, கிழக்கில் வாழுகின்ற தமிழர்கள் ஜனநாயக முறைப்படி அரசியல் செய்யவோ, ஜனநாயக ரீதியாகச் செயற்படவோ முடியாதவாறு Terrorist Investigation Division -TID, Criminal Investigation Department - CID பிரிவுகளைச் சேர்ந்தவர்களால் விசாரணைகளுக்குட்படுத்தப்பட்டும் அச்சுறுத்தப்பட்டும் வருகின்றார்களென்பதற்கு நான் இங்கு முன்வைத்த தகவல்கள் மிக முக்கிய ஆதாரங்களாகும். இன்னும் பலருடைய பெயர்களை அவர்கள் விசாரணைக்காக அறிவித்தும் இருக்கிறார்கள். விடுதலைப் புலிகளை மீள் உருவாக்கம் செய்கிறார்கள் என்பதாக அவர்கள் அதற்குக் காரணம் சொல்கிறார்கள்.

இந்த மண்ணில் இறந்துபோன விடுதலைப் புலிகளுடைய ஆத்மாக்களுக்கு விளக்கேற்றுவதற்கு, அவர்களுக்கு வணக்கம் செலுத்துவதற்கு நிலைமாறுகால நீதிப் பொறிமுறையின் அடிப்படையில் அனுமதிப்பதாக 2015ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் ஐக்கிய நாடுகள் மனித உரிமைகள் ஆணையகத்தில் இலங்கை அரசாங்கம் சார்பில் அப்போது வெளியுறவுத்துறை அமைச்சராக இருந்த அமரர் மங்கள சமரவீர அவர்கள் உறுதியளித்திருந்தார். அதற்குப் பிறகு, நாங்கள் 2016ஆம் ஆண்டு ஜனாதிபதியாக இருந்த கௌரவ மைத்திரிபால சிறிசேன அவர்களை இதே பாராளுமன்றக் கட்டிடத்தொகுதியில் சந்தித்துக் கதைத்தபொழுது, "வணக்கம் செலுத்துவதற்கு எந்தத் தடைகளும் இல்லை" என அவர் சொன்னார். ஆனால், அங்கு பூக்களை, அடையாளங்களை வைப்பதைத் தடுக்கிறார்கள். ஒரு கல்லைக்கூட நட முடியவில்லை. முழங்காவிலுள்ள, மாங்குளத்திலுள்ள, கிளிநொச்சிலுள்ள பொலிஸார் மாறி, மாறி அங்குள்ள செயற்பாட்டாளர்களுக்கு எதிராக முறைப்பாடுகளைச் செய்வதனால் பரந்தனிலும் கிளிநொச்சியிலும் இருக்கின்ற

புலனாய்வுத்துறையைச் சேர்ந்தவர்கள் அவர்களை அடிக்கடி விசாரணைகளுக்கு உட்படுத்துகிறார்கள். இதனால் அங்குள்ள செயற்பாட்டாளர்களும் மக்களும் மிகவும் அச்சத்துக்கு உள்ளாகி இருக்கின்றார்கள். இந்தச் செயற்பாடு இந்த நாட்டுக்கு உகந்ததா என்பதை தயவுசெய்து சிந்தித்துப் பாருங்கள்!

நான் இங்கு ஏற்கெனவே குறிப்பிட்ட மாவிட்டபுரத்தில் இருக்கின்ற - சித்தர்களுடைய வாழ்விடத்தை - சத்திரத்தைப் பறித்து, அதனை தனியாருக்கு வழங்குவதற்கு அரசாங்கம் முயற்சித்திருக்கிறது. அண்மையில் ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் யாழ்ப்பாணத்தில் நல்லை ஆதீனத்தைச் சந்தித்தபோது, சிவபூமி அறக்கட்டளையின் தலைவர் ஆறு திருமுருகன் அவர்களும் நல்லை ஆதீன முதல்வர் அவர்களும் அந்தக் காணியை விடுவித்துத் தருமாறு கோரினார்கள். அப்போது, அதனை விடுவிப்பதாகச் சொன்ன ஜனாதிபதி அவர்கள், இதுவரை அதை விடுவிக்கவில்லை என்ற ஆதங்கம் அவர்களுக்கு உண்டு. சொன்னதைச் செய்திருந்தால், அவர்களுக்கு திருப்தியாக இருந்திருக்கும். அது அவர்களுடைய சொந்த நிலம். ஆகவே, அதனை மீளவழங்க வேண்டும். அந்தக் காணியின் உறுதியும் என் கைவசம் இருக்கிறது. காலங்காலமாக சித்தர்கள் வாழ்ந்த, அவர்கள் தவம்செய்த, மடங்கள் இருந்த 105 பரப்புக்கொண்ட அந்த சிவபூமியை தயவுசெய்து உடனடியாக அவர்களிடம் கையளியுங்கள்! எமது பகுதிகளில் காணிகளைப் பறித்தல், அங்குள்ளவர்களைக் கைதுசெய்தல், அதனூடாக அங்குள்ள மக்களை அச்சுறுத்தலுக்கு உள்ளாக்குதல், அங்குள்ள மக்களுடைய எண்ணங்களைச் சிதைக்கின்ற நடவடிக்கைகளை மேற்கொள்ளல் போன்றவற்றை உள்ளடக்கிய ஒரு மறைமுக நிகழ்ச்சி நிரலை அரசாங்கம் வைத்திருப்பதை எங்களால் பார்க்க முடிகின்றது.

இது மிக மோசமானது. இவ்வாறான நிலைமைகள் மாற்றப்பட வேண்டும். பெண்களுக்குரிய உரிமைகள், அவர்களுக்குரிய அரசியல் அந்தஸ்து, அவர்களுக்கான சம அந்தஸ்து என்பன தொடர்பாக எங்களுடைய தமிழரசுக் கட்சி திறந்த அரங்குகளில் பலமுறை சொல்லியிருக்கிறது. குறிப்பாக, அரசியலில் பெண்களுக்கு 50:50 ஒதுக்கீடு இருக்க வேண்டும் என்று நாங்கள் தெளிவாகச் சொல்வதுண்டு. வெறுமனே நீங்கள் உள்ளூர் அதிகாரசபைத் தேர்தல்களில் மட்டும் பெண்களுக்கு 25 சதவீதத்தை ஒதுக்கிவிட்டு, ஏனைய தேர்தல்களில் அவ்வாறான ஒதுக்கீடு பற்றி எந்தத் தகவலையும் சொல்லாமல் இருப்பது இந்த நாட்டின் சட்டத்துக்கு மிகப் பாதகமானது. எனவே, அந்த ஒதுக்கீட்டை பெண்களுக்கு 50 சதவீதமாகவும் ஆண்களுக்கு 50 சதவீதமாகவும் கொண்டு வாருங்கள்! பெண்களுக்குரிய உரிமையை அங்கீகரியுங்கள்! அப்பொழுதுதான் இந்த நாட்டில் அபிவிருத்தியும், எழுச்சியும் இடம்பெறும். அத்தோடு, இந்த நாட்டில் நல்ல காரியங்கள் இடம்பெறுவதற்கு பெண்களும் காரணமாக அமைவார்கள். இலங்கைத் தமிழரசுக் கட்சியினராகிய நாங்கள் 50 சதவீத ஒதுக்கீட்டைப் பெண்களுக்கு வழங்குவதற்கு எப்போதும் தயாராக இருக்கிறோம் என்பதை இங்கு மிகத் தெளிவாக திரும்பவும் பதிவு செய்கின்றேன். நீங்கள் அந்தச் சட்ட ஏற்பாட்டைக் கொண்டுவந்தால், அதற்கு எங்களுடைய கட்சி ஆதரவளிக்கும் என்பதையும் நான் இந்த இடத்தில் பதிவு செய்கின்றேன்.

இன்று இந்த நாட்டில் மிகப் பெரிய இடர் ஏற்பட்டிருக்கிறது. நாட்டில் நிலவும் சீரற்ற காலநிலை காரணமாக 23 மாவட்டங்களில் 251 பிரதேச செயலாளர் பிரிவுகளில் 23,723 குடும்பங்களைச் சேர்ந்த 87,376 பேர் பாதிக்கப்பட்டுள்ளதாக இன்றைய 'வீரகேசரி', 'தினக்குரல்', 'தமிழன்' ஆகிய பத்திரிகைகள் செய்தி வெளியிட்டுள்ளன. இன்று நான் பத்திரிகைகளில் பார்த்த செய்திகளை அடிப்படையாக வைத்தே இந்தத் தகவலை வெளியிடுகின்றேன். இன்றைய 'வீரகேசரி' பத்திரிகையில்,

"இரண்டு வாரங்களில் 24 பேர் உயிரிழப்பு"

என்ற செய்தி முதற் பக்கத்தில் பிரசுரிக்கப்பட்டுள்ளது.

இன்று இந்த நாடு மிகப்பெரிய இடரைச் சந்தித்திருக்கின்றது. பல மாவட்டங்களில் மக்கள் போக்குவரத்துச் செய்ய முடியாமல் இருக்கிறார்கள். ஏனெனில், மண்சரிவு ஏற்படுவதால் பாதைகள் பாதிக்கப்பட்டிருக்கின்றன. இந்த இடர் காரணமாக உயிரிழந்த மக்களின் குடும்பத்தினருக்கு இந்த உயர்ந்த சபையில் எனது அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன். இடர் வருகின்ற ஒவ்வொரு முறையும் எங்களுடைய மலையகம் சார்ந்த சகோதரர்களே அதிகமாகப் பாதிக்கப்படுகின்றார்கள். மழை, மண்சரிவால் அதிகமாகப் பாதிக்கப்படுகின்றவர்களாக அவர்கள் இருக்கின்றார்கள். அவர்களின் நிம்மதியான வாழ்க்கை மற்றும் சீரான போக்குவரத்துக்கு இந்த இடர் தடையாக உள்ளது. ஆகவே, இடர்களிலிருந்து அவர்களைக் காப்பாற்றுவதற்குப் பொறி முறை ஒன்று உருவாக்கப்பட வேண்டுமென்பதை நான் இந்த இடத்தில் பதிவுசெய்கின்றேன்.

மேலும், யாழ்ப்பாண மாவட்டத்தில் ஊர்காவற்றுறையைச் சேர்ந்த 11 வயதுடைய நிரோசன் விதுசா மற்றும் 5 வயதுடைய நிரஞ்சன் அனுஷ்கா ஆகிய இரு பெண் பிள்ளைகள் நேற்று முன்தினம் துவிச்சக்கரவண்டியில் அருகிலுள்ள கடைக்கு வயல் வரம்பால் செல்லும்போது தவறி குட்டையொன்றில் விழுந்ததன் காரணமாக இருவரும் அந்த இடத்திலே உயிரிழந்திருக்கிறார்கள். வெள்ளப்பெருக்கு காரணமாக நீர் தேங்கிநின்றபொழுது வழமையான பாதையெனக் கருதி அப்பிள்ளைகள் சென்றிருக்கிறார்கள். அவர்களுடைய அறியாமை, அந்த வயதிலே இருக்கின்ற துடிப்பின் காரணமாக அவர்கள் சென்றதால் அவர்களுடைய உயிர் பறிபோயிருக்கின்றது. அந்தக் குழந்தைகளின் உறவினர்களுக்கும் இந்த உயர்ந்த சபையிலே எனது அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நாட்டினுடைய வளர்ச்சி மற்றும் முன்னேற்றம் என்பது தனிமனித செயற்பாடுகளில் தங்கியிருக்கின்றது. மனித அர்ப்பணிப்பும் தியாகமும் அந்தத் தியாகத்தினூடான வளர்ச்சியும் ஒரு நாட்டினுடைய முன்னேற்றத்திலே பெரும் பங்கு வகிக்கின்றது. தேசிய இனங்களில் ஒன்றான தமிழினம் எப்பொழுதும் அச்சுறுத்தப்பட்டு, அவர்களின் நிலம் பறிக்கப்பட்டு, இராணுவப் பிடிக்குள் வைக்கப்பட்டு, அவர்கள் விசாரணைகளுக்குட்படுத்தப்பட்டு, அடக்கப்படுகின்றபோது அவர்களுடைய நிம்மதியற்ற வாழ்வு ஏனைய இனத்தையும் இந்த மண்ணிலே நிம்மதியாக வாழவிடாது என்பதை நான் இந்த இடத்திலே பதிவு செய்கின்றேன். இவற்றுக்கு நீதியான ஒரு தீர்வு வேண்டும். இந்த நிலைமைகள் நடைபெறாமல் தடுக்கப்படவேண்டும். இந்த நாட்டில் இருக்கின்ற ஒவ்வொருவரும் சிந்தித்து பெண்களுக்கான உரிமையை சரியான முறையில் கொடுத்தால் இந்த நாட்டை முன்னேற்ற முடியும் என்பதையும் பதிவுசெய்து நிறைவுசெய்கின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.30]

ගරු මංජුලා දිසානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පළමුවෙන්ම, විෂය භාර අමාත්‍යවරයා විධියට කටයුතු කරන අතිගරු ජනාධිපතිතුමා විසින් කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අවස්ථාවේ

[ගරු මංජුලා දිසානායක මහත්මිය]

මෙම පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරියක් විධියට වචන කිහිපයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මම මේ අවස්ථාවේදී විශේෂ ස්තුතියක් කරන්න අවශ්‍යයි අපේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදයේ ගරු සභාපතිතුමියට.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතඅතර, මාණ්ඩුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] took the Chair.

ගරු මංජුලා දිසානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යවරයා විධියට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනකොට, මම විශේෂයෙන් ස්තුතියක් කරන්න අවශ්‍යයි මන්ත්‍රීවරියන්ගේ සංසදයේ ගරු සභාපතිතුමිය විධියට කටයුතු කරන ගරු වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියට. එතුමිය සුවිශේෂී කාර්යභාරයක් ඉෂ්ට කළා කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට. මා ඉදිරියේ සිටින ඔබතුමියට කාන්තාවක් විධියට මම අපි සියලුදෙනාගේම ගෞරවය සහ ප්‍රණාමය පුද කරනවා. ඇත්තටම අපි සියලුදෙනාම වෙනුවෙන් එතුමිය නායකත්වය ගත්තා, මේ කෙටුම්පත අද දවසේ මේ සභාවට අරගෙන එන්න.

විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශ්ව ප්‍රකාශනය මඟින් ඉදිරිපත් කර තිබෙන සියලුදෙනාටම සමානව සැලකීමේ, -වෙනස්කොට නොසැලකීමේ- සමානතාවෙන් යුතුව කටයුතු කිරීමට අවස්ථාව සලසා ගැනීමේ හැකියාව අපට මේ කෙටුම්පත තුළින් ලබා ගන්න හැකි වෙයි කියලා මා විශ්වාස කරනවා. ඒ මොකද එහෙම කියන්නේ? 1979දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් CEDAW සම්මුතිය, එහෙම නැත්නම් කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් ඉවත් කිරීමේ ප්‍රඥප්තිය රටවල් 130ක එකඟතාවෙන් තමයි සම්මත කර ගත්තේ. 1980දී අපි මෙකට එකතු වුණා. 1981 ඉඳලා ඒක අපේ රටේ ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු කළා. නමුත් අදටත් ඒකේ යම් යම් අඩු පාඩු තිබෙනවා. ඒ අඩු පාඩුව දැකලා, අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය ආරම්භ කරලා, එදා මෙදා තුර, පසුගිය අවුරුදු කිහිපයේම අපි ඒ ගැන කථා කළා. විශේෂයෙන්ම මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ප්‍රමුඛ නිලධාරීන්. පාර්ලිමේන්තු සැසිවාරය පැවැත්වෙන හැම අවස්ථාවකම අපි මේ පිළිබඳව සාකච්ඡා කළා, මන්ත්‍රීවරියන්ගේ සංසදය පැවැත්වුවා. ඒ නිලධාරීන් ඒ හැම අස්ථාවකම අපිත් එක්ක එකතු වෙලා මේ පිළිබඳව කටයුතු කළා. ඒ නිසා මම මෙය අවස්ථාවක් කර ගන්නවා ඒ අයට ස්තුති කරන්නට.

මා විශ්වාස කරනවා අපේ රටේ ජනගහනයෙන් සියයට 53ක් වුණු කාන්තාවන්ට මෙතෙක් කාලයක් සිදු වුණා වූ අතවරයන්ගෙන් මිදෙන්නට සහ යම් අස්වැසිල්ලක් ලබන්නට මේ පනත් කෙටුම්පත තුළින් හැකියාව සහ ශක්තිය ලැබෙයි කියලා.

ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපතිතුමිය විධියට කටයුතු කරනවා. අපේ ඒ සංසදයට පක්ෂ, විපක්ෂ භේදයක් නැහැ; පොහොට්ටුවේ ද, සජබයේ ද එහෙම නැත්නම් ජනතා විමුක්ති පෙරමුණේ ද කියලා වෙනසක් නැහැ. අපි 12දෙනාම එකමුතු වෙලා, අත්වැල් බැඳගෙන තමයි මේ කාර්යය කළේ. එහෙම නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය විධියට අපි රටට හොඳ ආදර්ශයක් දීලා තිබෙනවා කියා මම විශ්වාස කරනවා.

මෙම පනත් කෙටුම්පතෙහි මූලිකම කාරණා විධියට මා දකින්නේ, කාන්තාවන් සම්බන්ධයෙන් ආරම්භ කරන්නට නියමිත ජාතික කොමිෂන් සභාව සහ කාන්තා අයිතිවාසිකම් සඳහා පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේත් කාර්යභාරයයි. විශේෂයෙන්ම අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයට අවස්ථාවක් ලබා දී තිබෙනවා, එම කොමිෂන් සභාවට නියෝජිතයන් දෙදෙනෙකු නම් කරන්න. ඒකත් සුවිශේෂී අවස්ථාවක් විධියට මම දකිනවා. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම දුරු කිරීම සඳහා, කාන්තාවන් සම්බන්ධයෙන් ද සමානාත්මතාවෙන් යුතුව කටයුතු කිරීම සඳහා CEDAW ප්‍රඥප්තිය මඟින් පියවර ගෙන තිබෙනවා.

මම මෙහිදී සුවිශේෂ කරුණක් ඉදිරිපත් කළ යුතුයි. එදා කාන්තා පොලිස් නිලධාරිනියකට නීතිය ඉදිරියට යන්න සිදු වුණා, කාන්තා සහකාර පොලිස් අධිකාරි තනතුරෙහි කටයුතු කිරීමට තමාහට අවස්ථාව ලබා ගන්න. ලිංග භේදයෙන් තොරව -තමාගේ ලිංගිකත්වය බාධාවක් කර නොගෙන, තමාගේ ලිංගික දිශානතිය ගැටලුවක් කර නොගෙන- මේ රටේ ඉපදෙන, ජීවත් වන හැම පුරවැසියෙකුටම සමානාත්මතාවෙන් යුතුව කටයුතු කරන්නට අවස්ථාව සලසා දීමේ ප්‍රමුඛ පියවරක් විධියට මම මේ පනත් කෙටුම්පත දකිනවා.

කාන්තා නියෝජනය අපේ රටේ ජනගහනයෙන් සියයට 53ක් වුණත්, රැකියා නියුක්තියේදී අපේ රටේ තිබෙන්නේ සියයට 35ට අඩු කාන්තා නියෝජනයක්. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබූ කාන්තාවන් ඉන්නවා, සියයට 60ටත් එහා ප්‍රමාණයක්. නමුත් රැකියා නියුක්තිය දිහා බැලුවාම අපට ඇති වෙනවා, උසස් අධ්‍යාපනය ලැබූ, බුද්ධිමතුන් බවට පත් වුණු අපේ කාන්තාවන් කොතැනද ඉන්නේ කියන ගැටලුව. මොකද, විවාහ වුණාට පසුව සමහර කාන්තාවන්ට රැකියාවකට යන්න දෙන්නේ නැහැ. එහෙම නැත්නම් රැකියාවකට ගියාට පසුව ඇති වන යම් යම් ගැටලු සහගත තත්ත්වයන් නිසා, උසස්වීම් ලබා ගැනීමේදී ඇති වන ගැටලු සහගත තත්ත්වයන් නිසා සමහර කාන්තාවන් තම රැකියා අත්හැර යනවා. විශේෂයෙන් දරුවන් රැක බලා ගැනීමේදී තිබෙන ගැටලුකාරී තත්ත්වයන් නිසාත් තමන්ගේ රැකියාව දෙවැනි කොට සලකන්න කාන්තාවට සිද්ධ වෙලා තිබෙනවා. මවක් විධියට මේ ජාතියට උතුම්ම කාර්යභාරයක් කරන්නේ කාන්තාවන්. මොකද, අනාගත පරපුර දායාද කිරීමේ වගකීම පැවරිලා තිබෙන්නේ කාන්තාවන්ට. අපේ රටේ ජනගහනය එන්න එන්නම අඩු වෙනවා. මෙවර ජන සංගණනයේදී ජනගහනයේ වර්ධනයක් නොව, ඍණ වර්ධනයකුයි වාර්තා වී තිබුණේ.

තම පවුලේ ආර්ථිකය ශක්තිමත් කර ගන්නට කාන්තාවන් රැකියාවල නියුක්ත වීමත් මේ කාලයේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් වෙලා තිබෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, අද දවසේ මේ ගෙනැවිත් තිබෙන පනත් කෙටුම්පත හරහා විශේෂයෙන්

වතුකරයේ ජීවත් වන කාන්තාවන් ඇතුළුව සියලු කාන්තාවන් සවිබලගැන්වීම අනිවාර්යයෙන් කළ යුතුයි කියා. ආගම් විධියට ගත්තාම, අපි බහු ආගමික සමාජ වටපිටාවකයි ජීවත් වෙන්නේ. විශේෂයෙන්ම විවාහ නීතියේදී අපේ කාන්තාවන්ට සිදු වෙලා තිබෙන යම් යම් ගැටලුසහගත තත්ත්වයන්ට තවමත් පිළිතුරු සොයා ගන්න අපට නොහැකි වුණත් මා විශ්වාස කරනවා, අද දවසේ ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත හරහා හෝ අපේ කාන්තාවන්ට යම් අස්වැසිල්ලක් ලැබේවි කියලා.

අද දවසේ ඉදිරිපත් කළ කාන්තාවන් සවිබලගැන්වීමේ පනත් කෙටුම්පත හරහා කාන්තාවන් පිළිබඳ කොමිෂන් සභාවක් පිහිටුවීමත්, ඊට අදාළ වන කාර්යභාරයන් ඉෂ්ට සිද්ධ කිරීම සඳහා අවශ්‍ය කරන වටපිටාව සකස් කිරීමත් වැදගත්. ඒ වාගේම, අරමුදල් ඇති කිරීම ආදි කාරණා තුළිනුත් අපේ පිහිට අවශ්‍ය වන කාන්තාවන් සවිබලගන්වන්න පුළුවන් වනවා. කාන්තාවක් විධියට තමන්ගේ ඉලක්ක කරා යන ගමනේදී ඇති වන්නා වූ විවිධ බාධාවලින් -විශේෂයෙන් ලිංගික වශයෙන් අතවරයන්ට ලක් වීම, එහෙම නැත්නම් තමන්ගේ ජීවිතයේ එදිනෙදා සිදු වන කටයුතුවලදී අතවරවලට ලක්වීම ආදියෙන්- මිදීම අත්‍යවශ්‍ය වෙනවා. ස්වාධීන වූත්, ශක්තිමත් වූත් කාන්තාවක් විධියට -ගැහැනියක් විධියට- සමාජය ජයග්‍රහණය කිරීම සඳහා යන ගමනට මේ පනත් කෙටුම්පත අත්වැලක් වෙයි කියා මා විශ්වාස කරනවා.

ඒ අත්වැල සපයන්නට හැකියාව, ශක්තිය ලැබීම පිළිබඳවත් සතුටු වෙමින්, මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලුදෙනාගෙන් මා ඉල්ලා සිටිනවා, පක්ෂ භේදයකින් තොරව, විවාදයකින් තොරව, අපි සියලුදෙනා එකතු වෙලා මේ පනත් කෙටුම්පත සම්මත කරලා, මේ රටේ සමස්ත කාන්තාවන් වෙනුවෙන් කටයුතු කරන්නට එකතු වෙමු කියලා. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you. The next speaker is the Hon. (Dr.) (Ms.) Harini Amarasuriya. You have 10 minutes.

[අ.භා. 1.40]

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කර තිබෙන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත කාලෝචිත පනත් කෙටුම්පතක්. එයට අපේ සම්පූර්ණ සහයෝගය පළ කරන්න කැමැතියි.

ඇත්ත වශයෙන්ම කාලයක් තිස්සේ මේ රටේ කාන්තාවන් -ගැහැනුන්- වෙනුවෙන් වැඩ කරපු සංවිධානවල, ක්‍රියාධරයින්ගේ ඉල්ලීමක් වුණු කාන්තාවන් වෙනුවෙන් ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවීම මේ පනත් කෙටුම්පත තුළින් සිදුවීම පිළිබඳව අපි බෙහෙවින් සතුටු වෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ පනත් කෙටුම්පත හුදෙක් ලියවිල්ලකට විතරක් සීමා නොවී පනත් කෙටුම්පතේ අරමුණ ඇත්තටම ඉටු කරවීමට, ඒ අරමුණ ළඟා කරවීමට අවශ්‍ය සියලු පසුබිම නිර්මාණය වෙයි කියලා.

මෙහිදී විශේෂයෙන් කියන්න ඕනෑ මේ පනත් කෙටුම්පත සකස් කිරීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයත්, ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවත් මැදිහත් වූ බව. ඒ වාගේම මේ පනත් කෙටුම්පත ලැබීමත් සමඟම ගිය සතියේ ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් මේ පනත් කෙටුම්පත වඩාත් ශක්තිමත් වන සංශෝධන කිහිපයක් ඉදිරිපත් කළා. අපි බලාපොරොත්තු වෙනවා, ආණ්ඩුව ඒ සංශෝධන ඇතුළත් කරයි කියලා. ඒවා, පනත ක්‍රියාත්මක කිරීමේදී ඉදිරියේදී එන්න පුළුවන් දුර්වලතා මඟ හරින්න ඉදිරිපත් කරපු සංශෝධනයි. විශේෂයෙන්ම ombudsperson කෙනෙකු පත් කරන්න මේ පනත් කෙටුම්පතෙන් යෝජනා කර තිබෙනවා.

ඒ තනතුර ස්වාධීන එකක් විය යුතුයි කියලා අපි තරයේ විශ්වාස කරනවා. එම ඔම්බුඩ්ස්මන්වරයා ජාතික කොමිෂන් සභාවට පිටින් සිටිය යුතු, කොමිෂන් සභාවේ සාමාජිකයකු නොවන අයෙකු විය යුතුයි කියන එක එම කමිටුවෙන් යෝජනා වෙලා තිබෙනවා. ඒ වාගේම, මේ පනත් කෙටුම්පත තුළින් යෝජනා වෙලා තිබෙන සමථකරණය පිළිබඳ ක්‍රියාවලිය නිශ්චිත විය යුතුයි සහ ශක්තිමත් විය යුතුයි කියන එකත් අපි යෝජනා කරලා තිබෙනවා. ඒ සංශෝධන මේ පනත් කෙටුම්පතට එකතු වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

අපේ රටේ පනත් කෙටුම්පත් සහ ප්‍රතිපත්ති අනුමත කිරීමට වඩා අප ගැටලුවලට, අභියෝගවලට මුහුණ දෙන්නේ ඒවා ක්‍රියාත්මක කරන්න ගියාම බව අපි සියලුදෙනා දන්නවා. ඒ නිසා සම්මත කිරීමෙන් පසු පනත ක්‍රියාත්මක කිරීමේදී ආණ්ඩුව විශේෂ අවධානයක් දිය යුතුයි. මේ වාගේ ප්‍රගතිශීලී පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන මේ ආණ්ඩුවම තමයි එයට වගකිව යුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් සියයට 50ක් කප්පාදු කරන්නේ. නමුත් අපි බලාපොරොත්තු වෙනවා, සම්මත කිරීමට නියමිත මේ පනත් කෙටුම්පත ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ආයතනික පසුබිම සහ මුදල් පසුබිම නිසි අයුරින් නිර්මාණය වෙයි කියලා.

මේ කියන ජාතික කොමිසම සාර්ථක වෙන්න නම්, මේ පනත් කෙටුම්පතේ අරමුණු හරියාකාරව ඉෂ්ට වෙන්න නම් මුදල්, මානව සම්පත් සහ ඒ තාක්ෂණ සහාය අනිවාර්යයෙන් ලැබිය යුතුයි. එහෙම නොවුණොත් අපේ රටේ තිබෙන වෙනත් ප්‍රගතිශීලී පනත්, ප්‍රතිපත්ති වාගේ මේ පනත් කෙටුම්පතත් බිම් මට්ටමේ ගැහැනුන්ට කිසිම ඵලදායීතාවක් ඇති නොවන පනත් කෙටුම්පතක් බවට පරිවර්තනය වේවි. එසේ නොවිය යුතුයි කියන එක අපි අවධාරණය කරනවා.

අපි මේ මොහොතේ වග බලා ගත යුතු කාරණයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය හැටියටත්, ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව හැටියටත් අප යෝජනා කර තිබෙන්නේ, එකින් එකට විවිධ පනත් කෙටුම්පත් ගෙනෙනවාට වඩා විශේෂයෙන් අපත් එකඟ වෙලා තිබෙන ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූල වන විධියට අවශ්‍ය ව්‍යවස්ථාපිත සංශෝධනත් අපේ නීති පද්ධතිය තුළ කිරීම යෝග්‍ය වන බවයි. විශේෂයෙන්ම CEDAW සහ CRC ආදි කාන්තාවන් හා ළමයින්ගේ අයිතිවාසිකම් තහවුරු වන ජාත්‍යන්තර ප්‍රඥප්තිවලට අපේ රට අත්සන් කරලායි තිබෙන්නේ. නමුත් ඒවා අපේ නීතිවල ඒ විධියට ප්‍රකාශයට පත් වෙලා නැහැ. ඒ නිසා අපේ සමස්ත නීති පද්ධතිය තුළ ඒ හිඩැස් හරියට හඳුනාගෙන අප ඒවා ආමන්ත්‍රණය කළ යුතුයි. විශේෂයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තිබෙන සමහර කොටස් සහ මේ පනත් අතර යම්කිසි පරස්පරභාවයක් මතු නොවන ලෙස කටයුතු කිරීමට අපි වග බලා ගත යුතුයි. එහෙම නැත්නම් ඒවා ක්‍රියාත්මක කිරීමේදී ඇත්තටම විවිධ ප්‍රශ්න මතු වෙන්න පුළුවන්. ඒ නිසා අපි යෝජනා කරලා තිබෙනවා, CEDAW එකට අනුකූලව අපේ පනත් සංශෝධනය විය යුතුයි -වෙනස්විය යුතුයි- කියා; ඒවා යම්කිසි අධ්‍යයනයක් කරලා ඉදිරිපත් කළ යුතුයි කියලා. ඒවා CEDAW එකට අනුකූල වන විධියට වෙනස් කළ යුතුයි කියන යෝජනාව අපි ඉදිරිපත් කරලා තිබෙනවා. අපි

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය]

බලාපොරොත්තු වෙනවා, රජය ඒ පිළිබඳවත් ඔවුන්ගේ අවධානය යොමු කරයි කියලා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ වාගේම අපි හිතනවා, පනත් ක්‍රියාත්මක කිරීමේදී පරස්පරභාවයක් නොතිබිය යුතුයි කියලා.

රජය ගන්නා වෙනත් ප්‍රතිපත්ති තීරණ හා වෙනත් පනත් කෙටුම්පත් සම්මත කිරීම හරහා මේ පනත් කෙටුම්පත සම්මත කිරීමෙන් බලාපොරොත්තු වන ප්‍රගතිශීලි ප්‍රතිසංස්කරණ කර ගන්න අපට සමහර වෙලාවට බැරි වෙන්න පුළුවන්. අපි උදාහරණයක් ගනිමු. මේ මොහොතේ මේ රටේ ගැහැනුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු, අර්බුද මතු වෙන්නේ ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්ති නිසා.

රජයේ ආර්ථික ප්‍රතිපත්ති හරහා පැටවෙන බර, ඇති වන පීඩනය, ඉතාම බරපතළ ලෙස කාන්තාවන්ට බලපානවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මෙවැනි ප්‍රගතිශීලි පනත් කෙටුම්පත් අනුමත කරගෙන, කාන්තාවන්ට ඉතාම අහිතකර වන වෙනත් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමෙන් ආණ්ඩුව වැළකී සිටින්න ඕනෑ කියලා. ඇත්තෙන්ම ඒවා හරි අරමුණකින් මිස, නැවත වතාවක් අපේ රටේ කාන්තාවන් රවටන, ජාත්‍යන්තරය මුළා කරවන performative විය යුතු නැහැ. විශේෂයෙන් අපි හිතනවා මේ වෙලාවේ ආර්ථික ප්‍රතිපත්ති ගැනීමේදී අවධානයට යොමු විය යුතු කරුණු දෙකක් තිබෙනවා කියලා. එකක් තමයි, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වැටුප් පරතරය. ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව මත පදනම් වෙලා ඇති වෙච්ච වැටුප් පරතරය පිළිබඳව අවධානය යොමු විය යුතුයි. විශේෂයෙන්ම ශ්‍රම බලකාය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය ගැන කථා කරන මොහොතක සුරැකුම් වැඩ - කාන්තාවන් මත පැටවිලා තිබෙන සුරැකුම් වැඩ - පිළිබඳවත් අවධානය යොමු විය යුතුයි. මෙය කාන්තාවන් ශ්‍රම බලකායට සහභාගී වීමට ඍජුවම බලපාන දෙයක්.

අදත් මට වාර්තා වුණා transfers පිළිබඳව. පොලිස් නිලධාරිනියන් transfer යනකොට මේවා ඔවුන්ට බලපාන දේවල්. එතකොට ඔවුන්ට ශ්‍රම බලකායට ඵලදායී විධියට සහභාගි වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ සුරැකුම් වැඩ පිළිබඳව අපි කොහොමද මැදිහත් වෙන්නේ? සුරැකුම් වැඩ කාන්තාවන්ගේ තනි වගකීමක් නොවන නිසා මෙම පනත් කෙටුම්පතේ අරමුණ වන, "සමාජභාත්මතාව" ඇති කිරීමේ වුවමනාවක් ඇත්නටම අපට තිබෙනවා නම් ඒකට යම් කිසි සමාජ වගකීමක් දැරීම අනිශයින්ම වැදගත්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
I am winding up, Sir.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නැවත වතාවක් මම කියන්නේ මෙයයි. අපි මෙම පනත් කෙටුම්පත අනුමත කරනවා. විශේෂයෙන්ම කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව පිහිටුවීම කියන කාරණය අපි අනුමත කරනවා. හැබැයි, මෙහි එන්න තිබෙන පරස්පරතාවලටත් අවධානය යොමු කරන්න. මේක ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව වගවිය යුතුයි කියන කාරණයත් මම අවධාරණය කරනවා. කාලය ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Piyal Nishantha De Silva. You have 20 minutes.

[අ.භා. 1.50]

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා (ධීවර රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பியல் நிஷாந்த த சில்வா - கடற்றொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyal Nishantha De Silva - State Minister of Fisheries)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රමාද වෙලා හෝ මෙවැනි කාලෝචිත පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙන ඒම පිළිබඳවත්, එය විවාදයට ගැනීම පිළිබඳවත් මම මුලින්ම ස්තුතිවන්ත වනවා. ඒ වාගේම අපේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදයට මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා, මෙවැනි පනත් කෙටුම්පතක් ගෙන ඒමට කටයුතු කිරීම ගැන. මෙම පනත් කෙටුම්පතට ගරු රාජ්‍ය ඇමතිතුමියගේ සහයෝගය ලැබීම පිළිබඳවත් මම ඉතාම සතුටු වනවා. මා සතුටු වන්නේ, මම මීට පෙර තිබුණු ආණ්ඩුව තුළ කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යවරයා හැටියට කටයුතු කළ නිසායි. විශේෂයෙන්ම ඒ කෙටි කාලය තුළ කාන්තා හා ළමා විෂය පථය පිළිබඳව දීප ව්‍යාප්තව ඉතා සුවිශේෂ කාර්යභාරයක් එම අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමිය ඇතුළු නිලධාරින් සහ විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල හිටපු අපේ ඒ සියලු නිලධාරින්ගේ සහයෝගයෙන් ඉටු කරන්න ලැබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම තුළින් ඉටු කර ගන්න බලාපොරොත්තු වන්නේ බොහෝම හොඳ අරමුණු ටිකක්.

කාන්තාවන් සවිබලගැන්වීම උදෙසා විධිවිධාන සැකසීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව හා කාන්තා සවිබලගැන්වීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, කාන්තාවන් සම්බන්ධව ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම, කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම තුළ කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනයට එරෙහිව නඩු පැවරීම, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් නතර කිරීම වැනි කාරණා මුල් කරගෙන තමයි මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙන්නේ. ඒකයි මෙහි තිබෙන වටිනාකම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මම අමාත්‍යාංශය කරන කාලයේ අපේ රටේ කාන්තාවන් වෙනුවෙන් ආරම්භ කරපු ඒ වැඩසටහන් ටික නීතියක් තුළින් මේ මහ පොළොවේ යථාර්ථයක් කරන්නට පුළුවන් වීම ගැන මම විශේෂයෙන් සතුටු වෙනවා. මම හිතනවා මේ පාර්ලිමේන්තුවේ සිටින අපේ සහෝදර මන්ත්‍රීවරු 225දෙනාම මේ ගැන දන්නවා කියලා. මොකද, අපේ අමාත්‍යාංශයෙන් කරපු විෂය පථ පිළිබඳව විවිධ ක්‍රමවේද භාවිත කරමින් මේ මන්ත්‍රීවරු දැනුවත් කිරීමට මම කටයුතු කළා.

"රටකි, දැයකි, ලොවකි ඇය" වැඩසටහන 2021දී අපි ආරම්භ කළා, ලෝක කාන්තා දින වැඩසටහනත් එක්ක. හැබැයි, අපි කාන්තාවන්, දරුවන් පිළිබඳව කථා කරනවා නම් එක දිනයකට සීමා නොවී වසරේ දවස් 365ම ඇය ගැන කථා කරන්න ඕනෑ. ඒ නිසා ලෝක කාන්තා දිනයට පමණක් සීමා නොවී මෙවැනි වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන්නට අපට හැකියාව

ලැබුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යහපත් දෙමවුපියභාවය වෙනුවෙන් අම්මා පිළිබඳව, අම්මාගේ ගුණය පිළිබඳව කථා කරන්න "අම්මාවරුනේ" සංකල්පය අපි නිර්මාණය කළා. ඒ වාගේම අපි "දියණිය" වැඩසටහන ක්‍රියාත්මක කළා. මම කථා කරන්න ටික මොහොතකට කලින් අපේ විපක්ෂ නායකතුමා දැරියන්ගේ සනීපාරක්ෂාව පිළිබඳව කථා කළා. මම හිතන විධියට එතුමා එතුමාගේ යහ පාලන සමය තුළ තමයි ඒ පිළිබඳව කථා කළේ. ඒ පිළිබඳ කථා කරලා එතුමාට නමකුත් වැටුණා. හැබැයි, වැඩේ නම් ක්‍රියාත්මක වුණේ නැහැ. කථා කරපු දේ ක්‍රියාත්මක කරන්නට එතුමාට හැකියාව ලැබුණේ නැහැ. හැබැයි, පියල් නිශාන්ත ඒ අමාත්‍යාංශයේ සිටින සියලු නිලධාරීන් එක්ක එකතු වෙලා පෞද්ගලික ආයතනයකුත් සම්බන්ධ කරගෙන "දියණිය" වැඩසටහන හරහා ගැහැනු දරුවන්ගේ සනීපාරක්ෂක අවශ්‍යතා පිළිබඳව පාසල් මට්ටමින් ඉතාම හොඳ වැඩ පිළිවෙළක් ආරම්භ කළා. අපි පාසල් 672ක මේ වැඩසටහන ක්‍රියාත්මක කරලා දැරියන්ට නොමිලේ සනීපාරක්ෂක තුවා ලබා දෙන්න කටයුතු කළා. අපේ වර්තමාන රාජ්‍ය ඇමතිතුමියත් මේ වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ පිළිබඳව එතුමියට මම ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම "දිරිය ජනනී" වැඩසටහන තුළින්, සාර්ථකභාවයට පත්වූ ආබාධිත කාන්තාවන් පිළිබඳව අපි වැඩි අවධානයක් යොමු කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඊළඟට ව්‍යවසායක කාන්තාවන් පිළිබඳව අපි වැඩි අවධානයක් යොමු කළා. ඒ අය පිළිබඳ අපි වැඩිම අවධානයක් යොමු කළ යුතු නිසා "ව්‍යවසායක ඇගැයීම" වැඩසටහන යටතේ අපි ඒ කටයුත්ත කළා.

අපි හැම දාම කාන්තාවන් පිළිබඳව කථා කරනවා. ඇය වෙනුවෙන් කිඹුල් කඳුළු හෙළනවා. හැබැයි, ක්‍රියාත්මක කරන මේ වැඩසටහන් මහ පොළොවේ යථාර්ථයක් බවට පත් වෙනවාද කියලා බලන්නේ නැහැ. ඒ නිසා පිරිමින් හැටියට අපට ලොකු වගකීමක් තිබෙනවා, මේ කාන්තාවන් ආරක්ෂා කර ගන්න. අපි කාන්තාවන් පිළිබඳව කථා කරනවා විතරක් නොවෙයි, ක්‍රියාත්මක වීම තුළ ඇය ශක්තිමත් දිරිය කතක් බවට පත් කරන්නේ කෙසේද කියන එක පිළිබඳවත් සලකා බැලිය යුතුයි. ඒ නිසා අපි ආරම්භ කළා, "අතිශයින්ම පිරිමින්ට පමණයි" වැඩසටහන. මෙය පිරිමින් තුළින් සිදුවන අඩුපාඩුකම් මොනවාද, ඒ අඩුපාඩුකම් හදාගන්නේ කොහොමද කියලා පිරිමි විතරක් කථා කරන බොහොම සෞන්දර්යාත්මක වැඩසටහනක්. අපි මේ වැඩසටහන ආරම්භ කරලා රට පුරා ක්‍රියාත්මක කරන්න කටයුතු කළා.

ඊළඟ එක තමයි, "පළමු පාසල මව් කුසයි" කියන වැඩසටහන. මේ විධියට අපි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළා. ඒ වාගේම මම මේ කාරණය පිළිබඳව සතුටු වෙනවා, හිටපු පෙර පාසල් රාජ්‍ය අමාත්‍යවරයා හැටියට. පෙර පාසල්වල 40,000කට ආසන්න ලියාපදිංචි ගුරුවරු ප්‍රමාණයක් ඉන්නවා. ඒ, කාන්තාවන්. ඒ කාන්තාවන් වෙනුවෙන් "ගුරු අභිමානී" වැඩසටහන යටතේ එම රුපියල් 250 දීමනාව රුපියල් 2,500 දක්වා වැඩි කළා. වර්තමාන ජනාධිපතිතුමාත් එක්ක අපි දැන් සාකච්ඡා කරලා මෙය රුපියල් 5,000 දක්වා වැඩි කරන්නට අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා.

ඒ වාගේම පෞද්ගලික මට්ටමෙන් මම සම්බන්ධ වෙලා පෙර පාසල් ගුරුවරුන්ට බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාල 4ක ගුරු පුහුණු පාඨමාලා ලබා දුන්නා. සෞභාග්‍යයේ පෙර පාසල් ඇති කළා; සංවර්ධනය කළා. ලංකාව පුරාම පෙර පාසල්වලට දෙන්න පුළුවන් උපරිම ශක්තිය ලබා දීලා ඒ පෙර පාසල් සංවර්ධනය කළා. අපි මේ කටයුතු ක්‍රියාත්මක කළා වාගේම කාන්තාවන්ට හිරිහැර, හිංසනයන් සිද්ධ වෙනවා නම්, ඒවා ක්ෂණිකව දැනුම් දීම සඳහා "1938" ක්ෂණික ඇමතුම් දුරකථන සේවා වැඩ පිළිවෙළ ඇති කළා. ඒ වාගේම අපේ දැරියන් වෙනුවෙන් සාක්ෂි පටිගත කිරීමේ, වීඩියෝ කිරීමේ මධ්‍යස්ථාන දෙකක් ආරම්භ කරන්නට අපට හැකියාව ලැබුණා. මේ සියලු දේවල් පිළිබඳව සමහර අය අවුරුදු ගණනාවක් තිස්සේ කථා කරනවා. නමුත් කථාව විතරයි. මෑත කාලයේ "කයියනායක" කියලා අමුතු වචනයක් ඇවිල්ලා තිබෙනවා. විපක්ෂ නායකතුමා ඇතුළු මේ ගොඩක් අය නිකම් කථාවට පමණක් සීමා වෙච්ච අය බවට පත් වෙලා තිබෙනවා. කාන්තාවන් පිළිබඳව කිඹුල් කඳුළු හෙළන අය ප්‍රායෝගික මට්ටමින්ම මේ වැඩසටහන්වලට සම්බන්ධ විය යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ කාන්තාවන් සම්බන්ධයෙන් කථා කරනකොට අවිවාදයෙන් තොරව අප සෑම දෙනාම පිළිගන්නා කාරණය තමයි, අපේ සංස්කෘතිය තුළ ගෘහ මූලිකයා පියා වුවත්, අපට තිබෙන්නේ පීතෘ මූලික සමාජයක් වුවත්, කාන්තාවන් තුළ ඇති විස්මිත හැකියාවන් තුළ තමයි අපි කවුරුත් රැකිලා ඉන්නේ කියන කාරණය. සමහර වෙලාවට ගැහැනු පිළිබඳව; කාන්තාවන් පිළිබඳව එක එක කථා කියනවා. "ගැහැනු ගැවුණු තැන නිවනක් නැහැ" කියලා සමාජයේ සමහර අය කියනවා. හැබැයි, කාන්තාව නැතුව ලෝකයක් නැහැ. විශේෂයෙන්ම මෙවැනි පනතක් තුළින් හෝ ඒ පිළිබඳව අපි වැඩි අවධානය යොමු කිරීම ඉතාම කාලෝචිත වැඩක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දෙකෝටි විසි ලක්ෂයකට ආසන්න ජනතාවක් ජීවත් වෙන මේ රටේ සියයට 52ක් ඉන්නේ කාන්තාවන්. කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳව කථා කරනකොට, ඇය සවිබලගැන්වීමේ කටයුතු අපි ඉතාම හොඳින් තේරුම් ගෙන ක්‍රියාත්මක කළ යුතුයි. පවුල තුළ, සමාජය තුළ, රැකියා ස්ථාන තුළ, විශේෂයෙන්ම දේශපාලන වශයෙන් මෙන්ම ආර්ථික, සමාජීය වශයෙන් කාන්තාවන් සවිබලගැන්විය යුතු බවයි මගේ විශ්වාසය. ඒ විතරක් නොවෙයි. සෑම අංශයක් තුළම කාන්තාවන් සඳහා සැලකිය යුතු අවස්ථා නිර්මාණය කළ යුතු බැවින් මේ පනත තුළ එවැනි අවස්ථා ඇති කරන්න උත්සාහ කිරීම සම්බන්ධයෙන් මා සතුටු වෙනවා. රාත්‍රී සේවය තුළ කාන්තාවන් මුහුණ දෙන ගැටලු වාගේම පොදු ප්‍රවාහන සේවා තුළදී පවා කාන්තාවන් දැඩි ලෙස හිංසනයට, අපයෝජනයට හා ගැටලු රාශියකට මුහුණ දෙන බව සමාජ මාධ්‍ය හරහා නිතර නිතර වාර්තා වෙනවා. ඒ විතරක් නොවෙයි. කාන්තාවන් හා ගැහැනු දරුවන් බිය වැද්දවීම් මෙන්ම ඔවුන්ගේ අසභ්‍ය දර්ශන භුවමාරු කිරීම් නිසා බොහෝ කාන්තාවන්, තරුණ දරුවන් සියදිවි නසා ගැනීම්වලට පෙළඹිලා තිබෙනවා. ඒ නිසා අපි අනිවාර්යයෙන්ම මේ තත්ත්වය නැති කිරීම උදෙසා නීති සම්පාදනය කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ කාන්තාවන් බොහොමයක් වෙළා ගත් විශාල ගැටලුවක් තිබෙනවා. ඒ තමයි, දෛනිකව මුදල් එකතු කිරීම මත පදනම්ව ණය දීමේ වැඩ පිළිවෙළ. මේක සති වාරික වශයෙනුත් ක්‍රියාත්මක වෙන වැඩ පිළිවෙළක්. ඒ නිසා අපි මේ පිළිබඳවත් වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. මොකද, මේ තත්ත්වය උඩ කාන්තාව ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපේ රටේ ආර්ථිකයට වැඩි දායකත්වයක් ලැබෙන්නේ කාන්තාවන්ගෙන්. වතු කම්කරු, විදෙස්ගත ශ්‍රමිකයන්, ගෘහ සේවය, ඇඟලුම් වැනි අංශ තුළ කාන්තාවන් සවිබලගැන්වීම විශේෂයෙන්ම අප කළ යුතුයි. ස්වාභාවික ව්‍යසන, වසංගත වැනි තත්ත්වයන්ගෙන් හා යුද්ධ කාලයේ දීත් වැඩිම පීඩාව සිද්ධ වුණේ කාන්තාවන්ට. යුද්ධය හේතුවෙන් තම ස්වාමියා මිය ගොස් කාන්තාවන් බොහෝ දෙනෙක් වැන්දඹු තත්ත්වයට පත්වීම නවතා දුන් අපේ පස්වන විධායක ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට අපි විශේෂයෙන් ස්තුතිවන්ත විය යුතුයි. එවැනි තත්ත්වයකට පත් වූ කාන්තාව ගොඩ නැඟීමටත්, ඇය ආරක්ෂා කිරීමටත් එදා කටයුතු කළා.

[ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ දියත් කරන වෑයම සාර්ථක වෙන්න නම්, ක්‍රියාත්මක කරන හැම වැඩසටහනක්ම ලංකාවේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ක්‍රියාත්මක කරන්න ඕනෑ. එය තමයි ඉතා වැදගත් වෙන්නේ. එක දිනයකට පමණක් සීමා නොවී, එක ස්ථානයකට පමණක් සීමා නොවී, දීප ව්‍යාප්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් බිමට බැහැලා ක්‍රියාත්මක කළ යුතු වැඩ පිළිවෙළක් අපි කාන්තාවන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන්නට ඕනෑ.

සමාජ සංස්ථාව තුළ කුඩාම ඒකකය වෙන්නේ පවුලයි කියන එක අපි දන්නවා. පවුල - කුටුම්බය - තුළ කාන්තාවන් සවිබලගැන්වීම උදෙසා රජයක් ලෙස අපි ප්‍රතිපත්ති පමණක් නිර්මාණය කරලා මදි. ඒ අරමුණ උදෙසා වැඩසටහන් නිර්මාණය කළ යුතු වෙනවා. දකුණු කොරියාව ආර්ථික අතින් වැටුණු වෙලාවේ, පාර්ක් ජනාධිපතිතුමියගේ සමයේ ඒ රටේ කාන්තාවන් තමන්ගේ කොණ්ඩය කපලා wigs හදලා තමයි රටේ ආර්ථිකය නැවත ගොඩ ගත්තේ. ඒ නිසා අපිත් අපේ රටේ කාන්තාවන්ගේ හැකියාව, ශක්තිය උපරිමයෙන් ප්‍රයෝජනයට ගත හැකි නව ආර්ථික ප්‍රතිපත්තියක් ඇති කරන්නට ඕනෑ. අපේ රටේත් කාන්තාවන් සම්බන්ධ කර ගත්ත ආර්ථිකයක් ඇති කිරීම වඩා සුදුසු බවයි මගේ හැඟීම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයේ මානව අයිතිවාසිකම් පිළිබඳව සඳහන් වෙලා තිබෙනවා. එහි 11වන ව්‍යවස්ථාව අනුව කිසිවෙකුත් වද හිංසනයට ලක් නොවිය යුතු බවත්, 12වන ව්‍යවස්ථාව අනුව හැමෝටම සමානාත්මතාවෙන් සැලකිය යුතු බවත් සඳහන් වුවද, කාන්තාවන් සම්බන්ධයෙන් වන ප්‍රායෝගික තත්ත්වය ගැන සතුටු වෙන්න පුළුවන්ද කියන ගැටලුව අප තුළ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාන්තා හිංසනය, අපයෝජනය, කුඩා දැරියන් ගැබ් ගැනීම පිළිබඳව අපි එදා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයෙන් විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරගෙන ගියා. දශක කිහිපයක් තිස්සේ අපේ කාන්තාවන්ට අත්වෙලා තිබෙන ඉරණම අපට එයින් පැහැදිලි වුණා. මම හිතන විධියට අපේ කාන්තාවන් වර්තමානය තුළත් දැඩි පීඩනයකට ලක් වෙලා සිටිනවා. දශක ගණනාවක් තිස්සේ කාන්තා හිංසනය, අපයෝජනය, කුඩා දැරියන් ගැබ් ගැනීම පිළිබඳව අපි දිගින් දිගටම පාර්ලිමේන්තුවේ කථා කළාට, කථා කරන ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න නම් අපි ඒකාබද්ධව යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි. එතැනදී ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේද, එහෙම නැත්නම් කාන්තාද, පිරිමිද කියන එක නොවෙයි වඩා වැදගත් වෙන්නේ. අප සියලුදෙනා එකට එකතු වෙලා, දේශපාලන මත පැත්තකට දමලා දරුවන් සහ කාන්තාවන් වෙනුවෙන් පෙනී සිටීමයි වැදගත් වන්නේ. එහෙම වුණොත් අපට සුන්දර රටක් නිර්මාණය කර ගන්න පුළුවන්. එහෙම නැතුව මේ ගෙනෙන පනත් කෙටුම්පත්, මේ අණ පනත් පාර්ලිමේන්තුවේ සම්මත කර ගත්තාට වැඩක් නැහැ, ඒවා ක්‍රියාත්මක කිරීමේදී අපි දෙගොල්ලන් දෙපැත්තට වෙලා එය කඹ අදින තරගයක් බවට පත් කරගෙන ඉන්නවා නම්. ඒ නිසා දිගින් දිගටම කථා කරනවාට වඩා අපි ක්‍රියාත්මක වෙන වැඩ පිළිවෙළ ආරම්භ කරමු.

වර්තමානයේ මම නියෝජනය කරන්නේ ධීවර අමාත්‍යාංශය. මේ අමාත්‍යාංශය තුළ කටයුතු කිරීමේදීත් කාන්තාවන් හා ළමයින් පිළිබඳව මම වැඩිම වගකීම දරාගෙන ඉන්නවා; අවධානය යොමු කරගෙන ඉන්නවා. මොන අමාත්‍යාංශයක හිටියත් අපි අපේ යුතුකම සහ වගකීම ඉටු කරන්නට ඕනෑ. ඒ වාගේම කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය ඇමතිතුමියට විතරක් මේ වගකීම පවරලා අපට පැත්තකට වෙලා ඉන්න බැහැ. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයට මේ වගකීම පවරලා පැත්තකට වෙලා ඉන්න බැහැ. කාන්තාවන් සහ දරුවන් ආරක්ෂා කරන්න අප සියලුදෙනාට වගකීමක් තිබෙනවා. ඒ වගකීම ඉටු කරන්නට මේ සභාව තුළ අප සියලුදෙනා කැප වෙන බව අපි ජනගත කරන්න ඕනෑ.

විශේෂයෙන්ම වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා කාන්තාවන් සම්බන්ධව විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන්නට අවධානය යොමු කරලා, ඒ දැනුවත් කරන වැඩසටහන් ආරම්භ කරන්න කියලා අපට උපදෙස් ලබා දීලා තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාව තමයි හොඳම අවස්ථාව. මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනාවා විතරක් නොවෙයි, මේ පනත් කෙටුම්පතේ ඇතුළත් වෙලා තිබෙන දේවල් ක්‍රියාත්මක කරන්නටත් අපි කැප වෙමු කියන පණිවුඩයත් මේ අවස්ථාවේ දී ලබා දෙමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Dullas Alahapperuma. You have four minutes.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
Sir, I had six minutes.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Because of the delay in the morning, time has been reduced and you have four minutes now.

[අ.භා. 2.07]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
Okay, Sir.

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපේ සමාජය තුළ කාන්තාව අසරණවීම කියන කාරණය පිළිබඳ තර්කයක් නැහැ. හැබැයි ආබාධ සහිත කාන්තාවක් පළමුව අසරණ වෙනවා, කාන්තාවක් වීම නිසා. ඒ වාගේම ඇය දෙවනුවත් අසරණ වෙනවා, ආබාධ සහිත වීම නිසා. ඒ කියන්නේ, ආබාධ සහිත කාන්තාවක් ශ්‍රී ලාංකීය සමාජය තුළ දෙවතාවක් අසරණ වෙනවා.

මේ සභාවේ කථා කරන්න තව කථිකයන් රාශියක් ඉන්නවා. එතුමන්ලා මේ පනත් කෙටුම්පත පිළිබඳව සහ එම අයිතිවාසිකම් ගැන කථා කරාවි. මම මේ කෙටි කාලය මිඩංගු කරන්න බලාපොරොත්තු වෙන්නේ මෙම පනත් කෙටුම්පතේ තිබෙන තාක්ෂණික කාරණා 3ක් පිළිබඳවත්, ආබාධ සහිත කාන්තාවන්ට සාධාරණයක් ඉෂ්ට කරන්නේ කොහොමද කියන කාරණාවත් පිළිබඳව විතරයි.

ඊට ප්‍රථම මා මෙය අවස්ථාවක් කර ගන්නවා, විෂය භාර අමාත්‍යවරයා වන ගරු ජනාධිපතිතුමාට මේ වෙනුවෙන් ස්තුති කරන්න. අපි කිසිදු චකිතයක් නැතිව අපේ සහයෝගය, එකඟතාව සහ ආශීර්වාදය මේ වෙනුවෙන් පිළිගන්වනවා. විෂය භාර ඇමතිවරයා වන ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාටත්, රාජ්‍ය අමාත්‍ය ගීතා කුමාරසිංහ මැතිනියටත්, මේ වෙනුවෙන් විශාල කැපකිරීමක්, උනන්දුවක්, අභ්‍යාසයක් කළ අපේ ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය ප්‍රමුඛ මන්ත්‍රීවරියන්ගේ සංසදයටත්, අපේ ගරු තලතා අතුකෝරල මැතිනියගේ සභාපතිත්වයෙන් යුතු ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවටත් අපි නිර්ලෝභීව අපේ ගරුත්වය සහ කෘතවේදීත්වය පුද කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මම ඔබතුමාට කිව්වා, තාක්ෂණික කාරණා තුනක් පෙන්වා දෙන්න තිබෙනවා කියලා. මම හිතනවා, ඔබතුමා බොහොම කෘතවේදීව ඒ වෙනුවෙන් මට වැඩිපුර විනාඩියක්වත් ලබා දේවි කියලා. ඒ තාක්ෂණික කාරණා තුන මොනවාද? මේ පනත් කෙටුම්පතේ යටතේ හැදෙන කොමිෂන් සභාවේ සංයුතියට අදාළව 9වන වගන්තියේ ඉතා පැහැදිලිව සඳහන්ව තිබෙනවා, කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට නුසුදුසුකම් මොනවාද කියලා. ඒ අනුව කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට නුසුදුසුකම් 7ක් සඳහන්ව තිබෙනවා. එහි එක් නුසුදුසුකමක් ලෙස සඳහන් වෙනවා, අධිකරණයක් විසින් වස්තු භංගත්වයට පත්වූවකු බවට විනිශ්චය කරනු ලැබ ඇත්නම් හෝ විනිශ්චය කළහොත් කියන කාරණය. තවත් නුසුදුසුකමක් ලෙස සඳහන් වෙනවා, මනසේ හෝ ශරීරයේ අසනීපයක් හෝ වෙනත් අශක්තතාවක් හේතුවෙන් ධුරය දිගටම කරගෙන යෑමට නොහැකි වීම කියන කාරණය. තවත් නුසුදුසුකමක් ලෙස සඳහන් වෙනවා, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ සිර දඬුවමක් විඳ ඇත්නම් කියන කාරණය. මම මේ හරහා කැබිනට් මණ්ඩලයටත්, ගරු ජනාධිපතිතුමාටත් යම් යෝජනාවක් කරනවා. ශරීරයේ අසනීපයක්, සිහිවිකල්වීමක් කියලාත් මෙතැන නුසුදුසුකමක් සඳහන් වෙනවා. පාර්ලිමේන්තුවේ මහ ලේකම් අපේ කුෂානි රෝහණදීර මැතිනිය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදයේ ලේකම්තුමිය විධියට කටයුතු කරනවා. ඒ නුසුදුසුකම් යටතේ සිහිවිකල්වීම නම් කරලා තිබෙනවා නම්, වස්තු භංගත්වයට පත්වූවකු නම් කරලා තිබෙනවා නම්, කාන්තාවන් සවිබලගැන්වීම සඳහා ක්‍රියාත්මක කරන්න යන මේ පනත් කෙටුම්පතේ වගන්තියක් විධියට ඇතුළත් විය යුතුයි, ස්ත්‍රී අපචාර චෝදනාවකට ලක් වූ අයෙකු කියන කාරණයත්. ඒ කාරණයත් ඇතුළත් කරන්නට ඕනෑය කියලා මම සද්භාවයෙන් කාන්තාවන්ට ගරුත්වයක් විධියට යෝජනා කරනවා. ඒක පළමුවැනි තාක්ෂණික කාරණාව.

දෙවැනි කාරණය මෙයයි. මෙහි 10වැනි වගන්තියේ තිබෙනවා, සාමාජිකයකුගේ ධුරය හිස්වීමට බලපාන හේතු මොනවාද කියලා. ඒ අනුව සඳහන් වෙනවා, එකී සාමාජිකයා මියයෑම මත, එකී සාමාජිකයා ජනාධිපතිවරයා අමතා යවන ලද ලිපියක් මඟින් ඉල්ලා අස්වීම මත කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have been given two minutes extra from the time allotted to the Hon. Piyal Nishantha De Silva.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
Thank you very much, Sir.

මෙතැනදී මම ඉල්ලීමක් කරනවා, සාමාජිකයන් ඉවත් කිරීම හෝ ඉල්ලා අස්වීම කියන එකට, කාන්තා අපයෝජන පිළිබඳ චෝදනාවක් එල්ල වූ විට, ඔහු අදාළ චෝදනාවෙන් නිදොස්කොට නිදහස් වනතෙක් තාවකාලිකව මේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත් කළ යුතුයි කියන කාරණය ඇතුළත් කරන්න කියලා. ඒක මම කරන යෝජනාවක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ දෙවතාවක් අසරණභාවයට පත්වන ආබාධ සහිත කාන්තාවන් ගැන විතරයි මෙතැනදී කථා කරන්නේ කියලා මම කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ අවසාන වශයෙන් ජන සංගණනයක් වුණේ 2012දී. ඒ සංගණනය ප්‍රකාරව මේ රටේ ජනගහනයෙන් සියයට 8.7ක් ආබාධිත බව තහවුරු වුණා. ගරු සභාවේ සිටින මා මිත්‍ර ගරු රමේෂ් පතිරණ සෞඛ්‍ය ඇමතිතුමාත් ඒ බව දන්නවා. 2012දී ආබාධිත ප්‍රජාව 1,662,000ක්. ඒ කියන්නේ, සියයට 8.7ක්. ඒ සංගණනයට වයස අවුරුදු 5ට අඩු දරුවන් භාජන කළේ නැහැ. පියල් නිශාන්ත රාජ්‍ය ඇමතිතුමා ඒක දන්නවා. කනගාටුවට කාරණය, මේ 1,662,000න් සියයට 57ක්ම කාන්තාවන් වීමයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මට මතක විධියට, ආබාධිත ප්‍රජාවගෙන් සියයට 74ක් 2012දී කිසිදු ආර්ථික කටයුත්තකට සම්බන්ධ වුණේ නැහැ. මෙයින් අතිබහුතරය කාන්තාවන්. ඒ පිරිස අතරින් පාසල් යන වයසේ දරුවන්ගෙන් සියයට 34ක් ප්‍රාථමික අධ්‍යාපනයවත් ලබා ගෙන නැහැ. සියයට 34ක්! හිතන්න, මේ ඉන්න බහුතරය කාන්තාවන්. ඒක කොයි තරම් අවාසනාවන්ත තත්ත්වයක්ද? ඒ නිසාම මට මේක කියන්න ඉඩ දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. විනාඩි දෙකකින් මම කථාව අවසන් කරනවා. මම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් අවශ්‍ය වෙලාව ඉල්ලා දෙන්නම්.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 6වන වගන්තියෙහි ආබාධ සහිත කාන්තාවන් පිළිබඳව සඳහන් වෙනවා. ඒ අනුව, "ආබාධ සහිත ස්ත්‍රීන්" යන මාතෘකාව යටතේ අංක 01 විධියට සඳහන් වෙනවා, "ආබාධ සහිත ස්ත්‍රීන් හා ගැහැනු ළමයින් බහුවිධ වෙනස්කොට සැලකීම්වලට ලක් වෙන බව රාජ්‍ය පාර්ශ්වයන් පිළිගනී, සහ ඒ සබැඳි සියලු මානව අයිතිවාසිකම් හා මූලික නිදහස ඔවුන් විසින් පූර්ණව හා සමානව බුක්ති විඳීම සහතික කිරීමට පියවර ගත යුතුය" යනුවෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මේක ඉතා ම වැදගත් කාරණාවක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

එහි අංක 02 විධියට සඳහන් වෙනවා, "රාජ්‍ය පාර්ශ්වයන් විසින් මෙම ප්‍රඥප්තියෙන් දක්වන ලද මානව අයිතිවාසිකම් හා මූලික නිදහස ස්ත්‍රීන් විසින් භාවිත කිරීම හා බුක්ති විඳීම තහවුරු කිරීමේ අරමුණින් ස්ත්‍රීන්ගේ පූර්ණ සංවර්ධනය, ප්‍රගමනය හා බලගැන්වීම සහතික කිරීමට සුදුසු පියවර සියල්ල ගත යුතුය" කියලා.

අවසන් වශයෙන් මෙන්න මේ කාරණාව මම යෝජනා කරනවා. මේක ඉතා වැදගත් යෝජනාවක්. මේ පිහිටුවනු ලබන කොමිෂන් සභාව ඉතා වැදගත් එකක්. කොමිෂන් සභාවේ සංයුතියේ ධුර 7ක් තිබෙනවා. ඒ ධුර 7න් දෙකක් පත් කිරීම සඳහා

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

ජනාධිපතිතුමා විසින් නිර්දේශ ලබා ගත යුතු වෙනවා, කථානායකවරයා විසින් පත් කරන ලද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදයෙන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සාමාජිකයන් හත්දෙනාගෙන් සභාපතිවරයා විය යුත්තේ කාන්තාවක්ය කියන ඉල්ලීම මම කරනවා. එය ඉතාම හොඳයි. මෙන්න මේ ඉල්ලීම ඇතුළත් කරගන්න. මම කවදාවත් මූලාසනයේ අණට අකීකරු වෙලා නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ගරු රමේෂ් පතිරණ ඇමතිතුමනි, ඔබතුමා කැබිනට් මණ්ඩලයේදී ජනාධිපතිතුමාට කියන්න, මා විසින් ම යෝජනා කළ බව, මේ හත්දෙනාගෙන් කෙනෙක් ආබාධ සහිත කාන්තාවක්ය කියන එක මේ පනත් කෙටුම්පතට සංශෝධනයක් විධියට ඇතුළත් කරන්න කියලා. මොකද, රටේ මුළු ජනගහනයෙන් සියයට 3ක් ආබාධ සහිත ප්‍රජාවක් ඉන්න නිසා.

ඔබතුමා මට අමතර කාලයක් ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. Niroshan Perera. You have six minutes.

[අ.භා. 2.16]

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත ගැන විවාද කරන අද, කාන්තාවන් ශක්තිමත් කිරීම සඳහා කොමිෂන් සභාවක් පිහිටුවීම ඇතුළු කරුණු අපි සාකච්ඡා කරනවා. විශේෂයෙන්ම අපි රටක් හැටියට පිළිගන්න ඕනෑ, මේ රටේ අනාගතය ශක්තිමත් කරන්න ඕනෑ නම් කාන්තාවන් ශක්තිමත් කරන්න ඕනෑය කියන එක. කාන්තාවන් ශක්තිමත් කිරීම නීතිවලින් විතරක් කරන්න බැහැ. අපි ඒක මේ මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කරන්න ඕනෑ. ශ්‍රී ලංකාවේ කාන්තාවන් අද ඉතාම දුර්වල තත්ත්වයක ඉන්න බව අපි දකිනවා. එක පැත්තකින්, ආර්ථික ප්‍රශ්න හින්දා අද වනකොට විශාල පීඩනයක් මේ රටේ කාන්තාවන්ට එල්ල වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ ගෙවල් පාලනය කිරීම, ළමයින් බලා ගැනීම, ආහාර සකස් කිරීම ඇතුළු සියලු දේකම වගකීම අද කාන්තාවට උරුම වෙලා තිබෙනවා. ආර්ථික ප්‍රශ්නත් එක්ක අද වෙනකොට කාන්තාවන්ට මේ සියලු ප්‍රශ්න කළමනාකරණය කරගන්න සිදු වෙලා තිබෙනවා. ඒ හින්දා මේ රජය කාන්තාව කෙරෙහි මීට වඩා අවධානය යොමු කරලා, ප්‍රායෝගික වශයෙන් ඒ ප්‍රශ්න කළමනාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය සහන ප්‍රථමයෙන්ම ලබා දිය යුතු බව අපි මේ අවස්ථාවේදී මතක් කරනවා.

අද වෙනකොට කාන්තාවන් විශාල ප්‍රමාණයක් රැකී රක්ෂා කරනවා. ඒ වාගේම, ඔවුන් රැකී රක්ෂා සඳහා යෑමට සහ අනෙකුත් කාරණා වෙනුවෙන් මේ රටේ පොදු ප්‍රවාහන සේවය පාවිච්චි කරනවා. කාන්තාවන් පොදු ප්‍රවාහන සේවය භාවිත කරද්දි අද වෙනකොට විවිධ අන්දමින් ලිංගික පීඩා විඳින්නට සිද්ධ වෙලා තිබෙනවා. අපි මේ සභාවේදී යෝජනා කළා, අඩු තරමින් පොදු මගී ප්‍රවාහන සේවා සඳහා CCTV කැමරා සවි කරලා, කාන්තාවන්ට එවැනි පීඩා ගෙන දෙන පුද්ගලයන් අල්ලන්නට කටයුතු කරන්න කියලා. නමුත් අපි දැක්කා, රජයෙන් ඒකට යහපත් ප්‍රතිචාරයක් හම්බ වුණේ නැති බව. විටින් විට පොලිස් කාන්තාවන් දාලා, පොදු ප්‍රවාහන සේවය සඳහා භාවිත කරන බස් රථවල වැටලීම් කළත්, ඒකත් යම්කිසි ප්‍රමාණයකට මේ වෙනකොට සීමා වෙලා තිබෙනවා. ඒ හින්දා මේ රටේ කාන්තාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා මේ අවස්ථාවේදී මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම කාන්තාවන් රැකී රක්ෂා කරලා රැට ගෙදර එද්දි ඒ අයට අවශ්‍ය ආරක්ෂාවත් ලබා දිය යුතුයි.

අපි දන්නවා, මේ වෙනකොට සමාජයේ පාතාල ක්‍රියාකාරකම් පැතිරිලා තිබෙන බව. විවිධ මත් ද්‍රව්‍යවලටත්, මත්පැන්වලටත් ඇබ්බැහි වුණු විවිධ පුද්ගලයන් අද වෙනකොට ගම්මානවල සැරිසරනවා. ඒ හින්දා පොලීසියත් එක්ක එකතු වෙලා ප්‍රජා පොලිස් කමිටු මගින් කාන්තාවන්ගේ ආරක්ෂාව සඳහා ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු වනවා වාගේම, ඒ සඳහා අවශ්‍ය නීති ක්‍රියාත්මක කිරීම සඳහාත් විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ වාගේම අද අපි දකිනවා, මේ රටේ උපත් ප්‍රමාණය අඩු වෙලා තිබෙන බව. කාන්තාවන් ලබන උතුම්ම පදවිය තමයි මව් පදවිය. අද වෙනකොට මේ රටේ උපත් ප්‍රමාණය අඩු වෙලා තිබෙන හින්දා තව ටිකක් කල් යනකොට මේ රටේ ජනගහනය අඩුවීමේ ප්‍රවණතාවකුත් ඇතිවීමට ඉඩකඩ තිබෙනවා. ජනගහනය අඩු වෙනවා කියන්නේ රටක් දුර්වල වෙනවා කියන එකයි. ඒ අනුව රටක් ආර්ථික වශයෙන් දුර්වල වෙනවා; සමාජයීය වශයෙන් දුර්වල වෙනවා. ඒ හින්දා මේ රටේ උපත් ප්‍රමාණය නැවත නඟාසිටුවීම සඳහා ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම අවශ්‍යයි. අපි දන්නවා, ඉතා දියුණු රටක් වන ජපානයේ පවා උපත් ප්‍රමාණය අඩුවීම හේතුවෙන් ඒ රටේ ආර්ථිකය කඩා වැටීම, සමාජයීය වශයෙන් කඩා වැටීම ඇතුළු විශාල පීඩනයක් එල්ල වෙලා තිබෙන බව. ඒක මේ රට තුළත් ඇති වෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසා මේ රටේ වැඩිහිටි ජනගහනය බලා ගැනීමට අනාගත පරපුරක් නැතිවීමේ අවදානමත් මේ රට තුළ තිබෙනවා. ඒ පිළිබඳ යම්කිසි විසඳුමක් සෙවීමේදී කාන්තාවන් සවිබලගන්වලා, උතුම් වූ මව් පදවිය අගය කරමින්, ඉස්සරහට යෑම ඉතා වැදගත් බව මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය දිගින් දිගටම අඩුවීමත්, වෙන රටවල් එක්ක ගත්තාම මේ රටේ කාන්තාවන් දේශපාලනයට පැමිණීම ඉතා අඩුවීමත් කියන කාරණා අපි සැලකිල්ලට ලක් කරන්න ඕනෑ. ඒක මේ සමාජයේ තිබෙන ප්‍රශ්නයක්; මේ රටට බලපාන ප්‍රශ්නයක්. ඒ නිසා අපට නීති-රීති මඟින් පමණක් දේශපාලනය තුළත්, පාර්ලිමේන්තුව තුළත් කාන්තා නියෝජනය වැඩි කරන්න බැහැ. ඒ සඳහා පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරියන් ඇතුළු ඒ කාන්තා සංසදය සම්බන්ධ කරගෙන ප්‍රායෝගික වැඩ පිළිවෙළක් මේ රට තුළ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය වැඩි කිරීම මඟින් කාන්තාවන්ට බලපාන ප්‍රශ්නවලට මීට වඩා විසඳුම් ලබා දීමට අවධානය යොමු කිරීමේ අවස්ථාවත් අපට ලැබෙනවා.

ඒ නිසා මේ පනත් කෙටුම්පත සම්මත කර, විශේෂයෙන්ම මෙය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා අප සියලුදෙනාම එකතු වෙලා වැඩ කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා කියන කාරණයත් මතක් කර දෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Gevindu Cumaratunga. You have 15 minutes.

[අ.භා. 2.22]

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තවශයෙන්ම අද විවාදයට ගත් පනත් කෙටුම්පත පිළිබඳ කරුණු දැක්වීමට පෙර මා කැමැතියි, අපේ මේ පාර්ලිමේන්තුවේ සිටින මහජන නියෝජිතයන් සුපරික්ෂාකාරීව, වගකීමකින් යුතුව කටයුතු කරනවාද කියන කාරණය ඔබ හමුවේත්, රට හමුවේත් මතු කරන්නට.

අද කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත විවාදයට ඉදිරිපත් කර තිබෙනවා. ඊළඟට, අපේ රටේ නිදහස් අධ්‍යාපනය මුහුණ දෙන අභියෝග පිළිබඳ කල්තැබීමේ යෝජනාව හෙට විවාද කරනවා. අනිද්දා ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත විවාදයට ගන්න නියමිතයි. බ්‍රිතාන්‍යයන් මේ රටේ විදුලිබල උත්පාදනය පටන් ගත් දා සිට තිබුණු සියලු ක්‍රම උඩු-යටිකුරු කරන පනත් කෙටුම්පතක්, ඒක. ඊළඟට, සිකුරාදා රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත විවාදයට ගැනීමට නියමිතයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකක්ද මේ හදිසිය? මැතිවරණයෙන් පරදියි කියලා භයේද? එහෙම නැත්නම්, මැතිවරණයෙන් පසුව පත්වන පාර්ලිමේන්තුවට එන්නේ ඔළමොට්ටළයෝ ටිකක්, කිසිම පනතක් ගෙනෙන්න බැරි වෙයි, ඒ නිසා අපි මේ පනත් ඔක්කොම ටික හදා දීලා යන්න ඕනෑ කියලාද හිතන්නේ? පාර්ලිමේන්තුවේ ඉන්නවා, මන්ත්‍රීවරුන් 225දෙනෙක්. බලන්න, අද මන්ත්‍රීවරුන්ගේ කථික ලැයිස්තුව. කථික ලැයිස්තුවේ 28දෙනායි ඉන්නේ. පනත් කෙටුම්පතක් වෙනුවෙන් කථා කරන්න දෙන්නේ එක දවසක් නම්, ඉතුරු 200ක් පමණ දෙනා නිකම් ඉන්න ඕනෑ. ඉතින් මොන එකකට අපට පඩි ගෙවනවාද කියලාවත් මට තේරෙන්නේ නැහැ, ඇත්තටම. අප පාර්ලිමේන්තුවට එවපු සංවිධාන, මහජනයා, ගරුතර සංඝ රත්නය දෙන උපදෙස් අනුව පනත් කෙටුම්පතක් අධ්‍යයනය කරලා ඒ ගැන මේ සභාවේදී සාකච්ඡා කරන්න අපට බැරි නම් තේරුමක් තිබෙනවාද? ඔබතුමන්ලාට බහුතරයක් තිබෙනවා නම්, දවස් තුනක් විවාද කර ගත්තත් මේක සම්මත කරගන්න පුළුවන් නේ. ශ්‍රී ලංකා විදුලිබල පනත දවස් තුන-හතරක් වාද විවාද කරලා, අපට කියන්න තිබෙන කරුණුත් රට හමුවේ තබන්න දීලා, සම්මත කරගන්න බැරි ඇයි?

ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Agriculture and Plantation Industries)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පනත් කෙටුම්පත් විවාද කිරීමේ දින තීන්දු කරන්නේ ආණ්ඩුව නොවෙයි. ඒ සඳහා පක්ෂ නායක රැස්වීම පවත්වනවා. එම රැස්වීමට සියලු පක්ෂ නියෝජනය කරන නායකයෝ සම්බන්ධ වෙනවා. *[බාධා කිරීමක්]* එම පක්ෂ නායක රැස්වීමේදී තමයි විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත් එකඟතාව මත මේ දින තීන්දු කරන්නේ. *[බාධා කිරීමක්]* එහෙම නැතුව ආණ්ඩු පක්ෂය තනියෙන් තීන්දුවක් අරගෙන නැහැ.

ඊළඟට, පනත් කෙටුම්පත් හදිසියේ ඉදිරිපත් කරනවා කියා එතුමා කිව්වා. මේ පනත් කෙටුම්පත් තබාගෙන ඉන්න ඕනෑකමක් නැහැ. *[බාධා කිරීමක්]* ඒ නිසා ඊළඟ අවස්ථාවේදී ආණ්ඩු බලය එනවාද, නැද්ද කියන හේතුව නිසා නොවෙයි, ප්‍රමාද නොකර අවශ්‍යතාවට ප්‍රමුඛතාව දීලා තිබෙනවා. අවශ්‍ය නම් විවාදයට තව දින එකතු කරගන්න පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you, Hon. Minister. Hon. Gevindu Cumaratunga, please continue with your speech.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

අපේ කණ්ඩායමට Parliamentary Business Committee එකේ නියෝජනයක් නැහැ. කථානායකතුමා ඇතුළු හැමෝගෙන්ම අපි අහන්නේ මේකයි. අපිට, අපේ යුතුකම ඉෂ්ට කරන්න ඉඩක් දෙන්නේ නැද්ද? අපි අහන්නේ ඒ ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් හෝ ආණ්ඩුවෙන් විතරක් නොවෙයි අපි මේ අහන්නේ. මහජනයා නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවට පත් වී තිබෙන 225දෙනාට තමන්ගේ අදහස් දක්වන්නවත් අවස්ථාවක් දෙන්නේ නැත්නම් වැඩක් තිබෙනවාද?

දෙවැනි කාරණය මේකයි. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාත් කිව්වා නේ, "විපක්ෂ නායකතුමා, විපක්ෂය" යනාදි වශයෙන්. ඔබතුමන්ලාත් ඒ කමිටුවේ ඉන්නවා නේ. ඉතින් ඔබතුමන්ලා දෙන්නකෝ, දවස් තුනක්. *[බාධා කිරීමක්]* ඒක තමයි, අන්න හරි. අන්න, ඇත්ත කිව්වා. නමුත්, ඔබතුමන්ලාට ඕනෑකමක් නැහැ. ඒක තමයි ප්‍රශ්නය. ඇයි, භයද? ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත ගැන දවස් තුනක් විවාද කළොත් ඔබතුමන්ලාට ඔය තිබෙන බහුතරය නැති වෙයි කියලා භයද? ඔබතුමන්ලාගේ පැත්තේම -ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ- ඉන්න සමහරුන්ට "අම්මෝ, මේකට අත ඔසවන්නේ කොහොමද?" කියලා හිතෙයි කියලා භයද? ඒකද ප්‍රශ්නය? *[බාධා කිරීමක්]* ඇයි දෙයියනේ, බහුතරය ගැන විශ්වාසයක් තිබෙනවා නම්, දවස් තුනක විවාදයක් දෙන්නකෝ. අපට, අපේ කරුණු ටික කියන්න දෙන්නකෝ. අඩු ගණනේ අපේ විරෝධය පළ කළා කියලා හැන්සාඩ් වාර්තාවේ සඳහන් වෙන්නවත් ඉඩ දෙන්නකෝ. එහෙම නැත්නම් භයද, අපි කියන කරුණු ඇහුවාම ඔය පැත්තේ ඉන්න අයගේ අත එසවෙන්නේ නැතුව යයි කියලා? නැත්නම් ඡන්දය විමසන වෙලාවට කලින් ඒ අය මාරු වෙලා යයි කියලා භයද? එහෙම භය නැත්නම් කරුණාකරලා විවාදයක් සඳහා නියමිත දින ගණනක් දෙන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ඔබතුමාගෙනුත් -මූලාසනයෙනුත්- ඉල්ලනවා, මේ ගැන බැරෑරුම්ව හිතන්න කියලා. එහෙම නැතිව මෙහෙම කරන එකේ තේරුමක් තිබෙනවාද? මෙහෙම කලබලයක් මොකක් වෙනුවෙන්ද?

අනෙක් කාරණය මෙයයි. පනත් කෙටුම්පත්වල වැරදි තිබෙනවා. සමහර වෙලාවට "ඇ" යන්න බලන්න කියනවා. හැබැයි, බැලුවාම ඒවායේ "ඇ" කියා එකක් නැහැ. නමුත් ඉංග්‍රීසි පනත් කෙටුම්පතේ නම් ඊට අදාළව අක්ෂරයක් තිබෙනවා. මේවා ඉදිරිපත් කරන්න ඒ තරමට කඩිමුඩියක්! ඊළඟට, ඉංග්‍රීසි වචන පිටින් සිංහල පිටපතේ තිබෙනවා. මේ විධියට කලබලයක් එක්ක මොකක්ද මේ කරන්නේ? රට අවුල් කරලා, අවුලෙන් අවුලට යැවීමද ඒකේ පරමාර්ථය?

අපි දන්නේ නැහැ, මෙවැනි කටයුතු කෙරෙන්නේ කුමක් වෙනුවෙන් ද, කුමක් අරමුණු කරගෙන ද කියලා. මම හිතන හැටියට නම් මේ ගැන සලකන්න මූලාසනයේ සිටින ඔබතුමාටත් වගකීමක් තිබෙනවා, මූලාසන මණ්ඩලයටත් වගකීමක් තිබෙනවා, කථානායකතුමාටත් වගකීමක් තිබෙනවා. මෙතැනදී ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සමහර අයට විතරක් අවස්ථාව දීලා හරියන්නේ නැහැ. අපේ අදහස් දක්වන්නත් අපට අවස්ථාව දෙන්න. ඔබතුමන්ලා බහුතරයෙන් පනත් කෙටුම්පත සම්මත කර ගනියි. ඒකට ප්‍රශ්නයක් නැහැ. අපි ඒක අභියෝගයට ලක් කරන්නේ නැහැ. හැබැයි, අඩුම තරමින් අපි නියෝජනය කරන

[ගරු ගෙවිඳු කුමාරතුංග මහතා]

ජනයාගේ මතය මේ පාර්ලිමේන්තුවේ කියන්න අවස්ථාවක් අපට දෙන්න. අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ ඔවුන් වෙනුවෙන් නේ. එහෙම ලැබෙන්නේ නැත්නම් මේ කියන ප්‍රජාතන්ත්‍රවාදය මොකක්ද?

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ -Online Safety Bill එකේ- වගන්ති තිස්ගණනක් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නිවැරදි කරන්න කිව්වා. ඔය ආසනයේම වාඩි වෙලා හිටපු ගරු අධිකරණ ඇමතිතුමාම කිව්වා, වගන්ති තුනක් අපට මහ හැරිලා තිබෙනවා කියලා. ඒවා දැනටමත් කැබිනට් මණ්ඩලයට අලුතින් ඉදිරිපත් කර තිබෙනවා කිව්වා. නමුත්, ඒවා තවමත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණේ නම් නැහැ. ඉතින් ඇයි මේ කලබලය? ඒවා මහ හැරෙන්නේ ඇයි? ඒකද අපි රටට දෙන ආදර්ශය? අපි දරුවන්ට දෙන ආදර්ශය? කලබලේ ඕනෑ දෙයක්, ඕනෑ වැරැද්දක්, ඕනෑ එකක් ගෙනැල්ලා, "අපට බහුතරය තිබෙනවානේ" කියලා කටයුතු කරනවා. අද පාරේ යනකොටත් වාහන එළවන්නේ එහෙම නේ. සංඥාව රතු ද, නිල් ද, කොළ ද කියලා ප්‍රශ්නයක් නැහැ. මාර්ග නීති ගැන ප්‍රශ්නයක් නැහැ. "අපට යන්න ඕනෑ, අපි ගියා" කියලා යනවා. මේ පාර්ලිමේන්තුවෙන් දෙන ආදර්ශයත් ඒක ද? එහෙනම් මේ නීති මොකටද? එහෙම නම් මේ පාර්ලිමේන්තුව නීති සම්මත කරන්නේ මොකටද?

ඊළඟට, අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත - කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත- ගැන කථා කරන්න මම කැමැතියි. මේ තුළිනුත් හරි අපූරු කටයුත්තක් කෙරෙනවා. අපේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමියත් මේ ගරු සභාවේ ඉන්නවා. මම එතුමිය ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයෙනුත් ඉල්ලීමක් කරනවා. මම දැන් මේ කියන කාරණය, ඔබතුමියලාගේ මැදිහත් වීම අවතක්සේරු කිරීමක් විධියට හිතන්න එපා. අදාළ කොමිෂන් සභාවට සාමාජිකයන් හත්දෙනෙකු පත් කිරීමේදී පස්දෙනෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් පත් කරනවා. දෙදෙනෙක් අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයෙන් පත් කරනවා. එහෙම වුණොත්, මොන එකකට ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක්? මම කියන්නේ ඒ සංසදයට නම් හතම යෝජනා කරන්න කියන්න. අනික් පනත්වලදී ඇමතිතුමා නම් යෝජනා කරනවා. එතකොට අගමැතිතුමා, විපක්ෂ නායකතුමා, කථානායකතුමා සහ ජනාධිපතිතුමාගේ නියෝජිතයෙක් ඉන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් ඒ යෝජනා සුදුසු ද කියලා බලලා සුදුසු අය නිර්දේශ කරනවා, ජනාධිපතිතුමාට. නමුත් මෙතැනදී දෙන්නෙක් ඉවත් කරලා කටයුතු කරනවා. මේ පනත් කෙටුම්පත අභිංසක වෙන්න පුළුවන්. අනෙක් පනත් කෙටුම්පත්වලදීත් ඇමතිතුමාට පත් කරන්න පුළුවන් නියෝජිතයන් ඉවත් කර ගත්තොත් මොකද වෙන්නේ?

මේ පනත් කෙටුම්පත අභිංසක හින්දා කාටවත් ප්‍රශ්නයක් නැති වෙයි. හැබැයි, ඊළඟට ඉදිරිපත් වෙන පනත් කෙටුම්පතත් අභිංසකද? ඊළඟට ඉදිරිපත් වෙන විටුලිබල පනත් කෙටුම්පතේදීත් දෙදෙනෙක් නම් කරන බලය තව කවුරු හරි කෙනෙකුගේ සාක්කුවට දමා ගත්තොත්, අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් පත් කිරීමේ පරමාර්ථයට වෙන්නේ මොකක්ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවම විහිළුවක් වෙලා නොවෙයි ද ඉවර වෙන්නේ? ඒ නිසා අපි මේ සභාවෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ වගන්ති සම්බන්ධයෙන් බැරෑරුම්ව හිතන්න කියලා. මන්ත්‍රීතුමියලා මේ නම් යෝජනා කරන එක ගැන අපට කිසිම ගැටලුවක් නැහැ. අපි එතුමියලාට කියන්නේ නම් හතම යෝජනා කරන්න කියලා. එහෙම යෝජනා කරලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කියන්න සම්මත කරන්න කියලා. මේ කැලි කැලි බෙදා ගන්න ගත්තාම ඉවර වෙන්නේ කොහෙන්ද?

ඒ වාගේම ගරු සරත් වීරසේකර මන්ත්‍රීතුමාත් මේ කරුණු වලට අවධානය යොමු කළා. මේ පනත් කෙටුම්පත කියවන කොට, මෙය අපි හැදුණු වැඩුණු සංස්කෘතිය තුළ බිහි වුණු පනත් කෙටුම්පතක් ද කියන ගැටලුව යම් ආකාරයකට අපට දැනෙනවා. අපි මාතෘත්වයට, අම්මාට සැලකුවේ, එහෙම නැත්නම් සහෝදරියන්ට සැලකුවේ අප විසින් ගරු කළ යුතු, වන්දනාමාන කළ යුතු අය හැටියට. ඒ වෙනුවට යම් ආකාරයකට මේ කාන්තාව වහලෙකු හැටියට සලකා ගොඩ නැඟිව්ව බටහිර සමාජයක සමානාත්මතාව වෙනුවෙන් ඇති කරපු වගන්තිත් මේ ගෙනෙන පනත තුළ තිබෙනවා ද කියන යම් යම් සැක සංකා මතු වෙනවා. මොකද, අපේ සමාජය මාතෘත්වය වෙනුවෙන් පතන්නේ සම තැන නොවෙයි, අපට වඩා, අන් අයට වඩා ඉහළ තැනක්. ඒ සුවඳ අපට මේ පනතෙන් දැනෙන්නේ නැති වීම ගැන අපි කනගාටු වෙනවා.

ඒ වාගේම බලන්න, මෙහි දෙවැනි වගන්තියේ (ඇ)හි මෙසේ සඳහන් වෙනවා:

> "ස්ත්‍රී පුරුෂභාවය සහ ලිංගික දිශානතිය මත පදනම්ව සිදුවන සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම්වලින් කාන්තාවන් ආරක්ෂා කිරීම;"

අවසාන වශයෙන් "කාන්තාවන් ආරක්ෂා කිරීම" කියන කාරණය තිබෙන නිසා කාන්තාවන් සවිබලගැන්වීමේ පනතකට අදාළ වෙන්න පුළුවන්. හැබැයි, "ස්ත්‍රී පුරුෂභාවය සහ ලිංගික දිශානතිය මත පදනම්ව සිදුවන සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම්වලින් ..." කිව්වාම, අවසාන වශයෙන් මේ අර්ථ දැක්වීම යන්නේ කොතැනටද කියන එක ගැන බලවත් සැක සංකා මතු වෙනවා. කාන්තාවට ගරු කිරීම සම්බන්ධයෙන්, සම තැන දීම සම්බන්ධයෙන් අපට ගැටලුවක් නැහැ. ඒ වාගේම සංක්‍රාන්තික ලිංගිකයන් සම්බන්ධයෙන් අනුකම්පා සහගතව බැලීම පිළිබඳවත් ගැටලුවක් නැහැ. හැබැයි, ප්‍රකෘතිය වෙනුවට විකෘතිය ආදර්ශය කරන්න හදන අණපනත් ගේන්න යනවා නම් අපට ඒකට එකඟ වෙන්න බැහැ. ලෝකය පරිණාමය වෙච්ච ආකාරයක් තිබෙනවා, ලෝකයේ ප්‍රකෘතියත් තිබෙනවා. විකෘතිය සම්බන්ධයෙන් දයානුකම්පාවෙන් බැලිය යුතුයි කියන අදහසත් එක්ක අපට කිසිදු ගැටලුවක් නැහැ. මෙය සියලු ආගම්වල පුරුදු පුහුණු කෙරෙනවා. හැබැයි, ප්‍රකෘතියට වඩා විකෘතිය උස්සා තැබීමේ ප්‍රයත්නයක් තිබෙනවා නම්, ඒ ගැන සැලකිලිමත් වෙන්න කියලා අපි අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයෙන් ඉල්ලා සිටිනවා.

මම අද මතු කරපු ප්‍රශ්නය සම්බන්ධයෙන්ම කථා කළොත්, එක දවසකට එක පනත් කෙටුම්පතක් බැගින් තමයි විවාද පවත්වන්නේ. ඒ තරමට මේ පාර්ලිමේන්තුව කාර්යක්ෂම වෙන්නයි හදන්නේ. හැබැයි ඒ, මන්ත්‍රීවරු 25දෙනෙකුට කථා කරන්න දීලා 200ක් නිහඬ කරවලා.

පසුගිය ජනරජ දිනයේත් මේ පාර්ලිමේන්තුව රැස් වුණා. අපි ඉතාම සතුටින් සිටියේ. මිලේච්ඡ, කුරිරු ත්‍රස්තවාදය පරාජය කිරීමේ 15වැනි සංවත්සරය තිබුණේ මැයි 19වැනි දා. මැයි 22වැනි දා අපේ රට ජනරජයක් වුණු දවස. එදාම මේ පාර්ලිමේන්තුව රැස් වුණා. අපි කථා කරන්න වෙලාවක් වෙන් කරගෙන තිබුණා. ආණ්ඩු පක්ෂයේ කථිකයෝ අවසන් වුණාම සභාවේ ගණපූරණය නැහැ කියලා අනෙක් අයට කථා කරන්නත් නොදී ගෙදර ගියා. එම නිසා අපට අපේ අදහස් ප්‍රකාශ කරන්නවත් අවසථාවක් ලැබුණේ නැහැ. මේ පාර්ලිමේන්තුව ඒ විධිය නම්; මහජන නියෝජිතයෙක් වුණු මට වේලාව වෙන් කර ගත්තත් අවසාන වශයෙන් කථා කරන්න ලැබෙන්නේත් නැත්නම්, අපි නියෝජනය කරන පුරවැසියාගේ තත්ත්වය මොකක්ද?

වැඩි කාලයක් නැහැ, පසුගිය දවසක පුරවැසියා මේ පාර්ලිමේන්තුව ප්‍රතික්ෂේප කරමින් වියරු මහජන අරගළයක යෙදුණා. ඒක වැරදිද? මේ පාර්ලිමේන්තුව තුළ අපට කථා කරන්නවත් වේලාවක් ගන්න බැරි නම්, වැදගත් විධියට, පිළිවෙළට, අපට දීලා තිබෙන, නීති රීතිවලට අනුකූලව අපි ලබා ගත් කාලයේවත් අපට කථා කරන්න දෙන්නේ නැත්නම්, මොකක්ද මේ පාර්ලිමේන්තුවෙන් රටට දෙන ආදර්ශය?

පසුගිය දිනක විජයග්‍රහණයේ සැමරුම තිබුණා. අවාසනාවකට, එදා අපි ජනාධිපතිතුමාව දැක්කේ නැහැ. එතුමාට රට රැක දුන් රණ විරුවන්ට වඩා, ජීවිත පරිත්‍යාග කරපු රණ විරුවන්ට වඩා, අත පය පරිත්‍යාග කරලා මේ දේශය රැක දුන් රණ විරුවන්ට වඩා, වෙන විදේශ සංචාරයක් ලොකු වෙන්න ඇති. ඒ අඩුව පුරවන්න අගමැතිතුමා හෝ එදා එම අවස්ථාවට සහභාගි වීම පිළිබඳව අපි කෘතඥ වෙනවා. හැබැයි, ඒ ජයග්‍රහණයට දේශපාලන අරුතක් දෙන්න තමයි 2019 ජනාධිපතිවරණයේදීත්, 2020 මහ මැතිවරණයේදීත් අපි ජනවරමක් ඉල්ලා සිටියේ; අපි තුනෙන් දෙකක බලයක් ඉල්ලා සිටියේ. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැටියට අපි තුනෙන් දෙකක් ඉල්ලා සිටියේ, ඒ රණ විරුවන් රැක දුන් රටට ගැළපෙන, ඒ ජයග්‍රහණයට ගැළපෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගේන්න. කෝ, ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව? කෝ, ඒ ජනවරමට අනුව ගේනවා කියපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව? මේවාට තිබෙන කඩිමුඩිය එම ප්‍රතිඥා ඉෂ්ට කරන්න කෝ තිබෙනවාද? දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පටන් ත්‍රස්තවාදය අවියක් කරගෙන, ඒකීය ශ්‍රී ලංකාවට හානි වන ආකාරයට, අපේ සමස්ත ජනතාව අතර සුහදත්වයට හානි වන ආකාරයට, බෙදීම් නීතිගත වන ආකාරයට ගෙනැවිත් තිබෙන මේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වීසි කරලා, මුළු රටටම, මුළු රටේම පුරවැසියාට එක හා සමානව ආඩම්බර වෙන්න පුළුවන් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වෙනුවෙන් තමයි අපි ඒ ජනවරම නිර්මාණය කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මම කථාව ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

නමුත්, ජනරජය අද කොයිබට ද? අපි පසුගිය දවස්වල දැක්කා, රේගුව විජාතිකයන් අතට පත් කර තිබෙන බව. අපේ රටේ දොරටු පාලනය කරන්නේ මේ රටේ පුරවැසිභාවයවත් නැති, මේ රටේ රජයට සම්බන්ධයක් නැති විජාතිකයන් පිරිසක් නම් අපේ ජනරජය යන්නේ කොයිබට ද? රාමායණයේ මං පෙත් ගැන කථා කරනවා. රාමායණය නමැති කාව්‍යය තුළ සඳහන් පරිදි, ලංකා රාජ්‍ය පරද්දලා ගිනි තැබූ හනුමාට කෝවිල් හදන්න කථා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ සියල්ල විසින් පෙන්නුම් කරන්නේ මවුබිමේ හෙට දවස හමුවේ ඇති අභියෝගයි. ඒ අභියෝග ගැන ගැඹුරින් සිතා කටයුතු කරන ලෙස රට වැසියාගෙන් ඉල්ලා සිටිමින් මම මගේ කථාව අවසන් කරනවා. ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. (Mrs.) Muditha Prishanthi. You have 13 minutes.

[අ.භා. 2.38]

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
(மாண்புமிகு (திருமதி) முதிதா பிரிஸான்தி)
(The Hon. (Mrs.) Muditha Prishanthi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතා වැදගත් මාතෘකාවක් මුල්කොට ගෙන අද දවසේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව කාන්තාවක් විධියට මා පළමුවෙන්ම ස්තුතිය පළ කරනවා.

කාන්තාවන් වෙනුවෙන්, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම විශේෂ කාරණයක්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපතිතුමිය මේ පනත් කෙටුම්පත ගෙනෙන්න බොහෝ මහන්සියක්, වෙහෙසක් දැරුවා. ඒ වාගේම අපේ ගරු රාජ්‍ය අමාත්‍යතුමියත් ඒ වෙනුවෙන් විශාල මහන්සියක් ගත්තා. එම නිසා මම මේ අවස්ථාවේ දී ඒ දෙපළටම - පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ ගරු සභාපතිතුමියටත්, ගරු රාජ්‍ය අමාත්‍යතුමියටත්- ස්තුතිවන්ත වෙනවා, ප්‍රමාද වෙලා හෝ මෙම පනත් කෙටුම්පත ගෙනෙන්න කටයුතු කිරීම පිළිබඳව. මෙම පනත් කෙටුම්පත ගැන කථා කිරීම හෝ සම්මත කිරීම පමණක් නොව මෙය ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියලාත් මම ඉල්ලා සිටිනවා. මේ රටේ සියයට 52ක් ඉන්නේ කාන්තාවෝ. ඒ නිසා විශේෂයෙන්ම රටේ ආර්ථිකය පවත්වා ගෙන යෑමට කාන්තාව සෘජු දායකත්වයක් ලබා දෙනවා. මැද පෙරදිග ගෘහ සේවයේ අපමණ දුක් විඳින, රටට විදේශ විනිමය ගෙනෙන කාන්තාවන් ද මේ වෙලාවේ අපි සිහිපත් කළ යුතුයි. කාන්තාවට සමාජයේ වගකීම වාගේම තම පවුලේ වගකීම ද තිබෙනවා. ඒ අය මේ ප්‍රශ්න සියල්ලට ඉතා ධෛර්යවන්තව මුහුණ දෙනවා.

කාන්තාවක් සවිබලගැන්වීමේදී බොහෝ දෙනා සිතන්නේ ශක්තිමත් ආර්ථිකයක් ඇයට ලබා දීම ගැනයි. එහෙත් මා යෝජනා කරන්නේ කාන්තාවන් සවිබලගැන්වීමේදී ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා දේශපාලනික යන අංශ හතරම ප්‍රමාණාත්මකව, ගුණාත්මකව සවිබලගැන්වීම කළ යුතුය කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආර්ථිකමය වශයෙන් කාන්තාව සවිබලගැන්වීමේ දී කාන්තාවට සමාජයීය හා සංස්කෘතික යන අංශවලින් පීඩා ගෙන දෙන අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. කාන්තාවන් දේශපාලනමය වශයෙන් සවිබලගැන්වීමේදී විශේෂයෙන් දායකත්වය ලබා දිය හැක්කේ දේශපාලන පක්ෂවලටයි. මහජන ඡන්දයෙන් නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේදී ප්‍රමාණාත්මක කාන්තා නියෝජනයක් තිබිය යුතුයි. අද සංස්ථා මණ්ඩලවලට නිලධාරීන් පත් කිරීමේදී කාන්තා නියෝජනය ඉතා අඩු තත්ත්වයක පවතිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාන්තාවන් පිළිබඳව පවතින සමාජ ආකල්ප දියුණු කිරීම සඳහා ජනමාධ්‍යවලට ද විශාල වගකීමක් තිබෙනවා. මාතෘ මූලික සමාජ ක්‍රමයක් තුළයි අපි ජීවත්

[ගරු මුදිතා ප්‍රශාන්ති මහත්මිය]

වන්නේ. කාන්තාව යනු, සමාජය තුළ ගෞරවයට, ආදරයට පාත්‍ර විය යුතු කොටසක්ය යන ආකල්පය සමාජය තුළ වර්ධනය විය යුතුයි. විශේෂයෙන්ම වෙළඳ පොළ ආර්ථික රටාව තුළ සමාජ සාරධර්ම පිරිහීම හේතුවෙන් වඩාත් පීඩාවට පත් වන්නේ කාන්තාවයි. ඒ නිසා කාන්තාවන් ඉහළට ඔසවා තැබීමේ කාර්යභාරය වෙනුවෙන් ජනමාධ්‍යයට ප්‍රබල වගකීමක් තිබෙනවා යැයි මා විශ්වාස කරනවා.

කාන්තාවන් සවිබලගැන්වීමේ පනත් කෙටුම්පත සම්මත වූවාට පසු එ් සම්බන්ධව සමාජය තුළ පුළුල් හා ගැඹුරු කතිකාවක් ඇති කළ යුතු යැයි මා යෝජනා කරනවා. කාන්තාවගේ ආරක්ෂාව වෙනුවෙන් කොපමණ නීති තිබුණත් ඒවා පිළිබඳව සමාජය දැනුවත් නොවීම ගැටලුවක්. ඒ නිසා මෙම පනත් කෙටුම්පත පිළිබඳව සෑම අංශයක්ම දැනුවත් කරන නව වැඩසටහනක් වෙනමම ආරම්භ කළ යුතුය කියාත් මා යෝජනා කරනවා. කාන්තාව පිළිබඳව වත්මන් රජයේ විශේෂ අවධානයක් පවතින බැවින් මේ නව වැඩසටහන තුළින් කාන්තාව සවිබලගැන්වීමට සුදුසු කාලය මේ රජය පවතින කාල සීමාවම වන බව විශ්වාස කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle. You have nine minutes.

[අ.භා. 2.43]

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. මට වෙන් කර තිබුණු විනාඩි 12, විනාඩි 9කට අඩු වෙලා තිබෙනවා.

කෙසේ වෙතත්, අපි අද සන්තෝෂ වෙනවා හැම පක්ෂයකම මන්ත්‍රීතුමියලාට පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංඝයට එකතු වෙලා රටේ කාන්තාවන් වෙනුවෙන් වැදගත් පනතක් හඳන්න හැකි වීම පිළිබඳව. ඒ වාගේම මේ වෙලාවේ මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, විශේෂයෙන් ගරු ජනාධිපතිතුමා කාන්තාවන් සවිබලගැන්වීම සඳහා, කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා විශාල ශක්තියක්, ආශීර්වාදයක් ලබා දෙන බව.

සමහර අය හිතන්න පුළුවන්, කාන්තාවන් සවිබලගැන්වීම සඳහා පනත් කෙටුම්පතක් ගෙනාවේ ඇයි කියලා. අපේ රටේ සමහර ක්ෂේත්‍රවල කාන්තාවන් බොහොම ඉදිරියෙන් ඉන්නවා. නිදහස් සෞඛ්‍යය, නිදහස් අධ්‍යාපනය හරහා වැඩිපුරම ප්‍රතිලාභ අත් කරගෙන තිබෙන්නේ කාන්තාවන්. විශේෂයෙන් universitiesවලට වැඩිපුරම ඇතුළත් වන්නේත් කාන්තාවන්. විවිධ පීඨවල අද බහුතරයක් ඉන්නේ කාන්තාවන්. වෛද්‍ය පීඨය ගත්තත්, නීති පීඨය ගත්තත් එහෙමයි. හැබැයි, අද විධිමත් රැකියා ක්ෂේත්‍රය තුළ කාන්තාවන් ආර්ථිකයට හයිය ලබා දෙන්නේ සියයට 35ක් පමණයි.

ඒ වාගේම අපේ රටට විදේශ විනිමය ගෙනෙන්නත් කාන්තාවන්ගෙන් විශාල දායකත්වයක් ලැබෙනවා. එහිදී ආයෝජන ප්‍රවර්ධන කලාප, වැවිලි ක්ෂේත්‍රය ආදි ක්ෂේත්‍රවල සේවය කරන කාන්තාවන්ගෙනුත් විශාල දායකත්වයක් ලැබෙනවා. ඒ සියලු ක්ෂේත්‍රවල සේවය කරන සියලු කාන්තාවන් අපි මේ අවස්ථාවේදී ගෞරවයෙන් සිහිපත් කරනවා.

තවමත් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වන කාන්තාවන් සියයට 25ක් පමණ ඉන්නවා. කාන්තාවට රැකියාවට යෑමට අවශ්‍ය වුණත් විවාහ වීමෙන් පසුව ඊට අවශ්‍ය පසුබිම නොමැතිකම නිසා ඇයට ඒ සඳහා ඉඩ කඩක් ලැබෙන්නේ නැහැ. කාන්තාවට අද සමාජය විසින් විශාල වගකීම් රාශියක් පවරා තිබෙනවා. ඒ එක්කම කාන්තාවක වීම නිසාම අසාධාරණයට ලක් වන කාන්තාවන් ඉන්නවා. පසුගිය කාලයේ අපි දැක්කා, ප්‍රසිද්ධ මාධ්‍ය ආයතනයක රැකියාව කරපු කාන්තාවක් රැකියාවෙන් අස් වෙලා යනවා. ඒ ඇයි? උසස්වීම් ලබා දීමට ලිංගික අල්ලස් ඉල්ලුවාම ඒක ප්‍රතික්ෂේප කළ නිසා. එසේ අගතියට පත් කාන්තාවකට පැමිණිලි කරන්න යන්න තැනක් නැහැ.

පොලීසිය හරහා ගියත් සාධාරණය ඉෂ්ට වෙන්න කාලයක් යනවා. ඒ නිසා අපි ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කළා මේ කරුණු සොයා බලන්න විශේෂ කාරක සභාවක් පිහිටුවන්න කියලා. කාන්තාවක වීම නිසා අසාධාරණයකට ලක් වෙනවා නම්, පැමිණිලි කිරීමට තැනක් අවශ්‍යයි. හැබැයි, ස්ථීර ක්‍රමයක් අනුව තමයි අද මේ පනත් කෙටුම්පත හරහා කාන්තා කොමිසමක් ස්ථාපිත කරන්නේ. කාන්තාවක් වීම නිසා අසාධාරණයට ලක් වෙනවා නම්, ප්‍රචණ්ඩත්වයට ලක් වෙනවා නම්, අපට ඒ ස්වාධීන කොමිෂන් සභාව හරහා කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කරන්න හැකි වෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංඝයද විතරක් නොවෙයි, විවිධ කාන්තා සංවිධානවලින් කාලයක් තිස්සේ ඉදිරිපත් කළ ඉල්ලීමක් වුණේ, කාන්තාවන් වෙනුවෙන් ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවන්න කියන එකයි. මේ පනත් කෙටුම්පත යටතේ ඒක ස්ථාපිත වෙනවා කියලා අපි මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව තහවුරු කිරීම සහ කාන්තාවන් සවිබලගැන්වීමේ ජාතික ප්‍රතිපත්තියක් හදන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංඝයට හැකියාව ලැබුණා. 1981 තමයි කාන්තාවන්ට එරෙහිව පවත්නා සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් ඉවත් කිරීමේ ප්‍රඥප්තිය හෙවත් CEDAW එක ratify වෙන්නේ. හැබැයි, ඒක ratify වෙලා අවුරුදු 43ක් ගතවෙලත් ඒක ගෘහස්ථ නීතියක් බවට පරිවර්තනය කර ගන්න අපට තවමත් හැකියාව ලැබිලා නැහැ. අපි ඒක මේ පනත් කෙටුම්පතින් කරන්න හැදුවත්, අපට ඒක කර ගන්න පුළුවන් වුණේ නැහැ. ඒක අඩුපාඩුවක් හැටියට අපි දකිනවා. අපි යෝජනා කරලා තිබෙනවා, කාන්තා අයිතිවාසිකම් ඇතුළත් කොටසක් මේකට එකතු කරන්න කියලා. මට පෙර කථා කරපු අනෙකුත් ගරු මන්ත්‍රීතුමියලා කියපු සංශෝධනවලට අමතරව, සෑම කාන්තාවක්ම කාන්තා අයිතිවාසිකම් සඳහා හිමිකම් ලැබිය යුතු අතර, කිසිදු කාන්තාවක් එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප නොකළ යුතුයි, කියලා සංශෝධනයක් ඇතුළත් කිරීම සඳහා අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමියගේ ප්‍රධානත්වයෙන් තිබුණු රැස්වීමේදී අපි යෝජනා කරලා තිබෙනවා. හැබැයි, මේ CEDAW එක ගෘහස්ථ නීතියක් බවට පත් කරන එකත් ඉතාම වැදගත් වෙනවා. ඒකත් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න කියලා යෝජනා කරලා, අපේ අාංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමිය වන ගරු තලතා අතුකෝරල මැතිනිය ලිපියකින් දැනුම් දීලා තිබෙනවා. හැබැයි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් ඒකට බාධාවක් වෙනවා. කාන්තාවන් සවිබලගැන්වීමේ පනත හරහා හැම කාන්තාවකට ඒ වරප්‍රසාදය, අයිතිය, -අයිතිවාසිකම- ලැබෙන්නේ නැහැ කියන එක තමයි අපි දකින්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තමයි ඉහළින්ම තිබෙන නීති කෙටුම්පත වන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12වැනි ව්‍යවස්ථාවෙන් ස්ත්‍රී-පුරුෂ

භේදයකින් තොරව සමානාත්මතාව තහවුරු කරලා තිබුණත්, එහෙම තහවුරු නොවුණු අවස්ථාවල ඒ වෙනුවෙන් සක්‍රියව මැදිහත් වෙන්න පුළුවන් කියන එක සඳහන් වෙලා තිබුණත්, 16වැනි ව්‍යවස්ථාවෙන් පුද්ගලික නීති හරහා සමහර කාන්තා ජන කොට්ඨාසවලට යම් කිසි අසාධාරණයක් සිදු වෙනවාය කියන එකත් අපි මතක් කරන්න ඕනෑ.

හැබැයි, පළමුවැනි පියවර හැටියට මේ නීතිය ප්‍රගතිශීලි වුණත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකදී 16 වන ව්‍යවස්ථාව අහෝසි කිරීම ඉතාම වැදගත් වෙනවා. මොකද, අපි දියුණුයි කියන කාලයක තමයි ඉන්නේ. අපි අද AI තාක්ෂණය ගැන කථා කරනවා. හැබැයි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම සමහර ජන කොටස් පීඩනයකට සහ පසුගාමී තත්ත්වයකට ලක් කරලා තිබෙනවා. ඒ නිසා ඒක වහාම සංශෝධනය වෙන්න ඕනෑ කියලා මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඒ වාගේම, මේ පනත් කෙටුම්පතෙන් ඔම්බුඩ්ස්මන්වරයෙක් පත් කිරීමට යෝජනා කරලා තිබෙනවා. ඒ ඔම්බුඩ්ස්මන්වරයා ස්වාධීන කාන්තා කොමිෂන් සභාවට පත්වෙන්න තමයි යෝජනා කරලා තිබෙන්නේ. අපි යෝජනා කරනවා, එහි සංශෝධනයක් කරලා ඔම්බුඩ්ස්මන්වරයා ස්වාධීන පුද්ගලයකු හැටියට පත් කරන්න ඕනෑ කියලා.

මට කලින් කථා කරපු අපේ මන්ත්‍රීතුමියලා තවත් සංශෝධන ගැන කිව්වා. අපි විශ්වාස කරනවා, Committee Stage එකේදී ඒ සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන් වෙයි කියලා. ඒ වාගේම අපි දකින විධියට මෙතැනදී කාන්තා අයිතිවාසිකම් හැටියට පිළිගෙන තිබෙන්නේ, අධ්‍යාපනයට සහ රැකියා අවස්ථා සඳහා පිවිසීමට කාන්තාවන්ට සමාන අවස්ථා තිබිය යුතුයි කියන කාරණා. විශේෂයෙන්ම CEDAW එකේ ඉලක්කවල - targetsවල - තිබෙනවා, සමානාත්මතාව, රැකියාවට ඇති ප්‍රවේශය, සෞඛ්‍යයට ඇති ප්‍රවේශය, අධ්‍යාපනයට ඇති ප්‍රවේශය, විවාහය සහ පවුල් ජීවිතයට ඇති අයිතිය කියන ඒවා. අපි ඒවා හඳුනා ගෙන නැහැ. ඒවාත් ඉතාම වැදගත් කියන එක මතක් කරන්න ඕනෑ. ඒ නිසා මේ CEDAW එක domestic law එකක් හැටියට ගෙන එනතුරුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන ව්‍යවස්ථාව අහෝසි කරනතුරුත් කාන්තාවන්ට සමස්ත සවිබලගැන්වීමක් ලැබෙන්නේ නැහැ කියන එක අපි මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම අද වෙනකොට කාන්තාවන් විවිධාකාරයේ ප්‍රචණ්ඩත්වයට ලක් වෙනවා. විශේෂයෙන් පොදු ප්‍රවාහනය භාවිත කරන කාන්තාවන්ගෙන් සියයට 90කට වඩා විවිධ හිරිහැරවලට ලක් වෙනවා. මේ තත්ත්වය අපට නීතියෙන් විතරක් වෙනස් කරන්න බැහැ. මට කලින් කථා කළ මන්ත්‍රීවරු කිව්වා අපට සංස්කෘතියක් තිබෙනවා, අපි මානෘත්වයට ගරු කරනවා කියලා. අපි සංස්කෘතියේ තිබෙන ධනාත්මක කාරණා අගය කිරීමට ලක් කරන බව ඇත්තයි. හැබැයි, අපේ සංස්කෘතියේ සමහර තැන්වල තිබෙනවා කාන්තාව පහත් කරලා සලකන අවස්ථා. ඒ නිසා අපි ආකල්පමය වෙනසක් ඇති කරන්න ඕනෑ. කාන්තාව සහ පිරිමියා එකිනෙකා තේරුම් ගෙන, එකිනෙකාට ගෞරව කරන ඒ ආකල්පමය වෙනස ඇති කරන තාක් කල් අපට නීතියෙන් පමණක් සමහර දේවල් ලබා ගන්න බැරි වෙයි කියලා මම හිතනවා.

විශේෂයෙන් දෙමාපියන් ගෙදරදී ගැහැනු දරුවා සහ පිරිමි දරුවා හඳන සහ රැක බලා ගන්නා ආකාරයේ වෙනසක් තිබෙනවා. එතැනදී තමයි අපි gender imbalance එක, මෙම අසමානතාව හඳුන්වා දෙන්නේ. ගැහැනු දරුවාට වඩා පිරිමි දරුවා බලවත් කියන හැඟීම දෙමාපියන් ඇති කරලා තිබෙනවා. ඒ නිසා ඒ සමානාත්මතාව ගෙදරදීමයි පටන් ගන්න ඕනෑ. ගැහැනු දරුවෙක් වේවා, පිරිමි දරුවෙක් වේවා ඔවුන්ට සමාන අවස්ථා ලබා දීලා, ඔවුන්ගේ හැකියා සහ දක්ෂතාවලින් ඉදිරියට යන්න ඉඩ ප්‍රස්ථා ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම ගැහැනු සහ පිරිමි දරුවන්ට එකිනෙකාට ගෞරව කර ගන්නා ආකල්ප අපි අධ්‍යාපනය තුළින් පෝෂණය කරන්න ඕනෑ. නීති ගේනවා වාගේම, ආකල්පමය වෙනස තුළින් තමයි අපි ගෞරවනීය සමාජයක ජීවත් වෙන්න පුළුවන් වටපිටාව සකස් කර ගන්න ඕනෑ.

අද සමහර වෙලාවට ගැහැනු දරුවෙක් පාරක යනවිට විවිධ උසුළු විසුළු කිරීම්වලට ලක් වෙනවා. ඒ අපේ පහත් ආකල්ප නිසායි. ඒ නිසා තවදුරටත් අපට හැම එකක්ම සංස්කෘතියටම යටත් කරන්න බැහැ. සමහර ජන කොටස් කාන්තාවන් සහ තරුණ ගැහැනු දරුවන් පීඩනයට ලක් කරනවා නම්, ඊට එරෙහි වීමට අපි සියලුදෙනාම කටයුතු කරන බවත් මතක් කරන්න ඕනෑ.

අපි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. අද දරිද්‍රතාව නිසා බොහෝ ගැහැනු දරුවන්ට මාසික ඔසප්වීම්වලදී සනීපාරක්ෂක තුවා පාවිච්චි කිරීමේ ලොකු ගැටලුවක් තිබෙනවා. මේ පිළිබඳව කාන්තා සංසදය අපේ රාජ්‍ය අමාත්‍යතුමියට විටින් විට කරුණු, යෝජනා ඉදිරිපත් කළා. වරෙක එතුමිය මැදිහත් වුණා, ඒවාට තිබුණු taxes සම්පූර්ණයෙන් ඉවත් කරන්න. හැබැයි, නැවත VAT එක introduce කළාම සනීපාරක්ෂක තුවාවල මිල අධික වුණා. නමුත්, පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාගේ පූර්ණ සහයෝගයෙන් කාන්තා සංසදයට හැකියාව ලැබුණා අපේ අධ්‍යාපන අමාත්‍යතුමා සමඟ කථා කරලා තෝරා ගත් පාසල්වල ගැහැනු දරුවන්ට අවශ්‍ය සනීපාරක්ෂක තුවා නොමිලේ ලබා දීමට. මම හිතන විධියට ඒ ජාතික උත්සවය 06වෙනි දා පැවැත් වෙනවා. විශේෂයෙන් අපේ කාන්තා සංසදයේ සියලු මන්ත්‍රීතුමියලාට මගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරන්න ඕනෑ, ඒ සෑම කටයුත්තකදීම අපට ශක්තිය සහ සහයෝගය ලබා දීම පිළිබඳව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තමයි gender pay gap එක. අපේ රටේ රජයේ සේවයේ එකම රැකියාව කරනකොට කාන්තා සහ පුරුෂ කියලා වැටුප්වල වෙනසක් නැහැ. හැබැයි අපේ සමාජයේ සමහර කොට්ඨාසවල, පෞද්ගලික අංශයේ එකම රැකියාව කළත් පුරුෂයන්ට වඩා අඩු වැටුප් කාන්තාවන්ට ගෙවන තැන් තිබෙනවා. කාන්තා සංසදය මේ වෙනකොට ඒ සම්බන්ධ පර්යේෂණයක් - research එකක් - කරනවා, ඒ gender pay gaps තිබෙන තැන් ටික හඳුනාගෙන, ඒ සඳහා අවශ්‍ය නීති කෙටුම්පත් කරලා, ඒවා අවම කිරීමට මැදිහත් වීම සඳහා. මම විශ්වාස කරනවා ඒ පර්යේෂණයේ ප්‍රතිඵල හරහා අපට කටයුතු කරන්න හැකියාව ලැබෙයි කියලා.

කාන්තාවන් සමහර ක්ෂේත්‍රවලින් කොපමණ ඉදිරියට ගිහිල්ලා හිටියත්, විශේෂයෙන්ම තීන්දු තීරණ ගන්නා මට්ටමේදී අපි ඉන්නේ බොහෝම පහළ. විශේෂයෙන්ම අපි මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට. පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය සියයට 2ට වඩා අඩුවෙන් තිබුණේ. එතුමා අග්‍රාමාත්‍යතුමා හැටියට සිටියදී ඒකට සියයට 25ක කෝටාවක් ගෙනාවා. අද වෙනකොට පළාත් පාලන ආයතන විසුරුවලා. හැබැයි කාන්තාවන් සියයට 23ක් ඒ පළාත් පාලන ආයතනවල හිටියා.

ඒ, ඉතාම දක්ෂ කාන්තාවන්. හැකියාව තිබෙන කාන්තාවන්. කාන්තා සංසදයට හැකියාව ලැබුණා, විවිධ අවස්ථාවල විවිධ සංවිධානත් එක්ක එකතු වෙලා එම කාන්තාවන් පුහුණු කරලා ඊළඟ පියවර හැටියට ඔවුන්ට පළාත් සභාවට වුණත් යන්න පුළුවන් මට්ටමට ඔවුන්ගේ හැකියාව, කුසලතාව නිර්මාණය කරන්න, වර්ධනය කරන්න මැදිහත් වෙන්න. පළාත් සභාව තුළ -පළාත් සභා නීතිය ක්‍රියාත්මක නොවුණාට- සියයට 25ක කෝටාවක් කාන්තාවන් වෙනුවෙන් වෙන් වෙලා තිබෙන බව අපි දන්නවා. අපේ සංසදය විවිධ අවස්ථාවල විවිධ කටයුතු කරමින්

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

පාර්ලිමේන්තු නියෝජනය වැඩි කරගන්නත් කටයුතු කර තිබෙනවා. ඒවායේ සාර්ථක ප්‍රතිඵල තවමත් අපට ලැබී නැහැ. විශේෂයෙන්ම අපි පෞද්ගලිකවම ප්‍රධාන පක්ෂවල මහ ලේකම්තුමන්ලා හමුවෙලා ඉල්ලීමක් කළා, පක්ෂ ව්‍යවස්ථා සංශෝධනයක් කරලා කාන්තා නියෝජනය වැඩිකර ගන්න කියලා. ඒ වාගේම පෞද්ගලික මන්ත්‍රී යෝජනා 2ක් අපි මේ වෙනකොට ඉදිරිපත් කරලා තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225න් 196ක් ඡන්දයෙන් පත් වෙනකොට 29ක් ජාතික ලැයිස්තුවෙන් පත් වෙන්නේ. ඒ 29 දෙනාගෙන් සියයට 50ක් කාන්තාවන් පත් කරන්න කියන යෝජනාව, එක යෝජනාවක්. එය විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමේදී ඇතුළත් කරන්න කියලා අපි ඉල්ලා තිබෙනවා. ඒ වාගේම කාන්තාවන්ට දේශපාලනයට ඇතුළු වෙන්න ලොකු බාධා තිබෙනවා. 1931දී මොලමුරේ මැතිනිය තම ආදරණීය පියාගෙන් පසුව ඡන්දය ඉල්ලුවා. ඒ, ඉතාම ගෞරවනීය අවස්ථාවක්. මොකද, පුරුෂාධිපත්‍යය තිබිච්ච වෙලාවක එතුමියට ලොකු ශක්තියක් ලැබුණා, තරග කරලා දේශපාලනයට එන්න. හැබැයි අවුරුදු අනූ ගණනකට පසු අදත් බහුතරයක් කාන්තාවන් දේශපාලනයට එන්නේ, ස්වාමිපුරුෂයාගේ ඇවෑමෙන්, එක්කෝ සහෝදරයාගේ ඇවෑමෙන්, එහෙම නැත්නම් පියාගේ ඇවෑමෙන්. ඔක්කොම නොවෙයි, බහුතරයක් එහෙමයි. ඒ ක්‍රමය වෙනස් කරන්න කියලායි අපි කියන්නේ. අද කාන්තාවන්ට දේශපාලනයට ඇතුළු වෙන්න බැරිවෙලා තිබෙන්නේ ප්‍රධාන පක්ෂවල තීන්දු-තීරණ ගන්නා තැන්වල, nomination boardsවල කාන්තාවන් නොමැති නිසායි. අපේ ප්‍රධාන පක්ෂවල නායකයන් හැටියට තවමත් සිටින්නේ පුරුෂයන් පමණයි. පුරුෂාධිපත්‍යය නිසා ඒ තැන්වලට කාන්තාවන් සුදුසුයි කියලා මොනම වෙලාවකවත් හිතන්නේ නැහැ. ඒ නිසා ඒ තැන්වලට කාන්තාවන් යොමු වෙන්නේ නැහැ. ඒ නිසා, ප්‍රධාන පක්ෂවල තීන්දු-තීරණ ගන්නා මට්ටම්වලින් සියයට 30ක්වත් කාන්තාවන් පත් කළ යුතුයි කියලා අපි සංශෝධනයක් ගෙනෙනවා. ඒ තැන්වල කාන්තා නියෝජනය වැඩි කරගන්න පුළුවන් නීතිය හරහා විතරයි. ඉල්ලීම් කළත්, ස්වේච්ඡාවෙන්වත් ඒවා වෙනස් වෙන්නේ නැහැ කියන විශ්වාසය තමයි අපට තිබෙන්නේ. ඒ නිසා තීන්දු-තීරණ ගන්නා මට්ටමින් සියයට 30ක් කාන්තාවන් පත් කරන්න කියලා අපි සංශෝධනයක් ගෙනෙනවා.

ඒ වාගේම තවත් සංශෝධනයක් ගෙනෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ තමයි දිස්ත්‍රික්කයේ නාම යෝජනාවලින් සියයට 33ක් අනිවාර්යයෙන්ම කාන්තාවන්ට දිය යුතුයි කියන එක. මොකද, නීතිය මඟින් විතරයි කාන්තා නියෝජනය වැඩි කරන්න පුළුවන්. තීන්දු-තීරණ ගන්නකොට කාන්තා පුරුෂ දෙගොල්ලන්ම එකතු වුණොත් තමයි ඒ තීන්දු සර්ව සම්පූර්ණ වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

සියයට 52ක ජනගහනයක් පැත්තකට දාලා තමයි දැන් අපි තීන්දු-තීරණ ගන්නේ. අණ පනත් සකස් කරද්දී කාන්තාවන්ගේ අවශ්‍යතා ගැන බොහෝ විට සැලකිල්ලට ලක් වෙන්නේ නැහැ. ඒ නිසා මම මේ අවස්ථාවේදී සතුටු වෙනවා, අද පක්ෂ භේදයකින් තොරව සියලුදෙනාම, -

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

Sir, I would like to give a few minutes to the Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle from the time allotted to me so that she would have more time.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Already, the balance of the Hon. (Mrs.) Muditha Prishanthi's time too had been allotted to her.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමියට. ඔබතුමියගේ වටිනා කාලය මා වෙනුවෙන් ලබා දීම පිළිබඳව අගය කිරීමට ලක් කරනවා.

ගෙදරකදී වුණත් අම්මයි, තාත්තයි දෙන්නාම එකතු වෙලා තමයි තීන්දු-තීරණ ගන්නේ. ඒ දෙන්නා එකතු වෙලා තීන්දු-තීරණ ගන්නකොට ඒ පවුල ශක්තිමත් වෙනවා. ඒ වාගේම ඒ දරුවන්ගේ අනාගතය බොහොම සාර්ථකයි, බොහොම කල එළියි. පවුලේ ආර්ථිකය සීමිත නම්, හැම වෙලාවේම ඒ අම්මා බලනවා ආහාර සුරක්ෂිතතාවට වැඩිපුර සල්ලි වෙන් කරන්න. අම්මා ඒ සල්ලි අරගෙන ෂොපිං ගිහිල්ලා විසිතුරු භාණ්ඩ ගන්නේ නැහැ. ඒ විධියට රටක තීන්දු-තීරණ ගන්නකොටත් කාන්තාවන් සහ පුරුෂයන් කියන දෙගොල්ලන්ම එක තැනක වාඩි වෙලා තීන්දු-තීරණ ගන්නවා නම් ඒක වඩාත් යහපත් වෙයි කියලා මම විශ්වාස කරනවා.

අපේ පවිත්‍රාදේවී වන්නිආරච්චි මැතිනියට අපි ගරු කරනවා. ඇය තමයි මේ ආණ්ඩුවේ සිටින එකම කැබිනට් අමාත්‍යවරිය. හැබැයි, අනාගත පාර්ලිමේන්තුවක දී මීට වඩා කාන්තාවන් කැබිනට් මණ්ඩලය තුළ වාඩි විය යුතුයි කියා අපි බලාපොරොත්තු වෙනවා. මීට වඩා රාජ්‍ය අමාත්‍යවරියන් සිටිය යුතුයි කියා අපි බලාපොරොත්තු වෙනවා. එහෙම වුණොත් මේ රටට හිතකර තීන්දු-තීරණ රාශියක් ගන්න පුළුවන් වෙයි කියලා මා හිතනවා.

ඒ වාගේම අපි මේ පනත් කෙටුම්පත සකස් කරන්න තව ප්‍රධාන කාරණාවක් හේතු වුණා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය එකතු වෙලා ප්‍රතිපත්තියක් හැදුවා. විශේෂයෙන්ම මම

මතක් කරන්න ඕනෑ, අපේ රටේ කාන්තා ප්‍රඥප්තියක් හැදුණේ 1993දී බව. ඒ කාන්තා ප්‍රඥප්තියෙන් එදා කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කාන්තා කොමිසමක් වෙනුවට කාන්තා කමිටුවක් පත් කරන්න යෝජනා වුණා. නමුත්, ඔවුන්ට නීතියෙන් කිසිම බලයක් තිබුණේ නැහැ. ඒ නිසා ඒ කාන්තා කමිටුවෙන් බලාපොරොත්තු වෙච්ච අපේක්ෂා ඉෂ්ට කරගන්න ලැබුණේ නැහැ. ඒ වාගේම වරින් වර උත්සාහ ගත්තා, කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳව ප්‍රතිපත්තියක් හදන්න. නමුත්, ඒ සඳහා හැකියාව ලැබුණේත් නැහැ. ඒ අනුව තමයි කාන්තා ප්‍රතිපත්තියක් හදන්න අපට -පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයට- හැකියාව ලැබුණේ. විද්‍යාත්මක පසුබිම එක්ක, විශේෂයෙන්ම කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරු හදපු විද්‍යාත්මක document එකක් base කරගෙන තමයි කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය මේ කටයුත්ත සිදු කළේ. විශේෂයෙන්ම අපේ රාජ්‍ය අමාත්‍යතුමිය ගැනත් මම මතක් කරන්න ඕනෑ. එතුමිය කාන්තා අමාත්‍යාංශයේ ලේකම්තුමිය, අතිරේක ලේකම්තුමිය ඇතුළු කණ්ඩායමට පූර්ණ සහයෝගය සහ නිදහස දුන්නා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය එක්ක එකතු වෙලා මේ ප්‍රතිපත්තිය හදන්න. ඒ වාගේම එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල තාක්ෂණික සහයෝගය සහ ප්‍රතිපාදන ලබා දුන්නා, මේ වෙනුවෙන්. විශේෂයෙන්ම ආචාර්ය රමණි ජයසුන්දර මැතිනියත් මේ අවස්ථාවේ දී අපි සිහිපත් කරන්න ඕනෑ.

අපි ප්‍රධාන තේමා 8ක් ඔස්සේ මේ ප්‍රතිපත්තිය හැදුවා. මම ඒවා එකින් එක කියන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. පළමු තේමාව වුණේ "අනන්‍යතාව සහ ස්වාධීනත්වය". මම ඒ ගැන විස්තර කරන්න යන්නේ නැහැ. මේ ප්‍රතිපත්තියේ දෙවැනි තේමාව වුණේ "ආර්ථික සවිබලගැන්වීම සහ ඵලදායී රැකියා නියුක්තිය". මම හිතන විධියට රටක් හැටියට ගත්තාම ඒක ඉතාම වැදගත් වෙනවා. රටෙන් කොටසක් ආර්ථිකමය වශයෙන් සවිබලගන්වන්නේ නැතිව රටකට දියුණු වෙන්න අමාරුයි. අපේ රටේ කාන්තාව වෙනුවෙන් ආයෝජනය කරනවා, ඇය මවිකුස පිළිසිඳ ගත් දවසේ ඉඳලා විශ්වවිද්‍යාලයෙන් pass out වෙනකල්. හැබැයි, ඒ ආයෝජනයේ උපරිම ප්‍රයෝජන ගන්නේ නැහැ. ඇයට රැකියාවකට ගිහිල්ලා ඒ රැකියාව කරන්න පුළුවන් වටපිටාව, පරිසරය නිර්මාණය කරලා නැහැ. ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමියත් කියපු විධියට, තරුණ යුවළවලට රැකියා කරන්න අවශ්‍ය වටපිටාව හදලා දෙන්න ගුණාත්මක දිවා සුරැකුම් මධ්‍යස්ථාන - day-care centres - ස්ථාපිත කරන්න කටයුතු කරනවා නම් හොඳයි. එහෙම වුණොත් තමයි අපට රටේ ආර්ථික සංවර්ධනය ශක්තිමත් කරගන්න පුළුවන් වෙන්නේ. ඒ වාගේම, කාන්තාව ආර්ථිකමය වශයෙන් ශක්තිමත් වුණොත් තමයි කාන්තාවට පූර්ණ සවිබලගැන්වීමක් ලැබෙන්නේ. එහෙම නැත්නම් ආර්ථිකමය වශයෙන් පුරුෂයා මත යැපෙන්න සිද්ධ වුණොත් බොහෝ විට අද තිබෙන ආර්ථික ප්‍රශ්නත් එක්ක ගෙවල්වල අඩ දබර, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සිදු වනවා අපි දකිනවා. අපට ඒවා අවම කර ගැනීමට හැකියාව ලැබෙන්නේ නැහැ. ඊළඟට, මෙම ප්‍රතිපත්තියේ තුන්වැනි තේමාව වුණේ "සමාජ සමානත්මතාව සහ සවිබලගැන්වීම". එහිදී 3:1 හැටියට අධ්‍යාපනය ගැන කථා කරනවා, සෞඛ්‍ය ගැන කථා කරනවා, මූලික අවශ්‍යතා ගැන කථා කරනවා. ඒ වාගේම මාධ්‍ය ගැන කථා කරනවා. හතරවැනි තේමාව, "පරිසරය සහ ආපදා කළමනාකරණය". පස්වැනි තේමාව වුණේ "තීරණ ගැනීමේදී සමානාත්මතාව". මම ඒ ගැන විස්තර කළා. හයවැනි තේමාව වුණේ "යුක්තිය, සාමය සහ ආරක්ෂාව කරා ප්‍රවේශය" කියන එක. එහිදී අපි subtitles හැටියට "යුක්තිය කරා ප්‍රවේශය", "සාමය සහ ආරක්ෂාව" දක්වා තිබෙනවා. ඊළඟට, හත්වැනි තේමාගත ක්ෂේත්‍රය තමයි මේ ප්‍රතිපත්ති, "ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ නිදහස". එහෙම වුණොත් තමයි කාන්තාවගේ පූර්ණ දායකත්වය පවුලේ වාගේම රටේ සංවර්ධනයට අපට ලබාගන්න පුළුවන් වෙන්නේ. අටවැනි තේමාව තමයි "ගැහැනු ළමයා පිළිබඳ විශේෂ අවධානය සහිත වීම". මේ තුළ ආබාධ සහිත කාන්තාවන්ගේ සහ වෙනත් අවශ්‍යතා ඇති කාන්තාවන්ගේ අවශ්‍යතාත් සැලකිල්ලට අරගෙන තිබෙනවා. මේ වෙලාවේ මම මේ කාරණය විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මේ ප්‍රතිපත්තිය හදන්නත්, නීති-රීති හදන්නත් අපේ සංසදය එක්ක එකතු වෙලා කටයුතු කිරීම පිළිබඳව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා හැටියට අපේ ගරු ජනාධිපතිතුමාටත්, රාජ්‍ය අමාත්‍යතුමියටත්, ඒ වාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු එතුමියගේ කාර්ය මණ්ඩලයටත් මගේ ස්තුතිය පුද කරනවා. ඒක අපට ඉතාම ලොකු ශක්තියක්.

ඊළඟට, මේ සඳහා අපි ක්‍රියාකාරී සැලැස්මක් හදන්න ඕනෑ. මේ ප්‍රතිපත්තිය හැදුවාට ප්‍රතිපත්තියේ තිබෙන දේවල් පොළොවේ පැළ කරන්න නම් කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන සැලසුමක් හදන්න ඕනෑ. ඒ සඳහා නායකත්වය දෙන්නත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය සූදානම් කියන එකත් මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ.

මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද අපි සම්මත කරගන්නේ ඉතා ප්‍රගතිශීලී පනතක්. යම් යම් අඩුපාඩු තිබුණාට එය කාන්තාව සවිබලගැන්වීම සඳහා, කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය පනතක්. මේකේ ගෝනි බිල්ලෙක් නැහැ. සැඟවුණු අමුත්තෝ, සැඟවුණු කාරණා නැහැ. ඒක අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මොකද මීට කලින් කථා කරපු සමහර මන්ත්‍රීවරුන් හිතුවා, ගබ්සා කිරීම් සම්බන්ධව සහ කලලයක ආරක්ෂාවට බාධාවක් වන නීති මේ පනත තුළ තිබෙනවා කියලා. එවැනි කිසිදු ගැටලුවක් මෙහි නැහැ. කාන්තාව, මව කියන චරිතය ආරක්ෂා කරන්න, ශක්තිමත් කරන්න, ඇගේ ඵලදායීතාව වැඩි කරන්න හැමෝටම සතුටින්, සාධාරණව ජීවත් වෙන්න පුළුවන් හොඳ සමාජයක් නිර්මාණය කිරීම සඳහා තමයි මේ පනත ගේන්නේ. සංස්කෘතියට ධනාත්මක දේවල් එකතු කරගෙන ඍණාත්මක දේවල් වෙනස් කරලා කාන්තා-පුරුෂ කියලා වෙනස් බවක් නැතුව අපි කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා අපේ ආකල්ප හදාගන්න ඕනෑ. අපේ සමාජයේ ඉන්නවා, gender minorities. ඒ, ඔවුන් උපන් හැටි. අපට ඒවා වෙනස් කරන්න බැහැ. සමාජයේ නොයෙක් වෙනස්කම් තිබෙනවා. පරිපූර්ණ පුද්ගලයන් හැටියට සමහරුන් ඉපදෙනවා වාගේම තවත් සමහරුන් ආබාධ සහිතවත් ඉපදෙනවා. ඒ සියල්ලන්ටම මේ සමාජයේ සහයෝගයෙන් ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක් අපි හදන්න ඕනෑ. එතැනදී සියයට 51ක් වුණු කාන්තාවගේ ආරක්ෂාව වෙනුවෙන්, කාන්තාව සවිබලගැන්වීම වෙනුවෙන්, කාන්තාවගේ ඉදිරි අනාගතය වෙනුවෙන් ගෙනා ඉතාම ප්‍රගතිශීලී පනතක් ලෙස මෙම පනත හඳුන්වන්න පුළුවන්. පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව සියලුදෙනා එකට එකතු වෙලා මේ ගැන කථා කිරීම පිළිබඳව මගේ සතුට පළ කරමින්, ඒ සඳහා ආදර්ශය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදය ලබා දී ඇති බවත් මම මතක් කරනවා. රට වෙනුවෙන් එකට වැඩ කරන්න පුළුවන් කියන පණිවුඩයත් අපි ලබා දීලා තිබෙනවා. මට අමතර කාලය ලබා දුන් ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනියටත් මගේ ස්තුතිය පුද කරමින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සියලු මන්ත්‍රීතුමියලාට නැවතත් මගේ ගෞරවය හා ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. (Mrs.) Rohini Kumari Wijerathna. You have 10 minutes.

[අ.භා. 3.07]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මැක්සිම් ගෝර්කිගේ "අම්මා" නවකථාවේ ලෝක ප්‍රකට කියමනක් තිබෙනවා, "ලෝකය පවතින්නේ හිරුගේ හිරු කිරණවල රශ්මියෙන් සහ මවගේ කිරි මතයි" කියලා. ඇය සවිබලගැන්වීම, ලොව සවිබලගැන්වීමයි කියන එක ඒකෙන් පැහැදිලි වෙනවා. අපේ රටේ ඇය සවිබලගැන්වීමේ කාර්යයට කර -උර දීපු ගරු ජනාධිපතිතුමාට මගේ ගෞරවනීය ස්තුතිය කාන්තාවක් හැටියට මා පුද කර සිටිනවා. ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපතිතුමිය ප්‍රමුඛකොට ගත් මන්ත්‍රීවරියන් සියලුදෙනාටත්, ඒ වාගේම ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමිය වන තලතා අතුකෝරල මැතිනිය ප්‍රමුඛ ඒ කණ්ඩායමටත් මගේ ගෞරවය මේ වෙලාවේ පුද කර සිටිනවා. මොකද, යම් ප්‍රමාණයකින් හෝ කාන්තාව සවිබලගැන්වීමට අවශ්‍ය පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා යම් ප්‍රවේශයක් ගැනීම සම්බන්ධයෙන්. නමුත්, සවිබලගැන්වීම කියන්නේ පුළුල් මාතෘකාවක්. සවිබලගැන්වීම කියන එක ඇතුළේ අංග කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම ශාරීරිකව සවිබලගැන්වීම, මානසිකව සවිබලගැන්වීම, සමාජයීය වශයෙන් සවිබලගැන්වීම, දේශපාලනිකව සවිබලගැන්වීම සහ ආර්ථික වශයෙන් සවිබලගැන්වීම මෙහිදී කෙරෙන්න ඕනෑ. මේ පනත තුළ මෙන්න මේ කියපු කාරණා කථා වෙනවා නම් එය ඉතා සාර්ථක පනතක් හැටියට මා දකිනවා.

මේ පනතේ කථා වෙනවා, CEDAW එක හරහා කථා කරන කාන්තා අයිතීන් සපුරා ගැනීමේ ඉලක්ක ගැන. හැබැයි, අපේ රටේ CEDAW එක බලාත්මක නොකර ඒ ඉලක්ක සාක්ෂාත් කර ගන්නේ කොහොමද කියන එක පිළිබඳව අපට ගැටලුවක් තිබෙනවා. 1981දී එකඟ වුණු CEDAW එක මේ පනත තුළින් හෝ ක්‍රියාත්මක කර ගන්න පුළුවන් නම්, ඒක මේ රටේ කාන්තාවන් ඇතුළු වැඩ කරන සියලු ජනතාව ලබන ජයග්‍රහණයක් හැටියට මා දකිනවා. විශේෂයෙන්ම මේ පනත තුළින් 190වන සම්මුතිය - Convention 190 - බලාත්මක කර ගන්න අපට හැකියාවක් ලැබෙනවා නම් ඒක ඉතා වැඩදායී වෙනවා.

මොකද, වැඩ බිමේ සිදුවන සියලු ආකාරයේ හිංසා වළක්වා ගැනීම එහි අරමුණ වෙනවා. ඒ තුළ මේ රටේ ඉන්න ජනගහනයෙන් සියයට 52ක් පමණ වන කාන්තාවන් මේ රටේ ආර්ථිකයට දායක කර ගැනීමේ හැකියාවකුත් තිබෙනවා. ඒකෙන් සෘජුවම ආර්ථිකයටත් යම්කිසි බලපෑමක් සිදුවනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාන්තාවන් පිළිබඳව ජාතික කොමිෂන් සභාවක් පත් කිරීම ඉතාම වැදගත්. හැබැයි මට ගැටලුවක් තිබෙනවා, ඒක ක්‍රියාත්මක වෙන්නේ කුමන ආයතනය හරහා ද කියලා. ඒ පිළිබඳවත් ටිකක් පැහැදිලි කරනවා නම් මා හිතනවා ඉතාම හොඳයි කියලා. ඊළඟට, ඔම්බුඩ්ස්මන්වරියක් පත් කිරීම ගැන හැමෝම කථා කරපු නිසා මම ඒ ගැන දීර්ඝව කථා කරන්නේ නැහැ. නමුත්, එයත් ඉතාම සාධනීය කාරණාවක් හැටියට මා දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ අන්තර්ගතයට සංශෝධන කිහිපයක් එකතු විය යුතුයි. ඒ සඳහා මම යෝජනා කිහිපයක් ඉදිරිපත් කරනවා. 33 වගන්තියෙන් අනතුරුව, "සමාන වටිනාකමින් යුත් රැකියා සඳහා ස්ත්‍රීන් හා පුරුෂයන් අතර සමාන වේතන ලබා දීම තහවුරු කිරීම සඳහා නීති හා ක්‍රියාමාර්ග සංශෝධන කිරීම, ප්‍රවර්ධනය කිරීම" කියන උපවගන්තිය එකතු වෙනවා නම් හොඳයි. මොකද ගරු මන්ත්‍රීවරුන් පැහැදිලි කරනවා මම දැක්කා, රාජ්‍ය සේවයේත්, පෞද්ගලික සේවයේත් එළිපිට නොවුණත්, සමාජයේ සමහර තැන්වලදී කාන්තාවන් ලඝුකොට සැලකීම සහ ඇයට අඩු වේතනයක් ලබා දීම සිදුවන බව. ඒවා නිවැරැදි කර ගන්න අපට මේ පනත තුළින් නීතිමය ප්‍රතිපාදන ලබා දෙනවා නම් ඉතාම වැදගත් වෙනවා.

දෙවන සංශෝධනය හැටියට 27 පිටුවේ, 15 සිට 17 දක්වා ඡේළි ඉවත් කර, "කොමිෂන් සභාව විසින් අරමුදලේ පවත්නා ඊට වහාම අවශ්‍ය නොවන මුදල් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි කාන්තාවන් සවිබලගැන්වීමට සහාය වන්නා වූ වැඩසටහන්වල ආයෝජනය කරනු ලැබිය හැකිය" කියන කොටස ඇතුළත් කරනවා නම් සුදුසුයි කියා මා යෝජනා කරනවා.

මා එලෙස මෙම පනත් කෙටුම්පත සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටින්නේ, අරමුදලේ මුදල් ආයෝජනය කරන්නේ කොතැනද කියන කාරණය පිළිබඳව පැහැදිලි ප්‍රතිපාදන දීලා නැති නිසායි. එහෙම නොවුණොත් ඒවා කොතැනටද යන්නේ කියන එක පිළිබඳව අපට ගැටලුවක් ඇති වෙනවා. මොකද, ඉතිහාසයේ එක එක අරමුදල් එක එක තැන්වලට ගිහින් තිබෙනවා. අපි දැක්කා, ගොවි විශ්‍රාම වැටුප් අරමුදලේ තිබුණු මුදල් අන්තිමට කොහේටද ගියේ කියලා. අභිංසක ගොවියාට විශ්‍රාම වැටුප දී ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා කාන්තාවන් සම්බන්ධයෙන් පිහිටුවන අරමුදලේ මුදල් අනවශ්‍ය විධියට හිතුමතේ කොතැනක හෝ ආයෝජනය කරන්න ගියොත්, ඒකේ පාඩුවත් කාන්තාවටම දරාගන්න වේවි. ඒ නිසා මෙන්න මේ සංශෝධන දෙක ඇතුළත් විය යුතු බව මම යෝජනාවක් හැටියට ඉදිරිපත් කරනවා.

ඊට අමතරව, කාන්තාව ආර්ථිකව සවිබලගන්වන්නත් ඕනෑ. ඇයගේ අනාරක්ෂිත බව තිබෙන්නේ එතැන. ආර්ථික වශයෙන් කාන්තාවක් සවිබලගැන්විලා තිබෙනවා නම්, ඇය අනික් හැම අතින්ම සවිබලගැන්වෙනවා. විශේෂයෙන්ම ආර්ථිකව අස්ථාවර කාන්තාව ස්වාමියා ඉදිරියේ අනාරක්ෂිතයි; පවුලේ නෑදෑයන් ඉදිරියේ අනාරක්ෂිතයි; සමාජය තුළ අනාරක්ෂිතයි. එම නිසා කාන්තාව ආර්ථිකයට දායක කර ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කරලා, ඇය ආර්ථික වශයෙන් සවිබලගැන්වෙනවා නම් ඇය හැම අතින්ම ආරක්ෂිතයි කියන එක මම මේ වෙලාවේ කියනවා. විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත තුළින් කාන්තාව මානසිකව සවිබලගැන්වෙන බවත්, සමාජයීය වශයෙන් සවිබලගැන්වෙන බවත් මම කියන්න ඕනෑ. හැබැයි, කාන්තාව ආර්ථිකව සවිබලගැන්වෙන බව මේ පනත් කෙටුම්පතේ ඇතුළත්ව තිබෙන්නේ කොතැනද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. එම නිසා ඒ කාරණා මෙම පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න කියා මම යෝජනා කරනවා.

කාන්තාව දේශපාලනිකව සවිබලගැන්වීම ගැන අපේ කමිටුවේ සභාපතිතුමියත් දැන් යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. නමුත්, කාන්තාවන්ට පළාත් පාලන ආයතන තුළ සියයට 25ක කෝටාව ලැබුණු පමණින්ම ඇය දේශපාලනිකව සවිබලගැන්විලා තිබෙනවා ද කියලා අපට ප්‍රශ්නයක් මතු වෙනවා. ඇයගේ ගුණාත්මකභාවය ගැන ඒ ආයතන තුළ කොතැනකවත් සමීක්ෂණයක්, පසුවිපරමක් කෙරිලා, ඇයව ප්‍රතිපෝෂණය කිරීමක් කොතැනකවත් සිදු වෙනවා ද කියන ගැටලුව අපට තිබෙනවා. ඒ වාගේම ඇය ආයතනය තුළ කථා කරලා තිබෙනවාද, ඇය ඒ ආයතනයට නව පනත් පිළිබඳව අලුත් යෝජනා ගෙනැවිත් තිබෙනවාද කියන කාරණා සම්බන්ධයෙන් අපට පසුවිපරමක අවශ්‍යතාව තිබෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා,

දේශපාලනිකව කාන්තාව සවිබලගැන්වීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක් ගැනීම මෙම පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න කියලා.

මුලින් කිව්වා වාගේ පළාත් සභාවට, පාර්ලිමේන්තුවට වාගේම ජාතික ලැයිස්තුවටත් අදාළව කෝටාවක් ලබා දීලා කාන්තාව දේශපාලන වශයෙන් සවිබලගැන්වීම සුදුසුයි කියන එක මම මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ. ඒ වාගේම අපි දකිනවා, අපේ කාන්තාවන් කොයි තරම් ඉහළට ඉගෙන ගත්තත්, රජයේ සේවයේ වැඩිපුර හිටියත් රාජ්‍ය පරිපාලන යන්ත්‍රණයම සකස් වෙලා තිබෙන්නේ පිරිමින් විසින් පිරිමින් උදෙසා සකස් කරපු ප්‍රතිපත්ති රාමුවකින් කියන එක. ඒ නිසා ඇතැම් තැන්වලදී කාන්තාවට glass ceiling එකක් තිබෙනවා. කාන්තාවන්ට ඇතැම් රැකියාවල ඉහළට යන්න බැරිකමක් තිබෙනවා. ඒ නිසා කාන්තාවට තිබෙන ඒ බාධා ඉවත් කරලා, ඉදිරියට යන්න අවශ්‍ය වටපිටාව මේ පනත තුළින් ඇත්තටම ඇති වෙනවා නම්, කාන්තාව සැබෑ ලෙස සවිබලගැන්වීමක් සිද්ධ වෙනවා. ඒ සඳහා මේ රටේ සමස්ත රාජ්‍ය සේවය තුළට සහ පළාත් සභා ක්‍රමය තුළට කාන්තා සවිබලගැන්වීම ඇතුළත් කරන්න ඕනෑ කියා අපි යෝජනා කරනවා.

විශේෂයෙන් මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. ප්‍රසූත නිවාඩුව නිසාම ඇතැම් ආයතනවලට කාන්තාවන් බඳවා ගැනීමට අකැමැත්තක් තිබෙනවා. ඒ නිසා ඒ සඳහා වන ප්‍රතිපාදන කෙසේද සකස් විය යුත්තේ කියන එක, එහෙම නැත්නම් ඇයට වැහෙන මේ දොර ඇරලා දෙන්නට ක්‍රමයක් මේ තුළින් සකස් කරලා දෙන්න ඕනෑ කියලා අපි යෝජනා කරනවා.

2022 වර්ෂය ගත්තොත්, විශ්වවිද්‍යාලවලට බඳවා ගත් ප්‍රමාණයෙන් සියයට 60ක් ඉන්නේ කාන්තාවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have one more minute.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

තාර්කිකව ගත්තොත්, අධ්‍යාපනයේදී කාන්තාව සවිබලගැන්විලා තිබෙනවා. ගැහැනු දරුවන් ඉදිරියෙන් ඉන්නවා. නමුත් අධ්‍යාපනයෙන් සවිබලගැන්වුණු කාන්තාවට ඉන් පසුව වුණේ මොකක්ද කියලා කොතැනද සමීක්ෂණයක් කරලා තිබෙන්නේ කියන එක මම මේ සභාවෙන් ප්‍රශ්න කරනවා. ඒ නිසා සවිබලගැන්වෙන කාන්තාවගේ ඉදිරි ගමනට අවශ්‍ය ප්‍රතිපාදන සකස් කරලා දීමත් ඇය සවිබලගන්වන්නට කරන එක කාර්යයක් හැටියට මම දකිනවා.

ඒ වාගේම අපි මේ කාරණය පාර්ලිමේන්තුවේදී දිගින් දිගටම කියනවා. කාන්තාවට හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට සංවේදී වුණු අය වැයක් සකස් කරන්න කියලා මම නැවත වතාවක් යෝජනා කරනවා. ඒ තුළින් කාන්තාව මේ රටේ ආර්ථිකයට දායක කර ගන්නට පුළුවන්කම ලැබෙනවා. සියයට 52ක් වෙච්ච කාන්තාව අමතක කරලා රටක ආර්ථිකය ගොඩ නහන්නේ කොහොමද කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා.

ඒ වාගේම අපේ රටේ පවතින ඇතැම් විවාහ නීති, දේපළ අයිතිය පිළිබඳ නීති, ඉඩම් පිළිබඳ නීති ගැන අපි කථා කරන්න ඕනෑ. මේවා තුළින් කාන්තාවට වෙනස්කොට සැලකීමක් සිද්ධ වෙනවා නම් මේ පනත තුළින් එය වැළැක්වීමට දොරගුළු ඇර දෙන්න -අවශ්‍ය ඉඩහසර හදලා දෙන්න- කියා මම ඉල්ලනවා.

කාන්තාවගේ ආරක්ෂාව වාගේම සනීපාරක්ෂාව ගැනත් අපි කථා කරන්න ඕනෑ. අපි සතුටු වෙනවා, භයවැනි දා පාසල් දැරියන්ට සනීපාරක්ෂක තුවා ලබා දෙන්න කටයුතු කිරීම පිළිබඳව. ඒක බොහොම හොඳයි. නමුත් මට ප්‍රශ්නයක් තිබෙනවා, කාන්තා හිතකර වැසිකිළි කැසිකිළි පද්ධති රජයේ ආයතනවල, පෞද්ගලික ආයතනවල ස්ථාපිත වෙලා තිබෙනවාද කියලා. ඒවා බොහොම ප්‍රාථමික කරුණු. මේ වෙනකොට කාන්තාවන් වෙනුවෙන් ඒවා සකස් වෙලා තිබෙනවාද කියන කාරණයටත් අපි විසඳුම් ලබා දෙන්නට අවශ්‍යයි.

රැකියාවට යන කාන්තාවන්ගේ දරුවන් තියලා යන්න දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉතාම අවශ්‍යයි. විශේෂයෙන් වතුකරයේ දරුවන් තියලා යන්න දිවා සුරැකුම් මධ්‍යස්ථාන තිබෙන බව අපි දන්නවා. හැබැයි, ඒවායේ ප්‍රමිතිය ගැන කියන්නත් කනගාටුයි. දරුවන් තියලා යන සමහර ස්ථානවල එළු පැටව්, හරක් පැටව් ඉන්නවා. මෙන්න මෙවැනි තත්ත්වයක් තුළ වතුකරයේ ජනතාව ගැන අපි විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. ඇයගේ ශ්‍රමය තමයි අපට විදේශ විනිමය වෙලා එන්නේ.

අවසාන වශයෙන් මම කියනවා, කාන්තාව සවිබලගැන්වීමකින් තොරව රටකට අනාගතයක් නැහැ, ලෝකයට අනාගතයක් නැහැ කියලා. නමුත් මොකක්වත් නැති රටක කාන්තාව සවිබලගන්වන්නට මෙවැනි පනතක් ගෙන ඒම පිළිබඳව මම නැවත වතාවක් ගරු ජනාධිපතිතුමාට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයට, ආංශික අධීක්ෂණ කාරක සභාවට ගෞරවය හා ස්තුතිය පුද කරනවා.

(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் பெண்களின் வலுவூட்டல் சட்டமூலம் மீதான விவாதம் நடைபெற்றுக்கொண்டு இருக் கின்றது.

2023ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் தியாக தீபம் திலீபன் அண்ணாவுடைய நினைவேந்தல் காலப்பகுதியில், நாங்கள் அவருடைய திருவுருவப்படம் தாங்கிய ஊர்தியொன்றை அம்பாறையிலிருந்து ஆரம்பித்து வணக்க நிகழ்வுகளுக்காக மக்கள் மத்தியில் எடுத்துச் சென்றோம். ஸ்ரீ லங்கா பொலிஸ் புலனாய்வுப் பிரிவினர், ஸ்ரீ லங்கா அரச புலனாய்வுப் பிரிவினர் மற்றும் இராணுவப் புலனாய்வுப் பிரிவினரின் பங்குபற்றுதலோடு சிங்களக் காடையர்களால் சரிதாபுர பகுதியில் வைத்து எங்களுடைய அந்த ஊர்திமீது தாக்குதல் நடத்தப்பட்டது. அதுமாத்திரமன்றி, என்மீதும் சட்டத்தரணி காண்டீபன்மீதும் எங்களுடைய கட்சி உறுப்பினர்கள் மீதும் மோசமான தாக்குதல்கள் நடத்தப்பட்டன. அந்த ஊர்தியைச் செலுத்திய சாரதியான தர்மலிங்கம் தர்மிலனை கடந்த மே மாதம் 28ஆம் திகதி பயங்கரவாத விசாரணைப் பிரிவினர் விசாரணைக்கென கொழும்புக்கு அழைத்து, அவருக்கு கைவிலங்கிட்டு, தலையில் கைத்துப்பாக்கியை வைத்து அச்சுறுத்தி, விசாரணை செய்திருக்கிறார்கள். இந்தச் செயற்பாட்டை நாங்கள் மிகவும் வன்மையாகக் கண்டிக்கின்றோம்.

திருகோணமலையில் நடைபெற்ற அந்தத் தாக்குதல் சம்பவத்தைத் திரிபுபடுத்துவதற்கும், அந்தச் சம்பவத்துக்குக் காரணமான உண்மையான குற்றவாளிகளை அடையாளங் காட்டுகின்ற செயற்பாடுகள் எதிர்காலத்தில் நடைபெறாமல் தடுப்பதற்குமாகத்தான் - அதிலிருந்து விலகிச்செல்ல வைப்பதற்குமாகத்தான் - இந்த விசாரணை நடைபெற்றிருக்கிறது. இது தொடர்பாக அரசாங்கம் உரிய விசாரணைகளை மேற்கொள்ள வேண்டும். லொஹான் ரத்வத்தே அவர்கள் அநுராதபுர சிறைச்சாலையில் கைதிகளை அச்சுறுத்திய சம்பவத்தின் பின்னரும் தொடர்ச்சியாக இராஜாங்க அமைச்சராக இருந்து வருகின்றார். இன்று இவ்வாறான சம்பவங்கள் நடைபெறுவது சர்வசாதாரணமாகிவிட்டது. இந்த நிலைமை நீடிக்கக் கூடாது. இதற்கு முற்றுப்புள்ளி வைக்கப்பட வேண்டும். எனவே, கைவிலங்கிட்டு, தலையில் கைத்துப் பாக்கியை வைத்து, விசாரணை நடத்திய அதிகாரிகள் தண்டிக்கப்பட வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அண்மையில் க.பொ.த. உயர்தரப் பரீட்சைப் பெறுபேறுகள் வெளிவந்தன. எனினும், திருகோணமலை மாவட்டத்திலுள்ள ஒரு பாடசாலையில் மாணவிகளுடைய பெறுபேறுகள் வெளிவரவில்லை என்ற ஆதங்கம் சகோதர முஸ்லிம் மக்கள் மத்தியில் இருக்கின்றது. அந்தச் சமூகத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர்களும் இங்கு இவ்விடயம் தொடர்பில் தங்களுடைய கவலையை வெளிப்படுத்தி இருந்தார்கள். திருகோணமலை ஸாஹிரா கல்லூரியிலிருந்து பரீட்சைக்குத் தோற்றிய 70 மாணவிகளுடைய பரீட்சைப் பெறுபேறுகளே இவ்வாறு நிறுத்தி வைக்கப்பட்டு இருக்கின்றது. இது உண்மையிலே மிகவும் கவலைக்குரிய விடயமாகும். அந்த மாணவிகள் பெரும் கனவுகளோடு தங்களுடைய கல்வியைத் தொடர்ந்தவர்கள். அவர்களுடைய பரீட்சைப் பெறுபேறுகள் நிறுத்திவைக்கப்பட்டு இருப்பதானது, அவர்களுக்குப் பெரும்

ஏமாற்றத்தையும் அதிருப்தியையும் விரக்தியையும் ஏற்படுத்தி இருக்கிறது. எனவே, இந்த விடயத்தில் மதம் சார்ந்து, இனம் சார்ந்து பாரபட்சம் நடைபெற்றிருக்கின்றதா என்பது தொடர்பில் ஆராயப்பட வேண்டுமெனவும், பாதிக்கப்பட்டுள்ள அந்த மாணவிகளுக்கு உடனடியாக நீதி வழங்கப்பட வேண்டுமெனவும், அந்த மாணவிகளுடைய பெறுபேறுகள் உடனடியாக வெளியிடப்பட வேண்டுமெனவும் நான் இந்த இடத்தில் பொறுப்புணர்வோடு வலியுறுத்திக் கேட்டுக்கொள்கின்றேன்.

பல்கலைக்கழக கல்விசாரா ஊழியர்கள் கடந்த மாதம் 2ஆம் திகதி தொடக்கம் இன்றுவரை - கிட்டத்தட்ட 34 நாட்களாக - தொடர் வேலைநிறுத்தப் போராட்டத்தில் ஈடுபட்டு வருகின்றார்கள். இவர்களுடைய கோரிக்கைகளை இன்றுவரை கல்வி அமைச்சு கண்டுகொள்ளவில்லை. அதன் காரணமாக கிட்டத்தட்ட 120,000 மாணவர்கள் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள். எனவே, உடனடியாக இந்தப் பல்கலைக்கழக கல்விசாரா ஊழியர்களுடைய கோரிக்கைகள் நிறைவேற்றப்பட வேண்டும். பல்கலைக்கழக விரிவுரையாளர்களுக்குச் சம்பள உயர்வு வழங்கப்பட்டு, அவர்களுடைய ஏனைய கோரிக்கைகளும் நிறைவேற்றப்பட்டு இருக்கின்றன. இந்நிலையில், பல்கலைக்கழகங்களில் கல்வி கற்கின்ற மாணவர்களுடைய நலன்களுக்காகவும் சமூகத்தின் உயர்வுக்காகவும் மிக நீண்ட காலம் அர்ப்பணிப்போடு உழைத்து வருகின்ற பல்கலைக்கழக கல்விசாரா ஊழியர்களின் சம்பள முரண்பாடு சார்ந்த கோரிக்கைகளும் சம்பள உயர்வுக் கோரிக்கைகளும் கருத்தில் எடுக்கப்படாமல் இருப்பதென்பது மிகவும் வேதனை அளிக்கின்றது.

அரசாங்கம் அரசியலுக்காகப் பல்கலைக்கழக விரிவுரையாளர்களின் சம்பள உயர்வைச் செய்துவிட்டு, கல்விசாரா ஊழியர்களைப் புறக்கணிக்கின்றதா? என்ற கேள்வி எழுகின் றது. பல்கலைக்கழக விரிவுரையாளர்களுக்குச் சம்பள உயர்வைச் செய்யாவிட்டால், அவர்கள் கற்பித்தல் நடவடிக்கைகளை நிறுத்தி விடுவார்கள். அதனால் பெரும் குழப்பம் ஏற்படும் என்பதற்காக அவர்களுக்குப் பயந்து, மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் அவர்களுக்கான சம்பள உயர்வைச் செய்துவிட்டு, பல்கலைக்கழகங்களின் வளர்ச்சிக்காகவும் அவற்றினுடைய நலன்களுக்காகவும் மிக நீண்ட காலமாக அர்ப்பணிப்போடு உழைத்து வருகின்ற கல்விசாரா ஊழியர்களின் கோரிக்கைகளை 2016ஆம் ஆண்டிலிருந்து புறக்கணித்து வருவதென்பது ஏற்றுக்கொள்ள முடியாது. ஆகவே, உடனடியாக அரசியல் சித்து விளையாட்டுக்களை விடுத்து, சமூகத்தினதும் நாட்டினதும் உயர்வுக்காக சிறந்த மாணவர்களை உருவாக்குகின்ற அல்லது எதிர்கால தொழிற்றுறைக்குத் தகுதியானவர்களை உருவாக்குகின்ற பல்கலைக்கழகங்களில் பணியாற்றுகின்ற கல்விசாரா ஊழியர்களின் சம்பள உயர்வுக் கோரிக்கை நியாயமான முறையில் பரிசீலிக்கப்பட வேண்டும். இன்று வரையில் அவர்கள் சார்ந்த தொழிற்சங்கங்களைக்கூட முறையாகச் சந்தித்து, அவர்களுடைய பிரச்சினைகள்கூட கேட்டறியப்படவில்லை என்ற ஆதங்கம் அவர்கள் மத்தியில் இருக்கின்றது.

ஆகவே, இவ்வாறான பொறுப்பற்ற செயற்பாடுகளை மேற்கொள்வதைக் கைவிட்டு, உடனடியாக கல்வி அமைச்சும் அரசாங்கமும் பல்கலைக்கழக கல்விசாரா ஊழியர்களை அழைத்து, அவர்களுடைய பிரச்சினைகளைக் கேட்டறிய வேண்டும். அவர்களுடைய கோரிக்கைகளை உடனடியாக உங்களால் நிறைவேற்றமுடியாவிட்டாலும்கூட, அவர்களுடைய கோரிக்கைகளை குறிப்பிட்டதொரு காலப்பகுதியில் நிறைவேற்றி வைப்போமென்ற உத்தரவாதத்தையேனும் வழங்கி, அவர்களுடைய வேலைநிறுத்தப் போராட்டத்தை முடிவுக்குக் கொண்டுவருவதற்கு நீங்கள் முன்வர வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
Madam, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, Hon. State Minister.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் பல்கலைக்கழக கல்விசாரா ஊழியர்கள் பற்றிப் பேசுவது சந்தோசமாக இருக்கின்றது. தொடர்ந்து மூன்றாவது நாளாக நாங்கள் இன்று காலையிலும் வேலைநிறுத்தம் செய்கின்றவர்களுடைய முக்கிய நபர்களுடன் பேச்சுவார்த்தை நடத்தினோம். இந்த வாரம் முடிவதற்குள் இது தொடர்பில் நல்லதொரு முடிவுக்கு நாங்கள் வருவதற்கான எல்லா ஆயத்தங்களும் செய்யப்பட்டு இருக்கின்றன. அதற்கு உங்களுடைய உதவியும் தேவையாக இருக்கின்றது. தற்பொழுது யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தின் துணைவேந்தர் வெளிநாடு சென்றிருக்கின்றார். அவர் இலங்கைக்கு வந்தவுடன், நாங்கள் யாழ்ப்பாணப் பல்கலைக்கழகம் குறித்தான தீர்மானத்தை எடுப்போமென நான் இந்தச் சபையில் சொல்ல விரும்புகின்றேன்.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, அது நல்ல விஷயம்! நீங்கள் இது தொடர்பாக அக்கறையுடன் செயற்பட்டு, உடனடியாக இந்த வேலைநிறுத்தப் போராட்டத்தை முடிவுக்குக் கொண்டுவர வேண்டும். அவர்களுடைய கோரிக்கைகள் ஏற்றுக்கொள்ளப்பட வேண்டும் என்பது மிகப் பிரதானமானது. அதற்காக நீங்கள் எடுக்கின்ற முயற்சிகளுக்கு நான் நன்றி தெரிவிக்கின்றேன். உடனடியாக இந்த விடயம் கவனத்திற் கொள்ளப்பட வேண்டுமெனக் கேட்டு, என்னுடைய கருத்துக்களை நிறைவுசெய்கின்றேன். நன்றி!

[4.20 p.m.]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Presiding Member, first of all, I must congratulate the Women Parliamentarians' Caucus consisting of the Hon. (Dr.) (Mrs.) Sudarshini Fernadopulle, the Hon. (Mrs.) Thalatha Athukorala and yourself, Madam, for initiating this Women Empowerment Bill. This has been discussed for a long period of time and I am glad that it is finally going to be made into a law in this country.

Madam, I want to just pick one matter coming under this piece of legislation. That is, equal access in terms of menstrual products for young women, particularly school girls. You know that there is a concept called "horizontal inequality". Horizontal inequality means that if you belong to a particular group and by actions of the Government - I am talking about this in terms of public finance, budgetary allocations and what the Government spends on public goods - if you do not have adequate or equal access to services, then you can classify that situation as being horizontally unequal or horizontal inequity. Throughout the day, we have been hearing in this Parliament about women empowerment. Even though women comprise 52 per cent of our population, Madam, only 5 per cent of the Members in this House are women including you, Hon. (Mrs.) Rohini Kumari Wijerathna.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

So, when a matter is discussed here, obviously, you all have a little bargaining power; men always have their way.

Then, if we take gender equal budgeting, I must say that the Women Parliamentarians' Caucus has been pushing for that agenda since this Parliament was elected in 2020. That Caucus, I must mention, has also been supported by the NDI, the Westminster Foundation for Democracy, the Advocata Institute, the Centre for Poverty Analysis, Verite Research and others, who came before it on multiple occasions, and has been talking about and making aware, particularly the male Members, about the need to address the issue of period poverty. It is well known that more than 50 per cent of women in this country are not able to spend adequate amounts monthly on menstrual products. What this means is that many young girls who go to school otherwise stay at home on such days because they do not have access to these products. As a father, I know this. My daughter always tells me, "*Thaththa*, you do not understand what it means to be a woman. You do not bleed." I say, "Okay, I understand." This is a conversation I have had with my daughter ever since she was 11 or 12 years of age. Over the years, I have come to realize how it has affected them. Like the Hon. Eran Wickramaratne said earlier, you do not choose to be a man or a woman.

In this situation, lack of access to menstrual products has become a huge problem to some women in the society.

Madam, I articulate once again the issue I raised earlier, that there is horizontal inequality across the gender. If you are a woman, you are subjected to this horizontal inequality among women, within the gender also. Some women who are wealthy do not have a problem, but those who are not, do have a problem with regard to having access to these products. So, in fact, I am trying to tell my daughter and all other daughters of all fathers in this country that this Parliament is finally trying to address that issue. I want to tell my daughter that I have not failed her and the millions of other daughters. While it is a fact that my daughter is not going to avail herself of this subsidy provided by the State, for anyone who wishes to avail themselves of this subsidy, I wish to say that finally, it is actually happening.

Now that the Hon. Minister of Education is also approaching his seat, I must bring to his attention that the first proposal made to this House was to consider providing vouchers for menstruating, school-going young women to buy menstrual products on the condition that it has to be decided upon by themselves and their parents whether they want to avail themselves of that voucher or not. On that condition, we proposed a certain budget. We said, "Look, this is what it would cost the Government to ensure that every school-going, young woman is able to overcome period poverty because the Government and this Parliament, by far controlled by men, have now taken the decision to consider the plight of those young women." Therefore, we, as the Committee on Public Finance - my Colleague the Hon. (Dr.) Suren Raghavan is also here - proposed to this House that a voucher be provided to them. The original estimate was about Rs. 11 billion based on the calculations we had made. Subsequently, after many discussions in the Committee on Public Finance, in the Women Parliamentarians' Caucus and with the staff concerned of the Hon. Ministry of Education, the Ministry of Defence and the Ministry of Finance, the Hon. Minister of Education has allocated Rs. 1 billion starting from this week to provide vouchers for 800,000 school-going women.

I applaud you, Hon. Minister. That is something which should have happened long years back, but it is finally happening.

Madam, there is another issues I want to raise here. The UNICEF and others have calculated that the average length of a menstrual period of a woman is about four-and-a-half days and the number of sanitary pads required per day is four. That means, the total number of sanitary pads required per cycle is about 18 and the average price of a sanitary pad is about Rs. 18.75. Hon. Minister, I looked at the calculation you have made. You are going to allocate Rs. 150 for a packet of sanitary napkins. I surfed on the Internet to see what brands you could buy at Rs. 150. We understand that only 4 per cent of sanitary napkins are imported and 96 per cent are made locally. One company owns a 76 per cent market share and the other company has a market share of 20 per cent. If you look at the average prices of sanitary napkins - I do not want to read the brand names - the lowest is Rs. 219 for a packet of 10 napkins. Then, other brands cost Rs. 315, Rs. 439, Rs. 300, Rs. 425, Rs. 420, Rs. 425 et cetera. So, you are going to allocate only Rs. 150 per month per school girl. I found that there is one particular brand you could buy for Rs. 150, but that packet has only eight sanitary pads. Eight sanitary pads are not enough. According to health professionals, Hon. Minister, a women needs 15 to 16 sanitary pads per cycle, which means you have to give at least Rs. 337.50 per girl child per month. So, if you calculate that amount assuming there are 1,234,651 young girls of school-going age between grade 6 and 13, you will find that you need to provide Rs. 5 billion per year for that project. You also can do the calculation and it will come to about Rs. 5 billion. Then, assuming there are only six more months remaining in this year, you have to provide half that amount, which means two-and-a-half billion rupees. Hon. Minister, you have already allocated Rs. 1 billion. So, for the remaining six months, you are short of another one-and-a-half billion rupees. Suppose you are going to give the voucher to only 800,000 young school girls as opposed to the 1.2 million who are there, then you are short of about Rs. 620 million .

Hon. Minister, my point is, do not start the programme by giving it to just 800,000 school girls. You say that you are going to focus on schools in difficult and rural areas. But, my suggestion is this, Hon. Minister. There are school-going, young women in Obeysekarapura and Bandaranayakapura in my area, Kotte, too, who cannot afford to buy such products. So, it does not have to be only school girls in rural areas; it does not have to be only

those in remote areas. It could also be those in the cities; it could also be those in Colombo 05 or Mattakkuliya. So, what I am saying is, do not do it like that. My proposal is to give them a voucher. The school teacher can make that decision and tell the school girls, "Here is the letter. You can take it to your parents." Then, the parents could reply saying, "Yes, we want the voucher for our daughter." If they want the voucher, give them the voucher. If you have only 1.2 million school girls of that age, let us say only 50 per cent of them face period poverty. Then, you are going to need only 600,000 vouchers. So, let the mother decide, let the girl child decide whether the voucher is needed or not; you do not decide that, Hon. Minister. So, that way, there would be a fairer and equitable distribution of those vouchers as opposed to the Minister, the chairman of the committee or somebody else deciding on that. Therefore, my point is, let us do it in the right way; let us not fail. If you start giving a voucher, from which the number of pads that could be bought would not be enough for a month, then they would be disappointed with this whole programme. If they would be disappointed with the whole programme, then it would fail. Therefore, it would be better to give a voucher adequate enough to buy the required number of pads for a month, at least, to a smaller number of school girls. Eight pads per month is not enoughe for them. I, as a father, know that eight pads a month is not enough for them. I have no problem with talking about this.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Your time is over, Hon. Member. Please wind up.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Within a minute, I will finish.

I have no problem with talking about this. As I said earlier, my daughter told me, "*Thaththa*, you do not know about menstruating. You try going through it!" So, I know how difficult it is for them.

We are happy about the implementation of this programme. I understand that its launch is going to take place at the Janadhipathi Balika Vidyalaya, Kotte, my own Electorate. Unfortunately, even though I am the person who submitted that proposal to this House, I have not been invited to its launch. That is okay; it does not matter as long as the programme goes through. I congratulate and encourage you, Hon. Minister.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
You have to join them.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I do not need to join them. How can I? I am not a woman; I am a man.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
That is why we are inviting you.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
They are inviting only women. I am the one who fought for it. I fought for it and will continue to fight for it.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
You can improve it.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I will certainly improve it in the future because in the next six months, we will take office. Our Leader, the Hon. Sajith Premadasa, is the one who talked about this in 2019 when many of you all - I am not saying that you did, Hon. Minister - laughed at it. Many women laughed at it; some so-called "actresses" came on television and laughed at it. They called the Hon. Sajith Premadasa "Pad Man"; they called him "Pad Man". There is no problem with being called "Pad Man". We are proud that he was called "Pad Man" because it was his idea that you all are finally implementing. Also, let us celebrate this Bill, which you have really been responsible for bringing in, Madam Chair.

There is one last point I want to mention here. That is, a 51.6 per cent effective tax is charged on imported raw materials. Only 4 per cent of the sanitary pads needed are imported and you import the raw materials needed to make them locally. Those raw materials are taxable. If you look at the data furnished by the Committee on Public Finance, you will see that you collect a miniscule amount by taxing the raw materials needed for sanitary napkins. So, give it up.

Let us get rid of the 51.6 per cent effective tax on raw materials imported to make sanitary napkins because, according to the Ministry of Finance, only Rs. 37 million was collected from that. So, what is the point in having that?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I will in one minute, Madam.

The last point I am going to make is that there are also - maybe, you need to consider that - what are called reusable fabric sanitary napkins. It is being championed

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

by no less a person than Selyna Peiris of the "Selyn Foundation" under the flagship of #BleedGood. We all participated in its presentation. So, probably, there are other alternatives - reusable fabric menstrual products - to disposable pads, which you can also look at.

In conclusion, I would like to say that we are happy, for my daughter and all the other daughters in this country, about the implementation of this programme and their fathers are standing up today to support the Women Empowerment Bill. It is a proud day for me and all the fathers who are here. Let us hope that this would only be a start and that we would build on this, ensuring that there would be a day when there would not be a need for discussion on women's empowerment anymore because every woman in this country would be empowered.

Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමීය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.38]

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (වනජීවී හා වන සම්පත් සංරක්ෂණ සහ වාරිමාර්ග අමාත්‍යතුමිය)
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரும் நீர்ப்பாசன அமைச்சரும்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law - Minister of Wildlife and Forest Resources Conservation and Minister of Irrigation)
මට එතරම් කාලයක් අවශ්‍ය වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම බෙහෙවින් සතුටු වෙනවා, අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ බෙහෙවින් ක්‍රියාකාරී නායිකාවක විධියට කටයුතු කරන ඔබතුමිය මූලාසනයේ සිටින මේ අවස්ථාවේ මෙම ගරු සභාව ආමන්ත්‍රණය කරන්නට ලැබීම ගැන. විශේෂයෙන් මේ කාලය කාන්තාවන්ට, කාන්තා අයිතිවාසිකම්වලට යම් තැනක් ලැබෙන කාලයක් කියලා මට හිතෙනවා. ඒ වාගේම, අනාගතයේදීත් එසේම වේවි කියලා මට හිතෙනවා. පාර්ලිමේන්තුවේ අවධානය කාන්තාවන් කෙරෙහි යොමු වෙලා කාන්තාවන්ට සමානව සැලකිය යුතුයි, කාන්තාවන්ගේ අයිතීන් සුරක්ෂිත කළ යුතුයි, කාන්තාවන්ට සම අවස්ථා ලබා දිය යුතුයි කියන මතවාදය ලංකාවේ මනෝභාවයක් විධියට ඇති වීම ගැන කාන්තාවක් විධියට මම සතුටු වෙනවා.

අද අප මේ කටයුත්ත කරන්නේ ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන්. කාන්තා කටයුතු විෂයය භාරව ඉන්න අමාත්‍යවරයා විධියට එතුමා රාජ්‍ය ඇමතිනී ගරු ගීතා කුමාරසිංහ මැතිනියත් එක්ක එකතු වෙලා මේ රටට දායාද කරපු මේ පනත් කෙටුම්පත මේ රටේ කාන්තාවන්ට තව පියවරක් ඉදිරියට යන්න විශේෂ අවස්ථාවක් ලබා දීමක් කියලා මම හිතනවා. කාන්තාවන් ගැන බොහොම හිතවාදීව කටයුතු කරලා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන අපි අපගේ ස්තුතිය පළමුවෙන්ම අපේ ගරු ජනාධිපතිතුමාට පුද කරන්න ඕනෑ. ගරු රාජ්‍ය ඇමතිතුමියටත් ස්තුතිය පුද කරන්න ඕනෑ. ඒ වාගේම, මේ සඳහා සුවිශේෂී කාර්යභාරයක් කරපු අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සභාපතිතුමිය වන ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය ප්‍රමුඛ පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව එම සංසදයේ කටයුතු කරන සියලු ගරු මන්ත්‍රීතුමියලාටත් අපේ ස්තුතිය පුද කරනවා.

දරුවන් දෙදෙනෙකු ඉන්න අම්මා කෙනෙකු විධියටත්, කාන්තාවක වීම නිසා විවිධ ප්‍රශ්නවලට මුහුණ දීපු කෙනෙකු විධියටත්, මේ රට දිහා බලන විට මට හිතෙනවා, කාන්තාව ශක්තිමත් කිරීමට යම්කිසි රටක් තීන්දුවක් ගන්නවා නම්, ඒ තුළින් මුළු මහත් සමාජයම ශක්තිමත් වෙනවා කියලා. කුටුම්බය රකින, කුටුම්බය ආරක්ෂා කරන ප්‍රධානියා අම්මායි. ඒ නිසා කාන්තාව ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන්, දේශපාලන වශයෙන්, අධ්‍යාපනික වශයෙන් ශක්තිමත් වෙනවා කියන්නේ සමස්ත සමාජයම ශක්තිමත් වෙනවා කියන එකයි. ඒ නිසා අපි ඒ සම්බන්ධයෙන් බොහොම වැදගත් පියවරක් ගෙන තිබෙනවා. ඒ සඳහා කොමිසමක් විතරක් පත් කරන්නේ නැතිව එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික රාමුව වාගේම යන්ත්‍රණයකුත් මේ තුළ සකස් කිරීම සම්බන්ධයෙන් කාන්තාවක විධියට මම බෙහෙවින් සතුටු වෙනවා; ආඩම්බර වෙනවා.

විශේෂයෙන්ම අපේ මන්ත්‍රීවරියන් කථා කරපු සියලු කාරණා දිහා බලන කොට මට හිතෙනවා, කාන්තාවන් මේ රටේ ඉහළ තැන්වලට, සමාජයේ ප්‍රධාන තැන්වලට යෑම තුළ නිවැරදි තීන්දු ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙනවා කියලා. කාන්තාවන් නායකත්වය දරන සෑම තැනකම පාහේ එහෙමයි. පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධුරයේ අද කටයුතු කරන්නේත් කාන්තාවක්. අපි අපේ මහ ලේකම්තුමිය ගැන බෙහෙවින් ආඩම්බර වෙනවා. මට හිතෙනවා, පිරිමි කටයුතු කරනවා වාගේම, සමහර අවස්ථාවලදී ඊටත් එහා ගිහිල්ලා කටයුතු කිරීමේ හැකියාව, දරා ගැනීමේ හැකියාව, ප්‍රශ්න අවම කර ගැනීමේ හැකියාව එතුමියට තිබෙනවා කියලා. කාන්තාව සම්බන්ධයෙන් මම විශ්වාස කරන දෙයක් තිබෙනවා. කාන්තාවගේ ස්වභාවය - nature එක - තමයි ගොඩක් තැන්වලදී බොහොම ඉවසීමෙන් කටයුතු කිරීම. සමහර විට ඒ ඉවසීම මෝඩකම, බයාදුකම සහ බාල්දුකම විධියට සමාජය තක්සේරු කරනවා. යම්කිසි ප්‍රශ්නයක් ඇති වන කොට බොහෝ අවස්ථාවලදී කාන්තාවන් ඉවසීමෙන් කටයුතු කරනවා. පිරිමි අය අතර නම් ගුටි බැට හුවමාරු වන සමහර අවස්ථා අපි දැක තිබෙනවා; යම්කිසි ප්‍රශ්නයකදී එකක් කිව්වොත් දෙකක් කියන ස්වභාවයක් අපි දැක තිබෙනවා.

නමුත් කාන්තාවන් ඒ වාගේ අවස්ථාවලට පෙළඹීම ප්‍රතිශතයක් විධියට බොහොම අඩුයි. කවුරු හරි බැන්නොත් එය මුල ඉඳලාම දරා ගැනීමේ හැකියාව කාන්තාවට තිබෙනවා. ආදරයට වුණත්, තාත්තා කෑ ගහන කොට දරා ගත්තු කාන්තාව තුළ, ස්වාමියා කෑ ගහන කොට දරා ගත්තු කාන්තාව තුළ සමාජයේ ඉදිරියට, ඉහළ තැන්වලට යන විටත් දරා ගැනීමේ ශක්තිය තිබෙනවා.

අපි තවත් දෙයක් දකිනවා. විශේෂයෙන් වයසක කාන්තාවන් තමයි ගොඩක් දුරට ආගමික පැත්තට යොමු වෙන්නේ. හැම පවුලකම වාගේ එහෙමයි. ජනගහනයෙන් සියයට 52ක් කාන්තාවන් සිටින මේ රටේ ආගමික සිද්ධස්ථානවල වැඩිපුරම ඉන්නේ කාන්තාවන්. ඒ කියන්නේ, ඒ කාන්තාවන්ගේ සිත් තුළ ජේසුස්වහන්සේ ජීවත් වෙනවා, බුදුන් වහන්සේ ජීවත් වෙනවා. ඒ හැම කෙනෙක්ම බුදු කෙනෙකුගේ සිත වාගේ සිතක් හදා ගන්න බලාපොරොත්තු වෙනවා; ජේසුස්වහන්සේගේ සිත වාගේ සිතක් හදා ගන්න බලාපොරොත්තු වෙනවා, මහම්මද්තුමාගේ සිත වාගේ සිතක් හදා ගන්න බලාපොරොත්තු වෙනවා. එම නිසා කාන්තාව

mature වෙමින් සමාජයේ යම් යම් තැන්වල ඉහළට යන කොට, රටට බෙහෙවින් හිතකර වන විධියට, බොහොම පළල් විධියට හිතනවා. අපේ රට විශේෂයෙන් බහු ආගමික, බහු සංස්කෘතික පදනමක් සහිත රටක්. මේ රටේ ආගමක් අදහන්නේ නැති කාන්තාවෝ බොහොම අඩුයි. කාන්තාවන් බොහොම පළල්ව සිතනවා. ඕනෑවට වඩා දහලගෙන යන, ඕනෑවට වඩා පස්සෙන් යන, අපේ ආගම පැත්තෙන් බලන කොට ඕනෑවට වඩා තණ්හාවෙන්, වෛරයෙන් ගත කරන ස්වභාවය කාන්තාවන් තුළ ප්‍රමාණාත්මකව අඩුයි කියලා මම හිතනවා. යම්කිසි අවස්ථාවක යම්කිසි ආයතනයක ප්‍රධාන තනතුරකට කෙනෙකු පත් කරන කොට -දෙපාර්තමේන්තුවක ප්‍රධාන තනතුරට, එහෙම නැත්නම් අමාත්‍යාංශයක ලේකම් ධුරයට, එහෙමත් නැත්නම් වෙනත් ආයතනයක ප්‍රධාන තනතුරකට පත් කරන කොට- කාන්තාවක් පත් කිරීම නුසුදුසුයි කියලා, කාන්තාවක වීම නිසාම එවැනි ප්‍රධාන තනතුරක් ලබා දීම නුසුදුසුයි කියලා රටක් තීන්දු කරනවා නම් ඒක නිවැරැදි තීරණයක් නොවෙයි කියලා මම හිතනවා. ඕනෑම තැනක ඕනෑම තනතුරක් ලබා දුන්නාම බොහොම ඉවසීමෙන්, වගකීමෙන්, ප්‍රඥාවෙන්, වුවමනාවෙන් සහ කැපවීමෙන් වැඩ කරන්න පිරිමින්ට වාගේම කාන්තාවන්ටත් පුළුවන් කියා මම හිතනවා. එම නිසා සමානාත්මතාව අනුව කාන්තාවට නිසි අයිතිවාසිකම් ලබා දෙන්නට නීතිමය යන්ත්‍රණයක් සැකසීම තුළ මේ රට මීට වඩා යහපත් තැනකට අරගෙන යන්න අපට පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් විධියට විශ්වාස කරනවා, මේ රටේ පාර්ලිමේන්තුව තුළ ප්‍රතිශතයක් විධියට අඩුම ගණනේ කාන්තා මන්ත්‍රීවරියන් සියයට 25ක්වත් අනිවාර්යයෙන් සිටිය යුතුයි කියලා. සමහර රටවල පාර්ලිමේන්තු නියෝජනය තුළ සියයට 50ක්ම කාන්තාවන්. එම අවස්ථාව කෝටා වශයෙන් ලබා දීලා තිබෙනවා, ආගම් වශයෙන් සලකා ලබා දීලා තිබෙනවා, ජාතීන් වශයෙන් සලකා ලබා දීලා තිබෙනවා. කෝටාව කියන කාරණය නැති වුණත් මේ රටේ කාන්තාවන්ට fight කරලා දේශපාලනයට එන්න පුළුවන්, එක් එක් දේශපාලන පක්ෂවල ලැයිස්තුවලට කාන්තාවන් ඇතුළත් කළොත්. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තුළ දැන් ඒ කාරණය සිද්ධ වෙමින් පවතිනවා. මම කියන්න ඕනෑ, අපේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කාන්තාවන්ට සලකා තිබෙන බව. මොකද, අපේ පක්ෂයේ වත්මන් භාණ්ඩාගාරික ධුරය මට ලබා දීලා තිබෙනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විධියට බලන විටත් එම පක්ෂය කොයි සෑම වෙලාවකම කාන්තාවන් අවතක්සේරු නොකර, ඒ අයට හිමි තැන, සුදුසු තැන ලබා දීලා තිබෙනවා. එම නිසා රටේ තිබෙන හැම පක්ෂයක්ම කාන්තාවන් පිළිබඳව තීන්දු, තීරණ ගැනීමේදී ඒ හැම පක්ෂයකම සංයුතිය, නිලධාරි මණ්ඩලයේ සංයුතිය සැලකිල්ලට ගැනීමේදී කාන්තාවන්ට තැනක් ලබා දිය යුතුයි කියලා මම හිතනවා. ඒ වාගේම, එම පක්ෂවල ඡන්දය ඉල්ලන ලැයිස්තුව තුළ කාන්තාවන්ට වැඩිපුර අවස්ථාවක් ලබා දිය යුතුයි. මේ රටේ ඊළඟ කැබිනට් මණ්ඩලය තුළ එක කාන්තාවක් නොවෙයි, අඩුම ගණනේ සියයට 20ක්, 30ක්වත් කාන්තාවන් සිටිය යුතුයි. "පාර්ලිමේන්තුවේ කාන්තාවන් සියයට 25ක්වත් ඉන්න ඕනෑ, කැබිනට් මණ්ඩලය තුළ සියයට 25ක්වත් ඉන්න ඕනෑ" යනුවෙන් ඇති වන මනෝභාවය පක්ෂ නායකයින් තුළ ඇති වෙන්න ඕනෑ; රට තුළ ඇති වෙන්න ඕනෑ. එම නිසා මෙවැනි නීත්‍යානුකූල යන්ත්‍රණයක් සහ කොමිෂන් සභාවක් පත් කිරීම ඉතාම කාලෝචිතයි කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා දීර්ඝව කථා කරන්නේ නැහැ.

මේ රටේ කාන්තාවන් වෙනුවෙන් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරමින් ඔවුන් වෙනුවෙන් උපරිම සාධාරණීකරණයක් කිරීම සඳහාත්, ඔවුන්ට සමානතාවෙන් සැලකීමට නීත්‍යානුකූල රාමුවක් සැකසීම සඳහාත් එම විෂය භාර අමාත්‍යවරයා විධියට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා විසින් ගත් මේ පියවර ඉතා පුළුල් ඉදිරි පියවරක් බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත පිළිබඳ දෙවන වර කියවීමේ විවාදය ඉදිරි දිනකදී තවදුරටත් පැවැත්වීම පිණිස කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.
அதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.
The Debate stood adjourned accordingly.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සහ 3 ඉදිරිපත් කිරීම.

ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

இலங்கை பட்டயக் கப்பல்தரகர்கள் நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

INSTITUTE OF CHARTERED SHIPBROKERS OF SRI LANKA (INCORPORATION) BILL

පනත් කෙටුම්පත (ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවෙහි දී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.

[சட்டவாக்க நிலையியற் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்ட மூலத்தைப் பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.

Order for consideration of Bill, as amended (in the Legislative Standing Committee), read.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව පිළිගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.

විනා විවාදයේ, ඒකමතිකව පිළිගනු ලැබිණි.
එබැවින්, සංශෝධිත ආකාරයට මූන්‍රාම්මුරෙ මතිප්පිඩප්පට්ටු නිරෙවේර්ත්තප්පට්ටවාරු තුන්වන වර කියවීම සඳහා පිළිගනු ලැබිණි.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

தெதிகம ஸ்ரீ மைத்திரீ பிரக்ஞார்த்த பௌத்த கல்வி தஹம் சபாவ (கூட்டிணைத்தல்) சட்டமூலம்

DEDIGAMA SRI MAITHRI PRAGNARTHA BOUDDHA EDUCATIONAL DAHAM SABHAWA (INCORPORATION) BILL

පනත් කෙටුම්පත (ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවෙහි දී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.

[சட்டவாக்க நிலையியற் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்ட மூலத்தைப் பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.

Order for consideration of Bill, as amended (in the Legislative Standing Committee), read.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව පිළිගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයේ, ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.

විනා විවාදයේ, ඒකමතිකව පිළිගනු ලැබිණි.
එබැවින්, සංශෝධිත ආකාරයට මූන්‍රාම්මුරෙ මතිප්පිඩප්පට්ටු නිරෙවේර්ත්තප්පට්ටවාරු තුන්වන වර කියවීම සඳහා පිළිගනු ලැබිණි.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එදුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා.

පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් අධ්‍යයන කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කිරීම
பாடசாலை விளையாட்டுப் பயிற்றுவிப்பாளர்களைக் கல்விசார் பணியாட்டொகுதிக்குள் உள்ளீர்த்தல்
ABSORPTION OF SCHOOL SPORTS COACHES INTO ACADEMIC STAFF

[අ.භා. 4.49]

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2019 වර්ෂයේදී රජයේ පාසල් සඳහා ක්‍රීඩා පුහුණුකරුවන් 3,750ක් බඳවා ගැනීමට කටයුතු කරන ලදී. එවකට ගරු අග්‍රාමාත්‍යතුමාගේ අභිමතාර්ථය වූයේ, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යයන විෂයන්හි ප්‍රායෝගික ඉගැන්වීම්, කොට්ඨාස, කලාප, පළාත් හා සමස්ත ලංකා ක්‍රීඩා තරඟවලට ඉදිරිපත් වන පාසල් සිසුන්ගේ පුහුණුවීම් කටයුතු සිදු කිරීම, ශිෂ්‍ය හට, බාලදක්ෂ ආදී විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා දායකත්වය සැපයීම හා මනා භික්මීමක් සහ විනයකින් යුතු දරු පරපුරක් බිහි කිරීමයි.

මේ වනවිටත් කැපවීමෙන් කටයුතු කරන එම ක්‍රීඩා පුහුණුකරුවන් අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ඇතුළත් කර අනියම් පදනමින් තබා ගැනීම ඉතා කනගාටුදායක තත්ත්වයකි. දරුවන්ගේ අනාගතය වෙනුවෙන් කටයුතු කරන මේ ක්‍රීඩා පුහුණුකරුවන් අධ්‍යයන කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කර ස්ථීර පත්වීම් ලබා දීම සඳහා මෙම ගරු සභාවේ අවධානය යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2019 මැයි මාසයේ විතර තමයි මේ අය බඳවා ගත්තේ. මේ වන විට වසර 5ක පමණ කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත් ඔවුන් තවම ස්ථීර සේවයේ පිහිටුවා නැහැ. ඒකට ප්‍රශ්න තිබෙනවා. 3,750ක් තමයි මෙසේ බඳවා ගත්තේ. දැනට එයින් 2,500 - 3,000ක් අතර ප්‍රමාණයක් රැකියාවේ නියුතුව ඉන්නවා. මේ අයගෙන් විශාල ප්‍රමාණයක් දැන් සේවයේ නැති බවටත් අප දැනුවත් වෙලා තිබෙනවා. මේ පිරිස අතර A/L සමත් නැති විශාල පිරිසක් සිටිනවා. මේ සඳහා ජාතික

මට්ටමේ ක්‍රීඩකයන්, සමස්ත ලංකා මට්ටමේ ක්‍රීඩකයන් තමයි බඳවාගෙන තිබෙන්නේ. මේ පිරිස අතර A/L සමත් නැති අය හිටපු නිසා මේ වෙනකොට එයින් සියයට 90ක විතර ප්‍රමාණයක් අ.පොස. උසස් පෙළ සමත් වෙලා, Higher National Diploma එකත් කරලා තිබෙනවා. Higher National Diploma එක කරපු අය අතර මේ වසරෙන් අවසන් වන කණ්ඩායමකුත් ඉන්නවා. ඔවුන්ගේ සුදුසුකම් මත අපි මොකක් හරි criteria එකක් හදන්න ඕනෑ. දැන් අවුරුදු 5ක් විතර වෙනවා, මේ අය තවම ස්ථිර කරලා නැහැ. සාමාන්‍යයෙන් ගුරු සේවයට බඳවා ගැනීමේදී උපාධියක් තිබිය යුතුයි කියලා තිබෙනවා. මේ අයට දැන් අසාධාරණයක් වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් රුපියල් 27,950ක විතර basic salary එකකට තමයි ඔවුන් දැනට සේවයේ ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැනට මේ අය Sabaragamuwa University එකේ, Sri Jayewardenepura University එකේ HND පාඨමාලාව කරනවා. එම නිසා මේ අය වෙනුවෙන් මොකක් හරි ක්‍රමවේදයක් හදලා, ඔවුන්ව ස්ථිර සේවයේ පිහිටුවිය යුතුයි. මොකද, ඔවුන්ට දරුවෙකුගේ කිසිම වගකීමක් ගන්න විධියක් නැහැ.

ළමයෙක් තරගයකට සහභාගි කරවන්න බැහැ. මොකද, ළමයින්ගේ වගකීම ගන්න ඔවුන්ට කිසිම බලයක් නැහැ. දැන් මේ අය පාසල්වල ඔවුන්ගේ ක්‍රියාකාරකම් කරනවා. පාසලේ හැම දෙයකටම ළමයින්ව සූදානම් කරනවා, ක්‍රීඩා තරගවලට සූදානම් කරනවා. ඒ හැම දෙයක්ම කරනවා. හැබැයි, වගකීම ගන්න බැහැ, මොවුන්ට අවශ්‍ය සුදුසුකම් නොමැති නිසා, ස්ථිර සේවයේ නොමැති නිසා සහ ගුරුවරු ඒ වගකීම දෙන්න කැමැති නැති නිසා. මම අධ්‍යාපන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා එක්ක මේ ගැන කථා කළා. අපි ඉංග්‍රීසි විෂය සඳහාත් ඩිප්ලෝමාධාරීන් මේ ආකාරයෙන් බඳවා ගත්තා. ගුරුවරයෙක් විධියට බඳවා ගන්න බැරි නම් මේ අය සඳහා මොකක් හෝ ක්‍රමවේදයක් හදන්න. මම හිතන විධියට මේකට අලුතින් මොකක් හෝ ක්‍රමවේදයක් හැදිය යුතුයි. Higher National Diploma එකක් කරලා, එහෙම නැත්නම් ඔවුන්ට ඉස්සරහට NVQ Level 6 එකට යන්න පුළුවන් විධියට ක්‍රමවේදයක් හදලා, "මෙන්න මේ qualifications තිබෙනවා නම් ස්ථිර වෙන්න පුළුවන්" කියලා මේ අයව ස්ථිර කිරීමේ ක්‍රමවේදයක් හදන්න කියන එක තමයි මගේ ඉල්ලීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ගොල්ලන් දැන් පාසල් ළමයින්ව ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට යොමු කරනවා. හැබැයි, ප්‍රශ්නය තමයි, මොවුන් දැන් අනධ්‍යයන කාර්ය මණ්ඩලය හැටියට ඉන්න එක. මොවුන් විසින් සමහර තරගවලට ළමයි සම්බන්ධ කරනකොට, ඔවුන් ගැන වැඩි විශ්වාසයක් නැහැ. ඒ වාගේම, ඔවුන්ව ගණන් ගන්නේ නැති තත්ත්වයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අයව බඳවා ගැනීමේදී ප්‍රශ්නයක් තිබිලා තිබෙනවා. ඒක ඇත්ත, බඳවාගත්ත ක්‍රමවේදයේ වැරැද්දක් තිබෙනවා. නමුත්, අපි දැන් මේ අයව රැකගත යුතුයි. මොකද, අපේ ගොඩක් පාසල්වල ශාරීරික අභ්‍යාස උපදේශකවරු, PTIsලා නැහැ. අනාගතයේ අපට මේ අයගෙන් උපරිම ප්‍රයෝජනයක් ලබාගන්න පුළුවන්. මොකද, මේ අය දක්ෂ ක්‍රීඩකයන්. රටට යම්කිසි කීර්තියක් ගෙනැත් දුන්, සමස්ත ලංකා මට්ටමේ ක්‍රීඩකයන් වාගේ අය තමයි මේ බඳවාගෙන තිබෙන්නේ. අපි දැන් පසුගිය වැරැද්ද ගැන කථා කරලා වැඩක් නැහැ. මේ අයව ස්ථිර කරලා, ඔවුන්ට යම්කිසි බලයක් ලබා දීලා, ඔවුන්ට ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කරගෙන අපේ අභිංසක දරුවන්ට ශක්තියක් වෙලා අපේ දරුවන්ගේ ක්‍රීඩා කුසලතා නංවා ගැනීම තමයි දැනට අවශ්‍යව තිබෙන්නේ. ඒ නිසා මම මේ ගරු සභාවට යෝජනා කරනවා, හොඳ criteria එකක් යටතේ මේ අයව බඳවා ගැනීමට අලුත් ක්‍රමවේදයක් සකස් කරලා ඒ ක්‍රමවේදය අනුව කටයුතු කරන්න කියලා. මින් ඉදිරියට මේ විධියට බඳවා ගැනීම් නොකර, මොකක් හෝ නිවැරදි system එකකට මේ අයව බඳවාගන්න. විශේෂයෙන්ම පාසල් දරුවන්ටයි මේ අය උගන්වන්නේ. පාසල් දරුවන් කියන්නේ අපේ රටේ හදවත. මේ දරුවන්ට උගන්වන්න යම්කිසි කෙනෙක් ගුරුවරයෙක් වශයෙන් බැඳෙනවා නම් ඔහු හැම දෙයකින්ම පෝෂණය විය යුතුයි. දරුවා පෝෂණය කරන්න නම් දරුවාට උගන්වන කෙනාත් දැනුමෙන් ශක්ති සම්පන්න කෙනෙක් විය යුතුයි. එහෙම නැති අය බඳවාගත් නිසා තමයි, බඳවා ගැනීමේ ක්‍රමවේදයේ තිබුණු වරදක් නිසා තමයි අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. නමුත්, ඒක ඒ අයගේ වරදක් නොවෙයි. මම මේ ගරු සභාවෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඔවුන්ට මේ භාරදූර වගකීම් පවරන ක්‍රමවේදයක් හදලා, ඔවුන්ගේ qualifications මදි නම් අවශ්‍ය සුදුසුකම් සපුරා ගැනීමේ ක්‍රමවේදයක් හදලා ඔවුන් ස්ථිර කිරීමට කටයුතු කරන්න කියලා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය.

[අ.භා. 4.56]

ගරු මංජුලා දිසානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු සුදර්ශන දෙනිපිටිය මැතිතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරමින්, ඒ සම්බන්ධව කරුණු කීපයක් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනවා. පාසල්වල ක්‍රීඩා පුහුණුකරුවන් විධියට 2019 වර්ෂයේදී තමයි මේ අයව බඳවාගත්තේ. මම මේ අවස්ථාවට සම්බන්ධ වෙන්නේ මේ පිරිස අතරින් බහුතරයක් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් බඳවාගෙන තිබෙන නිසායි. මේක කුරුණෑගල දිස්ත්‍රික්කයේ අපත් මුහුණ දී තිබෙන ප්‍රායෝගික ගැටලුවක්. සමහර අය කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් බොහෝ පිට ප්‍රදේශවල සේවය කරනවා. ඒ අය තවමත් ඉන්නේ පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩලය විධියට, අනියම් පත්වීමක් යටතේ. ඔවුන්ට ස්ථිර පත්වීමක් ලැබිලා නැහැ. මේ නිසා ඔවුන්ගේ තරුණ ජීවිතවල ලොකු අවදානමක් තිබෙනවා. කුමන රජයකින්, කවුරු ඒක කළත් මේ අයව ස්ථිර කරලා, ඔවුන්ගේ රැකියාවේ ස්ථිරභාවය වාගේම, ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන්නට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු විධියට අපටත් වගකීමක් තිබෙනවා.

ඒ නිසා, ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ගෙනා මේ යෝජනාව මා ඉතා අගය කරනවා. මෙය, කාලෝචිත යෝජනාවක්. මම හිතන විධියට මෙම යෝජනාව ගැන පක්ෂ විපක්ෂ භේදයක් නැතුව අපට කථා කරන්න පුළුවන්. මේ දරුවෝ සියලුදෙනාම අපේ රටේ දරුවන්; අපේ අනාගතය. ඒ වාගේම මේ අය දක්ෂතා පෙන්වපු අය. ක්‍රීඩාව පැත්තෙන් සමස්ත ලංකා මට්ටමේ, ජාතික මට්ටමේ සහතික තිබෙන, හැකියාව, දක්ෂතාව පෙන්වපු දරුවෝ තමයි මේ. මේ අය පාසල් පද්ධතිය තුළ ඉතා සුවිශේෂී කැපවීමකින් කටයුතු කරනවා. මේ අය අනධ්‍යයන කාර්ය මණ්ඩලයේත් ස්ථිර අය නොවුණත්, පාසල් පද්ධතියේ සිටින ගුරුවරුන් හා සමානවම, සමහර වෙලාවට ඊටත් එහා ගිහින් සමස්ත පාසල් පද්ධතිය තුළ තිබෙන සියලු වගකීම් දරනවා. මම පෞද්ගලිකවත් ඒ ගැන දන්නවා. පාසල තුළ කරන ක්‍රීඩා කටයුතු, බාලදක්ෂ කටයුතු, විෂය බාහිර ක්‍රියාකාරකම් කියන සියලු කටයුතුවල දී මේ අය නායකත්වය ගන්නවා; මූලිකත්වය ගන්නවා; කැප වෙනවා. මේ අයගේ ඒ කැප කිරීම ඇත්තටම පාසල් පද්ධතියට ගොඩක් වටිනවා. ඒ කරන කැප

[ගරු මංජුලා දිසානායක මහත්මිය]

කිරීමට වටිනාකමක් දෙන්න නම්, ඉතාම ඉක්මනින් කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් අරගෙන අනිවාර්යයෙන්ම ඔවුන්ගේ සේවය ස්ථිර කිරීම ඉතා සුදුසුයි. මොකද, මේ කාල වකවානුව වෙනකොට ඇත්තටම අපේ පාසල් පද්ධතිය තුළ ගුරුවරුන්ගේ ලොකු හිඟයක් තිබෙනවා. මේ අය ස්ථිර කළොත් ඒ ගුරු හිඟය මහ හරවා ගන්නත් පුළුවන්. මොකද, පාසල් පද්ධතිය තුළ තිබෙන සියලු කටයුතුවල දී විදුහල්පතිවරුන් හා ආචාර්ය මණ්ඩල සමඟ හරි හරියට ගැටෙමින් ඒ අය කටයුතු කරන නිසා.

මෙම කාරණය පිළිබඳව තවත් කථා කරනවා නම්, අපට ගොඩක් දේවල් කථා කරන්න පුළුවන්. අපි හැමෝම -225 දෙනාම - එකතු වෙලා පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අද මේ පාර්ලිමේන්තුවේ දී මේ කාරණය සාකච්ඡා කරනවා වාගේම, අනාගතයේ දී මේ අයගේ ජීවන තත්ත්වය නඟා සිටුවන්නත් කටයුතු කළ යුතුයි. පාසල් පද්ධතිය තුළ කටයුතු කිරීමේ දී ඔවුන් කරන කැප කිරීමට වටිනාකමක් එකතු කරන්නට නම් ඔවුන් බඳවා ගත් ක්‍රමය කෙසේ වෙතත්, ඔවුන් ස්ථිර කරනකොට යම් කාලයක් දීලා වෘත්තිය සුදුසුකම් සහතික කරවා ගෙන එම කටයුතු කළ යුතුයි. පසුගිය කාලයේ ස්වේච්ඡා ගුරුවරුන් බඳවා ගත්තා, අවුරුදු දෙකක පුහුණුවක් දීලා. එම පුහුණුවෙන් පසුව ඒ අය ගුරු සේවයට එකතු කර ගත්තා වාගේ අපේ සහෝදර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට මේ අයටත් යම් වෘත්තිය සුදුසුකමක් සහතික කරවා ගෙන, ඊට අදාළ සහතිකය ලබා ගත්තාට පසු සේවය ස්ථිර කරන තැනට කටයුතු කළ යුතුයි. ඒ ආකාරයට මේ අයගේ රැකියා ස්ථිර කර, පාසල් පද්ධතිය තුළට ඔවුන් ලබා දෙන සේවය තවදුරටත් ලබා ගන්නට අවශ්‍ය ශක්තිය, හැකියාව ඇති වන ආකාරයට කටයුතු කර දෙන එක සුදුසුයි කියා යෝජනා කරමින් මා නිහඬ වෙනවා.

මට මේ කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, මෙම කාරණය ගැන මටත් වචනයක් කථා කරන්න තිබෙනවා. මූලාසනයේ සිටිමින් කථා කරන එක සුදුසු නැති වුණත් මම මේ කාරණය කියන්න ඕනෑ.

විශේෂයෙන්ම ක්‍රීඩා පුහුණුකරුවන් පාසල් අධ්‍යාපන කාර්ය මණ්ඩලයට අයත් කිව්වාට, ඒ අය අධ්‍යාපන කටයුතුවලත් යෙදෙනවා. ඒ වාගේම මේ සමඟර අය ශාස්ත්‍රපති දක්වා උපාධියත් අරගෙන තිබෙනවා. ගරු ඇමතිතුමනි, උතුරු සහ නැඟෙනහිර සිවිල් ආරක්ෂක සේවයේ යෙදී සිටි අය ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ දී කැබිනට් පත්‍රිකා යොමු කරලා ඒවා අනුමත කරගෙන, ඒ අය අන්තර්ග්‍රහණය කළා. ඒ වාගේ ක්‍රමයක් සකසා හෝ මේ අය ගැනත් බලනවා නම් හොඳයි, අපට සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපන ගුරුවරුන්ගේ හිඟයක් පවතින නිසා. විශේෂයෙන්ම මේ ක්‍රීඩා පුහුණුකරුවන් දරුවන් සමඟ අධ්‍යයන කටයුතුවලත් යෙදෙන නිසා ඒ අය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියා මා යෝජනා කරනවා.

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාට අදහස් දැක්වීමට අවස්ථාව.

[අ.භා. 5.01]

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2019 වර්ෂයේ නව බඳවා ගැනීම් පටිපාටියක් හඳුන්වා දීලා තමයි ක්‍රීඩා පුහුණුකරුවන් 3,888දෙනෙක් බඳවා ගෙන තිබෙන්නේ. ඒ අය බඳවා ගන්නා අවස්ථාවේදීම අනියම් පදනමින් නොවෙයි බඳවා ගෙන තිබෙන්නේ. ඔවුන් බඳවා ගෙන තිබෙන්නේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව ස්ථිර ස්වභාවයෙන්, විශ්‍රාම වැටුප් සහිත රැකියාවක් හැටියට. ඔවුන්ට රාජකාරි ලැයිස්තුවක් තිබෙනවා. ඒ අනුව කිසිදු ක්‍රීඩා පුහුණුකරුවෙකු අනියමින් බඳවා ගෙන නැහැ. ඔවුන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2023 දෙසැම්බර් 23වැනි දා පවත්වා තිබෙනවා. එහි ප්‍රතිඵල ලැබුණාම ඒ සියලුදෙනා පරිවාස කාලයෙන් පසුව ස්ථිර කිරීමට අමාත්‍යාංශය අවශ්‍ය කටයුතු කරමින් සිටිනවා. නමුත් ක්‍රීඩා පුහුණුකරුවන් බඳවා ගැනීමේ දී, බඳවා ගැනීමේ පටිපාටිය අනුව "කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන කාණ්ඩ 02" යන සේවා ගණයට අයත් වන ආකාරයට තමයි එම බඳවා ගැනීම් සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ අනුව අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අදාළ වන සේවා ගණයකට තමයි මේ අය බඳවා ගෙන තිබෙන්නේ.

මේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනධ්‍යයන කාර්ය මණ්ඩලයට තමයි ඒ අය ස්ථිර වෙන්නේ. ගුරු සේවා ව්‍යවස්ථාව අනුව, අපට ගුරුවරු බඳවා ගන්න පුළුවන් ක්‍රම දෙකකට. හැබැයි, ඉතිහාසයේ විවිධ අවස්ථාවල අපි යම් යම් පිරිස් බඳවා ගෙන තිබෙනවා. දැන් ඔබතුමිය කිව්වා වාගේම උතුරු-නැඟෙනහිර යුද්ධය තිබුණු නිසා ග්‍රාම ආරක්ෂක සේවයේ යෙදෙන අය පාසල්වලට දැම්මා. දැන් ඒ අයට ගුරුවරුන් හැටියට පත්වීම් දෙන්න කියනවා. එහෙම දේවල් එක එක වකවානුවල සිදු වෙලා තිබෙනවා. දැනටත් ඒ ඉල්ලීම තිබෙනවා. ඒ අතර උපාධි ගත්ත සමඟර අය ඉන්නවා. ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව සුදුසුකම් සපුරා තිබෙන අය ඉන්නවා නම්, ඒ පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් දාන්නම් කියලායි මම කිව්වේ. මේ අයටත් මට කියන්න තිබෙන්නේ, අනාගතයේ දී මේ තිබෙන තනතුර ස්ථිර කරලා ඒ ගොල්ලන්ගේ ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ තිබෙන සුදුසුකම් අනුව බඳවා ගැනීම් සඳහා යම් වැඩ පිළිවෙළකට යා යුතුයි කියන කාරණය තමයි. හේතුව මෙකයි. දැනට තිබෙන සේවා ව්‍යවස්ථාව අනුව උසස්පෙළ "Z" අගය අනුව වාර්ෂිකව නිකුත් කරන ගැසට් නිවේදනය මත, අවුරුදු දෙකක් නේවාසික පුහුණුව සහ අවුරුද්දක් පාසල්වල පුහුණුව ලබා දීලා තමයි ශික්ෂණ ඩිප්ලෝමාධාරීන් හැටියට ගුරු මේ අය සේවයට බඳවා ගන්නේ. උපාධිධාරීන් ගුරුවරුන් ලෙස බඳවා ගන්නේ අවුරුදු 35ට අඩු අය, තරග විභාගයකින් පසුවයි. විෂය අනුව ගළපා ගෙන ඒ අයට පත්වීම් ලබා දෙනවා. ඒක තමයි මේ දිනවල කරගෙන යන්නේ. ඉතින් ඒ අනුව මේ අයට අදාළ කරන්න වෙන්නේත් ඊට අදාළ ක්‍රමයක්. ඒ අනුව, පවත්වපු විභාගය පදනම් කරගෙන මේ පිරිස ස්ථිර කිරීම සඳහා අවශ්‍ය කටයුතු අපි කරගෙන යනවා. මට මේ කාරණය තමයි කියන්න තිබෙන්නේ. මේ වනකොටත් මාස 15ක් තිස්සේ සංවර්ධන නිලධාරීන් පිරිස ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව බඳවා ගන්න බැරිව අපි උසාවියේ නඩු කියනවා. උසාවියේ pending නඩුවක් තිබිය දී කිසිම කෙනෙක් ඊට පිටතින් බඳවා ගන්නය කියලා මට කැබිනට් පත්‍රිකාවක් දාන්න බැහැ. එතැන අපි හිර වෙලා තිබෙනවා. නමුත්, මේ අවස්ථාවේ දී

මේ පිරිස වෙනුවෙන් මට කියන්න පුළුවන් වෙන්නේ, ඒ ගොල්ලන් බඳවා ගත්ත ශ්‍රේණියේ ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ අපි කරගෙන යනවා කියන එකයි. ඒ අයට ස්ථිර පත්වීමක් ලැබෙනවා. ඊට පස්සේ තමයි ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සුදුසුකම් අනුව බඳවා ගැනීමේ කාර්ය පටිපාටිය පිළිබඳව සලකා බලන්න වෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්ඩලික සභාපතිතුමිය)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඒ ගොල්ලන්ට උසස්වීම්වලට යන්න මොනවා හෝ ක්‍රමයක් තිබෙනවාද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්ඩලික නීතිඥ (කලානිති) සුසිල් ප්‍රේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
කළමනාකරණ සේවයේම උසස්වීම් තිබෙනවා නේ. ඒකෙන් ඉස්සරහට යන්න පුළුවන්. එපමණයි මට කියන්න තිබෙන්නේ.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවිදක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.04ට, 2024 ජූනි 05 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් තියේය.
අදන්පඩි පි. ප. 5.04 මණික්කු පාරාළුමන්‍රම්, 2024 යූන් 05, පුදන්කිළමෙ මු.ප. 9.30 මණිවරෙ ඔත්තිවෛක්කප්පට්ටදු.
Parliament adjourned accordingly at 5.04 p.m. until 9.30 a.m. on Wednesday, 05th June, 2024.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

වෙන්නප්පුව, සිංගක්කුලිය දේවාලය: මහා සභාව අවලංගු කිරීම
வென்னப்புவ, சிங்கக்குளிய தேவாலயம்: பொதுச் சபையை இரத்துச் செய்தல்
SINGAKKULIYA DEVALAYA, WENNAPPUWA: CANCELLATION OF GENERAL ASSEMBLY

2094/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) නිලවරණයක් පැවැත්වීම සඳහා වෙන්නප්පුව, සිංගක්කුලිය දේවාලයේ මහා සභාව 2024.02.25 දින කැඳවා තිබූ අතර පසුව එම මහා සභාව අවලංගු කර ඇති බව දන්නේද;

(ii) එම මහා සභාව අවලංගු කිරීම සඳහා අධිකරණ නියෝගයක් නිකුත් කර තිබේද;

(iii) එම මහා සභාව අවලංගු කරන ලෙස දන්වා බෞද්ධ කටයුතු කොමසාරිස් හෝ වෙනත් නිලධාරියෙක් ලිපියක් නිකුත් කර තිබේද;

(iv) එසේ නම්, එම ලිපිය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වනේන්ද?

(ආ) (i) සාමාජික ගාස්තු අය කර සිංගක්කුලිය දේවාලය සඳහා සාමාජිකයන් බඳවාගෙන ඇති බව දන්නේද;

(ii) මහා සභාව අවලංගු කිරීමට එරෙහිව එම දේවාලයේ සාමාජිකයන් විසින් විරෝධතා ඉදිරිපත් කර තිබේද;

(iii) එසේ නම්, මහා සභාව අවලංගු කිරීම හේතුවෙන් ඉහත දේවාලයේ සාමාජිකයන්ගේ මානව හිමිකම් හා අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එය නිවැරදි කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வென்னப்புவ, சிங்கக்குளிய தேவாலயத்தின் பொதுச் சபையானது, நிர்வாகிகளுக்கான தேர்தலை நடாத்துவதற்காக 2024.02.25ஆம் திகதி கூட்டப்பட்டிருந்ததோடு, பின்னர் குறித்த பொதுச் சபைக் கூட்டம் இரத்துச் செய்யப் பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி பொதுச் சபைக் கூட்டத்தை இரத்துச் செய்வதற்கு நீதிமன்றம் கட்டளை பிறப்பித்திருந்ததா என்பதையும்;

(iii) குறித்த பொதுச் சபைக் கூட்டத்தை இரத்துச் செய்யுமாறு அறிவித்து பௌத்த அலுவல்கள் ஆணையாளர் அல்லது வேறு அலுவலரால் கடிதமொன்று விநியோகிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், குறித்த கடிதத்தைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சந்தாப் பணம் அறவிட்டு சிங்கக்குளிய தேவாலயத்துக்கு அங்கத்தவர்கள் இணைத்துக் கொள்ளப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) பொதுச் சபைக் கூட்டத்தை இரத்துச் செய்தமைக்கு எதிராக மேற்படி தேவாலயத்தின் அங்கத்தவர்களால் எதிர்ப்புகள் முன்வைக்கப் பட்டுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், பொதுச் சபைக் கூட்டத்தை இரத்துச் செய்ததன்மூலம் மேற்படி தேவாலயத்தின் அங்கத்தவர்களது மனித உரிமைகள் உள்ளிட்ட உரிமைகள் மீறப்பட்டுள்ளதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) ஆமெனில், அதனைச் சீர்செய்வதற்காக மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) whether the General Assembly of Singakkuliya Devalaya, Wennappuwa was convened on 25.02.2024 for an election and later it was cancelled;

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

(ii) whether a court order has been issued for the annulment of the General Assembly;

(iii) whether the Commissioner of Buddhist Affairs or any other officer has issued a letter informing him to cancel the aforesaid General Assembly; and

(iv) if so, whether the letter would be produced?

(b) Will he also inform this House -

(i) whether he is aware that the members have been enrolled for Singakkuliya Devalaya by charging membership fees;

(ii) whether objections have been raised by the members of the aforesaid devalaya, against the cancellation of the General Assembly;

(iii) if so, whether it is accepted that the human rights and rights of the members of the aforesaid devalaya have been violated due to the cancellation of the General Assembly; and

(iv) if so, the steps taken to rectify the situation?

(c) If not, why?

ගරු විදුර වික්‍රමනායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)

(The Hon. Vidura Wickramanayaka - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

(අ) (i) ඔව්.

(ii) නැත.

(iii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ලේකම්ගේ DNK/SWD/1/OTHER/20/01 හා 2024.02.22 දිනැති ලිපිය මඟින් 2024.02.25 දින යොදා තිබූ මහා සභා රැස්වීම පැමිණිල්ල සම්බන්ධ පරීක්ෂණය පැවැත්වෙන 2024.03.19 දින දක්වා තාවකාලිකව නතර කරන ලෙස දංකොටුව ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇත.

(iv) ඔව්. **ඇමුණුමෙහි*** සඳහන් වේ.

(ආ) (i) නොදනී.

(ii) ඔව්.

(iii) මහා සභා රැස්වීම අවලංගු කර ඇත්තේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නියෝගය පරිදි වේ.

(iv) සිංගක්කුලිය අයියනායක දේවාලය 1931 අංක 19 දරන විහාර දේවාලගම් ආඥා පනතේ 4/1 වගන්තිය යටතේ පාලනය වන දේවාලයක් නොවන අතර, මෙවැනි දේවාල සඳහා නිලවරණ පැවැත්වීම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු නොකරන අතර මෙවැනි දේවාල සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්ගේ මැදිහත්වීම යටතේ පාලක මණ්ඩලයක් පත් කර ගැනීම සිදු වේ. ඒ අනුව ඉදිරියට කටයුතු සිදු විය යුතුය.

(ඇ) අදාළ නොවේ.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

(அ) (i) ஆம்.

(ii) இல்லை.

(iii) இலங்கை மனித உரிமைகள் சபையின் செயலாளரின் இல. DNK/SWD/1/OTHER/20/01 மற்றும் 2024.02.22ஆம் திகதியிடப்பட்ட கடிதத்தின்மூலம் 2024.02.25ஆம் திகதி நடைபெறவுள்ள மகா சபைக் கூட்டம் தொடர்பான முறைப்பாடு விசாரிக்கப்படும். 2024.03.19ஆம் திகதி வரையில் தற்காலிகமாக நிறுத்துமாறு தங்கொட்டுவை பிரதேச செயலாளருக்குத் தெரிவிக்கப்பட்டிருந்தது.

(iv) ஆம். (இணைப்பு*)

(ஆ) (i) தெரியாது.

(ii) ஆம்.

(iii) இலங்கை மனித உரிமைகள் சபையின் உத்தரவுக்கு அமையவே மகா சபைக் கூட்டம் இரத்துச் செய்யப்பட்டுள்ளது.

(iv) சிங்கக்குளிய ஐயனார் தேவாலயமானது, 1931இன் 19ஆம் இலக்க விகாரைகள் மற்றும் அறக்கட்டளை நிலையங்கள் கட்டளைச் சட்டத்தின் 4/1 அத்தியாயத்தின்கீழ் நிர்வகிக்கப்படும் தேவாலயம் அல்ல என்பதுடன், இத்தகைய தேவாலயங்கள் தொடர்பிலான வாக்கெடுப்புகள் பௌத்த மத அலுவல்கள் திணைக்களத்தினால் நடாத்தப்படமாட்டாது. இத்தகைய தேவாலயங்கள் தொடர்பில் பிரதேச செயலாளரின் மேற்பார்வையின்கீழ் நிர்வாக சபை ஒன்று தெரிவுசெய்யப்பட்டு, ஏனைய செயற்பாடுகள் முன்னெடுக்கப்படும்.

(இ) ஏற்புடையதன்று.

(a) (i) Yes.

(ii) No.

(iii) The Divisional Secretary of Dankotuwa had been informed to temporarily suspend the General Assembly, which was to be held on 25.02.2024, by letter No. DNK/SWD/1/OTHER/20/01 dated 22.02.2024 of the Secretary of the Human Rights Commission of Sri Lanka until 19.03.2024 when the investigation related to the complaint would be held.

(iv) Yes. Given in **Annex***.

(b) (i) Do not know.

(ii) Yes.

(iii) The General Assembly had been cancelled according to order of the Human Rights Commission of Sri Lanka.

(iv) The Singakkuliya Aiyyanayaka Devalaya is not a devalaya controlled under Section 4/1 of the Buddhist Temporalities Ordinance, No. 19 of 1931 and the elections for such devalaya are not being conducted by the Department of Buddhist Affairs. A controlling board is appointed under intervention of the Divisional Secretary in regard of such devalayas. Accordingly, further actions should be taken.

(c) Not relevant.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

313 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 313 - இல. 02
Volume 313 - No. 02

2024 ජූනි 05වන බදාදා
2024 யூன் 05, புதன்கிழமை
Wednesday, 05th June, 2024

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2024 ජූනි 05වන බදාදා
2024 யூன் 05, புதன்கிழமை
Wednesday, 05th June, 2024

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 213]

ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 213]

අගමැති ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාට ශුභාශිංසන [තීරුව 214]

විගණකාධිපතිවරයාගේ වාර්තාව [තීරුව 218]

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [තීරුව 222]

ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න [තීරු 226-252]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 252-276]

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
ජේ.සී. අලවතුවල පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු හෙක්ටර් අප්පුහාමි මහතා] - පළමුවන වර කියවන ලදී [තීරුව 276]

ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත:
නියෝග [තීරුව 277]

සිවිල් ගුවන්සේවා පනත:
රෙගුලාසි [තීරුව 278]

ඛනිජතෙල් සම්පත් පනත:
නියෝග [තීරුව 278]

කල් තැබීමේ යෝජනාව:
අධ්‍යාපන ක්ෂේත්‍රයේ බරපතළ ගැටලු සඳහා ස්ථිර විසඳුම් [තීරු 283– 406]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
பகிரங்க நிதிசார் முகாமைத்துவம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 213]
பொருளாதார நிலைமாற்றம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 213]

பிரதமர் ஸ்ரீ நரேந்திர மோடிக்குப் பாராட்டுக்கள் [ப: 214]

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 218]

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 222]

மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள் [ப: 226-252]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 252-276]

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
ஜே.சீ. அலவதுவல மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 276]

இலத்திரனியல் கொடுக்கல்வாங்கல் சட்டம்:
ஒழுங்குவிதிகள் [ப: 277]

குடியியல் வான்செலவுச் சட்டம்:
ஒழுங்குவிதிகள் [ப: 278]

பெற்றோலிய வளங்கள் சட்டம்:
ஒழுங்குவிதிகள் [ப: 278]

ஒத்திவைப்புப் பிரேரணை:
கல்வித்துறையிலுள்ள சிக்கலான பிரச்சினைகளுக்கு நிரந்தரத் தீர்வுகள் [ப: 283-406]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Public Financial Management Bill: Petition to the Supreme Court [Col. 213]
Economic Transformation Bill: Petitions to the Supreme Court [Col. 213]

FELICITATIONS TO PRIME MINISTER SHRI NARENDRA MODI [Col. 214]

AUDITOR-GENERAL'S REPORT [Col. 218]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 222]

QUESTIONS POSED TO HON. PRIME MINISTER [Cols. 226-252]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 252-276]

PRIVATE MEMBERS' BILLS:
J. C. Alawathuwela Foundation (Incorporation) - [The Hon. Hector Appuhamy] - Read the First time [Col. 276]

ELECTRONIC TRANSACTIONS ACT:
Regulations [Col. 277]

CIVIL AVIATION ACT:
Regulations [Col. 278]

PETROLEUM RESOURCES ACT:
Regulations [Col. 278]

ADJOURNMENT MOTION:
Permanent Solutions to Critical Problems in the Education Sector [Cols. 283-406]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2024 ජූනි 05වන බදාදා
2024 யூன் 05, புதன்கிழமை
Wednesday, 05th June, 2024

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
பகிரங்க நிதிசார் முகாமைத்துவம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
PUBLIC FINANCIAL MANAGEMENT BILL: PETITION TO THE SUPREME COURT

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "රාජ්‍ය මූල්‍ය කළමනාකරණ" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් ගරු කථානායකතුමා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

II

ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
பொருளாதார நிலைமாற்றம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
ECONOMIC TRANSFORMATION BILL: PETITIONS TO THE SUPREME COURT

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

2024 ජූනි 04 දිනැති ගරු කථානායකතුමාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සම් පහට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ආර්ථික පරිවර්තන" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් නවයක පිටපත්, ගරු කථානායකතුමා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය.

අගමැති ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාට ශුභාශිංසන
பிரதமர் ஸ்ரீ நரேந்திர மோடிக்குப் பாராட்டுக்கள்
FELICITATIONS TO PRIME MINISTER SHRI NERENDRA MODI

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரும்)
(The Hon. Dinesh Gunawardena - Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මා විශේෂයෙන් නැඟී සිටින්නේ අපේ අසල්වැසි, මිත්‍ර, ඓතිහාසික වශයෙනුත් අන් ක්ෂේත්‍ර සියල්ල සමඟ එකට කටයුතු කිරීමේ ශක්තිය දීර්ඝ කාලයක් තිස්සේ ගොඩ නඟාගෙන ඇති ඉන්දියාවේ අග්‍රාමාත්‍ය ධුරය සඳහා තුන්වන වරටත් මහජන ඡන්දයෙන්, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයෙන් තේරී පත් වූ භාරතීය ජනතා පක්ෂයේ නායක ගරු මෝදි මැතිතුමා ලැබූ ජයග්‍රහණයට සුබ පතන්නයි.

ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා අද ජයග්‍රහණය කර තිබෙන්නේ, මේ ලෝකයට දැවැන්ත පණිවුඩයක් ගෙන ගිය ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරයා හැටියටයි. ඒ වාගේම, අපි කවුරුත් දන්නා පරිදි පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ යෝධ පියා ලෙස හා වර්තමානයේ ලෝකයේ වැඩිම ජනගහනය සිටින රට වන ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරයා හැටියට එතුමා නව ආණ්ඩුව පිහිටුවීමට නියමිතයි. ඒ වාගේම ආසියානු රටවල් සමඟ ඇති මිත්‍රත්වය, සහයෝගය හා එකමුතුව වාගේම ශ්‍රී ලංකාව සමඟ ඇති ක්‍රියාකාරී සහයෝගය මේ අවස්ථාවේදී ගෞරවයෙන් සිහිපත් කරමින්, මෝදි අග්‍රාමාත්‍යවරයා ලැබූ මේ ජයග්‍රහණය තුළින් තවත් නව ජයග්‍රහණ උදා කර ගැනීමට ඉන්දියාවට හැකි වේවා කියා අපි සුබ පතනවා. ඒ වාගේම සාමයේ හා සංවර්ධනයේ අලුත් ඉලක්ක ඉන්දියාවටත්, ලෝකයටත් දායාද කරන්නට ආර්ථික ක්ෂේත්‍ර හා අනෙකුත් ක්ෂේත්‍ර තුළින් එතුමාට පුළුවන් වනු ඇතැයි අපි විශ්වාස කරනවා. ඒ සඳහාත් එතුමාට අපි සුබ පතනවා. ඒ අනුව දීර්ඝ කාලයක සිට ශ්‍රී ලංකාවත්, ඉන්දියාවත් අතර ශක්තිමත්ව තිබෙන ද්විපාර්ශ්වික සබඳතා සහ විවිධ ක්ෂේත්‍රවල ඇති අන්‍යෝන්‍ය බැඳියාවන් වර්ධනය කර ගැනීමට ඉදිරියේදීත් හැකි වනු ඇතැයි අපි විශ්වාස කරනවා.

ඒ වාගේම, ශ්‍රී නරේන්ද්‍ර මෝදි අග්‍රාමාත්‍යතුමාට ඒ කටයුතු කරගෙන යෑමට මෙම ජයග්‍රහණය ශක්තියක් වේවායි ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයා හැටියට මා ප්‍රාර්ථනය කරනවා.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

Sir, now I would like to read the letter sent to His Excellency Shri Narendra Modi by me. I quote:

"His Excellency Shri Narendra Modi
Prime Minister of the Republic of India

Excellency,

I offer my heartiest congratulations to you on the resounding victory of the Bharatiya Janata Party (BJP)-led National Democratic Alliance which assures your third consecutive term as Prime Minister of India, the largest Parliamentary democracy in the world.

As a close South Asian neighbour with deep friendship and strongest ties, Sri Lanka is committed to work together with India to overcome challenges and explore new opportunities for enhancing cooperation, peace and prosperity as the world's largest population and a giant economy in the world.

I look forward to continuously work with Your Excellency to further promote the strong, longstanding bilateral ties that are built on the foundation of shared beliefs and principles.

Please accept, Excellency, the assurance of my highest consideration."

Thank you, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොඩි පවුලකින් සමාජයට බිහි වෙලා පවුල් බලයක්, ධන බලයක්, පිරිවර බලයක්, ඥාති බලයක් නොමැතිව, ගුජරාට් ප්‍රාන්තය කේන්ද්‍ර කර ගනිමින් එහි මහ ඇමතිවරයා හැටියට විශිෂ්ට සංවර්ධනයක් ක්‍රියාත්මක කරමින් ඉන්පසුව ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරයා හැටියට එක වතාවක් නොවෙයි, පිට පිට තුන් වතාවක්ම පත් වීම සහ රජයක් නිර්මාණය කිරීම පිළිබඳව ගරු මෝදි මැතිතුමා ප්‍රමුඛ භාරතීය ජනතා පක්ෂයටත්, ඒ වාගේම NDA එකටත් මේ අවස්ථාවේදී අපේ ශුභාශිංසන පිරිනමනවා. විශේෂයෙන්ම නේරු අග්‍රාමාත්‍යතුමාගෙන් පසුව තුන් වතාවක් අග්‍රාමාත්‍ය ධුරය හොබවන්නට වරම් ලබපු මෝදි අග්‍රාමාත්‍යතුමා, එක දිගටම ජනතා විශ්වාසය ලබා ගනිමින්, ජනතා පිළිගැනීමට ලක් වෙමින් මේ ක්‍රියාත්මක කරපු වැඩ පිළිවෙළ පිළිබඳව අපි, අපේ සතුට පළ කර සිටිනවා.

රටක් හැටියට ගත්තොත්, ශ්‍රී ලංකාවත්, ඉන්දියාවත් අතර සමීප මිත්‍රතාවක් තිබිය යුතුයි කියන එකයි අපේ අදහස. ඒ නිසාම අපි විශ්වාස කරනවා, ලෝක ජනගහනය වැඩිම රට වුණු ඉන්දියාවට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සලයේ ස්ථිර සාමාජිකත්වයක් ලබා දීම මේ අවස්ථාවේදී යෝග්‍ය වෙනවාය කියලා. විශේෂයෙන්ම ගෝලීය බල කේන්ද්‍රස්ථාන දිහා බැලුවාම ඉන්දියාවට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සලයේ ස්ථිර නියෝජනත්වයක් ලබා දීම සත්‍ය වශයෙන්ම සිදු විය යුතු දෙයක්. ඒ යෝජනාවට මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225දෙනාගේම ආශීර්වාදය ලැබෙනවා කියන එක අපට විශ්වාසයි. එයත් යෝජනාවක් හැටියට මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා.

විශේෂයෙන්ම මෝදි kkkඅග්‍රාමාත්‍යතුමාට ඉන්දියාවේ විවිධ ප්‍රාන්ත කේන්ද්‍ර කරගෙන ඉතා ශක්තිමත් මැතිවරණ ව්‍යාපාරයක් ක්‍රියාත්මක කරමින් බොහෝ ප්‍රාන්තවල මහජන නියෝජනත්වය ලබා ගන්නට හැකියාව ලැබුණා. පිට පිටම තුන් වතාවක් ජයග්‍රහණය කරනවා කියන එක ලෙහෙසි, පහසු ක්‍රියාවක් නොවෙයි. ඒක ඉතා ඓතිහාසික ක්‍රියාවක්.

මෝදි අග්‍රාමාත්‍යතුමාගේ ඒ ක්‍රියාව තුළින් අපිත් අවබෝධයක් ලබා ගන්නට ඕනෑ. මීට දශක කිහිපයකට පෙර ඉන්දියාව බොහොම අමාරු තත්ත්වයක සිටි මොහොතක, ආර්ථිකය කඩා වැටී තිබුණු මොහොතක, ජනතා කේන්ද්‍රීය ආර්ථික ප්‍රතිසංස්කරණ වාගේම ජනතා කේන්ද්‍රීය ආර්ථික සංවර්ධනයක් ක්‍රියාත්මක කරමින්, "සැමට සෞභාග්‍යය", "බෙදා ගත් සෞභාග්‍යය", "සැවොම ඇතුළත් කර ගත් ආර්ථික වර්ධනය" යනාදී ප්‍රතිපත්ති එතුමා විසින් ක්‍රියාත්මක කළා. ඒ ප්‍රතිපත්ති තුළින් ඉදිරියට යෑම නිසා, ලෝකයේ මේ බල ප්‍රදේශවල බොහෝ රටවල් ඉතාම මන්දගාමී ආර්ථික වර්ධනයක් ක්‍රියාත්මක කරනකොට, අද දවසේත් ආර්ථික වර්ධනය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යෑමට ඉන්දියාවට හැකි වී තිබෙනවා. විශේෂයෙන්ම කොවිඩ්-19 ව්‍යසනයෙන් පසුවත් දැවැන්ත ආර්ථික වර්ධනයක් ක්‍රියාත්මක කරන්නට ඉන්දියාවේ ආර්ථික මොඩලය බොහෝ ලෙස ඉවහල් වෙලා තිබෙනවා. මෙහිදී අපි අවබෝධ කර ගන්නට ඕනෑ, ආර්ථික ප්‍රතිලාභ හැමෝම බෙදා ගත් තැන ජනතා ඉල්ලුම සහ විශ්වාසය වැඩි වන බව. හැබැයි, ආර්ථික වර්ධනය කොටසකට පමණක් සීමා වනකොට අන්න ඒ අවස්ථාවලදී පසුබෑම් සිදු වනවා.

අපි මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ගරු මෝදි අග්‍රාමාත්‍යතුමාට සුබ පතනවා. ඒ වාගේම එතුමා එම ධුරයට පත්වීම සම්බන්ධයෙන් අපි සතුටු වෙනවා. මම මතක් කරන්න ඕනෑ, විශේෂයෙන්ම යහ පාලන රජය ක්‍රියාත්මක වූ කාලයේ "ශ්‍රීමත් නරේන්ද්‍ර මෝදි" උදාගම්මානය නිස්සමහාරාම පුරවරයේ ඉදිකරන්නට අපි කටයුතු කළ බව. එදා අපි දුටුවා, මෝදි අග්‍රාමාත්‍යතුමාගේ වැදගත්කම.

විශේෂයෙන් අපේ රට බංකොලොත්භාවයට පත් වුණු අවස්ථාවේ තනි රටක් හැටියට වැඩිම ආධාර, ණය ආධාර, උපකාර ප්‍රමාණයක් ලබා දුන්නු රට තමයි ඉන්දියාව. ඒ පිළිබඳව මෝදි අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ ඒ රජයට අපේ ස්තුතිය නැවත නැවතත් පුද කරනවා. මේ බලප්‍රදේශයේ පමණක් නොවෙයි මුළු ලෝකයේම, විශේෂයෙන් දකුණේ රටවල -දකුණු බල ප්‍රදේශය නියෝජනය කරන රටවල- ජනතාවගේ හැඟීම්, සිතුම් පැතුම් සාක්ෂාත් කරන්නට ජාත්‍යන්තරයේත් ඒ වැඩ පිළිවෙළ ගෙන යන්නට එතුමාට ධෛර්යය, ශක්තිය, වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මේ අවස්ථාවේ අපේ පූර්ණ ස්තුතිය නැවතත් පුද කර සිටිනවා.

Sir, let me take this opportunity to congratulate Prime Minister elected His Excellency Narendra Modi on his record or remarkable achievement. He is the first Prime Minister of India after His Excellency Shri Jawaharlal Nehru to have had consecutive victories, three times in a row, at the Indian Parliamentary Elections and it is a testament to his noble vision, practical policies and to his system of governance, that for the third time in a row, the citizens of India across all States had expressed a remarkable and historic confidence in His Excellency Modi's political and governance programme.

While congratulating Prime Minister Modi, I would like to, at this juncture, propose from the Parliament of Sri Lanka that India should be duly made a permanent

member of the United Nations Security Council. That is of utmost importance. As the country which possesses the largest population in the whole world and also examining the world economic, military and security power configuration, I feel that that representation of India in the United Nations Security Council must be promoted and achieved. We, all the 225 Members in this august Assembly, would like to propose that India be made a permanent member of the United Nations Security Council. I think it is long overdue and should be implemented as quickly as possible. I am pretty sure that the five permanent members who are there right now in the UN Security Council would have no objection to establishing this world power reality in the United Nations structure.

Sir, Prime Minister Modi has been a remarkable person who commenced his work from humble beginnings. He was from a small family; he did not have a huge family background. He did not have a power base to commence his work, but with his remarkable achievements as Chief Minister of Gujarat and then afterwards, as a three-time Prime Minister of India, he has exhibited his stupendous energy, charisma, hard work and singular determination to make India number one in the world. When most of the countries in the region are going through sluggish economic growth, we see India as a unique country which has extricated itself from the COVID menace or catastrophe. India has been a shining example as to how you get yourself out of desperate situations, despair, economic catastrophe and transform and translate a bad situation into a good one. Sir, I would like to congratulate Prime Minister elected His Excellency Shri Narendra Modi on his remarkable achievement across most states. Of course, there had been states where he has done very well and certain States where the BJP-NDA Alliance is yet to make its imprint.

However, I think holding the position of Prime Minister three times is a remarkable achievement and we applaud him on his achievements and success.

We would like to have a very close relationship continuously with India, our great and brotherly neighbour. We would also like to have a strong, productive and constructive relationship with them. We saw India's brotherly, neighbourly relationship with Sri Lanka, with them becoming the largest single donor to us, contributing an amount of US Dollars 6 billion in grants, loans and financial support. We appreciate the support India has provided us when Sri Lanka had been suffering from a variety of challenges including economic bankruptcy.

Sir, once again I congratulate His Excellency Shri Narendra Modi and his team, the BJP-NDA alliance, on this remarkable achievement and let us work together to ensure that mutual benefits and prosperity are maximized and achieved.

Thank you.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXXII කොටස ගරු කථානායකතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

II

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩය - 2021 වර්ෂය සඳහා රාජ්‍ය සංස්ථා, සමාගම්, බැංකු ආයතන (2018 අංක 19 දරන විගණන පනතේ 12 වගන්තියට අදාළ ආයතන) විගණනයේ දී ආයතනික යහපාලන විෂයයන්ට අදාළව අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඇතුළත් ඒකාබද්ධ විශේෂ විගණන වාර්තාව ගරු කථානායකතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iii) 2023 වර්ෂය සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2023 වර්ෂය සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(v) 2023 වර්ෂය සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vi) 2023 වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vii) 2023 වර්ෂය සඳහා නීති කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(viii) 2023 වර්ෂය සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව;

(ix) 2023 වර්ෂය සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(x) 2023 වර්ෂය සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(xi) 2023 වර්ෂය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා කිලිනොච්චිය, මුලතිව්, මාතර, කෑගල්ල, මාතලේ, කොළඹ, පුත්තලම, පොළොන්නරුව, රත්නපුර, ගාල්ල, අම්පාර, බදුල්ල, නුවරඑළිය, මහනුවර සහ කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කාර්ය සාධන වාර්තා;

(iii) 2023 වර්ෂය සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iv) 2023 වර්ෂය සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂ භාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාරණයක් කියන්න තිබෙනවා. මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ.

අපේ ගරු අග්‍රාමාත්‍යතුමා යටතේ මෙය ඉදිරිපත් වුණු නිසායි මම මේ කාරණය අහන්නේ. රජය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ වැඩසටහනක් ගැනයි මා අහන්නේ. ඒ තමයි, ග්‍රාමීය මට්ටමින් ජනතා ක්ෂේත්‍රීයව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු ජනසභා වැඩසටහන. ගරු අග්‍රාමාත්‍යතුමනි, ජනාධිපතිවරයා ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්න කරු ජයසූරිය මැතිතුමාට භාර දුන්නා. ඇත්තවශයෙන්ම ඒක හොඳ වැඩසටහනක්, නරක වැඩසටහනක් නොවෙයි. නමුත්, අපට දැන ගන්න ලැබී තිබෙනවා, ඒ ජනසභා වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී යම් යම් දේශපාලන විරෝධතා ඇති වෙලා තිබෙනවා කියලා; ඒ වාගේම ඔබතුමාත් ඒකට ඒ තරම්ම කැමැත්තක් දක්වන්නේ නැහැ කියලා. මේ ගැන ඔබතුමාට පැහැදිලි කරන්න පුළුවන්. මම චෝදනා කරනවා නොවෙයි, මේ. මම කියන්න කැමැතියි, ඒ ජනසභා වැඩසටහන සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදී - participatory democracy - වැඩසටහනක් බව.

ඇත්තවශයෙන්ම මේකෙන් පළාත් පාලන ආයතනවල මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියලාට අගතියක්, හානියක් වෙන්නේ නැහැ. ඒ නිසා මම කියනවා, කරු ජයසූරිය මැතිතුමාට භාර දුන්න ඒ කර්තව්‍යය වන ජනසභා වැඩසටහන හොඳ වැඩක් සහ ග්‍රාම රාජ්‍ය සංකල්පය තුළ ක්‍රියාත්මක විය යුතු වැදගත් වැඩසටහනක් බව. ඒ නිසා ඒක කරගෙන යන්නට අවස්ථාව ලබා දෙන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ලිපිලේඛනාදිය පිළිගැන්වීම යටතේ, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා.

ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා)
(මාණ්පුමිකු சட்டத்தரணி நிமல் சிறிபால த சில்வா - துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva, Attorney-at-Law - Minister of Ports, Shipping and Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැවිලි කර්මාන්ත අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු විදුර වික්‍රමනායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Vidura Wickramanayaka - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු උදයකාන්ත ගුණතිලක මහතා
(மாண்புமிகு உதயகாந்த குணதிலக்க)
(The Hon. Udayakantha Gunathilaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
(மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ)
(The Hon. Upul Mahendra Rajapaksha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද 2020 සහ 2021 වර්ෂ සඳහා හින්දු සංස්කෘතික අරමුදලේ වාර්ෂික කාර්ය සාධන වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
(மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ)
(The Hon. Upul Mahendra Rajapaksha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 2018 සහ 2019 වර්ෂ සඳහා බුද්ධශාසන අරමුදලේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2022 වර්ෂය සඳහා හින්දු සංස්කෘතික අරමුදලේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු අග්‍රාමාත්‍යතුමනි, අපේ ගරු රවීන්ද්‍ර රන්දෙණිය හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා අද දවසේ සිනමා ජීවිතයේ 50 වැනි සංවත්සරය සමරනවා. ඒ වාගේම එතුමා සිය 79 වැනි උපන් දිනයත් අද දිනයේ සමරනවා. එතුමාගේ සිනමා දිවිය තුළ එතුමා සිනමාවට කළ සේවාව, කලා ක්ෂේත්‍රයට කළ සේවාව වෙනුවෙන් මේ ගරු සභාවේ අප සියලුදෙනාගේම ශුභාශිංසනය, ගෞරවය ගරු රවීන්ද්‍ර රන්දෙණිය මැතිතුමාට පුද කරන ලෙස මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝක පරිසර දිනය - World Environment Day - අදට යෙදී තිබෙනවා. ලෝක පරිසර දිනය යෙදී තිබෙන අද දිනයේ මා කියන්න කැමැතියි, මේ කාරණයත්. විශේෂයෙන්ම අපේ රට දූපත් රාජ්‍යයක් හැටියට මිල කළ නොහැකි ස්වාභාවික සම්පත් රැසකින් පොහොසත්, ඒවායෙන් ආශීර්වාදය ලැබූ රටක්. අපේ රටේ පරිසරය ඉතාම ඉහළ මට්ටමකින් ආරක්ෂා කරමින් රටේ සංවර්ධන ජාතික න්‍යාය පත්‍රයට තිරසරභාවය බාධාවකින් තොරව ඒකාබද්ධ කිරීම අවශ්‍ය වෙලා තිබෙනවා. ලෝක පරිසර දිනයේදී ක්‍රියාත්මක වන සියලු ක්‍රියාකාරකම් පරිසර හිතකාමී ආකාරයට ක්‍රියාත්මක කළ යුතු යැයි අපි යෝජනා කරනවා. විශේෂයෙන්ම 2021දී ජාතික හරිත ප්‍රවේශය ආරම්භ කරපු ශ්‍රී ලංකාවේ ප්‍රධාන ධාරාවේ ප්‍රථම හරිත දේශපාලන පක්ෂය වන්නේ සමගි ජන බලවේගයයි; අපේ කණ්ඩායමයි. එහි නායකයා හැටියට, මේ රටේ සියලුම පරිසර සම්පත් සුරක්ෂා කෙරෙන, ඒවා ආරක්ෂා කරන, සොබාදහම, වෘක්ෂලතා ආරක්ෂා කරන ප්‍රතිපත්තියකට යොමු වෙමින් අපේ රටේ තිරසර සංවර්ධන රටාව ක්‍රියාත්මක කිරීමට අපි කැප වෙමු කියාත් ලෝක පරිසර දිනය යෙදී තිබෙන අද දිනයේදී මා ඉල්ලා සිටිනවා.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) අහුණකොලපැලැස්ස, ග.නි.ස.ම. නිවාස, අංක ඊ 3/1 දරන ස්ථානයෙහි පදිංචි පී.පී.ජී. පද්මාවතී මහත්මියගෙන් සහ වෙනත් අටදෙනෙකුගෙන් ලැබුණු පෙත්සම;

(2) මාතලේ, කයිකාවල, රත්තොට පාර, අංක 57 දරන ස්ථානයෙහි පදිංචි රත්නසිරි තෙන්නකෝන් මහතාගෙන් සහ වෙනත් පස්දෙනෙකුගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) උකුවෙල, වරකන්ද වත්ත, පන්සල පාර, අංක 05 දරන ස්ථානයෙහි පදිංචි එස්.පී.කේ. වික්‍රම පතිරණ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තිස්සමහාරාමය, දකුණු රණකෙළිය, පුස්තෝලමුල්ල දරන ස්ථානයෙහි පදිංචි සරත් කුමාර වන්නි ආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) திலக் ராஜபக்ஷ)
(The Hon. (Dr.) Thilak Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අම්පාර, උහන, කුමාරිගම, අංක 20/60/02 දරන ස්ථානයෙහි පදිංචි ආර්.එම්.එන්.එස්. බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ සිංහල සිනමා වංශ කථාවේ රංගධරයකු වූත්, මෙම පාර්ලිමේන්තුව තුළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙසත් කටයුතු කළාවූ රවීන්ද්‍ර රන්දෙණිය ශූරීන්ගේ උපන් දිනයට සහ ඔහු වෙනුවෙන් පැවැත්වෙන උපහාර උළෙල වෙනුවෙනුත් ගරු විපක්ෂ නායකතුමා සුබ පැතුම් එකතු කළා. ලංකා ආණ්ඩුව වෙනුවෙන් සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා වශයෙන් මමත් එතුමාට සුබ පැතුම් එක් කරනවා. මා නිෂ්පාදනය කළ "සිරිමැදුර" චිත්‍රපටයේ වචනයක්වත් කථා නොකර කරන ලද රංගනයට රටේ හොඳම නළුවාට හිමි සම්මානය ඔහු හිමි කරගත්තා. එවැනි ප්‍රතිභාපූර්ණ රංගන ශිල්පියෙකු වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට, රජය, ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් මේ අවස්ථාවේ අපේ ගෞරවය හා උපහාරය පුද කරනවා.

ගරු අකිල එල්ලාවල මහතා
(மாண்புமிகு அகில எல்லாவல)
(The Hon. Akila Ellawala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අකිල එල්ලාවල මන්ත්‍රීතුමා.

ගරු අකිල එල්ලාවල මහතා
(மாண்புமிகு அகில எல்லாவல)
(The Hon. Akila Ellawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වී තිබෙන අධික ගංවතුර තත්ත්වය සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කරපු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සඳහා මට මුලින් අවස්ථාව දෙනවා නම් ලොකු දෙයක්. මොකද, මේ ප්‍රශ්නය අද රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වී තිබෙන ලොකුම ප්‍රශ්නය බවට පත්වෙලා තිබෙන නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අද ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් අහන පළමුවන ප්‍රශ්නය ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාගේ නිසා ඒ සඳහා එතුමාගේ එකඟතාවක් තිබෙනවාද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නය අද දින ඇසීමට නියමිත ප්‍රශ්න අතරට ඇතුළත් කරලා නැද්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඇතුළත් කරලා තිබෙනවා. 4වැනි ප්‍රශ්නය විධියට තමයි ඒක තිබෙන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මගේ ප්‍රශ්නයෙන් පස්සේ එතුමාට අවස්ථාව දෙමු. අපි මේ ගැන ඊයේත් කථා කළා. දැන් මගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නම්. ඊට පස්සේ එතුමාට අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතකොට තව මන්ත්‍රීවරු දෙදෙනෙක් ඉන්නවා නේ, ප්‍රශ්න ඉදිරිපත් කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ඒ ගොල්ලන්ටත් අවස්ථාව දෙන්න, කපන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කපන්න නොවෙයි. එතුමා ඉල්ලීම කරන්නේ පළමුවෙන් එතුමාගේ පෙත්සම ගන්න අවසර දෙනවාද කියලායි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මගේ ප්‍රශ්නය පෙත්සම්වලට අදාළ නැහැ. මගේ ප්‍රශ්නය තිබෙන්නේ අගමැතිතුමාගෙන් අහන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අගමැතිතුමාගෙන් ඇසීමට නියමිත ප්‍රශ්නවල 4වැනි තැනට තමයි ගරු අකිල එල්ලාවල මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය තිබෙන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
උදේ 10.30ට මගේ ආංශික අධීක්ෂණ කාරක සභාව පටන් ගන්නවා. එම නිසා මගේ ප්‍රශ්නයෙන් පස්සේ දෙවැනි ප්‍රශ්නය හැටියට එතුමාට අවස්ථාව දෙන්න.

ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න
மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
QUESTIONS POSED TO HON. PRIME MINISTER

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

(අ) (i) ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පිළිගන්නා ලද්දේ කවදාද?

(ii) එකී ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය අනුව පිළිගත් දිනයේ සිට මේ දක්වා ඇගයීම සම්බන්ධයෙන් සිදු කරන ලද ධනාත්මක ක්‍රියාකාරකම් මොනවාද?

(iii) ජාතික ඇගයීම් සංස්කෘතියක් ශ්‍රී ලංකාව තුළ විධිමත්ව ක්‍රියාත්මක කිරීමට ඇති බාධා රජය හඳුනාගෙන තිබේද?

(iv) එසේ නම්, එම බාධා මොනවාද?

(v) ජාතික පොලිස් කොමිසම, ජාතික අධිකරණ කොමිසම, රාජ්‍ය සේවා කොමිසම, මැතිවරණ කොමිසම, විගණන කොමිසම ආදී ස්වාධීන කොමිෂන් සභා ක්‍රමය අවශ්‍ය සංශෝධන සහිතව ගලපා ගනිමින් ස්වාධීන ජාතික ඇගයීම් කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීමෙහිලා රජය කටයුතු කරන්නේද?

නොඑසේ නම් ඒ මන්ද?

(ආ) (i) ජාතික ඇගැයීම මේ වන විටත් රජයේ එක් අමාත්‍යාංශයක නිලධාරීන් පිරිසකගේ ග්‍රහණයට පත්ව ඇති බවත්;

(ii) ජාතික විගණන කොමිෂන් සභාව වැනි ස්වාධීන කොමිෂන් සභාවක් ජාතික ඇගැයීම වෙනුවෙන් ස්ථාපනය නොවීමත්;

(iii) ජාතික ඇගැයීම් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සිතාමතා ප්‍රමාද කිරීමත්, මෙම නිලධාරිවාදයේ ප්‍රතිඵලයක් බව එතුමා දන්නේද? ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

(ඇ) (i) ජාතික ඇගැයීම වෙනුවෙන් 2024/2025 වර්ෂ තුළ රජයේ සක්‍රිය මැදිහත්වීම පිළිබඳව ගන්නා ලද/ගැනීමට නියමිත සාධනීය ක්‍රියාමාර්ග මොනවාද?

(ii) ජාතික ඇගැයීම වෙනුවෙන් 2024/2025 වර්ෂ සඳහා අය වැයෙන් මුදල් වෙන් කිරීමට අපේක්ෂා කරන්නේද? එසේ නම් ඒ කොපමණ මුදල් ප්‍රමාණයක්ද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අගය කරනවා, බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී මේ විශේෂ කාරණාව සම්බන්ධව ප්‍රශ්න කිරීම ගැන. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(අ) (i) ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය ගරු අමාත්‍ය මණ්ඩලය විසින් 2018 ජූනි 26වැනි දින අනුමත කරනු ලැබ ඇත.

(ii) a. ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව 2023.09.08 දින ප්‍රකාශයට පත් කර ඇත.

b. 2023 අගෝස්තු මස සිට 2024 මාර්තු මස දක්වා වූ කාලය තුළ රාජ්‍ය සේවයේ විවිධ ස්තර එනම්, අමාත්‍යාංශ, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල නියෝජනය කරන නිලධාරීන් 147ක් වෙනුවෙන් දින 03 බැගින් වූ පුහුණු වැඩසටහන් 06ක් දිවයින පුරා මේ වන විට පවත්වා එම නිලධාරීන් ද ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණුකරුවන් ලෙස පුහුණු කරමින් ඇත.

c. එමෙන්ම, අදාළ කාලය තුළ අමාත්‍යාංශ, පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නියෝජනය කරන නිලධාරීන් 702ක් වෙනුවෙන් දින දෙකේ වැඩසටහන් 18ක් පවත්වා ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව දැනුවත් කර ඇත.

d. 2023.12.05 දින එළැඹි අංක 23/2283/604/223 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුවෙහි ප්‍රතිපාදන අනුව කටයුතු කිරීම පිණිස 2024 ජනවාරි මස 09වන දින මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් ජාතික ඇගැයීම් මෙහෙයුම් කමිටුව ස්ථාපනය කරනු ලැබ ඇත.

e. මුදල් අමාත්‍යාංශය මඟින් 2024 ජනවාරි මස 12 දිනැතිව නිකුත් කරනු ලැබ ඇති අංක 2024/01 දරන ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ චක්‍රලේඛය මඟින් ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම් හා කාර්යභාරය පිළිබඳව සියලු ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත.

මෙයින් පෙන්නුම් කරන්නේ මෙහි ප්‍රගතිය ලබමින් තිබෙනවා කියන එකයි. මෙය පියවරෙන් පියවර ගමන් කළ යුතු දෙයක්, ගරු මන්ත්‍රීතුමනි.

f. මුදල් අමාත්‍යාංශය මඟින් 2024 පෙබරවාරි මස 01 දිනැතිව නිකුත් කරනු ලැබ ඇති අංක 2024/02 දරන ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ චක්‍රලේඛය මඟින් සියලු අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙතින් 2025 වසර සඳහා ඇගැයීම් යෝජනා කැඳවා ඇත. ඒ අනුව, 2024 මැයි 15 දින වන විට අමාත්‍යාංශ 13කින් හා පළාත් සභා 06කින් ඇගැයීම් යෝජනා 23ක් ඉදිරිපත් කර ඇති අතර, ඒ අතුරින් යෝජනා 13ක් සඳහා මේ වන විට ජාතික ඇගැයීම් මෙහෙයුම් කමිටුවෙහි අනුමැතිය ලැබී ඇත.

(iii) නැත.

(iv) දැනට නම් නැහැ. ප්‍රමාදයක් පමණයි තිබෙන්නේ. ඒක කාලීනව ක්‍රියාත්මක කිරීම සඳහා පියවරෙන් පියවර ගමන් කරලා තිබෙනවා.

(v) එලෙස ස්වාධීන ජාතික ඇගැයීම් කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීමට රජය මෙතෙක් කටයුතු යොදා නැති අතර, ජාතික ඇගැයීම් ප්‍රතිපත්තියෙහි 4.2වැනි ප්‍රකාශය අනුව දැනට පවතින රජයේ ආයතනික සැකැස්ම තුළින්ම ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ආයතනික රාමුව හඳුනා ගෙන ඇත.

මම කලින්ම ඒක ප්‍රකාශ කළා. එහි අරමුණ වෙන්නේ ඇගැයීම සෑම රාජ්‍ය ආයතනයකම සාමාන්‍ය ක්‍රියාකාරකමක් බවට පරිවර්තනය කිරීමත්, රාජ්‍ය අංශය තුළ ඇගැයීමේ නව සංස්කෘතියක් නිර්මාණය කිරීමටත්, එම කාර්යය සඳහාම නව ආයතන පද්ධති ස්ථාපනය කිරීම තුළින් ආයතන නඩත්තුව සඳහා රජයට දැරීමට සිදුවන අමතර වැය බර වළක්වා ගැනීමත්ය.

මේ අතරතුර මම කියන්න ඕනෑ, රජය ඉතා පැහැදිලිව කරපු ප්‍රකාශයක සඳහන් දෙයක්. ජනාධිපතිතුමාත්, පාර්ලිමේන්තුවත් අය වැය ලේඛනයෙන් එය අනුමත කළා. ලංකාවේ තිබෙන දෙපාර්තමේන්තු ගණනාවක්, එහෙම නැත්නම් සමාන්තර දෙපාර්තමේන්තු රාශියක් ඒකාබද්ධ කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ පියවරට අපි ගමන් කරමින් තිබෙනවා. ඒ අනුව අනවශ්‍ය නාස්තිය හා වැය ශීර්ෂ අඩු කර ගැනීමට ද පුළුවන් වෙනවා ඇති.

ඇගයීම රාජ්‍ය අංශය තුළ නිසි ලෙස ආයතනගත කිරීම පිණිස ඉහත විස්තර කර ඇති පියවර මේ වන විටත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබෙනවා. ඇගැයීම තුළින් අපේක්ෂා කරනුයේ ව්‍යාපෘති, වැඩසටහන් හා ප්‍රතිපත්තිවල ඵලදායිතාව, කාර්යක්ෂමතාව, අදාළත්වය, ගැළපීම, බලපෑම හා තිරසරභාවය පිළිබඳව නිරන්තරව ස්වාධීන අධ්‍යයනයක් කිරීම තුළින් පාඩම් ඉගෙනීම සහ එම පාඩම් ඉදිරි සැලසුම් සාර්ථකව සිදු කිරීම සඳහා උපයෝගි කර ගැනීමයි. එමෙන්ම ඇගැයීම්වල ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනට ඇතුළත්ව තිබෙන බවත්, ඇගැයීම සඳහා වූ ස්වාධීන කොමිෂන් සභාවක අවශ්‍යතාව හදිසියේ පැන නොනඟින බවත් ප්‍රකාශ කරන්න කැමැතියි.

මීට අතිරේකව, ඒ පිළිබඳව කොමිෂන් සභාවක විස්තරයක්, ඇති කරන කාල වකවානුව, ඒ වාගේම පාර්ලිමේන්තුව තුළ දැනට කෙරෙන කර්තව්‍යයන් ගැන සහ එම අමාත්‍යාංශයට සම්බන්ධ දෙපාර්තමේන්තුවක් මඟින් කෙරෙන මේ කර්තව්‍යයේ ප්‍රගතිය ගැන අපේ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා විසින් අවශ්‍ය නම් ප්‍රකාශ කරනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිරි ප්‍රශ්නවලට අදාළ පිළිතුරු මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුරෙහි ඉතිරි කොටස:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி:*

** Rest of the Answer tabled:*

(ආ) (i) ඉහත (අ) (ii)හි d, e, f, g සහ h අනුව එවැනි තත්ත්වයක් නොපවතින බව මනාව පැහැදිලි වේ.

(ii) ඉහත (අ) (v) අනුව මෙම කරුණ සාධාරණීකරණය කළ නොහැක.

(iii) ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය අවම වශයෙන් වසර 03ක්වත් ප්‍රායෝගික තලයේ ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ඇගැයීම

සඳහා නව පනතක අවශ්‍යතාව සලකා බැලීම සුදුසු බැවින් එය කිසියම් නිලධාරීන් පිරිසකගේ මැදිහත්වීමක් හේතුවෙන් වන ප්‍රමාදයක් නොවන බව ප්‍රකාශ කළ හැක. 2025-2027 කාල සීමාව තුළ ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ඇගැයීම් පනතක අවශ්‍යතාව සලකා බැලීමෙන් අනතුරුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ.

(ඇ) (i) 2024 වසර තුළ මේ වන විට රජය විසින් ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග ඉහත (අ) (ii)හි d, e, f, g සහ hහි සඳහන් කර ඇත. 2025 වසරේදී සිදු කිරීමට ජාතික ඇගැයීම් මෙහෙයුම් කමිටුව මඟින් අනුමත කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාළ පූර්ව සූදානම් කටයුතු ද, ඒ සඳහා 2025 වසරට අවශ්‍ය අය වැය ප්‍රතිපාදන වෙන් කිරීමද 2024 වසර තුළදී සිදු කිරීමට සැලසුම් කර ඇත. එමෙන්ම, ඉදිරියේදී රජයේ ආයතන මඟින් ඇගැයීම් සිදු කිරීමේදී තාක්ෂණික සහාය අවශ්‍ය වේ නම් එම සහාය ලබා දීමට සුදුසු ප්‍රවීණත්වය හා පළපුරුද්ද සහිත ප්‍රවීණයන්ගේ තොරතුරු රැස් කිරීමට හා එම පිරිස්වල සහාය අවශ්‍ය අවස්ථාවලදී එම දත්ත අදාළ අවශ්‍යතා ඇති ආයතනවලට ලබා ගැනීමටත් හැකි වන ක්‍රමවේදයක් 2024-2025 කාල රාමුව තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

(ii) 2024 සඳහා ඇගැයීම් වෙනුවෙන් රුපියල් මිලියන 2ක ප්‍රතිපාදන වෙන් කරනු ලැබ ඇති අතර, සමස්ත රාජ්‍ය අංශය තුළ ඇගැයීම් සක්‍රීයව ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත්තේ 2025 වසරේ සිට වන බැවින්, ජාතික ඇගැයීම් මෙහෙයුම් කමිටුව මඟින් අනුමත කරනු ලැබ ඇති ඇගැයීම් යෝජනා 13 ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික අය වැයෙන් රුපියල් මිලියන 18ක පමණ ප්‍රතිපාදන වෙන් කිරීමට යෝජනා වී ඇත. එමෙන්ම, මෙම වර්ෂය අවසන් වීමට පෙර හඳුනා ගනු ලබන ඇගැයීම් විෂයයට අදාළ සුදුසු වැඩසටහන් සඳහාද 2025 අය වැය යෝජනා ඉදිරිපත් කෙරෙනු ඇත.

(ඈ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු අග්‍රාමාත්‍යතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇගැයීමේ ක්‍රියාවලියේදී ප්‍රධාන කරුණු 3ක් තිබෙනවා. මම දන්නේ නැහැ, ඔබතුමාට ඔය දුන් තොරතුරුවල එම කරුණු සඳහන්ව තිබෙනවාද කියලා. ඇගැයීම සම්බන්ධව 2019 වසර වෙනකොටම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පනත් කෙටුම්පතක් හදලා තිබුණා. එතකොට අංක 1, ඒ පනත් කෙටුම්පත.

දෙවැන්න මෙයයි. ඔබතුමන්ලා කියනවා, ආයතනික රාමුවක් වෙනම හදන එක වියදම් යන කාරණයක්, සමාන්තර, එක හා සමානව යන, duplicate වැඩ කෙරෙන ආයතන දැන් ඒකරාශි කරනවා, ඒකාබද්ධ කරනවා, නැත්නම් merge කරනවා කියලා. හැබැයි එහෙම කිව්වත්, යෝජිත ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතෙන් BOI එක වෙනුවට ආයතන 5ක් ඇති වෙනවා.

ඇගැයීම කියන්නේ ස්වාධීන වැඩක්. මේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය, කාර්ය මණ්ඩලය පවා මේ ඇගැයීමේ ක්‍රියාවලියට සම්බන්ධ වුණා. ඒක හරියට විගණනයක් වාගේයි. ඒකට විගණන කොමිසම, එහෙම නැත්නම් විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙනම වුවමනා නැහැ, ඒකත් රාජ්‍යය තුළින්ම කරන්න පුළුවන් වාගේ අදහසක් තමයි තිබෙන්නේ. ඉතා පැහැදිලිවම ඇගැයීමේ ක්‍රියාවලිය අත්පත් කරගෙන තිබෙන, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වුවමනාව මේකයි.

ඒගොල්ලන් ඒක ලස්සනට පෙන්වන්න හදනවා, වෙනම ආයතනික පද්ධතියක් වුවමනා නැහැ කියලා. නමුත් ඇත්ත කථාව නම් ඒක විගණනය හා සමාන, විගණනයටත් වඩා එහා ගිය වැඩ පිළිවෙළක් කියන එකයි. විගණනයෙන් කරන්නේ, කෝටුවක් තියාගෙන දඬුවම් කරනවා වාගේ වැඩක්. හැබැයි, ඇගැයීම විසින් තමයි යම් ව්‍යාපෘතියක් කරන්නට පෙර ඒ ගැන හොයා බලන්නේ, ක්‍රියාවලිය සිදු වෙනකොට හොයා බලන්නේ වාගේම, ක්‍රියාවලියේ පසුවිපරම ගැන හොයා බලන්නේ. ඒක විගණනයට වඩා එහා ගිය දැවැන්ත විද්‍යාත්මක වැඩ පිළිවෙළක්. අපට වඩා සමහර කාරණාවලින් පසුගාමී නේපාලයේ පවා ඇගැයීම් කියන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ -අපේ එහෙම නැති වුණත්- කොටසක්. ඒ නිසා ස්වාධීන ඇගැයීමේ ක්‍රියාවලිය රාජ්‍ය අංශ හරහා සිදු කිරීම ප්‍රායෝගික නැහැ, ගරු අගමැතිතුමනි. සංක්‍රාන්ති කාලයක මේ ඇගැයීමේ සංස්කෘතිය පුරුදු කරනකල් ඒක හොඳයි. හැබැයි, වහාම විය යුතුව තිබෙන්නේ, ස්වාධීන කොමිෂන් සභාවක් හරහා ව්‍යුහයක් නිර්මාණය කරන එකයි.

තුන්වැනි කාරණය මෙයයි. ඇගැයීම තරමක් මිල සහිතයි. ඒක මිල සහිත ක්‍රියාවලියක්. ඒකට යම්කිසි මුදලක් වුවමනායි. ඒ නිසා ජාතික අය වැයෙන් මේ ඇගැයීමේ ක්‍රියාවලියට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කළ යුතු වනවා වාගේම, ජාතික ඇගැයීමේ ක්‍රියාවලිය ව්‍යාපෘති සමඟ ඒකාබද්ධ කිරීමද කළ යුතුයි.

ඒ නිසා පළමුවෙනි අතුරු ප්‍රශ්නය විධියට මම ඔබතුමාගෙන් අහන්න කැමතියි, මේ පනත් කෙටුම්පත -අනික් ඒවා ඔක්කොම පොඩ්ඩක් පැත්තකින් තියමුකෝ- ගේන්න ඇයි ප්‍රමාද කරන්නේ, මේ පනත් කෙටුම්පත කොපමණ කාලයකින් ගේන්න පුළුවන්ද කියලා. මොකද, වර්තමාන ජනාධිපතිතුමා, අගමැතිතුමා ලෙස සිටියදී 2019 දී ආණ්ඩුව පරාජයට පත් වෙනකොට මේ පනත් කෙටුම්පත සකස් කරලා තිබුණා. හැබැයි, ඊයේ-පෙරේදා සිට කඩිමුඩියේ, දඩිබිඩියේ තවත් පනත් කෙටුම්පත් ඉදිරිපත් කරනවා. නමුත්, 2019දී සකස් කරපු මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ නැහැ. ඇයි මේ පනත් කෙටුම්පත ගේන්න ප්‍රමාද, ඇයි ඒකට බාලගිරි දෝෂය, මේ පනත් කෙටුම්පත කොපමණ කාලයකින් ඉදිරිපත් කරනවාද කියලා කියන්න පුළුවන්ද?

ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා වෙනුවෙන් ඒ ප්‍රශ්නයට මම පිළිතුරු ලබා දෙනවා. බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඇගැයීමේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිගටම පාර්ලිමේන්තුව තුළදී කථා කරනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය හඳුන්වා දීම ජනාධිපතිතුමා විසින් පසුගිය වර්ෂයේ සිදු කළා. ඒක පනත් කෙටුම්පතක් බවට පරිවර්තනය කරන්න අපටත් යම්කිසි කාල පරිච්ඡේදයක් අවශ්‍යයි. *[බාධා කිරීමක්]* ඒක තමයි, ගරු මන්ත්‍රීතුමා. දැන් අවුරුද්දකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. මේ ප්‍රතිපත්තිය එළිදක්වලා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය රාමුව සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්ට සහ රජයේ අනෙකුත් ආයතනවලට අපි දැනුම් දීලා තිබෙනවා. අපි හිතනවා, මේ අවුරුද්ද අවසාන වුණාට පස්සේ -ලබන අවුරුද්ද වෙද්දී- මෙහි ක්‍රියාකාරිත්වයත් සලකා බලා අඩුපාඩු තිබෙනවා නම් තවදුරටත් ඒවා ශක්තිමත් කරගෙන අලුත් පනත් කෙටුම්පතක් ගේන්න පුළුවන් කියලා. ඒ වාගේම ගරු මන්ත්‍රීතුමා කිව්වා, අනෙක් පනත් කෙටුම්පත් ගේන්න කඩිමුඩියේ කටයුතු කළා, හැබැයි වෙනස්කමකට භාජන වෙන හොඳ පනත් කෙටුම්පත් ගේන්න ආණ්ඩුව කටයුතු කරන්නේ නැහැ කියලා.

හැබැයි, ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ තුළ අපි පනත් කෙටුම්පත් රාශියක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒක ඇත්ත. ඒවා විශේෂයෙන් අනාගතවාදී දර්ශනයක් එක්ක තමයි ඉදිරිපත් කළේ. හැබැයි, මේ ගෙනෙන පනත් කෙටුම්පත් අනාගතවාදී පනත් කෙටුම්පත් කියලා ඔබතුමා

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

විශ්වාස කරනවා නම් මම කියන්න කැමතියි, ඒ පනත් කෙටුම්පත් සම්මත කර ගන්න සහයෝගය ලබා දෙන්න ඕනෑ කියලා. නමුත්, ඔබතුමන්ලා කථා කරනවා වාගේ මේ පනත් කෙටුම්පත්වලට සහයෝගයක් ලබා දීලා නැහැ. මේ ඇගැයීමේ ප්‍රතිපත්තිය පනත් කෙටුම්පතක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියත් අපි රජයක් හැටියට සිදු කරනවා. මොකද, රජයක් හැටියට අපි දන්නවා, රටේ ආර්ථික අර්බුදයක් ඇති වුණා කියලා. ඒ ආර්ථික අර්බුදය නැවත අවුරුදු පහකින්, භයකින් ඇති නොවෙන්න දීර්ඝ කාලීනව කටයුතු කිරීමේ අවශ්‍යතාව පිළිබඳ අවබෝධයෙන් අපි ඉන්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ පනත් කෙටුම්පත වාගේම දැනට ඉදිරිපත් කරලා තිබෙන අනෙක් පනත් කෙටුම්පත්වලටත් ඔබතුමන්ලා විරුද්ධත්වයක් දක්වන්නේ නැති වෙයි කියලා. කලින් ඒවාට විරුද්ධ වුණාට ඉදිරියේදීවත් විරුද්ධ වෙන්නේ නැතුව, අවශ්‍ය අගය එකතු කරන්න ඕනෑ නම් ඒ අගය එකතු කරලා, ඒවා සම්මත කරන්න රජයට සහයෝගය දක්වන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට උත්තරය ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමා තමයි ලබා දුන්නේ. අනෙක් කාරණා වාගේ නොවෙයි, ඒ පනත් කෙටුම්පත තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල වන්නා වූ දෙයක් හෝ වෙනත් කිසිම බාධාවක් ඇති වෙන්නේ නැහැ. ඔබතුමන්ලා ගෙන එන අනෙකුත් පනත් කෙටුම්පත් ගැන අපට කියන්න බැහැ නේ. ඒවා අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා සහ කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා වාගේ දේවල්. "ඉර පැවිවොත් මල් පිපේවි, වැසි වැස්සොත් ගහ ගලාවි" වාගේ කථා බැහැ. අපි දන්නේ නැහැ නේ, ගෙනෙන්නේ කොයි වාගේ ඒවාද කියලා. හැබැයි, මේ හදපු පනත් කෙටුම්පත, අපි කවුරුත් එකඟ වෙච්ච පනත් කෙටුම්පතක්. මම ඔබතුමාගෙන් අතුරු ප්‍රශ්නය අහන්නම්. ඒක නිසා ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නකෝ. ඒක ඉදිරිපත් කළාම ඒ ගැන බලන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා ඊළඟ අතුරු ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ඔබතුමාගෙන් අහන දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අග්‍රාමාත්‍යතුමනි, ඇගැයීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් මට තේරෙන්නේ නැහැ. කාල රාමුව පසුගිය අවුරුද්දේ ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් එළිදැක්වූවා. ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය,-

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය පසුගිය අවුරුද්දේ එළිදැක්වූවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය 2018දී එළිදැක්වූයේ. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය ඇමතිතුමා ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය පසුගිය අවුරුද්දේ එළිදැක්වූවා කියනවා නම්, ඒක බරපතළ ප්‍රශ්නයක්. රාජ්‍ය ලාංඡනය සහිතව 2018 අවුරුද්දේදී එළිදක්වපු ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය මා ළඟ තිබෙනවා. ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය එළිදැක්වූයේ 2018 අවුරුද්දේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා එය ඉදිරිපත් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ඒ ප්‍රතිපත්තිය එළිදැක්වූයේ පසුගිය අවුරුද්දේ කියලා එතුමා කියනවා නම් ඒක ලොකු පටලැවිල්ලක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

එතුමා ඒ කාරණයට උත්තර දෙයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

පසුගිය අවුරුද්දේ එළිදැක්වූයේ කාල රාමුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රශ්නය අහන්නම්කෝ. ඊට පස්සේ එතුමාට උත්තර දෙන්න කියන්නකෝ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය ඇහුවාට පස්සේ උත්තර දෙන්න. ඔබතුමා කෙටියෙන් ප්‍රශ්නය අහන්න. මේ ප්‍රශ්නයට දැන් විනාඩි 16ක් ගත වෙලා තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ තිබෙන පාර්ලිමේන්තු ගත්තාම, පාර්ලිමේන්තුවකදී ඇගැයීම සම්බන්ධ යෝජනා දෙකක් ඉදිරිපත් කරපු එකම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා මමයි.

ජාතික ඇගැයීම් ප්‍රතිපත්තියක් මේ රටට ගෙනෙන්න කියලා පෞද්ගලික මන්ත්‍රී යෝජනාවකුත්, සභාව කල්තැබීමේ යෝජනාවකුත් පළමුවැනි වතාවට ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා මමයි. ඒ අනුව, ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය ගෙනාවේ 2018දී. මෙන්න, ඒ ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය. මම මේ පොත සභාගත කළොත්, මේක දෙන්න වනවා. නමුත්, මට මේ පොත දෙන්න විධියක් නැහැ. ඒ නිසා මම මේ පොතේ ඡායා පිටපතක් ඕනෑ නම් සභාගත කරන්නම්. හැබැයි, ඒකට සහභාගි වුණු නිලධාරින් සියලුදෙනා දන්නවා, ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය රනිල් වික්‍රමසිංහ මැතිතුමා, අග්‍රාමාත්‍යවරයා ලෙස සිටි කාලයේදී තමයි එළිදැක්වූයේ කියලා. පසුගිය අවුරුද්දේ සිදු වුණේ, ජාතික ඇගැයීම් ප්‍රතිපත්තියට අදාළව කාල රාමුවක් සකස් කළ එක. ඒ ගැන ගරු අගමැතිතුමාගේ පිළිතුරේත් පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ පිළිතුර බැලුවොත් ඔබතුමාට ඒ කාරණය දැනගන්න පුළුවන්. ඔබතුමාට වැරදීමක් වුණේ. එම නිසා ආපහු ඔබතුමා අගමැතිතුමාගේ පිළිතුර අරගෙන බලන්නකෝ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
හොඳයි, මම අතුරු ප්‍රශ්නය අහන්නම්. මම ඉතා පැහැදිලිව අහන්නේ මේකයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ජාතික ඇගැයීම් ප්‍රතිපත්තිය 2018දී ඉදිරිපත් කළා. පසුගිය අවුරුද්දේ ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් ඒ කාල රාමුව ඉදිරිපත් කළා. දැන් ඒකට පනත් කෙටුම්පතක් අලුතින් හදන්න ඕනෑ කියනවා. හරි, ඒක කමක් නැහැ කියමුකෝ. 2018 සිටි රනිල් වික්‍රමසිංහ මහත්මයාට වඩා වෙනස් රනිල් වික්‍රමසිංහ මහත්මයෙක් නේ දැන් ඉන්නේ. ඒ නිසා දැන් අලුතින් පනත් කෙටුම්පතකුත් හදනවා කියමුකෝ. ඒ පනත් කෙටුම්පත හැදෙනවාත් එක්කම මේ වෙනුවෙන් දැනට ක්‍රියාත්මක වෙන්නේ අගමැතිතුමාගේ පිළිතුර අනුව නම්, පවතින ආයතනික රාමුව. හැබැයි, ඔබතුමන්ලා පිළිගන්නවාද, ජාතික විගණනය හා සමානව ජාතික ඇගැයීම කියන කාරණයත් ක්‍රමිකව ස්වාධීන වෙලා, ස්වාධීන ආයතනික පද්ධතියකට අපි පරිවර්තනය වෙන්න ඕනෑය කියලා? එහෙම නම්, ඒ පරිවර්තනය වීමට අදාළ කාල රාමුවක් ඉදිරිපත් කරනවාද?

හරි සරලයි කාරණය.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා හිතාගෙන ඉන්නවා, එතුමා තරම් මේ පිළිබඳව දන්න කෙනෙක් මේ ගරු සභාවේ නැහැ කියලා. ජාතික ඇගැයීම් ප්‍රතිපත්තියක් ගැන 2018, 2019 කාල වකවානුව තුළ කථා කළාට implementation programme එකක් ගැන කථා කරලා තිබුණේ නැහැ. ජාතික ඇගැයීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය වශයෙන් ඇති කර ගත්ත එකහතා ක්‍රියාත්මක කිරීම රජයක් හැටියට අපට තනියම කරන්න අමාරුයි කියන කාරණය අපි තේරුම් ගත්තා. ඒ සඳහා විශේෂඥ දැනුම සහ තාක්ෂණික දැනුම තිබෙන අය අපට අවශ්‍යයි. ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා ගන්නත් අපි කටයුතු කළා. ඒක අපි launch කළා. නමුත්, තිබෙන ප්‍රශ්නය මේකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇගැයීමේ ප්‍රතිපත්තියක් පිළිබඳව ප්‍රතිපත්තිමය වශයෙන් ආණ්ඩුව එකඟ වෙලා තිබේද්දී, ඒ සඳහා කටයුතු ක්‍රියාත්මක කරද්දී, ඊට අමතරව මේ අවුරුදු දෙක තුළ ප්‍රතිසංස්කරණ රාශියක් අපි කළා. ඇගැයීමේ ප්‍රතිපත්තියක් ගෙන එන එක, ඒක අනාගතයට කොච්චර වැදගත්ද කියන එක, ඒ වාගේම මෙවැනි අර්බුද ඇති නොවන්න ඒ වාගේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම යනාදී කාරණා අපි පිළිගෙන තිබෙනවා. ඒක ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වැඩසටහනත් රජය ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වාගේම ඊට සමගාමී කටයුතුත් කරලා තිබෙනවා.

ඒ වාගේම අනාගතයට නොගැළපෙන ප්‍රතිපත්ති අයින් කරලා, ගැළපෙන ප්‍රතිපත්ති සහිත ප්‍රතිසංස්කරණ රාශියක් අරගෙන ආවා. දැන් ඒ ප්‍රතිසංස්කරණ සියල්ලටම විරුද්ධ වෙලා, ඒවා නොකර ඉන්න කියලා ඡන්දය දීලා එක ප්‍රතිපත්තියක් වෙනුවෙන් මේ ආකාරයට පෙනී සිටිනවා නම්, මම එතුමාට ආරාධනා කරනවා ඇගැයීමේ ප්‍රතිපත්තියක්, නීතියක් රටේ ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙන්නේ රට ඉදිරියට යන්න පුළුවන් තැනකට ආවොත් විතරයි කියලා. ඒක මේ පරිවර්තනයේ එක කොටසක්. හැබැයි, තව කොටස් රාශියක් මේ පරිවර්තනයේ තිබෙනවා. පරිවර්තනයේ එකකට විතරක් පක්ෂ වෙලා, අනෙක් සියලු කොටස්වලට විරුද්ධ වෙලා, සම්පූර්ණ පරිවර්තනයක් කරන්න සහ බලාපොරොත්තු වෙන ඉලක්ක වෙත ගමන් කරන්න අපට බැහැ. ඒ හින්දා මේ දක්වන උනන්දුවම අනෙකුත් ප්‍රතිසංස්කරණවලටත් දැක්වුවොත්, එතුමන්ලාගේ ක්‍රියා කලාපයේ තිබෙන යථාර්ථය පෙනෙයි කියා මම හිතනවා. හැබැයි, කියන්නේ එකක්, පෙනී සිටින්නේ තව එකක් වෙනුවෙන්. ඒ නිසා සමස්තයක් වශයෙන් රට ඉදිරියට යෑමේ වැඩ පිළිවෙළටත් මේ ආකාරයටම දායකත්වය දක්වන්න කියලා අපි ඉල්ලා සිටිනවා

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 02, ගරු වීරසුමන වීරසිංහ මැතිතුමා.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමාගෙන් මා අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

1. රාජ්‍ය සේවයට බඳවා ගැනීම්, ස්ථිර කිරීම් අත්හිටුවමින් රජය නිකුත් කරන ලද චක්‍රලේඛය නිසා රාජ්‍ය සේවයේ බරපතළ ප්‍රශ්න ගණනාවක් ඇති වී තිබෙන නිසා අදාළ පාර්ශ්ව දැඩි කලකිරීමට ලක්ව ඇති බව ඔබතුමා පිළිගන්නේද?
    1.1 ඒ සඳහා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?
    1.2 නොඑසේනම්, ඒ මන්ද?
2. පළාත් පාලන ආයතනවල දීර්ඝ කාලයක් අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම තුළ සිටි අය ස්ථිර කිරීමට රජය ගන්නා ලද තීරණය ක්‍රියාත්මක වන්නේ කවදාද?
3. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය තුළ දීර්ඝ කාලයක් මෑත් පවර් ක්‍රමයට සේවය කළ අය - ශ්‍රම කොන්ත්‍රාත්/සේවා කොන්ත්‍රාත් - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවයට අනුයුක්ත කරන්නේ කවදාද?
    3.1 ඒ සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග මොනවාද?
    3.2 නොඑසේනම්, ඒ මන්ද?
4. රැකියා විරහිත උපාධිධාරීන් ප්‍රමාණය වේගයෙන් වැඩි වෙමින් ඇති අතර, ඔවුන් සඳහා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?
5. විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවකයන්ගේ ගැටලුවලට ගන්නා විසඳුම් මොනවාද?
    5.1 එම විසඳුම් ක්‍රියාත්මක කරන්නේ කවදාද?
    5.2 නොඑසේනම්, ඒ මන්ද?
6. ග්‍රාම නිලධාරීන් හා අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් විෂමතා පිළිබඳව ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?
    6.1 එම යෝජනා ක්‍රියාත්මක කරන්නේ කවදාද?
    6.2 නොඑසේනම්, ඒ මන්ද?
7. ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සැකසීම සඳහා කටයුතු කරනවාද?
    7.1 ඒ සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද?
    7.2 නොඑසේනම්, ඒ මන්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒ ප්‍රශ්නයට අපේ රාජ්‍ය ඇමතිතුමා පිළිතුරු දෙයි. නමුත් මම ඔබතුමාගේ සහ සභාවේ අවධානයට යම් කාරණයක් ගෙනෙන්න කැමතියි. මම දැන් සභානායකතුමාටත් මේ ගැන කිව්වා. මේ ස්ථාවර නියෝගය හා එය ඇති වුණු හේතු සාධකය අපි යළි අවධානයට ගත යුතුයි. බ්‍රිතාන්‍යයේ මේ සම්ප්‍රදාය ඇති කිරීමේ පරමාර්ථය වුණේ අග්‍රාමාත්‍යවරයාගෙන් හදිසි වැදගත් කාරණයක් ගැන විමසීමට අවස්ථාව ලබා දෙන්නයි. නමුත් ඊයේ යම් යම් දේවල් ගැන විපක්ෂ නායකතුමා නඟපු ප්‍රශ්න අදත් repeat වෙනවා. මේ ප්‍රශ්න සමුදායට අපි උත්තර දෙන්න ලෑස්තියි. ඒ අතරතුර මම ගරු නියෝජ්‍ය කථානායකතුමාට කියා සිටිනවා, මීට පස්සේ අපි වෙනුවෙන් ඒ ස්ථාවර නියෝගය අනුව කටයුතු කරන්න ඔබතුමා බැඳී සිටිනවා කියලා. මොකද, පැහැදිලිව, අපි මේ සම්ප්‍රදායය ගත්තේ House of Commonsවලින්. මෑත කාලයේ - පසුගිය පාර්ලිමේන්තු කාලයේ - යම් යම් සංශෝධන කර තිබෙනවා. පිළිතුරු දීමට වෙලාව ඕනෑ නම්, දවසේ ඕනෑම වෙලාවක අග්‍රාමාත්‍යතුමා ඇවිත් පිළිතුරක් ලබා දෙනවා නම්, ඒ වනතුරු එම ප්‍රශ්නය අහන මන්ත්‍රීතුමාට ඉන්න වෙනවා.

අමාත්‍යාංශ 10කට විතර අදාළ ප්‍රශ්න මේ ප්‍රශ්නය ඇතුළට දාලා තිබෙනවා. මූලාසනයට තිබෙනවා අයිතියක් අදාළ නැති දේ කපා හරින්න; it is a right of the Chair. Standing Ordersවලට පටහැනි නම් කපා හරින්න පුළුවන්. But still, the Question would be allowed. ඉතින් මෙක කථානායකවරු කිහිපදෙනෙක් මීට කලින් කළා. මම කියන්නේ කිසිම මන්ත්‍රීවරයෙකුට ප්‍රශ්න අහන්න එපා කියන එක නොවෙයි. අමාත්‍යාංශ 10ක විතර තිබෙන ප්‍රශ්න ගෙනැල්ලා අහනවා. අපට ඒවාට උත්තර දෙන්න පුළුවන්; උත්තර සභාගත කරන්න පුළුවන්. නමුත් අදට නියමිත කටයුතු සහ අනික් ඔක්කෝම කටයුතු මේ නිසා ඇනහිටිනවා. මේ ගැන අවධානය යොමු කරන්න ඕනෑ, විපක්ෂ නායකතුමාත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත්, විශේෂයෙන් ගරු කථානායකතුමාත්. මම මේ ප්‍රශ්නයට රාජ්‍ය ඇමතිතුමාට උත්තර දෙන්න කියනවා. මම විශේෂයෙන් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ "Questions to the Prime Minister" සම්ප්‍රදාය පිළිබඳ ලේඛනයක් **සභාගත*** කරනවා.

මේ ක්‍රමය ඇති කළේ අපේ ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා අගමැතිවරයා ලෙස සිටි කාලයේ. කිරිඇල්ල මැතිතුමනි, ඔබතුමා සභානායක වශයෙන් සිටි කාලයේ. Then, you all followed a certain procedure. But now, you all have gone totally outside that procedure as well as the Standing Orders and I also feel that it is being misused. We can answer anything under the sun, but we will have to allocate the whole day for it.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අහන ප්‍රශ්නවලදී ඊයේත් සමාන ප්‍රශ්න දෙකක් දීලා තිබුණා. ඇත්ත වශයෙන්ම දෙවැනි ප්‍රශ්නය ප්‍රතික්ෂේප කරන්න තිබුණා. ඊයේ පාර්ලිමේන්තුව ඇතුළේ ප්‍රශ්න ඇති වුණේ සමාන ප්‍රශ්න දෙකක් අහපු නිසායි. එතකොට පළමුවෙනි ප්‍රශ්නය පිළිගත්තා නම් දෙවැනි ප්‍රශ්නය ප්‍රතික්ෂේප කරන්න තිබුණා. නමුත් ප්‍රශ්න දෙකම පිළිගෙන තිබුණා. ඉතින් ඒවා පිළිගන්න නිලධාරීන්ට තිබුණා ස්ථාවර නියෝග අනුව දෙවැනි ප්‍රශ්නය ප්‍රතික්ෂේප කරන්න. නමුත් ඒ දෙකම පිළිගත්ත නිසා තමයි ඊයේ අනවශ්‍ය ප්‍රශ්නයක් ඇති වුණේ. අපේ ගරු අග්‍රාමාත්‍යතුමා කියන්නේ ස්ථාවර නියෝග ගැන මීට වඩා සැලකිලිමත් වෙන්න ඕනෑ කියලායි. පාර්ලිමේන්තුව තුළ මෙවැනි ප්‍රශ්න සාකච්ඡා කරන්නේ නැතුව කාර්යාලවල කටයුතුවලදී මීට වඩා සැලකිලිමත් වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඒ ගැන සුවිශේෂී අවධානය යොමු කරලා අවශ්‍ය කටයුතු කරන්නම්.

ගරු රාජ්‍ය අමාත්‍යතුමා, පිළිතුර ලබා දෙන්න.

ගරු අශෝක ප්‍රියන්ත මහතා (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக்க பிரியந்த - உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ashoka Priyantha - State Minister of Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශයටත්, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාගේ ප්‍රකාශයටත් ඌනපූරණයක් එකතු කරමින් මම කාරණයක් කියන්න කැමැතියි. බලපුවාම මෙතැන තිබෙන්නේ ප්‍රශ්නයක් නොවෙයි, ප්‍රශ්න පත්‍රයක්. මෙතැන අමාත්‍යාංශත් ගණනාවක්; දෙපාර්තමේන්තුත් ගණනාවක්. ඒ වාගේම මේ වෙද්දී විසඳෙමින් පවතින ගැටලු ගණනාවක් එකට එකතු කරලා, එකට දාලා ප්‍රශ්න අහලා තිබෙනවා. ඇත්තටම ගරු මන්ත්‍රීතුමාත් මේ ගැන අවධානය යොමු කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ අද මේකට උත්තර දෙන්න සේරම මැති ඇමතිවරුන්ට නැඟිට නැඟිට කථා කරන්න වෙනවා. ඒ වාගේම අනික් අතට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ආපසු අතුරු ප්‍රශ්නත් අසාවි. මම ගරු අගමැතිතුමා වෙනුවෙන් මේ ප්‍රශ්නයට උත්තර දුන්නත්, මේ ප්‍රශ්න විෂයයන් ගණනාවකට අදාළ ප්‍රශ්න. මෙහි ප්‍රශ්න 8ක් විතර තිබෙනවා, හරියට O/L, A/L ප්‍රශ්න පත්‍රයක් වාගේ. ඒකට ප්‍රතිඋත්තරයක් දෙන්නත් සාධාරණව බැහැ. ගරු මන්ත්‍රීතුමා එකඟ වෙනවා නම් යම් විධියකට මේ ප්‍රශ්නය විධිමත් විධියකට අහලා සාධාරණ උත්තරයක් ගන්න, අපට උත්තර දෙන්න පුළුවන්. මොකද, මේ ප්‍රශ්නයට උත්තරය අපේ නිලධාරීන්ගෙන් මට හම්බ වුණෙත් අද උදේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ උත්තරය බලලා කියවන්න පුළුවන්. එහෙමද හොඳ, නැත්නම් ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය විධිමත් විධියට අහලා උත්තර දැන ගන්නවාද කියන කාරණය මා දැන ගන්න කැමැතියි.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද ප්‍රමාණයක් තිබෙනවා. ඒක ස්ථාවර නියෝග විධියට රැක දෙන්න. අගමැතිතුමා කියපු කාරණාව සත්‍යයක් වෙන්න පුළුවන්. ඒ කියන්නේ, අගමැතිතුමාගෙන් අහන ප්‍රශ්නය කාලීන අත්‍යවශ්‍ය ප්‍රශ්නයක් කියන කාරණාව. මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට පත්වෙලා අවුරුදු 4ක් වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, මම ආණ්ඩුවේ සිටියදීත්, විපක්ෂයේ සිටියදීත් අගමැතිතුමාගෙන් ප්‍රශ්න අහන්න ලැබෙන පළමුවෙනි අවස්ථාවයි මේ. එතකොට ගරු අගමැතිතුමනි, අපි මෙහෙම අහන්නේ නැතුව කොහොමද ප්‍රශ්න අහන්නේ? ඔබතුමාගෙන් පෞද්ගලිකව කාමරයට ගිහිල්ලා අහන්නද? මේ ප්‍රශ්නවල තිබෙන කාලීන වැදගත්කම සහ කාරණා ගත්තොත්, මම හිතන විධියට මෙය ආණ්ඩුව විධියට විශාල මැදිහත්වීමක් වෙලා තිබෙන, ආණ්ඩුවටත් තිබෙන ප්‍රශ්නයක්. ඒ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නිසා මේ ප්‍රශ්නයට උත්තර දෙනවාද, නැද්ද කියන එක ආණ්ඩු පාර්ශ්වයෙන් තීන්දු කරන්න. මා උපකල්පනය කරන ආකාරයට සහ මේ දේශපාලනය තුළ මේක ඉතාම වැදගත් කාරණාවක් විධියට කල්පනා කරලා තමයි මේ ප්‍රශ්නය මතු කළේ. ඒ නිසා ඒ කාරණාවට උත්තරය බලාපොරොත්තු වෙනවා. උත්තර දෙනවාද, නැද්ද කියන කාරණය,-

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමන්ගේ හෘදය සාක්ෂිය දන්නවා, මොකක්ද කාරණාව කියලා. ගරු අග්‍රාමාත්‍යතුමා වෙනුවෙන් මම, මේ ප්‍රශ්නයට ලැබිලා තිබෙන විධියට උත්තරය දෙන්නම්.

1. නැත.

   1.1 අවස්ථානුකූලව ගනු ලැබේ.

   1.2. පැන නොනඟී.

2. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මේ වන විටත් ඉදිරිපත් කර ඇති අතර, අදාළ අනුමැතිය ලද පසු සති දෙකක් තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

3. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ස්ථිර කාර්ය මණ්ඩලයට අනුයුක්ත කළ හැක්කේ එහි අනුමත කාර්ය මණ්ඩලයේ ඇතිවන පුරප්පාඩු සඳහා පමණි. එහෙත්, අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු නොමැති බව වාර්තා වේ.

   එමෙන්ම පවතින ආර්ථික අර්බුදය හමුවේ එළැඹී රජයේ ප්‍රතිපත්තිය අනුව සියලු නව බඳවා ගැනීම් දැඩි ලෙස සීමා කර ඇත. උක්ත තත්ත්වය යටතේ මෑන් පවර් ක්‍රමයට සේවය කරන කාර්ය මණ්ඩලය ස්ථිර කාර්ය මණ්ඩලයට අනුයුක්ත කිරීමට හැකියාවක් නොමැත.

   3.1. පැන නොනඟී.

   3.2. පැන නොනඟී.

4. උපාධිය මූලික සුදුසුකම ලෙස සලකනු ලබන තනතුරු හා සේවා සඳහා ද සීමාකාරී තත්ත්වයක් යටතේ වුවද, අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කෙරෙමින් පවතී. උදාහරණයක් ලෙස දීප ව්‍යාප්ත සේවාවන්ට බඳවා ගැනීමේ තරග විභාගයන් එලෙසින්ම පැවැත්වේ. රජයේ පාසල්වලට ගුරුවරුන් බඳවා ගැනීමද සිදු කෙරේ.

   රාජ්‍ය විශ්වවිද්‍යාලවලට තේරී පත්වන සිසුන් අතරින් විශේෂයෙන්ම මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා යනාදී උපාධිධාරීන් රැකියාගත කිරීමේදී රැකියා වෙළෙඳපොළ ඉල්ලුමක් නොමැති වීම ආශ්‍රිතව ගැටලු මතු වන්නට විය. එම තත්ත්වයට පිළියමක් ලෙස මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පහත සඳහන් ක්‍රියාමාර්ග හරහා උපාධිධාරීන් රැකියාගත කිරීමේ ප්‍රතිශතය ඉහළ නංවා ඇත.

   මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උපාධි පාඨමාලාවන්ගේ විෂයමාලා නූතනයට ගැළපෙන පරිදි යාවත්කාලීන කිරීම.

   නව උපාධි පාඨමාලා හඳුන්වා දීමේදී වෙළෙඳ පොළ සමීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව එහි ප්‍රතිඵල පදනම් කර ගනිමින් උපාධි පාඨමාලා හඳුන්වා දීම.

   විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ STEM education ප්‍රවර්ධනය කිරීම.

   මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨ ආශ්‍රිතව තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශ බැඟින් පිහිටුවා එම විද්‍යාර්ථීන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීමට කටයුතු කිරීම.

   විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන සිසුන්ට තම අධ්‍යාපන පාඨමාලා ආරම්භ වන තෙක් ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය කර ගැනීම සඳහා "The Pre-University Online/ E-learn English Language Teaching" හඳුන්වා දී ඇති අතර, එමඟින් ඉංග්‍රීසි භාෂාවේ කථනය, කියවීම, සවන්දීම හා ලිවීම යන කුසලතාවන් වර්ධනය කර ගැනීමට විද්‍යාර්ථියාට හැකි වනු ඇත.

   කෘත්‍රිම බුද්ධිය - AI - විශ්වවිද්‍යාල විෂය ධාරාවන්ට හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී.

   ප්‍රශ්න අංක 5, 5.1, 5.2 යටතේ අහලා තිබෙන කාරණය පිළිබඳව අපේ රාජ්‍ය ඇමතිතුමාත් කථා කළා. ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළකුත් දියත් කළා. රාජ්‍ය ඇමතිතුමා සභාවේ ඉන්නවා. ඒක වෙනම දැන ගන්න පුළුවන්. රාජ්‍ය ඇමතිතුමාට ඒ පිළිබඳව උත්තර දෙන්න පුළුවන්.

6. රාජ්‍ය සේවයේ විවිධ සේවක කණ්ඩායම් අතර පවතින වැටුප් විෂමතාවන් ආශ්‍රිතව එකී සේවක කණ්ඩායම් විසින් ඉදිරිපත් කර ඇති නියෝජනයන් පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු කරමින් එකී විෂමතාවන් නිවැරදි කිරීම සඳහා 2025 අය වැය මඟින් පියවර ගැනීමට හැකි වන පරිදි යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට විශේෂඥ කමිටුවක් පත් කරන ලෙස ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටීමට 2024.05.27 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. ඊට අදාළ විස්තර ඇතුළත් ඇමුණුම **සභාගත*** කරමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රාම නිලධාරීන්ගේ සේවාව සහ සේවා ව්‍යවස්ථාව පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කරලා, මේ වෙද්දී එය අනුමත කරලා තිබෙනවා. ගරු අගමැතිතුමාත් අත්සන් කරලා තිබෙනවා. මමත් ඒ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සොයා බැලීම් කරලා තිබෙනවා. කැබිනට් මණ්ඩලයේ, ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා දීලා රාජ්‍ය සේවා කොමිසමට එය යොමු කරලා තිබෙනවා. දැන් සමහරු දැනගෙන තිබෙනවා, රාජ්‍ය සේවා කොමිසමෙන් මේ වැඩේ වෙන්න යනවා කියලා. ඒ නිසා මේ වෙද්දී ඒක බෙදා ගන්න ගොඩක් අය පොර කනවා. ඉතින් මේ කටයුත්ත කෙරෙනවා. හොයා බැලුවාම මට ආරංචියක් ලැබුණා, රාජ්‍ය සේවා කොමිසමට යම් පිරිසක් ලියුමක් දීලා තිබෙනවා කියලා, මේක අනුමත කරන්න එපාය කියලා. අපි ප්‍රශ්න විසඳන්න යද්දී ඒ ප්‍රශ්නය විසඳනවාට කැමති නැද්ද දන්නේත් නැහැ. ඒ විසඳන ප්‍රශ්නය බෙදා ගන්න ගොඩක් අය උත්සාහ කරනවා.

මම තව කාරණයක් ගැන ඔබතුමා දැනුවත් කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එකම ප්‍රශ්නයක් දිගටම එක ළඟ අහන්න දෙන්න එපා. මේ ප්‍රශ්නය මීට සති කිහිපයකට කලින්, එනම් 2024.05.22 වැනිදාත් මේ පාර්ලිමේන්තුවේ මේ විධියටම අහලා තිබෙනවා. මේ කාල සීමාව තුළ ග්‍රාම නිලධාරීන්ගේ ප්‍රශ්නය පස්, හය වතාවක් අහලා තිබෙනවා. ඒ සඳහා ඉතාම වැදගත් ආකාරයට සියලු කරුණු සහිතව පිළිතුරුත් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මේ පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරු මා එක්ක පෞද්ගලිකව කථා කරලා, දුරකථනයෙනුත් කථා කරලා, මේ කාරණා පිළිබඳව දැනගෙන මට උදව් කරලා තිබෙනවා. ඒකටත් ආණ්ඩුව විපක්ෂයේ සියලුදෙනාට ස්තුතිවන්ත වෙනවා.

7. ප්‍රශ්න අංක 6හි පිළිතුර අදාළ වේ. මේ යටතේ ජාතික වැටුප් ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රශ්නයක් තමයි අහලා තිබෙන්නේ.

   7.1. පැන නොනඟී.

   7.2 පැන නොනඟී.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම දන්නවා, මේක සංකීර්ණ ප්‍රශ්නයක් බව. මම ඒක පිළිගන්නවා. උත්තර දෙන්න ටිකක් සංකීර්ණ බවත් පිළිගන්නවා. නමුත් ගරු අගමැතිතුමනි, මේ ප්‍රශ්නය, මේ මොහොතේ අපේ රටේ හැම ක්ෂේත්‍රයක්ම ඉතා කලකිරීමට සහ සංකීර්ණත්වයට පත්වෙලා තිබෙන නිසාවෙන් මතු කරන ප්‍රශ්නයක් මිසක් පෞද්ගලිකව දේශපාලනික වශයෙන් සහ වෙනත් කාරණාවක් නිසා මතු කරන ප්‍රශ්නයක් නොවෙයි. ගරු අගමැතිතුමනි, මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයක් නිකුත් කළා, 2022.04.26වැනි දා. ඒ, ජාතික අය වැය චක්‍රලේඛය, 2022/03 කියන චක්‍රලේඛය. ඒ වාගේම ගරු අගමැතිතුමාගේ අත්සනින් 2022.09.12වැනි දින කැබිනට් මණ්ඩල තීන්දුවෙන් ගත්ත තීන්දුත් එක්ක මේ පවතින ආර්ථික තත්ත්වය තුළ රාජ්‍ය සේවයට බඳවා ගැනීම සම්බන්ධව තීන්දුවක් ගත්තා. අපි පිළිගන්නවා, පවතින තත්ත්වය තුළ ඒක සාධාරණ කාරණාවක් කියලා. දැන් අවුරුදු දෙකකට පස්සේ ඔබතුමාගෙන් මේ කාරණය අහන්න හේතු වුණු කාරණාව මෙකයි. මේ බඳවා ගැනීම්, උසස්වීම් සහ වෙනත් කාරණා සම්බන්ධයෙන් ගත්ත ඒ තීන්දුව, මේ ආර්ථික ප්‍රශ්නය සමනය කරන්න ගත්ත තීන්දුවක්. ඒක ඒ වෙලාවේ ගත්ත නිවැරදි තීන්දුවක්. හැබැයි, මේ කාරණාව සම්බන්ධව යම් පසුවිපරම් කිරීමක් සිදු වෙලා තිබෙනවාද කියලායි අපි අහන්නේ, ගරු අගමැතිතුමනි.

මේ හේතුවෙන් බොහෝ රාජ්‍ය ආයතන පවත්වාගෙන යෑමේ බරපතළ ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා. මොකද, ඒ රාජ්‍ය ආයතන තිබෙන තැනින් ඉස්සරහට ගෙන යෑම සඳහා අත්‍යවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීමට නොහැකි වීම කියන ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. ඒ නිසා මේ චක්‍රලේඛය පිළිබඳව යම් පසුවිපරමක් සිදු කර තිබෙනවා ද කියන ප්‍රශ්නය ගරු අගමැතිතුමාගෙන් සහ ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මම අහන්න කැමතියි.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අමාත්‍යාංශ මට්ටමින් මේ පිළිබඳව සතිපතා සාකච්ඡා කරනවා; කරුණු විමසනවා. ගරු අග්‍රාමාත්‍යතුමාගේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් මීට අදාළව කමිටුවක් පත් කර තිබෙනවා. ඒ කමිටුවත් අවශ්‍ය උපදෙස් ලබා දෙමින්, අදාළ නිර්දේශ, ඉදිරි ක්‍රියා මාර්ග ගනිමින් පවතිනවා. අපේ අමාත්‍යාංශයිය උපදේශක කාරක සභාවේත් මේ පිළිබඳව කථා කරමින් පවතිනවා. අවශ්‍ය රාජ්‍ය සේවාවන් කඩා වැටීමකට ලක් නොකර ඒවාට අදාළ බඳවා ගැනීම් සිදු කරමින් ඉදිරියට පවත්වාගෙන යන්න කටයුතු කරමින් තිබෙනවා.

අපි රටේ පවතින තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. මීට අවුරුදු දෙකකට කලින් රාජ්‍ය සේවකයන්ට එකවර වැටුප් ගෙවන්න බැරි තත්ත්වයක් තිබියදී තමයි ගරු අග්‍රාමාත්‍යතුමාත්, මමත් මේ අමාත්‍යාංශය භාර ගත්තේ. වර්තමානය වෙද්දී රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ගෙවන තත්ත්වය හදලා ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා කියන ආයතන පවත්වා ගෙන යන්නට අවශ්‍ය සේවකයන් බඳවා ගැනීමක් යම් මට්ටමකට කරමින් පවතිනවා. එතුමා මතු කරපු ප්‍රශ්නයට පිළිතුර වශයෙන් මා කියනවා, ඔව්, අපි නිරන්තරයෙන් මේ කාරණය සමඟ බැඳී සිටිනවා වාගේම මේ ගැන සොයා බලනවා කියලා. අපට හැකි පළමුවෙනි අවස්ථාවේදීම රාජ්‍ය සේවයට අවශ්‍ය අය බඳවා ගැනීමට කටයුතු කරනවා.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහනවා, ඔබතුමන්ලා අපහසුතාවට පත් නොවන ආකාරයට. ගරු අගමැතිතුමනි, ඔබතුමන්ලාත් අපත් මොන පැත්තේ හිටියත් -ආණ්ඩුවේ හිටියත්, විපක්ෂයේ හිටියත්- වැටුප් සහ වෙනත් කාරණා සම්බන්ධයෙන් මෙතෙක් ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ නිසාම, වෛද්‍යවරුන්ට DAT allowance එක දෙන කොට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පහළ කාර්ය මණ්ඩලයත් DAT allowance එක ඉල්ලනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තත් එහෙමයි. මේ කියන වැටුප් විෂමතා හා සම්බන්ධ කාරණාවේදී එක ක්ෂේත්‍රයකට සාධාරණයක් කරන කොට, එක ප්‍රශ්නයක් විසඳන කොට තවත් ප්‍රශ්න ගණනාවක් පැන නඟිනවා. ඒ නිසා කවුරු ආණ්ඩු බලයට ආවත් ගැටලුවකට මුහුණ දෙනවා. අද ඔබතුමන්ලා ආණ්ඩුවේ ඉන්නවා. හෙට වෙනත් කෙනෙක් බලයට එන්න පුළුවන්. ජාතික වැටුප් ප්‍රතිපත්තියක් අවශ්‍යයි කියන කාරණාව සමාජයේ ප්‍රබල ඉල්ලීමක් සහිත කාරණාවක්. යම් යම් අවස්ථාවල මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුණා. නමුත්, ජාතික වැටුප් ප්‍රතිපත්තිය ආදි කාරණා ඉතිහාසයට පමණක් එකතු වෙච්ච කාරණා බවට පත් වුණා. මේ හැම ක්ෂේත්‍රයක්ම එහෙමයි. ජාතික වැටුප් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවන තාක්කල් මේ අර්බුදය විසඳන්න ලැබෙන්නේ නැහැ. අද හැම ක්ෂේත්‍රයකම අර්බුද තිබෙනවා. මේ අර්බුදය තුළ ග්‍රාම නිලධාරීන්ට විශාල ප්‍රශ්නයක් ඇති වී තිබෙනවා. ඔවුන් වැඩ වර්ජන ඇතුළු වෙනත් ක්‍රියා මාර්ග ගනිමින් තිබෙනවා. තවත් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මම ඒවා එකින් එකට කියන්න යන්නේ නැහැ. වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා වන ක්‍රියා මාර්ග ගත යුතුමයි. පාර්ලිමේන්තුවේ මේ දවස්වල හැම දාම වාගේ පනත් කෙටුම්පත් ගණනාවක් සම්මත වෙනවා, ආණ්ඩුවේ සහ රජයේ විශාල මැදිහත්වීමත් එක්ක. ජාතික වැටුප් ප්‍රතිපත්තියක් කියන කාරණාව මේ වාගේ අර්බුදකාරී අවස්ථාවක රට ගොඩ ගන්න පුළුවන් කාරණාවක්. ඒ නිසා කවුරුත් එකතු වෙලා ජාතික වැටුප් ප්‍රතිපත්තියක් හැදීම සඳහා වන ක්‍රියා මාර්ගයක් ගන්නවා ද, එහෙම ක්‍රියා මාර්ගයක් ගන්නවා නම් ඒ කුමක්ද කියලා මා දැන ගන්න කැමතියි.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා කියන මේ ප්‍රශ්නය විසඳීම අපි හැමෝම එකතු වෙලා කරන්න ඕනෑ. මේක අපි හැමෝම එකතු වෙලා විසඳන්න පුළුවන් ප්‍රශ්නයක්. ඒ වාගේම මෙතුමා කිව්වා මේ වෙද්දී ග්‍රාම නිලධාරීන්ගේ වැඩ වර්ජනයක් තියෙනවා කියලා. සමහර පිරිසක් ඒ සමඟ සිටියත් බහුතරයට අපි කෙළෙහි ගුණ දක්වන්නට ඕනෑ. මට ඊයේ දවසේත් ස්තුති කළා, අපේ ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා. මේ තිබෙන ව්‍යසනකාරී තත්ත්වය හමුවේ වසමේ ඉන්න ග්‍රාම නිලධාරි සහ ක්ෂේත්‍ර නිලධාරි ඔය කියන වර්ජන කිසි දෙයක් කරන්නේ නැහැ. ඔවුන් මඩේ, වතුරේ, වගුරේ, ගෙවල් කඩා වැටුණු තැන්වල, මිනී තිබෙන තැන්වල සිටිමින් තම සේවය ඉටු කරනවා. ඉතින් අපි මෙතැනට ඇවිල්ලා ඔවුන් වැඩ කරන එක අවමානයට ලක් කරමින් ඒ සමස්ත නිලධාරීන් වැඩ වර්ජනයක් කරනවා කියලා කියන්න හොඳ නැහැ. මොකද, ඒක වැඩ කරන අයටත් අගෞරවයක්. මා මීට පෙර කිව්වා වාගේ, මේ කියන ව්‍යවස්ථාව එළියට එන්න, රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් එයට අනුමැතිය ලබා දෙන්න දින කිහිපයක් පමණක් තිබිය දී සමහර වෘත්තීය සමිති නායකයන් එය තමන්ගේ අතට පත් කර ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා.

ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමාත් මේ ආණ්ඩුව හදන්න මහන්සි වෙච්ච මන්ත්‍රීවරයෙක්; ආණ්ඩුව ගෙන

එන්න මහන්සි වෙච්ච මන්ත්‍රීවරයෙක්. අද විපක්ෂයට ගිහින් ඉන්න එතුමාට තමන් විපක්ෂයේ ඉන්නවා කියලා ප්‍රශ්නයක් අහලා සතුටු වන එක සහ එය mediaවලට දා ගන්නා එක ලේසියි. හැබැයි, වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාත්, මාත් ඇතුළු අප හැමෝටම හැටනවලක්ෂයක ජනමතයක් ලබා දුන්නේ මේ කියන ප්‍රතිපත්ති ආදිය හදන්නයි. ඒ නිසා පැනලා යන්නේ නැතිව අපි ඔක්කෝම කටිටිය එකතු වෙලා මේක හදමු. අපි දැනටත් මේ වෙනුවෙන් වැඩ කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කරන ප්‍රශ්න යටතේ 03වන ප්‍රශ්නය, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මැතිතුමා.

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ජුනි 05වන දායි; ලෝක පරිසර දිනයයි. ලෝක පරිසර දිනය නිමිත්තෙන් අද වාගේ දවසක මේ ප්‍රශ්නය ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යතුමාගෙන් අසන්නට ලැබීම නිසා මා වාසනාවන්තයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ දැනට පවතින උද්භිද උද්‍යාන සඳහා ඉහළ දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණයක් පවතින අතර, පළාත් නවය සඳහාම උද්භිද උද්‍යාන ඇති කිරීම තුළින් දේශීය ආර්ථිකයට විශාල ආදායමක් උපයා ගත හැකි බව නොරහසකි. එමෙන්ම, පාසල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ද මෙම උද්‍යාන වැදගත් වේ.

1. ශ්‍රී ලංකාවේ පළාත් අනුව දැනට පවතින උද්භිද උද්‍යාන සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේ ද?
2. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව ශාක සංරක්ෂණය, ඖෂධ පැළෑටි හා මල් වගා කිරීමේ කර්මාන්ත දියුණු කිරීම සඳහා කටයුතු කිරීම ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමක් වන අතර, ඒ සඳහා දැනට ගෙන ඇති ක්‍රියා මාර්ගවල ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත් වන්නේ ද?
3. ශ්‍රී ලංකාවේ පළාත් නවයම ආවරණය වන පරිදි ජාතික උද්භිද උද්‍යාන පිහිටුවීමට සැලසුමක් පවතින්නේ ද? නොඑසේ නම් ඒ මන්ද?
4. සියලු පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල නාගරික වනාන්තර ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියක් සැලසුම් කර තිබේ ද? තිබේ නම් එහි වර්තමාන ප්‍රගතිය කුමක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සුදර්ශන දෙනිපිටිය මැතිතුමා මෙම ප්‍රශ්නය ඇසීම මම අගය කරනවා. බොහෝ විට සාම්ප්‍රදායික ප්‍රශ්නවලින් පිරුණු මේ සභාවට අද වැනි දිනක මෙවැනි ප්‍රශ්නයක් ඇසීම කනට ඉතාම මිහිරිදායක කාරණයක්. මොකද, ලෝකය අද දිනයේ සාකච්ඡා කරන්නේ අපේ පරිසරය සුරක්ෂිත කිරීම ගැනයි. මේ ප්‍රශ්නය තුළින් අද එතුමා ඇසුවේ අනාගතයට බලපාන ඉතා වැදගත් කාරණාවක්. අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා වෙනුවෙනුත්, අදාළ ගරු ඇමතිතුමා වෙනුවෙනුත් මා මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නම්.

1. දැනට පවතින උද්භිද උද්‍යාන සංඛ්‍යාව 05කි.
   i. රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය, මධ්‍යම පළාත.
   ii. හක්ගල ජාතික උද්භිද උද්‍යානය, නුවරඑළිය, මධ්‍යම පළාත.
   iii. හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය, ගම්පහ, බස්නාහිර පළාත
   iv. මිරිජ්ජවිල උද්භිද උද්‍යානය, හම්බන්තොට
   v. සීතාවක උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල, බස්නාහිර පළාත
2. ඔව්.

   ඒ සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය ඇමුණුම Iහි දැක්වේ.
3. පළාත් අනුව නොව දේශගුණික කලාප අනුව උද්භිද උද්‍යාන 10ක් පිහිටුවීමට සැලසුම් කර ඇත. මේ වන විට උද්භිද උද්‍යාන **ව්‍යාජ්තිය** සැලසුම් කර ඇති ආකාරය සිතියමෙහි දැක්වේ. (ඇමුණුම II) එසේ සැලසුම් කර ඇති උද්භිද උද්‍යාන 10 අතුරින් 05ක් ආශ්‍රිතව මේ වන විට මූලික කටයුතු ආරම්භ කොට ඇත.
   01. ගාල්ල අක්මීමන කඩොලාන උද්භිද උද්‍යානය
   02. වවුනියාව උද්භිද උද්‍යානය
   03. අම්පාර
   04. පොළොන්නරුව
   05. දෙනියාය

   ඒවා සකස් කර තිබෙන්නේ ඒ විෂය පිළිබඳ මනා දැනුමක් ඇති, ඒ ක්ෂේත්‍රයේ කාලයක් කටයුතු කරපු අය. ඒ නිසා ඒ ප්‍රයෝජනය ප්‍රදේශවාසීන්ට පමණක් නොව, රට පුරා විහිදී සිටින ජනතාවටත්, ඒ වාගේම පාසල් යන දරුවන් සැමදෙනාටත් ලබාගන්න පුළුවන් ආකාරයට ඉලක්කයකට අනුව අපි වැඩ කරනවා.
4. පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ප්‍රකාශයක් ගරු ජනාධිපතිතුමා ගිය අය වැය ලේඛනයේදී ඉදිරිපත් කළා. ඒ අනුව යමින් සියලුම පළාත් පාලන ආයතන බලප්‍රදේශ තුළ නාගරික වනාන්තර, එසේ නැත්නම් නාගරික හරිත කලාප ඇති කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් උපදෙස් ලබා දීලා තිබෙනවා. දැනට පළාත් පාලන ආයතන විසුරුවා හැර තිබෙන නිසා නාගරික වනාන්තර සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබෙනවා.

   "නාගරික වන සංකල්ප" ප්‍රතිපත්තිය ජනාධිපති කාර්යාලයේ උපදෙස් මත නාගරික හා නිවාස අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් අදාළ පාර්ශ්වකාර ආයතනවල සහභාගිත්වයෙන් මේ වන විට සකස් කර ඇත.

   - නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරනු ලබන විවෘත භූමි අවකාශ සංවර්ධන සැලැස්ම මඟින් නාගරික වනාන්තර සංකල්පය.

     විවෘත භූමි සැලැස්මෙන් හඳුනා ගන්නා විවෘත භූමි අවකාශ,

     නාගරික උද්‍යාන

     උද්භිද උද්‍යාන

     කුඩා උද්‍යාන

     පිටිටනි

     නාගරික වන උද්‍යාන

     ඔසු උද්‍යාන

     නාගරික තෙත්බිම් උද්‍යාන

     ජලාශ්‍රිත උද්‍යාන ලෙස සංවර්ධනය කිරීමට පළාත් පාලන ආයතන විසින් බලාපොරොත්තු වෙනවා.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ඒ වාගේම, විවිධ පළාත් පාලන ආයතන විසින් දීර්ඝ කාලයක සිට මේ සංකල්පය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබෙනවා. විශේෂයෙන් අපේ රටේ පැරණි මහ නගර සභාවල ඒ සැලැස්ම ආරම්භ කොට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මේ වැඩ පිළිවෙළ ගැනද අවධානය යොමු කරන්න උදවු වීම සඳහා මේ ප්‍රශ්නය යොමු කිරීම ගැන.

පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල නගර සැලසුම් සකස් කිරීමේදී නාගරික ප්‍රදේශ ලෙස ප්‍රකාශිත ප්‍රදේශවල විවෘත භූමි අවකාශ - public outdoor recreation space - සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී නගර ආශ්‍රිතව වනාන්තර ඇති කිරීම සඳහා සැලසුම් සකස් කර ඇති අතර, මෙම භූමි සැලසුම්වල නාගරික උද්‍යාන, උද්භිද උද්‍යාන, කුඩා උද්‍යාන, නාගරික වනෝද්‍යාන, ඔසු උද්‍යාන, නාගරික තෙත් බිම් උද්‍යාන හා ජලාශ්‍රිත උද්‍යාන වැනි නාගරික වනාන්තර සංකල්පය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

මේ වන විට රත්නපුර මහ නගර සභාව, මහනුවර මහ නගර සභාව වැනි මහ නගර සභා බල ප්‍රදේශ තුළ ස්වාභාවික වනාන්තර භූමි සංරක්ෂණය කරමින් පවතී.

උදා: රත්නපුර මහ නගර සභාව - පොම්ප කැලය රක්ෂිත වනය

මහනුවර මහ නගර සභාව - දුනුමඩලාව රක්ෂිත වනය

ඇමුණුම I සහ II **සභාගත*** කරමි.

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාට මා බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමනි, දැනට අපේ ප්‍රදේශය වන බදුල්ල දිස්ත්‍රික්කයේත්, නුවරඑළිය දිස්ත්‍රික්කයේත් මල් වගාකරුවන් විශාල සංඛ්‍යාවක් සිටිනවා. මේ වෙනකොට ගොඩක් මල් විදේශ රටවලින් ආනයනය කිරීමක් සිදු වෙනවා. ඒ නිසා මල් නිෂ්පාදනය කරන අය අසරණ තත්ත්වයකට පත් වෙලා සිටිනවා. ගරු අග්‍රාමාත්‍යතුමනි, මේ imports සීමා කරලා, control කරලා මෙම මල් වගාකරුවන් තව තවත් දිරිමත් කරන්න අපිට පුළුවන් නම් අපිට ඒ නිෂ්පාදන සියල්ල කළ හැකියි. පිච්ච මල්, රෝස මල් වාගේ ඒවාත් දැන් import කරන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ඒක නිසා මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. ගරු අගමැතිතුමනි, මල් වගාකරුවන් දිරිමත් කරන කටයුත්තක් මේ වෙනකොට සිදු වෙනවාද කියලාත් මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අදාළ දෙපාර්තමේන්තුවලට හා අදාළ ආයතනයට මේ කාරණය යොමු කරලා සාකච්ඡා කර තිබෙනවා. වීනය අද තුන්වැනි ස්ථානයට පැමිණිලා තිබෙනවා, අවුරුදු 10ක් ඇතුළතදී මල් අපනයනය කිරීම සම්බන්ධයෙන්. ඔබතුමාත්, තවත් මන්ත්‍රීවරු ගණනාවකුත් ඒ මධ්‍යස්ථානයට ගොස් ඒ පර්යේෂණකරුවන්ද ලංකාවට පැමිණ තිබෙනවා. ඒ නිසා නුවරඑළිය, මහනුවර, -කන්ද උඩරට- බදුල්ල, රත්නපුර වැනි දිස්ත්‍රික්කවල අයට මේ ක්ෂේත්‍රයට ඇතුළත් වීම සම්බන්ධයෙනුත් ඒ සාකච්ඡා සිදු කරමින් තිබෙනවා. එම ක්‍රියාවලිය සාර්ථක කරගන්න ඉඩම් නිදහස් කිරීමට රජය සූදානම් බවටත්, පෞද්ගලික අංශයටත් මල් අපනයනය සඳහා පිවිසීමට ඉඩ ලබාදීමටත් තීරණයක් අරගෙන තිබෙනවා.

එය ක්‍රියාත්මක කිරීමේදී ඔබතුමාගේ ප්‍රදේශය පිළිබඳවත් සුවිශේෂ වැදගත්කමක් දක්වලා තිබෙනවා. ඒ කාලයේ ඉඳලාම කොළඹට, එහෙම නැත්නම් කොළඹ ඉඳලා අපේ නිශ්චිත විදේශ රටවලට ගමන් කරන්න කැමැති අයට මල් අරන් යන්නේ එක්කෝ බණ්ඩාරවෙලින්, එක්කෝ නුවරඑළියෙන්. ඔබතුමා නිවැරදියි. එක රාත්‍රී කාලයකදී මුළු දුම්රියක් පුරවා මල් එනවා කොළඹට. ඒ තරම් දියුණුව තිබුණු මේ ක්ෂේත්‍රය, අපනයන ක්ෂේත්‍රය කරා වඩාත් දියුණු කරන්න ගන්නා උත්සාහයට මූලික සැලැස්මක් සකසමින් තිබෙනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔව්, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කංචන විජේසේකර ඇමතිතුමා සභාවේ ඉන්න වෙලාවේ මම මේ කාරණය කියන්න ඕනෑ. ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඊයේ Sectoral Oversight Committee එක පැවැත්වුණා. අපි එහිදී සංශෝධන ගණනාවක් ඉදිරිපත් කළා. ඇත්තවශයෙන්ම, Sectoral Oversight Committee එකේ සභාපතිතුමා කියලා තිබෙනවා ඒවා පිළිගන්නවා කියලා. ඉතින්, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සංශෝධන අපට අද ඕනෑ. මොකද, හෙට ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත විවාදයට ගන්නවා නම් ඒ සංශෝධන අපට අද ඕනෑ. මොකද, අපි දැනගන්න ඕනෑ අපේ සංශෝධන පිළිගත්තාද, එහෙම නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයේ සංශෝධන පිළිගත්තාද කියලා. එහෙම නැත්නම් Online Safety Bill එක වාගේ අන්තිමට මේක කඩිමුඩියේ සම්මත කරලා, ශ්‍රේෂ්ඨාධිකරණය අනුමැතිය දීපු නැති සංශෝධන, අනුමැතියක් නොලබපු සංශෝධන මෙතැනින් සම්මත වෙන්න පුළුවන්. ඉතින්, අද අපට ඒ සංශෝධන ටික අවශ්‍යමයි. අපේ සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමාත් ඉන්නවා, කංචන විජේසේකර ඇමතිතුමාත් ඉන්නවා. අද අපට ඒ සංශෝධන අවශ්‍යයි. මොකද, අපි දැනගන්න ඕනෑ අපේ සංශෝධනවලින් පිළිගන්නේ මොනවාද, පිළිගන්නේ නැත්තේ මොනවාද කියලා.

ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ දවසේ පැවති ආංශික අධීක්ෂණ කාරක සභාවට විපක්ෂ නායකතුමාත් සහභාගි වුණා. එහිදී ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපත් කර තිබෙන හැම සංශෝධනයක්ම පිළිගන්න ආණ්ඩුව වශයෙන් අපි එකඟ වුණා. ඒ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අනුව, අපි ආණ්ඩුවෙන් වෙනත් සංශෝධන ඉදිරිපත් කරන්නේ නැහැ. ඊට අමතරව, ආංශික අධීක්ෂණ කාරක සභාව තව එක සංශෝධනයක් ඉදිරිපත් කළා, විශේෂයෙන්ම සියයට 50ට තිබෙන limit එක සියයට 15ට ගෙනෙන්න. ඒකට අපි එකඟ වුණා. ඒ සියයට 15ට ගෙනෙන එකට එකඟව සහ ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දී තිබෙන සියලුම සංශෝධන පිළිගන්නවා. ඒ සංශෝධන ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා හෙට දවසේ නියමිත ආකාරයට විවාදය පවත්වන්න අපි කටයුතු කරනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

Sir, I asked a simple question. We want the Amendments today. We do not want them at the last moment because in the case of the Online Safety Bill, Amendments that were not supported by the Supreme Court were ultimately passed.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන විධියට කාරක සභා කාර්යාලයෙන් එම සංශෝධන ලබා දෙයි. ඔබතුමාට ඒවා බලන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. අපිට කියන්න තිබෙන්නේ අපි අලුතින් සංශෝධන ගෙනෙන්නේ නැහැ කියන එක. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ප්‍රශ්නයක් වෙන්නේ අපි තව සංශෝධන ගෙනාවොත් නේ. අපි වෙන සංශෝධන ගෙනෙන්නේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය එකඟ වුණු සංශෝධන පමණයි අපි ඉදිරිපත් කරන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මටත් මේ කාරණයටම අදාළව දෙයක් කියන්න තිබෙනවා. විනාඩියක් දෙන්න පුළුවන්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

කියන්න, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

බොහොම ස්තුතියි, ඔබතුමාට. අපි Sectoral Oversight Committee එකට එන්න බලාපොරොත්තු වුණා. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. විනාඩියක් - [බාධා කිරීම්] විනාඩියක් දෙන්න. මේක වැදගත් ප්‍රශ්නයක් නේ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔය සම්බන්ධව විවාදයක් තිබෙනවා නේ. එතැනදී ඉතුරු ඒවා ගැන කථා කරමු. *[බාධා කිරීම්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

නැහැ, නැහැ. විවාදයක් ගැන නොවෙයි අහන්නේ. සංශෝධන ගැන අහන්නේ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඒක තමයි. ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පතට අදාළ සංශෝධන ගැන නේ අහන්නේ. එම පනත් කෙටුම්පත ගැන හෙට සහ අනිද්දා විවාදය තිබෙනවා නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ඒක නොවෙයි අහන්නේ. අපි සංශෝධන වගයක් - *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අපි න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරමු, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු අකිල එල්ලාවල මැතිතුමා අගමැතිතුමාගෙන් අසන ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණයට අදාළ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අදාළ ප්‍රශ්නයක් ඇහුවේ නැහැ. *[බාධා කිරීම්]* එතුමා පැහැදිලි කිරීමක් කළේ. ගරු අකිල එල්ලාවල මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු අකිල එල්ලාවල මහතා
(மாண்புமிகு அகில எல்லாவல)
(The Hon. Akila Ellawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු අගමැතිතුමාගෙන් අහන ප්‍රශ්නය මෙයයි.

ගරු අග්‍රාමාත්‍යතුමනි, මෙම දිනවල රට තුළ පවතින අයහපත් කාලගුණික තත්ත්වය මත නාය යෑම්, ජල ගැලීම්, නිවාස, දේපළ හා ජීවිත හානි රටේ සෑම ප්‍රදේශයකින්ම පාහේ වාර්තා වී ඇත.

1. (අ) 2024.05.15 දින සිට 2024.05.30 දින දක්වා කාලය තුළ ආපදාවලට ලක් වී ඇති වංචල, නිශ්චල දේපළවල වටිනාකම් වෙන් වෙන් වශයෙන් දිස්ත්‍රික්ක අනුව කොපමණද?

   (ආ) සිදුව ඇති ජීවිත හානි කොපමණද?

   (ඇ) මේ වනවිට කොපමණ සංඛ්‍යාවකට වන්දි මුදල් ගෙවා ඇත්ද?

   (ඈ) තවදුරටත් ගෙවිය යුතුව ඇති වන්දි මුදල් ප්‍රමාණය කොපමණද?

2. (අ) මෙම ආපදා සඳහා සහන සැලසීමට රජය කොපමණ මුදලක් වෙන් කර ඇත්ද?

   (ආ) එම මුදල කොතෙක් දුරට ප්‍රමාණවත් වී ඇත්ද?

3. දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි හඳුනා ගත් නිරන්තර නාය යෑම්වලට, ගංවතුර තත්ත්වයන්ට ලක් වන භූමි ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ආරක්ෂාව හා ඔවුන් වෙනත් ප්‍රදේශවල පදිංචි කරවීමට ඇති හැකියාව පිළිබඳව රජය සතු කිසියම් සැලසුමක් හෝ වැඩ පිළිවෙළක් තිබේද?

   එසේ නම්, එහි වර්තමාන ප්‍රගතිය කුමක්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය ගැන ඊයේ දිනයේත් පාර්ලිමේන්තු රැස්වීම් අවස්ථාවේදී වරුවක් පමණ සාකච්ඡා කළා. නමුත් මම හිතන විධියට මෙතැනදී ඉතා වැදගත් වන්නේ ගරු එල්ලාවල මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය අසා තිබෙන්නේ ගිය සිකුරාදා වීමයි. මොකද, the deadline was Friday; ගිය සිකුරාදා තමයි ප්‍රශ්නයට කල් දෙන්න තිබුණු අවසාන අවස්ථාව. නමුත් ඊට පසුව තමයි ඉතිහාසගත ධාරානිපාත වර්ෂාවක් ඇද හැළුණේ මිලිමීටර් 400ක පමණ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ගම් ප්‍රදේශයෙන් පහළ සිට අපේ බල ප්‍රදේශ ඔක්කොම ඒ වර්ෂාවෙන් යට වුණා. කවදාවත් යට වුණු නැති ප්‍රදේශ ප්‍රමාණයක් යට වුණා.

මෙම ප්‍රශ්නයට අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා ඊයේ දිනයේත් පිළිතුරක් ලබා දුන්නා. අදත් එතුමා පිළිතුරක් ලබා දෙයි. ඒ නිසා මම කාලය ගන්නේ නැහැ. ඔබතුමාගේ ප්‍රශ්නයට පසුව දීර්ඝව පිළිතුරු දෙන්න පුළුවන්, අපි කාලය අරගෙන තිබෙන නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් රාජ්‍ය ඇමතිතුමා.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன் - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Premitha Bandara Tennakoon - State Minister of Defence)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අකිල එල්ලාවල මන්ත්‍රීතුමා අහලා තිබෙන්නේ 2024.05.30වැනි දා වෙනතුරු තත්ත්වය පිළිබඳවයි. නමුත්, මම අද දිනය වෙනතුරු තත්ත්වය ගැන කියන්නම්. 2024.05.15 දින සිට 2024 ජූනි මාසයේ 4වැනි දින දක්වා කාලය තුළ මෙම ආපදා තත්ත්වය මත සිදු වී ඇති හානි පිළිබඳව මම පැහැදිලි කිරීමක් කරන්නම්.

1. (අ) 2024.05.15 දින සිට 2024.06.04 දින දක්වා කාලය තුළ ආපදාවට ලක් වූ ච්චල හා නිශ්චල දේපළවල වටිනාකම මේ වන විටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් තක්සේරු කෙරෙමින් පවතී. අදාළ අවසන් තොරතුරු මෙතෙක් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමට නියමිතයි. වාර්තා වී ඇති පරිදි පූර්ණ නිවාස හානි 71ක්, අර්ධ නිවාස හානි 9,377ක්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි 825ක් සහ යටිතල පහසුකම් පද්ධති හානි 63ක් සිදු වී ඇත.

සුරක්ෂිත මධ්‍යස්ථාන 165ක පවුල් 3,261ක සාමාජිකයන් 13,028ක් රඳවා ඇති අතර, ඒ පිරිස් වෙත ආහාර සහ අනෙකුත් පහසුකම් සැපයෙමින් පවතී.

(ආ) 2024.05.15 දින සිට 2024.05.31 දින දක්වා වාර්තා වී ඇති ජීවිත හානි සංඛ්‍යාව 11කි.

2024.06.01 දින සිට 2024.06.04 දින දක්වා වාර්තා වී ඇති ජීවිත හානි සංඛ්‍යාව 18කි.

ඒ අනුව මේ දක්වා 29දෙනෙකුට ජීවිත අහිමි වී ඇත. 2024.05.15 දින සිට මේ දක්වා සිදු වෙවිව ජීවිත හානි සංඛ්‍යාව 30යි. අද දවසේ උදේ වරුවේත් ජීවිත හානියක් වාර්තා වුණා.

(ඇ) ජීවිත හානි වෙනුවෙන් රුපියල් 250,000ක උපරිමයකට යටත්ව මරණ පාරිතෝෂික ලබා දීම සිදු කරන අතර 2024.05.15 දින සිට 2024.05.31 දින දක්වා සිදුව ඇති ජීවිත හානි වෙනුවෙන් 11 දෙනෙකු සඳහා රුපියල් 25,000 බැගින් රුපියල් 275,000 අත්තිකාරම් ගෙවා ඇති අතර, ඉතිරිය අයදුම්පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කළ පසු ගෙවීමට නියමිතය.

ස්වාභාවික ආපදාවක් හේතුවෙන් සිදුවන නිවාස හා දේපළ හානි සඳහා එක් නිවසකට උපරිමය රුපියල් 2,500,000කට යටත්ව වන්දි ලබා දීම සිදු කෙරෙන අතර ගෘහ උපකරණ හානි සඳහා වන්දි උපරිමය රුපියල් 25,000කි.

එමෙන්ම රුපියල් මිලියන 10ට අඩු වාර්ෂික පිරිවැටුමක් ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා රුපියල් 2,500,000ක උපරිමයකට යටත්ව [තොග හානි සඳහා උපරිමය රුපියල් 100,000ක වන්දි මුදල ද ඇතුළුව] වන්දි ලබා දීම සිදු කෙරේ.

නිවාස හා දේපළ හානි සඳහා තක්සේරු කටයුතු සිදු කර ඇති රුපියල් 10,000කට අඩු හානි සඳහා වන්දි ලබා දීම මේ වන විටත් එක් එක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කර ඇති ප්‍රතිපාදන මඟින් සිදු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.

රුපියල් 10,000කට වැඩි නිවාස හා දේපළ හානි තක්සේරු කිරීම් ප්‍රාදේශීය මට්ටමින් මේ වන විටත් සිදු කරමින් පවතී.

ගරු මන්ත්‍රීතුමනි, අපි දැනට වන්දි වශයෙන් මරණ පාරිතෝෂික දීමනාව ලෙස ජීවිත හානි වෙවිව අයගේ අවසන් කටයුතු කර ගැනීමට රුපියල් 25,000ක මුදලක් ඒ පවුල් වෙත ලබා දීලා තිබෙනවා. ඊට අමතරව ජීවිත හානි වෙවිව එම පවුල්වල පිරිසට අපි තවත් වන්දි මුදලක් දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ස්වාභාවික ආපදාවක් හේතුවෙන් සිදුවන නිවාස හා දේපළ හානි සඳහා එක් නිවසකට ලබා දෙන වන්දි මුදල පිළිබඳව අපි අවසන් තීන්දුවක් මෙතෙක් ලබා ගෙන නැහැ. තිබෙන හානියත් තක්සේරු කරලා එම කටයුත්ත අපි ඉදිරි කාලයේ දී කරන්න බලාපොරොත්තු වෙනවා. මෙම හානිවලට වන්දි මුදල් ලබා දීමේ දී අපි ප්‍රවේශම් වෙන්න ඕනෑ. මොකද, අපේ මූල්‍ය තත්ත්වය අපි සැලකිල්ලට ගන්න ඕනෑ. අපට වුවමනාව තිබුණාට, ආසාව තිබුණාට අපට කරන්න පුළුවන් ප්‍රමාණයක් තිබෙනවා. ඒ අනුව මෙම වන්දි මුදල් ලබා දෙන්න අපි ඉදිරි කාලයේ දී කටයුතු කරනවා.

(ඈ) නිවාස හා දේපළ හානි තක්සේරු කිරීමේ කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතින බැවින් ගෙවිය යුතුව ඇති සම්පූර්ණ වන්දි මුදල නිශ්චිතව කිව නොහැක.

2. (අ) 2024 වර්ෂය සඳහා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත වෙන්කොට ඇති මුදල රුපියල් මිලියන 1,554.5යි.

(ආ) නිවාස හා දේපළ හානි වන්දි ලබා දීම වෙනුවෙන් 2024 වර්ෂය සඳහා වෙන් කර දුන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවුණහොත්, මහා භාණ්ඩාගාරය වෙතින් අමතර ප්‍රතිපාදන වෙන් කර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

විශේෂයෙන් ජනාධිපතිතුමා සඳුදා දිනයේ විශේෂ කැබිනට් පත්‍රිකාවක් අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළා. එහෙම කරලා මේ ආපදා තත්ත්වය කැබිනට් මණ්ඩලයට දැනුම් දුන්නා. ඒ වාගේම මුදල් ප්‍රතිපාදන ලබා දෙන්න එතුමා විසින් මහා භාණ්ඩාගාරයට උපදෙස් ලබා දීලා තිබෙනවා. ඒ අනුව දැනට පවතින චක්‍රලේඛයේ අපි පූර්ණ වෙනසක් කළා. දෛනිකව ආහාර වේලක් ලබා දෙන්න තිබෙන මුදල සියයට 33කින් වැඩි කරලා

තිබෙනවා. තේ එකක්, කිරි එකක්, ළමයෙකුට කිරි පිටි ටිකක් දෙන්න මේ වක්‍රලේඛය තුළ ප්‍රතිපාදන තිබුණේ නැහැ. අපි ඒකත් වෙනස් කළා, ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම සාමාන්‍යයෙන් ආහාර වේල ලබා දෙනකොට සහන මධ්‍යස්ථානයකට එන්න ඕනෑ. සහන මධ්‍යස්ථානය තුළදී තමයි ආහාර ලබා දෙන්නේ. අපි ඒ තත්ත්වයත් වෙනස් කළා. ආරක්ෂාව සඳහා නිවාසවල ඉහළ මාලවල රැඳී සිටින පවුල් වෙත බෝට්ටුවලින්, ඒ වාගේම ඔරුවලින් ගිහිල්ලා ආහාර වේල් ලබා දෙන්න අපි දැනට කටයුතු කරලා තිබෙනවා.

ඒ වාගේම මම මේ වෙලාවේ රාජ්‍ය සේවයේ සියලු අංශ වෙත විශේෂ ස්තුතියක් පුද කරන්නට ඕනෑ. දිසාපතිවරුන්ට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට, ක්ෂේත්‍ර නිලධාරීන්ට, ආපදා සහන සේවා මධ්‍යස්ථානයට, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට, ත්‍රිවිධ හමුදාවට, පොලීසියට සහ සිවිල් ආරක්ෂක බලකායට අපි විශේෂ ස්තුතියක් පුද කරනවා. විශේෂයෙන්ම 01වැනි දා උදෑසන 2.00 පමණ ඉඳලා පළාත් තුනක ඔවුන් තවමත් මේ ක්‍රියාවලියේ රැඳී ඉන්නවා.

3. නාය යෑම් සහ නාය යෑමේ අධිඅවදානම හේතුවෙන් පදිංචි ස්ථානවලින් ඉවත් විය යුතු ලෙස ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගෙන ඇති පවුල් සංඛ්‍යාව 15,025යි. ආරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කිරීම පිණිස පහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් අනුමැතිය ලබා දී ඇත.
    - 17/1216/715/017 හා 2017 ජුනි 27
    - 17/2340/715/017-I හා 2017 ඔක්තෝබර් 24
    - 19/2259/120/037 හා 2019 අගෝස්තු 27

ගරු මන්ත්‍රීතුමනි, මේක සංකීර්ණ වැඩසටහනක්. නිවාස 15,000ක් හදන්න ඕනෑ. මේ නිවාස 15,000න් යම් කොටසක් අපි කරලා තිබෙනවා. නමුත් තිබෙන ප්‍රශ්නය තමයි, සමහරු අලුත් නිවස අරගෙන පරණ නිවසත් අතහරින්නේ නැති එක. මේ සෙල්ලම නවත්වන්න දැන් අපට සිද්ධ වෙනවා. එහෙම ඉවත් නොවන අය වෙනුවෙන් නීතිමය කටයුතු කරන්න සිද්ධ වෙනවා.

ඒ වාගේම අපට නිරීක්ෂණය වෙන තවත් දෙයක් තිබෙනවා. මේ නිවාසවලින් බහුතරයක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් අනුමැතිය ලබාගෙන නැහැ. කඳු ආශ්‍රිතව නිවාස හදද්දී අවසරයක් ගන්න ඕනෑ, අනුමැතියක් ගන්න ඕනෑ, plan එක approve කර ගන්න ඕනෑ. නමුත් එවැනි කිසිම දෙයක් කරලා නැහැ. එවැනි ප්‍රශ්න තිබෙනවා. ඒවා විසඳාගන්න ඕනෑ. අපි ඉදිරි කාලයේ ඒ තත්ත්වය මඟ හරවාගන්න කටයුතු කරනවා. අනවසර ඉදිකිරීම් ගණයට තමයි මේ නිවාසත් ඇතුළත් වෙන්නේ. කෙසේ වෙතත්, අපි ගත් තීන්දු වෙනස් කරන්නේ නැහැ. නමුත්, ඉදිරියට යද්දී නීතිමය තත්ත්වය ගැන අපට අනිවාර්යයෙන්ම බලන්න වෙනවා. සහන, ආධාර, දීමනා ලබා දීමේ දී අනවසර ඉදිකිරීම් පිළිබඳව ඉදිරි කාලයේ දී අපට යම්කිසි වෙනසක් කරන්න සිදු වෙනවාය කියන එකත් මතක් කරන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි.

නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ මේ වනවිටත් දිස්ත්‍රික්ක 14ක -බදුල්ල, නුවරඑළිය, මහනුවර, මාතලේ, කෑගල්ල, කළුතර, මාතර, රත්නපුර, හම්බන්තොට, ගාල්ල, කොළඹ, ගම්පහ, කුරුණෑගල හා මොනරාගල- දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ නැවත පදිංචි කිරීම් සිදුවෙමින් පවතී. මෙම වැඩසටහනට අනුව ප්‍රතිලාභියා විසින් තම නිවස ඉදිකර ගැනීමේ ක්‍රමය අනුගමනය කරනු ලබයි.

අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුකූලව, පහත විකල්ප අවස්ථා 03ක් යටතේ ද නැවත පදිංචි කිරීම් සිදු කරනු ලබයි.

(i) ඉඩමක් සමඟ නිවසක් මිලදී ගැනීමට රුපියල් මිලියන 1.6ක් ලබා දීම.

(ii) ඉඩමක් මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 0.4ක් සහ එහි නිවස ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 1.2ක් ලබා දීම.

(iii) රජයේ ඉඩම් ලබා දී එම ඉඩමෙහි නිවස ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 1.2ක් ලබා දීම.

ප්‍රතිලාභියා විසින්ම නිවාසය ඉදිකර ගැනීමේ ක්‍රමය යටතේ පවතින දුර්වලතා මහඟරවා ගනිමින් නැවත පදිංචි කිරීමේ වැඩසටහන් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස කොන්ත්‍රාත්කරුවන් මඟින් නිවාස ඉදිකර දීමේ ක්‍රමය යටතේ නිවාස 10,000ක් ඉදිකිරීම සඳහා අංක අමප/20/1900/303/044 හා 2021.01.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත. එහෙත් පසුගිය කාලය තුළ රට තුළ ඇති වූ ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ශීඝ්‍ර ලෙස ඉහළ යෑම හේතුවෙන් නිවසක් ඉදිකිරීම සඳහා ලබා දෙන රුපියල් මිලියන 1.2ක මුදලට නිවාස ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් කිසිවෙකුත් ඉදිරිපත් නොවී ඇති බැවින්, නිවසක් ඉදිකිරීම සඳහා ලබා දෙන මුදල වැඩි කිරීම සඳහා නව අමාත්‍ය මණ්ඩල සන්දේශයක් සකස් කර නිරීක්ෂණ සඳහා මේ වනවිටත් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

ප්‍රතිලාභියා විසින් නිවස ඉදිකර ගැනීමේ ක්‍රමය යටතේ මේ වනවිට,

ඉදිකිරීම් සම්පූර්ණ කර ඇති නිවාස සංඛ්‍යාව - 2,300

ඉදි කෙරෙමින් පවතින නිවාස සංඛ්‍යාව - 2,571

සමස්ත වැය - රුපියල් මිලියන 5,445.12

නිරිතදිග මෝසම් තත්ත්වය සක්‍රිය වීම සහ අනපේක්ෂිත කාලගුණ විපර්යාස තත්ත්වය සමඟ ඇද හැලෙන අධික වර්ෂාපතනය හේතුවෙන් නායයෑමේ අධිඅවදානම් කලාපවල ජීවත්වන පවුල්වලට පවතින ජීවිත අවදානම කෙරෙහි අවධානය යොමු කරමින් නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කරන ලෙස 2024.05.21 දින මේ සම්බන්ධයෙන් පැවති විශේෂ සාකච්ඡාවේ දී ගරු ජනාධිපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

ඒ අනුව, නායයෑම් හේතුවෙන් නිවාස පූර්ණ ලෙස හා අර්ධ ලෙස හානි වී ඇති පවුල් 3,315ක් -ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ප්‍රමුඛතා අංක 01 යටතේ හඳුනාගෙන ඇති පවුල් - කඩිනමින්ම නැවත පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. එමෙන්ම, ගංවතුරෙන් පූර්ණ ලෙස නිවාස හානි වූ පවුල් ද අවස්ථානුකූලව නැවත පදිංචි කර ඇත.

ගරු අකිල එල්ලාවල මහතා
(மாண்புமிகு அகில எல்லாவல)
(The Hon. Akila Ellawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න කලින් කිහිපදෙනෙකුට මගේ ස්තුතිය ප්‍රකාශ කරන්න ඕනෑ. මම නියෝජනය කරන්නේ රත්නපුර දිස්ත්‍රික්කය. අපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 9කට ආසන්න ප්‍රමාණයක් මේ ව්‍යසනයට මුහුණ දුන්නා. ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත්, ඒ වාගේම විෂයභාර රාජ්‍ය අමාත්‍ය ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමාත් රත්නපුරයට ඇවිල්ලා දිස්ත්‍රික් ලේකම්තුමා සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සාකච්ඡා කළා. ඒ නිසා මම එතුමන්ලාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම දිස්ත්‍රික් ලේකම්තුමා දවස් 4ක් තිස්සේ එක දිගට නිදි වරමින් මේ කටයුතු කරනවා. එතුමාටත්, සියලු ප්‍රාදේශීය ලේකම්වරුන්ටත්, ශ්‍රී ලංකා පොලීසිය, ශ්‍රී ලංකා යුද හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු සියලු නිලධාරීන්ටත් ඒ කරපු කර්තව්‍යය වෙනුවෙන් රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මාගේ ස්තුතිය ප්‍රකාශ කරනවා.

[ගරු අකිල එල්ලාවල මහතා]

මගේ අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. මේ වෙනකොට ගංවතුර තත්ත්වය මැඩ පැවැත්වෙමින් තිබෙනවා. නමුත් දැන් තිබෙන ප්‍රශ්නය තමයි මිනිස්සුන්ට බීමට ජලය නැති එක. මොකද, තිබෙන සියලු ළිං ගංවතුර නිසා අපවිත්‍ර වුණා. ඒවා පිරිසිදු කර ගන්න මිනිස්සුන්ට මේ දවස්වල ආර්ථික ශක්තියක් නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පුළුවන් නම් ඒ සඳහා පළාත් පාලන ආයතනවලට මුදල් ප්‍රතිපාදන ලබා දෙන්න. නළ ජලය ලැබෙන්නේ නැති ප්‍රදේශවල ජනතාවට පිරිසිදු ජලය ලබා ගැනීමට නොහැකි වෙලා තිබෙනවා. ඒ ගැන පළාත් පාලන ආයතනවලට කථා කරලා ඇහුවාම එතුමන්ලා කියනවා, මුදල් ප්‍රතිපාදන නැහැ කියලා. ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දෙන්න පුළුවන් නම් ඒක ගොඩක් වටිනවා.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අද පෙරවරු 11.30ට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සියලු අංශ එක්ක විශේෂ සාකච්ඡාවක් පවත්වනවා. එක පැත්තකින් ගංවතුර තිබියදීත්, ගංවතුර බැස යෑමේදීත් අපේ role එක පොඩ්ඩක් වෙනස් වෙනවා. ඒ සඳහා අවශ්‍ය තීන්දු තීරණ ගන්න අවශ්‍යයි. ඒ නිසා මම ගරු නියෝජ්‍ය කථානායකතුමාටත් කිව්වා, මේ ප්‍රශ්නය ඉක්මනින් අහලා අවසන් කරන්න කියලා. මොකද, අපට ඒ සාකච්ඡාවට යන්න තිබෙන නිසා. ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අපි පිළිගන්නවා. අපට දෙන්න පුළුවන් සහයෝගය අපි ලබා දෙනවා. පළාත් පාලන ආයතන, ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය ඇතුළු සියලු සංවිධාන මේ වෙනුවෙන් යොමු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු අකිල එල්ලාවල මහතා
(மாண்புமிகு அகில எல்லாவல)
(The Hon. Akila Ellawala)

රත්නපුරය කියන්නේ, සිංහල අලුත් අවුරුද්දෙන් පස්සේ දවස් 45ක් ඇතුළත හැමදාම ගංවතුරට ලක්වෙන ප්‍රදේශයක්. නමුත් මේ ගංවතුර ආවේ අවුරුදු හතරකට පස්සේ. ඒ වුණාට මේකට ස්ථිරසාර විසඳුමක් තිබෙන්න ඕනෑ, ගරු අගමැතිතුමනි. මම යෝජනාවක් කරන්න කැමැතියි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා රත්නපුරයට ආපු වෙලාවේ dry-dam system එක ගැනත් සාකච්ඡා කළා. මේ යෝජනා කරලා තිබෙන dry-dam system එක pipelines තිබෙන project එකක්. ඒකට දැන් අවුරුදු ගණනාවක් වෙනවා. මූල්‍ය ප්‍රතිපාදන නොමැති නිසා තමයි නැවතිලා තිබෙන්නේ. මම නියෝජනය කරන බලංගොඩ ආසනයෙන් පටන් ගන්නා වේ ගඟ ගැලුවා නම් ඕට වඩා ලොකු ව්‍යසනයක් වෙනවා. එහෙම වුණා නම් කළු ගඟ ඕටත් වඩා උතුරනවා. ව්‍යසනයට, බලංගොඩ ප්‍රදේශයට වැස්සේ නැහැ. ඒ නිසා වේ ගඟ රත්නපුර නගරයට එන එක වළක්වලා ඇඹිලිපිටිය වාගේ වෙනත් ප්‍රදේශයකට හරවන්න ක්‍රමයක් තිබෙනවා නම් ඒක කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. රත්නපුර නගරයේ දී වේ ගඟත්, කළු ගඟත් එකතුවෙන නිසා තමයි මේ ගංවතුර තත්ත්වය හැමදාම උදා වෙන්නේ. ඒකට ඔබතුමන්ලා මොනවා හරි වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් ඒක ලොකු දෙයක්.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක වැදගත් කාරණයක්. සාමාන්‍යයෙන් ගංවතුර මතක් වෙන්නේ, ගංවතුර වෙලාවට විතරයි. හැබැයි, අපි ඒ ගැන නිරන්තරයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. අපට mitigation projectsවලට අනිවාර්යයෙන් යන්න වෙනවා. කොච්චර මුදලක් ගියත් ඒක කරන්න වෙනවා. මේ වෙලාවේ අපි දරන මූල්‍ය වියදම, පාඩුව, සමාජ හානිය, පාරිසරික හානිය සැලකිල්ලට ගත්තොත් අපට ඒ project එකක් එක අවුරුද්දකදී කරන්න පුළුවන්. ඒක තමයි සත්‍යය. මෙවැනි ව්‍යාපෘති කිහිපයක් අපි රට පුරා හඳුනාගෙන තිබෙනවා. ඒ ව්‍යාපෘතිවලට අනිවාර්යයෙන්ම යන්න වෙනවා. අවාසනාවට, අපේ රටේ ගොඩ-පෙරකදෝරුවෝ වැඩියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට උපදෙස් දෙන්න ගොඩක් කට්ටිය ඉන්නවා.

මේ රටේ සිටින හැම කෙනෙකුටම මතයක් තිබෙනවා. ඒ කෙසේ වෙතත් රජයට සිද්ධ වෙනවා, නිවැරදි, හොඳ, වැදගත් තීන්දුව හඳුනා ගෙන එය ක්‍රියාත්මක කරන්නට. අපේ අමාත්‍යාංශය ඉදිරි කාලයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් එක්ක එකතුව මේ වෙනුවෙන් කටයුතු කරනවා.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවස්ථාව දෙන්න විධියක් නැහැ. න්‍යාය පත්‍රයේ කටයුතු ගොඩක් ප්‍රමාද වෙලා තිබෙන්නේ.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (වනජීවී හා වන සම්පත් සංරක්ෂණ සහ වාරිමාර්ග අමාත්‍යතුමිය)
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி)பவித்ராதேவி வன்னி ஆரச்சி - வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரும் நீர்ப்பாசன அமைச்சரும்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law - Minister of Wildlife and Forest Resources Conservation and Minister of Irrigation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඊයේත් වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට උත්තර දෙනකොට පෙරවරු 11.45 පසු වුණා. දැන්, අද දිනයේ වේලාවත් පෙරවරු 11.08යි. අපි පක්ෂ නායක රැස්වීමේදීත් මේ ගැන කථා කරන්නම්. මම හිතන විධියට, ප්‍රශ්නවලට උත්තර දීම සඳහා විශාල කාලයක් ගත වන නිසා, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ප්‍රශ්න අහන දිනයට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයට නොදැම්මොත් හොඳයි.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

උමා ඔය ව්‍යාපෘතිය: විස්තර
உமா ஓயா கருத்திட்டம்: விபரம்
UMA OYA PROJECT: DETAILS

1152/2024

1. ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)
වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උමා ඔය ව්‍යාපෘතියේ වැඩකටයුතු අවසන් කර තිබේද;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය විවෘත කරනු ලබන දිනය කවරේද;

(iv) එම ව්‍යාපෘතිය මඟින් ආවරණය කරනු ලබන ප්‍රදේශ කවරේද;

(v) ඉහත ව්‍යාපෘතිය තුළින් අස්වද්දනු ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உமா ஓயா கருத்திட்டத்தின் பணிகள் பூர்த்தி செய்யப்பட்டுள்ளனவா;

(ii) இதற்காகச் செலவிடப்பட்டுள்ள நிதித்தொகை யாது;

(iii) மேற்படி கருத்திட்டம் அங்குரார்ப்பணம் செய்யப் படும் திகதி யாது;

(iv) மேற்படி கருத்திட்டத்தினால் உள்வாங்கப்படும் பிரதேசங்கள் யாவை;

(v) மேற்படி கருத்திட்டத்தின்கீழ் பயிரிடப்படும் வயற்காணிகளின் அளவு யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation:

(a) Will she inform this House -

(i) whether the construction work of the Uma Oya Project has been completed;

(ii) the amount of money spent on the said project;

(iii) the date on which the aforesaid project will be opened;

(iv) the areas covered by the said project; and

(v) the total area of paddy fields that would be harvested under the project mentioned above?

(b) If not, why?

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னி ஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) උමා ඔය ව්‍යාපෘතිය යටතේ විදුලිය උත්පාදනය කිරීම සඳහා ඉහළ නිමිනයේ කළ යුතු සියලුම ඉදිකිරීම් වැඩ අවසන් කර ඇති අතර, පහළ නිමිනයේ වැඩ කටයුතුවලින් සියයට 75ක් පමණ ද නිම කර තිබේ. ඉතිරි වැඩවල ඉදිකිරීම් කරගෙන යනු ලැබේ.

(ii) ඉහළ නිමිනයේ වැඩ සඳහා ඇස්තමේන්තු මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 529ක් වන අතර, අද දිනට මුළු වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 512කි. පහළ නිමිනයේ වැඩ සඳහා ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 17,900ක් වන අතර, අද දිනට මුළු වියදම රුපියල් මිලියන 15,900කි.

(iii) මෙම ව්‍යාපෘතියේ විදුලිය උත්පාදනය කිරීම 2024 වර්ෂයේ අප්‍රේල් මස 24වන දින විවෘත කරන ලදී. පහළ නිමිනයේ වැඩ නිමවන ආකාරයට ඒ ඒ කොටස් විවෘත කරනු ලබයි.

(iv) ව්‍යාපෘතිය මඟින් සෘජුවම බදුල්ල, මොනරාගල, හම්බන්තොට යන දිස්ත්‍රික්ක ආවරණය කෙරේ.

(v) මෙම ව්‍යාපෘතිය යටතේ ඉඩම් සංවර්ධනය කිරීමේදී කුඹුරු ඉඩම් ලෙස සංවර්ධනය කිරීම වෙනුවට වගා ඉඩම් ලෙස සංවර්ධනය කිරීම ප්‍රධාන අරමුණක් වන අතර, එම වගා ඉඩම් තුළ වී වගා කිරීම් ද කළ හැකි වන අතර, එසේ වුවත් මෙම වගා ඉඩම් තුළ වාණිජ කෘෂි සංවර්ධන (CAD - Commercial Agriculture Development) හා අපනයන කෘෂිකර්ම සංවර්ධනය - Export Agriculture Development - කෙරෙහි ඉවහල් වන වගාවන් ප්‍රවලිත කිරීමට රජය අපේක්ෂා කෙරේ.

මේ අනුව මෙගාවොට 120ක ජල විදුලි බලය නිෂ්පාදනයෙන් පසු නිකුත් කෙරෙන ජලය උමා ඔය පහළ නිමිනයේ, එනම් කිරිඳි ඔය ද්‍රෝණිය තුළ අලුතින් තැනීම් කර ඇති අලිකොට ආර ජලාශයට ලැබීමෙන් පසු එම ජලය උපයෝගී කරගෙන පහළ නිමිනයේ මොනරාගල දිස්ත්‍රික්කය තුළ තිබෙන වැල්ලවාය/තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වගා ඉඩම් සහ බදුල්ල දිස්ත්‍රික්කය තුළ තිබෙන හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වගා ඉඩම් මෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ තිබෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ඉඩම් වශයෙන් සම්පූර්ණ වගා බිම් අක්කර 21,000ක්, එනම් අලුතින් ඉඩම් අක්කර 10,000ක් හා එක කන්නයක් වගා කරමින් තිබූ ඉඩම් අක්කර 11,000ක් තුළ දෙකන්නයම වගා කිරීමට අවශ්‍ය ජලය ලබා දීමට හැකි වන පරිදි පහළ නිමිනයේ සංවර්ධන කටයුතු ඉටු කරමින් සිටී.

මේ අනුව කටයුතු කිරීම සඳහා දැනටමත් වැල්ලවායේ අලිකොට ආර ජලාශයේ ඉදිකිරීම් නිමකර, හඳපානාගල ජලාශයේ ධාරිතාව තුන් ගුණයකින් වැඩිවන ආකාරයට එම ජලාශය වැඩිදියුණු කිරීමද නිමකර, මෙහි වම් ඇළ/දකුණු ඇළ යටතේ වගා ඉඩම් සංවර්ධනය කිරීමටත්, ඒ යටතේ දැනටමත් ජලය ලබා දීමත් ඉටු කරමින් සිටින අතර, කුඩා ඔය ජලාශයේ සියයට 95ක් පමණ ඉදිකිරීම් වැඩ නිම කරමින්, ඒ යටතේද ඇළ මාර්ග සංවර්ධනය කිරීමේ කටයුතු ඉටු කරමින් සිටී. මෙම ක්‍රියාවලිය තුළදී පහළ නිමිනයේ එක් කන්නයක් පමණක් වගා කරමින් සිටි කුඩා වැව් 108කට යල/මහ කන්න දෙකම වගා කිරීමට ජලය ලැබෙන ආකාරයට ඇළ මාර්ග ඉදිකිරීමද සිදු කෙරේ. මෙම වැව් 108 තුළින් අබලන් වැව් ලෙස හඳුනා ගත් වැව් 58ක් පුනරුත්ථාපනය කිරීමද පහළ නිමින සංවර්ධනයට ඇතුළත් අතර, එම වැව්වලින් 46ක වැඩ දැනටමත් නිමකර ඇත.

මෙම ව්‍යාපෘතිය දියත් කිරීම නිසා ඉහත සඳහන් ප්‍රතිලාභවලට අමතරව දැනටමත් ඉහළ නිමිනයේ ඉදිකර ඇති පුහුල්පොල හා ඩයරබා ජලාශ දෙක උපයෝගී කරගෙන බණ්ඩාරවෙල, බදුල්ල හා මොනරාගල ප්‍රදේශවල පානීය ජල අවශ්‍යතා සඳහාද අවශ්‍ය ජලය ඝන මීටර් දසලක්ෂ 39ක් - 39 MCM - ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ලබා දීමට හැකියාව ලැබෙනු ඇත. මේ වන විටත් පුහුල්පොල ජලාශය හරහා ඇටම්පිටිය ජලාශ

[ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය]

යෝජනා ක්‍රමය මඟින් බණ්ඩාරවෙල මහ රෝහලට හා ඒ අවට සිටින ප්‍රජාවට අවශ්‍ය පානීය ජලය සැපයීම ඉටු කරනු ලබයි.

එසේම ඩයරබා ජලාශය මඟින් විසල් බණ්ඩාරවෙල ජල යෝජනා ක්‍රමයට ජලය ලබා දීමට අවශ්‍ය ජල මූලාශ්‍ර නිර්මිතය. (Water intake structure) මේ වන විටත් මෙම ජලාශය තුළ ඉදිකිරීම් අවසන් කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ව්‍යාපෘතිය තුළින් ආර්ථිකයට එක් වුණු ප්‍රතිලාභ ගැන ගරු ඇමතිතුමියගේ පිළිතුරේදී මනාව පැහැදිලි කළා. මම අතුරු ප්‍රශ්න දෙකම අහන්න බලාපොරොත්තු වෙනවා, ගරු අමාත්‍යතුමියනි.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. යහ පාලන ආණ්ඩුව ආපු හැටියේම මැදමුලනට වතුර ගෙනියන project එක කියලා තමයි මේ ව්‍යාපෘතිය නැවැත්වූයේ. යහ පාලන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ජනතා විමුක්ති පෙරමුණ ලොකු නාට්‍යයක් රඟපෑවා. ඒ වාගේම හිටපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

වුණා, JVP එකේ ඒ බොරුවලට. දැන් ඇමතිතුමියත් කියපු විධියට ඒ ව්‍යාපෘතිය හරහා මේ රටේ දැවැන්ත සංවර්ධනයක් සිද්ධ වුණා. නමුත්, 2015 ජනවාරි 08වන දායින් පසු එම ව්‍යාපෘතියේ කටයුතු මන්දගාමී වුණා, නිලධාරින් භය වුණා. වාරිමාර්ග අමාත්‍යාංශය දළ වශයෙන් මාස 9ක විතර කාලයක් මේ ව්‍යාපෘතියේ කටයුතු නැවැත්වූවා. ඒ වාගේම සමහර නිලධාරින් ද ටයි පටි මාරු කළා. එච්.ජී.එස්. ගුණවර්ධන කියන වාරිමාර්ග අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙකු කිව්වා, මෙකට ඩොලර් මිලියන 540ක් යන්නේ නැහැ, ඩොලර් මිලියන 250කින් කරන්න පුළුවන් කියලා. ඒ කාලයේ මේ ව්‍යාපෘතිය හැඳින්වූයේත් "මැදමුලන ව්‍යාපෘතිය" කියලායි. ලංකාවේ පළමුවෙනි RCC වැව් බැම්ම තාක්ෂණය තිබෙන්නේ මේ ව්‍යාපෘතිය තුළයි. ඒ කියන්නේ, ඇමතිතුමිය කියපු විධියට පුහුල්පොල සහ ඩයරබා ජලාශ දෙක හැදුවේ roller-compacted concrete කියන තාක්ෂණයෙන්. ඒ, ලංකාවේ පළමුවෙනි වතාවට. ඒ වාගේම තමයි, උමං හෑරීම සඳහා tunnel boring machine එක ගෙනැල්ලා ලංකාවේ පළමුවෙනි වතාවට ඉතා ඉහළ තාක්ෂණය ඔස්සේ තමයි ඉරාන නිලධාරින් ඒ කටයුතු කළේ. ඒ, ඉතා හොඳ feasibility එකක් කරලා.

දැන් ඔබතුමිය කියන විධියට වතුර නැතිවීම නිසා අක්කර 21,000ක් වගා කරන්න බැරි වුණා, අවුරුදු 7ක් තිස්සේ. ඒ අවුරුදු 7 තුළ ආර්ථිකයට වුණු හානිය කොපමණද කියලා ගණනය කරලා තිබෙනවාද?

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னி ஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය සම්බන්ධව මම උත්තරයක් දෙන්නම්. යම් කණ්ඩායම් ඇවිල්ලා කරපු උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් විධියට මේ ව්‍යාපෘතිය නැවතුණා.

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

ගරු ඇමතිතුමියනි, යම් කණ්ඩායම් නොවෙයි, ඒ ජනතා විමුක්ති පෙරමුණේ සමන්ත විද්‍යාරත්න ඇතුළු පිරිස. යම් කණ්ඩායම් කියන්න එපා.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආර-ච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

මේ ව්‍යාපෘතිය අඩුම ගණනේ 2018 වසර වෙනකොට ඉවර වෙන්න තිබුණු එකක්. මේ ව්‍යාපෘතියේ අරමුණ වුණේ බදුල්ල දිස්ත්‍රික්කයේ තිබෙන වතුර ටික හම්බන්තොට සහ මොනරාගල දිස්ත්‍රික්කවලටත් ගෙන යන එක. ඉඩම් අක්කර 21,000කට export agriculture සහ commercial agriculture සඳහා වගා කරන්න වතුර ලබා දීමට තමයි මේ ව්‍යාපෘතිය ආරම්භ කළේ. මේක අවුරුදු ගණනාවක් ප්‍රමාද වුණු බව අපි දන්නවා, යම් යම් උද්ඝෝෂණවල ප්‍රතිඵල විධියට. අඩුම ගණනේ 2018දීවත් මේ ව්‍යාපෘතිය හදලා ඉවර කරන්න තිබුණා. රටට හොඳ වැඩක් වෙනකොට ඒවාට අකුල් හෙළන්න හොඳ නැහැ. මේ ව්‍යාපෘතිය හම්බන්තොට දිස්ත්‍රික්කයට ගියාට ඒකෙන් මැදමුලනට වතුර යන්නේ නැහැ. නමුත්, මේ වැඩේ කළේ මැදමුලනට වතුර ගෙනියන්න කියලා ඒ කටයුත්ත කඩාකප්පල් කිරීම තුළ රටට විශාල පාඩුවක් වුණා. මම හිතන විධියට මේ ව්‍යාපෘතිය වැව් 108කට විතර වතුර ලබා දෙන්න කරපු ව්‍යාපෘතියක්. මෙහිදී කළු ගල විතරක් කිලෝමීටර 15ක් විදලායි ඉහළ ද්‍රෝණියේ ඉඳලා කිරිඳි ඔය ද්‍රෝණියට වතුර ගේන්නේ.

ඒ වාගේම ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි මේ විධියට කළු ගල උඩ ඉඳලා පහළට මීටර් 620ක් සිරස් අතට විදලා ඒ වතුර ටික උපයෝගී කරගෙන විදුලිය ජනනය කරන්නේ. පාඩුව නම් මම ගණනය කර නැහැ. නමුත් මොන රජයක් විසින් කළත්, මේ පාර්ලිමේන්තුවේ උගත්, බුද්ධිමත් මන්ත්‍රීවරු හොඳ වැඩවලට විරුද්ධ විය යුතුයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. එහෙම වුණොත් රටට විශාල පාඩුවක් තමයි සිද්ධ වෙන්නේ. ඒක මොන ආණ්ඩුව කළත් එහෙමයි. වෙන කොහේට හරි වතුර ගෙනියනවා, බොන්න වතුර ගෙනියනවා කියලා ඒ ව්‍යාපෘතිය නවත්වලා ප්‍රශ්න ඇති කරපු එක හොඳයි කියලා මම නම් හිතන්නේ නැහැ. වර්ෂ ගණනාවක සිට මේ ව්‍යාපෘතිය විවෘත නොකිරීමේ පාඩුව අපි ගණනය කරලා නැහැ. ඒ වාගේම ගොවිතැනෙන් වෙච්ච පාඩුවත් දැනට ගණනය කරලා නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු ඇමතිතුමියගෙන් ඉල්ලා සිටිනවා, ජනතා විමුක්ති පෙරමුණේ සුපුරුදු ගෝත්‍රික සටන් පාඨවලට වාගේම උද්ඝෝෂණවලට පින්සිද්ධ වෙන්න මේ රටේ ආර්ථිකයට වෙච්ච හානිය පිළිබඳව ගණනය කිරීමක් කරන්න කියලා. මොකද, මේ වනවිට රට පුරා බොරු බේගල්

ඇදබාමින්, ජනතාව නැවත වතාවක් නොමඟ යවමින් කටයුතු කරන ජනතා විමුක්ති පෙරමුණ, අවුරුදු 7ක් තිස්සේ උමා ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න ඉඩ නොදීම තුළ රටේ ආර්ථිකයට, එහෙම නැත්නම් කෘෂි කර්මාන්තයට වෙච්ච හානිය ගණනය කරලා සතියක් ඇතුළත හෙළිදරව් කරන්න කියලා ඔබතුමියගෙන් මම ඉල්ලා සිටිනවා.

ඔබතුමියගේ අමාත්‍යාංශ ලේකම්වරයා ඇතුළු විද්වතුන්ටත් කියන්න, මේ වාගේ දේවල් පිළිබඳව කට වහගෙන ඉන්න එපා කියලා. සමහර විට ඒගොල්ලනුත් දැන් ටයි පටි මාරු කරන්න බලාපොරොත්තුවෙන් ඇති. හැබැයි, ඒගොල්ලන්ට කියන්න, මේ හානිය ගණනය කරලා රටට කියන්න කියලා. ඒ වාගේම අපට ලැබුණු තොරතුරු අනුව නම් සමහර විශේෂඥයනුත්, විද්වතුනුත් ඔය උද්ඝෝෂණවලට සම්බන්ධ වුණා. එම නිසා ඒ අය සම්බන්ධයෙනුත් විනය ක්‍රියා මාර්ග ගන්න කියලා ඔබතුමියගෙන් මම ඉල්ලා සිටිනවා.

අපේ විදුලිබල හා බලශක්ති ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. මම ගරු ඇමතිතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. ඇමතිතුමිය ප්‍රකාශ කරපු ආකාරයට ජනතා විමුක්ති පෙරමුණ අවුරුදු 7ක් තිස්සේ මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඉඩ නොදීම නිසාත්, මේ සම්බන්ධ උද්ඝෝෂණවලට සහභාගි වෙලා ජාතික ජනන සැලැස්මට හානි කිරීම නිසාත් ජනන පද්ධතියට මෙගාවොට් 120ක් එකතු කිරීම නවත්වන්න සිද්ධ වුණා. ඒ නිසා ඩීසල් බලාගාර මුදලාලිලාට විශාල වශයෙන් සන්තෝසම් හම්බ වුණා; ඒ වාගේම ලොකු ආදායමක් ඔවුන්ට හම්බ වුණා. ජනතා විමුක්ති පෙරමුණට පින්සිද්ධ වෙන්න තමයි ඒ පෞද්ගලික විදුලි බලාගාර, ඩීසල් බලාගාර හිමියන්ට අවුරුදු 7ක් පුරාවට තමන්ගේ හොද්ද බොර කරගන්න පුළුවන් වුණේ. ඒ නිසා අවුරුදු 7ක් තිස්සේ ඒ වෙච්ච පාඩුව කොච්චරද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු කංචන විජේසේකර මහතා
(මාණ්පුමිකු කඤ්ඡන ඛිජේසේකර)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මධුර විතානගේ මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නය යටතේ විදුලි බලය සම්බන්ධයෙන් වූ කාරණාවලට පමණයි මට උත්තර දෙන්න පුළුවන් වෙන්නේ. පසුගිය කාලයේ විදුලි බිල සම්බන්ධයෙන් කටයුතු කරනකොට අපට මේ කාරණා තේරුණා. ඇමතිතුමිය කියපු ආකාරයට 2017 වර්ෂයේ තමයි මේ ව්‍යාපෘතිය අවසන් කරන්න නියමිතව තිබුණේ. නමුත්, මේ ව්‍යාපෘතිය 2018දීවත් අවසන් කරගන්න තිබුණා, දේශපාලන වශයෙන් සංවිධානාත්මකව උද්ඝෝෂණ නොතිබුණා නම්. ඉඩම් සම්බන්ධයෙනුත් ගැටලු තිබුණා. නමුත් ඒ ගැටලු සියල්ලම 2018 වෙනකොට අවසන් කරගන්න තිබුණා. ජල විදුලියෙන් විදුලිය උත්පාදනය නොකර ඩීසල්වලින්, දැවිතෙල්වලින් විදුලිය උත්පාදනය කරපු නිසාත්, උමා ඔය ව්‍යාපෘතියෙන් විදුලි ජනනය කිරීම අහිමි වීම නිසාත් අපට අවුරුද්දකට රුපියල් බිලියන 9ක් අඩු වෙලා තිබෙනවා කියායි අපි ඇස්තමේන්තු කර තිබෙන්නේ. සාමාන්‍යයෙන් ගත්තොත් රුපියල් බිලියන 63ක් විතර වාගේ පසුගිය කාලය පුරා අහිමි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමන්ත විද්‍යාරත්න ඇතුළු ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ක්‍රියාකාරින් පසුගිය කාලය පුරාවට විශාල බිල්ලෙක් මැව්වා, උමා ඔය බැම්මේ ලොකු හිලක් තිබෙනවා, බණ්ඩාරවෙල නගරයම යට වෙනවා, බදුල්ල සම්පූර්ණයෙන්ම යට වෙනවා වාගේ දේවල් කියලා. ව්‍යාපෘති ක්‍රියාත්මක කරනකොට ඒ මහින් යම් පරිසර බලපෑමක් සිදු වෙනවාද කියලා අධ්‍යයන සහතික කරනවා. ඒ නිසා යම් බලපෑමක් සිද්ධ වෙලා තිබෙන තැන්වලට අවශ්‍ය විසඳුම් පවා අපි ලබා දී තිබෙනවා. ඉඩම් ප්‍රශ්න වාගේම මානුෂීය වශයෙන් තිබෙන ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්න මාස කිහිපයක් ගත වුණු බව අපි පිළිගන්නවා. ඒ වාගේම තවත් ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ඒ ප්‍රශ්නවලට ගරු ඇමතිතුමිය විසින් මේ වනවිට විසඳුම් ලබා දෙමින් සිටිනවා. නමුත්, රුපියල් බිලියන 9ක් අපට අවුරුද්දකට අහිමි වුණා, මේ ව්‍යාපෘතිය නතර වීමත් සමඟ. ඒ විතරක් නොවෙයි. මධුර විතානගේ මන්ත්‍රීතුමනි, මේ කටයුත්ත දේශපාලන ව්‍යාපාරයක් හැටියට පාවිච්චි කළා. 2018 පළාත් පාලන මැතිවරණයට ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් වුණේ, "මාලිමාව" ලකුණෙන් නොවෙයි, "සීනුව" ලකුණෙනුත් නොවෙයි, "ටැප්" එක ලකුණෙන්.

එම පළාත් පාලන මැතිවරණයේදී ඔවුන් බණ්ඩාරවෙල නගර සභාවට තරග කළේ "ටැප්" එක ලකුණින්. ඒ "ටැප්" එක ලකුණ පෙන්වලා තමයි කිව්වේ ජල අර්බුදයක් එනවා කියන එක. මේ අය කාලයෙන් කාලයට මෙවැනි ව්‍යාපෘති කඩාකප්පල් කරන්න, නවත්වන්න කටයුතු කරලා තිබෙනවා. සාම්පූර් බලාගාරයේ කටයුත්තත් නවත්වන්න ලාල් කාන්ත ඇතුළු පරිසර සංවිධාන තමයි උසාවියට ගියේ. ඒ කටයුතු නවත්වන්න කියලා උසාවියෙන් නියෝගයක් ලබා දුන්නේ නැහැ. ඒක අවශ්‍ය වෙලාවට ඉෂ්ට වුණා නම් අද විදුලිබල ප්‍රශ්නය ඉවරයි. දැන් අපට ගල් අඟුරු බලාගාරයකට යන්න බැහැ. නමුත්, ඒ සැලසුම් කරපු විධියට කටයුතු කළා නම් ඒ වෙලාවේදී විදුලිබල ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනවා.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් මිනිත්තුවක කාලයක් ඉල්ලා සිටිනවා. මේ ගරු සභාවේදී ගුණවර්ධන කියන ලේකම්වරයාගේ නම සඳහන් කළා. ඒ ලේකම්තුමාම තමයි මිලියන 520කට ගිවිසුම අත්සන් කරලා තිබෙන්නේ. ඒක වැරැද්දුවා කියලා දැන් කියනවා නම් ඒක වැරැදියි. දෙවැනි කාරණය මේකයි. ඒ වෙලාවේ කැබිනට් ඇමතිවරයා විධියට හිටියේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාය කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

සාම්පූර් බලාගාරය පිළිබඳ ගිවිසුම අත්සන් කළේ මම විදුලිබල ඇමති ධුරය දරපු කාලයේ. ඉන්දියානු රජයත්, ලංකා රජයත් එකතු වෙලා සමාගමක් හදලා තමයි ඒ බලාගාරය හදන්න පටන් ගත්තේ. එහෙම නැතිව ඒක පෞද්ගලිකව කළ දෙයක් නොවෙයි. අපි director boards පත් කරලා, ඉඩම් අත්පත් කරගෙන, tender document එකත් හැදුවා, ලෝකයේ තිබෙන හොඳම coal power plant එක ගන්න. හැබැයි, ඒක ක්‍රියාත්මක වුණේ නැති නිසා රටේ විදුලිබල නිෂ්පාදනය වැඩි වියදමක් දරා ඉන්ධනවලින් කරන්න පසුකාලීනව අපට සිදු වුණා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කියන්න, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවල පළමුවැනි ප්‍රශ්නයට විතරයි තවම උත්තර දීලා තිබෙන්නේ. තව ප්‍රශ්න හතරක් අහන්න තිබෙනවා. ඒක නිසා ගරු සභානායකතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, දිවා ආහාර විවේකය සඳහා තිබෙන වේලාවත් විවාදය සඳහා යොදා ගන්න කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
වෙලාව ඕනෑ නේද? අද උත්තර දෙන්න තිබෙනවා නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දිවා ආහාර විවේකය සඳහා තිබෙන වේලාවත් විවාදය සඳහා යොදා ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 2 -1246/2024- (2), ගරු ඉරාන් වික්‍රමරත්න මහතා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 3 -1251/2024- (2), ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ජනතාව බලාගෙන ඉන්නවා, පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් යුක්තිය ඉටු වෙයි කියලා. අපි දිගින් දිගටම මේ ප්‍රශ්නය අහනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නැවත චෝදනාවක් ISIS තර්ජනයක් තිබෙනවා කියලා තිබෙද්දී මම අහන්නේ බොහොම සරල ප්‍රශ්නයක්. පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳ විමර්ශනය කරපු ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ නිලන්ත ජයවර්ධන පිළිබඳව කර තිබෙන නිර්දේශය මොකක්ද? පොලීසිය භාර ඇමතිතුමා ඒ නිර්දේශය ක්‍රියාත්මක කරනවාද කියන එක විතරයි මේ අහන්නේ. ඒකට උත්තරයක් දෙන්න බැරිව මාස දෙක ගණනේ කල් ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි වතාවට තමයි අද මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න මාස දෙකක් කල් ගත්තේ. අපි දන්නවා, මේ ආණ්ඩුවට අවශ්‍යතාවක් තිබෙනවා,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න අමාත්‍යතුමා මාස දෙකක කාලයක් ඉල්ලා තිබෙනවා. ඒ කාලය ලබා ගන්න අමාත්‍යතුමාට අවස්ථාව තිබෙනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

2015 සිට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති: මොනරාගල දිස්ත්‍රික්කය

2015ஆம் ஆண்டு முதல் நகர அபிவிருத்தி அதிகாரசபையால் நடைமுறைப்படுத்தப்பட்டுள்ள கருத்திட்டங்கள்: மொனராகலை மாவட்டம்

PROJECTS IMPLEMENTED BY URBAN DEVELOPMENT AUTHORITY FROM 2015 : MONARAGALA DISTRICT

1281/2024

4. ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W. H. M. Dharmasena)
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියේ නම සහ ඒ සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ව්‍යාපෘති අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) මේ වනවිට වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(v) එම ව්‍යාපෘතිවල වැඩ අවසන් නොකිරීමට හේතු කවරේද;

(vi) ඒවායේ වැඩ කඩිනමින් අවසන් කිරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

නගර අපිවිරුත්ති මත්‍රුම් වීටමෛප්පු අමෛච්සරෛක් කේට්ට විනා:

(අ) (i) 2015ආම් ආණ්ටු මුතල් ඉතුවරෛ නගර අපිවිරුත්ති අතිකාරසපෛයාල් මොනරාකලෛ මාවට්ටත්තිල් නටෛමුරෛප්පටුත්තප්පට්ටුළ්ළ කරුත්තිට්ටංකළින් එණ්ණික්කෛ යාතු;

(ii) මේර්පටි ඔව්වොරු කරුත්තිට්ටත්තිනතුම් පෙයර් මර්රුම් අතර්කාකච් චෙලවිටප්පට්ටුළ්ළ නිතිත් තොකෛ වෙව්වේරාක යාතු;

(iii) මේර්පටි කරුත්තිට්ටංකළිල් තර්පෝතු පණිකළ් පූර්ත්තිචෙය්යප්පට්ටුළ්ළ කරුත්තිට්ටංකළින් එණ්ණික්කෛ මර්රුම් අවර්රින් පෙයර්කළ් යාවෛ;

(iv) ඉන්රළවිල් පණිකළ් පූර්ත්තිචෙය්යප්පටාතුළ්ළ කරුත්තිට්ටංකළින් එණ්ණික්කෛ මර්රුම් අවර් රින් පෙයර්කළ් යාවෛ;

(v) මේර්පටි කරුත්තිට්ටංකළින් පණිකළ් පූර්ත්ති චෙය්යප්පටාමෛක්කාන කාරණංකළ් යාවෛ;

(vi) අවර්රින් පණිකළෛත් තුරිතමාකප් පූර්ත්ති චෙය්වතර්කු මේර්කොළ්ළප්පටුම් නටවටික් කෛකළ් යාවෛ;

එන්පතෛ අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා;

(ஆ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Urban Development and Housing:

(a) Will he inform this House of the -

(i) number of projects implemented by the Urban Development Authority in Monaragala District from 2015 to date;

(ii) name of each project and the amount spent on them, separately;

(iii) number of completed projects and their names, out of aforesaid projects;

(iv) number of projects that have not yet been completed and their names;

(v) reasons for non-completion of aforesaid projects; and

(vi) steps that will be taken to complete the aforesaid projects, immediately ?

(b) If not, why?

ගරු තේනුක විදානගමගේ මහතා (නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு தேனுக விதானகமகே - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு இராஜாங்க அமைச்சர்)

(The Hon. Thenuka Vidanagamage - State Minister of Urban Development and Housing)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 15යි.

(ii) වර්ෂ 2015 සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ ඒ සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන්

01	මොනරාගල පොදු වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	රුපියල් මිලියන 58.59
02	බිබිල පොදු වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	රුපියල් මිලියන 49.10
03	වැල්ලවාය පොදු වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	රුපියල් මිලියන 74.84
04	නීල හරිත උද්‍යාන ව්‍යාපෘතිය - මොනරාගල	රුපියල් මිලියන 27.08
05	නීල හරිත උද්‍යාන ව්‍යාපෘතිය - වැල්ලවාය	රුපියල් මිලියන 27.11
සියක් නගර සංවර්ධන ව්‍යාපෘති		
06	ඔක්කම්පිටිය නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය	රුපියල් මිලියන 16.37
07	වැල්ලවාය නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය	රුපියල් මිලියන 16.64
08	ඇතිමලේ නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය	රුපියල් මිලියන 16.81
09	තණමල්විල නගරයේ භූමි අලංකරණ ව්‍යාපෘතිය	රුපියල් මිලියන 13.63
10	සෙවනගල ඩංඩුම මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය	රුපියල් මිලියන 12.77
11	කතරගම හරිත බිම් තීරුව සංවර්ධන ව්‍යාපෘතිය	රුපියල් මිලියන 16.81
12	කතරගම ප්‍රවේශ චතුරශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය	රුපියල් මිලියන 400
13	කතරගම කිරිවෙහෙර ආසන්නයේ පිහිටි ගුවන් අංගණය අසල කඩ කාමර 14 ඉදිකිරීමේ ව්‍යාපෘතිය	
14	මහසෙන් විහාරය, සෙල්ලකතරගම භූමි අලංකරණ ව්‍යාපෘතිය	
15	සෙල්ලකතරගම මහජන උද්‍යානය ඉදිකිරීම හා භූමි අලංකරණ ව්‍යාපෘතිය	

[ගරු තේනුක විදානගමගේ මහතා]

(iii) ව්‍යාපෘති 14ක් අවසන් කර ඇත. එය පහත පරිදි වේ.

වර්ෂ 2015 සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ නිම කරන ලද ව්‍යාපෘති

1. මොනරාගල පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය.
2. බිබිල පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය.
3. වැල්ලවාය පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය.
4. නීල හරිත උද්‍යාන ව්‍යාපෘතිය - මොනරාගල
5. නීල හරිත උද්‍යාන ව්‍යාපෘතිය - වැල්ලවාය
6. ඔක්කම්පිටිය නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය
7. වැල්ලවාය නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය
8. ඇතිමලේ නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය
9. තණමල්විල නගරයේ භූමි අලංකරණ ව්‍යාපෘතිය
10. සෙවනගල ඩංඩුම මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය
11. කතරගම හරිත බිම් තීරුව සංවර්ධන ව්‍යාපෘතිය
12. කතරගම ප්‍රවේශ චතුරශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය
13. මහසෙන් විහාරය, සෙල්ලකතරගම භූමි අලංකරණ ව්‍යාපෘතිය
14. සෙල්ලකතරගම මහජන උද්‍යානය ඉදිකිරීම හා භූමි අලංකරණ ව්‍යාපෘතිය

(iv) 01යි. කතරගම කිරිවෙහෙර ආසන්නයේ පිහිටි ගුවන් අංගනය අසල කඩ කාමර 14 ඉදිකිරීමේ ව්‍යාපෘතිය.

(v) අරමුදල් නොමැති වීම.

(vi) අරමුදල් ලද විටදී අවශ්‍ය පියවර ගැනීමට තීරණය කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W. H. M. Dharmasena)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, වැඩ අවසන් නොකරපු ව්‍යාපෘති ටික කඩිනමින් අවසන් කර දෙන්න කටයුතු කරන්න කියන ඉල්ලීම මුලින්ම මම කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. නාගරික සංවර්ධන අධිකාරියට අයත් කාර්යාලයක් මොනරාගල නගරයේ තිබුණා. එම කාර්යාලය මේ වනකොට බදුල්ලට ගෙන ගොස් තිබෙනවා. උප කාර්යාලයක් කතරගම තිබෙනවා. හැබැයි, මොනරාගල දිස්ත්‍රික්කයේ මධ්‍ය කොටස වෙන්නේ මොනරාගල නගරය, නැත්නම් බුත්තල නගරය. එම කාර්යාලය නැවත බුත්තල නගරයට හෝ මොනරාගල නගරයට ගෙනෙන්න. මොකද, ජනතාවට තම ව්‍යාපෘති සැලසුම් අනුමත කර ගැනීම ඇතුළු තවත් එක එක අවශ්‍යතා තිබෙනවා නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉටු කර ගන්න. මගේ ප්‍රධාන ඉල්ලීම තමයි, නාගරික සංවර්ධන අධිකාරියේ මෙම කාර්යාලය මොනරාගල දිස්ත්‍රික්කයේ ස්ථාපිත කරන්න කියන එක. හැබැයි මෙහිදී සමහර අය ප්‍රකාශ කරයි, කතරගම කාර්යාලයක් තිබෙනවා නේද කියලා. කතරගම තිබෙන කාර්යාලය හෝ බුත්තලට හෝ මොනරාගලට ගෙනෙන්න. මොකද, කතරගම තිබෙන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ කෙළවරක. එම නිසා මොනරාගල දිස්ත්‍රික්කයේ මධ්‍ය ස්ථානයක එම කාර්යාලය ස්ථාපිත කරන්න පුළුවන් ද කියලා තමයි මම අහන්නේ, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)

ගරු මන්ත්‍රීතුමනි, මේක අද ඊයේ කෙරුණු දෙයක් නොවෙයි. එම කාර්යාලය බදුල්ලට ගෙනියලා අවුරුදු ගණනක් වනවා. මොනරාගලයි, කතරගමයි කෙරෙන ව්‍යාපෘති සංඛ්‍යාව සහ වැඩ සංඛ්‍යාව අනුව තමයි ඒ ස්ථානය ගත්තේ. ඔබතුමාගේ ඉල්ලීම අනුව සතියකට දවසක් හෝ දෙකක් නිලධාරියෙක් මොනරාගල ස්ථාපිත කරන්න කටයුතු කරන්න කියලා අපි දැනුම් දෙන්නම්.

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W. H. M. Dharmasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11ක් තිබෙනවා. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11ට අයත් ග්‍රාම නිලධාරි වසම්වලින් සියයට 90ක්ම නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන ප්‍රදේශ විධියට ගැසට් කරලා තිබෙනවා. ඒ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම නොදියුණු ග්‍රාම නිලධාරි වසම් තිබෙනවා. උදාහරණයක් වශයෙන් බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගත්තොත් එහි කුමාරගම, කුමාරපුර, රහතන්ගම, බුරුතගොල්ල, උඩඅරාව, හොරබොක්ක වාගේ ප්‍රදේශ ඉතා නොදියුණුයි. ඒ අය ණයක් ගන්න plan එකත් අරන් බැංකුවට ගියාම, plan එක ප්‍රාදේශීය සභාවෙන් අනුමත කරගෙන එන්න කියන අවස්ථා තිබෙනවා. ප්‍රාදේශීය සභාවට ගියාට පසුව නාගරික සංවර්ධන අධිකාරියේ කමිටුවකින් අනුමත කර ගන්න අවශ්‍යයි කියන කථාව කිව්වාම ඒ ගම්වල ජීවත් වන අය ඉතාම අසරණ වනවා. බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විතරක් නොවෙයි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11 තුළම තිබෙන්නේ නොදියුණු වසම්. මේවා නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන ප්‍රදේශ විධියට ගැසට් පත්‍රයකින් කළ පවරා ගැනීම අවලංගු කරලා එම වසම් ප්‍රාදේශීය සභාව යටතේ පවත්වාගෙන යන්න අවස්ථාව ලබා දෙන්න පුළුවන් ද, ගරු රාජ්‍ය ඇමතිතුමනි?

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)

ඒ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු කරන්නම්.

ගරු මන්ත්‍රීතුමනි, සෑම ප්‍රාදේශීය සභාවකම කමිටුවලට ආයතනයේ නිලධාරීන් සම්බන්ධ වනවා. එම නිලධාරීන්ගෙන් අවශ්‍ය කටයුතු කර ගන්න පුළුවන්. ඔබතුමා මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරන්න. ඒ පිළිබඳව අපි අවශ්‍ය කටයුතු කරන්නම්.

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W. H. M. Dharmasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකම ඇහුවා නේ.

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W. H. M. Dharmasena)
ඒ සම්බන්ධවම ඉල්ලීමක් කරන්න තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මේ පවරා ගත් වසම්වලින් නොදියුණු ග්‍රාම නිලධාරි වසම් ටික පමණක් ප්‍රාදේශීය සභාව යටතේ තියන්න කියලා මම ඉල්ලා සිටිනවා, දුප්පත් මිනිසුන්ගේ යහපත සඳහා.

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
අවුරුදු ගණනක් තිස්සේ ඒ ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරලා අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. ඔබතුමා කියනවා නම් වසමක ඒ කටයුතු ඉවත් කර ගන්න කියලා, ඒ සම්බන්ධව දැනුවත් කරන්න. අපි ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කරන්නම්.

ගුරු පුරප්පාඩු: කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක
ஆசிரியர் வெற்றிடங்கள்: குருநாகல் மற்றும் புத்தளம் மாவட்டங்கள்
TEACHER VACANCIES: KURUNEGALA AND PUTTALAM DISTRICTS

1284/2024

5. ගරු අසංක නවරත්න මහතා
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කවල මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) පුරප්පාඩු පිරවීම ප්‍රමාද වන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කල්වි අමාත්‍යාංශයේ භාර රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවට පිළිතුරු දෙන ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மற்றும் புத்தளம் மாவட்டங்களில் இன்றளவில் நிலவும் ஆசிரியர் வெற்றிடங்களின் எண்ணிக்கை ஒவ்வொரு கல்விக் கோட்டத்துக்கும் ஏற்ப தனித்தனியே எத்தனை என்பதையும்;

(ii) மேற்படி ஆசிரியர் வெற்றிடங்களை நிரப்புவதற்கு மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) வெற்றிடங்களை நிரப்புவது தாமதமாகும் பட்சத்தில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) separately, the number of teacher vacancies currently existing in each of the educational divisions in Kurunegala and Puttalam Districts;

(ii) the steps that will be taken to fill the aforesaid vacancies; and

(iii) if there is a delay in filling those vacancies, the reasons for such delay?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(i) කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කවල පළාත් පාසල්වල මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු ඇමුණුම 01 මඟින්ද, ජාතික පාසල්වල ඇති ගුරු පුරප්පාඩු ඇමුණුම 02 මඟින්ද ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 01 පහත දැක්වේ.

2023.12.31 දිනට ගුරු පුරප්පාඩු සංඛ්‍යාව

අනු අංකය	වයඹ පළාතේ පළාත් පාසල්වල ගුරු පුරප්පාඩු	
	අධ්‍යාපන කොට්ඨාසය	පුරප්පාඩු සංඛ්‍යාව
1	ඉබ්බාගමුව	225
2	රිදීගම	265
3	ගනේවත්ත	199
4	නිකවැරටිය	75
5	කොටවෙහෙර	120
6	කොබෙයිගනේ	69
7	වාරියපොල	92
8	මාවතගම	155
9	පොල්ගහවෙල	209
10	කුරුණෑගල	220

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

අනු අංකය	වයඹ පළාතේ පළාත් පාසල්වල ගුරු පුරප්පාඩු	
	අධ්‍යාපන කොට්ඨාසය	පුරප්පාඩු සංඛ්‍යාව
11	කුලියාපිටිය	152
12	බිංගිරිය	160
13	උඩුබද්දාව	112
14	පඬුවස්නුවර	120
15	දඹනැක්ගෙදර	85
16	අලව්ව	112
17	පන්නල	159
18	නක්කාවත්ත	49
19	ගල්ගමුව	235
20	ගිරිබාව	139
21	පොල්පිතිගම	289
22	මහව	230
කුරුණෑගල දිස්ත්‍රික්කය මුළු ගුරු පුරප්පාඩු		3,471
23	ආරච්චිකට්ටුව	160
24	හලාවත	225
25	වෙන්නප්පුව	185
26	නාත්තන්ඩිය	214
27	පුත්තලම උතුර	270
28	ආණමඩුව	105
29	පුත්තලම දකුණ	172
30	කල්පිටිය	198
31	පල්ලම	105
පුත්තලම දිස්ත්‍රික්කය මුළු ගුරු පුරප්පාඩු		1,634
වයඹ පළාතේ පළාත් පාසල්වල මුළු ගුරු පුරප්පාඩු		5,105

ඇමුණුම 02 පහත දැක්වේ.

වයඹ පළාතේ ජාතික පාසල්වල 2023.12.31 දිනට ගුරු පුරප්පාඩු

දිස්ත්‍රික්කය	අධ්‍යාපන කොට්ඨාසය	පුරප්පාඩු
කුරුණෑගල	ගල්ගමුව	4
කුරුණෑගල	ගනේවත්ත	12
කුරුණෑගල	ගිරිබාව	14
කුරුණෑගල	ඉබ්බාගමුව	4
කුරුණෑගල	කොබෙයිගනේ	13
කුරුණෑගල	කුලියාපිටිය නැඟෙනහිර	0
කුරුණෑගල	කුලියාපිටිය බටහිර	34
කුරුණෑගල	කුරුණෑගල	1
කුරුණෑගල	මහව	1
කුරුණෑගල	මාවතගම	25
කුරුණෑගල	නිකවැරටිය	2
කුරුණෑගල	පන්නල	24
කුරුණෑගල	පොල්ගහවෙල	12
කුරුණෑගල	පොල්පිතිගම	2
කුරුණෑගල	උඩබද්දාව	6
කුරුණෑගල	වාරියපොල	2
කුරුණෑගල	බිංගිරිය	5
පුත්තලම	හලාවත	16
පුත්තලම	නාත්තන්ඩිය	6
පුත්තලම	පුත්තලම උතුර	26
පුත්තලම	වෙන්නප්පුව	40
මුළු පුරප්පාඩු		249

(ii) මේ වනවිටත් පළාත් මට්ටමින් උපාධිධාරීන් බඳවා ගැනීමට විභාග පවත්වලා පුරප්පාඩු 2,969ක් සඳහා වයඹ පළාතේ පත්වීම් දීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. මේ කටයුතු මාස තුනකින් පමණ ප්‍රමාද වුණා, අභියාචනාධිකරණයේ නඩුවක් පවරලා තිබුණු නිසා. ඒ නඩුව අවසන් වෙන්න ගත වූ කාලයත් එක්ක පසුගිය මාසයේදී පත්වීම් දීම ආරම්භ කළා. දෙවැනි වටයේ පත්වීම් දීමට දැනට කටයුතු කරගෙන යනවා. එතකොට පළාත් පාසල්වල තිබෙන පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට 60කට වැඩි ප්‍රමාණයක පුරප්පාඩු පිරෙනවා. ජාතික පාසල්වල වැඩි වශයෙන් තිබෙන්නේ විද්‍යා, ගණිත, තාක්ෂණ සහ විදේශ භාෂා ගුරු පුරප්පාඩු. මේ වනවිට ජාතික මට්ටමින් විභාගය පවත්වලා, සම්මුඛ පරීක්ෂණ අවසන් කරලා විභාග දෙපාර්තමේන්තුවට යවලා තිබෙනවා, අවසාන ලකුණු ලබා ගන්න. ඒ ලකුණු ලබා දුන්නාට පස්සේ පත්වීම් දීමේ ඉදිරි කටයුතු

කරනවා. මම හිතනවා, මේ කටයුත්ත ඊළඟ සති දෙක තුළදී අවසන් කරන්න පුළුවන් වෙයි කියලා. එතකොට මේ පුරප්පාඩු 249 පිළිබඳ ප්‍රශ්නය විසඳෙනවා.

(iii) පුරප්පාඩු පිරවීම ප්‍රමාද වීමට හේතුව තමයි අධිකරණයට යාම. මේ ගැන මේ ගරු සභාවේ කිහිප වතාවක් කථා කළා. පසුගිය වතාවේ කථා කළාට පස්සේ ගිය මැයි මාසයේ 20වැනි දා ගන්න තිබුණු නඩුව එදා ගත්තේ නැහැ. ඒක තව මාසයකට කල් ගියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතාම පැහැදිලිව නැවත වතාවක් මේ කාරණය මේ සභාවේ කියනවා. මම හිතනවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන ප්‍රතිපාදන ටික පැහැදිලි කරලා දෙන එක මගේ යුතුකමක් කියලා. මම ඒක රටේ ජනතාවගේ දැන ගැනීමටයි කියන්නේ.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඇ) අනුව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

"නීතිය අනුව පාර්ලිමේන්තුව විසින් ම ක්‍රියාත්මක කළ හැකි පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර හා බලතල සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය, -හොඳට අවධානය යොමු කරන්න ඕනෑ, ජනතාවගේ අධිකරණ බලය- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද නැතහොත් වෙනත් යම් නීතියකින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන මඟින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය;"

දැන් ජනතාවගේ අධිකරණ බලය කොහේද තිබෙන්නේ? මෙහේ; පාර්ලිමේන්තුවේ. ජනතාවගේ පරමාධිපත්‍යය කොටස් තුනයි. ඒ, විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ. විධායක බලය තිබෙන්නේ ජනතාව විසින්ම තෝරා පත්කර ගන්නා ලද ජනාධිපතිවරයාටයි. රටේ ආරක්ෂාව ඇතුළු ජනතාවගේ විධායක බලය සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ආ) යටතේ සඳහන් වෙනවා. එතකොට ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනමත විචාරණයකදී හැර අනෙක් අවස්ථාවේ පාර්ලිමේන්තුවටයි තිබෙන්නේ. **එතකොට** 70 වන ව්‍යවස්ථාවේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය කියන්නේ මෙන්න මේකට. නඩුවක් ප්‍රමාද වෙන එක ගැන පාර්ලිමේන්තුවේ මිසක් පදික වේදිකාවේ කථා කරන්න බැහැ නේ. ඒක තමයි ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාත් එදා සඳහන් කළේ. පාර්ලිමේන්තුව උත්තරීතරයි කියන්නේ ඕකයි. ඉතින්, ඒක වෙනත් තැන්වලට තේරෙන්නේ නැති එක ගැන මට යමක් කරන්න බැහැ. මේ රටේ සාමාන්‍ය ජනතාවට තේරුම් ගන්න තමයි මම මේක කියන්නේ.

අපි මේ කාරණයත් මතක තියාගන්න ඕනෑ. අනුර බණ්ඩාරනායක මැතිතුමා ඔය කථානායක පුටුවේ ඉඳගෙන ඓතිහාසික තීන්දුවක් දුන්නා. එතුමා ඒ තීන්දුව නිකම් දුන්නේ නැහැ. මහා බ්‍රිතාන්‍යයේ වෙස්ට්මින්ස්ටර් ක්‍රමය, වෙනත් රටවල නඩු තීන්දු යන සියල්ලම අරගෙන තමයි එතුමා ඒ තීන්දුව දුන්නේ. ඒකෙන් කිව්වේ, "අධිකරණයට බැහැ, පාර්ලිමේන්තුවේ කටයුතුවලට මැදිහත් වෙන්න" කියලායි. මම ඒකත් මේ අවස්ථාවේ මතක් කරනවා. මම ඊට වඩා යමක් ඒ ගැන කියන්නේ නැහැ, විභාග වෙන්න තිබෙන නඩු නිසා. නමුත් සභානායකවරයා හැටියට මට යුතුකමක් සහ වගකීමක් තිබෙනවා, මේ රටේ උත්තරීතර ව්‍යවස්ථාවේ තිබෙන කරුණු අනුව පාර්ලිමේන්තුවට තිබෙන බලතල සම්බන්ධයෙන් මේ රටේ සාමාන්‍ය ජනතාවට දැන ගැනීමට කරුණු පැහැදිලි කරලා දෙන්න. ඒ ගැනත් කියමින් මම කියන්නේ නඩු ප්‍රමාදය ගැන මට යමක් කරන්න බැහැ කියලායි.

නමුත් අධිකරණයෙන් තීන්දුව දුන්න දවසට සමස්ත ලංකාව හැටියට පවත්වන්නා වූ විභාගය තිබ්බොත් හරි. අද වැලිඔය ප්‍රදේශයට ගුරුවරුන් යවන්න විධියක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉන්නේ වයඹ. එහා කෙළවරෙන් ගත්තොත්, අනුරාධපුරයේ මායිමට එන වැලිඔය තිබෙන්නේ මූලතිව් දිස්ත්‍රික්කයේ. ඒ සිංහල පාසල්වලට ගුරුවරුන් දෙන්න විධියක් නැහැ. වඩුකන්ද තිබෙන්නේ වවුනියාව සිංහල දකුණු ප්‍රදේශයේ. එහේට ගුරුවරුන් දෙන්න විධියක් නැහැ. මොකද, උතුරු පළාතෙන් සිංහල මාධ්‍ය උපාධිධාරීන් බිහි වෙන්නේ නැහැ. ඒ වාගේම, විද්‍යා පීඨවලට එන්නේත් නැහැ. ඒ නිසා තමයි සමස්ත ලංකාව හැටියට අපි විභාගය පැවැත්වූයේ. උතුරු මැද උපාධිධාරීන් සූදානම් නම් වැලිඔයට යවන්න පුළුවන්; වවුනියාවට යවන්න පුළුවන්. කුරුණෑගල වැඩි නම් පුත්තලමට යවන්න පුළුවන් වයඹ පළාත හැටියට. නමුත් මේ තත්ත්වය තේරුම් ගන්නේ නැහැ. මාස 15ක් තහනම් නියෝගයක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ, විභාගය පැවැත්වීම අත්හිටුවලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විභාගයක් පවත්වන එක අත්හිටුවලා මාස 15ක් ගිහිල්ලා තිබෙනවා. ඉතින් මේක මේ ගරු සභාවේ කථා කරන්නේ නැතුව මම වෙන කොහේද කථා කරන්නේ?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කැබිනට් මණ්ඩලයේදී කථා කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
කැබිනට් මණ්ඩලයේ කථා කරලා වැඩක් නැහැ නේ. කැබිනට් එකට පුළුවන් විධායකය වශයෙන් ගන්නා වූ තීන්දු ගන්න. පාර්ලිමේන්තුවට තමයි මම මේ පෙන්වා දුන්නේ, ව්‍යවස්ථාවට අනුව බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි කියන කාරණය. *[බාධා කිරීමක්]* ඔව් ඉතින්, පාර්ලිමේන්තුවේ එම බලය ක්‍රියාත්මක කරපු අවස්ථා ඉතිහාසයේ තිබෙනවා. මම ඒ ගැන කියන්න යන්නේ නැහැ, කාල වේලාව යන නිසා.

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙකයි. HND ඩිප්ලෝමාධාරීන්ට 2021දී පවත්වපු විභාගය අනුව ඒ ගොල්ලන්ගේ ලකුණු එවලා සම්මුඛ පරීක්ෂණ අවසන් කරලා තිබෙනවා. ඒකේ අවසන් ලකුණ ලැබුණාම - ඊළඟ සති දෙකතුන ඇතුළත - ඒ පත්වීම් ටික ලබා දෙනවා. එතකොට ඉංග්‍රීසි ගුරු නිහයට යම් ප්‍රමාණයක පිළිතුරක් ලැබේවි. ඊළඟට උපාධිධාරීන් හැටියට ඔබතුමාගේ පළාතේම අයට ඊළඟ වට දෙකේදී පත්වීම් දෙනකොට ඔය තිබෙන ප්‍රශ්නය බොහෝ දුරට සමනය වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

(ආ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළව එවා තිබෙන විස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු අසංක නවරත්න මහතා
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)
පිළිතුර ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි.

ඇත්තටම අපි දන්නවා, ඔබතුමා අධ්‍යාපන විෂය භාර ගත්තාට පසුව අපේ පළාතේ පමණක් නොව මුළු රටේම අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්න විසඳීම සඳහා විශාල වශයෙන් මැදිහත් වෙනවා කියලා; ක්‍රියාකාරීව කටයුතු කරනවා කියලා. අපි එය දැකලා තිබෙනවා. විශේෂයෙන් ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ඔබතුමා ගන්නා වෙහෙස පිළිබඳවත් අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වාගේම වයඹ පළාතේත් ගුරු විභාග දෙකක් පවත්වා ඒ ගුරු විභාග දෙකේ ප්‍රතිඵල පදනම් කරගෙන ගුරුවරුන් බඳවා ගැනීමේ කටයුතු මේ දවස්වල ආරම්භ කරලා තිබෙනවා. ඒ බඳවා ගැනීම් එක්ක පසුගිය කාලය පුරාම සංවර්ධන නිලධාරී පත්වීම් ලබා ගුරුවරුන් විධියට පාසල්වල වැඩ කරපු විශාල පිරිසක් ඉන්නවා. ඒ ගොල්ලන් හුඟදෙනෙක් ඒ විභාගයට පෙනී සිට තිබෙනවා. නමුත් ඒ විභාගයට පෙනී නොහිටපු පිරිසකුත් ඉන්නවා. ඒ ගොල්ලන්ට මොකක්ද වෙන්නේ කියන කාරණාවත් අපි දැන ගන්න කැමැතියි. ඒත් එක්කම තවත් කාරණාවක් මතු කරන්න තිබෙනවා. මම ඒ කාරණා දෙකටම පිළිතුරු බලාපොරොත්තු වෙනවා. ස්වේච්ඡා ගුරුවරුන් විධියට අවුරුදු 6, 7, 8, 10, 15 වැඩ කරන ඩිප්ලෝමාධාරීන් ඉන්නවා දෙමළ ඩිප්ලෝමා, තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා, ඉංග්‍රීසි ඩිප්ලෝමා හදාරපු. ඉතින් ඒ උදවියගේ සේවය ස්ථීර කර ගැනීම සඳහාත් වැඩ පිළිවෙළක් අවශ්‍යයි. අපි මීට පෙරත් ගුරු සහායක විධියට පත්වීම් ලබා දුන්නා. ඒ සම්බන්ධයෙනුත් යම් වැඩ පිළිවෙළක් අමාත්‍යාංශය විධියට හදන්න කියන ඉල්ලීම මා කරනවා. මොකද, ඒ සමහර උදවිය අතිදුෂ්කර පාසල්වල සේවය කරනවා. සමහර උදවිය කිසිම දීමනාවක් ලබන්නේ නැතුව වසර 10, 15 වැඩ කරනවා. ලංකාවේම ගත්තත්, මා හිතන්නේ එවැනි අය හාරපන්සියයකට වඩා නැහැ. ඒ නිසා ඒ අයගේ ප්‍රශ්නය විසඳීම සඳහාත් මැදිහත් වෙන්න කියන ඉල්ලීම කරන්න මා කැමැතියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි වරද තමයි සංවර්ධන නිලධාරීන් හැටියට උපාධිධාරීන් ගත්තු වෙලාවේ කිසිදු වග විභාගයකින් තොරව පුහුණුවන්නන් හැටියට අධ්‍යාපන ක්ෂේත්‍රයට 23,000ක් අනුයුක්ත කිරීම. දැන් ඒ පිරිසෙන් කොටසක් තමයි උසාවි ගිහිල්ලා තිබෙන්නේ, "මේ විභාගය නවත්වන්න. විභාගයක් එපා. අපට පත්වීම් දෙන්න" කියලා. ඒ වාගේම තවත් පෙත්සම් හතරක් තිබෙනවා. අවුරුදු 40 දක්වා අපි අවසර අරගෙන දුන්නා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන්. මොකද, මේවායේ පත්වීම් බලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාව. ඒ එකඟතාවෙන් එහාට ගිහිල්ලා වයස අවුරුදු 40න් එහා අයටත් පත්වීම් දෙන්න කියා ඉල්ලා තිබෙනවා. ගුරු සේවා ව්‍යවස්ථාවේ සඳහන්ව තිබෙන්නේ උපාධිධාරියෙකු ගුරු සේවයට බඳවා ගන්නවා නම්, තරග විභාගයක් තියලා ලකුණු මත තෝරාගෙන, සම්මුඛ පරීක්ෂණයක් තියලා, සම්මුඛ පරීක්ෂණයේ ලකුණු සහ විභාගයේ ලකුණු එකතු කරලා එහි සාමාන්‍ය අගය අරගෙන පුරප්පාඩු සංඛ්‍යාව සහ විෂය ගැළපීම මත පත්වීම් දෙන්න කියලායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අතරතුරේ ඉන්නවා තව කොටසක්. විභාගයට පෙනී ඉඳලා දැන් මේ සම්මුඛ පරීක්ෂණයට ආවාම තමයි ඒ අය දන්නේ පාසලේ උගන්වන්න තිබෙන විෂය තමන්ගේ උපාධියේ විෂයන් සමඟ ගැළපෙන්නේ නැහැ කියලා.

මම දැන් උදාහරණයක් ගන්නම්කෝ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තිබෙනවා, Criminology. දැන් මේ ගරු සභාවේ සිටින මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා විශ්වවිද්‍යාලයේ හිටපු කාලයේ ඒ විෂයය තිබුණේ නැහැ. *[බාධා කිරීමක්]* කොළඹ විශ්වවිද්‍යාලයේ. Criminology කියලා වෙනම විෂයයක් පටන් අරගෙන තිබෙනවා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ. හැබැයි ඒ විෂයය ඇතුළත් degree එක කරලා නීති විද්‍යාලයේ විභාගය සමත් වෙන්නත් බැහැ. මොකද, Criminology කියන එක LLB එක නොවෙයි. ඒක වෙනම විෂය මාලාවක්. එතකොට ඒ විෂයය ඉගෙන ගත්තු උපාධිධාරියෙක් විභාගයට පෙනී ඉඳලා ලකුණු අරගෙන සම්මුඛ පරීක්ෂණයට ආවාම තමයි අපි දන්නේ, ඒ උපාධිධාරියාට උගන්වන්න විෂයයක් අපේ පාසල්වල නැහැ කියලා. පාසල් පද්ධතියේ නැහැ නේ, ඒ විෂයයට අදාළව උගන්වන්න විෂයයක්. එතකොට මොකද වෙන්නේ? ලකුණු අරගෙන තිබුණත් සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රතික්ෂේප වෙනවා. ඒක එකක්. අනෙක් අතට, වාණිජ අංශයේ උපාධියක් තිබෙන කෙනෙක් ලකුණුවලින් තේරිලා එනවා කියලා අපි හිතමු. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ එකී සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වෙච්ච 1,000ක් ඉන්නවා කියලාත් හිතමු. හැබැයි විෂය පුරප්පාඩු තිබෙන්නේ 200යි. එතකොට පත්වීම් 200යි නේ දෙන්න පුළුවන්. එතකොට වාණිජ උපාධිධාරීන්ට කියන්න පුළුවන්ද, භූගෝලය උගන්වන්න, එහෙම නැත්නම් රසායන විද්‍යාව උගන්වන්න, නැත්නම් ගණිතය උගන්වන්න කියලා? එහෙම කරන්න බැහැ. එතකොට වෙන්නේ මොකක්ද? විභාගය සමත් නමුත් පත්වීම ලබන්න අවශ්‍ය අදාළ විෂය ධාරාව, විෂය සංකලනය නැහැ.

ඊළඟ කාරණය මෙකයි. තමන් ගත්තු උපාධියේ core subjects නොවෙයි නම්, මුළු උපාධියේම transcript එක ගත්තාම ඒකේ විෂයයන්වලින් තුනෙන් එකක් - one-third - පාසලේ උගන්වන විෂයයට අදාළව තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් එය උපාධිධාරියාටත් අසාධාරණයක්; දරුවාට ඊටත් වඩා අසාධාරණයක්. ඒ නිසා ඔය පෙනුමට තිබෙනවා තරම් සරල නැහැ ඒ ප්‍රශ්නය. විභාගය සමත් වෙන්න පුළුවන්. ඒක හොඳයි. හැබැයි එතැනින් එහාට සම්මුඛ පරීක්ෂණයට ගියාම තමයි විෂයය ගැළපීම ගැන බලන්නේ. ඉතින් මෙන්න මේ හේතුව නිසා තමයි ඔය ප්‍රශ්නය තිබෙන්නේ. ඔය කියපු 23,000න් අඩුම තරමින් 8,000ක් විතර මේ වන කොට පළාත් මට්ටමෙන් විභාගවලට පෙනී ඉඳලා, ලකුණු අරගෙන, සම්මුඛ පරීක්ෂණයට ගිහිල්ලා, පත්වීම ලබලාත් ඉවරයි. ඒ සංඛ්‍යාව අඩු වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු දෙවැනි ප්‍රශ්නයට අදාළ කාරණය සම්බන්ධයෙන් අපට ඊට වඩා දෙයක් කරන්න බැහැ. කැබිනට් පත්‍රිකා දමන්න බැහැ, උසාවියේ නඩුව ඉවර වනකල්.

දෙවැනි කාරණය, ස්වේච්ඡා ගුරුවරුන් ගැනයි. ගරු මන්ත්‍රීතුමනි, ඩිප්ලෝමාධාරීන් අධ්‍යාපන ක්ෂේත්‍රයට තවදුරටත් ගෙනැල්ලා නම් මේ අධ්‍යාපනය හදන්න බැහැ. මම මේ භාර ගත්තේ, අවුරුදු දෙකහමාරක තාවකාලික වගකීමක්. මම ඒක ගැන ඊළඟ කථාවේදී කියනවා. ඒ කොටස කරලා දෙන්න මට පුළුවන්. ස්වේච්ඡා පදනමින් අරගෙන පිරිසකට මේ ක්ෂේත්‍රයේ රැකියා දීම ආදි ඔක්කොම අපි කරාවි. හැබැයි මතක තියා ගන්න, එහෙම මේ අධ්‍යාපනය හදන්න බැරි බව. ඒ නිසා තමයි ළමයි උපකාරක පන්තියේ නවතින්නේ; පාසලෙන් බැහැරට යන්නේ. මොකද, මතයක් හැදීගෙන යනවා, මේ අධ්‍යාපනය වැඩක් නැහැ කියලා.

මම මගේ කථාවේදී කියන්නම්, මට පෞද්ගලිකව දරුවන් කියපු කථා. පළමුවැනි විද්‍යා පීඨය හැදුවේ 1986දී. වර්තමාන ජනාධිපතිතුමා අධ්‍යාපන ඇමතිවරයා හැටියට 1985දී තමයි ජාතික අධ්‍යාපන ආයතනය හැදුවේ. 1986දී විද්‍යා පීඨ පටන්

ගත්තා. පළමුවැනි විද්‍යා පීඨ අට හැදුවා. දැන් විද්‍යා පීඨ 19ක් තිබෙනවා. ඒ 19ට ගන්නේ උසස් පෙළ විභාගයේ Z අගය අනුව, ඉල්ලුම් කරන විෂයය අනුව. හැබැයි ඔබතුමා දන්නවාද, දිස්ත්‍රික් පදනමෙන් විද්‍යා පීඨවලට ගන්න කොට සමහර අවස්ථාවල 0.6යි, Z-score එක. ඒ අයත් විද්‍යා පීඨවලට එනවා. 0.6 Z-score එක තිබෙන කෙනෙක් තමයි විද්‍යා පීඨවලට අරගෙන දරුවන්ට උගන්වන මට්ටමට ගෙනෙන්න අපට සිදු වෙලා තිබෙන්නේ. ඒක කරන්න පුළුවන්ද? ඒ නිසා විද්‍යා පීඨ 19 ඒකරාශි කරලා campuses, faculties, departments හැටියට ශ්‍රී ලංකා අධ්‍යාපන විශ්වවිද්‍යාලය හදන්න කෙටුම්පත හදලාත් ඉවරයි දැන්. එතකොට ඩිප්ලෝමාවක් නොවෙයි දෙන්නේ. කෙළින්ම offer කරන්නේ B.Ed. එක.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් තාක්ෂණ අධ්‍යාපන-

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
දැනට තිබෙන ටික දෙනවා. ඒක නවත්වන්නේ නැහැ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. අපි යන්න හදන තැන ගැනයි මම කිව්වේ. ඉස්සරහට, ජාතික ශික්ෂණවේදී ඩිප්ලෝමාව වෙනුවට උපාධියක් ලබා දෙනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඒ යන්න හදන තැන නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
දැන් ඉන්න අයට ප්‍රශ්නයක් නැහැ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ප්‍රශ්නයක් තිබෙනවා. ඒකයි මම කියන්නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මොකක්ද ප්‍රශ්නය?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
අපට ඉදිරිපත් කරපු ලිපියක සඳහන් වෙනවා, "නයිවල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පාරිභෝගික විද්‍යා හා නිපැයුම් තාක්ෂණ අධ්‍යයන අංශයේ 2017-2018 අධ්‍යයන වර්ෂවල අපගේ ඩිප්ලෝමාව..." ආදී වශයෙන්. එහි සඳහන් කරලා තිබෙනවා, අදාළ අභ්‍යන්තර අධ්‍යයන වර්ෂ දෙකක් සඳහා රජයේ පාසල්වල ගෘහ ආර්ථික විද්‍යා විෂයයට අදාළව වසරක ගුරු පුහුණුවක් ලබා තිබෙනවා කියලා.

හැබැයි, දැන් මේ කට්ටිය බඳවා ගන්නේ නැහැ කියලා කියනවා. මම දන්නේ නැහැ ඇයි කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමාට ඔය ප්‍රශ්නය යොමු වෙලා තිබෙන එක හරි. ඔය ළමයි මාවත් හමු වුණා. ඒක තමයි මම කියන්නේ එක එක කාලවලදී වෙච්ච දේවල් තමයි මේවා. නයිවල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගෘහ ආර්ථික විද්‍යාව ගැන නේ මේ කියන්නේ. අපේ විද්‍යා පීඨවලත් ගෘහ ආර්ථික විද්‍යාව කරනවා නේ, ශික්ෂණ ඩිප්ලෝමාධාරීන් හැටියට. එතකොට මෙතැනදී ඒ ලබාදෙන NVQ එකේ ප්‍රශ්නයක් තිබෙනවා, NVQ Level 6 ද, NVQ Level 5 ද කියලා. අපේ එක යන්නේ NVQ Level 6ත් එහාට. *[බාධා කිරීමක්]* මම ඒක දන්නවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, මේ ඩිප්ලෝමාවේදී ගුරු පුහුණුව ලැබුවායින් පසුව ගුරු පත්වීමක් දෙනවා කියලා පොරොන්දුවක් තිබෙනවා. ඒකයි කියන්නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ගුරුවරුන්ට න්‍යායාත්මකව සහ ප්‍රායෝගිකව නියම වශයෙන් පුහුණුව ලබා දෙන්නේ විද්‍යා පීඨවල සහ ගුරු අභ්‍යාස විද්‍යාලවල. පාසලකට ගිහිල්ලා පුහුණුවක් ලැබුවා කියලා ඔහුට මනෝවිද්‍යාව පිළිබඳව පුහුණුවක් දෙන්නේ නැහැ. පාසලේ මනෝවිද්‍යාව උගන්වන්න කවුද ඉන්නේ? ඒක කරන්නේ ගුරු අධ්‍යාපනඥයන්. මේකට මට කරන්න දෙයක් නැහැ. මේ, හදා ගෙන තිබෙන ක්‍රමවේදය. අපි මේ ගැන සලකා බලනවා. නමුත්, ඉදිරියට වෙන දේ මම කිව්වේ. උපාධිධාරියෙක් පාසලට යවලා ගුණාත්මකභාවයෙන් යුතු ගුරුවරයෙක් දෙනතුරු මේ අධ්‍යාපනය හදන්න බැහැ. ඒක නිසා මම නම් තවදුරටත් කැමැති වෙන්නේ නැහැ මේ 'ස්වේච්ඡා' කියන කථාව අරගෙන මේ වැඩේ කරන්න. අපි පත්වීම් දෙන්න බලාපොරොත්තු වෙන්නේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව අනුවයි.

ගරු අසංක නවරත්න මහතා
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට අදාළ දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා අහනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
ගරු ඇමතිතුමනි, ඇත්තටම මේක වර්තමාන විභාග සම්බන්ධ ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, විදුහල්පති විභාගයේ II ශ්‍රේණියේ විභාගයේ කඩඉම් විභාගය 2023 ඔක්තෝබර් මාසයේ 21වන දා පැවැත්වුවා. ඒ විභාගයට - විදුහල්පති II ශ්‍රේණියේ විභාගයට - ලියපු ගුරුවරුන් 13දෙනෙකුගේ ප්‍රතිඵල ආවේ නැහැ. එහිදී ඒ සම්බන්ධයෙන් කරුණු දක්වා තිබුණා ඒගොල්ලන් විභාගය ලියනකොට හිජාබය පැළඳ ගෙන විභාගය ලිව්වාය කියලා. හිජාබය කියන්නේ, හිස් ආවරණය. හිස් ආවරණය පැළඳ ගෙන විභාගය ලිව්වා කියලා ඒගොල්ලන්ට විභාග දෙපාර්තමේන්තුව විසින් 2023 දෙසැම්බර් මාසයේ 08වන දා විභාග දෙපාර්තමේන්තුවට කැඳවා තිබෙනවා විමර්ශනය කරන්න. ගරු ඇමතිතුමනි, ඒගොල්ලන්ව කැඳවලා විමර්ශනයක් කරලා නැහැ. එහිදී ඒගොල්ලන්ට කියලා තිබෙනවා මොකක්ද වුණේ කියලා

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ලියලා දෙන්න කියලා. එතකොට විභාගයට ගිය 13දෙනාම ඒ සම්බන්ධයෙන් ලියලා දීලා තිබෙනවා. මාර්තු මාසයේ 6වන දා මේ විභාගයේ ප්‍රතිඵල නිකුත් වෙලා තිබෙනවා. නමුත්, එහිදී ඒගොල්ලන්ට දන්වා තිබෙන්නේ ඒ අයගේ විභාග ප්‍රතිඵල අවලංගු කළා කියලා, cancelled කියලා; ප්‍රතිඵල අත්හිටුවලා. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා අපේ අධ්‍යාපන අමාත්‍යාංශය නිකුත් කරලා තිබෙන චක්‍රලේඛය අනුව විභාගයක් ලියනකොට කවුරුන් හෝ ශිෂ්‍යාවක් හිජාබයක් පැළඳ සිටියා නම්, කන පෙනෙන විධියට හිජාබය පැළඳ ඇයට විභාගය ලියන්න ඉඩකඩ ලබා දීලා තිබෙනවා. ඇය සම්පූර්ණයෙන්ම කන ආවරණය කරලා නම් විභාග ශාලාවේ විභාග පරීක්ෂක නිලධාරියාට හෝ නිලධාරි මහත්මියට හරි කියන්න පුළුවන් කන ආවරණය නොවන විධියට එය සකස් කරගෙන විභාගය ලියන්න කියලා. ඒකත් ඇය අහන්නේ නැත්නම් ඇයව විභාග ශාලාවෙන් එළියට දාන්න පුළුවන්. එවැනි කිසිදු ආකාරයේ ක්‍රියාමාර්ගයක් ගන්නේ නැතිව, එහෙම දැනුම් දීමකුත් නැතිව විභාගය ලියලා ඉවර වෙලා විභාග ප්‍රශ්න පත්‍ර ඔක්කෝම භාර දුන්නාට පස්සේ ඔවුන් විභාග දෙපාර්තමේන්තුවට note එකක් දාලා යවනවා, "හිජාබයක් පැළඳ ගෙන ලිව්වා" කියලා. විභාග දෙපාර්තමේන්තුව ඒ note එක මත ඒ අයගේ විභාග ප්‍රතිඵල නිකුත් කරන්නේ නැහැ. ඊට පස්සේ විභාග දෙපාර්තමේන්තුව මේ ගැන විමර්ශනය කරන්න ඒ අයට අඩගැහුවාමත්, ඒ විමර්ශනවලට කරුණු අහලා ලියුමක් ගන්නවා. එහෙම නැතිව නිසියාකාර විමර්ශනයක් වෙලාත් නැහැ. ගරු ඇමතිතුමනි, මෙහිදී විදුහල්පති සේවයට ලියපු 13දෙනෙකුගේ ප්‍රතිඵල අද වෙනකොට අත්හිටුවා තිබෙනවා. ඉතින් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා වහාම මේකට මැදිහත් වෙලා මේ අයට සාධාරණත්වයක් ඉෂ්ට කරන්න කියලා. බස්නාහිර පළාතේ වුණු සිද්ධියක්, මේක. මම හිතන විධියට මේ 13දෙනාම බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ. ඔබතුමා දන්න,වා කොළඹ නගරයේත් විදුහල්පතිවරු නැති පාසල් විශාල ප්‍රමාණයක් තිබෙන බව. පළාත් සභාවට තවම ඒක හරියට කළමනාකරණය කර ගන්න බැරි වෙලා තිබෙනවා. කොළඹ නගරයේ තිබෙන පාසල් වැඩි හරියක තවම ඉන්නේ වැඩ බලන විදුහල්පතිවරු.

මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, වහාම මේ සම්බන්ධයෙන් මැදිහත් වෙලා ඉක්මනින් සාධාරණත්වයක් ඉෂ්ට කරලා දෙන්න කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක නම් ලොකු ප්‍රශ්නයක් නොවෙයි. IIIවන ශ්‍රේණියේ සිට IIවන ශ්‍රේණියට යන්නත්, IIවන ශ්‍රේණියේ සිට Iවන ශ්‍රේණියට යන්නත් විභාග පවත්වන්නේ නැතිව අවුරුදු ගණනක් තිබුණා. ඒ විභාග ටික තියලා දැන් අපි ඒ ගොල්ලන්ට උසස්වීම් ටික දෙනවා. ඊළඟට, හිජාබය පැළඳීමෙන් යම් ප්‍රශ්නයක් මතු වුණොත් ප්‍රතිඵල අත්හිටුවීමක් විතරයි කරන්නේ; cancel කිරීමක් නොවෙයි. විමර්ශනය කරලා ඔවුන්ට ප්‍රතිඵල නිකුත් කරනවා. ඒක ළමයින්ටත් එහෙමයි. සමහර තැන්වලදී මේ අය දෙපැත්තේම කන් වහගෙන හිටියාම අපි දන්නේ නැහැ කන ඇතුළේ මොනවා තියාගෙන ඉන්නවා ද කියලා. මොකද, කන ඇතුළේ තියාගෙන ඉන්න පුළුවන් සියුම් උපකරණ දැන් තිබෙනවා. එම නිසා තමයි ඒ සම්බන්ධයෙන් සැක පහළවෙලා ඒක කරන්නේ. අත්හිටුවා කියලා ප්‍රතිඵල cancel කරන්නේ නැහැ. මම අද දවසේ විවාදය තුළදී ඔබතුමාට මේ සම්බන්ධයෙන් අවසාන පිළිතුරක් දෙන්නම්. මොකද, විභාග කොමසාරිස්තුමාත් මෙතැන තිබෙන රාජ්‍ය නිලධාරීන්ගේ මැදිරියේ අද ඉන්නවා. එතුමාගෙන් අහලා මම ඒ පිළිතුර ලබා දෙන්නම්. අද දවස තුළදී මම ඒකට උත්තරයක් දෙන්නම්. ඔබතුමා අහපු දෙවැනි ප්‍රශ්නයටත් මම උත්තරයක් දෙන්නම්. බස්නාහිර පළාතේ ගුරුවරු 192ක් වැඩියි කියලා වෙනත් පළාතකට යවන්න හැදුවා. මම ඒක නැවැත්වුවා. නවත්වලා මම කිව්වා, "නැහැ, මේක තුළ ඉන්න වැඩ ආවරණය වෙන තැන් සහ අනෙක් ඒවාට පත්වීම් දෙන්න" කියලා. දැන් ඒ ගොල්ලන් ඒක කරගෙන යනවා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 10.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - *[බාධා කිරීමක්]* අවසානයේදී කථිකයෝ ඉතිරි වුණොත් බලමු කීදෙනෙක් ඉන්නවා ද කියලා. සමහර දවසට මමයි, මූලාසනාරූඩ ගරු මන්ත්‍රීතුමායි විතරයි මේ සභාවේ ඉන්නේ. ඒ වෙලාවටත් ඉන්නවා නම් මම කාලය ලබා දෙන්නම්. -*[බාධා කිරීමක්]* නැහැ, ඉන්නවා නම් මම දෙන්නම්.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ජේ.සී. අලවතුවල පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
ஜே.சீ. அலவதுவல மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
J. C. ALAWATHUWELA FOUNDATION (INCORPORATION) BILL

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"ජේ.සී. අලවතුවල පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු මුජිපුර් රහ්මාන්)
(The Hon. Mujibur Rahuman)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப் படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Buddhasasana, Religious and Cultural Affairs for report.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2 සහ 3 ඉදිරිපත් කිරීම.

ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත: නියෝග
இலத்திரனியல் கொடுக்கல்வாங்கல் சட்டம்: ஒழுங்குவிதிகள்
ELECTRONIC TRANSACTIONS ACT: REGULATIONS

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යවස්ථාව සහ 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8(2) වගන්තිය සමඟ කියවිය යුතු 24 වගන්තිය යටතේ තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2022 දෙසැම්බර් 22 දිනැති අංක 2311/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.03.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

සිවිල් ගුවන්සේවා පනත: රෙගුලාසි
குடியியல் வான்செலவுச் சட்டம்: ஒழுங்குவிதிகள்
CIVIL AVIATION ACT: REGULATIONS

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 117(2)(ණ) වගන්තිය යටතේ කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය හරහා පියාසර කරන ගුවන්යානා වෙත ශ්‍රී ලංකාව විසින් සපයනු ලබන ගගන නාවික පහසුකම් සහ සේවාවන් භාවිතා කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 දෙසැම්බර් 12 දිනැති අංක 2362/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.03.22 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ඛනිජතෙල් සම්පත් පනත: නියෝග
பெற்றோலிய வளங்கள் சட்டம்: ஒழுங்குவிதிகள்
PETROLEUM RESOURCES ACT: REGULATIONS

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 4(අ) සහ16(4) වගන්ති සමඟ කියවිය යුතු 48 වගන්තිය යටතේ සහ 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 13(3) වගන්තිය සමඟ කියවිය යුතු 48 වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2024 මාර්තු 05 දිනැති අංක 2374/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.05.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, වැදගත් කරුණු දෙකක් බොහොම කෙටියෙන් ඔබතුමාට ඉදිරිපත් කරන්න මම කැමැතියි. අපේ රටේ ජනතාව, ඒ වාගේම රණ විරුවන් මියන්මාරයේත්, රුසියාවේත් සිවිල් රැකියාවලට යවනවා කියලා ඒ රටවලට පිටත් කර හැරලා, අද වන විට ඒ අය දැඩි ලෙස අසහනයට ලක්වෙලා, අනාථ වෙලා සිටින බව ඔබතුමාත් දන්නවා. ඇත්ත වශයෙන්ම අපේ රටින් ගිය සමහර උදවිය රුසියාවට ගියාට පස්සේ ඒ අය යොමු කරලා තිබෙන්නේ යුක්‍රේන යුද්ධයටයි. නමුත්, ඒ අය ගියේ වෙනත් රැකියාවකටයි. මේ විධියට යුද්ධයකට යොමු කරලා, සමහර උදවියගේ ජීවිතත් අහිමි වෙලා තිබෙනවා කියලා වාර්තා වෙනවා. මේ පිළිබඳව රජය වහාම මැදිහත් වෙන්නට ඕනෑ. දැන් ශ්‍රී ලංකාව නියෝජනය කරන තානාපතිවරයෙක්වත් රුසියාවේ නැහැ. මේ වාගේ තත්ත්වයක් තුළ විශේෂයෙන්ම මියන්මාරයටත්, රුසියාවටත් සමඟි ජන බලවේගයෙන් වෙනමම මන්ත්‍රී දූත කණ්ඩායමක් යැව්වා. අපේ ගරු සුජිත් සංජය පෙරේරා මැතිතුමාත්, ගරු ජේ.සී. අලවතුවල මැතිතුමාත්, ගරු වසන්ත යාපාබණ්ඩාර මැතිතුමාත් අපි යවලා, විශේෂයෙන්ම අපේ මට්ටමින් කරන්නට පුළුවන් දේ කරන්නට අපි වැඩ පිළිවෙළක් යෙදෙව්වා. හැබැයි, - *[බාධා කිරීමක්]* නැහැ, රටවල් දෙකටම ගියා. මියන්මාරයටත් ගියා, රුසියාවටත් ගියා. ඒ රටවලට මේ විධියට ගිය අයගේ පවුල් දැන් සම්පූර්ණයෙන්ම අසරණ වෙලා ඉන්නේ. ඒ ගිය පුද්ගලයෝත් අසරණ වෙලා ඉන්නේ. මේ පිළිබඳව අපේ මන්ත්‍රීවරු ගණනාවක් පාර්ලිමේන්තුවේ කථා කළා. හැබැයි, ගරු අමාත්‍යතුමනි, මේකට විසඳුමක් නැහැ. විපක්ෂයෙන් මන්ත්‍රී දූත කණ්ඩායම් යවලා වැඩ කටයුතු කරන්න පුළුවන් නම්, රජයටත් පුළුවන් නේ මේ සඳහා යම්කිසි සක්‍රිය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. එම නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, මේ සම්බන්ධයෙන් අදම ජනාධිපතිවරයාත් එක්ක සාකච්ඡා කරලා, හෙට උදේට අපට විසඳුමක් ලබා දෙන්න මොකක්ද මේ වෙනුවෙන් ගන්නා පියවර කියලා. - *[බාධා කිරීමක්]* නැහැ, තව කාරණයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. මේ කාරණයත් මම ඉදිරිපත් කළාට පස්සේ ඔබතුමාට ප්‍රශ්න දෙකටම උත්තර දෙන්න පුළුවන්.

රුසියාවේ සහ මියන්මාරයේ අනාථ වුණු අපේ ජනතාව ඉන්නවා. ඒ වාගේම විශ්‍රාමික හමුදා නිලධාරිනුත් එහේ ගිහිල්ලා තිබෙනවා. දැන් ඇමතිතුමාටම හිතා ගන්න පුළුවන් නේ, විශ්‍රාම ගියාට පස්සේ විශ්‍රාම වැටුපෙනුත් ජීවත් වෙන්න බැරි තත්ත්වයක් නිසා තමයි මේ ගොල්ලන් විදේශ රටකට ගියේ කියන එක. ඒ ගොල්ලන් ගියේ යුද්ධ කරන්න නොවෙයි. ඒ ගොල්ලන් ගියේ සිවිල් රැකියාවලට. හැබැයි, මේ මිනිස් ජාවාරම්කරුවන් අපේම රටේ පුරවැසියන්ව මියන්මාරයේත්, රුසියාවේත් රැකියා ලබා දෙනවා කියලා - සිවිල් රැකියා ලබා දෙනවා කියලා - ඒ අයව අරගෙන ගිහිල්ලා යුද්ධයට යොමු කරලා අනාථ කර තිබෙනවා. ඒ නිසා මම මේ කාරණාව ඔබතුමාට ඉදිරිපත් කරනවා. කරුණාකරලා, මේ වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලා හෙට උදේට රජය උත්තරයක් ලබා දෙන්න.

ඊළඟ කාරණාව මෙයයි. මම කාරණා දෙකම ඉදිරිපත් කරන්නම්, ගරු ඇමතිතුමනි. එතකොට ඔබතුමා කාරණා දෙකටම එකවර උත්තර දෙන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඉදිරිපත් කළ කාරණා දෙකම එකයි නේ. *[බාධා කිරීමක්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඊළඟ කාරණාව මෙයයි, ගරු ඇමතිතුමනි. ඇත්ත වශයෙන්ම අපේ ක්‍රිකට් කණ්ඩායමට අපි සුබ පතනවා; T20 World Cup එක ජයග්‍රහණය කරන්නට අපේ සුබපැතුම්, ආශීර්වාදය අපි ඔවුන්ට පිරිනමනවා. හැබැයි, මම ඔබතුමාට කියන්න කැමැතියි, ඒ අයගේ tour එකේ logistics පිළිබඳව. ඒ කියන්නේ, ඒ අයගේ cricket matches schedule කරපු ආකාරය පිළිබඳව. ශ්‍රී ලංකාවට විතරයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. මේක බරපතළ ගැටලුවක්. මම ඔබතුමාට මේක කියන්න කැමැතියි. ICC rulesවල තිබෙනවා ලු, ඒ ගොල්ලන් ඉන්න hotel එකයි, ක්‍රීඩාංගණයි අතර උපරිම 45 minutes distance එකක් තිබෙන්න ඕනෑ කියලා. අපේ team එක locate කරලා තිබෙන්නේ පැය එකහමාරක් තිස්සේ යන්න තිබෙන **තැනකට.** ඒක පළමුවැනි කාරණාව.

දෙවැනි කාරණාව මෙයයි. ඒ අය පළමුවෙනි match එකට නිව්යෝර්ක්වලට යන්නට පැය 8ක් airport එකේ රස්තියාදු වෙලා තිබෙනවා. ඒක නිසාම ඒ ගොල්ලන්ට practise match එකට සහභාගි වෙන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි, විශේෂයෙන්ම වනිදු හසරංග, ඒ වාගේම මහේෂ් තීක්ෂණ බොහොම පැහැදිලිව, - මේ අය පසුබෑමට හේතු දක්වනවා නොවෙයි. නමුත්, මම අහන්නේ මේ කාලසටහන - schedule එක - ගැනයි. අපේ රටේ ක්‍රිකට් බලධාරින්ට දැන් ICC එකත් එක්ක බොහොම ලස්සන සම්බන්ධතා තිබෙනවා නේ. ඇයි, මේ ශ්‍රී ලංකාවට විතරක් කුඩම්මාගේ සැලකිලි? පළමුවෙනි matches හතර venues හතරක දාලා තිබෙන්නේ ඇයි? විශේෂයෙන්ම මම මේ ගැනත් කියන්න කැමැතියි. තීක්ෂණ කියනවා, "So unfair for us. We have to leave every day because we are playing at four different venues" කියලා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

Matches හතර, හතර පොළක.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Matches හතර, හතර පොළක. මේක ලංකාවට විතරයි. තවදුරටත් කියනවා, "We took a flight from Miami and we had to wait eight hours in the airport to catch the flight" කියලා. ගරු අමාත්‍යතුමනි, මම අහන්නේ මේ කාලසටහන් පිළිබඳව, මේ වැඩ පිළිවෙළ පිළිබඳව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයත්, ක්‍රීඩා අමාත්‍යාංශයත් - ක්‍රිකට් ක්‍රීඩාව මේ අමාත්‍යාංශය යටතට එන්නේ - ඇත්ත වශයෙන්ම සොයා බැලුවේ නැද්ද? මේ schedulings ගැන සොයා බැලුවේ නැද්ද? අපේ ක්‍රිකට් කණ්ඩායම ගිහිල්ලා ඉන්න hotels ගැන බැලුවේ නැද්ද? ඒ අයට practise කරන්නට නැහැ, ඒ අයට පහසුකම් ටික නැහැ. කිසිම international team එකකට නැති කුඩම්මාගේ සැලකිල්ලක් ICC එකෙන් ඒ අයට ලැබෙනවා. මේ පිළිබඳවත් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. කරුණාකරලා රජයේ අවධානය යොමු කරලා මේ cricketersලාට ලබා දිය යුතු පහසුකම් ටික ලබා දෙන්න. පරංගියා කෝච්චේ ගියා වාගේ schedules හදලා ඒ අයගෙන් අපට ජයග්‍රහණය බලාපොරොත්තු වෙන්න පුළුවන්ද? Practise කරන්නත් බැරි නම්, ඒ අය මහන්සියට ලක් වෙනවා නම්, fatigued නම්, ඇත්ත වශයෙන්ම ඒ ගොල්ලන්ගේ output එකේ අඩුවක් සිදු වෙනවා. මම ඒ අයගේ පසුබෑමට හේතු දක්වනවා නොවෙයි. නමුත්, scheduling පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, practise කිරීමේ ප්‍රශ්නයක් තිබෙනවා. ඔක්කොටම ඉස්සෙල්ලා

ඉන්න hotel එක තිබෙන්න ඕනෑ, ඒ cricket match එක ගහන ground එකට විනාඩි 45කට මෙහා කාලයකින් යන්න පුළුවන් වන විධියට. නමුත්, මේක තිබුණේ පැය එකහමාරක පමණ කාලයකින් යන්න පුළුවන් ස්ථානයක. ඒ නිසා කරුණාකරලා මේ කරුණු-කාරණා පිළිබඳව අවධානය යොමු කරලා, මේකට නිසි පියවර ගන්න කියලා බොහොම ගෞරවයෙන් මම ඉල්ලීමක් කරනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා අසන ලද පළමු ප්‍රශ්නය වූයේ මියන්මාරයට සහ රුසියාවට සිවිල් රැකියාවලට යැයි පවසා යවන ලද පිරිස්වලට යුද්ධය තත්ත්වයන්වලට මුහුණදීමට සිදු වුණාය කියන කාරණය. මේ පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය මැදිහත් වෙලා, ගිය සතියේ දී රුසියානු තානාපතිතුමා සමඟත් ප්‍රවෘත්ති සාකච්ඡාවක් පැවැත්වූවා මම දැක්කා.

ඒ අනුව තීන්දුවක් අරගෙන තිබෙන බව මාධ්‍ය වාර්තා මඟින් මම දැක්කා. ඒ තීන්දුව තමයි, කවුරුන් හෝ ලංකාවෙන් වීසා ලබාගෙන රුසියාවට යනවා නම්, ඔවුන් ආරක්ෂක හමුදාවල හිටපු සාමාජිකයන් නම් අනිවාර්යයෙන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඒ පිළිබඳ තොරතුරු ලබාගෙන එකඟතාව ලබාගන්න ඕනෑය කියන එක. ඒ අනුව මින් මතුවට රුසියාවට යන ප්‍රශ්නය එතැනින් නවත්වලා තිබෙනවා. අනෙක් කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් කටයුතු කරගෙන යනවා. දැනට අපේ විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමතිතුමා සහ ආරක්ෂක ලේකම්තුමා ඇතුළු කණ්ඩායමක් රුසියාවට යවලා මේ පිළිබඳව සියලු තොරතුරු අරගෙන ඒ අවශ්‍ය සහනය සලසා දෙන්නට අපි බලාපොරොත්තු වෙනවා.

මියන්මාරය සම්බන්ධයෙනුත් ඒ තත්ත්වයම අපි දැක්කා. ඒ රටේ ඉන්න අපේ තානාපතිතුමා ඒකට සම්බන්ධ වෙලා යම් කණ්ඩායමක් ගෙන්වන්න කටයුතු කළා. තවත් කටයුතු රාශියක් මේ වෙලාවේ කරගෙන යනවා. ඒ නිසා දැනට ඒ සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයත්, අනෙක් පැත්තෙන් හමුදා සෙබළුන් සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයත් එක්ව කටයුතු කරගෙන යනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ආණ්ඩුවෙන් කණ්ඩායමක් යනවා කිව්වාට තවම ගිහිල්ලා නැහැ කියලායි මම හිතන්නේ. ආණ්ඩුවෙන් කණ්ඩායමක් යනවා කිව්වා නේ. නමුත් තවම ගිහිල්ලා නැහැ. අපේ කණ්ඩායම ගියා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔබතුමන්ලාගේ කණ්ඩායමට ඉක්මනට යන්න පුළුවන්. ඒ ගොල්ලෝ කැමැතිත් ඇති ඉක්මනට රුසියාවට යන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

අපේ කණ්ඩායම ගියා. ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා, සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා, වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා ඇතුළු අපේ team එක ගියා. නමුත් ආණ්ඩුවේ team එක ගියේ නැහැ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔබතුමන්ලාගේ කණ්ඩායම කැමැත්තෙන් යනවා ඇති.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

මට මතකයි, රුසියාවේ හිටපු ශ්‍රී ලංකා තානාපතිවරයෙක් කියලා තිබුණු දෙයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය බෙරාගන්න තිරය පිටුපස - behind-the-scene - වැඩ හුඟක් කරන්න තිබෙනවා. රුසියාවේ හිටපු ශ්‍රී ලංකා තානාපතිට contacts තිබෙනවා; he has contacts. එතුමා කියලා තිබුණා, "මා යැව්වා නම් කට්ටිය ගේනවා" කියලා. නමුත් එතුමාවත් යවලා නැහැ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඉස්සෙල්ලා එතුමාට කියන්න, ඒ හැංගිච්ච තැනින් එළියට එන්න කියලා. අවුරුදු 2ක් එතුමා හැංගිලා නේ හිටියේ. ඒ මොකද කියලාත් එතුමාගෙන් අහන්නකෝ. ඔය ලොකු කථා කියන්නේ නැතුව, ඔය පුළුවන්කම් ඔක්කෝම තියෙද්දි එතුමා අවුරුදු දෙකක් නිස්සේ හැංගිලා හිටියේ ඇයි කියලා කියන්න.

ඒ කෙසේ වෙතත්, ඔබතුමන්ලාට ලොකු වැඩ කොටසක් තිබෙනවා, ඉස්සරහට මේ සම්බන්ධයෙනුත් කරන්න. *[බාධා කිරීමක්]* නිකම් අවුට් වුණාට හරියන්නේ නැහැ. නිකම් අවුට් වෙලා බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අවසන් කරන්න, ගරු ඇමතිතුමනි. පිළිතුරු දීලා අවසන් කරන්න. විවාදය පටන් ගන්න තමයි පරක්කු වෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

මම ගරු සභානායකතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභානායකතුමනි, ඔබතුමාම දැන් කිව්වා අපට ඉස්සරහට ලොකු වැඩ කොටසක් කරන්න තිබෙනවා කියලා. ඒක ඉතා වැදගත් ප්‍රකාශයක්. ඒකෙන්ම පිළිගෙන තිබෙනවා, අපේ අනාගත වගකීම්. මම ඔබතුමාට ආරාධනා කරනවා, ඒ වගකීම්වලින් කොටසකුත් භාරගන්න එන්න කියලා.

ඒක නොවෙයි, ගරු සභානායකතුමනි. මේක සංකීර්ණ ප්‍රශ්නයක්, මානුෂීය ප්‍රශ්නයක්, සංවේදී ප්‍රශ්නයක්, පවුල් පිළිබඳ ප්‍රශ්නයක්. රුසියාවට ගිය මේ කට්ටිය වැරදි මාර්ගයේ ගියාය කියන කාරණා ගැන අපට ඕනෑතරම් හොයන්න පුළුවන්, ඕනෑතරම් කියන්න පුළුවන්. නමුත් ඔවුන් ගියේ නැතිබැරිකමට නේ. එහෙම නැතුව මොළේ අමාරුවක් තියාගෙන නොවෙයි නේ. කෑම ටික කන්න නැතිව, කෑම වේල් තුන පිරිමහගන්න බැරිව ඒ මිනිස්සුන්ගේ පවුල්වල තිබෙන නැතිබැරිකම නිසා නේ රුසියාවට ගියේ. කොහොමහරි ඒ ගොල්ලෝ ගියාට පස්සේ අපට මේ පිළිබඳව රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීමක් අවශ්‍ය වෙනවා. ඒ වාගේම මේ ප්‍රශ්නයට විසඳුම් අවශ්‍යයි. මම මේ කාරණය දේශපාලනීකරණය කරන්න හදනවා නොවෙයි. නමුත් මේකට විසඳුම් අවශ්‍යයි. අපේ මන්ත්‍රී කණ්ඩායමකුත් අපි රුසියාවට

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

යැව්වේ ඒ නිසායි. අපි ඇත්ත කථා කරන්න ඕනෑ. රජය මේ කාරණය කොච්චර මතු කළත්, රාජ්‍යය පාර්ශ්වයෙන් මේකට දක්වපු ප්‍රතිචාරය ගැන අපි සතුටු වෙන්නේ නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් මැදිහත්වීමක් අවශ්‍යයි, ගරු අමාත්‍යතුමනි. ඔබතුමා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න. මේ ක්‍රිකට් ප්‍රශ්නය ගැනත්, රුසියා-මියන්මාර ප්‍රශ්නය ගැනත් තොරතුරු ලබාගෙන පුළුවන් නම් අපට හෙට උදේට උත්තරයක් ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මොකද, ඒක බරපතළ මානුෂීය ප්‍රශ්නයක්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා දෙවැනි ප්‍රශ්නය විධියට ක්‍රිකට් කණ්ඩායම ගැන ඇහුවා. ඒ ගැන පළවුණු මාධ්‍ය වාර්තාත් මම දැක්කා. අපි ක්‍රීඩා අමාත්‍යාංශයට දැනුම් දීලා ඒකට හෙට පිළිතුරක් ලබා දෙන්නම්.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ බරපතළ ගැටලු සඳහා ස්ථිර විසඳුම්
கல்வித்துறையிலுள்ள சிக்கலான பிரச்சினைகளுக்கு நிரந்தரத் தீர்வுகள்
PERMANENT SOLUTIONS TO CRITICAL PROBLEMS IN THE EDUCATION SECTOR

[අ.භා. 12.08]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"මෙරට නිදහස් අධ්‍යාපනය විවිධ හේතූන් මත පසුගිය කාලයේ අන් කවරදාකටත් වඩා අර්බුදයකට ලක් විය. කොවිඩ් වසංගතයත්, ආර්ථික අර්බුදයත් සමඟ බිඳ වැටුණු අධ්‍යාපනයේ සමතුලිතතාව තවමත් නිසි පරිදි යථා තත්ත්වයට පත්ව නැත.

මේ හරහා සම්පත් බෙදී යෑමේ විෂමතාවක් මතු වූ අතර එය මානව හා භෞතික සම්පත් ලෙස දක්නට ලැබිණි. නිසි කාල සටහනකට අනුව ජාතික විභාග පවත්වා ගැනීමට අපොහොසත් වීම හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යෑමට නොහැකි වීම මේ වන විට බරපතළ ගැටලුවක් බවට පත්ව ඇත.

පාසල් පද්ධතිය තුළ පවතින ගුරු හිඟය හේතුවෙන් දුෂ්කර පළාත්වල දරුවන් මේ වන විට අසරණ තත්ත්වයකට පත්ව ඇත. තවද, පාසල්වල පවතින භෞතික සම්පත් හිඟය හා දිවා ආහාරය වැනි ශිෂ්‍ය සුබසාධන කටයුතු පූර්ණ ධාරිතාවකින් පවත්වාගෙන යෑමට අපොහොසත් වීම අධ්‍යාපන ක්ෂේත්‍රය මේ වන විට මුහුණ දී ඇති තවත් අර්බුදයකි.

අධ්‍යාපන පරිපාලන සේවය, ගුරු අධ්‍යාපනඥ සේවය, විදුහල්පති සේවය, ගුරු උපදේශන සේවය, ගුරු සේවය සහ අනධ්‍යාපන සේවාවන්හි වැටුප් ගැටලු මෙන්ම ව්‍යක්තීය ගැටලු ද වාර්තා වේ. මේ වන විටත් අනධ්‍යාපන සේවක වර්ජනය හේතුවෙන් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය අකර්මණ්‍ය වී ඇති අතර වැටුප් විෂමතාව මුල් කර ගනිමින් ගුරුවරුන් ද යළි ව්‍යක්තීය ක්‍රියාමාර්ගයකට යොමුව ඇත. එබැවින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින මෙම ගැටලු හදුනාගෙන ඒ සඳහා ස්ථිර විසඳුම් ලබා දීමටත්, එමඟින් දරුවන්ට සාර්ථක අධ්‍යාපනයක් ලබා දීමට රජයට මැදිහත් වන ලෙසත් මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, B.B. King කියනවා, "The beautiful thing about learning is that no one can take it away from you" කියලා.

"ඉගෙනුම සම්බන්ධව අලංකාරවත්ම දෙය වනුයේ, එය කිසිවකුට උදුරාගත නොහැකි වීමයි".

මේකම වදන් කවි පොතේ මෙහෙම කියනවා:

"තිබූ නැනක සොර සතුරන් ගත නොහෙ නා
එ සැඩ මනා වත් වතුරෙන් වල නො හෙ නා
කෝප වුවත් රජ මැතිඳුන් ගත නො හෙ නා
උගත මනා ශිල්පයමයි මතු රැකෙ නා"

නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ කෝප වෙච්ච රජ මැතිඳුන් සහ උසස් නිලධාරීන් වැටත්, නියරත්, ගොයම කාපු හින්දා අද මේ රටේ අධ්‍යාපනය තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ලොකු අර්බුදයකට වැටිලා තිබීමයි. අද ඒවා බිඳ වැටිලා ගිහින් තිබෙන නිසා ඒ සම්බන්ධයෙන් කථා කරන්න සිදු වීම සතුටට කරුණක් හැටියට මා දකින්නේ නැහැ. මොකද, රටක ජීවනාලිය, එහෙම නැත්නම් හෙට දවස අපි භාර දෙන්න ඉන්නේ මේ රටේ දරු පරම්පරාවටයි. ගරු අධ්‍යාපන ඇමතිතුමා දන්නවා, අද පවතින අධ්‍යාපන ක්‍රමයෙන් දරුවාට වැඩකුත් නැහැ, රටට වැඩකුත් නැහැ, ලෝකයට වැඩකුත් නැහැ කියලා. මොකද, එහෙම වැඩක් තිබෙනවා නම් දරුවන් මේ තරම් මානසික පීඩාවකට පත් වෙන්නේ නැහැ. අපේ අධ්‍යාපන ක්‍රමය හොඳ තත්ත්වයක තිබෙනවා නම්, අවුරුදු 13ක් පාසල් ගිහිල්ලාත් රැකියාවක් නැතිව දරුවන් බෝක්කු උඩ රස්තියාදු වෙන්නේ නැහැ. අද තරුණ තරුණියන්ට විශ්වවිද්‍යාලයකට ගිහින් උපාධියක් අරගෙන ඇවිල්ලා රස්සාවක් සොයාගන්න බැරිවෙලා තිබෙනවා. ඒ උපාධියෙන් ලෝකයේ වෙනත් රටක තියා ලංකාවේ ආයතනයකටවත් රස්සාවකට යන්න බැරිවෙලා තිබෙනවා. මෙන්න මේ ගැටලු ගැන අද අපට කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා, මේ නොගැළපෙන අධ්‍යාපන ක්‍රමය නිසා.

අපි දන්නවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙනවා කියලා දැන් සෑහෙන කාලයක් ඉඳන් කථා කරන බව. ඒකට බාලගිරි දෝෂය; අද නොවේ හෙට. ඇත්තටම මේ පවතින අධ්‍යාපන ක්‍රමය තුළ තිබෙන තරගය, එහෙම නැත්නම් ළඟ ඉන්න එකාත් පරදා යෑම දකින්න ලැබෙනවා. මොකද, අද දෙමව්පියනුත් දරුවන්ට

කියන්නේ මොකක්ද? පුංචිඅම්මාගේ පුතාට වඩා හොඳට විභාගය කරපන්, අල්ලපු ගෙදර එකාට වඩා හොඳට විභාගය කරපන්, නැත්නම් ගෙදර එන්න එපා කියලායි අද දෙමව්පියන් දරුවන්ට කියන්නේ. මෙන්න මෙවැනි තත්ත්වයක පවතින අධ්‍යාපන ක්‍රමයක් තමයි අපට තිබෙන්නේ. අද මනෝ වෛද්‍යවරු, මනෝ උපදේශකවරු අපට කියන දේ තමයි, ඔවුන්ගෙන් සහන ලබාගන්න, බෙහෙත් කරගන්න ඔවුන් ළඟට වෙනදාට වඩා වැඩි දරු පිරිසක් දැන් එනවාය කියන එක. මේ අධ්‍යාපන ක්‍රමය තුළින් මේ රටේ දරුවන් මානසික ලෙඩඩු බවට නම් පත් කරන්නේ, මේ අධ්‍යාපන ක්‍රමය අපට ගැළපෙන්නේ කොහොමද කියලා අපට අහන්න වෙනවා. මේ අධ්‍යාපන ක්‍රමය ඇතුළේම සාරධර්ම පද්ධතිය බිඳ වැටිලා ගිහිල්ලා, සාරධර්ම නොහඳුනන දරු පරම්පරාවක් එළියට ඇවිල්ලා තිබෙනවා සහ එළියට එනවා. ඒ වාගේම, මේ අධ්‍යාපන ක්‍රමය ඇතුළේ ආකල්ප කුණු වුණු සමාජයකට මේ දරුවන් යවන්න හදනවා. ලෝකයේ අනෙක් රටවල ප්‍රාථමික අධ්‍යාපනය ලබා දෙන්නේ කොහොමද, ද්විතීයික අධ්‍යාපනය ලබා දෙන්නේ කොහොමද, කුසලතාවට - skill එකට - තැනක් දීලා අධ්‍යාපන ක්‍රමය සකස් වෙන්නේ කොහොමද කියන එකට ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. පාසල් අධ්‍යාපනයෙන් හොඳ ශිෂ්‍යයෙක් එළියට දෙන්නේ කොහොමද කියලා ඕනෑ තරම් උදාහරණ අපට ගන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියනවා, පහ වසර ශිෂ්‍යත්වය මේ රටේ දරුවන්ට දෙන පීඩනය අයින් කරන්න, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළේ හෝ මේ අවුරුදු 10ක දරුවාට දෙන පීඩනය අයින් කරන්න ඔබතුමා මැදිහත් වෙන්න කියලා. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ශිෂ්‍යත්ව ක්‍රමය ගෙනාවේ බුද්ධි ඵලය 115ට වැඩි දරුවන් තෝරාගෙන ඔවුන්ට ඉගෙනුම් අවස්ථා ලබා දෙන්නයි. නමුත්, අද පහ වසර ශිෂ්‍යත්වය විභාගය දරුවාට පාසලක් සොයාගන්න විභාගයක් බවට පත් වෙලා තිබෙනවා.

ඒ නිසා ළඟ තිබෙන පාසලට වඩා දුර තිබෙන පාසලට, නම තිබෙන පාසලට දරුවා යවන තැනට මේ අධ්‍යාපන ක්‍රමය සැකසී තිබෙනවා. ඒකට හේතුවක් තිබෙනවා. අපට දෙමව්පියන්ට කියන්න බැහැ, ළඟ තිබෙන පාසලේ දරුවා තබාගන්න කියලා. ඒ ඇයි? අර දුරින් තිබෙන පාසලේ, එහෙම නැත්නම් නම තිබෙන පාසලේ තිබෙන සම්පත් ටික ළඟ තිබෙන පාසලේ ඉගෙනුම ලබන දරුවාට ලැබෙන්නේ නැහැ. ඒ වාගේම ඒ පාසලට අවශ්‍ය ගුරුවරුත් නැහැ. මෙන්න මේ වාගේ හේතු නිසා දරුවන් ඒ පාසල්වල තබාගන්න කියලා දෙමව්පියන්ට කියන්න බැරිකමක් අපට තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මම නැවත වතාවක් එනවා, ඔබතුමා ඉදිරිපත් කර තිබෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට. විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ කමිටුවෙන් ඊට අදාළ එක කොටසක් එවනවා. ඔබතුමාගේ කමිටුවෙන් තව එකක් කියා තිබෙනවා. හැබැයි, ඒ එකක්වත් ක්‍රියාත්මක වන තත්ත්වයක් අපට පෙනෙන්නේ නැහැ. ඒ තුළ අපේ දරුවන්ටත් වැඩක් නැති, රටේ ආර්ථික ප්‍රවර්ධනයට එකතු වෙන්නේත් නැති, ලෝකයටවත් ප්‍රයෝජනයක් නැති ශිෂ්‍යයෙක් මේ අධ්‍යාපන ක්‍රමයෙන් එළියට එනවා. අපි කෘත්‍රිම බුද්ධිය - artificial intelligence - ගැන කථා කරනවා. නමුත්, computer එකක් ඇහැට නොදැකපු දරුවන් සිටින පාසල් අදටත් අපේ රටේ තිබෙනවා. හැබැයි, විපක්ෂ නායකතුමා "සක්වල" වැඩසටහන යටතේ පාසල් දරුවන්ට කොම්පියුටර් ලබා දෙනකොට, ඇතැම් පක්ෂ නායකයන්ට ගාය හැදෙනවා. ඒවාට ඔවුන් කියනවා, "බෙදනවා" කියලා. මම උදාහරණයක් කියන්නම්. මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේ නාඋල අධ්‍යාපන කලාපයේ තිබෙන නිකුල විද්‍යාලයේ දරුවන්ට තොරතුරු තාක්ෂණය විෂයයක් වශයෙන් ඉගෙන ගන්න තිබෙනවා. හැබැයි, ඒ පාසලට කොම්පියුටර් එකක් නැහැ. එහෙම පාසල් තිබෙනවා. එහෙම නම් මේ රටේ සම්පත් බෙදී යෑමේ ලොකු ගැටලුවක් තිබෙනවා කියන එක මම ඔබතුමාට කියන්න ඕනෑ.

ඒ වාගේම මේ වෙනකොට දරුවන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් පවා නිසියාකාරව නැහැ. මේවා තමයි දරුවන්ට තිබෙන ප්‍රශ්න. මම ඊයේ-පෙරේදා දවසක ආඳාවල කියන ගමට ගියා. ඒ ගමට බස් එකක් යන්නේ නැහැ. ඒ ගමේ දරුවන් පාසලට යන්න කිලෝමීටර් දෙකක් පමණ පහළට පයින් එන්න ඕනෑ. ගල්බඩ කියන ගමේ ඉඳලාත් කිලෝමීටර් ගණනාවක් දරුවන් පාසලට යන්න පාරේ පයින් එන්න ඕනෑ. අවට තිබෙන්නේ අලි සිටින කැලය. මේ ගම්වල බස් ධාවනය වෙන්නේ නැහැ. ඇයි, පාරවල් හොඳ නැහැ. එහෙම නැත්නම් බස් නැහැ. ඩිපෝ අධිකාරිගෙන් ඇහුවාම කියනවා, රියදුරන් නැහැ කියලා. මම දන්නේ නැහැ, මේ සියලු ප්‍රශ්න විසඳා අවසන් වෙනකොට, දරුවන්ගේ අධ්‍යාපනයට මොනවා වෙයිද කියලා. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමාත් අධ්‍යාපන විෂයය පිළිබඳව වගකීම් දරපු කෙනෙක්. ඒ නිසා ප්‍රවාහනය සම්බන්ධයෙන් තිබෙන මේ ගැටලුවලට ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, අධ්‍යාපනික කටයුතුවලට අවශ්‍ය ද්‍රව්‍යවල මිල ගැනත් මේ වෙලාවේ මා සඳහන් කළ යුතුයි. ඒකත් එක හේතුවක් වෙලා තිබෙනවා, අද දරුවන්ට පාසල් හැර යෑමට. එම නිසා මම මූලික වශයෙන් දරුවන්ට තිබෙන ඒ ගැටලු ගැන ඔබතුමාට මතක් කරනවා, ගරු අධ්‍යාපන ඇමතිතුමනි. ඔබතුමා දන්නවා, හය වසරේ දරුවෙකුට අවශ්‍ය පොත් ටික අරගන්න අවුරුද්ද මුලදී රුපියල් 20,000ක්වත් ඕනෑ බව. එතකොට පවුලේ ආදායම ගැන සලකා බැලුවාම ඒ දරුවන්ගේ දෙමව්පියන්ට ඒ දරුවන් පාසලකට යවන්න පුළුවන් ද කියන ප්‍රශ්නයත් මතු වෙනවා. දරුවා පාසලකට යවනවාද, එහෙම නැත්නම් කන්න දෙනවාද කියන ප්‍රශ්නය අද දෙමව්පියන්ට මතු වෙනවා. පවුලක දරුවන් දෙදෙනෙක් ඉන්නවා නම්, කොයි දරුවාද පාසල් යවන්නේ කියන ප්‍රශ්නයත් අද ඔවුන්ට මතු වෙනවා. මෙන්න මෙවැනි තත්ත්වයක් අද වන විට පවතිනවා.

ඒ වාගේම ඔබතුමාට කියන්න ඕනෑ, ඉසුරුපායේ එහෙම නැත්නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ පවතින දුර්වලතා ගැනත්. එහි පවතින දුර්වලතාව සහ අකාර්යක්ෂමතාව හේතුකොටගෙන ඇති වුණු ප්‍රශ්න ගණනාවකුත් තිබෙනවා. ඒ පිළිබඳව ඉදිරියේදී විස්තර කිහිපයක් මම ඉදිරිපත් කරන්නම්. විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයට දත්ත පද්ධතියක් නැතිකම විශාල ගැටලුවක් වෙලා තිබෙනවා. පසුගිය දවසක පැවැති අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී, මේ රටේ ජාතික පාසල්වල ගුරුවරුන් කී දෙනෙක් ඉන්න ඕනෑද කියලා මම ඇහුවාම, ලේකම්තුමාටවත් ඒකට උත්තරයක් දෙන්න බැරි වුණා. ඒ වාගේම දැනට පවතින ගුරු නිහය කොච්චරද කියලා ඇහුවාම, ඒකටත් උත්තරයක් දෙන්න බැරි වුණා. අවුරුදු ගණනාවක් තිස්සේ කියනවා, ඒවාට database එකක් හදන්න කියලා. නමුත්, ඒ තත්ත්වය තවම ඇති වෙලා නැහැ. මේකට මෘදුකාංගයක් - software එකක් - හදන එක rocket science එකක් නොවෙයිනේ. අද විද්‍යාව ඒ තැනට ගිහින් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, අමාත්‍යාංශය ඇතුළේ තිබෙන නිලධාරිවාදය සහ අකාර්යක්ෂමතාව නැති කිරීමට අවශ්‍ය තීන්දු-තීරණ ඔබතුමා ගන්න ඕනෑ කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් එක්ක කථා කරලා ඇතැම් විසඳුම්වලට ආවත් ඒ ලේකම්තුමියලා, එහෙම නැත්නම් විෂයයට අදාළ නිලධාරීන් එළියට ඇවිත් කියනවා, ඇමතිතුමා නොවෙයි, කවුරු කිව්වත් ඔවුන් මේවා කරන්නේ නැහැ කියලා. එහෙම දෙයක් සිද්ධ වෙනවා නම්, මේ රටේ අධ්‍යාපනය හොඳ තැනකට ගෙනෙන්නේ කොහොමද කියන එක මම ඔබතුමාගෙන් අහනවා.

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින වෘත්තිකයන්, ඒ කියන්නේ යම් යම් සේවාවල නියුක්ත වූ පුද්ගලයන් ඉතාම අතෘප්තිමත් ඔවුන්ගේ සේවය පිළිබඳව. එහෙම අතෘප්තිමත් සේවයක ඉඳලා ඵලදායිතාවකින් යුතු අධ්‍යාපනයක් මේ රටේ දරුවන්ට ලබා දෙන්නේ කොහොමද කියලා මම ඔබතුමාගෙන් ප්‍රශ්න කරනවා.

ඒ වාගේම ඔබතුමා දන්නවා, ඉංග්‍රීසි ගුරුවරුන් 2,500ක් බඳවා ගන්න අවශ්‍ය සම්මුඛ පරීක්ෂණ පැවැත් වූ බව. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ඉගෙනුම ලබන දරුවන් ගණනාවක් ඒ සඳහා අයදුම් පත් ඉදිරිපත් කළා.

ඒ දරුවන්ගේ විභාග ප්‍රතිඵල ආවේ මැයි මාසයේ 31වැනි දා. හැබැයි, සම්මුඛ පරීක්ෂණයට අයදුම් කිරීම සඳහා අවසාන දිනය හැටියට නම් කර තිබුණේ මාර්තු 31වැනි දා. මේ අයගේ ප්‍රතිඵල නිකුත් කිරීම පරක්කු වෙන්න හේතු වුණේ ප්‍රායෝගික විභාගයේ ප්‍රතිඵල ඉක්මනින් දීපු නැති එකයි. මේ වෙනුවෙන් ඒ දරුවන්ට වන්දි ගෙවන්න සිදු වෙලා තිබෙනවා. මේ නිසා ඒ අයට මේ පත්වීම් ලබා දීම සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා.

ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉන්න ඇතැම් බහිරවයන් නිසා සිදු වුණු දෙයක් මම උදාහරණයක් වශයෙන් කියන්නම්. අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින්ට Super Grade එකට එන්න අවස්ථාව තිබුණා. නමුත්, පරක්කු කරලා, පරක්කු කරලා ඒ අය Super Grade එකට ගියාය කියන ලියුම ආවේ ඒ අය සේවයෙන් විශ්‍රාම ගියාට පසුවයි. මම ඒ සඳහාත් උදාහරණයක් කියන්නම්. මහනුවර හිටපු පළාත් අධ්‍යක්ෂතුමිය වන චම්පිකා මායාදුන්න වාගේම, අමාත්‍යාංශයේ හිටපු ගයාත්‍රි අබේගුණසේකර Super Grade එකට ගියාය කියන ලියුම ආවේ ඒ අය retire වුණාටත් පසුව. Super Grade කියන එක තමයි ගුරුවරයෙකුට යන්න පුළුවන් උපරිම තැන. එතැනට යන්න කාටත් හීනයක් තිබෙනවා. අමාත්‍යාංශය ඒකට ඒ විධියට වැට බඳිනවා නම් මම ඔබතුමාට කියනවා, ඒ සම්බන්ධයෙන් කටයුතු කරපු නිලධාරින් සම්බන්ධයෙන් විනය ක්‍රියා මාර්ග ගන්න කියලා.

ඊළඟ කාරණාව තමයි, සම්පත් බෙදී යෑමේ විෂමතාව. අපේ රටේ 40,000කට ආසන්න ප්‍රමාණයක ගුරු හිඟයක් තිබෙනවා. සංවර්ධන නිලධාරින් 22,000ක් ඉන්නවා. මම හිතන්නේ ඒකෙනුත් 16,000ක් විතර තමයි දැන් ඉන්නේ. ඒ උපාධිධාරින් මේ වෙනකොට ගුරු සේවයට බඳවා ගන්න කටයුතු කරනවාය කියනවා. හැබැයි, ඒ කටයුත්ත එක එක පළාතේ, එක එක විධියටයි කරන්නේ. බස්නාහිර පළාතේ එක විධියක්; ප්‍රතිඵල එන්නත් කලින් පත්වීම් ලබා දීලා තිබෙනවා. දකුණු පළාතේ අනුමත වෙච්ච ප්‍රමාණයට වඩා වැඩි පිරිසක් බඳවා ගන්න යනවා. ඒක හොඳයි. මධ්‍යම පළාත ගැන කිව්වොත්, මධ්‍යම පළාතේ අනුමත ගුරු මණ්ඩලය 33,028ක් විය යුතුයි. නමුත්, සිටින්නේ 26,694ක්. ඒවායේ පුරප්පාඩු තිබෙනවා. සංවර්ධන නිලධාරින්ගෙන් 2,078ක් ආවරණය වෙනවා. උපාධිධාරින් 341දෙනෙක් තමයි බඳවා ගන්න දැන් අනුමත කරලා තිබෙන්නේ. දෙවැනි අදියර යටතේ 378දෙනෙකු බඳවා ගන්නත් අනුමත කරලා තිබෙනවා. හැබැයි, පුරප්පාඩු තව 3,537ක් ඉතුරු වෙනවා. මම ඔබතුමාට යෝජනා කරනවා, මේ රටේ දරුවන්ට,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසානයි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අවශ්‍ය කාලය ලබා දෙන්න කියලා ගරු විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

රටේ හැමදෙනාම සම්බන්ධයෙන් එක තීරණයක් ගන්න. මම යෝජනා කරනවා, මධ්‍යම පළාතේ විභාගය සමත් උපාධිධාරින් සියලුදෙනාම සම්මුඛ පරීක්ෂණයට කැඳවලා, ඒ අයගෙන් සුදුසුකම් තිබෙන අය බඳවා ගන්න වාගේම, ඒ අයට ඉක්මනින් පුහුණුවක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

විශේෂයෙන්ම එක එක වෘත්තීන් ගැනත් මම කියන්නම්. විල්ගමුව අධ්‍යාපන කලාපය ගත්තොත්, 739දෙනෙක් අනුමතයි. නමුත්, අපට ගුරුවරු 269දෙනෙක් හිහයි. නාඋල අධ්‍යාපන කලාපයේ 167දෙනෙක් හිහයි. ගලේවෙල අධ්‍යාපන කලාපයේ 593දෙනෙක් ඉන්න ඕනෑ. නමුත් එතැනටත් 100කට වැඩි ප්‍රමාණයක් අවශ්‍යයි. ගැටලු තිබෙන සේවා කීපයක් තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට මේ කාරණයත් කියන්න කාලය ලබා දෙන්න. පරිපාලන සේවයේ මෙන්න මෙහෙම ගැටලුවක් තිබෙනවා. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගන්නා අවස්ථාවේදී වැටුප් සංශෝධන සිදු කරන දිනය පදනම් කරගෙන වැටුප් විෂමතාවක් ඇති වෙන බව පරිපාලන නිලධාරින් කියනවා. 2016දී පැවැති විභාගයෙන් බඳවා ගත් නිලධාරින්ට වැටුප් විෂමතාව වඩාත් බලපාන බව ඒ නිලධාරින්ගේ අදහස වෙලා තිබෙනවා. ඒ නිසා වැටුප් සම්බන්ධයෙන් පවතින ගැටලුව විසඳා දෙන්න, ඒ වාගේම, එතෙක් ඒ අයට දීමනාවක් ලබා දෙන්න කියාත් ඒ අය ඉල්ලනවා.

ඊළඟට ගුරු අධ්‍යාපනඥ සේවය සැලකිල්ලට ගත්තොත්, 2021 වසරේදී ගුරු-විදුහල්පති වැටුප් විෂමතාව සකස් කරනකොට අනිකුත් සේවා අමතක කරලා තමයි වැටුප් විෂමතාව දුරු කළේ. ඒ තුළින් ගුරු අධ්‍යාපනඥ සේවයට හිමි වැටුපේ වැඩිවීමක් සිදු වෙලා නැහැ. මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්. 2021.12.31 දින සිට 2022.01.01 දිනට වැටුපේ වෙනස බින්දුවයි. වැටුප වැඩි වෙලා නැහැ. ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියට හිමි වැටුප රුපියල් 76,175යි. 2022 වසරේදීත් වැටුප ඒකමයි. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, වැටුප් විෂමතාව ඉවත් කරන තුරු ඒ අයට දීමනාවක් දෙන්න කියලා මම කියනවා.

ඒ වාගේම ඒගොල්ලන්ගේ උසස්වීම් පිළිබඳව ගත්තොත්, අවුරුදු 30ක් ගත වුණත් අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට එන්න ඒ අයට ලොකු ගැටලුවක් තිබෙනවා. මෙන්න මේ ගැටලු පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා විසඳා දෙන්න. මොකද, අධ්‍යාපන පරිපාලන සේවයේ අයට මම හිතන්නේ ඒ කටයුත්ත නිසියාකාරයෙන් ක්‍රියාත්මක වෙනවා. ඔවුන් III ශ්‍රේණියේ සිට අවුරුදු 6කින් II ශ්‍රේණියට යනවා. II ශ්‍රේණියේ සිට අවුරුදු 6කින් I ශ්‍රේණියට යනවා. නමුත්, ගුරු අධ්‍යාපනඥ සේවයේ අයට ඒ තත්ත්වය මහ හැරිලා ගිහින් තිබෙනවා.

ඒ වාගේම විද්‍යා පීඨ ගත්තොත්, 2020, 2021, 2022, 2023 කියන වර්ෂ සඳහා කණ්ඩායම් බඳවා ගැනීමට තිබෙනවා.

මේ වෙනකොට 2020, 2021 වර්ෂ සඳහා සිසුන් බඳවා ගැනීමට අදාළ ගැසට් පත්‍රය ඔබතුමන්ලා නිකුත් කරලා තිබෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අඩු තරමින් විද්‍යාපීඨවලට තෝරාගත් සිසුන්ගේ නාම ලේඛනයවත් ඉදිරිපත් කරන්න කියලා. මොකද, එතකොට ඒ දරුවන්ට වෙනත් රැකියාවකට හරි යන්න පුළුවන්. 2022, 2023 වර්ෂ සඳහා සිසුන් බඳවා ගැනීම් සඳහාත් අදාළ ගැසට් පත්‍රය නිකුත් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, විද්‍යාපීඨවල සිටින සීමාවාසික දරුවන්ට රුපියල් 8,000ක දීමනාවක් ලබා දෙනවා. නමුත්, ඒ දීමනාව ප්‍රමාණවත් නැහැ කියලා මම හිතනවා. මොකද, සීමාවාසිකව ඉන්නකොට බෝඩිමක් සොයා ගන්න ඕනෑ, ගුරු උපකරණ හදන්න ඕනෑ, අධ්‍යාපන උපකරණ හදන්න ඕනෑ, visual aids හදන්න ඕනෑ. මේවාත් එක්ක ගත්තාම එම දීමනාව ඒ අයට මදි.

ඒ වාගේම තමයි පෝෂණ තත්ත්වය. දරුවෝ විතරක් නොවෙයි, විද්‍යාපීඨයෙන් එළියට එන ගුරු ශිෂ්‍යයාත්, ඒ කියන්නේ ගුරුවරයාත් මන්දපෝෂණයෙන් පෙළෙනවා, ගරු ඇමතිතුමනි. ඒ නිසා මම ඔබතුමාට කියනවා, ඒ අයට අවශ්‍ය පහසුකම් සලසා දෙන්න කියලා. මේ විද්‍යාපීඨ, විශ්වවිද්‍යාල බවට පත් කිරීම ගත්තොත්, අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු ගණනාවක් ඒ තුළින් විසඳාගන්න හැකි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුහල්පති සේවය ගත්තාම, එම සේවය හැර වෙනත් සේවාවක් නැහැ, උසස්වීමක් ලබා ගත්තාට පස්සේ වැටුප අඩු වන. මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II ශ්‍රේණියේ ඉඳලා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට යනකොට රුපියල් 76,720 ඉඳලා රුපියල් 74,845 දක්වා පඩිය අඩු වෙනවා. ඒ සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් ලිපිය සහ මට ඉදිරිපත් කර තිබෙන විදුහල්පති සේවයේ ගැටලු 36ක් ඇතුළත් ලේඛනයත් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

විශේෂයෙන්ම, ගුරු සේවයේ තනතුරට හිමි වැටුපට සාපේක්ෂව විදුහල්පති සේවයේ වැටුප වර්ධනය නොවීම පිළිබඳ කාරණයට ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඒ වාගේම වැටුප් වර්ධකය පිළිබඳවත් ගැටලුවක් තිබෙනවා. එම ගැටලුවත් විසඳා දෙන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, ඔබතුමාම තමයි වැඩබලන විදුහල්පතිවරු පත් කළේ කියන එක. මම දන්නේ නැහැ, පසුගිය කාලවල අධි සේවක ගණයේ විදුහල්පතිවරු පත් කරලා තිබෙනවා. අද ඒගොල්ලන් වළං කටු වාගේ. මැට්ටටත් නැහැ; වළඳටත් නැහැ. ගුරු සේවයේ ඉඳලා තමයි ඒ අයට විශ්‍රාම යන්න සිදු වෙලා තිබෙන්නේ. එවැනි තත්ත්වයක් අද ඒ අයට ඇති වෙලා තිබෙනවා. මට ලැබී තිබෙන්නේ සීමිත කාලයක් නිසා මේ සියලු ප්‍රශ්න ඉදිරිපත් කරන්න බැහැ. නමුත්, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, විදුහල්පති සේවය තුළ තිබෙන මේ ගැටලුව ගැන සොයා බලන්න කියලා. ඒ වාගේම ඒ අයට නිසි විධියට උසස්වීම් ලබා දෙන්න, වැටුප සකස් කරලා දෙන්න කියන ඉල්ලීමත් මම කරනවා.

ඒ වාගේම ගුරු උපදේශක සේවය සම්බන්ධයෙන් ඔබතුමා සමඟ සාකච්ඡා ගණනාවක් පැවැත්වුවා. තාක්ෂණික කමිටුව පත් කරන්න කිව්වා, බලහත්කාරයෙන් ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කරන එක නවත්වලා ඒ අයට ලිපියක් නිකුත් කරන්න කිව්වා. ඔබතුමාත් එක්ක ගරු විපක්ෂ නායකතුමාත්, මමත්, ඒ කණ්ඩායමත් සාකච්ඡාවක් පැවැත්වුවා. ඒ අවස්ථාවේදී ඔබතුමා ඒකට එකඟ වුණා. හැබැයි, කියන්න කනගාටුයි, අද වෙනකල් ඒ තත්ත්වය ඇති වෙලා නැහැ. මේවා කරන්න මුදල් වැය වෙන්නේ නැහැ. ඔබතුමා කිව්වා, විශ්‍රාම යනකොට ඒ අය හිටපු සේවයට ගළපා විශ්‍රාම වැටුප හදන්න කියලා. නමුත් මේ වෙනකොටත් ඒක ගළපන්නේ නැතිව හිටපු නිසා ඒ අය විශ්‍රාම ගිහිල්ලා තිබෙනවා.

ඊළඟට, වැටුප් වර්ධක නොගෙවීම සහ අධ්‍යයන තනතුරක් වූ ගුරු උපදේශකවරු, කලාප අධ්‍යාපන කාර්යාලවලට ගාල් කරලා කිසිදු නිශ්චිත රාජකාරියක් නොපවරා තිබීම නිසා ඔබතුමාට රුපියල් කෝටි ගණනක මුදලක් නාස්ති වෙනවා කියා මම හිතනවා. මම එහෙම කියන්නේ ගුරු උපදේශකවරයා කරන්න ඕනෑ කාර්යය විෂය අධ්‍යක්ෂක කරන්න යන නිසායි.

ඊළඟට, ගුරු සේවය ගත්තොත්, 02/97 චක්‍රලේඛයෙන් සිදු වුණු අසාධාරණය මත ගුරුවරයාට ලැබිය යුතු වැටුප් වර්ධකයෙන් තුනෙන් එකයි දුන්නේ. තව තුනෙන් දෙකක් දෙන්න තිබෙනවා. ඔබතුමන්ලා ඒ සඳහා එක එක හේතු කියනවා. ඔබතුමාගේ අතිරේක ලේකම්තුමිය කියනවා, වැටුප් විෂමතාවක් නැහැ කියලා. ඇතැම් ගුරු සංගම් සහ ඇතැම් දේශපාලන පක්ෂ මේ ප්‍රශ්නය හිහන්නාගේ තුවාලය කරගෙන තිබෙනවා. මේකෙන් පීඩා විඳින්නේ මේ රටේ දරු පරම්පරාව. එම නිසා මම ඔබතුමාට කියනවා, මේ ප්‍රශ්නය තවදුරටත් හිහන්නාගේ තුවාලය කර ගන්න කාටවත් අවස්ථාව දෙන්න එපා කියලා. ඒ වාගේම අපේ ගුරුවරු අභිකුණ්ටකයාගේ රිළවා වාගේ වෙලා ඉන්නවා. බඩ පිනුමක් ගහන්න කියනකොට බඩ පිනුමක් ගහන්න ඕනෑ; උඩ පිනුමක් ගහන්න කියනකොට උඩ පිනුමක් ගහන්න ඕනෑ; නැන්දම්මලාගේ ගෙදර ගිහිල්ලා එන්න කිව්වාම කෝටුව කරේ තියාගෙන ඇවිදලා එන්න ඕනෑ. ගුරු සංගම් හා ඇතැම් දේශපාලන පක්ෂ විසින් ගුරුවරයා අද ඒ වාගේ තැනකට පත් කරලා තිබෙනවා. එම නිසා ගුරුවරයාගේ අභිමානය තියාගෙන දරුවෝ ඉස්සරහට ගිහිල්ලා නම්බුවක් ඇතුව උගන්වන්න පුළුවන් විධියට වැඩ කටයුතු කරලා දෙන්න. ගුරුවරයා කියන කෙනා ලස්සනට, පිළිවෙළට ඇඳලා යන්න ඕනෑ. නමුත් අද පවතින උද්ධමනය තුළ ඇඳුමක් ගන්න පුළුවන්ද? ඒ අයගේ ප්‍රවාහන පහසුකම් සලසා ගන්න ගමන් දරුවන්ගේ හැම දෙයක් ගැනම බලන්නත් ඕනෑ.

ඒ වාගේම ගුරු මාරු ප්‍රතිපත්තියක් නැහැ. ඒ නිසා දේශපාලනඥයන්ගේ පස්සේ යන්න සිදු වෙලා තිබෙනවා; කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක ෂේප් එකේ තියාගන්න සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම ප්‍රින්සිපල් ෂේප් එකේ තියාගන්නත් සිදු වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි.

යහ පාලන රජය කාලයේ අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් අපි නිශ්චිත ගුරු මාරු ප්‍රතිපත්තියක් හැදුවා. ඒක දීලා තිබෙනවා අධ්‍යාපන අමාත්‍යාංශයට. ලේකම් විධියට රණසිංහ මහත්මයා ඉන්නකොට මම ගිහිල්ලා කථා කළා. එතුමා අදාළ නිලධාරියා කැඳවලා ඇහුවා, පාර්ලිමේන්තුව අනුමත කරපු ගුරු මාරු ප්‍රතිපත්තියක් තිබෙනවාද කියලා. ඒ නිලධාරියා කිව්වා, "ඔව්, තිබෙනවා. අපි ඒක සංශෝධනය කරනවා පාර්ලිමේන්තුවේ අනුමැතියට" කියලා. ලේකම්තුමා කිව්වා, පාර්ලිමේන්තුව අනුමත කරලා තිබෙනවා නම් ඒක ක්‍රියාත්මක කරන්න කියලා. දැන් ඒ ලේකම්වරයා නැහැ. ඊට පස්සේ ලේකම්වරියෝ දෙදෙනෙක් ආවා. හිසේ කැක්කුමට කොට්ටේ මාරු කරනවා වාගේ ලේකම්වරු මාරු කළාය කියලා අධ්‍යාපනයේ තිබෙන ගැටලු විසඳෙන්නේ නැහැ, ගරු ඇමතිතුමනි.

ඊළඟට පිරිවෙන් ගුරුවරු ගැන කථා කරන්න ඕනෑ. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට රජයේ ගුරුවරයාගෙන් සියයට 8ක් කපනවා. පිරිවෙන් ගුරුවරයාගෙන් සියයට 14ක් කපනවා. ඒක සියයට 8 දක්වා අඩු කරලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම විශ්‍රාම පූර්ව නිවාඩුව පාසල් ගුරුවරයාට ලැබුණත් පිරිවෙන් ගුරුවරයාට ලැබෙන්නේ නැහැ. අධ්‍යාපන සුදුසුකම් සමාන වුණත්, සමාන ශ්‍රේණි පැවතුණත් මාරුවීම් ක්‍රමයක් නැති නිසා පිරිවෙන් ගුරුවරයා පීඩාවට පත් වෙනවා.

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

අග්‍රහාර රක්ෂණ ක්‍රමය ගත්තොත්, විශ්‍රාම ගියත් රජයේ ගුරුවරයාට අග්‍රහාර රක්ෂණයේ ප්‍රතිලාභ ලැබෙනවා. නමුත්, පිරිවෙන් ගුරුවරයාට ලැබෙන්නේ නැහැ. ඒ වාගේ ගැටලු ගණනාවක් තිබෙනවා. අනධ්‍යයන කාර්ය මණ්ඩලය ගැනත් කථා කළ යුතුයි. විශේෂයෙන්ම පාසල් ක්‍රීඩා පුහුණුකරුවෝ ගැන ඊයේත් කථා කළා. ගරු ඇමතිතුමනි, මට ඔබතුමාට එක දෙයක් කියන්න ඕනෑ. ඒ අය ස්ථිර කරලා දෙන්න. ඔබතුමා කියනවා, අනධ්‍යයන විධියට බඳවා ගත් නිසා අධ්‍යයන කටයුත්තකට යොමු කරන්න, අන්තර්ග්‍රහණය කරන්න බැහැ කියලා. ඒක වෙන්න පුළුවන්, බඳවා ගැනීමේ පටිපාටිය ඇතුළේ. හැබැයි, මම ඔබතුමාට එක දෙයක් කියනවා. මේ අය තමයි සමස්ත ලංකා ගිහිල්ලා පදක්කම් දිනා ගත්ත අය. එහෙම නැත්නම් ශාරීරික අධ්‍යාපනය ප්‍රායෝගිකව කරලා සුදුසුකම් ලැබූ අය.

මම ගුරුවරියක හැටියට විහාර මහා දේවි බාලිකා විද්‍යාලයේ වැඩ කරනකොට ඒ විද්‍යාලයේ සෆියා යමීන් කියලා ගැහැනු ළමයෙක් හිටියා. ඒ ගැහැනු ළමයා හැමදාම periods දෙකක් ඉවර වුණාට පස්සේ තමයි පන්තියට එන්නේ. ඒ ඇයි? ඒ දරුවා උදේට practisesවලට යනවා. ඒ දරුවා සමස්ත ලංකා පදක්කම් දිනාගත් කෙනෙක්. ජාත්‍යන්තර තරගවලටත් යනවා. ඒ දරුවා අධ්‍යාපන කටයුතු, සමාන්‍ය පෙළ විභාගය කර ගන්න කරපු අරගළය මම දැක්කා. ක්‍රීඩාවේ යෙදුණු අයට උසස් රැකියාවකට එන්න ගැටලුවක් තිබෙනවා, හමුදාවේ නැත්නම් ඒ වාගේ එකක නැතිව. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, ඒගොල්ලෝ කඩඉම් විභාග කරගෙන තිබෙනවා නම්, ඒ අයට උසස්වීම් ලබා දෙන ක්‍රමයක් තිබෙනවා නම් උසස්වීම් ලබා දෙන්න කියලා. මොකද, අර මම කියපු කාරණය නිසා. ඒ වාගේම අනධ්‍යයන කාර්ය මණ්ඩලය ගත්තාම පාසල් කාර්ය සහායකයන්ට උසස්වීම් ලබා ගන්න ක්‍රමයක් නැහැ, විධිමත් මාරුවීම් ක්‍රමයක් නැහැ, නිල ඇඳුමක් නැහැ, නිල ඇඳුම් දීමනාවක් නැහැ, නිසි duty list එකක් නැහැ. ඒ වාගේ ගැටලු තිබෙනවා. සංවර්ධන නිලධාරීන්ගේ ගැටලුවට නඩුවක් තිබෙනවා කියලා ඔබතුමා දන්නවා, ගරු ඇමතිතුමනි. ඒ නිසා පාර්ලිමේන්තුවේදීත් ඒ ගැන කථා කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ රටේ දරුවන්ගේ නාමයෙන් මම ඉල්ලා සිටිනවා, සංවර්ධන නිලධාරීන්ගේ ගැටලුව විසඳලා ඒ අය හැකි ඉක්මනින් අධ්‍යාපනය සේවයට අන්තර්ග්‍රහණය කරන්න කටයුතු කරන්න කියලා.

පාසල් මුරකරුවන්ටත් අර කියපු ගැටලු ටික තිබෙනවා. ඒ අයගේ තනතුරු නාමය වෙනස් කරලා දෙන්න. මුරකරු කිව්වාම ඒ අයට පොඩි පිළිගැනීමක්වත් නැහැ. ඒ නිසා ඒ අය "පාසල් ආරක්ෂක නිලධාරීන්" හැටියට නම් කරන්න කියලා මම යෝජනා කරනවා. ඒ වාගේම ඔවුන් රාත්‍රී කාලයේත් සේවයේ යෙදෙන නිසා ඒ අයට රාජකාරී හැඳුනුම්පතක් ලබා දෙන්න කියලාත්, අවදානම් දීමනාවක් ලබා දෙන්න කියලාත් යෝජනා කරනවා.

ඒ වාගේම තමයි පුස්තකාල සහායක තනතුර. 2015, 2016, 2017 කියන වර්ෂවලදී අධ්‍යාපන අමාත්‍යාංශය මේ අයට කම්කරු පත්වීම් ලබා දුන්නා. ඔබතුමා ඒක දන්නවා. 2019 දී සම්මුඛ පරීක්ෂණයක් පවත්වලා ඒ අය පුස්තකාල සහායක තනතුරට අන්තර්ග්‍රහණය කළා. හැබැයි, මේ වෙනකොට අවුරුදු 05ක් ගතවෙලා තිබුණත් තවම ඒ අය ස්ථිර කරලා නැහැ. 2024.01.08 වැනි දා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත වතාවක් ඒගොල්ලන් අර කම්කරු තනතුරටම පත් කරලා තිබෙනවා. මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමිය.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම අවසන් කරනවා.

රැකියා ලක්ෂය වැඩසටහන යටතේ බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකායට ගත්ත අට පාස් අය මේ අයට උඩින් - මේ අය සුදුසුකම් තිබෙන අය - පුස්තකාල සහායක හැටියට පත් කරලා තිබෙනවා. එහෙම දේවල් සිද්ධ වෙනවා කියලා ඔවුන් අපට කියනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන හොයලා බලන්න. එහෙම දෙයක් සිදුවෙලා තිබෙනවා නම් ඒකට නිසි විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන්න.

තව එක කාරණයක් කියලා මම කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊයේත් මේ කාරණය කථා කළා. විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවක ගැටලුව නිසා අද විශ්වවිද්‍යාල වසා දමන්න සිද්ධ වෙලා තිබෙනවා. එහිදී ඔබතුමන්ලා කිව්ව කාරණාවට එහා ගිහිල්ලා, රාජ්‍ය පද්ධතියේ ආයතන වර්ගීකරණය කරනකොට, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 6/2016 දරන චක්‍රලේඛයට අනුව, සාමාන්‍යයෙන් වැටුප් සම්බන්ධයෙන් චක්‍රලේඛ තුනක් ඉදිරිපත් කරනවා. ඒ අනුව රාජ්‍ය සේවය, අර්ධ රාජ්‍ය සේවය සහ ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය සතු සමාගම් හා විශ්වවිද්‍යාල සේවය පදනම් කරගෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක් නිකුත් වෙනවා. ඒ වාගේම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයක් නිකුත් වෙනවා. ඒ වාගේම, 4/2016 කියලා කළමනාකරණ සේවා චක්‍රලේඛයක් නිකුත් වෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමා ප්‍රකාශ කරපු ආකාරයට 4/2016(1) චක්‍රලේඛයෙන් විශ්වවිද්‍යාල පද්ධතියට කරපු වැටුප් කප්පාදුව නිවැරැදි කිරීම මඟින්, වෙනත් පාර්ශ්වයකට බලපෑමක් ඇති වෙනවාය කියන එක අසත්‍යයක් කියලා මම හිතනවා. මොකද, එයට හේතුව අනෙක් පාර්ශ්වවල වැටුප් සියයට 107කින් වැඩි වුණා. මේ අයට සියයට 92යි වැඩි වුණේ. ඒ අය ඉල්ලන්නේ, අර කිව්ව චක්‍රලේඛවලින් වැඩි වෙන්න නියමිත සියයට 15 දෙන්න කියලායි. මේ අනධ්‍යයන කාර්ය මණ්ඩල ගැටලුව නිසා, අද උසස් අධ්‍යාපනය සම්පූර්ණයෙන් කඩාකප්පල් වෙලා තිබෙන්නේ. විශ්වවිද්‍යාල වසා දමන්න වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න. යුද්ධ කරන්න අවශ්‍ය නැහැ රටක් යටත් කර ගන්න. මේ රටේ අධ්‍යාපනය විනාශ කරලා දැම්මොත්, මේ රට ඕනෑම කෙනෙකුට නතු කර ගන්න පුළුවන්කම තිබෙනවා කියන එකත් මතක කරමින්, ඉහත කිව්ව ගැටලුවලට විසඳුම් ලබා දෙන්න කියලා මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු විපක්ෂ නායකතුමා.

Order, please! ඊට ප්‍රථම, කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA took the Chair.

[අ.භා. 12.36]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)

(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Sajith Premadasa -Leader of the Opposition)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ අධ්‍යාපනය මුහුණ දෙන අභියෝග පිළිබඳව ඉතාම වතුර කටීකත්වයකින් යුතුව ගරු රෝහිණී කුමාරි කවිරත්න මැතිනිය සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරපු යෝජනාව මා ස්ථීර කරනවා.

නෙල්සන් මැන්ඩෙලා මැතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා, "අධ්‍යාපනය යනු ලෝකය වෙනස් කිරීම සඳහා ඔබට භාවිත කළ හැකි බලවත්ම අවියයි"; "Education is the most powerful weapon which you can use to change the world" කියලා. ඒ ප්‍රකාශය තහවුරු කරමින්, අද අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන අවිධිමත්, අක්‍රමවත් වැඩ පිළිවෙළ සම්පූර්ණ ප්‍රතිසංස්කරණයකට, ප්‍රතිව්‍යුහගත කිරීමකට ලක් විය යුතුයි කියලා මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා.

දැන් බොහෝදෙනෙක් අධ්‍යාපනය ගැන කථා කරනකොට, මුල් ළමාවිය අධ්‍යාපනය අමතක කරලා කථා කරනවා. ගරු රෝහිණී කුමාරි කවිරත්න මැතිනිය ප්‍රමුඛ සමගි ජන බලවේගයේ අපි, මුල් ළමාවිය අධ්‍යාපනයෙන් දරුවන්ගේ අධ්‍යාපනය විධිමත්ව ක්‍රියාත්මක විය යුතුයි කියන එක විශ්වාස කරනවා. ඒකට විද්‍යාත්මක හේතුවක් තිබෙනවා. දරුවෙක් ඉපදුණාම ඔහුගේ මොළය සියයට 70ක් වර්ධනය වීම සිද්ධ වෙන්නේ අවුරුදු 5 දක්වායි. ඒ කාල වකවානුව තුළ ක්‍රියාත්මක වෙන අධ්‍යාපනය තමයි මුල් ළමාවිය අධ්‍යාපනය කියන්නේ. ඒ කියන්නේ වයස අවුරුදු 3ත්, 5ත් අතර අධ්‍යාපනය.

අපේ රටේ පෙර පාසල් 17,087ක් තිබෙනවා. ඒ ගුරුවරු 33,000ක් පමණ ඉන්නවා. තවත් විශාල ප්‍රමාණයක් සහාය ගුරුවරු වශයෙන් ඉන්නවා. සිසු ජනගහනය 387,000ක් පමණ වෙනවා. හැබැයි, අපේ රටේ පෙර පාසල් අධ්‍යාපනය, එහෙම නැත්නම් මුල් ළමාවිය අධ්‍යාපනය අවිධිමත්. ඒ ගැටලුවට අලුත්, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හරහා අපි විසඳුම් දෙන්නට බලාපොරොත්තු වෙනවා. UNICEF වාර්තා අනුව දු දරුවන්ගෙන් සියයට 20ක ප්‍රමාණයක් පෙර පාසල් අධ්‍යාපනයට යොමු වෙන්නේ නැහැ.

මේ අධ්‍යාපනයේ බරපතළ ප්‍රශ්න රැසක් තිබෙනවා. එකක් තමයි, අරමුදල් ප්‍රමාණාත්මක නොවීම පිළිබඳ ප්‍රශ්නය. අධ්‍යාපනය වෙනුවෙන් විශාල වශයෙන් අරමුදල් අවශ්‍ය වෙනවා. ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන ක්ෂේත්‍ර සඳහා විශාල මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා.

අපි බොහෝ විට හිතනවා රාජ්‍ය ආදායම කියන ආයුධය - අවිය - උපයෝගී කරගෙන මේ ප්‍රශ්නයට ප්‍රමාණවත් අරමුදල් ලබා ගන්න පුළුවන් කියලා. අපි විශ්වාස කරනවා, රාජ්‍ය ආදායමට අමතරව, ඔය සුසුරුදු රාමුවට කොටු වෙන්නේ නැතිව ඉන් පිට පැනලා අලුත් ක්‍රම හරහා අධ්‍යාපනය දියුණු කිරීම සඳහා කටයුතු කරන්න ඕනෑ කියලා. එහෙම තමයි අපි "සක්වල" වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ; සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු කරන්න "හුස්ම" වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ.

අපේ රජයක් තුළ අපි විශේෂයෙන් බලාපොරොත්තු වෙනවා රාජ්‍ය නොවන පෞද්ගලික දානපති පරිත්‍යාගශීලීන් සම්බන්ධ කරගෙන අපේ රටේ නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කරන්නට වැඩ පිළිවෙළ යොදන්න. නිදහස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාසල් 10,096ක් තිබෙනවා කියලා අපේ ගරු ඇමතිතුමා කිව්වා. හතළිස් එක්ලක්ෂයක් දරුවන් ඒවායේ අධ්‍යාපනය ලබනවා. අපි පාසල් සංවර්ධන අධ්‍යාපන කැපකරු ක්‍රම හරහා දානපතියාත්, පාසලත් බද්ධ කරනවා. හැම පාසලකටම භාරකාර අරමුදලක් ස්ථාපනය කරලා ඒ අරමුදලට දායකත්වය ලබා දෙන්න ප්‍රදේශයේ දානපතියන් උනන්දු කරවනවා. එසේ දායකත්වය ලබා දෙන දානපතියන්ට රාජ්‍ය මැදිහත්වීම තුළින් යම් සහන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා.

ඒ වාගේම, ඔබතුමන්ලා දන්නවා sister city/twinning programme එක ගැන. ඒ තමයි, මෙරට පළාත් පාලන ආයතනත්, පිට රටවල පළාත් පාලන ආයතනත් බද්ධ කරන වැඩසටහන. අපට පුළුවන් ලෝකයේ මුදල් අය කරන, ලාභ ලබන, පෞද්ගලික පාසල් 10,096ක් අපේ රටේ නිදහස් අධ්‍යාපනයේ පාසල් 10,096ත් එක්ක බද්ධ කරන්න. මොකද, පිට රටවල ඒ ආයතන ලබන ලාභයෙන් කොටසක් අනිවාර්යයෙන් වෙන් කරනවා සමාජ සත්කාරක වැඩසටහනට, corporate social responsibility වැඩසටහනට. ඒ වැඩසටහන හරහා අපි අපේ පාසල් 10,096ට ආධාර උපකාර ලබා ගන්නවා. ඇත්ත වශයෙන්ම සමගි ජන බලවේගයේ අධ්‍යාපන වැඩ පිළිවෙළ තුළ අපි බලාපොරොත්තු වෙනවා මේ කියපු ආකාරයට කටයුතු කරන්න. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට අධ්‍යාපනයට වෙන් කරන මුදල මෙච්චරයි කියලා කිව්වත්, කවදාවත් ඒ ඉලක්කය කරා යන්නේ නැහැ. ඒ විධියට මේ රටේ ජනතාව අන්දවන්නේ නැතිව අපි බලාපොරොත්තු වෙනවා, අලුත් වැඩසටහන් තුළින් -නැවුම් වැඩසටහන් තුළින්- අධ්‍යාපනයට අවශ්‍ය අරමුදල් ටික ලබා ගන්න. ඒ වැඩසටහන් තුන පමණක් නොව, අපි තවත් නිර්මාණශීලි වැඩසටහන් ගණනාවක් සම්පාදනය කරමින් සිටිනවා.

සම්පත් බෙදී යෑමේ විෂමතාවත් බරපතළ ගැටලුවක්; බරපතළ ප්‍රශ්නයක්. ඒ ගැන ගරු රෝහිණී කුමාරි විජේරත්න මැතිනිය දීර්ඝ ලෙස විග්‍රහ කළා. "ඇති හැකි පාසල්" සහ "නැති බැරි පාසල්" කියලා දෙකොට්ඨාසයක් අද තිබෙනවා. මේ ප්‍රශ්නයට අපි විසඳුමක් ලබා දෙන්නට ඕනෑ. අපි විශ්වාස කරන හැටියට ඒ දේ කරන්න පුළුවන් හොඳම ක්‍රමය තමයි, රටේ තිබෙන පාසල් 10,096ම සුහුරු පාසල් බවට පත් කිරීම සඳහා වන රාජ්‍ය ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම. "ළඟම පාසල සුහුරු පාසල", "අපේ පාසල සුහුරු පාසල". ඒකයි අපේ ප්‍රතිපත්තිය. පාසල් සුහුරු පාසල් බවට පත් කරලා ඒ පාසල්වලට ලබා දිය යුතු සම්පත් එලෙසම ලබා දෙන ආකාරයට අපි කටයුතු කරන්න ඕනෑ. මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ බරපතළ මානව සම්පත්, භෞතික සම්පත් විෂමතා තිබෙනවා. ඒ ඌනතා පිළිබඳව හෙට උදේ වනකල් වුණත් කථා කරන්න පුළුවන්, ගරු අධ්‍යාපන ඇමතිතුමනි. යටිතල පහසුකම්වලත් බරපතළ විෂමතාවක් තිබෙනවා.

මම පසුගිය දවසක ගියා දෙහිඅත්තකණ්ඩියේ සඳුන්පුර විද්‍යාලයට. දෙමාපියෝ රුපියල් ලක්ෂ 20ක් එකතු කරලා එහි ශ්‍රවණාගාරයට අඩිතාලම දා ගන්න කටයුතු කරලා තිබුණා. ඇත්ත වශයෙන්ම ඒක දෙමාපියන්ගේ කාර්යයක් නොවෙයි. නිදහස් අධ්‍යාපනය තුළ අපි ඒ සම්පත දු දරුවන්ට ලබා දිය යුතුයි.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මේ කාරණයත් හොඳට මතක තබා ගන්න. අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නොවුවත් අපි විශ්වාස කරනවා "අධ්‍යාපනය" මූලික අයිතියක් කියලා; ඒක මානව අයිතියක්. අපි එහි Fundamental Rights Chapter එක වෙනස් කරනවා. මොකද, Fundamental Rights Chapter එකේ තිබෙන්නේ දේශපාලන සහ සිවිල් අයිතිවාසිකම් විතරයි. අපි ඒකට ඇතුළත් කරන්නට ඕනෑ, ආර්ථික, සමාජයීය, ආගමික, සංස්කෘතික, සෞඛ්‍යමය, අධ්‍යාපනික යනාදී අයිතිවාසිකම්. සමාජයට බද්ධ වුණු ඒ අයිතිවාසිකම් පවා ඉදිරියේදී එම පරිච්ඡේදයට ඇතුළත් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

පාසල් උපකරණවල මිල ඉහළ යෑම සහ පාසල් දූ දරුවන්ගේ පෝෂණ තත්ත්වය ගැනත් කථා කළ යුතුයි. ගරු ඇමතිතුමනි, එදා හතළිස්තුන් ලක්ෂයක් පාසල් දූ දරුවන්ට නිල ඇඳුම්, දිවා ආහාරය ලබා දුන්නා. එහිදී දරුවන් වර්ගීකරණය කළේ නැහැ. දූ දරුවන් හතළිස්තුන් ලක්ෂයටම එකාකාරයට සැලකුවා. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද දිවා ආහාරය දෙන්නේ, 1 සිට 5 ශ්‍රේණි දක්වා දරුවන්ට විතරයි. එතකොට, 6 සිට 11 දක්වා ශ්‍රේණිවල දරුවන්ට? 6 සිට13 දක්වා ශ්‍රේණිවල දරුවන්ට? මම හිතනවා, ඒ ප්‍රතිපත්ති වෙනස් කරලා අපට කොච්චර අමාරු වුණත් අනෙක් ක්ෂේත්‍රවලට අදාළව මූල්‍ය කළමනාකරණය කරලා හෝ මේ රටේ නිදහස් පාසල් පද්ධතියේ, අධ්‍යාපන පද්ධතියේ පාසල් 10,096 හි දූ දරුවන් හතළිස්එක් ලක්ෂයටම දිවා ආහාරය ලබා දෙන්න ඕනෑ කියලා. අපේ රජයක් තුළ එය අනිවාර්යයෙන් ලබා දෙනවා. ඒක අපේ අනිවාර්ය ප්‍රතිපත්තියක්.

විශේෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ මානව සම්පත ගැන රෝහිණී කුමාරි විජේරත්න මැතිනිය හොඳ විග්‍රහයක් කළා. අධ්‍යාපනයේ පරිවර්තනයක් වෙන්නට ඕනෑ කියලා කවුරු කොච්චර කථා කළත්, එම ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු කරන මානව සම්පතේ ආත්ම තෘප්තිය ශක්තිමත් කරන්නේ නැතුව අපට ඒ කර්තව්‍යය ඉෂ්ට කරන්නට බැහැ. විශේෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනධ්‍යයන, ගුරු, විදුහල්පති, ගුරු උපදේශක, ගුරු අධ්‍යාපනඥ, ගුරු සංවර්ධන නිලධාරි, අධ්‍යාපන පරිපාලන කියන අංශ 7හි තිබෙන ප්‍රශ්නවලට -ගැටලුවලට- තිරසර විසඳුම් ලබා දෙන්නට ඕනෑ. ඇත්ත වශයෙන්ම අර තාක්ෂණ කම්ටුව ස්ථාපනය කරලා වැඩ කටයුතු කළා නම්, අධ්‍යාපනයේ මානව සම්පතේ තිබෙන විෂමතා, ඌනතා පිළිබඳ ගැටලු විසඳන්නට අපට බොහෝදුරට හැකියාව ලැබෙනවා. අනධ්‍යයන ක්ෂේත්‍රයේ අය ස්ථිර කර ගැනීමේ ප්‍රශ්නය, වැටුප් ප්‍රශ්නය, උසස්වීම් ප්‍රශ්න ආදියට විසඳුම් ලබා දෙන්නට ඕනෑ. ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාත් එක්ක ඒවා ගැන සාකච්ඡා කළා.

ගුරු ක්ෂේත්‍රය ගන්න. අපි හැමෝම පිළිගන්නවා, ගුරු ක්ෂේත්‍රයේ වැටුප් විෂමතාවක් තිබෙනවා කියලා. ඒ නිසා තමයි දීමනාවක් දීලා ඒකෙන් තුනෙන් එකක් ලබා දුන්නේ. ගරු අමාත්‍යතුමනි, හතළිස්එක් ලක්ෂයක් දූ දරුවන් වෙනුවෙන් විශිෂ්ට සේවාවක් ඉටු කරන අපේ රටේ ගුරු භවතුන් දෙලක්ෂ හතළිස්එක්දහසකට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයගේ ඒ දීමනාවේ ඉතිරි තුනෙන් දෙක ලබා දෙන වැඩ පිළිවෙළකට ඔබතුමා ප්‍රවේශ වෙන්නට ඕනෑ. මම ඉල්ලා සිටිනවා, ඔබතුමාගේ කථාවේදී කාල සටහනක් සහිතව -මෙන්න මේ කාල වකවානුව වන කොට අපි ඒ කටයුත්ත ක්‍රියාත්මක කරනවා කියලා- ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්න කියලා. කොහොමටත් ඒ කර්තව්‍යය අපේ රජයක් තුළ අපි අනිවාර්යයෙන් ක්‍රියාත්මක කරනවා කියා මම මේ අවස්ථාවේ කියන්නට කැමැතියි.

විදුහල්පති වැටුප් විෂමතාව ගැනත් කිව යුතුයි. ගරු ඇමතිතුමනි, මොන ලෝකෙද තනතුරෙන් promotion එකක් ලැබෙන කොට වැටුපෙන් demotion එකක් ලැබෙන්නේ? අපේ විදුහල්පති- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, සමාවෙන්න. මගේ කථාවෙන් පසුව ඔබතුමා උත්තර දෙන්න. බාධා කරන්න එපා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
බාධාවක් නොවෙයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට බාධාවක්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු ජී.එල්. පීරිස් මිටපු ඇමතිතුමාට ඒකට උත්තර දෙන්න පුළුවන්. එතුමා තමයි අවුරුදු දෙකහමාරක් -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මෙහෙම කියන්නම්කෝ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. මට time තිබෙනවා. බය වෙන්න එපා; ප්‍රශ්නයක් නැහැ. *[බාධා කිරීමක්]* මොකක්ද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
තව වෙලාව දෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා වෙලාව දෙන්න. බොහොම ස්තුතියි. අන්න, ගරු ඇමතිතුමා වෙලාව දෙනවා ලු. සම්ප්‍රදාය අනුව විපක්ෂ නායකතුමාට වෙලාව ලබා දීම ගැන පොඩ්ඩක් උගන්වන්න. මොකද, එහෙම ප්‍රශ්නයක් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 13ක කාලයක් වෙන් කර තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සම්ප්‍රදාය උගන්වන්න. *[බාධා කිරීමක්]* හරි නේ. දන්නවා නේ. බොහොම හොඳයි. දැන් ඉගෙන ගත්තා නේද?

ගරු ඇමතිතුමනි, promotion එකක් ලැබෙන කොට වැටුපෙන් demotion එකක් ලැබෙන්නේ කොහේද? ඒ නිසා විදුහල්පති වැටුප් විෂමතාව- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මම ඒ ගැන කියන්නම්. ගරු ඇමතිතුමා, ඔබතුමා ගරු ජී.එල්. පීරිස් හිටපු ඇමතිතුමා ගැන කථා කළා නේ. මම ඇත්ත කියන්නම්කෝ. මම, ඇඟිල්ල දිගු කර ගන්නවා මට. ඒකට මා ඇතුළුව අපි හැමෝම වග කියන්න ඕනෑ. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

එහෙමද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔව්, එහෙම තමයි. මේක එක්කෙනෙකුගේ, දෙන්නෙකුගේ ප්‍රශ්නයක් කියලා අපි කථා කරන්න යන්නේ නැහැ. මමත් වග කියනවා. මම වගකීම භාර ගන්නම්කෝ. අනෙක් අය වගකීම් භාර ගන්න කැමැති නැහැ නේ. මම වගකීම භාර ගන්නම්. මගේ වගකීම මම භාර ගන්නම්. මේ අපි හැමෝම ඒකට වග කියන්නට ඕනෑ. විදුහල්පති වැටුප් විෂමතාවට විසඳුමක් ලබා දෙන්නට ඕනෑ. ගුරු උපදේශක ක්ෂේත්‍රයේ වැටුප් වර්ධක වැඩසටහන ක්‍රියාත්මක කරලා නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් ඒවාට එකඟ වුණා.

නිලධාරීන් ක්‍රියාත්මක කරන්නේ නැහැ. අධ්‍යාපනඥ සේවයේ වැටුප් ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම තමයි සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රශ්නයත්. ගරු ඇමතිතුමනි, මේ රටේ 40,000ක ගුරු හිඟයක් තිබෙන මොහොතක අපේ රටේ අධ්‍යාපනයේ නිත්‍ය නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් අතිවිශිෂ්ට සේවාවක් කළා. කොරෝනා සමයේ සහ අද දවස වනකොටත් මේ අධ්‍යාපනය කඩා වැටෙන්නට නොදී ඒ විශිෂ්ට සේවාවක් ඉෂ්ට කරපු 22,000ක් සංවර්ධන නිලධාරීන් අපට නිකම් කරකවලා අත්හරින්න බැහැ. අපි මානුෂීය ලෙස ඒ අයගේ හඬට සවන් දෙන්නට ඕනෑ. කරුණාකරලා ඒ අයත් ස්ථාපනය කිරීම පිළිවෙළකට ක්‍රියාත්මක කරන්න.

රෝහිණී කවිරත්න මැතිනිය පිරිවෙන් ගුරු ප්‍රශ්නය ගැනත් ඒ වාගේම අනධ්‍යයන සේවයේ මුරකරුවාගේ ඉඳලා, කම්කරුවාගේ දක්වා ප්‍රශ්න ගැනත් කථා කළා.

මට ඇහුණා ඔබතුමා කියනවා, "ස්වේච්ඡා කරපු පමණින් ගුරුවරුන් වෙන්න බැහැ. අනිවාර්යයෙන්ම උපාධියක් තිබෙන්නට ඕනෑ" කියලා. මට කියන්න, අනධ්‍යයන සේවයේ උපාධිධාරීන් කොච්චර ඉන්නවාද කියලා? *[බාධා කිරීමක්]* මට බාධා කරන්න එපා. මගේ කථාවෙන් පස්සේ ඔබතුමා උත්තර දෙන්න. කලබල වෙන්න එපා. ඔබතුමායි, මමයි මිත්‍රයෝ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

හැබැයි, මම උත්තර දෙන වෙලාවට ඔබතුමා මේ සභාවේ ඉන්න ඕනෑ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට අද "සක්වල" වැඩසටහනට සහභාගි වෙන්න තිබෙනවා. *[බාධා කිරීමක්]* මම ඔබතුමාගේ සම්පූර්ණ කථාව YouTube එකෙන් බලන්නම්. මම ඇත්ත කථා කරන්න ඕනෑ. අද අපි බිංගිරියේ "සක්වල" වැඩසටහන කරනවා. ඔබතුමා දන්නවා නේ, අපි වැඩ කරන විපක්ෂයක් කියලා. කයිවාරු විතරක් නොවෙයි, අපි වැඩ කරනවා. මට බාධා කරන්න එපා. ඔබතුමා කිව්වා නේ ස්වේච්ඡා කරපු පළියට ගුරු පත්වීම් දෙන්න බැහැ කියලා. Master's Degrees ගත් අය අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්නවා, කම්කරුවන් හැටියට; මුරකරුවන් හැටියට. කරුණාකරලා අන්න ඒ අයටත් ඉණිමගක් හදන්න අධ්‍යාපන ක්ෂේත්‍රයේ යා යුතු තැනට යන්න පුළුවන් විධියට. Merit-based, ඒ කියන්නේ හැකියාව හා ක්‍රියාකාරිත්වය තුළ, meritocracy මත ඉදිරියට යන්න ක්‍රමයක් හදන්න.

ඒ වාගේම මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. අපේ රටේ අධ්‍යාපනයට අදාළ විෂය නිර්දේශය හදන්නේ කොහොමද? මොකක්ද ඒකට පදනම් කරගන්නේ? දියුණු රටවල විෂය නිර්දේශය හදන්නේ ජාත්‍යන්තර ශ්‍රම වෙළඳ පොළේ ඉල්ලුම, සැපයුම අනුව. අපේ රටේ කොහොමද හදන්නේ? කවුද syllabus එක, curriculum එක හදන්නේ? මොකක්ද National Institute of Education - NIE එක - කරන්නේ? මොකක්ද ඒකේ පදනම? අපි අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම්පූර්ණ සංශෝධනයක් කරන්න ඕනෑ. අපේ රෝහිණී මැතිනිය කිව්වා වාගේ අපට බැහැ සම්ප්‍රදායානුකූල පහේ ශිෂ්‍යත්වය, O/L, A/L විභාග ක්‍රමය මතම යැපෙන්න. ඒ ඔක්කෝම කරන්නේ කටපාඩම් - rote learning, parroting - ක්‍රමයට. හැබැයි, අද ප්‍රායෝගික යථාර්ථය මොකක්ද? අපි දැනගන්න ඕනෑ, theories දැන ගෙන, න්‍යායන් දැනගෙන ඒවා apply කරලා විසඳුම් ලබා ගන්න. ප්‍රශ්න විසඳන්නන් - problem solvers - බිහි කරන්න ඕනෑ. ප්‍රශ්නයක් analyse කරලා ඒවාට උත්තර සපයන්නන් බිහි කරන්නට ඕනෑ. කටපාඩම් කරන්න දෙයක් නැහැ. ඒ ඔක්කෝම අන්තර්ජාලයේ තිබෙනවා. අපි දැන ගන්නට ඕනෑ, theories apply කරලා ප්‍රශ්නවලට විසඳුම් ලබා ගන්න. 40,000ක ගුරු හිඟයක් තිබෙනවා නේ. ඒ ගුරු හිඟය තුළ පුදුමාකාර ලෙස පළාත් සභා පිස්සු නටනවා නේ, ගරු ඇමතිතුමනි. ඒ අයට හරියට උපාධිධාරී ගුරු බඳවා ගැනීමේ ගැසට් එක ගහගන්නවත් බැහැ. ගැසට් එක ගහ ගන්න බැරි අධ්‍යාපන පරිපාලනයක් පළාත් සභාවල තිබෙන්නේ. හැම තැනකම අව්චාරු කරගෙන. හැම තැනක්ම විනාශ කරගෙන. උතුරට ගියත් එකයි. උතුරු මැදට ගියත් එකයි. දකුණට ගියත් එකයි. අධ්‍යාපන පරිපාලන නිලධාරීන්, එහෙම නැත්නම් ඊට සම්බන්ධ නිලධාරීන් ඒ ගැසට් එක ගහපු එක සම්පූර්ණයෙන්ම විනාශ කරගෙන තිබෙනවා. ඔබතුමාත් ඒක දන්නවා. මේකට විසඳුමක් අවශ්‍යයි. අධ්‍යාපන බලධාරීන්ගේ වැරදිවලට ඒ උපාධිධාරී ගුරුවරුන් පළි නැහැ. ඒක නිසා උපාධිධාරී ගුරු පත්වීම් ලබා දීමට පැහැදිලි වැඩ පිළිවෙළක් සකස් කරන්න.

ඇත්ත වශයෙන්ම අපේ රටේ දූ දරුවන්ට නිසි කාලයට -නිසි වෙලාවට- විභාග පවත්වන්නේ නැහැ. ඒ ගැටලුවටත් විසඳුමක් ලබා දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතිය, ආගම සහ ස්ත්‍රී පුරුෂභාවය කේන්ද්‍ර කරගෙන පාසල් වර්ගීකරණය කිරීම ගැනත් අපි තවදුරටත් හිතන්නට ඕනෑ. භාෂා ප්‍රතිපත්තිය ගැන අපි හොඳට හිතන්නට ඕනෑ. දන්නවා නේ, දැන් අපේ රටේ කණ්ඩායමක් ඉන්නවා, "සිංහල පමණයි" කියන. සිංහල පමණයි කිව්වාම, පාසල් 10,096ක ඉගෙන ගන්න ලක්ෂ 41ක් වන අපේ රටේ දූ දරුවන්ට සෙතක් වනවා ද? එහෙම, "සිංහල පමණයි" කියලා කියන්නේ ජනාධිපති පුටුව ගැන හිත හිතා. හැබැයි, ඒකෙන් දරුවන්ට සෙතක් වෙන්නේ නැහැ. එහෙම කියනකොට තවත් කට්ටියක් කියනවා,-

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමා අහගෙන ඉන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කවුරු අහගෙන හිටියත් කමක් නැහැ. මගේ මතය නේ කියන්නේ. භාෂණයේ නිදහස තිබෙනවා නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් කට්ටියක් කියනවා, "දමිළ පමණයි" කියලා. දමිළ පමණයි කියන්නේ මොනවාටද? ඒ, පාර්ලිමේන්තුවට එන්න තිබෙන ආශාවට. දරුවෝ ලක්ෂ 41 ගැන හිතලා නොවෙයි, ඒ කථාව කියන්නේ. ඒ නිසා මම පැහැදිලිව කියනවා, ඉංග්‍රීසි භාෂා කේන්ද්‍රීය අධ්‍යාපනයට මුල් තැන දිය යුතුයි. අපේ රටේ පාසල් 10,096ක මානව සම්පත් ඌනතාවලටත්, භෞතික සම්පත් ඌනතාවලටත් විසඳුම් සපයමින් ඉංග්‍රීසි භාෂා කේන්ද්‍රීය අධ්‍යාපනයට මුල් තැන දීමේ වැඩ පිළිවෙළ අපි ආරම්භ කරනවාමයි කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. අනිවාර්යයෙන්ම එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට ඕනෑ. සිංහල පමණයි, දමිළ පමණයි කියලා හරියන්නේ නැහැ. ඒකෙන්, ලක්ෂ 41ක් වන පාසල් දූ දරුවන් අනාථභාවයට පත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, science, technology, English, engineering, mathematics, medicine, law, information technology, computer science, environmental science, management science කියන මේ ක්ෂේත්‍ර තමයි ලොව වැඩිම ඉල්ලුම තිබෙන ක්ෂේත්‍ර. තාක්ෂණ ක්ෂේත්‍රය කේන්ද්‍ර කරගෙන අපි ඉදිරියට යන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමාම දන්නවා, පාසල් 10,096ක් තිබෙනවා නේ. A/L හදාරන්නට අවස්ථාව ලබා දෙන්නේ පාසල් 3,000කින්. ඒකෙනුත් science stream එක, mathematics stream එක තිබෙන්නේ පාසල් 980ක. ඒක සියයට 10කට වැඩිය අඩුයි. අපේ රටට මෙහෙම ඉදිරියට යන්න පුළුවන්ද? ලොව ජයග්‍රහණය කරන්න මෙහෙම පුළුවන්ද? ඔබතුමා දන්නවා, අපේ නායක කාරකාදීන් හොඳ five-star hotelsවලට ගිහිල්ලා, seven-star hotelsවලට ගිහිල්ලා කියනවා, "ඩිජිටල් විප්ලවයක් ඇති කරනවා" කියලා. ඩිජිටල් විප්ලවයක් ඇති කරනවා නම් ගරු ඇමතිතුමනි, ඇයි information technology කියන විෂය 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා පමණක් නියමිත විෂයයක් කරලා තිබෙන්නේ? ඒක 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා නියමිත විෂයයක් වෙන්න ඕනෑ. මම කියනවා, මූලික අධ්‍යාපනය පෙර පාසලේත් දෙන්නට ඕනෑ කියලා. Information technology කියන විෂය 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා පමණක් උගන්වමින් අපි කෙහොමද ඩිජිටල් ආර්ථිකයකට යන්නේ? අපි කොහොමද ඩිජිටල් විප්ලවයකට, ඩිජිටල් යුගයකට පරිවර්තනය වෙන්නේ? මේවා මොන බොරු කථාද? ඔක්කෝටම ඉස්සෙල්ලා තොරතුරු තාක්ෂණ විෂය 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා නියමිත විෂයයක් කරන්න. ඒ විතරක් ප්‍රමාණවත් නැහැ. ඉගැන්වීම් කටයුතු ඉංග්‍රීසි භාෂාවෙන් කෙරෙන්නට ඕනෑ. ඒ වාගේම IT, compulsory subject එකක් කරන්නට ඕනෑ. හැබැයි, මේ දේ කරන්නට පෙර භෞතික සම්පත් සහ මානව සම්පත් ඌනතාවට අනිවාර්යයෙන්ම විසඳුමක් ලබා දෙන්නට ඕනෑ.

ඊළඟට, මම විශේෂයෙන්ම කථා කරන්න කැමැතියි, වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව. අපි අධ්‍යාපනය ඇතුළට entrepreneurship ගෙනෙන්නටත් ඕනෑ. අපි අදහස් කරනවා, නව ව්‍යවසාය දස ලක්ෂයක් - one million new business startups - ආරම්භ කරන්න. ව්‍යවසායකත්වය පිළිබඳවත් පාසල් දූ දරුවන්ට අවබෝධයක් ලබා දෙන්නට ඕනෑ. ඒ හැඩගැස්වීම් කරන්නට ඕනෑ. අපි ඒ වෙනස අනිවාර්යයෙන්ම කරනවා.

අද අධ්‍යාපනයේ බරපතළ බෙදීමක් තිබෙනවා. කී දෙනෙක් A/L විභාගයට පෙනී සිටිනවාද, කීදෙනෙකුට විශ්වවිද්‍යාල වරම් ලැබෙනවාද, කීදෙනෙකුට විශ්වවිද්‍යාල වරම අහිමි වනවාද? පැහැදිලිව, නිශ්චිතව මම කියා සිටිනවා, නිදහස් අධ්‍යාපනය තමයි අංක එක. පාසල් 10,096ක් smart schools බවට පත් කරලා, නවීකරණය කරලා, දියුණු කරලා නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කරමින් මේ රටේ සිසු පරපුරට අනෙකුත් විකල්ප අධ්‍යාපන අවස්ථා ලබා දෙන්නට ඕනෑ. ඒ option එක තිබෙන්නට ඕනෑ. ඒ option එක නැති කිරීම නිසා අපේ රටට විශාල සම්පත් ප්‍රමාණයක් අහිමි වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, අධ්‍යාපනයෙන් විශාල මුදලක් උපයන රටවල් ගැන. 2021-2022 අධ්‍යයන වර්ෂයේ විතරක් ඇමෙරිකා එක්සත් ජනපදය ලබා තිබෙනවා ඇමෙරිකන් ඩොලර් බිලියන 32ක ආදායමක්. පොඩ්ඩක් හිතන්න, ඒ 2021-2022 අධ්‍යයන වර්ෂයට විතරයි.

එක්සත් රාජධානිය වර්ෂ 2021-22 දක්වා Sterling Pounds 41.9 billion උපයා තිබෙනවා. ඕස්ට්‍රේලියාව 2022දී ඩොලර් බිලියන 25.5ක් උපයා තිබෙනවා. කැනඩාව Canadian Dollars 22.3 billion උපයා තිබෙනවා. ජර්මනියේ 458,000කට වැඩි ජාත්‍යන්තර ශිෂ්‍ය පරපුරක් ඉන්නවා. ප්‍රංශයේ 402,000කට වැඩිය ඉන්නවා. අධ්‍යාපනයේ ඒ option එක අපේ රටේ දූ දරුවන්ට ලබා දෙන්න බැරි ඇයි? අපේ රටත් අධ්‍යාපනයෙන් ආදායමක් ලබන, විදේශ විනිමය සොයන, විදේශීය රටවල සිසු දූ දරුවන්ටත් අධ්‍යාපනය ලබා දෙන අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් කරන්න බැරි ඇයි? අනිවාර්යයෙන්ම අපි එතැනට යන්නට ඕනෑ, ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි. අපේ රටේ අධ්‍යාපනයෙන් විදේශ විනිමය උපයාගත හැකි අවස්ථා තිබෙනවා. අපට විදේශ ශාඛා මණ්ඩප සහ අන්තර්ජාතික අධ්‍යාපන සංවර්ධනය ක්‍රියාත්මක කරන්න පුළුවන්. ජාත්‍යන්තර ශිෂ්‍ය වෙළෙඳ පොළ පුළුල් කිරීම තුළින් අපට ඒ තැනට යන්නට පුළුවන්. EdTech සහ මාර්ගගත ඉගෙනුම—Education Technology and online learning - හරහා, වෘත්තීය පුහුණු සහ නිපුණතා සංවර්ධනය හරහා, පෞද්ගලික අංශ ආයෝජන හරහා, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය හරහා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්. ඒ වැඩ පිළිවෙළ අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කළ යුතුයි.

ඒ වාගේම අපට තිබෙන්නට ඕනෑ, holistic education approach එකක්. චිත්තවේගීය බුද්ධිය පිළිබඳව අවධානය - emphasis on emotional intelligence - යොමු කරන්නට ඕනෑ. ව්‍යාපෘති පාදක ඉගෙනුම - project-based learning - වැනි නව ක්‍රමවලට අපි යන්නට ඕනෑ. Lifelong learning and skills development, ඩිජිටල් සහ තාක්ෂණික සාක්ෂරතාව, ලෝක පුරවැසි අධ්‍යාපනය, අන්තර් විෂය ධාරාගත ඉගෙනුම් මොඩියුලය ආදී වශයෙන් මේ අධ්‍යාපනය තුළ පුදුම අවස්ථාවක් තිබෙනවා, අපේ රටට ඩොලර් උපයන්න; ආදායමක් ලබා ගන්න. හැබැයි, මම එක කාරණයක් කියන්න කැමැතියි. අපේ ප්‍රතිපත්තිය විය යුත්තේ නිදහස් අධ්‍යාපනය සුරක්ෂා කරමින් මේ ගමන ක්‍රියාත්මක කිරීමයි කියන එක මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

අවසාන වශයෙන් මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න බලාපොරොත්තු වෙනවා, ජාත්‍යන්තර ශිෂ්‍ය තක්සේරුකරණය සඳහා වූ වැඩසටහනට, Programme for International Student Assessment - PISA - වෙත. අපි මේ වැඩසටහනේ ශ්‍රේණිගත කිරීම්වලට ඇතුළත් වන ආකාරයට අපේ අධ්‍යාපනය වැඩිදියුණු කරන්නට ඕනෑ. මේක ක්‍රියාත්මක වෙන්නේ ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයෙන්, Organization for Economic Cooperation and Development -

OECD - මහින්. අවුරුදු 15ක් වූ සිසුන්ගේ කුසලතාව හා දැනුම පරීක්ෂා කිරීම තුළින් මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම රටේ සිසු පරපුරේ දක්ෂතාව වර්ධනය කරන්නට, නිපුණතාව වර්ධනය කරන්නට, හැකියාව වර්ධනය කරන්නට benchmark එකක් වෙනවා. සිංගප්පූරුව මේ PISA කියන වැඩසටහන ඉතාම ප්‍රතිඵලදායි ආකාරයට ක්‍රියාත්මක කරනවා. අපේ රට තුළත් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙන ආකාරයට අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය ශක්තිමත් කරන්නට ඕනෑ.

ඒ වාගේම රජය තීන්දු කරලා තිබෙනවා, අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න. මම කියන්න කැමතියි, ඒවායේ අපැහැදිලිකම් රැසක් තිබෙන බව. ඒක පළාත් සභා හරහාද, මධ්‍යම ආණ්ඩුව හරහාද, කොයි ආකාරයටද ක්‍රියාත්මත කරන්නේ? ඒ වැඩසටහන තුළ අඩුපාඩුකම් රැසක් තිබෙනවා. මේ කාරණය මතක තබාගන්න. මොන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් ක්‍රියාත්මක කළත් නිදහස් අධ්‍යාපනය රැකගෙන තමයි අපි ඒ වැඩකටයුතු ක්‍රියාත්මක කරන්නට ඕනෑ.

අපේ විශ්වවිද්‍යාල පද්ධතියේ තත්ත්වය අතිශයින්ම බෙදනීයයි. මේ වෙනකොට අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ strike එක නිසා බරපතළ ගැටලු රාශියක් නිර්මාණය වෙලා තිබෙනවා. මම අතිශයින්ම පක්ෂයි, විශ්වවිද්‍යාලයේ සිසු ගහනය වැඩි කරන එකට. හැබැයි, සිසු ගහනය වැඩි කරනකොට මානව සම්පත, භෞතික සම්පත ලබා දීලායි වැඩි කරන්නට ඕනෑ. නමුත් එහෙම කළේ නැහැ. පසුගිය කාලයේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පහසුකම් වැඩි කරන්නේ නැතිව ඉවක් බවක් නැතිව සිසුන් ඇතුළත් කර ගැනීම වැඩි කළා. එතකොට මොකද වෙන්නේ?

ශිෂ්‍ය ගුරු අනුපාතය - student-teacher ratio - වෙනස් වෙනවා. ඒ වෙනස්වීම තුළින් අපේ රටේ විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වලින් පහළටම යනවා. ඉතින්, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, විශ්වවිද්‍යාල cadre එක ගැන. ඇත්ත වශයෙන්ම එය 11,000ක්, 12,000ක් වෙන්නට ඕනෑ. නමුත් මම හිතන විධියට ඇත්ත වශයෙන්ම cadre එක 8,000යි. එයිනුත් 6,000ක් පමණ තමයි ඉන්නේ.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon.(Dr.) Suren Raghavan - State Minister of Higher Education)
We have 11,400 on payment.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
11,000ක් ඉන්නවා ද විශ්වවිද්‍යාලවල?

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
Last month, salaries were drawn by 11,400.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විශ්වවිද්‍යාල academic කාර්ය මණ්ඩලය 11,000ක් ඉන්නවා?

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
Yes, we can prove that. Last month, salaries were drawn by 11,400.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Is that true, ගරු ඇමතිතුමා? මහාචාර්ය, කථිකාචාර්ය, ආචාර්ය ඔක්කෝම 11,000ක් ඉන්නවා? ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා වගකීමෙන්ද කියන්නේ?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Maybe, on contract basis.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Okay. එතකොට, එහෙම නම් මම හිතන්නේ මම කිව්වේ බොරුවක්. සිසු-ආචාර්ය අනුපාතය අඩු වෙලා නැහැ නේ.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
එය සියයට 15.4යි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එහෙම නම් ශ්‍රේණිගත කිරීම්වලින් අපේ රට පහළට යන්නේ කොහොමද?

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
වෙන දේවල් නිසා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
වෙන දේවල් නිසා කියන්නේ, ඒ මොනවාද? හරි, හරි. *[බාධා කිරීමක්]* නැහැ, ඔබතුමා නොවෙයි නේ කැබිනට් ඇමති. මම ආමන්ත්‍රණය කරන්නේ කැබිනට් ඇමතිතුමාට. ඉතින් මම පැහැදිලිව මෙතුමාට කියන්න කැමැතියි, අපේ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ අඩුපාඩු රැසක් තිබෙන බව. ආචාර්ය, මහාචාර්ය, කථිකාචාර්යවරුන්ගේ බරපතළ භිඟයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම මම කියන්න කැමැතියි, මේ බුද්ධි ගලනය - brain drain - පාලනය කරන්නට යම් වැඩ පිළිවෙළක් ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන්නට ඕනෑ බව. තාවකාලිකව යම් වැඩසටහනක් ක්‍රියාත්මක කරලා තිබෙන බව අපි දන්නවා. ඊට වඩා විධිමත් වැඩසටහනක් මේ රටේ උගතුන් බුද්ධිමතුන් මේ රටේ රඳවා ගන්නට ක්‍රියාත්මක කළ යුතුයි කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. මම බොහොම පැහැදිලිවම ඔබට කියන්න කැමැතියි, අපේ රජයක් තුළ අධ්‍යාපනයේ සැබෑ පරිවර්තනාත්මක යුගය අපි නිර්මාණය කරන බව. අපි නිදහස් අධ්‍යාපනය වඩ වඩාත් ශක්තිමත් කරනවා, නූතනවාදී කරනවා, ප්‍රතිසංස්කරණය කරනවා. රටේ තිබෙන අධ්‍යාපන බෙදීම බොහොම පැහැදිලියි නේ, ගරු ඇමතිතුමා. Overseas School of Colombo, Colombo

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

International School, Elizabeth Moir කියන පාසල්වලට යන දරුවා සහ අපේ රටේ නිදහස් අධ්‍යාපනය ලබන දරුවා අරගෙන බැලුවොත්, ඒ දරුවෝ දෙන්නා වෙන වෙනම දේශීය සහ විදේශීය විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා රැකියා අවස්ථාවකට යනකොට interview එකේදී Englishවලින් එයට මුහුණ දෙන හැටි බලන්න පුළුවන්. මම මේ කථා කරන්නේ ඉංජිනේරු ක්ෂේත්‍රය ගැනවත්, වෛද්‍ය ක්ෂේත්‍රය ගැනවත්, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය ගැනවත්, පරිගණක විද්‍යා ක්ෂේත්‍රය ගැනවත් නොවෙයි. මම මේ කථා කරන්නේ කලා ක්ෂේත්‍රය පිළිබඳව. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, අද රැකියා විරහිත උපාධිධාරීන් කොපමණ ඉන්නවාද? 50,000කට වැඩි ප්‍රමාණයක් අද ඉන්නවා. 50,000කට වැඩි උපාධිධාරීන් පෞද්ගලික ආයතනවලට ගිහිල්ලා රැකියා ඉල්ලනකොට කියනවා, "ඔබගේ අධ්‍යාපනය අපේ ආයතනයේ රැකියා කරන්නට සුදුසු නැහැ"යි කියලා. ඒ විධියට මේ රටේ තරුණ පරපුර, දරු පරපුර අනාථ කරන අධ්‍යාපන ක්‍රමයකින් අපට වැඩක් නැහැ. නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කරන්නට ඕනෑ. ඒ වාගේම මේ අධ්‍යාපන ක්‍රමය තුළ සිසු පරපුරට විකල්ප අධ්‍යාපන අවස්ථා ලබා දෙන්නට ඕනෑ. මම දන්නවා, ඒක කිව්ව හැටියේ මඩ ගහන්නට පටන් ගනීවි, පෞද්ගලීකරණය කරනවා කියලා. පෞද්ගලීකරණය කරනවා කියලා මඩ ගහන ඇත්තන්ගේ දු දරුවන් ඔක්කෝම යන්නේ international schoolsවලට. ඒ ඔක්කෝම යන්නේ overseas universitiesවලට. ඒවාට ගිහිල්ලා උපාධි අරගෙන තමන්ගේ දරුවත් එක්ක පින්තූරය දාගන්න එක හොඳයි. නමුත් නිදහස් අධ්‍යාපනය නවීකරණය කරන එක හොඳ නැහැ. ඉතින් මේ වාගේ දෙබිඩි, දිව දෙකේ ගමනක් නම් අපි යන්නේ නැහැ. රාජ්‍ය අධ්‍යාපනය, නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කරන්නට ඕනෑ කියන එක අපි පැහැදිලිවම කියනවා. හැබැයි, මේ රටේ පාසල් දරු පරපුරට, සිසු පරපුරට වෙනත් විකල්ප අධ්‍යාපන අවස්ථා පිට රට නොවෙයි, අපේ රට තුළම ලබා දෙන්නට ඕනෑ කියන එක ප්‍රකාශ කරනවා.

අපේ ගරු රෝහිණී කුමාරි කවිරත්න මැතිනිය ඉතාම චතුර ලෙස ඉදිරිපත් කරපු යෝජනාව ස්ථිර කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සභානායකතුමා. ඔබතුමාට විනාඩි 36ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.07]

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලීන මාතෘකාවක් පිළිබඳව ගරු රෝහිණී කවිරත්න මැතිනිය විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට අදාළව, මා අධ්‍යාපන ඇමතිවරයා හැටියට මෙවර මෙම අමාත්‍යාංශය භාරගත් අවස්ථාවේ සිට මේ දක්වා කරපු වැඩකොටසත්, ඉදිරි කාලය තුළ සමස්තයක් හැටියට මේ සඳහා අප විසින් ගනු ලබන වැඩ පිළිවෙළත් සැකෙවින් විස්තර කරන්නට බලාපොරොත්තු වෙනවා.

2022 ජූනි මාසය ආරම්භ වන විට රටේ පැවති තත්ත්වයත් එක්ක තමයි එදා අපි මේ අමාත්‍යාංශය භාර ගත්තේ. 2020, 2021 වසරවල කොවිඩ් 19 වසංගතය, ගුරු විදුහල්පති වෘත්තීය ක්‍රියාමාර්ග හා ඉන්පසු ඇති වූ අරගළයත් එක්ක අධ්‍යාපන ක්ෂේත්‍රය දැඩි පසුබෑමකට ලක් වුණා. ඒ නිසා ශිෂ්‍යත්ව විභාගය, අපොස සාමාන්‍ය පෙළ විභාගය, අපොස උසස් පෙළ විභාගය, උත්තර පත්‍ර පරීක්ෂාව, ප්‍රතිඵල නිකුත් කිරීම ආදී සියල්ල මාස හයකින් එහාට කල් ගිහිල්ලා තිබුණා. ඒ වාගේම විභාගවලට අදාළ ප්‍රායෝගික පරීක්ෂණත් පවත්වන්න බැරිව හිටියා. විභාග කාලසටහන්, පාසල් වාරසටහන් ගැළපුණේ නැහැ. මේ සභාවේම සෝෂාව නිසා අපට සිදු වුණා, විභාග කල් දමන්න. ඊළඟට, 2019 වසරේ සිට ගුරුවරුන්ගේ වෘත්තීය පුහුණු සැසි පවත්වා නැහැ. සියලු බඳවා ගැනීම් ද නවතා තිබුණා. මේ, මම අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගන්නකොට තිබුණු තත්ත්වය. ඒ වන විට පැවති ගුරු හිඟය තවත් තීව්‍ර වුණා, අවුරුදු 65ට තිබුණු විශ්‍රාම යෑමේ වයස 2019-2020 කාලයේ අවුරුදු 60ට අඩු කරපු නිසා. නව බඳවා ගැනීම්වලට මුදල් ප්‍රතිපාදන තිබුණේත් නැහැ. වැටුප් ගෙව්වේත් බොහොම අමාරුවෙන්. පාසල් දරුවන්ට පෙළ පොත්, නිල ඇඳුම්, දිවා ආහාර ලබා දීමේ වැඩ පිළිවෙළක් තිබුණේත් නැහැ. පාසලට දරුවන් රැගෙන යන්න බස් රථවලට, වෑන් රථවලට ඉන්ධන තිබුණේත් නැහැ. ඒ නිසා පාසල් සති ගණන් වහලා තිබුණා. උත්තර පත්‍ර පරීක්ෂාවට යන්න ගුරුවරුන්ට ෂෙඩ් එකකට ගිහිල්ලා පෙට්‍රල් ගහගන්න බැරි වුණා. ඒකට පෝලිමේ ඉන්න වුණා. මම මේ කියන්නේ එදා රට තිබුණු තැන පිළිබඳව. ඒ වාගේම එදා පැය 14ක් විදුලිය කපලා තිබුණා. විදුලි බලය තිබුණේ නැහැ. ඒ නිසා ළමයින්ට online උගන්වන්නවත් විධියක් තිබුණේ නැහැ. ප්‍රවාහන පහසුකම් නැති නිසා දුර බැහැර ළමයි ආසන්න පාසලට අනුයුක්ත කරන්න සිදු වුණා. පාසල් නිල ඇඳුම් දෙන්න වැඩ පිළිවෙළක් තිබුණේත් නැහැ. ඩෙස්ක්, පුටු එකක්වත් අලුතින් හදලා තිබුණේ නැහැ, අවුරුදු පහකින්. 2019දී විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ විභාගය පවත්වා තිබුණත්, මම පත්වීම් දෙනකල් ම ඒ පත්වීම් දීලා තිබුණේ නැහැ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කියමින් හිටියා මිසක් කිසි දෙයක් වුණේ නැහැ. හැබැයි, ඒ ටික කරන්න බැරි වෙච්ච අය තමයි ඔබතුමන්ලාගේ පැත්තේ පළමුවැනි පේළියේ ඉන්නේ.

විපක්ෂ නායකතුමා කියපු කරුණු වැඩි හරියකට මම උත්තර දෙන්න ඕනෑ. නමුත්, එතුමාත් නැඟිටලා ගියා. මම හිතුවා, එතුමා මෙතැන ඉඳීවි කියලා. මම කිව්වේ පසුගිය අවුරුදු දෙකහමාරක් තිස්සේ තිබුණු තත්ත්වය. මම ඊට වඩා ඒ ගැන කියන්න යන්නේ නැහැ. *[බාධා කිරීමක්]* Reform වෙන්න වෙලාවක් නැහැ. අවුරුදු 75ක් විතර ගත වුණාම කොහේද reform වෙන්න වෙලා තිබෙන්නේ? *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාත් ඒ ගැන දන්නවා නේ. ඒවා තමුන්නාන්සේලාට liabilities. මම දන්නේ නැහැ ඒ ඇයි කියලා.

ඊළඟට, 2022 ජූනි මාසයේ ඉඳලා අවුරුදු දෙකක් තුළ අපි ගත්ත ක්‍රියාමාර්ග ගැනත් මම කියන්නම්. තවම අපි ජූනි මාසයට ළඟා වෙනවා. විභාග කාලසටහන, වාරසටහන යාවත්කාලීන කරන්න අපි ක්‍රමානුකූලව කටයුතු කළා. මේ අවුරුද්දේ අපි උසස් පෙළ විභාග දෙකක් පවත්වනවා. ජනවාරි-පෙබරවාරි මාසවල තිබුණු විභාගයේ ප්‍රතිඵල මාස තුනහමාරෙන් අපි ලබා දුන්නා, ගිය සතියේ. මේ අවුරුද්දේ අගෝස්තුවල පවත්වන්න තිබුණු විභාගය තමයි නොවැම්බර් මාසයේ පවත්වන්නේ. හැබැයි 2025 වසරට යනකොට අපට ඒ විභාග ටික ගන්න පුළුවන්, සැප්තැම්බර් මාසයට හෝ අගෝස්තු මාසයට. ඊළඟට, අප්‍රේල් මාසයේදී පවත්වන්න තිබුණු සාමාන්‍ය පෙළ විභාගය තමයි මැයි මාසයට කල් ගියේ. ඒකේ ප්‍රතිඵල දෙනකොට සැප්තැම්බර් මාසය වෙවි. 2025 අවුරුද්දේ දෙසැම්බර් වෙනකොට ඉන්න ඕනෑම ඇමතිවරයෙකුට පුළුවන්, නියමිත විධියට දෙසැම්බර් මාසයේදීම විභාගය පවත්වන්න.

2023, 2024 වර්ෂ දෙකේම පෙළ පොත් ටික අපි ලබා දුන්නා. ලබන අවුරුද්දට ඕනෑ කරන පෙළ පොත් සඳහාත් අපි ටෙන්ඩරය දීලා ඉවරයි, State Printing Corporation එකට. මම මේ අමාත්‍යාංශය භාර ගන්නකොට State Printing Corporation එකේ රුපියල් මිලියන 1,200ක අයිරාවක් තිබුණා. දැන් State Printing Corporation එක ලාභ ලබනවා; a Rs. 2.3 billion profit. නිල ඇඳුම්වලින් සියයට 70ක් මම 2023දී චීනයෙන් ගත්තා; 2024දී සියයට 80ක් ගත්තා. ලබන අවුරුද්ද සඳහාත් අපි ඉල්ලීම් කළා. දැන් ඒ සඳහාත් අපට යහපත් ප්‍රතිචාර ලැබෙමින් පවතිනවා.

පාසල් දිවා ආහාරය දීලා තිබුණේ, මිලියනයකට ආසන්න සංඛ්‍යාවකට. දැන් ඒ සඳහා රුපියල් බිලියන 26ක් වියදම් වෙනවා. රජය වෙන් කළ රුපියල් බිලියන 16 සහ තවත් විවිධ ක්‍රම එක්ක මිලියන 1.7ක පිරිසකට දැන් අපි දිවා ආහාරය ලබා දෙනවා. ජාතික පාසල් හැර අනෙක් සියලු පාසල්වල ප්‍රාථමික අංශයේ දරුවන්ට සහ ළමයි 100ට අඩු සියලු පාසල්වල සියලු දරුවන්ට - පාසල් 9,000කට ආසන්න සංඛ්‍යාවක සිටින- දිවා ආහාරය දැන් ලබා දෙනවා.

ඊළඟට, සනීපාරක්ෂක තුවා පිළිබඳ කාරණය. හෙට ඒ කටයුතු ආරම්භ කරනවා. ලබන 10වැනි දා ඉඳලා ඒවා ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

2022දී ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන ශතයක්වත් තිබුණේ නැහැ. 2023-2024 කාලයේ බොහොම අමාරුවෙන් GEM Project එකෙනුයි, අපේ ප්‍රතිපාදනවලිනුයි මේ ප්‍රතිසංස්කරණ යම් ප්‍රමාණයක කටයුතු කරගෙන යනවා.

අධ්‍යාපන පරිපාලන සේවය IIIහි කුසලතා මත පත්වීම් ලබා දීමේ කටයුතු දැන් සූදානම් කරලා තිබෙන්නේ. අවුරුදු 3ක් තිස්සේ ඒ පත්වීම් දෙන්න බැරිව හිටියේ. 2022 වර්ෂය වෙනකොට පාසල්වල පැවති ක්‍රීඩා තරග ආදී සියල්ල නැවතිලා තිබුණේ. දැන් වාර්ෂිකව ඒ සියලු තරග පවත්වනවා. Netball, volleyball, swimming යනාදී සියලු ක්‍රීඩාවල ජාතික ක්‍රීඩා තරග පවා පවත්වා විෂය සමගාමී හා බාහිර ක්‍රියාකාරකම් අපි ඒ මට්ටමට ගෙනැල්ලා තිබෙනවා.

ඊළඟට, අධ්‍යාපන සේවා සම්බන්ධව ගත්තොත්, අධ්‍යාපන පරිපාලන සේවයේ පුරප්පාඩු සඳහා අවුරුදු 3කින් බඳවා ගැනීම් කරලා තිබුණේ නැහැ. දැන් සංවෘත විභාගයේ ප්‍රතිඵල දීලා ජූනි 30ට කලින් ඒ පත්වීම් ටික දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. අධ්‍යාපන පරිපාලන සේවයට සංවෘත විභාගයෙන් 404දෙනෙක් බඳවා ගන්නත්, විවෘත විභාගය පවත්වන්න අවශ්‍ය කටයුතුත් මේ වෙනකොට අපි කරලා තිබෙනවා. ගුරු අධ්‍යාපනඥ සේවයේ පුරප්පාඩු 808ක් පිරවීමට දෙවැනි සම්මුඛ පරීක්ෂණයත් පවත්වා දැන් ඒ කටයුතු අවසන් කරගෙන යනවා, ඒ පත්වීම් ටික දෙන්න. ඒ වාගේම විදුහල්පති පත්වීම් ද අවුරුදු 5කින් ලබා දීලා තිබුණේ නැහැ. අපි ඒ පත්වීම් 4,672ක් දැන් දීලා තිබෙනවා.

වැඩ බලන විදුහල්පතිවරු 1,800ක් දැන් ඉන්නවා. ලබා දුන් උපදෙස් අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාළ තොරතුරු යැවීමේ ප්‍රමාදය තිබෙන්නේ පළාත්වලින් තොරතුරු ගෙන්වා ගන්න තිබෙන ප්‍රමාදය නිසායි. ඒ තොරතුරු අද හෝ හෙට යැව්වොත් අපට සති දෙකක් තුළදී ඒ කටයුත්තත් අවසන් කරන්න පුළුවන්. ගුරු උපදේශක සේවයේ පත්වීම්වලට අදාළ කටයුතුත් දැන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තිබෙන්නේ. කිහිප වතාවක්ම ඒ පිළිබඳව අපි සාකච්ඡා කළා. රාජ්‍ය සේවා කොමිෂන් සභාව එක්ක මේ දේවල් සම්බන්ධයෙන් ගනුදෙනු කරමින් තමයි මේ කාර්යයන් කරගෙන යන්න අපට සිද්ධ වෙලා තිබෙන්නේ.

ඊළඟට, ගුරුවරුන් බඳවා ගැනීම ගැනත් මා කථා කළ යුතුයි. අපේ රටේ 40,000ක ගුරු හිඟයක් තිබෙනවා, ඒක අතිශයෝක්තියක් නොවෙයි. මා ළඟ පළාතෙන් පළාතට ඒ සියලු තොරතුරු තිබෙනවා. පළාත් නවයේම ජාතික පාසල්වල ගුරුවරුන් 189,891ක් ඉන්නවා. මේ වෙනකොට සංවර්ධන නිලධාරීන් හැටියට 18,789දෙනෙක් ඉන්නවා. දැන් ගුරු හිඟය 26,092යි. නමුත්, ඒ සංඛ්‍යාවෙන් 18,789ක් register එකේ නැහැ. එතකොට මේ 26,000න්, 18,000ක් අඩු වුණාම ඉතිරි 8,000යි. සත්‍ය ගුරු හිඟය තමයි ඒ සංඛ්‍යාව. මේ 8,000 ගන්නකොට ගුරු සහායකයන් විධියට 2,535ක් ගන්න ගැසට් කරනවා. ඊළඟට, පළාත් මට්ටමින් තවත් 6,000කට විතර පත්වීම් දීමට නියමිතව තිබෙනවා, දෙවැනි හා තුන්වැනි වටවලදී. ඊළඟට, ජාතික පාසල්වලට අපි පත්වීම් 2,000ක් තව සති දෙකක් තුළ ලබා දෙනවා. විද්‍යාව, ගණිතය, තාක්ෂණවේදය, විදේශ භාෂා කියන අංශවලින් සියලු ජාතික පාසල්වල පවතින පුරප්පාඩු ඒ තුළින් අපි පුරවනවා. විභාග දෙපාර්තමේන්තුවට අද එම ප්‍රතිඵල යවා‍වි. ලබන සතියෙන් පසු අපට ඒ පත්වීම් දෙන්න පුළුවන්. ජූනි මාසය අවසන් වෙලා ජූලි මාසය මැද වෙනකොට 10,535කට පත්වීම් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. පත්වීම් 10,535ක් දුන්නාම සත්‍ය හිඟතාව 7,303යි. අපි සංවර්ධන නිලධාරීන්ගේ කොටස අතහැරියොත් තිබෙන තත්ත්වය තමයි මම පෙන්නුවේ. ඒ නිසා මේ හුදු සංඛ්‍යාලේඛන කවුරුවත් කියන පලියට විශ්වාස කරන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට අවුරුදු 10කට කලින් 330,000ක තිබුණු වාර්ෂික දරු උපත් සංඛ්‍යාව මේ වෙනකොට වර්ෂයකට ලක්ෂ තුනකටත් වඩා අඩු වෙලා. එම නිසා දැන් Grade 01 admissions ප්‍රමාණය සත්‍ය වශයෙන්ම අඩු වෙමින් පවතිනවා. එතකොට අපට ගණනය කරන්න වෙනවා, ඊළඟ අවුරුදු කිහිපය තුළ කොහොමද මේ මානව සම්පත කළමනාකරණය කරන්නේ කියන කාරණය.

ඊළඟට අපි බලාපොරොත්තු වෙනවා, පළාත්වල තිබෙන කලාප මට්ටමින් ගුරු තුලනයක් කරන්න. අපි උදාහරණයක් ගනිමු, උතුරු කොළඹ ඉඳලා අවිස්සාවේල්ලට. එම කලාපයේ ජාතික පාසල් ටික හැර අනෙක් පාසල්වල රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ගණිතය කියන විෂයයන් 4 උගන්වන්න ඉන්න උපාධිධාරී ගුරුවරුන් සංඛ්‍යාව, එම සියලු පාසල්වල ඉන්න ශිෂ්‍ය සංඛ්‍යාවේ එකතුව අනුව බැලුවාම ගණිතය සහ විද්‍යා විෂය ධාරාවල ගුරු ශිෂ්‍ය අනුපාතය කීයද කියලා බලන්න පුළුවන්. මෙන්න මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල තිබෙන වැදගත්ම දේ පරිපාලන ප්‍රතිසංස්කරණයයි. එම පරිපාලන ප්‍රතිසංස්කරණය පිළිබඳව අපි ගරු මන්ත්‍රීතුමන්ලාත් එක්ක මීට අවුරුදු එකහමාරකට කලින් කථා කළා. පළාත් නවයේ units නවයක් මේ සඳහා පිහිටුවන්න ඕනෑ. ඊළඟට, කලාප 100, 120කට වැඩි වෙන්න ඕනෑ. ඊළඟට කොට්ඨාස පරිවර්තනය වෙන්න ඕනෑ, මණ්ඩල බවට. එතකොට මණ්ඩල 350ක් වෙනවා. ඊළඟට, පාසල් 10,096ම පර්ෂද 1,200කට අපි සංවිධානය වෙනවා.

ඒ අනුව හැම පර්ෂදයකම ප්‍රමුඛ පාසලක් තිබෙනවා, 1AB සහ 1C පාසල් සමඟ. විපක්ෂ නායකතුමා කිව්වේ ඒ සංකල්පය පිළිබඳව තමයි. මොකද, ඒ පර්ෂදය තුළ පාසල් 10කට, සියලු සම්පත් ටික තිබෙන පාසල් අඩුම තරමින් දෙකක් හැදුණොත්, ප්‍රාථමික පාසල්වලින් සහ 1-11 දක්වා පන්ති තිබෙන පාසල්වලින් එන දරුවෝ ටිකට ඒ පාසල්වලට යන්න පුළුවන්. එතකොට හම්බන්තොට දරුවෙක් ආපසු කොළඹට එන්න ඕනෑ නැහැ. මෙන්න මේක තමයි එදා හදපු කන්නන්ගර සංකල්පය. හැබැයි, ඒක අවුරුදු කිහිපයක් තුළ වෙනස් වෙලා තිබෙනවා. පසුගිය සතියේ අමාත්‍ය මණ්ඩලය ඒ සැලැස්ම අනුමත කළා; පළාත් සභාවල එකඟතාව ගත්තා; නීතිපතිතුමාගේ එකඟතාව ගත්තා. අපි

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

දැන් ඉස්සරහට ඒ කටයුත්ත කරගෙන යනවා. හැබැයි, ඒ කටයුත්ත කරගෙන යනකොට අපේ මානව සම්පත වන පරිපාලන සේවයේ නිලධාරීන්, ගුරු උපදේශකවරු, විදුහල්පතිවරු ක්‍රමානුකූලව ස්ථානගත කරගෙන යන්න ඕනෑ. එතකොට සම්පත් බෙදී යෑමත් එක්ක මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනවා. සම්පත් බෙදී යෑම ඉතාම පහසුවෙන් කරන්න පුළුවන්, මේ පර්ෂද, මණ්ඩල සහ කලාප ටික එකට ගත්තාම. කලාපයෙන් කෙරෙන්නේ පරිපාලනය. අධ්‍යාපන මණ්ඩලයෙන් කෙරෙන්නේ supervision එක. පර්ෂදයෙන් කෙරෙන්නේ, ඒ පර්ෂදය තුළ සම්පත් කළමනාකරණය කරගෙන පර්ෂද සියල්ලම එක මට්ටමට, එක ඉලක්කයක් කරා යෑම සඳහා කටයුතු කිරීම. හැබැයි, මතක තියා ගන්න, අපි මේ කටයුත්ත කරන්නේ භෞතික සම්පත් සහ මානව සම්පත් නිහ වෙලාවක බව. මේ දෙකම කළමනාකරණය කරගෙන තමයි අපට ඉදිරියට යන්න වෙලා තිබෙන්නේ.

ඊළඟට, අපි අධ්‍යාපන පරිපාලන සේවයේ ධාරිතාව වර්ධනය කළා. මේවා අවුරුදු ගණනක් තිස්සේ කරලා තිබුණේ නැහැ. ඒ වාගේම තමයි, ගුරුවරුන්ගේ උසස්වීම් හා EB Examination. දැන් ලක්ෂයකට වැඩි පිරිසක් ඉන්නවා, මොඩියුල ක්‍රමය යටතේ මේ කටයුතු කරගන්න බැරිව. මේ ක්‍රමය වෙනස් කරන්න ව්‍යත්තීය සමිති එක්ක සාකච්ඡා කළා වාගේම, ඒ අයත් එක්කම එකතු වෙලා කමිටුවකුත් හදලා තිබෙනවා. ඒ කමිටුව විසින් සකස් කළ වාර්තාව අපි රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යැව්වා. ඒ තීන්දුව අපට ඊළඟ සති දෙක, තුන ඇතුළත ලැබෙයි. එතකොට ලක්ෂ ගණනකගේ උසස්වීම් සම්බන්ධයෙන් තිබුණු ප්‍රමාදයට, EB Examination එක පිළිබඳ ප්‍රශ්නයට විසඳුම ලැබෙනවා. ඒ වාගේම විදුහල්පතිවරුන්ගේ EB Examination එකට අදාළ විභාග දෙකම දැනට පවත්වා තිබෙනවා. විදුහල්පතිවරුන්ගේ ගැටලු පිළිබඳ සඳහන් කමිටු වාර්තාව අරගෙන, එයින් එකඟ වෙච්ච කරුණු පිළිබඳව අමාත්‍ය මණ්ඩල සන්දේශය ඉදිරිපත් කරලා තිබෙනවා. දීමනා වැඩි කිරීම සම්බන්ධයෙන් වාගේම, අධිශ්‍රේණියක් පත් කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා මේ වෙනකොට සති දෙක, තුනක් වෙනවා. ඒකේ නිරීක්ෂණ ආවාම ලබන සතිය වනවිට මම හිතනවා, අනුකමිටුවට ඒ කාරණය අරගෙන සාකච්ඡා කරලා අපට යම් යම් තීන්දුවලට එන්න පුළුවන් කියලා.

ඊළඟට, ව්‍යත්තීය සමිති ගැනත් මම කියන්නම්. මට හිතෙන විධියට, මම තරම් ව්‍යත්තීය සමිති සමඟ වෙන කවුරුවත් සාකච්ඡා කරලා නැතිව ඇති. අධ්‍යාපන ක්ෂේත්‍රයේත්, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේත් තත්ත්වය ඒකයි. අපේ ගරු සුරේන් රාඝවන් රාජ්‍ය ඇමතිතුමා ඒ අය එක්ක එක පැත්තකින් කථා කරනවා. මම තවත් පැත්තකින් කථා කරනවා. අපි කථා කරන්නේ නිකම් නොවෙයි. මේ අනධ්‍යයන සේවකයන් සම්බන්ධයෙන් අවධානය යොමු කරලා තිබෙන ප්‍රශ්නය මතු වුණේත් 2018දී. 2018දී සෙසු ශ්‍රේණිවලට සියයට 107ක වැඩිවීමක් දෙනකොට, අනධ්‍යයන සේවකයන්ට දුන්නේ සියයට 92යි. ඔබතුමන්ලා ඒ බව දන්නවා. ඒ ඇති වෙච්ච සියයට 15ක gap එක තමයි ඔවුන් මේ ඉල්ලන්නේ. ඒ සියයට 15ක gap එක පිරවීම සඳහා අපි අමාත්‍ය මණ්ඩල සන්දේශ ඉදිරිපත් කරලා, නිරීක්ෂණත් එවා තිබෙනවා. හැබැයි, සමහර නිරීක්ෂණවලට මම එකඟ නැහැ. නමුත්, අපි ඒවා ප්‍රතික්ෂේප වෙන්න නොදී තියාගෙන ඉඳලා ඒ සමස්තයම කමිටුවකට යොමු කරලා තිබෙනවා, ඊළඟ අය වැයට යෝජනා ඉදිරිපත් කරලා, ඒ අය වැය ලේඛනයෙන් ප්‍රතිපාදන වෙන් කරගෙන ජනවාරි මාසයේ ඉඳලා ක්‍රියාත්මක කරන්න. මේක තමයි ව්‍යත්තීය සමිති කාලාන්තරයක් තිස්සේ ඉල්ලුවේ. අපට දැන් එපා, ජනවාරියේ දෙන්න, හැබැයි, වක්‍රලේඛය නිකුත් කරන්න කියලා ඒ අය කියනවා. හැබැයි, වක්‍රලේඛය නිකුත් කරන්න වෙන්නේ අය වැයට මේ යෝජනාව ඇතුළත් කරලා, ඒ අය වැය සම්මත වුණාමයි. වක්‍රලේඛයක් භාණ්ඩාගාරයට එක වතාවටම නිකුත් කරන්න බැහැ. ඒ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරලා තමයි වක්‍රලේඛය නිකුත් කරන්න ඕනෑ. අපි ඒ කාරණය තේරුම් ගන්න ඕනෑ. හැබැයි, අපට එකඟ වෙන්න පුළුවන්, අපි ඒ සඳහා අවශ්‍ය ගමන් මාර්ගයේ යනවාය කියන කාරණය සම්බන්ධයෙන්.

ඊළඟට, අනධ්‍යයන සේවකයන්ගේ අනෙක් ඉල්ලීම වුණේ MCA එක. ඒ කියන්නේ, හිලව් දීමනාව. දැන් අධ්‍යයන කාර්ය මණ්ඩලවලට සියයට 25ක අධ්‍යයන දීමනාව දුන්නා. සියයට 25 දැන් සියයට 38ක් වෙලා තිබෙනවා. එතකොට දැන් සම්පූර්ණ අධ්‍යයන දීමනාව සියයට 188ක්; now, it is 188 per cent. ඒක දුන්නාට පස්සේ තමයි මේ ඉල්ලීම ආවේ. ඒක කාලාන්තරයක් තිස්සේ තිබුණු ඉල්ලීමක් නොවෙයි. ඒ ඉල්ලීම අරගෙන බලනකොට, වර්ෂයක් මැද ප්‍රතිපාදන තිබෙන්න ඕනෑ ඒක ගෙවන්න. අපි කියලා තිබෙනවා, ඒ වෙනුවෙන් ප්‍රතිපාදන තිබෙන ප්‍රමාණය බලන්න කියලා. එහෙම බලලා භාණ්ඩාගාරයේ එකඟතාව ලබා ගන්න ඕනෑ. අපේ රාජ්‍ය ඇමතිතුමා ඊයේ සාකච්ඡාවක් පැවැත්වුවා. අද ඒ යෝජනා එවලා තිබෙනවා. මම හිතනවා, අපට ඊළඟ දවස් දෙක, තුන ඇතුළත ඒ සම්බන්ධයෙන් එකඟතාවකට එන්න පුළුවන් කියලා. ඒ අයගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නයක් අපි මතු කරන්නේ නැහැ. අපි දන්නවා, ඒ අය දැන් මාස එකහමාරක් තිස්සේ ගෙදර ඉන්නවා කියලා. දැන් ඒ සමහරුන්ට ජීවත් වෙන්න ක්‍රමයක් නැහැ. අපි ඔවුන්ට ප්‍රශ්නයක් ඇති කරන්නේ නැහැ. හැබැයි, ඔවුන් සේවයට වාර්තා කළොත් අපට වැටුප් ගෙවන්න පුළුවන්. මෙන්න මේ කරුණු ටික අපි ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා. මොකද, රාජ්‍ය සේවයේ විවිධ අංශවල පවතින ප්‍රශ්න එකවර විසඳීම ගැන තමයි අමාත්‍ය මණ්ඩලයේදී සාකච්ඡා වුණේ.

වෛද්‍යවරුන්ට වැටුප් වැඩි කළාම අන්‍ය සේවකයෝත් වැටුප් වැඩි කරන්න කියා ඉල්ලුවා. ඔවුන් ඒ වෙනුවෙන් වැඩ වර්ජනය කරමින් හිටියා. ඒ නිසා රෝගීන්ට බරපතළ ප්‍රශ්නයක් ඇති වුණා. අද විශ්වවිද්‍යාල පද්ධතියේ වෙලා තිබෙන්නෙත් ඒකයි. මේ ප්‍රශ්නය එක තැනකින් විසඳෙනකොට තවත් තැනකින් අනෙක් පැත්තෙන් මතු වෙනවා. මේක සීසෝවක් වාගේයි. හෙට ආණ්ඩුව ගන්න කියන්නකෝ, ඔය කථා කරන අයට. එහෙම ආණ්ඩුව ලබාගෙන, අනිද්දා ඉඳලා මේ ඉල්ලීම් ටික ඉටුකර දෙන්න කියලා මම ඒ අයට අභියෝග කරනවා. මේ කියන හැම එකක් පිටුපසම දේශපාලනයක් තිබෙනවා, නැත්තේ නැහැ. ගුරුවරුන් ලෙඩ නිවාඩු දැමීම පිටුපසත් දේශපාලනයක් තිබෙනවා. නමුත්, මම ඒ ගැන විවෘතව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒක, ඒගොල්ලන්ගේ අයිතිය. විශ්වවිද්‍යාලවල අනධ්‍යයන සේවයේත් එහෙම තත්ත්වයක් තිබෙන්න පුළුවන්. ඒකත් ඔවුන්ගේ අයිතියක්. නමුත්, පාර්ලිමේන්තුවේත්, ඉන් පිටතදීත් මේ ගැන සෝෂා කරන සියලු දේශපාලනඥයන්ට මම කියනවා, හෙට ආණ්ඩුව අරගෙන අනිද්දාට මේ ඔක්කොම ඉල්ලීම් ටික ලබා දෙන්න කියලා.

ගුරු වැටුප් විෂමතාව විසඳන්න රුපියල් බිලියන 40ක් - Rs. 40 billion - ඕනෑ. ඒ තුනෙන් එකක් එක කොටසකට. මම මේ එක පැත්තක් ගැන විතරයි කිව්වේ. එක පැත්තකින් කියනවා, ගුරු වැටුප් විෂමතාව විසඳන්න කියලා. අනෙක් පැත්තෙන් කියනවා, විදුහල්පතිවරුන්ගේ වැටුප අඩුයි කියලා. ඉතින්, දෙයියනේ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව ඇති වුණේ 1994දී ගුරුවරුන්ගේ ගුරු සේවා ව්‍යවස්ථාව හැදුවාම නේ. මේකේ ඉතිහාසය දැනගන්න ඕනෑ. බී.සී. පෙරේරා වැටුප් කොමිසමෙන් මොකක්ද කළේ? සමස්ත රාජ්‍ය සේවයේම වැටුප් හදනකොට ගුරුවරුන්ගේ වැටුප පැත්තකින් තියලා ඉතුරු අයට දුන්නා. ඇයි

ඒ? මේක එදා ඉඳලාම තිබෙන ප්‍රශ්නයක්. ඒ නිසා තමයි කියන්නේ, පටන් ගන්නකොටම වරද්දා ගත්තොත් දිගටම වරදිනවා කියලා. මම එක කාරණයක් කියන්නම්. දැන් මේ ඔක්කොම දෙන්නේ පොරොන්දු නේ. දැන් මේ පොරොන්දුත් විසඳන්න පටන් ගන්න කෝ. එහෙම වුණොත්, දැන් තිබෙන පඩිය ගෙවන්න හම්බ වෙන්නේත් නැහැ කියලා මම අභියෝග කරනවා. මේ රට ගෙනියන හැටි, අද ආර්ථිකය තිබෙන හැටි, රජයට ආදායම් උපදවන හැටි ඉස්සෙල්ලා හිතන්න. සුරංගනා කථා කියලා මේ වාගේ දේවල් කරන්න බැහැ. කොයි රටේ පාසල්ද කැමති අපේ පාසල් එක්ක twin කරලා, එහේ සල්ලි මෙහේ එවන්න. එහෙම සල්ලි එවන්න හදනකොට කියයි, remittances කරන්න බැහැයි කියලා.

ලෝකයේ ප්‍රධාන විශ්වවිද්‍යාලයක් වන හාවර්ඩ් විශ්වවිද්‍යාලය උදාහරණයකට ගන්න. අපේ රාජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. හාවර්ඩ් විශ්වවිද්‍යාලය පවත්වාගෙන යන්නේ කොහොමද? භාරයකින්. Trust එකකින්. *[බාධා කිරීමක්]* John Harvard Trust එකෙන් තමයි ඒවා පටන් ගත්තේ.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
With a US Dollars 40 billion endowment fund.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඕනෑම ප්‍රධාන විශ්වවිද්‍යාලයක් උදාහරණයකට ගන්න. ඒ හැම විශ්වවිද්‍යාලයක්ම මුදල් අය කරනවා. ඊළඟට, කාගේ හෝ භාරයකින් පටන් ගත්ත අරමුදලකින් තමයි ඒවා පවත්වාගෙන යන්නේ.

දැන් කියනවා, අධ්‍යාපනයට GDP එකෙන් සියයට 6ක් වෙන් කරනවා කියලා. ඒක බොහොම හොඳයි. ඒක තමයි UNESCO එකේ තිබෙන benchmark එක. හැබැයි, දැන් ප්‍රශ්නය කොතැනද තිබෙන්නේ? දැන් මේ ඔක්කොම කථා කරන්නේ කරවටක් ගිලිලා නහයෙන් උඩට වතුර යන්න හදනකොට පිදුරු ගහේ එල්ලිලා ඉන්නා වෙලාවක. හැබැයි, මේ පිදුරු ගහ අත ඇරුණොත් ඔය තිබෙන තත්ත්වයෙනුත් පල්ලෙහාට ගිහිල්ලා ගිලෙනවාය කියන එක ඒ අයට තේරෙන්නේ නැහැ. ඒක තමයි සත්‍යය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව කාරණා කීපයකුත් කියන්න බලාපොරොත්තු වෙනවා. ඒ අතරතුර තමයි මම මේ කරුණු ටිකත් කිව්වේ.

ඊළඟට, විෂය මාලා සංවර්ධනය ගැන කථා කරමු. UNESCO එකේ තිබෙන norm එක ගන්නකෝ. ප්‍රාථමික අධ්‍යාපනය ගැන මොකක්ද කියන්න තිබෙන්නේ? බලන්න ඒ අර්ථ නිරූපණය. ප්‍රාථමික අධ්‍යාපනයේදී තිබෙන්නේ ලිවීමේ, කියැවීමේ සහ සුහුරු කුසලතා පිළිබඳ හැකියාව ලබා දෙන එක. ජාතික අධ්‍යාපන ආයතනයේ ඉන්න අය නිකම්ම ආපු අය නොවෙයි. ඒගොල්ලන් මේ රටේදී O/L, A/L විභාග කරලා, උපාධිය ලබාගෙන, පශ්චාත් උපාධියත් ලබාගෙන, සමහර විට PhD එක පිට රටකදී කරපු අය. දැන් එතුමන්ලාට නේ මේ උපදෙස් දෙන්නේ, විෂය මාලාව හදන්න. දැන් මේ විෂය මාලාව හදන එකටත් ජාතික අධ්‍යාපන ආයතනයට පාර්ලිමේන්තුවෙන් තමයි උපදෙස් දෙන්නේ. මම හිතන්නේ, වඩා හොඳයි ඒ DG තනතුරට සුදුසුකම් තිබෙන අය පාර්ලිමේන්තුවෙන් තෝරලා යැව්වා නම්. මේ රටේ බුද්ධිමත් ජනතාවට තමයි මේ විධියට කියන්නේ. ඒ නිසා පරිස්සමින් කථා කරන්න. ඉස්සරහට මැතිවරණයක් තිබෙනවා. ඡන්ද දායකයා බලයි, විෂය නිර්දේශය හදන්න පාර්ලිමේන්තුවෙන් උපදෙස් දෙනවා නම් අපේ ළමයි ටික කොහේද නවතින්නේ කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA left the Chair, and THE HON. KINS NELSON took the Chair.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිරේක කරුණුත් මට කියන්න වෙනවා. මොකද, එක කාලයක් කිව්වා, නීති විද්‍යාලය ළඟ ඉඳගෙන, නීති විද්‍යාලයෙන් එළියට වීසිවෙන පනතක් බලලා නීතිය කරන්න පුළුවන් කියලා.

මේ අධ්‍යාපනයත් එහෙම කරන්න බැහැ. මේක නිකම් නොවෙයි, කාලාන්තරයක් තිස්සේ ආපු එකක්. ඒ ගැන අපි දන්නවා.

දැන් PISA Test එක ගැන කිව්වා. PISA Test එකේ විෂයයන් කීයක් කරනවාද කියලා කියන්න බලන්න. මම ඒක ඒ වෙලාවේ නැඟිටලා ඇහුවේ නැහැ. PISA කියන්නේ Programme for International Student Assessment කියන එක. That is the meaning of PISA. PISA Test එක පටන් ගත්තේ 2000 වර්ෂයේ. ඇමෙරිකා එක්සත් ජනපදයේ පටන් ගත්තා, STEM education එක. ඔය STEM එක අද STEAM වෙලා ලෝකය පුරා රටවල් 90කට වැඩි ප්‍රමාණයක ගිහිල්ලා තිබෙනවා. STEM education එක තිබෙන රටවල දරුවන්ගේ කුසලතාව විෂයන් තුනකින් - ගණිතයත් එක්ක - මනින්න තමයි PISA Test එක තිබෙන්නේ. 2015 වර්ෂයේ පැවති PISA Test එකේදී සිංගප්පූරුව පළමුවැනියට ආවා, වියට්නාමය අටවැනියට ආවා. පළමුවැනි රටවල් 5 තුළ තමයි හැමදාම Finland ඉන්නේ. ඒ විස්තර මට කියන්න පුළුවන්. හැබැයි PISA Test එකට යන්න නම් STEM education මෙහේ තිබෙන්න ඕනෑ. හැබැයි අවුරුදු ගණනක් තිස්සේ අපට ඒක කරන්න බැරි වුණා. ඒ නිසා දැන් National Science Foundation එකත් එක්ක STEM education එක popularize කරන programme එකක් වෙනම ක්‍රියාත්මක වෙනවා. ලේසි නැහැ මේවා කියනවා වාගේ කරන්න. අපි මේ අවුරුදු දෙක තුළ පොත් ටික දීලා, නිල ඇඳුම් ටික දීලා, බස් ටික ධාවනය කරවලා, ලයිට් දීලා මේ ඔක්කෝමත් කරන ගමන් තමයි දැන් මේකත් කරන්න පටන් අරගෙන තිබෙන්නේ. අපි මේ දීලා තිබෙන ගණනින් සපත්තුත් දුන්නා, 750,000කට.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ඊළඟට මේවාට අවශ්‍ය ප්‍රතිපාදන ගැන අහනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ඊළඟ අවුරුදු හතරට අවශ්‍ය ප්‍රතිපාදන වෙනුවෙන් අපි දැනටත් ආසියානු සංවර්ධන බැංකුවත් එක්ක negotiate කරනවා. අපට GEM Project එකෙනුත් ප්‍රතිපාදන හම්බ වෙනවා. විෂය මාලා ප්‍රතිසංස්කරණ ඉක්මනින් කරන්න පුළුවන් කියලා සමහරු හිතනවා. දැන් එක සැරයක් මට ඔය කාරණාවට මුහුණ දෙන්න වුණා නේ. අමාත්‍ය ධුරයෙන් එළියට දමන්න කලින් මම පාර්ලිමේන්තුවේ කිව්වා, පැය 48න් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන්න බැහැ කියලා. "පොළේ කථාවට" වඩා ඒකත් හේතුවක් වුණා, මා එළියට දමන්න. ඉතින් ඇත්ත ඒක නේ. දැන් තිබෙන විෂයමාලා සංවර්ධනය කරන්න අවුරුදු 8ක cycle එකක් තිබෙනවා. අන්තිමට ඒක කෙටි කරලා ගත්තාම අවුරුදු 5ක් හෝ 6ක් යනවාමයි. දැන් 1, 6, 10 ශ්‍රේණිවලට piloting එක කරනවා. දැන් problem solving, critical thinking ගැන කියනවා. ඉතින් ඒක මෙතැන - පාර්ලිමේන්තුවේ - පෙන්වන්න ඕනෑ නේ. ඒක පාර්ලිමේන්තුවට පෙන්වන්න ඕනෑ. Problem solving කියන එක උදාහරණයකට දමලා case study එකක් අරගෙන පෙන්වන්න. Critical thinking කියන එකත් ඒ විධියට පෙන්වන්න. ඒ නිසා මේවා හුදෙක් වචනවලට සීමා කරන්න එපා. අපි පශ්චාත් උපාධි කරනකොට ඔය ඔක්කෝම කරලා තිබෙන්නේ. Case studies අරගෙන තමයි අපි ඒවා ගැන පැය ගණන් කථා කරන්නේ. අර රාජ්‍ය නිලධාරි මැදිරියේ ඉන්නවා මහාචාර්යවරු, ආචාර්යවරු. ඒ ගොල්ලන්ට ඇහෙන්න ඕවා කියන්න එපා. මොකද, problem solving, critical thinking කියන්නේ විසිඑක්වන සියවසයේ මේ යන වර්ධනයත් එක්ක ආපු සංකල්පත් එක්ක යන දේවල්. හැබැයි මේවා ඉතිහාසයේ ඉඳලාම තිබුණා.

අහන්නකෝ, tacit knowledge ගැන. මට නැඟිටලා අහන්න දුන්නා නම් මම අහනවා. What is tacit knowledge? මම දැන් ඒක උගන්වන්න යන්නේ නැහැ, මෙතැන. හැබැයි අපි ඉගෙනගෙන තිබෙනවා. අපි practise කරලා තිබෙනවා. මට නීතිඥ වෘත්තිය කරන්න බැහැ නේ, ඔය දෙකම නැතුව. පුළුවන්ද? ඒකට problem solvingයි, critical thinkingයි දෙකම ඕනෑ. Otherwise, how are you going to cross-examine a witness in the witness box? මමත් මේ විෂයය කරන්නේ ඇමතිකම් කිහිපයක් කරලා ඒ පළපුරුද්දත් එක්ක. මම අධ්‍යාපන අමාත්‍යාංශයේ කටයුතුත් නිකම් කරනවා නොවෙයි. මම මේ භාරගත්තේ තාවකාලික වගකීමක්. මම පැහැදිලිවම කියනවා, මම මේක සදාකාලිකව කරන්න භාරගත්තා නෙවෙයි කියන එක. සමහරු භාර නොගෙන පැනලා ගියාම, අස්වෙලා ගියාම, ආවේ නැති වුණාම අපි භාරගත්තා, මේක යන්තම් තිබිච්ච තැනින් අරගෙන පීල්ලට දාලා දෙන්න. දැන් ඒක තමයි අපි මේ කරගෙන යන්නේ. අනෙක් කථා, සුරංගනා කථා ඔක්කෝම කියන්න පුළුවන්. වැල්ලේ ගෙවල් හදන්නත් පුළුවන්. හැබැයි, ලොකු රැල්ලක් ආවාම ගහගෙන යනවා. අහසේ මාළිගා තනන්නත් පුළුවන්, සිහින මාළිගා හදන්නත් පුළුවන්. හැබැයි ඒවාට ජනතාව රැවටෙනවාද, නැද්ද කියන එක ඊළඟ මාස කිහිපයේ තීන්දු කරයි. එදාට ඒ වගකීම භාර දෙන අයට භාර දෙයි. දැන් තිබෙන කොටස තමයි අපි කරන්නේ.

මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා, භාෂාව කියන Chapter එක. දැන් මට වෙලාව නැහැ අදාළ Article එක අරගෙන කියවන්න. මට මතක විධියට 21වැනි ව්‍යවස්ථාවද කොහේද. Chapter IV එකේ භාෂාව කියන එකේ ඉතා පැහැදිලිව තිබෙන කාරණය මම කියන්නම්. මම මේවා ගැන කියන්න ඕනෑ නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පොඩ්ඩක් වැඩිපුර වෙලාව ගන්නවා. මම ඒ කාලය කළමනාකරණය කරන්නම්. දැන් ඉංග්‍රීසි භාෂා කේන්ද්‍රීය අධ්‍යාපනයක් දෙනවාය කිව්වා නේ. අන්න අපේ ගෙවිඳු කුමාරතුංග මැතිතුමා බොහොම අවධානයෙන් බලාගෙන ඉන්නවා. මෙන්න, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා භාෂාව ගැන.

එහි IV වැනි පරිච්ඡේදයේ, 21(1)වන ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වනවා:

"(1) යම් තැනැත්තකුට ජාතික භාෂා දෙකෙන් කවර මාධ්‍යයකින් වුව ද අධ්‍යාපනය ලැබීමට හිමිකම ඇත්තේ ය:"

දැන් ඉංග්‍රීසි කේන්ද්‍රීය අධ්‍යාපනය ගෙනෙනවා නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ ව්‍යවස්ථාව සංශෝධනය කරන්න. මම දන්නේ නැහැ, ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා මේකට එකඟ වෙයිද කියලා. හැබැයි, ඊළඟට මෙසේ සඳහන් වනවා:

"එසේ වුව ද, ජාතික භාෂාවක් නොවන භාෂාවක් ඉගැන්වීමේ භාෂා මාධ්‍යය වන උසස් අධ්‍යාපන ආයතනයකට මෙම අනුව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවන්නේ ය."

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාවේදී කියන්න, මම වෙලාව දෙන්නම්.

මම කිව්වේ, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන හැටියටයි අපි අධ්‍යාපනය ගෙන යන්නේ කියන එක. අපට ඕනෑ ඕනෑ හැටියට මේක කරන්න බැහැ. හැබැයි, මතක තබාගන්න, 1961න් පසු 2000දී කැබිනට් පත්‍රිකාවක් මඟින් නැවත උසස් අධ්‍යාපන ආයතනවල ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන්න පටන්ගත්තා. ඒක තමයි 6 ශ්‍රේණිය දක්වා ආවේ. අද 6 ශ්‍රේණියෙන් ඉහළ bilingual education තිබෙන්නේ මේ හේතුව නිසායි. ඔබතුමන්ලා දන්නවාද, ඉංග්‍රීසි භාෂාව උගන්වන්න උපාධිධාරීන් ගන්න අපි විභාග පැවැත්වුවා, interviews පැවැත්වුවා. නමුත් ආපු සංඛ්‍යාව ප්‍රමාණවත් නැහැ, බදවාගන්න. මෙන්න මේකයි තත්ත්වය. ඉතින්, අපි කොහෙන් හරි කෙළවරකින් පටන්ගන්න ඕනෑ. ඒවා දැන් අපි පටන් අරගෙන, කරගෙන යනවා. 1 සහ 2 ශ්‍රේණිවල අපි භාවිතයෙන් ඉංග්‍රීසි භාෂාව පටන් අරගෙන තිබෙනවා. කවුරුත් ඒක කළේ නැහැ.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

හෙදයි, කියන්න. අපේ ගෙවිඳු කුමාරතුංග මැතිතුමාට අවස්ථාව දෙන්න.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. අපේ අදහස නම් ලෝකයේ දියුණු වෙච්ච සෑම රටක්ම, - අද මේක ඉංග්‍රීසි භාෂාව මුල් කරගෙන පර්යේෂණ කරලා, සාධනය කරලා, විශාල ආචාර්ය උපාධි නිබන්ධන ගණනාවක් තිබෙනවා - තමන්ගේ මව් භාෂාව මුල් කරගෙන තමයි දියුණු වෙලා තිබෙන්නේ. යුරෝපයේත් එහෙමයි. ඔය එංගලන්තය නොවෙයි යුරෝපය කියන්නේ. ඒ වාගේම ආසියාව දෙස බලන්න. ජපානය වේවා චීනය වේවා කොරියාව වේවා ඒ විධියට තමයි දියුණු වෙලා තිබෙන්නේ. දැන් කොරියාවේ රස්සාවක් කරන්නත් කොරියානු භාෂාව ඉගෙන ගන්න ඕනෑ නේ. ඉංග්‍රීසි භාෂාව ඉගෙනගෙන ඒක කරන්න බැහැ නේ. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, අපේ අදහස ඒකයි. අපි කියන්නේ ඉංග්‍රීසි විතරක් නොවෙයි, 6 ශ්‍රේණියේ ඉඳලා ජර්මන්, ප්‍රංශ, හින්දි, චීන භාෂාවලටත් ලෝකය විවර කරන්න, ඒවාටත් අපේ අධ්‍යාපනය විවර කරන්න කියායි. අපේ ඉල්ලීම ඒකයි. මේ ඉංග්‍රීසි වහල්භාවයෙන් මිදෙනකල් අපේ රට දියුණු වීමක් හෝ අපේ රටේ අවදි වීමක් වෙන්නේ නැහැ. ඒකයි අපේ අදහස.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Thank you.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වැඩ පිළිවෙළ දැන් ක්‍රියාත්මක කරගෙන යනවා. 6 සිට 13 දක්වා ශ්‍රේණිවල ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන්න ගුරුවරු මදි. යම් නිශ්චිත කාලයක් සඳහා විශ්‍රාම ගිය ගුරුවරුන් බඳවාගන්න දැන් අපි නිවේදන නිකුත් කරන්න කටයුතු කරලා තිබෙනවා.

ඊළඟට, විශේෂ අධ්‍යාපනය ගැන කවුරුත් කථා කළේ නැහැ. ඒක පැත්තකට දාලා තිබුණේ. ශ්‍රවණ ඌනතා, කථන ඌනතා, autism තිබෙන ඔක්කොම දරුවන් අද කලවමේ ඉන්නේ. විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථාන ගණන අඩුයි. අඩුම ගණනේ දිස්ත්‍රික්කයකට එක මධ්‍යස්ථානයක්වත් තිබෙන්න ඕනෑ. අද එහෙමවත් නැහැ. ඉතින්, ඒ වැඩ පිළිවෙළට අපි අවධානය යොමු කරලා තිබෙනවා.

ඊළඟට විදේශ ආධාර එන්නේ එක එක ආයතනවලින්. Digitalization ගත්තාම, චීන ආධාර යටතේ ඩොලර් මිලියන 20ක් එන්න තිබුණා. ඒක යට ගිහින් තිබුණේ. අපි ඒක එළියට අරගෙන තිබෙනවා දැන්. මේ පර්ෂද හැදීම කඩිනම් කළේ මේකයි. මේ පර්ෂද මූලස්ථානම තිබෙන්නාවූ පාසල් 1,220ත් ඇතුළුව පාසල් 1,500ක් අපි ඩිජිටල්කරණය කරනවා. එතැනින් ලැබෙනවා digitalize කරන්න අඩුම වශයෙන් boards 1,000ක්. ඒ එකක් මම හිතන්නේ over Rs. 1 million. Projectors අවශ්‍ය නැහැ, කැමරා එකත් ඒකේම තිබෙනවා. මේ තමයි නවීන තාක්ෂණය. ඊළඟට, TRC එකෙන් තව 1,500ක් ගන්නවා. මේ 2,500ම ජාලගත කරලා පාසල් 1,500ක් ජාලගත වෙනවා, මේ digitalization networking යටතේ. එතකොට පර්ෂද මූලස්ථානයේ networking එනකොට, ඊළඟ අදියර එන්නේ වටේ තිබෙන්නාවූ අනෙක් පාසල් ටිකට. ඒ පාසල් ටිකත් අපි ජාලගත කරනවා. මේ smartboard එකක් දෙනවා කියන්නේ blackboard එකට replace කිරීමක් නොවෙයි. Smartboard එකක් දෙනවාය කියන්නේ networking එකක් එක්ක එක වැඩ පිළිවෙළකට යන එක. අධ්‍යාපන අමාත්‍යාංශය කරන්නේ ඒක. හැබැයි, කවුරු හෝ පාසලකට පුවරුවක් දෙනවා නම් අපි ඒක එපා කියන්නේ නැහැ. අපි ඒකත් භාවිත කරනවා මේ වැඩ පිළිවෙළට.

ඊළඟට, අපි AI උගන්වන්න පටන් අරගෙන තිබෙනවා 9 ශ්‍රේණියෙන් ඉහළ pilot project එකක් විධියට. අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ කරද්දි pilot project එකක් කරන්න ඕනෑ. නිකම් කරන්න බැහැ. ගුරුවරයා එතැනට ගෙනෙන්න ඕනෑ, දැනුවත් කරන්න ඕනෑ. අපට තනියම බැරි නිසා මයික්‍රොසොෆ්ට් ආයතනයත් එක්ක අවුරුදු දෙකක් කථා කරලා, ඒ අයගේ සහයෝගය ලබාගෙන තමයි මේක ජාත්‍යන්තර මට්ටමට ගෙනාවේ.

ගුරුවරුන් පුහුණු කරන්න CRC මධ්‍යස්ථාන 85ක් තිබුණා. ඒ ප්‍රමාණය දැන් වන විට 100 දක්වා වැඩි කර තිබෙනවා. මේ හැම ප්‍රශ්නයක්ම තිබියදීත් අපි විභාග ප්‍රතිඵල වර්ධනය කරගෙන තිබෙනවා.

ඊළඟට පිරිවෙන් අංශය ගනිමු. පිරිවෙන් අංශයට ගුරුවරුන් බඳවා ගන්නේ කොහොමද? පිරිවෙන් අංශයට ගුරුවරුන් බඳවා ගන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය සාමාන්‍ය ගුරු සේවයට බඳවා ගන්නා විධියට නොවෙයි. පරිවේණාධිපතිවරුන්ගේ එකඟතාව මතයි ඒ අය පත් කර ගන්නේ.

ගරු විජිත බේරුගොඩ මහතා (පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித பேருகொட - பிரிவெனாக் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. Vijitha Berugoda - State Minister of Piriven Education)

කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්සේලාගේ එකඟතාව මත.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔව්, කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්සේලාගේ එකඟතාව මත. පිරිවෙන් අංශය ගැන මම දැන් කථා කරන්නේ නැහැ. මොකද, එම විෂයය භාර ගරු විජිත බේරුගොඩ රාජ්‍ය ඇමතිතුමා දැන් මේ සභාවේ ඉන්න නිසා. ඒවාට එතුමාට උත්තර දෙන්න පුළුවන්. වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් වශයෙන් රජයේ ගුරුවරුන්ගෙන් අය කරන ප්‍රමාණය සහ පිරිවෙන් ගුරුවරුන්ගෙන් අය කරන ප්‍රමාණය අතර තිබෙන වෙනස -සියයට 8 සහ 14 වශයෙන් තිබෙන වෙනස- ගැන අපි දන්නවා. අපි ඒ ගැන සාකච්ඡා කරලා තිබෙනවා. ඒ සඳහා විසඳුම් ක්‍රියා මාර්ගයකට යන්න ඕනෑ. ඒ ගැන කිසි තර්කයක් නැහැ.

"සති පාසල" වැඩසටහන ගැන කවුරුවත් කථා කළේ නැහැ. අද එම වැඩසටහන පාසල් 9,000ක ක්‍රියාත්මකයි, ආගම් භේදයකින් තොරව.

අපි ජාත්‍යන්තර ජයග්‍රහණ රාශියක් දිනා ගත්තා. මම මේ අමාත්‍යාංශය භාර ගන්න කොට, UNESCO සාමාජිකත්වය අහිමි වෙන්නයි තිබුණේ. ඒ වාර්ෂික දායක මුදල ගෙවා තිබුණේ නැහැ. Commonwealth of Learningහි සභාය අහිමි වෙන්නයි තිබුණේ. ඒ දෙකටම අදාළ මුදල් ගෙවා, රටවල් 144ක ඡන්ද ලබා ගනිමින් තමයි අපි UNESCO එකේ Board එකට පත් වුණේ. මින් ඉදිරියට මෙම අමාත්‍යාංශය භාර ගන්නා ඕනෑම ඇමතිවරයෙකුට තවත් අවුරුදු තුනක් එම මණ්ඩලය තුළ කටයුතු කරන්න පුළුවන්. අපි ඒ පදනම හදා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස්වල සාමාන්‍ය පෙළ විභාගය අවසන් කළ දූ දරුවන්ට පාසලේ උසස් පෙළ පන්ති පටන් ගත්තා. එතැනදීත් ගැටලු එනවා. ඊයේ මට කථා කරලා කිව්වා, ප්‍රධාන පෙළේ පාසලක සියයට 90ක් දරුවෝ පාසල් ඇවිත්

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

සිටි බව. වැස්ස නොතිබුණා නම් සියයට 100ම එනවා. ඉස්සර වුණේ කොහොමද? අපොස (සාමාන්‍ය පෙළ) විභාගය පවත්වා මාස හතරක් පමණ ගත වෙනවා, ප්‍රතිඵල එන්න. ඒ දරුවෝ අයාලෙ යනවා. අද ඒක වෙන්නේ නැහැ. හැබැයි, ගුරුවරුන්ට වැඩිපුර මහන්සි වෙන්න සිදු වෙනවා. ඒ අය අද ඒක කරනවා. විදුහල්පතිවරුන්ටත් මහන්සි වෙන්න සිදු වෙනවා. පාසල්වල තිබෙන ඩෙස්, පුටු, බංකු මදි ඇති; පන්ති කාමර මදි ඇති. මොකද, double batch නේ. ඒ තත්ත්වය මාසයක් දෙකක් පවතීවි. 13 වසරේ සිසුන් study leave අරගෙන පාසල් එන්නේ නැති වන විට අලුත් කණ්ඩායමට ඒ course එකේ සම්පූර්ණ දින ගණන පවත්වාගෙන යන්න පුළුවන්.

ඊළඟට පෙර පාසල් අධ්‍යාපනය ගැනිමු. UNICEF සංවිධානයත් එක්ක එකතුව ජාතික අධ්‍යාපන ආයතනය විසින් ජාතික ප්‍රතිපත්තියට අනුරූපව පෙර පාසල් වෙනුවෙන් programme එක හදා අවසන්. ToTලා train කරනවා. ඊට අදාළව, පළාත් නවයේ අධිකාරි නවයක් තිබෙනවා. ඒ අයත් එක්ක ඒ වැඩ කටයුත්ත සිදු කර තිබෙනවා. දැන් පෙර පාසල් ගුරුවරු 34,000ක් ඉන්නවා. ඔවුන් අතර ඩිප්ලෝමාධාරීන් 6,000යි ඉන්නේ. ඉතින් මේ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය ඇති වෙයි.

වයස අවුරුදු 4 සම්පූර්ණ වුණු හැම දරුවෙක්ම අපි පෙර පාසල්ගත කරනවා. ඒ සඳහා වත්කමක් නැති දෙමව්පියන් සිටිනවා නම් අපි ඒකට වැඩ පිළිවෙළක් හදනවා. වැසී යන පාසලක පන්තියක් අරගෙන -අපේ ගුරුවරුන් නොවෙයි- පෙර පාසල් සඳහා පුහුණු කරන ගුරුවරුන්ට අපි අවස්ථාව ලබා දෙනවා, එම ස්ථානයේ පෙර පාසලක් පවත්වා ගෙන යන්න. එවැනි ප්‍රායෝගික වැඩසටහන්වලට අපි යනවා. වයස අවුරුදු 4 සම්පූර්ණ වුණු හැම දරුවෙක්ම -සියයට 100ම- පෙර පාසල්ගත කිරීම තමයි අපේ වැඩ පිළිවෙළ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෙර පාසල් ගුරුවරයෙකුට රජයෙන් ලැබෙන දීමනාව රුපියල් 2,500යි. මම දන්නවා, ඊළඟ සති දෙකතුන තුළ ඒ ප්‍රමාණය වැඩි වෙයි කියලා. වැඩි වන ප්‍රමාණය ගැන මම දන්නේ නැහැ. නමුත් වැඩි වේවි. එම කාරණය කෙරෙහි දැන් අවධානය යොමු කරලායි තිබෙන්නේ.

මම මෙහිදී තවත් කාරණයක් සඳහන් කරන්න කැමැතියි. ඔව්, 5 ශිෂ්‍යත්වය දරුවන්ට බර වැඩියි. මනෝ විද්‍යාඥයන් ඒ ගැන කියා තිබෙනවා. ඒ නිසා තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ විභාග බර අඩු කරමින් ක්‍රියාකාරකම් සහ මොඩියුල පදනම් කරගෙන තක්සේරුවක් කරන්නේ. ඒකට ගැළපෙන්න boards ටික හැදෙන්න ඕනෑ. මොකද, පන්ති කාමරය ගැන තක්සේරුව හරිද කියන එක check කරන්න කවුරු හරි ඉන්න ඕනෑ. ඒකට ඒ පිරිස පත් කරන්න ඕනෑ. ඒ නිසා තමයි ප්‍රතිසංස්කරණයේ ප්‍රධාන කොටස් දෙකක් අපි ඉස්සරහට ගත්තේ. ඒවා තමයි, පරිපාලනමය වෙනස්කම සහ විෂය මාලා සංවර්ධනය. එහෙම නැති වුණොත් තවත් අවුරුදු 10කට බැහැ, ඒවා කරන්න.

ඊළඟට, විශ්වවිද්‍යාල ගැන කිව යුතුයි. මම ඒ ගැන වැඩිදුර කථා කරන්නේ නැහැ. මොකද, අපේ ගරු උසස් අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා මේ සභාවේ ඉන්න නිසා. එතුමා ඒ ගැන කියාවි. අද අපේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ courses කීයක් තිබෙනවාද? First degree එකට අදාළව 863ක් තිබෙනවා. Postgraduate degree එකේ ඊට වඩා වැඩියි. ගරු සුරේන් රාඝවන් රාජ්‍ය ඇමතිතුමනි, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉතිරි කාරණා ගැන ඔබතුමා පැහැදිලි කරන්න. විෂය භාර රාජ්‍ය අමාත්‍යවරයා විධියට ඔබතුමා ඒ ගැන දන්නවා නේ. ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. Academic allowance එක බොහොම අමාරුවෙන් තමයි වැඩි කළේ. හැබැයි, ඒකත් එක්ක තමයි අනෙක් ප්‍රශ්නය ආවේ. ඒක හැම තැනම වෙන දෙයක්.

වෘත්තීය අධ්‍යාපනය ගැන ලොකුවට ප්‍රශ්න මතු වුණේ නැහැ. නමුත් ප්‍රතිසංස්කරණ වැඩසටහනට අනුව Grade 9 වන කොට දරුවා තක්සේකරුවට ලක් කරනවා. දරුවා G.C.E. O/L විභාගයෙන් fail කරන්නේ නැහැ. ඒ වෙනුවට තක්සේරුවක් කරලා දරුවාට අවශ්‍ය වෘත්තීය පුහුණුවට යොමු කිරීමේ වැඩ පිළිවෙළට අපි එනවා. ඒ සඳහා අවශ්‍ය industry එක අපි යොදා ගන්නවා.

අද මොකක්ද වෙලා තිබෙන්නේ? මම මේ ළඟදී Medical Faculties දොළහේම පීඨාධිපතිවරුන් ගෙන්වා කථා කළා. කරාපිටියේ intake එක 300යි. මම මේ ළඟදී ගියා, to University of Illinois. එය ඇමෙරිකාවේ තිබෙන top-level medical college එක. අනෙක් එක, Houstonවල Baylor College of Medicine. 100යි, intake එක!

මොකද, ඒගොල්ලෝ ratio එක maintain කරනවා. රෝහලකට ගියත්, patientsලාගේයි medical studentsලාගේයි ratio එකක් තිබෙනවා. ඊළඟට, lecturersලාගේයි විශ්වවිද්‍යාල දරුවන්ගේයි ratio එකක් තිබෙනවා. ඉතින් universitiesවල rankingsවල ratio එකේ නිර්ණායකය එකම දේ නොවෙයි.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
ඒක හරි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමා ඒ ගැන කියන්න. Rankings හදන ක්‍රමයක් තිබෙනවා. ලෝකයේ rankings ගත්තොත්, ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ්, ප්‍රින්ස්ටන්, හාවර්ඩ්, යේල්, ජෝන්ස් හොප්කින්ස් ආදි වශයෙන් විශ්වවිද්‍යාල කිහිපයකම නම් කියාගෙන යන්න පුළුවන්. හැබැයි, ඒවායේ rankings හදන ක්‍රමයක් තිබෙනවා. ඒවායේ උපාධිය දෙන්නේ මුදලට, නිකම් නොවෙයි. නමුත්, අපේ first degree එක දෙන්නේ නිකම්. අපේ දන්ත පීඨයේ එක ශිෂ්‍යයෙකුට රුපියල් ලක්ෂ 125ක් වැය වනවා. වෛද්‍ය ශිෂ්‍යයෙකුට රුපියල් ලක්ෂ 80ත්, 90ත් අතර මුදල් ප්‍රමාණයක් වැය වනවා. ඒ, මේ රටේ ජනතාවගේ මුදල්; ජාතික ධනය. ඒ මුදල් තමයි ඒ සඳහා වියදම් කරන්නේ. ඒ නිසා අපි මේවා ගැන බලන්න ඕනෑ.

පෙරේදා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව කැබිනට් පත්‍රිකාවක් ආවා. දැන් වැඩ නැවතිලා තිබෙන හැම ගොඩනැඟිල්ලකම වැඩ කටයුතු ආරම්භ වෙලා තිබෙනවා. ඒවා

සමීපව අධීක්ෂණය කරනවා. SAITM ගොඩනැඟිල්ල අරගෙන මොරටුව පීඨයේ ප්‍රශ්නය විසඳුවා. සබරගමුවේ ප්‍රශ්නය විසඳලා දැන් ඉදි කිරීම් ටික කරගෙන යනවා. ගාල්ල කරාපිටියේ ගොඩනැඟිලි දෙකක වැඩ දැන් අවසන් වෙමින් යනවා. අනික් පැත්තෙන්, වයඹ වැඩ කටයුතු කෙරීගෙන යනවා. අවුරුදු 3ක් තිස්සේ මුදල් නැතිකම නිසා, ආධාර ආවේ නැති නිසා නැවතිච්ච ඒ දේවල් අපි නැවත ක්‍රියාත්මක කරගෙන යනවා. අපි වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේත් සෑම ආයතනයකම, NAITA, VTA සහ Ceylon-German Technical Training Institute කියන හැම එකකම, intake එක දෙගුණ කරලා තිබෙනවා. පරක්කු වෙලා තිබුණු වැඩ කොටස් අපි ඉස්සරහට ගෙනැල්ලා තිබෙනවා.

මම දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ; වෙන් වෙන් වශයෙන් පිළිතුරු දෙන්න යන්නේත් නැහැ. මේ ගරු සභාවේ සිටින අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය, තිබෙන ප්‍රශ්න ඉදිරිපත් කරලා ඒවා විසඳන්න අපිත් එක්ක බොහොම සමීපව කටයුතු කරගෙන යනවා.

2021, 2022 වර්ෂ සඳහා දැන් විද්‍යා පීඨවලට සිසුන් තෝරාගෙන යනවා. 2022, 2023 වර්ෂ සඳහා ගැසට් නිකුත් කරන්න තිබෙනවා. විදුහල්පති සේවාව ගැන මම කිව්වා. වැඩ බලන විදුහල්පතිවරු ගැන කිව්වා. රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ගුරු උපදේශක සේවාව පිළිබඳව උපදෙස් ලැබුණු ගමන් අපි ඒ වැඩ ටික පටන් ගන්නවා.

අපි භාණ්ඩාගාරයේ නිලධාරීන් එක්ක වැටුප් විෂමතාව සම්බන්ධයෙන් ඊයේත් සාකච්ඡාවක් කළා. ඒ සඳහා මට යන්න හම්බ වුණේ නැහැ. මම 12.30 වෙනතුරු මෙතැන හිර වුණා. ලබන අඟහරුවාදා මමයි, ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමායි භාණ්ඩාගාර නිලධාරීන් එක්ක සාකච්ඡා කරනවා. අපි නැවත වතාවක් වෘත්තීය සමිති නියෝජිතයෝත් එක්ක සාකච්ඡා කරලා මේ සඳහා විසඳුම් වැඩ පිළිවෙළකට යනවා. අපි පිළිගන්නවා, විෂමතාවක් තිබෙන බව. හැබැයි ඒ විෂමතාව නිසා වැටුප් වැඩි කරන හැම එකක්ම ගුරු කාර්ය සාධනයට සම්බන්ධ වෙන්න ඕනෑ. 1994 ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය හැදුවේ කාර්ය සාධනයත් එක්ක වැටුප් වැඩි වන විධියට. කාර්ය සාධනය පැත්තකින් තියලා වැටුප් විතරක් වැඩි කළාට තේරුමක් නැහැ. ඒක වෘත්තීය සමිතිත් පිළිගන්නවා. ඒ නිසා මේ කාරණා දෙක එකිනෙකට බද්ධ කරලා යන වැඩ පිළිවෙළකට අදාළ විසඳුම් ක්‍රියා මාර්ගවලට ගිහිල්ලා තිබෙනවා. අපේ අලුත් ලේකම්තුමිය ඉතා ඕනෑකමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් එක්ක මේ වැඩ කරගෙන යනවා. මේ කටයුතුවලදී ජාතික අධ්‍යාපනය ආයතනයත් විශාල වෙහෙසක් දරනවා.

ආයතනවල යම් යම් ප්‍රශ්න තිබෙන්න පුළුවන්. ගරු රෝහිණී කුමාරි මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කියපු කාරණය හරි. ගයාත්‍රි මහත්මිය retire වුණාට පස්සේ තමයි එතුමියට Super Grade එක ආවේ. අපි සුමාන දෙකකට කලින් interview එක පැවැත්වුවා. Interview එකට 10දෙනෙක් ආවා. පස්දෙනායි ඉතිරි වුණේ. පස්දෙනෙක් විශ්‍රාම ගිහිල්ලා තිබුණා. කාලාන්තරයක් තිස්සේ ඇති වෙච්ච මේ arrears එක තමයි මම clear කරගෙන ඉස්සරහට එන්නේ. මෙහි තිබෙන ප්‍රායෝගික ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් තමයි අපි අධ්‍යාපනය වැටෙන්න නොදී ඉස්සරහට අරගෙන යන්නේ. මෙය ජාත්‍යන්තර තලයට ගෙන යන්න පුළුවන්. ඒ සඳහා විශාල මහන්සියක් දරන්න වෙනවා. ඒ සඳහා ප්‍රතිපාදන අවශ්‍ය වෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයට මීට වඩා ප්‍රතිපාදන වැඩි විය යුතුයි කියන කාරණය මම පිළිගන්නවා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු ඇමතිතුමනි, මට ඔබතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා බස්නාහිර පළාත් මහ ඇමති ධුරයේ හිටපු කාලයේ ඉඳලා ගොඩක් මහන්සි වෙලා වැඩ කළා කියලා මම දන්නවා. මම ඔබතුමාට සුබ පතනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂතුමා වන ආචාර්ය එස්. කරුණාකරන් මහතාට ප්‍රශ්නයක් තිබෙනවා. එතුමා දැන් පාදුක්ක, මීපේ හන්දිය, ජාතික අධ්‍යාපන ආයතනයේ වැඩ කරනවා. එතුමා තමයි එහි අධ්‍යක්ෂතුමා. එතුමාට එතැන වැඩ කරන්න දෙන්නේ නැහැ. ජාතිවාදය පදනම් කරගෙන එතුමාට විරුද්ධව වැඩ කරගෙන යනවා. එතුමාට මේ පත්වීම ලබා දුන්නේ පෙබරවාරි මාසයේ. එතුමා මේ ප්‍රශ්නය ගැන ඔබතුමාට කථා කළා. ඒ වාගේම එතුමා ජනාධිපතිතුමාගේ කාර්යාලයට කථා කළාම තමයි මේ ප්‍රශ්නයට මැදිහත් වුණේ. එතුමාට සාධාරණය ඉටු කර දෙන්න. ජාතිවාදය පදනම් කරගෙන එතුමාට විරුද්ධව වැඩ කරන නිලධාරීන් ඉන්නවා. මගේ ළඟ ඒ අයගේ නම් තිබෙනවා. මට සදාචාරයක් තිබෙන නිසා මම ඒ නම් කියන්නේ නැහැ. කරුණාකරලා එතුමාට සාධාරණය ඉෂ්ට කරලා දෙන්න. එතුමාට සුදුසුකම් තිබුණු නිසා තමයි එතුමා interview එකෙන් දිනුවේ. Interview එකට face කරලා interview එකෙන් දිනලා එතුමා ඒ පත්වීම ලබාගෙන තිබෙනවා. එම නිසා එතුමාට වැඩ කරන්න දෙන්න.

දමිළ නිසාද එතුමාට එතැන වැඩ කරන්න ඉඩ දෙන්නේ නැත්තේ කියලා මට තේරෙන්නේ නැහැ. අද වෙනකොට මේ රට ජාතිවාදී කාල පසු කරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා එතුමාට වැඩ කරන්න දෙන්න. ඕනෑ නම් අනික් අයට වෙන කොහේට හරි යන්න කියන්න. ඒකට කමක් නැහැ. එතුමාට සාධාරණය ඉටු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. එතුමා ජනාධිපතිතුමාට appeal කරලා තිබෙනවා. මට ඒකේ copy එකක් එවලා තිබෙනවා. මම මේ ලිපිය ඔබතුමාට දෙන්නම්. එතුමාට සාධාරණය ඉෂ්ට කරලා දෙන්න බලන්න.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තරය මට ලැබිලා තිබෙනවා. හොඳයි, ඔබතුමා අහන්න.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, මුස්ලිම් ගැහැනු ළමයින්ට හිජාබ් ඇඳගෙන පාසල්වලට යනකොට සමහර අවස්ථාවල ප්‍රශ්න ඇති වෙනවා. ඒ වාගේම හිජාබ් ඇඳගෙන විභාග ලිවීමට යෑමේදීත් ප්‍රශ්න ඇති වෙනවා. Hijab is only a headscarf. That headscarf is a religious requirement for Muslim girls and particularly at exam centres, they have been forced to remove it. So, if there is any reason to check them, that must be explained and examination of their headscarves is permitted, but not permanently removing them because that is a religious requirement. That is also happening in some non-Muslim schools. So, in that regard, kindly issue a circular, clarifying matters and have that implemented.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මීට පෙර මේ සම්බන්ධයෙන් තවත් කරුණු දෙකක් ඉදිරිපත් වුණා. ඒ වාගේම අද උදේ තවත් ප්‍රශ්නයක් මතු කළා. ඒ තමයි, ගරු මුජිබුර් රහුමාන් මැතිතුමා මතු කළ ප්‍රශ්නය. විභාග මධ්‍යස්ථානය, අංක 116, විවේකානන්ද දෙමළ මහා විද්‍යාලය, ශාලා අංක 2. අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගයේදී වූ සිද්ධියක් සම්බන්ධයෙන් තමයි ඒ ප්‍රශ්නය අහලා තිබුණේ. ඒ පිළිබඳව තොරතුරු ලැබී තිබෙනවා. විභාග නීති රීති සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ 17. (iii) (ආ) වගන්තියට සහ 17. (iv) වගන්තියට අදාළව අනන්‍යතාව තහවුරු නොකිරීම මත විභාග නීති රීති උල්ලංඝනය කරලා තිබෙනවා. වෙනත් හේතුවක් නිසා නොවෙයි. සිංහල, දෙමළ, මුස්ලිම් කියලා නැහැ, ඒක කාටත් අදාළයි. ඒ අනුව තමයි 10ක් අවලංගු කරලා තිබෙන්නේ.

දෙවැනි කාරණය, ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික නොකිරීම. ඇත්ත නේ. Admission card එකක් අරගෙන යනවා නම්, ඒක certify කරලා අරගෙන යන්න ඕනෑ. පරිපාලන සේවයේ විභාගයට පෙනී සිටින කෙනා දන්නේ නැද්ද, ඒක සහතික කරගෙන යන්න ඕනෑ කියලා? ඒ අනුව එක් අයෙකුගේ විභාගය අවලංගු වෙලා තිබෙනවා. අනික් එක්කෙනා identity එක තහවුරු කරලා නැහැ. ඒ විධියට දෙදෙනෙකුගේ විභාගය අවලංගු වෙලා තිබෙනවා. ඒ වාගේම ජංගම දුරකථන ළඟ තබා ගැනීම නිසා හත්දෙනෙකුගේ විභාගය අවලංගු කරලා තිබෙනවා. බලන්නකෝ, මෙහෙම වෙලා තිබෙන්නේ ළමයින්ට නොවෙයි. පරිපාලන සේවයේ විභාගයට ලියන්න ගිහිල්ලා හත්දෙනෙක් ජංගම දුරකථන තබාගෙන ඉඳලා තිබෙනවා! ඒ අයට විභාගය තහනම් කිරීම විභාග නීති රීතිවලට අදාළයි.

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමනි, ඒ හැර දරුවන් සම්බන්ධයෙන් ඔබතුමා කියපු කාරණය ගත්තොත්, තැන් කිහිපයකදී තේරුම් කරලා දුන්නාම ඒ අය ඒකට අවනත වෙලා තිබෙනවා. ත්‍රිකුණාමලයේ ප්‍රශ්නයක් ආවා. අපි ඒ සම්බන්ධ තොරතුරු ලබා ගත්තා. අපි ඒ විමර්ශන අවසන් කරලා ප්‍රමාද නොකර ප්‍රතිඵල ලබා දෙනවා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමිය කෙටියෙන් ප්‍රශ්නය අහන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, ඔබතුමා බොහොම ආවේගශීලිව උත්තර දුන්නා. කොහොම වුණත් මම කිව යුතු එක දෙයක් තිබෙනවා. විෂය නිර්දේශ හදන්නේ NIE එකෙන් තමයි. නමුත් ඒක කාලයට ගැළපෙන්නේ නැත්නම් හෝ යම් කිසි ගැටලු තිබෙනවා නම් හෝ මහජන නියෝජිතවරු හැටියට අපි ඒවා පෙන්වන්න ඕනෑ. එහෙම නැතුව පාර්ලිමේන්තුවෙන් DG පත් කරන එක නොවෙයි කරන්න ඕනෑ.

ඒ වාගේම තවත් කාරණයක් තිබෙනවා. විපක්ෂ නායකතුමා කාලයට ගැළපෙන යෝජනා කිහිපයක් ගෙනාවා. අපි ඒවා කරන්න ඕනෑ. ඔබතුමා අවසානයේදී කිව්වා, මුදල් නැතිකම නිසා කරන්න බැහැ කියලා. එම නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, අපි මොන ක්‍රමයකින් හෝ ඒ මුදල් ටික ලබා ගැනීම සඳහා අධ්‍යාපනය සඳහා වෙන් කරන මුදල වැඩි කර ගන්න ඕනෑ. එහෙම නැති වුණොත් මේවා වෙනත් අය අවභාවිත කර ගන්නවා, ඒ ගොල්ලන්ගේ දේශපාලන වැඩවලට. ඒ තුළින් අන්තිමට පාඩුව සිද්ධ වෙන්නේ මේ රටේ දරුවන්ට. අන්න ඒ නිසායි අද මේ විවාදය පාර්ලිමේන්තුවට ගෙනාවේ. දරුවන්ට සිදු වන පාඩුව අවම කර ගන්න නම්, ඒ ඒ වෘත්තීන්වල සේවාවල සිටින අයගේ ප්‍රශ්නවලට අපි අවධානය යොමු කරන්න ඕනෑකම තිබෙනවා. එම නිසා මම ඔබතුමාගෙන් නැවත වතාවක් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව බොහොම කාරුණිකව බලන්න කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇත්ත වශයෙන්ම බංකොලොත් වුණු රටක වුණත්, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ අධ්‍යාපනය සඳහා වැඩිපුර මුදලක් වෙන් කරලා තිබෙනවා. 2023 වර්ෂයට වඩා 2024 වර්ෂයේ මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව සමස්ත අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් බිලියන 517ක් වෙන් කරලා තිබෙනවා. ඒ කියන්නේ, ADB, World Bank, SESIP Programme වාගේ ඒවායින් ලැබෙන මුදල් හැර. ඊට අමතරව අපි පුළුවන් තරම් උත්සාහ ගන්නවා ඒ මුදල වැඩිකර ගන්න. අද වටිනා යෝජනා හා අදහස් ආවා. ඒවා ගැන කිසි ගැටලුවක් නැහැ. අපි ඒවා සලකා බලනවා. ඔබතුමියලාටත් පුළුවන්, තව මාස තුන හතරක් ගියාට පස්සේ ක්‍රියාකාරී ලෙස ඔය වැඩ පිළිවෙළට සම්බන්ධ වෙන්න. මම භාර ගත්තේ අවුරුදු දෙකහමාරක තාවකාලික තනතුරක්. එක මුලින්ම කියලා තමයි මගේ කථාව පටන් ගත්තේ. මම ඒ මතයේ ඉන්නේ. මම මේක අවුල් කරලා යන්නේත් නැහැ, වෙනත් කෙනෙකුට කරන්න බැරි තැනකට ගේන්නේත් නැහැ.

කරන්න පුළුවන් තැනකට ගෙනැල්ලා දෙන එක තමයි මගේ වගකීම. ජාත්‍යන්තර සමුළුවලට ගිහිල්ලා ඒවායෙන් ලබා ගත් අත්දැකීම් තුළින් තමයි මම කිව්වේ, අපි හිතන තරම් මේ වැඩ සුන්දර නැහැ කියලා. මේවා ක්‍රියාත්මක කරන්න ගියාම මතුවෙන ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒවාත් එක්ක පොර බදමින් තමයි අපි මේවා මෙතැනට, මේ පීල්ලට ගෙනැල්ලා තිබෙන්නේ. ඒ කාරණය තමයි මම කිව්වේ.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියනි, ඉතා කෙටියෙන් කාරණය කියන්න. මොකද, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්න කාගේ කාලයක ඇති වුණත් කමක් නැහැ. ඔබතුමා බොහොම සංවේදීව ඒවා දිහා බලන නිසා ඔබතුමාගේ කාලයේදී මේ ප්‍රශ්න ටික ඉවර කරලා දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.54]

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අධ්‍යාපන ඇමතිතුමාගේ කථාව අහගෙන හිටියා. අධ්‍යාපන ඇමතිතුමා, අපි ප්‍රශ්න ඉදිරිපත් කරනකොට ඒවාට ඉතාම සාවධානව ඇහුම්කන් දීලා උත්තර හොයන්න උනන්දුවක් දක්වලා තිබෙනවා. ඒ වාගේම අවශ්‍ය වෙලාවට රැස්වීම් පවත්වලා අපට කථා කරන්න අවස්ථාව ලබා දෙනවා. අපි ඒක අගය කරනවා. ඔබතුමා කථා කරනකොට මට පැන නැඟුණු ප්‍රශ්නයක් තමයි ඔබේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියද ඔබ නියෝජනය කරන්නේ කියන එක. ඔබතුමා ප්‍රායෝගිකව මේ ප්‍රශ්න මතු කළාට, මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ගැන හොයලා බලනකොට සම්පූර්ණයෙන්ම වෙනස් විධියේ ප්‍රතිපත්ති සම්පාදනයක් තමයි සිද්ධ වෙන්නේ කියන එක පැහැදිලියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
වෙනස් වීමකුත් තිබෙනවා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
මේ ළඟදී ඉදිරිපත් කරලා තිබෙනවා, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව; NEPF - National Education Policy Framework - එක. මම හිතන්නේ නැහැ, එහි ඔබතුමා කියන ගැටලු හඳුනාගෙන ඒවාට පිළිතුරු ලබා දීලා තිබෙනවා කියලා. ඒකෙන් වෙන්නේ හාත්පසින්ම වෙනස් දෙයක්. අතිශයින්ම භයානක, නිදහස් අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම වැනසෙන ප්‍රතිපත්තියක් තමයි ජනාධිපති කාර්යාලයෙන් නිකුත් කරලා තිබෙන්නේ. මම දැක්කා, රාජ්‍ය ඇමතිතුමාගේ සමාජ මාධ්‍යයේ පළ කරලා තිබෙනවා, ඔබතුමා ඒ පිළිබඳව දන්නේ නැහැ කියලා. මට හිතෙන විධියට මේක තමයි ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉතිහාසයේ ඉඳලාම තිබෙන ප්‍රශ්නය මොකක්ද කියන එක කථා කළා. ගුරු වැටුප් විෂමතාව ඇත්තටම ආරම්භ වන්නේ 1994දී. අනධ්‍යන කාර්ය මණ්ඩලයේ වැටුප් ප්‍රශ්නයත් කාලයක් තිස්සේ උද්ගත වෙලා තිබෙන බරපතළ ප්‍රශ්නයක්. එතකොට මෙතැන ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මොකක්ද? එන එන ආණ්ඩුව මැදිහත්වෙන *ad hoc* විධිය නිසා මේ ප්‍රශ්න එන්න එන්නම උග්‍රවෙලා තිබෙනවා. නමුත්, කොතැනින් හරි මේ ප්‍රශ්න විසඳන්න පටන් ගන්න ඕනෑනේ. කොතැනින් හරි ඉතිහාසයේ වෙච්ච වැරදි නිවැරදි කිරීම සඳහා යම්කිසි තීන්දු තීරණ ගන්න වෙනවා.

අද වෙනකොට අපේ අධ්‍යාපන ක්‍රමයේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පැන නැඟිලා තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි අපේ මානව සම්පතේ තිබෙන ප්‍රශ්න. ගුරුවරුන්, අනධ්‍යයන කාර්ය මණ්ඩලය, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් යන සියලුදෙනාගේම වෘත්තීයභාවය රැක ගැනීමට අපොහොසත් වීම. වැටුප් පිළිබඳව විතරක් නොවෙයි, ගුරු සේවය තුළ වැටුප් වැඩි කරමින් වෘත්තීය සමිති එක්ක ආපු එකඟතා ක්‍රියාත්මක නොකිරීම නිසා තමයි මේ අර්බුදය පැන නැඟිලා තිබෙන්නේ. ඒ හා සමගාමීව අපි යෝජනා කරන්නේ, ගුරු සේවයේ ගුණාත්මකභාවය වැඩි කිරීමට නිසි විධියට පියවර ගත යුතු බවයි. මේක හරියට සිද්ධ වෙන්නේ නැති නිසා, ඉතිහාසය තුළ වෙච්ච වැරදි නිවැරදි නොකිරීම නිසා එන්න එන්නම මේ ප්‍රශ්න බරපතළ තැනකට ඇවිල්ලා තිබෙනවා. ඒකෙන් ලැබෙන ප්‍රතිඵලය මොකක්ද? ඒ නිසා අවුරුද්දකට කිහිප වතාවක් අපේ විශ්වවිද්‍යාල පද්ධතිය වැහෙනවා. මේ වෙනකොට ප්‍රතිඵල නිකුත්වෙලා තිබෙන දරුවන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරගෙන නැහැ. ඒ වාගේම ගිය අවුරුද්දේ ප්‍රතිඵල නිකුත් වෙච්ච ළමයින්වත් අරගෙන නැහැ. මේ අවුරුද්දේ ප්‍රතිඵලත් නිකුත්වෙලා තිබෙනවා.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
I need to correct you, Hon. Member.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
Could you respond after I finish because I have only eight minutes?

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
You cannot establish a wrong argument.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
You can respond after I am done. I have only eight minutes. So, please, let me speak. - *[Interruption]*

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
But, you cannot establish wrong arguments. It is only for the UVPA, University of Visual and Performing Arts, that students have not been taken. That is because 700 students need - *[Interruption]* So, do not establish wrong arguments.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
That is not correct. Online පටන් අරගෙන තිබුණාට ළමයින් විශ්වවිද්‍යාලවලට ඇතුළු වෙලා නැහැ. ඒ ප්‍රශ්නය තවම තිබෙනවා. මෙවර උසස් පෙළ විභාගයේ results නිකුත් වෙලාත් තිබුණත්, තවම ඊට ඉස්සෙල්ලා batch එකේ වැඩ හරියට පටන් අරගෙන නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම දැන් graduate employment scheme එකක් පටන් අරගෙන තිබෙනවා. ඒ රැකියාව ලබා ගැනීමට ඔවුන්ගේ original certificates විශ්වවිද්‍යාලවලින් ලබා ගත යුතුයි. මේ තිබෙන තත්ත්වය තුළ ඒවා ලබා ගන්නත් බැරි වෙලා තිබෙනවා. මම කියන්න හදන්නේ, අපි ප්‍රශ්නවලට හරියට මැදිහත් නොවීම නිසා මේ system එක මේ විධියට අකර්මන්‍ය වෙන්න ඉඩ දීලා තිබෙනවා කියන එකයි. ඒ නිසා ඒක සිද්ධ වෙන්නේ කාගේ වාසිය සඳහාද කියන එක පිළිබඳ ප්‍රශ්නයක් ඇත්තටම පැන නඟිනවා. මේ විධියට විශ්වවිද්‍යාලවල ප්‍රශ්න පැන නැඟුණේ ඉතිහාසය අනුව 1994 වර්ෂයේද, 2015 වර්ෂයේද කියන එක අපට අදාළ නැහැ. අපට ඒ ප්‍රශ්නවලට හරියට විසඳුමක් ලැබිය යුතුයි. ඇත්තටම අපි දකින විධියට මෙතැන තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, මේ තීන්දු-තීරණ

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය]

ගන්නේ ආණ්ඩුව තුළ ඇති එකඟතාවක් මතද කියන එක. මේ ප්‍රශ්නවලට මැදිහත් වෙලා, මේවා හරියට විසඳන්න ඇත්තටම ආණ්ඩුවේ බලය තිබෙන්නේ කාටද? මොකද, ගරු අමාත්‍යතුමා එක විසඳුමක් යෝජනා කරනකොට, තව පැත්තකින් තව එකක් කියනවා. උදාහරණයක් මම කියන්නම්. මම මැදිහත් වෙලා මොරටුව විශ්වවිද්‍යාලයේ clinical training පිළිබඳව ගරු අමාත්‍යතුමා එක්ක සාකච්ඡාවක් කරනකොට, වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල ඒ වෙනුවෙන් වෙන් කරනවා කියන යෝජනාව ආවා. ඒක කරන්න අවම වශයෙන් අවුරුදු දෙකක් යනවා කියලා සෞඛ්‍ය අමාත්‍යාංශයම එතැනදී කිව්වා. ඉස්සෙල්ලාම නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල රජයට තිබෙන ණය පියවා ගන්න වෙනවා, ඒ සඳහා විශාල මුදලක් වැය වෙනවා කියලා කිව්වා. දැන් ඒ අවුරුදු දෙක ගත වනතුරු clinical training සිද්ධ වෙන්නේ කොහේද? ඒ රැස්වීමේ දී යෝජනා වෙලා තිබුණා, කළුතර නාගොඩ රෝහල ඒ සඳහා පාවිච්චි කළ හැකියි, ඒක වැඩිය ප්‍රායෝගිකයි කියලා. මම දන්නවා, එතැනදී නෙවිල් ප්‍රනාන්දු රෝහලට යන්න ශිෂ්‍යයන්ගේ කැමැත්තක් තිබෙන බව. නමුත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් ඒ සඳහා අවුරුදු දෙකක්වත් ගත වෙනවා කියන එක පැහැදිලිව කිව්වා. එතකොට ඒ අවුරුදු දෙක ඇතුළත සිද්ධ වෙන්න යන්නේ මොකක්ද?

දැන් ආයුර්වේද විශ්වවිද්‍යාලයේ courses ආරම්භ කරලා තිබෙනවා. ඒ ගොල්ලන්ට clinical training යන්න ස්ථාන නැහැ. ඒ courses අටසිය ගණනක් තිබෙනවා වෙන්න පුළුවන්. නමුත් ඒ coursesවලට අදාළ clinical training යන්න ස්ථාන නැත්නම්, ඒවා recognize කිරීමේ ක්‍රියාවලිය හරියට සිද්ධ වෙලා නැත්නම් ඒ courses නිකම් offer කරලා තේරුමක් නැහැ. ඒවා ආරම්භ කරනකොට මේ ක්‍රියාවලිය ගැන අවබෝධයක් එක්ක තමයි ආරම්භ කරන්න ඕනෑ. එහෙම නැත්නම් අවසානයේ දී ඒ ශිෂ්‍යයන්ට තමයි මේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ. ඔවුන් courses කරනවා. ඔවුන් බලාපොරොත්තු වෙනවා අවසානයේ දී යම් කිසි විධියකින් ඒ ලබන degree එක හරහා ඔවුන්ට රැකියාවක් ලබා ගන්න පුළුවන් කියලා. නමුත්, එවැනි තත්ත්වයක් උදා වෙන්නේ නැහැ.

අපි දේශපාලනඥයන් හැටියට කල්පනා කරනවා, විෂය නිර්දේශය තිබිය යුත්තේ කොහොමද කියන කාරණය පාර්ලිමේන්තුවට වැඩක් නැහැ කියලා. ඒක අපේ වැඩක් නොවෙයි. නමුත්, අපේ වැඩේ තමයි ඒ ආයතනික ව්‍යුහය හරියට හදන එක. NIE එකටද, NEC එකටද, අධ්‍යාපන අමාත්‍යාංශයටද ඒ අවශ්‍ය පහසුකම් දෙන එක, ඒ ආයතන ව්‍යුහය හරියට හදන එක, එතැන සිටින නිලධාරීන්ට ස්වාධීනව කටයුතු කර ගෙන යෑමට අවශ්‍ය පසුබිම හදන එක තමයි අපේ කාර්යභාරය විය යුත්තේ. නමුත්, ඓතිහාසිකව සිද්ධ වෙලා තිබෙන්නේ මේ ආයතන ව්‍යුහ දුර්වල කිරීම තුළින් ඒ එක ආයතනයක්වත් ඒ නිලධාරීන්ගේ දැනුම පාවිච්චි කරලා ඔවුන්ට අවශ්‍ය විධියට අපක්ෂපාතී ලෙස කටයුතු කිරීමට නොහැකි වීමයි. එක් එක් අවස්ථාවලදී ලෝකයේ තිබෙන මොකක් හරි කථාවක් ගේනවා. STEM education කියලා එකක් පටන් ගත්තා. දැන් STEM education පරණයි කියන එක අපි පිළිගන්නේ කවදාද? ඉතින්, ඒක හරියට තේරුම් ගන්නේ නැතුව මේ විධියට මොකක් හරි වචනයක් අල්ලාගෙන එක එක්කෙනා දුවනවා. ඒක නොවෙයි විය යුත්තේ.

මට තව පොඩි කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණා ටිකත් කියන්න. විෂය නිර්දේශ තීරණය කරන්න ඕනෑ අපි නොවෙයි; syllabus එක මොකක්ද කියන එක තීරණය කරන්න ඕනෑ අපි නොවෙයි. දේශපාලනඥයන්ගේ සහ ආණ්ඩුවේ වගකීම විය යුත්තේ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන එකයි. දේශපාලන මැදිහත්වීම් නොකර, නිලධාරීන්ට ඔවුන්ගේ කටයුතු හරියට කරගෙන යන්න ඉඩ දෙන එකයි කළ යුත්තේ. එහෙම නැතිව අපේ තිබෙන hobby-horses අරගෙන ඒවාත් එක්ක දුවන එක නොවෙයි විය යුත්තේ. එවැනි දේවල් නිසා තමයි මේ අවුල ඇතිවෙලා තිබෙන්නේ. දේශපාලනඥයන්ගේ මැදිහත්වීම් තුළින් අවුල් කිරීම නිසා තමයි වැටුප් විෂමතාව ඇවිල්ලා තිබෙන්නේ. කවදා හරි මේවා විසඳන්න ඕනෑ. ඒවා විසඳුවේ නැත්නම් මේ රටේ පුරවැසියන්ට, විශේෂයෙන්ම අපේ ශිෂ්‍යයන්ට තමයි මේ ප්‍රශ්නය බලපාන්නේ. මේ තත්ත්වය නිසා ඔවුන්ගේ අනාගතය සම්බන්ධයෙන් විශාල ගැටලු පැන නැඟිලා තිබෙනවා. කවදා හරි මෙන්න මේක නවත්වන්න නම්, අපේ කාර්යභාරය මොකක්ද කියලා හඳුනා ගන්න ඕනෑ. නිලධාරීන්ට ඔවුන්ගේ වැඩේ කර ගන්න දෙන්න. ආයතන ව්‍යුහය ශක්තිමත් කිරීම සහ ආයතන ව්‍යුහය පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් -මානව සම්පත සහ මුදල්- හරියට වෙන් කරන්න. මම හිතන විධියට එච්චර තමයි අපෙන් විය යුත්තේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සයිටම් එක ගැන කථා කළා. ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය කියපු ඒ කාරණයට මම සම්පූර්ණයෙන් එකඟ වෙනවා. මොකද, අද ඇත්තටම අධ්‍යාපන අමාත්‍යාංශයේ සමඟර නිලධාරීන් සහ එතැන සිටින deansලා එකතු වෙලා ඒ කටයුත්ත කරන්න හදනවා. මොරටුව විශ්වවිද්‍යාලයට අවශ්‍ය සායනික පහසුකම් සපයන්න තමයි අපි කළුතර රෝහල හැදුවේ. අපි ඒක ශික්ෂණ රෝහලක් කළා. ඒකේ medicine, surgery, paediatrics, obstetrics and gynaecology and psychiatry කියන major specialties පහටම අද units හදලා තිබෙනවා. Netherlands **ආධාර**වලින් වෙනමම paediatric and maternity hospital එකක් හදලා තිබෙනවා, LRH එකට වඩා හොඳ. මේ ඔක්කෝමත් තිබියදී දැන් කියනවා මොරටුවේ සායනික පුහුණුව සයිටම් එකට ගෙනියනවා කියලා. කළුතර, දොඩම්ගොඩ medical faculty එක හදන්නත් KOICA එකත් එක්ක සාකච්ඡා කරලා ඒ වැඩ පිළිවෙළ සකස් කරලා තිබුණා. University එකේ medical faculty එක කළුතර තියන්න plan කලේ එහෙමයි. එතකොට දැන් මේ ඔක්කෝම එකින් එක වෙනස් වෙලා. මොරටුවේ සායනික පුහුණුව සයිටම් එකට ගෙනයනවා නම්, මුදල් බිලියන ගාණක් වියදම් කරලා කළුතර Teaching Hospital එකක් හැදුවේ මොකටද?

සයිටම් එක රජයට ගත්තෙත් මම. මම ඒ වෙලාවේ හැමෝගෙන්ම බැණුම් ඇහුවා. නමුත් ඒක රජයට ගත්ත නිසා තමයි ඒක රජයේ තිබෙන්නේ. සයිටම් එකේ කිසිම පහසුකමක් නැහැ, ඒ specialties කරන්න. ඒක තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් කියන්නේ, ඒක කරනවා නම් අවුරුදු 2ක් යනවා කියලා ඒක හදන්න. එතකොට ළමයි ඉන්නේ කොහොමද? හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය කියන කාරණය සම්පූර්ණ සත්‍යයක්. උසස් අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමනි, අඩුම තරමින් මේ ගැන කථා කරන්න රැස්වීමක් කැඳවන්න. අපි දේශපාලනය පැත්තක තියලා ඇවිල්ලා ඒ ගැන කථා කරන්නම්. නැත්නම් මහා අර්බුදයක් ඇති වෙනවා. ඒකත් අර්බුදයක් වෙලා, ඔබතුමන්ලාට ආපහු විසඳුම් සොයන්න වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.06]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අධ්‍යාපනය සම්බන්ධයෙන් කල් තැබීමේ විවාදයක් තිබුණත් මට ලැබී තිබෙන කෙටි කාලය තුළ විශේෂයෙන්ම මම මේ කාරණය කියන්න ඕනෑ. පසුගිය දවස්වල ඇති වුණු වර්ෂා තත්ත්වයත් එක්ක කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 36කට අධික ප්‍රමාණයක ජනතාව පීඩාවට පත් වුණා, සුළු ගංවතුර තත්ත්වයක් නිසා. 2016දී මිලිමීටර් 180ක වර්ෂාපතනයක් ඇති වුණු වෙලාවේ කොළොන්නාවට මහ ගංවතුරක් ආවා. එහිදි පවුල් 27,000කට අධික පවුල් ප්‍රමාණයක් අසරණ වුණා. ඒ අයට රුපියල් මිලියන 2,300ක පමණ වන්දි ලබා දෙන්න සිද්ධ වුණා. ඒ ගංවතුර බැහැලා යන්න විශාල දවස් ප්‍රමාණයක් ගතවුණා. නමුත් මෙවර මිලිමීටර් 450ක වර්ෂාපතනයක් ඇති වුණු වෙලාවේත් සුළු ගංවතුර තත්ත්වයක් තමයි ඇති වුණේ. ඒ නිසා මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, 2016දී ආපු ගංවතුරෙන් පසුව අපි, -යහ පාලන රජය- කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළත්, ඉන් පිටතත් floodgates හදලා, නාගලගම්වීදියේ පොම්පාගාරයක් හදලා, අඹතලේ පොම්පාගාරයක් හදලා ගංවතුර පාලන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිසා තමයි මේ මට්ටමට ගංවතුර අඩු වුණේ කියන එක. නමුත් කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ, අපට ඒ සම්පූර්ණ ව්‍යාපෘතිය අවසන් කර ගන්න බැරි වුණු බව. යහ පාලන රජය අවසන් වීමත් එක්ක, කළු පාලම සහ බෝධිය පටුමගේ ස්ථාපිත කරන්න තිබුණු පොම්පාගාර නිර්මාණය කරන්න මේ ආණ්ඩුව කටයුතු කලේ නැහැ. ඒ නිසා තමයි එම ප්‍රදේශ අද මේ තරමින්වත් පීඩාවට ලක් වෙලා තිබෙන්නේ. එහෙම නොවුණා නම්, ඒ පොම්පාගාර තිබුණා නම් මීට වඩා අඩු ප්‍රමාණයකින් තමයි ගංවතුර තත්ත්වය බලපාන්නේ. ඒ වාගේම ගංවතුර බැස යාම ඉතා ඉක්මනින් සිද්ධ වෙනවා. මම මේ පිළිබඳව පැහැදිලි කරලා මෙහි ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘතියට 2023 වර්ෂයේ අය වැයෙන් මුදල් වෙන් කරන්න කියලා වත්මන් ගරු ජනාධිපතිතුමාගෙන් 2022.10.31වන දා ලිඛිතව ඉල්ලීමක් කර තිබෙනවා. හැබැයි, මේ වෙනකල් ඒ සම්බන්ධයෙන් මොකුත් සිද්ධ වෙලා නැහැ. ඒ ලිපියේ පිටපතක් මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කරලා, 2023.10.09වැනි දා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට දැනුම් දීමකුත් කර තිබෙනවා. මේ අවස්ථාවේදී එම ලිපියේ පිටපතකුත් මා **සභාගත*** කරනවා.

ප්‍රාදේශීය ලේකම්වරයා විසින් SLLDC එකට මේ ලිපිය යොමු කළාට, රජයෙන් මුදල් වෙන් කර නැති නිසා ඒ කටයුත්ත සිද්ධ වුණේ නැහැ.

කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංවතුර පාලනය සඳහා තව වැඩ 3යි කරන්න ඉතිරි වෙලා තිබෙන්නේ. හැම අවුරුද්දකම වෙසක් පෝයට සමගාමීව සිද්ධ වෙන මේ ගංවතුර ගැලීම නවත්වන්න නම්, ඒ ප්‍රදේශය තුළ කරන්න තිබෙන්නේ තව රුපියල් මිලියන 700ක් විතර වැය වන කටයුත්තක්. බෝධිය පටුමහ අසල පොම්පාගාරයක් ඉදිකිරීම සහ ඉතාම වේගයෙන් වතුර ටික ගඟට අදින්න පුළුවන් විධියට කළු පාලමේ හදලා තිබෙන floodgate එකටත් පොම්පාගාරයක් ඉදිකළ යුතුයි. කොහිලවත්ත හන්දිය අසලින් තමයි මේ වතුර ටික කැරකෙන්න ගන්නේ. ඒ නිසා එතැනින් එහා පැත්තේ බියගම පැත්තට දාලා තිබෙනවා වාගේ වතුර ඇතුළට නොඑන්න තාප්පයක් දැම්මොත් මේ ප්‍රශ්නය සෑහෙන දුරකට පාලනය කරගන්න පුළුවන්.

ගංවතුර ආවාම ජනතාව දුක් විඳිනවා. එතකොට ඔවුන් කඳවුරුවලට යනවා. ඊට පස්සේ ඔවුන්ට බත් පාර්සල් බෙදන්න ඕනෑ. බත් පාර්සල් බෙදීම ප්‍රමාද වුණාම ඒවා පිළිණු වෙනවා. අද දවසේත් එලෙස බෙදූ බත් පාර්සල් ප්‍රමාණයක් පිළිණු වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගැටලුකාරී තත්ත්වයට සම්පූර්ණ විසඳුමක් ලබා දීම සඳහා මේ වැඩ කටයුතු තුන තමයි සිදු කළ යුත්තේ. එහෙම නැතුව, ගංවතුර ආවාම ඇවිල්ලා බලලා, සාකච්ඡා තියලා කථා කර කර ඉන්න එක නොවෙයි කළ යුත්තේ.

මම විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු වුණත්, පසුගිය සඳුදා ගංවතුර ආපු වෙලාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබිච්ච සාකච්ඡාවකට අනාරාධිතව සහභාගි වුණා. හැබැයි මම සතුටු වෙනවා, මේ ව්‍යාපෘතිය පිළිබඳව සම්පූර්ණ අවබෝධයක් තිබෙන පුද්ගලයෙකු විධියට කළ යුතු දේ පිළිබඳව ඒ සාකච්ඡාවේදී අදාළ නිලධාරීන් සහ එතැනට ආපු දේශපාලන අධිකාරිය දැනුවත් කරන්න මට හැකිවීම පිළිබඳව. ඒ වාගේම ජනාධිපතිතුමාට මම පැහැදිලිවම කිව්වා, මේ වක්‍රලේඛය වෙනස් කරන්න කියලා. මොකද, මේ වක්‍රලේඛයට අනුව අවතැන්වූවන් කඳවුරට ආවාම තමයි කෑම දෙන්නේ. එතකොට අවතැන්වූවන් ගෙවල්වල ඉන්නවා නම් ඔවුන්ට කෑම ලැබෙන්නේ නැහැ. සාමාන්‍යයෙන් අපේ පළාතේ තිබෙන ගෙයකට පයින් ගැහුවොත් දොර කඩාගෙන වැටෙනවා. ඒ නිසා ඔවුන් camp එකකට යන්නේ නැහැ. මේ ගැන මම ජනාධිපතිතුමාට කිව්වාට පසුව තමයි ඒ වක්‍රලේඛය වෙනස් කරලා ගෙවල්වල ඉන්න අයටත් කෑම ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කැබිනට් පත්‍රිකාවක් නිකුත් කළේ.

මේ වන විට බඩු මිල ඉතාම වේගයෙන් ඉහළ ගිහින් තිබෙනවා. ඒ වාගේම වතුර බිල, විදුලි බිල ආදී හැම එකක්මත් වැඩිවෙලා තිබෙනවා. හැබැයි, ආපදාවන්ට ලක් වූ අයට ලබා දෙන සහන මුදල වැඩිවෙලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කඩේ තිබෙන බත් පැකට් එකක මිල කීයද? හැබැයි, පුද්ගලයෙකුට ලබා දෙන කෑම වේලකට ආණ්ඩුව වෙන්කර තිබෙන්නේ රුපියල් 150යි. මම දන්නේ නැහැ, ඒ මුදලෙන් කෑම වේලක් ගන්න පුළුවන්ද කියලා. ඒ නිසා තමයි පිළිණු කෑම ලැබෙන්නේ. දවසටම රුපියල් 450යි වෙන්කර තිබෙන්නේ. ඒ නිසා තමයි පෝෂ්‍යදායී ආහාර වේලක් නොලැබෙන්නේ. ඒ නිසා අපි ඉතාම පැහැදිලිව කියනවා, මේ වක්‍රලේඛය වෙනස් කරන්න කියලා. මේ ලබා දෙන මුදල් අදට ගැළපෙන විධියට, market price එකට ගැළපෙන විධියට ලබා දෙන්න ඕනෑ.

ඒ වාගේම එදිනෙදා හම්බ කරගෙන ජීවත් වෙන ජනතාවට, ගංවතුරෙන් යට වෙලා තිබෙන ඔවුන්ගේ නිවාසවලට නැවත යනකොට ඒවා පිරිසිදු කරන්න අමුතුවෙන් වියදමක් දරන්න වෙනවා. අර්ධ හානි වෙච්ච ගෙවල් හදා ගන්නත් වෙනම වියදමක් දරන්න වෙනවා. ඒ නිසා අපි රජයෙන් ඉල්ලීමක් කරනවා, ඒ සඳහාත් යම් මුදලක් ලබා දෙන්න කියලා. මුදල් ලබා දීලා විතරක් හරියන්නේ නැහැ. ජනාධිපතිතුමාටත්, රජයටත් අපි කියනවා, මේකට master plan එකක් අපි හදලා ඉවරයි කියන කාරණය. අමුතුවෙන් කමිටු පත් කරන්න දෙයක් නැහැ. Master plan එක හදලා සැලකිය යුතු වැඩ කොටසක් කරපු නිසා තමයි මේ අවස්ථාවේ සුළු ගංවතුරක් ඇති වුණේ. ඒ නිසා දැන් වතුර බැස යෑම සඳහා කළ යුතු දේවල් කළ යුතුයි. Master plan එකේ තිබෙන විධියට පොම්පාගාර දෙක ඉදිකිරීම සඳහා මුදල් වෙන් කරන්න. එහෙම නැතුව ආපදාව ආවාම ජනාධිපති මාධ්‍ය අංශය

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

විසින්, "අන්න, ජනාධිපති prompt attention දෙන්න කිව්වා, කෑම දෙන්න සල්ලි release කරන්න කිව්වා" කියලා වැඩක් නැහැ. මහජනතාවගේ බදු මුදල් නාස්ති නොකර සම්පූර්ණ මුදලෙන් භාගයක් හරි ලබා දීලා මේ පොම්පාගාර හැදීමේ කටයුත්ත ආරම්භ කළා නම් හොඳයි. එහෙම වුණොත් ලබන අවුරුද්දේ මුල් කාර්තුවේ හරි ඒ ටික අපට අවසන් කර ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රදේශයේ ගංවතුර පාලනය කිරීම සඳහා කැලණි ගඟේ මෝය කට පළල් කිරීමේ ව්‍යාපෘතියක් පවා ක්‍රියාත්මක කරන්න පුළුවන්. අනෙක් රටවලත් එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. එවැනි දෙයක් කරලා මේ පොම්පාගාර ටික හැදුවොත් ඒ හරහා කඩුවෙලින්, හෝමාගමින්, අවිස්සාවේල්ලෙන් එන වතුර වුණත් ඉක්මනට මුහුදට යවාගන්න පුළුවන්. එහෙම වුණොත් ඒ ප්‍රදේශවලට එන ගංවතුර පාලනය කරගන්න පුළුවන්. ඒ නිසා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීලා මේ වැඩකටයුතු ආරම්භ කරන්න කියලා ආණ්ඩුවට අපි යෝජනා කරනවා.

මම පැහැදිලිව ප්‍රකාශ කරන්න කැමැතියි, වත්මන් ආණ්ඩුව ඒ කටයුත්ත ආරම්භ නොකළොත් තව මාස තුනකින් එන අලුත් ආණ්ඩුව යටතේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය හරහා SLLDC එකත්, වාරිමාර්ග අමාත්‍යාංශයත් එකතු කරගෙන මේ පොම්පාගාර හැදීමත්, ඒ වාගේම කොහිලවත්ත හන්දියේ වතුර ඉක්මනින් බහින තැනින් බැම්ම හැදීමත් කරලා මේ ප්‍රදේශවල ගංවතුර සියයට 90ක් පාලනය කිරීම සඳහා වූ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන බව. අද හවස් වෙනකොට මේ ගංවතුර සම්පූර්ණයෙන් බැස ගිය පසු එම ප්‍රදේශවල ඉන්න ජනතාවට දිය යුතු ආධාර ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මැතිවරණ කාලයට නම් කොළොන්නාවට අපේක්ෂකයන් ඔක්කෝම එනවා, නැන්දේ, මාමේ, අයියේ, අක්කේ කියාගෙන. නමුත්, දැන් ඔවුන් මේ ගැන කථා කරන්නේවත් නැහැ. අධ්‍යාපන ඇමතිතුමාත් මේ සභාවේ කථා කළා. ඒ ජනතාව ගැන වචනයක් කිව්වේ නැහැ. මම විශේෂයෙන්ම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, ඒ කටයුතු කඩිනමින් ආරම්භ කරලා ජනතාවට අවශ්‍ය සහන ලබා දෙන්න කියලා. අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු වාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[පි.ප. 2.14]

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
නන්දි, කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ!

ඉන්දු කල්විත්තුරෙයිල් ඉරුක්කින්ර කුරෙපාඩුකළ් තොටර්පාකප් පාරාළුමන්රත්තින් කවනයීර්ප්පුක්කාන ඔර් ඔත්තිවෛප්පුප් පිරේරණෙයොන්රු එතිර්ක්කට්සියිනාල් මුන්වෛක්කප්පට්ටිරුක්කින්රතු. තර්පොළුතු කටන්ත වරුටත්තිල් නටෙපෙර්ර ක.පොත. උයර්තරප් පරීට්සෛප් පෙරුපේරුකළ් වෙළිවන්තිරුක්කින්රන. අතන් පිරකාරම් කුරිප්පාක මර්රෙය මාකාණංකළුටන් ඔප්පිටුම්පෝතු වට මාකාණ මාණවර්කළ් තංකළුටෙය මුයර්සියාල් සිරන්ත පෙරුපේරුකළෛප් පෙර්රිරුක්කින්රාර්කළ්. ආනාල්, මර්රෙය මාකාණංකළෝටු ඔප්පිටුම්පෝතු අන්ත මාකාණත්තිල් ආසිරියර් පර්රාක්කුරෛ අතිකමාක ඉරුක්කින්රතු. කුරිප්පාක, ක.පොත. උයර්තර වකුප්පුප් පාටංකළුක්කු ආසිරියර් පර්රාක්කුරෛ ඉරුක්කින්රතු. අණ්මෛයිල් මාණ්පුමිකු ජනාතිපති අවර්කළ් වට මාකාණත්තිල් 356 පේරුක්කු ආසිරියර් නියමනංකළෛ වළංකිවෛත්තාර්; අවෛ මාකාණ මට්ටප් පාටසාලෛකළුක්කුරිය නියමනංකළාකුම්. ආයිනුම්, ඉන්නුම් අන්තප් පාටසාලෛකළිල් වෙර්රිටම් නිලවුකින්රතු. අතේපෝන්රු, තේසියප් පාටසාලෛකළිලුම් වෙර්රිටම් නිලවුකින්රතු.

කුරිප්පාක, මන්නාර් St. Xavier's Boys' Collegeඉල් නිලවුම් ආසිරියර් පර්රාක්කුරෛ තොටර්පාක නාන් කෞරව අමෛච්සර් සුසිල් පිරේමජයන්ත අවර්කළිටම් සොල්ලියිරුන්තේන්. අතර්කු අවර් ඉතුපර්රිත් තාන් කවනම් සෙලුත්තුවතාකක් කූර්, කල්වි අමෛච්සින් සෙයලාළරුක්කු නාන් අනුප්පවිරුන්ත කටිතත්තිල් minute පණ්ණිත් තන්තිරුන්තාර්. නාන් අන්තක් කටිතත්තෛච් සෙයලාළරුක්කු අනුප්පියිරුන්තේන්. තර්පොළුතු ඉංකේ අමෛච්සින් සෙයලාළර්කළ් සමූකමාකියිරුක්කින්ර කාරණත්තිනාල්, නාන් අන්ත විටයත්තෛ මීණ්ටුම් ඥාපකප්පටුත්ත විරුම්පුකිරේන්. මන්නාර් මාවට්ටත්තින් නකර්ප් පකුතියිල් ඉරුක්කින්ර තේසියප් පාටසාලෛයාන St. Xavier's Boys' Collegeඉල් නිලවුකින්ර ආසිරියර් පර්රාක්කුරෛ උටනටියාක නිවර්ත්তි සෙය්යප්පට වේණ්ටුම්.

අටුත්තු, එමතු පිරතේසංකළිල් 2017, 2018, 2019ආම් ආණ්ටුකළිල් ආරම්පික්කප්පට්ට පාටසාලෛක් කට්ටිටංකළින් නිර්මාණප් පණිකළ් 75 සතවීතම් මුටිවුර්ර නිලෛයිල්, මුළුමෛයාකප් පූර්ත්তි සෙය්යප්පටාතතනාල් අන්තක් කට්ටිටංකළ් පාවනෛයර්රුක් කිටක්කින්රන. ආකවේ, අන්තක් කට්ටිට වේලෛයෛප් පූර්ත්ති සෙය්වතර්කාන නිතියෛ එතිර්කාලත්තිල් කල්වි අමෛච්සිනූටාක වළංකවේණ්ටුමෙන්රු කේට්ටුක්කොළ්වතෝටු, තර්පොතු වළංකවිරුක්කින්ර ආසිරියර් නියමනංකළින්පෝතු වටක්කිල් ඉරුක්කින්ර තේසියප් පාටසාලෛකළුක්කු උයර්තර පාටංකළුක්කුරිය ආසිරියර්කළෛ නියමිප්පතර්කු උටනටියාකක් කල්වි අමෛච්සු නටවටික්කෛ එටුක්කවේණ්ටුමෙන්රුම් කේට්ටුක්කොළ්කින්රේන්.

කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, උංකළින් අනුමතියුටන් ඉන්නුම් ඔරු සිල විටයංකළෛ නාන් ඉංකේ කුරිප්පිට විරුම්පුකිරේන්. නේර්රෛය තිනම් 04.06.2024 අන්රු වවුනියා මාවට්ටත්තින් වවුනියා වටක්කුප් පිරතේස සෙයලකත්තිර්කුට්පට්ට නෙටුංකේණි තෙර්කු GN Divisionඉල් ඉරුක්කින්ර සුප්පිරමණියම් රජනිකාන්තන් එන්ර නපරින් වීට්ටිර්කුළ් පොලිස් වාකනමොන්රු තිටීරෙන උට්පුකුන්තිරුක්කින්රතු. ඉන්තච් සම්පවම් නේර්රුප් පිර්පකල් 4.10 මණියළවිල් නටන්තතු. අන්ත වාකනත්තිර්කුළ් පුළියංකුළම් OICඋම්, කනකරායන්කුළම් OICඋම්, ඉන්නුම් නාන්කු පොලිස් උත්තියෝකත්තර්කළුමාක ආරු පොලිස් උත්තියෝකත්තර්කළ් මුළුමෛයාන කුටිපෝතෛයිල් ඉරුන්තිරුක්කින්රාර්කළ්. කුටිපෝතෛයිල් වාකනම් සෙලුත්තියතන් කාරණමාක අන්ත වාකනම් වීතියෛ විට්টු විලකි මරුපුරම් ඉරුන්ත වීට්টුක්කුළ් පුකුන්තිරුක්කින්රතු.

අතු ඕර් ආසිරියරුටෛය වීටු එන්පතාල්, අව්වේළෛයිල් අංකු මාලෛ නේර වකුප්පු නටෛපෙර්රුක්කොණ්ටිරුන්තතු; අන්ත වීට්টුක්කුළ් 42 මාණවර්කළ් කල්වි කර්රුක්කොණ්ටු ඉරුන්තිරුක්කිරාර්කළ්. කටවුළුටෛය කිරුපෛයාල් අත්තනෛ

உயிர்களும் மயிரிழையில் காப்பாற்றப்பட்டு அந்த மாணவர்கள் உயிர் பிழைத்திருக்கின்றார்கள். இது மிகவும் கேவலமான, மோசமான செயல் என்பதை நான் இந்த இடத்தில் பதிவுசெய்ய விரும்புகின்றேன். இந்த அரசாங்கம் நேர்மையாகச் செயற்படுவதாகவிருந்தால், நாட்டினுடைய மாண்புமிகு ஜனாதிபதி அவர்களிடமும் பொலிஸுக்குப் பொறுப்பான அமைச்சர் டிரான் அலஸ் அவர்களிடமும் அந்த ஆறு பொலிஸ் உத்தியோகத்தர்களையும் உடனடியாகப் பணி இடைநீக்கம் செய்து, அவர்களிடம் விசாரணை நடத்தப்பட வேண்டுமென்று நான் இந்தச் சபையினூடாகக் கோரிக்கை விடுக்கின்றேன். நாட்டில் சட்டமும் ஒழுங்கையும் பாதுகாக்கின்ற, நடைமுறைப்படுத்துகின்ற, கண்காணிக்கின்ற பொலிஸ் அதிகாரிகள், பொலிஸ் நிலையப் பொறுப்பதிகாரிகள் முழுமையான குடிபோதையில் வாகனத்தைச் செலுத்தி ஒரு வீட்டுக்குள் புகுத்தியுள்ளார்கள்.

குறித்த அந்த வாகனத்தைப் புளியங்குளம் OIC செலுத்தியிருக்கின்றார். அந்தப் பொலிஸ் பொறுப்பதிகாரிகள் முழுமையான குடிபோதையில் மிக மிலேச்சத்தனமாக அங்கு நடந்திருக்கிறார்கள். இதற்காக அரசாங்கம் வெட்கப்பட வேண்டும். இப்படியான பொலிஸ் அதிகாரிகளை வைத்துக்கொண்டு நாட்டில் எவ்வாறு சட்டத்தையும், ஒழுங்கையும் நிலைநாட்ட முடியும்? இங்கு பலரும் பல்வேறுபட்ட கருத்துக்களைச் சொல்வார்கள். ஆனால், இதற்குரிய சரியான பதிலை வழங்குவதற்கு யாரும் தயாரில்லை.

தமிழீழ விடுதலைப் புலிகளினுடைய காலத்தில் அங்கு ஒரு காவல்துறை இருந்தது. மிகவும் பண்பாகவும் ஒழுக்கமாகவும் நடந்துகொண்டு சட்டம், ஒழுங்கை முழுமையாகக் கடைப்பிடித்த அவர்களைத்தான் நாங்கள் உண்மையான காவல்துறையாக உணர்ந்தோம். ஆனால், நேற்று இடம்பெற்ற சம்பவத்துடன் தொடர்புடைய வவுனியா வடக்கு, புளியங்குளம், நெடுங்கேணி, கனகராயன்குளம் பிரதேசப் பொலிஸ் அதிகாரிகள் முழுமையான குடிபோதையில் அங்கு சென்று தேவையற்ற விதத்தில் பலர்மீது பொய் வழக்குகளைச் சுமத்தி அட்டகாசம் செய்திருக்கிறார்கள். நேற்றைய இந்தச் சம்பவம் தொடர்பில் நான் வன்னிப் பிராந்தியப் பொலிஸ்மா அதிபருக்குத் தொலைபேசி ஊடாகத் தெரிவித்திருந்தேன். குறித்த சம்பவத்தில் குடிபோதையில் செலுத்தப்பட்ட பொலிஸாரின் வாகனம் வீதியைவிட்டு விலகி அங்குள்ள ஒரு வீட்டிற்குள் சென்றுள்ளது. ஆனால், இன்று காலை அங்கு சென்ற Traffic Police குறித்த விபத்து வீதியில் நடந்ததாகப் பதிவு செய்திருக்கிறார்கள். இது உங்களுக்கு வெட்கமாக இல்லையா? நெடுங்கேணி, புளியங்குளம், கனகராயன்குளம் ஆகிய மூன்று பொலிஸ் நிலையங்களைச் சேர்ந்த OICமாரும் அங்கு ஜனநாயக விரோதமாக, மக்களை மதிக்காத தன்மையுடன் தொடர்ச்சியாகச் செயற்பட்டுக்கொண்டு இருக்கிறார்கள். ஜனாதிபதி அவர்கள் பொருளாதார ரீதியாக நாட்டை முன்னேற்றலாம். ஆனால், இப்படியான கீழ்த்தரமான அதிகாரிகளை வைத்துக்கொண்டு எவ்வாறு நாட்டில் சட்டத்தையும் ஒழுங்கையும் நிலைநிறுத்தப்போகின்றார்?

இச்சம்பவமானது எந்தவித உயிரிழப்பையும் ஏற்படுத்தாது நேற்றைய தினம் பகல் நேரத்தில் இடம்பெற்றதனால் அங்கிருந்தவர்கள் காப்பாற்றப்பட்டார்கள். ஒருவேளை இது இரவு நேரத்தில் நடந்திருந்தால், பொலிஸார் இதனை வேறு சம்பவமாக மாற்றி, அண்மையில் இரவு வேளையில் ஆலயங்களில் இடம்பெற்ற சம்பவத்தின்போது அங்கிருந்த எங்களுடைய குருக்கள் மற்றும் பக்த அடியார்களைச் சிறையிலடைத்தது போன்று பொதுமக்கள்மீது பொய்க் குற்றச்சாட்டுகளைச் சுமத்தி அவர்களைச் சிறையில் அடைத்திருப்பார்கள். எனவே, நேற்றைய தினம் சுப்பிரமணியம் ரஜனிகாந்தன் என்பவருடைய வீட்டில் நடந்த அராஜகமான செயலுக்காக அந்த ஆறு பொலிஸாரையும் உடனடியாகப் பணி இடைநீக்கம் செய்து, அவர்கள்மீது முழுமையான விசாரணையை மேற்கொண்டு, உரிய தண்டனை வழங்கவேண்டுமென்று நான் மாண்புமிகு ஜனாதிபதி அவர்களிடமும், பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் கௌரவ டிரான் அலஸ் அவர்களிடமும், வன்னிப் பிராந்தியப் பொலிஸ்மா அதிபரிடமும் இந்தச் சபையினூடாகக் கேட்டுக்கொள்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

நான் முன்பு குறிப்பிட்டதுபோல குறித்த பொலிஸ் அதிகாரிகள் அந்தப் பிரதேசத்தில் மிகவும் சண்டித்தனமான முறையில்தான் எல்லாவற்றையும் செய்து வருகிறார்கள். குறித்த விபத்து நடந்தபோது அந்த பொலிஸ் வாகனத்திற்குள் 9 'பியர் ரின்"களும், 2 சாராயப் போத்தல்களும் காணப்பட்டன. ஒரு பொலிஸ் அதிகாரியும் இரண்டு பொலிஸ் நிலையப் பொறுப்பதிகாரிகளும் முழுமையான குடிபோதையில் வாகனத்தைச் செலுத்தி விபத்தை ஏற்படுத்தியிருப்பது இந்த நாட்டுக்கே அபகீர்த்தி என்பதை நான் இந்த நேரத்தில் கூறிக்கொண்டு, இது தொடர்பில் அரசாங்கம் வெட்கப்படவேண்டுமென மீண்டுமொருமுறை என்னுடைய பதிவைச் செய்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.23]

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
(மாண்புமிகு இம்தியாஸ் பாக்கிர் மாக்கார்)
(The Hon. Imthiaz Bakeer Markar)
මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට ලැබී තිබෙන මේ සීමිත කාලය තුළ මම විශේෂයෙන් එක කාරණයක් ගැන පමණක් කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා.

මෙවැනි කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියට පළමුවෙන්ම ස්තුති කිරීම මගේ යුතුකමක් වනවා. එතුමිය මේ යෝජනාව පටන් අරගෙන තිබෙන්නේ, "මෙරට නිදහස් අධ්‍යාපනය විවිධ හේතූන් මත පසුගිය කාලයේ අන් කවරදාකටත් වඩා අර්බුදයකට ලක් වෙලා තිබෙනවා" කියමින්. ඇත්තටම දුෂ්කර පාසල්වල ඉගෙන ගන්නා නැති බැරි පවුල්වල දරුවෝ මේ නිසා බොහෝ ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙනවා. මම කැමැතියි, මට ලැබී තිබෙන මේ විනාඩි හතර තුළ කළුතර කලාපයේ පාසල්වල තිබෙන බැරෑරුම් ප්‍රශ්නයක් වන ගුරු හිඟය පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය

[ගරු ඉමතියාස් බාකීර් මාකාර් මහතා]

යොමු කරවන්න. මම මීට කලිනුත් කීප විටක් මේ ගැන අවධානය යොමු කරවලා තිබෙනවා. ඒ හැම අවස්ථාවේදීම ඊට හොඳින් ප්‍රතිචාර දැක්වුවා. හැබැයි, ප්‍රායෝගිකව සෑහීමකට පත් වෙන්න පුළුවන් කිසිම විසඳුමක් මේ වනතුරු ලැබිලා නැහැ. අද කළුතර අධ්‍යාපන කලාපයට අයත් බේරුවල අධ්‍යාපන කොට්ඨාසයේ පමණක් සියයට 36ක ගුරු හිඟයක් පවතිනවා. ගුරුවරු 100ක් ඉන්න ඕනෑ තැන, 36දෙනෙක් නැහැ. ඒ කාරණය ගැන හිතා බලන්න. එය බරපතළ තත්ත්වයක්. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මේ සංඛ්‍යාලේඛන නිලධාරි මහත්වරු මඟිනුත් සනාථ කර ගන්නට පුළුවන් වේවි. බේරුවල අධ්‍යාපන කොට්ඨාසයේ උසස් පෙළ පන්ති සඳහා විද්‍යා, ගණිත උපාධි ගුරුවරු 14දෙනෙකුගේ හිඟයක් තිබෙනවා. අවුරුදු 10ක්, 12ක් තිස්සේ මේ ගුරුවරු නැහැ. කොහොමද ඒ දරුවෝ විභාගවලට මුහුණ දෙන්නේ? කරුණාකරලා මේ ගැන හොයා බලන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඊළඟට, බේරුවල අධ්‍යාපන කොට්ඨාසයේ ඉංග්‍රීසි ගුරුවරුන් 54දෙනෙකුගේ හිඟයක් තිබෙනවා. කළුතර අධ්‍යාපන කලාපයේ ඉංග්‍රීසි ගුරුවරුන්ගේ හිඟය 92ක් විතර වනවා. අවුරුදු 10ක්, 12ක් තිස්සේ මෙහෙම ගුරු හිඟයක් පවතිනකොට දරුවෝ විභාගවලට මුහුණ දෙන්නේ කොහොමද? ගරු ඇමතිතුමා මට කිව්වා, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පුහුණුව අවසන් කළ අයට ගුරු පත්වීම් ලබා දුන් පසු මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනවා කියලා. නමුත්, ඒ ගුරුවරුන්ට මේ පාසල්වලට පත්වීම් ලබා දෙන්නේ නැහැ. ඔවුන් පිට පළාත්වලට යවනවා. සමහර විට මේ කොට්ඨාසයේ ගුරු හිඟය තිබෙද්දී මේ කොට්ඨාසයේම පදිංචි ගුරුවරුන්ව යවන්නේ වෙනත් පළාත්වලට. මම දන්නේ නැහැ ඒ තීන්දු-තීරණ ගන්නේ කවුද කියලා. ඒ නිසා පැය දෙකක්, පැය දෙකහමාරක් ගත කරලා දුර ගෙවාගෙන එම ගුරුවරුන්ට වෙනත් පාසල්වලට යන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා අසහනයෙන්, අතෘප්තියෙන් තමයි ඒ ගුරුවරු වැඩ කරන්නේ. කාලයක් තිස්සේ ගුරු හිඟය තිබෙන මේ ප්‍රදේශවල එම ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන් පියවර ගත යුතුයි. අධ්‍යාපන විෂය භාර ඇමතිවරයා වන ඔබතුමාට මේ සම්බන්ධව මම ඍජුව ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. නමුත්, මේ සම්බන්ධව හොයා බලන්න. මෙයට විසඳුමක් ලැබිය යුතුයි. එහෙම නැත්නම් මේකෙන් අසරණ වෙන්නේ දුප්පත් දු දරුවෝ.

මම මීට වඩා මේ ගැන දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගුරු හිඟය ඉතාම බැරෑරුම් ප්‍රශ්නයක්. අද සමහර ගම්වලට ගියාම දුප්පත් දෙමව්පියන් සහ දරුවන් මේ ප්‍රශ්නය මතු කරනවා. ගරු ඇමතිතුමනි, එම නිසා මේ ප්‍රශ්නයට ඉක්මනින් විසඳුමක් ලබා දෙන්න. මේ සංඛ්‍යාලේඛන පෙන්වලා, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලින් සහ උපාධි පත්වීම්වලින් ඒ ඒ දිස්ත්‍රික්කවලට ගුරුවරු ලබා ගත්තත්, සැබෑ අවශ්‍යතාව තිබෙන පාසල්වලට ඒ ගුරුවරු යවන්නේ නැහැ. උපාධිධාරී ගුරුවරුන්ව සමහර වෙලාවට ප්‍රාථමික පාසල්වලට යවනවා. ඒ වාගේම ළමයි විශාල සංඛ්‍යාවක් ඉන්න පාසල්වලට නොයවා, ළමයි දෙතුන් දෙනෙකු ඉන්න පාසල්වලට යවනවා. ඒ නිසා මම මේ කරුණු අවධාරණයෙන් යුතුව ප්‍රකාශ කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ප්‍රමුඛ අවධානය මේ කාරණා සඳහා යොමු වනු ඇතැයි විශ්වාස කරමින්, මගේ කරුණු ඉදිරිපත් කිරීම මෙතෙකින් අවසන් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.26]

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon.(Dr.) Suren Raghavan - State Minister of Higher Education)

මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා මේ ගරු සභාවෙන් පිටව ගිය නිසා එතුමාගේ කාලයත් මට ගන්න කිව්වා. එතුමාට වෙන් කර තිබුණු මුළු කාලයම මට අවශ්‍ය නැහැ. නමුත්, ප්‍රාථමික ප්‍රශ්න කිහිපයකට පිළිතුරු දිය යුතුයි කියා මම හිතනවා. ඒ නිසා එතුමාට වෙන් වී තිබෙන කාලය පිළිබඳවත් කරුණාකර ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය වැනි ජාතික, ජාත්‍යන්තර විෂයයක් පිළිබඳව විවාද කිරීම ගැන සහ ඒ විවාදයට ශුභවාදී විධියට දායක වන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා. සාමාන්‍යයෙන් මම උදේ වරුවේ පාර්ලිමේන්තුවට එන්නේ නැහැ. ඒකට හේතු දෙකක් තිබෙනවා. එක හේතුවක් තමයි, උදේ වරුවේ බොහෝ වෙලාවට සිදු වන්නේ මාධ්‍ය සන්දර්ශන පැවැත්වීම. ඒ කියන්නේ, රාජ්‍යය ගොඩනහන්නට සහ සමාජය ගොඩනහන්නට අවශ්‍ය කරන ප්‍රශ්න ඇසීම නොවන නිසා. දෙවැනි හේතුව මෙකයි. මට රෑ වනතුරු යමක් කියවන්නට ඕනෑ. එය මගේ ජීවිතයේ තිබෙන එක පුරුද්දක්. මම අවම වශයෙන් පොතක පිටු 15ක්වත් කියවලා තමයි නින්දට යන්නේ. එම නිසා මම උදේ වරුවේ පාර්ලිමේන්තුවට එන්නේ නැහැ. නමුත්, අද උදේ වරුවේ සිට මම පාර්ලිමේන්තුවේ රැඳී සිටියා. මොකද, විෂය අපේ නිසා. ඒ වාගේම වැදගත් විෂයයක් නිසා.

මේ මොහොත වනවිට විශ්වවිද්‍යාල සිසුන් ලක්ෂ 2ක් - 200,000 students - සහ ඒ අයගේ දෙමාපියන් විඳින වේදනාව මට දැනෙනවා. රුපියල් 64,000ක පඩියක් අරගෙන උසස් අධ්‍යාපන රාජ්‍ය ඇමතිවරයා හැටියට ඒ වේදනාව කරපින්නාගෙනයි මේ මොහොතේදී මම මෙම විවාදයට සහභාගි වන්නේ. එයට හේතුව මෙකයි. 12,700ක් වන විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීය සමිති 18ක් තිබෙනවා. ඒ වෘත්තීය සමිති 18 ගෙනයන වැඩ වර්ජනය නිසා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියල්ලෝම වැඩ නවත්වා තිබෙනවා.

මෙයට හේතුව, මාස දෙකකට කලින් අපි විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට ලබා දුන් සියයට 38ක පඩි වැඩි කිරීම පදනම් කරගනිමින් ඒ අය සියයට 25ක පඩි වැඩිකිරීමක් ඉල්ලා සිටීම සහ උපකුලපතිවරු අතරේ තිබිය යුතු සාකච්ඡාව කඩා වැටීමයි කියා මා හිතනවා.

ගරු රවුෆ් හකීම් මැතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමා මගේ විෂයයම ඇමතිවරයෙක් හැටියට කරපු කෙනෙක්. Hon. Rauff Hakeem, you may remember that you said this is one of the most difficult Ministries you had handled because to get anything done, it would take ages or even decades. Those were your words, as I remember. So, you understand. අද වනකොට මේ ඉල්ලීම වෙනුවෙන් පමණක් රජයට අවශ්‍ය කරනවා, රුපියල් බිලියන 1.8ක්; we need Rs. 1.8 billion just to meet this demand. And, we also understand that that demand would not stop there. Tomorrow, it would be be the railways, the day after tomorrow, it maybe the postal service and then, the transport service or the Sri Lanka Ports Authority, of

which you were the one time Minister. So, politicization of workers' demands is on the horizon. සේවකයන්ගේ සාධාරණ ඉල්ලීම දේශපාලනගත කිරීම කියන දෙය ක්ෂිතිජයක් සේ පැහැදිලිව අපට පෙනෙනවා. නමුත් අපි ඒ සේවකයන් වාගේම ඒ සේවකයන් නිසා දුක්විඳින ලක්ෂ දෙකක් පමණ වන අපේ අනාගතය භාර ගන්න ඉන්න දුවා දරුවන්ගේ අභිප්‍රාය ගැන හිතන්න ඕනෑ. ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ඔබතුමා මාධ්‍යවේදියෙකු ලෙස ඉන්න කාලයේ සිට ඔබතුමාට අධ්‍යාපනය පිළිබඳව වේදනාවක්, ආත්මකථනයක් තිබුණු බව මා පෞද්ගලිකව දන්නවා. ඔබතුමා කෙටි කාලයක් අධ්‍යාපන ඇමතිවරයා වෙලා හිටියා. ඒ කාලයේදී ගත්ත උත්සාහය මා දැක්කා. මම උතුරුකරයේ ආණ්ඩුකාරවරයා විධියට හිටපු කාලයේත් ඔබතුමා ඒ ප්‍රදේශයට ඇවිල්ලා අධ්‍යාපනය ගැන සොයා බැලුවා. මන්ද යත්, අපි පහළ පන්තියෙන් උඩට ආපු අය. අපට නඟින්න තිබුණු එකම ඉණිමඟ අධ්‍යාපනයයි. අන්න ඒ නිසා තමයි අපි කැක්කුමෙන් කථා කරන්නේ. මේක දේශපාලනීකරණය කරන්න එපා. කරුණාකර අධ්‍යාපනය කියන විෂයවත් මේ රාජ්‍යය ගොඩනඟන්නට යොදා ගනිමු. වැදගත් වන්නේ පක්ෂ, විපක්ෂ කියන කාර්යය නොවෙයි.

අද උදේ සිට අහපු ප්‍රශ්න සහ ඒවාට දුන් විග්‍රහ දිහා බලද්දී අපි දැක්කේ මොකක්ද? රෝග නිධානය වෙනුවට රෝග ලක්ෂණ ගැනයි කථා කෙරුවේ. තම-තමන්ගේ රෝස පාට, නිල් පාට, දම් පාට, කොළ පාට කණ්ණාඩිවලින් රෝග ලක්ෂණය දිහා බලලා කියනවා, "අන්න අර දේ වෙලා නැහැ, මෙන්න මේ දේ වෙලා නැහැ" කියලා. නමුත් රෝග නිධානය මොකක්ද? රෝග නිධානය නම් ජාතික අධ්‍යාපන, උසස් අධ්‍යාපන ප්‍රතිපත්තියකට අපි ජාතියක් හැටියට එකඟ වෙලා නැති එකයි.

මම දොස් කියන්නේ නැහැ, මට කලින් හිටපු මැති ඇමතිවරුන්ට. නමුත් විශ්වවිද්‍යාල පටන් ගැනීමේ සිට, විශ්වවිද්‍යාලවල තිබෙන උපාධි පටන් ගැනීමේ සිට, විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා දරුවන් සංඛ්‍යාව දක්වාම දේශපාලනීකරණය කළ, කරමින් සිටින අතීතයක් සහ වර්තමානයක් තුළ අපි හිරවී ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසිඑක්වන සියවසේ තෙවැනි දශකය මැද ඉන්නා අපි ඉස්සෙල්ලාම කළ යුත්තේ, ජාතික වශයෙන් අධ්‍යාපනය යනු කුමක්ද, උසස් අධ්‍යාපනය යනු කුමක්ද යන්න නිර්වචනය කර ගැනීමයි. ඒ නිර්වචනය වටා අපේ ආයතනික සහ අපේ ආර්ථිකය අපි ගොඩනඟන්නට අවශ්‍යයි.

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමා මගේ පාසලේ හිටපු කෙනෙක්. මම ඒ ගැන සතුටු වෙනවා. එතුමා සහ මම සතුටු විය යුතුයි, මේ රටේ අධ්‍යාපනය සහ ශිෂ්ටාචාරය තාර්කික තැනකින් පටන් ගැනීම ගැන. Critical thinking අපට ආවේ කොයි කාලයේද? මිහිඳු හාමුදුරුවෝ අහපු ප්‍රශ්නයෙන් තමයි critical thinking ආවේ. අඹ ගස ගැන, පරිසරය ගැන, සත්වයා ගැන, පරිපාලනය ගැන එළිමහනේ කරපු සංවාදයකින් අපේ ශිෂ්ටාචාරය පටන් ගත්ත බව අපේ ඉතිහාසයේ ලියැවී තිබෙනවා. එහෙම නම් critical thinking අපට අලුත් දෙයක් නොවෙයි. We had critical thinking in our civilization. Somehow, we have given up that idea and got into what I call "extremely boxed thinking". මේ ළඟදී අපට ඉල්ලීමක් ලැබෙනවා, SLIATE එකෙන්. මේ ළඟදී විවෘත කරපු SLIATE එකේ වැලිමඩ කාර්යාලයේ අධ්‍යක්ෂවරයා අපට ලියුමක් ලියනවා, "කරුණාකරලා වායුසමීකරණ යන්ත්‍රයක් එවන්න" කියලා. වැලිමඩ ඉන්න කෙනා මේ ඉල්ලන්නේ. මම දන්නේ නැහැ, වැලිමඩට වායුසමීකරණ යන්ත්‍රයක් අවශ්‍ය මොන ප්‍රමුඛතාව යටතේද කියලා. මම කියන්න උත්සාහ කරන්නේ මේකයි. අපේ අධ්‍යාපනය පිළිබඳව කථා කරද්දී පාසල් ගොඩනැඟිල්ලක දොර, පාසල් ගොඩනැඟිල්ලක වහලය, පාසලට යා යුතු මාර්ගය යනාදි මේ සියල්ලත් අවශ්‍යයි. හැබැයි, අපට අධ්‍යාපනය නිර්වචනය කර ගන්නට බැරි නම්, උසස් අධ්‍යාපනය නිර්වචනය කර ගන්නට බැරි නම් ඒ සියල්ලම අපතේ යනවා.

මේ අවුරුද්දේ අපි රුපියල් බිලියන 540ක් සෘජුව හා වක්‍රව අධ්‍යාපනයට වෙන් කරලා තිබෙනවා. ඒ සියල්ලක්ම ඔබගේ බදු මුදල්; මේ රටේ මිනිසුන්ගේ බදු මුදල්; මේ රටින් මැද පෙරදිග ගොස් වැඩියෙන් දහදුක් විඳින කාන්තාවන්ගේ බදු මුදල්. ඒ සියල්ලක්ම අපතේ යනවා, අධ්‍යාපනය නිර්වචනය කරමින් අපි එකඟ වෙලා ඉදිරියට ගෙනිච්චේ නැත්නම්; 2030, 2040, 2050 වෙද්දී මේ රටේ අධ්‍යාපන ක්‍රමය, උසස් අධ්‍යාපන ක්‍රමය, තාක්ෂණවේදය, පර්යේෂණ ක්‍රමය, පර්යේෂණ සංස්කෘතිය කොතැනද තිබෙන්න ඕනෑ කියන එකඟතාවට ආවේ නැත්නම්. ඒ නිසා මම මේ දේශපාලන නායකයන්ගෙන්, පහන් පත්තු කරන දෑතින් වැඳ ඉල්ලන්නේ කරුණාකර අධ්‍යාපනය ගැන විතරක්වත් දේශපාලනයෙන් තොරව හිතන්නට පුරුදු වෙන්න කියලායි. නමුත් එහි පෙරනිමිති මට නොපෙනීම ගැන ඉතාම කනගාටුයි. අධ්‍යාපනයේදී විය යුත්තේ යහපත් දේවල් බොහොමයක් තිබියදී වඩාත් යහපත් දේ තෝරා ගැනීමේ බුද්ධිය ලබා දීමයි. අපි අධ්‍යාපනය කියන්නේ ඒකටයි. යහපත් ඔක්කොම දේ ජේනවා. නමුත් ඒ යහපත් දේවල් මැද තාර්කිකව, විද්‍යානුකූලව, වඩාත් යහපත් දේ සොයා ගැනීමට තමයි අපට අධ්‍යාපනයක් අවශ්‍ය වන්නේ. අන්න ඒ බුද්ධි වර්ධනය තමයි අපි අධ්‍යාපනය යනුවෙන් අදහස් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතක හැටියට වසර 2000දී තමයි ලෝකයට mobile phones හඳුන්වා දුන්නේ. එතකොට, දැනට අවුරුදු 24ක් වෙනවා. ඒ කියන්නේ එක යුගයක්; එක පරපුරක්. නමුත් මේ අවුරුදු 24 තුළදී ඩිජිටල්කරණය කියන එක අපේ ජීවිතයට සම්පූර්ණයෙන් බද්ධ වී තිබෙනවා. උදේ සිට සවස දක්වා; ජාතික ගීය ගැයීමේ සිට, බුදුන් වැඳීමේ සිට, උසස් අධ්‍යාපනයේ පර්යේෂණය දක්වා අද ඩිජිටල්කරණය නැතිවම බැරි තත්ත්වයට පත් වී තිබෙනවා. එහෙම නම් අපි අනාගතගාමීව අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය කරද්දී අවශ්‍ය කරන ප්‍රධාන කාරකයක් වන්නේ, අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය ඩිජිටල්කරණය කිරීමයි. අධ්‍යාපන ක්ෂේත්‍රය ඩිජිටල්කරණය කිරීමෙන් තොරව අපට අනාගතයක් ගැන හිතන්නට බැහැ; කෘත්‍රිම බුද්ධිය - AI - ගැන හිතන්නට බැහැ; augmented realities ගැන හිතන්නට බැහැ; ඒ වාගේම අපට virtual realities ගැන හිතන්නට තහනම් වෙනවා. එහෙම නම්, සංස්කෘතික රාජ්‍යයක් වුණු ශ්‍රී ලංකාව තුළ ඩිජිටල්කරණයට තිබෙන බාධා මොනවාද?

බොහෝ අය බයයි ඩිජිටල්කරණය සිදු වුණොත් තමන්ගේ job එක නැති වෙනවා කියලා.

අද ගරු අධ්‍යාපන ඇමතිතුමා ඉදිරිපත් කළා, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල 17ක අපි ලබා දෙන විවිධ වර්ගයේ උපාධි සංඛ්‍යාව කොපමණද කියලා. එම ප්‍රමාණය, 864යි. නමුත් මට තවම ෂුවර් නැහැ ඒක 864 ද, 895 ද කියලා. මන්ද යත්, එක තැනකවත් සංක්ෂිප්ත වුණු, රැස් වුණු තොරතුරු නැහැ. ඒවා අතින් ගණන් කරන්න ඕනෑ. ඒවා files පෙරළා බලන්න ඕනෑ. මෙන්න මේ ක්‍රමය වෙනස් විය යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ක්‍රමය වෙනස් වී අපි ඇත්ත දත්ත මත පදනම් වුණු කතිකාවකට යා යුතුයි. එක එක්කෙනා තැන් තැන්වලින් සොයා ගන්නා තොරතුරු මත පදනම්ව නොවෙයි. ගරු පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා දත්ත ගැන විශ්වාස කරන දේශපාලනඥයෙක්. මා හිතන විධියට, එතුමා මොරටුව විශ්වවිද්‍යාලයේ ඉන්න කොට ඉගෙන ගත්තු ලොකුම දේ ඒක තමයි. අපි ඇත්ත දත්ත මත පදනම්ව සත්‍ය සොයන්න ඕනෑ.

[ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා]

නමුත් අද මොකද වෙන්නේ? එක එක්කෙනා එක එක දේවල් කියනවා. දැන් කිව්වා, ගිය අවුරුද්දේ විශ්වවිද්‍යාලවලට ළමයි අරගෙන නැහැ කියලා. ඒක අර්ධ සත්‍යයක්. එහෙම අරගෙන නැත්තේ කොහේද? සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට - UVPA එකට - විතරක් ළමයින් ගන්න අපට බැරි වෙලා තිබෙනවා. එයට වුණත් ගන්න බැරි වෙලා තිබෙන්නේ ගායනය, වාදනය සහ නර්තනය කියන කොටස් තුනට අදාළව විතරයි. ඒ, එම 700 කණ්ඩායම එකට තබා පන්ති, දේශන පවත්වන්නට අමාරු තත්ත්වයක් තිබෙන නිසාවෙනුයි. මොකද, ශබ්දය පිළිබඳ වටපිටාවෙන් ගැටලු මතු වී තිබෙනවා. නමුත් අපි ඒකටත් විසඳුමක් සොයමින් ඉන්නවා. මහවැලියෙන් ඉඩමක් ලබාගෙන අවශ්‍ය කටයුතු කරමින් ඒ දරුවන් ලහිලහියේ විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගන්නට අපි සූදානම් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෑතක් වෙනතුරු ජාතික විශ්වවිද්‍යාල 17ත්, ඊට අනුබද්ධිත පශ්චාත් උපාධි ආයතන 19ත් පාලනය වුණේ එළියේ සිටින දේශපාලන පක්ෂයක වුවමනාව නිසා; එළියේ සිටින බලය අල්ලන්නට උත්සාහ කරන කණ්ඩායමක වුවමනාව නිසා. අද වෙනකොට කඩා වැටිච්ච දේශයක, කඩා වැටිච්ච ආර්ථිකයක බලාපොරොත්තු නැති වුණු අවස්ථාවකදී පවා උසස් අධ්‍යාපනය හා අධ්‍යාපන ක්‍රමය, එම පද්ධතිය යාපනයේ උතුරේ ඩෙල්ෆ්ට්වල සිට දකුණේ දෙවුන්දර තුඩුව දක්වා පාසල් 10,194ක දරුවන් මිලියන 4.2කුත්, විශ්වවිද්‍යාල 17ක දරුවන් ලක්ෂ දෙකක් සහ ආචාර්ය, මහාචාර්යවරුන් 11,400ක් සමඟ -සියයට 95ක සාර්ථකත්වයකින් - නඩත්තු කර ගෙන යනවා. ඔව්, තවමත් පැහැදිලිවම අවපාත තිබෙනවා; පැහැදිලිවම අඩු පාඩු තිබෙනවා.

මේ රටේ බුද්ධි ගලනය සිදු වුණේ දරුවන්ගේ හේතුවක් නිසා නොවෙයි. ආර්ථිකය කඩා වැටුණාම මධ්‍යම පාන්තික අය රට දාලා යන එක ස්වාභාවිකයි. ඒ නිසා අපට අහිමි වුණා, 600කට අධික ආචාර්ය, මහාචාර්යවරු පිරිසක්. විශේෂයෙන්ම වෛද්‍ය, ඉංජිනේරු, තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉන්න වෘත්තිකයන් පිරිසක් අපට අහිමි වුණා. වික්ටර් රත්නායක මහත්මයාගේ ගීතයක කියනවා වාගේ "හිතින් යන අය අතින් අල්ලා නවත්වන්නට බැහැ". සංක්‍රමණය මානව අයිතියක්. නමුත් වෛද්‍ය පීඨයේ මහාචාර්යවරයෙක් රටින් පිට වුණාම, සංක්‍රමණය වුණාම හෙට ගිහිල්ලා තව එක්කෙනෙකුට කියන්න අපට බැහැ, "ඔයා මහාචාර්ය වෙන්න" කියලා. මොකද, එහෙම කෙනෙක් බිහි වෙන්න කාලයක් ගත වෙනවා. අවුරුදු 20ක, 25ක දැනුමත් අරගෙනයි එතුමා හෝ එතුමිය පිට වෙන්නේ. අපි ඒ හා සමාන අර්බුද රාශියකට මුහුණ දෙමින් සිටිනවා.

මා පෙරළා බැලූ දත්තයන්වල, කොළවල සඳහන්ව තිබෙනවා, අවුරුදු 10කට, අවුරුදු 7කට පෙර වෛද්‍ය පීඨයක් පටන් ගත්තා නම් වැය වෙන මුදල කීයද කියලා. ඒ, බිලියන 5ක් හෝ 6ක්. මොකද, වෛද්‍ය පීඨයක තිබෙනවා, දෙපාර්තමේන්තු, එහෙම නැත්නම් අංශ 12ක්, from anatomy to anaesthesiology. In a faculty of medicine, we have about 13 different departments. So, five to ten years ago, we only needed a maximum of Rs. 4 billion to Rs 5 billion to start a faculty of medicine. But, today, what is the cost? Today, we need at least Rs. 25 billion just to start a faculty of medicine and another Rs. 2 billion every year to maintain it. So, that is the challenge we are facing. මේක තමයි අපේ අර්බුදය; අපේ අභියෝගය. මේ අභියෝගය රාඝවන්ටවත්, ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමාටවත්, ඩලස් අලහප්පෙරුම මැතිතුමාටවත්, පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමාටවත් නොවෙයි තිබෙන්නේ. මෙය ජාතිය ඉදිරියේ තිබෙන අභියෝගයක්. එහෙම නම් අපට කිසි විධියකින් සාරධර්මීය හෝ බුද්ධිමය හැකියාවක් හෝ අයිතියක් නැහැ, තවදුරටත් දේශපාලනය කරමින් මේ ප්‍රශ්න දෙස බලන්නට.

කළ යුත්තේ කුමක්ද? ශ්‍රී ලංකාව බුද්ධි ශිෂ්ටාචාරයේ කොටසක් බව ඉතිහාසයේ ලියැවෙනවා. දකුණු ආසියානු සංස්කෘතීන් තුනක් තුළින් පෝෂණය වුණු මගේ මව් රටයි මෙය. එහෙම නම් 2030දී, 2040දී, 2050දී මේ කලාපයේ රටවල් ද ඇතුළුව ලෝකයේ රටවල් යන්නේ කොතැනට ද, එහිදී අභිමානවත් දේශයක පුරවැසියන් හැටියට අපේ ජනතාවට ජීවත් වීමේ අයිතිය හා අවකාශය ලබා දෙන්නට හැකි වෙන ආකාරයට අධ්‍යාපනය ප්‍රතිසකස් කරන්නේ කෙසේද යන්න පිළිබඳව ජාතික කතිකාවක් අවශ්‍යයි, එය දේශපාලනයෙන් තොර වූ කතිකාවක් විය යුතුය යන්නයි මගේ යෝජනාව. ඒ නිසා විශ්වවිද්‍යාල ආරම්භ කිරීම, විශ්වවිද්‍යාල නඩත්තු කිරීම, විශ්වවිද්‍යාලවල තිබෙන ගුණාත්මකභාවය වැඩි කිරීම, විශ්වවිද්‍යාලවල තිබෙන ප්‍රශ්න, අභියෝග ජය ගැනීම කියන කාර්යයේදී අපි සාමූහිකව වැඩ කරමු කියන ආයාචනය, ඉල්ලීම මා ඔබ ඉදිරියේ කරනවා. මෙයට "යාඥාව" කිව්වත් කමක් නැහැ. කරුණාකර එය ඉටු කරන්න. අපට මැතිවරණ කරන්න පුළුවන්. මැතිවරණයක් අවශ්‍ය වෙනවා. මැතිවරණ තියන්න පුළුවන්. ඒ සියල්ලෙන් ඔබ්බට ගිහින්, හෙට මේ රටේ නායකත්වය ගන්න හිතන කවුරු හෝ වේවා, අන්න ඒ ප්‍රශ්නය පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ බව සඳහන් කරමින්, මම දැන් ප්‍රායෝගික ගැටලු කිහිපයකට යොමු වෙන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොත වෙනකොට මුළු රටම දන්නවා, විශ්වවිද්‍යාල 17ක්ම වැසී තිබෙනවා කියලා. ඒකට හේතුවත් මුළු රටම දන්නවා. ඒ, විශ්වවිද්‍යාලවල අනධ්‍යයන සේවකයන් සිය ඉල්ලීම් ඉදිරිපත් කරමින් කරගෙන යන වැඩ වර්ජනයයි. සියයට 25ක පඩි වැඩි කිරීමක් ඒ අය ඉල්ලුවා. ඒ සියයට 25 දෙන්න රජයට වර්ෂයකට රුපියල් බිලියන 1.8ක් අවශ්‍ය වෙනවා. මන්ද යත්, අපට ඉන්නවා අනධ්‍යයන සේවකයන් 14,200ක්. ඒ අය අතරින් 564දෙනෙක් විධායක ශ්‍රේණියට අයිතියි. ඉතුරු අය සියල්ලෝම විධායක නොවන කණ්ඩායමට අයිතියි. ඒ අයට අදාළව වෘත්තිය සමිති 18ක් තිබෙනවා. මා හිතන විධියට, ඒ වෘත්තිය සමිති 18හිම ඉල්ලීම් 35කට අධික ප්‍රමාණයක් තිබෙනවා. මේ අර්බුදය මතු වන්නට ප්‍රධාන ඉල්ලීම් දෙකක් හේතු වුණා. ඒ ප්‍රධාන ඉල්ලීම්වල පළමුවැනි කොටස 2016දී සිදු වෙච්ච අගතියක් - an anamoly that happened in 2016 - හා සම්බන්ධයි. මගෙ දෙයියනේ, එය මම පාර්ලිමේන්තුව තියා දේශපාලනය ගැන හීනයක්වත් දැකපු නැති කාලයක්. මම දන්නේ නැහැ, ඒ කාලයේ හිටපු විෂය භාර ඇමතිවරයා හෝ මුදල් ඇමතිවරයා කවුද කියලා. අපි ඒකට කියන්නේ "107 අගතිය" කියලා. මොකද, කණ්ඩායමකට 107ක් වැඩි කරද්දී අනෙක් අයට වැඩි කළේ 93යි. එතකොට සියයට 15 gap එකක් තිබෙනවා. ඒ පිළිබඳව අවුරුදු 8ක් තිස්සේ සාකච්ඡා කරලාත් භාණ්ඩාගාරයටත්, සේවකයන්ටත් සම්මුතියකට එන්න බැරි වෙලා තිබෙනවා. මා දන්නා අංක ගණිතයේ හැටියට නම්, මා දන්නා ප්‍රශ්න විසඳීමේ ක්‍රමවේදයේ හැටියට නම්, එය ඒ තරම් ගැටලුවක් නොවෙයි. භාණ්ඩාගාරයේ අය කියනවා, එහෙම අගතියක් වුණේ නැහැ කියලා. නමුත් මේ අය කියනවා, අගතියක් වුණා කියලා. ඉතින් අවශ්‍ය වෙන්නේ, කණ්ඩායම් දෙකම ගෙන්වා සාකච්ඡා කර විසඳුමකට ඒමයි. කමිටුවක් පත් කර තිබෙනවා, ගාමිණී ලොකුගේ මැතිතුමාගේ නායකත්වය යටතේ, 2019දී. ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා ඇතුළු තවත් කිහිපදෙනෙක් එකතුව ඒ වාර්තාව ලබා දී තිබෙනවා. ඒ වාර්තාවේත් කියනවා, එවැනි අගතියක් වෙලා තිබෙනවා නම් කරුණාකරලා එය සමථයට පත් කරන්න කියලා. නමුත් දැන් භාණ්ඩාගාරයට තිබෙන අර්බුදය, අභියෝගය නම්, එය එක

තැනක සිදු වුණු අගතියක් හැටියට පිළිගත්තොත්, තවත් තැන් රාශියක සිදු වූ අගතියක් ලෙස පිළිගන්නට සිදු වීමයි. ඒ වාගේ තත්ත්වයකට අපි කියනවා, snowball effect කියලා. ඒ වාගේ ලොකු අර්බුදයක් ඇති වෙන්න පුළුවන් බව කියනවා. ගරු පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමනි, ඒ අගතිය දුරු කරමින් 2016 සිට අද දක්වා ඉල්ලන වෙනස කරන්නට පමණක් රුපියල් බිලියන 6.8ක් අවශ්‍ය වෙනවා, පොලී රහිතව. 2016දී දෙන්න ඕනෑ නම්, ඒ කාලයේ දීලා තිබෙන්න ඕනෑ. එහෙම දුන්නා නම් අපි පොලියත් දෙන්න එපා යැ. ඒ අනුව ගණන් බැලුවොත්-

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
මම ඔබතුමාගේ නම කිව්වේ, ඔබතුමා කැමැත්තෙන්-

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම මේ කථා කරන්නේ පියෙකු හැටියට; රජයේ විශ්වවිද්‍යාලයක ඉගෙන ගන්නා දරුවෙකුගේ පියෙකු හැටියට. මේ දරු පරම්පරාවට පසුගිය කාලයේ විශාල අගතියක් සිදු වුණා. පාස්කු ප්‍රහාරය, කොවිඩ් 19 වසංගතය,-

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
කොවිඩ් 19 වසංගතය, ආර්ථික අර්බුදය සහ අරගළය.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
අරගළය නොවෙයි. රට බංකොලොත් වීම වාගේ සිදුවීම් ගණනාවක් නිසා මේ දරු පරම්පරාවට අගතියක් වුණා. ඔබතුමා දන්නවා, සල්ලි තිබෙන මිනිසුන්ගේ දරුවන් දැන් පෞද්ගලික විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබලා උපාධි ලබන බව; පශ්චාත් උපාධි ලබන බව. ප්‍රතිපත්තිගරුක මිනිසුන් හැටියට අපි උසස් පෙළ විභාග ආදි රජයේ විභාග සමත් වුණු අපේ දරුවන් රජයේ විශ්වවිද්‍යාලයකට යවලා අද බලාගෙන ඉන්නවා. කාලයක් විශ්වවිද්‍යාල ගුරුවරු කිව්වා, "බදු වැඩියි, ඒ නිසා අපිට පඩි වැඩි කරන්න" කියලා.

ඔවුන්ට සියයට 25ක allowance එකක් දුන්නා. දැන් අනධ්‍යයන සේවකයන් කියනවා, ඔවුන්ටත් සියයට 25ක allowance එකක් දෙන්න කියලා. මේ ප්‍රශ්නයේ මූල, අග මොකක්ද කියලා මේ දරුවෝ දන්නේ නැහැ, ගරු ඇමතිතුමා. මේක කරුණාකරලා විසඳන්න. මොකද, මේ දුප්පත් ජනතාවගේ දරුවන් තමයි අද මේ බැට කන්නේ. මේකෙන් වෙන්නේ පෞද්ගලික අධ්‍යාපනය සඳහා පෞද්ගලික විශ්වවිද්‍යාලවලට මේ ඉන්නා හැම කෙනාගේම දරුවන් යොමු වෙන එක විතරයි. ඒ නිසා කරුණාකරලා මේ ප්‍රශ්නය හැකි ඉක්මනින් විසඳන්න. මේකේ ආරම්භය වෙන මොකක්වත් නොවෙයි, APIT එක ලක්ෂ දෙකහමාරේ ඉඳන් ලක්ෂයට අඩු කරලා ගත්ත ප්‍රශ්නය.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
ඔබතුමා අධ්‍යාපනය පිළිබඳ පෞද්ගලිකවම මගෙන් අහන නිසා තමයි ඔබතුමාගේ නම සඳහන් කළේ.

මම මිනිත්තු 12 ඇතුළත කථා කළේත් ඒ ගැන. මේක පාඨලී චම්පිකගේ ප්‍රශ්නයක් නොවෙයි, රාඝවන්ගේ ප්‍රශ්නයක් නොවෙයි. අපි දෙපොළම එකතු වී මේක කරන්න ඕනෑ. ඒක නිසා අපිට ඇඟිල්ල දිගු කරන්න පුළුවන් හිටපු ඇමතිවරුන්ටත්. මට කියන්න පුළුවන් නේ, ගරු රවුෆ් හකීම් ඇමතිතුමා අධ්‍යාපන ඇමති වෙලා හිටපු කාලයේ තිබුණු ප්‍රශ්නයක් මේක කියලා. මට කියන්න පුළුවන් නේ, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා අධ්‍යාපන ඇමති වෙලා හිටියා, මේක එතුමාගේ කාලයේ තිබුණු ප්‍රශ්නයක් කියලා. නැහැ, ප්‍රශ්නයේ කොටසක් නොවෙයි, විසඳුමේ කොටසක් වෙන්න උත්සාහ ගන්න. අපි කොහොමද මේක විසඳන්නේ කියලා බලලා ඒක කරන්න උත්සාහ කරමු.

පසුගිය දවස් තුනේදීම මේ සම්බන්ධව රැස්වීම් 6ක් පවත්වා තිබෙනවා. දැන් අපිට ලිඛිතව ලැබිලා තිබෙනවා ඒ අයගේ කොන්දේසි සමඟ එකඟ වෙන්න කැමතියි කියලා. අපි ඒ කොන්දේසි ඒ අයට ලබා දෙන්න උත්සාහ ගන්නවා මේ දවස් දෙකතුන තුළදී. අපි කරන දෙයට භාණ්ඩාගාරය කැමති වුණා නම් අපිට පුළුවන් වෙයි ලබන සතියේ යළිත් සියලු කටයුතු පටන් ගන්න. ඔබතුමාගේ දියණියට ආපහු මොරටුව විශ්වවිද්‍යාලයට එන්නත් පුළුවන් වෙයි, ගරු මන්ත්‍රීතුමනි. ඒ වගකීම පියෙක් හැටියට මටත් තිබෙනවා, මේ රටේ අනාගතය ගැන හිතන්න. ඊට වඩා, මේ රටේ අධ්‍යාපනය තුළින් ගොඩ නැඟුණු කෙනෙක් හැටියට මට මේ අධ්‍යාපනය කඩා වට්ටන්න දෙන්න බැහැ. එය ගෝලීයකරණයද, එය ජාත්‍යන්තරකරණය ද, එය භාණ්ඩකරණය ද කියන එක නොවෙයි වැදගත් වෙන්නේ. අපි රාජ්‍ය අධ්‍යාපනය රැක ගන්නට සියලු දේ කළ යුතුයි. ඒකට ඔබතුමා කැපවීමෙන් ඉන්න බව අපි දන්නවා. ඒ නිසා අපි කළ යුත්තේ මේ සංවාදය මෙතැනින් නොනවත්වා, මේ සංවාදය හුදෙක් එක එක පක්ෂවලට එක එක තැන්වලට යොමු නොකර, මේ සංවාදයේ තිබෙන අර්ථය අරගෙන ආර්ථිකය කොතැනට ද යවන්න ඕනෑ කියලා බලා ඒ අනුව කටයුතු කිරීමයි. අපි පළමුවෙනි වතාවට මේ වසරේ පමණක් රුපියල් බිලියන 530ක් ආරක්ෂක අමාත්‍යාංශය සඳහා වන අය වැයටත් වඩා ඉහළින් ගිහිල්ලා අධ්‍යාපනය සඳහා යොදවනවා. ඒකත් මදි. මොකද, ඉල්ලුම ඒ තරමට වැඩි වෙලා තිබෙනවා. මේ වසරේ 176,000ක් ශිෂ්‍ය-ශිෂ්‍යාවෝ මේ රටේ උසස් අධ්‍යාපනයට - විශ්වවිද්‍යාල අධ්‍යාපනයට - සුදුසුකම් ලැබුවා. නමුත්, අද අපිට එයින් ගන්න වෙන්නේ කීයද? අපිට කොච්චර ගත්තත් ගන්න වෙන්නේ, ශිෂ්‍යයන් 42,000යි. මේකේ යථාර්ථය ඔබතුමා දන්නවා. එතකොට තව විශ්වවිද්‍යාලයක් අද පටන් ගත්තත්, ඒ ගොඩනැඟිලි හදලා ඉවර වෙනකොට තව අවුරුදු තුනක්වත් ගත වෙනවා.

ඒ නිසා මම කියන්න කැමතියි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීවරයා මේ වෙලාවේ ගරු සභාවේ නැතත් එතුමාගේ මෙල්බර්න් ප්‍රකාශය ඉතා වැදගත් ප්‍රකාශයක් බව. මෙල්බර්න් නුවරදී එතුමා ප්‍රසිද්ධියේ කිව්වා, මේ රටේ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ විදේශ කියන අධ්‍යාපන ක්‍රමවේද තුනම පිළිගන්නා බව. එහෙම නොකර අපිට බැහැ, හාවර්ඩ් විශ්වවිද්‍යාලයක් හදන්න; එහෙම නොකර අපිට බැහැ කවදාවත් හාවර්ඩ් විශ්වවිද්‍යාලයක් තියා IIT එකක්වත් හදා ගන්න. මන්ද යත්, අද සිදු වෙලා තිබෙන ආර්ථික ගෝලීයකරණය ඔබතුමා විසින්වත් මා විසින්වත් නවත්වන්න පුළුවන් දෙයක්වත් නොවෙයි. අපට අවශ්‍ය වෙන්නේ හමන හුළඟ නවත්වන එක නොවෙයි, ඒ හුළඟට එරෙහිව ශ්‍රී ලාංකික ජාතියක් හැටියට ජීවත්වීමේ අභිමානය අපේ දුවා දරුවන්ට ලබා දීමයි. අන්න ඒ සඳහා වූ අධ්‍යාපන ක්‍රමවේදයක්, ආයතනික ක්‍රමවේදයක්, පුද්ගලයන්ගේ ක්‍රමවේදයක් තිබිය යුතුයි.

[ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක දෙයක් කිව යුතුයි. විශ්වවිද්‍යාලවල ප්‍රශ්න විසඳීමේ ක්‍රමවේදය ඉතාම ශෝචනීය තත්ත්වයකයි තිබෙන්නේ. එයට හේතුව අපේ බුද්ධි දරිද්‍රතාව. We are living in a country where intellectual poverty is the hallmark of the higher education sector. They are unable to sit down and talk, solve problems and come to a conclusion. මේක අද ඊයේ වෙච්ච දෙයක් නොවෙයි. කාලාන්තරයක් තිස්සේ වෙච්ච දෙයක්. මම හිතනවා ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා මාත් එක්ක එකඟ වෙයි කියලා. අපි පාසල් යද්දී මේ රටේ විශ්වවිද්‍යාලයේ සිටි ආචාර්ය මහාචාර්යවරු ලෝකයම දන්නා අය. චන්ද්‍රා වික්‍රමගේ, සිරිල් පොන්නම්පෙරුම, නන්දදාස කෝදාගොඩ ගැන ලෝකයම දන්නවා. අද විශ්වවිද්‍යාලවල මහාචාර්යවරුන්ගේ නම් ඒ department එකේ ඉන්නා ළමයින්වත් දන්නේ නැහැ. මේක ඇත්තක්. ජයදේව උයන්ගොඩ නමැති මහාචාර්යවරයා කවුද කියලා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යාව විෂය හදාරන පළමු වසරේ ශිෂ්‍යයෙක් දන්නේ නැහැ. අවුරුදු 35කට පස්සේ, දේශපාලන විද්‍යාව පිළිබඳ දකුණු ආසියාවේ බුද්ධිමතෙක් හැටියට ලෝකය පිළිගත්ත ඒ මහාචාර්යවරයාගේ නමවත් දන්නේ නැති ක්‍රමයකටයි අපි මේ අධ්‍යාපනය කරගෙන යන්නේ.

එම නිසා මෙය නැවැත්විය යුතුයි, මෙය ගැන ප්‍රශ්න කළ යුතුයි, මෙයට හරස් වී අපි ජාතිය වෙනුවෙන් මෙයට දායකත්වය දිය යුතුයි කියා මා සිතනවා. ගරු පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමා ඇසූ ප්‍රශ්නයට කෙටි පිළිතුරක් වශයෙන් මම කියන්න ඕනෑ, රැස්වීම් 4ක් මගේ මූලිකත්වයෙන් දවස් දෙකකදී පැවැත්වුණු බව. ඒ ගොල්ලන්ගෙන් කොන්දේසි දමා අපිට ලිපි ලැබී තිබෙනවා. ඒ කොන්දේසි අපි සලකා බලනවා. ලබන සතිය වෙද්දී මෙය අවසන් කරලා, පුළුවන් හැකි ඉක්මනින් නැවත විශ්වවිද්‍යාල පටන් ගැනීමට හැකි වෙයි කියන සුබවාදී ලකුණු අපට පෙනෙනවා. මට සියයට සියයක් පොරොන්දු වෙන්න බැහැ. මොකද, මේකට භාණ්ඩාගාරයේත් වැඩකොටසක් තිබෙන නිසා. ඔබතුමා ඒ පිළිබඳව දන්නවා, ඔබතුමා මට වඩා ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයෙක් සහ හිටපු ඇමතිවරයෙක් නිසා.

මම කියන්න ඕනෑ, අද වන විට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල තුනක් - කොළඹ විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - පළමු වතාවට ලෝකයේ හොඳම විශ්වවිද්‍යාල 1,000ට ඇතුළත් වී තිබෙන බව; the Universities of Peradeniya, Colombo and Sri Jayewardenepura have entered the best 1,000 universities in the world. That is an achievement for a nation which has fallen and is now getting up, which was attacked by terrorists in 2019, which was devastated by COVID-19, which was made to fall by the bad political and economic decisions and almost got its democratic foundations destroyed. But, today, thanks to the far-sighted leadership, the international community and all of us, even the most peripheralized citizen because he or she pays the much needed taxes, our nation is rising up again. අන්න ඒ උදව්යගේ සාමූහිකත්වය නිසා අද අපට පුළුවන් වෙලා තිබෙනවා නැඟී සිටින්න.

අපි ගිය ගමන වැරදියි නම්, වැරදි රාශියක් කළා නම්, අලුත් ගමනක් පටන් ගන්නා මේ මොහොතේදී අපට වැදගත් වෙනවා, අලුත් ගමනේදී කලින් කරපු වැරදි නොකර, අලුත් දේවල් කරන්නට උත්සාහ ගැනීමට. ඒ නිසා කාරණා 3ක් මම කියන්නට කැමැතියි. එකක් තමයි, අපට ජාතික පෙර පාසල් අධ්‍යාපනයක් අවශ්‍යයි; අධ්‍යාපන ප්‍රතිපත්තියක් අවශ්‍යයි. ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, ඔබතුමා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් කටයුතු කරපු කාලයේත් මේ දේවල් කරන්න උත්සාහ ගත්තා. නමුත්, තවමත් ඒ දේවල් කරන්න බැරිවෙලා තිබෙනවා. උතුරේ උගන්වන්නේ මොකක්ද? උතුරේ එක්කෙනෙක් උගන්වනවා, "මේ මුළු රටම තිබුණේ දෙමළ මිනිහාටය. විජය ඇවිල්ලා මේක අල්ලා ගත්තා" කියලා. මෙන්න මේවා තමයි ඒ දරුවාට උගන්වන දේ. දකුණේ සමහර පෙර පාසල්වල උගන්වන්නේ මොකක්ද? "දුටුගැමුණු රජ්ජුරුවෝ තමයි හිටියේ. එතුමා මේ රටේ හිටියා. සිංහල අය විතරයි මේ රටේ හිටියේ. දෙමළ මිනිස්සු කවදා හෝ දවසක මේ රටට කඩා පැන්න අය. ඒ නිසා මේ අය එළවන්න ඕනෑ" කියලා උගන්වනවා. මම දන්නේ නැහැ, මද්‍රසා පාසල්වල මොනවා උගන්වනවා ද කියලා. එය එසේ නොවිය යුතුයි. එහෙම උගන්වන පරපුරකට කවදාවත් එකට ජීවත් වෙන්නට බැරි වෙනවා. ජාතික කතිකාවකින් පෙර පාසල් අධ්‍යයන ක්‍රමයක් අපට අවශ්‍ය වෙනවා. එය උතුරද, දකුණද, කන්ද උඩරටද, කළුතරද කියලා බලන්නේ නැතිව, මද්‍රසා ද, දහම් පාසලද කියන්නේ නැතිව, "අපට ජාතියක් හැටියට ගොඩ නැගෙන්නට පුළුවන්, අපේ ජාතික කොඩිය යටතේ, නොබෙදුණු රටක, විවිධත්වයක් තුළ අපට ජීවත් වෙන්න පුළුවන්" කියන ඒ සංකල්පයට අවශ්‍ය වන පෙර පාසල් අධ්‍යයන ප්‍රතිපත්තියක් අපට අවශ්‍යයි. එය ලඟි ලඟියේ ගෙන ආ යුතුයි. දෙවනුව, 5වැනි ශ්‍රේණියේ විභාගය අද වෙනකොට මැදි වයසේ දෙමව්පියන්ගේ ජීවිතයේ ලොකුම අභියෝගය බවට පත්වී තිබෙනවා. ඇයි? ජාතික පාසලකට තමන්ගේ දරුවන්ව ඇතුළත් කරන්න තිබෙන එකම ක්‍රමය ඒකයි. ඒ නිසා එම දරුවාගේ කරපිට පටවන ආතතිය, පීඩනය, බලපෑම, තෙරපුම විවිධාකාරයි; මානසිකයි, ආර්ථිකයි, කායිකයි, සාමාජීයයි. "මෙය අවශ්‍ය ද?" කියන ප්‍රශ්නය අපි ඇසිය යුතුයි. තුන්වැනුව, මේ ක්‍රමවේදය තුළ අපට අපොස (සාමාන්‍ය පෙළ) - GCE (O/L) - සමත් වෙලා උසස් පෙළ ඉගෙනීමට ධාරාවන් 6ක් තිබෙනවා. මේ ධාරාවන් 6 හරහා පමණ ද අපට ලෝකයට පුරවැසියන් බිහි කළ හැක්කේ? එහෙම නම් අපි කොහොමද මේක ගණනය කරන්නේ? මගේ යෝජනාව මේකයි. 8වැනි ශ්‍රේණියේදී - ඒ කියන්නේ වයස අවුරුදු 13දී, 14දී - මනෝ විද්‍යාඥයන්, සෞඛ්‍ය විද්‍යාඥයන් කියනවා, 'තීරණ ගන්න පුළුවන් බුද්ධියක් තිබෙන්න පුළුවන් දරුවෙක්' කියලා. ඒ අයගෙන් අහන්න පුළුවන්, ඒ අය එතෙක් කල් ලබාගෙන තිබෙන ප්‍රගතිය පිළිබඳව. සටහන්වල ඒ දේවල් තිබෙනවා, ගණිතයට දක්ෂද, භාෂාවට දක්ෂද, කලාවට දක්ෂ ද, ප්‍රශ්න විසඳීමට දක්ෂද, critical thinkingවලට දක්ෂ ද කියලා. එතැනදී ඒ දරුවා සහ දෙමව්පියන් සමඟ සාකච්ඡා කරන්නට පුළුවන්. මෙය දැනට කැනඩාව, පින්ලන්තය වාගේ රටවල සිදු වෙනවා. ඒ පුරවැසියාට අයිතියක් දෙනවා, ඔහුට හෝ ඇයට ලබා ගන්නට පුළුවන්, යන්න පුළුවන් ක්‍රමවේදය මොකක්ද කියලා. එතකොට අපට දැනට තිබෙන උසස් පෙළ, ඊළඟට විශ්වවිද්‍යාලය, ඊළඟට පළමුවෙනි උපාධිය කියන පටු, හීන වුණු මාර්ගයේ නොගිහින් අපේ පුරවැසියන්ට බහුතරයක් වුණු, විවිධත්වයෙන් සමන්විත වුණු පූර්ණ, පුළුල් වූ අධ්‍යාපන ක්‍රමවේදයක් ලබා දෙන්නට පුළුවන්.

හතරවනුව, විශ්වවිද්‍යාල 17ක් රාජ්‍යය යටතේ තිබෙනවා. රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල 26ක් තිබෙනවා. ඒ දෙකටම අමතරව පිට රට උපාධි ලබාදෙන ආයතන හැටියට ලියාපදිංචි වෙච්ච ආයතන 237ක් තිබෙනවා, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි. Affiliated degree-awarding institutes 203ක් මුලතිව්වල ලියාපදිංචි වෙලා තිබෙනවා. ඒවා ඔක්කොම companies යටතේ ලියාපදිංචි වෙලා තිබෙන්නේ. මම ඒ ගොල්ලන්ගෙන් වාර්තාවක් ඉල්ලුවාම ඒ ගොල්ලන් කියනවා, "ඔබට අයිතියක් නැහැ අපෙන් වාර්තාවක් ඉල්ලන්න. අපි companies. අපි Companies Act එක

යටතේ ලියාපදිංචි වෙච්ච ආයතන විධියට යවලා තිබෙනවා" කියලා. මොකද, මට එන්න කියනවා, ඒ ගොල්ලන්ගේ උපාධි ප්‍රදානෝත්ස්වයට. ඒකට මම යන්නේ නැහැ. මම කියන්නේ, "උපාධි ප්‍රදානෝත්සවයට එන්න ඕනෑ නම් ඔය ගොල්ලන්ගේ පසුගිය අවුරුදු 3ක වාර්තා මට එවන්න. ඒකේ අධ්‍යාපන වාර්තාව සහ මූල්‍ය පරිපාලන වාර්තාව මට එවන්න" කියලායි; I say, "I need financial accounts and educational accounts for the last three years. Only then, I will come to any of your events." එහෙම හොයලා බලද්දී 270ගණනක් තිබෙන්නේ. මේක අයාලේ යනවා. මා දන්නවා, රුසියාවට යවන්නයි කියලා මුදල් ගන්න බව. පළමුවෙනි semester එකට විතරයි ගෙවලා තිබෙන්නේ. රුසියාවට ගිහිල්ලා බලද්දී කියපු විශ්වවිද්‍යාලය නොවෙයි, වෙන විශ්වවිද්‍යාලයක් තිබෙන්නේ. මෙන්න මේ ක්‍රමය අපි නැවැත්විය යුතුයි. බර්ලින් තාප්පය තිබියදී බිහි කළ, රුසියාව සෝවියට් සමූහාණ්ඩුව හැටියට තිබියදී බිහි කළ, - ඒ කියන්නේ, අවුරුදු 45කට කලින් බිහි කළ - ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාගේත් නායකත්වය යටතේ තිබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තම දිවිය අවසන් කොට ඇත. ඒ නිසා අපි ඒ වෙනුවට ජාතික උසස් අධ්‍යාපන සංවර්ධන කොමිසමක් බිහි කරනවා. ඒ පිළිබඳ කෙටුම්පත මේ මොහොතේ සකස් වෙමින් පවතිනවා. එහි සරලම රේඛාව නම්, රාජ්‍ය, රාජ්‍ය නොවන කියලා විශ්වවිද්‍යාල දෙකම පරිපාලනය කරන්නට පුළුවන් councils දෙකක්, අධිකාරි දෙකක් ඒ කොමිෂන් සභාව යටතේ බිහි වීම. නමුත්, ඒ අධිකාරි දෙකටම පොදු වුණු ජාතික අධිකාරියක් බිහි වෙනවා. ඒ, Education Quality Accreditation Authority කියන අධිකාරිය. ඒ කියන්නේ, රාජ්‍යය ද, රාජ්‍ය නොවන ද, තවත් ආයතනයකට සම්බන්ධ ද කියන එක නොවෙයි වැදගත් වන්නේ. ජාතියක් හැටියට අපේ අධ්‍යාපනයේ ප්‍රමිතිය පිළිබඳව එක ආයතනයයි තිබෙන්නේ. එතකොට NSBM එකේ degree එක ගත්තත්, කොළඹ විශ්වවිද්‍යාලයේ degree එක ගත්තත් වෙනසක් වෙන්න විධියක් නැහැ. එක quality එකක් තිබෙන්න ඕනෑ. මුදල් ගෙවීම තමයි වෙනසකට තිබෙන්නේ. ඒ quality එක නැත්නම් ජාතියක් හැටියට එකට එක වතාවේම ගොඩ නැඟෙන්නට අපට බැරි වෙනවා. මන්ද යත්, ආර්ථික සංවර්ධනයට බලපාන ප්‍රධානම ආයෝජනය අධ්‍යාපනයයි. මෙය කොරියාවේ අපි දැක්කා; ජපානයේ දැක්කා; පින්ලන්තයේ දැක්කා. එහෙනම්, ජනාධිපතිතුමා ඇතුළු නායකත්වය මේ මොහොතේ දී වැඩ කරමින් යන, අනාගතය ගැන බලන මේ 2025 - 2030 කාලය තුළ දී අපේ ණය ප්‍රතිව්‍යුහගත කර අපි සහන කාලයක් අරගෙන 2030 සිට ගොඩ නහන්න හදන අලුත් ශ්‍රී ලංකාව තුළ අපට තිබිය යුතු ප්‍රධාන අංගයක් වෙන්නේ, ජාතික අධ්‍යාපන ක්‍රමවේදයයි.

පස්වෙනි කාරණය තමයි තාක්ෂණ අධ්‍යයනය. තාක්ෂණ අධ්‍යයනයට අද තිබෙන බාධාව කුමක්ද? ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය අපට දුන් තැග්ගක්. හාඩ් උසස් තාක්ෂණ ආයතනය අපට දුන් තැග්ගක්. නමුත්, මේ ආයතන දෙක හැර අපට ජාතික තාක්ෂණික ආයතන පටන් ගන්නට තිබෙන අපහසුව මොකක්ද? අපි UNIVOTEC එක පටන් අරගෙන තිබෙනවා. එක විශ්වවිද්‍යාලයක් තිබෙනවා, අපට. ඊළඟට, ජාතික පුහුණු කිරීමේ අධ්‍යාපනය අපි වැඩිදියුණු කරලා VTA එකක් පටන් අරගෙන තිබෙනවා. නමුත්, මේ ප්‍රමාණයන් අපට මදි වී තිබෙනවා. ඒ නිසා අපට අවශ්‍ය වෙනවා, රාජ්‍ය හා රාජ්‍ය නොවන කියන ආයෝජනයන් යටතේ තව තවත් මේ ආයතන ඇති කරන්නට. දැන් වෙලා තිබෙන්නේ මේකයි, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා. මම හිතනවා ඔබතුමාගේ නම නිතරම කිව්වාට ප්‍රශ්නයක් නැතිව ඇති කියලා. මොකද, ඔබතුමා අධ්‍යාපනය පිළිබඳව ආත්මයෙන්ම හිතන කෙනෙක් නිසායි මම කියන්නේ. ඊලෝන් මස්ක් තක්කඩියෙක් යයි කියන රටකයි අපි ජීවත් වෙන්නේ. එහෙම කියලා ඊළඟ දවසේ සමාවෙන්න කියලා කියනවා. ඊලෝන් මස්ක් කියන පුද්ගලයා තක්කඩියෙක්, ආර්ථික ඝාතකයෙක් කියලා ඊළඟ දවසේ කියනවා, "සමාවෙන්න, මම එහෙම කිව්වාට" කියලා. එවැනි අය නායකත්වය ගන්න බලන් ඉන්න රටක තමයි මේ අපි කථා කරන්නේ. මේ ඛේදවාචකයේ හාස්‍යය ඒකයි.

මට ලැබී තිබෙන්නේ කෙටි කාලයක් නිසා අධ්‍යාපනය සම්බන්ධයෙන් මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. උදේ බුදු පහන පත්තු කර, පල්ලියට ගිහින් කුරුසය ළඟ යාඥා කර, කෝවිලට ගිහින් පළමුවැනි යාඥාව කර එන මේ දේශයේ ඒ ආධ්‍යාත්මයට පසු අපි සියලුදෙනාම - ජනාධිපතිතුමාගේ සිට මිරිස්සේ ධීවරයා දක්වාත්, මුලතිව්වල ආබාධිතව ජීවත් වන උමා සහෝදරිය දක්වාත්, අර රාජ්‍ය නිලධාරි මැදිරියේ වාඩි වෙලා සිටින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති - Chairman of the UGC - මහාචාර්ය සම්පත් අමරතුංග දක්වාත් සියලුදෙනාම- එක සේ එක් විය යුතු එක කාරණයක් තිබෙනවා. අපේ අධ්‍යාපනය ජාතික විය යුතුයි, එය ජාත්‍යන්තර විය යුතුයි. අපි කිසි කෙනෙක් දෙමළ, සිංහල, මුස්ලිම්, අර පක්ෂයේ, මේ පක්ෂයේ කියලා බෙදෙන්නේ නැතුව ඒ වෙනුවෙන් එක් වෙන්න ඕනෑ කියන ආයාචනය, ආරාධනය මා කරනවා. එය මේ ජාතියේ පළමුවැනි හඳ ගැස්ම වේවා! බලය ගැනීම, ලැබුණු බලයේ රැඳී සිටීම නොවෙයි, අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත්තා වූ අලුත් ශිෂ්ටාචාරයක ගමන අපේ රටේ ආරම්භ වේවායි කියා ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[3.02 p.m.]

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Bismillahir Rahmanir Raheem.

Hon. Presiding Member, I must, at the very outset, say that this issue relating to the non-academic staff of universities or their demands, as the current State Minister of Higher Education said a while ago, began way back in 2016. I, too, as Minister holding the portfolio of Higher Education for a short while around 2018/2019, attempted to resolve the problem by submitting three Cabinet Papers. It is a matter of regret that the issue remains unresolved to date and I am sure it should now be resolved by discussion with those trade unions. I am told that about 18 trade unions are involved in this. Particularly, I must say that they must be mindful that whatever the academic staff is getting for their research purposes and as various other allowances cannot apply to them and that they must also be reasonable in negotiating this increase. As the current State Minister of Higher Education already said, the issue pertains to be the amount that the Treasury would finally have to allocate, in case the increment is allowed. Also, there is an issue of further anomalies happening in other sectors. All that have to be taken into consideration and these issues must be resolved without any further delay as the entire university system has come into a serious paralysis situation.

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

Sir, having mentioned that, may I now move on to another matter which was adverted to by the Leader of the Opposition in his speech this morning. He very carefully analysed one of the serious lapses in our education system, particularly those relating to the English medium instruction classes and the need to establish a separate English stream in our government schools.

As a student who came from the rural areas and also who had had the opportunity of receiving admission to a popular school in Colombo, the Royal College, through the government scholarship scheme, I am one who will always attest about the gap and the seriousness of this gap between the rural schools and the city schools or the prominent schools in the country. Therefore, it is important that we pay our attention to this area.

In this regard, Sir, I would like to **table*** a letter from a particular charity based in Australia, who have been doing wonderful work in Sri Lanka from 2004 onwards.

I had a chance meeting with the Chairman of that charity, Dr. (Ms.) Donna Vaughan. I was impressed by the wonderful work they have been doing and have tried to assist them by taking them to meet the former Secretary to the Ministry of Education, Ms. Wasantha Perera. And also, I introduced them to the Governor of the Eastern Province to see that this is incorporated into the official programme of the Ministry of Education involving all our government schools. They are running a very worthwhile programme, through which in the last year alone they have enrolled more than 1,000 English teachers to be trained under the novel programme called "Lotus English Literacy Programme", which has been to develop essential literacy skills in children as they learn English and to enhance their competency development in line with the Government curriculum and syllabi. So, that is a very important programme. It is now being run with the assistance of the Jaffna University, the Eastern University and the South Eastern University. So, that must be adopted officially through a memorandum of understanding to be signed with the Ministry of Education. I earnestly ask the Minister to instruct the current Secretary to the Ministry of Education to take it up because that was discussed with the earlier Secretary, Ms. Wasantha Perera and she had responded to this NGO, promising them that they would discuss it with the National Institute of Education and incorporate it, possibly, into our National Education Policy Framework as well so that the programme could be properly implemented all over the Island. I would like to commend that NGO called "Partners in Micro-Development Inc", an Australian-based entity which has been working wonderfully in our country for several years, has trained several teachers and has implemented it as a model programme in several schools. There are thousands of teachers to be trained. I am told that, by next week, their team will arrive here in Sri Lanka and they are due to train even teachers from the Central Province. It was at my request that they have moved to the Central Province, but there is a difficulty. I was able to connect them with the Governor of the Eastern Province, Mr. Senthil Thondaman, and he was good enough to instruct the Provincial Director of Education to incorporate that programme in an official manner. But, unfortunately, the provincial educational authorities of the Central Province still have not got involved properly with that programme. Therefore, I am requesting the Hon. Minister to go through the letter which I have tabled and which had been handed over to Ms. Wasantha Perera, former Secretary, and instruct the current Secretary on further action. Unfortunately, Secretaries to Ministries are changing like in "Musical Chairs"; every Secretary coming to the Ministry of Education does not last beyond a year. Therefore, I would prefer if the Minister takes it upon himself to instruct the current Secretary to have a discussion with the National Institute of Education, incorporate it into our National Education Policy Framework and see that this programme is implemented for the benefit of all our children studying in government schools.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.10]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මුලින් මට තිබුණේ විනාඩි 6ක කාලයක්. සභානායක ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමා ඒ පාර්ශ්වයේ වෙලාවෙන් තමයි අපි කිහිපදෙනෙකුට මේ අවස්ථාව ලබා දීලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදය ඇතුළේ විනාඩි 10ක කාලයක් තුළ කථා කරන්න මාතෘකා රාශියක් තිබෙනවා. ඒ, මේ මොහොතේ උද්ගත වෙලා තිබෙන ප්‍රශ්නය ගැන මේ සභාවේ පුනපුනා කථා කරපු දේවල් වෙන්න පුළුවන්. වැටුප් විෂමතා ගැන, විශ්වවිද්‍යාල පද්ධතියේ ආචාර්ය, මහාචාර්යවරුන්ට එකතු කරපු නොමනා බදු පිළිබඳව, අනධ්‍යයන සේවක වර්ජනය පිළිබඳව, ගුරු-වැටුප් විෂමතාව පිළිබඳව, විදුහල්පති සහ ගුරු ඌනතා පිළිබඳව, නිදහස් අධ්‍යාපනයේ කප්පාදුව පිළිබඳව ආදී වශයෙන් මාතෘකා රාශියක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේ කෙටි වෙලාව ඇතුළේ මම මේ සියලු මාතෘකා ගැන කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මා හිතනවා, මේ මොහොතේ කරුණු 2ක් පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කරවන්න ඕනෑය කියලා. ඉන් පළමුවැනි කාරණාව මෙයයි. මේ සභාවේ කවදාවත් කථා නොකරන -මම ඒක අවධාරණයෙන් කියනවා- මේ රටේ සිටින විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ කාරණය. දෙවැනි කාරණය මෙයයි. මේ සභාවේ අඩුවෙන් කථා කරන, අඩුවෙන් කථා කරපු

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අපේ රටේ තෘතීයික අධ්‍යාපනය පිළිබඳ කාරණය. General education ගැන, higher education ගැන උදේ ඉඳන් රෑ වෙනකම් අපි කථා කරලා තිබෙනවා. විසඳුම් තිබුණත්, නැතත් කථා කරලා තිබෙනවා. ඒ නිසා මෙන්න මේ මට ලැබුණු සොච්චම් වෙලාව මම වැය කරන්න කැමැතියි, මේ කාරණා දෙක ගැන කථා කරන්න.

ඊට පෙර මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට. මේ වෙලාවේ සභාවේ නොහිටියත්, ඊයේ මේ සභාවේදී එතුමා වැදගත් ප්‍රකාශයක් කළා. එතුමා කිව්වා, "මම ඉන්නකම් නිදහස් අධ්‍යාපනයට අත තියන්න කාටවත් ඉඩ දෙන්නේ නැහැ" කියලා. "ජාතික සම්පත් නිර්ලෝභීව විකුණන්න සූදානම් වෙන, ජාතික අරටුවලට බය නැතුව අත තියන්න සූදානම් වෙන පසුබිමක නිදහස් අධ්‍යාපනය ඒ ආකාරයට විනාශ කරන්න මම ඉඩ දෙන්නේ නැහැ" කියලා අධ්‍යාපන ඇමතිවරයා විධියට විතරක් නොවෙයි, සභානායකවරයා විධියටත් ඊයේ මේ සභාවේදී ප්‍රකාශ කිරීම වෙනුවෙන් එතුමාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැන් මාගේ මාතෘකාවට එනවා. මම මාතෘකා දෙකක් ගැනයි කථා කරන්නේ. ඉන් එකක්, කවදාවත් මේ සභාවේ කථා නොකරන විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ කාරණය. ඒකට අපි inclusive education කියලා නූතන ව්‍යවහාරයේ භාවිත කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක, සමාජයක පුද්ගලයෙකුගේ, සංවිධානයක ශිෂ්ටසම්පන්න බව, ශීලාචාරකම මනින නූතන මිම්මි අතරේ තිබෙන ප්‍රධාන මිම්මක් තමයි, ඒ රාජ්‍යය, ඒ සමාජය, ඒ පුද්ගලයා තමන්ගේ සමාජයේ, තමන්ගේ රටේ ආබාධ සහිත ප්‍රජාවට ගරු කරන්නේ, සලකන්නේ, පිළිගන්නේ කොහොමද කියන එක. ගරු ඇමතිතුමනි, මේක ශිෂ්ටසම්පන්න බව, ශීලාචාර බව මනින ලෝකයේ පවතින නූතන මිම්මක්. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය අපි මේ මිම්මෙන් මැනලා බලමු. එතකොට තේරේවි, අපි කොයිතරම් ශීලාචාරද, කොයිතරම් ශිෂ්ටසම්පන්නද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අවසාන සංගණනයට අනුව පාසල් යන වයසේ ඉන්න ආබාධ සහිත දරුවන්ගෙන් සියයට 34ක් මූලික අධ්‍යාපනයවත් ලබන්නේ නැහැ. මේක තමයි තත්ත්වය. රටේ ජනගහනයෙන් සියයට 8.7ක් ආබාධිතයි. ඒ කියන්නේ 1,662,000ක්. හැබැයි, මේ 2012 සංගණනය අවසානයේ සංඛ්‍යාලේඛන. ඒ අනුව සියයට 34ක් කිසිදු ආකාරයක අධ්‍යාපනයකට යොමු වන්නේ නැහැ. අපේ රටේ තිබෙනවා, මේ ආබාධ සහිත විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා වෙන් වූ පාසල්. රජයේ පාසල් 3ක් තිබෙනවා; ආධාර ලබන පාසල් 27ක් තිබෙනවා. මේ පාසල් 30ම ඉන්නවා, දරුවෝ 2,135ක්. මීට අමතරව යම් යම් රාජ්‍ය නොවන සංවිධාන වශයෙන් පවත්වාගෙන යන ස්ථාන කිහිපයකුත් තිබෙනවා. මේ පාසල් පද්ධතිය යටතේ 2,135දෙනෙක් ඉන්නවා, දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන පාසල් 3ත්, ආධාර ලබන පාසල් 27ත්. ඒ වාගේම, විශේෂ අධ්‍යාපන ඒකක සහිත පාසල් 879ක් තිබෙනවා. මේ පාසල් 879හි ඉන්නවා, විශේෂ අවශ්‍යතා සහිත දරුවෝ 9,470දෙනෙක්. මේ පාසල්වල සිටින දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය මොකක්ද? දැන් විශේෂ අධ්‍යාපන ඒකක සහිත පාසල් 879ක් තිබුණා වුණත් ඒවායේ මතු වෙච්ච ප්‍රශ්න රාශියක් තිබෙන බව අපි දන්නවා.

හැබැයි, මේ ප්‍රශ්න මම සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට, සුරේන් රාඝවන් රාජ්‍ය ඇමතිතුමාට, විජිත බේරුගොඩ රාජ්‍ය ඇමතිතුමාට, මේ ආණ්ඩුවට ලඝු කරන්න හදන්නේ නැහැ. මේක ඉතිහාසයේ මෑත කාලීනව හැම ආණ්ඩුවක්ම, හැම පාලනයක්ම වග කිව යුතු, එහෙම නැත්නම් වගකීම් පැහැර හැරපු මාතෘකාවක්. එක් කෙනෙක් නොවෙයි, විත්ති කූඩුවේ ඉන්නේ. අපි ඉන්නෙත් විත්ති කූඩුවේ. ඒක අවංකව කියන්නට ඕනෑ. මේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ පාසල්, ආධාර ලබන පාසල් පාලනය වන්නේ 1961 උපකෘත පාසල් සඳහා වූ පනතින්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආබාධ සහිත ප්‍රජාව අන්තර්කරණය සඳහා වන පාර්ලිමේන්තු සංසදය විධියට අපි හෙට ගරු ඇමතිතුමාගෙන් අවස්ථාවක් ඉල්ලා තිබෙනවා, මේ ගැන සාකච්ඡා කරන්න. දැන් ගැටලු රාශියක් තිබෙනවා. මේ පනත වහාම යාවත්කාලීන - update - කරන්නට ඕනෑ. මේක තමයි පළමුවන කාරණය. ඒ කියන්නේ, අවුරුදු 64කට පෙර ගෙනා පනතකින් මේක පාලනය වෙනවා. ඒ දරුවන්ට අදාළ විශේෂ ඒකක සහිත පාසල්වල සංඥා භාෂාව උගන්වන්න ගුරුවරු නැහැ; බ්‍රේල් ක්‍රමයෙන් උගන්වන්න ගුරුවරු නැහැ. ඒක කොයිතරම් බෙදවාචකයක්ද? මේ ප්‍රශ්නයට අපි රටක් විධියට ආමන්ත්‍රණය කරන්න ඕනෑ. රාඝවන් රාජ්‍ය ඇමතිතුමා කථාව අවසන් කළේ ජාතික සහ ජාත්‍යන්තර කියන පදනම් දෙක අපේ අධ්‍යාපනයේ පදනමක් වෙන්නට ඕනෑය කියායි. ඒක ඇත්ත. ඒ අර්ථයෙන් බැලුවත් ප්‍රමාද කරන්නේ නැතිව මේ පනත සංශෝධනය කරන්න මේ සමස්ත පාර්ලිමේන්තුවම එකතු වෙන්නට ඕනෑ. මේ සංඥා භාෂාව අඩු ගණනේ පනතක් විධියට රටේ සම්මත වෙලා නැහැ. UNDP එකේ උපකාරයෙන් මේ සංඥා භාෂාව අද පාර්ලිමේන්තුවට ලැබී තිබෙනවා. එය ලැබී තිබෙන්නේ රාජ්‍ය අනුග්‍රහයෙන් නොවෙයි, UNDP එකේ අනුග්‍රහයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, NIE එකේ මේ සංඥා භාෂාව පිළිබඳ අවුරුද්දක ඩිප්ලෝමාවක් තිබෙනවා. එතැන විතරයි මේ පහසුකම තිබෙන්නේ. ඒ නිසා තමයි මේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටින පාසල් ඒකකවලටවත් මේක උගන්වන්න විධියක් නැති වෙලා තිබෙන්නේ. මේක බරපතළ බෙදවාචකයක්. ඒ වාගේම, ප්‍රතිපාදනවල ගැටලු තිබෙනවා. ඇඳුම් ටික ලැබෙනවා; පොත් ටික ලැබෙනවා; ඊළඟට ගුරු වැටුප් ටික ලැබෙනවා. හැබැයි, අනෙක් ගුරුවරුන්ට ලැබෙන නිදහස් ගමන් බලපත්‍ර ඒ අයට ලැබෙනවාද? නැහැ. ආධාර ලැබෙනවාද? නැහැ. මේ වාගේ බරපතළ ප්‍රශ්න රාශියක් තිබෙනවා. මම ඒවා විග්‍රහ කරන්න යන්නේ නැහැ. ඒ නිසා පළමුවෙනි කාරණය තමයි මේ පනත සංශෝධනය වෙන්නට ඕනෑ, සංශෝධනය කරන්නට ඕනෑ කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අම්මා කෙනෙක් මට ලිපියක් එවා තිබුණා. 2024 මැයි 30 දිනැති එම ලිපියේ සඳහන් වෙනවා, එල්.කේ. අජන්තා, අංක 35, හෙලේනාවත්ත, ගල්මුරුව,- *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් මම මේ ලිපිය කියවන්නේ නැතිව **සභාගත*** කරනවා.

ගාසා තීරයේ දවස් ගණනාවක් බඩගින්නේ ඉන්නා අනාථයෙකුට ක්‍රීම් ක්‍රැකර් බිස්කට් එකක් දිගු කළා වාගේ තමයි වෙලාව ලැබෙන්නේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

කෙසේ වෙතත්, මේ අවස්ථාවේදී අඩු ගණනේ මගේ දෙවැනි මාතෘකාව touch කරන්න හෝ මම බලාපොරොත්තු වෙනවා. ඒ තමයි, තෘතීයික අධ්‍යාපනය පිළිබඳ කාරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ වෘත්තීය අධ්‍යාපනය ලබා දෙන ආයතන විධියට තිබෙන රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන ගත්තාම, ඒවායේ දරුවෝ 157,000ක් පමණයි ඉගෙනුම ලබන්නේ. එම 157,000න් පාඨමාලා අත්හැර යන කණ්ඩායම - dropouts - අඩු-වැඩි වශයෙන් සියයට 30ක් පමණ වෙනවා. මේකයි තත්ත්වය. මෙම පාඨමාලා යාවත්කාලීන වෙන්නට ඕනෑ. 2012දී, මම යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන ඇමතිවරයා විධියට කටයුතු කළ කාලයේ මමත් මැදිහත් වෙලා මේ ආයතනවල ගුරුවරුන් පාසල්වලට යවා තමයි අපි තාක්ෂණවේදය විෂය ආරම්භ කළේ. අද වනවිට තාක්ෂණවේදය විෂය පාසල් 478ක තිබෙනවා. එම පාසල් 478 තුළ 11, 12 වසරවල දරුවන්ගෙන් සියයට 11ක් පමණ තාක්ෂණවේදය විෂය හදාරනවා. ඒ වාගේම විශ්වවිද්‍යාල පද්ධතිය තුළත් තාක්ෂණ පීඨ ආරම්භ කර තිබෙනවා. මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වශයෙන් කටයුතු කරන අපේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මැතිතුමාට. එතුමා අද රාජ්‍ය නිලධාරි මැදිරිය තුළ සිටින බව සඳහන් වුණා. අද වනවිට රාජ්‍ය විශ්වවිද්‍යාල 17න්, විශ්වවිද්‍යාල 12ක තාක්ෂණ පීඨ ආරම්භ කර තිබෙනවා. හැබැයි, මේ වෘත්තීය අධ්‍යාපනය හරහා - NAITA එකෙන් වෙන්න පුළුවන්; Technical Collegesවලින් වෙන්න පුළුවන්; VTA එකෙන් වෙන්න පුළුවන් - ලබා දෙනු ලබන පාඨමාලා යාවත්කාලීන වෙන්න ඕනෑ. මොකද, ජාත්‍යන්තර වෙළෙඳ පොළට අදාළ පාඨමාලා නොවෙයි සමහර විට ඒවායින් ලබා දෙන්නේ. තාක්ෂණය වේගයෙන් දියුණු වෙනවා; වේගයෙන් ඉදිරියට ගමන් කරනවා. අපි digital technology පිළිබඳව, green technology පිළිබඳව, marine technology පිළිබඳව, එහෙම නැත්නම් aviation technology පිළිබඳව, එහෙමත් නැත්නම් ලෝකයේ ageing population වේගයෙන් ඉහළ යන වෙලාවක healthcare sector එක පිළිබඳව වන පාඨමාලා වෙළෙඳ පොළ ඉලක්ක කරගෙන ඇති කරන්නට ඕනෑ. නමුත් මෙතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර 30ක කාලයක් ලබා දෙන්න.

මම විශ්වාස කරන විධියට, අපට දැන් තිබෙන ප්‍රධාන ප්‍රශ්න අතර විරැකියාව නිසා තිබෙන අර්බුදය, රටේ ජාතික ආර්ථිකය පිළිබඳව තිබෙන අර්බුදය කියන මේ අර්බුදවලට හේතු වන ප්‍රධාන කාරණාවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පාසල් පද්ධතිය තුළ උසස් පෙළ පන්ති පැවැත්වෙන පාසල් 2,952ක් තිබෙනවා. එයින් සියයට 65කම ගණිතය, විද්‍යාව, තාක්ෂණය කියන විෂය ධාරා උගන්වන්නේ නැහැ; සියයට 65කම නැහැ. මම නැවත කියනවා, මෙය එක පාර්ශ්වයකට විතරක් ඇඟිල්ල දිගු කරන්න ඕනෑ කාරණයක් නොවෙයි කියන එක. උසස් පෙළ පන්ති තිබෙන පාසල්වලින් පාසල් සියයට 65ක විද්‍යාව විෂය ධාරාව නැහැ; ගණිතය විෂය ධාරාව නැහැ; තාක්ෂණ විෂය ධාරාව නැහැ. සියයට 65ක කලා විෂය ධාරාව විතරයි තිබෙන්නේ. මේ තත්ත්වය තමයි අර්බුදයේ මවි වන්නේ. ඒ නිසා අපි මෙන්න මේ කාරණය සම්බන්ධව තීන්දුවක්ගෙන මෙතැනින් එහාට ගමන් කරන්න හිතන්නේ නැත්නම් රටක් විධියට අපට අනාගතයක් උදා කරන්න බැහැ කියා මා හිතනවා. *[බාධා කිරීමක්]* මම දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මට කථාව අවසන් කරන්න කියලා කියන බව. මම කවදාවත් සභාවට අවනත නොවන කෙනෙක් නොවෙයි. ඒ නිසා තව කියන්නට කරුණු තිබුණත්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව නැවත ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, කෘතවේදී වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.24]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මට විනාඩි අටක කාලයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටටම බලපාන විෂයයක්, අධ්‍යාපනය කියන්නේ. එම විෂයය පිළිබඳව පුළුල් දැනුමක් තිබෙන, ප්‍රායෝගික අත්දැකීම් සහිත, ගුරුවරියක් ලෙසත් කටයුතු කර පාර්ලිමේන්තුවට තේරී පත් වුණු මන්ත්‍රීවරියක් තමයි අද ඉතා වැදගත් යෝජනාවක් සභාව කල්තබන අවස්ථාවේදී ඉදිරිපත් කළේ. ඒ වාගේම විපක්ෂයේ ඉඳගෙනත් අධ්‍යාපන ක්ෂේත්‍රයට සුවිශාල මෙහෙවරක් ඉෂ්ට කරන විපක්ෂ නායකතුමා තමයි මේ යෝජනාව ස්ථිර කළේ. විෂයානුබද්ධ දැනුම පැත්තෙන් මේ ප්‍රශ්න ගැන හොඳ අවබෝධයක් තිබෙන ඇමතිවරයෙක් තමයි අද මේකට පිළිතුරු දෙන්නේ. එම නිසා විනාඩි 8ක් හෝ කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අහලා තිබෙනවා, 19වැනි සියවසේදී ලෝකය කාර්මිකකරණයට පා තැබුවේ අනාගතයේ ධනය සහ බලය යන සියල්ලම කාර්මිකකරණය මත පදනම් වෙයි කියන උද්‍යෝග පාඨය සමඟයි කියලා. නමුත් ඒ කාර්මිකකරණයේ ලෝක තරගයට මුහුණ දෙන්න අපට බැරුව ගියා. ඒ තරගයට රටක් ලෙස ඇතුළු වෙන්න අපට බැරුව ගියා. කාර්මික විප්ලවය හමුවේ අපි ජයග්‍රහණ අත් පත් කර ගන්න අසමත් වුණු නිසා තමයි මේ කථා කරන මයික් එක, අපි පාවිච්චි කරන ටෙලිෆෝන් එක, මේ ලයිට් එක, අපි අඳින ඇඳුම්වල රෙද්ද, ඒවාට අල්ලන බොත්තම පවා අපේ රටේ නිෂ්පාදනය කරන්න බැරුව ආනයනය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ලෝකයේ කාර්මිකකරණයේ සිට කෘත්‍රිම බුද්ධිය දක්වා ගමන් කරද්දී අපට දියසෙන් කුමාරයෙකු පහළ වනතුරු බලාගෙන ඉන්න සිද්ධවෙලා තිබෙන්නේ අන්න ඒ පසුබෑම නිසාය කියලා අපි කල්පනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මීට දශක තුන හතරකට කලින් ලෝකයට අලුත් තේමා පාඨයක් ආවා. ඒ තමයි, "අනාගතයේ දැනුම තමයි ධනය වෙන්නේත්, බලය වෙන්නේත්" කියන එක. ඒ දැනුම ධනය වූ, දැනුම බලය වූ සමාජයක් තමයි අද අප ඉදිරියේ තිබෙන්නේ. ඒ දැනුම ධනය වූ සමාජය තුළින් අපි

පසුගාමී වෙනවා නම්, ඒ තරගයේදීත් අපට ජයග්‍රහණය ලබා ගන්න බැරි වුණොත්, අපි කුඩා කාලයේ කිව්වා වගේ "ශ්‍රී ලංකාව තවමත් සංවර්ධනය වෙමින් තිබෙන රටක්" කියමින් දියසෙන් කුමාරයෙක් බිහි වනතුරු බලාගෙන ඉන්න අපේ ඊළඟ පරම්පරාවටත් සිද්ධ වෙයි. එම නිසා දරුවන්ගේ අධ්‍යාපනය කියන කාරණයේදී මේ සභාව නියෝජනය කරන අප සියලුදෙනාටම විශාල වගකීමක් තමයි පැවරිලා තිබෙන්නේ. අද අධ්‍යාපනයේ තිබෙන මේ විශාල තරගය තුළ දරුවන්ට විශාල පීඩාවකින් තමයි අධ්‍යාපන ජයග්‍රහණ ලබා ගන්න සිද්ධවෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට පසුගිය කාලයේ මුහුණ දුන් අර්බුද හමුවේ අපි දැක්ක දෙයක් තමයි, හැකියාව තිබෙන දෙමව්පියෝ තමන්ගේ දරුවන් විදේශ අධ්‍යාපනයට යොමු කරන්න උත්සාහ කරපු හැටි. තවත් පිරිසක් සුපිරි, ජනප්‍රිය යැයි කියන පාසල්වලට දරුවන් ඇතුළු කරන්නත්, ජාත්‍යන්තර පාසල්වලට දරුවන් ඇතුළු කරන්නත් කටයුතු කළා. ඒ වාගේම පෞද්ගලිකව ගුරුවරු නිවසට ගෙන්වලා ඉගැන්වීමටත් කටයුතු කළා. එවැනි විකල්ප ක්‍රම අනුගමනය කරපු හැටි අපි දිගටම දැක්කා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඒ එකක්වත් කර ගන්න බැරි, බාහිර පන්තිවලට යවන්න බැරි, ට්‍යුෂන් ගාස්තු ගෙවන්න බැරි සුවහසක් දෙමව්පියන්ට තමන්ගේ දරුවන් වෙනුවෙන් තිබෙන එකම පිළිසරණ රජයේ පාසල් පද්ධතිය පමණයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහෝදෙනා කියන්නේ සමාජයේ පවතින විෂමතා නැති කළ හැක්කේ අධ්‍යාපනයෙන් කියායි. ඒ වාගේම අපි අමතක නොකළ යුතු දෙයක් තිබෙනවා. ඒ තමයි, අධ්‍යාපනය තුළ පවතින විෂමතා සමාජයේ සියලු විෂමතාවන්ට මුල් වෙනවාය කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රටේ පාසල්වලට සම්පත් බෙදී යෑමේදී විශාල විෂමතා පවතින බව අපි දකිනවා. භෞතික සම්පත් විතරක් නොවෙයි, මානව සම්පත් පවා නිවැරදිව බෙදෙන්නේ නැහැ. පාසල්වල විශාල ගුරු හිඟයක් පවතිනවා. මම නියෝජනය කරන්නේ දකුණු පළාත. දකුණු පළාත තුළ 3,210ක ගුරු හිඟයක් පවතිනවා. උපාධිධාරීන් 8,500ක් විතර ගුරු විභාගය සමත්වෙලා, සමහරුන්ට පත්වීම් ලැබී තිබෙනවා, තවත් සමහරු පත්වීම් ලැබෙනතුරු බලාගෙන ඉන්නවා. ගුරු තරග විභාගය සමත් පිරිසෙනුත් පුරප්පාඩු 3,210 පිරෙව්වායින් පස්සේ උපාධිධාරීන් 5,000ක් විතර එතැනිනුත් ඉවත් වෙනවා. ඒකෙන් අපට පෙනෙනවා, අපේ අධ්‍යාපන ක්‍රමයේ නිවැරදි විය යුතු තැන් කොපමණ තිබෙනවාද කියලා. මේ ගුරු හිඟය දරුවන්ට විශාල ලෙස බලපානවා. රජය සල්ලි හොයාගෙන ගුරුවරු ලබා දෙනතුරු බලාගෙන ඉන්න දරුවන්ට පුළුවන්කමක් නැහැ. අදටත් නියම වෙලාවට ජාතික විභාග පැවැත්වෙන්නේ නැහැ. ගුරු විභාගය සමත් පිරිසට ඉක්මනින් ගුරු පුහුණුවක් ලබා දීලා පාසල්වලට අනුයුක්ත කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ගුරුවරුන්ට ප්‍රශ්න රාශියක් තිබෙනවා. දැනට සේවය කරන විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට වැටුප් වැඩි වීමෙන් තුනෙන් එකක් විතරයි තවමත් ලබා දීලා තිබෙන්නේ. ඉතිරි තුනෙන් දෙක ඉක්මනින් ලබා දිය යුතුව තිබෙනවා. නැත්නම්, මේ තිබෙන ජීවන බර හමුවේ ලයිට් බිල් ගෙවීම, වතුර බිල් ගෙවීම, දරුවන්ගේ වියදම් දැරීම, ගෙදර දොර වියදම්, ගමන් වියදම් දැරීම සහ යුතුකම් ඉටු කිරීම් වැනි කටයුතුවලදී ගුරුවරුන්ට බරපතළ ගැටලු ඇති වෙනවා.

අංක 35/2016/(i) චක්‍රලේඛයෙන්, 2015 අපේ යහ පාලන රජයෙන් වැඩි කරපු රුපියල් 10,000 අදියර තුනකින් වැඩි කරන්න තීන්දු කළා. ඒක, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති හැටියට පත් වුණාට පස්සේ ඒ කාලයේ නිකුත් කරපු චක්‍රලේඛයකින් ඉවත් කළා. මේක ගුරුවරුන්ටත්, විශ්‍රාමිකයන්ටත් ලබා දිය යුතුව තිබෙනවා. ඒ වාගේම අංක 2/1997 චක්‍රලේඛයෙන් බී.සී. පෙරේරා වැටුප් වාර්තාවෙන් සිදුවුණු අසාධාරණය ගැන එදා ඉඳලාම ගුරුවරු සටන් කරනවා අපි දැක්කා. නමුත් 2021 දී තමයි තුනෙන් එක ලැබුණේ. 1997 සිට මේ සඳහා සටන් කළ, 2021 වනවිට විශ්‍රාම ගිය අයට තවමත් මේ ප්‍රශ්නය විසඳලා දෙන්න රජය අසමත් වෙලා තිබෙනවා. ඒ ගුරුවරුන් වැඩි දෙනෙක් දුෂ්කර පාසල්වල සේවය කරපු උදවිය. Pushbikesවලින් ඉස්කෝලේ ගිහිල්ලා උගන්වපු අය එතැන ඉන්නවා. පයින් කඳු බඩගාලා දරුවන්ට උගන්වපු අය එතැන ඉන්නවා. සමහර වෙලාවට දුර පළාත්වල ගිහිල්ලා නතරවෙලා දුෂ්කර සේවයක යෙදුණු උදවිය එතැන ඉන්නවා. ඒ නිසා ඒ අයට ඉක්මනින් ඒ ප්‍රශ්නය විසඳා දිය යුතුව තිබෙනවා. ඒ ප්‍රශ්නවලට විසඳුමක් නොලබාම සමහරු දැනටමත් මිය ගිහිල්ලා තිබෙනවා. සමහරු රෝගී තත්ත්වයෙන් පසු වෙනවා. ඒ නිසා මේ විශ්‍රාම වැටුප් ගැටලුව විසඳුමක් ලබා දීම සඳහා වර්තමාන වැටුප් වැඩි වීමට ගළපා ඒ අයටත් ලබා දීමට කටයුතු කරන්න කියලා අපි ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අධ්‍යාපනයේ වැදගත් මූලධර්මයක් තමයි පාසල දරුවාට ප්‍රියජනක තැනක් විය යුතුයි කියන එක. නමුත් අද තිබෙන තත්ත්වය තුළ දරුවොත් ඉන්නේ අසතුටින්, ගුරුවරුත් ඉන්නේ අසතුටින්. අධ්‍යාපන ඇමතිවරයා ප්‍රතිසංස්කරණ ගැන නිතර කථා කරනවා. එතුමා මේ විෂය පිළිබඳව උනන්දුවක් දක්වන, හොඳ දැනුමක් තිබෙන කෙනෙක්. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කඩිනමින් සිදු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් කියන එක අපි නැවත නැවතත් මතක් කරලා දෙන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට වෙන් වූ කාලය අවසානයි කියලා කියන්න ලැහැස්ති වෙන නිසා මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අධ්‍යාපනය තුළ ඇතිවෙලා තිබෙන අසමතුලිතතා නැති කරලා, ශ්‍රී ලංකාවේ රජය මඟින් ලබා දෙන නිදහස් අධ්‍යාපනය පිළිබඳව බිඳ වැටෙමින් පවතින ජනතා විශ්වාසය යළිත් තහවුරු කරන්නට පියවර ගන්නා ලෙස ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිමින් මෙවැනි වෙලාවක මට විනාඩි 8ක කාලයක් හෝ ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත බොරුගොඩ රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

ගරු විජිත බේරුගොඩ මහතා (පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித பேருகொட - பிரிவெனாக் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. Vijitha Berugoda - State Minister of Piriven Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ නම උච්චාරණය කිරීමේදී වැරදීමක් සිදු වුණා. මගේ නම බේරුගොඩ, අර කියපු වචනය නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සමාවෙන්න, ගරු විජිත බේරුගොඩ රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 3.32]

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය විසින් වැදගත් විෂයක් පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කළා. මේ පිළිබඳව ගරු අධ්‍යාපන අමාත්‍යතුමාත්, උසස් අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමාත්, විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුනුත් ඉතා වටිනා අදහස් ඉදිරිපත් කළා. අපි දන්නවා, අධ්‍යාපනය කියන්නේ, පුළුල් සංකල්පයක්. රටේ සෑම පුරවැසියෙකුටම තමන්ගේ ජීවිතය හැඩගස්වා ගැනීමට අධ්‍යාපනය වැදගත්. අධ්‍යාපනයේත් පරමාර්ථයක් තිබෙනවා. අධ්‍යාපනයේ පරමාර්ථය තමයි යහපත් පුරවැසියෙක් නිර්මාණය කිරීම. හැබැයි යහපත් පුරවැසියෙක් නිර්මාණය කිරීම කියන ඒ වැදගත් පරමාර්ථය තිබුණාට රටක තිබෙන සමාජ හා ආර්ථික අවශ්‍යතා මත මේ පරමාර්ථයෙන් එහා ගිහිල්ලා අධ්‍යාපනයට අර්ථකථන දෙන අවස්ථා තිබෙනවා. හැබැයි, ඒක වැදගත් වෙනවා. මොකද, අපි දන්නවා, මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් බිහිකරන නිමි වස්තූන් ජාතික ආර්ථික දේහයට උරා ගන්නේ නැහැ කියලා. ඒ නිසා තමයි වරින් වර පත් වුණු ආණ්ඩු, අධ්‍යාපන අමාත්‍යවරු විවිධ ප්‍රතිසංස්කරණ හරහා මේ අධ්‍යාපනයෙන් බිහි වන පිරිසට තමන්ගේ ජීවිතය හැඩ ගස්වා ගැනීම සඳහා ඒ අධ්‍යාපනය තුළින් උපකාර කිරීම කියන කාරණය සිද්ධ කරන්නේ. අපට අධ්‍යාපනය අර්ථ දක්වන්න පුළුවන්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. KINS NELSON left the Chair, and THE HON. SAMANPRIYA HERATH took the Chair.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක අතකින් අපට අධ්‍යාපනය අර්ථ දක්වන්න පුළුවන්, "ජීවත් වීම සඳහා අධ්‍යාපනය" යනුවෙන්; අනෙක් අතට අර්ථ දක්වන්න පුළුවන්, "ජීවිතය සඳහා අධ්‍යාපනය" යනුවෙන්. ජීවත් වීම සඳහා අධ්‍යාපනය කියන එක මුලින්ම ගනිමු. විශේෂයෙන්ම කුසලතා වැඩි දියුණු කරන එක, ජාත්‍යන්තර සහ දේශීය ශ්‍රම වෙළෙඳ පොළට ගැළපෙන ව්‍යෘත්තිකයෙකු නිර්මාණය කරන එක ආදි කාරණා තුළින් ජීවත් වීම සඳහා අධ්‍යාපනය යන්න අර්ථ ගන්වන්න අපට පුළුවන්. හැබැයි, ජීවිතය සඳහා අධ්‍යාපනය ලබනවා කියන්නේ, ඉතා වැදගත් කාරණයක්. මොකද, සමාජයේ යුතුකම් සහ වගකීම් ඉෂ්ට කරගෙන, යහපත් පුරවැසියෙකු විධියට ජීවත් වෙන්නත්, මේ රටේ ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික ප්‍රගමනය වෙනුවෙන් කටයුතු කරන නිර්මාණශීලි, හොඳ දැක්මක් සහිත පුද්ගලයෙකු නිර්මාණය කරන්නත් අධ්‍යාපනය වැදගත් වෙනවා. විවිධ පුද්ගලයන් මේ කාරණා දෙක ඔස්සේම අධ්‍යාපනය ලබන අවස්ථා තිබෙනවා.

අද අපේ රටේ අධ්‍යාපනය පිළිබඳව කථා කරන කොට, ගුරුවරුන්ගේ ප්‍රමාණාත්මකභාවයක් නැතිකම, වැටුප් විෂමතාව, විෂය නිර්දේශවල ගැටලු, විදුහල්පතිවරුන්ගේ වැටුප් ගැටලු, උසස්වීම් පිළිබඳ ගැටලු, ගුරු අධ්‍යාපනඥ සේවය හා ගුරු උපදේශක සේවය පිළිබඳ ගැටලු යනාදී වශයෙන් ගැටලු ගණනාවක් ගැන කාලාන්තරයක් තිස්සේ කථා කරනවා. ඒවාත් විසඳා ගත යුතු ගැටලු තමයි. හැබැයි, අපි වැඩිපුර අවධානය යොමු කරන්නේ, අධ්‍යාපන පද්ධතිය තුළ පන්ති කාමරයේ සිටින ශිෂ්‍යයා කෙරෙහියි. අපේ රටේ අධ්‍යාපන ඇමතිතුමා ඉන්නවා; පළාත් අධ්‍යාපන ඇමතිවරු ඉන්නවා; අධ්‍යාපන අමාත්‍යාංශවල ලේකම්වරු, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරු, විදුහල්පතිවරු, ගුරු උපදේශකවරු, ගුරුවරු ආදි වශයෙන් මේ අධ්‍යාපන පද්ධතිය ඉස්සරහට ගෙන යන පිරිසක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්නවා. හැබැයි, ඒ සියලුදෙනාගේ කාර්ය භාරය වෙන්න ඕනෑ, පන්ති කාමරය තුළ ඉගෙන ගන්නා දරුවාගේ විෂය දැනුම, ආකල්ප සහ කුසලතා නංවන වැඩ පිළිවෙළත් එක්ක ගමන් කිරීමයි. එමෙන්ම, අධ්‍යාපනය හා සම්බන්ධ අවාසිදායක තත්ත්වයන් මඟ හරවා ගත යුතුයි.

අපි දන්නවා, 1948 ඉඳලා හෝ නිදහස් අධ්‍යාපන යුගයේ ඉඳලා මේ දක්වා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රගමනයට හැම ආණ්ඩුවක්ම කටයුතු කර තිබෙන බව. හැබැයි, හුඟක් වෙලාවට ඒවා කියැවෙනවා අඩුයි. අද වන විට පාසල් සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා; ගුරුවරුන්ගේ සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා; ඒ වාගේම, අධ්‍යාපන ප්‍රතිඵල වැඩි වෙලා තිබෙනවා. මගේ මතකය අනුව කියන නිසා මේ සංඛ්‍යාලේඛනවල සමහර විට වෙනස්කම් තිබෙන්න පුළුවන්. 1990 ගණන්වල පවත්වපු සාමාන්‍ය පෙළ විභාගයෙන් සමත් වූ ප්‍රමාණය ගෙන බලමු. ඒ කාලයේ 100ක් විභාගය ලිව්වා නම් සමත් වෙන්නේ විසිගණනක් විතර. හැබැයි, අද වන කොට අපොස (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල සියයට 80 දක්වා, එහෙම නැත්නම් සියයට 70 දක්වා ප්‍රමාණාත්මක වශයෙන් වැඩි වෙලා තිබෙනවා. අපොස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵලයත් එහෙමයි. අපොස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල ගත්තොත්, විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වන ශිෂ්‍යයන් සංඛ්‍යාව මේ වසරේත් සැලකිය යුතු ප්‍රමාණයක් වනවා. සියයට 64.33ක් වාගේ ප්‍රමාණයක් උසස් පෙළ විභාගයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබෙනවා. එහෙම නම්, විභාග ප්‍රතිඵලවල වර්ධනයක් තිබෙනවා. විශ්වවිද්‍යාල සංඛ්‍යාව ගත්තොත්, 1980 ගණන්වල විශ්වවිද්‍යාල 8ක් විතර තිබුණේ. දැන් විශ්වවිද්‍යාල සංඛ්‍යාව 17ක් වනවා. එදා විශ්වවිද්‍යාලවලට ඇතුළත් වුණේ 5,000ක විතර ප්‍රමාණයක්. අද විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන

ප්‍රමාණය 40,000ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ විධියට ප්‍රමාණාත්මකව සහ ගුණාත්මක වර්ධනයක් සිදු වෙලා තිබෙනවා. හැබැයි, අපි අඩු පාඩු පිළිබඳව සැලකිය යුතුයි.

අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයට සෑම ආණ්ඩුවක්ම විශාල වැඩකොටසක් කරලා තිබෙනවා. හැබැයි, අඩුපාඩුකම් ද ඇති වෙලා තිබෙනවා. ඒ අඩුපාඩුකම් නිවැරැදි කරගෙන, මේ රටේ දරුවන්ගේ අනාගතය සකස් කරන්න, වර්තමානයට වඩා අනාගතය දකින දරුවන් පිරිසක් බිහි කරන්න මේ සියලුදෙනා කටයුතු කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය සඳහන් කළා, පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්න කිහිපයක්. මම ඉතා කෙටියෙන් ඒවාටත් පිළිතුරු දෙන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් වශයෙන් රජයේ ගුරුවරුන්ගෙන් අය කරන්නේ සියයට 8යි. හැබැයි, පිරිවෙන් අධ්‍යාපනයේ ගුරුවරුන්ගෙන් සියයට 14ක් අය කරනවා. ඒක අසාධාරණයි තමයි. මම මේ රාජ්‍ය අමාත්‍ය ධුරයට පත් වුණු දවසේ ඉඳලා අධ්‍යාපන අමාත්‍යතුමා සමඟ එකතු වෙලා ඒ ගැනත් කථා කළා. ඒ ගැන භාණ්ඩාගාරය එක්කත් කථා කළා; රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය එක්කත් කථා කළා. ඒ ප්‍රමාණය අඩු කරලා දෙන්න කියා ඉල්ලා සිටියා. මේ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමඟ එක්ව ඒකාබද්ධ කැබිනට් පත්‍රිකාවක් සකස් කර තිබෙනවා. මේ තත්ත්වය වෙනස් කරලා පාසල් ගුරුවරුන්ට හා සමානව පිරිවෙන් ගුරුවරුන්ටත් අවස්ථාව ලබා දෙන්න අපි මේ වන කොට කටයුතු කරගෙන යනවා. ආරම්භයේ ඉඳන් අපි ඒ කටයුත්ත ක්‍රියාත්මක කළා. අනෙක, විශ්‍රාම පූර්ව නිවාඩුව පාසල් ගුරුවරුන්ට ලැබෙනවා. හැබැයි, පිරිවෙන් ගුරුවරුන්ට ලැබෙන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා, කාලය අවසන්.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණා ටික පැහැදිලි කරන්න මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

පිරිවෙන් අධ්‍යාපනය තුළ ප්‍රධාන විෂයයන් 6ක් තිබෙනවා. එක ගුරුවරයෙක් උගන්වන්නේ එක විෂයයයි. පාලි භාෂාව උගන්වන්නේ එක ගුරුවරයෙක්. එහෙම බැලුවාම, විශ්‍රාම පූර්ව නිවාඩු දුන්නොත් පිරිවෙන්වල ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ට ලොකු අසාධාරණයක් වෙනවා. ඒ හින්දායි විශ්‍රාම පූර්ව නිවාඩු ලබා නොදෙන්නේ. එය පිරිවෙන් පනතෙහිම තිබෙන හින්දා වෙනස් කරන්න අමාරුයි.

අනෙක් කාරණය මෙකයි. අග්‍රහාර රක්ෂණය විශ්‍රාම ගිය ගුරුවරුන්ට ලැබුණාට පිරිවෙන් ගුරුවරුන්ට ලැබෙන්නේ නැහැ. අපි දැන් ඒ ගැන රක්ෂණ සමාගමත් සමඟ සාකච්ඡා කරමින් සිටිනවා. ඒ ප්‍රශ්නය විසඳෙයි කියා අපි හිතනවා. අපි මේ කාරණා පිළිබඳව විශේෂයෙන් මතක් කළ යුතුයි. මොකද, අපට හුඟක් වෙලාවට පිරිවෙනේ කටයුතු කරන්න වෙන්නේ පිරිවෙන් පනතත් එක්ක. අපි මේ වන කොට පිරිවෙන් පනතට සංශෝධනයක් ඉදිරිපත් කරන්න සාකච්ඡා කරමින් සිටිනවා, කමිටුවකුත් පත් කරලා. අපි විශ්වාස කරනවා ඒක කරන්න අපට පුළුවන් වෙයි කියලා.

අධ්‍යාපන විෂය පිළිබඳ ප්‍රවීණ දැනුමක් තිබෙන අපේ අධ්‍යාපන අමාත්‍යවරයා අර්බුදකාරී සමයක අධ්‍යාපන අමාත්‍ය ධුරය භාර ගෙන, ඒ වගකීම තම දෙවුර මත පටවා ගෙන, පවතින ආර්ථික, සමාජ තත්ත්වය තුළ මේ ගැටලු එකින් එකට විසඳුම් ලබා දෙමින් කටයුතු කරගෙන යනවා. හුඟක් ප්‍රශ්නවලට විසඳුම් දීලා තිබෙනවා. තවත් ප්‍රශ්නවලට විසඳුම් දෙන්නත් තිබෙනවා. මේ රටේ තිබෙන මුදල් තත්ත්වයත්, රටේ තිබෙන ආර්ථික හැකියාවත් මත තමයි මේ ප්‍රශ්න ඇති වන්නේ. ඉස්සරත් -1989 වාගේ කාලයේත්- කිව්වා මට මතකයි, "කොළඹට කිරි - අපට කැකිරි" කියලා. එසේ කියමින් උද්ඝෝෂණ කළේත් සම්පත්වල බෙදී යෑමේ විෂමතාව නිසා. ඒ නිසා තමයි එවකට සිටි රාජ්‍ය නායකයා තරුණ අසහන කොමිසමක් පත් කරලා එහි නිර්දේශ මත ජාතික අධ්‍යාපන කොමිසමක් පත් කරන්නත් කටයුතු කළේ. අද ඒ වාගේ යම් යම් සාධනීය ක්‍රියා මාර්ග ගෙන තිබෙනවා. හැබැයි, තවම නොවිසඳුණු ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රශ්න විසඳීමට අවශ්‍ය කටයුතු කරගෙන යනවා. ඒවායේ සාධනීය ප්‍රතිඵල ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පාඨලී චම්පික රණවක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.42]

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිබඳව සංවාදයක් නැවත ඇති වෙලා තිබෙනවා. මොකද, රජය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරගෙන යන බව අපට දැන් පෙනෙනවා. ඒ පිළිබඳ විවිධ විරෝධතා මේ සමාජයේ තිබෙනවා. අද මේ සමාජයේ මතු කර තිබෙන අදහසක් තමයි, මේ රටේ තිබෙන්නේ ප්‍රභූ දේශපාලනයක්, ඒ ප්‍රභූ දේශපාලනය නිර්ප්‍රභූන් අතට පරිවර්තනය වන අවස්ථාවක මේ රට තිබෙනවා කියන එක. ඇතැම් දේශපාලන විද්වතුන් දැන් එවැනි අදහස් ප්‍රකාශ කරමින් සිටිනවා.

මේ රටේ ඉතිහාසය අරගෙන බැලුවොත්, 1931දී අපට සර්වජන ඡන්ද අයිතිය ලබා දුන්නා. එතැනදී තමයි ප්‍රභූවරුන් අතේ තිබුණු දේශපාලනය ප්‍රථම වතාවට නිර්ප්‍රභූන් අතට පත් වුණේ. ඊට පෙර පවුම් 3,000ට වඩා ආදායම තිබෙන, ඉංග්‍රීසි ලියන්න, කියන්න පුළුවන්, අවුරුදු 30ට වැඩි පිරිමින්ට විතරක් තිබුණු ඡන්ද අයිතිය මේ රටේ සමස්ත වැඩිහිටි ජනතාවට ලැබුණා. විශේෂයෙන්ම කියන්න ඕනෑ, එංගලන්තයටත් ඒ අයිතිය ලැබුණේ ඊට වසර කිහිපයකට කලින් වන බව. ඒ වාගේම එංගලන්තයේ යටත් විජිතවල කිසිම තැනක නොතිබුණු අයිතියක් තමයි අපට දුන්නේ. ඒ සර්වජන ඡන්ද අයිතිය ලැබීමෙන් පසුව මේ රටේ සිදු වුණු ලොකුම දේශපාලන, සමාජ විප්ලවය තමයි නිදහස් අධ්‍යාපනය. එය 1943 ආරම්භ වෙලා, 1946 ඉඳන් මේ රටේ ක්‍රියාත්මක වෙනවා. එහිදී සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර, ඒ. රත්නායක වැනි මහත්වරුන්ට මේ රට ණයගැතියි. අප වැනි අය අද මේ ගරු සභාවේ ඉන්නේ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගරයන්ගේ නිදහස් අධ්‍යාපනයට පින් සිදු වෙන්නයි.

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

ඒ වාගේම, 1952දී මේ පාර්ලිමේන්තුව තීරණය කළා, රක්ෂණ ප්‍රතිලාභයක් වෙනුවට නිදහස් සෞඛ්‍ය සේවයක් ඉදිරියට ගෙන යන්න. ඒකේ ප්‍රතිඵලයක් හැටියට ඇමෙරිකා එක්සත් ජනපදයට සමාන ආයු කාලයක් අද අපේ රටේ ජනතාව භුක්ති විඳිනවා. මම මේ කාරණා ටික කිව්වේ, පසුගිය අවුරුදු 76ම මොකුත් වුණේ නැහැ, දැන් තමයි වෙන්න යන්නේ කියලා මේ රටේ මතයක් තිබෙන නිසායි. දේශපාලන මැදිහත්වීම තුළින් එතෙක් කල් ප්‍රභූවරුන්ට විතරක් හිමි වෙලා තිබුණු අධ්‍යාපනය, එතෙක් කල් ප්‍රභූවරුන්ට විතරක් හිමි වෙලා තිබුණු සෞඛ්‍ය සේවය පසුව නිර්ප්‍රභූ පන්තියටත් ලැබුණා. ඒ වාගේම 1956 සහ 1961 සිදු වුණු ස්වභාෂා අධ්‍යාපනය හරහා මේ රටේ නිර්ප්‍රභූ දේශපාලනය බලාත්මක වෙලා තිබෙනවා. ඒක අමතක කරලා අපට කටයුතු කරන්න බැහැ. හැබැයි විටින් විට විවිධ පිරිස් ඉදිරිපත් වෙලා තමන්ගේ පවුල, තමන්ගේ කල්ලිය, තමන්ගේ පක්ෂය ඉදිරියට ගැනීම නිසා විශාල පිරිසකට අවස්ථා අහිමි වුණා. කුසලතාවාදය මේ රට තුළ නැති වීම තමයි අද මේ රට මුහුණ දී තිබෙන බලවත් අර්බුද ගණනාවකටම මූලසාධකය වුණේ. නමුත්, මේ රටේ මේ සා විශාල අධ්‍යාපන ව්‍යාපාරයක් පහේ ශිෂ්‍යත්වයේ ඉඳන් සාමාන්‍ය පෙළ, උසස් පෙළ, විශ්වවිද්‍යාල මට්ටම දක්වා ඇති වෙලා තිබෙන්නේ, මේ සා විශාල පිරිසක් දැඩි උනන්දුවකින් කටයුතු කරන්නේ, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ස්වාධීනව ක්‍රියා කරන නිසායි. දේශපාලකයාගේ ලිපියෙන් විශ්වවිද්‍යාලයටත් පත්වීම ලබා ගන්න පුළුවන්කමක් මේ රටේ තිබුණා නම්, මෙවැනි අධ්‍යාපන ව්‍යාපාරයක් පවතින්නේ නැහැ. විභාග දෙපාර්තමේන්තුව හරහා, Z-Score එක හරහා, පරිගණකය හරහා කුසලතා පදනමින් විශ්වවිද්‍යාලයට යන්න අවස්ථාව ලබා දීම නිසාත්, විශ්වවිද්‍යාලවල උපාධිය ලබා ගැනීමේ කුසලතා පදනම තිබීම නිසාත් තමයි මේ සා විශාල අධ්‍යාපන ව්‍යාපාරයක් මේ රටේ ඇති වෙලා තිබෙන්නේ. නිකමට හිතලා බලන්න, කෘෂි කර්මාන්තයේත්, ව්‍යාපාරකරණයේත්, දේශපාලනයේත් -මේ හැම තැනකම- විභාග දෙපාර්තමේන්තුව වාගේ කුසලතාවට පමණක් මුල් තැන දෙන ක්‍රියාවලියක් තිබුණා නම්, මේ රට මොන තරම් විප්ලවීය පරිවර්තනයකට භාජන වෙයිද? අදටත් මේ රට මේ අර්බුදයෙන් ගලවා ගන්න පුළුවන් වෙන්නේ, මේ රටේ නිදහස් අධ්‍යාපනය හරහා බිහි වෙච්ච ඒ කුසලතා පරපුරට පමණයි. ඒ පරපුරට වගකීම් දෙන, ඒ පරපුරට දේශපාලන බලය දෙන ක්‍රියාවලියකින් පමණයි මේ අර්බුදය අපට ජයගත හැකි වන්නේ. ඉතින්, මේ රජය පමණක් නොවෙයි, වෙන ඕනෑම රජයක් අධ්‍යාපනය සම්බන්ධයෙන් අත තියන්න යනවා නම්, කන්නන්ගර මූලධර්මවලට හෝ විභාග ක්ෂේත්‍රයේ තිබෙන තරගකාරිත්වයට අත තියන්න යනවා නම්, විශේෂයෙන්ම වෘත්තීය අධ්‍යාපනය තුළ අපි ලබා ගෙන තිබෙන තැන, වෛද්‍ය, ඉංජිනේරු, කළමනාකරණ, නීති ආදී ක්ෂේත්‍රවල අපි ලබා ගෙන තිබෙන තැන පලුදු කරන්න, හානි කරන්න හදනවා නම්, සාමාන්‍ය ජනතාවට ඉහළට නගින්න තිබෙන එකම ඉණිමගට පහර දෙන්න හදනවා නම්, ඒකට ඉඩ දිය යුතු නැහැ. ඒකට ඉඩ දෙන්න ගිහිල්ලා තරුණ කැරලි හරහා සිය දහස් ගණනක්, ලක්ෂ ගණනක් මේ රටේ ජනතාව මිය ගිය බවත් අපි අවධාරණය කරන්න ඕනෑ. මේ ගෙනැල්ලා තිබෙන යෝජනාවල එවැනි හානිකර අංග විශාල ප්‍රමාණයක් තිබෙන බවත් මේ අවස්ථාවේ අවධාරණය කරනවා. ඒ නිසා මීට වඩා පුළුල් ජාතික කතිකාවක් හරහා මේ ක්‍රියාවලිය සිදු කළ යුතුයි කියලා යෝජනා කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.47]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ තිබෙන බරපතළ ප්‍රශ්නයක් තමයි, රැකියා සඳහා බඳවා ගත්ත තරුණයන්ගේ ප්‍රශ්නය. ඔබතුමන්ලා දන්නවා ඇති, රැකියා නැති අයට රැකියා ලබා දෙනවා කියලා 2017 දී ඩෙංගු මර්දන ව්‍යාපෘතියට 1,500ක පිරිසක් බඳවා ගත් බව. ඒ අයගේ මාසික වැටුප රුපියල් 22,000යි. දෛනික වැටුප රුපියල් 733යි. 2017 ඉඳලා අද වෙනකල් ඒ අය තමන්ගේ වෘත්තිය කරගෙන යනවා. දැනට 900ක් වාගේ ප්‍රමාණයක් තමයි ඒ වෘත්තියේ ඉන්නේ. ඒ අය තවම ස්ථිර කරලා නැහැ. ඒ නිසා ගරු ජනාධිපතිතුමාගෙනුත්, සෞඛ්‍ය ඇමතිතුමාගෙනුත් අපි ඉල්ලීමක් කරනවා, ඒ අයගේ පත්වීම් ස්ථිර කර දෙන්න කියලා.

අධ්‍යාපනය ගැන හැමෝම කථා කරනවා. මේ, ඉතාම අමාරුවෙන් ජාති, ආගම්, කුල මල භේදයක් නොමැතිව රට ගමන් කරන වෙලාවක්. මේ වෙලාවේදීත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ උසස් පෙළ විභාගයට පෙනී සිටි 70දෙනෙකුගේ results අත්හිටුවා තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ නිලධාරීන් රාජ්‍ය නිලධාරී මැදිරියේ මේ වෙලාවේ ඉන්නවා. ඒ හැමෝගෙන්ම මම ඉල්ලීමක් කරනවා, ඒ 70දෙනාගේ results වහාම නිකුත් කරන්න කියලා. ඔවුන් කිසි වරදක් කරලා නැහැ. ඒ අයගේ ආගම්වලට අනුකූලව විභාග ශාලාවේ ඉඳලා තිබෙනවා. ජාති, ආගම්, කුල මල භේදයක් මේ රටේ ඇති කරන්න මේ ඇතැම් නිලධාරීන් උත්සාහ කරනවා. ඒවාට ඉඩදෙන්න එපා. ඒ සම්බන්ධයෙන් වහාම පියවරක් ගන්න කියලා අධ්‍යාපන ඇමතිතුමාගෙනුත්, නිලධාරීන්ගෙනුත් ඉල්ලීමක් කරනවා.

අපේ රටේ අධ්‍යාපනය ගැන හැමෝම කථා කරනවා. ඉතාම ආඩම්බරයි, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර උතුම් නායකතුමා නිදහස් අධ්‍යාපනය අපට ලබා දුන්නා. හැබැයි, ඒ නායකතුමා හරි ආකාරයෙන් තමයි එය ලබා දුන්නේ. එය නිවැරැදිව ඉදිරියට අරගෙන යන්නේ නැති එක අපේ රටේ තිබෙන බරපතළ ප්‍රශ්නයක්. ඇයි? ආණ්ඩුවක් වෙනස් වෙන කොට, දේශපාලන නායකයෙකු වෙනස් වෙන කොට, අධ්‍යාපන ප්‍රතිපත්ති වෙනස් කරනවා. ලෝකයේ දියුණුම අධ්‍යාපනයක් තිබෙන රාජ්‍යවල දේශපාලකයෝ වෙනස් වෙනවා; නායකයෝ වෙනස් වෙනවා. හැබැයි, ඒ අයගේ අධ්‍යාපන ප්‍රතිපත්ති කවදාවත් වෙනස් වෙන්නේ නැහැ. ඒකයි, ඒ රටවල අධ්‍යාපනයේ දියුණුවක් වෙලා තිබෙන එක අපට බලාගන්න පුළුවන්. පාර්ලිමේන්තුව නියෝජනය කරන අපි නේ, නීති ගෙනෙන අය. අපි 1948 ඉඳලා තවම අධ්‍යාපනයත් එක්ක සෙල්ලම් කර කර ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ ඉන්න අපි 225දෙනා එකට එකතු වෙලා අධ්‍යාපනය සම්බන්ධයෙන් නිවැරැදි ප්‍රතිපත්තියක් හදාගෙන, අපේ රට අධ්‍යාපනය අතින් දියුණු රාජ්‍යයක් බවට පත් කරන්න ඕනෑ කියලා මම අද මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කර සිටිනවා.

අපේ රටේ නිදහස් අධ්‍යාපනය ලබා ගත්, නිදහස් අධ්‍යාපනයෙන් ඉදිරියට ආපු මේ හැම කෙනෙක්ම මේ රට ගැන හිතන්න ඕනෑ. අපේ රටට 1948 දී නිදහස ලැබුණා. එදා ඉඳන් අද වෙනකල් අපේ රටේ නිදහස් අධ්‍යාපනය ලබාගත් අය ඒ ලබා ගත් දෙයින් හරි දෙයක් කරනවාද කියන එක ගැන අපි හිතන්න ඕනෑ. අපේ රටේ ආර්ථිකය විනාශ වෙලා, රටේ ඉදිරි ගමනක් යන්න බැරි වෙලා තිබේද්දීත් තවම නිදහස් අධ්‍යාපනය ලබා ගත් අයගේ ප්‍රශ්න තිබෙනවා. මේ අය මොනවාද කරන්නේ? පාසල් යන කොට කණ්ඩායමක් පිකට්ං කරනවා. පාසලින් අයින් වෙලා කැම්පස්

එකට ගිහිල්ලා තව කණ්ඩායමක් පිකටිං කරනවා. කැම්පස් එකට ගිහිල්ලා එළියට ආවාම "රැකියාවක් දියව් දියව්" කියලා පිකටිං කරනවා. රැකියාව දුන්නාට පස්සේ රැකියාවට ගිහිල්ලාත් පිකටිං කරනවා. ඔබ සියලුදෙනාගෙන්ම මම ඉල්ලීමක් කරනවා. ඔබ එවැනි දේවල් කරන එක ඔබේ අනාගත රටට කරන බලපෑමක්, රට විනාශ කරන ගමනක්, ඒක නිසා එහෙම කරන්න එපා කියලා මම හැම දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා. තමන්ගේ පටු දේශපාලන අරමුණු වෙනුවෙන්, ඉදිරියේදී බලයට එන්න ඕනෑ කියලා හිතලා මේ දේවල් කරන්න එපා. එක්කෝ, කැම්පස් එකේ දරුවන් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් රජයේ රැකියාවක් කරන කණ්ඩායමක් වෙන්න පුළුවන්; පාසල් යන දරුවන් ඒවාට සම්බන්ධ නැහැ. මේ වාගේ දේවල් අපේ රටේ සිදු වෙනවා. ඒ නිසා, මේ වාගේ දේවල් කරන්න එපා කියලා අපේ රටේ නිදහස් අධ්‍යාපනය ලබාගත් අයගෙන් මම ඉල්ලා සිටිනවා.

අපේ රට ලෝකයේ තිබෙන හොඳම රටක්. ලෝකයේ හොඳම අධ්‍යාපනයක් තිබෙන රට බවට අපේ රට පත් වෙන්න ඕනෑ කියලා අද ඉන්න ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා බලාපොරොත්තු වෙනවා. ලංකාව අධ්‍යාපනයෙන් දියුණු රාජ්‍යයක් වෙන්න ඕනෑ කියලා එතුමා එදා අධ්‍යාපන ඇමතිවරයා විධියට විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. එතුමාගේ බලපොරොත්තුවක් තිබෙනවා, ලංකාවේ අනාගත දරුවන්ට ලෝකයේ දියුණු රාජ්‍යයන් එක්ක ගමන් කළ හැකි දියුණු අධ්‍යාපන ක්‍රමයක් තිබෙන රටක් බවට අපේ රට පත් කරන්න. අපේ රටේ ඉන්න සියලු ජනතාව එතුමාගේ ඉදිරි ගමනට උදව් කරන්න කියලා ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.53]

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉස්කෝලේ පහේ, හයේ පන්තිවල ඉන්දෙද්දී ආපු අධ්‍යාපන ධවල පත්‍රිකාව නැවත වතාවක් නව අධ්‍යාපන ධවල පත්‍රිකාවක් ලෙස එන්න එබිකම් කරද්දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට අකල් මරණයක් ළඟා කරන්න ලැහැස්ති වෙද්දී, මේ වැදගත් විවාදයේදී ඒ පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කෙටි කාලයක් හෝ ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. පළමුවෙන් මම ගරු අධ්‍යාපන ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. උසස් අධ්‍යාපනයට අදාළ නව පනත් කෙටුම්පත් ගෙනැල්ලා, කන්නන්ගර මැතිතුමා මේ රටේ දුප්පත් පවුල්වල දරුවන්ට ලබා දීපු අවස්ථාව නැවත උදුරා ගන්න හදද්දී එතුමා අධ්‍යාපන ඇමතිවරයා හැටියට නිදහස් අධ්‍යාපනය නැති භංග කිරීමට කිසිසේත් ඉඩ නොදෙනවා කියා පාර්ලිමේන්තුවේදී ඊයේ දීපු සහතිකය පිළිබඳව අපි එතුමාට උදක්ම කෘතඥ වෙනවා. එතුමා ඒ අභියෝගයට ඉතාම සාර්ථකව මුහුණ දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක පැත්තකින්, පාස්කු ඉරු දින ප්‍රහාරය නිසාත්, අනෙක් පැත්තෙන්, කොවිඩ් වසංගතය නිසාත්, විදුලිය, ඉන්ධන, ගෑස් අර්බුද නිසාත්, ඊනියා ගාලු මුවදොර අරගළය නිසාත් අපේ රටේ අධ්‍යාපනය පසුගිය කාලයේ බලවත් පසුබෑමකට ලක් වුණා. ඒ තුළින් අපේ දරුවෝ බලවත් අසාධාරණයකට, අයුක්තියකට හා මහ පීඩාවකට ලක් වුණා. ඒ කාලය තුළ දරුවෝ තමන්ගේ කාලයෙන් විශාල කොටසක් නිරපරාදේ නාස්ති කළා; කා දැමුවා. අපේ දරුවන්ගේ අනාගතය, කාලය තවදුරටත් කා දමන්න අප කිසිවෙකුටවත් අයිතියක් නැහැ. ඒ නිසා දැන් පාසල් පද්ධතියට ගුරු අරගළ ඕනෑ නැහැ. අනධ්‍යයන සේවක අරගළ, අධ්‍යයන සේවක අරගළ විශ්වවිද්‍යාල පද්ධතියට ඕනෑ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අරගළ ඇති වෙනවා නම් ඒවා වළක්වන්න පියවර ගැනීම පාලකයන්ගේ බරපතළ වගකීමක් වෙනවා; අනුල්ලංඝනීය වගකීමක් වෙනවා.

අපේ රටේ ගුරුවරුන් දැන් බරපතළ අර්බුදයකයි ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගුරුවරයා තෘප්තිමත් වුණොත් විතරයි තෘප්තිමත් අධ්‍යාපනයක් තුළින් ඵලදායි ශිෂ්‍යයෙක්, වැදගත් පුරවැසියෙක්, බලවත් පුරවැසියෙක් නිර්මාණය කරන්න පුළුවන් වන්නේ. ඒ සඳහා ගුරුවරයා ඉගෙනගත යුතුමයි, හැදෑරිය යුතුමයි. ඒ නිසා තමයි අපේ රටේ ගුරුවරයාට සතියේ දින පහේම පස්වරු 1.30න් පස්සේ විවේකය ලැබෙන්නේ, සති අන්ත දින දෙකක් විවේකය ලැබෙන්නේ. ඒ, අධ්‍යයනය සඳහායි; හෙට දවසේ ඉගැන්වීමට ඕනෑ කරන පූර්ව සූදානම සඳහායි; පොතපත කියවීමට හා හැදෑරීම සඳහායි. නමුත් අද අපේ රටේ ගුරුවරුන් දෙස බැලුවොත්, ඔවුන් නොකරන්නේම හැදෑරීමයි. ඒ ඇයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මේ ලබන සොච්චම් වැටුපෙන් ගුරුවරයාට අද ජීවත් වෙන්න බැහැ. ඔබතුමාත් බිම් මට්ටමේ සිටින මහජන නියෝජිතයෙකු හැටියට ඒ ගැන දන්නවා ඇති. අද වෙනකොට ගුරු වෘත්තියට අමතරව වෙනත් වෘත්තීන්වල නියැළෙන්න ගුරුවරුන්ට සිද්ධ වෙලා තිබෙනවා. ඇතැම් අය මෝසන් වැඩ කරනවා. ඇතැම් අය වඩු වැඩ කරනවා. ඇතැම් අය සිකියුරිටි ජොබ් කරනවා. ඇතැම් අය ටියුෂන් දෙනවා. මම දැක්කා, මේ මැයි මාසයේ 26වැනි දා අනුරාධපුරයේ, තලාවේ, වරාගොඩ කියන ගමේ පාලිත සනත් ධර්මසිරි කියන ගුරුවරයා සිකියුරිටි ජොබ් එකක් කරලා පාන්දර 5.30ට ඔහු නිදිමතේ ගෙදර ඇවිල්ලා, නැවත ඉස්කෝලයට යනකොට බවුසරයක හැපිලා මිය ගියා කියලා. ඔහු ගැන හොයලා බලද්දී ඒ ගුරුවරයා ඉතාම දුෂ්කර ජීවිතයක් තමයි ගත කරලා තිබෙන්නේ. ගුරු වෘත්තියෙන් ලැබෙන පඩිපතින් තමන්ගේ දරු පවුල නඩත්තු කරගන්න බැරි නිසා ඔහු නගරයේ සිකියුරිටි ජොබ් එකකට ගිහින් තිබෙනවා. සිකියුරිටි ජොබ් එක ඉවර වෙලා උදේ පාන්දර ගෙදර ඇවිල්ලා, නැවත ඉස්කෝලේ යන්න එනකොට බවුසර් එකක හැපිලා ඔහු මිය ගිහින්. මේක තමයි නූතන ගුරුවරයාගේ ඛේදවාචකය. ඒ නිසා මේ ගුරුවරයා ශක්තිමත්ව ගුරු භූමිකාව නියෝජනය කරන ගුරුවරයෙක් බවට පත් කිරීම පාලකයන්ගේ වගකීමක් වෙනවා. ඒ ගුරුවරු නිසාම නොවෙයි දරුවෝ නිසාය කියන එක අපි මේ වෙලාවේ අවධාරණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්‍රාමික ගුරු විදුහල්පතිවරුන්ගේ විශාල අදෝනාවක්, දුක්ගැනවිල්ලක් තිබෙනවා, බී.සී. පෙරේරා වැටුප් කොමිෂන් සභාවේ වාර්තාව ප්‍රකාරව ඔවුන්ට 1997 සිට තවමත් සාධාරණය ඉෂ්ට වෙලා නැහැ කියලා. මේ විශ්‍රාමික ගුරුවරු, අපට උගන්වපු ගුරුවරු. ඒ අයගෙන් අද ඉතාම අතළොස්සයි ඉන්නේ. ඔවුන් බොහොම වයෝවෘද්ධව, රෝගීභාවයෙන් පෙළෙනවා. ඒ අයට ලැබෙන සොච්චම් විශ්‍රාම වැටුපෙන් ඒ අයගේ බෙහෙත් හේත් ටික ගන්න බැහැ. ඒ නිසා ඒ අය විශාල දුක්ගැනවිල්ලක් කියමින් උසාවි ගාණේ, අධ්‍යාපන අමාත්‍යාංශය ගාණේ රස්තියාදු වෙමින් සිටිනවා. බී.සී. පෙරේරා වැටුප් කොමිෂන් සභාවෙන් නිකුත් කළ වාර්තාවට අනුව පළ කළ චක්‍රලේඛය ප්‍රකාරව සෙසු රාජ්‍ය සේවකයන්ට, සෙසු විශ්‍රාමිකයන්ට ඒ අයගේ වැටුප හා දීමනා ලැබුණා. නමුත් ගුරුවරුන්ට සහ විදුහල්පතිවරුන්ට ඒක තවම ලබා දීලා නැහැ. අනේ, පින් සිද්ධ වෙයි. මේ ලෙඩ ගාණේ ඉන්න වැඩිහිටි ගුරුවරු, විදුහල්පතිවරුන්ගේ මුහුණ බලලා ඒ අයගේ දුක්ගැනවිල්ලටත් කඩිනමින් සාධාරණයක් ඉටු කරන්න කියලා මා ඉතා ඕනෑකමින් මේ වෙලාවේ අවධාරණයෙන් යුතුව කියා සිටිනවා.

[ගරු ජයන්ත සමරවීර මහතා]

අපේ රටේ පාසල් අධ්‍යාපනයේ තිබෙනවා විශාල රෝගයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ රෝගයට උත්තර හොයන්නේ කොහොමද කියලා අධ්‍යාපන බලධාරින් කල්පනා කරන්නට ඕනෑ. අපේ රටේ කුඩා පාසල් එන්න එන්න කුඩා වෙනවා; ලොකු පාසල් එන්න එන්න ලොකු වෙනවා. ගමේ පාසල් එන්න එන්න කුඩා වෙනවා; නගරයේ ජනප්‍රිය පාසල් එන්න එන්න ලොකු වෙනවා. මේකට උත්තරයක් හොයන්න ඕනෑ. කුඩා පාසල් පෙළෙන මේ අර්බුදයට උත්තරයක් හොයා ගන්න බැරි වුණොත්, භෞතික සම්පත්වල හා මානව සම්පත්වල බරපතළ විෂමතාවක් ඇති වෙලා දුප්පත් දරුවෝ ඒ නිසාම අධ්‍යාපනයෙන් පිටමං වේවි. ඒ යථාර්ථයට මුහුණ දෙන්න රජයට සිද්ධ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ බවත් අවධාරණය කරන ගමන් විශේෂයෙන්ම මම මේ කාරණයත් කියන්න ඕනෑ.

මෙතැන අපට ඇහුණා, මව් භාෂාව අත හැරීම පිළිබඳව නන් දෙඩවිලි. ලෝකයේ අධ්‍යයන වාර්තා ගණනාවක, සමීක්ෂණ වාර්තා ගණනාවක ලියවිලා තිබෙනවා, මව් භාෂාවෙන් තමයි අධ්‍යාපනය ලබා දිය යුතු වන්නේ කියලා. අපේ අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය කරන්නට ඕනෑ. නව ලෝකයට ගැළපෙන නවීන මිනිසෙක් නිර්මාණය කරන්නට ඕනෑ. අපේ රටේ අභියෝගවලට ගැළපෙන අපේ උරුමය සහ සභ්‍යත්වය මත පදනම් වුණු නව මිනිසෙක් ලෝකයට නිර්මාණය කිරීමට අපේ අධ්‍යාපනය නව ආකාරයෙන් ප්‍රතිසංස්කරණය වෙන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. හැබැයි, ඒ මවු භාෂාවේ, අපේ සභ්‍යත්ව උරුමයේ දෙපා තබාගෙන මිසක් එතැනින් උගුල්ලපු මිනිහෙක් නොවෙයි නිර්මාණය කරන්න ඕනෑ කියන එකත් අවධාරණය කරමින්, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.01]

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් මාතෘකාවක් යටතේ කථා කරන්න ලැබීමත් සතුටක්. අපේ heart එක වැනි අපේ දරුවන්ගේ අනාගතයට බලපාන මාතෘකාවක් ගැනයි අපි කථා කරන්නේ. අපි දන්නවා, කොවිඩ් වසංගතයත් එක්ක අපි පත් වුණු තත්ත්වය. එය බොහෝ අමාරු කාලයක්. එය දරුවන්ගේ අනාගතයට විශාල වශයෙන් බලපෑවා. අවාසනාවන්ත ලෙස දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කඩා වැටුණා. තවම ඒක හරියට streamline කර ගන්න නොහැකි වෙලා තිබෙනවා. හැබැයි, අධ්‍යාපන ඇමතිතුමා miracle එකක් කළා වාගේ පුදුම ඉක්මනින් ඒවා යථා තත්ත්වයට පත් කරන්න අවශ්‍ය කටයුතු කරමින් පවතිනවා.

අපේ රටේ පාසල් 10,096ක් තිබෙනවා. මට මතකයි, 1988, 1989 කාලයේත් මේ වාගේ තත්ත්වයක් තිබුණු බව. ඒ, මම උසස් පෙළ කරපු කාලය. ඒ කාලයේත් මේ වාගේම තත්ත්වයක් තිබුණා. නියමිත කාලයට විභාග පවත්වා ගන්න නොහැකි වුණා. ඒ කාලයේත් ප්‍රශ්න ගොඩක් තිබුණා. ඒ වාගේම තමයි පසුගිය කාලයේත් ඉන්ධන, විදුලිය, ගෑස් ඇතුළු බොහෝ අත්‍යවශ්‍ය භාණ්ඩ නැතුව අපි අසරණ වෙලා, කර ගන්න දෙයක් නැතිව සිටියා. පාසල් පවත්වාගෙන යන්න බැරිවීම නිසා නියමිත කාලයට විභාගයක් තියා ගන්න නොහැකි වුණා. ශිෂ්‍යත්ව විභාගය, සාමාන්‍ය පෙළ හා උසස් පෙළ කියන හැම විභාගයකටම එය බලපෑවා. ඒ නිසා තමයි විභාග කල් ගියේ. හැබැයි, අද වනකොට යම්කිසි මට්ටමකට ඒ කටයුතු ගෙනැල්ලා තිබෙනවා. මම හිතන විධියට 2025 වනකොට අපට නියමිත කාලයට විභාග පවත්වන්න පුළුවන් වෙයි. ඒක තමයි අධ්‍යාපන ඇමතිතුමාගේ අවශ්‍යතාව. එතුමා එම කාර්යය සඳහා අවශ්‍ය කටයුතු කරන ගමන් තව ගොඩක් දේවල්වලට මුහුණ දෙනවා. ඒ අතර අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු අයගේ වෘත්තියමය ගැටලුත් මතු වෙනවා. මේක වැඩ වර්ජන කරන වෙලාවක්ද? අභිංසක දරුවන්ගෙන් පළි ගන්නද ඕනෑ? සමහර වෘත්තිය සමිති ක්‍රියාත්මක වන විධියට අභිංසක දරුවන්ගෙන් පළි ගැනීමක් තමයි අපි දකින්නේ. ඒක නිසා තමයි මේ විභාග කටයුතු කර ගන්න නොහැකි වෙලා තිබෙන්නේ. ඉදිරියේ දීත් කර ගන්න විධියක් නැහැ. ඒ නිසා විශ්වවිද්‍යාලවල අභිංසක දරුවන් ලොකු ගැටලුවකට මුහුණ පා තිබෙනවා. මේ සියල්ලටම මුහුණ දෙමින්, අධ්‍යාපන ඇමතිතුමා ප්‍රමුඛ අධ්‍යාපන බලධාරින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු - education reforms - සකස් කරගෙන යනවා. අපේ ජාතික පාසල් සහ පළාත් පාසල් කියලා වර්ග දෙකක් තිබෙනවා. ඒ දෙක එකතු කරගෙන එක මාර්ගයක ගමනක් යන්න, කලාපවලට බෙදලා ගමනක් යන්න අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතුත් මේ වනකොට සිදු වෙමින් පවතිනවා. ශිෂ්‍යත්ව විභාගය සම්බන්ධයෙනුත් දරුවන්ට යම් සහනදායී ක්‍රමවේදයක් සකස් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතිනවා. ඒ අතර මෙවැනි වෘත්තිය ගැටලුවලටත් මුහුණ දෙමින් ඉස්සරහට යනවා. ඒක ලෙහෙසි පහසු කටයුත්තක් නොවෙයි.

ඊළඟට, පෙර පාසල් සම්බන්ධයෙන් මම ගරු අමාත්‍යතුමාව දැනුවත් කරන්න කැමැතියි. ඔබතුමා දැන් පෙර පාසල් සම්බන්ධයෙන් යම් ක්‍රමවේදයක් සකස් කරමින් සිටිනවා. විශේෂයෙන්ම බදුල්ල දිස්ත්‍රික්කය ගත්තොත්, පෙර පාසල් ගුරුවරු 2,764දෙනෙක් ඉන්නවා. ඒ අතර ඩිප්ලෝමාධාරී teachersලා 2,567දෙනෙක් ඉන්නවා. ඩිප්ලෝමාධාරී නොවන teachersලා ඉන්නේ 197දෙනෙක් පමණයි. අනික් සියලුදෙනාම ඩිප්ලෝමාධාරී teachersලා බවට පත් වුණා. අනික් අයත් දැන් පුහුණු ගුරුවරුන් වෙලා තිබෙනවා. මේ විධියට ඌව පළාතේ මේ සම්බන්ධව හොඳ ක්‍රමවේදයක් හදලා දැන් ඒක ක්‍රියාත්මක වෙමින් පවතිනවා. සමහර පෙර පාසල්වල අපි දකිනවා, නොයෙක් දේවල් උගන්වන බව. හරියටම criteria නැති නිසා හරි system එකකට එන්න ඕනෑ නිසා තමයි මම මේ දැනුවත් කිරීම කරන්නේ. ඒක කරන්න පුළුවන්. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන බව අපි දන්නවා.

ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන්ම අපට තිබෙන ලොකු ප්‍රශ්නයක් තමයි, ඉංග්‍රීසි ගුරුවරුන්ගේ හිඟය. අපේ දිස්ත්‍රික්කයේත් ඒ ප්‍රශ්නය තිබෙනවා. අපේ පළාතේත් ඒ ප්‍රශ්නය තිබෙනවා. ඒ වාගේම quality teacher කෙනෙක් නැති එකේ ප්‍රශ්නයක් තිබෙනවා, English වලට. ඒ නිසා තමයි අපට මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. විශ්වවිද්‍යාලයකින් උපාධිධාරියෙක් එළියට එනකොට ඒ කෙනාගේ ඉංග්‍රීසි දැනුම අඩු නම්, ඒක ලොකු ප්‍රශ්නයක්. ඒ නිසා තමයි අපේ ප්‍රදේශයේ උපාධිධාරින්ට ඉහළට යන්න බැරි වෙලා තිබෙන්නේ. මොකද, එතැනින් එහාට examinations බොහොමයක්ම තිබෙන්නේ Englishවලින්. ඒ නිසා මෙන්න මේ පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හැම වෙලාවකම යෝජනා කරන්නේ, අපේ දරුවන්ට physical fitness තිබෙන්න ඕනෑ කියායි. අපේ දරුවන්ගෙන් බොහෝ පිරිසක් දැන් බෝ

නොවන රෝගවලින් පෙළෙන දරුවන් බවට පත් වෙලා ඉන්නේ. අවුරුදු 10, 15, 20 වෙනකොටම හෘදය වස්තුවේ ප්‍රශ්න ආදී නොයෙකුත් ප්‍රශ්න ඔවුන්ට මතු වෙලා. ඔවුන් ක්‍රීඩාවට යොමු නොවීමේ ප්‍රශ්නය තමයි මෙතැනදී මා දකින්නේ. ඒ සම්බන්ධයෙන් ඔබතුමා නොයෙකුත් උත්සාහයන් ගන්නා බව මම දන්නවා. නමුත්, තවමත් ඒකට අවශ්‍ය කටයුතු සිදුවෙලා නැහැ. සාමාන්‍ය මට්ටමින් තමයි එම කටයුත්ත තිබෙන්නේ. මේ ගැනත් විශේෂ අවධානයක් යොමු කරන්න කියා මා ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සමහර මන්ත්‍රීතුමන්ලා අද උදේ ඉඳන් මන්දපෝෂණය ගැනත් කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ සම්බන්ධව pilot project එකක් කළා, කන්දකැටිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා වශයෙන්. ඒ ප්‍රදේශයේ ආයුර්වේද වෛද්‍යවරයා, MOH ආදී වශයෙන් වූ කණ්ඩායමක් එකතු කරගෙන ඒ ප්‍රදේශයෙන් සොයා ගන්න පුළුවන් දේවල් එකතු කරලා මම උත්සාහ කළා, මන්දපෝෂණය තුරන් කරන්න අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර වේලක් දරුවන්ට ලබා දීම සම්බන්ධව එම ව්‍යාපෘතිය කරන්න. ගරු අමාත්‍යතුමනි, මා හිතන හැටියට කන්දකැටිය ප්‍රදේශය ආශ්‍රිතව සිදු කළ ඒ ව්‍යාපෘතිය සාර්ථක වුණා. හොඳ ආහාර වේලක් දරුවන්ට ලබා දෙන්න පුළුවන් ක්‍රමවේදයක් එහිදී අපි එකතු කළා. ඒකත් ඉතාම වැදගත් වෙනවා. ඒ ප්‍රදේශයේ අපි එය කළේ pilot project එකක් හැටියටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වෙලාවක් දෙන්න, එක ඉල්ලීමක් කරන්න. දැන් තිබෙන දෙමළ පාසල්, මුස්ලිම් පාසල් අපේ කුඩා කාලයේ තිබුණේ නැහැ, ගරු අමාත්‍යතුමනි. දෙමළ පාසල්, මුස්ලිම් පාසල් කියලා අපි බෙදලා තිබුණේ නැහැ. අපි ඔක්කෝම එකට හිටියේ. ඒ නිසා අපි හොඳට සහෝදරයන් වාගේ හිටියා. නමුත්, මේ වෙනකොට තිබෙන තත්ත්වයත් එක්ක දෙමළ පාසල්, මුස්ලිම් පාසල් කියලා බෙදපු නිසා තමයි අපට මේ ජනවාර්ගික ප්‍රශ්න ඇතුළු ගොඩක් ප්‍රශ්නවලට මුහුණ දෙන්න වුණේ. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමා දැන් මේ කරගෙන යන වැඩ පිළිවෙළට මෙන්න මේ යෝජනාවත් එකතු කරන්න පුළුවන් නම් වැදගත් වන බව. මේ බෙදීම නවත්වන්න ඔබතුමා කටයුතු කරන්න. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමාට එය කරන්න පුළුවන්. ඔබතුමා බොහෝ කාර්යයන් කරන කෙනෙක්. අනිවාර්යයෙන් ඔබතුමාට තමයි මේ කාරණය කරන්න පුළුවන් වෙන්නේ. අධ්‍යාපනයේ වෙනසක් කරන්න පුළුවන් නම්, ඒක කරන්න පුළුවන් වෙන්නේ ඔබතුමාටයි. ඒක අපි දකිනවා, ඔබතුමා කරගෙන යන මේ වැඩ පිළිවෙළත් එක්ක. ඒ නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ බෙදලා තිබෙන පාසල් සියල්ලම ශ්‍රී ලාංකික පාසල් විධියට සලකා එකට වැඩ කරන්න සලස්වන්න කියලා. එහෙම කරන්න පුළුවන් නම් අපට ඉදිරියට එන බොහෝ ප්‍රශ්න විසඳා ගන්න පුළුවන් වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩි නිවේදනයක් කරන්නයි මම නැඟී සිටියේ. උදේ ගරු එස්.එම්. මරික්කාර් මැතිතුමාත් මේ ගැන අවධානය යොමු කරලා තිබුණා. පසුගිය දින කිහිපය තුළ පැවති අයහපත් කාලගුණ තත්ත්වය නිසා විශේෂයෙන්ම දකුණු පළාතේ මාතර, ගාල්ල දිස්ත්‍රික්ක දෙකේ, සබරගමුව පළාතේ රත්නපුර, කෑගල්ල දිස්ත්‍රික්ක දෙකේ සහ බස්නාහිර පළාතේ කැලණි ගං තීරයේ කලාප කිහිපයක පාසල්වලට අපි අද නිවාඩු ලබා දුන්නා. ඒ වාගේම එතුමා අවධානය යොමු කළා, විශේෂයෙන් කොළොන්නාව, කැලණිමුල්ල ප්‍රදේශවල ජීවත් වන පාසල් දරුවන්ගේ පෙළ පොත් සහ අභ්‍යාස පොත් පවා ගංවතුරට අහුවෙලා තිබෙනවා කියලා. අපි අදාළ පළාත්වල සියලු පළාත් බලධාරීන්ට දැන්වුවා, ඒ ගැන සොයා බලන්න කියලා. ඒ වාගේම මහජන නියෝජිතයන් හැටියට අපේ මන්ත්‍රීවරුන්ටත් පුළුවන්, ඒ ගැන අපේ අවධානය යොමු කරවන්න. එහෙම කළොත් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු මාර්ගයෙන් තොරතුරු අරගෙන, පෙළ පොත් නැති වෙච්ච සියලු දරුවන්ට පෙළ පොත් ටික ලබා දෙන්න අපට පුළුවන්. ඒ වාගේම අභ්‍යාස පොත් නැති වෙච්ච දරුවන්ට ඒවාත් යම් ක්‍රමයකින් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න දැනටමත් අපි කටයුතු සූදානම් කරලා තිබෙනවා කියාත් මේ වෙලාවේ මම කියන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු වී. රාධාකෘෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා

.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜகத் சமரவிக்ரம அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SAMANPRIYA HERATH left the Chair, and THE HON. JAGATH SAMARAWICKRAMA took the Chair.

[பி.ப. 4.09]

ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாட்டில் 'கொவிட்' தொற்று, பொருளாதார நெருக்கடி என்பன ஏற்பட்ட பிறகு, கல்வித்துறையில் சில மாற்றங்கள் ஏற்பட்டதை எங்களால் அவதானிக்கக்கூடியதாக இருந்தது. குறிப்பாக, அந்தக் காலகட்டத்தில் மாணவர்களின் கல்வி நிலை வீழ்ச்சியடைந்திருந்தது. ஒழுங்காகப் பாடசாலைக்குப் போக முடியாமை, பாடசாலைகளில் பரீட்சைகள் குறித்த காலத்தில் நடைபெறாமை என்பன காரணமாக மாணவர்களுடைய கல்வி நிலையில் மாற்றங்கள் ஏற்பட்டிருந்ததை எங்களால் அவதானிக்கக்கூடியதாக இருந்தது. நாடு ஓரளவுக்கு வழமைக்குத் திரும்பிய பிறகு, கல்வித்துறையில் பல்வேறு மாற்றங்கள் நடைபெற்று

[ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා]

වරුවතෙයුම් අවතානික්කක්කූඩියතාක ඉරුක්කිරතු. අතිලුම් විසේටමාක, තර්පෝතෙය කල්වි අමෙච්චර් කෙළරව සුසිල් පිරේමජයන්ත අවර්කළ් කල්විත් තුරෙයිල් පල මාර්රංකළෙක් කොණ්ටුවන්තු, කල්විච් චෙයර් පාටුකළෙ ඔරු මුරෙමෙයින්කීළ් කොණ්ටුවරුවතර්කුරිය නටවටික්කෙකළෙ එටුත්තු වරුකිරාර් එන්පතෙ නාංකළ් සන්තෝසමාක ඒර්රුක්කොළ්ළ වේණ්ටුම්. අවර් අනුපවම් මික්ක ඔරු කල්වි අමෙච්චරාක ඉරුප්පතෙයුම් නාංකළ් කාණ්කිරෝම්. අවර් කල්විත්තුරෙයිල් මුන්නෙටුක්කින්ර විටයංකළෙ නාංකළ් පාරාට්ටුකින්රෝම්. අතේනේරම්, මලෙයකප් පකුතියිල් ඉරුක්කින්ර පාටචාලෙකළිල් නිලවුකින්ර පිරච්චිනෙකළෙ ඉංකු එටුත්තුච් චොල්වතු එන්නුටෙය කටමෙයාකුම්.

ඉන්රු මලෙයකත්තිල් 844 පෙරුන්තෝට්ටප් පාටචාලෙකළ් ඉරුක්කින්රන. ඉවෙ ඌවා, මත්තිය, චප්රකමුව, මේල් මර්රුම් තෙන් මාකාණංකළිල් කාණප්පටුකින්රන. ඉප්පොළුතු ඉන්තප් පාටචාලෙකළ් වළර්ච්චියටෙන්තු වරුවතෙ නාංකළ් අවතානික්කක්කූඩියතාක ඉරුක්කින්රතු. නාන් ඉංකු ඔරු විටයත්තෙච් චුට්ටික්කාට්ට විරුම්පුකින්රේන්. ඉම්මුරෙ කපරකලෙ පාටචාලෙයිල් Advanced Level පරීට්චෙක්කුත් තෝර්රිය අත්තනෙ මාණවර්කළුම් චිත්තියටෙන්තුළ්ළනර්. එම පාසල අතිදූෂ්කර පාසලක්. හඳුරන්කෙත කලාපයේ තිබෙන්නේ. ඒ පාසලේ සිසුන් දහනවදෙනෙකු විභාගයට පෙනී සිටියා. ඒ දහනවදෙනාම pass වුණා; passed rate 100 per cent. ඉව්වාරාන විටයංකළෙ නාංකළ් නිච්චයමාකප් පාරාට්ට වේණ්ටුම්. ඉම්මුරෙ නුවරෙලියා මාවට්ටත්තිල් ක.පොර.ත. උයර්තරප් පරීට්චෙයිල් චිරන්ත පෙරුපේරුකළ් කිටෙත්තිරුප්පතෙ නාංකළ් අවතානික්කක්කූඩියතාක ඉරුක්කින්රතු. පාටචාලෙකළිල් ආචිරියර් පර්රාක්කුරෙ ඉරුන්තුම්, ඉව්වාරාන results එටුප්පතෙන්පතු පාරාට්ටුක්කුරිය විටයමාකුම්. ඉතර්කාක නාංකළ් අප්පාටචාලෙකළින් අතිපර්කළෙයුම්, ආචිරියර්කළෙයුම් නිච්චයමාකප් පාරාට්ට වේණ්ටුම්.

කෙළරව අමෙච්චර් අවර්කළේ, එමතු පකුතියිල් කල්විත්තුරෙයිල් කාණප්පටුකින්ර චිල පිරච්චිනෙකළෙ නාන් උංකළුක්කුච් චොල්ලිවෙක්ක විරුම්පුකින්රේන්. නීංකළ් මුන්නරුම් කල්වික්කුප් පොරුප්පාන අමෙච්චරාක ඉරුන්තිරුක් කිරීර්කළ්. අතනාල් අන්තප් පකුතිකළිලුළ්ළ නිලෙමෙකළ් පර්රි උංකළුක්කුත් තෙරියුම්! මුන්නර් ඌවා, චප්රකමුව, මත්තිය මාකාණංකළිල් තනියාකත් තමිල්මොළි අලුකුකළ් ඉරුන්තිරුක් කින්රන; තමිල් Directors ඉරුන්තිරුක්කිරාර්කළ්. ආනාල්, ඉප්පොළුතු අංකු තමිල් Directors ඉල්ලෙ. Central Province එකේ දෙමළ මාධ්‍ය අහෝසි කරලා; දෙමළ මාධ්‍ය departments අහෝසි කරලා තිබෙනවා. මම දන්නේ නැහැ, මොකටද එහෙම කළේ කියලා. ඒ ගොල්ලන් ආයෙත් පත් කරන එකක් නැහැ කියලායි මම හිතන්නේ. ආයෙත් පළාත් සභා ඇති කළොත් තමයි ඒ ගැන කථා කරන්නවත් පුළුවන් වෙන්නේ.

ඉප්පොළුතු අංකු තමිල් මොළිමූල අතිකාරිකළ් ඉල්ලෙ; තමිල් මොළියිල් සුර්රරික්කෙකළ් වෙළියිටප්පටුවතිල්ලෙ; තමිල් මොළියිල් චෙයලමර්වුකළ් - seminars - නටෙපෙරු වතිල්ලෙ. ඉව්වාරාන සූළ්නිලෙයිල්, අංකුළ්ළ තමිල් අතිකාරිකළ්, තමිල් ආචිරියර්කළ්, තමිල් අතිපර්කළ් එව්වාරු තංකළුටෙය කාරියංකළෙ මේර්කොළ්වාර්කළ්? ඉතු මිකවුම් වරුත්තත්තුක්කුරිය විෂයමාකුම්. එනවේ, කෙළරව අමෙච්චර් අවර්කළ් ඉතනෙක් කරුත්තිර්කොණ්ටු, අංකු තමිල් මොළිමූලම් සුර්රරික්කෙකළෙ වෙළියිටුවතර්කුම් චෙයලමර්වුකළෙ නටත්තුවතර්කුම් නටවටික්කෙයෙටුක්ක වේණ්ටුමෙන නාන් අන්පාකක් කේට්ටුක්කොළ්කින්රේන්.

කෙළරව අමෙච්චර් අවර්කළ් ඉන්නුමොරු විෂයත්තෙයුම් තෙරින්තුකොළ්ළ වේණ්ටුම්. අතාවතු, ඉප්පොළුතු පෙරුන්තෝට්ටප් පකුතිකළිල් කුරිප්පාක ඌවා, චප්රකමුව, මත්තිය මාකාණංකළිල් dropouts අතිකමාක ඉරුක්කින්රතු. ඉතර්කුක් කාරණම්, පොරුළාතාරච් චික්කල් ආකුම්. පෙර්රෝරිතම් පෝතිය වරුමානම් ඉල්ලාතතන් කාරණමාක, ඔරු කුටුම්පත්තිල් 4 පිළ්ළෙකළ් ඉරුන්තාල්, 2 පිළ්ළෙකළෙප් පටිප්පතර්කු අනුප්පිවිට්ටු, මර්රෙය 2 පිළ්ළෙකළෙයුම් වේලෙක්කු අනුප්පුකිරාර්කළ්. ආකවේ, ඉන්ත dropoutsඅක් කුරෙප්පතර්කු නටවටික්කෙ එටුක්කප්පට වේණ්ටුමෙන නාන් අන්පාකක් කේට්ටුක්කොළ්කින්රේන්. මේලුම්, අංකුළ්ළ පාටචාලෙකළිල් GCE (Advanced Level) පාට ආචිරියර්කළුක්කාන පර්රාක්කුරෙ නිරෙයවේ ඉරුක්කින්රතු. පට්ටතාරි ආචිරියර්කළෙ නියමිත්තු, අප්පිරච්චිනෙයෙත් තීර්ප්පතර්කු නටවටික්කෙ එටුක්ක වේණ්ටුම්. ඉව්විටයම් මාකාණ චපෙයින්කීළ් ඉරුන්තාලුම්කූට, නීංකළුම් අතිල් අක්කරෙ චෙලුත්ත වේණ්ටුමෙන නාන් අන්පාකක් කේට්ටුක් කොළ්කින්රේන්.

නේර්රෙය තිනම් ඉච්චපෙයිල් කෙළරව විමල් වීරවංස අවර්කළ්, 2,000 ආචිරියර්කළ් ඉන්තියාවිලිරුන්තු ඉංකු වන්තු, මලෙයකප් පකුතිකළෙ ආක්කිරමිත්තුක්කොණ්ටු ඉරුප්පතාකවුම්, අවර්කළ් වේරු විෂයංකළිල් ඊටුපට්ටුක්කොණ්ටු ඉරුප්පතාකවුම් චොන්නාර්. අතනෙ කෙළරව අමෙච්චර් අවර්කළ් මරුතලිත්තිරුන්තාර්. ඉව්වාරාන කුර්රච්චාට්ටුක්කළෙ මුන්වෙප්පතෙ මක්කළ් පිරතිනිතිකළ් තවිර්ත්තුක්කොළ්ළ වේණ්ටුමෙන නාන් ඉන්ත නේරත්තිල් චොල්ලික්කොළ්ළ විරුම්පුකින්රේන්. පෙරුන්තෝට්ටප් පකුතිකළිලුළ්ළ පාටචාලෙකළිල් නිලවුම් ආචිරියර් පර්රාක්කුරෙයෙ නිවර්ත්ති චෙය්වතර්කු නටවටික්කෙ එටුප්පතාක කෙළරව අමෙච්චර් අවර්කළ් චොල්ලියිරුක්කිරාර්.

ඉප්පොළුතු කල්වි මරුචීරමෙප්පු නටෙපෙර්රු වරුකින් රතු. අතන්මූලම් මාණවර්කළ් තාංකළ් කර්කින්ර කල්වික් කේර්ර තොළිලෙප් පෙර්රුක්කොළ්වතර්කෙන චිල මාර්රංකළ් කොණ්ටුවරප්පට ඉරුක්කින්රන. ඉවෙ එතිර්කාලත්තිල් වේලෙවාය්ප්පෙ උරුවාක්කුවතර්කු මික මුක්කියමානතාක ඉරුක්කුම් එන්පතෙ නාන් චොල්ලික්කොළ්ළ විරුම්පුකින්රේන්. Ginigathhena Central College මාණවි ඔරුවර් Engineering Technology පිරිවිල් අකිල ඉලංකෛ රීතියිල් මුතලාවතු ඉටත්තෙප් පෙර්රු චිත්ති පෙර්රිරුක්කින්රාර් එන්පතෙ නාන් මිකවුම් පෙරුමෙයුටන් කූරික්කොළ්ළ විරුම්පුකින්රේන්. ගිනිගත්හේන මධ්‍ය මහා විද්‍යාලයේ සිසුවියක් මෙවර උසස් පෙළ විභාගයෙන් Island first rank අරගෙන තිබෙන බව මම මේ අවස්ථාවේදී සතුටෙන් කියනවා.

නාට්ටිල් පොරුළාතාර වළර්ච්චි ඒර්පට වේණ්ටුමානාල්, කල්වික් කොළ්කෙයිල් මාර්රම් කොණ්ටුවරප්පට වේණ්ටුම්. කල්වික් කොළ්කෙයිල් මාර්රම් කොණ්ටුවරුවතු තොටර්පිල් පෙර්රෝරුක්කු විළිප්පුණර්වු ඒර්පටුත්තප්පට වේණ්ටුම්. GCE (O/L) අල්ලතු GCE(A/L)ක්කුප් පිරකු මේර්කොණ්ටු එන්න චෙය්වතෙන්පතු තොටර්පිල් මුරෙයාන වළිකාට්ටල් ඉන්මෙයාල් නිරෙයප් පිළ්ළෙකළ් ඉප්පොළුතු මිකවුම් කෂ්ටප්පටුකිරාර්කළ්.

ඉන්රු කෙළරව රෝහිණි කුමාරි විජේරත්න අවර්කළ් කොණ්ටුවන්තිරුක්කින්ර ඉන්තප් පිරේරණෙයෙ නාංකළ් වරවේර්කිරෝම්. නාංකළ් එංකළුටෙය පිරච්චිනෙකළෙච් චුට්ටික්කාට්ටි ඉරුක්කිරෝම්. අවර්රුක්කුත් තීර්වු කාණ වේණ්ටියතු කෙළරව අමෙච්චර් අවර්කළුටෙය

පොරුප්පාකුම්. මාකාණ සපෙකළ් මීළ ඉයංක වේණ්ටුම්. මාකාණ සපෙකළ් මූලමාකත්තාන් එංකළුටෙය පකුතියිල් කල්වියිල් මරුමලර්ච්චියෙ එර්පටුත්ත මුටියුම්. Central Government එල්ලාවර්රෙයුම් පාර්ප්පතෙන්පතු මුටියාත ඔරු කාරියමාකුම්. එනවේ, මාකාණ සපෙත් තේර්තල්කළෙ නටත්ති, මාකාණ සපෙකළෙ ඉයක්කුවතර්කු නටවටික්කෙ එටුක්ක වේණ්ටුමෙන නාන් ඉන්ත නේරත්තිල් කේට්ටුක්කොළ්කින්රේන්. නේර්රු ඉන්තියාවිල් වෙළියාකිය තේර්තල් මුටිවුකළින්පටි, කෙළරව නරේන්තිර මෝටි අවර්කළ් මූන්රාවතු තටවෙයාකවුම් අන්ත නාට්ටිනුටෙය පිරතමරාකත් තෙරිවාකියිරුක්කින්රාර්. අවරුක්කු එංකළුටෙය වාළ්ත්තුක්කළෙත් තෙරිවිත්තුක් කොළ්කින්රෝම්.

අණ්මෙයිල් ඉලංකෙක්කු වන්ත ශ්‍රී.ශ්‍රී. රවිශංකර් කුරුජි අවර්කළ් සොන්න ඔරු විෂයත්තෙ නාන් ඉංකු සොල්ල වේණ්ටුම්. අතාවතු, පාටප් පුත්තකත්තිල් ඉරාමායණත්තෙප් පුකුත්ත වේණ්ටුමෙන අවර් සොල්ලියිරුක්කිරාර්. නේපාළත් තිලිරුන්තු වන්ත පුත්ත පෙරුමානින් කරුණෙ සම්පන්තමාන විෂයංකළ් ඉලංකෙයිල් පාටප්පුත්තකංකළිල් ඉරුක්කින්රන. අතේපෝල්, ඉරාමායණත්තෙයුම් කට්ටායම් පාටප් පුත්තකත්තිල් පුකුත්ත වේණ්ටුම්. ඉලංකෙ ඉල්ලාවිට්ටාල් ඉරාමායණම් ඉල්ලෙයෙනවුම් අවර් සොල්ලියිරුක්කිරාර්. ඉතු මික මුක්කියමාන ඔරු විෂයමාකුම්. ඉරාමායණම් ඔරු පාටමාක ඉරුන්තු වරුකින්රතු. අතෙ මේලුම් වලුප් පටුත්තුවතර්කාන විෂයංකළෙච් සෙය්ය වේණ්ටුම්. ඉලංකෙ නාට්ටෙප් පොරුළාතාර වීළ්ච්චියිලිරුන්තු මීට්ටෙටුප්පතර්කු ඉරාමායණ trail මුක්කිය පංකු වකික්කින්රතු.
විශේෂයෙන්ම රාමායනය අපේ අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් කරන්න ඕනෑය කියලා ගුරුදේව් ශ්‍රී ශ්‍රී රවි ශංකර් ළහදී ලංකාවට ආපු වෙලාවේ කිව්වා. අපේ economy එක මේ තුළින් දියුණු කරන්න පුළුවන්. ගොඩක් අය ලංකාවට එනවා. *[බාධා කිරීමක්]* එතුමාත් කිව්වේ ඒක තමයි. අපි පසුගිය මාසයේ 19වැනි දා උත්සවයක් පැවැත්වුවා. ඉන්දියානු සම්භවයක් සහිත පුද්ගලයන් 2,000කට වඩා ඒ අවස්ථාවට සහභාගි වුණා. 10,000කට වඩා ඒ උත්සවයට පැමිණියා. *[බාධා කිරීමක්]* සීතාඑළියේ පිහිටි සීතා අම්මාන් කෝවිලත්, අයෝධ්‍යා කෝවිලත් අතර සම්බන්ධයක් තිබෙනවා. ඒගොල්ලනුත් counter එකක් open කරලා තිබෙනවා. අපේත් counter එකක් open කරලා තිබෙනවා. ඒ තුළින් අපේ රටවල් දෙක අතර විශේෂ වැඩ පිළිවෙළක් කරන්න පුළුවන් වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. *[බාධා කිරීමක්]* හොඳයි. එපමණයි මට කියන්න තිබෙන්නේ.

Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු එච්.එම්.එම්. හරීස් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[ප.ව. 4.19]

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(මාණ්පුමිකු එච්.එම්.එම්. හාරීස්)
(The Hon. H.M.M. Harees)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

කෙළරව තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළේ! කෙළරව කල්වි අමෙච්චර් සුසිල් පිරේමජයන්ත අවර්කළ් සපෙයිල් ඉරුක්කින්ර ඉව්වේළෙයිල් ඔරු විටයත්තෙ ඥාපකප්පටුත්ත විරුම්පුකින්රේන්. අණ්මෙක් කාලමාක කිළක්කු මාකාණත්තිල් මිකවුම් මුක්කියමානතොරු විටයම් පේසප්පට්ටු වරුකින්රතු. කෙළරව අමෙච්චර් අවර්කළුටෙය පොරුප්පින් කීළුළ්ළ පරීට්සෙත් තිණෙක්කළත්තින් තීර්මානම් සම්පන්තමාක ඉන්රු කටුම් වාතප් පිරතිවාතංකළ් නටෙපෙට්රු වරුකින්රන. කටන්ත වාරම් Advanced Level පරීට්සෙප් පෙරුපේරුකළ් වෙළිවන්තපෝතිලුම්, තිරුකෝණමලෙ ස්ආහිරා කල්ලූරියෙච් සේර්න්ත 70 මාණවිකළින් පෙරුපේරුකළ් වෙළිවරවිල්ලෙ. ඉන්රුවරෙ අතු තොටර්පිල් එන්නත් තීර්මානමුම් පරීට්සෙත් තිණෙක්කළත්තාල් එටුක්කප්පටරාමල් ඉරුප්පතු මිකවුම් කවලෙයළික්කිරතු. ඉන්ත විටයමානතු, අන්ත මාණවිකළුක්කු මන උළෙච්චලෙ එර්පටුත්ති ඉරුක්කින්රතු.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන මම විභාග කොමසාරිස් ජනරාල්තුමාට දැනුම් දුන්නා. ඉතා කඩිනමින් ඒ ප්‍රතිඵල ලබා දෙයි. දැන් පරීක්ෂණ අවසන් කරලා තිබෙන්නේ. ඒක ලොකු වරදක් නොවෙයි. ඒ ළමයි ඔළුව වහගෙන හිටියා කියන ප්‍රශ්නය තමයි එතැන තිබුණේ. මම ඊයේත් ඒ ගැන කථා කළා. අදත් ඇවිල්ලා හිටියා. ඉක්මනට ඒ කටයුතු ඉවර කරලා ප්‍රතිඵල යවයි.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(මාණ්පුමිකු එච්.එම්.එම්. හාරීස්)
(The Hon. H.M.M. Harees)
ඉක්මනින් කියන්නේ, මේ සතිය ඇතුළත පුළුවන්ද, ගරු ඇමතිතුමනි?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පුළුවන්, පුළුවන්. ඉක්මනට ප්‍රතිඵල යවයි. මම ඊයේත් ඒ ගැන කිව්වා. ඔබතුමා කරපු ඉල්ලීමත් එක්ක ඒ කටයුතු ඉදිරියේදී සිදු වෙයි.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(මාණ්පුමිකු එච්.එම්.එම්. හාරීස්)
(The Hon. H.M.M. Harees)
ස්තුතියි, ගරු ඇමතිතුමනි. ඒ පාසල් සිසුන් මානසිකව වැටිලා ඉන්නේ. ඒ නිසා තමයි ඔබතුමා සභාවේ ඉන්නා වෙලාවේ මම ඒ ගැන කථා කළේ. ඔබතුමා ලබා දුන් පිළිතුර ගැන ස්තුතිවන්ත වෙනවා.

අන්ත මාණවිකළුටෙය පෙරුපේරුකළෙක් කූටිය විරෙවිල් වෙළියිටුවතාක කෙළරව කල්වි අමෙච්චර් අවර්කළ් කූරියිරුක්කිරාර්. ඉතර්කාක නාන් කෙළරව අමෙච්චර් අවර්කළුක්කු අන්ත මාණවර්කළ් චාර්පාක නන්රි තෙරිවික්ක විරුම්පුකින්රේන්. මික මුක්කියමාක, අන්තප් පාටචාලෙ මාණවිකළ් තමතු මතම් චාර්න්ත විතිකළින්පටි තලෙයෙ මරෙත්තුක් කොණ්ටු පරීට්සෙ එළුතියතු ඉන්රු චර්චෙක්කුරිය ඔරු විටයමාකප් පේසප්පටුකින්රතු. උණ්මෙයිලේයේ අන්ත මාණවිකළ් එන්තවිතමාන උළ්නෝක්කමුම් ඉන්රියේ ඉව්වාරු පරීට්සෙ එළුතියිරුක්කිරාර්කළ්. අන්ත නේරත්තිල් පරීට්සෙ මණ්ටපත්තිල් ඉරුන්ත මේර්පාර්වෙයාළර්කළ් එන්ත විතමාන නටවටික්කෙයෙයුම් එටුක්කාත නිලෙයිල්, ඉප්පොළුතු තිටීරෙන්රු අන්ත මාණවිකළින් පරීට්සෙ පෙරුපේරුකළෙ වෙළියිටාමල් ඉරුප්පතෙයිට්ටු, ඉන්රු පාරාළුමන්ර උරුප්පිනර්කළ්, චමූකත් තලෙවර්කළ් එනප් පලරුම් කවලෙක්කු උට්පට්ටිරුක්කින්රනර්.

කෙළරව අමෙච්චර් අවර්කළ් ඉප්පොළුතු ඉතු තොටර්පිල් චිරන්තතොරු තීර්මානත්තෙ අරිවිත්තිරුක්කිරාර්.

[ගරු එච්.එම්.එම්. හරීස් මහතා]

වරවිරුක්කින්ර පෙරුපේරුකළිල්තාන් අන්ත 70 මාණවිකළුටෙය එතිර්කාලමුම් තංකියිරුක්කින්රතු. තිට්ටමිට්ටු එන්තත් තවරෙයුම් සෙය්යාත අන්ත මාණවිකළ් තණ්ටික්කප්පටක් කූටාතු. අන්තප් පාටසාලෙයානතු, තිරුකෝණමලෙ මාවට්ටත්තිලුළ්ළ පිරපලමාන ඔරු පාටසාලෙ; කටන්ත කාලංකළිල් සිරන්ත පෙරුපේරුකළෙප් පෙට්රිරුක්කින්ර ඔරු පාටසාලෙ. ඉන්ත විටයම් වේරු කණ්ණෝට්ටත්තිලුම් පාර්ක්කප්පටුකින්රතු. ඒතාවතු සතිත්තිට්ටම් ඉරුක්කින්රතාවෙන්ර සන්තේකත්තුටන් ඉව්විටයම් පාර්ක්කප්පටුකින්රතු. නිච්සයමාක අව්වාරු ඉරුක්ක මාට්ටාතු.

පරීට්සෛත් තිණෛක්කළමානතු, නාට්ටු මක්කළින් නම්පික්කෛයෛප් පෙට්ර ඔරු තිණෛක්කළමාකුම්. අතිලුම් කුරිප්පාක, තර්පෝතෛය කෛරව කල්වි අමෛච්සර් අවර්කළ් ඉන්ත නාට්ටු මක්කළුටෙය නන්මතිප්පෛප් පෙට්රවර්; කණ්ණියමාන මුරෙයිල් සෙයර්පාටුකළෛ මුන්නෙටුක්කින්ර ඕර් අරසියල් තලෛමෛ එන්රු පෙයර් එටුත්තවර්. අන්ත මාණවිකළුටෙය පෙරුපේරුකළෛ වෙළියිටුවතර්කු නටවටික්කෛ එටුප්පතාක අවර් කූරියිරුක්කිරාර්. අතෛ ඉන්ත වාරත්තුක්කුළ් වෙළියිටුමාරු නාන් කේට්ටිරුක්කින්රේන්. අන්ත මාණවිකළුටෙය පෙරුපේරුකළ් නිච්සයම් වෙළියිටප්පටුම් එන්ර නම්පික්කෛ එනක්කු ඉරුක්කින්රතු.

කෛරව අමෛච්සර් අවර්කළේ, උංකළුටෙය පොරුප්පින්කීළුළ්ළ කල්වි අමෛච්සින් පුතිය තීර්මානත්තින්පටි, ආසිරියර් පයිර්සික් කලාසාලෛකළ් මූටප්පට්ටු වරුකින්රන. නාන් පිරතිනිතිත්තුවප්පටුත්තුකින්ර අම්පාරෛ මාවට්ටත්තිලුළ්ළ අට්ටාළෛච්සේනෛ ආසිරියර් පයිර්සික් කලාසාලෛයුම් මූටප්පට්ටිරුක්කින්රතු. ඇතනාල් අතන් කට්ටිටංකළ් මර්රුම් නිලත්තෛ ඉන්නුමෝර් අරස නිරුවනත්තුක්කු වළංකුවතර්කුරිය තීර්මානත්තෛ එටුක්කවේන්ටිය නිලෛමෛ ඒර්පට්ටිරුක්කිරතු. අට්ටාළෛච්සේනෛ පිරතේසත්තිලුළ්ළ පළ්ළිවාසල් නිර්වාකත්තිනරුම් සිවිල් අමෛප්පුප් පිරතිනිතිකළුම් එන්නිටම් වේන්ටුකෝළ් ඔන්රෛ විටුත්තිරුක්කිරාර්කළ්. අන්ත ආසිරියර් පයිර්සික් කලාසාලෛක්කුරිය කට්ටිටංකළෛයුම් මෛතානත්තෛයුම් අප්පයිර්සික් කලාසාලෛක්කු අරුකිලුළ්ළ - කිට්ටත්තට්ට 10 මීර්රරුක්කුළ් ඉරුක්කින්ර - අට්ටාළෛච්සේනෛ තේසිය පාටසාලෛක්කුක් කෛයළික්ක වේන්ටුමෙන වේන්ටුකෝළ් විටුත්තිරුක්කිරාර්කළ්. අට්ටාළෛච්සේනෛයිල් කල්වි අමෛච්සින්කීළ් ඉරුක්කින්ර ඔරේයොරු පාටසාලෛ අට්ටාළෛච්සේනෛ මත්තිය කල්ලූරි ආකුම්. අන්තප් පාටසාලෛයිල් උයර් තරප් පිරිවුක්කාන කට්ටිටප් පිරච්සිනෛ උට්පට මෛතානප් පිරච්සිනෛයුම් ඉරුක්කින්රතු. මේර්කුරිත්ත ආසිරියර් පයිර්සික් කලාසාලෛයින් කට්ටිටංකළෛයුම් මෛතානත්තෛයුම් අප් පාටසාලෛක්කු වළංකිනාල්, අංකු කල්වි කර්කින්ර 3,000ක්කුම් මේර්පට්ට මාණවර්කළ් නිච්සයමාකප් පයනටෛවාර්කළ් එන්ර නම්පික්කෛ එංකළුක්කු ඉරුක්කින්රතු. එංකළුටෙය කිළක්කු මාකාණමානතු, යුත්තත්තිනාලුම් සුනාමි අනර්ත්තත්තිනාලුම් මිකවුම් පාතික්කප්පට්ට ඔරු මාකාණම් එන්පතු උංකළුක්කුත් තෙරියුම්! නාන් අංකුළ්ළ පල පාටසාලෛකළුක්කු නේරටියාකච් සෙන්රිරුක්කිරේන්. අංකු පෝතියළවු තළපාටංකළ් ඇල්ලාමෛ පාරියතොරු පිරච්සිනෛයාක ඉරුක්කින්රතු. ඉව්විටයත්තෛප් පාටසාලෛ අතිපර්කළ් පල්වේරු සිරමංකළුක්කු මත්තියිල් මුකාමෛත්තුවම් සෙය්තු වරුකින්රාර්කළ්. කෛරව කල්වි අමෛච්සර් අවර්කළ් ඉන්ත විටයත්තිල් තලෛයිට්ටු, තළපාට වසතිකළ් ඇල්ලාත පාටසාලෛකළුක්කුත් තළපාටංකළෛප් පෙට්රුක් කොටුප්පතර්කුරිය නටවටික්කෛකළෛ මේර්කොළ්ළ වේන්ටුමෙන නාන් ඉන්තච් සපෛයිල් වේන්ටුකෝළ් විටුක්කින්රේන්. ඉතනූටාක අංකුළ්ළ පල්ලායිරක්කණක්කාන මාණවර්කළින් සිරමංකළෛප් පෝක්ක මුටියුමෙන නාන් නම්පුකින්රේන්.

කෛරව කල්වි අමෛච්සර් අවර්කළේ, ඇන්රු නීංකළ් කල්වික් කොළ්කෛ සම්පන්තමාක ආක්කපූර්වමාන පල නටවටික්කෛකළෛ එටුත්තු වරුකින්රීර්කළ්. ඇන්රු නාන් ඉන්තච් සපෛයිල් ඔරු චට්ටත්තරණියාකප් පේසුකින්රේන්. අතර්කුක් කාරණම්, එමතු නාට්ටිල් කල්වික් කොළ්කෛ සිරන්ත මුරෙයිල් ඉරුන්තතුතාන්. කුරිප්පාක, සි.ටපිළ්යූ.ටපිළ්යූ. කන්නංකරා අවර්කළුටෙය ඉලවසක් කල්විත් තිට්ටත්තිනාලුම්, 1971ආම් ආණ්ටු කාලප්පකුතියිල් කල්වි අමෛච්සරාක ඉරුන්ත මර්හූම් පතියුතීන් මුහ්මූත් අවර්කළින් කොළ්කෛයිනාලුම්, පින්තංකිය පිරතේසංකළිලුළ්ළ මාණවර්කළුක්කුප් පල්කලෛක්කළක අනුමති කිටෛක්කප් පෙර්රතු. ඉව්වාරු පින්තංකිය පිරතේසංකළිලුළ්ළ මාණවර්කළ් කල්විමාන්කළාක වරුවතර්කු ඉවර්කළුටෙය කල්වික් කොළ්කෛයුම් ඔරු කාරණමාක අමෛන්තතු. නමතු නාට්ටිල් ඔව්වොරු වරුටමුම් මූන්රු ඉලට්චත්තුක්කුම් මේර්පට්ට මාණවර්කළ් A/L පරීට්සෛක්කුත් තෝර්රිනාලුම්, 25,000 - 30,000 මාණවර්කළේ අරස පල්කලෛක්කළකංකළුක්කුත් තෙරිවු සෙය්යප්පටුකිරාර්කළ්. අමෙරික්කාවිල් ඇරුප්පතුපෝල, ඒන් එමතු නාට්ටුක්කු අරුකිලුළ්ළ ඉන්තියාවිල් ඇරුප්පතුපෝල, එමතු මාණවර්කළුක්කුම් පල්කලෛක්කළක කල්වි වාය්ප්පු ඉලකුවාක්කප්පට වේන්ටුම්.

කෛරව අමෛච්සර් අවර්කළේ, උංකළුටෙය පුතිය කල්වික් කොළ්කෛයින්කීළ් ඉන්ත නාට්ටිල් තනියාර් පල්කලෛක් කළකංකළුක්කු අනුමති කොටුත්තායිනුම්, එල්ලෝරුක්කුම් පල්කලෛක්කළකක් කල්වි වාය්ප්පෛ වළංක වේන්ටුම්. 'එල්ලෝරුක්කුම් පල්කලෛක්කළකක් කල්වි' එන්ර පුතියතෝර් අත්තියායත්තෛප් පුරට්චිකරමාක උංකළුටෙය තලෛමෛයිල් ඉන්ත නාට්ටිල් ඒර්පටුත්ත වේන්ටුමෙන නාන් ඉන්තච් සපෛයිල් උංකළිටම් වේන්ටුකෝළ් විටුක්කින්රේන්. අතුමට්ටුමල්ල, අන්තප් පල්කලෛක්කළකංකළිල් වසතිකුරෛන්ත මාණවර්කළ් කල්වි කර්පතර්කු ඒර්රවකෛයිල්, අතාවතු අවර්කළ් කට්ටණම් සෙලුත්তි කල්වි කර්පතර්කු ඒර්ර වකෛයිල්, එමතු අරස වංකිකළුම් තනියාර් වංකිකළුම් අවර්කළුක්කුක් කල්වික් කටන් - student loan - තිට්ටත්තෛ අරිමුකප්පටුත්ත වේන්ටුම්. අතන්මූලම් අන්ත මාණවර්කළ් කටන්පෙර්රාවතු කල්වි කර්රු, සමුතායත්තිල් සිරන්ততොරු නිලෛයෛ අටෛවාර්කළ්. තොළිල්නුට්පම් සාර්න්ත පට්ටමාක ඉරුක්කලාම් අල්ලතු වේරු තුරෛකළ් සාර්න්ත පට්ටංකළාක ඉරුක්කලාම්, උලක තොළිල් සන්තෛයිල් කිරාක්කියාක ඉරුක්කින්ර තොළිල්කළුක්කු ඒර්රතොරු පට්ටත්තෛප් පෙරුවතර්කු ඉන්ත නාට්ටිල් පුතිය කල්වික් කොළ්කෛ කළමාක අමෛය වේන්මෙන නාන් ඉන්ත ඉටත්තිල් වේන්ටුකෝළ් විටුක්කින්රේන්.

කෛරව අමෛච්සර් අවර්කළේ, එංකළුටෙය අම්පාරෛ මාවට්ටත්තිලුළ්ළ පොත්තුවිල් පිරතේසත්තෛ මෛයප්පටුත්ති තනියානතොරු කල්වි වලයම් උරුවාක්කප්පට වේන්ටුමෙන නාංකළ් නීණ්ටකාලමාක වේන්ටුකෝළ් විටුත්තු වරුකින්රෝම්. අතනෛයුම් නීංකළ් කවනත්තිලෙටුත්තු නිරෛවේර්රිත්තර වේන්ටුමෙනක් කේට්ටුක්කොළ්කින්රේන්. ඇන්රු නීංකළ් Cabinet අනුමති ඌටාක මාකාණ සපෛකළුක්කුක් කීළුළ්ළ පාටසාලෛකළුක්කුම් ආසිරියර්කළෛ නියමිප්පතර්කු නටවටික්කෛ එටුත්තු වරුකින්රීර්කළ්. කිළක්කු මාකාණත්තිලුළ්ළ කෂ්ටප් පිරතේසංකළිලුළ්ළ පල පාටසාලෛකළිල් පල්ලායිරක්කණක්කාන ආසිරියර් වෙර්රිටංකළ් ඉරුන්තුකොණ්ටු ඉරුක්කින්රන. අවර්රෛප් පූර්ත්തි සෙය්වතර්කු අණ්මෛයිල් මාකාණ සපෛ නටවටික්කෛ

එදුත්තිරුන්නතු. තූරතිරුෂ්ටම් එන්නවෙන්නාල්, ආට්සේර්ප්පුච් සෙය්යප්පට්ටවර්කළින් එණ්ණික්කෙ කුරෙවාක ඉරුප්පතු තාන්. ඉතනාල් ඉන්රු අංකුළ්ළ පට්ටතාරිකළ් විරක්තියිල් ඉරුන්තුකොණ්ටු ඉරුක්කිරාර්කළ්. අන්ත නියමනම්කූට, ඉප්පොළුතු ඉටෙනිරුත්තප්පට්ටු ඉරුක්කින්රතු. කිළක්කු මාකාණත්තිලුළ්ළ පාටසාලෙකළුක්කුක් කූටුතලාන ආසිරියර්කළෙ ආට්සේර්ප්පතර්කුම්, අවර්කළුක්කාන නියමනංකළෙ විරෙවාක වළංකුවතර්කුම් නටවටික්කෙ එටුක්ක වේණ්ටුම්.

ඉන්රු කල්විත්තුරෙ සාර්න්ත අතිකාරිකළින් නියමනංකළින්පෝතු පාරපට්සම් ඉටම්පෙරුවතාක නාංකළ් අරිකින්රෝම්. ඉතුතොටර්පිල් මේන්මුරෙයීටු සෙය්වතර්කු එර්පාටුකළෙච් සෙය්තු තර වේණ්ටුම්. කුරිප්පාක, තමිල්, මුස්ලිම් මක්කළ් තංකළුක්කු ඉළෛක්කප්පටුකින්ර අනීති තොටර්පිල් මුරෙප්පාටු සෙය්තු, විරෙවාක නියායත්තෙප් පෙරුවතර්කු එර්ර වකෙයිල්, ඉන්ත නාට්ටිල් සිරුපාන්මෙයිනර් නලන් සාර්න්ත ආණෙක්කුමු ඔන්රෙ - a Commission for minorities - නියමිප්පතර්කු අරසියලමෛප්පු රීතියාක ඕර් එර් පාට්ටෙච් සෙය්ය වේණ්ටුම්. ඉව්වාරානතෝර් ආණෙක්කුමු ඉප්පොළුතු ඉන්දියාවිලුම් සිංකප්පූරිලුම් ඉයංකි වරුකින්රතු. ඉන්ත නාට්ටිල් වාළ්කින්ර තමිල්, මුස්ලිම්, මලෙයකත් තමිළර්කළින් නලන්කරුති, අරසියලමෛප්පිනූටාක සිරුපාන්මෙයිනර් නලන් සාර්න්ත ආණෙක්කුමු ඔන්රෙ නියමිප්පතර්කු පාරාළුමන්ර උරුප්පිනර්කළාකිය නාංකළ් මුන්වර වේණ්ටුමෙනක් කේට්ටු විටෙපෙරුකින්රේන්. නන්රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතක කාලයක් තිබෙනවා.

[අ.හා. 4.32]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අලගියවන්න මුකවෙට්තුමා විසින් රචනා කරන ලද සුභාෂිතයේ සඳහන් කවියකින් මම මගේ කථාව ආරම්භ කරන්නම්.

"අල්ලට සිහාවත් රස නැති කැවිලි කකා
වල් කොළ බිම අතුට නිදි නොලැබ දුක් තකා
කල් ගිය රෙදි වැරළි ඇඳ දැලි කුණෙන් වකා
ඇල්මෙන් අකුරු උගනිව් ඉදිරි වැඩ තකා"

මේ, අපේ අතීතයේ අධ්‍යාපනය. හැබැයි, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමන්ලාගෙන් පස්සේ මේ රටේ නිදහස් අධ්‍යාපනය ස්ථාවර වුණාට පස්සේ දවස ගාණේ අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන පහසුකම් ටිකෙන් ටික දියුණු වෙන්න පටන් ගත්තා. විශේෂයෙන් 1977 දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා බලයට පත් වුණාට පස්සේ නොමිලේ පොත්පත් ලබා දීම, ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා බලයට පත් වුණාට පසුව නොමිලේ නිල ඇඳුම්, දිවා ආහාර ලබා දීම වැනි විශාල වැඩ කටයුතු රාශියක් සිද්ධ වෙන්න පටන් ගත්තා. මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය පුළුල් වුණා. විද්‍යා පීඨ ඇති වී පුහුණු ගුරුවරුන් බිහි වී ඒ සියල්ල සංවර්ධනය වෙමින් මේ රටේ අධ්‍යාපනයට විශාල සේවයක් සිදු වුණා. ඉන්පසුව පළාත් සභා ක්‍රමය හරහා අධ්‍යාපනය ඉතාම කඩිනමින් - ශීඝ්‍රයෙන්- දේශපාලනීකරණය වෙන්න පටන් ගත්තා. විශේෂයෙන් සමගාමී ලැයිස්තුවේ පළාත් සභාවලට අයිති පාසල් තුළ දක්ෂ ගුරුවරුන්ට, දක්ෂ විදුහල්පතිවරුන්ට නොවෙයි අවස්ථාවක් ලැබුණේ. ඒ පළාත් සභාවේ මහ ඇමතිවරයාට හෝ ඇමතිවරයාට වැඩියෙන් පෝස්ටර් ගහන, වැඩියෙන් රැස්වීම්වල අමතන, වැඩියෙන්ම කඩේ යන ගුරුවරු විදුහල්පතිවරු වුණා; අධ්‍යක්ෂවරු වුණා; පරිපාලනයේ ඉහළට ගියා. ඒ ගුරුවරුන්ගෙන් ඉගෙන ගන්නා දරුවන් පිරිසක් අපේ රටට ලැබුණා. එහෙම තමයි අධ්‍යාපනය දේශපාලනයෙන් වර්ණ ගැන්වුණේ. එහෙම දේශපාලනයෙන් වර්ණ ගැන්විලා දැන් නැවතත් සියයට තුනක් තිබෙන කණ්ඩායම අධ්‍යාපනය දේශපාලනයෙන් වර්ණ ගන්වන්න හදනවා. ගුරුවරුන්ගේ වැටුප් ප්‍රශ්නයකට මුවා වෙලා, ගුරුවරුන්ගේ වැඩවලට උදවු කරනවා කියලා ගුරුවරු ටික තමන්ගේ සාක්කුවට, පොකට් එකට දාගෙන අද පාසල් ටික වර්ණ ගන්වන්න හදනවා. ඒ ගුරුවරුන් හරහා දරුවන් මේ සමාජයට, මේ දේශපාලනයට, මේ පාර්ලිමේන්තුවට වෛර කරන වෛරක්කාරයින් පිරිසක් බවට පත් කරන්න හදනවා, සියයට තුනක් තිබෙන කයිසනායකලා ටික එකතු වෙලා.

අද අපි දකිනවා, සමහර විදුහල්වල විදුහල්පතිවරු, ගුරුවරු විශාල ප්‍රමාණයක් අර ස්වාධීනව ඉන්න ගුරුවරුන්වත් තමන්ගේ දේශපාලන මතයට සම්බන්ධ කර ගන්න උත්සාහ දරන ආකාරය. ඔවුන්ගේ ප්‍රධානම පරමාර්ථය තමන්ගේ පක්ෂය වෙනුවෙන් දේශපාලනය කරන එක මිස, දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කටයුතු කරන එක නොවෙයි. මේක බොහොම සාහසික දෙයක්. අධ්‍යාපනය කියන්නේ SLTB ඩිපෝ එකක් නොවෙයි. අධ්‍යාපනය තුළින් තමයි අපේ අනාගත පරම්පරාව හැඩ ගැන්වෙන්නේ; ඔවුන්ගේ අධ්‍යාත්මය, පෞරුෂය ගොඩ නැඟෙන්නේ; අපේ රටට අවශ්‍ය වෙන ශ්‍රේෂ්ඨිකයින්, විද්වතුන් ගොඩ නැඟෙන්නේ. කවුරු හෝ පාසල්වලට, අධ්‍යාපනයට දේශපාලනය ගේන්න හදනවා නම් ඒක සාහසික අපරාධයක් කියන එක මේ අවස්ථාවේ අපි මූලික වශයෙන්ම කියන්න ඕනෑ.

ආණ්ඩුවේ පාසල් ගැන කථා කරනවා නම්, ඒවා තිබෙන්නේ අපේ සාමාන්‍ය ජනතාවගේ දරුවන්ට. අපි දන්නා හැටියට ඔය කයිසනායක මහත්තයලාගේ, දිසානායක මහත්තයලාගේ පක්ෂයේ, ඉහළ ඉන්න නායකයින්ගේ දරුවන් ආණ්ඩුවේ පාසල්වලට යන්නේ නැහැ. ඒ ගොල්ලෝ හැම කෙනෙක්ම යන්නේ ජාත්‍යන්තර පාසල්වලට. ආණ්ඩුවේ විශ්වවිද්‍යාලවලට යන්නේ නැහැ. ඒ හැම කෙනෙක්ම යන්නේ පෞද්ගලික විශ්වවිද්‍යාලවලට. ආණ්ඩුවේ පාසල් ටික තිබෙන්නේ අපේ ගම්වල ඉන්න සාමාන්‍ය ජනතාවගේ දරුවන්ට. සාමාන්‍ය ජනතාවගේ දරුවන්ගේ පරිහරණය සඳහා තිබෙන රාජ්‍ය පාසල්වලට අනිවාර්යයෙන් ආණ්ඩුවේ සහයෝගය ඕනෑ. ඒවාට යටිතල පහසුකම් ඕනෑ. විශේෂයෙන් පෝෂණය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන මේ අවස්ථාවේ ඔවුන්ට ආහාර වේලකුත් ලබා දෙන්න ඕනෑ. අධ්‍යයන, අනධ්‍යයන සේවකයින්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම තෘප්තිමත් ගුරුවරු හිටියොත් තමයි තෘප්තිමත් අධ්‍යාපනයක් ලැබෙන්නේ. එතකොට තමයි තෘප්තිමත් පාසලක්, තෘප්තිමත් ශිෂ්‍යයෙක් අනිවාර්යයෙන්ම ගොඩ නැඟෙන්නේ. ඒ නිසා අපි ආණ්ඩුවට අවධාරණය කරනවා, කරුණාකරලා තෘප්තිමත් පාසලක් ගොඩ නැඟීම සඳහා කටයුතු කරන්න කියලා.

ඒත් එක්කම උසස් අධ්‍යාපනය ගැනත් මම කථා කරන්න ඕනෑ. මොකද, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේත් විවිධ ප්‍රශ්න තිබෙනවා. ගමේ දරුවෙකුට ඉහළට යන්න තිබෙන එකම අවස්ථාව උසස් අධ්‍යාපනයයි. අප වාගේ මිනිසුන්ට ඉහළට යන්න තිබුණු එකම අවස්ථාව උසස් අධ්‍යාපනයයි; විශ්වවිද්‍යාල අධ්‍යාපනයයි. දරුවන් විශ්වවිද්‍යාලවලට ආවාම ඒ දරුවන්ට දහසක් ප්‍රශ්න. ශිෂ්‍යාධාර පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. මහපොළ පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. අනෙකුත් පහසුකම් පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. විශ්වවිද්‍යාල ආචාර්යවරු විශාල ප්‍රමාණයක් දවස

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

ගණනේ රට අත්හැර යනවා. ඒ වාගේම, විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවකයින්ටත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අනුව, විශ්වවිද්‍යාලවල අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලවලටත් ප්‍රශ්න තිබෙනවා.

විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවකයන්ගේ ප්‍රශ්නය ගැන මම විශේෂයෙන් කියන්න කැමතියි. අධ්‍යයන කාර්ය මණ්ඩලවල අයගේ සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලවල අයගේ වැටුප් වැඩි කිරීම කරද්දී අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට නොලැබුණු සියයට 15 ලබා ගැනීම වෙනුවෙන් තමයි ඔවුන් මේ වර්ජනය කරන්නේ. ඒ සියයට 15 ඔවුන්ට ලබා දිය යුතුයි. අනධ්‍යයන සේවකයන්ගේ දරුවන්ටත් කුසගින්න දැනෙනවා.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අද උදේ වරුවේ මේ ගරු සභාවේ රැඳී සිටි බවක් මම දැක්කේ නැහැ. උදේ වරුවේ සිටම මේ ප්‍රශ්නය ගොඩ නැඟුණා. අපි පැහැදිලිව පිළිතුරු දීලා තිබෙනවා. පසුගිය දවස් දෙක තුළ දී සාකච්ඡා වට හතරකින් සමන්විතව මේ ගැන සාකච්ඡා කළා. අපට දැන් ලිපි ලැබිලා තිබෙනවා. වෘත්තීය සමිති 18ක් තිබෙනවා. සේවකයන් 12,400ක ප්‍රශ්නයක් ගැනයි මේ කථා කරන්නේ. මේ ප්‍රශ්නය විසඳන්නට රුපියල් බිලියන 1.8ක් රජයට අවශ්‍ය වෙනවා. නමුත්, ඒ ගොල්ලන්ගේ සහෘදත්වයෙන් මේ සාකච්ඡාව සාර්ථක පැත්තට ගිහින් තිබෙනවා. මේ මොහොත වනකොට අප අතර එකඟතාවක් තිබෙනවා. ලබන දවස් කිහිපය තුළ භාණ්ඩාගාරයේ අනුමැතියත් සමඟ අපි මේ ප්‍රශ්නය විසඳා ගන්නවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමා.

මොකද, විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලවල ඉන්න අයටත් බඩගින්න දැනෙනවා. ඔවුන්ටත් දරුවන් ඉන්නවා. ඔවුන්ටත් සෞඛ්‍ය ගැටලු -ලෙඩ රෝගවලට බෙහෙත් හේත් ලබා ගැනීම පිළිබඳ ගැටලු- ආදිය තිබෙනවා. කට්ටියකට කිරි දීලා, කට්ටියකට කැකිරි දෙනවා නම් වැරදියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලවල ප්‍රශ්නය විසඳන්න ආණ්ඩුව පරක්කු වෙන්න, පරක්කු වෙන්න කාටද අසාධාරණය සිදු වෙන්නේ? ඒකෙන් අසාධාරණය සිදු වන්නේ විශ්වවිද්‍යාල දරුවන්ට. විභාග පාස් වෙලා විශ්වවිද්‍යාලවලට එන ගමේ අහිංසක, දුප්පත් දරුවන්ගේ අධ්‍යාපනය තමයි එයින් ඇනහිටින්නේ. එක කාලයක් කොරෝනා වසංගතය නිසා ඒ දරුවන්ගේ අධ්‍යාපනය ඇනහිටියා. ඊට පස්සේ අරගළය නිසාත්, විදුලි පහසුකම් නැති නිසාත් ඒ ළමයින්ගේ අධ්‍යාපනය ඇනහිටියා. දැන් මේ වැඩ වර්ජනය නිසාත් ඒ දරුවන්ගේ අධ්‍යාපනය ඇනහිටිනවා. ඒ විතරක් නොවෙයි. වාමාංශික, සමාජවාදී කියන කණ්ඩායම් ඒ අහිංසක දරුවන්ට ඉගෙන ගන්න දෙන්නේ නැහැ. ඔවුන් එළියට දක්කනවා, ඇතුළට දක්කනවා; හරක් ගාලක වාගේ එළියට දක්කනවා, ඇතුළට දක්කනවා. වාමාංශිකයි, සමාජවාදීයි, ප්‍රගතිශීලියි කියන දේශපාලන කණ්ඩායම් ඒ දරුවන්ට ඉගෙන ගන්න දෙන්නේ නැත්නම්, ආණ්ඩුවෙනුත් මේ වාගේ කෙනෙහිලිකම් කරනවා නම්, මේ දෙගොල්ලෝම කරන්නේ එකමයි. ගහෙන් වැටුණු මිනිහාට ගොනා අනිනවා වාගේ, විශ්වවිද්‍යාලවල අහිංසක දරුවන්ට සමාජවාදී හැනිකරය කියන ගොනා අනිද්දී ආණ්ඩුවේ කණ්ඩායම කියන කාක්කෝත් කොටන්න ගියොත් මොකද වෙන්නේ? ඒ දරුවන්ට ගහෙන් වැටුණාම ගොනාත් අනිනවා නම්, කාක්කොත් කොටනවා නම් මා හිතන්නේ ඒ දරුවන්ට බලවත් අසාධාරණයක් සිදු වෙනවා කියලායි. ඒ නිසා මම මේ රජයෙන් ඉල්ලීමක් කරනවා. ඒ ගොන්නු ඇන්නාට කමක් නැහැ. ජනතාව ඒ ප්‍රශ්නය විසඳයි. හැබැයි, ආණ්ඩුව ඒ අහිංසක දරුවන්ට කොටන්න, අරියාදු කරන්න එපා කියන ඉල්ලීම මේ අවස්ථාවේදී කරමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කුමාරසිරි රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.41]

ගරු කුමාරසිරි රත්නායක මහතා
(மாண்புமிகு குமாரசிறி ரத்னாயக்க)
(The Hon. Kumarasiri Rathnayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලය තුළ විවිධ හේතූන් නිසා නිදහස් අධ්‍යාපනයට සිදු වූ බලපෑම් සම්බන්ධයෙන් අද මේ යෝජනාව තුළින් කරුණු ඉදිරිපත් වුණා. අපි දන්නවා, පසුගිය කාලය තුළ රටේ කොරෝනා වසංගත තත්ත්වයක් ඇති වුණ බව. ඒ වසංගත තත්ත්වයත් එක්ක මේ රටේ ආර්ථික අර්බුදයකුත් ඇති වුණා. ඒ එක්කම රටේ අරගළකාරී තත්ත්වයකුත් ඇති වුණා. ඒ හේතූන් එක්ක පාසල් පද්ධතියට විශාල බලපෑමක් සිදු වුණා. ඒ බලපෑමත් එක්ක වරින් වර පාසල් වසා දමන්නටත් සිදු වුණා. ඒ වාගේම පාසල් පද්ධතිය තුළ අධ්‍යයන කටයුතු පවත්වා ගෙන යෑමේ බාධාවන් ද වරින් වර ඇති වුණා. එසේ බාධා ඇති වුණත් පාසල් පද්ධතිය නැවත ආරම්භ කරලා, අධ්‍යයන කටයුතු ආරම්භ කරමින්, මහ හැරුණු විෂය නිර්දේශ කොටස් නැවත පාසල තුළ උගන්වන ආකාරය අපි දැක්කා. නිසි වෙලාවට විභාග පවත්වන්නට නොහැකි වුණත් -එහි යම් ප්‍රමාදයක් තිබුණත්- අදාළ විභාග පවත්වමින්, ඒ ප්‍රමාදය සාමාන්‍ය අතට පත් කරන්න වර්තමාන අධ්‍යාපන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාත්, අපේ රාජ්‍ය අමාත්‍යතුමන්ලා සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ කටයුතු කරන සියලු ලේකම්වරුන් සහ කාර්ය මණ්ඩලත් විශාල වෙහෙසක් ගත්තා. ඒ පිළිබඳව අපේ ස්තුතිය මේ අවස්ථාවේදී පිරිනමනවා. විශේෂයෙන්ම යම් ප්‍රමාදයක් තිබුණත්, විභාග පවත්වමින්, ප්‍රතිඵල ලබා දෙමින් කටයුතු කළ විභාග දෙපාර්තමේන්තුවටත් අපේ ස්තුතිය පුද කරන්නට මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

මේ කථා කරන කාරණා අතරේ අද වැඩිපුරම කථා වුණේ, අපේ පාසල් පද්ධතිය තුළ තිබෙන ගුරුවරුන්ගේ අවශ්‍යතාව පිළිබඳවයි. එහෙම නැත්නම්, පවතින ගුරු හිඟය පිළිබඳවයි.

අධ්‍යාපන අමාත්‍යාංශය අද වන විට හැම පළාතකම ගුරු අවශ්‍යතාව හඳුනාගෙන තිබෙන බව අපි දන්නවා. ඒ අවශ්‍යතාවන්ගෙන් යම් ප්‍රමාණයක් සම්පූර්ණ කරන්න පසුගිය කාලය තුළ අවස්ථාව ලබා දුන්නා. නමුත්, අද දවසේ මේ විවාදයේදී කරුණු ඉදිරිපත් කරපු හැම කෙනෙකුගෙන්ම සඳහන් වුණේ ඒ ලැබුණු ගුරුවරුන් සංඛ්‍යාව ප්‍රමාණවත් නැහැ කියන එකයි. මම නියෝජනය කරන ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේත් මේ වන විට කලාප 4ක ගුරු පුරප්පාඩු 1,665ක් තිබෙනවා. ඒවා අතරින් වැඩිම පුරප්පාඩු ප්‍රමාණය වන පුරප්පාඩු 455ක් වැල්ලවාය අධ්‍යාපන කලාපයට අදාළව තිබෙනවා. ඒ වාගේම, මේ වන කොට මොනරාගල අධ්‍යාපන කලාපයේ ගුරු පුරප්පාඩු 382ක් තිබෙනවා; බිබිල අධ්‍යාපන කලාපයේ ගුරු පුරප්පාඩු 532ක් තිබෙනවා; තණමල්විල අධ්‍යාපන කලාපයේ ගුරු පුරප්පාඩු 295ක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගුරු පුරප්පාඩුවලින් වැඩි ප්‍රමාණයක් පවතින්නේ විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි වැනි විෂයයන්වලටයි. ඒ නිසා අපි අද දකිනවා, මොනරාගල අධ්‍යාපන කලාපයේ සියඹලාණ්ඩුව ආදි කොට්ඨාසවල අපොස (සාමාන්‍ය පෙළ) විභාගයට ඉදිරිපත් වන දරුවන් වැඩිපුරම අසමත් වෙන්නේ විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි ආදි විෂයයන් බව. එම නිසාම උසස් පෙළ විෂයයන් හදාරද්දී ඒ දරුවන්ට විද්‍යා විෂයයන්, ගණිතය විෂයයන් හදාරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. එම නිසා අධ්‍යාපන කොට්ඨාසයක් විධියට එතැන ලොකු අසාධාරණයක් සිදු වෙනවා. අපි ඒ පිළිබඳව පළාත් සභාව දැනුවත් කළා. පළාත් සභාවෙන් පත්වීම් ලබා දීමේදී ඒ පාසල්වලට ප්‍රමුඛතාව දීම ගැන අප කථා කළත්, පසුගිය කාලය තුළ ඒ අවස්ථාව මහ හැරුණා. පුරප්පාඩු පවතින පාසල් මොනවාද, කුමන පාසල්වල, කුමන ගුරු පුරප්පාඩු ද පවතින්නේ කියන කාරණය පිළිබඳව තවමත් පළාත් සභාව නිවැරදිව හඳුනාගෙන නැහැ කියන එකයි මගේ අදහස.

ඒ වාගේම, නිවැරදි ගුරු ස්ථාන මාරුවීම් ක්‍රමවේදයක් භාවිත නොකිරීම නිසාත් ගැටලු රාශියක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා අද වන විට නගරය ආසන්නයේ තිබෙන පාසල්වල ගුරු අතිරික්තයක් තිබෙනවා. දැන් මොනරාගල කලාපය ආසන්නයේ පාසල්වල ගුරු අතිරික්තයක් තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කය ගත්තත් ඒ වාගේමයි. බණ්ඩාරවෙල, බදුල්ල වැනි කලාපවල ගුරු අතිරික්තයක් තිබෙනවා. නමුත්, මහියංගණය, පස්සර ආදි කොට්ඨාසවලට යනකොට, අපේ මොනරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ආදී ප්‍රදේශවලට යනකොට ගුරු හිඟයක් තිබෙනවා. ඒ නිසා අපි යෝජනා කළා, විශේෂයෙන්ම දිස්ත්‍රික්කයෙන් පත්වීම් ලබන සියලුදෙනාට අදාළ දිස්ත්‍රික්කය තුළ පත්වීම් ලබා දෙන ක්‍රමවේදයක් අනුගමනය කරන්න කියලා. නමුත් ඒ සඳහා තවමත් නිවැරදි විසඳුමක් ලැබිලා නැහැ. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යතුමාගේ අවධානය ඒ සඳහා යොමු කරන්න කියලා මම මේ වෙලාවේ විශේෂයෙන් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික පාසල්වල ගුරු හිඟය ගැනත් කියන්න ඕනෑ. මොනරාගල දිස්ත්‍රික්කයේ අද වන විට ජාතික පාසල් 10ක් තිබෙනවා. ඒ පාසල්වලත් මේ වන විට ගුරු හිඟයක් පවතිනවා. ගුරුවරුන් 25කට ආසන්න සංඛ්‍යාවක් මේ වන විටත් පළාත් සභා පාසල්වලින් අනුයුක්ත කරලා තිබෙනවා, එකී ජාතික පාසල්වල ගුරු අවශ්‍යතාව සම්පූර්ණ කරන්න. මේ වන විට ජාතික පාසල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතින බව දැන ගන්න ලැබුණා. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු නිලධාරී මහත්වරුන්ගෙන් මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා, ඒ පාසල් තුළ පවතින පුරප්පාඩු හඳුනාගෙන අවශ්‍ය ගුරුවරුන් ලබා දීමට කටයුතු කරන්න කියලා. දෙමළ මාධ්‍ය පාසල්වල පවතින ගුරු හිඟය නැති කිරීම සඳහා ගරු අමාත්‍යතුමා මේ වන විටත් අවශ්‍ය කටයුතු කරගෙන යන බව දැනුම් දුන්නා. මම ඒ සම්බන්ධයෙන් එතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මොනරාගල දිස්ත්‍රික්කයේ දෙමළ පාසල් 12ක් තිබෙනවා. එම පාසල්වලින් එකම පාසලකවත් විද්‍යාව, ගණිතය වැනි විෂයයන් හදාරන්න ඒ දරුවන්ට අවස්ථාවක් නැහැ. ඒ දරුවන් විද්‍යා විෂයයන්, ගණිත විෂයයන් හදාරනවා නම් බදුල්ල හෝ මඩකලපුව වැනි ප්‍රදේශවලට යන්න සිද්ධ වෙලා තිබෙනවා. නමුත්, මේ දිස්ත්‍රික්කයේ වැඩිපුර ඉන්නේ කම්කරු ජනතාව. ඒ අයගේ දරුවන්ට මේ අවස්ථාව ලබා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා දමිළ මාධ්‍යයෙන් පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ට විද්‍යාව සහ ගණිතය විෂයයන් ඉගෙන ගැනීමට අවස්ථාව සලසා දීමේ වැඩ පිළිවෙළක් හදන්න කියලා මම මේ වෙලාවේ විශේෂයෙන් මතක් කරනවා.

ඊළඟට දුෂ්කර පාසල් ගැන කථා කළොත්, දමිළ මාධ්‍ය පාසල් වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ කඳුකර ප්‍රදේශවල. ඒ පාසල්වල අවුරුදු 20ක්, 25ක් තිස්සේ සේවය කරන ගුරුවරුන් ඉන්නවා. ඒ අයටත් පහසු පාසල් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම අපේ ඇමතිතුමාගෙන් ඉල්ලනවා, මේ නව පත්වීම් ලබා දීමත් එක්ක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගුරු උපදේශක සේවාව තුළ තිබෙන වැටුප් විෂමතාව ගැන කථා කළොත්, ගුරු උපදේශක සේවයට සම්බන්ධ වුණු ගුරුවරුන්ගේ වැටුප් වර්ධක පිළිබඳව පසුගිය කාලය තුළ නිරන්තරයෙන් කථා කළා. ඒ අයගේ වැටුප් වර්ධක තිබුණේ, II වැනි පන්තියේ ගුරු වැටුප් වර්ධකය රුපියල් 1,335ක් සහ ගුරු සේවයේ I වැනි පන්තියේ අයට රුපියල් 1,630ක් වශයෙන්. මෙය ගුරු උපදේශක සේවාවට පත් වීමේදී රුපියල් 930ක් දක්වා අඩු වුණා. මෙය ගැළපුම් දීමනාවක් ලෙස ලබා දුන්නත්, ඒ අයගේ ඉල්ලීම වෙන්නේ මෙය නිවැරදි කරන්න, අර කලින් වැටුප් වර්ධක නැවත ඔවුන්ට ලබා දෙන්න කියන එකයි. එය ලබා දෙන්න බාධාවක් නැහැ. මෙය සංවෘත සේවාවක් බවට පත් කරලා තිබෙන නිසා ගැටලුවක් නැහැ කියන එකයි අපේ අදහස. ඒ සම්බන්ධයෙනුත් අවධානය නැවත යොමු කරන්න කියලා මම විශේෂයෙන් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1999 දී රජයේ ප්‍රමුඛතා කාර්යයන් සඳහා බඳවාගත් උපාධිධාරීන් ඉන්නවා. මේ උපාධිධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශයේත්, ජාතික පාසල්, විද්‍යාපීඨ, ගුරු මධ්‍යස්ථානවල සේවය සඳහා බඳවාගෙන තිබෙනවා. නමුත්, මේ අය ශ්‍රේණිවලට උසස් කිරීම තවමත් සිද්ධ වෙලා නැහැ. ඒ වාගේම මේ අයගේ වැටුප් පියවර තවම ලැබිලා නැහැ. මෙය අවුරුදු 25කට ආසන්න කාලයක් තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. අධ්‍යාපන අමාත්‍යාංශය මේ ප්‍රශ්නය විසඳන්න තවමත් කටයුතු කරලා නැහැ. මේ අය දැන් විශ්‍රාම යන්නත් ආසන්නයි; වයස අවුරුදු 55 ඉක්ම වූ අය ඉන්නේ. ඒ නිසා මම විශේෂයෙන්ම මේ අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරුන්ගේ අවධානයට මේ කාරණය යොමු කරලා, මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලනවා. මේ වනකොට රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඒ අයගේ පැත්තෙන් අවශ්‍ය කටයුතු කරගෙන යනවා. නමුත්, මේ අමාත්‍යාංශයේ වගකීම් තවමත් ඉටු වෙලා නැහැ. ඒ නිසා ඒ පිළිබඳ අවධානය යොමු කරන්න කියලාත් විශේෂයෙන් මතක් කරනවා.

වැඩි දෙනෙක් ගුරු-විදුහල්පති වැටුප් ප්‍රශ්නය පිළිබඳව කථා කළා. අදියර තුනකදී මේ වැටුප් ලබා දීමේ යෝජනාව ක්‍රියාත්මක වෙන්නේ 2022 වර්ෂයේ ඉඳලා. පළමුවෙනි අදියර ලබා දුන්නා. දෙවෙනි සහ තුන්වෙනි අදියර ලබාදෙන බව ගරු ඇමතිතුමා පසුගිය කාලයේ සඳහන් කළා. නමුත්, ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සම්බන්ධයෙන් ගැටලුවක් මෙම ආර්ථික තත්ත්වය හමුවේ මේ වනකොට ඇති වෙලා තිබෙනවා. කෙසේ වුවත්, අපි ගරු ඇමතිතුමා සමඟ සාකච්ඡා කරද්දීත් කිව්වේ, මේ වර්ෂය තුළ කෙසේ හෝ එය ලබා දෙනවා කියලායි. එම නිසා නැවතත් ඒ පිළිබඳ අවධානය යොමු කරන්නය කියන ඉල්ලීම කරමින්, ගරු

[ගරු කුමාරසිරි රත්නායක මහතා]

අමාත්‍යතුමා ඇතුළු අධ්‍යාපන අමාත්‍යාංශය මේ පද්ධතිය තුළ තිබෙන ගැටලු අවම කරගෙන දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කරන්නා වූ කාර්යභාරය නැවතත් අගය කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.51]

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය විසින් අද දින සභාව කල්තබන අවස්ථාවේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව ඉතා කාලෝචිත යෝජනාවක්. අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කරද්දි මුලින්ම මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තත්ත්වය පිළිබඳව සඳහන් කරන්නම්. විශේෂයෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පාසල් 250ක්, ජාතික පාසල් 9ක් තිබෙනවා. ඒ වාගේම ගුරු පුරප්පාඩු 1,053ක් තිබෙනවා. විශේෂයෙන්ම අලුත් උපාධිධාරී පත්වීම් ලබා දෙනකොට උතුරු මැද පළාතේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පසුගිය කාලයේ විශාල අර්බුදයක් ඇති වුණු බව ඔබතුමාත් දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ උපාධිධාරින්ට පත්වීම් ලබා දීමේදී සමහර අයට තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට පත්වීම ලැබෙනකොට, තමන්කඩුවේ ඉන්න ඕනෑ කෙනාට වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට පත්වීම දුන්නා. එහෙම වුණාම සමහර වෙලාවට ගුරු පත්වීම අරගෙන බස් තුනක යන්න වෙනවා. එහෙම නැත්නම් මේ අයව අනුරාධපුරයේ කෙළවර ප්‍රදේශයක තිබෙන පාසලකට දැම්මා. අවශ්‍යතාව තිබුණත්, ඒ ප්‍රදේශයේම ඉන්න උපාධිධාරින්ට ඒ පත්වීම ලැබුණත්, ඒ අයට ඒ අවස්ථාව ලැබුණේ නැහැ. පත්වීම ලබාගන්න කොට ඒ අය ගිවිසුමක් අත්සන් කරනවා, අවුරුදු දෙකක් විතර යනකම් ස්ථාන මාරුවක් ලබාගන්නේ නැහැ කියලා. එම නිසා ඒ අය දැඩි අපහසුතාවට පත් වුණා. නව පත්වීම් ලබාදෙන කොට මේ උපාධිධාරින් දැඩි අපහසුතාවට පත් වුණා. ඒ නිසා මින් ඉදිරියටවත් ඒ කොට්ඨාසයේ, අදාළ ඉස්කෝලයේ ඒ විෂය භාර ගුරුවරුන්ගේ පුරප්පාඩු තිබෙනවා නම්, පත්වීමක් ලැබිච්ච උපාධිධාරියෙකු ඒ ගමේම ඉන්නවා නම් ඔහුට ඒ අවස්ථාව ලබා දුන්නොත් තමයි ප්‍රායෝගික වන්නේ. ඒ වාගේ වැඩ පිළිවෙළක් දියත් කළොත් ගුරුවරු ස්ථානමාරු අරගෙන තැන් තැන්වලට යන්නේ නැහැ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ කවුරුහරි කෙනෙකු පත්වීම් ලැබ පොළොන්නරුවට ආවොත්, ඒ ගුරුවරයා බලන්නේ කොහොමහරි ඒක ගමට හදාගෙන යන්න.

ඒ වාගේම අපි බලන්න ඕනෑ, ගුරු නිවාස ගැනත්. පොළොන්නරුවේ තෝපාවැව ජාතික පාසල ගත්තොත්, එහි ගුරුවරු 108දෙනෙක් ඉන්නවා. නමුත් ඔවුන්ට කිසිම ගුරු නිවාසයක් නැහැ. විලේයාය ජාතික පාසල ගත්තොත්, එහිත් එකම ගුරු නිවාසයක්වත් නැහැ. තිබෙන ගුරු නිවාස සම්පූර්ණයෙන්ම විනාශ වෙලා. සමහර අවස්ථාවලදි මෙන්න මේ පහසුකම් තිබෙනවාද කියන එක ගැන අපිට බලන්න වෙනවා. ගුරුවරු පාසල්වලට ගියාම ඒ අයට ඉන්න තැනක් තැන්නම්, ගමේත් සුදුසු තැනක් නැත්නම් ඒ ගොල්ලන් කොහේද ඉන්නේ? ඔවුන් පාරේ ඉන්නද? ඉස්කෝලේ ඉන්නද? ඒ නිසා ඒ අය බලනවා, සුදුසු තැනකට තමන්ගේ ස්ථාන මාරුව අරගෙන යන්න. පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තොත්, එහි පානීය ජලය නැති පාසල් 71ක් තිබෙනවා. ඒ වාගේම, වැසිකිළි පහසුකම් නැති පාසල් 93ක් තිබෙනවා. ඒ නිසා දරුවන් සහ ගුරුවරු අපහසුතාවට පත් වෙනවා. එක පැත්තකින් දරුවෝ අපහසුතාවට පත් වෙනවා. අනෙක් පැත්තෙන් ගුරුවරුත් අපහසුතාවට පත් වෙනවා. ඒ නිසා මෙන්න මේ කාරණා නිවැරදි වුණොත් ඉතා හොඳයි කියලා මම කියනවා. තෝපාවැව ජාතික පාසල ගත්තාම, එහි ක්‍රීඩා පිට්ටනිය සකස් කරන්න රුපියල් කෝටි 4ක විතර මුදලක් වැය වෙලා තිබෙනවා. හැබැයි රුපියල් කෝටි 4ක මුදලක් වැය කළත් මේ ක්‍රීඩාංගණය දරුවන්ට සෙල්ලම් කරන්න පුළුවන් විධියට තවම සකස් වෙලා නැහැ. දරුවන්ට මේවා නරඹන්න එතැන හරි විධියට ක්‍රීඩාංගණයක් ඉදි වෙලා නැහැ. ක්‍රිකට් සෙල්ලම් කරන දරුවන්ට pitch එක හරි විධියට සකසලා නැහැ. විශාල මුදලක් වැය වුණත් එහි වැඩ හරියට වෙලා නැහැ. ඒ නිසා මම අපේ අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානයට ඒ කාරණය යොමු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බාර් ලයිසන් ලබාදීම ගැන කථා කළොත්, දැන් ඒවා පාසල් ඉස්සරහ දාන්නත් දෙනවා, පන්සල් ඉස්සරහා දාන්නත් දෙනවා. හැම තැනටම මේ බාර් ලයිසන් ලබා දෙනවා. මේ ප්‍රශ්නය මේ සභාවට යොමු කරන්න කියලා මට කිව්වා. මහවැලි අධිකාරිය විසින් 2023.06.07වැනි දා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 254 ග්‍රාමසේවක වසමේ, විජයබාපුර කියන කොට්ඨාසයේ යම් පුද්ගලයෙකුට ව්‍යාපාරයක් කිරීම සඳහා අවශ්‍ය බලපත්‍රය ලබා දෙනවා. මේ බලපත්‍රය ලබා දීලා ටික කාලයක් යනකොට මේ ස්ථානයට බාර් ලයිසන් එකකුත් ලබා දෙනවා. මේ ස්ථානය ඉස්සරහ පන්සලක් තිබෙන්නේ. ගමේ විහාරස්ථානයේ විහාරාධිපති නායක ස්වාමීන් වහන්සේ, ගම්වාසීන් ඇතුළු සියලුදෙනා මේකට විරුද්ධ වුණා. මහවැලි අධිකාරිය විසින් දුන්නු බලපත්‍රය අවලංගු කරලා කියනවා, "දින 14ක් ඇතුළත මේ ස්ථානය මෙතැනින් අයින් කරන්න" කියලා. හැබැයි මේ බාර් ලයිසන් එක ලබා දීමත් එක්ක ගම්වාසීන් තවමත් මහා අරගළයකට මුහුණ දී සිටිනවා. ඒ ගමේ පවුල් 162ක් ඉන්නවා. මේ පවුල් 162න් 72කම ඉන්නේ සමෘද්ධිලාභීන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගම ගොවි ජනපදයක්. මේ ගම ඇතුළත පන්සල ඉස්සරහ ස්ථානයට බාර් ලයිසන් එකක් ලබා දී තිබෙනවා. දැන් දිගින් දිගටම, දිගින් දිගටම මේ වාගේ දේවල් වෙනවා. දැන් පාසල් ඉස්සරහටත් බාර් ලයිසන් දෙනවා, පන්සල් ඉස්සරහටත් දෙනවා, කෝවිල් ඉස්සරහටත් දෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව කොච්චර කාලයක් තිබෙනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පොළොන්නරුව මහ නගර සභාව විසින් විශාල මුදලක් වැය කරලා කඩ 11ක සංකීර්ණයක් හැදුවා. ඒකේ පර්චස් 62ක් තිබෙනවා. ඒ ප්‍රදේශයේ පර්චස් එකක් රුපියල් ලක්ෂ 25 ගණනේ

තමයි විකිණෙන්නේ. එහෙම බැලුවොත් ඉඩම විතරක් රුපියල් ලක්ෂ 1,550ක් වටිනවා. පොළොන්නරුව මහ නගර සභාවෙන් මේ ගොඩනැඟිල්ල හදන්න වැය කර තිබෙනවා, රුපියල් ලක්ෂ 657ක්. රුපියල් ලක්ෂ 657ක් වැය කරපු මේ ස්ථානය -ඒ කඩ 7- අවුරුදු 30කට බදු දෙනවා, රුපියල් ලක්ෂ 320කට. ඒකෙනුත් සියයට 50යි ගෙවලා තිබෙන්නේ. මේ ස්ථානයටත් අරක්කු ලයිසන් එකක් ලබා දී තිබෙනවා. ගමේ විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ මාව හම්බවෙන්න ඇවිල්ලා ඇහුවා "මන්ත්‍රීතුමා, මේක ගැන ඔබතුමා දන්නවාද?" කියලා. එතකොට මම කිව්වා, "මේක ගැන මම දන්නේ නැහැ හාමුදුරුවනේ" කියලා. එතකොට, කවුද මේකට ලයිසන් එක දීලා තිබෙන්නේ? බලන්න, මේක පොළොන්නරුව මහ නගර සභාවට අයිති ඉඩමක්. ඒකේ ඒ ගොඩනැඟිල්ල හදන්න මුදල් වියදම් කරලා තිබෙනවා. මේක රුපියල් මිලියන 200ක් විතර වටිනා ඉඩමක්. රුපියල් මිලියන 200ක් විතර වටිනා ඉඩමක් සහ ගොඩනැඟිලි රුපියල් මිලියන 16කට අවුරුදු 30කට බදු දීලා තිබෙනවා. මේ ස්ථානයට අරක්කු ලයිසන් එකකුත් දීලා තිබෙනවා. මේ ස්ථානයේ පාසල් දෙකක් තිබෙනවා. කදුරුවෙල නගර මහා විද්‍යාලය එක පැත්තකින් තිබෙනවා, පන්සල එක පැත්තකින් තිබෙනවා. මෙන්න මේ දේවල් නිවැරදි වෙන්න ඕනෑ. කරුණු රාශියක් කියන්න තිබුණත් අවස්ථාව නැති නිසා මම ඒ අවශ්‍ය ලියකියවිලි ඔක්කොම **සභාගත*** කරනවා. මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.57]

ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ නොවෙනස් වන එකම දේ තමයි වෙනස් වීම. රෝහිණී කුමාරි කවිරත්න මන්ත්‍රීතුමිය අද දින සභාව කල් තබන අවස්ථාවේ අධ්‍යාපනය පිළිබඳව ගෙනාපු යෝජනාව ගැන සාකච්ඡා කරන මේ වෙලාවේ අපි ඇත්තටම සිහිපත් කරන්නට ඕනෑ, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාට පින් සිද්ධ වෙන්න තමයි මේ පාර්ලිමේන්තුවේ 225දෙනාම අද මෙතැන ඉන්නේ කියන එක. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපන පනත ගෙනැල්ලා ඒ පනත සම්මත කළේ නැත්නම් අද අපේ රටේ කිසිම දරුවෙකුටවත්, මෙතැන ඉන්න කිසිම කෙනෙකුටවත් නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිලාභ ලැබෙන්නේ නැහැ. මම හිතන විධියට ඉතාම අභියෝගාත්මක කාලයක් තමයි පසුගිය 2019 සිට මේ දක්වා අපි ගත කරන්නේ. එවන් අවස්ථාවක අධ්‍යාපනයට එල්ල වෙච්ච විශාල අභියෝග තිබෙනවා. එම අභියෝග ජයග්‍රහණය කරන්නට කටයුතු කරගෙන යද්දී, දැන් අපට විපක්ෂයේ අය එහා පැත්තේ ඉඳගෙන විවිධ දේවල් කියනවා. ඒ වාගේම විවිධ යෝජනා කරනවා. විපක්ෂ නායකතුමා සුභුරු පන්ති කාමර විවෘත කරමින් යනවා. විපක්ෂ නායකතුමා සුභුරු පන්ති කාමර විවෘත කරන එක හොඳයි.

බලන්න, අද ළමයෙකුගේ පොත් බෑග් එක ගත්තොත්, ඒ බෑග් එකක් අඩුම ගණනේ කිලෝ 18කට, 20කට වැඩිය බරයි. අද ලෝකය බොහෝ ලෙස වෙනස් වෙලා තිබෙනවා. ලෝකයේ බොහෝ රටවල ළමයි අද පොත් අරගෙන යන්නේ නැහැ, tab එකක්, එහෙම නැත්නම් computer එකක් තමයි අරගෙන යන්නේ. ඒ තැනට තාක්ෂණය වෙනස් වෙලා තිබෙනවා. ලෝකය එතැනට ගිහිල්ලා තිබෙනවා. අපේ ජනාධිපතිතුමා හැම වෙලාවේම මේ කාරණය එතුමාගේ ඔළුවේ තබාගෙන වැඩකටයුතු කරන නායකයෙක්. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා. ඇත්තටම විශ්වවිද්‍යාල පද්ධතිය ගත්තත්, හැම නගරයක් නගරයක් පාසාම පෞද්ගලික අංශයෙන් හෝ විශ්වවිද්‍යාල විවෘත කරන්න ඕනෑ කියන එක තමයි එතුමාගේ ආකල්පය වෙලා තිබෙන්නේ. ඒක ඉතාම හොඳ දෙයක්. අධ්‍යාපනය කෙරෙහි ඒ වාගේ නැඹුරුතාවක් තිබෙන නායකයෙක් අද මේ රටේ නායකයා විධියට කටයුතු කරනවා. ඒ වාගේම, අධ්‍යාපන ඇමතිතුමාත් මේ සම්බන්ධයෙන් විශාල උනන්දුවකින් කටයුතු කරනවා.

මම කරුණු කිහිපයක් කෙරෙහි මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම, ජාතික පාසල්වලට විදුහල්පතිවරු පත් කරද්දී බලපා තිබෙන ගැටලුවක් සම්බන්ධව මම කරුණු ඉදිරිපත් කරන්න කැමැතියි. ජාතික පාසල්වලට විතරක් නොවෙයි, පාසල්වලට විදුහල්පතිවරු පත් කිරීමේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් තමයි ඒ පත් කිරීම් කරන්නේ. හැබැයි, අද මේ විදුහල්පතිවරු පත් කිරීම විශාල අභියෝගයක් වෙලා තිබෙනවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ මත පත් වන විදුහල්පතිවරු නොවෙයි බොහෝ ජාතික පාසල්වල ඉන්නේ. එක්කෝ මේ කොමිෂන් සභා අහෝසි කරන්න ඕනෑ. මේ කොමිෂන් සභා වැඩක් නැහැ. කොමිෂන් සභාවෙන් නිර්දේශ නොකරපු අය අද දක්ෂ විදුහල්පතිවරු ලෙස කටයුතු කරනවා. ඒ ගැන තර්කයක් නැහැ. දක්ෂ අය දක්ෂයි. හැබැයි, ඒ විදුහල්පතිවරුන්ට පරිපාලන සේවයේ ශ්‍රේණිධාරීන්ට වාගේ ඒ අවශ්‍ය සුදුසුකම් නැහැ. හැබැයි, ඔවුන් දක්ෂයි. සුදුසුකම් මත නිර්දේශ කරලා කොමිෂන් සභාවෙන් විදුහල්පතිවරයෙක් එව්වාම, ඒ විදුහල්පතිවරයාට වැඩ කරන්න බැරි තත්ත්වයට, ඔහුට වැඩ භාර දෙන්නේ නැති තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. මට ඕනෑ තරම් උදාහරණ කියන්න පුළුවන්. අපේ ප්‍රදේශවලත් එහෙම සිදුවෙලා තිබෙනවා. උද්ඝෝෂණය කරනවා. එක්කෝ පාර්ලිමේන්තුවට ඇවිල්ලා විපක්ෂ නායකතුමාට දැනුම් දෙනවා. අපේ ප්‍රදේශයේ තිබෙනවා මරීනා විද්‍යාලය කියලා මුස්ලිම් විද්‍යාලයක්. ඒ විද්‍යාලයේ විදුහල්පතිවරයා ගොඩක් ඈත ප්‍රදේශයකින් ආපු වැඩ බලන විදුහල්පතිවරයෙක්. විදුහල්පති ශ්‍රේණියේ එක විදුහල්පතිවරයෙක් තමයි විද්‍යාලයක ඉන්න ඕනෑ. අධ්‍යාපන පරිපාලන සේවයේ විදුහල්පතිවරයෙක් මේ පාසලට වැඩ බලන්න දාලා තිබෙනවා. මම මේ කාරණය අධ්‍යාපන අමාත්‍යාංශයේ බලධාරීන්ගේ අවධානයට යොමු කරන්න කැමැතියි. මම දහස් වතාවක් මේ ගැන කිව්වා. නමුත්, කනකට ගත්තේ නැහැ. අපි ඇමතිතුමාට කියලා තිබෙනවා, මේ ගැන. මේකෙන් නීත්‍යානුකූලව පත් කරන විදුහල්පතිවරු අපහසුතාවට පත් වෙනවා. එක්කෝ මේක නතර කරන්න. එහෙම නැත්නම් අපට මේ වැඩකටයුත්ත කරගෙන යන්න ලැබෙන්නේ නැහැ. මේ සම්බන්ධව අවධානය යොමු කරන්න කියලා මම විශේෂයෙන්ම අධ්‍යාපන ඇමතිතුමාට කියනවා. මමත් පිළිගන්නවා, විදුහල්පති ශ්‍රේණි තිබුණත්, පරිපාලන සේවාව තිබුණත් ඒ කිසිම දෙයක් නැති දක්ෂ විදුහල්පතිවරු ඉන්න බව.

එහෙම අය නැහැ කියලා මම කියන්නේ නැහැ. නමුත් අද මේ තුළ මාෆියාවක් මතු වෙලා තිබෙනවා. මම මුලින් සඳහන් කළ විද්‍යාලයේ විදුහල්පතිවරයාට පාසල් සංවර්ධන සමිතියේ ආදි ශිෂ්‍යයන් එකතු වෙලා ලක්ෂ එකහමාරක වාගේ මුදලක්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සමන්ප්‍රිය හේරත් මහතා]

ගෙවනවා. මම ඒකට නරකක් කියනවා නොවෙයි. හැබැයි, ඔහුට ලක්ෂ එකහමාරක වාගේ මුදලක් ගෙවනවා. මේ සමහර දේවල් අද මාෆියාවක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. සමහර දුප්පත් පාසල් තිබෙනවා, ඒ අයට මෙවැනි දේවල් කරගන්න බැහැ. ඒ නිසා මම කියන්න කැමැතියි, මේවා සම්බන්ධයෙන් එක ක්‍රමවේදයක් හදන්න කියලා. ඒ වාගේම සමහර ඉස්කෝලවලට තවම විදුහල්පතිවරු නැහැ. නක්කාවත්ත ජාතික පාසලට තවම විදුහල්පතිවරයෙක් නැහැ. මමත් ගියේ එම පාසලට. අපි ඒ සම්බන්ධවත් අවධානය යොමු කළ යුතුයි. මොකද, ඒ දරුවන්ගේ දෙමව්පියන් බණින්නේ අපට. ගරු ශාන්ත බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමාත් නක්කාවත ජාතික පාසලේ ආදි ශිෂ්‍යයෙක්. අපි දෙදෙනාටම දෙමව්පියන් බණිනවා, අපි කිසිම දෙයක් ගැන සොයා බලන්නේ නැහැ කියලා. ඒ දෙමව්පියන් දන්නේ නැහැ, විශේෂයෙන්ම විදුහල්පතිවරු පත් කරනු ලබන්නේ අධ්‍යාපන සේවා කමිටුවෙන් කියන කාරණය. ජනතාව ඒ ගැන දන්නේ නැහැ. ඒ නිසා ඔවුන් අපට දෝෂාරෝපණය කරනවා, "පාසලේ ආදි ශිෂ්‍යයෝ දෙදෙනෙක් පාර්ලිමේන්තුවේ ඉන්නවා. නමුත් අවුරුදු තුනක් තිස්සේ විදුහල්පතිවරයෙක් නැහැ" කියලා. අද වනවිටත් එම පාසලේ ඉන්නේ වැඩබලන විදුහල්පතිවරයෙක්.

අද අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පරිපාලනය සම්පූර්ණයෙන්ම අකාර්යක්ෂම වෙලා තිබෙනවා. මේ ගැනත් සොයා බලන්න. මේ සම්බන්ධයෙන් අපි ඇමතිතුමාටත් විටින් විට කථා කරලා තිබෙනවා. ඒ වාගේම මම අධ්‍යාපන අමාත්‍යාංශයටත් දෙතුන් වතාවක් ගියා. සමහර නිලධාරීන් ඉන්නවා, ඒ අයට කියන දේවල් බීරි අලින්ට වීණා වාදනය කරනවා වාගේයි. අපි ගිහිල්ලා කිව්වාම, ඒ වෙලාවට "ආ හරි, හරි" කියනවා. ඇත්තටම අපි මේවා මෙතැනදී කියන්න ඕනෑ දේවල් නොවෙයි. මේ සම්බන්ධයෙන් යම් කිසි ක්‍රමවේදයක් හැදුවා නම්, මේවා මෙතැන කථා කරන්න තරම් දේවල් නොවෙයි. මෙවැනි හේතු නිසා විදුහල්පතිවරුන් පත් කිරීම සම්බන්ධයෙන් පවතින කොමිෂන් සභාවත් අද වනවිට හැල්ලුවට ලක් වෙලා තිබෙනවා. ඒ වාගේම පත් කළ විදුහල්පතිවරුන් පවා අද හැල්ලුවට ලක් වෙලා තිබෙනවා. අද ඒ විදුහල්පතිවරුන්ට වැඩ භාර ගන්න දෙන්නේ නැහැ. මේ සඳහා යම් ක්‍රමවේදයක් ඇති. නමුත් ඒ ක්‍රමවේදයෙන් එහාට ගිහිල්ලා අද මේ තුළ මාෆියාවක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් සොයා බලන්න.

මහජන නියෝජිතයින් විධියට මේවා ගැන අපි මෙතැනට ඇවිල්ලා කථා කරනවා. විපක්ෂ නායකතුමා, එහෙම නැත්නම් මුස්ලිම් ඇමතිවරයෙක් මෙතැන ඒ ගැන කථා කරනවා. ඒ අයත් අධ්‍යාපනය ගැන මහ ලොකුවට කථා කරනවා. හැබැයි, මෙතැන එහෙම කථා කළාට ඒක වැරදි වැඩක්; වැරදි දෙයක්, විපක්ෂ නායකතුමා කථා කළත්, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කථා කළත්. මොකද, විදුහල්පතිවරු පත් කිරීම සම්බන්ධව එක ක්‍රමවේදයක් හැදුවා නම්, මෙතැනදී අපට එහෙම කථා කරන්න වෙන්නේ නැහැ කියන කාරණය මම සිහිපත් කරන්න ඕනෑ. ඒ නිසා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නය කියා මා නැවත වතාවක් සඳහන් කරනවා.

ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිබෙන උපකාරක පන්ති සම්බන්ධවත් මම කථා කළ යුතුයි. අද වනවිට උපකාරක පන්ති සම්බන්ධයෙන් මතයක් ඇති වෙලා තිබෙනවා, විශේෂයෙන්ම ටියුෂන් දීම සම්බන්ධව විවේචන කරනවා. නමුත් ඒ සම්බන්ධයෙන් මගේ මතය, ඊට එහා ගිය දෙයක්. ඇත්තටම මේ ටියුෂන් ක්ෂේත්‍රය තුළත් ඉතාම හොඳ ගුරුවරු ඉන්නවා. අපේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ගරු බී.වයි.ජී. රත්නසේකර මැතිතුමා ඉතාම හොඳ, දක්ෂ ගුරුවරයෙක්. එතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වෙන්න පවා එම කාරණය බලපෑවා. ඒ වාගේම තමයි මුතුගල සර්. මම දැක්කා, එතුමා ගැන ෆේස් බුක් එකේ පවා පළ වෙනවා. එතුමා අපේ ප්‍රදේශයේ සිටින දක්ෂ ගුරුවරයෙක්. එවැනි ගුරුවරුන් හොඳ දේවල් මේ සමාජයට දායාද කරනවා. ඒ වාගේ හොඳ, දක්ෂ ගුරු පිරිසක් ඇත්තටම මේ සමාජයේ ඉන්නවා. ඒ නිසා ඔවුන්ගෙන් ගත හැකි හොඳ දේවල් අපි ගන්න ඕනෑ. ඒකට දොස් කියනවාට වඩා, ඒ අයගෙන් ගන්න තිබෙන හොඳ දේවල් අපි අපේ දරුවන්ට අරගෙන දෙන්න ඕනෑ. කාල වේලාව අවසන් නිසා මම මුලින් සඳහන් කළ කාරණා සම්බන්ධව අවධානය යොමු කරන්නය කියා නැවත වතාවක් සිහිපත් කරනවා.

අවසාන වශයෙන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ කටයුතු ගැනත් සඳහන් කළ යුතුයි. ඇත්තටම අපේ ඇමතිතුමා විශාල මහන්සියක් ගන්නවා. නමුත් සමහර කාරණා තවම ඉෂ්ට වෙලා නැහැ. විශේෂයෙන්ම මම මෙතැනදී කථා කළේ අපේ ප්‍රදේශයේ තිබෙන පාසල් කිහිපයක් සම්බන්ධයෙන් පමණයි. එම කාරණා කෙරෙහි දැඩි අවධානය යොමු කරන්නය කියන කාරණය නැවතත් සිහිපත් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (මහාචාර්ය) චරිත හේරත් මැතිතුමා. ඔබතුමාට මිනිත්තු හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.06]

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සාකච්ඡාවට සම්බන්ධ වෙන වෙලාවේ මුලින්ම මම ස්තුතිවන්ත වෙනවා, අපේ ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේත් අනුග්‍රහයෙන් මිනිත්තු කිහිපයක් ලබා දීම ගැන.

අද මේ විවාදය තුළ ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව - National Education Policy Framework - පිළිබඳව සාකච්ඡා කරයි කියලා මම බලාපොරොත්තු වුණා. නමුත් පසුව එය වෙනස් වෙලා තිබෙනවා, සභාව කල් තැබීමේ හුදු විවාදයක් බවට. නමුත් අපේ රටේ අධ්‍යාපනය සම්බන්ධව විශාල සාකච්ඡාවක් මේ පාර්ලිමේන්තුව තුළ සිදු විය යුතුව තිබෙනවා. වර්තමාන අධ්‍යාපන ඇමතිතුමා මේ පිළිබඳව දන්නා කෙනෙක්. එතුමා ඒ සම්බන්ධව විශාල වශයෙන් මහන්සි වෙනවා. අපි එතුමාටත් සුබ පතනවා. නමුත් එතුමාටත් විසඳන්න බැරි ඉතා බරපතළ ව්‍යුහාත්මක ගැටලු - structural issues - ගණනාවක් සහ ආයතනික ගැටලු - institutional issues - ගණනාවක් අපේ රටේ මේ අධ්‍යාපන ක්ෂේත්‍රය පුරා තිබෙනවා.

ඒ නිසා මේ සම්බන්ධව අපි පාර්ලිමේන්තුව විධියට බරපතළ මැදිහත් වීමක් සිදු කරන්න ඕනෑ. ඒක, හුදු සභාව කල් තැබීමේ යෝජනාවකට, සාකච්ඡාවකට එහා ගිය පුළුල් අවශ්‍යතාවක් කියලා මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

ඒ වාගේම මේ වෙලාවේදී තව එක කාරණයක් අපේ අවධානයට ගන්න පුළුවන්. රජය, එහෙම නැත්නම් වර්තමාන ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවේ ප්‍රතිපත්ති 41ක් තිබෙනවා. ඉන් ප්‍රතිපත්ති 31ක් සම්බන්ධව

අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ එකඟතාව ලැබී තිබෙනවා. තව ප්‍රතිපත්ති 10කට අපේ එකඟතාව ලැබී නැහැ. නමුත්, අනාගතයේදී මේ සම්බන්ධව පුළුල් සාකච්ඡාවකට යන්න ඕනෑය කියලා අපි යෝජනා කරලා තිබෙනවා.

මේ වෙලාවේ තවත් වාර්තාවක් ගැන මගේ අවධානය යොමු කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාගේ මූලිකත්වයෙන් "ලංකාවේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම" කියලා තවත් වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරලා තිබෙනවා. මේ වාර්තා දෙක සම්බන්ධයෙන් රටේ විවිධ ක්ෂේත්‍රවල විවිධ අදහස් පළ වෙනවා. විශේෂයෙන්ම විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ, ඒ වාගේම රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සම්බන්ධ නැති අනිකුත් ආයතන තුළ මේ පිළිබඳව විශාල සාකච්ඡාවක් සිදු වෙනවා.

අද වෙනකොට ඇත්තටම අපේ රටේ අධ්‍යාපනය මුදා නොගත් කලාපයක් බවට පත් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාටත් මතක ඇති, "මුදා නොගත් කලාප" කියන වචන කිහිපය යම්කිසි කාලයකදී මේ රටේ අහන්න ලැබුණු බව. ඒ කියන්නේ, ඒ සඳහා රාජ්‍ය යන්ත්‍රණයෙන් හරි වෙන කිසිම දෙයකින් හරි නිසි ප්‍රමිතිකරණයක්, නිසි රෙගුලාසිකරණයක් නැහැ කියන එකයි. අන්න ඒ වාගේ තැනකට අපේ රටේ අධ්‍යාපනය හැම පැත්තෙන්ම තල්ලු වෙලා තිබෙනවා. ඒ කියන්නේ විෂය මාලාව පැත්තෙන් විශාල ප්‍රශ්න මේ තුළ තිබෙනවා. ගුරු පුහුණුව පැත්තෙනුත් විශාල ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම පාසල් පරිපාලනය පැත්තෙනුත් තවත් විශාල ප්‍රශ්නයක් අපේ රටේ තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් අපේ රටේ පාසල් අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම පළාත් සභාවට පවරා තිබෙනවා. පාසල් අධ්‍යාපනය පළාත් සභාවෙන් මධ්‍යම රජයට අරගෙන තිබෙන්නේ "ජාතික පාසල්" කියන සංකල්පය හරහායි. ගරු අධ්‍යාපන ඇමතිතුමාත් දැන් මේ සම්බන්ධව කථා කළා. මේ සම්බන්ධව පුළුල් සංවාදයක් අපේ රටේ කරන්න අවශ්‍යයි. ඇතුලත්මුදලි මැතිතුමා තමයි, "ජාතික පාසල්" කියන සංකල්පය ගෙනැල්ලා යම්කිසි පාසල් සංඛ්‍යාවක් මධ්‍යම රජයට පවරා ගත්තේ. දැන් ඒ සංඛ්‍යාව 300ක් විතර වෙලා තිබෙනවා. නමුත්, පළාත් පාසල්වල ප්‍රමිතිය සම්බන්ධව බරපතළ ප්‍රශ්නයක් මේ වෙනකොට තිබෙනවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව අපි පාසලේ පරිපාලනය පළාතට දෙනවා නම්, පළාත් අධ්‍යාපනය සම්බන්ධව පුළුල් සංගායනාවක් කරන්න ඕනෑ, පුළුල් එකඟතාවක් හදන්න ඕනෑ. වයඹ පළාතේ එක විධියකටත්, බස්නාහිර පළාතේ තව විධියකටත් ගුරුවරුන් බඳවා ගන්නවා. ඌව පළාතේ තවත් විධියකට බඳවා ගන්නවා. එකම විෂයය උගන්වන ගුරුවරයා බඳවා ගැනීමේදී ඌව, බස්නාහිර, වයඹ කියන පළාත් තුනේ ලකුණු දෙන්නේ තුන් විධියකට. ඒ නිසා මේ රටේ අධ්‍යාපනය මුදා නොගත් කලාපයක් වාගේ අවුල් වෙලා ගිහිල්ලා තිබෙනවා.

ඊළඟට විශ්වවිද්‍යාල අධ්‍යාපනය සම්බන්ධව ගත්තොත්, අද ඒ පිළිබඳව විවිධ සාකච්ඡා ඇති වෙලා තිබෙනවා. මම දැක්කා, විශ්වවිද්‍යාලවල අනධ්‍යයන කාර්ය මණ්ඩල ප්‍රශ්නය මේ දවස්වල ඉදිරියට ඇවිත් තිබෙන ආකාරය. හැබැයි, මේ අනධ්‍යයන කාර්ය මණ්ඩල ප්‍රශ්නයේත් සමහරු නොකියන ප්‍රශ්න අන්තර්ගතව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයක් ඉන්නවා. ඒ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කොටස් දෙකක් ඉන්නවා, administrative and non-administrative කියලා. මේ administrative කාර්ය මණ්ඩලය අධ්‍යයන කාර්ය මණ්ඩලය ගන්න සියලු වරප්‍රසාද ගන්නවා. සප්ත වාර්ෂික නිවාඩුව - sabbatical leave - ගන්නවා. ඒ අය ඒ පහසුකම් ඔක්කෝම අරගෙන තිබෙන නිසා ඊට පහළින් ඉන්න අනධ්‍යයන සේවකයන්ට පුංචි හෝ දෙයක් ලබා දීමේ අවස්ථාව නැති වෙලා තිබෙනවා. හැබැයි, මේ මැද ඉන්න පරිපාලන කාර්ය මණ්ඩලය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වරප්‍රසාද ගැනීම සම්බන්ධව අපි නැවත හිතා බලන්න ඕනෑය කියලා මම කියන්න කැමැතියි. මගේ මිත්‍රයෝ එතැන ඉන්නවා. මම මෙහෙම කිව්වාම එතුමන්ලා අමනාප වෙන්න පුළුවන්. මහ බැංකුවේ ඉන්න අනධ්‍යයන සේවකයන්ට වෙනම වැටුපක් දෙන්න බැහැ කියලා අපි තර්ක කරන ගමන්, ලංකාවේ ඉන්න එකම විශේෂඥයාට දෙන දීමනාව ඒ විශේෂඥයා ඉන්න දෙපාර්තමේන්තුවේ ඉන්න තවත් කෙනෙකුට දෙන්න ඕනෑය කියලා අපි තර්ක කරන එක වැරැදියි. මට විනාඩි දෙකක් තිබෙන නිසා මම මේ කිව්වේ පොඩි කාරණයක් විතරයි.

නමුත්, මේ සම්බන්ධව පුළුල් තේරුම් ගැනීමක් අවශ්‍යයි. ඒ වාගේම මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව අපේ රටේ නියාමනයක් ඇත්තේම නැහැ. විශේෂයෙන්ම පාසල් අධ්‍යාපනය සම්බන්ධව කටයුතු කරන NIE එකට ලබා දෙන ශක්තිය තවත් වැඩි කරන්න අවශ්‍යයි. NIE එක කියන්නේ පාසල් විෂය මාලා සංවර්ධනයත්, ගුරු පුහුණුවත් කියන අංශ දෙක වෙනුවෙන්ම කටයුතු කරන අපේ රටට තිබෙන එකම ආයතනය. එම නිසා විෂය මාලාවත්, ගුරු පුහුණුවත් වෙනුවෙන් වැඩ කරන ජාතික ආයතනය විධියට NIE එක ශක්තිමත්ව ඉස්සරහට ගන්න වැඩ කිරීම අවශ්‍යයි. ඒ සඳහා හැම රජයකම උදව්, උපකාර ලැබෙන්න ඕනෑය කියා අපි විශ්වාස කරනවා.

ගරු අධ්‍යාපන ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවට පැමිණියා. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා, මට මේ වෙලාවේ කථා කරන්න විනාඩි කිහිපයක් ලබා දීම පිළිබඳව. විශේෂයෙන්ම අපේ රටේ අධ්‍යාපනය අත්‍යවශ්‍ය කලාපයක් විධියට සමහර උවදුරුවලින් මුදාගෙන ශක්තිමත්ව, නිසියාකාරව ස්ථාපිත කරන්න මේ සභාවේ අපි සැමට අවස්ථාව ලැබෙයි කියා බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය නිමා කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු කුලසිංහම් තිලීපන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු තුනක කාලයක් තිබෙනවා.

[ප.ප. 5.13]

ගරු කුලසිංහම් තිලීපන් මහතා
(මාණ්පුමිකු කුලසිංකම් තිලීපන්)
(The Hon. Kulasingam Dhileeban)
නන්දි, කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ! නාන් ඉංකු නිරෙය විටයංකළ් පර්රිප් පේස වේණ්ටුම්. ආනාලුම්, නේරම් පෝතාදු. මුන්නාළ් කල්වි ඉරාජාංක අමෛච්චර් කෞරව ඉරාතාකිරුෂ්ණන් අවර්කළ්, ඉරාමා යණත්තෛප් පාටප් පුත්තකත්තිල් ඉණෛක්ක වේණ්ටුමෙනච් චොල්ලියිරුන්තාර්. අදු නල්ල විටයම්. ඉතන්පොළුදු ඉරාවණනෛ ඔරු වීරනාකත්තාන් කාට්ට වේණ්ටුමේ ඔළිය, කෝළෛයාක අල්ල එන්පතෛ නාන් ඉන්තච් චපෛයිල් පතිවු චෙය්දු කොළ්කින්රේන්.

මාණ්පුමිකු ජනාතිපති අවර්කළුම් අමෛච්චර්කළුම් ඉරාජාංක අමෛච්චර්කළුම් නාට්ටෛක් කට්ටියෙළුප්පුවතර්කු එව්වාරාන වේලෛත්තිට්ටංකළෛ මුන්නෙටුත්තාලුම්, අවර්කළුක්කුක්කීළ් ඉරුක්කක්කූටිය අතිකාරිකළ් චරියාන මුරෛයිල් චෙයර්පට්ටාල් මාත්තිරමේ ඉන්ත නාට්ටුක්කු විමෝචනම් කිටෛක්කුම්. කල්වි තොටර්පාකප් පේසුවතර්කුප් පල විටයංකළ් ඉරුන්තාලුම්, නාන් ඉන්ත උයිරිය චපෛයිල්

[ගරු කුලසිංහම් තිලීපන් මහතා]

ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். நாம் மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் பலமுறை முன்வைத்த கோரிக்கைக்கு அமைய, இன்று வன்னியில் பல்லாயிரக்கணக்கான ஏக்கர் காணிகளை விடுவிப்பதற்கான வேலைத்திட்டங்கள் நடை பெறுகின்றன. மாண்புமிகு ஜனாதிபதி அவர்களுக்கு ஒரு முகத்தையும் மக்களுக்கு இன்னொரு முகத்தையும் காட்டக் கூடிய அதிகாரிகள் பலர் இருக்கின்றார்கள்.

நேற்றும் நேற்று முன்தினமும் காணிகளை விடுவிப்பதாக மாண்புமிகு ஜனாதிபதிக்குத் தெரிவித்துவிட்டு, மக்கள் வசிக்கக் கூடிய காணிகளை அபகரிக்கின்ற வேலைத்திட்டத்தை மாவட்டச் செயலக அதிகாரிகளும் வனவள அதிகாரிகளும் இன்னும் சில அரச உத்தியோகத்தர்களும் முன்னெடுத்திருப்பது மிகுந்த வேதனை அளிக்கின்றது. அன்புக்குரிய கிராம சேவையாளர்களே! உங்களைப் பகடைக்காய்களாக ஆக்கக்கூடிய ஒரு வேலைத்திட்டத்தை மாவட்டச் செயலக அதிகாரிகள் முன்னெடுத்திருப்பதை நீங்கள் உணர வேண்டும். உங்களது கையொப்பம் இருந்தால் மட்டுமே வனவளத் திணைக்களத் திடமிருந்து அந்தக் காணிகளை விடுவிக்க முடியும். எனினும், காடாக்கக்கூடிய வேலைத்திட்டத்துக்கு உங்களது கையொப்பத்தைப் பெறுவதற்கு அழுத்தம் கொடுக்கப்படுகிறது. நீங்கள் எந்தவித அழுத்தத்துக்கும் அஞ்சாமல், மக்கள் நலன்கருதி வனவளத் திணைக்களத்தின்கீழுள்ள மக்களுடைய காணிகளை விடுவிக்கின்ற நடவடிக்கைக்கு மட்டும் கையெழுத்திட வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். சமீபத்தில் மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் வவுனியாவுக்கு வந்தபொழுதுகூட, காணிகளை நிச்சயமாக விடுவிப்பதாக அவர் தெரிவித்திருந்தார். இருந்தாலும், வன்னியில் இருக்கக் கூடிய எம்மைப் போன்ற மக்கள் பிரதிநிதிகளை மடையர்களென நினைத்துக் கொண்டு, சில அரச அதிகாரிகள் செயற்படுவது மிகுந்த வேதனை அளிக்கின்றது. எனவே, எதற்கும் அஞ்சாமல் மக்கள் நலன் கருதி இந்தக் காணிகளை விடுவிப்பதற்குரிய நடவடிக்கைகளை கிராம சேவையாளர்கள் எடுக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.16]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! கல்வி சம்பந்தமான இன்றைய ஒத்திவைப்புவேளைப் பிரேரணை மீதான விவாதத்தில் கலந்து கொண்டு, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற திருகோணமலை மாவட்டத்தில் உள்ள மிக முக்கியமானதொரு பிரச்சினையைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். இதற்கு முன்னர் இச்சபையில் பாராளுமன்ற உறுப்பினர்கள் பலரும் இப்பிரச்சினை பற்றி பேசியிருந்தார்கள். குறிப்பாக, திருகோணமலை கல்வி வலயத்துக்கு உட்பட ஸாஹிராக் கல்லூரியிலிருந்து இம்முறை க.பொ.த. உயர் தரப் பரீட்சைக்குத் தோற்றிய 70 மாணவிகளுடைய பெறுபேறுகள் வெளிவராமை இன்று முஸ்லிம் மக்கள் மத்தியிலும் மாணவர்கள் மத்தியிலும் கல்விமான்கள் மத்தியிலும் சர்ச்சைக்குரிய ஒரு விடயமாக மாறியிருக்கிறது.

குறித்த 70 மாணவிகளும் கொழும்பிலுள்ள பரீட்சைத் திணைக்களத்துக்கு விசாரணைக்கு வரவேண்டுமென 2024ஆம் ஆண்டு மே மாதம் 31ஆம் திகதி இலங்கைப் பரீட்சைத் திணைக்களத்தால் கடிதமொன்று அனுப்பப்பட்டு இருந்தது. இந்த விடயம் என்னுடைய கவனத்துக்குக் கொண்டுவரப்பட்ட பின்னர், இவ்விடயம் தொடர்பில் பரீட்சைகள் ஆணையாளருடன் பேசி, அந்த விசாரணையை திருகோணமலையில் நடாத்துவதற்கு முயற்சிகள் மேற்கொள்ளப்பட்டன. அதற்கு பரீட்சைகள் ஆணையாளர் சம்மதம் தெரிவித்தார். அதன்படி, அந்த விசாரணை திருகோணமலையிலே நடைபெற்றது. அதன் பின்னர், அம்மாணவிகள் பெறுபேறுகளை எதிர்பார்த்திருந்தார்கள். க.பொ.த. உயர்தரப் பரீட்சைப் பெறுபேறுகள் வெளியான தினம் தங்களுடைய பெறுபேறுகள் இடைநிறுத்தப்பட்டு இருக்கின்றன என்ற விடயத்தை அவர்கள் அறிந்தார்கள். இதனால் அந்த மாணவிகளும் அவர்களுடைய பெற்றோர்களும் பெரும் அதிர்ச்சி அடைந்தார்கள்.

பரீட்சைப் பெறுபேறுகள் வெளியான அன்றைய தினமே நான் உடனடியாகப் பரீட்சைகள் ஆணையாளரைத் தொடர்பு கொண்டு இந்த விடயம் சம்பந்தமாகப் பேசினேன். மேற்குறித்த சம்பவம் தொடர்பில் விசாரணைகள் முன்னெடுக்கப்படுகின்ற காரணத்தால் அம்மாணவிகளுடைய பெறுபேறுகள் வெளியிடப்படவில்லை என்றும் அவற்றை இந்தக் கிழமைக்குள் வெளியிடுவதற்கு முயற்சிகள் எடுக்கப்படும் என்றும் அவர் சொன்னார். அதற்கு அடுத்த நாள் நான் கௌரவ கல்வி அமைச்சர் அவர்களைத் தொலைபேசி மூலமாகத் தொடர்புகொண்டு இது தொடர்பில் கேட்டேன். அதற்கு அவரும், "விசாரணை நடைபெறுகின்ற காரணத்தினால்தான் அம்மாணவிகளுடைய பெறுபேறுகள் இடைநிறுத்தப்பட்டு இருக்கின்றன. இந்தக் கிழமைக்குள் அவர்களுடைய பெறுபேறுகளை வெளியிடுவோம்" என்று கூறினார்.

தற்பொழுது, இச்சபையில் கௌரவ கல்வி அமைச்சர் அவர்கள் இருக்கின்றார். கௌரவ அமைச்சர் அவர்களே, க.பொ.த. உயர்தரப் பரீட்சைப் பெறுபேறுகள் வெளியாகி சில நாட்கள் ஆகிவிட்டன. இன்றைய தினத்திலிருந்து இரண்டு வாரகாலம் re-correctionக்குரிய காலமாக அறிவிக்கப்பட்டு இருக்கிறது. Re-correctionக்குரிய காலம் அறிவிக்கப்பட்டுள்ள நிலையிலும், அம்மாணவிகளுடைய பெறுபேறுகள் இன்னும் வெளிவரவில்லை. இதனால் அந்த மாணவிகள் re-correctionக்கு விண்ணப்பிக்க முடியாத நிலைக்குத் தள்ளப்பட்டு இருக்கிறார்கள். ஆகையால், மிக விரைவில் இந்த விசாரணையைச் சரியான முறையில் முடிவுக்குக் கொண்டு வந்து, சிறந்ததொரு தீர்வைக் கண்டு, அந்த மாணவிகளுடைய பெறுபேறுகளை வெளியிட வேண்டுமென நான் கௌரவ அமைச்சரிடம் வேண்டுகோள் விடுக்கின்றேன். இது சம்பந்தமான பல விடயங்கள் உங்களுடைய மட்டத்தில் பேசப்பட்டிருக்கின்றன; பரீட்சைத் திணைக்களத்தில் பேசப்பட்டிருக்கின்றன. அதுமாத்திரமன்றி, இவ்விடயம் தொடர்பில் எல்லா விடயங்களும் தெரியப்படுத்தப்பட்டும் இருக்கின்றன. ஆகையால், நீங்கள் கூடிய சீக்கிரம் இதற்கு ஒரு தீர்வை வழங்க வேண்டும் என்பது எல்லோருடைய எதிர்பார்ப்பாகவும் இருக்கின்றது. இம்முறை நாடளாவிய ரீதியில் 130 மாணவ, மாணவிகளுடைய results இடைநிறுத்தி வைக்கப்பட்டிருக் கின்றன. அவர்களில் 70 மாணவிகள் ஒரே பாடசாலையைச் சேர்ந்தவர்கள் என்பது கவலையளிக்கிறது. இவ்விடயம் தொடர்பில் பல கருத்துகள் முன்வைக்கப்படுகின்றன. நேரம் இடம்கொடுக்காமையால் என்னால் அந்த விடயங்களைப் பேச முடியவில்லை. கௌரவ

அமைச்சர் அவர்கள் இந்த விடயத்தைக் கவனத்திலெடுத்து, மிக விரைவாகத் தீர்த்து வைக்க வேண்டுமென நான் இந்த உயரிய சபையில் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் இறுதியாக ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். இன்று எங்களுடைய கிண்ணியா - வெள்ளாங்குளம் பிரதேசத்தில் யானை தாக்கி ஒருவர் உயிரிழந்திருக்கிறார். இரண்டு தினங்களுக்கு முன்னர், புளியங்குளம் பகுதியில் ஒரு சிங்கள நபர் யானை தாக்கி உயிரிழந்திருப்பதாகச் சொல்லப்படு கின்றது. வெள்ளாமை அறுவடை செய்யப்படுகின்ற இந்தக் காலத்தில் யானைகளுடைய அட்டகாசம் கூடுதலாகக் காணப்படுகின்றது. இதனால் மனித உயிர்கள் இழக்கப்படு கின்ற நிலை எங்களுடைய பிரதேசங்களில் காணப்படுகின்றது. ஆகையால், அரசாங்கம் இது சம்பந்தமாகக் கூடிய கவனம் செலுத்தி, மிக விரைவில் யானை - மனித மோதலைக் கட்டுப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.22]

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ ගංවතුරෙන් පීඩාවට පත් පවුල් වෙනුවෙන් සහන ලබා දීමේ කටයුතුවල නිරත වෙමින් වාහනයේ යන අතරතුරදී මම අහගෙන හිටියා, අද දිනයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ගෙන ආ සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳ විවාදයේදී ගරු මරික්කාර් මන්ත්‍රීතුමා ඉංජිනේරු මහත්මයෙක් වාගේ කාරණා ගණනාවක් සඳහන් කරනවා. කොළඹ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපි ඔක්කොම මේ වෙලාවේදී ජනතාවට සහන ලබා දෙමින් තමයි ඉන්නේ. පෞද්ගලිකව මැදිහත් වෙමින් ඒ වැඩ කටයුතු සිදු කරමින් සිටින අවස්ථාවේදී එතුමා විසින් සිදු කළ ඒ විවේචනය, සුදුසු විවේචනයක් නොවෙයි. මොකද, එතුමා මේක විග්‍රහ කළේ දේශපාලන වශයෙන් යම්කිසි ආකාරයකට වාසි ගන්න අපි කටයුතු කරනවා වාගේයි. අපට දේශපාලන වශයෙන් වාසි ගන්න අවශ්‍යතාවක් නැහැ. ජනතාව වෙනුවෙන් එකට එකතු වෙලා වැඩ කරන්න ඕනෑ මේ වාගේ වෙලාවක අදාළ වක්‍රලේඛය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න, ගෙවල්වල සිටින ජනතාවටත් කෑම දෙන්න යෝජනා කළේ එතුමාය කියා වාගේ කථාවක් කිව්වා. ආණ්ඩුවක් හැටියට අපි කවුරුත් කථා කරලා ගත් තීන්දුවක් මේ පාර්ලිමේන්තුවේදී ඒ විධියට තනි මන්ත්‍රීවරයෙකුගේ සාක්කුවකට දමා ගන්න එක සුදුසු නැහැ. මොකද, අපි කවුරුවත් මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී කථා කළේවත් නැහැ. නමුත් එතුමාට උත්තරයක් දෙන්න ඕනෑ නිසායි මම මේ කාරණය කිව්වේ. මොකද, කණ්ඩායමක් හැටියට අපි දවස් තුනහතරක් තිස්සේ විශාල පරිශ්‍රමයක් දරමිනුයි මේ කටයුතු සිදු කරමින් ඉන්නේ. අදත් කඩුවෙල ආසනයේ ස්ථාන 28කට ගිහිල්ලා, අන්තිම මොහොතේ තමයි මම මේ ගරු සභාවට ආවේ. එවැනි අවස්ථාවක කවුරුන් හෝ දේශපාලනමය වශයෙන් වාසි ගන්නකොට අකැමැත්තෙන් හෝ මෙම විවාදයට අවශ්‍ය නැති කාරණා කියන්න අපටත් සිද්ධ වෙනවා. ඒ නිසා මම කියනවා, මේ වෙලාවේදී ඒ විපක්ෂ දේශපාලනය කරන්න එපා, මහ පොළොවේ තිබෙන, මහ පොළොවේ කළ යුතු දේශපාලනය කරමු කියලා.

විශේෂයෙන්ම අද දිනයේදී අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව තමයි අපි කථා කරන්නේ. කඩුවෙල ආසනයේ බොහෝ දේශපාලන කටයුතු කරපු නායකයෙක් වන ගරු සුසිල් ප්‍රේමජයන්ත අධ්‍යාපන අමාත්‍යතුමා දන්නවා, මම පදිංචි වෙලා සිටින නිවසට ඉස්සරහ තමයි බෝමිරිය ජාතික පාසල තිබෙන්නේ කියලා. එම ජාතික පාසල, එතුමා විශාල මුදල් ප්‍රමාණයක් වැය කරලා හදපු පාසලක්. ඇත්තටම ඊයේ දිනයේදී ගංවතුර සම්බන්ධයෙන් සොයා බලන්න සාගල රත්නායක මහත්මයාත් එක්ක අපි යම් ස්ථානයකට ගියාම තරුණයින් කණ්ඩායමක් ඇවිල්ලා එතුමාගෙන් ඉල්ලීමක් කළා. ඒ, ගංවතුර සම්බන්ධ ප්‍රශ්නයක්වත්, ගෙවල් යටවීමේ ප්‍රශ්නයක්වත් නොව බෝමිරිය ජාතික පාසලේ විදුහල්පතිවරයා සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නයක්. මේවා පාර්ලිමේන්තුවේ කථා කළ යුතු නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එතුමා විදේශ රටක ඉන්නකොට, ළමයින් 5,000ක් ඉන්න ජාතික පාසලේ කාර්යාලය වසා දමා තිබුණු අවස්ථාවේ මට පාර්ලිමේන්තුවේදී කථා කරලා ජී.එල්. පීරිස් මැතිතුමාට කියලායි කාර්යාලය විවෘත කරන්න වුණේ. ඉන් අනතුරුව නැවත වතාවක් එතුමා දැන් විදුහල්පති වෙලා තිබෙනවා. ඒ පාසල ගන්න දෙයක් නැහැ. ජනතාව කියන මේ කාරණා මට පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්න වෙනවා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් මැදිහත්වෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජීමනාස්ටික් සංගමය විසින් සංදර්ශන ජීමනාස්ටික් තරගාවලියක් පවත්වනවා. එ් තරගාවලියට අවසර ගන්න ඕනෑ. වැඩබලන පාසල් ක්‍රීඩා අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා, ඒ.ඩබ්ලිව්. නානායක්කාර කියලා. එතුමා කියනවා, "අමාත්‍යතුමා නොවෙයි කවුරු කිව්වත් මට ප්‍රශ්නයක් නැහැ" කියලා. එහෙම භයියක් ඔහුට තිබෙනවා. මම එතුමාට දුරකථන ඇමතුමක් ගන්න උත්සාහ කළා. නමුත් එතුමා ඇමතුම ගන්නේ නැහැ. සමහර නිලධාරීන් ඉන්නවා එසේ කටයුතු කරන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ තියෙන්නේ පස්සේ. මැතිවරණ ඉවර වෙලා අපි ඒ තීන්දු තීරණ ගනිමු. මේ අය හිතාගෙන ඉන්නවා, ආණ්ඩු පෙරළන්න. ආණ්ඩු පෙරළෙන්න කමක් නැහැ. ආණ්ඩු පෙරළෙන්නේ. හැබැයි මේ රටේ මැතිවරණයක් පවත්වනවා නම්, ඒකට තව මාස 3ක් තිබෙනවා. එතෙක් අපි වැඩ කරන්න ඕනෑ. ඒ නිසා ආණ්ඩුවක් ගත්තොත්, ප්‍රතිපත්තියක් අනුව වැඩ කරන්න ඕනෑ. මම මේ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවනවා. මම විශ්වාස කරනවා, ගරු අමාත්‍යතුමා ඒ ගැන අවධානය යොමු කරයි කියලා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහාචාර්ය චන්න ජයසුමන මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.26]

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා අපට කාලය ලබා දීම පිළිබඳව. පාර්ලිමේන්තුවට එන්න ඉස්සෙල්ලා මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතියේ මහාචාර්යවරු විධියට කටයුතු කරපු මටත්, මහාචාර්ය වරිත හේරත් මැතිතුමාටත් කථා කරන්න වෙලාව ලැබුණේ ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ අනුග්‍රහය නිසායි. අපට කථා කරන්න විනාඩියක හෝ දෙකක වෙලාවක් ලබා ගන්න, අඩුම ගණනේ මේ රටේ විශ්වවිද්‍යාලයට යාම තියා, සාමාන්‍ය පෙළවත් සමත් නොවුණු මිනිස්සුන්ගේ පසුපස යන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ ගැන බලවත් කනගාටුව ප්‍රකාශ කරන ගමන් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට නැවත වතාවක් මම ස්තුතිවන්ත වෙනවා.

බොහොම සම්භාවනීය, ගරු කළ යුතු අමාත්‍යවරයෙක් සහ රාජ්‍ය අමාත්‍යවරයෙක් අද අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉන්නවා. නමුත් ඔබතුමන්ලා ගන්නා තීන්දු තීරණ ඒ ආකාරයටම ක්‍රියාත්මක වෙනවාද කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා. අපි දන්නවා, ලේකම්වරයෙක් ඉන්නවා, ඒ වාගේම අතිරේක ලේකම්වරු මම හිතන විධියට 18ක්, 20ක් විතර ඉන්නවා. හැබැයි, අද මොන විධියට ද කටයුතු කරන්නේ කියලා ගැටලුවක් තිබෙනවා. මීට ඉස්සෙල්ලාත් මම මේ කියන්න යන කාරණා දෙක මතු කරලා තිබෙනවා. නමුත් අදත් ඒ ගැන මතු කරන්න වෙනවා. මොකද, ප්‍රතිපත්ති ගැන කථා කරන්න වෙලාවක් නැහැ.

පළමු කාරණය මෙයයි. මම නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට සම්බන්ධ නිලධාරීන් සැලකිය යුතු පිරිසක් අවුරුදු 10කට වැඩි කාලයක් ගුරුවරු ලෙස කටයුතු කරලා තිබෙනවා. අපි ඉල්ලීමක් කළා, ඔවුන්ව ගුරු සේවයේ 3 II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන්න කියලා. උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තොත්, අනුරාධපුර කලාපයේ 25දෙනෙක්, කැබිතිගොල්ලෑවේ 60දෙනෙක්, තඹුත්තේගම දෙදෙනෙක්, ගලෙන්බිඳුණුවැව එක්අයෙක්, කැකිරාවේ එක් අයෙක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් 11දෙනෙක් මේ අතර සිටිනවා. මීට පෙරත් අමාත්‍යතුමා කිව්වා, ඒ කටයුත්ත ඉෂ්ට සිද්ධ කරනවා කියලා. ඔබතුමාට එය නැවතත් සිහිපත් කරනවා. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 177දෙනකු සිටිනවා, ගුරු සේවයේ කටයුතු කරන. ඒ සියලුදෙනා කඩිනමින් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මම නියෝජනය කරන දිස්ත්‍රික්කයට යාබද දිස්ත්‍රික්කය වන වවුනියාව දිස්ත්‍රික්කයෙන්, උතුරු පළාතෙන් ලැබුණු ඉල්ලීමකුත් තිබෙනවා. මම හිතනවා, රාජ්‍ය ඇමතිතුමාත් මේ පිළිබඳව දැනුවත් කියලා. 42,000ක් පමණ සිංහල ජනතාවක් උතුරු පළාතේ ඉන්නවා. පාසල් සිසුන් 11,000කට ආසන්න පිරිසක් ඉන්නවා. සිංහල මාධ්‍ය පාසල් 26යි මුළු උතුරු පළාතටම තිබෙන්නේ. වවුනියාවේ 18යි, වැලිඔය 7යි, මන්නාරමේ 1යි. විද්‍යා අධ්‍යාපනය ලබන්න පුළුවන් පාසල් 2යි උතුරු පළාතේම තිබෙන්නේ. ඒ, මඩුකන්ද ජාතික පාසල සහ වවුනියාව පැරකුම් මහා විද්‍යාලය. උතුරු පළාතේ දරුවන්ට සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් ගුරුවරු පිරිසක් නැහැ. ඒ වාගේම උසස් පෙළ පන්ති පැවැත්වෙන පාසල් 7ක් පමණයි මුළු උතුරු පළාතටම තිබෙන්නේ. උතුරු පළාතට සිංහල මාධ්‍ය ගුරුවරුන් බඳවා ගැනීමේ දී බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. පළාත් සභා ක්‍රමය හඳුන්වා දීමත් සමඟ එහි අඩුපාඩු ගැන විවිධ විවේචන තිබුණා. විශේෂයෙන්ම උතුරු පළාතේ සිංහල ජනතාවට, සිංහල ළමුන්ට බරපතළ අසාධාරණයක් වෙන බව මම මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරන්න ඕනෑ. මීට පෙර HND පාඨමාලාව හදාරපු -3.1(ඇ) යටතේ- සිංහල මාධ්‍ය ගුරුවරු 4දෙනෙකු බඳවා ගැනීමට නියමිතව තිබුණා. 11දෙනෙකු විභාගයට පෙනී සිටියා. හැබැයි, ඒ 11දෙනාම විභාගය අසමත්. මේ ළඟදි නැවත වතාවක් පළාත් සභා පාසල්වලට ගුරුවරු බඳවා ගැනීම සඳහා පරීක්ෂණයක් පැවැත්වුවා. ඒ පරීක්ෂණයට සහභාගී වුණු අයගෙන් එක් කෙනෙකු හැරෙන්න අනෙක් සියලුදෙනාම අසමත්. ගරු අමාත්‍යතුමනි, අපි හොයා බැලුවා, උතුරු පළාත් සභාව මඟින් පවත්වන විභාගයෙන් උපාධිධාරීන් අසමත් වෙන්නේ ඇයි කියලා. උතුරු පළාත් සභාව සිංහල මාධ්‍ය ගුරුවරුන් බඳවා ගැනීමේ දී විභාගයට ලබා දෙන්නේ දෙමළ මාධ්‍යයෙන් හදන ප්‍රශ්න පත්‍රය සෘජුව සිංහලට translate කරලා. ගරු අමාත්‍යතුමනි, ඒකයි මේ අය අසමත් වීමට හේතුව.

එහි සමහර ඒවාට උත්තර නැහැ. උත්තර දුන්නාට පාස් වෙන්නේත් නැහැ. ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, ඒ නිසා ඒ ගැන ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න. මේ රටේ කොටසක් වන උතුරු පළාතේ සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරන සිසුන්ට බරපතළ අසාධාරණයක් වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! විවාදයේ කටයුතු අවසන් වනතෙක් කාලය ලබා දීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු මහාචාර්ය චන්න ජයසුමන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීලා වාඩි වෙන්නම්.

Supreme Court එකේ අයට නොතේරුණාට, ඔය ප්‍රශ්නය විසඳන්න තමයි, මම ගැසට් නිවේදනය නිකුත් කරලා රජයේ සේවයේ ඉන්න උපාධිධාරීන් සහ සංවර්ධන නිලධාරීන් සඳහා මුළු දිවයිනටම 2023 මාර්තු මාසයේ 25වන දා විභාගය පවත්වන්න ගියේ. මඩකලපුව දිස්ත්‍රික්කයෙන් ප්‍රමුඛව කණ්ඩායම් තුනක් ගිහිල්ලා, ඒ විභාගය තහනම් කරන්න පෙත්සම් ගොනු කළා. මට පළාත් මට්ටමින් පත්වීම් දීලා ඔය ප්‍රශ්නය විසඳන්න බැරි බව අපි දන්නවා. මෙය ප්‍රායෝගික ප්‍රශ්නයක්. උතුරු පළාතෙන් උපාධිධාරීන් බිහි වෙන්නේ නැත්නම්, අපි පොදුවේ විභාග දෙපාර්තමේන්තුවෙන් විභාගය පවත්වනවා. ඒකට උතුරු පළාත, නැඟෙනහිර පළාත, දකුණ පළාත ඇතුළු සියලු පළාත්වලින් ඔක්කොම අය ඉල්ලුම් කරනවා. එතකොට උතුරුමැද පළාත කියන්නේ මායිම් දිස්ත්‍රික්කය. උතුරුමැද පළාතේ උපාධිධාරීන්

අපට ඉන්නවා. ඒ අය අපට යවන්න පුළුවන් අල්ලපු මායිමට. ඒක නිසා තමයි, පළාත් මට්ටමින් නොපවත්වා ජාතික මට්ටමින් විභාගයක් පැවැත්වීමට තීරණය කළේ. ඒ විභාගය නවත්වලා දැන් මාස 15ක් වෙනවා. මෙන්න මේ ප්‍රශ්නය නිසා තමයි, ඇත්තටම ඔය ගුරුවරුන්ගේ ප්‍රශ්නය ඇති වෙන්නේ. ඔබතුමා ඔය කියන සිංහල ළමයින් 42,000කගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔය නඩුව හිර කර ගෙන ඉන්න අය වග කියන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු චන්න ජයසුමන මන්ත්‍රීතුමා, ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් තිබෙනවා.

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) සන්න ජයසුමන)
(The Hon. (Prof.) Channa Jayasumana)
ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඒ ප්‍රශ්නය විසඳීම සඳහා ඔබතුමා දරපු උත්සාහය පිළිබඳව අපි සතුටු වෙනවා. ගරු අමාත්‍යතුමනි, ඒ ප්‍රශ්නය විසඳන්න බැරිව හිර වෙලා තිබෙන්නේ එතැන නම්, උතුරු පළාතේ තිබෙන සිංහල මාධ්‍ය පාසල් 26ම මධ්‍යම රජයට පවරා ගන්න කියලා මම යෝජනා කරනවා. ඒවා සමගාමී ලැයිස්තුව යටතේ තිබෙන්නේ. ඒක නිසා ඔබතුමාගෙන් ඉල්ලනවා, උතුරු පළාතේ තිබෙන සිංහල මාධ්‍ය පාසල් 26ම මධ්‍යම රජයට පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න, ඒ ළමුන්ට සාධාරණය ඉෂ්ට සිද්ධ කරන්න කියලා. ඒ පියවර ගත්තොත්, ඔබතුමා මේ ජාතිය වෙනුවෙන් විශිෂ්ට සේවයක් කරපු අධ්‍යාපන අමාත්‍යවරයෙක් බවට පත් වෙනවා නිසැකයි. මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු තවරාජා කලෛයි අරසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[ප.ව. 5.31]

ගරු තවරාජා කලෛයි අරසන් මහතා
(මාණ්පුමිකු තවරාජා කලෛ අරසන්)
(The Hon. Thavaraja Kalai Arasan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று எதிர்க்கட்சியினரால் கொண்டுவரப்பட்டு இருக்கின்ற கல்வித்துறை சார்ந்த சிக்கல்கள் சம்பந்தமான ஒத்திவைப்பு வேளைப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்கு வாய்ப்பு வழங்கியமைக்கு நான் நன்றி தெரிவிக்கின்றேன்.

ஒரு நாடாக இருக்கலாம் அல்லது ஒரு பிரதேசமாக இருக்கலாம், கல்வியால் மாத்திரம்தான் அது முன்னேற்றம் அடைய முடியும் என்பது எங்கள் எல்லோரது கருத்தாகும். அந்த அடிப்படையில் கல்வியை மேம்படுத்தவேண்டியது எல்லோரினதும் கடமையாகும். எங்களுடைய கௌரவ அமைச்சர் அவர்களும் கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களும் இங்கு பேசும்பொழுது, கல்வியில் கூடுதலான ஆதிக்கத்தைச் செலுத்துவது அரசியல் என்பதாகக் கூறியிருந்தார்கள். நானும் இதனால் பாதிப்பைச் சந்தித்தவன் என்ற அடிப்படையில், அவர்கள் கூறிய விடயத்தை 100 சதவீதம் ஏற்றுக் கொள்கின்றேன்.

நான் அம்பாறை மாவட்டத்தில் சம்மாந்துறைப் பிரதேசத்தை அண்டியுள்ள ஒரு பகுதியிலே வாழ்ந்து வருகின்றேன். ஓர் எல்லைக் கிராமமாக இருக்கின்ற எங்களுடைய பிரதேசமானது, கடந்த கால யுத்தம் உட்பட எல்லாவற்றாலும் பாதிக்கப்பட்ட ஒரு பிரதேசமாக இருக்கின்றது. கடந்த 03ஆம் திகதி சம்மாந்துறை கல்வி வலயத்துக்கான கல்விப் பணிப்பாளர் நியமனம் வழங்கப் பட்டது. அந்தக் கல்வி வலயத்தில் 71 பாடசாலைகள் இருக்கின்றன. அவற்றில் 27 பாடசாலைகள் தமிழ் பாடசாலைகளாகவும் 44 பாடசாலைகள் முஸ்லிம் பாடசாலை களாகவும் இருக்கின்றன. கிழக்கு மாகாண சபையானது, அந்தக் கல்வி வலயத்துக்கான கல்விப் பணிப்பாளரை முறையாக நியமிக்க வேண்டும் என்பதற்காக நேர்முகப் பரீட்சையொன்றை நடாத்தி, பொருத்தமான ஒருவரை நியமனம் செய்தது. அவர் ஒரு தமிழராக இருந்ததன் காரணமாக முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களும் முன்னாள் கிழக்கு மாகாண சபை உறுப்பினர்களும் அதற்கு எதிர்ப்புத் தெரிவித்தார்கள். அதாவது, அங்கு ஒரு தமிழர் வலயக் கல்விப் பணிப்பாளராக வரமுடியாது என்ற கருத்தை முன்வைத்தார்கள். இதனால் நாங்கள் மிகவும் மோசமானதொரு சூழலைச் சந்தித்தோம்.

இந்த நாட்டின் கல்வித்துறையைச் சீரழிப்பதற்கு அரசியல் பயன்படுத்தப்படுகின்றது என்பதற்கு இது நல்லதோர் உதாரணமாகும். இதனால்தான் நாங்கள் கடந்த காலங்களில் கௌரவ கல்வி அமைச்சர் அவர்களையும் கௌரவ கல்வி இராஜாங்க அமைச்சர் அவர்களையும் சந்தித்து, எங்களுக்கென தனியானதொரு கல்வி வலயம் வேண்டுமெனக் கூறி இருந்தோம். கடந்த காலங்களில் நாங்கள் நியமனங்களில் மாத்திரமல்ல, வளப் பங்கீட்டிலும் புறக்கணிக்கப்பட்டு இருக்கிறோம் என்பதை நான் இங்கு ஆணித்தரமாகக் கூற முடியும். இந்த நாட்டிலுள்ள அரசியல்வாதிகள் தங்களுக்கு இருக்கின்ற அரசியல் செல்வாக்கையும் பலத்தையும் பயன்படுத்தி, குறிப்பிட்ட இடங்களில் கல்வியைச் சீரழித்திருக்கிறார்கள் என்பதை நீங்கள் ஏற்றுக்கொள்ள வேண்டும். ஒரு குடியேற்றக் கிராமமான எங்களுடைய கிராமம் கல்வியில் படிப்படியாக வளர்ச்சியைடைந்து கொண்டிருக்கின்ற இந்தக் காலகட்டத்தில் பல தடைகள் ஏற்படுகின்றன.

இச்சபையில் வளப்பகிர்வு சம்பந்தமாகப் பேசப்பட்டது. உண்மையிலே சில பாடசாலைகளுக்கு இன்றுவரை கணிதம், விஞ்ஞானம், ஆங்கிலம் ஆகிய பாடங்களுக்கு ஆசிரியர்கள் நியமிக்கப்படாமல் இருக்கின்றன. முன்னர் எங்களுடைய பிள்ளைகள் நகர்ப்புறங்களுக்குச் சென்றுதான் உயர் கல்வியைக் கற்கவேண்டியதொரு சூழல் இருந்தது. ஆனால், இப்பொழுது படிப்படியாக முன்னேற்றம் அடைந்து, எங்களுடைய பிரதேசத்திலேயே அந்தக் கல்வியைக் கற்கக்கூடியதாக இருக்கின்றது. எங்களுடைய பிரதேசத்துக்கு இன்னும் பல வளங்களை வழங்கி, அங்கு கல்வி நிலையை உயர்வடையச் செய்ய வேண்டுமென நான் கௌரவ கல்வி அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் உங்களிடம் ஒரு கருத்தை முன்வைக்க விரும்புகின்றேன். கல்முனை வடக்குப் பிரதேச செயலகத்துக்கு முன்னால் சூழற்சி முறையிலான ஓர் உண்ணாவிரதப் போராட்டத்தை மக்கள் தொடர்ந்து 70 நாட்களாக முன்னெடுத்து வருகின் றார்கள். இந்த நாட்டில் இருக்கின்ற பொது நிருவாகம் தங்களுக்கு அநீதி இழைக்கிறது என்ற விடயத்தை முன்வைத்தே இந்தப் போராட்டத்தை முன்னெடுக்கிறார்கள். குறிப்பாக, நேரடியாகப் பாதிக்கப்பட்டவர்களே போராட் டத்தை முன்னெடுத்து இருக்கிறார்கள். இந்த நாட்டில் பொது நிருவாகத்துக்குப் பொறுப்பாக இருக்கின்ற கௌரவ அமைச்சர் அவர்களோ அல்லது அமைச்சின் செயலாளரோ அல்லது

[ගරු තවරාජා කලෙයි අරසන් මහතා]

அதிகாரிகளோ இந்த விடயத்தில் பராமுகமாக இருக்கிறார்கள். குறிப்பாக, இந்த விடயம் பற்றி இந்தச் சபையில் தமிழ் அரசியல்வாதிகள் விளக்கம் தெரியாது பேசுவதாக முஸ்லிம் அரசியல்வாதிகள் பேசியதையிட்டு நான் மிகவும் மனவேதனை அடைகின்றேன்.

கல்முனை 1C என்ற கிராம சேவையாளர் பிரிவை ஊடறுத்துச் செல்லும் கழிவுநீர் வடிந்தோடுகின்ற பகுதியிலுள்ள ஒரு குட்டையை மறித்து தனிநபர் ஒருவர் தடுப்புச் சுவர் அமைத்து, அந்த அரச காணியை மண் போட்டு நிரப்பியிருக்கிறார். அது சம்பந்தமாக நான் கிழக்கு மாகாண ஆளுநர் அவர்களுக்குக் கடிதம் அனுப்பினேன். அதுமாத்திரமன்றி, தகவல் அறியும் சட்டத்தின்மூலம் நிலஅளவைத் திணைக்களத்திடமிருந்து எங்களுடைய கிராம அபிவிருத்திச் சங்கம் அது தொடர்பான தகவல்களையும் பெற்றிருக்கின்றது. மாகாண சபையானது, பொறியியலாளர்களையும் தொழில்நுட்ப உத்தியோகத்தர் களையும் நேரடியாக அவ்விடத்துக்கு அனுப்பி, களஆய்வை மேற்கொண்டு, கழிவுநீர் வடிந்தோடுகின்ற காணிக்குக் குறுக்காகத்தான் தடுப்புச் சுவர் அமைக்கப்பட்டு இருப்பதாக எங்களுக்கு எழுத்துமூலம் அறிக்கை சமர்ப்பித்திருக்கிறது. அதேபோன்று, அது அரசுக்குச் சொந்தமான காணி என்பதாக நிலஅளவைத் திணைக்களமும் எங்களுக்கு அறிக்கை சமர்ப்பித்திருக்கிறது. அது தொடர்பான ஆவணங்களையும் சமர்ப்பித்து இருக்கிறது. இவ்வாறு இந்தப் பிரச்சினை சென்றுகொண்டு இருக்கின்றபொழுது, கிராம அபிவிருத்திச் சங்கம் நீதிமன்றத்துக்குச் சென்று நீதியைக் கோருகின்ற நிலைமையில், கடந்த 22ஆம் திகதியும் 28ஆம் திகதியும் கல்முனை மாநகர சபைக்குச் சொந்தமான வாகனங்களைப் பயன்படுத்தி அந்த இடத்தில் மண் நிரப்பப்பட்டு இருக்கிறது. அந்த இடத்துக்கு கிராம சேவையாளர் சென்று அச்செயற்பாட்டுக்குத் தடைவிதித்தபொழுது, "உங்களைக் கொண்டுபோய் அடைப்போம்" என்று பொலிஸார் எச்சரிக்கை விடுத்திருக்கிறார்கள்.

இவ்வாறு கல்முனை வடக்குப் பிரதேச செயலாளர் பிரிவில் தமிழர்களுடைய பூர்வீக நிலங்களை ஆக்கிரமித்துத் தம்வசப்படுத்துகின்ற செயற்பாடு தொடர்ந்துகொண்டு இருக்கின்றது. நேரடியாக அவ்விடத்தைப் பார்வையிட்டு அறிக்கை செய்யுமாறு நான் கடந்த மாதம் பொது நிருவாகத்துக்குப் பொறுப்பாக இருக்கின்ற அமைச்சர் அவர்களைக் கேட்டிருந்தேன். அதுவும் நடக்கவில்லை. அங்கிருக்கின்ற மாவட்டச் செயலாளர்கூட, அது சம்பந்தமாக எந்த நடவடிக்கையையும் எடுக்கவில்லை. இப்பொழுது இந்த விடயம் நீதிமன்றத்தின் முன்னிலையில் இருக்கின்றது. இவ்வாறு நிலைமை இருக்கும்பொழுது, மண்ணிட்டு நிரப்புகின்ற செயற்பாட்டை கல்முனை மாநகர சபை ஆணையாளர், அந்த மாநகர சபைக்குச் சொந்தமான வாகனங்களைப் பயன்படுத்தியே செய்திருக்கிறார். இது மிக மோசமானதோர் ஊழல் நடவடிக்கையாகும். எனவே, இவ்விடயத்தில் சம்பந்தப்பட்டோர் கூடிய நடவடிக்கை யெடுக்க வேண்டுமென இந்த உயரிய சபையைக் கேட்டு அமர்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.39]

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் எங்களுடைய தேச விடுதலைக்காக, சிங்கள - பௌத்த பேரினவாத ஆக்கிரமிப்புக்கு எதிராக போராடப் புறப்பட்ட முதல் மாவீரன் பொன். சிவகுமாரன் அண்ணன் அவர்களுடைய 50ஆவது ஆண்டு நினைவு நாளாகும். நான் பிறந்த அதே ஆண்டில்தான் அவர், இந்தத் தேசத்தின் விடுதலைக்காக சிங்கள - பௌத்த பொலிஸாரின் அராஜகத்துக்கு முன்னால் தன்னுடைய உயிரைத் தியாகம் செய்திருக்கிறார். அவரை நான் இந்த இடத்தில் நினைவு கூர்கின்றேன்.

அடுத்ததாக, தமிழ்த் தேசத்தின் தேசிய மலரான கார்த்திகைப் பூவை DSI பாதணி உற்பத்தி நிறுவனம் அண்மையில் பாதணி ஒன்றில் பொறித்திருந்தது. அதற்கு நாங்களும் தமிழ் மக்களும் பரவலாக எதிர்வினை ஆற்றியதைத் தொடர்ந்து, அந்த நிறுவனம் மனச்சாட்சி அடிப்படையில் தன்னுடைய தவறை ஏற்றுக்கொண்டு, அந்த உற்பத்திகளை மீளப் பெறுவதாக அறிவித்திருக்கின்றது. அதற்காக நாங்கள் அந்த நிறுவனத்துக்கு எங்களுடைய நன்றியைத் தெரிவித்துக்கொள்கின்றோம்.

இம்மாதம் ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையின் கூட்டத்தொடர் நடைபெறவிருக்கின்ற நிலையில், தற்போது ஐக்கிய நாடுகள் சபையின் நிரந்தர வதிவிடப் பிரதிநிதியும் அவருடைய குழுவினரும் வடக்கு, கிழக்குக்கு விஜயம் மேற்கொண்டிருக்கிறார்கள். அவர்களுடைய விஜயத்தை நாங்கள் வரவேற்கின்றோம். சிங்கள - பௌத்த ஆட்சி யாளர்கள் தமிழர்களுக்கு எதிராக மேற்கொள்கின்ற ஒடுக்கு முறைகளுக்கு எதிராக ஐ.நா. சபையின் நிரந்தர வதிவிடப் பிரதிநிதியும் அவருடைய குழுவினரும் மேற்கொள்கின்ற முயற்சிகளுக்கு எங்களுடைய மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக்கொள்கின்றோம். நாங்கள் இந்தச் சந்தர்ப்பத்தில் அவரூடாக ஐ.நா. சபையிடம் சில கோரிக்கைகளை முன்வைக்க விரும்புகின்றோம். முதலாவது, இலங்கைக்கென விசேட அறிக்கையாளர் - Special Rapporteur - ஒருவரை இலங்கையின் பெயர்குறித்து நியமிக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றோம். அடுத்து, வடக்கு, கிழக்கைப் போரால் பாதிக்கப்பட்ட பிரதேசமாகப் பிரகடனம் செய்து, அதனை அபிவிருத்தி செய்வதற்கு விசேட நிதி ஒதுக்கீடுகளை ஐ.நா. மனித உரிமைகள் பேரவை ஊடாகப் பெற்றுத் தருவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றோம். மேலும், தமிழ் மக்கள்மீது நடைபெற்ற இனப்படுகொலைக்குப் பொறுப்புக்கூறல் கடந்த 12 வருடங்களாக நடைபெறவில்லை. மனித உரிமைகள் பேரவைக்குள் முடக்கப்பட்டிருக்கின்ற இந்தப் பொறுப்புக் கூறல் விவகாரத்தை சர்வதேச குற்றவியல் நீதிமன்றத்தை நோக்கி எடுத்துச் செல்வதற்கு நடவடிக்கையெடுக்க வேண்மெனவும் கேட்டுக்கொள்கின்றோம்.

இன நல்லிணக்கத்தை ஏற்படுத்தல் என்ற பேரில் ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவை அரசியலமைப்புக்கான 13ஆம் திருத்தச் சட்டத்தை முழுமையாக நடைமுறைப் படுத்துவது பற்றியும் மாகாண சபைத் தேர்தலை நடத்துவது பற்றியும் பேசிக்கொண்டிருக்கின்றது. அந்த விடயம் பயனற்றது. ஏனெனில், எங்களால் ஒற்றையாட்சிக்கு உட்பட்ட

எந்தவொரு தீர்வையும் ஏற்றுக்கொள்ள முடியாது. அதனால் தமிழ்த் தேசம், இறைமை, சுயநிர்ணய உரிமை என்பன அங்கீகரிக்கப்பட்ட, சிங்கள தேசமும் தமிழ்த் தேசமும் சமத்துவம் என்ற அடிப்படையில் அமைந்த, ஒரு சமஷ்டி அரசியலமைப்பு உருவாக்கப்படுவதற்கான அழுத்தங்களை சர்வதேச சமூகம் மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றோம். 2016ஆம் ஆண்டு ரணில் - மைத்திரி ஆட்சிக் காலப்பகுதியில் உருவாக்கப்பட்ட புதிய அரசியல் யாப்பு வரைவானது, ඒකීය රාජ්‍ය அடிப்படையில் அமைந்தது. அதையும் நாங்கள் நிராகரிக்கின்றோம் என்பதை இந்த இடத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றோம்.

அடுத்து, வட மாகாண சபைக்கு முன்னால் அரச சாரதிகள் சங்கத்தினர் தொடர் போராட்டமொன்றில் ஈடுபட்டிருக் கிறார்கள். அவர்கள் பல வருடங்களாகப் பணியில் ஈடுபட்டு வருகின்றனர். தாபன விதிக்கோவையின் பிரகாரம், ஐந்து வருடங்கள் கடந்த பிற்பாடு, அவர்களுக்கு இடமாற்றம் வழங்கப்பட வேண்டும். ஆனாலும், இதுவரை அவர்களுக்கு இடமாற்றம் வழங்கப்படவில்லை. இதனால் அவர்கள் மிகவும் மன உளைச்சலுக்கு உள்ளாகி இருப்பதுடன், அவர்களுடைய குடும்பத்தினரும் நிர்க்கதி நிலையில் இருக்கிறார்கள். இம்மாதம் 1ஆம் திகதிக்கு முன்னர் அவர்களுக்கான இடமாற் றங்களை வழங்குவதாக வட மாகாண ஆளுநர் வாக்குறுதி வழங்கியிருந்தபோதிலும், தற்பொழுது அது பிற்போடப் பட்டிருக்கிறது. இதனால் அவர்கள் குழப்பம் அடைந்திருக் கிறார்கள். ஆகவே, வட மாகாண அரச சாரதிகள் சங்கத் தினருடைய கோரிக்கைகள் உடனடியாக நிறைவேற்றப்பட வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, நேற்றைய தினம் நெடுங்கேணிப் பகுதியில் ஒரு பொலிஸ் வாகனம் விபத்துக்குள்ளாகி இருக்கிறது. அந்த வாகனத்தை புளியங்குளம் பொலிஸ் நிலைய OIC செலுத்திச் சென்றிருக்கிறார். அந்த வாகனத்தில் கனகராயன்குளம் பொலிஸ் நிலையப் பொறுப்பதிகாரியும் இருந்திருக்கிறார். ஐந்து பொலிஸார் நிறை மதுபோதையில் இருந்திருக்கிறார்கள். புளியங்குளம் பொலிஸ் நிலையப் பொறுப்பதிகாரி நிறை மதுபோதையில் வாகனத்தைச் செலுத்திச் சென்றதால் ஏற்பட்ட அந்த விபத்தில் 40 பிள்ளைகள் மயிரிழையில் உயிர்தப்பி இருக்கிறார்கள். புளியங்குளம் பொலிஸ் நிலையத்தில் கடந்த ஏப்பிரல் மாதம் 12ஆம் திகதி பொதுமகன் ஒருவர் பதில் OICஆலும் இன்னுமொரு பொதுமகனாலும் தாக்கப்பட்ட சம்பவம் நடைபெற்றிருக்கிறது. அதேபோன்று கடந்த சிவராத்திரி தினத்தன்று வெடுக்குநாறி மலையில் வைத்து நாங்கள் கைதுசெய்யப்பட்டபோதும் இந்தப் பொலிஸ் நிலையப் பொறுப்பதிகாரிகள் அங்கு காடைத்தனமான செயற்பாடுகளில் ஈடுபட்டிருந்தார்கள். இவ்வாறான செயற்பாடுகளில் ஈடுபடுகின்றவர்களுக்கு எதிராக நீங்கள் இனியாவது நடவடிக்கையெடுத்து, அவர்களை அந்தப் பதவிகளிலிருந்து அகற்றுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். இல்லையென்றால், இவர்கள் தொடர்ந்தும் பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் கௌரவ டிரான் அலஸ் அவர்களுடைய அடியாட்களாக இருப்பார்கள் என்பதை நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இன்றைய தினம் மாண்புமிகு ரோஹினி குமாரி விஜேரத்ன அவர்களால் கொண்டுவரப்பட்டு இருக்கின்ற கல்வி மறுசீரமைப்பு தொடர்பாக பிரேரணை வரவேற்கத்தக்கது. தற்பொழுது, இச்சபையில் கௌரவ கல்வி அமைச்சர் அவர்கள் இருக்கின்றார். அவர் மிகவும் நேர்மையாகச் செயற்படுகின்ற அமைச்சர் என்ற வகையில், நான் அவருடைய கவனத்துக்கு ஒரு விடயத்தைக் கொண்டுவர விரும்புகின்றேன். உண்மையிலேயே நீங்கள் கல்விச் சீர்திருத்தத்தை வெற்றிகரமாகச் செய்ய வேண்டுமென்றால், முதலில் இந்த நாட்டிலுள்ள ஒற்றையாட்சி முறைமையை ஒழிக்க வேண்டும். நீங்கள் ஒரு சட்டத்தரணியும்கூட. ஒற்றையாட்சி முறைமை ஒழிக்கப்பட்டு, சமஷ்டி அரசியலமைப்பு கொண்டுவரப்பட்டால் மட்டும்தான் நீங்கள் எதிர்பார்க்கின்ற கல்வி மறுசீரமைப்பை ஏற்படுத்த முடியும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. කාලය අවසානයි.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
நான் முடிக்கிறேன்.

வடக்கு, கிழக்கிலுள்ள கல்வித்துறை சார்ந்தவர்கள் மத்திய அரசாங்கத்துக்கு எடுபிடிகளாக இருக்க வேண்டும் என்றுதான் எதிர்பார்க்கப்படுகின்றார்கள். இதனால் அவர்களால் நேர்மையாகக் கடமையாற்ற முடியாத நிலைமை காணப்படுகின்றது. இந்த நிலைமை மாற்றப்பட வேண்டுமாக இருந்தால், உண்மையிலேயே கல்வித்துறை மேம்பட வேண்டுமாக இருந்தால், ஒற்றையாட்சி முறைமை ஒழிக்கப்பட்டு, வடக்கு, கிழக்கை சிங்கள - பௌத்த மயமாக்க வேண்டுமென்ற நிகழ்ச்சித்திட்டமும் நீக்கப்பட வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. කාලය අවසන් වෙලා තිබෙන්නේ.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
தயவுசெய்து ஒரு நிமிடம் கொடுங்கள்!

அடுத்து, கிளிநொச்சியிலுள்ள பொறியியல் பீடத்தில் நடைபெற்ற ஒரு சம்பவத்தைச் சொல்கின்றேன். அங்கு பணியாற்றுகின்ற சாலிய சம்பத் என்ற சிரேஷ்ட விரிவுரையாளர் மிகவும் இனவாதமாகச் செயற்படுகின்றார். அங்குள்ள தமிழ் மாணவர்களை அச்சுறுத்தி, அவர்களை அங்குள்ள விகாரைக்கு வழிபாட்டுக்குக் கொண்டு செல்கின்றார். இதுதான் வடக்கில் இருக்கின்ற பெரும்பான்மையின அதிகாரிகளின் செயற்பாடாக இருக்கின்றது. இதனைத் தமிழ் அதிகாரிகள் கண்டும் நடவடிக்கையெடுக்க முடியாதவர்களாக இருக்கின்றார்கள். இவற்றுக்கெல்லாம் முற்றுப்புள்ளி வைக்கப்பட வேண்டுமெனக் கேட்டு நிறைவுசெய்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජගත් ප්‍රියංකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.46]

ගරු ජගත් ප්‍රියංකර මහතා
(மாண்புமிகு ஜகத் பிரியங்கர)
(The Hon. Jagath Priyankara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙන් වෙලා තිබෙන්නේ ඉතාම කෙටි කාලයක් නිසා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ගැටලු සම්බන්ධව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී අපේ දිස්ත්‍රික්කයට අදාළ ගැටලු කිහිපයක් පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවන්න මම බලාපොරොත්තු වෙනවා.

ප්‍රධාන වශයෙන්ම මට අධ්‍යාපනයේ වටිනාකම තේරුණා, මට කලින් කථා කළ සෙල්වරාජා කජේන්ද්‍රන් මැතිතුමාගේ කථාවෙන්. මම එතුමාගේ කථාවේ සිංහල පරිවර්තනයට ඇහුම්කන් දුන්නා. එතුමා දිගින් දිගටම කථා කළේ සිංහල බෞද්ධ පොලීසියට එරෙහිව දිවි පුදපු අය ගැන, සිංහල බෞද්ධ පාලනය ගැන. ගරු අමාත්‍යතුමනි, අපට තිබෙන ලොකුම අභියෝගය තමයි එතුමන්ලාගේ තිබෙන මේ ආකල්ප වෙනස් කිරීම. සිංහල වේවා, දෙමළ වේවා, මුස්ලිම් වේවා, බෞද්ධ වේවා, කිතුනු වේවා, ඉස්ලාම් වේවා ඒ සියලුදෙනාගේම ආකල්ප වෙනස් කරලා මනස සකස් කිරීම අපට අධ්‍යාපනයෙන් තමයි පටන් ගන්න වෙන්නේ. අධ්‍යාපනය ගැන බොහොම කුඩා ප්‍රමාණයක් තමයි එතුමා කථා කළේ. ඉතින් ඒ ගැන මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ප්‍රධාන වශයෙන්ම අධ්‍යාපනය කියන විෂය පළාත් සභාවට අයිති වෙලා තිබෙන තත්ත්වය තුළ, පුත්තලම දිස්ත්‍රික්කයේ ගුරු හිඟය ගැන මා යමක් කිව යුතුයි. අපි වයඹ පළාත් සභාවට ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ වෙනකොට වයඹ පළාත් සභාව මඟින් ගුරුවරුන් බඳවා ගැනීම් කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒත් මම හිතන්නේ නැහැ, මේ බඳවා ගැනීම් කටයුතුවලින්වත් පුළුවන් වෙයි කියලා අපට අවශ්‍ය ඉලක්කයට ළඟා වෙන්න. අපේ හලාවත සහ පුත්තලම අධ්‍යාපන කලාප දෙකට අදාළව පාසල් 371ක් තිබෙනවා, ගරු අමාත්‍යතුමනි. මේ වෙනකොට එහි ගුරු හිඟය 2,102ක් වෙනවා. ගුරු තනතුරු 2,102ක ඉතා බරපතළ හිඟයක් දිස්ත්‍රික්කය තුළ පවතිනවා.

මම තවත් කාරණයක් පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි. මෙවැනි ගුරු හිඟයක් පවතින අතරේ සමහර පාසල්වල අවශ්‍ය ළමුන් සංඛ්‍යාව නැහැ. මේ තිබෙන තත්ත්වය තුළ මට නිරීක්ෂණය වෙලා තිබෙනවා, 1 සිට 11 වසර දක්වා ළමයි ඉන්න පාසල් දෙකක්. ඉන් එකක ළමයි 95යි ඉන්නේ, අනෙක් එකේ 98යි ඉන්නේ. හැබැයි, එක පාසලක ගුරුවරු 17දෙනෙක් ඉන්නවා, තවත් එකක 15දෙනෙක් ඉන්නවා. එතකොට ළමයි පස්දෙනෙකුට, හයදෙනෙකුට ගුරුවරයෙක් වෙන් වෙලා තිබෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා මේ සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම වැදගත් කියලා. මොකද, එක පැත්තකින් මේ රජයේ ඉඩම්, අනෙක් පැත්තෙන් රජයේ ගොඩනැඟිලි, අනෙක් පැත්තෙන් ගමේ ඉස්කෝලයක් තිබෙනවා කියන සංකල්පය එතැන තිබෙනවා. දිස්ත්‍රික්කයේ විශාල ගුරු පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙනවා. නමුත්, මේ ළමයින් පස් හයදෙනෙකුට එක ගුරුවරයෙක් වෙන් වෙනවා කියන කාරණය සැලකිල්ලට අරගෙන එක්කෝ, මේ පාසල් ඒකාබද්ධ කරන්න ඕනෑ, නැත්නම් -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුයි" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு ஜகத் சமரவிக்ரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. JAGATH SAMARAWICKRAMA left the Chair, and THE HON. PREMNATH C. DOLAWATTE took the Chair.

ගරු ජගත් ප්‍රියංකර මහතා
(மாண்புமிகு ஜகத் பிரியங்கர)
(The Hon. Jagath Priyankara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සුදුසු වැඩ පිළිවෙළක් සකස් කිරීම අතිශයින් වැදගත් කියලා මා විශ්වාස කරනවා. අපේ දිස්ත්‍රික්කවලදී අධ්‍යාපනයට ඍජුවම බලපෑම් සිදු කරන තවත් කාරණයක් තමයි ප්‍රවාහන පහසුකම්.

ප්‍රවාහන පහසුකම් සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයත් සම්බන්ධ වෙලා "සිසු සැරිය" වාගේ වැඩසටහන් ක්‍රියාත්මක වන ස්ථානවල ඉතා පහසු තත්ත්වයක් පැවැතුණත් සමහර ස්ථානවල එහෙම නැහැ. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශයත් මැදිහත් වෙලා, අපේ ප්‍රදේශයේ ආනමඩුව, නාත්තණ්ඩිය, වෙන්නප්පුව යන ආසනවල බොහෝ ස්ථානවලට ඒ ප්‍රවාහන පහසුකම් සපයන්න පුළුවන්කම තිබෙනවා නම් හොඳයි. මොකද, අපි සමහර අවස්ථාවල ඩිපෝවලට කථා කළාම බස් තිබෙනවා, රියැදුරන් නැහැ කියනවා. පසුගිය දවසක අපි මැදිහත් වෙලා, වෙන්නප්පුව ඩිපෝවෙන් උදේ වරුවට බස් රථයක් ගත්තා. නමුත්, සවස එන්න රියැදුරෙක් නැහැ කිව්වා. මේ වාගේ කුඩා කුඩා දේවල් නිසා දෙමාපියන්ට දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් විශාල වියදමක් දරන්න සිද්ධ වෙනවා. ඒ සඳහා යම් සහනයක් ලබා දෙන්න හැකියාවක් තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා.

ඊළඟ කාරණය තමයි, විදුහල්පතිවරුන් පිළිබඳ ප්‍රශ්නය. වැඩ බලන විදුහල්පතිවරුන් විවිධ ගැටලුවලට මුහුණ දෙමින් තිබෙන අවස්ථාවක, අනධ්‍යයන කාර්ය මණ්ඩලවල පුරප්පාඩුත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම තමයි, පාසල්වල ආකර්ෂණීය විෂයන් සඳහා සම්පත්වල අඩුවක් තිබෙනවා. භාෂාව වෙන්න පුළුවන්, තාක්ෂණය වෙන්න පුළුවන්, ඒ වාගේ දේවල් සඳහා තිබෙන පහසුකම්වල අඩුකමක් අපි දකිනවා. ඒ නිසා වයඹ පළාතේ විශේෂයෙන්ම කුරුණෑගල සහ පුත්තලම කියන දිස්ත්‍රික්ක පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම අධ්‍යාපන කලාපය තුළ ගුරුවරුන්ගේ සහ සම්පත්වල බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒක නිසා ප්‍රශ්නවලට උත්තර දෙනකොට, පොදුවේ උත්තර නොදී මේවා විශේෂ ස්ථාන විධියට සලකා මේ ගැටලු නිරාකරණය කරන්න. ඔබතුමා සුවිශේෂ කාර්යභාරයක් මේ කාලපරිච්ඡේදයේදී ඉෂ්ට කරමින් ඉන්නවා කියන එක අපි දන්නවා. ඒ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන්න කියන ඉල්ලීම විශේෂයෙන්ම මම කරනවා.

ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රයේ අපි හැමදාමත් දකින දෙයක් තමයි වෘත්තීය අරගළ. අපි විශ්වාස කරනවා, ඒ වෘත්තීය අරගළවලදී ගුරුවරයාට, විදුහල්පතිවරයාට, අධ්‍යාපන ක්ෂේත්‍රයේ අයට වැඩි දීමනා, අවස්ථා ප්‍රමාණයක් ලබා දිය යුතුයි කියලා. ඒක නිසා මේ ගැටලු ඇති වෙන්න කලින් ඒවාට මැදිහත් වෙනවා නම්, වඩා හොඳයි කියලා මම හිතනවා.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(මාණ්පුමිකු (කලානිධි) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
මුදල් අවශ්‍යයි නේ.

ගරු ජගත් ප්‍රියංකර මහතා
(මාණ්පුමිකු ஜகத் பிரியங்கர)
(The Hon. Jagath Priyankara)
මුදල් අවශ්‍යයි තමයි. ඒක හරි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. මම කියන්නේ, ප්‍රශ්නයක් එනකොට අපි ඒ ප්‍රශ්නය විසඳනවා නේ.

ප්‍රශ්නයක් එනකොට, ස්ට්‍රයික් කරනකොටම විසඳනවා. *[බාධා කිරීමක්]* ඒක ඉතාම පැහැදිලිව තේරෙනවා. ගුරු වෘත්තීය සංගම්වල අයට අපි කියනවා, ඔබ ගුරුවරුන් මිසක්, බස් රථ රියැදුරන් නොවෙයි කියන එක. ඒ නිසා ගුරුවරුන්ගේ අභිමානය ආරක්ෂා වන විධියේ වඩා නිර්මාණශීලී වෘත්තීය සටන් කෑදවීම තමයි ඔබට අවශ්‍ය. එහෙම නොවුණොත් ළමයින්ගේ අධ්‍යාපනය නැවතිලා විභාග නවතිනකොට, ඒවායේ ප්‍රතිඵල පරක්කු වෙනකොට, විශ්වවිද්‍යාලයට ඇතුළු වීම පරක්කු වෙනකොට කාටවත් නොවෙයි punishment එක දීලා තිබෙන්නේ; ඇමතිවරුන්ටත් නොවෙයි, ආණ්ඩුවලටත් නොවෙයි, මේ රටේ අධ්‍යාපනය ලබන දරු දැරියන්ගේ ජීවිත තමයි අවුරුද්දෙන් හමාරෙන් ආපස්සට ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා ගුරු විදුහල්පති වෘත්තීය සමිති සියල්ලගෙන්ම මම ඉල්ලීමක් කරනවා, අධ්‍යාපන කටයුතු අඩාළ වන ඒවා හැර ඔබට ගැළපෙන වෘත්තීය සටන් පාඨ තෝරා ගන්න කියලා. ඒ වාගේම තමයි විශ්වවිද්‍යාලයේ අපේ මිත්‍රයින්ගෙන්, ශිෂ්‍ය ව්‍යාපාරයේ මිත්‍රයින්ගෙන් අපි ඉල්ලනවා, විශ්වවිද්‍යාලය තුළ අපි කටයුතු කරපු ආකාරයට වඩා වෙනස් විධියට හිතලා අධ්‍යාපනයට අවශ්‍ය කරන නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන්න කියලා. ඒ ප්‍රතිසංස්කරණ අලුතෙන් වැළඳගන්න සියලුදෙනාම කැප වෙමුයි කියන යෝජනාව කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අලි සබ්රි රහීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[පි.ප. 5.52]

ගරු අලි සබ්රි රහීම් මහතා
(மாண்புமிகு அலி சப்ரி ரஹீம்)
(The Hon. Ali Sabri Raheem)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைමைதாங்கும் உறுப்பினர் அவர்களே, புத்தளம் மாவட்டத்தில் 400 පාඨශාලාවන්ට ඇති ගුරු හිඟය පියවීම සඳහා ඔබතුමා ගත් ක්‍රියාමාර්ගය ගැන මුලින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, ඒ ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රියාවලියේදී ඉතිහාසයේ පළමු වතාවට ඒ ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වුණු සියලුම නිලධාරීන්ට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, ඒ ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රියාවලියේදී ඉතා ඉහළ ප්‍රතිඵල ලබා දුන් ඒ ගුරුවරු

[ගරු අලි සබ්රි රහීම් මහතා]

උණ්මයිලේ ඉව්වාරු අපරික්කප්පටුකින්ර කාණිකළිල් අන්ත මක්කළ් පාරම්පරියමාකප් පයන්පටුත්ති වන්ත buildings ඉරුක්කින්රන, quarters ඉරුක්කින්රන, උප්පුක් කළඤ්සියම් ඉරුක්කින්රතු. ඉවෙයෙල්ලාම් ඉරුක්කත්තක්කතාකත්තාන් ඉන්ත නිලත්තෙ වේරොරුවරුක්කුක් කොටුප්පතර්කාන මුයර්සිකළුම් වේලෙත්තිට්ටංකළුම් නටෙපෙර්රුක්කොණ්ටිරුක්කින්රන. අතනාල් ඉන්ත උයර් සපෙයිල් එංකළුටෙය මාණ්පුමිකු සනාතිපති, එංකළුටෙය පිරතමර්, කාණි අමෙච්චර් මර්රුම් අරසාංකම් මුතලානෝරිටම් නාංකළ් තයවාකක් කේට්ටුක් කොළ්වතාවතු, ඉන්ත විටයංකළිල් තලෙයිට්ටු ඉන්තක් කාණික් කොළ්ළෙයර්කළිටමිරුන්තු පුත්තළම් මක්කළින් කාණිකළෙප් පාතුකාත්තු, අතනෙ උරියවර්කළුක්කු වළංකුවතර්කාන ඒර්පාටුකළෙච් චෙය්යවේණ්ටුම් එන්රුතාන්.

අතේපෝන්රු, පුත්තළම් මාවට්ටත්තින් කර්පිට්ටියිලිරුන්තු උටප්පු වරෙයුමාන සුමාර් 70 කිලෝමීට්ටර් අළවිලාන පිරතේසත්තිල් උළ්ළ නිලත්තිල් විවසායම් චෙය්යප්පට්ටු වරුකින්රතු; පාරම්පරියමාක, ඒරක්කුරෙය 50 වරුටංකළුක්කු මුර්පට්ට කාලත්තිලිරුන්තු අංකු විවසාය නටවටික්කෙකළ් මේර්කොළ්ළප්පටුකින්රතු. තම්පුළ්ළෙ, තම්පුත්තේකම, නුවර පෝන්ර ඉටංකළිල් ඉන්ත විවසාය උර්පත්තිප් පොරුට්කළෙ විර්පනෙ චෙය්කින්ර සන්තෙකළ් අළකාන මුරෙයිල් අමෙක්කප්පට්ටිරුක්කින්රන. ආනාල්, පුත්තළත්තිල් නුරෙච්චෝලෙයිල් ඉරුක්කින්ර මරක්කරිච් සන්තෙ අරෙකුරෙයාන මුරෙයිල්, අතාවතු කූරෙ ඉල්ලාමල්, චරියාන අමෙප්පුළ්ළ building ඉල්ලාමල්, අපිවිරුත්ති චෙය්යප්පටාතු ඉරුන්තුකොණ්ටිරුක්කින්රතු. අන්ත මක්කළුටෙය මරක්කරිකළ් වෙයිලිල් කාය්න්තුම් මළෙයිල් නනෙන්තු අළුකියුම් පෝකින්ර නිලෙමෙයිලේතාන් කොළුම්පුක්කු එටුත්තුවරප්පටුකින්රතු. අතනාල්, ඉන්ත ජාතික ප්රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මූලම් ඉතනෙ නවීනප්පටුත්තික් කොටුක්කුම්පටි නාංකළ් මාණ්පුමිකු සනාතිපතියිටම් තයවාකක් කේට්ටුක් කොළ්කින්රෝම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. member, please conclude your speech.

ගරු අලි සබ්රි රහීම් මහතා
(මාණ්පුමිකු අලි සබ්රි රහීම්)
(The Hon. Ali Sabri Raheem)
Okay. Then, thank you very much, Sir.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ජානක වක්කුඹුර රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු ජානක වක්කුඹුර මහතා (පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු ஜானக வக்கும்புர - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura - State Minister of Provincial Councils, Local Government and Environment)
මට විනාඩි 6ක් තිබෙනවා කිව්වා නේද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 6ක් ලබා දෙන්න විධියක් නැහැ.

[අ.භා. 5.59]

ගරු ජානක වක්කුඹුර මහතා
(මාණ්පුමිකු ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් අපේ ඇමතිතුමාට උත්තර දෙන්න මේ වෙලාවේ විපක්ෂයේ කවුරුවත් සභාවේ නැහැ. කල් තැබීමේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමියවත් සභාවේ නැහැ. උදේට TV එකට පෙනෙන්න කථා කරලා මේගොල්ලෝ යනවා. ඇමතිතුමා ලබා දෙන උත්තරය අහන්න කවුරු හරි සභාවේ ඉන්න ඕනෑ නේ. උදේම කථා කළාම ඒ කොටස නේ මාධ්‍යයට ගන්නේ. ඒ නිසා ඒ අවස්ථාවට මෙතුමන්ලා ඉන්නවා.

ගරු ඇමතිතුමනි, මේ අයහපත් කාලගුණ තත්ත්වය නිසා පාසල් විශාල සංඛ්‍යාවකට ගංවතුරෙන් හානි සිදු වී තිබෙනවා. මම ඊයේ පාසල් 2කට ගියා. මම ඊයේ දවසේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා, පසුව රෑ 12.00 වෙනකන් ගංවතුරට හසුවුණු ගෙවල් ගණනාවකටම ගියා. ගංවතුරේ සෑඩ පහරට අසුවෙලා දරුවන්ගේ පෙළ පොතේ ඉඳලා සියල්ලම නැති වෙලා තිබෙනවා. මඩ වතුර නිසා දරුවන්ගේ පාසල් ඇඳුම් තනිකරම කහ පාට වෙලා. සල්ලි තිබෙන අය ඒවා අලුතෙන් දරුවන්ට අරගෙන දුන්නත්, බැරි අයට ඒක කරගන්න අමාරු වෙයි. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, නිල ඇඳුම් සහ පෙළ පොත් ටික ඒ අයට ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා, ගරු ඇමතිතුමනි. ඒ වාගේම තමයි, ඕනෑම ඇඳුමකින් සැරසිලා දරුවන්ට තමන්ගේ අධ්‍යාපන කටයුතු කරන්න පාසලට යන්න අවස්ථාව ලබා දෙන්න කියලාත් ඉල්ලා සිටිනවා.

ගුරු හිඟය කියන්නේ හැමදාම තිබිච්ච දෙයක්. මෙවර ගුරුවරු වැඩි ප්‍රමාණයක් බඳවා ගන්න බැරි වෙලා තිබෙන කාරණය ගරු ඇමතිතුමා හැමදාම පැහැදිලි කරනවා. මේ වනකොට පළාත් සභාවලිනුත් ගුරුවරු යම් ප්‍රමාණයක් බඳවා ගන්න කටයුතු කර තිබෙනවා. සබරගමුව පළාත් සභාව හරහාත් මේ මාසය ඇතුළත යම් පත්වීම් ප්‍රමාණයක් ලබා දෙන්න කටයුතු කරමින් සිටිනවා. ඒ වාගේම පාසල්වල තිබෙන අඩුපාඩු සම්පූර්ණ කරන්න මේ අවුරුද්දේ සෑම පළාතකටම රුපියල් මිලියන 560 ගණනේ අපේ අමාත්‍යාංශය හරහා ලබා දුන්නා. මේ අඩුපාඩු සම්පූර්ණ කරන්න පළාත් සභාවේ මුදල්වලට අමතරව තමයි අපි ඒ මුදල් ලබා දුන්නේ. පාසල්වල අඩුපාඩු සම්පූර්ණ කරන්න රජයක් හැටියට අපි විශාල වැඩ කොටසක් ඉෂ්ට සිද්ධ කරනවා. අපි කොච්චර අඩුපාඩු සම්පූර්ණ කළත් තවත් අඩුපාඩු තිබෙනවා. පාසල්වල දරුවන් වැඩි වෙනකොට ගොඩනැඟිලිත් හදන්න ඕනෑ. ඒවා repair කරන්නත් ඕනෑ; පැරණිම ගොඩනැඟිලි අලුත්වැඩියා කර දෙන්න ඕනෑ. ඒ වාගේම තමයි ගුරු කාර්යමණ්ඩලවල තිබෙන ගැටලු විසඳන්නත් ඕනෑ. හැබැයි දරුවන්ගේ පැත්තෙන් බැලුවාම දරුවන් වැඩි දෙනෙක් අද පාසල් යනවා හා සමානවම පෞද්ගලික පන්තිවලට යනවා. පාසල් ඉස්සරහ පෞද්ගලික පන්ති වැඩි ප්‍රමාණයක් තිබෙනවා. නිදහස් අධ්‍යාපනය ගැන අද ඔක්කොම කථා කරනවා. විශාල මුදලක් ඒ වෙනුවෙන් වියදම් කරන්නත් සිදු වෙලා තිබෙනවා. ප්‍රශ්නයක් ඇති වෙන නිසා ඒ ගැන කවුරුවත් මුකුත් කියන්නේ නැහැ. පාසලෙන් කරන කටයුත්ත අපි හරියාකාරව

ඉෂ්ට කර දෙනවා. ගුරුවරුන්ගේ ප්‍රශ්නය විසඳන්නත් ඇමතිතුමා ලොකු මහන්සියක් දරනවා. ගම්බද පාසල්වල ගුරු හිඟය තදටම තිබෙනවා. මොකද, ගුරුවරු වැඩි ප්‍රමාණයක් ඉන්නේ නගරබද පාසල්වල. ගම්බද පළාත්වල දෙමව්පියන් ඒ පාසල්වලට ගුරුවරු ඉල්ලා ගෙන කලාප කාර්යාලවලට එනවා.

මම ළඟදී පොතුපිටිය විද්‍යාලයේ සුහුරු පන්ති කාමරයක් විවෘත කරන්න ගියා. අපි පළාත් සභාව හරහා අපේ අමාත්‍යාංශයෙන් ඒකට රුපියල් මිලියන 24ක් - ලක්ෂ 240ක් - වැය කළා. එවැනි මුදලක් වැය කරලා තමයි අපි ඒ පන්ති කාමරය ලබා දුන්නේ. අර දහයේ ඒවා නොවෙයි. පසුගිය මාසයේ අපි රුපියල් මිලියන 365ක් දීලා සුහුරු පන්ති කාමර 17ක් විවෘත කළා. ඒවා ඒ දරුවන්ට ඉගෙන ගන්න පුළුවන් තත්ත්වයට අංග සම්පූර්ණ ලෙස අපි හදලා දීලා තිබෙනවා.

මම කියපු පොතුපිටිය විද්‍යාලයේ විශාල ගුරු හිඟයක් තිබෙනවා. කලවාන තමයි මගේ ආසනය. ඒ වාගේ දුෂ්කර පාසල්වල ගුරු හිඟය වැඩියි. ද්‍රවිඩ පාසල්වලත් ඒ වාගේම ගුරු හිඟයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ලොකු වෙහෙසක් ගන්නවා, ඒ ප්‍රශ්නය විසඳන්න. ඒක ඔබතුමාටත් විසඳන්න බැරි තත්ත්වයක තිබෙනවා. පළාත් සභාවලටත් බලය දීලා තිබෙනවා, යම් තාක් ඒ ප්‍රශ්නය විසඳන්න. ගරු ඇමතිතුමනි, ඒ වැඩ කටයුතු සඳහා ලොකු මහන්සියක් දරන එක ගැන ඔබතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. ඡන්දය පැත්තකින් තියලා ඔබතුමා වැඩ කරනවා. අපි එය අගය කරනවා. ඒ වාගේම තමයි අමාත්‍යාංශයට අලුතින් පත් වුණු ලේකම්තුමියත්. ඕනෑම වෙලාවක යමක් කිව්වාම එතුමිය අහලා බලලා හොයලා කියනවා. රෑ කථා කරලා කිව්වත්, ඒ ගැන හොයලා අපට කියනවා. ඊයේ රෑත් ගරු ඇමතිතුමා කථා කරලා කිව්වා, දරුවන්ගේ තිබෙන ගැටලුවක් ගැන. එතුමිය ඒ වෙලාවේත් කිව්වා, අපේ පැත්තෙන් කරන්න පුළුවන් උදව්වක් තිබෙනවා නම් කරනවා කියලා. මේ රටේ දරුවන් වෙනුවෙන් කරන කාර්යභාරය සාර්ථක කර ගන්න අපි ඔබතුමාට සුබ පතනවා, ගරු ඇමතිතුමනි. පාසල් පද්ධතිය තුළ ගුරුවරුන්, දෙමව්පියන් කියන හැමෝටම ප්‍රශ්න තිබෙනවා.

අපි හැම වෙලාවේම ගුරු ගෞරවය තියලා කටයුතු කරන්න අපි කැමැතියි. අපි ගුරුවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, ස්ට්‍රයික් කරනවාට වඩා දරුවන්ගේ පැත්තෙන් හිතලා කටයුතු කරන්න කියලා. රජයක් හැටියට යමක් දෙන්න පුළුවන් නම් අපි ඕනෑම වෙලාවක ගුරුවරයාගේ පැත්තේ ඉන්නේ. කවදාවත් ඒකට විරුද්ධ වෙන්නේ නැහැ. ඒ අයට සහනයක් දෙන්න පුළුවන් නම් හැම වෙලාවේම ඒ සහනය ලබා දෙන්න අපි කටයුතු කරනවා. එම කාර්ය මණ්ඩලවල ඉන්න හැමෝටම ඒ සහනය දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. පසුගිය කාලයේ දරුවන්ට ඉගෙන ගන්න බැරි වුණා, යම් යම් ප්‍රශ්න නිසා. කොවිඩ්වලින් පස්සේ යාන්තම් නිවැරැදි මාර්ගයට ඇවිල්ලා වැඩ කටයුතු කරන කොට ඒ අයට සහයෝගය ලබා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

අපේ අධ්‍යාපන ඇමතිතුමා, ඒ වාගේම පළාත් නවයේම අධ්‍යාපන ලේකම්වරු ඇතුළු අපේ ආණ්ඩුකාරවරුන් විශාල කාර්යභාරයක් මේ කාලයේ ඉෂ්ට කරනවා. මේ ගුරු හිඟය විසඳලා දෙන්න ඒ අවශ්‍ය කරන මැදිහත් වීම කරන්න. ගුරුවරු 13,500ක් විතර මේ වෙනකොට බඳවා ගෙන තිබෙනවා. නමුත් අවුරුද්දකට විශාල ගුරුවරුන් ප්‍රමාණයක් විශ්‍රාම යනවා. ඒ හා සමානම පිරිසක් අපි හැම අවුරුද්දේම බඳවා ගන්න ඕනෑ. ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. හැම අවුරුද්දකටම සැරයක්, ඒ අවුරුද්දේ දෙසැම්බර් මාසයේදී ගණනය කරලා, ඒ විශ්‍රාම යන ගුරුවරු ප්‍රමාණය ඊට කලින් බඳවා ගත්තොත් හැම දාම ගුරු ප්‍රශ්නය විසඳලා දෙන්න අපට පුළුවන් වෙයි. එක කලාපයක ගුරුවරු වැඩිපුර පිරිසක් හිටියත් ප්‍රශ්නයක් නැහැ. ඕනෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින් මේ වනවිට සංවර්ධන නිලධාරීන් අතිරික්තව කොච්චර ඉන්නවාද කියලා ඇහුවොත්, දෙතුන් සියයකට වැඩිය ඉන්නවා. එහෙම නම් ගුරුවරුන් වැඩිපුර හිටියාට කමක් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට පුළුවන්කමක් තිබෙනවා නම් මම කිව්වා වාගේ ඒ විධියේ ප්‍රතිපත්තියක් හදන්න. අවුරුද්ද අවසානයේ විශ්‍රාම යන ප්‍රමාණය අනුව ඊළඟ අවුරුද්දේ ජනවාරි 1වැනි දා වෙනකොට පත්වීම් දෙන්න වැඩ කටයුතු කරන්න. මේ සියලු කටයුතු කරන්න ඔබතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි, ගරු රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට සෑහෙන කාලයක් ලැබුණා. විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙකුවත් මේ අවස්ථාවේ සභාවේ හිටියා නම් හොඳයි. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙන එනවා නම්, විපක්ෂයෙන් කවුරුන් හෝ සභාවේ සිටිය යුතුයි කියලා ස්ථාවර නියෝග වෙනස් කරනකොට රීතියක් දමන්න ඕනෑ. මම ඒක නිරීක්ෂණය කරනවා, ගරු ඇමතිතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
යෝජනාව ගෙනෙන කෙනාවත් සභාවේ සිටිය යුතුයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔව්, අඩු තරමේ යෝජනාව ගෙනෙන කෙනාවත් සභාවේ සිටිය යුතුයි.

මීළඟට, ගරු අ. අරවින්ද් කුමාර් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විවාදය අවසන් කරන්න පුළුවන්.

[ප.ව. 6.06]

ගරු අ. අරවින්ද් කුමාර් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அ. அரவிந்த் குமார் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. A. Aravindh Kumar - State Minister of Education)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாங்கள் கல்வி அமைச்சுடன் சம்பந்தப்பட்ட ஒத்திவைப்புவேளைப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு இருக்கின்றோம். அரசியல் நோக்கோடு கொண்டுவரப்பட்ட ஒரு பிரேரணையாகவே நான் இந்தப் பிரேரணையைப் பார்க்கின்றேன். பட்டு தேசபாலன வாசி ගන්න ගෙනාපු යෝජනාවක් හැටියටයි මම මේ යෝජනාව දකින්නේ. කමක් නැහැ. කෙසේ වෙතත், ඒ ගැනත් කථා කරන්න එපා යැ. නැත්නම් විපක්ෂයේ ඉන්න අයට වෙන වැඩක් නැහැ නේ.

கௌரவ கலாநிதி சுசில் பிரேமஜயந்த அவர்களின் வழிகாட்டலின்கீழ் சரியானதொரு பாதையில் சென்றுகொண்டு இருக்கும் ஓர் அமைச்சாகவே நான் கல்வி அமைச்சைப் பார்க்கின்றேன். இப்பொழுது அவரோடு இணைந்து செயலாற்றுவதற்குக் கல்வி அமைச்சுக்குச் சிறந்ததொரு செயலாளர் நியமிக்கப்பட்டு இருக்கின்றார். இந்த இருவரோடும் இணைந்து நாங்கள் பயணித்துக்கொண்டு இருக்கின்றோம். இப்பொழுது நாங்கள் கல்விச்

[ගරු අ. අරවින්ද් කුමාර් මහතා]

சீர்திருத்தத்தைக் கொண்டுவருவதற்கு ஆழமாகவும் வேகமாகவும் தீவிரமாகவும் செயற்பட்டுக்கொண்டு இருக்கின்றோம். இந்தச் சீர்திருத்தமானது, மிக விரைவில் கொண்டுவரப்பட இருக்கின்றது. அவ்வாறு கொண்டுவரப்பட்டால், அது எமது நாட்டின் கல்வித்துறையில் இதுவரை காலமும் இல்லாத பாரியதொரு மாற்றத்தை ஏற்படுத்தக்கூடியதாக அமையும் என்பதில் எவ்வித மாற்றுக் கருத்தும் கிடையாது.

அண்மையில் நாங்கள் அதிபர் தரம் IIIக்கான நியமனங்களை வழங்கினோம். இந்நியமனத்தைப் பெற்றுக் கொள்வதற்குக் காத்திருப்போர் பட்டியலில் உள்ளவர்களுக்கும் வெகுவிரைவில் நியமனம் வழங்கப்படுவதற்கான வாய்ப்பு இருக்கின்றது. இப்பொழுது நாங்கள் ஆசிரியர் பற்றாக்குறையை கொஞ்சம் கொஞ்சமாகத் தீர்த்து வருகின்றோம். பட்டதாரிகளை ஆசிரியர் சேவைக்குள் உள்வாங்கும் பணியானது, மாகாண மட்டத்திலும் மத்திய அரசாங்க மட்டத்திலும் இடம்பெற்று வருகின்றது. இங்கு பல்வேறு குற்றச்சாட்டுக்கள் முன்வைக்கப்பட்டன. அவை தொடர்பில் நாங்கள் அலட்டிக்கொள்ளவேண்டிய அவசியமில்லை. ஏனெனில், கௌரவ அமைச்சர் சுசில் பிரேமஜயந்த அவர்களின் தலைமையின்கீழ் இப்பொழுது நாங்கள் ஓர் இலக்கை நோக்கிப் பயணித்துக்கொண்டு இருக்கின்றோம். இதுவரை கல்வி அமைச்சுக்குக் கிடைக்காத ஒரு சிறந்த அமைச்சராக நான் அவரைப் பார்க்கின்றேன். ஏனெனில், அவர் தொலைநோக்கோடு செயற்படுகின்ற ஓர் அமைச்சர். நாங்கள் தொழிற்பயிற்சியுடன்கூடிய பாடநெறிகளை அமுல்படுத்துவதற்குத் திட்டமிட்டிருக்கிறோம். அதனைப் புதிய கல்விச் சீர்திருத்தத்துக்குள் உள்வாங்க வேண்டுமென்ற நிலைப்பாட்டில் நாங்கள் இருக்கின்றோம்.

இங்கு பேசிய பலர், ஆங்கில மொழிப் பயன்பாடு இல்லாமல் போனது பற்றிப் பிரஸ்தாபித்தார்கள். அதிலும் குறிப்பாக, ஆங்கில மொழி இல்லாமல் போனதால் ஏற்பட்டுள்ள விளைவுகள் பற்றிக் குறிப்பிட்டார்கள். எவ்வாறு ஆங்கில மொழிப் பயன்பாடு இல்லாமற் போனது? நாங்கள் அதை இல்லாமல் ஆக்கினோமா? என்றால், இல்லை! 1956இல் இந்த நாட்டில் அரசகரும மொழியாகச் சிங்கள மொழி மாத்திரம் இருக்க வேண்டும் என்று ஒரு சட்டம் கொண்டுவரப்பட்டதன் காரணமாகப் படிப்படியாக ஆங்கில மொழிப் பயன்பாடு பாடசாலைகளில் இல்லாமலாக்கப்பட்டது. அதாவது, ஆங்கில மொழி மழுங்கடிக்கப்பட்டது. இப்பொழுது நாங்கள் ஆங்கில மொழி தேவையென்று வரிந்துகட்டிக்கொண்டு, மீண்டும் அதை அமுல்படுத்துவதற்கான திட்டங்களை குறிப்பாக பாடசாலைகளில் ஆங்கில மொழியூடாகப் பாடங்களை நடத்துவதற்கான திட்டங்களைச் செயற்படுத்தி வருகின்றோம். நாங்கள் பல வருடங்கள் ஆங்கில மொழியைப் பயன்படுத்தாமல் விட்டதனால், எமது கல்வியின் தரம் குறைந்திருக்கின்றது; எமது அரச இயந்திரத்தின் தரம் குறைந்திருக் கின்றது; எமது வெளிநாட்டுத் தொடர்புகளின் தரம் குறைந்திருக்கின்றது. ஆங்கில மொழியை இல்லாமலாக்கியதன் தாக்கத்தை இப்பொழுது நாங்கள் உணர்ந்து, செய்த தவறைத் திருத்திக்கொள்வதற்காகச் செயற்பட்டுக்கொண்டு இருக்கின்றோம்.

இந்தியாவிலிருந்து 2,000 ஆசிரியர்கள் வரவழைக்கப் பட்டு உள்ளதாகவும், அவர்கள் பல்வேறு விடயங்களில் ஈடுபட்டு வருவதாகவும் இங்கு ஓர் அப்பட்டமான, எந்தவித ஆதாரமும் இல்லாத குற்றச்சாட்டு முன்வைக்கப்பட்டது. மத்திய கல்வி அமைச்சாக இருக்கலாம் அல்லது மாகாணக் கல்வி அமைச்சாக இருக்கலாம், கல்வி அமைச்சினால் ஓர் ஆசிரியரேனும் இந்தியாவிலிருந்து வரவழைக்கப்படவில்லை. அதற்கான வாய்ப்பும் இல்லை. அதற்கான அவசியமோ, தேவையோ கிடையாது. இப்பொழுது இந்தியாவிலிருந்து உல்லாசப் பயணிகள் ஆயிரக்கணக்கானோர் தினந்தோறும் எமது நாட்டுக்கு வந்துகொண்டு இருக்கின்றார்கள்; எதிர்காலத்திலும் வருவார்கள். இந்தக் குற்றச்சாட்டை முன்வைத்தவருக்கு அவ்வாறு வருபவர்கள் ஆசியர்கள்போல் தென்பட்டிருக்கக் கூடும். அதனால்தான் அவர், இந்தியாவிலிருந்து ஆசிரியர்கள் வரவழைக்கப்பட்டு இருக்கிறார்கள் என்றும் அவர்கள் இங்கு பல்வேறு குற்றச்செயல்களில், துர்வேலைகளில் ஈடுபட்டுக் கொண்டு இருக்கிறார்கள் என்றும் அப்பட்டமான ஒரு குற்றச்சாட்டை இந்த உயர் சபையில் முன்வைத்தார். அதில் எவ்வித உண்மையும் கிடையாது என்பதை நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மலையகப் பிரதேசத்திலுள்ள கோட்டக் கல்விக் காரியாலயங்களாக இருக்கலாம்; வலயக் கல்விக் காரியாலயங்களாக இருக்கலாம்; மாகாணக் கல்விக் காரியாலயமாக இருக்கலாம்; மாகாணக் கல்வி அமைச்சாக இருக்கலாம்! இவற்றில் தமிழ்மொழி தெரிந்த அதிகாரிகள் இல்லையென்ற ஒரு குற்றச்சாட்டு இங்கு முன்வைக்கப்பட்டது. நான் அதனை ஏற்றுக்கொள்கின்றேன். இந்தக் குற்றச்சாட்டை முன்வைப்பவர்கள், அதனை எவ்வாறு நிவர்த்தி செய்ய முடியும் என்பதைப் பற்றியும் கூற வேண்டும். குறித்த தரத்துடன்கூடிய அதிகாரிகள் இல்லை என்பதுதான் மலையகப் பிரதேசத்திலுள்ள பிரதான பிரச்சினையாக இருக்கின்றது. இப்பொழுது மலையகத்தில் கல்வி நிர்வாக சேவை தரம் - IIIக்கு 46 பேர் நியமிக்கப்பட்டு இருக்கின்றார்கள். எதிர்வரும் காலங்களில் மலையகப் பிரதேசத்தில் கல்வி நிர்வாக சேவை அதிகாரிகளுக்கான பற்றாக்குறை நிச்சயமாக நீங்கும் என்பதில் எவ்வித மாற்றுக் கருத்துக்கும் இடம் கிடையாது. மலையகப் பிரதேசம் உட்பட ஏனைய பிரதேசங்களிலும் ஆளணிப் பற்றாக்குறை முழுமையாகத் தீரவில்லை. எல்லா இடங்களிலும் ஆளணிப் பற்றாக்குறை இருக்கின்றது. ஆனால், மலையகத்தில் சற்று அதிகமாகவே இருப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. இப்பொழுது நாங்கள் கொஞ்சம் கொஞ்சமாக மலையகப் பாடசாலைகளிலுள்ள ஆசிரியர் பற்றாக்குறையை நிவர்த்திசெய்து வருகின்றோம். மலையகத்தில் 2,535 ஆசிரிய உதவியாளர்களை நியமிப்பதற்கான வர்த்தமானி அறிவித்தல் அநேகமாக இந்த மாதம் வெளிவரும் என்ற எதிர்பார்ப்பு எமக்கு இருக்கின்றது.

இது மலையகக் கல்வி வளர்ச்சிக்குப் பெரும் உதவியாக இருக்கும் என்ற விடயத்தை நான் இங்கு கூறிக்கொள் கின்றேன். இப்பொழுது மலையகத்தில் அண்ணளவாக 900 பட்டதாரிகள் வேலைவாய்ப்பின்றி இருக்கின்றார்கள். அண்மையில் நான் கௌரவ அமைச்சர் சுசில் பிரேமஜயந்த அவர்களிடம் இந்த 900 பட்டதாரிகளுக்கும் நியமனம் வழங்கப்பட வேண்டுமென்ற கோரிக்கையை முன்வைத்தேன். அதற்கு அவரிடமிருந்து சாதகமான பதில் கிடைத்தது. இப்பொழுது நாங்கள் அது தொடர்பிலான காய்நகர்த்தல்களை மேற்கொண்டு வருகின்றோம் என்பதை இந்த உயரிய சபையில் பெருமையோடு கூறிக்கொள்கின்றேன்.

அண்மையில் வெளிவந்த கல்விப் பொதுத் தராதர உயர் தரப் பரீட்சைப் பெறுபேறுகளைப் பார்க்கும்போதும், நாங்கள் கல்வியில் நல்ல நிலை நோக்கி நகர்ந்துகொண்டு இருக்கின்றோம் என்ற விடயம் தெளிவாகின்றது. கல்வி அமைச்சானது, தனது செயற்பாடுகளைச் சரியாக மேற்கொள்கின்றது என்பதற்கு இதைவிட வேறு உதாரணம்

தேவையில்லை. இப்பொழுது நாங்கள் கொரோனா காலத்துக்கு முன்னர் இருந்த நிலைமைக்கு வந்துகொண்டு இருக்கின்றோம். மேலும், ஒத்திப்போடப்பட்ட பரீட்சைகளின் கால இடைவெளியைக் கொஞ்சம் கொஞ்சமாகக் குறைத்துக்கொண்டு வருகின்றோம். முன்னர் எவ்வாறு ஓகஸ்ட் மாதத்தில் க.பொ.த. உயர் தரப் பரீட்சை இடம்பெற்றதோ, எவ்வாறு டிசம்பர் மாதத்தில் க.பொ.த. சாதாரண தரப் பரீட்சை இடம்பெற்றதோ, எவ்வாறு ஓகஸ்ட் மாதத்தில் தரம் ஐந்து புலமைப்பரிசில் பரீட்சை இடம்பெற்றதோ, அவ்வாறே எதிர்வரும் காலங்களில் அந்தந்தப் பரீட்சைகளை நடத்துவதற்கான செயற்பாடுகளை கல்வி அமைச்சு என்ற ரீதியில் நாங்கள் முன்னெடுத்து வருகின்றோம்.

நான் பிரதிநிதித்துவப்படுத்தும் ஊவா மாகாணமானது, தற்போது வெளிவந்துள்ள உயர் தரப் பரீட்சைப் பெறுபேறுகளின் அடிப்படையில், அகில இலங்கை ரீதியில் 3ஆவது இடத்தைப் பிடித்திருக்கின்றது. முன்பெல்லாம் 7ஆவது இடம், 8ஆவது இடம், 9ஆவது இடம்தான் ஊவா மாகாணத்துக்கான இடமாக இருந்தது. இப்பொழுது ஊவா மாகாணமானது 3ஆவது இடத்துக்கு வந்திருப்பதானது, பதுளை மாவட்டத்தின் மக்கள் பிரதிநிதி என்ற வகையில் எனக்குப் பெருமையாக இருக்கின்றது. கல்வி இராஜாங்க அமைச்சர் என்ற வகையில், அதைவிடப் பெருமையாக இருக்கின்றது.

இறுதியாக, ஒரு விடயத்தைத் தொட்டுவிட்டுப் போகலாமென நான் நினைக்கின்றேன். பெருந்தோட்டத் தொழிலாளர்களின் மிக மோசமான சம்பள நிலையைக் கருத்திற்கொண்டு, இப்பொழுது மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்களின் வழிகாட்டலின்கீழ், தொழில் அமைச்சர் அவர்கள் தோட்டத்தொழிலாளி ஒருவரின் தினச் சம்பளம் 1,700 ரூபாய் என வர்த்தமானியூடாகப் பிரகடனப்படுத்தி இருக்கின்றார். உண்மையிலேயே இது வரவேற்கக்கூடிய ஒரு விடயமாகும். இதுவரை காலமும் தோட்டத்தொழிலாளர்கள் இவ்வளவு பெரிய சம்பள அதிகரிப்பைப் பெற்றது கிடையாது. தற்பொழுது 1,000 ரூபாயாகவுள்ள நாட்சம்பளமானது, 1,700 ரூபாயாக அதிகரிக்கப்பட்டுள்ளது. இது 70 சதவீதமான சம்பள அதிகரிப்பாகும். இருந்தாலும்கூட, தற்போதைய வாழ்க்கைச் செலவுக்கேற்ற சம்பளமாக நான் இதனைப் பார்க்கவில்லை. ஆனாலும், இதனை வழங்குவதற்குப் பெருந்தோட்டக் கம்பனிகள் தயாராக இல்லை. வர்த்தமானி அறிவித்தல் வெளிவந்த உடனேயே அதுதொடர்பில் தமது ஆட்சேபனையைப் பெருந்தோட்டக் கம்பனிகள் தொழில் அமைச்சுக்குத் தெரிவித்தன. தொழில் அமைச்சு அதனை உதாசீனப்படுத்தியது. அதாவது, அந்த ஆட்சேபனையை ஏற்றுக்கொள்ளவில்லை. ஈற்றில் பெருந்தோட்டக் கம்பனிகள் மேன்முறையீட்டு நீதிமன்றத்துக்குச் சென்றன. இப்பொழுது நீதிமன்றத்தில் பெருந்தோட்டக் கம்பனிகள் மூக்கறுபட்டுப் போயிருக்கின்றன. அவை கோரிய தடையுத்தரவை மேன்முறையீட்டு நீதிமன்றம் வழங்கவில்லை. இப்பொழுது பெருந்தோட்டக் கம்பனிகள் தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 ரூபாய் நாட்சம்பளத்தை வழங்கியாக வேண்டும் என்ற நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றன. அதைப் பெருந்தோட்டக் கம்பனிகள் வழங்குவதற்குத் தயாராக இல்லாவிட்டால், தோட்டங்களை மீண்டும் அரசாங்கத்திடம் கையளித்துவிட்டு வெளியேற வேண்டுமெனக் கேட்டு, வாய்ப்பளித்த கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்!

එකල්හී වේලාව අ. භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව රෑට අනුකූලව, අ. භා. 6.17ට, 2024 ජූනි 06 වන බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 වන තෙක් කල් තියේය.

අප්පොழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 6.17க்கு, பாராளுமன்றம் 2024 யூன் 06, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.17 p.m. until 9.30 a.m. on Thursday, 06th June, 2024.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

313 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 313 - இல. 3
Volume 313 - No. 3

2024 ජූනි 06වන බ්‍රහස්පතින්දා
2024 யூன் 06, வியாழக்கிழமை
Thursday, 06th June, 2024

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2024 ජූනි 06වන බ්‍රහස්පතින්දා
2024 யூன் 06, வியாழக்கிழமை
Thursday, 06th June, 2024

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [පිටුව 407]

ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [පිටුව 407]

ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ වාර්තාව [පිටුව 410]

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [පිටුව 410]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 423-450]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

උතුරු, නැඟෙනහිර රක්ෂිත වනාන්තර නැවත සීමා නිර්ණය කිරීම [පිටුව 463]

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත:

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [පිටු 472- 618]

කල් තැබීමේ යෝජනාව:

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ආදේශකයන්ට ස්ථිර පත්වීම් ලබා දීම [පිටු 619-626]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

பகிரங்க நிதிசார் முகாமைத்துவம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 407]

பொருளாதார நிலைமாற்றம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 407]

ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவின் அறிக்கை [ப: 410]

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 410]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 423-450]

தனி அறிவித்தல் மூல வினா:

வடக்கு, கிழக்கில் வன ஒதுக்கங்களை மீள எல்லை நிர்ணயம் செய்தல் [ப: 463]

இலங்கை மின்சாரம் சட்டமூலம்:

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 472-618]

ஒத்திவைப்புப் பிரேரணை:

இலங்கை தபால் திணைக்களத்தின் பதிவுசெய்யப்பட்ட பதிலீட்டு ஊழியர்களுக்கான நிரந்தர நியமனங்கள் வழங்கல் [ப: 619 - 626]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Public Financial Management Bill: Petition to the Supreme Court [Col. 407]

Economic Transformation Bill: Petitions to the Supreme Court [Col. 407]

REPORT OF COMMITTEE ON ETHICS AND PRIVILEGES [Col. 410]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 410]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 423-450]

QUESTION BY PRIVATE NOTICE:

Re-demarcation of Forest Reserves in North and East [Col. 463]

SRI LANKA ELECTRICITY BILL:

Read a Second, and the Third time, and passed as amended [Cols. 472-618]

ADJOURNMENT MOTION:

Grant of Permanent Appointments to Registered Substitutes in Department of Posts [Cols. 619-626]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2024 ජූනි 06වන බ්‍රහස්පතින්දා
2024 யூன் 06, வியாழக்கிழமை
Thursday, 06th June, 2024

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
பகிரங்க நிதிசார் முகாமைத்துவம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
PUBLIC FINANCIAL MANAGEMENT BILL: PETITION TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2024 ජූනි 05 දින මාගේ නිවේදනයේ සඳහන් පෙත්සමට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "රාජ්‍ය මූල්‍ය කළමනාකරණ" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

II
ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
பொருளாதார நிலைமாற்றம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
ECONOMIC TRANSFORMATION BILL: PETITIONS TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2024 ජූනි 04 සහ 05 දිනවල මාගේ නිවේදනයන්හි සඳහන් පෙත්සම් දහහතරට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ආර්ථික පරිවර්තන" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් තුනක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

III
පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2024 ජූනි 06 බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 1.00ට කාරක සභා කාමර අංක 02හිදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සභාගී වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

IV
සම්බන්ධීකරණ කාරක සභා රැස්වීම
இணைப்புக் குழுக் கூட்டம்
MEETING OF LIAISON COMMITTEE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සම්බන්ධීකරණ කාරක සභාවේ රැස්වීමක් 2024 ජූනි 06 බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 2.30ට කාරක සභා කාමර අංක 03හිදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සභාගී වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ජනාධිපති කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2023 වර්ෂය සඳහා මන්නාරම සහ යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වාර්ෂික කාර්ය සාධන වාර්තා.

මෙම වාර්තා විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව,

2024 අප්‍රේල් 22 දිනැති අංක 2381/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2024 ජූනි 04 දිනැති අංක 2387/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරමින් කරන ලද ප්‍රකාශනය.- [අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ වාර්තාව
ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவின் அறிக்கை
REPORT OF COMMITTEE ON ETHICS AND PRIVILEGES

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු කථානායකතුමනි, නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරය සඳහා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V. Radhakrishnan)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Education on -

i. Annual Report of the University of Sri Jayewardenepura for the year 2022;

ii. Forty-fourth Annual Report of the University Grants Commission for the year 2022;

iii. Annual Reports of the National Institute of Education for the years 2019 and 2020;

iv. Annual Report of the University of Peradeniya for the year 2022; and

v. Annual Report of the State Printing Corporation for the year 2021,

which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු නාලක බණ්ඩාර කෝට්ටෙගොඩ මහතා
(மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட)
(The Hon. Nalaka Bandara Kottegoda)
බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද වාර්තාව සලකා බලමින්, විශේෂයෙන්ම ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත තුළ ආයෝජකයන් මඟින් විදුලිබල ක්ෂේත්‍රය තුළ ඒකාධිකාරයක් ගොඩනැගීම අවහිර කරමින් ඊට අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම දැනට විදුලිබල මණ්ඩලයේ සේවක වැටුප්වලට අමතරව ඔවුන් දැනට අත්විඳින දීමනා හා වරප්‍රසාද වැනි දේවල් ඒ ආකාරයටම ලබා දෙන ලෙස කමිටුව නිර්දේශ කරලා තිබෙනවා. මේ ආකාරයෙන් සාධනීය නිර්දේශ කිහිපයක් එකතු කර තිබෙනවා.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චරිත හේරත් මැතිතුමා.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගරු කථානායකතුමනි, මම මේ point එක මතු කරන්නේ, ස්ථාවර නියෝග 50 (2) යටතේ අපේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාව සම්බන්ධවයි. 50 (2) ස්ථාවර නියෝගය යටතේ කියනවා, මෙවැනි වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනතුරු එම කාර්යයට අදාළ පනත් කෙටුම්පත් move කරන්නේ නැහැ කියලා.

ගරු කථානායකතුමනි, මේ වාර්තාව දැන් මමත් බැලුවා. මේ වාර්තාව දැන් සභාමේසය මත තිබෙනවා. ඒ වාර්තාව මන්ත්‍රීවරුන්ට පරිහරණය කිරීමට ඉඩ ලබා දිය යුතුයි කියන අදහස තමයි මේ ස්ථාවර නියෝගයේ තිබෙන්නේ. නමුත් මේක අදම සාකච්ඡාවට ගන්න පනත් කෙටුම්පතක් වීම නිසා ඒ ඉඩ අහිමි වෙනවා. එතකොට මේ ස්ථාවර නියෝගයේ අභිමතාර්ථය සාධනය වෙන්නේ නැහැ. ඒ නිසා මේ සම්බන්ධව පාර්ලිමේන්තුවේ අවධානය යොමු කළ යුතුයි කියලා මම හිතනවා. මට ප්‍රශ්නයක් නැහැ. ගරු ඇමතිතුමාගේ පනත් කෙටුම්පත සාකච්ඡා කරන්න අද සහ හෙට කියන දවස් දෙකම තිබෙනවා. ඒක නොවෙයි ප්‍රශ්නය. මේ ස්ථාවර නියෝගයේ අභිමතය වන්නේ, යම් පනත් කෙටුම්පතක් සම්බන්ධව ආංශික අධීක්ෂණ කාරක සභාවේ මතය මේ සභාවේ මන්ත්‍රීවරුන් දැනගත යුතුයි කියන එකයි. එය දැනගන්නවා තමයි මේ මොහොතේ. නමුත් මේ පනත් කෙටුම්පත අදම විවාදයට ගැනීම, නැත්නම් වහාම විවාදයට ගැනීම හරහා ස්ථාවර නියෝගයේ අභිමතයට හානියක් වෙනවා කියලායි මම තර්ක කරන්නේ. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවධානය පිණිසයි මම මේ කාරණය කිව්වේ.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව ආංශික අධීක්ෂණ කාරක සභාවට වගකීමක් තිබෙනවා, පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් Supreme Court Determination එකත් එක්ක සංසන්දනය කරලා සහතිකය ඉදිරිපත් කරන්න. ඒක කළ යුත්තේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා. හැබැයි, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයාගේ තීරණය ඊයේ දවසේ විෂයභාර අමාත්‍යවරයා විසින් මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා. එතකොට මේ පාර්ලිමේන්තුව ක්‍රියාත්මක වෙන්නේ විධායකයට අවශ්‍ය විධියටයි කියන එක පැහැදිලි වෙලා තිබෙනවා. ඒ නිසා දිගින් දිගටම අපි කිව්වේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපිව විධායකයේ නියෝග ක්‍රියාත්මක කරන්න තල්ලු කරන්න හදන්න එපා, කරුණාකරලා අපට මේ සඳහා සුදුසු අවස්ථාවක් දෙන්න කියායි. මේ සම්බන්ධව විවාද කරන්න හෙට දිනයත් ලබා දීලා තිබෙනවාද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නැහැ.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
විවාද කරන්න හෙට දිනය ලබා දීලාත් නැහැ. ගරු කථානායකතුමනි, සුප්‍රීම් උසාවිය කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) අනුව්‍යවස්ථාවට මුළු පනත් කෙටුම්පතම පූර්ණ වශයෙන් පටහැනියි කියලා. මෙම පනත් කෙටුම්පතේ වගන්ති 54ක් තිබෙනවා. ඒ වගන්ති 54න්, වගන්ති 13ක් සංශෝධනය කරන්නට තීරණය කරලා තිබෙනවා. මේක සුළුකොට තකන්න බැහැ. මොකද, ඔබතුමාත් ඇතුළුව අපි හැම කෙනාගේම ජීවිතවලට, රටේ ආර්ථිකයට -හැම දෙයටම- බලපාන දෙයක් තමයි විදුලි බලය.

අනෙක් කාරණය මෙයයි. මේ පනත් කෙටුම්පත ක්‍රියාත්මක වෙන්නේ අද, හෙට නොවෙයි. මේ ආණ්ඩුව තිබෙන්නේ තව මාස දෙකයි හෝ තුනයි. අනාගතයේදී ආණ්ඩු බලය ගන්න ලැබෙන කණ්ඩායමට තමයි මේකෙන් ප්‍රශ්න ඇති වෙන්නේ.

ඒ නිසා කරුණාකරලා මේ පිළිබඳව විධිමත්ව සොයා බලා, අවධානය යොමු කරලා තමයි මේක කරන්න ඕනෑ. ඇමතිවරයා කිව්වා, මේ සම්බන්ධයෙන් අවුරුදු දෙකක consultation process එකක් තිබුණාය කියලා. අවුරුදු දෙකක consultation process එකක් තිබුණාය කියලා ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කළාම, සුප්‍රීම් උසාවිය කියනවා, මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) අනුව්‍යවස්ථාවට සම්පූර්ණයෙන්ම පටහැනියි කියලා. ඒ වාගේ

[ගරු නීතිඥ වන්දිම වීරක්කොඩි මහතා]

තත්ත්වයක් උද්ගත වෙලා තියෙද්දි ගරු කථානායකතුමනි, කරුණාකර ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් අපට මේ පිළිබඳව සාකච්ඡා කරලා, රටට වැදගත් වෙනස්කම් සහිත පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම මම කරනවා. අපේ චරිත හේරත් මැතිතුමා කිව්ව පරිදි ඔබතුමාට මේ මොහොතේදීත් ඒ සඳහා හැකියාව තිබෙනවා, තාක්ෂණිකව සහතිකය ඉදිරිපත් කිරීමට ප්‍රථම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම කළ නොහැකි බැවින්.

ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, නීත්‍යානුකූලව පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න ඕනෑ කරුණු සියල්ලම සම්පූර්ණ කරලා තිබෙන්නේ. සමහරු අධිනීතිඥ කිව්වාට ඒ අයට අඩු තරමින් අධිපණ්ඩිතකමක්වත් නැහැ. ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය - Supreme Court Determination එක - කියවා ගන්න බැරි නීතිඥවරු පාර්ලිමේන්තුවේ ඉන්න එක ගැන මම කනගාටු වෙනවා. මෙම පනත් කෙටුම්පත ගැන ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ තිබෙන්නේ මොකක්ද? ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි කරුණු තිබෙනවාය කියායි. හැබැයි, ඒක නිවැරදි කර ගැනීම සඳහා සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත්, නීති කෙටුම්පත් සකස් කරන්නේ ඇමතිවරු, මන්ත්‍රීවරු නොවෙයි, ගරු කථානායකතුමනි. මේ මන්ත්‍රීවරු ඒකවත් දන්නේ නැද්ද කියන්න මම දන්නේ නැහැ. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවක් තිබෙනවා. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව ඒක කෙටුම්පත් කළාට පස්සේ, නීතිපතිවරයා ඒකට සහතිකයක් ලබා දෙනවා. නීතිපතිවරයා සහතිකය ලබා දුන්නාට පස්සේ තමයි කැබිනට් මණ්ඩලය ඒකට අනුමැතිය ලබා දෙන්නේ. ඒ අනුමැතියෙන් පස්සේ තමයි එය ගැසට් කරලා, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් වෙන්නේ. මෙම පනත් කෙටුම්පත එලෙස අභියෝගයට ලක් වුණාට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණය කියන කරුණුවලට අපි එකඟ වුණා.

දැන් මෙතුමා කියනවා, කමිටුවේ වාර්තාවට ඉස්සෙල්ලා කිව්වා කියලා. කමිටුවට සහභාගි වුණු එතුමාත් දන්නවා, කමිටුවට සහභාගි වෙලා අපි එකඟ වුණ බව, ශ්‍රේෂ්ඨාධිකරණයේ නිගමනවල තිබෙන කරුණු සියල්ලටම අපි එකඟ වනවා කියලා. ඒ වාගේම තව කරුණක් කමිටුවෙන් ඉදිරිපත් කළා. මම කිව්වා, ඒකටත් අපි එකඟ වෙන්නම් කියලා. අපි එකඟ වෙච්ච කරුණු විතරයි කියලා තිබෙන්නේ. තව කරුණු ගණනාවක් එතුමා යෝජනා කර තිබෙනවා. ගරු කථානායකතුමනි, කවුරුන් හෝ කියනවා නම් මේ තිබෙන Amendment එක කියවන්න වෙලාව නැහැ, Amendment එක තේරුම් ගන්න බැහැ කියලා, මම මේ කාරණය කියන්න කැමැතියි. විපක්ෂය නියෝජනය කරන නීතිඥවරු ගණනාවක් ඉන්නවා. එළියේ ඒ ගොල්ලන්ගේ නම් ගහන්නේ "අධිනීතිඥ", "ජනාධිපති නීතිඥ", "ජනාධිපති උපදේශක" කියලායි. "අපි උසාවියේ අවුරුදු 20ක් කටයුතු කර තිබෙනවා" කියලායි කියන්නේ. අවුරුදු 20ක්, 30ක් උසාවියේ කටයුතු කරලා මේ පිටු 11ක් කියවගන්න බැරි නම් ඒ අධිනීතිඥකම පැත්තකට දමන එක තමයි කරන්න තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත අපි නිවැරදිව ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ගැන මීට පෙර Parliamentary Business Committee එකේදී කථා කළා. Parliamentary Business Committee එකේදී ඕනෑ නම් ඉල්ලන්න තිබුණා, දින 4ක, 5ක විවාදයක්. මෙතුමන්ලා මීට පෙර දින 4ක, 5ක විවාද ඉල්ලලා තිබෙනවා. හැබැයි, එක දිනක විවාදයකට එකඟ වෙලා Order of Business එකට දැම්මාට පස්සේ, පාර්ලිමේන්තු රැස්වීම් පටන් ගත්තාට පස්සේ දැන් මෙහෙම කියන එක වැරදියි, ගරු කථානායකතුමනි. මේ පනත් කෙටුම්පත අද දවසේ අපි විවාදයට ගන්නවා. නීත්‍යානුකූල ගැටලුවක් තිබෙනවා නම් එතුමන්ලාට අභියෝග කරන්න පුළුවන්.

ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)

ගරු කථානායකතුමනි, යම් කිසි පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පස්සේ මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට අමතරව ඕනෑම පුරවැසියෙකුට ඒ පනත් කෙටුම්පත සඳහා මැදිහත්වීමේ අවස්ථාවක් ව්‍යවස්ථානුකූලව ලබා දීලා තිබෙනවා. එතකොට ජනතාව ඒ අවස්ථාව පාවිච්චි කරලා අධිකරණයට ගිහිල්ලා තිබෙනවා. අධිකරණයෙන් ඒ නින්දුව, එහෙම නැත්නම් නියෝගය ඔබතුමාට ලැබිලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ජනතාවගේ බලාපොරොත්තුව මේ තිබෙන ඒකාධිකාරය බිඳ දමලා ඉදිරියේදී තරගකාරීව, විශේෂයෙන්ම සැපයුම පිළිබඳව සහ ඒ පාලනයට අවශ්‍ය වැඩ කටයුතුවලට වෙනස්කම් ලබා දෙන්නයි.

ගරු කථානායකතුමනි, විපක්ෂය මේ දවස් කීපය තුළම කටයුතු කළේ මේ විවාදය කල් දාන්න පුළුවන්ද කියලා බලන්නයි. රජයක් හැටියට අපිට මෙය කල් දැමීමට හැකියාවක් නැහැ, අවශ්‍යතාවකුත් නැහැ. අපි අදාළ කාල රාමු තුළ කටයුතු කර තිබෙනවා. ඒ හින්දා තවත් සංශෝධන අවශ්‍ය නම් ඒ යෝජනා ඉදිරිපත් කරලා, මේ විවාදය පවත්වලා අපි අද මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමටත් සැලසුම් කර තිබෙනවා. මෙය ප්‍රමාද කිරීමට හැකියාවක් නැහැ. දැනටම අවුරුදු දෙකකට වඩා ප්‍රමාද වෙලායි තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

ගරු කථානායකතුමනි, මට කාරණා දෙකක් කියන්න තිබෙනවා. පළමුවැන්න මේකයි. මේ පනත තාක්ෂණික කාරණා ඇතුළත් පනතක්. ඒ පනතට සංශෝධනත් බරපතළ විධියට තිබෙනවා. මට තේරුණු ආකාරයට නම් එක සංශෝධනයකට විකල්පයක් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් යෝජනා කරලාවත් නැහැ. ඒකට කිසිම විධියකට, වෙනස් කළොත් කියලාවත් සංශෝධන ඉදිරිපත් කරලා නැහැ.

දෙවැනි කාරණාව මෙයයි, ගරු කථානායකතුමනි. මේ සම්බන්ධයෙන් එක් දවසක විවාදයක් නම් තිබෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට වැඩිම වුණොත් අපි 25දෙනෙකුට, 30දෙනෙකුට තමයි අදහස් දක්වන්න හම්බ වෙන්නේ. අඩුම වශයෙන් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට තමන්ගේ අදහස ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාට බහුතරය තිබෙනවා නම් පනත්

කෙටුම්පත සම්මත කරගන්න. හැබැයි, ඒක අදම කරගන්න මොකක්ද තිබෙන හදිසිය? මෙවැනි තාක්ෂණික පනතක් සම්බන්ධයෙන් කරුණු දක්වන්න සාධාරණ කාලයක් ලබා දෙන්න. ගරු කථානායකතුමනි, ඔබතුමා කථානායක හැටියට අපේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී ඉන්න. එහෙම නැත්නම් අපි මන්ත්‍රීවරු හැටියට මෙතැනට එන එකේ තේරුම මොකක්ද? ඒකේ තේරුමක් නැහැ. අපි ඔබතුමාගෙන් ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනවා, කරුණාකරලා මන්ත්‍රීවරු හැටියට අපේ අදහස් රට හමුවේ තියන්න, මේ පාර්ලිමේන්තුව හමුවේ තියන්න ඒ අවස්ථාව ලබාදෙන්න කියලා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, විෂයභාර අමාත්‍යතුමා විසින් මේ පනත් කෙටුම්පත පිළිබඳව අදහස් ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ පුරා දවසක් වෙන් කරලා පක්ෂ, විපක්ෂ අයට අදහස් ලබාදෙන්න අවස්ථාව දුන්නා.

ආණ්ඩු පක්ෂයේ අපි ඒකට ගියා. අපට මේකේ යම් සැක හිතෙන දේවල් තිබුණා. අපි ඒ පිළිබඳව ඇමතිතුමාත් එක්ක වාද විවාද කළා. එතුමා ඇවිල්ලා ඉතාම හොඳින් මේ ගැන පැහැදිලි කළා. පැහැදිලි කළාට පසුව අපි යම් එකඟතාවකට ආවා. හවස 2.00 ඉඳලා විපක්ෂයට කාලය දුන්නා. විපක්ෂයේ සියලු පක්ෂවලට ආරාධනා කළා මේ පිළිබඳ සාකච්ඡා කරන්න එන්න කියලා. *[බාධා කිරීමක්]* ඔබතුමා පොඩ්ඩක් ඉඳගන්නකෝ. *[බාධා කිරීමක්]* ඔබතුමා ඉඳගන්නකෝ. මම නේ කථා කරන්නේ. මරණාධාර සමිතියකවත් ඡන්දය ඉල්ලගන්න බැරි එක්කෙනෙක් නේ. ඉඳගන්නකෝ අනේ. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට අවස්ථාව දුන්නා, අදහස් ප්‍රකාශ කරන්න. විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කළා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිව්වා, මේකට මීට වඩා බලතල දෙන්න ඕනෑ කියලා. ඊට පස්සේ පක්ෂ නායක රැස්වීමේදී ගරු ඇමතිතුමා කිව්වා වාගේ එක දිනක විවාදයක් ඉල්ලුවා. දින හතරක් ඉල්ලුවා නම් දෙන්න තිබුණා. මේ වෙලාවේ නිකම් මේ market කරගන්න කථා කරන්නේ නැතිව, කලින් කිව්වා නම් මේ විවාදයට දින හතරක් ගන්න තිබුණා, ගරු කථානායකතුමනි. ඒ වාගේම, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට විරෝධතාව දක්වන්නත් තිබුණා. ඒ අවස්ථාවේ සියලුදෙනා පක්ෂ වෙලා මේ වෙලාවේ වෙන දෙයක් කරන එක අසාධාරණයි. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේදී මම තව දවසක් ඉල්ලුවා, ඔබතුමාට මතක ඇති. නමුත් දුන්නේ නැහැ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
You are too late.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
"Too late" නොවෙයි, පක්ෂ නායක රැස්වීමේදී ඉල්ලුවේ. ගරු කථානායකතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමා කියනවා, "You are too late" කියලා. අහගෙන ඉන්නේ නැතිව එහෙම කියනවා. අනික, මේ ගොල්ලන්ට අයිතියක් නැහැ. මොකද, මේ ගොල්ලන් රට බංකොලොත් කරපු නිසා තමයි මේක විකුණන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපිද?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමන්ලා රට බංකොලොත් කෙරුවා නේ. සල්ලි නැහැ දැන්. *[බාධා කිරීම්]* සතේ අතේ නැහැ. දැන් ටයි, කෝට් ගහගෙන එනවා රට බංකොලොත් කරලා. *[බාධා කිරීම්]*

රට බංකොලොත් කරලා දැන් සතේ අතේ නැතුව ලජ්ජා නැතුව මේ ආයතන විකුණනවා. *[බාධා කිරීම්]* ගිය මැතිවරණවලදී -ජනාධිපතිවරණයේදී, පාර්ලිමේන්තු මැතිවරණයේදී- ඔබතුමන්ලා කිව්වාද, මේ ආයතන විකුණනවා කියලා? ඔබතුමන්ලා එහෙම කිව්වාද? *[බාධා කිරීම්]* වරමක් තිබෙනවාද? නිකම් මේ - *[බාධා කිරීම්]* දමලා යන්න මේක තවත් කන්නේ නැතුව. දමලා යන්න. *[බාධා කිරීම්]* රට බංකොලොත් කරලා කුඩැල්ලෝ වාගේ එල්ලිලා ඉන්නවා. *[බාධා කිරීම්]* ලජ්ජා නැද්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අපට අද දවසේ වැඩ කටයුතු කර ගන්න බැරි වෙනවා, ඔය විධියට ගියොත්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අපි කලින් සතියේ සාකච්ඡා කරලා තමයි අදට මේ න්‍යාය පත්‍රය යොදා ගෙන තිබෙන්නේ. ඔබතුමා අද පස් වරු 1.00ට පක්ෂ නායක රැස්වීමක් කැඳවා තිබෙනවා, මින් ඉදිරියට අදාළ වන න්‍යාය පත්‍රය ගැන -ඊළඟ න්‍යාය පත්‍රය ගැන- සාකච්ඡා කරන්න. යම් ආකාරයකින් කාලය මදිකමක් තිබෙනවා නම්, අද දිනයේදී පුළුවන් තරම් කාලය ලබා දෙන්න අපට ගැටලුවක් නැහැ. ඊළඟ කාරණය තමයි - *[බාධා කිරීමක්]*

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
අපට හෙට දිනයත් දෙන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්නකෝ, ඔබතුමා.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙවින්දු කුමාරතුංක)
(The Hon. Gevindu Cumaratunga)
මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ. හෙට දිනය- *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
හෙට දිනයත් ගන්නවාද, නැද්ද කියන එක Parliamentary Business Committee එකේදියි අප තීන්දු කරන්නේ. ගරු කථානායකතුමනි, සමහර අය මේ ගැන දන්නේ නැතුව ඇති. මේ පාර්ලිමේන්තුවේදී දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කළේ එක දවසින්. *[බාධා කිරීම්]*

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙවින්දු කුමාරතුංක)
(The Hon. Gevindu Cumaratunga)
අපි ඒකටත් විරුද්ධ වුණා. [බාධා කිරීම්]

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඉතින් ඒක තේ, ප්‍රශ්නය. *[බාධා කිරීම්]* ඒක අතුරු ප්‍රශ්නයක්. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමා, මේක මරණාධාර සමිතියක් නොවෙයි; මේක පාර්ලිමේන්තුව. *[බාධා කිරීම්]* ඔබතුමා හිතනවා, මේක මරණාධාර සමිතියක් කියලා. සැරින් සැරේ ඕනෑ ඕනෑ විධියට - *[බාධා කිරීම්]* මම සභානායක. *[බාධා කිරීම්]* You had better go through the Standing Orders. If the Leader of the House is on his feet, you cannot interrupt. That is in the Standing Orders. මේ මිනිස්සු මරණාධාර සමිතියකවත් කථා කරන්න වටින්නේ නැහැ. මේක පාර්ලිමේන්තුව. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. සභානායකතුමාට - *[බාධා කිරීම්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉස්සෙල්ලා ස්ථාවර නියෝග කියවලා එන්න. පාර්ලිමේන්තුවට ඇවිල්ලා දැන් අවුරුදු හතරක් විතර වෙනවා. තවම ස්ථාවර නියෝග ගැන දන්නේ නැහැ. මහ ලොකුවට ලෝකය පුරා ගිහිල්ලා කයිය ගහනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්‍රප්පට්ටුළ්ළතු.]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමනි, මේ සභාවේ වැඩ කරන ක්‍රමයක් තිබෙනවා. *[බාධා කිරීමක්]* මේ සභාවේ වැඩ කරන ක්‍රමය ගැන තමයි ස්ථාවර නියෝගවල සඳහන්ව තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඒක ඒ ගොල්ලන්ගෙන් අහන්න, ගරු මන්ත්‍රීතුමා. මම හිටියා නම් දාන්නේ නැහැ, ඔබතුමාව. කලින් වතාවේ දැම්මේත් නැහැ; මේ සැරේ හිටියා නම් දාන්නේත් නැහැ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෛප්පඩි අකට්‍රප්පට්ටුළ්ළතු.]
[Expunged on the order of the Chair.]

පාර්ලිමේන්තුවට එවලා හරි යනවා යැ. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, අපි න්‍යාය පත්‍රයේ වැඩකටයුතුවලට යමු. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අපි න්‍යාය පත්‍රයේ වැඩකටයුතුවලට යමු. *[බාධා කිරීම්]* වැඩිදුර කාලය ඕනෑ නම්, අද දහවල් 1.00ට පැවැත්වෙන පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී අපි ඒ ගැන සාකච්ඡා කරමු.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මේ ගැන දහවල් 1.00න් පස්සේ කථා කරමු. ඔබතුමන්ලාට හවසට කාලය දෙනවා කිව්වා නේ. *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(මාණ්පුමිකු සජිත් පිරේමතාස - එතිර්ක්කට්චි මුතල්වර්)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා බාධා කරන්න එපා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ ශ්‍රී ලංකා විදුලිබල පනත අපේ රටේ විදුලි උත්පාදන ක්‍රමවේදයේ ඉතා විශාල වෙනසක් සිදු කරන පනතක්. ඒ නිසා මේ පනත බොහොම සංකීර්ණයි. මේ සංකීරණ පනත තුළින් මේ වෙනස්කම කරන කොට අපි මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. මේ පනත තුළින් ඇති විය හැකි සියලු බලපෑම් පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගෙන, ඒවා අධීක්ෂණය කරලා, යම් යම් අඩු පාඩුකම් තිබෙනවා නම් ඒවා මඟ හරවා ගෙන අපි මෙය ක්‍රියාත්මක කිරීම පිළිබඳ තීන්දුව ගන්නට ඕනෑ.

මම ගරු කථානායකතුමාට යෝජනා කරනවා, විශේෂයෙන්ම විදුලි ක්ෂේත්‍රය තුළ සිදු කරන්නට යන මේ විපර්යාසය තමන්ගේ තනි බලයට, හිතු මතයට කරන්නේ නැතුව, වැඩිදුර අධ්‍යයනයට, වැඩිදුර අධීක්ෂණයට ලක් කරමින්, තවදුරටත් සාකච්ඡා කරමින් මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්නවාද, නැද්ද කියන තීන්දුව හෙට දවසේ ගනිමු කියලා. පුළුල් සාකච්ඡාවකින් පසුව එම කාර්යය ඉෂ්ට කිරීම වැදගත්. මා එහෙම කියන්න හේතුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ ගරු සභාවේ ප්‍රකාශ කරපු ආකාරයට මේ වෙනස කරන්නට ඇත්තටම වරමක් තිබෙනවාද? මේක ජනතාව ලබා දුන් වරම ද? ඇත්ත වශයෙන්ම, නැහැ. ජනතාව රට බංකොලොත් කරන්න වරමක් දුන්නේ නැහැ. හැබැයි, රට බංකොලොත් කළා. මේ විධියට ජාතික දේපළ, ජාතික සම්පත් හිතු හිතු ආකාරයට ප්‍රතිව්‍යුහගත කරන්නට වරමක්

දුන්නේත් නැහැ. ඉතින් මේ තත්ත්වය තුළ, රටත් බංකොලොත් වෙලා, තිබෙන සම්පත් ටිකත් විකුණා කන්නට හදන යුගයක, මම ඔබතුමාට යෝජනා කරනවා අප හෙට දිනයේත් මේ පිළිබඳව විවාද කරලා මෙය අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව හෙට දිනයේ තීන්දුවක් ගනිමු කියලා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඒක අද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී කථා කරන්න. ගරු සභානායකතුමා එකඟ වුණා නේ, එහිදී ඒ ගැන කථා කරන්නම් කියලා.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්ඩලික නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා. ඔබතුමා මොකක්ද කියන්නේ?

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්ඩලික නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමා ටිකිරි කථාවක් කිව්වා. මේ පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කරන්නේ එහි ව්‍යවස්ථානුකූල තත්ත්වය තීන්දු කරන්න විතරයි. පාර්ලිමේන්තුව හැටියට අපි තමයි ප්‍රතිපත්ති තීන්දු ගන්නේ. දැන් උසාවිය තීන්දු කරලා තිබෙනවා, මාස 6ක් නොවෙයි, අවුරුද්දක් ඇතුළත මේ පනතේ කටයුතු ක්‍රියාත්මක කිරීමට හැකියි කියලා. උසාවියට පුළුවන්ද, මාස 6කින් කරන්න පුළුවන්ද, අවුරුද්දකින් කරන්න පුළුවන්ද කියලා තීන්දු කරන්න? මොන උපදේශකයා ද-

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඕකේ රීති ප්‍රශ්නයක් නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්ඩලික නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ වාගේ ටිකිරි ආතල් දෙන්න එපා කියන්න. ජනාධිපතිවරයා කියන ඒවා මෙතැනට ඇවිල්ලා ගිරව් වාගේ කියලා ටිකිරි ආතල් දෙන්න එපා, ඇමතිතුමා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්ඩලික මුජීබුර් රහ්මාන්)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඔව්, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්ඩලික මුජීබුර් රහ්මාන්)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, අද ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ විවාදයට ගන්නා අවස්ථාවේදී, වැඩබලන ඝාමාන්‍යාධිකාරිතුමා විසින් අද දවසේ සිට නැවත දැනුම් දෙනතුරු ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් නිවාඩු ලබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් කරලා තිබෙනවා. විදුලිබල හා බලශක්ති ඇමතිතුමා ගරු සභාවේ වාඩි වෙලා ඉන්නවා. අපි ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, අද දින සිට නැවත දැනුම් දෙනතුරු මේ විධියට සියලු සේවකයන්ගේ නිවාඩු තහනම් කරන්න හේතුව මොකක්ද කියලා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක අපට අදාළ නැහැ. ඒක පරිපාලන ප්‍රශ්නයක් නේ. ඒක මේ පනත් කෙටුම්පතට අදාළ නැහැ නේ.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්ඩලික ගෙවිඳු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්ඩලික ගෙවිඳු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි, මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මේ විවාදයට අදාළ නැති දේවල් කියමින් අපහාස කරනවා නේ. එතුමා කියන්නේ, මරණාධාර සමිතියකටවත් මම සුදුසු නැහැ කියලා නේ. එතුමන්ලාගේ පක්ෂයේ නායකයෝ තමයි, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා, ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා සහ බැසිල් රාජපක්ෂ මැතිතුමා. එතැනින් නේ මාව පත් කළේ. එතැනින් මාව පත් කළා විතරක් නොවෙයි, "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය ලිවීමේදී මාව ඒ කමිටුවේ කොටස්කාරයෙකු කර ගත්තා. මේ කරන දේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලද? "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මේ ගැන සඳහන් වී තිබෙන්නේ කොතැනද? චමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. දිනේෂ් ගුණවර්ධන අගමැතිතුමාත් ඉන්නවා. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රකාශයකුත් කළා නේ. අපි අහන්නේ, මේ කරන දේ ඒකට එකඟද කියන එකයි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. කරුණාකරලා ඔය කාරණය වෙනම ගන්න.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්ඩලික ගෙවිඳු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
මේ කරන දේ ඒකට එකඟද? මේ පෞද්ගලීකරණයට ඔබතුමන්ලා එකඟද?

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
අපි දැන් න්‍යාය පත්‍රයේ කටයුතුවලට යොමු වෙමු.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - கைத்தொழில் அமைச்சரும் சுகாதார அமைச்சரும்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Industries and Minister of Health)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගාල්ල, උළුවිටිකේ, ඕපාත, "නුවන්" යන ලිපිනයෙහි පදිංචි ඔ.ඒ. කලංසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගාල්ල, උළුවිටිකේ යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.කේ.එස්. රුක්ෂාන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු අනුරාධ ජයරත්න මහතා (අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுராத ஜயரத்ன - நீதி மற்றும் சிறைச்சாலை அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne - State Minister of Justice and Prison Affairs)

ගරු කථානායකතුමනි, කොළඹ 06, කිරුළපන, මහවෙල පෙදෙස, අංක 43 දරන ස්ථානයෙහි පදිංචි ජී.එච්. ජානක කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අනුප පස්කුවල් මැතිතුමා, පෙත්සම ඉදිරිපත් කරන්න.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

Sir, we have to adhere to the Standing Orders. I rise to a point of Order. Please, Sir!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

You wait a little till the Petitions are presented.

ගරු අනුප පස්කුවල් මහතා (සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுப பஸ்குவல் - சமூக வலுவூட்டுகை இராஜாங்க அமைச்சர்)
(The Hon. Anupa Pasqual - State Minister of Social Empowerment)

ගරු කථානායකතුමනි, පැළැද, අක්කර 20, අංක 429/04 දරන ස්ථානයෙහි පදිංචි පී.එච්. චම්ලා දිල්රුක්ෂි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බලංගොඩ, පින්නවල, හිටුවල යන ලිපිනයෙහි පදිංචි එච්.එල්.ඒ.එල්. කුමාරි මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කුරුවිට, මිල්ලවිටිය, අශෝක පෙදෙස යන ලිපිනයෙහි පදිංචි පී.ඒ. අනුලාවති මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

ගරු කථානායකතුමනි, මම කවදාවත් point of Order එකක් අරගෙන වෙනත් දේවල් කියලා නැහැ. ඒ හින්දා මෙහෙම කරන්න එපා.

ස්ථාවර නියෝග 50 (2) යටතේ, "යම් ආංශික අධීක්ෂණ කාරක සභාවක වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ කාලය ඉකුත් වෙනතෙක් පාර්ලිමේන්තුව විසින් ඒ පනත් කෙටුම්පත සම්බන්ධව කිසිදු පියවරක් ගනු නොලැබිය යුත්තේය" කියලා සඳහන් වෙලා තිබෙනවා. මේක මගේ ප්‍රශ්නයක් නොවෙයි. අපි මේ පනත් කෙටුම්පත ඉදිරියේදී ගනිමු. නමුත්, මේ ස්ථාවර නියෝගයට අනුව යම් ඉඩක් දිය යුතුයි කියලායි මම තර්ක කරන්නේ. එහෙම නැතිව ඔබතුමා මේක පෞද්ගලික ප්‍රශ්නයක් විධියට ගන්න එපා. Standing Orders ඇතුළත මේක ඉදිරියට යන්න බැහැ කියලා මම කියන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා තීරණයක් ගන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 50 (2) හි සඳහන් වන්නේ මෙසේයි:

> "එවැනි සෑම පනත් කෙටුම්පතක්ම පළමුවැනි වර කියවීම නිම වූ වහාම යෝජනාවක් නොමැතිව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කරනු ලැබිය යුත්තේ ය.
>
> කාරක සභාව විසින් පනත් කෙටුම්පතට සංශෝධන යෝජනා කරනු ලැබිය හැකි ය. කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ආපසු වාර්තා කරන තෙක්..."

ඔබතුමා කියන එක හරි. අද වාර්තාව ඉදිරිපත් කළා. *[බාධා කිරීමක්]* කොහේද? ඊයේ තිබ්බිව එකේ වාර්තාව අද ඉදිරිපත් කරන්නේ නැතුව කවදාද ඉදිරිපත් කරන්නේ? පෙරේදා ඉදිරිපත් කරන්නද? අපි මේ procedure එක follow කර තිබෙනවා. ඒ අනුව වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා. මට පෙන්වා දෙන්න ඕනෑ කළේ ඒකයි. ඒ ගැන තර්කයක් නැහැ.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය: භෞත චිකිත්සකවරුන්
ஸ்ரீ லங்கா கிரிக்கெட் நிறுவனம்: இயன் மருத்துவர்கள்
SRI LANKA CRICKET: PHYSIOTHERAPISTS

1285/2024

1. ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සේවය කරනු ලබන භෞත චිකිත්සකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් භෞත චිකිත්සකවරයාගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් භෞත චිකිත්සකවරුන්ගේ රාජකාරි ස්වභාවය කවරේද;

(iv) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් හා වෙනත් දීමනා කවරේද;

(v) ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ වර්තමාන පසුබෑම මහහරවා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஸ்ரீலங்கா கிரிக்கெட் நிறுவனத்தில் பணிபுரியும் இயன் மருத்துவர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வோர் இயன் மருத்துவரின் பெயர் மற்றும் முகவரி தனித்தனியே யாதென்பதையும்;

(iii) மேற்படி இயன் மருத்துவர்களின் கடமையின் தன்மை யாதென்பதையும்;

(iv) இவர்களுக்கு வழங்கப்படும் சம்பளம் மற்றும் பிற கொடுப்பனவுகள் யாவை என்பதையும்;

(v) இலங்கை கிரிக்கெட் அணியின் தற்போதைய பின்னடைவைத் தவிர்ப்பதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Sports and Youth Affairs:

(a) Will he inform this House -

(i) the number of physiotherapists employed at the Sri Lanka Cricket;

(ii) the name and address of each such physiotherapist, separately;

(iii) the nature of the duties of the physiotherapists mentioned above;

(iv) salaries and other allowances paid to them; and

(v) measures taken to overcome the current set back of the Sri Lankan Cricket Team?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 07කි.

(ii) මෙම භෞත චිකිත්සකවරුන් සියලුදෙනාම සේවා නියුක්ත ගිවිසුමක් යටතේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ ගිවිසුම්ගත වී ඇති නිසාවෙන් ඔවුන්ගේ තොරතුරුවල රහස්‍යභාවය රැකීම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතු යුතුකමක් වන බැවින් නිසි නීතිමය ක්‍රියාමාර්ගයකින් තොරව එම තොරතුරු තෙවන පාර්ශවයක් සඳහා අනාවරණය කළ නොහැකි බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සඳහන් කර ඇත.

(iii)
- ශ්‍රී ලංකාව හා සම්බන්ධ සියලුම ජාතික කණ්ඩායමේ ක්‍රීඩකයින්ගේ ආබාධ කළමනාකරණය අධීක්ෂණය කිරීම.
- ආබාධ කළමනාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය සියලුම වෛද්‍ය සහ අනෙකුත් අදාළ යොමු කිරීම් සම්බන්ධීකරණය කිරීම.
- ක්‍රිකට් කණ්ඩායම් සමඟ තරග සංචාර සඳහා සහභාගී වීම.
- වෛද්‍යවරුන්, පුහුණුකරු සහ ඉහළ කාර්ය සාධන පුහුණුව සහ පුනරුත්ථාපන ඒකකයේ කළමනාකරු සමඟ ආබාධ අවම කර ගැනීම සඳහා කටයුතු කිරීම.
- රෝග විනිශ්චය කිරීම, ප්‍රතිකාර කිරීම සහ සැලසුම් කිරීම.
- ආබාධ අවම කිරීම (මාංශ පේශී පරීක්ෂාව ඇතුළුව), ආබාධ අවම කිරීමේ කළමනාකරණ උපාය මාර්ග, ආබාධ ප්‍රකෘතිමත් කිරීමේ ප්‍රොටෝකෝල සහ ක්‍රීඩකයාගෙන් ක්‍රීඩකයාට පුද්ගලීකරණය කරන ලද ව්‍යායාම් සහ පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සියලු කළමනාකාරිත්වය, තේරීම්කරුවන්, පුහුණුකරුවන්, ක්‍රීඩකයන් සහ සහායක කාර්ය මණ්ඩලය සමඟ නිතිපතා සන්නිවේදනය.
- භෞත චිකිත්සක සටහන් හෝ වාර්තා තබා ගැනීමේ උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම.
- භෞත චිකිත්සාව සහ වෛද්‍ය විද්‍යාවට අවශ්‍ය පරිදි අදාළ නිෂ්පාදන ඇණවුම් නඩත්තු කිරීම.
- අනෙකුත් සහායක කාර්ය මණ්ඩලය, පුහුණුකරුවන්, ක්‍රීඩකයන් සහ පරිපාලකයන් සමඟ නිත්තර සම්බන්ධතා පවත්වා ගනිමින් අවශ්‍ය සේවය ලබා දීම.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

- ආදර්ශය තබා ශ්‍රී ලංකාව විසින් සංවිධානය කරන ලද සියලු කණ්ඩායම් ක්‍රීඩක වගකීම් ඉටු කිරීම සහ ඒවාට අනුකූල වීම.
- ඕනෑම කණ්ඩායම් ක්‍රීඩකයන්ගේ භෞත චිකිත්සක අවශ්‍යතා සඳහා සහාය වීමට ඉදිරිපත් වීම.

(iv) මෙම භෞත චිකිත්සකවරුන් සියලු දෙනාම සේවා නියුක්ත ගිවිසුමක් යටතේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ ගිවිසුම් ගත වී ඇති නිසාවෙන් ඔවුන්ගේ තොරතුරුවල රහස්‍යභාවය රැකීම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතු යුතුකමක් වන බැවින් නිසි නීතිමය ක්‍රියාමාර්ගයකින් තොරව එම තොරතුරු තෙවන පාර්ශ්වයක් සඳහා අනාවරණය කළ නොහැකි බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සඳහන් කර ඇත.

(v) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ඉහළ කාර්යය සාධන අංශය විසින් විවිධාකාර වැඩ පිළිවෙළ සකස් කර ඇති අතර දැනට ක්‍රියාත්මක කරමින් පවතින බවද සඳහන් කර ඇත. (එම වැඩසටහන් පිළිබඳව ඇමුණුම 01 සිට ඇමුණුම 05 දක්වා සඳහන් කර ඇත.) ඇමුණුම් **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මට පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන්ද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ක්‍රීඩකයෝ ඔක්කෝම ඇමෙරිකාවටයි, බාබර්ඩෝස්වලටයි ගිහිල්ලා, ක්‍රීඩා කරන්න.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, ඒක තමයි මම ඇහුවේ මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන්ද කියලා. අපේ සභානායකතුමා ඒකට උත්තර දෙන්න-

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමා අහන්න.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු ඇමතිතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු 2017 වසරේ තමයි ආරම්භ කළේ.

මෙම ක්‍රිකට් ක්‍රීඩාංගණය හදන්න විශාල මුදලක් වැය කළා. දැනට අවුරුදු 7ක් ගතවෙලා තිබෙනවා. නමුත්, ඒක හදලා නිම කරන්න විධියක් නැහැ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ක්‍රිකට් සෙල්ලම් කරන දරුවන්ට ක්‍රිකට් පුහුණු වෙන්න මධ්‍යස්ථානයක් නැහැ. එම ක්‍රීඩාංගණය ඉක්මනින්ම හදලා නිම කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ජාතික මට්ටමට යන්න සුදුසුකම් තිබෙන දරුවෝ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඉන්නවා, උතුරු මැද පළාතේත් ඉන්නවා. උතුරු මැද පළාතේ සිටින දරුවන්ට ඒ ක්‍රිකට් ක්‍රීඩාංගණය වැදගත් වෙනවා, ගරු ඇමතිතුමනි. එහි ඉදිකිරීම් කටයුතු අවසන් කරන්නේ කවදාද කියන එකයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය වන්නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එම ප්‍රශ්නයට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් පිළිතුරු ලබාගෙන ඔබතුමාට දැනුම් දෙන්නම්.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුර ප්‍රශ්නය ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් අහලා තේරුමක් නැහැ. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -1700/2024- (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ඊයේ දවසේ ගරු සභානායකතුමාට මම වැදගත් කාරණාවක් මතු කළා. T20 World Cup එකට ගිය අපේ Sri Lankan Cricket Team එකට ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා. ICC Regulations උල්ලංඝනය වෙලා තිබෙනවා. ඒ අය නවතින hotel එක, ground එකේ ඉඳලා විනාඩි 45ක දුරකින් තමයි තිබෙන්න ඕනෑ. නමුත්, එය පැය එකහමාරක් තිස්සේ යන්න ඕනෑ දුරකින් තිබෙන්නේ. ඒ වාගේම අපේ කණ්ඩායම පමණයි වෙන වෙනම venues 4ක ඒ matches ගහන්න දමලා තිබෙන්නේ. ඒ වාගේම ඒගොල්ලන්ට flight එක delay වීම නිසා, flight එක ගන්න බැරි වීම නිසා practice matches පවා අහිමි වෙලා තිබෙනවා. මම ඊයේ දවසේ දීත් ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. ඒ පිළිබඳව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ගන්නා පියවර මොකක්ද?

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මනා සම්බන්ධතාවක් තිබෙනවාය කියනවා නේ, ICC එකත් එක්ක. ඉතින් ඇයි, ICC එක මේ වාගේ අසාධාරණයක් අපේ රටේ ක්‍රිකට් කණ්ඩායමට කරන්නේ? මට පෙනෙන විධියට ඒ අය හිතාමතාම මොන යම් හෝ ක්‍රමයකට අපේ ක්‍රීඩකයන්ගේ තෙහෙට්ටුව වැඩි කරන වැඩ පිළිවෙළකට ගිහිල්ලා තිබෙනවා. මම අහන්න කැමැතියි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය logistics පිළිබඳව, World Cup cricket matchesවල schedule එක පිළිබඳව, hotel accommodation, practise matches, flight arrangements ගැන උනන්දුවක් දක්වලා නැද්ද කියලා. මොනවාද මේ නිලධාරීන් කරලා තිබෙන්නේ? මේ අය පොල් ගාලා තිබෙන්නේ. ගරු සභානායකතුමනි, මට ඒකට උත්තරයක් ඕනෑ. මම ඊයේ ඔබතුමාගෙන් ඒ ගැන ඇහුවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මා එම කරුණු යොමු කළා. උත්තරය ලැබිලා නැහැ. හෙට දිනයේ උත්තර ලැබුණාම මම එය ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -1702/2024- (1), ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

පුත්තලම දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම: විසඳුම්
புத்தளம் மாவட்டத்தில் நிலவும் யானை-மனித மோதல்: தீர்வுகள்
HUMAN-ELEPHANT CONFLICT IN PUTTALAM DISTRICT: SOLUTIONS

1727/2024

4. ගරු ජගත් ප්‍රියංකර මහතා
(மாண்புமிகு ஜகத் பிரியங்கர)
(The Hon. Jagath Priyankara)
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා පුත්තලම දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම හේතුවෙන් මිය ගිය පුද්ගලයන් සංඛ්‍යාව සහ වන අලින් සංඛ්‍යාව එක් එක් වනජීවී කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පුත්තලම දිස්ත්‍රික්කයේ පවතින අලි-මිනිස් ගැටුමට ස්ථිර විසඳුමක් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வனசீவராசிகள் மற்றும் வன வளங்கள் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டு தொடக்கம் இதுவரை புத்தளம் மாவட்டத்தில் யானை-மனித மோதல் காரணமாக மரணித்துள்ள ஆட்களினதும் காட்டு யானைகளினதும் எண்ணிக்கை, ஒவ்வொரு வனசீவராசிகள் வலயத்துக்கு ஏற்ப தனித்தனியே யாதென்பதையும்;

(ii) புத்தளம் மாவட்டத்தில் நிலவும் யானை-மனித மோதலுக்கு நிரந்தரத் தீர்வொன்றைப் பெற்றுக் கொடுப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Wildlife and Forest Resources Conservation:

(a) Will she inform this House -

(i) the number of people and wild elephants died due to the human-elephant conflict in Puttalam District, separately according to each wildlife zone, from 2010 to date; and

(ii) the measures that will be taken to provide a permanent solution to the human-elephant conflict in Puttalam District ?

(b) If not, why?

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (වනජීවී හා වන සම්පත් සංරක්ෂණ සහ වාරිමාර්ග අමාත්‍යතුමිය)
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னி ஆரச்சி - வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரும் நீர்ப்பாசன அமைச்சரும்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law - Minister of Wildlife and Forest Resources Conservation and Minister of Irrigation)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඇමුණුම 01 හා 02 මගින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 01

මිනිස් මරණ (පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම අනුව)

දිස්ත්‍රික්කය		ප්‍රා.ලේ. කොට්ඨාසය	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024.05.22	එකතුව
පුත්තලම	1	කරුවලගස්වැව	1	1	2	3	4	2	0	1	3	0	2	3	2	4	1	29
	2	ආණමඩුව	1	0	0	0	0	0	0	0	0	0	0	0	0	0	1	2
	3	වනාතවිල්ලුව	0	0	1	0	0	0	0	0	0	0	0	1	1	1	1	5
	4	නවගත්තේගම	0	0	1	1	0	0	1	1	1	1	1	2	1	2	0	12
	5	පල්ලම	0	0	0	0	0	0	0	0	0	0	1	0	0	0	0	1
	6	පුත්තලම	0	0	0	2	0	0	1	1	1	2	0	2	0	0	0	10
	7	මහකුඹුක්කඩවල	1	0	0	0	0	0	0	0	1	1	3	1	0	0	0	7
	එකතුව		3	2	4	6	4	2	2	3	6	4	7	9	4	7	3	66

[ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මී]

ඇමුණුම - 02

වනඅලි මරණ සංඛ්‍යාව (පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම අනුව)																		
දිස්ත්‍රික්කය		ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024.05.22	එකතුව
පුත්තලම	1	කරුවලගස්වැව	2	4	9	1	3	2	8	4	1	2	4	6	5	5	3	59
	2	ආනමඩුව	0	0	1	0	0	0	0	0	1	0	1	0	1	2	1	7
	3	වනාතවිල්ලුව	1	1	2	2	3	3	2	5	2	3	4	1	3	3	1	36
	4	නවගත්තේගම	2	3	4	3	1	0	0	4	0	6	3	6	4	3	1	40
	5	පුත්තලම	1	4	1	0	0	0	1	3	2	1	3	2	0	0	1	19
	6	මහකුඹුක්කඩවල	0	0	0	0	0	0	0	2	1	1	0	0	2	2	0	8
	එකතුව		**6**	**12**	**17**	**6**	**7**	**5**	**11**	**18**	**7**	**13**	**13**	**15**	**15**	**15**	**7**	**169**

(ii) ඔව්.

1. පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති ගම්මානවල වනඅලි තර්ජන අවම කිරීම සඳහා විදුලි වැටවල් 20ක් ඉදිකර ඇති අතර, එහි සමස්ත දිග කිලෝමීටර 350කි. මේ වන විට එය බහුකාර්ය සංවර්ධන සහායකයින් හා සිවිල් ආරක්ෂක භටයින් යොදවා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ හොඳින් නඩත්තු කරමින් පවත්වාගෙන යනු ලබයි.
2. වනඅලි රංචු ගම්මානවලට ඇතුළු වූ අවස්ථාවලදී සංවිධානාත්මකව වනඅලි පලවා හැරීමේ මෙහෙයුම් සිදු කර, වනඅලි රක්ෂිත ප්‍රදේශ වෙත නැවත පලවා හැරීමට කටයුතු කරනු ලබයි.
3. ජනතාවගෙන් ලැබෙන පැමිණිලි අනුව පුත්තලම වනජීවී කාර්යාලයේ නිලධාරීන් විසින් ගම්මානවලට පැමිණෙන වනඅලින් පලවා හැරීම සඳහා අවස්ථානුකූලව පියවර ගනිමින් පවතී.
4. පුත්තලම දිස්ත්‍රික්කයේ වනඅලින්ගෙන් සිදුවන දේපළ හානි හා වගා හානි අවම කිරීම සඳහා ගොවි සංවිධාන හා ගම්වාසීන් වෙත අලි වෙඩි ලබා දීමට කටයුතු කරන අතර, අදාළ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ඉල්ලීම සලකා බලා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත අලි වෙඩි නිකුත් කර ග්‍රාම නිලධාරීන් හරහා අලි වෙඩි අවශ්‍යතාව පවතින ගොවි සංවිධාන වෙත හා ගම්වාසීන් වෙත ලබා දීමට කටයුතු කරනු ලබයි.

(ආ) අදාළ නොවේ.

ගරු ජගත් ප්‍රියංකර මහතා
(*மாண்புமிகு ஜகத் பிரியங்கர*)
(The Hon. Jagath Priyankara)

ගරු අමාත්‍යතුමියනි, අපි විශාල වියදමක් දරලා දිස්ත්‍රික්කය පුරා අලි වැටවල් ඉදිකරලා තිබුණත්, කරුවලගස්වැව, එගොඩපිටිය, පාලියාගම, තේවනුවර, නවගත්තේගම සහ මා නියෝජනය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුකැටියාව, මහබැද්දෑව, රලපනාව වැනි තැන්වලත්, කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලින් අලි ගැවසුණේ නැති අටේ කණුව වැනි නාගරික ස්ථානවලත් විශාල වශයෙන් අලි ඉන්නවා. මට පැහැදිලියි, අපි ප්‍රශ්න කරන තරම් මේවාට උත්තර දෙන්න පහසු නැහැ කියන එක. නමුත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා සිවිල් ආරක්ෂක බලකාය හදන අලි වැට යම් ආකාරයකට අසාර්ථක වීමටත්, පෞද්ගලිකව මිනිසුන් හදාගෙන තිබෙන අලි වැටවල් සාර්ථක වීමටත් යම් හේතුවක් හඳුනා ගෙන තිබෙනවාද, එහෙම නැත්නම් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අලි වැට සියයට සියයක් සාර්ථකයි කියන තක්සේරුවේ අමාත්‍යාංශය විධියට ඔබතුමිය ඉන්නවාද කියන කාරණයත් පළමු අතුරු ප්‍රශ්නය විධියට මම අහන්න කැමැතියි.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னி ஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අලි වැටවල් සකස් කරනු ලබන්නේ තාක්ෂණික අවශ්‍යතා සියල්ල සපුරාලමින් ප්‍රමිතියකට අනුවයි. අපි පිළිගන්නවා, අලි වැටවල් සම්බන්ධව පසුගිය කාලයේ ප්‍රශ්න ඇති වුණා කියලා. අපට සේවක සංඛ්‍යාවක් මදි වෙලා තිබුණා, පසුගිය අවුරුදු ගණනාව පුරාවට මේ අලි වැටවල් නඩත්තු කරන්න. පෞද්ගලික අංශය අලි වැටවල් හදනවා නම් ඒවා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ standardsවලට, ඒ නිර්මිතයන්ට අනුකූලව තමයි හැදිය යුත්තේ. මම එහි technical තත්ත්වය, තාක්ෂණික තත්ත්වය සම්බන්ධයෙන් expert කෙනෙක් නොවෙයි. හැබැයි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තාක්ෂණික කරුණු මත, විද්‍යාත්මක සේවයේ නිලධාරීන් ඉන්න දෙපාර්තමේන්තුවක්. ලංකා ඉතිහාසය පුරාම අලි වැටවල් නඩත්තු කරගෙන යන්නේ ඒ තාක්ෂණික කරුණු අනුවයි. නමුත් අපි පිළිගන්නවා, අලි වැටවල් කැඩෙනකොට හදාගන්න අවශ්‍ය තරමට සේවක සංඛ්‍යාවක් අපට හිටියේ නැහැ කියලා. ඒ නිසා තමයි අලුතින් 4,000කට ආසන්න සේවක සංඛ්‍යාවක් - cadre එකක් - අනුමත කරගෙන බහුකාර්ය සංවර්ධන නිලධාරීන්ට ඉදිරියේදී පත්වීම් ලබා දීලා අපේ තිබෙන යම් අඩු පාඩු හදාගන්න අපි කටයුතු කරන්නේ.

ගරු ජගත් ප්‍රියංකර මහතා
(*மாண்புமிகு ஜகத் பிரியங்கர*)
(The Hon. Jagath Priyankara)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමිය ප්‍රකාශ කළ ආකාරයට අපට පැහැදිලි වෙලා තිබෙනවා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හදන අලි වැටක සාමාන්‍යයෙන් අඩි පහක විතර උසක් තිබෙන බවත්, අඩි භාගයක් විතර පොළොව යටට දමන බවත්. නමුත්, පෞද්ගලිකව හදන අලි

වැටවල උස අඩි 10ක් විතර වෙනවා, අඩි දෙකක් විතර පොළොව යටට දමනවා. ඔබතුමියට පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරන මහජන නියෝජිතයින් වශයෙන් අපිත්, සිවිල් සංවිධානත්, ප්‍රජා සංවිධාන ව්‍යුහයත් අලි වැට සහ මේ ක්‍රියාවලිය සම්බන්ධව අවශ්‍ය සහයෝගය ලබා දෙනවා. අලි ගම් වදින්නේ විශේෂයෙන්ම අලින්ට ආහාර පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන නිසායි.

ඒ වාගේම තමයි අපේ දිස්ත්‍රික්කයේ තිබෙන දුෂ්කර ප්‍රදේශවල වීදි ලාම්පු නැහැ. වීදි ලාම්පු තිබුණත් අලි ගම් වදින එක නවතින්නේ නැහැ. නමුත්, අඩු තරමින් එතකොට මිනිස්සුන්ට අලියා පෙනෙනවා නේ. වීදි ලාම්පු නැති නිසා අලියා පෙනෙන්නේ නැහැ. මේ ගම්වල විදුලි ආලෝකය නැති එකත් මිනිස්සුන්ගේ ජීවිත නැති වෙන්න විශාල වශයෙන් බලපා තිබෙනවා. ඉතාම දිළිඳු පළාත් පාලන ආයතන ප්‍රමාණයක් තමයි පුත්තලම දිස්ත්‍රික්කයේ අග කොටසේ තිබෙන්නේ. ඒ නිසා ඒ සම්බන්ධව අපි ප්‍රජා ව්‍යුහයත් එක්ක මැදිහත් වෙලා ඔබතුමියගේ අමාත්‍යාංශයට තවදුරටත් සක්‍රියව සම්බන්ධ වෙලා මේ කටයුත්ත කර ගන්න යම් යෝජනාවලියක් ඉදිරිපත් කරන්නේ නම්, ඒ සම්බන්ධව ප්‍රතිචාර දක්වන්න ඔබතුමිය සූදානම්ද?

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னி ஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ, අප අතරින් වෙන් වූ ගරු සනත් නිශාන්ත මැතිතුමා ගැනත්. ඇත්තටම පුත්තලම දිස්ත්‍රික්කයේ තිබෙන මෙවැනි ප්‍රශ්න ගැන අපි කිහිප වතාවක්ම කථා කළා; ඒවාට අවශ්‍ය විසඳුම් පවා ගත්තා. අවසාන වශයෙන් සනත් නිශාන්ත මැතිතුමා මගෙන් ඉල්ලීමක් කරලා තිබුණා, මහජන නියෝජිතයන් සමඟ මේ සම්බන්ධව තවත් සාකච්ඡාවක් කරන්න කියලා. මේ සම්බන්ධව සාකච්ඡාවක් කරලා සුදුසු නීත්‍යානුකූල ක්‍රියාමාර්ගවලට එළඹෙන්න අපට පුළුවන්. අපි මේ මාසය ඇතුළත ඔබතුමන්ලාට එම සාකච්ඡාවට දිනයක් දෙන්නම්.

ගරු අශෝක ප්‍රියන්ත මහතා (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக்க பிரியந்த - உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ashoka Priyantha - State Minister of Home Affairs)

ගරු ඇමතිතුමියනි, ඔබතුමිය මේ වෙද්දීත් මේ කාරණයට අවධානය යොමු කරලා තිබෙනවා. මීට අවුරුදු දෙකකට විතර කලින් තිබුණු අලි-මිනිස් ගැටුමේ ස්වභාවය නොවෙයි, වර්තමානයේ තිබෙන්නේ. දැන් ඒ තත්ත්වය අඩු වෙලා තිබෙනවා. එලෙස අඩු වෙන්න හේතුව, අපි බහුකාර්ය සංවර්ධන සහායකයන් අලි වැට නඩත්තු කිරීමට යෙදවීමයි. බහුකාර්ය සංවර්ධන සහායකයන් විශාල පිරිසක් අලි වැට නඩත්තු කිරීමට යොදවා තිබුණත්, අනික් ක්ෂේත්‍රවල බහුකාර්ය සංවර්ධන සහායකයන්ගේ සේවය ස්ථිර වුණත්, මේ අයගේ සේවය තවම ස්ථිර කරලා නැහැ. ඒ නිසා ඔබතුමියගේ අවධානය යොමු කරලා ඒ අයට සිදුවන අසාධාරණයට විසඳුමක් ලබා දෙන්න. විශේෂයෙන්ම ඔබතුමියත් දන්නවා, මේ අය මේ ආණ්ඩුව යටතේ බඳවා ගත් අය බව. යම් විධියකට මේ කාල සීමාව තුළ ඔවුන්ගේ සේවය ස්ථිර කළේ නැත්නම් ඔවුන්ට ලොකු අසාධාරණයක් වෙනවා. ඔවුන් අලි වැටත් ආරක්ෂා කරනවා; මිනිස්සුත් ආරක්ෂා කරනවා; ඒ වාගේම ගොවිතැනත් ආරක්ෂා කරනවා. හැබැයි, අපි ඔවුන්ව ආරක්ෂා කරලා නැහැ. ඔබතුමිය මේ අමාත්‍යාංශය භාර ගත්තේ ළඟදී. මම දිස්ත්‍රික්කයේ ඉන්න මහජන නියෝජිතයෙකු විධියට ඔබතුමියගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, පුළුවන් නම් මේ අවස්ථාවේ ඒ පිළිබඳව අදහසක් දක්වන්න කියලා.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னி ஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

මම ස්තුතිවන්ත වෙනවා, ස්වදේශ කටයුතු රාජ්‍ය ඇමතිතුමා මේ සභාවේදී මේ කාරණය මතු කිරීම ගැන. විශේෂයෙන්ම කියන්න ඕනෑ, ඒ නිසා තමයි අපි අලුතෙන් සේවක සංඛ්‍යාවක් බඳවා ගත්තේ කියලා. අපි මේ අය බඳවා ගන්නේ දැනට නිශ්චිතව තිබෙන cadre එක ඇතුළට හෝ සේවක සංඛ්‍යාව ඇතුළට නොවෙයි, අලුත්ම සේවකයෝ විධියටයි. නමුත්, මහ පෙන්වන මහත්වරු - guidesලා - මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දැම්මා. ඔවුන් ඉන්නේ අපේ ස්ථිර cadre එකේ නොවෙයි. ඔවුන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දැම්මා, අපේ දැනට තිබෙන cadre එකට ඔවුන්ව බඳවා ගන්න කියලා. ඒ අවස්ථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණය සහ නීතිපති දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා මේ බහුකාර්ය සංවර්ධන සහායකයන් බඳවා ගැනීම නවත්වා තිබෙනවා.

ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තමයි තාවකාලිකව ඒ කටයුත්ත නවත්වා තිබෙන්නේ. උසාවියට කරුණු ඉදිරිපත් කරපු සංචාරක මහ පෙන්වන්නන්ගේ ඉල්ලීම තිබෙන්නේ, ඒ අය දැනට තිබෙන cadre එකට බඳවා ගන්න කියලා. මේ සතියේ - මට මතක විධියට අද - අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් රැස් වෙනවා, තිබෙන cadre එකට ඉන්න අය බඳවා ගැනීම සම්බන්ධයෙන් තීන්දුවක් දෙන. මා හිතනවා, ඒ කමිටුවෙන් ඉතා ම සාධනීය ප්‍රතිචාරයක් අපට ලබා දෙයි කියලා. ඒ තීන්දුව ලැබුණු වහාම අපි උසාවියට ගිහිල්ලා කරුණු ඉදිරිපත් කරලා, බහුකාර්ය සංවර්ධන සහායකයන් බඳවා ගැනීමට අවශ්‍ය නියෝගය උසාවියෙන් ලබා ගන්නවා. මෙතැන තිබෙන ප්‍රශ්නය, මම මේ අමාත්‍යාංශයට අලුත් වීම හෝ වෙනත් කාරණයක් නොවෙයි, මෙය උසාවියේ තිබෙන කරුණක් වීමයි. අපි ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා, භාරදහස් ගණනක් අලුතෙන් බඳවා ගැනීමට, අලුත් සේවක සංඛ්‍යාවක් ඇති කරලා මේ කටයුත්ත සිදු කිරීම ගැන. නමුත්, මෙය උසාවියේ තිබෙන ගැටලුවක්. ඇත්තටම එතැන යම් අසාධාරණයක් තිබෙන බව මටත් පෙනෙනවා. මොකද, මහ පෙන්වන්නන්ට රස්සාව දෙන්න කියලා වෙනත් කණ්ඩායමකට රස්සාව දීම නවත්වා තිබෙන එකේ යම් අසාධාරණයකුත් පෙනෙනවා. කොහොම වුණත්, තිබෙන සේවක සංඛ්‍යාවට මහ පෙන්වන්නන් ඇතුළත් කර ගත්තාට පස්සේ අපි උසාවියට ගිහිල්ලා කියනවා, බහුකාර්ය සංවර්ධන සහායකයන්ට ස්ථිර පත්වීම් ලබා දීම සම්බන්ධයෙන් තිබෙන තහනම් නියෝගය ඉවත් කර දෙන්න කියලා.

රජයේ වී ගබඩා: ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
அரச நெற்களஞ்சியசாலைகள்: திருகோணமலை மாவட்டம்
GOVERNMENT PADDY WAREHOUSES: TRINCOMALEE DISTRICT

1737/2024

5. ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iii) ඉහත එක් එක් ගබඩාවේ ගබඩා කළ හැකි වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

(iv) වර්ෂ 2015 සිට මේ දක්වා ඉහත ගබඩාවල ගබඩා කරන ලද වී ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් වී ගබඩා අතරින් මේ වනවිට භාවිතයට නොගන්නා වී ගබඩා තිබේද;

(ii) එසේ නම්, එම වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iv) භාවිතයට නොගන්නා වී ගබඩා නැවත භාවිතයට ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති වී ගබඩාවලින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

කමත්තොழිල් මත්‍රුම් පෙරුන්තෝට්ටක් කෛත්තොழිල් අමෛච්චරෛක් කේට්ට වින්නා:

(අ) (i) තිරුකෝණමලෛ මාවට්ටත්තිලුළ්ළ අරස නෙල් කළඤ්සියසාලෛකළින් එණ්ණික්කෛ යාදු;

(ii) අවෛ අමෛක්කප්පට්ටුළ්ළ ඉටංකළ් යාවෛ;

(iii) මේල්පඩි ඔව්වොරු කළඤ්සියසාලෛයිලුම් කළඤ්සියප්පටුත්තක්කූඩිය නෙල්ලින් අළවු වෙව්වේරාක යාදු;

(iv) 2015ආම් ආණ්ටු මුදල් ඉදුවරෛ මේල්පඩි කළඤ්සියසාලෛකළිල් කළඤ්සියප්පටුත්තප්පට්ට නෙල්ලින් අළවු ඔව්වොරු වරුටත්තුක්කුම් ඒර්ප වෙව්වේරාක යාදු;

එන්පතෛ අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ආ) (i) මේල්පඩි (අ)(i)ඉල් කුරිප්පිටප්පටුම් නෙල් කළඤ්සියසාලෛකළුක්කු මත්තියිල් තර්පොදු පයන්පටුත්තප්පටාදුළ්ළ කළඤ්සියසාලෛකළ් උළ්ළනවා;

(ii) ආමෙනිල්, මේල්පඩි නෙල්කළඤ්සියසාලෛකළින් එණ්ණික්කෛ යාදු;

(iii) අවෛ අමෛන්දුළ්ළ ඉටංකළ් යාවෛ;

(iv) පයන්පටුත්තප්පටාදුළ්ළ නෙල්කළඤ්සියසාලෛ කළෛ මීණ්ටුම් පයන්පටුත්තුවතර්කාක මේර් කොළ්ළප්පට්ටුළ්ළ නටවටික්කෛකළ් යාවෛ;

(v) තිරුකෝණමලෛ මාවට්ටත්තිලුළ්ළ නෙල්කළඤ් සියසාලෛකළිලිරුන්තු උච්ච් පයනෛප් පෙරුව තර්කාක නටෛමුරෛප්පටුත්තප්පටවුළ්ළ වේලෛත් තිට්ටංකළ් යාවෛ;

එන්පතෛයුම් අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Will he inform this House -

(i) the number of paddy warehouses of the Government located in Trincomalee District;

(ii) the places where they have been established;

(iii) the quantity of paddy that can be stored in each of the above warehouses, separately; and

(iv) the quantity of paddy stored in the above warehouses from 2015 to date, separately according to each year?

(b) Will he also inform this House -

(i) whether there are any paddy warehouses, among the paddy warehouses mentioned in (a)(i) above, which are not taken for any use currently;

(ii) if so, the number of such paddy warehouses;

(iii) the places where they are located;

(iv) the measures that have been taken to re-use the paddy warehouses which are not in use; and

(v) the programmes to be implemented to take the maximum use of the warehouses in Trincomalee District?

(c) If not, why?

ගරු ඩී.බී. හේරත් මහතා (පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு டீ.பீ. ஹேரத் - கால்நடை வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)

(The Hon. D.B. Herath - State Minister of Livestock Development)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වී අලෙවි මණ්ඩලය විසින් පරිහරණය කරන වී ගබඩා සංඛ්‍යාව 24කි.

එනම්,

වී අලෙවි මණ්ඩලය සතු - 23යි.

ගොවි සංවිධාන සතු - 01යි.

(ii) ඇමුණුම 01හි දක්වා ඇත.

ඇමුණුම 01

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
පරිහරණ තත්ත්වය

දිස්ත්‍රික්කය	ගබඩා අංකය	ගබඩා	පිහිටීම		ගබඩා ධාරිතාව මෙ.ටොන.
			ග්‍රාම නිලධාරී වසම	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	
ත්‍රිකුණාමලය	1	ජේවර්ෂත්‍රියන්පුර මහවිද්‍යාල වී	මහවිද්‍යාල වී	මොරවැව	500
	2	කන්කලේ 01	227 කන්කලේ නගරය	කන්කලේ	800
	3	කන්කලේ 02			1,000
	4	කන්කලේ 03	227 කන්කලේ දකුණ		800
	5	කන්කලේ 04			1,000
	6	කල්ලාරු 1	මහදැලුම	කේරුවර	1,000
	7	කල්ලාරු 2			1,000
	8	කිලිවෙරි	කිලිවෙරි 218 A	ඉසුර්	500
	9	මැදවිය	මැදවිය	ගෝමරන්කඩවල	200
	10	ගෝමරන්කඩවල	ගෝමරන්කඩවල		1,000
	11	පත්තුලම	පත්තුලම	මොරවැව	500
	12	සුරන්ගල් PMB	සුරන්ගල්	කින්නියා	450
	13	කඩුලගමුව 01	පුළුකුඩියිරුප්පු කඩුලගමුව	කඩුලගමුව	1,000
	14	කඩුලගමුව 02			1,000
	15	කඩුලගමුව 03			500
	16	ලුවිලෙන් 01	ඊත්තාසකර් 243 G	ත්‍රිකුණාමලය	2,000
	17	ලුවිලෙන් 02			2,000
	18	ලුවිලෙන් 03			500
	19	ලුවිලෙන් 04			500
	20	ලුවිලෙන් 05			500
	21	ලුවිලෙන් 06			500
	22	ලුවිලෙන් 07			500
	23	ලුවිලෙන් 08			550
	24	සුරන්ගල් FO	සුරන්ගල්	කින්නියා	250
එකතුව					18,550

(iii) ඇමුණුම 01හි දක්වා ඇත.

(iv) ඇමුණුම 02හි දක්වා ඇත. ඇමුණුම 02 **සභාගත*** කරමි.

(ආ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) වී මිලදී ගැනීමට අපේක්ෂිතයි.

- වී මිලදී ගැනීම හරහා වෙළෙඳ පොළේ වී සඳහා වන සහතික මිල ස්ථාවරව පවත්වාගෙන යෑම තුළින් ගොවියා ආරක්ෂා කර ගැනීමට.
- ඉදිරියේදී සහල් වෙළෙඳ පොළට පිවිසීමට බලාපොරොත්තු වන බැවින් ඒ සඳහා අවශ්‍ය ගබඩා පහසුකම් ලබා ගැනීමට.

(ඇ) අදාළ නොවේ.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(මාණ්පුමිකු இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ சபாநாயகர் அவர்களே, திருகோணமலை மாவட்டத்திலுள்ள அரச நெற்களஞ்சியசாலைகள் சம்பந்தமாக என்னால் பல ஆண்டுகளுக்கு முன்னர் வழங்கப்பட்ட கேள்வி இன்றுதான் கேட்கப்படுகின்றது. திருகோணமலை மாவட்டத்தில் நெற்களஞ்சியசாலைகளின் தேவைப்பாடு மிக அவசியமாகக் காணப்பட்ட சூழலில்தான் நான் இந்தக் கேள்வியை முன்வைத்திருந்தேன். கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக கேள்வியைக் கேட்கின்றேன்.

கிண்ணியாவில் காணப்படுகின்ற குறிஞ்சாக்கேணி, கிண்ணியா ஆகிய இரு கமநல சேவை நிலையங்களுக்குக்கீழ் 25 விவசாய சம்மேளனங்கள் காணப்படுகின்றன; 7,000க்கும் மேற்பட்ட விவசாயக் குடும்பங்கள் காணப்படுகின்றன; சுமார் 8,500 ஏக்கர் நிலத்தில் நெற்செய்கை செய்யப்படுகின்றது.

விவசாயிகள் தாங்கள் அறுவடை செய்யும் நெல்லைச் சேமிப்பதாலும், அவற்றை அரச களஞ்சியசாலைகளுக்கு வழங்குவதாலும் கட்டாயம் அவற்றை உலர்த்தவேண்டி உள்ளது. எனினும், அங்கு நெல்லை உலர்த்துவதற்குத் தேவையான சீமெந்துத் தளங்கள் இல்லாத நிலை காணப்படுகின்றது. அத்துடன், அவர்களிடம் நெல்லை உலர்த்துவதற்கான இயந்திரப் பொறிமுறைகளும் இல்லை. இதனால் அந்தப் பிரதேசங்களில் நெல் 'மாபியா'க்கள் நெல்லின் விலையை அதிகரிக்கின்ற சூழலும் ஏற்பட்டிருக்கிறது. குறிப்பாக ஆயிலியடி, சூரங்கல், குரங்குபாஞ்சான், நடுவூற்று, கண்டக்காடு போன்ற முக்கிய இடங்களை மையப்படுத்தியாவது சீமெந்துத் தளங்களை அமைத்து, நெல்லைக் காயவைப்பதற்கு ஏதாவது வேலைத்திட்டமொன்றை உங்களுடைய அமைச்சுமூலம் முன்னெடுக்க முடியுமா? என நான் கேட்கின்றேன்.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ඩී.බී. හේරත් මහතා
(மாண்புமிகு டீ.பீ. ஹேரத்)
(The Hon. D.B. Herath)

ගරු කථානායකතුමනි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වී ගබඩා 24ක් තිබෙනවා. දැනට රජය වී මිලදී ගැනීම සඳහා සෘජුව මැදිහත් නොවන නිසා ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණා සඳහා අපිට කෘෂිකර්ම අමාත්‍යාංශය හැටියට මැදිහත් වෙන්න පුළුවන්. විශේෂයෙන් ඒ කලාපයේ වී නිෂ්පාදනය බහුල වශයෙන් සිද්ධ වෙන නිසාත්, ගොවීන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න අවශ්‍ය වගකීම අපි ඉටු කළ යුතු නිසාත්, මේ වී ගබඩා 24 දැනට භාවිත කරන්න පුළුවන් තත්ත්වයේ තිබෙන නිසාත් ඔබතුමාගේ ඉල්ලීම ඉටු කරන්න පුළුවන්. අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරලා ඒ වෙනුවෙන් වැඩසටහනක් හදා ගන්න අපි කැමතියි.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ சபாநாயகர் அவர்களே, எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தில் குளங்களைப் புனரமைக்கின்ற வேலைத்திட்டங்கள் குறைவாகவே இடம்பெறுகின்றன. அங்குள்ள குளங்கள் சரியான முறையில் புனரமைக்கப்படாத ஒரு நிலையே காணப்படுகின்றது. எங்களுடைய கிண்ணியா பிரதேசத்தை எடுத்துக்கொண்டால், அங்கு குரங்குபாஞ்சான், இரட்டைக்குளம் உட்பட இன்னும் பல சிறிய குளங்கள் இருக்கின்றன. அவற்றைப் புனரமைத்தால் அங்குள்ள விவசாயிகள் நன்மை அடைவார்கள். அதுபோன்றுதான் சம்பூர் பிரதேசத்தில் -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය දීර්ඝ වැඩියි. ප්‍රශ්නය අහන්න තිබෙන්නේ විනාඩි දෙකයි.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

ප්‍රශ්නය තමයි මම අහන්නේ, ගරු කථානායකතුමනි. පොඩ්ඩක් පැහැදිලි කරලා කිව්වොත් තමයි ඒ කාරණය තේරෙන්නේ.

அதுபோன்றுதான் குச்சவெளி, வானல, சம்பூர் போன்ற பிரதேசங்களிலும் குளப் புனரமைப்பு சம்பந்தமான விடயம் முன்னெடுக்கப்படாமல் இருக்கின்றது. அரசாங்கத்தால் நிதி ஒதுக்கப்பட்டாலும், அந்த நிதி சரியான முறையில் பயன்படுத்தப்படாத காரணத்தால், ஒவ்வொரு வருடமும் நிதி கோருகின்ற அல்லது அந்தக் குளங்களைப் புனரமைக்கச் சொல்கின்ற நிலைமை காணப்படுகின்றது. ஆகையால், போதியளவு நிதியை ஒதுக்கி, அந்தக் குளங்களைப் புனரமைக்கின்ற வேலைத்திட்டத்தை மேற்கொண்டு, அவற்றைச் சரியான முறையில் பராமரிக்கக்கூடிய வகையில், ஏதாவது வேலைத் திட்டமொன்றை உங்களுடைய அமைச்சின் மூலம் முன்னெடுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නයක් නොවෙයි අහන්නේ, කථාවක් කරනවා නේ.

ගරු ඩී.බී. හේරත් මහතා
(මාණ්පුමිකු ඩ.පී. හේරත්)
(The Hon. D.B. Herath)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ තිබෙන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු ඒ වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතුවලට දායක වෙන්න පුළුවන්. ඔබතුමා ඒ අවශ්‍යතා ඉදිරිපත් කළාම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒ සඳහා මැදිහත් වෙලා ඒ කටයුතු ටික ඉෂ්ට කරන්න පුළුවන්. ඊට අමතරව අමාත්‍යාංශය සම්බන්ධ විදේශ ව්‍යාපෘති තිබෙනවා. ඒත් එක්කම ඔබතුමාගේ ඉල්ලීම ඉටු කරන්නත් අපට මැදිහත් වෙන්න පුළුවන්. අනිවාර්යයෙන්ම ඒ ඉල්ලීම් අපි ඉටු කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -1749/2024- (1), ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

මඩකලපුව මහාධිකරණය: විනිශ්චයකාරවරු
மட்டக்களப்பு மேல் நீதிமன்றம்: நீதிபதிகள்
HIGH COURT, BATTICALOA: JUDGES

1873/2024

7. ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(මාණ්පුමිකු එම්.ඒ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 ජූලි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා මඩකලපුවේ මහාධිකරණ නඩු කටයුතුවලට පත් කරන ලද සහ මාරුවීම් ලබා දෙන ලද විනිශ්චයකාරවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත මාරුවීම්, විනිශ්චයකාරවරුන්ට මාරුවීම් ලබා දෙන සාමාන්‍ය ක්‍රමයට සිදු කරන ලදේද්ද;

(iii) නොඑසේ නම්, ඉහත මාරුවීම්වලට හේතු කවරේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020 யூலை 01 முதல் 2020 டிசம்பர் 31 வரை மட்டக்களப்பு மேல் நீதிமன்றத்துக்கு நியமிக்கப் பட்ட மற்றும் மட்டக்களப்பு மேல் நீதிமன்றத் திலிருந்து இடமாற்றம் செய்யப்பட்ட நீதிபதி களின் பெயர்களை வெவ்வேறாகவும்;

(ii) நீதிபதிகள் வழமையாக இடமாற்றம் செய்யப் படுகையில், பின்பற்றப்படும் வகைமாதிரியான நடவடிக்கை முறைகளுக்கு அமைவாக, மேற்குறிப்பிட்ட இடமாற்றங்கள் மேற்கொள்ளப் பட்டனவா என்பதையும்; மற்றும்

(iii) இன்றேல், மேலே குறிப்பிடப்பட்டுள்ள இடமாற்றங்களுக்கான காரணங்கள் எவை என்பதை யும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice, Prisons Affairs and Constitutional Reforms:

(a) Will he inform this House -
(i) separately, the names of the judges appointed to and transferred from the High Court sitting in Batticoloa from 1st July, 2020 to 31st December, 2020;
(ii) whether the above transfers were done following the ordinary course of regular transfer of judges; and
(iii) if not, the reasons for the above-mentioned transfers;

(b) If not, why?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2020 ජූලි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා මඩකලපුවේ මහාධිකරණය හා සම්බන්ධ මාරුවක් හෝ පත් කිරීමක් සිදු කර නොමැත.
(ii) පැන නොනඟී.
(iii) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 -1876/2024- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 -1908/2024- (1), ගරු තිස්ස අත්තනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 -1911/2024- (1), ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ටෙන්ඩර් අංක 2022/MSD/V/R/P/0066 යටතේ හදිසි ඖෂධ මිලදී ගැනීම්: විස්තර
2022/MSD/V/R/P/0066ஆம் கேள்விப் பத்திரத்தின் கீழ் செய்யப்பட்ட அவசர மருந்துக் கொள்வனவு: விபரம்
EMERGENCY PURCHASE OF DRUGS UNDER TENDER NO. 2022/MSD/V/R/P/0066: DETAILS

1700/2024

2. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. S.M. Marikkar)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හදිසි මිලදී ගැනීමේ යෝජනා ක්‍රමය අනුව අංක 2022/MSD/V/R/P/0066 ටෙන්ඩරය යටතේ මිලදී ගැනීම සඳහා අනුමත වූ ඖෂධ වර්ග තිස්දෙක (32) කවරේද;

(ii) එම ඖෂධ අතරින් සපයන ලද ඖෂධ වර්ග කවරේද;

(iii) එම ඖෂධ ලියාපදිංචි කර තිබේද;

(iv) ඉහත ටෙන්ඩරය ප්‍රදානය කිරීමේදී සම්මත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ඖෂධ භාවිත කිරීමෙන් අහිතකර ප්‍රතිවිපාක වාර්තා වී තිබේද;

(ii) එම ඖෂධ සඳහා වැඩ ඇණවුම් ඉල්ලීම් ලබා දුන්නේ කවුරුන්ද;

(iii) සෙල්සියස් අංශක 2 - 8 අතර උෂ්ණත්වයක් යටතේ ලබා දිය යුතු සමහර ඖෂධ ඉහත ඇණවුම තුළ අන්තර්ගත වී තිබියදී, වෛද්‍ය සැපයුම් අංශය විසින් එම ඇණවුම සඳහා අනුමතිය ලබා දීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාතාර අමෙච්සරෙක් කේට්ට වීනා:

(அ) (i) அவசர பெறுகைத் திட்டத்தின்படி 2022/MSD/V/R/P/0066ஆம் இலக்க கேள்விப் பத்திரத்தின்கீழ் கொள்வனவு செய்வதற்காக அனுமதி வழங்கப்பட்ட முப்பத்திரண்டு (32) வகையான மருந்துகள் யாவை என்பதையும்;

(ii) மேற்படி மருந்து வகைகளுள் விநியோகம் செய்யப்பட்ட மருந்து வகைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி மருந்துகள் பதிவு செய்யப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) மேற்படி கேள்விப்பத்திரத்தை வழங்கும்போது, ஏற்றுக் கொள்ளப்பட்ட கேள்விப் பத்திர நடவடிக்கைமுறை பின்பற்றப்பட்டுள்ளதா என்பதையும்;

(v) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி மருந்துகளைப் பாவித்தமையால் ஏற்பட்ட பாதகமான விளைவுகள் பதிவாகியுள்ளனவா என்பதையும்;

(ii) மேற்படி மருந்துகளுக்கான அனுப்பாணைக் கோரிக்கை யாரால் சமர்ப்பிக்கப்பட்டது என்பதையும்;

(iii) 2 - 8 பாகை செல்சியசுக்கு இடைப்பட்ட வெப்ப நிலையின்கீழ் வழங்கப்பட வேண்டிய சில மருந்துகள் குறித்த கட்டளையினுள் உள்ளடங்கியிருந்த நிலையிலும், மருத்துவ வழங்கல் பிரிவினால் மேற்படி கட்டளைக்கான அனுமதி வழங்கப்படுவதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) the thirty two (32) types of drugs approved under tender number 2022/MSD/V/R/P/0066 and under emergency purchases;

(ii) out of the aforesaid drugs, the types of drugs that were provided;

(iii) whether the above drugs have been registered;

(iv) whether the standard tender procedure has been followed when the above tender was granted; and

(v) if not, why?

(b) Will he also inform this House -

(i) whether any harmful effects have been reported by using the said drugs;

(ii) the person who has issued the Work Order Request for the said drugs; and

(iii) the reasons for the Medical Supplies Division (MSD) to grant its approval to purchase the above drugs, while the above order included several drugs which should be stored in a temperature of 2-8 degrees Celsius?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) හදිසි මිලදී ගැනීම් යෝජනා ක්‍රමය අනුව අංක 2022/MSD/V/R/P/0066 යන ඇණවුම යටතේ මිලදී ගැනීම් සඳහා යොමු කර ඇත්තේ අයිතම 09ක් පමණි.

New Srno	Item	Unit	New Order List Number	Order Quantity	Grn Received Qty	Balance Quantity By Grn
00200102	Digoxin Inj. 500 mcg/2mL Amp.	Amp	2022/MSD/V/R/P/00066	1,200	740	460
00200302	Furosemide (Frusemide) Inj. 20mg/2mL Amp.	Amp	2022/MSD/V/R/P/00066	625,000		625,000
00200701	Amiodarone Tab. 100mg	Tab	2022/MSD/V/R/P/00066	500,001		500,001
00201901	Sildenafil Tab. 50mg	Tab	2022/MSD/V/R/P/00066	375,000		375,000
00204701	Enoxaparin Inj. 4000IU/0.4mL PFS/Vial	PF. Syr	2022/MSD/V/R/P/00066	200,000	15,000	185,000
00204702	Enoxaparin Inj.6000/0.6mL PFS/Vial	PF.Syr	2022/MSD/V/R/P/00066	250,000	181,000	69,000
00205404	Aspirin Enteric-coated Tab75mg	Tab	2022/MSD/V/R/P/00066	65,000,000		65,000,000
00205902	Tranexamic Acid Tab/Cap 500mg	Tab	2022/MSD/V/R/P/00066	450,000		450,000
00205903	Tranexamic Acid Inj. 500mg/5mL Amp.	Amp	2022/MSD/V/R/P/00066	120,000		120,000

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

(ii) එම ඖෂධ අතරින් සපයා ඇති ඖෂධ වන්නේ,
I. Digoxin injection 5 mcg in 2 ml Ampule
II. Enoxaparin injection 6000 IU /06 ml PFS/Vial
III. Enoxaparin injection 4000 IU/0.4 ml BFS/Vial

(iii) මෙම ඖෂධය ලියාපදිංචිය අත්හැර දැමීම යටතේ ලබාගෙන ඇත. (WOR)

(iv) සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වූ මාර්ගෝපදේශය (Introducing Guidelines for Health Sector Emergency Procurement Process) අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ හදිසි ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම ඖෂධ වර්ගවලට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත.

(v) පැන නොනඟී.

(ආ) (i) නැත.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය.

(iii) සෙල්සියස් අංශක 2-8 අතර උෂ්ණත්වයක් යටතේ ලබා දිය යුතු අයිතම උක්ත ඇණවුම තුළ අඩංගු නොවේ.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -1702/2024- (1), ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

වකුගඩු රෝගීන්ගේ නිවාස අලුත්වැඩියා කිරීම: මූල්‍ය ආධාර වැඩසටහන
சிறுநீரக நோயாளிகளின் வீடுகளைப் புனரமைத்தல்: நிதியுதவித் திட்டம்
REPAIR OF HOUSES OF KIDNEY PATIENTS: FINANCIAL ASSISTANCE PROGRAMME

1749/2024

6. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு இஷாக் ரஹ்மான் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Ishak Rahuman)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වකුගඩු රෝගීන් සිටින පවුල්වල නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මූල්‍යමය ආධාරයක් ලබා දෙන්නේද;

(ii) එම මූල්‍යමය ආධාරය කොපමණද;

(iii) එම ආධාරය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් කවරේද;

(iv) ආධාරය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත මූල්‍යමය ආධාරය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ මේ වනවිට එම ආධාරය ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සුදුසුකම් සපුරා ඇති සියලුම ඉල්ලුම්කරුවන්ට එම ආධාරය ලබා දෙන්නේද;

(iii) එසේ නම් එම දිනය කවරේද;

(iv) ස්ථිර නිවසක් නොමැති වකුගඩු රෝගීන් සිටින පවුල් සඳහා නිවසක් ඉදිකර දීමේ වැඩසටහනක් ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

නගර අපිවිරුත්ති මත්‍රුම් වීඩමෛප්පු අමෛච්සරෛක් කේට්ට විනා:

(அ) (i) சிறுநீரக நோயாளிகளுள்ள குடும்பங்கள் வாழும் வீடுகளைப் புனரமைப்பதற்காக தேசிய வீடமைப்பு அதிகாரசபையால் நிதியுதவி வழங்கப்படுகின்றதா என்பதையும்;

(ii) அவ்வாறெனின், அந்நிதியுதவி எவ்வளவு என்பதையும்;

(iii) அந்நிதியுதவியைப் பெறுவதற்குத் தேவையான தகைமைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி நிதியுதவியைப் பெறுவதற்காகச் சமர்ப்பிக்க வேண்டிய ஆவணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்குறிப்பிட்ட நிதியுதவியைப் பெற்றுக் கொள்வதற்காக விண்ணப்பித்துள்ள நபர்களின் எண்ணிக்கை மற்றும் இன்றளவில் அந்நிதியுதவி வழங்கப்பட்டுள்ள நபர்களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்ட ரீதியாக தனித்தனியே யாதென்பதையும்;

(ii) தகைமைகளைப் பூர்த்திசெய்துள்ள சகல விண்ணப்பதாரிகளுக்கும் அந்நிதியுதவி வழங்கப் படுமா என்பதையும்;

(iii) ஆமெனில், அத்திகதி யாதென்பதையும்;

(iv) நிரந்தர வீடு இல்லாத சிறுநீரக நோயாளி களுள்ள குடும்பங்களுக்கு வீடுகளை அமைத்துக் கொடுக்கும் நிகழ்ச்சித்திட்டம் ஒன்றை ஆரம்பிப் பதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development and Housing:

(a) Will he inform this House -

(i) whether the National Housing Development Authority provides financial assistance to repair the houses of the families of the kidney patients;

(ii) if so, the amount of aforesaid financial assistance;

(iii) the qualifications required to receive the aforesaid financial assistance; and

(iv) the documents required to be submitted to receive the aforesaid financial assistance?

(b) Will he also inform this House -

(i) separately, as per each district, the number of people who have applied for aforesaid financial assistance and the number of people who received the assistance so far ;

(ii) whether the assistance is provided to all eligible applicants;

(iii) if so, the date; and

(iv) whether measures will be taken to start a programme to build houses for the families of the permanent houseless kidney patients?

(c) If not, why?

ගරු තේනුක විදානගමගේ මහතා (නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு தேனுக விதானகமகே - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Thenuka Vidanagamage - State Minister of Urban Development and Housing)

ගරු කථානායකතුමනි, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2017-2019 කාල වකවානුව තුළ මේ සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක වුවද, මේ වන විට වකුගඩු රෝගීන්ට නිවාස ආධාර ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක නොවන බව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය දන්වා සිටී.

(ii) එවකට ලබා දුන් මුදල රුපියල් 500,000කි.

(iii) කාලික වකුගඩු රෝගයෙන් පෙළෙන බවට සහතික ලත් පුද්ගලයන්ගෙන් සමන්විත නිවසක අවශ්‍යතාව ඇති පවුලක් වීම.

(iv) කාලික වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගියෙකු බවට සහ ප්‍රතිකාර ගන්නා බවට වෛද්‍ය වාර්තා, නිවාස ඉදිකිරීම කළ යුතු බවට ග්‍රාම නිලධාරී වාර්තාව, නිවසක් ඉදිකිරීම සඳහා නිරවුල් ඉඩමක් පවතින බවට සහතිකය, ආදායම් සහතික, බැංකු ගිණුම් තොරතුරු, ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත.

(ආ) (i) 2017-2019 කාලය තුළදී දිස්ත්‍රික්ක අනුව ආධාර ලබා දුන් පුද්ගලයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

වකුගඩු නිවාස ආධාර වැඩසටහන

වර්ෂ 2017 සිට 2019 දක්වා

දිස්ත්‍රික්කය	නිවාස සංඛ්‍යාව
අනුරාධපුරය	1,334
පොළොන්නරුව	1,305
බදුල්ල	71
කුරුණෑගල	532
මාතලේ	168
මොනරාගල	99
මුලතිව්	23
වවුනියාව	148
ත්‍රිකුණාමලය	85
අම්පාර	514
කොළඹ	02
ගම්පහ	18
කළුතර	52
මහනුවර	69
රත්නපුරය	64
එකතුව	**4,484**

(ii) එම වැඩසටහන ක්‍රියාත්මක වූ 2017-2019 කාල වකවානුව තුළ සුදුසුකම් සපුරා තිබූ සියලුම ඉල්ලුම්කරුවන්ට එම ආධාර ලබා දුන් බවට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය දන්වා සිටී.

(iii), (iv) එම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද 2017-2019 කාල වකවානු තුළ ඉල්ලුම් කරන ලද සියලු ඉල්ලුම්කරුවන්ට නිවාස ආධාර ලබා දුන් අතර, මේ වනවිට එම වැඩසටහන ක්‍රියාත්මක නොවන බව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය දන්වා සිටී.

(ඇ) අදාළ නොවේ.

පාසල් ශිෂ්‍යාවන් සඳහා සනීපාරක්ෂක තුවා ලබාදීමේ වැඩසටහන: විස්තර
பாடசாலை மாணவிகளுக்கு அணையாடைகளை வழங்கும் வேலைத்திட்டம்: விபரம்
PROGRAMME TO PROVIDE SANITARY NAPKINS TO FEMALE STUDENTS: DETAILS

1876/2024

8. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වන විට පාසල් අධ්‍යාපනය ලබන සිසුවියන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ සනීපාරක්ෂක තත්ත්වය උසස් කිරීමේ අරමුණින් ඔවුන්ට සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහනක් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩසටහන සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) සියලු පාසල් සිසුවියන් ආවරණය වන පරිදි එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போது பாடசாலைகளில் கல்வி பயிலும் மாணவிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அவர்களுடைய உடல் நலவியல் நிலைமையை மேம்படுத்தும் நோக்கத்தில் அவர்களுக்கு விடாய்க்கால அணையாடைகளை வழங்குவதற்கான வேலைத்திட்டமொன்று அமைச்சினால் நடைமுறைப்படுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அவ்வேலைத்திட்டத்துக்காக ஒதுக்கப்பட்டுள்ள நிதித் தொகை எவ்வளவு என்பதையும்;

(iv) சகல பாடசாலை மாணவிகளையும் உள்ளடக்கி அவ்வேலைத்திட்டத்தை நடைமுறைப்படுத்துவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of female students who are schooling in Sri Lanka at present;

(ii) whether a programme has been implemented by the Ministry to provide sanitary napkins to them in a bid to improve their personal hygiene;

(iii) if so, the amount allocated for the aforesaid programme; and

(iv) the measures that will be taken to implement the aforementioned programme, covering all female students?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන ප්‍රස්තුතය හා සම්බන්ධ උත්සවයකටම තමයි ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය දැන් සම්බන්ධ වෙලා ඉන්නේ. එතුමිය අද මේ ගරු සභාවට පැමිණ නැත්තේ කාන්තා සංසදය හැටියට එතුමිය මේ උත්සවයට සහභාගි වෙලා සිටින නිසායි.

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පාසල් අධ්‍යාපනය ලබන සිසුවියන් සංඛ්‍යාව (පාසල් සංගණනය 2022 - අධ්‍යාපන අමාත්‍යාංශයේ සංගණන ශාඛාවේ තොරතුරු අනුව)

	විස්තරය / ශ්‍රේණි පරාසය	සිසුවියන් සංඛ්‍යාව
1	1-5	773,712
2	6-9	657,095
3	10-11	330,182
4	12-13	235,992
5	විශේෂ අධ්‍යාපන ඒකක	2,780
	මුළු සිසුවියන් සංඛ්‍යාව	1,999,761

(ii) මේ වනවිට අතිදුෂ්කර, දුෂ්කර, හුදෙකලා පාසල්, වතු පාසල් හා දරිද්‍රතා සිසුන් සහිත නාගරික පාසල්වල ශිෂ්‍යාවන් ඇතුළත් පළාත් පාසල්වල ඉගෙනුම ලබන ශිෂ්‍යාවන් මිලියන 0.8කට, 2024 වර්ෂයේ මාස 8ක් සඳහා විවෘත වෙළෙඳ පොළෙන් ශිෂ්‍යාවන්ගේ කැමැත්ත මත ඉහළ ගුණත්වයක් සහිත සනීපාරක්ෂක තුවා සාධාරණ මිලක් යටතේ මිලදී ගැනීමට හැකි වන සේ සැකසූ රුපියල් 1,200ක් වටිනා වවුචර්පතක් ලබාදීමට ED/ACT/24/26 හා 2024.03.15 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශය ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අංක: අමප 24/0561/607/018-1 හා 2024.04.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය හිමිවී ඇති බව දන්වා ඇත. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

තවද, සනීපාරක්ෂක තුවා භාවිතය හා නිසි පරිදි බැහැර කිරීම පිළිබඳව පාසල් ශිෂ්‍යාවන් දැනුවත් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් උපදෙස් පත්‍රිකාවක් නිර්මාණය කර, එය අධ්‍යාපන අමාත්‍යාංශය හරහා පාසල් ශිෂ්‍යාවන්ට බෙදා දීමටද නියමිතය.

(iii) මේ සඳහා 2024 වර්ෂයට ප්‍රතිපාදන වෙන් වී නොමැති අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ සුභසාධක වැඩසටහන් යටතේ වන 126-1-2-3-1501 වැය විෂය මඟින් දුෂ්කර, අතිදුෂ්කර හා හුදෙකලා පාසල්වල සිසුන්ට හා තෝරා ගත් පිරිවෙන්වල ගිහි පැවිදි සිසුන්ට 2023 වර්ෂය සඳහා රජය මඟින් පාසල් පාවහන් මිලදී ගැනීමට ලබා දෙන තිළිණපත් 2023 දෙසැම්බර් සිට 2024 ජනවාරි, පෙබරවාරි මාසවල ලබා දීමට කටයුතු කර ඇති බැවින්, 2024 වර්ෂයට එම සිසුන්ට නැවත පාවහන් ලබාදීමේ අවශ්‍යතාවක් නොමැති නමුත්, ඒ සඳහා රුපියල් බිලියන 2.5ක් වෙන් වී ඇති අතර, එම ප්‍රතිපාදනවලින් රුපියල් බිලියනයක් මෙම ව්‍යාපෘතිය සඳහා යොදා ගැනීමට නියමිතය.

(iv) පාවහන් ලබා දීමට වෙන් වී ඇති ප්‍රතිපාදනවලින් පාවහන් ලබා දීමෙන් පසු මෙම වසරේ ඉතිරිවී ඇති ප්‍රතිපාදන යොදාගෙන මෙම සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහන මෙම වසරේදී සිසුවියන් මිලියන 0.8ක් සඳහා ක්‍රියාත්මක කරනු ලබන අතර, සියලු පාසල් සිසුවියන් ආවරණය වන පරිදි එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2025 වසරේදී ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

(ආ) අදාළ නොවේ.

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: දිළිඳු පවුල් සවිබලගැන්වීම

'அஸ்வெசும' நலன்புரி நன்மைகள் திட்டம்: வறுமைக்குட்பட்ட குடும்பங்களை வலுவூட்டல்

ASWESUMA WELFARE BENEFIT SCHEME: EMPOWERMENT OF POOR FAMILIES

1908/2024

9. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු තිස්ස අත්තනායක මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Tissa Attanayake)

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කරන ලද අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ වර්ෂ 2024 සිට 2026 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දිළිඳු හා අන්ත දිළිඳු පවුල් ලක්ෂ 12ක් සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) එම වැඩසටහන ආරම්භ කිරීමට අපේක්ෂිත කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சமுர்த்தி அபிவிருத்தித் திணைக்களத்தால் வரைவு செய்யப்பட்ட 'அஸ்வெசும' நலன்புரி நன்மைகள் திட்டத்தின்கீழ் 2024 முதல் 2026 வரையான காலப்பகுதியில் வறுமைக்குட்பட்ட மற்றும் மிகவும் வறுமைக்குட்பட்ட இலட்சம் குடும்பங்களை வலுவூட்டும் வேலைத்திட்டத்துக்காக அமைச்சரவையின் அங்கீகாரம் கிடைத்துள்ளதா என்பதையும்;

(ii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை யென்பதையும்;

(iii) மேற்படி வேலைத்திட்டத்தை ஆரம்பிப்பதற்கு எதிர்பார்க்கப்படும் காலப்பகுதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Women, Child Affairs and Social Empowerment:

(a) Will he inform this House -

(i) whether Cabinet approval has been received for the programme to empower 12 hundred thousand families living in poverty and extreme poverty conditions during the period from 2024 to 2026 under the Aswesuma welfare benefit scheme drafted by the Samurdhi Development Department;

(ii) if not, the reasons thereof; and

(iii) the periods during which the said programme is expected to be commenced?

(b) If not, why?

ගරු අනුප පස්කුවල් මහතා
(மாண்புமிகு அனுப பஸ்குவல்)
(The Hon. Anupa Pasqual)

ගරු කථානායකතුමනි, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දුප්පත් හා අත්ත දිළිඳු පවුල් ලක්ෂ 12ක් සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා 2024.03.11 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. (අනුමැතිය ලබා දුන් ලිපියෙහි පිටපතක් සහ සවිබලගැන්වීමේ වැඩසටහනෙහි සාරාංශ වාර්තාවක් ඇමුණුම 01හි** දක්වා ඇත.)

(ii) අදාළ නොවේ.

(iii) "අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම ප්‍රධාන අදියර දෙකක් යටතේ සිදු කෙරේ.

01. නියමු ව්‍යාපෘතියක් (Pilot project) ක්‍රියාත්මක කිරීම.

- නියමු ව්‍යාපෘතිය විදේශ මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක කෙරෙන අතර, ඒ අනුව ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර යටතේ දිස්ත්‍රික්ක 13ක පවුල් 10,000ක් හා ලෝක බැංකු ආධාර යටතේ දිස්ත්‍රික්ක 12ක පවුල් 6,000ක් සවිබලගැන්වීමට කටයුතු කෙරේ.
- නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන කාල පරිච්ඡේදය.
- ආසියානු බැංකු මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක කෙරෙන නියමු ව්‍යාපෘතිය (පවුල් 10,000ක් සවිබලගැන්වීම) 2024-2026 දක්වා වසර දෙකක් තුළ ක්‍රියාත්මක කෙරේ.

  2024 වසරේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන කාල පරිච්ඡේදය - 2024 අප්‍රේල් සිට 2024 දෙසැම්බර් දක්වා වේ.

  (මේ වනවිට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, ක්‍රියාත්මක කාල වකවානු ඇතුළත් සාරාංශ වාර්තාවක් ඇමුණුම 02**හි දක්වා ඇත.)

- ලෝක බැංකු මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක කෙරෙන නියමු ව්‍යාපෘතිය (පවුල් 6,000ක් සවිබලගැන්වීම) 2024-2027 දක්වා වසර 3ක කාලයක් තුළ ක්‍රියාත්මක කෙරේ.

  2024 වර්ෂයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන කාල පරිච්ඡේදය - 2024 ජූලි සිට 2024 දෙසැම්බර් දක්වා වේ.

  මේ වනවිට ව්‍යාපෘතියේ සැලසුම් කටයුතු සිදු කරමින් පවතින අතර, 2024 වර්ෂය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඉදිරි කාල වකවානු ඇතුළත් සාරාංශ වාර්තාවක් ඇමුණුම 02හි දක්වා ඇත.

02. පවුල් සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන යටතේ, 2024 සිට 2026 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ප්‍රතිලාභී පවුල් ලක්ෂ 12ක සවිබලගැන්වීමට අපේක්ෂිත අතර, ඒ යටතේ 2024 වර්ෂය තුළ පවුල් ලක්ෂ 3ක් සවිබලගැන්වීමට කටයුතු කෙරේ.

- සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කෙරෙන කාල වකවානු

  ඉහත සඳහන් පරිදි ආසියානු සංවර්ධන බැංකු හා ලෝක බැංකු මූල්‍යාධාර යටතේ නියමු ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලෙසත්, එහි අත්දැකීම්ද පදනම් කරගෙන සුබසාධක ප්‍රතිලාභී පවුල් ලක්ෂ 12ක් සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරන බවත් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව දැනුම් දී ඇත.

- කෙසේ වුවත්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන 2024 මාර්තු මාසයේදී ආරම්භ කරන ලදී. ඒ අනුව, 2024 වර්ෂය තුළ "අස්වැසුම" ප්‍රතිලාභ ලබන පවුල් ලක්ෂ 3ක් සවිබලගැන්වීමට අදාළව සුදුසු පවුල් හඳුනා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර, මේ වනවිට පවුල් 188,042ක් දිස්ත්‍රික්ක මට්ටමින් හඳුනා ගැනීම අවසන් කර ඇත.

  දිස්ත්‍රික් මට්ටමින් සවිබලගැන්වීම සඳහා හඳුනා ගත් පවුල් පිළිබඳව වාර්තාවක් ඇමුණුම 03**හි දක්වා ඇත.)

- ඒ අනුව, සවිබලගැන්වීමට හඳුනාගෙන ඇති පවුල් 188,042කට අදාළව පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීමේ කටයුතු දිස්ත්‍රික් මට්ටමින් ආරම්භ කර ඇත.

- තවද, 2024 වර්ෂය තුළ සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කාලවකවානු ඇතුළත් වාර්තාවක් ඇමුණුම 02හි දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

2015 සිට 2022 දක්වා පොල් තෙල් ආනයනය: විස්තර
2015-2022 வரையான தேங்காய் எண்ணெய் இறக்குமதி: விபரம்
IMPORT OF COCONUT OIL FROM 2015-2022: DETAILS

1911/2024

10. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Premnath C. Dolawatte)

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට 2022 දක්වා එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පොල් තෙල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) පොල් තෙල් ආනයනය කරන ලද රටවල් සහ සමාගම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முதல் 2022ஆம் ஆண்டு வரை ஒவ்வோர் ஆண்டிலும் இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட தேங்காய் எண்ணெயின் அளவு யாதென்பதையும்;

(ii) அதற்காகச் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) தேங்காய் எண்ணெய் இறக்குமதி செய்யப்பட்ட நாடுகள் மற்றும் நிறுவனங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Economic Stabilization and National Policies:

(a) Will he inform this House -

(i) the amount of coconut oil imported into Sri Lanka in each year from 2015 to 2022;

(ii) the amount spent thereon; and

(iii) the countries and companies from which the coconut oil was imported, separately?

(b) If not, why?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

වර්ෂය	ප්‍රමාණය (කිලෝග්‍රෑම් මිලියන)
2015	3.45
2016	2.25
2017	4.34
2018	9.92
2019	3.68
2020	76.66
2021	98.64
2022	12.32

(ii)

වර්ෂය	වටිනාකම (රුපියල් මිලියන)
2015	841.57
2016	531.48
2017	1,344.55
2018	2,724.55
2019	652.34
2020	16,331.62
2021	32,847.03
2022	7,312.01

(iii) පොල් තෙල් ආනයනය කරන ලද රටවල් සහ සමාගම් ඇමුණුම 01**හි සහ ඇමුණුම 02**හි දක්වා ඇත.

(ආ) පැන නොනඟී.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ජාතික වැදගත්කමක් තිබෙන ගැටලුවක් පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම මියන්මාරය සහ රුසියාව කියන රටවලට ගිය අය පිළිබඳව පසුගිය දවස්වල විශාල වශයෙන් සාකච්ඡා වුණා. ඊයේත් පාර්ලිමේන්තුවේදී මේ පිළිබඳව සාකච්ඡා වුණා. අපි විදේශගත වෙලා සිටියදීත් ඒ දේවල් දැක්කා. විශේෂයෙන්ම විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාට මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. විපතට පත් වූ අය වෙනුවෙන් කඳුළු හලන දෙමව්පියන් සහ විපතට පත්වූවන්ගේ කඳුළු පිසදැමීම වෙනුවෙන් වාර්තාවක් හදන්න එතුමා අපට මහපෙන්වීමක් සහ උපදෙස් ලබා දුන්නා, මේ පිළිබඳව තොරතුරු එක්රැස් කරලා, මේ ප්‍රශ්නය විසඳන්න ප්‍රවේශයක් තිබෙනවාද කියා සොයා බැලීම සඳහා.

විපක්ෂයේ මන්ත්‍රීවරු විධියට ජේ.සී. අලවතුවල මැතිතුමාත්, සුජීත් සංජය පෙරේරා මැතිතුමාත්, මමත් ඇතුළු පිරිස මියන්මාරය සහ තායිලන්තය කියන රටවල් දෙකේම මේ පිළිබඳ සාකච්ඡා කිහිපයක් ආරම්භ කළා. මේ පිළිබඳව රජයට දැනුම් දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගරු කථානායකතුමනි. තායිලන්තයේ, අධිකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන DSI - Department of Special Investigation - කියලා විශේෂ ආයතනයක් තිබෙනවා. මේ ආයතනය සම්බන්ධ කරගෙන සාකච්ඡා ආරම්භ කළොත් මියන්මාරයේ රඳවාගෙන ඉන්න 49දෙනා බේරා ගන්න අපට පුළුවන්, ගරු කථානායකතුමනි. මම යෝජනාවක් කරනවා. නේපාලයේ සහ උගන්ඩාවේ ළමයින් බේරා ගත්තේ මේ ආයතනය දිගින් දිගටම කළ සාකච්ඡාවල ප්‍රතිඵලයක් විධියට. විදේශ ඇමතිතුමා හරහා මේ DSI එක සමඟ අඛණ්ඩව සමීප සාකච්ඡා ආරම්භ කරන්න කියලා අපි යෝජනා කරනවා. අපි විශ්වාස කරනවා, රුසියාවට දහසකට අධික ප්‍රමාණයක් ලංකාවෙන් විදේශගත වෙන්න ඇති කියලා. 220ක් සම්බන්ධයෙන් වන වාර්තාවක් අපි සෙන්ට් පීටර්ස්බර්ග් කොන්සල්වරයාටත්, තානාපතිතුමාටත් භාර දීලා ඉල්ලීමක් කළා, අඛණ්ඩව සමීප සබඳතාවක් පවත්වමින් කටයුතු කරන්න කියලා. රුසියාව අපේ මිත්‍ර පාක්ෂික රටක්. මේ ප්‍රශ්නය ඔය කියන තරම් කළු නැහැ කියලාත් මම කියනවා. ඒ කියන්නේ, මේක බේරා ගන්න පුළුවන් තත්ත්වයක්. ඊයේ ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරමින් මේ පිළිබඳ ආණ්ඩුවෙන් විමසන්න කියලා කිව්වා. අඩුම ගණනේ සේවා ගිවිසුමක් නැතිව ගිහිල්ලා ඉන්න අය සම්බන්ධ අවධිමත් තත්ත්වය විධිමත් කරන්න අපට පුළුවන් නම්, අඩුම ගාණේ රෝහල්ගත වෙලා ඉන්න 10දෙනා ගැනත්, ඊට වැඩිපුර ඉන්නවාද කියන එක ගැනත්, එහෙම නැත්නම් මේ වන කොට අනතුරකට ලක් වෙච්ච, අතුරුදහන් වූ අය සම්බන්ධයෙන් තොරතුරක් ඒ අයගේ පවුල්වලට ලබා දෙන්න පුළුවන් නම් මම විශ්වාස කරනවා, කඳුළු සලමින් ඉන්න ඒ මිනිස්සුන්ට එය අස්වැසිල්ලක් වෙයි කියලා. ඒ නිසා කරුණාකරලා මේ ගැන ආණ්ඩුවේ අවධානය යොමු කරවන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු වරුණ ලියනගේ මහතා
(මාණ්පුමිකු வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
ගරු කථානායකතුමනි, වැදගත් කාරණාවක් කියන්න මටත් පොඩි වේලාවක් ලබා දෙන්න.

පසුගිය කාලයේ රත්නපුර දිස්ත්‍රික්කයට ඇති වූ වර්ෂාපතනය එක්ක අපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකකට -ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයටත්, අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයටත්- බරපතළ හානි සිද්ධ වුණා. මේ වනකොටත් ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගමනාගමන කටයුතු නැවතිලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අශෝක ප්‍රියන්ත රාජ්‍ය ඇමතිතුමා ගරු සභාවේ ඉන්න නිසා.

අද වනකොට ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්තුමා තමයි, අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් වැඩ බලන්නේ. ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 20ක් තිබෙනවා. ඒකෙන්, වසම් 18ක් යට වෙලා තිබෙන්නේ. තවමත් ඒ වසම් යට වෙලා තිබෙන්නේ. අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේත් ග්‍රාම නිලධාරි වසම් 21ක් තිබෙනවා. ඒකෙන්, වසම් 18ක් යට වෙලා තිබෙන්නේ. මේ ප්‍රාදේශීය ලේකම්තුමාට තනියෙන් වැඩ කරන්න බැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, අශෝක ප්‍රියන්ත රාජ්‍ය ඇමතිතුමාට කියලා ඉක්මනටම අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ප්‍රාදේශීය ලේකම්වරයෙක් යොමු කර දෙන්න කියලායි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාරණය මොකක්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, නුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමා කියපු කාරණය ඉතා වැදගත්. ඒ සම්බන්ධව අපිත් දිගටම වැඩ කටයුත්තක් කරගෙන යනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඒක ගැන ඒ මන්ත්‍රීතුමා කිව්වා නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. මේ කථාව වැදගත්. ඒකයි මම කිව්වේ. අපි ආණ්ඩුවට කථා කරලා කිව්වා, කරුණාකරලා මේකට අවශ්‍ය කරන වැඩකටයුතු ටික කරන්න කියලා. මොකද, මේ අයට ගිහිල්ලා කථා කරන්න රුසියාවෙන් අපට දින ටික දෙන්න ඕනෑ. ලබන 26වැනි දා සහ 27වැනි දා තමයි ඒ සඳහා දැන් දීලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මෙතුමන්ලාත් ඒකට ගිය එක හොඳයි. රුසියාවේ රෝහල් එකක

[ගරු දයාසිරි ජයසේකර මහතා]

නොවෙයි විශාල සංඛ්‍යාවක, campsවල මේ අනතුරට ලක් වුණු අය විශාල පිරිසක් ඉන්නවා. ඒ අයව ගන්න සාකච්ඡා කරන්න රුසියාවෙන් දීලා තිබෙන්නේ ලබන 26වැනි දා සහ 27වැනි දා කියන දිනයන්. අපි රුසියානු රජයත් එක්ක ඉතා හොඳ සම්බන්ධතාවක් තිබෙන රටක්. පෙරේදාත් ඒ අහිංසක කාන්තාවෝ ලංකාවේ රුසියානු තානාපති කාර්යාලය ඉස්සරහට ඇවිල්ලා ඔවුන්ගේ අය බේරලා දෙන්න, පුළුවන්තරම් ඉක්මනින් මේක කරන්න කියලා කියා තිබෙනවා. නමුත් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් මේකට තවදුරටත් මහන්සි වෙන්න ඕනෑ. මොකද, ඒ ගොල්ලෝ ලබන 26 සහ 27වැනි දා දුන්නා කියලා අපි 26 සහ 27වැනි දා වෙනකම් ඉඳලා හරියන්නේ නැහැ. එතකොට ඒ මිනිස්සු මැරෙනවා. තව කීයක් මැරේවිද කියලා අපි දන්නේත් නැහැ. ආණ්ඩුවට ඒකට මැදිහත් වෙන්න කියලායි අපි කියන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ඔය කාරණය ගැන අපි අවධානය යොමු කරන්නම්.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු හර්ෂන රාජකරුණා)
(The Hon. Harshana Rajakaruna)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු හර්ෂන රාජකරුණා)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, අපේ වරුණ ලියනගේ මන්ත්‍රීතුමාත් මේ කාරණය ගැන කථා කළා. මේ ගංවතුර ප්‍රශ්නයේදී ගම්පහ දිස්ත්‍රික්කයේ බොහෝ තැන්වලට වතුරෙන් වෙච්ච ඒ පීඩාව දැන් අවසන් වෙමිනුයි තිබෙන්නේ. අපේ ආණ්ඩුව පැවති 2015-2019 කාල සීමාවේත් -2016, 2017 වර්ෂවල- මේ ආකාරයටම ගංවතුර ගැලුවා. ඒ අවස්ථාවලදී ඉතා පැහැදිලිවම රක්ෂණයක් තිබුණා. එවකට පැවති රජය විසින් ස්වාභාවික විපත් සම්බන්ධයෙන් රක්ෂණයක් ඇති කරලා ඒ විපත් නිසා පීඩාවට පත් වන අයට යම් වන්දියක් - යම් compensation එකක් - ලබා දෙන්න කටයුතු කළා. ගරු සභානායකතුමනි, ඒකට දැවැන්ත මුදල් ප්‍රමාණයක් වැය වුණා. මේ වෙනකොට අපේ රටේ ව්‍යාපාරවලට විශාල හානියක් සිදු වෙලා තිබෙනවා. නිවාස අර්ධ, පූර්ණ වශයෙන් හානි වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මට දැනගන්න අවශ්‍යයි, ඒ කාලයේදී තිබුණු ඒ රක්ෂණය තවමත් තිබෙනවාද කියලා. ගරු සභානායකතුමනි, මම ඔබතුමාගෙනුයි මේ ගැන අහන්නේ. පසුගිය 2015-2019 කාල සීමාවේදී ස්වාභාවික විපත් සම්බන්ධයෙන් යම් රක්ෂණයක් තිබුණා. ඔබතුමා දන්නවා ඇති, 2016, 2017 වර්ෂවලදී ඇති වුණු ඒ ගංවතුර තත්ත්වය ඇතුළු අනෙකුත් ආපදාවලදී මේ රක්ෂණය මහින් විශාල- *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ඔබතුමා ඔය කාරණය ගැන කිව්වා ඇති. ඔබතුමාගේ කාරණය කියැවුණා නේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මටත් පොඩ්ඩක් අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
ඒ කාරණය ගැනමයි මමත් කියන්නේ, ගරු කථානායකතුමනි. කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයත් ගංවතුරින් යටවුණා. ගරු සභානායකතුමනි, ඔබතුමාටත් මතක ඇති, ගිය වර අපි රුපියල් මිලියන 23,000ක් වන්දි වශයෙන් දුන් බව. ඊයේ වෙනකොට ඒ වතුර බැහැලා ගිහින් තිබෙනවා. ජනතාව දැන් clean කරන වැඩ ටික පටන් අරගෙන තිබෙන්නේ. මම ඉල්ලීමක් කරනවා, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් යොදවන්නේ නැතිව, ආපදා කළමනාකරණ නිලධාරීන් සහ ග්‍රාම නිලධාරී මහත්වරු යොදවා ඒ පිළිබඳව කඩිනමින් තක්සේරුව පටන්ගන්න කියලා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු හර්ෂන රාජකරුණා)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමා සභාවේ ඉන්නවා. එතුමාගෙන් අපි මේ කාරණය අහනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා උත්තර දෙනවාද?

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන් - පාතුකාප්පු இராஜாங்க அமைச்சர்)
(The Hon. Premitha Bandara Tennakoon - State Minister of Defence)
ගරු කථානායකතුමනි, අපි දැන් ආපදාවෙන් පසුව අවශ්‍ය තීන්දු තීරණ අරගෙන ඒ කටයුතු සිද්ධ වෙනවා. ඒ සම්බන්ධයෙන් අපට සහාය දුන් සියලු දෙනාටම අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. ආපදාව නිසා වෙච්ච හානිය පිළිබඳව තක්සේරුව ලබා ගන්න අපට සති කිහිපයක් යනවා. ඒ වාගේම, රක්ෂණය සම්බන්ධයෙන් කථා කළොත්, එක කාලයක ලංකාවේ සියලුම ගෙවල් රක්ෂණය කළා, ගරු කථානායකතුමනි. රජය විසින් තමයි ඒ රක්ෂණය කළේ. ඒක අපි තක්සේරු කළාම, ඒකට ගෙවන premium එක ඉතාම බරපතළ ගණනක්. ඒ වාගේම, premium එකත් එක්ක සංසන්දනය කළාම අපට එන ප්‍රතිලාභය; ජනතාවට ලැබෙන ප්‍රතිලාභය සම්බන්ධයෙන් අපට ගැටලු තිබෙනවා. නමුත්, මේ රටේ තිබෙන සියලුම නිවාස රක්ෂණය කරන්න රජයට පුළුවන්කමක් නැහැ. අපි දැන් තීන්දු කර තිබෙනවා, එක් පැත්තකින් රජයේ දේපළ නැවත ගොඩනඟන්නත් ඕනෑ; අපි පාර හදන්න ඕනෑ, ඉස්කෝල හදන්න ඕනෑ, බෝක්කු හදන්න ඕනෑ, පාලම හදන්න ඕනෑ. ඒ වාගේම, අපේ ආර්ථික තත්ත්වය පිළිබඳව අපි අවබෝධයක් ගන්න ඕනෑ. රජයකට කරන්න පුළුවන් සීමාව අපි තේරුම් ගන්න ඕනෑ. එහෙම කරලා රට බංකොලොත් කරන්නත් බැහැ. ඒක නිසා රජය වගකීමක් ගන්නවා. රජයෙන් දෙන්න පුළුවන් සහන අපි දෙනවා. ආර්ථිකයට ගැළපෙන විධියට, දරාගන්න පුළුවන් විධියට තමයි මේ කටයුතු කරන්න වෙන්නේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
ඒ කියන්නේ, වන්දි දෙන්නේ නැද්ද?

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
මොකක්ද ඉල්ලන වන්දිය?

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
වතුරෙන් යටවෙච්ච ගෙවල්වලට හානිපූරණ වන්දිය දෙන්නේ නැද්ද?

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු මන්ත්‍රීතුමා, තර්ජනය කරලා අහන්න එපා. නිකම් චණ්ඩි පාට් දාන්න එන්නත් එපා. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, රජයට දෙන්න පුළුවන් වන්දිය, දෙන්න පුළුවන් ගණන දෙනවා. මම අහගෙන හිටියා මන්ත්‍රීතුමා ඊයේත් අපි ගත්ත තීන්දුවක් සම්බන්ධයෙන් "මම තමයි ඒක කළේ" කියලා කිව්වා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
ඔව්.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
මම TV එකෙන් තමයි ඒක දැක්කේ. ඒක දැකලා මට උඩ පැන පැන හිනා. ගරු කථානායකතුමනි, මේක අපි ගත්ත ප්‍රතිපත්තිමය තීන්දුවක්. ඒක ගත්තේ මුළු රටේම තත්ත්වය තක්සේරුවට අරගෙන.*[බාධා කිරීමක්]*

චණ්ඩි පාට් දමාගෙන එන්න එපා. *[බාධා කිරීම්]* චණ්ඩි පාට් දමාගෙන එන්න එපා. *[බාධා කිරීම්]* චණ්ඩින්ට බය නැහැ. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්න සම්බන්ධයෙන් අප ගන්නා තීන්දුවලට අවසානයේ වග කියන්න ඕනෑ අපියි. රටේ ආර්ථිකයට වග කියන්න ඕනෑ අපියි. *[බාධා කිරීම්]* චණ්ඩි පාට් දමලා ඉල්ලුවාට ඒ ඉල්ලන ඉල්ලන දේවල් දෙන්න සූදානම් නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ස්තුතියි, ගරු රාජා ඇමතිතුමා. *[බාධා කිරීම්]* කරුණාකර - *[බාධා කිරීම්]* දැන් ඔය කියන්න යන්නේ ගංවතුර ප්‍රශ්නය ගැන නේ. ගංවතුර ප්‍රශ්නය ගැන කථා කරලා ඉවරයි. *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න, මේ කලබැගෑනිය ඉවර කරන්න. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔව්, ගරු සභානායකතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. ගරු කථානායකතුමනි, ඊයේ ගරු මරික්කාර් මන්ත්‍රීතුමා අවධානයට යොමු කර තිබුණා, වතුරට යට වුණු කොළොන්නාව, වැල්ලම්පිටිය, කැලණිමුල්ල වාගේ ප්‍රදේශවල සිටින පාසල් දරුවන්ගේ පෙළ පොත් සහ අභ්‍යාස පොත් සම්බන්ධයෙන් යම් පියවරක් ගන්න කියලා. මම ඒ ගැන දන්නවා. මම දැනටත් ඒ සම්බන්ධයෙන් උපදෙස් දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට එකතු වන තොරතුරු ටිකත් අපට ලබා දෙන්න, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මාර්ගයෙන්. දරුවන්ගේ පෙළ පොත් සහ අභ්‍යාස පොත් විනාශ වෙලා තිබෙනවා නම්, මම අමාත්‍යාංශය හරහා ඒ අය වෙනුවෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා, ඊළඟ සති දෙක තුළ ඒවා ලබා දීමට.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, අපි රජයක් විධියට මේ කටයුත්ත හරියට කරන්න ඕනෑ. මේ ක්‍රමය අවභාවිත කරන්න දෙන්න පුළුවන්කමක් නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, ගරු රාජා ඇමතිතුමා,-

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, කරුණාකර ඉඩ දෙන්න. *[බාධා කිරීම්]* ගෙදරක වහලට පොල් ගෙඩියක් වැටුණත්, ඇස්බැස්ටෝස් එක රජයෙන් අරගෙන දෙන්න ඕනෑ. එහෙම වන්දි ක්‍රමයක් මේ රටේ තිබෙන්නේ. *[බාධා කිරීමක්]* අහගෙන ඉන්න, මන්ත්‍රීතුමා. එහෙම වන්දි ක්‍රමයක් හදලා තිබෙන්නේ. අපි එක් තැනක ගෙවල් 18කට රුපියල් ලක්ෂය බැගින් වන්දි ලබා දුන්නාම, හැන්දෑවේ කුකුළු මසුයි, ගල් බෝතලයයි ගෙනැල්ලා පාට් දමපු ගෙවලුත් තිබුණා. ගරු කථානායකතුමනි, අපි අන්න ඒක නවත්වන්න ඕනෑ. ඒ නිසා වැදගත් තීන්දු අරගෙන ක්‍රමයකට ඒ කටයුතු කරන්න ඕනෑ. *[බාධා කිරීම්]* චණ්ඩි පාට් දැම්මාට දෙන්නේ නැහැ. *[බාධා කිරීම්]*

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු හර්ෂන රාජකරුණා)
(The Hon. Harshana Rajakaruna)
මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දැන් ඒ ප්‍රශ්නය ගැන කථා කරලා ඉවරයි.

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]* ගංවතුර සම්බන්ධව අහපු ප්‍රශ්නයට උත්තර දීලා ඉවරයි.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු හර්ෂන රාජකරුනා)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, මම ඇහුවා ප්‍රශ්නයක්. මට විනාඩියක් දෙන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒකට උත්තර දීලා ඉවරයි. *[බාධා කිරීම්]*

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමා, ඔබතුමා උත්තර දුන්නා නේ. *[බාධා කිරීම්]* කරුණාකර ඔක දැන් නතර කරන්න. අදට නියමිත විවාදයට අදාළව කටයුතු කරන්නේ නැද්ද, අපි?

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, ඒ සිද්ධිය වුණු වෙලාවේ ඉඳලා අපේ නිලධාරීන් - *[බාධා කිරීම්]* මට විනාඩියක් දෙන්න. *[බාධා කිරීම්]*

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමා, අපිත් ඡන්දයෙන් ආපු මන්ත්‍රීවරු. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මන්ත්‍රීතුමන්ලා වුණා කියලා මේ සභාවේ රීති කඩන්න දෙන්න බැහැ.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු හර්ෂන රාජකරුනා)
(The Hon. Harshana Rajakaruna)
වැදගත් කථාවක් මේක. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි. [බාධා කිරීම්]

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, අද මේ විවාදය කරන්නේ නැද්ද කියන්නකෝ. *[බාධා කිරීම්]*

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, මම මේ කථාව කියන්න ඕනෑ. *[බාධා කිරීම්]*

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමා, ආණ්ඩු පක්ෂයට විතරක් අවස්ථාව දෙන්නේ ඇයි? *[බාධා කිරීම්]*

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, ඒ සිද්ධිය වුණු වෙලාවේ ඉඳන් අපි ඒ ජනතාවට සහන ලබා දෙනවා; ඒ කටයුතුවලට සහයෝගය ලබා දෙනවා; වන්දිත් ලබා දෙනවා. හැබැයි, මේ මන්ත්‍රීතුමා චණ්ඩි පාටි දාන නිසා නොවෙයි, ඒ. ගරු කථානායකතුමනි, ඒක රජයේ ප්‍රතිපත්තිය. හැබැයි, මේ දේවල් අවභාවිත කරන්නත් අපි කාටවත් ඉඩ තියන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ඒ ඇති.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු හර්ෂන රාජකරුනා)
(The Hon. Harshana Rajakaruna)
මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි. මේක වැදගත් කාරණයක්.

ගරු රාජ්‍ය ඇමතිතුමා දැන් කිව්වා, මුළු රටම රක්ෂණය කිරීමට දැවැන්ත වියදමක් යනවා කියලා. නමුත් අයහපත් කාලගුණ තත්ත්වයන් නිසා ආපදාවට ලක් වන ප්‍රදේශ තිබෙනවා. මුළු රටම රක්ෂණය කිරීමේ ගැටලුවක් තිබෙනවා නම් ඒ ප්‍රදේශ විතරක් හෝ රක්ෂණය කළා නම් හරි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, වියදම කියන එක රක්ෂණය නොකර ඉන්න එකට නිදහසට කාරණාවක් නොවෙයි. ඒ ප්‍රදේශ තමයි හැමදාම යට වෙන්නේ. 2016, 2017 වසරවලදී අපි ලොකු වන්දියක් ලබා දුන්නා, ඒ මිනිසුන්ට නැවත නැඟිටින්න. ඒක ඉතාම වැදගත්. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, අනෙක් අතට ඔබතුමා කිව්වා, අරක්කු බෝතලෙයි, කුකුළු මසුයි ගෙනැල්ලා පාටි දමන කථාවක්. එහෙම කරන පිරිසකුත් ඇති. මේ කියන කථාවලට අනුව අපට නම් පෙනෙන්නේ, හානි වෙච්ච බහුතර පිරිසකට තමන්ගේ ව්‍යාපාර ගොඩ නහා ගන්න රජයෙන් සාධාරණ වන්දියක් නොලැබෙන බවක්. ඒ හින්දා මම හිතන්නේ නැහැ ඒක සාධාරණයි කියලා. ඔබතුමන්ලා ජනතාවට අවශ්‍ය පරිදි සහනයක් ලබා දෙන්න ඕනෑ. ඒ වන්දිය ලබා දීම සඳහා ඔබතුමන්ලා වගකීමෙන් කටයුතු කරන්න ඕනෑ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේක, චණ්ඩිකමක්වත්, වෙන දෙයක්වත් නොවෙයි. අපේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කරන ඉතා කාරුණික ඉල්ලීමක්. *[බාධා කිරීම්]*

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, එතුමාට උත්තර දෙන්න මට අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙන උත්තරයක් ඉක්මනින් කියන්න. *[බාධා කිරීමක්]*

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගරු රාජ්‍ය ඇමතිතුමා උත්තර දෙනතුරු ඉන්න.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, මේ කාරණාව සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමා සඳුදා කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් යොමු කර තිබෙනවා. මෙම ආපදාව සමනයට පත් වුණාට පස්සේ ඒ පිළිබඳව තක්සේරු අරගෙන ත්‍රිවිධ හමුදාව යොදවා අවශ්‍ය කටයුතු කරනවා කියා ගරු ජනාධිපතිතුමා මාධ්‍යට ප්‍රකාශයකුත් කර තිබෙනවා. එහෙම තත්ත්වයක් යටතේ, ලකුණු දමා ගන්න මෙතැන නිකම් කෑ ගහන්න එපා කියන එක තමයි මගේ කාරුණික ඉල්ලීම.

ගරු කථානායකතුමනි, මෙවර ආපදා සහන ලබා දීම යටතේ අපි ආහාර වේල් ලබා දෙන එක සියයට 33කින් වැඩි කළා. සලාක මල්ල ලබා දෙන එක අපි සියයට 40කින් වැඩි කර තිබෙනවා. ඒ වාගේම, සහන මධ්‍යස්ථානවලට කිරි පිටි ටික, තේ ටික ලබා දෙන්නත් අපි කටයුතු කර තිබෙනවා. *[බාධා කිරීම්]* ඒ වාගේම මම කියනවා, අපට චණ්ඩි පාටි දමන්න එපා කියලා. මොකද, අපි ඒවාට භය වෙන්නේ නැහැ. ඒක පළමුවැනි කාරණය.

ගරු කථානායකතුමනි, අනෙක් කාරණය මේකයි. ඒ ආපදා සහන අවභාවිත කරන්න කාටවත් ඉඩ තබන්නත් බැහැ. එයත් කරුණාවෙන් සලකන්න කියලා තමයි මම ඉල්ලන්නේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු මරික්කාර් මන්ත්‍රීතුමා. මේ වාදය ඔය කථාවෙන් පස්සේ ඉවරයි.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අපේ ගරු රාජ්‍ය ඇමතිතුමනි, වර්තමාන ජනාධිපතිතුමාම තමයි මේ රක්ෂණ ක්‍රමය හඳුන්වා දුන්නේ. අපි ගිය වතාවේත් වන්දි විධියට රුපියල් මිලියන 23,000ක් දුන්නා. සහන කඳවුරුවල ඉඳලා ගෙවල්වලට යන ඒ ජනතාවට ගෙවල් පිරිසිදු කර ගන්න තිබෙනවා, ගෙවල්වලට බඩු මුට්ටු ගන්න තිබෙනවා. ඒ සඳහා වන්දි ලබා දෙන්න කියලා විතරයි අපි ඉල්ලුවේ. ඔබතුමා ආරක්ෂක රාජ්‍ය ඇමති කියලා අපට චණ්ඩි පාටි දැම්මාට අපි භය වෙන්නේ නැහැ. ඉල්ලීමක් තමයි මම ඉස්සෙල්ලාම කළේ. අපි විපක්ෂයේ ඉන්න නිසා තමයි ආණ්ඩුවෙන් එම ඉල්ලීම කළේ. මොකද, ඒ ජනතාව දවසේ කුලියට වැඩ කරන අය. කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු විධියට ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාත් ඒ ගැන දන්නවා. දවසේ ආදායම ලබන වතු නිවාසවල ජනතාවයි ඒ ඉන්නේ. ඒ අය සහන කඳවුරුවල ඉඳලා ගෙදර යන කොට ඒ අය අතේ සල්ලි නැහැ. ඒ අයට ගෙවල් clean කර ගන්න ඕනෑ. ගලි වතුර, වැහි වතුර, ගංවතුර ඔක්කෝම එකට එකතු වෙලා ගෙවල් අපවිත්‍ර වෙලා තිබෙන්නේ. අපි කරපු මූලික සාකච්ඡාවලදී එකඟතාවන්ට ආවා. ඒ කටයුත්ත ආරම්භ කරන්න කියලා තමයි අප ඉල්ලන්නේ.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ආයෙත් උත්තර දෙන්න ගියොත් අද දවසේ මේක ඉවර වෙන්නේ නැහැ. එතකොට අද දවසේ කටයුතු එකක්වත් කරන්න ලැබෙන්නේ නැහැ.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඉක්මනින් කියන්න.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, ඒ මන්ත්‍රීතුමා මුලින්ම ඔය විධියට කථා කළා නම් ප්‍රශ්නය ඉවරයි. අනෙක් එක, මම කාටවත් චණ්ඩි පාටි දාලත් නැහැ, දමන්නේත් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, දැන් ඔය වාදය අවසන් කරන්න.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් අපි දැන් තීන්දු අරගෙන ඉවරයි. තීන්දු අරගෙන ඉවර වෙලා තිබියදී, ඒක මාධ්‍යවල පළ වෙලා තිබියදී, රජයේ ප්‍රතිපත්තිය ප්‍රකාශ කරලා තිබියදී ලකුණු දමා ගන්න මෙතැනට ඇවිල්ලා බොරුවට කෑ ගහන එක- *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඇති නේ. ඕක නතර කරන්න.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, ඡන්දයෙන් පාර්ලිමේන්තුවට එන්නේ කට වහගෙන ඉන්න නොවෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. *[බාධා කිරීමක්]*

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)
වැඩ කරන්න. බොරුවට කෑ ගහන්න එපා. *[බාධා කිරීමක්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු රාජ්‍ය ඇමතිතුමා, විනාඩියක් ඉන්නවාද?

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම අපේ මන්ත්‍රීවරුන් මෙතැන ඉස්මතු කරන්නේ ජනතාවගේ ප්‍රශ්න. ඒ අය යම් කිසි වේදනාවකින් කථා කරන්නේ. ඒ පිළිබිඹු කරන්නේ ජනතාවගේ වේදනාවයි. මොකද, ජනතාව අසීමිත පීඩනයකට ලක් වෙලා ඉන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමා කිව්වා, වියළි සලාක, ඒ වාගේම පිසින ලද ආහාර සඳහා වෙන් කරපු මුදල් ප්‍රමාණය වැඩි කළා කියලා. ඔබතුමා ඒක කිව්වාට පස්සේ මම ප්‍රාදේශීය ලේකම්වරයෙකුට කථා කරලා ඒ ගැන ඇහුවා. නමුත් තවම එවැනි චක්‍රලේඛයක් නිකුත් වෙලා නැහැ. එම නිසා මම බොහොම කාරුණිකව ඉල්ලීමක් කරනවා. පිසින ලද ආහාරවලට සහ වියළි සලාකවලට දෛනිකව සහ සතිපතා ලබා දෙන මුදල ඔබතුමා කියන ආකාරයට වැඩි කරලා තිබෙනවා නම්, ඒක මේ සභාවේ විතරක් ප්‍රකාශ කරලා හරියන්නේ නැහැ, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි.

ඒක අලුත් චක්‍රලේඛයක් හරහා වහාම ප්‍රාදේශීය ලේකම්වරුන්ට යවන්න. ඔබතුමා ඒ ප්‍රකාශය කරපු මොහොතේම මම ප්‍රාදේශීය ලේකම්වරයෙකුට දුරකථන ඇමතුමක් දීලා ඒ ගැන ඇහුවා. එහෙම චක්‍රලේඛයක් තවම නිකුත් වෙලා නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර ඒ වැඩි කරපු ප්‍රමාණය ගැන චක්‍රලේඛයක් හරහා දැනුම් දෙන්න කියලා. මා හිතන විධියට, 2022 වර්ෂයේ මැද භාගයේ -ජුනි හෝ ජූලි- නිකුත් කරපු චක්‍රලේඛය තමයි තවමත් ක්‍රියාත්මක වෙන්නේ. මම මේ ගරු සභාවේදී ඒ ගැන පුනපුනා කථා කළා. ඒ චක්‍රලේඛය වෙනස් කරලා, ඒ සංශෝධිත වැඩි කිරීම් ටික ප්‍රාදේශීය ලේකම්වරුන්ට යවන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)
අපි පෙරේදා ඒ සම්බන්ධයෙන් දිසාපතිවරුන් සියලුදෙනා සමඟ "Zoom" මඟින් සාකච්ඡා කළා. අපි මෙම තත්ත්වය ඔවුන්ට දැනුම් දීලායි තිබෙන්නේ. ඒ වාගේම, අපි ඊයේ උදෑසන දිස්ත්‍රික් ලේකම්වරුන් එක්ක "Zoom" මඟින් සාකච්ඡා කළා. අපි ඒ අයටත් මේ නියෝගය දැනුම් දීලායි තිබෙන්නේ. ගරු විපක්ෂ නායකතුමනි, අපි පළාත් පාලන ආයතනවලට, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට දුන්නු මුදල්වලින් රුපියල් මිලියන 160ක මුදලක් වියදම් නොකර තවමත් තිබෙනවා. මේ සම්බන්ධයෙන් ගත යුතු පියවර ගැන සියලු උපදෙස් අපි දීලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම්වරුනුත් දැනුවත් කර තිබෙනවා. මට පිළිගන්න බැහැ, තවම මේ සම්බන්ධයෙන් තොරතුරක් ප්‍රාදේශීය ලේකම්වරුන්ට ලැබුණේ නැහැ කියන එක. මම එය පිළිගන්න සූදානම් නැහැ. මොකද, මම පෞද්ගලිකව ඊයේත්, පෙරේදාත් දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ කථාබහ කරලා, ඔවුන්ගේ ප්‍රශ්නවලට මේ වන කොට විසඳුම් ලබා දීලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා හෝ මෙතුමාට මේ ගැන පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න. මේකෙදි වාචිකව උපදෙස් දීම ප්‍රමාණවත් වන්නේ නැහැ. ඒ වැඩි කරපු මුදල ලබා දීම සඳහා ක්‍රියාත්මක වන්නේ චක්‍රලේඛයක් හරහා, එහෙම නැත්නම් යම් රෙගුලාසියක් මඟින් දිස්ත්‍රික් ලේකම්වරුන්ට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඒ බව දන්වා යැවීම තුළිනුයි. එතකොට තමයි, ඒ මුදල වැය කරන්න පුළුවන් වෙන්නේ.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)
ගරු කථානායකතුමනි, චක්‍රලේඛය යවලා ඉවරයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, චක්‍රලේඛය දැන් යවලා ඉවර ලු.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම යෝජනා කරන්නේ බොහොම සරල දෙයක්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඔය වැඩි කරපු ප්‍රමාණ ලබා දීමේ කටයුත්ත කටින් කිව්වාට නිලධාරීන් ක්‍රියා කරන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක යවලා ලු, තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් ඉන්නකෝ. සාක්ෂි ඇතිව නේ මම දැන් මෙය කියන්නේ. ඒ වැඩි කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ට තවම ලිඛිතව, නෛතිකව දැනුම් දීලා නැහැ. ඒක ලබා දෙන්න කියලායි මම කියන්නේ. එච්චරයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගංවතුර නිසා ප්‍රමාද වෙන්න ඇති.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට ඔබතුමාට යොමු කරන්න තව පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ කාරණය කියන්න මට විනාඩියක කාලයක් දෙන්න. මොකද, මේක වැදගත් ප්‍රශ්නයක්.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම මීට පෙරත් මේ කාරණය සම්බන්ධයෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. නීත්‍යානුකූලව ත්‍රිවිධ හමුදාවෙන් ඉවත් වෙන්නට 2024 අප්‍රේල් 20 සිට 2024 මැයි 20 දක්වා ඔබතුමන්ලා පොදු සමා කාලයක් දුන්නා නේ. හමුදා සේවයට බැඳීමෙන් අනතුරුව යම් විශේෂිත පුහුණුවක් ලද අයවලුන්ට ඒ අවස්ථාව ලබා දීලා නැහැ.

2024 අප්‍රේල් 02 දිනට පෙර නිවාඩු නොමැතිව හමුදා සේවයට වාර්තා නොකර සිටින අයටත් ඒ පොදු සමා කාලය තුළ ඉවත්වීමට අවස්ථාව ලැබිලා නැහැ. විශේෂයෙන්ම රාජ්‍ය අරමුදල් භාවිතයෙන් හදාරන ලද පාඨමාලාවලට අදාළව බැඳුම්කර අත්සන් කර ඇති මෙම අය සූදානම් ඒ මුදල් ගෙවීමක් සිදු කර හෝ හමුදාවෙන් ඉවත් වෙන්න. ඒ නිසා මේ අය ගැන සානුකම්පිතව හිතා බලලා, නිවාඩු නොමැතිව සේවයට වාර්තා නොකර සිටින ඉහත සඳහන් පුද්ගලයින්ගට මෙම පොදු සමාව ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම බොහොම ගෞරවයෙන් ඔබතුමාගෙන් නැවත වරක් ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)

ගරු කථානායකතුමනි, අපි දිසාපතිවරුන්ට මෙම චක්‍රලේඛය ඉදිරිපත් කර තිබෙනවා. මේ අය සමඟ අපි වාචිකව සාකච්ඡා කර තිබෙනවා. ඔවුන්ගේ සියලු ඉල්ලීම් අපි සම්පූර්ණ කර තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, හමුදාවේ Executive Committee එක හමුදාව තියා ගන්න, හමුදාවේ අනාගතය වෙනුවෙන් ගත්ත තීන්දුවක් ඒක. ඒක නිසා ඒ තීන්දුව අපට මේ වෙලාවේ වෙනස් කරන්න පුළුවන්කමක් තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. ඒක තමයි ඇත්ත; සත්‍යය. ඒක හමුදාවේ අනාගතය, හමුදාවේ පරිපාලනය වෙනුවෙන් හමුදාව ඇතුළෙන් ගත්ත තීන්දුවක්. ඒක වෙනස් කරන්න රජය මේ වෙලාවේ සූදානම් නැති බව මම කනගාටුවෙන් දැනුම් දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා, දැන් ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

උතුරු, නැඟෙනහිර රක්ෂිත වනාන්තර නැවත සීමා නිර්ණය කිරීම
வடக்கு, கிழக்கில் வன ஒதுக்கங்களை மீள எல்லை நிர்ணயம் செய்தல்
RE-DEMARCATION OF FOREST RESERVES IN NORTH AND EAST

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

උතුරු, නැඟෙනහිර පළාත්වල යුද්ධය අවසන් වූ පසු ජීවත් වන ජනතාවට තමන්ගේ ජීවන උපායන් පවත්වා ගෙන යාමට අවශ්‍ය වන පරිදි ඉඩම් පරිහරණය කිරීමේ ගැටලුව තවමත් ඔවුන්ගේ නොවිසඳුණු ගැටලු අතර ප්‍රමුඛතාවක් ගනී. ඊට එක් හේතුවක් වන්නේ, ජනාවාස ආශ්‍රිත ඉඩම් බොහොමයක් අවශේෂ කැලෑ ලෙස ගැසට් වී තිබීමයි.

එසේම, මෙම ඉඩම් ජනතාවට නිදහස් කිරීම සම්බන්ධයෙන් දැනට රජය ගනු ලබන ක්‍රියාමාර්ගයන්හිදී ගැටලුසහගත තත්ත්වයන් පවතින බව පේනවා. ඒ නිසා මේ කරුණු වෙනුවෙන් අපි ඉදිරිපත් කරන පහත ප්‍රශ්නවලට රජයෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

01. මෙරට වනගහනය සම්පූර්ණයෙන්ම සිතියම්ගතකොට තිබේද? එම භූමි ප්‍රමාණය ජාතික මට්ටමින්, දිස්ත්‍රික්ක මට්ටමින් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සහගත කළ හැකි වන්නේද?

02. පසුගිය දිනක ජනාධිපතිවරයා විසින් 1985 වර්ෂයේ මිනින්දෝරු සිතියම්වලට අනුව රක්ෂිත හා අවශේෂ කැලෑ නිදහස් කරනු ලබන බව පවසා තිබෙනවා. මෙසේ නිදහස් කිරීම සඳහා හඳුනාගෙන ඇති හෝ ප්‍රාදේශීය ලේකම්වරු විසින් නිදහස් කිරීමට ඉල්ලා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද? ඒ අනුව දිස්ත්‍රික්ක මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මේ වන විට නිදහස් කර ඇති ඉඩම් ප්‍රමාණයන් කොපමණද?

03. ජනාධිපතිවරයා විසින් සඳහන් කළ 1985 වර්ෂයේ සිතියම මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සකස් කළ සිතියමක්ද?

වෙනත් ආයතනයක් විසින් සකස් කළ සිතියමක් ද? එසේ නම්, එම ආයතනය කුමක් ද? මිනින්දෝරු දෙපාර්තමේන්තුව සතුව මෙම ප්‍රදේශවලට අදාළව 1985 වර්ෂයට අයත් ගුවන් සිතියම් පවතින බව වාර්තා වේ. එය සත්‍යය ද? එසේ නම්, එම සිතියම් මත පදනම්ව රක්ෂිත හා අවශේෂ කැලෑ හඳුනා ගැනීමේ හැකියාවක් නොමැති ද?

04. 2012 වර්ෂයේ දී වන සංරක්ෂණ ආඥාපනත යටතේ GPS - Global Positioning System - බණ්ඩාංක මඟින් ලබා ගත් තොරතුරු මත රක්ෂිත වනාන්තර ගැසට් කර ඉඩම් නිදහස් කිරීම නිසා ජනතාව බොහෝ ගැටලුවලට මුහුණ දුන් බව වාර්තා වේ. එම නිසා යම් ආකාරයක රක්ෂිත වනාන්තර නැවත ගැසට් කරන්නේ නම් ඊට ප්‍රථමයෙන් සිවිල් සංවිධාන, ග්‍රාම නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරු සහ අනෙකුත් නිලධාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව එම රක්ෂිත වනාන්තර හඳුනා ගැනීම වඩාත් සුදුසු නොවේ ද? නොඑසේ නම්, රජය සතුව ඒ සඳහා වෙනත් ක්‍රමවේදයක් පවතී ද?

ගරු කථානායකතුමනි, මම පසුගිය දවස්වල අම්පාර දිස්ත්‍රික්කයේත්, මොනරාගල දිස්ත්‍රික්කයේත්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් උතුරු ප්‍රදේශයේත්, නැඟෙනහිර කලාපයේ බොහෝ ප්‍රදේශවලත් සංචාරය කළ අවස්ථාවේදී බොහෝ දෙනා මතක් කළා, ඒ අයගේ පාරම්පරික ගොවි බිම් අහිමි වෙලා තිබෙනවා, වගා බිම් අහිමි වෙලා තිබෙනවා කියලා. මේ තත්ත්වය තුළ රජය කියා තිබෙනවා, ඒ වගා බිම් ටික ආපහු ලබා දෙනවා කියලා. හැබැයි ඒක තවම කට වචනයට පමණයි සීමා වෙලා තිබෙන්නේ. ඒ නිසා මම අහනවා, රජය ලබා දුන්නු ඒ පොරොන්දුව ක්‍රියාත්මක කරන්නේ කවදාද කියලා. ඒ පිළිබඳ වැඩ පිළිවෙළක්, කාල සටහනක්, මාර්ග සිතියමක් ඉදිරිපත් කරන්න කියාත් ඉල්ලීමක් කරනවා.

05. මේ අතර 2383/05 ගැසට් පත්‍රය මඟින් වෙඩිතලතිව් ස්වාභාවික රක්ෂිතය මඟින් ප්‍රකාශයට පත් කළ ඉහළ ජෛව විවිධත්වයෙන් යුතු ගොඩබිම් හා මුහුදු රක්ෂිතයක් හෝ එහි සැලකිය යුතු කොටසක් ඉවත් කර ඇති බවට පරිසරවේදීන් මැසිවිලි නඟයි. මේක සත්‍යයක් ද? මීට හේතු වූ කරුණු කවරේ ද? මේ සම්බන්ධයෙන් තාක්ෂණික පාරිසරික අධ්‍යයනයක් සිදු කර තිබේ ද? ඒ කවදා ද? එසේනම්, එම වාර්තාව සභාගත කරන්නේ ද? මෙම ගැසට් පත්‍රයෙහි උපලේඛනයේ විස්තර කර ඇති භූමි ප්‍රදේශය ඉවත් කරනු ලබන බවට සඳහන් කර ඇත. එම උපලේඛනය සභාගත කළ හැකි ද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මේ කරුණ පිළිබඳව අපි මතයක් ප්‍රකාශ කරනවා නොවෙයි. ඒවායේ සත්‍ය තොරතුරු දැනගන්නටයි අපි මේ ප්‍රශ්නය - විශේෂයෙන්ම වෙඩිතලතිව් ප්‍රශ්නය- ඉදිරිපත් කළේ.

ඒ තොරතුරුත් අපට ලබා දෙන්න කියලා මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා. නැවත නැවතත් ඒ ගොවි ජනතාව කෘෂි කාර්මික කටයුතු ක්‍රියාත්මක කරගෙන ගිය පාරම්පරික ගොවිබිම් ආරක්ෂා කරන වැඩ පිළිවෙළකට රජය යා යුතුයි. එක පැත්තකින් රටේ වන ගහනය ශක්තිමත් කරනවා වාගේම පාරිසරික පැත්ත ශක්තිමත් කරනවා වාගේම ජනතාවගේ කෘෂිකර්මාන්ත ක්‍රියාවලිය අඩපණ වෙන්නට නොදී කටයුතු කිරීම වැදගත් කියලා මම මතක් කරන්නට කැමැතියි. ස්තුතියි.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (වනජීවී හා වන සම්පත් සංරක්ෂණ සහ වාරිමාර්ග අමාත්‍යතුමිය)

(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரும் நீர்ப்பாசன அமைச்சரும்)

(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law - Minister of Wildlife and Forest Resources Conservation and Minister of Irrigation)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

01. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ නිර්වචනයට අනුව වනාන්තර ලෙස සැලකෙන්නේ තුරු ආවරණය සියයට 10ට වඩා වැඩි, හෙක්ටෙයාර 0.5කට වඩා වැඩි ප්‍රදේශයක පැතිරී පවත්නා කෘෂි කාර්මික නොවන භූමි වන අතර, තුරු ආවරණය සාදන ශාක මීටර් පහට වඩා උස විය යුතුයි.

එම නිර්ණායක සපුරන භූමි ප්‍රදේශ ඇතුළත් කරමින් 2020 වර්ෂයේ මෙරට වන ගහනය සිතියම් සකස් කර ඇත. එම වනාන්තරවලට රජයට අයත් වනාන්තර මෙන්ම පෞද්ගලික අංශයට අයත් වනාන්තරද ඇතුළත් වේ. එම භූමි ප්‍රමාණය ජාතික වශයෙන් හා දිස්ත්‍රික් මට්ටමින් ගණනය කර ඇත. දිස්ත්‍රික් මට්ටමින් ගණනය කිරීමේ විස්තර ඇතුළත් ලේඛනය ඇමුණුමෙහි දක්වා තිබෙනවා. එම ඇමුණුම මම **සභාගත*** කරනවා.

ඒ අනුව 2020 වසර වනවිට ශ්‍රී ලංකාවේ ස්වාභාවික වනාන්තර ප්‍රමාණය සියයට 29.1ක් විධියට සඳහන් වෙනවා.

මෙම වන ගහනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගණනය කිරීමක් සිදු කරලා නැහැ. එයට හේතුව වන්නේ සමහර ස්වාභාවික වනාන්තර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට සීමා නොවී එය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක් කරා ව්‍යාප්තව පැවතීමයි.

02. උතුරු හා නැඟෙනහිර පළාත්වල 1985 මිනින්දෝරු සිතියම් පාදක කරගනිමින් තිරසර වනාන්තර කළමනාකරණය තුළින් ඉඩම් ගැටලු නිරාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.

උතුරු හා නැඟෙනහිර පළාත්වල වනාන්තර, රක්ෂිත වනාන්තර ලෙස ප්‍රකාශයට පත් කරන ලද්දේ මීට වසර සියයකට පමණ පෙරය. ඉන් පසුව 2009 වර්ෂයේ යුද්ධය අවසානයෙන් පසු 2012 වර්ෂයේදී හා ඊට ආසන්න වර්ෂවලදී වනාන්තර රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබුවේ භූමිතික ඛණ්ඩාංක භාවිත කරමිනි.

එම කාලයේ තිබූ තත්ත්වය අනුව ප්‍රායෝගික බිම් මැනුමක් කිරීමට හැකියාවක් නොතිබුණි. එබැවින් යුද්ධය නිසා ජනතාව විසින් අතහැර දමා ගොස් තිබූ ඔවුන් පදිංචිව සිටි ඇතැම් ඉඩම්ද රක්ෂිතවලට ඇතුළත් වූ අතර එය ගැටලුවක් විය. උතුරු හා නැඟෙනහිර ප්‍රදේශවල රක්ෂිත ප්‍රකාශයට පත් කිරීමේදී රක්ෂිතවල මායිම් සලකුණු කිරීමක් සිදු නොවීය. කාලයක් ගතවීමේදී එම රක්ෂිත ප්‍රදේශවලින් යම් යම් භූමි කොටස් ජනතාව විසින් සංවර්ධනය කර ඇති බව නිරීක්ෂණය විය. යුද්ධයෙන් පසුකාලීනව පැමිණි ජනතාව සමහර ඉඩම්වල පදිංචි විය. එම නිසා උතුරු හා නැඟෙනහිර පළාත්වල රක්ෂිත වනාන්තර තිබුණද ඒවායෙන් කොටසක් ජනාවාස හා කෘෂිකාර්මික භූමි ලෙස පැවතුණි. තවද රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් නොකරන ලද වනාන්තර ද උතුරු හා නැඟෙනහිර ප්‍රදේශවල පැවතුණි. එම සියලු වනාන්තරවල මායිම් හඳුනාගෙන මායිම් සලකුණු කර එම වනාන්තර ආරක්ෂා කිරීම අවශ්‍ය විය.

මේ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අනෙකුත් ආයතන සහ ප්‍රජාව ඒකාබද්ධව කටයුතු කිරීම සඳහා යන්ත්‍රණයක් අංක අමප/23/0147/613/002 හා 2023.01.23 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශයෙන් සහ අංක අමප/23/2367/613/008-1 හා 2023.12.18 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශයෙන් යෝජනා කෙරුණු අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එම අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම්තුමන්ගේ ප්‍රාදේශීය, ග්‍රාමීය නියෝජිතයින් සහ නිලධාරීන්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් ද ඒකාබද්ධව දැනට පවතින වනාන්තරවල මායිම් හඳුනා ගනිමින් පවතී.

මෙම ක්‍රියාවලියේදී උතුරු හා නැඟෙනහිර පළාත්වල සියලු දිස්ත්‍රික්කවල සංවර්ධනය කරන ලද ජනාවාස හා කෘෂිකාර්මික භූමි ලෙස පවතින තවදුරටත් වනාන්තර ලෙස කළමනාකරණය කළ නොහැකි හෙක්ටෙයාර 103,364.23ක් නිදහස් කිරීම සඳහා හඳුනාගෙන ඇත. ඒ පිළිබඳව විස්තර පහත දක්වා ඇත. ඒ සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ නිර්දේශය මත අන්තර් අමාත්‍යාංශ කමිටුවේ අනුමැතිය ලැබී ඇත.

රක්ෂිත වනාන්තර තුළ පිහිටි නිදහස් කිරීමට හඳුනා ගන්නා ලද සංවර්ධිත ඉඩම්

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රමාණය (හෙක්ටෙයාර)
1	වවුනියාව	12,964.17
2	කිලිනොච්චිය	22,536.93
3	මුලතිව්	17,449.35
4	යාපනය	-
5	මන්නාරම	2,895.88
6	ත්‍රිකුණාමලය	24,250.14
7	මඩකලපුව	11,137.53
8	අම්පාර	12,130.23
	මුළු එකතුව	103,364.23

** පිළිතුර අවසානයේ පළ කර ඇත.*

** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of Answer.*

මීට අමතරව විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ලේකම්වරුවන් විසින්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පාලනය කරනු ලබන වනාන්තරවලින් ඉඩම් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

එසේ ඉල්ලිම් කරන ලද ඉඩම් ප්‍රමාණය දිස්ත්‍රික්ක වශයෙන් පහත දක්වා ඇත.

අනු අංකය	දිස්ත්‍රික්කය	ඉල්ලීම් කරන ලද ඉඩම් ප්‍රමාණය (හෙක්ටෙයාර)
1	වවුනියාව	8,935.24
2	කිලිනොච්චිය	3,515.11
3	මුලතිව්	3,043.24
4	යාපනය	423.62
5	මන්නාරම	13,020.01
6	ත්‍රිකුණාමලය	19,441.04
7	මඩකලපුව	2,139.46
8	අම්පාර	543.92
මුළු එකතුව (හෙක්ටෙයාර)		51,061.64

ඉහත සඳහන් භූමි මේ වන විට වනාන්තර තත්ත්වයේ පවතින නිසා එම ඉඩම් නිදහස් කිරීමට අන්තර් අමාත්‍යාංශ කමිටුව අනුමත කර නොමැත. කෙසේ වුවද, 1985 වනාන්තර තත්ත්වයේ නොපැවති වර්තමානයේ වනාන්තර ලෙස පවතින ඉල්ලීම් පිළිබඳව වන සංරක්ෂණ ආඥා පනතේ හා ජාතික පාරිසරික පනත්වල ප්‍රතිපාදන අනුව ඉදිරියේදී සලකා බැලීමට අන්තර් අමාත්‍යාංශ කමිටුව තීරණය කර ඇත.

03. ඔව්.

1985 ඉඩම් පරිහරණ සිතියම මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇත. වර්තමානයේ වනාන්තර සිතියම් සකස් කරනු ලබන්නේ චන්ද්‍රිකා ඡායාරූප භාවිතයෙන් වන අතර 1985 ගුවන් ඡායාරූප මඟින් වනාන්තර භූමි හඳුනා ගැනීම ඉතා අපහසු කටයුත්තක් වේ.

04. 2012 වර්ෂයේ දී වන සංරක්ෂණ ආඥා පනත යටතේ වනාන්තර වශයෙන් පවතින භූමි GPS බණ්ඩාංක මඟින් සිතියම් සකස් කර ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම තාක්ෂණික ගැටලු මත සමහර අවස්ථාවන්හි ජනතාවට ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදු විය. ඒ අනුව, 2023.01.23 දිනැති අමාත්‍ය මණ්ඩල අංක අමප/23/0147/613/002 මඟින් සහ අංක අමප/23/2367/613/008-1 හා 2023.12.18 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශවලට ලැබී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් ඒකාබද්ධව මායිම් හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ඇත. ඒ අනුව, දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන්, මිනින්දෝරු දෙපාර්තමේන්තු නිලධාරීන්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඒකාබද්ධව දිස්ත්‍රික්ක මට්ටමින් සාකච්ඡා පවත්වා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ නිර්දේශ සහිතව අන්තර් අමාත්‍යාංශ කමිටුවට යොමු කර එහි අනුමැතිය ඇතිව මේ සියලු නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම්තුමන්ලාගේ නිලධාරීන්, ග්‍රාමීය නිලධාරීන් හා ප්‍රජාව ඒකාබද්ධව ක්ෂේත්‍රයේ මායිම් හඳුනාගෙන රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කරනු ලබයි. එය ඒකාබද්ධ ප්‍රවේශයක් අනුව කටයුතු කිරීමක් බැවින් මෙම ක්‍රමවේදය ප්‍රමාණවත් බව නිරීක්ෂණය වේ.

05. වෙඩිතලතිව් ස්වාභාවික රක්ෂිතය අංක 1956/13 හා 2016.03.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇත. ඉන්පසුව මන්නාරම දිස්ත්‍රික්කයේ ජලජීවී වගා කර්මාන්තපුරයක් ඉදි කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරනු ලැබූ ව්‍යාපෘති යෝජනාවක් වසර ගණනාවක් තිස්සේ දීර්ඝව සලකා බැලීමෙන් අනතුරුව 2021.08.11 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් වෙඩිතලතිව් ස්වාභාවික රක්ෂිතයෙන් හෙක්ටෙයාර 169ක භූමි ප්‍රමාණයක් අදාළ ව්‍යාපෘතිය සඳහා බැහැර කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව එහි හෙක්ටෙයාර 169ක භූමි ප්‍රමාණයක් වනඝත්ව හා වන්‍යජීවී ආරක්ෂක ආඥා පනතේ දැක්වෙන විධිවිධාන අනුව රක්ෂිතභාවයෙන් ඉවත් කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.

2018 සැප්තැම්බර් මස මේ සම්බන්ධයෙන් තාක්ෂණික පාරිසරික අධ්‍යයනයක් සිදු කර ඇත. එම වාර්තාවේ පිටපතක් ඉදිරියේ දී සභාගත කළ හැක. ගැසට් පත්‍රයෙහි සඳහන් නීති කෙටුම්පත් සම්පාදක විසින් අනුමත කර ඇති උපලේඛනයේ පිටපතක් සභාගත කළ හැක.

සභාමේසය මත තබන ලද ඇමුණුම:
**சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
**Annex tabled:*

Natural Forest Cover - 2020

Serial No.	District	FC 2020 (ha)	FC 2020 (%)
1	Ampara	150,178.10	34
2	Anuradhapura	250,222.00	35
3	Badulla	68,597.41	24
4	Batticaloa	51,084.24	21
5	Colombo	2,054.51	3
6	Galle	21,450.93	13
7	Gampaha	1,669.69	1
8	Hambantota	57,136.12	22
9	Jaffna	4,749.45	4
10	Kalutara	18,561.47	11
11	Kandy	47,053.23	24
12	Kegalle	15,142.51	9
13	Kilinochchi	35,129.60	27
14	Kurunegala	21,987.39	4
15	Mannar	115,819.20	58
16	Matale	77,173.12	37
17	Matara	18,421.48	14
18	Monaragala	223,557.60	39
19	Mullaithivu	171,508.98	64
20	NuwaraEliya	38,382.38	22
21	Polonnaruwa	130,147.60	38
22	Puttalam	84,197.34	27
23	Ratnapura	74,783.38	23
24	Trincomalee	121,472.20	45
25	Vavuniya	108,512.40	56
Total		**1,908,992.33**	**29.1**

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමියනි, ඔබතුමිය තාක්ෂණික - technical - උත්තරයක් දුන්නේ. විවිධ දිස්ත්‍රික්කවලට ගිහිල්ලා ජනාධිපතිවරයාම පොරොන්දු වෙලා තිබෙනවා, පාරම්පරික ගොවි බිම් ටික නිදහස් කරනවා කියලා. ඇත්තවශයෙන්ම කිව්වොත් ඒක නිකම් කථාවට පමණයි සීමා වෙලා තිබෙන්නේ. උදාහරණයක් වශයෙන් කිව්වොත්, පදවි ශ්‍රී පුර, ගෝමරන්කඩවල, මොරවැව, තඹලගමුව, කන්තලේ, සේරුවිල, වේරුගල හා ඉච්චලම්පත්තුව කියන ප්‍රදේශවල බරපතළ ගැටලු තිබෙනවා. මම ඒ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කොටසක් විතරයි කිව්වේ. ඒ වාගේම අම්පාර දිස්ත්‍රික්කයේත්, මොනරාගල දිස්ත්‍රික්කයේත්, උතුරුකරයේත් බරපතළ ගැටලු තිබෙනවා. මම සඳහන් කරපු සහ සඳහන් නොකරපු ඒ දිස්ත්‍රික්කවල හැම බල ප්‍රදේශයකම වාගේ ගැටලු තිබෙනවා. එතුමා ගිහින් පොරොන්දු වෙලා තිබෙනවා, පාරම්පරික ගොවි බිම් ටික නිදහස් කරනවා කියලා. එම ගොවි බිම් ටික නිදහස් වනතෙක් ඒ ජනතාව බොහොම ඕනෑකමින් සහ බලාපොරොත්තු සහගතව බලාගෙන ඉන්නවා.

ඒ සම්බන්ධයෙන් ඔබතුමිය ඇතුළු රජය ගන්න පියවර මොකක්ද කියන එක ගැන පැහැදිලි අවබෝධයක් අපට නැහැ. එම නිසා මට ඒ ප්‍රශ්නයට උත්තරයක් අවශ්‍යයි.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අපි ගන්නා ක්‍රියාමාර්ගය තමයි මම මේ වෙනකම් මගේ පිළිතුරේදී කිව්වේ. දිසාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, ග්‍රාම නිලධාරීන් ඇතුළු ඒ ගම්වල ඉන්න ජනතාව දන්නවා, අපි ගත් ක්‍රියාමාර්ගය ගැන. ඒ ක්‍රියාමාර්ගය පැහැදිලිව මා ලබා දුන් පිළිතුරේ සඳහන් වෙලා තිබෙනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉක්මනින් කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමිය සභාවේ ඉන්න වෙලාවේ මෙම කරුණ ඉදිරිපත් කරන්න අවශ්‍ය නිසායි මම ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කළේ. ඒ සඳහා මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම වනාතවිල්ලුව, මයිලන්කුලම යන ගම්මානවල තිබෙන වනඅලි ප්‍රශ්නයට ගමේම අය විසඳුමක් හදාගෙන තිබෙනවා, අලින්ට එන්න බැරි වෙන්න පළලට අගල් කපලා. හැබැයි, ඒකට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක්, ආධාරයක් හෝ කිසිම දෙයක් ලැබිලා නැහැ. ගරු ඇමතිතුමියනි, මම ඔබතුමියගෙන් ඉතාම කාරුණිකව මේ සම්බන්ධව ඉල්ලීමක් කරනවා. ඒ අයට අස්වැසුමවත් මොකුත් අවශ්‍ය වෙන්නේ නැහැ, ඒ අයගේ වගා ටික බේරා ගත්තා නම්. එම නිසා කරුණාකරලා ඒ ගැන පෞද්ගලිකව සොයා බලා ඔවුන්ට අවස්ථාවක් ලබා දෙන්න. මම ඔබතුමියට පෞද්ගලිකවත් මේ සම්බන්ධව කථා කරන්නම්. යම් මුදල් ප්‍රමාණයකුත් ඔවුන්ට ලබා දෙන්න හැකි නම් බොහොම ස්තුතියි කියන එක තමයි මම කියන්නේ.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, අපි පුත්තලම දිස්ත්‍රික්කයට අවශ්‍ය ප්‍රමාණයට අලි වැටවල් හදලා තිබෙනවා. අගල් කපන එක සම්බන්ධයෙන් ගත්තොත්, උසාවියේ නඩුවක් දාලා තිබෙන නිසා අගල් කැපීම දැනට නවත්වා තිබෙනවා. ඔබතුමා කියන කාරණය ඇත්ත. තාක්ෂණිකව අවශ්‍ය තැනදී අගල් කපන්න ඕනෑ. හැම තැනකම අගල් කපන එක නවත්වා තිබෙන එක වැරදියි. ඒ නිසා මේ සම්බන්ධව මා යොමු කළ කැබිනට් පත්‍රිකාව ඉදිරියේදී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වේවි. අපි කැබිනට් මණ්ඩලයේදී මේ සම්බන්ධව තීන්දුවක් ගත්තාම උසාවියට ගිහිල්ලා නැවත කියනවා, අවශ්‍ය තැන්වල අගල් කපන්න ආණ්ඩුව තීන්දුවක් අරගෙන තිබෙන නිසා උසාවියෙන් ලබා දී තිබෙන තහනම් නියෝගය ඉවත් කර දෙන්න කියලා. ඔබතුමා කියන කාරණය සම්බන්ධයෙන් මම තවදුරටත් මැදිහත් වන බව මේ අවස්ථාවේදී ගෞරවයෙන් මතක් කරනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

Sir, could we take the lunch interval also for the Debate?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes. Does the House agree?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු පියංකර ජයරත්න මන්ත්‍රීතුමා.

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු ඇමතිතුමියනි, විශේෂයෙන් ආනමඩුව මැතිවරණ කොට්ඨාසයේ තමයි අලි-මිනිස් ගැටුම විශාල වශයෙන් තිබෙන්නේ. ඔබතුමිය මේ ප්‍රදේශයට ඇවිත් අප සමඟ මේ සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරලා පරීක්ෂා කළොත් හොඳයි කියා මා හිතනවා. නැත්නම් මේ ප්‍රශ්නය එන්න එන්න වැඩි වෙනවා.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, මේ මාසය ඇතුළත අපි ඒ සාකච්ඡාව කරමු.

ගරු විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு விமலவீர திசாநாயக்க)
(The Hon. Wimalaweera Dissanayake)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමලවීර දිසානායක හිටපු ඇමතිතුමාට තිබෙන ප්‍රශ්නය මොකක්ද?

ගරු විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு விமலவீர திசாநாயக்க)
(The Hon. Wimalaweera Dissanayake)
මම අවුරුදු එකහමාරකින් පාර්ලිමේන්තුවේ කථා කරලා නැහැ, මටත් ඉඩක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு விமலவீர திசாநாயக்க)
(The Hon. Wimalaweera Dissanayake)
මම හිටපු වනජීවී ඇමතිවරයා. ඒ, එක පැත්තකින්. අනෙක් පැත්තෙන්, විපක්ෂ නායකතුමා කිව්වා වාගේ මේ රටේ බොහෝ ප්‍රදේශවල වනඅලි ප්‍රශ්නය තිබෙනවා. වනඅලි පහරදීම් නිසා අවුරුද්දකට රුපියල් කෝටි 30,000ක් විතර වටිනා දේපළ විනාශ වෙනවා. හැබැයි, මේ ප්‍රශ්නයට විසඳුමක් ගන්න ගියාම ඩොලර්වලින්, පවුම්වලින් විදේශ ආධාර ගන්න අය උසාවි ගිහින් තහනම් නියෝග ගන්නවා. ඔය අලි අගල් කැපීම ආරම්භ කළේ මම. උසාවියේ මේ නියෝග දෙන අයගේ ගෙවල්වලට අලි ගහන්නේත් නැහැ. නඩු දමන අයගේ ගෙවල්වලට අලි ගහන්නේත් නැහැ. හැබැයි, අවසානයේ ජීවිත දහස් ගණනක් විනාශ වෙනවා. අලිත් මැරෙනවා. මිනිස්සුත් මැරෙනවා. දේපළත් විනාශ වෙනවා. ඒ නිසා මේක ජාතියේ බරපතළ ඛේදවාචකයක්. මිනිස්සු ගම් අතහැරලා යනවා. විපක්ෂ නායකතුමා කිව්වා වාගේ මහඔය ප්‍රදේශයේ මිනිස්සු ගම් අතහැරලා යනවා. මේ ප්‍රශ්නයට කිසිම පිළියමක් නැහැ. රට ගොඩනහන්න නම්, කෘෂිකර්මය ආරක්ෂා කරන්න නම් වන ජීවීන්ගෙන් වන හානිය නතර කර ගන්න ඕනෑ. ගරු ඇමතිතුමිය කිව්වා වාගේ ම අවශ්‍ය තැනදී අලි අගල් කපන්නේ නැතිව මේ ප්‍රශ්නය විසඳන්න බැහැ.

ඕනෑ නම් මම උදාහරණයක් පෙන්වන්නම්. උඩවලව වනෝද්‍යානය ආසන්නයේ කිලෝමීටර පහමාරක අලි අගලක් කපලා තිබෙනවා, මම ඇමති ධුරයේ හිටපු කාලයේ. එතැනින් මෙහාට අලි එන්නේ නැහැ. වැල්ලවායේත් එහෙම තැනක් තිබෙනවා. අනුරාධපුරයේත් එහෙම තැනක් තිබෙනවා. චන්ද්‍රසේන හිටපු ඇමතිතුමා ඒකට සාක්ෂි දරාවි. නමුත්, පසුව එම කටයුත්ත නතර කළා. මේ රටේ ඕනෑ තරම් විශේෂඥයන්, විද්‍යාඥයන් කථා කරනවා, අලින්ගෙන් වන හානිය වළක්වා ගන්නේ කොහොමද කියලා. හැබැයි, ඔවුන්ගෙන් කිසි කෙනෙක් ළඟ නිවැරැදි වැඩ පිළිවෙළක් නැහැ. ගරු ඇමතිතුමියනි, ජනතාවට රෑට ගෙවල්වල නිදාගන්න බැහැ, මිනිස්සුන්ට පාරේ යන්නත් බැහැ, පාරේ ගියත් මරනවා, පාසලට යනකොට දරුවන් මරනවා, හේනට යනකොට මිනිස්සු මරනවා. මේ සතුන් හරියට නිකම් එල්ටීටීඊකාරයෝ වාගෙයි.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එතුමා කියන කථාවේ සත්‍යයක් තිබෙනවා. උසාවිය දීලා තිබෙන මේ තහනම් නියෝගය ඉවත් කර ගැනීම සඳහා රජයක් විධියට අපි කැබිනට් මණ්ඩලයේදී තීන්දුවක් අරගෙන නැවත උසාවියට ගිහිල්ලා කරුණු කියන්නයි බලාපොරොත්තු වෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ඉදිරිපත් කිරීම, ගරු ඇමතිතුමා.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත
இலங்கை மின்சாரம் சட்டமூலம்
SRI LANKA ELECTRICITY BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[පූ.භා. 11.10]

ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා විදුලිබල පනත අලුත් පනත් කෙටුම්පතක් ලෙස ඉදිරිපත් කිරීමේදී අපට එල්ල වන ප්‍රධානම චෝදනාව වෙන්නේ මේක අපි කඩිනමින් ගෙනෙන, මේ ආණ්ඩුව කලබල කරලා ගෙනෙන පනත් කෙටුම්පතක් හැටියට සඳහන් කිරීමයි. ගරු කථානායකතුමනි, අපි පිළිගන්න ඕනෑ, අපේ විදුලිබල ක්ෂේත්‍රයේ සෑම පාරිභෝගිකයෙක්ම පසුගිය කාලය පුරාම චෝදනා එල්ල කළේ සේවාවන් නිසි ලෙස පවත්වාගෙන යෑමේ නොහැකියාව, කාර්යක්ෂමතාව, විදුලි බිල සහ අපේ විදුලි ක්ෂේත්‍රයේ තිබෙන අඩුපාඩු පිළිබඳව බව. 1969න් ආරම්භ වෙච්ච අපේ තිබෙන පනත නූතන ලෝකයට ගැළපෙන ආකාරයට සංශෝධනය වෙලා නැහැ, ගරු කථානායකතුමනි. විවිධ අවස්ථාවලදී අපේ ව්‍යවස්ථාව සංශෝධනය වෙලා තිබෙනවා. විවිධ අණ පනත් සංශෝධනය වෙලා තිබෙනවා. නමුත් විදුලිබල ක්ෂේත්‍රය සම්බන්ධව ගත්තොත්, අලුත් පනතක් නොමැතිව අපට අනාගතයට විවෘත වෙන්න පුළුවන්කමක් නැහැ, ගරු කථානායකතුමනි. කවුරු හරි හිතනවා නම්, වර්තමාන පනත තුළිනුත් මේ කටයුත්ත කර ගන්න පුළුවන් කියලා, එහෙම නම් අර පසුගිය කාලය පුරාවටම විදුලිබල ක්ෂේත්‍රයේ තිබුණු අවශ්‍යතා ටික සම්පූර්ණ කරන්නට මේ පනත භාවිත කරලා කටයුතු කිරීමේ

[ගරු කංචන විජේසේකර මහතා]

අවකාශය තිබුණා. ගරු කථානායකතුමනි, නමුත් අපි පිළිගන්න ඕනෑ කාරණය මෙයයි. අපි දේශපාලනඥයන් හැටියට බැණුම් අහනවා; පාර්ලිමේන්තුවේ සිටින සියලුදෙනාම බැණුම් අහනවා; ඇමතිවරු බැණුම් අහනවා. නමුත් මේ කිසිම ඇමතිවරයෙකු ගිහිල්ලා නොවෙයි, අවශ්‍ය තාක්ෂණික උපදෙස් දෙන්නේ. මේ කවුරුවත් නොවෙයි, මේකට අවභිරතා ඇති කරලා තිබෙන්නේ. ඒ, විදුලිබල මණ්ඩලය ඇතුළේ ගොඩනැඟිලා තිබෙන ඒකාධිකාරය. ගරු කථානායකතුමනි, විදුලිබල මණ්ඩලය තරම් ඒකාධිකාරයට ග්‍රහණය වෙච්ච තවත් ආයතනයක් මේ රට ඇතුළේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හරියටම හරි.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

පසුගිය කාලය පුරාවට විවිධ ආණ්ඩු, විවිධ ඇමතිවරු විවිධ අවස්ථාවලදී උත්සාහ කළා, මේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙනියන්න. ඒ ඇමතිවරු නොවෙයි, ඒ කටයුත්ත අවභිර කළේ. තිබුණු ආණ්ඩුත් නොවෙයි, ඒ කටයුත්ත අවභිර කළේ. ඒ කටයුත්ත අවභිර කරපු පිරිසක් මේ ආයතනය තුළම හිටියා. ඒ පිරිසට සහයෝගය දෙන දේශපාලන කණ්ඩායමක් එළියේත් ඉන්නවා. ඒ එළියේ ඉන්න දේශපාලන කණ්ඩායමට සහයෝගය දක්වන වෘත්තීය සමිති කණ්ඩායමකුත් ඇතුළේ ඉන්නවා. ඔවුන් ඇතුළේ ඉඳගෙන ඔවුන්ගේ සියලු දේවල් කර ගන්නවා. හැබැයි අනාගතයේදී රටට අවශ්‍ය විදුලිබලය ලබා දීම පිළිබඳව, විදුලි ක්ෂේත්‍රයේ අනාගතය පිළිබඳව ඔවුන් කටයුතු කරන්නේ නැහැ, ගරු කථානායකතුමනි. මේ පනත් කෙටුම්පත අපි ගේන්නේ අවුරුදු දෙකක් තිස්සේ සාකච්ඡා කරලා. මේ හා සම්බන්ධ පළමුවෙනි කැබිනට් පත්‍රිකාව මම ඉදිරිපත් කරන්නේ 2022 ජූලි මාසයේදීයි. 2022 ජූලි මාසයේ කමිටුවක් පත් කරලා මාස තුනක් මේ පිළිබඳව අපි සාකච්ඡා කළා. ඊට පාර්ලිමේන්තුව නියෝජනය කරපු විදුලිබල ක්ෂේත්‍රය හා සම්බන්ධව හිටපු සියලු ඇමතිවරුන්ට ආරාධනා කළා; එ් වාගේම පාර්ලිමේන්තුව නියෝජනය කරන නොකරන සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කළා, ඇවිල්ලා අපට මේකට අවශ්‍ය තොරතුරු දෙන්න කියලා. නමුත්, ඒ සඳහා සහභාගි වුණේ කිහිපදෙනායි. අපි සියලු දේශපාලන පක්ෂවල නියෝජිතයන්ට මේ සඳහා ආරාධනා කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ආරාධනා කළා. නමුත්, ආවේ කිහිපදෙනායි. ඒ පිරිස ලබා දුන් තොරතුරුත් අරගෙන වෘත්තීය සමිති, පාලන අධිකාරිය, පාර්ශ්වකරුවන් සහ විවිධ පුද්ගලයන් එක්ක සාකච්ඡා කරලා තමයි පළමුවෙනි වාර්තාව ඉදිරිපත් කළේ. ඒ වාර්තාව ඉදිරිපත් කරලා අපි අගෝස්තු මාසය වෙනකොට තින්දු කළා, මේ පනත කෙටුම්පත් කරන්න. කෙටුම්පත් කරන්න අවශ්‍ය සහාය අපි විවිධ පාර්ශ්වවලින් ලබා ගන්න ඕනෑ. මොකද, මේකේ තිබෙන තාක්ෂණික කාරණා පිළිබඳව වැඩි අවබෝධයක් අපට නැති නිසා. නමුත් කවුරුහරි හිතනවා නම්, විදුලිබල මණ්ඩලයේ ඉන්න අයගෙන්ම උපදෙස් අරගෙන මේක කරන්න ඕනෑය කියලා, එහෙමනම් ඒ අය බලාපොරොත්තු වුණේ විදුලිබල මණ්ඩලය මේ තිබෙන විධියටම ඒකාධිකාරයක් හැටියට පවත්වාගෙන යන්න අලුත් පනතක් ගෙන ඒමයි. විදුලිබල මණ්ඩලය ඇතුළේ ඉන්න අයගෙන් උපදෙස් අරගෙන නම් මේ පනත් කෙටුම්පත හදන්න ඕනෑ, අපට පනතක් වෙනස් කරන්න යන්න ඕනෑ නැහැ. එහෙම නම් ඇතුළේ ඉන්න අයටම මේක කරගෙන යන්න තිබුණා. හැබැයි, පසුගිය කාලයේ ආණ්ඩු, ඇමතිවරු ඒ ඒ අවස්ථාවලදී වෘත්තීය සමිති විසින් ග්‍රහණයට ලක් කර ගත්තේ කොහොමද?

ගරු කථානායකතුමනි, ඔබතුමාටත් මතක ඇති, 2022 ජූලි මාසයේ සහ අගෝස්තු මාසයේ අවස්ථා දෙකකදී මේ රටේ විදුලි බලය පැය 24ක් කප්පාදු කළ බව. එහෙම කරලා කිව්වා, ඔවුන්ගේ ඉල්ලීම් ඉෂ්ට කර දෙන්නේ නැත්නම් නැවත විදුලිය දෙන්නේ නැහැ කියලා. ගරු කථානායකතුමනි, පසුගිය අවුරුද්දේත් මේකට උත්සාහ කළා. ගරු කථානායකතුමනි, ඇමතිවරයා හැටියට මම ඒකට ඉඩ දුන්නා නම්, අපට පැය 24ම විදුලිය ලබා දෙන්න නොහැකි වෙනවා. අපේ තිබුණු ආණ්ඩුව ගෙදර යවන්නත්, එදා හිටපු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට විරුද්ධව ජන මතයක් නිර්මාණය කරන්න විදුලිබල මණ්ඩලයත් හේතු වුණා. මොකද, අවශ්‍ය තීන්දු-තීරණ ගත්තේ නැහැ. අවශ්‍ය ප්‍රතිපත්තිවලට අනුමැතිය දීලා තිබුණු නමුත් ඒ අනුමැතියන් ක්‍රියාත්මක කළේ නැහැ. ගරු කථානායකතුමනි, අපි සාකච්ඡා කරලා තමයි අද මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ.

ඊට පස්සේ අපි ඒක ගැසට් කළා. නමුත්, ගැසට් කරපුවා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. අපි අවස්ථාව ලබා දුන්නා, යෝජනා සහ ඔවුන්ගේ නිර්දේශ දෙන්න කියලා. ඒ අනුව යෝජනා හා නිර්දේශ 800ක් පමණ අපිට ඉදිරිපත් වුණා. ඊට පස්සේ අපි පසුගිය අවුරුදු එකහමාර තුළ ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, USAID එක, JICA එක වැනි සංවර්ධන නියෝජිත ආයතනවලින් තාක්ෂණික සහාය ඉල්ලුවා. මම මේ අවස්ථාවේදී එක කාරණයක් කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මේ පනත, මෙන්න මේ අහවල් පුද්ගලයාගේ කියන්න පුළුවන් පනතක් නොවෙයි. මේ පනතේ අපේ අවශ්‍යතා, රටේ අවශ්‍යතා තිබෙන්නේ. අපි ඒ අවශ්‍යතා වෙනුවෙන් ඔවුන්ගෙන් උපදෙස් හා තාක්ෂණික සහාය අරගෙන මේ කටයුත්ත කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ පනත මේ ආණ්ඩුව ගෙනෙන නිසා විපක්ෂයට විරුද්ධ වෙන්න සිද්ධ වෙලා තිබෙනවාය කියන එක මම දන්නවා. විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු සමහර වෙලාවට අපිට කථා කරලා කියනවා, මේක කෙරෙන්න ඕනෑ වැඩක් කියලා. 2002දීත් මෙවැනිම ආකාරයේ පනතක් ගෙනාවා, සේවාවන් වෙන් කරන්න. ඒක අනුමත වුණා. හැබැයි, ඊටත් වැඩිය පුළුල් ලෙස අද මේ සේවාවන් කාර්යක්ෂම කිරීමේ යෝජනාවක් ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ නැහැ, කාටවත් මේ පනතට විරුද්ධ වෙන්න පුළුවන් කියලා.

ගරු කථානායකතුමනි, මම නිකමට වාගේ මේ කාරණය කියන්නේ. දැන් සමගි ජන බලවේගය නේ ප්‍රධාන විපක්ෂය. ඔවුන් පසුගිය ජූලි මාසයේ "The Blueprint" කියලා economic blueprint එකක් එළිදැක්වූවා. ජූලි මාසයේ එළිදක්වපු "The Blueprint"හි "Energy and Utilities Reform" කියන එකෙන් මොකක්ද කියන්නේ?

> "Restructure energy and utility SOEs".

ඒ කියන්නේ, විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රයේ තිබෙන රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කරන්න කියායි. ඊළඟට එහි මෙසේ සඳහන් වෙනවා:

> "Unbundle the CEB and introduce competition in generation and distribution."

මොකක්ද, මේ කියන්නේ? සේවාවන් වෙන් කරන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිණින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [මාණ්ඩුමිකු අජිත් රාජපක්ෂ] තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE]took the Chair.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම කියන සේවාවන් වෙන් කරන්න කියනවා. ඊළඟට, ජනනයට සහ බෙදා හැරීමට තරගකාරිත්වයක් ගෙනෙන්න කියනවා. මොකක්ද, මේ කියන්නේ? තරගකාරිත්වයක් ගෙනෙන්න පුළුවන්ද, රජයේ ආයතනවලට? ඔබතුමන්ලාත් කියන්නේ පෞද්ගලික ආයෝජන ගෙනෙන්න, පෞද්ගලික තරගකාරිත්වයක් ගෙනෙන්න කියායි. ජනනයේ යම් කිසි තරගකාරිත්වයක් දැනුත් තිබෙනවා. හැබැයි, ඔබතුමන්ලා යෝජනා කරන්නේත් ඒ කටයුත්ත. එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "Separate the transmission grid to allow the necessary investments."

දැන් ඒක තමයි අපි මේ කරලා තිබෙන්නේ. මේ යෝජනා කරලා තිබෙන්නේත් ඔබතුමන්ලා ප්‍රතිපත්තිය තුළ ඉදිරිපත් කරලා තිබෙන දේ. මම තවදුරටත් ඒ ගැන කියන්නම්.

සමගි ජන බලවේගය එහෙම කිව්වාට අපි එහෙම නැහැ කියන මාලිමාවේ අය ටිකක් ඉන්නවා නේ. මාලිමාවේ අය පසුගිය දවසක ඉදිරිපත් කළා නේ, බලශක්තිය පිළිබඳ ප්‍රතිපත්තියක්. ඉංජිනේරුවරු 8,000ක් ගෙනැල්ලා වාඩි කළා. ලංකාවේ ඉංජිනේරුවරු එච්චර ප්‍රමාණයකුත් නැහැ. ඔක්කොම ඉංජිනේරුවරු කියලා රන්ජන් ජයලාල්ලා වාගේ කට්ටියක් ගෙනැල්ලා වාඩි කළා. මම ඇත්තටම හිතුවේ ඔවුන් ඒ ප්‍රතිපත්තිය හදනකොට රන්ජන්ගෙන්වත් පොඩි උපදෙසක් අරගෙන ඇති කියායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන්ගේ ප්‍රතිපත්තියෙන් මොකක්ද කියන්නේ? "Reducing electricity generation cost, reaching strategic electricity generation mix at least economic cost". පසුගිය සති ගණනාවේදීම පලු යන්න මට පහර ගැහුවා, "least cost" කියන එක අයින් කරලා, "least economic cost" කියන එකක් දාලා තිබෙනවාය කියලා. දැන් මාලිමාවේ ප්‍රතිපත්තිය හැටියට තිබෙන්නේ, "least economic cost" කියලා නේ. මොකක්ද එතකොට මේකේ වෙනස? මම දන්නේ නැහැ, ඉංග්‍රීසි පරිවර්තනයේ මොකක් හෝ ප්‍රශ්නයක්ද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට, එහි මොකක්ද කියන්නේ? "Connecting with BIMSTEC Electrical Supergrid." දැන් අපි යෝජනා කරන්නේ ඉන්දියාවත් එක්ක සම්බන්ධ වෙන්න කියායි. ඊළඟට, කලාපීය රටවල්, BIMSTEC එකට අයත් රටවල්, එහා පැත්තෙන් සිංගප්පූරුව, අනික් පැත්තෙන් මැද පෙරදිග රටවල් ඉන්දියාව එක්ක සම්බන්ධ වෙනවා. අපි පසුගිය කාලයේ කථා කළේ මේ රටවල් සම්බන්ධ කර ගන්නයි. මේ අය මෙච්චර කල් ඇවිල්ලා කිව්වේ මොකක්ද? "මේගොල්ලන් ඇවිල්ලා රටේ තිබෙන දේවල් ඉන්දියාවට දෙන්න හදනවා, ඉන්දියාවට connect කරන්න හදනවා" කිව්වා. මාලිමාවේ ප්‍රතිපත්තියේ තිබෙන්නේ මොකක්ද? "Connecting with BIMSTEC Electrical Supergrid."

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

BIMSTEC රටවල් මොනවාද කියලා නම් කරන්න කියන්න.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

මම හිතන විධියට, BIMSTEC රටවල් මොනවාද කියන්න ඔවුන් දන්නේත් නැහැ. මම හිතන විධියට, මේ විස්තර ඔවුන්ට කවුරුන් හෝ දීපු දෙයක්. ඒ විස්තර ගෙනැල්ලා, ප්‍රතිපත්තියට ඇතුළු කරලා තිබෙනවා.

එහි ඊට පස්සේ මොකක්ද කියන්නේ? "Entering international energy trading." ඒ කියන්නේ, ජාත්‍යන්තර බලශක්ති වෙළෙඳාමට අපි ඇතුළු වෙන්න ඕනෑය කියන එකයි. ජාත්‍යන්තර ආයෝජකයෝ ආවොත් ගමේ මිනිස්සුන්ට කියනවා, අන්න අරයා එනවා, මෙයා එනවා, මෙයා ආවොත් එහෙම මෙහෙම වෙනවාය කියලා. හැබැයි, මට සමගි ජන බලවේගයේ සහ මාලිමාවේ ප්‍රතිපත්තිවල කිසිම වෙනසක් පෙනෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේකේ තවදුරටත් තිබෙනවා, "Grooming national companies in international energy markets" කියලා. මට තේරෙන්නේ නැහැ, මොකක්ද මේ කියන්නේ කියලා. ජාත්‍යන්තරයට එන්න එපාය කියනවා. දැන් විවිධ රටවල මේ කටයුත්ත කරගෙන යන ක්‍රමයටම තමයි කරන්න කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක්ද මේ අපි කරන්න බලාපොරොත්තු වෙන්නේ? ලොකු මතයක් හදලා තිබෙනවා, මේ පනත ගෙනැල්ලා තිබෙන්නේ විදුලිබල මණ්ඩලය විකුණන්න කියලා. මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට මම අභියෝග කරනවා, මේ පනත් කෙටුම්පත ඇතුළේ විකුණන්න කියා දමලා තිබෙන කොටස මොකක්ද කියලා පෙන්වන ලෙසට. මොකද, විකුණන්න ඕනෑ නම් දැන් තිබෙන පනත අනුවත් විකුණන්න පුළුවන්.

ලෙකෝ සමාගම කියන්නේ මොකක්ද? ලංකා විදුලි (පුද්ගලික) සමාගම. ලංකා විදුලි (පුද්ගලික) සමාගම කිව්වාට ඒක පෞද්ගලික ආයතනයක්ද? නැහැ. ඒකේ සියයට සියයක් කොටස් තිබෙන්නේ ආණ්ඩුවට. මෙහෙම තමයි සමාගම් බවට පරිවර්තනය කරන්නේ. කුමන හෝ ආණ්ඩුවකට ලෙකෝ සමාගම විකුණා දමන්න අවශ්‍යතාව තිබුණා නම්, පසුගිය අවුරුදු හතළිහේ ඒක විකුණන්න තිබුණා. මේ ආණ්ඩුවට මුදල් අමාරුකම් තිබෙනවා, බංකොලොත් වෙලා ඉන්නේ, මේක විකුණුවොත් හොඳයි කියලා හිතුවා නම්, අපට පසුගිය අවුරුදු දෙකේත් ඒක කරන්න තිබුණා. හැබැයි, ඒක නොවෙයි අපේ බලාපොරොත්තුව. අපි මොකක්ද කියන්නේ? ඒකාධිකාරයක් හැටියට තිබෙනකොට ඒ ආයතනයේ කාර්යක්ෂමතාවක් නැහැ; විනිවිදභාවයක් නැහැ. ඇමතිවරු, මන්ත්‍රීවරු -දේශපාලනඥයෝ- තමයි බැණුම් අහන්නේ. හැබැයි, දූෂණය, වංචාව ඇති වෙන්නේ, කාර්යක්ෂමතාව නැති වෙන්නේ කොහොමද? ඒක ඇතුළේ නිලධාරීන් අතර ඉන්න ඒකාධිකාරී කණ්ඩායමක් නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහරු කියනවා, මේ පනත ගෙනැල්ලා තිබෙන්නේ ඇමතිවරයාගේ බලය වැඩි කර ගන්න කියලා. ඇමතිවරයා බලය පාවිච්චි කරනවා නම්, දැන් තිබෙන පනත තමයි හොඳම, බලවත්ම පනත. දැන් තිබෙන පනත අනුව ඕනෑ නම් මගේ ඛ්‍රයිවර්ව ගෙනැල්ලා මට සාමාන්‍යාධිකාරිවරයා ලෙස පත් කරන්න පුළුවන්. නමුත්, එතැන හදා ගත්තේ මොකක්ද? පනතක් තිබෙනවා. පනත තිබෙන අතරේ ඇතුළේ ව්‍යවස්ථාවක්

[ගරු කංචන විජේසේකර මහතා]

හදාගෙන ඉන්නවා, විදුලි ඉංජිනේරු සංගමය කියලා ත්‍රස්තවාදී කණ්ඩායමක්. තවත් ඉංජිනේරු සංගම් තිබෙනවා. ස්වාධීන ඉංජිනේරුවන් ඉන්නවා; ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවන් ඉන්නවා; mechanical engineersලා ඉන්නවා; civil engineersලා ඉන්නවා. ඒ අය මේකට සම්බන්ධ වෙන්නේ නැහැ. හැබැයි, මේකට සම්බන්ධ වුණාම එල්ටීටීඊ එකටත් වඩා දරුණුයි. ඒ කට්ටිය තමයි තීන්දු කරන්නේ වැඩට ආපු දවසේ, ඊළඟට GM වෙන්නේ කවුද කියලා. පසුගිය අවුරුද්දේ හිටපු සාමාන්‍යාධිකාරිවරයා විශ්‍රාම යනකොට මට ඇවිල්ලා කිව්වා, "ඊළඟට ඉන්න කෙනා පත් කරන්න, ඔහු තමයි අපි හදාගෙන ඉන්නේ" කියලා. මම ඇහුවා, හැදුවේ කොහොමද කියලා. අපේ ආයතනය ඇතුළේ එවැනි ක්‍රමවේදයක් තිබෙනවාය කිව්වා. මම ඇහුවා, ඔහු කවුද කියලා. ඔහු විදුලි ඉංජිනේරුවරයෙක් කිව්වා. මම ඇහුවා, එතකොට වෙනත් ඉංජිනේරුවන්ට මේකේ අවස්ථාවක් නැද්ද, පරිපාලනය ගැන අවබෝධයක් තිබෙන කෙනෙකුට එහෙම අවස්ථාවක් නැද්ද, ES කෙනෙකුට එහෙම අවස්ථාවක් නැද්ද කියලා. නැහැ, ඒ ඔක්කොම යටපත් කරලා තිබෙන්නේ. විදුලිබල මණ්ඩලයේ වෘත්තීය සමිති නායකයන් කියලා ඉන්න අයට අද දහදෙනෙක් එළියට ගෙන්වා ගන්න බැහැ නේ. ඇයි, ඒ? ඔවුන් සම්පූර්ණයෙන් විශ්වාසය බිඳගෙන තිබෙන්නේ. අද ඉන්න නිලධාරීන්, සේවකයන් අතිබහුතරයක් මේ ප්‍රතිසංස්කරණවලට පක්ෂයි. ඔවුන් දන්නවා, පසුගිය කාලයේ ඔවුන්වත් මුළා කරගෙන තමයි කණ්ඩායමක් හිටියේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පසුගිය කාලයේ මේ පිළිබඳව හොඳ අධ්‍යයනයක් කළා. මේ පනත වෙනස් කළාට පස්සේ සමහරුන්ට තිබෙන බිස්නස් නැති වෙනවා. ඇත්ත කථාව ඒකයි. සමහරු තමන්ගේම සමාගම්වලට තමයි කොන්ත්‍රාත් ටික දීලා තිබෙන්නේ. දැන් කියනවා නේ, අපි පෞද්ගලීකරණය කරන්නයි යන්නේ කියලා. විදුලිබල මණ්ඩලය ඇතුළේ දැන් තිබෙන සේවාවන් තිබෙන්නේත් පෞද්ගලික අංශයත් එක්ක නේ. ගස්වල අතු කපන්නේ කොහෙන්ද? විදුලිබල මණ්ඩලයෙන්ද ඒවා කරන්නේ? නැහැ. පෞද්ගලික කොම්පැනි විසින් තමයි ඒ කටයුතු කරන්නේ. Connections දෙන්නේ විදුලිබල මණ්ඩලයෙන්ද? නැහැ. විදුලිබල මණ්ඩලයෙන් නොවෙයි, පෞද්ගලික ආයතනවලින් තමයි connections දෙන්නේ. Disconnections කරන්නේ කවුද? බැණුම් අහන්නේ අපි. Disconnections කරන්නේත් පෞද්ගලික ආයතනවලින්. සේවා ලබා දෙන්නේ කවුද? පෞද්ගලික ආයතනවලින්. ආයතනය ඇතුළේ ඉන්නවා, සේවක මණ්ඩලයක්. ඒ වාගේම ඒ සේවක මණ්ඩලයේ ඉහළ තනතුරුවල ඉන්න අයම නොවෙයි; පහළම තලයේ ඉන්න අයත් නොවෙයි; ඉහළ, පහළ, මැද අතරතුර කණ්ඩායම් ඉන්නවා, මේ තීන්දු-තීරණ ගන්න. ඒ කට්ටියට ඕනෑ තැන්වලින් තමයි වාහන ටික අරගෙන තිබෙන්නේ; ගොඩනැඟිලි ටික අරගෙන තිබෙන්නේ. මම ඒ සම්බන්ධව ලැයිස්තුවක් අරගෙන තිබෙනවා. වාහන rent කරලා තිබෙන්නේ කොහෙන්ද කියලා එතකොට බලා ගන්න පුළුවන්. මම ඒ ලැයිස්තුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නම්. කාගේ වාහනය, කාටද අරගෙන තිබෙන්නේ කියලා එතකොට දැනගන්න පුළුවන්. වාහන 4,000ක් කුලියට අරගෙන තිබෙනවා; ගොඩනැඟිලි කුලියට අරගෙන තිබෙනවා. අපට විදුලි බිල වැඩි කරන්න වුණේ ඇයි? ඇත්ත කථාව අපි තේරුම් ගන්න ඕනෑ; ආර්ථික අර්බුදය වාගේම නිසි කලට විදුලි බලාගාර ඉදිකරන්න ඉඩ දුන්නේ නැති නිසා තමයි විදුලි බිල වැඩි කරන්න සිදු වුණේ. උමා ඔය ව්‍යාපෘතිය අවුරුදු හතක් පරක්කු වුණා. ඇතුළේත් ඉන්නවා කණ්ඩායමක්; ඒ කණ්ඩායම එළියේත් දේශපාලනය කරනවා. ඔවුන් ඇතුළේත් දේශපාලනය කරනවා; එළියේත් දේශපාලනය කරනවා.

මම එක කාරණයක් කියන්නම්. අපේ ආණ්ඩුව යටතේ ගෙනාවා, New Fortress Energy කියන LNG supply එකට යෝජනාවක්. ඒක ගෙනාවාම කැබිනට් මණ්ඩලයේම ඉන්න අය ඒකට විරුද්ධ වුණා; ගිහිල්ලා නඩු දැම්මා. ඒකෙන් මොකක්ද වුණේ? ඩොලර් මිලියන 200ක ආයෝජන නැති වුණා. අද වෙනකොට බලාගාර ටික හැදිලා තිබෙනවා; ස්වාභාවික වායුවලින් විදුලිය ජනනය කරන බලාගාර බවට ඒවා පරිවර්තනය වෙලා තිබෙනවා. හැබැයි, අපට ගෑස් ලබා ගන්න විධියක් නැහැ. ඇයි, ඒ? කවුරුවත් ඒ සඳහා ආයෝජනය කරන්න එන්නේ නැහැ. විදුලිබල මණ්ඩලයටත් ඒ වෙනුවෙන් මුදල් ආයෝජනය කරන්න පුළුවන්කමක් නැහැ. මේ පාර්ලිමේන්තුවට ඇත්තටම මෙහෙම වෙලා තිබෙන්නේ, පොළොවේ යථාර්ථය ගැන දන්නේ නැති මහාචාර්යවරු, ආචාර්යවරු ටිකක් ඉන්න නිසායි. තනතුර ආචාර්ය, මහාචාර්ය. නමුත්, මෙලෝ දෙයක් දන්නේ නැහැ. ප්‍රායෝගිකව කිසි දෙයක් ඉදිකරන්න විධියක් නැහැ. එහෙම කණ්ඩායමක් ඉන්නවා. ඒ කණ්ඩායම පනත් බලනවා; මේ ආයතනය ස්වාධීන වෙන්න ඕනෑ, ඇමතිගේ බලය ගලවන්න ඕනෑ, ආණ්ඩුවේ බලය ගලවන්න ඕනෑ කියනවා. එහෙම නම් ඉතින් පාර්ලිමේන්තුවේ බලය ඔක්කොම කොමිෂන් සභාවලට දීලා නිකම් ඉන්න.

රජයක් තිබෙන්නේ, රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නයි. දැන් ඇවිල්ලා මගෙනුත් අහනවා, "මේ පනත ඇතුළේ මේ මේ දේවල් තිබෙනවා නේද, ඇමතිවරයා නේද තීන්දු කරන්නේ, කවුද පත් කරන්නේ කියලා?" යනුවෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයතනයක් තිබෙන්නේ රජය යටතේ නම්, ඒ රජය යටතේ තිබෙන ආයතන ගැසට් කරලා තිබෙන්නේ අදාළ ඇමතිවරයා යටතේ නම්, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඒ ආයතනයට අදාළ පත් කිරීම් කරන්නේ අදාළ ඇමතිවරයා. දැන් ලංකා විදුලිබල මණ්ඩලයේ ඉන්නේ මම පත් කරපු සභාපති. විදුලිබල ඇමතිවරයා හැටියට සාමාන්‍යාධිකාරී පත් කළේ මම. හැබැයි, ඒ අයිතිය තිබෙන්නේ මට විතරක් නොවෙයි. ඊළඟට එන ඇමතිවරයාට වුණත් ඒ අයිතිය තිබෙනවා. අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන්න ඒ ඇමතිවරයාටත් අයිතිය තිබෙනවා. ඇයි? ඒ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අපි මේ පනතේ යෝජනා කරලා තිබෙනවා, මේවා සමාගම් බවට පරිවර්තනය වෙන්න ඉස්සෙල්ලා unbundling කියන එක, සේවාව වෙන් වෙන්න,

ජනනය සමාගම් 4ක් බවට පත් වෙන්න. සමාගම් 4ක් කිව්වාම එක්කෙනෙක් කියනවා "අන්න අදානි..." කියලා. ඉන්දියාවේ ගිහිල්ලා අමූල් සමාගමත් එක්ක කථා කළා වාගේ අදානි එක්කත් කථා කරලා ආවාද, නැද්ද කියලා කියන්න මම දන්නේ නැහැ. අපේ ආණ්ඩුව නම් එහෙම කිසිම සාකච්ඡාවක් කරලාත් නැහැ; කරන්න බලාපොරොත්තුවකුත් නැහැ. කා එක්කවත් එහෙම පෞද්ගලීකරණයට යන්න අපේ බලාපොරොත්තුවක් නැහැ. ඒ සහතිකය මට දෙන්න පුළුවන්. එහෙම යන්න අපි කටයුතු කරලා නැහැ. ජනනය සමාගම් 4කට වෙන් වෙනකොට අපි කිව්වා, අපේ තිබෙන ජල විදුලි බලාගාර සියල්ලම සියයට 100ක් රජය සතුව පවතින කොටස් හැටියට ඉස්සරහටත් පවත්වාගෙන යනවා කියලා. ඒක කවුරු ආවත් වෙනස් කරන්න බැහැ. ඒකත් ගිහිල්ලා කිව්වා, "කොරියාවට විකුණලා තිබෙන්නේ, ඉන්දියාවට විකුණලා තිබෙන්නේ" කියලා. එහෙමත් කථා හැදුවා. ඊළඟට, අපේ ගල් අඟුරු සමාගම තිබෙනවා, අපේ තිබෙන thermal power plants ටික. ඒ කියන්නේ, අපේ තිබෙන දැව් තෙල්වලින්, ඩීසල්වලින් දුවන බලාගාර ටික. ඊළඟට, අපේ පුනර්ජනනීය බලාගාර වෙනම තිබෙනවා. දැන් දැවිතෙල් තිබෙන බලාගාර, ඩීසල් තිබෙන බලාගාර ටික ආණ්ඩුවකට පුළුවන් ද පරිවර්තනය කරන්න, ආයෝජනය කරන්න? අද දැවිතෙල් සහ ඩීසල් ලෝකයෙන් ඇත්

වෙනවා. ඒවායින් ඇත්වෙලා අපි අනිවාර්යයෙන්ම ස්වාභාවික වායු, ගෑස්වලට - LNG transformation එකකට - යන්න ඕනෑ. ඒකට යන්න ආණ්ඩුවට මුදල් තිබෙනවා ද? ආණ්ඩුවට මුදල් නැහැ. ඒ සඳහා පෞද්ගලික අංශයෙන් ආයෝජන ගෙන්වා ගන්න ඕනෑ. ඒක තමයි අපි කිව්වේ, ඒක වෙන වෙනම සමාගම් බවට පත් කරලා, ආණ්ඩුව පාලනය තියාගෙන ඒ ආයෝජන ටික ගේන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඇස්තමේන්තු කරලා තිබෙනවා, 2030 වන විට අපි පුනර්ජනනීය බලශක්තිය සියයට 70ක් ජනනය කරනවා කියලා. ඒ සඳහා අපි ප්‍රතිපත්තිය හදලා තිබෙනවා. එය ක්‍රියාත්මක කරන්න කවුද වියදම් කරන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිරි අවුරුදු හයේදී විතරක් මේක ක්‍රියාත්මක කරන්න විදුලිබල මණ්ඩලය ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක් ඇස්තමේන්තු කරලා තිබුණා. ඒක ඇස්තමේන්තු කරලා තිබෙන්නේ මම නොවෙයි. ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක් අවශ්‍යයි ඊළඟ අවුරුදු 6ට. ඇමෙරිකානු ඩොලර් බිලියන 12ක් අපේ සංචිතවල තිබෙනවා ද? අපි ඊළඟ අවුරුදු 6ට අවශ්‍ය සියලුම ආයෝජන අවුරුදු 6 ඉවර වෙලාද කරන්න බලාපොරොත්තු වන්නේ? නැහැ. අපේ තිබෙන සම්ප්‍රේෂණ රැහැන් ටික, යටිතල පහසුකම් ටික දියුණු කරන්න ඇමෙරිකානු ඩොලර් බිලියන 06ක් යනවා. ඒවා සංවර්ධනය කරන්න තිබෙන විභවයන්ට තවත් ඩොලර් බිලියන 6ක් යනවා. අපේ රටේ හොඳම විභවයන් ටික, සූර්ය සහ සුළං විභවයන් තිබෙන්නේ උතුරු-නැඟෙනහිර පළාත්වල. හැබැයි, පසුගිය ඉතිහාසයේම උතුරු-නැඟෙනහිර පළාත්වල මේක සංවර්ධනය කරලා නැහැ. අපේ යටිතල පහසුකම් සංවර්ධනය වෙලා නැහැ, උතුරු-නැඟෙනහිර පළාත්වල. උතුරු-නැඟෙනහිර පළාත්වල අවශ්‍ය සම්ප්‍රේෂණ රැහැන් ටික හදන්න, ඒ අවශ්‍ය යටිතල පහසුකම් ටික හදන්න, ඒ සංවර්ධනය කරන්න, ඒ විභවයන් පාවිච්චි කරන්න, අපේ රටේ අවශ්‍යතාව පමණක් නොවෙයි, අපි ලෝකයේ අනෙක් රටවලටත් අපනයනය කරන්න පුළුවන් විභවයන් තිබෙන රටක් කරන්න නම් අනිවාර්යයෙන්ම පෞද්ගලික ආයෝජන එන්න ඕනෑ. ඒ පෞද්ගලික ආයෝජන එන්න තමයි අපි කියන්නේ මේක විවෘත වෙන්න ඕනෑ කියලා. හැබැයි, අපේ තිබෙනවා NSO - National System Operator - එක. CEB එක වාගේ එකක් තිබෙන්න ඕනෑ විදුලිය මිලදී ගන්න, අපේ තිබෙන විදුලිය මිලදී ගැනීම් ගිවිසුම් ගැන කටයුතු කරන්න, අද කොහෙන්ද විදුලිය ගන්නේ, විදුලිය බෙදා හරින්නේ කොහෙන්ද කියන ඒවා ගැන සොයා බලන්න. ඒ පිළිබඳව සොයා බලන්න තිබෙන හදවත තමයි ඒ. දැන් හැමෝම කියනවා නේ, අපේ තිබෙන බලශක්ති සුරක්ෂිතතාව විකුණන්න යන්නේ කියලා. මේ බලශක්ති සුරක්ෂිතතාව රටක පවතින්නේ මේ system එක ඇතුළේ. ඒක තමයි අපි යෝජනා කරලා තිබෙන්නේ සියයට 100ක් ඒක රජය සතුව පවත්වා ගන්න කියලා. මම දන්නේ නැහැ, ඔබතුමන්ලා Committee Stage එකේදී වෙන යෝජනාවක් දාලා මේ දේවල් වෙනස් කරනවා ද කියලා. අපි ඉදිරිපත් කරලා තිබෙන යෝජනාවේ නම් තිබෙන්නේ සියයට 100ක් එක රජය සතුව පවත්වාගෙන යන්න කියලායි. එතකොට ඔහු තමයි තීන්දු කරන්නේ කොහොමද මේක කරගෙන යන්නේ කියලා.

ඊළඟට තිබෙනවා අපේ transmission line එක. Transmission line company එකට අපි කිව්වේ සියයට 51කට වැඩි කොටසක් ආණ්ඩුව පවත්වාගෙන යන්න, ඉතිරි කොටසට ආයෝජන ගෙන්වා ගන්න කියලා. මම කලින් කිව්වා වාගේ ආයෝජන නැතිව අපට මේ සම්ප්‍රේෂණ කරන්න බැහැ. දැන් මෙතැන ඉන්න අපේ මන්ත්‍රීවරු හැමදාම කථා කරන්නේ මොකක්ද? අද voltage drop එකක් කියලා. Rooftop solar සවි කරනවා, connection එක දෙන්නේ නැහැ, විදුලිබල මණ්ඩලයෙන්. ගෙදර trip switch off වෙනවා, ලයිට් යනවා, දවසකට දහසැරයක්, පහළොස් සැරයක් ඒක off වෙනවා. ඒක ඇමති ද ගිහිල්ලා ද off කරන්නේ? ඒක කරන්නේ දේශපාලන අධිකාරිය ද? නැහැ. අපේ system එකට ඒක දරා ගන්න බැහැ. මේ system එක upgrade කරන්න ඕනෑ. ඒක upgrade කරන්න නම් ආයෝජන අවශ්‍යයි. විදුලිබල මණ්ඩලය සතුව හෝ රජය සතුවත් එවැනි වත්කමක් නැහැ ඒකට ආයෝජනය කරන්න.

ඊළඟට, අපි distribution එකට සමාගම් හතරක් ගැන කියලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැනුත් තිබෙන්නේ DD1, DD2, DD3 and DD4 කියලා. ඒක LECO එක වර්ගයේ සමාගම් හතරක් බවට පරිවර්තනය කරන්න තමයි කියලා තිබෙන්නේ. හැබැයි, "සමාගම්" කියනකොටම කට්ටිය කියනවා, විකුණලා ඉවරයි කියලා. විකුණන්න ඕනෑද නැද්ද කියන එක තීන්දු කරගන්න. රජය -අපි- යෝජනා කර තිබෙන්නේ, LECO model එකේ සමාගම් හතරක් කරන්න කියලා. LECO එකෙන් කරන කාර්යභාරය පිළිබඳ යම් යම් විවේචන තිබෙනවා. හැබැයි, අපි LECO එකයි, CEB එකයි කරන සේවාවන් ගත්තොත් LECO එක උඩින් ඉන්නවා. ඒ කරන ක්‍රියාවලියේ වෙනසක් තිබෙනවා. හැබැයි, LECO එකත් රජය සතුව තිබෙන්නේ. එතකොට ඇයි අපට ඒක විධියට අනුගත වෙන්න බැරි? ඊළඟට, අපි යෝජනා කර තිබෙනවා, තව සමාගම් දෙකක්. Provident Fund එක සහ Pension Fund එක භාරව කටයුතු කරන්න එකක්. ඊළඟට, තිබෙන අනෙකුත් assets ටික භාරව කටයුතු කරන්න. ඒ කියන්නේ, අපට සංචාරක බංගලා තිබෙනවා, පුහුණ මධ්‍යස්ථාන තිබෙනවා. ඒ ඔක්කොම එකකට ගෙනැල්ලා මේ සියලුදෙනාට පාවිච්චි කරන්න පුළුවන් වන විධියට ඒක නිර්මාණය කරන්න.

ඒ වාගේම කියලා තිබෙනවා, මහජන උපයෝගිතා කොමිසම අයින් කරලා මේ ඉන්න Regulator අයින් කරන්න යන්නේ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වගකීමෙන් කියනවා, නියාමකගේ - Regulatorගේ - බලය අපි අවම කරලා නැති බව. නියාමකගේ බලය ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යන්න කියලා තිබෙනවා. ඒ වාගේම විදුලිබල ක්ෂේත්‍රයේ අවශ්‍ය වෙනස්කම් කිරීම සඳහා අවශ්‍ය සංශෝධනත් අපි ඉදිරිපත් කළ යුතුයි. ඒක සිදු කළ යුත්තේ මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතට. ඒ නිසා මහජන උපයෝගිතා කොමිසම තවදුරටත් ඒ කටයුත්ත කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක් හැටියට අපි විවෘත වෙන්න ඕනෑ නැද්ද? Power wheelingවලට යන්න ඕනෑ නැද්ද? Open accessවලට යන්න ඕනෑ නැද්ද? Wholesale markets හදන්න ඕනෑ නැද්ද? මේවා ලෝකයේ හැම රටක්ම සිදු කරගෙන යන දේවල්. අපි කථා කරනවා, carbon neutrality ගැන, renewable energy ගැන, grid connectivity ගැන, green hydrogen ගැන. හැබැයි, මේවා කරන්න නීති රාමුවක් තිබෙන්න ඕනෑ. මේ නීති රාමුව තමයි, මේ පනත් කෙටුම්පත ඇතුළේ තිබෙන්නේ. මම දන්නවා, හුහක් අයට තමන් යෝජනා කරන දේ මේ ආණ්ඩුව කළාම ටිකක් අමාරුයි කියලා. පසුගිය අවුරුදු දෙකේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපේ ආණ්ඩුව -ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ- ශක්තිය ලබා දීලා, මේ රටට අවශ්‍ය පනත් ටික සම්මත කරලා තිබෙනවා. සමහර අය කියන්න පුළුවන්, හෝල්සේල් එකේ පනත් ගෙනෙනවා කියලා. ඒ කට්ටිය ආණ්ඩු කරද්දී ගෙනෙන්න බැරි වෙච්ච එකයි, හිතපු නැති එකයි අපේ වැරැද්දක් නොවෙයි නේ. අපි ඒ වෙනුවෙන් කටයුතු කරලා, අවුරුදු දෙකක් ඇතුළත මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙනවා. රටට අවශ්‍ය නීති ගෙනැවිත් තිබෙනවා. මේ කණ්ඩායම දවස් දෙක, තුනක විවාදයක් ඉල්ලනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විවාද කරන්න දවස් 100ක් දුන්නත් විරුද්ධ කට්ටිය විරුද්ධයි. මේකට පසුගිය අවුරුදු දෙකෙත් අදහස් හා යෝජනා ලබා නොදුන් අය දවස් දෙකකදී ප්‍රායෝගික අදහස් හා

[ගරු කංචන විජේසේකර මහතා]

යෝජනා ලබා දෙයි කියලා ඔබතුමාට හිතන්න පුළුවන් ද? එහෙම දෙන්නේ නැහැ. හැබැයි, මට පුදුමයට කාරණය මේකයි. සමහරු පසුගිය මාසයේ අපට ඇවිල්ලා කිව්වා, "මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න, මේක තමයි කරන්න ඕනෑ. ඔබතුමාට තමයි මේක කරන්න පුළුවන්, අපිටත් ඕක කරගන්න බැහැ, අපි පැත්තක ඉන්නම්" කියලා. එහෙම කියලා ඊයේ සමහරු පාරේ උද්ඝෝෂණ කළා. මේවා තමයි කෙරෙන්න ඕනෑ කියලා මෙහේ කියනවා. හැබැයි, මාධ්‍යයට ගිහිල්ලා කියනවා, "නැහැ, මේකට විරුද්ධයි" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවට හංගලා, කැබිනට් එකට හංගලා, ආණ්ඩුවට හංගලා විකුණන ඒවා අපි කරලා නැහැ කියන එක මට කියන්න පුළුවන්. මේ පනත් කෙටුම්පත ඇතුළේ විකිණීමක් කොහෙවත් නැහැ. ප්‍රතිසංස්කරණ රටට අවශ්‍යයි. එම නිසා ඒ කටයුතු කරගෙන යා යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ක්‍රියාවලිය ඇතුළේ අහන ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනවා. මේකෙන් විදුලි බිල අඩු කරන්න පුළුවන්ද, වැඩි වෙනවාද? කියලා අහනවා. වෘත්තීය සමිති කියනවා, "නැහැ, නැහැ. ඊළඟ දවසේම විදුලි බිල වැඩි වෙලා යනවා" කියලා. මම එකක් කියන්න ඕනෑ. ප්‍රතිසංස්කරණ කියන එකේදී අද රටට පනත් කෙටුම්පතක් සම්මත කරලා, හෙට උදේ වනකොට විදුලි බිල අඩු කරනවා කියලා හිතනවා නම් ඒක මිථ්‍යාවක්. මේ ප්‍රතිසංස්කරණ කිරීම තුළින් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? කරන සේවය කාර්යක්ෂම කිරීම. අපේ රටේ තිබෙන විදුලිබල මණ්ඩලයයි, ඉන්දියාවේ තිබෙන විදුලිබල ක්ෂේත්‍රයේ ඉන්න සමාගමකුයි ගන්න. ඉන්න ප්‍රමාණය ගන්න. ඊටත් වඩා ඉන්න පුද්ගලයා ඉවු කරන වගකීම මොකක්ද කියලා හිතන්න. අපේ රටේ විදුලිබල මණ්ඩලයේ එකම වගකීම ඉවු කරන්න 10දෙනෙක්, 12දෙනෙක් ඉන්නවා. එකම වගකීම ඉවු කරන්න. ඒවා වෙනස් වෙන්න ඕනෑ නැද්ද? අපි මේ පනත ඇතුළේ තහවුරු කර තිබෙන කාරණයක් තිබෙනවා. දැනට ස්ථිර සේවයේ බඳවාගෙන ඉන්න සියලුදෙනාට ඊළඟ සමාගම බවට පරිවර්තනය වනකොට අපි ඉවත් කරන්නේ නැහැ. ඔවුන්ට දැනට තිබෙන වැටුප් -වේතන- එලෙසම ක්‍රියාත්මක වෙනවා කියලා අපි එකඟතාව පළ කර තිබෙනවා. ඒක පනත් කෙටුම්පත ඇතුළෙත් තිබෙනවා. හැබැයි, ලොකු බිල්ලෙක් මවලා තිබෙනවා, 15,000ක් 20,000ක් අයින් කරන්න හදන්නේ කියලා. නැහැ, අපි යෝජනා කර තිබෙනවා, ඉදිරි අවුරුදු තුනේදී විශ්‍රාම යන පිරිස්වලට එහෙම බඳවා ගන්න එපා. අලුත් cadre එකක් හදන්න. විශ්‍රාම යයි, සමහරු ඉවත් වෙලා යයි, සමහරු කාලයක් යනකොට ඉවත් වෙයි. ඒ යනකොට මේක තුලනය කරලා අවශ්‍ය ප්‍රමාණයට ගෙනෙන්න කියලා.

ඒ අවශ්‍ය ප්‍රමාණයට ගෙනෙන්න ඕනෑ. මේ කටයුත්ත කිරීම සඳහා අවුරුදු දෙකක්, තුනක් යයි. අපි අද පනත් කෙටුම්පත ගෙනෙනවා. පනත් කෙටුම්පත ගෙනැල්ලා සම්මත කළාට පස්සේ Regulations ගෙනෙන්න තිබෙනවා. ඊළඟට යම් යම් තාක්ෂණික කරුණු ඉදිරිපත් කරන්න තිබෙනවා. අපේ රටේ මේ කටයුත්ත සිදු කිරීම කොහෙන් හරි ආරම්භ වෙන්න ඕනෑ. හැබැයි විදුලි බිල දැනෙන්න අඩු වෙන්න නම් මොකක්ද වෙන්න ඕනෑ? පළමුවැනි දේ විධියට වෙන්න ඕනෑ, පරිපාලන වියදම් අඩු කරගෙන කාර්යක්ෂමතාව වැඩි කිරීම. එසේ කළොත් විදුලි බිල අනිවාර්යයෙන් අඩු කරන්න පුළුවන්. අපි ගිය අවුරුද්දේ ඒක ඔප්පු කළා. ඔප්පු කළේ කොහොමද? වැඩකට නැති ගොඩනැඟිලි වැනි දේවලට වියදම් කරපු ඒවා -වැඩකට නැති වියදම්- අපි පසුගිය කාලයේ කපා හැරියා. එහෙම කපා හැරලා තමයි, ඒ වියදම් අඩු කරලා තමයි විදුලි බිලට යම් සහනයක් දෙන්න පුළුවන් වුණේ. අපි ඒ බව කිව්වා. එහෙම නැත්නම් අපට විදුලි බිල ශීඝ්‍රයෙන් වැඩි කරන්න සිදු වෙනවා, මේ තිබෙන පනත ඇතුළේ, මේ තිබෙන system එක ඇතුළේ. 2022 අගෝස්තු මාසය වන කොට මම විදුලිබල ඇමතිවරයා හැටියට වැඩ භාරගෙන මාස 4යි. මම ඇමතිවරයා හැටියට ඇවිල්ලා මාස 4න් විදුලි බිල වැඩි කළා නොවෙයි. එවැන්නක් නොවෙයි සිදු වුණේ. මේක කාලයක් තිස්සේ සිදු වෙච්ච ක්‍රියාදාමය නිසා ඇති වුණු ක්‍රියාවලියක්. හැබැයි දැන් අපට විදුලි බිල අඩු කරගෙන යන්න පුළුවන් වෙන්නේ ඇයි? කාර්යක්ෂමතාව වෙනුවෙන් යම් යම් තීන්දු තීරණ අරගෙන තිබෙන නිසායි. හැබැයි කරන්න තවත් හුඟක් දේවල් තිබෙනවා.

ලංකා විදුලිබල මණ්ඩලයේ outsource කරපු සේවා තිබෙනවා. අපේ සාමාන්‍යාධිකාරිතුමා, සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් මම ඇහුවා, ඇයි අපට මේවා විදුලිබල මණ්ඩලය ඇතුළෙන් කරන්න බැරි කියලා. එතකොට අපේ පරිපාලනය කිව්වා, එළියෙන් කරන එකට යන වියදමයි, ඇතුළෙන් කරන එකට යන වියදමයි අතර ලොකු වෙනසක් තිබෙනවා කියලා; එළියේ එක්කෙනාට වාහනයක් දෙන්න ඕනෑ නැහැ, එයා කොහොම හරි ගිහින් වැඩේ කරනවා, ඇතුළේ එක්කෙනාට වාහනයත් දෙනවා, overtime එකත් දෙනවා, ඩ්‍රයිවර් කෙනෙකුත් දෙනවා, තනියට තව මිනිහෙකුත් දෙනවා, එයාට දෙන පඩි ඇතුළු ඔක්කෝම එකතු කළාම ඒ වියදමයි එළියේ කෙනාට යන වියදමයි අතර ලොකු වෙනසක් තිබෙනවා කියලා. මොකක්ද මේ ක්‍රමවේදය?

මම යෝජනා කළේ විදුලිබල මණ්ඩලය ඇතුළේ සේවකයන්ගේ වැටුප් තල වැඩි කරන්න කියලායි. එහෙම නැතුව දීමනා - allowances - විධියට එල්ලන්න කියලා නොවෙයි. දීමනා විධියට එල්ලනවාට කැමති කණ්ඩායමක් ද ඉන්නවා. ඒ කණ්ඩායම 27,000කින්ම එක්දහස් ගණනයි. ඒ අය allowances විධියට එල්ලනවාට කැමති කට්ටිය. පහළ සේවකයන්ට salary එක වැඩි වෙන්න ඕනෑ. ඉහළ සේවකයන්ටත් salary එක වැඩි වෙන්න ඕනෑ. අපි පිළිගන්නවා, විදුලි ඉංජිනේරුවන්ට කලාපීය රටවලට හා සමාන මුදලක වැටුපක් ලැබෙන්න ඕනෑ කියලා. හැබැයි ඒ වැටුප ලැබෙනවා වාගේම කලාපීය රටවල විදුලි ඉංජිනේරුවන් කරන සේවය සහ දරන වගකීම මේ ඉංජිනේරුවන් ද ඉවු කරන්න ඕනෑ. ඒක කරන්නේ නැතුව දීමනා, වැටුප් වැඩි කරන්න කියන එකට අපි එකඟ වෙන්නේ නැහැ. Collective Agreement කියලා එකක් ගහගෙන -ඒක නීත්‍යානුකූල ද, නැද්ද කියන ප්‍රශ්නයකුත් තිබෙනවා- අවුරුදු තුනෙන් තුනට සියයට 25ක වැටුප් වර්ධකයක් ලබා දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිතලා බලන්න, කිසිම කාර්ය සාධනයක් නැතුව ඉන්න 27,000ටම අවුරුදු තුනෙන් තුනට සියයට 25කින් වැටුප් වැඩි කළාම ඒක කොහේටද දැනෙන්නේ කියලා. එසේ සියයට 25කින් වැටුප් වැඩි කරන කොට ඒ අවුරුදු තුන ඇතුළේ අඩුම තරමින් අඩු වියදම් නව විදුලි බලාගාර හෝ ඇවිල්ලා තිබෙනවා නම්, තිබෙන විදුලි බලාගාරවලට වඩා අඩු පිරිවැයකින් විදුලිය ජනනය කරන්න පුළුවන් නම් ගැටලුවක් නැහැ. හැබැයි ඒ වියදම කොහේටද යන්නේ? පාරිභෝගිකයාටයි. පාරිභෝගිකයාට දමන්නේ නැතුව ආණ්ඩුව ඒ වියදම දරනවා නම්, බදුවලින් එකතු කරලා හෝ වක්‍රවත්, ඍජුවත් ඒ වියදම යන්නේ මේ රටේ මහ ජනතාවටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිකමට මේ කාරණය ගැන හිතලා බලන්න. මම මේ ගැන සොයා බැලුවා. සමහර අය වෘත්තීය සමිති කියලා සේවයෙන් නිදහස් වෙලා ඉඳලා තිබෙනවා. අපරාදේ කියන්න බැහැ, රංජන් ජයලාල් අවුරුදු 26ක් එසේ සේවයෙන් නිදහස් වෙලා ඉඳලායි තිබෙන්නේ. ඔහු එක දවසක්වත් සේවය කරලා නැහැ. හැබැයි කයිවාරු ගහන්නේ තමන් විදුලිබල මණ්ඩලයේ අයිතිකාරයා වාගෙයි. කයිවාරු ගහන්නේ එහෙමයි. ඔහු කථා කරන්නේ නිකම් එහි ඉංජිනේරුවා වාගෙයි. නමුත් ඉංජිනේරු දැනුමකුත් නැහැ. ඒක හින්දාම තමයි මේ වාගේ

ප්‍රතිපත්ති හදන්නත් උදවු කරන්න ඇත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිකම් හිතන්න, ව්‍යක්තීය සමිති කියලා නිදහස් වෙලා ඉන්න කෙනාටත් අවුරුදු තුනෙන් තුනට සියයට 25කින් බෝනස් දෙන්නයි, වැටුප් දෙන්නයි තිබෙන ක්‍රමවේදය මොකක්ද කියලා. ඔහු මොනවා කළාට ද? උද්ඝෝෂණය කරලා, කටයුතු කඩාකප්පල් කළාට ද? උද්ඝෝෂණය කරලා ආණ්ඩු අක්‍රිය කළාට ද? උද්ඝෝෂණය කරලා තමන්ගේ මඩිය වැඩි කර ගෙන රටේ ජනතාව මත ඒ බර පැටෙව්වාට ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඇත්ත කථා කරන්න ඕනෑ. මේ 225දෙනාට බැණුම් අහන්න සිදු වෙලා තිබෙන්නේ මෙවැනි කණ්ඩායම් ක්‍රියාත්මක වීම නිසා සහ ඒවා පාලනය නොකරපු නිසා. මගේ අවුරුදු දෙකේ නම් මා කිව්වේ, "මම නම් ව්‍යක්තීය සමිතිවලට ඕනෑ විධියට නටන්න දෙන්නේ නැහැ" කියලායි. එහෙම නටනවා නම් මට මේ ධුරයේ ඉඳලා වැඩකුත් නැහැ. අපට එහෙම තීන්දු-තීරණ ගන්න බැරි වුණා නම් අද දවසේත් පැය 12ක්, 14ක් විදුලිය කප්පාදු කරන්න අපට සිදු වෙනවා. එහෙම වුණා නම් අපට අද දවසේත් ඉන්න වෙන්නේ හිටපු විධියටමයි.

අමාරු -අසීරු- තීන්දුවලටත් අපි බෙල්ල දුන්නා. මම බැණුම් ඇහුවා විදුලි බිල වැඩි කරපු එකට. හැබැයි ඒක ඒ වෙලාවේ කරන්න ඕනෑ දෙයක් හින්දා මම බෙල්ල දුන්නා. එහෙම කළේ නැත්නම් අපට විදුලිය දෙන්න බැහැ. හැබැයි අද විදුලි බිල අඩු වේගෙන යනවා. අපි මේ සතියේ අද හෝ හෙට විදුලි බිල අඩු කිරීමට අදාළව අපේ අලුත් යෝජනාව මහජන උපයෝගිතා කොමිසමට ඉදිරිපත් කරනවා. සමහරු කියනවා මම දැක්කා, "දැන් වහිනවා, දැන්ම ඉදිරිපත් කරන්න" කියලා. අපේ රටේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ මාස හතරෙන් හතරට ඒ ක්‍රියාවලිය සිදු කරන එකයි. ඒකට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය දීලා තිබෙනවා. පාර්ලිමේන්තුවට ඇවිල්ලා ලකුණු දාගන්න, අද කරන්න, හෙට කරන්න කියලා අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ඒකට ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය අනුගමනය කරලා අපි පසුගිය සතියේ අපේ යෝජනාව සකස් කරලා අවසන් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා විදුලිබල මණ්ඩලය ඒ යෝජනාව මහජන උපයෝගිතා කොමිසමට යවයි. ඒ තමයි, ලබන ජූලි මාසයේ පළමුවැනි දා ඉඳලා අප කරන්න බලාපොරොත්තු වන විදුලි බිල අඩු කිරීමට අදාළ යෝජනාව.

එසේ විදුලි බිල අඩු කිරීමේදී අපි රජය වශයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තා, අඩුම තීරුවලට -ගෘහස්ථ කාණ්ඩවල ඉන්න ජනතාවට, ඒ විදුලි පාරිභෝගිකයින්ට- වැඩි සහනයක් දෙන්න ඕනෑ කියලා. ඒ අනුව, අපි යෝජනාව ඉදිරිපත් කරනවා. මම දන්නේ නැහැ, මහජන උපයෝගිතා කොමිසම ඒ යෝජනාව ඒ විධියටම අනුමත කරයි ද, වෙනස් කරයි ද කියලා.

ඒකක 0-30 අතර පාවිච්චි කරන අපේ පාරිභෝගිකයින් ලක්ෂ 18ක් ඉන්නවා. දැන් ඔවුන්ගෙන් විදුලිය ඒකකයකට අය කරන්නේ රුපියල් 8යි. ඒ රුපියල් 8ක මුදල රුපියල් දෙකකින් අඩු කරලා රුපියල් 6ක් කරන්න කියා අපි යෝජනා කරනවා. එතකොට ජල විදුලි බලාගාරවල භාවිත වන අඩුම ගණන ඒ පුද්ගලයින්ට දෙන්න පුළුවන්. ඊළඟට, ඒකක 30-60 අතර පාවිච්චි පිරිස. ඒ කාණ්ඩයේ තමයි වැඩිපුර පාරිභෝගිකයන් පිරිසක් ඉන්නේ. ඒ කියන්නේ, ඒ තුළ විදුලි පාරිභෝගිකයින් ලක්ෂ 20කට වැඩි පිරිසක් ඉන්නවා. දැන් ඒ පිරිසගෙන් විදුලිය ඒකකයකට අය කරන්නේ රුපියල් 20යි. ඒකකයකට අය කරන ඒ රුපියල් 20ක මුදල රුපියල් 9ක් දක්වා රුපියල් 11කින් අඩු කරන්න අපි යෝජනා කරනවා. ඊළඟට, ඒකක 60-90 අතර පාවිච්චි කරන පාරිභෝගිකයින් ලක්ෂ 15ක් විතර ඉන්නවා. දැන් ඒ පිරිසගෙන් ඒකකයකට රුපියල් 30ක් අය කරනවා. ඒ රුපියල් 30ක මුදල රුපියල් 18 දක්වා අඩු කරන්න අපි යෝජනා කරනවා. ඒකක 90-120 අතර පාවිච්චි කරන අයගෙන් ඒකකයකට දැනට රුපියල් 50ක් අය කරනවා. ඒ රුපියල් 50ක මුදල රුපියල් 30 දක්වා අඩු කරන්න අපි යෝජනා කරනවා. මේ කොටසේ තමයි මැදි ආදායම්ලාභී පවුල්වල ජීවත් වන අය, රජයේ රැකියා කරන අය -රාජ්‍ය සේවකයන්- මාසයේ පඩියට ජීවත් වන බහුතරයක් ඉන්නේ. අපේ පාරිභෝගිකයින් ලක්ෂ 68ක් ඉන්නවා. ඒ ලක්ෂ 68න්, ලක්ෂ 40කට වඩා පිරිසකට විශාල සහනයක් ලබා දෙන්න කියලා අපි යෝජනා කරනවා. ඊට සාපේක්ෂව ආගමික සිද්ධස්ථානවලත් ඒ ඒ categoriesවලට ඒ ඒ ගණන ආදේශ කරන්නත් යෝජනා කරනවා. ඒ වාගේම කුඩා කර්මාන්ත තිබෙනවා. අපි උදාහරණයකට ගනිමු, පොඩි කඩයක් දාගෙන ඉන්න කෙනෙක්. අර general purpose කියන category එකේ තමයි පාසල්, සෞඛ්‍ය මධ්‍යස්ථාන ආදිය තිබෙන්නේ. ඒවායේත් මේ හා සමානව විදුලි ගාස්තු අඩු කිරීම සඳහා වන යෝජනාව අපි සකස් කර තිබෙනවා. ඒ යෝජනාව හෙට හෝ සඳුදාට මහජන උපයෝගිතා කොමිසමට යවනවා. යැව්වාට පසුව ජූලි 01වන දා ඉඳලා ඒක ක්‍රියාත්මක කරන්න මහජන උපයෝගිතා කොමිසමට පුළුවන්. විදුලි බිල තවත් අඩු කරන්න පුළුවන් කියලා ඔවුන් හිතනවා නම් අපි ඒකටත් සහයෝගය දෙනවා. මේ, ලංකා විදුලිබල මණ්ඩලය පැත්තෙන් යෝජනා කර තිබෙන දේ. එය පාලන අධිකාරිය පැත්තෙන් යෝජනා කරලා හදලායි මට එව්වේ.

අපට මේ කටයුත්ත කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ කාර්යක්ෂමතාව වැඩි කරලා මිස අමුතුවෙන් බලාගාර එකතු කරලා නොවෙයි. එක බලාගාරයක් එකතු වුණා. ඒ, උමා ඔය බලාගාරය. උමා ඔය බලාගාරයේ සහනය එනවා. හැබැයි, ඊට වඩා සහනයක් දෙන්න නම් මොකක්ද කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපි අඩු වියදම් බලාගාර ගෙනෙන්න ඕනෑ.

ආයෝජකයන් ගෙන්වා ගන්නත් ඕනෑ කියලා කියනවා. ආයෝජකයන් එනකොට, ඒ අය කොහොමද ආවේ කියලාත් අහනවා. මේක පුදුම රටක් වෙලා. ටෙන්ඩර් එකෙන් ආවත් අහනවා, ටෙන්ඩර් එකේ මොකක් හරි යටි ගනුදෙනුවක් තිබෙනවා නේද කියලා. විදුලිබල ඇමතිවරයා හැටියට මම මේ රටේ තිබෙන නීතිමය ප්‍රතිපාදනවලින් බැහැර වෙලා අපේ ආණ්ඩුවට කිසිම යෝජනාවක්, unsolicited proposal එකක් ගෙනැත් දීලා නැහැ. අදානි ව්‍යාපෘතිය මම එන්න ඉස්සර වෙලා කැබිනට් මණ්ඩලය අනුමත කරපු දෙයක්. ඔබතුමන්ලාට ඒ ගැන අහන්න පුළුවන් විපක්ෂයේ ඉන්න ගරු ජී.එල්. පීරිස් හිටපු ඇමතිතුමාගෙන්. ඒක ඒ වෙලාවේ හිටපු කැබිනට් ඇමතිවරුන් විසින් අනුමත කරලා ලබා දීපු දෙයක්. ඒ කැබිනට් මණ්ඩලය අනුමත කරලා ආපු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන ගිහින් තිබෙනවා. එය ක්‍රියාත්මක කරගෙන යද්දී පසුගිය කාලයේ ඒ සම්බන්ධයෙන් අපට විවේචන එල්ල වුණේ, ඇයි මේ රජයන්-රජයන් අතර - G2G - යෝජනා ගන්නේ, ඇයි මේ unsolicited proposalsවලට යන්නේ කියලා නේ. G2G කියන එක unsolicited නොවෙයි, දැන් තිබෙන පනත අනුව. එහෙම නම් හිටපු පාලන අධිකාරියට පනත වෙනස් කරන්න තිබුණා. හැබැයි, අපි මේ අලුත් පනත් කෙටුම්පත ඇතුළේ යෝජනා කර තිබෙනවා ප්‍රසම්පාදන කටයුත්ත - procurement process එක - තරගකාරී මිල ගණන්වලට පමණක් සිදු කරන්න. අර කියපු G2G කියන එකත් අපි අයින් කරලා තිබෙනවා. අනෙකුත් සියලු දේවල් අයින් කරලා තිබෙනවා. මේකට කවුරු හරි විරුද්ධ වෙනවා නම් විරුද්ධ වෙන්නේ අප දැන් අයින් කරලා, නිවැරදි කරලා, විනිවිදභාවය ඇති කරන දේවලට ද කියලායි මට නම් හිතෙන්නේ. අපේ බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් ඉදිරිපත් කරපු යෝජනා තිබුණා. ඒවායින් සමහර යෝජනා අපි පිළිගෙන තිබෙනවා. අපට කියලා තිබෙනවා, ඉදිරියේදී යම් රජයක් පෞද්ගලික ආයෝජන ගෙනෙන්න තීන්දු කළොත් ඒ සමාගම්වල තනි පාලනයක් ඇති වෙලා සමාගම් අතර ඒකාධිකාරයක් හැදෙන්න පුළුවන් කියලා. අපි ඒක අවම කිරීම සඳහා සියයට 50ට තිබුණු අයිතියේ සීමාව සියයට 15ක උපරිමයක් දක්වා ගෙනැල්ලා තිබෙනවා. ඒ අනුව තරගකාරිත්වයක් ඇති වෙනවා. ඒ වාගේම, ඒකාධිකාරයක් ගොඩ නැහෙන්නේ නැති වන විධියට ඒ කටයුතු සිද්ධ වෙලා තිබෙනවා.

[ගරු කංචන විජේසේකර මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මගේ වෙලාවෙන් කොටසක් තබා ගන්නවා, විවාදය අවසානයේදී පිළිතුරු ලබා දෙන්න. මම මේ සභාවේ සිටින සියලු දෙනාගෙන් ඉල්ලීමක් කරනවා. තමන්ගේ වෘත්තීය සමිති කිහිපයක ඉල්ලීම් මත ඔවුන්ට උදව්වක් කරන්න ඕනෑ නිසා මෙයට විරුද්ධ වෙන්න ඕනෑ කියලා කවුරුන් හෝ හිතනවා නම්, ඡන්දයට ගමට ගියාම මිනිස්සු ඒ ගැන බලා ගනියි. මතක තබා ගන්න, මිනිස්සු බලාගෙන ඉන්නවා, මේ විදුලිබල ක්ෂේත්‍රය ප්‍රතිසංස්කරණය කරන්නේ කවුද, අඩාළ කරන්නේ කවුද කියලා. මේ කරන්න යන කටයුත්ත කළොත් තමයි විදුලිබල ක්ෂේත්‍රයේ අප බලාපොරොත්තු වන තැනට යන්න අපට පුළුවන් වෙන්නේ.

ලෝකයේ අනෙක් රටවලට ගිහිල්ලා හැම තැනින්ම මුදල් පවා එකතු කරගෙන එනවා නේ. සම්මන්ත්‍රණත් පවත්වනවා නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ අනෙක් රටවලට ගිහිල්ලා නම් ලොකු කථා කියලා එනවා. මම බැලුවා, විදුලිබල ක්ෂේත්‍රයේ ඒකාධිකාරය රජය සතුව පමණක් ම තිබෙන්නේ ලෝකයේ මොන රටවලද කියලා. එහෙම රටවල් කීපයයි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ඒ රටවල් මොනවාද කියලා කියන්නම්. ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම කියන අංශ තුනම සම්පූර්ණයෙන්ම ආණ්ඩුව සතුවම පවත්වා ගෙන යන රටවල් මොනවාද? ඒ රටවල් තමයි උතුරු කොරියාව, කියුබාව, වෙනිසියුලාව, ලෙබනනය, ඇල්බේනියාව, සෘනාව සහ මියන්මාරය. ඒ රටවල තිබෙන තත්ත්වය බැලුවාම අපට පෙනෙනවා, ඇයි එහෙම වෙලා තිබෙන්නේ කියලා. ඒ ප්‍රතිපත්ති නම් අනුගමනය කරන්නේ මට නම් කිසි ගැටලුවක් නැහැ. මාලිමාවේ; ජනතා විමුක්ති පෙරමුණේ හදුන්නෙත්ති මහත්මයාත් හැම තිස්සේම කියන්නේ කියුබාව දිහා බලන්න, මෙහෙම බලන්න කියලා නේ. ඒ නිසා ඒ ප්‍රතිපත්තිවලට සමාන වෙන්න පුළුවන්. බලාපොරොත්තු වෙන්නේ ඒ වාගේ තත්ත්වයක් නම්, කමක් නැහැ. හැබැයි, එහෙම නැතුව බොරුවට අර ඉංජිනේරුවන් චූන් කරන්න, අනෙක් මිනිස්සු චූන් කරන්න මොනාක් එකට ගෙන්වා රැස්වීම් පවත්වා, මැද පෙළ ඡන්ද ටික ගන්න, ව්‍යාපාරිකයන්ගේ ඡන්ද ගන්න බොරු ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කරන්න එපා. අපි ඉදිරිපත් කර තිබෙන වැඩ පිළිවෙළම ඉදිරිපත් කර තිබෙනවා, මෙතැනත්. හැබැයි, මේකට විරුද්ධ වෙනවා.

විපක්ෂ නායකතුමා හැම තිස්සේම කියනවා, අපි වැඩ කටයුතු ක්‍රියාවෙන් තමයි පෙන්වන්න ඕනෑ, කථාවෙන් නොවෙයි කියලා. මම හිතනවා, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කථාවට හෝ පොතකට පමණක් සීමා කරන්නේ නැතුව ක්‍රියාවෙන්ම කරන බවට සහතිකයක් දෙන්න අද ඉදිරිපත් කර තිබෙන මේ ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත හොඳ අවස්ථාවක් කියලා. අපි පනතක් ගෙනාවත්, ඔබතුමන්ලා පනතක් ගෙනාවත් ඕනෑ නම් අපට ඒ පනත්වල ඇද-කුද හොයන්න පුළුවන්; මේ වචනය නොවෙයි ගැළපෙන්නේ, මේ වචනය නොවෙයි තිබෙන්නේ කියලා කියන්න පුළුවන්. අපි කාටවත් බැහැ, සියලු දෙනාම සියයට 100ක් සෑහීමට පත් වන පනත් ගෙනෙන්න. ඒක නිසා තමයි එසේ සම්මත කරන පනත් සංශෝධනය කරන්න අවශ්‍ය අවස්ථාවල විවිධ ආණ්ඩු ඒවාට සංශෝධන ඉදිරිපත් කර තිබෙන්නේ. අපේ ව්‍යවස්ථාවටත් සංශෝධන 21ක් එකතු වෙලා තිබෙනවා නේ. ව්‍යවස්ථාව හරි නම්, අපි එහෙම සංශෝධන ඉදිරිපත් කරන්න ඕනෑ නැහැ නේ. මේ පාර්ලිමේන්තුවේම අපි ඒ සංශෝධන සම්මත කර තිබෙනවා නේ, ව්‍යවස්ථාවටත්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා සමගි ජන බලවේගය හා ජනතා විමුක්ති පෙරමුණ කියන දේ ක්‍රියාවෙන් කරන බවත් පෙන්වන්න; බලය ගත්තොත් එහෙම කරනවා කියලා අඩුම තරමේ හැඟීමක් හෝ පළ කරන්න අද මේ ශ්‍රී ලංකා විදුලිබල පනත හරහා අවස්ථාවක් ලැබී තිබෙනවා. මේ විවාදය කල් දමන්න හිතාගෙන, අද ගන්න එපා, කථා කරන්න වෙලාව නැහැ කියනවා. නමුත් අවුරුදු දෙකක් කථා කළේ නැති මිනිස්සු පැය දෙකක් ඇතුළත කථා කරයිද? අපි රජය හැටියට මේ විවාදය අද දවසේ පවත්වනවා. සවස 4.30ට ඡන්දය ගන්න නියමිතයි. ඒ අනුව අපි එම කටයුතු කරනවා. මම දැක්කා, අද කථා කරන්න ඔබතුමන්ලාගේ කථික මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා. එම කථිකයන්ගේ අදහස්වලට අපි උත්තර ලබා දෙන්නම්.

අපි විශ්වාස කරනවා, විදුලිබල ක්ෂේත්‍රයේ දැවැන්ත වෙනසක් විය යුතු බව. අපි පනත්වලට සංශෝධන ගෙනාවාට, මම හිතන විධියට අපේ රටේ මෑත ඉතිහාසය තුළ සම්පූර්ණ ක්ෂේත්‍රයක් වෙනුවෙන් අලුතින්ම පනතක් ගෙනෙන පළමුවෙනි අවස්ථාව තමයි, මේක. ඒ නිසා ඒ වෙනුවෙන් මට සහයෝගය ලබා දුන් ගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමාට, කැබිනට් මණ්ඩලයට, රාජ්‍ය ඇමතිවරුන්ට, මගේ අමාත්‍යාංශයේ රාජ්‍ය ඇමතිවරුන් දෙපොළට, ඒ වාගේම අපේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී කණ්ඩායමට, අමාත්‍යාංශයේ නිලධාරීන්ට, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ සම්බන්ධව අපට උදව් කරන්න කමිටුවක් හැටියට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වුණු විශේෂඥ කණ්ඩායමක් හිටියා. ඒ අයටත්, ඒ වාගේම අපට උදව් කරපු අපේ සංවර්ධන නියෝජිත ආයතනවල නිලධාරීන්ට හා මේ සම්බන්ධව අදහස් හා යෝජනා ලබා දුන් විපක්ෂයේ පාර්ශ්වකරුවන් ඇතුළු සියලු දෙනාටත් මා ස්තුතිවන්ත වෙනවා. මම දන්නවා, මේ හැම පනතකම, හැම ප්‍රතිපත්තියකම ඇතුළේ තිබෙන කාරණා සම්බන්ධව අපේ වාණිජ මණ්ඩලවලින් පවා පෙන්වා දී තිබෙනව බව. අපේ National Chamber of Commerceහි ප්‍රතිපත්තිය පවා "Energy sector: unbundling of services and energy transition" ලෙස යෝජනාවක් හැටියට ඉදිරිපත් කර තිබෙනවා. මේ කටයුතු වෙනුවෙන් ඔබතුමන්ලා සහාය ලබා දෙයි කියා මා හිතනවා. සහාය ලබා දෙන්න නොහැකි නම්, අඩුම තරමේ විරුද්ධ වෙන්නේ නැතුව හෝ කටයුතු කරන්න කියන ඉල්ලීම මා කරනවා. මම හිතනවා ඒකත් අමාරුයි කියලා. මොකද, IMF එකට යන්න, යන්න කිව්වා. ඊට පසුව IMF එකේ යෝජනා එනකොට, විරුද්ධ වුණු කණ්ඩායම් හිටියා; භාර ගත්තේ නැති කණ්ඩායම් හිටියා. ඒ ආකාරයට මේගොල්ලන් අවස්ථා ගණනාවකදී මේ රටේ ජනතාවට පෙන්වා දී තිබෙනවා, කියන දේ කරන්නේ නැති කණ්ඩායමක් කියලා. හැබැයි, මේ කටයුත්තේදී එහෙම නොවේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. නමුත් මට විශ්වාස කරන්න අමාරුයි, ඔබතුමන්ලා එහෙම සහයෝගය දක්වා ක්‍රියා කරයි කියලා. විදුලිබල ක්ෂේත්‍රය නව මාර්ගයක් වෙත විවෘත කිරීම සඳහා සහයෝගය දැක්වූ සහ සහයෝගය දක්වන හැමෝටම මා ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම මම කියන්න ඕනෑ, විදුලිබල මණ්ඩලයේ ඉන්න හැම කෙනාම මේකට විරුද්ධ නැති බව. විරුද්ධ අය ගත්තොත්, 27,000ක් හිටපු තැන දැන් 24,000යි ඉන්නේ. මම හිතන විධියට 50කටත් අඩු පිරිසක් තමයි මේකට විරුද්ධ වෙන්නේ. සියලුදෙනා කැමැතියි, මේක කරන්න. සියලුදෙනා කැමැතියි, තමන්ට හොඳ වැටුපක් ලැබෙනවා නම්, තමන්ගේ සේවය ඇගයීමකට ලක් වෙනවා නම්. මම ස්තුතිවන්ත වෙන්නත් ඕනෑ, මෙන්න මේ අයටත්. පසුගිය මාස දෙක තුළ ආපදා තත්ත්වය හමුවේ මේ කටයුතුවලදී අවදානම අරගෙන වැඩ කරපු විදුලිබල මණ්ඩලයේ විශාල පිරිසක් ඉන්නවා. අලුතින් බඳවා ගත් කාර්මික නිලධාරීන් ගස්වල නැඟලා, කණුවල නැඟලා ගස්වල අතු ඉවත් කරලා එහෙම ලොකු සේවයක් කළා. එහෙම කැපවීමක් කරපු පිරිස් ඉන්නවා. ඒ වාගේ පිරිස්වලට, අවදානමක් අරගෙන වැඩ කරන පිරිස්වලට ඔවුන්ගේ අවදානම වෙනුවෙන් තව යම් දෙයක් වෙන්න ඕනෑ කියන මතයේ මම තදින්ම ඉන්නවා. නමුත් electricity line එකේ වැඩ කරන එක්කෙනායි, office එකේ වැඩ කරන

telephone answer කරන එක්කෙනායි අතරේ ක්‍රමවේදයේ වෙනසක් තිබෙන්න ඕනෑ. ප්‍රසාද දීමනා ලබා දීමේ ක්‍රමවේදයේ වෙනසක් තිබෙන්න ඕනෑ. ඔවුන්ගේ ඇගයීම් ක්‍රමවේදයේ වෙනසක් තිබෙන්න ඕනෑ. උසස්වීම්වලට ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. ස්ථාන මාරුවීමයි, උසස්වීමයි තෝරන්න ඕනෑ වෘත්තීය සමිතිය නොවෙයි. ඒ නිසා තමයි මම ස්ථාන මාරු මණ්ඩලවලින් වෘත්තීය සමිති ඉවත් කරලා තිබෙන්නේ. ඒක කරන්න දෙන්න බැහැ. නමුත් නිරීක්ෂණය කරන්න පුළුවන්. හැබැයි වෘත්තීය සමිති මෙච්චර කල් කිව්වේ, අපේ එක්කෙනෙක් නම් මෙතැන ඉන්න ඕනෑ, මේ වෘත්තීය සමිතියට බැඳුණොත් විතරයි ඔහුව මෙතැන තියන්නේ කියලායි. එ්ක තමයි මෙච්චර කල් කරගෙන ගිහිල්ලා තිබෙන්නේ. ඔවුන් කරපු දේවල්වලින් මේ කාරණය එකක් වෙනවා. මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ විදුලිබල මණ්ඩලය ඇතුළත තිබෙන වෘත්තීය සමිති ඔක්කෝම ටික නැති වෙනවා කියන එකත් මට කියන්න පුළුවන්. මම ඒ ගැන නම් සතුටු වෙනවා. මේ කියන අනික් බිල්ලෝ නම් මේ තුළින් මතු වෙන්නේ නැහැ. බලශක්ති සුරක්ෂිතතාව නැති වුණා නම්, පසුගිය අවුරුදු දෙකේ නේ නැති වුණේ. Electricity දෙන්න බැරි වීමද විදුලිබල සුරක්ෂාව කියන්නේ? එහෙම දෙන්න බැරි වුණු පනතකට, එහෙම දෙන්න බැරි වුණු විදුලිබල මණ්ඩලයකට වඩා අලුතින් යමක් කරන්න පුළුවන් දෙයක් වෙනුවෙන් සහය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා එදුත්තියම්පප්පෙරුම්ත්තු.
Question proposed.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු මුජිපුර් රහූමාන්)
(The Hon. Mujibur Rahuman)

ගරු ඇමතිතුමනි, මට ඔබතුමාගෙන් පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න තිබෙනවා. ඔබතුමාගේ කථාවේ මුලදී කිව්වා, විදුලිබල මණ්ඩලය විකුණන්න ඕනෑ නම් මේ පනත යටතේත් ඒක කරන්න පුළුවන් කියලා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, LTL Transformers (Pvt.) Limited එකට සියයට 28ක් ලබා දුන්නේත් මේ පනත යටතේ ද කියලා.

ගරු කංචන විජේසේකර මහතා
(මාණ්පුමිකු කඤ්චන විජේසේකර)
(The Hon. Kanchana Wijesekera)

මේ ප්‍රශ්නයෙන් මට full toss එකක් දාලා දුන්නේ. ඒක හොඳයි. LTL Transformers (Pvt.) Limited එකට දුන්නේ මොකක්ද කියන්නකෝ. LTL Transformers (Pvt.) Limited එකේ අයිතිය දැන් කාටද තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? LTL Transformers (Pvt.) Limited එකේ අයිතිය තිබෙන්නේ විදුලිබල මණ්ඩලයට සියයට 63ක් සහ සියයට 27 සහ සියයට 10 බැගින් තව සමාගම් දෙකකට. ඒක තමයි ව්‍යුහය. ඒ ව්‍යුහයෙන් විදුලිබල මණ්ඩලය සතු කොටස්වලින් සියයට 28ක් West Coast Power (Pvt.) Limited එකට දුන්නා. West Coast Power (Pvt.) Limited කියන්නේ පෞද්ගලික ආයතනයක් ද? West Coast Power (Pvt.) Limited එකේ ව්‍යුහය මොකක්ද? මහා භාණ්ඩාගාරයට ඒකේ සියයට 41.45ක් අයිතියි; EPF එකට සියයට 27.5ක් අයිතියි; LECO එකට සියයට 18.18ක් අයිතියි. එතකොට කොටස් සියයට 100කින් කොටස් 87ක අයිතිය තිබෙන්නේ රජයටයි. LECO එක සියයට 100ක් ආණ්ඩුවේ නේ; CEB එකට අයිති එකක් නේ. ඔබතුමන්ලා අකැමැතියි නම් වෙන ක්‍රමයක් මට කියන්න. වෙන කාට හරි - එළියේ තැනකට - දෙන්න කැමැති වුණාද කියලා මම දන්නේ නැහැ, මුජීබුර් මන්ත්‍රීතුමා. හැබැයි අපි ඒ කොටස්වල වෙනස් කිරීම කරලා තිබෙන්නේ රජය අතර කරපු ක්‍රියාවලියක් නිසායි. ඒ ප්‍රශ්නය ඇහුවාට බොහොම ස්තුතියි.

ගරු කබීර් හෂීම් මහතා
(මාණ්පුමිකු කබීර් හාශීම්)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, දැන් තිබෙන්නේ ඔබතුමාගේ වෙලාව. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

ගරු කබීර් හෂීම් මහතා
(මාණ්පුමිකු කබීර් හාශීම්)
(The Hon. Kabir Hashim)

මේකට මගේ කාලයෙන් ගන්න එපා. මේ ප්‍රශ්නය සම්බන්ධයි මට කථා කරන්න ඕනෑ. *[බාධා කිරීම්]* ගරු ඇමතිතුමනි, සභාව නොමඟ යවන්න එපා.

ගරු කංචන විජේසේකර මහතා
(මාණ්පුමිකු කඤ්චන විජේසේකර)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය අඩුයි කියලා දැන් කිව්වා නේ. මම අවසානයේදී ඔය ඔක්කෝම ප්‍රශ්නවලට විනාඩි 10කින් උත්තර දෙන්නම්. කථාවලට විතරක් වෙලාව ගන්න. අපෙන් කාලය කපන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ගරු කබීර් හෂීම් මැතිතුමනි, ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ඔබතුමාට අමතර කාලය ඕනෑ නම් කිරිඇල්ල මන්ත්‍රීතුමාගෙන් අහන්න.

[පූ.භා. 11.53]

ගරු කබීර් හෂීම් මහතා
(මාණ්පුමිකු කබීර් හාශීම්)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, LTL Transformers (Pvt.) Limited සමාගම ගැන ගරු ඇමතිතුමා කිව්වා. LTL Transformers (Pvt.) Limited එකට රුපියල් බිලියන 28කට කොටස් සියයට 28ක් ලබා දුන්නා. LTL Transformers (Pvt.) Limited කියන්නේ පෞද්ගලික සමාගමක්. රජයට අයිති විදුලිබල මණ්ඩලයේ කොටස් ටික එහෙම අළෙවි කරනවා නම්, පළමුවැනි කාරණය තමයි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුයි. දෙවැනි කාරණය, අඩු තරමින් ඒ පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කරන්න තිබුණා. ඒ ලබා ගත් වටිනාකම ප්‍රමාණවත් ද? ඇමතිවරයා තනියෙන් ඒ නිර්දේශය කරන්නේ කොහොමද? මේ වාගේ කටයුතුවල දිගටම යෙදිලා ඉන්න අවස්ථාවක ඇමතිවරයා මේ සභාවට උත්තර දිය යුතුයි, LTL Transformers (Pvt.) Limited එකට විදුලිබල මණ්ඩලයේ කොටස් ටික ලබා දීම පිළිබඳව.

දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? රජයට අයිති කොටස් ප්‍රමාණය සියයට 50ට වඩා අඩු වෙනවා. එසේ අඩු වීමක් සිදු වෙනකොට LTLහි කළමනාකරණ කණ්ඩායමට COPE එකට ඇවිල්ලා වාර්තා කරන්න අයිතියක් ඇති වෙන්නේ නැහැ; අවශ්‍යතාවක් ඇති වෙන්නේ නැහැ. එම නිසා අනිවාර්යයෙන්ම මෙහි යම් ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට හරියට උත්තරයක් දුන්නේ නැහැ, මේ සභාව නොමඟ යැව්වා.

[ගරු කබීර් හෂීම් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමතිවරයෙක් නම් තමන්ට පූර්ණ බලය තිබෙන්න ඕනෑ, නැත්නම් වැඩක් නැහැ කියලා ගරු ඇමතිතුමා කිව්වා. හැබැයි ඇමතිතුමා, එක දෙයක් මතක තබාගන්න. ඔබතුමාට බලය තිබෙන්නට ඕනෑ. හැබැයි, ඔබතුමා පෞද්ගලික අංශයක විධායක නිලධාරියෙක් නොවෙයි. පෞද්ගලික අංශයක විධායක නිලධාරියෙකුට පූර්ණ බලය අරගෙන තමන් කැමති විධියට අධ්‍යක්ෂකවරු පත් කරන්න පුළුවන්, ඉවත් කරන්න පුළුවන්. හැබැයි, ඔබ පත්වෙලා ඉන්නේ අයිතිකාරයා හැටියට නොවෙයි, මුරකරුවෙක් හැටියටයි. රට වෙනුවෙන් ඔබට වගවීමක් තිබෙනවා. ඔබට හිතෙන විධියට පත්වීම් ලබා දෙන්න හෝ අයින් කරන්න හෝ තනි තීරණ ගන්න හෝ බැහැ. ඔබ මේ පාර්ලිමේන්තුවට වගකිව යුතුයි. ඒ ප්‍රශ්නය තමයි අපි මේ වෙලාවේ මතු කරන්නේ.

"The Blueprint" එකේ තිබෙන දේවල් අපි ක්‍රියාත්මක කරනවා. හැබැයි, ඔබතුමන්ලා හිතුමතයට වැඩ කරනවා වගේ නොවෙයි ඒක කරන්නේ, වගවීමක් ඇතුව. රටේ ජනතාවට වගවීමක් ඇතුව තමයි ඒ "The Blueprint" එක ක්‍රියාත්මක කරන්නේ. අපි සහ ඔබ අතර තිබෙන වෙනස ඒකයි. ඒක හරියට දැන ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත පිළිබඳව විදුලිබල අංශයේ ප්‍රධාන කොටස්කරුවන්ගේ අදහස් ගොඩක් තිබුණා. ඒ වාගේම ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පතට විපක්ෂය වෙනුවෙන් අද මගේ අදහස් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ශ්‍රී ලංකාව කාර්මික නිෂ්පාදනයේ කේන්ද්‍රස්ථානයක් කරනවා නම්, ඉදිරියේ දී අපි අපනයනය මත දුවන ආර්ථිකයක් සකස් කරනවා නම්, අනිවාර්යයෙන්ම අපේ ප්‍රාග්ධන පිරිවැය අඩු කළ යුතුයි. දෙවනුව, අපේ විදුලිබල ශක්ති පිරිවැයත් අපි අඩු කළ යුතුයි. ඒකේ කිසිම තර්කයක් නැහැ. එම නිසා නවෝත්පාදනය, නව තාක්ෂණය, ඒ වාගේම නව්‍ය ක්‍රම සමඟ විදුලිබල ක්ෂේත්‍රය තුළ තරගකාරී මොඩලයක් ඇති කිරීම අත්‍යවශ්‍යයි. අපි ඒක ගැන තර්ක කරන්නේ නැහැ. එම නිසා ජනප්‍රිය ස්ථාවරයක් අරගෙන මේ පනතට කිසිම හේතුවක් නැතුව විරුද්ධ වෙන්න අපට පුළුවන්. හැබැයි, ප්‍රධාන විපක්ෂය හැටියට සමහි ජන බලවේගය ඒ ස්ථාවරයේ නැහැ. නමුත් අවශ්‍ය දේ රට වෙනුවෙන් කෙළින් කථා කරන්න අපි සූදානම්, ගරු ඇමතිතුමනි. හැබැයි, මේ නව පනත තුළින් රටේ අරමුණ ඉෂ්ට වෙයිද කියන ප්‍රශ්නය මතු වෙනවා. විදුලිබල අංශයේ ප්‍රධාන කොටස්කරුවන් මේ පනත ගැන චෝදනා ගොඩක් කරලා තිබෙනවා. ඔවුන් කියනවා, ඔවුන්ගේ අදහස්වලට ඇහුම්කන් දුන්නේ නැහැ, සාකච්ඡා හරියට පැවැත්වූයේ නැහැ, සමාජ සංවාදයක් ඇති කළේ නැහැ කියලා. දැන් ඇමතිතුමා කිව්වා, "එහෙම වුණේ නැහැ, මාස ගණනක් මේක ගැන සාකච්ඡා කළා" කියලා. ඒ වාගේම ලංකා විදුලිබල මණ්ඩලයේ වෘත්තීය සමිතිවලට ප්‍රමාණවත් කාලයක් දුන්නේ නැහැ කියන චෝදනාවත් තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් පවා ඒක කියනවා. එම නිසා අද ඔවුන්ගේ සේවය අනිවාර්ය කළා. මොකද, එහෙම නැති වුණොත් පාර්ලිමේන්තුව ඉස්සරහට ඇවිල්ලා ඒ අය වර්ජනය කරයි කියලා භය වෙලාද දන්නේ නැහැ. ඒ නිසා ඇමතිතුමා අද ඔවුන්ගේ සේවය අනිවාර්ය කළා.

ඊළඟට, ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවරුන්ගේ සංගමයත් කියනවා, ඒ ගොල්ලන්ට අවශ්‍ය අවස්ථාවත් දුන්නේ නැහැ කියලා. The Institution of Engineers, Sri Lanka - IESL - එකත් චෝදනා කරනවා, ඒ ගොල්ලොත් එක්ක ප්‍රමාණවත් සාකච්ඡාවක් කළේ නැහැ කියලා. ඒ වාගේම සමාජයේ සිටින විශේෂඥයෝත් ඒක කියනවා; ඔවුන්ගෙන් බලවත් චෝදනා එල්ල වෙනවා. ඒකම තමයි අපටත් කියන්න තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ප්‍රධාන විපක්ෂය හැටියට අපි ඇමතිතුමාට මෙන්න මේ කාරණය කියන්න ඕනෑ. පෙරේදා තමයි මේ පනත් කෙටුම්පත සාකච්ඡා කරන්න ආංශික අධීක්ෂණ කාරක සභාවට ගෙනාවේ. මේ තරම් ගැඹුරු, ජාතික වැදගත්කමක් තිබෙන පනත් කෙටුම්පතක් දවස් දෙකකට කලින් තමයි ආංශික අධීක්ෂණ කාරක සභාවට ගෙනාවේ. එහෙම කරලා එක දවසකින් තීරණයක් ගත්තවා. දැන් මේ පනත් කෙටුම්පත කලබලයේ, අවිධිමත්ව ගෙනාවා කියන එක හොඳටම තහවුරු වෙන්නේ කොහොමද? ශ්‍රේෂ්ඨාධිකරණය කියපු එකෙන් තමයි ඒක ඊට වඩා තහවුරු වෙන්නේ. මේ තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වගන්ති විශාල ප්‍රමාණයක් තිබෙනවා කියලා තමයි ශ්‍රේෂ්ඨාධිකරණය කියන්නේ. එක් වගන්තියක් සඳහා ජනමත විචාරණයකට යන්න ඕනෑ කියලාත් තිබුණා. ඒකෙන්ම පෙනෙනවා, මේ පනත් කෙටුම්පත සකස් කරනකොට හරියාකාරව කල්පනා කරලා නැහැ කියලා. මේක කලබලේ; හදිසියේ කළාය කියන එක ඒකෙන්ම පැහැදිලි වෙනවා. එම නිසා සමාජය තුළ ඇතිවෙලා තිබෙන ඒ තත්ත්වය සාධාරණයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිය ගත්තොත් එය ආර්ථික භාණ්ඩයක්, ඒ වාගේම නිෂ්පාදිත යෙදවුමක්. හැබැයි, අනෙක් පැත්තෙන් විදුලිය මහජන උපයෝගීතාවක්, ඒක මහජන සේවාවක්. In other words, Hon. Minister, you have to understand that making electricity an accessible and affordable commodity has to be one of the targets.

උදාහරණයක් හැටියට මෙහිදී ඇමතිතුමා ක්‍රියා කර තිබෙන ආකාරය සහ රජය ක්‍රියා කර තිබෙන ආකාරය බලමු. පසුගිය කාලයේ රජයේ ක්‍රියාකලාපය බැලුවාම 2022 අගෝස්තු මාසයේ විදුලි ගාස්තුව සියයට 66කින් වැඩි කළා. ඊළඟට, 2023 ඔක්තෝබර් මාසය වෙනකොට විදුලි ගාස්තුව සියයට 88කින් වැඩි කළා. ඊළඟට, 2023 ඔක්තෝබර් මාසයේ විදුලි ගාස්තුව සියයට 18කින් වැඩි කළා. ඒ වැඩි කරපු එකේ ප්‍රතිඵලය මොකක්ද? මේ රටේ අඩු ආදායම්ලාභීන් ලක්ෂ 5කට වැඩි ප්‍රමාණයකගේ විදුලිය විසන්ධි කළා. ඒක තමයි ප්‍රතිඵලය. ඒකට කිසිම ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ, ඒකට උත්තරයක් දුන්නෙත් නැහැ. මේ නව පනතෙනුත් ඔය වාගේ තත්ත්වයක් ඇති වුණොත් මොකක්ද වෙන්නේ? පාරිභෝගිකයාට දෙන ආරක්ෂාව පිළිබඳව හරියට කියා දීලාත් නැහැ; එතකොට ඒක පැහැදිලිත් නැහැ. එතුමන්ලාගේ දැන් තිබෙන ක්‍රියාකලාපය අනුව වැඩ කරලා තිබෙන හැටි බලන්න. දැන් ඇමතිතුමා කියනවා විදුලි ගාස්තුව අඩු කරන්න යනවා කියලා. ලක්ෂ 5කට වැඩි ප්‍රමාණයක විදුලිය විසන්ධි කළාට පසුවයි දැන් ඒක කියන්නේ.

නව පනතින් මා කලින් සඳහන් කළ අරමුණු දෙක ඉටු වෙනවාද? ආර්ථික භාණ්ඩයක්, නිෂ්පාදිත යෙදවුමක් සහ මහජන උපයෝගීතාවක්, මහජන සේවාවක් කියන අරමුණු මේ පනතින් ඉෂ්ට වෙයිද? ඒක හරියට ඉෂ්ට වෙනවාද කියලා බලන්න තමයි විපක්ෂය සංශෝධන කිහිපයක් ගැන කථා කරන්නේ. ඉන් එකක් තමයි, මේ කෙටුම්පතේ කියනවා වියදම මත ප්‍රතිසාදන කරන පාරිභෝගික මිලක්, එහෙම නැත්නම් cost-reflective consumer tariff එකක් අය කළ යුතුයි කියලා. හැබැයි, ප්‍රධාන ප්‍රශ්නය මේකයි. විදුලි උත්පාදනයේ සාධාරණ මිල කුමක්ද? What is the reasonable cost of electricity generation? ඒක තීරණය කරන්නට නියාමකයාට අවශ්‍ය බලතල දීලා තිබෙනවාද? එහෙම නැත්නම් මේ පනතින් දේශපාලනීකරණයක් සිදු වෙනවාද කියලා හරියට බලන්න ඕනෑ. ඔය ප්‍රශ්න ටික තමයි අපට තිබුණේ. ඒ නිසා, ශක්තිමත් නියාමකයෙක් සිටිය යුතුයි කියන තැන විපක්ෂය හැටියට අපි අනිවාර්යයෙන්ම සිටිනවා. ඒ නියාමකයාගේ බලතල අඩු කරන්න, දියාරු කරන්න ඉඩ තියන්න බැහැ. ඇමතිතුමා කියනවා පනතේ එහෙම නැහැයි කියලා.

The issue at hand, Hon. Minister, is to what extent the Draft Bill would permit these proposals to be implemented practically in a manner which ensures that the benefits flow to the citizens of Sri Lanka by making electricity accessible and affordable. Can we develop our renewable energy sector so that it would yield a dollar income and not one which would be exploited by foreign companies? Has this Act got those safeguards? Unbundling, using new technology is good, but would the systems yield benefit to our country or would those benefit some fly-by-night investors, as it had been happening in the past? And, it is happening right now. So, there is no doubt that foreign capital and foreign technology are very important for the country; we do not doubt that for a moment. But, there has to be safeguards to see that that is implemented.

ගරු ඇමතිතුමාත් දන්නවා, ශ්‍රී ලංකාවට පුනර්ජනනීය බලශක්ති සම්පත උපරිමයෙන් තිබෙන බව. පුනර්ජනනීය බලශක්තිය උපයන්න උපරිම සම්පත් තිබෙනවා. දැන් සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින්ම කියනවා අපේ අක්වෙරළ, - මුදුහු වෙරළ - සුළං බලය උපයා ගැනීමේ හැකියාව, power potential එක ගිගාවොට් 102ක් විශාලයි කියලා. ඒ වාගේම සූර්ය බලයෙන් අපට ගිගාවොට් 106ක ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන්. මේක වෙන රටවල නැති විශාල ප්‍රමාණයක සම්පතක්. අපට 2030-2040 පුනර්ජනනීය බලශක්ති ඉලක්කයට යන්න මේකෙන් ගිගාවොට් 10ක් ලැබුණා නම් ඇති. ඒ කියන්නේ, සුළං සහ සූර්ය බලයේ එකතුව. 2030 දී අපේ ඉලක්කය, රටේ ඉලක්කය සියයට 70ක විදුලි සැපයුම පුනර්ජනනීය බලශක්තිය හරහා ලබා ගැනීමයි. ඒ සියයට 70 සූර්ය බලය සහ සුළං බලය මෙගාවොට් 9,000ක්, එහෙම නැත්නම් megawatt hours 15,300 ක් ලබා ගැනීමයි. ඒ වාගේම 2040දී තව මෙගාවොට් 17,000ක් වැඩි කළාම අපට මෙගාවොට් පැය 37,000ක - megawatt hours 37,000 - නිෂ්පාදනයක් ලබා ගන්න පුළුවන්. මේකෙන් සිදු වෙන්නේ මොකක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පුනර්ජනනීය බලශක්ති ඉලක්කය සියයට 70ට ගෙනිච්චා නම් තාප බලාගාර ඉල්ලුම අඩු වෙනවා.

තෙල් ආනයනය ඉබේම අඩු වෙනවා. ඒකෙන් මොකක්ද සිද්ධ වෙන්නේ? ඩොලර් බිලියන ගණනක් මේ රටට ඉතිරි වීම. මේ පනතේ ඉලක්කය විය යුත්තේ ඒකයි. ඒ කියන්නේ, ඩොලර් බිලියන ගණනක් ඉතිරි කිරීම. ඒ වාගේම අපි නිෂ්පාදනය කරන පුනර්ජනනීය බලශක්තිය අපනයන භාණ්ඩයක් බවට පරිවර්තනය කරන්නත් පුළුවන්. ඒ කියන්නේ, විදුලිය අපනයනය කරන්න පුළුවන්. ඒ වාගේම තමයි, විදුලි ඒකකයට යන වියදමත් අඩු වෙනවා. විදුලි පාරිභෝගිකයන්ටත් ඒක පහසුවක් වෙනවා. අපේ නිෂ්පාදන වියදමත් අඩු වෙනවා. ඒ වාගේම තරගකාරී තැනකටත් අපට යන්න පුළුවන් වෙනවා. හැබැයි, අපේ මේ සම්පත් වෙන සමාගම්වලට සූරාකන්න හෝ උපයෝජනය කරන්න හෝ ඉඩ හැදුණා නම්, ඒ දේවල් සිදු වෙන්නේ නැහැ. නමුත්, අද ඒ වාගේ තත්ත්වයක් අපේ රට තුළ ඇති වෙලා තිබෙනවා. අපේ සම්පත් උපයෝජනය වෙනවා. එතකොට මේ පනත තුළ ඒ සඳහා ආරක්ෂාව තිබෙනවාද? ඒ ක්‍රමවේදය හරියට ක්‍රියාත්මක වෙනවාද කියා සොයා බැලීමේ වගකීම විපක්ෂය හැටියට අපට තිබෙනවා. විදුලිය සම්බන්ධ පනතක් වුණත් මෙතැනින් තමයි එය හරි හැටි සම්මත වෙන්න ඕනෑ. ඍජු රෙගුලාසි තිබෙන, ඍජු නියාමනයක් තිබිය යුතු ක්‍රමවේදයක් ඇති වෙන්න ඕනෑ. හැබැයි, මේ පනත තුළ නිර්දේශපාලනීකරණය ප්‍රමාණවත්ව සිදු වෙලා තිබෙනවාද කියන ප්‍රශ්නය අපට මතු වෙනවා. ඇමතිතුමා කියනවා, එතුමාට බලතල තිබෙන්න ඕනෑ කියලා. හැබැයි, කොයි තරම් ප්‍රමාණයක බලතල තිබෙන්න ඕනෑද? වගවීම කොතැනින්ද පටන් ගන්න ඕනෑ කියන එක එතුමා කල්පනා කරන්නේ නැහැ. ඒ වාගේම ස්වායත්ත නියාමනයක් මේ පනත හරහා සිදු වෙනවාද කියන ප්‍රශ්නයත් මෙහිදී මතු වෙනවා. ඒ නිසා මේ පනත තුළ යම් අඩුපාඩු ප්‍රමාණයක් තිබෙන බවත්, හිඩැස් තිබෙන බවත් පෙනී යනවා. එම කාරණා විශේෂයෙන්ම ඉදිරිපත් කරන්න මම කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව කොපමණ වෙලාවක් තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලයෙන් තව මිනිත්තු 2ක් තිබෙනවා. ඒ වාගේම කිරිඇල්ල මැතිතුමාගෙන් අමතර කාලයක් ගන්නත් පුළුවන්.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
මම ඒ කාලය ගන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, උදාහරණයක් ගත්තොත් ඔබතුමා කථා කරපු මේ unbundling ලෝක බැංකුවෙන් හැම රටකටම කියන දෙයක්. සමහර රටවල මේක ක්‍රියාත්මක කරලා අනාගත්ත අවස්ථාත් තිබෙන බව ඔබතුමාත් දන්නවා. උදාහරණයක් විධියට පිලිපිනය ගනිමු. පිලිපිනයේ මැනිලාවල වැඩිම විදුලි ගාස්තුව අය කරනවා. හැබැයි, ඒවා private සමාගම්; unbundle කරලා තිබෙනවා. එතැන දේශපාලනීකරණයක් සිදු වෙලා තිබෙනවා. පෞද්ගලික සමාගම් ඇමතිවරයාත් එක්ක - දේශපාලන අධිකාරියත් එක්ක - එකතු වෙලා පාරිභෝගිකයන්ගෙන් අය කරන විදුලි ගාස්තුව හිතුමතයට වැඩි කරනවා. ඒ වාගේ ප්‍රශ්න ඇති නොවෙන්න තමයි අපි කියන්නේ, මේක හරියට නියාමනය විය යුතුයි කියලා. මම හිතනවා, ඒකට ඇහුම්කන් දෙන එක ඔබතුමාගේ යුතුකමක් කියලා. කරු ජයසූරිය මැතිතුමාගේ කාලයේදී -2002දී- එක්සත් ජාතික පෙරමුණ ආණ්ඩුව මේ වාගේ පනතක් ඉදිරිපත් කළා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති. ඔබතුමාත් ඒක ගැන කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පනතේ තිබුණේ මේක unbundle කරන්න කියලා. නියාමනය සහ නිර්දේශපාලනීකරණය කරන්නට අවශ්‍ය වෙන කරුණු මීටත් වඩා ඒ පනතේ තිබුණා. හැබැයි ගරු ඇමතිතුමනි, ඒ වෙලාවේදී ඔබතුමන්ලාගේ කණ්ඩායම ම - අද මේ කණ්ඩායම - තමයි ඒ පනතටත් විරුද්ධව පෙනී සිටියේ. මට පුදුමයි, එදා මීට වඩා නියාමනයක් තිබුණු, රෙගුලාසි තිබුණු, විනිවිදභාවයක් තිබුණු ඒ පනතට විරුද්ධ වෙලා, ඊට වඩා දේශපාලනීකරණය කරන, ඇමතිවරයාට වැඩි බලයක් ලැබෙන මේ පනත අද ඔබතුමන්ලා විසින්ම ඉදිරිපත් කිරීම ගැන. කෙසේ වෙතත් එක කාරණයක් අද මට සහතික කරගන්න පුළුවන්. අද මේ පනත සම්මත වෙන්නේ නැහැ. සම්මත නොවෙන කාරණය මොකක්ද කියලා මම කියන්නම්.

ඇමතිතුමනි, ඔබතුමා අපේ ස්ථාවරය ගැන කිව්වා. ඔව්, අපි මෙයට යම් එකඟතාවක් තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ ස්ථාවරයත් ඔබතුමා පෙන්නුවා නේ. මාලිමාවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් තිබෙනවා නේ, මේක වෙනස් වෙන්න ඕනෑ කියලා. හැබැයි ඔබතුමන්ලා නියෝජනය කරන කණ්ඩායමේ සිටින මහින්ද රාජපක්ෂ මහත්තයා ළඟදී කිව්වා, ප්‍රතිව්‍යුහගත කිරීමට, පෞද්ගලීකරණයට එතුමා විරුද්ධයි කියලා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ බහුතරයක්ම ඔය පැත්තේ නේ ඉන්නේ. එතකොට කොහොමද ඔවුන් අත ඔසවන්නේ මේ පනතට? ඔවුන්ට අත ඔසවන්න බැරි වෙනවා. ඇඳගෙන ඉන්න එක තමයි අද ඔසවන්න වෙන්නේ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
අත ඔසවනවා.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ඔබතුමන්ලාට අත ඔසවන්න බැරි වෙනවා. මොකද, මහින්ද රාජපක්ෂ මහත්තයා කියපු විධියට ඔබතුමන්ලා මේකට විරුද්ධ වෙන්න ඕනෑ. අත නොවෙයි, ඇඳගෙන ඉන්න එක තමයි ඔසවන්න වෙන්නේ. එතකොට අද කොහොමද ඔබතුමා මේක සම්මත කරගන්නේ? අපි අත ඔසවනවාද, නැද්ද කියලා අපි කියන්නම්. අපි ඉදිරිපත් කරන සංශෝධනවලට ඔබතුමා එකඟ වෙනවා නම්, අනිවාර්යයෙන්ම අපි මේ පනත සම්මත කර ගැනීමට සහාය දෙන්නම්. ඔබතුමා මේක කියන්නකෝ. ඔබතුමා එකඟ වෙනවාද? අපි ඉදිරිපත් කරන සංශෝධනවලට ඔබතුමා එකඟ වෙනවා නම්, අපට පුළුවන් සහාය දෙන්න.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
සංශෝධන කෝ?

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
අපි ඉදිරිපත් කරනවා. එම සංශෝධන අපි ඔබතුමාට එවන්නම්.

Hon. Deputy Speaker, there are some key issues that I want to raise with the Hon. Minister. The difference between the Public Utilities Commission of Sri Lanka Act, No. 35 of 2002 brought by the Hon. Karu Jayasuriya and the Act brought by you, Hon. Minister, is this. With this Act, you have brought in the National Electricity Advisory Council. According to Clauses 3.(4) and 3.(8) (*a*) of the Bill, the power to appoint and remove members of the National Electricity Advisory Council is vested with you, the Minister. The Minister could also co-opt members as and when required. What I am trying to say is that as per the Public Utilities Commission of Sri Lanka Act, No. 35 of 2002, the members of the PUCSL, which is now playing the proposed NEAC's role, are appointed by the Minister in charge of policy planning with the concurrence of the Constitutional Council. That gives accountability and is very transparent. Therefore, in this proposed Act, we think the appointment mechanism should be changed. Also, Section 7 in the 2002 Act clearly states that the members of the PUCSL can only be removed by bringing the matter before Parliament, whereas, according to this Bill, you can remove any member whenever you want. So, there are checks and balances in the existing Act.

Then, as per Clause 3.(12) of the Bill, you, Hon. Minister, can give directions to the NEAC as you like. As per Clause 4.(11) *(a)*, the Minister could ask for detailed and specific guidance to be given to the Regulator and as per Clause 4.(11) *(b)*, the Minister can provide detailed and specific guidance to the National System Operator. So, you have powers going beyond all these provisions, to tell the Regulator what to do and to give him detailed and specific guidance. Okay, those would relate to the principles, but it also means that you can influence the Regulator and the National System Operator.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
I am going to finish, Sir.

Part VIII of the Bill details the instructions on tariff settings as against the Electricity Reform Act, No. 28 of 2002. As per Section 29 of 2002 Act, the functions on tariff principles and settings are vested with the Regulator and a broader framework is provided whereas, as per this Bill, the Minister can issue a detailed policy. There is a long list and I am not going to read it out. To an extent, I believe, the methodology rests in your hands. But, Hon. Minister, you have been telling me that it is the Regulator's job to develop the methodology. I hope you would certify that because that independence has to be there.

One other thing we are very concerned about, Sir, is consumer protection. In the Electricity Reform Act, No. 28 of 2002, there is a Chapter - Chapter IV - dedicated entirely to the purpose of consumer protection. But, I feel that this Bill is silent on consumer protection. So, there are issues with regard to that. - *[Interruption.]* Okay, I would like to see how good those safeguards are, as compared to those in the 2002 Act.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
It is in Clause 31.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Okay.

Hon. Minister, I am also concerned about the fact that there are issues relating to certain appointments. We are going to bring in some Amendments and will share those with you. These are progressive Amendments; these Amendments will ensure that Sri Lanka would derive the benefits.

I would like to wind up by telling you, Hon. Minister, why these checks and balances need to be there. Hon. Minister, I have been raising this issue hundreds of times. With regard to the Adani Group's renewable energy project of generating 500MW - we do understand that we need the technology and the financial strength of Adani Group; we need the investment - when the Cabinet

approved their unit rate of 8 US cents, we told you that there would be another tender that was going to be opened two weeks ago. There were more than five international bidders and we believe that their unit rates would be below 6 US cents, and you could use that to negotiate with the Adani Group to bring down the rate. But, so far, your Ministry has not even allowed the opening of the tender; you have illegally stopped the opening of the tender. We ask the Minister, if we give you more powers, what more could happen? There are systems that have to be adhered to. So, we are looking forward to seeing that the Minister makes sure that that tender is opened and we get the least cost - that is why we are talking about the least cost - for any wind power or solar power project that we would be given out.

Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

[අ.භා. 12.14]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

විදුලිබල ක්ෂේත්‍රයට අදාළව අද දවසේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත ගැන අපි එක ප්‍රශ්නයක් අහන්නට ඕනෑ. ඇයි, මේ ප්‍රතිසංස්කරණ 2002දී ඉදිරිපත් වනකොට වර්තමානයේ ආණ්ඩු පාර්ශ්වයේ සිටින කොටස් ඒකට විරුද්ධ වුණේ? වර්තමාන පනත් කෙටුම්පතත්, 2002 පනතත් සන්සන්දනාත්මකව බැලුවොත් වගකීම, වගවීම, විනිවිදභාවය තිබෙන්නේ 2002 පනතේ. රටත් බංකොලොත් වෙලා, ජන ජීවිතත් දැවැන්ත ව්‍යසනයකට ලක් වුණු මොහොතක අක්‍රමවත්, අවිධිමත් ආකාරයෙන් දුර්වල, රටට හානියක් වන පනත් කෙටුම්පතක් ඉදිරිපත් වීම ගැන අපි කනගාටු වෙනවා. Unbundling process එක ගැන අපේ එකඟතාව අපි පළ කළේ අද-ඊයේ නොවෙයි, 2002 වර්ෂයේදී; 2024දී නොවෙයි. ඒක නිසා මම පැහැදිලි කරන්න කැමැතියි, ඇයි අපි මේ පනත් කෙටුම්පතේ ප්‍රධාන විධිවිධානවලට විරුද්ධ වන්නේ කියලා.

ගරු ඇමතිතුමනි, කබීර් හෂීම් මැතිතුමා කියපු ආකාරයට අපි ඉදිරිපත් කර තිබෙන සාධනීය සංශෝධන ක්‍රියාත්මක කරන්නට ඔබතුමා සූදානම් නම් ඒ සාධනීය සංශෝධන තුළ වගවීම, වගකීම, විනිවිදභාවය නිර්මාණය වීම තුළ අපට මේ පනත් කෙටුම්පතට සහයෝගය පළ කරන්නට බාධාවක් නැහැ. හැබැයි, අපි ඉදිරිපත් කරපු සංශෝධන ටික අනුමත කරන්න ඕනෑ; ඒවා ඇතුළත් කර ගන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතේ අඩුපාඩුකම් ගණනාවක් තිබෙනවා. ඇත්තටම මෙහි ව්‍යුහාත්මක දුර්වලතාවක් තිබෙනවා. විශේෂයෙන්ම unbundling process එක බොහොම සංකීර්ණයි; ඒක complicated. ඒ ක්‍රමවේදය මීටත් වඩා සරල වෙන්නට ඕනෑ, ප්‍රායෝගික වෙන්නට ඕනෑ. Unbundling තුළ ආයතන 12කට වැඩි ප්‍රමාණයක් නිර්මාණය වෙනවා. Generation සඳහා 4යි; transmission සඳහා 2යි; distribution සඳහා 5යි; Employees' Provident Fund එකට සහ pension එකට 1යි. ඒ ක්‍රමවේදය මීට වඩා සරල වෙලා, මීට වඩා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි වැඩ පිළිවෙළක් බවට පත් වෙන්නට ඕනෑය කියන එක තමයි අපේ අවංක මතය. විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැතියි, මේ process එක, මේ සංකීර්ණ - complicated - වැඩ පිළිවෙළ මීට වඩා සරලව, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ආකාරයට නිර්මාණය වෙන්නට ඕනෑ බව. ඒ වාගේම මේකේ ලබා දීලා තිබෙන කාල පරාසය යථාර්ථවාදී නැහැ කියලා අපි හිතනවා. ඒක හරිම irrational timeline එකක්. ඇත්තවශයෙන්ම මේකේ තිබුණේ මාස හයයි. අපි පක්ෂයක් හැටියට අපේ මහ ලේකම්තුමා මුල් කරගෙන ඒකට අභියෝග කළා. ඒක බොහොම high-profile challenge එකක්. අපේ සමගි ජන බලවේගයේ නීතිඥ සංගමයේ ජනාධිපති නීතිඥවරුන් ලවා තමයි අපි ඒ challenge එක කළේ. ඒ challenge එක තුළ ශ්‍රේෂ්ඨාධිකරණය මේ මාස 6 ප්‍රායෝගිකභාවය නැතිකම අවබෝධ කරගෙන ඒක මාස 12ක් කරලා තිබෙනවා. හැබැයි, අපි පොඩ්ඩක් ඒ ගැන හිතන්න ඕනෑ. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට පෙර කරන්නට ඕනෑ වැඩ කටයුතු ගණනාවක් තිබෙනවා. Preliminary Transfer Plan එක, National Electricity Policy එක - ජාතික විදුලිබල ප්‍රතිපත්තිය - National Tariff Policy එක, ඒ වාගේම Long-term Power System Development Plan එක, Annual Power Procurement Plan එක කියන ඒ ඔක්කොම කොන්දේසි සම්පූර්ණ කිරීමෙන් පසුව තමයි ඒ appointed date එක ක්‍රියාත්මක වෙන්නේ. හැබැයි, ඒ කොන්දේසි ක්‍රියාත්මක වීම සඳහා ඇත්තටම ශ්‍රේෂ්ඨාධිකරණයත් තීන්දු කරලා තිබෙන කාල පරාසය මාස 12ක්. අපි විශ්වාස කරනවා, ඒක ප්‍රායෝගික නැහැ කියලා.

ඒ නිසා මේ කොන්දේසි ටිකත් සම්පූර්ණ කරලා, ඒ appointed date එක මාස 12ක් තුළ automatically apply වෙනකොට, ඇත්තවශයෙන්ම deadlock situation එකක් නිර්මාණය වෙනවා; එතැනත් නැති, මෙතැනත් නැති ඉතාම අක්‍රිය වෙන තැනකට අපි තල්ලු වෙනවා. ඒක අපි මහ හරවා ගන්නට ඕනෑ කියන එක පැහැදිලි කරන්නට ඕනෑ. ඒ නිසා පළමුවැනිම දේ තමයි, මේ unbundling process එක බොහොම සංකීර්ණයි, ඒක ප්‍රායෝගික නැහැ කියන එක. ඒක ප්‍රායෝගික වෙන්නට ඕනෑ; ඒක සරල වෙන්නට ඕනෑ.

ඊළඟ කාරණාව තමයි, මේ ක්‍රියාදාමය තුළ මේ කාල පරාසය - timeline එක - යථාර්ථවාදී නොවීම. ඒ වාගේම, මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, මේ පනත හරහා මේ ක්ෂේත්‍රය - sector එක - බරපතළ විධියට politicize වෙනවා කියන එක; මේක දේශපාලනීකරණයට ලක් වෙනවා. ඇත්තවශයෙන්ම ඇමතිවරයාට බලතල රැසක් ලැබෙනවා. සංවරණ සහ තුලන - checks and balances - අහිමි වෙනවා. දැන් බලන්න, Power Sector Reforms Secretariat එකට, National Electricity Advisory Council එකට වාගේම successor companiesවලට Director Boards පත් කිරීම් ඇමතිවරයා විසින් කරන්නේ. එතුමාට සම්පූර්ණ බලය, authority එක ලැබෙනවා. ඇත්තවශයෙන්ම ඇමතිවරයාට හැකියාව ලැබෙනවා, Regulatorව සහ National System Operatorව micromanage කරන්න. අපි විශ්වාස කරනවා, මේ විධියට ඇමතිවරයාගේ බලතල වැඩිවීම තුළ අපිට මේ පනත් කෙටුම්පතට එකඟවීම අපහසු කාර්යයක් කියලා.

ඒ වාගේම, විශේෂයෙන් මම සඳහන් කරන්නට කැමැතියි, මේ පනත් කෙටුම්පත හරහා Regulatorව සම්පූර්ණයෙන්ම දුර්වල කරලා තිබෙනවාය කියන එක. දැන් බලන්න, PUCSL එක Regulator බවට පත් කළේ, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත මඟින්. ඒ වාගේම, Sri Lanka Electricity Act, No. 20 of 2009 මඟින් Regulations, authorize කළා. ඇත්තවශයෙන්ම ඒකෙන් Regulatorට, tariff safety, consumer protection, dispute resolution, authority over Electrical Inspectors, authority to issue Regulations, formulate National Electricity Policy, approve technical and operational codes, ability to enforce technical and other

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

standards relating to safety, quality, continuity and reliability of electricity supply යනාදී වශයෙන් කොන්දේසි පනවලා, Regulatorව ශක්තිමත් කළා. මේ පනතින් වෙන්නේ, Regulatorගේ බලය ඉවත් කරලා, ඇමතිවරයාගේ බලය ශක්තිමත් කරන එකයි.

ඒ වාගේම, මේ පනත් කෙටුම්පතේ කිසිම තැනක continuous power supply ගැන සඳහනක් නැහැ; අඛණ්ඩ විදුලි සැපයුම තහවුරු කරන කිසිම දෙයක් මේ පනත් කෙටුම්පතේ නැහැ. එහෙම කොහොමද වෙන්නේ? ඇත්තවශයෙන්ම, මීට පෙර පනත්වල ඒ ගැන බොහොම පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ අඛණ්ඩව විදුලිය සැපයීමේ වගකීම තිබෙනවා. ඒක මේ පනත් කෙටුම්පතේ නැහැ. එහෙම වගකීමක්, වගවීමක් මේ පනත් කෙටුම්පතේ නැහැ. ඒ නිසා Regulatorව අඩපණ කරලා, Regulatorගේ තටු කපලා, superseding the authority of the independent Regulator, licensing, tariff, procurement වැනි වැදගත් තීන්දු-තීරණ ගන්න ඇමතිවරයාට බලය දෙනවා. මේ ප්‍රසම්පාදන ක්‍රමවේදය, tariff එක තීන්දු කිරීම, licensing පිළිබඳව මහා අසීමිත බලයක් ඇමතිවරයාට ලබා දෙනවා. අපි හිතනවා, ඒක ඉතාම අගතිගාමී, ප්‍රතිගාමී, හානියක් වන ක්‍රියාවක් හැටියට.

ඒ වාගේම අපි බොහොම පැහැදිලිව කියන්නට ඕනෑ, මේ power sector එක liberalize කරනකොට, ඇත්තවශයෙන්ම Regulator, strong වෙන්නට ඕනෑ කියන එක; Regulator ශක්තිමත් වෙන්නට ඕනෑ. ඒ මොකද, Regulatorට බලය තිබෙන්නට ඕනෑ, විවිධ ඌනතාවලට, විවිධ විෂමතාවලට විසඳුම් ලබා දෙන්න.

Regulatorව empower කරන්නට ඕනෑ; Regulatorව සවිබලගන්වන්නට ඕනෑ. නමුත් මෙතැන වෙලා තිබෙන්නේ, Rgulatorගේ තටු කපලා, බලය අයින් කරලා, ඇමතිවරයාගේ බලය වර්ධනය කිරීමයි. එය ඉතාම අගතිගාමී හා වැරදි ක්‍රියාවක් හැටියට අපි දකිනවා.

ඇත්ත වශයෙන්ම electricity sector එකේ දැන් තිබෙන්නේ State monopoly එකක් නේ. ඒ State monopoly එක වෙනුවට private monopoly එකක් - පෞද්ගලික ඒකාධිකාරයක් - බිහිවීමේ ප්‍රවණතාව මේ පනත් කෙටුම්පතේ මුල් අවස්ථාවේ පිටපතේ තිබෙනවා. ඒ කියන්නේ, "සියයට 50කට වැඩි අයට.." කියන වගන්තිය තිබුණත්, සියයට 49ක කණ්ඩායමකට private monopolies නිර්මාණය කිරීමේ හැකියාව නිර්මාණය වනවා. හැබැයි, අපි කරපු බල කිරීම තුළ - අපි නම් ඉල්ලුවේ 49 per cent එක 10 per centවලට අඩු කරන්න කියලා - ඇමතිවරයා එකඟ වෙලා තිබෙනවා එය සියයට 15 දක්වා අඩු කරන්න; අඩු කරන්න එකඟ වෙලා තිබෙනවාය කියලා කියනවා. එය එසේ නම්, ඒක ප්‍රගතිශීලි ක්‍රියාවක් බව මම සඳහන් කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත යටතේ successor companies 12ක් නිර්මාණය වනවා. හැබැයි, ඒ companies 12ට අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම ගැන පැහැදිලිව සඳහන් වෙලා නැහැ. එම නිසා අපට හිතා ගන්නට සිද්ධ වෙන්නේ ඒ පත්කිරීම් පවා සිදු වෙන්නේ ඇමතිවරයා හරහා කියලායි. අපට පැහැදිලි වෙලා තිබෙන්නේ National System Operator සහ Board එක ඇමතිවරයා විසින් පත් කරනවා කියලා. නමුත්, Director Boards ගැන පනත් කෙටුම්පතේ කථාවක් නැහැ; නිහඬයි. ඒකෙන් ගම්‍ය වන්නේ ඒ බලයක් ඇමතිවරයා සතු වන බවයි.

ඇත්ත වශයෙන්ම මම මතක් කරන්න කැමැතියි, Electricity Reform Act, No. 28 of 2002හි Section 50 යටතේ Monitoring and Advisory Committee එකක් propose කරලා තිබුණා, ඒ form කරපු companiesවල Board of Directors ලා, දේශපාලන ඇඟිලි ගැසීම් අවම කරලා, ඒ හරහා පත් කිරීම් ක්‍රියාත්මක කරන්නට. ඇත්ත වශයෙන්ම 2002 පනතේ පාඩම් ඉගෙන ගන්නේ නැතුව තමයි මේ දුර්වල පනත් කෙටුම්පත, මේ අවාසිදායක පනත් කෙටුම්පත, මේ අගතිගාමී පනත් කෙටුම්පත නිර්මාණ වෙලා තිබෙන්නේ කියන එක මම මේ අවස්ථාවේ කියන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තවත් ප්‍රශ්නයක් තිබෙනවා. මේ පනත් කෙටුම්පතේ විදුලිබල මණ්ඩලයේ assets සියල්ල value කරන method එකක් නැහැ. ඒ වෙනුවෙන් කිසිම ක්‍රමවේදයක් - methodology එකක් - නිර්මාණය කරලා නැහැ. මතක තබා ගන්න, විදුලිබල මණ්ඩලය සතු රුපියල් ට්‍රිලියනයකට වැඩි සම්පත් ප්‍රමාණයක් තිබෙන බව. ඇයි මම එහෙම කියන්නේ? මේ විදුලිබල මණ්ඩලයට අයිති power plants, reservoirs, grid substations, distribution lines, buildings, land වාගේම විවිධ human resources තිබෙනවා. ඒ වාගේම shares අයින් කරන - divest කරන - පැහැදිලි ක්‍රමවේදයක් සඳහන් වෙලාත් නැහැ. එතකොට asset valuation එක ගැන ක්‍රමවේදයකුත් නැහැ; shares dispose කරන ආකාරය ගැන ක්‍රමවේදයකුත් නැහැ. හැබැයි, 2002 පනත බැලුවා නම් ඒකේ බොහොම පැහැදිලිව තිබෙනවා. ඉතින්, මටම හිතා ගන්නට බැහැ. ඇත්ත වශයෙන්ම කිව්වොත්, 2002 පනතේ නිර්මාතෘවරයා රනිල් වික්‍රමසිංහ මැතිතුමා. එතුමාගේම යටතේ ගෙනා 2002 පනතේ තිබෙන බොහෝ යහපත් කොන්දේසි, යහපත් වගන්ති අයින් කරලා මේ නිර්මාණය වන 2024 පනත හරහා මේ කරන්නට යන වැරදි දේ ජනාධිපතිවරයාට නොතේරීම ගැන ඇත්තටම අපි පුදුම වනවා. මොකද, 2002 වැඩසටහනේ නිර්මාතෘවරයාත් එතුමා නිසා. එතුමාත් අපිත් එකම ආණ්ඩුවල හිටියා. මම හිතන විධියට අපේ ගරු කංචන විජේසේකර මැතිතුමා 2002 කාල වකවානුවේ දේශපාලනයේ නොසිටින්න ඇති. හැබැයි, මේ වර්තමාන ආණ්ඩු පක්ෂයේ දේශපාලන ධාරාව මහ පාරට බැහැලා මිනිස්සු කුලප්පු කරලා, මිනිස්සුන්ව උද්ඝෝෂණවලට යොදවලා, පාද යාත්‍රාවලට යොදවලා ඔය විවිධ කණ්ඩායම් එක්ක එකතු වෙලා 2002 කරන්නට ගිය ප්‍රශස්ත වැඩසටහන සම්පූර්ණයෙන්ම කඩාකප්පල්කාරී ක්‍රියාවකට ලක් කළා. ඒ නිසා මේක ගැන මම ඇත්ත වශයෙන්ම පුදුම වෙනවා.

ඊළඟ කාරණාව තමයි විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත සම්පූර්ණයෙන්ම නිහඬයි, විදුලිබල මණ්ඩලයේ මේ subsidiaries පිළිබඳව. මේ subsidiary ආයතන බිලියන ගණන් වටිනවා. මොනවාද මේ ආයතන? LTL Holdings (Pvt.) Limited, Sri Lanka Energies (Pvt.) Limited, Lanka Electricity Company (Pvt.) Limited, Lanka Coal Company (Pvt.) Limited and Trincomalee Power Company Limited. ඒ්වායේ කොටස්වලට මොකක්ද වෙන්නේ? මේවායේ කොටස්වලට මොකක්ද ගන්නා ක්‍රියාමාර්ගය කියලා අපි අහන්න කැමැතියි. ඉතින් ඇත්ත වශයෙන්ම මේ අණපනත්වල මේ වාගේ නිහැඩියාවක් තිබෙනකොට, අර LTL එකේ සිදුවුණු ගනුදෙනුව සංසන්දනය කරනකොට මහා බියකරු, භයංකර තත්ත්වයක් නිර්මාණය වෙනවා. ඇමතිවරයාට ඕනෑ ඕනෑ විධියට මේ කොටස්, රාජ්‍ය කොටස්, රටේ සම්පත්, පොදු ජනතාවගේ සම්පත් තමන්ගේ හිතුමතයට කුණුකොල්ලයට අළෙවි කිරීමේ ප්‍රවණතාව වැඩි වෙනවා මේ අණපනත්වල තිබෙන මේ බරපතළ දුර්වලතාව තුළ.

ඒ වාගේම මේ අවස්ථාවේ මම විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ, මේ Power Sector Reforms Secretariat එක

දේශපාලනීකරණයට ලක් කිරීම ගැන. බොහොම අත්තනෝමතික විධියට තම තමන්ට හිතුමතේට තමයි මේකේ සාමාජිකයන් පත් කිරීමේ ක්‍රියාවලිය සිදු වෙන්නේ. මම නම් ගම් කියන්නට යන්නේ නැහැ. මේකට කිහිප දෙනෙක් දැනට පත් කරලාත් තිබෙනවා. අපට දැන ගන්න ලැබිලා තිබෙනවා, ජාත්‍යන්තර මූල්‍ය ආයතනයක සිටි, විවිධ අක්‍රමිකතා නිසා ඉවත් කරන්නට යෙදුණු පුද්ගලයෙකුත් මේකට පත් කර තිබෙනවා කියලා. ඔහු ඉවත් කරන්නට ඉස්සෙල්ලා ඉල්ලා අස් වුණා. ඒක වෙනම කතන්දරයක්. දැන් ඔහුත් ඉන්නවා මේ Power Sector Reforms Secretariat එකේ. ඒ නිසා ඒක අනිවාර්යයෙන්ම මේ ආකාරයෙන් දේශපාලනීකරණයට ලක් කිරීම ගැන අපි බරපතළ ලෙස අපේ විරෝධතාව මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නට ලැහැස්තියි.

ඒ වාගේම මේ අලුත් පනත් කෙටුම්පතේ පාරිභෝගිකයා ආරක්ෂා වීම - consumer protection - ගැන ඇත්ත වශයෙන්ම බොහොම දුර්වල ප්‍රතිපත්තියක් අනුගමනය කරලා තිබෙන්නේ. ඒක නිකම් copy, paste කරලා තිබෙනවා, 2009 අංක 20 දරන පනතේ 40, 41, 42 කියන Sections. ඉතින් ඒක වැරදියි නේ. දැන් මේ power sector එක liberalize වෙන මොහොතක, open access සහ wholesale market conditions යන තත්ත්වයන් නිර්මාණය වීම තුළ මීට වඩා ශක්තිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නට ඕනෑ, පාරිභෝගිකයාගේ අයිතිය ආරක්ෂා කරන්න; පාරිභෝගිකයාගේ ඒ ඕනෑ එපාකම්වලට මූලිකත්වය ලබා දෙන්නට. කනගාටුදායක කාරණාව තමයි 2009 දී තිබුණු දේ copy, paste කරලා ඇතුළත් කරලා තිබෙන එක. මම හිතනවා, ඒකත් ඇත්ත වශයෙන්ම බරපතළ දුර්වලතාවක් බව. ඒ වාගේම ශ්‍රේෂ්ඨාධිකරණයට පින් සිද්ධ වෙන්න විදුලිබල මණ්ඩලයේ විදුලි ක්ෂේත්‍රයට සම්බන්ධ සියලු වැඩ කරන ජනතාවගේ, ඒ නිලධාරි කණ්ඩායමේ, සේවක පිරිසකගේ අයිතිවාසිකම් ආරක්ෂා වුණා; ඇමතිවරයාගේ පනත් කෙටුම්පතේ තිබුණු ප්‍රතිපාදනවලට වැඩිය ඔබ්බට ගිය වරප්‍රසාද ලැබුණා; ඒ වාගේම තිබුණු වරප්‍රසාද ටික රැකෙනවා. ඒ පිළිබඳව අපේ පූර්ණ ගෞරවය ශ්‍රේෂ්ඨාධිකරණයට මේ අවස්ථාවේදී පුද කරනවා. මම කාරුණිකව ඉල්ලීමක් කරනවා, විදුලිබල ක්ෂේත්‍රයේ වැඩ කරන ජනතාව පිළිබඳව මීට වඩා මානුෂීය ආකාරයෙන් කටයුතු කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම Regulator ශක්තිමත් වන්නට වැදගත්ම හේතුවක් තමයි අපේ රටේ බලශක්ති සුරක්ෂිතභාවය. ඒක වැදගත් කාරණාවක්. එය ජාතික ආරක්ෂාවට සෘජුවම බලපාන කාරණාවක්.

මොකද, Regulator ශක්තිමක් වුණු නැන තමයි ජාතික ආරක්ෂාවත් වඩාවඩාත් තහවුරු වෙන්නේ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව විපක්ෂයක් හැටියට අප ඉදිරිපත් කරන සංශෝධන ටික භාර ගන්නට ඔබතුමන්ලා කරුණාකර කටයුතු කරන්න කියලා.

මගේ කථාව අවසන් කරන්නට පෙර මම තවත් කාරණා කීපයක් කියන්න කැමැතියි. මේ ගරු සභාවේදී මුජිබුර් රහුමාන් මැතිතුමාත්, කබීර් හෂීම් මැතිතුමාත් LTL එක ගැන කථා කළා. බලන්න, මේ පනත් කෙටුම්පතින් ඇමතිවරයාගේ බලතල ශක්තිමත් වෙනවා; Regulatorගේ බලතල අවම වෙනවා; ඇමතිවරයාට හිතූ මතයට වැඩ කටයුතු කරන්න හැකියාව ලැබෙනවා. ඒ තුළ තමයි විදුලිබල මණ්ඩලයට අයිති LTL එකේ කොටස්වලින් කොටසක් West Coast Power (Pvt.) Limited එකට පවරන්නට අත්තනෝමතික තීන්දුවක් අරගෙන තිබෙන්නේ. හැබැයි මේ පිළිබඳව Cabinet decision එකේ තිබෙනවා, මේක විනිවිදභාවයෙන් යුක්තව කළ යුතුයි කියලා, that you have to be in compliance with the legal provisions and obtain due approval. විනිවිදභාවයෙන් යුක්තව මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක විය යුතුයි කියන එක මේ තීන්දුවේ තිබෙනවා. හැබැයි කිසිම ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොකොට, පාර්ලිමේන්තුව දැනුවත් කරන්නේ නැතුව, නීතිපති අනුමැතියකින් තොරව, තරගකාරී bidding ක්‍රමයකට - competitive bidding ක්‍රමයකට - යන්නේ නැතුව, proper valuation එකක් කරන්නේ නැතුව, කිසිම valuation වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේ නැතුව මේ ගොල්ලන් තීන්දු කරලා තිබෙනවා, සියයට 28ක කොටස් මාරු කරන්න, අර තිබෙන බිලියන 79ක ණය ගෙවීමේ කොටසක් හැටියට. අපි අහනවා ප්‍රශ්නයක්, ශ්‍රී ලංකා රුපියල් බිලියන 26.08ක් වටිනා සියයට 28ක කොටස් due process එකක්, විනිවිදභාවයෙන් යුක්ත වූ ක්‍රමවේදයක් අනුගමනය කරන්නේ නැතුව ඒ කටයුත්ත කළේ ඇයි, ඒකට Chief Valuerගේ validation එකක් ගත්තේ නැත්තේ ඇයි, නීතිපතිවරයාගේ concurrence එකක් ගත්තේ නැත්තේ ඇයි, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව දැනුවත් නොකළේ ඇයි කියලා. ඉතින් විනිවිදභාවයෙන් යුක්ත වූ ක්‍රමවේදයකින් තොරව ඇමතිවරයාගේ තනි මතයට මේ කර්තව්‍යය ඉෂ්ට සිද්ධ කළේ කොහොමද කියලා අපි ප්‍රශ්න කරනවා. මෙහිදී ඒකම කදිම නිදසුනක් වනවා. Regulator ශක්තිමත් කරලා, ඇමතිවරයාගේ බලතල වඩාවඩාත් වගවීමට, වගකීමට යොමු කරලා, ඇමතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමේදී ඕනෑ නම් ව්‍යවස්ථාදායක සභාවේ අනුමැතියත් ලබා ගෙන ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම වඩාත් වග වන ආකාරයට සංවරණ සහ තුලන - checks and balances - ක්‍රියාවලියක් තුළ ක්‍රියාත්මක කරන්න පුළුවන්.

මම විශේෂයෙන්ම තවත් කාරණාවක් කියන්න කැමැතියි. අපි දන්නවා, මෙගාවොට් 500ක සුළං බල ව්‍යාපෘතියක් Government-to-Government ලෙස ක්‍රියාත්මක කරමින් ඒකකයක් US ශත 8කට ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන බව. ඉතින් මම ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. බොහොම හොඳයි, සුළං බලයෙන් 500 MW උත්පාදනය කරන එක. නමුත් එහිදී tender process එක අනුගමනය කරන්නේ නැත්තේ ඇයි? ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඇයි? මෙගාවොට් 50ක සුළං බල ව්‍යාපෘතියකට ඒ වාගේම ටෙන්ඩර් කැඳවා තිබෙනවා. අමාත්‍යවරයා සමඟ පැවැති සාකච්ඡාවලදී අපි - විශේෂයෙන් කබීර් හෂීම් මැතිතුමා - පුනපුනා කිව්වා අර මෙගාවොට් 500 ව්‍යාපෘතියේ tariff rate එක තීන්දු කරන්නට පෙර මේ ටෙන්ඩරයෙන් 50 MW project එකට නිර්මාණය වන tariff rate එක බලාගෙන, ඒක පදනම් කරගෙන 500 MW ව්‍යාපෘතියට අදාළ price negotiation එක ක්‍රියාත්මක කරන්න කියලා. මමත් ඒ අවස්ථාවේ හිටියා. විශේෂයෙන් කබීර් හෂීම් මැතිතුමා ඇතුළු අපේ විපක්ෂයේ කණ්ඩායම් අවස්ථා ගණනාවකදී එසේ යෝජනා කළා.

දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? අර 50 MW wind power project ටෙන්ඩර් එකේ ඉදිරි ගමන දැන් අත්හිටුවා තිබෙනවා. ඒකට bidderලා තුන්දෙනෙක් විතර ඉන්න බව කියනවා. නමුත් දැන් ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ; ඒක හංගලා තිබෙනවා. ඇයි ඒක හංගලා තිබෙන්නේ? මෙගාවොට් 500 වැඩසටහන තුළ ඒ unsolicited proposal එකට වැඩි tariff rate එකක් ලබා දීලා කොතැනකින් හෝ ගසා කන්න හදනවා කියන එකයි අපට හිතෙන්නේ. ඉතින් මම ඉල්ලා සිටිනවා, අර මෙගාවොට් 50 වැඩ පිළිවෙළ ඉදිරියට ක්‍රියාත්මක කරන්න කියලා. ඒක යටපත් - stifle - කරන්නේ නැතිව, ඒ tender process එක කඩාකප්පල් කරන්නේ නැතිව එතැනින් ලැබුණු pricing එක ගැන සොයා බලා එය පදනම් කරගෙන 500 MW වැඩසටහන කරුණාකර ක්‍රියාත්මක කරන්න. මේ කරන හැම දෙයක්ම competitive procedure එකක් හරහා ක්‍රියාත්මක කිරීම වඩාත් යෝග්‍යයි, වඩාත් විනිවිදභාවයකින් යුක්තයි කියන එක මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අවසාන වශයෙන් මම පෙන්වා දෙන්න කැමැතියි, competitive proceduresවලට යෑමේ වැදගත්කම. මීට මාස ගණනාවකට පෙර අපට ඇහුණා, Poonakary Floating Solar Project එකක් ගැන. මම මතකයෙන් මේ කරුණු කියන්නේ. ඒ, මෙගාවොට් 700ක එකක්. Poonakary Floating Solar Project එක හරහා එවැනි විදුලි උත්පාදනයක්, සුනිත්‍ය බලශක්ති උත්පාදනයක් ක්‍රියාත්මක කරන්න යනවා කියන එක මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා. කොටින්ම කියනවා නම්, ජනාධිපතිතුමාත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ ගැන කිව්වා. කොහොමද ඒක වෙලා තිබෙන්නේ? ඒක unsolicited proposal එකක්. United Solar කියන කොම්පැනියට තමයි දීලා තිබෙන්නේ. හැබැයි, අප ඒවා ගැන තොරතුරු අනාවරණය කරන කොට මොහොතින් මොහොත Director Boardsවල අයගේ නම් ටික වාෂ්ප වුණා; අලුත් අලුත් නම් ආවා. බැලින්නම්, ඕස්ට්‍රේලියාවේ solar panels distribute කරන කණ්ඩායමක් නම් කරලා තමයි Cabinet Paper එකකුත් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ඇයි කියලා දන්නවාද? ඕස්ට්‍රේලියාව allow කරනවා, මේ වාගේ tender processවලින් ගන්න permits විකුණන එක. ජනාධිපතිතුමාත් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ ව්‍යාපෘතිය ගැන කිව්වා. මම හිතන විධියට, ඒ ආයතනයේ නම United Solar Energy. අපි තොරතුරු අනාවරණය කළාට පස්සේ ඒ ආයතනයේ නමත් එහාට මෙහාට වුණා, Director Boardsවල නම් පවා වෙනස් වුණා. මෙන්න මේ හේතු නිසා තමයි අපි කියන්නේ, ප්‍රසම්පාදන ක්‍රමවේදයේ වගකීම, වගවීම සහ විනිවිදභාවය අපි අතිශයින් සුරක්ෂා කරන්නට ඕනෑ කියලා.

මම තවත් දෙයක් කියන්න කැමතියි. මට මතක විධියට, 2022 ජූලි මාසයේ විදුලිබල සංශෝධන පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු වෙලාවේ හර්ෂ ද සිල්වා මැතිතුමා කිව්වා, 10 MW දක්වා feed-in-tariffs වැඩසටහන ක්‍රියාත්මක කරන්න, 10 MWවලට වඩා වැඩි හැම එකක්ම තරගකාරී ක්‍රමවේදයක් - competitive procedure එකක් - හරහා ක්‍රියාත්මක කරන්න කියලා. නමුත් අවසානයේ මොකක්ද වුණේ? ආණ්ඩුව ඉස්සෙල්ලා ඒකට එකඟ වෙලා අන්තිම මොහොතේ ඒක withdraw කළා. අපට ආරංචි වුණා, සති දෙකකට පෙර Cabinet එක 139ක list එකක් කඩිමුඩියේ අනුමත කර ගත්තා කියලා. ඒ, මෙගාවොට් 2,000කට වැඩි ප්‍රමාණයේ ඒවා. ඒවා ඔක්කෝම negotiated projects. ඒවා කඩිමුඩියේ අනුමත කරලා ක්‍රියාත්මක කරන්න හදනවා. ඒ අපරාධය කරන්න එපා. කරුණාකර ඒ හැම ටෙන්ඩර් එකක්ම digital platform එකක් හරහා විනිවිදභාවයකින් යුක්තව ක්‍රියාත්මක කරන්න. මේ බංකොලොත් රටේ ලක්ෂ 220ක් මත අධික විදුලි බිලක් පටවලා මේ කරන ගසා කෑම වහා නතර කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. අපි අපේ සාධනීය, ප්‍රගතිශීලි සංශෝධන ගණනාවක් ඉදිරිපත් කරනවා. ඒ සියල්ල ප්‍රගතිශීලි ඒවායි. ඒවා මේ පනතට ඇතුළත් කරන්නට සංවේදී වෙන්න කියලා මම ඇමතිවරයාටත්, රජයටත් යෝජනා කරනවා. ස්තුතියි.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. මම පිළිතුරු දෙන්න හිටියේ අවසානයේ. නමුත් අද විපක්ෂ නායකතුමාට වැදගත් දවසක් වන නිසා, අද සවස එතුමාට විවාදයක් තිබෙන නිසා එයට සූදානම් වෙන්න අවස්ථාවක් දෙන්න ඕනෑ. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා බලාගෙන ඉන්න නිසා ඒ සඳහා අවස්ථාව ලබා දෙමින්, ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නවලට මම පිළිතුරු ලබා දෙන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම LTL Holdings සම්බන්ධයෙන් පැහැදිලි කළා. එතුමා අහගෙන හිටියා. එතුමාගේ තේරුම් ගැනීමේ නොහැකියාවද කියලා මම දන්නේ නැහැ. West Coast Power (Pvt.) Limited කියන්නේ පෞද්ගලිකව පවත්වාගෙන යන කොම්පැනියක් නොවෙයි. මම නැවත වතාවක් කියනවා, West Coast Power (Pvt.) Limited එකේ කොටස්වලින් භාණ්ඩාගාරයට සියයට 41.45ක්, EPF එකට සියයට 27.5ක්, LECO එකට සියයට 18.18ක් තිබෙන බව. එතකොට එහි සියයට 87ක් රජය අතින් පාලනය වෙන්නේ. ඒක නීත්‍යානුකූල කරලා තිබෙන්නේ. ඔබතුමාට පුළුවන් ඕනෑ නම් ගිහිල්ලා අභියෝග කරන්න.

අපි නම් පනත් ඇතුළේ copy, paste කරලා නැහැ. ඔබතුමාට නම් හැම දාම උදේ පාන්දර පාර්ලිමේන්තුව ඇතුළේ copy, paste කරපු ඒවා දෙනවා කියන එක අපට තේරෙනවා. ඒ නිසා අවබෝධයෙන් කථා කරන්නේ කවුද කියන එක පිළිබඳව ජනතාව හොඳට තේරුම් ගනීවි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවක් පනතක් ගෙනෙනකොට පනතට ඇතුළත් කරන දේවල් තිබෙනවා, Regulationsවල තිබෙන දේවල් තිබෙනවා. පනතකට හැම දේම ඇතුළත් කරන්න ඕනෑ කියා සිතීමෙන්, මේ පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳවත්, අපේ රටේ නීතිය පිළිබඳවත් අවබෝධයක් නැහැ කියන එක තේරුම් යනවා.

දෙවැනි කාරණාව මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම නොවෙයි මේ රටේ ව්‍යවස්ථාව හදලා තිබෙන්නේ. රජය යටතේ පවතින ආයතනයක් නම්, රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් නම් ඒ ව්‍යවස්ථාපිත ආයතනයට සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන්නේ ඒ විෂය භාර අමාත්‍යවරයා. ඒ ආයතන ටික පෞද්ගලික අංශයට දීලා රජය හෝ ඇමතිවරයා එම තනතුරුවලට පුද්ගලයන් පත් නොකරන තත්ත්වයට පත්කරන්න ඔබතුමන්ලා කැමැති නම්, ඔබතුමන්ලාට ඒ තීන්දුව ගන්න පුළුවන්. නමුත් රජය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයක නම් කටයුතු කෙරෙන්නේ ඒ විධියටයි. අපි LECO එක ගනිමු. LECO එක රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක්. රටේ ව්‍යවස්ථාවේම තිබෙනවා, විෂය භාර ඇමතිවරයා තමයි අධ්‍යක්ෂ මණ්ඩලය සහ සභාපතිවරයා පත් කරන්නේ කියලා. මට ව්‍යවස්ථාව වෙනස් කරන්න බැහැ. මෙතුමා ප්‍රකාශ කරනවා ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කරනවා කියලා. එහෙම කටයුතු කරන්න යෝජනා කරන්නේ විපක්ෂ නායකතුමා. ඒ නිසා මේ රටේ නීතිය පිළිබඳව අවබෝධයක් නැතිව, පනත් පිළිබඳව අවබෝධයක් නැතිව ඔය විධියට වැඩ කරන්න බැහැ. ඒ වාගේම tariff එක පිළිබඳව ඇමතිවරයාට තීන්දු ගන්න බැහැ. නමුත් රජයකට අයිතියක් තිබෙන්න ඕනෑ. සමහරු හිතාගෙන ඉන්නවා මම සදාකාලික ඇමති හැටියට ඉන්නයි මේ පනත හදලා තිබෙන්නේ කියලා. මම මේ පනත් කෙටුම්පතේ කොහේවත් දාලා නැහැ, මේ පනත ක්‍රියාත්මක වෙන දවසේ සිට දිගටම කංචන විජේසේකර විදුලිබල ඇමතිවරයා හැටියට ඉන්නවා කියලා. ඒක ඊළඟට පත්වන ඇමතිවරයාට එන වගකීමක්. පවතින රජයට හෝ පසුව පත්වෙන රජයකට ප්‍රතිපත්ති තීන්දු තීරණ ගන්න අයිතියක් තිබෙන්න ඕනෑ. විදුලි බිල සම්බන්ධ ප්‍රතිපත්ති තීන්දුව, ජනන සැලසුම පිළිබඳ ප්‍රතිපත්ති තීන්දුව ගැනීමේ අයිතිය ආණ්ඩුවකට තිබෙනවා. හැබැයි, ඒවා ගණනය කිරීමේ බලය තිබෙන්නේ නියාමන කොමිෂන් සභාවටත්, එම ආයතනයටත් බව මම මතක් කරනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට යන්න ඕනෑ නිසායි මම ඉක්මනට මේ කාරණා ටික කිව්වේ. මම ඔබතුමාට සුබ පතනවා. මම හිතන විධියට අද සවස 6.00ට ස්වාධීන රූපවාහිනී සේවයත් සූදානම් වෙලා ඉන්නවා, ඔබතුමන්ලාගේ සංවාදය සඳහා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු නලින් ප්‍රනාන්දු ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.48]

ගරු නලින් ප්‍රනාන්දු මහතා (වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் பர்னாந்து - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Nalin Fernando - Minister of Trade, Commerce and Food Security)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ විපක්ෂ නායකතුමාත්, විපක්ෂයේ මන්ත්‍රීවරුත් මේ පනත් කෙටුම්පත ගැන අදහස් දක්වමින් සඳහන් කළේ තිබුණු පනතත් එක්ක විදුලිබල මණ්ඩලය ඉතාම හොඳට ක්‍රියාත්මක වෙලා අවශ්‍ය කරන තීන්දු අරගෙන ඒ තීන්දු තීරණත් එක්ක ඉතාම දියුණු තත්ත්වයකට පත් වෙලා මේ රටේ ජනතාවට ඉතාම සාධාරණ විධියට විදුලි බිලක් ලබා දීලා, මේ රටේ ජනතාව විදුලබල මණ්ඩලය කෙරෙහි විශාල විශ්වාසයකින් සහ ඉතා කැමැත්තෙන් ඉන්න අවස්ථාවක මේ ආණ්ඩුව පනත වෙනස් කරලා රටේ ජනතාව අමාරුවේ දමන්න යනවා වාගේයි. අනේ දෙවියනේ! විපක්ෂයට මේ කාරණය තේරෙන්නේ නැද්ද? පසුගිය කාලයේ විදුලි බිල වැඩි කිරීම නිසා මේ රටේ මිනිස්සු කොච්චර දුක් වින්දාද කියන එක අපට අමතක කරන්න බැහැ. විශේෂයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විධියට මටත් විශාල වගකීමක් තිබෙනවා. මේ රටේ පාරිභෝගිකයාගේ විදුලි බිල සම්බන්ධව විශාල ප්‍රශ්න ගණනාවක් අපට තිබෙනවා.

පසුගිය කාලයේ කාර්යක්ෂම සේවයක් සපයලා, ඉතාම හොඳ සේවාවක් ලබා දුන්නා නම්, පාරිභෝගිකයින් ඒ ගැන කියපු දේවල් එක්ක තමුන්නාන්සේලාට මේ ගැන මීට වැඩිය ඇස් ඇරලා බලන්න ඕනෑ අවස්ථාව මේක නොවෙයි කියා මම මතක් කරනවා.

අවසානයේ මොකක්ද වුණේ? විදුලිබල මණ්ඩලයේ අවුරුදු 25ක, 30ක අකාර්යක්ෂමතාව, බලාගාර හදන්න අවශ්‍ය තීන්දු ගත්තේ නැති නිසා එහි අවසාන ප්‍රතිඵලය, ඒ වාගේම තිබෙන බලාගාරවල කාර්යක්ෂමතාව ඇති නොකිරීම, මේවායේ තිබුණු හොරකම් සහ නාස්තිය නිසා වෙච්ච පාඩුව පැය 24කින් විදුලි බිලට ඇතුළත් කරලා පාරිභෝගිකයන්ට ලබා දීලා ඒ ආයතනය ලාභ ලබන ආයතනයක් බවට පත් කළා. මේ සම්බන්ධව අහනකොට කිව්වේ, "IMF එක කියනවා මේවා පාඩු ලබන්න බැහැ, නියමිත වියදමට හරියන මිලක් ඇති කරන්න කියලා" යනුවෙන් නේ. ඒ මිල ඇති කෙරුවා කියලා අපි ගෙනාපු අර සියලු පව් ටික පැය 24ක් තුළ පාරිභෝගිකයන්ට ලබා දුන්නා. අපි අද මොකක්ද මේකෙන් කරන්නේ? මෙච්චර සාර්ථකව වැඩ පිළිවෙළ ගෙනිච්චා නම් දෙවියනේ රටේ මිනිස්සු සන්තෝෂ වෙන්න එපා යැ. රටේ මිනිස්සුන්ට හරි සන්තෝෂයි, විදුලි බිල සම්බන්ධව. එළිවෙද්දි හැම දාම අහන්නේ, "කවදාද, විදුලි බිල අඩු කරන්නේ?" කියලා. ඔවුන් කියනවා, "අපිට ජීවත් වෙන්න බැහැ" කියලා. අපි වැටුප ගත්තාම පළමුවෙන්ම ගෙවන්නේ විදුලි බිල. විදුලි බිල ගෙව්වාම අපට කන්න සල්ලි නැති වෙනවා, ළමයාව ඉස්කෝලේ යවන්න බැරිව යනවා, ළමයාගේ ටියුෂන් ගාස්තුව දෙන්න සල්ලි නැති වෙනවා, වැටුපක් අරගෙන මෙතරම් බිලක් ගෙව්වාම අපි ජීවත් වෙන්නේ කොහොමද කියලා ඔවුන් අහනවා. ඒ අස්සේ විපක්ෂයේ අය කියනවා, "තිබුණු පරණ පනත හොඳයි. අලුත් පනත් කෙටුම්පත් ඉදිරිපත් කරලා මේවා වෙනස් කරන්න එපා" කියලා. ඒ පනතේ විශාල ලෙස කරුණු තිබුණා ලු, පාරිභෝගිකයා ආරක්ෂා කරන්න. පාරිභෝගිකයාව ආරක්ෂා කරනවා නම්, කොහොමද පාරිභෝගිකයාට මෙච්චර අමාරු, ලොකු විදුලි බිලක් දෙන්නේ. මේක පුදුම කථාවක් නේ. පාරිභෝගිකයා ආරක්ෂා කරන්න ලු පනතේ කරුණු තිබෙන්නේ. පනතේ තිබුණු විධියටම පසුගිය කාලයේ කරලා තිබෙනවා නේ. පාරිභෝගිකයා නියමෙට ආරක්ෂා කරලා තිබෙනවා. ඒ පනතට ආයෙත් අලුතෙන් කරුණු දාලා පාරිභෝගිකයා ඉදිරියටත් ආරක්ෂා කර ගන්න කියලා තමයි අපේ විපක්ෂ නායකතුමා කියන්නේ. අනේ! මේ වැඩක් නැති විධියට උදේ වරුවේම වෙලාව නාස්ති කරලා, වැඩක් නැති විධියට රටේ ජනතාවට විහිළු සපයන එක මෙතැනින්වත් නවත්වන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ රටේ පාරිභෝගිකයාට අවශ්‍ය අවසාන ප්‍රතිඵලය මොකක්ද? අපේ රටේ පාරිභෝගිකයාට අවශ්‍ය වෙන්නේ විදුලි බිල අඩුවීමයි. මෙතුමන්ලා අවුරුදු 25ක්, 30ක් තිස්සේ කරපු ඒවායේ ප්‍රතිඵලය මොකක්ද? අපේ රට, ආසියාතික රටවලින් ලොකුම විදුලි බිල තිබෙන රට බවට පත් කළා. එච්චරයි කළේ. හොඳම කප් එක ගහලා දුන්නා. ඒ අස්සේ කියනවා, කාර්යක්ෂමතාව හොඳට කර ගන්න ඕනෑ නැහැ ලු. තිබුණු පනත හොඳයි ලු. මේ කියන්නේ ඇමතිවරයාගේ බලතල ගැන ලු. ඇමතිවරයාට නොවෙයි, මොන කෙනාට ගියත් අපිට වැඩක් නැහැ. පාරිභෝගිකයාට අවශ්‍ය වන්නේ තමන්ට අවශ්‍ය සේවය සහ තමන්ට දරා ගන්න පුළුවන් විදුලි බිලක්. මේ සම්බන්ධව වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා ඇමතිවරයා වශයෙන් මට තිබෙන්නේ විශාල කලකිරීමක්. ඒ නිසා අපි හැම තිස්සේම කරන්න කියන්නේ, අවශ්‍ය කරන පනත් වෙනස් කරලා, ඒ තුළ මේ ආයතනයේ කාර්යක්ෂමතාව වැඩි කරලා ඒ වාගේම අලුත් විදුලි බලාගාර ඇති කරලා, පුනර්ජනනීය බලශක්තිය වැඩි කරන වැඩ පිළිවෙළ ගෙන ගිහිල්ලා එහි අවසාන ප්‍රතිඵලය පාරිභෝගිකයාට ලබා දෙන්න කියලායි. පනතකට කෑ ගහ-ගහ ඉඳලා, පනතේ තිබෙන ඒවා හොඳයි, හොඳයි කියලා ඒ පනත එක්ක අපිට වැළලෙන්න පුළුවන්කමක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේක මේ රටේ ආර්ථිකයේ හැරවුම් ලක්ෂ්‍යයක් නිර්මාණය කරන පනතක්. ඇයි මම එහෙම කියන්නේ? අපි පසුගිය අවුරුදු දෙක තුළ නව නීති 80ක් පමණ මේ පාර්ලිමේන්තුව තුළ සම්මත කළා. එතකොට අහනවා, පනත් ගෙනැල්ලා, නීති ගෙනැල්ලා කන්නද, ඒකේ ප්‍රතිඵලය මොකක්ද කියලා. මේ රටේ ආර්ථිකය හදන්න, මේ රටේ ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළක් ගෙනියන්න, මේ කඩා වැටුණු රට නැවත ගොඩනඟන අවශ්‍ය කරන වැඩ පිළිවෙළට ඕනෑ කරන අලුත් නීති, එහෙම නැත්නම් කෙටුම්පත් තමයි අපි හැදුවේ.

අද මේ ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? පසුගිය කාලයේ පැවැති ආර්ථික අර්බුදයට පළමුවෙන්ම බලපාපු ආයතනයක් තමයි ලංකා විදුලිබල මණ්ඩලය.

ඒ ඇයි? විදුලිබල මණ්ඩලයේ තිබුණු අකාර්යක්ෂමතාව සහ එම ආයතනය ලැබූ පාඩුව. ඒ පාඩුව කොහෙන්ද ගෙව්වේ? ඒක ගෙව්වේ මහා භාණ්ඩාගාරයෙන්. මහා භාණ්ඩාගාරයෙන් ඒක ගෙවනවා. එතකොට රටේ මුදල් එතැනට යනවා. වැය වන වියදමට වඩා අඩුවෙන් අපිට ලයිට් බිල දෙනවා. පාරිභෝගිකයාට අඩුවට විදුලිය දෙනවා කියලා, වැය වන වියදමට වඩා අඩුවෙන් විදුලිය ලබා දෙනවා. අවසානයේදී ඒ වියදම රජයෙන් ලබා දෙනවා. ඒකේ අවසාන ප්‍රතිඵලය වුණේ මොකක්ද? රටේ බලශක්ති අර්බුදයක් ඇති වෙද්දී, රටට අවශ්‍ය කරන මුදල් ටික නැති වෙද්දී, විදුලිය නිෂ්පාදනය කරන්න අවශ්‍ය තෙල් ටික නැති වෙද්දී, අවශ්‍ය කරන පෙට්‍රල් ටික, ඩීසල් ටික මේ රටට නැති වෙද්දී තමයි මේකේ රහේ තේරුණේ; අපි කරලා තිබෙන්නේ මොකක්ද කියන එක තේරුණේ එතකොටයි. ඒ නිසා අපිට විදුලිබල මණ්ඩලයේ ඉන්න පුද්ගලයන් එක්ක නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ ගෙන ගිය වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් තමයි අපට ප්‍රශ්නයක් තිබෙන්නේ. මේවාට නායකත්වය දුන්න

[ගරු නලින් ප්‍රනාන්දු මහතා]

පුද්ගලයෝ, මේවා සම්බන්ධයෙන් තීන්දු තීරණ ගත්තේ නැති පුද්ගලයෝ, මේ පනත් වෙනස් කරලා අවශ්‍ය කරන වෙනස්කම් නොකරපු පුද්ගලයෝ පිළිබඳ ගැටලුවක් තමයි අපට තිබෙන්නේ. විදුලිබල මණ්ඩලයේ සියලුම සේවකයන් මේකට අදාළ වෙන්නේ නැහැ. හැබැයි, අපි කවුරු මොනවා කිව්වත්, පසුගිය අවුරුදු 10ක්, 15ක්, 20ක් ඇතුළත අපි තීන්දු තීරණ නොගත් එකේ ප්‍රතිඵලය තමයි අද රටේ ජනතාවට අත්විඳින්න වෙලා තිබෙන්නේ.

මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතේ යම් යම් අඩු පාඩු තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් අපට සාකච්ඡා කරලා ඒක වෙනස් කර ගන්න පුළුවන්. හැබැයි, පසුගිය පනත් කෙටුම්පත මඟින් කාර්යක්ෂම, ඉතාම සාර්ථක ආයතන තුළින් මේ රටේ ජනතාව ප්‍රතිලාභ ලැබුවා කියන එක අපට කියන්න බැහැ. ඕනෑ නම් විපක්ෂයේ සිටින මන්ත්‍රීවරු එළියට බැහැලා හන්දියකට ගිහිල්ලා පාරිභෝගික ජනතාවගෙන් ඒ ගැන ඇහුවොත් ඔබතුමන්ලාට උත්තර දෙයි. "හරිම සාධාරණ ලයිට් බිලක් තිබුණේ, ඔබතුමන්ලා ඉතාම හොඳින් ඒක අපට පැහැදිලි කරලා දුන්නා" කියමින් ජනතාව පොලු අරගෙන ඔබතුමන්ලාට සලකයි කියන එක නම් මට පාරිභෝගික ඇමතිවරයා විධියට හොඳින්ම කියන්න පුළුවන්. ඒ නිසා මේ පනත් කෙටුම්පතට හඬවෙලා, "පසුගිය පනත හොඳයි, මේ ගෙනාපු පනත නරකයි" කියන එකේ ප්‍රතිඵලයක් නැහැයි කියලා මම විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ. විපක්ෂ නායකතුමා ඊයේ-පෙරේදා පපුවට ගහ-ගහ කිව්වා, "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයා ආරක්ෂා කරන්න මම මේ පාර්ලිමේන්තුවේ තිස් වතාවක් කථා කළා; හතළිස් වතාවක් කථා කළා; පනස් වතාවක් කථා කළා" කියලා. අනේ දෙවියනේ! විපක්ෂ නායකතුමාට අපි මතක් කරන්න ඕනෑ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයා නැති වුණේ විදුලි බිල නිසාය කියලා. මේ විදුලි බිල වැඩිවීම තමයි ඒ අයට දරාගන්න බැරිව මෙවැනි තත්ත්වයකට පත් වුණේ. එහෙම නම් අපි සියලු දෙනාටම වගකීමක් තිබෙනවා, විදුලි බිල අඩු කරන්න අවශ්‍ය කරන පහසුකම් ටික ඇති කරලා, ඒ වෙනුවෙන් අවශ්‍ය කරන නීති ටික වෙනස් කරන්න අප සියලු දෙනාගේම සහයෝගය ලබා දීමට. අපි සියලුදෙනා එකතුවෙලා මේක වෙනස් කරන්න සහයෝගය ලබා දීලා, විදුලිබල මණ්ඩලය හරහා නැවතත් රටේ ජනතාවට සේවයක් කරන්න පුළුවන් විධියට සාධාරණ මිලට විදුලිය ලබාදෙන ආයතනයක් බවට එය පත් කරන්න අවශ්‍ය කටයුතු අපි සිදු කරන්න ඕනෑ. ඒක ඇතුළේ අපට ඕනෑ තරම් වෙනස්කම් කර ගන්න පුළුවන්. ඒ වාගේම, එහි සේවකයන්ගේ අයිතිවාසිකම් රැකගන්න කටයුතු කරන්න පුළුවන්. ඒ අයගේ වරප්‍රසාද, ඒ අයගේ පඩි වැඩිකිරීම් ආදිය ලබා ගන්න පුළුවන්. හැබැයි. රටේ පාරිභෝගික ජනතාවට මේකෙන් වන හානිය අවම කර ගන්න අපට වගකීමක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟට මම කියන්න ඕනෑ, මහජන උපයෝගිතා කොමිසම ගැන. මම හැමදාම බලනවා මේ කොමිසමෙන් කරන්නේ මොකක්ද කියලා. මේ කොමිසම තිබෙන්නේ පාරිභෝගිකයා වෙනුවෙන් මැදිහත් වෙන්න; පාරිභෝගිකයා ආරක්ෂා කරන්න. මේක තමයි පාරිභෝගිකයාට සහනයක් ලබාදෙන විධියට විදුලි බිල අඩු කරන්න සැලසුම් සකස් කරන ආයතනය. ඒ වාගේම, ලංකා විදුලිබල මණ්ඩලයට - Ceylon Electricity Board එකට - යෝජනා ඉදිරිපත් කරන්නේත් මේ ආයතනය තමයි. පාරිභෝගිකයා රැකගන්න තිබුණු ආයතනය ඇතුළු සේරම එකතු වෙලා අවසානයේ මිල වැඩි කරලා පාරිභෝගිකයාව අමාරුවේ දැම්මා. මේ ආයතන සේරම එකතු වෙලා එච්චරයි කෙරුවේ. ඒ නිසා මම කියන්නේ මේකයි. මේ පාර්ලිමේන්තුවේ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරු ඉඳගන්න ඕනෑ රටේ ජනතාව පැත්තේ. එහෙම නැතිව වෙන වෙන පුද්ගලයන්ගේ පැත්තේ ඉඳගෙන, අපේ දේශපාලන අරමුණු සඳහා කථා කිරීම නොවෙයි අපි කළ යුත්තේ. කෙටියෙන් කිව්වොත්, අද අවශ්‍ය වෙලා තිබෙන්නේ විදුලි බිල අඩු කරගන්නා වැඩ පිළිවෙළකට අපි සියලුදෙනා එකඟ වීමයි. ඒ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළකට අපි සහයෝගය ලබා දෙන්න ඕනෑ.

අපේ ආණ්ඩුවක් තිබුණත්, විපක්ෂය ආයෙත් ආණ්ඩුවක් ගත්තත්, අවසානයේ මේ සියලුදෙනාගේම වගකීම වෙන්න ඕනෑ පාරිභෝගිකයාට සහන සැලසෙන වැඩ පිළිවෙළකට යෑමයි. එතැනදී අපි කිව්වා වාගේ, ප්‍රසම්පාදන වැඩ පිළිවෙළවල්වලට, අලුත් වැඩ පිළිවෙළවල්වලට යන යෝජනා අපට තිබෙනවා නම්, ඒවා වෙනස් කරගන්න හැකියාව තිබෙනවා. අවසානයේ අපි සියලුදෙනාගෙන්ම ඉල්ලන්නේ මෙයයි. විපක්ෂය එළියට පෙනෙන්න කථා කළාට මේ පනත් තුළින් වන දේ ඇත්තටම දන්නවා; මේකේ ප්‍රතිඵලය දන්නවා. ඒ නිසා මේ පනතට තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන්නය කියන ඉල්ලීම කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නලින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, மாண்புமிகு ஜகத் சமரவிக்ரம அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. JAGATH SAMARAWICKRAMA took the Chair.

[අ.භා. 1.00]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින Sri Lanka Electricity Bill එක පිළිබඳව පාර්ලිමේන්තුව තුළ විවාද කරනවා. අපි පසුගිය දශක කිහිපය තුළ Ceylon Electricity Board - CEB - එක දිහා බැලුවේ, ශ්‍රී ලංකාවේ සිටින ජනතාවට විදුලිය සැපයීම සේවයක් වශයෙන් කරගෙන යන ආයතනයක් විධියටයි. අනෙකුත් රටවල් ගත්තාම consumerට option එකක් තිබෙනවා, තමන්ගේ service provider තෝරා ගන්න. එයාට ආයතන 4ක්, 5ක් තිබෙනවා. ඒ ආයතන 4, 5න් එයාට ගැළපෙන ආයතනයක් තෝරාගෙන ඒ ආයතනය හරහා විදුලිය මිලදී ගැනීමේ හැකියාව වෙනත් රටවල

තිබෙනවා. හැබැයි, CEB කියන්නේ රාජ්‍ය ආයතනයක් නිසා පසුගිය දශක ගණනාව තුළ මේ පිළිබඳ කිසිම ගැටලුවක් තිබුණේ නැහැ. මොකද, ඒක රජයට සේවයක් සපයනවා. The CEB is meant to be and has been a service provider to the country; it has not been a money-making or a profit-making entity. But, right now, we are in a monopoly situation; අපි දැන් ඉන්න තත්ත්වය monopoly එකක්. CEB එක තනි monopoly එකක්. The CEB is the only player in this country which is providing electricity supply; මේ රටට විදුලිය ලබා දෙන්න ඉන්නේ CEB එක විතරයි. ජනතාව කැමැති වුණත්, අකැමැති වුණත්, CEB එක මොන කොන්දේසි දැම්මත්, මොන මිලට විදුලිය දුන්නත්, කරන්ට් කපන එකේ දී මොන මොන බලු වැඩ මිනිස්සුන්ට කළත්, රටේ ජනතාවට මේ CEB එක හැර වෙන යන්න තැනක් නැති තත්ත්වයක් තිබෙන්නේ. ඒ වාගේ අවස්ථාවක තමයි අද විදුලිබල ඇමතිතුමා Sri Lanka Electricity Bill එක මේ පාර්ලිමේන්තුව තුළ විවාද කරන්න ඉදිරිපත් කර තිබෙන්නේ.

යම් පනත් කෙටුම්පතක් ව්‍යවස්ථාවට පටහැනි ද නැද්ද, ව්‍යවස්ථාවට ඉහළින් ගිහින් තිබෙනවාද නැද්ද කියලා බලලා Supreme Court එකෙන් decision එකක් දෙනවා මිස මේකේ තිබෙන ගැටලු ප්‍රායෝගිකව ඉදිරි අනාගතයට බලපාන්නේ කොහොමද කියන එක ගැන පැහැදිලි කිරීම Supreme Court එකේ වගකීමක් ද, රාජකාරියක් ද කියන්න ඇත්තටම මම දන්නේ නැහැ. ඒ වාගේ අවස්ථාවක Sri Lanka Electricity Bill එක හරහා ඇමතිවරයාට - අද ඉන්නේ කංචන විජේසේකර ඇමතිවරයා - අසීමිත බලතල -අවශ්‍ය තරම් බලතල; අපට හිතා ගන්න බැරි තරම් බලතල - unnecessary powers that we cannot even imagine - අද ලැබෙනවා කියන එක තමයි ඇත්ත තත්ත්වය. ඇත්තටම මෙවැනි වැදගත් පනත් කෙටුම්පතක් හදිසියේ මේ පාර්ලිමේන්තුවෙන් සම්මත කරගන්න යන එක ගැන ලොකු සැකයක් තිබෙනවා. ඊයේ ගෙවිදු කුමාරතුංග මන්ත්‍රීතුමාත් කියනවා මම දැක්කා, මේ පනත් කෙටුම්පත ගැන හරියට කරුණු දක්වන්නවත් කාලය මදි කියලා. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව අපට අලුත් කාරණා හොයාගන්නවත් කාලයක් නැති අවස්ථාවක තමයි මේ පනත් කෙටුම්පත සම්මත කරන්න හදන්නේ. මේ පනත් කෙටුම්පත තුළින් ඇමතිවරයාට අසීමිත බලතල දීලා තිබෙනවා.

මේ රටෙහි අසීමිත බලතල තිබුණු පුද්ගලයන් මේ රටට කරලා තිබෙන විනාශය අපි දැකලා තිබෙනවා. කංචන විජේසේකර මැතිතුමා විදුලිබල ඇමතිවරයා හැටියට අද කටයුතු කරනවා. එතුමා උගත්, තරුණ ඇමතිවරයෙක්. හැබැයි, අනාගතයේ දී මේ අමාත්‍යාංශයේ ඇමතිවරයා හැටියට කිසිම දෙයක් නොතේරෙන, මේ රට විනාශ කරන, ඒ කියන්නේ corruptionවලින් ඉහළින්ම සිටින, හොරකම් කරන එකම තම මතය හැටියට තියාගෙන ඉන්න කෙනෙක් පත් වෙච්ච දවසට මේ රටේ සිටින පාරිභෝගිකයන්ගේ ඉරණම මොකක්ද?

පසුගිය කාලයේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එක රැයකින් organic පොහොරවලට මාරු වෙන තීන්දුව ගත්ත එකෙන් රටට වෙච්ච විනාශය අපි දැක්කා නේ. අද උදේ අපි දැක්කා, මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරයා, ජූඩ් සමන්ත ජයමහ නැමති පුද්ගලයාට ජනාධිපති සමාව ප්‍රදානය කරමින් ලබා දුන් තීන්දුව වැරදියි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කර තිබෙනවා. අපි දකිනවා, මේ රට තුළ යම් පුද්ගලයන් තමන්ට තිබෙන බලතල අයුතු ලෙස භාවිත කරලා, වැරදි තීන්දු-තීරණ ගත්තාම ඒකේ ප්‍රතිවිපාක මුළු රටේම සිටින ජනතාවට අත් විඳින්න සිදු වන බව. බැසිල් රාජපක්ෂ මහත්මයා මුදල් ඇමති වශයෙන් හිටපු කාලයේ ඒ ගොල්ලන් අතරේ සිටි කල්ලියක් එකතු වෙලා රටේ ආර්ථිකය විනාශ කරපු හැටි අපි දැක්කා නේ.

ඒ වාගේම CEB එක භාරව ඉන්න ඇමතිවරයාට මේ දෙන අසීමිත බලතල තුළින් අනාගතයේ මේ CEB කියන එක නැත්තටම නැති වෙන තත්ත්වයටත් පත් වෙන්න පුළුවන්. මේ පනත් කෙටුම්පතේ තිබෙනවා, ඇමතිතුමාට අවශ්‍ය විධියට National System Operatorsලා පත් කරගන්න පුළුවන් කියලා. ඊට අමතරව, National Electricity Advisory Council එකටත් ඇමතිවරයාට ඕනෑ කණ්ඩායමක් පත් කරන්න පුළුවන්. So, we are, in essence, creating a monopoly where the Minister has absolute discretion; he can do whatever he wants. මම කිව්වා වාගේ, මෙච්චර කල් රජයේ සේවයක් වශයෙන් පවත්වාගෙන ආ මේ ආයතනය මින් ඉදිරියට ඇමතිවරයාගේ පෞද්ගලික ව්‍යාපාරයක් වශයෙන් පවත්වාගෙන යෑමේ තත්ත්වයකට වුණත් පත් වෙන්න පුළුවන්. මම නැවත වරක් කියන්නේ මේකයි. මම මේ ඇඟිල්ල දිගු කරන්නේ කංචන විජේසේකර ඇමතිවරයාට නොවෙයි. අනාගතයේ මේ අමාත්‍යාංශයට Minister of Power and Energy හැටියට එන කෙනාට පුළුවන්, මේක පෞද්ගලික ව්‍යාපාරයක් වාගේ කරගෙන යන්න. ඒ ඇයි? මේකේ තිබෙනවා, Long-term Power System Development Plan එකක්. ඒ Long -term Power System Development Plan එක අනුව කියන්න පුළුවන්, අපි සුළං බලයෙන් විදුලිය මෙච්චරක් ගන්නවා, solar බලයෙන් මෙච්චරක් ගන්නවා, ඩීසල්වලින් මෙච්චරක් ගන්නවා, මේ ක්‍රමයෙන් මේච්චරක් ගන්නවා කියලා. එතකොට ඒ විදුලිය ගන්න එකට තමන්ට අවශ්‍ය ප්‍රමාණයට කොමිස් ටික හදාගන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ කථාවෙන් පස්සේ කරුණු දක්වන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.වී. චානක රාජ්‍ය ඇමතිතුමා.

ගරු ඩී.වී. චානක මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.வி. சானக - மின்சக்தி மற்றும் வலுசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. D.V. Chanaka - State Minister of Power and Energy)

ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාවෙන් මම කාලය ගන්නම්. දැනටත් මේ සියලු කාර්යයන් කරන්නේ CEB එකෙන්. හැබැයි, CEB එකේ Board එක පත් කරන්නේත් ඇමතිතුමා; CEB එකේ Chairman පත් කරන්නේත් ඇමතිතුමා; CEB එකේ GM පත් කරන්නේත් ඇමතිතුමා. මේ අලුත් වෙන පනතින් බලය පිළිබඳව වෙනසක් කරලා නැහැ. මොකද, රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව සඳහන්ව තිබෙනවා, Board එකකට නිලධාරීන් පත් කරනකොට අමාත්‍යවරයාට තමයි ඒ බලය දෙන්නේ කියලා. ඒ හැරුණාම අමුතු බලයක් මේ පනත ඇතුළේ ස්ථාපනය කරලා නැහැ.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියන විධියට දැනට තිබෙන පනතත් වැරදියි, මේ අලුතෙන් එන එකත් වැරදියි. ඒකත් වැරදියි, මේකත් වැරදියි, එම නිසා කමක් නැහැ, අපි මෙහෙම කරගෙන යමු කියලා නේ ඔබතුමාත් කියන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම නැවත වාරයක් කියනවා, විෂය භාර රාජ්‍ය ඇමතිතුමා වන ඔබතුමාටවත්, ඇමතිතුමාටවත් නොවෙයි මම මේ ඇඟිල්ල දිගු කරන්නේ කියලා. අපට මේ rate එකට සුළං බලයෙන් විදුලිය දෙන්න, අපි ඒකට මෙච්චර ගණනක් දෙන්නම් කියලා අනාගතයේ මේ ඇමති ධුරයට එන පුද්ගලයෙකු කිව්වොත් මොකක්ද වෙන්නේ? අන්න ඒක තමයි මෙහි අනාගත plan එක. දැන් නැතුවට එතකොට කියයි, National Electricity Advisory

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

Council එක පත් කරන්නේ විෂය භාර ඇමතිතුමාය කියලා. එතකොට ඉදිරියේදී පත්වන ඇමතිවරයා කියාවි, මේක එතුමා ගෙනාපු පනතක් නොවෙයි, පසුගිය ආණ්ඩුවෙන් සම්මත කරපු එකක්, මේ පනත යටතේ එතුමාට දීලා තිබෙන බලතල අනුව තමයි එතුමා කටයුතු කරන්නේ කියලා. මේක තනිකර ම අනාගතයට monopoly එකක්. CEB එක monopoly එකක් බවට පත්වන බැරෑරුම් තත්ත්වයක් මෙහි තිබෙනවා. මම ඒකයි කිව්වේ, CEB එකත් එක්ක compete කරන්න වෙන වෙන ආයතන තිබුණා නම්, රටේ ජනතාව කියාවි, මේ CEB එකේ තිබෙන හොරකම්, දූෂණ, වංචා නිසා වැඩි ප්‍රමාණයක විදුලි බිලක් ඔවුන්ට ගෙවන්න වෙලා තිබෙන නිසා ඔවුන් වෙන ආයතනයකින් විදුලිය ලබා ගන්නවා කියලා. හැබැයි, අද එහෙම කියන්න පුළුවන් තත්ත්වයක් නැහැ.

ඊළඟට, පාරිභෝගික කටයුතු පිළිබඳ ඇමතිවරයා පාරිභෝගිකයා ආරක්ෂා කිරීම පිළිබඳව මීට පෙර කථා කරනවා මම දැක්කා. පසුගිය මැයි 08වැනි දා ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා නඟපු ප්‍රශ්නයකට කංචන විජේසේකර ඇමතිතුමා පිළිතුරු සපයා තිබෙනවාත් මම දැක්කා. එතුමා කියලා තිබෙනවා, රතු බිල් මිලියන 30ක් - 30 million red bills - යවා තිබෙන බව. රතු බිල ගැන හැමෝම දන්නවා. මොකද, අද තිබෙන ආර්ථික තත්ත්වය අනුව හැම ගෙදරකටම විදුලිය සම්බන්ධයෙන් රතු බිල් තමයි එන්නේ. මොකද, රතු බිල් එවන්න කලින් කාටවත් බිල් ගෙවන්න විධියක් නැහැ. පාරිභෝගිකයා ආරක්ෂා කිරීම පිළිබඳව කථා කරන පාරිභෝගික කටයුතු සම්බන්ධ ඇමතිවරයා අහගෙන හිටියේ නැද්ද දන්නේ නැහැ, කංචන විජේසේකර ඇමතිතුමාගේ මේ කථාව. එතුමා ඒ කථාවේ කියා තිබෙනවා, 1.3 million connections disconnect කරලා තිබෙනවා කියලා. ඒ කියන්නේ, connections ලක්ෂ 13ක් විසන්ධි කර තිබෙනවා. ඒ වාගේම accounts 126,000ක් සම්පූර්ණයෙන් වසා දමා තිබෙනවා කියලාත් එහි කියා තිබෙනවා. ඒ කියන්නේ, මේ රට තුළ ඉන්න ජනතාවගෙන් විදුලිය භාවිත කරපු ජනතාව - connections තිබුණු ජනතාව- 126,000ක් ගෙවල්වල ඉන්නවා, "නැවත අපට බිල් ගෙවන්නත් බැහැ, අපට විදුලියත් එපා" කියලා, ඒවා cut කරලා දාලා අද මොනවා හරි පහනක් පත්තු කරගෙන. මොකද, මේ යන විධිය අනුව ඔවුන්ට විදුලි බිල ගෙවන්න බැහැ. පාරිභෝගික කටයුතු සම්බන්ධ ඇමතිතුමා දැන් කිව්වා, මිල අඩු කර ගැනීම තමයි පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීමේ ප්‍රතිපත්තිය කියලා. ලැබිච්ච වර්ෂාපතනයත් එක්ක දෙසැම්බර් මාසයේදී විදුලි බිල අඩු කරන්න තිබුණා. හැබැයි, අඩු කළේ නැහැ. මම ඊට කලින් තිබුණු විවාදයකදීත් මේ ගැන කථා කළා. ඒ තිබුණු වර්ෂාපතනයත් එක්ක විදුලි බිලට සැප්තැම්බර් මාසයේ කරපු tariff hike එක කිරීමේ අවශ්‍යතාවක් තිබුණේ නැහැ. එතකොට දැන් මේ සභාවේ ඉන්න රාජ්‍ය ඇමතිතුමා නොවෙයි, අනෙක් රාජ්‍ය ඇමතිතුමා හිටියේ. එතුමාත් ඒ ගැන දැනගෙන හිටියේ නැහැ. මේ රට තුළ අද පාරිභෝගිකයා නැත්තටම නැති වෙලා තිබෙන්නේ; විනාශ වෙලා තිබෙන්නේ. ජනවාරි මාසයේදී විදුලි සම්බන්ධතා 74,516ක් disconnect කරලා තිබෙනවා. පෙබරවාරි මාසයේදී 110,639කුත්, මාර්තු මාසයේදී 96,263කුත්, අප්‍රේල් මාසයේදී 65,504කුත් වශයෙන් විදුලි සම්බන්ධතා විසන්ධි කර තිබෙනවා. මම හිතනවා. අප්‍රේල් මාසයේදී බෝනස් හම්බ වුණු නිසා රජයේ සේවකයෝ බිල් ගෙවන්න ඇති කියලා. ඊට පසුව මැයි මාසයේ - අවුරුදු කාලා ඉවර වුණාම සල්ලි නැහැ - විදුලි සම්බන්ධතා 132,300ක් විසන්ධි කර තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

நாங்கள் மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டங்களுக்கும் பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டங்களுக்கும் செல்லும் போது, அங்குள்ள மக்கள் எங்களிடம், "ஐயா! 1,000 ரூபாய் bill செலுத்தவேண்டி இருந்தது. அதைச் சரியான நேரத்தில் செலுத்தாமல் விட்டதனால், எங்களுடைய மின் இணைப்பைத் துண்டித்து விட்டார்கள்" என்று சொல்கிறார்கள். அந்த நேரத்தில் எங்களுடைய மாவட்டத்தைப் பிரதிநிதித்துவப் படுத்தும் சிறுபிள்ளைத்தனமான இராஜாங்க அமைச்சர்கள், உடனடியாக அதை நிறுத்த வேண்டுமென்று சொல்கின்றார்கள். That has been outsourced. அதாவது, மின் இணைப்பைத் துண்டிக்கும் பொறுப்பை outsource பண்ணியிருக்கிறார்கள். மின் இணைப்பைத் துண்டித்த பிறகு, திரும்பவும் இணைப்பைப் பெறுவதற்கான தொகையைச் செலுத்த முடியாமல், எங்களுடைய மக்கள் நிரந்தரமாகவே இருட்டில் வாழவேண்டிய ஒரு சூழல் ஏற்படும். எமது மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் சிறுபிள்ளைத் தனமான இராஜாங்க அமைச்சர்கள் இன்று இந்தச் சட்டமூலத்துக்கு எதிராக வாக்களிக்காமல் விட்டால், அது மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கும் அனைத்து மின்சாரப் பாவனையாளர்களுக்கும் செய்யும் பாரிய துரோகமாகும். இந்தத் துரோகிகள் எங்களுடைய மாவட்டத்திலுள்ள மக்கள் மின்சாரம் இல்லாமல் இருட்டில் வாழ்வதற்கு ஆதரவாக வாக்களிப்பார்கள் என்றால், அது தொடர்பில் எங்களுடைய மக்கள் விழிப்பாக இருக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

මෙම අමාත්‍යාංශය පිළිබඳව තොරතුරු හොයා ගන්නත් බැහැ. Engineer කෙනෙකුගෙන් ඇහුවොත් කියනවා, DGMගේ ලිඛිත approval එකක් නැතුව තොරතුරු දෙන්න බැහැ කියලා. හොරෙන් හොයා ගන්නා ලද තොරතුරු අනුව තමයි අපට දැන් විවාදවලදී කථා කරන්න වෙලා තිබෙන්නේ. CEB එක ආයතනයක් වශයෙන් අද වන විට සිදු කරන සේවය, එක ඇමතිවරයෙකුගේ ව්‍යාපාරයක් වශයෙන් පරිවර්තනය කිරීම තරයේ හෙළා දකිමින් මගේ කථාව අවසන් කරනවා.

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එස්.බී. දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු ජගත් සමරවික්‍රම අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. JAGATH SAMARAWICKRAMA left the Chair, and DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] took the Chair.

[අ.භා. 1.11]

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂ නායකතුමාගේත්, රාසමාණික්කම් මන්ත්‍රීතුමාගේත්, කබීර් හෂීම් මන්ත්‍රීතුමාගේත් කථා ගැන මට හරි පුදුමයි. මම 1994 වසරේ ඉඳලා මේ වනතෙක් අමාත්‍යාංශ 11ක ඇමති ධුර දරා තිබෙනවා. එම අමාත්‍යාංශ 11 යටතේම තිබුණු ආයතන සියල්ලටම අදාළ අධ්‍යක්ෂවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන් පත් කළේ මම. ඒ නිසා මම පැහැදිලිව කියන්න කැමැතියි, මෙම පනත තුළින් කංචන ඇමතිතුමාට සාමාන්‍ය ඇමතිවරයෙකුට ලැබෙන බලතලවලට වඩා කිසිම බලයක් ලැබෙන්නේ නැති බව. අපේ ව්‍යවස්ථාව අනුව අනෙක් ඇමතිවරුන්ට ලැබෙන බලය තමයි කංචන ඇමතිතුමාටත් ලැබී තිබෙන්නේ. ඒක තමයි පළමුවෙනි කාරණය.

දෙවැනි කාරණය විධියට මම කියන්න කැමැතියි, මේ කාරණය. අපි උමා ඔය ව්‍යාපෘතිය ප්‍රමාද කරලා මේ රටට රුපියල් බිලියන 10ක, 15ක පමණ පාඩුවක් සිදු කළා. අපි සාම්පූර් බලාගාරය හදන්නේ නැතුව තවත් රුපියල් බිලියන 15ක්, 20ක් විතර අපේ රටට අලාභ කළා. ඒ විතරක් නොවෙයි. අපේ විදුලිබල මණ්ඩලයේ වර්තමාන සභාපතිතුමාත් එක්ක කටයුතු කිරීමේදී අද වන විට ධනාත්මකව පොඩි පොඩි වෙනස්කම් ඇති වෙලා තිබුණාට, පසුගිය කාලයේ මිනිස්සු පවත්වා ගෙන ගිය කුඩා ජල විදුලි බලාගාරවලට අවසර නොදීම නිසා ඒවා පන්සිය ගණනක් පමණ හිර කර තිබුණා. ඒවා අපේ රට තුළ විදුලිය උත්පාදනය කරන්න පැවති ව්‍යාපෘති. ඒ වාගේම තමයි සුළං බල ව්‍යාපෘති, සෝලා පැනල මඟින් ක්‍රියාත්මක සූර්ය බල ව්‍යාපෘති වාගේ දහස් ගණනක් ව්‍යාපෘති පවා හිර කර තිබුණා. මේක අපේ grid එකට දමන්න බැහැ කියා මොනවා හෝ කියමින් ඒවාට එන්න නොදී පුළුවන් තරම් හිර කර තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර කාලවලදී සමහර ජලාශවල ජලය විදුලිය උත්පාදනයට යොදා නොගෙනම අපතේ යනවා. ඊට පසුව රටට විදුලිය නැහැ. විදුලිය සල්ලිවලට ගන්නවා. විදුලිබල මණ්ඩලයට ඒ විධියට විදුලිය විකිණීමට විදුලිය උත්පාදනය කරන ඒ විදුලි ජනක යන්ත්‍රවල අයිතිකරුවෝ කවුද? බොහෝ අයිතිකරුවෝ විදුලිබල මණ්ඩලයේම ඉන්න ජ්‍යෙෂ්ඨ නිලධාරීන්. රුපියල් කෝටි-ප්‍රකෝටි ගණනක් පාඩු ලබමින්, අවුරුද්දකට දෙතුන් වතාවක් බෝනස් ගනිමින්, මේ ආකාරයට පවත්වා ගෙන ගිය විදුලිබල මණ්ඩලය අතට ගත්ත කංචන විජේසේකර තරුණ ඇමතිවරයා දැඩි තීන්දු අරගෙන, එඩිතර තීන්දු අරගෙන මේ පනත් කෙටුම්පත ගෙන එන්නට ශක්තිමත් වීම පිළිබඳව එතුමාටත්, අද වන විට අසනීප තත්ත්වයෙන් ඉන්න එතුමාගේ ආදරණීය පියාටත් මගේ විශේෂ ගෞරවය මේ වෙලාවේ පිරිනමන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය කෑ ගසමින් කථා කරන්නේ පෞද්ගලීකරණය ගැනයි. ඇයි, මේකට භය වෙන්නේ? මම පුංචි කතන්දර කිහිපයක් කියන්නම්. 1965 අගෝස්තු 09වැනි දා ලී ක්වාන් යූ මලයාසියාවෙන්, සිංගප්පූරුව කඩලා පැත්තකට ගත්තා. එතුමා ඉන්දියාවට හා ඉන්දුනීසියාවට ගිහිල්ලා පස් නැව් 70ක් අරගෙන ගිහින් සිංගප්පූරුවේ වැලි බිම පස්වලින් පිරෙව්වා. ඊට පස්සේ එතුමා ලංකාවට ඇවිල්ලා ඩඩ්ලි සේනානායක හිටපු අගමැතිතුමාගෙන් ගස් නැව් 2ක් ඉල්ලාගෙන ගිහිල්ලා -අගමැතිතුමා නිකම් දුන්නේ- අපේ පැළෑටිවලින් සිංගප්පූරුව පිරෙව්වා. ඊට පස්සේ ලී ක්වාන් යූ මැතිතුමා ජපානයට ගිහිල්ලා, ජපානයෙන් ජෙනරේටර් ඉල්ලුවාම, ඔවුන් ජෙනරේටර් 10ක් තැගි දුන්නා. මේ ජෙනරේටර් 10 අරගෙන ඇවිල්ලා ලී ක්වාන් යූ මොනවාද කළේ? සිංගප්පූරුවේ මිනිස්සුන්ට ඒ ජෙනරේටර් 10 විකුණුවා. ඒවා විකුණලා විදුලිය ලබා ගැනීම සඳහා ටෙන්ඩරයක් call කළා. එහෙම කරලා අර පෞද්ගලික ජෙනරේටර් අයිතිකරුවන්ගෙන් තමයි සිංගප්පූරුව විදුලිය ලබා ගත්තේ. ඒ පෞද්ගලික විදුලි නිෂ්පාදකයන්ගෙන් තමයි සිංගප්පූරු රජය අදත් මුළු රටටම විදුලිය ලබා ගන්නේ. ඉතින්, මේකට තිබෙන භය මොකක්ද?

මහතීර් මොහොමඩ් මැතිතුමා බලයට ඇවිල්ලා ඉස්සෙල්ලාම කරපු දේ තමයි විදුලි නිෂ්පාදනය හා බෙදා හැරීමේ ආයතන, සමාගම්වලට පැවරීම. ඒක තමයි පළමුවැනියෙන් කරපු දේ. දකුණු කොරියාවේ ජෙනරල් පාර්ක් බලයට ඇවිල්ලා ඉස්සෙල්ලාම කරපු දේ තමයි ඒ රටේ විදුලි නිෂ්පාදනය හා බෙදා හැරීම සමාගම්වලට - පෞද්ගලික ආයතනවලට - පැවරීම. ඒ රටවල් මේ විධියට දියුණු වුණා.

1972 - 1978 කාලයේ සිදු වූ මහා කඩා වැටීමත් එක්ක සියයට සියයක්ම රාජ්‍ය ආයතන තිබුණු චීනය ඇතුළු සමාජවාදී රටවල් කඩාගෙන වැටුණා. සෝවියට් දේශය කැලි 15කට කැඩුණා. නමුත් ඒ වෙලාවේ චීනය බේරා ගත්තා. චීන කොම්යුනිස්ට් පක්ෂ පාලනය යටතේ බලය අතට ගත් ඩෙන්ග් ෂියාඕපිං ඉස්සෙල්ලාම කළේ මොකක්ද? විදුලි නිෂ්පාදනය හා බෙදා හැරීම පෞද්ගලික අංශයට දුන්නා. දේශීයව විතරක් නොවෙයි, විදේශීය ව්‍යාපාරික සමාගම් තුනකටත් දුන්නා. මොකක්ද වුණේ? අද චීනය ලෝකයේ බලවත්ම රට. මීලඟදී ගැනීමේ ශක්තිය අනින් ඇමෙරිකා එක්සත් ජනපදයටත් වඩා ඩොලර් බිලියන 5,000ක් ඉහළින් අද චීනය ඉන්නවා. අද වනකොට චීනය, ඇමෙරිකාවටත් ඩොලර් ට්‍රිලියන 3.4ක ණය දීලා තිබෙනවා. ඒ අනුව චීනය වේගයෙන් දියුණු වුණා.

1972-1978 සිදු වූ මහා ආර්ථික කඩා වැටීමත් එක්ක රුසියාව කඩාගෙන වැටෙන්න යද්දී රුසියාවේ හිටපු ජනාධිපති සහ කොම්යුනිස්ට් පක්ෂ ලේකම් ගොර්බචෝෆ්, පෙරස්ත්‍රොයිකා වැඩසටහන ගෙනාවා. පෙරස්ත්‍රොයිකා වැඩසටහන හරහා ප්‍රතිසංස්කරණ රාශියක් ඇති වැඩ පිළිවෙළක් තමයි එතුමා යෝජනා කළේ. මොකක්ද, එහි තිබුණු පළමුවැනි දේ? පළමුවැනි දේ තමයි විදුලි නිෂ්පාදනය හා බෙදා හැරීම සමාගම්වලට - පෞද්ගලික අංශයට - පැවරීම. මේක තමයි පළමුවැනි දේ හැටියට තිබුණේ.

වියට්නාමය අපට වඩා බොහොම පහළින් හිටපු රටක්. අද වනකොට වියට්නාමය අපට වඩා බොහොම වේගයෙන් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. මොකක්ද ඒකට හේතුව? දේශීය හා විදේශීය ආයෝජකයන්ට ආදරයෙන් ආමන්ත්‍රණය කරලා, ආදරයෙන් ඔවුන් පිළිගෙන ඔවුන්ව ආරක්ෂා කිරීම. වියට්නාමය මොකක්ද කළේ? 1972 - 1978 මහා කඩා වැටීම ඉදිරියේ වියට්නාමය ආර්ථික ප්‍රතිසංස්කරණ විධියට පළමුවෙන්ම මොකක්ද කළේ? ඔවුන් විදුලිය සැපයීම හා බෙදා හැරීම සමාගම්වලට පැවරුවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි, අද අපේ රටට මෙහෙම වෙලා තිබෙන්නේ මේ ආයෝජකයන්ට කරන අසාධාරණකම් නිසාය කියලා. එක අවස්ථාවකදී අපේ රටේ ආයෝජකයෙක් රක්ෂණය ගත්තා. ඔහුගෙන් ඒක උදුරා ගත්තා. ඒ පුද්ගලයාට ඒ සල්ලිවත් දුන්නේ නැහැ. ඒ පුද්ගලයාම අපේ රටේ Lanka Hospitals ගත්තා. ඒ පුද්ගලයාගෙන් ඒකත් උදුරා ගත්තා. එලෙස උදුරා ගත්ත සල්ලි ගෙව්වේත් නැහැ. Waters Edge එක සල්ලි දීලා ගත්තා. ඒකත් නැවත උදුරා ගත්තා. ඒ පුද්ගලයාගේ සල්ලි ටික දුන්නේත් නැහැ. ආයෝජකයන්ට අපේ රටේ හැම රජයක් ගැනම සත පහක විශ්වාසයක් නැහැ.

[ගරු එස්.බී. දිසානායක මහතා]

විදේශ ආයෝජකයන්ට අපේ රට ගැන සත පහක විශ්වාසයක් නැහැ. හැබැයි, පසුගිය කාලය තුළ ඒ ආයෝජකයන්ට තිබුණු බිය, සැක වර්තමාන රජය යම් තරමකට ඉවත් කළා. ඒකේ ගෞරවය ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අපි ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම ගරු කංචන විජේසේකර ඇමතිතුමා වැනි අලුත් ඇමතිවරුන්ට අපි ඒ ගෞරවය ලබා දෙන්න ඕනෑ. ඒකෙන් මොකක්ද වුණේ? ඒකෙන් වුණේ, අපි බලාපොරොත්තු වුණාට වඩා 2023 වසරේදී අපේ රටේ දළ දේශීය නිෂ්පාදනය වැඩි වුණු එකයි. එය රුපියල් බිලියන 27,630 දක්වා වැඩි වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි බලාපොරොත්තු වුණාට වඩා අපේ රටේ ඒක පුද්ගල ආදායම රුපියල් ලක්ෂ 12 දක්වා වැඩි වුණා. අපේ රටේ ඒක පුද්ගල ආදායම කවදාවත් රුපියල් ලක්ෂ 12 දක්වා වැඩි වුණේ නැහැ. සංචාරක ව්‍යාපාරයෙන් ලැබුණු ආදායම සියයට 80කින් වැඩි වුණා. ඒ නිසා අපි අමතක කරන්න හොඳ නැහැ, ආයෝජකයින් අපේ රජයන් කෙරෙහි තිබුණු බිය නැති කිරීම තමයි, මේ කෙටි කාලය තුළ අපි ලබපු සාර්ථකත්වයට හේතුව කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

හැබැයි, මතක තබා ගන්න, ඒ සාර්ථකත්වය අපි ලබා ගත්තේ මේ රටේ දේශීය හා විදේශීය ආයෝජකයින්ට අපේ රට ගැන තිබුණු භය නැති කරලා කියන එක. ඒ නිසා මම කියන්න කැමැතියි, ලංකා විදුලිබල මණ්ඩලය ආයතන 12කට වෙන් කරලා, ඒ ආයතන තුළ තරගකාරිත්වයක් ඇති කරලා, එතැන තිබෙන මාෆියාව කඩා දාලා, ඒවා ආයෝජකයින් අතට පත් වුණත්, මේ රටේ ආර්ථික සංවර්ධනයට, රටේ ආර්ථික ශක්තිය ඉහළට ගෙනියන්න ඒක ශක්තියක් වෙනවා මිසක දුර්වලතාවක් නොවෙයි කියන එක. ඒ නිසා මේ පනත් කෙටුම්පතට අපි සම්පූර්ණ සහයෝගය දෙන බව මම කියන්න කැමැතියි. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Vijitha Herath. You have nine minutes.

[අ.භා. 1.22]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දිනය, ඉතිහාසයේ පාවා දීමේ දිනයක් බවට පත් වුණා. 2019දී ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට ජන වරම ලැබුණේ, රාජ්‍ය දේපළ විකුණන්න නොවෙයි, විකුණා තිබෙන රාජ්‍ය දේපළත් නැවත පවරා ගන්නයි. මට මතකයි, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයා විහාරමහාදේවී උද්‍යානයේදී ඉතා පැහැදිලිව කිව්වා, මේ විකුණන දේවල් ගන්න එපා, අපි ආවාට පස්සේ නැවත ඒවා පවරා ගන්නවාය කියලා. එදා ජන වරම දුන්නේ, මේ විකිණීමට විරුද්ධවයි. එත්මන් රනිල්-රාජපක්ෂ ආණ්ඩුව 2019දී ලබා ගත් ඒ හැටනවලක්ෂයක් ජනතාවගේ ජන වරමට පස්ස හරවා තමයි, අද මේ ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. මේ ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පතින් ලංකා විදුලිබල මණ්ඩලය කොටස් 12කට කඩලා, එය පෞද්ගලික අංශයට පවරා දීමක් ඉතා පැහැදිලිව සිද්ධ වෙනවා. පෞද්ගලික අංශයේ තරගකාරිත්වය ඇති කරනවාය කිව්වාට ඒකටත් පටහැනිව තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. පෞද්ගලික අංශයේ තරගකාරිත්වය තුළ මිල අඩු වෙනවාය කියලා ඔබතුමන්ලා කියනවා නම්, මේ පනත් කෙටුම්පතේ අඩංගු දේවල් ගත්තාම, ඇත්තටම ඒ තරගකාරිත්වය ඇති වෙන්නේත් නැහැ. මේ පනත් කෙටුම්පතේ 20 (4) වගන්තියෙන් ඉතා පැහැදිලිව ඒක ඔප්පු වෙනවා. ජනනය, සම්ප්‍රේෂණය හා බෙදා හැරීම සියයට 50කට වඩා වැඩියෙන් කොටස් දරන සමාගමකට එහි පාර්ශ්ව දෙකක් දරන්න බැහැ කියලා ඉතා පැහැදිලිව මුල් පනතේ අඩංගු වුණා. දැන් ඔබතුමන්ලා එක එක ඒවා කියනවා. නමුත්, මුල් පනතේ ඉතා පැහැදිලිව ඒක තිබෙනවා. එතැනින්ම පැහැදිලියි, මේ පනත තුළින් ඇති කරන්නේ ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය අනුව පෞද්ගලික අංශයේ තරගකාරිත්වයත් නොවෙයි කියන එක. මේ පනත් කෙටුම්පතේ 20 (6) වගන්තියේ ඒ ගැන සඳහන්ව තිබෙනවා.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පතේ 30 (4) වගන්තියේ ඉතා පැහැදිලිව මෙසේ සඳහන් වෙනවා:

> "අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, ජාතික ආර්ථිකයේ සුබසිද්ධිය උදෙසා, තොග විදුලිබල වෙළෙඳපොළ පිහිටුවීමට පෙරාතුව උත්පාදන බලපත්‍රලාභීන් සමඟ විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම්වලට එළඹීම සඳහා බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට ඉඩ ලබා දිය හැකි ය."

මොකක්ද මේ කියන්නේ? අවුරුදු 5ක කාලයක් තුළ තොග වෙළෙඳ පොළ ඇති කරන්න කියනවා. අවුරුදු 5 මදි නම්, අවුරුදු 10ක් දක්වා දීර්ඝ කරන්න කියනවා. හැබැයි, තොග වෙළෙඳ පොළ ඇති වෙන්න කලින්, තොග වෙළෙඳ පොළේ තරගකාරිත්වය ඇති වෙලා, ඒ විවෘත තරගය ඇති වෙන්න කලින්, අවශ්‍ය බලපත්‍ර ලබා දෙන්න ඇමතිවරයාට බලය තිබෙනවා. ඔබතුමන්ලා කියන ඒ විවෘත වෙළෙඳ පොළ ගැනත් මේ පනත් කෙටුම්පත තුළ සඳහන් වෙන්නේ නැහැ. ඒ නිසා හරි පැහැදිලියි, මේ පනත් කෙටුම්පතින් ඇත්තටම සිද්ධ කරලා තිබෙන්නේ වෙන මොනවත් නොවෙයි කියන එක. පෞද්ගලික අංශයේ තරගකාරිත්වය තුළ මිල අඩු කරනවා, පාරිභෝගිකයාට වාසියක් වෙනවා කියලා පාරම්බෑවාට මේ පනත් කෙටුම්පතේ අඩංගු දේවල් තුළින් සිද්ධ වෙන්නේ, පෞද්ගලික අංශයේ ඒකාධිකාරයක් ඇති කිරීමයි.

දැන් පට්ට ගහනවා; හම ගහනවා, රාජ්‍ය ඒකාධිකාරිත්වය තිබෙනවා, ඒ රාජ්‍ය ඒකාධිකාරිත්වය නිසා තමයි, ලංකා විදුලිබල මණ්ඩලය බංකොලොත් තත්ත්වයට පත් වුණේ කියලා.

හැබැයි, ඔබතුමන්ලා මේ කරන්නේ මොකක්ද? ඉලක්කසහගතව, පෞද්ගලික ඒකාධිකාරී තැනකට මේක තල්ලු කරන එකයි. ඒක තමයි මෙහි 20 (6) වගන්තියෙනුයි, 30 (4) වගන්තියෙනුයි ඉතා පැහැදිලිව, තර්කානුකූලව ඔප්පු වෙන්නේ. එම නිසා තවදුරටත් මෙතැන විවෘත කථාවක් නැහැ. උදාහරණයක් ගත්තොත්, Region 1 කියන කොළඹ ඉඳලා ත්‍රිකුණාමලය දක්වා කලාපයේ, එතැනින් උතුරට තිබෙන කලාපයේ මේ තිබෙන වගන්තිවලට අනුව දැනටමත් ප්‍රායෝගිකව සිද්ධ වෙන දේ ඒක නේ. තනි ආයතන නේ මිලදී ගන්නේ. සුළං බලය - wind power - ගත්තත්, සූර්ය බලය - solar power - ගත්තත් ඒවාට අදාළ

ප්‍රධාන මර්මස්ථාන ටික ගන්නේ එක ආයතනයකින්. එතකොට ඉතා පැහැදිලිව අපේ රටේ එම කලාපය තුළ තනි පෞද්ගලික ආයතනයක ඒකාධිකාරයක් ඇති වෙනවා. ඔබතුමන්ලා මේ පනතෙන් කරන්නේ ඒකට අවශ්‍ය නෛතික පදනම හදලා දෙන එක නේ. ඉතින්, මේක හංගන්න දෙයක් නැහැ. මේකේ රහස හරි පැහැදිලියි. මේක අපේ රටේ විදුලි බලය ඉන්දියාවේ අදානි කොම්පැනියට දෙන්න ගෙනාපු පනත. කොළේ වහන්න දෙයක් නැහැ. "මට කලින් වෙන කවුරු හරි ගෙනාවා, මම නොවෙයි ගෙනාවේ" කියන කථා බයිලා. හරි පැහැදිලිව මෙතැන තිබෙන වුවමනාව තමයි, unsolicited proposals මත කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරලා මේක අදානි සමාගමට දෙන එක. හැබැයි, අනුමත කළාට බැහැ, මේකට අවශ්‍ය නීතිමය රාමුව ඕනෑ. ඒ නීතිමය රාමුව තමයි මේ ගෙනෙන්නේ. ඒ තරගකාරිත්වය තිබෙනවා නම් ඉන්දියාවේ අදානි සමාගම විතරමද තිබෙන්නේ? වෙනත් සමාගම් නැද්ද? ඇයි, එවැනි අයට තරගකාරිත්වයට එන්න ඉඩ හදන්නේ නැත්තේ? අඩුම තරමින් ඉන්දියාව ඇතුළේවත් විවෘත ටෙන්ඩර් පටිපාටිය ක්‍රියාත්මක වෙලා නැහැ නේ. මේ සඳහා අදානි සමාගමම තෝරා ගන්න හේතුව මොකක්ද? මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා කොළේ වහලා ගහන්න දෙයක් නැහැ. අපේ රටේ විදුලිබලය තනි පෞද්ගලික ආයතනයක බලාධිකාරයකට, ඒකාධිකාරයකට පවරා දීමක් තමයි මේ පනත මඟින් සිදු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බලශක්තිය කියන්නේ, රටේ ආරක්ෂාවට, ජාතික ආරක්ෂාවට, ජාතික ආර්ථිකයට ප්‍රබල ලෙස බලපාන සාධකයක්. අපි වාගේ පුංචි රටකට, විශේෂයෙන්ම ආර්ථිකමය වශයෙන් ශක්තිමත් නැති රටකට අත්‍යවශ්‍ය කාරණා දෙකක් තමයි බලශක්තියේ ස්වෛරීත්වය සහ ආර්ථිකයේ ස්වාධීනත්වය. එහෙම නැති වුණොත් අපට පවතින්න බැහැ. මොකද, අපි පසුගිය කාලයේ පෞද්ගලීකරණය කියලා අපේ තෙල් ටික ඉන්දියන් සමාගමකට, චීන සමාගමකට, ඇමෙරිකානු සමාගමකට දුන්නා. ඒ තරගකාරිත්වය ඇතුළේ දැන් තෙල් මිල අඩු වෙලා තිබෙනවාද? ඒ අය එනකොට කොහොමද කිව්වේ? චීන සමාගමක් එනවා, ඉන්දියන් සමාගම එක්ක තරග කරනවා, ඇමෙරිකානු සමාගම එනවා, එතකොට මේ සමාගම් තුනේ තරගය නිසා තෙල් මිල අඩු වෙනවා කිව්වා. තරගය නිසා තෙල් මිල අඩු වුණාද? නැහැ. තෙල් මිල තුන් හතර ගුණයකින් වැඩි වුණා. ඇත්තටම ගත්තොත් ප්‍රශ්නය තිබෙන්නේ කොතැනද? නිවැරදි ටෙන්ඩර් පටිපාටියක් යටතේ, procurement procedure එකකට අනුව සිද්ධ වෙනවා නම් ඒ තරගය ඇතුළේ යම් යම් දේවල්වල මිල අඩුවීම් වෙනවා. පසුගිය කාලයේ ටෙන්ඩර් පටිපාටියකින් තොරව ලබා දුන් ව්‍යාපෘතිවලින් සිදු වුණු මිල වැඩිවීම් පිළිබඳ විස්තර මා ළඟ තිබෙනවා.

සුළං බලය ගත්තොත්, 2014, 2015 වර්ෂවල Wind Power Plants Nos. 13, 14, 15 ලබා දුන්නේ ටෙන්ඩර් නැතුවයි. එතකොට කිලෝවොට් එකක් රුපියල් 21.40යි, 21.96යි, 19.43යි. නමුත් 2020 ලබා දුන් 16 සහ 17 කියන plant numbers දෙකේ prices වුණේ, රුපියල් 13.07යි සහ 13.07යි. ටෙන්ඩර් දාපු නිසා මිල අඩු වුණා. Solar power ගත්තත් එහෙමයි. 6, 7, 8, 9 සහ 10 අංක යටතේ ඇති plants ගත්තොත්, 2017 සහ 2019 ටෙන්ඩර් පටිපාටියෙන් තොරව ලබා දුන් ඒවායේ ඒකකයක මිල රුපියල් 23.10යි, 23.10යි. ටෙන්ඩර් දැම්මාට පස්සේ ඒ තරගකාරිත්වය ඇතුළේ ඒකකය රුපියල් 17.95ට අඩුවෙලා තිබෙනවා. එම නිසා මෙතැන තිබෙන්නේ කොළේ වහලා ගහන ගැහිල්ලක්. ඉතා පැහැදිලිව මේ පනත් කෙටුම්පතේ තිබෙන්නේ, විදුලිබල මණ්ඩලය කොටස්වලට කඩලා විකුණා දැමීමක්. ඒක මේ පනතේ ඉතා පැහැදිලිව අඩංගු වෙලා තිබෙනවා. ඒක අපි දකින්නේ ලංකාව වාගේ රටක බලශක්තිය ගැටලුකාරී තත්ත්වයකට ගමන් කිරීමක් හැටියට. විශේෂයෙන් ජනතය දැනටමත් පෞද්ගලික අංශය විසින් කරනවා. ඒ පිළිබඳව විවාදයක් නැහැ. හැබැයි, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම රජය සතුව තිබිය යුතුයි. දැන් මේ අය උතුරු කොරියාවයි, කියුබාවයි, මියන්මාරයයි උදාහරණ විධියට ගන්නවා. හැබැයි, සිංගප්පූරුව අමතක වුණා. ඔය කියන ධනවාදී මොඩලය තිබෙන සිංගප්පූරුවේ සම්ප්‍රේෂණය සියයට 100ක් රජය සතුයි. ඇයි, කොළේ වහන්නේ? ඇයි, ඒක කියන්නේ නැත්තේ? දේශන පවත්වපු ප්‍රදීප් පෙරේරා සිංගප්පූරුව ගැන දන්නේ නැද්ද? මේ පාර්ලිමේන්තුවේ Committee Room එකකට ඇවිල්ලා එක් එක් රටවල් උදාහරණ විධියට ගත්තා. ඒක තමයි අද ඇමතිවරයා කියෙව්වේ. එතැන සිංගප්පූරුව ගැන කථා කළේ නැහැ. අද සිංගප්පූරුවේ ඉඳලා ඕස්ට්‍රේලියාවට කේබල් පද්ධතියක් අදින්න යනවා. ඒක පටන් ගන්නවා. දැනට feasibility study එක කරනවා.

එහේ hydro power නැහැ, එහේ සියයට 95ක්ම තිබෙන්නේ LNG. හැබැයි, සිංගප්පූරුවේ ඉඳලා ඕස්ට්‍රේලියාවට කේබල් පද්ධතියක් අදින්න කටයුතු කරන්න සිංගප්පූරුව සමත් වෙලා තිබෙන්නේ, සම්ප්‍රේෂණය සියයට 100ක්ම සිංගප්පූරු ආණ්ඩුව සතු නිසා. වෙන උදාහරණ අවශ්‍ය නැහැ. ඒ නිසා අපි ඉතා පැහැදිලිව කියනවා මේක ඇතුළේ තිබෙන්නේ විකිණිල්ලක්; privatization කිරීමක් තමයි කියලා.

ඇත්තටම අපේ රටේ ඉංජිනේරුවෝ විවිධ අවස්ථාවලදී මේ පිළිබඳව උපදෙස් දුන්නා, ලිඛිතව දුන්නා. ඒ එකක්වත් ගණන් ගත්තේ නැහැ. 2023, -ගිය අවුරුද්දේ- දෙසැම්බර් මාසයේ ලිඛිතව යෝජනා දුන්නා. ඒවා ඔක්කෝම පැත්තකට දාලා තමයි කාගේවත් වුවමනාවට මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. මම අහගෙන හිටියා උදේ ඇමතිවරයා කියනවා ලංකාවේ ඉංජිනේරුවෝ 4,000ක්වත් නැහැ කියලා. ඒකෙන්ම ජේනවා ඇමතිවරයාගේ දැනුමේ තරම. අද ලංකාවේ ඉංජිනේරුවෝ 20,000කටත් වැඩිය ඉන්නවා. විදුලි ඉංජිනේරුවෝ, electronic engineers, වාරිමාර්ග ඉංජිනේරුවරු, marine engineers, civil engineers ආදී වශයෙන් ඉංජිනේරුවරු 20,000කට වඩා ලංකාවේ ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනතේ මුඛ්‍ය අරමුණ වෙන මොකක්වත් නොවෙයි. මම පෙන්වලා දීපු වගන්ති දෙකෙන් ඉතා පැහැදිලිව, තර්කානුකූලව ඔප්පු වෙනවා මේ තිබෙන්නේ පෞද්ගලික අංශයේ ඒකාධිකාරයක් ඇති කිරීම බව. ඒ හරහා අපේ බලශක්තියේ ස්වෛරීත්වය, අපේ බලශක්තියේ ස්වාධීනත්වය නැති වෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පතට අපි පැහැදිලිවම විරුද්ධයි. මේ විකිණිල්ලට එරෙහිව මේ ආණ්ඩුවට මේ රටේ ජනතාවගේ විරෝධය ඉතා පැහැදිලිව තිබෙනවා කියන එක සඳහන් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. D.V. Chanaka. You have 12 minutes.

[අ.භා. 1.32]

ගරු ඩී.වී. චානක මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.வி. சானக - மின்சக்தி மற்றும் வலுசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. D.V. Chanaka - State Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. මට ඉතා කෙටි කාලයක් තිබෙන නිසා විජිත හේරත් මැතිතුමා මවපු බිල්ලෝ සියල්ලටම මම උත්තර දෙන්න යන්නේ නැහැ. හැබැයි, එක

[ගරු ඩී.වී. චානක මහතා]

කාරණයක් මම මතක් කරන්න කැමතියි. එතුමා කිව්වා තරගකාරීත්වය ඇති කරන්න කියලා චීනයෙන්, ඉන්දියාවෙන්, ඇමෙරිකාවෙන් තෙල් සමාගම් ආවා, ආපු දවසේ ඉඳලා තුන්ගුණයක් හතරගුණයක් තෙල් මිල වැඩි වුණා කියලා. මම දන්නේ නැහැ එහෙම වුණේ මොන රටෙද කියලා. ලංකාවේ එහෙම දෙයක් වුණේ නැහැ. ඒ සමාගම් ලංකාවට එනකොට තෙල් මිල රුපියල් 400 ගණන්වල තිබුණේ. දැන් 300 ගණන්වලට අඩු වෙලා. එතකොට 400 ගණන්වල ඉඳන් 300 ගණන්වලට ආපු එක තුන් හතරගුණයක් වැඩිවීමක් ලෙස විජිත හේරත් මන්ත්‍රීතුමා දැකීම මොන ගණිතයක්ද කියලා මට නම් හිතා ගන්න බැහැ. ඒ වාගේ කාරණා සම්බන්ධව පෝලිමට පෝලිමට බිල්ලෝ මවාගෙන ගිය හින්දා මට තිබෙන මේ කෙටි වේලාව මම භාවිත කරන්නේ නැහැ එතුමාට උත්තර දෙන්න.

විශේෂයෙන්ම මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා කංචන විජේසේකර ඇමතිතුමා, අපේ රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ හේරත් මැතිතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා, හිටපු ලේකම්තුමා ඇතුළු කණ්ඩායමට. මම පෞද්ගලිකව දන්නවා, එතුමන්ලා මාස 18ක් එක දිගට මේ පිළිබඳව කටයුතු කළ බව. කංචන විජේසේකර ඇමතිතුමා අඩුම වශයෙන් සතියට දවස් තුනක්වත් ඒ Committee එකේ වාඩි වෙලා, එකින් එක, එකින් එක බලලා, ප්‍රශ්න හඳුනාගෙන, ඒ ප්‍රශ්නවලට විසඳුම් සොයන්න තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ.

අපි දන්නවා මේ සභාවෙන් එළියට ගියාම විපක්ෂයේ සියයට 90ක්ම කංචන විජේසේකර ඇමතිතුමාගේ පසුපසින් ඇවිල්ලා පිටට තට්ටු කරලා "මල්ලි", එහෙම නැත්නම් "ඇමතිතුමා" කියලා කතා කරලා "ඔබතුමා හරි වැඩේ කරන්නේ" කියලා කියනවා. දැන් මමත් එක්ක elevator එකේ ඉඳලා ආව මන්ත්‍රීතුමාත් කියනවා, "අපි විපක්ෂයක් විධියට මේකට පක්ෂ වුණොත් අපට ගමට ගිහින් කියන්න දෙයක් නැහැ. ඒ හින්දා තමයි අපි විරුද්ධ වෙන්නේ. හැබැයි, හදවතින් අපි දන්නවා කංචන ඇමතිතුමා හරි වැඩේ තමයි කරන්නේ කියලා" යනුවෙන්. ඒක මේකේ ඉන්න බහුතරයක් දන්නවා. මේ 225දෙනාම දන්නවා මේක තමයි වෙන්න ඕනෑ කියලා. හැබැයි අවාසනාවකට, තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් මේ විධියට විරුද්ධ වෙනවා.

අපි දන්නවා ඉදිරිපත් කළ කිසිම පනතක්, කිසිම Bill එකක් සියයට 100ක් සාධාරණව, perfect විධියට ඉදිරිපත් වෙලා නැහැ කියලා. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අවස්ථා විසි ගණනකදී සංශෝධනය වෙලා තිබෙනවා. මේ කෙටුම්පතේ අඩු පාඩු තිබෙනවා නම් අපි හදා ගනිමු. ප්‍රශ්නයක් නැහැ. අඩු පාඩු තිබෙනවා නම් ඔබතුමන්ලා සංශෝධන ඉදිරිපත් කරන්න, අපි හදා ගනිමු. ඔබතුමන්ලාට ආරාධනා කළා මේ පිළිබඳව සාකච්ඡා කරන්න. බහුතරයක් මන්ත්‍රීවරු සහභාගි වුණේ නැහැ. අපි proposals ඉල්ලුවා, බහුතරයක් මන්ත්‍රීවරු ලබා දුන්නේ නැහැ. වෘත්තීය සමිති, ඇතුලු සියලුදෙනා එක්ක අමාත්‍යතුමා පෞද්ගලිකව සාකච්ඡා කළා. එතුමා ආංශික අධීක්ෂණ කාරක සභාවට ගිහිල්ලා Observer කෙනෙක් හැටියට වාඩි වෙලා, සභාපතිතුමාගෙන් අවසරය අරගෙන මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නවලට උත්තර දුන්නා. කවදාවත් එහෙම වෙලා නැහැ. පාර්ලිමේන්තුවට Bill එකක් ඉදිරිපත් කරනකොට කවදාවත් විපක්ෂයේ මන්ත්‍රීවරු කලින්ම ගෙන්වලා දැනුවත් කරලා නැහැ. හැබැයි ඒ දේ වුණා, විපක්ෂයේ අදහසුත් ගත්තා. ඒ සියල්ලම එකතු කරලා තමයි අද මේ දේ කරන්නේ.

අනෙක් කාරණය තමයි, හැම තිස්සේම මේක ලසු කරන්න හදනවා "විකුණන්න හදනවා, විකුණන්න හදනවා" කියලා. අද ගුවන් තොටුපොළ වෙනම සමාගමක් විධියට තිබෙන්නේ. අද විදුලිබල මණ්ඩලයේ LECO එක වෙනම සමාගමක් විධියට තිබෙන්නේ. හැබැයි ඒ සමාගම් වෙන් වුණු පළියට ඒක පෞද්ගලීකරණය වෙනවා කියලා කොහේවත් සඳහන් වෙන්නේ නැහැ.

හැබැයි, මේකේ අරමුණ තමයි ආයතනය කාර්යක්ෂම කරන එක. අපට මේ පනත් කෙටුම්පත සම්බන්ධව ජනමත විචාරණයකට යන්න පුළුවන් නම් හොඳයි. මොකද, රටේ ජනතාවගෙන් බහුතරයක් -සියයට 90කට වැඩි පිරිසක්- මෙය අනුමත කරනවා කියලා මට ලොකු විශ්වාසයක් තිබෙනවා. මම ජනතාවගෙන් අහන්න කැමැතියි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් අහන්න කැමතියි, ලංකා විදුලිබල මණ්ඩලය හරහා මේ වනකල් රටට සිදු වුණු සේවාව ගැන ඔබතුමන්ලා සතුටුද කියලා. මේ විදුලිබල මණ්ඩලයෙන් ඔබතුමන්ලාට ලැබුණු විදුලි බිල පිළිබඳව ඔබතුමන්ලා සතුටු ද? දකුණු ආසියාවේ වැඩිම විදුලි බිල ගෙවන පාරිභෝගිකයන් විධියට ඔබතුමන්ලා විදුලිබල මණ්ඩලය ගැන සතුටු ද? තමන්ගේ ගෙදර solar panels සවි කරන්න ගියාම, application එක ලබා ගන්න තැන ඉඳලා solar panels සවි කිරීම දක්වා යන කාලය පිළිබඳව ඔබතුමන්ලා සතුටු ද? ඒ වාගේම, මෙගාවොට් 10ක project එකක් කරන්න ගියාම මාස 8 ඉඳන් අවුරුදු 2ක් දක්වා ආයතන වටේ යන්න සිදු වන එකට ඔබතුමන්ලා සතුටු ද? වැඩිය ඕනෑ නැහැ, ඊයේ පෙරේදා වෙච්ච සිද්ධියක් මම කියන්නම්. මේ ගරු සභාවේ මට ඉදිරිපස ආසනයක සිටින රාජ්‍ය ඇමතිවරයකුගේ භාර්යාව විදුලිබල මණ්ඩලයට ගිහින් කියනවා, solar panels සවි කිරීම සඳහා application එකක් දාන්න ඕනෑ කියලා. මම ඒ රාජ්‍ය ඇමතිතුමාගේ නම කියන්නේ නැහැ. එක දවසක් යනවා; දෙන්නේ නැහැ. දෙවැනි දවසේ යනවා; දෙන්නේ නැහැ. තුන්වැනි දවසේ ගියාම ඒ රාජ්‍ය ඇමතිතුමාගේ භාර්යාවට කියනවා, ගෙදරට solar panels ඕනෑ නම් රුපියල් 75,000ක් දෙන්න කියලා. රටට විදුලිය සපයන්න solar panels ආවා නම් තරගකාරීත්වය වැඩි වෙනවා; විදුලි ඒකකයක මිල අඩු වෙනවා. හැබැයි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? විදුලිබල මණ්ඩලයේ වැඩ කරන ඉංජිනේරුතුමාට දෙන්න ඕනෑ, රුපියල් 75,000ක්. මේ ආණ්ඩුවේ ඉන්න ප්‍රබලම රාජ්‍ය ඇමතිතුමාගේ භාර්යාවටත් එසේ නම් විදුලිබල මණ්ඩලය අපේ ගම්වල ජනතාවට කොහොම සලකනවාද කියලා මම ඔබතුමන්ලාගෙන් අහන්න කැමතියි. කොච්චර අය ඉන්නවාද solar panels සවි කරගෙන, connection එක ගන්න බැරිව? කොච්චර අය ඉන්නවාද grid availability එක check කර ගන්න බැරිව? මේක තමයි ඇත්ත තත්ත්වය. මේක රටේ ජනතාව දන්නවා. හැබැයි, විපක්ෂය මේ ගැන නොදන්නවා වාගේ හැසිරෙනවා. මේ ප්‍රශ්නයට විසඳුම තමයි අප මේ සූදානම් කරගෙන යන්නේ.

දැන් විපක්ෂයේ හැමෝම වාගේ කියනවා මේ ආණ්ඩුව තිබෙන්නේ තවත් මාස දෙකයි, කංචන ඇමතිතුමා මේ අමාත්‍ය ධුරයේ ඉන්නේ තවත් මාස දෙකයි කියලා. උපරිම වුණොත් තවත් මාස තුනයි කියලා තමයි ඔබතුමන්ලා කියන්නේ. ඉතින්, එතුමා ඉන්නේ තවත් මාස තුනයි නම්, මේ වැඩ පිළිවෙළට අවුරුදු තුනක් යනවා නම්, මේක high speed ම ගියත් අවුරුදු එකහමාරක් යනවා නම්, මාස තුනකින් පසුව ඔබතුමන්ලා මෙය වෙනස් කර ගන්නකෝ. ඔබතුමන්ලා මේකට අකමැති නම් ඔබතුමන්ලා මෙය වෙනස් කර ගන්න. හැබැයි, ඔබතුමන්ලාට විශ්වාසයක් තිබෙනවා මේ ආණ්ඩුව ඉස්සරහට යනවා කියලා. ඔබතුමන්ලාට විශ්වාසයක් තිබෙනවා කංචන විජේසේකර ඇමතිතුමා තමයි තවත් අවුරුදු පහක් විදුලිබල ඇමතිවරයා හැටියට ඉන්නේ කියලා. ඒක තමයි ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්නය. අපි පැහැදිලිවම කියන්න ඕනෑ, මේ රටේ අවශ්‍යතාව තමයි මේ සියයට සියයක් ඉටු කරන්නේ කියලා.

අද අපේ විදුලිබල මණ්ඩලය ඉන්නේ Level Iවල. අපි එය ගෙන යන්න හදන්නේ Level IIවලට. හැබැයි, එතැනින් නැවතිලා බැහැ. අපි යන්න ඕනෑ Level IIIවලට. Phone connection එකක් ගන්න ගියාම මේක ඩයලොග් ද, මොබිටෙල් ද, හච් ද කියලා කැමැති එකක් තෝරා ගන්නවා වාගේම, විදුලිය ගන්න ගියාමත් තමන්ට කැමැති දේ තෝරා ගැනීමේ හැකියාව අපි රටේ ජනතාවට ලබා දෙන්න ඕනෑ. මේක Level IIවලට ගෙන යන කොට අපි මුලින්ම power wheeling allow කරනවා. ඒ power wheeling තුළින් වෙනත් ඉඩමක සෝලා පද්ධතිය සවි කර ගෙන, එහෙම නැත්නම් wind farm එක හදාගෙන තවත් කෙනෙකුට විදුලිය විකිණීමේ හැකියාව, එහි ආරම්භය මේ Level II එක ඇතුළේ අපි හදනවා. Level IIIවලට ගියොත් තමයි තරගකාරිත්වය වැඩි වෙන්නේ. ඒකාධිකාරයක් තිබෙනවා නම් විදුලිය නිපදවන්නේ ඩීසල්වලින් ද, coalවලින් ද, සුළංවලින් ද, විදුලිය ඒකකයක් හදන්නේ රුපියල් 160ට ද, රුපියල් 135ට ද, රුපියල් 15ට ද කියලා ප්‍රශ්නයක් නැහැ. මොකද, නිලධාරීන්ට තමන්ගේ පඩිය ලැබෙනවා, වාහනය ලැබෙනවා, පහසුකම් ලැබෙනවා, bonus එක ලැබෙනවා. එහෙම නම්, ඒකාධිකාරයක් තිබෙන කොට ඒ කිසි කෙනෙකුට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, රට තුළ තරගකාරිත්වය ඇති වුණොත් එහෙම කරන්න බැහැ. විදුලිබල මණ්ඩලය තමන්ගේ විදුලිය unit එකක් රුපියල් 38ට විකුණනවා නම්, තවත් සමාගමක් ඇවිල්ලා unit එකක් රුපියල් 18ට විකුණනවා නම් විදුලිය ලබා ගන්න කෙනා යන්නේ ඒ ආයතනයට. ඒක තමයි වෙන්න ඕනෑ. එතකොට දන්නේම නැතිව ඒ ආයතන ටිකත් රුපියල් 75,000ක් නැතුව හෝ ගෙදරට solar power ලබා දෙන තැනට පත් කර ගන්න පුළුවන් වෙනවා. ඒ තැනට තමයි අපි මේ රට අරගෙන යන්නේ.

පසුගිය කාලයේ වාගේම මීට පෙර කථා කරපු මන්ත්‍රීවරුන් විශාල පිරිසක් අහපු ප්‍රශ්නයක් තමයි 2016 විදුලි ඒකකයක් රුපියල් 15ට, 16ට ගත්තා නම් ඇයි දැන් ගන්න බැරි කියන එක. එහෙම බැරි වෙන්න හේතුව ඔබතුමන්ලායි. ඔබතුමන්ලා තමයි එදා උමා ඔය ව්‍යාපෘතිය නැවැත්වූයේ. උමා ඔය බලාගාරය හැදුවා නම්, ඒ වෙලාවේ ඩොලරයට ගෙවපු රුපියල් ප්‍රමාණයත් එක්ක unit එකක් රුපියල් 5ට දෙන්න තිබුණා. එය තමයි රුපියල් 125ට ගන්න අපට සිදු වුණේ. එදා උමා ඔය ව්‍යාපෘතිය නැවැත්වූයේ නැත්නම්, සාම්පූර් බලාගාර ව්‍යාපෘතිය නැවැත්වූයේ නැත්නම් අද විදුලිය ඒකකයක මිල රුපියල් 38ක් නොවෙයි; රුපියල් 20යි. රුපියල් 20ට දෙන්න පුළුවන් විදුලිය ඒකකය රුපියල් 38ට වැඩි වුණේ එදා ඇතැම් පිරිස් උද්ඝෝෂණය කළ නිසා. නිවාස ආදිය ගිලා බසිනවා කියලා උමා ඔය ව්‍යාපෘතිය නැවැත්වූවා. සාම්පූර් ව්‍යාපෘතියත් නැවැත්වූවා. Solar power බලාගාරයක් හදන්න අපි ගියාම විපක්ෂයේ මන්ත්‍රීවරු විවිධ කණ්ඩායම් එක්ක එතැනට යනවා. Offshore wind powerවලට අද potential එකක් තිබෙනවා. වැව් මත පාවෙන සූර්ය බලාගාරයක් හදන්න නොවෙයි, ඒකේ feasibility study එක කරන්න ගියත් විපක්ෂයේ මන්ත්‍රීවරු කණ්ඩායම් අරගෙන එතැනට යනවා. එහෙම තමයි මේ රට ආපස්සට ගෙනිච්චේ. මේ රට ආපස්සට ගෙන යන්න වෘත්තීය සමිති විශාල කාර්යභාරයක් කළා; විපක්ෂය විශාල කාර්ය භාරයක් කළා.

කවදාවත් කිසිම ආණ්ඩුවක් අඩුම මිලට විදුලිය දෙන ප්‍රතිපත්තිය වෙනස් කළේ නැහැ. හැබැයි, යහපාලන ආණ්ඩුව කාලයේ ජනතා විමුක්ති පෙරමුණත් එක්ක එකතු වෙලා ඒ ප්‍රතිපත්තිය විනාශ කර දැම්මා. ඒවායේ ප්‍රතිඵල තමයි අද ජනතාවට විඳින්න සිදු වෙලා තිබෙන්නේ.

අද අපට ආයෝජන අවශ්‍යයි. අද මේ කලාපයේ වැඩිම offshore wind potential එක තිබෙන්නේ ලංකාවේ. එය ගිගාවොට් 44ක්. ලංකාවේ විදුලිබල අවශ්‍යතාව සම්පූර්ණයෙන් renewable energyවලින් ගත්තත් අපට අවශ්‍ය වන්නේ ගිගාවොට් 4යි; එනම් මෙගාවොට් 4,000යි. හැබැයි, අපේ potential එක තිබෙනවා, ගිගාවොට් 44ක්. ඒවා අපනයනය කරන්න ඕනෑ. මෙගාවොට් 14ක් වාගේ තමයි දැනට offshore wind turbinesවලින් හදන්නේ. ගිගාවොට් එකක් හදන්න ආසන්න වශයෙන් ඩොලර් බිලියනයක් වැය වෙනවා. ඩොලර් බිලියන 40කවත් ආයෝජන ආවොත් තමයි එය green hydrogen බවට පරිවර්තනය කරලා අපනයනය කරන්න අපට පුළුවන් වෙන්නේ. ලෝකය 2030 වන කොට offshore wind powerවලට යනකොට ඒ තැනට යන්න අවශ්‍ය පසුබිම තමයි අපි ලංකාව තුළ ක්‍රියාත්මක කරන්නේ.

මම වැඩිපුර වෙලාව ගන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපේ ගරු කංචන විජේසේකර ඇමතිතුමා, ගරු රාජ්‍ය ඇමතිතුමා ඇතුළු කණ්ඩායම විදුලි බිල අඩු කරන්න, ආයෝජනවලට දොර අරින්න ගන්නා මේ උත්සාහයට අපි ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Dayasiri Jayasekara. You have 10 minutes.

[අ.භා. 1.43]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉතා වැදගත් පනත් කෙටුම්පතක් ගැනයි අප මේ විවාද කරන්නේ. අවුරුදු දෙකක්, තුනක් තිස්සේ ඉදන් සාකච්ඡා කරලා ගෙනාපු පනත් කෙටුම්පතක් කියලා තමයි අපේ විදුලිබල සහ බලශක්ති ඇමතිතුමා මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ප්‍රකාශ කළේ. හැබැයි, මුල ඉඳලාම අපට තිබුණු ප්‍රශ්නය තමයි, stakeholdersලා එක්ක, විශේෂයෙන්ම මේකට අදාළ වන පිරිස් එක්ක මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළා මදි නේද කියන එක. අපි ඒ ගැන දිගින් දිගටම කරුණු මතු කළා. හැබැයි, ඒ අය ඔක්කෝම එක්ක සාකච්ඡා කරලායි තිබෙන්නේ කියන මතයේ තමයි ගරු ඇමතිතුමා හිටියේ. ඒ නිසාම තමයි මම මේ කාරණය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළේ. මොකද, මේ පනත් කෙටුම්පත පළමුවැනි දවසේ ඉදිරිපත් කළාම, ඒකේ සිංහල වචන ගැන අපට ප්‍රශ්න ගණනාවක් තිබුණා. මම කිව්වා, ඒක හදපු අය ගෙන්වන්න, ඒ ගැන සාකච්ඡා කළේ කොහේද කියන එක අපට කියන්න කියලා. හැබැයි ඒ වරප්‍රසාද ප්‍රශ්නය, ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේත් නැහැ. ඒකට අද වනකල් වෙච්ච දෙයකුත් නැහැ. මම දන්නේ නැහැ, ඒකට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. එහෙම කැඳෙව්වා නම් අපට CCTV කැමරා පරීක්ෂා කරලා හෝ බලාගන්න තිබුණා, කොච්චර රැස්වීම් සංඛ්‍යාවක් තිබුණා ද, එහෙම දෙයක් වුණා ද කියලා.

මම තවත් විශේෂ කාරණයක් කියන්න කැමැතියි. විදුලිබල ක්ෂේත්‍රයේ මේ කියන ප්‍රතිව්‍යුහගතකරණයට අදාළ මූලිකම කාරණා විධියට දැක්කේ, ආයතන ස්වාධීන කිරීම, ආයතන නිර්දේශපාලනීකරණය, ආයතන ක්‍රියාවලියේ විනිවිදභාවය වැඩි කිරීම, සේවා නියාමනය පහසු කිරීම ආදියයි. හැබැයි, මේ පනත් කෙටුම්පතෙහි සමස්තය ගෙන බැලුවාම බොහොම පැහැදිලිව තේරෙනවා, ආයතන නිර්දේශපාලනීකරණය වෙනුවට සියලු ආයතන සම්පූර්ණයෙන් දේශපාලනීකරණයට ලක් වන තත්ත්වයක් තිබෙන බව.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ඊළඟට, මේ හදන ආයතන තුළ කරන පත් කිරීම් සියල්ලම කරන්නේ අමාත්‍යවරයා. හැබැයි කියන්නේ, රටේ තිබෙන සාමාන්‍ය තත්ත්වය තමයි තිබෙන්නේ කියලා. ඊට වඩා ස්වාධීන වෙච්ච ආයතන ඕනෑ තරම් ලංකාව තුළ තිබෙනවා. අද වෙනකොට, මේ Boards 12ම පත් කරන්නේ ඇමතිවරයා; අධ්‍යක්ෂක මණ්ඩල පත් කරන්නේ ඇමතිවරයා. කංචන විජේසේකර ඇමතිතුමා ගැන නොවෙයි මම මේ කියන්නේ. කවුරු හරි ඊළඟට එන ඇමතිවරයෙක් ඒ විනාශය කරන්න පුළුවන් ඉඩකඩ තිබෙනවා. ඔබතුමා දන්නවා නේ, මෙච්චර කාලයක් හිටපු ඇමතිවරු කරපු දේවල්. මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, 6,000ක් විතර බඳවා ගන්න තිබියදී බඳවා නොගෙන පාඩුවේ මේ අමාත්‍යාංශය අල්ලා ගෙන ඉන්න එක ගැන. වෙන කෙනෙක් නම් මේ පනත් කෙටුම්පත ගේන්න කලින් ඒවා පුරවලා තමයි මේ කටයුත්ත කරන්නේ. නමුත් මම කියන්නේ, consultations කරන්නේ නැතිකමේ ප්‍රශ්නය ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට ඊයේ සිද්ධ වුණා, නිලධාරීන් එක්ක පැය 4ක්, 5ක් විතර මේ ගැන කථා කරන්න. මේ සම්බන්ධයෙන් සමහර ආයතන, සමහර පුද්ගලයන්, සමහර වෘත්තීය සමිති අපෙන් ඉල්ලීම් කළා. ඒ අයට වෙලාවක් දෙන්න කමිටුව විධියට අපට හැකියාව ලැබුණේ නැහැ. මම මේ කියන්නේ ඒකයි. Sectoral Oversight Committees මේ පාර්ලිමේන්තුවේ හදන්නේ මොකටද? පනත් කෙටුම්පතක් කැබිනට් මණ්ඩලය තුළින් සම්මත වූ වහාම ඒ ගැන කථා කරන්න තමයි මේ කමිටු හදලා තිබෙන්නේ. උසාවියේ තිබෙනවා, උසාවියේ තිබෙන හින්දා මේක කරන්න බැහැ කියලා නොවෙයි කියන්න ඕනෑ. යම් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර කිසියම් විධියකට කැබිනට් මණ්ඩලයෙන් සම්මත වුණා නම්, එදා ඉඳලා ඒ ගැන සාකච්ඡා කරන්න තමයි මේ Sectoral Oversight Committees හදලා තිබෙන්නේ. විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට, Sectoral Oversight Committee එකට මම දිගින් දිගටම ලිව්වා, කරුණාකරලා මේ පනත් කෙටුම්පත ගේන්න, අපට කථා කරන්න ඕනෑ කියලා. හැබැයි සභාපතිතුමාගේ බියවීමක් ද, නැත්නම් මොකක් හරි හේතුවක් මතද කියලා මම දන්නෙ නැහැ, එය සිදු වුණේ නැහැ. මම එතුමාට චෝදනා කරන්නේ නැහැ. නමුත් අවසානයේ සිද්ධ වුණේ, එක දවසින්, පැය තුන හතරකින් අපට මේ ගැන කථා කරන්න සිද්ධ වීමයි. මේක හරි අසාධාරණයි. මෙතරම් වැදගත් පනත් කෙටුම්පතක් ගැන අපට මීට පෙර කථා කරන්න අවස්ථාවක් හම්බ වුණේ නැහැ. ඒකේ ප්‍රතිඵලය මොකක්ද? තමුන්නාන්සේලා දන්නවා නේ, Online Safety Bill එක ගැන. ඒ Bill එක හැදුවේ, Sectoral Oversight Committee එකේ ලේකම්තුමා. අවසානයේ මොකද වුණේ? මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් මතු වුණා, ශ්‍රේෂ්ඨාධිකරණයේ ගෙනාපු සංශෝධනවලට වඩා වෙනත් ඒවා ඒක ඇතුළට දාලා කියලා. හැබැයි, මොකක්ද සිද්ධ වුණේ, මේ කැපිල්ලේ අවසානයේ? මෙතැන පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියත් ඉන්න නිසායි මම මේක කියන්නේ. අන්තිමටම සිද්ධ වුණේ මොකක්ද? අර නිලධාරියා ඉවත් කළා. Online Safety Bill එකේ තිබිච්ච වරද අවසාන වශයෙන් පැටෙව්වේ, Sectoral Oversight Committee එකේ හිටපු ඒ නිලධාරියාට. ඒ නිලධාරියාට කරන්න දෙයක් නැහැ. මොකද, අවසාන මොහොතේ නේ ගේන්නේ. මෙතැනත් තිබෙන්නේ, රෑ එළිවෙනකල් හදපු එකක්. මම මහ ලේකම්තුමියගෙන් උදේ කථා කරලා මේ ගැන ඇහුවා. මේක වැරදියි. මම ඇමතිතුමාටත් කථා කරලා කිව්වා.

ගරු ඇමතිතුමනි, මේක කමිටුවේදී අපිම කථා කරලා අපිම හදපු එක. මේකේ තිබෙනවා, අමාත්‍යවරයාගේ concurrence කියන එක. මෙහි ඉංග්‍රීසි පිටපතේ existing Clauses වල තිබෙන්නේ, "...with the concurrence of the Minister...." කියලා. Proposed Amendment එකේ තිබෙන්නේ, "with the consent of the Minister", කියලා. ඒක සම්පූර්ණයෙන් වැරදියි. "Consent" කිව්වාම, තව එහාට ගිහිල්ලා තිබෙනවා. "Concurrence" කියන්නේ, ඊට බොහොම පල්ලෙහා එකක්. සුරේන් රාඝවන් මැතිතුමාට තේරෙනවා නේ, concurrence and consent. සම්පූර්ණයෙන්ම වැරදියි. ඒ කියන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ ඒවාට වඩා වෙනත් ඒවායි දාලා තිබෙන්නේ. ඒත් ඇමතිතුමා කිව්වා, "ශ්‍රේෂ්ඨාධිකරණයට දාලායි තිබෙන්නේ. වෙන මොකක්වත් දාන්න එපා" කියලා. අපි කිව්වා, "informed" කියලා දාමු කියලා. අඩුම තරමේ Ministerට courtesy එකක්වත් තිබෙනවා නේ, මේක යවන්න. දැන් මොකක්ද කරලා තිබෙන්නේ? අද ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතේ මොකක්ද තිබෙන්නේ? English version එකේ තිබෙන්නේ, "with the concurrence of the Minister"; proposed Amendment එකේ තිබෙන්නේ, "with the consent of the Minister" කියලා. ඇමතිතුමාගෙන් ඇහුවාම කියනවා, "මම නම් ඕක දාන්නේ නැහැ" කියලා. එතකොට කමිටුව ගත්ත තීන්දුවට මොකද වෙන්නේ? මෙහි සිංහල අනුවාදය ඊටත් හපන්. "අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව" කියලා දාලා, ඊළඟට "අමාත්‍යවරයාගේ අනුදැනුම ඇතිව" කියලාත් දාලා තිබෙනවා, සිංහලෙන්. සම්පූර්ණයෙන් වැරදියි නේ. *[බාධා කිරීමක්]* ඒක තමයි. සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? මේ ආණ්ඩුව පනත් කෙටුම්පත් ඉදිරිපත් කරනවා. IMF එක කිව්වාම හෙට උදේ මේක සම්මත කර දීපල්ලා කියලා, ඒක උස්සගෙන පාර්ලිමේන්තුවට එනවා. ඊට පස්සේ අපට කථා කරන්නත් ඉඩක් නැහැ, මිනිස්සුන්ට ඒ ගැන හොයන්න විධියකුත් නැහැ.

ඊළඟට තිබෙනවා, "... පිණිස ක්‍රියා කරනු ලැබිය යුතු ය" කියලා.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon.(Dr.) Suren Raghavan - State Minister of Higher Education)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. (Dr.) Suren Raghavan?

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
Hon. Member, I am not a lawyer, but as I understand, with regard to every Act, its Sinhala version is what finally stands.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Dayasiri Jayasekara, please continue.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, the Sinhala version is not clear. That is the problem.

අනෙක් එකත් අහගන්න. 3වන වගන්තියේ 3 (අ) උප වගන්තියට අපි ඉදිරිපත් කරපු එක ඉංග්‍රීසි පිටපතේ හරියට තිබෙනවා. Clause 3*(b),* වල, "The Council may..." කියලා තිබුණු එකට අපි යෝජනා කළා, "The Council shall" කියලා. ඒක ඉංග්‍රීසි පිටපතේ දමලා තිබෙනවා. හැබැයි, සිංහල පිටපතේ මොකද වෙලා තිබෙන්නේ? සිංහල පිටපතේ, "... සුභසිද්ධිය පිණිස ක්‍රියා කරනු ලැබිය යුතු ය" කියලා පටලවලා දමලා තිබෙනවා. තිබුණේ, "පිණිස ක්‍රියා කරනු ලැබිය හැකි ය" කියලා. "ලැබිය යුතු ය" කියන එක දමලා අනෙක් එක මේ පැත්තට දමලා තිබෙනවා. අද මේවා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඇයි? ඔබතුමන්ලා හදිසියේ පනත් කෙටුම්පත් ගෙනෙන නිසායි. මේවා ගැන කථා කරන්න මිනිස්සුන්ට ඉඩක් නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මේවා ගැන කථා කරන්න ඉඩක් නැහැ. මෙතැනට ඇවිල්ලා මේවාට විරුද්ධව කෑ ගහන එක තමයි අවසානයේ අපට තීන්දු වෙලා තිබෙන්නේ. අපි මුල ඉඳලාම කිව්වා, මේ පනත් කෙටුම්පත ගැන අපට ප්‍රශ්නයක් නැහැ, හැබැයි මේ ක්‍රමය ගැන විශාල ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මේකේ 24,000ක් පමණ සේවකයෝ ඉන්නවා. ඒ අය අනාගතයේ සිද්ධ වෙන්නේ මොකක්ද, ක්‍රියාත්මක වෙන්නේ මොකක්ද කියන එක ගැන දැන ගන්න ඕනෑ. ඒ නිසා තමයි ඒ මිනිස්සු පාරට බැහැලා ඉන්නේ. ඒ නිසා තමයි ඒ අය කථා කරන්නේ. හැබැයි, කථා කරනකොට ඒ අය වැරදිකරුවෝ බවට පත් වෙනවා. මම මේ කියන්නේ, අන්තවාදී ලෙස කථා කරන අය ගැන නොවෙයි.

අනෙක් කාරණය මෙයයි. අපි දිගින් දිගටම මතු කරපු කාරණයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා දමපු එකේ වැරැද්දක් තිබෙනවා. මෙතැන "such Order" කියලා, ඊට පස්සේ කොමාවක් තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරපු එකේ ඒක නැහැ. මේවා පවා ප්‍රශ්න තමයි. එතැන නීතිඥයින්ට කියන්න මෙක හදන්න කියලා. මොකද, ඒකෙත් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

අද LTL එක සම්බන්ධව විශාල අර්බුදයක් මතු වෙලා තිබෙනවා. ඔබතුමා කිව්වා, අපි මෙක මෙහෙමයි කළේ, මෙහෙමයි කළේ කියලා. මම 2004 ඉඳලා මේ පාර්ලිමේන්තුවේ COPE එකේ අවුරුදු ගණනක් ඉන්නවා. ඒ කාලයේ අපි - COPE එකෙන් - කිව්වා, ලංකා විදුලිබල මණ්ඩලය හැමතැනම පැටව් -කොම්පැනි - ගහලා තිබෙනවා කියලා. LTL Transformers (Pvt.) Limited, LTL Projects (Pvt.) Limited වාගේ අරවා මේවා කියලා කොම්පැනි තොගයක් තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලයෙන් එළියට එන අය තමයි ඒවායේ සභාපති, එහෙම නැත්නම් CEO වෙන්නේ. ඒවා විදුලිබල මණ්ඩලයෙන් හදාගෙන තිබෙන කොම්පැනි. ඒ, තමන්ගේ වැඩ කර ගන්න. මේ LTL එකේ, විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයාත් ඉන්නවා, සාමාන්‍යාධිකාරිවරයාත් ඉන්නවා. විදුලිබල මණ්ඩලයට අයත් සියයට 63ක් වන කොටස්වලින් සියයට 28ක් දෙනවා LTL එකට. එතකොට විදුලිබල මණ්ඩලය share එක අතහරිනවා. ඒ share එක අතහරින එකට විදුලිබල මණ්ඩලය කියන්නේ, අපි LTL එකට, එහෙම නැත්නම් කෙරවලපිටියට බිලියන 52ක් ණයයි, ඒකට හිලව් වෙන්න තමයි මේක කරන්නේ කියලා. හැබැයි, අනෙක් පැත්තෙන් LTL එක, විදුලිබල මණ්ඩලයට බිලියන 14ක් දෙන්න තිබෙනවා. අද වෙනකොට ඒක වැඩිවෙලා බිලියන 20ක් විතර වෙලා තිබෙනවා. බිලියන 52කට තමුන්නාන්සේලා LTL එකට සියයට 28ක කොටස් විකුණුවා නම් අනෙක් ටික හිලව් කර ගත්තේ නැත්තේ ඇයි? දැන් ඇමතිතුමා කියනවා නේ, මේක නිවැරදියි, ක්‍රියාත්මක කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නමුත් මෙන්න තිබෙන විධිය, කැබිනට් පත්‍රිකාවේ: "Through a transparent mechanism and in compliance with the legal provision and with due approvals...". මේක තමයි ඔබතුමා දමපු කැබිනට් පත්‍රිකාවේ තිබෙන්නේ. කරුණාකරලා, ඔබතුමා ඒ කැබිනට් පත්‍රිකාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. ඒ අනුව ක්‍රියා කරලා තිබෙනවාද කියලා මට කියන්න. මේ concurrence එක AGගෙන් අරගෙන තිබෙනවාද කියලා මට කියන්න. මේ approvals ටික අරගෙන තිබෙනවා ද කියලා මට කියන්න. මේකේ share එකක ගණන නිවැරදිව හදලා තිබෙනවාද කියලා මට කියන්න. එහෙම සිද්ධ වෙලා නැහැ. ඒ නිසායි මම ඊයේ මේ ගැන කිව්වේ. මේක - LTL එකට කොටස් විකිණීම සම්බන්ධව, කොටස් දීම සම්බන්ධව - වෙනමම කථා කරන්න ඕනෑ කාරණයක්. There is no transparency at all in this whole deal. මේ පනත ගෙනෙන්න කලින් මේ ටික ඉවර කරනවා.

මේ ටික ඉවර කරලා, අර තිබුණු shares ටික අත හරිනවා. විදුලිබල මණ්ඩලයේ සභාපති හා සාමාන්‍යාධිකාරි - GM - කියන දෙදෙනාම ඉන්නවා LTL Board එකේ. විදුලිබල මණ්ඩලයට අයිති shares ටික කැත නැතුව දෙනවා පෞද්ගලික සමාගමකට. දීලා තමන්ගේ ආයතනය නැති කර ගන්නවා. පුදුම මිනිස්සු නේ. මෙහෙම කරනවාද? තමන්ගේ වළ කපා ගන්නවා වාගේ වැඩක් නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you were given more time. Please wind up now.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, කථා කළ යුතු කරුණු තව ගණනාවක් තිබෙනවා. එම නිසා මෙම පනත් කෙටුම්පත ගැන කථා කරන්න අපට තව දවසක් දෙන්න. කළ යුතු සංශෝධන ගණනාවක් අපි ඔබතුමාට ඉදිරිපත් කරලා තිබෙනවා. නිවැරදිව මේ කාර්යය කරන්න ඕනෑ. අපි මේක කඩාකප්පල් කරන්න හදනවා නොවෙයි. අපි සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. අවංකව මේ කටයුත්ත කරන්න නම් ඒවාට ඔබතුමාගේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I am taking my time to respond to this.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු LTL කාරණය සම්බන්ධව මම දෙවතාවක් උත්තර දුන්නා. ඔබතුමා අහගෙන නොසිටින්න ඇති. උදේ වරුවේත් ප්‍රශ්න දෙකක් ඇහුවා. ඔබතුමා හිතාගෙන ඉන්නේ West Coast Power Company එක පෞද්ගලික එකක් කියලා. West Coast Power Company එකේ shareholdersලා කවුද? West Coast Power Company එකේ සියයට 41ක කොටස් අයිතිය තිබෙනවා Treasury එකට. EPF එකට සියයට 27ක් තිබෙනවා. LECO එකට සියයට 18ක් තිබෙනවා. පෞද්ගලික සමාගමක් වන ලක්දනවි සමාගමට තිබෙන්නේ සියයට 13යි. එතකොට මෙහි සියයට 87ක අයිතිය තිබෙන්නේ ආණ්ඩුවට. LTL එකේ කොටස් අයිතිය තිබෙන්නේ කාටද? LTL එකත් ආණ්ඩුවට අයිති සමාගමක්. CEB එකට තිබෙනවා, සියයට 35ක කොටස්. West Coast Power Company එකට තමයි සියයට 28ක් තිබෙන්නේ. West Coast Power Company එක කියන්නේ පෞද්ගලික සමාගමක් නොවෙයි. ඔබතුමා හිතන විධියට යාළු මිත්‍රාදීන්ට දීලා නැහැ. ඒකට මුදල් අමාත්‍යාංශය අනුමැතිය අරගෙන තිබෙනවා. ඔබතුමා බලන්න, නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය අරගෙන තිබෙනවා. ඔබතුමාට ඕනෑ නම් නීතිය ඉදිරියට ගිහින් අභියෝග කරන්න. නියමිත ක්‍රමවේදය අනුගමනය කරලා නැත්නම් අභියෝග කරන්න. මෙතැන නිකම් බොරුවට කියව කියවා ඉන්න එපා. මෙම පනත් කෙටුම්පතට ඔබතුමා විරුද්ධයි කියලා අපි දන්නවා. පනත් කෙටුම්පත ගැන කථා කරන්න දෙයක් නැතිව, ඇහෙන දේ කියන්න එපා. අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවට ඇවිල්ලාත් කළේ එක එක්කෙනාට copy and paste කරන එක තමයි. විපක්ෂ නායකතුමා හා ඔබතුමා අතර කිසි වෙනසක් නැහැ. කවුරු හෝ ලියලා දීපු දෙයක් අරගෙන ඇවිල්ලා ගිරවෙක් වාගේ කියවන එක කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක ගැන කථා කරන්න ප්‍රමාණවත් කාලයක් ලැබුණේ නැහැ කියලා ගරු මන්ත්‍රීතුමා තවත් දවසක් ඉල්ලනවා. අවුරුදු දෙකක් තිස්සේ මේ පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කළා නේ. ඔබතුමන්ලා කිසිම සාකච්ඡාවකට එන්නේ නැතිව දැන් ඇවිල්ලා තව දවසක් ඉල්ලනවා. සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා නම් අපි ඒවා පිළිබඳව අවධානය යොමු කරනවා. කිසිම යෝජනාවක් ඉදිරිපත් කරන්නේ නැතුව අවසාන මොහොතේ ඇවිල්ලා කියනවා, තව දවසක් දෙන්න ලු.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, thank you for the clarification.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Dayasiri Jayasekara.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, මතක තබා ගන්න. තමුන්නාන්සේ අවුරුදු දෙකක් අමාත්‍යාංශය භාරව හිටියාට මිනිස්සුත් එක්ක කථා කළේ නැහැ. තමුන්නාන්සේ කළේ පුස් පාට දම දමා ඉන්න එක. අපිත් එක්ක කථා කළේ නැහැ. තමුන්නාන්සේ කියපු පළමු රැස්වීමට අපි ආවා. ඊට කලින් අපට කථා කරලා තිබුණෙ නැහැ. ඒ රැස්වීමට ආවමත් අපට කථා කරන්න හම්බ වුණේ නැහැ. තමුන්නාන්සේ අපට එන්න කියලා presentation එකක් කළා. තමුන්නාන්සේ ඒකයි කළේ. මතක තබා ගන්න, අපි මෙම පනත් කෙටුම්පතට විරුද්ධව කථා කරනවා නොවෙයි. මේවා කෙරෙන්න ඕනෑ වැඩ. හැබැයි, කරන්න ඕනෑ විධියක් තිබෙනවා. මිනිස්සුත් එක්ක සාකච්ඡා කරන්න ඕනෑ. සාකච්ඡා කරලායි කරන්න ඕනෑ. තමුන්නාන්සේ අවුරුදු දෙකක් තිස්සේ මේක හමස් පෙට්ටියේ තියාගෙන ඉඳලා දැන් ගෙනැල්ලා ඉදිරිපත් කළාම අපි කොහොමද ඒ ගැන කථා කරන්නේ? එහෙම ප්‍රශ්නයක් තිබෙනවා. නැතුව වෙන ප්‍රශ්නයක් නොවෙයි.

අනෙක් එක තමයි විදුලිබල මණ්ඩලයේ shares ටික දෙන එක. ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි. අපි කියන්නේ, විදුලිබල මණ්ඩලයේ තිබෙන shares ටික LTL එකට දෙන එක ගැනයි. අපට තිබෙන ප්‍රශ්නය ඒකයි. කරන්න තිබුණේ මොකක්ද? ඒ sharesවලට හොඳ මිලක් ගන්න තිබුණා. ඒ මිල අරගෙන නැහැ. මට කියන්න, මිල කීයද කියලා. හොඳ මිලක් නියම කරලා නැහැ. නිකම් දීලා දමපු එකයි කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Gamini Lokuge. You have 11 minutes.

[අ.භා. 1.59]

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දිනයේදී අපි විදුලි පාරිභෝගිකයන් වෙනුවෙන් වැදගත් පනත් කෙටුම්පතක් සම්මත කරනවා. විදුලිබල ප්‍රශ්නය ඇති වුණේ ඇයිද කියන එකයි අපි පළමුව කල්පනා කරන්න ඕනෑ. මේ ප්‍රශ්නය කවදාවත් ඇති වන්නේ නැහැ, පසුගිය රජය ස්ථිර ජනන සැලැස්මක් සකස් කර තිබුණා නම්. නොරොච්චෝලේ බලාගාරය ඉදි කළායින් පසුව ජනන සැලැස්මක් අනුව විදුලිය නිෂ්පාදනයක් හෝ බලාගාරයක් ඉදි වුණේ නැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ ගල් අඟුරු බලාගාරය ඇති කරපු නිසා තමයි අදටත් විදුලිබල මණ්ඩලයට කටයුතු පවත්වාගෙන යන්න පුළුවන් වෙලා තිබෙන්නේ. එම බලාගාරයෙන් මෙගාවොට් 300ක් ජාතික පද්ධතියට එකතු වනවා. ඒ ජනන සැලැස්මේ තව අදියරක් තිබුණා. ඒ අදියර ක්‍රියාත්මක කළේත් නැහැ. සාම්පූර් බලාගාරය ඉදිකරන්න තිබුණා. ඒක කළෙත් නැහැ. අවසානයේ, 2018 වනකොට ලංකාවේ විදුලි හිඟයක් ඇති වුණා. විදුලි හිඟය ඇති වනකොට පෞද්ගලික අංශයෙන් වැඩි මිලට විදුලිය මිලදී ගැනීම තමයි කරන්න සිදු වුණේ. ඒක දිගටම කරගෙන ආවා. අදටත් කෙරෙනවා.

ඊළඟට, උමා ඔය ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය. එය මීට අවුරුදු 9කට ඉස්සෙල්ලා ආරම්භ කරලා, කටයුතු අවසන් කරන්න තිබුණා. ඒක ඉරාන රජය හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට තිබුණු ගෞරවයට කරන සැලකිල්ලක් වශයෙන් ලබා දුන් ව්‍යාපෘතියක්.

එම ව්‍යාපෘතිය යටතේ විදුලිය නිෂ්පාදනය කිරීම මීට අවුරුදු නවයකට කලින් කරන්න තිබුණේ. නමුත් මේ රටේ දේශපාලන පක්ෂ කිහිපයක් එකතු වෙලා බණ්ඩාරවෙල නගරය යට වෙනවා කියලා විවිධ අභූත චෝදනා කරලා ඒක ඇදගෙන ගියා. මේ අවුරුද්දේ එම ව්‍යාපෘතිය ආරම්භ කරලා මෙගාවොට් 132ක් පද්ධතියට ලබා ගැනීමට කටයුතු කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. ඒ කාලයේ එම කටයුතු අඩාළ වීම නිසා මේ රටේ විදුලි පාරිභෝගිකයින් තමයි දුක් වින්දේ. අපට මෙතැන ඕනෑ තරම් තර්ක කරන්න පුළුවන්; ඕනෑ තරම් සාකච්ඡා කරන්න පුළුවන්. නමුත් අවසානයේ පාරිභෝගිකයින් තමයි අමාරුවේ වැටෙන්නේ. ඔවුන්ට තමයි වැඩි මිලට විදුලිය ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේ පනත් කෙටුම්පත සම්මත වීමත් එක්ක විදුලිය නිෂ්පාදනය කිරීම අලුත් වැඩ පිළිවෙළකට ගියාම, ගරු ඇමතිතුමා කිව්වා වාගේ තරගකාරී මිලකට විදුලිය ලබා ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. එතකොට, විදුලි පාරිභෝගිකයින් වන ජනතාවට විශාල සේවයක් කරන්න විදුලිබල මණ්ඩලයට හැකි වෙයි.

මේ පනත් කෙටුම්පත අධ්‍යයනය කරනකොට මට පෙණුනු එක කාරණාවක් තිබෙනවා. විදුලිබල මණ්ඩලයේ සිටින සේවකයින් සමාගම් කිහිපයකට සම්බන්ධ වෙනකොට ඒ ගොල්ලන්ගේ ස්වාමිත්වය මාරු වෙනවා. ලංකාවේ කම්කරු නීතිය අනුව ස්වාමිත්වය මාරු වෙනකොට ඒ ගොල්ලන්ට gratuity ගෙවන්න සිදු වෙනවා. ස්වාමිත්වය මාරු වෙනකොට ඒ සියලු දෙනාට gratuity ගෙවන්න සිදු වෙනවා. ඒක විවිධාකාරයෙන් සිද්ධ වෙලා තිබෙනවා. බනිජ තෙල් නීතිගත සංස්ථාවේ, කොළොන්නාවේ Ceylon Petroleum Storage Terminals Limited එක ඇති වෙනකොට ඒ gratuity එක seize කරලා ඒ ගොල්ලන් විශ්‍රාම යනකොට ලබා දෙන්න වැඩ පිළිවෙළක් ඇති කළා.

ඒ වාගේම විදුලිබල මණ්ඩලයේ තව ප්‍රශ්නයක් තිබෙනවා. විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල පවත්වා ගෙන යන්නේ විදුලිබල මණ්ඩලය යටතේමයි. නමුත් අද නීතියක් තිබෙනවා, අලුතින් පෞද්ගලික අර්ථසාධක අරමුදල් සමාගම් ඇති කරන්න බැහැ කියලා. ඒ නිසා සේවකයින්ගෙන් අය කරන මුදල් Central Bank එකට යවන්න ඕනෑ. ඒ නිසා අද අපේ සේවක අර්ථසාධක අරමුදල ආසියාවේ තිබෙන ශක්තිමත්ම අරමුදල බවට පත් වෙලා තිබෙනවා. මම ඇමතිතුමාට යෝජනා කරනවා, අලුතින් සමාගම් ඇති කළාම මේ පනතේ තිබෙන විධියට සමාගමක් ඇති නොකර සේවකයින්ගේ අර්ථසාධක මුදල් සේවක අර්ථසාධක අරමුදලට යවන්න ලෑස්ති කරලා ඒ අනුව කටයුතු කරන්න කියලා. මොකද, විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල් මහ බැංකුවට යැවීමේ දී යම් යම් වංචා සිද්ධ වෙලා විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. අද විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල් සම්බන්ධව නඩු තිබෙනවා. ඒ නිසා ස්වාමිත්වය මාරු වෙනකොට අර්ථසාධක අරමුදල පිළිබඳව නැවත කල්පනා කරන්න කියා මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අලුත් සමාගම් ඇති වෙනකොට රටේ කම්කරු නීතිය අනුව අර්ථසාධක අරමුදල් සේවක අර්ථසාධක අරමුදලට භාර දෙන්න කියා මම ඉල්ලා සිටිනවා. එතකොට ඒ මුදලට ස්ථිරත්වයක් හා වගකීමක් ඇති වෙනවා. මොකද, ඒක පාලනය වෙන්නේ Central Bank එක යටතේයි. ලංකාවේ සියලුම අර්ථසාධක අරමුදල් පාලනය වන්නේ සේවක අර්ථසාධක අරමුදල හරහායි.

ලංකා ගමනාගමන මණ්ඩලයේත් එහෙම ප්‍රශ්නයක් තිබුණා. එහි පෞද්ගලික අර්ථසාධක අරමුදලක් තිබුණා. ඒ අර්ථසාධක අරමුදලින් හරියාකාරව ගෙවන්න බැරි වුණා. ඒ එක්කම ලංකා ගමනාගමන මණ්ඩලය විමධ්‍යගත කළා. අලුත් සමාගම් හදලා නැවත ක්‍රියාත්මක වෙනකොට, ඒක සේවක අර්ථසාධක අරමුදලට සම්බන්ධ කරපු නිසා අද ලංගම සේවකයින්ට විශ්‍රාම ලබා ගෙදර යනකොට කිසිම ප්‍රශ්නයක් නැතිව අර්ථසාධක අරමුදල් ලබා ගන්න පුළුවන් වෙලා තිබෙනවා. පෞද්ගලික ආයතන යටතට පත් කළාම විශාල ප්‍රශ්න කිහිපයක් හැම තැනම ඇති වෙලා තිබෙනවා. ඒ තත්ත්වය විදුලිබල මණ්ඩලයේ ඇති වෙයි කියලා මම හිතන්නේ නැහැ. නමුත් ලංකාවේ අර්ථසාධක අරමුදල් තිබෙන්නේ සේවක අර්ථසාධක අරමුදල යටතේයි. ඒ නිසා අලුත් සමාගම් ඇතිවෙනකොට, ස්වාමිත්වය මාරු වෙනකොට ඒ සියල්ලම සේවක අර්ථසාධක අරමුදලට ඇතුළත් කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අලුත් සමාගම් හැදෙනකොට ඒ අලුත් සමාගම්වලට විදුලිබල මණ්ඩලයේ සේවකයන්ට තිබුණු පහසුකම් සියල්ලම ලබා දෙන්න කියා මම ඉල්ලා සිටිනවා. ඒකට හොඳ උදාහරණයක් තමයි ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව කොළොන්නාවේ Ceylon Petroleum Storage Terminals Limited එකේ හදනකොට ඒ ගිවිසුමට ඇතුළත් කරලා තිබුණා, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සිටියදී ලැබුණු සියලුම පහසුකම් කොළොන්නාව Ceylon Petroleum Storage Terminals Limited එකේ අයටත් ලැබෙන්න ඕනෑ කියලා. ඒක ඒ ආකාරයෙන්ම කෙරෙනවා. ඒ වාගේ යම් වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. දැනට විදුලිබල මණ්ඩලයේ සේවකයින් භුක්ති විඳින සියලුම පහසුකම් සමාගම්වලට වෙන් වුණාට පසුවත් ඒ ආකාරයෙන් ලැබෙන්න සලස්වන්න කියා, ඒ ගැන සලකා බලන්න කියා මම ඇමතිතුමාට කියනවා. ඊයේ ආංශික අධීක්ෂණ කාරක සභාව රැස් වූ අවස්ථාවේත් ඔය කාරණාව ඉදිරිපත් කළා.

ඒ හින්දා ඒ ගැන සැලකිලිමත් වෙන්න කියා මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ කටයුත්තේදී අපි බලාපොරොත්තු වෙනවා, මේ රටේ විදුලිබල ක්ෂේත්‍රයේ විශාල දියුණුවක් ඇති වෙලා පාරිභෝගික ජනතාවට විශාල පහසුකම්, සහන ලැබෙයි කියලා. ඒ හින්දා අපි ඒ ගැන ඉතා සතුටු වෙනවා. ඒ වාගේම විදුලි බලය අද අපේ රටේ හැමෝටම අවශ්‍ය වෙලා තිබෙනවා. මේ රටේ නිෂ්පාදන දියුණු කරන්න, කර්මාන්ත දියුණු කරන්න තිබෙන ලොකුම බාධාව තමයි, විදුලි බිල වැඩිවීම. සෑම කර්මාන්තශාලාවකටම, සංචාරක ව්‍යාපාරයේ සෑම හෝටලයකටම අද තිබෙන විශාලම බිල තමයි, විදුලි බිල. ඒ විදුලි බිල අඩු කර ගන්න පුළුවන් වුණා නම්, ඒක මේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රයටත්, පොදු ජනතාවටත් කරන යහපතක් හැටියට අපි දකිනවා. ඇමතිතුමා ඉදිරිපත් කරන මෙම පනත තුළින් ඒ පහසුකම් මේ රටේ ජනතාවටත්, කර්මාන්තවලටත් ලැබෙයි කියා අපි විශ්වාස කරනවා. එහෙම ලැබුණොත් අපේ රටේ ආර්ථිකයට විශාලම ශක්තියක් ලැබෙන ආයතනයක් බවට මේ ආයතනය පත් වෙයි කියා අපි විශ්වාස කරනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න අපේ සම්පූර්ණ සහයෝගය එතුමාට ලබා දෙනවා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The Hon. Wimal Weerawansa. You have seven minutes.

[අ.භා. 2.06]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත සාකච්ඡාවට ගන්න පෙර අපි ඉල්ලා සිටියා, අඩු ගණනේ දෙදිනකවත් විවාදයක් මේ සම්බන්ධයෙන් අවශ්‍යයි කියලා. නමුත් ආණ්ඩු පක්ෂයෙන්වත්, ඒ පක්ෂ නායක රැස්වීම නියෝජනය කරන විපක්ෂයේ උදවියගෙන්වත් ඒ සාධාරණය ඉටු වුණේ නැහැ කියන එක මම මුලින්ම අවධාරණය කරන්න ඕනෑ. ඒ නිසා විනාඩි 7ක් වාගේ සුළු කාලයක් තමයි මන්ත්‍රීවරුන් 13කට වැඩි සංඛ්‍යාවක් ඉන්න කණ්ඩායමක් වෙනුවෙන් කථා කරන්න මට ලැබිලා තිබෙන්නේ.

ඔබතුමාත් දන්නවා, විදුලි බලය කියන්නේ ඉතාම සංවේදී කාරණයක් බව. ඒ වාගේම බලශක්තියේ ප්‍රධානතම සාධකය බව. ලෝකයේ ගොඩක් රටවල් කර්මාන්තමය අතින් ඉදිරියට ගියා නම්, ඒ ගිහිල්ලා තිබෙන්නේ විදුලිබල පිරිවැය අඩුවීම කියන සාධකයත් එක්කයි. විදුලිබල පිරිවැය වැඩි නම් ඒ කිසිම රටකට බැහැ, තමන්ගේ නිෂ්පාදන කොච්චර ගුණාත්මකව ඉහළ මට්ටමක තිබුණත් ලෝක වෙළෙඳ පොළ තුළ තරග කරන්න. ඒකට හේතුව, නිෂ්පාදන පිරිවැය ඒ හේතුව මතම වැඩි වීම. අපේ රට තිබෙන්නේ දකුණු ආසියාවේ වැඩිම විදුලි බිලක් සහිත රටක් කියන විරුදාවලිය ලබපු තත්ත්වයක. ඒ නිසා අපේ කර්මාන්තකරුවා විදේශ නිෂ්පාදන සමඟ විදේශ වෙළෙඳ පොළේ තරග කරනවා කියන්නේ ඉතාම අසීරු සහ අභියෝගාත්මක කාර්යයක්. මේ පිරිවැය වැඩිවීම විසින් ඔවුන්ට මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ ඉතාම දරුණු දුෂ්කර තත්ත්වයකට.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දන්නවා, Sikkim කියන ප්‍රාන්තය ඉන්දියාවේ 22වන ප්‍රාන්තය කර ගත්තාට පසු Lhendup Dorji කියන පාලකයා එම ප්‍රාන්තයේ නායකයා බවට පත් වුණා කියන කාරණය. Lhendup Dorji මුලින්ම මැතිවරණයට තරග කළාම පරාජයට පත් වුණා. ඊට පස්සේ RAW එක මූලික වෙලා විරෝධතා ව්‍යාපාර පටන් ගත්තා, මැතිවරණය දූෂිතයි කියලා. අපේ ඔය ගාලු මුවදොර අරගළය වාගේ එකක් ආවා. ඊට පස්සේ ඒ රජුට සිද්ධ වුණා, නැවත මැතිවරණය පවත්වන්න. මොකද, ඔහු බය වුණා. නැවත මැතිවරණය පැවැත්වූවාම Sikkim ප්‍රාන්තයේ නායකයා ලෙස Lhendup Dorji පත් වුණා. 1973දී පමණ තමයි ඔය මම කියන සිද්ධිය වුණේ. ඊට පස්සේ මොකක්ද කළේ? ඉන්දියාව Lhendup Dorji එක්ක ගිවිසුම් හතඅටක් අත්සන් කළා. එහෙම කරලා එම ප්‍රාන්තය ඉන්දියාව සමඟ විදුලිබල සහ ඛනිජ තෙල් කියන ක්ෂේත්‍රවලින් ඒකාබද්ධ කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් අපටත් කියනවා නේ, connectivity කියලා. ඒ connectivity එක Sikkim ප්‍රාන්තය සමඟ ඇති කළා. අන්තිමට එම ප්‍රාන්තයේ පාර්ලිමේන්තුවේ පක්ෂ, විපක්ෂ ඔක්කෝම එක වෙලාවක තීරණය කරනවා, ඉන්දියාවෙන් අපට තිබෙන පීඩනයෙන් ගැලවෙන්න අපි චීනයත් එක්ක එකතු වෙන්න ඕනෑ කියලා. ඒ අනුව ඒ තීරණය ගන්න අවශ්‍ය යෝජනාව ඔවුන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ වෙලාවේ ඉන්දියාව මොකක්ද කළේ? එතෙක් ඒකාබද්ධව පැවති තෙල් නළයත් අක්‍රිය කළා; විදුලිබල පද්ධතියත් අක්‍රිය කළා. එතකොට Sikkim ප්‍රාන්තයේ ජනතාවට කළුවරේ ඉන්නත් සිද්ධ වුණා, ඉන්ධන නැතුව පෝලිම්වල ඉන්නත් සිද්ධ වුණා. ඒ නිසා මේ බලශක්තිය කියන්නේ දේශපාලන උපකරණයක්.

විශේෂයෙන්ම රටක දේශපාලන ස්ථෛර්ය්‍යත්වය පාගා දමන්න පාවිච්චි කළ හැකි උපකරණයක්. අද වෙලා තිබෙන්නේ මොකක්ද? අර ගිනි ගත් ගෙදරට වතුර ගහන්න වාගේ තමයි දැන් මේවා අරගෙන එන්නේ. සමහරුන්ට පෙනෙන්නේ ආර්ථිකය නැමැති ගිනි ගන්න ගෙදරට වතුර ගහන්න තමයි දැන් කංවන විජේසේකර ඇමතිතුමා මේ පනත් සංශෝධනය අරගෙන එන්නේ කියලා. හැබැයි මේ කරන්නේ වතුර ගහන එක නොවෙයි, ඒ අස්සේ ගේ මංකොල්ල කන එක. වතුර බාල්දියකුත් ගෙනෙනවා. ඒක ගෙනෙන ගමන් ගෙදර තිබෙන ඉතුරු දේවත් තට්ටු කරනවා. දැන් තමුන්නාන්සේලා කියනවා, මේ පනත් කෙටුම්පතේ ඉංග්‍රීසි පරිවර්තනයේ තිබෙන ආකාරයට, 33kVට වැඩි ඒවා තමයි ජාතික විදුලිබල පද්ධතියට අයිති වෙන්නේ කියලා. එතකොට 33kVට වඩා අඩු ඒවා කොහේටද අයිති වෙන්නේ? අදානි අපට රුපියල් 13ට විකුණන විදුලි ඒකකය ඉන්දියාවේ දෙන්නේ රුපියල් 3ට. 33kVට වඩා අඩු විදුලි බලය කොහේටද දෙන්නේ? එය ජාතික විදුලිබල පද්ධතියට එනවාද, නැද්ද? මෙම පනත් කෙටුම්පතේ ඉංග්‍රීසි පරිවර්තනයේ තිබෙන්නේ එකක්, සිංහල පරිවර්තනයේ තිබෙන්නේ තව එකක්. මම දන්නේ නැහැ, මොකක්ද මේ වෙලා තිබෙන වෙනස කියලා. ඒ කියන්නේ National Grid එකට අයිති නොවන විධියට වෝල්ට් 33,000ක් දාලා තිබෙන්නේ ඇයි? එහෙම දැමීමෙන් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? ඒ කියන්නේ වෝල්ට් 33,000ට අඩු නම්, National Grid එක සම්බන්ධ පාලනයෙන් තොරව ප්‍රාදේශීය වශයෙන් විදුලිබල පද්ධතිය පවත්වාගෙන යන්න පුළුවන්. ඒක දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක ගළපා ගන්න හදපු ක්‍රමයක්ද?

දැන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා පිළිබඳවත් සාකච්ඡා වෙනවා. අපට දැනට ලැබිලා තිබෙන වාර්තා අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම අහෝසි වෙලා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඕනෑ කරන විධියට පළාත් විශ්වවිද්‍යාල ආකාරයට විශ්වවිද්‍යාල ක්‍රියාත්මක කරන්න යනවා. ජාතික විදුලිබල පද්ධතිය 33,000Vවලට අඩු කරන්නත්, ඊට වඩා අඩු ඒවා ගැන ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධතාවක් නැති වෙන්නත් හේතුව මොකක්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have one more minute.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
One more minute?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, you have one more minute.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
One more minute තමයි ඉතින්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees
You have been allotted seven minutes and now you have only one minute left.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ඔව්, ඒක මම දන්නවා. විනාඩි හතෙන් දැන් හයක් ගිහිල්ලා. ඒක තමයි ඔබතුමා "one more minute" කියන්නේ. මම කථාව

පටන් ගත්තා විතරයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. පනතේ තිබෙන ගොඩක් දේවල් කියන්න බැහැ, විනාඩි හතෙන්.

මම මතු කරන එක කරුණක් තමයි ඇමතිතුමනි, ඔය වෝල්ට් 33,000 කථාව. ඔබතුමා එය පැහැදිලි කරන්න, මොකක්ද ඒකට හේතුව කියලා. සිංහල පරිවර්තනයේ තිබෙන්නේ එකක්. ඉංග්‍රීසි පරිවර්තනයේ තිබෙන්නේ තවත් එකක්. මම දන්නේ නැහැ, මීට කලින් මේ ගැන කථා වුණාද කියලා. එතකොට ජාතික විදුලිබල පද්ධතියට මේක එකතු වෙන්න ඕනෑ.

මා මතු කරන දෙවැනි කරුණ මෙයයි. මෙහෙම ගියොත් Sikkim කියන ප්‍රාන්තයට වෙච්ච දේ වාගේ දෙයක් තමයි අපටත් වෙන්නේ. දැන් තෙල් නළයක් එනවා, ඉන්දියාවෙන්. විදුලිබල පද්ධතියටත් එහෙන් නළයක් එනවා. අපට දැන් පස්වැදෑරුම් connectivity එකක් එනවා. මුදල් වශයෙන් connectivity එනවා, රේගු වශයෙන් connectivity එනවා, බලශක්තිය අතින් connectivity එනවා. ඔහොම පස්වැදෑරුම් connectivity එකක් ඇවිල්ලා, ඒකෙන් තමයි අන්තිමට මේ රටේ ස්වෛරීභාවය නැත්තටම නැති වෙන්නේ, Sikkim කියන ප්‍රාන්තයට වෙච්ච දේ වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
මම තව විනාඩියයි ගන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියන්නේ මේකයි. රටේ බලශක්ති සුරක්ෂිතභාවය කියන්නේ ඉතාම සංවේදීව ජාතික ආරක්ෂාවත් එක්ක බැඳිච්ච දෙයක්. ජාතික ආරක්ෂාව කියන්නේ ආරක්ෂක හමුදාව විතරක් නොවෙයි. ආහාර සුරක්ෂිතතාව, බලශක්ති සුරක්ෂිතතාව කියන ඒ ඔක්කෝම ජාතික ආරක්ෂාවත් එක්ක බැඳුණු දේවල්. එල්ටීටීඊ ත්‍රස්තවාදයත් එක්ක යුද්ධ කරන්න හම්බ වෙන්නේ නැහැ, උතුරු, නැහෙනහිර විදුලිබල පද්ධතියේ පාලනය තිබුණේ වෙන කාගේ හරි අතේ නම්. මම එය කියන්නේ උදාහරණයක් හැටියටයි. ඒ නිසා කරුණාකරලා බලශක්ති සුරක්ෂිතතාව කියන සංවේදී කාරණය ගැන මීට වඩා ගැඹුරින් කල්පනා කරලා කටයුතු කළ යුතුයි කියන එකයි අපේ යෝජනාව.

දැන් ගාමිණී ලොකුගේ මැතිතුමා කිව්වා, මේ පනත් කෙටුම්පත සම්මත වුණාම අඩු මිලට විදුලිය ගන්න පුළුවන් කියලා. මේ ඉදිරිපත් කරලා තිබෙන යෝජනාවෙන් මේ රටේ විදුලි පාරිභෝගිකයාට අඩු මිලට විදුලිය ගන්න පුළුවන් වෙයි කියලා කවුරු හරි හිතනවා නම්, ඒක මිථ්‍යාවක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
පොඩ්ඩක් ඉන්න. Wind up කරනවා.

මේකෙන් වෙන්නේ මොකක්ද? විවිධ විදේශීය සමාගම් අතට මේ කටයුත්ත ගිහිල්ලා ඔවුන්ට අභිමත ආකාරයට අධික විදුලි පිරිවැයකට මේ රටේ ජනතාවට කර ගහන්න සිදුවීමයි. දැන් මිනිස්සු හිතාවි, මේ සංශෝධනයෙන් ඔවුන්ට එහෙම දෙයක් වෙයි කියලා.

අනාගතයේදී අපි බලමු, තමුන්නාන්සේලා මේ ගෙනෙන ප්‍රතිසංස්කරණවලින් මොකද වෙන්නේ කියලා. තරුණ ඇමතිවරයෙක් නිසා අපි ඔය කියන කාලය වෙනකොටත් ඔබතුමා ජීවත් වෙයි, අපි ජීවත් වුණේ නැතත්. එතකොටත් ඔබතුමාට ඒවාට උත්තර දෙන්න වෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. (Dr.) Harsha de Silva. You have nine minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Rohini Kumari Wijerathna to the Chair?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
Sir, I propose that the Hon. (Mrs.) Rohini Kumari Wijerathna do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair, and THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA took the Chair.

[අ.භා. 2.16]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කථා කරන්න නියමිත වේලාව ඕනෑ. ඒ වේලාව ගන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි telephone එකක් ගත්තොත් ඒකට package එක විධියට භාවිත කරන්නේ මොබිටෙල්ද, ඩයලොග්ද, හච්චි, එයාර්ටෙල්ද කියන එක අපේ තීරණයක්. හැබැයි, එතකොට අපිට පුළුවන්, එහි quality of service බලන්න; අපිට පුළුවන්, එහි tariff එක බලන්න. අපිට තිබෙන හොඳම package එක අපිට තෝරා ගන්න පුළුවන්. හැබැයි, කවදා හෝ electricityවලටත් මේක කරන්න පුළුවන්, ඒක කොහොමද වෙන්නේ, ඒක කිසි විධියකටවත් අපිට හිතා ගන්නවත් බැහැ නේද කියලා කවුරුන් හෝ හිතනවා නම්, එහෙම හිතන එක වැරදියි. එතැනට අපට යන්න පුළුවන්. ඒ අනුව අපේ ගෙදරට, මොන distributorගෙන්ද විදුලිය ගන්නේ, ඔහු දෙන package එක මොකක්ද කියා බලලා හොඳම package එක ගන්න

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

පුළුවන් වෙන්න ඕනෑ. එතැනදී තමයි පාරිභෝගිකයාට සම්පූර්ණයෙන්ම සාධාරණයක් ඉෂ්ට වෙන්නේ. ආණ්ඩුව විසින් කිසි දෙයක් කියන්නේ නැහැ. පාරිභෝගිකයාට ඒ බලය තිබෙනවා. මොකද, අවසානයේ අපිට අවශ්‍ය වෙන්නේ අඩු මිලට, හොඳ ගුණාත්මකභාවයකින් යුතුව විදුලිය ලබා ගැනීමයි.

අපේ කර්මාන්ත ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමා කියන ලොකුම ගැටලුව තමයි, විදුලි බිල වැඩියි, ඒ නිසා කර්මාන්තවලට දරා ගන්න බැහැ, අපි ලෝක වෙළෙඳ පොළේ තරගකාරී නැහැ, ඒ නිසා අපේ කර්මාන්ත කරගෙන යන්න බැහැ කියන එක. හැබැයි, ඉතාම අඩු මිලකට, තරගකාරීව පුද්ගලයෙකුගෙන් wheel කරලා, electricity ලබා ගන්න ක්‍රමවේදයක් අපිට හදන්න පුළුවන් නම්, එතකොට ඒ කර්මාන්තය ඊට වඩා තරගකාරී වෙනවා. අපි එදා හිටපු තැනමයි අද ඉන්නේත්; ඒ තැනම තමයි හෙටත් ඉන්නේ. ඒ සඳහා මේ තරගකාරීත්වය අවශ්‍යයි. ඒ නිසා 2002දී ගෙනාපු ඒ වැඩ පිළිවෙළට අපේ සම්පූර්ණ සහයෝගය තිබුණා. මේ electricity sector එක unbundle කරන එක පිළිබඳව අපට ගැටලුවක් නැහැ. ඒක අපි කෙළින්ම භය නැතිව කියනවා. ඒක තමයි අපේ ප්‍රතිපත්තිය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගැටලුව මේකයි. මේ කරන වැඩ පිළිවෙළේ නොයෙකුත් ප්‍රශ්න තිබෙනවා. ඒවා විසඳා ගන්න ඕනෑ. ඒවාට අපි amendments ගෙනෙන්න ඕනෑ. මම හිතන විධියට, අපි පැය 25කට වඩා මේ ගැන සාකච්ඡා කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඊයේත් පැය හතරහමාරක්, පහක් ඒ ගැන සාකච්ඡා කළා; රෑ 12.00 වෙනතුරු අපි විපක්ෂ නායකතුමා සමඟ සාකච්ඡා කළා. අපි මේක නිකම් විහිළුවට ගන්නේ නැහැ; බොරුවට තැන් තැන්වලට ගිහිල්ලා කථා කරන්නේත් නැහැ. ඒ නිසා අපි Amendments ටිකක් ගෙනෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ Amendments පිළිගනීවි කියලා. ඒ Amendments පිළිගන්නවා නම් අපි ඒ වෙනුවෙන් සහයෝගය ලබා දෙන්න කිසිම විධියකින් පැකිළෙන්නේ නැහැ. හැබැයි, ඔබතුමා ඒ Amendments ටික පිළිගන්න ඕනෑ. මොකද, සද්භාවයෙන් තමයි අපි මේ Amendments ටික ගෙනෙන්නේ. මට ලැබී තිබෙන්නේ විනාඩි 9ක් නිසා ගොඩක් දේවල් ගැන කථා කරන්න හැකියාවක් නැහැ. නමුත්, මෙතැනදී අපි කියන්න ඕනෑ, මේ තරගකාරීත්වය ගෙනෙන්න නම් ඒ නියාමන අධිකාරියට යම් බලයක් තිබෙන්න ඕනෑය කියන එක. ඒ බලය අඩු කරන්න එපා. ඒ බලය අඩු වෙන විධියට තමයි මේ නීතිය කෙටුම්පත් වෙලා තිබෙන්නේ.

උදාහරණයක් හැටියට ගත්තොත්, වෙන රටවල් සමඟ අපි විදුලිය integrate කළෝතින් එහෙම ජාතික ආරක්ෂාවට ගැටලුවක් ඇති වෙනවා. දැන් ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාත් කිව්ව ආකාරයට මේ පනත් කෙටුම්පතේ තිබෙන්නේ කැබිනට් මණ්ඩලයට තීරණයක් ගන්න පුළුවන්, වෙන රටක් සමඟ පද්ධතිය එකතු කරනවා නම් කියන එකයි. හැබැයි, ඒ ප්‍රතිපත්තිමය තීරණය ගත්තාට නියාමනය කරන අධිකාරියට කොන්දේසි මොනවාද කියලා තීරණය කරන්න බලය තිබෙන්න ඕනෑ බව අපි කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් ඔබතුමිය කියන්න, ඒක නරක සංශෝධනයක්ද කියලා. ඇයි, ඒ සංශෝධනය නරක? මොකද, ඒ නියාමන අධිකාරියට තමයි බලය තිබෙන්නේ, tariff එක නියාමනය කරන්න. ඔවුන් තමයි දන්නේ carrying capacity එක මොකක්ද, generation එක මොකක්ද කියලා. මම මේ සම්බන්ධයෙන් තාක්ෂණිකව දන්නේ නැහැ. නමුත්, ඒවායේ තිබෙන limitations මොනවාද?

ඒ අනුව තමයි අපට නිවැරදි tariff එකට මේක connect කරන්න පුළුවන් වන්නේ. උදාහරණයක් හැටියට අපි ඉන්දියාවත් එක්ක connect කළොත්, ඉන්දියාවේ ඒකකයක් විකුණන්නේ ඇමෙරිකානු ඩොලර් ශත 3ට නම්, අපි විකුණන්නේ ඇමෙරිකානු ඩොලර් ශත 5ට නම්, එහෙමනම් මේක connect වෙලා තිබෙනකොට ඉන්දියාවෙන් මේ පැත්තටයි electricity එන්නේ; මේ පැත්තෙන් ඒ පැත්තට යන්නේ නැහැ. එහෙම නම් ඒවා වළක්වන්න අපට barricade එකක් දමන්න වෙනවා. ඒක ඇරෙන්නේ අර Regulatorට මෙන්න මේ කොන්දේසි හරහා තමයි මේකට එකඟ වෙන්න ඕනෑ කියලා බලය තිබුණොත් විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ පාර්ලිමේන්තුවට එන්න කලින් ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂඥවරයෙක් හැටියටත්, මේ කලාපයේ රටවල් කිහිපයකම මේ සම්බන්ධයෙන් උපදේශකවරයෙක් හැටියටත් වැඩ කරලා තිබෙනවා. මම දැකලා තිබෙනවා, නේපාලය, භූතානය වාගේ රටවල් ඉන්දියාවත් සමඟ connectivity එක ඇති කරගත්තේ කොහොමද කියලා. ලෝකයේ යුරෝපය වාගේ රටක් ගත්තාම මේ ඔක්කොම ඒවායේ integrated grid එකක් තිබෙන්නේ. Interconnectivity කියන එක ගැන කරු ජයසූරිය මහත්මයා කථා කළේ 2002දී.

අපට සුළං බලය හරහා ගිගාවොට් 65ක් මෙතැනින් ජනනය කරන්න පුළුවන් නම් - අපට ගිගාවොට් 65ක් ඕනෑ නැහැ නේ - ඒකෙන් අපනයන ආදායමක් උපයා ගන්නත් පුළුවන් වෙන්න ඕනෑ. ඒ නිසා අපි මේක ගැන පුළුල්ව බලන්න ඕනෑ. හැබැයි, එලෙස බලනකොට පාරිභෝගිකයා ශක්තිමත් කර ගැනීම සඳහාත්, පාරිභෝගික අයිතීන් සුරක්ෂා කර ගැනීම සඳහාත් වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ.

අනෙක් කාරණය තමයි, මේකේ market power එක. අපි සියලුදෙනාම කථා කරනකොට මම යෝජනාවක් ගෙනාවා. අපි හිතමු, එක ආයතනයකට සියයට 49ක් අයිතිය තිබෙනවා, ඒ ආයතනය generating company එකක් කියලා. ඒ ආයතනයට distribution company එකකටත් අයිතිය ලබා ගන්න නම් සියයට 49කට වඩා අඩු වශයෙන් පළමුවැනි එකේ අයිතිය තිබෙන්න ඕනෑ කියලා මේකේ සඳහන්ව තිබුණා. අපි යෝජනා කළා, එහෙම නොවෙයි, ගරු ඇමතිතුමා, බැංකුවක වුණත් සියයට 15 තමයි limit එක කියලා. ඒ නිසා මේක සියයට 15ට අඩු කළා. මොකද, සියයට 49ක් ඕනෑ නැහැ, ආයතනයක් control කරන්න. අපි සන්තෝෂ වෙනවා, එතුමා ඒ යෝජනාව ගෙනැත් තිබීම ගැන.

අනෙක් එක තමයි, මේ market concentration කියන එක. උදාහරණයක් හැටියට පාරිභෝගිකයාගේ සුබසිද්ධිය තහවුරු කරන්න නම් ඇත්තවශයෙන්ම මේ තරගකාරීත්වය අවශ්‍යයි. දැන් තිබෙන ගැටලුව මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. දැන් සමහරු අහනවා, ඔන්න හෙට-අනිද්දා එනවා ලු, United Petroleum Lanka (Pvt.) Limited එක කියලා. ඊයේ -පෙරේදා ආවා, Sinopec එක. ඊට කලින් ආවා, තව මොකක්ද ඉන්දියානු කොම්පැනියක්. බලාගෙන යනකොට මේ හැමෝගේම තිබෙන්නේ එකම ගණනක් නේ. මිල අඩු වෙලා නැහැ නේ. අපි කථා කරන විධියට තරගකාරීත්වය නිසා මිල අඩු වෙලා නැහැ නේ. එහෙම වෙලා තිබෙන්නේ ඇයි? සමාජ වෙළෙඳ පොළ ආර්ථික වැඩ පිළිවෙළක් තමයි සමගි ජන බලවේගය විශ්වාස කරන්නේ. ඒක තමයි අපි ඉදිරියේදී මේ රටේ මහ පොළොවේ ක්‍රියාත්මක කරන්න ගේන්නේ. එතැනදී එක පැත්තකින් තරගකාරීත්වය ඇති කරන අතරතුර, අනෙක් පැත්තෙන් අපේ අවධානය දැඩිව යොමු වෙනවා, පාරිභෝගිකයාට යුක්තිය හා සාධාරණය ලබා දීමට. ඒක තමයි අපේ වැඩ පිළිවෙළ. අපි බොරුවට බිල්ලෝ මවන්නේ නැහැ. හැබැයි, ඉස්සරහට යන ලෝකයත් එක්ක අපි ගමන් කරන්නේ ඒ මූලික කාරණා දෙක ඇති කර ගන්නයි. එතැනදී ගරු ඇමතිතුමාට අපි යෝජනාවක් ඉදිරිපත් කරනවා. ඇත්තවශයෙන්ම පාරිභෝගිකයා ගැන

හදවතින් හිතනවා නම්, ලෝකයේ market competition එක මනින ජාත්‍යන්තර ක්‍රමවේද තිබෙනවා. අපි එදා ඔබතුමාගේ කමිටුවටත් ඇවිල්ලා ඉදිරිපත් කළා, HHI - Herfindahl-Hirschman Index - කියන එක. මෙවැනි තාක්ෂණික මිනුම් දඬු හරහා අපට සනාථ කරන්න පුළුවන්, විදුලිබල වෙළෙඳ පොළේ ඇත්තටම අපි බලාපොරොත්තු වන තරගකාරී තත්ත්වය තිබෙනවාය කියලා. ඔන්න ඔය වාගේ සංශෝධන - amendments - තමයි අපි ගේන්න බලාපොරොත්තු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, CEB එකට assets තිබෙනවා. අපි හොයා බැලුවාම CEB එකට රුපියල් බිලියන 1,000කට වඩා මේ assets තිබෙනවා. මේවා නොයෙකුත් ආයතනවලට වෙන් වෙනවා. හැබැයි, කවදා හරි දවසක මේවා යම් කිසි විධියකට පෞද්ගලික ආයතනත් සමඟ එකතු කර ගන්නවා නම්, public-private partnerships වෙන්න පුළුවන්; joint ventures වෙන්න පුළුවන්; මේවායේ ඇත්ත වටිනාකම කුමක්ද කියන එක පිළිබඳව මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙලා තිබුණේ නැහැ. ඇත්තවශයෙන්ම අපි තමයි මේ සම්බන්ධයෙන් අධිකරණයට ගියේ. අපේ මහ ලේකම්තුමා තමයි අපේ ජනාධිපති නීතිඥවරු හරහා අධිකරණයට ගිහිල්ලා මේවා පෙන්වා දුන්නේ. එතකොට ගරු අධිකරණය දීපු තීන්දුවේ තිබෙනවා, කවදා හරි එහෙම කරනවා නම් රජයේ valuation එක ලබා ගන්න ඕනෑය කියලා. රජයේ valuation එක ලබා නොගෙන මේවා අන්සතු කරන්න හැකියාවක් නැහැ. ඒකට හොඳම උදාහරණය තමයි, LTL එකේ කොටස් සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වය. මේක පිළිගන්න පුළුවන් දෙයක් නොවෙයි. රජයට අයිති කොටස් KPMG සමාගම විසින් පමණක් value කරලා, සියයට 28ක ප්‍රමාණයක්, රුපියල් බිලියන 28කට විකුණා තිබෙනවා, LTL කියන පෞද්ගලික සමාගමට. අපි හැමදාම දන්නවා, LTL සමාගමේ නිලධාරීන් COPE එකත් එක්ක ලොකු ගැටලුවක හිටියා කියලා. ඔවුන් කිව්වා, "අපි ඔබතුමන්ලා කියන දේ අහන්නේ නැහැ, ඔබතුමන්ලාගේ කමිටුවලට එන්නේ නැහැ" කියලා.

ඒ, සියයට 63ක් තිබිච්ච අවස්ථාවේ. දැන් මේක සියයට 35ට අඩු වෙලා තිබෙනවා. අපට ප්‍රශ්නයක් නැහැ, පෞද්ගලික ආයතන සමඟ එකතු වෙලා වැඩ කළාට. හැබැයි, මෙවැනි අන්සතු කිරීම් කරනවා නම් ඒවා විනිවිදභාවයෙන් සහ සම්පූර්ණයෙන්ම තරගකාරී බවින් කළ යුතුය කියන අදහස ශ්‍රේෂ්ඨාධිකරණය ගෙනැවිත් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම විනාඩියෙන් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒකට හේතුව, ඉස්සරහදී මෙහෙම වෙන්න දෙන්න බැහැ. එතකොට මේ procurement එක කරද්දී, ඒ කියන්නේ, මිලදී ගනිද්දී ඒ තරගකාරීත්වය තිබෙන්න ඕනෑ. අදානිට අපේ කිසිම විරුද්ධතාවක් නැහැ. හැබැයි, අදානිගේ සමාගමෙන් ඇමෙරිකානු ඩොලර් ශත 8.26ට විදුලිය ඒකකයක් ගන්න එක සාධාරණ ද? ඔවුන් කියන්නේ capital cost එකක් තිබෙනවා, රට බංකොලොත් වෙලා කියලායි. ඒක අපි දන්නවා. අපේ රට හැම දාම බංකොලොත් වෙන්නේ නැහැ. හෙට-අනිද්දා වනකොට මේ රට බංකොලොත්භාවයෙන් එළියට එනවා. ඊට පස්සේ එහෙම ආවාම අපට step-down tariff එකක් කරන්න පුළුවන්. අවුරුදු 20ක් සඳහා විදුලි ඒකකයකට ඇමෙරිකානු ඩොලර් ශත 8.26ක් ගෙවන්න ඕනෑ නැහැ. ඒක වැඩිපුර ගෙවීමක් වනවා. මෙවැනි කාරණා සම්බන්ධයෙන් තීරණ ගන්නකොට පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය සංශෝධන කිහිපයක් අපි ඉදිරිපත් කරනවා. ගරු ඇමතිතුමනි, අපි විශ්වාස කරනවා, ඔබතුමා සද්භාවයෙන් අපේ සංශෝධන භාර ගනිවි කියලා. එහෙම වුණොත් අපට මේ ගමන ඔබතුමාත් එක්ක යන්න හැකියාව තිබේවි. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.28]

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon.(Dr.) Suren Raghavan - State Minister of Higher Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක් මතු කරමින් තමයි මගේ කථාවට ප්‍රවේශ වෙන්න සිද්ධ වෙන්නේ. අවාසනාවකට හෝ වාසනාවකට මෙන් ඔබතුමිය මුලසුනේ සිටිනවා. ඊයේ මේ සභාව තුළ පුරා පැය 9ක් තිස්සේ ජාතික අවශ්‍යතාව පිළිබඳව, අධ්‍යාපනය පිළිබඳව කතිකාවක් සහ විවාදයක් සිද්ධ වුණා. ඒක අවශ්‍යයි. අවම වශයෙන් ශිෂ්ටත්වයක් තිබෙන්න ඕනෑ, විවාදය යෝජනා කරන අය හා ස්ථිර කරන අය මුළු විවාදයට සවන් දීමට. එය සිදු වෙන්නේ නැත; සිදු වුණේ ද නැත. පස් වරු 5.30ට කැන්ටීන් එක වැහුවා, පස් වරු 6.30 වනකල් මේ සභාව රැස් වී සිටියා. නමුත්, විපක්ෂයේ සිටියේ පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරන අලි සබ්රි රහීම් මැතිතුමා පමණි. මම අහන්නේ, අපි ඔටුවෝද, ප්‍රශ්න සියල්ලක්ම අහලා ගෙදර ගියාට පස්සේ ඒ ප්‍රශ්න සියල්ලට පිළිතුරු දෙන්න? මම වෘත්තීය සමිති නායකයන් එක්ක පැයෙන් පැයට කථා කරනවා, මේ වහලා තිබෙන විශ්වවිද්‍යාල 17 විවෘත කරන්න. නමුත්, මට මෙතැනින් යන්න ලැබුණේ නැහැ, ප්‍රශ්න පත්තරයක්ම ලබා දීලා ඒ අය පිට වුණු නිසා. ඉතින්, ඔබතුමිය කථානායකතුමාට සද්භාවයෙන් යෝජනා කරන්න, කරුණාකරලා විවාද කිරීමට යෝජනා ඉදිරිපත් කරන අය සහ විවාද ස්ථිර කරන අයවත් විවාදය අවසන් වනතුරු විවාදයට සහභාගි වී ඉන්න කියා දන්වන්න කියා. එතකොට අපට සංවාදශීලී, සංවරශීලී ශිෂ්ටත්වයක් කරා යා හැකි වනවා.

මම දැන්, දවසේ මාතෘකාවට එන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපි නැවතත් පැමිණ තිබෙන්නේ මේ රටේ එක්තරා කඩඉමකටයි. මට කලින් කථා කළ නව ලිබරල්වාදය පිළිබඳව පූර්ණව විශ්වාස කරන හර්ෂ ද සිල්වා මන්ත්‍රීවරයා ද, එතුමාට කලින් කථා කළ මා මිත්‍ර විමල් වීරවංශ මන්ත්‍රීවරයා ද කථා කළ පරස්පර විරෝධී කඳවුරු දෙකක කතිකාව අපි කාලාන්තරයක් තිස්සේ -අවුරුදු 30ක්, 40ක් පමණ කාලයක් තිස්සේ- අසා ඇතැම් විට සිත් පිනවීම් කරවාගෙන, ඇතැම් විට සිත් රිදවාගෙන ගෙනගිය දේශපාලන කතිකාවක්. විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ කතිකාවේ තිබුණේ ජාතික සම්පත් රැකගැනීම, ඉන්දියානු ව්‍යාප්තවාදයට විරුද්ධ වීම, එය කොහොමද නවත්වන්නේ, අපි චීනයේ කොටසක් වෙන්නේ නැතිව කොහොමද නවත්වන්නේ, ගෝලීයකරණයට යට නොවී සිටින්නේ කෙසේද, මේ සම්බන්ධීකරණය තුළින් රාජ්‍ය ආරක්ෂාව ඇති වනවාද, නැතිවෙන්නේ කෙසේද යන්නයි.

[ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා]

මෙය මා විශ්වවිද්‍යාලයේ යද්දීත් එතුමාගෙන් අසා තිබූ කතිකාවල තිබෙනවා. එය ඇත්ත වෙන්නට පුළුවන්. ඒ කඳවුරේ තිබෙන අදහසක් තමයි ඒක. ඒක නැහැයි කියන්නට බැහැ. ඊළඟට, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ගෙන ආ තර්කය තමයි, මේ ටික කරන්නට පුළුවන්, නමුත් අපි කියන විධියට කරන්න කියන එක. මා හිතනවා, මේ බුද්ධිමත් සභාවට අවශ්‍ය වෙන්නේ මේ දෙක අතරේ බුද්ධිමය සංකලනය සහ සමතුලිතභාවයයි. අද උදේ සිට මා සවන් දුන් කතිකාවල ඇමතිවරයාට විරුද්ධව, මේ පනත් කෙටුම්පතට විරුද්ධව තිබුණු චෝදනාව වුණේ මෙය තවත් විනිවිද විය යුතු බවයි.

මා හිතනවා, අපි සහභාගිත්ව දේශපාලනයක ඉන්නවා නම්, if we are in a dialogical democracy and if that democracy is the basis for our governance, we must have it. Even if the Opposition does not ask for it, we must offer transparency beyond the expectation of the Opposition. I hope this House, the Hon. Minister and all the experts who are in the Officials' Box would make sure that unquestionable transparency would take place during this process. As already mentioned, දැනටත් කියා තිබෙන පරිදි බලශක්ති ආරක්ෂාව රාජ්‍යයක තිබිය හැකි ප්‍රධාන ආරක්ෂාවන් පහෙන් එකකි. පළමුවැනි එක, ආහාර ආරක්ෂාව - food security; දෙවැනි එක, සෞඛ්‍ය ආරක්ෂාව - health security; තුන්වැනි එක, ආර්ථික ආරක්ෂාව. හතරවනුව එන්නේ මෙන්න මේ බලශක්ති ආරක්ෂාව - energy security of a State; පස්වනුවටයි වැටෙන්නේ military security, භෞමික අඛණ්ඩතාව පිළිබඳව ජාතික ආරක්ෂාව පිළිබඳව වන කාරණාව.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට ගෙදර යන්නට තරම් මේ රටේ අරගළය සිදු වුණේ රසායනික පොහොර නවත්වපු වෙලාවේ නොවෙයි, එතුමා උතුරු-නැගෙනහිර පිළිබඳව කරපු ප්‍රකාශ නිසා නොවෙයි, පැය 13ක් විදුලිය කප්පාදු කරපු නිසායි. එදින තමයි එතුමාට ගෙදර යන්න පාර හැදුණු පළමුවැනි අරගළය සිදු වුණේ. එම අරගළයේදී අර තරුණයන් තුන්දෙනා කාඩ්බෝඩ් එකක ලියාගෙන විහාරමහාදේවී උද්‍යානයේ බුදු පිළිමය ඉස්සරහට ඇවිත් කිව්වා "Gota, go home!" කියලා. අතීතය මතක අයට ඒවා මතක ඇති. මන්ද, වත්මන් සමාජය, මේ 'Z" පරපුර පූර්ණව රැඳිලා ඉන්නවා විදුලි බලය හා සම්බන්ධව, බලශක්තිය හා සම්බන්ධව. ඒ ගොල්ලන්ගේ ලෝකය පැය 13ක් අඳුරු කළාම 'Z" පරපුරේ ආකල්ප කොහොමද කියන එක අපි දන්නවා. ඒ ගොල්ලන්ට විදුලි බලය හොයා ගත්තේ කවුද කියලා දැනගන්න අවශ්‍ය නැහැ, තෝමස් අල්වා එඩිසන් ගැන දැනගන්න අවශ්‍ය නැහැ, විමලසුරේන්ද්‍ර ගැන දැනගන්න අවශ්‍යත් නැහැ. ඒ ගොල්ලන්ට අවශ්‍ය විදුලිය. අම්මා විදුලි බිල ගෙවනවාද, තාත්තා විදුලි බිල ගෙවනවාද කියන එකත් ඒ ගොල්ලන්ට වැඩක් නැහැ. ඒක ඒ පරපුරේ හැටි. ඒක අපි සමාජ විද්‍යාත්මකව වෙනම විශ්ලේෂණය කළ යුතු කාරණයක්. නමුත් ඒ අය හිතුවා, "පැය 13ක් අපේ ජීවිතය අඳුරේ තියන්න තමුසෙට අයිතියක් නැහැ" කියලා. අද වත්මන් සමාජය තුළ විදුලි බලය මොනතරම් සහසම්බන්ධද අපේ ජීවිතවලට? දැන් මෙතැන විදුලි බලය නැත්නම් මොකද වෙන්නේ? ඒ නිසා මේ විදුලි බලය පිළිබඳව තිබෙන්නේ මානුෂික මානව අයිතියක්. මේ රට තමන්ගේ මව්බිම හැටියට පිළිගන්නා සියලුදෙනාම තමන්ගේ ජීවිතයට අවශ්‍ය බලශක්තිය මානව අයිතියක් හැටියට පිළිගත යුතුයි. අපිට එය ලබා දිය හැකිද?

මට මතකයි, මා මිත්‍ර මනෝ තිත්තවැල්ල - ඔහු දැන් ජීවතුන් අතර නැහැ - 1996දී මට කියපු කථාවක්. ඔහු එවකට PERC ආයතනයේ සභාපති. ඔහු කිව්වා, "රාඝවන්, දකුණු ආසියාවේ සිටුවන ලොකුම හොරකම තමයි ලංකා විදුලිබල මණ්ඩලය" කියලා. ලංකා විදුලිබල මණ්ඩලයේ හිටපු සමහර සේවකයන්ට ලන්ඩනයේ Piccadilly Circusවල ගෙවල් තිබුණේ. Buckingham Palace එකට ඇවිදින දුර. මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා ඒක දන්නවා. ඔවුන්ට කොහොමද එහෙම ගෙවල් අයිති කරගන්න මුදල් ලැබුණේ? යටින් දිවුණු, අපි කවුරුත් දන්නේ නැති, රාජ්‍යය වෙළා ගත්තා වූ, ජනාධිපතිවරුවත් දන්නේ නැති විධියේ මහා අගතීන් අපේ පාරිභෝගිකයාට සිදු කළා. මා මිත්‍ර මංගල සමරවීර මැතිතුමාත් අද ජීවතුන් අතර නැහැ. එතුමා Telecom deregulation එක කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ පියා වැඩ කළේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ. අපි අවුරුදු 7ක් හිටියා, අර අංක කරකවන telephone එක ගෙදරට ගන්න. නමුත් අපි වෙළෙඳ පොළ විවෘත කරපු නිසා අද බොහෝ මන්ත්‍රීවරුන්ට telephones තුනක් තිබෙනවා. ඒවා තමයි, official එක, private එක සහ අතිශය private එක. අපි මේ තරම් දුරට- *[බාධා කිරීමක්]* අතිශය private. ඔව්, ඔව්. නමුත් ඒවා වුණේ කොහොමද? *[බාධා කිරීමක්]* පස්සේ කියන්නම්. දැන්ම ඔවා කියන්න බැහැ නේ. කොහොමද එහෙම වුණේ? අපි තරගකාරී ලෝකයට ඇතුළු වුණා, නියමනයක් ඇතිව, නියාමනයක් ඇතිව. තරගකාරී ලෝකය අවශ්‍යයි. නමුත් ඒ නියාමනය මොකක්ද කියන එකයි අවශ්‍ය වෙන්නේ. මා කළ සුළු පරීක්ෂණයක් අනුව රටවල් 192ක; ලතින් ඇමෙරිකානු හා අප්‍රිකානු හා සංවර්ධනය වන ආසියානු රටවල් 56ක රාජ්‍යය සතුව තිබුණු අතිශය ඒකාධිකාරය - monopoly එක - විදුලි බලය බෙදා හැරීමේදී මතු වුණු ගැටලු පිළිබඳව ඕස්ට්‍රේලියානු ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ජෝන් පෙඩ්රික් ලෝක මට්ටමින් කළ පර්යේෂණයෙන් කියන්නේ මෙය කළ යුතු දෙයක් කියලායි.

පළමු අවුරුදු 15 තුළ එසේ කළ රටවල විදුලි බිල අඩු වීම නිසා, එය නිෂ්පාදන කර්මාන්තයට සෘජුවම බලපෑ නිසා, ඒ රටවල නිෂ්පාදන ධාරිතාව වැඩි වීම, අපනයනය වැඩි වීම සහ රැකියා උත්පාදනය වැඩි වීම සක්සුදක් සේ සිදු වී තිබෙනවා. අවශ්‍ය නම් මට ඒ පර්යේෂණ සහරාව සහ ලිපිය සභාගත කරන්නට පුළුවන්. එහෙම නම් අපි කළ යුත්තේ මහ ජනයාගේ පැත්තෙන්, පාරිභෝගිකයාගේ පැත්තෙන් බලා මේ විවාදය සිදු කිරීමයි.

අද දකුණු ආසියාවේ වැඩියෙන්ම විදුලි බිල ගෙවන්නේ ශ්‍රී ලංකාවේ පුරවැසියන්. අද වන කොට ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට බරක් වෙලා තිබෙන මේ විදුලි බිල තමන්ගේ ජීවිතයට සරිලන, තමන්ගේ ජීවිතයට පහසු වන විධියේ, ආශීර්වාදයක් වන විධියේ දෙයක් බවට පරිවර්තනය කිරීම තමයි අවශ්‍ය වන්නේ.

ගරු හිටපු ජනාධිපතිතුමා දැන් මේ සභාවේ ඉන්නවා. එතුමා තමයි මේ රටේ පළමු වතාවට, දෙමළ කථා කරන කෙනෙක් උතුරේ ආණ්ඩුකාරවරයා වශයෙන් පත් කළේ; උතුරට දෙමළ ආණ්ඩුකාරවරයකු පත් කළේ. ගරු හිටපු ජනාධිපතිතුමනි, ඒ ගැන ඔබතුමාට ස්තුතියි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම කර කර ඉඳලා, පැන්නා එළියට.

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon. (Dr.) Suren Raghavan)
දේශපාලනයේදී ඔබතුමා පැන්නේ නැද්ද? ඔබතුමාට තව නමක් තිබෙනවා. මම ඒක කියන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඒවා ගැන කථා කරන්න ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* කොච්චර පැන්නාද කිව්වොත්, දැන් අතරමං වෙලා ඉන්නේ. කරුණාකර මට කථා කරන්න ඉඩ දෙන්න. *[බාධා කිරීමක්]*

මම උතුරේ ආණ්ඩුකාරවරයා වෙලා සිටිද්දී, මන්නාරමේ විදුලි බලය නිෂ්පාදනය කිරීමේ හැකියාව ගැන සොයා බලද්දී- *[බාධා කිරීමක්]* ඒ General Manger ඉන්නවා, මෙතැන රාජ්‍ය නිලධාරි මැදිරියේ. එතුමා ඒ ගැන කියයි. මන්නාරමේ සූර්ය බලශක්තියෙන් නිපදවපු විදුලිය ජාතික පද්ධතියට - National Grid එකට - ගෙනෙන්න බැහැ කිව්වා. මේ ජාතික විදුලිබල පද්ධතිය සකස් කරලා තිබෙන්නේ hydraulic ඒවාට විතරයි, සූර්ය බලයෙන් නිපදවන ඒවා එයට එක් කරන්න බැහැ කිව්වා. මෙන්න මේ වාගේ බොරු තොගයක්; පට්ට කෙබර තොගයක් කියලා තමයි මේ ජාතික සම්පත හිර කරමින්, ජාතික ධනය හිර කරමින් මේ රටේ පුරවැසියාගේ අයිතිය උදුරාගෙන තිබෙන්නේ.

අපි අද හවස මේ පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය දෙනවා. මෙය ආරම්භයක් පමණයි. මම ගරු ඇමතිතුමාගෙනුත්, අනෙක් අයගෙනුත් ඉල්ලන්නේ මේ ඉදිරිපත් වී තිබෙන සුවිශේෂ වුණු යෝජනා ටික සලකා බලා, පුළුවන් නම් මීටත් වඩා -හැකිතාක් දුරට- විනිවිදව මේ පනත් කෙටුම්පත සකස් කරලා තව අවුරුදු 10කින් ඔබතුමාගේ නමත් කියැවෙන විධියට, නිලධාරීන්ගේ නම් ද කියැවෙන විධියට මේ වර්තමානය පෙරළන්න කියලායි. අද ජීවතුන් අතර නැති වුණත්, මංගල සමරවීර කියන දේශපාලනඥයාගේ නම එසේ කථා කරන්නට පුළුවන් වන විධියේ සේවයක්, වෘත්තියක් එතුමා ඒ industry එකට කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාටත් එහෙම වෙන්න පුළුවන්. මේ රටේ අනාගතය භාර ගන්න ඉන්න දුවා දරුවන් අපට කියනවා, "ඔයගොල්ලන්ගේ චින්තනය නොවෙයි වැදගත් වෙන්නේ. ඔයගොල්ලන් පනස් ගණන්වල, හැට ගණන්වල හිතපු දේ නොවෙයි වැදගත් වෙන්නේ. අනාගතය සකසන්නට යන පාර හදලා දෙන්න" කියලා. අන්න ඒ ඉල්ලීමට සහ ආයාචනයට අපි සවන් දෙමු කියන පණිවුඩය ලබා දෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) චරිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.40]

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට සම්බන්ධ වන්නට ලැබීම ගැන මම බෙහෙවින් සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ විෂයය සම්බන්ධවත්, මේ පනත් කෙටුම්පත සම්බන්ධවත් මන්ත්‍රීවරයෙකු විධියට මම විවිධ අවස්ථාවල ලිඛිතවත්, ඒ වාගේම සාකච්ඡා මට්ටමිනුත් යම් යම් මැදිහත්වීම් සිදු කර තිබෙනවා. මේ ප්‍රශ්නය ගැන අප කථා කරන්නේ අද උදේ ගරු ඇමතිතුමා මේ සභාවේදී ප්‍රකාශ කළ විධියට නොවෙයි. අප මේ ප්‍රශ්නය ගැන බලන්නේ මේ රටේ පුළුල් දේශපාලන අවශ්‍යතාවක් තුළයි. එහෙම නැතුව හුදු පෞද්ගලික අපේක්ෂා වෙනුවෙන් නොවෙයි අප මේ ප්‍රශ්නය දෙස බලන්නේ.

මට ලැබී තිබෙන්නේ විනාඩි 7ක පොඩි කාලයක් නිසා මගේ මේ කථාවේදී ප්‍රධාන කරුණු දෙකක් ආමන්ත්‍රණය කරන්න කැමැතියි. පළමු කාරණය තමයි, අප අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන සන්දර්භය - context. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දේශපාලනයේදී සන්දර්භීය වටිනාකම් - contextual values - තමයි තිබෙන්නේ. Absolute values කියන ඒවා politicsවල නැහැ. ඒ නිසා හැටනවලක්ෂයේ ජන වරම කියන එකට තිබෙන්නේත් contextual value එකක්. ඒ සන්දර්භයට - context එකට - පමණයි ඒ අගය කිරීම තිබෙන්නේ.

ඒ නිසා අපි දේශපාලනයේ විනිශ්චයන් කරන්න ඕනෑ සන්දර්භීය අගය කිරීම් ඇතුළේ. අපි ඒක තේරුම් ගන්න අවශ්‍යයි. එහෙම නැතුව, absolute definitions කියා වර්ගයක් දේශපාලනයේ නැහැ.

අපේ රටේ විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණයක් අවශ්‍යද, නැද්ද? අවශ්‍යයි. අපේ රටේ විදුලිබල ක්ෂේත්‍රයේ බරපතළ ප්‍රශ්න තිබෙනවාද, නැද්ද? තිබෙනවා. අපේ රටේ විදුලිබල ක්ෂේත්‍රය අලුත්වැඩියා කරන්න ඕනෑද, එපාද? ඕනෑ. අපේ රටේ විදුලිබල ක්ෂේත්‍රය විශේෂයෙන්ම grid එකෙන් පටන් ගෙන බෙදා හැරීම දක්වා පළල් ප්‍රශ්න ගණනාවක හිර වෙලා තේද තිබෙන්නේ? ඔව්. හැබැයි, මේ ප්‍රශ්න ඔක්කොටම උත්තරය "ඔව්" කියන එක වුණාට, ඒවා විසඳන්න පුළුවන් වෙන්නේ දේශපාලන සන්දර්භීය තේරුමක් ඇතුළේ මිස, වික්‍රමසිංහට, විජේසේකරට වුවමනා හින්දා නොවෙයි. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

අපි ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ, මේ රටේ දේශපාලනය අද තිබෙන්නේ කොතැනද කියන කාරණය. ඒ සන්දර්භීය මොහොත තේරුම් ගන්න. රටේ ජනතාව ආණ්ඩුව එපා කියා හිටපු ජනාධිපති ගෙදර යැව්වා. රටේ ජනතාව හිටපු අගමැති එපා කියා, කැබිනට් මණ්ඩලය එපා කියා ඒ අය ගෙදර යැව්වා. රටේ ජනතාව මේ රටේ පාලනය වෙනස් කළා. ඊළඟට අපි ඊළඟ පාලනය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙක් පත් කළා; succeeding Government එකක් හැදුවා. ඒක හරි. මගේ මිත්‍රයන් එහි ගරු ඇමතිතුමන්ලා විධියට කටයුතු කරන එක හරි. එම succeeding environment එක ඇතුළේ මේක කරන්න පුළුවන්ද? තමන් කැමති නිසා, තමන්ගේ මිත්‍රයන්ට ඕනෑ නිසා, කොම්පැනිකාරයන් කියන නිසා, වික්‍රමසිංහ කැමැති නිසා, විජේසේකර කැමති නිසා ලංකාවේ නීති හදන්න බැහැ. ඒකයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතැන තිබෙන ප්‍රශ්නය. එහෙම නැතුව කංවන එක්ක අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. එතුමා දක්ෂ තරුණයෙක්. හැබැයි, මේ ප්‍රශ්නය ගන්නා විධිය වැරදියි. ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

මේ තිබෙන්නේ succeeding Government එකක් - අනුප්‍රාප්තික ආණ්ඩුවක්. අනුප්‍රාප්තික ජනාධිපතිවරයා විතරක් නොවෙයි ඉන්නේ. මම ඒක ආයෙත් කියනවා. මේ තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පත් කරගත් succeeding Government එකක්. එහෙම පත් කරගත් government එකක කරන්න පුළුවන් වැඩ තිබෙනවා; කරන්න බැරි වැඩත් තිබෙනවා. ඕනෑ නම් මේ කටයුත්ත කරන්න පුළුවන්. මොකද, පුරවැසියන් නැති කාලයක යටත් වැසියන් වාගේ අත ඔසවන 100ක් හිටියොත්, මෙවැනි පනත් කෙටුම්පත් ගෙනෙන්න පුළුවන්. මේක මහ කජ්ජක් නොවෙයි. හැබැයි, මම කියන්නේ දේශපාලන සන්දර්භයත් එක්ක තියලා මෙය කියවන්න කියලායි. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට මම ගරු කරනවා. මොකද, එතුමා මේක දේශපාලන සන්දර්භයක තබා කිව්වා, "මේ වැඩ කරන්න එපා" කියලා. එතුමා දේශපාලනය දන්නා හින්දායි එහෙම කිව්වේ. මෙවැනි දේවලට අත ඔසවන්න, අත ඔසවන්න සමාජයෙන් තමුන්නාන්සේලා ඇතුළු අපි ඔක්කොම එළියට දමන මොහොත ඇතක නොවෙයි. ඒ මොහොත එනකල් දින ගණින්නයි අපට සිදු වෙලා තිබෙන්නේ.

සමහරු කිව්වා, මරණාධාර සමිතියකවත් වැඩ කරපු නැති අයයි මෙතැන කථා කරන්නේ කියලා. "මරණාධාර සමිතියකවත් වැඩ කරපු නැති අය" කියලා කිව්වා. හැබැයි, මෙතැන තිබෙන මේ ප්‍රශ්නය ඊට වඩා පළල් එකක්. ඒ වාගේම සමහරු අපට විහිළු කළා, අමාත්‍යාංශ ගැන දන්නේ නැතුව, මන්ත්‍රීකම් කරන්නේ

[ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා]

නැතුව, ඇමතිකම් කරන්නේ නැතුව කොහොමද මෙහෙම කියන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සන්දර්භය ගැන අපි දන්නවා. මේ රටේ අමාත්‍යාංශවල වැඩ කරන විධිය ගැන අපි දන්නවා. මේ රටේ අමාත්‍යාංශ එක්ක අපි වැඩ කරලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
මට ලබා දුන් විනාඩි 7 අවසන් වුණා ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තවත් මිනිත්තු 2ක කාලයක් තිබෙනවා.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ප්‍රශ්නය සම්බන්ධව අපි ඉතාම පැහැදිලිව කිව යුතු දෙයක් තිබෙනවා. විදුලිබල මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගතකරණයක්, එහෙම නැත්නම් අලුත් වීමක් පිළිබඳ ප්‍රශ්නය, එකක්. හැබැයි, මේ කරමින් යන වැඩේ අපේ රටේ දේශපාලනය bulldoze කිරීමක්. ඕනෑ නම් නිදිකුම්බා ගහක් ගලවන්නත් බුල්ඩෝසරයක් දමන්නත් පුළුවන්. ඒ වාගේම තමයි, ආණ්ඩුවට 113ක බහුතරයක් තිබෙනවා නම් මෙහෙම දේවල් කරන්න පුළුවන්. හැබැයි, එහෙම කරන එකෙන් ඇති කරන දේශපාලන බලපෑම අපේ සමාජය ඇතුළේ විශාල වශයෙන් ඉදිරියට එන්න නියමිතව තිබෙනවා.

මේකේ අභ්‍යන්තරයේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම National Electricity Advisory Council එක සම්බන්ධ ප්‍රශ්නයේදී ගරු කංචන විජේසේකර මැතිතුමා මා සමඟ විරුද්ධ වුණා. එතුමාට මම ඒ ගැන Committee එකේදීත් කිව්වා. අද මම ඒ සඳහා වෙනමම Amendment එකකුත් ගෙනැවිත් තිබෙනවා. අවශ්‍ය නම් එය පිළිගන්න පුළුවන්, අනවශ්‍ය නම් ප්‍රතික්ෂේප කරන්න පුළුවන්. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ ඒකයි. හැබැයි, මම ඉතා පැහැදිලිව කියනවා, හැම දාම විදුලිබල ඇමති කංචන විජේසේකර නොවෙයි කියන එක. අපි හදන්නේ නීතියක්; මේ රට ඉස්සරහට ගමන් කරවීම සඳහා tariff policy එකක්. ඇමතිතුමා තීරණය කරන National Electricity Advisory Council එකක් අපි හදමින් ඉන්නේ. මේක කොච්චර දුරක් ගිහිල්ලා, කොහේට ගිහිල්ලා ඉතුරු වෙයිද කියලා අපි දන්නේ නැහැ. කෙසේ වෙතත් මේ National Electricity Advisory Council එක සම්බන්ධ ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක් විධියට මතුව තිබෙනවා.

ඊළඟට, මේ හා සම්බන්ධ වුණු තවත් ප්‍රශ්න ගණනාවක්ම මේ තුළ තිබෙනවා. 2002 අංක 28 දරන විදුලිබල ප්‍රතිසංස්කරණ පනතේ 51වන වගන්තිය යටතේ ඉතාම පැහැදිලිව මේ National Electricity Advisory Council එක Monitoring and Advisory Committee කියලා වැදගත් විධියට ගෙනැල්ලා තිබුණා.

අඩු ගණනේ ඒකවත් මේකට replace කරන්න කියලා මම එතුමාට කමිටුවේදීත් කිව්වා. එතුමා ඒක පිළිගත්තේ නැහැ. නමුත් යටත් වැසියන් රාශියක් ඉන්න තැනක මේ යන ගමන් මාර්ගය තුළ විදුලිබල පනත් කෙටුම්පත සම්මත වෙන්න පුළුවන්. හැබැයි විදුලිබල පනත් කෙටුම්පත සම්මත වීමේ ජයග්‍රහණය අපේ රටේ දේශපාලන වශයෙන් විශාල කුණාටුවක් බවට පත් වෙමින් අපි ඔක්කෝටම විරුද්ධ වෙන බරපතළ රැල්ලක් ඇති කරනවා කියන එක මට පැහැදිලියි. ඒ නිසා මේ වෙලාවේදී මම ඉතා පැහැදිලිව ප්‍රකාශ කරන්නේ, මෙය සන්දර්භීය වශයෙන් ගත්තාම ඉතා වැරැදි අවස්ථාවක ගෙනෙන පනතක්, අභ්‍යන්තරිකව ගත්තාම මෙහි ප්‍රශ්න රාශියක් තිබෙනවා. මේ තුළ ඇති සමහර ඒවා සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න ශ්‍රේෂ්ඨාධිකරණය යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේ තත්ත්වයක තිබෙන පනතක් හදිසියේ ගෙන ඒම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන කාරණය මේකයි. මම අද උදේ, ස්ථාවර නියෝග 50 (2) යටතේ සඳහන් වන කාරණාව ගැන කිව්වා. පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනෙන පටිපාටියක් තිබෙනවා. ඒ පිළිබඳව ආංශික අධීක්ෂණ කාරක සභාවේ අවසාන තීරණය එනතුරු එය අපේ agenda එකට ආයුතු නැහැ. නමුත් අද ඒක ඇවිල්ලා තිබෙනවා. පටිපාටියට පිටින් ඉතා වේගයෙන් කරගෙන යන මේ වැඩේ හරහා නෛතික ක්‍රියාදාමයේ බරපතළ ගැටලුවක් ඇති වෙන බව ප්‍රකාශ කරමින්, අපි මෙයට විරුද්ධව ඡන්දය ලබා දෙන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Selvarajah Kajendren. You have six minutes.

[பி.ப. 2.48]

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் இலங்கை மின்சாரம் சட்ட மூலம் தொடர்பான விவாதம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. இந்தச் சட்டமூலமானது, மிக நீண்ட காலத்துக்கு இலங்கையிலுள்ள இரண்டு தேசத்து மக்களையும் பாதிக்கக்கூடிய ஒரு சட்டமூலமாகும். அதாவது, தமிழ்த் தேசம், சிங்கள தேசம் ஆகிய இரண்டு தேச மக்கள்மீதும் பாரிய தாக்கத்தை ஏற்படுத்தக்கூடிய ஒரு சட்டமூலமாக இருக்கின்றது. அவ்வாறானதொரு சட்டமூலத்தை இந்தச் சபையில் கொண்டுவந்து நிறைவேற்றுவதற்கான அங்கீகாரம் இந்த அரசாங்கத்துக்கு இருக்கின்றதா? என்ற பாரிய கேள்வி எழுகின்றது.

2022ஆம் ஆண்டில் மக்கள் ஆணை பெற்றிருந்த கோட்டாபய ராஜபக்ஷவும் அவருடைய தலைமையிலான அரசாங்கமும் மக்களால் விரட்டியடிக்கப்பட்டு, மக்கள் வழங்கிய ஆணையை வாபஸ்பெற்று இருக்கின்ற ஒரு நிலைமையில், மக்கள் ஆணையில்லாத - 99 சதவீதமான மக்களால் நிராகரிக்கப்பட்ட - ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் இடைக்கால ஜனாதிபதியாகப் பதவியேற்றிருக்கிறார். மக்கள் ஆணை மீளப்பெறப்பட்ட நாடாளுமன்ற உறுப்பினர்களைக் கொண்ட ஓர் அரசாங்கம், இந்தச் சட்டமூலத்தைக் கொண்டு வருவது இந்தத் தீவிலுள்ள இரண்டு தேசத்து மக்களையும் மிக நீண்ட காலத்துக்குப் பாதிக்கக்கூடியது.

அடுத்து, வடக்கு, கிழக்கிலுள்ள பல இடங்களில் காற்றாலை மூலம் மின் உற்பத்தி மேற்கொள்ளப்படுகின்றது. அதுதொடர்பாக எங்களுடைய தேசத்திலுள்ள அரசியல் தரப்புக்களோடு எந்தவிதமான கலந்துரையாடலும் மேற்கொள்ளப்படவில்லை. எங்களுடைய தேசத்தில் காற்றாலைகளை நிறுவுவது தொடர்பான முடிவுகள் எதேச்சதிகாரமாகவே எடுக்கப்படுகின்றது. குறிப்பாக, மன்னார் மாவட்டத்திலும், தனங்கிளப்பு பகுதியிலும் நிறுவப்பட்டிருக்கின்ற காற்றாலைகளால் மீன் உற்பத்தி பாதிக்கப்படுகின்ற அதேநேரம், மக்களுடைய இயல்பு வாழ்க்கையும் பெருமளவில் பாதிக்கப்பட்டுள்ளது. இந்தச் செயற்பாடுகளை நாங்கள் மிகவும் வன்மையாகக் கண்டிக்கின்றோம். எங்களுடைய தேசம் சார்ந்து எடுக்கப்படுகின்ற முடிவுகள் எங்களுடன் பேசப்பட்டுத்தான் எடுக்கப்பட வேண்டும். ஆனாலும், அந்த அடிப்படையில் எந்தச் செயற்பாடும் முன்னெடுக்கப்பட்டு இருக்கவில்லை. அதனால் இந்தச் சட்டமூலத்துக்கு எங்களுடைய ஆதரவை வழங்க முடியாது என்பதை இந்த இடத்தில் பதிவுசெய்து, வேறு விடயங்களுக்குள் செல்கின்றேன்.

வடக்கு, கிழக்குப் பகுதிகளில் பொலிஸாரின் அராஜகங்கள் தொடர்ச்சியாக இடம்பெற்று வருகின்றன. குறிப்பாக, 19.11.2023 அன்று வட்டுக்கோட்டைப் பொலிஸாருடைய custodyஇன்கீழ் இருந்த இளைஞர் ஒருவர், பொலிஸாரால் கடுமையாகச் சித்திரவதைக்கு உள்ளாக்கப்பட்டு உயிரிழந்திருக்கிறார். அவருடைய கொலை தொடர்பாக 4 பொலிஸார் கைதுசெய்யப்பட்டு இருக்கின்றபோதிலும்கூட, அவருக்குச் சித்திரவதை நடைபெற்ற நான்கு நாட்களும் வட்டுக்கோட்டை பொலிஸ் நிலையத்தில் பொறுப்பதிகாரியாக இருந்த OICமீது இதுவரை எந்தவிதமான நடவடிக்கையும் எடுக்கப்படவில்லை. இது தொடர்பில் பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் உரிய கவனம் செலுத்தாமல் இருப்பது ஏன்? என்ற கேள்வி எங்கள் மத்தியில் எழுந்திருக்கின்றது. ஆகவே, இது தொடர்பாக உரிய நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும்.

நேற்று முன்தினம் பொன்னாலைப் பகுதியில் பெண் தலைமைத்துவக் குடும்பத்தைச் சேர்ந்த கிருஷ்ணவேணி என்ற பெண்மணி தன்னுடைய வளவில் குழாய் கிணறு ஒன்றை அமைத்துக்கொண்டு இருந்தபொழுது, அங்கு சென்ற வட்டுக்கோட்டைப் பொலிஸார், அதற்கு அனுமதி பெறப்படவில்லை என்பதைக் காரணங்காட்டி, அவரிடமிருந்து 8,000 ரூபாய் கப்பம் பெற்றிருக்கிறார்கள். அந்தப் பெண்மணியின் மகன் இப்பொழுது க.பொ.த. உயர் தரத்தில் படித்துக்கொண்டு இருக்கின்றார். அவர் தன்னுடைய பாடசாலைக் கல்வி நேரம் போக, மிகுதி நேரத்தில் கூலி வேலை செய்து சம்பாதித்த பணத்தில்தான் அந்த குழாய்க் கிணறு அமைக்கின்ற பணி மேற்கொள்ளப்பட்டிருக்கிறது. அந்தப் பணத்திலிருந்துதான் 8,000 ரூபாயை வட்டுக்கோட்டைப் பொலிஸார் பறித்துச் சென்றிருக்கிறார்கள். சுமணசிறி, குமார, கசுன் என்ற 3 பொலிஸ் உத்தியோகத்தர்களே இந்தக் கப்பத்தைப் பெற்றிருக்கிறார்கள். எனவே, இவர்கள்மீது நடவடிக்கை எடுக்கப்பட வேண்டும்.

அடுத்து, ஆனைக்கோட்டை, ஆறுகால்மடத்தைச் சேர்ந்த கந்தசாமி சேகரன் என்ற மனநிலை பாதிக்கப்பட்டவர், கடந்த 14.11.2023 அன்று காரைநகர் பகுதியிலுள்ள கிராம சேவையாளர் அலுவலகம் ஒன்றில் சந்தேகத்துக்கிடமான முறையில் நின்றதாக கிராம சேவையாளரால் வட்டுக்கோட்டை பொலிஸாருக்குத் தெரியப்படுத்தப்பட்டதன் அடிப்படையில், அவர் பொலிஸாரால் கைதுசெய்யப்பட்டு கொண்டு செல்லப்பட்டு இருக்கின்றார். அதற்குப் பிற்பாடு, 18.11.2023 அன்று பொன்னாலைச் சந்திக்கு அருகிலுள்ள பற்றைக்குள்ளிருந்து அவருடைய சடலம் சிதைந்த நிலையில் மீட்கப்பட்டது. அந்தச் செய்தியைச் சேகரிப்பதற்குச் சென்ற புவனேஸ்வரன் கஜிந்தன் என்ற ஊடகவியலாளர் பொலிஸாரால் அச்சுறுத்தப்பட்டு இருக்கின்றார். இந்தக் கொலை தொடர்பாக இன்றுவரை எவரும் கைதுசெய்யப்படவில்லை. இது வட்டுக்கோட்டைப் பொலிஸாரால் மேற்கொள்ளப்பட்ட படுகொலை!

அடுத்து, காங்கேசன்துறை விசேட பொலிஸ் பிரிவைச் சேர்ந்த 90829 இலக்கமுடைய பொலிஸ் உத்தியோகத்தர் கடந்த மே மாதம் 21ஆம் திகதி பொது மகன் ஒருவரை வாளால் வெட்டியிருக்கிறார். இன்றுவரை அவர்மீது நடவடிக்கை எடுக்கப்படவில்லை. கடந்த 30ஆம் திகதி யாழ்ப்பாணத்தில் நடைபெற்ற மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் கலந்துகொண்ட யாழ்ப்பாணத்துக்குப் பொறுப்பான உதவிப் பொலிஸ் அத்தியட்சகர் - ASP, குறித்த பொலிஸ் உத்தியோகத்தர்மீது மேற்கொள்ளப்பட்ட தாக்குதலைத் தடுக்க முற்பட்ட பொழுது, தவறுதலாக அந்த வாள் வெட்டு நடைபெற்றதாகக் கூறியிருக்கிறார். அது அப்பட்டமான பொய்! என்னிடம் அது தொடர்பான ஆவணங்கள் - புகைப்படங்கள் - இருக்கின்றன. நான் அவற்றைச் சபாபீடத்தில் ***சமர்ப்பிக்கின்றேன்.** எனவே, இது தொடர்பில் உரிய நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

கடந்த 04ஆம் திகதி பாதுகாப்பு அமைச்சின் செயலாளரால் வர்த்தமானி அறிவித்தல் ஒன்று வெளியிடப்பட்டு இருக்கின்றது. அதில் தமிழீழ விடுதலைப் புலிகள் அமைப்பினதும் தமிழர் புனர்வாழ்வுக் கழகத்தினதும் வேறு சில அமைப்புகளினதும் சொத்துக்கள் முடக்கப்படுவதாகக் குறிப்பிடப்பட்டுள்ளது. இதனை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். இவ்வாறு தமிழீழ விடுதலைப் புலிகள் அமைப்பினதும், தமிழர் புனர்வாழ்வுக் கழகத்தினதும் சொத்துக்கள் முடக்கப்படுவதாக வெளியிடப்பட்டுள்ள வர்த்தமானி அறிவித்தல் மீளப் பெறப்பட வேண்டும். தமிழீழ விடுதலைப் புலிகள் அமைப்பு, தமிழர் புனர்வாழ்வுக் கழகம் என்பவற்றின் மீதான தடைகள் நீக்கப்பட வேண்டுமென நாங்கள் வலியுறுத்துகின்றோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up now.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு ஒரு நிமிடம் கொடுங்கள்!

பல்கலைக்கழக கல்விசாரா ஊழியர்கள் தொடர் போராட்டத்தில் ஈடுபட்டிருக்கிறார்கள். இதனால் பல்கலைக்கழக மாணவர்கள் பாதிக்கப்படுகின்றார்கள். இங்கு கௌரவ உயர் கல்வி இராஜாங்க அமைச்சர் அவர்கள், தாங்கள் அதைத் தீர்ப்பதற்காகப் பேசிக்கொண்டிருப்பதாகச் சொன்னார். அந்த ஊழியர்களோடு பேசப்பட்ட விடயங்கள் தொடர்பில் எழுத்து மூல உத்தரவாதம் இல்லாததாலே தொடர்ந்து போராட்டம் நடைபெறுகின்றது. தயவுசெய்து, அவர்களுடைய கோரிக்கைகளை நிறைவேற்றுவதற்கு உரிய நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டுமென வலியுறுத்தி, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.හා. 2.54]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සුවිශේෂ පනත් කෙටුම්පතක් පිළිබඳව පාර්ලිමේන්තුවේ විවාද කරන අවස්ථාවේ විපක්ෂයේ මන්ත්‍රීවරු ගණනාවකගේ කථා මම අහගෙන හිටියා. මා මිත්‍ර චරිත මන්ත්‍රීතුමාගේ කථාවත් මම අහගෙන හිටියා. එතුමන්ලා කියන විධියට මෙක අනුප්‍රාප්තික ආණ්ඩුවක්. මේ අනුප්‍රාප්තික ආණ්ඩුවට කිසිම තීන්දුවක් ගන්න බැහැ. පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙනෙන්න බැහැ. මේ ආණ්ඩුව ජනාධිපතිවරයෙකු පත් කරලා අවුරුදු එකහමාරක් උඩ බලාගෙන ඉන්න ඕනෑ; එතුමන්ලා කියන හැටියට අනුප්‍රාප්තික ආණ්ඩුවකට මොනවත්ම කරන්න බැහැ. පසුගිය කාලයේ බංකොලොත් වුණු ආණ්ඩුවට මොකුත් කරන්න බැහැ; විදුලි කප්පාදුව එහෙමම තිබෙන්න ඕනෑ; තෙල් පෝලිම් එහෙමම තිබෙන්න ඕනෑ. ඒක තමයි එතුමන්ලා අදහස් කරන්නේ. එතුමා කියන විධියට මේ ආණ්ඩුවට කිසිම දෙයක් කරන්න බැහැ. මේ පනත් කෙටුම්පත වැරැදියි කියලා හිතෙනවා නම්, ඇයි ඔබතුමාට කියන්න බැරි ඔබතුමාගේ නායක සජිත් ප්‍රේමදාස මහත්තයාගේ නායකත්වයෙන් අනාගතයේදී ආණ්ඩුවක් පිහිටෙව්වාම අපි මේ පනත අහෝසි කරනවා කියලා? *[බාධා කිරීමක්]* විපක්ෂයම පිළිගන්නවා, ඊළඟ අවුරුදු පහේත් මේ රටේ ජනාධිපති වෙන්නේ රනිල් වික්‍රමසිංහ මහත්තයා කියලා. විපක්ෂයම පිළිගන්නවා, ඊළඟ අවුරුදු පහේත් මේ රටේ විදුලිබල ඇමති කංචන විජේසේකර කියලා. *[බාධා කිරීමක්]* ඒක නේ, මේ ප්‍රශ්නය තිබෙන්නේ. ඒක නේ, තමුන්නාන්සේලාට තිබෙන ප්‍රශ්නය. *[බාධා කිරීමක්]* මගේ නොවෙයි තමුන්නාන්සේලාගේ ප්‍රශ්නය ඒකයි. ඇයි, ඔබතුමන්ලාට කියන්න බැරි අපේ ආණ්ඩුවක් ආවාම අපි ඒක වෙනස් කරනවා කියලා? ඒක නොකියන්නේ ඔබතුමන්ලා දන්නවා, ඔබ පරාදයි ඔබතුමන්ලාගේ නායකයා දිනන්නේ නැහැ කියලා. ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්නය ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක තමයි හැමදාම කළේ. දේශපාලන භූමිකාව තුළ අපේ විපක්ෂය හැමදාම කළේ මොකක්ද? මෙවැනි අණපනත්, තීරණ නොගත් හින්දා තමයි අවුරුදු දෙකකට කලින් මේ රට බංකොලොත් වුණේ. මේ රට විදුලි කප්පාදුවකට ගියේ, ආර්ථික අර්බුදයකට ගියේ මෙවැනි දේවල් සිද්ධ වුණු නිසායි. ඒ නිසා මම විශ්වාස කරනවා, අඩු ගණනේ මෙවැනි තීරණයකදීවත් පක්ෂ විපක්ෂ අපි ඔක්කෝම එකට එකතු වෙලා එක මතකයට ඇවිල්ලා මේ කටයුත්ත කරනවා නම් වඩාත් හොඳයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මීට අවුරුදු 22කට කලින් තමයි මේ ප්‍රතිසංවිධානය පිළිබඳව රජය තීරණය කළේ. මේක අද ඊයේ ගත් තීන්දුවක් නොවෙයි. මා මිත්‍ර චරිත මන්ත්‍රීතුමා කිව්වා, මේක අපේ විජේසේකර ඇමතිවරයාට, වික්‍රමසිංහ මහත්තයාට ඕනෑ විධියටයි ගෙනෙන්නේ කියලා. එතුමා කියපු විධියට, මේ පනත් කෙටුම්පතේ ලියලා තිබෙනවා, කංචන විජේසේකරටයි, රනිල් වික්‍රමසිංහටයි මේක ලියලා දෙනවා කියලා. එතුමා එහෙම තමයි කිව්වේ. එහෙම තමයි අපට එතුමාගේ කථාවෙන් තේරුණේ. ඒ නිසා අපි ඔබතුමන්ලාට කියන්න ඕනෑ, මේක වැරැදි විධියට අර්ථකථනය කරන්න එපාය කියලා. මේ ආයතනය ප්‍රතිසංවිධානය කරන්න ඕනෑ කියලා තීරණය කළේ අවුරුදු 22කට කලින්. චරිත හේරත් මන්ත්‍රීතුමනි, ලංකා විදුලිබල මණ්ඩලයේ වයස අවුරුදු 55යි. එය වියපත් මහල්ලෙක්; ලංකා විදුලිබල මණ්ඩලය කියන්නේ වියපත් මහල්ලෙක්.

මම මේ ආයතනයේ වැඩ කළා. මේ ආයතනයේ තිබෙන ඒකාධිකාරය ගැන මම හොඳට දන්නවා. මේ ආයතනයේ තිබෙන අකාර්යක්ෂමතාව ගැන අපි හොඳට දන්නවා. ඔබතුමා දන්නවා, මේ ආයතනය කොච්චර loss එකක් පෙන්වනවා ද කියලා. මේකේ සියයට 18ක් losses තිබුණා. ලෝකයේ හැම රටකම සියයට 4යි, සියයට 5යි losses තිබෙන්නේ. නමුත් අපේ රටේ මේ loss එක අඩු කර ගන්න කටයුතු කරලා නැහැ. අධික මිලට බලාගාර හදනවා. ඒ සියල්ල සිද්ධ වුණා. එම නිසා මෙහි වෙනසක අවශ්‍යතාව රට හඳුනාගෙන තිබුණා. අවුරුදු 22ක් තිස්සේ මේ වෙනසට යන්න බැරි වුණා. හැබැයි, වත්මන් අමාත්‍යතුමා මේ අභියෝගය භාර අරගෙන මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ජනතා විමුක්ති පෙරමුණ -ජේවීපී එක- කියනවා අපි දැක්කා, මේ හදන්නේ විකුණන්න කියලා. කියන්න හරිම ලෙහෙසියි. ඇයි එහෙම කියන්නේ? මේ කරන්නේ දේශපාලනය. මේකේ කොහේද විකිණීමක් ගැන සඳහන් කරලා තිබෙන්නේ? ඔබතුමන්ලාට ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න අවස්ථාව දුන්නා. මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පෙත්සම් 6ක් ඇවිල්ලා තිබුණා. ශ්‍රේෂ්ඨාධිකරණය ඒ සියල්ල පිළිබඳව අවධානය යොමු කළා. ඉවත් කළ යුතු වගන්ති ඉවත් කරන්න කිව්වා. ඒවා ඉවත් කළා. පැහැදිලිව කිව්වා, සේවකයෝ කිසි කෙනෙක් අයින් කරන්න බැහැ, සේවකයන්ගේ වැටුප් කිසිවක් අඩු කරන්න බැහැ කියලා. ඒ සියල්ල ඇතුළත් කරලා තමයි මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. එම නිසා අනියත බිල්ලෝ මවන්න එපා කියන එකයි අපි ඔබතුමන්ලාට කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේකෙන් විදුලිබල මණ්ඩලය කැලි 22කට කඩනවා කියලා මෙතුමන්ලා කිව්වා. නැහැ, generation, transmission and distribution කියලා ප්‍රධාන වශයෙන් අංශ තුනකටයි කැඩෙන්නේ. මම ඔබතුමන්ලාගෙන් අහනවා, generation එක වෙනම කැඩෙනවාට ඔබතුමන්ලා විරුද්ධද? මගේ පාසල් මිත්‍රයා හිනාවෙනවා. මම ඔබතුමාගෙන් අහනවා, generation එක මීට ඉස්සෙල්ලා තිබුණු විධියට, - *[බාධා කිරීමක්]* ඇහෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* හොඳයි, හොඳයි, බොහොම ස්තුතියි. ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට නැවතත් මතක් කරනවා. ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට එන්න කලින් පුළුවන් නම් ඔබතුමාගේ ගමේ මරණාධාර සමිතියක ඡන්දයක් ඉල්ලලා දිනලා එන්න කියලා. එහෙම නැත්නම් සුබසාධක සමිතියක තනතුරකට ඉල්ලන්න. මරණාධාර සමිතියකින් දිනන්න බැරි, සුබසාධක සමිතියක ඡන්දයකින් දිනන්න බැරි කෙනෙක් පාර්ලිමේන්තුවට ඇවිල්ලා නිකම් කථා කරන්න එපා. අඩු ගණනේ වාහනය එළවන්න ඩ්‍රයිවර් කෙනෙක් නැහැ. තමන්මයි වාහනය එළවාගෙන එන්නේ. ඡන්දය වෙනුවෙන් වැඩ කරන්න ඩ්‍රයිවර් කෙනෙක්වත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නිෂ්පාදනය - generation එක - ගැන සඳහන් කරමින් මම දැන් කියාගෙන ආවේ, නිෂ්පාදනය වෙනම කැඩුවාම මේ ආයතනය ලාභ ලබන ආයතනයක් වෙන්න ඕනෑ කියලායි. ඉස්සර ලංකා විදුලිබල මණ්ඩලය unsolicited proposals කියලා ආයෝජකයෝ ගෙනාවා. මට මතකයි, හැම ආණ්ඩුවක් කාලයේම විදුලි බලාගාර වෙනම හදන්න unsolicited proposals ගෙනාවා. ඒවායින් මහා පරිමාණයේ කොමිස් ලැබෙනවා. එහෙම කරලා ලංකා විදුලිබල මණ්ඩලයට ගෙනැල්ලා ඒ යටතේ විදුලි බලාගාර හදනවා. මේකෙන් ලංකා විදුලිබල මණ්ඩලයට විශාල පාඩුවක් සිදු වෙනවා. හැබැයි, මේ පනත තුළ unsolicited proposals නැහැ.

ඊළඟට කියනවා, G2G කියලා. කොහේ හෝ රටකින් මොකක් හරි ගැටගහලා ගෙනෙනවා. එහෙම ගෙනැල්ලා කියනවා G2G කියලා. ඊට පස්සේ විදුලිය ඒකකයකට මහා පරිමාණයේ මිලක් ගහනවා. මේ පනත තුළ ඒවා නැහැ. මේකේ G2G නැහැ, unsolicited proposals නැහැ. ඉතින් මම අහන්නේ, ඔබතුමන්ලා

ඒකට විරුද්ධද? ඒකට විරුද්ධ ද කියන එකයි මම අහන්නේ. මේ ක්‍රමවේදය තුළ සියලුම ව්‍යාපෘති ටෙන්ඩර් කරන්න ඕනෑ. ඒ නිසා මම කියනවා, මේ කාරණයත්. කංචන විජේසේකර ඇමතිතුමාට ඕනෑ නම්, එතුමා හොරෙක් නම්, එතුමාට මෙවා කරගන්න ඕනෑ නම්, එතුමාට මේ පනතේ වගන්ති ඒ විධියටම තියන්න පුළුවන්කම තිබුණා නේ.

ඊළඟට අපි transmission ගැන බලන්න ඕනෑ. විදුලිබල මණ්ඩලයේ transmission ගත්තාම, 2015 වෙනකොට මේ රටේ විදුලිය අවශ්‍යතාව සියයට 100ක්ම සපුරා තිබුණා. සේවකයෝ 15,000යි සිටියේ. 2020 වෙනකොට සේවක සංඛ්‍යාව 25,000 දක්වා වැඩි කළා. සේවකයෝ 10,000ක් වැඩිපුර දැම්මා. සේවකයෝ 10,000ක් වැඩිපුර දාලා හොඳ සේවයක් ලබා දෙන්න පුළුවන් වෙලා තිබෙනවාද? සේවකයෝ 10,000ක් වැඩි වුණත්, ලංකා විදුලිබල මණ්ඩලය ඇතුළේ සේවාවන් පෞද්ගලීකරණය කළා. ඔබතුමන්ලා බලන්න, ඉස්සර විදුලිය විසන්ධි කරන්න ගියේ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයා, ගස්වල අතු කපන්න ගියේ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයා, අපේ ලයිට් ටික කැඩුණාම ඒවා හදන්න ආවේ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයා. අද සේවකයින් වැඩියෙන් ඉඳලත් මේ සියලු දේ පෞද්ගලීකරණය කරලා තිබෙනවා. මේක ඇතුළේ තිබෙන්නේ මාෆියාවක්. එම නිසා අපි මතක තියාගන්න ඕනෑ දෙයක් තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලයේ බොහෝ අය හිතාගෙන ඉන්නවා, විදුලිබල මණ්ඩලය ඇතුළේ තමයි ලංකාව තිබෙන්නේ කියලා. ඒ ගොල්ලන්ට තේරෙන්නේ නැහැ, ලංකාව ඇතුළේ තමයි විදුලිබල මණ්ඩලය තිබෙන්නේ කියලා. එම නිසා ඒ ගොල්ලෝ හිතනවා, විදුලිබල මණ්ඩලයට ඕනෑ විධියට ඒක දුවන්න ඕනෑ කියලා. එහෙම යන්න බැහැ. එහෙම ගිහිල්ලා තමයි මේ විනාශය සිද්ධවෙලා තිබෙන්නේ.

ඔබතුමන්ලා කිව්වා, අපි මේ ආයතනය පෞද්ගලීකරණය කරන්න හදනවා කියලා. මීට කලින් - පළමුවෙන්ම - ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමකට ගියේ, 1983 LECO එක ගලවපු වෙලාවේයි. එම නිසා generation ඇතුළු මේ සියල්ල ගත්තාම, ඒ අංශ රජයට අයිති සමාගම් හැටියටයි යන්නේ. ඔබතුමන්ලා කිව්වා විකුණනවා කියලා. ගරු ඇමතිතුමා කිව්වා, LECO එක අයිති රජයට කියලා. එම නිසා අපි මේකේ වැරදි භූතයෙක් හදන්න අවශ්‍ය නැහැ.

විදුලිබල මණ්ඩලය පසුගිය අවුරුදු 55 තුළ මේ රටේ ආර්ථිකයට කරලා තිබෙන විනාශයෙන් ගොඩ එන්න නම් රටක් හැටියට අපි ඔක්කෝම එකතු වෙන්නට ඕනෑ. ඉතාම අඩු වියදමකින් විදුලිය නිෂ්පාදනය කරන බලාගාර අපි හදාගන්නට ඕනෑ.

අපට ජනන සැලැස්මක් නැහැ. විදුලිබල මණ්ඩලයේ බුද්ධිමත් ඉංජිනේරුවන් හිටියා. නමුත්, ජනන සැලැස්මක් තිබුණේ නැහැ. අපි අවුරුදු කීයකින් බලාගාරයක් හදලා නැද්ද? ඔබතුමන්ලා කියන්න, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයෙන් පස්සේ එක විදුලි බලාගාරයක් හදලා තිබෙනවාද කියලා? කිසිදු විදුලි බලාගාරයක් හදලා නැහැ. ජනන සැලැස්මක් නැහැ. Transmission losses අඩු කරලා නැහැ. සේවකයින් අඩු කරන්න කටයුතු කරලා නැහැ. ඒ කිසිම දෙයක් මේ ආයතනය විසින් සිද්ධ කරලා නැහැ. *[බාධා කිරීමක්]* මා මිත්‍ර ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ පෞද්ගලික කාරණයක් ගැන කථා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අමතක කළ යුතු නැහැ, මේ රටේ ජීවත් වන මිලියන 22ක් වන ජනගහනයට විදුලිය අවශ්‍යයි කියන එක. රටේ ජාතික ආර්ථිකයට සුවිශේෂීව බලපාන කාර්යයක් තමයි විදුලි බලයෙන් සිද්ධ වෙන්නේ. මේ රටේ සංචාරක ව්‍යාපාරයට වෙන්න පුළුවන්, රටේ ආර්ථිකයට වෙන්න පුළුවන්, මේ සියල්ලටම බලපාන සේවයක් තමයි විදුලිය කියලා කියන්නේ. ඒ නිසා, අනිවාර්යයෙන්ම විදුලිබල මණ්ඩලය ප්‍රතිසංවිධානය විය යුතුයි; ඒ වෙනසට යා යුතුයි. ඒ ආයතනය ඇතුළේ තිබෙන දූෂණය, නාස්තිය, වංචාව නවතින්න ඕනෑ. කාර්යක්ෂම ආයතනයක් බවට එය පත් වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය කාලයේ වැස්සා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳයි.

කොළඹ විදුලිය විසන්ධි වුණාම, පානදුර ඉඳලා කළුතර දක්වාම LECO එකෙන් විදුලිය දෙන්නේ. විසන්ධි වුණාට පස්සේ විනාඩි පහක් ඇතුළත ආපහු විදුලිය දෙනවා. හැබැයි, අපේ ප්‍රදේශවල සමහර තැන්වල විදුලිය විසන්ධි වෙලා දවස් 5, 6, 7, 10 ගත වෙනවා. රත්නපුරේ අපේ ගරු ප්‍රේමලාල් ජයසේකර රාජ්‍ය අමාත්‍යතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ඒ පැතිවල විදුලිය විසන්ධි වෙලා දවස් 10ක් යනතුරු විදුලිය දී ගන්න බැරිවෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* රත්නපුරේට තවම විදුලිය නැහැ ලු. ඒ නිසා තමයි මෙවා කාර්යක්ෂම ආයතන බවට පත් කරන්නේ. ඒ නිසා අපි කියන්නේ, මේ ගැන වැරැදි විධියට හිතන්න එපා කියලායි. මේ ගැන සුබවාදීව හිතන්න. රටක් හැටියට හිතන්න. මේ දිහා දේශපාලන කෝණයෙන් බලන්න එපා. මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මීට පෙර කිසිම ඇමතිවරයෙක් මේ විෂය පිළිබඳව පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ එක්ක එකට ඉඳගෙන කථා කරනවා මම දැකලා නැහැ. මම බලාගෙන හිටියා, විපක්ෂ නායකතුමා එතුමා එක්ක මේ පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡාවකට ආවා. විපක්ෂ නායකතුමා බොහොම සාවධානව අහගෙන හිටියා. එතුමා මේකට කිසිම විරෝධතාවක් දැක්වූයේ නැහැ. එතුමා ශබ්ද නැතුව එතැනින් එළියට ආවා. ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඒ රැස්වීමේදී කිව්වා, මීට වැඩිය බලතල දෙන්න ඕනෑ කියලා. විපක්ෂය එහෙම කථා කරලා, අද මෙතැනට ඇවිල්ලා කියනවා, අපි මේ පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය දෙනවා කියලා. ඒක තමයි ඔබතුමන්ලාගේ දේශපාලනය. අපි ඒ පිළිබඳව විරුද්ධ නැහැ.

කරු ජයසූරිය මැතිතුමා විදුලිබල හා බලශක්ති ඇමතිතුමා වශයෙන් සිටියදී තමයි මේ යෝජනාව ගෙන ආවේ. මේ පනත ගෙන ආවේ එතුමායි. ඒ නිසා, අවුරුදු 22කට පස්සේ හරි මේ රටේ ජාතික ආර්ථිකයට දැවැන්ත පිටුවහලක් වෙන, විදුලිබල ක්ෂේත්‍රය වෙනුවෙන් දායකත්වයක් දෙන, ඒ ඓතිහාසික තීන්දුව ගැනීම පිළිබඳව හා මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන ඒම පිළිබඳව ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.05]

ගරු අමිර්තනාදන් අයිඩික්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்றைய தினம் இந்தச் சபையில் நடைபெறுகின்ற இலங்கை மின்சாரம் சட்டமூலம் தொடர்பான Debateஇல் கலந்துகொண்டு, அதுதொடர்பில் என்னுடைய கருத்துகளைச் சொல்லலாமென நினைக்கின்றேன். அதற்கு முன்னர், அண்மையில் இந்தியாவில் நடந்து முடிந்த நாடாளுமன்றத் தேர்தலின் முடிவுகளின்படி, மூன்றாவது முறையாகவும் மக்களுடைய ஆணையைப் பெற்று, பிரதமராகத் தெரிவு செய்யப்பட்டிருக்கின்ற நரேந்திர மோடி அவர்களுக்கு இந்த உயரிய சபையில் எங்களுடைய வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றோம். தமிழ் நாட்டைப் பொறுத்தமட்டில், அங்கு முதலமைச்சராக இருக்கின்ற ஸ்டாலின் அவர்களுடைய தி.மு.க. கட்சி 40 தொகுதிகளிலும் வெற்றி பெற்றிருக்கிறது. அதற்காக தமிழ் நாட்டு முதலமைச்சர் அவர்களுக்கும் எங்களுடைய வாழ்த்துக்களைத் தெரிவித்துக்கொள்கின்றோம்.

இன்றைய விவாதத் தலைப்புக்கு அப்பாற்பட்ட சில விடயங்களைப் பேசிவிட்டு, இலங்கை மின்சாரம் சட்டமூலம் தொடர்பில் பேசலாமென நினைக்கின்றேன். அண்மையில் அம்பாறை மாவட்ட நாடாளுமன்ற உறுப்பினர் கௌரவ முஸ்ஸாரப் அவர்கள், கல்முனை வடக்குப் பிரதேச செயலக விடயம் தொடர்பில் சில கேள்விகளை எழுப்பியிருந்தார். கல்முனை வடக்குப் பிரதேச செயலகமானது, 1993.07.28ஆம் திகதிய அமைச்சரவைத் தீர்மானத்தின்படி, 30 வருடங்களாகப் பிரதேச செயலகமாக இயங்கி வருகின்றது. அது கௌரவ முஸ்ஸாரப் அவர்களுக்குத் தெரியாதென நினைக்கின்றேன். அந்த அமைச்சரவைத் தீர்மானம் தொடர்பான ஆவணங்களை நான் சபாபீடத்தில் ***சமர்ப்பிக்கின்றேன்.**

ஏன் இந்தப் பாகுபாடு? அந்தப் பிரதேச செயலகத்துக்கு ஒரு கணக்காளரை நியமித்து, அங்குள்ள தமிழ் மக்களை வழி நடத்தக் கூடிய செயற்பாடுகளை அரசாங்கம் மேற்கொள்ளாமல் இருப்பதைப் பார்க்கின்றபோது, எங்களுக்கு மிகவும் மன வருத்தமாக இருக்கின்றது. கல்முனை வடக்குப் பிரதேச செயலகத்தில் பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டம் பல வருடங்களாக நடைபெற்றிருக்கின்றன. ஆனால், இப்பொழுது புதிதாக வந்துள்ள பிரதேச அபிவிருத்திக் குழுவின் தலைவர் அங்கு கூட்டம் நடத்துவதற்குத் தயங்குகிறார். முஸ்லிம் மக்களுடைய வாக்குகளைப் பெறுவதற்கான ஓர் உத்தியாக அவர் அதைப் பாவிக்கிறாரோ தெரியவில்லை. ஆனால், அவருடைய பேச்சுக்கள் நடுநிலையான, எல்லோரையும் கவரக் கூடியவையாக இருக்கின்றன.

கல்முனை வடக்குப் பிரதேச செயலகப் பிரிவிலுள்ள மக்கள் தொடர்ந்து போராட்டம் மேற்கொண்டு வருகின்றார்கள். கௌரவ பிரதமர் அவர்கள் ஒரு குழுவை நியமித்து, இவ் விடயத்தை நியாயமான முறையில் விசாரித்து, இதிலுள்ள சரி, பிழையைக் கண்டறிந்து, கல்முனை வடக்குப் பிரதேச செயலகத்தை இயக்குவதற்கான நடவடிக்கைகளை மிக விரைவில் மேற்கொள்ள வேண்டும். நாங்கள் அங்கு சென்ற போது, தங்களை நையாண்டி செய்வதாகவும் கேவலமாகப் பேசுவதாகவும் ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டிருந்த பெண்கள் அழுதழுது சென்னார்கள். இந்த மக்களுடைய குறையைத் தீர்க்கவேண்டியது அரசாங்கத்தின் கடமையாகும். கல்முனை வடக்குப் பிரதேச செயலகத்துக்குக் கணக்காளர் ஒருவரை நியமித்தால், அது தானாகவே இயங்குவதற்கான வாய்ப்பு இருக்கின்றது. இந்த விடயம் தொடர்பில் அரசாங்கம் விசாரணை committee ஒன்றை நியமித்து, இது தொடர்பில் விசாரித்து, தக்க தீர்வைப் பெற்றுக்கொடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, எங்களுடைய மன்னார் மாவட்டத்தில் பறவைகள் சரணாலயமானது நகர்ப் புறத்திலே இருக்கின்றது. மன்னார் நகர்ப் புறத்தில் ஒரு கட்டிடம் கட்டமுடியாத சூழல் காணப்படுகின்றது. அதுமாத்திரமன்றி, மன்னார் நகரத்தை development செய்ய முடியாத நிலையும் காணப்படுகின்றது. நான் இங்கு இரண்டு விடயங்களை எடுத்துக் கூறலாமென நினைக்கின்றேன். விடத்தல்தீவு கடற்கரையோரப் பகுதியில் பல ஏக்கர் காணிகள் விடுவிக்கப்பட்டு இருக்கின்றன. அந்த இடங்கள் மீன் உற்பத்தி செய்யப்படுகின்ற இடங்களாக இருக்கின்றன. அதுமட்டுமல்ல, அந்த இடங்கள் கடலரிப்பைத் தடுக்கின்ற இடங்களாகவும் இருக்கின்றன. அந்த இடங்களைப் பண்ணைகளுக்குக் கொடுத்தால், அங்கு நிச்சயமாக கடலரிப்பு ஏற்படும். அதுமட்டுமல்ல, பண்ணைகளுக்குள் இருக்கின்ற கழிவுகள் கடலுக்குள் செல்கின்றபொழுது, கடல் மாசுபடக் கூடிய சூழலும் ஏற்படும். அந்தப் பகுதிகளை விடுவிப்பதை விட, மன்னார் நகர்ப் பகுதியை விடுவிப்பது சிறந்ததென நாங்கள் கருதுகின்றோம். அந்த வகையில், இதனை உடனடியாகச் செய்ய வேண்டுமென Wildlife இற்குப் பொறுப்பான அமைச்சரிடத்தில் நாங்கள் கேட்டுக்கொள்கின்றோம்.

கடலரிப்புக்கு உள்ளாகியுள்ள வங்காலைப் பிரதேசத்தை நான் நேரில் சென்று பார்த்தேன். அங்கு கடலரிப்பானது மிக மோசமாக இருக்கின்றது. இதனால் வீடுகள்கூட பாதிப்படைவதற்கான வாய்ப்பு இருக்கின்றது. நான் இது சம்பந்தமாக மாண்புமிகு சனாதிபதி அவர்களிடமும் முறையிட்டேன். அங்கு கடலரிப்பைத் தடுப்பதற்கு அணை போட வேண்டுமென்றும் அதற்கான நடவடிக்கைகளை உடனடியாக மேற்கொள்ள வேண்டுமென்றும் நான் அவரிடம் கேட்டுக்கொண்டேன். மன்னாரில் கடலரிப்பானது, கூடுதலாக ஏற்படுவதற்கு வாய்ப்பு இருக்கின்றது. வாங்காலைப் பிரதேசத்தைக் கவனத்திலெடுக்க வேண்டும். இல்லையேல், அந்தக் கிராமமே அழிவடையக் கூடும். அவ்வாறானதொரு நிலையில்தான் இப்பொழுது அந்தக் கிராமம் காணப்படுகின்றது. ஆகவே, அங்கு கடலரிப்பைத் தடுக்கக்கூடிய வகையில் நிலங்களை விடுவிக்க வேண்டும். குறிப்பாக, எங்களுடைய மக்கள் பயன்படுத்தக்கூடிய நிலங்களை விடுவிக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். எங்களுடைய மக்கள் நிலம் சம்பந்தமான பல்வேறு பிரச்சினைகளைச் சந்தித்துக்கொண்டு இருக்கின்றார்கள். இவை உடனடியாகக் கவனத்தில் எடுக்கப்பட வேண்டும். அண்மையில் மாண்புமிகு ஜனாதிபதி அவர்கள் காணி உறுதிகளை வழங்கியிருந்தார். அந்த நிகழ்வுகளில் நாங்களும் கலந்து கொண்டோம். இன்னும் பலருக்கு காணி உறுதிகளைப் பெறுவதற்கான சந்தர்ப்பம் உண்டு. அவற்றையும் வெகுவிரைவில் கொடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய மன்னார் பிரதேசத்தில் அமைக்கப்பட்டுள்ள காற்றாலை மின் உற்பத்தி நிலையத்தால் பாரிய பிரச்சினை ஏற்பட்டிருக்கிறது. அது சம்பந்தமான தகவல்களை எங்களாலும் உங்களுக்குப்

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පෙට්‍රුත්තර මුඩියුම්. නීංගල් මක්කළුක්කු ඉන්ත විඩයම් සම්බන්තමාග ඔරු විළක්කත්තෙක් කොඩුක්ක වේණ්ඩුම්. නීංගල් මක්කළුඩෙය අපිප්පිරායත්තෙප් පෙට්‍රුත්තාන් ඉන්ත විඩයංගළෙක් කෙයාළ වේණ්ඩුම්. අංගු වාළුකින්ර මක්කළ් අපායකරමාන සූළලිල් ඉරුප්පතාග උණර්කින්රාර්කළ්. මන්නාරිල් කඩල් මට්ටමුම් නිල මට්ටමුම් සමමාග ඉරුක්කින්රතු. අංගු ආරම්පත්තිල් මේර්කොළ්ළප්පට්ට කාර්රාලෙ මින් උර්පත්ති නඩවඩික්කෙකළ් plan පණ්ණි සෙය්යප්පඩාත කාරණත්තාල්, මළෙක් කාලංකළිල් මන්නාර් නකරම් නීරිල් මූළ්කින්ර නිලෙ ඒර්පට්ටිරුක්කිරතු. ආකවේ, නීංගල් ඉන්ත විඩයම් පර්රි කුරිත්ත කම්පනිකළෝඩු මාත්තිරම් පේසාමල්, අංකිරුක්කින්ර මක්කළෝඩුම් මක්කළ් පිරතිනිතිකළෝඩුම් පේස වේණ්ඩුම්. අව්වාරු සෙය්තාල්තාන් අන්ත විඩයංගළෙත් තුරිතමාකවුම් එන්තවොරු තවරුම් ඉල්ලාමලුම් සෙය්ය මුඩියුම්.

කෞරව අමෙච්චර් අවර්කළේ, ඉන්රු මින්සාරම් සම්බන්තමාන විඩයත්තිල් පල කුළරුපඩිකළුම් පිරච්සිනෙකළුම් ඉරුන්තාලුම්කූඩ, අවර්රෙයෙල්ලාම් නීංගල් සමාළිත්තු කොණ්ඩු සෙයර්පඩුකින්රීර්කළ්. අතර්කාක නාන් උංකළෙප් පාරාට්ටුකින්රේන්. ඉප්පොළුතු මින්සාරප් පට්ටියල් paper වඩිවිල් වළංගප්පඩාමල් කුරුඤ්සෙය්තිමූලම් වරුවතාල්, එංකළුඩෙය කිරාමප් පුරංකළිල් කෛත්තොලෛපේසි පයන්පඩුත්තාත පෙරුම්පාලාන මින් පාවනෙයාළර්කළාල් මින් කට්ටණත්තෙ උරිය කාලත්තුක්කුළ් සෙලුත්ත මුඩිව තිල්ලෙ. අතනාල් මින් ඉණෙප්පු තුණ්ඩික්කප්පඩුකින්ර ඕර් අපාය නිලෙ ඒර්පට්ටිරුක්කින්රතු. මින් කට්ටණත්තෙ උරිය කාලත්තුක්කුළ් සෙලුත්තවිල්ලෙ එන්රාල්, වට්ටියුම් අර්විඩප් පඩුකින්ර ඔරු සූழ්නිලෙ කාණප්පඩුකින්රතු. එනවේ, නීංගල් ඉන්ත ඉරණ්ඩු විඩයංගළෙයුම් කරුත්තිර්කොළ්ළ වේණ්ඩුමෙනක් කේට්ටුක්කොළ්කින්රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up.

ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා
(මාණ්පුමිකු අමිර්තනාතන් අඩෛක්කලනාතන්)
(The Hon. Amirthanathan Adaikkalanathan)
Please give me one more minute.

ඉරුතියාග, මලෛයකම් සම්බන්තමාන ඔරු විඩයත්තෛච් සොල්ල විරුම්පුකින්රේන්. අන්නියර් ආට්චික් කාලත්තිල් මලෛයකත්තිල් මින් උර්පත්ති සෙය්වතර්කෙන ඔරු system නඩෛමුරෛයිල් ඉරුන්තතු. ඉතු තේයිලෛත් තොළිර්චාලෛ කළුක්කුච් චිරන්ත ඉලාපත්තෛප් පෙට්‍රුක්කොටුක්කුම් ඔරු මුරෛමෛයාකුම්. කෙල්ලි, මහාඑලිය, කොට්ටකලෛ මර්රුම් තලවාක්කලෛ පෝන්ර ඉටංකළිලුළ්ළ තේයිලෛත් තෝට්ටංකළිල් මේර්කුරිත්ත මුරෛමෛ චාර්න්ත උපකරණංකළ් උළ්ළන. අවර්රෛච් චීර්සෙය්තු නඩෛමුරෛක්කුක් කොණ්ඩුවරුකින්ර පට්චත්තිල්, තෝට්ටත් තොළිලාළර්කළුක්කුක් කුරෛන්තළවු මින් කට්ටණත්තෙ අර්විඩුවතර්කාන වාය්ප්පු ඉරුප්පතාකච් චිලර් සොල්කින්රාර්කළ්. ඉතු තොටර්පිල් නීංගල් කවනමෙටුක්ක වේණ්ඩුමෙනක් කේට්ටු, විටෛපෙරුකින්රේන්. නන්රි! වණක්කම්!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.16]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු මුජීපුර් රහ්මාන්)
(The Hon. Mujibur Rahuman)
මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන මේ වෙලාවේදී අපි සියලුදෙනාම මතක් කර ගත යුතු කාරණයක් තිබෙනවා. 2019දී මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව බලශක්තිය පිළිබඳ ප්‍රතිපත්තිය තුන් වතාවක් වෙනස් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ වාගේම ලක්විජය බලාගාරයේ මෙගාවොට් 300ක් හඳන 4වැනි අදියර ආරම්භ කළා. නමුත්, තමුන්නාන්සේලා ඒක කරන්නේ නැතිව අවලංගු කර දැම්මා. ඒ වාගේම පරිසරයට හිතකර විධියට කෙරවළපිටියේ මෙගාවොට් 300ක LNG බලාගාරයක් හැදීමේ ඉදිකිරීම් කටයුතු පටන් ගත්තා. තරගකාරී මිල ගණන්වලට ඒකට ටෙන්ඩර් කැඳවීම් කළා; ඇගැයීම් වාර්තා හැදුවා; අන්තිමට ඒ සියලු දේවල් අවලංගු කරලා දැම්මා. අපි දන්නේ නැහැ, ඇයි ඒක අවලංගු කළේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතුමන්ලාගේ ක්‍රියාකාරකම් සහ අත්තනෝමතික දේශපාලන අතපෙවීම් නිසා තමයි අඩු මුදලට ලබා දෙන්න පුළුවන් විදුලි ඒකකයක මිල අද වෙනකොට ඉතාම ඉහළ මිලක් දක්වා වැඩි වෙලා තිබෙන්නේ. අපි දන්නවා, පසුගිය අවුරුද්දේ මේ කාලය වෙනකොට විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 60කට වැඩි ලාභයක් ලැබූ බව. ඉතාම අධික ලාභයක් ලැබුවත්, ජනතාවට ඉතාම සුළු ප්‍රමාණයක සහනයක් තමයි විදුලිබල මණ්ඩලය ලබා දීලා තිබුණේ. නමුත්, මේ අලුත් පනත යටතේත් අවම මුදලකට විදුලිය ඒකකයක් ලබා දෙනවා කියන සහතිකය ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු ඇමතිතුමා උදේ කථා කරද්දි ඇහුවා, ඇමතිවරයෙක් හැටියට එතුමාට විශාල බලතල ප්‍රමාණයක් ලබා දෙනවාට ඇයි අකැමති කියලා. බලතල නැතිව කරපු ගනුදෙනු තිබෙනවා. විශේෂයෙන් එතුමා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවක් ගැනත් මම කියන්න ඕනෑ. Adani Green Energy Limited එකත් සමඟ එකතු වෙලා සුළං බලයෙන් මෙගාවොට් 484ක විදුලිය ලබා ගැනීම සඳහා 2024 මැයි මාසයේ 07වෙනි දින ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව යටතේ එතුමා තීන්දු කරලා තිබෙනවා, unit එකක් ඇමෙරිකානු ඩොලර් 0.826කට ගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2023 නොවැම්බර් මාසයේ 30වෙනි දා කැබිනට් මණ්ඩලය විසින් පත් කළ කමිටුව නිර්දේශ කරනවා, ඇමෙරිකානු ඩොලර් 0.55කට unit එකක් ගන්න කියලා. නමුත්, 2024 මැයි මාසයේ 07වෙනි දා ඇමතිතුමා ඉදිරිපත් කරපු Cabinet Paper එකේ කියා තිබෙන්නේ unit එකක් ඇමෙරිකානු ඩොලර් 0.826කට ගන්නයි. ඇයි, මේ තරම් විශාල වෙනසක්?

ඊළඟට, සුළං විදුලි බලය මෙගාවොට් 50ක් ලබා ගැනීමේ ව්‍යාපෘතිය සඳහා මැයි මාසයේ 09වෙනි දා ටෙන්ඩර් කැඳෙව්වා. ඒ ටෙන්ඩර් කැඳවීම අනුව අපට දැනට තොරතුරු ලැබිලා තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් 0.5කට unit එකක් ගන්න පුළුවන් කියලා. ඒ ව්‍යාපෘතියේ ටෙන්ඩර් කැඳවීම අවසන් කරලාත් ඉවරයි. නමුත්, තවම ඒ ටෙන්ඩර් විවෘත කළේ නැහැ. අපි දන්නේ නැහැ, ඇයි තවම ඒවා විවෘත කරන්නේ නැතිව ඉන්නේ කියලා. මෙගාවොට් 50ක සුළං විදුලිය unit එකක් ඇමෙරිකානු ඩොලර් 0.5 බැගින් ලබා ගන්න පුළුවන් නම්, මෙගාවොට් 484ක සුළං විදුලි බලය ලබා ගැනීම වෙනුවෙන් අපි අදානි සමාගමට unit එකක් සඳහා ඇමෙරිකානු ඩොලර් 0.826ක් ගෙවන්නේ ඇයි?

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉන්දියාවේ අදානි සමාගම විතරක් නොවෙයි විදුලි ව්‍යාපෘති කරන්නේ. විදුලි ව්‍යාපෘති කරන තව සමාගම් ඉන්දියාවේ තිබෙනවා. ඇයි, ඉන්දියාවේ අදානි සමාගමටම මේක දෙන්නේ? කිසිම ටෙන්ඩර් ක්‍රියා පටිපාටියක් නැහැ. එතුමන්ලා කියනවා, G2G කියලා. අපි දන්නවා, අදානි සමාගම කියන්නේ ඉන්දියාවේ රාජ්‍ය සමාගමක් නොවෙයි, පෞද්ගලික අංශයේ සමාගමක් බව. කඩිමුඩියේ ඒ සමාගමට මේක දෙන්න මේ තරම් සැරසෙන්නේ ඇයි කියන එක තමයි අපට තිබෙන ගැටලුව. ඔබතුමන්ලා කියන විනිවිදභාවය, අලුත් පනතින් ඇති කරන විනිවිදභාවය ගැන කිසිදු විශ්වාසයක් ඇති වෙනවාද, ඔබතුමන්ලා කළ ඒ ගනුදෙනු දිහා බැලුවාම? ඒ හින්දා තමයි අපි මේවා කියන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා එක පැත්තකින් කියනවා, බලතල අවශ්‍යයි කියලා. නමුත් ඒවා බලතල නැතිව, සීමිත බලතල ප්‍රමාණයකින් කළ ගනුදෙනු. අසීමිත බලතල ප්‍රමාණයක් ලැබුණොත් ඇමතිතුමා මොන විධියකට ක්‍රියා කරයිද කියන එක පිළිබඳව සාධාරණ සැකයක් අපට තිබෙනවා.

විශේෂයෙන්ම මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. ගරු ඇමතිතුමා උදේ ඉඳන් අපට LTL එක ගැන කිව්වා. අපි එතුමාට මතක් කරන්න ඕනෑ, LTL එකේ සියයට 63ක කොටස් ලංකා විදුලිබල මණ්ඩලයට අයිතිව තිබුණු බව. ඊළඟට, මෙතුමන්ලා එයින් සියයට 28ක කොටස් LTL එකට පැවරුවා. එලෙස පැවරීම තුළ දැන් LTL එකට සියයට 55ක කොටස් තිබෙනවා. දැන් ගරු ඇමතිතුමා කියනවා, LTL එක ඊළඟට අයිති වෙන්නේ West Coast Power (Pvt.) Limited එකට කියලා. ඒ වාගේම ගරු ඇමතිතුමා කියනවා, West Coast Power (Pvt.) Limited එකේ වැඩි කොටස් තිබෙන්නේ රජයට කියලා. එහෙම නම් අපි අහන්නේ, West Coast Power (Pvt.) Limited එක විගණකාධිපතිතුමාගේ විගණනයට ලක් වෙන්නේ නැත්තේ ඇයි කියලායි. ගරු ඇමතිතුමනි, West Coast Power (Pvt.) Limited එක රජයේ සමාගමක් නම්, ඒ නිලධාරීන් COPE එකට එවන්න ඔබතුමා භාර ගන්නවාද? ඔවුන් COPE එකට එන්නේ නැහැ. ඔවුන් විගණනයට යටත් වෙන්නේ නැහැ. ඒක තමයි අපි කියන්නේ, ඉතාම වංචනික විධියට මේ ගනුදෙනු කරලා තිබෙනවාය කියලා.

අවසාන වශයෙන් මේ නිලධාරීන්ට අපි එක දෙයක් කියනවා. අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉන්නවා, නිලධාරීන් ඉන්නවා. ඔබතුමන්ලා මතක තබා ගන්න, මේ ආණ්ඩුව තිබෙන්නේ තව මාස හතරයි කියන එක. මේ ආණ්ඩුවට තව මාස හතරකින් යන්න වෙනවා. ඇමතිතුමා හැම දාම ඔය ඇමති ධුරයේ ඉන්නේ නැහැ. නමුත්, නිලධාරීන් හැටියට කරන හැම ගනුදෙනුවකටම ඔය නිලධාරීන් වග කියන්න ඕනෑ. ලේකම්තුමාගේ අත්සන, අනෙක් නිලධාරීන්ගේ අත්සන් තිබෙන්නේ. ඒ නිසා තමුන්නාන්සේලාට ගැලවෙන්න බැහැයි කියන එක අපි ඒ නිලධාරීන්ට මතක් කරනවා. දේශපාලනඥයන් ඇවිල්ලා, අවුරුදු ගණනාවකට දූෂිත ගනුදෙනු,- අපි දැක්කා නේ, කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමාගේ අමාත්‍යාංශය භාරව සිටි ලේකම්තුමාට වුණේ මොකක්ද කියලා. අන්තිමට කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා විතරක් නොවෙයි, ලේකම්තුමාත් තවම ඉන්නේ රිමාන්ඩ් බන්ධනාගාරයේ. ඒ නිසා අපි විදුලිබල මණ්ඩලයේ ඉන්න නිලධාරී මහත්වරුන්ටත්, අමාත්‍යාංශයේ ලේකම්වරයාටත් මතක් කරනවා, ආණ්ඩුව ඉන්නේ අඩමානයක බව. තව මාස හතරකින්, එහෙම නැත්නම් තව පෝය හතරකින් මේ රාජපක්ෂ-වික්‍රමසිංහ ආණ්ඩුවට යන්න වෙනවා. එහෙම ගියාට පස්සේ මේ ඉන්න නිලධාරීන්ට මේවාට වගකියන්න වෙනවාය කියන එක මම මතක් කරන්න ඕනෑ.

දේශපාලනඥයන්ගේ ඒ දූෂිත වංචා යට ගහන්න, ඒවාට අනුමැතිය දෙන්න ජනතාවගේ බදු මුදල්වලින් පඩි ලබා ගන්න රාජ්‍ය නිලධාරීන් කිසිදු විටෙකවත් කටයුතු කරන්න එපා කියලා අපි ඒ නිලධාරීන්ට මතක් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.23]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අද බලශක්තිය ගැනයි කථා කරන්නේ. බලශක්තිය කියන්නේ රටක තිබෙන ප්‍රධානම විෂයයක්; ඒ වාගේම එක පැත්තකින් රටේ ආරක්ෂාවටත්, අනෙක් පැත්තෙන් රටේ ජීවත් වන ජනතාවටත් අත්‍යවශ්‍ය වූ සාධකයක්. බලශක්තිය මෙහෙයවීම රජයක් විසින් මොන ආකාරයෙන් කළ යුතුද කියන එක ගැන අපි හිතන්න ඕනෑ. මෙන්න මේ කාරණය තමයි ප්‍රධාන වශයෙන් අපි සලකා බැලිය යුත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රාජ්‍ය බලය යටතේ ආයතන පවත්වාගෙන යද්දී ඒවා තුළ දූෂණ කටයුතු සිදු වෙනවා නම්, ඒවායේ ක්‍රියාකාරිත්වය අඩු වෙනවා නම්, අඩපණ වෙනවා නම්, එහෙම නැත්නම් පාරිභෝගික ජනතාවට ඒවායෙන් නියමිත සේවා ලැබෙන්නේ නැහැයි කියනවා නම්, ඒ දුර්වලතාව මහ හැරීම සම්බන්ධයෙන් වූ වගකීම පැහැදිලිවම පාර්ලිමේන්තුවත්, ආණ්ඩුවත් භාර ගත යුතුයි. ඒ ආකාරයේ දෙයක් රටක සිද්ධ වෙන්න බැහැ. ඒවා නිවැරදි කරන්න ඕනෑ.

අපි system change එකක් ගැන කථා කරනවා. රාජ්‍ය සේවය තුළ system change එකක් කරනවා නම්, රාජ්‍ය සේවය අත්හැර දාලා, ඒකෙන් ගැලවිලා, ඒක පෞද්ගලික අංශයට භාර දීලා ඒ වැඩ කොටස කරන්න පුළුවන් කියනවා නම්, ඒක අසාර්ථක රාජ්‍යයක ප්‍රතිඵලයක් හැටියටයි අප දකින්නේ. රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය කියන දෙඅංශයම එකට එකතු වෙලා වැඩ කටයුතු කිරීම වෙනත් කාරණාවක්.

මට තිබෙන්නේ විනාඩි 5ක් වැනි පොඩි කාලයක් නිසා ගරු අමාත්‍යතුමාට මේ කාරණය විශේෂයෙන්ම මතක් කරන්න මම කැමැතියි. නොරොච්චෝලේ බලාගාරය හදද්දී පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රදේශයේ අපේ ජනතාව මේ මහ පොළොවේ දිවි පිදුවා, මේක හදන්න දෙන්න බැහැ කියලා. දැන් නොරොච්චෝලේ බලාගාරය හදලා ඉවරයි. දැන් ඒක ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ බලාගාරය ක්‍රියාත්මක වෙද්දී ඒ ප්‍රදේශයේ පරිසර දූෂණය සිදු වෙනවා වාගේම ජනතාවට ඒ තුළින් සිදු වෙන හානියත් ඉතාම බරපතළයි. හැබැයි, ඒ හානිය විඳගෙන ඒ ජනතාව ඉන්නවා. මොකද, ඒ බලාගාරයෙන් රටට ප්‍රතිඵලයක් ලැබෙන නිසා. හැබැයි, අද ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පතේ සඳහන් වැඩසටහන අනුව මේ ආයතනය යම් ආකාරයකින් පෞද්ගලික අංශයට ලබා දුන්නොත්, දැනට ඒ නඩත්තු කටයුතු කරන චීන සමාගමටම තමයි ලැබෙන්නේ. එහෙම වුණොත්, ඒ ප්‍රදේශය චීන කොලනියක් වෙයි; චීනයට ඒක භාර දෙයි.

ඊළඟට අපි බලමු, මන්නාරමේ ඉදිකර තිබෙන සුළං විදුලි බලාගාරය ගැන. 2019දී අවසාන කරපු ඒ සුළං විදුලි බලාගාරයට මොකක්ද වෙන්නේ? මේ බලාගාරය ඉතාම හොඳින් ක්‍රියාත්මක වෙනවා. මේ බලාගාරයත් අදානිගේ වෙච්දි? එහෙම වුණොත් මතු වන ප්‍රශ්නය මොකක්ද? එහෙම වුණොත්, අදානි සමාගමට මේ

බලාගාරයේ තිබෙන ඒ කොටස් ටික විතරක් නොවෙයි, ඒ ඉඩම් කොටසත් හම්බ වෙනවා. අද ඉන්දියාවේ සමහර දේවල්වලට විශාල වශයෙන් ශක්තිය ලබා දෙන, සමහර වෙලාවට ඉන්දියාවේ දේශපාලනඥයින්ට වඩා ඉහළින් ඉන්න කෙනෙක් තමයි අදානි කියන්නේ. අදානිට මේ ප්‍රදේශයම අයිති වෙද්දී අපට මොකද වෙන්නේ? දැනටත් ධීවරයන් හැටියට කටයුතු කරන අපේ අභිංසක ජනතාවට trawling ක්‍රමය යටතේ මසුන් අල්ලා ගැනීමට නොහැකි වී තිබෙනවා, ඉන්දියාවෙන් ඇවිල්ලා අපේ රටේ මුහුදු පැළෑටියක්වත් තියන්නේ නැතුව මුහුදු පතුලම හාරගෙන යන නිසා. ඒක නවත්වා ගන්න බැරිව රටක් හැටියට ඒ දිහා හූල්ල-හූල්ලා බලාගෙන සිටියදී අදානිත් ඇවිල්ලා අර ප්‍රදේශයම අල්ලා ගත්තොත් මොකක්ද වෙන්නේ? ඉන්දියාවත් එක්ක අපට ප්‍රශ්නයක් නැහැ; ඉන්දියානු රජය එක්ක ප්‍රශ්නයකුත් නැහැ. හැබැයි, අදානි කියන ව්‍යාපාරිකයාට මේක දෙන්න මේ ආණ්ඩුවේ සිටින ඔබතුමන්ලා කැමැතිද? මොකද, මේ පනත අනුව මේක පෞද්ගලික අංශයට ලබා දෙන්න අවශ්‍ය කරන ඉඩකඩ, නීති රාමුව එකවරම සකස් වෙනවා, අමාත්‍යවරයා දැන හෝ නොදැන, එහෙම නැත්නම් වෙනත් බලපෑමක් මත. මේ කටයුත්ත ඉදිරි කාලයේදී සිද්ධ වෙන්නේ නැහැ කියන එක මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළදී ඔබතුමන්ලාට කියන්න පුළුවන්ද?

ඒ සම්බන්ධයෙන් විශේෂයෙන්ම රාජපක්ෂ ප්‍රතිපත්තිය මොකක්ද කියලා අපි අහනවා. ඊයේ-පෙරේදාත් කිව්වා, පෞද්ගලික අංශයට රජයේ ආයතන විකුණන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ නැහැ කියලා. අපි අහන්න කැමැතියි, මේ කාරණය. රාජපක්ෂ ප්‍රතිපත්තියේ තිබෙනවාද මේවා පෞද්ගලික අංශයට දෙනවාද නැද්ද කියලා? මේ රටේ සමස්ත ජනතාවට ඇහෙන්න මේ පාර්ලිමේන්තුවේදී අද ප්‍රකාශයක් කරන්න, ඒ ආයතන පෞද්ගලික අංශයට ඒ විධියට ලබා දෙන්නේ නැහැ කියලා. රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගතකරණය කරලා සංවර්ධනය කරන වැඩ කටයුතු කරනවා වාගේම අලුතින් පෞද්ගලික අංශයේ ව්‍යාපෘති මේ රටට ආවාට කමක් නැහැ. ඒක තමයි කළ යුත්තේ. රාජ්‍ය අංශයේ තිබෙන ඒවා ප්‍රතිව්‍යුහගතකරණය කරලා ඒවා ඉදිරියට ගෙනයන ගමන් අලුතින් එන සියලු දේ පෞද්ගලික අංශයත් එක්ක එකතු වෙලා අලුතින් දියුණු වෙන වැඩසටහන් එක්ක, අලුත් ක්‍රමවේද, අලුත් නිෂ්පාදන එක්ක ක්‍රියාත්මක කළාට කමක් නැහැ. හැබැයි, රටක් හැටියට අපට තිබෙන විශාලම විෂයය හැටියට සැලකෙන, එහෙම නැත්නම් රටේ ජනතාවට අත්‍යවශ්‍ය සේවාවක් හැටියට සැලකෙන බලශක්තිය සම්බන්ධයෙන් තීන්දු-තීරණ ගනිද්දී මතක තියාගන්න, මේවා පෞද්ගලික අංශයට ලබා දුන්නොත් මේ රටම ඒ ගොල්ලන්ට පාලනය කරන්න හැකියාවක් ලැබෙන බව.

එදා අපේ රටේ වැඩිපුරම විදුලිය නැතුව ගියේ ඉන්ධන ගෙනෙන්න සල්ලි තිබුණේ නැති නිසා. එදා මේ රටේ මිනිසුන්ට විදුලිය නැතුව අන්ධකාරයේ ඉන්න සිදුවුණා. ඒ පහසුකම් ටික ලබා ගන්න බැරුව ගියා. කර්මාන්ත කරන්න බැරුව ගියා. හැබැයි, ඒ වාගේ රටට වැදගත් ආයතනයක් වෙනත් ආයතනයක, වෙනත් රටක පාලනයට ගියාම ඒක අපට පහසු වෙයි කියලා හිතන්න එපා. ශ්‍රී ලංකාවේ මිනිසුන්ගේ නිදහස ඒ විධියට භුක්ති විඳින්න අවස්ථාවක් ලැබෙයි කියලා අපට විශ්වාස කරන්න බැහැ. ඒ නිසා මේ පනත් කෙටුම්පතට අත ඔසවන්න පෙර තමුන්නාන්සේලා සියලුදෙනාගෙන් අපි ඉල්ලනවා, මේ ආයතන ඒ ආකාරයෙන් පෞද්ගලික අංශයට විකුණන්නේ නැහැ කියලා මේ රටට විවෘත ප්‍රකාශයක් ලබා දෙන්න කියලා. තමුන්නාන්සේලා අත ඔසවන්න පෙර එය මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.29]

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලංකා විදුලිබල මණ්ඩලය ඒ වාගේම අමාත්‍යාංශය මූලික වෙලා පසුගිය දවස් කිහිපයේම මේ පාර්ලිමේන්තුවේදී දැනුවත් කිරීම් - presentations - කිහිපයක් තිබුණා. ඒවාට ආණ්ඩු පක්ෂය සහ විපක්ෂයේ මන්ත්‍රීවරු සියලුදෙනාට ආරාධනා කළා. ඇමතිතුමා, අදාළ නිලධාරීන්, ඒ අදාළ විශේෂඥයෝ ඇවිල්ලා මහා ලොකුවට මවන බිල්ලා ගැන වගන්තියෙන් - වගන්තියට, කරුණෙන් - කරුණට පැහැදිලි කිරීම් කළා. ඒකට විපක්ෂ නායකතුමාත් ආවා; හිටපු විදුලිබල ඇමතිතුමාත් ආවා. ඒ වාගේ සියලුදෙනා ඇවිල්ලා තමන්ට තිබෙන ප්‍රශ්න ඉදිරිපත් කරලා ඒ අදාළ විශේෂඥයන්ගෙන් උත්තර ගත්තා. ඒ අවස්ථා දෙක තුනකට මමත් සහභාගී වුණා. ඒ presentations ඉදිරිපත් කරන වෙලාවේ, ඒ පනත් කෙටුම්පත පිළිබඳ කරන අදහස් දැක්වීමේදී කිසිම ගැටලුවක් තිබෙනවා මම දැක්කේ නැහැ. කලින් හිටපු ඇමතිවරයෙක් විදුලිබල සහ බලශක්ති ඇමතිතුමාට canteen එකේදී කියනවා මට ඇහුණා, "මට පොඩි ප්‍රශ්න දෙකක් තිබුණේ. ඒ presentation ඒකේදි ඒකත් නිරාකරණය කර ගත්තා. එහෙම අවුලක් පෙනෙන්න නැහැ " කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සමගි ජන බලවේගයේ "The Blueprint"හි 22, 23 පිටුවල මේ ගැන පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. මේ පනත් කෙටුම්පතේ තිබෙන විධියටම තොරතුරු තිබෙනවා. ඒ වාගේම ජාතික ජනබලවේගය ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ බලශක්තිය පිළිබඳ කාරණය අටවැනි කාරණාව විධියට තිබෙනවා. එහි ඉතා පැහැදිලිවම තිබෙන්නේ අද ඉදිරිපත් කරන පනත් කෙටුම්පතේ කාරණාමයි. මම මේ රටේ ජනතාවට කියන්න කැමැතියි, "The Blueprint"හි 22, 23 පිටුත් ඒ වාගේම ජාතික ජනබලවේගය ඉදිරිපත් කරපු ලියවිල්ලේ 8වැනි කාරණාවත් හොඳට කියවලා අද ඉදිරිපත් කරන පනත් කෙටුම්පතේ කාරණාත් හොඳට කියවන්න කියලා. එතකොට තමුන්නාන්සේලාට, රටේ ජනතාවට පෙනෙනවා, මේකේ වෙනසක් නැහැ කියලා.

වචනවල හැඩය, සමහර වචන ලියලා තිබෙන විධිය අනුව යම් යම් වෙනස්කම් තිබෙන්න පුළුවන්. නමුත්, මූලික හරය ගත්තොත් ඉතා පැහැදිලිවම ඒවායේ තිබෙන්නේ මේ පනත් කෙටුම්පතේ කාරණාම තමයි. COPE එකේ සාමාජිකයෙක් හැටියටත් මම විශේෂයෙන්ම කාරණයක් කියන්න කැමැතියි. මේ විදුලිබල පනත විතරක් නොවෙයි, බොහෝ රාජ්‍ය ව්‍යාපාරවල අණ පනත් නව ලොවට ගැළපෙන විධියට, ගෝලීය තරගකාරිත්වයට ගැළපෙන විධියට, නව ලොවේ කළමනාකරණයට ගැළපෙන විධියට, තිබෙන ජාතික අවශ්‍යතා අනුව සහ පෞද්ගලික හා රාජ්‍ය ව්‍යවසායකයින් අතර එකිනෙකට ප්‍රශ්නයක් ඇති නොවෙන ආකාරයට තරගකාරීව ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන කාරණා පිළිබඳ ලොකු අධ්‍යයනයක් කරලා සකස් කරන්න ඕනෑ. එහෙම නැතිව මේ නවවන පාර්ලිමේන්තුවේදීත් අර පළමුවන පාර්ලිමේන්තුවේ හා දෙවන පාර්ලිමේන්තුවේ සම්මත කරපු පනත් ගැන කථා කරලා නිකම් බොරුවට කොරහේ කිඹුල්ලු දැකලා වැඩක් වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොහෝ කාරණාවලදී හැමදාම, හැම තිස්සේම කොහෙන් හරි කැරකිලා ගිහිල්ලා නවතින්නේ රාජපක්ෂලා ළඟ. මොන ආණ්ඩුවෙත් වැරදි තිබෙනවා. මොන ආණ්ඩුවෙත් අපට එකඟ වෙන්න බැරි කාරණා තිබෙනවා. විශේෂයෙන් නවක මන්ත්‍රීවරයෙක් විධියට මම

[ගරු නීතිඥ මධුර විතානගේ මහතා]

කියන්න කැමැතියි, මොන රජයක් ආවත්, මොන ජනාධිපති කෙනෙකු හිටියත්, කවුරු වැරැද්දක් කළත් එ් සම්බන්ධයෙන් අපේ විවේචන තිබෙන බව. විශේෂයෙන් ජාතික ජනන සැලැස්ම හැම රජයක්ම ඉතාම අසාර්ථක විධියට තමයි කළමනාකරණය කළේ. මම පොඩි අදහසක් ඉදිරිපත් කරන්නම්. ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කාලයේදී මෙගාවොට් 61යි ජාතික විදුලිබල පද්ධතියට එකතු වුණේ. ජෝන් කොතලාවල මැතිතුමාගේ කාලයේ බින්දුවයි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේදී මෙගාවොට් 6ක් එකතු වුණා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ මෙගාවොට් 900ක් එකතු වුණා. ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ මෙගාවොට් 140ක් එකතු වුණා. චන්ද්‍රිකා මැතිනියගේ කාලයේදී මෙගාවොට් 225ක් එකතු වුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ මෙගාවොට් 1,350ක් එකතු වුණා. මහ ලොකු ආර්ථික ඔස්තාර්ලා හිටපු, දැවැන්ත දැනුමක් තිබෙන, ප්‍රබුද්ධ විචාරකයින් හිටපු 2015 යහ පාලන රජයෙන් මම අහන්න කැමැතියි, ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් කීයක් එකතු කළාද කියලා. තමුන්නාන්සේලා ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් කීයක් එකතු කළාද? බින්දුවක් එකතු කරලා අද මේ ජනන සැලසුමක් ගැන කථා කරනවා. මම උදාහරණයක් කියන්නම්. 2018-2021 ජනන සැලසුම අනුව මෙගාවොට් 2,032ක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කරන්න ඕනෑ. හැබැයි, 2020 ජනවාරි වෙනකොට යහ පාලන ආණ්ඩුව ගෙදර ගියේ ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් එකක්වත් එකතු කරන්නේ නැතිවයි. දැන්, ඒ කට්ටිය මෙතැනට ඇවිල්ලා ලොකු කතන්දර කියනවා, සංදර්ශන පෙන්වනවා. නමුත් නිත්ත ඇත්ත ඒකයි; සත්‍යය ඒකයි.

මේ අණ පනත් අනිවාර්යයෙන්ම වෙනස් වෙන්න ඕනෑ. අපි පසුගිය කාලයේත් මේ වාගේ මහා වාදයක් කළා, පුනර්ජනනීය බලශක්තිය - සූර්ය බලය සහ සුළං බලය - විදුලිබල පද්ධතියට එකතු කර ගන්න අවසර නොදීම නිසා. විදුලිබල මණ්ඩලයේත්, අමාත්‍යාංශයෙත් බලවත් මාෆියාවක් තිබුණා. පනතේ තිබුණු "or" කියන වචනය අල්ලා ගත් නිසා අපට වසර ගණනාවක්ම විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්තිය ගෙනෙන්න බැරි වුණා. ඒ වාගේම ගෝලීය තරගකාරිත්වයත් එක්ක, අපේ රටට අතපොවපු රටවලට අවශ්‍ය වෙලා තිබෙනවා සැලසුම් සහගතව අපේ රටේ ජනන සැලසුම අවුල් කරලා, මේ පද්ධතිය අවුල් කරලා අපේ රටේ බලශක්ති අර්බුදයක් නිර්මාණය කරලා තමන්ගේ අවශ්‍යතා ඉෂ්ට කර ගන්න. පසුගිය කාලය හොඳින් නිරීක්ෂණය කළොත් අපට ඒක පෙනෙනවා. LNG බලාගාරයට ඇමෙරිකාවේ ආයෝජන එනකොට ඒකට bid කරපු අනෙක් රටවල් මොකද කළේ? ජනතා විමුක්ති පෙරමුණ, එහෙම නැත්නම් වෙනත් වෘත්තීය සම්මිතිවල බළල් අත් ලව්වා කටයුතු කරලා ඒ ආයෝජනවලට එන්න දෙන්නේ නැහැ; ඒ විදුලි බලාගාර හදන්න ඉඩ දෙන්නේ නැහැ. උද්ඝෝෂණ කරනවා. මෙගාවොට් 500ක සාම්පූර් බලාගාරය හදන්න ඉඩ දුන්නේ නැහැ. ඒ වාගේම උමා ඔයේ හිලක් තිබෙනවා කියමින් ලොකු නාඩගමක් නැටුවා. දැන් ඒක සනීප වෙලා තිබෙන්නේ. ඊයේ ඇමතිතුමිය කිව්වා, හිලක් අල්ලාගෙන දඟලපු නිසා රටට වෙච්ච ආර්ථික හානිය ගැන; ජනතා විමුක්ති පෙරමුණේ බොරු හිල නිසා රටට වෙච්ච හානිය ගැන. මේ නිසා අවුරුදු 7ක් අක්කර 21,000ක් වගා කරන්න බැරි වුණා.

වසරකට රුපියල් බිලියන 9 ගණනේ, බිලියන ගණනාවක් රටට පාඩු වුණා. දළ වශයෙන් රුපියල් බිලියන 63ක් රටට පාඩු වුණා. ඒ වාගේ දැවැන්ත පාඩුවක් සිදු කර තිබෙනවා.

අපේ රටේ ඉන්න බළල් අත් ලවා අපේ රටේ ජනන සැලැස්ම හිතා මතා, සාහසික ලෙස කඩාකප්පල් කර තිබෙනවා. මේ රටේ ජනන සැලැස්මක් ක්‍රියාත්මක කරන්න ඉඩ දෙන්නේ නැහැ. ඒ, වෙනත් රටවල අවශ්‍යතා නිසා. මේ රටේ ජාතික ආරක්ෂාව බිඳ වට්ටලා, මේ රට වක්‍රාකාරව තමන්ගේ ග්‍රහණයට අරගෙන, තමන්ට ඕනෑ විධියට නටවන්න තමයි ගොඩක් රටවල් උත්සාහ කරන්නේ. අද මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමෙන් පසුව ඉතා විනිවිදභාවයෙන් කටයුතු කරලා, එම ආයතනයේ කළමනාකාරීත්වය, කාර්යක්ෂමතාව හා ඵලදායිතාව මැන බලන්න අපට පුළුවන්.

පසුගිය දවස් ටිකේම අපි මාධ්‍යයෙන් දැක්කා, මේ කාරණාව සම්බන්ධයෙන් කළ විවේචන. ඒ විවේචනවල පොඩි පොඩි කෙඳිරිලි තමයි තිබෙන්නේ. "අපිත් මේ පනත් කෙටුම්පතට කැමතියි. මේකේ හොඳත් තිබෙනවා. ඒ වුණාට මේකේ මෙන්න මේ වාගේ දේවල් වෙනස් වුණා නම් හොඳයි" යනාදිය කියනවා. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය පැහැදිලිව දීලා තිබෙන නිර්දේශ අකුරක් නෑර පිළිපැදලා, ඉතා විනිවිදභාවෙන් යුතුව තමයි මේ පනත ජනගත කිරීම කරන්නේ.

අතීතයේ පැවති එක එක රජයන් ගනිපු වැරදි ප්‍රතිපත්ති නිරණ නිසා ජනතාව අද විශාල පීඩනයකට ලක් වෙලා ඉන්නවා. මීට කලින් විපක්ෂයේ කථික මන්ත්‍රීවරයෙක් කියනවා මම අහගෙනයි, ලක්විජය බලාගාරයෙන් ජාතික පද්ධතියට එකතු වීමට නියමිතව තිබූ මෙගාවොට් 300ක් නැති වුණා කියලා. ඒක ඇත්ත. හිටපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මැතිතුමා ගොනාට අන්දවලා, කුලප්පු කරලා, ජාතික විදුලිබල පද්ධතියට එකතු කරන්න තිබුණු ඒ මෙගාවොට් ප්‍රමාණය නැති කරන්න යම් කිසි සැලසුමක් ක්‍රියාත්මක වුණා. ඒ වාගේම අපි පසුගිය කාලය පුරා නිරීක්ෂණය කරපු කාරණා අනුව පෙනෙනවා, ලංකා විදුලිබල මණ්ඩලය අතිශය දූෂිත ලෙස, විනිවිදභාවයෙන් තොරව වැඩ කටයුතු කර තිබෙන බව. මම එහි හැම නිලධාරියෙකු ගැනම, හැම සේවකයෙකු ගැනම නොවෙයි මේ කියන්නේ; ඒ වාගේම වෘත්තීයභාවයෙන් යුක්තව කටයුතු කරන අය ගැන නොවෙයි මේ කියන්නේ. මෙගාවොට් 1 ගණනේ නිපදවිය හැකි ජෙනරේටර් 50ක් ගෙනැල්ලා ලංකා විදුලිබල මණ්ඩලයේ බලවත් දූෂිත ගනුදෙනුවක් සිදු වුණා. යහපාලන ආණ්ඩුව කාලයේ හිටපු ඒ සමහර දූෂිත නිලධාරීන් මේ ආණ්ඩුවටත් සම්බන්ධ වෙලා ඉන්නවා. ඒ නිලධාරීන් ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරය රජයට අහිමි කළා. එවැනි විවිධ ක්‍රියාමාර්ග නිසා අද වන කොට බලවත් විනාශයක් මේ රටට සිදු කර තිබෙන බව විගණන වාර්තා අනුව පැහැදිලි වෙනවා. ඒ අය මහ ජනතාවගේ මුදල් බොහෝ සෙයින් කාබාසිනියා කර තිබෙනවා. කොයි අප්පුහාමිලා කොයි පැත්තේ ඉඳන් කයිවාරු ගැහුවත් ඒ හැමෝගේම කිල්ලෝටවල හුනු තිබෙනවා. එහෙම නම්, අතීතයේ වෙච්ච වැරදි යළි ඇති වෙන්න දෙන්න නරකයි. ඒ වාගේම, හැම්මිබරව, ජනතාව පිනවන කටයුතු කරනවාට වඩා ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීම වෙනුවෙන් අපි නිවැරැදිව වැඩ කටයුතු කරන්න ඕනෑ; නිවැරදි තීරණ ගන්න ඕනෑ. සමහර තීරණ ඉතා අමිහිරියි, තිත්තයි. තිත්ත වුණත් සත්‍ය දේ තමයි අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. කොරහේ කිඹුල්ලු දකිමින් මේ ප්‍රශ්න විසඳන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.41]

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ මොහොතේ විදුලිබලය සහ බලශක්තිය අපේ රටට අත්‍යවශ්‍ය සහ වැදගත් සාධකයක්. විදුලි බලය නිෂ්පාදනය කිරීමේදී පැවැති කාර්යක්ෂමතාව අඩුකම කියන ප්‍රශ්නය නිසා, මේ ගෙන ගිය වැඩ පිළිවෙළ නිසා, මේ රටේ පැවැති දූෂණ නිසා අපේ සියලු ක්ෂේත්‍ර මේ වන විටත් විශාල පසු බෑමකට ලක් වෙලා තිබෙනවා කියා අපි දන්නවා. ලංකා විදුලිබල මණ්ඩලය මේ මොහොතේත් විශාල ලාභයක් ලබමින් තිබියදීත් රජය ඒ සහනය පාරිභෝගිකයාට සහ කර්මාන්තකරුවන්ට ලබා නොදීම තුළ මේ රටේ ආර්ථිකය විශාල අභියෝගයකට ලක් වෙලා තිබෙනවා. එවන් මොහොතක යම් යම් සංශෝධන සිදු කිරීම, නීති වෙනස් කිරීම අනිවාර්යයෙන් අවශ්‍යයි. ඒ ගැන අපේ කිසිදු විවාදයක් නැහැ. හැබැයි, තවත් ප්‍රශ්න ඇති වන ආකාරයට, අනවශ්‍ය ප්‍රශ්න මැවෙන ආකාරයට සංශෝධන සිදු කිරීම සහ නව පනත් ඉදිරිපත් කිරීම සිදු නොවිය යුතුයි කියන එකයි මහජන නියෝජිතයෙකු හැටියට මගේ මතය.

ඒ හින්දා තමයි අප කියන්නේ, කරුණාකර අදාළ කණ්ඩායම් එක්ක සාකච්ඡා කරලා මේ කටයුතු කරන්න කියලා. ආණ්ඩුව දිගින් දිගටම කිව්වා, විවිධ සාකච්ඡා පැවැත්වූවා කියලා; දිගින් දිගටම කිව්වා, විවිධ කණ්ඩායම් හමු වුණා කියලා. සමහර අය එක්ක නම් කථා කරලා තිබුණා. හැබැයි, අපිත් එක්ක සාකච්ඡා කරපු, අපව හමු වුණු වෘත්තිකයන්, පාරිභෝගිකයන්, වෘත්තීය සමිති නියෝජිතයන් බොහෝ දෙනෙකු එක්ක මේ සම්බන්ධයෙන් කථා කරලා ඒ අයගේ අදහස් ලබා ගැනීම සිදු කර තිබුණේ නැහැ. එහි ප්‍රතිඵලයක් හැටියට වෙලා තිබෙන දේ අපි දැක්කා. මෑත ඉතිහාසයේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පනත් කෙටුම්පතක් සම්බන්ධව ලබා නොදුන් තීරණයක් මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් දී තිබෙනවා. මේ රජය විසින් ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවේ සභාගත කරලා ජනතාව විසින් උසාවියට ගෙන ගිය, අද මේ පාර්ලිමේන්තුවේ කඩිමුඩියේ සම්මත කර ගන්න උත්සාහ කරන මේ පනත් කෙටුම්පත පිළිබඳව සඳහන් වුණේ, මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාවට සම්පූර්ණයෙන් පටහැනි පනත් කෙටුම්පතක් හැටියටයි. මේ පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයට යන්නේ ප්‍රතිපත්ති ගැන කථා කරන්නවත්, විශේෂඥ දැනුම තිබෙන කණ්ඩායමක් විසින් තීරණ ගන්නවත් නොව මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ ගැටීමක් - ව්‍යවස්ථානුකූල ගැටීමක් - ඇති වෙනවාද කියලා සලකා බලන්නයි. මේ පනත් කෙටුම්පතේ වගන්ති 54යි තිබෙන්නේ. ඒ වගන්ති 54න් 12ක් හෝ 13ක් සංශෝධනය කළ යුතුයි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කරනු ලැබුවා. අප මෙවන් අවස්ථාවක් දකින්නේ දීර්ඝ කාලයකින්. මට නම් මතක ඇති කාලයක කිසිම පනත් කෙටුම්පතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාවට අනනුකූලයි කියලා තීන්දු කරලා නැහැ.

අපි මේ කාරණයම කිව්වා, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ගෙනෙන විටත්. අප කියා සිටියේ මේ රටේ නීතිය තවදුරටත් ඉදිරියට යා යුතු නමුත්, නීතිය වෙනස් විය යුතු නමුත් ජනතාවගේ නාමයෙන් ප්‍රායෝගික පනතක් ගේන්න කියලායි. නමුත් අද මොකක්ද වෙලා තිබෙන්නේ, Online Safety Bill එක සම්බන්ධයෙන්. අද එය ක්‍රියාත්මක කර ගන්න බැරිව ඉන්නවා. අපි විශාල මුදලක් වියදම් කරලා, පාර්ලිමේන්තුවේ කාලය කා දමලා ඒ පනත් කෙටුම්පත සම්මත කළත්, දැන් ඒ පනත ක්‍රියාවට නැංවීම සඳහා නැවතත් සංශෝධන ගෙනෙන්න පාර්ලිමේන්තුව, කැබිනට් මණ්ඩලය සාකච්ඡා කරමින් ඉන්නවා. අපි ඉල්ලන්නේ කලබල වෙන්නේ නැතිව කටයුතු කරන්න කියලායි.

මම එක ප්‍රායෝගික උදාහරණයක් කෙටියෙන් කියන්නම්. එය, මේ පනත සම්මත වෙලා ක්‍රියාත්මක කිරීමේදී මතු වන ගැටලුවක්. මේ රටේ තිබෙන විදුලිබල මණ්ඩලයට අයිති සම්පත්, එනම් භෞතිකව පෙනෙන සම්පත් වාගේම අනෙකුත් සම්පත් පිළිබඳ valuation එක - එහි වටිනාකම - ගණනය කිරීම සඳහා මෙතෙක් කටයුතු කරලා නැහැ. මෙතෙක් ගණනය කිරීමට කටයුතු කරපු නැති ඒ වටිනාකම ගණනය කිරීම සඳහා කොපමණ කාලයක් යනවාද කියන එක පිළිබඳ අවබෝධයක් අදටත් නැහැ.

අවුරුදු එකහමාරක්, දෙකක් සාකච්ඡා කරලා ගෙනාවා කියපු මේ පනත් කෙටුම්පතේ සඳහන් වුණේ මාස 6කින් මේ පනත ක්‍රියාත්මක කරන්න පුළුවන් කියලායි. දැන් උසාවිය කියලා තිබෙනවා, අවුරුද්දකින් ක්‍රියාත්මක කරන්න පුළුවන් කියලා. මෙය අවුරුද්දකින් ක්‍රියාත්මක කරන්න පුළුවන් කියලා උසාවිය තීන්දු කළේ මොන පදනමක් මත ද? අපිත් එක්ක සාකච්ඡා කරපු විශේෂඥයින් කියන විධියට නම් ඒ කටයුත්ත කිරීමට ඊට වඩා කාලයක් යනවා. ඒ සඳහා භාවිත කරන ක්‍රමවේදය මොකක්ද, උපයෝගි කර ගන්නේ කුමන කණ්ඩායම්ද යන්න ගැන කිසිම සාකච්ඡාවක් අද වනකල් තිබිලා නැහැ. මේකෙන් වෙන්නේ මොකක්ද? ඒ කියන අවුරුද්ද පැන්නාට පසුව වෙන්නේ මොකක්ද? එතකොට මේ ආණ්ඩුවට හරිම ලේසියි. උපරිම තවත් මාස තුනකින් -පෝය තුනකින්- මේ ආණ්ඩුව ගෙදර යනවා. බලයට පත් වන අපේ ආණ්ඩුවට කටයුතු කරගෙන යන්න බාධාවක් ඇති කරලා නිකම් සිහිනි සිනාවක් දමන්න තමුන්නාන්සේලා කටයුතු කරන බව අපි දන්නවා.

හැබැයි, මතක තබා ගන්න, මේ රටේ ජන මතය මොකක්ද කියන එක. මේ රටේ මිනිස්සුන්ට අයිතියක් හැටියට තිබෙන අවම මිලට විදුලිය ලබා ගැනීමේ හැකියාවවත් මේ පනත හරහා සිද්ධ වෙලා නැහැ. අවම පිරිවිතර යටතේ නිෂ්පාදනය කිරීමට තිබෙන ඒ හැකියාව, අයිතියවත් මේ පනත හරහා පුද්ගලයන්ට, ජනතාවට ලබා දීලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගෘහිණියක් හැටියට, මවක් හැටියට, මහජන නියෝජිතයෙක් හැටියට ඔබතුමිය දන්නවා, අද විදුලි බිල ගෙවා ගන්න බැරුව ළතැවෙන මිනිස්සු ගැන. එදා අපට තිබුණු අභියෝගය විදුලිය නැති අයට විදුලිය සපයන එක. අද තිබෙන ප්‍රශ්නය මොකක්ද? විදුලිය තිබුණාට ගෙදර විදුලි බලය කපලා. එහෙම විදුලිය විසන්ධි කරපු පවුල් ලක්ෂ 11කට වැඩිය අද මේ රටේ ඉන්නවා, බිල ගෙවා ගන්න බැරුව. එහෙම තත්ත්වයක් තුළදීත් හිත්පිත් නැතුව තමන්ගේ හෙංචයියන් ආයෝජකයන් කියලා ගෙනැල්ලා ඒ අයට අවශ්‍ය විධියට ඒ දීපු ගනුදෙනු -මාස දෙකකින් ගෙදර යන්න වෙන හින්දා ඊට කලින්- සාධාරණීකරණය කරන්න හදනවා. දැන් මේ පනත් කෙටුම්පතේ කියනවා, unsolicited proposals කිසිවක් අනුමත වෙන්නේ නැහැ කියලා. හැබැයි, G2G කියලා ගෙනැල්ලා තිබෙනවා, අදානි සමාගම. අදානි සමාගම ඉන්දියානු රජයේ සමාගමක්ද? ඉන්දියාවේ ඕනෑ තරම් ආයෝජකයෝ ඉන්නවා. ඕනෑ තරම් සමාගම් තිබෙනවා. ඉන්දියානු ආයෝජකයෝ ලංකාවට එන එකට අපි විරුද්ධ නැහැ. හැබැයි, දැන් කියන්නේ මොකක්ද? G2G කියලා, කිසිම ක්‍රමවේදයක් නැතුව, කිසිදු වගකීමකින් තොරව මිත්‍රකම මත, විවිධ හේතු මත, විවිධ ලාභ මත ගෙනැල්ලා හඳුන්වා දීපු ඒ ආයෝජකයා ඇතුළු අනෙකුත් කණ්ඩායම්වල ඒ කරපු මගඩි ටික වහ ගන්නට පාරක් කපා ගන්න තමයි මේ ආකාරයට කඩිමුඩියේ මේ පනත ගේන්නේ කියන එක අපට කියන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, LTL එකේ කොටස් හදිසියේම විකුණා දමා තිබෙනවා අපි දැක්කා.

[ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා]

ඔබතුමියත්, ඇමතිතුමාත් හිටියා, Sectoral Oversight Committee එකේ. නීතිපති දෙපාර්තමේන්තුවවත් දන්නේ නැතුව -නීතිපති දෙපාර්තමේන්තුවටවත් ඉදිරිපත් කරන්නේ නැතුව- අවසරය ගන්නේ නැතුව එහි කොටස් පෞද්ගලික අංශයට විකුණා දමා තිබෙනවා. මම හිතන විධියට, ඒ ආයතනය රජයට බිලියන දොළහමාරක්ද, විසිපහක්ද ගෙවිය යුතුව තිබියදි -එවැනි මුදලක් හිඟව තිබෙද්දී- ඒ ටික අය කර ගන්නෙත් නැතුව තමයි විකුණලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වංචා පිළිබඳව සොයා බලන්නට වහාම කටයුතු කරන්න කියා අපි බල කර ඉල්ලනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා මම කියනවා, මේ කෙටි කාලය තුළ මේ නටන්න හදන නාඩගම් පිළිබඳව නිලධාරි මහත්වරු කල්පනාකාරී විය යුතුයි කියලා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරින් කිහිප දෙනෙක්ම මේ මොහොතෙත් ඉන්නේ හිරගෙදර. පසුගිය කාලයේත් ඒ වාගේ දේවල් වුණා. ඒ නිසා දේශපාලනඥයන්ගේ හිත පිනවන්න, දේශපාලනඥයන්ගේ අවශ්‍යතා ඉටු කර ගන්න, ඒ වාගේම බලයට එන ආණ්ඩුව කරදරයට පත් කරන්න, බලයට එන ආණ්ඩුවට ප්‍රශ්න ඇති කරන්න, මේ රට තමන්ට කරන්න බැරි නම් තමන්ගෙන් ගිලිහෙන බලය ලබා ගන්න අයට මේ රට ඉදිරියට ගෙන යන්න බැරි විධියට මේ කටයුතු කරන්න පාර්ලිමේන්තුව තුළ අද මන්ත්‍රීවරු හැටියට අපි ඉඩදීම සුදුසුද කියලා මම ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් අහන්න කැමැතියි. මේ ආයතනයේ සේවකයෝ 23,000ක් ඉන්නවා. මේ රටේ පවුල් 23,000ක් මේ ආයතනයෙන් ජීවත් වෙනවා. මෙහෙම කරද්දි ඒ අයගේ සේවාවන්ට තිබෙන guarantee එක මොකක්ද කියන එක පිළිබඳව අපට සැක තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අදත් සේවකයෝ කුඩු කරලා, මේ රටේ දාන්න පුළුවන් තදබලම නීති දාලා, සේවකයෝ ගාල් කරලා, සේවකයෝ බය කරලා, සේවකයන්ගේ ජීවත් වීමේ අයිතිය නැති කරන මට්ටමට පත් කරලා, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙනවා. අද මුළු රටම, හැමදෙනාම මේ පාර්ලිමේන්තුවෙන් එළියේ ඉඳගෙන බලාගෙන ඉන්නේ, අපේ විදුලිබලය, බලශක්ති සම්පත කුණුකොල්ලයට විකුණලා දමලා සතුටු වෙන්න, ඒකෙන් ලාභ ලබන්න පාර කපන්න යන මේ පනත් කෙටුම්පතට අත උස්සලා -ඡන්දය දීලා- ගෙදර යන්නේ කවුද කියලායි. අපි ඉතාම වගකීමෙන් මේ කියන්නේ. මේ රටේ විදුලිබල පනතේ වෙනස්කම් කරන්න ඕනෑ. ඒ වෙනස්කම් කරන්න ප්‍රගතිශීලී විධියට. රටේ අනාගතය ගැන හිතලා, ක්ෂේත්‍රයේ අනාගතය ගැන හිතලා, පාරිභෝගිකයාට මුල් තැන දීලා, සේවකයා ගැන හිතලා පනතක් ගෙනෙනවා නම්, ඒ පනතට අපි එකඟයි. මේ පනත් කෙටුම්පත ගැන කථා කරන්න අපි දවස් දෙකක විවාදයක් ඉල්ලුවා. ඒකවත් දෙන්නේ නැතුව අත්තනෝමතිකව, බලෙන් සම්මත කර ගන්න උත්සාහ කරන මේ පනත් කෙටුම්පතට අපි විරුද්ධ බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එම්.යූ.එම්. අලි සබ්රි ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 16ක කාලයක් තිබෙනවා.

ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු (திருமதி) රෝහිණී කුමාරි විජේරත්න අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු මදුර විතානගේ අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA left the Chair, and THE HON. MADHURA WITHANAGE took the Chair.

[අ.භා. 3.55]

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி - வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry, PC - Minister of Foreign Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා ගෙනාපු මේ පනත් කෙටුම්පත ගැන කථා කළොත්, මුලින්ම මේ unbundling කරන්න ඕනෑ කිව්වේ වෙන කවුරුවත් නොවෙයි, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා. එතුමා තමයි ඒක පටන් ගත්තේ. එතුමා තමයි LECO එක ලංකාවේ පටන් ගත්තේ. LECO එක විකුණනකොටත් දවස් හතක්, අටක් මේ රටේ වෘත්තීය සමිති වර්ජනය කළා. ඒ ගොල්ලන්ට ඕනෑ, කිසිම දෙයක් ඒ ගොල්ලන්ගේ පාලනයෙන් ගිලිහෙන්නේ නැතුව, මේ රටේ ආණ්ඩුවයි, ජනතාවයි තමන්ට නතුව තියාගෙන, තමන්ගේ වාසියට මේක පාවිච්චි කරන්න. ඒකට ඉඩ දෙන්න බැහැ. මේ unbundling කිරීම කවදා හරි කරන්න ඕනෑ. මුලින්ම මම ගරු විදුලිබල ඇමතිතුමාට සුබ පතනවා, බය නැතුව මේ තීන්දු තීරණවලට ආපු එක ගැන. ලෝකයේ සෑම තැනකම මේ වෙනකොට විදුලිය ජනනය කිරීම, බෙදා හැරීම, නියාමනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම unbundle කරලා තිබෙන්නේ. ලංකාවේ විතරයි මෙවැනි ඒකාධිකාරයක් තිබෙන්නේ. ඒකාධිකාරයක් කොහේද තිබෙන්නේ, එතැන තමයි අකාර්යක්ෂමතාව තිබෙන්නේ. ඒකාධිකාරය කොතැනද තිබෙන්නේ, එතැන තමයි වංචාව තිබෙන්නේ. ඒකාධිකාරය කොතැනද තිබෙන්නේ, එතැන තමයි දූෂණය ක්‍රියාත්මක වෙන්නේ. ඒකට පුරුදු පුහුණු වෙච්ච අය ඒක දාලා යන්න කැමැති නැහැ. මොන පනත් කෙටුම්පත ගෙනාවත් විපක්ෂය විරුද්ධ වෙනවා. මට මතකයි, මීට අවුරුදු දෙකකට ඉස්සර වෙලා ආසියාවේ හොඳම Personal Data Protection Act එක ගෙනාවා. ඒකටත් විරුද්ධ වුණා. දෙමළ

ළමයින්ට bail දෙන්න තුස්තවාදය වැළැක්වීමේ පනතට අපි සංශෝධනයක් ගෙනාවා. ඒකටත් විරුද්ධ වුණා. ඒක සාමාන්‍යයි. ඒ නිසා මම හිතනවා, ඒක වැඩිය ගණන් ගන්න හොඳ නැහැ කියලා. ඒ ගොල්ලන් විරුද්ධ වෙනවා. නමුත් ඒකෙන් අවසාන වශයෙන් මොකක්ද වෙන්නේ?

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු ඇමතිතුමා, ඒක නම් අසාධාරණයි. දෙමළ ළමයින්ට ඇප දෙන්න ඔබතුමන්ලා පනතට සංශෝධනයක් ගෙනාවා. ඒකට විපක්ෂයේ අපි විරුද්ධ වුණා කියලා කියනවා නම් ඒක වැරදියි. එහෙම නොවෙයි, අපිට ඕනෑ ඔවුන්ට bail දෙන්න; we are for that.

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)

හොඳයි, මම පිළිගන්නම්. පනත යටතේ- *[බාධා කිරීමක්]* පනත යටතේ අත්අඩංගුවට ගත්ත අයට අධිකරණ ක්‍රියාදාමය තුළින් සාධාරණයක් ඉෂ්ට කරන්න අවස්ථාව දෙනකොට ඒකටත් විරුද්ධ වුණා. එහෙම කියමුකෝ, අපි. ඒක මතක තියා ගන්න. ඒ නිසා ඒ පිළිබඳව වැඩිය තකන්න එපා. ඔබතුමාගේ වැඩ කටයුතු කරගෙන යන්න.

දැන් අපේ විදුලිබල මණ්ඩලය සම්පූර්ණයෙන්ම රජය සතුව තිබෙන්නේ. කියනවා, රජය සතුයි කියලා. හැබැයි, තනිකරම එය පාලනය කරන්නේ වෘත්තීය සමිති විසින්. ඒ විධියට අවුරුදු 51ක් තිබිලා තිබෙනවා. නමුත් මේකට කවුරුවත් කැමති නැහැ. මොකක්ද කියන්නේ? ආසියාවේ වැඩිම විදුලි බිල අය කර ගන්නේ මේ ගොල්ලන් කියලා නේ කියන්නේ.

ඉතින් **එදා** රජයට කියලා ඒක හදා ගන්න තිබුණා නේ. වෘත්තීය සමිතියට ඒක හදා ගන්න තිබුණා නේ. කොච්චර දුරට ඒ ගොල්ලන් හොඳට කරලා තිබෙනවාද කිව්වොත්, 2022 වර්ෂයේ දී විදුලිබල මණ්ඩලය අපේ ඇමතිතුමා භාර ගන්නකොට -හිටපු ඇමතිවරුන් හිටියා- පැය 13ක් විදුලිය කැපුවා. මිනිස්සු පාරට බැස්සා. එතුමා ඇවිල්ලා මාව හමු වුණා. එතකොට, මම මුදල් අමාත්‍යතුමා. මම කිව්වා, භාණ්ඩාගාරයෙන් සත පහක්වත් දෙන්නේ නැහැ, ඔනැනින්ම හොයා ගෙන කරන්න කියලා. මොකද, ආයෙත් භාණ්ඩාගාරයෙන් මුදල් දෙනවා කියන්නේ නැවතත් අපේ මිනිස්සුන්ට tax ගහන්න සිද්ධ වෙනවා. මොකද, භාණ්ඩාගාරයට දේශපාලනඥයන්ගේ සාක්කුවෙන් මුදල් දෙන්නේ නැහැ. එතුමාට ඒ ධෛර්යය තිබුණා; ඒ හැකියාව තිබුණා. ඒක කරන එකට අපි සියලු දෙනාම එකතු වෙලා එතුමාට උදව් කරනවා වෙනුවට, එතුමාට බොරු චෝදනා රාශියක් ඉදිරිපත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අඩු මුදලට විදුලි බලය දෙනවා නම් මොනවාද කරන්න පුළුවන් වෙන්නේ? කොහොමද, ඒක දෙන්නේ? කථාවලින් පුළුවන්ද ඒක දෙන්න? පිරිවැය අඩු කරන්න ඕනෑ. පිරිවැය අඩු කරනවා නම් ඒක අඩු කරන්නේ කොහොමද? පුනර්ජනනීය විදුලි බලයට අවස්ථාව දෙන්න ඕනෑ. පුනර්ජනනීය විදුලි බලය කියන්නේ මොකක්ද? සූර්ය බලයට අවස්ථාව ලබා දෙන්න ඕනෑ; සුළං බලයට අවස්ථාව ලබා දෙන්න ඕනෑ; Green hydrogenවලට අවස්ථාව ලබා දෙන්න ඕනෑ. 2006 අපි පුනර්ජනනීය බලශක්ති අධිකාරිය පිහිටෙව්වා. ඔවුන්ට target එකක් දුන්නා, මෙච්චර ප්‍රමාණයක් approve කරන්න කියලා. පසුගිය අවුරුදු 15ක් තිස්සේ ඉඳලා අපි බලාගෙන ඉන්නවා. කී දෙනෙකුටද අවස්ථාව දුන්නේ? කිසිම project එකක් approve කරන්න දුන්නේ නැහැ. අපි දන්නවා, LNG බලාගාර 5ක් කඩාකප්පල් කළ බව. ඇමතිතුමාට නොවෙයි, රජයට නොවෙයි, කැබිනට් මණ්ඩලයට නොවෙයි, පාර්ලිමේන්තුවට නොවෙයි බලය තිබෙන්නේ, වෘත්තීය සමිතිවලට. එහෙම නම් වෘත්තීය සමිතිවලට කියන්න ඕනෑ ජනාධිපතිවරණයට ඇවිල්ලා ඡන්දය දාලා ඔවුන්ට රට පාලනය කරන්න දෙන්න කියලා. වෘත්තීය සමිතිවලට අවශ්‍ය විධියට රට පාලනය කරන්න ඉඩ දෙන්නට බැහැ. එහෙම නම්, කැබිනට් මණ්ඩලයක් ඕනෑ නැහැ. අමාත්‍යවරයෙක් ඕනෑ නැහැ. පාර්ලිමේන්තුවක් ඕනෑ නැහැ. වෘත්තීය සමිති තමයි මේ විරුද්ධ වෙලා ඉන්නේ. හැබැයි, අපි එක දෙයක් කියන්නට ඕනෑ. අතිවිශාල සේවක සංඛ්‍යාවක් මේක පිළිගෙන තිබෙනවා. මට මතකයි, ඔවුන් අපිවත් පෞද්ගලිකව හමු වෙලා කිව්වා, "කොහොම හරි මේක කරලා මේ ඒකාධිකාරය බිඳින්න, ඔවුන්ට අවශ්‍ය විධියට මේ වැඩේ කරගෙන යන්න ඉඩ දෙන්න එපා" කියලා. පිරිවැය අඩු කර ගන්නට ඕනෑ නම් අපිට සිද්ධ වෙනවා අනිවාර්යයෙන්ම මෙහෙම කරන්න. පසුගිය අවුරුදු කිහිපය තුළ LNG බලාගාර පහක් කඩාකප්පල් කළා. ඒ කියන්නේ සූර්ය බලයෙන් විදුලිය නිෂ්පාදනය කරන projects 500ක් ආපස්සට දාලා තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතකයි, අවුරුදු තුනකට ඉස්සෙල්ලා මමයි, ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමායි, නාමල් රාජපක්ෂ මැතිතුමායි වෙනම කමිටුවක් පත් කරලා මේවා ඉක්මනට clear කරන්නට උත්සාහ කළා. මම එක උදාහරණයක් කියන්නම්. ඒ වනකොට විදුලි බලය ජනනය සඳහා ඒ කාලයේ තිබුණු මුදල මත විදුලි ඒකකයක් රුපියල් 14.50 ගණනේ ගෙවන project එකක් තිබුණා. තව project එකක් තිබුණා, විදුලි ඒකකයක් රුපියල් 11.00යි. රුපියල් 14.00 දිගටම ගෙවනවා. රුපියල් 11.00ට ගෙවන එක clear කරන්නේ නැහැ, අවුරුදු එකහමාරක් තිස්සේ. ඇහුවාම කියන්නේ මොකක්ද? ඒක clear කරන්න බැරි ලු. මේක unsolicited proposal එකක් ලු. Unsolicited proposal එකක් වුණත්, solicited proposal එකක් වුණත් අවුරුදු දෙකකට ඉස්සෙල්ලා විදුලි ඒකකයක් රුපියල් 14ට දීලා තිබෙනවා නම්, රුපියල් 11ට දුන්නාම වෙන්නේ මොකක්ද? හැබැයි, රුපියල් 85කට thermal power දීලා තිබෙනවා, ඒකට විරුද්ධ වුණාද? නැහැ. රුපියල් 110ට ඩීසල් බලාගාරවලට විදුලිය දීලා තිබෙනවා, විරුද්ධ වුණාද? නැහැ. ඇයි, ඒ? ඒ ගොල්ලන්ට ඒකෙන් කොමිස් තිබෙනවා. ඒක තමයි ඇත්ත කථාව. ඇයි, දේශපාලනඥයන් ඒකේ වගකීම භාර ගන්නේ? ඇයි, අමාත්‍යතුමා ඒකේ වගකීම භාර ගන්නේ? එකක් මතක තියා ගන්න ඕනෑ. කවුරුන් හෝ ආණ්ඩු කරන්න හීන මවනවා නම් හැමදේටම විරුද්ධ වෙලා ඒ precedent එකක් හදන්න එපා. මිනිස්සුන්ට වැඩ කරන්න අවස්ථාව ලබා දෙන්න. භය නැතිව නිවැරදි තීන්දු-තීරණ අරගන්න. එතකොට තමයි අවසාන වශයෙන් මිනිස්සුන්ට ඔවුන්ගේ සම්පූර්ණ ප්‍රතිලාභය ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, SJB එකෙන් - විපක්ෂයෙන් - "The Blueprint" කියලා එකක් ඉදිරිපත් කරලා තිබෙනවා. I would like to remind them of the reforms they are suggesting in "The Blueprint". What do they say? “Unbundle the CEB and introduce competition in generation and distribution.” මේ, අපි කියන දෙයක් නොවෙයි, මේ ගොල්ලන් කියන එකක්. ඊළඟට කියනවා, "Separate the transmission grid to allow the necessary investments to permit the absorption of wind and solar and to introduce services such as wheeling.”

මොකක්ද අපි ඊට වඩා මෙතැන කරලා තිබෙන වෙනස? ඔබතුමන්ලාගේ "The Blueprint" එකට එකඟද, නැද්ද? ප්‍රශ්නය තිබෙන්නේ අද හවස ඡන්දය දෙනකොට මෙතුමා ඉදිරිපත් කළ

[ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

පනත් කෙටුම්පතට එකඟද, නැද්ද කියන එක නොවෙයි. ඔබතුමන්ලාගේ "The Blueprint" එකට එකඟද, නැද්ද කියන එක. "The Blueprint" එක හදපු මිනිස්සු නැඟිටලා ඒකට විරුද්ධව කථා කරනවා. එතුමන්ලාම කියනවා, මේක unbundle කරන්න ඕනෑ ලු. ජනනය කරන එක වෙන් කරන්න ඕනෑ ලු, බෙදා හරින එක වෙන් කරන්න ඕනෑ ලු, සම්ප්‍රේෂණය කරන එක වෙන් කරන්න ඕනෑ ලු. ඉතින්, කොහේද පෞද්ගලික තරගයක්? අපි කරනකොට එහෙමයි. අනෙක් අය කරනකොට මෙහෙමයි. මේ බොරුවෙන් අපි එළියට එන්න ඕනෑ. ජනනය සඳහා පෞද්ගලීකරණයේ අඩුව මොකක්ද? පෞද්ගලීකරණය නිසා ආයෝජන ඇවිල්ලා එකිනෙකා එක්ක තරග කරලා, ඒ තරගය තුළ අඩුම මුදලට රජයට මේක විකුණන්න පුළුවන් නම් අවසාන වශයෙන් ඒකේ වැදගත්කම ලැබෙන්නේ කාටද? අද අපි ඉදිරිපත් කර තිබෙනවා, cost-reflective pricingවල වටිනාකම. හැබැයි, ඒ ගැන කවුරුත් කියන්නේ නැහැ.

අපි බලන්නට ඕනෑ, අමාත්‍යාංශය ඉදිරිපත් කර තිබෙන අලුත් මිල ගණන්. ඒකක 0 සිට 30 අතර රුපියල් 8 සිට රුපියල් 6 දක්වා අඩු කර තිබෙනවා; ඒකක 30 සිට 60 අතර රුපියල් 20 සිට රුපියල් 9 දක්වා සියයට 50කටත් වැඩියෙන් අඩු කර තිබෙනවා; ඒකක 60 සිට 90 අතර රුපියල් 30 සිට රුපියල් 18 දක්වා සියයට 40කින් අඩු කර තිබෙනවා; ඒකක 90 සිට 120 අතර රුපියල් 20කින් අඩු කර තිබෙනවා. එය, සියයට 40ක්. මේක තමයි පාරදෘශ්‍යභාවය. ජලය වැඩියෙන් ලැබෙනකොට විදුලි ඒකකයක් නිෂ්පාදනය කරන්න යන මිල අඩු වෙනවා. විදුලිය නිෂ්පාදනය කරන්න යන මිල වැඩි වෙනකොට විදුලි බිල වැඩි වෙනවා. ඒ යථාර්ථයට, ඒ ප්‍රායෝගිකත්වයට මේ රටේ මිනිස්සු හුරු වෙන්නට ඕනෑ. එහෙම නැතිව මොකක්ද කළේ? 2011 ඉදලා 2022 වනකල් කිසිම දවසක අපි විදුලි බිල වැඩි කළේ නැහැ. නමුත්, එකපාරටම සියයට 100කට වඩා විදුලි බිල වැඩි කරන්න සිද්ධ වුණා. එය ජනතාවට දරා ගන්න බැරි වුණා. ඒක අපි පිළිගන්නවා. හැබැයි, දැන් ආපසු අපි විදුලි බිල අඩු කරගෙන යනවා. මොකක්ද අපට තිබෙන විකල්පය? ජලයෙන් විදුලි ඒකකයක් නිෂ්පාදනය කරන්න වැය වෙන්නේ රුපියලයි, දෙකයි. රුපියල් 22ක් විතර යනවා, coalවලින් විදුලිය නිෂ්පාදනය කරන්න. රුපියල් 22ක්, රුපියල් 26ක් පමණ ප්‍රමාණයක් සූර්ය බලයෙන් විදුලි ඒකකයක් නිෂ්පාදනය කරන්න යනවා. ඩීසල්වලින් නිපදවන විදුලි ඒකකයක් සඳහා රුපියල් 95ක් අපි ගෙවනවා. සමහර තැන්වලට රුපියල් 110ක් ගෙවනවා. ඒකට කවුරුත් විරුද්ධ වෙලා නැහැ. හැබැයි, රුපියල් 26ට ගෙනෙනකොට විරුද්ධ වනවා, රුපියල් 22ට ගෙනෙනකොට විරුද්ධ වනවා. Average cost එක රුපියල් 34යි. Average cost එක රුපියල් 34 නම්, රුපියල් 34ට වඩා යම් ප්‍රමාණයකට අඩුවෙන් විදුලිය ජනනය කරනවා නම්, ඒකේ අවසාන වාසිය යන්නේ පාරිභෝගිකයාට. ඇයි ඒකට විරුද්ධ වෙන්නේ?

මේ පනත තුළින් අනිවාර්යයෙන්ම unsolicited proposals සම්පූර්ණයෙන්ම ඉවත් කරලා දමනවා. Solicited proposals තමයි ලබා ගන්න උත්සාහ කරන්නේ. අපි සියලුදෙනාම එකඟ වන එක තැනක් තිබෙනවා. ඒ තමයි, ජනනය පෞද්ගලීකරණය කරන්නට ඕනෑ කියන එක. ජනනය තරගකාරීත්වයට ඉදිරිපත් කරන්න ඕනෑ. වඩා ලාභදායි ජනකයට ඒ අවස්ථාව ලබා දෙන්න ඕනෑ. බෙදා හැරීම පෞද්ගලීකරණය කළ යුතුයි, තරගකාරීත්වයට විවෘත කළ යුතුයි කියලා කියන්නේ SJB එකේ "The Blueprint" එක, අපි නොවෙයි. හැබැයි, එක දෙයක් තිබෙනවා. සම්ප්‍රේෂණය අපි භාර ගත යුතුයි. සම්ප්‍රේෂණය වෙන කාටවත් දෙන්නට බැහැ. එතැන තිබෙනවා, energy security එකක්. ජාතික බලශක්ති පද්ධතිවල ආරක්ෂාව හා උපාය මාර්ගික වැදගත්කම සුරැකීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරු - National System Operator, NSO - කෙනෙක් ඉන්නවා. මේක සියයට සියයක් රජය සතුව පවතිනවා. ඒක වෙන කාටවත් දෙන්න දෙන්නේ නැහැ.

ඊළඟට කියනවා, මේ පනත් කෙටුම්පත හදිසියෙන් ගෙනාවා ලු. මේක හදිසියෙන් ගෙනාපු එකක් නොවෙයි. 2022 ඉඳලා - මුල් අවස්ථාවේ ඉඳලා - දිගින් දිගටම අපි මේ ගැන කථා කළා. මේ පනත් කෙටුම්පත සකස් කරන්න වෙනම කමිටුවක් පත් කළා. UNDP එක, USAID එක, World Bank එක එකතු වෙලා consultations රාශියක් සිදු කළා. පනත් කෙටුම්පත ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයේ මුල් වතාවට ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කළා. ඒකේ යම් යම් ගැටලු - විශේෂයෙන්ම භාෂා ගැටලු - තිබෙනවා කියලා ඉවත් කර ගත්තා.

ඔය විධියට කථා කරන්න ගියොත් කථා කර කර ඉන්න වෙයි, කිසිම දවසක මේ පනත ගේන්න හම්බ වෙන්නේ නැහැ. ඒ හින්දා මේක හදිසියේ ගෙනාවා කියන එක සම්පූර්ණයෙන් අසත්‍යයක්, මුළාවක්. නමුත් එකම දේ තමයි, මෙතෙක් කල් කථා කර කර හිටපු දේ අපි ප්‍රායෝගිකව ගෙනැල්ලා ඉෂ්ට කරගන්න උත්සාහ කරන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලීකරණය ඔය කියන තරම් භයානකද? මම කියනවා, 1994දී ගරු මංගල සමරවීර හිටපු ඇමතිතුමා මූලිකත්වය අරගෙන කරපු SLT එක පෞද්ගලීකරණයට පෙර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තිබුණු තත්ත්වයයි, අද ශ්‍රී ලංකාවේ SLT එකේ සහ අපේ telecommunication industry එකේ තිබෙන තත්ත්වයයි අතර වෙනස බලන්න කියලා. තරගකාරීත්වය තුළින් කාටද වාසිය ලැබිලා තිබෙන්නේ? රජය මේකට ආයෝජනය කරනවාද? රජය හොඳට වාසි අරගෙන මුදල් තත්ත්වය අමාරු නම් tax එකක් දමනවා. ඒ අනුව සියයට 10ක් දමනවා, Internet එකට.

ඉස්සර යම් කෙනෙකුට අවුරුදු 10ක පමණ කාලයක් ලැයිස්තුවක ඉන්න වුණා, තමන්ගේ දුරකථන සම්බන්ධතාව ලබා ගන්න. තරගකාරීත්වය හින්දා අද වෙනකොට ජනගහනයටත් වඩා අධික දුරකථන සම්බන්ධතා සංඛ්‍යාවක් තිබෙන බව ඉතා පැහැදිලියි. ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 22යි. දුරකථන සම්බන්ධතා තිබෙනවා, මිලියන 30ක් විතර. ඒ කියන්නේ පෞද්ගලීකරණය කියන එක එතරම් නරක දෙයක් නොවෙයි. පෞද්ගලීකරණය කියන එකෙන් අදහස් කරන්නේ නැහැ, අපි මේ තිබෙන සමනලවැව ජලවිදුලි බලාගාරය විකුණන්න හදනවා කියලා. ඒක විකුණන්න හැකියාවක් ඇත්තේත් නැහැ. ජලවිදුලි බලාගාරවල අයිතිය තිබෙන්නේ ලංකා විදුලිබල මණ්ඩලයට නොවෙයි. ලංකා විදුලිබල මණ්ඩලය ඒවායෙන් යම්කිසි ප්‍රයෝජනයක් ගන්නවා. නමුත්, ඒකට වෙනම ආයතනයක් තිබෙනවා. ඒක පෞද්ගලීකරණය කරන්න බැහැ. අපි මුලින් කියපු ආකාරයට ප්‍රධාන වශයෙන් මේ unbundling කිරීම තුළින් මේ ආයතනය වෙන් කරනවා. ඒ අනුව ලංකා විදුලිබල මණ්ඩලය ආයතන අටකට කඩනවා. දැනට, ඉතා හොඳින්, කාර්යක්ෂමව ක්‍රියාත්මක වෙන ආයතනත් තිබෙනවා. නමුත්, සමහර ආයතන අකාර්යක්ෂමයි. අර කාර්යක්ෂම ආයතන අතරින් අකාර්යක්ෂම ආයතන රිංගනවා. වෙන් වෙන්ව ඔවුන්ගේ දත්ත නැහැ, පාරදෘෂ්‍යභාවයක් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විදුලිබල මණ්ඩලය ආයතන අටකට කැඩුවාට පස්සේ තේරේවි, ඒ ආයතන අටෙන් වඩාත් කාර්යක්ෂම කවුද, කාර්යක්ෂම නොවන්නේ කවුද, දූෂණය සිද්ධ වෙන්නේ කොතැනද, පාඩු ලබන්නේ කවුද, ලාභ ලබන්නේ කවුද කියන එක. ඒක තමයි පාරදෘශ්‍යභාවයේ, විනිවිදභාවයේ, accountability එකේ උපරිම ඵලය. ඒ නිසා මම නැවත වතාවක් කියන්නේ මෙයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ පනත කාලයක් තිස්සේ ක්‍රියාත්මක විය යුතුව තිබුණු පනතක්. මේකෙන් ඒකාධිකාරය බිඳ වැටෙනවා. මේ පනත අනුව පෞද්ගලීකරණය කෙසේ වෙතත් මේ ආයතනවලින් පෞද්ගලික ආයෝජන ලබා දෙනවා. හැබැයි, ඒක කරනකොට ඉතා පැහැදිලිව රටේ සුරක්ෂිතභාවයට සහ energy security එකට හානි නොවන ආකාරයකින් ඒක කරන්න අපි කැප වෙලා සිටිනවා කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.10]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මම කියන්න ඕනෑ, මේ reformsවලට අපි විරුද්ධ නැහැ කියන එක. මේ සම්බන්ධව පක්ෂයක් විධියට අපිත් දිගින් දිගටම අදහස් දක්වලා තිබෙනවා. අපේ "The Blueprint" එකේ මේ reforms ගැන කියලා තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලය unbundle කරන්න ඕනෑ, කොටස් කිහිපයකට වෙන් වෙන්න ඕනෑ කියන තැන අපි ඉන්නවා. හැබැයි එහෙම කියලා ඔබතුමන්ලා උද්ධච්ච ආකාරයට professionalsලාගෙන්, engineering associationsවලින්, engineersලාගෙන් අහන්නේ නැතුව මේ කරන්න යන reformsවලට අපි එකඟ නැහැ.

ඔබතුමන්ලා මේක කඩිමුඩියේ කරන්න දරන උත්සාහය පිළිබඳවත් අපට බරපතළ ප්‍රශ්න තිබෙනවා. මේ දේවල් කඩිමුඩියේ කරන්න යන එක පිළිබඳව, හදිසිය පිළිබඳව තිබෙන හොඳම උදාහරණය තමයි, පසුගිය පස්වැනි මාසයේ 21වැනි දා ඔබතුමන්ලා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරපු එක. අපි දන්නවා, 21වැනි දා එය කැබිනට් මණ්ඩලයට දැම්මාම 22වැනි දා out වෙන බව. එතකොට ඒක ගැන අපට දැනගන්න පුළුවන්. හැබැයි, out වෙන කැබිනට් පත්‍රිකා ලැයිස්තුවේ මේක නැහැ. කොළේ වහලා හංගලා තමයි මේ Cabinet Paper එක දමන්නේ. එය තමයි, "Implementation of Renewable Energy Projects Received Through Expressions of Interest".

මේ, අභිලාෂ කැඳවීම පිළිබඳ කැබිනට් පත්‍රිකාව. මේ කැබිනට් පත්‍රිකාවේ ව්‍යාපෘති 49ක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට මේ හදිසි අභිලාෂ කැඳවීම් 49කට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නේ කුමන අරමුණකින්ද? දැන් මේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ පවා තිබෙනවා, මීට කලින් අනුමැතිය ලබා ගත්, පරණ approvalවලට අවස්ථාව තිබෙනවා කියලා. හැබැයි ඒ competitive bidding කරපු, ඒ කියන්නේ තරගකාරී ලංසු කැඳවීම් මත කරන ලද අනුමැති සඳහා තමයි ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පවා අනුමැතිය, අවසරය දීලා තිබෙන්නේ ඔබතුමන්ලාට මේ කටයුත්ත කිරීමට. හැබැයි, ඒ අවසරයවත් සලකා බලන්නේ නැතිව, 05වැනි මාසයේ 21වැනි දා හදිසියේ ඉදිරිපත් කරන ලද මේ Cabinet Memorandum එක හරහා ව්‍යාපෘති 49කට අවසරය දීලා තිබෙනවා. මේ ව්‍යාපෘති 49 අතර පොඩි පොඩි ව්‍යාපෘති නොවෙයි, විශාල ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා. මෙගාවොට් 100, මෙගාවොට් 700, මෙගාවොට් 80, මෙගාවොට් 100, මෙගාවොට් 100 වශයෙන්. මම හිතන විධියට, මේවා එකතු කරලා බැලුවොත් විශාල ප්‍රමාණයක්. මෙගාවොට් 50ට වැඩි ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් මෙහි තිබෙනවා.

ගරු මනුෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara - Minister of Labour and Foreign Employment)
732යි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
එතකොට එකතුව මෙගාවොට් 732ද? ඔබතුමාට ගණන් බැරිද, මනුෂ නානායක්කාර ඇමතිතුමා? යන යකා කොරහත් බිඳගෙන යනවා කියා කථාවක් තිබෙනවා නේ. තව මාස තුනකින් යන යකා කොරහ බිඳගෙන තමයි මේ යන්න යන්නේ. අපට ආරංචියි, පසුගිය ටිකේ බාර් ලයිසන් ගණනාවක් දුන්නා කියලා. ඒකත් අර යන යකා කොරහ බිඳගෙන යනවා වාගේ වැඩක් තමයි. අපට ආරංචියි, කැසිනෝ ලයිසන් දෙකක් දෙන්න යනවා කියලා. ඒකත් යන යකා කොරහ බිඳගෙන යනවා වාගේ වැඩක් තමයි. ඒ වාගේම තමයි, මේ අභිලාෂ මත - EoIs මත - ලයිසන් 49ක් දෙන්නේත්. මේවා මේ ආණ්ඩුව අන්තිම මාස දෙක තුනේ හොරකම් කරන්න, හම්බ කරන්න, සල්ලි එකතු කරන්න කරන ව්‍යාපෘති. අපට ආරංචියි නේ, ජනාධිපතිතුමා දැන් මැතිවරණ කාර්යාලයකුත් දැම්මා කියලා. ඉතින්, මේවා පිට දාලා සල්ලි හොයන එකයි කරන්නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බයද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
කිසිම බයක් නැහැ. ගමට ගියාම බය කියලා නාමයක්වත් නැහැ. ඔක්කෝම සූට් ගහලා ඉන්නේ, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ටයි එක ඇඳලා තිබෙන්නේ. අද අනුමත කරන්න හදන්නේ ඒ වාගේ අපට එකඟ වෙන්න බැරි පනත් කෙටුම්පතක් කියන එක මම පැහැදිලිවම කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, Ceylon Electricity Board එක ගැන. අද වෙනකොට දකුණු ආසියාවෙන්ම සියයට 99යි දශම ගණනක් මුළු රටම විදුලිනය කරලා තිබෙන්නේ අපේ රටේ පමණයි. සාමාන්‍යයෙන් දශම ගණනක් ඉතිරි වෙනවා. ඒක සියයට සියයක් කරන්න බැහැ. ඒක සාමාන්‍යයි. එතකොට අපේ network loss එක සියයට 7කට වඩා අඩු මට්ටමකට දැන් ඇවිල්ලා තිබෙනවා. ඒක දකුණු ආසියාවේ නොවෙයි, මුළු ආසියාවේම ඉතා ඉහළ මට්ටමක්. අපට හොඳ විදුලි

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

පද්ධතියක් තිබෙනවා. ඒ වාගේම, අපට මහවැලිය ඇතුළු විශාල ජලවිදුලි බලාගාර පද්ධතියකුත් තිබෙනවා. අද වන විට මේ බලාගාරත් වෙන වෙනම කඩන්න හදනවා. Unbundle කරන්න කිව්වාට අපි කිව්වේ නැහැ, බලාගාරයෙන් බලාගාරය කඩන්න කියලා. ජනනය, බෙදාහැරීම සහ සම්ප්‍රේෂණය - generation, distribution and transmission - කොටස් තුනකට කැඩීම පිළිබඳව තමයි අපි කථා කළේ. හැබැයි, අද මොකක්ද කරන්න යන්නේ? මහවැලිය යටතේ තිබෙන වික්ටෝරියා ඇතුළු විශාල විදුලි බලාගාර ටිකත් මෙතුමන්ලා වෙන වෙනම කඩන්න හදනවා. මේවා ගැන තක්සේරු කරන්නේ කවුද කියලා අපි ඊයේ-පෙරේදා Sectoral Oversight Committee on Energy and Transportහිදී ඇහුවාම කිව්වා, මේ තක්සේරුව කරන්නේ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට තව විනාඩි කිහිපයක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාගෙන්ද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනයෙන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම දැනුම් දීලා නම් නැහැ, මූලාසනයට.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අපේ රටේ තිබෙන වික්ටෝරියා වාගේ බලාගාරයක් උදාහරණයකට ගන්නකෝ. ඒ වාගේ දැවැන්ත විදුලි බලාගාරයක තක්සේරුවක් කරන්න පුළුවන් engineering background එකක් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට තිබෙනවාද? එම තක්සේරුව හරියට කෙරුණේ නැත්නම්, ඊළඟට මේවා විකුණද්දී තුට්ටු දෙකට විකිණිලා යයි. මේවා යටින් අපූරුවට ගේම් ගහයි. ඒ නිසා පැහැදිලිවම මෙතැන තිබෙන්නේ අපේ රටේ තිබෙන විදුලිබල පද්ධතිය, අපේ විදුලි බලය තුට්ටු දෙකට කාට කාට හෝ විකුණා මේ බංකොලොත්භාවයෙන් ගොඩ එන්න කියලා දරන උත්සාහයක්. ඒකට යටින් හොරකම, වංචාව, දූෂණය ඕනෑ තරම් තිබෙනවා. ඒ නිසා අපි පැහැදිලිවම කියන්නේ මේ වැඩේට අපි එකඟ නැහැ කියලායි. අපි මේ රටේ ජනතාවට පොරොන්දුවක් දෙනවා, මේ ගෙනෙන පනත අනිවාර්යයෙන්ම ඔක්තෝබර් අග පත්වන සජිත් ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ ආණ්ඩුවේ පළමුවෙනි කැබිනට් මණ්ඩලයෙන්ම හකුළා මීට වඩා හොඳ පනතක් ගෙන ඒමට අවශ්‍ය විධිවිධාන සලසනවාය කියලා. ඒ පොරොන්දුව අපි මේ රටේ ජනතාවට ලබා දෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න. මූලාසනයෙන් ඔබතුමාට අමතර වේලාවක් ලබා දීලා නැහැ. කරුණාකර කථාව අවසන් කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, යන යකා කොරහත් බිඳගෙන යන මේ වාගේ වැඩ පිළිවෙළවල් තිබෙන්නේ විදුලිබල මණ්ඩලයේ විතරක් නොවෙයි කියන එක. හැම තැනකම මෙවැනි කටයුතු තිබෙනවා, ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉඳලාම. ඒ නිසා මෙම වැඩ පිළිවෙළට විරෝධය පළ කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.19]

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා විදුලිබල මණ්ඩලය කොටස් 12කට -සමාගම් 12කට- වෙන් කිරීමට අදාළ මේ පනත් කෙටුම්පත පිළිබඳව අපි සලකා බලන්න ඕනෑ, රජය අනෙකුත් රාජ්‍ය ව්‍යාපාර හා රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් ගෙන තිබෙන ප්‍රතිපත්තියට අනුකූලවයි. අද වනවිට රටේ රාජ්‍ය ආයතන 1,200ක් පමණ තිබෙනවා. මීට අවුරුදු 100කට කලින් මේ රටේ රාජ්‍ය ආයතන 10යි තිබුණේ. එහෙම නම් මේ රාජ්‍ය ආයතන පිළිබඳව සමස්ත ඇගැයීමක් කරලා මේ ආයතන ප්‍රමාණය අඩු කරන්න, මේ ආයතනවල ඵලදායීතාව වැඩි කරන්න, මේ රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය, ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව විද්‍යාත්මක, කළමනාකරණ විගණනයක් කළ යුතුව තිබුණා. මේ ගැන අපි COPE එකේදී සිදු කළ යෝජනාවකට අනුව මුදල් අමාත්‍යාංශය යම් විගණනයක් ආරම්භ කර, එය සිදු කරගෙන ගිහින් තිබුණා.

අපි හඳුනා ගන්න ඕනෑ, දැනට බෝර්ඩ් ලැලි හැටියට විතරක් රාජ්‍ය ආයතන කීයක් තිබෙනවාද කියලා. ඒවා වහන්න ඕනෑ. ඒ වාගේම එකම ක්‍රියාවලියට රාජ්‍ය ආයතන තුන-හතර තිබෙනවා. ඒවා එකතු කරන්න ඕනෑ. සමහර රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කරන්න ඕනෑ. තවත් සමහර රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන අතර රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය - public-private partnership - ඇති කරන්න ඕනෑ. තවත් සමහර රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කරන්න ඕනෑ. නමුත් එවැනි විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය කරන්නේ නැතුව අතැනින් ටෙලිකොම් එක විකුණනවා; මෙතැනින් රක්ෂණ සංස්ථාව විකුණනවා; තව තැනකින් ගෑස් කොම්පැනිය විකුණනවා; තව තැනකින් විදුලිබල මණ්ඩලය කොටස් කරන්න හදනවා. එවැනි ක්‍රියාවලියකින් මේ රාජ්‍ය සේවය ඉදිරියට යන්නේ නැහැ.

හුඟදෙනෙක් හිතාගෙන ඉන්නවා, මේවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝග කියලා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල රාජ්‍ය ආයතන - විශේෂයෙන්ම ලංකා විදුලිබල මණ්ඩලය වැනි ආයතන - ඉදිරියට ගෙන යෑම සඳහා යහ පාලන මූලධර්ම ගණනාවක් හඳුන්වා දුන්නා, සභාපතිලා, අධ්‍යක්ෂ මණ්ඩල පිළිබඳව ව්‍යක්තීය ප්‍රවේශයක් ගන්න කියලා; ඒ වාගේම මේවා පිළිබඳව කිසියම්

ආකාරයක කාර්ය සාධන ඇගැයීමක් කරන්න කියලා. ඒ කිසිවක් කරන්නේ නැතුව තැනින් තැනින් කරගෙන යන මේ ක්‍රියාවලියෙන් මේ රාජ්‍ය ආයතන පද්ධතිය මීටත් වඩා බරපතළ අර්බුදයකට යන බව මම මතක් කරන්න ඕනෑ.

මේ වසරේ පළමුවෙනි මාස පහ තුළ ලංකා විදුලිබල මණ්ඩලය අතිරේක වශයෙන් රුපියල් බිලියන 90ක්, ඒ කියන්නේ රුපියල් කෝටි 9,000ක් උපයා තිබෙනවා. ආසන්න වශයෙන් ලක්ෂ 75ක් පමණ වන විදුලි පාරිභෝගිකයන්ගෙන් වැඩිපුර රුපියල් 12,000 බැගින් මේ කාල සීමාව තුළදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් අය කරගෙන තිබෙනවා. ඒ විධියට අධික ගාස්තු අය කරන්න එපා කියලා අපි කිව්වා. අද ඇමතිතුමා ප්‍රකාශ කළා, විදුලි ගාස්තු අඩු කරනවා කියලා. නමුත් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමට මේ දක්වා එවැනි ලියැවිල්ලක් ඇවිල්ලා නැහැ. කෙසේ නමුත් මේ ක්‍රියාවලිය නිසා විදුලි ඒකක 60ට වඩා අඩුවෙන් පාවිච්චි කරන දුගී ජනතාව වාගේම මේ රටේ ව්‍යාපාරික ප්‍රජාව නැති වෙලා යනවා. කලාපයේ අපිට සමකාලීන අනෙක් රටවල තත්ත්වය ගැන බැලුවාම, විශේෂයෙන්ම වියට්නාමයට ආයෝජන සඳහා ප්‍රධාන ආයතන ගමන් කරන්න බලපාන ප්‍රධාන හේතුව වන්නේ එම ක්ෂේත්‍රවලට අදාළව සියයට 40කින් පමණ ඒ රටේ විදුලි බිල අඩු වීමයි. ඒ නිසා cost-reflective කිව්වාම, අධික ලාභ ඉපැයුවත් ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්ය සාධනය වැඩි කරන්නේ නැතුව, එහි සියලු දුක්ඛ දෝමනස්සයන් පාරිභෝගිකයන් මත පැටවීම සම්පූර්ණයෙන්ම වැරදියි.

විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කළ යුතුද? ඔව්. එහෙම නම් ඒක කරන්න ඕනෑ කොහොමද? මොනවාද, ඒ් සඳහා පාවිච්චි කළ යුතු මූල ධර්ම? මෙවැනි ක්‍රියාවලියකදී පළමු කාරණය තමයි විදුලි බලය සපයන්නා. ඔහු එක ප්‍රධාන සාධකයක්.

ඒ වාගේම විදුලි පරිභෝජකයා. ඒ, දෙවැනි සාධකය. තුන්වැනි සාධකය තමයි විදුලිබල ප්‍රතිපත්තිය, බලශක්ති ප්‍රතිපත්තිය පිළිබඳ තීරණ ගන්න ආණ්ඩුව, විධායකය, ඇමති මණ්ඩලය හා ඒ ප්‍රතිපත්ති සැකසුම් ක්‍රියාවලිය. ඒ වාගේම හතරවැනි සාධකය තමයි, පාරිභෝගිකයාත්, විදුලි බලය සපයන්නාත්, ආණ්ඩුවේ ප්‍රතිපත්තිත් එක්ක රටේ ඉදිරි ගමන ගැන කල්පනා කර බලලා මේ සියල්ල නියාමනය කරන නියාමන ක්‍රියාවලිය. මේ කොටස් හතර අතර තිබෙන සමබරතාව බිඳිලා එක පැත්තකට ඇදිලා ගියොත් මොකද වෙන්නේ? මේ පනතින් බොහෝදුරට ප්‍රතිපත්ති සකසන්නාට; ඇමතිතුමාට, විධායකයට විශාල බලයක් හිමි වෙනවා විතරක් නොවෙයි, පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා 2009 වසරේ විදුලිබල පනතෙන් නියාමන අධිකාරියට ලබා දුන් බලතල විශාල ප්‍රමාණයකුත් ඉවත් කරලා තිබෙනවා. ඒ අනුව මේ පනතෙන් මේ සමමිතිය ප්‍රතිපත්තිමය වශයෙන් සම්පූර්ණයෙන්ම බිඳ වැටිලා තිබෙන බව කනගාටුවෙන් වුණත් මම ප්‍රකාශ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල මණ්ඩලය කොටස්වලට වෙන් කිරීම සඳහා, එහෙම නැත්නම් unbundling කිරීම සඳහා 2002දී යෝජනාවක් ඉදිරිපත් වුණා. ඒ අනුව ලංකා විදුලිබල මණ්ඩලය කොටස් 6කට වෙන් කරන්න යෝජනා වුණා. ඒ, ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම ආදී වශයෙනුයි. නමුත් එ්ක ක්‍රියාත්මක වුණේ නැහැ. මොකද, 2009 දක්වා ඒක ඇදගෙන ආවා. විදුලිබල පනත ඊට සමානුරූපීව වෙනස් කළේ නැහැ. ඒක වෙනස් කළේත් අවස්ථාවාදීවයි. ඒ, ආසියානු සංවර්ධන බැංකුවේ ආධාරයක් බලාපොරොත්තුවෙන්. එහෙම නැතිව විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණින් නොවෙයි. කොහොම නමුත්, ඒ ක්‍රියාවලිය මීට වඩා සරලයි. පළමුවෙන්ම මම කියන්න ඕනෑ, ඒ ක්‍රියාවලියත් එක්ක බලනකොට ඉතාම සංකීර්ණ ක්‍රියාවලියක් තමයි මේ පනතින් ඇති කරලා තිබෙන්නේ කියන එක. විදුලිබල ක්ෂේත්‍රයේ වගකියන්නෙක් නැහැ. අද වෙනකොට විදුලිබල මණ්ඩලය කියලා ඒකකයක් තිබෙනවා. ඒ, ඒකකය විදුලිය අත්හිටුවීමකදී, විදුලි කප්පාදුවකදී, එහෙම නැත්නම් විදුලිය බිඳ වැටීමකදී කිසියම් දුරකට ඒ පාරිභෝගිකයන්ට වග කියනවා. නමුත් මේ සංකීර්ණතාව විසින් මේ ආයතන 12න් කවුද, කාටද වග කියන්නේ කියන එක පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් ඇති කරලා තිබෙනවා.

මේ පනතින් වෙනස් වෙන ඊළඟ කාරණය මෙයයි. මෙහිදී සම්ප්‍රේෂණ ක්‍රියාවලියට පෞද්ගලික අංශය ගෙනැල්ලා තිබෙනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. පෞද්ගලික අංශය දැනුත් කුඩා-කුඩා විදුලි ව්‍යාපාර, විදුලි ව්‍යාපෘති කරනකොට එවැනි දේ කරනවා. නමුත් අප මතක තබා ගත යුතුයි, විදුලිය පිළිබඳ කාරණයේදී විදුලි ඒකාධිකාරයන් ඇති වෙන්න තිබෙන ඉඩකඩ වැළැක්වීමට රජයට තිබෙන මූලිකම අංගය තමයි සම්ප්‍රේෂණය රජය සතු වීම කියන එක. ඒ ක්‍රියාවලිය වෙනස් වුණොත් අනිවාර්යයෙන්ම විදුලි ඒකාධිකාරයක් ඇති වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, අපි මේ රටට ටයිල් ගෙන්වීම නතර කළාම දෙදෙනෙක් ඒකාධිකාරයක් හදා ගත් බව. ඒ වාගේම තමයි, සීනි ඒකාධිකාරයක් හදා ගත්තා; බිත්තර ඒකාධිකාරයක් හදා ගත්තා. විදුලිබල ක්ෂේත්‍රයේ විතරක් නොවෙයි, මේ වාගේ ඉතා පුංචි ක්‍රියාවලින්වලත් බලගතු ඒකාධිකාරයන්, කරීකාවාදිත්වයන් ඇති කර ගන්නවා. ඒක නතර කරන්න රජයට තිබෙන ලොකුම අවිය තමයි සම්ප්‍රේෂණය රජය සතු කරගැනීම.

අපි දන්නවා, කැලිෆෝනියා විදුලි මාෆියාව ගැන. කැලිෆෝනියානු ආණ්ඩුවේ ආණ්ඩුකාරවරයාව ගෙදර යවන්න තරම් බලවත් වුණේ එහි සම්ප්‍රේෂණ පද්ධතිය රජය සතු නොවීමයි. ඒ නිසා සම්ප්‍රේෂණය පිළිබඳ ක්‍රියාවලිය රජය සතු විය යුතුමයි. මෙතැන සමාගම් දෙකකට එය කඩලා තිබෙනවා. එකක්, විදුලි පද්ධති. ඒ කියන්නේ, wire system එක රජයට සියයට සියයක් අයිතිය තිබෙන කොම්පැනියකට දීලා තිබෙනවා. ඒ වාගේම dispatch එක ඇතුළු අනිකුත් ක්‍රියාවලිය රජයට සියයට 50ක අයිතියක් තිබෙන ව්‍යාපාරයකට දීලා තිබෙනවා. එතැන තමයි වැදගත් දේ තිබෙන්නේ. පසුගිය කාලයේ විදුලිබල මණ්ඩලය පාඩු ලැබුවේ, නොයෙකුත් ආකාරයේ දූෂණ ක්‍රියාවලින්ට විශාල වශයෙන් යොමු වුණේ මේ dispatch එක ක්‍රියාත්මක කිරීමේදි සිදු වුණු විශාල ව්‍යාකූලතා නිසායි. ඒ නිසා මේ ක්‍රියාවලිය තුළ රටේ විදුලිබල පද්ධතිය පාලනය කරන්න නොහැකි තත්ත්වයක් අනාගතයේදී ඇති වෙන්න පුළුවන්. 2002 වසරේදී ඉදිරිපත් වුණු පනතට වඩා මේ විදුලිබල පනත් කෙටුම්පතේ තිබෙන විශේෂත්වය තමයි විදුලිබල පද්ධතිය පාවිච්චි කරලා, ඕනෑම කෙනෙකුට විදුලිය ජනනය කරලා, තමන්ට ඕනෑම තැනකට විදුලිය ගෙනියන්න ඉඩකඩ තිබීම. Wheeling principle එකට නිලභාවයක් ලබා දීලා තිබෙනවා. මේ තුළින් මොන විධියේ ප්‍රතිඵල ඇති වෙයිද කියන්න බැහැ. නමුත් 2002දී ඉදිරිපත් වූ පනතට වඩා මෙහි තිබෙන මූලිකම වෙනස මේ ක්‍රියාවලියයි. මේ ක්ෂේත්‍රයේ නියැළුණු කෙනෙක් හැටියටත්, මේ සංවාදයට දායක වුණු කෙනෙක් හැටියට මම මේ අවස්ථාවේදි අනතුරු අඟවනවා, මේක අවිධිමත් ආකාරයට හෝ විධිමත් ආකාරයට හෝ ක්‍රියාත්මක කළහොත් තව අවුරුදු කීපයක් යනකොට ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය කාටවත් පාලනය කරන්න බැරි, වියවුල්සහගත, කතිපයාධිකාරයන්ට අසු වුණු, මාෆියාවලට අසු වුණු ක්‍රියාවලියක් බවට පත් වෙන්න තිබෙන අනතුර වැඩියි කියලා. එම නිසා, කරනවා නම් 2002 පනතේ තිබෙන අඩු පාඩු ගැන කල්පනා කර බලා නිසි ආකාරයෙන් සිදු කිරීම තමයි කළ යුත්තේ කියන යෝජනාව කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජේෂ්ඨ විනානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.හා. 4.27]

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාදයට ගෙන තිබෙන ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත පිළිබඳව විවිධ අදහස් පළ වුණා. ඒ අතරින් අපේ ගරු අලි සබ්‌රි ඇමතිතුමාගේ ප්‍රකාශයකින්ම මම මගේ අදහස් දැක්වීම ආරම්භ කරනවා. එතුමා කිව්වා, පෞද්ගලීකරණය කියන්නේ බිය විය යුතු දෙයක් නොවෙයි කියලා. මම පිළිගන්නවා, ලංකාව වාගේ රටක පෞද්ගලීකරණය විය යුතු, පෞද්ගලීකරණය කළ යුතු ආයතන තිබෙන බව. නමුත් මම ඉතිහාසය මතක් කරලා දෙන්න කැමැතියි. ගරු කංචන විජේසේකර ඇමතිතුමා අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙනවා. එතුමා අද විපක්ෂයේ ඉඳලා, මේ පනත් කෙටුම්පත වෙන කවුරු හරි ගෙනාවා නම්, ගරු කංචන විජේසේකර මැතිතුමා කථා කරන්නේ කොහොමද කියන කාරණාව මට මේ වෙලාවේ සිහිපත් වෙනවා.

මට මතකයි, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා හම්බන්තොට වරාය හදලා, එම වරායේ වැය බර මේ රටට දරා ගන්න බැරුව තිබෙන වෙලාවේ, එය පෞද්ගලීකරණය කරන වෙලාවේ කංචන විජේසේකර මැතිතුමා, ඩී.වී. චානක මැතිතුමා ඇතුළු මන්ත්‍රීවරු රාශියක් හම්බන්තොට ගිහිල්ලා, උද්ඝෝෂණ කරලා පෞද්ගලීකරණයට විරුද්ධව විශාල පෙරළියක් කළ ආකාරය. අද එතුමන්ලා පෞද්ගලීකරණය ඉතාම සුවදායී කියලා ප්‍රකාශ කිරීම හරහා අපට පෙනෙනවා, මේ ඔළු ගෙඩි ටික වෙනස් කරන්න රනිල් වික්‍රමසිංහ මැතිතුමා කොච්චර මෙහෙයක් කර තිබෙනවාද කියලා. ඒ ටික නියමෙට වෙනස්වෙලා තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. අපේ පරණ නායකයා පොදුජන පෙරමුණේ තරුණ මන්ත්‍රීවරුන්ගේ ඔළු ටික නියමෙට හෝදලා තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. මොකද, පෞද්ගලීකරණය ගැන එතුමන්ලාම හදපු ඒ ව්‍යාපෘතියේදි එදා ඒ දාපු ජෝගි ටික දැන් මතක් කරලා දෙනවා.

ගරු කංචන විජේසේකර ඇමතිතුමනි, මේක හදිසියේ ගෙනාපු පනතක් නොවෙයි කියලා අලි සබ්‌රි ඇමතිතුමාම කිව්වා. අපි දන්නවා, අලි සබ්‌රි ඇමතිතුමන්ලා වාගේ නීති ප්‍රවීණයෝ රාශියක් ආණ්ඩු පක්ෂය නියෝජනය කරනවා කියලා. ඒ නීති සහාය අරගෙන, සියල්ල කරලා අවුරුදු ගණනාවක් කටයුතු කරලා මේක ඉදිරිපත් කළා නම්, මෑත කාලයේ ගෙනාපු පනත් කෙටුම්පතක් වුණු මේ පනත් කෙටුම්පතට අධිකරණයෙන් මේ තරම් විශාල සංශෝධන ප්‍රමාණයක් -වගන්ති 54න්, 12කට වැඩි ප්‍රමාණයකට සංශෝධන ප්‍රමාණයක්- ආවේ ඇයි කියන කාරණාව ගැන ඔබතුමන්ලා දෙවරක් සිතිය යුතුයි. මේ රටේ ජනතාවට වැඩදායී වෙන්න, ඵලදායී වෙන්න විදුලිබල මණ්ඩලය සකස් කරනවා නම්, එහි වෙනස්කම් කරනවා නම්, අධිකරණය තුළින් මේ වගේ තීන්දු තීරණ ආවේ ඇයි කියන එක ගැන ඔබතුමන්ලා දෙසැරයක් හිතන්න ඕනෑ. ගරු නලින් බණ්ඩාර මැතිතුමා කිව්වා වාගේ අද වෙලා තිබෙන්නේ, මේ මොහොතේ රටේ තිබෙන ප්‍රශ්නය තේරුම් අරගෙන, මේ මොහොතේ බංකොලොත්භාවයට පත් වුණු රටේ තිබුණු තත්ත්වය මතක් කර දෙමින් ඔබට ඕනෑ කරන දේවල් කරගෙන යන එකයි.

කංචන විජේසේකර ඇමතිතුමා කිව්වා, එතුමා ඇමති ධුරය භාර ගන්නකොට දවසකට පැය 12ක් විදුලිය කප්පාදු කළා කියලා. මම අහන්න කැමැතියි, දවසට පැය 12ක් විදුලිය කප්පාදු කරන තැනට මේ රට ගෙනාපු, මේ රටේ විදුලිබල මණ්ඩලය අරගෙන ආපු ඇමතිවරු කවුද කියලා. ගරු අලි සබ්‌රි ඇමතිතුමා කිව්වා වාගේ 1990න් පස්සේ මේ රටේ විදුලිබල ඇමතිවරු විධියට හිටපු සියලුදෙනාම පොදුජන පෙරමුණ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරපු අය. යහ පාලන ආණ්ඩුව කාලයේ හිටපු විදුලිබල ඇමතිවරයාත් දැන් ඔබතුමන්ලාත් එක්කයි ඉන්නේ. එහෙම නම්, අවුරුදු 30කට ආසන්න කාලයක් මේ රටේ විදුලිබල ඇමතිවරු හැටියට හිටපු සියලු දෙනාටම තමයි ඔබතුමා ඒ කථා කළේ. කංචන විජේසේකර ඇමතිතුමාට මගේ පෞද්ගලික ගෞරවයක් තිබෙනවා. වෙනස්කම් කළ යුතු සමහර ඒවා තිබෙනවා. දුමින්ද දිසානායක මැතිතුමාටත් මගේ ගෞරවය තිබෙනවා. පුනර්ජනනීය බලශක්තිය එක එක මාෆියාවන්ට හසුවෙලා වැහිලා තිබුණා. එහි යම් කිසි හරාත්මක වෙනසක් ඇති කරන්න එතුමා උත්සාහ කළා. ඒක විය යුතු දෙයක් කියලා මම විශ්වාස කරනවා. හැබැයි ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඒ වාගේම පරිසර අමාත්‍යාංශය වාගේ සමහර ආයතන අදටත් දෙන්න ඕනෑ clearance දීලා මේ රටේ ව්‍යාපාරිකයන්ට - දේශීය ව්‍යාපාරිකයන්ට- ලබා දිය යුතු ශක්තිය, හයිය දෙන්නේ නැහැ. එම නිසා අපි හිතනවා, මේ වෙනස්කම් කරනකොට විනිවිදභාවයක් තිබෙන්න අවශ්‍යයි කියලා. මේ වෙනස්කම් වෙන්න ඕනෑ, මේ ව්‍යාපෘති සඳහා ආයෝජකයෝ එන්න ඕනෑ. හැබැයි, ආයෝජකයින්ට එන්න බැහැ. අපේ රටේ ආයෝජනය කරන්න එන්නේ හොරු ටිකක් විතරයි. එහෙම නැතිව විශාල ගණන්වල ආයෝජනවලට, විනිවිදභාවයෙන් යුතුව කරන, තරගකාරී ආයෝජනවලට මිනිස්සු එන්නේ නැහැ. මේ රටේ තිබෙන නීති තුළ, මේ රටේ තිබෙන ක්‍රමවේදය තුළ ඔවුන්ට සිදු වන පාඩුවක් තිබෙනවා.

පසුගිය කාලයේ පුනර්ජනනීය බලශක්තිය සැපයූ දේශීය ආයෝජකයන්ට අවුරුද්දක් යන තෙක් මුදල් ගෙවන්න බැරි වුණා, ගරු ඇමතිතුමනි. එතකොට මේවාට ආයෝජනය කරන ව්‍යාපාරිකයෝ කල්පනා කරනවා, අපි ඒවා වෙනුවෙනුත් යම් මුදලක් ඉතිරි කරන්න ඕනෑ කියලා. මම අවසාන වශයෙන් මේ කාරණයත් කියනවා. ඔබතුමන්ලා කමිටු පත් කරලා මොනවා කළත්, අවසානයේ යම් කණ්ඩායමක් බලාපොරොත්තු වන දේ විතරයි වෙන්නේ. මට මතකයි, අපි පසුගිය කාලයේ දිගින් දිගටම ක්‍රිකට් ගැන කථා කළා, කෑ ගැහුවා. මේක ගැන කියන්නත් ඒ උදාහරණයම ඇති, ගරු ඇමතිතුමනි.

ගරු අලි සබ්‌රි ඇමතිතුමනි, ඒ වෙනුවෙන් පත් කළ කමිටුවේ ඔබතුමා හිටියා. ගරු කංචන විජේසේකර ඇමතිතුමා හිටියා. ගරු මනුෂ නානායක්කාර ඇමතිතුමා හිටියා. ඔබතුමන්ලා නිර්දේශ රාශියක් දුන්නා. නමුත්, ඒ එක නිර්දේශයක්වත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, අද LPL එකට පල් හොරු ටිකක් ගෙනැල්ලා මේ රටේ ක්‍රිකට් විනාශ කරනවා.

ගරු ඇමතිතුමනි, මම හිතනවා, මේ සියල්ලටම අවංකව, සද්භාවයෙන් වැඩ කරන ඇමතිවරු දහදෙනෙක් හරි ආණ්ඩුවේ හිටියා නම්, අපට නියමිත ගමන යන්න පුළුවන් කියලා. එහෙම නැතුව, රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ඕනෑ විධියට මේක කළමනාකරණය කර ගන්න අත උස්සන පිරිසක් ඉන්න නිසා තමයි අද මේ දේවල් වෙලා තිබෙන්නේ. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.33]

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක පුදුම පාර්ලිමේන්තුවක්. මගේ නම කථික ලැයිස්තුවේ තිබුණේ නැහැ. මේ පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට කාලය මදි කියලා, තව දවසක් දෙන්න කියලා මේ සියලු මන්ත්‍රීවරු වෙනුවෙන් අපි ඉල්ලීමක් කළා. එතකොට අද සවස පක්ෂ නායක රැස්වීමක් තිබෙනවා කිව්වා. ඒ අනුව හෙට දවසේත් මේ විවාදය තිබෙනවාද, එහෙම නැත්නම් පක්ෂ නායක රැස්වීමේදී ගත්ත තීන්දුව මොකක්ද කියලා අහන්න, මම මේ ලේකම්තුමන්ලා ළඟට ගියා. එතකොට එතුමන්ලා මට කියනවා, මට විනාඩි පහක කාලයක් දෙන්න කියලා කථානායකතුමා කියලා ලු. අඩු ගණනේ ඒක ඊට කලින් දැනුම් දුන්නේවත් නැහැ. අපේ රටේ පාර්ලිමේන්තුව මෙහෙම නම්, අපි මේ රටට නීති හදන්නේ කොහොමද? මම මේ පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව අහන්නේ. මම රට වෙනුවෙන්, පොදුවේ මන්ත්‍රීවරු වෙනුවෙන් තව දවසක් විවාදය සඳහා ඉල්ලුවාම, මට විනාඩි පහක අල්ලසක් දෙනවා. ඒකද අපේ පාර්ලිමේන්තුවේ කාර්යභාරය? අපි රටට දෙන ආදර්ශය මේකද? මම දන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. *[බාධා කිරීමක්]* ගරු විදේශ කටයුතු ඇමතිතුමා කිව්වා, දැන් විදුලි බිල අඩු කරලා තිබෙනවා කියලා. ඒ කවදා ඉඳන්ද?

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ජූලි 01වැනි දා ඉඳන්.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

ඒක අද කියලා එව්වේ ඇයි? [බාධා කිරීමක්] ඒක තමයි. නියම දවස නේද? නියම දවස. ලජ්ජා නැද්ද? ලජ්ජාවක් කියලා එකක් ගෑවිලාවත් නැද්ද? විදුලි බිල වැඩි කරලා, වැඩි කරලා, වැඩි කරලා දැන්- *[බාධා කිරීමක්]* අද "දිවයින" පුවත් පතේ තිබෙන්නේ මොකක්ද? අද "දිවයින" පුවත් පතේ තිබෙනවා, "ලයිට් කපපු ගෙවල්වලින් වැඩිපුර ගත් කෝටි 30 මාස 3ක් ඇතුළත යළි දෙන්න මහජන උපයෝගිතා කොමිසම නියෝග කරයි" කියලා.

ගෙවල්වල ලයිට් කැපුවා විතරක් නොවෙයි. ලයිට් බිල වැඩි කරලා, ලයිට් කපලා, ආපහු සම්බන්ධතාව දෙන්න වැඩිපුරත් මුදල් අය කරලා. ඒක ආපහු ගෙවලාත් නැහැ. ඒක මාස තුනක් ඇතුළත ගෙවන්න කියලාත් නියෝග තිබෙනවා. කීයක්ද? රුපියල් කෝටි 30ක්. එහෙම තිබියදී අද අපිට කෙටි පණිවුඩ එවනවා. අනේ, ජූලි මාසයේ ඉඳන් ලයිට් බිල අඩු කරනවා ලු. හැම තැනම පගාව. අපි රටේ පගාව නැති කරන්න ඕනෑ ලු; දූෂණය නැති කරන්න ඕනෑ ලු. මේ මොනවාද කියන්නේ? හිටපු අධිකරණ ඇමතිතුමා - දැන් විදේශ කටයුතු ඇමතිතුමා - ඒකත් කලිසමක් ඇඳගෙන, කෝට් එකක් ඇඳගෙන, ටයි එකකුත් දමාගෙන මේ සභාවට ඒක කියනවා. ලජ්ජයි. ඊට පස්සේ එතුමාම ඇහුවා, සමගි ජන බලවේගයේ "The Blueprint" එක ගැන. ඔබතුමාගේ පක්ෂය මොකක්ද?

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ඔබතුමාගේ පක්ෂයමයි.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

බලන්න, මගේ පක්ෂයෙන් මෙන්න මේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කළේ. මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඔය අද ගේන ඒවා තිබෙනවාද? මේකේ ඔය කියන කාරණා තිබෙනවාද? මේකේ පිටු එකහමාරකට වඩා තිබෙන විස්තරය කියවලා බලන්න, ඔය කියන ඒවා තිබෙනවාද කියලා. ඔබතුමන්ලා කථා කරන්නේ, ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන්නේ සමගි ජන බලවේගයේ "The Blueprint" එක නම්, ඔබතුමන්ලා ඔය පක්ෂයෙන් අස් වෙලා ඒ පක්ෂයට යන්න.

ඊළඟට මේ ජන වරම සම්බන්ධයෙන් කථා කරද්දි, කලින් කථා කරපු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා ඇහුවා, "එතකොට මේ ඉතුරු අවුරුදු ගණනම රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා නිකම් ඉන්න ඕනෑද?" කියලා. නැහැ, එතුමා පත්වුණු ජනාධිපතිවරයෙක් සම්බන්ධයෙන් නේ ඉදිරිපත් වුණේ. ඒ ජනාධිපතිවරයාට ජනවරමක් තිබෙනවා. ඒ ජනවරමේ ඉදිරි කාලය වෙනුවෙන් එතුමාට කරන්න දේවල් තිබෙනවා. ඒවා මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙනවා. ඔබතුමන්ලා මේ ප්‍රතිපත්ති ප්‍රකාශය කියෙව්වේ නැද්ද? ඔබතුමන්ලා මේවා වෙදිකාවල කිව්වේ නැද්ද? මේ ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාත්මක කරන්න. ඒකට තමයි එතුමාට අවස්ථාව ලැබිලා තිබෙන්නේ. එතුමාට ලැබිලා තිබෙන්නේ හැටනවලක්ෂයේ ජනවරම. අලුත් ජන වරමක් ඕනෑ නම්, ඉදිරියේදී ජනාධිපතිවරණයක් එනවා. අපි හිතනවා, ඔබතුමන්ලා ඉදිරියේදී මහ මැතිවරණයක් ලබා දෙයි කියලා. මේවා ඒ මහ මැතිවරණයේදී ඉදිරිපත් කරන්න. ඒ මහ මැතිවරණයේදී ඉදිරිපත් කරලා- *[බාධා කිරීමක්]* මේවා සම්මත කර ගන්න.

කංචන විජේසේකර ඇමතිතුමා කියන විධියට දැන් අපට පෙට්‍රල් හරි ලාබෙට ලැබෙනවා. දැන් පෙට්‍රල් හොඳටම ලාභයි; දැන් නිකම් යන්නත් පෙට්‍රල් දෙනවා.

මම ඔබතුමාගෙන් අහපු ප්‍රශ්නයට දුන්නු උත්තරය මතකද? කංචන විජේසේකර මැතිතුමා ඔය ඇමති ධුරයට පත් වෙලා අවුරුද්දයි මාස නවයයි. දසලක්ෂයකට විදුලි සම්බන්ධතා නැති කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාම දුන්නු උත්තරයේයි එය සඳහන්ව තිබෙන්නේ. ලංකාවේ පවුල් ඒකකවලට අදාළව විදුලි සම්බන්ධතා මිලියන 7යි තිබෙන්නේ. ඔබතුමා ඒ හතෙන් එකකට, එනම් මිලියනයකට විදුලි සම්බන්ධතා නැති කරපු ඇමතිවරයා. ඊට කලින් අවුරුදු 10ටම විදුලි සම්බන්ධතා නැති කරලා තිබෙන්නේ මිලියන 1.3කටයි. ඒකට තව පොඩ්ඩයි තිබෙන්නේ. තවත් මාස දෙකක් ගියාම ඔබතුමාට පුළුවන් කලින් අවුරුදු 10 තුළම ගෘහස්ථ විදුලි සම්බන්ධතා අහිමි කළ ගණන සම කරන්න. විදුලි බිල ගෙවා ගන්න බැරි ඒ අහිංසකයෝ - විශේෂයෙන් පාඩම් කරන ළමයි- දුක් විඳිනවා.

ඔබතුමන්ලා එදා ඡන්දය ඉල්ලා ගත්තේ පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය පෙන්වලා නේ. මගේ අතේ මේ තිබෙන්නේ ඒක. මේකේ නැහැ ඔහොම කතන්දර. ඔබතුමන්ලා මෙය පෙන්වා ලබා ගත්තු ජන වරමට සහමුලින් පටහැනිවයි කටයුතු කරමින් ඉන්නේ. අපි පිළිගන්නවා වෙනස් වෙන්න පුළුවන් බව. 'අපි ඉදිරිපත් කළ ප්‍රතිපත්තිය වැරදියි' කියලා ඔබතුමන්ලාට හිතෙනවා නම්, එය වෙනස් කරන්න පුළුවන්. තවත් මාස කිහිපයයි නේ තිබෙන්නේ. කරුණාකර ලබා ගන්න, අලුත් ජන වරමක්. පුළුවන් නම් ඔබතුමන්ලාගේ මේ විදුලිබල පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න, ඊළඟ මහ මැතිවරණයට සහ ජනාධිපතිවරණයට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. කාලය අවසානයි.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

"රනිල් දැක්ම" හෝ වෙනත් මොකක් හෝ නමකින් -අපි දන්නේ නැහැ, ඒ නම මොකක්ද කියලා- ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පත ඉදිරි ඡන්දවලට ඉදිරිපත් කරන්න. ඉදිරිපත් කරලා ජන වරමක් ලබා ගන්න. ජන වරමක් ලබා ගෙන මෙය ක්‍රියාත්මක කරන්න. එදා මේ තිබෙන ප්‍රතිපත්ති ප්‍රකාශයට ජන වරම ලබා ගෙන අද විදුලිබල මණ්ඩලය සම්පූර්ණයෙන් පෞද්ගලීකරණය සඳහා වන පනත ක්‍රියාත්මක කරන්න යනවා. *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. කාලය අවසානයි.

මීළඟට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.39]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் - மின்சக்தி மற்றும் வலுசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Indika Anuruddha Herath - State Minister of Power and Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පැවැත්වෙන අද දිනයේත් ගොඩක් අය අදහස් ඉදිරිපත් කළේ, "විකුණනවා" කියන එකක් ගැනයි. හැබැයි මේ මුළු විවාදය පුරාවට මට නම් පෙනුණේ, පාර්ලිමේන්තුවට ගෙනාපු විදුලිබල පනත් කෙටුම්පත මාතෘකාවක් කරගෙන, එය විකුණන්න ගොඩක් දේශපාලන පක්ෂ සහ දේශපාලනඥයන් උත්සාහ කරන බවයි . මොකද, මේක අරගෙන එළියට යන්න පුළුවන්, මහ ජනතාව ළඟට යන්න පුළුවන්, ජනතාව එක්ක කථා කරලා මේක -විදුලිබල මණ්ඩලය නොවෙයි, මේ මාතෘකා- හොඳට විකුණන්න පුළුවන්. පිනට පාර්ලිමේන්තුවට ආපු අයගේ ඉඳලාම විපක්ෂයේ සියලු කණ්ඩායම් දැන් සූදානම් වෙලා ඉන්නවා, මෙය විකුණන්න. මොකක් විකුණන්න ද? මේ මාතෘකාව විකුණන්න.

විෂය භාර ගරු අමාත්‍යතුමා වසරකට වැඩි කාලයක් මේ පනත් කෙටුම්පත වෙනුවෙන් මහන්සි වුණා. මේ සම්බන්ධ විශේෂඥයන් සහ විශේෂයෙන්ම අද පාර්ලිමේන්තුව නියෝජනය කරන හිටපු විදුලිබල අමාත්‍යවරුන් විශාල සංඛ්‍යාවක් එක්ක අපි මේ ගැන සාකච්ඡා කළා. ඒ හැමෝම කියපු අදහස තමයි මෙය unbundle කරන්න, මෙහි තිබෙන වගකීම් කඩලා ඒ ඒ කණ්ඩායම්වලට භාර දෙන්න කියන එක.

මේ කාරණයේදී අද අප දකින ගැටලුව මොකක්ද? 1960 ගණන්වල ඇති වුණු පනතත් එක්ක අපට වුවමනාවක් තිබුණා, විදුලිය සැපයුම වැඩි කරන්න. හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා, යුද්ධය අවසන් වනවාත් එක්කම රටට සියයට 100ක් විදුලිය දෙන්න ඕනෑ කියන තීන්දුව ගත්තා. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ තීන්දුව ගැනීමේ ප්‍රතිඵලයක් විධියට, ලාම්පු එළියෙන් පාඩම් කළ ළමයාට, ලාම්පු එළියෙන් වැඩ කටයුතු කළ විශේෂයෙන් උතුරු නැඟෙනහිර ජනතාවට අද සියයට 100ක් විදුලිය ලබා දීලා විදුලිබල පද්ධතිය සක්‍රිය කර තිබෙනවා. එදා එහෙම පද්ධති තිබුණේ නැහැ. එදා එහෙම විදුලිය ලබා දී තිබුණේ නැහැ. එදා ඒ ගොල්ලන් ඉන්ධන ලබා ගන්නත්, ඉන්ධනවලින් විදුලිය ලබා ගන්නත් යද්දි අතිමහත් දුෂ්කරතාවන්ට මුහුණ දුන්නා. හැබැයි ඒ ප්‍රශ්න විසඳුවා. එයින් පසුව ආපු ගැටලුව මොකක්ද? එයින් පසුව ආපු එකම ගැටලුව තමයි විදුලි ඉල්ලුමට අවශ්‍ය කරන විධියට විදුලිය ලබා දෙන බලාගාර නැතිකම. එතුමා ඒ වැඩ කටයුත්තත් කළා. එතුමාගේ පාලන කාලය තුළ එතුමා මෙගාවොට් 1,000කට වැඩි ප්‍රමාණයක් විදුලිබල පද්ධතියට එකතු කළා. අපේ ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා ඒ පිළිබඳ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළා. අද විපක්ෂය නියෝජනය කරන කණ්ඩායම්වලින් බහුතරයක් විදුලි බලාගාර හදපු නැති කට්ටිය සහ විදුලි බලාගාර විනාශ කරපු කට්ටිය; ඒ වාගේම විදුලි බලාගාර පිහිටුවන එක වළක්වපු කට්ටිය.

අප මේ විවාදය පුරාවට දැකපු දෙය, ආණ්ඩු පක්ෂයේ අපේ මන්ත්‍රී කණ්ඩායමත් ඉදිරිපත් කළ ප්‍රශ්නය තමයි, උමා ඔය ව්‍යාපෘතියට මොකක්ද කළේ, තාප විදුලි බලාගාරවලට මොකක්ද කළේ කියන එක. ඒ සියලු ව්‍යාපෘති ඇනහිටපු නිසා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේ තීන්දුවක් ගත්තා. විදුලි බිල සියයට 70කින් අඩු කරන්න නම් පුනර්ජනනීය විදුලි බලය අපේ පද්ධතියට එකතු කරන්න ඕනෑ කියලා; පුනර්ජනනීය විදුලි බලය අපේ විදුලිබල පද්ධතියට එකතු කරන්න නම් විදුලි බලය නිපදවන්න පුළුවන් ප්‍රදේශවල, ඒ විභවයන් තිබෙන ප්‍රදේශවල සම්ප්‍රේෂණ මාර්ග අලුතින් ගොඩ නඟන්න ඕනෑ කියලා.

අපේ ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා, ඇමෙරිකානු ඩොලර් බිලියන 10කට වැඩි මුදලක් මේ සඳහා වියදම් වෙනවා, ඒක ලංකාවේ රජයට දරන්න බැහැ, ඒ නිසා අද අපි ඉදි කර තිබෙන විදුලි බලාගාරවලින් බහුතරයක් පුනර්ජනනීය විදුලි බලාගාර බවට පරිවර්තනය කර ගන්න, LNG බලාගාර බවට පරිවර්තනය කර ගන්න, එහෙමත් නැත්නම් සුළං විදුලි බලාගාර බවට පරිවර්තනය කර ගන්න ඒ ඒ කලාපවලට මේ සම්ප්‍රේෂණ මාර්ග ගෙන යන්න සිද්ධ වෙනවා කියලා. මෙන්න මේ ගැටලුව අපේ රටේ අනාගතයේ එන ඕනෑම රජයකට තිබෙනවා. ඒ නිසා ගරු අමාත්‍යතුමා මේ සියල්ල ගැන සාකච්ඡා කරලා ඒවාටත් ගැළපෙන ආකාරයට තමයි මෙය සැලසුම් කළේ. 2002 දී ඉදිරිපත් කළ පනතේත් මේ යම් යම් දේවලට ඉඩ කඩ තිබුණා. ඒවාටත් ගැළපෙන ආකාරයට අවශ්‍ය වෙන් කිරීම් කරලා මෙය සකස් කර තිබෙනවා.

මෙහිදී මතු වුණා, බලාගාර වෙන් වෙන් වශයෙන් වර්ග කරන්නේ මොකටද කියන ප්‍රශ්නය. අපි උදාහරණයක් ගනිමු. තාප බලාගාර පවත්වාගෙන යන පුද්ගලයන්ට ඒ වෙනුවට වෙනත් බලාගාර ඉදි කරන්න පුළුවන්. ඊට වඩා අඩු මුදලකින් විදුලිය නිෂ්පාදනය කරන සුළං සහ සූර්ය බලාගාර තිබෙනවා නම්, ඒවායෙන් රටේ ආදායමට සරිලන ආකාරයට, එහෙම නැත්නම් ලාභදායී විධියට විදුලිය ලබා ගන්න පුළුවන්. මේ හැම එකකින්ම වාසි ලැබෙන්නේ පාරිභෝගිකයාටයි.

මේ රට තුළ විදුලි පාරිභෝගිකයන් 70 ලක්ෂයකට වැඩි ගණනක් ඉන්නවා. ඒ පාරිභෝගිකයන්ට අවශ්‍ය වන්නේ, කාර්යක්ෂම සහ ගුණාත්මකභාවයෙන් යුක්තව අඩු මුදලට විදුලිය ලබා ගැනීමයි. ඒ සඳහා වන ප්‍රභවයන් අපේ රට තුළ තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ කියනවා අපි දැක්කා, ඒ ප්‍රභව පාවිච්චි

කරලා විදුලිය අපනයනය කරන්න අපට පුළුවන් කියලා. හැබැයි ඒ සඳහා වන අන්තර් සම්බන්ධතාව - interconnection එක - හදද්දී ඒකට විරුද්ධ වෙනවා. එහෙම නැත්නම් කියනවා, ඒක වෙනත් පැත්තකට ගෙන යන්න ඕනෑ කියලා. එහෙමත් නැත්නම් කියනවා, ඒක කරන්න යන ක්‍රමවේදය වැරදියි කියලා. මේ හැමෝම තම ප්‍රතිපත්ති ප්‍රකාශනවලින් ජනතාව ඉදිරියේ ලස්සන චිත්‍ර මැව්වාට, මෙතුමන්ලා අද මුළු පාර්ලිමේන්තු කාලයම පාවිච්චි කළේ මේ මාතෘකාව අරගෙන ගිහින් ආණ්ඩුවට ප්‍රහාර එල්ල කරන්නයි.

මේ වෙනස කළ යුත්තක්. අපි හෘදය සාක්ෂියට එකඟව ආණ්ඩු කරන්න ඕනෑ. අද ආණ්ඩුව කරන අපි හෙට ආණ්ඩුව නොකරන්න පුළුවන්. ඊට පසුව ආයෙත් අපි ආණ්ඩුව කරන්න පුළුවන්. හැබැයි අප හැමෝම දන්නා දෙයක් තිබෙනවා. පසුගිය කාල වකවානුවේ විදුලි බලය නැති පීඩාව ඔබතුමන්ලා, අපි ඇතුළු සියලුදෙනා අත් වින්දා. අපොස (උසස් පෙළ) විභාගය ලියන්න යන දරුවන්ට විදුලි බලය නැතිව පාඩම් කරන්න සිදු වෙච්ච කාලයක් තිබුණා. ඒ කාල වකවානුව තුළ දරුවෝ දුක් වින්දා. ඒ වාගේම පැය 10, 12, 15 විදුලිය නැතුව මේ රටේ ජනතාව දුක් වින්දා. ඒකේ ප්‍රතිඵලයක් විධියට අතිබහුතර ජන වරමක් තිබ්බ ආණ්ඩුව කඩාගෙන වැටුණා. හැබැයි, "බලශක්තිය" කියන එක රටේ ආණ්ඩු වෙනස් කරන්නත්, රටේ ඉදිරි ගමනටත් කොච්චර දුරට බලපානවාද කියන කාරණය අපට මතක් කරලා දුන්නේ, බොහොම මෑතකදීයි. එහෙම නම්, මේ ප්‍රතිසංස්කරණ සිදු විය යුතුමයි. මේ ප්‍රතිසංස්කරණ ගෙනැල්ලා මේ විදුලිබල ක්ෂේත්‍රය නවීකරණය කළ යුතුමයි. මේ පනත් කෙටුම්පතේ යම් යම් අඩු පාඩු, යම් යම් ප්‍රශ්න, යම් යම් ගැටලු තිබෙනවා නම්, ඒවා නිවැරදි කර ගන්න මේ පාර්ලිමේන්තුව තමයි සුදුසුම තැන.

ඔබතුමන්ලාත් දන්නා පරිදි මේ පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණය හමුවට ගෙන ගියා; මෙය ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් වුණා. ඊට පසුව තීන්දු තීරණ ගණනාවක් දුන්නා. අපි ඒ තීන්දු තීරණ පිළිගත්තා. මේ පනත හරහා අප බලාපොරොත්තු වන්නේ, ඉදිරි කාලය තුළ මේ රටට ආයෝජකයන් පැමිණෙනවා නම්, මේ රටේ කර්මාන්ත බිහි වෙනවා නම්, මේ රටේ දියුණුව ඇති වෙනවා නම් ඒ සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන විදුලි බලය සැපයීම මේ රට තුළ අඩු මුදලට කළ හැකියි කියන ස්ථාවරභාවය ගොඩ නැඟීමයි. මේ පාර්ලිමේන්තුව තුළ පැවැති කම්ටු රැස්වීම්වලදී පවා අනාවරණය වුණා, unbundle කරන ක්‍රමයෙන් තොරව කටයුතු කරන, එහෙම නැත්නම් අයිතිය සියයට 100ක් රජය සතුව තියාගෙන කටයුතු කරන රටවල් මොනවාද කියන එක. අපි ඒ ගැන සොයා බැලුවා. කියුබාව, උතුරු කොරියාව, වෙනිසියුලාව, ලෙබනනය, දකුණු අප්‍රිකාව, ඇල්බේනියාව, ඝානාව, ලාඕසය, බුරුමය ආදි රටවල් මුලින් කී ක්‍රමවේදයට නොයා මෙම ක්ෂේත්‍රය සියයට 100ක් රජය සතුව තබා ගැනීම නිසා අද වැටිලා තිබෙන තැන, පත් වෙලා තිබෙන තැන කරුණු අධ්‍යයනය කරලා ඔබතුමාලාටත් සොයා ගන්න පුළුවන්.

රටක් විධියට අප ආයෝජකයෙකුට ආරාධනා කරනවා නම්, අපේ බලශක්ති ස්ථාවරත්වය අපි ඒ ආයෝජකයන්ට පෙන්වන්න ඕනෑ. ඒ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න සූදානම් වෙද්දී ඒවා ක්‍රියාත්මක කිරීමට තිබෙන අපහසුතා අපි දකිනවා. අද මේ ගරු සභාව තුළ කථා කළා, අභිලාෂ කැඳවා ඇති යම් යම් ව්‍යාපෘතිවලට අවශ්‍ය අනුමැතීන් කැබිනට් පත්‍රිකාවක් හරහා කඩිනමින් ලබා දුන්නා කියලා. ඒ කිසිම ව්‍යාපෘතියකට අනුමැතියක් ලබා දීලා නැහැ.

ව්‍යාපෘති ඉදිරිපත් කිරීමක් පමණයි කරලා තිබෙන්නේ. මොකද, ඒවායේ ඒ අභිලාෂ කැඳවීම කරලා තිබෙන්නේ මේ අමාත්‍යවරයා ඉන්න කාල සීමාව තුළ නොවෙයි. ඉතිහාසයේ මේ අභිලාෂ කැඳවීම් කරපු ආයෝජකයන්ට අසාධාරණයක් නොවෙන ආකාරයෙන් තමයි ඒ අභිලාෂ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, කැබිනට් මණ්ඩලය හරහා ඒ අභිලාෂ කැඳවපු ඒ ස්ථානවල ඒ ප්‍රභව තිබෙනවා නම්, ඒ අවස්ථාව තිබෙනවා නම් ඒක ගැනීමට ක්‍රමවේදයක් සකස් කරලා තිබෙන්නේ. ඒක නිසා මේ හදන නව පනත තුළ ඕනෑ කෙනෙකුට පැහැදිලිවම ඒ ගැන කථා කරන්න පුළුවන්. මේ පනතට කලින් පනත තුළත් ඕනෑ තරම් විෂමචාර ක්‍රියා, පිළිගත නොහැකි ක්‍රියා සිදු වුණා. ඒවා ආදර්ශයට අරගෙන ඒවා නොවෙන විධියට මේ පනත බොහොම පරිස්සමට හදන්නයි උත්සාහ කරලා තිබෙන්නේ. හැබැයි, මේ පනත තුළත් සියයට 100ක් එවැනි කටයුතු නොවෙයි කියන එකට සහතිකයක් දෙන්න කිසි කෙනෙකුට බැහැ. හැබැයි, මේ පනත අභියෝගයට ලක් කරන්න, එහෙම නැත්නම් මේ පනතේ යම් යම් වැරැද්දක්, අඩුපාඩුවක් වෙනවා නම් ඕනෑ කෙනෙකුට ඒ ගැන කථා කරන්න පුළුවන්.

මේකේ, වගකීම් ගන්න කෙනෙක් නැහැ කියලා හිටපු අමාත්‍යවරයෙක් කිව්වා. මේ පනත තුළ පැහැදිලිව පෙන්වලා තිබෙනවා, වගකීම් ගත යුතු පුද්ගලයා කවුද කියන එක. ඒ වාගේම තව තැනකදී කිව්වා, මේ පනත තුළින් සම්ප්‍රේෂණ මාර්ගවල අයිතිය වැඩි ප්‍රමාණයක් යම් යම් ඒකාධිකාරීන්ට යනවා කියලා. ඒක සීමා කරලා තිබෙන තැන් මේ පනත තුළ පැහැදිලිව පෙන්වා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය අද රටේ තීරණාත්මක සන්ධිස්ථානයකට අපේ විදුලිබල ක්ෂේත්‍රය ගෙනැල්ලා තිබෙනවා. ඒ තත්ත්වයට ගෙනෙන්න දිවා, රෑ නොබලා ගරු අමාත්‍යතුමා, ලේකම්තුමා, සභාපතිවරු, සාමාන්‍යාධිකාරිවරු සමඟ කණ්ඩායමක් කටයුතු කළා. විදුලි ක්ෂේත්‍රයට සම්බන්ධ අතිබහුතරයක පිරිසක් - සභාපතිවරු, උපසභාපතිවරු ඒ වාගේම සාමාන්‍යාධිකාරිවරු, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරු විශාල ප්‍රමාණයක්- මේ ක්‍රමය තුළ, මේ වැඩ පිළිවෙළ තුළ ඒ ගොල්ලන්ගේ කාල වේලාව නොතකා උපරිමයෙන් සහයෝගය ලබා දුන්නා.

අපේ විදුලි බිල වැඩි වීම, එහෙම නැත්නම් පාරිභෝගිකයාට ලබා දෙන සේවාවන්හි මිල වැඩි වීම සිදු වෙලා තිබෙන්නේ යම් යම් කළමනාකරණ කටයුතුවල තිබෙන අඩුපාඩු නිසා. ඒ නිසා මේ විධියට 12කට වෙන් කළොත් ඒ ආයතන 12 සඳහා වගකීමක් ගත යුතු පුද්ගලයන් අනිවාර්යයෙන් නම් වෙනවා. ඒ පුද්ගලයන්ට වගකීම් දරන්න සිදු වෙනවා. ඒ වගකීම් හරහා මිල අඩු කර ගන්න පුළුවන් වෙනවා.

මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. උදාහරණයකට අපි නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ගනිමු. අද වෙද්දී අපට පුළුවන් වෙලා තිබෙනවා, තරගකාරී මිල ගණන්වලට ගල් අඟුරුවල මිල අඩු කර ගන්න. හැබැයි, ඒ මිල අඩු වීම ලැබුණත් මිල අඩු වීමත් එක්ක ගල් අඟුරු -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු මධුර විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு மதுர விதானகே அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. MADHURA WITHANAGE eft the Chair, and THE HON. SPEAKER took the Chair.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු කථානායකතුමනි, මම ප්‍රකාශ කරමින් හිටියේ මේ කාරණයයි. මීල අඩු වුණත්, ඒ බලාගාර සතු පරිපාලනමය වියදම් සහ වෙනත් වියදම් සඳහා රුපියල් දෙකතුනක් ගල් අඟුරුවලින් විදුලිය නිෂ්පාදනය කරන ඒ පිරිවැයට එකතු කරන්න සිදු වෙනවා. ගල් අඟුරුවලින් විදුලි ඒකකයක් නිපදවීම රුපියල් 22ක මිලකට ගණනය කළත් පරිපාලන සහ වෙනත් වියදම් නිසා ඒ විදුලි ඒකකයක් රුපියල් 24, 25, 26 වාගේ මිලක් වෙනවා. දැන් මේ නව පනත තුළින් ඒ බලාගාරය පාවිච්චි කරන, ඒ බලාගාරයට අයිතිවාසිකම් කියන, එහෙම නැත්නම් ඒ බලාගාරය නඩත්තු කරන ප්‍රධානියාට ඒවා වෙනුවෙන් වෙන වෙනම වගකියන්න වෙනවා. මෙන්න මෙවැනි ක්‍රමවේද, වගකීම් ඒ හැම ආයතනයක් භාර ගන්න සාමාන්‍යාධිකාරිවරයෙකුට, එහෙම නැත්නම් වගකිව යුත්තෙකුට තිබෙනවා. අපි සමහර තැන්වල දකිනවා, සමහර නඩත්තු කටයුතුවලදී දීර්ඝ කාලයක් ගත වෙන බව. ඒ වාගේම අලුත් සම්බන්ධතාවක් ලබා ගැනීමේදී විශාල කාලයක් ගතවන අවස්ථා තිබෙනවා. ආයෝජකයෝ ඇවිල්ලා ට්‍රාන්ස්ෆෝමර් තියා ගන්න බැරුව සෑහෙන කාලයක් රට තුළ කටයුතු කරන අවස්ථා තිබෙනවා. හැබැයි, මේ වගකීම් බෙදා දීම තුළ ඒ වගකිව යුත්තාට නිසි කාලයක් එනවා. ඒ කාලය තුළ ඒකට උත්තර ලබා දිය යුතුයි. මෙන්න මෙවැනි කරුණු කාරණා ගණනාවක් මේ පනතට අඩංගු කරලා තිබෙනවා. මේ පනතේ තිබෙන සුබවාදී පැත්ත ගොඩාක් අය දැක්කේ නැහැ. අසුබවාදීව, දේශපාලනිකව ඒ ගැන එළියට ගිහිල්ලා ප්‍රකාශ කරන්න තමයි උත්සාහ කළේ. මේ කටයුතු කරන ඇමතිවරයාවත්, ආණ්ඩුවවත්, ජනාධිපතිවරයාවත් සදාකාලික නැහැ.

හැබැයි, අපි හදන ප්‍රතිපත්ති හරියාකාරව හදාගත්තොත් ඒක තමුන්නාන්සේලාටද, අපටද කියලා නැහැ, ඒකෙන් රටට වැඩදායී තත්ත්වයක් ඇතිවේවි. මේ කටයුත්තට සියලුදෙනාම හෘදය සාක්ෂියට එකඟව සහයෝගය ලබා දෙයි කියා බලාපොරොත්තු වෙමින්, මේ වෙනුවෙන් මහන්සි වෙච්ච සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.53]

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු කථානායකතුමනි, මම වැඩි කාලයක් ගන්නේ නැහැ. මම වැඩි කාලයක් නොගන්න හේතුව, අද විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට වැදගත් දවසක් වන නිසායි. විපක්ෂ නායකතුමාට විවාදයකට සහභාගි වෙන්න තිබෙන නිසා ඉක්මනට මේ කටයුතු අවසන් කළ යුතුයි. අද විපක්ෂයේ ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනෙකු අතර පැවැත්වීමට නියමිත විවාදයට සහභාගි වීමට ඉඩ සැලැස්විය යුතුයි. අද දවසේ උදේ ඉඳලා මේ පනත් කෙටුම්පත වෙනුවෙන් අදහස් ඉදිරිපත් කරමින්, යම් යම් යෝජනා ඉදිරිපත් කරමින් විවිධ අදහස් ප්‍රකාශ කරපු සියලු දෙනාටම මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මම උදේත් කථා කරපු නිසා කරුණු කිහිපයක් විතරක් කියන්නම්. ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, මම ලක්ෂ 10කගේ විදුලිය විසන්ධි කරපු විදුලිබල අමාත්‍යවරයා බවට පත්වෙයි කියලා. හැබැයි, මම නම් සතුටු වෙන්නේ මේ නිසායි, ගරු කථානායකතුමනි. මම මේ අමාත්‍ය ධුරය භාර ගන්න අවස්ථාවේ මේ රටේ පැය 13ක විදුලි කප්පාදුවක් තිබුණා. ඒ වාගේම නිවාස ලක්ෂ 70කට විදුලිය තිබුණේ නැහැ. නිවාස ලක්ෂ 70කට විදුලිය නැති වෙලාවක ඒ අභියෝගය භාරගෙන ඒ නිවාස ලක්ෂ 70ට -පවුල් ලක්ෂ 70ට- නැවත විදුලිය ලබා දෙන්න හැකිවීම ගැන මම සතුටු වෙනවා. ඒ අවස්ථාවේ හැංගිලා හිටපු පිරිසට - ඔය කථා කරපු මන්ත්‍රීතුමා වාගේ - එළියට යන්න පුළුවන් විධියට පරිසරය සකස් කරලා දුන්නා. මට මතකයි, ඒ වෙලාවේ ඔය සමහර අය වාහනයත් මාරු කරලා තමයි ආවේ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා තොප්පිය දමා ගන්න එපා. වාහනය පවා මාරු කරලා කටයුතු කරපු කට්ටිය තමයි එදා හිටියේ. දැන් ඉන්ධන මිල ගැන කථා කරනවා. ඒ වෙලාවේ ඔබතුමාට ඉන්ධනවලට වැය වෙන මුදල ඉතුරු වුණා. මොකද, ගමන් කරන්න තැනක් තිබුණේ නැහැ, ඇඳ යට හිටියේ. හැබැයි, දැන් රටේ හොඳට ඇවිදින්න පුළුවන්. ඒ විධියට ඇවිදින්න දැන් රටේ නිදහස ඇතිවෙලා තිබෙනවා, ස්ථාවරභාවය ඇතිවෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මම කාගේවත් නමක් කිව්වේ නැහැ. මම කිව්වේ, මීට අවුරුදු 2කට ඉස්සෙල්ලා මේ රටේ විවිධ පුද්ගලයෝ ඇඳ යට හිටියා කියලා විතරයි. ඇඳ යට හිටපු කට්ටිය අද ඇඳ යටින් එළියට ඇවිල්ලා මේ ආණ්ඩුවත් විවේචනය කරලා මේ රටේ කලින් සිදුවුණු ක්‍රියාදාමයට නැවත වතාවක් පරිසරය නිර්මාණය කරමින් සිටිනවා කියන එක නම් අපට පෙනෙනවා.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ නම කිව්වේ නැහැ නේ. ඇමතිතුමාට පිළිතුරු දෙන්න ඉඩ හරින්න.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු කථානායකතුමනි, අපේ ගරු මන්ත්‍රීවරු විදුලිබල පනත් කෙටුම්පත සම්බන්ධයෙන් තමන්ගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කළා. මේ විදුලිබල පනතින් ජයග්‍රහණ රාශියක් ලැබෙනවා. ඒ ලැබෙන ජයග්‍රහණ මේ රටේ ජනතාවට භුක්ති විඳින්න අවස්ථාව ලැබෙනවා වාගේම මීළඟ ජනාධිපතිවරණයට ඉස්සෙල්ලා ජනතාවට හොඳ අවස්ථාවක් ලැබෙනවා, දෙවැනි තුන්වැනි වතාවටත් භයවෙලා පැනලා ගිය කට්ටිය පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගන්න. ගරු කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, මේ කාරණය. මේ පාර්ලිමේන්තුව තුළ ව්‍යාකූලත්වයක් ඇතිවෙලා, හිටපු ජනාධිපතිතුමාට ඉවත් වෙන්න කියලා බලපෑම් කරනකොට හිටපු ජනාධිපතිතුමා ප්‍රධාන විපක්ෂයට අවස්ථාවක් ලබා දුන්නා ඒ වගකීම් භාරගන්න කියලා. *[බාධා කිරීම්]* මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අපි අද දවසේ ඉදිරිපත් කරන මේ විදුලිබල පනතින් ජයග්‍රහණ රාශියක් ලැබෙනවා. ඒවා මේ රටේ ජනතාවට භුක්ති විඳින්න අවස්ථාව ලැබෙනවා.

පළමුවැනි කාරණය තමයි, ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත අද දින සම්මත කිරීමෙන් පසුව විදුලිබල ක්ෂේත්‍රයේ දශක ගණනාවක් කථා කරපු ප්‍රශ්න විසඳීම සඳහා ප්‍රවේශයක් ලැබෙනවා. මේ පනත් කෙටුම්පත පිළිබඳව ඔබතුමන්ලා සාකච්ඡා කළා. ඒ වාගේම පාර්ලිමේන්තුවේ සිටින සියලුදෙනාම දැනට තිබෙන පනතේ අඩු පාඩු, දැනට තිබෙන ක්‍රියාවලියේ අඩු පාඩු විවේචනය කරපු අවස්ථා තිබෙනවා. අපි ඒ හැම එකක් ගැනම කථා කළා. ගරු කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පත අපි ඉදිරිපත් කළ නිසාමද විපක්ෂය විරුද්ධ වෙන්නේ කියලා මට

හිතෙනවා. ඒ කනගාටුව අපට තිබෙනවා. හැබැයි, අපේ බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳව මෙතුමන්ලා ඉදිරිපත් කර තිබෙන ප්‍රතිපත්ති දෙකේම - සමගි ජන බලවේගයේ "The Blueprint" එකේ සහ මාලිමාවේ blueprint එකේ - අන්තර්ගත සියලු දේ අපේ පනත් කෙටුම්පත තුළ තිබෙනවා.

එදා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා රජය භාර ගන්න කියලා එතුමන්ලාගෙන් ඉල්ලුවාම පැනලා ගියා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Order, please! විවාදයේ කටයුතු අවසාන වනතෙක් කාලය ලබා ගැනීමට අවශ්‍යයි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, "විවාදයේ කටයුතු අවසාන වනතෙක් කාලය ලබා ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ගරු ඇමතිතුමා කථාව කරගෙන යන්න.

ගරු කංචන විජේසේකර මහතා
(මාණ්පුමිකු කඤ්චන විජේසේකර)
(The Hon. Kanchana Wijesekera)
ගරු කථානායකතුමනි, අපි මෙම පනත් කෙටුම්පතේ ඇතුළත් කර තිබෙන සියලු දේ මෙතුමන්ලාගේ සැලැස්මේන් ඉදිරිපත් කරලා තිබෙනවා. එහෙම නම් අද භය වෙන්නේ මොකටද? අද භය වෙලා දුවන්නේ වෘත්තිය සමිතිවලට; ලංකා විදුලිබල මණ්ඩලයේ වෘත්තිය සමිතිවලට. එදා අරගළය නිසා ආණ්ඩුව භාර ගන්න භය වුණා. එතුමන්ලාට ආර්ථිකය නිවැරදි තැනට ගෙනෙන්න බැහැ කියන එක තේරුම් ගත්තා. අද තමන් ඉදිරිපත් කරලා තිබෙන ප්‍රතිපත්තියේ කරුණුවලටම විරුද්ධව අත ඔසවන්න සමගි ජන බලවේගය ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට සිදුවීම වෙන මොනවත් නොවෙයි, වෘත්තිය සමිතිවලට බිය වීමක් හැටියටයි මම දකින්නේ.

ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරු කිහිපදෙනෙක් කිව්වා "සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා, ඒවාට එකඟ වනවා නම් අපි සහයෝගය දෙන්නම්" කියලා. ඒ ගැන ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. හැබැයි, ඔබතුමා විතරයි එහෙම කිව්වේ. විපක්ෂ නායකතුමා, නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා සහ අවසානයේ කථා කරපු විපක්ෂයේ හැම මන්ත්‍රීවරයෙකුම වාගේ කිව්වේ, "මෙම පනත් කෙටුම්පතට අපි විරුද්ධයි. අපි ඡන්දය දෙන්නේ නැහැ. අපේ සංශෝධන ඔබතුමා භාර ගන්නවා නම් අපි කැමැතියි" කියලායි. ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතකට විරුද්ධ නම් සංශෝධන ඉදිරිපත් කරන්නේ මොකටද?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Yes, Hon. Kiriella?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, කාරක සභා අවස්ථාවේදී තමයි - at the Committee Stage - අපි ඒක කියන්නේ. මෙතුමා ඒක දන්නෙත් නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Yes, Hon. (Dr.) Harsha de Silva?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු ඇමතිතුමනි, මෙම විවාදය පටන් ගත්තේ ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. එතුමාගේ කථාවේ සිට අපේ ගරු මන්ත්‍රීවරු කිව්වේ, අපි මේ reform එකට විරුද්ධ නැහැ, හැබැයි, මේ කරන ක්‍රමය පිළිබඳව ගැටලු තිබෙනවා කියලා. අපි සංශෝධන 17ක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඔබතුමන්ලා එම සංශෝධන පිළිගනීවි කියලා අපි බලාපොරොත්තු වනවා. මොකද වෙන්නේ කියලා බලන්න කාරක සභා අවස්ථාව එන කල් ඉඳිමු.

ගරු කංචන විජේසේකර මහතා
(මාණ්පුමිකු කඤ්චන විජේසේකර)
(The Hon. Kanchana Wijesekera)
ගරු කථානායකතුමනි, මම වැඩි වෙලාවක් නොගෙන කථාව අවසන් කරන්නම්.

මෙම ක්‍රියාවලියට මාස 18කට වැඩි කාලයක් ගතවුණා. මේ සඳහා උදවු උපකාර කළ අපේ ප්‍රතිසංස්කරණ කමිටුවේ සාමාජිකයන්ට, ඒ වාගේම හිටපු ලේකම්වරුන්ට, වර්තමානයේ සිටින ලේකම්වරුන්ට, ලංකා විදුලිබල මණ්ඩලයේ සියලු නිලධාරීන්ට, අපේ සංවර්ධන නියෝජිත ආයතනවල සියලු නිලධාරීන්ට, නීති කෙටුම්පත් කාර්යාලයේ සියලු නිලධාරීන්ට, නීතිපති දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන්ට හා කැබිනට් මණ්ඩලය ඇතුළු රජයට මම ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න ඕනෑ. අපේ නිලධාරීන්ට පොඩි තර්ජනයකුත් එල්ල වුණා, "බලාගෙන ඉන්න තව මාස දෙක තුනයි තිබෙන්නේ" කියලා. හැබැයි, මේ රටේ විදුලිය නැතිව සිටිනකොට, ඉන්ධන නැතිව සිටිනකොට කිසි කෙනෙක් උත්සාහ කළේ නැහැ, මොකක්ද මේ වෙච්ච ප්‍රශ්නය කියලා කියන්න. ඒකට අධිකරණය ඉදිරියට ගියේ නැහැ. ගරු කථානායකතුමනි, අපේ නිලධාරීන් සද්භාවයෙන් කටයුතු කර තිබෙනවා. පසුගිය කාලයේ ඒ වෙනුවෙන් පෙනී සිටි -

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නයක්ද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායන් තිබෙනවා. නිමල් ලාන්සා මන්ත්‍රීතුමා විපක්ෂයේ අසුන්ගෙන සිටින මන්ත්‍රීවරයෙක්. මේ වෙලාවේ එතුමා ගිහින් ආණ්ඩු පක්ෂය පැත්තේ ඉන්නවා. මේ ගරු සභාවේ විනයක් සහ රීතියක් තිබෙනවාද, නැද්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන බලන්නම්.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත ගෙන ඒම සඳහා සහයෝගය දක්වපු සියලුදෙනාට මම ස්තුතිවන්ත වනවා. මේ තුළින් අපේ රටේ සිදු කිරීමට බලාපොරොත්තු වන විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රවේශයක් ලැබෙනවාය කියන කාරණයත් මතක් කරමින්, අදහස් දක්වපු සියලුදෙනාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත, දෙවන වර කියවීම. සභාව එකඟද?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
අපේ සංශෝධන පිළිගන්නේ නැහැ කියන නිසා අපි විරුද්ධයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්ද විමසීමක් අවශ්‍යද?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
අවශ්‍යයි.

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the Division Bell -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාම අසුන් ගන්න.
දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි බලන්න.

ආණ්ඩු පාර්ශ්වය පැත්තේ ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

ගරු මර්ජාන් ෆලීල් මහතා
(மாண்புமிகு மர்ஜான் பளீல்)
(The Hon. Marjan Faleel)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මර්ජාන් ෆලීල් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ කොයි ආකාරයෙන්ද?

ගරු මර්ජාන් ෆලීල් මහතා
(மாண்புமிகு மர்ஜான் பளீல்)
(The Hon. Marjan Faleel)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විරුද්ධ පාර්ශ්වය පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෆවුසි මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ කොයි ආකාරයෙන්ද?

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාධාකෘෂ්ණන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ කොයි ආකාරයෙන්ද?

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
විරුද්ධයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ තවත් ගරු මන්ත්‍රීවරු ඉන්නවාද?
කිසිවෙකු නැති බවයි පෙනෙන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සහා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 101; විරුද්ධව 58; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 101; எதிராக 58; விலகியிருந்தோர் 0.
According to Electronic Voting, Parliament divided: Ayes 101; Noes 58; Abstain 0.

G 001. Pavithradevi Wanniarachchi	Yes
G 002. Nimal Siripala De Silva	Yes
G 003. Chamal Rajapaksa	Yes
G 004. Mahinda Rajapaksa	Yes
G 006. Susil Premajayantha	Yes
G 007. Dinesh Gunawardena	Yes
G 009. Douglas Devananda	Yes
G 010. Bandula Gunawardana	Yes
G 012. Wijeyadasa Rajapakshe	Yes
G 014. Ramesh Pathirana	Yes
G 015. M. U. M. Ali Sabry	Yes
G 016. Vidura Wickramanayaka	Yes
G 017. Kanchana Wijesekera	Yes
G 018. Manusha Nanayakkara	Yes
G 019. Tiran Alles	Yes
G 020. Nalin Fernando	Yes
G 021. Ajith Rajapakse	Yes
G 022. Jeewan Thondaman	Yes
G 023. Ranjith Siyambalapitiya	Yes
G 025. Dilum Amunugama	Yes
G 026. Mohan Priyadarshana De Silva	Yes
G 027. Janaka Wakkumbura	Yes
G 028. Shehan Semasinghe	Yes
G 029. Kanaka Herath	Yes
G 030. Thenuka Vidanagamage	Yes
G 031. Pramitha Bandara Tennakoon	Yes
G 032. Lasantha Alagiyawanna	Yes
G 033. Rohana Dissanayaka	Yes
G 034. Premalal Jayasekara	Yes
G 036. Vijitha Berugoda	Yes
G 037. Lohan Ratwaththe	Yes
G 038. Tharaka Balasuriya	Yes
G 039. Indika Anuruddha Herath	Yes
G 040. Siripala Gamalath	Yes
G 041. Anuradha Jayaratne	Yes
G 043. D.V. Chanaka	Yes
G 044. Sisira Jayakody	Yes
G 045. Piyal Nishantha De Silva	Yes
G 046. Prasanna Ranaweera	Yes
G 047. D. B. Herath	Yes
G 048. Shasheendra Rajapaksa	Yes
G 049. Seetha Arambepola	Yes
G 050. Shantha Bandara	Yes
G 051. K. Kadder Masthan	Yes
G 052. Asoka Priyantha	Yes
G 053. A. Aravindh Kumar	Yes
G 054. Geetha Samanmale Kumarasinghe	Yes
G 055. Suren Raghavan	Yes
G 056. Sivanesathurai Santhirakanthan	Yes
G 058. Anupa Pasqual	Yes
G 059. Johnston Fernando	Yes
G 060. S. B. Dissanayake	Yes
G 061. Gamini Lokuge	Yes
G 062. Vajira Abeywardena	Yes
G 063. Janaka Bandara Tennakoon	Yes
G 064. C. B. Rathnayake	Yes
G 066. S. M. Chandrasena	Yes
G 067. Mahindananda Aluthgamage	Yes
G 068. Rohitha Abeygunawardana	Yes
G 070. Sarath Weerasekara	Yes
G 071. Wimalaweera Dissanayaka	Yes
G 074. Kapila Athukorala	Yes
G 075. Gayashan Nawananda	Yes
G 076. S. M. M. Muszhaaraff	Yes
G 077. S. C. Muthukumarana	Yes
G 078. Jayantha Ketagoda	Yes
G 079. Sampath Athukorala	Yes
G 080. Thisakutti Arachchi	Yes
G 081. U. K. Sumith Udukumbura	Yes
G 082. Pradeep Undugoda	Yes
G 083. Sanjeeva Edirimanna	Yes
G 084. Akila Ellawala	Yes
G 087. Nalaka Bandara Kottegoda	Yes
G 089. Kokila Gunawardene	Yes
G 090. Milan Jayathilake	Yes
G 092. Sudarshana Denipitiya	Yes
G 093. Isuru Dodangoda	Yes
G 094. Premnath C. Dolawatte	Yes
G 095. Muditha Prishanthi	Yes
G 096. Sudath Manjula	Yes
G 099. Kumarasiri Rathnayaka	Yes
G 101. Upul Mahendra Rajapaksha	Yes
G 102. M. Rameshwaran	Yes
G 103. Rajika Wickramasinghe	Yes
G 104. M. W. D. Sahan Pradeep Withana	Yes

G 105. Madhura Withanage	Yes
G 106. D. Weerasingha	Yes
G 107. Samanpriya Herath	Yes
G 108. Sagara Kariyawasam	Yes
G 109. Yadamini Gunawardena	Yes
G 110. Manjula Dissanayake	Yes
G 111. Ranjith Bandara	Yes
G 112. Jayantha Weerasinghe	Yes
G 114. Lalith Varna Kumara	Yes
G 115. S. Jagath Samarawickrama	Yes
G 116. M. G. Weerasena	Yes
O 006. Gayantha Karunatilleka	No
O 007. Lakshman Kiriella	No
O 008. Sajith Premadasa	No
O 010. Patali Champika Ranawaka	No
O 011. Palany Thigambaram	No
O 012. Mano Ganesan	No
O 015. G.L. Peiris	No
O 016. Anura Dissanayaka	No
O 022. Kabir Hashim	No
O 023. Thalatha Athukorala	No
O 024. Abdul Haleem	No
O 026. Harsha De Silva	No
O 028. R. M. Ranjith Madduma Bandara	No
O 029. Dilip Wedaarachchi	No
O 030. Niroshan Perera	No
O 031. Eran Wickramaratne	No
O 032. J. C. Alawathuwala	No
O 033. John Seneviratne	Yes
O 034. Anura Priyadharshana Yapa	Yes
O 036. Dullas Alahapperuma	No
O 037. Vijitha Herath	No
O 040. Ali Sabri Raheem	Yes
O 044. Ashok Abeysinghe	No
O 047. Ajith Mannapperuma	No
O 048. Buddhika Pathirana	No
O 049. M. S. Thowfeek	No
O 050. Nalin Bandara Jayamaha	No
O 051. Hector Appuhamy	No
O 052. Thushara Indunil Amarasena	No
O 053. Dilan Perera	No
O 054. Wimal Weerawansa	No
O 055. Piyankara Jayaratne	Yes
O 057. Harini Amarasuriya	No
O 061. Velu Kumar	No
O 062. Kavinda Heshan Jayawardhana	No
O 063. Mayantha Dissanayake	No
O 064. K. Sujith Sanjaya Perera	No
O 065. S. M. Marikkar	No
O 066. Imran Maharoof	No
O 068. Mujibur Rahuman	No
O 069. Harshana Rajakaruna	No
O 070. Rohini Kumari Wijerathna	No
O 071. Hesha Withanage	No
O 072. Waruna Liyanage	No
O 073. Jayarathna Herath	No
O 075. Chandima Weerakkody	No
O 076. Dayasiri Jayasekara	No
O 081. M. Udayakumar	No
O 083. Kins Nelson	No
O 085. Udaya Gammanpila	No
O 086. Nalaka Godahewa	No
O 087. Channa Jayasumana	No
O 089. Nimal Lanza	Yes
O 090. Jayantha Samaraweera	No
O 091. B. Y. G. Rathnasekara	No
O 096. K. P. S. Kumarasiri	No
O 097. Upul Galappaththi	No
O 098. Shan Vijayalal De Silva	No
O 106. Wasantha Yapabandara	No
O 107. Thilak Rajapakshe	No
O 109. Gevindu Cumaratunga	No
O 110. Charitha Herath	No
O 111. Weerasumana Weerasinghe	No

Electronic Voting Result:

Participants:	
Present	159
Votes:	
Yes	101
No	58
Abstain	0

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 101යි; විරුද්ධව 58යි.

නැතී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි. ඒ අනුව, පක්ෂව ඡන්දය දුන් මුළු සංඛ්‍යාව 103යි.

නැතී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව, විරුද්ධව ඡන්දය දුන් මුළු සංඛ්‍යාව 59යි.

ඒ අනුව, ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත දෙවන වර කියවීම සම්මතයි.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

තීරමානික්කප්පට්ටது:
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Susil Premajayantha]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[THE HON. SPEAKER in the Chair.]

1 වන වගන්තිය.- (ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දින)

வாசகம் 1.- (சுருக்கப் பெயரும் நடைமுறைக்கு வரும் தேதியும்)

CLAUSE 1.- *(Short title and dates of operation)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Sir, on behalf of the Minister of Power and Energy I move,

(1) "In page 2, leave out all words in line 26 and insert:

'of this section, section 2, section 3, section 4, section 9, subsection (1) of section 10, paragraph (b) of subsection (2) of section 10, subsection (3) of section 10, subsection (5) of section 10, section 14, section 15, section 17, section 18, section 38, section 39 and the sections specified' ";

(2) "In page 2, leave out all words in lines 30 to 33 (both inclusive) and insert:

'appointed date'):

Provided that, prior to making such Order, the Minister shall be satisfied that the Preliminary Transfer Plan, the National Electricity Policy, including the National Tariff Policy, the Annual Power Procurement Plan and the Long Term Power System Development Plan have been prepared, approved and are in place in accordance with the provisions of this Act:' " ;

(3) "In page 3, leave out all the words in lines 1 to 7 and insert:

'Provided further, if no appointed date is published in the *Gazette* as required by this subsection even though the Minister is satisfied that the requirements in the first proviso have been met, the provisions of this Act, other than the provisions of this section, section 2, section 3, section 4, section 9, subsection (1) of section 10, paragraph (b) of subsection (2) of section 10, subsection (3) of section 10, subjection (5) of section 10, section 14, section 15, section 17, section 18, section 38 and section 39 and the sections specified in subsection (4) of this section, shall come into operation immediately upon the expiry of twelve months from the date on which the Bill becomes an Act of Parliament.' "; and

(4) "In page 3, leave out all the words in lines 8 to 9 and insert:

'(3) The provisions of this section, section 2, section 3, section 4, section 9, subsection (1) of section 10, paragraph (b) of subsection (2) of section 10, subsection (3) of section 10, subsection (5) of section 10, section 14, section 15, section 17, section 18, section 38 and section 39 shall come into operation on the date on which the Bill' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. Kabir Hashim to move the Amendment.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු සභාපතිතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට එකඟ වෙන අතර, සැලසුම් හතරම අවසන් වන තෙක් මෙම පනත ක්‍රියාත්මක නොවන බවට සංශෝධන විය යුතුයි කියලා යෝජනා කරනවා.

Sir, I move,

"In page 3, add the following new sentence after Subsection 3:

'For the avoidance of doubt, it is hereby stated that the Appointed Date shall be a date only upon the completion of the first proviso of the subsection (2) of this section.' "

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. Dayasiri Jayasekara to move the next Amendment.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Sir, I move,

"In page 2, delete lines 31 and 33 and substitute the following:

'However, the Minister may, at any time within two months prior to the expiration of the said twelve months, with the approval of the Cabinet of Ministers extend such period, by Order published in the Gazette, for another period of six months at a time so however, the aggregate period of such extensions shall not exceed twenty-four months.'"

ගරු සභාපතිතුමනි, මෙයින් අදහස් කරන්නේ මේකයි. විශේෂයෙන් මේ ක්‍රියාදාමය ඉස්සරහට ගිහිල්ලා තව මාස හයකින්, අවුරුද්දකින් මේක කර ගන්න බැරි වුණොත්, ඇත්තටම safeguard එකක් දාලා තිබෙනවා, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අරගෙන මේක තව ඉස්සරහට ගෙනියන්න ඇමතිතුමාට පුළුවන් කියලා. මේක හොඳ යෝජනාවක් විධියටයි මම දකින්නේ. ඔබතුමන්ලාගේ කැමැත්ත, අකැමැත්ත තීරණය කරන්න පුළුවන්. මොකද, මේකේ තිබෙන තත්ත්වය එක්ක ගරු සභානායකතුමනි, මේ assets ටික ගන්න බැරි වුණොත්, අපේ තිබෙන assets ටික හරියට declare කර ගන්න බැරි වුණොත්, සොයා ගන්න බැරි වුණොත් අවුරුද්දකින් මේක ඉවරයි. මම දන්නේ නැහැ, අවුරුද්දකින් මේ කටයුත්ත කරන්න පුළුවන්ද කියලා. ඔබතුමා දන්නවා නේ, ඒ කාලය තුළ මේක කරන්න පුළුවන්ද, බැරිද කියලා ප්‍රශ්නයක් තිබෙන බව. අපි කියන්නේ මේකයි. ඒ වෙලාවට අමාත්‍යවරයාට බලය තිබෙනවා, කැබිනට් මණ්ඩලයට ගිහිල්ලා මේ කාලය තව දීර්ඝ කර ගන්න. මෙහෙම එකක් තිබෙන එකේ වටිනාකමක් තිබෙනවා කියායි මම කියන්නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Hon. Chairman, we are not agreeable to the Amendments moved by the Hon. Kabir Hashim and the Hon. Dayasiri Jayasekara.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මේ ඇමතිතුමාට වැදගත් දෙයක් නොවෙයි, ඊළඟට එන ආණ්ඩුවක ඇමතිවරයෙකුට ඇති වෙන ප්‍රශ්නයක් තමයි මම මේ විසඳන්න හැදුවේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

But, the Government has refused to accept that.

Clause 1 has been passed subject to the Amendments moved by the Hon. Minister.

***1** වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

1ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 1, as amended, ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Clause 2, Amendment to be moved by the Hon. Kabir Hashim.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු සභාපතිතුමනි, මේ සංශෝධනය පුරවැසියන්ගේ අයිතිය තහවුරු කරන දීර්ඝ කාලීන සැලසුම්වලට අනුගතව හා අවම විදුලි වියදමක් ලැබෙන බවට සහතික කරන සංශෝධනයක්.
Sir, I move,

"In page 5, delete line 14 and substitute the following:

'electricity are met as per the long term power system development plan, whilst ensuring efficient use' "

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Sir, we are not agreeable to the Amendment moved by the Hon. Kabir Hashim.

***2** වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

2ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 2, ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (ජාතික විදුලිබල උපදේශක සභාව පිහිටුවීම)
வாசகம் 3.- (தேசிய மின்சார மதியுரைப் பேரவையைத் தாபித்தல்)

Clause 3.- (*Establishment of the National Electricity Advisory Council*)

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Sir, I move,

"In page 8, leave out all words in line 27 and insert:

'in electrical engineering and administration.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. Kabir Hashim to move the Amendment.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු සභාපතිතුමනි, මෙය National Electricity Advisory Council යන ආයතනයට පනත මඟින් යෝජිත සාමාජිකයන් පත්වීම නිර්දේශපාලනීකරණයව සිදු වන බව සහතික වන සේ ඉදිරිපත් කරන සංශෝධනයක්.
Sir, I move,

"In page 7, delete line 25 and substitute the following:

'the Constitutional Council, one of whom shall be appointed' "

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Then, the Hon. (Prof.) Charitha Herath to move the next Amendments.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

Sir, I move,

(1) "In page 6, delete the entire Clause 3 and substitute the following:

'THE NATIONAL ELECTRICITY POLICY AND POLICY GUIDELINES

3. (1) The Minister may appoint an Advisory Committee (hereinafter referred to as the 'Committee') for the purpose of advising the Minister in formulating the national electricity policy in respect of -

(i) matters relating to the Electricity Industry and formulation of the national electricity policy in terms of section 4 of this Act;

(ii) matters relating to the implementation of the Electricity Industry reforms in accordance with the provisions of this Act, relating to the generation, transmission, distribution, trade, supply and procurement of electricity in Sri Lanka;

(iii) on the modalities relating to the formulation of proposals and plans for the development of the Electricity Industry including the establishment of competitive electricity markets including interconnections with regional markets through the reform process in order to ensure its successful implementation;

(iv) optimal utilization of indigenous energy resources, including renewable energy, modern technologies and energy efficiency to meet the electricity demand ensuring the least cost principle;

(v) matters related to the preparation of the Long Term Power System Development Plan in terms of the national electricity policy under the provisions of this Act;

(vi) matters relating to the formulation of the national tariff policy, in consultation with the Ministry of Finance and the Regulator, to ensure consumer affordability, financial sustainability and the sustainability of the regulated entities; and

(vii) any other matter connected with or arising out of the national electricity policy.

Provided that, the Committee shall further advise the Minister and provide recommendations on matters relating to the appointment of the board of directors and establishment of the successor companies incorporated as limited companies under the Companies Act, No. 07 of 2007 in terms of section 17 of this Act;

(2) The Committee shall consult the relevant stakeholders and shall act in good faith and in the best interests of the country and the consumers.

(3) The Committee shall consist of the following eight members appointed by the Minister, and the committee shall be directly under the purview of the Secretary to the Ministry of the Minister and the Ministry of the Minister shall provide all necessary facilities for the conduct of the Committee;

(a) Director General of the Department of National Planning;

(b) Director General of Public Utilities Commission of Sri Lanka;

(c) Director General of Sri Lanka Sustainable Energy Authority;

(d) a person to represent the development finance banks in Sri Lanka, nominated by the Governor of the Central Bank of Sri Lanka reached eminence and has at least twenty years of experience in economics;

(e) a representative from the Institution of Engineers Sri Lanka, nominated by such Institute, who has expertise, reached eminence and has at least twenty years of experience in the fields of renewable energy, energy transition and energy policy making;

(f) a representative of the Ceylon Chamber of Commerce, nominated by such Chamber, who has expertise, reached eminence and has at least twenty years of experience in the field of energy policy making;

(g) a representative of the Institute of Chartered Accountants of Sri Lanka, nominated by such Institute, who has expertise, reached eminence and has at least twenty years of experience in finance and market operations;

(h) a person having expertise, reached eminence and has at least twenty years of experience in the field of power system planning and operation;

Provided that, any member of the Committee shall not be in any conflict of interest related to the duties of the Committee.

(4) The Secretary to the Ministry of the Minister shall ensure proper functioning and discharge of duties of the committee and may provide guidelines to the committee with the advice of the Minister on matters related to the national electricity policy.' "

(2) "In Page 6, '(6) Change the name of the 'National Electricity Advisory Council' or 'Council' to 'Advisory Committee' and 'Committee' as applicable throughout the Bill"

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Hon. Chairman, we are not agreeable to the Amendments moved by the Hon. Kabir Hashim and the Hon. (Prof.) Charitha Herath.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Clause 3 has been passed subject to the Amendment moved by the Hon. Minister.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 3, as amended, ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. Kabir Hashim to move an Amendment to Clause 4.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු සභාපතිතුමනි, ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා ජාතික විදුලිබල ප්‍රතිපත්තිය යනු දෙකකි. ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා වෙනම ව්‍යවස්ථාපිත ආයතනයක් ඇති බැවින්, එම කටයුතු මෙම උපදේශක සභාවට යටත් නොකිරීම සඳහායි අප මෙය ඉදිරිපත් කරන්නේ.

Sir, I move,

"In Page 13, delete lines 4 and 5 (Subsection (h))"

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Chandima Weerakkody to move the next Amendment.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

Sir, I move,

"In page 11, delete line 21 and substitute the following:

'(2) After the Bill becomes an Act of Parliament, the' "

ගරු සභාපතිතුමනි, ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කිරීම මෙම පනත් කෙටුම්පත සම්මත වෙච්ච දවසේ ඉඳලා මාස හයක් ඇතුළත සකස් කරන්න කියන යෝජනාවයි මේ කරන්නේ. නැත්නම් ඒ ප්‍රතිපත්තිය සකස් කරන්න සෑහෙන කාලයක් යනවා, මේ පනත ක්‍රියාත්මක වෙච්ච දවස වෙනකල් බලාගෙන හිටියොත්. ඒ නිසා රටට වැදගත්, ජාතික විදුලිබල ප්‍රතිපත්තිය කඩිනමින් සකස් කරන එක. ඒ වෙනුවෙන් මේ යෝජනාව කරනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. (Prof.) Charitha Herath to move the next Amendment.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

Sir, I move the following Amendment to Section 8 of Clause 4,

"In page 14, delete lines 11 to 13 (both inclusive) and substitute the following:

'electricity policy arises, the Minister may review the national electricity policy with the assistance of the Committee.' "

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Dayasiri Jayasekara.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I move,

"In page 12, delete line 13 and substitute the following:

'investment portfolios in energy technologies' "

ගරු සභාපතිතුමනි, incentives දීමේ බලය අමාත්‍යවරයා යටතේ තිබීමෙන් ඇත්තවශයෙන්ම තරගකාරිත්වයට බාධාවක් එන්න පුළුවන්. මොකද, ඇමතිවරයාට බලය තිබෙනවා, තමන්ට කැමැති incentives දෙන්න. ඉතින් ඒක තීරණය කරන එක යම්කිසි විධියකට නැවැත්වූවොත්, ඇත්තවශයෙන්ම විශාල තරගකාරිත්වයක් එයි කියන විශ්වාසය අපට තිබෙනවා, කැමැති කැමැති කෙනාට දෙනවාට වඩා. ඒ නිසා අපි මේක යෝජනාවක් විධියට ඉදිරිපත් කරනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Hon. Chairman, we are not agreeable to the Amendments moved by the Hon. Kabir Hashim, the Hon. Chandima Weerakkody, the Hon. (Prof.) Charitha Herath and the Hon. Dayasiri Jayasekara.

4 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
4ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 4 ordered to stand part of the Bill.

5 සිට 8 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
5ஆம் வாசகத்திலிருந்து 8ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 5 to 8 ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Chandima Weerakkody to move an amendment for the heading under Part IV.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
Sir, I move,

"In page 25, delete line 2 - heading under Part IV - and replace with the following:

'Establishment of the Independent System Operator.' "

"Independent System Operator" හැටියට නම් කරන්න කියලා ඉල්ලනවා, instead of "National System Operator".

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, we are not agreeable to the Amendment moved by the Hon. Chandima Weerakkody to the heading under Part IV.

9 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
9ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 9 ordered to stand part of the Bill.

10 වන වගන්තිය.- (ජාතික පද්ධති ක්‍රියාකරු වෙත බලපත්‍රය නිකුත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය සහ කර්තව්‍ය)

வாசகம் 10.- (தேசிய முறைமைத் தொழிற்படுத்துநருக்கு உரிமம் வழங்குதலும், பணிப்பாளர் சபையும் அதன் பணிகளும்)

CLAUSE 10.- *(Issue of licence to the National System Operator, the Board of Directors and functions)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,

(1) "In page 26, leave out all words in line 6 and insert:

'electrical engineering and administration who shall be appointed by the Board with' ";

(2) "In page 33, leave out all the words in lines 1 to 4 (both inclusive) and insert:

'(14) The National System Operator shall enter into -

(a) power purchase agreements with generation licensees and transmission service agreements with transmission licensees as specified in subsection (12): ' "; and

(3) "In page 33, leave out all the words in line 18 and insert:

'agreements;

(b) power purchase agreements with generation licensees incorporated under the preliminary transfer plan specified in paragraph (a) of subsection (2) of section 18;

(c) power sales agreements with distribution licensees incorporated under the preliminary transfer plan specified in paragraph (a) of subsection (2) of section 18;

(d) a transmission service agreement with the National Transmission Network Service Provider incorporated under the preliminary transfer plan specified in paragraph (a) of subsection (2) of section 18 and subsection (12) of this section.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Dayasiri Jayasekara to move his Amendment.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I move,

"Delete lines 4 and 5."

ගරු සභාපතිතුමනි, මේ ක්‍රියාදාමය ඇත්තටම expertsලා අතින් කෙරෙන්න ඕනෑ කාරණයක්. ඒක ඇත්තටම තිබෙන පරණ documents ඔක්කෝම එක්ක, සාකච්ඡා කරලා කරන්න ඕනෑ කාරණයක්. ඒක තනිකර අමාත්‍යවරයාගේ අතට යාම සම්පූර්ණ, - Council එක කිව්වාම Council එකට පමණක් මේක භදන්න දීම තුළ අනෙක් සියලුදෙනාගේ සහාය ගැනීමට යම් ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා තමයි අපි මෙය 4 වන වගන්තියට ඉදිරිපත් කරන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Harsha de Silva to move his amendments to Clause 10.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I move,

"In page 26, delete line 24 and substitute the following:

'system of Sri Lanka ensuring continuous supply of electricity;' "

අපි විශ්වාස කරන්නේ, අත්වැරදීමක් නිසා මේක අයින් වෙලා තිබෙනවාය කියලා. මොකද, 2002 අංක 28 දරන පනතේත්, 2009 අංක 20 දරන පනතේත් දෙකේම තිබෙනවා, අඛණ්ඩ විදුලි සේවාව ලබා දිය යුතුයි කියලා. එතකොට "අඛණ්ඩ විදුලි සේවාව" කියන එක මේකේ miss වෙලා තිබෙනවා. ඉතින් අපි කියන්නේ, අඛණ්ඩව විදුලි සේවාව ලබා දිය යුතුයි කියන්න, "අඛණ්ඩ විදුලි සේවාව" කියන එක add කරන්න කියලා; එච්චරයි. මොකද, කවුරුහරි මේකේ වගකීම ගන්න ඕනෑ. ඒ හැම පනතේම, අඛණ්ඩ විදුලි සේවාව ලබා දිය යුතුයි කියන එක තිබෙනවා. මේකේ නැහැ. මම හිතන විධියට, ඒක miss වෙලා. සද්භාවයෙන් මේ කියන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒකටත් විරුද්ධද?

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු (මහාචාර්ය) චරිත හේරත් මැතිතුමා, සංශෝධන ඉදිරිපත් කිරීමට.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
Sir, I move,

"In page 29, delete line 15 and substitute the following:

'are to be implemented by the Independent System Operator only on the recommendation of the Advisory Committee appointed under section 3.' "

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Harsha de Silva, you can move the rest of your Amendments to Clause 10.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Chairman, Page 26 එකේ Amendment එකට මොකද වුණේ? "අඛණ්ඩ විදුලි සේවාව" කියන එක එකතු කරන්න කියලා අපි කියන්නේ. මේක වැරදීමක්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
First, you complete moving all your Amendments. Then, the Government will decide.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මෙහෙමයි. මෙතැන වෙලා තිබෙන්නේ, මේක miss වෙලා. මේක වැරදීමක්. මේක typographical error එකක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒකවත් තේරෙන්නේ නැහැ නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මේකේ තිබෙන්නේ මෙහෙමයි. අඛණ්ඩව විදුලි සේවාව ලබා දෙන්න කියලා තිබෙන්න ඕනෑ. මෙච්චර කල් තිබුණු හැම විදුලිබල පනතේම තිබෙනවා, විදුලිබල මණ්ඩලයට හෝ licensorට, අඛණ්ඩව විදුලිය ලබා දීමේ වගකීම තිබෙනවාය කියලා. කරුණාකරලා, මෙතැන දේශපාලනයක් නැහැ, ගරු සභාපතිතුමනි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Hon. Chairman, the Amendments moved by the Hon. Dayasiri Jayasekara, the Hon. (Dr.) Harsha de Silva, the Hon. (Prof.) Charitha Herath -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, there are some more Amendments to be moved to Clause 10.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I am talking about Clause 10.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Yes. For Clause 10, we moved our Amendments.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Minister, for Clause 10, your Amendment was "Delete line 6 and substitute the following: 'electrical engineering and administration who shall be appointed by the Board with' ". ඒක ගැන නොවෙයි මේ කියන්නේ. Clause 10 එකට මම ගෙනා Amendment එක තිබෙන්නේ page 26 එක සඳහා. - *[බාධා කිරීමක්]* හරි, කියන්නකෝ එහෙම නම්. මට මයික් එක දීපු නිසායි මම කිව්වේ. එතුමා කලින් කියනවා නම්, කියන්න. ප්‍රශ්නයක් නැහැ. හැබැයි මම කියන්නේ, ඔබතුමන්ලාට මේක miss වෙලා කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
We are not agreeable to that.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභාපතිතුමනි,-

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභාපතිතුමනි, මේක - "අඛණ්ඩ විදුලි සැපයුම" - මේ පනතේ තිබිය යුතු දෙයක්. ඇයි, ඒකට විරුද්ධ? මට තේරෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, would you agree to that?

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු සභාපතිතුමනි, මෙතුමන්ලා ලබා දීලා තිබෙන සංශෝධන සියල්ල පරීක්ෂා කරලා තිබෙන්නේ, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, අමාත්‍යාංශයේ නිලධාරීන්. අවශ්‍යතාවක් නැහැ කියලායි කියන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාත් එක්ක තිබෙන විවාදයක් නොවෙයි. මේක pass වුණායින් පස්සේ නැවත අපිට උසාවියට යන්න බැහැ. මම කියන්නේ මේක අත් වැරදීමක් කියලායි. ලංකාවේ අද වෙනකන් තිබුණු හැම විදුලිබල පනතේම තිබුණු දෙයක්, මේ කාරණය. අඛණ්ඩ විදුලිය ලබා දිය යුතුයි කියන එක වගකීමක්. දෙයියන්ගේ නාමෙන් මේ වෙලා තිබෙන්නේ printing mistake එකක්. අපි මේක භාර ගනිමු. මේකේ මහ ලොකු දෙයක් නොවෙයි, කරන්න තිබෙන්නේ. අද වෙනකන් තිබුණු සියලු විදුලිබල පනත්වල වගකීමක් හැටියට තිබෙනවා, "අඛණ්ඩ විදුලිය සැපයිය යුතුයි" කියලා. ඇයි, ඒක අයින් කරන්නේ?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
කොහොමත් ආයතනය තිබෙන්නේ අඛණ්ඩව විදුලිය දෙන්න තමයි. ඒක අලුතෙන් කියන්න ඕනෑ නැහැ. - *[බාධා කිරීම්]* No, I have gone through hundreds and hundreds of Acts. There is no need to include that; it is not necessary. - *[Interruption.]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Typographical errors will be corrected at the end, do not worry.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු සභාපතිතුමනි, මට පොඩ්ඩක් අවස්ථාව දෙන්නකෝ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. (Dr.) Harsha de Silva?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Leader of the House, if you look at the 2002 Act සහ 2009 පනත, ඒ දෙකේම තිබෙනවා, "අඛණ්ඩව විදුලිය සැපයිය යුතුයි" කියලා. මේකේ වෙලා තිබෙන්නේ වැරදීමක්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මේ සියලු Amendments, ශ්‍රේෂ්ඨාධිකරණය යෝජනා කළ ඒවා සහ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී යෝජනා කළ සියල්ල incorporate කරලා, නීති කෙටුම්පත් සම්පාදකගේ එකඟතාව ඇතිව, නීතිපතිගේ එකඟතාව ඇතිව ඇමති මණ්ඩලය නැවත සංශෝධනයට එකඟ වෙලා තමයි මේ එවලා තිබෙන්නේ. ඉතින්, මට එතැනින් එහාට මේක වෙනස් කරන්න බැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු සභාපතිතුමනි, අපි මෙතැන දේශපාලනය කරන්න ඕනෑ නැහැ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු සභාපතිතුමනි, මේක Bill එකේ "Objects of the Act" යටතේ තිබෙනවා. මෙහි තිබෙන එකක් ආයෙත් දාන්න අවශ්‍ය නැහැ, ගරු සභාපතිතුමනි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Chairman, I want a Division on that Amendment. ගරු සභාපතිතුමනි, අපි මෙතැන දේශපාලනයක් නොවෙයි කරන්නේ. සද්භාවයෙන් මේක ගෙනෙන්නේ. අපි Officials' Box එකේ ඉන්න නිලධාරීන්ගෙන් අහමු. ඔවුන්ගෙන් අහලා කියන්න, ගරු ඇමතිතුමා. මේකේ තිබෙනවා, අඛණ්ඩ විදුලි සේවාව ලබා දීම කියන එක. අපි සද්භාවයෙන් මේක ගෙනෙන්නේ. මේක පිළිගන්න බැරි නම් අපට මේකට Division එකක් දෙන්න.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
That is supposed to be the objective of this Bill.

(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපට Division එකක් දෙන්න. Sir, we want a Division on those proposed words .

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Is that the only Amendment you are moving to Clause 10?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
No, there are a couple of others. Shall I move those?

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Please go ahead and finish them off.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Thank you. Sir. I move,

"In page 29, delete line 13 and substitute the following:

'The Regulator shall, with the consent of the Minister, prescribe the procedure, format' "

මේකෙන් කියන්නේ ඇමතිවරයාගෙන් අහලා Regulatorට ඒක කරන්න කියලායි. ඒක පිළිගන්නේ නැත්නම් මට ප්‍රශ්නයක් නැහැ. ඒකට මම argue කරන්නේ නැහැ.

Then, Sir, I also move,

"In page 32, delete line 26 and substitute the following:

'by the Cabinet of Ministers, on the recommendation of the Regulator' "

මෙතැන කියන්නේත් ගරු ඇමතිතුමාට Regulatorගෙන් විමසන්න කියලායි. ඉතින් ඒ සංශෝධන දෙක භාර ගන්නේ නැත්නම් මම argue කරන්නේ නැහැ. හැබැයි, Clause 10ට අදාළව අප සඳහන් කරන, ලංකාවේ අඛණ්ඩ විදුලි supply එක දෙන්න ඕනෑ කියන එක පිළිගන්න. ඒ වෙනුවෙන් නම් අපි argue කරනවා. ඔබතුමන්ලා ඒක පිළිගන්නේ නැත්නම් අපි Division එකක් ඉල්ලනවා; ඡන්දයක් ඉල්ලනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, do you agree with that Amendment?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
No, we are not agreeable to that. We have already moved our Amendment.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, we want a Division on that.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
I will give you a Division.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
We do not want to waste time of the House, calling for a Division on every Clause, but this is an important Amendment, Sir. මේක සද්භාවයෙන් භාර ගන්න.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, මෙය 2(අ) - "Objects of the Act" - යටතේ තිබෙනවා. එහි මෙසේ සඳහන් වනවා:

"සෑම විට ම විනිවිදභාවයෙන් යුතු ප්‍රතිපත්ති හරහා, මුළු කාලය පුරාම ශ්‍රී ලංකාව පුරා සපයනු ලබන සහ නිසි පරිදි සම්බන්ධීකරණය වූ, කාර්යක්ෂම සහ පිරිමැසුම්දායක විදුලිබල සැපයුම් පද්ධතියක, සැපයීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වගකිව යුතු ස්වාධීන සහ වගකීමෙන් බැඳී සිටින සංස්ථාමය අස්තිත්ව හරහා වැඩිදියුණු වූ විදුලිබල කර්මාන්තයේ කාර්යසාධනය සහතික කිරීම;"

ඉතින්, "මුළු කාලය පුරාම" කියන්නේ මොකක්ද? ඔබතුමාට පනත් කෙටුම්පත කියවා ගන්න බැරිව ඔය විධියට කියන්න එපා. *[බාධා කිරීමක්]* මොකක්ද, ඒ තිබෙන්නේ?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු සභාපතිතුමනි, හැම විදුලිබල පනතකම වගකීමක් හැටියට තිබෙනවා,- *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමා මෙහෙමයි. මේකට fight කරන්න ඕනෑ නැහැ. එහි තිබෙනවා, "the availability and continuous supply of electricity" කියලා. That has more clarity. මෙහි කෙළින්ම කියනවා, ඔබට තිබෙන වගකීමක් කියලා, විදුලිබලය continuously supply කිරීම. 2002 විදුලිබල පනතේත් මෙය සඳහන්ව තිබුණා. පිළිගන්නේ නැත්නම් පිළිගන්න එපා. මෙතැන දේශපාලනයක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Point of Order එකක් නහන්න බැහැ නේ, ගරු මන්ත්‍රීතුමා, ඡන්දය විමසන වෙලාවට.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට පොඩි අදහසක් කියන්න ඕනෑ, මේ පනත් කෙටුම්පතේ තිබෙන කාරණයක් ගැන, ගරු සභාපතිතුමා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාගේ තව තිබෙන Amendments මොනවාද කියලා කියන්න. *[බාධා කිරීමක්]*

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු සභාපතිතුමනි, සිංහලෙන් තේරෙන්නේ නැත්නම් ඒ අදාළ කොටස මම ඉංග්‍රීසි භාෂාවෙන් කියවන්නම්. Clause 2. *(a)* of the Bill states, I quote:

"to ensure improved Electricity Industry performance through independent and accountable corporate entities responsible for the provision and maintenance, of a well-coordinated, efficient and economical system of electricity supply throughout Sri Lanka at all times, through transparent policies;

Hon. Member, I do not know why you cannot understand that.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
You are reading from Clause 2. *(a)* under "Objects of the Act", is it? I accept that. But here, we are talking about an Amendment to page 26, to what the National System Operator is responsible for.

මම කියන්නම්, ඇයි කියලා. මේක ඉස්සර තිබුණේ එක ආයතනක් හැටියට. දැන් මේ ආයතනය කොටස්වලට කඩනවා. එතකොට විදුලිය ජනනය කරන ආයතන තිබෙනවා, සම්ප්‍රේෂණය කරන ආයතන තිබෙනවා, බෙදා හරින ආයතන තිබෙනවා. දැන් මේ තිබෙන්නේ, සම්ප්‍රේෂණය කරන ආයතනය, National System Operator. එතකොට මේ National System Operatorට තමයි වගකීම තිබෙන්නේ, ජනනය කරපු විදුලිය මිල දී ගෙන බෙදා හරින්න. එහෙම නම්, එදා වාගේ නොවෙයි, අද මෙය කොටස්වලට කැඩෙනවා. එසේ කොටස්වලට කැඩෙන නිසා තමයි අප මෙහි වැදගත්කම සම්බන්ධයෙන් තවදුරටත් අවධානය යොමු කරන්න ඕනෑ. එදා ඔය විධියට සඳහන්ව තිබුණා නම් ප්‍රශ්නයක් නැහැ. හැබැයි, එදා වුණත් - 2002ත්, 2009ත් - continuous electricity supply එක දෙන්න ඕනෑ කියන වගකීම ඒ licensee වෙත තිබෙනවා.

ඉතින් මම මෙතැනදී ඉදිරිපත් කරන කාරණය මේකයි. මෙය තුනට බෙදපු නිසා ඒ තුන් දෙනාම මේ වගකීම භාර ගන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම වගකීම භාරගත යුත්තේ මූලික වශයෙන්ම National System Operator. මොකද, අර අයගෙන් අරගෙන distributorට දීමේ වගකීම එයාට තමයි තිබෙන්නේ. මම ගරු ඇමතිතුමා කියන දෙයට විරුද්ධ වෙන්නේ නැහැ. ඔබතුමාටත්, මටත් මේක තේරෙනවා. සිංහල සහ ඉංග්‍රීසි කියන භාෂා දෙකෙන්ම අපට තේරෙනවා. මෙය යෝජනා කරන්නේ මේ ආයතනය කොටස්වලට කඩන නිසා. This has been brought only to add a word, Sir, only to add one word. Why do you not accept it? Just add it.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, we do not agree with that Amendment proposed by the Hon. (Dr.) Harsha de Silva since it is already there in the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay, we will record all that.

Clause 10 has been passed subject to the Amendments moved by the Hon. Minister.

***10* වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

10ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 10, as amended, ordered to stand part of the Bill.

11 වන වගන්තිය.- (ප්‍රසම්පාදනය)
வாசகம் 11.- (பெறுகை)
CLAUSE 11.- *(Procurement)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,
"In page 34, leave out all words in line 37 and insert:

'subsection:

Provided further, the selection of the party to whom approval has been granted or the letter of award has been issued shall be selected pursuant to a competitive and transparent procurement process:' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. (Dr.) Harsha de Silva, to move an Amendment.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I move,
(1) "In page 35, delete line 11 and substitute the following:

(i) The Minister, on the recommendation of the Regulator and with the approval of the' "; and

(2) "In page 35, delete line 18 and substitute the following:

'(ii) The Minister, on the recommendation of the Regulator and with the approval of the' "

National System Operator වෙත අමාත්‍යවරයාගේ නියෝග නිකුත් කිරීම නියාමකයාගේ නිර්දේශය මත පමණක් සිදු කිරීම තහවුරු වනු වස් තමයි අපි මෙක ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒක භාර ගන්නේ නැත්නම් කමක් නැහැ. හැබැයි, අපි ඒක ඉදිරිපත් කරනවා. All these Amendments we are bringing in are not to take away the power of the Minister, but to ensure that the Regulator is in the know, to bring in some oversight and checks and balances.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Prof.) Charitha Herath.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
Sir, I move,
"In Page 35, delete line 10 and substitute the following:

'(3) The Minister may on the advice of the Advisory Committee, by' "

Sir, I think this is a very important Amendment. The Hon. Minister has introduced a new Advisory Council and what I propose will empower that, if you add it.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, we are not agreeable to the Amendments proposed by the Hon. (Dr.) Harsha de Silva and the Hon. (Prof.) Charitha Herath.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Clause 11 has been passed subject to the Amendments moved by the Hon. Minister.

11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 11, as amended, ordered to stand part of the Bill.

12 සහ 13 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
2ஆம், 13ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 12 and 13 ordered to stand part of the Bill.

14 වන වගන්තිය.- (ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය ඉල්ලුම් කිරීම සඳහා වන යෝග්‍යතාවය)

வாசகம் 14.- (தேசிய மின்கடத்துகை வலையமைப்புச் சேவை வழங்குநர் உரிமத்துக்காக விண்ணப்பிப்பதற்கான தகவுடைமை)

CLAUSE 14.- *(Eligibility to apply for national transmission network service provider licence)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,
"In page 39, leave out all words in line 3 and insert:

'14.(1) No person other than a company incorporated' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Chandima Weerakkody, to move an Amendment.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
Sir, I move,
"In page 40, delete lines 03 and 04 and substitute the following:

'person who is applying for an additional transmission licence under subsection (2).' "

ගරු සභාපතිතුමනි, එයින් යෝජනා කරන්නේ මේ කාරණයයි. දැනට තිබෙන්නේ අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා හැටියටයි. බලපත්‍රයක් ඉල්ලුම් කරන කෙනාට තමයි මේක අදාළ වෙන්නේ. එම නිසා මේ සංශෝධනය එකතු කරන ලෙස ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. පනත ක්‍රියාත්මක වීමේදී මෙය ඉතාම වැදගත් කාරණයක්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, do you accept the Amendment?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, we are not agreeable to the Amendment proposed by Hon. Chandima Weerakkody.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Clause 14 has been passed subject to the Amendments moved by the Hon. Minister.

14 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
14ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 14, as amended, ordered to stand part of the Bill.

15 සහ 16 වන වගන්ති කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
15ஆம், 16ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 15 and 16 ordered to stand part of the Bill.

17 වන වගන්තිය.- (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගම් සංස්ථාගත කිරීම සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කරන ලද කටයුතු එම සමාගම් සතු කිරීම)

வாசகம் 17.- (2007ஆம் ஆண்டின் 07ஆம் இலக்க, கம்பெனிகள் சட்டத்தின்கீழ் வரையறுக்கப்பட்ட கம்பெனிகளைக் கூட்டிணைத்தலும் இலங்கை மின்சாரச் சபையின் மீளக் கட்டமைக்கப்பட்ட செயற்பாடுகளை அதன் கண் உரித்தாக்குதலும்)

CLAUSE 17.- *(Incorporation of Limited Companies under the Companies Act, No. 07 of 2007 and the vesting therein of the restructured activities of the Ceylon Electricity Board)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,

(1) "In page 44, leave out all words in lines 9 and 10 and insert:

'such limited companies shall be prepared in accordance with the provisions of this Act. Subject to the provisions'" ;

(2) "In page 44, leave out all words in lines 14 to 16 (both inclusive) and insert:

'vested by operation of law, in each of such limited companies.' " ;

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(3) "In page 44, leave out all words in line 17 and insert:

'(2) (a) On the appointed date, by virtue of the operation'" ;

(4) "In page 44, leave out all words in line 24 and insert:

'functions shall vest in the limited companies' " ; and

(5) "In page 44, leave out all words in line 27 and insert:

'section 18.

(b) The Secretary to the Treasury shall be initially allotted hundred *per centum* of the shares in the successor companies incorporated under this section other than the companies referred to in items (a), (f) and (h) (ii) of Schedule 1 in which the Secretary to the Treasury shall be permanently allotted hundred *per centum* of the shares.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

17 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

17ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 17, as amended, ordered to stand part of the Bill.

18 වන වගන්තිය.- (පැවරුම් සැලැස්ම පිළියෙල කිරීම)

வாசகம் 18.- (கைமாற்றல் திட்டத்தைத் தயாரித்தல்)

CLAUSE 18.- *(Preparation of the transfer plan)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,

(1) "In page 45, leave out all words in line 32 and insert:

'commence operations;' " ;

(2) "In page 46, leave out all words in line 9 and insert:

'Industry; and

(c) The Secretary to the Treasury may, with the prior approval of the Cabinet of Ministers, and having followed a transparent and competitive bidding process as stipulated by law dispose of any shares issued or allotted to him in any successor company other than the companies referred to in items (a), (f) and (h) (ii) of Schedule 1 or of any rights over such shares only after the publication of the final transfer plan in the Gazette in terms of paragraph (b):

Provided that, the Secretary to the Treasury shall, in disposing any shares as specified in paragraph (c) ensure that the Government holds more than fifty per centum of the shares of the company referred to in item (e) of Schedule 1.' " ;

(3) "In page 48, leave out all words in line 16 and insert:

'Fund and the monies required to meet the Provident Fund obligations of the employees of the Ceylon Electricity Board: ' " ;

(4) "In page 49, leave out all words in line 10 and insert:

'months of this section comes into operation; ' " ;

(5) "In page 49, leave out all words in line 20 and insert:

'on terms and conditions not less favourable than those enjoyed by them on the day preceding the appointed date under their contract of' " ;

(6) "In page 49, leave out all words in lines 25 and 26 and insert:

'terms and conditions of such scheme shall be prescribed within four months of this section comes into operation; and

(g) identify the share capital, the management structure and the source of funds for the entities to be established under subsection (1) of section 17.' " ;

(7) "In page 50, leave out all words in line 28 and insert:

'Board who opts for voluntary retirement from the date on' " ; and

(8) "In page 51, leave out all words in line 14 and insert:

'Pension Fund, as the case may be, and the successor companies shall make all other statutory payments including gratuity to the employees of the Ceylon Electricity Board who have become the employees of the successor companies. The period that an employee served with the Ceylon Electricity Board shall be taken into consideration when calculating the statutory payments that are payable to such employees.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Chandima Weerakkody, to move an Amendment.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
Sir, I move,
"In page 45, delete lines 24 to 26 and substitute the following:

'thereafter to be published in the Gazette shall contain all details of the vesting of the' "

ගරු සභාපතිතුමනි, මේක ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයට සමපාත වන ආකාරයට මේ හුවමාරු සැලැස්ම සකස් කළාට පස්සේ ගැසට් පත්‍රයේ පළ කිරීම අනිවාර්ය වනවා. ඒ කටයුත්ත වෙනුවෙන් තමයි මම මේ සංශෝධනය යෝජනා කරන්නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, we are not agreeable to that Amendment.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු ඇමතිතුමා, මොන පදනමක් මත මේකට විරුද්ධ වනවාද කියන එක මට නම් හිතාගන්න බැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Clause 18 has been passed subject to the Amendments moved by the Hon. Minister.

***18** වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
18ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 18, as amended, ordered to stand part of the Bill.

***19** වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*
9ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 19 ordered to stand part of the Bill.

20 වන වගන්තිය.- (බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමේ යෝග්‍යතාවය)
வாசகம் 20.- (உரிமமொன்றுக்காக விண்ணப்பிப்பதற்கான தகவுடைமை)
CLAUSE 20.- (*Eligibility to apply for a licence*)

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,

(1) "In page 54, leave out all words in line 16 and insert:

'(6) A person who holds more than fifteen *per centum* of" "; and

(2) "In page 54, leave out all words in lines 29 and 30 and insert:

'generation licence;

(f) a generation licence and a distribution licence; or

(g) more than one distribution licence.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. (Dr.) Harsha de Silva, to move an Amendment.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු සභාපතිතුමනි, ඒ සංශෝධනය අපි තමයි ඉදිරිපත් කළේ. ඒක එතුමන්ලා පිළිගෙන තිබෙනවා. ඒ නිසා අපි ඒ සංශෝධනය ගෙනෙන්නේ නැහැ. මෙතැනින් කරන්නේ සියයට 50ට තිබුණු බලය සියයට 15ට අඩු කිරීම, තව ආයතනයක් ගන්නවා නම්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Clause 20 has been passed subject to the Amendments moved by the Hon. Minister.

***20** වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
20ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 20, as amended, ordered to stand part of the Bill.

21 වන වගන්තිය.- (බලපත්‍රයක් සඳහා වන අයදුම්පත සහ බලපත්‍රය ප්‍රදානය)
வாசகம் 21.- (ஓர் உரிமத்துக்கான விண்ணப்பமும் உரிமம் அளிக்கப்படுதலும்)
CLAUSE 21.- (*Application for a licence and grant of licence*)

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,

"In page 55, leave out all words in line 11 and insert:

'applicant, proceed to ' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

***21** වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
21ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 21, as amended, ordered to stand part of the Bill.

***22** වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*
22ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 22 ordered to stand part of the Bill.

23 වන වගන්තිය.- (බලපත්‍ර වීකරණය හෝ අවලංගු කිරීම සහ බලාත්මක කිරීමේ නියෝග)
வாசகம் 23.- (உரிமங்களையும் வலுவுறுத்தற் கட்டளைகளையும் திரிபுபடுத்துதல் அல்லது இல்லாதொழித்தல்)
CLAUSE 23.- (*Modification or revocation of licences, and enforcement orders*)

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,

(1) "In page 58, leave out all words in lines 25 and 26, and insert:

'to modify any licence in the national interest, proceed to modify the' " ;

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(2) "In page 59, leave out all words in lines 3 and 4 and insert:

'as specified in subsection (3), revoke by Order published in the *Gazette*, a' " ; and

(3) "In page 64, leave out all words in line 3 and insert:

'the Regulator may, by' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

23 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

23ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 23, as amended, ordered to stand part of the Bill.

24 සිට 30 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

24ஆம் வாசகத்திலிருந்து 30ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 24 to 30 ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
To Clause 31, an Amendment is to be moved by the Hon. (Dr.) Harsha de Silva.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I move,

"In page 78, add the following new sentence after line 2:

'Provided that, such policy guidelines shall be formulated in accordance with globally accepted and implemented methodologies.'"

මෙතැන අපි කියන්නේ market concentration එක සම්බන්ධයෙන්. ඒ කියන්නේ, වෙළෙඳ පොළ බලය. එතකොට වෙළෙඳ පොළ බලය, පාරිභෝගිකයාගේ market concentration එක අඩු කරන්න යොදා ගන්නා ක්‍රමවේද පිළිබඳව. අපි කියන්නේ, "globally accepted" කියලා. මම ගරු ඇමතිතුමා එක්කත් කථා කළා. ලෝකයේ බොහෝ රටවල liberalize කරලා තිබෙන electricity sector එක, Herfindahl-Hirschman Index කියන එක පාවිච්චි කරනවා. යුරෝපා සංගමය, ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ජපානය, ඉන්දියාව, බ්‍රසීලය, දකුණු අප්‍රිකාව ඇතුළු බොහෝ රටවල මේක මනින ක්‍රමයක් තිබෙනවා. ඒ කියන්නේ, බොහෝ වෙලාවට කියනවා, මේ කට්ටිය market එක corner කළා කියලා. එහෙම නැත්නම් මේ කට්ටිය මාෆියාවක් දැම්මා, හාල්වලට, බිත්තරවලට, ලූනුවලට මාෆියාවක් දැම්මා යනාදී වශයෙන්. හැබැයි, මේක මනින ක්‍රමයක් තිබෙනවා නම් ඒ ක්‍රමය ඇතුළත් කළ යුතුය කියන එකයි අපි කියන්නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, we are not agreeable to that Amendment.

31 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

31ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 31, ordered to stand part of the Bill.

32 සිට 37 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

32ஆம் வாசகத்திலிருந்து 37ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 32 to 37 ordered to stand part of the Bill.

38 වන වගන්තිය.- (ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය පිහිටුවීම)
வாசகம் 38.- (மின்சக்தித்துறைச் சீர்திருத்தச் செயலகத்தைத் தாபித்தல்)
CLAUSE 38.- (*Establishment of the Power Sector Reforms Secretariat*)

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,

(1) "In page 84, leave out all words in lines 7 to 11 (both inclusive) and insert:

'(2) (a) The Minister shall appoint not more than five persons with integrity, one of whom shall have not less than ten years' experience in electrical engineering, and the other four persons with not less than ten years of experience in one or more of the following fields to be members of the Power Sector Reform Secretariat:-

(i) power system planning and operation' " ;

(2) "In page 84, leave out all words in lines 15 to 17 (both inclusive) and insert:

'(v) public private partnership; or

(vi) finance.' " ;

(3) "In page 84, leave out all words in line 19 and insert:

'not less than fifteen years' experience in one or more of the following fields to be the' " ;

(4) "In page 84, leave out all words in line 21 and insert:

'(i) power system planning and operation;' " ; and

(5) "In page 84, leave out all words in lines 24 to 27 (both inclusive) and insert:

'(iv) electrical engineering;

(v) public private partnership; or

(vi) finance.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

38 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

38ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 38, as amended, ordered to stand part of the Bill.

39 වන වගන්තිය. - (ලංකා විදුලිබල මණ්ඩලය විසින් ස්වකීය සන්තකයේ ඇති සියලු දත්ත සහ තොරතුරු ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය වෙත ලබා දිය යුතු බව)

வாசகம் 39.- (இலங்கை மின்சாரச் சபை, அதன் உடைமையிலுள்ள எல்லாத் தரவுகளையும் தகவல்களையும் மின்சக்தித்துறைச் சீர்திருத்தச் செயலகத்துக்கு வழங்குவதற்குத் தேவைப்படுத்தப்படுதல்)

CLAUSE 39.- (*Ceylon Electricity Board required to provide all data and information in its possession to the Power Sector Reforms Secretariat)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,

"In page 87, leave out all words in line 3 and insert:

'the appointed date with such valuation being carried out by the Chief Valuer:' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

39 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
39ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 39, as amended, ordered to stand part of the Bill.

40 සිට 47 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
40ஆம் வாசகத்திலிருந்து 47ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 40 to 47 ordered to stand part of the Bill.

48 වන වගන්තිය.- (දුෂ්කරතා ඉවත් කිරීම)

வாசகம் 48.- (சிரமங்களை அகற்றுதல்)

CLAUSE 48.- (*Removal of difficulties*)

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,

"In page 96, leave out all words in lines 1 to 9 (both inclusive)."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

48 වන වගන්තිය, පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.
48ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 48, ordered to be left out of the Bill.

49 සිට 51 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
49ஆம் வாசகத்திலிருந்து 51ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 49 to 51 ordered to stand part of the Bill.

52 වන වගන්තිය.- (ඉවත් කිරීම් සහ අන්තර්කාලීන විධිවිධාන)

வாசகம் 52.- (நீக்கங்களும் நிலைபெயர்கால ஏற்பாடுகளும்)

CLAUSE 52.- *(Repeals and Transitional Provisions)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,

(1) "In page 100, leave out all words in lines 20 to 22 (both inclusive) and insert:

'under section 10;' " ; and

(2) "In page 101, leave out all words in line 13 and insert:

'nine months and within six months from the appointed date,' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

52 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
52ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 52, as amended, ordered to stand part of the Bill.

53 වන වගන්තිය.- (අර්ථ නිරූපනය)

வாசகம் 53.- (பொருள்கோடல்)

CLAUSE 53.- *(Interpretation)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,

"In page 109, leave out all words in lines 5 and 6 and insert:

'consisting of transmission assets and grid substations owned' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Chandima Weerakkody, to move an Amendment.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
Sir, I move,

"In page 106, delete lines 26 and 27 and substitute the following:

'works and other hydraulic works, but does not' "

මේක ඉතාම වැදගත් කාරණයක්, ගරු සභාපතිතුමනි. මේ තිබෙන ක්‍රමයට ජලාශවල අයිතියත් විදුලි බලාගාර පාලනය කරන අයට පැවරෙන ආකාරයට තමයි මේ පනතේ කෙටුම්පතේ දැනට ලියැවිලා තිබෙන්නේ. මේක තාක්ෂණික දෝෂයක් හැටියට මා

[ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා]

දකිනවා. කිසිදු ආකාරයකට ජලාශ සහ dams, විදුලි බලාගාර පාලනය කරන අයට අයිති වෙන්නේ නැහැ. ඒවා අයිති මධ්‍යම රජයට. ඒ නිසා එම ජලාශ - reservoirs - and dams, those two words "reservoirs, dams" should be deleted. I strongly believe that this Amendment should be accommodated.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, we are not agreeable to that Amendment.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මේ තුළින් වෙන්නේ මේකයි. ජලාශවල පාලනය විදුලි බලාගාර පාලනය කරන අයට දුන්නොත්, ගොවීන්ට ලොකු ප්‍රශ්නයක් වෙනවා. ජලාශවල පාලනය තනිකර විදුලි බලාගාර පාලනය කරන අයට දුන්නොත් ගොවීන්ට වතුර ලබා ගැනීමට නොහැකි වෙනවා. රටේ කෘෂිකර්මයට වින කරන -

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
We are not agreeable to that Amendment.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Clause 53 has been passed subject to the Amendment moved by the Hon. Minister.

53 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
53ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 53, as amended, ordered to stand part of the Bill.

54 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
54ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 54, ordered to stand part of the Bill.

I වන උපලේඛනය
அட்டவணை I
SCHEDULE I

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,

(1) "In page 114, Schedule 1, leave out the words 'shall on the date of the coming into operation of this Act, being a date no later than six months from the date on which this Act has been certified by the Speaker in terms of Article 79 of the Constitution as an Act of Parliament,' and insert:

'shall on the appointed date' " ;

(2) "In page 115, Schedule I (*a*), leave out the words 'shares are held by the Government of Sri Lanka to take' and insert:

'shares are held by the Secretary to the Treasury to take' " ;

(3) "In page 115, Schedule I (*f*), leave out the words 'one company of which the Government of Sri Lanka' and insert:

'one company of which the Secretary to the Treasury' " ; and

(4) "In page 116, Schedule I (*h*) (ii), leave out the words 'the Government' and insert:

'the Secretary to the Treasury.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

I වන උපලේඛනය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
அட்டவணை I திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Schedule I, as amended, ordered to stand part of the Bill.

II වන උපලේඛනයේ සිට IV වන උපලේඛනය තෙක් උපලේඛන පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
அட்டவணை IIஇலிருந்து அட்டவணை IV வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Schedules II to IV ordered to stand part of the Bill.

පූර්වීකාව පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
முன்னுரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Preamble ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය, දීර්ඝ නාමය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் விரிவுப் பெயரும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.
Enacting Clause, Long Title and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sir, I move,

"That the Bill, as amended, be now read the Third time."

I also request permission to correct the language and typographical errors, grammatical errors, numerical errors and consequential Amendments to the Bill.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත රීට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.
Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා.

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ආදේශකයන්ට ස්ථිර පත්වීම් ලබා දීම
இலங்கை தபால் வழங்கல் திணைக்களத்தின் பதிவுசெய்யப்பட்ட பதிலீட்டு ஊழியர்களுக்கான நிரந்தர நியமனங்கள்
GRANT OF PERMANENT APPOINTMENTS TO REGISTERED SUBSTITUTES IN DEPARTMENT OF POSTS

[අ.භා. 6.10]

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා බඳවාගනු ලබන්නේ පළමුව ලියාපදිංචි ආදේශකයන් ලෙස බඳවාගෙන ඒ අයගේ ජ්‍යෙෂ්ඨත්වය මත ස්ථිර කාර්ය මණ්ඩලයේ ඇති වන පුරප්පාඩු පිරවීමෙනි. මේ යටතේ ලියාපදිංචි ආදේශකයන් ලෙස බඳවාගන්නා පිරිස් වර්ෂ ගණනාවක්ම ලියාපදිංචි ආදේශකයන් ලෙස සේවය කරමින් විශාල කැපකිරීමක් කරයි. ඔවුන්ගේ ජීවිතවලින් හොඳම තරුණ කාලය මේ සඳහා වැය වේ.

නමුත්, මෙසේ බඳවාගෙන වර්ෂ 7ක්, 8ක් පමණ සේවය කළ ලියාපදිංචි ආදේශකයන් ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබියදී ස්ථිර නොකරයි. මෙම ස්ථිර කිරීම සඳහා 2022 වර්ෂයේ නිකුත් කරන ලද රාජ්‍ය සේවයට බඳවාගැනීම අත්හිටුවීම සඳහා වූ භාණ්ඩාගාර චක්‍රලේඛය අදාළ නොවේ. සමහර පුරප්පාඩු ඇති වී තිබෙන්නේ එම චක්‍රලේඛයේ දිනයට පෙර සිටයි. ඒ වාගේම මෙම ක්‍රමය තැපැල් දෙපාර්තමේන්තුවේ මෙතෙක් තිබූ සාමාන්‍ය ක්‍රමයකි. මෙම ස්ථිර කිරීම් තුළින් රජයට විශාල වැය බරක් ද ඇති නොවේ. එම නිසා ආදේශක කණ්ඩායමට ස්ථිර පත්වීම් ලබාදෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව යටතේ තැපැල් කාර්යාල 653ක් මේ රටේ ස්ථාපනය කර තිබෙනවා. ඒ වාගේම උප තැපැල් කාර්යාල 3,410ක් ක්‍රියාත්මක වෙනවා, ගරු කථානායකතුමනි. ඒ අනුව 26,000කට ආසන්න සමස්ත කාර්ය මණ්ඩලයක් සිටිනවා. ගරු කථානායකතුමනි, තැපැල් දෙපාර්තමේන්තුවට සේවකයන් බඳවාගන්නා ක්‍රමවේද දෙකක් තිබෙනවා. එකක් තමයි, නිලධාරීන් බඳවාගන්නා ක්‍රමවේදය. ගරු කථානායකතුමනි, ඔවුන් බඳවාගන්නේ විවෘත තරග විභාගයකින් සහ අභ්‍යන්තර තරග විභාගයකින්. ඒ වාගේම කනිෂ්ඨ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ ක්‍රමවේදයකුත් තිබෙනවා. ඒ ක්‍රමවේදය අනුව බාහිර කම්කරුවන් ලෙස ද, ලියාපදිංචි ආදේශක කම්කරුවන් ලෙස ද කනිෂ්ඨ කාර්ය මණ්ඩලය බඳවාගන්නවා, ගරු කථානායකතුමනි. කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සිටින සේවකයන් විශ්‍රාම ගිය පසු තමයි මේ ලියාපදිංචි ආදේශක කම්කරුවන්ගේ සේවය ස්ථිර කරන්නේ.

ගරු කථානායකතුමනි, 2022දී මෙම අදාළ චක්‍රලේඛය නිකුත් කරන්න පෙර බඳවාගත් 1,000කට ආසන්න පිරිසකුත් මේ වනකොට ස්ථිර නොකර ඉන්නවා. ඒ, 2022දී නිකුත් කළ චක්‍රලේඛය නිසා. ඒ වාගේම, 2022ට පසුව ආදේශක කම්කරුවන් හැටියට බඳවාගෙන ස්ථිර නොකරපු අයත් විශාල පිරිසක් ඉන්නවා. ඒ නිසා ගරු අමාත්‍යතුමාගෙන් මම ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, 2022දී නිකුත් කළ චක්‍රලේඛය සලකා නොබලා 2022ට පෙර සහ 2022න් පසු බඳවාගත් මේ ආදේශක කම්කරුවන් ස්ථිර කරන්න කියලා.

ඒ වාගේම මේ වනකොට තැපැල් දෙපාර්තමේන්තුව තුළ සේවක ගැටලු විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ සම්බන්ධව මා වෙත ලැබී ඇති ලිපියක් මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

විශේෂයෙන් කාර්ය මණ්ඩලයේ ස්ථිර පත්වීම් ලබා නොදීම, කනිෂ්ඨ කාර්ය මණ්ඩලයේ උසස්වීම් ලබා නොදීම, වැඩ බලන තනතුරු දරමින් සේවය කරන උප තැපැල් ස්ථානාධිපතිවරුන් සඳහා ස්ථිර පත්වීම් ලබා නොදීම, සීමිත තරග විභාග ප්‍රතිඵල මත තවදුරටත් බඳවා ගැනීමට ඇති දෙවන පෙළ නිලධාරීන් බඳවා නොගැනීම වාගේ කාරණා කිහිපයක් නිසා තැපැල් දෙපාර්තමේන්තුවේ වැඩ කරන නිලධාරීන් විශාල ප්‍රශ්න රාශියකට මුහුණ දී සිටිනවා. මම හිතන විධියට මේ අවස්ථාවේදී ඇමතිතුමා නම් සභාවේ නැහැ. එතුමා එළියට ගිහිල්ලා.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

රාජ්‍ය ඇමතිතුමා ඉන්නවා.

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

ඔව්, ශාන්ත බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමා ඉන්නවා. ගරු කථානායකතුමනි, මම මීට පෙරත් අවස්ථා ගණනාවකදී මෙවැනි යෝජනා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මෙම යෝජනාව ඉදිරිපත් කරමින්, මම නැවතත් මෙම ඉල්ලීම කරනවා. තැපැල් දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ සේවකයන් සහ නිලධාරීන් 26,000කට ආසන්න ප්‍රමාණයක් රට පුරා සේවය කරනවා. ඒ අය කොවිඩ් වසංගතය පැවැති වෙලාවේදීත් විශාල කාර්යභාරයක් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනාගතයේදී මැතිවරණ පවත්වන්න නියමිතව තිබෙනවා. එකක්, ජනාධිපතිවරණය. ඊළඟට, පළාත් පාලන මැතිවරණය, පළාත් සභා මැතිවරණය වාගේ මැතිවරණ පැවැත්වීමට නියමිතව තිබෙනවා. එම මැතිවරණවලදී ඡන්ද කාඩ් බෙදීම ඇතුළු බොහෝ කාර්යයන් සිදු කරන්නේ තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා, 2022 වර්ෂයේ නිකුත් කළ චක්‍රලේඛය දිහා නොබලා මෙම ආදේශක කණ්ඩායම ස්ථිර කිරීමට කටයුතු කරන්න කියලා. මොකද, 2022ට පෙර ආදේශකයන් ලෙස බඳවා ගත් 1,000කට ආසන්න ප්‍රමාණයකුත් ස්ථිර වෙන්න හිටියා. නමුත් මෙම චක්‍රලේඛය නිසා ඒ අය ස්ථිර කළේ නැහැ. ඒ වාගේම 2022න් පසුව ගත් අය ස්ථිර කළේත් නැහැ. ඒ නිසා මේ කාරණය පිළිබඳව ඉතා කරුණාවෙන් සලකා බලන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි, අවස්ථාව ලබා දීම සම්බන්ධව.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 6.16]

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා අද ඉතාම වැදගත් යෝජනාවක් සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කළා. එම යෝජනාව මම ස්ථිර කරනවා.

මෙම ගැටලුව සම්බන්ධව මීට පෙරත් පාර්ලිමේන්තුව තුළ අවස්ථා ගණනාවකදී අදහස් ඉදිරිපත් වුණා. අපේ රටේ තිබෙන ආර්ථික අර්බුදය තුළ 2022 අප්‍රේල් මාසයේ 26වැනි දින මුදල් අමාත්‍යාංශය නිකුත් කළ චක්‍රලේඛය සහ 2022 සැප්තැම්බර් මාසයේ ගරු අගමැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව අනුව රාජ්‍ය සේවයට කරන බඳවාගැනීම් අත්හිටුවීමට තීන්දුවක් ගත්තා. එදා ඒ පැවැති තත්ත්වය තුළ එවැනි තීන්දුවක් ගැනීම සාධාරණයි. මොකද, ඒ වනවිට රාජ්‍ය සේවකයන්ට පඩි ගෙවා ගන්නවත් බැරි පරිසරයක් තිබුණේ. හැබැයි, මේ වනවිට ඒ පැවැති තත්ත්වය පියමං කරලා අවුරුදු දෙකක් ගත වී තිබෙනවා. අනෙක් පැත්තෙන් බැලුවාම, මේ රටේ ආර්ථිකය ගොඩගෙන තිබෙනවා, රට හොඳ තත්ත්වයට ගෙනැල්ලා තිබෙනවා, රට හරි මහට ගෙනගොස් තිබෙනවා වැනි කාරණා ආණ්ඩුව පැත්තෙන් කියැවෙන කාලයක්, මේ. මෙම චක්‍රලේඛ නිසාවෙන් ඇති වී තිබෙන මේ හා සමාන ගැටලු සම්බන්ධව ගරු අගමැතිතුමාගෙන් අසන ප්‍රශ්න යටතේ මම ඊයේ දිනයේ ප්‍රශ්නයක් ඉදිරිපත් කරනු ලැබුවා. නමුත් ඒකට සාධාරණ උත්තරයක් ලැබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ චක්‍රලේඛය නිසාවෙන් විනාශයට පත් වෙමින් තිබෙන සහ විනාශයට පත් වුණු රාජ්‍ය ආයතන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ අතර මේ චක්‍රලේඛය නිසාවෙන් රාජ්‍ය සේවය පිළිබඳ කලකිරීම නිසා එයින් ඉවත් වුණු අය වාගේම, බරපතළ අර්බුදවලට ගොදුරු වුණු කණ්ඩායම් ඉන්නවා. මම මුලින් සඳහන් කළ ආකාරයට මේ චක්‍රලේඛය නිසා කඩාගෙන වැටුණු ආයතන අතර එකක් බවට පත් වෙමින් තිබෙනවා, තැපැල් දෙපාර්තමේන්තුවත්. ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා කිව්වා වාගේම අවුරුදු හයකට, හතකට, අටකට නොවෙයි, අවුරුදු දහයකට වැඩි කාලයක් ආදේශකයන් විධියට දෛනික වැටුපට සේවය කරන විශාල පිරිසක් තැපැල් දෙපාර්තමේන්තුව තුළ ඉන්නවා. ඒ අයගේ ස්ථිර වීමේ සිහිනය මම හිතන විධියට නොපෙනෙන මායිමකට, දුරකට තල්ලු වෙමින් තිබෙනවා.

තවත් රාජ්‍ය ආයතන ගණනාවක මේ වාගේ ප්‍රශ්න තිබෙන බව ඇත්ත. පළාත් පාලන ආයතනවලත් මේ වාගේ ප්‍රශ්නයක් තිබුණා. නමුත් එසේ පළාත් පාලන ආයතනවල අවුරුදු ගණනාවක් සේවය කර ස්ථිර නොවී සිටි අය ස්ථිර කිරීමට කැබිනට් මණ්ඩලය තීන්දුවක් ගෙන තිබෙනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙන්න පුළුවන්; ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙන්න පුළුවන්; මේ වාගේ ස්ථිර නොවුණු කණ්ඩායම් ඒවායේත් ඉන්නවා. හැබැයි, තැපැල් දෙපාර්තමේන්තුව කියන්නේ ඊට වඩා භාත්පසින්ම වෙනස් තැනක්. තැපැල් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු අය සිදු කරන සේවය ගැන ගරු රාජ්‍ය ඇමතිතුමා දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අයට අපේ වාගේ ගම්වල කිලෝමීටර ගණනක් ආවරණය කරන්න වෙනවා. මොකද, තැපැල් කලාපවල සීමා නිර්ණය කිරීම කාලයකින් සිදු කර නැහැ. ඒ නිසා එක තැපැල්කරුවෙකුට දෛනිකව විශාල ප්‍රදේශයක් ආවරණය කරන්න සිද්ධ වෙනවා. ඒවා පහසු ප්‍රදේශත් නොවෙයි. මම නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය මැතිවරණ කොට්ඨාසයේ තිබෙන ඇතැම් ගම් දිහා බලනකොට, ඒ පැතිවල සේවය කරන තැපැල්කරුවන්ට මම හිතන විධියට ඔවුන් ගන්නා වැටුපට අමතරව තවත් වැටුපක් එකතු කළ යුතුයි, ඔවුන් සිදු කරන සේවාව නිසාවෙන් සහ එහිදී ඇති වන අපහසුතා නිසාවෙන්. එම ප්‍රදේශවල පවතින කඳු හෙල් තරණය කරමින් ඔවුන්ට ඉතා දැඩි කැප කිරීමක් කරන්න සිද්ධ වෙනවා, ඔවුන්ගේ සේවය ලබා දීමේදී. නමුත් එවැනි කැප කිරීමක් කරන ඔවුන්ගේ සේවාව සම්බන්ධව ඇගැයීමක් ලබා දී නැහැ. ඒ වාගේම ඔවුන්ගේ රැකියාවල සුරක්ෂිතභාවයක් සිදු වී නැහැ.

තැපැල් දෙපාර්තමේන්තුව සම්බන්ධව රජය මේ මොහොත වනවිට ඉන්නා ස්ථාවරය පිළිබඳව අපට ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ගරු ශාන්ත බණ්ඩාර මැතිතුමනි, මෙම විෂය භාර රාජ්‍ය ඇමතිතුමා විධියට ඔබතුමා කටයුතු කරනවා වුණත්, මේ සම්බන්ධයෙන් කැබිනට් ඇමතිතුමා ඉන්නා ස්ථාවරය සම්බන්ධව අපට ප්‍රශ්න තිබෙනවා.

තැපැල් දෙපාර්තමේන්තුව මේ තිබෙන තැනින් ගොඩගන්න මනසක එතුමා නැහැ. මේ දෙපාර්තමේන්තුව ඈවර කරලා, විකුණාගෙන කන්න පුළුවන් නම්, එවැනි මනසක් තිබෙන තත්ත්වයක් තමයි පෙනෙන්න තිබෙන්නේ. නුවරඑළියේ ඉඩමේ ඉඳලා ගත්තොත්, තැපැල් දෙපාර්තමේන්තුව සතුව වටිනා ඉඩම් ප්‍රමාණයක් සෑම නගරයකම ප්‍රධාන ස්ථානවල තිබෙනවා. මේවාට මොකක්ද කරන්නේ කියා කල්පනා කරනවා මිසක් මේක ගොඩගන්න සහ මේ සේවකයන් සම්බන්ධ කාරණාවේදී ඍජු මැදිහත්වීමක් වෙන බවක් පෙනෙන්න නැහැ. තැපැල් දෙපාර්තමේන්තුව ඈවර කරන්න නියමිත ආයතනයක් බවට පත් වෙමින් තිබෙනවා. හැබැයි, තැපැල් දෙපාර්තමේන්තුව කියන්නේ එහෙම ඈවර කරන්න පුළුවන් ආයතනයක් නොවෙයි. රාජකීය තැපෑල, එහෙම නැත්නම් එක්සත් රාජධානියේ Royal Mail එක ලෝකයේ ආදර්ශවත්, ලාභ ලබන ආයතනයක් බවට පත් වෙමින්

යනවා. ඒ වාගේම ලෝකයේ රටවල් ගණනාවක තැපැල් ක්ෂේත්‍රය කියන්නේ, ඉතාම ලාභ ලබන සහ තාක්ෂණයත් එක්ක මුසු වෙච්ච ක්ෂේත්‍රයක්. හැබැයි, අපි එතැනට යන්න අසමත් වෙලා තිබෙනවා, තවමත් සාම්ප්‍රදායික විධියට තැපැල්කරුවන් ලියුම් බෙදීම සහ මේ දෙපාර්තමේන්තුව මෙතැනින් ඉස්සරහට ගෙනියන්නේ නැති තත්ත්වය තුළ. ඒ නිසා courier services, අරවා මේවා කියා කොහේවත් ඉන්න අය අසීමිත ලාභ ලබනවා, භාණ්ඩ සහ වෙන දේවල් ප්‍රවාහනය කිරීම හරහා. මේ නිසා පෞද්ගලික ආයතන අසීමිත ලෙස ලාභ ලබමින් සිටිනවා. ඒ නිසා තැපැල් දෙපාර්තමේන්තුව සතු සම්පත් කළමනාකරණය කරලා, අපට මේ සම්පත් හරියාකාරව ඒවාට යොදවන්න පුළුවන්කමක් ලැබිලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාවේ සඳහන් වන කාරණාව මත මේ තැපැල්කරුවන්ගේ ස්ථිරවීම අවශ්‍ය වන්නේ ඇයි? මේ සාමාන්‍ය තැපැල්කරුවන් වාගේම මට මතක විධියට මහින්ද විජේසේකර මැතිතුමා තැපැල් ඇමතිවරයාව සිටි වෙලාවේදීද කොහේද වතුකරය සඳහා වෙනම තැපැල්කරුවන් ප්‍රමාණයක් පත් කළා. මොකද, වතුවල ලියුම් බෙදීමක් සිද්ධ වුණේ නැහැ. වතුකරයට ලියුම් බෙදීම කරන තැපැල්කරුවන් ඉතාම දුෂ්කර රාජකාරි සේවයක් කරන්නේ. මේ, තැපැල්කරුවන්ගේ සේවාව ස්ථිරවීම අත්‍යවශ්‍ය වෙලාවක් කියන කාරණාව සිහිපත් කරන ගමන්ම ඒ සඳහා රජයේ තිබෙන යම් සීමා ලිහිල් කරමින් මේ සේවාව රැක ගැනීම සඳහා වන ඒ මැදිහත්වීම වෙන්න කියන කාරණාවත් මේ අවස්ථාවේදී මා සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිරියේදී එන මැතිවරණ කාලයේදී තැපැල් සේවාව ඉතාම අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් වෙනවා. ඒ වාගේම තාක්ෂණය මොන තරම් දියුණු වුණත්, මේ රටේ අහිංසක මිනිස්සුන්ට තවමත් තැපැල ගැන විශ්වාසයක් තිබෙනවා. ඒ නිසා තැපැල් සේවකයන් කරන ඒ කැප කිරීම වෙනුවෙන් ඔවුන්ට ඇගැයීමක් විධියට දීර්ඝ කාලයක් ඒ රැකියාවේ නියුතු අනියම්, ආදේශක එහෙම නැත්නම් දෛනික වැටුප් මත සේවය කරන ඒ තැපැල්කරුවන් ස්ථිර කිරීම සඳහා වන ක්‍රියාමාර්ග වහාම ගන්න කියා ඉල්ලා සිටිමින්, ඒ සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් වූ මේ යෝජනාව තවත් එක් සභාව කල්තැබීමේ යෝජනාවක් බවට පත් නොකර ඒ සඳහා වන මැදිහත්වීම වහාම ලබා දෙන්න කියන කාරණාවත් සිහිපත් කරමින්, මෙම යෝජනාව නැවතත් ස්ථිර කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ශාන්ත බණ්ඩාර රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 6.22]

ගරු ශාන්ත බණ්ඩාර මහතා (ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சாந்த பண்டார - வெகுசன ஊடக இராஜாங்க அமைச்சர்)
Clause 27 of the Bill confers upon the Minister the power to make regulations in order to give effect to the preceding clauses of the bill. It is reproduced below:

27. *(1) The* ***Minister*** *may, for the purpose of* ***giving effect to the principles of this Act, make regulations*** *in respect of any matter which is required by this Act to be prescribed or in respect of which regulations are required or authorized to be made under this Act.*

(2) Every regulation made by the Minister shall be published in the Gazette and shall come into operation on the date of such publication, or on such later date as may be specified in the regulation.

(3) (a) Every regulation made by the Minister shall, within three months after its publication in the Gazette, be brought before Parliament for approval.

(b) Any regulation which is not so approved shall be deemed to be rescinded as from the date of such disapproval, but without prejudice to anything duly done thereunder.

(4) Notification of the date on which a regulation is deemed to be rescinded shall be published in the Gazette.

Under this Clause the power of the Minister is to make regulations for the purpose of giving effect to the principles of this Act. I have already held that the objects of this Bill are inconsistent with the Constitution. Therefore, Clause 27 also becomes inconsistent with the Constitution.

Clause 28

As mentioned in the discussion under Clause 3, this Clause will be in contravention of Article 9 of the Constitution in so far as it would have the effect of superseding any other law, including those Acts of incorporation and regulation of the various Buddhist Chapters in the country.

I have held that the promulgation of this Bill is inconsistent with Article 12 of the Constitution. I also have held that the objects of this Bill in Clause 2 read with Clause 3, Clause 4 would be inconsistent with Articles 9, 10, 12, 14(1)(e) and 27(1)(g) of the Constitution. In the same way, I have also held that Clauses 4, 7 ,17, 18, 25, 26 and 27 are inconsistent with Articles 9, 10, 12(1), 14(1)(e), 14(1)(f), 27(1)(g) of the Constitution. I have held that power being vested in the Council set up under Clauses 5 and 6 read with Clause 7 are inconsistent with Articles 9, 10, 12(1), 14(1)(e), 14(1)(f) and 27(1)(g) of the Constitution. Therefore Clauses 17 and 18 of the Bill which set out the requirement of the office of 'Gender Focal Point' and the provisions in Clauses 8 to 16 and 19 to 24 of the Bill, which are incidental provisions for the existence, management and exercise of powers and duties of the Council are also inconsistent with Articles 9, 10, 12(1), 14(1)(e), 14(1)(f) and 27(1)(g) of the Constitution.

According to Article 4, the fundamental rights is one of the components of the Sovereignty of the People. Article 4(d) not only unequivocally calls upon all the organs of government to respect, secure and advance, the Fundamental Rights which the Constitution has declared and recognized, but also calls upon all the organs of government not to abridge, restrict or deny, save in the manner and to the extent provided in the Constitution. According to Article 3 of the Constitution the sovereignty of the People is inalienable.

I have already held that some of the Articles of the Constitution with which the main provisions of this Bill are inconsistent are Articles 10, 12 and 14 of the Constitution which confer fundamental rights on the citizens of this country. As shown above the fundamental rights are part of the sovereignty of the people of this country. Thus, any derogation of the fundamental rights guaranteed by the Constitution would amount to the derogation of the sovereignty of the people. In terms of Article 4(d) the fundamental rights which are by the Constitution declared and recognised shall be respected, secured and advanced by all the arms of government and shall not be abridged, restricted or denied save in the manner and to the extent provided in the Constitution. That is one of the ways through which the people are entitled to exercise and enjoy their sovereignty. Thus, for the reasons stated in this determination the main provisions of the Bill have also become inconsistent with Article 4 read with Article 3 of the Constitution.

Thus, the objects of the Bill are inconsistent with Articles 3, 4(d), 9 and 10 of the Constitution and they are inseparable from the other provisions of the Bill. This compels us to hold that the Bill as a whole is inconsistent with Articles 3, 4(d), 9 and 10 of the Constitution.

Thus, I determine that the Bill as a whole cannot be enacted into law, unless the appropriate procedure laid down in Articles 83 and/or Article 84 read with Article 80 of the Constitution which requires that the number of votes cast in favour thereof must amount to not less than two-thirds of the whole number of Members of Parliament (including those not present), and is approved by the People at a Referendum.

I place on record our appreciation of the assistance given by the learned Counsel who appeared for the Petitioners, the learned Counsel for the Intervenient Petitioners and the learned Deputy Solicitor General who represented the Hon. Attorney-General, in this proceeding.

JUDGE OF THE SUPREME COURT

YASANTHA KODAGODA, PC, J.

Honourable Justice P. Padman Surasena was pleased to share with me the draft Determination prepared by him relating to the Bill titled 'Gender Equality' published in the Gazette of 17th April 2024 and subsequently placed before the Order Paper of Parliament on 7th May 2024. Having perused the afore-stated draft Determination, I find myself in agreement with the finding reached by Justice P. Padman Surasena, that the Application made by the 1st and the 2nd Intervenient Petitioners in SC SD Petition No. 54/2024 cannot be permitted due to the reasons enumerated in Justice Surasena's draft Determination.

Furthermore, I find myself in agreement with Justice Surasena's finding that, taken as a whole, the Gender Equality Bill is inconsistent with Article 12 of the Constitution read with Articles 3 and 4 of the Constitution. Therefore, I agree with Justice Surasena's finding that the Bill as a whole cannot be enacted into law unless the procedure laid down in Article 83 or 84 of the Constitution read with Article 80 of the Constitution is followed by Parliament and the Bill is approved by not less than two thirds of the whole number of Members of Parliament and subsequently approved by the People at a Referendum.

However, in view of the salient features contained in the afore-stated Bill and due to some of the findings reached by Justice Surasena, it is necessary for me to lay down my own reasons for the afore-stated finding that the Bill as a whole is inconsistent with Article 12 read with Articles 3 and 4 of the Constitution. Therefore, it is to be noted that my agreement with Justice Surasena's draft Determination is only to the extent provided herein.

Prior to a discussion on some of the objectionable features of the Bill, it is necessary for purposes of clarity that I state, that the jurisdiction vested in this Court in terms of Article 121 of the Constitution, is unique in that, its role is not to sanction or condemn the policy underlying a Bill, but to, in terms of Article 123(1) of the Constitution, arrive at a finding and express such finding on whether a Bill or any provision thereof is inconsistent with the Constitution, and if so, state which provision or provisions of the Constitution is inconsistent with the Constitution. It is necessary to place on record that the Constitution has vested discretion in this Court to consider the constitutionality of a Bill as a whole and or to examine and comment on the constitutionality of individual clauses. Thus, for good reason, this Court is under no compulsion to examine and comment on all clauses of a Bill. Particularly where the objectionable clauses go into the very root of the Bill and revision of such clauses would not be feasible unless the entire character of the Bill is changed, then, this Court is entitled to comment on the Bill as a whole.

A consideration of the totality of the clauses of the Bill gives rise to the finding that the overall underlying objective of the enactment of the Bill is to ensure and provide for gender equality and women's empowerment. It is necessary to observe that policy makers appear to have taken cognisance of the need to ensure that all persons of this country independent of or notwithstanding their 'sex' and their 'gender' are treated equally before the law and are accorded equal protection of the law.

The Black's Law Dictionary, 11th Edition provides that, 'sex' means the sum of the peculiarities of structure and function that distinguish a male from a female organism. Thus, 'sex' is a natural inheritance of a human being. While both the Black's Law Dictionary (11th Edition) and the Merriam – Webster's Dictionary of Law (1996 Edition) do not provide a definition of the term 'gender', the Oxford English Dictionary provides that, contextually 'gender' means 'the state of being male or female (chiefly in cultural or social contexts)'. While the term 'gender' is not interpreted in the Bill, the term 'gender identity' has been interpreted as 'the cultural, economic, social and political characteristics, role and opportunities through which women, men and others are socially constructed and valued'. In contemporary usage, it is well accepted that 'gender' means the male sex or the female sex, especially when considered with reference to social and cultural differences rather than biological ones, or one of a range of other identities that do not correspond to established ideas of being a male or a female. These identities have acquired the nomenclature of lesbian, gay, bisexual, transgender, intersex, queer / questioning, a-sexual and many other terms (such as non-binary and pansexual). During the hearing, learned counsel submitted that, these identities are continuing to evolve, and newer identities are emerging. Therefore, it is necessary to recognise that the term 'sex' found in Article 12(2) of the Constitution, cannot by any interpretation be recognised in the eyes of the law, as now meaning both the conventional term 'sex' and the term 'gender' which is of more recent origin.

Ensuring equal protection of the law to persons of all genders and gender identities is in consonance with Article 12(1) of the Constitution which reflects a core value contained in the Constitution of the Democratic Socialist Republic of Sri Lanka. All persons are equal before the law and are entitled to the equal protection of the law. By no stretch of argument can one advance the proposition that 'persons' as contained in Article 12(1) of the Constitution would mean only the male and the female sexes. Indeed, irrespective of a person's gender identity, every human being must be recognised as a 'person'. Therefore, there is nothing inconsistent in the afore-stated underlying policy *vis a vis* Article 12(1) of the Constitution. In fact, given matters on public record, it is necessary for me to observe that, indeed, developing a legislative framework to give effect to gender equality and women's empowerment in public affairs is salutary and is in furtherance of the core values contained in the Constitution.

However, in my view, what the Bill indirectly seeks to do is to amend Article 12(2) of the Constitution by ensuring that no citizen shall be discriminated against on the ground of 'gender' or 'gender identity'. That is with the view to prevent even a reasonable classification on the ground of gender or gender identity to justify differential treatment. As pointed out by Mr. Manohara De Silva, PC who appeared for the Petitioners in SC SD 54/2024, what the Bill as a whole proposes to do, is to elevate the protection given to persons of different gender identities to protection beyond what is provided by Article 12(1) of the Constitution, and provide protection accorded under Article 12(2) of the Constitution. While it is not the role of this Court to comment on the merits or otherwise of that policy of elevating the degree of protection, it is necessary to point out that realisation of that policy through the enactment of the Bill amounts to an amendment to Article 12(2) of the Constitution. The proposed Bill is an attempt to amend Article 12(2) of the Constitution by substituting the term 'sex' with the term 'sex and gender'. This may be due to well-founded reasons pertaining to the need to respect equality independent of or notwithstanding the gender or gender identity of a person. However, that is not a process that can be given effect to by an ordinary Bill. The desired result can only be achieved by enacting an 'Amendment to the Constitution' which amends Article 12(2) of the Constitution in the afore-stated manner. That therefore is one objectionable feature in the Bill.

Another objectionable feature is the desire on the part of the drafters of the Bill to provide for a legislative framework that would empower the Gender Equality Council (to be established in terms of clause 5 of the Bill) to regulate and thereby interfere with the functioning of 'private institutions' (which would include sole proprietorships which comes within the corresponding definition of the Bill) in the realm of gender equality and empowerment of women. Justice Surasena in his draft Determination has explained in detail as to how that proposed mechanism would have an impact on private religious and educational institutions. I need to add that the same mechanism can have an adverse impact on the exercise of fundamental rights recognised under Article 10 of the Constitution. If for instance, through the legislative mechanism encapsulated in the Bill, the Gender Equality Council directs a person running a private institution to select for employment a particular number of individuals who are of a particular gender identity, that direction may be an infringement of that person's right to freedom of thought, conscience and religion. This same principle would apply to religious institutions including but not limited to those of the Buddha Sasana (which has the protection afforded by Article 9 of the Constitution). If a particular religious institution which is managed with private resources which nevertheless comes within the definition of a 'private institution' is inclined to accept to its fold, only persons of a particular sex or a particular gender identity, directing such an institution to admit to its fold persons belonging to the other sex or other gender identities would infringe Article 10 read with Articles 14(1)(b), (c) and (e) of the Constitution.

In terms of the core values contained in the Constitution of this country, there is limited opportunity afforded to the state to interfere with the functioning of private institutions which may include sole proprietorships and religious institutions. While the state is entitled in terms of the Constitution to entertain a policy for the protection of gender equality and women's empowerment, and give effect to such policy through organs of the state, the state cannot compel private institutions to adhere to such policy, unless they on their own volition opt to adopt such policy. That would be an infringement of the fundamental rights recognised by the Constitution.

Article 3 of the Constitution provides that in the Republic of Sri Lanka sovereignty is in the People and is inalienable. Furthermore, it provides that Sovereignty includes the powers of government, fundamental rights and the franchise. Read with Articles 10 and 14 of the Constitution, the component of sovereignty referred to as fundamental rights as contained in Article 4(d) of the Constitution would include the fundamental right to engage in religious activities and lawful private businesses or entrepreneurial activities. Therefore, an intrusion into the exercise of such rights which is not within the scope of Article 15 would amount to an intrusion into the Sovereignty of the People. It is on that premise that I subscribe to the view of Justice Surasena that the enactment of this Bill would require not only approval by Parliament by a simple majority or by a special majority, but approval by the People at a Referendum as provided by Article 83 of the Constitution as well.

I must mention that, a consideration of the totality of the clauses of the Bill discloses the fact that, in its present form of formulation, the provisions of the Bill relating to 'gender equality'

are inseparable from the provisions relating to 'women's empowerment'. Therefore, it is not possible to permit only the enactment of the provisions of the Bill pertaining to the empowerment of women.

In the circumstances, subject to the foregoing, I find myself in agreement with the draft Determination of Justice Padman Surasena.

JUDGE OF THE SUPREME COURT

KUMUDINI WICKREMASINGHE J.

I have had the opportunity to peruse the determinations of Justice P. Padman Surasena and Justice Yasantha Kodagoda, PC, above. For the reasons set out therein, I am in agreement with the determinations that the Bill as a whole cannot be enacted into law, unless the appropriate procedure laid down in Articles 83 and/or Article 84 read with Article 80 of the Constitution which requires that the number of votes cast in favour thereof must amount to not less than two-thirds of the whole number of Members of Parliament (including those not present), and is approved by the People at a Referendum.

JUDGE OF THE SUPREME COURT

II

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්

சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள்

LEGISLATIVE STANDING COMMITTEE: ADDITIONAL MEMBERS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ)" පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළ වන මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් මවිසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටෙගොඩ මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

"දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)" පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට ගරු ජගත් සමරවික්‍රම මහතා අතිරේක සාමාජිකයෙකු වශයෙන් මවිසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

III

වරප්‍රසාද: නොගෙවූ විදුලි බිල්පත් පිළිබඳ රංජන් ජයලාල් මහතා කළ අසත්‍ය ප්‍රකාශය

சிறப்புரிமை: செலுத்தப்படாத மின் கட்டணப் பட்டியல் தொடர்பான திரு. ரஞ்சன் ஜயலாலினது தவறான கூற்று

PRIVILEGE: FALSE STATEMENT MADE BY MR. RANJAN JAYALAL REGARDING UNPAID ELECTRICITY BILLS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා විසින් 2024 මාර්තු 21 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

IV

වරප්‍රසාද: ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර ඇති SC/FRA/131/23 දරන පෙත්සම

சிறப்புரிமை: உயர் நீதிமன்றுக்குச் சமர்ப்பிக்கப்பட்ட SC/FRA/131/23ஆம் மனு

PRIVILEGE: PETITION SUBMITTED TO SUPREME COURT UNDER SC/FRA/131/23

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ලලිත් වර්ණ කුමාර මහතා විසින් 2024 අප්‍රේල් 01 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරමි.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

මෙම පරිපූරක ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2023 වර්ෂය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2023 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(v) 2023 වර්ෂය සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(vi) 2023 වර්ෂය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා මොනරාගල, හම්බන්තොට සහ වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වාර්ෂික කාර්ය සාධන වාර්තා.

මෙම වාර්තා විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව;

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව; සහ

(iii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මැතිවරණ කොමිෂන් සභාව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

2023 අංක 34 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2024.04.05 සිට 2024.04.30 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ සංවර්ධන වැඩසටහන සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන.- [අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
සභාපීඨයේ තබා තිබිය යුතු බවට නියෝග කරන ලදී.
Ordered to lie upon the Table.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගැනිණි.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124(6) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පෙරේදා නීතිපතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේදී කිව්වා, මින් ඉදිරියට මැතිවරණ කොමිසම වෙනුවෙන් පෙනී හිටින්නේ නැහැ, මොකද, ඒ අය හරියාකාරව රාජකාරි කරලා නැහැ කියලා.

පෙරේදා අග්‍ර විනිශ්චයකාරතුමා කිව්වා, මැතිවරණ පැවැත්වීමේ බලය තිබෙන්නේ පැහැදිලිවම මැතිවරණ කොමිසමට කියලා. ඒකත් හරියට ඉෂ්ට කරලා නැහැ කිව්වා. මැතිවරණ කොමිසමට හැම පැත්තෙන්ම චෝදනා එනවා. පාර්ලිමේන්තුවක් හැටියට අපි ඒ ගැන විමසිලිමත් වෙන්න ඕනෑ. නීතිපතිතුමා කියනවා මින් ඉදිරියට මැතිවරණ කොමිසම වෙනුවෙන් පෙනී හිටින්නේ නැහැ කියලා. අග්‍ර විනිශ්චයකාරතුමා කියනවා මැතිවරණ පවත්වන්න බලය තිබෙන්නේ මැතිවරණ කොමිසමට කියලා. කෙසේ හෝ මැතිවරණය පවත්වන්න ඕනෑ කියන එක තමයි,- *[බාධා කිරීමක්]* ඔබතුමා තරහා වෙන්න එපා, පොඩ්ඩක් ඉන්න. ඔබතුමාට හදිසි වුණාට මට හදිසි නැහැ. මම කියන්නේ මේකයි.

අනික් කාරණය මෙයයි. පසුගිය අවස්ථාවක මැතිවරණ කොමිසමේ නිලධාරීන්ට ආණ්ඩුකාර පත්වීම් දුන්නා. එහෙම ලබා දුන් එක පත්වීමක් තමයි, උතුරේ ආණ්ඩුකාර ධුරය. මේ විධියට තමයි මැතිවරණ කොමිසමේ අය කටයුතු කරලා තිබෙන්නේ. එක පැත්තකින් නොවෙයි, හතර පැත්තකින්ම කොමිසමට චෝදනා. ඉදිරියේදී ජනාධිපතිවරණයක් එනවා. ඒකයි මම මේ කාරණය ඉදිරිපත් කළේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම යටතේ, ගරු සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා.

ගරු හරින් ප්‍රනාන්දු මහතා (සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஹரின் பர்னாந்து - சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சரும் விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சரும்)
(The Hon. Harin Fernando - Minister of Tourism and Lands and Minister of Sports and Youth Affairs)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා යොවුන් සේනාංකයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

මෙම වාර්තාව ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාරක සභා වාර්තා පිළිගැන්වීම යටතේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කිරීම, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන්නම්. නමුත්, ඊට කලින් වැදගත් කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමතියි. මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති තනතුර භාර ගත්තේ අතිවිශාල ගැටලු, අභියෝග කිහිපයක් ජයග්‍රහණය කරමින්.

මේ පාර්ලිමේන්තු කාරක සභාවෙන් මා දෙවරක් ඉවත් කළා. තුන්වැනි වර ගරු විපක්ෂ නායකතුමාගේ දැඩි ඉල්ලීම මත මෙතැන සටන් කරලා, සති ගණනක් සභාපති කෙනෙක් නැතිව ඉඳලා තමයි සභාපති වශයෙන් මා පත් කළේ. මට මේකෙන් වරප්‍රසාදයක් ලැබෙන්නේ නැහැ. මගේ wifeගෙන් ඇහුවොත් කියයි, මම නිදාගන්නේ පාන්දර 2.45ට, 3.00ට. මට office එකක් නැහැ, Analystsලා තුන්දෙනෙක් එක්ක තමයි වැඩ කරන්නේ. ඒ ඔක්කෝම එක්ක ඒ වැඩකටයුතු කරනකොට යම්කිසි ගරුත්වයක් තිබෙන්න ඕනෑ. මොකද, අපි ඔක්කෝම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමාට තවම staff එකක් නැද්ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
තවම staff එකක් නැහැ. Analystsලා තුන්දෙනායි ඉන්නේ. ඒ අයටත් පඩි ගෙවන්න විධියක් නැහැ. කොහොම හරි ඒ උදවු කරන කෙනෙකුට පඩි ගෙවන්න කියලා මම වදින්න ඕනෑ. එහෙමයි ඒ වැඩ ටික කරගෙන යන්නේ. මට එක staff analyst කෙනෙක්වත් නැහැ. හැම මුදල් පනතක්ම අපි විශ්ලේෂණය කරන්න ඕනෑ. ඒ හැම එකකටම ගහගන්න ඕනෑ, මරා ගන්න ඕනෑ. ඉතින්, මොකක්ද මේ කාරක සභාවේ තත්ත්වය? ඇයි මම මේක කරන්නේ? මෙහෙම ගියොත්, මගේ blood pressure එක වැඩිවෙලා මැරෙන්න තමයි වෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්වර කේන්ති ගන්න එපා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එතුමාට staff එකක් දෙන්නකෝ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට විශාල කාර්යභාරයක් පැවරිලා තිබෙනවා. වර්තමාන ජනාධිපතිතුමා අගමැති වෙලා ඉන්නකොට තමයි ස්ථාවර නියෝග යටතේ ඒ කමිටුව අලුතින් නිර්මාණය කළේ. ඒකේ වැදගත්කම අපට ඉතා දැඩිව දැනෙනවා, මේ වාගේ ආර්ථික ප්‍රශ්නයක් තිබෙන වෙලාවක. ඒ නිසා මීළඟට පවත්වනු ලබන - ලබන සතියේ වෙන්න පුළුවන්- කමිටුවට අපි අදාළ කරුණු ටික ඉදිරිපත් කරලා මේ ගැන විශේෂයෙන්ම සලකා බලමු. කිරිඇල්ල මැතිතුමාත් ගරු සභාවේ ඉන්නවා. කවුරු පාලනයේ හිටියත්, කවුරු විපක්ෂයේ හිටියත් මේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ කටයුතු කාර්යක්ෂමව කරගෙන යෑමට අවශ්‍ය සම්පත් ටික ලබා දෙන්න ඕනෑ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. මට කියන්න දෙන්න. සමහර වෙලාවට මට අතින් පඩි ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. මම කොහොම ද ඒක කරන්නේ? *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. ගරු කථානායකතුමාට මම කියන්න කැමැතියි, මේ සභාපතිකම ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් කරලා ගත්ත දෙයක් බව. උදාහරණ කිහිපයක් ගත්තොත්, පළමුවෙනි පාර මා එළවන්න හේතුව තමයි, ගල් අහුරු ප්‍රශ්නය. ඒ ප්‍රශ්නය හින්දා පළමුවෙනි පාර මාව එළෙව්වා. ගරු කථානායකතුමා ඒක හොඳටම දන්නවා. එදා ඒ ගල් අහුරු ගත්තා නම් අද ගෙවන්න සිද්ධ වන ප්‍රමාණය කියන්න. ඩොලර් 300 ගණනකට ද කොහේද තමයි ගල් අහුරු මිලදී ගන්න ගියේ, අවුරුදු ගණනකට. අපි මැදිහත්වෙලා ඒක නැවැත්තුවා. ඒ නිසා අපට පුළුවන් වුණා විශාල වංචාවක් නවත්වන්න, ගරු කථානායකතුමනි.

දෙවෙනි වතාවේ මාව පන්නන්න හේතුව මේකයි. මේ කට්ටිය Waters Edge එකට එක්ක ගෙන ගිහිල්ලා කථා කරන්න කිව්වා, ඇයි අපි බංකොලොත් වෙන්න කලින් IMF Programme එකට, එහෙම නැත්නම් ප්‍රතිසංස්කරණවලට යා යුත්තේ කියලා. ඒකට මේ කට්ටිය බස් එකේ දමා ගෙන ගියා කියලා මෙතැන මට විරුද්ධව වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළා, පාර්ලිමේන්තුවේ මුදල් අවභාවිත කරලා බස් එකක ඒ අය ගෙනිව්වා කියලා. ඒ අය බස් එකේ ගෙනිව්වේ පෙට්‍රල් ගණන් නිසායි. හැමෝම වාහන කීපයක යනවාට වඩා බස් එකේ යන එක හොඳ නිසා.

ඊට පස්සේ, Casino Regulator කෙනෙක් නැති නිසා අපි ඒවාට licence දෙන්න බැහැ කිව්වා. ඒ ගැන දැන් දන්නවා. ඒ සම්බන්ධ වාර්තාව තමයි දැන් ඉදිරිපත් කරන්නේ.

ඊළඟට, Value Added Tax එක. සෞඛ්‍යයට, කෘෂිකර්මයට VAT ගහන එකට විරුද්ධව අපි දැඩිව පෙනී සිටියා. ඒ වාගේ ගොඩක් ඒවා තිබෙනවා. නමුත්, මම උදාහරණ දෙකයි තුනයි කියන්නේ. PickMe එකට සහ Uber එකට වෙන වෙනම tax ගහනවා, ඒක අසාධාරණයි කියලා කවුද කථා කළේ? රජයේ මුදල් පිළිබඳ කමිටුවෙන් - අපේ කමිටුවෙන් - ඒ ගැන කථා කළේ. නමුත්, තවම ඒක වෙනස් කළේ නැහැ. නමුත් අපි දිගින් දිගටම මේ ගැන කථා කරනවා. කිරි පිටි මිල වැඩි කරන්න ගියාම අපි ඇහුවා ඇයි, මිල වැඩි කරන්නේ, කෝ, formula එක කියලා. ඊට පස්සේ රුපියල් 350කින් ද කොහේද කිරි පිටි මිල අඩු කළා.

ඊළඟට, සීනි වංචාව පිළිබඳවත් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් තමයි දිගින් දිගටම කථා කළේ.

ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාත් දන්නවා, අපි ඉස්සෙල්ලාම මේ කාරණය කථා කළේ පරණ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී කියලා.

ඊට පස්සේ මහ බැංකුවේ පඩි වැඩි කිරීම සම්බන්ධ ගැටලුව ගැන කථා කළා. ඒ විධියේ මහා අමාරු ප්‍රශ්නවලට මා මැදි වුණා. එතකොට කවුරුත් මා වෙනුවෙන් පෙනී සිටියේ නැහැ. එකපාරක් ණය ප්‍රතිව්‍යුහගත කරන්න ගිය වෙලාවේ ගරු විපක්ෂ නායකතුමා මේ කාරක සභාවට එන්න අවසර ඉල්ලුවා. මේ පාර්ලිමේන්තුවේ සමහරු ඒකට අවසර දුන්නේ නැහැ. ඒක කොච්චර කැත වැඩක්ද? විපක්ෂ නායකවරයාට තිබෙන්න ඕනෑ ඒ අයිතිය. අන්තිමට ඒකට මාත් මැදි වුණා.

ඊට පස්සේ ඊයේ-පෙරේදා ගෙනෙන්න ගියා, ක්ෂුද්‍ර මූල්‍ය සම්බන්ධයෙන් වන පනත. ඒ පනත ගෙනාවා නම් තිබ්බිව ප්‍රශ්නය තවත් උග්‍ර වෙනවා. අපි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් පෙන්වා දීපු නිසා ඒක හකුළා ගත්තා. ඒකට අලුත් පනතක් ගෙනෙනවා කියලා කිව්වා. PAYE Tax එක සියයට 24කට අඩු කරන්න පුළුවන් surcharge එකක් කියලා අපි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් ගණන හදලා මේ පාර්ලිමේන්තුවේ සභාගත කළා. මේ වාගේ නොයෙකුත් දේවල් අපි කරලා තිබෙනවා.

තව කටයුත්තක් අපි කරලා තිබෙනවා. වරාය නගරයට නීති හදන්න අයිතියක් තිබෙනවා කියලා ඒ ගොල්ලෝ duty-free shop එකක් දමන්න යෝජනාවක් ගෙනාවා. එතැනදි අපි විතරයි නැඟිටලා කිව්වේ "ඔහේලාට ඔය අයිතිය නැහැ. අයිතිය තිබෙන්නේ පාර්ලිමේන්තුවට" කියලා. ඊට පස්සේ ඒ ගොල්ලෝ ඒක හකුළා ගත්තා. දැන් ඒ යෝජනාව පාර්ලිමේන්තුවට අලුතින් ගේනවා ලු. අපි මේ වාගේ ගොඩක් දේවල් කළා.

ගරු කථානායකතුමනි, අවසානයේ වීසා ප්‍රශ්නය පිළිබඳවත් සාකච්ඡාවක් කරන්න අපි පටන් ගත්තා. නමුත් අපිට ඒක හරියට කරගෙන යන්න හැකියාවක් ලැබුණේ නැහැ. ඒ ගැන අතිශයින් මම කනගාටු වෙනවා. ඒකට අතිශයින් බලපෑම් සිද්ධ වුණා. වෘත්තීමය තත්ත්වය සම්පූර්ණයෙන්ම විහිළුවක් බවට පත් වුණා. මා දැඩි අපහසුතාවට පත් වුණා. යම් සාමාජිකයෝ, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය කමිටුවට බලෙන් කැඳෙව්වා. කමිටුවේ සභාපති හැටියට මම කිව්වා, "එහෙම කරන්න එපා. මට දෙන්න ඒ ගරුත්වය. මම තීරණය කරන්නම්" කියලා. එතුමියගෙන් ඒ ගැන අහන්න. මහ ලේකම්තුමියත් කමිටුවට කැඳෙව්වා.

එතුමිය මේ පාර්ලිමේන්තුවේ administration සම්බන්ධ ප්‍රධානියා. මොකක් හරි ගැටලුවක් තිබෙනවා නම් සාකච්ඡා කර ගන්න අපට පුළුවන්. ඕනෑ නම් මා මේ තනතුරෙන් පන්නන්න. මට ප්‍රශ්නයක් නැහැ. අත්සන් වගයක් ගත්තා ලු, මාව එළවන්න. මම යන්නම්. එතකොට මට වෙලාවට නිදා ගන්න හරි පුළුවන්. මගේ ආතතියත් අඩු වෙනවා. හැබැයි, මම මේවා කරන්නේ සද්භාවයෙන්. විපක්ෂය වෙනුවෙන් ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා තමයි මගේ නම යෝජනා කළේ. විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකමතික යෝජනාව අනුව තමයි මම මේ තනතුරට පත් වෙලා ඉන්නේ. මා ඕනෑ නැත්නම් කියන්න. මම යන්නම්. හැබැයි, මම ඉන්න කල් හැම දේම හොයනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒක හරි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම ඉන්නකල් හැම දේම හොයනවා. ඕනෑ නම් මාව පන්නන්න. දෙකෙන් එකක් ගරු කථානායකතුමා තීරණය කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අපි එතුමාට සම්පූර්ණ සහයෝගය දෙනවා. මේක ඉතාම දුෂ්කර කාර්යයක්. අපි ඒක පිළිගන්න ඕනෑ. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමනි, මා නිතන විධියට, ඔබතුමාව පන්නා ගන්න කාටවත් ඕනෑ නැහැ. මන්දා, මට නම් එහෙම ඕනෑකමක් නැහැ. මොකද, ඔබතුමා ආර්ථික විද්‍යාව විෂය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් තිබෙන කෙනෙක්. ඔබතුමා researches කරනවා. මේ සඳහා ඔබතුමාට හොඳ සූදානමක් තිබෙනවා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට අවශ්‍ය වන්නේ එවැනි සාමාජිකයන්. ඒ නිසා අපේ සම්පූර්ණ සහයෝගය තිබෙනවා. ඔබතුමා පැන්නීමේ අදහසක් ගැන මම නම් දන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, ඔබතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන්න.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත යටතේ නියෝගය;

(ii) 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත යටතේ නියමය; සහ

(iii) 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ නිවේදනය

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, අස්වැසුම වැඩසටහනේ මුදල් ගෙවන එක නැවතිලා තිබෙනවා, 2023 දෙසැම්බර් 31වැනි දා ඉඳලා සහ 2024 මාර්තු 31වැනි දා ඉඳලා.

ගරු කථානායකතුමනි, කාණ්ඩ දෙකක් යටතේ අස්වැසුම දීමනාව ගෙව්වා. ගෙවපු රුපියල් 2,500 රුපියල් 5,000 කරලා,

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ගෙවපු රුපියල් 5,000 ඒ හැටියටම වහාම ලබා දෙන්න අපේ කාරක සභාව තීරණය කළා. එම ප්‍රතිලාභීන්ට ලබන සතියේ ඉඳලා එම දීමනාව දෙන්න පුළුවන් වෙයි. අනෙක් කාණ්ඩ දෙක වන දුප්පත් පවුලකට රුපියල් 8,500ක් සහ අන්ත දිළිඳු පවුලකට රුපියල් 15,000ක් වන දීමනා ගෙවීම 2026 වන කල් දීර්ඝ කරලා තිබෙනවා. එතැනදී නැවතත් මතු වෙච්ච ගැටලුව තමයි සංගණනයක් නැතිව එය කරන්න බැහැ කියන එක. ගරු විපක්ෂ නායකතුමා තමයි දිගින් දිගටම ඒ කාරණය ඉදිරිපත් කළේ. ඒ නිලධාරිනුත් එය දැඩිව පිළිගන්නවා. ඔවුන් කිව්වා, "සංගණනය පටන් අරගෙනයි තිබෙන්නේ. ගැටලු ගොඩක් තිබෙනවා. ඒ නිසා ඒ ගැටලු විසඳ ගන්න ඕනෑ" කියලා. ඒ, පළමු කාරණාව.

දෙවැනි කාරණාව තමයි, කැසිනෝ. එය බරපතළ ප්‍රශ්නයක්, ගරු කථානායකතුමනි. ඒ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට ලියුමක් ලියන්න කියලා මම ඊයේ අපේ ලේකම් කාර්යාලයට දැනුම් දුන්නා. කැසිනෝ තිබෙන නමුත් නියාමනයක් නැහැ. නියාමනයක් නැතුව කැසිනෝ පවත්වාගෙන යන්න බැහැ. ඒ licence fee එක බිලියන 5 සිට බිලියන 10 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒක හොඳයි. රජයට ලැබෙන මුදල් නවත්වන්න අපට කිසිම ඕනෑකමක් නැහැ. හැබැයි, නියාමනයක් තිබෙන්න ඕනෑ. උදාහරණයක් කියන්නම්, ගරු කථානායකතුමනි. මම මේ කියන්න යන කථාව ඇහුවාම ඔබතුමා පුදුම වෙයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කැසිනෝ පිළිබඳව කටයුතු කරන ප්‍රධාන නිලධාරිනිය ඇවිල්ලා හිටියා අපේ කාරක සභාවට. අපි එතුමියගෙන් ඇහුවා, දැන් ඒ බදු එකතු කරනවාද කියලා. එතකොට එතුමිය කිව්වා, "ඔව් එකතු කරනවා. ඔක්කෝම බදු වෙලාවට ගෙවලා තිබෙන්නේ. එක ආයතනයක් නඩුවක් දාලා තිබෙනවා. ඒක අපට අදාළ නැහැ. ඒක නඩුවෙන් බේරා ගනියි. අනෙක් අය ගෙවලා තිබෙන්නේ. දැන් ගෙවනවා. හැබැයි, ඒ බදු ගෙවන්නේ ඔවුන් ඉදිරිපත් කරන voluntary disclosures අනුවයි" කියලා. ඊළඟට අපි ඇහුවා, - මම විතරක් නොවෙයි, අපේ කාරක සභාවේ සියලුදෙනා ඇහුවා - online casinos ගැන. එතකොට එතුමිය කියනවා, online casinos ලංකාවේ නැහැ කියලා.

ඊට පසුව අපි Google කරලා බැලුවාම ලංකාවේ ඕනෑ තරම් online casinos තිබෙනවා. එතකොට සමහරු කිව්වා, මේක ලංකාවෙන් පිටත වෙන්නේ කියලා. එතකොට අපි පෙන්නුවා ලංකාව ඇතුළේ online casinos තිබෙනවා කියලා. ඒවාට නොමිමර තිබෙනවා, links තිබෙනවා. ඒ ඔක්කොම තිබෙනවා. නමුත් එතුමිය දන්නේ නැහැ කිව්වා. එතුමියට ඉහළින් ඉන්න Senior Commissioner කිව්වා, "ඔව්, ඔව්. තිබෙනවා. හැබැයි, දීලා තිබෙන licence එකේ පිටුපස online casinos කරන්න බැහැ කියලා ගහලා තිබෙනවා. ඒත් online casinos කරනවා" කියලා. එතකොට අපි ඇහුවා, එහෙම නම් මොකක්ද ඒකට කරන්නේ කියලා. නමුත් මොකුත් කරන්නේ නැහැ. මොකක්ද මේක? කොහොමද මෙහෙම කරන්නේ? අපට තීන්දු ගන්න බලයක් නැහැ. ඒ නිසා මේ පිළිබඳව වහාම සොයා බලන්න කියලා මුදල් ඇමතිවරයා වන ගරු ජනාධිපතිතුමාට ඊයේම ලිපියක් යවන්න කියලා අපි direct කළා. එක්කෝ මේවා legalize කරන්න, එහෙම නැත්නම් මේවා illegal කරන්න. ඒ දෙකෙන් එකක් කරන්න. මොකද, රජයට එන්න තිබෙන බදු ලැබෙන්නේ නැහැ. ඒ අයගෙන් කෝටි ප්‍රකෝටි ගණන් බදු ගන්නේ නැතිව අභිංසක මිනිහාට සියයට 36ක බද්දක් ගහනවා. PAYE Tax එක සියයට 36ක් ගහලා තිබෙනවා. කිරිපිට්ටුවලට බදු ගහනවා. අනෙක් හැම දෙයකටම බදු ගහනවා. ඒ නිසා මේ ගැටලුව වහාම නිරාකරණය කර ගන්න කියලා මම කියනවා. ගරු මුදල් රාජ්‍ය ඇමතිවරු දෙදෙනාම දැන් මේ ගරු සභාවේ ඉන්නවා. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා දෙපළගේම අවධානය යොමු කරන්න කියා මම කියනවා. මේ ගැන තීරණයක් අදම ගන්න. මේක මෙහෙම වෙන්න දෙන්න එපා. මේක හරිම අසාධාරණයි. හිතන්න ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමනි, ඔහු අපට කිව්වා - ඒ කමිටුවේ verbatim එක තිබෙනවා - "ඔව්. licence එකේ පිටුපස ගහලා තිබෙනවා online casinos කරන්න බැහැ කියලා. හැබැයි, online කරනවා. නමුත් අපට කරන්න දෙයක් නැහැ" කියලා. මේකට නීතියක් නැහැ. ඒ නීතිය ගේනවා කියලා මේ පාර්ලිමේන්තුවේ පොරොන්දු වුණේ කවදා ද? අද වනකල් ඒ නීතිය ගෙනැල්ලා නැහැ. මාර්තු 31වැනි දා ගේනවාමයි කිව්වා. හැබැයි, ගෙනාවේ නැහැ.

ඊයේ මහ බැංකුවේ Financial Intelligence Unit එකේ අය ඇවිල්ලා හිටියා. ඔවුන්ට මගේ ගරුත්වය පිරිනමනවා. ඔවුන් කිව්වා, අපි මේ ගොල්ලන්ගේ draft එක බැලුවා, AG approve කරලා තිබෙන draft එකත් බැලුවා කියලා. හැබැයි, ඒකේ මහ විශාල ප්‍රශ්න ගොඩක් තිබෙනවා. මොකද, ඒකේ හිල් ගොඩක් තිබෙනවා. ඒ නිසා මෙතැන money launderingවලට, terrorism financingවලට ඕනෑ තරම් ඉඩ තිබෙනවා. ඒ නිසා අපි කිව්වා, මේක ගොඩක් වෙනස් වෙන්න ඕනෑ කියලා. ඒ නිසා ඒ අය තව කාලයක් ඉල්ලුවා. අපි ඒ කාලය ලබා දුන්නා, ගරු ඇමතිතුමා. නමුත් මේ කටයුතුවල ඉවරයක් වෙන්න ඕනෑ කියන එක තමයි අපේ කාරක සභාව දැඩි ලෙස ගරු ජනාධිපතිතුමාට එතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටියේ.

ඔන්න ඔය කාරණා දෙක තමයි අපි අද සභාගත කරන්නේ.

බොහොම ස්තුතියි.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු ඩී. වීරසිංහ මහතා
(மாண்புமிகு டீ. வீரசிங்க)
(The Hon. D. Weerasingha)

ගරු කථානායකතුමනි, ආහාර සුරක්ෂිතතාව සහ කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද සත්ව සුඛසාධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙය දීර්ඝ කාලයක් තිස්සේ නොයෙක් අවස්ථාවල සාකච්ඡා කරපු, මිනිස්සුන්ගේ සහ සත්වයන්ගේ -දෙගොල්ලන්ගේම- අයිතිවාසිකම් ආරක්ෂා වෙන පරිදි සකස් කරන ලද පනත් කෙටුම්පතක්, ගරු කථානායකතුමනි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමාගේත් අවසරය ඇතිව මේ අවස්ථාවේ මම කරුණු දෙකක් ඉදිරිපත් කරන්න කැමැතියි. විශේෂයෙන්ම පළමුවෙන්ම මම හිතන්නේ මේ පාර්ලිමේන්තුවේ අප සියලුදෙනාගේම ගරුත්වය ඇයට හිමි වෙන්නට ඕනෑ. ඇය තමයි පාදුක්ක, වග ඉරිදා පොළ ප්‍රදේශයේ ඇති වුණු මහා ගං වතුර තත්ත්වයට හසුවුණු අඹු සැමි යුවලක් බේරා ගන්නට ඉදිරිපත් වුණු චරිත්මා ජිනේන්ද්‍රී මාඉටිපේ දියණිය. ඇය 17 හැවිරිදි දැරියක්. පාදුක්ක සිරි පියරතන විදුහලේ ඇය ඉගෙනුම ලබන්නේ.

වග ඉරිදා පොළ ආසන්නයේ තිබෙන වක් ඔයේ ප්‍රචණ්ඩ සැඩ පහරට ලක් වුණු අඹු සැමි යුවලක් පිහිනා ගොස් බේරා ගන්නට ඒ දැරිය සමත් වුණා. අපේ රටේ ගෞරව නාම, අනෙක් හැම දේම ලැබෙන්නේ වැඩිහිටි අයට. නමුත් 17 හැවිරිදි පාසල් දැරියක් කළ ඒ වීර ක්‍රියාවට මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනාගේම ගරුත්වය හිමි විය යුතුයි.

ඒ වාගේම චරිත්මා ජීනේන්ද්‍රි දැරියගේ සියලු දේවල් ගං වතුර නිසා අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා පුළුවන් නම් ඒ දැරියට ජනාධිපති අරමුදලින් යම් කිසි ආධාරයක් ලබා දීම අපේ යුතුකමක්. මොකද, ඒ තරම් වීරෝදාර ක්‍රියාවකට ඒ දැරිය හවුල් වුණා; නායකත්වය දුන්නා; ජීවිත දෙකක් බේරා ගත්තා. ඒ නිසා ඇයට පාර්ලිමේන්තුවේ අප සියලුදෙනාම භේදයකින් තොරව ප්‍රණාමය පුද කළ යුතුයි කියලා මම යෝජනා කරනවා.

දෙවැනි කාරණාව මේකයි, ගරු කථානායකතුමනි. මම මේ විගණන වාර්තාවකින් උපුටා දක්වන්නේ. බැක්ටීරියා මඟින් ඇති වන ආසාදනවලට භාවිත කරන meropenem එන්නත රෝහල් පද්ධතියේ සහ වෛද්‍ය සැපයුම් අංශයේ ප්‍රමාණවත් තරම් තිබියදීත්, හදිසි මිලදී ගැනීම් යටතේ එන්නත් කුප්පි 450,000ක් මිලදී ගන්නට රජය වැය කරලා තිබෙනවා, රුපියල් 368,955,000ක්. ඇත්ත වශයෙන්ම ඒ එන්නත් කුප්පියක් සාමාන්‍ය ඇණවුම් යටතේ ලබා ගන්න පුළුවන්, රුපියල් 1,075.60කට.

හැබැයි, එන්නත් කුප්පියක් මිලදී ගෙන තිබෙන්නේ රුපියල් 1895.50කට. මේ එන්නත් ඖෂධ තොග තිබියදීත් - ඇත්ත වශයෙන්ම ඒ ඇණවුම කරන අවස්ථාවේ දීත් එන්නත් තිබිලා තිබෙනවා, කුප්පි 488,590ක්. විශේෂයෙන්ම එන්නත් කුප්පි මෙච්චර ප්‍රමාණයක් වෛද්‍ය සැපයුම් අංශයේ සහ රෝහල් පද්ධතියේ තිබුණු බවට විගණනය ඔප්පු කරලා තිබෙනවා. කුප්පි 488,590ක් තිබිය දී කොහොමද එහෙම හදිසි මිලදී ගැනීමක් කළේ තවත් 450,000ක? ඒ වාගේම ඒ ක්‍රියාව නිසා රුපියල් 368,955,000ක පාඩුවක් රජයට, රටට සිදු වෙලා තිබෙනවා. මම ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට යෝජනා කරනවා, මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කිරීම ඉතාම වැදගත් බව. මොකද, ඇත්ත වශයෙන්ම සැපයුම්කරුවන්ට ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය ලැබිලා ටික කාලයකදී තමයි හදිසි මිලදී ගැනීම් හරහා මේ ප්‍රෝඩාව, මේ වංචාව කරලා තිබෙන්නේ. ඒ පිළිබඳව අපට වාර්තාවක් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා මතු කරන ලද පළමු කාරණය වන, පාදුක්ක සිරි පියරතන විදුහලේ චරිත්මා ජීනේන්ද්‍රි ශිෂ්‍යාව ගං වතුරෙන් විපතට පත් වෙච්ච අය ක්ෂණිකව බේරා ගැනීමට කටයුතු කිරීමේ ක්‍රියාව පිළිබඳව ඊයේ මාධ්‍ය මඟිනුත් කරුණු වාර්තා කර තිබෙනවා මම දැක්කා. ඒ අනුව මමත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන්- බස්නාහිර පළාතේ පාසලක් පාදුක්ක සිරි පියරතන විදුහල - යම් පියවරක් ගැනීමට කටයුතු කරන බව එතුමාට සඳහන් කරනවා.

දෙවැනි කාරණය වන, meropenem එන්නත පිළිබඳව සෞඛ්‍ය ඇමතිතුමා මඟින් කරුණු පැහැදිලි කරලා දෙන්න අවශ්‍ය කටයුතු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පෙත්සම් පිළිගැන්වීම, ගරු ඩලස් අලහප්පෙරුම මහතා.

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා.

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

ගරු කථානායකතුමනි, පාදුක්ක සිරි පියරතන විද්‍යාලය මම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිත්වය දරන ප්‍රදේශයේ තමයි පිහිටා තිබෙන්නේ. ගරු විපක්ෂ නායකතුමා සඳහන් කරපු ඒ දිරිය දියණිය විශාල වීර ක්‍රියාවක් කරලා තිබුණේ. ඒ දෙමව්පියන් කියපු ආකාරයට පිරිමියෙකුවත් කරන්නේ නැති වැඩක් ඒ වෙලාවේ ඒ දියණිය නොබියව, අභීතව කරලා තිබුණා. "හිරු" නාළිකාවෙන් ඒ පිළිබඳව විශාල ඇගයීමක් කරලා තිබුණා මම දැක්කා. විදුහල්පතිතුමා සහ අපි ඒ වෙනුවෙන් එම දියණියව ඇගයීමට ලක් කරන්න දැනටමත් සාකච්ඡා කර තිබෙනවා. එවැනි දරුවන් විශාල ප්‍රමාණයක් ආපදාවට ලක් වෙලාත් තිබෙනවා. ගරු ඇමතිතුමා කිව්වා, ඔවුන්ගේ උපකරණ ලබා ගැනීමට සහ අනෙකුත් කටයුතු සඳහා යම් සහයෝගයක් ලබා දෙනවා කියලා. ඒ වාගේම තවදුරටත් ඔවුන්ට අපි හැමදෙනාම විශාල දායකත්වයක් ලබා දෙන්න වෙයි. ඒ දියණිය කරපු කාර්යභාරය වෙනුවෙන් අවධානය යොමු කරනවා වාගේම, අනෙක් පැත්තෙන් සියලුම දරුවන් වෙනුවෙන් මේ වෙලාවේ අපේ අවධානය යොමු කර කටයුතු කළ යුතුයි කියන කාරණාවත් මම මතක් කරනවා. එම දියණිය පිළිබඳව සඳහන් කිරීම පිළිබඳව ගරු විපක්ෂ නායකතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමා.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

ගරු කථානායකතුමනි, පසුගිය දවසක විපක්ෂ නායකතුමා විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම අත් විඳපු ප්‍රශ්නයක් ගැන මේ සභාවේ අවධානය යොමු කරවා තිබුණා. මම ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ශ්‍රී ලංකා කණ්ඩායම පැය 7ක් flight එකක් නැතිව අතරමං වෙලා හිටියා කියන කථාව තමයි එතුමා වැඩියෙන්ම දිගහැර දැක්වූයේ. හැබැයි, ඒ වෙලාවේ ලංකාවේ කණ්ඩායම පමණක් නොවෙයි එම තත්ත්වයට මුහුණ දුන්නේ. ශ්‍රී ලංකා කණ්ඩායමත්, අයර්ලන්ත කණ්ඩායමත්, දකුණු අප්‍රිකානු කණ්ඩායමත් කියන කණ්ඩායම් තුනම flight එකක ඇති වූ තාක්ෂණික දෝෂයක් නිසා පැය 7ක් ෆ්ලොරිඩාවල airport එකේ අතරමං වීමක් සිදු වුණා. ක්‍රිකට් ආයතනයෙනුත් මේ සම්බන්ධයෙන් අපි විමසීමක් කරලා තිබෙනවා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය දැනටමත් මේ සම්බන්ධයෙන් ICC එකට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා.

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

ඒකට හේතුව, එක එක රටවලට එක එක විධියට සලකා තිබීමයි. කිලෝමීටර ගණනින් බැලුවොත්, බංග්ලාදේශය තමයි වැඩියෙන්ම සංචාරය කරන්නේ. දෙවනුව ලංකාව. ඒ වාගේ, එක එක කණ්ඩායම්වලට කොහොමද මේක තිබෙන්නේ කියලා බලන්න ඕනෑ. හැබැයි, ඇත්තටම මේ මොහොත වනවිට ඇමරිකානු ක්‍රිකට් ආයතනයත් ICC එකෙන් තහනම් වෙලා ඉන්නේ. එවැනි අර්බුද රාශියක් තුළ තමයි මේ ක්‍රිකට් තරගාවලිය ICC එක විසින් ඇමෙරිකාවේ පවත්වන්නේ. එම ගැටලු එක එක කණ්ඩායම්වලට පොදුයි නේ.

ඒ නිසා මම හිතනවා, අතිශයින් ප්‍රථම වතාවට ඔය වාගේ ප්‍රශ්න අහද්දී මීට වඩා පොඩ්ඩක් සැලකිලිමත් වෙනවා නම් හොඳයි කියලා. මොකද, හරියට කරුණු නොදැන හැම දේකටම කථා කිරීමේදී පහක් දමන්නට අවශ්‍යතාවක් නැහැ නේ. හැබැයි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ක්‍රීඩා අමාත්‍යාංශයේ DG විසින් කරුණු විමසා ලිපියක් යවා තිබෙනවා. මොකද, සති දෙක-තුනකට ඉස්සෙල්ලා අපිම කිව්වා, ක්‍රිකට් ආයතනයෙන් කෙනෙක් පත්කර මේ කණ්ඩායමට අඩු පාඩු නොවෙන විධියට කටයුතු සලස්වන්න කියලා. ඒ නිසා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ඒ සම්බන්ධයෙන් පුද්ගලයෙක් පත් කර තිබෙනවා. එතුමා එහේ ගිහිල්ලාත් තිබෙනවා. නමුත්, මේ ප්‍රශ්න ඇති වීම සම්බන්ධයෙන් මේ මොහොත වෙනකොට අපි කරුණු විමසා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පියවර ගැනීමට අපි කිසිවිටෙකත් පසුබට වෙන්නේ නැහැ. අපි අනිවාර්යෙන්ම එම කටයුත්ත කරනවා කියන එකත් මම මතක් කරන්න ඕනෑ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, ඒ flight delay එක, එක ප්‍රශ්නයක් පමණයි. මම තවත් ප්‍රශ්නයක් මතු කළා. සාමාන්‍යයෙන් අපි දන්නා ආකාරයට cricketersලාට ඉන්න hotel accommodation දෙන්නේ ICC Rules and Regulations අනුව ground එකයි hotel එකයි අතර distance එක 45 minutes වශයෙන්. නමුත් අපේ cricketersලාට පැය එකහමාරක - one-and-a-half hours - දුර ප්‍රමාණයක් යන්න තිබෙනවාය කියන එක ඇත්තවශයෙන්ම අසාධාරණයි කියන කාරණාව මම කියන්න ඕනෑ.

අනෙක් එක, මම මේ හැම කාරණාවක් සම්බන්ධයෙන්ම cricketersලාවයි quote කරන්නේ. බලන්න, අපේ ක්‍රීඩකයෙක් කියලා තිබෙන දේ: "Even from the hotel it, (the practise venue) is one hour and 40 minutes. Even today, (for the match against South Africa), we had to wake up around 5.00 a.m. to come here." මේ කවුද කියන්නේ? මහේෂ් තීක්ෂණ. මගේ වචන නොවෙයි. Cricketersලාම ඉදිරිපත් කරපු මැසිවිලියි මම මේ ඉදිරිපත් කරන්නේ. ඒ නිසා මේ පිළිබඳව යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න. අනෙක් රටවල් ගැන නම් මට එච්චර වැඩක් නැහැ. ICC නීතිරීති, රෙගුලාසි තුළ අපේ රටේ Cricket Team එකට ලබා දිය යුතු නිසි පහසුකම් අපි දිනා දෙන්න ඕනෑ. අපි ඒ වෙනුවෙන් සටන් කරන්න ඕනෑ.

ඒ වාගේම මම අවධානය යොමු කරන්න කැමැතියි, T20 World Cup තරග පවත්වපු Nassau County International Cricket Stadium එකේ pitch එක සම්බන්ධව. ඒ pitch එක ක්‍රිකට් ක්‍රීඩාව කරන්නට නුසුදුසු pitch එකක් කියන එක දැන් ICC එක පවා පිළිගෙන තිබෙනවා. ඉතින්, අපි මේ කරුණු-කාරණා පිළිබඳව වාද-භේද ඇති කර ගන්න අවශ්‍ය නැහැ. අපි පක්ෂ හෝ අනෙකුත් භේදවලින් තොරව අනිවාර්යයෙන්ම අපේ ක්‍රිකට් කණ්ඩායම වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ. ඒ වාගේම අපි ප්‍රශ්න කරන්න ඕනෑ, ICC එක කොහොමද ක්‍රිකට් ක්‍රීඩාවට නුසුදුසු pitches අනුමත කරන්නේ කියලා. අපට ආරංචියි, ඒ pitch එක නිර්මාණය කිරීමේදී වෙනත් රටවලින් අරගෙන ඇවිල්ලා තමයි ඒවා ස්ථාපනය කරලා තිබෙන්නේ කියලා. ඒ කෙසේ වෙතත්, ඒ pitch එකේ නුසුදුසුභාවය ගැනත් බරපතළ ප්‍රශ්න තිබෙනවා. මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ කරුණු නොදැන නොවෙයි. ඇත්තටම cricketersලාගේම statements උපුටා ගෙන තමයි මම ඒ අදහස් ටික ඉදිරිපත් කළේ.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා pitch එක සම්බන්ධව කිව්ව කථාව මම පිළිගන්නවා. සාමාන්‍යයෙන් ලෝකයේ ඕනෑම පිට්ටනියකට ratings තිබෙනවා. මේ පිට්ටනියට දැන් rating එකක් දෙන්න බැහැ. මොකද, ජූනි 14වැනි දායින් පස්සේ මේ පිට්ටනිය කෑලිවලට ගලවනවා. ඇත්ත වශයෙන්ම මේක එළියට ගන්න ඕනෑ කරුණක්. ඒ වාගේම අපේ ක්‍රිකට් තහනම් වුණා කියලා අවුරුදු 19න් පහළ ක්‍රිකට් ලෝක කුසලාන තරගාවලිය ලංකාවේ පැවැත්වීමේ අවස්ථාව අපට දුන්නේ නැහැ, වෙන රටකට දුන්නා. හැබැයි, USAවල ක්‍රිකට් තහනම් වෙලා තිබියදීත් ඒ රටේ ක්‍රිකට් ලෝක කුසලාන තරගාවලි පවත්වනවා. එහෙම වෙන්නේ නොයෙකුත් හීන්දු නිසා වෙන්න ඇති. ඉන්දියාව හා පාකිස්තානය අතර ක්‍රිකට් තරගයක් ඇමෙරිකාවේ ගහනවා කියන්නේ, දැනට අඩුම ටිකට් එක ඩොලර් 3,000ට යනවා. ඒ නිසා මෙහෙම වෙන්න නොයෙකුත් හේතු ඇති. කෙසේ වෙතත්, ගරු විපක්ෂ නායකතුමා මේ කරුණු ඉදිරිපත් කිරීම ගැන මම සතුටු වෙනවා. ඔබතුමා කියපු දේ හරි. අපේ ක්‍රීඩකයෝත් කිව්වා වාගේ, ඇත්තටම ඒ Brooklyn Bridge Marriott Hotel එකේ සිට මේ ground එකට හැතැප්ම 39ක් තිබෙනවා. New Yorkවල තිබෙන traffic එකත් එක්ක තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. ඉන්දියානු කණ්ඩායම ඉන්නේ පිට්ටනියට ළඟම තිබෙන Long Island hotel එකේ. මමත් ඒ පිට්ටනියට ගියා. පෞද්ගලික මුදලින් තමයි මම ඒ රටට ගියේ. ඕනෑ නම් හොයලා බලන්න පුළුවන්. මම ඒ රටට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මුදල්වලින් ගියේත් නැහැ, ක්‍රීඩා අමාත්‍යාංශයෙන් මුදල් අරගෙන ගියේත් නැහැ. මම අපේ කණ්ඩායම practise කරන දවසේත් එතැනට ගියා. ඒ පිට්ටනිය ඇත්තවශයෙන්ම නුසුදුසු පිට්ටනියක් කියන එක පැහැදිලිව පෙනෙන්න තිබුණා. අපි බලාපොරොත්තු වෙනවා, හෙට දවසේදී, ඒ කියන්නේ අද රෑට තිබෙන තරගයේදී අපේ කණ්ඩායම නැවත වතාවක් පණ ගැන්විලා එයි කියලා. මම සතුටු වෙනවා, පක්ෂ භේදයකින් තොරව මෙවැනි කරුණක් ඉදිරිපත් කිරීම ගැන.

මෙහිදී අපේ ක්‍රීඩකයන්ට වාගේම අනෙක් ක්‍රීඩකයන්ටත් මෙවැනිම දේවල් සිදු වුණා. Brooklyn Bridge Marriott Hotel එකේ තවත් කණ්ඩායම් දෙකක් හිටියා. ඔවුන්ටත් මේ ප්‍රශ්නයම තිබුණා. මම කලින් කිව්වා වාගේ අපි සති තුනකට ඉස්සෙල්ලා ශ්‍රී ලංකා ක්‍රිකට් එකේ නියෝජිතයෙක් යැව්වා, මේ දේවල් ගැන සොයා බලන්න කියලා. ඒ සම්බන්ධයෙන් නිසියාකාරව කටයුතු නොවීම ගැන අපි අනිවාර්යයෙන්ම පරීක්ෂණයක් කරනවා කියන එක මේ අවස්ථාවේදී මම මතක් කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගේ පිළිතුරෙන් බොහොම බරපතළ කාරණාවක් ඉස්මතු වුණා. ඒ කියන්නේ, අසමබර ආකාරයට රටවලට සැලකීම. යම් යම් රටවල් තහනම්

වෙනකොට යම් යම් දේවල් අහිමි වෙන්නටත්, යම් යම් රටවල් තහනම් වෙනකොට ඒ අයිතිවාසිකම් එලෙසම තියන්නටත් කිසියම් හෝ හේතු ඇති. මේ තත්ත්වය තුළ අපි විශ්වාස කරනවා, ICC එක තුළ තිබෙන මේ වැරදි සැලකිල්ලට - ඒ කියන්නේ බලවත් අයට සලකනවා, බලවත් නැති අයව පාගා දමනවා - එරෙහිව අපි නැඟී සිටින්න ඕනෑ කියලා. මම දන්නවා, අපි එක රටක් පමණයි කියලා. ICC එකේ member countries ගණනාවක් එකතු වෙලා මේ අසාධාරණයට විරුද්ධව ඉදිරිපත් වෙන්න ඕනෑය කියලා මම මේ අවස්ථාවේදී යෝජනා කරන්න කැමැතියි. ගරු ඇමතිතුමාගේ පිළිතුරෙන් බොහොම පැහැදිලිව ඉස්මතු වුණා, බලවත් රටවලට එක සැලකිල්ලකුත්, අනෙක් රටවලට තවත් සැලකිල්ලකුත් තිබෙන බව.

ක්‍රිකට් ක්‍රීඩාව තුළ ICC එකට මෙහෙම කටයුතු කරන්න ඉඩ දෙන්න බැහැ කියන එක තමයි මම යෝජනා කරන්නේ. විශේෂයෙන්ම රජයක් හැටියට ඔබතුමන්ලා ඒ ස්ථාවරය දරනවා නම්, ඒකට පක්ෂපාතීව, ඒ කියන්නේ ICC එකේ වැරදි ක්‍රියාකලාපයට විරුද්ධව නැඟී සිටින්නට අපිත් සූදානම්.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

මේ සම්බන්ධයෙන් අපි දැනටමත් ලිපි ඉදිරිපත් කරලා තිබෙනවා. ඊළඟ පාර්ලිමේන්තු රැස්වීම් දවසේ මම ඒවා සභාගත කරන්නම්. ගරු කථානායකතුමනි, ඒ වාගේම ICC එකේ ඊළඟ AGM එක ජූලි මාසයේදී පවත්වන්නේ ලංකාවේ. ඒක ලංකාවට ලොකු අවස්ථාවක් වෙනවා. ක්‍රිකට් ක්‍රීඩාව කරන සියලු රටවල් මේකට සහභාගි වෙනවා. මම විපක්ෂ නායකතුමාට කියන්න ඕනෑ, අපිත් අපේ ක්‍රීඩා සංගම්වල දූෂණ ගැන කථා කළාට මව් ක්‍රීඩා සංගම්වල තමයි ලොකුම ප්‍රශ්න තිබෙන්නේ කියලා. FIFA එක ගත්තොත්, ඒක ලෝකයේ ලොකුම ප්‍රශ්න තිබෙන තැනක් හැටියට නඩු ගිය බවත් වාර්තාවෙලා තිබෙනවා. එම නිසා මේවා සාමාන්‍ය දේවල් බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ලංකාවේත් සමහර ක්‍රීඩා සංගම් ඔය විධියටම කටයුතු කරන්නේ කියන එක මේ වෙලාවේ මමත් පිළිගන්නවා. Lobby කරන එක තමයි අපට කරන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. Lobby කරලා මේ සම්බන්ධයෙන් අපේ විරෝධතාව ඉදිරිපත් කරන එකයි කරන්න තිබෙන්නේ. අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නත්, ඒ වාගේම ඉදිරියේදී මේ වාගේ වැඩ නොවන විධියට කටයුතු කරන්නත් බලාපොරොත්තු වෙනවා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)

ගරු කථානායකතුමනි, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා කැසිනෝ බද්ද ගැන කිව්වා. ඒක බදු ගෙවන අයට බොහොම සංවේදී කථාවක්. එම නිසා ඒ සම්බන්ධව මම කෙටි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.

2010දී තමයි කැසිනෝ සඳහා ඉස්සෙල්ලාම නියාමන පනතක් ගෙනාවේ. හැබැයි, ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. 2022දී තමයි ඒක ක්‍රියාත්මක කරන්න අවශ්‍ය නීතිමය කටයුත්ත අපි සිදු කළේ. ගරු කථානායකතුමනි, ඉන් පසුව තමයි කැසිනෝ ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ වැඩ පිළිවෙළක් අපි හැදුවේ. නිකම් නොවෙයි, කැසිනෝ බලපත්‍රයක් සඳහා අපි රුපියල් කෝටි 50ක් අය කරනවා. එතෙක් මෙහෙම එකක් තිබුණේ නැහැ. 2022දී තමයි රුපියල් කෝටි 50ක් අය කරලා බලපත්‍රයක් දෙන්න පටන් ගත්තේ. ඒ වාගේම එතෙක් වාර්ෂික ගාස්තුව විධියට තිබුණේ රුපියල් කෝටි 20යි. 2023 වර්ෂයේ ඉඳලා අපි ඒක රුපියල් කෝටි 50ක් බවට පත් කළා. ඒ වාගේම ඒ ගොල්ලන්ගේ මුළු ආදායමෙන් සියයට 15ක බද්දක් - Turnover Tax එකට සමාන බද්දක් - අපි අය කරනවා. ඊට අමතරව, මෙය ශ්‍රී ලාංකිකයන් තුළ වර්ධනය කිරීමේ අවශ්‍යතාවක් නැති නිසා ශ්‍රී ලාංකිකයෙක් කැසිනෝශාලාව ඇතුළට යනවා නම් ඩොලර් 50ක් අය කරනවා. ඊටත් අමතරව, ආදායම් බදු ලෙස කැසිනෝ ව්‍යාපාරයෙන් සියයට 40ක් ගන්නවා. මේවා දැන් තමයි ක්‍රියාත්මක වෙන්නේ, ගරු කථානායකතුමනි.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියපු කථාව ඇත්ත. කැසිනෝශාලා ලියාපදිංචිය සඳහා බලපත්‍රයක් ලබා දෙන නිසා තමයි කැසිනෝ ක්‍රීඩාව online කරන්න බැහැ කියන එක ආවේ. මීට කලින් online විධියටත් කළා, හැම විධියටම කළා. මේක අපි දැන් ඒ විධියට පාලනය කරලා තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පුළුවන් වෙන්නේ tax එක අයකරන්න විතරයි, ගරු කථානායකතුමනි. ඔවුන්ට මේවා නවත්වන්නවත්, නියාමනය කරන්නවත් බැහැ. එම නිසා අපි දැන් සූදු නියාමන අධිකාරිය පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට කටයුතු කරගෙන යනවා. අවසාන වශයෙන් දැන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශය ඒක විමර්ශනයට ලක් කරමින් තිබෙනවා. අපේ නිලධාරීන් මේ ඔක්කෝම විස්තර ඊයේ එතුමාට කියා තිබෙනවා. දැනට මේ පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවටත් ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ඉතාම ඉක්මනින් සූදු නියාමන අධිකාරිය පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගේනවා. ඒක ගෙනාවාම මේ ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙනවා වාගේම, කිසිදු නියාමනයක් නොතිබුණු මේ සියල්ල සියයට 100ක්ම නියාමනය කරන්න අපි කටයුතු කරනවා. මට මේ රටේ බදු ගෙවන ජනතාවට කියන්න අවශ්‍යව තිබෙන්නේ, අපි කැසිනෝ වාගේ ව්‍යාපාර අතහැරලා කිසිම දවසක සාමාන්‍ය අයගේ බදු ගැන අවධානය යොමු කරන්නේ නැහැ කියලායි. මේ වෙනුවෙන් කරන්න පුළුවන් සියල්ලම අපි කරනවා. කිසිදු බද්දක් අය නොකළ, නැත්නම් ලියාපදිංචියක් නොකළ ආයතනවලින් බදු අය කිරීම රුපියල් කෝටි 50න් තමයි පටන් ගන්නේ, ගරු කථානායකතුමනි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I need to respond to that.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Again, are you going to get into a debate?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I do not want to get into a debate, Sir, but to respond to what the Hon. State Minister said.

ගරු කථානායකතුමනි, දැන් එතුමා කථා කළේ හරියට මම වැරදිකාරයා වාගේයි. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. කැසිනෝ නියාමන අධිකාරිය පනතක් ගේන්න ඕනෑ නිසා තමයි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ඒ ගැසට් එක approve නොකළේ. එහෙම නැතුව මේක ආණ්ඩුවෙන් ගෙනාපු දෙයක් නොවෙයි. මෙතුමා පෙන්වන්න හදන්නේ මේක ආණ්ඩුවෙන් ගෙනාවා කියලා නේ. ආණ්ඩුවෙන් නොවෙයි ගෙනාවේ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් තමයි licence එක දෙන එක refuse කළේ. ගරු ජනාධිපතිතුමා තමයි මෙතැනදී නැඟිටලා කිව්වේ, රජයේ මුදල්

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

පිළිබඳ කාරක සභාව එක්ක එකතුවෙලා මේක කරන්න කියලා. මේ බෙරාගන්න හදන්නේ කාවද? Online casinos කරනවා නම් ඇයි බදු නොගහන්නේ?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(මාණ්පුමිකු රන්ජිත් සියම්බලාපිටිය)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු කථානායකතුමනි, දැන් බැලුවාම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව තමයි ඔක්කෝම කරන්නේ. අපි මොකුත්ම කරන්නේ නැහැ. ඒකත් එක කාරණයක්. කමක් නැහැ. මම ස්තුතිවන්ත වෙනවා, උගත් මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා ඒ කාරණාව හරියට ඉෂ්ට කරන එක ගැන. හැබැයි, මේ කාල සීමාවේ එතුමන්ලා පැත්තකට වෙලා මේ කරුණු කියද්දී මේ කාරණාවට මැදිහත් වෙලා, මේ හැම කටයුත්තකම වගකීම භාරගෙන, අභියෝගය භාර අරගෙන ජනාධිපතිතුමා ඇතුළු අපි මේක කළාය කියන එක මම පැහැදිලිව කියන්න අවශ්‍යයි. මේ කාරණාවේදීම ඒක පැහැදිලි වෙනවා. පැහැදිලිව, පියවරෙන් පියවර අපි මේ හැම දේකටම උත්තර සොයාගෙන යනවා, ගරු කථානායකතුමනි.

නියාමනයක් නොතිබුණු, ලියාපදිංචියක් කිසිසේත්ම නිබුණේ නැති කැසිනෝ ව්‍යාපාරයට රුපියල් කෝටි 50ක බද්දක් අය කරන්න අපි ඊළඟ සති කිහිපය තුළදී නියාමන පනත් කෙටුම්පතක්, නැත්නම් සියලු සූදු පාලනය කරන්න අධිකාරි පනත් කෙටුම්පතක් ගේනවා. එහෙම පියවරෙන් පියවර යන්නේ නැතුව, එකවරම ඒ ගැන මේ පාර්ලිමේන්තුවේදී මේ වාගේ කථා කරන එක සාධාරණද කියලා මට ප්‍රශ්නයක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. (Dr.) Harsha de Silva, please do not go into a debate now.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
I am not going into a debate, Sir. අපේ සාධාරණත්වය තිබෙන්නේ මේ රටේ සාමාන්‍ය මිනිස්සු වෙනුවෙන්, කැසිනෝකාරයෝ වෙනුවෙන් නොවෙයි. අපේ සාධාරණත්වය තිබෙන්නේ සාමාන්‍ය මිනිස්සු වෙනුවෙන්.

ගරු කථානායකතුමනි, මම නැවත නැවතත් මේ කාරණය කියන්න කැමැතියි. මෙතුමන්ලා රුපියල් කෝටි 50ක් ගැන කථා කරනවා. මේ විධියට අලුතින් licences දෙන්න තීරණය කළේ, ඒක approve කළේ ඊයේ. ඊයේ තමයි ඒක approve කළේ. ඒක තමයි අද මේ පාර්ලිමේන්තුවට ගෙනාවේ. දැන් නිකම් කථා කරන්නේ කලින් ඒ ගැන කටයුතු කළා වාගේයි. ඊයේ තමයි ඒක approve කළේ. *[බාධා කිරීමක්]* හිනාවෙන්න එපා. ඊයේ නේ approve කළේ. ඒ වාර්තාව තමයි මේ තිබෙන්නේ. ඒක නේ අද ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්නේ කලින් ඔබතුමන්ලා මේ කටයුත්ත කළා වාගේයි. අපි මේ වෙනුවෙන් ඇති කරන pressure එක නිසා තමයි ඔබතුමන්ලා මේවා කරන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
That is good. දැන් ඔය විධියට ගිහිල්ලා ඔබතුමාටත් blood pressure හැදෙනවා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(මාණ්පුමිකු රන්ජිත් සියම්බලාපිටිය)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හරිම වැදගත්. අපි ඒක පිළිගන්නවා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියන විධියට, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව නොතිබුණා නම් අපි මුකුත් කරන්නේ නැහැ. 2023 වර්ෂයේදී තමයි අපි මේ බලපත්‍ර දීමේදී ඒ සඳහා රුපියල් මිලියන 500 බැගින් අය කළේ. අවශ්‍ය නම් ඒ ගැන වෙනම debate එකක් අරගෙන අපට කථා කරන්න පුළුවන්. හැබැයි, මේ කාරණා රටේ ජනතාව දැනගන්න ඕනෑ. ජනාධිපතිතුමා තමයි මුදල් අමාත්‍යවරයා. 2022දී මේ අභියෝගය භාර ගන්න බැහැ කියලා එතුමන්ලා කියද්දි, අපි මේ අභියෝගය භාරගෙන පියවරෙන් පියවර ඉදිරියට යනවා. ගරු කථානායකතුමනි, මට ඒක විතරයි කියන්න අවශ්‍ය වෙන්නේ. *[බාධා කිරීම්]* අපි ගොඩට වෙලා මේක දිහා බලාගෙන හිටියේ නැහැ. ජලයෙන් ගිලෙන්න යන මේ ශ්‍රී ලංකාව, අපි ජලයට බැහැලා, කර ගහලා අරගෙන යනවා. *[බාධා කිරීම්]*

ගරු ජේ.සී. අලවතුවල මහතා
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]* ඔය කාරණාවට වෙනම විවාදයක් ගන්න.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ කාරණය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. අපේ රටේ තරුණ තරුණියන් කණ්ඩායමක් මියන්මාරයේ -බුරුම දේශයේ- සයිබර් අපරාධ කණ්ඩායමකට අහු වෙලා ඉන්නවා. ඒ ගැන පැහැදිලිව කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ දරුවන්ගේ දෙමව්පියන් විපක්ෂ නායකතුමාගේ කාර්යාලයට ඇවිල්ලා තමන්ගේ දුක කිව්වා වාගේම අපිවත් හමු වෙලා ඒ සම්බන්ධයෙන් දැනුම් දුන්නා. ඒ වාගේම, රුසියාවේ යුද පෙරමුණට ගිහිල්ලා ඉන්නා අපේ රණ විරුවන් සම්බන්ධයෙනුත් විපක්ෂ නායකතුමා විශේෂ අවධානය යොමු කරලා, ඒ ගැන සොයා බලන්න අපේ මන්ත්‍රීවරුන් තිදෙනෙක් එරටට පිටත් කළා. අපේ සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමාත්, වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමාත්, මමත් ඒ සඳහා පිටත් වුණා.

ගරු කථානායකතුමනි, ඒ ගැන මම පොඩි කාරණයක් කියන්න ඕනෑ. අපට පුළුවන් වුණා, මියන්මාරයේ නියෝජ්‍ය විදේශ ඇමතිවරයා හමු වෙලා, ඒ සම්බන්ධව එතුමාගේ විශේෂ අවධානය යොමු කරවන්න. තායිලන්තයේ border එකේ තමයි ඒ කණ්ඩායම රඳවාගෙන ඉන්නේ. ඒ අනුව තායිලන්තයේ නියෝජ්‍ය විදේශ ඇමතිවරයාව හමු වෙලා, ඒ සම්බන්ධව එතුමාගේ විශේෂ අවධානය යොමු කරවන්න අපට අවස්ථාවක් ලැබුණා. අපි පැහැදිලිවම කියන්න ඕනෑ, ඒ තරුණ තරුණියන් 49දෙනා මේ වෙනකොට මියන්මාරයේ යම් කණ්ඩායමක් -ඒ කියන්නේ රජයේ

පාලනයෙන් බැහැර කණ්ඩායමක්- රඳවාගෙන, ඒ අයට නොයෙකුත් වධ හිංසා දෙමින්, පොරොන්දු වුණු ආකාරයෙන් පඩිනඩි ආදී මොනවත් ලබා නොදී ඒ අයව ඉතා අවාසනාවන්ත තත්ත්වයකට පත් කර තිබෙන බව. ඒ අයව ඉතා කඩිනමින් එතැනින් නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය මූලික සාකච්ඡා ආරම්භ කරන්න අපට අවස්ථාව ලැබුණා. විශේෂයෙන්ම අපි ඒ සම්බන්ධව විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, එතුමා අපට ඒ සඳහා සම්පූර්ණ සහයෝගය ලබා දුන්නා. ඒ වාගේම විදේශ කටයුතු ඇමතිතුමාත් ඒ තානාපති කාර්යාල හරහා අපට යම් සහයෝගයක් ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ඉතාම අවාසනාවන්ත තත්ත්වයට පත් වෙලා ඉන්න අපේ සොල්දාදුවන් -අපේ රණ විරුවන්- සම්බන්ධයෙන් සොයා බලන්න අපි රුසියාවට ගියා. රුසියාවේ මොස්කව් නගරයේත්, St. Petersburg නගරයේත් රෝහල්ගත වෙලා ඉන්න අපේ සොල්දාදුවන් සමඟ අපි සාකච්ඡා කළා. අපට පෙනෙන විධියට 1,000කට වැඩි ප්‍රමාණයක් ඒවායේ ඉන්නවා. තුවාල ලබා සහ ගිවිසුම් ප්‍රකාරව අවශ්‍ය දේවල් නොලැබෙන සොල්දාදුවන් 220කගේ තොරතුරු අපට ඒ සොල්දාදුවන් විසින් ලබා දුන්නා. අපි ඒ තොරතුරු ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට අලුතෙන් පත් වුණු රුසියානු තානාපතිතුමාටත්, St. Petersburg කොන්සල්වරයාටත් ලබා දීලා තිබෙනවා. ඉදිරියේදී ඒ අය සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නවලට අවධානය යොමු කරන්න විදේශ කටයුතු අමාත්‍යාංශයට ඒ තොරතුරු ඉවහල් වෙයි. මේ වෙනකොට ජීවිත අහිමිවීම් සහ අතුරුදහන්වීම් 10ක් විතර සිද්ධ වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරලා, ඒ අයටත් සහනයක් ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ කටයුතු ද ආරම්භ කර තිබෙනවා කියන එකත් ඉතා පැහැදිලිව අපි මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පෙත්සම් පිළිගැන්වීම, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා. *[බාධා කිරීමක්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
තවත් කාලය දෙන්න බැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
මේ කාරණය වැදගත්, ගරු කථානායකතුමනි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මේක වරප්‍රසාද,- *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මොකක්ද, ඒ?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
සමාවෙන්න, ගරු කථානායකතුමනි, කාලය ගත්තාට. මේක දැන් සිදු වෙච්ච දෙයක්. ප්‍රවෘත්තියක් පළ වෙලා තිබෙනවා, "විදේශිකයන්ට ගුවන් තොටුපොළෙන් වීසා ලබා දීමේ ක්‍රමය වෙනස් කර පෞද්ගලික ආයතනයට ලබා දීමෙන් ඇති වූ ආන්දෝලනාත්මක සිද්ධියක් සම්බන්ධයෙන්..." යනුවෙන්. ටෙලිකොම් ආයතනයෙන් ඩොලර් එකක් ලබාගෙන විදේශිකයන්ට වීසා දුන්නා. දැන් ඒ සඳහා ඩොලර් 25ක් ගන්නවා. ඒ ගැන කථා කරන්න ඒ අයව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට කැඳවා තිබුණා. නමුත් ඒ අය කාරක සභාවට ආවේ නැහැ. ඒ නිසා මම මේ සභාවට ඇවිල්ලා කිව්වා, ඒ අය වරප්‍රසාද කඩ කරලා තිබෙනවාය කියලා.

මම ඒ කට්ටියගේ නියෝජිතයන් හම්බ වෙලා, ඩීල් එකක් දමා ඒක යට ගහලා දැම්මා කියලා දැන් ප්‍රවෘත්තියක් පළ කර තිබෙනවා. මෙහෙම වෙන්නේ කොහොමද, ගරු කථානායකතුමනි? එදා මාව පත් කරපු අපහසුතාව පිළිබඳව මම ඔබතුමාට කිව්වා. මම මෙතැනදීත් ඒ ගැන කිව්වා. කවුද මේවා කරන්නේ? කාගේ වුවමනාවටද මේක මගේ පැත්තට හරවන්න හදන්නේ? මේ වීසා ප්‍රශ්නය සම්බන්ධයෙන් මම ලබන සතියේ වාර්තාවක් ඉදිරිපත් කරනවා. එතකොට සිද්ධ වෙලා තිබෙන සම්පූර්ණ දෙයම මේ පාර්ලිමේන්තුව දැනගන්නවා. කාටද ඕනෑකම තිබෙන්නේ, මට පහර ගහන්න? පාරේ යනකොට මම මරලා දැම්මොත් මොකද කරන්නේ? ගරු කථානායකතුමනි, මම ඔබතුමාට දැඩිව කියනවා, මගේ ආරක්ෂාව පිළිබඳව ඔබතුමාට වගකීමක් තිබෙන බව; මගේ ආරක්ෂාව පිළිබඳව ඔබතුමාට වගකීමක් තිබෙනවා. මේක ඩොලර් බිලියන ගණනක වැඩක්. ගරු කථානායකතුමනි, අද මම මේ කාරණය කිව්වා කියන එක මතක තියා ගන්න. මාව පාරේ මරලා දැම්මොත් ඒකට මේ ප්‍රශ්නය පිටුපස ඉන්න කට්ටියට වගකියන්න සිද්ධ වෙනවා. මොකක්ද මට කරන්න කියන්නේ? මේකේ වංචා, දූෂණ වහන්න කියලාද කියන්නේ? මොකක්ද මට කරන්න කියන්නේ? මෙහෙම තර්ජනය කරන්න, චෝදනා කරන්න පුළුවන්ද? මොකක්ද මේකේ තේරුම?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේක බරපතළ ප්‍රශ්නයක්. හර්ෂ ද සිල්වා මැතිතුමාව දෙවතාවක්ම ඉවත් කළා, Public Finance Committee එකේ සභාපති ධුරයෙන්. මොකක්ද ඒකට හේතුව? එතුමා ඒ විෂයය ගැන හොඳ අවබෝධයක් තිබෙන විශාරදයෙක්. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳව නිර්ව්‍යාජ, විනිවිදභාවයෙන් යුක්ත වූ අදහස් ඉදිරිපත් කිරීම නතර කරන්නටයි එතුමාව අස් කළේ. රට බංකොලොත් වුණාට පස්සේ අපි පුන-පුනාම යෝජනා කළා, එතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති කරන්න කියලා. ඊට පස්සේ, බොහොම අමාරුවෙන් එතුමාව පත් කළා. එතුමා සභාපති ධුරයට පත් කළාට පස්සේ මොකක්ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සිද්ධ වෙන්නේ? රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කරන මන්ත්‍රීවරු ඇවිල්ලා එතුමාට තර්ජනය කරනවා. කොහොමද එහෙම වෙන්නේ? එහෙම කොහොමද වෙන්නේ? එතුමා VFS Global ගනුදෙනුව ගැන හොයලා බලනකොට රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කරන මන්ත්‍රීවරු ඇවිල්ලා එතුමාට තර්ජනය කරනවා. එක පැත්තකින් එහෙම කරලා, අනෙක් පැත්තෙන් රජයම එක එක වහල්ලු දම්මලා, එතුමාට චෝදනා කරනවා, එතුමා ඒක යටගහනවා කියලා.

මොකක්ද මේ කරන්නේ? මොකක්ද මේ විහිළුව? ඔබතුමා දන්නවාද, මහ බැංකු ගනුදෙනුවටත් වඩා බරපතළ විනාශයක් තමයි මේ ගනුදෙනුවේදී සිදු වෙලා තිබෙන්නේ කියලා? ඒක තමයි

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඇත්ත කථාව. ඒ නිසා කරුණාකරලා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාට රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කරන මන්ත්‍රීවරුන් ඇවිල්ලා තර්ජනය එල්ල කරන එක වහා නතර කරන්නට ඕනෑ. ඒකට ඔබතුමා විසඳුමක් ලබා දෙන්නට ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ ගැන කිසිම චෝදනාවක්, පැමිණිල්ලක් මේ වනතුරු අපට ලැබිලා නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
එතුමාගෙන් අහන්නකෝ, මම කියන්නේ ඇත්තද, බොරුද කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කවුද ඔබතුමාට තර්ජනය කළේ, ගරු මන්ත්‍රීතුමා?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
දැන් ඔබතුමාට මම කිව්වා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී මාව අතිශය අපහසුතාවට පත් කළා කියලා. මම ඉදිරිපත් කළේ දැන් වෙච්ච කථාවක්. මම ඔබතුමාට කියන්නේ අදෘශ්‍යමාන බලවේග මේ පිටුපස ඉන්නවා කියන එකයි. මම දන්නේ නැහැ, ඒ කවුද කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක හැම තැනම සිදු වෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
මම කියන්නේ මගේ ජීවිතයට අවදානමක් තිබෙනවා කියලායි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාට එහෙම තර්ජනයක් තිබෙනවාද කියලා පැහැදිලිව කියන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
මාව මරනවාය කියලා කිව්වේ නැහැ. මම ඔබතුමාට කියන්නේ මෙකයි. මම නේ ඒ සිද්ධියට මුහුණ දෙන්නේ. මගේ සපත්තු දෙකට ඔබතුමා ආවොත් ඔබතුමාට තේරෙයි, මෙතැන තිබෙන ගැටලුව මොකක්ද කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එහෙම එකක් තිබෙනවා නම් කරුණාකරලා කියන්න. ඒ ගැන විභාග කරන්න පුළුවන්.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු මුජිපුර් රහ්මාන්)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ හිටපු සාමාජිකයෙකු හැටියටයි මම මේ කාරණය කියන්නේ. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ඉතා බරපතළ කරුණක් හෙළිදරව් කළේ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව කියන්නේ රටේ මුදල් සම්බන්ධව තීන්දු ගන්නා හා උපදෙස් දෙන පාර්ලිමේන්තුවේ තිබෙන ඉතා වැදගත් කාරක සභාවක්. එවැනි කාරක සභාවක් තුළින් යම් යම් ගනුදෙනුවල දූෂණ, වංචා හොයන්න ගියාම එතුමාට තර්ජනාත්මකව කථා කරන එක හොඳ දෙයක් නොවෙයි. ඒ කියන්නේ, මරනවා කියලා කෙළින් කියන්න ඕනෑ නැහැ, ගරු කථානායකතුමනි. "තමුසේ මේක හොයන්න එපා" කියන එක ඉතා බරපතළයි. එතුමාට එහෙම චෝදනා කරලා තිබෙනවා; "තමුසේ මේවා හොයන්න එපා" කියලා තර්ජනය කරලා තිබෙනවා. එහෙම කරන්නේ, අනියම් ආකාරයෙන් VFS Global එකත් එක්ක ගනුදෙනු කරපු පුද්ගලයෝ; ඒකෙන් සල්ලි ගත් පුද්ගලයෝ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ ගැන පැමිණිල්ලක් කරන්න. ඒ සම්බන්ධයෙන් හොයලා බලන්නම්.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු මුජිපුර් රහ්මාන්)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලනවා, එතුමාට ලබා දී තිබෙන ආරක්ෂාව වැඩි කරන්න කියලා.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(මාණ්පුමිකු හරින් පර්නාන්දු)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, ඉදිරි පෙළ ඉන්නා මන්ත්‍රීවරුන් ඔක්කොම කැබිනට් මණ්ඩලයේ හිටියා. කැබිනට් මණ්ඩලයේදී මම මොනවාද කිව්වේ කියන එක කැබිනට් ඇමතිවරුන්ගෙන් අහන්න. හැබැයි, මේ ගරු සභාවේම ඉන්න මන්ත්‍රීවරයෙක් -මගේ පරණ මිත්‍රයා- දවසක පාර්ලිමේන්තුවේදී කිව්වා, මමත් ඔය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා වාගේ VFS Global එකෙන් ගනුදෙනු කරලා හම්බ කරගෙන තමයි කට වහගෙන ඉන්නේ කියලා. කට වහගෙන නැහැ. Tourism industry එකේ ඉන්නා අය මේ මොහොත වෙනකොටත් නඩු දාලා තිබෙන්නේ; උසාවි මාර්ගයට ගිහිල්ලා තිබෙන්නේ. මගේ පෞද්ගලික මතය තමයි මම කියලා තිබෙන්නේ. ඒ සම්බන්ධව කැබිනට් මණ්ඩලයේ ඇමතිවරුන් සියලුදෙනා දන්නවා.

නමුත් මට සාමූහික වගකීමක් තිබෙනවා. ඔබතුමන්ලාටත් කැබිනට් මණ්ඩලයේ හිටියා නම් ඒක තේරෙයි. මට සාමූහික වගකීමක් තිබෙනවා. ඒක කැබිනට් මණ්ඩලය ගත් තීන්දුවක්. හැබැයි, ඒ තීන්දුව contest වෙලා තිබෙනවා. ඒක change කරන්න පුළුවන් තැන්වලදී අපි change කරලා තිබෙනවා. අපි single-entry visa එක, තිබුණු ගණනටම - ඩොලර් 50ටම - ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම රටවල් 7කට වීසා නැතිව අපේ රටට එන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම දැන් අපි වාර්තාවක් හදලා අවසන් කරලා තිබෙනවා, -ඒක එකොළොස් දෙනෙකුගේ සහභාගීත්වයෙන් හදපු වාර්තාවක්- රටවල් 67කට free visa ලබා දෙන්න. ඒ නිසා මෙතැනදී වගකීමක් ගන්න පුළුවන් ඇමතිවරයෙක් හැටියට, අභියෝගයක් ගන්න පුළුවන් ඇමතිවරයෙක් හැටියට මේ ගැන සාකච්ඡා කරලා මේක වෙනස් කරන්න මම කටයුතු කරනවා. හැබැයි හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට චිතරක් නොවෙයි, ඔය චෝදනාව මටත් එල්ල කළා. හර්ෂ ද

සිල්වා මන්ත්‍රීතුමාට එහෙම කිව්වා වාගේ මටත් මේ පාර්ලිමේන්තුවේදී ඔය විධියටම මන්ත්‍රීවරයෙක් කියලා තිබෙනවා. එහෙනම් මමත් කියන්න ඕනෑ, මගේ ආරක්ෂාවට තර්ජනයක් තිබෙනවා කියලා. මොකද, මම VFS Global එකත් එක්ක ගනුදෙනුවක් කළා කියලා චෝදනා කරපු නිසා.

මේ ඊයේ පෙරේදා VFS Global ආයතනයේ නිලධාරීන් ඇවිල්ලා අපිව මුණ ගැහිලා කිව්වා, ඩොලර් ලක්ෂ 5ක් promotionsවලට දෙන්නම් කියලා. අපි කිව්වා, අපට ඒක ගන්න හැකියාවක් නැහැ, ඒ ගැන සාකච්ඡා කරන්න Tourism Advisory Committee එකට යොමු කරන්නම් කියලා. ඒකේ සභාපති හැටියට කටයුතු කරන්නේ, ජෙට්වින්ග් එකේ ප්‍රධානියා වන හිරාන් කුරේ මහත්මයා. එතුමාට භාර දුන්නා ඒ ගැන සාකච්ඡා කරන්න. හැබැයි, එතුමන්ලා කිව්වා, ඒ සාකච්ඡාවට යන්න කැමැති නැහැ කියලා. ඒ නිසා අපි ඒ සාකච්ඡාව ගෙනිව්වේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම චෝදනාවක් ඔබතුමන්ලාට කරන්න පුළුවන්. මම නැති වෙලාවේදී ඔබතුමා කරපු චෝදනාවත්, මේ දැන් හර්ෂ ද සිල්වා කියපු චෝදනාවට සමානයි. ඔබතුමා කිව්වා, මම සම්බන්ධයි කියලා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු ඇමතිතුමනි, ඔය ප්‍රශ්නය මෙතැනින් නතර කරමු. ඕකට වෙන දවසක විවාදයක් ගන්න.

මීළඟට, පෙත්සම් පිළිගැන්වීම.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු டலஸ் அழහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, හතරවැනි වතාවට ඔබතුමා මාව නම් කළේ; මම නැහිටිටෙ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමාගේ පෙත්සම ඉදිරිපත් කරන්න.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු டலஸ் அழහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, වීනවරාය, ධාන්‍යාගම, ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථානය අසල, අංක 43/1 දරන ස්ථානයෙහි පදිංචි එච්.ඒ.පී. ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(මාණ්පුමිකු வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු කථානායකතුමනි, දික්වැල්ල, පොල්ගහමුල්ල, "ජය නිවස" යන ලිපිනයෙහි පදිංචි පී.ඒ. කරුණාසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යැවිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, හරින් ප්‍රනාන්දු ඇමතිතුමා කිව්වා එතුමාට ඩොලර් ලක්ෂ 5ක්,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන point of Order එකක් නැහැ.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -1916/2024- (1), ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -1939/2024- (1), ගරු මිලාන් ජයතිලක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය: 2019 සිට සිදු කරන ලද වැටලීම්
பாவனையாளர் அலுவல்கள் அதிகாரசபை: 2019இலிருந்து மேற்கொள்ளப்பட்ட சுற்றிவளைப்புகள்
CONSUMER AFFAIRS AUTHORITY: RAIDS CONDUCTED FROM 2019

1967/2024

3. ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා
(මාණ්පුමිකු யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)
වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කර ඇති වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැටලීම් සංඛ්‍යාව අතරින් මේ වනවිට නීතිමය පියවර ගෙන ඇති වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත වැටලීම් සංඛ්‍යාව අතරින් සමථයකට පත් කරගෙන ඇති වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(iv) පාරිභෝගිකයන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම උදෙසා අධිකාරියේ මෙහෙයුම් අඛණ්ඩව සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

[ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා]

(ආ) එකම භාණ්ඩය විවිධ මිල ගණන් යටතේ අළෙවි කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

වර්ත්තක, වාණිප මට්‌ටුම් උණවුප් පාතුකාප්පු අමైච් චරైක් කేට්ට වినා:

(அ) (i) 2019ஆம் ஆண்டிலிருந்து இதுவரையில் பாவனையாளர் அலுவல்கள் அதிகாரசபையால் மேற் கொள்ளப்பட்டுள்ள சுற்றிவளைப்புகளின் எண்ணிக்கை யாது;

(ii) அவற்றில் தற்போது சட்ட நடவடிக்கை எடுக்கப் பட்டுள்ள சுற்றிவளைப்புகளின் எண்ணிக்கை யாது;

(iii) மேற்கூறப்பட்ட சுற்றிவளைப்புகளில் சுமுக மாகத் தீர்க்கப்பட்டுள்ள எண்ணிக்கை யாது;

(iv) பாவனையாளர்களின் பாதுகாப்பை உறுதிப் படுத்துவதற்காக அதிகாரசபையின் நடவடிக்கை கள் தொடர்ச்சியாக மேற்கொள்ளப்படுகின்ற னவா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) ஒரேவிதமான பொருள் பல்வேறு விலைகளின்கீழ் விற்பனை செய்யப்படுவது தொடர்பாக எடுக்கப்படு கின்ற நடவடிக்கைகள் யாவை என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce and Food Security:

(a) Will he inform this House -

(i) the number of raids carried out by the Consumer Affairs Authority since 2019 to date;

(ii) the number of raids to which legal actions have been taken;

(iii) the number of settlements made in respect of the above number of raids; and

(iv) whether the operations of the Authority are being continued to ensure the security of consumers?

(b) Will he also inform this House of the measures taken regarding the sale of the same product at different rates?

(c) If not, why?

ගරු නලින් ප්‍රනාන්දු මහතා (වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் பர்னாந்து - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Nalin Fernando - Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට පිළිතුර,- *[බාධා කිරීම්]* දැන් ඇති ඕක. පොඩ්ඩක් නවත්වන්නකෝ. උදේ ඉඳන්ම පාර්ලිමේන්තුව හෑවා. දැන්වත් අවස්ථාව දෙන්නකෝ, වැඩ කරන්න. උදේ ඉඳන්ම බලාගෙන ඉන්නවා. කථානායකතුමා ඔය ඔක්කොටම අවස්ථාව දෙනවා නේ. වැඩ නවත්වලා ඇවිල්ලා අපි මෙතැන ඉඳගෙන ඉන්නවා, ගරු කථානායකතුමනි. ප්‍රශ්නයට උත්තර දෙන්න විධියක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි. ඔබතුමා උත්තර දෙන්නකෝ.

ගරු නලින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) වර්ෂ 2019 සිට 2024 පෙබරවාරි සඳහා මේ දක්වා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කර ඇති වැටලීම් සංඛ්‍යාව 92,050කි.

(ii) එම වැටලීම් සංඛ්‍යාවෙන් මේ වන විට නීතිමය පියවර ගෙන ඇති සංඛ්‍යාව 87,337කි.

(iii) සමථයකට පත් කරගෙන ඇති සංඛ්‍යාව 996කි.

(iv) ඔව්.

(ආ) ක්‍රියාමාර්ග ගෙන නොමැත.

එකම භාණ්ඩය විවිධ මිල ගණන් යටතේ අළෙවි කිරීම හේතු කීපයක් නිසා සිදු විය හැක. උදාහරණ ලෙස භාණ්ඩයේ ගුණාත්මකභාවය නිෂ්පාදකයාගේ වෙළෙඳ නාමය සතු කීර්ති නාමය, භූගෝලීය පිහිටීම, යොදවා ගනු ලබන ඇසුරුමේ ස්වභාවය, භාණ්ඩය නිෂ්පාදකයාගේ ධාරිතාව මත මහා පරිමාණ පිරිමැසුම් ලබා ගත හැකි වීම යනාදී කරුණු ගණනාවක් මත එකම භාණ්ඩය විවිධ මිල ගණන් යටතේ වෙළෙඳ පොළේ අළෙවි කරනු ලැබීමේ අවස්ථා ඇත.

තරගකාරී විවෘත වෙළෙඳ ආර්ථික පරිසරයක් තුළ විවිධ වෙළෙඳ නාම යටතේ විවිධ මිල ගණන්වලට එකම භාණ්ඩය, එනම් සිමෙන්ති ඇතුළු ගොඩනැඟිලි ද්‍රව්‍ය, ඇසුරුම් කරන ලද ආහාර ද්‍රව්‍ය වැනි විවිධ වෙළෙඳ නාම යටතේ විවිධ ඇසුරුම් ක්‍රම භාවිත කරමින් පාරිභෝගිකයා ආකර්ෂණය කර ගැනීම මත පදනම්ව විවිධ මිල ගණන් යටතේ භාණ්ඩ අළෙවිය සිදු විය හැක. කෙසේ වෙතත්, භාණ්ඩ තෝරා ගැනීමේ අයිතියට කිසිදු බලපෑම් කිරීමක් පාරිභෝගිකයාට සිදු නොවන ආකාරයෙන් භාණ්ඩ අළෙවි කිරීම් වෙළෙන්දන් විසින් සිදු කළ යුතු වේ.

වෙළෙඳ පොළේ විකුණනු ලබන ඇසුරුම් කරන ලද භාණ්ඩවල මිල සහ කල් ඉකුත්වීමේ දිනය අනිවාර්යයෙන් සඳහන් කළ යුතුව ඇති අතර, මෙම නියමයන් උල්ලංඝනය කරන නිෂ්පාදකයන්ට සහ වෙළෙන්දන්ට එරෙහිව නෛතික ක්‍රියා මාර්ග ගැනීම නොකඩවා සිදු කරනු ලබයි. එසේ වුවද, යම් භාණ්ඩයක අසාමාන්‍ය ලෙස අධික මිලකට අළෙවි වීම සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ට, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙතට පැමිණිලි කිරීමේ හැකියාවක් ඇත.

මෙම තත්ත්වයන් සම්බන්ධයෙන් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී ගරු මන්ත්‍රීතුමන්ලා දක්වා ඇති අදහස් හා යෝජනා අනුව දැනට අමාත්‍යාංශයේ මහපෙන්වීම යටතේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් තෝරාගත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල, රක්ෂණ හා ගැල් කුලී අගය, විනිමය අනුපාතිකය, තීරුබදු/ බදු ව්‍යුහයන්, නාස්තිය හා ආන්තිකය ඇතුළු අනෙකුත් මූලිකාංග මත පදනම්ව ඒවායේ ප්‍රකාශිත මිල ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත.

මෙම ක්‍රියාවලිය මඟින් වෙළෙඳ පොළ මිල ගණන් පිළිබඳව තවදුරටත් පාරිභෝගිකයන් දැනුවත් වනු ඇත. ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය ද දැනුවත් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)

ගරු ඇමතිතුමනි, මට ඔබතුමාගෙන් විශේෂ ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. අද වෙද්දී අපේ රටේ වෙළෙඳ පොළ දිනෙන් දින පුළුල් වෙමින් පවතිනවා. වෙළෙඳ ස්ථාන, ව්‍යාපාරික ස්ථාන වැඩිවෙමින් පවතිනවා. හැබැයි, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය තුළින් අපේ පාරිභෝගික ජනතාව රැකෙනවාද කියන එක සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ගම්වල ඉන්න දේශපාලනඥයන් හැටියට විශාල වශයෙන් අපි දකිනවා, අපේ පාරිභෝගිකයන් නොයෙක් අවස්ථාවල අපහසුතාවට පත් වෙන ආකාරය. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය තුළින් අපේ පාරිභෝගිකයන්ට වෙන සේවාව මීට වඩා වඩාත් කාර්යක්ෂමව ඉටු කරන්න යම් වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා අපි දැනගන්න කැමැතියි.

ගරු නලින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)

ගරු කථානායකතුමනි, සුමිත් උඩුකුඹුර මන්ත්‍රීතුමා මතු කළ කාරණය හරි. මොකද, අද වෙද්දී තාක්ෂණය භාවිත කරන, විශාල වශයෙන් සංකීර්ණ වෙච්ච, පුළුල් වෙච්ච වෙළෙඳ පොළක් තමයි අප රට තුළ තිබෙන්නේ. හැබැයි, ඒ තුළ පාරිභෝගිකයාට විශාල වශයෙන් අසාධාරණකම් වෙනවා වැඩියි. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය තමයි, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත අවුරුදු ගණනාවකින් -අවුරුදු 15කින්, 20කින්වත්- සංශෝධනය නොකිරීම. ඒ නිසා මම විෂය භාර අමාත්‍යවරයා වශයෙන් පත් වුණාට පස්සේ ඒ පනත වෙනස් කරලා, අද වෙද්දී ඒකට කැබිනට් මණ්ඩල අනුමැතිය අරගෙන, නීතිපතිතුමාට යොමු කරලා, නීතිපතිතුමාගේ අවසාන නිරීක්ෂණය යටතේ ඒ පනත් කෙටුම්පත අපි තව සුමාන දෙකකින් විතර මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න බලාපොරොත්තු වෙනවා. මේ තුළින්, පාරිභෝගිකයා ආරක්ෂා කරන වැඩ පිළිවෙළෙහි මූලිකව කරන්න තිබෙන කාරණා ටික අපට ඉස්සරහට ගෙනයන්න පුළුවන්.

පසුගිය කාලය දිහා බැලුවාම අපට පෙනී යනවා, මේ ආර්ථිකය කඩා වැටීමත් එක්ක, කොවිඩ් වසංගතයත් එක්ක වෙළෙඳ පොළ තුළ වෙළෙඳුන් විශාල වශයෙන් -අධික- ලාභ තියාගන්න තත්ත්වයක් තිබුණු බව. භාණ්ඩ සහවා ගැනීම් ආදී දේවල් නිසා වෙළෙඳ පොළට භාණ්ඩ අඩුවෙන් නිකුත් කරලා, වැඩි මිලට විකුණන තත්ත්වයක් පසුගිය කාලය තුළ තිබුණා. අපි විශාල පරිශ්‍රමයක් යොදලා අද වෙද්දී භාණ්ඩ මිල පහතට ගෙනෙන්න කටයුතු කර තිබෙනවා. අපි ඒ සියලු සමාගම් ගෙන්වලා කථා කරලා තමයි මෙවැනි තීන්දු අරගෙන තිබෙන්නේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විමර්ශන නිලධාරීන් ඉන්නේ මුළු ලංකාවටම - දිස්ත්‍රික්ක 25කට - 277දෙනායි. දිවයින පුරා අපේ කාර්යාල 25ක් තිබෙනවා. ඒ කාර්යාල 25ටම ඉන්නේ විමර්ශන නිලධාරීන් 277දෙනායි. එතකොට 10දෙනෙක්, 12දෙනෙක් වාගේ තමයි දිස්ත්‍රික්කයකට ඉන්නේ.

ඉතින්, ඒ අය අදාළ නීතිමය කටයුතුවලට උසාවිවලට යන්න ඕනෑ; නඩුවලට යන්න ඕනෑ. මෙවැනි තත්ත්වයක් තුළ අපට මේ කටයුතු කළමනාකරණය කරන්න ලේසි වන්නේ නැහැ. ඒ නිසා අපි අවශ්‍ය බඳවා ගැනීම් කරන්න කටයුතු කරනවා. විමර්ශන නිලධාරීන් වැඩි කරලා, වෙළඳ පොළ ගැටලුවලට ශක්තිමත්ව මුහුණ දෙන්න පුළුවන්, පාරිභෝගිකයා ආරක්ෂා කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් තවත් මාසයක් ඇතුළත අලුතින් ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරනවා.

ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මීට වර්ෂයකට කලින් භාණ්ඩ තිබුණු මිල නොවෙයි දැන් තිබෙන්නේ. විශේෂයෙන්ම ඉන්ධන, ගෑස්, විදුලි බලය ආදි දේවල මිල දැන් රජය ක්‍රමක්‍රමයෙන් අඩු කරගෙන යනවා. හැබැයි, එහි වාසිය පාරිභෝගික ජනතාවට ලැබෙන්නේ නැහැ. අපි දැනගන්න කැමැතියි, එහි වාසිය ගන්නේ ව්‍යාපාරිකයා ද කියලා. මොකද, ජනතාවට ඒ වාසිය ලබා දෙන්න කටයුතු කරන බවක් අපි දකින්නේ නැහැ. ඒකට අවස්ථාව හදලා දෙන්න ඔබතුමන්ලා සතුව වැඩසටහනක් තිබෙනවා ද?

ගරු නලින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)

ගරු මන්ත්‍රීතුමනි, මම කලිනුත් කිව්වේ ඒක තමයි. ආර්ථික අර්බුදයෙන් පස්සේ විශේෂයෙන්ම මේ වෙළෙන්දන් සහ සමාගම් අධික ලාභයක් ලබමින් කටයුතු කෙරුවා. හැබැයි, අපි පිළිගන්න ඕනෑ කාරණයකුත් තිබෙනවා. ඒ තමයි, 2019ට සාපේක්ෂව අද වෙද්දී ඉන්ධන මිල, විදුලි බිල සහ අනෙකුත් මිල ගණන් ආදිය වැඩි වෙලා තිබීම. ඒවාත් නිෂ්පාදන පිරිවැයට එකතු වෙනවා. ඒ ප්‍රමාණය ගත්තත් අද වෙද්දී විශාල මුදලක්. අප ඒ කාලයේ රුපියල් 100ට, රුපියල් 125ට ගත්තු ඩීසල් ලීටරයක් අද රුපියල් 350ක්, රුපියල් 360ක් විතර වෙනවා. එදාට වඩා තුන්ගුණයකින් විතර මිල වැඩි වෙලා තිබෙනවා. එවැනි දේවලුත් මේ සඳහා බලපා තිබෙනවා. ඒ කෙසේ වෙතත් වෙළඳ පොළ නිරීක්ෂණ කටයුතුවලදී අපට තේරෙනවා, ඊට වඩා වැඩි ලාභ තීරුවක් වෙළෙන්දන් තියා ගන්නවා කියලා. විශේෂයෙන්ම, සමාගම්. මම ගිය සතියේ සිමෙන්ති සමාගම්වල නිලධාරීන් ගෙන්වා සාකච්ඡා කළා. ඒ අය සිමෙන්ති කොට්ටයක් විකුණන්නේ රුපියල් 1,950කට. හැබැයි, උපරිම සිල්ලර මිලක් දාලා තිබෙනවා, රුපියල් 2,400යි කියලා. ඒක කිසිම තේරුමක් නැති උපරිම සිල්ලර මිලක්. මොකද, රුපියල් 450ක විතර පරාසයක් තුළ සිමෙන්ති විකුණන වෙළෙන්දාට ඕනෑ ගාණකට විකුණා ගන්න පුළුවන් හැකියාව ඒ හරහා ලබා දීලා තිබෙනවා. ඒ නිසා මම ඒ අයට කිව්වා, තමන් සිමෙන්ති කොට්ටයක් රුපියල් 1,950ට විකුණනවා නම්, රුපියල් 2,000ක උපරිම සිල්ලර මිලක් තමයි තිබෙන්න ඕනෑ කියලා. එවැනි සිදුවීම් විශාල ප්‍රමාණයක් වෙළෙඳ පොළ තුළ සිදු වෙනවා. ඒ නිසා තමයි පාරිභෝගිකයා දැනුවත් කරන්න ඕනෑ කියලා අප කියන්නේ. මෙවැනි තත්ත්වයක් තුළ මේ මේ භාණ්ඩවල මිල මේ මේ ගණන් වෙනවා කියලා අපි ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ කියන්නේ, ප්‍රකාශිත මිලක්. එතකොට පාරිභෝගිකයා දැනුවත් වෙනවා, මේ භාණ්ඩය මෙච්චර ගාණකට විකුණන්නේ ඇයි කියලා. ඒ නිසා ඉදිරියේදීත් එවැනි සමාගම්වලට විරුද්ධව කටයුතු කරන්න අපි සූදානම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -1993/2024- (1), ගරු වාසුදේව නානායක්කාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

සේවක අර්ථසාධක අරමුදල: විස්තර
ஊழியர் சேமலாப நிதியம்: விபரம்
EMPLOYEES' PROVIDENT FUND: DETAILS

2006/2024

5. ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය දරන, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වන විට එම අරමුදලේ ඇති මුදල කොපමණද;

(iii) එම මුදල් වෙනත් වැඩසටහන් සඳහා භාවිත කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊழியர் சேமலாப நிதியத்துக்குப் பங்களிப்புச் செய்கின்ற பகுதியளவு அரச மற்றும் தனியார் துறை ஊழியர்களின் எண்ணிக்கை வெவ் வேறாக யாது;

(ii) இன்றளவில் மேற்படி நிதியத்திலுள்ள நிதித் தொகை எவ்வளவு;

(iii) மேற்படி நிதி வேறு திட்டங்களுக்காகப் பயன் படுத்தப்படுகின்றதா;

(iv) ஆமெனில், அத்திட்டங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Economic Stabilization and National Policies:

(a) Will he inform this House -

(i) the number of semi-government and private sector employees, separately, contributing to the Employees' Provident Fund;

(ii) the amount of money in the Fund at the moment;

(iii) whether those monies are used for other programmes; and

(iv) if so, what those programmes are?

(b) If not, why?

ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සතුව ඇති තොරතුරු මඟින්, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයන් වෙන්කොට හඳුනා ගැනීමට හැකියාවක් නොමැත.

(ii) සේවක අර්ථසාධක අරමුදලේ වටිනාකම 2024 පෙබරවාරි මස අවසන් වන විට රුපියල් බිලියන 3,912.3කි.

(iii) ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් අරමුදලේ මුදල්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ සඳහන් කාර්යයන්ට පමණක් භාවිත කරන අතර, වෙනත් වැඩසටහන් සඳහා භාවිත නොකරයි.

(iv) අදාළ නැත.

(ආ) පැන නොනඟී.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

ගරු කථානායකතුමනි, සංචාරක විෂය භාර ගරු ඇමතිතුමාත්, මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්න නිසා මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය හැටියට අහන්න කැමැතියි, VFS වීසා මගඩිය පිළිබඳව. ගරු රාජ්‍ය ඇමතිතුමනි, agreement එකේ තිබෙනවා, ඩොලර් මිලියන 200ක් ඒගොල්ලන් ආයෝජනය කරනවා කියලා. ඒ ආයෝජනය ලැබිලා තිබෙනවාද? It is a very simple question.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

Sorry, could you repeat it? Which one are you referring to? Is it about the VFS investment or what?

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

They have promised to invest about US Dollar 200 million.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

The VFS, is it?

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

Yes.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

Hon. Speaker, I am not in a position to answer that Supplementary Question because the main Question does not say anything about the VFS; it is about the Employees' Provident Fund. So, now, I am not in a position to answer that, but if you raise a separate Question on the VFS, Hon. Member, we can get down the details and give an answer.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

Similarly, on the same lines, I would like to raise about the visa payment receipt which says "powered by

CCAvenue". ගරු රාජ්‍ය ඇමතිතුමනි, agreement එකේ මුකුත් නැති වුණාට CCAvenue එක පිළිබඳවත් පාර්ලිමේන්තුව දැනුවත් කළොත් හොඳයි. ගරු සංචාරක ඇමතිතුමනි, CCAvenue කියන ආයතනය මා හිතන විධියට fintech ආයතනයක්.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

Sir, I request the Hon. Member to raise a separate Question on that also. Then, we will get the required details presented in Parliament accordingly.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු රංජිත් සියඹලාපිටිය මුදල් රාජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ ඉන්න නිසා මම විශේෂයෙන්ම අහන්න කැමැතියි, මහ බැංකුවේ පඩි වැඩි කිරීම පිළිබඳව. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඒ පිළිබඳව මේ උත්තරීතර සභාව දැනුවත් කළොත් හොඳයි. මහ බැංකුවේ පඩි වැඩි කිරීම් කරලා තිබෙනවාද? ඒ පඩි වැඩි කිරීම් පිළිබඳව, about the raising of salaries of the staff of the Central Bank පිළිබඳව දැන ගන්න කැමතියි. The Central Bank finally agreed that they would defer those payments for their senior staff. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒකට දැන් මොකක්ද වෙලා තිබෙන්නේ?

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

Sir, once again, if the Hon. Member raises a seperate Question, we can give the answer in detail.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, that has no relevence to your Question.

ප්‍රශ්න අංක 6 -2021/2024- (1), ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 -2045/2024- (1), ගරු ලලිත් එල්ලාවල මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 -2057/2024- (1), ගරු වේලු කුමාර් මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 -2075/2024- (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

සුළු හා මධ්‍ය පරිමාණ සංචාරක ක්ෂේත්‍රය: සංවර්ධනය
சிறிய மற்றும் நடுத்தர அளவிலான சுற்றுலாத்துறை: அபிவிருத்தி
SMALL AND MEDIUM-SCALE TOURISM SECTOR: DEVELOPMENT

2084/2024

10. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ සංචාරක ක්ෂේත්‍රය නහා සිටුවීම සඳහා බ්‍රිතාන්‍යයේ ප්‍රසිද්ධ රක්ෂණ සමාගමකින් ශ්‍රී ලංකාවට රුපියල් කෝටි 4,100ක දෙමුහුන් ප්‍රදානයක් ලැබීමට නියමිත බවත්;

(ii) එම ප්‍රදානය ලැබීම වැළැක්වීම සඳහා මහා පරිමාණ ව්‍යාපාරිකයන් පිරිසක් උත්සාහ කරන බවට ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ සංචාරක ව්‍යාපාරික සංගමය පෙන්වා දී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ සංචාරක ව්‍යාපාරිකයන්ගේ අභිවෘද්ධිය උදෙසා ලබා දීමට නියමිත එම දෙමුහුන් ප්‍රදානය ලබා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் சிறிய மற்றும் நடுத்தர அளவிலான சுற்றுலாத்துறையைக் கட்டியெழுப்புவதற்கு பிரித்தானியாவின் பிரசித்திபெற்ற காப்புறுதி நிறுவனமொன்றிடமிருந்து 4,100 கோடி ரூபாய் கலப்பு அடிப்படையிலான மானியம் கிடைக்க விருக்கின்றதென்பதையும்;

(ii) கிடைக்கவிருக்கின்ற மேற்படி மானியத்தைத் தடுப்பதற்குப் பாரியளவிலான சில வர்த்தகர்கள் முயற்சித்து வருவதாக இலங்கை சிறிய மற்றும் நடுத்தர அளவிலான சுற்றுலாத்துறை வர்த்தகச் சங்கம் சுட்டிக்காட்டியுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) இலங்கையிலுள்ள சிறிய மற்றும் நடுத்தர அளவிலான சுற்றுலாத்துறை வர்த்தகர்களின் மேம்பாட்டுக்காகப் பெற்றுக்கொடுக்கப்படவுள்ள மேற்படி கலப்பு மானியத்தைப் பெற்றுக்கொள்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Tourism and Lands:

(a) Is he aware that -

(i) Sri Lanka is due to receive a hybrid grant of Rs. 4,100 crores from a well-known insurance company in Great Britain with a view of developing the small and medium-scale tourism sector in Sri Lanka; and

(ii) the Small and Medium Scale Tour Operators Association of Sri Lanka has pointed out that a group of large-scale businessmen are trying to prevent the receipt of that grant?

(b) Will he inform this House of the measures that would be taken to receive that grant, which is meant for the advancement of the small and medium-scale tour operators in Sri Lanka?

(c) If not, why?

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

ගරු කථානායකතුමනි, ගිය සුමානයේ මේ ගරු මන්ත්‍රීතුමාගේ උපන් දිනය යෙදී තිබුණා. එදා ලොකු පාටියක් එහෙම දාලා තිබුණා. මා මුලින්ම ගරු මන්ත්‍රීතුමාට සුබ පැතුම් පිරිනමනවා.

ගරු කථානායකතුමනි, එතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i), (ii)

ASUIA නමැති ආයතනය විසින් ඩොලර් මිලියන 150ක මෘදු ණයක් සියයට 6.5ක පොලී අනුපාතයක් මත ලබා දීමට යෝජනා කර තිබුණි.

(ආ) එම ණය මුදල ලබා ගැනීමට කටයුතු නොකරනු ලැබේ.

(ඇ) එම ප්‍රදානය ඇමෙරිකානු ඩොලර් මිලියන 672ක වගකීමක් ලෙස අදාළ ආයතනයට නැවත ගෙවීමට සිදු වන්නකි. තවද, ශ්‍රී ලංකාවට පැමිණෙන සෑම සංචාරකයෙකුටම ඇමෙරිකානු ඩොලර් 32ක් අනිවාර්ය වෛද්‍ය හා ගමන් රක්ෂණාවරණයන් සඳහා වසර 07ක කාලයක් වෙනුවෙන් ASUIA ආයතනය සමඟ බැඳීමකට යටත් වීමට සිදුව තිබුණි. එම දෙමුහුන් ප්‍රදානය ලබා ගැනීමේදී -ණය ප්‍රමාණය ලබා ගැනීමේදී- මෙරට සංචාරක කර්මාන්තයට අවාසිදායක හා අහිතකර බලපෑම් ඇති වන බව හඳුනා ගන්නා ලද නිසා එම ප්‍රදානය ලබා ගැනීම ක්‍රියාත්මක නොවුණි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, අපි දන්නවා කොරෝනා අවධියෙන් පසුව මෙරට සංචාරක ව්‍යාපාරය විශාල කඩා වැටීමකට ලක් වුණු බව. හැබැයි, දැන් ක්‍රමිකව අපේ රටට සංචාරකයින්ගේ පැමිණීම වර්ධනය වෙමින් පවතිනවා. ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයේ ආයෝජකයන්ගේ අවශ්‍යතාව අපි දැඩිව දකිනවා. මොකද, වැඩි වන සංචාරකයින් පිරිසට ප්‍රමාණවත් පහසුකම්වල, හෝටල් සහ ඔවුන්ගේ අවශ්‍යතාවලට සරිලන යටිතල පහසුකම්වල දියුණුව ප්‍රමාණවත් නැති බව අපි දකිනවා, ගරු සංචාරක ඇමතිතුමනි. ක්‍රමිකව වැඩි වන සංචාරක ව්‍යාපාරයට අලුතින් එන ආයෝජකයන්ට සහ සංචාරක කර්මාන්තයේ යෙදී සිටින අයට යම් දිරි ගැන්වීමක්, එහෙම නැත්නම් විශේෂ මූල්‍ය ශක්තියක්, විශේෂ ණය පැකේජයක් ලබා දීමට රජය විධියට ඔබතුමන්ලා කටයුතු කරගෙන යනවා ද? මොකද, ඔවුන් යම් කාලයක් රැඳී ඉඳලා හෝටල් වැඩිදියුණු කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා.

ඒවා repair කරන්න අවශ්‍ය ලොං තිබෙනවා. ඒ වාගේම නව ආයෝජන කිරීමේ අවශ්‍යතා ඔවුන්ට තිබෙනවා. ඒ සඳහා රජයක් විධියට ඔබතුමන්ලා යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද?

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඇසීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මොකද, මේක මම අමාත්‍යාංශය භාරගත් දවස්වල ඉඳන් කථා වෙච්ච මාතෘකාවක් නිසා. ඇත්ත වශයෙන්ම මම ඇමති ධුරය භාර ගන්න වෙලාවේ ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ විශාල කඩා වැටීමක් තිබුණා. එක සංචාරකයෙක්වත් ලංකාවේ හිටියේ නැහැ. ඒ වාගේම හිටපු සංචාරකයන් පිරිසත් ගියා. ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට ණය නැවත ගෙවීම පිළිබඳවත් ලොකු ප්‍රශ්නයක් තිබුණා. ඒ කියන්නේ, moratorium එක. Moratorium එක සම්බන්ධයෙන් අපි තමයි ඉස්සෙල්ලාම මේ සාකච්ඡාව මේ ආයතනයත් එක්ක කැඳෙව්වේ. ඊට පස්සේ ඔවුන් අපි ඒකට කැමැති නැති වෙච්ච අවස්ථාවේ සංචාරක ක්ෂේත්‍රයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් කිහිප දෙනෙක් එකතු කරගෙන සාකච්ඡාවක් අරගෙන කිව්වා, ඩොලර් මිලියන 150ක් විතර අපට හම්බ වෙනවා, ඇයි, ලංකා රජය මේක ගන්නේ නැත්තේ කියලා. ඉතින් මේ ප්‍රශ්නය අහපු එක නියමයි. අනිශයින්ම ප්‍රථම වතාවට මේ ප්‍රශ්නය අහපු එක උදාරයි; ඇත්ත වශයෙන්ම උදාරයි. හරියට "ලලයි ලිලයි ලයි" එකේ වාගේ. මොකද, මේකට හේතුව කියන්නම ඕනෑ. මේකත් අර VFS එක වාගේ ප්‍රශ්නයක්; කෙළින්ම VFS එක වාගේ ප්‍රශ්නයකින් මම බේරුණු එකක්. ඒ නිසා මම බය නැතුව ආඩම්බරයෙන් ඒක කියනවා. ඔබතුමා තවම මාත් එක්ක තිබෙන මිත්‍රකමට මේක ඇහුවාද කියලත් සැකයි, ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, මේ ගැන අහපු එක හොඳයි. මොකද, මේකෙදිත් ඩොලර් 32ක් සංචාරකයෙකුගෙන් ගන්න ඕනෑ. ඒක IATA එක හරහා අවුරුදු 7ක් ගන්න ඕනෑ. දැන් මේ වීසා ප්‍රශ්නය ගැන කියලා කෑ ගහනකොට ඔබතුමන්ලා මගෙන් අහනවා, ඇයි insurance එකක් දාලා සංචාරකයන්ගෙන් තව ඩොලර් 32ක් ගන්නේ නැත්තේ කියලා. ඔබතුමාට මේ ප්‍රශ්නය ලියලා දුන්කෙනා උදාරයි කිව්වේ ඒකයි. මොකද, ඒක නොකියා කියලා තිබෙන්නේ. අවුරුදු 7කට සංචාරකයෙකුගෙන් ඩොලර් 32ක්. හිතලා බලන්නකෝ, මෙහෙන් තව පැත්තකින් VFS එකෙන් ගන්නවා. තව ඩොලර් 32ක් ගත්තොත් සංචාරකයෙක් එයිද ලංකාවට? මේ ඩොලර් මිලියන 150 මුහුණට පෙන්වලා අපට moratorium එක ගෙවාගනින් කියලා දීලා අනික් පැත්තෙන් හැම සංචාරකයෙකුගෙන්ම එනකොට ඩොලර් 32ක් IATA එක හරහා air ticket එකෙන් ගන්නවා. ඒකට අපි අකමැති වුණා. ඒකයි අපි කිව්වේ ඒක දෙන්නේ නැහැ කියලා. මමත් කැමැතියි, ඩොලර් මිලියන 150ක් grant එකක් විධියට හම්බ වෙනවා නම්. නමුත් එය grant එකක් විධියට නොවෙයි, ණයක් විධියට දෙන්නේ.

මේ මොහොතේදී මම කියන්න ඕනෑ, මේ කාරණයත්. ඔව්, අපි පුළුවන් විධියට දැනට soft liquor licences දීලා තිබෙනවා, ලංකාවේ 2,000කට වඩා. එහෙම දුන්නේ ඒ ආයතනවලට මේ ණය ගෙවා ගෙන යන්න කීයක් හරි ආදායම සොයා ගන්නයි. ඒ සඳහා බියර් සහ වයින් licences දුන්නා, සංචාරක ක්ෂේත්‍රයේ හැම registered ආයතනයකටම; අපි දිගට හරහට ඒ licences දුන්නා. එහෙම දුන්නේ සංචාරක ක්ෂේත්‍රයේ යෙදුණු ඔවුන්ට ආදායමක් සොයාගෙන සුද්දෝ මේ රටට එන්නේ නැති කාලයේ කොහොම හරි කරලා sustain වෙලා ඒකෙන් ණය ගෙවා ගන්න. ඊට පස්සේ පර්මිට් එක දැන් හදලා තිබෙනවා. හැබැයි, ඒවාට ක්‍රමවේදයක් තිබෙනවා. මට ඕනෑ විධියට, මට ඕනෑ ආයතනවලින් ගේන්න බැහැ. ඒක කරන්න පුළුවන් ලංකාවේ registered ආයතනවලින් පමණයි. ඒ ගොල්ලන් දෙන්න ඕනෑ, maintenance සඳහා අවුරුදු පහක සහතිකයක්. ඊළඟට දෙන්න ඕනෑ, අවුරුදු 5ක warranty එකක්. ලියාපදිංචි ආයතනවලට විතරයි ඒ වාහන ගේන්න පුළුවන්. Tourism Development Levy - TDL - එක ගෙවන registered ආයතනවලට අපි ඒ අවස්ථාව ලබා දුන්නා.

ඔබතුමා මගෙන් අහපු ප්‍රශ්නය තමයි, සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රගමනය වෙනුවෙන් කරලා තිබෙන්නේ මොනවාද කියන එක. ඒවා තමයි එම ක්ෂේත්‍රයේ ප්‍රගමනය වෙනුවෙන් කරලා තිබෙන්නේ. හැබැයි එන හැම සුද්දාගෙන්ම සල්ලි ගන්න ක්‍රමයට අපි විරුද්ධ වුණා. ඒක නිසා තමයි මම VFS එකටත් විරුද්ධ වුණේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(*மாண்புமிகு நலின் பண்டார ஜயமஹ*)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා අහනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ උත්තරයට මම පොඩි කොටසක් එකතු කරන්න ඕනෑ. ඔබතුමා කියන විධියට, මහා පරිමාණ ඩීල් එකක් තමයි මේ ඇවිල්ලා තිබෙන්නේ. ඔබතුමා ඒකෙන් බේරුණා වාගේ කථාවක් තමයි මේ කිව්වේ, නේද?

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(*மாண்புமிகு ஹரின் பர்னாந்து*)
(The Hon. Harin Fernando)

ගරු කථානායකතුමනි, එතැනදී බේරුණා කියන්නේ, සුද්දෙකුගෙන් අය කරන තවත් ගාස්තුවක් අය නොකර සිටීමට පුළුවන් වීම. මම එකක් කියන්නම්. ඔය වාගේ ඩීල්වලදී අනිවාර්යයෙන් කිසියම් ගණනක් offer කරනවා, ඇමතිවරුන්ට. ඒක සාමාන්‍ය කරුණක්. මට නම් කවුරුවත් offer කරන්න ඇවිල්ලා නැහැ. නමුත් මම දන්නවා ඩොලර් 32ක් කියන්නේ මහා විශාල ප්‍රමාණයක් බව. Insurance එක ඩොලර් 32ක් කියන්නේ, ඒ ගොල්ලන් reinsure කරලා තිබෙන්නේ Lloyd's සමාගමත් එක්ක. Lloyd's සමාගමත් එක්ක කියලා කිව්වාට ඒ ගොල්ලන් කොවිඩ් කාලයේ insurance එකක් දීලා තිබෙනවා. දීලා, ඒකට නොගෙවපු මුදලකුත් තිබෙනවා. සංචාරක අමාත්‍යාංශය People's Leasing & Finance එකට ගිහිල්ලා - එතැන බ්‍රෝකර්ලා ඉන්නවා; agencies තිබෙනවා. ඉතින් ඒක මහා පටලැවිල්ලක්. ඒ නිසා අපි ඒකට ඒ වෙලාවේදීත් අකමැති වුණා. කොහොම හරි අපි ආවාට පස්සේ, මම මේ අමාත්‍යාංශය භාර ගත්ත වෙලාවේ ඉඳලා ඒක නැවත වතාවක් ආවා. මම ඒක කමිටුවකට යොමු කරලා සම්පූර්ණයෙන් අධීක්ෂණය කරලා ඒ ගැන සලකා බැලුවා. සංචාරකයන් එන එක ප්‍රවර්ධනය කරන්න ඕනෑ කාලයේදී අපි තවත් මුදලක් ඔවුන්ගෙන් අය කිරීම සුදුසු නැහැ කියන එකයි මගේ අදහස. හැබැයි මම සම්පූර්ණයෙන්ම බැහැර කරන්නේ නැහැ, සංචාරකයෙකුට හොඳ insurance එකක් දෙන එක හොඳයි කියන එක. හැබැයි ඒකේ දෙපැත්තක් තිබෙනවා. මොකද, රටට එන සංචාරකයන් ගොඩක් වෙලාවට insurance එකක් අරගෙන එන්නේ. හැබැයි ඇල්ල වාගේ ප්‍රදේශයකට යන සංචාරකයෙකුට යම් කිසි අසනීපයක් වුණොත් යන්න වෙන්නේ බදුල්ල මහ රෝහලට. ඒ අයව private hospital එකකට ගෙන යන්න විධියක් නැහැ. මොකද, helicopter service එකක්, air ambulance එකක් නැහැ, ලංකාවේ. ඒ වාගේ ප්‍රශ්න තවම තිබෙනවා. ඒ නිසා insurance එකක් තිබෙන එක හොඳයි. හැබැයි ඒක optional වෙන්න ඕනෑ, compulsory වෙන්න බැහැ. Compulsory වුණොත්, එතැනදී තමයි ගේම් එක සැර වැඩි වෙන්නේ. ඒ නිසා ඒක option එකක් විධියට දෙන්න පුළුවන් ක්‍රමවේදයක්, platform හදන එක තමයි වඩා ඵලදායී වෙන්නේ. හැබැයි අපි දන්නවා, එන ගොඩක් සංචාරකයන්ට Bupa, Aviva වාගේ ලොකු, හොඳ insurance covers තිබෙන බව. හැබැයි ඒ වාගේ එකක් නැති සංචාරකයනුත් ඉන්නවා. එහෙම අය ආවාම අපි දකිනවා, ඒ සමහර සංචාරකයන් සීගිරියේදී බඹරු ගහලා සීගිරිය රෝහලේ ඉන්නවා. ඉතින් මම යෝජනා කරලා තිබෙනවා අපේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට - Sri Lanka Tourism Development Authority, SLTDA එකට - අඩු ගණනේ සුද්දෝ වෙනුවෙන් ඒ පළාත්වල රජයේ ඉස්පිරිතාලවල සුද්දන්ට ඉන්න පුළුවන් වාට්ටුව ගණනේවත් හදන්න කටයුතු කරන්න කියලා. අපි නුවර ගත්තොත්, එහි නම් අඩු ගණනේ පෞද්ගලික රෝහල් කිහිපයක් තිබෙනවා. නමුත් ත්‍රිකුණාමලය, අරුගම්බේ වාගේ සුද්දන් ඉන්න ප්‍රදේශවල පෞද්ගලික රෝහල් නැහැ. ඔවුන්ට ලැබෙන්නේත් සාමාන්‍ය service එක. ඒ නිසා මේ වාගේ insurance එකක් එන එක හොඳයි. නමුත් ඒක optional විය යුතුයි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(*மாண்புமிகு நலின் பண்டார ஜயமஹ*)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු ඇමතිතුමනි, ඔබතුමා මගේ අතුරු ප්‍රශ්නයට උත්තර දුන්නේ නැහැ, මූලික ප්‍රශ්නයේම තමයි කැරකුණේ. හැබැයි, අපි දන්නවා 1990 සුවසැරිය ගිලන් රථ සේවාව හරහා බොහෝ විදේශිකයන් ප්‍රමාණයක් දිනපතා රෝහල්ගත කරන බව. මම කිව්වේ මේකයි. මේ ප්‍රදානය ඔබතුමා ගත්තේ නැහැ. ඔබතුමන්ලා සංචාරක ව්‍යාපාරයට අදාළ යටිතල පහසුකම් - වැසිකිළි කැසිකිළි පහසුකම් ආදිය- සංවර්ධනය කරන්න,-

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(*மாண்புமிகு ஹரின் பர்னாந்து*)
(The Hon. Harin Fernando)

ප්‍රදානයක් කියන්නේ grant එකක්. මේක grant එකක් නොවෙයි, loan එකක්. වැරදි කථා කියන්න එපා. ඔබතුමා අසත්‍ය නේ කියන්නේ. අසත්‍ය සමාජගත කරන්න එපා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(*மாண்புமிகு நலின் பண்டார ஜயமஹ*)
(The Hon. Nalin Bandara Jayamaha)

මම ඇහුවේ, සංචාරක ක්ෂේත්‍රය නඟා සිටුවීම සඳහා එහි යටිතල පහසුකම් සංවර්ධනයට ඔබතුමා වැඩ පිළිවෙළක් කරනවාද කියලායි. සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ සංචාරකයින්ට ශක්තියක් දෙන්න අඩුම ගණනේ ඔබතුමන්ලාගේ දේශීය අරමුදල්වලින් හෝ වැඩ පිළිවෙළක් කරනවා ද, සහනදායී විධියකට හෝ ණයක් දෙනවාද කියලායි මම ඇහුවේ.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(*மாண்புமிகு ஹரின் பர்னாந்து*)
(The Hon. Harin Fernando)

මම නම් දන්නේ නැහැ, මෙතුමා ණය ගන්න හරි ආසා ඇති, ගරු කථානායකතුමනි. මම නම් කැමති නැහැ ව්‍යාපාරිකයෝ ණය වෙලා, ණය වෙලා නැති වෙනවාට. අපේ අදහස මේ industry එක liberalize කරන එකයි. අපි ඒ ගොල්ලන්ට permits දීලා තිබෙනවා නම්, ඒ ගොල්ලන්ට liquor licences දීලා තිබෙනවා නම්, ඒ ගොල්ලන් තමන්ගේ ව්‍යාපෘතිය හදා ගන්නවා නම් ඒ ව්‍යාපෘතිය තුළින්මයි ඒ ගොල්ලන් හැදෙන්නේ. එහෙම නැතිව ණයක් ගන්නවා නම් ඔවුන්ගේ performance එක අනුව දෙන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, ලංකාවට වැරදිලා තිබෙන තැන මම කියන්නම්. මේ රට දියුණු කරන්න සුබසාධනයෙන් පුළුවන් කියලා කවුරුන් හෝ හිතනවා නම්, අපි අවුරුදු 72ක් තිස්සේ වැටුණු වළටම තමයි ආයෙත් වැටෙන්නේ. ඒ අවුරුදු 72ක් තිස්සේ වැටුණු වළටම වැටෙන්න ඕනෑ නම් මිනිස්සුන්ට බොරුවට ප්‍රදාන දිදී, ණය දිදී රුපියල් ලක්ෂ 30ක් විතර වටිනා වැඩසටහනට රුපියල් ලක්ෂ 10ක් දීලා, ඊට පස්සේ එතැනත් තව පොඩ්ඩක් ණය දීලා, එතැනත් කඩා වට්ටනවා වෙනුවට ඒ මිනිස්සුන්ව දෙපයින් හිටවන වැඩ පිළිවෙළක් තමයි කළ යුත්තේ. ඒ නිසා අපි කරන්න ඕනෑ industry එක liberalize කරන එක, industry එකට දුවන්න පුළුවන් අවස්ථාව ලබා දෙන එක, market එක ඒ ගොල්ලන්ට ඕනෑ විධියට දුවන්න පුළුවන් විධියට හදලා දෙන එක මිසක්, ණය දීලා මිනිස්සු තවත් ණයකාරයෝ කරන එක නොවෙයි. මම දන්නේ නැහැ ඒකද මේ ගොල්ලන්ගේ ප්‍රතිපත්තිය කියලා, ගරු කථානායකතුමනි. එහෙම නම් ඉතින් දෙයියන්ගේම පිහිටයි.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(*மாண்புமிகு முஜிபுர் ரஹுமான்*)
(The Hon. Mujibur Rahuman)

දෙවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම හිතන විධියට ඔබතුමන්ලා අතුරු ප්‍රශ්න තුනක් අහලායි ඉන්නේ, දෙකක් නොවෙයි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉක්මනට අහන්න. කාලය ගත වෙලා තිබෙන්නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු සංචාරක ඇමතිතුමනි, වීසා ලබා දීමේ දී පසුගිය දා VFS Global ආයතනයත් එක්ක අත්සන් කරපු ගිවිසුම අනුව සංචාරකයෙකුගෙන්, එහෙම නැත්නම් රටට ඇතුළු වෙන විදේශිකයෙකුගෙන් වීසා ගාස්තු හැටියට අය කරන මුදල ඩොලර් 18.50ක් ලෙස තමයි සඳහන් වෙලා තිබුණේ. ඩුබායිවල තිබෙන VFS Global, GBS Technology Services and IVS Global FZCO කියන ආයතනය රිසිට් පතක් නිකුත් කර තිබෙනවා.

ඒකෙදී ඒ ගොල්ලන් සංචාරක ගාස්තු, tourist visa fees කියලා අරගෙන තිබෙනවා, ඩොලර් 40ක්. ඊළඟට, service fees කියලා අරගෙන තිබෙනවා, තව ඩොලර් 10ක්. මේ විධියට ඩොලර් 50ක් ඒ ගොල්ලන් අරගෙන තිබෙනවා. මේ ගිවිසුම අනුව තිබෙන්නේ ඩොලර් 18.50ක් කියලා. එතකොට ගරු ඇමතිතුමනි, ඩොලර් 18.50කට ගිවිසුම අත්සන් කරලා ඩොලර් 50ක් සංචාරකයෙකුගෙන් ලබා ගන්නේ කොහොමද? මේක ඉතාම බරපතළ තත්ත්වයක්, ගරු කථානායකතුමනි. ගිවිසුමට ඇතුළත් කර තිබෙන මුදල නොවෙයි අරගෙන තිබෙන්නේ, ඊට වඩා වැඩි මුදලක්. ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඒ ගැන මොකක්ද කියන්න තිබෙන්නේ?

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය මට අදාළ නැති එකක්. මගේ මිත්‍රයා නැවත වතාවක් පාර්ලිමේන්තුවට ආපු නිසා මම කැමැතියි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අදාළ නැත්නම් උත්තර දෙන්න එපා.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
නැවත වතාවක් ඔබතුමන්ලා පටලවාගෙන තිබෙන්නේ. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව තිබෙන්නේ සංචාරක ඇමතිවරයා යටතේ නොවෙයි. එය තිබෙන්නේ මහජන ආරක්ෂක ඇමතිතුමා යටතේයි. සීගිරි ගලේ ප්‍රශ්නයක් වෙලා බඹරෙක් විද්දත් හැම දාම මම වැරදියි. Pigeon Island එකට ගිහිල්ලා බෝට්ටුකාරයෙක් මොනවා හෝ කළත්, ඒකටත් සංචාරක ඇමතිවරයා වැරදියි. හැබැයි, Pigeon Island එක භාරව තිබෙන්නේ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ ඇමතිවරියට. සීගිරිය අයිති වෙන්නේ Ministry of Buddhasasana, Religious and Cultural Affairs එකට. ඒ වාගේම, tourist visa අයිති වන්නේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව අයත් මහජන ආරක්ෂක අමාත්‍යාංශයට. මේකට මම උත්තර දෙන්නම්. හැබැයි, මේක මට අදාළ කාරණයක් නොවෙයි. නමුත් මේ කියපු කථාවට මම උත්තර දෙන්නම්, ගරු කථානායකතුමනි. ඔබතුමා හරි, ගරු මන්ත්‍රීතුමනි. Agreement එක අත්සන් කර තිබෙන්නේ visa fee එක ඩොලර් 18යි ගණනකට තමයි. හැබැයි, මෙතුමන්ලා ඉස්සෙල්ලාම දැම්මේ six-month multiple-entry visa එකක්. මම කට කැඩෙනකල් මේ පාර්ලිමේන්තුවට මේ ගැන කිව්වා නමුත්, තවම තේරුම් අරගෙන නැහැ. Six months multiple-entry visa එකට, ඒ කියන්නේ දවස් 60ක් එකවර ඉන්න පුළුවන් visa එකට තමයි ඩොලර් 18යි ගණනක් charge වෙන්නේ. Single-entry visa එක යටතේ දවස් 30ක් තුළ එකපාරයි ඇතුළු වෙන්න පුළුවන්, multiple times ඇතුළු වෙන්න බැහැ. එහෙම වුණොත් ඩොලර් 40යි, ලංකාවේ visa fee එක, ඩොලර් 10ක් ඒ ගොල්ලන්ගේ service charge එක. ඒකත් වුණේ, මේකට විරුද්ධ වුණාට පස්සේ කැබිනට් මණ්ඩලයේ අපි තීන්දුවක් අරගෙන කිව්වා, single-entry visa fee එක වැඩි කරන්න බැහැ කියලා. මොකද, මේ ගොල්ලන් අර agreement එක අත්සන් කරද්දී යම්කිසි තාක්ෂණික දෝෂයක් වෙලා මේ single-entry visa එක තිබුණේ නැහැ. Agreement එකේ තිබුණේ six months multiple-entry visa ගැන පමණයි. කවදාහරි ලංකාවට දවස් දෙක තුනකට එන්න ඕනෑ මිනිහෙක් මොන එකකටද මාස 6ක visa එකක් ගන්නේ. මම දන්නේ නැහැ ඒක කොහොමද වුණේ කියලා. එතැන එහෙම එකක් වෙලා තිබුණා. *[බාධා කිරීමක්]* ඒක කොහොම හරි වෙනස් කරගෙන ඒ අවස්ථාවේ කැබිනට් මණ්ඩලයේ කථා කරලා, සාකච්ඡා කරලා තමයි, ඒක තේරුම් කරලා, රණ්ඩු කරලා වැඩේ වෙනස් වුණේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය, ප්‍රශ්න අංක 1.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය අහලා අවසන් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය විධියට ගියොත් ඔබතුමන්ලා අද දවසේම ඔය ගැන කථා කරයි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මාතර සම්බන්ධකම් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මාතර සම්බන්ධකම් තිබුණාට මට කමක් නැහැ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු විධියට ඒ තර්කය හරි. මම කියන්නේ multiple-entry visa ගන්න කෙනාට ඩොලර් 18.50ක් අය කරලා, single-entry visa ගන්න කෙනාට ඊට වඩා වැඩි ගණනක් අය කරන එක සාධාරණ නැහැ. ඒක වැරදියි නේ. Visa fee එක ගැන මම මේ කියන්නේ.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

මගේ හොඳ නීතිඥ මහත්මයා මීට වඩා පොඩ්ඩක් කරුණු අධ්‍යයනය කරලා එන්න. ඒ, ඩොලර් 18.5 කියන්නේ service charge එක. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීමක්]* හරි, agreement එකේ තිබෙන්නේ service fee එක US Dollars 18.5 කියලා. ගරු කථානායකතුමනි, the normal multiple-entry visa fee for six months is US Dollars 75. ඒ US Dollars 75 plus service charge එක ගැන තමයි මෙතුමා කියන්නේ. එතකොට single-entry visa එකට තිබෙන්නේ US Dollars 40 plus service charge US Dollars 10. ඒකයි, එතැන තිබෙන වෙනස. මේක අඩුයි. එළියට ගිහිල්ලා ආවාට පසුව කරුණු පොඩ්ඩක් අමතක වෙනවා වාගේ, නේද?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
නැහැ, නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ආවේණික ඖෂධ පැළෑටි අපනයනය: විස්තර
தனித்துவமான மூலிகைத் தாவரங்களின் ஏற்றுமதி: விபரம்
EXPORT OF ENDEMIC HERBAL PLANTS : DETAILS

1916/2024

1. ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා (ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය වෙනුවට)
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார - மாண்புமிகு (திருமதி) ராஜிகா விக்கிரமசிங்ஹ சார்பாக)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law on behalf of the Hon. (Mrs.) Rajika Wickramasinghe)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඖෂධ පැළෑටි වර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාව ඖෂධ පැළෑටි අපනයනය කරන්නේද;

(iii) එසේ නම්, එම ඖෂධ පැළෑටි වර්ග කවරේද;

(iv) ඒවා අපනයනය කිරීමෙන් වාර්ෂිකව උපයනු ලබන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைக்குத் தனித்துவமான மூலிகைத் தாவர வகைகள் யாவை என்பதையும்;

(ii) இலங்கை மூலிகைத் தாவரங்களை ஏற்றுமதி செய்கின்றதா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி மூலிகைத் தாவர வகைகள் யாவை என்பதையும்;

(iv) அவற்றை ஏற்றுமதி செய்வதன்மூலம் வருடாந்தம் ஈட்டப்படுகின்ற வருமானம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) the endemic herbal plants in Sri Lanka;

(ii) whether Sri Lanka exports herbal plants;

(iii) if so, what those herbal plant varieties are; and

(iv) the annual revenue earned through the export of them?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඖෂධ පැළෑටි වර්ග 173ක් ඇති අතර ඒවා **ඇමුණුමෙහි**** දක්වා ඇත.

(ii) ඔව්.

(iii) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අපනයනය සඳහා එකහතාව ඉල්ලා එවනු ලබන ඖෂධ පැළෑටි සඳහා එකහතා ලබා දීම පමණක් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

(iv) අදාළ නොවේ.

(ආ) පැන නොනගී.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය: පෞද්ගලික අංශයට බදු දී ඇති ඉඩම්
இலங்கை துறைமுக அதிகாரசபை: தனியார் துறைக்கு குத்தகைக்கு விடப்பட்ட காணிகள்
SRI LANKA PORTS AUTHORITY: LANDS LEASED TO PRIVATE SECTOR

1939/2024

2. ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා (ගරු මීලාන් ජයතිලක මහතා වෙනුවට)
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார - மாண்புமிகு மிலான் ஜயதிலக்க சார்பாக)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law on behalf of the Hon. Milan Jayathilake)

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අතරින් ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා මේ වනවිට භාවිත කරනු ලබන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් පෞද්ගලික අංශයට බදු පදනම මත ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම සමාගම්/ආයතන කවරේද;

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා]

(v) ඉඩම් බදු දීම මඟින් අධිකාරිය උපයන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை துறைமுக அதிகாரசபைக்குச் சொந்த மான காணிகளின் விஸ்தீரணம் யாது என்ப தையும்;

(ii) அவற்றில் நிர்மாணங்கள் மற்றும் அபிவிருத்திப் பணிகளுக்காகத் தற்போது பயன்படுத்தப்படு கின்ற காணிகளின் விஸ்தீரணம் யாது என்பதையும்;

(iii) மேற்படி காணிகள் குத்தகை அடிப்படையில் தனியாருக்கு வழங்கப்பட்டுள்ளனவா என்ப தையும்;

(iv) அவ்வாறாயின், அக்கம்பெனிகள் / நிறுவனங்கள் யாவை என்பதையும்;

(v) காணிகளைக் குத்தகைக்கு வழங்குவதன்மூலம் அதிகாரசபை ஈட்டுகின்ற வருடாந்த வருமானம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Ports, Shipping and Aviation:

(a) Will he inform this House -

(i) the extent of land owned by Sri Lanka Ports Authority;

(ii) the extent of land, out of the aforesaid extent, that is being used for constructions and development activities by now;

(iii) whether those lands have been leased to the private sector;

(iv) if so, what those companies/institutions are; and

(v) the annual revenue earned by the Authority through the leasing of lands?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අක්කර 9,418.78.

(ii) අක්කර 3,428.

(iii) ඔව්.

(iv) එම ආයතන **ඇමුණුමෙහි**** දක්වා ඇත.

(v) ඉඩම් බදු දීමෙන් 2023 වසරේ වරාය අධිකාරිය ලබා ඇති ආදායම - රුපියල් 6,088,751,019.99කි.

(ආ) පැන නොනගී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -1993/2024- (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -2021/2024- (1), ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

**** ප්‍රස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ආර්ථික සංවර්ධන නිලධාරීන්: විස්තර
பொருளாதார அபிவிருத்தி உத்தியோகத்தர்கள்: விபரம்
ECONOMIC DEVELOPMENT OFFICERS : DETAILS

2045/2024

7. ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා (ගරු ලලිත් එල්ලාවල මහතා වෙනුවට)
(මාණ්පුමිකු சட்டத்தரணி வசந்த யாப்பாபண்டார - மாண்புமிகு லலித் எல்லாவல சார்பாக)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law on behalf of the Hon. Lalith Ellawala)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අනුයුක්තව ග්‍රාම නිලධාරි වසම්වල සේවය කරනු ලබන ආර්ථික සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් ලෙස රාජ්‍ය සේවයට බඳවා ගන්නා ලද වර්ෂය කවරේද;

(iii) එම සංවර්ධන නිලධාරීන්ට ලබා දී ඇති රාජකාරි ලැයිස්තුව කවරේද;

(iv) එම සංවර්ධන නිලධාරීන් රජයේ ගුරු සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා අන්තර්ගහණය නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருமான வரைக் கேட்ட வினா:

(அ) (i) பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சுடன் இணைந்ததாக கிராம அலுவலர் பிரிவுகளில் சேவையாற்றும் பொருளாதார அபிவிருத்தி உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(ii) மேற்படி உத்தியோகத்தர்கள், அபிவிருத்தி உத்தியோகத்தர்களாக அரசசேவைக்கு ஆட்சேர்க்கப்பட்ட வருடம் யாதென்பதையும்;

(iii) மேற்படி அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கு வழங்கப்பட்டுள்ள கடமைப்பட்டியல் யாதென் பதையும்;

(iv) மேற்படி அபிவிருத்தி உத்தியோகத்தர்கள் அரச ஆசிரியர் சேவையின் வெற்றிடங்களை நிரப்பு வதற்காக உள்ளீர்க்கப்படாமைக்கான கார ணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and the Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of Economic Development Officers working in Grama Niladhari divisions, attached to the Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government;

(ii) the year in which the aforesaid officers were recruited to the Public Service as Economic Development Officers;

(iii) the list of duties assigned to aforesaid Economic Development Officers; and

(iv) the reasons for non-absorption of those Development Officers to fill the vacancies in the Government teaching service?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අනුමත තනතුරු ගණන - 16,341කි.
දැනට සේවයේ නිරත නිලධාරීන් සංඛ්‍යාව - 17,569කි.
විස්තර **ඇමුණුම 01** මඟින් දක්වා ඇත.

ඇමුණුම 01

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු ආර්ථික සංවර්ධන නිලධාරීන්ගේ අනුමත තනතුරු සංඛ්‍යාව

අනු අංකය	දිස්ත්‍රික්කය	අනුමත තනතුරු ගණන	දැනට සේවයේ නිරත නිලධාරීන් සංඛ්‍යාව
01	කොළඹ	638	601
02	ගම්පහ	1255	1253
03	කළුතර	832	876
04	මහනුවර	1380	1588
05	මාතලේ	601	788
06	නුවරඑළිය	491	484
07	ගාල්ල	1009	1009
08	මාතර	776	777
09	හම්බන්තොට	636	680
10	යාපනය	582	581
11	මන්නාරම	173	175
12	වවුනියාව	150	176
13	මුලතිව්	190	88
14	කිලිනොච්චි	143	100
15	මඩකලපුව	451	455
16	අම්පාර	656	1182
17	ත්‍රිකුණාමලය	318	317
18	කුරුණෑගල	1900	1901
19	පුත්තලම	642	612
20	අනුරාධපුර	806	955
21	පොළොන්නරුව	337	284
22	බදුල්ල	645	724
23	මොනරාගල	409	639
24	රත්නපුර	683	675
25	කෑගල්ල	638	649
මුළු එකතුව		16,341	17,569

[ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(ii) 2013 වර්ෂයේදී සංවර්ධන නිලධාරීන් 14,000ක් බඳවා ගෙන ඇත.

2015 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව සිටි එම ආර්ථික සංවර්ධන නිලධාරීන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත. (ස්වදේශ කටයුතු චක්‍රලේඛ 5/2015 - **ඇමුණුම 02**** මඟින් දක්වා ඇත.)

(iii) HA/1/1/9/11 ගොනු අංකයේ 2022.11.25 දිනැති ලිපිය මඟින් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු ආර්ථික සංවර්ධන නිලධාරීන් හට රාජකාරී ලැයිස්තුව ඇතුළත් ලිපියක් යොමු කර ඇත. එය **ඇමුණුම 03**** මඟින් දක්වා ඇත.

(iv) එය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් විමසීම වඩා යෝග්‍ය බව දන්වා සිටිමි.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -2057/2024- (1), ගරු වේලු කුමාර් මහතා.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි වසන්ත යාප්පාපණ්ඩාර)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නව විදුලි සම්බන්ධතා ලබා දීමේදී කරන ලද තැන්පතු: ගෙවිය යුතු පොලිය
புதிய மின் இணைப்புகளை வழங்கும்போது இடப்படும் வைப்புத் தொகை: செலுத்தப்பட வேண்டிய வட்டி
DEPOSITS MADE FOR PROVISION OF NEW ELECTRICITY CONNECTIONS: INTEREST TO BE PAID

2075/2024

9. ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා (ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවට)
(මාණ්පුමිකු සට්ටත්තරණි වසන්ත යාප්පාපණ්ඩාර - මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන සාර්බාග)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law on behalf of the Hon. Thushara Indunil Amarasena)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා, නව විදුලිය සම්බන්ධතා ලබා දීමේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් තැන්පතු ලෙස අයකර ගෙන ඇති මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම තැන්පත් මුදල් වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලි පාරිභෝගිකයන්ට ගෙවීමට ඇති පොලී මුදල කොපමණද;

(iii) එම පොලී මුදල් විදුලි පාරිභෝගිකයන්ට කඩිනමින් ගෙවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை புதிய மின் இணைப்புகளை வழங்கும்போது, இலங்கை மின்சார சபையால் வைப்புத் தொகையாக அறவிடப்பட்டுள்ள மொத்தப்பணத் தொகை ஆண்டுவாரியாகத் தனித்தனியே எவ்வளவென்பதையும்;

(ii) மேற்படி வைப்புத் தொகைக்கான வட்டியாக இலங்கை மின்சார சபையால் மின் பாவனையாளர்களுக்குச் செலுத்தப்படவேண்டியுள்ள பணத்தொகை எவ்வளவென்பதையும்;

(iii) இவ்வட்டிப் பணத்தை மின் பாவனையாளர்களுக்கு விரைவில் செலுத்துவதற்கு எடுக்கப் படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he inform this House -

(i) separately, of the total amount charged by the Ceylon Electricity Board as deposits when providing new electricity connections from year 2015 to date each year;

(ii) the total interest payment to be made to the electricity consumers by the Ceylon Electricity Board for the aforesaid deposits; and

(iii) the measures that will be taken to make the aforesaid interest payments to the electricity consumers as soon as possible?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** ප්‍රශ්නකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා නව විදුලිය සම්බන්ධතා ලබා දීමේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් තැන්පතු ලෙස අය කරගෙන ඇති මුළු මුදල එක් එක් වර්ෂය අනුව පහත පරිදි වේ.

වර්ෂය	ලැබීම් (රු.මි.)
2015	1,318.17
2016	1,474.42
2017	1,169.87
2018	992.49
2019	908.77
2020	728.69
2021	805.34
2022	761.35
2023	514.92
2024 (මාර්තු මස දක්වා)	137.40

(ii) ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 වගන්තිය පරිදි විදුලි බෙදා හැරීම් බලපත්‍රලාභියෙකුට විදුලි පාරිභෝගිකයන්ගෙන් ආරක්ෂක තැන්පතුවක් ලබා ගත හැක. එමෙන්ම උපලේඛන 02හි 3 වගන්තියේ පරිදි බලපත්‍රලාභියෙකුට විදුලි පාරිභෝගිකයෙකුගෙන් සාමාන්‍ය විදුලි ගාස්තුව මෙන් දෙගුණයක් ලබා ගත හැක.

එමෙන්ම 28 වගන්තියේ ප්‍රතිපාදන පරිදි ඇප මුදලක් වශයෙන් යම් මුදල් ප්‍රමාණයක් බෙදා හැරීමේ බලපත්‍රලාභියා වෙත තැන්පත් කළ අවස්ථාවේම එම මුදල එම බලපත්‍රලාභියා සතුව පවත්නා කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ඇති බලපත්‍රලාභියා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි යම් අනුපාතයකට අනුව ඒ මුදල් ප්‍රමාණය මත පොලියක් බලපත්‍රලාභියා විසින් පාරිභෝගිකයාට ගෙවිය යුතු වේ. මෙම අනුපාතය තීරණය කරනු ලබන්නේ මහජන උපයෝගීතා කොමිසම විසිනි.

ඒ අනුව 2023 වර්ෂය සඳහා තොග සැපයුම් පාරිභෝගිකයින්ට රුපියල් මිලියන 546.40ක් ද, සාමාන්‍ය සැපයුම් පාරිභෝගිකයන්ට රුපියල් මිලියන 574.40ක් ද, 2024 මාර්තු මස වනවිට තොග සැපයුම් පාරිභෝගිකයන්ට රුපියල් මිලියන 240.12ක් ද, සාමාන්‍ය සැපයුම් පාරිභෝගිකයන්ට රුපියල් මිලියන 21.70ක් ද පොලී මුදල් වශයෙන් ගෙවා ඇත.

තොග සැපයුම් පාරිභෝගිකයන්ට සෑම මසකම අවසානයේදී ද, සාමාන්‍ය සැපයුම් පාරිභෝගිකයන්ට සෑම වර්ෂයකම අවසානයේදී ද පොලී මුදල් ගෙවීමට දැනටමත් කටයුතු කරගෙන යනු ලැබේ.

(iii) මේ වනවිටත් විදුලි පාරිභෝගිකයන්ට ගෙවීම් සිදු කරන බැවින් අදාළ නොවේ.

(ආ) සියලු තොරතුරු ඉහත දක්වා ඇති බැවින් අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා.

ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ දෙවන වාර්තාවේ නිර්දේශ: මුදල් රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

வழிவகைகள் பற்றிய குழுவின் இரண்டாவது அறிக்கையின் பரிந்துரைகள்: நிதி இராஜாங்க அமைச்சரினது கூற்று

RECOMMENDATIONS IN SECOND REPORT OF COMMITTEE ON WAYS AND MEANS: STATEMENT BY STATE MINISTER OF FINANCE

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සැසිවාරයේදී ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද දෙවන වාර්තාවේ සඳහන් කරුණු පිළිබඳව අදහස් දක්වමින් ප්‍රකාශයක් සිදු කිරීමට අපේක්ෂා කරමි.

මෙම කාරක සභාවට පවරන ලද රාජකාරිය අනුව රටේ මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීමේ බලතල පවරා ඇත. ඒ අනුව එම කාරක සභාව විසින් බදු අය කිරීම, තීරු බදු සහ රජයේ අනෙකුත් ආදායම් වර්ධනය කිරීමේ ක්‍රියාමාර්ගවලට කටයුතු පිළිබඳව පවතින ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීමත්, එම ප්‍රතිපත්තිවල වෙනස්කම් සිදු කිරීම අවශ්‍ය නම් ඒ සඳහා සුදුසු ක්‍රමවේද යෝජනා කිරීමත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ රාජකාරිවලට මහත් රුකුලක් වී ඇති බව දැන්වීමට කැමැත්තෙමි.

එසේම රජයේ බදු ආදායම් රැස් කිරීම, වර්ධනය කිරීම හා විධිමත් කිරීමට අදාළ ක්‍රියාමාර්ග රජයේ ආදායම් රැස් කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් වඩාත් ප්‍රගතිශීලීව ක්‍රියාත්මක කරමින් පවතී. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ වනවිටත් නව නිර්දේශ භාවිත කරමින් ස්වයංක්‍රීයව බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීමේ ලිපිගොනු සැකසීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත. දැනට අය කර ගැනීමට පවතින හිඟ බදු සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීමේ දී පවතින නීතිමය රාමුව තුළ හා අනෙකුත් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට අනුගතව කටයුතු කිරීම සිදු කරමින් පවතී. කෙසේ වෙතත් පවතින නීතිමය බාධා වර්තමානයට ගැළපෙන පරිදි අවශ්‍ය නීති තවදුරටත් වෙනස් කිරීමට පියවර ගනිමින් සිටී.

එසේම මේ වෙන විට තොරතුරු තාක්ෂණය භාවිතය තුළින් රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව, බැංකු හා මූල්‍ය ආයතන මෙන්ම අනෙකුත් ආයතනයන්හි බදු ගෙවන්නන් හඳුනා ගැනීමේ තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත මාර්ගගතව ලබා දීම සඳහා වන නීතිමය ප්‍රතිපාදන ද හඳුන්වා දීමට කටයුතු කර ඇත.

රේගු දෙපාර්තමේන්තුව විසින් බදු අය කිරීමේ කටයුතු පහසු කිරීමට සහ අවදානම් කළමනාකරණය කිරීමේ පියවර ද හඳුන්වා දී ඇත. දැනට රේගු භාණ්ඩ වෙන්දේසි කටයුතු සඳහා ද මාර්ගගත ක්‍රමය භාවිත කිරීමට පියවර ගෙන ඇත. සුරාබදු දෙපාර්තමේන්තුව කළමනාකරණය සඳහා ආදායම් පරිපාලන පද්ධතියක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඒ සඳහා මූලික ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කර ඇත.

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

ගරු කථානායකතුමනි, අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, වැඩිහිටි, ආබාධිත හා වකුගඩු රෝගී දීමනා ගෙවීමේ වැඩසටහන ඒකාබද්ධ කර ක්‍රියාත්මක කිරීම සඳහා පරිගණක පද්ධතිය දැනටමත් සකස් කර ඇති අතර ඉදිරියේ දී මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය. එසේම අස්වැසුම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට ඇතුළත් නොවන අනෙකුත් බාහිර ප්‍රතිලාභ දීමනා ලැයිස්තු ඉදිරියේ දී ක්‍රමානුකූලව මෙම යෝජනා ක්‍රමයට ඇතුළත් කිරීමට කටයුතු කරමින් සිටී. ඒ අනුව අනෙකුත් සුබසාධක ප්‍රතිලාභ සඳහා අදාළ කර ගත හැකි පරිදි මෙම පරිගණක පද්ධතිය සංවර්ධනය කරමින් පවතී. එසේම දැනට පවතින නිර්ණායක සංශෝධනය කිරීම පිළිබඳව තාක්ෂණික කමිටුවක් මඟින් අධ්‍යයනය කරමින් පවතී. ඒ අනුව මෙම අස්වැසුම යෝජනා ක්‍රමය විධිමත් පරිදි ක්‍රියාත්මක කිරීම තුළින් වඩාත් සුදුසුකම් සහිත ප්‍රතිලාභීන් පිරිසක් සඳහා ප්‍රතිලාභ ලබා දීමට අපේක්ෂා කරමි.

ඒ අනුව මෙම කමිටුවේ දෙවන වාර්තාව මඟින් කරනු ලැබූ නිර්දේශවලට අදාළ ක්‍රියා මාර්ග අප දැනටමත් සිදුකර ඇත. එම ක්‍රියා මාර්ග කඩිනම් කර ගැනීමට මෙම වාර්තාවේ සඳහන් ඇතැම් නිර්දේශ මහත් පිටුවහලක් විය. දැනටමත්, මෙම වාර්තාවේ සඳහන් නිර්දේශ සඳහා මුදල් විෂය භාර අමාත්‍යවරයා වන අතිගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණ හා සිදු කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳව සඳහන් වාර්තාව සකස් කර ඇති අතර එතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඉදිරි පාර්ලිමේන්තු සැසි වාරයකදි එය සභාගත කරන බව දැන්වීමට කැමැත්තෙමි.

අවසාන වශයෙන්, මෙම කමිටුවේ සභාපතිවරයා වන පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා ඇතුළු සියලු සාමාජික ගරු මන්ත්‍රීතුමන්ලාට මේ සම්බන්ධයෙන් දැක්වූ සහයෝගයට ස්තුතිවන්ත වෙමි.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු විපක්ෂ නායකතුමා අහන ලද ප්‍රශ්නයකටත් මම දැන් පිළිතුරු ලබා දෙන්නම්.

2022 ජූලි මාසයෙන් පසුව නිකුත් කර ඇති මත්පැන් බලපත්‍ර: මුදල් රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

2022 யூலைக்குப் பின்னர் வழங்கப்பட்ட மதுபான உரிமங்கள்: நிதி இராஜாங்க அமைச்சரினது கூற்று

LIQUOR LICENCES ISSUED AFTER JULY, 2022: STATEMENT BY STATE MINISTER OF FINANCE

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(*மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய*)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා 2024.05.14 දින ස්ථාවර නියෝග 27 (2) යටතේ ඇසූ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. 2022.07.01 දින සිට 2024.05.21 දින දක්වා මත්පැන් අළෙවිය සඳහා නිකුත් කරන ලද අයදුම්පත ප්‍රමාණය 1,424ක් වන අතර, එම නිකුත් කරන ලද අයදුම්පත ලියාපදිංචි සමාගම් සහ තනි පුද්ගල ව්‍යාපාර ලෙස අයදුම් කර ඇත. එම අයදුම්පත් සංඛ්‍යාව විස්තරාත්මක වාර්තාවක් මෘදු පිටපතක - CD එකක - මම ගෙනැවිත් තිබෙනවා. ඒ සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ නම් මෙහි අහලා තිබුණා. ඒ තොරතුරු සියල්ලත් CD එකේ තිබෙනවා, ඔබතුමන්ලාට බලන්න පුළුවන්. ඊට අමතරව මුද්‍රිත ලේඛනයකුත් තිබෙනවා. ඒ සියල්ල ඇමුණුම් 01 වශයෙන් මම **සභාගත*** කරනවා..

02. 2022.07.01 දින සිට 2024.05.21 දින දක්වා මත්පැන් අළෙවිය සඳහා නිකුත් කරන ලද සුරාබදු අයදුම්පත් සංඛ්‍යාව 1,424කි. ඒ අනුව නිකුත් කරන ලද සුරාබදු බලපත්‍ර සංඛ්‍යාව 404ක් වන අතර පහත සඳහන් පරිදි ඒවා වර්ගීකරණය කර ඇත.

	සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය රහිත			සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය සහිත		
01.	ර.බී. 03 (තොග වෙළඳ බලපත්‍ර)	10		ර.බී. 07/ 08 (හෝටල් බලපත්‍ර)	ර.බී. 07	75
					ර.බී. 08	65
02.	ර.බී. 04 (සිල්ලර වෙළඳ බලපත්‍ර)	40		ර.බී. 11 (ආපනශාලා බලපත්‍ර)		100
03.	ර.බී. 04 SU (සුපිරි වෙළඳසැල් සිල්ලර වෙළඳ බලපත්‍ර)	99		ර.බී. 22 B (බීර හා වයින් ස්ථානීය පරිභෝජනය)		06
04.	ර.බී. 11 (ආපනශාලා බලපත්‍ර)	03				
05.	ර.බී. 13 A (සමාජශාලා බලපත්‍ර)	03				
06.	ර.බී. 22 A (බීර හා වයින් සිල්ලර වෙළඳ බලපත්‍ර)	03				
	එකතුව	158		එකතුව		246

සැ.යු: උක්ත වර්ගීකරණයට අදාළව නිකුත් කරන ලද බලපත්‍රවල සවිස්තරාත්මක වාර්තාවක් ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත. ඇමුණුම 02 **සභාගත*** කරමි.

ගරු කථානායකතුමනි, සුරාබදු නිවේදන 902 හා 02/2024හි දක්වා ඇති පරිදි මත්පැන් බලපත්‍ර ලබා දීමේ මාර්ගෝපදේශ හා කොන්දේසිවලට අනුකූලව මත්පැන් බලපත්‍ර ලබා දී ඇත. අදාළ ගැසට් නිවේදනවල පිටපත් ඇමුණුම් 03 හා 04 ලෙස ඉදිරිපත් කර ඇත. දීර්ඝ විස්තර නිබෙන නිසා මම ඒවාත් **සභාගත*** කරනවා.

- මත්පැන් බලපත්‍ර අයදුම්පත් 13ක් ප්‍රතික්ෂේප කර ඇති අතර ඉහත සුරාබදු නිවේදනවල දක්වා ඇති අවශ්‍යතා සපුරා නොතිබීම හා එකී බලපත්‍ර ලබා දීමට එරෙහිව මහජනතාව විසින් දක්වන විරෝධතා මත පවත්වනු ලබන සාධාරණ පරීක්ෂණයන්හි නිර්දේශයන්ට අනුව අයදුම්පත් ප්‍රතික්ෂේප කර ඇත.

  මත් වතුර පරිභෝජනය 2022 වර්ෂයේදී ලීටර මිලියන 43.3ක් වූ අතර එය 2023 වර්ෂයේදී ලීටර මිලියන 35.1ක් දක්වා අඩු වී ඇත.

03. සුරාබදු නිවේදන 902 හා 02/2024හි දක්වා ඇති මාර්ගෝපදේශ හා කොන්දේසි අනුව අවශ්‍යතා සපුරාලීම

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මත බලපත්‍ර ලබා දීම නිර්දේශ කෙරේ. මෙය දීර්ඝ ක්‍රියාවලියක්. මත්පැන් බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේ සිට අළෙවිය ආරම්භ කිරීම දක්වා වන ක්‍රියාවලිය ඇමුණුම 05 හැටියට සැකෙවින් දක්වා ඇත. ඇමුණුම 05 **සභාගත*** කරමි.

04. සුරාබදු නිවේදන 902 හා 02/2024 අනුව ඒ ඒ පළාත් සඳහා නිකුත් කිරීමට ඇති බලපත්‍ර සංඛ්‍යාව පහත දැක්වේ.

සුරාබදු නිවේදනය	ර.බී. 04 (මත්පැන් සිල්ලර විකිණීමේ වෙළෙඳ බලපත්‍රය	සංචාරක මණ්ඩලයේ අනුමැතිය රහිත ර.බී. 07/08 (හෝටල් බලපත්‍ර)	සංචාරක මණ්ඩලයේ අනුමැතිය රහිත ර.බී. 11 (ආපනශාලා බලපත්‍ර)
902	1,104	34	362
02/2024	1,578	34	362
වැඩිපුර ලබා දීමට හැකි සංඛ්‍යාව	474	-	-

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ජනගහනයේ වැඩිවීමත් එක්කයි මේ බලපත්‍ර වැඩිපුර ලබා දෙන්න සිදු වෙන්නේ. මොකද, සුරාබදු නිවේදනය 902 අනුව 2008දී බලපත්‍ර 1,104ක් ලබා දීමට නිර්දේශ කරලා තිබුණත්, 2024 වසරේ ජන අනුපාතය අනුව එම ප්‍රමාණය 1,578ක් ලෙස වෙනස් කරලා තිබෙනවා.

ඉහත ගැසට් නිවේදනවල දක්වා ඇති සීමා ර.බී. 04 සිල්ලර බලපත්‍ර, සංචාරක මණ්ඩල අනුමැතිය රහිත ර.බී. 07/08 බලපත්‍ර හා සංචාරක මණ්ඩලයේ අනුමැතිය රහිත ආපනශාලා බලපත්‍ර සම්බන්ධයෙන් පමණක් වන අතර, ර.බී. 04 සුපිරි වෙළෙඳ සැල් සඳහා සිල්ලරට මත්පැන් විකිණීමේ බලපත්‍ර ඇතුළු සෙසු මත්පැන් බලපත්‍ර සඳහා එකී සීමා කිරීමක් නොමැත. සුරාබදු නිවේදනයේ පිටපත් මේ සමඟ අමුණා ඇත. එය ඇමුණුම 03 හා 04 ලෙස මීට පෙර සභාගත කරන ලදී.

05. • බදු අය කිරීම සම්බන්ධව අදාළ වන ආයතන පහත දක්වා ඇත.

- මත්පැන් බදු - සුරාබදු දෙපාර්තමේන්තුව - සුරාබදු නිවේදන 04/2023
- බලපත්‍ර ගාස්තු - 1.

සුරාබදු දෙපාර්තමේන්තුව (නිෂ්පාදන බලපත්‍ර හා මෘදු මත්පැන් බලපත්‍ර ගාස්තු)

2. පළාත් සභා (බලපත්‍ර ගාස්තු)

- මුද්දර ගාස්තු - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- VAT - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- සමාජ ආරක්ෂණ බද්ද - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- ආදායම් බද්ද - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- ආනයන බදු - ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව

• 2023 වසරට අදාළ බදු හා ගාස්තු අය කරගෙන තිබෙනවා. එය 2022 වර්ෂය සමඟ සැසඳීමේදී වැඩිවීමක් පෙන්නුම් කරයි. එය ඇමුණුම 06 ලෙස ඉදිරිපත් කරමි. ඇමුණුම 06 **සභාගත*** කරමි.

• සුරාබදු නිවේදන 02/2024 හා 03/2024 අනුව මත්පැන් අයදුම්පත්‍ර ගාස්තු, මත්පැන් බලපත්‍ර ගාස්තු, ආරක්ෂිත ඇප තැන්පතු හා කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් පමණක් අය කරනු ලබන ගාස්තුව - one-time payment - අය කිරීම් වේ. ඉන් බලපත්‍ර ගාස්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් අය කරගෙන පළාත් සභා ගිණුමට බැර කෙරේ.

06. • සතොස වෙළෙඳ සැල් 100ක් සඳහා මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර -ර.බී. 04, සුපිරි වෙළෙඳ සැල්- 100ක් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර, මේ වන විට ඉන් බලපත්‍ර 50ක් ලබා දී ඇත. ඊට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය හා ලබා දී ඇති බලපත්‍රවල සාරාංශ සටහනක් ඇමුණුම 07 සහ 07(a) ලෙස මේ සමඟ ඉදිරිපත් කරමි. ඒ අනුව ඇමුණුම 07 සහ 07(a) **සභාගත*** කරමි.

07. මෘදු මත්පැන් අළෙවිය සඳහා සුරාබදු නිවේදන 902, 05/2022 සහ 02/2024 අනුව පහත පරිදි බලපත්‍ර නිකුත් කර ඇත. එය ඇමුණුම 08 ලෙස **සභාගත*** කරමි.

		2022	2023	2024
සුරාබදු නිවේදන 902 හා 02/2024 යටතේ	ර.බී. 22A සංචාරක මණ්ඩලයේ අනුමැතිය රහිත (ස්ථානීය පරිභෝජනය නොවන)	-	01	02
	ර.බී. 22B සංචාරක මණ්ඩලයේ අනුමැතිය සහිත (ස්ථානීය පරිභෝජනය සඳහා)	-	01	05
සුරාබදු නිවේදන 05/2022 අනුව	සංචාරක මණ්ඩලයේ අනුමැතිය සහිත (ස්ථානීය පරිභෝජනය සඳහා)	140	425	-

08. දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කළ පනතක් බැවින්, එහි සංශෝධන පිළිබඳව ප්‍රකාශ කළ නොහැක.

ගරු කථානායකතුමනි, සුරාව වර්ධනය කිරීමේ අපේක්ෂාවක් රජයට කිසිසේත්ම නැහැ. ඒක ඉතාම පැහැදිලිව පෙනෙනවා. බදු වැඩි කිරීම නිසා 2023 වර්ෂයේ පමණක් සුරා මිල සියයට 108කින් වැඩි වුණා. 2022දී පාවිච්චි කරපු ලීටර් මිලියන 43.3ක ප්‍රමාණය

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

2023දී ලීටර් මිලියන 35.1ක් දක්වා අඩු වුණා. ඒ කියන්නේ, 2023 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ සුරාව භාවිතය සියයට 19කින් අඩුවෙලා තිබෙනවා. බොහෝ වාර්ෂික බලපත්‍ර ගාස්තු අපි සියයට දස ගුණයකින් වැඩි කරලා තිබෙනවා. ප්‍රථම වතාවට ආරම්භක ගාස්තුව ලෙස -ර.බී. 04 තමයි ජනප්‍රියම බලපත්‍රය- රුපියල් කෝටියේ සිට කෝටි එකහමාර දක්වා මුදලක් අපි රජයට අය කර ගන්නවා.

ඊළඟට චෝදනාවක් තිබුණා, සුපිරි වෙළෙඳ සැලක් දාලා සුරා බලපත්‍රයක් ඉල්ලීමේ අයිතියක් හැදිලා තිබෙනවා කියලා. මේක පෙර තිබුණේ, වාර්ෂික පිරිවැටුම -වර්ෂයේ මුළු ආදායම- රුපියල් මිලියන 70 නම්, සුපිරි වෙළෙඳ සැලක් ලෙස සලකා මෙම බලපත්‍රය ඉල්ලන්න පුළුවන් විධියට. අපි ඒ රුපියල් මිලියන 70 මෙවර රුපියල් මිලියන 1,000 දක්වා වැඩි කළා, ගරු කථානායකතුමනි. ඒ නිසා හැම විටෙකම රජයේ උත්සාහය නීති විරෝධී මත්පැන් අවම කිරීම, රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සහ ඒ තුළින් නීත්‍යානුකූල මත් වතුර භාවිතය අධෛර්යවත් කිරීමයි.

විශේෂයෙන්ම අහපු, මේ මත්පැන් බලපත්‍ර සඳහා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරපු සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ නාම ලේඛනය මම දැනටමත් සභාගත කර තිබෙනවා. ඕනෑම ආකාරයකින් ඒක නිරීක්ෂණය කරන්න, ඒ ගැන කථා කරන්න මේ සභාවට පුළුවන්. ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු ලබා දෙන්න තිබෙනවා. නමුත්, උන්වහන්සේ තවම පැමිණ නැහැ. ඒ නිසා උන්වහන්සේ පැමිණි දවසක ඒ ප්‍රශ්නයට මම උත්තර ලබා දෙන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මම තවත් කාරණයක් ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, පසුගිය කාලයේ ඉතා ශීඝ්‍ර ලෙස මෘදු මත්පැන් බලපත්‍ර - beer permits - ලබා දීම ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒක මතින් තොර ප්‍රතිපත්තියට පටහැනියි. මම පිළිගන්නවා, සංචාරක ක්ෂේත්‍රය කේන්ද්‍ර කරගෙන යම් යම් පහසුකම් ලබා දීම සංචාරක කර්මාන්තයේ කොටසක් හැටියට ක්‍රියාත්මක වෙන්න ඕනෑ බව. හැබැයි, මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, සංචාරක කර්මාන්තය ක්‍රියාත්මක නොවන ගම්මාන ඇතුළේත් මේ බලපත්‍ර ලබා දී තිබීම සම්බන්ධව. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාත් මේ ගැන හොඳින්ම දන්නවා. මහනුවර ඇතුළු විවිධ ප්‍රදේශවල එලෙස බලපත්‍ර ලබා දීලා තිබෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේවා ගැන සොයා බලා, පරීක්ෂා කරලා නුසුදුසු තැන්වලට ලබා දීලා තිබෙන මෘදු මත්පැන් බලපත්‍ර අහෝසි කරන්න කටයුතු කරන්න කියලා.

විහාරස්ථානවල නායක ස්වාමීන් වහන්සේලා, අනෙකුත් ආගමික නායකයින් වාගේම මේ රටේ සිවිල් සමාජය -සිවිල් පුරවැසියන්- මේකට තරයේ විරෝධතාව පළ කර තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ආණ්ඩුවට සම්බන්ධකම් තිබෙන අපේ ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් -ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමාගෙන්- ඔබතුමා ඕනෑ නම් මේ පිළිබඳව අහන්න. එතුමා ඔබතුමාට එහා පැත්තේ අසුනේ ඉන්නවා නේ. ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, බරවකුඹුක, වෙලන්ගහවෙල ප්‍රදේශයට මත්පැන්හලක් ලබා දීම සඳහා බලපත්‍රය ලබා දීම ගැන කියන්න. අපේ ස්වාමීන් වහන්සේලා ඔබතුමා හමු වෙන්නත් ආවා නේ. මා හමු වෙන්නත් ආවා. විහාරස්ථාන ළඟ, පාසල් ළඟ, ඒ වාගේම ගම්මාන ඇතුළේ, මොනම සංචාරක කර්මාන්තයක්වත් ක්‍රියාත්මක නොවන ප්‍රදේශවල මේ මත්පැන් බලපත්‍ර ලබා දීම සිද්ධ කරලා තිබෙනවා. මතින් තොර රටක් නිර්මාණය කරන්නේ මෙහෙමද? සංචාරක කර්මාන්තය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නියමිත සුදුසුකම් සහිතව එය ලබා දීම ගැන අපට විරෝධතාවක් නැහැ. නමුත්, කරුණාකරලා විවිධ පුද්ගලයන් බා ගැනීමේ අරමුණින්, විවිධාකාරයෙන් ක්‍රියාත්මක වන මෘදු මත්පැන් බලපත්‍ර අල්ලස් දියත් කිරීම වහා නතර කරන්න කියා මා ඉල්ලීමක් කරනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එක්තරා ගමකට මත්පැන් බලපත්‍ර 6ක් දීලා, මත්පැන්හල් 6ක් විවෘත කරලා තිබෙනවා. ඒ ගමේ හාමුදුරුවෝ voice-cut එකක් දීලා හොඳ කථාවක් කිව්වා, "අපි ඉල්ලුවේ වතුර. නමුත්, අපට දුන්නේ මත්වතුර" කියලා. ඕනෑ නම්, මම ඔබතුමාට ඒ voice-cut එක එවන්නම්. ඇත්තවශයෙන්ම ඒ ගමේ නම කියන්න මටත් ලජ්ජයි. මේ වාගේ තත්ත්වයක් තමයි තිබෙන්නේ. මේ ගම හද්දා පිටිසර ගමක්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මේවා තනිකර අල්ලස්.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, ඉතාම පැහැදිලිව, මම මේ කාරණය කියන්න කැමැතියි. අයදුම්පත්‍ර 1,424ක් ඉදිරිපත් වෙලා තිබෙනවා. හැබැයි, සුරාබදු බලපත්‍ර 404යි දීලා තිබෙන්නේ. කිසිදු වෙලාවක සොයා බැලීමකින් තොරව, විරෝධතා නොසලකා බලපත්‍ර දෙන්නේ නැහැ. ඒක තමයි වැදගත්ම කාරණය.

ඊළඟ කාරණාව මෙයයි. ර.බී. 04 බලපත්‍ර 500කට ආසන්න ප්‍රමාණයක් අලුතින් දෙන්න පුළුවන්. හැබැයි, දීලා තිබෙන්නේ 100කට ආසන්න ප්‍රමාණයක් පමණයි. ඒ නිසා මේ කියන කාරණාව ගැන අපි කිසිම වෙලාවක කලබල වෙන්නේ නැහැ. ඔබතුමන්ලා කියපු කාරණාව ගැන මම ඉතාම වැදගත් විධියට සොයා බලනවා. මේකේ තව පැත්තක් තිබෙනවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ දිගන ප්‍රදේශයෙන් මට එවපු පෙත්සමක් තිබෙනවා, ගරු කථානායකතුමනි. දිගන ප්‍රාදේශීය ලේකම්වරයාට ලියපු පෙත්සම මටත් එවා තිබෙනවා. ඒකේ 400දෙනෙක් අත්සන් කරලා තිබෙනවා.

මේ 400දෙනාගෙන් වැඩි දෙනෙකුගේ දුරකථන අංකත් එහි තිබෙනවා. කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් වෙත දිගන ප්‍රදේශවාසීන් විසින් යවන ලද පෙත්සම මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා, ගරු කථානායකතුමනි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමනි, මේකේ පැති දෙකක් තිබෙනවා. දිගන නගරයේ අලුතින් වයින් ස්ටෝර්ස් එකක් ආරම්භ කරනවාට ලොකු විරෝධතාවක් ඇති වෙලා, බස්වලින් සෙනහ අරගෙන කොළඹටත් ආවා. හැබැයි, 400දෙනෙකු අත්සන් කරලා ප්‍රාදේශීය ලේකම්ට යැවිව පෙත්සමේ මාතෘකාව හැටියට තිබෙන්නේ, "දිගන නගරයේ ආරම්භ වූ 'නිව් දිගන වයින් ස්ටෝර්ස්' සුරාබදු බලපත්‍රයට ස්තුතිය පුද කිරීම සඳහා" කියායි. එම පෙත්සමේ පිටපතක් මටත් එවා තිබෙනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"අවුරුදු 30 පුරාවට දිගන නගරය තුළ එක් බලපත්‍රයක් පමණක් ක්‍රියාත්මක වූ අතර එම නිසා දැඩි ඒකාධිකාරයක් පැවතිණි. එමඟින් මහ ජනතාවට තමාගේ අභිමතය පරිදි භාණ්ඩ මිලදී ගැනීමට නොහැකි වූ අතර එම වෙළෙඳ සැල කැමති භාණ්ඩ පමණක් අළෙවි කෙරුණි. විශේෂයෙන් වෙළෙඳ පොළේ වැඩි ඉල්ලුමක් පවතින "සංස්ථා අරක්කු" ඔවුන් අළෙවි නොකරන ලදී. එම නිෂ්පාදන ලබා ගැනීම සඳහා විශාල දුරක් ගෙවා මැණික්හින්න, තෙල්දෙණිය හෝ නත්තරම්පොත වෙත පැමිණිය යුතු විය.

එසේම පැවති වෙළෙඳ සැල මඟින් නිෂ්පාදන පාලන මිලට අළෙවි නොකළ අතර වැඩි මිලට අළෙවි කෙරිණි. බියර් සඳහා රුපියල් 20ක්ද, සියලු අරක්කු රුපියල් 20 හා රුපියල් 50 අතර වැඩි මිලට අළෙවි කෙරිණි. එසේ අළෙවි කරන ලද්දේ මහ ජනතාවට වෙනත් විකල්පයක් නොමැති බැවිනි. සුරාබදු නිවේදන අනුව වැඩි මිලට විකිණීම මෙන්ම තෝරාගත් භාණ්ඩ අළෙවි කිරීම බලපත්‍ර කොන්දේසි කඩ කිරීමකි. විශාල ජන ඝනත්වයක් පවතින දිගන නගරයට නව සුරාසැලක අවශ්‍යතාව ඉතා තදින් පැවතිණි.

දින කිහිපයකට ඉහතදී ආරම්භ කරන ලද 'නිව් දිගන වයින් ස්ටෝර්ස්' මඟින් මහ ජනතාවට සැලසී ඇත්තේ විශාල සහනයකි. එසේම වෙනත් ප්‍රදේශවලට නිෂ්පාදන මිලදී ගැනීමට ගිය ජනතාව නගරය තුළ රැඳී ඇත. එමඟින් අනෙකුත් ව්‍යාපාරද දියුණුවට ලක් වෙමින් පවතී. එසේම නව වෙළෙඳ සැල සංස්ථා අරක්කු අළෙවි කරන අතර පාලන මිලට නිෂ්පාදන අළෙවි කරයි. මෙමඟින් ඇති වූ තරඟකාරිත්වය මත පැවති වෙළෙඳ සැලද පාලන මිලට නිෂ්පාදන අළෙවි කිරීම අරඹා ඇත. එසේ නම් පැවති වෙළෙඳ සැල මඟින් අවුරුදු 30ක් පුරාවට දිගන ජනතාවට දැඩි අසාධාරණයක් සිදු කර ඇත.

එම නිසා දිගන සියලු ජනතාව ඔබතුමියට මේ නව සුරාසැල විවෘත කිරීම සම්බන්ධව ඉතා ඕනෑකමින් ස්තුතිය පළ කරන අතර එසේම අපහට දැනගන්නට ලැබී ඇති පරිදි පැවති වෙළෙඳ සැල නොයෙකුත් ක්‍රියා මඟින් මෙම නව වෙළෙඳ සැල නවතා දැමීමට ක්‍රියා කරන අතර ඒ සඳහා නගරයේ සියලු ජනතාවගේ විරුද්ධත්වය ප්‍රකාශ කර සිටිමු. ජනතාවගේ අත්සන් ලේඛනයක්ද මේ සමඟ අමුණා ඇති අතර නව වෙළෙඳ සැලට එමඟින් කැමැත්ත පළ කර ඇත."

පැවති වෙළෙඳ සැලේ හිමිකරු මේ නව සුරාසැල විවෘත කිරීම නවත්වන්නට ක්‍රියා කරනවා. නමුත්, 400දෙනෙකු එම පෙත්සමට අත්සන් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේ පැති දෙකක් තිබෙනවා. අපි ඉතාම සැලකිල්ලෙන් මේ කියන විරෝධතා පිළිබඳව විමසා බලනවා. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

රජයේ ප්‍රතිපත්තිය ඒකද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් ප්‍රධාන වැඩකටයුතුවලට යමු. *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමා, අපි ප්‍රධාන වැඩකටයුතුවලට යමු. *[බාධා කිරීමක්]* දැන් ඔබතුමා කථා කළා නේ, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එතුමා පෙත්සමක් කියෙව්වා නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
හරි, හරි. Debate එකේදිම ඒ ගැන කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක debate එකේදි කියන්න. *[බාධා කිරීමක්]* ඒකට උත්තර දෙන්න ඔබතුමා ඕනෑ නැහැ නේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඔබතුමා මොකක්ද කියන්නේ?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මෙතුමා පෙත්සමක් කියෙව්වා, ගරු කථානායකතුමනි. මම අහන්නේ මේකයි. වෙරි මරගාතේ අත්සන් කරන පෙත්සම්වලින් රජයේ ප්‍රතිපත්තිය තීරණය කරනවාද? වෙරි මරගාතේ තමයි ඒකට අත්සන් කරලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමාත් වගකීමෙන් තොරව කටයුතු කරනවා නේ. අපි මේ සභාව පවත්වාගෙන යන්නේ නැද්ද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මම බොහොම වගකීමෙන් ප්‍රකාශ කරනවා, ඇත්තටම රජයට ආධාර උපකාර කරන මන්ත්‍රීවරුන්ට වෙනත් නම් යොදලා මත්පැන් බලපත්‍ර ලබා දීමේ වැඩ පිළිවෙළක් ගැන ඉස්සෙල්ලාම මේ පාර්ලිමේන්තුවට හෙළිදරව් කළේ මමයි කියන එක. මන්ත්‍රීවරු ඕවාට හවුල් වෙලා ඉන්නවා නම් අත්සන් භාරසියයක් නොවෙයි, භාරදාහක් වුණත් ගන්න පුළුවන්, හොර අත්සනුත් දාලා. මම පැහැදිලිව මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. මම මේ කාටවත් දෝෂාරෝපණය කරනවා නොවෙයි, ගරු කථානායකතුමනි. මම මේ ප්‍රශ්නය ඇහුවේ මහජන නියෝජිතයෝත් මේවාට සම්බන්ධ වෙලා සිටිනවාද කියන කාරණය පැහැදිලිව දැනගන්නයි.

ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමනි, මේ කාරණය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඔබතුමාට එහා පැත්තේ වාඩි වෙලා ඉන්න නියෝජ්‍ය කථානායක අජිත්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

රාජපක්ෂ මැතිතුමාගෙන් අහන්නකෝ, ඇඹිලිපිටිය ප්‍රදේශයේ එහෙම විරෝධතාවක් නැද්ද කියලා. ඔබතුමාම උත්තර දෙන්නකෝ. ඔබතුමාටත් විරෝධතාව ආවා නේ; මටත් ආවා, ඒ විරෝධතාව, එහෙම ජරා වැඩක්, කැත වැඩක් කරනවාය කියලා. ඒ නිසා මම ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඔය පෙත්සම් පිටුපස යන්න එපා කියලා. ඔය වාගේ පෙත්සම්වලට ඕනෑ තරම් අත්සන් කරන්න පුළුවන්. ඒ නිසා ඔබතුමා ක්ෂේත්‍ර පරීක්ෂණයක් කර බලලා ඒවා ගැන තීන්දු-තීරණ ගන්න. එච්චරයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඕකට උත්තර දෙන්න ගියොත් තව ප්‍රශ්න අහනවා.

ගරු සභානායකතුමා, අපි ප්‍රධාන වැඩ කටයුතුවලට යොමු වෙමු.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින ආණ්ඩුවේ වැඩකටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 54 සහ අංක 55 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 66 සහ 73 දරන යෝජනා ඉල්ලා අස් කර ගැනීම, ගරු සභානායකතුමා.

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත: නියෝග
கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழுச் சட்டம்: ஒழுங்குவிதிகள்
COLOMBO PORT CITY ECONOMIC COMMISSION ACT: REGULATIONS

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 66, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග පිළිබඳ යෝජනාව ඉල්ලා අස්කර ගැනීමට මා අවසර පතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

අවසර දෙන ලදුව, නියෝග ඉල්ලා අස්කර ගන්නා ලදී.
ஒழுங்குவிதிகள், அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.
Regulations, by leave, withdrawn.

අත්‍යවශ්‍ය මහජන සේවා පනත: යෝජනා සම්මතය
அத்தியாவசிய பொதுமக்கள் சேவைச் சட்டம்: தீர்மானம்
ESSENTIAL PUBLIC SERVICES ACT: RESOLUTION

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ ඇති විෂය අංක 73, අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය පිළිබඳ යෝජනාව ඉල්ලා අස්කර ගැනීමට මා අවසර පතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

අවසර දෙන ලදුව, යෝජනා සම්මතය ඉල්ලා අස්කර ගන්නා ලදී.
தீர்மானம், அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.
Resolution, by leave, withdrawn.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 43 සිට 54 දක්වා ඉදිරිපත් කිරීම.

රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත
பொதுத் தனிசு முகாமைத்துவம் சட்டமூலம்
PUBLIC DEBT MANAGEMENT BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 44 - වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියමය, විෂය අංක 45 - දේශීය ආදායම් පනත යටතේ යෝජනාව, විෂය අංක 46 සිට 50 දක්වා - විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් 5ක්, විෂය අංක 51 - දේශීය ආදායම් පනත යටතේ නියෝගය, විෂය අංක 52 - සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ නියෝග, විෂය අංක 53 - වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත යටතේ නියෝගය, විෂය අංක 54 - සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ අස්වැසුම් සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය ද අනුමත කිරීම සඳහා මා ඉදිරිපත් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විවාදය ආරම්භ කිරීම, ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ වීය.

අතන්පිටකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිණින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] තලෙමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] took the Chair.

[පූ.භා. 11.22]

ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)

ගරු කථානායකතුමනි, අපේ රටේ ආර්ථික අර්බුදයක් පැවතිලා, දැන් නැවත ආර්ථිකය ප්‍රකෘතිමත් මට්ටමට පත් වෙලා තිබෙනවා. ඒ අසීරුම කාල පරිච්ඡේදය අවසන් කර ආර්ථිකයේ වර්ධනයක් වෙත ගමන් කරන මොහොතේ, මීට වර්ෂ කිහිපයකට ප්‍රථම සිදු විය යුතු ප්‍රතිසංස්කරණ රාශියක් දැන් සිදු කරමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේ රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත ගැනත් විවාද කරනවා. අපි සියලුදෙනාම දන්නවා, වර්තමානයේ අපේ රටේ ණය කළමනාකරණය සම්බන්ධයෙන් විශාල ගැටලුවක් තිබෙන බව. අපේ රටේ ණය තිරසරභාවයක් නොමැති වීම නිසා නැවත එය ඇති කර ගැනීම වෙනුවෙන් රජය ක්‍රියා මාර්ග රාශියක් අරගෙන තිබෙනවා. මේ සිදු කරපු ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට විරුද්ධ පක්ෂය අපට සහයෝගය ලබා දුන්නේ නැහැ කියන එක මම නැවතත් කියනවා. නමුත්, සිදු කළ යුතුව තිබෙන, වෙනස් විය යුතුව තිබෙන තැන් වෙනස් කිරීමට ආණ්ඩුව කටයුතු කළා. රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ, අපේ රටේ මෙතෙක් පැවැති ණය කළමනාකරණ ක්‍රමවේදය වෙනස් කර එහි වගකීම කේන්ද්‍රගත තැනකට ගෙන ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවන ආකාරයට රට කළමනාකරණය කිරීමයි. අපි ජාත්‍යන්තරයත් එක්ක සාකච්ඡා කරලා යෝජනා කිහිපයකට එකඟතාව පළ කරලා, මේ වෙනකොට ඒවා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ රාජ්‍ය ණය ප්‍රමාණය 2022 අවුරුද්දේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 128ක්ව පැවතුණා. 2032 අවුරුද්ද වෙද්දී ඒ ප්‍රමාණය සියයට 95ක් දක්වා අඩු කර ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා. රජයේ මුදල් සැපයුම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 34.6ක්ව පැවතුණා. ඒක සියයට 13ක් දක්වා අඩු කර ගැනීමටත් අපි බලාපොරොත්තු වෙනවා. විදේශ ණය සේවාකරණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.4ක්ව පැවතුණා, 2022 අවුරුද්දේදී. එය සියයට 4.5ක් දක්වා අඩු කර ගැනීමටත් අපි බලාපොරොත්තු වෙනවා. මෙන්න මේ ප්‍රධාන කාරණා තුන මත තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත්, අපේ ණය හිමියනුත් ශ්‍රී ලංකාවට අවශ්‍ය සහයෝගය ලබා දී තිබෙන්නේ.

ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමේදී අලුත් ක්‍රමවේදවලට ශ්‍රී ලංකාව අනුගත වෙන්න ඕනෑය කියන කාරණය මම හිතන විධියට තර්කයක් හැටියට මතු කිරීම අවශ්‍ය වෙන්නේ නැහැ. මේ රටේ කවුරු ආණ්ඩු පාලනය කළත් අවසානයේ රටේ මිලියන 22ක ජනතාවට රජයක් විසින් ඉටු කළ යුතු කාරණා, වෙනස් කළ යුතු කාරණා, වෙනස් විය යුතු කාරණා සිදු කිරීම තමයි රජයක වගකීම බවට පත් වෙන්නේ. වර්තමානයේ අපේ රටේ පවතින්නේ කිසිදාක ඇති නොවෙච්ච තත්ත්වයක් තුළ බිහි වෙච්ච පාර්ලිමේන්තුවක් සහ පත් වුණු ජනාධිපතිවරයෙක්. එක වෙලාවක ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා නායකත්වය දරන රජයක් තිබුණා. එතුමාගේ ඉවත් වීම සමඟ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා නායකත්වය දෙන රජයක් අද රටේ පවතිනවා. හැබැයි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඉවත් වුණාම, අපේ රටේ ව්‍යවස්ථාව තුළ ක්‍රමවේදයක් තිබෙනවා, අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙක් පත් කර ගැනීමට. ඒ ජනාධිපතිවරයා පත් කර ගැනීමත් සමඟම නිරන්තරයෙන්ම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මතු කරන කාරණයක් තමයි, මේ ප්‍රතිසංස්කරණවලට යන්න රජයට ජනවරමක් නැහැ කියන එක. ඒ සඳහා ජනවරමක් රජයට තිබෙනවා.

ව්‍යවස්ථානුකූලව පත් වුණු ජනාධිපතිවරයෙක්, රජයක් මේ රටේ ක්‍රියාත්මක වෙනවා. මේ රජයේ වගකීම තමයි නැවත පෙර පැවති අර්බුදයට නොයන ආකාරයට රට කළමනාකරණය කිරීම. ඒක නිසා අපේ රටේ ණය තිරසරභාවයක් ඇති කර ගැනීම වෙනුවෙන් මේ වෙනකොට අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු වෙනවා වාගේම ඒ සඳහා අවශ්‍ය ජාත්‍යන්තර සහයෝගය අපට ලැබෙනවා. ඒ තුළ මේ රටේ ආර්ථිකය පිළිබඳව විශ්වාසයක් මේ වනකොට ජනතාව තුළ, රට තුළ, ආයෝජකයන් තුළ, ජාත්‍යන්තරය තුළ ගොඩනැඟෙමින් පවතිනවා.

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ දිනය වෙද්දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඔවුන්ගේ මාධ්‍ය සාකච්ඡාව තුළ ප්‍රකාශ කරනවා වැදගත් කාරණයක්. ජුනි මාසයේ 12වැනි දා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඔවුන්ගේ විධායක මණ්ඩලයේදී ශ්‍රී ලංකාව පිළිබඳ දෙවැනි සමාලෝචනය සම්බන්ධයෙන් සාකච්ඡා කරනවා කියන එක මේ වනකොටම නිවේදනය කර තිබෙනවා. ඒක ශ්‍රී ලංකාවට ඉතා වැදගත්. අපි විශ්වාස කරනවා, අපි මෙතෙක් කරපු ප්‍රතිසංස්කරණ සහ එකඟතා සම්පූර්ණ කිරීම තුළ ඒ වාගේම පෙන්වලා තිබෙන කැපකිරීම තුළ අපට එතැනින් එහාට යන්න ඒ කියන්නේ, තුන්වැනි වාරිකය නිදහස් කර ගැනීමේ ගැටලුවක් ඇති වෙන්නේ නැහැ කියලා. ඒ විශ්වාසය රජයක් හැටියට අපට තිබෙනවා. ඊයේ දිනය වෙද්දී "IMF is Confident in Imminent Debt Deals as Sri Lanka's Economic Reforms Show Strong Results" නැමති පුවත් වාර්තාව IMF එක මාධ්‍ය හමුවේ ප්‍රකාශ කළ දේ වාර්තා කළේ කෙසේද? "The International Monetary Fund said that there is strong expectation that agreements with external commercial creditors consistent with programme parameters will be reached soon" කියලා. මෙහි ප්‍රධාන වශයෙන් කියනවා, වාණිජමය ණය හිමියන් සමඟ අපේ එකඟතාවක් - agreement in-principle - ඇති කර ගැනීමට අවශ්‍ය එකඟතාව නුදුරේම ඇති කර ගැනීමට හැකියාවක් තිබෙනවා කියලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විශ්වාසය පළ කරනවා යනුවෙන්. මේ වෙනකොටම අපි ද්විපාර්ශ්වික ණය හිමියන් එක්ක, නිල ණය හිමියන් එක්ක, නිල ණය හිමියන්ගේ කමිටුව සමඟ සාකච්ඡා කරලා, ඒ අවශ්‍ය සහයෝගය දෙපාර්ශ්වයෙන්ම ලැබිලා තිබෙනවා. ඒ කියන්නේ, එක පැත්තකින් Official Creditor Committee - OCC - එකේ, අනෙක් පැත්තෙන් Paris Club Secretariat එකේ - ඒ සියලුදෙනාගේම - සහයෝගය ඇතුව අපි මේ වනවිටම ප්‍රතිපත්තිමය වශයෙන් නිල ණය හිමියන් එක්ක එකඟතාවන්ට ඇවිල්ලා තිබෙනවා. OCC එකේ ඉන්න නිල ණය හිමියන් සහ අනෙක් පැත්තෙන් චීනය සමඟ එකඟතාවන්ට ඇවිල්ලා තිබෙනවා.

ඊළඟට, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, දැනට සාකච්ඡා වෙන - හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා නිතරම කථා කරන - කාරණය තමයි, බැඳුම්කර හිමියන් සමඟ ඇති කරගෙන තිබෙන සාකච්ඡාව. අපි එකඟතාවකට ඇවිල්ලා නැති වුණාට ධනාත්මකව ඒ සාකච්ඡා වටයට ප්‍රවිෂ්ට වෙලා තිබෙනවා, බැඳුම්කර හිමියන් සමඟ ප්‍රතිව්‍යුහගතකරණයක් වෙනුවෙන්.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මට පැහැදිලි කර ගැනීමක් කර ගන්න තිබෙනවා, ගරු රාජ්‍ය ඇමතිතුමනි. දැන් අපේ සම්පූර්ණ ණය ප්‍රමාණය කීයද?

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ඔබතුමා අහන්න හදන කාරණය මම දන්නවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
සම්පූර්ණ ප්‍රමාණය කියන්න.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
පොඩ්ඩක් ඉන්න, මම කියන්නම්. What do you want to know? The domestic debt or the total debt?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
The entire debt.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Okay. Then what else do you want to know? - [*Interruption.*] Okay. You want to know about the recent Report which was published by the IMF, is it? - *[Interruption.]* I will tell you in detail. If you do not disturb me, I will tell you in detail. Right now, I have the details with me. - [*Interruption*] No. I will explain to you, Hon. Member. Please, let me finish this. Then, I will explain to you. Do not worry, I have the details. I was ready for it because I knew that this question would be raised by you. Generally, you like to raise questions and come into arguments with me because your prime focus is the camera. So, do not worry, I will allow you to have your statement made before the camera.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හර්ෂ මන්ත්‍රීතුමා සමාජගත කරන්න උත්සාහයක් දැරුවා කාරණයක්. එතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී රජය විසින් ඉදිරිපත් කරන යෝජනා පිළිබඳව තක්සේරුවක් කරලා සම්මත කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීලා තිබෙනවා. සමහර වෙලාවට වෙනස්කම් යෝජනා කරලාත් තිබෙනවා. ඒ වෙනස්කම්වලින් හොඳ ඒවා, රජයට කරන්න පුළුවන් වෙනස්කම් ටික අපි සිදු කරලා තිබෙනවා. දැන් ප්‍රශ්නය තිබෙන්නේ, හර්ෂ මන්ත්‍රීතුමා නිරන්තරයෙන් කියන කාරණයක් තමයි දැනට එකඟතාවකට ඇවිල්ලා නැති බැඳුම්කර හිමියන් - ISB holdersලා - සමඟ සාකච්ඡාවේදී that we have agreed for a 7 per cent haircut. The point I am trying to make is, when the negotiations and discussions are still going on, it is not fair that some outsider - of course, you have all the right to say what you want - comes and makes a description of what the decision of the Government is going to be. That is the point I am trying to make. The whole restructuring process was approved in Parliament and once the discussions were concluded, we have presented a Report on the discussions. Similarly, once the ongoing discussions with the ISB holders are concluded, we will certainly report to Parliament because it is good for all the Members to know what the outcome is.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඉතා සංකීර්ණ කාරණාවක්, මෙතැනදී මේ ගැන සරලව කථා කළාට. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා උදේ එතුමාට තිබෙන ප්‍රශ්නයක් පිළිබඳව කිව්වා. එතුමා කිව්වා, මෙන්න මේ මේ දේවල් ගැන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ කථා කරලා තිබෙනවා, ඒ නිසා එතුමාට යම්කිසි ආකාරයක තර්ජනයක් එල්ල වෙනවා කියලා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව තිබෙන්නේ ඒ දෙය සාකච්ඡා කරන්න. අපි වගකියන ආණ්ඩුවක් හැටියට රජයේ මුදල් පිළිබඳ කාරක සභාව බැහැර කරලා, ස්ථාවර නියෝග අත්හිටුවලා මේ පාර්ලිමේන්තුවේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් තීන්දු ගන්න කටයුතු කළේ නැහැ. අපි හැම අවස්ථාවකදීම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කරලා කාරක සභාවෙන් ලබා දෙන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පස්සේ තමයි අදාළ විවාදය සිදු කළේ. දැන් මට තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා ගරු කථානායකතුමාගෙන් ආරක්ෂාව ඉල්ලුවා. ඔබතුමාට ආරක්ෂාව

ලබා දෙන්න ගරු කථානායකතුමා කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. හැබැයි, මට තිබෙන ප්‍රශ්නය මෙයයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පරිස්සම් වෙන්න ඕනෑ ඔබතුමාගේම කඳවුරෙන්. ඔබතුමා කියපු news reports ගැන මමත් පොඩ්ඩක් බැලුවා. මට දැනෙන ආකාරයට ඒ බොහෝ දේවල් සමඟි ජන බලවේගයට සම්බන්ධ පාර්ශ්ව විසින් සමාජ මාධ්‍ය තුළ පළ කරන ලද තොරතුරු. සමහර විට ඒ අය හිතනවා ඇති, හර්ෂ මන්ත්‍රීතුමා ඉදිරියේදී ජනාධිපතිතුමා එක්ක එකතු වෙයි කියලා. ඒ සැකය තුළ එතුමාට මේ ආකාරයට ආණ්ඩුව ඇතුළු වෙනත් පාර්ශ්ව තර්ජනය කරනවා කියලා ඉඟි කරන්න උත්සාහ කරනවා ඇති.

එතුමාව ඉවත් කිරීමටවත්, එතුමාට බලපෑම් කිරීමටවත් රජයට අවශ්‍ය නැහැ. හැම මන්ත්‍රීවරයෙකුටම අදහස් ප්‍රකාශ කරන්න අයිතියක් තිබෙනවා. ඒක ඇත්ත. අනික, අපි එතුමාව ඉවත් කරන්නේ මොකටද? අවසානයේ හර්ෂ මන්ත්‍රීතුමාව පත් කරන්නේත්, ජනාධිපතිතුමා, ආණ්ඩු පක්ෂය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කළා, මේකට හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සුදුසුයි, සහයෝගය දක්වන්න කියලා. ඉනින් ජනාධිපතිතුමාම සහයෝගය දීලා පත් කරපු රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාව ආණ්ඩුව අයින් කරන්නේ මොකටද?

අනෙක, අපි රටක් හැටියට යන ගමන් මහ සම්පූර්ණයෙන්ම වෙනස්. ඉස්සර යම් යම් දේවල් විනිවිදභාවයෙන් යුතුව සිදු නොවෙන්න ඇති. හැබැයි, වර්තමානයේ සියලුම කටයුතු විනිවිදභාවයෙන් යුතුව සිදු වෙනවා. ඒකට හේතුව, මේ රටේ ආර්ථිකය පිළිබඳව බරපතළ වගකීමක් ආණ්ඩුවට තිබෙන නිසා. අපි 17 වතාවක් IMF එකට ගිහිල්ලා තිබෙනවා. අපි 17 වතාවක් IMF එකට ගියේ ඇයි? අපි 16 වතාවක් කරපු ප්‍රතිසංස්කරණ නිවැරදිව, නිසි ආකාරයට ක්‍රියාත්මක නොකරපු නිසායි. අපි ටික කාලයක් යනවා, ඔළුව උස්සනවා, ආපහු ඒ ඔක්කෝටම පයින් ගහලා පැත්තකට දමනවා, එහෙම නැත්නම් ආණ්ඩු වෙනස් වෙනවා, ආණ්ඩුව ඇතුළේ යම් යම් පාර්ශ්වවල කාරණා නිසා ජාත්‍යන්තරයත් එක්ක එකට යන්න ඕනෑ කියන මතයට අපට එකඟ වෙන්න බැහැ, විවිධ දේශපාලන බලපෑම් එනවා. ඊට පස්සේ ඉවත් කර ගැනීම සිදු කරනවා. රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත තුළින් වර්තමානයේ අප මුහුණ දෙන ගැටලු රාශියට අනාගතයේ මුහුණ නොදෙන මංපෙතක් විවෘත වෙනවා. ඒ හින්දා මා හිතන්නේ නැහැ, ඔබතුමන්ලා කවුරුවත් මේකට විරුද්ධව කටයුතු කරයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මූලික වශයෙන් ඉදිරිපත් කරන කාරණා අතරින් තවත් දෙකක් ගැන සඳහන් කරන්න තිබෙනවා. එකක් තමයි, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ නියෝගවලට - Regulationsවලට - කරන ලද amendments. අනෙක තමයි, payment scheme එකේ කරන වෙනස්කම. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, 2002දී ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් යටතේම තමයි සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය ක්‍රියාත්මක වුණේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් යටතේ තමයි ඒ පනත සම්මත කළේ. මම බැලුවා, ඒ අවස්ථාවේ කවුද පාර්ලිමේන්තුවේ හිටියේ කියලා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාත්, ගරු විපක්ෂ නායකතුමාත්, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාත් ඒ වෙලාවේ පාර්ලිමේන්තුව නියෝජනය කර තිබෙනවා. ඔබතුමන්ලා එකඟතාවක් පළ කරලා තිබෙන ක්‍රමයක් තමයි වර්තමානයේදී අප ක්‍රියාත්මක කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී අපට ප්‍රශ්න කීපයක් ආවා. මම ඒවා ගැන කියන්නම්. "අස්වැසුම" කියන්නේ, විශේෂයෙන්ම මේ රටේ දිළිඳු ජනතාව හඳුනාගෙන ඔවුන්ට අවශ්‍ය සහයෝගය ලබා දීමේ වැඩසටහනක්. ඒ අය හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් තිබෙනවා. ඒක විනිවිදභාවයකින් කෙරෙන කටයුත්තක් වනවා. කිසිම කෙනෙකුට බලපෑමක් ඇති නොවන ආකාරයට එමඟින් කටයුතු කරන්න පුළුවන්. හැබැයි, අවුරුදු ගණනාවකට පස්සේ ක්‍රියාත්මක කරන අලුත් ක්‍රමවේදයක් හින්දා එය තවදුරටත් ශක්තිමත් විය යුතුයි කියලා අපි දකිනවා. මොකද, අවුරුදු 28ක සුබසාධක දීමනා ලබා දීමේ ක්‍රමවේදය අවුරුද්දකින් වෙනස් කරන්න බැහැ. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු ඇමතිතුමනි, අප බලාපොරොත්තු වන්නේ, සහතික කිරීමේ වටය මේ මාසයේ ආරම්භ වුණාට පස්සේ පළමුවෙනි වටයේ තිබුණු දුර්වලතා ද නැති වෙලා මීට වඩා ශක්තිමත්ව, ඒ කියන්නේ සියයට 80ක විතර සාර්ථකත්වය සියයට 90ක් දක්වා ගෙන යන්නයි. ඊළඟට, තුන්වෙනි අවුරුද්ද ක්‍රියාත්මක වෙද්දී අප බලාපොරොත්තු වන සාර්ථකත්වය ලබා ගන්න අපට පුළුවන් වේවි. 2023 අවුරුද්දට අපි සුබසාධක දීමනා ලබා දීම වෙනුවෙන් රුපියල් බිලියන 184ක් වියදම් කළා. මේ අවුරුද්දේ රජය බලාපොරොත්තු වෙනවා, සුබසාධක දීමනා වෙනුවෙන් -අස්වැසුම සුබසාධක දීමනා වෙනුවෙන්- රුපියල් බිලියන 205ක් වියදම් කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ප්‍රදේශවල ජනතාව ඇවිල්ලා ඔබතුමන්ලා ඇතුළු අප හැමෝටම නහන මැසිවිල්ලක් තිබෙනවා. එක කාණ්ඩයකට -විශේෂයෙන්ම අවධානමට ලක් වූ කාණ්ඩයට සහ සංක්‍රාන්තික කාණ්ඩයට- දෙසැම්බර් මාසයේ 31වැනි දා වනකොට ගෙවීම් කරලා අවසාන වුණා. අනෙක් කාණ්ඩයට මාර්තු මාසයේ 31වැනි දා වෙද්දී ගෙවීම් කරලා අවසන් වුණා. නමුත්, මේ ආර්ථික අර්බුදය තවමත් සම්පූර්ණයෙන් නිරාකරණය වෙලා නැහැ නේ. ඒ හින්දා තමයි ගරු ජනාධිපතිතුමා අය වැය ලේඛනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරද්දී යෝජනා දෙකක් කළේ. එකක්, මේ සංක්‍රාන්තික සහ අවදානමට ලක් වූ කාණ්ඩ දෙකම එක කාණ්ඩයක් සේ සලකා රුපියල් 2,500 බැගින් ගෙවපු කාණ්ඩයටත් දීමනාව රුපියල් 5,000 සීමාව දක්වා වැඩි කිරීම. ඒ අයට මේ මාස හයටම ගෙවීම් සිදු කරලා නැහැ. ඒ හින්දා අද අපි පාර්ලිමේන්තුවෙන් බලාපොරොත්තු වන්නේ, අන්න ඒ කාණ්ඩ දෙක සඳහා ජනවාරි සිට ජූනි දක්වා අදාළ ගෙවීම කරන්න අවශ්‍ය අනුමැතිය ලබාගෙන, ජූලි මාසයේ සිට රුපියල් 5,000 බැගින් මාසිකව ගෙවීම් කටයුතු ආරම්භ කිරීමටයි.

ඊළඟට, අනෙක් කාණ්ඩ ගත්තොත්, ඒ කාණ්ඩවල ජූනි මාසයේ ගෙවීම නතර වෙලා තිබෙනවා, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු ඇමතිතුමනි. මොකද, ඒ අදාළ ගැසට් නිවේදනය අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කටයුතු කළත් එහි ඇති වෙච්ච යම් අපැහැදිලිතාවක් පිළිබඳව නීතිපතිවරයා වෙත ගිහින් පැහැදිලි කර ගැනීමක් සිදු කරවාගෙන නැවත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අපට සිදු වුණා. ඒ අනුව අන්ත දිළිඳු සහ දුප්පත් කියන කාණ්ඩ සඳහා ජූනි මාසයට අදාළ ගෙවීම සිදු කරන්න මේ ගැසට් නිවේදනය හරහා අපි පාර්ලිමේන්තුවේ අනුමැතිය ඉල්ලනවා. ඒ අනුව ජූලි මාසයේ ඉඳලා සාමාන්‍ය පරිදි මේ ගෙවීම් කටයුතු සිදු කරන්න අපට පුළුවන්. මෙන්න, මේක තමයි මේ ගැසට් නිවේදනයේ සඳහන් යෝජනාව තුළින් අප බලාපොරොත්තු වන්නේ.

ඊළඟට, අපි සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ Regulations ද වෙනස් කරනවා. ඒකට හේතුව, පළමුවෙනි වටය ක්‍රියාත්මක වෙද්දී යම් යම් දුර්වලතා වාර්තා වීම. ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන් කිව්වා, මහ ජනතාව කිව්වා, මේ පාර්ලිමේන්තුවේ අපිත් කථා කළා. කමිටුවලත් කථා කළා. ඒ දුර්වලතාත් හඳුනාගෙන, ඒ මෘදුකාංගයේත් ඇති වෙලා තිබුණු දුර්වලතා නිවැරදි කරලා, වඩා හොඳ ක්‍රමවේදයක් අනුගමනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මෙහිදී ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා -

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව - යෝජනා කර තිබුණා, මේ ඉලෙක්ට්‍රොනික ක්‍රමවේදය පමණක්ම භාවිත කරන්න කියලා.

ඒකට රජයක් හැටියට අපි සියයට 100ක් එකඟයි. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා. මම නියෝජනය කරන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කය. එහි හොරොව්පතානේ කොනට ගිහිල්ලා බලන්න; කැබිතිගොල්ලෑවේ කොනට ගිහිල්ලා බලන්න. අපේ ප්‍රදේශවල තවම අප බලාපොරොත්තු වන මට්ටමට Internet connection එක විහිදිලා නැහැ. ඒ හින්දා අපි රජයේ නිලධාරියා කෙරෙහි විශ්වාසයක් තබා තිබෙනවා. මේ Internet connection එක අවශ්‍ය පරිදි නැති තැන්වල ජනතාවට තමන්ගේ ඉල්ලුම් පත්‍රය online ඉදිරිපත් කරන්න බැරි හින්දා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටුවා තිබෙන කාර්යාලයට ඒවා ලබා දුන්නාම කිසිදු වෙනසක් නොකර අදාළ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්න රජයේ නිලධාරියා කටයුතු කරාවි කියලා අපි විශ්වාස කරනවා.

මේ Regulation එක ක්‍රියාත්මක වුණාම මේ සැරේ අපි කරන්න බලාපොරොත්තු වන තවත් දෙයක් තිබෙනවා. සමහර අය අසත්‍ය තොරතුරු දීලා ප්‍රතිලාභ අරගෙන තිබෙනවා. ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමනි, මේ සැරේ තමන්ගේ අයදුම් පත්‍රය සහතික කරන නිලධාරියා විසින් ලබා ගනිද්දී අවසානයේ ඇති වන එකඟතාව record වෙනවා. එතකොට කවුරු හරි ඒ සඳහා අභියාචනයක්, විරෝධතාවක් දැක්වුවහොත් නිවැරැදි තොරතුරු සොයා ගන්න අපට පුළුවන්. මොකද, අපට record එකක් තිබෙනවා. ප්‍රතිලාභියා කියනවා, "මේ ටික තමයි මා සතු වත්කම් ටික, මේක තමයි මගේ ආදායම, මේක තමයි මගේ වියදම" කියලා. යම්කිසි නොමඟ යැවීමක් සිදු වෙලා තිබෙනවා නම්, ඒ නොමඟ යැවීම සිදු වෙලා තිබෙන තැන හඳුනා ගැනීමේ හැකියාව එමඟින් අපට ලැබෙනවා.

මේ වන කොට දහඅට ලක්ෂයකට අස්වැසුම් ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමට අනුමත වෙලා තිබුණත්, ගෙවීම් සිදු කරලා තිබෙන්නේ 1,612,247කට පමණයි. ඒකට හේතුව, තවත් ලක්ෂ 2කට ආසන්න ප්‍රමාණයක් තමන්ගේ බැංකු ගිණුම් ආරම්භ කරලා තහවුරු කිරීම් සිදු කරලා නැති එකයි. ඒකට අපි අලුත් වැඩසටහනක් ක්‍රියාත්මක කරගෙන යනවා.

ඒ එක්කම අපට පුළුවන් වෙලා තිබෙනවා, පළමුවැනි වතාවට අපේ රටේ සමාජ ආරක්ෂණ දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කරන්න. ඒ හරහා අපි මේ රටේ දිළිඳුම කණ්ඩායම තුළ - ඒ ලක්ෂ දහඅටෙම - මූල්‍ය අන්තර්ගතභාවයක් - financial inclusion එකක් - ඇති කරලා තිබෙනවා. ඊට අමතරව, රජය පොහොර සහනාධාරය ලබා දීමේදී බැංකු හරහා ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. අනෙක් ගෙවීම් කරද්දීත් දැන් බැංකු හරහා කටයුතු කර තිබෙනවා, අතරමැද පුද්ගලයෙකු නැතුව. අපි එක පැත්තකින්, සමාජ ආරක්ෂණ දත්ත පද්ධතියක් ඇති කර තිබෙනවා. අනෙක් පැත්තෙන්, මූල්‍ය අන්තර්ගතභාවය නැත්නම් financial inclusion එකේ weight එක වැඩි කරන්න කටයුතු කර තිබෙනවා, විනිවිදභාවයක් තිබෙන කටයුත්තක් හඳුන්වා දී තිබෙනවා. ඒ වාගේම, "අස්වැසුම" වැඩසටහන යටතේ දූෂණ සහ අක්‍රමිකතා අවම කරන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා. එම වැඩසටහන යටතේ පළමුවැනි වටයේ පවුල් ලක්ෂ 20කට ප්‍රතිලාභ ලබා දෙන්න බලාපොරොත්තු වුණා, ප්‍රතිලාභ ලබා දීමේ සංඛ්‍යාව පවුල් ලක්ෂ 24ක් දක්වා වැඩි කරන්න තවම හැකියාවක් නැති හින්දා. මොකද, අපේ රටේ ආර්ථික අර්බුදය තවම සම්පූර්ණයෙන් නිම වෙලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මේ අස්වැසුම වැඩසටහන සම්බන්ධයෙන් බැලූ බැල්මට යම් චෝදනාවක් එන්න තිබෙන කාණ්ඩ දෙකක් තිබෙනවා. ඒ තමයි, සංක්‍රාන්තික කාණ්ඩය සහ අවදානමට ලක් වුණු කාණ්ඩය.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙන්නේ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවත් විනාඩි 10ක් අමතරව දෙන්න. මම ආණ්ඩු පක්ෂ කාර්යාලයට ඒ බව දැනුම් දීලා තිබෙනවා.

අවදානමට ලක් වූ කාණ්ඩයට සහ සංක්‍රාන්තික කාණ්ඩයට අයත් වන අය සැබැවින්ම දුප්පත් අය නොවෙන්න පුළුවන්. නමුත් මේ පවතින ආර්ථික අර්බුදය තුළ ඔවුන් බලපෑමකට ලක් වෙච්ච කණ්ඩායමක්. ඒ අයටත් මේ අවුරුද්දේ දෙසැම්බර් මාසයේ 31වන දා දක්වා ගෙවීම් හිමිකම් ලැබීමට හැකි වන පරිදි අවශ්‍ය කටයුතු ආණ්ඩුව සිදු කරනවා. ඒ වාගේම, යම්කිසි චෝදනාවක් තිබෙනවා නම්, ඒ චෝදනාව සම්බන්ධවත් අවශ්‍ය කටයුතු ද ආණ්ඩුව සිදු කරාවි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ විශාල ප්‍රශ්නයක් තිබුණා, වැඩිහිටි දීමනාව ලබන, වකුගඩු රෝගී දීමනාව ලබන, ආබාධිත දීමනාව ලබන අය සම්බන්ධයෙන්. මෙන්න මේ කාණ්ඩ තුන සම්බන්ධයෙන් එක්තරා සීමාවක් තිබුණා. ඒ සීමාවෙන් උඩට යන්න බැහැ. එතකොට කවුරු හරි කෙනෙකු අන්ත්‍රා වනකල් ඉන්න ඕනෑ, තවත් කෙනෙකු මේ ලේඛනයට ගන්න.

මේ ලැබිච්ච දත්තත් එකතු කරලා අය වැය ලේඛනය තුළ ඇත්තටම සිදු විය යුතු ප්‍රතිසංස්කරණයකට ගරු ජනාධිපතිතුමා අවසරය ලබා දුන්නා. පාර්ලිමේන්තුව ඒක අනුමත කළා. මොකද, මීට පෙර අපේ රටේ විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන්ගෙන් 142,000කට විතරයි දීමනා ලැබුණේ.

නමුත්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය හරහා අපට වාර්තා වුණු තොරතුරු අනුව අඩු ආදායම්ලාභීන් 410,000ක් මේ සහයෝගය රජයෙන් ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වකුගඩු රෝගීන් සඳහා ලබා දෙන දීමනාව මෙතෙක් ලැබුණේ 48,000කට විතරයි. හැබැයි, වාර්තා වෙලා තිබෙනවා 50,000ක්. ඒ වාගේම වැඩිහිටි ආධාරය මෙතෙක් ලැබුණේ 505,000කට පමණයි. පවුලක් හැටියට සලකලා තමයි ඒ දීමනාව දුන්නේ. හැබැයි, ඒ අය අඩු ආදායම්ලාභී වීම, අවුරුදු 70ට වඩා වැඩි වීම කියන කාරණා සැලකිල්ලට අරගෙන එකම පවුලේ එවැනි අය දෙදෙනෙක් ඉන්නවා නම් ඒ පුරවැසියන් දෙදෙනාටම එම දීමනාව ලබා දෙන්නට අපි කටයුතු කරනවා. පුරවැසියන් 505,000කට දීපු දීමනාව සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශය වාර්තා කරලා තිබෙනවා, 820,000කට ලබා දෙනවා කියලා. ඒ අනුව, මීට පෙර 695,000කට මේ කියන වැඩිහිටි දීමනාව, වකුගඩු රෝගී දීමනාව හා ආබාධිත දීමනාව ලැබුණා. මේ ප්‍රමාණය පුද්ගලයන් හැටියට 1,280,500 දක්වා වැඩි කරන්න අය වැය ලේඛනයෙන් අපි අවසර ඉල්ලුවා. ඒකට අනුමැතිය ලැබුණා, ජනාධිපතිතුමාට. මෙතෙක් අපි ගෙව්වේ කලින් තිබුණු දීමනාව. ඒ දීමනාව අලුත් දීමනාවට පරිවර්තනය කරලා ගෙවන්න තමයි අපි ඉල්ලන්නේ. ඒ කියන්නේ, රුපියල් 2,000ක් ලෙස ගෙවපු වැඩිහිටි දීමනාව රුපියල් 3,000 දක්වා වැඩි කළා. වකුගඩු රෝගීන්ට සහ ආබාධිතයන්ට ලබා දුන් රුපියල් 5,000ක දීමනාව රුපියල් 7,500

දක්වා වැඩි කළා. ඒ අනුව පුරවැසියන් 1,280,500ටම ඔවුන්ට හිමි දීමනා ජූලි මාසයේ සිට ඉදිරියට ගෙවන්න අවශ්‍ය තමයි අපි පාර්ලිමේන්තුවෙන් අනුමැතිය ඉල්ලන්නේ. මම හිතන්නේ නැහැ, මෙම වැඩසටහන් තුනට විපක්ෂය විරෝධතාව දක්වයි කියලා.

මේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ තුළ අපි දිගටම විපක්ෂයේ දෝෂ දර්ශනයට ලක් වුණා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, අපට දිගටම දෝෂාරෝපණයක් එල්ල වුණා. මැතිවරණය ඉලක්ක කරගෙන විපක්ෂය අපව දැඩිව විවේචනයට ලක් කරනවා. නමුත් මට ප්‍රශ්නයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ තමයි, මම ඇතුළු මේ රටේ හැම පුරවැසියෙක්ම බලාගෙන හිටියා ඊයේ දිනයේ සමගි ජන බලවේගයේ නායකතුමා සහ ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමා අතර විවාදය පැවැත්වෙයි කියලා. නමුත්, එම වැඩසටහනේ සජිත් ප්‍රේමදාස මැතිතුමා සිටිනවා මම දැක්කේ නැහැ. අනුර කුමාර දිසානායක මැතිතුමා විවාදයට ඇවිත් සිටියාට එම සාකච්ඡාවේදී ඉදිරි වැඩ පිළිවෙළක් ගැන එතුමා කථා කළේ නැහැ. එතුමා පොල් ගෙඩි කඩන විධිය, පොල් ගෙඩි ඔළුවට වැටෙන්නේ නැතිව කඩන විධිය ගැන කථා කළාට, වැඩ පිළිවෙළක් ගැන කථා කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මේ වැඩසටහනට විවේචන එල්ල කළාට මෙම වැඩසටහන වෙනස් කළ යුතු නම් ඒ සඳහා පිළිගත හැකි යෝජනා ලබා දෙන්න ජනාධිපතිතුමා ඕනෑවටත් වඩා අවස්ථාව ලබා දුන්නා. ගරු පාර්ලිමේන්තුව ඒ සඳහා පාවිච්චි කරන්න හැකියාව තිබුණා. ඒ අවස්ථාව පාවිච්චි නොකරපු නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දෙවැනි සමාලෝචනය යද්දී එම අරමුදලත් එක්ක සාකච්ඡාවකුත් ලැස්ති කළා. නමුත්, සමගි ජන බලවේගයයි, ජනතා විමුක්ති පෙරමුණයි ඒක මග හැරියා. ඊළඟට, ඊයේ රූපවාහිනී නාළිකාවක තිබුණු විවාදයට එතුමන්ලා එයි කියලා අපි බලාගෙන හිටියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොන තරම් විවේචන ආවත් අපි රජයක් හැටියට කළ යුතු නිවැරදි කිරීම් සිදු කරන්න කැප වෙලා කටයුතු කර තිබෙනවා. අපේ වැඩ පිළිවෙළ අපි ඉදිරිපත් කර තිබෙනවා. මේ යන ගමන් මග දේශපාලනික වශයෙන් වෙනස් කරන්න බැහැ කියන එකත් අපි කියලා තිබෙනවා. ඒ නිසා හොඳටම පැහැදිලියි, රජයේ වැඩ පිළිවෙළ මොකක්ද කියලා. හැබැයි, ඊයේ දිනයේ විපක්ෂ නායකතුමා නියෝජනය කරන සමගි ජන බලවේගයටයි, ජාතික ජන බලවේගයටයි දෙගොල්ලන්ටම බැරි වුණා තමන්ගේ වැඩ පිළිවෙළ රට හමුවේ කියන්න. එහෙම නම් මොකක්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමන්ලා කරන්න බලාපොරොත්තු වන්නේ? මට තේරෙන විධියට මැතිවරණය ප්‍රකාශයට පත් කළාට පසුව මැතිවරණ වේදිකාවලට ගිහිල්ලා පිළිගත නොහැකි, ක්‍රියාත්මක කරන්න බැරි කෙටි කාලීනව ජනප්‍රිය වෙන්න පුළුවන් කථා ටිකක් කරන්න තමයි සූදානම් වෙන්නේ. මැතිවරණය ප්‍රකාශයට පත් කරන දිනයත්, මැතිවරණය පවත්වන දිනයත් අරගෙන ඒ දවස් 35 හෝ 40 තුළ අපි සාමාන්‍ය ව්‍යවහාර භාෂාවෙන් කියනවා වාගේ ගැලරිය පිනවන කථා ටිකක් කරන්න තමයි මේ සූදානම් වන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ආර්ථිකයත් එක්ක සෙල්ලම් කරන්න අපි කාටවත් බැහැ. අපි දැන් රටේ ආර්ථිකය ස්ථාවර වෙලා තිබෙනවා. ගමන් මග නිවැරදි වෙලා තිබෙනවා. ගමන් මග ස්ථාවර වෙලා තිබෙනවා. ජාත්‍යන්තරය ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීලා තිබෙනවා. හැබැයි, අපි කාටවත්, දේශපාලනය කරන්න රටේ ආර්ථිකය පාවිච්චි කරන්න බැහැ. මම කනගාටු වෙනවා, එය රටම බලාගෙන හිටපු විවාදයක්. ඔබ දෙගොල්ලෝ අතර වාද විවාද ඕනෑ තරම් ඇති වුණා. මට මතකයි, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා කිව්වා, සජබයේ ආර්ථික කමිටුව එක්ක ආණ්ඩුවට විවාදයක් කරන්න කියලා.

මම ඒ වෙලාවේත් කිව්වා, "අපි සූදානම්" කියලා. හැබැයි, අපි විවාදයකට යන්නේ මොකටද? අපේ වැඩ පිළිවෙළ අපි ඉදිරිපත් කරලා තිබෙනවා. වැඩ පිළිවෙළ ඉදිරිපත් කරලා නැත්තේ සජබ සහ ජාතික ජන බලවේගයයි. මම කලිනුත් කිව්වා වාගේ මට තිබෙන ප්‍රශ්නය තමයි, බලය ගන්නවා කියලා විශ්වාසයෙන් කටයුතු කරන උදවියට මේ තරම් මේ රටේ ජනතාව රවටිටන්න පුළුවන්ද කියන එකයි. තමුන්ගේ ආර්ථික වැඩ පිළිවෙළ මොකක්ද? මේ විවාදය ඒ ගොල්ලන්මයි යෝජනා කළේ. අපි නොවෙයි යෝජනා කළේ. ඉස්සෙල්ලා පාර්ශ්ව තුනක් ගැන කිව්වා. අපිට එන්න කිව්වා, රජය වෙනුවෙන්. සමඟි ජන බලවේගයට කිව්වා, ජාතික ජන බලවේගයට කිව්වා. අපි ඒකටත් එකඟ වුණා. ඊළඟට ඒ දෙගොල්ලන්ම තීන්දු කරනවා, "නැහැ. මේ විවාදයට රජය ඕනෑ නැහැ. සමඟි ජන බලවේගයයි, ජාතික ජන බලවේගයයි විවාදය කරනවා" කියලා. ඔවුන්ගේ වැඩ පිළිවෙළ අහන්න ඒ විවාදය කරනකම් අපි බලාගෙන හිටියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කනගාටුවෙන් වුණත් මම මේ කාරණය කියන්න ඕනෑ. අපි කියපු දේ සනාථ වෙලා තිබෙනවා. වැඩ පිළිවෙළක් නැති කණ්ඩායමක් දේශපාලන අරමුණක් ඉටු කර ගන්න ඡන්දයට කලින් ගොඩක් මහන්සි වෙනවා. ඒකේ අවසාන ප්‍රතිඵලය මොකක්ද? මේ කණ්ඩායම් දෙකටම හැකියාවක් ලැබුණේ නැහැ අපේ රටේ ජනතාවට ඔවුන්ගේ ආර්ථික වැඩ පිළිවෙළ පිළිබඳව, නිශ්චිතව ගන්න පියවරයන් පිළිබඳව පැහැදිලි කරන්න. අවසානයේදී එතුමන්ලාට කියන්න වුණේ ජනාධිපතිතුමා ගියපු වැල් පාලමේ ඒ විධියටම ඉදිරි ගමන ගිහිල්ලා ආර්ථිකය ශක්තිමත් කර ගන්නවා කියන එකයි.

හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට මම ගරු කරනවා. විපක්ෂ නායකතුමා ළිං මැඩි මානසිකත්වයේ සිටියාට, හර්ෂ මන්ත්‍රීතුමා කිව්වා එතුමන්ලා ළිං මැඩි මානසිකත්වයක නැහැ කියලා. ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා නිතරම මට කියනවා, අපේ ආණ්ඩුව යටතේ තමයි රට බංකොලොත් වුණේ කියලා. ඉතින් මම ඔබතුමාට මොකක්ද කියන්නේ? ඔබතුමා හිතනවා ඒක ඔබතුමාගේ වීරත්වයක් කියලා. නැහැ, අපි වෙනස් විය යුතු නම් වෙනස් විය යුතුයි. ඒ යන ගමන, ඒක රහසක් නොවෙයි නේ. ඔබතුමාට ඕනෑ කවදා හරි ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් ඇවිල්ලා රට සුබවාදී මුදිත කරන්න පුළුවන් කියලා, එතකම් ජනතාව දුක් විඳින එකද? ඒක කරන්න බැහැ. වෙනස් විය යුතු නම් වෙනස් විය යුතුයි. වෙනස් විය යුතු තැන මොකක්ද කියන එක ඒ අවස්ථාවේදී තීන්දු කළ යුතුයි. ඒ නිසා මෙතැන ඉන්න කිසිම කෙනෙක් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට සහයෝගය දක්වලා ආණ්ඩුවක් හැදුවේ දේශපාලන අරමුණක් එක්ක කියලා මම හිතන්නේ නැහැ. ඒ වෙලාවේ රටේ අවශ්‍යතාව තිබුණේ ඒකයි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, එදා ඔබතුමාටත් පාරේ බැහැලා යන්න බැරි වුණා. විපක්ෂ නායකතුමාට, ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාට මොකද වුණේ කියලා අපට මතකයි. ගහලා නේ, එළෙව්වේ. ගහලා එළවද්දී මොකද වුණේ? පැනලා දුවන්න සිද්ධ වුණා.

මම මේ දේශපාලන කාරණා කිව්වේ හේතුවක් ඇතිවයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ආණ්ඩුවට චෝදනා කළාට, ඔබතුමා පරිස්සම් වෙන්න ඕනෑ සමඟි ජන බලවේගයෙන්මයි, ගරු මන්ත්‍රීතුමනි. මොකද, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට ආර්ථිකය පිළිබඳව උපදෙස් දුන්නේ, රාජ්‍ය පාලනය පිළිබඳව උපදෙස් දුන්නේ නාලක ගොඩහේවා මන්ත්‍රීතුමා. එතුමා එවකට ඇමතිවරයෙක්. ඒක රහසක් නොවෙයි. ඒක අපි සියලු දෙනාම පිළිගන්නවා. එතුමාත් දැන් ඔබතුමන්ලාගේ පිලට ගිහිල්ලා තිබෙනවා. එතකොට මට දැන් තිබෙන ප්‍රශ්නය තමයි, හර්ෂ ද සිල්වාට තර්ජනය කරන්නේ නාලක ගොඩහේවාද, එහෙම නැත්නම් ඒ ආර්ථික කවුන්සලයට සම්බන්ධ වෙන්න කැමැති තව කෙනෙක්ද? ඒ නිසා නාලක ගොඩහේවා මන්ත්‍රීතුමා කියන දේවල් පිළිගත්තොත් ඔබතුමන්ලාට වෙන්නේත් ඒක තමයි.

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා ණය පිළිබඳව මගෙන් ප්‍රශ්නයක් ඇහුවා. ඔබතුමා හිතුවා, මම ඒක අමතක කරයි කියලා. නේද? *[බාධා කිරීමක්]* I am going to tell you that. - *[Interruption.]* Let me answer. I am going to answer your question, Hon. Chief Opposition Whip. අපේ රටේ දේශීය ණය - domestic debt - ප්‍රමාණය 2023 අවුරුද්ද අවසාන වන විට රුපියල් බිලියන 17,051යි. 2024 මාර්තු මාසය අවසාන වන විට රුපියල් බිලියන 17,252යි. මේ තත්ත්වය තුළ වැඩිවීමක් තිබෙනවා. ඒ කියන්නේ, ඒක dollar rate එකට ගත්තොත්, exchange rate එක දිහා බැලුවොත් 2023 අවුරුද්ද වන විට සාමාන්‍ය වශයෙන් රුපියල් 323ක් විතර තමයි exchange rate එක තිබුණේ. හැබැයි, මේ වන විට එය රුපියල් 301කට තමයි convert කර තිබෙන්නේ. එතකොට යම් වැඩිවීමක් dollar term එකෙන් තිබෙනවා. ඒක අපි පිළිගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, අපේ foreign debt portfolio එක ඩොලර් බිලියන 37යි. Foreign debt portfolio එක දැනට තිබෙන්නේ ඩොලර් බිලියන 37යි. මේක ඇතුළේ අඩංගු වෙනවා මේ කාල සීමාව තුළ ඩොලර් බිලියන 5.5ක් විතර. ඒ කියන්නේ, 2022 අප්‍රේල් මාසයේ සිට මේ දක්වා. ඔබතුමන්ලා දන්නවා, අපි multilateral debt service කළාට bilateral debt service කරලා නැහැ කියලා.

එතකොට මේකත් ඇතුළත්ව ඩොලර් බිලියන 37ක් තිබෙනවා. ඔබතුමාගේ ප්‍රශ්නයට මම උත්තරය දුන්නා කියලා මම හිතනවා. මට ඊට වඩා බාධා කරන්න එපා. මම දන්නවා, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා හිතුවා මම මේ ප්‍රශ්නයට උත්තරයක් නොදී පැනලා යයි කියලා. අවසාන මොහොත වෙනකම් අහගෙන හිටියේ නැහිටලා අහන්න, "කෝ, මම අහපු ප්‍රශ්නයට උත්තරේ?" කියලා. ඔබතුමාට අදාළ කාරණයට පිළිතුරු ලැබුණා කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රටක් හැටියට අසීරු තීන්දු ගත්තා. දේශපාලනික වශයෙන් මීට පෙර අපේ ආණ්ඩු නොගත්ත තීන්දුත් ගත්තා. අපි ඒවාටත් සහයෝගය දීලා තිබෙනවා. ඒක සමච්චලයට ලක් විය යුතු කාරණාවක් නොවෙයි. දැන් ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්නය තමයි 2022 ඇති වෙච්ච තත්ත්වය 2024 මැයි මාසය වෙද්දී නොතිබීම. 2022 ඇති වෙච්ච තත්ත්වය 2024 මැයි මාසය වෙද්දී නොතිබීම තමයි විපක්ෂයේ දේශපාලන කඳවුරට තිබෙන ප්‍රශ්නය.

ආර්ථික වර්ධනයක් ලබා ගැනීම, exchange rate එකේ ඇති වෙලා තිබෙන ස්ථාවරත්වය, උද්ධමනය සියයට 70 සිට සියයට 1 දක්වා අඩු වීම, අපි අනුගමනය කළ ප්‍රතිපත්ති තීන්දු තුළ, විශේෂයෙන්ම බලශක්ති ප්‍රතිපත්තිය තුළ පිරිවැය සහ විකුණුම් මිල අතර තිබෙන ගැළපීම - මේ සියල්ල - අලුත් තමයි. නමුත් මේ සියල්ල ලෝකයේ අනෙක් හැම රටක්ම අනුගමනය කරනවා. මෙන්න මේ තත්ත්වයට මේ රට ගෙනෙන්න රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ රජය මේ රටේ මහජනතාවත් එක්ක එකතු වෙලා විශාල කැප කිරීම් ප්‍රමාණයක් කළා. ජනතාව විසින් ලබා දුන් සහයෝගය අපි නිරන්තරයෙන් අගය කිරීමකට ලක් කරනවා. අපි කිසිම අවස්ථාවක ඒක නොසලකා හරින්න සුදානම් නැහැ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මේ රටේ මෙම පරිවර්තනය සිදුවිය යුතු කාල පරිච්ඡේදයයි. මේ පරිවර්තනය 2000 මූල දශකයේ සිදුවුණා නම්, මේ අර්බුදයට අපි ගමන් කරන්නේ නැහැ. අද ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා අපෙන් අර ප්‍රශ්නය ඇහුවාට, "ජාත්‍යන්තරයත් එක්ක මැදිහත් වෙන්න එපා, ලෝක බැංකුවත් එක්ක මැදිහත් වෙන්න එපා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක මැදිහත් වෙන්න එපා" කියලා එදා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට බලපෑම් කරපු සියලු දෙනා අද එක්කෝ, සමගි ජන බලවේගයත් එක්ක එකතු වෙලා ඉන්නවා, එහෙම නැත්නම් විපක්ෂයේ අනික් අය එක්ක අත්වැල් බැඳගෙන ඉන්නවා. ඔබතුමන්ලා චෝදනා කරන අපේ කණ්ඩායම යථාර්ථය තේරුම් අරගෙන නිවැරදි වෙලා වර්තමානයට ගැළපෙන ආර්ථික ප්‍රතිපත්තියක් රටේ අනාගතය වෙනුවෙන් හදලා තිබෙනවා. මම ඔබතුමාගෙන් අහන ප්‍රශ්නය මෙකයි. අපේ ආණ්ඩුව විනාශ කරලා, සුනුවිසුනු කරලා, ජාත්‍යන්තරයට පයින් ගහපු, ජාත්‍යන්තරයේ ප්ලග් එක ගලවපු කණ්ඩායමත් එක්ක ඔබතුමන්ලා අත්වැල් බැඳගෙන අද අපට චෝදනාවක් එල්ල කරන්නේ ඇයි? ඔබතුමන්ලාටත් අත්වෙන ඉරණම ඔතැනින් පහළට යාම මිස ඔතැනින් නැඟිටීම නොවෙයි, කිරිඇල්ල මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා මේ ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළට සහයෝගය දක්වන්න හදනකොට, "සහයෝගය දක්වන්න එපා" කියලා ඔබතුමන්ලාට බලපෑම් එනවා. අද හර්ෂ මන්ත්‍රීතුමාට වෙලා තිබෙන්නේ ඒකයි. එතුමාගේ දැනුම ප්‍රයෝජනයට අරගෙන මේ රජයට දක්වන,- මම කියන්නේ නැහැ එතුමා රජයට එකතු වෙලා සහයෝගය දක්වනවා කියලා. හැබැයි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට එතුමා ගෙන යන ක්‍රියාමාර්ගයට අද බොහෝ වෙලාවට තර්ජන එල්ල කරන්නේ එදා ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව නොමඟ යවපු, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට ජනතාව විසින් ලබා දුන් ජනවරමෙන් අයින් වෙලා පුටුවෙන් බැහැලා යන්න සිදු වුණු අවස්ථාවේ, ඒ සඳහා එතුමාව මෙහෙයවපු කණ්ඩායම් කියන එක මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. වෙනස් වෙන්න ඕනෑ නම් අපි වෙනස් වෙන්න ඕනෑ. ඒක අපට කියන්න බැහැ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ලබන සුමානේ තව කට්ටියක් එනවා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ඒක මම දන්නේ නැහැ. ඔබතුමන්ලා ගණන් හද හදා ඉන්න. ඒ පැත්තට යන ගණන, මේ පැත්තට එන ගණන ඔබතුමා හද හදා ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි අවශ්‍ය අණපනත් සම්මත කරන්න රජයට බහුතරය තිබෙනවා. වැදගත් වෙන්නේ ඒකයි. ඒ නිසා ඔබතුමා ඕනෑ කෙනෙක් ගන්න. ඔබතුමන්ලාගේ පැත්තෙනුත් අපේ පැත්තට ඒවි. ඒ පිළිබඳවත් සාකච්ඡා වෙනවා. හැබැයි, මම ඒක ගැන කථා කරන්න යන්නේ නැහැ. මොකද, නිවැරදි හොඳ අනාගතයක් වෙනුවෙන් මේ රට ආර්ථිකමය වශයෙන් මෙහෙයවද්දී අවශ්‍ය වෙන අණපනත් සම්මත කරන්න අවශ්‍ය බහුතරය රජයට තිබෙනවා. ඒ දේශපාලන ස්ථාවරත්වය රජය තුළ තිබෙනවා. ඒ නිසා මට ඔබතුමාට කියන්න වෙන්නේ ඉතිහාසයේ මීට අවුරුදු දෙකකට කලින් හිටපු ජනාධිපතිතුමාට අත් වෙච්ච ඉරණම ඔබතුමන්ලාට අත්වෙන්න වැඩි කාලයක් යන්නේ නැහැ කියලායි. මොකද, එතුමාට උපදෙස් දීපු සියලු දෙනා අද ඔබතුමන්ලාගේ කරට අත දාගෙන උපදෙස් දෙන තැනට ඇවිත් තිබෙනවා. මම මීට වැඩිය කථා කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා තවත් අදහස් දක්වලා මේ අණපනත්වල, මේ Regulationsවල, මේ payment scheme එකේ යම් වෙනසක් සිදු කළ යුතු නම් අපට ඒ පිළිබඳ යෝජනා කරන්න. අපි ඒ වෙනස්කම් කරන්න සූදානමින් ඉන්නවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[මධ්‍යාහ්න 12.00]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පතට විරුද්ධ නැහැ. අපි ඒකට එකඟයි කියන එක ඉස්සෙල්ලාම කියන්න ඕනෑ. ඒක සටහන් කර ගන්න. මොකද, මේක කාලයක් තිස්සේ විය යුතු දෙයක්. ඒක දැන් හෝ සිදු වීම ගැන අපි සන්තෝෂ වෙනවා. එහි කාරණා කිහිපයක් තිබෙනවා. ඒ පිළිබඳව මම අවධානය යොමු කරන්නම්.

අනෙක් එක, අස්වැසුම ලබා දීම පිළිබඳව අපේ විරෝධතාවක් කිසිසේත්ම නැහැ. ඒක ලබාදීම පිළිබඳවත් වගකියන විපක්ෂයක් හැටියට අපි එකඟයි. එතැනදී ජනතාවට ආර්ථික වශයෙන් නැවත සිට ගැනීමට මාස 9කින් පුළුවන් කියලා ඔබතුමන්ලා විශ්වාස කළා. 2023 අවසන් වෙනකොට රුපියල් 2,500ක දීමනාව ඒ සංක්‍රාන්ති කණ්ඩායමට නොලැබුණත්, 2024 මාර්තු 31වෙනි දා වෙනකොට ඒ අවදානමට ලක්වූ කට්ටියගේ අවදානම නැති වෙනවා කියලාත් බලාපොරොත්තු වුණා. නමුත් ඒක එහෙම වුණේ නැහැ. ඒ නිසා තව මාස නවයක් දීර්ඝ කරන්න කාලය ඉල්ලා තිබුණා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණාවල වැදගත්කම සලකා මෙයට සහයෝගය ලබාදීමට කටයුතු කිරීම ගැන අපි ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. හැබැයි, ඔබතුමා කිරිඇල්ල මැතිතුමාවත් පොඩ්ඩක් දැනුවත් කරන්න. මොකද, ඔබතුමන්ලාගේ එකඟතා එතුමා හවස් වෙද්දී නිට්ගමන් කඩනවා. ඒ පිළිබඳවත් ඔබතුමා අවධානය යොමු කරන්න. මොකද, ඊට පසුව ඒ අගෞරවය ඔබතුමාට ඒවි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)

එහෙම කිසි ගැටලුවක් නැහැ. ඇත්ත වශයෙන්ම ඒ පැත්තේ, මේ පැත්තේ සියලුදෙනා ඉන්නේ ජනතාව වෙනුවෙන් වැඩ කරන්න. ඔබතුමන්ලා පිළිගෙන තිබෙනවා, බලාපොරොත්තු වෙච්ච විධියට නැවත ආර්ථිකය ගොඩ ඇවිල්ලා නැහැ කියන එක. මාස 9කට තමයි අස්වැසුම දෙනවා කියලා කිව්වේ. නමුත් තව මාස 12ක් දෙන්න කියලා ඉල්ලුවා. ඒකට අපි එකඟ වෙනවා. ඒ යථාර්ථය පිළිගන්න වෙනවා. ඉතින් ඔබතුමන්ලා ඉලක්කම්වලින් මොනවා කිව්වත්, තව මාස 12කට නැවත අස්වැසුම දීර්ඝ කරන්න කරන ඉල්ලීමෙන්ම පෙනෙන්නේ, ඇත්ත වශයෙන්ම මහ පොළොවේ යථාර්ථය. ඒ යථාර්ථය තමයි මිනිස්සුන්ට ජීවත් වෙන්න අමාරුයි කියන එක. ඒක තමයි මේ කථාව. ඉතින් ඒ නිසා ඒ ගැන තවදුරටත් සාකච්ඡා කරන්න අවශ්‍යතාවක් නැහැ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය ඇමතිතුමා මගේ නම සඳහන් කළා.

මේක පාර්ලිමේන්තුව. පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු විවිධ අදහස් ප්‍රකාශ කරනවා. නමුත් අවසාන වශයෙන් අපි එක මතයක එකට ඉන්නවා. මොකද, අපේ පැත්තේ ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවා. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ මතවලට සමහර වෙලාවට අපි පක්ෂ වෙනවා; විරුද්ධ වෙනවා. ඒක තමයි තිබිය යුත්තේ. නමුත් අවසාන වශයෙන් අපි එක මතයකට එනවා. නමුත් මේ ගොල්ලන්ට වුණේ මොකක්ද? අර කලින් එක්කෙනා ඉන්නකොට මේ ගොල්ලන් දුන් telephone call එකටත් උත්තර දුන්නේ නැහැ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)

I am not going to disturb you, (Hon.) (Dr.) Harsha de Silva. I am sorry, do not get me wrong.

මම ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාට කිව්වේ මෙකයි. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් මේ තත්ත්වය තේරුම් අරගෙන වෙනස් විය යුතු තැන වෙනස් විය යුතුයි කියලා පිළිගත්ත එක ගැන මම ඇත්තටම සතුටු වෙනවා. විවිධ මතවාද තිබෙනවා. හැබැයි, ඒ මතවාද සියල්ල රටක් වෙනුවෙන් එක තැනකට එන්න ඕනෑ. ක්‍රියාවෙන් මෙතෙක් ඔප්පු නොකළත්, අද සිට කිරිඇල්ල මැතිතුමා ඇතුළු කණ්ඩායම ඒ කාරණය ඔප්පු කරන්න කටයුතු කරයි කියා මා විශ්වාස කරනවා. මම කියන්නේ හර්ෂ ද සිල්වා මැතිතුමා පීඩනයකට ලක් කරන්න එපා කියන එකයි. හර්ෂ මන්ත්‍රීතුමාගේ blood pressure වැඩි කළේ සමගි ජන බලවේගය මිසක් අපි නොවෙයි. ඒකයි මම මේ කියන්න උත්සාහ කළේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට මතක නැහැ. IMF කණ්ඩායම පාර්ලිමේන්තුවට ආ පළමු අවස්ථාවේ මම මෙතුමා ඉදිරියේම ඒ ආපු කාන්තාවට කිව්වා, අපේ රටට ණය ගෙවන්න අවුරුදු 10ක් දෙන්න කියලා. මම කිව්වේ නැද්ද? මම කිව්වේ නැද්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ඒ ගැන තවත් විවාදයකට යන්න එපා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

Hon. State Minister, you should answer my question. මම කිව්වේ නැද්ද? මම කිව්වා, ඔබතුමා ඉදිරියේ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)

I am going to answer you. Sir, may I have the mike?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ඔව්, ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමනි, ඇත්තටම ඒ වෙලාවේ කථානායකතුමා තමයි පාර්ලිමේන්තුවේදී ඒ සැසිය සංවිධානය කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා කිව්වා ශ්‍රී ලංකාවට සහයෝගය දෙන්න කියලා. හැබැයි, ඒ සියල්ල අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාම, එක්කෝ එතුමා කියනවා

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

විරෝධතාව සලකුණු කර ගන්න කියලා; එහෙම නැත්නම් Division එකක් ඉල්ලනවා. ඒකයි මම කිව්වේ, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියපු දේට අදත් Division එකක් ඉල්ලයිද කියලා. එදා කිරිඇල්ල මන්ත්‍රීතුමා එහෙම කිව්වා, ඒක ඇත්ත. හැබැයි, ඔබතුමා ඒ කියපු දේ ක්‍රියාවෙන් ඔප්පු කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් අවසන් කරන්න. ඒ ගැන විවාදයකට යන්න එපා. *[බාධා කිරීමක්]*

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම පෙන්වා දෙන්න හැදුවේ, අපි ජාත්‍යන්තරය ඉදිරියේ අපේ රට පාවා දුන්නේ නැහැ කියන එකයි. අපි ජාත්‍යන්තරය ඉදිරියේ IMF එකෙන් ආපු ඒ කාන්තාවට කිව්වා, අවුරුදු 10ක් අපට කල් දෙන්න කියලා. නමුත් පාර්ලිමේන්තුවට ආවාම අපි වාද විවාද කර ගන්නවා. පාර්ලිමේන්තුව ඇතුළේ වෙන තත්ත්වයක් තිබෙන්නේ. නමුත් ජාත්‍යන්තරය ඉදිරියේ අපි එකට පෙනී සිටියා. එච්චරයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියන්නේත් ඒකයි. අපි වගකියන විපක්ෂයක්. මම ඒක නැවතත් අවධාරණය කරන්න ඕනෑ.

අපි නොයෙකුත් දේවල් ගැන මෙතැන විවාද කරනවා. නමුත්, අවසාන වශයෙන් අපේ රට වෙනුවෙන් අපි පෙනී ඉන්නවා. එම නිසා හැම දේටම විරුද්ධ වෙනවාය කියලා එකක් අපට නැහැ. හොඳ දෙයක් කරනවා නම් අපට ඒකේ ගැටලුවක් නැහැ. නමුත් මෙතැනදී මූලික වශයෙන් මම නැවතත් කියන්නේ මේකයි. අස්වැසුම වැඩසටහන දීර්ඝ කිරීමෙන් පිළිගන්න වෙන මූලිකම දේ වෙන්නේ, දත්තවලට, සංඛ්‍යාලේඛනවලට වඩා මහ පොළොවේ යථාර්ථය සම්පූර්ණයෙන්ම වෙනස් කියන එකයි. ඒ නිසා ඒ ගැන නැවත තර්ක කරන්න ඕනෑ නැහැ.

අනෙක් කරුණ, කැබිනිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අවට Internet නැති එක. අපි ඒක පිළිගන්නවා. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. අපි electronically කරන්න කිව්වේ data storage එක, එහෙම නැතුව data collection එක නොවෙයි. Storage එක electronically තමයි අපි හැම තැනම කරන්නේ. 21වන ශත වර්ෂයේ files ළඟ තියාගන්නේ නැහැ. Data storage එක electronically කරන්න කියන එක තමයි අපේ කාරක සභාව දීපු නිර්දේශය. ඔබතුමන්ලා ඒක පිළිගන්නේ නැත්නම් මම දන්නේ නැහැ, ඔබතුමන්ලා ඇත්ත වශයෙන්ම තාක්ෂණයත් එක්ක ඉස්සරහට යනවාද, පස්සට යනවාද කියලා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
It is anyway stored electronically. The change was introduced after 28 years. So, we have to allow the officials to get used to that. About "Aswesuma", the knowledge is quite less among the recipients, the officials, the Hon. Members and also among the other people. In the first year, yes, the data has been electronically stored and also whatever that was handed over physically was also stored. So, we will have a smooth transition into a complete electronic storage. Anyway, at the moment, electronic storage is taking place.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හරි. ඊළඟට කිව්වා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව පත් කරනකොට, ඒවායේ යෝජනා භාර ගන්නවා, කවදාවත් Standing Orders suspend කරලා වැඩ කරලා නැහැ කියලා. ඇත්ත වශයෙන්ම ගරු රාජ්‍ය ඇමතිතුමාට අමතක වෙලා තිබෙනවා, 2020 වර්ෂයේ ඉඳලා රට බංකොලොත් වෙච්ච දවස වෙනකල්ම Standing Orders suspend කරලා මුදල් කාරක සභාව පත් කළේ නැහැ කියන එක. ඒක තමයි ඇත්ත. ඉතින් ඒ නිසා ඒ ගැන ආයෙත් තර්ක කරන්න ඕනෑ නැහැ. මෙතැන Standing Orders suspend කරලා, විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට මුදල් කාරක සභාවේ සභාපති ධුරය දෙන්න ඕනෑ නැහැ කියන එකට වග කියන්න ඕනෑ කථානායකවරයා. එතුමා තමයි ඒක කළේ. ඒකට ඉඩ දුන්නේ එතුමා. ඉතින් ඒක තමයි ඇත්ත. මෙතැන එහෙම කළේ නැහැ කියලා ආයෙත් අනන්මනන් කියන්න එපා.

මම මේ කරුණත් කියන්න ඕනෑ. සමගි ජන බලවේගයේ ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ විවාදයකට අපි විපක්ෂයේ කණ්ඩායම්වලට කථා කළා. ඔවුන් පැමිණියේ නැහැ. මෙහිදී අපට හංගන්න දෙයක් නැහැ. අපේ ප්‍රතිපත්තිය මොකක්ද කියන එක, "The Blueprint" එක මගින් අපි 2021 වර්ෂයේ මුලදී ඉදිරිපත් කළා. ඒක යාවත්කාලීන කරලා 2022 වර්ෂයේ පෙබරවාරි මාසයේදී මේ පාර්ලිමේන්තුවේ සඳහන් කළා. ඒක ගැන තමයි අද රටේ හැමෝම කථා කරන්නේ. ඇමතිවරු ඒවායේ colour printouts අරගෙන ඇවිල්ලා කථා කරනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු ඒවා ගැන පැය ගණන් කථා කරනවා, රූපවාහිනී නාළිකාවල. වෙන කිසිම කෙනෙකුට එහෙම එකක් නැහැ. අපේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා අපි කියා තිබෙනවා. එතැනින් අපි අයින් වෙන්නේ නැහැ. "The Blueprint" එක අපි යාවත්කාලීන කරලා "The Blueprint: Version 3.0" එක හෙට-අනිද්දා වෙනකොට නැවතත් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. "The Blueprint : Version 2.0" එක ගෙනෙනකොට තිබුණු තත්ත්වය නොවෙයි අද තිබෙන්නේ. එදා තිබුණේ රට ස්ථාවර කිරීම පිළිබඳ අවශ්‍යතාවක්. රට ස්ථාවර කිරීම සඳහා කළ යුත්තේ කුමක්ද කියන එක අපි ඉදිරිපත් කළා. අපි ඒකේ කෙළින්ම කිව්වා, IMF එකට යන්න කියලා. ඔබතුමන්ලා IMF එකට යන්න එපා කියනකොට අපි තමයි IMF එකට යන්න ඕනෑ කියලා කිව්වේ. 2020දී මේ පාර්ලිමේන්තුවේදී මම හිතන්නේ අපි දහතුන් වතාවක් කියලා තිබෙනවා, IMF එකට ගිහිල්ලා රට බංකොලොත් වෙන්න කලින් බේරා ගන්න කියලා. ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමාත්, මමත් රූපවාහිනී නාළිකාවල මේ පිළිබඳව විවාද කළා. එතුමා කිව්වා යන්න ඕනෑ නැහැ, අපට homegrown solutions තිබෙනවා කියලා. ඒ වුණාට අපි කිව්වා, යන්න කියලා. දැන් මෙතුමන්ලා සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා. ඒකට කමක් නැහැ. *[බාධා කිරීමක්]* Do not disturb. I never disturbed you. සමහරු වෙනස් වෙලා. දැන් විපක්ෂයේ ඉන්න සමහරු කියනවා ලු, IMF එකත් එක්ක වැල් පාලමේ ඉතුරු ටිකත් යන්න ඕනෑ ය කියලා. ඒ ටික තමයි අපි මුල ඉඳලා ම කිව්වේ. අපි මුල ඉඳලා කියපු දේ ඇහුවා නම් හරි. මම නැවත නැවතත් කියනවා, අපි මේක දැක්කා, දැකලා අපි කිව්වා, බංකොලොත් වෙන්න කලින් රට බේරා ගන්න කියලා. ණය පැහැර හරින්නෙක් හැටියට රට

නම් කරලා ලජ්ජාවට පත් වෙන්න කලින් මේක කරන්න කියලා අපි කිව්වා. නමුත් ඔබතුමන්ලා කිව්වා, නැහැ, නැහැ, අපි දන්නවා, homegrown solutions තිබෙනවා කියලා. නිවාඩ කබ්රාල් රාජ්‍ය ඇමතිවරයා මේ සභාවේ එදා හිටියා. එතුමා අපට හිනා වුණා; සමච්චල් කළා. අන්තිමට මොකක්ද වුණේ? අපි කිව්ව දේවල්වලට එදා හිනා වුණා, සමච්චලයට ලක් කළා, එහෙම නැත්නම් තර්ජනය කළා. ඔබතුමන්ලාටත් ඕනෑ නම් දැනුත් එහෙම කරන්න.

හැබැයි, රට වෙනුවෙන් ඔබතුමන්ලාට ඇත්ත වශයෙන්ම හදවතේ කැක්කුමක් තිබෙනවා නම්, අපේ විපක්ෂය කියන දේවල් අහන්න. ඉඳලා හිටලා හරි එහෙම ඇහුවොත් මේ ප්‍රශ්නය තවදුරටත් අනාගන්නේ නැතිව බේරා ගන්න පුළුවන් වෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉදිරිපත් කළ පනත් කෙටුම්පත ගැන අපේ කාරක සභාවේදී සාකච්ඡා කරපු අවස්ථාවේදීත්, මීට කලිනුත් බොහෝදෙනා කියන්න උත්සාහ කළා, රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත යටතේ මධ්‍ය කාලීන ණය කළමනාකරණ වැඩ පිළිවෙළක් - medium-term debt management strategy එකක් - ඉදිරිපත් කරනවා කියලා. ඇත්ත වශයෙන්ම මේක ඉස්සෙල්ලාම නීතියක් වුණේ, 2019 අප්‍රේල් මාසයේදී. 2019 අප්‍රේල් මාසයේ තමයි හිටපු අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා මෙවැනි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළේ. එය ඉදිරිපත් කරලා එතුමා පෙන්වා දුන්නා, ණය පැහැර හරින තත්ත්වයකට නොඑන්න නම් මෙන්න මේ මේ ක්‍රියාමාර්ග ගන්න ඕනෑ කියලා. ඒ සඳහා කුලුනු තුනක් තිබුණා. පළමුවෙනි කුලුන මොකක්ද කියලා මම කියන්නම්. මේක ඔබතුමන්ලා විසින්ම කඩාකප්පල් කරපු දෙයක්. මම පෙන්වන්නම් ඒ කොහොමද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙනි කුලුනට අපි කියනවා, hot money කියලා. ඒ කියන්නේ මේකයි. පිටරට ඉන්න අය ලංකාවට ඩොලර් ගෙනැල්ලා, ඒ ඩොලර් රුපියල්වලට convert කරලා, ඒ මුදල් භාණ්ඩාගාර බිල්පත්වල, බැඳුම්කරවල ආයෝජනය කරනවා. ඕනෑම වෙලාවක අපේ රටේ පොලී අනුපාතය වෙනත් රටවලට සාපේක්ෂව පහළට යනවා නම්, මේ මුදල් නැවතත් ඩොලර්වලට පරිවර්තනය කරලා ඇමෙරිකාවට හෝ එංගලන්තයට හෝ ජපානයට හෝ ඕස්ට්‍රේලියාවට හෝ ගෙනියන්න පුළුවන්. ඒක හැම දාම, හැම තත්පරයේම ලෝකයේ මූල්‍ය වෙළෙඳ පොළේ ක්‍රියාත්මක වෙනවා. ඒ විධියට දවසකට කෝටි ප්‍රකෝටි ගණන් එහෙට මෙහෙට මේ මුදල් යනවා. ඒවාට තමයි අපි hot money කියන්නේ. එතකොට ලංකාවේ විදේශ සංචිතවල එවැනි මුදල් විශාල වශයෙන් තිබුණා. අපි 2015දී ආණ්ඩුව ගන්නකොට සංචිත හැටියට තිබුණු ඒ ඇමෙරිකානු ඩොලර් බිලියන 8.2න් ඇමෙරිකානු ඩොලර් බිලියන 2.2ක්ම තිබුණේ hot money.

ඊළඟට තිබුණා, swap කියලා දෙයක්. මම හිතන්නේ නිවාඩ කබ්රාල් තමයි මේ ගැන මහ ලොකුවට කථා කළේ. බංග්ලාදේශයෙනුත් swap එකක් ගත්තා. Swap කියන්නේ කෙටි කාලීනව ගන්නා ණයක්. එතකොට ඔය සංචිත කියලා පෙන්වපු ඇමෙරිකානු ඩොලර් බිලියන 8.2න්, ඇමෙරිකානු ඩොලර් බිලියන 3.5ක් තිබුණේ short-term swaps. මාස හයෙන්, මාස තුනෙන් ඒවා නැවත ගෙවන්න ඕනෑ. එතකොට පළමුවෙනි pillar එක හැටියට මේ medium-term debt management strategy එකේ තිබුණේ, මේ short-term money, hot money සහ swaps පුළුවන් තරම් අඩු කරලා, පුළුවන් තරම් දීර්ඝ කාලයකට මේ ණය ගෙවන කාල සීමාව, එහෙමත් නැත්නම් කල් පිරෙන කාලය වැඩි කර ගැනීමයි. ඒක තමයි, රාජ්‍ය ණය කළමනාකරණ පනතේ තිබුණු පළමුවෙනි කුලුන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි කුලුනත් මම කියන්නම්. අද ගරු මංගල සමරවීර මැතිතුමා ජීවත්ව හිටියා නම් මේක ලස්සනට කියාවි. අවාසනාවකට, ඒ වැදගත් මනුස්සයා මිය ගියා. කෙටි කාලීන ණය ඩොලර්වලින් ගන්න එක නවත්වන්න, එහෙම නැත්නම් කෙටි කාලීන ණය ගන්න එපා කියලා එතුමා කිව්වා. ඒක තමයි දෙවැනි කුලුන විධියට තිබුණේ. Swaps ගන්න එපා, ඒවා දීර්ඝ කාලීනව කළමනාකරණය කර ගන්න ඕනෑ කිව්වා.

ඊළඟට, 2017-2018 කාලයේ මංගල සමරවීර මහත්තයා තවත් වැදගත් දෙයක් කළා. 1960 ගණන්වලට පස්සේ පළමුවෙනි වතාවට අපේ ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් තිබුණා. ප්‍රාථමික ගිණුමේ අතිරික්තය කියන්නේ අපට ලැබෙන ආදායමයි, අපි එදිනෙදා කරන වියදමයි අතර -පොලිය අයින් කළාම- තිබෙන වෙනස. අපේ ප්‍රාථමික ගිණුමේ ශේෂය ධන කර ගන්න, ඍණ කර ගන්න එපා කියලා එදා එතුමා කිව්වා. එදා ජීවත් වෙන්න ණය ගන්න ඕනෑ වුණේ නැහැ. බදු හෝ රජයේ ආදායම් ඒ සඳහා ලැබුණා. මංගල සමරවීර මැතිතුමා අමාත්‍යතුමා වශයෙනුත්, ඉරාන් වික්‍රමරත්න මැතිතුමා රාජ්‍ය ඇමතිවරයා වශයෙනුත් තමයි එදා කටයුතු කළේ. ඒ අය තමයි 2017-2018 කාලයේ පළමු වතාවට ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් ගත්තේ. ඒක මේ අවුරුද්දේත් ඇවිල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, තවත් මිනිත්තු දෙකකින් ඔබතුමාගේ කථාව නතර කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපේ පැත්තට වෙන් වූ කාලයෙන් තව විනාඩි දෙකක්, තුනක්, හතරක් මට ලබා දේවි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එතකොට ක්‍රමක්‍රමයෙන් ජාත්‍යන්තර ණය ලබා ගැනීම අඩු කර ගන්න තමයි මේ වැඩ පිළිවෙළ යොදා තිබුණේ. ඒකට අපි කියනවා, එහෙම වුණාම rollover risk එක අඩු වෙනවා කියලා. අපට බැඳුම්කරයක් ගෙවන්න තිබෙනවා.

අපේ හිටපු කථානායක ගරු වමල් රාජපක්ෂ මැතිතුමනි, 2022 අප්‍රේල් මාසයේ 12වෙනි දා වාගේ දවසක කිව්වා, අපිට මේ ණය ගෙවා ගන්න බැහැ කියලා.

එහෙම තමයි රට බංකොලොත් වුණා කියලා ජාත්‍යන්තරයට ප්‍රකාශ වුණේ. ඒ කියන්නේ මොකක්ද? අපට සංචිත තිබුණේ නැහැ, ඩොලර් බිලියනයක් වන ඒ ණය නැවත ගෙවන්න. බොහෝ වෙලාවට වෙන්නේ ඒ ණය නැවත ගෙවීමට අපි ජාත්‍යන්තරයෙන් නැවතත් roll over කරන එක, එහෙම නැත්නම් ණය ගන්න එක. එතකොට 2022දී ගෙවන්න තිබුණු ඩොලර් බිලියනය ගත්තේ ඔබතුමාගේ සහෝදරයා වන ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා, 2012 අප්‍රේල් මාසයේ 12වැනි දා. එතකොට මේ rollover risk එක නැති කරගන්න, rollover risk එක අඩු කරගන්න තමයි අර මම කියපු මධ්‍ය කාලීන ණය කළමනාකරණ වැඩ පිළිවෙළක් ගෙනෙන්න මංගල සමරවීර මැතිතුමා එදා උත්සාහ කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා එදා හිටපු බව මට හොඳට මතකයි. එදා 2018 ඔක්තෝබර් මාසයේ දවසක්. මම තමයි එදා ආණ්ඩුවේ රාජ්‍ය ඇමතිවරයකු හැටියට Active

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

Liability Management Act එක ගෙනාවේ. ඒ කියන්නේ, සක්‍රීය වගකීම් කළමනාකරණ පනත. ඒ පනත් කෙටුම්පත උදේ පාර්ලිමේන්තුවට ගෙනාවා. ඒක ගෙනෙන්න කලින් නොයෙකුත් ප්‍රශ්න ඇති වුණා, මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමාත් එක්ක. අද කථා කරන පුද්ගලයින් එදා ඒක ගෙනෙන්න දෙන්න බැහැ කියලා ඒකට හරස් කැපුවා. මට මතකයි, උදේ 6.30ට හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හමුවෙන්න ගියා, ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මැතිතුමාත් එක්ක. මම හිතන්නේ එතකොට Minister of Sports විධියට හිටපු දයාසිරි ජයසේකර මැතිතුමා තමයි Race Courseවල තිබෙන එතුමාගේ කාර්යාලයට ගිහින් මේ ගැන සාකච්ඡා කළේ. පසුව නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමන්ලා එකතු වෙලා කොහොම හෝ වැඳලා කරලා අපට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න අවස්ථාව ඉල්ලා ගත්තා. එදා කිසිකෙනෙකුට මේ ප්‍රශ්නය තේරුණේ නැද්ද කියන්න මම දන්නේ නැහැ. හැබැයි, එදා අපි මේ ප්‍රශ්නය දැක්කා. ඊට පසුව මේ සභාවට ඇවිල්ලා ඒ පනත් කෙටුම්පත සම්මත කර ගත්තා. එතකොට හවස 4.30 විතර වෙන්න ඇති. එදා මගේ දුව සින්දු කියන concert එකක් තිබුණා, කාන්තා විද්‍යාලයේ. හවස 4.30ට පනත් කෙටුම්පත සම්මත කරගෙන, මම ඒ concert එකට ගියා. 6.30ට විතර මට කෝල් එකක් ආවා, "අන්න, ඔයගොල්ලන්ගේ ආණ්ඩුව ගෙදර ඇරියා" කියලා. මම ඇහුවා, "මොකක්ද ගෙදර ඇරියා කියන්නේ?" කියලා. එදා තමයි දින 52 කුමන්ත්‍රණය පටන් ගත්තේ. දින 52 කුමන්ත්‍රණය පටන් ගත්ත ගමන් මොකක්ද කළේ? කෙළින්ම එම පනත ඉරලා කුණු බක්කියට දැම්මා. ඒකයි වුණේ. එතකොට කිව්වා, "නැහැ, මේක අවශ්‍ය නැහැ, මේක ක්‍රියාත්මක කරන්න ඕනෑ නැහැ, අපට තිබෙනවා දේශීය වැඩ පිළිවෙළක්" කියලා. Homegrown solution කියලා මහ ලොකුවට කියවාරු ගැහුවා, කබරාල්ලා සහ එතැන හිටපු සෙට් එක. ඊට පසුව මේක සම්පූර්ණයෙන්ම දේශපාලනීකරණය වුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමාට උපදෙස් දීපු කට්ටිය සම්පූර්ණයෙන්ම මහින්ද රාජපක්ෂ මුදල් ඇමතිවරයා නොමහ යැව්වා. ඊට පසුව කණ්ඩායමක් එකතු වුණා. ඒ විධියට කණ්ඩායමක් එකතු වෙලා කුමන්ත්‍රණයක් කළා, දෙන්නම් වැඩේ මේ කට්ටියට කියලා.

කොහොම නමුත් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවකට අනුව නැවතත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වුණා. හැබැයි, මේ කුමන්ත්‍රණය දියත් කරලා ඊට පසුව 2019දී නැවත ආණ්ඩුව වෙනස් කළා. මට කියන්න ඕනෑ කළේ මේ ඓතිහාසික කටයුත්ත ගැන. අද නැවතත් මේ පනත් කෙටුම්පත ගෙනෙනවා. නීතිය අනුව මේ ආකාරයට Public Debt Management Act කියලා එකක් තිබුණේ නැති වුණාට Medium-Term Debt Management Strategy එකක් මංගල සමරවීර මැතිතුමා ගෙනාවා. මේකෙන් කරන්න හදන දේ එතුමා එදා කළා. අපි මේ ඇතිවන තත්ත්වය දැක්කා. අපි මේ රට පාලනය කරන්න යනවා නම් මේ රටේ තිබෙන ගැටලු තේරුම් ගන්න ඕනෑ. IMF එකට බැණලා, ඒ හාදයා, මේ හාදයා කියලා එහෙම කරන්න බැහැ. ඔබතුමන්ලා දැන් කියනවා, ණය ප්‍රතිව්‍යුහගත කරගෙන යනවා කියලා. ජාත්‍යන්තර ණය ප්‍රතිව්‍යුහගත කරන එකේ කොටස් දෙකක් තිබෙනවා. එකක් තමයි ද්විපාර්ශ්වික ණය හිමියන් සමඟ එකඟතාව. ඒක අත්සන් කරයි කියලා බලාපොරොත්තු වෙනවා. අත්සන් කරනවා නම් දෙයියන්ගේ නාමයට ඒක හොඳයි; රට වෙනුවෙන් හොඳයි. ඒ නිසා අත්සන් කරන්න. හෙට අත්සන් කරනවා නම් අපි ඒ වෙනුවෙන් සහයෝගය ලබා දෙනවා. සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා සහ අපි හමුවන හැම අවස්ථාවකදීම ඒ අයට කියන්නේ සහයෝගය දෙන්න කියලායි. චීන කණ්ඩායම හමුවෙනකොට අපි එහෙම කියනවා; ජපාන කණ්ඩායම හමුවෙනකොට අපි එහෙම කියනවා; ප්‍රංශ කණ්ඩායම හමුවෙනකොට අපි එහෙම කියනවා. අපි කුහක නැහැ. ඒ නිසා මේ දේ කරගන්න.

හැබැයි, ඊළඟ එක තමයි ගැටලුව. ඒ කියන්නේ ජාත්‍යන්තර පෞද්ගලික ණය හිමියන් සමඟ අත්සන් කරන්න යන එකඟතාව ගැන ලොකු ගැටලුවක් තිබෙනවා. ඔවුන් අප්‍රේල් මාසයේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එම යෝජනාවට එකඟ වෙන්න එපා. එම යෝජනාවට එකඟ වුණොත්, ඇත්ත වශයෙන්ම 2028දී haircut එක එනකොට, එය සියයට 28 ඉඳලා සියයට 7ට අඩුවීමට බොහෝ විට සියයට 70කට වැඩි ප්‍රතිශතයක් තිබෙනවා කියලා මම අද කිව්වා කියන එක කරුණාකරලා හැන්සාඩ් වාර්තාවේ සටහන් කර තබා ගන්න. පසුව කියන්න එපා, හර්ෂ ද සිල්වලා, කබීර් හෂීම්ලා මේවා කිව්වේ නැහැ කියලා. කබීර් හෂීම්ලා, හර්ෂ ද සිල්වලා, ඉරාන් වික්‍රමරත්නලා අද කියනවා ඒක අත්සන් කරන්න එපා කියලා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, මම ඔබතුමාට disturb කළේ නැහැ නේ. Please, speak after me.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Okay, you finish your speech.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හොඳයි.

හැබැයි, ඒකත් එක්ක තව පැත්තක් තිබෙනවා. විපක්ෂයේ සමහර අය මේක කියන්නේ නැහැ. රජයෙන් තව යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒක dual one-time test කියලා එකක්. ඒ dual one-time test එකට එකඟ වුණොත් අර සියයට 70ක ප්‍රමාණයට තිබෙන අවදානම දුරු වෙනවා. එහෙම වුණොත් ඇත්තවශයෙන්ම අපිට සියයට 28ක haircut එකක් තබා ගන්න බොහෝ දුරට පුළුවන් වෙනවා. හැබැයි, ඒකේ ගැටලු කිහිපයක් තිබෙනවා. මොකද, මේකේ conditions 72ක් ඉදිරිපත් කර තිබෙනවා; options 72ක් තිබෙනවා. ඒකට කියන්නේ MLB - Macro-linked Bond - කියායි. එහෙමත් නැත්නම් එක්සත් ජනපද ඩොලර්වලින් මැන්නාම රටේ ආර්ථිකය කොච්චර දුරට ශක්තිමත් වෙනවාද, විශාල වෙනවාද කියන එකයි ඒකෙන් කියන්නේ. ඒකට තව එකතු කර තිබෙනවා, රටේ මූර්ත ආර්ථික වර්ධන වේගය. ඉතින් මේ වාගේ combinations 72ක් එක්ක තමයි මේ options ඉදිරිපත් කර තිබෙන්නේ. නමුත් ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳ පොළේ පුද්ගලයෝ ඒ වාගේ options 72කට එකඟ වෙන්න සූදානම් නැහැ. අපි කියනවා, ගන්නා bond එකක් index eligible වෙන්න ඕනෑ කියලා. Index eligible නැත්නම් ඒගොල්ලන් සූදානම් නැහැ, ඒකට එකඟ වෙන්න. ඉතින් මෙතැන පරස්පරයක් තිබෙනවා. මේ පරස්පරය විසඳා ගන්න.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියන කාරණාව ප්‍රතික්ෂේප කරනවා. මොකද, මෙතුමා නිරන්තරයෙන් කියන්න හදන කාරණාව තමයි, මේ එක කාණ්ඩයකින් සියයට 30ක haircut එකක් ඉල්ලනවා, අනෙක් කාණ්ඩයට සියයට 7ක haircut එකක් ලබා දෙන්න රජය එකඟ වෙලා තිබෙනවා කියන එක. ඒ සම්බන්ධයෙන් එකඟතාවක් තිබුණා නම්, second round of talks සඳහා යන්න ඕනෑ නැහැ නේ. එහෙම නම් මන්ත්‍රීතුමනි, පළමුවෙනි සාකච්ඡා වටයෙන්ම අපි ඒක අවසාන කරනවා නේ, එකඟ වෙලා. එකඟතාවකට ආවේ නැති නිසා නේ මෙහෙම වෙන්නේ. ඒ වුණත් ඔබතුමන්ලාගේ කඳවුර ඇවිල්ලා කියන්නේ, රජයට එකඟතාවකට එන්න බැහැ කියායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සාකච්ඡා කියන දේ එක තැනකින් අවසාන වෙන්නේ නැහැ. රජය පැත්තෙන් යෝජනාවලියක් තිබුණා. බැලුම්කර හිමියන්ගේ පැත්තෙනුත් යෝජනාවලියක් තිබුණා. ඒ දෙක අතරේ එකඟතාවකට එන්න දෙපාර්ශ්වයට බැරි වුණා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් ඒ සම්බන්ධයෙන් assessments කරගෙන ඉන්නවා. ඒ නිසා තවම එකඟතාවක් නැති කාරණයක් සම්බන්ධයෙන් එකඟතාවකට ආවා කියලා ප්‍රකාශ කිරීම වැරදියි. එහි අඩංගු අන්තර්ගතය පිළිබඳව කථා කළාට කමක් නැහැ. නමුත් එකඟතාවකට ඇවිල්ලා නැහැ, අපි.

ඊළඟ පියවර තමයි අපි මේ හැම creditor කෙනෙකුටම සමානාත්මතාවෙන් සලකනවා කියන එක. අපි ඒක කියා තිබෙනවා. ඒකත් එක්ක අපි ඉදිරි කටයුතු ගැන සාකච්ඡා ආරම්භ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු හර්ෂ ද සිල්වා මැතිතුමනි, ඔබතුමාගේ කථාව මිනිත්තුවකින් විතර අවසන් කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඇත්තවශයෙන්ම මම කියපු දේ මෙතුමා අහගෙන ඉඳලා නැහැ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
අහගෙන හිටියා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මොකද, මම කිව්වේ එකඟ වෙන්න එපා කියලායි.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
එකඟ වෙලා නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එකඟ වෙලා නැත්නම්, එකඟ වෙන්න එපා කියන්නේ නැහැ නේ. *[බාධා කිරීමක්]* එකඟ වෙලා නැත්නම්, එකඟ වෙන්න එපා කියන්නේ මොකටද? ඒක තමයි මම කිව්වේ. *[බාධා කිරීමක්]* මම කිව්ව දේ චමල් රාජපක්ෂ මැතිතුමාත් හොඳට අහගෙන හිටියා. මම කිව්වේ එකඟ වෙන්න එපා කියලායි. එකඟ වුණා කියලා කිව්වේ නැහැ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
එකඟ වෙලා නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එකඟ වෙලා නැත්නම්,- *[බාධා කිරීමක්]* ඒක තමයි කියන්නේ. Let me say it in English. - [*Interruption*.] No, I will tell you that in English. All what I am saying is, do not agree to that. - *[Interruption.]* I am saying that you all have not agreed so far. - [*Interruption*.] නැහැ. මෙතැන යෝජනා දෙකක් තිබෙනවා. එකක්, ඒ පැත්තෙන් අප්‍රේල්වල ඉදිරිපත් කළ යෝජනාව. අනෙක, ආණ්ඩුවේ යෝජනාව. මම කියන්නේ ආණ්ඩුවේ යෝජනාව හොඳයි කියන එකයි. ඒකත් එක්ක ඉස්සරහට යන්න. අරකට එකඟ වෙන්න එපා. මැතිවරණය බලාගෙනම ඕනෑම දේකට එකඟ වෙන්න එපා කියායි මම කියන්නේ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
එකඟ වෙලා නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මෙහෙම තමයි IMF එකට යන්න කිව්වාමත් මාත් එක්ක පැටලුණේ, ඒ කාලයේ. ඔහොම තමයි පැටලුණේ ඒ කාලයේත්. අපි කිව්වා, යන්න යන්න කියලා. "නැහැ, නැහැ. ඕනෑ නැහැ" කිව්වා. නමුත් ගියා. කමක් නැහැ. ගැටලුවක් නැහැ. මට කියන්න ඕනෑ වුණේ මේකයි. අපිට මේ ප්‍රශ්නය තේරෙනවා. අපි මේ ප්‍රශ්නය එදාත් දැක්කා. අපි මේ ප්‍රශ්නය අදත් දකිනවා. ඇත්තව වශයෙන්ම මේ ප්‍රශ්නය දිහා යථාර්ථවාදීව බලා, කුහක වෙන්නේ නැතුව ජනතාවගේ පැත්තෙන් පවා හිතලා තමයි අපේ යෝජනාවලිය ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා මේ රටේ මිනිස්සුන්ට අවස්ථාවක් තිබෙනවා. ඒ අවස්ථාව මොකක්ද? යථාර්ථවාදී වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්නේ කවුද කියන එක මැනලා බලන්න අවස්ථාවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණයත් කියලා අවසන් කරන්නම්. මේ ආණ්ඩුවට තව මාස කිහිපයයි තිබෙන්නේ. ඊට පස්සේ අපේ ආණ්ඩුවක් එනවා. ඒක කාටවත් නවත්වන්න බැහැ. අපේ ආණ්ඩුවෙන් මේ ප්‍රශ්නය විසඳන්න අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. දැන් ඒක හැම දෙනාගේම විවේචනයට ලක් වෙලා. ඒක හොඳයි. මොකද, විවේචනයට ලක් වෙන්න හරි අපි අපේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරලා තිබෙනවා. අපි කටට එන දේවල් තැන් තැන්වල කියන්නේ නැහැ. අපි කථා කරන්නේ අපේ නායකවරයා සමඟ එකතු වෙලා හදපු සමගි ජන බලවේගයේ ආර්ථික වැඩ පිළිවෙළ ගැන. ඒ තුළින් තමයි අපි මේ රට ගොඩ ගන්නේ කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

[අ.භා. 12.26]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථිකය ගැන විවාද කරනකොට, විශේෂයෙන්ම මම කියන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. අපි ඊයේ හොඳ, ලස්සන විවාදයක් දැක්කා. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ පිටපතකට අනුව, රනිල් වික්‍රමසිංහ මහත්මයා ITN එකේ සභාපතිවරයා විධියට පත් කරපු සුදර්ශන

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ගුණවර්ධනගේ අධ්‍යක්ෂණය යටතේ, ජනාධිපති මාධ්‍ය ඒකකයේ නිෂ්පාදනයක් ලෙස, ප්‍රධාන නළුවා විධියට අනුර කුමාර දිසානායකත්, සහාය නළුවා විධියට අර "යකඩ සුදා" විධියට බොහොම ප්‍රසිද්ධ සුධර්මන් ද, ගුධර්මන් ද - නැහැ, වැරදුණා - ගුධර්මන් රදලියගොඩ කියලා කෙනෙකුත් විසින් ඒ ලස්සන නාට්‍යය ඊයේ ඉදිරිපත් කළා.

අපි දැක්කා, ඒ ගොල්ලෝ ජනාධිපති ලේකම් කාර්යාලයේද කොහෙද කලින් ටිකක් පුහුණු වෙලා එහෙම ඇවිල්ලාත් තිබෙනවා. විශේෂයෙන්ම ඒ විවාදය ගැන මම තමයි මුලින්ම අභියෝගය කළේ. ඒ, අපේ ආර්ථික කමිටුවේ ඉන්න හර්ෂ ද සිල්වා, කබීර් හෂීම්, ඉරාන් වික්‍රමරත්න කියන තුන්දෙනාත් එක්කයි. හැබැයි ඒ විවාදයෙන් පැනලා ගිහිල්ලා ජනාධිපති අපේක්ෂකයෝ දෙන්නා අතරේ විවාද කරමුයි කියන කොට අපි කිව්වා, විවාද දෙකම කරමු කියලා. මේකට උදාහරණයක් විධියට කියන්න පුළුවන් හොඳ කතන්දරයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දවසක් ගොදුරක් ගිල දමා හොඳට බඩ පිරිලා ඉන්න සිංහ රජෙකුට, සිංහයාට වඩා උස මහත, හොඳ දළ දෙකක් තිබෙන තඩි ඌරු නාම්බෙක් මුහුණට මුහුණ හම්බ වෙනවා. සිංහයාට ඒ අවස්ථාවේ බඩ පිරිලා තිබුණු හින්දා, "වෙන වෙලාවක නුඹ අල්ලා ගන්නම්" කියලා සිංහයා ගණන් ගන්නේ නැතිව යන්න ගියා. හැබැයි, ඒ වෙලාවේ ඌරු නාම්බා සිංහයා තමන්ට බය වුණා කියලා බොහොම උජාරුවෙන් හිතුවා. ඒ නිසා සිංහයාට අභියෝග කරන්න ඒ ඌරු නාම්බා කටයුතු කළා. ඌරු නාම්බා සිංහයාට අභියෝග කළා. සිංහයා අභියෝගය පිළිගත්තා. අභියෝගය පිළිගෙන අහවල් දවසේ, අහවල් වෙලාවට, අහවල් ගල් පොත්තට එන්නම් කියලා ඌරු නාම්බට කිව්වා. ඒ අදාළ දිනය - 6 වැනි දා - කිට්ටු වෙන කොට ඌරු නාම්බාට තේරුණා වැඩේ වැරදුණා කියලා. දැන් මොකක්ද කරන්නේ කියලා ඌරු නාම්බා කල්පනා කළා. අලි වාගේ විශාල සතුන්ට පවා ඡොට් එක දුන්නු මේ සිංහයා ඌරු නාම්බා මරයි කියලා හිතුවා. ඌරු නාම්බා වෙව්ලන්න ගත්තා. ඌරු නාම්බා ඌරු සීයා වෙත ගිහිල්ලා වෙන්න යන දේ ගැන කියලා පොඩි උපදෙසක් ඉල්ලුවා. -මම දන්නේ නැහැ, ඒ ඌරු සීයා ජනාධිපති ලේකම් කාර්යාලයේ ද ඉන්නේ කියලා. එයාට "රතු අලි පැටියා" කියලාත් කියනවා නේ- ඉතින් ඌරු සීයා ඌරු නාම්බට උපදෙසක් දුන්නා. ඌරු නාම්බා අදාළ වෙලාවට සටනට ආවා. සටනට ආවේ කොහොමද? නිකම් නොවෙයි. ඌරාගේ ඇඟ හැම තැනම අසුවි තවරා ගෙන ආවේ; ඔළුවේ ඉඳන් ඇඟ පුරාම අසුවි තවරා ගෙන ආවේ. ඊට පස්සේ ඌරා ළඟට එනකොට සිංහ රජාට ගඳ ආවා. සිංහ රජාට ඌරාගේ ගඳ ඉවසන්න බැරිව, "මම වෙනම උඹත් එක්ක ගනුදෙනුව කරගන්නම්" කියලා ඌරාට දිනුම දීලා පැත්තකට යන්න ගියා.

ඊයේ වුණේත් අන්න ඒ වාගේ වැඩක් තමයි. සුදර්මන් රදලියගොඩ කියන්නේ කවුද කියලා අපි හොඳට දන්නවා. ඒ, යකඩ වංචාවක් සම්බන්ධයෙන් arrest කරපු කෙනෙක්. ඒ වාගේම තමන්ගේ නාළිකාවේ ප්‍රවෘත්ති කියන නිවේදිකාවකට ලිංගික අතවර කරන්න ගිහිල්ලා මාට්ටු වුණු කෙනෙක්. එහෙම කෙනෙක් එක්ක එකතුවෙලා තමයි ඊයේ ඔය විවාදය රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ පිටපතකට අනුව ක්‍රියාත්මක කරන්න කටයුතු කළේ. මීට කලින් විජය පුවත් පත් ආයතනයෙනුත් ඔය වැඩේ කරන්න හැදුවා. ඊට පස්සේ ITN එක මේක භාර ගත්තා. 4වැනි දා තමයි අපට ලියුමක් එව්වේ, ITN එකේ මෙන්න මෙහෙම විවාදයක් තිබෙනවා කියලා. එම නිසා ඌරු නාම්බෙක් එක්ක විවාද කරන්න අපි මඩ වගුරකට ගියේ නැහැ, ඊයේ. හැබැයි, මේ රටේ ස්වාධීන ආයතනයක්, ස්වාධීන කණ්ඩායමක් -අර ITN එක වාගේ ස්වාධීන ආයතන නොවෙයි- මැදිහත් වන ඕනෑම විවාදයකට අපේ ආර්ථික කමිටුවත්, අපේ නායකතුමාත් එනවා. එම නිසා ඊයේ පැහැදිලිවම ITN එක රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ පිටපතකට අනුව තමයි කටයුතු කළේ. ඒ පිටපතට ජනාධිපති ලේකම් කාර්යාලයෙනුත් විශාල සහයෝගයක්, ශක්තියක් ලබා දුන්නා කියන එක අපි දන්නවා. ඒ නිසා වරෙන්තු තිබෙන, ජනාධිපති ලේකම් කාර්යාලයෙන් අනියම් වැටුප් ගන්න, ටෙලිකොම් එකේ යකඩ හොරකම් කරනවාය කියලා චෝදනා තිබෙන සුධර්මන් රදලියගොඩයි, අනුර කුමාරයි එකට මැව් වුණාට, සුධර්මන් රදලියගොඩයි, අනුර කුමාරයි ඉන්න තැන ඉඳගන්න සජිත් ප්‍රේමදාස සූදානම් නැහැ; සමගි ජන බලවේගය සූදානම් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊට කලින් අපි ආර්ථිකය පිළිබඳ විවාදයට දින දාලා තිබුණා. ITN එක ඔය කියනවා වාගේ ස්වාධීන ආයතනයක් නම්, ඒ ගොල්ලන්ට තිබුණා නේ, දිනයක් දාලා අපේ ආර්ථික කණ්ඩායමටයි, ජාතික ජන බලවේගයේ ආර්ථික කණ්ඩායමටයි එන්න කියන්න. හැබැයි, එහෙම වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම තව විනාඩියකින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මට විනාඩි 12ක කාලයක් තිබෙන නිසා දිවා ආහාර විවේකයෙන් පසුවත් මට කාලය තිබෙනවා.

පැහැදිලිවම, ඊයේ සිදු වීමෙන් ෆේස් බුක් එකේ කොටන අයට -අර බයියෝ සෙට් එකම තමයි තවමත් කොටන්නේ- චූන් වුණාට අපට චූන් නැහැ, රටේ ජනතාවට චූන් නැහැ. අපි විවාදවලින් පලා යන්නේත් නැහැ. අපේ ආර්ථික කමිටුවේ විවාදයත්, නායකයන් අතර විවාදයත් ස්වාධීන තැනක, ස්වාධීන පිරිසක් එක්ක කරන්න සූදානම්. ඒ විවාදය පැවැත්වීම ගැන නලින්ද ජයතිස්සත් එක්ක සාකච්ඡා කරන්නයි මා පත් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා-

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට තව විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ඉක්මනට අවසන් කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා විනාඩි දෙකක් වැඩිපුර අරගෙන තිබෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(*மாண்புமிகு நலின் பண்டார ஜயமஹ*)
(The Hon. Nalin Bandara Jayamaha)
එහෙම නම්, දිවා ආහාර විවේකයෙන් පසුව ඔබතුමා මට කාලය ලබා දෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
ඔව්, දෙනවා.

දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු අපර භාග 1.00 දක්වා අත්හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.
அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.
Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා, ඔබතුමාට මිනිත්තු 6ක කාලයක් ඉතිරි වෙලා තිබෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(*மாண்புமிகு நலின் பண்டார ஜயமஹ*)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ITN එකේ තිබුණු one -man show විවාදය, පාළු ගෙයි වළං බිඳපු විවාදය, එහෙම නැත්නම් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ පිටපතකට අනුව රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ගෝලයා, සුදර්ශන ගුණවර්ධන අධ්‍යක්ෂණය කරපු, ජනාධිපති මාධ්‍ය ඒකකයෙන් නිෂ්පාදනය කරපු, අනුරයි, සුධර්මනුයි -අපට ගුදර්මන් කියලාත් කියැවෙනවා. එහෙම නැත්නම්, "යකඩ හොරා", "යකඩ සුදා" කියලත් කියැවෙනවා- රහපාපු නාට්‍යය ගැනයි මා කියමින් සිටියේ. අනුර කුමාර වැටිච්ච තැන ගැන අපට අලුතින් කියන්න ඕනෑ නැහැ. එය බොහොම පැහැදිලියි. අනුර කුමාරට "රතු අලි පැටියා" කියලා විමල් වීරවංශ නම දැම්මේ මෙන්න මේ හින්දා. අපට ලොකු සැකයක් තිබෙනවා ජනාධිපති මාධ්‍ය ඒකකයට ගිහිල්ලා සුධර්මනුයි, අනුර කුමාරයි practise කළා ද කියලා. ඇයි, ඊයේ දෙන්නා හොඳට ප්‍රශ්න ටික හුවමාරු කරගෙන, ලස්සනට වැඩේ කළා. අනුර කුමාරලාට ඕනෑ ITN එකට ගිහිල්ලා විවාද කඩේ වහලා දාන්න. විවාද කඩේ වහන්න අපි ඉඩ දෙන්නේ නැහැ. අපේ ආර්ථික කම්ටුවත්, අපේ නායකයාත් විවාදයට සූදානම්. හැබැයි, ඉනින් අපි අසූචි තවරාගත්තු ඌරන් වාගේ ITN එක වාගේ මඩ වගුරක බැහැලා, ඒ වාගේ තැන්වල විවාද කරන්නේ නැහැ. මේ අවස්ථාවේදීත් මම මේ රටේ තිබෙන ස්වාධීන මාධ්‍ය ආයතනවලට ආරාධනා කරනවා, මේ විවාද දෙකට මැදිහත් වෙන්න කියලා. මීට කලින් අපි ලිඛිතවත් ආරාධනා කළා. මේ විවාද දෙකම රටට අවශ්‍ය විවාද දෙකක්. හැබැයි, දැන් මේ ගොල්ලෝ විවාද කඩේ වහන්න උත්සාහ කරනවා. හැබැයි, අපට තවත් ඕනෑ තරම් කල් තිබෙනවා ඒ විවාදය කරන්න. ඒක මඟ හරින්න ඕනෑ හින්දා තමයි ඊයේ ITN එකට ගිහිල්ලා ඒ වැඩේ කළේ.

දැන් රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ වුවමනාව මොකක්ද? එතුමාගේ වුවමනාව අපට බොහොම පැහැදිලිව පෙන්වා දෙන්න පුළුවන්. මොකද, ජනාධිපති අපේක්ෂකයා විධියට සජිත් ප්‍රේමදාස මහත්මයාට ඡන්දය දෙන්න අද සියයට 50ක් ඉන්නවා. සියයට 20ක් විතර ඉන්නවා JVP එකේ අනුර කුමාරට. එතුමා සජිත් ප්‍රේමදාස මහත්මයාගේ කිට්ටුවකවත් තියන්න බැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඊටත් යටින් ඉන්නේ. ඒ, සියයට 10ක, 12ක සීමාවේ. දැන් රනිල් වික්‍රමසිංහ මහත්මයාට ඕනෑ වෙලා තිබෙන්නේ සියයට 35ක් අරගෙන ජනාධිපති වෙන්න. එතුමා ඒකට පාවිච්චි කරන උපක්‍රමය තමයි සජිත් ප්‍රේමදාසගේ ඡන්ද සියයට 15ක්, 20ක් අතර ප්‍රමාණයකින් අඩු කිරීම සහ අනුර කුමාරගේ ඡන්ද සියයට 10කින්, 12කින් වැඩි කිරීම. ඒ අස්සෙන් රිංගලා සියයට 35ක් ඡන්ද අරගෙන මේ රටේ ජනාධිපති වෙන්න තමයි එතුමා උත්සාහ කරන්නේ. එතුමා එහෙම නේ හිතාගෙන ඉන්නේ; ගණන් හදාගෙන ඉන්නේ. එතුමා මේ සැරේ ඡන්දයට එන්නේ සියයට 35 ප්‍රතිශතයකින් ජනාධිපතිවරයා බවට පත් වෙන්නයි, මුළු ඡන්ද සංඛ්‍යාව තුනට බෙදලා. ඒ සඳහා එතුමාට අවශ්‍යයි සජිත්ගේ ඡන්ද ටික අඩු කිරීම, අනුරගේ ඡන්ද ටික වැඩි කිරීම සහ ඒ හරහා අස්සෙන් ගහලා තමන්ගේ ඡන්ද ටික වැඩි කර ගැනීම. ඉතින් ඒකට තමයි තමන්ගේ සුවව, කීකරු බලු කුක්කා ගෙනැල්ලා, ගෝලයා ගෙනැල්ලා රූකඩයක් විධියට ඉන්දවලා තමන්ගේ ගෝලයන් දෙන්නාත් ඉන්දවාගෙන -විශාල චෝදනා තිබෙන රදලියගොඩ වාගේ හොරෙක් ළඟ තියාගෙන, දූෂිතයෙක් ළඟ තියාගෙන- ඒ විවාදය කරන්න ගියේ. අනේ අර ෆයිල් මිටියේ තිබුණේ නැද්ද දන්නේ නැහැ, රදලියගොඩගේ ෆයිල් එක? ලජ්ජයි, අනුර කුමාර දිසානායක. දැන් නැද්ද පුටුවේ? එහෙම නම් ඔය පුටුවටත් ගහන්න ඕනෑ, "නැහැ" කියලා. ලජ්ජයි, අනුර කුමාර දිසානායකලා; JVPකාරයෝ ගැන. ආණ්ඩුවේ channel එකකට ගිහිල්ලා විවාද කරනවා. පෞද්ගලික channels කීයක් නම් කථා කළා ද ඒ විවාදය කරමු කියලා. යමල්ලාකෝ ඒ එකකට. "සිරස" නාළිකාවෙන් කථා කළා, "හිරු" නාළිකාවෙන් කථා කළා, "දෙරණ" නාළිකාවෙන් කථා කළා, "ස්වර්ණවාහිනී" නාළිකාවෙන් කථා කළා, "සියත" නාළිකාවෙන් කථා කළා. ඒ එකකටවත් යන්නේ නැතිව ITN එකට ගිහිල්ලා ඒකේ ඉන්න දූෂිත, වංචනික, ඒ වාගේම පොහොට්ටුවේ නාම යෝජනා ලැයිස්තුවේ හිටපු රදලියගොඩත් එක්ක ලජ්ජා නැතිව ඒ අසූචි වළේ ඉඳගෙන හිටියා.

අපි මේ රටේ ජනතාවට කියනවා, අනුර කුමාර දිසානායක කාගේ න්‍යාය පත්‍රයට ද වැඩ කරන්නේ කියන එක හොඳට හඳුනා ගන්න කියලා. ඒ, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ න්‍යාය පත්‍රයට අනුව. ඒ න්‍යාය පත්‍රය තුළින් රනිල් වික්‍රමසිංහ හදනවා එතුමා ඉස්සර වෙන්න, අනුර කුමාර හදනවා එතුමා ඉස්සර වෙන්න. දෙන්නම හදනවා සජිත්ව පල්ලෙහාට දාන්න. ඕක තමයි ඇත්ත.

අපි විවාදයෙන් පැනලා ගිහිල්ලා නැහැ. අපි විවාදය සඳහා තවමත් විවෘතයි. ඒ විවාදය කරන තැන කොහේද, නාළිකාව මොකක්ද කියන එක ගැන නලින්ද ජයතිස්ස එක්ක කථා කරන්න මම අවස්ථා ගණනාවක උත්සාහ කළා. මැදිහත්කාර පාර්ශ්ව අපි දෙන්නා meet කරන්න උත්සාහ කළා. ඒවා ඔක්කොගෙන්ම පැනලා ගිහිල්ලා රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ පිටපතට අනුව වැඩ කරලා තිබෙනවා. ඒ නිසා මම මේ රටේ මිනිසුන්ට කියනවා, මේක තේරුම් ගන්න කියලා.

හඳවතින් නොවෙයි, බුද්ධියෙන් බලන්න. අපි විවාදවලින් පැනලා ගිහිල්ලා නැහැ. අපි ඕනෑම මොහොතක ඒ කියපු විවාද දෙකට සූදානම්. හැබැයි මඩ ගොහොරුවල, දූෂිතයන් එක්ක ඒක පාර්ශ්විකව කරන විවාදවලට නොවෙයි, මේ රටේ සියලු නාළිකාවලට විවෘත වන, මේ රටේ සියලු ජනතාවට බලන්න පුළුවන් විවාදවලට අපි තවදුරටත් සූදානම්. ITN එක ඇතුළට රිංගලා one-man show එකක් පෙන්නලා, රූකඩ සංදර්ශන පෙන්නලා, කඩේ වහලා මේ විවාදයෙන් මුවා වෙන්න උත්සාහ කරන්න එපා කියා මම කියනවා.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

අනුර කුමාර දිසානායක මහත්මයාගේ ගෝලයන් ටිකටත් යමක් කියන්න ඕනෑ. හඳුන්නෙත්ති මහත්මයා ඊලෝන් මස්ක් ගැන කිව්ව දේ මතකයි නේ. ඒ වාගේ දේවල් කියන හාදයෝ තියාගෙන තමයි ඒ අය වැඩ කරන්නේ. අද ඉන්න තරුණයන් බොහොම updated; ව්‍යාපාරිකයන් බොහොම updated. ඒ නිසා ඉස්සෙල්ලාම හඳුන්නෙත්ති සහෝදරයාත් update වෙන්න. තමන්ගේ ප්‍රධාන ආර්ථික උපදේශකයා update කරගෙන හරි විවාදයකට එන්න. එතකොට අපිත් සූදානම් බව සඳහන් කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 25ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.07]

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පාර්ලිමේන්තුවේදී පනත් කෙටුම්පතක්, නියමයන්, නියෝග ආදිය රාශියක් සම්මත කරන දිනයක්. ඒවා අතරින් විශේෂයෙන් රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත ඉතාම වැදගත්. "ණය කළමනාකරණය" යන වචනය පාවිච්චි කළ වහාම අපට හැඟෙන අදහස් කීපයක් තිබෙනවා. ඵලදායීතාව, වැය බර අඩු වීම, ණය ගෙවීමේ හැකියාව පවත්වා ගැනීම ආදී කරුණු සියල්ල ණය කළමනාකරණය තුළ පවතිනවා. ණය වියදම කියන්නේ, පොලිය. ඵලදායීතාව කියන්නේ, ඒ ණය යෙදවීමෙන් අපට ආපසු ලැබෙන දේ, ගෙවීමේ හැකියාව සහ මූල්‍ය ශක්තිමත්භාවය පවත්වා ගැනීම. රාජ්‍ය ණය කළමනාකරණය තුළින් අප බලාපොරොත්තු වන්නේ මෙන්න මේ කරුණු වඩාත් හොඳින් පවත්වා ගැනීමයි. ඒවා නිසියාකාරව පවත්වා නොගැනීම නිසා තමයි පසුගිය අවස්ථාවක අපට කියන්න සිද්ධ වුණේ අපේ රට බංකොලොත්, අපට තාවකාලිකව ණය ගෙවන්න බැහැ කියලා.

දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව අපේ ණය තොගය 2022 වෙද්දී සියයට 128ක් වෙලා තිබුණා. ඒ වාගේම, ඒ වර්ෂය තුළ ගෙවන්න තිබුණු ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 34ක් වෙලා තිබුණා. එය ඉතාම අසීරු කටයුත්තක්; කළමනාකරණයකින් තොර තත්ත්වයක්. ඒවාට පැහැදිලි උත්තරයක් වශයෙන් තමයි අද විවාදයට ගැනෙන පනත් කෙටුම්පත තුළින් ණය කළමනාකරණය නීතිමය වශයෙන් ස්ථාවර කරන්න යන්නේ. මොකද, විශේෂයෙන් රාජ්‍ය ණය කළමනාකරණය සම්බන්ධයෙන් අඛණ්ඩ නීතියක් අවශ්‍යයි.

රාජ්‍යය ණය ගැනීම කියන එක වැරදි දෙයක් නොවෙයි. ලෝකයේ ඉතාම දියුණු, ශක්තිමත් රටවල් තමයි වැඩියෙන්ම ණය ගන්නේ. හැබැයි, ඔවුන් ණය කළමනාකරණය කරනවා. එනම්, එම ණය වඩාත් ඵලදායී දේවල යෙදවීම, ලෝකයේ අඩුම මිලට, අඩුම පොලියට ණය ගැනීමට උත්සාහ කිරීම සහ ණය ගෙවීමේ ශක්තිය පවත්වා ගෙන යෑම ආදිය සිදු කරනවා. අපිත් දැන් මේක තමයි කරන්න යන්නේ. ඒ සඳහා අඛණ්ඩ නීතියක් පවත්වා ගෙන යා යුතුයි. ණය ගැනීම සම්බන්ධයෙන් අපේ රටේ තිබෙන්නේ විසිරුණු ආයතන ක්‍රියාවලියක්. අපේ මහ බැංකුව විසින් විශේෂයෙන් දේශීය වශයෙන් ණය ගැනීම සිදු කරනවා. මුදල් අමාත්‍යාංශය විදේශ ණය ගැනීම් කරනවා. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ණය ගෙවීම කරනවා. මෙන්න මේ සියල්ල එක් ආයතනයකින් කරන්න රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයක් අවශ්‍යයි. ඒ සඳහා මුදල් අමාත්‍යාංශය තුළ වෙනම දෙපාර්තමේන්තුවක් සකස් කරනවා. අප ගන්නා ණය වඩාත් ඵලදායීව යෙදවීම, තිරසරභාවයකින් යුතුව ආපසු ගෙවීම කියන කාරණා පිළිබඳ වූ නීතිමය වැඩ පිළිවෙළක්, නීතිමය රාමුවක් තමයි අද අපි මේ පනත් කෙටුම්පත හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සම්මත කර ගන්න යන්නේ. මේක මීට බොහෝ කලකට පෙර කළ යුතුව තිබූ දෙයක්. ඒ නිසා මේක මේ රටේ අනාගතය වෙනුවෙන් ගෙන ආ ඉතාම වැදගත් වූ නීතියක් බව කියන්න පුළුවන්. මේ යුගය තමයි, දශක ගණනාවක අවශ්‍යතා සම්පූර්ණ වන කාල සීමාව. ඒ කාල සීමාවේදී තවත් එක් වැදගත් මූල්‍යමය අවශ්‍යතාවක් හැටියට, ආර්ථිකමය ශක්තිමත්භාවයක් සහිත පැහැදිලි ගමනක් පිළිබඳව වූ මග පෙන්වීමක් හැටියට ඉදිරිපත් කරන නීතියක් ලෙසත් මේ පනත් කෙටුම්පත හඳුන්වා දෙන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත යටතේ වන නියෝගයක් සහ නියමයක් ද අනුමැතිය සඳහා අද ඉදිරිපත් කර තිබෙනවා. මෙය අලුත් බද්දක් නොවෙයි. දැනට ක්‍රියාත්මක වන බද්දක්. අද කථා කරන මේ බදු සියල්ල දැනට ක්‍රියත්මක වන ඒවා. මේවා අලුතින් බදු පැනවීමක් හෝ අලුතින් වියදමක් ඇති වන දේවල් නොවන බව පැහැදිලිව කියන්න අවශ්‍යයි. අපි කිරි පිටි සඳහා සියයට 10ක බද්දක් පැනෙව්වා. එහෙම කරන්න හේතුවක් තිබෙනවා. ලෝකයේ කිරි පිටි මිල අඩු වීමත්, විශේෂයෙන් රුපියලේ අගය වැඩි වීමත් එක්ක ලංකාවට ආනයනය කරන කිරි පිටිවලින් ආනයනකරුවන්ට ලොකු ලාභයක් ලැබුණා.

ඒ ලාභය සම්පූර්ණයෙන්ම ජනතාවට ක්ෂණිකව ලබා දීමක් සිදු නොවන නිසා, රජය එයින් යම් ප්‍රමාණයක් ලබා ගැනීම තමයි කෙරුණේ. ඒකෙන් ජනතාවට කිසිම අගතියක් වුණේ නැහැ. මා දන්නා විධියට ඉන්පසුවත් කිහිපවරක් -දෙවරක් හෝ තුන්වරක්- මිල අඩු කරන්න තරම් ලාභ පරාසයක් ආනයනකරුවන් සතුව තිබුණා. අන්න ඒ ලාභ පරාසයෙන් කොටසක් රාජ්‍ය ආදායමට එකතු කර ගැනීම සඳහා තමයි, 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද හරහා කිරි පිටි සඳහා සියයට 10ක් වැඩි කළේ. විශේෂයෙන්ම 2023.12.31 දිනැති 2364/37 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය තුළින් අපි කළේ ඒක. ඒක සාමාන්‍යයෙන් රාජ්‍ය ආදායම පිළිබඳ කටයුතු කිරීමේදී ගන්නා එක් පියවරක්. ජනතාවට නොලැබෙන, ආනයනකරුවා නැත්නම් ව්‍යාපාරිකයා ලබන අසීමිත ලාභයෙන් යම් කොටසක් රාජ්‍ය ආදායමට එකතු කර ගැනීම තමයි මෙතැනදී සිද්ධ වුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟට තිබෙනවා, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ යෝජනාව. විශේෂයෙන්ම, සවුදි අරාබි රජය සමඟ අපි අත්සන් කළ ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම ඊට අදාළයි. අපේ යම් කිසි සහෝදරයෙක් සවුදි අරාබියේ වැඩ කරනවා නම්, ඔහුට ලැබෙන වැටුප සඳහා සවුදි අරාබියේදීත් ඔහු බද්දක් ගෙව්වා නම්, ඒ ගෙවීම ඉදිරිපත් කරලා අපේ රටෙදී යම් බද්දක් ගෙවීමෙන් වළකින්න ඔහුට පුළුවන්. ඔහුට ඒ සඳහා නිදහස ලබා දිය යුතුයි. සවුදි ජාතිකයෙකුට මේ රටේ ආයෝජනය කිරීමේදී හෝ මොනයම් කාරණයකදී යම් ආදායමක් ලැබෙනවා නම්, අපි ඒකෙන් බද්දක් ගත්තා නම්, ඔහුට පුළුවන් තමන්ගේ රටෙදී අපි

නිකුත් කළ බදු රිසිටිපත ඉදිරිපත් කරලා, ඒ රටේදී ගෙවන බද්දෙන් නිදහස් වෙන්න. මේ වාගේ ගිවිසුම් 45ක් අපි ලෝකයේ රටවල් එක්ක අත්සන් කරලා තිබෙනවා. ඒක අපේ රට වාගේ රටකට ඉතා වැදගත්. ඒ වාගේම, අපේ රටේ විශාල සේවක පිරිසක් සවුදි අරාබියේ වැඩ කරනවා. ඔවුන්ටත් මේකෙන් ලොකු ප්‍රයෝජනයක් වෙනවා. ඒ වාගේම අපේ අන්‍යෝන්‍ය සම්බන්ධතා සඳහා මේක ඉතාම වැදගත් වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම මේ සතියේම කථා බහට ලක් වුණු කාරණාවක් තමයි, තෙවන පාර්ශ්වයන්ගෙන් තොරතුරු ලබා ගැනීම සඳහා වන නියෝගය ඇතුළත් ගැසට් නිවේදනය. ඒක 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ තිබුණේ. 2023 අංක 4 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් තමයි, ඒක 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට ඇතුළත් වුණේ. මෙම පනතේ 123(8) වගන්තිය අනුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට මේ රටේ පුරවැසියන්ගේ ගනුදෙනු පිළිබඳ අදාළ තොරතුරු නිශ්චිත ආයතනවලින් ලබා ගැනීමට පුළුවන්. මෙකෙන් අදහස් වෙන්නේ නැහැ, මේක අලුත්ම දෙයක් කියලා. සාමාන්‍යයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට මේ අයිතිය තිබෙනවා. ඒක වඩාත් ක්‍රමානුකූල කිරීමක් තමයි, මේ 2024 මාර්තු 21 දිනැති අංක 2376/25 දරන ගැසට් නිවේදනයෙන් කෙරෙන්නේ. ඒක නිවේදනයක් විධියට 2024 මැයි මාසයේ 21වැනි දා නිකුත් කළා. ඊට පස්සේ තමයි ඒ ගැන කථා බහට ලක් වුණේ. විශේෂයෙන්ම, ඒ ගැසට් නිවේදනය අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්, බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන, කොළඹ කොටස් හුවමාරුව, කොන්ත්‍රාත් ප්‍රදානය කරන රජයේ ආයතන, 2024 ජූලි මාසයේ 01වැනි දාට පස්සේ අලුතින් කෙරෙන ගනුදෙනු සම්බන්ධයෙන් තොරතුරු ලබා දිය යුතුයි. මේ කියන්නේ පරණ ගනුදෙනු නොවෙයි. අපට අවශ්‍ය නැහැ, පරණ ඒවා සොයා ගෙන ගිහිල්ලා මේ රටේ ජනතාව තව තවත් පීඩනයට පත් කරන්න. හැබැයි අපට අවශ්‍ය අලුතින් කරන ගනුදෙනුවල තොරතුරු. මොකද, අපි කියලා තිබෙනවා, මේ වාගේ කටයුතු කරන සියලුදෙනාම බදු සඳහා ලියාපදිංචි වෙන්න කියලා. අපි රාජ්‍ය ආදායම වර්ධනය කරගෙන ක්‍රමානුකූල ගමනක් යන්න තමයි, මේ රටේ ජනතාවට ආරාධනා කරන්නේ. ඒ නිසා ජූලි මාසයේ 01වැනි දාට පස්සේ මෙවැනි ගනුදෙනු සම්බන්ධව කෙරෙන එදිනෙදා වාර්තා, මේ ආයතන විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ඉදිරිපත් කළ යුතුයි. ඒක තමයි මේ ගැසට් නිවේදනයෙන් කියන්නේ. ඒ නිසා කවුරුවත් අනියත බියක් හදා ගන්න අවශ්‍ය නැහැ, ඒ අයගේ ගිණුම ආපස්සට බලයි, ඒකෙන් ප්‍රශ්න ඇති වෙයි කියලා. නැහැ, අපි ඉදිරියට ඒ කටයුතු හරියට කරමු. ඒක තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ රටේ ජනතාවට යෝජනා කරන්නේ. ශක්තිමත් රාජ්‍ය ආදායමක් ලබාගත යුතු රටක් හැටියට, රාජ්‍ය ආදායමට දායක වන සැබෑ පුරවැසියකු හැටියට, අවංකව, නොබියව, ඒ වටිනාකමත් අරගෙන ඉස්සරහට යන්න අවශ්‍ය පසුබිම තමයි අපි මේ ක්‍රමානුකූලව නිර්මාණය කර ගෙන යන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. බැංකු ගිණුම් වුණත්, අලුතින් ආරම්භ කරන බැංකු ගිණුම් ගැන තමයි අපි මේ අහන්නේ. සමාජයේ යම් කිසි අනියත බියක් ඇති වෙලා තිබෙනවා, මේවා ආපස්සට බලයි කියලා. මේවා ඔක්කොම නැවත පරීක්ෂා කරලා ප්‍රශ්න ඇති වෙයි කියලා. නමුත් එහෙම වෙන්නේ නැහැ.

සමාජයට අලුතින් ප්‍රශ්න ඇති කරන්න අපට අවශ්‍ය නැහැ. මේ සමාජය ඕනෑ තරම් ප්‍රශ්නවලට මුහුණ දීපු සමාජයක්. අපට අවශ්‍ය මේ සමාජය ඉදිරියට යද්දී වඩාත් නීත්‍යානුකූල, රාජ්‍ය ආදායමට දායක වෙන පුරවැසියන් ඉන්න ශක්තිමත් ආර්ථිකයක් තිබෙන සමාජයක් බවට පත් කරන්නයි. විශේෂයෙන් මේකත් එක්කම බද්ධ වුණු කාරණයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ දවස්වල කථාවට හාජන වෙනවා, පසුගිය 2023 ජනවාරි මාසයේ 1වැනි දා ඉඳලා අපි බැංකු පොලිය මත සියයට පහක රඳවා ගැනීමේ බද්දක් තියා ගන්නවා කියලා. මේකේ සංකීර්ණ තත්ත්වයක් තිබෙනවා. සාමාන්‍යයෙන් රඳවා ගැනීමේ බද්දක ස්වභාවය තමයි ඒ රඳවා ගත් කොටස ඒ අදාළ පුද්ගලයා බදු ගෙවීමට නියමිත අයෙකු වුණොත් ඔහු ගෙවන බදු ප්‍රමාණයෙන් රඳවා ගත් ප්‍රමාණය අඩු කරන එක. හැබැයි බදු ගෙවීමට අවශ්‍ය නැති කෙනෙකු වුණොත් මොකක්ද කරන්නේ? බැංකුවකින් කෙනෙකුට ලැබෙන පොලියෙන් සියයට පහක් අපි රඳවා ගන්නවා. අපේ රටේ තිබෙන නීතිය අනුව මාසයකට රුපියල් ලක්ෂයකට වැඩි ආදායමක් තිබෙන අය විතරයි බද්දක් ගෙවන්න අවශ්‍ය. ඒක නිසා ලක්ෂයකට වඩා අඩු අයගෙත් සියයට පහක් අපි රඳවා ගන්නවා. බොහෝ ජනතාව හිතනවා, අපි ඒ සියයට පහ දඩයක් වාගේ ගත්තා කියලා. නැහැ. ඒ සියයට පහ ඔවුන්ට ආපසු ලබා ගැනීමට අයිතියක් තිබෙනවා. ඒක බදුකරණය වඩාත් ක්‍රමවත් කරන්න කරපු ක්‍රමයක්. අපි මේකෙදි -

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
නමුත් ඒක ගත්තු කෙනෙක් නැහැ.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඉන්නවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඔබතුමා කියන එක හරි. එහෙම ගන්න පුළුවන් කියනවා. නමුත් ඒ තිබෙන procedure එක බැරෑරුම් නිසා කිසිම කෙනෙක් ඒ සියයට පහ refund කරගෙන නැහැ.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේ කොටස් දෙකක් ඉන්නවා. අපට අවශ්‍ය වුණා, ඉස්සෙල්ලාම වැඩිහිටියන් සඳහා ඒ රඳවා තබා ගැනීම වඩාත් පහසු විධියට නිදහස් කරන්න. ඒ සඳහා අපි ක්‍රමයක් හැදුවා, අවුරුදු 60ට වඩා වැඩි අයගෙන් ඒ විධියට රඳවා ගත්තොත්, ඔහු කියනවා නම් මාසයකට රුපියල් ලක්ෂයක ආදායමක් නැහැ කියලා, කාර්තුවක් ගණනේ ඒක ලබා ගන්න. ඔබතුමා කියපු විධියට මෙතැන සංකීර්ණතාවක් තිබෙනවා. ඔහු ගිහිල්ලා ආදායම් බදු කාර්යාලයට ඒ ගැන කථා කළොත්, ඒ ගැන කරුණු ඉදිරිපත් කළොත්, ආදායම් බදු කාර්යාලය බැංකුවෙන් තොරතුරු අරගෙන ඒක නිදහස් කරනවා. ඒක හදුන්වලා දුන්නාට පස්සේ මේ කාල සීමාව තුළ එය නිදහස් කර ගත් ප්‍රමාණය ඒ අයිති ප්‍රමාණය එක්ක බැලුවාම අල්පයි. ඒක නිසා ඒකට ක්‍රමයක් හදන්න ඕනෑ. ඒක එක කණ්ඩායමක්. අවුරුදු 60ට වඩා වැඩි අයට අපි අවස්ථාව දීලා තිබෙනවා, කාර්තුවක් ගණනේ ගෙවන්න. හැබැයි, ඒ ක්‍රමය සංකීර්ණ බව මම පිළිගන්නවා. ඒකට තවත් සරල ක්‍රමයක් හැදිය යුතුයි.

දෙවැනි කාරණාව මෙයයි. අවුරුදු 60ක් වෙන්න ඕනෑ නැහැ. මේ රඳවා ගන්න සියයට පහ, මාසික ආදායම රුපියල් ලක්ෂය ඉක්මවා යන්නේ නැත්නම් ඒ මුදල ආපසු ගන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔහු ඒ සඳහා කළ යුත්තේ ප්‍රදේශයේ

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

ආදායම් බදු කාර්යාලයට ගිහිල්ලා ඒ සඳහා අවශ්‍ය පෝරමය පුරවලා කරුණු ඉදිරිපත් කිරීමයි. ඉන් පසු ඔහුගේ ගිණුමටම ඒ මුදල ආපසු ලබා දීමට කටයුතු සලස්වලා තිබෙනවා. මම ඊයේත් දීර්ඝ සාකච්ඡාවක් කළා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරියත් එක්ක. ඇත්තෙන්ම මේ මුදල ආපසු ලැබිය යුතු බොහෝ අයට මේ ක්‍රමය සංකීර්ණ වැඩියි. මගේ දිස්ත්‍රික්කය උදාහරණයට අරගෙන මම කරුණු කිව්වා. කෑගල්ලේ තමයි ඒ කාර්යාලය තිබෙන්නේ. දිස්ත්‍රික්කයේ කෙළවරේ ඉන්න කෙනෙකුට ඒක සංකීර්ණයි. ඒක නිසා දැනට අපි ක්‍රමයක් හදලා තිබෙනවා. හැබැයි, ක්‍රමය හැදුවාට ඒ ක්‍රම ප්‍රායෝගික කළ යුතුයි. මම පිළිගන්නවා, ඔබතුමා කියන්න හදන්නේත් ඒක කියලා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(*மாண்புமிகு அஜித் மான்னப்பெரும*)
(The Hon. Ajith Mannapperuma)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒක සද්භාවයෙන් කරපු බව මම පිළිගන්නවා. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ අපට ඔය වාගේ නැතුව ඇයි දිවුරුම් ප්‍රකාශනයක් මඟින් ඒක ලබා ගන්න බැරි? ළමා ඉනිරිකිරීම් ගිණුම්වලින් පවා සියයට පහක් කපනවා. පොඩි ළමයින්ට ආදායමක් ඇත්තේම නැහැ. අපට දිවුරුම් ප්‍රකාශයකින් සහතික කරන්න බැරිද? වර්ෂයෙන්, වර්ෂය දිවුරුම් ප්‍රකාශයක් ලබා දිය යුතුයි, "මගේ ආදායම මෙච්චරයි. වැඩි වුණොත් මම දැනුම් දෙනවා" කියලා. මොකද ඒ පොලියෙන්ම ජීවත් වෙන පුද්ගලයෝ ඉන්න නිසායි මම මේ කාරණය අහන්නේ.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(*மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய*)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියන කාරණාව ඇත්ත. බොහොම සංවේදී කරුණක්, මේක. අපි හැම සතියකම මේ ගැන කථා කරනවා. ජනාධිපතිතුමාගේ දැඩි අවධානයට මේක යොමු වෙලා තිබෙනවා. හැබැයි, ඒක දිවුරුම් ප්‍රකාශයක් වාගේ සරල ක්‍රමයකින් කරන්න බැරි හේතුවක් තිබෙනවා. ඉතා කලාතුරකින් ඒ සිදුවීම් වෙන්න පුළුවන්. වෙනත් අයගේ මුදල් පවා තමන්ගේ ගිණුම්වල තිබෙන පිරිසක් ඉන්නවා. අපිත් එක්ක මේ දවස්වල කටයුතු කරන ජාත්‍යන්තර සංවිධාන සූදානම් නැහැ, බදු එකතු කිරීමේදී නැවත සැරයක් යම්කිසි සිදුරක් හදලා දෙනවාට. අපි මුහුණ දෙන තත්ත්වය ඒකයි. ඒකෙන් අපි අදහස් කරන්නේ නැහැ, මේ රටේ තිබෙන මේ වාගේ සැබෑ ප්‍රශ්නවලට අපි උත්තර සෙවිය යුතු නැහැ කියලා. අපි ඒ සඳහා සූදානම්. මම අද උදේත් මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා එක්ක කථා කළේ, මේකට මීට වඩා සරල, පහසු, සැබෑවට ඒ මිනිසුන්ට ඒ මුදල ආපසු ගත හැකි ක්‍රමයක් හදන්න ඕනෑ කියලා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. බොහෝ අය හිතනවා, මේ සියයට 5 අපි දඩයක් වාගේ තබාගෙන ඉන්නවා කියලා. එහෙම නැහැ. යම්කිසි පුද්ගලයෙක් රුපියල් ලක්ෂයකට වඩා මාසික ආදායමක් ගන්නේ නැත්නම්, අපි රඳවා ගන්නා සියයට 5ක මුදල සැබෑවටම ඔවුන්ට අයිති වෙනවා. ඒ මුදල ආපසු ලබා දීම සඳහා වඩාත් සරල ක්‍රමයක් හදා ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒකට තමයි අපි දැන් මුහුණ දීලා තිබෙන්නේ. ඔබතුමාට තවත් යමක් කියන්න තිබෙනවාද?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(*மாண்புமிகு அஜித் மான்னப்பெரும*)
(The Hon. Ajith Mannapperuma)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියන එක හරි. මේකෙන් අයුතු ප්‍රයෝජන ගන්න අය ඉඳිවී. සියයට 3ක් පමණ සිටින වංචාසහගත පුද්ගලයන් නිසා සියයට 97ක් පමණ වූ නිවැරදි මිනිස්සුන්ට පීඩා විඳින්නට සිදුවෙලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. දිවුරුම් ප්‍රකාශයක් දුන්නාම, ඒකට condition එකක් දමලා, යම් වැරැද්දක් අහු වුණොත් නඩු දමන්න පුළුවන් විධියට කටයුතු කරන්න පුළුවන්. ලොකු ප්‍රමාණයක් නැහැ නේ, බොරු කරන අය. වැඩිහිටි අයට තමයි ජීවත් වීමේදී මේ ප්‍රශ්නය ඇති වෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, දිවුරුම් ප්‍රකාශයක් හරහා මේ කටයුත්ත සරල කරන්න කියලා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(*மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய*)
(The Hon. Ranjith Siyambalapitiya)

ඔබතුමා කියන ආකාරයට දිවුරුම් ප්‍රකාශ වාගේ සරල ක්‍රම පිළිබඳව අපි දීර්ඝව සාකච්ඡා කරලා තිබෙනවා. නමුත් අපි සිටින තත්ත්වයත් එක්ක ඒ වාගේ සරල විසඳුම්වලට යා නොහැකි තත්ත්වයක් තිබෙනවා. අපට ඒ බොහෝ දේවල් ගැන ලෝකයත් එක්ක කථා කරන්න වෙනවා. ඔබතුමා කියන කාරණය ඇත්ත. කිහිප දෙනෙකුගේ ප්‍රශ්නයක් නිසා ගොඩක් දෙනෙකුට හිරිහැරයක් වෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසා අපි ඉතා ගැඹුරින් සොයා බලනවා, ඒක විසඳන්නේ කොහොමද කියලා. දැනට ඒ මුදල ආපහු ගන්න පුළුවන්. ප්‍රශ්නය තිබෙන්නේ ඒ මුදල ගන්න තිබෙන ක්‍රමය සංකීර්ණ වැඩි වීමයි. අන්න ඒ සංකීර්ණ ක්‍රමය වඩාත් සරල කරලා, නැවතත් බදු අහිමි වීමේ සිදුරක් එතැන ඇති නොකිරීමට කටයුතු කිරීම සඳහා අපි ඉක්මන් වැඩ පිළිවෙළක් යොදන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අංක 2360/52 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවා තිබෙනවා. යෝගට්, වෙඩරු, කිරිවලින් නිපදවූ තැවරුම්, රටඉදි වැනි ද්‍රව්‍ය 11ක් සඳහා නොවැම්බර් මස 30 දක්වා තිබූ බද්ද තව දුරටත් දීර්ඝ කිරීමක් තමයි මේ නියමය හරහා සිදු කරන්නේ. එමඟින් බලාපොරොත්තු වන්නේ දේශීය නිෂ්පාදන ආරක්ෂා කිරීමයි. අපි ඒක මේ අවුරුද්දේ දෙසැම්බර් මාසය දක්වා පමණයි දීර්ඝ කරන්නේ. ඉන් පසුව, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වෙනුවට වෙනත් බදු ක්‍රමයක් හඳුන්වා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(*மாண்புமிகு அஜித் மான்னப்பெரும*)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(*மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய*)
(The Hon. Ranjith Siyambalapitiya)
මගේ වෙලාව අඩු වෙනවා නේ, ගරු මන්ත්‍රීතුමනි. එහෙම නම් මම ඔබතුමාගේ වෙලාවෙන් ගන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා, කෙටියෙන් අහන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(*மாண்புமிகு அஜித் மான்னப்பெரும*)
(The Hon. Ajith Mannapperuma)
මම කෙටියෙන් අහන්නම්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් මාස 6කට ඉස්සෙල්ලා මේ ගැන ඇහුවාම ඔබතුමා කිව්වා, ක්‍රමයක් සකස් කරලා refund කරනවා කියලා. ඔබතුමා දැන් ඒ සඳහා ක්‍රමයක් හදන්න ඇති. හැබැයි, ඒක ජනතාවට ප්‍රායෝගික දෙයක් වුණේ නැහැ. ඒකයි ප්‍රශ්නය. මේ ගැන හැමදාම

කථා කර කර ඉන්නවා වෙනුවට, මාසයක් ඇතුළත සරල ක්‍රමයක් නිර්මාණය කරනවා කියලා ඔබතුමාට කියන්න බැරිද? එහෙම නැති වුණොත් හරි ක්‍රමයක් එනතුරු තව අවුරුදු කීයක් අපට බලාගෙන ඉන්න වෙයිද?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම එච්චර සරල නැහැ. මේක සංවේදී කරුණක්. මම ඒක පිළිගන්නවා. හැබැයි, රාජ්‍ය ආදායම අපතේ යන්නේ නැති විධියට, අපි ගන්නා තීරණය නිසා යමෙකුට වැරැද්දක් කරන්න ඉඩ නොලැබෙන විධියට තමයි අපි නීතියක් හදන්න ඕනෑ. ඒ ගැටලුවට තමයි අපි මුහුණ දීලා තිබෙන්නේ. අපි මේ ප්‍රශ්නයේ තිබෙන ගැඹුරු බව, අසීරුතාව ඉතාම බරපතළ විධියට තේරුම්ගෙන තිබෙනවා. මගේ හැම සාකච්ඡාවක දීම මේ කාරණය අංක එකට අරගෙන තිබෙනවා. ජනාධිපතිතුමාත් ඒ වාගේමයි. බදු අහිමි වීමේ අලුත් සිදුරක් ඇති නොවීමේ වගකීම අපට භාර දීලා තිබෙනවා. මේ වෙලාවේ අපට මූල්‍යමය වශයෙන් උපදෙස් දෙන, ආධාර දෙන හැම කෙනෙකුම බලනවා, අපේ රාජ්‍ය ආදායම නැවත වතාවක් පහළට වැටෙන්න දෙන්නේ නැතිව, අලුත් සිදුරු ඇති කර ගන්නේ නැතිව අපි කටයුතු කරන්නේ කොහොමද කියලා. මෙන්න මේ ප්‍රශ්නත් එක්ක අපි ඒකට උත්තරයක් හොයනවා.

ඒ වාගේම අංක 2365/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ අපි 2023.12.14 දින සහල් ගෙන ඒමට කටයුතු කළා. මොකද, සහල් හිඟයක් ඇති වෙලා, වෙළඳ පොළේ මිල වැඩි වීමක් සිදු වුණා. ඒ නිසා සහල් මෙට්‍රික්ටොන් 50,000ක් පිටරටින් ගෙනෙන්න කටයුතු කළා. හැබැයි, දැන් සහල් ගෙන්වීම නවත්වලා තිබෙනවා. මොකද, නැත්නම් අලුත් කලබලයක් ඇති වේවි. ඒ ගැසට් එක අනුමත කර ගැනීම විතරයි අද කරන්නේ. දැන් ඒ සහල් ගෙන්වලාත් ඉවරයි, වෙළඳ පොළට දමලාත් ඉවරයි. සහල් අලුතින් ආනයනය කරන්නේ නැහැ.

ඒ වාගේම 2024 ජනවාරි 07වැනි දින අංක 2365/84 අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අර්තාපල් සඳහා රුපියල් 50ක විශේෂ බද්දක් පනවලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකාර්මික ප්‍රදේශයක ජනතා නියෝජිතයෙකු හැටියට ඔබතුමා දන්නවා, අපි එහෙම කළේ අපේ අර්තාපල් ගොවියා ආරක්ෂා කර ගැනීම සඳහා කියලා. ඒක දිගටම පවත්වාගෙන යන්න කියලා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් තිබෙනවා. ආනයනික අර්තාපල් සඳහා අය කරන රුපියල් 50ක බද්ද තවදුරටත් දීර්ඝ කර ගැනීමක් තමයි මෙම ගැසට් පත්‍රයේ සඳහන් නියමය මඟින් කරන්නේ.

ප්‍රධාන වශයෙන්ම අපේ දේශීය ගොවියා ආරක්ෂා කිරීම තමයි අපේ බලාපොරොත්තුව වෙන්නේ. ඒ වාගේම බඩ ඉරිඟු, උඳු, මුං සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් පනවා තිබුණා. බලපත්‍රයක් මඟින් පමණක් ආනයනය කිරීමේ දී උඳු කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 300ක, මුං ඇට කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 300ක, බඩ ඉරිඟු කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 25ක, කව්පි කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 300ක, කුරක්කන් සහ අනෙකුත් ධාන්‍ය වර්ගවලට ගැනෙන මිලට කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 300ක බද්දක් අය කරනවා. ඒ සම්බන්ධවයි මේ ගැසට් එක ගෙනෙන්නේ. හැබැයි, පසුගිය දා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් වුණා බලපත්‍ර අහෝසි කරලා, ශාක නිරෝධායන පනත යටතේ නිශ්චිත බද්දක් ගෙවලා - විශේෂයෙන්ම අපේ රටේ ගොවියා ආරක්ෂා වන පරිදි නිශ්චිත බද්දක් ගෙවලා - මේවා ගෙන්වීමට අවශ්‍ය අයට ඉඩ දෙන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ හැම එකකම අංක එක හැටියට අපි ගන්නේත්, අපේ රටේ ගොවියා ආරක්ෂා වන විධියේ බද්දක් තුළ පමණයි මෙවැනි ආදේශන තිබෙන භාණ්ඩ ගෙන ඒමට අපි ඉඩ දෙන්නේත්.

ඊළඟට, 2024 මාර්තු 01 දිනැති අංක 2373/42 දරන ගැසට් නිවේදනයේ පළ කර ඇති නියමය. සාමාන්‍යයෙන් අපි රට ඉඳි කිලෝවක් සඳහා රුපියල් 200ක බද්දක් අය කරනවා, ලංකාවට ගෙනෙද්දී. රාමසාන් සමයේ මුස්ලිම් බැතිමතුන් වෙනුවෙන් අපි ඒක රුපියල දක්වා අඩු කළා. උත්සව සමයෙන් පස්සේ ඒ සහනය නැහැ. නමුත්, ඒ ගැසට් එකත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම තමයි අද සිද්ධ වෙන්නේ.

ඒ වාගේම මේ රටේ සමස්ත ප්‍රජාවගෙන් අති බහුතරයකට සමාජ සුබසාධනය සම්බන්ධයෙන් වැදගත් වූ වෙනස්කම් කිහිපයක් අද විශේෂයෙන්ම ඉදිරිපත් වුණා. අපේ රටේ පවුල් 57 ලක්ෂයක් ඉන්නවා. සමාජ සුබසාධන අවශ්‍යතාවක් තිබේද කියලා විමසීම් කළ වහාම 33ලක්ෂයක් මේ සඳහා ඉදිරිපත් වුණා. එය පවුල්වලින් හරි අඩකටත් වඩා - සියයට 60ක - ප්‍රමාණයක්. මෙන්න මේ ප්‍රජාවට උදව් කිරීමේ දී විශේෂයෙන්ම ජනාධිපතිවරයා මුදල් අමාත්‍යවරයා ලෙස ඉතා සෘජු, අභියෝගාත්මක තීන්දු කිහිපයක් ගත්තා. ඒ තමයි, ලක්ෂ 16ක් වෙච්ච ප්‍රතිලාභීන් ලක්ෂ 24ක් දක්වා වැඩි කිරීම, රුපියල් 4,500ක දීමනාවක් ගත්ත ප්‍රතිලාභියාට රුපියල් 15,000 දක්වා වැඩි කිරීම, වාර්ෂිකව රුපියල් බිලියන 50ක්, 60ක් වූ වියදම බිලියන 183ක් දක්වා වැඩි කිරීම. එවැනි දැවැන්ත පියවර රාශියක් ගත්තා. මෙතැනදී අපි මුහුණ දුන් අභියෝගය තමයි, නුසුදුස්සන්ට ඒ සහන යෑම වැළැක්වීම. සමෘද්ධි ව්‍යාපාරය ඉතා හොඳ ව්‍යාපාරයක්. ඒ හරහා සෑහෙන්න සේවයක් ඉෂ්ට වුණා. හැබැයි, අවසානයේ ලෝකයෙන්ම ලැබුණු චෝදනාව තමයි, නුසුදුස්සන් පිරිසකට ඒ ප්‍රතිලාභ යනවා කියන එක. ඒ වාගේම කෙනෙක් ඇති හැකි අයෙක්, ශක්තිමත් අයෙක් බවට පත් කරන්න ප්‍රමාණවත් මුදලක් මෙතැනින් ලැබෙනවාද කියන ප්‍රශ්නයත් තිබෙනවා. මේකට පිළියම් යෙදීමට කටයුතු කිරීමේ දී, සුදුස්සන් තෝරා ගැනීමේ දී රජය අභියෝග රාශියකට මුහුණ දුන්නා. අද මේ වැඩසටහන ක්‍රියාත්මක කරද්දීත් අපි දන්නවා අඩුපාඩු තිබෙනවා කියලා. ගමට ගියත් අඩුපාඩු පෙන්වා දෙනවා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියත් අඩුපාඩු පෙන්වා දෙනවා. මේක පුදුමයක් නොවෙයි. මෙය 1995 සිට අවුරුදු 30ක් තිස්සේ ක්‍රියාත්මක වුණු ක්‍රමයක්. මේක ඇඟට ජීරණය වෙලා තිබෙන්නේ. ඒ ප්‍රජාව වෙන්න පුළුවන්, දේශපාලන අධිකාරිය වෙන්න පුළුවන්, නිලධාරීන් වෙන්න පුළුවන්. මෙවැනි ක්‍රමයක් වෙනස් කිරීමේ දී ඇති වන ගැටලුවලට තමයි අපි මුහුණ දීලා තිබෙන්නේ. දැන් අපි පියවරෙන් පියවර ඒවා නිවැරදි කරගෙන යනවා. තවදුරටත් නුසුදුස්සන්ට මේ සහන යෑම වැළැක්වීම සඳහා, සුදුස්සන්ට නොලැබීමට පිළිතුරු සෙවීම සඳහා වඩාත් වේගවත් වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරගෙන යනවා. විශේෂයෙන්ම ඒ අභියාචනයක් සලකා බැලීමේදී ඒ සඳහා ගත වන කාලය වැඩියි. ඒ සඳහා පත් කළ කමිටුවලට නම්‍යශීලිභාවයකින් යුත් නිලධාරීන් පත් කර ගැනීමට අවශ්‍යයි. නිර්ණායක මත බර තැබීම ගැන කථා කළොත්, සමහර බර තැබීම් අපේ සමාජයට ගැළපෙන්නේ නැහැ. ඒ තුළින් සුදුස්සන් ගිලිහී යෑමක් සිද්ධ වුණා. මේ කාරණාවලට උත්තර හොයන්න අවශ්‍ය වෙනස්කම් තමයි අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙන්නේ. මේ සුවිශේෂ වැඩ පිළිවෙළ වඩාත් නිවැරදි කර ගැනීමට අප සියලුදෙනාට මේ තුළින් අවස්ථාවක් සැලසේවි කියලා මම හිතනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විශේෂයෙන් මේ දිනවල වැඩියෙන් කථා වන මාතෘකාවක් තමයි, වාහන ආනයනය. අපි මේ පිළිබඳවත් ඉතාම සැලකිල්ලෙන් කටයුතු කරගෙන යනවා. ආනයන 2,000ක් නවත්තලා තිබුණු රටක වාහන ආනයනය කිරීම පමණයි දැන් නවත්වලා තිබෙන්නේ. ඒවාත් අවශ්‍යතාව මත ගෙන්වන්න

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

දෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැනටත් අපි සංචාරක කර්මාන්තයට අවශ්‍ය වාහන ගෙන්වන්න ඉඩ දීලා තිබෙනවා. මේවායේ හැම පැත්තක්ම තිබෙනවා. පොදු ප්‍රවාහනය සඳහා භාවිත කරන, සාමාන්‍ය ජනතාව භාවිත කරන වාහන, වඩාත් luxury වාහන තිබෙනවා. මේවායේ අවශ්‍යතාව අනුව කටයුතු කරන්න ඕනෑ.

ශ්‍රී ලංකාව තුළ වාහන එකලස් කරන කණ්ඩායම පසුගිය දා මාව මුණ ගැහුණා. ඒ සඳහා 30දෙනෙක් ලියාපදිංචි වෙලා ඉන්නවා, ආයතන 14කට අයත්.

ඔවුන් පෙන්වා දුන් ආකාරයට වාහන ගෙන්වන්නේ නැති කාලයේත් මෝටර් බයිසිකල් 38,144ක් සහ මෝටර් වාහන 6,286ක් එකලස් කරලා ඔවුන් රටට දාලා තිබෙනවා. ඔවුන්ගේත් ඉල්ලීමක් තිබෙනවා, අපි මේ ගන්න හැම තීරණයකදීම ඔවුන් පිළිබඳවත් බලන්න කියලා. කවදාද වාහන ගෙන්වන්නේ, කවදාද වාහන ගෙන්වන්නේ කියන එක නිතිපතා අහන ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණාවේදී ඉතා ගැඹුරු විශ්ලේෂණයක යෙදිලා, මේ සියලු පාර්ශ්වයන්ගේ අවශ්‍යතා බලලා තමයි අපට කටයුතු කරන්න වෙලා තිබෙන්නේ. මොකද, අපි එකවරක් වැටුණු වළක තවත් වරක් නොවැටිය යුතු නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අර මුලින් අහපු, අද දවලුත් කථා වෙච්ච කාරණාව ගත්තාම, මම පැහැදිලිව කියනවා, රජයට කිසිසේත්ම සුරාව වර්ධනය කිරීමේ අවශ්‍යතාවක් නැහැ කියලා. ඒ නිසා තමයි, අපි අවුරුද්දක් තුළ සුරා මිල සියයට 108කින් වැඩි කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන් වෙනවා, ගරු ඇමතිතුමනි.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(මාණ්පුමිකු රන්ජිත් සියම්බලාපිටිය)
(The Hon. Ranjith Siyambalapitiya)
මම කථාව අවසන් කරනවා. මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මිල වැඩිවීම නිසා සියයට 19කින් මත්පැන් අලෙවිය අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම වාර්ෂික බලපත්‍ර ගාස්තුවත් දහ ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. ප්‍රථම වතාවට මේ ර.බී. 4 කියන බලපත්‍රයට රුපියල් කෝටි එකහමාරක ගාස්තුවක් අපි අය කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි හැම දේකින්ම අපි බලාපොරොත්තු වෙන්නේ එක පැත්තකින් අනීතික සුරාව මැඩලීම සහ අනෙක් පැත්තෙන් නීතික සුරාවත් අධෛර්යවත් කිරීමයි. මේ සම්බන්ධව විවිධ විධියට විරෝධතා එනවා. මේ විරෝධතා අපි සැලකිල්ලට භාජන කරනවා. මේ විරෝධතාවලදී සමහර දේවල් සාධාරණයි. නමුත් සමහර විරෝධතා තිබෙනවා, මත්පැන් අලෙවිකරුවා විසින් නිර්මාණය කරන. ඒ අතර තවත් සමහර දේවල් තිබෙනවා, අනීතික මත්පැන් අලෙවිකරුවා විසින් නිර්මාණය කරන. මේ සියල්ල ගැනම සලකා බලා ඉල්ලුම්පත්‍ර 1,400කින්, 400කට විතරයි අපි බලපත්‍ර දීලා තිබෙන්නේ. ඇයි ඒ? බලපත්‍රයක් දීම සම්බන්ධව යම්කිසි විරෝධතාවක් එනවා නම්, අපි ඒවා ගැන ඉතා ගැඹුරින් සොයා බලා තමයි එම බලපත්‍රය දෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම නැත්නම් අපි ඒක අවලංගු කරනවා. ඒකේ කිසිම ගැටලුවක් නැහැ. හැබැයි මොන වාගේ විරෝධතාවක් ආවත්, රජයට කටයුතු කරන්න වෙලා තිබෙන්නේ නීතිමය පද්ධතිය තුළ පැන නැහෙන ඒ විරෝධතාව සාධාරණද කියා සොයා බලායි. නැත්නම් ඔහු උසාවි යනවා, මානව හිමිකම් කොමිසමට යනවා. අන්න ඒ නිසා කිසිම විටක මත්පැන් ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවක් රජයට නැහැ කියන කාරණාව කියමින් මේ වෙලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු එස්. නෝගරාදලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිදි) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විඩුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනාරූඪ විය.
අදන්පිරගු, මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු (මේජර්) සුදර්ෂන තෙනිපිටිය අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.
Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA took the Chair.

[ප.ප. 1.33]

ගරු සු. නෝගරාදලිංගම් මහතා
(මාණ්පුමිකු சு. நோகராதலிங்கம்)
(The Hon. S. Noharathalingam)
නන්ඩ්‍රි, කෞරව තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළේ! இன்றைய விவாதத் தலைப்புக்குள் செல்வதற்கு முன்னர், අණ්මෛයිල් නටන්තු මුටින්ත ඉන්දිය පොතුත් තේර්තල් පට්‍රිප් පේසලාමෙන නිනෛක්කින්‍රේන්. இந்தியா என்பது, மிகப் பெரியதொரு ஜனநாயக நாடு! சுமார் 1,400 மில்லியன் மக்களைக்கொண்ட அந்த நாட்டில் மிகப் பெரியதொரு ஜனநாயகத் தேர்தல் திருவிழா நடந்தேறியிருக்கின்றது. அதன் முடிவுகளின்படி, நரேந்திர மோடி அவர்கள் மூன்றாவது தடவையாகவும் இந்தியாவின் பிரதமராக இன்னும் ஓரிரு நாட்களில் பதவியேற்க இருக்கின்றார். அவருக்கும் அவருடைய பங்காளிக் கட்சிகளுக்கும் ஈழத் தமிழ் மக்களின் சார்பில் வாழ்த்துக்களைத் தெரிவிக்கின்றேன். அதேபோல், தமிழ் நாட்டில் மிகப் பெரியதொரு சாதனை வெற்றியைப் பெற்றுக்கொண்ட திராவிட முன்னேற்றக் கழகத்துக்கும் அதனுடைய தலைவரும் தமிழ் நாட்டின் முதலமைச்சருமான மு.க. ஸ்டாலின் அவர்களுக்கும் அதன் கூட்டுக் கட்சிகளுக்கும் ஈழத் தமிழ் மக்கள் சார்பில் எனது வாழ்த்துக்களைத் தெரிவிக்கின்றேன்.

உலகின் மிகப் பெரியதொரு ஜனநாயக நாடாகவும், தேர்தல்களை உரிய காலத்தில் நடாத்துகின்ற ஒரு நாடாகவும்

இந்தியா விளங்குகின்றது. ஆனால், எமது நாட்டில் துரதிருஷ்டவசமாக எந்தத் தேர்தலும் உரிய காலத்தில் நடாத்தப்படுவதில்லை. மிகவும் வெட்கப்படக்கூடிய அளவுக்கு தேர்தல்கள் காலந்தாழ்த்தப்படுகின்றன. உரிய காலத்தில் தேர்தல்களை நடாத்துகின்ற விடயத்தில் கடந்த கால ஆட்சியாளர்கள் அனைவரும் தோல்வியடைந்தவர்களாகவே இருக்கின்றார்கள்.

இப்பொழுதுகூட, தேர்தல்கள் உரிய காலத்தில் நடாத்தப் படுமா, இல்லையா? முதலில் எந்தத் தேர்தல் நடைபெறப் போகின்றது? என்பதை அறிய முடியாமல் இருக்கின்றது. ஏனென்றால், இங்கு எந்தத் தேர்தல் எப்போது நடாத்தப்பட வேண்டும் என்பதை இந்த நாட்டின் ஜனாதிபதி அல்லது அரசியல்வாதிகள்தான் தீர்மானிக்கின்றார்கள். இங்கிருக்கின்ற தேர்தல் ஆணைக்குழு தேர்தலைத் தாங்கள்தான் நடத்துவோம் என்ற உறுதியான நிலைப்பாட்டில் இல்லாத ஒரு நிலைமை இருக்கின்றது. இந்தியா பிராந்திய வல்லரசாக இருக்கின்றது; ஜனநாயகத்தில் முழுமையான நம்பிக்கைகொண்டிருக்கிறது. தேர்தல் ஊடாகத்தான் ஜனநாயகம் நிலைநாட்டப்படுகின்றது. எமது நாடு தேர்தல் விடயத்தில் தோல்வியடைந்த ஒரு நாடு என்பதை நாங்கள் ஏற்றுக்கொண்டே ஆகவேண்டும்.

தமிழ் நாட்டில் மு.க. ஸ்டாலினின் ஆட்சியே நிலவுகின்றது. அங்கு முகாம்களில் ஏதிலிகளாக - அகதிகளாக - இருக்கின்ற ஈழத் தமிழ் மக்கள் வாக்களிக்கின்ற தகுதியைப் பெறா விட்டாலும்கூட, அவர்களை அரவணைத்து, அவர்களுக்குரிய சமூக மேம்பாட்டுத் திட்டங்களை ஏற்படுத்தி, அவர்களுக்குரிய வாழ்க்கை முறையை அவர் அமைத்துக் கொடுத்துக்கொண்டு இருக்கின்றார். அங்கு அம்மக்களுக்கு வாக்குரிமை இல்லையென்று தெரிந்தும்கூட, அந்த மக்களைச் சிறப்பான கவனிப்பினூடாக அணைத்துச் செல்கின்ற சிறந்ததோர் ஆட்சியை அவர் மேற்கொள்கின்றார். ஒட்டுமொத்த அந்த மக்களும் திராவிட முன்னேற்றக் கழகத்தின் அல்லது மு.க. ஸ்டாலின் அவர்களுடைய ஆட்சியில் நம்பிக்கைகொண்டு, மீண்டும் அந்த ஆட்சிக்கு ஆதரவான ஒரு நிலைப்பாட்டை எடுத்திருக்கிறார்கள். இது பாராட்டப்படவேண்டிய விடய மாகும்.

ஆனால், இலங்கையில் எந்த கட்சி ஆட்சிக்கு வந்தாலும், சிறுபான்மை மக்கள்மீது குறிப்பாக, எங்களுடைய தமிழ் மக்கள்மீது இன ரீதியான, மத ரீதியான, மொழி ரீதியான பாகுபாடு காட்டப்படுகின்றது. இன்னமும் தமிழ் மக்களின் அரசியல் பிரச்சினைக்கு நிரந்தரத் தீர்வைக் காண்பதற்கு முயற்சி செய்யாமல், இனப் பிரச்சினையைத் தீர்ப்பதற்குத் தீர்க்கமானதொரு முடிவை எடுக்காமல், கடந்த கால அரசாங்கங்களும் நிகழ்கால அரசாங்கமும் தொடர்ந்து தமிழ் மக்களை ஏமாற்றி வருகின்ற நிலைமையே இருந்துகொண்டு இருக்கின்றது. எப்பொழுது நீங்கள் தமிழ் மக்களின் பிரச்சினைக்கு நிரந்தரமானதொரு தீர்வைக் காணப் போகின்றீர்கள்? இந்த நாட்டில் தொடர்ந்தும் தமிழ் மக்கள் ஓர் அடிமைப்பட்ட சமூகமாக இருக்க வேண்டுமென நீங்கள் எதிர்பார்க்கின்றீர்களா? நீங்கள் தமிழ் மக்களுக்கு எந்தத் தீர்வை வழங்குவதற்குத் தயாராக இருக்கின்றீர்கள்? என நான் எதிர்வரும் தேர்தலில் போட்டியிட இருக்கின்ற வேட்பாளர்களைப் பார்த்துக் கேட்கின்றேன். பெரும்பான்மை மக்களுடைய வாக்குகளை இழந்துவிடுவோம் என்ற அவநம்பிக்கையில் தமிழ் மக்களுக்கான தீர்வை வழங்குவதற்கு அல்லது அவர்களுக்குப் பிரச்சினைகள் இருக்கின்றன என்பதை ஏற்றுக்கொள்வதற்கு நீங்கள் தயங்குகின்றீர்கள். அம்மக்களுக் குத் தீர்வை வழங்கினால், அவர்களுக்குப் பிரச்சினைகள் இருக்கின்றன என்பதை ஏற்றுக்கொண்டால், ஆட்சியை இழக்க நேரிடுமென நீங்கள் பயப்படுகின்றீர்கள். இந்த நிலைமை மாற வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் இந்தியப் பிரதமரின் பதவிப்பிரமாண நிகழ்வில் கலந்து கொள்ள இருப்பதாக நான் ஊடகங்கள் வாயிலாக அறிந்தேன். இந்தியப் பிரதமராகப் பதவியேற்க இருக்கின்ற நரேந்திர மோடி அவர்கள், தமிழ் மக்களுக்கு நம்பிக்கை ஊட்டக்கூடியதொரு செய்தியை மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் சொல்வார் என்ற பாரிய எதிர்பார்ப்பு தமிழ் சமூகத்திடம் இருக்கின்றது. அது நிறைவேற வேண்டும். இலங்கை வாழ் தமிழ் மக்களின் பிரச்சினைக்குத் தீர்வு காண்பதற்கு அல்லது தமிழ் மக்களுடைய தேசிய அபிலாஷைகளை நிறைவேற்றக்கூடிய வகையில், இனப் பிரச்சினைக்கு அரசியல் ரீதியாக நிரந்தரத் தீர்வொன்றை எட்டுவதற்குப் பொருத்தமான அழுத்தங்களை வழங்க வேண்டுமென நான் இந்தியாவிடம் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

நலன்புரி நன்மைகள் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதம் நடைபெறுகின்ற இந்தச் சந்தர்ப்பத்தில் நான் இங்கு இன்னுமொரு விடயத்தைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். குறிப்பாக, எமது மாவட்டம் சார்ந்த சில விடயங்களை நான் இங்கு சொல்லவேண்டி இருக்கின்றது. அண்மையில் முன்னாள் போராளிகள் இணைந்து, தங்களுடைய நலன்புரி சம்பந்தப்பட்ட விடயங்களுக்கென சமூக மட்டத்தில் ஏற்றுக்கொள்ளப்பட்ட சங்கமொன்றை உருவாக்கி, அதனூடாகப் பல்வேறு உதவித் திட்டங்களை முன்னெடுத்து வந்தார்கள். அதாவது, அவர்கள் தங்களுடைய குடும்ப மேம்பாட்டுக்காகவும், தங்களுடைய குடும்பப் பிரச்சினைகளைப் பேசுவதற்காகவும், தங்களுடைய வாழ்வாதாரத்துக்காகவும், தங்களுடைய முன்னேற் றத்துக்காகவும் நலன்புரிச் சங்கம் ஒன்றை அமைத்துச் செயற்பட்டுக்கொண்டு இருந்த வேளையில், அந்தச் சங்கத் தைச் சார்ந்த முன்னாள் போராளியான அரவிந்தன் என்பவர் கைதுசெய்யப்பட்டு இருக்கின்றார். முன்னாள் போராளிகள் தங்களுடைய தேவைகளை இனங்கண்டு, நலன்புரி சார்ந்த சங்கமொன்றை அமைத்து, தங்களதும் தங்களது குடும்பங்களினதும் மேம்பாட்டுக்காகப் பல்வேறு திட்டங்களை முன்னெடுத்து வருகின்ற இந்த நேரத்தில், அவர்களைக் கைதுசெய்வதை நாங்கள் பொருத்தமானதொரு விடயமாகப் பார்க்கவில்லை. இச்செயற்பாடு நிறுத்தப்பட வேண்டும்.

முன்னாள் போராளிகள் தங்களுடைய நலன்புரி சார்ந்த விடயங்களுக்காகவோ அல்லது வேறு விடயங்களுக்காகவோ அணியாக, ஒற்றுமையாக ஓர் அமைப்பு சார்ந்து செயற்படுவதை நீங்கள் சந்தேகக் கண்கொண்டு பார்ப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. இது உடன் நிறுத்தப்பட வேண்டும். அவர்களுடைய வாழ்வாதாரத்துக்காக, சமூக மேம்பாட்டுக்காக, அவர்கள் வேறுபாட்டை உணராத வகையில் இந்தச் சமூகத்தோடு சேர்ந்து வாழ்வதற்காக அவர்களுக்கு வழிவகைகளைச் செய்து கொடுக்கவேண்டிய கடப்பாடு அரசாங்கத்துக்கு இருக்கின்றது. அது நிச்சயமாகச் செய்யப்பட வேண்டுமென்று இந்த நேரத்தில் நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

குறிப்பாக, எங்களுடைய பிரதேசங்களிலே காணிப் பிரச்சினை ஒரு தீராப் பிரச்சினையாக இருந்துகொண்டு இருக்கின்றது. காணிப் பிரச்சினை தீர்க்கப்படும் பட்சத்தில் மீதிப் பிரச்சினை பாரியதொரு பிரச்சினையாக இருக்காது. அங்கு காணிப் பிரச்சினைதான் தொடர்ந்தேர்ச்சியாக பாரிய

[ගරු සු. නෝගරාදලිංගම් මහතා]

பிரச்சினையாக இருந்துகொண்டு இருக்கின்றது. நேற்றும் நேற்று முன்தினமும் மாந்தை கிழக்கு பிரதேச செயலகப் பிரிவுக்குட்பட்ட பொதுமக்களுடைய விவசாய, குடியேற்றக் காணிகளிலே வன இலாகாவினர் எல்லைக் கற்களையிட்டு, அது தங்களுடைய பிரதேசம் என மீண்டும் புதிய விடயத்தைக் கையாளுகின்ற நிலைமை இருக்கின்றது. அண்மையிலே மாண்புமிகு ஜனாதிபதி அவர்கள் வடக்குக்கு விஜயம் மேற்கொண்டபோது, ஆயிரக்கணக்கான ஏக்கர் நிலங்களை விடுப்பதாக உறுதியளித்திருந்தார். அதற்கு முன்னரும் பல பிரதேசங்களில் உள்ள காணிகள் விடுவிக்கப்பட்டன. ஒருபுறம் காணி விடுவிப்பு நடந்துகொண்டு இருப்பதாக மாயை காட்டிக்கொண்டு, மறுபுறம் வன இலாகாவினரும் சம்பந்தப்பட்ட ஏனைய திணைக்களத்தினரும் பாதுகாப்புத் தரப்பினரும் மீண்டும் தமிழ் மக்களுடைய காணிகளை கபளீகரம் செய்கின்ற அல்லது பிடிக்கின்ற நிலைமை அங்கிருக்கின்றது. மாந்தை கிழக்குப் பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட அம்பாள்புரம் மற்றும் வன்னிவிளாங்குளம் ஆகிய பிரதேசங்களைச் சேர்ந்த மக்களுடைய கணிகளை நேற்றும் அதற்கு முன்னைய தினமும் வன இலாகாவினர் பிடித்து, அங்கு எல்லைக் கற்களையிட்டுள்ளனர். இப்படி இருக்கும்போது நீங்கள் எதற்காக காணிகளை விடுவிப்பதாகச் சொல்கின்றீர்கள்?

எங்களுடைய மாவட்ட ஒருங்கிணைப்புத் தலைவர் அவர்கள் நேற்று முன்தினம் இங்கே பேசுகின்றபோது, ஜனாதிபதி ஆயிரக்கணக்கான ஏக்கர் நிலங்களை விடுவித்துக் கொண்டு இருக்கும் பட்சத்தில் அங்குள்ள பிரதேச செயலகத் தினதும் மாவட்ட செயலகத்தினதும் சில உத்தியோகத்தர்கள் அதற்குத் தடையாக இருப்பதாகக் குற்றம் சாட்டியிருந்தார். உண்மையிலே மாவட்ட ஒருங்கிணைப்புக் குழுத் தலைவர் கூறியதுபோல, அங்கே அவ்வாறு நடைபெறுவதாகவிருந்தால் அப்படி குற்றச்செயல்களில் ஈடுபடுகின்ற அதிகாரிகள் யார் என இங்கே அவர்களது பெயரைக் குறிப்பிட்டுச் சொல்ல வேண்டும். அதைவிடுத்து, ஒட்டுமொத்த அதிகாரிகள்மீதும் குற்றம் சுமத்துவது ஏற்றுக்கொள்ள முடியாத விடயமாகும். பிரதேச செயலகத்தினுடைய அல்லது மாவட்டச் செயலகத் தினுடைய எந்த அதிகாரி காணி விடுவிப்பு விடயங்களில் தவறிழைக்கின்றாரோ, அவருடைய பெயரை இங்கே குறிப்பிட வேண்டும். அப்படிச் சொல்லாமல், சிறப்பாகக் கடமைகளைச் செய்கின்ற அதிகாரிகளையும் சேர்த்து குற்றம்சாட்டுவதை ஏற்றுக்கொள்ள முடியாது. ஆகவே, இந்த விடயத்திலே மிகவும் கவனமாக இருக்க வேண்டும்.

நான் இங்கே இன்னுமொரு விடயத்தைச் சொல்கிறேன். ஆறு மாதங்களுக்கு முன்னர் கடும் மழை காரணமாக தேராவில் குளம் நிரம்பியதால் அந்த குளத்திலிருந்து மேலதிக நீரை வெளியேற்றவேண்டிய நிலைமை இருந்தது. இதனால் சுமார் 15 - 20 குடும்பங்கள் வெள்ளத்தால் தத்தளித்துக்கொண்டு இருந்தன. அங்குள்ள ஒரு வீட்டில் மரணம் ஏற்பட்டபோதுகூட, அந்த மரணச் சடங்குகளை அந்த வீட்டில் வைத்துச் செய்ய முடியாமல் இருந்தது. அந்தக் குளத்தில் இருந்து மேலதிக நீரை வெளியேற்றுவதற்குப் பாரிய செலவாகுமென்பதால் 'லைக்கா' நிறுவனம் அதற்காக நிதி ஒதுக்கீடு செய்திருந்தது. ஆனால், இன்றுவரை அந்த மேலதிக நீரை வெளியேற்றும் திட்டம் பூர்த்தி செய்யப்படவில்லை. அதற்கு வன இலாகாவினர் தடையாக இருக்கின்றார்கள். குறிப்பிட்ட மரங்களை வெட்டி அங்கிருந்து அகற்ற வேண்டும் என்ற நிலைப்பாடு இருக்கின்றது. அங்கிருக்கின்ற சில திணைக்களங்கள் செய்கின்ற தவறின் காரணமாக அந்தக் குளத்தின் மேலதிக நீரை வெளியேற்றாததால் அங்கு நீரேந்துப் பகுதிகளிலே இருக்கும் மக்கள் 6 மாதங்களாகியும் மீளக்குடியேற முடியாத துர்ப்பாக்கிய நிலையில் இருக்கிறார்கள். வன இலாகாவினர் அதைச் செய்யாது காலங்கடத்துகின்றார்கள். மேலதிக நீர் வெளியேற்றும் நடவடிக்கைக்கு வன இலாகாவினர் மிக மோசமான இடையூறுகளை ஏற்படுத்திக்கொண்டு இருக்கின் றார்கள். இந்த விடயத்திலே அரசாங்கம் என்ன நிலைப் பாட்டை எடுத்திருக்கின்றது?

இங்கே வெள்ள நிலைமை பற்றிப் பேசுகின்றார்கள். தெற்கிலே வெள்ளம் என்றால் உடனடியாக நிவாரணங்கள் வழங்கப்படுவதோடு, தேவையான நடவடிக்கைகளும் உடனடி யாக முன்னெடுக்கப்படுகின்றன. ஜனாதிபதி அவர்களும் தேவையான உத்தரவுகளைப் பிரப்பிக்கின்றார். ஆனால், எங்களுடைய மக்களைப் பாரபட்சமாக நடத்துகின்ற நிலைமையை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now. Your time is over.

ගරු සු. නෝගරාදලිංගම් මහතා
(மாண்புமிகு சு. நோகராதலிங்கம்)
(The Hon. S. Noharathalingam)
Please give me one more minute, Sir.

முல்லைத்தீவு மாவட்டத்திலே தேராவில் குளத்து நீரை 6 மாதங்களாகியும் அகற்ற முடியவில்லை. அங்கே அந்த மக்கள் தத்தளித்துக்கொண்டிருக்கிறார்கள். பல்வேறு இன்னல்களுக் கும் இடைஞ்சல்களுக்கும் அவர்கள் உள்ளாகின்றார்கள். ஆகவே, இந்த விடயத்துடன் உடனடியாக மாவட்டச் செயலகம் தொடர்புபட்டு, சம்பந்தப்பட்ட அதிகாரிகள் அந்த நீரை வெளியேற்றுவதற்கான வழிவகைகளை கண்டுபிடித்து, அதனை உடனடியாகச் செய்ய வேண்டுமென்று இந்த நேரத்திலே கேட்டுக்கொண்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. (Dr.) Bandula Gunawardana. You have 16 minutes.

[අ.භා. 1.50]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු නෝගරාදලිංගම් මන්ත්‍රීතුමා උතුරුකරයේ දෙමළ ජනතාව වෙනුවෙන් ඉන්දියානු අග්‍රාමාත්‍ය ධුරයට පත් නරේන්ද්‍ර මෝදි මැතිතුමාට සුබ පැතුවා. ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමාත්, අග්‍රාමාත්‍යතුමාත්, සමස්ත ශ්‍රී ලාංකික ජනතාවත් ඉන්දියාවේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පැවැත් වුණු මහ මැතිවරණයෙන් ජයග්‍රහණය ලැබූ සියලු අපේක්ෂකයන්ට උණුසුම් සුබ පැතුම් පිළිගන්වනවා. විශේෂයෙන්, පසුගිය කාල පරිච්ඡේදයේ ශ්‍රී ලංකාවේ පැවැති අර්බුද විසඳීම සඳහා ඉතාම විශිෂ්ට

සහයෝගයක් ලබා දුන් ඉන්දියානු ජන නායක නරේන්ද්‍ර මෝදි මැතිතුමාටත්, එතුමා විසින් පිහිටුවන රජයටත් අපි සුබ පතන අතර, අනෙකුත් පළාත්වල ජයග්‍රහණය ලැබූ සියලු අපේක්ෂකයන්ටත් සුබ පතන්න කැමැතියි.

ගරු නෝගරාදලිංගම් මන්ත්‍රීතුමා සඳහන් කළා එතුමන්ලාගේ ප්‍රදේශවල තිබෙන ගැටලුවලට අපි විසඳුම් නොදී එතුමන්ලා රවටන බවක්. මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට රටේ පැවැති යුද ගැටුම් නිම වීමෙන් පසු, සිංහල, දෙමළ, මුස්ලිම් හා බර්ගර් කියන සියලු ජන කොටස්වලට කැමැති තැනක ජීවත්වීමට හා ජීවනෝපාය සලසා ගැනීම සඳහා එක හා සමානව කටයුතු කරන බවට ලංකාවේ දෙමළ නොවන සියලු දේශපාලන පක්ෂ අතර එකඟතාවක් තිබෙනවා. අද ඉදිරිපත් කර තිබෙන රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත ගෙනෙන්න අවශ්‍ය වුණේ ඇයි කියලාත් මම එතුමට දැනුම් දෙන්න කැමැතියි. යුද ගැටුම් නිමවීමෙන් පසුව උතුරු හා නැඟෙනහිර පළාත්වල ඒ-9 මාර්ගය සහ උතුරේ සම්පූර්ණයෙන් විනාශ වෙලා තිබුණ දුම්රිය මාර්ග සකස් කරලා, විදුලිය, ජන සන්නිවේදන ක්‍රම, ජලාපවහන ක්‍රම හා මං මාවත් ඇතුළු යටිතල පහසුකම් නැවත ගොඩනැංවීම සඳහා ලංකා ආණ්ඩුව අසීමිත ලෙස විදේශ ණය ආධාරවලින් මුදල් ප්‍රමාණයක් වියදම් කරලා තිබෙනවා. ඒ කටයුතු සඳහා ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ අනෙකුත් ආයතනවලින් ණය අරගෙන තිබෙනවා. යුද ගැටුම් නිම කිරීමෙන් පසු උතුරු, නැඟෙනහිර පළාත්වල ජනයාගේ පොදු යහපත වෙනුවෙන් ඒ සියල්ල තිබුණු තත්ත්වයට වඩා හොඳ තත්ත්වයට පත් කිරීම සඳහා ලබා ගත්ත ණය ප්‍රමාණය පිළිබඳ විස්තර මුදල් අමාත්‍යාංශය විසින් වෙනම සකස් කරලා කෘතියක් ලෙස මුද්‍රණය කළ යුතුයි කියලා මම යෝජනා කරන්න කැමැතියි. ඒ ණයත්, අප විසින් ගෙවීමට තිබෙන ණයවලින් කොටසක් ලෙස තිබෙනවා. ඒ ණයත් ඇතුළත්වයි සමස්ත ලාංකීය ජනතාව විසින් ණය ගෙවන්නේ. අද රටට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි ණය බර.

මීට අවුරුදු 35කට පෙර තමයි පාර්ලිමේන්තුවට මම තේරී පත් වුණේ. මගේ මංගල කථාව පවත්වලා තිබෙන්නේ 1989 මාර්තු මස 20වැනි දා. එම හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා, "1977 විවෘත වෙළඳ පොළ ආර්ථික ප්‍රතිපත්තිය පටන් ගැනීමෙන් පස්සේ 1988 වන කල් විදේශ ණයවල වැඩිවීම පමණක් සියයට 1,115ක්" කියලා. මගේ මංගල කථාවේදී හැන්සාඩ් වාර්තාවට ඇතුළු කරලා තිබෙන ටික මම **සභාගත*** කරනවා.

මම එදා -අවුරුදු 35කට ඉස්සෙල්ලා- කියා තිබෙනවා, මේ රට බංකොලොත් වෙන්න තිබෙන හේතු දෙක. එක් එක් අය කියනවා, ඒ අය නිවැරදිව කිව්වා යනාදී වශයෙන්. මම කියලා තිබෙනවා, "මේ රටට ඔරොත්තු නොදෙන, ආණ්ඩුව එදිනෙදා පවත්වාගෙන යෑමටවත් ප්‍රමාණවත් වියදම දරන්නවත් බැරි ආදායමක් තිබෙන්නේ. ඒ නිසා හැමදාම වර්තන ගිණුමේ වියදම පියවන්න බැරි හිඟයක් එනවා. ඒ හිඟය පියවා ගැනීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් ණය ගන්න සිදු වනවා. කවුරු ජනාධිපති වුණත්, කවුරු අගමැති වුණත්, කවුරු ආණ්ඩුව කළත්, ඔරොත්තු නොදෙන ලෙස දිගටම ණය ගන්නවා" කියලා. එය මම අවුරුදු 35කට ඉස්සෙල්ලාත් කියා තිබෙනවා.

දෙවැනි කරුණ මෙකයි. අපි රටින් භාණ්ඩ ගෙනැල්ලා පරිභෝජනය කළත්, ඒ සඳහා අවශ්‍ය ඩොලර් ප්‍රමාණය උපයා ගන්නේ නැතිව, අපනයනය කර ලබන ආදායමට වඩා දෙගුණයක් විතර වැය කර ආනයනය කරනවා. ඒ නිසා ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟයක් 1977 සිට සියලු ආණ්ඩු කාලසීමා තුළ පැවතිලා තිබෙනවා. රට බංකොලොත් වෙලා තිබෙන්නේ හේතු දෙකක් නිසායි. රාජ්‍ය අය වැයේ ඔරොත්තු නොදෙන ජංගම ගිණුමේ හිඟයත්, ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟයත් නිසා, දිගින් දිගටම සෑම රජයක්ම ණය අරන් ඒ ණය ගෙවා ගන්න බැරි තත්ත්වය ඇති වෙලා රට බංකොලොත් වුණා. මේ තත්ත්වය ඇති වුණේ ගෝඨාභය රාජපක්ෂ නිසාවත්, බදු අයින් කරපු නිසාවත් නොවෙයි. මේ තත්ත්වය පළමුවැනි වතාවට අනතුරුදායක ලෙස රටට දැනුණේ, බාහිර කම්පනවලට ඔරොත්තු දෙන්න බැරි, ණය තිරසරභාවය නැති රටක් කියන එක දැනුණේ 2001දී. 2001දී චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිතුමියගේ අවධියේ, ආචාර්ය පී.බී. ජයසුන්දර දිගටම මුදල් අමාත්‍යාංශයේ ලේකම් ලෙස සිටියදී, ලංකාවේ ආර්ථිකය 2022 දී ඇති වූ තත්ත්වයට වඩා සරල තත්ත්වයක් ඇතිවෙලා, නිදහසින් පස්සේ පළමුවැනි වතාවට ඍණ 1.4ක් වුණා. එදා කටුනායක ගුවන් තොටුපොළට එල්ටීටීඊ ප්‍රහාරය එල්ල වෙලා යුද ගැටුම් උග්‍රවෙලා තිබෙනකොට, ලෝක වෙළෙඳ පොළේ ඇති වෙච්ච කම්පනවලට ඔරොත්තු දිය නොහැකිව විදේශ විනිමය සංචිත කඩා වැටිලා, රුපියල බාල්දු වෙලා, විදේශ ණය බර වැඩි වෙලා, රාජ්‍ය අය වැය පාලනය කර ගන්න බැරි වෙලා, පාර්ලිමේන්තුවට අතුරු සම්මත ගිණුම් 28ක්, 30ක් ගෙනැල්ලා, ඒ තුළිනුත් සල්ලි හොයා ගන්න බැරිවෙලා මුදල් අච්චු ගහලා, මුළු රටම විනාශ වෙලා යනකොට, රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් සමඟ එස්.බී. දිසානායක, මහාචාර්ය ජී.එල්. පීරිස්, මහින්ද විජේසේකර, රාජිත සේනාරත්න ඇතුළු අපි ආණ්ඩුවක් පිහිටුවලා, මේ රටේ ඍණ වෙච්ච ආර්ථිකය, කඩා වැටුණු රට නැවත ගොඩ ගැනීම සඳහා අවුරුද්දක් තුළදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමඟ මෙවැනිම ගිවිසුමක් අත්සන් කළා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දූරදර්ශී, තීක්ෂණ, පරිණත ආර්ථික කළමනාකරණ ක්‍රමය තුළ ඒ සියල්ල කළා.

අපි එදා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව එකතු කරලා ආදායම් අධිකාරියක් ඇති කළා. ඒ වාගේම, දුම්රිය අධිකාරියක් ඇති කළා. ඒ වාගේම, අවශ්‍ය අනෙකුත් සියලු වෙනස්කම් කරලා ආර්ථිකය ඍණ තත්ත්වයෙන් ධන තත්ත්වයට ගෙනැල්ලා, පොලී අනුපාතය තනි ඉලක්කමට ගෙනැල්ලා, රුපියල අධිප්‍රමාණය කරලා, ඍණ ආර්ථිකය නැවතත් ධන ආර්ථිකයක් බවට පත් කළා. ඒ කාලයේදී සජිත් ප්‍රේමදාස මැතිතුමා නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍යවරයා විධියට තමයි කටයුතු කළේ. එදා එතුමාට මේ ආර්ථිකයේ කිසිම දෙයක් තේරුණේ නැහැ. අන්තිමට අපි ඒක කළාට පස්සේ එතුමා අපට නමක් පටබැන්දා "ධන-ඍණ" කියලා. එවැනි නමක් පටබැන්දේ ඍණ ආර්ථිකය ධන කළාටයි. රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා තමයි ලංකාවේ පාර්ලිමේන්තුවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳව, රට බංකොලොත් නොවීම පිළිබඳ නීත්‍යානුකූල විසඳුම මේ ගරු සභාවට ගෙනාවේ.

ඒ වෙලාවේ මුදල් අමාත්‍යවරයා ලෙස කටයුතු කළේ චොක්සි ඇමතිතුමා. එවකට මම තමයි ග්‍රාමීය කටයුතු පිළිබඳ කැබිනට් අමාත්‍යවරයා සහ මුදල් නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් හිටියේ. ඒ කාලයේ අපි ඇමතිවරු ලෙස වැඩ කරද්දී, කේම්බ්‍රිජ් කාර්යාලයේ, ආර්ථික කරුණු කාරණා සාකච්ඡා කරන මගේ කමිටුවට තමයි හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සහභාගි වුණේ. එතුමා හොඳටම දන්නවා, 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත ගෙනාවේ මේ රට බංකොලොත් වෙන එක වළක්වන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනතේ ප්‍රධාන කරුණු 3ක් කියා තිබෙනවා. 2006 වන විට ලංකා ආණ්ඩුවේ අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 5ක් විය යුතු අතර, ඉනික්බිති ලංකාවේ කවර ආණ්ඩුවක් ආවත් දිගටම අය වැය පරතරය සියයට 5ක හෝ සියයට 5ට අඩුවෙන් පවත්වා

** ප්‍රශ්නකාලයේ නබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

ගෙන යන්න ඕනෑ කියලා එහි සඳහන්ව තිබෙනවා. එහෙම වුණා නම්, මෙහෙම ණය ගන්න වෙන්නේ නැහැ. එහෙම වුණා නම් රට බංකොලොත් වෙන්නේ නැහැ. ඒ පනත් කෙටුම්පත අච්චු ගහලා මේ සභාව විසින් සම්මත කළා. ඒ අනුව, 2013 වන විට නොපියවා තිබෙන මුළු රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 65ට අඩු කරන්න ඕනෑ.

එහෙම කළා නම් මේ රට බංකොලොත් වෙන්නේ නැහැ. එහෙම නම් මීට අවුරුදු 10කට ඉස්සෙල්ලා -2013දී- ඒ ණය ප්‍රමාණය සියයට 65ට අඩු වෙනවා. ණය සඳහා ඇප වීම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 4.5ට වඩා වැඩි වෙන්න බැහැ. ඒ නීතිය මේ ගරු සභාව සම්මත කළා. ඒ සම්මත කරපු නීතියේ තිබෙන කරුණු ටික ක්‍රියාත්මක කළා නම් ලංකාව කවදාවත් ණය ගෙවන්න බැරි තත්ත්වයට පත් වෙන්නේ නැහැ, රට බංකොලොත් වෙන්නේ නැහැ කියන එක සහතික වශයෙන් කියන්න පුළුවන්.

කෙසේ වෙතත්, වැටිච්ච රටක් ගොඩ අරගෙන, රටක් එහෙම ගොඩ ගන්න පුළුවන් කියා පෙන්නලා, ඉදිරියේදී එසේ නොවන තත්ත්වයක් ඇති කළ, නිදහසින් පසු ලංකා ඉතිහාසයේ පහළ වූ එකම නායකයා රනිල් වික්‍රමසිංහ මැතිතුමා විතරයි කියන එක එතුමාට ගෞරවයක් ලෙස අප සඳහන් කළ යුතු වෙනවා. එදා සම්මත කරපු දේම තමයි දිට්ඨධම්මවේදනීය කර්මය අනුව එතුමාට කරන්න සිද්ධ වුණේ, 2022දී රට බංකොලොත් වුණාට පසුව. එතුමා ඒ අත්දැකීම, පළපුරුද්ද ලබා තිබූ නිසා තමයි - අනෙක් අය වගකීම නොගෙන බයේ පැනලා යන කොට- වගකීම භාර අරගෙන නැවතත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ විස්තීර්ණ ණය ගිවිසුමක් අත්සන් කරලා රටට හුස්ම ගන්න පුළුවන් තත්ත්වය ඇති කළේ.

විපක්ෂයේ අය කියනවා ආණ්ඩුව තිබෙන්නේ තව දවස් කිහිපයයි, මේ ආණ්ඩුව යනවා කියලා. අපේ ගරු මන්ත්‍රීතුමෙක් සඳහන් කළා, ඡන්ද පැවැත්වීම පිළිබඳ විශ්වාසයක් නැහැ, නියමිත දිනයට ඡන්ද පවත්වනවාද කියලා දන්නේ නැහැ කියා. රජය වෙනුවෙන් මම එතුමාට බොහොම පැහැදිලිව කියන්න කැමතියි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව නීරෝගී ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අවශ්‍ය හැම මැතිවරණයක්ම නියමිත කාලයට පවත්වන බවට ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රතිඥාවක් දී තිබෙන බව සහ මේ වර්ෂයේදී ජනාධිපතිවරණය පැවැත්වීම සඳහා අවශ්‍ය රුපියල් බිලියන 10ක මුදල මුදල් අමාත්‍යවරයා වශයෙන් එතුමා වෙන් කර තිබෙන බව. එහෙම නම්, ඔක්තෝබර් මාසයේ 17වන දාට ප්‍රථම ජනාධිපතිවරයෙකු තෝරා ගැනීම සඳහා වන ජනාධිපතිවරණය නිසැක වශයෙන් පවත්වන නිසා ඒ සඳහා උදව් කරන්න කියා මම ඒ ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා. රට බේරා ගන්න පුළුවන් නායකයෙකුට එතුමන්ලාගේ ශක්තියත් එකතු කරන්න කියා මම එතුමාට ආරාධනා කරන්න කැමතියි. ඊට පසුව නියමිත දිනවලට පාර්ලිමේන්තු මැතිවරණයත්, පළාත් සභා මැතිවරණයත්, පළාත් පාලන මැතිවරණයත් පැවැත්වීමේ ක්‍රියාවලිය දිගටම සිදු වෙනවා.

මම තවත් කාරණයක් කියන්න කැමතියි. මාස හයකින් පසුව මේ රට භාර ගන්නා බව කියන අය රටේ වාද විවාද කළ යුත්තේ සහ ජනතාවට උත්තර දිය යුත්තේ කුමක් ගැන ද? ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ අප ඇති කරගෙන තිබෙන විස්තීර්ණ ණය ගිවිසුම අනුව එකඟ වෙලා තිබෙන දේවල් තිබෙනවා. අපි රට ඇතුළේ ආර්ථිකය ස්ථාවර කළ යුතුව තිබෙනවා. ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා කිව්වා සේ අය වැය පරතරය අඩු කරගෙන ඉදිරි හැම වර්ෂයකම ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් පවත්වාගෙන යන්න අපි පොරොන්දු වෙලා තිබෙනවා. ඒ වාගේම, රටේ ආර්ථිකයට පිටතින් ගත්තු ණය -විදේශීය ණය- ප්‍රමාණය අපි 2027 වනකල් නොගෙවා ඉන්නේ විස්තීර්ණ ණය ගිවිසුමක් යටතේයි. තවත් මාස කිහිපයකින් 2025 වර්ෂය ලැබුවාට පසුව ජාත්‍යන්තර ගනුදෙනු - ආනයන අපනයන - කරන විට external resource gap එකක් ඇති වෙනවා කියලා පුරෝකථනය කර තිබෙනවා. 2025 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 5,018ක හිඟයක් ලංකාවේ ඇති වෙනවා; 2026දී ඇමෙරිකානු ඩොලර් මිලියන 3,608ක හිඟයක් ඇති වෙනවා; 2027දී ඇමෙරිකානු ඩොලර් මිලියන 3,911ක හිඟයක් ඇති වෙනවා. ඒ, ලංකා ආණ්ඩුව අත්සන් කරලා තිබෙන විස්තීර්ණ ණය ගිවිසුමේ එකඟතාවලට අනුව. එතකොට තවත් මාස කිහිපයකින් 2025 අවුරුද්ද ලබන කොට IMF එක පොරොන්දු වෙලා තිබෙන්නේ විස්තීර්ණ ණය පහසුකම - Extended Fund Facility - යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 663ක් ලබා දෙන්නයි. ඊට වඩා සතයක්වත් වැඩියෙන් දෙන්නේ නැහැ. මේ අවුරුද්ද අවසානයේ 2025 වර්ෂයේ අය වැය ලේඛනය හදන කොට IMF එක ඩොලර් මිලියන 700ක් දෙනවා. ලෝක බැංකුව පොරොන්දු වෙලා තිබෙනවා, ඩොලර් මිලියන 400ක් දෙන්න. ආසියානු සංවර්ධන බැංකුව ඩොලර් මිලියන 300ක් දෙනවා. අපට ඩොලර් මිලියන 3,655ක ණය සහනයක් ලැබෙනවා.

විපක්ෂ නායකතුමාගෙන් හෝ රට කරනවාය කියන අනෙක් අයගෙන් මම අහනවා, ඉදිරි ජනාධිපතිවරණයෙන් පසුව ඔක්තෝබර් වන කොට ජනාධිපතිවරයෙකු පත් වෙලා, පාර්ලිමේන්තුව පත් වෙලා 2025 අය වැය හදද්දී, අපට ලබා දීමට නියමිත ඇමෙරිකානු ඩොලර් මිලියන 700 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ගන්නවාද, නැද්ද කියලා. ඇමෙරිකානු ඩොලර් මිලියන 700 කියන්නේ රුපියල්වලින් ගත්තොත්, රුපියල් මිලියන 15 ලක්ෂයක විතර ප්‍රමාණයක්. එය කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත මුදලක්. ඒ මුදල නැතුව අය වැය හදනවා ද? ඒ ආණ්ඩුව ආවාම ලෝක බැංකුව ලංකාව සමඟ අත්සන් කරලා තිබෙන ගිවිසුමට පරිබාහිරව ගිහින් ඇමෙරිකානු ඩොලර් මිලියන 400ට වඩා වැඩි මුදලක් ඒ ආණ්ඩුවට ලබා දෙන ක්‍රමයක් තිබෙනවා ද? ආසියානු සංවර්ධන බැංකුව ඇමරිකානු ඩොලර් මිලියන 300ට වඩා වැඩියෙන් දෙනවා කියලා මේ කාට හරි කියලා තිබෙනවාද? විපක්ෂය කියන විධියට ඒ එකඟතා දශමයක් හරි වෙනස් කරාවිද? රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා යටතේ ලංකා ආණ්ඩුව අත්සන් කරලා මේ පාර්ලිමේන්තුවත් දැනුවත් කරපු ඒ ගිවිසුම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් වෙනස් කරාවිද? එහෙම කරන්නේ නැහැ. හැබැයි, විපක්ෂයේ අය මේ රටේ සාමාන්‍ය ජනයාට බොරුවට කියනවා, "අපි අලුත් ජනවරමක් ගන්නවා. ඒ ජනවරම අනුව අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කථා කරනවා" කියලා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පිස්සු කියලා හිතනවාද? ඒක ලංකාවට විතරක් බලපා තිබෙන එකක්ද? අන්තර්ජාතික ගෙවුම් ශේෂ පියවන්න එහෙම කටයුතු කරන මූල්‍ය ආයතන ලෝකයේ තිබෙනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නලින් ප්‍රනාන්දු ඇමතිතුමාගේ කාලය මට ලබා දෙන්න කියලා කිව්වා. ඒ අනුව, මට මේ කාරණය පැහැදිලි කරන්න ඉඩ දෙන්න, ගරු නලින් ප්‍රනාන්දු ඇමතිතුමාට නියමිත කාලයෙන් ලබාගෙන.

ඊට අවුරුද්දකට පසුව -2026දී- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 662ක් දෙනවා, මේ විස්තීර්ණ ණය පහසුකම සඳහා. 2026 අය වැය හදන්න IMF එක දෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 700යි; ලෝක බැංකුව දෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 400යි; ආසියානු සංවර්ධන බැංකුව දෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 300යි. අපි ණය සහනයක් බලාපොරොත්තු වෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 2,246ක. ඉදිරියේදී එන ආණ්ඩුවට 2027 අවුරුද්දේ IMF එක දෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 329ක්. අය වැය හදන්න දෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 600ක්. ලෝක බැංකුව දෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක්. ආසියානු සංවර්ධන බැංකුව දෙනවා ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක්. ණය සහනය ඇමෙරිකානු ඩොලර් මිලියන 1,482යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතකොට මදි වෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක්. ඒ මොන කාලයේදී ද? 2027දී. ඒ මදි වන ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500 ගන්න අපට යන්න වෙනවා ජාත්‍යන්තර වෙළඳ පොළට. මේ වෙලාවේ කවුරු ජනාධිපති වුණත්, කවුරු අගමැති වුණත්, කවුරු මුදල් ඇමති වුණත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ලංකාවේ කිසිම ස්වෛරීත්ව බැඳුම්කරයක් අරගෙන යන්න බැහැ. මොකද, බලු කපුටෙක්වත් ඒ බැඳුම්කරය ගන්නේ නැහැ. එය ගන්න පුළුවන්කම ඇති වෙන්නේත් 2027දී. ඒත් පුළුවන් වන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500යි. හැබැයි, ඒක ගන්න කොට ජාත්‍යන්තර සංචිතය වැඩි වෙලා තිබෙන්න ඕනෑ, ඇමෙරිකානු ඩොලර් බිලියන 14කට. මේ ගිවිසුම් ප්‍රකාරව ලබන අවුරුද්දේ අපි ජාත්‍යන්තර සංචිතය වැඩි කර ගන්න ඕනෑ, ඇමෙරිකානු ඩොලර් බිලියන 8.5ක් දක්වා. 2026දී ඇමෙරිකානු ඩොලර් බිලියන 10.8ක් දක්වා, 2027දී ඇමෙරිකානු ඩොලර් බිලියන 14.2ක් දක්වා ජාත්‍යන්තර සංචිතය වැඩි කර ගන්න ඕනෑ. ඒ නිසා තමයි මුදල් අමාත්‍යාංශය -මුදල් අමාත්‍යවරයා, මුදල් රාජ්‍ය ඇමතිවරුන් වන මෙතුමන්ලා සහ නිලධාරින්- ඕනෑ ඕනෑ විධියට මෝටර් රථ ගේන්න දෙන්නේ නැතුව, යම් පාලනයක් කරගෙන දවස ගණනේ පරීක්ෂාවෙන් සිටිමින් කටයුතු කරන්නේ.

මම ස්තුතිවන්ත වෙනවා, මුදල් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන ගරු ජනාධිපතිතුමාටත්, මුදල් රාජ්‍ය අමාත්‍යවරුන් වන ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාටත්, ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමාටත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුළු නිලධාරින්ටත්, මහ බැංකුවේ නිලධාරින් ඇතුළු සියලුදෙනාටත්, මේ ප්‍රමාණයට, මේ රට ජාත්‍යන්තර වශයෙන් කඩා නොවැටෙන තත්ත්වයට පවත්වාගෙන යෑම සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් හා ඒකට අවශ්‍ය නීතිය සම්පාදනය කිරීම සඳහා මෙවැනි ඓතිහාසික පනත් කෙටුම්පතක්, ණය කළමනාකරණය සඳහා අවශ්‍ය පනත් කෙටුම්පතක් අද මේ ගරු සභාවේ සම්මත කිරීමට සියලුදෙනා එක්ව කටයුතු කිරීම සම්බන්ධයෙන්. ඉදිරියේදී කවුරු ආණ්ඩුව ගත්තත්, ඒ අය මේ අණ පනත්වල තිබෙන නීති කැඩුවොත්, 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත කැඩීම වාගේම රට නැත්තටම නැති කිරීම පිළිබඳ වගකීම ඒ සියලුදෙනා භාර ගන්න ඕනෑ.

අපි රටේ ජනතාවට ඉතාම ගෞරවයෙන් දැනුම් දෙනවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ අපි ඇති කරගෙන තිබෙන ගිවිසුම් වෙනස් කළොත්, එයට ගරු කළේ නැත්නම්, පසුගිය 16 වනාවේ වාගේ විසි කළොත්, විදේශ ණය ගෙවීම සඳහා ගිවිසුම ඇති කර ගන්න දරලා තිබෙන උත්සාහයේ අවසාන තැනට ගිහිල්ලා ඒ ගිවිසුම ඇති කර නොගත්තොත්, ඕනෑම කෙනෙකුට ගන්න ආණ්ඩුව පවත්වාගෙන යන්න පුළුවන් වැඩිම කාලය සති දෙකයි, ගෙනාපු ඉන්ධන ටික තිබෙනකල් විතරයි කියලා. ඇයි ඒ? ඉතුරු ඉන්ධන ගෙනෙන්න, ඩොලර් බිලියන තුනක, හතරක, පහක බනිජ තෙල් ගෙනෙන්න නිකුත් කරන ඒ ණයවර ලිපියකට කවුරුවත් ගරු කරන්නේ නැහැ. අපට ගෑස් ගන්න ඩොලර් මිලියන තුනක් නැතුව ගෑස් නැව හැරිලා ගියා. ඒ වාගේ තමයි මේ ගිවිසුම ප්‍රකාරව කටයුතු කළේ නැත්නම්. ගෑස් නැවක් ගෙන්වා ගන්න දෙන ඒ ණයවර ලිපියක් කවුරුවත් පිළිගන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුරු රටේ ආණ්ඩු කළත් මොන දේශපාලන පක්ෂයකට වුණත් ඕනෑ තරම් පිස්සු කථා කියන්න පුළුවන්, වේදිකාවට ගිහිල්ලා ගිරිය පුප්පාගෙන කෑ ගහලා. හැබැයි ආණ්ඩුව කරනකොට හැම මාසයකම රාජ්‍ය සේවකයන්ට වැටුප් ගෙවන්න ඕනෑ, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට විශ්‍රාම වැටුප් ගෙවන්න ඕනෑ, අස්වැසුම ඇතුළුව අද මේ කියපු ආකාරයට විසිහතර ලක්ෂයකට සහනාධාර දෙන්න ඕනෑ, ගත්ත ණයවලට පොලී ගෙවන්න ඕනෑ. ඒ ටික ගෙවන්නවත් ප්‍රමාණවත් ආදායමක් නැත්නම් මොකද වන්නේ? මෙහෙම කියන අය රටේ අයට ඒ ඉලක්කම් එක්ක කරුණු කියන්න එපා යැ. මම උදාහරණයක් කියන්නම්. ගිය අවුරුද්දේ අමාරුයි කියලා, වැට පනවලා, ඒක සියයට 18ක් කරලා ඉතා අමාරුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එකතු කර දීලා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් බිලියන 1,550ක්. ශ්‍රී ලංකා රේගුව - Sri Lanka Customs - එකතු කරලා දීලා තිබෙනවා, රුපියල් බිලියන 923ක්. සුරාබදු දෙපාර්තමේන්තුව එකතු කරලා තිබෙනවා, රුපියල් බිලියන 169ක්. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 20ක් එකතු කරලා තිබෙනවා. බදු නොවන ආදායම හැටියට ලැබිලා තිබෙන ගණන රුපියල් බිලියන 219යි. ප්‍රදාන - grants - විධියට ලැබිලා තිබෙනවා, රුපියල් බිලියන 16ක්. විවිධ තැන්පතු වර්ගවලින් රුපියල් බිලියන 304ක් ලැබී තිබෙනවා. ඒ අනුව රුපියල් බිලියන 3,201යි භාණ්ඩාගාරය ගිය අවුරුද්දේ එකතු කරලා තිබෙන්නේ. බදු, බදු නොවන, ප්‍රදාන, තෑගි ඔක්කෝගෙන්ම භාණ්ඩාගාරයට ලැබී තිබෙන්නේ රුපියල් ට්‍රිලියන තුනයි. එයින් රාජ්‍ය සේවක වැටුප්, විශ්‍රාම වැටුප් සහ අස්වැසුම ඇතුළු සහනාධාර දීමනා ගෙවන්න වැය වෙලා තිබෙනවා, රුපියල් බිලියන 2,130ක්. පොලී ගෙවන්න වැය වෙලා තිබෙනවා, රුපියල් බිලියන 2,264ක්. ඒ පුනරාවර්තන වියදමට විතරක් වැය වෙලා තිබෙනවා, රුපියල් බිලියන 4,394ක්. එතකොට ගිය අවුරුද්දේ රාජ්‍ය සේවක වැටුප්, විශ්‍රාම වැටුප්, සහනාධාර හා පොලී ගෙවන්න රුපියල් බිලියන 4,394ක් වැය වෙලා තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් ට්‍රිලියන තුනක් ලැබිලා, එදිනෙදා පවත්වාගෙන යන්න 4.3ක් වියදම් වෙලා තිබෙනවා. ඉතින් මේ ආණ්ඩුව ගන්නවා කියලා කැට කඩලා කියන මිනිස්සු ඊළඟ දවසේ කියන්න ඕනෑ රටට, පඩි ගෙවන්න කීයක් යනවාද, විශ්‍රාම වැටුප් ගෙවන්න කීයක් යනවාද, පොලී ගෙවන්න කීයක් යනවාද, කීයක් ලැබෙනවාද කියලා. ඒ ආදායම වැඩි කරන්න වැට එක තවත් වැඩි කරනවාද, අඩු කරනවාද, අඩු කළොත් ඒ සල්ලි හොයා ගන්නේ කොහොමද කියලා කියන්න ඕනෑ. ඒ ගැන නේ විවාද කරන්න ඕනෑ. වෙන මොනවා ගැනද විවාද කරන්නේ? ආණ්ඩුව අරගෙන ඊළඟ සුමානේ ඉඳලා පඩි ගෙවන්න එපා යැ. විශ්‍රාම වැටුප් ගෙවන්නත් ඕනෑ. ඒවාට තිබෙන්නේ එච්චරයි.

ඊළඟට, ප්‍රාග්ධන වියදම් ලෙස ණය ගෙවීම් සඳහා වැය වෙලා තිබෙනවා, 8,893ක්. ට්‍රිලියන 13ක් එළියට ගිහිල්ලා තිබෙනවා, භාණ්ඩාගාරයෙන්. ට්‍රිලියන තුනක් ලැබිලා 13ක් එළියට යනවා නම්, 10ක් විදේශ ණය ගන්නේත් නැතුව -මෙතෙක් ණයට අරගෙන නේ දුවලා තිබෙන්නේ- ඊළඟ වර්ෂයේ ආණ්ඩුව ගන්න කෙනා ආණ්ඩුවේ මේ වැඩ ටික කරන්න එපා යැ. ඒ අයත් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ටික ගෙවන්න ඕනෑ, විශ්‍රාම වැටුප් ටික ගෙවන්න ඕනෑ, තුන් ගුණයකින් පස් ගුණයකින් වැඩි කරලා දෙන අස්වැසුම ගෙවන්න ඕනෑ, ණයවලට පොලී ගෙවන්න ඕනෑ. දැනට ණය විතරක් නොගෙවා ඉන්න සහනයක් තිබෙනවා.

මේවා ඔක්කෝම ගැට ගහලා ගිවිසුම්ගත කරලා තිබෙන එකෙන් යම් කිසි ආකාරයකට මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්න සියලුදෙනා - ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සිංහල, දෙමළ, මුස්ලිම්

[ගරු ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

සියලු මන්ත්‍රීතුමන්ලා - මේ ඉලක්කම්වලට එකඟ වුණේ නැත්නම් තමුන්නාන්සේලා සියලු දෙනාගේ ශාපය අනුව මුළු රටම සති දෙකකින් වෙනත් ආණ්ඩුවක් ඇවිල්ලා ඉවර වෙනවා. ජාත්‍යන්තර සහයෝගය නැතිව අපි නැති වෙනවා. ඒ නිසා තමයි, මේ භයානක උවදුරෙන්, භයානක අර්බුදයෙන් රට බේරා ගැනීම සඳහා තමයි, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතක් මේ ගරු සභාවට ඉදිරිපත් කරලා සම්මත කරන්න කටයුතු කරලා තිබෙන්නේ.

අද ණය කළමනාකරණය සඳහා වෙනම ආයතනයක් පිහිටුවා තිබෙනවා. මූලින්ම රාජ්‍ය ණය කළමනාකරණය සම්බන්ධයෙන් ලංකා ආණ්ඩුව වෙනුවෙන් රජයේ බැංකුකරු මූල්‍ය නියෝජිතයා, මූල්‍ය උපදේශකයා වශයෙන් සියලු වගකීම් දැරුවේ මහ බැංකුව. මහ බැංකුවේ වෙනම දෙපාර්තමේන්තුවක් තිබෙනවා, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව කියලා. ඔබතුමා බලන්න, 2015 වර්ෂයේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව අවසන් වෙලා, පළමු අය වැය කථාව ඉදිරිපත් කරපු අවස්ථාවේ දී රාජ්‍ය ණය කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රස්තාර සටහන් සහිතව අය වැය කථාවක් ඉදිරිපත් කළා. ඒ ඉදිරිපත් කළ අය වැය කථාවේ 2022, 2023, 2024, 2025 යන වර්ෂ රවුම් කරලා කියලා තිබෙනවා, "ඒ ණය පරිණත වෙනවා. ගෙවන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා" කියන එක. එදාත් ඒක කිව්වා. අවුරුදු තිස් ගණනක් තිස්සේ මේ ණය ඔරොත්තු දෙන්නේ නැති බව දිගටම කියලා තිබෙනවා. අවාසනාවකට, අපට වඩා හොඳට මේ ඉලක්කම මුළු ලෝකයම දන්නවා. ඒ නිසා මේ ණය ගෙවන්නේ නැතිව දවසක්වත් අපට ඉස්සරහට යන්න බැහැ. මොකද, මම ප්‍රවාහන ඇමතිවරයා වශයෙන් දන්නවා මාර්ග දස ලක්ෂයේ ව්‍යාපෘතිය, ගැටඹේ ගුවන් පාලම, කොහුවල ගුවන් පාලම, වෙනත් පාලම්, පාරවල් කියන මේ මොකක් කඩා වැටුණත් කිසිම විධියකින් ඒවා හදන්න බැහැ කියලා, ජාත්‍යන්තර සහයෝගය නැතිව. මොකද, කවදාවත් කිසිම ආණ්ඩුවක් පාරක් හැදීම, පාලමක් හැදීම, ඇනිකට් එකක් හැදීම, වේල්ලක් හැදීම, ගඟක් හැරවීම වාගේම, -මහවැලි ගඟ උතුරට හැරවීමේ ව්‍යාපෘතිය, උමා ඔය ව්‍යාපෘතිය, ගිං ගඟ, ඉහිණිමිටිය ව්‍යාපෘති- රටට බස් අරගෙන තිබෙන්නේ, දුම්රිය මැදිරි අරගෙන තිබෙන්නේ, රේල් පීලි යනාදී මේ සියල්ල අරගෙන තිබෙන්නේ ණයට. මේක විතරයි අපි කියලා නැත්තේ. මේ දේශපාලනඥයන් බොරුවට මිනිස්සුන්ට කියලා ණය ගත්තා, සල්ලි අව්වු ගැහුවා. මේ දෙකෙන් විතරයි හැම ආණ්ඩුවක්ම වැඩ කරලා තිබෙන්නේ.

මම එක උදාහරණයක් කියන්නම්. අපි ආණ්ඩුව ගන්න කලින් විපක්ෂයේ ඉන්නකොට -ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමාත් දන්නවා- අපේ ආර්ථික කටයුතුවලට පිටින් ඇවිල්ලා උපදෙස් දෙන ප්‍රධානියෙක් හිටියා. එතුමා තමයි නාලක ගොඩහේවා මහත්තයා. එතුමාට ගෞරවයක් ලෙසයි මම මේ කියන්නේ. මම අත් දැකීමකින් තමයි මේ කියන්නේ. එතුමා අරවා මේවා ඔක්කෝම ගැන අය වැයකදී කථාවක් කරනවා. අපි ඇමතිවරු, මන්ත්‍රීවරු ඉඳගෙන ඉන්නවා. මමත් ගුරුවරයකු ලෙස මේවා ගැන දැගෙන හිටියත් මටත් ඉඳගන්න කියලා ඒ ගොල්ලන් කථා කරනවා. ඉතින් මමත් ඉන්නවා. මම ඉතින් ඒක නැතිව වෙන එකක් කියන්න ගියාම, අපේ මිත්‍ර දැනටත් පාර්ලිමේන්තුවේ ඉන්න ගරු සී.බී.රත්නායක මැතිතුමා කිව්වා, "ඔබතුමා කියන ඒවා අහන්න නොවෙයි අපි ඇවිල්ලා ඉන්නේ. මේ නාලක ගොඩහේවාට විස්තර කරන්න දෙන්න" කියලා. මට ඒක හොඳටම මතකයි. මේ ඇත්ත කථාව. ඉතින් නාලක ගොඩහේවාලගේ උපදෙස් අනුව තමයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට ඒ ඉරණම අත් වුණේ. එතුමා ඒ තත්ත්වය ඊට වඩා හොඳට අත් කරදෙන්න හදන අනෙක් අයට ප්‍රවේශමෙන් ඒවා පරිහරණය කරන්න කියන එක විතරයි මට කියන්න තිබෙන්නේ. මොකද, අපි ඒවා පරිහරණය කරලා අත් දැකීමක් තිබෙන අය.

අර පළිබෝධ නාශකවල ගහලා තිබෙනවා නේ, "පළිබෝධ නාශක අනතුරු සහිතයි. ප්‍රවේශමෙන් පරිහරණය කරන්න" කියලා. මුළු ආර්ථික වැඩ පිළිවෙළම ලිව්වේ එතුමා. ඊට පස්සේ අධ්‍යාපනය කියන කොටස ලිව්වාම මම විරුද්ධ වුණා. මම කිව්වා, "මම මේක විකුණන්න එන්නේ නැහැ" කියලා. ඒ අවස්ථාවේ ඒ හදලා තිබෙන එකට මම විරුද්ධයි කිව්වාම, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු උප කුලපති මහාචාර්ය ළමාවංශ මැතිතුමායි, මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මැතිනියයි මගේ ගෙදරට එව්වා, අධ්‍යාපනය කියන කොටස මට ඕනෑ විධියට හදන්න කියලා. ඒ ටික මම මට ඕනෑ විධියට හැදුවා. අනෙක් කිසි දෙයකට මම සම්බන්ධ නැහැ. ඒවාට සම්පූර්ණ වග උත්තරකරු නාලක ගොඩහේවා කියන එක මම මේ හැන්සාඩ් වාර්තාවේ සඳහන් කරනවා. එතුමාට ඕනෑ නම් මේ ගැන විවාදයකට ඕනෑ වෙලාවක එන්න පුළුවන්. අපේ අනෙක් සහෘදයෝත් වැඩි දෙනෙක් ඉන්න නිසා අපට ඒ විවාදයට සහභාගි වෙන්න පුළුවන්. ඒ නිසා දේශපාලන වශයෙන් තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍ර අනුව කටයුතු කරන එක හොඳ නැහැ කියලායි මම නම් හිතන්නේ.

මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමාට අපි හැමෝම ගරු කරනවා. එතුමා අපේ පක්ෂයේ හිටපු සභාපතිතුමා. ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා තෝරගන්නාකොට ලසාර්ඩ් සමාගම තෝරාදීමේ කාර්යය කළේ එතුමා සභාපතිත්වය දරන Cabinet Subcommittee එකෙන්. මේක රනිල් වික්‍රමසිංහ පත් කරගත්ත ලසාර්ඩ් කොමිපැනියක් නොවෙයි. ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් කළේ, නීතිය පිළිබඳ විශාරද, නීතිය පිළිබඳ මහාචාර්ය, අපි කවුරුත් ගරු කරන (මහාචාර්ය) ජී.එල්. පීරිස් මැතිතුමා. එතුමන්ලාගේ උපදෙස් අනුව තමයි ලසාර්ඩ් සමාගම තෝරගත්තේ. ලසාර්ඩ් සමාගම තමයි අදත් ඒක කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ඉක්මනින් අවසන් කරන්නම්.

විදේශ විශේෂඥයන් සමඟ සාකච්ඡා කරලා පළමුවැනි අවුරුදු පහ, හය තුළදී මේ ණයවලින් සියයට 37ක් ගෙවන්න තමයි අපි ඔක්කෝම වැඩ පිළිවෙළ සකස් කරන්නේ. ඒ වාගේම සියයට 51ක් ගෙවන්න තිබෙන්නේ අවුරුදු 6-20 අතර. ඉතිරි සියයට 12 ගෙවන්න වෙන්නේ අවුරුදු 20කිනුත් පසුව. එම නිසා මේක එක් එක් අයගේ දේශපාලන න්‍යාය පත්‍ර අනුව කරන්න බැහැ. සමස්ත රට වැසියා මෙම විදේශ ණය ගෙවන්න බැඳිලා ඉන්නවා; ඒවා ගෙවන්න ඕනෑ. ඒවා කළමනාකරණය කරමින් එම වැඩ පිළිවෙළ නැවත ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරන බවට ජනතාව ඉදිරියේ දිවුරා සපථ කරන අයට පමණයි රට ගොඩ ගන්න පුළුවන් කියන එක සඳහන් කරමින් මගේ වචන කිහිපය මෙයින් සමාප්ත කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.21]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේක මුදල් අමාත්‍යාංශයට සම්බන්ධ අණ පනත් ගැන සාකච්ඡා කරන අවස්ථාවක්. මේ පිළිබඳව ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමා සමඟත් අපි කථා කළා. අපිත් මේ පිළිබඳව වෙනම

සාකච්ඡා කරලාත් තිබෙනවා. වැඩිහිටියන්ගේ තැන්පතු සඳහා ගෙවනු ලබන පොලියෙන් සියයට 5ක් කපන එක ගැනත් අද කථා කළා. ඇත්තටම වැඩිහිටියන්ගේ තැන්පතුවලින් විතරක් නොවෙයි, ළමා ඉතුරුම් ගිණුම්වලට ලැබෙන පොලියෙන් පවා සියයට 5ක් කපාගන්නවා.

අපි දන්නවා, බදු අය කරන්න සිද්ධ වුණු බව. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කෙසේ කිව්වත් පසුගිය කාලයේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ගත් වැරදි තීන්දු නිසා තමයි එහෙම වුණේ. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ප්‍රකාශ කළා, "බාහිර කම්පන" කියලා. අනුන්ගේ ලණු කෑම තමයි බාහිර කම්පන විධියට අපි දැක්කේ. රසායනික පොහොර තහනම් කරලා කාබනික පොහොර introduce කළේ, රටේ කාබනික පොහොර නැති වෙලාවක. ලෝකයේත් කාබනික පොහොර නැති වෙලාවක තමයි ඒක කළේ. "වියත්මග" කියලා හදාගෙන අනුන්ගේ ලණු කාපු එක තමයි කළේ. ඒවා තමයි මේ රට වැටෙන්න හේතු වුණු බාහිර කම්පන විධියට අපි දැක්කේ. කොහොම වුණත්, මේ රට වැටිටුවා. එසේ රට වැටිටුවාම බදු අය කරන්න සිදු වුණා. ඊට පසුව අත්‍යවශ්‍ය භාණ්ඩවලට පවා බදු අය කරන්න සිදු වුණා. නමුත්, බදු අය කිරීමේ දී නීතියක් තිබුණා, මාසයකට රුපියල් 100,000කට වැඩි ආදායමක් තිබෙනවා නම් විතරයි බද්දක් අය කරන්නේ කියලා. හැබැයි, ඒ නීතිය රජය විසින්ම කැඩුවා. ඒ නිසා රුපියල් 100,000ක ආදායමක් නැති ඉතිරි කිරීමේ ගිණුම්වලට ලබාදෙන පොලියෙන් සියයට 5ක් අය කිරීම රජය කරන නීතිවිරෝධී වැඩක් කියන එක අපි විශේෂයෙන් කියනවා. බදු අය කළාට කමක් නැහැ. හැබැයි, රජය හදපු නීති රජය විසින්ම කඩන එක තමයි ප්‍රශ්නය.

මේ ප්‍රශ්නය ළමා ඉතිරි කිරීමේ ගිණුම්වලටත් අදාළ වෙනවා. මම මාස 6කට ඉස්සරවෙලා ගරු සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමාගෙන් මේ ගැන ප්‍රශ්න කළා. අවුරුදු ගණනක් රටට සේවය කරලා, සේවය කරලා දරුවන්ට කරදරයක් නොවී තමන්ගේ අභිමානය තුළ ජීවත් වෙන්නට බැංකුවේ මුදලක් තැන්පත් කරලා එයින් ලැබෙන පොලියෙන් තමන්ට අවශ්‍ය බෙහෙත් ටික අරගෙන, ජීවිතයේ අනෙකුත් ප්‍රශ්න විසඳාගෙන හිටපු වැඩිහිටියන්ට ඇත්තටම යහ පාලන ආණ්ඩුව කාලයේ උත්තරයක් දුන්නා. ඔවුන්ගේ ස්ථාවර තැන්පතුවලට සියයට 15ක පොලියක් ලබා දුන්නා. මේ වැඩිහිටියන් වෙනුවෙන් එදා විශේෂ පොලියක් ලබා දුන්නා. වැඩිහිටියන් රැක බලා ගැනීමට තිබෙන depositsවලට සියයට 15ක පොලියක් දුන්නා. මේ රටේ තිබෙන ආර්ථික ව්‍යසනයත් එක්ක මේ පොලිය පහළ බැස්සාය කියන එක අපි පිළිගන්නවා. ගරු ජනාධිපතිතුමා එක්කත් අපි මේ ගැන කථා කළා. එතුමා කිව්වා, "මේ අවුරුද්දේ පොලිය වැඩි කරන්න බැහැ, මේ අවුරුද්දේ මූල්‍ය ප්‍රතිපාදන නැහැ, ලබන අවුරුද්දේ යම් ප්‍රතිශතයකින් පොලිය වැඩි කරන්නම්" කියලා. කමක් නැහැ. ලබන අවුරුද්දේ හෝ කමක් නැහැ වැඩිහිටියන්ගේ තැන්පතු සඳහා පොලිය වැඩි කරනවා නම්. වැඩිහිටියන් ගැන හිතලා, ඔවුන්ගේ ජීවත් වීම ගැන හිතලා, ඔවුන්ගේ අභිමානය ගැන හිතලා, අවුරුදු ගණනාවක් තිස්සේ ඔවුන්ගෙන් රටට සිදු වූ සේවය ගැන හිතලා ඒ පොලිය වැඩි කරනවා නම්, step by step හෝ කමක් නැහැ, වැඩි කරන්න. රටේ ආර්ථිකය, ආදායම් තත්ත්වය ගැන හිතලා පියවරෙන් පියවර හෝ ඒ පොලිය වැඩි කරනවා නම් හොඳයි. අඩු ගණනේ රුපියල් 250,000කට හෝ කමක් නැහැ සියයට 15ක පොලියක් ලබා දීලා, ඊළඟට, රුපියල් 500,000කට පොලිය ලබා දීලා, ඊළඟට තව කාලයකින් සියයට 10කට, - රට gradually ඉහළට යනවා කියලා කියනවා නම්, ක්‍රමානුකූලව ආර්ථිකය ඉහළ යනවා නම්, වැඩිහිටියන්ගේ ගිණුම්වලට ලබාදෙන පොලියත් පොඩ්ඩ පොඩ්ඩ හරි ඉහළ දමන ප්ලෑන් එකක් රටට ඉදිරිපත් කරන්න පුළුවන් නම් ඒක හොඳයි කියලා මම හිතනවා.

හැබැයි, දැන් කථා කරන්නේ ඒ ගැන නොවෙයි. දැන් කථා කරන්නේ රජය නීතිවිරෝධීව, නීතියට පටහැනිව අඩු ආදායම්ලාභීන්ගෙන් බදු අය කිරීම ගැනයි. මාස 6කට ඉස්සරවෙලා මේ පාර්ලිමේන්තුවේ දී ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමාගෙන් මා ප්‍රශ්නයක් ඇහුවා. ජීවත් වෙන්න බැහැයි කියලා මේ රටේ ජනතාව කෑගහද්දී, එයිනුත් වැඩිහිටියන් ඊටත් අමාරුවෙන් ජීවත් වෙද්දී, අවුරුදු ගණනක් සේවය කරලා දැඩි බලාපොරොත්තුවක් තබාගෙන තමන්ගේ සල්ලි ටික deposit කරලා, ඒකෙන් ලැබෙන පොලියෙන් බොහොම අමාරුවෙන් ගැටගහගෙන ජීවත් වෙද්දී, ඒකෙනුත් අනීතික විධියට සියයට 5ක ප්‍රමාණයක් අය කරගන්නවා කියලා කිව්වාම, සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේ දීම ප්‍රකාශ කළා, "නැහැ, අපි ඒක ආපසු ගෙවනවා" කියලා. හැබැයි, මාස 6කට පසුව අද ප්‍රශ්න කළාම එතුමා මේ පාර්ලිමේන්තුවේ දීම කියනවා, "ඒකට ක්‍රමයක් හැදුවා තමයි. හැදුවා වුණාට ඒක ගෙවන්න ක්‍රමයක් නැහැ, ඒ ක්‍රමය බොහොම සංකීර්ණයි, ආපසු ඒ මුදල ගත්ත කෙනෙක් නැහැ" කියලා. අනීතික විධියට, නීතිවිරෝධී විධියට, රටක නීතිය උල්ලංඝනය කරමින්, අඩු ආදායම්ලාභීන්ගෙන් බදු අය කරන එක, රුපියල් 100,000ක ආදායමක් නැති අයගෙන් අය කර ගන්න ඒ සල්ලි ඒ අයට ආපසු ගන්න බැහැ කියලා ඔබතුමා දන්නවා. එහෙම නම් කවදාද ඒ වරද නිවැරදි කරලා හදලා දෙන්නේ කියලා ඇහුවාම, "අපි ඒක ඉදිරියේ දී හදනවා, දින වකවානුවක් කියන්න බැහැ" කියලා කියනවා. අනේ දෙවියනේ! මුදල් අමාත්‍යාංශයක් මෙහෙම කටයුතු කරන්නේ කොහොමද, ගරු සේමසිංහ රාජ්‍ය ඇමතිතුමනි?

ඒ විධියට පොලියෙන් කපපු සියයට පහක මුදල තැන්පත්කරුට ආපසු ගෙවා ගන්න හැකියාවක් නැති මනුස්සයෙක් මේ රටේ මුදල් රාජ්‍ය ඇමතිකමක් කරන්නේ කොහොමද? ඒ සියයට පහ ආපසු ගෙවන ක්‍රමය ගැන කියන දිනයක් දන්නේත් නැහැ, එහෙම ක්‍රමයක් හදන්න දන්නේත් නැහැ. එහෙම නම් රට යථා තත්ත්වයට පත් කරන්නේ කොහොමද? "එසේ අනීතිකව කපන සියයට පහ අපි ආපසු ලබා දෙනවා" කියලා මාස හයකට ඉස්සෙල්ලා මුදල් රාජ්‍ය ඇමතිවරයාම පොරොන්දු වුණා. ඒකට ක්‍රමයකුත් හැදුවා. හැබැයි, ඒ ක්‍රමය ප්‍රායෝගික නැත්නම්, ඒ මිනිස්සු ඒ සල්ලි ආපසු අරගෙනත් නැත්නම්, ඒත් දැන් කියනවා, "මම දන්නවා මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. මේක අනීතිකයි" කියලා. ඒ මුදල ආපසු ගෙවන්න ඕනෑ කියලාත් දන්නවා. ඒ වෙනුවෙන් මාස හයකට ඉස්සෙල්ලා හදපු ක්‍රමය ප්‍රායෝගික නැහැයි කියලාත් දන්නවා. ඒ සියයට පහ ආපසු ගත්ත මිනිහෙක් නැහැ කියලාත් දන්නවා. ඉතින්, මේ ක්‍රමය කවදා වෙනස් කරයිද කියලා මම දන්නේ නැහැ. ඇමතිවරයෙකුගෙන් ලැබෙන්න ඕනෑ උත්තරයක්ද, ඒක? ජනතා නියෝජිතයන්, ඇමතිවරුන් පත් කර තිබෙන්නේ එවැනි කථා අහන්නද? ඒ නිසා මේ ජනතාවගේ දුක ගැන හිතලා, ජනතාවට එන පීඩාව ගැන හිතලා, මේ වැඩිහිටියන් විඳින පීඩාව ගැන හිතලා පොලිය වැඩි කිරීම කෙසේ වෙතත්, අනීතිකව පොලියෙන් අය කරපු සියයට පහ ගෙවන්න මාසයක් ඇතුළත කටයුතු කරන්න කියලා එතුමාට මම විශේෂයෙන්ම කියනවා.

රට ගොඩනැඟීම සඳහා විවිධ බදු ප්‍රතිපත්ති අද ඉදිරිපත් කළා. විවිධ ක්‍රම ඉදිරිපත් කළා. හැබැයි, මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු සේමසිංහ මැතිතුමනි, බදුවලින් විතරක් නොවෙයි රට හදන්න පුළුවන් කියන එක මම විශේෂයෙන්ම කියනවා. ඒ සඳහා විවිධ ක්‍රම තිබෙනවා. අපි පරිසර කමිටුවේ දීත් ඒ ගැන සාකච්ඡා කළා. එක එක ජනාධිපතිවරුන් පත් වෙනවා. එක කාලයක "උතුරු වසන්තය" කියලා ව්‍යාපෘතියක් ආවා. යම් ජනාධිපතිවරයෙක්, යම් ඇමතිවරයෙක් අයින් වුණාම, එතුමන්ලා සිටි කාලය තුළ සිදුකළ කටයුතු කඩාකප්පල් වෙනවා. ඊට පසුව "විසල් හම්බන්තොට" කියලා project එකක් ආවා. එම ව්‍යාපෘතිය හරහා හදපු තැන්වල අද වවුලන් ලගිනවා. ඒවා කළේ රටේ ජනතාවගේ සල්ලිවලින් නේ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා පත් වුණාට පසුව එතුමා

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

"පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය දියත් කළා. ඒ හරහා කෝටි 100කට වඩා වියදම් කරලා හදපු රාජ්‍ය සේවක ගොඩනැඟිල්ල අද වැසී ගිහින් තිබෙනවා.

බාගෙට හදපු මේ ගොඩනැඟිල්ලට රුපියල් කෝටි 100කට වඩා වියදම් කරලා තිබෙනවා. ඒ සඳහා වියදම් කළේ ජනතාවගේ සල්ලි. ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමනි, එදා ඒ ජනාධිපතිවරයා ඉන්න කොට රාජ්‍ය ආයතනවල ඔක්කෝම නිලධාරීන් කිව්වා, එක වහලක් යට ඉඳගෙන රාජ්‍ය සේවය සලසන්න මේ රාජ්‍ය සේවක ගොඩනැඟිල්ලට ඔවුන් එන්නම් කියලා. ඒක හොඳයි. හැබැයි, හිටපු ජනාධිපතිතුමා ගෙදර ගිය ගමන් මේ ගොඩනැඟිල්ලට එක ආයතනයක්වත් ගෙනාවේ නැහැ. ඉතින් මම අහන්නේ, රටේ තිබෙන මීට වඩා දේවල් ගැන අපට හිතන්න තිබෙනවා නේද කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි යාපනයේ නගර ශාලාවත්. රුපියල් කෝටි 1,515ක් ඇස්තමේන්තු කරලා අවුරුදු 3කට, 4කට ඉස්සෙල්ලා ක්‍රියාත්මක කරපු ව්‍යාපෘති තුළින් මේ රටේ ඉදිකරපු ගොඩනැඟිලිවලට රුපියල් කෝටි 398ක් දැනට වියදම් කරලා තිබෙනවා. මේ වෙනකොට ඒවා හදන එක බාගෙට නැවතිලා වවුල්ලු ලැගලා නටබුන් විධියට තිබෙනවා. අපට මේ සඳහා යම් වැඩ පිළිවෙළක් ඕනෑ. රටට ආදායම ගන්න ඕනෑ, රටේ ජනතාවගේ බදුවලින්ම විතරක් නොවෙයි.

අද බලන්න, බිත්තර ආනයනය කරන්න අරගෙන අවුරුද්දක් විතර වෙනවා. නමුත්, තවමත් අපට අවශ්‍ය බිත්තර ටික නිෂ්පාදනය කර ගන්න විධියක් නැහැ. ඒ සඳහා පිට රටට සල්ලි යවනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් අවසන් කරනවා.

අනෙක් පැත්තෙන්, අපි pine timber ආනයනය කරනවා. වාණිජ වන වගාවක් වන පයිනස් වගාව නිසා රටට අවුරුදු 20කට ඇති වෙන්න pine timber තිබෙනවා. ඒවා ගණන් වැඩි හින්දා ලංකාවේ තිබෙන මිලට වඩා අඩු මිලකට මලයාසියාවෙන් ඒවා ආනයනය කරනවා. ඒ සඳහා අවුරුද්දකට ඩොලර් මිලියන 5ක් වියදම් කරනවා.

ඒ වාගේම, ලංකාවේ කසළ, විශේෂයෙන්ම ප්ලාස්ටික් අවුරුද්දකට ටොන් ලක්ෂ 4ක් පාරට, ඇළදොළවලට විසි කරනවා. හැබැයි, අපි වර්ෂයකට ඩොලර් මිලියන 4ක් වියදම් කරලා වෙන රටවල කසළ ටොන් 6,000ක් ආනයනය කරනවා. එතකොට අපේ කසළවලින් හදන්න පුළුවන් කොපමණ ටික හදාගන්න. අපි monofilaments ආනයනය කරනවා. ගරු සේමසිංහ රාජ්‍ය ඇමතිතුමනි, මම කියන්නේ, මුදල් අමාත්‍යාංශයේ වැඩකටයුතුවලින් වාගේම අනික් අමාත්‍යාංශවලින් කරන වැඩවලිනුත් අපට ඩොලර් ඉතිරි කරගන්න පුළුවන්, ඒ ආදායම හදාගන්න පුළුවන් කියලායි. ඒ හින්දා මුදල් අමාත්‍යාංශයට අපි කියනවා, ගණන් හද හදාම, පනත් හද හදාම ඉන්නේ නැතිව රාජ්‍ය ආයතන ටිකත් එකතු කරලා ඒ හරහා අපට ඉතිරි කර ගන්න පුළුවන් ඩොලර් ටික, විදේශ විනිමය ඉතිරි කර ගැනීමට යම්කිසි වැඩ පිළිවෙළකුත් මේ එක්කම හදන්න කියලා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳ කාරණයක් මතු කළා. ඒ තමයි, විවිධ අවස්ථාවලදී විවිධ නායකයන් සහ මැති ඇමතිවරුන් පත්වෙලා, ආණ්ඩු පත් වුණත්, ප්‍රතිපත්තිය මාරු වෙන්නේ කොහොමද කියන කාරණාව. මම හිතනවා, ඒක අපි හොඳටම හඳුනා ගත්තා කියලා. ඒ වාගේම රටට අභාග්‍යසම්පන්න කාලයකුත් තිබුණා. පසුගිය අවුරුදු දෙක ඇතුළත අපට ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම නැති කරන්න බැරි වුණත් සැලකිය යුතු ප්‍රමාණයකින් අවම මට්ටමකට අපි අරගෙන ආවා. ඉතින් මේ තත්ත්වය ඉදිරියේදී ඇති නොවෙන්න තමයි අපි විසඳුමක් විධියට ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත හඳුන්වා දී තිබෙන්නේ. ඔබතුමා කියපු අදහස් එක්ක මම හිතනවා, ඔබතුමන්ලාගේ පක්ෂය ඒ සඳහා අධිකරණමය කටයුත්තකට යොමු වෙලා නැතිව ඇති කියලා. ඔබතුමා කිව්ව දේවල් අපි පිළිගන්නවා. මොකද, අපට තවදුරටත් ණය අරගෙන මේ කියපු ව්‍යාපෘති ඉදිරියට ගෙන යන්නත් බැහැ. අපි ආයෝජන මට්ටම් ගැන දන්නේත් නැහැ. ඒ සඳහා හිතකර පරිසරයකුත් නැහැ. අපි විරැකියාව, ආයෝජනය කියන මේ සියල්ල ඇතුළත්ව මේ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙනවා. ඒකට තව එකතු කරන්න ඕනෑ කාරණා තිබෙනවා නම්, අපි ඒ සඳහා විවෘතයි. අප සියලුදෙනාම පොදුවේ පිළිගන්නවා, ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව රටේ තිබෙනවාය කියන එක. ඉතින් අපි ඒ සඳහා මූල පුරලා තිබෙනවා. එහි යම් යම් කාරණාවල වෙනස්කම් විය යුතු නම් ඒ පිළිබඳව අපට සාකච්ඡා කරලා කටයුතු කරන්න පුළුවන්.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියපු දේවල් මම පිළිගන්නවා. මම තව කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේ රට ගොඩනැඟීම සඳහා, සංවර්ධනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වාගේ සභාවක් තුළින් අනුමැතිය එනවා නම් හොඳයි. එක එක ජනාධිපතිවරු, එක එක ඇමතිවරු එක එක ඒවා කියන කොට ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් පත් කරපු කමිටුවකින් filter වෙලා යනවා නම් ප්‍රායෝගික දේ සිද්ධ වෙනවා. මේ ජනාධිපතිතුමා කරන ව්‍යාපෘති ඊළඟ ජනාධිපතිතුමාට ප්‍රායෝගික නැති වෙලා ඒ ව්‍යාපෘතිවල වවුල්ලු ලඟිනවා. ඒ නිසා ස්වාධීන කණ්ඩායමකින් මේ රටේ සංවර්ධනය ගැන තීන්දු-තීරණ ගන්නවා නම් මම හිතනවා, මේ දේවල් නිවැරැදි වෙයි කියලා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ඔය කාරණය කලින් අවස්ථාවකදීත් සිදු වෙලා තිබෙනවා. වියත්මග වාගේ ඒවා ඇවිල්ලා පසුගිය කාලයේ ඒ තුළින් ගත්ත තීන්දු-තීරණ බොහෝ අසාර්ථක වුණා. ඒ වාගේ තත්ත්වයක් අපි කියනවා වාගේ සුන්දර නැහැ, ගරු මන්ත්‍රීතුමනි. පිටස්තර පුද්ගලයන්, ඒ කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට වග කියන්නේ නැති පිටස්තරම කණ්ඩායම් ඇවිල්ලා තීන්දු-තීරණ ගැනීම සුදුසු නැහැ. නමුත්, අපේ ප්‍රවාහයට ඔවුන්වත් එකතු කරගෙන ඉදිරියට යන්න පුළුවන් වැඩසටහනක් අපි ක්‍රියාත්මක කරමු. ඒකට අපේ විරුද්ධත්වයක් නැහැ. හැබැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගත්තොත්, ඒක පාර්ලිමේන්තුව නියෝජනය කරනවා, ආණ්ඩුව සහ විපක්ෂය කියන සියලුදෙනා නියෝජනය කරනවා, සිවිල් සංවිධානත් නියෝජනය කරනවා. ඉතින් අපි ඕනෑවට වඩා මේ කටයුත්ත සංකීර්ණ කරගෙන ඉස්සරහට යන්න ඕනෑ නැහැ. අපි ඇගැයීමේ ප්‍රතිපත්තියකුත් ගෙනැල්ලා තිබෙන්නේ ඒ කාරණාව නිසායි.

අපි බැලුවොත්, අගමැති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් National Operations Room එක ක්‍රියාත්මක වෙනවා. ඉතින්, මේවා පිළිබඳවත් assessment එකක් ගන්න. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමනි, මම ඔබතුමාත් එක්ක එකඟ වෙනවා. ඒ වාගේම ඉතිහාසයේ සිදු වුණු අඩු පාඩු නැවත ඇති නොවෙන්න කටයුතු කිරීමත් වැදගත් වෙනවා. පොදුවේ අරගෙන බැලුවොත්, සමස්තයක් හැටියට අපි එක තැනක ඉන්නවා. තවදුරටත් එකට කටයුතු කරන්නේ කොහෙමද කියලා අපි ඉදිරියේදී සාකච්ඡා කරමු.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඒ ඔක්කෝම ජනතාවගේ සල්ලි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.34]

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත - Public Debt Management Bill - ගැන කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. කාලයකට පස්සේ යම් කිසි මධ්‍යස්ථ, නැත්නම් balanced කථාවක් මෙහිදී අපි කළ යුතුව තිබෙනවා. මේ වෙලාවේ ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමා සභාවේ ඉන්නවා. මේ රටේ ණය කළමනාකරණය - debt management - පිළිබඳව අලුතින් නීතියක් ගේන්න සිදුවෙලා තිබෙනවා කියන්නේම, රටක් විධියට අපි බරපතළ කඩා වැටීමක ඉන්නවා කියන එකයි. ලෝකයේ බොහෝ රටවල public finance management laws තිබෙනවා. හැබැයි, public debt management law එකක් ගේන්න වෙනවා කියන එකෙන් ඒ රටේ මූල්‍ය විනය සම්බන්ධව පුළුල් කථාවක් කියනවා. අපේ රටේ එක් ආණ්ඩුවක් නොවෙයි, ආණ්ඩු ගණනාවක් එක දිගට ණය අරගෙන එම ණය නැවත ගෙවන්න බැරි තැනකට, ආර්ථිකය වැටෙන තැනකට ගමන් කරලා තිබෙනවා. මේ ප්‍රශ්නය ආමන්ත්‍රණය කරන්නේ නැතුව අපට ආර්ථිකය ගැන අලුතින් හිතන්න බැහැ. ඒ නිසා ණය කළමනාකරණය - debt management - කියන එක අලුත් විෂයයක් විධියට දැන් අපේ නීති පොතට ගේන්න වෙලා තිබෙනවා. ලෝකයේ දියුණු රටවල නීති පොත්වල debt management laws නැහැ, debt management සම්බන්ධ discipline එකක් තිබෙන්නේ. හැබැයි, අපට ඒකට නීතියක් දමන්නේ නැතුව බැහැ. ආපසු ගෙවන විධිය හිතන්නේ නැතුව එන එන ආණ්ඩු ණය අරගන්නවා වාගේම, විශේෂයෙන්ම අපේ GDP එකට සාපේක්ෂව ගත්තාම ඉතාම ඉහළ අගයකට ණය වාරික ගෙවන්න සිදුවන තත්ත්වයකට රටේ ආර්ථිකය වැටිලා තිබෙනවා. මේකෙන් එළියට යන්නේ කොහොමද කියන එක ගැන ශෙහාන් සේමසිංහ මැතිතුමන්ලාත්, අපිත් අතර විවිධ සංවාද තිබෙනවා. මේකෙන් එළියට යන්න IMF එක විසින් ඉදිරිපත් කළ agenda එක ඇතුළේ කොච්චර දුරක් යනවාද, ඒ agenda එකෙන් එළියට යන්නේ කවදාද කියන එක පිළිබඳ පුළුල් සංවාදයක් අපි අතර තිබිය යුතුයි; එය දැනටත් තිබෙනවා. මම හිතන විධියට ඊළඟ ජනාධිපතිවරණයේදී ප්‍රධාන මාතෘකාව වෙන්නේත් මේක.

මේ ආර්ථිකය ඉස්සරහට ගෙනියන්න අපි කුමන ආකෘතියක ගමන් කරනවාද කියන කාරණයේදී අපි මෙතෙක් කරලා තිබෙන වැඩවලින් එළියට යන්න, මෙතෙක් කරපු වැරදිවලින් එළියට යන්න අපට සමහර නීති අවශ්‍ය වෙනවා. ඒ අර්ථයෙන් ගත්තාම, මේ debt management සම්බන්ධ නීතියක් ගේන්න අපට එකඟ වෙන්න වෙලා තිබෙනවා. මේ සඳහා මීට ඉස්සෙල්ලාත්, 2002දී රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත ගෙනැල්ලා තිබුණා. හැබැයි, කිසිම ආණ්ඩුවක් තමන්ගේ Budget එක හදද්දී ඒක භාර ගත්තේ නැහැ. එම නිසා Budget එකෙන් වැඩි කරන, එහෙම නැත්නම් Budget එකෙන් වෙන් කරන සමාජ සුබසාධන පද්ධතිය ණය විධියට තමයි අද වෙනකල් ආවේ. ඒක බරපතළ තත්ත්වයක්. එම නිසා අද මේ ප්‍රශ්නය විසඳන්න සිදුවෙලා තිබෙනවා. මේ රටේ තිබුණු ආණ්ඩු ගණනාවක් විසින් ඇති කරපු තත්ත්වයෙන් එළියට යන්න අනාගත ආණ්ඩුවලට දෙන යම් කිසි නෛතික ආකෘතියක් හැදීම කියන එක තමයි අද අපි කරන සාකච්ඡාවලින්, අපි කරන සංවාදවලින් කථා කරන්න වෙලා තිබෙන්නේ. හැබැයි මම මෙතැනදී කියන්න කැමැතියි, රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත සහ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත අතර බරපතළ විධියේ වෙනසක් තිබෙන බව. ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත අනාගතයේ සංවාදයට ලක් වෙද්දී අපට ඒ සම්බන්ධයෙන් කථා කරන්න පුළුවන්.

අපේ රටේ සම්පූර්ණ ආර්ථික ආකෘතිය IMF වැඩසටහන ඇතුළේ හිර කරලා නීතියක් විධියට තබන එක තමයි ආර්ථික පරිවර්තන පනතේ අදහස වෙලා තිබෙන්නේ. හැබැයි, Public Debt Management Act එක ඇතුළෙන් අපට එකඟ වෙන්න වෙනවා, කොයි ආණ්ඩුවක් ආවත් ණය ගැනීමේ සීමාව මොකක්ද, ඒ වාගේම ඒ ඒ රජයන්වල fiscal policy එක ඇතුළේ තීන්දු-තීරණ ගන්නකොට ඒ ණය මත පදනම් වෙන්න පුළුවන් සීමාව මොකක්ද කියලා. එම නිසා අසීමිත සිහින ලෝකවල ඉඳලා Budget හදන්න බැරි තැනකට රට යා යුතුව තිබෙනවා.

ඒක මම දැක්කා, මමත් හිටපු අපේ ආණ්ඩුවේ 2020-2022 කාලයේ අවසාන අය වැය ඉදිරිපත් කරනකොට. ශ්‍රී ලංකා මුදල් සම්බන්ධව ඒගොල්ලන් කල්පනා කළේ සිහිනයක් වාගේයි. සිහිනයකදී කරපු කල්පනාවක් තිබුණේ; numbers විතරයි එකතු කරන්නේ. ඒවා ඔක්කොම අභ්‍යන්තරික ණය විධියට භාණ්ඩාගාර බිල්පත් හරහා ගෙඩි පිටින්, ගොඩවල් පිටින් ලබා ගැනීමට මැදිහත් වුණා. ඒ පිළිබඳව විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අපට ඒ ගැන ස්වයං විවේචනයක් වුණත් කරන්න සිදු වෙලා තිබෙනවා. එක අවුරුද්දක රුපියල් ට්‍රිලියන දෙකක, දෙකහමාරක විතර විශාල මුදලක් අභ්‍යන්තරික ණය විධියට ගත්ත ආණ්ඩුවක් තමයි, 2020-2022 කාල සීමාවේ තිබුණේ. ඒ නිසා ඒ ආණ්ඩුවේ financial managementවල වගකීම තිබෙන්නේ කාටද කියන එක පිළිබඳව වර්තමාන ආණ්ඩුවේ ඇමතිතුමන්ලා කථා කරනවා මම දැක්කා. මට ඉස්සෙල්ලා කථා කරපු ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා සමහර පුද්ගලයන්ගේ නම් කියනවා මම දැක්කා. ඒ ආණ්ඩුවේ විවිධ කණ්ඩායම් හිටියා. ඇත්තටම ඒ කණ්ඩායම්වල විවිධ බලපෑම් තිබුණා. හැබැයි, ඒ හුඟක් අය කැබිනට් මණ්ඩලයේ හිටියා. බන්දුල ඇමතිතුමන්ලා පවා හිටපු කැබිනට් මණ්ඩලවලින් තමයි, විශේෂයෙන්ම ඒ ආණ්ඩුවේ විසර්ජන පනත් කෙටුම්පත් සම්මත වුණේ. ඒ කැබිනට් මණ්ඩලවලින් තමයි, Budget Proposals අනුමත වුණේ. ඒ කැබිනට් මණ්ඩලවලින් තමයි ඔය කියන මූල්‍ය විනය කඩාගෙන වැටෙන තීන්දු-තීරණ තමයි, ඒ ඔක්කොගේම අත් දෙක ඔසවලා, ඉතාම සුවව, කීකරු විධියට ගත්තේ.

මම වියත්මහට සම්බන්ධ කෙනෙක් නොවෙයි. ඒ බව ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමන්ලා දන්නවා. අපි දේශපාලනය කරපු අය. නමුත්, මමත් විශ්වවිද්‍යාලයක උගන්වපු

[ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා]

කෙනෙක් නිසා, සමහර අවස්ථාවලදී ලාභෙට වියත්මහ කැල්ලට තල්ලු වෙනවා කියන එකත් මම කියන්න ඕනෑ. මම වියත්මහ නිසාම හුඟක් දේවල් නැති වෙච්ච පුද්ගලයෙක්. නමුත්, ඒ වියත්මහ කථාව වැදගත්. හැබැයි, මම කියන්නේ ඒක නොවෙයි. මම කියන්නේ, ඒ ආණ්ඩුවේ හුඟක් තීන්දු-තීරණ ගත්තේ ඒ කැබිනට් මණ්ඩලයෙන් කියන එකයි. ඒ කැබිනට් මණ්ඩලයේ හිටපු අය ඔක්කොම ඒවාට වග කියන්න ඕනෑ.

මම ගරු රාජ්‍ය ඇමතිතුමාට යෝජනා කරන්න කැමැතියි, ඔබතුමන්ලා ඉදිරිපත් කරපු මේ රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත යටතේ රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුවට නිලධාරීන් පත් කරද්දි Public Enterprises Department එකේ DG පත් කළා නම් හොඳයි කියලා. ඒක කරන්න පුළුවන්ද කියලා මම දන්නේ නැහැ. මොකද, public enterprisesවල තමයි, සමහර අවස්ථාවල රාජ්‍ය ණයවල භාරයේ කොටසක් තිබෙන්නේ, සමහර අවස්ථාවල guarantees දෙන්නේ. ඒ නිසා රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධව රජයේ තිබෙන ප්‍රධානම ආයතනය තමයි Treasury එක යටතේ තිබෙන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව. එ් නිසා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ DGවත් ඒ කමිටුවේ හිටියොත් හොඳයි කියලා මම විශ්වාස කරනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කැමැති නම් අද කාරක සභා අවස්ථාවේ සංශෝධන ඉදිරිපත් කිරීමේදී ඒ කාරණය දෙසත් බලන්න.

ඒ වාගේම මම හිතනවා, අපේ රටේ රාජ්‍ය ණය සම්බන්ධව නීතියක් පමණක් නොවෙයි, බරපතළ විනයගතවීමකුත් රාජ්‍යයට අවශ්‍යයි කියන එක. ණය මත පදනම් වෙලා සිහින දකින දේශපාලනයෙන් අයින් වෙන්න ඕනෑ වාගේම, ණය මත රාජ්‍ය සංවිධානය කරන තැනින් අපි යම්කිසි දුරකට ඉස්සරහට යන්නත් ඕනෑ. ඒ නිසා ආදායම් උපදවනසුලු රටක් හදන්න, රාජ්‍යයක් හදන්න අවශ්‍ය නම් ඒ ගැනත් හිතන්න ඕනෑ. ඒ නිසා මම විශ්වාස කරනවා, සෑහෙන්න කාලයකට පස්සේ public debt management law එකකට යන්න සිදු වීම ම රටක් විධියට කනගාටුදායක තත්ත්වයක් කියලා. මොකද, ලෝකයේ public finance manage කරන්න නීති හැදුවාට, public debt manage කරන්න කියලා වෙනම නීතියක් හදන්න අපේ රටට වෙලා තිබෙන්නේ, debt ගැන කිසිම වගකීමක් නැතුව ණය ගන්න රටක් බවට අපේ රට පත් වෙච්ච නිසායි. ඒ තත්ත්වයෙන් එළියට යන්න අපි හැමදෙනාටම අවස්ථාව ලැබෙයි කියලා බලාපොරොත්තු වෙන ගමන්, ඊළඟ ජනාධිපතිවරණ සංවාද මණ්ඩපය ඇතුළේ අපි මේ ප්‍රශ්නය හරියටම සංවාද කරන තැනකට යන්න ඕනෑ. ඒ වාගේම, public debt management එකත් එක්ක අපි එකඟ වුණාට ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත යටතේ ආර්ථිකයේ උත්පාදනය සම්බන්ධව, wealth creations සම්බන්ධව දක්වන අදහස එක්ක අපට බරපතළ ප්‍රශ්න තිබෙන බව ප්‍රකාශ කරමින්, ඒ ගැන අනාගතයේදී සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙන බවත් ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය නිමා කරනවා.

බොහොම ස්තුතියි.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා කිව්ව කාරණයක් ගැන මම කියන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමා මතු කරපු සංශෝධනය මේ වෙනකොටම ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකේ කියනවා, "The Director General of the Department of Public Enterprises is in charge of the subject of public enterprises of the Treasury" කියලා.

ඒ වාගේම ඔබතුමා ඉදිරි ගමන් මඟ පිළිබඳව ප්‍රශ්නයක් හැටියටද දන්නේ නැහැ මතු කළේ. විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ මේ ඇති කර ගත් එකඟතාවලින් බැහැර වෙලා ඉස්සරහට යන්න අපේ රජය යටතේ කටයුතු කරන්නේ නැහැ. මොකද, අපට නැවත දඟඅටවෙනි වතාවටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනකට මේ රට ගෙනයන්න අවශ්‍යතාවක් නැහැ.

ඒක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේත් බලාපොරොත්තුව නොවෙයි. ඔබතුමා කිව්ව කාරණය ඇත්ත. ඉතිහාසයේ වුණු වැරදි, නිවැරදි වීම සිදු විය යුතුයි. ඒ වැරදි, නිවැරදි කර ගැනීමට කවුරුත් ලජ්ජා වෙන්න ඕනෑත් නැහැ. ඒවා නිවැරදි කර ගැනීම සඟ අලුත් ප්‍රතිපත්ති අනුගමනය කිරීම අපි තවදුරටත් පමා කරන්න ඕනෑත් නැහැ. ඒ හින්දා මේක තමයි ගමන් මඟ. හැබැයි, අපි විශේෂයෙන්ම ඇහුවේ විපක්ෂයේ ගමන් මඟ මොකක්ද කියායි. නාලක ගොඩහේවා මන්ත්‍රීතුමා උපදෙස් දෙන විපක්ෂයේ ගමන් මඟ මොකක්ද කියන එකත් අපි දන්නේ නැහැ. ඒ ගැන තමයි අපිත් මේ පැහැදිලි කර ගැනීම කරන්නේ. ඔබතුමාටත් ඒ ගැන අපැහැදිලිතාවක් තිබෙනවා කියන එක තමයි පේන්න තිබෙන්නේ. අපේ ගමන් මඟ තමයි අපි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේක තමයි අපේ වැඩසටහන.

(මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ඒක ගැන දීර්ඝ කථාවක් තිබෙනවා. ගමන් මඟත් පැහැදිලි කරන්න අවශ්‍යයි. ඒ වාගේම IMF එකේ agenda එක ඇතුළේ යන කරුණු ගණනාවක් ගැනත් අනාගතයේදී ඔබතුමාට කථා කරන්න වෙයි. අපි ඒ ගැන කථා කරමු. අපි ඒක ඔය කියන විධියටම විශ්වාස කරන්නේ නැහැ. හැබැයි, මෙතෙක් ගත්ත ණය සම්බන්ධව රාජ්‍යයට විනයක් තිබෙන්න ඕනෑය කියන එක, IMF එක කිව්වත් නැතත් ඇත්ත කථාවක්. IMF එකේ කීම මත නොවෙයි අපි රාජ්‍ය ණය සම්බන්ධ කළමනාකරණයකට යන්න ඕනෑ කියන එකේ තේරුම හැටියට තිබෙන්නේ. හැබැයි, අපි විශ්වාස කරනවා, මේ රටේ ආර්ථිකය ඉස්සරහට ගැනීම - wealth creation - කොහොමද කරන්නේ කියන එක ගැන අලුත් වටයක සංවාදයක් අවශ්‍යයි කියලා. ඔබතුමන්ලාගේ මතය පැහැදිලියි. මම දන්නේ නැහැ, ඒ ගැන නාලක ගොඩහේවා මැතිතුමා මොකක්ද හිතන්නේ කියලා. ඒක ඔබතුමා වෙනම,-

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ඔබතුමාගෙන් ඇහුවේ, එතුමාත් ඔය මතයේද ඉන්නේ කියායි.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

නැහැ, ඒක මම දන්නේ නැහැ. එතුමා ඉන්නේ වෙනම අදහසක වෙන්න පුළුවන්. නමුත්, අපි විශ්වාස කරන්නේ ඔබතුමන්ලා ඉදිරිපත් කරලා තිබෙන ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත තුළින් අපට නැවත වතාවක්, දඟඅටවෙනි වතාවටත් IMF එකට යන්න වෙනවා මිසක් එයින් එහාට දෙයක් වෙන්නේ නැහැ කියන එකයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Ali Sabry Raheem. You have ten minutes.

[பி.ப. 2.45]

ගරු අලි සබ්රි රහීම් මහතා
(மாண்புமிகு அலி சப்ரி ரஹீம்)
(The Hon. Ali Sabri Raheem)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த 30 வருடங்களாகப் புத்தளம் மாவட்டத்தில் ஒரு முஸ்லிம் பாராளுமன்றப் பிரதிநிதித்துவம் இல்லாமல் இருந்த நிலையில், 2020ஆம் ஆண்டு இடம்பெற்ற பாராளுமன்றத் தேர்தலில் சிறுபான்மை மக்கள் ஒன்றிணைந்து பொதுச் சின்னத்தில் போட்டியிட்டு ஓர் ஆசனத்தைப் பெற்றுக்கொண்டார்கள்.

கடந்த 30 வருடங்களாகப் புத்தளம் தேர்தல் தொகுதி யானது, அபிவிருத்தியில் புறக்கணிக்கப்பட்டே வந்திருக்கிறது. உதாரணத்துக்கு, புத்தளம் Base Hospitalஐக் குறிப்பிடலாம். இந்த வைத்தியசாலையானது, கடந்த 30 வருடங்களாக அபிவிருத்தி செய்யப்படாத நிலையிலே இருக்கின்றது. இந்த Base Hospital வடமேல் மாகாண சபையின்கீழே இயங்கி வருகின்றது. வடமேல் மாகாண முதலமைச்சராக, அமைச்சர் களாக வருபவர்கள் குருநாகல் பகுதியைச் சேர்ந்தவர்களாக இருக்கின்றார்கள். புத்தளம் மாவட்டத்தைப் பிரதிநிதித்துவப் படுத்தி அம்மாகாண சபைக்கு ஓர் அமைச்சர் வருவதென்றால், அவர் சிலாபம், ஆனமடுவ போன்ற பிரதேசங்களைச் சேர்ந்த வர்களாகத்தான் இருப்பார். மத்திய அரசாங்கத்தின் அமைச்சர் களும் மாகாண அமைச்சர்களும் புத்தளம் நகரை மாற்றாந்தாய் மனப்பான்மையுடன்தான் பார்க்கின்றார்கள். எனவேதான், புத்தளம் Base Hospitalஐத் தரமுயர்த்தித் தருமாறு நான் இந்தச் சபையில் தயவாகக் கேட்டுக்கொள்கின்றேன்.

அதேபோன்று, மாகாண சபைக்குட்பட்ட நிக்கவெரட்டிய விலுள்ள வைத்தியசாலையானது, மூன்று வருடங்களுக்கு முன்னர்தான் Base Hospitalஆகத் தரமுயர்த்தப்பட்டது. இன்று அந்த hospital நல்ல முறையில் முன்னேற்றப்பட்டு இருக்கின் றது. ஆனால், புத்தளம் Base Hospitalஐ மட்டும் கைவிட்டிருக் கிறார்கள். இதற்கு என்ன காரணம் என்று தெரியவில்லை. புத்தளத்தில் சிறுபான்மை மக்கள் அதிகமாக வாழ்கின்ற காரணத்தினாலோ என்னவோ, அப்பிரதேசத்தை மாற்றாந்தாய் மனப்பான்மையுடன் பார்க்கின்ற சூழ்நிலை காணப்படுகின் றது. புத்தளம் Base Hospitalஆனது, 25 வருடங்களுக்கு முன்னரே Type-A hospital ஆகும். எனினும், அங்கு போதி யளவு bed வசதி இல்லை; போதியளவு doctors இல்லை; ஒழுங்கான பாதைகள் இல்லை; வடிகான் வசதிகள் இல்லை. இதனால் அந்த வைத்தியசாலையானது, ஒரு பிரதேச hospital போன்றுதான் காட்சியளிக்கின்றது.

இரண்டு மாதங்களுக்கு முன்னர், கௌரவ சுகாதார அமைச்சர் ரமேஷ் பதிரண அவர்கள் புத்தளம் மாவட்டத்துக்கு வருகை தந்திருந்தார். அப்போது புத்தளம் மாவட்டத்திலுள்ள பாராளுமன்ற உறுப்பினர்கள், அவரைப் புத்தளம் நகரிலுள்ள base hospital தவிர்ந்த, ஆனமடுவ, மாரவில, தங்கொட்டுவ போன்ற இடங்களிலுள்ள வைத்தியசாலைகளுக்கு அழைத்துச் சென்றார்கள். அவர் அந்த வைத்தியசாலைகளின் அபிவிருத்திக் காக இம்முறை budgetஇல் ஒதுக்கிய பணத்தில் 400 மில்லியன் ரூபாயை வழங்கியிருக்கிறார். ஏன் அவர் புத்தளம் நகரிலுள்ள வைத்தியசாலைக்கு வரவில்லை? யார் அவரைத் தடுத்தது? ஏன் புத்தளம் Base Hospitalக்கு நிதி ஒதுக்கீடு செய்வதில்லை என்று கேட்டால், அதற்குப் பதில் கிடைக்காத ஒரு சூழ்நிலை தான் காணப்படுகின்றது. புத்தளம் நகரமும் இலங்கை தீவுக்குள்தான் இருக்கின்றது. எனவே, புத்தளம் நகரை மாற்றாந்தாய் மனப்பான்மையுடன் பார்க்காமல், அதை இந்த நாட்டிலுள்ள ஒரு மாவட்டத்தின் பிரதான நகரமாகப் பார்க்க வேண்டுமென நான் இந்த உயர் சபையில் தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

2005ஆம் ஆண்டு புத்தளம் மக்கள் அங்கு තෙල් බලාගාරය என்னும் அனல் மின் உற்பத்தி நிலையத்தை அமைக்க வேண்டாமென ஆர்ப்பாட்டம் செய்தார்கள். அதன்போது, ஒரு மரணமும் ஏற்பட்டது. எனினும், சூழல் பாதிப்பை ஏற்படுத்தக் கூடிய තෙල් බලාගාරයஐ அங்கு அமைத்தார்கள். அதன்மூலம் முழு இலங்கைக்கும் electricity வழங்கப்படுகின்றது. எனினும், அங்குள்ள விவசாயிகளுக்கு இன்னமும் electricity பூரணமாக வழங்கப்படவில்லை. இவ்வாறு மிகவும் பின்னடைவான நிலையிலே புத்தளம் நகரம் இருக்கின்றது. புத்தளத்தில் பெரும்பான்மையாக சிறுபான்மையின மக்கள் வாழ்வதனாலா? அல்லது கடந்த 30 வருடங்களாக அத்தேர்தல் தொகுதியைப் பிரதிநிதித்துவப்படுத்தி சிறுபான்மை இனத்தைச் சேர்ந்த ஒரு பாராளுமன்ற உறுப்பினர் இல்லாத தனாலா? அந்நகரம் ஓரங்கட்டப்படுகின்றது என்று அங்கு வாழுகின்ற மக்கள் கேட்கின்றார்கள். என்னுடைய பார்வை யில், அங்கு சிறுபான் மையின மக்கள் அதிகமாக வாழுகின் றார்கள் என்பதனால்தான் ஓரங்கட்டப்படுகின்றது.

இந்த நாட்டில் கிட்டத்தட்ட 30 வருடங்கள் LTTE இயக்கத்தினருடன் யுத்தம் நடைபெற்றது. அந்த யுத்தமானது, கௌரவ மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய ஆட்சிக் காலத்தில் நிறைவுக்குக் கொண்டுவரப்பட்டது. கொழும்பிலிருந்து கிட்டத்தட்ட 450 கிலோமீற்றர் தூரத்திலுள்ள யுத்தம் நடை பெற்ற பிரதேசங்களான யாழ்ப்பாணம், முல்லைத்தீவு, மன்னார் போன்ற பிரதேசங்களில் இன்று அபிவிருத்தி நடைபெறு கின்றது. ஆனால், கொழும்பிலிருந்து கிட்டத்தட்ட 130 கிலோ மீற்றர் தூரத்திலுள்ள புத்தளம் அபிவிருத்தியில் புறக்கணிக்கப் பட்டு இருக்கின்றது. மாண்புமிகு ஜனாதிபதி அவர்கள் யாழ்ப்பாணத்துக்குச் செல்கிறார்; முல்லைத்தீவுக்குச் செல்கிறார்; மன்னாருக்குச் செல்கிறார். அங்கு புதிய புதிய buildings open பண்ணப்படுகின்றன. அதுமாத்திரமன்றி, அங்கு எல்லா விதமான அபிவிருத்திகளும் நடைபெறுகின்றன. ஆனால், புத்தளம் மட்டும் அபிவிருத்தி செய்யப்படுவதில்லை. காரணம், 30 வருடங்களாக அங்கு சிறுபான்மையின பிரதிநிதித்துவம் இருக்கவில்லை. 2020ஆம் ஆண்டுதான் நான் அங்குள்ள சிறுபான்மை மக்கள் சார்பில் பாராளுமன்றத்துக்குத் தெரிவா னேன்.

நான் பாராளுமன்றத்துக்கு வந்த பின்பும் புத்தளம் புறக்கணிக்கப்படுகின்றது. ஆனால், எங்களுடைய மக்கள் தொடர்ந்தும் ஐக்கிய தேசியக் கட்சிக்கும் ශ්‍රී ලංකා සුතන්ත්‍රිය கட்சிக்கும் மாறி மாறி வாக்களித்து, அங்கிருக்கின்ற பெரும் பான்மையின சமூகத்தைச் சார்ந்தவர்களைப் பாராளுமன்றத் துக்குத் தெரிவுசெய்து அனுப்புவார்கள். பெரும்பான்மையின சமூகத்தைச் சேர்ந்தவர்கள் தெரிவானாலும் பரவாயில்லை. அவர்கள் புத்தளத்துக்கென்று ஒதுக்கீட்டைப் பெற்றுக் கொடுக்கவில்லை; புத்தளம் hospitalஐ develop பண்ண வில்லை. புத்தளத்தில் 30 வருடங்களுக்கும் மேலாக வெள்ளப் பிரச்சினை இருக்கிறது. மழை பெய்கின்ற ஒவ்வொரு முறையும் புத்தளம் நகரம் வெள்ளத்தால் பாதிக்கப்படுகின்றது. அங்கே எந்தவிதமான அபிவிருத்தியும் இல்லை. ஆகவே, புத்தளத்துக்கு வந்து அங்கிருக்கின்ற சூழ்நிலையைப் பாருங்களென்று நான் மாண்புமிகு ஜனாதிபதி, மாண்புமிகு பிரதமர் மற்றும் உறுப்பினர்கள் என எல்லோரிடமும் இந்த உயர் சபையில் கேட்டுக்கொள்கின்றேன். அங்கு வந்து, புத்தளம் hospitalஐப் பாருங்கள்; பாதைகளைப் பாருங்கள்! உதாரணத்துக்கு, புத்தளத்திலிருந்து ஆனமடுப் பக்கமாகச் சென்றால், 'பொறல்'

[ගරු අලි සබ්රි රහීම් මහතා]

පාතෙකලේ කිටයාතු. ආනාල්, පුත්තලම් නකරත්තිල් 'කාපට්' පාතෙයෝ, 'කොංක්රීට්' පාතෙයෝ කිටයාතු. අංකේ 'පොරල්' පාතෙකළ්තාන් ඉරුක්කින්රන. පුත්තලම් නකර සපෙ අටුත්ත වරුටම් මානකර සපෙයාකත් තරමුයර්ත්තප්පට විරුක්කින්රතු. ආනාල්, අතු මානකර සපෙ පෝලවුම් ඉල්ලෙ; නකර සපෙ පෝලවුම් ඉල්ලෙ. පිරතේස සපෙයෙවිට, මෝසමාන නිලෙයිල් කාට්සියලික්කින්රතු. පුත්තලම් එන්පතු ඉලංකෙත් තීවිලුළ්ල ඔරු නකරම්. අතුවුම් පිරතාන නකරම්. ආකවේ, ඉන්ත විටයත්තෙක් කවනත්තිලෙටුත්තු, අන්ත මක්කළුක් කුරිය සේවෙකළෙච් සෙය්ය වේණ්ටුමෙන නාන් මාණ්පුමිකු ජනාතිපතියිටත්තිලුම් කෙළරව අමෙච්චර්කළිටත්තිලුම් කේට්ටුක්කොළ්කින්රේන්.

පුත්තලත්තිල් ඔරු Air Force camp ඉරුක්කින්රතු. අතු උංකළුක්කුත් තෙරියුම්. යුත්තත්තුක්කු මුන්පු, අතු 600 ඒක්කරාක ඉරුන්තතු. යුත්තත්තුක්කුප් පිරකු, අතු 1,000 ඒක්කරාකියතු. ඉප්පෝතු අතු 1,300 ඒක්කර්! අංකේ විවසායිකළුක්කුක් කාණිකළ් ඉල්ලෙ. අංකුළ්ල මක්කළ් කාණි කේට්ටුප් පෝරාටු කින්රාර්කළ්. අංකිරුන්ත ආයිරක්කණක්කාන විවසායක් කාණිකළ් තාප බලාහරයවුක්කෙන එටුක්කප්පට්ටු විට්ටතු. අතේපෝන්රු, සුර්රුලාත්තුරෙක්කෙන මේලුම් 1,000 ඒක්කර්කළෙ ඔතුක්කියිරුක්කිරාර්කළ්. අතන් කාරණමාක විවසායිකළුක්කු විවසායම් සෙය්වතර්කු කාණිකළ් ඉල්ලෙ. මිකුතික් කාණිකළෙයාවතු වළංකුංකළ් එන්රු කේට්ටාල්, අතනෙයුම් පාතුකාප්පු අමෙච්චුක්කු වළංකිවිට්ටාර්කළ්. ඉතනාල් විවසාය උර්පත්තිකළ් මිකවුම් කුරෙවටෙන්තුළ්ලන. ආනාල්, මුන්නර් එල්ලා විවසාය උර්පත්තිප් පොරුට්කළුම් තාරාළමාක පුත්තලත්තිල් කිටෙත්තන. කාණිකළෙ වළංකාතු තටුත්ත පිරකු, අංකු විවසාය උර්පත්තිකළ් කුරෙවටෙන්තිරුක්කින්රන. අන්රු විවසායක් කාණිකළිල් කීෆ්ප්පයිරාක තෙන්නෙයෙ උර්පත්ති සෙය්තාර්කළ්. අව්වාරු තෙන්නෙයෙ උර්පත්ති සෙය්තතාල් ඉන්රු අන්ත විවසායක් කාණිකළිල් විවසායම් සෙය්යමුටියාත සූර්නිලෙ ඉරුක්කින්රතු. ආකවේ, Air Force campක්කාක ඔතුක්කි වෛත්තිරුක්කින්ර කාණිකළෙ විටුවිත්තු, අවර්රෙ විවසායිකළුක්කු වළංක වේණ්ටු මෙන්රු නාන් ඉන්ත උයිරිය සපෙයිල් කේට්ටුක්කොළ් කින්රේන්. අංකු අනල් මින් නිලෙයම් ඉරුන්තාලුම්, අංකුළ්ල විවසායිකළ් electricity ඉල්ලාමල් කෂ්ටප්පටු කින්රාර්කළ්. අවර්කළුක්කු electricityඉ වළංක වේණ්ටු මෙන්රු කේට්ටුක්කොණ්ටු, එනතු සිරිය උරෙ මුටිත්තුක් කොළ්කින්රේන්. වස්සලාම්!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Next, the Hon. Eran Wickramaratne, you have 18 minutes.

[අ.භා. 2.55]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වැදගත් විෂයයක් ගැන සාකච්ඡා වෙනවා. ඒ, ණය කළමනාකරණය පිළිබඳ විෂයය. ඇයි අපි ණය ගන්නේ? අපි ණය ගන්නේ, ප්‍රධාන වශයෙන් අපට අය වැය පරතරයක් තිබෙන නිසායි. අය වැය පරතරයක් තිබෙනකොට එය පියවන්න සාමාන්‍යයෙන් ක්‍රම දෙකක් තිබෙනවා. එකක් තමයි, ණය ගැනීම. අනෙක් එක මුදල් අච්චු ගැසීම. ඔය ක්‍රම දෙක තමයි තිබෙන්නේ. පසුගිය අවුරුදු 75ක කාලය දිහා බැලුවොත්, අපට අය වැය පරතරයක් තිබිලා තිබෙනවා. අපේ ධනාත්මක ප්‍රාථමික ඉතිරියක් තිබුණේ, පස් වතාවක් පමණයි. ධනාත්මක ප්‍රාථමික ඉතිරියක් කියන්නේ, වියදමට වඩා ආදායම වැඩිවීම. ඒ කියන්නේ, මූල්‍ය බලන්නේ නැතුව, පොලී ගෙවීම් බලන්නේ නැතුව. එවැනි ආකාරයට ධනාත්මක ප්‍රාථමික ඉතිරියක් තිබුණේ, පස් වතාවයි. ඒ පස් වතාවෙන් දෙවතාවක් තමයි, 2018 සහ 2019. එතකොට, දීර්ඝ කාලයක් තිස්සේ අය වැය කළමනාකරණය ගැන ගැටලුවක් තිබෙනවා. ඒක ලොකු ගැටලුවක්. ඒක කොහොම හරි අපි විසඳන්න ඕනෑ.

අපේ කාලයේ මධ්‍ය කාලීන ණය කළමනාකරණය කිරීමේ වැඩ පිළිවෙළක් අපට තිබුණා. අපි Medium-Term Debt Management Strategy කියලා policy එකක් adopt කළා. ඒ වාගේම රටේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ගොඩක් පහළට වැටී තිබුණු නිසා අපි එදා බලයේ ඉන්නකොට -2015-2019 දී- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්කත් සාකච්ඡා කරලා, ඒක සියයට 10 ඉඳලා වැඩි කරගන්න උත්සාහ ගත්තා. අපට ඒක කරන්න පුළුවන් වුණා. අවුරුදු දෙකහමාරකින් සියයට 12 පසු කරගෙන, සියයට 13කට කිට්ටු කරගන්න පුළුවන් වුණා. ඒ සඳහා අපි අලුත් පනතක් ගෙනාවා. ආදායම් බදු සම්බන්ධ පනතක් අපි එදා ගෙනාවා. ඒ ක්‍රමය පවත්වා ගෙන යනකොට කුමන්ත්‍රණයක් ඇති වුණා; අපේ ආණ්ඩුව වෙනස් කළා. ඊට පස්සේ ජනාධිපතිවරණයක් තිබුණා. ඒ ජනාධිපති අපේක්ෂකතුමා රට වටේ ගියා; ජනාධිපති විධියට පත් වුණා. එතුමා ඇවිල්ලා මාසයක් තුළදීම සමහර දේවල් වෙනස් කළා. වෙනස් කළ එක දෙයක් තමයි, බදු ලබා ගන්න තිබුණු වැඩ පිළිවෙළ, ආදායම් ලබා ගන්න තිබුණු වැඩ පිළිවෙළ. තිබුණ වැඩ පිළිවෙළ අහෝසි කරලා අලුත් වැඩ පිළිවෙළකට ගියා. ඒ නිසා රටේ ආදායම තුනෙන් එකකින් කඩා වැටුණා. ඒ වාගේම ණය කළමනාකරණයේ තිබුණු වැඩ පිළිවෙළ, මධ්‍ය කාලීන වැඩ පිළිවෙළ ගැන සැලකුවේත් නැහැ. ඒකයි ඇත්තටම අපට වුණේ.

2020 වර්ෂයේ රාජ්‍ය ණය දිහා බැලුවොත්, සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 15,117ක් විතර වනවා. 2023 වෙනකොට ඒක රුපියල් බිලියන 28,695ක් වුණා. ඒ කියන්නේ, සියයට 90කින් වැඩි වෙලා තිබෙනවා. එහිදී එක කාරණයක් අපි පිළිගන්න ඕනෑ. ඇත්තටම රුපියලේ අගය වෙනස් වෙලා තිබෙන නිසායි එහෙම වුණේ. හැබැයි, රුපියල්වලින් මනිනවා නම්, ඒක සියයට 90කින් විතර වෙනස් වෙලා තිබෙනවා, 2020 ඉඳලා 2023 වනකොට. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියටත් ඒක වැඩි වෙලා තිබෙනවා; සෑහෙන ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. දේශීය ණය ගත්තොත්, ඒක සියයට 58ක් විතර තිබුණා. විදේශ ණය සියයට 38.7ක් විතර තිබුණා. නමුත් 2023 වන කොට දේශීය ණය ප්‍රමාණය ඉහළ ගිහින් තිබෙනවා. මොකද, විදේශ ණය ගන්න බැරි වී තිබෙන නිසා.

ඊළඟට, කෙසේ හෝ රට බංකොලොත් කියා ප්‍රකාශ කළා. ඇයි, රට බංකොලොත් කියලා ප්‍රකාශ කළේ? ඒ අපට ණය ගෙවන්න බැහැ කියලායි. බංකොලොත් කියලා ප්‍රකාශ කළාම සමගි ජන බලවේගය හැටියට අපි අධිකරණයට ගියා. අපේ නීතිඥවරු අධිකරණයට ගියා. ගිහිල්ලා අපි ඇහුවා කවුද ඒකට වගකියන්න ඕනෑ කියලා. අපි නීතිය ඉදිරියට ගියාම අධිකරණයෙන් තීරණයක් දුන්නා. එතැනදී රටේ ජනාධිපතිතුමා, රටේ අගමැතිතුමා, රටේ මුදල් ඇමතිතුමා, -එක පවුලක තුන්දෙනෙක්- ගැන කියනවා. මම හිතන විධියට ලෝකයේ එක රටකවත් මෙහෙම දේවල් සිදුවෙලා නැතුව ඇති.

මා ශිෂ්‍යයෙකු හැටියට විශ්වවිද්‍යාලයේ ඉන්න කොට අප්‍රිකාවේ සමහර රටවල් සම්බන්ධයෙන් ඔය වාගේ කථා ඇහුවා මට මතකයි. ඒ කථා අහපු අපි එදා හිනා වුණා මට මතකයි. අපි

හිනා වෙලා කිව්වා, "අපේ රට කොච්චර දියුණු ද, සුදුසු පුද්ගලයාට සුදුසු තැන දෙනවා, දැනුවත්කම තිබෙන අයට සුදුසු තැන දෙනවා" කියලා. මම කවදාවත් හිතුවේ නැහැ මගේ ජීවිත කාලයේ ඒක අනෙක් පැත්තට වෙයි කියලා. එදා අපි හිනාවට ලක් කරපු අප්‍රිකාවේ ඒ රටවල් අද කොච්චර ඉස්සරහට ගිහින් තිබෙනවාද, දියුණු වෙලා තිබෙනවාද බලන්න. නමුත් අපට අද සිදු වෙලා තිබෙන දේ මොකක්ද? අපි ඇත්තටම අනෙක් පැත්තට තමයි ගිහින් තිබෙන්නේ.

මා කියමින් සිටියේ අපේ රටේ අධිකරණ තීරණයක් ගැන. ඒක දේශපාලන තීරණයක් නොවෙයි. අධිකරණය වග කිව යුත්තන් නම් කළා. මා කලින් කී තුන්දෙනාට අමතරව මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන් දෙන්නෙක් සහ මහ බැංකුවේ හිටපු අධිපතිවරුන් දෙන්නෙකුත් නම් කළා, රට බංකොලොත් කිරීමට වග කියන්න ඕනෑ කියලා.

ආණ්ඩුව අද පනත් කෙටුම්පතක් විවාදයට ගෙනැල්ලා තිබෙනවා. මේ පනත් කෙටුම්පතේ අරමුණු දිහා බැලුවාම පෙනෙනවා, ඒ අරමුණු හොඳයි කියලා. ඒ නිසා මෙය ගෙනාපු එක හුහක් හොඳයි කියලා මම කියනවා. මෙහි ණය ගැනීම පිළිබඳව සඳහන්ව තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඇපකර ගැනත් තිබෙනවා. ඒක බොහොම වැදගත්. මොකද, රජය කෙලින්ම ගන්නා ණය තිබෙනවා. නමුත්, හුහක් වෙලාවට රාජ්‍ය ව්‍යවසායයන් - State-owned enterprises - තිබෙන නිසා ඒ අය ණය ගන්න බැංකුවලට යනවා. නමුත් බැංකුවලින් ඒ අයට ණය දෙන්නේ නැහැ, ඇපකරයක් අරගෙන එන්න කියනවා. එතකොට රජය නිකම් ඇපකරය දෙනවා. එහෙම ඇපකරය දුන්නාම ඇත්තටම ඒක ණයක් දෙනවා වාගේමයි. සමහර වෙලාවට ඒක දෙන්නේ බංකොලොත් වෙච්ච රජයේ ව්‍යවසායන්ට. කවුරු හරි හිතනවා නම් ඒකෙන් හොඳක් වෙනවා කියලා, හොඳක් වෙන්නේම නැහැ. මොකද, අපි ඒක හොඳින් සලකා බැලුවොත් පෙනෙනවා, ඒක රටට අවාසියක් බව. නමුත්, ඇපකර දීලා, ඒ වාගේ දේවල් කරගෙන කරගෙන ගිහිල්ලා අන්තිමට ඒ ණය රජයට ගෙවන්න සිදු වෙලා තිබෙනවා. මේ පනතේ තිබෙන තවත් අරමුණක් තමයි ඒවා ඔක්කෝම පාලනය කිරීම.

ණය කළමනාකරණය කරන්න කාර්යාලයක් විවෘත කරනවා ලු. මා හිතන විධියට, ඒක කළ යුතු දෙයක්. මොකද, 1949 ඉඳලා අදාළ පනතින් ණය ගැනීමේ වගකීම දුන්නේ මහ බැංකුවට. එතකොට එතැන ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, මහ බැංකුවට monetary policy එකේ විතරක් නොවෙයි fiscal policy එකේ වගකීමත් බාර දීලා තිබෙනවා. ඒක කළ යුතු දෙයක් නොවෙයි. මොකද, ඒ ගොල්ලන්ට තිබෙන්න ඕනෑ monetary policy එකේ වගකීම මිස fiscal policy එකේ වගකීම නොවෙයි. මහ බැංකුවට ඒ වගකීම තිබෙන කොට, "අපිට ණය ගන්න ඕනෑ" කියලා ආණ්ඩුව කිව්වාම, ඒ අය ගිහිල්ලා ඒ අයගේ තිබෙන එක එක instruments පාවිච්චි කරලා රජයට අඩුම පොලියට ණය අරගෙන දෙන්න ඕනෑ.

ඒ වාගේම, conflict of interest එකක් තිබෙනවා. අපි සේවක අර්ථසාධක අරමුදල උදාහරණයකට ගෙන බලමු. මමත් එහි පංගුකාරයෙක් වෙලා හිටියා. ඒකත් මහ බැංකුවෙන් තමයි කළමනාකරණය කරන්නේ. ඒ අය එය කළමනාකරණය කරන්නේ භාරකාරත්වය - trusteeship - පිළිබඳ වගකීම අරගෙන සේවකයාට උපරිම ප්‍රතිලාභය ලබා දෙනවා කියලායි. එක අතකින් රජයට අඩුම පොලියට ණය දෙන්න ඕනෑ, අනෙක් අතින් සේවකයාට ඉහළම පොලී ප්‍රතිලාභය ලබා දෙන්න ඕනෑ. ඉතින් එතකොට එතැන ලොකු ගැටලුවක් තිබෙනවා. ඒ ගැටලුවත් මේකෙන් විසඳන්න පුළුවන්. මොකද, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය අලුතින් විවෘත කළාම, ඒකෙන් සිදු වෙන්නේ ණය හා සම්බන්ධ කළමනාකරණයයි. එතකොට ණය ගැනීමේදී අසාධාරණයක් වෙන්නේ නැහැ.

විශේෂයෙන් ණය ප්‍රතිව්‍යුහගත කරනකොට මේ රජය සේවක අර්ථසාධක අරමුදලටත් පහරක් ගැහුවා. සේවකයන් අවුරුදු 20, 30, 40 මහන්සි වෙලා වැඩ කරනවා. ඔවුන් විශ්‍රාම ලැබුවාට පස්සේ තවත් අවුරුදු 30ක්, 40ක් පමණ ජීවත් වෙනවා. මේ රජය ඒ අයටත් පහරක් ගැහුවා. මොකද, සේවක අර්ථසාධක අරමුදලේ තිබෙන වටිනාකම අඩු කළා. සේවකයන්ට ලැබුණු පොලී ප්‍රතිශතය එක පාරටම අඩු වුණා. ඉතින්, අද තිබෙන ගැටලු ගැන තමයි මම මේ කථා කරන්නේ. මේ පනතේ අරමුණු හොඳයි කියලා මම යළිත් කියනවා. නමුත් කළ යුතු තව හුහක් දේවල් තිබෙනවා.

අය වැය පරතරය ගැන කථා කරද්දී, විශේෂයෙන් වියදම ගැන සලකා බලන්නම ඕනෑ. අපි ආදායම ගැන නේ කථා කරන්නේ. මොකද, fiscal consolidation එක කරලා තිබෙන්නේ - ඒ වැඩ පිළිවෙළ ඇති කරලා තිබෙන්නේ - ආදායම දිහා බලලා. ඉතින් ආදායම අනිවාර්යයෙන් වැඩි කරන්න ඕනෑ. නමුත් වියදම දිහාත් බලන්න වෙනවා. මොන ආණ්ඩුව තිබුණත් වියදම දිහා අනිවාර්යයෙන් බලන්න වෙනවා. වියදම දිහා බලද්දී, මම ඉස්සෙල්ලාම පටන් ගන්නේ නාස්තියෙන්. නාස්තිය බෙහෙවින් තිබෙනවා. මම ඊයේ පෙරේදා දවසක රජයේ වාහන ගැන වැඩසටහනක් දැක්කා. ඒකේ එක එක දේවල් සඳහන් කරනවා. විගණන වාර්තා වගයකුත් ඇවිල්ලා තිබෙනවා, රජය වාහන අරගෙන භාවිත කරනවාට වඩා වාහන lease එකට ගත්තාම සමහර විට ලාභයි කියලා. ඒක එක උදාහරණයක් පමණයි. මා ඒ කිව්වේ නාස්තිය තිබෙනවා කියන එකට උදාහරණයක්. මූල්‍ය කාර්යක්ෂමතාවක් තිබිය යුතුමයි. ව්‍යාපාරිකයෙක් නම් මම කථා කරන දේ ගැන දන්නවා. ඒ අය ව්‍යාපාරය සාර්ථක කර ගන්න යනවා නම්, වියදම පැත්ත බැලිය යුතුමයි; කාර්යක්ෂම වෙන්නම ඕනෑ; වියදම තදින් පාලනය කළ යුතුමයි.

දූෂණය පිළිබඳ ප්‍රශ්නයත් තිබෙනවා. ඒක ලොකු ප්‍රශ්නයක්. යන යන තැන ඒ ගැන ගොඩක් කථා වෙනවා. ඉස්සර ඒ ගැන කථා වුණේ, සුළුවෙන්. දැන් ඒ ගැන කථා වෙන්නේ මහා පරිමාණයෙන්. පොඩි තැන ඉඳලා ලොකු තැන දක්වාම කථා වෙනවා. අපි දන්නවා, රජයේ ඇමති කෙනෙකුට විරුද්ධවත් දූෂණ චෝදනාවක් එල්ල වුණා, තානාපති කාර්යාලයකින්. ඒ අය යම් කටයුත්තක් කරන්න යන කොට ඒ සම්බන්ධයෙන් වූ සාකච්ඡාවේදී අල්ලසක් ඉල්ලුවා කියන චෝදනාවයි ආවේ. ඒ වාගේ චෝදනාවක්වත් නො ආ යුතුයි. ඒකේ දෙකක් නැහැ. මේ රටේ නායකයෝ ඒ ගැන අවධානයෙන් ක්‍රියා කළ යුතුමයි. මොකද ඉහළම මට්ටමේ දූෂණ සම්බන්ධයෙන් ක්‍රියා කළේ නැත්නම් පහළ මට්ටමේ රුපියල් පනස්දාහේ, ලක්ෂ දෙකේ, තුනේ දූෂණ ගැන කථා කරලා වැඩක් නැහැ.

මට මතකයි, පසුගිය පාර්ලිමේන්තුවේ ඉන්න කොට ලොකුවට ගෙන ගිය කථාවක්. ඒ තමයි බැදුම්කර දූෂණයක් සිදු වුණාය කියන එක. ඒ ගැන ලොකුවට කථා කළා. ඒ වෙලාවේ ඡන්දය ඉල්ලන්න යන කොට රට වටේම ගිහිල්ලා කිව්වා, "බැදුම්කරය, බැදුම්කරය, බැදුම්කරය, හොරකම් කළා, හොරකම් කළා, හොරකම් කළා" කියලා. ඊට පසුව ආණ්ඩුව පෙරළුණා. අලුත් රජයක් ආවා. මේ රජයත් ඇවිල්ලා අවුරුදු හතරක් විතර වෙනවා නේ. එදා ඔබතුමන්ලා බැදුම්කර දූෂිතයන් නම් කළා. මම අහනවා ඒ බැදුම්කර දූෂිතයන්ට විරුද්ධව අද වන කල් ක්‍රියා කළා ද කියලා. මට මතකයි, එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් පහර ගැහුවා. එතුමාත් ඒකට නම් කළා. ඒ වාගේම, මහ බැංකුවේ අධිපති නම් කරලාම ගැහුවා. අද වනකල් -තවමත්- ඒක ගැන තීරණයක් නැහැ. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා "කවුද හොරා,

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

කවුද හොරා, කවුද හොරා" කියලා සිංදුවක් කියනවා වාගේ ඇහුවා මට මතකයි. නමුත්, ඒ සම්බන්ධයෙන් අද වනකල් තීරණයක් නැහැ. ඉහළම මට්ටමින් ඒ ගැන ක්‍රියා කරන්නේ නැත්නම් මේ රට හදන්න හුහක් අමාරුයි.

දූෂණය පිටුදැකීම සම්බන්ධයෙන් අපට නම් වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ වෙනුවෙන් කරන්න හුහක් දේවල් තිබෙනවා. අපි ඒ සඳහා තාක්ෂණය භාවිත කරන්න, ආදායම් එකතු කිරීමේ ඒකාධිකාරයක් ඇති කරන්න බලාපොරොත්තු වෙනවා. රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව කියන තැන්වලින් තමයි රටට හුහක්ම ආදායම් ලැබෙන්නේ. ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමා දන්නවා මේවා ගැන. ඒ ආදායම එකම තැනකට එකතු කර ගන්න ඕනෑ. පාරිභෝගිකයා, එහෙම නැත්නම් පුරවැසියා සහ නිලධාරියා අතර, පුරවැසියා සහ දේශපාලනඥයා අතර සිදු වන හමුවීම අඩු කරන්න පුළුවන් නම් දූෂණය අවම කර ගන්න අපට පුළුවන්. ඒකට තාක්ෂණය භාවිතය අත්‍යවශ්‍යයි. ඒ හරහා දූෂණය අවම කරන්න පුළුවන්. ඒකයි අපේ වැඩ පිළිවෙළ. සමහරු හොරකම් කරලා, කොමිස් අරගෙන පිට රටවල මුදල්, දේපළ තියාගෙන ඉන්න බවක් කියනවා. ඒ සම්බන්ධයෙන් නිසි ක්‍රියා මාර්ග ගන්න එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වැඩ පිළිවෙළක් තිබෙනවා, Stolen Asset Recovery Initiative කියලා. ඒකට ලෝක බැංකුවේ සහායත් ලැබෙනවා. අපි අනිවාර්යයෙන් ඒ නීතිය ගේනවා. මේ රජයට තවත් මාස තුනහතරක කාලයක් තිබෙනවා නේ. කරුණාකර ඒ කාලය තුළ මේ කියපු නීති ගෙනෙන්න කියලා මම අද රජයට කියනවා. ඒක කරන එක අත්‍යවශ්‍යයි. මොකද, දූෂණය හරහාත් සෑහෙන මුදල් ප්‍රමාණයක් අපතේ යනවා. ඉතින් එය වැළැක්වීම සඳහා අප ක්‍රියා කළ යුතුමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊටත් එහාට ගිහින් "ස්වාධීන නඩු පැවරීමේ කාර්යාලයක්" පිහිටුවන්නත් අපි බලාපොරොත්තු වෙනවා. අපි බලාගෙන ඉන්නේ නැහැ, නීතිපතිවරයා ගිහින් නඩු පවරන කල්. මොකද, නීතිපතිවරයා කියන්නේ රජයේ ප්‍රධාන නීති නිලධාරියා. හෙට ගිහින් ඒ නීති නිලධාරියාටම විරුද්ධව නඩුවක් දමන්න බැහැ නේ. ඒ නිසා තමයි අපි ස්වාධීන නඩු පැවරීමේ කාර්යාලයක් පිහිටුවන්න බලාපොරොත්තු වන්නේ. වියදම පැත්තෙන් බැලුවොත්, වියදම වැඩි වීමට නාස්තිය වාගේම දූෂණයත් හේතු වෙනවා.

ඊළඟ කාරණය, රාජ්‍ය බැංකුවලට කරන බල කිරීම. මා දේශපාලනයට එන්න ඉස්සර වෙලා වෙච්ච සිදුවීමක් මට මතකයි. ඒ දවස්වල එක පාරටම කිව්වා, රට තුළ අලුත් ගුවන් සේවාවක් පටන් ගන්නවා කියලා. ඒ අනුව Mihin Air කියලා ගුවන් සේවාවක් රට තුළ පටන් ගත්තා. ඊට පස්සේ මොනවාද කළේ? රජයේ බැංකුවලට කිව්වා, ඒකට සල්ලි දෙන්න කියලා. ඒක පරණ කථාවක්. නමුත්, මම දැන් මේ කථාව කියන්න හේතුවක් තිබෙනවා. රජයේ බැංකුවලට බල කරනවා, රජයේ ව්‍යවසායයන්ට මුදල් දෙන්න කියලා. ඒ බැංකුකරුවන් දන්නවා, ඒ ව්‍යවසායයන්ට මුදල් දීලා වැඩක් නැහැ කියලා. මොකද, ඒ මුදල නැවත එකතු කර ගන්න කවදාවත් බැහැ. නමුත්, ඒගොල්ලන්ට බල කරනවා. ඊට පස්සේ අහනවා, "අනේ, බැංකුව මෙහෙම ද කළේ?" කියලා. බැංකුව තමයි අවදානමේ දැම්මේ කියලා කියනවා. අපි ඒක අනිවාර්යයෙන් නතර කළ යුතුයි. එහෙම නැත්නම් බැංකුවලට කියනවා, ඇපකරයක් දෙන්න කියලා. People's Bank එකට සහ Bank of Ceylon එකට ගොඩක් ප්‍රශ්න ඇති කරලා තිබෙන්නේ, මේ වාගේ තීරණ හරහායි. ඒ වෘත්තීයවේදීන්ට ඉඩ දීලා නැහැ, ස්වාධීන තීරණ ගන්න. රජයේ නොවන බැංකුවකටත් ගිහිල්ලා බලන්න කියන්න. ඒ බැංකුව කියාවි, "ඔයගොල්ලන්ට මුදල් දෙන්න අපට බැහැ. මොකද, ඒ මුදල් ගෙවන්න ඔයගොල්ලන්ට බැහැ. ඒ නිසා යන්න" කියලා. ඊට පස්සේ රජයේ බැංකුවකට යනවා. මේවා ණය. මේවා capital නොවෙයි. මේවා ණය. Capital ඕනෑ තැනට ණය දමලා හරියන්නේ නැහැ. ඒ විධියට තමයි අසාර්ථක ව්‍යවසාය ඇති කරලා තිබෙන්නේ.

මම මේ කථා කරන්නේ, වියදම් පාලනය ගැන. තවත් දෙයක් වෙලා තිබෙනවා. අපි උදාහරණයක් ගනිමු. දේශපාලනඥයෙක් තීරණයක් අරගෙන කියනවා, අපි අධිවේගී මාර්ගයක් හදමු කියලා. දක්ෂිණ අධිවේගී මාර්ගය හදන එක ගැන කථා කරන කොට මම වැඩ කළේ ජාතික සංවර්ධන බැංකුවේ. මොරටුව විශ්වවිද්‍යාලය වාගේ තැන්වලින් විශේෂඥයින් ගෙන්වලා ඒ ගැන evaluation එකක් කළා මට මතකයි. Evaluation එකක් කරලා අපි තීරණයකට ආවා. මේ ආයෝජනය හොඳයි, ගාල්ල දක්වා හදන්න පුළුවන්, ඕනෑ නම් මාතර දක්වාත් හදන්න පුළුවන් වෙයි කියලා තමයි සාකච්ඡා වුණේ. නමුත් එය හම්බන්තොට දක්වා හදන්න බැහැ. කවදාවත් ආර්ථික evaluation එකකින් එය කරන්න බැහැ. නමුත්, හම්බන්තොට දක්වා හැදුවා. හම්බන්තොට වෙනත් ඒවාත් හදලා තිබෙනවා. මම එදා පාරේ එනකොට දැක්කා, හම්බන්තොට හදපු ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව. ඒක වහලා තිබෙන්නේ. බුද්ධික මන්ත්‍රීතුමා මේක හොඳින් අහගන්න. ඒක හදන්න තිබුණේ හම්බන්තොට නොවෙයි, මාතර. එහෙම නැත්නම් ගාල්ලේ. ඒක කියන්න ව්‍යාපාරිකයෙක් වෙන්න ඕනෑ නැහැ, ආර්ථික විද්‍යාඥයෙක් වෙන්න ඕනෑ නැහැ. ඒක ඕනෑම කෙනෙකුට කියන්න පුළුවන්. මොකද, එහෙම කළා නම් ඉබේම return එකත් තිබෙනවා. මම මේ කථාව කියන්න හේතුව මේකයි. මේ වාගේ නාස්තිකාර වියදම් සිදු වෙන්නේ මෙහෙමයි. යෝජනාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය ගත්තොත් ඔක්කොම හරි කියලා හිතනවා. මා කියන්නේ, අපි ඒ ක්‍රමයෙන් ඇත් වෙන්න ඕනෑ කියලායි. මුදල් රාජ්‍ය ඇමතිතුමාගෙන් -ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමාගෙන් - විතරක් ඒ ගැන අහනවා ඇති. Cabinet Papers ටික එනවා. මුදල් අමාත්‍යාංශයට කියනවා, comments දෙන්න කියලා. සාමාන්‍යයෙන් වෙන්නේ එහෙමයි. මා කියන්නේ, අපි ඊට වඩා විධිමත් ක්‍රමයක් හදන තැනට යන්න ඕනෑ කියලායි. ඉස්සර Planning Secretariat කියලා එකක් තිබුණා. එය ස්වාධීන එකක්.

Planning Secretariat එක හැටියට එයට කොහෙන් යෝජනාව ආවත් - ජනාධිපතිගෙන් ආවත්, අගමැතිගෙන් ආවත්, දේශපාලනයෙන් ආවත්, මහජනතාවගෙන් ආවත් - එය හරහා ගිහිල්ලා, ඒ ගොල්ලන්ගේ evaluation එක තමයි අපට එන්න ඕනෑ. ඒ සටහන් දැම්මාම තමයි කැබිනට් මණ්ඩලය අනුමත කරන්න ඕනෑ. නැත්නම් ජනාධිපතිට ඕනෑ, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 7ක කාලයක් ලැබෙනවා, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමාගේ කාලයෙන්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Thank you very much.

ඒක ඒ ක්‍රමයට එන්න ඕනෑ. මේ අපි කථා කරන්නේ රට ගැන. මේක පක්ෂයක් ගැනවත්, ආණ්ඩුව ගැනවත්, විපක්ෂය ගැනවත් නොවෙයි. මේ රට හදන්න දැන් වෙලාව ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි මේක හරියට කළ යුතුයි. මම වැඩබලන මුදල් ඇමති හැටියට ඉන්නකොට බදදා දවසක තමයි Cabinet Meeting එක

තිබුණේ. අහඹරුවාදා දවසේ රෑට විශාල ලේඛන මිටියක් එනවා. සමහර දවස්වලට ලේඛන 50ක් විතර බලන්න තිබෙනවා. මට මතකයි, එක දවසක් 100කට වඩා තිබුණා, බලන්න. එක එක යෝජනා, එක එක අමාත්‍යාංශවලින් එනවා. ඒ යෝජනා බලලා අපි ඒවා අනුමත කරන්න ඕනෑ. මේක තමයි වර්තමාන ක්‍රමය. අපි මේ ක්‍රමයෙන් ගැලවෙන්න ඕනෑ. මේ අවස්ථාවේ මට මතක් වෙනවා, ගරු කළු යුතු පුද්ගලයන්. මේ අය අපේ සීයලා වාගෙයි. එක් කෙනෙක් තමයි ආචාර්ය ගාමිණී කොරයා මැතිතුමා. කවුරුත් එතුමාගේ නම අහලා ඇති. එතුමා මුදල් අමාත්‍යාංශයේ Planning Secretariat එකේ හිටියා. ඊට පස්සේ එක්සත් ජාතීන්ගේ වෙළඳ හා සංවර්ධන සමුළුවේ මහ ලේකම්වරයෙකු වශයෙන් කටයුතු කළා. මේ Planning Secretariat එක නිසි සැලැස්මක් තිබෙන කාර්යාංශයක්. එතැන වෘත්තීයවේදීන්, රාජ්‍ය සේවකයන්, මේවා ගැන දන්නා අය ඉන්නේ. ඒ අය හොයලා බලලා කියනවා, "මේක කරන්න පුළුවන්. මේක කරන්න බැහැ" කියලා. යටිතල පහසුකම් වන ගුවන් සේවා වෙන්න පුළුවන්, වරාය වෙන්න පුළුවන්, අධිවේගී මාර්ග වෙන්න පුළුවන්. යටිතල පහසුකම්වලින් ප්‍රතිලාභ ලබා ගන්න සමහර වෙලාවට අවුරුදු 30ක්, 40ක් විතර යනවා. එතකොට capital එකක් තිබෙනවා නම් ඒවාට ඒ capital එක දමන්න පුළුවන්. අපට capital එක නැහැ. ඉතිරිය අඩුයි ලංකාවේ. සාමාන්‍යයෙන්, වැඩිම වුණොත් ලංකාවේ ඉතිරිය සියයට 15යි, සියයට 20යි. ඉන්දියාවේ සියයට 30යි, සියයට 35යි. චීනයේ සියයට 50ටත් වඩා වැඩියි. අපට එහෙම නැහැ. ඒ නිසා අපට අයෝජනය කරන්න බැහැ. ඒ නිසා ණය අරගෙන තමයි අපට මුදල් යොදවන්න සිද්ධ වෙන්නේ. එතකොට ප්‍රතිලාභය එන්නේ අවුරුදු 25කින්, 30කින්, 35කින් විතර. නමුත්, අවුරුදු 5කින් ණය ගෙවන්න සිද්ධ වෙනවා. එතකොට ද්‍රවශීලතාවේ ප්‍රශ්නයක් - liquidity problem එකක් - ඇති වෙනවා. ද්‍රවශීලතාවේ ප්‍රශ්නයක් ඇති වෙලා රට බංකොලොත් වන එක පුදුම වෙන්න දෙයක් නොවෙයි. අවුරුදු 20ක් විතර දුරට ගිහිල්ලා තිබෙනවා, යටිතල පහසුකම් පිළිබඳ ගැටලුව. අපට තිබුණා නම් Planning Secretariat එකක්, ඒක ස්වාධීන නම්, හරි පුද්ගලයන් එතැන හිටියා නම්, ඒ අය ඒ එකක්වත් අනුමත කරන්නේ නැහැ. ඒ තීරණය කැබිනට් මණ්ඩලයට නොවෙයි, මුදල් අමාත්‍යාංශයට එවනවා, "මේකයි අපේ නිගමනය. මේකයි අපේ තීරණය. මේක කරන්න බැහැ" කියලා. එහෙම එව්වාම අපට ඒක කරන්න බැහැ. අපි ඒක වෙනස් කරලා නැවතත් ඒ අයටම එවන්න ඕනෑ. මොකද, ඒ අයගේ අනුමතිය අත්‍යවශ්‍යයි.

මම මේ කථාව කිව්වාම සමහර අය කල්පනා කරනවා ඇති අපි මහජන නියෝජිතයන්, අපට ඡන්දය දීලා පාර්ලිමේන්තුවට එවලා තිබෙන්නේ, ඒ නිසා අපට ඕනෑම තීරණයක් ගන්න පුළුවන් කියලා. එහෙම මතයක් තිබෙනවා. මම හිතන විධියට ඒ මතය වැරැදියි. අපි මහජන නියෝජිතයන් තමයි. මහජන ඡන්දයෙන් තමයි තේරී පත් වෙලා ආවේ. ඒ වුණාට අපට ඕනෑ ඕනෑ තීරණ ගන්න බැහැ. අපට තීරණ ගන්න යම් කිසි රාමුවක් තිබෙන්න ඕනෑ. අපි නොදන්න දේවල් ගැන තීරණ ගන්න බැහැ නේ. කවුරුන් හෝ අසනීපයෙන් ඉන්නවා නම්, එ් පුද්ගලයාට ශල්‍යකර්මයක් කරනවා ද නැද්ද කියලා මට තීරණයක් ගන්න බැහැ නේ. ඒ තීරණය ගන්න නම් මම වෛද්‍යවරයෙක් වෙන්න ඕනෑ. සමහර වෙලාවට මම ඒ සමාගමේ ප්‍රධානියා වෙන්න පුළුවන්. ප්‍රධානියා වුණාට මම වෛද්‍යවරයාට නේ කථා කරන්නේ. ඒ වාගේ, කථානායකතුමාට ඔක්කොම තීරණ ගන්න බැහැ නේ, මෙතැන කවුරුන් හෝ අසනීප වෙලා වැටුණොත්. කථානායක නොව වෛද්‍යවරයා නේ තීරණය ගන්නේ. වෛද්‍යවරයා කියන එක අනුව තමයි කථානායක ක්‍රියා කරන්නේ, මෙතැනදී ප්‍රතිකාර කරනවාද, රෝහලට යවනවාද, මොනවා ද කරන්නේ කියලා. මහජන නියෝජිතයෙක් වුණාය කියලා අපට ඕනෑ ඕනෑ තීරණ ගන්න ගිය නිසා තමයි රටට වැරදිලා තිබෙන්නේ. ඒ නිසා මේ මතයෙන් අපි ඉවත් වෙන්න ඕනෑ. අපි ඒ විශේෂඥයන් කියන දේ, ඒ අයගේ දැනුම භාවිත කරන්න ඕනෑ. එහෙම නොකරන නිසා තමයි රට බංකොලොත් වෙලා තිබෙන්නේ. මම පොඩ්ඩක්වත් එකඟ නැහැ, කැබිනට් මණ්ඩලයේ අනුමතිය තිබෙනවා නම් ඕනෑම දෙයක් අපට කරන්න පුළුවන් කියන එකට. ඒ වැරදි මතයෙන් සම්පූර්ණයෙන්ම අපි අයින් වෙන්න ඕනෑ.

මම කිව්වා වාගේම මේ පනතේ අරමුණු හොඳයි. නමුත්, තව හුඟක් දේවල් තිබෙනවා, කරන්න. විශේෂයෙන්ම කළ යුතු ක්‍රියාවලියක් තිබෙනවා. මම නැවතත් එක දෙයක් ආණ්ඩුවෙන් ඉල්ලනවා.

පනතක් ගෙනැල්ලා විතරක් රටක් වෙනස් කරන්න, හදන්න බැහැ. අපි දුෂණ විරෝධී පනත ගෙනාවා. ඒක ගෙනැල්ලා දැන් මාස 9ක් විතර වෙනවා. ඒක හොඳ පනතක්. අපි ඒක ගැන සාකච්ඡා කළා, ඒක සංස්කරණය කරන්න ඕනෑ යෝජනා කළා. මම හිතන විධියට එවැනි යෝජනා 80ක් විතර තිබුණා. සාකච්ඡාවක් හරහා අපි ඒක කළා. අපි කථා කළා; එකඟ වුණා; පනත සම්මත කරගත්තා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

නමුත් මම ඊයේ ඇහුවා, ඒ පනත සම්බන්ධයෙන් නඩු කීයක් දාලා තිබෙනවාද කියලා. මම පුදුම වුණා. එක්දහස් නවසිය පණස් ගණන්වල තමයි ඔය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හැදුවේ. නඩු 7ක්ද, 9ක්ද කොහේද ලු උසාවියකට ගිහිල්ලා තීරණයක් වෙලා තිබෙන්නේ, 1959 ඉඳලා. මගේ අම්මේ! මේ රටේ ඉන්න හොරු ගණනයි, නඩු ගණනයි බලලා තීරණ ගණන බැලුවාම මෙන්න රටේ තත්ත්වය.

අද අලුත් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙනවා. ඒක හොඳම පනත් කෙටුම්පතක්. අපි මේ පනත් කෙටුම්පත් අනුමත කරගෙන ක්‍රියාවට බහින්න ඕනෑ. මොකද, හොඳ පනතක් තිබුණත් ක්‍රියාවට බැස්සේ නැත්නම් කිසිම වෙනසක් වෙන්නේ නැහැ. මම රජයෙන් ඉල්ලනවා, මේ පනත් කෙටුම්පතත් අනුමත කර ගත්තොත් වහාම ක්‍රියාත්මක කරන්න කියලා.

මට කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[3.19 p.m.]

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
Hon. Presiding Member, thank you very much for giving me this opportunity to speak on the Public Debt Management Bill.

පිස්කල් ප්‍රතිපත්තියට අදාළ මේ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරද්දි මේ කාරණය මම මුලින්ම කියන්න ඕනෑ. මේ රට ණය බරින් බිඳ වැටුණු රටක්. මෙරට ආර්ථික වශයෙන්

[ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා]

බංකොලොත් තැනකට පත් වෙලා තිබෙනවා කියලා අපට කියපු අවස්ථාවේ මේ රටේ දේශීය, විදේශීය ණය බර ඩොලර් බිලියන 83ක්. ණය බර ඩොලර් බිලියන 83ක්ව තිබියදී රට ආර්ථික වශයෙන් බංකොලොත්භාවයට පත් වෙලා ගත වුණු කාලය තුළ මේ රට කිසියම් විධියකට ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට පිවිසෙන බව රජය යුහුසුළුව ප්‍රකාශ කළා. පසුගිය කාලය මුළුල්ලේම අපි අපේක්ෂා කළා, අත්‍යවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණ පිස්කල් ප්‍රතිපත්තිය පැත්තෙන්, මූල්‍ය ප්‍රතිපත්තිය පැත්තෙන් කියන මේ දෙපැත්තෙන්ම සිද්ධ වෙන්න ඕනෑ කියලා. අපි ඒ මතයේ සිටියා. නමුත් අපි මේ පවතින තත්ත්වය හුදෙක් අතිශයෝක්තියකට පරිවර්තනය කරලා කථා කරනවා නම්, අපි තවදුරටත් මායාවක් විධියට සිතමින් මේ රටේ ඇත්ත ආර්ථික ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා නම් එය තවදුරටත් අපි මායාවේ ගිලීමට හේතු වෙනවාය කියන එක මතක් කරන්න වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඩොලර් බිලියන 83ක ණය බරක පැටලිලා, ඒ ණය බරෙන් රට බංකොලොත්භාවයට පත් වෙලා, තෙල් පෝලිම්, ගෑස් පෝලිම්, කිරිපිටි පෝලිම් ඇති වුණා. ආර්ථිකයේ බංකොලොත්වීම පිළිබඳව මේ ප්‍රකාශන භෞතික තලයේ දැක්වෙන ප්‍රකාශන විධියට අපි දැක්කා. අද ඒ තත්ත්වය නොමැතිවීම අපි හැමෝගෙම සන්තෝෂයට කාරණාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේ ගත වෙලා තිබෙන කාලය තුළ, ඒ කියන්නේ පසුගිය 2023 වසරේ මාර්තු 20වැනි දා ඉඳලා මේ අවුරුද්දේ -2024- මාර්තු වෙනකොට ඇති වෙලා තිබෙන අපේ ණය බර සංසන්දනය කරලා බලනකොට, රජය සඳහන් කරනවා රටේ ණය බර ඩොලර් බිලියනවලින් 100.184යි කියලා. ඩොලර් බිලියන 100.184යි. අපේ මුදල් රාජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. මම වැරදි නම් නිවැරදි කරන්න කියලා මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපි දන්නවා, 2023දී තිබුණේ ඩොලර් බිලියන 83යි කියලා. ඩොලර් බිලියන 83 සිට ඩොලර් බිලියන 100 දක්වා තවත් 17ක වැයක් දරලා තමයි අපි මේ තත්ත්වයට ඇවිල්ලා තිබෙන්නේ. මේ ඩොලර් බිලියන 17ක ප්‍රමාණය ගැන අපට සාකච්ඡා කරන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ලෝකයේ රටවල් චීනයට තිබෙන ණය බර ප්‍රමාණය අපිට සන්සන්දනය කරලා බලන්න පුළුවන්. අපි දන්නවා, විශේෂයෙන්ම චීනයට වැඩිම ණය බරක් තිබෙන්නේ පාකිස්ථානයෙන් බව. පාකිස්ථානය චීනයට ඩොලර් බිලියන 26.6ක් ණයයි. දෙවැනි ණය බර තිබෙන්නේ ඇන්ගෝලාවට. ඇන්ගෝලාව චීනයට ඩොලර් බිලියන 21ක් ණයයි. තුන්වැනියට චීනයට වැදගත් වන ණය වෙළෙඳ පොළ විධියට තිබෙන්නේ අපේ රට බව අපි දන්නවා; ශ්‍රී ලංකාව. අපි ඩොලර් බිලියන 8.9ක් චීනයට ණයයි. කල්පනා කරලා බලන්න, ලෝකයේ තුන්වැනියට චීනයට වැදගත් වන ණය වෙළෙඳ පොළ ශ්‍රී ලංකාව බවට පරිවර්තනය වෙද්දී, පසුගිය අවුරුද්දක වාගේ කාල සීමාවක් ඇතුළේ අපේ රටේ ණය බර ඩොලර් බිලියන 17කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. අපි කියනවා නම් අපේ රටේ විදේශ සම්පත්වල ප්‍රමාණය ඩොලර් බිලියන 5ට ඇවිල්ලා තිබෙනවා, ඒ නිසා රටේ ආර්ථිකය සමෘද්ධිය කරා ළඟා වෙමින් පවතිනවා කියලා. මම කියනවා, ඒවා කොණ්ඩේ බැඳපු චින්නුන්ට කියන්න කියලා. මොකද, ඒ ඩොලර් බිලියන 5කට ආසන්න විදේශ සංචිතය වැඩි කරගත්ත ආකාරය අපි හැමෝම දන්නවා. එයින් ඩොලර් බිලියන 1.6කට ආසන්න ප්‍රමාණයක් චීන යුවාන්වලින් ලැබුණු සල්ලි. ඒක අපට වියදම් කරන්න පුළුවන්කමක් නැහැ. එනකොට අපි ඒකට සියයට 6ක,7ක පොලියක් ගෙවනවා, මාස තුනෙන් තුනට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා රටේ ආර්ථිකයේ ප්‍රකාශනය විස්තර කරද්දි මේ රටේ මහජනතාව මායාවක පටලවන්න එපා කියලායි අපි කියන්නේ. වසරක දී ඩොලර් බිලියන 17කින් ණය බර ඉහළ යනකොට, ප්‍රබල වශයෙන්ම දේශීය ණය බර ඉහළ ගිහිල්ලා තිබෙන බව අපි දන්නවා. පසුගිය 2023 මාර්තු 20වැනි දා වෙනකොට ලංකාවේ දේශීය ණය බර තිබුණේ ඩොලර් බිලියන 43ක්, 42ක් වාගේ ප්‍රමාණයක්; ඩොලර් බිලියන 42ක ප්‍රමාණයක් තමයි තිබුණේ. අද ඩොලර් බිලියන 57.283ක් දක්වා දේශීය ණය බර වැඩි වෙලා තිබෙනවා.

එහෙම නම් ඩොලර් බිලියන 57 දක්වා දැවැන්ත ප්‍රමාණයක ණය බරක් දේශීය පැත්තෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. මෙබඳු තත්ත්වයක් තුළ අපේ රටේ උද්ධමනය සියයට එකටත් වඩා අඩුයි, වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සියයට එකටත් වඩා අඩුයි, රට ස්වයංපෝෂිත තත්ත්වයට ළඟා වෙමින් පවතිනවා කියලා අපි කියනවා නම්, මේ කරුණු කාරණා technical terms. මේ ආර්ථික විද්‍යාත්මක කරුණු කාරණා ප්‍රායෝගික තලයේ සාකච්ඡා කරනකොට මහජනතාවට මෙකෙන් පෙනෙන්නේ මායාවක්. කෙනෙක් කියනවා නම් රටක භාණ්ඩ මිල මට්ටම් පහළ බැසීම අඛණ්ඩව සිද්ධ වෙනවා කියලා, ඒක දෙපැත්තකින් බලන්න ඕනෑ. පාරිභෝගිකයාගේ පැත්ත වාගේම මේ රටේ ගොවියාගේ පැත්තත් අපි බලන්න ඕනෑ. පාරිභෝගිකයා භාණ්ඩ මිලදී ගන්නවා, ගොවියා භාණ්ඩ විකුණනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා රටක මිල මට්ටම මේ දෙදෙනාටම සාධාරණ වෙන්න ඕනෑ. ඒ නිසා තමයි රටේ ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලයෙන් approval අරගෙන පසුගිය සැප්තැම්බර් මාසයේ දී මහ බැංකුවත් එක්ක එකඟතාවකට ආවේ, රටේ උද්ධමනය සියයට 5ක මට්ටමට පවත්වා ගැනීම අපේ අරමුණ සහ වගකීම කියලා. ඔබතුමන්ලා audience එකට කථා කරනකොට අහන්න පුළුවන්, "විපක්ෂය කියන්නේ මේ මිල මට්ටම ඉහළ දාන්න කියලා ද " කියලා. එවැනි හුදු ප්‍රලාපයක් නොවෙයි අපි කියන්නේ. කවුරු හරි කියනවා නම් රටක මිල මට්ටම මේ විධියට අඛණ්ඩව දශම ගණන්වලට අඩුවෙලා තිබෙනවා කියලා, එය අඩු වෙලා තිබෙනවා කියන එක මුග්ධයෙකුට සමහර වෙලාවට තේරෙන්න පුළුවන්. ඔය කියන කථාව අනුව රටේ ප්‍රායෝගික සාර්ථකත්වයක් ඇති වෙලා තිබෙනවා කියලා එහෙම කෙනෙක් හිතන්න පුළුවන්. හැබැයි, මේ උද්ධමනය වාගේ ශාස්ත්‍රීය සංකල්ප, විදේශ වත්කම් වැනි ශාස්ත්‍රීය සංකල්ප හුදෙක් අහඹු ලෙස අරගෙන හුදෙකලාව පාවිච්චි කරද්දී අපි පරිස්සම් වෙන්න ඕනෑ. මොකද, අපි තවදුරටත් මායාවක පැටලිය යුතු නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රටේ ආර්ථිකය, මේ රටේ ණය කළමනාකරණය කරන්න ඕනෑ. හැබැයි, ණය කළමනාකරණය කරනවා කියලා මේ රටේ ණය බර වැඩි කරන ක්‍රියාවලියකට යනවා නම්, අපි ඒකට සහමුලින්ම විරුද්ධ වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය බර වැඩි වෙනකොට මේ රටේ නිෂ්පාදන ක්‍රියාවලියට වත්කම් ජනනය කරන්න ඕනෑ. ඒ නිසා අපි මුදල් රාජ්‍ය ඇමතිතුමාට මේ කාරණයත් කියන්න ඕනෑ. ඔබතුමා තරුණ, ජවසම්පන්න, අපි ආශීර්වාද කරන රාජ්‍ය අමාත්‍යවරයෙක්. එම නිසා මේ කාරණා කෙරෙහිත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා අපි යෝජනා කරනවා.

මේ ණය බර ඉහළට තල්ලු කරගෙන යන වේගයට මේ රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ඉදිරියට ගිහිල්ලා නැහැ. අපි සේවා සම්පාදනයෙන් ඉදිරියට ගිහිල්ලා නැහැ. අද රටේ තරුණයන්ට වෙලා තිබෙන්නේ මුහුදට පනින්නයි. අද වන විට අපේ රටේ තරුණ තරුණියන්ට මියන්මාරයේ මියාවඩ්වල වධකාගාරවලට යන්න සිදු වෙලා තිබෙනවා. ඇයි ඒ? මේ රටේ ඉඳගෙන ඒ අයගේ අරමුණු දිනා ගන්න බැරි නම්, ඒ අය වෙනත් රටකට ගිහිල්ලා හරි අරමුණු දිනා ගන්න බලනවා. අපේ රටේ විශ්‍රාමිකයන් ගත්තත්,

ඔවුන්ට ජීවත් වෙන්න ඒ ලැබෙන විශ්‍රාම වැටුප මදි. ඒ නිසා තමයි ඒ අයට මැදපෙරදිගට විතරක් නොවෙයි, සමහර වෙලාවට රුසියන්-යුක්‍රේන් යුද්ධයේ බිහිසුණු අත්දැකීම් ලබන්නත් ඒ රටවලට යන්න සිදු වුණේ. එවැනි රටවලටත් ඒ අයට tourist visa මත යන්න වුණේ ඇයි? මේ ආර්ථිකය නිසා ඔවුන්ට භෞතික වශයෙන් සම්පත් ප්‍රමාණයක් අත්පත් කර ගන්න බැහැ. ඒ නිසා කරුණාකරලා ණය බරත් එක්කම මේ රටේ සම්පත් වත්කම් ජනනය කිරීමේ නිෂ්පාදන ක්‍රියාවලිය වේගවත් කරන්න, ඇත්ත ආර්ථික වෘද්ධියක් වෙනුවෙන් කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා ජවසම්පන්න ආර්ථිකයක් පිළිබඳව කථා කළා. ඒක හොඳයි. ගරු මන්ත්‍රීතුමා මේ ක්‍රියාවලියට සම්බන්ධ හොඳ සහ නරක දෙකම කථා කළා. හැබැයි, මම එතුමාට මතක් කරලා දෙන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ තමයි, ඔය කියන කාරණා සියල්ල අස්සේ එතුමාට අමතක වුණා, මේ කාලපරිච්ඡේදය තුළ මුදල් අච්චු ගැසීමකට රජය යොමු වෙලා නැහැ කියන එක. රජයට දැන් ඒ පහසුකම නැහැ. රජයට දැන් තිබෙන්නේ දේශීය වෙළෙඳ පොළෙන් අරගෙන මේ ආදායම්, වියදම් කළමනාකරණය කර ගැනීම පමණයි. විවේචනය තුළ ඔබතුමා සාධනීය පැත්තකුත් කිව්වා. ඒක ඇත්ත. ඒ සාධනීය පැත්ත වාගේම සුවිශේෂීව අගය කළ යුතු තවත් කාරණාවක් තිබෙනවා. ඒ තමයි, මේ රටේ ප්‍රධානම ගැටලුවක් බවට පත් වෙච්ච, මහ බැංකුවෙන් මුදල් අච්චු ගහලා - Central Bank financing - වියදම පියවා ගන්න ගත්ත ක්‍රියා මාර්ගය දැන් රජය කිසිසේත්ම සිදු කරන්නේ නැති එක. අලුත් මහ බැංකු පනත ක්‍රියාත්මක කිරීමත් එක්ක අසීරු කළමනාකරණයක් තමයි සිදු කරන්නේ කියන එකත් මතක් කරන්න ඕනෑ. මහ බැංකු පනත ක්‍රියාත්මක කිරීමත් එක්ක රජයට, එහෙම නැත්නම් මහා භාණ්ඩාගාරයට දැන් ඒ අවස්ථාව නොමැති වෙලා තිබෙනවා. ඒකත් මතක් කරලා දුන්නොත් හොඳයි කියලා මම විශ්වාස කරනවා.

ඔබතුමා දේශීය ණය පිළිබඳවත් කථා කළා. ඔබතුමා බලන්න, 2023දී exchange rate එක. එදා 323කට අරගෙන තිබෙන්නේ. ඊට පස්සේ මේ පළමුවැනි කාර්තුවේ විතර 301කට අරගෙන තිබෙනවා. ඒ සියල්ල දෙස ධනාත්මකව බැලීම වඩාත් යෝග්‍යයි. තවදුරටත් කළ යුතු දේවල් තිබෙනවා නම් අපි ඒවාත් බලමු.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා නිවැරැදියි. ආණ්ඩුවේ වියදම් පියවා ගැනීමට මුදල් අච්චු ගහන්නේ නැහැ කියන එක අපි පිළිගන්නවා. ඒක හරි. ආණ්ඩුව වියදම් පියවා ගැනීමට මුදල් අච්චු නොගැසුවාට, වැඩි වූ විදේශ වත්කම්වල කොටසක් විදේශ ප්‍රේෂණ ලැබීම් කියලා අපි දන්නවා. මම කියන්නේ ඒ ලැබෙන ප්‍රමාණයට මුදල් අච්චු ගහනවා නම්, ඒ ප්‍රමාණය ආයෝජනය කරලා වත්කම් ජනනය කිරීමටත් වැඩසටහනක් ආරම්භ කරන්න කියලායි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The Hon. Gamini Waleboda. You have 13 minutes.

[අ.භා. 3.30]

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාද කරන Public Debt Management Bill එක සහ තවත් නියම, යෝජනා, නියෝග පිළිබඳවත් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඇත්තටම 2022දී ආර්ථික අර්බුදය නිර්මාණය වීමෙන් පසු මේ රට මුහුණ දීපු ආර්ථික අර්බුදය කළමනාකරණය කර ගැනීම සඳහා ප්‍රධානම සැලැස්ම විධියට වර්තමාන රජය අනුගමනය කරනු ලැබුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් මේ රජය වෙත ලබා දුන් නිර්දේශ සමුදායක්. ඒ නිර්දේශ සමුදායේ ප්‍රධානම කාරණාවක් බවට පත් වෙලා තිබුණා, අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම. මුලින්ම ඉදිරිපත් කරපු නිර්දේශවලින් එකක් තමයි, එය. එය ගෙනාවේ දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාවගේ ජීවනාරක්ෂාව තහවුරු කර ගැනීම සඳහායි. එවකට තිබුණු සමෘද්ධි සහනාධාර යෝජනා ක්‍රමය අහෝසි කරලා, ඒ වෙනුවට අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී මුලින් ගරු සභාවේම අනුමැතිය ලබා ගත්තා, මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතක් හරහා මාස 9ක් අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහ මාස 9ක කාල පරිච්ඡේදයකින් පසු ඔවුන් සවිබලගන්වන ක්‍රියාවලිය නිමා වන බවට සහ ඔවුන්ට ආර්ථික හැකියාවක් ලබා දීමෙන් අනතුරුව ඔවුන් ස්වාධීනත්වයෙන් යුතු ආර්ථික ශක්තියක් සහිත පිරිසක් බවට පත් කරනවා කියලා. නමුත් අද නැවත වතාවක් යෝජනාවක් ඉදිරිපත් කරනවා, ඒ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය මාස 12ක කාල පරිච්ඡේදයක් සඳහා දීර්ඝ කර ගන්න. ඉන් ගම්‍ය වන ප්‍රධාන කාරණාව මෙයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ න්‍යාය පත්‍රය, එහෙම නැත්නම් වැඩසටහන ගැන කලින් කියපු කාරණාව නැවත නැවත තහවුරු කරන්නක් තමයි මේ. ඒ මොකක්ද? මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමත්, ආර්ථික ප්‍රසාරණයක් ඇති කර ගැනීමත්, කර්මාන්ත හා සේවා ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කර ගැනීමත්, අපේ අපනයන වැඩි කර ගැනීමත්, ආනයන සීමා කිරීමත්, ඒ වාගේම විදේශ විනිමය ඉපැයීම් ප්‍රමාණය වැඩි කර ගැනීමත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලබා දෙන වැඩසටහන පමණක් ක්‍රියාත්මක කිරීමෙන් ළඟා කරගත නොහැකියි කියපු කාරණාව නැවත වතාවක් මේ ගරු සභාවේ සහතික කරමින්, සනාථ කරමින් තමයි අද මේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය තවත් මාස 12ක කාලයකට දීර්ඝ කිරීම සඳහා වූ යෝජනාවක් ඉදිරිපත් කරන්නේ. ඒ වාගේම මොකක්ද මේකෙන් කියන්නේ? ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ යෝජනා මාලාවෙන් පමණක් මේ ආර්ථිකය ශක්තිමත් කරලා ගොඩ ගන්න බැහැ කියන කාරණාව තමයි මේ කියන්නේ.

මම දැක්කා, අද උදේ අපේ ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමා ඉදිරිපත් කරපු සංඛ්‍යාලේඛන අනුව සහ දැන් ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමාට දීපු පිළිතුර අනුවත් විදේශ ණය ප්‍රමාණයේ විශාල වැඩි වීමක් වෙලා තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩොලර් බිලියන 20ක්, 22ක්ව තිබුණු ආනයන වියදම අපි ඩොලර් බිලියන 16ට අඩු කරගෙන තමයි අපේ සංචිත ප්‍රමාණය මේ වනකොට ඩොලර් බිලියන 5 ඉක්ම වූ ප්‍රමාණයක රඳවාගෙන තිබෙන්නේ. ඒක හොඳ දෙයක් වෙන්න පුළුවන්. හැබැයි, එය හොඳ දෙයක් වූ පමණින් මේ සාර්ව ආර්ථික ගැටලුවට විසඳුමක් හම්බ වෙමින් තිබෙනවාද? ඒකට අපේ පිළිතුර තමයි, නැහැ කියන එක. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා තමයි අපට

[ගරු ගාමිණී වලේබොඩ මහතා]

තමුන්නාන්සේලාත් එක්ක වාද කරන්න වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා පිස්කල් ප්‍රතිපත්තිය මුදල් අමාත්‍යාංශය හරහා ධනාත්මක ආකාරයට ක්‍රියාත්මක කරන්න උත්සාහ කළාට, මූල්‍ය ප්‍රතිපත්තිය පිස්කල් ප්‍රතිපත්තියට ගැළපෙන සමානුපාතික ආර්ථික ප්‍රසාරණයක් ලබා දෙන දිහාවට ගලාගෙන යෑමට සලස්වන්න, එය ගළපා ගන්න තමුන්නාන්සේලාට නොහැකි වෙලා තිබෙනවා. ඒකට හොඳම උදාහරණය තමයි, අද බැංකු තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය. මහජනතාවගේ ඉතිරි කිරීම්වලට බැංකු ගෙවන පොලී අනුපාතය අද සියයට 5යි, 6යි.

ඕනෑම ඉතිරි කිරීමකට, ස්ථාවර තැන්පතුවකට, කාලීන තැන්පතුවකට සියයට 5ක, 6ක වාර්ෂික පොලී අනුපාතයක් ගෙවන බැංකු හා මූල්‍ය පද්ධතිය මහජනතාවට, ආයෝජකයන්ට, කර්මාන්තකරුවන්ට ණය ලබා දෙන්නේ සියයට 15 ඉක්ම වූ පොලී අනුපාතයකටයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසුගිය අවුරුදු 50ක කාල පරිච්ඡේදය සැලකිල්ලට අරගෙන බලන්න. පසුගිය අවුරුදු 100ක කාල පරිච්ඡේදය සැලකිල්ලට අරගෙන බලන්න. දෙවන ලෝක යුද්ධ සමයේවත් ඉතිරිකිරීම්වලට මෙච්චර පහළ පොලී අනුපාතයක් ගෙවලා, ණය සඳහා මෙච්චර ඉහළ පොලී අනුපාතයක් අය කරපු කාල පරිච්ඡේදයක් අපට දකින්න ලැබෙන්නේ නැහැ. ඒ අනුව අද මහ බැංකුව අසමත් වෙලා තිබෙනවා, මේ ආර්ථික ප්‍රතිපත්තිවලට අනුගත වන ආකාරයේ සමානුපාතික මූල්‍ය ප්‍රතිපත්තියකට මූල්‍ය වෙළෙඳ පොළ යොමු කරන්න. ඒ නිසා අපි අවධාරණය කරන්නේ මූල්‍ය වෙළෙඳ පොළ හසුරුවන මේ ක්‍රියාවලියට වහාම මැදිහත් වෙන්න කියලායි. මහ බැංකුව කරන මේ අත්තනෝමතික ක්‍රියාවලියේ ප්‍රතිඵල වෙන්නේ සාර්ව ආර්ථිකය තවදුරටත් හැකිළීම, මහජනතාව අතේ තිබෙන මුදල් ටික බැංකු පද්ධතියට ඇදී ඒම. ඒවා භාණ්ඩාගාර බිල්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර විධියට නැවත මහ බැංකුව ලබා ගත්තා වුණාට, රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ප්‍රසාරණය කරන්න ඕනෑ ආකාරයට, අපනයන වර්ධනය කරන්න ඕනෑ ආකාරයට, ක්ෂුද්‍ර පරිමාණ, සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ, මහා පරිමාණ කර්මාන්තකරුවන්ගේ ප්‍රසාරණයවීමට අවශ්‍ය ආයෝජන ලබා දෙන ආයෝජන කලඹක් විධියට මූල්‍ය පද්ධතියේ ආයෝජන ගම් මට්ටමට, කර්මාන්ත මට්ටමට ගලාගෙන යන වැඩ පිළිවෙළක් සලස්වන්න ඔබතුමන්ලාට බැරි වෙලා තිබෙනවා. අපි මෙතැන පිස්කල් ප්‍රතිපත්තිය පිළිබඳව වාද විවාද කළාට, මේ පනත සම්මත කර ගත්තාට අපේ පාලනයෙන්, තමුන්නාන්සේලාගේ පාලනයෙන්, රජයේ පාලනයෙන් ගිලිහිලා තිබෙන මහ බැංකු අධිපතිවරයා විතරක් තනිව පාලනය කරන මූල්‍ය ප්‍රතිපත්තිය මේ අය වැය ප්‍රතිපත්තියට සමානුපාතික කර නොගන්නා තාක්කල් තමුන්නාන්සේලා ගන්න සියලු ප්‍රයත්න වතුරේ යනවා කියන කාරණාව, ඒවා ඵල දරන්නේ නැහැ කියන කාරණාව මේ සභාවට පෙන්නුම් කරලා දෙන්න අවශ්‍යයි.

2022 සිට 2027 වර්ෂය වෙනකම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව ඇතුළු ආයතන ලංකාවේ ආර්ථික වර්ධනය පිළිබඳව සංඛ්‍යාලේඛනගත කරලා තිබෙන විධියට, පුරෝකථනය කරලා තිබෙන විධියට සියයට එකක, සියයට දෙකක ආර්ථික වර්ධන වේගයක් තමයි අපේක්ෂා කරන්නේ. උපරිම සියයට තුනයි. එතකොට තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතේ කියනවා, සියයට පහක ආර්ථික වර්ධනයක් ලබා ගන්නවා කියලා. ඒ අනුව, ඔබතුමන්ලා සියයට පහක ආර්ථික වර්ධන අනුපාතයක් ලබා ගත යුතු බවට නීතියක් පනවනවා. දැන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා, සියයට දෙකයි, තුනයි ගන්න පුළුවන් කියලා. හැබැයි තමුන්නාන්සේලා කියනවා, ඒ ප්‍රතිපත්තිය අනුගමනය කරලා සියයට පහක් ගන්න පුළුවන් කියලා. එතකොට මේ සභාවට, මේ රටට බොරු කියන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලද, එහෙම නැත්නම් මේ ප්‍රතිපත්ති ඉදිරිපත් කරන මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළු ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත හදපු අයද කියන එක මම තමුන්නාන්සේලාගෙන් අහන්න කැමැතියි.

ඒ වාගේම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ඇතුළු ජාත්‍යන්තර ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන ප්‍රධාන කොන්දේසියක් වන සාර්ව ආර්ථික බැඳුම්කරවල තිබෙන අවදානම්සහගත බව පිළිබඳව මම අවධානය යොමු කරන්න කැමැතියි. ගරු ශෙහාන් සේමසිංහ මුදල් රාජ්‍ය ඇමතිතුමනි, ඔවුන් ඉදිරිපත් කරලා තිබෙන කොන්දේසිය ඉතා බරපතළ කොන්දේසියක්. ඔවුන් දෙයාකාරයකින් අපි කොටු කරලා තිබෙනවා. එක්කෝ, මේ සාර්ව ආර්ථික බැඳුම්කරවලට අපට එකඟ වෙන්න වෙනවා. එහෙම නැත්නම්, අපි ඉල්ලා සිටින ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් කල් ගිහිල්ලා අපට haircut එකක්, එහෙම නැත්නම් ණය ප්‍රතිව්‍යුහගත කිරීම හරහා අවශ්‍ය වන්නා වූ ඩොලර් බිලියන 12ක, 15ක ණය කළමනාකරණය කර ගැනීමේ, දීර්ඝ කර ගැනීමේ, කපා හැරීමේ ක්‍රියාවලියට යන්න බැරි වෙනවා. මම ඔබතුමන්ලාගෙන් අහනවා, මේකෙන් කොයි එකද රජය පිළිගන්න සූදානම් වෙලා තිබෙන්නේ කියලා. ඔබතුමන්ලා මේකෙන් කොයි එකද සාධාරණීකරණය කරන්නේ?

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආයෝජනවලින් පමණක් නොවෙයි, මේ ආර්ථිකය ප්‍රසාරණය වෙන්නේ. දේශීය ආයෝජනවලිනුත් මේ ආර්ථිකය ප්‍රසාරණය වීමට යම් ප්‍රමාණයක බලපෑමක් එල්ල වෙනවා. ඒ එල්ල වෙන බලපෑමත්, ඒ ආයෝජනයේ ප්‍රතිඵලත් මත අරමුදල් ලබා දීලා තිබෙන, ISBs දීලා තිබෙන, වාණිජ මට්ටමේ අනුපාතවලට ණය දීලා තිබෙන අයගේ පොලීවලට ඒ ආර්ථික වර්ධනයේ කොටසට දායක මුදල් විධියට ගෙවන්න සිද්ධ වෙන එකඟතාවකටද තමුන්නාන්සේලා යන්න හදන්නේ? දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී දේශීය ප්‍රාථමික වෙළෙඳ පොළේ ගැණුම්කරුවන්, විකුණුම්කරුවන් දහතුන් දෙනෙකුගේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමට සම්බන්ධ කර ගත්තේ නැහැ. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී මොකක්ද කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ප්‍රාථමික වෙළෙඳ පොළේ ගනුදෙනුකරුවන් දහතුන් දෙනෙකුගේ, දහහතර දෙනෙකුගේ ණය ප්‍රතිව්‍යුහගත නොකිරීම නිසා 2024 වර්ෂයේ අය වැයට වැඩි වෙච්ච පොලී වියදම් ප්‍රමාණය රුපියල් බිලියන 300කට වඩා වැඩියි.

ඒ ණයත් ප්‍රතිව්‍යුහගත කළා නම් මේ පාර්ලිමේන්තුවේ සම්මත කරපු අය වැය ලේඛනයේ පොලී වියදම් රුපියල් බිලියන 300කින් අඩු කර ගන්න තිබුණා. එහෙම වුණා නම් VAT එක සියයට 15 ඉඳලා සියයට 18 කරන්නේ නැතුව ඉන්න තිබුණා. රුපියල් 100,000 නොවෙයි, රුපියල් 200,000ක සීමාවේ තියලා PAYE Tax එක අය කර ගැනීමේ ප්‍රතිපත්තියකට යන්න තිබුණා. හැබැයි, ඒක නොකර ධනය උත්පාදනය කරලා, ආයෝජනය කර තිබෙන පන්තිය රකින්න ඕනෑ කරන ප්‍රතිපත්තිමය තීන්දුව දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ගත්තා. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, ඒ අමන, මරිමෝඩ වැඩේ විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී කරන්න එපා, ඒකට එකඟ වෙන්න එපා කියලා.

ඒ වාගේම අස්වැසුම වැඩසටහන පිළිබඳවත් යමක් ප්‍රකාශ කරන්න අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පවුල් ලක්ෂ 57කින්, පවුල් ලක්ෂ 16කට අස්වැසුම ලබා දීමට තීරණය කරන්නේ ලංකාවේ දුප්පත්කම සියයට 12.9ක්ව තිබෙන අවස්ථාවකයි. අද ජාත්‍යන්තරවත්, දේශීයවත් පිළිගත්ත දේ තමයි දුප්පත්කම සියයට 29.8ට වර්ධනය වෙලා තිබෙනවා කියන කාරණය. එහෙම සියයට 29.8ට දුප්පත්කම වර්ධනය වෙලා තිබෙන වෙලාවේදීත් මම කලින් කිව්ව ප්‍රමාණයට විතරක්

අස්වැසුම දීලා හරියන්නේ නැහැ. අපේ ගම්මාන ගත්තාම, විශාල පිරිසක් දැන් තුන්වේල කන්න බැරි, ඒ වාගේම අමාරුවෙන් ආර්ථිකය ගැට ගසා ගන්නා කණ්ඩායමක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලාට අත පිහදා ගන්න බැහැ. ලෝක බැංකු වාර්තාව කියනවා, 70ලක්ෂයක් දුප්පතුන් බවට පත් වෙලා තිබෙනවා කියලා. එහෙම නම් මේ ආර්ථික වෘද්ධිය, ආර්ථික ප්‍රසාරණය, ආර්ථිකය යථා තත්ත්වයට පත් වෙන තෙක් අස්වැසුම ඉදිරියට දීර්ඝ කරන මේ මාස 12ක කාලය තුළදී අපි ඉල්ලා සිටිනවා, අන්ත දරිද්‍රතාවෙන් ඉන්න පිරිස පිළිබඳව නැවත අවධානය යොමු කරලා, ඔවුන්ට අස්වැසුම ලබා දෙන ක්‍රියාවලියකට යන්න කියලා. එහෙම නොවුණොත් ඔවුන්ගේ මන්දපෝෂණ තත්ත්වය ඉහළ යනවා විතරක් නොවෙයි, පාසල් හැර යෑම ඉහළ යනවා විතරක් නොවෙයි, ඔවුන්ට ජීවත් වෙන්න බැරි තත්ත්වයකුත් නිර්මාණය වෙනවා.

ඒ වාගේම මේ රෙගුලාසිවලට සම්බන්ධ නොවුණත්, පොහොර සහනාධාරය ගැනත් මම සඳහන් කරන්න අවශ්‍යයි. දැන් පොහොර සහනාධාරය ලබා දෙනවා. ඒ වාගේම පොහොර මිලදී ගන්න ගොවීන්ට මුදල් දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහෙන් ආපු නියෝගයක් නිසාද දන්නේ නැහැ, සියයට 30ක් අඩු කරගෙන තමයි පොහොර සහනාධාරය සඳහා ගොවීන්ට මුදල් නිදහස් කරන්නේ. අපි කියන්නේ ඒක කරන්න එපා කියායි. පසුගිය දවස්වල අපි මේ පිළිබඳව සොයා බැලුවා. උඩවලව, ඇඹිලිපිටිය, කල්තොට, දියවින්න ප්‍රදේශවල ගොවීන්ට පොහොර සහනාධාරය දෙනකොට ගොවි සංගම්වලට කියනවා, සියයට 30ක් තියාගෙන සියයට 70ක් තමයි නිදහස් කරන්නේ කියා. අපි දන්නේ නැහැ, එහෙම කරන්නේ ඇයි කියලා. නමුත් නිලධාරීන් මෙවැනි ක්‍රියාවලියකට ප්‍රවේශ වෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* නැහැ, ගොවියාට නේ දෙන්නේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළින් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි හරහා ගොවි සංවිධානවලින් ගත්ත තොරතුරු අනුව සැබෑ ගොවියා හඳුනාගෙන තමයි මේ පොහොර සහනාධාරය ලබා දෙන්න නියම කරලා තිබෙන්නේ. හැබැයි, සියයට 30ක් රඳවාගෙන තමයි සමහර ප්‍රදේශවල මේ මුදල් නිදහස් කිරීම සිද්ධ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම සඳහන් කරන්න අවශ්‍යයි, සියයට 5ක Withholding Tax එක පිළිබඳවත්. මේ පිළිබඳව උදේත් කථා කළා. මුදල් රාජ්‍ය ඇමතිතුමා මේ සභාවට කියනවා, බැංකු ගිණුම්වලින් සියයට 60ක් ඉතිරි කිරීම් පවත්වාගෙන යන්නේ දුප්පත්, අහිංසක ජනතාව කියලා. ඔවුන්ට හම්බ වෙන එකම ආදායම, පොලී ආදායම විතරයි. විශ්‍රාම යනකොට ලැබුණු මුදල, පෞද්ගලික අංශයේ සේවය කරලා විශ්‍රාම ගන්නකොට ලැබුණු මුදල අරගෙන බැංකුවේ තැන්පත් කළාම ඒකෙන් සොච්චම් පොලියක් ඔවුන්ට හම්බ වෙනවා. අද ලැබෙන පොලිය සියයට 5යි, සියයට 6යි. හැබැයි, මේ ලැබෙන පොලියෙනුත් සියයට 5ක් කපා ගන්නවා. මේ වෙනුවෙන් යම් ක්‍රමයක් සකස් කරන්න පුළුවන්. තමුන්නාන්සේලා කියනවා, බදු ගෙවන්න ඕනෑ නැති කෙනෙකුගෙන් මේ සියයට 5 කපන්න ඕනෑ නැහැ කියලා. හැබැයි, බැංකුව මේ සියයට 5ක මුදල කපා හැර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කරනවා, බදු වගකීමක් නැති කෙනෙකුට එතැනට ගිහිල්ලා ඒ මුදල ලබා ගන්න පුළුවන් කියලා. නමුත්, මේ මුදල කවදාවත් ගන්න පුළුවන්කමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ආත්මයේදී නොවෙයි, ලබන ආත්මයේදීවත් ඒ මුදල් ගන්න හම්බ වෙන්නේ නැහැ, රජයට ගිය මුදලක් ඒ විධියට ගන්න ලැබෙන්නේ නැහැ. මොකද, ඒවා ආපසු ගෙවීමේ ක්‍රමය එච්චරටම සංකීර්ණයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න, මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්න. බදු ගෙවන සීමාව රුපියල් ලක්ෂයක් කියා අපි හිතමු. ලංකාවේ බැංකු පද්ධතිය සම්පූර්ණයෙන්ම පරිගණකගත කරලා නේ තිබෙන්නේ. ඇයි, රජයට එක නමකට, එක හැඳුනුම්පතකට තිබෙන සියලු බැංකු ගිණුම් ටික එකවර හඳුනා ගන්න බැරි? ඒ තාක්ෂණය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත් සතුයි, බැංකු පද්ධතියත් සතුයි, මහ බැංකුවත් සතුයි. ඒ වාගේම මහ බැංකුවේ මූල්‍ය අංශයත් සතුයි. එහෙනම් එක්කෙනෙකුගේ නමින් පොලියෙන් කැපෙන ප්‍රමාණයට සීමාවක් පනවා මේ සියලුදෙනාගෙන් සියයට 5 ගණනේ කපන එක නතර කරන්න රෙගුලාසි පනවන්න කියා ඉල්ලා සිටිමින්, මට මේ වේලාව ලබා දීම පිළිබඳවත් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. M.U.M. Ali Sabry. You have 16 minutes.

Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Kokila Gunawardene to the Chair?

ගරු ශාන්ත බණ්ඩාර මහතා (ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சாந்த பண்டார - வெகுசன ஊடக இராஜாங்க அமைச்சர்)
(The Hon. Shantha Bandara - State Minister of Mass Media)
Sir, I propose that the Hon. (Mrs.) Kokila Gunawardene do now take the Chair.

ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA left the Chair, and THE HON. (MRS.) KOKILA GUNAWARDENE took the Chair.

[අ.භා. 3.45]

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி - வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry, PC - Minister of Foreign Affairs)

අද දින වැදගත් පනත් කෙටුම්පතක් සහ අයිතම කිහිපයක් පිළිබඳව කරුණු ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා සන්තෝෂ වෙනවා. අප සියලුදෙනාම දන්නවා, ලංකාව සීමාවක් නැතුව ණය අරගෙන තිබෙනවා, ලංකාවේ ජනගහනයෙන් බෙදලා එක්කෙනෙක් මෙච්චර ප්‍රමාණයක් ණයයි කියලා පසුගිය කාලය තුළ දිගින් දිගටම කිව්ව බව. ණය ගැනීමේ සීමාවක් නැති නිසාත්, ඒ ණය ගෙවා ගන්න බැරි වෙච්ච නිසාත් අපි තීරණය කළා, ණය ගෙවන එක තාවකාලිකව අත්හිටුවන්න. ඒකටත් විවිධ දේවල් කිව්වා. ණය ගෙවන එක තාවකාලිකව අත්හිටුවා, අපි දැන් ඒ ගැන සාකච්ඡා කරගෙන යනවා.

අද උදේ දකින්න ඇති, IMF වාර්තාව අනුව ඔවුන් කියනවා, දැන් අවසාන අදියරට ඇවිල්ලා තිබෙනවා කියලා. ඒ සාකච්ඡා සාර්ථක වුණොත් දේශීය ණය, විදේශීය ණය සහ ඒ මත පොලිය ගෙවීම සඳහා යන කාලය දුරස්ථ කිරීම ඇතුළු ඒ සමස්ත ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකා ජන රජයට ලැබෙන සමස්ත වාසිය ඇමෙරිකානු ඩොලර් බිලියන 17ක්. ඒක එහා කියලාද කියන්නේ? ඒක වැරදි දෙයක්ද? ණය ගෙවා ගන්න බැරි නම්, අපි මොනවාද කරන්න ඕනෑ? සාමාන්‍ය ව්‍යාපාරිකයෙකුට තමන්ගේ ව්‍යාපාරයේ ණය ගෙවා ගන්න බැරි නම් ඔහු කරන්නේ, බැංකුවට ගිහිල්ලා කථා කරලා, ණය ප්‍රතිව්‍යුහගත කරන එක. එලෙස ණය ප්‍රතිව්‍යුහගත කරන එක තමයි ශ්‍රී ලංකා රජය විසින් 2022දී ක්‍රියාත්මක කළේ. මට මතකයි, මේ පාර්ලිමේන්තුවේදී තමන් විසින්ම ආර්ථික විශේෂඥයන් ලෙස හඳුන්වා ගන්නා කට්ටිය - ඉංග්‍රීසියෙන් අපි කියනවා, self-proclaimed economists කියලා - අපට කිව්වා, ඩොලරයට සාපේක්ෂව ලංකාවේ රුපියලේ අගය 700ට යනවා, 800ට යනවා, 1,000ට යනවා කියලා. නමුත් අපි ණය ප්‍රතිව්‍යුහගත කරපු නිසාත්, විදේශ ණය ගෙවන එක නවත්වපු නිසාත් අපට පුළුවන්කම ලැබුණා, ඩොලරය ඉදිරියට යන එක වළක්වා රුපියල ආරක්ෂා කර ගන්න. කොච්චර දුරට රුපියල ආරක්ෂා කර ගන්න හැකි වුණාද කිව්වොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය කාලය තුළ, 2023 වර්ෂය හා 2024 වර්ෂය සමස්තයක් වශයෙන් එකට අරගෙන බැලුවාම දළ වශයෙන් සියයට 20ක පමණ ප්‍රමාණයකින් රුපියල appreciate වෙලා තිබෙනවා. ඒක කවුරුවත් බලාපොරොත්තු වෙච්ච දෙයක් නොවෙයි. රුපියල් 376ට official market එකේ ගිය ඩොලරය, 410ට unofficial market එකේ ගිය ඩොලරය, රුපියල් 302 දක්වා ගෙනෙන්නට - එක කාලයක 290 දක්වා ගෙනෙන්නට - අපට හැකියාව ලැබුණේ, මේ තීන්දු-තීරණ ගන්නට අපි නොපැකිළුණු නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අප සියලුදෙනාම දන්නවා, පසුගිය කාලය තුළ ලංකාවේ ණය දිගින් දිගටම වැඩි වෙලා තිබෙන බව. ඊට හේතුව තමයි ඉවක් බවක් නැතුව ණය ගැනීම. විවිධ ආයතනවලින්, විවිධ agenciesවලින් විවිධ කටයුතු සඳහා ණය ගන්නවා. සමහර අවස්ථාවලදී හෙළිදරව් වුණා, භාණ්ඩාගාරය තුළවත් ඒ පිළිබඳව නිවැරදි තොරතුරු නැහැ කියලා. එහෙම නම් ණය කළමනාකරණය කර ගැනීම සඳහා මධ්‍යගත ක්‍රමයක් සකස් කිරීමේ තිබෙන වරද මොකක්ද? කිසිම වරදක් නැහැ. ඒකෙන් අපි උත්සාහ කරන්නේ ණය ගැනීම පාලනය කරන්නයි, ණය ගැනීම ක්‍රමවත් කරන්නයි, ණය ගැනීම සෘජුවම යම්කිසි දෙයකට සම්බන්ධ නම් ඒකට අනුගත කරන්නයි, ගන්න ණය ආපසු ගෙවීම සඳහා ක්‍රමයක් සකස් කරන්නයි. ඒක ලෝකයේ පිළිගත් සියලු තැන්වල තිබෙන දෙයක්. අපි සියලුදෙනාම නැවත නැවතත් කියනවා, ආර්ථිකයේ විශාල වෙනසක් වෙන්නට ඕනෑ, අපේ ආර්ථිකය දියුණු වෙලා නැහැ, අපනයනය පාදක කර ගත්ත ආර්ථිකයක් හදන්න ඕනෑ කියලා. එහෙම නම් එකම දෙය නැවත නැවතත් කරන්න අපට හැකියාවක් තිබෙනවාද? කිසිම හැකියාවක් නැහැ. 1991 වර්ෂයේදී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දළ වශයෙන් බංග්ලාදේශය export කළේ ඩොලර් බිලියන 2.2ක් වටිනා භාණ්ඩ. වියට්නාමය export කළේ ඇමෙරිකානු ඩොලර් බිලියන 3ක් පමණ වටිනා භාණ්ඩ. ලංකාව export කළා, ඩොලර් බිලියන 2.8ක් පමණ වටිනා භාණ්ඩ.

2024 වනවිට වියට්නාමය විශාල ආර්ථිකයක් ගොඩනඟලා ඇමෙරිකානු ඩොලර් බිලියන 464ක භාණ්ඩ අපනයනය කරනවා. බංග්ලාදේශය ඩොලර් බිලියන 87ක භාණ්ඩ අපනයනය කරනවා. අපේ රටේ තවම අපනයනය කරන්නේ බිලියන 16ක භාණ්ඩ. එහෙම නම් අපනයන ආර්ථිකයක් ගොඩනඟනවා කියලා කට්ටිකිව්වාට, මෙතැන උගුර ලේ රහ වෙනතුරු කෑ ගැහුවාට, එහෙම නැත්නම් conspiracy theory එකක් මවාපාලා මුළු ලෝකයම බලාගෙන ඉන්නේ ලංකාව ගිල ගන්න කියලා කථා කළාට, ඒකෙන් අපනයන ආර්ථිකයක් ගොඩනැඟෙන්නේ නැහැ. අපනයන ආර්ථිකයක් ගොඩනඟන්න නම් අපි ලංකාව තුළ ආයෝජනය සඳහා අවශ්‍ය අවස්ථාව දෙන්න ඕනෑ. ලංකාවේ මිලියන 22ක් විතර තිබෙන market එකට ආයෝජනය කරන්න කවුරුවත් එන්නේ නැහැ. එහෙමනම්, ඒ market එක අපි පුළුල් කරන්න ඕනෑ. ඒ market එක පුළුල් කරන්න නම් අපි නිදහස් වෙළෙඳ ගිවිසුම්වලට එළැඹෙන්නට ඕනෑ. අපි ඒ ගැන තමයි කල්පනා කරලා බලන්නේ.

Thirdly, since when we move on to the Public Business I may not be here, I just want to explain to this House about the tax on house rental income. We are going to have a Wealth Tax imposed and there will be a very high threshold. So, the income from 90-odd per cent of the houses given on rent by the people would not come under that and at least one house would be exempted from it. So, do not worry, the rental income on your house would be safe.

But, why is it that we are going to have a tax on the house rental income? Because house rentals are based on ratings. Then, we came up with the problem that rates belong to the provincial councils. So, if we go on the ratings, there is a possibility that the court could say that that money belongs to the provincial councils. So, we wanted to bring it under the Central Government. Therefore, we have used a different formula called rental income because Income Tax belongs to the Central Government. It is the same, we would have generally used the ratings, but to get over the Constitutional issue, we have done that. That tax is going to have a very high threshold and I do not think the vast majority of the people in this country should even be worried about their income from houses rented out. That is all.

But, we will have to get on with the Wealth Tax. I know, the SJB is very worried that the billionaires who are with them would get taxed. But, nevertheless, this is the reason for imposing it.

Thank you.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)

(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, කාරණයක් පිළිබඳව ගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. ගරු ජනාධිපතිතුමනි, විශේෂයෙන් අලුත් බදු පැනවීම සහ බදු වැඩි කිරීම් ක්‍රියාවලිය ඔබතුමා ප්‍රත්‍යක්ෂ කරන්නේ, රාජ්‍ය ආදායමේ සහ ඉලක්කවල තිබෙන හිඟතාව තුළයි. ඒ කියන්නේ, ඉලක්ක කරා යන්නට බැරිව රාජ්‍ය ආදායම ප්‍රමාණවත් ලෙස වැඩි කර ගැනීමේ ඉලක්කය ඇතිව විවිධ බදු යෝජනා වෙනවා.

ගරු ජනාධිපතිතුමනි, මම ඔබතුමාට යෝජනා කීපයක් කරන්නයි යන්නේ. අපට ක්‍රමවේදයක් නැද්ද, දැනට පවතින බදු දැලට - tax net එක තුළට - ඇතුළු නොවී සිටින කණ්ඩායම් ඇතුළු කර ගැනීමේ ක්‍රියාවලියකට යන්න? එවැන්නක් සකස් කළ යුතුය යන්නයි මගේ පළමුවැනි යෝජනාව. දෙවැනි යෝජනාව මේකයි. බදු අය කර ගැනීමේ ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂමව, වඩාත් විනිවිදභාවයෙන් යුක්තව digitalization programme එකක් හරහා ක්‍රියාත්මක කරන්නට අපට බැරි ඇයි? මම දන්නවා ඒකට විරුද්ධ විවිධ කණ්ඩායම් සිටින බව. Digitalization වැඩසටහන්, ඒ වාගේම වඩාත් කාර්යක්ෂම ක්‍රමවේද අවශ්‍යයි. මොකද, එතකොට අපට පුළුවන්කම ලැබෙනවා, විවිධ අමතර බදු හිටිහැටියේ පනවන්නේ නැතුව බදු දැලට හසු විය යුතු කණ්ඩායම් බදු දැලට හසු කර ගැනීමටත්, ඒ වාගේම බදු පරිපාලනය - tax administration - මීට වඩා කාර්යක්ෂම කිරීමටත්. අපි දන්නවා, කවුරු ආණ්ඩුවේ සිටියත්, බදු පරිපාලනය විනිවිදභාවයෙන් යුක්තව සිදු කරන්නට, එය වගවීමෙන්, වගකීමෙන් සිදු කරන්නට විරුද්ධ, ඒ වාගේම ඩිජිටල්කරණයට විරුද්ධ වෙනම කොට්ඨාසයක් සිටින බව. අපි ඒක පිළිගන්නවා. ඇත්ත වශයෙන් මේ බංකොලොත් රටේ අපේ යෝජනාව තමයි, බදු පිට බදු ගහලා බදු සුනාමියක් නිර්මාණය කරනවා වෙනුවට, බදු පරිපාලනය කාර්යක්ෂම කිරීමේ තදබල වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයි කියන එක. ඒ සඳහා උදව් කරන්න අපි සූදානම්. *-[බාධා කිරීමක්]* Just a moment, Hon. President. I have some more suggestions.

අපි සූදානම්, බදු පරිපාලන කාර්යක්ෂමතාව - tax administration efficiency එක - ප්‍රවර්ධනය කරන වැඩසටහනකට යන්න; ඒ වාගේම, බදු දැලට හසු විය යුතු, එනමුත් හසු නොවී සිටින කණ්ඩායම් ඒ සඳහා ගොනු කර ගන්න.

මම ගරු ජනාධිපතිතුමාට කරුණු කිහිපයක් කියන්නට කැමැතියි. මෙන්න මේ කරුණු පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න. ගිය වසරේ විතරක් රටේ ඉහළම ගණයේ ව්‍යාපාරිකයින් වෙත රුපියල් කෝටි ලක්ෂයකට අධික බදු සහන ලබා දීලා තිබෙනවා. ඒ විධියට ඉහළම ගණයේ ව්‍යාපාරිකයන්ට කෝටි ලක්ෂයක බදු සහන ලබා දීම මෙවන් තත්ත්වයක් තුළ සාධාරණ ද? කෝටි ලක්ෂයකට අධික බදු සහන ඉහළ ගණයේ ව්‍යාපාරිකයින්ට ලබා දීලා තිබෙන්නේ මොන පදනමක් යටතේ ද? ඔබතුමා මේ ගැන සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරන්න. ඇත්ත වශයෙන්, එම බදු සහන ලබා නොදුන්නේ නම් නව බදු වර්ග හඳුන්වා දීමට ජනාධිපතිතුමාට අවශ්‍යතාවක් නැහැ. දැන් අපට අහන්නට ලැබිලා තිබෙනවා, නව බදුවලින් රුපියල් කෝටි 60,000ක ආදායමක් ලබා ගන්න බලාපොරොත්තු වෙනවා කියලා. හැබැයි, ඉහත කී පරිදි මේ රටේ ඉහළම ගණයේ ව්‍යාපාරිකයින්ට බදු සහන ලබා දීම තුළ කෝටි ලක්ෂයක මුදලක් අහිමි වෙලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමනි, ඇත්තවශයෙන්ම බදු ගෙවීම් පැහැර හැරීම් දිහා බැලුවාම, කෝටි 120,000ක බදු පැහැර හැරලා තිබෙනවා. මේවා වැදගත් කරුණු. මේවා මේ පාර්ලිමේන්තුවේ කමිටු හරහා හෙළිදරව් වුණු යථාර්ථවාදී, සත්‍යවාදී කරුණු.

මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, මෙම කරුණු කාරණා කෙරෙහි. බදු නොගෙවීම, බදු පැහැර හැරීම සහ බදු සහන ලබා දීම යන කරුණු නිවැරදි කර ගත්තොත් ඔය පනවන්නට යන අමතර බදු, නිර්මාණය කරන්නට යන බදු සුනාමිය ඇත්ත වශයෙන්ම අවශ්‍ය වන්නේ නැහැ කියා අපි විශ්වාස කරනවා.

ගරු ජනාධිපතිතුමනි, මම කියන්න කැමතියි, අපේ රටේ රුපියල් කෝටිය ඉක්ම වූ බදු පැහැර හරින්නන් 4,200ක් සිටින බව. ඒ 4,200 දෙනාගෙන් ඒ බදු ටික අය කර ගන්නට රජය කටයුතු නොකරන්නේ ඇයි? අරක්කු ව්‍යාපාරයේ නිරත වන 23 දෙනෙකු අතරින් 5 දෙනෙකු බදු පැහැර හැර සිටි අවස්ථාවේ එම බදු පැහැර හරින්නන්ගේ බලපත්‍රය අහෝසි කිරීමට රජයට හැකියාවක් පැවතියේ නැහැ. මම ඔබතුමාගේ අවධානය ඒ කාරණය කෙරෙහිත් යොමු කරවන්න කැමැතියි. මොකක්ද ඒ අසීරුකම? මේ වෙලාව වන කොට ඒ අයගෙන් දෙන්නෙක් බදු ගෙවලා තිබෙනවා. හැබැයි, ඒ ගෙවපු අය පැහැර හැරපු බදු මුදල කෝටි 700ක්. ඒ බලපත්‍රය cancel කළොත් ඒ අය බදු මුදල අනිවාර්යයෙන් ගෙවයි.

මුදල් ඇමතිතුමා හැටියට කටයුතු කරන ගරු ජනාධිපතිතුමාගෙන් මම ප්‍රශ්නයක් ඇහුවා, රාජ්‍ය බැංකුවලින් පුද්ගලයන් හැටියට සහ ආයතන හැටියට විශාල ණය මුදල් අරගෙන ඒවා නොගෙවෙන පුද්ගලයන්ගේ සහ කණ්ඩායම්වල ලැයිස්තුව සහ ණය ප්‍රමාණ ඉදිරිපත් කරන්න කියලා.

රාජ්‍ය අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මැතිතුමා තමයි ඒකට උත්තර දුන්නේ. ඒ නම්, ගම් මොනවත් කියන්න බැහැ කිව්වා. නම් කියන්නත් බැහැ කිව්වා, කපා හැරපු ණය මුදල කියන්නත් බැහැ කිව්වා. මේක හරි අසාධාරණයි නේ. රාජ්‍ය බැංකුවලින් පුද්ගලයින් සහ ආයතන ණය අරගෙන ඒ ණය ගෙවන්නෙත් නැහැ. ඒ ණය නොගෙවපු අයගේ ලැයිස්තුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කිව්වාම ඒක "අතිශය පෞද්ගලිකයි, රහසිගතයි" කියලා උත්තරයක් එනවා. ඉතින්, මම ගරු ජනාධිපතිතුමාට කියන්න කැමැතියි, මෙන්න මේ බදු පැහැර හරින ධන කුවේරයින්ගෙන් ඒ බදු ටික ලබා ගත්තොත් -බදු දැලට ඇතුළු විය යුතු, එනමුත් විවිධ කූට ක්‍රමවලින් බදු දැලට ඇතුළු නොවී එයින් පිටත සිටින කණ්ඩායම් ටික බදු දැල ඇතුළට ගත්තොත්- ඒ වාගේම අරක්කු සමාගම් විසින් ගෙවන්න තිබෙන ණය ටික හරියාකාරව ගෙව්වොත්, අපට අලුතෙන් බදු පනවන්න අවශ්‍ය වෙන්නේ නැහැ කියන එක.

මේ රටේ වරප්‍රසාද ලත් යම් කොටසක් ඉන්නවා. ඒ අයගේ ණය ටික කපා හැරෙනවා. කොච්චර ණය කපා හැරියාද කියලා ඇහුවාම උත්තර දෙන්නෙත් නැහැ. ඒ අයගේ නම් මොනවාද කියලා අහනකොට නම් කියන්නෙත් නැහැ. හැබැයි, බදු බර වැඩි වෙනකොට ඒකේ අගතිය සිද්ධ වෙන්නේ ලක්ෂ 220ක් වූ මේ රටේ ජනතාවට. ඒ නිසා මේ ඉදිරිපත් කරපු කරුණු-කාරණා සැලකිල්ලට අරගෙන මේ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරන්න. අලුත් බදු ගේනවාට වඩා, අලුත් බදු හරහා රාජ්‍ය ආදායමක් අලුතෙන් ලබා ගන්නවාට වඩා, තිබෙන බදු ප්‍රතිශත වැඩි කරනවාට වඩා, මෙන්න මේ ක්ෂේත්‍ර පිළිබඳව මුදල් ඇමතිවරයා හැටියට ඔබතුමා අවධානය යොමු නොකරන්නේ ඇයි කියලා මම අහන්න කැමැතියි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න. විපක්ෂ නායකතුමා සංඛ්‍යාලේඛන වගයක් කිව්වා. මම හිතන්නේ නැහැ, ඒ සංඛ්‍යාලේඛන නිවැරදියි කියලා. කී දෙනෙකුගෙන් බදු එකතු කරගන්න තිබෙනවාද කියලා සොයා බලා ඒ විස්තර ටික මම එතුමාට ලබා දෙන්නම්.

ඒ වාගේම මම එතුමා කියපු කාරණයට එකඟයි. අපේ Ways and Means Committee එකයි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවයි දෙකම එකතු වෙලා අපට සාකච්ඡා කරන්න පුළුවන්, අමතර බදු කොහොමද එකතු කරන්නේ කියන එක ගැන. ඒ වාගේම IMF එකේ යෝජනාත් ඉදිරිපත් කරලා ඒ ගැනත් සාකච්ඡා කරන්න පුළුවන්. බැංකුවකට රහස්‍යභාවයක් තිබෙනවා. අපට ඒ කරුණු ඉදිරිපත් කරන්න බැහැ. ඒක නවත්වන්න ඒ අයට උසාවියට හෝ යන්න පුළුවන්. ප්‍රධාන බැංකු දෙකම ආණ්ඩුවේ බැංකු. මිනිස්සු ඒ බැංකු දෙකෙන් එක පාරට සල්ලි ගත්තොත් ඒ බැංකු දෙක කඩා වැටෙනවා. අපේ ආර්ථිකය පාලනය කරන්නේ රාජ්‍ය බැංකුවලින්. මූල්‍ය අංශයේ වැඩිම මුදල් ප්‍රමාණයක් තිබෙන්නේ රාජ්‍ය බැංකු දෙකේ. ඒ අවශ්‍ය වැඩකටයුතු අපි කරන්නම්.

ගරු කථානායකතුමනි, අද නම් අපේ විපක්ෂ නායකතුමාට වාසි දවසක්. මොකද අනුර දිසානායක මන්ත්‍රීතුමා එංගලන්තයේ නිසා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, අපටත් අවස්ථාව දෙන්න. මේ පාර්ලිමේන්තුව ජනාධිපතිතුමාගේයි, විපක්ෂ නායකතුමාගේයි පමණක් වන පාර්ලිමේන්තුවක් නොවෙයි. මේක අපි හැමෝගෙම පාර්ලිමේන්තුව. ඒක නිසා අපේ අදහස කියන්නත් අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා ඉතා සූක්ෂම පන්දු යැවීමක නිරත වුණා. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා ඉතා දක්ෂ ලෙස පළමුවැනි කාරණය මතු කළේ, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දෙන ලද තීන්දුව ගැන. ඔබතුමා ඒ තීන්දුවට අභියෝග කළා. එය පළමුවැනි කාරණය. ඒක චිතරක් කළොත් ඒ මාතෘකාව චිතරක් මේ සභාවේ සාකච්ඡාවට ලක් වෙයි කියන සූක්ෂ්ම ඥානය ඔබතුමාට තිබෙන නිසා -ඒකට කියන්න පුළුවන් කපටිකම කියලා- අතීතයට එක් වෙලා තිබෙන කොවිඩ් කාලයේ කාරණාවක් ඔබතුමා මතු කළා. මහින්ද රාජපක්ෂ මැතිතුමාත් සිටි පක්ෂ නායක රැස්වීමකදී හිටපු

[ගරු විමල් වීරවංශ මහතා]

අමාත්‍ය අතාඋල්ලා මැතිතුමා අපේත් එකඟතාව ඇතිව, ඒ මරණ වළලන්න ඉඩ දෙන්න කියන ඉල්ලීම කළා.

ඒ වෙලාවේ බැසිල් රාජපක්ෂ මහත්තයා පරල වෙලා, ප්‍රකෝප වෙලා ජනාධිපතිතුමා ගන්න තීරණවලට විරුද්ධ වෙන්න බැහැ කියලා විකාරයක් කළා. *[බාධා කිරීමක්]* එකඟයි. හැබැයි, ඒක අතීතයට එක් වුණු දෙයක්. ඒක ගැන අතීතයට අදාළ වේදනාවක් තිබෙන්න පුළුවන්. ඔබතුමා දෙවැනි පන්දුව හැටියට ඒ කාරණය යොමු කළා. එතකොට අපට ඕනෑ නම් පළමුවැනි පන්දුව ගැන කථා නොකර දෙවැනි පන්දුව ගැන කථා කරන්න පුළුවන්. ඊට පස්සේ ඔබතුමා ඉතා සූක්ෂම ලෙස අර කුලියට දෙන ගෙවල් සම්බන්ධයෙන් අය කරන බද්ද ගැන කියමින් ඒ පන්දුව තුන්වෙනුව යොමු කළා. අපේ විපක්ෂ නායකතුමා ඒ තුන්වැනි බෝලය ගත්තා. ගරු ජනාධිපතිතුමනි, මම නම් කියන්නේ ඔබතුමා දමපු බෝල තුනෙන් බලවත්ම පන්දුව තමයි පළමුවැනි පන්දුව. පළමුවැනි පන්දුව තමයි ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අභියෝග කරපු පන්දුව. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පනත් කෙටුම්පත් ගැන ලබා දෙන තීන්දුවලට ආණ්ඩු පක්ෂයේ ජනාධිපතිට හෝ අගමැතිට හෝ අභියෝග කරන්න පුළුවන් නම්, ඒවා අපි පිළිගන්නේ නැහැ කියලා කියන්න පුළුවන් නම්, පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න මේ රටේ පුරවැසියාට තිබෙන අයිතියට මොකද වෙන්නේ? *[බාධා කිරීමක්]* මට ඉඩ දෙන්න, මේ කාරණය ඔබතුමාට පැහැදිලි කරන්න.

කාන්තාවන් සවිබල ගන්වනවා නම් ඒක කාන්තාවන්ට පමණක් සීමා වෙන්න ඕනෑ. නමුත්, ඒක සංක්‍රාන්තික ලිංගිකයින්ටත් අදාළ වෙලා තිබෙනවා. ස්වභාවයෙන්ම හෝර්මෝන ප්‍රශ්න වැනි ඒවා නිසා සංක්‍රාන්තික ලිංගිකයන් හැටියට ඉන්න අය සම්බන්ධව අපි මානුෂීයව බලන්න ඕනෑ. ඒ වාගේම ඒ අය වෙනුවෙන් සාධාරණව කටයුතු කරන්න ඕනෑ. ඒ පිළිබඳව විවාදයක් නැහැ. හැබැයි, කාන්තාවන් සවිබලගැන්වීම කියන එක ඇතුළට ඒ අයව දැම්මේ ඇයි? ඒක එක කාරණයක්. අනෙක් එක, ඔබතුමාට කියන්න බැහැ, ඒ අය කාන්තාවන් කියලා. මම ඒකට හොඳ උදාහරණයක් කියන්නම්.

ඒ තමයි, සංක්‍රාන්තික ලිංගික ලියා තෝමස්ගේ සිද්ධිය. ඒක තමයි මේ සඳහා හොඳම උදාහරණය. සංක්‍රාන්තික ලිංගික ලියා තෝමස්, ඔලිම්පික් කාන්තා පිහිනුම් තරගාවලියට තරග කරන්න ආවාම ඔලිම්පික් ක්‍රීඩා කමිටුව එය ප්‍රතික්ෂේප කළා. ඔවුන් කියන්නේ, ජීව විද්‍යාත්මක කාන්තාවකට හැර, පසුකාලීනව විවිධ හෝර්මෝන හේතු මත ඒ තත්ත්වයට පත් වෙච්ච අයට මෙහෙම කාන්තා තරගවලට සහභාගි වෙන්න ඉඩ දෙන්න බැහැ කියන එක. එතකොට ඔලිම්පික් කමිටුව කියන්නේ, මානව හිමිකම් උල්ලංඝනය කරන කමිටුවක්ද? දැන් මෙතැනදී කරලා තිබෙන්නේ මොකක්ද? ජීව විද්‍යාත්මක කාන්තාව සවිබලගැන්වීම කියන එක හරි. ජීව විද්‍යාත්මක කාන්තාව සවිබල ගැන්වීමේ මුවාවෙන් විශාල ජාවාරමක් දැන් ලෝකයේ තිබෙනවා. දැන් සමහර බටහිර රටවල ප්‍රාථමික අංශයේ දරුවන්ගෙන් අහනවා, දෙමව්පියන්ගේ අවසරයකින් තොරව ලිංග විපර්යාස කරගන්න කැමැතිද කියලා. මේ, හොඳට ඉන්න කොලු පැටියාව ගැහැනු දරුවෙකු කරන්න, හොඳට ඉන්න ගැහැනු දරුවාව පිරිමි දරුවෙකු කරන්න හදනවා. පුරුෂ ලිංගයක් ඩොලර් 4,000යි. ඒ කරන operations විශාල මිලකින් යුක්තයි. ඒවා කරගත්ත හැම කෙනෙකුටම ජීවිත කාලය පුරාවට බෙහෙත් ගන්න සිදු වෙලා තිබෙනවා. බටහිර ඖෂධ සමාගම්වල ඕනෑකම් මේක අස්සට රිංගවලා තිබෙනවා. ජීව විද්‍යාත්මක කාන්තාවට අසාධාරණයක්, අසමානතාවක් සිද්ධ වනවා නම්, ඒ ප්‍රශ්නය මේ පනතින් විසඳෙනවා නම් අපි ඒකට සියයට දාහක් එකඟයි. ඒ වාගේම ස්වාභාවිකව, හෝර්මෝන හේතු මත සංක්‍රාන්තික ලිංගිකයන් හැටියට ඉන්න අයට සමාජයෙන් අසාධාරණයක්, නොසැලකිල්ලක් සිදු වෙනවා නම් ඒක නැති කරන්න මෙවැනි පනතක් ගෙනෙනවා නම් අපි එකඟයි. හැබැයි, එහෙම ගෙනෙන මුවාවෙන් මේ ජාවාරමට ඉඩ දෙන එක වැරැදියි. අනෙක, ඒ සංක්‍රාන්තික ලිංගිකයන් ජීව විද්‍යාත්මක කාන්තාවගේ ගණයට වැටෙන්නේ නැහැ. එහෙම නම්, ඔලිම්පික් කමිටුව අර කියපු ක්‍රීඩිකාවට තරග කරන්න ඉඩ දෙන්න ඕනෑ නේ. නමුත්, තරග කරන්න ඉඩ නොදුන්නේ ඇයි? ඒ නිසා, ඔබතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයට මේ විධියට අභියෝග කිරීම වැරැදියි.

එහෙම අභියෝග කරන සංස්කෘතියකට ගියොත්, අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා වැඩකුත් නැහැ ගරු ජනාධිපතිතුමනි, අන්තිමට ඔබතුමා සතුටු නැත්නම් මෙහෙමද වෙන්නේ? ඔබතුමා හැම දාම ඔය පුටුවේ ඉන්නේ නැහැ නේ. ඒක වෙනම දෙයක්. නමුත් කවුරු හරි ඔය පුටුවේ වාඩි වෙන කෙනා සතුටු නැත්නම්, අපි ශ්‍රේෂ්ඨාධිකරණය කියලා එකක් තියාගන්නේ මොකටද? ස්වාධීනත්වය කියන්නේ මොකක්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා,-

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
තුන්වැනි කාරණයත් කියලා මම අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

මම කනගාටු වෙනවා, මේ බරපතළ කාරණය ගැන තිබෙන අවධානය පැත්තකට දමලා, මේ විධියට කටයුතු කරන එක ගැන. *[බාධා කිරීමක්]* බදු ප්‍රශ්නත් බරපතළයි තමයි. දැන් අපි බදු පිට බදු කමින් ඉන්නවා. බදු පිට බදු කාලා, දැන් කොච්චර බදු පැනෙව්වත් ගාණක් නැති තත්ත්වයට පත් වෙලා වාගේ තමයි ඉන්නේ. ඒවාත් ප්‍රශ්න තමයි. හැබැයි ඒ ඔක්කෝටම වඩා බරපතළ ප්‍රශ්නය තමයි, මෙන්න මේ කාන්තාවන් සවිබලගැන්වීමේ පනත් කෙටුම්පත ඇතුළේ තිබෙන අන්තර්ගතය හරියට කියවාගන්නේ නැතුව ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට අභියෝග කරන එක. එහෙම අභියෝග කරනවා නම් ශ්‍රේෂ්ඨාධිකරණය වහලා දමන්න. ඔය විධියට කරනවා නම් ශ්‍රේෂ්ඨාධිකරණයක් තියාගෙන වැඩක් නැහැ.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Speaker, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Sumanthiran?

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Hon. Speaker.

Hon. President, I associate with your concerns about the Determination on the Gender Equality Bill. There may be issues that arise from the Supreme Court Determination. But, there is a point of Order I raise. That

is, what was read out by the Hon. Speaker today is the Supreme Court Determination on the Sri Lanka Telecommunications (Amendment) Bill. The Supreme Court Determination on the Gender Equality Bill was not read out.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
It was read out during the last Sitting Week.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
It was read out during the last Sitting Week, is it? Very well.

Hon. President, I wish to state that your concerns are valid. But, we are a little concerned about the route you are taking. If you go to appoint Select Committees for each and every determination of the Supreme Court, there will be a confrontational path. So, with utmost respect, may I suggest that the Bill be re-presented, maybe, with some changes or without changes and then, Parliament could request the Supreme Court to have a fuller Bench to consider it again. Then, we would be following a particular path, given that some of the judgments you cited including that which was given by a ten-judge Bench are considered. All that is valid. So, instead of challenging the Determination of the Supreme Court in this way, I suggest that we follow a non-confrontational path by re-presenting the Bill and asking the Supreme Court to consider it all over again.

Now, Sir, I want to raise another matter. In the month of March, I attended a meeting with the President and the President tweeted saying, "I invited Party Leaders to discuss the IMF Proposals. I always encourage open dialogue and shared commitment. TNA Leader and Parliamentarian, Mr. M. A. Sumanthiran, along with other stakeholders, joined me yesterday" and so on. Then, he had further said, "Mr. M. A. Sumanthiran voiced a key concern regarding the availability of IMF technical assistance reports. I am committed to releasing these reports to the TNA and Parliament. We discussed further how our Government remains dedicated to following a structured roadmap for economic stability." To this day, neither I nor this House have received those Technical Assistance Reports, Hon. President, that you promised to give us. While I attended that meeting, you said you would give it. Then, you tweeted that. After that, you came to this House and said that it will be presented. Now, three months have elapsed and the Technical Assistance - TA - Reports of the IMF have not been presented. So, I am raising a very serious concern. I do not want this also to be added to the list of things that you promised to deliver, but never delivered. There is a long list of things that you have promised to deliver and not delivered. So, this is in writing and you have given this commitment to the country. You, yourself had tweeted this on your personal "X" account, but we are yet to receive it.

Thank you.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ රීති ප්‍රශ්නය?

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය මතු කරන්නේ ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු කාරණය සම්බන්ධවමයි. මම point of Order එක මතු කරන්නේ, Standing Order No. 55 (2)(c) යටතේයි.

Standing Order No. 55(2)(c) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ලැබීමෙන් අනතුරුව, කථානායකවරයා විසින් එකී තීරණය පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබිය යුතු අතර, එම නිවේදනය සම්බන්ධයෙන් විවාදයකට අවසර දෙනු නොලැබිය යුත්තේය."

ගරු කථානායකතුමනි, මම විශ්වාස කරනවා, ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරපු එක කාරණයක් ඉතා වැදගත් කියලා. ඒ තමයි, ගරු සභාවට තිබෙන බලය ඒකෙන් සම්පූර්ණයෙන් වියෝවීමේ ප්‍රශ්නයක් ඇති වනවා කියන එක. එය ඉතාම පැහැදිලියි. නමුත්, මගේ පළමු concern එක මේකයි. එහෙම වුණාට, Standing Order No. 55(2)(c) යටතේ ගැටලුවක් මතු වෙනවා, අපි ඒ ප්‍රශ්නය විවාද කිරීමේ සම්ප්‍රදායකට ගියොත්. මොකද, Standing Order No. 55(2)(c)වලින් ප්‍රශ්නය විවාද කිරීම වළක්වා තිබෙනවා. අපි ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්න ඕනෑ කියලා මම හිතනවා. ඒක පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය මෙයයි, ගරු කථානායකතුමනි. ජනාධිපතිතුමා මේ ගරු සභාවේ සභිකයෙක් වෙන්නේ අපේ ව්‍යවස්ථාවට අනුව නම් half විධියට. ජනාධිපතිතුමා අපේ Legislature එකේ කොටසක් විධියට නොවෙයි, Executive එකේ කොටසක් විධියටයි ඉන්නේ. එතකොට Executive එකට ශ්‍රේෂ්ඨාධිකරණයට අමතන්න පුළුවන්. Executiveහි එතුමා යටතේ ඉන්න ඇමතිවරු, එතුමා යටතේ ඉන්න ලේකම්වරු ඕනෑ කෙනෙකුට විරුද්ධව තීරණයක් ගන්න පුළුවන්. ඒ නිසා තමයි එතුමා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් මෙය ප්‍රකාශයට පත් නොකර මෙතැනට ඇවිල්ලා ප්‍රකාශයට පත් කළේ. එහෙම කළේ, අපට තිබෙන වෙන ආවරණයක් ඇතුළට ඇවිල්ලා. ඒක ගැන මට තේරෙනවා. හැබැයි, මම කියන්නේ ගරු ජනාධිපතිතුමා Executiveහි ප්‍රධානියා ලෙස කරන ඉදිරිපත් කිරීමක් Legislature එක ඇතුළෙන් කරන එක සම්ප්‍රදායයක් විධියට වැරදියි කියලායි. මොකද, ඒක ඒ විධියට කළාම Legislature එකට තිබෙන ඉඩ Executive එක විසින් වෙන පැත්තකින් පාවිච්චි කළා වෙනවා. ඇත්තටම ජනාධිපතිතුමාට මේ Legislature එකේ ඡන්දය දෙන්න බලයක් නැහැ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව ජනාධිපතිතුමාට මෙතැන seat එක හදලා තිබෙනවා. ඒ ඔක්කෝම ඇත්ත. හැබැයි, ජනාධිපතිතුමා මෙතැනට එන එක ඉතා වැදගත්. මෙතුමා පත් වුණේ පාර්ලිමේන්තුවෙන් තමයි. නමුත්, ව්‍යවස්ථාවට අනුව Executive, ballot paper එකකින් පත්වන පුද්ගලයෙක්. Sir, we have two ballot paper systems

[ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා]

in this country. One ballot paper is cast completely to look after the legislative matters, which we are doing. But, the Executive is completely different. So, we are not supposed to mix these two. That is what I wanted to say. I am a new Member, but I am concerned and I am placing this before the seniors of this House.

Thank you.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ඇත්තවශයෙන්ම කාලය ඉතිරි කර ගැනීමේ අවශ්‍යතාව නිසා තමයි මම එක ප්‍රශ්නයක් විතරක් ගරු ජනාධිපතිවරයාගේ අවධානයට යොමු කළේ. මේ ආදාහනය, භූමදානය ගැන කථාව පිළිබඳව කිව්වොත්, ඒක කොවිඩ් කාලයේ මේ රටේ දේශපාලන ඉතිහාසයේ එක ජාතියක්, එක ආගමක් ඉලක්ක කරගෙන රජයක් ක්‍රියාත්මක කරපු ක්‍රියාදාමයක්. විශේෂඥයන් යැයි කියන කණ්ඩායමක් යොදාගෙන, තමන්ගේ ජාතිවාදය - racism - ඉස්මතු කරගෙන මේ රටේ ඉස්ලාම් ආගම අදහන මුස්ලිම් ජනතාවට විරුද්ධව ක්‍රියාත්මක කරපු නින්දිත ක්‍රියාදාමයක්, ඒක. WHO එකත් කියද්දි ඒක වැරදියි කියලා, විශේෂිත කමිටු දාලා මේ රටේ මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගෙන ඒ අය දඩයම් කරන්නට කරපු වැඩක්, ඒක. මම ජනාධිපතිවරයාට විශේෂයෙන්ම කියන්න කැමැතියි, කවුද මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කළේ කියලා. ඉස්ලාම් ආගම අදහන මුස්ලිම් ප්‍රජාවේ ඒ අයිතිය අහිමි කරමින් ඇත්තටම කරලා තිබෙන්නේ මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්. ඒක මේ රටේ එක ජාතියක් ඉලක්ක කරගෙන කළ දඩයම් කිරීමක්. පැහැදිලිව මම කියන්න කැමැතියි, අපි තමයි සමගි ජන බලවේගය -සමගි ජන සන්ධානය- හැටියට නොබියව මහ පාරට බැහැලා එවකට පැවති ආණ්ඩුවේ ඒ මෘග ප්‍රතිපත්තිය පරාජය කිරීමේ ගමන වෙනුවෙන් ලොකු හඬක් නැගුවේ කියන එක. ගරු ජනාධිපතිතුමනි, අලුත් නීති රීති ගෙනෙන එක බොහොම හොඳයි. මම දන්නවා, ඒ ආදාහන සහ භූමදාන ප්‍රශ්නයට ඔබතුමා හවුල් වුණේ නැහැ කියලා. ඒක මම පැහැදිලිව කියන්න ඕනෑ.

දැන් අලුත් නීති රීති ගේන්න හදනවා වාගේම, 2019දී පැවති ජනාධිපතිවරණයෙන් පස්සේ අන්ත ජාතිවාදය, අන්ත ආගම්වාදය කේන්ද්‍ර කරගෙන, මේ රටේ එක ජාතියක් ඉලක්ක කරගෙන, ඒ ජාතිය දඩයම් කරපු ඒ ක්‍රියාදාමය ක්‍රියාත්මක කළේ කවුද, ඒකට වගකියන්න ඕනෑ කවුද කියන එක පිළිබඳවත් පැහැදිලි පරීක්ෂණයක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු විපක්ෂ නායකතුමා,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම කථා කරලා ඉවර නැහැ, ගරු කථානායකතුමනි. මොකද, මම කිව්වා නේ මම කොටසක් ගැන විතරයි කථා කළේ කියලා. දැන් මට ඉතිරි කොටස් ටික ගැන කථා කරන්න අවස්ථාව දෙන්න.

මම මේ කාරණයත් කියන්න කැමැතියි. ගරු ජනාධිපතිතුමනි, මම කථා කළා ණයක් අරගෙන ඒ ණය නොගෙවා ඉන්න, ඒ කියන්නේ ණය default කරන කණ්ඩායම් ගැන. ගරු ජනාධිපතිතුමනි, කවුරු හෝ ණයක් අරගෙන ඒ ගනුදෙනු හරියට කරනවා නම්, විනිවිදභාවයෙන් යුක්තව ණය ගෙවීම් කරමින් තමන්ගේ ව්‍යාපාරික කටයුතු හෝ මොනවා හෝ කරගෙන යනවා නම්, ඒ ණය ගනුදෙනු ගැන ප්‍රශ්න කරන්න අපට අයිතියක් නැහැ කියලා මම පිළිගන්නවා. ඒකේ රහස්‍යභාවය සාධාරණයි. හැබැයි, මම ඔබතුමාගෙන් අහනවා මෙන්න මේ කාරණයත්. අධිපෝෂතුන් හිතාමතාම ණයක් ගන්නවා, ඒ ණය ගෙවන්නේත් නැහැ, රජයට බලපෑම් කරලා ඒ ණයෙන් කොටසක් කපා ගන්නවා. මේ අයගේ නම් ආදී තොරතුරු හෙළිදරව් කිරීම අතිශයින් වැදගත්. ඉතින් මම යෝජනා කරනවා, ඒ දේත් අනිවාර්යයෙන්ම ඉෂ්ට කරන්න කියලා.

ගරු කථානායකතුමනි, මේ සභාවේදී කියැවුණා, ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් නිර්දේශ පිළිබඳව. ඔබතුමාට මම අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය කියන ත්‍රිපාර්ශ්වය තිබෙන බව. මේ තුන්කට්ටුව තුළ සංවරණ සහ තුලන - checks and balances - ක්‍රමවේදය තිබෙනවා. ඒ වාගේම බලය බෙදලා තිබෙනවා, separation of powers කියන principle එක හරහා. ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දෙන යම් කිසි නිගමනයක අඩු පාඩු තිබෙනවා කියලා හැඟීමක් එනවා නම්, එය නිවැරැදි කළ යුත්තේ සංවරණ සහ තුලන ක්‍රමවේදයට හානියක් නොවී, එක branch එකක් තව branch එකක් අබිබවා නොයා, ඒක dominate කරන්නට, යටපත් කරන්නට, නිහඬ කරවන්නට යන ප්‍රතිරූපය නිර්මාණය කරන්නට නොදී වෙනත් ව්‍යවස්ථාදායක ක්‍රමවේදයක් අනුගමනය කරමිනුයි. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ, ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දෙන නිගමන පිළිබඳව Select Committees පත් කරනවාය කියන එක ගැන මම නම් කැමැත්තක් දක්වන්නේ නැහැ. නමුත් යම් කිසි දෝෂයක් තිබෙනවා නම්, යම් කිසි අඩුපාඩුවක් තිබෙනවා නම් වෙනත් නිවැරැදි නීත්‍යානුකූල, ව්‍යවස්ථානුකූල ක්‍රමවේදයක් අනුගමනය කරමින් අපි ඒ අඩුපාඩුව නිවැරැදි කර ගනිමු කියා මම යෝජනා කරනවා.

අවසාන වශයෙන් මේ කාරණයත් ගරු ජනාධිපතිතුමාට මම කියන්න ඕනෑ. මට කවුරු මේ රටේ හිටියත් එකයි, පිට රට හිටියත් එකයි, මම මගේ වැඩ ටික කරගෙන යනවා. ඔබතුමාත් විවිධ රටවලට ගිහිල්ලා විවිධ වැඩ කටයුතු කරනවා නේ. ඔබතුමා රට හිටියත් එකයි, මෙහේ හිටියත් එකයි; ජනාධිපති මන්දිරයේ හිටියත් එකයි, පෞද්ගලික නිවසේ හිටියත් එකයි. අපට ප්‍රශ්නයක් නැහැ, අපි අපේ වැඩ කටයුතු ටික කරගෙන යනවා. හැබැයි, මම එක කාරණයක් කියන්න කැමැතියි. අපි කරන හැම වැඩකින්ම අපි අගයක් එකතු කරනවා, we add value.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමාගේ කථාවේදී එතුමා මේ ආදාහනය, භූමදානය සම්බන්ධව කථා කරනකොට කිව්වා, එදා ආණ්ඩුව පත් කරපු කමිටුව විසින් එම මෘතදේහ ආදාහනය කරන්න කියලා නිර්දේශ ලබා දුන්නා, ඒ මත ආණ්ඩුව තීන්දු ගත්තා කියලා. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමාගේ ඒ කථාව වැරදියි කියලා මම හිතනවා. ඔබතුමාට මතක ඇති, ආණ්ඩුව එදා මේ සම්බන්ධව කමිටු දෙකක් පත් කළ බව. එකක් තමයි, නාක්ෂණ කමිටුව. ඊළඟට, තව expert panel එකකුත් පත් කළා. ගෝඨාභය රාජපක්ෂත් මහත්මයාත් එක්ක හිටපු Dr. Channa Perera වැනි අය ඒ නාක්ෂණ කමිටුවේ හිටියා. ඒ කණ්ඩායම තීන්දුවක් දුන්නා, ආදාහනය පමණක් කරන්න කියලා. ඒ නාක්ෂණ කමිටුව තුළ ඔබතුමා කිව්ව මෙත්තිකාලා, අරගොල්ලන්, මේගොල්ලන් ඔක්කෝම ඉඳලා තමයි ඔය තීන්දුව දුන්නේ. අලි

සබ්රි ඇමතිතුමාත් ඔය කාරණය දන්නවා. ඊට පසුව මුස්ලිම් ප්‍රජාව ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් ඉල්ලීමක් කළා, විද්වතුන්ගේ කමිටුවක් පත් කරන්න කියලා. ඒ විද්වතුන්ගේ කමිටුවේ සභාපති හැටියට පත් කළේ කොළඹ වෛද්‍ය විද්‍යාලයේ Dean හැටියට වැඩ කරන මහාචාර්ය ජෙනිෆර් පෙරේරායි. එතුමිය විසින් එතුමියගේ වාර්තාවෙන් පැහැදිලිව නිර්දේශයක් දුන්නා, WHO එක ලබා දීපු නිර්දේශ අනුව, ඒ guidelines අනුව කටයුතු කරන්න කියලා. නමුත් ගරු කථානායකතුමනි, එදා හිටපු කැබිනට් මණ්ඩලයයි, ජනාධිපතිවරයායි ඒ තීන්දුව පිළිගත්තේ නැහැ. ඒ හින්දා ගරු ජනාධිපතිතුමනි, තමුන්නාන්සේ අද පොහොට්ටුව එක්ක ආණ්ඩු කරනවාය කියලා පොහොට්ටුව සුද්ධ කරන්න එපා.

තමුන්නාන්සේ වාඩි වෙලා ඉන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

එක්ක. මොකද, මේක මානව ඉතිහාසයේ ගත්ත ඉතාම බරපතළ අපරාධ තීන්දුවක්. ඒ තීන්දුව ගත්ත කැබිනට් මණ්ඩලයත් එක්ක තමයි ඔබතුමා අද ඉන්නේ. ඒ හින්දා අපි ඔබතුමාගෙන් ඉල්ලනවා,

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු කථානායකතුමනි, මම එක කාරණයක් පැහැදිලි කරන්නට ඕනෑ. ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට පැමිණ විශේෂයෙන්ම ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳ කාරණය ගැන ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීන්දුව සම්බන්ධයෙන් එතුමා සතුටු නොවන බවත්, ඒ පිළිබඳව විවෘතව හිතන්න කියාත් ප්‍රකාශයක් කළා. විශේෂයෙන්ම විපක්ෂ නායකතුමා වාගේම අනික් මන්ත්‍රීවරුනුත් කථා කළා, විධායකය, ව්‍යවස්ථාදායකය සහ ශ්‍රේෂ්ඨාධිකරණය ත්‍රිත්වයක් හැටියට ගත්තොත් බල තුලනයක් ඇති වෙන්නේ කොහොමද කියන කාරණාව සම්බන්ධයෙන්. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා තනි පුද්ගලයෙක් හැටියට පාර්ලිමේන්තුවට ඇවිල්ලා, සමස්ත කැබිනට් මණ්ඩලය නියෝජනය කළත් මේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව සම්බන්ධයෙන් විධායක ජනාධිපති හැටියට ඉදිරිපත් කරන්නේ ඔබතුමාගේ පෞද්ගලික මතයද, නැත්නම් ආණ්ඩුවේ මතයද? ඇත්ත වශයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණය දීපු තීන්දුවේ යම්කිසි වරදක් තිබෙනවා නම්, ඔබතුමා කළ යුතුව තිබුණේ, ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සිටින මන්ත්‍රීවරු කැඳවලා, මෙන්න මේ වාගේ සාධාරණ යුක්ති සහගත කාරණයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය දීපු තීන්දුව වැරදියි කියලා ඒ අයට ඔබතුමාගේ අදහස ඉදිරිපත් කරන එකයි. එසේ අදහස ඉදිරිපත් කරලා, ඒ සාමූහික අදහසේ ප්‍රකාශකයෙක් හැටියට ඔබතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කරන එක තමයි මේ සමතුලනය පවත්වාගෙන යන්න තිබෙන ක්‍රමවේදය, මට තේරෙන විධියට. Gender එක - ස්ත්‍රී පුරුෂභාවය - සම්බන්ධයෙන් වන කාරණය අද ලෝකයේ රටවල් යොදා ගන්න විධිය සහ කථා කරන විධිය ගැන මේ පාර්ලිමේන්තුවේ සිටින අයටත් එක එක විධියේ කියැවීම් තිබෙනවා. බෞද්ධ රටක් හැටියට අපේ ආගමික මතවාදය තුළ ස්ත්‍රීන් සමාන අයිතිවාසිකම් තිබෙන අය හැටියට අපි ධර්මානුකූලව පිළිගෙන තිබෙනවා. නමුත් භාවිතාවේ හැටියට, අපේ රටේ ස්ත්‍රී පුරුෂභාවය සම්බන්ධයෙන් කටයුතු කරන එක කෙසේ වෙතත්, සංස්කෘතියක් හැටියට ඒ සම්බන්ධයෙන් අපි බටහිර මතවාදය සහ වෙනත් මතවාදවලට,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ස්වාමීන් වහන්ස, ඔය කාරණය විතරක් කියලා අවසාන කරන්න.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු කථානායකතුමනි, මම අවසන් කරනවා.

මම ගරු ජනාධිපතිතුමාගෙන් අහන්න කැමැතියි, මේ සම්බන්ධයෙන් එතුමාගේ අදහස මොකක්ද කියලා. මොකද, ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණය විවේචනය කරන එක සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒක එක කාරණයක්. හැබැයි, රටේ හැම කාරණයක් සම්බන්ධයෙන්ම - ජනාධිපති ධුරය අහෝසි කිරීමේ තීන්දුව සම්බන්ධයෙන්, නැත්නම් ජනමත විචාරණයක් අවශ්‍යද නැද්ද, පාර්ලිමේන්තුවේ කාලය දිගු කිරීම වැනි කාරණාවලදී - ඔබතුමා තනි පුද්ගලයෙක් හැටියට මේ විධියට පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශ කරන්න ගියොත්, මේ වාගේ සංකීර්ණ තත්ත්වයකදී ඒක විශේෂයෙන්ම ඉතාම නරක පූර්වාදර්ශයක් බව මම කියන්න කැමැතියි.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

කෞරව සභානායකතුමනි, මම ඉන්නේ ඔබතුමාගේ අදහස ඉදිරිපත් කරන්නයි. ඒ අදහස ඉදිරිපත් කරන්නේ ඔබතුමා ඇතුළු මේ සභාවේ සිටින සියලුම දෙනා ඒ අදහසට එකඟ වෙනවා කියන විශ්වාසයෙන්. ඒ අදහස තමයි, ගරු කථානායකතුමනි,

[ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා]

இந்த ஒற்றையாட்சி அரசியலமைப்பு ஒழிக்கப்பட்டு, இந்த நாட்டின் முன்னேற்றத்தில் சகல இனங்களும் - தமிழ்த் தேச மக்களும் சிங்களத் தேச மக்களும் - சமத்துவமாகப் பங்கெடுக்கக்கூடிய வகையில் சமஷ்டி அரசியலமைப்பொன்று கொண்டுவரப் பட்டால் மட்டுமே இந்த நாட்டில் நிரந்தரமான முன்னேற்றத்தை ஏற்படுத்த முடியும். அவ்வாறானதொரு முயற்சியை மாண்புமிகு ஜனாதிபதி அவர்கள் தன்னுடைய ஆட்சிக் காலத்தில் எடுக்க வேண்டும். ஒற்றையாட்சி முறைமையின் தோல்வியை ஒப்புக்கொண்டு, தமிழ்த் தேசமும் சிங்களத் தேசமும் அங்கீகரிக்கப்பட்ட அடிப்படையிலான ஒரு சமஷ்டி அரசியலமைப்பைக் கொண்டுவருவதற்கும், அதன்மூலம் இந்த நாட்டின் அபிவிருத்தியிலும் முன்னேற்றத்திலும் தமிழ் மக்களும் தங்களுடைய பங்களிப்பைச் செய்வதற்கும், இந்த நாட்டை உலக வல்லரசுகளின் தரத்துக்குக் கொண்டுவருவதற்குமான நடவடிக்கைகளை மாண்புமிகு ஜனாதிபதி அவர்கள் எடுக்க வேண்டும். இதனைச் செய்வதற்கு அவர் தயாராக இருக்கின்றாரா? என நான் கேட்கின்றேன். நன்றி!

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සරත් වීරසේකර මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

ගරු කථානායකතුමනි, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පතට අපි දැනටමත් සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා, කාන්තාව නිවැරදිව නිර්වචනය කරන්න අර කිව්වා වාගේ ජීව විද්‍යාත්මකව. ඒ වාගේම විවාහය, මව් පදවිය, ගර්භිණී මාතාව ගැනත් සඳහන් විය යුතුයි. කලලය පිළිබඳව කථා කළොත්, ගබ්සාව සහ ගණිකා වෘත්තිය වක්‍රව අනුමත කරන එක මේ තුළින් නවතිනවා. මේ සම්බන්ධයෙන් අපි දැනටමත් සංශෝධන ඉදිරිපත් කර තිබෙන බව මම නැවත මතක් කරන්න කැමැතියි.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු කථානායකතුමනි, බදු පිළිබඳව විපක්ෂ නායකතුමා යොමු කළ ප්‍රශ්නයෙන් එතුමා නැවතත් ඇහුවේ, මම දිනපතා, සතිපතා පිළිතුරු දෙන කාරණා කිහිපයක් ගැනයි. පසුගිය දිනක ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව විසින් වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ වාර්තාවේ කරුණුත් සලකා බලා ඉතා සවිස්තරාත්මක පිළිතුරක් අපි ලබන පාර්ලිමේන්තු වාරයේදී ලබා දෙනවා. මේ සියල්ලම නැවතත් ඒ පිළිතුරේ ඇතුළත් වෙනවා. ඒ පිළිබඳව විවාදයකට යනවා නම්, එතුමාට පුළුවන් විවාදයක් ඉල්ලන්න, ගරු කථානායකතුමනි. ඒ වාගේම බැංකු සහ බදු පිළිබඳව පිළිතුරු දෙන විට අපි බැඳිලා තිබෙන නීතියේ ප්‍රශ්නත් මම මේ සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නීති රාමුව තුළ තමයි අපට පිළිතුරු ලබා දෙන්න වෙන්නේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, විවාදයකට යන්න එපා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම විනාඩියයි ගන්නේ; I will not take long. මම විවාදයකට යන්නේ නැහැ. ගරු ජනාධිපතිතුමනි, ඇපැල් අධිකරණයේ පුරප්පාඩු පහක් තිබෙනවා. පහළ තනතුරුවල ඉන්න අයට ඉහළට එන්න අවස්ථාවක් නැහැ, ඇපැල් අධිකරණයේ උසස්වීම් දෙන්නේ නැති නිසා. ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අතාඋල්ලා මන්ත්‍රීතුමා.

ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

கௌரவ சபாநாயகர் அவர்களே, மாண்புமிகு ஜனாதிபதி அவர்களும் அமைச்சர்களும் இந்தச் சபையில் இருக்கின்ற இச்சந்தர்ப்பத்தில் இந்த நாட்டில் நடைபெறுகின்ற முக்கியமானதொரு விடயத்தைக் கூற விழைகின்றேன்.

අතිගරු ජනාධිපතිතුමා ඇතුළු ඇමතිවරු පුළුවන් නම් headphones දමාගෙන මම කියන කාරණාවලට පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා.

කඩන්ත යහ පාලන අරසාඟක කාලත්තිල් ක්රව පාරාළුමන්ර උරුප්පිනරුම් ශ්‍රී ලංකා මුස්ලිම් කාංකිරසින් තලෛවරුමාන රවුප් හකීම් අවර්කළ් අක්කරෛප්පර්රිල් "Leader Ashraf" එන්ර පෙයරිල් පාටසාලෛ ඔන්රෛ උරුවාක්කියිරුන්තාර්. අංකු කුර්රම් පුරිකින්ර සිලර්, අතේපෝන්රු තංකළුක්කුච් සෙල්වම් සේර්ක්ක නිනෛක්කින්රවර්කළ් අංකුළ්ළ කල්විත් තිණෛක්කළ අතිකාරිකළින් උතවියෝටු මුරෛයාන ආවණංකළ් එතෛයුම් සමර්ප්පික්කාතු පෝලියාන ආවණංකළෛච් සමර්ප්පිත්තු, කළ්ළත්තනමාක අන්තප් පාටසාලෛයින් පෙයරෛ මාර්රියිරුක්කින්රාර්කළ්. ඉප්පොළුතු ඉව්විටයම් නීතිමන්රත්තිල් ඉරුක්කින්රතු. ඉතු ඔරු මාපියාවාක අංකු නටෛපෙර්රුක් කොණ්ටු ඉරුක්කින්රතු. පිරච්සිනෛ අතුවල්ල.

ටිරාන් අලස් ඇමතිතුමාත් මේ කාරණයට ඇහුම්කන් දෙන්න ඕනෑ. කල්මුනෛ මේල් නීතිමන්රත්තුක්කු මේර්කුරිත්ත විටයම් තොටර්පාන වළක්කුක්කු එතිරාළියාකච් සෙන්ර ඔරුවරුටෛය bicycleඉල් 'කුටු'ඉ වෛත්තු, කාරෛතීවුප් පොලිසාර් අවරෛක් කෛතු සෙය්තිරුක්කිරාර්කළ්. තංකළ් වේලෛකළෛ මුටිප්පතර්කු උතවි සෙය්යාවිට්ටාල්, 'කඤ්සා' අල්ලතු 'කුටු' වෛත්තෝ, ඉලඤ්සම් කොටුත්තෝ පිටික්ක වෛප්පෝමෙන්රු කල්විත් තිණෛක්කළ උත්තියෝකත්තර්කළ්, පිරතේස සෙයලාළර්කළ් පෝන්ර අරස උත්තියෝකත්තර්කළ් මත්තියිලේ මිරට්ටුකින්ර කුළුවොන්රු අංකු උලාවික්කොණ්ටු ඉරුක්කින්රතු. ඉතු මික මුක්කියමානතොරු විටයමාකුම්.

කඩන්ත වාරම් මූතූරිල් නටෛපෙර්ර DCC කූට්ටත්තිල් ඔරුවර් එළුන්තු, ඔරු නපරුටෛය පෙයරෛච් සොල්ලි තිරුකෝණමලෛ මාවට්ටත්තිල් අවර් නිනෛක්කින්ර ඉටත්තිල් කාණිකළෛ - අතු LRC කාණිකළාක ඉරුක්කලාම් අල්ලතු අරසාඟක කාණිකළාක ඉරුක්කලාම් - අටෛප්පතාක් කුරිප්පිට්ටාර්. DS අල්ලතු උයර් අතිකාරිකළ් අතු තොටර්පාක් කේට්টාල්, "උංකළෛ 'කඤ්සා' වෛත්තුප් පිටික්ක වෛප්පෝම්" එන්රු පයමුරුත්තුකිරාර්කළ්. ඉතනාල් අව්වතිකාරිකළ් තංකළුටෛය වේලෛයෛච් සෙය්ය මුටියාමල් තටුමාරික් කොණ්ටු ඉරුක්කින්රාර්කළ්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Thank you very much, Hon. Member.

ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා
(මාණ්පුමිකු ඒ.එල්.එම්. අතාඋල්ලා)
(The Hon. A.L.M. Athaullah)
Sir, give me a minute, please.

තර්පොළුතු, ඉච්සපෛයිල් නීර්ප්පාසනත්තුක්කුප් පොරුප්පාන අමෛච්සර් අවර්කළ් ඉරුක්කින්රාර්. නාන් අවරිටම් ඔරු විටයත්තෛච් සොල්ල වේණ්ටුම්. කඩන්ත වාරම් අක්කරෛප්පර්රිල් වෙළ්ළම් ඒර්පටුවතර්කුක් කාරණමාක ඉරුන්ත කල්ලෝයා තිට්ටත්තින් කීෆාන වලතුකරෛ වාය්ක්කාලිලුළ්ළ අටෛප්පුකළෛත් තෝණ්ටුවතර්කු අරසාඟකම් 30 මිල්ලියන් රූපායෛ ඔතුක්කියිරුක්කිරතු. ඉන්ත නිලෛයිල්, අන්ත අටෛප්පුකළෛත් තෝණ්ටක්කූටාතු එන්රු කූරි, අන්තක් කළප්පෛ නිරප්පුකින්ර සෙයර්පාට්ටිල් ඊටුපටුකින්රවර්කළ් සිල අතිකාරිකළින් උතවියුටන් පොරියියලාළර් ඔරුවරිටම් 200,000 රූපාය් ඉලඤ්සත්තෛත් තිණිත්තු, අවරෛක් කෛතුසෙය්තු ඉරුක්කිරාර්කළ්. තර්පොළුතු, ඉන්ත විටයම්ම් නීතිමන්රත්තිල් ඉරුක්කින්රතු.

ඉප්පටියාන කුර්රච්සෙයල්කළ් නටෛපෙරුවතනාල්, නාම් නිනෛක්කින්රවාරු මක්කළුක්කු උරුතිකළෛ වළංකිනාලුම්, අවෛ කළ්වර්කළුක්කුත්තාන් පෝය්ච් සේරුකින්රන. පාතික්කප් පටුකින්ර මක්කළ් ඉතු තොටර්පිල් සොල්වතර්කු ඉටමිල්ලා මල් අලෛකින්රාර්කළ්. එනවේ, ඉතර්කොරු විසාරණෛක් commissionඉ අමෛත්තුත් තරවේණ්ටුමෙන්ර කෝරික්කෛයෛ නාන් මාණ්පුමිකු ජනාතිපතියිටම් මුන්වෛක්කින්රේන්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු ඩලස් අළහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න. ඉතා කෙටියෙන් මම මේ කාරණය කියන්නම්.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පනත් කෙටුම්පතට අදාළ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා කළ ප්‍රකාශය සම්බන්ධවයි මම මෙය කියන්නේ. මට නම් හිතෙන්නේ එතුමා මුට්ටිය දාලා බැලුවා කියලායි. මේක වැරදි පූර්වාදර්ශයක්, ගරු ජනාධිපතිතුමනි. එහෙම නම් අපට ඊට වඩා බරපතළ කාරණාවක් තිබෙනවා. උදාහරණයක් විධියට කියනවා නම්, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126(5)ගි ඉතා නිවැරදිව කියනවා, මූලික අයිතිවාසිකම් නඩුවක් සම්බන්ධයෙන් මාස දෙකක් ඇතුළත තමන්ගේ විනිශ්චය ලබා දිය යුතුයි කියලා. අධිකරණ ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා; හිටපු අධිකරණ ඇමතිතුමාත් ඉන්නවා. ගරු ජනාධිපතිතුමනි, පළාත් පාලන ඡන්දය සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් නඩු කිහිපයක් පවරා තිබෙනවා; අදට අවුරුද්දකුත් මාස පහක් වෙනවා. ඒක එක උදාහරණයක් විතරයි. මම හිතන විධියට, ඔබතුමා රාජ්‍ය නායකයා විධියට, විධායකයේ ප්‍රධානියා විධියට එවැනි කාරණා සම්බන්ධයෙන් තමන්ගේ මතය -ජනාධිපතිවරයා විධියට- ප්‍රකාශයට පත් කිරීමේ වරදක් නැහැ. නමුත් මම මුලින් කියපු කාරණාව වෙනුවෙන් පාර්ලිමේන්තුව පාවිච්චි කිරීම සහ යම් අප්‍රකාශිත අරමුණක්, ඊළඟ අරමුණක් වෙනුවෙන් යොදා ගැනීම මහජන නියෝජිතයෙක් විධියට මම ප්‍රතික්ෂේප කරනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
Hon. Speaker, the Hon. (Prof.) Charitha Herath questioned why I should be in Parliament. It is very clear in Article 32 of the Constitution, which states that the President can come to Parliament once in every three months. Also, I have every power and Privilege other than the right to vote. Earlier, some Presidents even chaired the Ministerial Consultative Committees. But, I have not chaired any of the Ministerial Consultative Committees. ජනාධිපතිතුමාට පාර්ලිමේන්තුවට ඇවිල්ලා සභාගි වෙන්න කියන වගන්තිය අපි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළේ 1978දීයි. ඇත්ත වශයෙන්ම දකුණු අප්‍රිකාවෙත් එම ක්‍රමය අරගෙන තිබෙනවා. දැනට සිරිල් රමපෝසා ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ ඒ විධියට ක්‍රියාත්මක වෙනවා. ඒක හොඳයි. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

දෙවනුව තිබෙන්නේ මෙන්න මේ ගැන. මම එකක් කියන්න ඕනෑ. අපි මෙතැන අපේ බලය තියා ගන්නවා ද, නැද්ද? ජනතාවටයි පරමාධිපත්‍යය තිබෙන්නේ. ඒ පරමාධිපත්‍යය ඇත්තවශයෙන්ම තිබෙන්නේ ආයතන දෙකකට. ඒ, පාර්ලිමේන්තුවටයි, ජනාධිපතිටයි. මේ අවස්ථාවේදී ඒ ආයතන දෙකම එක තැන ඉන්නේ. ඒකයි තීරණය. ඇත්තවශයෙන්ම අධිකරණයට බලතල එන්නේ පාර්ලිමේන්තුව මාර්ගයෙන්. මේක නේ අපි 1970 ඡන්දයෙන් තීරණය කළේ. 1967දී ලියනගේ එරෙහි රැජිනි නඩුවේදී කිව්වේ, මේ බලතල තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයට කියලායි, that the powers of the Supreme

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

Court was where it had laid earlier and that it goes back to the Royal Charter of Justice. ඒ ගැන විශාල විවාදයක් ගියා. එදා එක්සත් ජාතික පක්ෂයේ අපි කිව්වා, මේක තුනෙන් දෙකේ බලයෙන් වෙනස් කරන්න පුළුවන් කියලා. ඒත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කිව්වා, තුනෙන් දෙකේ බලයෙන් බැහැ කියලා. මොකද, Charter of Justice 1833දී රැජිනි එව්ව එකක් කියලා. කොහොම නමුත් 1970දී තුනෙන් දෙකේ බලයක් ලැබුණා ඒ කණ්ඩායමට. ඔබතුමාත් දන්නවා, ඒ අනුව රැස් වෙලා අපි ඔක්කොම -හැම පක්ෂයෙන්ම- එකඟ වුණා, මේ බලය එන්නේ ව්‍යවස්ථාදායක සභාවෙන් හදන ව්‍යවස්ථාවෙන් කියලා. ඒ බලය අරගත්තේ ජනතාව; ජනතාවගේ පරමාධිපත්‍යය. ඒක අපි තවම වෙනස් කරලා නැහැ. ඒත් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේදී ජනතා පරමාධිපත්‍යයට අපි ජනමත විචාරණයත් ඇති කළා. ඉස්සෙල්ලා පාර්ලිමේන්තුවෙන් කළේ. මේවා මේ සභාවේ අයිතිවාසිකම්. මට වුවමනා නැහැ, මේකට අත ගහන්න.

ඇත්තවශයෙන්ම 1978දී අපේ අධිකරණයේ නිදහස තවත් ශක්තිමත් කළා. මේ අවස්ථාවේදී අධිකරණය අරගන්නේ අධිකරණ බලතල නොවෙයි. There is a separate Chapter on the Judiciary. ඒ ගොල්ලෝ ගන්නේ පළමුවෙනි එකෙන්. මොකද, මේ රටේ නීති සම්මත කරන්නේ පාර්ලිමේන්තුවයි. ඊට පස්සේ කාටවත් ඒක ප්‍රශ්න කරන්න බැහැ. එතැනින් ඉවරයි. මෙතැනදී ඊට ඉස්සෙල්ලා උපදේශයක් දෙන්න නීතිය ව්‍යවස්ථා විරෝධියිද, නැද්ද කියලා. අපි ඇති කළා ව්‍යවස්ථාදායක උසාවියක්. New Zealand හා ඉන්ග්‍රන්තය වාගේ රටවල පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවක් විසින් තමයි තීරණය කරන්නේ මේක ව්‍යවස්ථාවට විරුද්ධ ද, නැද්ද කියලා. පසුව 1978දී එක්සත් ජාතික පක්ෂයේ - මමත් එතැන හිටියා - අපි කිව්වා, මේකට වෙනම ව්‍යවස්ථාදායක උසාවියක් වුවමනා නැහැ, ඒක නිකම් මුදල් නාස්ති කරන එකක්, ශ්‍රේෂ්ඨාධිකරණය තවත් ශක්තිමත් කරලා පාර්ලිමේන්තුව වෙනුවෙන් මේ බලය යොදවන්න කියලා. එව්වරයි මම කරලා තිබෙන්නේ. දැන් මෙතැන තිබෙන්නේ, මේ ගැන කුමක් ද කරන්නේ කියන එක. Here, there is no gender issue. What I have done is, taking up the National Policy on Gender Equality. දැන් මේ ගැන කෑ ගහන්න වැඩක් නැහැ. මේක මුලින්ම 2011දී කළේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා හිටියේ. ඉතින් මෙතුමා ඒකට විරුද්ධ නම් ඒ කාලයේ විරුද්ධ වෙන්න තිබුණා නේ. එතැන ඉඳන් කීයක් කළාද? අන්තිමට අපිට කරන්න සිදු වුණේ 2023දී. හරි, ඒක මේ ආණ්ඩුව යටතේ කළා. ඒකේ ප්‍රශ්නයක් නැහැ.

We have not gone on to recognize transgender. There is a big issue whether there is a third gender. India and some other countries recognize a third gender, not transgender. So, that also has not been resolved.

Actually, Sustainable Development Goal 5 talks of men and women, but, at the end, they say that in giving basic services, everyone must be treated alike, even transgender people. We all agree, whether it is the health service, education or employment, you cannot discriminate anyone. But, this Bill is about women's rights and basically, the National Policy on Gender Equality and Women's Empowerment is also on that. If you read that Policy, it would be very clear that it is all regarding the rights of women. There are a very few references to gender and those references are mainly in regard to equal treatment in health and other services. I have that whole Policy document here with me and if you want, I can read it. It states, I quote:

> "The National Gender Equality and Women's Empowerment Policy shall ensure the adoption of policy, legislative and institutional frameworks for gender equality and women's empowerment;"

So, Hon. Speaker, gender equality is for the purpose of women's empowerment. It goes on to state, I quote:

> "...the Policy shall ensure the de-jure and de-facto enjoyment of all human rights and fundamental freedom by women on equal ..."

So, this is to place women on an equal footing. It also states,

> "... Policy shall ensure the recognition, addressing and redressing of all forms of discrimination against women...",

And, it further states,

> "The National Gender Equality and Women's Empowerment Policy shall ensure the equal and equitable access to participation and decision making of women and gender minorities ...," .

There, we say "gender minorities".

I have my own views. I agree with the Hon. Wimal Weerawansa that transgender women should not take part in sports. It is a very sensitive issue. We cannot go into it. We have not accepted same-sex marriages. So, all those are out. Marriages are governed by the Ordinances. So, if you have a court determination which says that it is not, then what do you do with it? It is not like a normal judgment. So, all these are about women. I have my reservations on this Policy, but the Women Parliamentarians' Caucus went into it and this is the final document agreed to by the Women Parliamentarians' Caucus. So, kindly speak to them. දැන් අපේ ප්‍රශ්නය තිබෙන්නේ, අපි මේ අයිතීන් ආරක්ෂා කරනකොට ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා, නැහැ, මෙන්න මේ දේවල් ද වෙන්න පුළුවන් කියලා. ඉතින්, ලොකු ප්‍රශ්නයක් තිබෙන්නේ. The Government has not gone for same-sex marriages, mixing these things or for anything else. We have only stuck to the decision. If the Supreme Court says that and removes all the safeguards on Buddhism, what will happen?

ඒ ගොල්ලන් කියනවා, මේ එක පොඩි වගන්තියකින් මේ සියල්ල අපට වෙනස් කරන්න පුළුවන් කියලා. මොකක්ද, ඒ වගන්තිය? What is the Section they are talking about? It is there in every law in this country; හැම නීතියේම තිබෙන එකක්. ඒක ඉවත් කරන්න බැහැ. මේක අපි - ආණ්ඩුව - දමපු එකක් නොවෙයි. That is, "This Act prevails in case of inconsistency". Every Act has that. So, let us talk about it.

I have asked for a Select Committee because I want to ensure that we do not go into other areas, we stick to Sustainable Development Goal 5 and certainly to ensure that this does not apply in case of Buddhism. We have enough protection under Articles 9 and 12. Only this Bench - Supreme Court එක නොවෙයි; the Supreme Court has been very clear in cases - has decided to go rogue, මේ කලින් දීපු නඩු තීන්දු ඔක්කොම අයින් කරලා. That is why I said they have eaten up all the previous judgments, that it is judicial cannibalism. There is a complete body of laws, which is very clear on rights and three Judges have eaten

it up. So, what do you do for judicial cannibalism? If you could suggest some other way of dealing with it, I would not mind. Okay, if you want, we will speak with the Chief Justice also and ask him what we could do. But, this Bench had knocked out his judgment also, which is the governing one! You cannot go on like that.

එච්චරයි මට කියන්න තිබෙන්නේ. දෙවැනි කාරණය ගැන මම කථා කළේ. අපට කැබිනට් මණ්ඩලයෙන් තීරණ ගන්න බැහැ, උසාවිය තීරණයක් දුන්නායින් පස්සේ. ඒක මතක තබාගන්න ඕනෑ. උසාවිය තීරණයක් දුන්නා නේ. අපි ඔක්කොම දන්නවා, මේ අවස්ථාවේදී සිදු වුණු දේ. මේ ගැන විරුද්ධත්වය ප්‍රකාශ කළා. එක එක අදහස් ප්‍රකාශ කළා, වෙනත් පක්ෂවලින්. ඒත් එක කමිටුවකින් තීරණයක් දුන්නා. ඒ කමිටුව වැරදියි කියමුකෝ. කොහොම හරි, උසාවියට ගියා. උසාවිය ඒක තහවුරු කළා. ඊට පස්සේ ආණ්ඩුවකට බැණලා වැඩක් නැහැ නේ. එහෙම නම්, උසාවිය වෙන තීන්දුවක් දුන්නා නම්,- *[බාධා කිරීමක්]* මම මෙතැනට ආවේ අතීතය ගැන කථා කරන්න නොවෙයි. මට ඒකට වුවමනා නැහැ. ඕනෑ නම් මට ඒ ගැන -රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා අත් අඩංගුවේ සිටිද්දී කවුද කථා කළේ කියලා- කියන්න පුළුවන්. අපි ඒවාට යන්නේ නැහැ. ඒ ඔක්කොම අමතක කරලා දමමු. අපට පුළුවන් කථා කරලා කටයුතු කරන්න. මම කිව්වේ අපි ඉදිරියට යන්න ඕනෑ කියලා. විශේෂයෙන්ම මුජීබුර් රහුමාන් මැතිතුමා කිව්වා, මම ඇවිල්ලා තිබෙන්නේ ආණ්ඩුව ආරක්ෂා කරන්න කියලා. ඒ ආණ්ඩුව කරපු ඒවා ගැන ඒ ආණ්ඩුවේ අය කථා කරයි. මම මොනවාද කියන්නේ, ඒක වැරදියි කියලා මේ අයට නඩු තීන්දුවක් තිබුණාම? ඔය නඩු තීන්දු නේ ඔය ගොල්ලන් ආරක්ෂා කරන්නේ. ඔය නඩු තීන්දු නේ ආරක්ෂා කරන්නේ. ඒක වැරදියි. ඉතින්, මම මොනවා කියන්නද? මට කියන්න පුළුවන්ද, මෙතුමාට -ප්‍රසන්න රණතුංග ඇමතිතුමාට- මේක වැරදියි කියලා? ප්‍රසන්න රණතුංග ඇමතිතුමා මට කියයි, නඩු තීන්දුව අනුව අපි වැඩ කරනවා කියලා. අතීතය අමතක කරන්න. මෙතැනට වුවමනා නැහැ අන්තවාදය. ඒ බව මම ඔබතුමාට කියනවා. අන්තවාදය ගොඩෙන් ඔබතුමාව උස්සලා මමයි UNP එකට දැම්මේ. කරුණාකර, අනික් අය වාගේ අන්තවාදයේ ඉන්න එපා. මම තවම UNP එකේ ඉන්නේ. කරුණාකර, මේ අන්තවාදය ගැන කථා කරන්න එපා කියලා මම කියන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ලිපිලේඛනාදිය පිළිගැන්වීම, ගරු අග්‍රාමාත්‍යතුමා. *[බාධා කිරීමක්]* කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ගරු සභානායකතුමා න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්න. ගරු අග්‍රාමාත්‍යතුමා. *[බාධා කිරීමක්]*

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාට මොකක්ද කියන්න තිබෙන්නේ?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව දුන්නාට බොහොම ස්තුතියි.

ජනාධිපතිතුමා ව්‍යවස්ථාව ආරක්ෂා කරන්න ඉන්න එක ගැන අපට හුඟක් සන්තෝෂයි. *[බාධා කිරීම්]* නමුත්, මම ප්‍රකාශයක් කළ යුතුයි. ගරු කථානායකතුමනි, ඒක ඔබතුමාටත් සම්බන්ධයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උறුප්පිනර් ඉරුවර්)
(An Hon. Member)
නඩු තීන්දුවක් දුන්නේ නැහැ. *[බාධා කිරීම්]*

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)

අධිකරණය තීන්දු දීලා තිබෙනවා, මේ රටේ හිටපු ජනාධිපතිවරුන්ට විරුද්ධව. අධිකරණය ඩොනල්ඩ් ට්‍රම්ප්ට විරුද්ධවත් තීන්දු දීලා තිබෙනවා; ජෝ බයිඩන්ගේ පුතාට විරුද්ධවත් තීන්දු දීලා තිබෙනවා.මලයාසියාවේ සහ ඉන්දුනීසියාවේ හිටපු නායකවරුන් හිරේ යවලා තිබෙනවා. එහෙම නම්,අද වෙනස්වීමක් සිදු වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති. දේශපාලන නායකයන්ට විරුද්ධව තීන්දු දීලා තිබෙනවා. කථානායකට විරුද්ධව තවම අධිකරණ තීන්දු දීලා නැහැ.

ගරු කථානායකතුමනි, අපි ඔබතුමාව ආරක්ෂා කරන්න ඉන්නේ, පාර්ලිමේන්තුව ආරක්ෂා කරන්න ඉන්නේ. උල්ලංඝනය කරන්න බැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. ජනාධිපතිතුමාත් ඒක දැනගන්න ඕනෑ. නමුත් පත්වීම් ලබා දීමේදී උල්ලංඝනය කළා. ගරු කථානායකතුමනි, පොලිස්පති පත් කිරීමේදී ඔබතුමා ලියමනක් ලිව්වා. අනවශ්‍ය ලියමනක් ලිව්වේ. නීතිපතිගේ නිල කාලය දීර්ඝ කරන්න කියලා නිර්දේශයක් අද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට එනවා. ගරු කථානායකතුමනි, we must go for a rules-based system. නායකයින්ට ඕනෑ ඕනෑ විධියට ක්‍රියා කරලා තමයි මේ රට මේ තැනට වැටිලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කරුණාකර අපි දැන් න්‍යාය පත්‍රයට යොමු වෙමු.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
Rules-based system එකක් අවශ්‍යයි. අද එන නිර්දේශය ගැනයි අප මේ කියන්නේ. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අද මුළු දවසේම ඔය ගැන කථා කරකර ඉඳියි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
අද එන එකක් ගැන කියන්නේ, මේ. *[බාධා කිරීමක්]* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට අද එන නිර්දේශය ගැන කියන්නේ. ඔබතුමා ව්‍යවස්ථාව ආරක්ෂා කරන්න ක්‍රියා කළ යුතුයි. පුද්ගලයින්ගෙන් වැඩක් නැහැ. ඔබතුමාත් ආරක්ෂා වෙන්නේ එහෙමයි. ගරු කථානායකතුමනි, මේ තත්ත්වය දුර දිග ගියොත්, කථානායකතුමාට විරුද්ධවත් නඩු තීන්දු දෙන දවසක් එනවා. ඒක නිසා තමයි මම මේ කාරණය; අද ව්‍යවස්ථාව ආරක්ෂා කළ යුතුයි කියන කාරණය මෙතැනදී මතු කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු සභානායකතුමනි, කරුණාකර න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්න.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නිවේදන, නියෝගය, රෙගුලාසි සහ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 12 දිනැති අංක 2366/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 01/2024 දරන සුරාබදු නිවේදනය);

(ii) කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර සඳහා අයකරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 පෙබරවාරි 01 දිනැති අංක 2369/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 03/2024 දරන සුරාබදු නිවේදනය);

(iii) 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 4 වගන්තිය යටතේ කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර නියෝග සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 අප්‍රේල් 22 දිනැති අංක 2381/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(iv) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 මැයි 17 දිනැති අංක 2384/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි;

(v) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 මැයි 17 දිනැති අංක 2384/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි; සහ

(vi) 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 13 වගන්තිය ප්‍රකාරව, 2023 අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව.

මෙම නිවේදන, නියෝගය, රෙගුලාසි සහ වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවල යාපනය, ත්‍රිකුණාමලය, මුලතිව්, වවුනියාව, නුවරඑළිය, අනුරාධපුරය, කළුතර, මඩකලපුව, මන්නාරම, කෑගල්ල, මහනුවර, ගාල්ල, කිලිනොච්චිය, ගම්පහ, අම්පාර, හම්බන්තොට, මොනරාගල, මාතලේ, කුරුණෑගල, පුත්තලම, කොළඹ, පොළොන්නරුව, බදුල්ල සහ මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (වනජීවී හා වන සම්පත් සංරක්ෂණ සහ වාරිමාර්ග අමාත්‍යතුමිය)
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னி ஆரச்சி - வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரும் நீர்ப்பாசன அமைச்சரும்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law - Minister of Wildlife and Forest Resources Conservation and Minister of Irrigation)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවල වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු හරින් ප්‍රනාන්දු මහතා (සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஹரின் பர்னாந்து - சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சரும் விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சரும்)
(The Hon. Harin Fernando - Minister of Tourism and Lands and Minister of Sports and Youth Affairs)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - கைத்தொழில் அமைச்சரும் சுகாதார அமைச்சரும்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Industries and Minister of Health)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජී.එල්. පීරිස් මැතිතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු කථානායකතුමනි, ඉතාම කෙටියෙන් මගේ අදහස ඉදිරිපත් කරන්නම්. අද දහවල් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමක් පැවැත්වෙනවා. මීට ඉස්සර විශාල ප්‍රශ්න ඇති වුණා; ගැටලු ඇති වුණා. විශ්වාස භංගයකුත් මේ ගරු සභාවේ ඉදිරිපත් වුණා. එම නිසා මා ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, එවන් තත්ත්වයන් වැළැක්වීමට උපරිම උත්සාහය දරන්න කියලා. ගරු කථානායකතුමනි, මේ රටේ දැනට ඉඳලා තිබෙනවා නීතිපතිවරුන් 47දෙනෙක්. වර්තමානයේ සිටින්නේ 48වැනි නීතිපතිවරයා. මීට පෙර සිටි එක නීතිපතිවරයෙකුගේවත් නිල කාලය දවසකින්වත් වැඩි කරලා නැහැ; දීර්ඝ කරලා නැහැ. මේ අවස්ථාවේදී ඒක කිරීමෙන් නීතිපති ධුරයේ ගෞරවයට, ස්වාධීනත්වයට විශාල කැලැලක් අනිවාර්යයෙන්ම ඇති වන බව මම ඔබතුමාට ගෞරවයෙන් සඳහන් කරනවා. ඒ වාගේම, නීතිපති දෙපාර්තමේන්තුවේ ගොඩාක් අයට මම උගන්වලා තිබෙනවා. එහි ඉතාම දක්ෂ, හොඳ අත්දැකීම් තිබෙන නිලධාරීන් ඉන්නවා. දැන් අපි ඒ ගොල්ලන්ට කියනවා නම්, එක්ස්ප්‍රස් පර්ල් නෞකාව සම්බන්ධ නඩුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා හා නීති සංශෝධන, -අධිකරණ ඇමතිතුමා ඒ පිළිබඳව නායකත්වය ගන්නවා- ආදිය කරන්න නීතිපති දෙපාර්තමේන්තුවේ කාටවත් හැකියාවක් නැහැ, එක පුද්ගලයෙකුට පමණයි ඒවා කරන්න පුළුවන් වන්නේ කියලා, ඒක නීතිපති දෙපාර්තමේන්තුව හැල්ලූ කිරීමක්; අවතක්සේරු කිරීමක්; විශාල නිග්‍රහ කිරීමක්. අපේ රටේ ඉතිහාසයේ කිසිම අවස්ථාවකදී නොකරපු දෙයක් තමයි දැන් මේ කරන්න හදන්නේ. මේ සම්බන්ධයෙන් කිසිම පූර්වාදර්ශයක් නැහැ. ඉතින්, මේ අවුරුදු 76ක කාලය තුළ ප්‍රථම වතාවට එක පුද්ගලයෙකු තෝරාගෙන නීතිපතිවරයාගේ කාලය දීර්ඝ කරන්න හදනවා නම් මොකක්ද තත්ත්වය? ජනාධිපතිවරණය තව මාස කිහිපයකින් පවත්වන අවස්ථාවකදී තමයි මෙවැනි දේ සිදු කරන්නේ. අපි කථා කරන්නේ පුද්ගලයන් ගැන නොවෙයි, ආයතන ගැන. මේ රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයේදී නීතිපති දෙපාර්තමේන්තුව කියන්නේ කේන්ද්‍රීය ආයතනයක්. එම නිසා මෙවැනි දේවල් සිදු කිරීමෙන් විශාල හානියක් සිදු වෙනවා. මේක නොකරන්න කියලා මා ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ලිපිලේඛනාදිය පිළිගැන්වීම යටතේ, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, පෙනුණේ නැති වුණාට මේක අතිශයින්ම වැදගත් කාරණාවක්. ඒ කියන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවෙන් මේ පාර්ලිමේන්තුවට තමයි බලය දීලා තිබෙන්නේ බදු වැඩි කරන්න; අඩු කරන්න; අයින් කරන්න; එකතු කරන්න. එතකොට කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නීතිය ප්‍රකාරව ඔවුන් 2023දී ගැසට් නිවේදනයක් නිකුත් කරලා බදු නිදහස් කිරීම් වගයක් සිද්ධ කළා. එසේ සිදු කරලා ඒක රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ගෙනාපු අවස්ථාවේදී අපි ඔවුන්ට පෙන්වා දුන්නා, "ඔබතුමන්ලාට ඔය අයිතිවාසිකමක් නැහැ" කියලා. ඊට පස්සේ ඒ ගැසට් නිවේදනය පිළිබඳව තර්කයක් ඇතිවෙලා නීතිපතිවරයා තීන්දුවක් දුන්නා, "ඒ බලය ඔවුන්ට නැහැ. බදු වෙනස් කිරීමේ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට පමණයි" කියලා. ඒ නිසා 2023 දී නිකුත් කරපු ඒ ගැසට් එක අයින් කරලා, -ගරු රාජ්‍ය ඇමතිතුමාත් දැන් මේ සභාවේ ඉන්නවා.- 2024 අවුරුද්දේ ගිය මාසයේ අලුත් ගැසට් නිවේදනයක් නිකුත් කළා. ඒ ගැසට් නිවේදනයෙන් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පාර්ලිමේන්තුවේ අනුමැතිය ඉල්ලනවා, duty-free shopping complex එකක් ගේන්න. ඒක තමයි මේ අද පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, එහි වැදගත්කම තමයි, යම්කිසි පුද්ගලයන් පිරිසක් විසින් අපේ බලය ඩැහැගන්න උත්සාහ කරපු අවස්ථාවකදී අපි එය නවත්වලා පාර්ලිමේන්තුවට නැවත ඒ බලය ගෙනැල්ලා තිබෙන එක. පාර්ලිමේන්තුව ඒක අනුමත කරනවා නම් ඒකේ ගැටලුවක් නැහැ.

හැබැයි ඊට වඩා වැදගත් කාරණාවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ජනාධිපතිතුමා කියපු කථාව එතුමාගේ මාධ්‍ය ඒකකයෙන් දැන් දිගටම ඉදිරිපත් කරනවා, පළමුවැනි නිවාසයට මේ imputed tax එක ගහන්නේ නැහැ කියන එක. හැබැයි ගරු කථානායකතුමනි, පළමුවැනි නිවාසයටත් මේ බද්ද ගහනවා කියලා IMF Agreement එකේ තිබෙනවා. මෙන්න මෙහෙමයි තිබෙන්නේ: "Imputed rental income is deemed the income that homeowners could earn if they rented out their homes". මේක කලිනුත් ගැහුවා කියලා කථාවක් තිබෙනවා. "A similar tax was previously included in the Inland Revenue Act, No. 10 of 2006. Under this regime, primary residences were exempt - ගරු කථානායකතුමනි, හොඳට අහගන්න - and the assessed values for rating purposes were used to determine the base. Given the broad exemption and the use of outdated and downward-biased annual values, the tax generated hardly any revenue". 2006 වසරේදී මහින්ද රාජපක්ෂ මුදල් ඇමතිවරයා හැටියට මේ බද්ද ගෙන ආවාට පළමුවැනි නිවාසය, ඒ කියන්නේ ජීවත් වන නිවාසයට බදු අවශ්‍ය නැහැ, imputed tax එකක් ගහන්න ඕනෑ නැහැ කියලා කිව්වා. නමුත් දැන් එක්ක වෙනස් කරලා ගරු මුදල් ඇමතිතුමා අත්සන් කරපු IMF වාර්තාවේ තිබෙනවා, "Based on the recent IMF TA, an imputed rental income tax from owner-occupied and vacant residential property would be an appropriate substitute" කියලා. ඒකෙන් මොකක්ද කියන්නේ? ජනාධිපතිතුමා මෙතැන මොනවා කිව්වත්, අත්සන් කරලා තිබෙන වාර්තාවේ තිබෙනවා owner-occupied house කියලා. ඒ කියන්නේ ජීවත් වෙන ගෙදර. ජීවත් වෙන ගෙදරට තමයි owner-occupied house කියලා කියන්නේ. මට ගෙවල් දෙකක් තිබෙනවා නම්, මට ජීවත් වෙන්න පුළුවන් එක ගෙයක විතරයි. ඒ ජීවත් වෙන ගෙදරට බද්දක් ආරෝපණය කරන්න කියලා තිබෙනවා. හැබැයි මෙහෙමයි. අපි සමඟි ජන බලවේගය හැටියට අතිශයින් සන්තෝෂ වෙනවා, මේ රටේ මැද පන්තියේ ජනතාවට ගහන්න ගිය දැවැන්ත බද්දෙන් ඔවුන්ව බේරා ගන්න අපට පුළුවන් වුණු එක ගැන. මොකද, කිසි කෙනෙක් මේ සම්බන්ධයෙන් විවේචනයක් ඉදිරිපත් කළේ නැහැ. ඉරිදා සහ සඳුදා කියන දවස් දෙකේම සමඟි ජන බලවේගය විතරයි ආණ්ඩුවට දැඩි ප්‍රහාරයක් එල්ල කළේ. ඒ ප්‍රහාරය නිසා දැන් ජනාධිපතිතුමා කියනවා නම් මේක අකුළා ගන්නවා කියලා, අපි රටවැසියා, මැද පන්තිය වෙනුවෙන් එතුමාට ස්තුතිවන්ත වෙනවා. හැබැයි *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මෙතැන text එක ගහලා තිබෙනවා, ඉවත් කරගන්නවා කියලා.

ඊළඟ ප්‍රශ්නය මේකයි. බන්දුල ගුණවර්ධන ඇමතිවරයා කිව්වා, "Agreement එකේ ඉස්පිල්ලක් හෝ පාපිල්ලක් වෙනස් කරන්න බැහැ" කියලා. මේ Agreement එක වෙනස් කරනවා කියලා ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා. ගරු කථානායකතුමනි, ඒ තුළින් ගම්‍ය වෙන්නේ මෙච්චර කාලයක් ආණ්ඩුව කියලා තිබෙන්නේ ඇත්ත වශයෙන්ම සත්‍ය නොවෙයි කියන එකයි. එකඟ වුණු Agreement එක වෙනස් කරන්න පුළුවන් කියන එක තමයි අද ජනාධිපතිතුමා කියපු කථාවෙන් තේරෙන්නේ. ඒ නිසා අපි ජනතාවට කියන්න කැමැතියි, ඊළඟ මාස හතරෙන් නිර්මාණය වෙන අලුත් ආණ්ඩුවෙන් මේ අසාධාරණ බදු වෙනුවට විපක්ෂ නායකවරයා කියපු ආකාරයට කාර්යක්ෂමතාව වැඩි කරලා, බදු ගෙවිය යුතු පුද්ගලයන්ගෙන් බදු එකතු කරලා මේ වෙනස් කිරීම අපි කරනවා කියලා.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු නාලක බණ්ඩාර කෝට්ටෙගොඩ මහතා
(மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட)
(The Hon. Nalaka Bandara Kottegoda)

ගරු කථානායකතුමනි, බලශක්ති හා ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2021 වර්ෂය සඳහා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව;

(ii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2018, 2019, 2020 හා 2021 වර්ෂ සඳහා ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු කථානායකතුමනි, පුත්තලම, ඉහළ පුලියන්කුලම, පහළ පුලියන්කුලම දරන ලිපිනයෙහි පදිංචි ඩී.එම්.ජී.එස්. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

Hon. Speaker, I present a petition from Mr. A.L.M. Mukthar of No. 541/A/1, Water Supply Office Road, Sainthamaruthu - 14.

ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)

ගරු කථානායකතුමනි, නිකවැරටිය, නබඩෑව, තලාකොළ-හේන, "සිරි සෙවණ" දරන ලිපිනයෙහි පදිංචි ඒ.එම්.ආර්.එම්. අධිකාරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ලලිත් එල්ලාවල මහතා
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)

ගරු කථානායකතුමනි, වාද්දුව, පොතුපිටිය දකුණ, වටරවුම් පාර, "ප්‍රියංකර" දරන ලිපිනයෙහි පදංචි බී.එච්.ආර්. ප්‍රියංකර පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

ගරු කථානායකතුමනි, අවිස්සාවේල්ල, සීතාගම, අංක 11-බී දරන ලිපිනයෙහි පදිංචි වයි.කේ. ශ්‍රියාලතා එදිරිසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

වියළි කාලවලදී මධ්‍යම කඳුකරයේ වනාන්තර ගිනි තැබීම: වැළැක්වීම
வறட்சிக் காலத்தில் மத்திய மலைநாட்டுக் காடுகளுக்குத் தீ வைத்தல்: தடுத்தல்
SET FIRE ON FORESTS IN CENTRAL HILLS DURING DRY SEASON: PREVENTION

3/2024

1. ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)

වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) සෑම වර්ෂයකම අධික වියළි කාලගුණ තත්ත්ව පවතින කාලවලදී මහනුවර, පන්විල සහ උඩුවුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බලප්‍රදේශ ඇතුළු මධ්‍යම කඳුකරයේ බොහෝ ප්‍රදේශවල රක්ෂිත වනාන්තර, ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිත වනාන්තර සහ කුඩා ලදු කැලෑ ගිනි තබන බවත්;

(ii) ඒ හේතුවෙන් ජල උල්පත් සිඳියාම, වර්ෂා කාලයට කඳු මුදුන්වල ඇති ගල් පෙරළීම හා නාය යාම් ඇති වීම වැනි හානි සිදු වන බවත්;

එතුමිය දන්නේද?

(ආ) (i) එසේ නම්, එවැනි ගිනි තැබීම් වැළැක්වීම සඳහා පියවර ගෙන තිබේද;

(ii) උණුසුම් කාලගුණයත් සමඟ ගිනි ගැනීම් ශීඝ්‍රයෙන් පැතිරීම පාලනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iii) සංවේදී පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා තිරසර විසඳුමක් ලබා දෙන්නේද;

(iv) එසේ නම්, එම විසඳුම කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஒவ்வொரு வருடமும் அதிக வறட்சியான காலநிலை நிலவும் காலப்பகுதிகளில் கண்டி, பன்வில மற்றும் உடுதும்பரை பிரதேச செயலக ஆளுகைப் பிரதேசங்கள் உட்பட மத்திய மலைநாட்டின் பல பிரதேசங்களிலுள்ள ஒதுக்குக் காடுகளும் நீரேந்துப் பிரதேசங்களைச் சார்ந்த காடுகளும் சிறிய பற்றைக் காடுகளும் தீ வைக்கப்படுகின்றன என்பதையும்;

(ii) அதன் காரணமாக நீர் ஊற்றுக்கள் வற்றிப்போதல், மழைக் காலங்களில் மலை உச்சிகளிலுள்ள கற்கள் புரளுதல் மற்றும் மண்சரிவு ஏற்படுதல் போன்ற சேதங்கள் ஏற்படுகின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) ஆமெனில், மேற்படி தீ வைப்புகளைத் தடுப்பதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) வெப்பமான காலநிலையுடன் வேகமாகப் பரவும் தீயைக் கட்டுப்படுத்துவதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) உணர்திறன் வாய்ந்த சூழல் தொகுதியைப் பாதுகாப்பதற்காக நிலைபேறான தீர்வு வழங்கப்படுமா என்பதையும்;

(iv) ஆமெனில், அத்தீர்வு யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා]

asked the Minister of Wildlife and Forest Resources Conservation:

(a) Is she aware that -

(i) every year in periods of dry weather in Kandy, reserved forests, forests associated with water catchments and small shrub jungles in many areas in the central hills including the Divisional Secretary's Divisions of Kandy, Panwila and Ududumbara are set on fire; and

(ii) it causes damages such as drying of water springs, rolling down of stones from hilltops during rains and occurring of landslides?

(b) If so, will she inform this House -

(i) whether steps have been taken to prevent such acts of setting fire referred to above;

(ii) the steps that will be taken to control the rapid spread of fires in hot weather;

(iii) whether a sustainable solution will be provided towards protecting sensitive ecosystems; and

(iv) if so, what such solution is?

(c) If not, why?

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සෑම වර්ෂයකම අධික වියළි කාලගුණ තත්ත්ව පවතින කාලවලදී මහනුවර, පන්විල සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බලප්‍රදේශ ඇතුළු මධ්‍යම කඳුකරයේ බොහෝ ප්‍රදේශවල රක්ෂිත වනාන්තර, ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිත වනාන්තර, තෘණ භූමි සහ කුඩා ලඳු කැලෑ විවිධ හේතු මත පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් විසින් විවිධ කැලෑ ගිනි තැබීම සිදු කරනු ලබයි. මේවා බොහෝ විට ඉඩම් අත් පත් කර ගැනීම, සත්ත්ව පාලනයේ දී සතුන්ට ආහාර ලබා ගැනීම, දැව නොවන වනජ නිෂ්පාදන ලබා ගැනීම, විනෝදය හා නොදැනුවත්කම වැනි හේතූන් මත සිදු කරනු ලබයි.

(ii) ඔව්.

වියළි කාලයේ දී සිදු කරනු ලබන ගිනි තැබීම් නිසා පසට ඇති ශාක ආවරණය දුර්වල වීමත්, පසේ කාබනික ද්‍රව්‍ය පිලිස්සී විනාශ වී යෑමත්, වනාන්තර ආශ්‍රිත ජෛව විවිධත්වයට හානි වීමත්, ගින්නෙන් මිය ගිය ශාකවල මූල පද්ධති ඔස්සේ ජලය කාන්දු වීමත් හේතු කොටගෙන එම ප්‍රදේශවල නායයෑම්, ගල් පෙරළීම් වැනි තත්ත්වයන් ඇති වන අතර, පසේ ජලය රඳා ගැනීමේ හැකියාව හීන වීම නිසා ජල උල්පත් සිදී යෑම් වැනි තත්ත්වයන් ඇති වේ.

(ආ) (i) අවශ්‍ය පියවර ගෙන ඇත.

1. වරදකරුවන් වෙත නීතිමය පියවර ගැනීම.

- වන සංරක්ෂණ ආඥාපනතේ (2009 සංශෝධිත) II වන පරිච්ඡේදයේ රක්ෂිත වනයක තහනම් කරන ලද ක්‍රියා යටතේ 6.(2).(ව). වගන්ති ප්‍රකාරව යම් ගින්නක් දල්වන හෝ දල්වා තබන හෝ රැගෙන යන හෝ යම් ගින්නක් දැල්වීමට සලස්වන හෝ යම් ගින්නක් දැල්වෙමින් පැවතීමට හෝ පැතිර යාමට ඉඩ හරින යම් තැනැත්තෙකු වරදකරු වන අතර, අවුරුදු හතක් නොඉක්ම වූ කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් විසිපන්දහසකට නොඅඩු සහ රුපියල් දෙලක්ෂයක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ එකී බන්ධනාගාරගත කිරීම හා දඩය යන දෙකටම හෝ යටත් විය යුතුය.

- වන සංරක්ෂණ ආඥාපනතේ (2009 සංශෝධිත) II වන පරිච්ඡේදයේ රක්ෂිත වනයක තහනම් කරන ලද ක්‍රියා යටතේ 7.(1).(ඒ). වගන්ති ප්‍රකාරව යම් ගින්නක් දල්වන, දල්වා තබන හෝ දැල්වෙමින් තැබීමට ඉඩ හරින හෝ යම් ගින්නක් ඇවිලෙන්නට සලස්වන හෝ ගින්න පැතිරී යාමට ඉඩ හරින හෝ ගින්නක් රැගෙන යන යම් තැනැත්තෙකු වරදකරු වන අතර, අවුරුදු පහක් නොඉක්ම වූ කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් **දස** දහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂයක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ එකී බන්ධනාගාරගත කිරීම හා දඩය යන දෙකටම හෝ යටත් විය යුතුය.

2. ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- අදාළ ක්‍රියාකාරකම් සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික අය වැයෙන් සෑම දිස්ත්‍රික්කයක් වෙතම ප්‍රතිපාදන වෙන් කර ලබා දී ඇත.

- මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ප්‍රජා සහභාගීත්වයෙන් සිදු කරනු ලැබේ. උදාහරණ වශයෙන් ග්‍රාමීය ප්‍රජාව, පාසල් සිසුන්, රාජ්‍ය නිලධාරීන් (ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් හා ග්‍රාම නිලධාරීන්, ආපදා කළමනාකරණ අංශ, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන්) යනාදී වශයෙනි.

3. කිසියම් කැලෑ ගිනි ඇති වීමකදී එය මර්දනය කිරීම සඳහා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් හා ග්‍රාම නිලධාරීන්, ආපදා කළමනාකරණ අංශ, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහයෝගය ලබා ගැනීම.

4. ගිනි ඇති වෙන ගම්මාන ආශ්‍රිතව ප්‍රජා සහභාගිත්වයෙන් යුතු ගිනි ආරක්ෂණ කමිටු පිහිටුවීම, එම කමිටු මඟින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම හා ගිනි පාලනය සඳහා සහාය ලබා ගැනීම.

5. ගිනි නිවාරණය සඳහා ක්‍රියාත්මක කරනු ලබන පාර්ශ්වකාර ආයතනවල සහභාගිත්වයෙන් යුතු ඒකාබද්ධ යන්ත්‍රණවල කාර්යභාරයන්ට නිසි දායකත්වය දැක්වීම.

(ii)

- 2024 වර්ෂය සඳහා කැලෑ ගිනි ඇතිවීම වැළැක්වීම හා පාලනය වෙනුවෙන් වාර්ෂික අය වැයෙන් රුපියල් 10,000,000.00ක ප්‍රතිපාදනයක් වෙන් කර ඇත.
- එම ප්‍රතිපාදන මඟින් මුළු දිවයිනම ආවරණය වන පරිදි කිලෝමීටර 25ක ගිනි පටි ස්ථාපිත කිරීම, ගිනි මුරකරුවන් යෙදවීම, ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ඇතුළු ගිනි පාලන වැඩසටහන් 75ක් ක්‍රියාත්මක කිරීම හා ගිනි නිවීමේ උපකරණ කට්ටල 20ක් මිලදී ගැනීම සිදු කරයි.
- ගිනි ආරක්ෂණ කමිටු පිහිටුවීම, ගිනි ඇතිවීමට තුඩු දෙන ප්‍රදේශ හඳුනා ගැනීම හා තර්ජිත ප්‍රදේශ දැක්වෙන සිතියම් සකස් කිරීම ඇතුළු ක්‍රියාකාරකම් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.
- 2023 ඔක්තෝබර් 03 දින නිකුත් කරන ලද අමප 23/1667/613/018 දරන කැලෑ ගිනි ඇතිවීම වැළැක්වීම හා පාලනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම යන මැයෙන් යුත් අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.0 ඡේදයෙහි 3.1 සිට 3.9 දක්වා වන නිර්දේශ යටතේ කටයුතු කරන ලෙස දන්වමින් සියලු දිසා වන නිලධාරීන් දැනුවත් කිරීම හා මාර්තු මස 25 වන දින සිට 31 වන දින දක්වා කැලෑ ගිනි පාලන සතියක් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී.
- වාර්ෂිකව භාණ්ඩාගාරය මඟින් ලැබී ඇති ප්‍රතිපාදන සීමිත බැවින් කැලෑ ගිනි පාලනය කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගය ලබා ගැනීමටද අවශ්‍ය ඉල්ලීම් කර ඇත.
- අවශ්‍ය අවස්ථාවලදී ගුවන් හමුදා සහාය ලබා ගෙන බෙල් හෙලිකොප්ටර් මඟින් ගිනි නිවීම සඳහා පියවර ගැනීමට අපේක්ෂා කරයි.
- වන නිලධාරීන් මුර සංචාර කටයුතු වැඩි වාර ගණනක් සිදු කිරීම.
- විශේෂයෙන් 2024 වර්ෂය සඳහා මහනුවර දිසාවේ ඇති වනාන්තර තුළ ගිනි ගැනීම් මර්දනය සඳහා ප්‍රතිපාදන වශයෙන් රුපියල් 656,522.00ක මුදලක් වෙන් කර දී ඇත.
- එමෙන්ම ගිනි නිවාරණ වැඩසටහන් සඳහා විවිධ රාජ්‍ය නොවන ආයතනවල සහයෝගයෙන්ද වැඩ සටහන් කරනු ලැබේ.
- විශේෂයෙන් මහනුවර දිසාවේ ඇති වනාන්තර තුළ ගිනි ගැනීම් මර්දනය සඳහා පසුගිය වර්ෂ 5ක සිදු කළ වැඩසටහන් පිළිබඳ තොරතුරු හා ඉදිරියේදී කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් පිළිබඳ තොරතුරු ඇමුණුම මඟින් ඉදිරිපත් කරමි. ඇමුණුම **සභාගත*** කරමි.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

- ගිනි ගැනීම්වලට එරෙහිව ක්‍රියා කිරීම සඳහා වන ජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ හැකියා වර්ධනය සිදු කරනු ලැබේ.
- කැලෑබදව ඇතිවෙන ගිනි නිවීම සඳහා නිලධාරීන් යෙදවීම.
- ජනතාව දැනුවත් කිරීම.
- නීතිය ක්‍රියාත්මක කිරීම.

(iii) ශ්‍රී ලංකාවේ සියලු වනාන්තර සංවේදී පරිසර පද්ධතීන් වේ. මෙම සංවේදී පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා තිරසර විසඳුම් ලබා දී ඇත.

(iv) ඔව්.

- මෙම සංවේදී පරිසර පද්ධතිවලින් සුවිශේෂී සංවේදී පරිසර පද්ධති සංරක්ෂිත හා රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කර ඇත.
- උදාහරණ ලෙස මධ්‍යම කඳුකරයේ නකල්ස් සංරක්ෂිත වනාන්තරය හා සිංහරාජ වනාන්තරය දැක්විය හැක.
- මෙම කලාප දෙකම ජාතික උරුම වනභූමි ලෙස නීති මඟින් ප්‍රකාශයට පත් කිරීම. මීට අමතරව, ගාල්ල දිස්ත්‍රික්කයේ කන්නෙලිය වනාන්තරය හා පුත්තලම පුබුදුගම කඩොලාන වනාන්තරය ජාතික උරුම වනභූමි ලෙස ප්‍රකාශයට පත් කිරීමට යෝජනා කර ඇත. සිංහරාජ සංරක්ෂිතයට යාබදව ඇති වනාන්තර එකතුකොට සිංහරාජ වන සංකීර්ණයක් නිර්මාණය කිරීම.
- සිංහරාජ සංරක්ෂිතය හා නකල්ස් සංරක්ෂිතය යුනෙස්කෝ ලෝක උරුමයන් බවට පත් කර ගැනීමට කටයුතු කිරීම වැනි බහුවිධ කටයුතු සිදු කර ඇත.
- සංවේදී පරිසර පද්ධතීන් මෙලෙස ප්‍රකාශයට පත් කිරීම මඟින් මෙම අනිසි මානව ක්‍රියාකාරකම් පාලනය කිරීමට කටයුතු කර ඇත.
- සියලුම වනාන්තර වටා මායිම් කණු යෙදීම සහ ජනතාව දැනුවත් කිරීම සඳහා දැන්වීම් පුවරු යෙදීම මඟින් ජනතාව වනාන්තර තුළට ඇතුළු වීම පාලනය කිරීම සිදු වේ.
- එසේම වනාන්තර අවට වාසය කරන ප්‍රජාව, පාසල් සිසුන් සංරක්ෂණයේ අගය පිළිබඳව දැනුවත් කිරීම තුළින් ආකල්ප වර්ධනය කිරීම.
- සංරක්ෂිත, රක්ෂිත, ගම්බද කැලෑ හා අවශේෂ කැලෑ වනාන්තරවල පාරිසරික හානි සිදු කරන අයට එරෙහිව නීතිමය පියවර ගැනීම.

(ඇ) ඉහතින් පිළිතුරු ලබා දී ඇත.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමියනි, මහනුවර දිස්ත්‍රික්කය කියන්නේ, ඉතා සීමිත වනරොදක් තිබෙන ප්‍රදේශයක්. එම ප්‍රදේශයේ වනාන්තර එළිකිරීම, කැලෑ ගිනි තැබීම, රජයේ ඉඩම් අත්පත් කර ගැනීම හරහා සිදු වුණු විශාල විනාශයක් ගැන දැඩි ආන්දෝලනාත්මක තත්ත්වයක් තිබෙනවා; විශේෂයෙන්ම මහනුවර, පාතහේවාහැට

[ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා]

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිහිඹියකැලේ රක්ෂිතය විනාශ කිරීම පිළිබඳව. මේ වෙනකොට පිහිඹියකැලේ රක්ෂිතයේ අක්කර 10කට වැඩි ප්‍රමාණයක් එළි කරලා ඒ රජයේ ඉඩම අත්පත් කරගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, මොරගොල්ල ජල යෝජනා ක්‍රමය, නුගලියද්ද ප්‍රදේශයේ තිබෙන සක්විති ප්‍රජා ජල යෝජනා ක්‍රමය, ඒ වාගේම අංකෙළිපිටිය ජල යෝජනා ක්‍රමය ආදී ජල යෝජනා ක්‍රම ගණනාවකටම ජල පෝෂිත ප්‍රදේශය තමයි මේ පිහිඹියකැලේ රක්ෂිතය. පිහිඹියකැලේ රක්ෂිතයේ අක්කර 10ක් විනාශ කරනකල් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව නිශ්ශබ්දව ඉන්නේ ඇයි කියලායි අපි අහන්නේ. මේ පිළිබඳව කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නවාද කියන එක ගැන අද පැහැදිලිව ප්‍රකාශ කරන්න කියලා මම ගරු ඇමතිතුමියගෙන් ඉල්ලා සිටිනවා. පිහිඹියකැලේ රක්ෂිතයේ ආන්දෝලනය ගැන ඔබතුමියට වාර්තා වෙලා නැත්නම් ඒක විශාල ගැටලුවක්. මේ රක්ෂිතය තලාතුඔය, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආශ්‍රිතවයි තිබෙන්නේ. මම මේ සම්බන්ධයෙන් ඔබතුමියගෙන් පැහැදිලි පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ඒ රක්ෂිතය අයිති වෙන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටද, එහෙම නැත්නම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවටද කියන කාරණය නිවැරැදි කරගෙන ඒ සම්බන්ධයෙන් පෞද්ගලිකව සොයා බලා එය නැවැත්වීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට මම අද උපදෙස් දෙන්නම්.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අම්බුලුවාව වත්ත ඉඩම කියන ප්‍රදේශය හෙක්ටෙයාර 95.728ක ප්‍රදේශයක්. ඒ කියන්නේ අක්කර 236යි, රූඩ් 2ක්. ඒ වාගේම එය අම්බුලුවාව ජෛව විවිධත්ව මධ්‍යස්ථානය කියන ප්‍රදේශයට බද්ධ වෙලා තිබෙන බවත් ප්‍රකාශ වෙනවා. මම ලිපි ලේඛන ගණනාවක් මේ වෙලාවේ ඉදිරිපත් කරන්නම්. ඒක වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන්න කියලා තමයි නිර්දේශ කරලා තිබෙන්නේ. නමුත්, මේ වනතුරු භූක්තිය භෞතිකව භාර දීලා නැහැ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති, භූක්තිය පවරන්න කියලා තිබෙන අක්කර 236 තුළ මේ වෙනකොට විවිධ ඉදිකිරීම් කරනවා. පස් කපනවා, ගස් කපනවා, පාරවල් හදනවා. උඩපළාත ප්‍රාදේශීය ලේකම්තුමිය යම් දේශපාලන අධිකාරියකට බියක් දක්වන නිසා ද, එහෙම නැත්නම් වෙනත් මොකක් හරි අනර්ථයක් නිසා ද, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වෙලා ඒ අදාළ දේපළේ භූක්තිය භාර නොගන්නේ?

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ඒ කැලය අයිති වෙන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ද එහෙම නැත්නම් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ද කියන කාරණය ගැන සොයා බලා ඒ සම්බන්ධයෙන් ගත යුතු නීත්‍යානුකූල පියවර ගන්න කටයුතු කරන්නම්.

තල්දූවේ සෝමාරාම හිමි: මරණ සහතිකය
தல்துவே சோமாராம தேரர்: மரணச் சான்றிதழ்
THALDUWE SOMARAMA THERO: DEATH CERTIFICATE

41/2024

2. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 1948.02.04 දිනෙන් පසුව මරණ දඬුවම නියම කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ එල්ලා මරණයට පත් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එල්ලා මරණයට පත් කරන ලද පුද්ගලයින්ගේ මරණ සහතික ඥාතීන් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) හිටපු අග්‍රාමාත්‍ය ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ඝාතනය කිරීම සම්බන්ධයෙන් වැරදිකරු වූ තල්දූවේ සෝමාරාම හිමියන්ගේ මරණ සහතිකය මෙතෙක් නිකුත් කර නොමැති බවත්;

(ii) 1962.07.06 දින තල්දූවේ සෝමාරාම හිමි එල්ලා මැරූ බවට සඳහන් වුවද එදිනට එම නමින් මරණයක් ලියාපදිංචි වී නොමැති බවත්;

එතුමා දන්වන්නේද?

(ඇ) (i) තල්දූවේ සෝමාරාම හිමියන්ගේ මරණ සහතිකය නිකුත් නොකිරීම පිළිබඳ පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එහි නිගමනය කවරේද;

(iii) නොඑසේ නම්, පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iv) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමෙන් පසු අදාළ මරණ සහතික නිකුත් නොකළ තවත් පුද්ගලයන් සිටීද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியல மைப்பு மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் 1948.02.04ஆம் திகதியின் பின்னர், மரண தண்டனை விதிக்கப்பட்டதை யடுத்து தூக்கிலிடப்பட்டுக் கொல்லப்பட்ட ஆட்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) தூக்கிலிடப்பட்டுக் கொல்லப்பட்ட ஆட்களின் மரணச் சான்றிதழ்களை உறவினர்களிடம் கையளிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iii) ஆமெனில், அதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) முன்னாள் பிரதம அமைச்சர் கௌரவ எஸ். டப்ளியூ. ஆர். டி. பண்டாரநாயக்க அவர்களைப் படுகொலை செய்தமை தொடர்பில் குற்றவாளியாகத் தீர்ப்பளிக்கப்பட்ட தல்துவே

சோமாராம தேரரின் மரணச் சான்றிதழ் இதுவரையிலும் வழங்கப்படவில்லை என்பதையும்;

(ii) 1962.07.06ஆம் திகதி தல்துவே சோமாராம தேரர் தூக்கிலிடப்பட்டுக் கொல்லப்பட்டதாகக் குறிப் பிடப்பட்டாலும், அத்திகதியில் அப்பெயரில் மரணமொன்று பதிவு செய்யப்படவில்லை என்ப தையும்;

அவர் அறிவாரா?

(இ) (i) தல்துவே சோமாராம தேரரின் மரணச் சான்றிதழ் வழங்கப்படாமை தொடர்பாக விசாரணை மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதன் தீர்மானம் யாதென்பதையும்;

(iii) இன்றேல், விசாரணையொன்று மேற்கொள்ளப் படுமா என்பதையும்;

(iv) மரண தண்டனை நிறைவேற்றப்பட்டதன் பின்னர் மரணச் சான்றிதழ்கள் வழங்கப்படாத வேறு நபர்களும் உள்ளனரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Justice, Prison Affairs and Constitutional Reforms:

(a) Will he inform this House -

(i) of the number of persons who were hanged to death following the imposition of the capital punishment after 04.02.1948 in Sri Lanka;

(ii) whether arrangements would be made to make the Certificates of Death of the persons who were hanged to death available to their relatives; and

(iii) if so, the time it will take?

(b) Is he aware that -

(i) the Certificate of Death of Ven. Thalduwe Somarama Thero, who was found guilty of assassinating former Prime Minister late Hon S.W.R.D Bandaranayake, has not been issued yet; and

(ii) a Certificate of Death in the name of Ven.Thalduwe Somarama Thero dated 06.07.1962 has not been registered even though it is mentioned that he was hanged to death on that day?

(c) Will he also inform this House -

(i) whether an inquiry has been conducted in relation to the non-issuance of the Certificate of Death of Ven. Thalduwe Somarama Thero;

(ii) if so, its conclusion;

(iii) if not, whether an inquiry would be conducted; and

(iv) whether there are any other persons in relation to whom Certificates of Death have not been issued, following enforcement of the capital punishment?

(d) If not, why?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)

(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 1959 සිට 1975 දක්වා කාලය තුළ බෝගම්බර බන්ධනාගාරය තුළ 31 දෙනෙකු එල්ලා මරණයට පත් කර ඇති බවට ලේඛනවල සඳහන් වී ඇති බවට, දුම්බර බන්ධනාගාර අධිකාරි විසින් වාර්තා කර ඇත.

බන්ධනාගාර සංඛ්‍යාලේඛන අංශයේ දත්ත වාර්තාවල සඳහන් වන පරිදි 1969 සිට 1976 දක්වා එල්ලා මරණයට පත් කර ඇති සංඛ්‍යාව පහත පරිදි සඳහන් වේ.

වර්ෂය	එල්ලා මරණයට පත් කරන ලද සංඛ්‍යාව
1969	1
1970	-
1971	6
1972	6
1974	24
1975	4
1976	1
එකතුව	42

(ii) 1976න් පසු මරණ දඬුවමක් සිදු කර නොමැත. මරණ සහතික නිකුත් කිරීම සාමාන්‍ය ක්‍රමවේදයයි. ඉතා දිගු කාලයක් ගතව ඇති හෙයින් ලේඛන සොයාගත නොහැක.

(iii) මරණ දඬුවම ක්‍රියාත්මක නොකරන බැවින් පැන නොනඟී.

(ආ) (i) නොදනී.

අදාළ තොරතුරු සොයාගත නොහැක.

(ii) නොදනී.

අදාළ තොරතුරු සොයාගත නොහැක.

(ඇ) (i) පරීක්ෂණයක් සිදු කිරීමට ඉල්ලීමක් කර නැත.

(ii) අවශ්‍ය වුවහොත් පරීක්ෂණයක් කළ හැකිය.

(iii) ඉල්ලා සිටියහොත් සිදු කළ හැකිය.

(iv) 1976 වසරේ සිට මරණ දඬුවම ක්‍රියාත්මක කර නොමැත. වසර 46ක කාලය තුළ කිසිවෙකුත් එවැනි පරීක්ෂණ ඉල්ලා නොමැත.

(ඈ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பத்திரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා වර්තමානයේ සොයා ගන්න පුළුවන් තොරතුරුත් එක්ක පිළිතුර ලබා දුන් නිසාත්, ඔබතුමාට වෙලාව ඉතිරි කර දෙන්න ඕනෑ නිසාත්, මම එක අතුරු

[ගරු බුද්ධික පතිරණ මහතා]

ප්‍රශ්නයක් පමණක් අහලා ඉතිරි කාරණය ඔබතුමාට යොමු කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති විධියටත් පත් වෙච්ච නිසා මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම වැදගත් වෙනවා. ගරු කථානායකතුමනි, මේක තමයි වැඩේ. අපේ ගොඩක් ආයතනවල අතීත තොරතුරු නැහැ. පුවත් පත්වල පිටු කාලක්, අරික්කාලක් නොවෙයි, පිටු පුරා ගිය ප්‍රවෘත්තියක් පදනම් කරගෙන තමයි මම මේ ප්‍රශ්නය සැකසුවේ. ඒ තුළ ඉතා පැහැදිලිව තිබෙනවා, තල්දූවේ සෝමාරාම හිමියන්ට මරණ සහතිකයක් නිකුත් වෙලා නැහැ කියලා. ඔබතුමා සඳහන් කළා, ඉල්ලීමක් ආවොත් පරීක්ෂණයක් කරන්න පුළුවන් කියලා. තල්දූවේ සෝමාරාම හාමුදුරුවන් වෙනුවෙන් මට පෙනී ඉන්න පුළුවන්කමක් නැහැ. නමුත්, මේ මරණ සහතිකය විතරයි නිකුත් වෙලා නැත්තේ. මීට කලින් එල්ලා මරපු උදවිය වෙනුවෙනුත්, මීට පසුව එල්ලා මරපු උදවිය වෙනුවෙනුත්, 1976දී විලියම් ගොපල්ලව මැතිතුමා මරණ දඬුවම අත්හිටුවන තෙක් සිදු කළ සියලු එල්ලා මැරීම් සම්බන්ධයෙනුත් මරණ සහතික සියල්ල නිකුත් කර තිබෙනවා. තල්දූවේ සෝමාරාම හිමියන් එල්ලා මරන අවස්ථාවේ ගිහියෙක් විධියට හිටි බවත්, ඒ හිමිනමට මරණ සහතිකයක් නිකුත් වුණේ නැහැ කියන එකත් තමයි සඳහන් වෙන්නේ. ඒ නිසා මම ඔබතුමාට කියනවා, මේක වුණේ මොකක් නිසාද කියන කාරණය පැහැදිලි කරන්න කියලා. ගරු සභාවට මේ ප්‍රශ්නය නැවත ඉදිරිපත් කළොත් විතර නේ, අපට සභාවේදී මේ ගැන දැනගන්න පුළුවන් වෙන්නේ. මේ පිළිබඳව පෞද්ගලිකව හෝ සොයා බලා එම තොරතුරු ලබා දෙන්න පුළුවන් නම්, ඒක ඉතිහාසය පරිශීලනය කරන අයට, ඉතිහාසය ගවේෂණය කරන අයට වාගේම අපේ ගරු සභාවටත් දැනගැනීම වැදගත් වෙයි. ඒ නිසා ඔබතුමාගේ මට්ටමෙන් මේ සම්බන්ධයෙන් කළ හැකි දේ කුමක්ද කියන කාරණය පළමුවෙනි අතුරු ප්‍රශ්නය විධියට මම අහනවා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු කථානායකතුමනි, මරණ දඬුවම අවුරුදු 46ක් තිස්සේ ක්‍රියාත්මක වෙලා නැහැ. මරණ දඬුවම ක්‍රියාත්මක කරනකොට එය ක්‍රියාත්මක කරන්නේ වෛද්‍යවරයෙක් ඉදිරියේදියි. ඒ වෛද්‍යවරයා ඔහුගේ ප්‍රාණය නිරුද්ධ වුණා කියලා දෙන සහතිකයත් එක්ක මරණ සහතිකයක් නිකුත් කරනවා. ඒ හිමිනමගේ මරණය සිදු කළ බව වාර්තාගත වුණාට, මරණ සහතිකයක් දුන්නාද, නැද්ද කියන එක වර්තමානයේ තිබෙන වාර්තා අනුව අපට සොයා ගන්න බැහැ. හැබැයි, ඒ පිළිබඳ පරීක්ෂණයක් කිරීමේ අවශ්‍යතාවක් ඔබතුමාට තිබෙනවා නම්, අපට පුළුවන් පරීක්ෂණයක් කරන්න. පරීක්ෂණයක් කරලා ඉවර වෙලා ඒ විස්තර දෙන්නත් පුළුවන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මේකෙන් පැන නැඟුණු කාරණය පිළිබඳව වූ දෙවැනි අතුරු ප්‍රශ්නය මම ඔබතුමාටයි යොමු කරන්නේ. ගරු ඇමතිතුමාත් කිව්වා, මේ සම්බන්ධයෙන් ඉතිහාස තොරතුරු නැහැ කියලා.

ගරු කථානායකතුමනි, නිල්වලා ගඟ ඇතුළු ජල මූලාශ්‍ර ආශ්‍රිතව පැන නැඟී ඇති ගැටලු සම්බන්ධයෙන් සොයා බලන්න ඔබතුමා විශේෂ කාරක සභාවක් පත් කළා. ඒ වාගේම මේ ගඟ පිළිබඳව අතීත තොරතුරු කිසිවක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නැහැ. ඒක පළමුවැනි කාරණය. ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියන්න ඕනෑ, ඔබතුමා මේ කාරණයට මැදිහත් වෙන්න අවශ්‍ය බව. මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස සිට අතුරලිය හරහා කද්දුව දක්වා දිවෙන මාර්ගය මේ වෙනකොටත් සම්පූර්ණයෙන්ම ගැලවිලා ගිහිල්ලා. ඒක ඔබතුමා පළාත් සභා ඇමතිවරයෙකු විධියට සිටියදී හදපු මාර්ගයක්. ඉන් පසුවත් මේ මාර්ගයේ සංවර්ධන කටයුතු වුණා. නමුත්, මේ වෙනකොට ඒ මාර්ගය සම්පූර්ණයෙන්ම ගැලවිලා ගිහිල්ලා. හේනේගම සිට හොරගොඩ හරහා තෙලිජ්ජවිල දක්වා දිවෙන මාර්ගය මෙහිදී අතුරු මාර්ගයක් විධියට පාවිච්චි කරන්න පුළුවන්. නමුත්, මේ වෙනකොට ඒ මාර්ගයත් සම්පූර්ණයෙන්ම ගැලවිලා ගිහිල්ලා. ඒ නිසා ඒ මාර්ගයත් සංවර්ධනය කළ යුතු තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ වාගේම අකුරැස්ස, මාරඹ, අතුරලිය, හුලන්දාව වාගේ ප්‍රදේශවල ගෙවල් ඇතුළේ තවමත් පස් කඳු තිබෙනවා. මම වගකීමක් ඇතිව මේ කාරණය කියනවා. මම දැන් කථා කරන්න විනාඩි 15කට කලිනුත් ඒ අයට කථා කරලා බැලුවා. මීට විනාඩි 15කට පෙර වෙනකම් ඒ මිනිස්සුන්ට රජයෙන් වතුර බෝතලයක්වත් ලැබිලා නැහැ. ඒක එහෙමයි කියලා කවුරු හරි ප්‍රාදේශීය ලේකම් කෙනෙක් කියනවා නම්, ඔබතුමා ඒ ගැන හොයලා බලන්න ඕනෑ.

ඒ වාගේම හුලන්දාව වත්තේ බෙල්මන් කොටසේ වතු ආශ්‍රිතව ජීවත් වන අහිංසක මිනිස්සු කොරෝනා වාගේ උවදුරු අවස්ථාවලදී ඔවුන්ගේ ගෙවතුවල වවාගෙන තිබුණු කෙසෙල්, පැපොල්, මඤ්ඤොක්කා වැනි ගස් ටික වතු අධිකාරි විසින් ඉතා තිරශ්චීන විධියට ගලවලා තිබෙනවා. ඒ මිනිස්සුන්ට රුපියල් 1,700ක දෛනික වැටුපක් දෙනවා කියලා පාරම්බෑවාට රුපියල් 1,700 දෙන්නේ නැහැ. මම දන්නවා, තොණ්ඩමන් මැතිතුමා මේ වාගේ දේවල්වලට මැදිහත් වුණාම එතුමාටත් චෝදනා එන බව. මම එතුමා වාගේ ආවේගශීලි නැහැ. නමුත් ඒක දැක්කාම මට හිතුණා, එතුමා හැසිරුණු විධිය වැරදි නැහැ කියලා. මොකද, හුලන්දාව වත්තේ වතු ආශ්‍රිත ප්‍රජාවට හරිම නරක විධියට සලකලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගෙත් ඡන්ද දායකයෝ ඒ වතුවල ඉන්නවා. ගරු කථානායකතුමනි, ඒ නිසා ඒ ප්‍රදේශයට ගිහිල්ලා බලන්න කියලා මම ඔබතුමාට කියනවා. හුලන්දාව වත්තේ බෙල්මන් කොටසේ ඉන්න මිනිස්සු වවපු ගහක්, දෙකක් ඉතුරු කරලා කැන් පිටින් කෙසෙල් ගස් ටික කපලා, අන්නාසි පඳුරු ටික කපලා විනාශ කරලා තිබෙනවා. ඒ වතු ආශ්‍රිතව paralyze වූ වයසක අම්මා කෙනෙක් සහ තාත්තා කෙනෙක් පවා ජීවත් වෙනවා. දම්ළ ජනතාව ජීවත් වන ඒ ගම්මානයේ ගංවතුර උවදුර නිසා පස් කඳු නාය ගිහිල්ලා, එච්චර පීඩනයක් ඒ ජනතාවට එල්ල වෙලා තිබෙනවා.

ඊළඟට, පේද්දපිටිය, මාරඹ, මාරඹ උතුර වාගේ ප්‍රදේශවල තිබෙන ගෙවල් ඇතුළේ තවමත් පස් කඳු තිබෙනවා. අඩු ගණනේ ඒ අයට වතුර බෝතලයක්වත් ලැබිලා නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමා මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරනවා වාගේම මේ රටේ තුන්වැනි පුරවැසියා. මේ රටේ තුන්වැනි පුරවැසියා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයක මනුස්සයෙකුගේ ඉරණම මේක නම්, විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ ඡන්ද දායකයන්ගේ තත්ත්වය ගැන හිතන්න දෙයක් නැහැ. දෙවැනි අතුරු ප්‍රශ්නයට මම ඔබතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද, ඔබතුමා මූලාසනයේ ඉන්නකොට මට උත්තරයක් දෙන්න ඔබතුමාට බැරි වෙයි. හැබැයි මම ඔබතුමාට කියනවා, ඔය මූලාසනයෙන් බැහැලා ගියාට පස්සේ මේ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා. නිල්වලා ගඟ ඇතුළු ජල මූලාශ්‍ර ආශ්‍රිතව පැන නැඟී ඇති ගැටලු සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කළ විශේෂ කාරක සභාව අද රැස්වෙනවා. ඔබතුමාටත් පුළුවන් නම්, සවස 2.00ට ඒ විශේෂ කාරක සභාවට එන්න. ඔක්කෝම නිලධාරිනුත්

ඒ සඳහා සහභාගි වෙනවා. ඒ කාරක සභාවට ඇවිල්ලා හරි, නැත්නම් දුරකථන මාර්ගයෙන් හරි අකුරැස්ස, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකේ සහ පස් කඳු පහත් වුණු අනෙකුත් තැන්වල ප්‍රාදේශීය ලේකම්වරුන්ට කථා කරලා, දිස්ත්‍රික් ලේකම්වරයාට කථා කරලා ඒ මිනිස්සුන්ට යම් සහනයක් ලබා දෙන්න කියලායි මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ. ගරු කථානායකතුමනි, ඒ සඳහා ඔබතුමාගෙන් යම් මැදිහත්වීමක් අපි බලාපොරොත්තු වෙනවා. ඔබතුමා මූලාසනයේ ඉන්න ගමන් පුළුවන් නම් ඒ ගැන වචන දෙකක් කියන්න. ඒක හොඳයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. මම ඒ ගැන සොයා බලන්නම්.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්න විධියට ඇහුවේ, තල්දූවේ සෝමාරාම හිමි එල්ලා මැරීම සම්බන්ධව සහ ජල ගැලීමක් හේතුවෙන් ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ වෙච්ච ආපදාවක් පිළිබඳව නේ. *[බාධා කිරීමක්]* නැහැ. එතුමා ඔබතුමාගෙනුත් අතුරු ප්‍රශ්නයක් ඇහුවා නේ. ගරු කථානායකතුමනි, අපිත් කැමතියි, මීට පස්සේ තිබෙන අතුරු ප්‍රශ්න ඔක්කෝම අපෙන් අහන්නේ නැතුව ඔබතුමාගෙන්ම අහගන්නවා නම්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය ඇති, ගරු මන්ත්‍රීතුමා. නැත්නම් ඔය කථාව තවත් එහාට යනවා.

කුරුවිට, බෝපත් ඇල්ල නැරඹීමට පැමිණෙන සංචාරකයන්: අය කරන ගාස්තු
குருவிட்ட, போபத் எல்லைக்கு வருகைதரும் சுற்றுலாப் பயணிகள்: அறவிடப்படும் கட்டணம்
TOURISTS VISITING BOPATH ELLA, KURUWITA: FEES LEVIED

311/2024

3. ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර, කුරුවිට, බෝපත් ඇල්ල නැරඹීමට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයන්ගෙන් මුදල් අයකරන්නේද;

(ii) එසේ නම්, එම මුදල් අයකර ගනු ලබන ආයතනය කවරේද;

(iii) ඒ තුළින් එම ආයතනය උපයනු ලබන වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ආදායම යොදා ගනිමින් බෝපත් ඇල්ල නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගෙන තිබේද;

(v) බෝපත් ඇල්ල නැරඹීම සඳහා පැමිණෙන දේශීය ළමා සංචාරකයෙකුගෙන් හා විදේශීය ළමා සංචාරකයෙකුගෙන් අයකරනු ලබන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருமான வரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி, குருவிட்ட, போபத் எல்ல நீர்வீழ்ச்சியைப் பார்வையிட வருகைதரும் உள்நாட்டு மற்றும் வெளிநாட்டு சுற்றுலாப் பயணிகளிடமிருந்து பணம் அறவிடப்படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், அப்பணத்தை அறவிடும் நிறுவனம் யாதென்பதையும்;

(iii) அதனூடாக மேற்படி நிறுவனம் ஈட்டும் வருடாந்த வருமானம் எவ்வளவு என்பதையும்;

(iv) அவ்வருமானத்தைப் பயன்படுத்தி நீர்வீழ்ச்சியைப் பார்வையிட வருகைதரும் சுற்றுலாப் பயணிகளுக்குத் தேவையான வசதிகளை மேம்படுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) நீர்வீழ்ச்சியைப் பார்வையிட வருகைதரும் உள்நாட்டு மற்றும் வெளிநாட்டு சிறுவர்களிடமிருந்து அறவிடப்படும் பணம் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he inform this House -
(i) whether entrance fees are levied on local and foreign tourists who visit Bopath Ella in Kuruwita, Ratnapura;
(ii) if so, what organization collects such fees;
(iii) the annual income earned by the organization concerned through collecting fees;
(iv) whether measures have been taken to use money from this income in order to develop facilities which the visitors to the waterfall need; and
(v) the different fees levied on local child tourists and foreign child tourists who visit the waterfall, separately?

(b) If not, why?

ගරු ජානක වක්කුඹුර මහතා (පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜானக வக்கும்புர - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura - State Minister of Provincial Councils, Local Government and Environment)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

[ගරු ජානක වක්කුඹුර මහතා]

(අ) (i) ඔව්.

(ii) කුරුවිට ප්‍රාදේශීය සභාව

(iii) බෝපත් ඇල්ල රථගාල සඳහා වාර්ෂික ආදායම (2023 වර්ෂය) - රුපියල් 538,100.00

බෝපත් ඇල්ල ප්‍රවේශ පත්‍ර වාර්ෂික ආදායම (2023 වර්ෂය) - රුපියල් 4,640,460.00

2023 වර්ෂයේ සම්පූර්ණ ආදායම - රුපියල් 5,178,560.00

(iv) ඔව්.

බෝපත් ඇල්ල නැරඹීමට පැමිණෙන සංචාරකයන් සඳහා පානීය ජල පහසුකම් සැපයීමට ළිඳක් ඉදිකිරීම සහ ආරක්ෂාව තහවුරු කිරීම පිණිස යොදවන පොලිස් නිලධාරීන්ගේ මුර කුටිය අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් 660,000ක් සභාව විසින් වැය කර ඇති අතර, එම ස්ථානයේ සේවය සඳහා යොදවා ඇති එක් දෛනික කම්කරු වැටුපක් ගෙවීමට දිනකට රුපියල් 1,200 බැගින් 2022 සහ 2023 වර්ෂවල රුපියල් 796,238ක මුදලක් මෙම ආයතනය වැය කර ඇත. මීට අමතරව පළාත් සංචාරක අමාත්‍යාංශය මඟින් වැසිකිළි පද්ධතියක් සහ ඇඳුම් මාරු කරන ස්ථානයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 25.29ක මුදලක්ද 2022 සහ 2023 වර්ෂවල වැය කර ඇත.

එසේම 2024 වර්ෂයේ පළාත් පාලන බල ප්‍රදේශවල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් බෝපත් ඇල්ල පොදු රථගාල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 9.6ක මුදලක් වෙන් කර ඇත.

(v) දේශීය ළමා සංචාරකයෙකුගෙන් අය කරන මුදල - රුපියල් 20.00

විදේශීය ළමා සංචාරකයෙකුගෙන් අය කරන මුදල - රුපියල් 300.00

(ආ) අදාළ නොවේ.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම ගැන ගරු රාජ්‍ය ඇමතිතුමාට මා ස්තුතිවන්ත වනවා. රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන රාජ්‍ය අමාත්‍යවරයෙකු නිසා මේ කාරණය පිළිබඳව අවබෝධයකින් තමයි එතුමා මේ ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්න ඇත්තේ කියා මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය ඇහුවේ, මීට මාස කිහිපයකට පෙර මම එම ස්ථානයට ගිය වෙලාවේ දැකපු කාරණා නිසායි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් යනවා ඇති, එම ස්ථානයට. අපට රත්නපුර දිස්ත්‍රික්කයේ සංචාරක ආකර්ෂණීය ස්ථාන ගණනාවක් තිබෙනවා. ඒ ස්ථාන ගණනාව සංවර්ධනය කිරීමේ වගකීම පළාත් පාලන ආයතනවලට ලබා දීම හොඳයි. හැබැයි, පළාත් පාලන ආයතනයට ඒවා කර ගන්න මූල්‍ය හැකියාවක් නැහැ, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඔබතුමා දන්නවා, ඒ ලැබෙන ආදායම බෝපත් ඇල්ල සංචාරක ස්ථානයක් විධියට සංවර්ධනය කරන්න ප්‍රමාණවත් නැති බව. එම නිසා ප්‍රධාන අමාත්‍යාංශය මැදිහත් වෙලා තමයි ඒ කටයුතු කරන්න ඕනෑ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, සංවර්ධන කටයුතු පිළිබඳව ඔබතුමා කියපු සියල්ල ඇත්ත. නමුත්, මේ කාරණය කෙරෙහි ඔබතුමාගේ අවධානය මා යොමු කරවනවා. විශේෂයෙන්ම ඇල්ල අවට ඉඩම් විවිධ ව්‍යාපාරිකයෝ අනවසරයෙන් අල්ලා ගැනීම නිසා ඇල්ල ප්‍රදේශයට අයත් ඉඩම් බොහොමයක් අහිමි වෙලා තිබෙන්නේ. දැන් ඇල්ල අවට ඉඩම් ටික විතරයි ඉතුරු වෙලා තිබෙන්නේ. අපි දන්නවා, දුන්හිඳ ඇල්ල, රාවණා ඇල්ල වාගේ තැන් විශාල සංචාරක ආකර්ෂණයක් ලබාගෙන තිබෙන බව. බෝපත් ඇල්ල ඒ මට්ටමට ගෙන එන්න බැරි ප්‍රශ්න දෙකක් තිබෙනවා. එකක් තමයි, මාර්ගය පිළිබඳ ප්‍රශ්නය. මාර්ගය පිළිබඳ ප්‍රශ්නයට උත්තර හොයන්න ටිකක් අමාරු වුණත්, එම ස්ථානයේ තිබෙන ඉඩම් පිළිබඳ ප්‍රශ්නයට උත්තරයක් හොයන්න හැකියාව තිබෙනවා, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

මම මේ අවස්ථාවේදී ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ තිබෙන තවත් ලස්සන, සංචාරක ආකර්ෂණය තිබෙන තැනක් වෙනුවෙන් රජයේ මේ ඉඩම් ටික - අපට කාගේවත් ඉඩම් ගන්න ඕනෑ නැහැ- පවරාගෙන නිවැරදි ආකාරයට ඒවා පාලනය කරන්න ප්‍රාදේශීය සභාව වෙත යොමු කිරීමේ හැකියාවක් තිබෙනවාද?

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු මන්ත්‍රීතුමනි, ඒක අපි ප්‍රාදේශීය සභාවේ යෝජනාවකින් ප්‍රාදේශීය ලේකම් හරහා තමයි කරන්න ඕනෑ. අනවසරයෙන් රජයේ ඉඩම්වල ඉන්නවා නම් ඒ ඉඩම් නැවත වරක් රජයට පවරා ගැනීමේ කටයුත්තට අපි මැදිහත් වෙන්නම්. මොකද, ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලීමක් කරලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා තමයි ඒ ඉඩම් පවරා ගැනීම කරන්න ඕනෑ. එහෙම ඉඩම් අනවසරයෙන් අරගෙන තිබෙනවා නම් අපි ඉදිරියේදී ඒ ගැන සොයා බලා කටයුතු කරනවා.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමාට යොමු කරන මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. රත්නපුර දිස්ත්‍රික්කයේ අපට සංචාරකයින් ගෙන්වා ගන්න නිවැරදි වැඩසටහනක් තවම නැහැ කියලා ඔබතුමා දන්නවා. පොදුවේ වෙනත් දිස්ත්‍රික්කවල තිබෙන විධියට සම්පත් තිබුණාට, ආකර්ෂණීය තැන් තිබුණාට නිවැරදි ආකාරයට සංචාරකයින් ගෙන්වා ගන්න වැඩසටහනක් නැහැ. ඒ නිසා හෝටල් ව්‍යාපාරයේ නියුතු ජනතාවට ශක්තියක් වෙන්න, නැත්නම් වෙනත් ව්‍යාපාරවලට භයියක් වෙන්න පුළුවන්කමක් නැහැ.

ඒ වාගේම මම නියෝජනය කරන කොළොන්න මැතිවරණ කොට්ඨාසයේ මඩුවන්වෙල වලව්ව තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමා මේ ගැන දන්නවා. මඩුවන්වෙල වලව්ව අපි පොඩි කාලයේ ඉඳලා - අපි දන්න කාලයේ ඉඳලා - සංචාරකයින් යන තැනක්. ඔබතුමා මම මේ කියන්න හදන කාරණය ගැන දන්නවාද දන්නේ නැහැ. අද වෙනකොට ඒ අවට තිබෙන ඉඩම් ටික රජය විසින් බදු දෙන්න කටයුතු කරලා තිබෙනවා, දුම් කොළ වවන ව්‍යාපෘතියක් සඳහා පෞද්ගලික ආයතනයකට. මේ ගැන ඔබතුමා දැනුවත්ද දන්නේ නැහැ. මම හිතනවා, මේක නොවෙයි විය යුත්තේ කියලා. අපට ඉතිරි වෙලා තිබෙන ස්ථාන ටික සංවර්ධනය කරන්න ඕනෑ. මොකද, අලුතින් සංචාරක ආකර්ෂණීය ස්ථාන හදනවා කියන එක අපට අමාරු වැඩක්. දැනට තිබෙන ස්ථාන ටික රැක ගැනීම අපේ වගකීමක් වෙලා තිබෙන වෙලාවේ ජනාධිපතිතුමාගේ අලුත් ආර්ථික වැඩසටහන යටතේද කියන්න මම දන්නේ නැහැ, මඩුවන්වෙල වලව්වට අයිති ඉඩම්වලින් විශාල

ඉඩම් ප්‍රමාණයක් මේ වෙනකොට බදු දෙන්න අවශ්‍ය පිඹුරුපත් සකස් කරලා තිබෙනවා. මම හිතන විධියට, රාජ්‍ය අමාත්‍යවරයෙක් විධියට ඔබතුමාත් මේ ගැන දන්නවා ඇති. මේ සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය මොකක්ද, මේ තත්ත්වය වළක්වාලීමට ඔබතුමා දිස්ත්‍රික්කයේ රාජ්‍ය අමාත්‍යවරයෙක් විධියට යම් පියවරක් ගන්න සූදානම්ද කියලා මම අහනවා. අපි විපක්ෂය විධියට ඒ වෙනුවෙන් දැඩි විරෝධතාව ප්‍රකාශ කර තිබෙනවා. නමුත් ඒ ප්‍රශ්නයට සාධාරණ පිළිතුරක් ලැබිලා නැහැ වාගේම ඒ සම්බන්ධව අවධානයක් යොමු වෙලාත් නැහැ.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු කථානායකතුමනි, මෙතුමා කියන ආකාරයට කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයිති මඩුවන්වෙල වලව්ව ප්‍රදේශයේ එවැනි සිදුවීමක් වෙලා තිබෙනවාය කියන එක ගැන මම නම් තවම දන්නේ නැහැ. මම අදම ප්‍රාදේශීය ලේකම්ගෙන් සහ දිස්ත්‍රික් ලේකම්ගෙන් ඒ ගැන විමසීමක් කරන්නම්.

දෙවැනි කාරණය මෙයයි. මඩුවන්වෙල වලව්ව නරඹන්න සංචාරකයින් විශාල පිරිසක් එනවා. ඔවුන් සඳහා අවශ්‍ය පහසුකම් සපයන්න මගේ අමාත්‍යාංශයෙන් මම මුදල් වෙන් කර දීලා තිබෙනවා. හැබැයි, තවම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අවසරය දුන්නේ නැහැ, ඉදිකිරීම් කටයුතු කරන්න. ඔබතුමා දකිනවා ඇති, ඒ බැම්මෙන් එහා පැත්තේ වී මෝල්ක් වාගේම ගෙවල් තිබෙන බව. සංචාරකයින්ට පහසුකම් සපයන්න ගියාම තමයි බාධක දමන්නේ. අනෙක් ඔක්කොම කටයුතු එතැන කරනවා. දරුවන් විශාල පිරිසක් මෙම ස්ථානයට එනවා. ඒ පහසුකම් ටික හදලා දෙන්න තමයි අපේ අමාත්‍යාංශයෙන් මුදලක් වෙන් කරලා තිබෙන්නේ. අපි ඔබතුමන්ලාගෙන් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ඉල්ලා සිටිනවා. මම පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්තුමාට ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා, ඒගොල්ලන් කියන නීතියක් යටතේ පහසුකම් හදලා එතැන දියුණු කරන්න අපට අවස්ථාව ලබා දෙන්න කියලා. ඒ වාගේම ඔබතුමා කලින් කියපු කාරණාව ගැන සොයා බලා ඒ අවශ්‍ය කටයුතු අපි කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

ආබාධ සහිත පුද්ගලයන්: විස්තර
மாற்றுத்திறனாளிகள்: விபரம்
PERSONS WITH DISABILITIES: DETAILS

358/2024

4. ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2023.10.30 දින වනවිට ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව, අවුරුදු 5-10, 10-15, 15-20, 20-30, 30-40 සහ 40න් ඉහළ යන එක් එක් වයස් කාණ්ඩය, ස්ත්‍රී - පුරුෂ සමාජභාවය, ආබාධය සහ එක් එක් දිස්ත්‍රික්කය අනුව;

(ii) වයස අවුරුදු 5-20 අතර ආබාධ සහිත අය අතරින් ප්‍රාථමික, ද්විතියික හා තෘතීයික අධ්‍යාපනය ලබන සංඛ්‍යාව සහ අධ්‍යාපනය නොලබන සංඛ්‍යාව ස්ත්‍රී - පුරුෂ සමාජභාවය අනුව;

(iii) වයස අවුරුදු 20න් ඉහළ ආබාධ සහිත පුද්ගලයන් අතරින්, රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ සහ ස්වයං රැකියා ක්ෂේත්‍රයේ සේවය කරනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව ස්ත්‍රී - පුරුෂ සමාජභාවය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) ඉහත (iii)හි සඳහන් සංඛ්‍යාව මුළු ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2023.10.30ஆம் திகதியளவில் இலங்கையில் ஊன முற்ற ஆட்களின் எண்ணிக்கையானது 5-10, 10-15, 15-20, 20-30, 30-40 வயதுக்கு இடைப்பட்ட மற்றும் 40க்கு மேற்பட்ட எனும் ஒவ்வொரு வயதுப் பிரிவு, பாலினம், ஊனம் மற்றும் மாவட்டத்தின் அடிப்படையிலும்;

(ii) 5-20 வயதுக்கு இடைப்பட்ட ஊனமுற்றவர்களில் ஆரம்ப, இரண்டாம் நிலை மற்றும் மூன்றாம் நிலைக் கல்வி பெறுவோரின் எண்ணிக்கை மற்றும் கல்வி பெறாதவர்களின் எண்ணிக்கை பாலின அடிப்படையிலும்;

(iii) 20 வயதுக்கு மேற்பட்ட ஊனமுற்றவர்களில், அரசதுறை, தனியார் துறை மற்றும் சுயதொழில் வாய்ப்புக்களில் ஈடுபட்டுள்ள நபர்களின் எண்ணிக்கை பாலின அடிப்படையிலும்;

தனித்தனியே யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேலே (iii)இல் குறிப்பிடப்பட்டுள்ள எண்ணிக்கை, ஒட்டுமொத்த ஊனமுற்ற ஆட்களின் எண்ணிக்கையின் விகிதாசாரம் யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Women, Child Affairs and Social Empowerment:

(a) Will he inform this House -

(i) the number of persons with disabilities in Sri Lanka as at 30.10.2023 as per each age group of 5-10, 10-15, 15-20, 20-30, 30-40 and above 40 years, their gender, the nature of disability and the district;

(ii) out of the total number of people with disabilities aged between 5-20 years, the number who are receiving their primary, secondary and tertiary education and those not receiving education, as per gender basis; and

(iii) separately, out of the total number of people with disabilities aged above 20 years, the number of differently-abled people who are serving in state or private sectors or self-employed, as per gender basis?

the figure of (iii) above, as a percentage of the total number of persons with disabilities?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ පූර්ණ සංගණනයක් අවසන් වරට සිදු කර ඇත්තේ 2012 වර්ෂයේදීය. එනමුත් 2022 වර්ෂයට අදාළව ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධව දිස්ත්‍රික් මට්ටමින් හා ස්ත්‍රී-පුරුෂභාවය අනුව ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණයේදී ලබා ගත් දත්ත පහත දැක්වේ.

වගු අංක 01 - දිස්ත්‍රික්ක හා ස්ත්‍රී-පුරුෂභාවය අනුව අපහසුතාවෙන් පෙළෙන ජනගහනය

දිස්ත්‍රික්කය	එකතුව	පුරුෂ	ස්ත්‍රී
එකතුව	**951,884**	446,367	505,517
කොළඹ	**83,085**	36,308	46,777
ගම්පහ	**94,310**	41,539	52,771
කළුතර	**52,617**	23,511	29,106
මහනුවර	**60,892**	27,060	33,832
මාතලේ	**19,615**	10,490	9,125
නුවරඑළිය	**41,969**	20,286	21,683
ගාල්ල	**57,142**	27,123	30,018
මාතර	**48,912**	25,415	23,498
හම්බන්තොට	**32,597**	15,870	16,727
යාපනය	**24,237**	14,991	9,247
මන්නාරම	**4,532**	1,987	2,544
වවුනියාව	**9,920**	3,756	6,163
මුලතිව්	**2,148**	874	1,274
කිලිනොච්චිය	1,671	591	1,080
මඩකලපුව	**13,159**	5,789	7,370
අම්පාර	**32,542**	17,777	14,765
ත්‍රිකුණාමලය	**9,654**	5,460	4,194
කුරුණෑගල	**93,134**	41,985	51,149
පුත්තලම	**48,471**	20,470	28,001
අනුරාධපුරය	**50,568**	23,927	26,641
පොළොන්නරුව	**19,835**	9,584	10,250
බදුල්ල	**40,445**	17,190	23,255
මොනරාගල	**18,503**	11,192	7,311
රත්නපුරය	**51,333**	22,976	28,357
කෑගල්ල	**40,594**	20,216	20,377

විවලනා සංගුණකය ඉහළ අගයක් ගන්නා බැවින් මෙම ඇස්තමේන්තු භාවිතයේදී සැලකිලිමත් විය යුතුයි.

වගු අංක 02 - අධ්‍යාපන තත්ත්වය අනුව අවුරුදු 5-20 අතර අපහසුතාවෙන් පෙළෙන පුද්ගල සංඛ්‍යාව - 2022

ලබා ඇති අධ්‍යාපන මට්ටම	එකතුව	ස්ත්‍රී පුරුෂ භාවය	
		පුරුෂ	ස්ත්‍රී
එකතුව	36,987	23,410	13,577
1-5 ශ්‍රේණිය දක්වා	9,262	6,317	2,945
6-11 ශ්‍රේණිය දක්වා	7,728	4,628	3,100
12-13 ශ්‍රේණිය දක්වා	1,098	--	1,098
විශේෂ අධ්‍යාපන ආයතන	7,041	4,932	2,109
පාසල් නොගිය	11,857	7,533	4,324

විවලනා සංගුණකය ඉහළ අගයක් ගන්නා බැවින් මෙම ඇස්තමේන්තු භාවිතයේදී සැලකිලිමත් විය යුතුය. -- වාර්තා නොවූ

වගු අංක 03 - වෘත්තීය තත්ත්වය අනුව අවුරුදු 20ට වැඩි අපහසුතාවෙන් පෙළෙන පුද්ගල සංඛ්‍යාව - 2022

	එකතුව	ස්ත්‍රී පුරුෂ භාවය	
		පුරුෂ	ස්ත්‍රී
එකතුව	**110,579**	**78,657**	**31,922**
සේවා නියුක්ත	38,645	27,300	11,345
රාජ්‍ය අංශය	5,327	3,498	1,830
පෞද්ගලික අංශය	33,318	23,803	9,515
සේවා යෝජක	3,143	2,497	646
තමාගේ වැඩ කටයුත්තක නිරත	59,352	44,991	14,361
පවුලේ ආර්ථික කටයුත්තකට සහාය වන	9,438	3,868	5,570

විවලනා සංගුණකය ඉහළ අගයක් ගන්නා බැවින් මෙම ඇස්තමේන්තු භාවිතයේදී සැලකිලිමත් විය යුතුය.

(ii)

ලබා ඇති අධ්‍යාපන මට්ටම	පුරුෂ	ස්ත්‍රී	එකතුව
1-5 ශ්‍රේණිය දක්වා	6317	2945	9262
6-11 ශ්‍රේණිය දක්වා	4628	3100	7728
12-13 ශ්‍රේණිය දක්වා	-	1098	1098
විශේෂ අධ්‍යාපන ආයතන	4932	2109	7041
පාසල් නොගිය	7533	4324	11857
එකතුව	**23410**	**13577**	**36987**

(iii)

	පුරුෂ	ස්ත්‍රී	එකතුව
සේවා නියුක්ත	27,300	11,375	38,645
රාජ්‍ය අංශය	3,498	1,830	5,327
පෞද්ගලික අංශය	23,803	9,515	33,318
සේවා යෝජක	2,497	646	3,143
තමාගේ වැඩ කටයුත්තක නිරත	44,991	14,361	59,352
පවුලේ ආර්ථික කටයුත්තකට සහාය වන	3,868	5,570	9,438
එකතුව	78,675	31,922	110,579

(ආ) 2022 වර්ෂයට අදාළව ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධව දිස්ත්‍රික් මට්ටමින් හා ස්ත්‍රී පුරුෂභාවය අනුව ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණයේදී ලබා ගත් දත්ත අනුව ප්‍රතිශතය සියයට 11.61කි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2012න් පසු සංගණනයක් සිදුකර නොමැති අතර, 2024දී සිදු කරනු ලබන සංගණනයේදී වඩාත් යාවත්කාලීන වූ තොරතුරු ලබාදීමට හැකියාවක් ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, අදාළ අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යතුමිය නොමැති අවස්ථාවක ගරු අධ්‍යාපන ඇමතිතුමා සභානායකතුමා විධියට ලබාදීපු අංග සම්පූර්ණ පිළිතුර සම්බන්ධයෙන් මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාම සඳහන් කරපු 2012 අවසාන සංගණනය යටතේ -ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවටත් මෙය අදාළයි- කිසිදු ආර්ථික කටයුත්තකට දායක නොවන අයගේ ප්‍රමාණය සියයට 70.9ක්; සියයට 70.9ක් කිසිදු ආර්ථික කටයුත්තකට දායක වෙන්නේ නැහැ. නමුත් 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ මේ අය වෙනුවෙන් සියයට 3ක රැකියා අවස්ථා සහතික කර තිබෙනවා. නමුත් ගරු සභානායකතුමනි, මෙය කොහේදීවත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මෙතැනදී වුණත්, 33,318යි ඔබතුමාගේ සංඛ්‍යාලේඛන යටතේත්, පෞද්ගලික අංශයේ රැකියාවල නියුතු වෙලා ඉන්නේ.

ගරු කථානායකතුමනි, උදාහරණයක් විධියට ප්‍රතිපත්ති සම්පාදනය කරන පාර්ලිමේන්තුව දිහා බලන්න. මේක විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානයට පෞද්ගලිකව යොමු කරන්න. මා දන්නා තරමින් මේ පාර්ලිමේන්තුවේ 810ක කාර්ය මණ්ඩලයක් ඉන්නවා; සේවය කරන පිරිස 810ක්. ඒ සියයට 3ක ප්‍රමාණය ප්‍රතිපත්ති සම්පාදනය කරන උත්තරීතර පාර්ලිමේන්තුවට ආදේශ කරලා බැලුවොත්, අඩු ගණනේ ආබාධ සහිත පුරවැසියන්ගෙන් 26 දෙනෙක් මේ පාර්ලිමේන්තුව තුළ ඉන්නට ඕනෑ. නමුත් මා දන්නා තරමින් දෙන්නෙක් පමණයි ඒ කටයුත්තේ යෙදෙන්නේ. මේ විවාදය සජීවීව සංඥා භාෂාවට පරිවර්තනය කරන මැතිනිය පවා මා දන්නා තරමින් UNDP ආයතනය විසින් fund කරලා පාර්ලිමේන්තුවේ කටයුතු වෙනුවෙන් යොදවා ගන්නා අය. නමුත් cadre එකේ ඉඩ තිබෙනවා. ඉතින් ඒ නිසා මේ සම්බන්ධව පළමුවෙන්ම රටට ආදර්ශයක් දෙන්න පාර්ලිමේන්තුව තුළින්.

2012 දී කරන ලද අවසාන සංගණනය යටතේ වයස අවුරුදු 15ට වැඩි ජනගහනය 1,558,852ක් වනවා. ඒ අතරින් සියයට 70ක් කිසිදු ආර්ථික කටයුත්තකට දායක වෙන්නේ නැහැ; සියයට 70.9ක්. ඒක බරපතළ තත්ත්වයක්. ලෝක ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පැවැති එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 17වැනි සැසි වාරයට අපි ගිය සතියේ සහභාගි වුණා. ගරු කථානායකතුමනි, 2025, 2026 වසර දෙකේ - ඒ කියන්නේ එහි 18 වන සැසි වාරයේ සහ 19 වන සැසි වාරයේ- ලෝක ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන සැසි වාරවල සභාපතිත්වය ශ්‍රී ලංකාවටයි හිමි වුණේ.

අපේ මොහාන් පීරිස් තානාපතිතුමා, නියෝජ්‍ය තානාපති සුගීෂ්වර මැතිතුමා ඇතුළු අය මේ වෙනුවෙන් විශාල වෙහෙසක් ගත්තා. ඒ සැසි වාරයට සභාපතිවරයා වශයෙන් යනකොට මේ මූලික අයිතිවාසිකම් ටික තහවුරු වෙලා තිබුණේ නැත්නම් බරපතළ ප්‍රශ්නයක් වෙනවා. ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, පාර්ලිමේන්තුවෙන් මේක පටන් ගන්න, පාර්ලිමේන්තුවෙන් මේ සියයට 3 සහතික කරලා දෙන්න කියලා, රාජ්‍ය අංශයට යන්න ඉස්සර වෙලා. ඒක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ඒ පළමුවැනි අතුරු ප්‍රශ්නය ඔබතුමාටයි යොමු කර තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා, කරන්න පුළුවන් දේ මොකක්ද කියලා බලන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමාගේම සංඛ්‍යාලේඛන අනුව, 2012 අවසාන සංගණනය අනුව 1,548,000ක් කිසිදු අධ්‍යාපන කටයුත්තක නිරත වෙලා නැහැ. මම ස්තුතිවන්ත වෙනවා, ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට. ආබාධ සහිත වූවන් සඳහා වන පාර්ලිමේන්තු සංසදය විධියට අපි - මධුර විතානගේ මන්ත්‍රීතුමාත් එදා එයට සහභාගි වුණා - දැන් සති දෙකකට පෙර ආබාධ සහිත පුද්ගල සංවිධානත් පාර්ලිමේන්තුවට ගෙන්වලා එතුමා එක්ක ඉතා ඵලදායී සාකච්ඡාවක් කළා, ගරු කථානායකතුමනි. ඒ සාකච්ඡාවේ අවසන් ප්‍රතිඵලය විධියට ගරු ඇමතිතුමනි, මට මතක විධියට ජූලි මාසයේ 2 වැනිදා ඉසුරුපායේදී ඒ සියලු පාර්ශ්ව එකතු වෙලා සාකච්ඡා කරලා අවසන් තීන්දුවක් ගනිමු කියලා තීන්දු කළා. කිසිදු අධ්‍යාපනයක් නොලබන ප්‍රතිශතය බැලුවොත් ඉතාම බරපතළ තත්ත්වයක් තිබෙන්නේ. ප්‍රාථමික අධ්‍යාපනය ලබන්නේ දරුවන් දෙදහස් ගණනක් විතරයි. ඒක අධ්‍යාපන අමාත්‍යාංශයේ වරදක් කියලා නොවෙයි මම මේ කියන්නේ. ගරු ඇමතිතුමනි, අපි එදා සාකච්ඡා කළ පරිදිම විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය පදනම් වෙලා තිබෙන්නේ 1961 තරම් ආදි කාලයේ වූ පනතක් හරහා. එදා ඔබතුමා ඉතා ගෞරවයෙන් පිළිගත්තා සහ

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

ඒකට අවශ්‍ය මූලික තීන්දු තීරණත් ගත්තා, ඒ පනත යාවත්කාලීන කරන්න ඕනෑය කියලා. ඒක තමයි ආරම්භය වෙන්නට ඕනෑ. ඒ නිසා ආබාධ සහිත පුද්ගලයන්ගේ අනාගතය පිළිබඳව ගත යුතු පළමු තීන්දුව තමයි ඔවුන්ට විධිමත් අධ්‍යාපනයක් ලබා ගැනීම සඳහා ප්‍රවේශය ලබා දීම; ඩිජිටල් ප්‍රවේශය ලබා දීම; භෞතික ප්‍රවේශය ලබා දීම. ඒ නිසා අන්න ඒ පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒක නොකර ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ආබාධ සහිත පුද්ගලයන්ගේ අනාගතය වෙනුවෙන් ගනු ලබන කිසිදු තීන්දුවක් යුක්ති සහගත වෙන්නේ නැහැ; ප්‍රායෝගිකව සාර්ථක වෙන්නේ නැහැ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ මට තවත් ප්‍රශ්නයකටත් අද දිනයේ පිළිතුරු දෙන්න තිබෙනවා. ඒ ආශ්‍රයෙන් නම් තොරතුරු ලබාගෙන තිබෙනවා. කෙසේ වෙතත්, දැනට ආබාධ සහිත, පාසල් යන වයසේ දරුවන් 11,707දෙනෙක් ඉන්නවා, අපට ආපු ඒවායේ. ඒ කියන්නේ, රජයේ උපකෘත විශේෂ පාසල්වල, විශේෂ අධ්‍යාපන ඒකකවල, රජයේ විශේෂ පාසල්වල. හැබැයි, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන එක හරි. මම දැන් මේ දිනවල සංඛ්‍යාලේඛන සකස් කරගෙන යනවා, පාසල්ගත වන දරුවන්ගේ සංඛ්‍යාව සම්බන්ධයෙන්. උදාහරණයක් වශයෙන් 2023 වසරේ පාසල්ගත වූ, 1 ශ්‍රේණියට ඇතුළත් වූ දරුවන් සංඛ්‍යාව 287,000යි. හැබැයි, මීට අවුරුදු 10කට කලින් ඒක 330,000 මට්ටමේ තිබුණේ. ඒ වාගේම ඊයේ මම දැක්කා ප්‍රවෘත්තියක්, ප්‍රසව හා නාරීවේදය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙක් කිව්වා, පසුගිය කාලයේ උපත් සංඛ්‍යාව විශාල ප්‍රමාණයකින් අඩු වෙලා තිබෙනවාය කියලා. අපි දැන් ඒ අගයන් දෙක සසඳාගෙන යනවා. සාමාන්‍යයෙන් ගත්තොත්, සියයට යම් ප්‍රතිශතයක් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ඉපදෙනවා. හැබැයි, එතැන හඳුනා ගන්නා ප්‍රමාණයට වඩා හඳුනා නොගන්නා ප්‍රමාණයක් ඉන්නවා. ඒ වාගේම හඳුනා ගත්තත්, අර මම කියපු වර්ගයේ පාසල්වලට ඇතුළත් වෙන ප්‍රමාණයට අමතරව නිවාසවලත් පිරිසක් ඉන්නවා. ඒක බරපතළ ප්‍රශ්නයක්. ඒ පවුලට ප්‍රශ්නයක්; මුළු සමාජයටම ගැටලුවක්. මම මේ පිළිබඳව පූර්ව ළමා අවධි සංවර්ධනය කියන විෂයටත් එකතු කරලා තිබෙනවා, ඒ ගුරුවරුන්ටත් ඒ අයගේ පුහුණුවේදී ඒ තත්ත්වය හඳුනා ගැනීමේ දැනුම ලබා දෙන්න ඕනෑ නිසා. දැන් අපේ programme එක හදලා ඉවරයි පෙර පාසල් ගුරුවරියන් සඳහා. ඒ programme එකටත් මේක ඇතුළත් කරනවා.

ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, ග්‍රාම නිලධාරි වසම් පදනමෙන්, එහෙම නැත්නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ MOH කාර්යාල මට්ටමෙන් මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් කරන්න. මේකට සමානුපාත වෙනවා, අපේ අධ්‍යාපන පරිපාලන සැලැස්ම. අපි දැන් එය අනුමත කරලා තිබෙනවා; ඒක දැන් හදාගෙන යන්නේ. එතකොට ඒ මට්ටමෙන් උපතේ ඉඳලාම හඳුනා ගන්න පුළුවන්, විශේෂ අවශ්‍යතා තිබෙන දරුවන් කවුද කියලා. ඒක හඳුනා ගන්නකල් ඔබතුමා ඔය කියන ප්‍රශ්නය වෙනුවෙන් සෘජුව ප්‍රවේශ වෙන්න බැහැ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, ඇමතිතුමාගේ පැහැදිලි කිරීමට මම යමක් එකතු කරන්න ඕනෑ. ලංකාවේ 2012 අවසාන සංගණනය යටතේ ගත්තත්, මේ මොහොතේ ගත්තත් දකින කාරණයක් තිබෙනවා. ආබාධ සහිත වූවන් සඳහා වන පාර්ලිමේන්තු සංසදය විධියට අපි කිලිනොච්චි දිස්ත්‍රික්කයට ගියා; ඔබතුමා දන්නවා. අපි නුවරඑළිය දිස්ත්‍රික්කයටත් ගියා. ඔබතුමාගේ අනුග්‍රහයෙන් මාතර දිස්ත්‍රික්කයෙන් පටන් ගත්තා. ගරු ඇමතිතුමනි, ලොකුම බෙදවාචකය තමයි 2012 සංගණනය යටතේ බැලුවොත්, ආබාධ සහිත ප්‍රජාව වැඩිම දිස්ත්‍රික්කය තමයි නුවරඑළිය දිස්ත්‍රික්කය. වර්තමාන තොරතුරු යටතේ ආබාධ සහිත වැඩිම ප්‍රජාවක් ඉන්නේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ. හැබැයි අවාසනාව තමයි, රජයේ අනුග්‍රහය ලබන උපකෘත ගණයේ කිසිදු පාසලක් ඒ දිස්ත්‍රික්ක දෙක තුළම නොමැති වීම. උතුරු පළාතේ දිස්ත්‍රික්ක පහ තුළම තිබෙන්නේ එකම පාසලයි. ඒ, කයිතඩිවල තිබෙන පාසල විතරයි, ගරු ඇමතිතුමනි.

එය බරපතළ බෙදවාචකයක්. ඒ නිසා අදාළ තීන්දු ගැනීම ප්‍රමාද කරන්නේ නැතුව, සියලු භේදවලින් මිදිලා, පාර්ලිමේන්තුව විධියට ඒ කටයුත්ත සඳහා ප්‍රවේශ වන්නට අපි සූදානමින් ඉන්නවා. ජූලි 02වන දා ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන සාකච්ඡාවේදී අවසන් තීන්දු ගන්න පුළුවන්කමක් ලැබෙයි. විශේෂයෙන් මේ පනත සංශෝධනය කිරීම සඳහා අවස්ථාව ලැබෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒ සඳහා අපේ අමාත්‍යාංශය කටයුතු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5, ගරු ගයන්ත කරුණාතිලක මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු ගාමිණි වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු කථානායකතුමනි-[බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, මොකක්ද point of Order එක?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මේ සාකච්ඡාව යන අවස්ථාවේ පාර්ලිමේන්තුවෙන් අපට ලබා දුන්නා, ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව. විශේෂයෙන්ම උඩපළාත ප්‍රාදේශීය ලේකම්වරියගේ ක්‍රියා කලාපය පිළිබඳව තමයි මේ වාර්තාවේ සඳහන්ව තිබෙන්නේ. මෙහිදී මම විශේෂ කාරණයක් මතක් කරන්නට කැමැතියි. ගරු කථානායකතුමනි, රජය සතු දේපළක් පවරා ගැනීම පිළිබඳව උඩපළාත ප්‍රාදේශීය ලේකම්වරිය විසින් නීත්‍යානුකූලව කටයුතු කිරීමක් කෙරුණා. පළමුවෙන්ම ඒ ප්‍රාදේශීය ලේකම්වරිය සංචිතයට මාරු කළා. ඊට පසුව ඇය නිවැරැදි බව තහවුරු වීමෙන් පසු සේවය කළ ස්ථානයේම ආපසු සේවයේ පිහිටුවන්නට කටයුතු කළා. කූට ලේඛන උපයෝගී කර ගනිමින් රජය සතු දේපළක් තම පෞද්ගලික පරිහරණයට යොදා ගැනීමට ක්‍රියා කළ පිරිස් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීම නිසා තමයි එතුමියට

මෙවැන්නක් අත් විඳින්නට සිදු වුණේ. ඇත්ත වශයෙන්ම එතුමියට විරුද්ධව සාධාරණ පරීක්ෂණයක් සිදු කරලා නැහැ. මම එතුමියගේ පාර්ශ්වයෙන් කරුණු අධ්‍යයනය කළා. විශේෂයෙන්ම ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ ක්‍රියා කලාපය පිළිබඳවත් ගැටලුවක් තිබෙනවා. ඒ මන්ද කියතොත්, විශේෂයෙන්ම ඒ චෝදනා ලබා හිටපු මහජන නියෝජිතයාත් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට ගෙන්වා ඒ පරීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී, ඒ ක්‍රමවේදය විධිමත්ව ක්‍රියාත්මක වුණේ නැහැ කියන චෝදනාව තිබෙනවා. ඒ වාගේම ඒ ප්‍රාදේශීය ලේකම්තුමියට සාධාරණ සවන් දීමක් - hearing එකක් - සිදු වෙලා නැහැ. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. ඇත්ත වශයෙන් රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් අපි මීට වඩා ප්‍රශස්ත, වැදගත් ක්‍රමවේදයක්, විනිවිදභාවයෙන් යුක්ත වූ ක්‍රමවේදයක් අනුගමනය කරන්නට ඕනෑ. ඒ නිසා සිදු කරන පරීක්ෂණ සාධාරණ පරීක්ෂණ වෙන්නට ඕනෑ. ඒක පාර්ශ්වීය පරීක්ෂණ ක්‍රියාත්මක කරලා, වාර්තා හදලා අපේ රටේ රාජ්‍ය සේවය ශක්තිමත් කරන්නට බැහැ. ඒ නිසා මම මේ අවස්ථාවේ අපේ ගරු සභානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර ඒ ප්‍රාදේශීය ලේකම්තුමියගේ හඬටත් ඉඩ ලබා දීලා එතුමිය සම්බන්ධයෙන් සාධාරණ පරීක්ෂණයක් පවත්වන්නට කටයුතු කරන්න කියලා.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් මටත් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මට පොඩි වෙලාවක් දෙන්න.

ගරු ඇමතිතුමනි, අපි දන්නවා මේ වන කොට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අනධ්‍යයන සේවකයන් 17,000ක් විතර වැඩ වර්ජනයක් ක්‍රියාත්මක කරන බව. පසුගිය දවස්වල ඔබතුමා විශාල වශයෙන් මැදිහත්වීමක් -සෘජු මැදිහත්වීමක්- කරලා ඒ ප්‍රශ්නය නිරාකරණය කිරීමට කටයුතු විශාල ප්‍රමාණයක් කළා. නමුත් තවම ප්‍රශ්නය විසඳිලා නැහැ. ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය නොවිසඳීම තුළ අපේ රටේ ශිෂ්‍යයන්ට ජපානය, කොරියාව, ඉන්දියාව, ඇමෙරිකාව, එංගලන්තය ආදි රටවලින් ලබා දෙන ශිෂ්‍යත්වවලට පසුගිය කාලයේදී දහස් සංඛ්‍යාත ළමයින් සංඛ්‍යාවකට ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ගන්න බැරි වුණා. ඒ වාගේම පර්යේෂණ කටයුතු කිරීම, පර්යේෂණ කෘති එළි දැක්වීම, ජාත්‍යන්තර තරගකාරී විභාගවලට ළමයින් සූදානම් කිරීම සහ ඉදිරිපත් කිරීම, theses ලබා දීම, ආචාර්ය උපාධිය හදාරපු අයගේ වාර්තා ඉදිරිපත් කිරීම ද ඇතුළුව වාර්තා ඉදිරිපත් කිරීම ආදි කාරණාවලට අදාළ කටයුතුවල විශාල අඩපණ වීමක් සිදු වෙලා තිබෙනවා, මේ නිසා. ගරු ඇමතිතුමනි, එම සේවකයන්ගේ ප්‍රශ්නය විසඳීමට ඔබතුමා විශාල ප්‍රයත්නයක් ගත්තත්, මුදල් අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් සෘජු මැදිහත්වීමක් සිදු කරලා මේ ප්‍රශ්නය නොවිසඳන තත්ත්වයක් තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් අහනවා, මෙම ගැටලු විසඳන්නේ කවදාද කියලා.

ඒ වාගේම, අභ්‍යන්තර ශිෂ්‍යයින් ලක්ෂ එකහමාරකගේ විතර අධ්‍යාපනය සියයට 50ක විතර මට්ටමින් කඩාකප්පල් වෙලා නියමිත කාලයේදී විභාගය පවත්වන්න සහ ප්‍රතිඵල ලබා දෙන්න බැරි තත්ත්වයකුත් අද වන කොට ඇති වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඉක්මනින් කියන්න.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු කථානායකතුමනි, මේක වැදගත් ප්‍රශ්නයක්.

පසුගිය දවස්වල අ.පොස. උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් වුණා. ඒ අනුව විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීමට ඉල්ලුම් පත්‍ර කැඳවා තිබෙනවා. ඒ අනුව ළමයින් 40,000ක් බඳවා ගන්න සූදානමින් ඉන්නවා. වයස අවුරුදු 21, 22 වන කොට උපාධිය ලබා ගන්නා මට්ටමට ලංකාවේ අධ්‍යාපන ක්‍රමය ගෙනෙන්න කටයුතු සූදානම් කරමින් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය ඔක්කොම ඇත්ත. ඉක්මනට ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
මට පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වන්නේ, මේ අනධ්‍යයන සේවකයන්ගේ ගැටලුව නිරාකරණය කර ගන්න මුදල් අමාත්‍යාංශය හරහා ගරු අධ්‍යාපන ඇමතිතුමා සිදු කරන මැදිහත්වීම මොකක්ද කියන එකයි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු සභානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අන්න, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාත් නැඟී සිටිනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම උසස් අධ්‍යාපන ඇමති හැටියට කටයුතු කරද්දී අනධ්‍යයන සේවකයන් ඉල්ලපු දීමනාවෙන් සියයට 45ක් ලබා දුන්නා. ඉතිරි මුදල දෙන්න කැබිනට් පත්‍රිකාවකුත් ඉදිරිපත් කර තිබුණා. නමුත් ආණ්ඩුව බංකොලොත් වුණු නිසා එම කටයුත්ත කර ගන්න බැරි වුණා. අපි දන්නවා, ගරු අධ්‍යාපන අමාත්‍යතුමා ඒ ඉතිරි මුදල ගෙවන්න උත්සාහයක් ගන්නවා කියලා. ඊයේ පේරාදෙණිය මල්වත්ත ළඟ අනධ්‍යයන සේවකයන් තුන්හාරදහසක් පමණ විරෝධතා ව්‍යාපාරයක් පැවැත්වූවා. එය television එකේත් පෙන්නුවා. ගරු අමාත්‍යතුමා ඒ වෙනුවෙන් උත්සාහයක් ගන්නවා. නමුත් මෙතැනදී වෙලා තිබෙන්නේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙන්න සිටින ළමයින්ට ප්‍රමාදයක් වන එකයි. මගේ කාර්ය මණ්ඩලයේ කෙනෙක් මට කථා කරලා කිව්වා, තමාගේ දියණියගේ විභාග ප්‍රතිඵල ඇවිත් දැනට අවුරුද්දක් වන නමුත් ඇයට තවම විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙන්න බැරි වුණා කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අධ්‍යයන සහ අනධ්‍යයන කියන අංශ දෙකේම වැටුප් විෂමතාව ඉවත් කරන්න 2018දී දීමනාවක් ලබා දුන්නා. අධ්‍යයන අංශයේ මහාචාර්යවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්ගේ වැටුප් විෂමතාව ඉවත් කරන්න සියයට 107කින් වැටුප් වැඩිවීමක් ලබා දුන්නා. අනධ්‍යයන අංශයට දුන්නේ සියයට 85යි. එතකොට ඒ දෙක අතර පරතරය වන සියයට 15 දෙන්න කියලා තමයි මේ අය කියන්නේ. එදා ඉඳලා අද දක්වා අවුරුදු හයක් තිස්සේ මේ ගැටලුව තිබෙනවා. මේ සම්බන්ධව ත්‍රිපාර්ශ්වීය සමිති එක්ක සාකච්ඡා කරලා, එකඟතාවකට ආවා. මෙවර අය වැයෙන් ප්‍රතිපාදන හදලා නැති නිසා ඊළඟ අය

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

වැයට ඉදිරිපත් කරලා එය ජනවාරි සිට ක්‍රියාත්මක වන මට්ටමේ තමයි තිබුණේ. ඒ අතරතුර විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට දීමනාව සියයට 25ක් වැඩි කළා. එම දීමනාව වැඩි කළාම, දෙවැනි demand එක දැම්මා, අනධ්‍යයන කාර්ය මණ්ඩලයටත් සියයට 25කින් වැඩි කරන්න කියලා. අලුතින් ප්‍රතිපාදන වෙන් කරලා නැහැ. එහෙම නම්, අප ඉතිරි කරගත් මුදලකින් තමයි ගෙවීම් කරන්න තිබෙන්නේ. විශ්වවිද්‍යාල මට්ටමින් එක එක විශ්වවිද්‍යාල earned funds, ඒ කියන්නේ උපයා ගත් අරමුදල්වලින් ගෙවනවාට තව පිරිසක් විරුද්ධයි. ඒ නිසා ඒ මුදල පිළිබඳව ප්‍රශ්නයකුත් තිබුණා. ඊට අමතරව, කුමන දීමනාවක් දුන්නත්, භාණ්ඩාගාරයේ අනුමැතිය අවශ්‍යයි. මම අමාත්‍ය මණ්ඩල සන්දේශ දෙකක් ඉදිරිපත් කළා; සාකච්ඡා වට ගණනාවක් පැවැත්වුවා. ඒ ඔක්කොම කරලා තිබෙන්නේ. ඒ අතරතුර තමයි දැනට සතියකට පමණ පෙර අමාත්‍ය මණ්ඩලයෙන් විශේෂ කමිටුවක් පත් කළේ. මොකද, එක කණ්ඩායමක විෂමතාව ඉවත් කරන කොට, තවත් කණ්ඩායමක විෂමතාවක් ඇති වෙනවා. එතකොට හුදෙකලාව එක ප්‍රශ්නයක් අරගෙන විසඳන්න බැරි තැනකට තමයි මෙය ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි ඉල්ලීමක් කළා, "කරුණාකරලා වැඩට එන්න. අර කමිටුවට අපේ සහයෝගයත් දෙන්නම්. ඔයගොල්ලන්ගේත් සහයෝගය දෙන්න. ඒකට යෝජනා ඉදිරිපත් කරලා ප්‍රශ්නය විසඳා ගනිමු" කියලා. *[බාධා කිරීමක්]* ඔව්. අද දවස තුළ -මේ වෙලාවේත්- යම් යම් ව්‍යක්තීය සමිති UGC එකත් එක්ක සාකච්ඡාවක නිරත වෙමින් සිටිනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

රජයට මුදල් නැත්නම් අඩු ගණනේ ලිඛිත පොරොන්දුවක් හෝ දෙන්න කෝ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

අපි ලැහැස්තියි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ලිඛිතව දෙන්න. එතකොට ඒ අය වැඩට එයි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන එක හරි. අපි UGC Chairmanට දැනුම් දුන්නා, අද තිබෙන සාකච්ඡාවලදී අපි ලිඛිතව road map එක දෙන්න ලැහැස්තියි, ඒකට එකඟ වෙලා එන්න, එහෙම ආපු ගමන් වැටුප් ගෙවන්නම් කියලා. මොකද, මාස එකහමාරක් තිස්සේ ඔවුන්ට වැටුප් නැහැ. එම වැටුප් පවා ගෙවන්න අප සූදානම් කියන පණිවුඩය අද ලබා දුන්නා. අදත් -මේ වෙලාවේත්- සාකච්ඡාවක් පවත්වනවා. අපි බලමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, 5වැනි ප්‍රශ්නය අහන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු කථානායකතුමනි, දැන් වෙලාව පෙර වරු 11.45යි. තවම අපි ඉන්නේ 5වැනි ප්‍රශ්නයේ. ගරු සභානායකතුමනි, මම ඉල්ලා සිටිනවා දිවා ආහාර විවේකය සඳහා තිබෙන වෙලාවත් විවාදයට ලබා දෙන්න කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි,දිවා ආහාර විවේකයෙන් තොරව සභාවේ කටයුතු පවත්වාගෙන යමු. මොකද, සෑහෙන වෙලාවක් ගත වෙලා තිබෙන නිසා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දිවා ආහාර විවේකය සඳහා තිබෙන වෙලාවත් විවාදය සඳහා යොදා ගැනීමට සභාවේ එකඟතාව ලබා ගැනීමට අවශ්‍යයි. ඒ සඳහා සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye

2015-2020 දක්වා ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය සඳහා කර ඇති ඉල්ලුම්: විස්තර

2015-2020 வரை இலங்கையில் இரட்டைக் குடியுரிமைக்கான விண்ணப்பங்கள் : விபரம்

APPLICATIONS FOR DUAL CITIZENSHIP IN SRI LANKA FROM 2015-2020: DETAILS

368/2024

5. ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා ඉල්ලුම්කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ අතරින් ද්විත්ව පුරවැසිභාවය ලබා දී ඇති සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ද්විත්ව පුරවැසිභාවය සඳහා ඉල්ලුම් කරන ලද දිනයේ සිට ක්‍රියාවලිය සම්පූර්ණ වීම සඳහා නිශ්චිත කාලයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පොදුමක්කළ් පාදුකාප්පු අමෛච්චරෙක් කේට්ට විනා:

(அ) (i) 2015 தொடக்கம் 2020ஆம் ஆண்டு வரை இலங்கையில் இரட்டைப் பிரசாவுரிமை பெறுவதற்காக விண்ணப்பித்த நபர்களின் எண்ணிக்கை ஒவ்வோர் ஆண்டுவாரியாக தனித்தனியாக யாது என்பதையும்;

(ii) அவர்களில் இரட்டைப் பிரசாவுரிமை வழங்கப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை ஒவ்வோர் ஆண்டுவாரியாகத் தனித்தனியாக யாது என்பதையும்;

(iii) இரட்டைப் பிரசாவுரிமை பெறுவதற்கு விண்ணப்பித்த திகதியிலிருந்து அதனை வழங்குதல் வரையான செயன்முறைக்கு நிர்ணயிக்கப்பட்ட ஒரு காலப்பகுதி உண்டா என்பதையும்;

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security:

(a) Will he inform this House -

(i) separately, the number of persons who had applied for dual citizenship in Sri Lanka each year, from year 2015 to year 2020;

(ii) separately, the number of persons who have been granted dual citizenship; and

(iii) whether there is a specific time period for the entire process from applying for dual citizenship and it being granted?

(b) If not, why?

ගරු විරාන් අලස් මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)
(மாண்புமிகு டிரான் அலஸ் - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Tiran Alles - Minister of Public Security)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

වර්ෂය	පුද්ගලයන් සංඛ්‍යාව
2015	17,126
2016	14,802
2017	9,549
2018	9,750
2019	8,702
2020	3,988
එකතුව	63,917

(ii)

වර්ෂය	පුද්ගලයන් සංඛ්‍යාව
2015	16,184
2016	13,933
2017	8,881
2018	8,747
2019	7,405
2020	3,154
එකතුව	58,304

(iii) නැත.

(ආ) පැන නොනඟී.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ද්විත්ව පුරවැසිභාවය ඉල්ලුම් කළ ප්‍රමාණය හා ද්විත්ව පුරවැසිභාවය ලබා ගත් ප්‍රමාණය ගැන ලබා දුන් පිළිතුරට මම ස්තුතිවන්ත වනවා, ගරු ඇමතිතුමනි. මගේ අතුරු ප්‍රශ්නය මෙයයි. සාමාන්‍යයෙන් විදේශ ගමන් බලපත්‍රයක් ඉල්ලුම් කරනකොට රුපියල් 10,000ක් විතර ගෙවනවා. නිශ්චිත කාලයක් තුළ ඒ ගමන් බලපත්‍රය ලැබෙනවා කියලා තමයි කියන්නේ. නමුත්, සමහරුන්ගේ චෝදනාවක් තිබෙනවා මාසයක් විතර බලාගෙන ඉඳලා ගිහිල්ලා විමසුවාට පස්සේ තමයි passport එක සකස් කරලා දෙන්නේ කියලා. නොවැම්බර් මාසයේ ඉඳලා passport හිඟයක් තිබෙන නිසා මේ තත්ත්වය තිබෙනවා කියලා දැනගන්න තිබෙනවා. ඒ ගැන ඔබතුමා පොඩ්ඩක් සොයා බැලීමක් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. අපි දන්නවා, මාර්ගගත - online - ක්‍රමයට passports නිකුත් කිරීමක් ඔබතුමන්ලා පසුගිය අවුරුද්දේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උත්සවශ්‍රීයෙන් පටන් ගත් බව. එතැනදී කිව්වා, online ක්‍රමයට passport එකක් ඉල්ලුම් කළාම one-day service එක දින තුනකිනුත්, අනෙක් passports - සාමාන්‍ය විදේශ ගමන් බලපත්‍ර - දින 14කිනුත් නිවසට ලැබෙනවා කියලා. නමුත්, අද වෙනකොට බලාගෙන ඉඳලා, ඉඳලා විමසීම් කරන්න ගියොත් විතරයි ලු online ක්‍රමයට ඉල්ලපු passports සකස් වෙන්නේ. මේ පිළිබඳවත් සොයා බලන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු විරාන් අලස් මහතා
(மாண்புமிகு டிரான் அலஸ்)
(The Hon. Tiran Alles)
ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්නේ ද්විත්ව පුරවැසිභාවය ගැන ද, passports ගැන ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ද්විත්ව පුරවැසිභාවය ඉල්ලුම්කරපු අය ගැන නේ මගේ මුල් ප්‍රශ්නයෙන් ඇහුවේ. ඔබතුමාට අදාළ නිසායි මම මේ කාරණයත් ඇහුවේ. passports ලබා ගන්න ගියාම,- *[බාධා කිරීමක්]* සාමාන්‍ය passport එකක් රුපියල් 10,000ක් දීලා ඉල්ලුම් කළාට එය නියමිත වෙලාවට ලැබෙන්නේ නැහැ. මාසයක් විතර ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් විමසීම් කළාට පස්සේ තමයි සමහර අයට passport එක සකස් කරන්නේ.

ගරු විරාන් අලස් මහතා
(மாண்புமிகு டிரான் அலஸ்)
(The Hon. Tiran Alles)
නැහැ. ඒක වැරදියි. Online ක්‍රමය යටතේ නිකුත් කරන ඒවා ගැන නේ ඔබතුමා කියන්නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මම අහන්නේ සාමාන්‍ය විධියට ගන්න passport එක ගැන, ගරු ඇමතිතුමනි. ඊළඟට, මම ඇහුවා online ක්‍රමයට ඔබතුමන්ලා ප්‍රාදේශීය ලේකම් කාර්යාල,-

ගරු විරාන් අලස් මහතා
(மாண்புமிகு டிரான் அலஸ்)
(The Hon. Tiran Alles)
සාමාන්‍ය විධියට passport එක ගන්නකොට එතැනට ඇවිල්ලා සල්ලි බඳින්න ඕනෑ. One-day service නම් 20,000ක් ගෙව්වාම එදාම passport එක හම්බ වෙනවා. නැත්නම් සති දෙක තුනක් ඇතුළත දී හම්බ වෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
Online ක්‍රමයටද?

ගරු ටිරාන් අලස් මහතා
(மாண்புமிகு டிரான் அலஸ்)
(The Hon. Tiran Alles)
නැහැ, මම කියන්නේ online ක්‍රමය ගැන නොවෙයි. ඔබතුමා ඉස්සරවෙලා ඇහුවේ, ඇවිල්ලා application එක භාර දීලා සල්ලි බැඳලා passport එක ඉල්ලන එක ගැන නේ.

ඊළඟට, online ක්‍රමයේ දී දවස් තුනේ එක තිබෙනවා, දවස් පහළොවේ එක තිබෙනවා. මේ online ක්‍රමයේදී සමහර අවස්ථාවල ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ online ක්‍රමයට application එක දාලා මේ ගොල්ලන් සල්ලි ගෙවලා තිබුණාට සමහර විට දීලා තිබෙන telephone number එකට අපිට ආපහු ඒ ගොල්ලන්ට කථා කරන්න බැහැ. මොකද, ඔවුන් දීලා තිබෙන සමහර දත්ත වැරදියි. එතකොට අපිට ඒ ගොල්ලන්ව contact කරලා කථා කරලා ඒක හදන්න වෙනවා. සමහර වෙලාවට ඒ දීලා තිබෙන telephone numbers answer කරන්නේ නැහැ. සමහර වෙලාවට දීලා තිබෙන email address එකට email එක යැව්වාට email එක බලලා නැහැ. අන්න, ඒ වාගේ තත්ත්වවල දී පරක්කු වෙන අවස්ථා තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ඒ ගැන චෝදනා තිබෙන නිසා ඒ සම්බන්ධයෙන් නිශ්චිත වැඩ පිළිවෙළක් හදන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා අහනවා.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමනි, ඔබතුමා යටතේ පවතින ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රශ්නය තිබෙන්නේ, passports නිකුත් කිරීම සම්බන්ධවයි. පසුගිය කොවිඩ් අර්බුදයත් එක්ක ඒ සම්බන්ධයෙන් විශාල තදබදයක් තිබුණා.

ඔබතුමාගේ මැදිහත් වීමෙන් සහ online ක්‍රමය සහ වෙනත් ක්‍රමවේද තුළ ඒක යම් ප්‍රමාණයකට සාර්ථකව අඩු කරලා තිබෙනවා. නමුත්, මේ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල -දකුණු පළාතේ විතරක් නොවෙයි, විශේෂයෙන්ම මොනරාගල ඇතුළු ප්‍රදේශවල තිබෙන කාර්යාලවලත්- ප්‍රශ්න තිබෙනවා. මෙහිදී මාතර ප්‍රාදේශීය කාර්යාලයේ පසුගිය කාල සීමාව තුළ ප්‍රශ්න රාශියක් ඇති වී තිබෙන බව ඔබතුමා දන්නවා. කොළඹ කාර්යාලයට ඇවිල්ලා උදේ passport එකට අදාළ තොරතුරු භාරදීලා, හවස SMS එක එනකල් මොකක් හෝ වෙන වැඩක් කරන්න කොළඹ එන කෙනාට අවකාශ තිබෙනවා. නමුත්, මාතර කාර්යාලයේ පවතින බරපතළ ප්‍රශ්න ප්‍රමාණයක් පිළිබඳව පසුගිය කාලයේ අපි දිගින් දිගටම අදාළ තැන්වලට කථා කළා, ගරු ඇමතිතුමනි. මේ පිළිබඳව අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී සහ ඔබතුමාටත් කියන්න අපි උත්සාහ කළා. මේ කාර්යාලයේ තිබෙන තදබදය පිළිබඳව ඔබතුමාත් දන්නවා, ගරු කථානායකතුමනි. මිනිස්සුන් ඉතාම පීඩාවට පත් වෙනවා, මේ නිසා. මිනිස්සුන්ට ඉන්න තැනක්, waiting area එකක් නැහැ. ඒ පවතින ක්‍රමවේදය තුළ ප්‍රශ්න ගණනාවක් නිර්මාණය වෙලා තිබෙනවා. කොළඹ කාර්යාලයේ වාගේම ජාවාරමක් නිර්මාණය වෙමින් තිබෙනවා, මේ ස්ථානයේත්. අමාත්‍යාංශය සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සාකච්ඡා කරලා මේ කාර්යාලය ඉඩ පහසුකම් තිබෙන වෙනත් තැනකට ගෙනයන්න තීන්දු කරලා, ඒ සඳහා යම් ක්‍රියා මාර්ගයක් අරගෙන තිබුණා. නමුත් ඒක තවම ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ කටයුත්ත ක්‍රියාත්මක වෙනවාද කියන කාරණාව මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු ටිරාන් අලස් මහතා
(மாண்புமிகு டிரான் அலஸ்)
(The Hon. Tiran Alles)
අපට එවැනි කටයුතු කිහිපයක්ම ක්‍රියාත්මක කරන්න තිබෙනවා. සමහරවිට පවතින මුදල් ප්‍රශ්න නිසා අපට අලුත් තැන්වලට යන්න, ඒ තැන් අලුත්වැඩියා කරගන්න අමාරුයි. ඉතින්, අපි කොළඹ තිබුණු ප්‍රශ්නය විසඳුවා වාගේ හැකි ඉක්මනින් මාතර ප්‍රශ්නයත් විසඳන්න කටයුතු කරනවා.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු ඇමතිතුමනි, ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් ස්ථාන පවා තෝරාගෙන තිබෙනවා කියා මා දන්නවා. දැනටත් මේ කාර්යාලය පෞද්ගලික ගොඩනැඟිල්ලක තිබෙන්නේ. මේ පවතින මුදල් අර්බුදය තුළ වෙනත් ස්ථානයකට යෑම ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. ඒ වාගේම, අත් හැරපු රජයේ ගොඩනැඟිලි ගණනාවක් දැනටත් මාතර නගරයේ තිබෙනවා. විශේෂයෙන්ම අධිකරණ සංකීර්ණය වෙනත් තැනක ස්ථාපනය වීම තුළින් මෙන්ම තවත් අත් හැරපු රජයේ ගොඩනැඟිලි ගණනාවක් තිබෙනවා. මුදල් ප්‍රශ්නය නිසාවෙන් නම් වෙනත් තැනකට යන්නේ නැත්තේ, වෙන තැනකට යන්න අමාරුකම් තිබෙනවා නම් ගරු ඇමතිතුමනි, අමාත්‍ය මණ්ඩලය විසින් තීන්දුවක් අරගෙන ඉඩ පහසුකම් තිබෙන තැනක තාවකාලිකව හෝ මේ කාර්යාලය ස්ථාපිත කරන්න මැදිහත් වෙන්න කියන එක ගැන මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු ටිරාන් අලස් මහතා
(மாண்புமிகு டிரான் அலஸ்)
(The Hon. Tiran Alles)
හොඳයි, මම ඒ ගැන බලන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -371/2024- (2), ගරු නිරෝෂන් පෙරේරා මහතා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මට පොඩි කාරණයක් ඉදිරිපත් කරන්න තිබෙනවා. එය ඉතාම වැදගත් කාරණයක්. ගරු ඇමතිතුමනි, පසුගිය කාල වකවානුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අරමුදල් ලබා දීලා තිබුණේ නැහැ. අපි දිගින් දිගටම මේ ගැන කිව්වා. ඒ සම්බන්ධයෙන් විස්තර ඇතුළත් ලැයිස්තුවක් මා වෙත ලැබී තිබෙනවා. එම ලේඛනය මම **සභාගත*** කරනවා.

මේ ලැයිස්තුවේ සඳහන් සමහර මන්ත්‍රීවරුන්ට රුපියල් මිලියන 100ක් ලබා දීලා තිබෙනවා. ෆයිසාල් කාසිම් මැතිතුමාට රුපියල් මිලියන 100ක්, හරීස් මැතිතුමාට රුපියල් මිලියන 100ක්, ඉෂාක් රහුමාන් මැතිතුමාට රුපියල් මිලියන 100ක්, රිසාඩ් බදියුදීන් මැතිතුමාට රුපියල් මිලියන 84ක්, සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මැතිතුමාට රුපියල් මිලියන 100ක් ආදී වශයෙන් ලබා දී තිබෙනවා. මෙහෙම සලකන්නේ ඇයි දන්නේ නැහැ නේද? ගරු කථානායකතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් විධියටත් මම ඔබතුමාගෙන් මේ කාරණය ඇහුවා. මොකද, විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් කොටසක් තෝරාගෙන මෙහෙම රුපියල් මිලියන 100, 80, 60, 50 බැගින් දෙනකොට මොකක්ද තත්ත්වය? ඔබතුමා තමයි අපේ පාර්ලිමේන්තුවේ නායකයා. මම ඔබතුමාගෙන් ඉල්ලනවා, මෙහෙම දෙනවා නම් ඔක්කොටම දෙන්න කියන්න. ආණ්ඩුවට කත්අදින අයට රුපියල් මිලියන 50, 100 දීලා මේ කරන වැඩේ තේරුම මොකක්ද? ගරු කථානායකතුමනි, අපිත් ඡන්දයකින් ආවේ. විමධ්‍යගත අරමුදල් කියන්නේ මේ රටේ මිනිස්සුන්ට අයිති දෙයක්. අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඩක් කරන්න අපටත් විමධ්‍යගත අරමුදල් යටතේ මුදලක් ලබා දෙන්න ඕනෑ. ඒ මිනිස්සු අපෙන් අහනවා. විමධ්‍යගත අරමුදලින් සල්ලි ගන්න අපි ආණ්ඩුවට කඩේ යන්න ඕනෑද? මොකක්ද මේ නීතිය? ඒකයි මම කිව්වේ. අපේ නායකයා විධියට, මේ පාර්ලිමේන්තුව ආරක්ෂා කරන නායකයා විධියට ඔබතුමාගෙන් මම විශේෂයෙන් ඉල්ලනවා, කරුණාකර මේ ගැන ජනාධිපතිතුමා එක්ක කථා කරලා, මුදල් අමාත්‍යාංශයටත් කථා කරලා මේ මුදල සියලු දෙනාට ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ඒ කාරණයේදී මගේ පක්ෂයේ මන්ත්‍රීවරු තුන්දෙනෙකුගේ නම් කියැවුණා. පක්ෂ නායකවරු නොදැනුවත්ව මේ වාගේ දේවල් කරනකොට අන්තිමට අපට මේ මන්ත්‍රීවරුන්ටත් විනයානුකූලව පරීක්ෂණ සිදු කරන්න වෙයි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න ඉඩදෙන්න.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, වැදගත් ප්‍රශ්නයක් මේක. මමත් අවුරුදු 35ක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. හැම දාම අපි මේ විමධ්‍යගත අරමුදල් ගන්න කන්නලව් කළේ නැහැ.

අපට ඒක අනිවාර්යයෙන්ම හම්බ වුණා. එම නිසා, කථානායකතුමා හැටියට ඔබතුමා අප සියලු දෙනාටම එය ලබා දෙන්න කටයුතු කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ඉල්ලීම නේ දැන් කළේ. මම ඒ ඉල්ලීම යොමු කරන්නම්.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

නැහැ, නැහැ. ඔබතුමාට මේක කල් දමන්න බැහැ. ඔබතුමා හැම තිස්සේම කල් දානවා නේ. ඔබතුමා මේක ගැන තීරණයක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට තීරණයක් දෙන්න බැහැ නේ, මුදල් අමාත්‍යාංශයේ දේවල්වලට.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වැදගත් ප්‍රශ්නයක් ඉදිරිපත් කළේ. කොටසකට මේ මුදල් දීලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන අහලා බලන්නම්.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

මේක අල්ලස් දීමකට සමානයි නේ. මේක අල්ලස් දීමක්. කොටසකට දෙනවා; කොටසකට දෙන්නේ නැහැ. ඔබතුමා අපේ අයිතිවාසිකම ආරක්ෂා කරන්නේ නැහැ නේ. ඒක නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විමසා බලන්නම්. නමුත්, මුදල් අමාත්‍යාංශයේ දේවල්වලට මට, -

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

බලන්න දෙයක් නැහැ. තව මාස කිහිපයයි නේ තිබෙන්නේ. තව මාස කිහිපයයි තිබෙන්නේ. අද උදේත් කිහිප දෙනෙක් මට කථා කරලා ඇහුවා, මහනුවර දිස්ත්‍රික්කය වෙනුවෙන් විමධ්‍යගත අරමුදල් හම්බ වුණේ නැද්ද කියලා. මම කිව්වා, හම්බ වුණේ නැහැ කියලා. හැබැයි, අපේ දිස්ත්‍රික්කයේ සිටින විපක්ෂයේ

[ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

සමහර මන්ත්‍රීවරු මේ සල්ලි අරගෙන වැඩ කරනවා. සමහර උදවියට තැබෑරුම් ලයිසන් දීලා තිබෙනවා. මේක බෞද්ධ රටක් කියලා ලොකුවට කියනවා. ජනාධිපතිතුමා අද මේ සභාවේ දීත් බෞද්ධ ආගම ගැන කථා කළා. තැබෑරුම් ලයිසන් 500ක් දීලා තිබෙනවා. ජනාධිපතිතුමා අද උදේ මේ සභාවේ දී කථා කළා, බෞද්ධ ආගම ගැන. නමුත් ඡන්දයට වැඩ කරන අයට තැබෑරුම් ලයිසන් 500ක් දීලා තිබෙනවා. මෙතැන ඇවිල්ලා බෞද්ධ ආගම ගැන කථා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, දැන් අපි ඒ ප්‍රශ්නය ගැන දන්නවා නේ. ඒ ප්‍රශ්නය ගැන කථා කරන්නම්.

ප්‍රශ්න අංක 7, ගරු දයාසිරි ජයසේකර මහතා.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඇණවුම් කරන ඉන්ධන තොග ගොඩබෑම: විස්තර
இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்தால் கொள்வனவுக் கட்டளை விடுக்கப்படுகின்ற எரிபொருள் தரையிறக்கம்: விபரம்
UNLOADING OF FUEL STOCKS ORDERED BY CEYLON PETROLEUM CORPORATION: DETAILS

380/2024

7. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඇණවුම් කරනු ලබන ඉන්ධන තොග, ගොඩබාන ස්ථාන සහ ගොඩබාන ක්‍රමය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) නළ මඟින් ගොඩබාන්නේ නම්, ඒ සඳහා භාවිත කරනු ලබන නළ සංඛ්‍යාව කොපමණද;

(iii) එම නළ පද්ධතිය අකර්මණ්‍ය හෝ බාධා සහිත නම්, එය නවීකරණය කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර තිබේද;

(iv) එසේ නම්, ඇස්තමේන්තු මුදල කොපමණද;

(v) නළ පද්ධතියේ දෝෂ පවතින අවස්ථාවකදී ඉන්ධන නැවක් ගොඩබෑම සඳහා ගත වන දින සංඛ්‍යාව හා නළ පද්ධතිය කාර්යක්ෂමව පවතින අවස්ථාවකදී ඉන්ධන නැවක් ගොඩබෑම සඳහා ගත වන දින සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාව විසින් ඇණවුම් කරනු ලබන ඉන්ධන නැව් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉන්ධන නැවක් සඳහා ප්‍රමාද ගාස්තු ලෙස එක් දිනකට ගෙවිය යුතු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்தால் கொள்வனவுக் கட்டளை விடுக்கப்படுகின்ற எரிபொருள், தரையிறக்கப்படும் இடங்களும் தரையிறக்கப்படும் முறையும் தனித்தனியாக யாதென்பதையும்;

(ii) குழாய்கள்மூலம் தரையிறக்கப்படுமாயின், அதற்காகப் பயன்படுத்தப்படும் குழாய்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iii) மேற்படி குழாய்த் தொகுதி செயலிழந்து அல்லது அடைப்புகளைக் கொண்டதாக இருக்குமாயின், அதனை நவீனமயப்படுத்துவதற்கான மதிப் பீடுகள் தயாரிக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) ஆமெனில், மதிப்பீட்டுத் தொகை எவ்வளவென் பதையும்;

(v) குழாய்த் தொகுதியில் கோளாறுகள் உள்ள சந்தர்ப்பமொன்றில் எரிபொருளை கப்பலிலிருந்து தரையிறக்குவதற்காக எடுக்கப் படும் நாட்களின் எண்ணிக்கையும் குழாய்த் தொகுதி சிறப்பாகச் செயற்படும் சந்தர்ப் பமொன்றில் எரிபொருளை கப்பலிலிருந்து தரையிறக்குவதற்காக எடுக்கப்படும் நாட்களின் எண்ணிக்கையும் தனித்தனியாக எத்தனையென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கை சாதாரணமாக கொள்வனவுக் கட்டளை விடுக்கும் எரிபொருள் கப்பல்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) எரிபொருள் கப்பல் ஒன்றுக்கு தாமதக் கட்டணமாக ஒரு நாளைக்குச் செலுத்தவேண்டிய தொகை எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he inform this House -
  (i) the places where fuel stocks ordered by the Ceylon Petroleum Corporation are unloaded and the methods of unloading, separately;
  (ii) if unloading is carried out using pipes, how many pipes are used for the purpose;
  (iii) if the piping system is defunct or defective, whether estimates have been prepared to renovate it;
  (iv) if so, what the estimated amount is; and
  (v) the number of days spent for unloading a shipload of fuel when defects exist in the piping system and the number of days spent for it when the piping system is working efficiently?

(b) Will he also inform this House of the -
  (i) number of shiploads of fuel ordered by Sri Lanka usually; and
  (ii) amount that has to be paid as demurrage per day per fuel ship?

(c) If not, why?

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා (විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் - மின்சக்தி மற்றும் வலுசக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Indika Anuruddha Herath - State Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) මුතුරාජවෙල පර්යන්තය සඳහා SPBM - Single Point Bony Mooring - II නළ මාර්ග මඟින්.
කොළොන්නාව පර්යන්තය සඳහා DTB - Dolphin Tanker Berth - නළ මාර්ගය මඟින්.

(ii) මුතුරාජවෙල පර්යන්තයට නළ මාර්ග දෙකකි. (පෙට්‍රල් 92 හා ඔටෝ ඩීසල් සඳහා)
කොළොන්නාව පර්යන්තයට නළ මාර්ග තුනකි. (පෙට්‍රල්, ඩීසල්, Jet A-I/ Naphtha සඳහා නළ දෙකක් හා කළු/දැව් තෙල් - furnace oil - සඳහා එක් නළයක්.)

(iii) ඔව්.

(iv) ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 2,852කි.
ව්‍යාපෘතිය
කොළොන්නාවේ සිට කොළඹ සේරම් ගේට්ටුව දක්වා දැනට පවතින විෂ්කම්භය අහල් 10ක් සහිත නළ මාර්ගය, අහල් 18ක විෂ්කම්භය සහිත නව නළ මාර්ගයෙන් ප්‍රතිස්ථාපනය කිරීම හා දකුණු ජැටියේ සිට කොළඹ වරාය තුළට දිවෙන අහල් 10ක විෂ්කම්භය සහිත නළ මාර්ගය අහල් 12ක විෂ්කම්භය සහිත නල මාර්ගයක් ලෙසින් ප්‍රතිස්ථාපනය කිරීම.

(v) නළ පද්ධතිය කාර්යක්ෂම වන විට,

තෙල් වර්ගය	ගත වන කාලය
පිරිසිදු කළ සුදු තෙල් මෙට්‍රික් ටොන් 35,000 හා 40,000 අතර නැවක්	පැය 96 (දින 4)
කළුතෙල් - furnace oil - මෙට්‍රික් ටොන් 30,000ක නැවක්	පැය 120 (දින 5)
බොරතෙල් මෙට්‍රික් ටොන් 90,000ක නැවක්	පැය 36 (දින 3)

නළ පද්ධතියේ දෝෂයක් පවතින අවස්ථාවක ඉන්ධන නෞකාවක් ගොඩබෑම සඳහා ගත වන කාලය දෝෂයේ ස්වභාවය, ප්‍රමාණය හා එය යථා තත්ත්වයට පත් කිරීමට ගත වන කාලය ආදී කරුණු මත රඳා පවතී.

(ආ) (i) වසරකදී ඇණවුම් කරනු ලබන ඉන්ධන නැව් සංඛ්‍යාව එක් එක් වර්ෂයේදී ඉන්ධන සඳහා පවතින ඉල්ලුම මත රඳා පවතී. ඒ අනුව පසුගිය වසර පහ තුළ ශ්‍රී ලංකාව විසින් ඇණවුම් කරන ලද ඉන්ධන නැව් සංඛ්‍යාව පහත පරිදි වේ.

වර්ෂය	පිරිපහදු කළ ඉන්ධන නැව් සංඛ්‍යාව	බොර තෙල් නැව් සංඛ්‍යාව
2024 ජනවාරි සිට මැයි දක්වා	15	08
2023	53	18
2022	75	8
2021	100	13
2020	89	18
2019	94	20

තවද, 2024 වර්ෂයේ පළමු මාස 5 දක්වා පිරිපහදු කළ ඉන්ධන නැව් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩු වී ඇති අතර, එය ප්‍රධාන ලෙසම දෛනික ඩීසල් හා පෙට්‍රල් පරිභෝජනය පසුගිය වසරවලට වඩා අඩු වීම හේතු වී ඇති අතර එසේ පරිභෝජනය අඩු වීමට බලපෑ ප්‍රධාන සාධක අතර පසුගිය වර්ෂයේ අවසන් කාලයේ ජලාශ ප්‍රදේශවලට ලැබූ අධික වර්ෂාවත් සමගම ජල විදුලි නිෂ්පාදන ඉහළ යාමත් නිසා ලංකා විදුලිබල මණ්ඩලයේ ඩීසල් සඳහා වන ඉල්ලුම පහළ යෑමත්, ඉන්ධන මිල ගණන් ඉහළ යාම නිසා විවිධ කර්මාන්තශාලාවලින් තිබූ ඉල්ලුම අඩු වීම හා බනිජ තෙල් වෙළඳ පොළට නව තරඟකරුවන් පිවිසීමත් සමගම ලංකා බනිජ තෙල් සංස්ථාව සතුව පැවති වෙළඳ පොළින් කොටසක් නව තරඟකරුවන් අත්කර ගැනීම ආදී කරුණු හේතු වී ඇත.

(ii) එක් දිනයකදී ගෙවිය යුතු නැව් ප්‍රමාද ගාස්තුව, නැව, නැවෙහි ප්‍රමාණය, ධාරිතාව, කාලය සැපයුම්කරු ආදී කරුණු අනුව නැවෙන් නැවට වෙනස් වේ. පසුගිය වසර දෙක තුළදී අවම හා උපරිම ප්‍රමාද ගාස්තුව පහත පරිදි වේ.

වර්ෂය	පිරිපහදු කළ ඉන්ධන නැව් සඳහා සැපයුම්කරුවන් විසින් ලබා දී තිබූ නැව් ප්‍රමාද ගාස්තු අගයන්	බොර තෙල් නැව් සඳහා සැපයුම්කරුවන් විසින් ලබා දී තිබූ නැව් ප්‍රමාද ගාස්තු අගයන්
2023	අවම ඇ.ඩො. 30,000 උපරිම ඇ.ඩො. 60,000	අවම ඇ.ඩො. 28,000 උපරිම ඇ.ඩො. 90,000
2022	අවම ඇ.ඩො. 18,000 උපරිම ඇ.ඩො. 60,000	අවම ඇ.ඩො. 20,000 උපරිම ඇ.ඩො. 120,000

(ඇ) අදාළ නොවේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, 2021 වසරේ ඩොලර් මිලියන 57ක ඇස්තමේන්තුවක් යටතේ, ඒ කියන්නේ කෝටි 1,500ක විතර මුදල් ප්‍රමාණයකින් නළ පද්ධතියක් ඉදි කරන්න වැඩ පිළිවෙළක් සකස් කර තිබුණු බව. මම හිතන විධියට ඒක ඩොලර් හිඟතාවත් එක්ක **නැවතිලා** තිබුණා. ඊට පස්සේ උවයිස් මොහොමඩ් මැතිතුමාගේ කාල වකවානුවේ එතුමා කෝටි 500ක වියදමක් කරලා අහල් 18ක ප්‍රමාණයේ නළ පද්ධතියක් ඇතුළත් කිරීමට කටයුතු කළා. කෝටි 1,500ක්ව තිබූ වියදම කෝටි 500ක් දක්වා අඩු කරලා එතුමා විශාල සේවයක් කළා. විශේෂයෙන්ම අපි එතුමාට ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. ඉංජිනේරු උපතිස්ස බණ්ඩාර මැතිතුමාගේ වැඩ පිළිවෙළ අනුව තමයි ඒ කටයුත්ත කළේ. එතුමා දක්ෂ පුද්ගලයෙක්. එතුමා තමයි මේ වැඩ පිළිවෙළ සකස් කළේ. හැබැයි එතුමාවත් පැත්තකින් තියලා තමයි ඔබතුමන්ලා දැන් මේ ක්‍රියාදාමය සිද්ධ කරන්නේ.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

මේ සඳහා මිලියන 2,000කට වැඩි මුදල් ප්‍රමාණයක් වැය වනවා කියලා ඔබතුමා දැන් කිව්වා. ඒ මිලියන 2,000ක විතර මුදල් ප්‍රමාණය හොයා ගන්නේ කොහොමද කියලා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. ඒ වාගේම ඔබතුමා දන්නවා, නොවැම්බර් මාසයේ විතර බෝයාව අලුත්වැඩියා කරන්න තිබෙනවා කියලා. මම හිතන විධියට ඒ සඳහාත් කෝටි 450ක් විතර වැය වනවා. මේ කටයුත්ත කිරීමට හැකියාව තිබෙන දක්ෂ නිලධාරීන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්නවා. ඉතින්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ එවැනි නිලධාරීන් ඉන්න කොට,-

ගරු කථානායකතුමා
(මාණ්ඩූමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්ඩූමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේක හොඳින් පැහැදිලි කරන්නයි මේ කියන්නේ.

මෙවැනි ක්‍රියාදාමයක් තිබෙද්දී ඔබතුමන්ලා දැන් මේ කටයුත්ත Imodco කියන පෞද්ගලික සමාගමට දෙන්න යනවා. මේ ක්‍රියාදාමය කිරීම සඳහා එක දවසකට ඩොලර් 2,750ක්, ඩොලර් 3,000ක් අතර ප්‍රමාණයක් අය කර ගන්න වැඩ පිළිවෙළක් මේ ගොල්ලන් සකස් කරලා තිබෙනවා. ඉතින්, මේ ඩොලර් මිලියන 2,000ක විතර මුදල් ප්‍රමාණය සොයා ගැනීම සඳහා ඔබතුමන්ලා සකස් කර තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද, ගරු රාජ්‍ය ඇමතිතුමනි? ඒ වාගේම බෝයාව හැදීමේ ක්‍රියාවලියට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සිටින ඉංජිනේරුවරුන් යොදා ගන්නවා ද කියලාත් මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(මාණ්ඩූමිකු ඉන්දික අනුරුත්ත හේරත්)
(The Hon. Indika Anuruddha Herath)
හිටපු සභාපතිවරයා කටයුතු කරපු කාලයේ තමයි මේ ඇස්තමේන්තු කටයුතු සියල්ල සිද්ධ කළේ. මේක කරන්නේ කුමන පාර්ශ්වයද කියන තීන්දුවට තවම ඇවිල්ලා නැහැ, ගරු මන්ත්‍රීතුමා. ඒ වාගේම මේ වෙද්දී එම මුදල CPSTL එක සතුව තිබෙනවා. ඒ වාගේම අපි වගකීමෙන් කියනවා, එදා ගත් ඒ තීන්දුවම තමයි ක්‍රියාත්මක කරන්නේ කියලා. ඒ කියන්නේ, මේ සඳහා අවශ්‍ය නළ ටික මිලදී ගන්න ඕනෑ. මොකද, ඒවා නිෂ්පාදනය කිරීමේ ක්‍රමවේදයක් අපේ රටේ නැහැ. හැබැයි, ඔබතුමා කියන තාක්ෂණික දැනුම සහ හැකියාව තිබෙන පිරිස තමයි නළ එළීම සහ සිවිල් කටයුතු, එහෙමත් නැත්නම් ගොඩබිම තුළ කරන ක්‍රියාකාරකම් ටික කරන්නේ. ඒ විධියට තමයි මේක ඇස්තමේන්තු කරලා තිබෙන්නේ. අපි ඒක වගකීමෙන් කියනවා. මේක කෙරෙන්නේ කොටස් දෙකකටයි. ඒ කියන්නේ භාණ්ඩ මිලදී ගැනීමට යම් මුදලකුත්, ඒ වාගේම ඉදිකිරීම් කටයුතු සඳහා එම ආයතනය යොදා ගන්නා පිරිස වෙනුවෙන් යන වියදමත් විධියට. ඒ සඳහාත් ඇස්තමේන්තුවක් ඕනෑ. එම ඇස්තමේන්තු දෙකේ එකතුව තමයි රුපියල් මිලියන දෙදහස් අටසිය ගණනක් කියලා සඳහන් කර තිබෙන්නේ. එම නිසා එම ආයතන සතු සේවකයින් යොදාගෙන කරන කටයුතුවල මිල ගණන මේකෙන් අඩු වෙනවා. එතකොට අපට ඒ මුදලින් භාගයකට වැඩි කොටසක් අඩු කර ගන්න පුළුවන්.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(මාණ්ඩූමිකු මෛත්‍රිපාල සිරිසේන)
(The Hon. Maithreepala Sirisena)
ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඇහුවා, මේ කියපු මුදල සොයා ගන්නේ කොහොමද කියලා. ආණ්ඩුව දැන් මේ මුදල වේගයෙන් සොයාගෙන, සොයාගෙන යනවා. ඒ කොහොමද? හැම පාසලක් ළඟම රෙස්ටුරන්ට් එකකුත්, බාර් එකකුත් දාලා තිබෙනවා. ඒ වාගේම හැම පන්සලක් ළඟම රෙස්ටුරන්ට් එකකුත්, බාර් එකකුත් දාලා තිබෙනවා. ඒක නිසා දැන් ආණ්ඩුවට සල්ලි එනවා. ඒ සල්ලිවලින් ඒක කරන්නත් පුළුවන්. විමධ්‍යගත අරමුදල් ලබා නොදුන් මන්ත්‍රීවරුන්ට ඒ සල්ලිවලින් විමධ්‍යගත අරමුදල් ලබා දෙන්නත් පුළුවන්කම තිබෙනවා. ඒක මම ආණ්ඩුවට යෝජනා කරනවා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(මාණ්ඩූමිකු ඉන්දික අනුරුත්ත හේරත්)
(The Hon. Indika Anuruddha Herath)
ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විධියට අපි බාර්වල තෙල් විකුණන්නේ නැහැ. අපි තෙල් විකුණන්නේ ඉන්ධන පිරවුම්හල්වල. හිටපු ජනාධිපතිතුමාට ඒක වෙනස් විධියකට අවබෝධ වෙන්න ඇති. ඒක වෙනම කාරණාවක්.

ගරු කථානායකතුමා
(මාණ්ඩූමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(මාණ්ඩූමිකු ඉන්දික අනුරුත්ත හේරත්)
(The Hon. Indika Anuruddha Herath)
ගරු කථානායකතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා බෝයාව ගැන ප්‍රශ්න කළා. බෝයාවේ නඩත්තු කටයුතු සම්බන්ධ වගකීම් ඉටු කරන්නේත් මේ ආයතනයෙන් තමයි. ඒක වෙනත් ආයතනයකට දෙන්න සැලසුමක් ඇති, වැඩ පිළිවෙළක් ඇති කියලා කවුරු හෝ කියලා ඇති. නමුත්, අපි එහෙම වෙන්න ඉඩ තියන්නේ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්ඩූමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම තෙල් නැව්වලින් තෙල් අඩු වීම විශාල ප්‍රමාණයෙන් සිදු වෙනවා කියන එක දිගින් දිගටම පුවත් පත්වලත් පළ වුණා, රූපවාහිනියේත් විකාශය වුණා. උදාහරණයක් විධියට ගත්තොත්, 2022 නොවැම්බර් 28වන දා "Pusaka Java" නැවෙන් ගෙනාපු ඉන්ධනවලින් බැරල් 12,551ක් අඩුවෙලා තිබුණා. ඒ වාගේම 2022 දෙසැම්බර් 17වන දා ආපු නැවෙන් තෙල් බැරල් 13,235ක් අඩුවෙලා තිබෙනවා. ඔබතුමාත් දන්නවා, සාමාන්‍යයෙන් සියයට 0.3ක් තමයි වාෂ්ප වෙනවා කියලා ඇස්තමේන්තුවල සඳහන් කරලා තිබෙන්නේ කියලා. හැබැයි, ඉන්ධන ගොඩ බෑමේදී බැරල් 13,253ක් අඩු වුණා කියන්නේ සියයට 1.891ක් වාෂ්ප වෙලා තිබෙනවා කියන එකයි. එපමණ ප්‍රමාණයක් වාෂ්ප වෙලාද, නැති වෙලාද කියන එක තමයි ප්‍රශ්නය. ඊළඟට, බැරල් 12,551ක් ගෙනාපු නැවේ තෙල් වාෂ්ප වීම සියයට 1.734යි. එම හානිය පියවාගන්න ඒ කොම්පැනිය ඩොලර් මිලියන 770ක් ඉල්ලා තිබෙනවා. ඊළඟට, අනික් කොම්පැනිය ඩොලර් මිලියන 370ක් ඉල්ලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඇත්තටම මේවා ගැන බැලුවාම, නාවික හමුදාවෙන් කරපු පරීක්ෂණයෙන් කිව්වා, නළ පද්ධතියේ කිසිම සිදුරක් නැහැ කියලා. මම අහන්න කැමැතියි, මේ තරම් තෙල් තොගයක් ගේනකොට බැරල් දහතුන් දහස් ගණනක් අතුරුදහන් වෙන්න හේතුව මොකක්ද කියලා. ඒ වාගේම අපට ආරංචි වෙලා තිබෙන හැටියට මෙතැන මාෆියාවකුත් ක්‍රියාත්මක වෙනවා. එම තෙල් ටික

වෙනත් විධියකට විකුණන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. එක්කෝ සිද්ධ වෙන්න පුළුවන් දේ තමයි, නැව්වලින් ගෙනෙනවා කියන ප්‍රමාණයට වඩා ඇත්තටම ගෙනෙන ප්‍රමාණය අඩුවෙලා තිබීම. අපි ඒ නැව්වලට ප්‍රමාද ගාස්තු ගෙවන්නත් ඕනෑ. ඊළඟට, හානිපූරණය සඳහා සල්ලි ගෙවන්නත් ඕනෑ. ඒ වාගේම තෙල් හම්බවෙන්නේත් අඩුවෙන්. තෙල් ටික ගිලින ඒ බහිරවයා කවුද? ඒකයි මම අහන්නේ. මොකද, මේ ගැන ඔබතුමන්ලා දිගින් දිගටම සොයා බැලුවත්, ඒකට හේතුව තවමත් සොයා ගන්න බැරිවෙලා තිබෙනවා. ඒ සඳහා ගනු ලබන පියවර මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම මේ කාරණය කියන්න ඕනෑ. ඔබතුමාත් දන්නවා ඇති, ඉන්ධන ගොඩ බෑමට භාවිත කරන කොළොන්නාව නළ පද්ධතිය සකස් කරලා කොච්චර කාලයක් වෙනවාද කියන එක.

දැන් අවුරුදු 100කට ආසන්න කාලයක් වෙනවා. ඒ නිසා ඒ නළ පද්ධතිය තුළ යම් යම් වෙලාවට කාන්දුවීම් සහ අපතේ යෑම් සිද්ධ වෙනවා. මා ළඟ දැනටත් ඒ සම්බන්ධ වීඩියෝ දර්ශන තිබෙනවා. මේ බැරල් ප්‍රමාණය නිහවීමට හේතුව ඒකමයි කියලා අපි කියන්නේ නැහැ. ඒ වාගේම, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පරිගණකගත කරපු ආකාරයෙන් තමයි, දැනට මේ ගොඩබෑම් කටයුතු කරන්නේ. නමුත්, ඒවා මීනුම් කටයුතු කරන්නේ පැරණි ආකාරයට. ඒ නිසා දැන් තමයි ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට යම් කිසි ලාභයක් ලැබෙමින් තිබෙන්නේ. ඒ ලාභාංශ යොදා ගෙන තමයි, මේ නළ පද්ධතිය කඩිනමින් ප්‍රතිසංස්කරණය කරන්න, ප්‍රතිස්ථාපනය කරන්න කටයුතු කරන්නේ.

අපි දැනටමත් වෙනම විගණන කණ්ඩායමක් පත් කරලා, මේ ගැන පරීක්ෂණ කරගෙන යනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, මාසයක් දෙකක් ඇතුළත අපට මේ ගැන හරි තොරතුරු ලබා ගන්න පුළුවන් වෙයි කියලා. ඒ වාගේම එවැනි කටයුතු කරපු අයට විරුද්ධව අවශ්‍ය කටයුතු කරන්නත් අපි මේ වෙද්දි සූදානම් වෙලා ඉන්නවා. අපි වගකීමෙන් කියනවා, මේක පරිගණක ජාලයට ඇතුළත් කළාම, ඒ ක්‍රමය තුළින් ඩිපෝව දක්වාත්, ඩිපෝවේ සිට සිට නළ මාර්ගයෙන් ඉන්ධන හල දක්වාත් අපට මැනුම් කටයුතු කර ගන්න පුළුවන් කියන එක. එතකොට කිසිදු ආයතනයකට පාඩුවක් වෙන්නේත් නැහැ. ආපහු claim කරන්න ඔවුන් ලැහැස්ති වෙන්නේත් නැහැ. ඒ නිසා මම හිතනවා, අපට යථා කාලයේදී ඒ කටයුතු සූදානම් කර ගන්න පුළුවන් වෙයි කියලා.

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය: ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති
காலநிலை சூட்டிகை நீர்ப்பாசனக் கமத்தொழில் கருத்திட்டம்: அமுல்படுத்தப்பட்டுள்ள கருத்திட்டங்கள்
CLIMATE SMART IRRIGATED AGRICULTURE PROJECT: PROJECTS IMPLEMENTED

1244/2024

8. ගරු කුමාරසිරි රත්නායක මහතා
(மாண்புமிகு குமாரசிறி ரத்னாயக்க)
(The Hon. Kumarasiri Rathnayaka)

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP) නමින් ව්‍යාපෘතියක් මොනරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, එම එක් එක් කොට්ඨාසයේ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාල සීමාව, කෘෂි ව්‍යාපෘති හා වාරි ව්‍යාපෘති ලෙස එම එක් එක් කොට්ඨාසය සඳහා වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය යටතේ මේ වන විට ක්‍රියාත්මක කර අවසන් කර ඇති කෘෂි ව්‍යාපෘති වර්ග හා වාරි ව්‍යාපෘති වර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින කෘෂි ව්‍යාපෘති වර්ග හා වාරි ව්‍යාපෘති වර්ග, එම එක් එක් ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය සහ එම එක් එක් ව්‍යාපෘතිය අවසන් කිරීමට යෝජිත දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா

(அ) (i) காலநிலை சூட்டிகை நீர்ப்பாசனக் கமத்தொழில் கருத்திட்டம் (CSIAP) என்ற பெயரில் கருத்திட்ட மொன்று மொனராகலை மாவட்டத்தில் அமுலில் உள்ளது என்பதை அறிவாரா;

(ii) ஆமெனில், மேற்படி கருத்திட்டம் அமுல்படுத்தப் படுகின்ற பிரதேச செயலாளர் பிரிவுகள், மேற்படி ஒவ்வொரு பிரிவிலும் அக்கருத்திட்டம் அமுல் படுத்தப்படுகின்ற கால எல்லை, கமத்தொழில் கருத்திட்டங்கள் மற்றும் நீர்ப்பாசனக் கருத் திட்டங்கள் என்ற வகையில் மேற்படி ஒவ்வொரு பிரிவுக்கும் ஒதுக்கப் பட்டுள்ள தொகை என்பன வெவ்வேறாக யாவை;

(iii) மேற்படி கருத்திட்டத்தின்கீழ் இதுவரை அமுல் படுத்தி நிறைவுசெய்யப்பட்டுள்ள கமத்தொழில் கருத்திட்டங்களின் வகைகளும் நீர்ப்பாசனக் கருத்திட்டங்களின் வகைகளும் வெவ்வேறாக யாவை;

(iv) தற்போது அமுலிலுள்ள கமத்தொழில் கருத் திட்டங்களின் வகைகள் மற்றும் நீர்ப்பாசனக் கருத்திட்டங்களின் வகைகள், மேற்படி ஒவ்வொரு கருத்திட்டத்தினதும் தற்போதைய முன்னேற்றம் மற்றும் மேற்படி ஒவ்வொரு கருத்திட்டத்தையும் நிறைவுசெய்ய உத்தேசிக் கப்பட்டுள்ள திகதி என்பன வெவ்வேறாக யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Will he inform this House -

(i) whether he is aware that a project named Climate Smart Irrigated Agriculture Project (CSIAP) is being implemented in the Monaragala District;

[ගරු කුමාරසිරි රත්නායක මහතා]

(ii) if so, whether he will state the Divisional Secretary's Divisions within which the project concerned is implemented, the timeline for the implementation of the project in each such Division and the amounts allocated for agro-projects and irrigation projects in each such Division, separately;

(iii) the agro-projects and irrigation projects which have been completed under the above project by now, separately; and

(iv) agro-projects and irrigation projects which are still being implemented, the present progress of each such project and the proposed dates for completion in respect of each project, separately?

(b) If not, why?

ගරු කේ. කාදර් මස්තාන් මහතා (ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு கா. காதர் மஸ்தான் - கிராமியப் பொருளாதார இராஜாங்க அமைச்சர்)

(The Hon. K. Kader Masthan - State Minister of Rural Economy)

கௌரவ சபாநாயகர் அவர்களே, கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் சார்பாக நான் இந்த வினாவுக்கு விடையளிக்கின்றேன்.

(அ) (i) ஆம்.

(ii)

කරුත් තිට්ටම් සෙයිර්පටුත්තප්පටුම් පි.සෙ. පිරිවු	කරුත් තිට්ටම් සෙයිර්පටුත්තප්පට්ට කාලප් පකුති	විවසායක් කරුත් තිට්ටත්තිර්කු ඔතුක්කප්පට්ට නිති (රූ.මිල්.)	නීර්ප්පාසනක් කරුත් තිට්ටත්තිර්කු ඔතුක්කප්පට්ට නිති
පුත්තල	2019 ආම් ආණ්ටු ජූන් මාතම් මුතල් 2025 ආම් ආණ්ටු තිසම්පර් මාතම් වරෙ	125.0	312.18
වෙල්ලවාය		187.6	303.92
		312.6	616.1

(iii)

කරුත් තිට්ටම් සෙයිර්පටුත්තප්පටුම් පි.සෙ. පිරිවු	இது வரை செயற்படுத்தப்பட்டு நிறைவு செய்யப்பட்டுள்ள விவசாயக் கருத் திட்டங்கள்	இது வரை செயற்படுத்தப்பட்டு நிறைவு செய்யப்பட்டுள்ள நீர்ப்பாசனக் கருத் திட்டங்கள்
புத்தள	-காலநிலை நேர்த்தியான விவசாய செயன்முறைகளை பின்பற்றி பயிரிடப்பட்ட மொத்த நிலப் பரப்பு - 923 ஹெக்டேயர் -நன்மை கிடைத்த மொத்த நன்மைபெறுநர்களின் எண்ணிக்கை - 2596 - பயிர் உற்பத்தியின் கீழ் நெல், சோளம், பாசிப்பயறு, கவ்பி, உழுந்து, மிளகாய், வெங்காயம் போன்ற பயிரினங்கள் பயிரிடப்பட்டு 1748 மெற்றிக் டொன் உற்பத்திகள் கிடைத்துள்ளன. - விதை உற்பத்தி நிகழ்ச்சித் திட்டத்தின் கீழ் 4 விதை உற்பத்திக் கிராமங்கள் தாபிக்கப்பட்டு 86 ஹெக்டேயர் அளவான நிலத்திலிருந்து 311 மெற்றிக் டொன் உற்பத்தி செய்யப்பட்டுள்ளது. -இடைப் பயிர்ச்செய்கைப் போகத்தில் 719 ஹெக்டேயர் அளவான நிலத்தில் பயிரிடப்பட்டு 536 மெற்றிக் டொன் உற்பத்தி செய்யப்பட்டுள்ளது. -வீட்டுத் தோட்டப் பயிர்ச் செய்கை நிகழ்ச்சித் திட்டத்தின் கீழ் மேம்படுத்திய வீட்டுத் தோட்டங்களின் எண்ணிக்கை - 7800 -கொம்போஸ்ட்டு உர நிகழ்ச்சித் திட்டத்தின் கீழ் 766 மெற்றிக் டொன் கொம்போஸ்ட்டு உரமும் 200 லீற்றர் திரவ உரமும் உற்பத்தி செய்யப்பட்டுள்ளன. **வழங்கப்பட்டுள்ள விவசாய உள்ளீடுகள்** -தெளி நீர்ப்பாசன முறமைகள் - 216 -சொட்டு நீர்ப்பாசன முறைமைகள் - 50 -கிருமி தடுப்பு வலைகள் - 120 -பொலித்தீன் தழைக்கூளங்கள் - 28 **செலவு செய்யப்பட்டுள்ள நிதி - ரூ.மில். 105.56**	8 குளங்களின் பணிகள் நிறைவு செய்யப்பட்டுள்ளன. செலவு செய்யப்பட்ட நிதி - ரூ.மில். 181.23
வெல்லவாய	-காலநிலை நேர்த்தியான விவசாய செயன்முறைகளை பின்பற்றி பயிரிடப்பட்ட மொத்த நிலப் பரப்பு - 4306 ஹெக்டேயர் -நன்மை கிடைத்த மொத்த நன்மைபெறுநர்களின் எண்ணிக்கை - 1384 -பயிர் உற்பத்தியின் கீழ் நெல், சோளம், பாசிப்பயறு, கவ்பி, உழுந்து, மிளகாய், வெங்காயம் போன்ற பயிரினங்கள் பயிரிடப்பட்டு 2621 மெற்றிக் டொன் உற்பத்திகள் கிடைத்துள்ளன. - விதை உற்பத்தி நிகழ்ச்சித் திட்டத்தின் கீழ் 5 விதை உற்பத்திக் கிராமங்கள் தாபிக்கப்பட்டு 130 ஹெக்டேயர் அளவான நிலத்திலிருந்து 466 மெற்றிக் டொன் உற்பத்தி செய்யப்பட்டுள்ளது: -இடைப் பயிர்ச் செய்கைப் போகத்தில் 1080 ஹெக்டேயர் அளவான நிலத்தில் பயிரிடப்பட்டு 803 மெற்றிக் டொன் உற்பத்தி செய்யப்பட்டுள்ளது. -வீட்டுத் தோட்டப் பயிர்ச் செய்கை நிகழ்ச்சித் திட்டத்தின் கீழ் மேம்படுத்திய வீட்டுத் தோட்டங்களின் எண்ணிக்கை - 11700 -கொம்போஸ்ட்டு உர நிகழ்ச்சித் திட்டத்தின் கீழ் 1149 மெற்றிக் டொன் கொம்போஸ்ட்டு உரமும் 300 லீற்றர் திரவ உரமும் உற்பத்தி செய்யப்பட்டுள்ளன. **வழங்கப்பட்டுள்ள விவசாய உள்ளீடுகள்** -தெளி நீர்ப்பாசன முறமைகள் - 324 -சொட்டு நீர்ப்பாசன முறைமைகள் - 75 -கிருமி தடுப்பு வலைகள் - 180 -பொலித்தீன் தழைக்கூளங்கள் - 42 **செலவு செய்யப்பட்டுள்ள நிதி - ரூ.மில். 143.33**	14 குளங்களின் பணிகள் நிறைவு செய்யப்பட்டுள்ளன. செலவு செய்யப்பட்ட நிதி ரூ.மில். 258.1

(iv)

විවසායක් කරුත් තිට්ටම්	මුන්නේත්‍රම්	නිරෙවු සෙය්වතර්කු උත්තේසික්කප් පට්ටුළ්ළ තිකති	නීර්ප්පාසනක් කරුත් තිට්ටම්	මුන්නේත්‍රම්	නිරෙවු සෙය්වතර්කු උත්තේසික්කප් පට්ටුළ්ළ තිකති
පුත්තළ	2024/25 පෙරුම්පෝකප් පයිර්ච් සෙය්කෙයිනුම් මර්‍රුම් 2024 ඉටෙප් පයිර්ච් සෙය්කෙප් පෝකත්තිනුම් කීළ් 189 හෙක්ටේයර් අළවාන නිලත්තිල් පයිරිටුම් පොරුට්ටු කීළ්කාණුම් විවසාය උළ්ළීටුකළෛ වළංකුවතර්කු තේවෙයාන පෙරුකෛ නටවටික්කෛකළ් මේර්කොළ්ළප් පට්ටු වරුකින්රන. - තෙළි නීර්ප්පාසන මුරෛමෛකළ් - 2 - සොට්ටු නීර්ප්පාසන මුරෛමෛකළ් - 14 - සූරිය සක්තියිල් ඉයංකුම් නීරිරෛක්කුම් පාම්පි - 2 - කිරුමි තටුප්පු වලෛකළ් - 8 - පරූට්ටුත් තට්ටුක්කළ් - 2000 - පොලිත්තීන් තළෛක් කූළංකළ් - 146 **විළෛපොරුට්කළ්** - නෙල් - 1230 කි.කි. - චෝළම් - 140 කි.කි. - පාසිප්පයරු - 600 කි.කි. - නිලක්කටලෛ - 1000 කි.කි. - කව්පි - 400 කි.කි. - උළුන්තු - 600 කි.කි. - මිළකාය් - 4 කි.කි. **සෙලවු සෙය්වතර්කු උත්තේසික්කප් පට්ටුළ්ළ තොකෛ - රූ.මිල්. 25.5**	2025 ආම් ආණ්ටු මාර්ච් මාතම්	පුත්තළ	12 කුළංකළින් පුනරමෛප්පුප් පණිකළ් මේර්කොළ්ළප් පට්ටු වරුකින්රන. **සෙලවු සෙය්වතර්කු උත්තේසික්කප් පට්ටුළ්ළ තොකෛ - රූ.මිල්. 130.95**	2025 ආම් ආණ්ටු ජූන් මාතම්
වෙල්ලවාය	2024/25 පෙරුම්පෝකප් පයිර්ච් සෙය්කෙයිනුම් මර්‍රුම් 2024 ඉටෙප් පයිර්ච් සෙය්කෙප් පෝකත්තිනුම් කීළ් 282 හෙක්ටේයර් අළවාන නිලත්තිල් පයිරිටුම් පොරුට්ටු කීළ්කාණුම්		වෙල්ලවාය	4 කුළංකළින් පුනරමෛප්පුප් පණිකළ් මේර්කොළ්ළප් පට්ටු වරුකින්රන. **සෙලවු සෙය්වතර්කු උත්තේසික්කප් පට්ටුළ්ළ තොකෛ - රූ.මිල්. 172.97**	

	විවසාය උළ්ළීටුකළෛ වළංකුවතර්කු තේවෙයාන පෙරුකෛ නටවටික්කෛකළ් මේර්කොළ්ළප් පට්ටු වරුකින්රන. - තෙළි නීර්ප්පාසන මුරෛමෛකළ් - 4 - සොට්ටු නීර්ප්පාසන මුරෛමෛකළ් - 21 - සූරිය සක්තියිල් ඉයංකුම් නීරිරෛක්කුම් පාම්පි - 3 - කිරුමි තටුප්පු වලෛකළ් - 12				
	- මළෛනීර් සේමිප්පු ටාංකිකළ් - 3 - පාතුකාප්පුක් කූටාරංකළ් - 7 - මින්සක්තියිල් ඉයංකුම් නීරිරෛක්කුම් පාම්පි - 18 - පොලිත්තීන් තළෛක් කූළංකළ් - 218 - පරූට්ටුත් තට්ටුක්කළ් - 2000 **විළෛපොරුට්කළ්** - නෙල් - 1845 කි.කි. - චෝළම් - 210 කි.කි. - පාසිප්පයරු - 900 කි.කි. - නිලක්කටලෛ - 2000 කි.කි. - කව්පි - 600 කි.කි. - උළුන්තු - 900 කි.කි. - මිළකාය් - 6 කි.කි. **සෙලවු සෙය්වතර්කු උත්තේසික්කප් පට්ටුළ්ළ තොකෛ - රූ.මිල්. 38.26**				

(ஆ) ஏற்புடையதன்று.

ගරු කුමාරසිරි රත්නායක මහතා
(மாண்புமிகு குமாரசிறி ரத்னாயக்க)
(The Hon. Kumarasiri Rathnayaka)

පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු රාජ්‍ය ඇමතිතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කෘෂි කර්මාන්තයෙන් වැඩි පිරිසක් ජීවත් වන දිස්ත්‍රික්කයක් වන අපේ දිස්ත්‍රික්කය තුළ මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව විශේෂයෙන්ම මම සතුටු වෙනවා. ඒ වාගේම ඒ වෙනුවෙන් කටයුතු කරන කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීන්ටත් මා ස්තුතිය පළ කරනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භයේ ඉඳලා වසර දෙකක් යනතුරු ඉතාම මන්දගාමීවයි සිද්ධ වුණේ. ඒ නිසා ව්‍යාපෘතියේ කටයුතු ඒ කාලය තුළදී ප්‍රමාද වෙලා තිබුණා. නමුත්, පසුගිය

[ගරු කුමාරසිරි රත්නායක මහතා]

වසරක කාලයක සිට මේ දක්වා ඉතාම කඩිනමින් ඒ ව්‍යාපෘතියේ කටයුතු සිදු වෙමින් පවතිනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානය මා යොමු කරවන්නේ, මේ ව්‍යාපෘතිය ආරම්භයේදී ගොවීන් වෙනුවෙන් ලබා දුන්නු කහ වගා කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳවයි. ඒ ව්‍යාපෘතියට ගොවීන් තෝරාගෙන, වගා කරන්න අවශ්‍ය බීජ ගොවීන්ගේ මුදලින් ලබා ගන්න කියලා උපදෙස් ලබා දීලා තිබුණා. ඒ එක්කම ඒ අයට නළ ජල පද්ධතියක් සහ ඒ සඳහා අවශ්‍ය උපාංග සියල්ල ලබා දෙන බවත් කිව්වා. නමුත්, ව්‍යාපෘතියේ නිලධාරීන් ගොවීන්ට ඒ පොරොන්දුව ලබා දුන්නත්, කහ වගාව කරගෙන යන අතරතුර මේ කිසිම දෙයක් ඒ ගොවීන්ට ලැබුණේ නැහැ. ඒ වාගේම කිලෝග්‍රෑමයකට රුපියල් 600 බැගින් බීජ කිලෝග්‍රෑම් 150ක් ලබා ගන්න ගොවීන්ට යම් මුදල් ප්‍රමාණයක් වැය වුණා. එමෙන්ම නළ ජල පද්ධති සහ අමතර උපාංග ලබා දෙනවාය කිව්වත් ඒ කිසිම දෙයක් ලැබුණේත් නැහැ. ඒ නිසා කහ වගාව අසාර්ථක වුණා. ඒ තුළින් ලැබුණේ ඉතාම සුළු අස්වැන්නක්. ඒ අස්වැන්නත් හොඳ මිලකට අළෙවි කර ගන්න ගොවීන්ට අවස්ථාවක් ලැබුණේ නැහැ. එම නිසා මේ පිළිබඳව ඒ ගොවි සංවිධානයට අයත් ගොවීන් ව්‍යාපෘතියේ අධ්‍යක්ෂතුමාගෙන් දිගින් දිගටම ඉල්ලීම් කළා. ඒ පිළිබඳව අපිත් කථා කළා. නමුත්, ඒ අයට ලබා දිය යුතු සහනාධාර මුදල් මෙතෙක් ලැබිලා නැහැ. ඒ නිසා ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලනවා.

ගොවීන්ට සිදු වන ඒ අසාධාරණය නිසා ඔවුන් මේ ව්‍යාපෘතියෙන් අයින් වුණා. එම නිසා ඒ ගොවීන් කහ වගාවට සහ වෙනත් වගාවලට යොමු වුණේ නැහැ. ඒ පිළිබඳව අවධානය යොමු කරලා, ඒ අයට මුදල් ලබා දෙන්න කටයුතු කරන්න කියා මා ඉල්ලනවා. ඒ සඳහා ඔබතුමාගේ සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ මැදිහත්වීම කළ යුතුයි කියන කාරණය මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යද්දී වෙන් කරලා තිබුණු මුදල් ප්‍රමාණවත් නැති බව ව්‍යාපෘතියේ නිලධාරීන් පැවසුවා. ඒ නිසා තවත් අමතර මුදලක් ඒ සඳහා අවශ්‍යයි කියන කාරණය ඔවුන් සඳහන් කළා. ඒ වාගේම මෙහි කාලය පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරලා, මේ ව්‍යාපෘතිය ඉතා හොඳින් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය සහාය ලබා දෙන්න කියන ඉල්ලීම මම කරනවා. ඒ වාගේම මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය දැනුවත් කරලා, අදාළ පියවර ගන්න ඔබතුමා කටයුතු කරනවාද කියාත් මම දැනගන්න කැමැතියි.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(මාණ්පුමිකු කා. කාදර් මස්තාන්)
(The Hon. K. Kader Masthan)

கௌரவ உறுப்பினர் அவர்கள் கூறியதுபோல், விவசாயிகளுக்கு ஏற்பட்டிருக்கின்ற பாதிப்புகள் தொடர்பிலும் அவர்களுக்கு வழங்கப்படுமென உறுதியளிக்கப்பட்ட உபகரணங்கள் தொடர்பிலும் உரிய அதிகாரிகளுடன் கலந்துரையாடி, பாதிப்புகளை ஈடுசெய்யக்கூடிய விதத்தில் உரிய நடவடிக்கைகள் எடுக்கப்படும் என்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -2111/2024- (1), ගරු රවුෆ් හකීම් මහතා.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බලප්‍රදේශයේ විජේසේකර මාවත: ගොඩනැඟිලි රේඛා සීමාව අඩු කිරීම

தெஹிவளை-கல்கிசை மாநகர சபை அதிகாரப் பிரதேசத்திலுள்ள விஜேசேகர மாவத்தை: கட்டிட எல்லை வரம்பைக் குறைத்தல்

WIJESEKARA MAWATHA IN DEHIWALA-MT. LAVINIA MUNICIPAL COUNCIL AREA: REDUCTION OF BUILDING LINE LIMIT

2131/2024

10. ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
(மாண்புமிகு இம்தியாஸ் பாக்கிர் மாக்கார்)
(The Hon. Imthiaz Bakeer Markar)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශයට අයත් 540-බී ජයතිලක ග්‍රාම නිලධාරී වසමේ පිහිටි විජේසේකර මාවත/පාර යන මාර්ගයට අදාළ ගොඩනැඟිලි රේඛා සීමාව, එම මහ නගර සභාවේ වර්ෂ 2007-2020 සංවර්ධන සැලැස්ම අනුව මාර්ගය මධ්‍යයේ සිට අඩි 20ක් ලෙස පැවති නමුත් වර්ෂ 2020-2031 සංවර්ධන සැලැස්ම අනුව එම සීමාව අඩි 10ක් ලෙස අඩු කර තිබේද;

(ii) එසේ නම්, වර්ෂ 2020-2031 සංවර්ධන සැලැස්ම අනුව ඉහත මාර්ගයේ ගොඩනැඟිලි රේඛා සීමාව මාර්ගය මධ්‍යයේ සිට අඩි 10ක් දක්වා අඩු කිරීමට හේතු කවරේද;

(iii) වර්ෂ 2020-2031 සංවර්ධන සැලැස්ම අනුව දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශයට අයත් වෙනත් මාර්ගවල ගොඩනැඟිලි රේඛා සීමාව, පෙර පරිදිම මාර්ගය මධ්‍යයේ සිට අඩි 20ක් ලෙස පවත්වාගෙන යාමට තීරණය කර තිබේද;

(iv) එසේ නම්, ඉහත මාර්ගයේද ගොඩනැඟිලි රේඛා සීමාව, මාර්ගය මධ්‍යයේ සිට අඩි 20 සීමාවේ දිගටම පවත්වාගෙන යාම සඳහා පියවර ගන්නේද;

(v) ඉහත මාර්ගයේ දෙපස සිදු කර ඇති ගොඩනැඟිලි ඉදිකිරීම්, නාගරික සංවර්ධන අධිකාරියේ නීති රීතිවලට අනුකූල වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச் சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) தெஹிவளை-கல்கிசை மாநகர சபை அதிகாரப் பிரதேசத்துக்குரிய 540-பீ ஜயதிலக்க கிராம அலுவலர் பிரிவில் அமைந்துள்ள விஜேசேகர மாவத்தை/வீதி என்ற பாதையின் கட்டிட எல்லையானது, மேற்படி மாநகர சபையின் 2007-2020ஆம் ஆண்டுகளுக்கான அபிவிருத்தித் திட்டத்தின்படி வீதியின் மத்தியிலிருந்து 20 அடிகளாகக் காணப்பட்டபோதிலும், 2020 - 2031ஆம் ஆண்டுகளுக்கான அபிவிருத்தித் திட்டத்தின்படி மேற்குறித்த எல்லையானது 10 அடிகளாகக் குறைக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், 2020 - 2031ஆம் ஆண்டுகளுக்கான அபிவிருத்தித் திட்டத்தில் மேற்குறித்த வீதியின் கட்டிட எல்லையை வீதியின் மத்தியிலிருந்து 10 அடிகளாகக் குறைத்தமைக்கான காரணம் யாதென்பதையும்;

(iii) 2020 - 2031ஆம் ஆண்டுகளுக்கான அபிவிருத்தித் திட்டத்தின்படி, தெஹிவளை-கல்கிசை மாநகர சபை பிரதேசத்துக்குரிய வேறு வீதிகளின் கட்டிட எல்லைகளை முன்பிருந் ததைப் போன்றே வீதியின் மத்தியிலிருந்து 20 அடிகளாகவே பேணிச் செல்வதற்குத் தீர்மானிக் கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி வீதியினதும் கட்டிட எல்லையை வீதியின் மத்தியிலிருந்து 20 அடிகளாகத் தொடர்ந்தும் பேணிச் செல்வதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(v) மேற்படி வீதியின் இருமருங்கிலும் நிர்மாணிக்கப் பட்டுள்ள கட்டிடங்கள், நகர அபிவிருத்தி அதிகாரசபையின் சட்டவிதிகளுக்கு இசைவானதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and the Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether the building line limit related to Wijesekara Mawatha/Road, located in 540-B Jayathilaka Grama Niladhari Division of Dehiwala-Mt. Lavinia Municipal Council has been reduced to10 feet according to the 2020-2031 Development Plan even though as per the 2007-2020 Development Plan, it remained 20 feet from the centre of the road;

(ii) if so, the reasons for reducing the building line limit of the aforesaid road to 10 feet from the centre of the road as per the 2020-2031 Development Plan;

(iii) whether it has been decided to maintain the building line limit of the other roads of the Dehiwala-Mt. Lavinia Municipal Council area at 20 feet from the centre of the road in terms of the 2020-2031 Development Plan, as previously done;

(iv) if so, whether steps are taken to maintain the building line limit of the aforesaid road as well at 20 feet from the centre of the road; and

(v) whether the building construction activities on both sides of the aforesaid road comply with the rules of the Urban Development Authority?

(b) If not, why not?

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) විජේසේකර මාවත/ පාර යන මාර්ගයට අදාළ ගොඩනැඟිලි රේඛා සීමාව මාර්ග මධ්‍යයේ සිට අඩි 10ක් ලෙස 2007 වර්ෂයට පෙර සිටම දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා ලේඛනවල සඳහන් වන අතර, එකල සිටම රාජකාරී කටයුතු සඳහා භාවිත කර ඇත්තේද ගොඩනැඟිලි සීමාව අඩි 10ක් ලෙස වේ. නමුත් සංවර්ධන සැලැස්මෙහි සිද්ධිගත මාර්ගය යටතේ ගොඩනැඟිලි සීමාව නිවැරදිව සඳහන් නොවීම මත අඩි 20ක් ලෙස දක්වා තිබුණද, 2022-2031 සංවර්ධන සැලැස්මෙහි ගොඩනැඟිලි සීමාව අඩි 10 ලෙස නිවැරදිව සඳහන් කර ඇත.

(ii) අඩු කිරීමක් සිදු කර නොමැත.

(iii) නැත. 2022-2031 සංවර්ධන සැලැස්මේ ගොඩනැඟිලි සීමා නිවැරදිව දක්වා ඇති අතර, එය විවිධ ප්‍රමාණවලින් යුක්ත වේ.

(iv) නැත.

(v) නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසිවලට පටහැනි ඉදිකිරීම් නිරීක්ෂණය වන බැවින්, එම ඉදිකිරීම් පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර රෙගුලාසිවලට පටහැනිව සිදු කරන ලද ඉදිකිරීම් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරී පනත ප්‍රකාරව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සඳහා හඳුනා ගැනීම් සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
(மாண்புமிகு இம்தியாஸ் பாக்கிர் மாக்கார்)
(The Hon. Imthiaz Bakeer Markar)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කරන්න පෙර මම ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමාට නිලධාරීන් විසින් ලබා දී තිබෙන තොරතුරුවල නිරවද්‍යතාව පිළිබඳව නැවත සොයා බැලීමක් කරන්න කියලා. එසේ කිරීම සුදුසුයි කියන යෝජනාව මා ඉදිරිපත් කරනවා.

අඩි 20ක ගොඩනැඟිලි රේඛා සීමාව අඩි 10 දක්වා අඩු කිරීමට තීරණය කර ඇත්තේ මේ සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින පසුබිමක බවත්, ඒ තුළින් නඩු

[ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා]

කටයුතුවලට බලපෑමක් සිදු වන බවත්, 2020-2031 සංවර්ධන සැලැස්මේ කරුණු මේ අයුරින් වෙනස් කිරීමට කඩිමුඩියේ තීරණය කර ඇත්තේ දූෂිත ගනුදෙනු හේතුවෙන් බවටත් ප්‍රදේශවාසීන් නඟන චෝදනා පිළිබඳව සොයා බැලීමට ගරු රාජ්‍ය ඇමතිතුමන්ගේ අවධානය යොමු කරන්නේද?

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඒ ප්‍රශ්නය පිළිබඳව මම නැවත වතාවක් සොයා බැලීමක් සිදු කරනවා. මම කීප වතාවක් මේක මෙහෙම වෙනස් වෙන්න බලපෑ හේතුව ගැන සොයා බලා, පසුබිම් වාර්තාවකුත් ගෙන්වලා, ඒක දෙතුන් වරක් කියවලා ආපහු යැව්වා, එහෙම අඩු කිරීමක් කළාද කියලා විමසා. ඒගොල්ලන් කියන්නේ ඒක අත්වැරදීමකින් වුණු එකක් කියායි. ඔබතුමා කිව්ව කාරණය පිළිබඳව නැවත වරක් සොයලා මම ඒ ගැන ඔබතුමාට දැනුම් දෙනවා.

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
(மாண்புமிகு இம்தியாஸ் பாக்கிர் மாக்கார்)
(The Hon. Imthiaz Bakeer Markar)

ගරු කථානායකතුමනි, එම සොයා බැලීම මධ්‍යස්ථ වීම සඳහාත්, අපක්ෂපාත වීම සඳහාත් මේ නඩුව පවරපු ඒ ප්‍රදේශයේ තට්ටු 8 ගොඩනැඟිල්ල හදන කෝටිපති ව්‍යාපාරිකයා සහ නඩු පවරා තිබෙන ප්‍රදේශවාසීන්ගේ නියෝජිතයන්වත් කැඳවලා දෙගොල්ලන්ටම සවන් දීලා, මොකක්ද හරි, මොකක්ද වැරදි කියලා සොයා බැලීමට ඔබතුමා මැදිහත් වෙනවා නම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ඔබතුමා ඒ සම්බන්ධයෙන් විස්තරයක් මට ලබා දෙන්න. මම ඔවුන් අපේ අමාත්‍යාංශයටම කැඳවලා අවශ්‍ය කටයුතු කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු විපක්ෂ නායකතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ආබාධ සහිත දරුවන් සඳහා අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව
ஊனமுற்ற பிள்ளைகளுக்கான கல்வி மற்றும் தொழிற்பயிற்சி
EDUCATION AND VOCATIONAL TRAINING FOR CHILDREN WITH DISABILITIES

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

මෙරට සමස්ත ජනගහනයෙන් සියයට 8.7ක් පමණ වූ ආබාධිත ප්‍රජාව මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් මා නිරන්තරයෙන්ම මේ පාර්ලිමේන්තුව හමුවේ කරුණු ඉදිරිපත් කළා. නමුත්, ඇතැම් ගැටලු සම්බන්ධයෙන් රජය විසඳුම් ලබා දීම සම්බන්ධයෙන් විශාල පසුබෑමක් පවතින බව අපට පෙනී යනවා. එබැවින්, ආබාධිත ප්‍රජාව මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් යළිත් වරක් රජයේ අවධානය යොමු කරවීම පිණිස පහත සඳහන් ප්‍රශ්න මා යොමු කරනවා.

දළ වශයෙන් අපේ රටේ ලක්ෂ 18කට වැඩි ආබාධිත ප්‍රජාවක් ගැනයි මම මේ කථා කරන්නේ. අද දවසේ ඉදිරිපත් කරන මේ ප්‍රශ්නයට පිළිතුරු පමණක් නොවෙයි, සාධනීය විසඳුම් පවා රජයෙන් අපි බලාපොරොත්තු වෙනවා .

01. මෙරට ආබාධ සහිත, පාසල් යන වයසේ දරුවන් කොපමණ සංඛ්‍යාවක් සිටී ද? එම දරුවන්ට ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබන පාසල් කොපමණ සංඛ්‍යාවක් මෙරට පවතී ද? ප්‍රාදේශීය ජන සංයුතියේ සිටින ආබාධිතයින් සංඛ්‍යාව අනුව ආබාධ සහිත දරුවන්ට අධ්‍යාපනය ලැබෙන බවට තහවුරු කිරීමට සිටින ගුරුවරු ප්‍රමාණවත් ද? පාසල් යටිතල පහසුකම් ප්‍රමාණවත්ව පවතී ද? එසේනම්, එම දත්ත සංඛ්‍යාලේඛන ජාතික හා පළාත් වශයෙන් ඉදිරිපත් කළ හැකි ද? ආබාධිත දරුවන්ට ඉගැන්වීම් සිදු කරනු ලබන - විශේෂයෙන්ම ශ්‍රවණාබාධිත - ගුරුවරුන් සඳහා සංඥා භාෂා පිළිබඳ ප්‍රවීණතාව ප්‍රමාණවත්ව ලබා දිය නොහැකි ද?

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, braille system and braille communication වැඩ පිළිවෙළ පිළිබඳව. යම්කිසි රාජ්‍ය මැදිහත්වීමක් හරහා ඒ ක්‍රමවේද වැඩි දියුණු කරන්න කටයුතු කරනවාද?

ආබාධ සහිත ගුරුවරුන් සඳහා අවශ්‍ය පහසුකම් පාසල්වල අවශ්‍ය පරිදි පවතින බවට සහතික වන්නේ ද?

ඒ වාගේම ඇමතිතුමා පොරොන්දු වෙලා තිබෙනවා, ආබාධිත දරුවන් ඉන්න පාසල්වලටත් දිවා ආහාරය ලබා දෙනවා කියලා. නමුත්, තවම ඒ දේ ක්‍රියාත්මක වෙලා නැහැ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ පිළිබඳව ඉක්මන් ක්‍රියාමාර්ග ගන්න කියලා.

02. වර්තමානයේ ආබාධිත දරුවන් වෙන් කර ඉගැන්වීමේ ක්‍රමවේදය වෙනුවට සියලුදෙනා අන්තර්ගත වූ අධ්‍යාපනයක් - inclusive education - ලබා දීමේ ක්‍රමවේදය විදේශීය රටවල් විසින් -විශේෂයෙන්ම ෆින්ලන්තය, කැනඩාව වැනි රටවල් - අනුගමනය කරනු ලබනවා. වෙන් වෙන්ව යටිතල පහසුකම් සැපයිය නොහැකි ස්ථානවල තෝරා ගත් ගුරු පුහුණු සහ අවම භෞතික සම්පත් ලබා දී මෙම ක්‍රමවේදය මඟින් සියලුදෙනාම අන්තර්ගත කරගත් අධ්‍යාපනයක් - inclusive education - නියමු ව්‍යාපෘතියක් වශයෙන් හෝ ක්‍රියාවට නැංවිය නොහැකි ද? නොහැකි නම් ඒ මන්ද?

03. ආබාධ සහිත දරුවන්ට නිසි වෘත්තීය පුහුණුවක් - vocational training - ලබා දීමේ වැඩ පිළිවෙළක්දැනට ක්‍රියාත්මක වන්නේ ද? එසේ නම්, මේ වන විට වෘත්තීය පුහුණුව ලැබූ ආබාධ සහිත පුද්ගලයින් කොපමණ සංඛ්‍යාවක් සිටී ද? මේ සම්බන්ධව ලෝකයට මේ වන විට පූර්වාදර්ශ සපයන එංගලන්තයේ හා ජර්මනියේ ප්‍රතිපත්ති ආදර්ශ කොට වත්මන් රැකියා වෙළඳපොළට ගැළපෙන පරිදි සහ ව්‍යවසායකත්වයට යොමු විය හැකි පරිදි ආබාධිත ප්‍රජාව වෙනුවෙන් වෘත්තීය පුහුණුව හා වෘත්තීය මාර්ගෝපදේශ ප්‍රතිපත්තියක් සකස් කර ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි ද? ආබාධිත වීම නිසා ඇතැම් බැංකු මේ අයට ණය පහසුකම් ලබා දෙන්නේ නැහැ.

අපි මතක තබා ගන්නට ඕනෑ, ආබාධිත තත්ත්වයෙන් සිටියත් බොහෝ දෙනා ස්වශක්තියෙන්, ස්වෝත්සාහයෙන් ආදායම් මාර්ග නිර්මාණය කරගෙන, හොඳ ව්‍යාපාර ක්‍රියාත්මක කරන ව්‍යවසායකයන් විධියට සිටින බව. එසේ නම් එවන් තත්ත්වයක් තුළ යමෙක් ආබාධිත වූ පමණින් බැංකු ණය ලබාදීම ප්‍රතික්ෂේප කිරීම මානව අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක් හැටියටයි අපි දකින්නේ. මේ පිළිබඳව රජයේ මැදිහත් වීම කුමක්ද?

ව්‍යවසායකත්ව අවස්ථා වෙනුවෙන් ඉල්ලීම් කරනු ලබන එවැනි ණය ඉල්ලීම් සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් ලබා දිය නොහැකිද?

මම මතක් කරන්න කැමැතියි, ආබාධ සහිත පුද්ගලයන්ට ඖත්තීය පුහුණුව ලබාදීමට අදාළව ලෝකයේ රටවල බොහෝ පූර්වාදර්ශ තිබෙන බව. In the United Kingdom, the Disability Confident Scheme encourages employers to recruit and retain disabled employees. In Germany, the Social Code Book IX promotes vocational rehabilitation and integration of people with disabilities into the labour market. මම මේ කථා කරන්නේ අපේම රටේ ලක්ෂ 18ක් ජනතාවගේ අයිතීන් සුරක්ෂා කිරීම වෙනුවෙන්.

04. "අස්වැසුම" ප්‍රතිලාභ නිමි පවුල්වල සිටින ආබාධ සහිත පුද්ගලයන්ට හා වකුගඩු රෝගීන්ට දීමනා ලබා දීමේදී එය "අස්වැසුම" ප්‍රතිලාභයටම අන්තර්ග්‍රහණය කිරීමක් සිදු කරනු ලබන බවට වාර්තා වෙනවා. මෙය සත්‍යයක්ද? එසේ නම් එය ක්‍රියාත්මක කරනු ලබන්නේ කෙසේද? කවදා සිටද? මෙමඟින් ආබාධිත ප්‍රජාවට හෝ වකුගඩු රෝගීන්ට දැනටමත් ලබා දෙන දීමනාවේ අඩු වීමක් සිදු නොවන බවට රජය සහතික වන්නේද?

05. රාජ්‍ය සේවයේ පුරප්පාඩුවලින් සියයට තුනක අවස්ථාවක් ආබාධිත ප්‍රජාවට ලබා දිය යුතු වෙනවා. එසේම කොන්දේසි සහිත විභාගයකට මුහුණ දීමකින් හා කුසලතා පදනම මත පත්වීම් ලබා දිය හැකි වෙනවා. මෙවර පළාත් මට්ටමින් ගුරු පත්වීම් ලබා දීමේදී ආබාධිත ප්‍රජාවට මෙම අවස්ථාව ලබා දී ඇති බව රජයට සහතික කළ හැකිද? නොඑසේ නම් ඊට හේතුව කුමක්ද?

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1988/27 මඟින් රාජ්‍ය සේවය සහ රාජ්‍ය සංස්ථාවල ඇබෑර්තු පිරවීමේදී පවතින පුරප්පාඩුවලින් සියයට තුනක අවස්ථාවක් ආබාධිත ප්‍රජාවට ලබා දිය යුතු බවට එදා රජය තීන්දු කරලා තිබෙනවා. 2007 වසරේදී ගුරු පත්වීම් ලබා දීමේදී ආබාධිත ප්‍රජාවට විභාග සඳහා මුහුණ දීමකින් තොරව කුසලතා පදනම මත පත්වීම් ලබා දිය යුතු යැයි ඒ වෙනුවෙන් කැබිනට් මණ්ඩල තීන්දුවකුත් ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ අරගෙන තිබෙනවා. මොනවාද ඒවාට වුණේ?

06. ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධව නව පනත් කෙටුම්පත් සකස් කිරීමේ ප්‍රගතිය කුමක්ද?

ගරු සභානායකතුමනි, ආබාධ සහිත ප්‍රජාවගේ අයිතිවාසිකම් සම්බන්ධ නව පනත් කෙටුම්පත පිළිබඳව අනන්තවත් අපි මේ සභාවේ අහලා තිබෙනවා; ප්‍රශ්න කරලා තිබෙනවා. එය අද එනවා, හෙට එනවා, අනිද්දා එනවා කියලායි කියන්නේ. නමුත් ඒක ක්‍රියාවට නැංවෙන්නේ නැහැ. කවදාද මේවා ක්‍රියාත්මක කරන්නේ?

> එම පනතේ, ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් නීති සහ ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්වය අධීක්ෂණය සඳහා ස්වාධීන යන්ත්‍රණයක් පිහිටුවීමට ප්‍රතිපාදන තිබේද? ශ්‍රවණාබාධිත පුද්ගලයන්ට වැදගත්වන සංඥා භාෂා පනත් කෙටුම්පත මෙතෙක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොවීමට හේතු කවරේද?

07. ආබාධ සහිත තැනැත්තන් පොදු ස්ථානවලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම් සහිත රෙගුලාසි තවමත් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් රජය දැනුවත්ද? එසේ නම් ඇමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, ජපානය වැනි රටවල ප්‍රමිතීන් අනුගමනය කොට මෙරට මෙම තත්ත්වයන් නිවැරැදි කිරීමට රජය ගෙන ඇති පියවර කවරේද?

08. ආබාධිත ප්‍රජාව භාවිත කරනු ලබන උපාංග හා උපකරණවල අඩුවක් - හිඟයක් - වෙළඳ පොළ තුළ දැකිය හැකි බව වාර්තා වෙනවා. ඒ සම්බන්ධයෙන් රජය දැනුවත්ද? එසේ නම් ඒ පිළිබඳ රජය ගෙන ඇති පියවර කවරේද? ආබාධිත ප්‍රජාවට දේශීය රක්ෂණ සමාගම් මඟින් සෞඛ්‍ය රක්ෂණාවරණයක් ලබා ගැනීමේ අවස්ථාවක් හිමි කරදීම සඳහා වැඩ පිළිවෙළක් රජයට සකස් කළ නොහැකිද?

09. මෑත කාලීනව ස්වාභාවික උවදුරු වැඩි වශයෙන් වාර්තා වෙනවා. රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය මඟින් ඒ සම්බන්ධව ජනතාවට පූර්ව අනතුරු ඇඟවීම් සිදු කළත් ආබාධිත ප්‍රජාව, විශේෂයෙන් ශ්‍රවණාබාධිත ප්‍රජාව ඒ වාගේම දෘශ්‍යාබාධිත ප්‍රජාව ඉලක්ක කොට මෙම සන්නිවේදනය සිදු නොවන බව අපට දකින්නට, අහන්නට ලැබෙනවා.

මේ සම්බන්ධව මාධ්‍ය හා රාජ්‍ය ආයතන එක්ව කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ නොහැකිද? එසේම හදිසි තත්ත්වයන්හි දී ආබාධිත අයගේ අවශ්‍යතා කළමනාකරණය සඳහා විශේෂිත වූ ක්‍රමවේදයක් සකස් කළ නොහැකිද?

ගරු කථානායකතුමනි, මා සතුව තිබෙනවා ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය. ලෝක සම්මුති ගණනාවකට අපි අත්සන් කරලා තිබෙනවා. ලෝක සම්මුතිවලට අත්සන් කළාට ඒ ලෝක සම්මුති අපේ රටේ ක්‍රියාත්මක වන නීතියක් බවට පරිවර්තනය කරන්නට හැකියාවක් ලැබිලා නැහැ. The Convention on the Rights of Persons with Disabilities and the Optional Protocol to the Convention on the Rights of Persons with Disabilities ආදි ජාත්‍යන්තර ප්‍රඥප්ති රටේ නීති - enacting legislations - බවට පත් කර ක්‍රියාත්මක කිරීමට රජය අපොහොසත් වෙලා තිබෙනවා. ඒ නිසා මම කාරුණිකව ඉල්ලා සිටිනවා, මේ වැඩසටහන් ටික ආබාධිත ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න කියලා; ඒ කටයුත්ත ඉෂ්ට සිද්ධ කරන්න කියලා.

ඇමෙරිකාවේ තිබෙනවා, Modified Accelerated Cost Recovery System එකක්. ඒ වැඩ පිළිවෙළ හරහා disabled ප්‍රජාවට ප්‍රාග්ධනයට ප්‍රවේශය - access to credit - ලැබෙනවා. ඒ වාගේම ආබාධිත ප්‍රජාවට tax credits ලබා දීම, tax incentives ලබා දීම සිදු කරනවා. The Americans with Disabilities Act - ADA - එක යටතේ ඉතා විශාල සහන ප්‍රමාණයක් ලැබෙනවා. නමුත් කනගාටුයි කියන්න, අපේ රටේ ආබාධිත ප්‍රජාවට තවමත් -අදටත්- ලැබෙන්නේ කුඩම්මාගේ සැලකිලි. මම ගරු සභානායකතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, මා ඉදිරිපත් කරපු මේ ගැටලුවලට ආබාධිත ප්‍රජාවගේ පැත්තෙන් නිසි විසඳුම් සහිත පිළිතුරු ලබා දෙන්න කියලා. බොහොම ස්තූතියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයේ ප්‍රශ්න 9ක් තිබෙනවා. ඒකේ පළමුවැනි ප්‍රශ්න තුන අධ්‍යාපනයට සෘජුව සම්බන්ධ වෙනවා. මම මුලින් ඒවාට පිළිතුරු ලබා දෙනවා. අනෙක් ප්‍රශ්නවලට අදාළ රාජ්‍ය අමාත්‍යවරු පිළිතුරු ලබා දෙයි.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

01. මෙරට පාසල් යන වයසේ ආබාධිත දරුවන්: උපකෘත විශේෂ පාසල්වල 2,135යි; විශේෂ අධ්‍යාපන ඒකකවල 9,476යි; රජයේ විශේෂ පාසල්වල 96යි; එකතුව 11,707යි.

එම දරුවන්ට ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබන පාසල්: උපකෘත විශේෂ පාසල් 27යි; රජයේ විශේෂ පාසල් 3යි; රජයේ පාසල්වල පිහිටුවා ඇති විශේෂ අධ්‍යාපන ඒකක 879යි; එකතුව 909යි.

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට ප්‍රමාණවත් ගුරුවරුන් නොමැති බව පිළිගන්නවා. 1:5 අනුපාතයට අනුව හිඟ ගුරුවරුන් සංඛ්‍යාව 473යි. විශේෂ දරුවන් සඳහා වෙනත් ගුරු ශිෂ්‍ය අනුපාතයක් නොව 1:5 අනුපාතය තමයි යොදා ගන්නේ. විශේෂ අධ්‍යාපන ඒකකවල සිටින ගුරුවරුන් සංඛ්‍යාව 1,456යි; විශේෂ පාසල්වල සිටින ගුරුවරුන් සංඛ්‍යාව 412යි; එකතුව 1,868යි.

පාසල්වල යටිතල පහසුකම් ප්‍රමාණවත් නැහැ. එම දත්ත, සංඛ්‍යාලේඛන පාසල් මට්ටමින් ලබා දිය හැකියි.

ආබාධිත දරුවන්ට -විශේෂයෙන් ශ්‍රවණාබාධිත දරුවන්ට- ඉගැන්වීම් සිදු කරනු ලබන ගුරුවරුන් සඳහා සංඥා භාෂා පිළිබඳ ප්‍රවීණතාව ප්‍රමාණවත්ව ලබා දිය හැකියි. බ්‍රේල් ක්‍රමයට ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කරලා G.C.E. O/L සහ G.C.E. A/L විභාගවලදී ලබා දෙනවා. ඒකට වෙනම මුද්‍රණාලයක් පවා තිබෙනවා. දැනටමත් ජාතික අධ්‍යාපන ආයතනය සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව ක්‍රියාත්මක කරමින් පවතිනවා. අධ්‍යාපන අමාත්‍යාංශය ගුරු පුහුණුවීම් සිදු කරනු ලබන අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 1/2023 චක්‍රලේඛය පරිදි ශ්‍රවණ ඌනතා දරුවන්ට ඉගැන්වීම් සිදු කරනු ලබන ගුරුවරුන් අනිවාර්යයෙන් සංඥා භාෂා ප්‍රවීණතාව ලබා තිබිය යුතුයි. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සංඥා භාෂාව පිළිබඳ පරීක්ෂණයක් සිදු කර, ප්‍රවීණතා සහතිකය ලබා දීමත්, ප්‍රවීණතාව ලබා නොගත් ගුරුවරුන් වෙනුවෙන් නැවත පුහුණු සැසි පවත්වා ප්‍රවීණතාව ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමත් කරනු ලබනවා. දැනට ආබාධ සහිත ගුරුවරුන් සඳහා අවශ්‍ය පහසුකම් පාසල්වල ප්‍රමාණවත් නැහැ.

02. අන්තර්කරණ අධ්‍යාපන - inclusive education - ක්‍රමය දියුණු රටවල ක්‍රියාත්මක වෙනවා. එම ක්‍රමය ක්‍රියාත්මක වන පාසල්වල ගුරු සහායකයෙක් ඉන්නවා. ඒ ගුරු සහායකයා තමයි, යම් ආබාධයක් තිබෙන දරුවන් වෙනමම බලා ගන්නේ. අපේ රටේත් එවැනි ක්‍රමයක් යොදන්න අවශ්‍ය වෙනවා.

Inclusive education ක්‍රමය නියමු ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාවට නංවා තිබෙනවා. ශ්‍රී ලංකාව තුළ අන්තර්කරණ අධ්‍යාපනය අවධිමත්ව සිදු වී ඇති අතර, අධ්‍යාපන අමාත්‍යාංශය 2020 වර්ෂයේ සිට 37/2020 චක්‍රලේඛය නිකුත් කරමින් අන්තර්කරණ අධ්‍යාපනය නීත්‍යානුකූලව සිදු කිරීම සඳහා පියවර ගෙන තිබෙනවා. ඒ සඳහා විදුහල්පතිවරුන්, ගුරුවරුන්, විශේෂ අධ්‍යාපන ගුරුවරුන් පුහුණු කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කර ඇති 33/2022 විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය පිළිබඳ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්ව අවුරුදු 3දී මෙම දරුවන් හඳුනාගෙන, කලාප කාර්යාලවල පිහිටුවා ඇති තක්සේරු කමිටු මඟින් තක්සේරුකරණය සිදු කරනු ලබනවා. මෙමඟින් හඳුනා ගන්නා පහළ මට්ටමේ බුද්ධි මට්ටමක් සහිත දරුවන්, වයස අවුරුදු හතරේදී සාමාන්‍ය පාසල්වල පිහිටුවා ඇති විශේෂ අධ්‍යාපන ඒකකවලට මෙන්ම, උපකෘත විශේෂ පාසල්වලට යොමු කර අන්තර්කරණ අධ්‍යාපනයක් කරා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ii මඟින් පුහුණු කර, වයස අවුරුදු පහේදී සහ අවුරුදු හයේදී සාමාන්‍ය පන්ති කාමරය වෙතට යොමු කිරීමට කටයුතු කරලා තිබෙනවා.

එසේම ඉහළ බුද්ධි මට්ටමක් සහිත දරුවන් වයස අවුරුදු පහේදී සාමාන්‍ය ආකාරයට 1 ශ්‍රේණියට ඉල්ලුම්පත් යොමු කර, අන්තර්කරණ අධ්‍යාපනයට යොමු කරවීමේ අවස්ථා සලසා තිබෙනවා.

මේ සඳහා 1 ශ්‍රේණියට සිසුන් බඳවා ගැනීමේ සාමාන්‍ය චක්‍රලේඛය වෙනස්කම් සිදු කරමින් 2024 වර්ෂයේ සිට මෙම විශේෂ අවශ්‍යතා සහිත දරුවන් අතරින් සියයට 3ක අවස්ථාව ලබා දී තිබෙනවා. මෙම දරුවන්ගේ නාම ලේඛනය කලාප කාර්යාලය මඟින් අදාළ පාසල් වෙත යොමු කරනු ලබන අතර, ජාතික පාසල් නාම ලේඛනය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් පසු පාසල් වෙතට දැනුම් දෙනු ලබනවා.

අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් අනෙකුත් දෙපාර්තමේන්තු සහ ආයතන එක්ව අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාවට නැංවීම සඳහා වසර දහයක ඒකාබද්ධ සැලැස්මක් -master plan- සකස් කර තිබෙනවා. මෙය කෙටි කාලීනව, මධ්‍ය කාලීනව සහ දිගු කාලීනව ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතිනවා. මේ සඳහා ජාතික අධ්‍යාපන ආයතනය, සමාජ සේවා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඇතුළුව විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා කටයුතු සිදු කරන සියලු දෙපාර්තමේන්තු මෙම සැලැස්මේ කොටස්කරුවන් ලෙස කටයුතු කරනවා.

ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් මීට වසර කිහිපයකට පෙර හෝමාගම වෙනිවැල්කොළ ප්‍රදේශයේ ආධාර ව්‍යාපෘතියක් යටතේ සම්පූර්ණ සම්පත් මධ්‍යස්ථානයක් හදලා තිබෙනවා. ඒ සම්පත් මධ්‍යස්ථානය මඟින් තවදුරටත් කටයුතු කරගෙන යනවා.

03. ආබාධිත දරුවන්හට හැදෑරීමේ භාෂාවක් නොපවතින ඕනෑම පුහුණු පාඨමාලාවක් සඳහා ඇතුළත් වීමේ හැකියාව තිබෙනවා. එම දරුවන්හට ඇගැයීම් පැවැත්වීමේදී විශේෂ ක්‍රමවේදයක් යටතේ පවත්වනු ලබනවා.

මෙහිදී වෘත්තීය පුහුණුව ලබා දීමට කටයුතු කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ අයට යම් අරමුදලකුත් දෙනවා. මෙය මා හොඳින්ම දන්නවා. විවිධ දේවල් නිෂ්පාදනය සඳහා - විශේෂයෙන්ම සූපවේදය යටතේ- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් දිරිගැන්වීම් ලබා දෙනවා. උදාහරණයක් ගනිමු. පීටිසා වාගේ දේවල් නිෂ්පාදනය කරන සමූහයක් ඉන්නවා. ඒ වාගේ සමූහ කිහිපයක් හදලා තිබෙනවා. ඒකට එක්තරා ව්‍යාපෘතියකින් ආධාර ද ලැබෙනවා. අපි එය දිගටම පවත්වාගෙන යනවා. පාඨමාලාව අවසන් වන කොට ඒ සඳහා අවශ්‍ය උපකරණ, පුහුණුව ආදි සියල්ල ලබා දීලා, ඒ ගොල්ලන්ට ඒවා ස්වයංව කරගෙන යෑමේ පහසුකමත් සලසා තිබෙනවා.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ තොරතුරු පද්ධතියට අනුව, මේ වන විට ආබාධ සහිත දරුවන් 489දෙනෙකු විවිධ පාඨමාලා යටතේ පුහුණුව ලබනවා. එම නිසා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රතිපත්තිය දැනටමත් ක්‍රියාත්මක කරනවා. හැබැයි, මේවා තවදුරටත් ව්‍යාප්ත කරලා පවත්වාගෙන යා යුතුයි.

මෙතැන තිබෙන ලොකුම ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. උදාහරණයක් වශයෙන් ගනිමු, ශ්‍රවණාබාධිත දරුවන්. ඕස්ට්‍රේලියාව ආදි රටවල ශ්‍රවණාබාධිත දරුවන් එක්කෙනෙක්වත් නැහැ. මොකද, ඒ ඔක්කොටම cochlear

implant surgery එක අවුරුද්දක් වෙන්න කලින් සිදු කරනවා. අපේ රටේ 1,000ක් සම්පූර්ණ කළා. හැබැයි, එහි මිල ඉතා අධිකයි. ලක්ෂ 25ක් විතර යනවා, එක උපාංගයකට. හැබැයි, අපිත් මැදිහත් වෙලා එය සිදු කරලා තිබෙනවා. මේ වන කොට ඒවා වැඩිදුරටත් වර්ධනය වෙනවා. කොහොම වුණත් අපි මේ කටයුතු කරගෙන යනවා. ඉතාම කුඩා අවධියේදී මේ ආබාධය හඳුනා ගත්තොත්, ඊළඟ අවුරුදු දෙක තුනේදී ඒ අයගෙන් සෑහෙන පිරිසක් පාසල්ගත කරලා අන්තර්කරණ අධ්‍යාපනයට යොමු කරන්න අපට පුළුවන්. ඉතින්, ඒ කටයුතු කරගෙන යනවා. ඒ විතරක් නොවෙයි, පෙර පාසල් ගුරුවරුන් වෙනුවෙන් හදලා තිබෙන උපදෙස් සංග්‍රහය යටතේ, පුහුණුවීම් පාඨමාලාව යටතේ ඉදිරි කාලය තුළ ඒ අයටත් මේ පිළිබඳ අවබෝධය ලබා දෙනවා. දරුවන් අවුරුදු තුනේදී තමයි ඉස්සෙල්ලාම පෙර පාසල් ගුරුවරුන් ළඟට එන්නේ. එතැනදී මේ ආබාධය හඳුනා ගන්න බැරි වුණොත් අමාරුයි. එම නිසා ඒ හඳුනා ගැනීම සඳහාත් අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපි දැනට කටයුතු කරගෙන යනවා.

පළාත් සභා කිහිපයක සියයට තුනේ quota එක දෙන්නේ නැහැ කියලා මට පැමිණිලි ලැබුණා, ගරු විපක්ෂ නායකතුමනි. ඒ වෙලාවේ අපි නැවත ලියුම් යවලා ඒ අයට කිව්වා, සියයට තුනේ quota එක දෙන්න කියලා. යම් පිරිසක් ඇවිත් මාවත් හමු වුණා. තවත් කොහේ හෝ දීලා නැත්නම් ඉදිරියේදී ලබා දෙන පත්වීම්වලදීත් ඒ සියයට තුන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව ලබා දෙන්න කටයුතු කරනවා.

ගරු විපක්ෂ නායකතුමාගේ සෙසු ප්‍රශ්නවලට -විශේෂයෙන්ම අස්වැසුම ප්‍රතිලාභ ගැන- අදාළ රාජ්‍ය ඇමතිවරුන් විසින් පිළිතුරු ලබා දෙනවා ඇති. රාජ්‍ය සේවයේ පුරප්පාඩු ගැන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනුව මම කිව්වා.

ඊළඟට ලබන ජූලි 02වැනි දා කෙටුම්පතක් ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ අධ්‍යාපන ඒකකයත්, යම් කණ්ඩායමකුත් දැනට කටයුතු කරගෙන යනවා. ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා විදේශගත වෙලා ආවෙත්, ඒ රාජ්‍ය නොවන සංවිධාන හරහා ඒ ජාත්‍යන්තර සමුළුවට නියෝජිතයෙක් හැටියට සහභාගි වෙලායි. මේ ඔක්කෝම ඒක රාශි කරලා ඒ සඳහා අදහස් ලබාගෙන කටයුතු කිරීමේ වැඩ පිළිවෙළක් දැනට ක්‍රියාත්මක කරගෙන යනවා.

ආබාධිත අයට පොදු ස්ථානවලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම් සහිත රෙගුලාසි ක්‍රියාත්මක කිරීම විවිධ අමාත්‍යාංශවලටයි පැවරෙන්නේ. ගරු විපක්ෂ නායකතුමනි, ඒ නිසා අපිට ඒ ප්‍රශ්න එම අමාත්‍යාංශවලට යොමු කරන්න වෙනවා, ඔබතුමාගේ පිළිතුර සම්පූර්ණ වීම සඳහා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු සභානායකතුමනි, මම විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ ඩලස් අලහප්පෙරුම මැතිතුමා ගැන. එතුමා, ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපතිතුමා. එතුමාව ඒ ධුරයට පත් කිරීම සඳහා වූ යෝජනාව පක්ෂ නායක රැස්වීමට ඉදිරිපත් වුණාම බොහෝදෙනා ඒ පත්වීමට විරුද්ධ වුණා. මම ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙනවා. මම කථානායකතුමාට දැඩි බලපෑමක් කරලා තමයි එතුමාව ඒකට පත් කරගත්තේ. ඒ විතරක් නොවෙයි, අද වන විට ඩලස් අලහප්පෙරුම මැතිතුමා ආබාධිත ප්‍රජාව වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සම්මේලනවලටත් සහභාගි වෙලා ආබාධිත ප්‍රජාවගේ අඩුපාඩුකම්, අගහිඟතා, අයිතිවාසිකම් පිළිබඳව කථා කරලා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශිෂ්ට නියෝජනත්වයක් බොහොම දැවැන්ත ලෙස ඉෂ්ට කළා.

හැබැයි මේ ඔක්කෝම කළා වුණත් මම කනගාටුවෙන් යුතුව හෝ මේ කාරණයත් කියන්නට ඕනෑ. ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නයට අදාළව අධ්‍යාපන පැනිකඩවලට ඔබතුමා උත්තර දුන්නා. මේ ආබාධිත ප්‍රජාව සතු අයිතිවාසිකම් සුරක්ෂා වෙන අලුත් කෙටුම්පත පිළිබඳව අපි මේ සභාවේ පුන පුනාම ඇහුවා. එය අද ඉදිරිපත් කරනවා, හෙට ඉදිරිපත් කරනවා, ඊළඟ මාසයේ නීති-රීති ගෙනෙනවා කියලා කිව්වාට අද මෙම ප්‍රශ්නයේ ඉතිරි කොටස්වලටත් උත්තර දෙන්නට ඇමතිවරු සභාවේ නැහැ. ගරු සභානායකතුමනි, මම ඉල්ලීමක් කරනවා මේ පාර්ලිමේන්තු සතියේ සෙසු ඇමතිවරු කැඳවලා ඒ උත්තර ලබා දෙන්න කටයුතු කරන්න කියලා. මොකද, දහඅට ලක්ෂයක් වූ මෙරට ආබාධිත ප්‍රජාවගේ හැඟීමක් තිබෙනවා, මේ රටේ රාජ්‍ය තන්ත්‍රය තුළ ඒ අයගේ අයිතිවාසිකම් පිළිබඳව දැඩි උනන්දුවක් නැහැ කියලා. ඒක එක ආණ්ඩුවකට සීමා වුණු දෙයක් නොවෙයි, ආණ්ඩු ගණනාවක් තුළ තිබුණු දෙයක්. ගරු සභානායකතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඒ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්න ගරු ඇමතිතුමන්ලා උනන්දු කරවන්න කියලා.

අවසාන කාරණාව මෙයයි, ගරු කථානායකතුමනි. අපේ ගරු සභානායකතුමා මේ සභාවේ ඉන්න අවස්ථාවේ අපේ චමල් රාජපක්ෂ මැතිතුමාත් මේ අවස්ථාවේ මේ සභාවේ සිටින එක ගැන මම සතුටු වෙනවා. ගරු සභානායකතුමනි, ලොකු මැසිවිල්ලක් තිබෙනවා, ඔබතුමාගේ අවධානයට යොමු කරන්න. ග්‍රාම නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාව, වැටුප් තලය ඇතුළු අනෙකුත් ගැටලු සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදී අපි පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කළා. ඒ වාගේම, අදාළ අමාත්‍යවරයාත් ඒ ග්‍රාම නිලධාරී සංගම් එක්ක සාකච්ඡා කරලා යම්කිසි එකඟතාවකට ආවා. ඒක බොහොම හොඳයි. හැබැයි, අමාත්‍යාංශය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යවලා තිබෙන මෙම සේවා ව්‍යවස්ථාව පිළිබඳ කෙටුම්පත, විවිධ ග්‍රාම නිලධාරී සංගම් නියෝජනය කරන කණ්ඩායම කරුණු කාරණා ඉදිරිපත් කරලා එළැඹුණු එකඟතාව මත සකස් කළ එක නොවෙයි, වෙනස් එකක්. එහෙම වෙනස් එකක් යවලා දැන් headline එක ගහලා කියනවා, "මෙන්න, ග්‍රාම නිලධාරිතුමන්ලා බලාපොරොත්තු වෙන සේවා ව්‍යවස්ථාව ලැබුණා" කියලා.

විශේෂයෙන් මම කියන්න කැමැතියි, ග්‍රාම නිලධාරීන් වෙනුවෙන් ගෙවනු ලබන දීමනා ඉහළ දැමීම පිළිබඳව කිසිම නිර්දේශයක් නැති බව. තවමත් තිබෙන්නේ 2016දී ලබා දුන්නු රුපියල් 600ක මාසික දීමනාව. ඒ වාගේම, ග්‍රාමීයව 1,000 සිට 2,000 දක්වාත්, නාගරිකව 3,000 දක්වාත් කාර්යාල දීමනාව වැඩි කරලා තිබුණත්, ඒ මුදලට කාර්යාල පහසුකම් ලබා ගන්නට බැහැ. ග්‍රාම නිලධාරිවරයා අතින් ගෙවලා තමයි ඒ කාර්යාල පහසුකම් ලබා ගන්නේ. ඒ වාගේම පුරප්පාඩු පිරවීම සඳහා නවක ග්‍රාම නිලධාරීන් 1,942ක් බඳවා ගත්තත්, ඒ ගොල්ලන්ගේ තුන් මාසයක පුහුණුව සඳහා අනුමත මාසික දීමනාව රුපියල් 3,000යි. ගරු ඇමතිතුමනි, රුපියල් 3,000කින් මාසිකව ඔය පුහුණු කටයුතු කරගෙන යන්නට කටයුතු කරන්නේ කොහොමද කියන එක මම අහන්න කැමැතියි. ඒ නිසා පුහුණු දීමනාව හැටියට මූලික වැටුප හෝ ලබා දෙන්න පුළුවන් නම් ඒක බොහොම වැදගත් වෙනවා.

ගරු කථානායකතුමනි, ග්‍රාම නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාව පිළිබඳව කථා කරද්දී චමල් රාජපක්ෂ මැතිතුමා ගැනත් සඳහන් කළේ එතුමාගෙනුත් මම මේ කාරණය සම්බන්ධව ප්‍රශ්න කරලා තිබෙන නිසායි; අවස්ථා ගණනාවකදී ප්‍රශ්න කරලා තිබෙනවා. හැබැයි සාකච්ඡා කරපු සේවා ව්‍යවස්ථාව නොවෙයි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යවා තිබෙන්නේ. මේ නිසා බරපතළ වරදක්, බරපතළ අඩු පාඩුවක් සිදු වෙලා තිබෙනවා. මේ පිළිබඳවත් හෙට හෝ අනිද්දා දවසේ පාර්ලිමේන්තුවට උත්තරයක් ලබා දෙන්න කියලා අදාළ ඇමතිවරයාගෙන් මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා සඳහන් කළා ග්‍රාම නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාව පිළිබඳව. මම ස්වදේශ කටයුතු රාජ්‍ය ඇමතිවරයා හැටියට හිටපු කාලයේ තමයි ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, ඒ වාගේම තාක්ෂණ නිලධාරීන් තමන්ගේ සේවා ව්‍යවස්ථා සකස් කළේ. නමුත්, එම කටයුත්තට කල්ගත වීම නිසා වෘත්තීය සමිති කණ්ඩායම් ඇතුළු සියලු කණ්ඩායම් ගෙනැල්ලා සාකච්ඡා කරලා එකඟතාවකට ඇවිල්ලා වාර්තාව භදන්න දුන්නා. හැබැයි, ඊට පසුව මම අමාත්‍යාංශය භාරව හිටියේ නැහැ. මට ආරංචියි, ඒවා නිලධාරීන් මේස ලාච්චුවල තියාගෙන ඉඳලා තිබෙන බව. ඒවා ඉහළ නිලධාරීන්ට යවා නැහැ. එම නිසා හැම දාම ගැටුම්. විපක්ෂ නායකතුමනි, ඒ කාරණය මතු කරපු එක ගැන ඔබතුමාට ස්තුතියි. ඒ ගැන අවධානය යොමු කර ඉක්මන් පියවරක් ගන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම කියපු කාරණාව චමල් රාජපක්ෂ මැතිතුමා සාක්ෂි ඉදිරිපත් කරලා ඔප්පු කළා. හරියටම හරි. එකට වාඩි වෙලා පැමිණි එකඟතාව පැත්තකින් තියලා, අනුමත කර ගන්න වෙනත් කුට ලේඛන යවන්නේ කොහොමද? ඒක බරපතළ ප්‍රශ්නයක්. මේ කාරණයට ඉදිරිපත් වීම සම්බන්ධව අපේ චමල් රාජපක්ෂ මැතිතුමාට මම ස්තුතිවන්ත වනවා. ගරු කථානායකතුමනි, පැමිණි එකඟතා ලාච්චුවක් අස්සට දාලා, ග්‍රාම නිලධාරී සේවා ව්‍යවස්ථාවයි කියලා අනුමත කර ගන්න වෙනත් කුට ලේඛන යවලා තිබෙනවා. කරුණාකරලා ඔබතුමාත් මේකට මැදිහත් වෙලා, මේ වරද නිවැරදි කරන්න කියලා රජයට උපදෙස් දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

වරප්‍රසාද: ගරු අනුරාධ ජයරත්න මහතා 2024.02.09 දින ඉදිරිපත් කළ වරප්‍රසාද ප්‍රශ්නය නීතිපතිවරයා වෙත යොමු කිරීම

சிறப்புரிமை: மாண்புமிகு அனுராத ஜயரத்ன அவர்கள் 2024.02.09ஆம் திகதி முன்வைத்த சிறப்புரிமைக் கேள்வியை சட்டமா அதிபருக்கு ஆற்றுப்படுத்தல்

PRIVILEGE: REFERRING QUESTION OF PRIVILEGE RAISED BY HON. ANURADHA JAYARATNE ON 09.02.2024 TO ATTORNEY-GENERAL

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුරාධ ජයරත්න මහතා විසින් ගම්පොළ උඩපළාත ප්‍රාදේශීය ලේකම් ලෙස ආත්මා දිලුක්ෂි ජයරත්න මහත්මියගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් 2024.02.09 දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරයේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් සලකා බලා එකී කාරක සභාව 2024 ජූනි මස 06 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව මගින් එම කාරක සභාව නිර්දේශ කර ඇති පරිදි 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 26(1)(ආ) වගන්තිය යටතේ වාර්තා කිරීම පිණිස නීතිපතිවරයා වෙත යොමු කළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா வினவப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දිනට නියමිත කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 8 දක්වා ඉදිරිපත් කිරීම.

සංචාරක කටයුතු පනත: නියමය

சுற்றுலாப் பயணத்துறைச் சட்டம்: கட்டளை

TOURISM ACT: ORDER

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව, සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 සැප්තැම්බර් 07 දිනැති අංක 2348/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.01.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2, 3, 4, 5 - සංචාරක කටයුතු පනත යටතේ තවත් නියෝග 4ක්, විෂය අංක 6 - හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග, විෂය අංක 7 - රජයේ ඉඩම් ආඥාපනත යටතේ නියෝග සහ විෂය අංක 8 - ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ වූ නියෝග ද මා ඉදිරිපත් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය ආරම්භ කිරීම, ගරු එම්.යූ.එම්. අලි සබ්රි අමාත්‍යතුමා.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] took the Chair.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා. පොඩ්ඩක් සංශෝධනය වෙයි.

[අ.භා. 12.53]

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி - வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry, PC - Minister of Foreign Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින වැදගත් නියම සහ නියෝග කිහිපයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ යටතේ මම කැමැතියි, ක්‍රිකට් ක්‍රීඩාව ඇතුළු ක්‍රීඩා පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න. එම විෂයයට අදාළව කරුණු ඉදිරිපත් කිරීමට පෙර අද උදේ ගරු සභාවේ සාකච්ඡා වුණු කාරණයක් පිළිබඳව එවකට කැබිනට් මණ්ඩලයේ හිටපු ඇමතිවරයෙක් හැටියට මා අදහස් දැක්වීමක් කරන්නට ඕනෑ.

කොවිඩ් මරණ ආදාහනය කිරීම පිළිබඳව මුලින්ම නීතියක් ගෙනාවා, 2020 මාර්තු මාසයේ මුල් සතියේ. එහිදී එම මෘතදේහ ආදාහනය සඳහා පමණක් අවසර ලබා දීලා තිබුණත් ඒ පිළිබඳව අපි ගිහිල්ලා කරුණු කිව්වාට පසුව, ඒ ගැන සලකා බලා ඒක වෙනස් කරලා ආදාහනය සහ භූමදානය කියන දෙකටම අවසර ලබා දුන්නා.

නමුත්, අවාසනාවකට වාගේ, 2020 මාර්තු මාසයේ 29වැනි දා හෝ 30වැනි දා කොවිඩ් ආසාදිත මුස්ලිම් අයෙකුගේ මරණයක් සම්බන්ධයෙන් -එම දේහය භූමදානය සඳහා- මීගමුව ප්‍රදේශයෙන් පළමුවැනි ඉල්ලීම කරනු ලැබුවා. ඒ වෙලාවේ නීතිය අනුව ඊට කැමැත්ත ලබා දීමට හැකියාව තිබියදී, එක රැයින් ඒ නීතිය වෙනස් වුණා. එක රැයින් නීතිය වෙනස් වුණාම අපි ඔහුව ආදාහනය කළා. එවකට සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් හිටියේ දැනට විශ්‍රාම ගොස් සිටින වෛද්‍ය අනිල් ජාසිංහ මැතිතුමායි. එතුමාත් එක්ක මේ ගැන කථා කරනකොට එතුමා කිව්වා, මේ වෙලාවේ මේ කටයුත්ත කරන්නට කියලා ඒ ගොල්ලන්ට යම් කිසි කමිටුවකින් උපදෙස් ලැබිලා තිබෙනවා කියලා. එම කමිටුවේ සභාපතිවරයා හැටියට හිටියේ වෛද්‍ය චන්න පෙරේරා මහතායි. මහාචාර්ය මෙත්තිකා විදානගේ මහත්මියත් එම කමිටුවේ හිටියා. අපි ගිහින් ඔවුන් සියලු දෙනා එක්ක සාකච්ඡා කළා. නමුත් ඔවුන් ඒ මතයෙන් එළියට එන්න කිසිසේත්ම කැමැත්තක් දැක්වුවේ නැහැ. ඊළඟට, මේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරු අට දෙනෙක් එක්ක - මට මතක විධියට අපේ තව්ෆික් මන්ත්‍රීතුමාත් සිටියා - අපි ගිහින් ඒ කමිටුව මුණගැහුණා. මම ඊට කලින් දෙසැරයක් ලංකාවේ විශේෂඥ වෛද්‍යවරු අට දෙනෙක් එක්ක - ෂෙරීෆ්ඩීන් මහත්මයා, රිෂ්වි ෂෙරීෆ් මහත්මයා, චජිර දිසානායක මහත්මයා ඇතුළු කණ්ඩායමක් එක්ක - ගිහින් මේ කමිටුව හමුවුණා. එතැනදීත් ඔවුන් එයට කැමති වුණේ නැහැ. පසුව හිටපු සෞඛ්‍ය ඇමතිනි පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනියට ඉල්ලීමක් කරලා අපි අට දෙනා කමිටුව හමුවීමට ගියා. ගියාම ඔවුන් අපි ඉදිරියේ කිව්වා, මේ අවස්ථාව නොදීපු එක හොඳයි කියලා එක්තරා ආගමික නායකයෙක් ඔවුන්ට ලිපියක් ලියා තිබෙනවා කියලා. එහෙම කිව්වා නේද? At that point in time, they said that a leader of a particular religious community had written to them, approving what they had done. So, there were a lot of things going on behind the curtains.

අපි කැබිනට් මණ්ඩලයේදිත් මේ ගැන දිගින් දිගටම සාකච්ඡා කළා. කැබිනට් එකේ කාගේවත් අකමැත්තක් තිබුණේ නැහැ, ඔවුන්ට සාධාරණයක් ඉෂ්ට වෙන නිසා. නමුත් මේ කමිටුව ඒ මතයෙන් එළියට එන්න බැහැම කිව්වා. ඊට පස්සේ තමයි එ්කේ තව කොටසක් විධියට මුජිබුර් රහුමාන් මහත්මයාත් උදේ කියපු ජෙනිෆර් කමිටුව පත් කළේ. ඔවුන් යෝජනා කළාට පස්සේ තමයි කොවිඩ් මෘතදේහ ඔට්ටමාවඩිවලට හෝ යවන්න අපට හැකියාව ලැබුණේ. එහෙම නැතිව කැබිනට් එකෙන් ඒක කරන්න එපා කියලා කිව්වේ නැහැ. ඒ කථාව වැරදියි. කැබිනට් එකේ හිටපු අයට සාධාරණයක් කරන්නට ඕනෑ. විමල් වීරවංශ මැතිතුමා, උදය ගම්මන්පිල මැතිතුමා ඇතුළු සියලු දෙනාම කිව්වේ, "මේ සඳහා අවස්ථාව දුන්නාට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අපට ඔය කාරණයට කට දාන්න බැහැ. ඒක කමිටුව හරහා කරගන්න" කියලායි. ඒක තමයි ඇත්තටම වුණේ. ඉන් පසුව අපි ඔට්ටමාවඩිවල ඒ භූමදාන කටයුතු කළා. එවැනි දෙයක් නැවත කවදාවත් සිදු නොවිය යුතුයි.

මෙත්තිකා විදානගේ මහත්මිය ඒ කාලයේ කිව්වා, ඒ වයිරස් පොළොව තුළට ගියාම අවුරුදු සියයකට පස්සේ වුණත් පොළොව කඩාගෙන එන්න පුළුවන් කියලා. ඊට පසුව අපි ජීවන් තොණ්ඩමන් ඇමතිතුමාට කියලා එතුමාගේ අමාත්‍යාංශය හරහා පරීක්ෂණයක් කළා. දැන් එම වාර්තාව ලැබිලා තිබෙනවා. එම වාර්තාවේ කියා තිබෙනවා, එහෙම කිසිම දෙයක් වෙන්නේ නැහැ කියලා. ඒ අනුව අපි Cabinet Paper එකක්, -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
මගේ වෙලාවෙන් ගන්න එපා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සබ්රි අමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මට මැදිහත් වෙන්න අවස්ථාව ලබා දීම ගැන.

ගරු ඇමතිතුමනි, දේශීය විශේෂඥ කමිටුව නිර්දේශ දුන්නා කියන කථාව ඔබතුමා කිව්වා. වෛද්‍යමය ප්‍රශ්නවල දී ගෝලීය මට්ටමක්; ගෝලීය standard එකක්; international standard එකක් අපට තිබෙනවා නේ. ඔබතුමා මේ කාරණය අවබෝධ කර ගත්තොත් හොඳයි. WHO Regulations, international best practices, ඒ කියන්නේ ලෝකයේ අනෙකුත් රටවල් අනුගමනය කරපු ක්‍රියාමාර්ග, පිළිගත් ලෝක සම්මුතියක්, ක්‍රියාදාමය ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක් තිබෙනවා නේ. ඇත්ත වශයෙන්ම අපට ඒක පදනම් කරගෙන ඉදිරියට යන්න තිබුණා නේ.

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
අනිවාර්යයෙන්ම.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න. මේක මම ඔබතුමාට පෞද්ගලිකව කියන කතන්දරයක් නොවෙයි. හැබැයි අවසානයේ අපි දැක්ක දෙයක් තිබෙනවා. ඔබතුමා තරහා වෙන්න එපා මේක කිව්වාට.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ රජය තුළ මුස්ලිම් ජනතාව, ඉස්ලාමීය ආගම දැඩි ලෙස ඉලක්ක කරගත් අන්ත ජාතිවාදී, අන්ත ආගම්වාදී කටයුතු තිබුණා. මුස්ලිම් ඉස්ලාමීය ප්‍රජාව යටපත් කරන්නට, ඒ අයගේ සංස්කෘතික ආගමික රටාව විනාශ කරන්නට දැඩි ප්‍රයත්නයක් තිබුණා. ඒකේ ප්‍රතිඵලය තමයි WHO එක objections ඉදිරිපත් කරද්දීත්, එහෙම කරන්න එපා, එපා කියද්දීත්, අපි රටක් හැටියට මේ නින්දිත ක්‍රියාව කළේ, ඉස්ලාමීය ආගම ධර්මයට අනුව කරන්න තිබුණු ඒ යුතුකම් ටික පැහැර හැරියේ. ඒකට මම ඔබතුමාට පෞද්ගලිකව චෝදනා කරනවා නොවෙයි. සමස්තයක් හැටියට ගෝඨාභය රාජපක්ෂ රජයට මම මේ චෝදනාව එල්ල කළ යුතුමයි. ඒ ස්ථාවරයේ මම එදාත් හිටියා, අදත් ඉන්නවා.

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි එම්.යූ.එම්. அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)

ඒ, ඔබතුමාගේ මතය. නමුත් මම කිව්වේ වෙච්ච දේ. ඒ අනුව ජෙනිෆර් කමිටුවේ තීරණය ආවාට පස්සේ එම දේහ ආදාහනය සහ භූමදානය කරන්න ඔට්ටමාවඩිවලට යන්න අවස්ථාව ලබා දුන්නා. ඒ අනුව තමයි ඒක සිද්ධ වුණේ. නමුත් අලුත් පනත් කෙටුම්පත ගෙන ඒම තුළින් අපි බලාපොරොත්තු වන්නේ මොකක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ගැන මිනිත්තුවකින් කියලා ඉවර කරන්නම්. අපේ ගරු ජීවන් තොණ්ඩමන් ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ජල පරීක්ෂණයක් කළාට පසුව, එවැනි කිසිදු කාන්දුවීමක් සිදු වෙලා නැහැ, එවැනි විෂබීජ ඇත්තෙත් නැහැ කියා ඔප්පු වෙලා තිබෙනවා. ඒ අනුව අපි Cabinet Paper එකක් ඉදිරිපත් කළා, ඒ ගැන පරීක්ෂා කරලා වාර්තාවක් දෙන්න කියලා. ඒ වාගේම නීතියට පටහැනිව වැඩ කරපු එවැනි අයට විරුද්ධව ගන්න පියවර මොකක්ද කියන එකත් අහන්න කියලා. නමුත් අවාසනාවකට වාගේ අපි මේකට විරුද්ධව උසාවි ගියාම උසාවියෙනුත් මේක ප්‍රතික්ෂේප කළා. ඒ නිසා තමයි අලුත් පනත් කෙටුම්පතක් ගෙනෙන්න අපි යෝජනා කළේ. ජනාධිපතිතුමා අදත් කිව්වා, මෙවැනි දෙයක් නැවත කිසි දවසක නොවෙන්නට අලුත් පනතක් ඉදිරියේ දී ගෙනෙනවා කියලා. ආදාහනය සහ භූමදානය යන ඕනෑ දෙයක් ඒ කැමැත්ත අනුව ලබා දෙන්නට අපි එම පනතෙන් බලාපොරොත්තු වනවා. Dispute එකක් වුණත් උසාවියට ගියාම එහිදී ඒක තීරණය කරන්න පුළුවන්. ඒ ඇරුණාම ඉතාම සුවිශේෂී අවස්ථාවලදී WHO එක විසින් යම්කිසි පියවරක් ගත්තොත් විතරක්, යම් තැනකට ආවොත් විතරක් එය අනුගමනය කිරීම සඳහා අමාත්‍යවරයාට බලය තිබෙනවා. ඉතින්, වෙච්ච දේ සිද්ධ වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක වැරදියි කියලා මම කියපු නිසා මා ත්‍රස්තවාදියෙක් කියලා හංවඩු ගහලා නායක හාමුදුරුනමක් මට චෝදනා කළා. මට උසාවි ගිහිල්ලා තහනම් නියෝග ගන්න වුණා. මම කවදාවත් ඒක හරියි කියලා කිව්වේ නැහැ. නමුත් සීමාවක් ඇතුළේ ඉඳගෙන අපට කරන්න පුළුවන් දේ කරන්න පුළුවන්. අපි විපක්ෂයේ නොවෙයි. මම ඒක නිවැරදි කරන්නට ඕනෑ, මුජීබර් රහුමාන් මැතිතුමා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
ගරු ඇමතිතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමාගේ එකඟතාව තිබෙනවා නම් ඔබතුමාට කථා කරන්න පුළුවන්. මොකද, වේලාව සංශෝධනය වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවසර තිබෙනවාද, මෙතුමාට කථා කරන්න?

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි එම්.යූ.එම්. அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
කෙටියෙන් කියන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
ගරු ඇමතිතුමා, මෙතැනදී ඔබතුමා එක දෙයක් අමතක කළා. ඔබතුමාට මතක් කරන්න ඕනෑ, මේ කාරණයත්. විශේෂයෙන්ම පළමුවෙනි තාක්ෂණ කමිටුව ඒක දෙන්න බැහැ කියලා කිව්වාම තමයි විද්වත් කමිටුව පත් වුණේ. ඒ විද්වත් කමිටුව පත් වුණේ සියලුදෙනාගේම ඉල්ලීම උඩ. ඊළඟට ඔබතුමාට මතකද, පාකිස්තාන අගමැති ඉම්රාන් ඛාන් ලංකාවට ඇවිල්ලා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කළා, මේකට ඉඩ දෙන්න කියලා. එදා ෂැන්ග්‍රි-ලා හෝටලයේ අපි විපක්ෂය හැටියට ඉම්රාන් ඛාන් අගමැතිතුමා හම්බ වෙන වෙලාවේ ඔබතුමාත් එතැනට ආවා. ඔබතුමා ඇවිල්ලා එදා ඉම්රාන් ඛාන් අගමැතිතුමාට අපි ඉස්සරහ පණිවුඩයක් දුන්නා, "The President has agreed for burials" කියලා. ඔබතුමා එහෙම කිව්වා, ඔබතුමාට මතක ඇති. ඒ කියන්නේ ජාත්‍යන්තර වශයෙන් විශාල ලෙස පීඩනයක් ආවාට පසුව තමයි එකඟ වුණේ. අපි ඒක පැහැදිලි කර ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමා, ඔබතුමාට තව මිනිත්තු 8යි තිබෙන්නේ.

ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා
(මාණ්පුමිකු ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ආතාඋල්ලා මන්ත්‍රීතුමා.

ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා
(මාණ්පුමිකු ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
කෞරව අමෙච්චර් අවර්කලේ, කොවිට්-19 තොට්රු කාරණමාක ඉරන්තවර්කළ් සම්පන්තමාක අප්පෝතිරුන්ත සුකාතාර අමෙච්චර් අවර්කළ් තනක්කු ඉල්ලාත ඔර් අතිකාරත්තෙප් පයන්පටුත්ති ඉරුන්තාර්. අවර් gazette ඌටාකත්තාන් ඉන්තප් පිළෙයෙච් චෙය්තාර්. එතිර්කාලත්තිල් ඉව්වාරු ඉටම්පෙරාමල් ඉරුප්පතර්කුච් චට්ටත්තිලුම් මාර්රම් කොණ්ටුවරප්පට වේණ්ටුම්.

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි එම්.යූ.එම්. அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
That is why, Hon. Member, we are trying to bring in a new law. In terms of that law, it would be the right of the people to decide whether they should be buried or cremated upon their death. Only in case of a WHO

decision, the Minister can force people to do otherwise. That is the idea.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිද්ධ වෙච්ච දේවල් ඉවරයි. ඉදිරියේ දී එවැනි දේවල් නොවෙන්නට අපි වග බලා ගන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා පනත පිළිබඳව අපි සාකච්ඡා කරන මේ අවස්ථාවේ ක්‍රිකට් ගැන මම වචනයක් කියන්නට ඕනෑ. 1996දී අපි ක්‍රිකට් ලෝක කුසලානය ජයග්‍රහණය කළා. අපි දන්නවා, ඊට ඉස්සෙල්ලා මේ කටයුතුවලට සහභාගි වෙලා සම්පූර්ණයෙන්ම කටයුතු කළේ කිසිම මුදලක් ආපසු අය කර ගන්නට බලාපොරොත්තු නොවන, තමන්ගේ ශ්‍රමය, කාලය, මුදල ඒ සඳහා වැය කරපු එවකට හිටපු කෘතහස්ත දේශපාලනඥයන් සහ ව්‍යාපාරික ප්‍රජාවේ නායකයන් බව.

1996දී අපි ක්‍රිකට් ලෝක කුසලානය ජයග්‍රහණය කරනකොට ආනා පුංචිහේවා මැතිතුමා තමයි ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස සිටියේ. නමුත් ඊට පස්සේ විශාල වශයෙන් කීර්තියයි, මුදලයි, බලයයි ලැබුණාට පස්සේ ඒ කටයුතු ඊට වඩා වෙනස් තැනකට යන්න පටන් අරගෙන තිබෙනවා. මට මතකයි මුරලිදරන් මහත්මයා පසුගිය දවසක කිව්වා, "මම කොළඹ දිස්ත්‍රික්කයෙන් ඡන්දය ඉල්ලුවොත් සිංහල ජනතාව මට ඡන්දය දීලා පාර්ලිමේන්තුවට යවයි, හැබැයි ක්‍රිකට් කමිටුවේ ඡන්දයට මම පෙනී හිටියොත් මට එක ඡන්දයක්වත් ලැබෙයිද කියලා සැකයි" කියලා. ලෝකයේ වැඩිම Test Cricket wickets ලබා ගත්ත ශ්‍රී ලංකාවේ කීර්තිමත්ම ක්‍රීඩකයා ඒ විධියට කියනවා නම්, එතැන මොකක් හරි අවුලක් තිබෙනවා. ඒ නිසා පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි කියලා මම හිතනවා. ඔළු ගෙඩි විතරක් වෙනස් කරලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඒකට අනිවාර්යයෙන්ම system change එකක් සිද්ධ වෙන්න ඕනෑ. ඒ සඳහා ක්‍රිකට් සඳහා දක්ෂ පරිපාලන නිලධාරීන්, විවිධ ක්ෂේත්‍රවල විශේෂඥ හැකියාව ඇති අය, ක්‍රිකට් ක්‍රීඩා කරපු අය සහ clubsවලින් තෝරා ගන්නා අය ඇතුළු සමතුලිත නියෝජනයක් තිබිය යුතුයි කියලා මම යෝජනා කරනවා.

මට මතකයි මේ ප්‍රශ්නය මතු වෙච්ච වෙලාවේ, ගිය අවුරුද්දේ ගරු ජනාධිපතිතුමාගේ ඉල්ලීම මත කැබිනට් අනුකමිටුවක් පත් කළා. ඒ කැබිනට් අනුකමිටුවේ සභාපතිවරයා හැටියට මම කටයුතු කළා. ඒකට ගරු කංචන විජේසේකර ඇමතිතුමා, ගරු ටිරාන් අලස් ඇමතිතුමා සහ ගරු මනුෂ නානායක්කාර ඇමතිතුමා යන ඇමතිවරු තිදෙනාත් හිටියා. අපි අවම වශයෙන් තිස්අටදෙනෙකු විතර සමඟ කථා කරලා, දවස් 25ක් විතර ඔවුන්ට සාකච්ඡාවලට අවස්ථාව දීලා, දිවා රෑ නොබලා කටයුතු කරලා, පිටු 48කින් සමන්විත වාර්තාවක් ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම අපි හඳුනා ගත් ක්ෂේත්‍ර කිහිපයක් ගැන එහි තිබෙනවා. දක්ෂතා තිබෙන අය එකතු කරලා, ක්‍රිකට් පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය පසුබිම සලස්වන්නට ඕනෑ, ඒ සඳහා සුදුසු අය පත් කිරීම සඳහා අවශ්‍ය පසුබිම සැලසෙන්න ඕනෑ කියලා තමයි අපි යෝජනා කරන්නේ. ඒ Cabinet Subcommittee Report එකේ Executive Summaryහි තිබෙන කරුණු කිහිපයක් මම කියවන්නට ඕනෑ.

It states, I quote:

> "1. The SLC administration consists of three primary arms: a. Regulatory b. Cricket administration, and c. Technical matters responsible for cricket and player management. We believe that each of those groups should be distinctly delineated and should not encroach upon one another. They should have enough autonomy to act appropriately. Although the Ministry of Sports and Youth Affairs is in charge of overseeing sports in general, the responsibility for managing and running cricket activities lies with SLC. The administration of SLC should delegate technical responsibilities, such as coaching and player management, to qualified technocrats who are recruited under a process outlined in the report."

Then we are saying, I further quote:

> "2. The existing framework of SLC has been specifically designed to cater to a select group of persons, enabling them to maintain their control over all aspects of cricket. Consequently, this structure has deterred individuals possessing expertise, ability, experience, and a strong desire to participate in cricket administration.
>
> 3. Thus, it is imperative to overhaul the entire cricket framework by implementing essential administrative reforms and constitutional amendments. The current situation grants the existing set of stakeholders unrestricted authority to carry out their goals and virtually unlimited control over finances. Therefore, we cannot expect their complete cooperation in implementing any significant reforms that would guarantee a transparent, independent, and equitable management of cricket based on merit and talent as it will be detrimental to those who are benefitting from the status quo.
>
> 4. Therefore, most appropriate method for implementing these reforms is by legislative action, specifically by enacting a law that introduces a new constitution to SLC, as outlined in the report."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තිබෙන ස්වභාවය එහෙම පිටින්ම ස්වේච්ඡාවෙන් - voluntarily - වෙනස් කරන්න හැකියාවක් තිබෙයි කියා අපි විශ්වාස කරන්නේ නැහැ. මොකද, එහෙම වුණොත් භුක්ති විඳින වරප්‍රසාද ඔවුන්ට අහිමි වෙන නිසා. ඒ නිසා අපි පාර්ලිමේන්තුව හැටියට ඉදිරිපත් වෙලා අලුත් නීතියක් ගෙනැල්ලා ඒ නීතියට අනුව කටයුතු කළ යුතු බව යෝජනා කරලා තිබෙනවා. අපි කැබිනට් මණ්ඩලයට එම වාර්තාව ඉදිරිපත් කළාට පස්සේ කැබිනට් මණ්ඩලයෙන් කමිටුවක් පත් කළා, ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිශ්චයකාර චිත්‍රසිරි මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතුව, හර්ෂ අමරසේකර මැතිතුමා, සම්පත් බැංකුවේ සභාපති හා ජනාධිපති නීතිඥ, සහ තවත් මහත්වරු කිහිපදෙනෙක් එක්ක. දැන් ඒ වාර්තාවට අනුව ඔවුන් constitution එකක් හදලා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ constitution එකට අනුව යෝජනා කරන්නේ, දහඅටදෙනෙකුගෙන් යුක්තව මෙය ක්‍රියාත්මක විය යුතු බවයි. නවදෙනෙක් තෝරා ගන්න ඕනෑ, clubs මාර්ගයෙන්. පස්දෙනෙක් nomination හරහා - ඒ කියන්නේ පොදුවේ ඔවුන්ගෙන් නාම යෝජනා කැඳවා - තෝරා ගත යුතුයි. අවම වශයෙන් ඒ නවදෙනාගෙන් පස්දෙනෙක් ක්‍රිකට් ක්‍රීඩකයන් විය යුතුයි. ඒ හැරුණු විට අනෙක් අය නීතිය, ආර්ථිකය, කළමනාකරණය පිළිබඳව පුළුල් දැනුමක් ඇති අය විය යුතුයි.

ඒ අනුව මෙහි කළමනාකරණයක් තිබෙනවා. Club system එකෙන් ගන්නා නවදෙනායි, එළියෙන් ගන්නා නවදෙනායි එකතු වෙලා දක්ෂ කණ්ඩායමක් බිහි කිරීම තමයි එම කමිටුවෙන් යෝජනා කරලා තිබෙන්නේ. ඔවුන් ඒ නවදෙනා තෝරා ගැනීම සඳහා nomination කමිටුවක් යෝජනා කරලා තිබෙනවා. Institute of Chartered Accountantsහි President, Bar Association එකේ President යන අය ඒ nomination කමිටුවේ සිටිය යුතුයි කියලා යෝජනා කරලා තිබෙනවා. ඔවුන් එකතු වෙලා නවදෙනෙක් තෝරලා මේ කමිටුවට දෙන්න ඕනෑ. ඒ අනුව මේ දහඅටදෙනා එකතු වෙලා මේ ආයතනය කළමනාකරණය කළ යුතුයි කියන එක තමයි අපි යෝජනා කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාර්තාව ජනාධිපතිතුමාට මෑතකදී ලබා දුන්නා. ඒ වාර්තාවට අනුව නීතිය සම්මත කළ යුතුයි කියන එක තමයි අපි ඉල්ලා සිටින්නේ.

[ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

මොකද, එහෙම නැතිව ඔළු ගෙඩි මාරු කරලා, පුද්ගලයන් මාරු කරලා සම්පූර්ණයෙන්ම මේ ක්‍රමය ඉවත් කිරීමේ හැකියාවක් නැහැ. අපට පෙනෙනවා, අද වෙනකොට ක්‍රිකට්වලට වෙලා තිබෙන දේ. පසුගිය අවුරුද්දේ එක්දින ක්‍රිකට් ලෝක කුසලාන තරඟාවලිය ඇතුළට එන්නට අපට qualifying matches ගහන්න සිද්ධ වුණා. ඒ 2023 World Cup එකේදි first leg එකෙන්ම අපේ කණ්ඩායම නැති වෙලා ගියා. අපි ඉතිහාසයේ ප්‍රථම වතාවට ICC Champions Trophy එකට සෙල්ලම් නොකර ඉන්නවා. මේ සැරේ 2024 T20 World Cup එකේ පළමුවෙනි අදියරෙන්ම අපි එළියට ගිහිල්ලා තිබෙනවා. මේ බෙදවාචකයෙන් එළියට එන්න ඕනෑ. එහෙම නම්, නැවත නැවත එකම කණ්ඩායමකට මේක කරන්න බැහැ කියන එක මේ වෙනකොට ඔප්පු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සඳහා යම් කිසි දෙයක් වහාම ක්‍රියාත්මක විය යුතුයි. එහිදී සමහර අය වෙනුවෙන් අපි lawyersලා හැටියට පෙනී ඉඳලා තිබෙනවා. ඒ, lawyer කෙනෙකුගේ role එක. නමුත්, අපි මේ සභාවට ආ පසු අපට වගකීම තිබෙන්නේ පොදුවේ මේ රටේ මහජනතාව ගැන. ඒ නිසා පුද්ගලයෝ දිහා නොබලා ක්‍රීඩාවට සහ ක්‍රීඩාවේ උන්නතිය සඳහා, විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය සඳහා අවශ්‍ය කටයුතු කිරීමට අප සියලුදෙනා එකතු වී කටයුතු කළ යුතුයි කියා මා යෝජනා කරනවා. ඒ තුළින් විතරයි ක්‍රිකට් ක්‍රීඩාව යළි යථා තත්ත්වයට පත් කිරීමට හැකියාව ලැබෙන්නේ. අඩුම ගණනේ ඊට අවශ්‍ය අඩිතාලම හරි දමන්න ලැබෙන්නේ. මොකද, අපට මීට වඩා පහළට යන්න දෙයක් නැහැ. 1996දී World Cup එක දිනා ගත්ත රටක්, අපි. අපි 2014දී විස්සයි 20 ලෝක කුසලානය දිනා ගත් රටක්. ඊට අමතරව 2003දී අපි Cricket World Cup Semi-Finals ගැහුවා; 2007දී අපි එහි Finals ගැහුවා. 2011දී අපි World Cup එකේ Finals ගැහුවා. 2012දී අපි T20 එකේ Finalsවලට ආවා. 2009දී අපි T20 Finalsවලට ආවා. එවන් කණ්ඩායමක් අද මේ තත්ත්වයට වැටිලා තිබෙනවා නම්, මේ පරිපාලනය තුළ යම් කිසි දෙයක් හරියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියන එක ඉතා ම පැහැදිලියි. ඒ නිසා මේ තත්ත්වය උඩු යටිකුරු කරලා - අපි ඉංග්‍රීසියෙන් කියනවා, overhaul එකක් කියලා - සම්පූර්ණයෙන් වෙනසක් කරන්න ඕනෑ. ඒ වෙනස කිරීමේදී චිත්‍රසිරි කමිටුව විසින් ලබා දීලා තිබෙන අලුත් නීතිය අනුව Sri Lanka Cricket Constitution එක වෙනස් කළ යුතුයි කියන එක මම යෝජනා කරනවා. ඔවුන් විසින්ම ඒක හදනවා කියලා බලාපොරොත්තු වෙනවා නම් ඒක කවදාවත් වෙන්නේ නැහැ. නීතියක් හැටියට පාර්ලිමේන්තුවෙන් එය සම්මත කර ගත්තාට පස්සේ ICC එකට පමණක් නොවෙයි, අනෙක් අයටත් ඒකට එකඟ වෙන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව මිනිත්තුවක කාලයක් විතරක් දෙන්න, තව එක කරුණක් කියලා මගේ කථාව අවසන් කරන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උදාහරණයක් හැටියට අපේ වාර්තාවේ අපි පෙන්වා දීලා තිබෙනවා, ඕස්ට්‍රේලියාවේ ක්‍රිකට් ආයතනයට සාමාජිකයන් තෝරා ගැනීම සඳහා ඡන්දය ලබා දෙන ආකාරය, ඉන්දියාවේ ඡන්දය ලබා දෙන ආකාරය හා ලංකාවේ ඡන්දය ලබා දෙන ආකාරය. ලංකාවට තිබෙනවා, ඡන්ද 147ක්. අපේ population එක මිලියන 22යි. ඉන්දියාවේ population එක බිලියන 1.4යි, ඡන්ද තිබෙන්නේ 38යි. එංගලන්තයේ මිලියන 60ක ජනතාවට තිබෙන්නේ, ඡන්ද 18යි. පාකිස්තානයේ මිලියන 231ක ජනතාවට තිබෙන්නේ ඡන්ද 17යි. ඕස්ට්‍රේලියාවේ මිලියන 25කට තිබෙන්නේ ඡන්ද 6යි. ඒ අය එකතු වෙලා තමයි තෝරා ගන්නේ ඔවුන්ගේ ක්‍රිකට් පරිපාලනය කළ යුත්තේ කවුද කියන එක. හැබැයි මිලියන 22ක ජනතාවක් ඉන්න ලංකාවේ ඡන්ද තිබෙනවා, 147ක්. ඉතින් මේක ඉතා භයානක තත්ත්වයක්. මෙම තත්ත්වය තුළින් හොඳක් වෙලා නැහැ. හොඳක් වෙලා තිබෙනවා නම් එහෙම නියාගත්තාට කමක් නැහැ. නමුත්, තිබුණු තත්ත්වයත් එන්න එන්නම පහළට වැටෙනවා. ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව කරන්න ඕනෑ balance sheet එක පෙන්වලා මෙච්චර මුදලක් තිබෙන්න ඕනෑ කියලා නොවෙයි. එහෙම කරන්න නම්, බිස්නස් එකක් කරන්න ඕනෑ. එහෙම නැතිව events නියන්න කියලා කියන්නත් බැහැ.

එහෙම නම්, event management company එකක් දාන්න ඕනෑ. වැදගත්ම දේ ක්‍රිකට් ක්‍රීඩාව ඉදිරියට යන්නට ඕනෑ. ක්‍රිකට්වල අනාගතය තීරණය වෙන්න ඕනෑ. ඒ සඳහා මේ වෙනස සිදු විය යුතුයි කියලා අපි යෝජනා කරනවා. ඒ සඳහා ගරු ජනාධිපතිතුමාට ලබා දීපු ඒ උපදෙස් අනුව ඉක්මනට මේ නීතිය පාර්ලිමේන්තුවට ගෙනෙයි කියලා මම හිතනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු දොළහක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.15]

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු අලි සබ්රි ඇමතිතුමාගේ අදහස් දැක්වීමෙන් පසුව මේ විවාදයට එක්වන්නට ලැබීම ගැන මා ඉතා සතුටු වෙනවා. ශ්‍රී ලාංකීය ක්‍රිකට් ප්‍රේක්ෂකයන් වෙනුවෙන් අලි සබ්රි ඇමතිතුමා ආණ්ඩුවේ අමාත්‍යවරයකු ලෙස අද කරපු ප්‍රකාශයට විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු වන මම මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ ඇත්ත කථාව කියන්න බැරි, ඇත්ත කථාව දන්නා විශාල පිරිසක් මේ ආණ්ඩුවේ ඇමතිවරු විධියට, මන්ත්‍රීවරු විධියට ඉන්නවා. ඒ වාගේම, ගරු ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, මේ මොහොත වෙනකොටත් ශ්‍රී ලංකා ක්‍රිකට් එකෙන් වැටුප් ලබා ගන්නා පිරිසක් -ආණ්ඩු පක්ෂයේ කිහිප දෙනෙක්- ඉන්නවා කියලා. ඔවුන්ගෙන් අපට මෙවැනි සාධාරණ ප්‍රකාශයක්වත් බලාපොරොත්තු වෙන්න බැහැ. අපි ක්‍රිකට් ගැන කථා කරන්නේ මේ රටේ ක්‍රිකට්වලට තිබෙන ආදරය නිසායි. හැබැයි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මේ වෙනකොට මට විරුද්ධව වාරණ නියෝගයක් ලබාගෙන තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම අදත් ප්‍රවේශමෙන් කථා කරන්නේ. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට යට වෙලාවත් ගරු අධිකරණයට අපහාසයක් වෙන්න මම ඉඩ තබන්නේ නැහැ. අපි ක්‍රිකට් ගැන කථා කරනවාට විරුද්ධව මුදල් කන්දරාවක් වියදම් කරමින් වාරණ නියෝග ගන්නවා. අනාගතයේත් මේ රටේ ජනප්‍රිය නීතිවේදීන් අල්ලාගෙන කෝටි ගණන් මුදල් ගෙවලා මේ විධියට වාරණ නියෝග අරගෙන අපට නඩු දමන්න කටයුතු කරයි. හැබැයි, මේ ප්‍රශ්නවලට උත්තර සොයන්න කටයුතු කරන්නේ නැහැ. අලි සබ්රි ඇමතිතුමාගේ කථාව ඇහුවා නම් අපේ රටේ ක්‍රිකට්වල හරය ගැන හොඳ අවබෝධයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග ගෙනෙන්නේ සියලු ක්‍රීඩාවලට අදාළවයි. මේ පනත ගැන මේ රටේ ජනතාවට අවබෝධයක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ

බොහෝදෙනෙකුටත් ඒ ගැන අවබෝධයක් නැතිව ඇති. ඒ වාගේම, ගෙනෙන පනත් ගැන අපේ රටේ මිනිස්සුන්ට විශ්වාසයකුත් නැහැ. මොකක්ද හේතුව? පසුගිය කාලයේ ගෙනාපු අණපනත්වලට අනුවද අපේ රටේ -විශේෂයෙන්ම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය- කටයුතු කරන්නේ කියලා අපි දිගින් දිගටම ප්‍රශ්න කළා. ඒකට උත්තර දෙන්න කවුරුවත් නැහැ. ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමා මේ වෙලාවේ සභා ගර්භයේ නැතත් ක්‍රීඩා අමාත්‍යවරයා විධියට එතුමා මේ කථාව අහගෙන ඉන්නවා නම්, මේ කාරණය අපි එතුමාගේ අවධානයට යොමු කරනවා. එතුමා මේ වෙනකොට ශ්‍රී ලංකා රග්බි සංගමයේ, ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ, ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා සංගමයේ සහ ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනයේ ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවා තිබෙනවා. ඒ සංගම් සහ සම්මේලන අහෝසි කරලා තිබෙනවා. මා දන්නා තරමින් එයට හේතුව, වාර්ෂික සාමාජික රැස්වීමේදී -AGM එකේදී- සම්මත කරගත යුතු මූල්‍ය වාර්තා නිවැරදි ආකාරයට සම්මත කර නොගැනීම වාගේ අවශ්‍ය ක්‍රියා මාර්ග නිසි පරිදි නොගැනීමයි. හැබැයි, ක්‍රිකට් ආයතනයත් මේකට සම්බන්ධයි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පසුගිය වර්ෂයේ මූල්‍ය වාර්තාව AGM එකට දාලා සාමාජිකයන්ගෙන් අනුමත කරලා නීත්‍යානුකූලව දෙන්න තිබෙන අවසාන දිනය වූ මැයි 31වැනි දා වෙනකොටවත් එය ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා. අපි ගිහින් Auditor-Generalගෙන් ප්‍රශ්න කළා, මෙන්න මේ ආකාරයට මුදල් වියදම් කරලා තිබෙනවා, මේ වියදම් කිරීම් සාධාරණද, ඒ නිසා කරුණාකර ක්‍රිකට් ආයතනයෙන් මේ ගැන විමසන්න කියලා. මා විශ්වාස කරනවා, විගණකාධිපතිවරයා ඒ යුතුකම ඉටු කර තිබෙනවාය කියලා. ඒවාට උත්තර දීලා සාමාජිකයන් ඉස්සරහට ගිහිල්ලා මේ මූල්‍ය වාර්තාව සම්මත කරගන්න බැරි තැනක ක්‍රිකට් ආයතනය හිර වෙලා තිබෙනවා. අද වෙනකල් ඒ වාර්තාව දීලා නැහැ. ඇමතිවරයා වැඩ කරන්නේ හැම ක්‍රීඩා සංගමයකටම සමානව නම්, හැම ක්‍රීඩා සංගමයක් ගැනම එක විධියට හිතලා නම්, මේ වෙනකොට ක්‍රිකට් ආයතනයත් සම්පූර්ණයෙන්ම විසුරුවා දමා කාගේ හෝ යටතට, අඩු ගණනේ හරින් ප්‍රනාන්දු ඇමතිවරයාගේ ලේකම්වරයා යටතට හෝ අරගෙන යන තැනට කටයුතු කරන්න ඕනෑ කියා මා හිතනවා. හැබැයි, ඒක වෙන්නේ නැහැ. ඇයි, ඒක වෙන්නේ නැත්තේ? 1996දී අර්ජුන රණතුංග ඇතුළු මේ රටේ කීර්තිමත් ක්‍රීඩකයන් ටිකක් නිර්මාණය කරපු ඒ ජයග්‍රහණයත් එක්ක ක්‍රිකට් ආයතනයට සල්ලි එන්න පටන් ගත්තා. ඊට පසුව තමයි මේ ආයතනයට මුදලාලිලා ආවේ. අලි සබ්‌රි ඇමතිතුමා කියපු ආකාරයට මුදලාලිලා ටිකක් මේකට ආවා. ඒ මුදලාලිලා කොටස් බෙදාගෙන, බෙදාගෙන ගිහිල්ලා, දැන් මේ වර්තමාන මුදලාලි සල්ලිවලට හැම කෙනාම අරගෙන තිබෙනවා. ඒ සල්ලිවලට ගත්ත පිරිසත් එක්ක ක්‍රිකට් ආයතනයට වෙනම නීතියක් තිබෙන්නේ. අපි අහනවා, ශ්‍රී ලංකා රග්බි සංගමයට, ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයට, ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා සංගමයට සහ ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනයට අදාළ වන නීතිය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අදාළ වන්නේ නැත්තේ ඇයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ක්‍රීඩා සම්මේලනයේ ව්‍යවස්ථාව යටතේ නව නීති මාලාවක් ගෙනැල්ලා තිබෙනවා. මේ අවස්ථාවේදී ඒ නව නීති මාලාව ඇතුළත් ලේඛනය මම **සභාගත*** කරනවා.

මේ නව නීති මාලාව ගෙනෙන්න වර්තමාන අමාත්‍යවරයාට රෙද්දක් ඇඳගෙන කටයුතු කරන්න පුළුවන්ද කියලා මම අහනවා. ගරු ඇමතිතුමනි, මම මේ කියන කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරන්න. රොෂාන් රණසිංහ හිටපු ඇමතිවරයා මේ රටේ ක්‍රිකට් පරිපාලනය විසින් කරන දූෂණයට විරුද්ධව යම් උත්තරයක් හොයන්න කටයුතු කළා. ඒ අනුව එතුමා යෝජනාවක් ඉදිරිපත් කළා. මීට පෙර 2016 වෙනකම් තිබුණේ අවුරුද්දෙන් අවුරුද්ද නිලවරණය පවත්වන ක්‍රමය. නමුත් රොෂාන් රණසිංහ මැතිතුමා එය අවුරුදු දෙකක් විධියට යෝජනා කළා. ක්‍රිකට් ආයතනය එයට විරුද්ධ වුණා. නමුත් අධිකරණයේදී 2023 අගෝස්තු 01වැනි දා ඉඳලා එකඟ වුණා, අවුරුදු හතරකින් සභාපතිවරයෙක්, ලේකම්වරයෙක් ඉවත් වෙන්න. දැන් අලුතින් ගෙනැවිත් තිබෙන නීතිය මොකක්ද? අද වනවිට ගෙනැවිත් තිබෙන අලුත් නීතිය අනුව සභාපතිවරයාට පුළුවන් අවුරුදු 16ක් වනතුරු ඉන්න. සභාපති පුටුවේ අවුරුදු හතර බැගින් දෙවතාවක් ඉන්න පුළුවන්, ඉතුරු අවුරුදු අට වෙන තනතුරක ඉන්න පුළුවන් කියනවා. හැබැයි, එතකොට මොකද වෙන්නේ?

දැන් කථා කරන්නේ AI යුගයක් ගැන. මහ ලොකුවට කථා කරනවා තරුණයාට අවස්ථාව දෙන යුගයක් ගැන. ජනාධිපතිතුමාත් කියනවා, තාරුණ්‍යයට ශක්තිය දෙන්න ඕනෑ කියලා. එතකොට මෙහෙම අවුරුදු 60-70 වෙනකම් අවුරුදු 16ක් තිස්සේ එක පුටුවක ඉන්න පුළුවන් විධියට මේ පනත් වෙනස් කරන්නේ ක්‍රිකට් ආයතනයේ අවශ්‍යතාවටද? මේවා වර්තමානයේ ඉන්න පාලනයට අවශ්‍ය විධියට හදනවා නම්, මම හිතන විධියට රොෂාන් රණසිංහ මහත්තයා එළියට එද්දී බෙල්ල තියලා හෝ එතුමාගේ ආත්ම ගරුත්වයත් බේරාගෙනයි කටයුතු කළේ කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වෙනකොට ක්‍රිකට් පරිපාලනය කොච්චර දුරට දේශපාලනීකරණය වෙලාද, ඒ තුළ දේශපාලනය කොච්චර දුරට මුල් බැස තිබෙනවාද කිව්වොත්, ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉඳිමින් තමයි මේ අය කටයුතු කරන්නේ. ඊයේ-පෙරේදා දවසක පාසල් ක්‍රිකට් ක්‍රීඩකයන්ට සම්මාන ප්‍රදානෝත්සවයක් තිබුණා. ක්‍රිකට් ආයතනය ඒ තෑගි ටික දුන්නේ ජනාධිපති ලේකම් කාර්යාලයට එක්කගෙන ගිහිල්ලා. ජනාධිපති ලේකම් කාර්යාලය පාවිච්චි කරගෙන දේශපාලනය කරනවා. මේ මාස තුනේ ඔය ගේම් ගහගෙන යන්න. හැබැයි, අවම වශයෙන් හෝ මේවාට මැදිහත් වෙනවා නම් හොඳයි. ගරු හරින් ප්‍රනාන්දු අපේ සහෝදර ඇමතිතුමා මේ වෙලාවේ සභාවට ආපු එක වඩාත් හොඳයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාම ඉදිරිපත් කර තිබෙන මේ නව නීති මාලාව යටතේ තිබෙනවා, A සහ B ශ්‍රේණියේ ක්‍රීඩා සංගමයක භාණ්ඩාගාරිකවරයා විය යුත්තේ අඩුම තරමින් Chartered Accountant කෙනෙක් කියලා. ඔබතුමා ඉදිරිපත් කළ නීති මාලාවේ එහෙම තිබෙනවා. නමුත් මම කියනවා, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ඉන්නේ bookkeeper කෙනෙකු විධියටවත් qualifications නැති මිනිහෙක් කියලා. ඇයි, ඒ භයිය දීලා තිබෙන්නේ? ඒ මොකටද? ඕනෑ විධියට ගේම් එක ගහගෙන යන්නයි එහෙම කරලා තිබෙන්නේ. සමහර වෙලාවට මේ තුළ එක එක කල්ලි හදාගෙන ඉන්නවා. ක්‍රීඩා clubs හදාගෙන ඔවුන්ට සන්තෝසම් දීගෙන යනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාටත් පාලනය කරගන්න බැරි තැනට මේ අය ක්‍රීඩා සංගම් හදාගෙන මේ මොහොත වෙනකොට තමන්ට අවශ්‍ය විධියට කටයුතු කරනවා කියලා මම විශ්වාස කරනවා.

මම උදාහරණයක් කියන්නම්. ඒ ක්‍රීඩා සංගම්වල ඉන්නවා, ජනාධිපතිතුමාගේ උපදේශකයෙක් කියලා කියා ගන්නා පුද්ගලයෙක්. මම හිතන විධියට ඒ පුද්ගලයාටත් අවශ්‍ය විධියට ක්‍රිකට් ආයතනයේ මුදල් පාවිච්චි කරන්න කටයුතු කරනවා. ඒ නිසා අපි හිතනවා, මේ රටේ ක්‍රීඩා සංගම් සියල්ලටම එක නීතියක් ගෙනෙන්න හරින් ප්‍රනාන්දු ඇමතිතුමා කටයුතු කරනවා නම් හොඳයි කියලා. එතැනදී ෂමීල් සිල්වාට, සුජීව ගොඩලියද්දට ඕනෑ විධියට ආරක්ෂා වෙන්න දෙන්න හොඳ නැහැ. මම එහෙම

** පුස්තකාලයේ තබා ඇත.*

** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු හේෂා විතානගේ මහතා]

කියන්න හේතුවක් තිබෙනවා. 2022දී T20 World Cup matches පරාද වුණාම, ක්‍රිකට් පරිපාලනය තුළ ඉන්න ඒ අය කිව්වා, අපි 2024දී අනිවාර්යයෙන් Cup එක ගන්නවා, 2024දී Cup එක ගන්න අවශ්‍ය සැලසුමක් තිබෙනවා කියලා. හැබැයි, 2024 වෙද්දී මොකද වෙලා තිබෙන්නේ? අද වෙනකොට - 2024දී - අපි මුල් වටයෙන්ම එළියට ගිහින් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අය නේපාලයත් එක්ක තරග කළ වෙලාවේ වැහැපු එක ලොකු දෙයක්. මොකද, ඒ වෙලාවේ නේපාලයත් එක්ක තරග කළා නම් ඒකත් අපි පරාද වෙනවා කියන තරමේ මානසික බිඳීමක් අපේ රටේ මිනිසුන් තුළ තිබුණා.

අලි සබ්රි ඇමතිතුමා සඳහන් කළ එක කාරණයකට මම විරුද්ධයි. එතුමා කිව්වා, මේ structure එක වෙනස් වෙන්න ඕනෑ, නීති වෙනස් වෙන්න ඕනෑ කියලා. හැබැයි, එතුමා කිව්වා, පුද්ගලයන් වෙනස් වෙන්න ඕනෑ නැහැ කියලා. නමුත් මම කියනවා, මේ පුද්ගලයන් වෙනස් කිරීමට කටයුතු කිරීමයි ඉස්සෙල්ලාම කරන්න ඕනෑ කියලා. මොකද, මේ ඉන්න කණ්ඩායම දන්නවා, මේකේ රහ. මේ කණ්ඩායම දන්නවා, මේ පරිපාලනය හරහා ඇමතිවරයාට බලපෑම් කරන්නේ කොහොමද කියලා. රොෂාන් රණසිංහ ගෙදර යන තැනට තල්ලු කළේ ෂම්මි සිල්වාය කියන එක අපි දන්නවා. ඒ වාගේම හරින් ප්‍රනාන්දු ඇමතිතුමා මේ ඇමතිකම භාර ගන්න ඉස්සෙල්ලා ඔවුන් ප්‍රකාශයක් කළා, "අපි මේකට හරින් ගෙනෙනවා" කියලා.

මම දන්නේ නැහැ එහෙම පුළුවන් ද කියලා. හරින් ප්‍රනාන්දු ඇමතිවරයා ඒ තැනට ගේන්න ක්‍රිකට් ආයතනයේ සභාපතිට පුළුවන් ද? ඒක තීන්දු කරන්නේ ජනාධිපතිවරයා. එතැනට මේක පත් වෙලා තිබෙනවා නම්, සල්ලිත් එක්ක මේ විධියට දඟලන්න ඉඩදීලා තිබෙනවා නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ක්‍රිකට්වලට 2024දී මෙහෙම වුණා විතරක් නොවෙයි, 2026දීවත් අපට ක්‍රිකට් ගැන බලාපොරොත්තු තියාගන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මම කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමනි, ඔබතුමා විපක්ෂයේ සිටියදී අපි එකට ඉඳගෙන කථා කළා, මේ IPG එක හරහා මේ රටේ ක්‍රිකට්වලට, සූදුවලට සම්බන්ධ වෙන්න LPL එක යොදාගෙන එවකට හිටපු ඇමතිවරයකු කටයුතු කරපු එක ගැන. අද වෙනකොට IPG එකට ඕනෑ විධියට මේ ගේම් එක කොච්චර දුරට ගිහිල්ලා තිබෙනවා ද කියලා හරින් ප්‍රනාන්දු ඇමතිතුමාගෙන් මම අහනවා. ගරු ඇමතිතුමනි, පසුගිය දවසක Dambulla Aura Team එකේ owner, එහෙමත් නැත්නම් ඒ කණ්ඩායම මිලදී ගත් ව්‍යාපාරික පුද්ගලයා අත්අඩංගුවට ගත්තා. ක්‍රිකට් ආයතනය සහ IPG එකේ තිබෙන ගිවිසුම් අනුව අපි දන්නවා, යම්කිසි auction එකකට එනවා නම්, අදාළ කණ්ඩායම මිලදී ගන්නා පුද්ගලයා සම්පූර්ණ මුදල තැන්පත් කරලා තමයි ඒ කණ්ඩායම් මිලදී ගන්න ඕනෑ කියලා. එතකොට මේ පුද්ගලයාත් IPG එකේ මුදල් තැන්පත් කරලා තිබෙන්න ඇති. නමුත් අද වෙනකොට ඒ මුදලට මොකද වුණේ කියන එක ගැන ප්‍රකාශයක් එන්නේ නැහැ. ඒ ගැන ගරු ඇමතිතුමා ප්‍රකාශ කරලාත් නැහැ. ඒ පුද්ගලයා මේ වෙනකොට අත්අඩංගුවේ ඉන්නවා. දැන් වෙන කෙනෙක් ඒ team එක මිලදී ගත්තා කියලා ප්‍රකාශ වෙනවා. මේ IPG එක, අනිල් මෝහන්ලා එකතුවෙලා මේ රටේ ක්‍රිකට් දවසින් දවස විනාශ කරලා, මේ රටේ ක්‍රීඩකයන් සම්පූර්ණයෙන්ම සූදු ක්‍රීඩාවට බද්ද කරලා තිබෙනවා. ගිය සැරේ LPL එක වෙලාවේ එක ක්‍රීඩකයෙක් සූදුවලට සම්බන්ධයි කියලා අහුවුණා. ඒක අපි දැක්කා. මෙවැනි දේවල් අපි ඉතිහාසයේ දැකලා තිබුණේ නැති දේවල්. වර්තමානය වන විට අපේ ක්‍රිකට් ක්‍රීඩාව මේ තත්ත්වයට ඇවිල්ලා තිබෙන්නේ මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ පරිපාලනයට ඕනෑ විධියට ඇමතිවරයා අබ්බවා ගිහින් තිබෙන නිසා කියලායි මම නම් හිතන්නේ. අපි හරින් ප්‍රනාන්දු ඇමතිවරයා සම්බන්ධයෙන් එවැනි දෙයක් තවම දැක්කේ නැහැ. ඔවුන් රොෂාන් රණසිංහ හිටපු ක්‍රීඩා ඇමතිවරයා අබ්බවා කටයුතු කරන්නත් අවශ්‍ය දේවල් කළා. එම නිසා අපි හිතනවා, හරින් ප්‍රනාන්දු ඇමතිතුමාටත් මේක දැඩි අභියෝගයක් වෙනවා කියලා. ජනාධිපතිවරයාගේ උපදේශකවරු මේක පාලනය කරනවා නම්, ඇමතිවරයෙකුට මේක දරාගන්න පුළුවන් ද කියන සැකය තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී කියනවා, LPL ගැහුවා කියලා මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ කිසිම වර්ධනයක්, ක්‍රිකට්වල අනාගතයට කිසිම සෙතක් වෙන්නේ නැහැ කියලා. ඉන්දියාවේ ඉන්න සූදුකාරයෝ ටිකක් ගෙනැල්ලා මේ හරහා ඔවුන් පෝෂණය වෙනවා. ඒ වාගේම, ලංකාවේ මේකට සම්බන්ධ වෙලා ඉන්න කොමිස්කාරයෝ ටිකකට අවස්ථාව ලැබෙනවා හැර, රටේ ක්‍රිකට් නැඟිටින්න හයියක් වන විධියට මේ වැඩසටහන යන්නේ නැහැ. හැබැයි, ඉන්දියාවේ IPL එක ගහන්නේ ඒ රටේ ක්‍රීඩකයෝ හදන්න; ඒ රටේ ක්‍රීඩා කණ්ඩායම් දියුණු කරන්න; ඒ රටේ ක්‍රිකට් ක්‍රීඩාව වර්ධනය කරන්න. නමුත් අපි LPL එකෙන් අද වෙනකල් එවැනි සැලසුමක් හදලා නැහැ. අඩුම තරමේ පුහුණුකරුවෙකුටත් අවස්ථාවක් නැහැ. ඊයේ-පෙරේදා මම හම්බ වෙන්න පුහුණුකරුවෙක් ආවා. ඒ පුහුණුකරුවාට තිබෙන එකම නුසුදුසුකම තමයි, ෂම්මි සිල්වාගේ club එකෙන් එහා පැත්තේ තිබෙන club එකට ගියා කියන එක. මෙවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ. අඩුම ගාණේ LPL එක අපේ පුහුණුකරුවෙකුටවත් අවස්ථාවක් නැති තැනක තිබෙනවා නම්, විශේෂයෙන්ම ඒකට ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වෙන්න ඕනෑ කියලා මම හිතනවා. අලි සබ්රි ඇමතිතුමාත් කිව්වා වාගේ මේ නීතිය වෙනස් කරලා, අවශ්‍ය කටයුතු කළ යුතුයි. මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් මහා කැපකිරීම් කරපු ක්‍රීඩකයන් විශාල පිරිසක් ඉන්නවා. අර්ජුන රණතුංග මැතිතුමන්ලා වාගේ ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් දැවැන්ත කැපකිරීම් කරපු උදවිය අපට කවදාවත් අමතක කරන්න බැහැ. ඒ අය වාගේම මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් වැඩ කරන්න ඉදිරිපත් වෙන්න කැමැති හෂාන් තිලකරත්න, රොෂාන් මහානාම වැනි අය ඉන්නවා. ඒ වාගේ කණ්ඩායමක් එක්ක ගරු ඇමතිතුමා නිවැරදි ප්‍රවේශයක් ගන්නවා නම්, අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ අනාගතය හොඳ වේවි. මේ ඉන්න නිලධාරීන්ට තවදුරටත් කාලා බඩ පුරවාගෙන ඉන්න පුළුවන් විධියට අලුතින් නීති හැදෙනවා නම්, අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව මේ තිබෙන තත්ත්වයෙනුත් පහළට වැටෙන්න පුළුවන්. හෙට-අනිද්දා ජපානය, චීනය වාගේ රටවල් ක්‍රිකට් ගැහුවොත්, ඒ රටවලටත් පහළට අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව ඇවිල්ලා, මේ රටේ ක්‍රිකට්වල මළගම උදාවෙන තැනට එනවා. ඒ නිසා අපි අපේක්ෂා කරනවා, ඉදිරි දින කිහිපය තුළ හෝ මේ වැටිලා තිබෙන තැනින් ගොඩ එන්න අදාළ බලධාරීන් අවශ්‍ය විධියට ක්‍රියා කරයි කියලා.

මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී අපි මේ සම්බන්ධයෙන් විවාද දෙකක් කළා. මේ විවාද දෙක හරහා පාර්ලිමේන්තුවේ සුළු මන්ත්‍රීවරු කිහිප දෙනෙක් හැර සියලුදෙනාගේම මතය වුණේ, ඒ

සියලුදෙනාම එකතු වුණේ මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව නහාසිටුවීමට අවශ්‍ය නීති හදන්න ඕනෑ කියලායි. ඒකට අවශ්‍ය පියවර ගත යුතුයි කියලා යෝජනා කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 23ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.30]

ගරු හරින් ප්‍රනාන්දු මහතා (සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஹரின் பர்னாந்து - சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சரும் விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சரும்)
(The Hon. Harin Fernando - Minister of Tourism and Lands and Minister of Sports and Youth Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සංචාරක කර්මාන්තයට අදාළව නියම 5ක් සහ නියෝග 3ක් ඉදිරිපත් කර තිබෙනවා. ක්‍රීඩාවට ගෙනාපු anti-doping නියෝගයක් නිසා - සංචාරක ක්ෂේත්‍රය ගැන වැඩිපුර ප්‍රශ්න නැති නිසා වෙන්න ඇති - ක්‍රිකට් ක්‍රීඩාව අල්ලාගෙන, match එකක් පැරදුණාම ඒකෙන් මහා විනිදනයක් ගන්න විපක්ෂය කටයුතු කරනවා. විපක්ෂය මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම ගැන මම ගොඩක් ආඩම්බර වෙනවා.

දැන් විනය ගැන කථා කරනවා. විනය සහ ක්‍රීඩාව ගැන කථා කරනවා. මගේ මිත්‍රයෙක්, අපේ හිතවතෙක් වන මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් එදා කිව්වා, සමහර මිනිස්සු සමහර මිනිස්සුන්ට යට වෙලා තමයි පාර්ලිමේන්තුවල ඉන්නේ කියලා. එක නාළිකාවක් බලද්දී මටත් සැකයක් ඇති වෙනවා, ඒ නාළිකාවෙයි, ඒ මන්ත්‍රීවරයාගෙයි තිබෙන එකම ඉලක්කය ශ්‍රී ලංකාවේ ක්‍රිකට් විනාශ කිරීම ද කියලා. මොකද, ඒ නාළිකාව - මම නමින් කියන්නේ නැහැ - match එකක් පැරදුණාම කවි ලියනවා, ඒ නාළිකාවේ නම දාලා. ඒ නාළිකාවේ ප්‍රධාන නළුවා එතුමා. එතකොට මේ ඔක්කෝම එක්ක කල්පනා කරන කොට ඔවුන් ඇත්තටම ක්‍රීඩාවට ආදරෙයි ද කියලා සැකයක් ඇති වෙනවා. මට ෂම්මි සිල්වා කියන කෙනා එක්ක කිසිම ප්‍රශ්නයක් නැහැ. එකක් මතක තබා ගන්න, ක්‍රීඩා අමාත්‍යාංශයට අයිති වෙන්නේ ක්‍රිකට් විතරක්ම නොවෙයි. ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රීඩා 73ක් තිබෙනවා. ක්‍රීඩා 73ක් තිබෙනකොට ඊයේ පෙරේදා ඒ සඳහා රෙගුලාසියක් දැම්මා. මෙතුමන්ලා දන්නවා ද දන්නේ නැහැ, ඒ රෙගුලාසිය අනුව Executive Committee එකේ අවුරුදු 16ක් හිටියොත් ඔහුට සභාපති වෙන්නත් බැහැ කියලා. මම දන්නා තරමින් ෂම්මි සිල්වා අවුරුදු 16ක් ඉඳලාත් ඉවරයි. ඊළඟ පාර නිලවරණයේදී එතුමාට ඉල්ලන්නත් බැහැ. ඒ නිසා මේ තිබෙන්නේ පෞද්ගලික වෛරයක්, පෞද්ගලික තරහක්.

හැබැයි මට මේ ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳ විෂයවත්, ක්‍රීඩා අමාත්‍යාංශයවත් ගන්න වුවමනාවක් තිබුණේ නැහැ. රොෂාන් රණසිංහ මන්ත්‍රීතුමා කිව්වා, එතුමාගේ තේ එකකට වහ දැම්මා, කැබිනට් එකෙන් තේ එකක්වත් බොන්න බයයි කියලා. ජනාධිපතිගේ Chief of Staff එතුමාව මරන්න ඉන්නවාය කිව්වා. එහෙම කියපු කෙනෙක් කැබිනට් එකෙන් අයින් කළා මිසක්, එතුමා කරපු කිසිම චෝදනාවක් නිසා රනිල් වික්‍රමසිංහ මහත්තයා එතුමාව අයින් කළේ නැහැ. කොහේවත් යන බර කරත්තයක් මගේ කර පිට තැබුවා. එතකොට ශ්‍රී ලංකා ක්‍රිකට් තහනම් වෙලා තිබුණා; ශ්‍රී ලංකා රගර් තහනම් වෙලා තිබුණා. තව ක්‍රීඩා තුනක්, ෆුට්බෝල් තහනම් වෙලා තිබුණා. දැන් එකක්වත් තහනම් වෙලා නැහැ. World Cup එකට ගිහිල්ලා ගහපු matches තුනෙන්, දෙකක් පැරදුණාම අර නිදාගෙන හිටපු අය ආයෙත් නැඟිටලා. හැබැයි, මම භාර ගත් ගමන්ම තිබුණු tours තුනම දිනුවාම "හොඳයි" කිව්වේ නැහැ. අන්න ඒකයි මම හැමදාම කිව්වේ, ක්‍රීඩා අමාත්‍යාංශය තරම් නන්නත්තාර තැනක් නැහැ කියලා. දිනනකොට හොඳයි. පැරණි ක්‍රීඩකයා පරදින කොට ඇමතියා පළි. පුදුම කරුමයක්. ජේෂා විනානගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා ක්‍රීඩා ඇමති වුණත් ඔබතුමාටත් ඔය දේම තමයි වෙන්නේ. ඒක හොඳට මතක තබා ගන්න.

ඊළඟට, චෝදනා ගැන කිව්වොත්, ඔබතුමා කිව්වා, මම ක්‍රීඩා ආයතන හතරක් අයින් කළා කියලා. අයින් කළේ, රග්බි ක්‍රීඩාව. World Rugby එක අපි cancel කරලා තිබුණා. World Rugby එකෙන් අපට කිව්වා, ව්‍යවස්ථාව - constitution එක - වෙනස් කරන්න කියලා. ඒ ව්‍යවස්ථාව වෙනස් කරන්න අපි ඔක්කෝම එකඟ වුණා. එතකොට මම හිටියේ නැහැ. ඒ හිටපු කමිටුව, ක්‍රීඩකයන්ගෙන් සංයුක්ත කමිටුවක් පත් කරලා ඒ ගොල්ලෝ ඒක approve කර ගත්තා. ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම කල්පනා කළොත් මේ ක්‍රීඩා සංගම් හැම එකකම තිබෙන්නේ වෙනම ගේම් එකක්. හැමදාම බලයේ ඉන්න බලන ගේම් එකක් තිබෙන්නේ. ඒක ක්‍රිකට්වලට පමණක් සීමා වෙලා නැහැ. අපි ක්‍රිකට් ගැන මෙච්චරම කථා කරන්නේ, ලංකාවට මුදල් ටිකක් එන, ලංකාවට පිළිගැනීමක් තිබෙන, ලෝකයට පෙනෙන්න තිබෙන ක්‍රීඩාව ක්‍රිකට් ක්‍රීඩාව නිසායි. ඔබතුමන්ලාත් එක්ක වැඩ කරන තිලංග සුමතිපාල මේක අල්ලා ගෙන ඉන්න බැලුවේ නැද්ද? මම ඔහු ගැලෙව්වේ කොහොමද? ඔබතුමන්ලා ඒවාට ස්තුතියි කියනවාද?

ඒ වාගේම සූදු ව්‍යාපාරයේ ඉන්න කිසිම කෙනෙකුට මොනම ක්‍රීඩාවකවත්, -මම නැවතත් කියනවා, ක්‍රිකට් පමණක් නොවෙයි මොනම ක්‍රීඩාවකවත්- තනතුරක් දරන්න බැහැ කියලා අපි එදා නීති ගෙනාවා. එදා ඔබතුමා මාත් එක්ක හිටියා. එතකොට සජිත් ප්‍රේමදාස මහත්තයා ඡන්දය ඉල්ලනවා, 16වැනි දා. කථානායකතුමා විධියට හිටියේ කරු ජයසූරිය මහත්මයා. එතුමාට කියලා විශේෂ පාර්ලිමේන්තුවක් කැඳවලා අවුරුදු ගණනක් කිසිම ඇමතිවරයෙක් කරන්නේ නැතිව පහු කරගෙන, පහු කරගෙන, පහු කරගෙන ආපු එක අපි දවස් තුන, හතරෙන් ඒ ඡන්දයට ඉස්සෙල්ලා ඉදිරිපත් කරලා පාස් කර ගත්තා. ඡන්දයට ගිහිල්ලා හිටිය නිසා එදා පාර්ලිමේන්තුවේ හිටියේ හතර දෙනායි. අපි ඉක්මනට එදා ඒ තත්ත්වය වෙනස් කර ගත්තා. ඔබතුමා ඔය කියන ඔක්කෝම දේවල් අද සිද්ධ වෙන්නේ ඒකෙන් පස්සේ තමයි.

ගරු මන්ත්‍රීතුමනි, LPL ගැන ඔබතුමා මගෙන් ඇහුවා. LPL එක IPG එකට දුන්නේ මම ද? ඒ දුන්නු කෙනා ඔබතුමා දන්නවා. මම ඔබතුමා කියන කථාවට සියයට 100ක් එකඟයි. එන හැම investor කෙනෙක්ම vet වෙන්න ඕනෑ; vetting process එකක් තිබෙන්න ඕනෑ.

ICC එක වුණත් ඒවාට සම්බන්ධ වෙන්න ඕනෑ. මම නීතියක් ගෙනෙනවා, ඕන් මතුවට ලංකාවට එන සෑම investor කෙනෙක්ම පරිපාලනය වෙනවාද නැද්ද, vet කරලා නොවෙයිද ගන්නේ කියන කාරණය සම්බන්ධයෙන්. එහෙම නොකර ගන්නවා නම් එයාට අවස්ථාව දෙන්න බැහැ.

ගරු ජේෂා විනානගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා අර විධියට කිව්වාට, ගිය වතාවේ පැවැති LPL තරගාවලිය සම්බන්ධයෙන්

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

ඔබතුමාගේ පැත්තේම ඉන්න කෙනෙකුටත් චෝදනාවක් එල්ල වෙලා තිබෙනවා. හෙට අනිද්දා වන කොට බලන්න, එතුමාත් පරීක්ෂණයට ලක් කරනවා. ඒක මට ආරංචියි. ඒ වංචනික ක්‍රියා නවත්වන්න පුළුවන් නීතියක් තිබෙන එකම රටයි ලෝකයේ තිබෙන්නේ. ඒ තමයි මේ ලංකාව. ඒ, ඔබතුමාත්, අපිත් "යූඑන්පී" කියන එකම පක්ෂයේ ඉන්න කොට ගෙනාපු නීතිය. ඒ නීතිය නිසා තමයි අර මිනිහා හිරේ ඉන්නේ.

Legends Tournament එකක් ආවා. ඒ Legends Tournament එක එනකොට මම බැලුවේ සංචාරක ක්ෂේත්‍රය පැත්තෙන්. ඇයි? ලංකාවට සංජේ දත් ආවා, ක්‍රිස් ගේල් ආවා. යුවරාජ් සිං දළ දා මාළිගාවට ගිහිල්ලා මල් පූජා කරලා වැන්දා. මම ඒ තුන්දෙනා ලංකාවට ගේන්න වියදම් කළා නම්, advertisement එකක් ගහන්න මට කීයක් යයිද? ඒ Legends Tournament එකට ඒ ගොල්ලන් ඇවිල්ලා ක්‍රීඩා කළා. එතැනදී එහෙන් මෙහෙන් incidents කිහිපයක් වුණා. අපි SIS එක යවලා අත් අඩංගුවට ගැනීම් කළා. ඒ අත් අඩංගුවට ගත් අය තවමත් ඉන්නේ ලංකාවේ හිර ගෙදර. ලෝකයේ මොන රටේ ද එහෙම නීතියක් තිබුණේ? ඒක තමයි අපි ගෙනාපු නීතිය.

චිත්‍රසිරි කමිටු වාර්තාව ගැනත් දැන් කථා කළා. සමහර අයට සමහර දේවල් කියන්න හරි ලේසියි, පහසුයි. චිත්‍රසිරි කමිටුව ලබා දුන් වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අපි පාස් කර ගනිමු. එතකොට, ඒක නීතියක් වෙනවා.

තව එක කරුණක් මතක තබා ගන්න. දේශපාලනය අත ගහන හැම ක්‍රීඩාවක්ම විනාශයි. ගරු මන්ත්‍රීතුමනි, පාකිස්තානය ගැන අද ඔබතුමා අර විධියට කිව්වාට, පාකිස්තානයේ ක්‍රිකට් සභාපතිවරයා පත් කරන්නේ ඒ රටේ අගමැතිවරයා. පාකිස්තානයත් ලෝක කුසලාන තරගාවලියේ පළමුවැනි රවුමෙන්ම පැරදිලා ගෙදර ගියා; USA Team එකටත් පරාදයි. දැන් ඒ ගොල්ලෝ ක්‍රිඩකයෝ 6දෙනෙක් අස් කරලා තිබෙනවා. ඒ ඇයි? අපි උදාහරණයක් ගනිමු. Sri Lanka Cricket එකේ සභාපතිවරයා පත් කරන්න හෙට රනිල් වික්‍රමසිංහ මහත්මයාට බලය දීලා එතුමා කවුරු හරි යාළුවෙකු ගෙනැල්ලා දැම්මොත් මොකද වෙන්නේ? ඒකද කරන්න ඕනෑ? පසුගිය අවුරුදු දෙකට Pakistan Cricket Board එකේ presidentsලා 6 දෙනෙක් මාරු වෙලා තිබෙනවා. මා කියන්නේ, අපි ඊට වඩා බෙහෙවින් බුද්ධිමත්ව කටයුතු කරන්න ඕනෑ කියලායි. එදා ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා එක්ක කථා කරද්දී, argument එකක් වුණු වෙලාවේදී මම කිව්වා, ICC එකට දෙබිඩි පිළිවෙතක් තිබෙන්නේ, ICC එක වැරැදියි කියලා. මම ඒක පිළිගන්න කැමැතියි. එහෙත්, ICC එකට අභියෝග කරන්න ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට බැහැ. නීතිය තේරුම් ගන්න. අපි ICC එකට අභියෝග කළාට ICC එක සත පහකට අප ගණන් ගන්නේ නැහැ. ICC එක අහන්නේ, "අපියි උඹලාට සල්ලි එවන්නේ, උඹලාගේ පාර්ලිමේන්තුව කොහොමද අපට කියන්නේ?" කියලායි. කියන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවා. ඒ තමයි රටේ නීතිය වෙනස් කිරීම. ඒක තමයි අපි දැන් කරන්නේ. ඒ සඳහා තමයි චිත්‍රසිරි වාර්තාව හැදුවේ. ඒකේ සමහර කාරණාවලට මම එකඟයි, සමහර කාරණාවලට මම පෞද්ගලිකව එකඟ නැහැ. හැබැයි, රට, කැබිනට් මණ්ඩලය, පාර්ලිමේන්තුව හැටියට එකඟ වෙනවා නම්, ඒක ක්‍රියාත්මක කරන්නයි මම බැඳිලා ඉන්නේ. ඒක, මගේ responsibility එක.

මට සමහර වෙලාවට මෙහෙම හිතෙනවා. ක්‍රීඩා සංගම්වල තිබෙන ප්‍රශ්න Chartered Accountant දන්නේ නැහැ නේ. එයාත් ඉන්න ඕනෑ. ඒකේ ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේම, ක්‍රීඩා සංගම්වල ප්‍රශ්න නීතිඥයෙක් දන්නේත් නැහැ නේ. එතකොට, ක්‍රිකට් සංගමය නියෝජනය කරන්න පිටින් ගෙනැල්ලා, සම්පූර්ණ වගකීම ඒ ගොල්ලන්ට භාර දෙන එක හරිද? නැහැ. සංයුතියක් තිබෙන්න ඕනෑ. ඒ සංයුතිය ගැන සාකච්ඡා කරමු.

අපේ ඡන්ද ප්‍රමාණය වැඩියි තමයි. අපේ රටේ paper clubs, බොරු clubs රගර්වලත් තිබෙනවා, ක්‍රිකට්වලත් තිබෙනවා. රගර් ගත්තොත්, provincesවලට ඡන්ද 9ක්, 10ක් තිබෙන ක්‍රීඩා සංගම් තිබෙනවා, රගර් බෝලයක්වත් නැති. මේක ඉතිහාසයේ ඉඳලාම ක්‍රීඩා සංගම්වල සිදු වුණු වැඩක්. ඒක තමයි අපි නවත්වා ගන්න ඕනෑ. මේක ක්‍රිකට් ක්‍රීඩාවට විතරක් නොවෙයි, හැම ක්‍රීඩාවකටම අදාළ වෙන්න ඕනෑ. අන්න එහෙම වුණොත් තමයි, මේ ප්‍රශ්නය විසඳා ගන්න අපට පුළුවන් වෙන්නේ.

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඔබතුමා දැල් පන්දු නිලවරණය ගැනත් කිව්වා. අනෙක් ඒවායේ නිලවරණ කැඳෙව්වා කිව්වා. අපි ඇතැම් ක්‍රීඩා සංගම් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් යටතට ගත්තේ ඒවා පරිපාලනය කරන්න නොවෙයි, ඒ ගොල්ලන්ට ඡන්දය පවත්වන්න කියන්නයි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඡන්දය පවත්වන කාලය ගැන කිව්වොත්, ඡන්දය පවත්වන්න නම් SGM එකක් තියලා දින 21ක් හෝ ඒ වාගේ දින ගණනක් දෙන්න ඕනෑ. ඒ සඳහා තමයි අපි ඒක කළේ. මම ඔබතුමාට කියනවා, මම ආපු දායින් පසුව ලංකාවේ කිසිම ක්‍රීඩාවකට එක අන්තර් කම්ටුවක්වත් දැම්මේ නැති බව. ඉස්සර අන්තර් කම්ටු හැම තැනම තිබුණා. දැල් පන්දු ගැන මම දන්නවා ද? එල්ලේ ගැන මම දන්නවා ද? මේ ක්‍රීඩා 73 ගැනම මම දන්නවා ද? එහෙම පෙරේත වෙලා මගේ මිනිහෙක් දාලා ඒවා run කරන්න බැහැ. ඒවායේ හිටපු මිනිස්සු දමන්න ඕනෑ.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු ඇමතිතුමනි, ඒ සියලු ක්‍රීඩා ගැන නැතත්, ඔබතුමා ක්‍රිකට් ගැන දන්නවා නේ. ක්‍රිකට් ගැන දන්නා කෙනෙකු වන ඔබතුමාගෙන් මා ඇහුවේ, මේ ක්‍රිකට් පරිපාලනය ඔබතුමාත් කඩේ යවනවා නේද කියලායි. ඒ අයට මූල්‍ය වාර්තා - financial statements - දෙන්න තිබෙන දවසට ඒ මූල්‍ය වාර්තා නොදී මහ හරින එක ලොකු වරදක් නේද? ඔබතුමා ඒ වෙනුවෙන් ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ නේද?

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

මම ඒකට උත්තරයක් දෙන්නම්. ICC එකේ CEO ඇවිල්ලා ගරු ජනාධිපතිතුමා හමු වුණා. අපි ඇහුවා, අපේ වාර්තා සහ මේ වාර්තා ගැන ඔබතුමා කියන්නේ මොකක්ද කියලා. ඒ ගොල්ලන් කිව්වා, මේ දීලා තිබෙන වාර්තාව ICC එක පිළිගන්නවා කියලා. ගරු මන්ත්‍රීතුමනි, මම මේ ඔබතුමාට අවංකව කියන්නේ. මමත් ඒ සාකච්ඡාවේ හිටියා. ICC එක දීපු මුදල්වලට අදාළව දීලා තිබෙන ඒ වාර්තාව ICC එක පිළිගන්නවා නම්, "Accounts are okay. We do not have a problem" කියලා in writing දෙනවා නම් අපි මොකක්ද කරන්නේ කියන්න? හැබැයි, මේ චිත්‍රසිරි වාර්තාව අත්‍යවශ්‍යයි. මොකද, ඒ අනුව මා දන්නා තරමින් 147ක් වන ඡන්ද ප්‍රමාණය පළමුවෙනි stage එකේදීම 60කට අඩු වෙනවා. ඒ වාර්තාව study කරලා, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සමස්තයක් හැටියට මේ ප්‍රශ්නය විසඳා ගන්න ඕනෑ. එහෙම නැති වුණොත් ගැටලුවක් වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හිතනවා ඇති, මේක හරිම ලේසියි කියලා. ඒ ඡන්ද තිබෙන clubsවලින් ඒ ගොල්ලන්ගේ ඒ ඡන්ද අයිතිය ගැලෙව්වොත්, ඒ ගොල්ලන්

කැමැති වෙයි කියලා ඔබතුමා හිතනවාද? කැමැති වෙන්නේ නැහැ. ඇයි ඒ? ඔබතුමාගේ පළාතේ, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ Ratnapura Cricket Club එක ගනිමු. ඒ ගොල්ලන්ට තිබෙන ඒ ඡන්ද අයිතිය එතැනින් අයින් වෙනවා නම්, ඒ ගොල්ලන් කැමැතිද?

ගරු අලි සබ්‌රි ඇමතිතුමා එක්ක මම තර්ක කරනවා නොවෙයි. එතුමා එංගලන්තය ගැන කිව්වා; ඕස්ට්‍රේලියාව ගැන කිව්වා. ඉන්දියාවේ ජනගහනය විශාල වුණත් එහි ක්‍රිකට් ආයතනයට තෝරා ගන්නේ ඡන්ද 38කින් බව කිව්වා. ඒ ඒ රටවල ක්‍රිකට් ආයතනවල සංයුතිය වෙනස්. ඒ ගොල්ලන්ගේ provincial system එකක් තිබෙනවා. ඉස්සෙල්ලාම, province එකෙන් ඡන්දයක් තියලා, province එකෙන් එන එක්කෙනාට ඡන්දය දෙනවා. ඒ ඡන්දය අරගෙන තමයි ජාතික මට්ටමට එන්නේ. එහෙමයි ඒ ඡන්ද සංඛ්‍යාව අඩු වෙන්නේ. එහෙම නැතුව 37ක් තෝරලා, 37දෙනෙක් විතරක් ඡන්දය දීලා එනවා නොවෙයි. විවිධ ක්‍රම තිබෙනවා. අපට ගැළපෙන, සුදුසුම ක්‍රමය අපි තෝරා ගත යුතුයි. අපි කියන්න ඕනෑ, "අරහේ මෙහෙම වුණා, මෙහේ මෙහෙම වුණා. අර විධියට වුණා" කියලා නොවෙයි. තර්ක කර ගැනීම හරි ලේසියි.

මම ගරු භේෂා විතානගේ මන්ත්‍රීතුමා කියපු සියයට 90ක් කාරණා එක්ක එකඟයි. හැබැයි, සමහර විට වැරැදි මතයක් ඇති වෙන්න පුළුවන්. දේශපාලන අත පෙවීමකින් තොරව, රටේ නීතියත් සමඟ අපි වෙනස් වුණාට පස්සේ, ICC එකට බැහැ මොකුත් කියන්න. හැබැයි, අපි අත්තනෝමතික ලෙස කටයුතු කරනවා කියලා ICC එකට තේරුණොත්, ඒක ප්‍රශ්නයක්.

අපේ රට, ඇත්තටම පුංචි රටක්. මම ඒකයි එදා කිව්වේ. ඇමෙරිකානු ක්‍රිකට් ආයතනයත් තහනම් වෙලා. හැබැයි ඇමෙරිකාවේ ICC Men's T20 World Cup තරගාවලිය පැවැත්වුණා. අපේ රටේ ක්‍රිකට් තහනම් වෙලා තිබෙන කොට, ICC Under-19 Men's Cricket World Cup තරගාවලිය අපේ රටේ පවත්වන්න දුන්නේ නැහැ. අපට ICC එක සැලකුවේ දෙබිඩි පිළිවෙතක ඉඳන්. ඒ පිළිබඳව අපේ බලවත් විරෝධය අපි ලියා යැව්වා. බොහොම දරුණුවට ලියලා යැව්වා, එහෙම කිරීම වැරැදියි කියලා. ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයේ AGM එක ජූලි මාසයේ ලංකාවේදී පැවැත්වෙන්නේ. ඒ AGM එකේදී ඒ ගොල්ලන් ඒ කාරණාව අවධානයට ගනීවි. හැබැයි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සංයුතිය වෙනස් කිරීම ගැන මම ICC එකේ කිහිපදෙනෙකු මුණ ගැහිලා කථා කරලා තිබෙනවා. ඒ ගොල්ලන් කිව්වේ, "ඔයගොල්ලන්ගේ රටේ නීතියට අපි ඇඟිලි ගහන්නේ නැහැ. ඔයගොල්ලෝ රටේ නීතිය අනුව එය හදා ගෙන එන්න" කියලායි. එහෙම නැතිව අපි පාර්ලිමේන්තුවෙන් pass කරලා තීරණයක් දෙනවා කිව්වොත්, ඒ ගොල්ලන් කැමැති නැහැ පාර්ලිමේන්තුව කියන එක පිළිගන්න. හැබැයි, අපි ඒක රටේ නීතියක් විධියට ව්‍යවස්ථානුකූලව හදා ගත්තොත්, ඒ ක්‍රමය නොපිළිගන්න ඒ ගොල්ලන්ට බැහැ. ඒ නිසා එතැනට තමයි අපි යා යුත්තේ. අපි එතැනට යමින් පවතිනවා.

ඔබතුමන්ලා කිව්වා, මේ පාර ලංකාවේ Team එක මෙහෙම පැරැදුණා, අර විධියට පැරදුණා කියලා. ඔබතුමන්ලා කිව්වා, ලංකාව 1996දී ක්‍රිකට් ලෝක කුසලානය දිනුවා; 2014දීත් දිනුවා කියලා. 2007දීත්, 2011දීත් විවිධ ජයග්‍රහණ ලැබුවා කිව්වා. ඔබතුමන්ලා ඒ වාගේ කථා කිව්වා. ඒ දිනන කොට හිටියේත් මේ කියන විධියේ කමිටුවක්ද? නැහැ නේ. එතකොටත් ඔය පරිපාලනයම, ඔය නම් කියන අයම ඒවා ඇතුළේ හොල්මන් කර කර හිටියා. ආනා පුංචිහේවා මහත්මයා හිටියේ 1996දී. ඊට පසුව තිලංග සුමතිපාල තමයි වැඩිම කාලයක් හිටියේ. එහෙම බැලුවාම, තිලංග සුමතිපාලගේ කාලයේ නේ ඒ කියපු තරග ඔක්කෝම වාගේ දිනුවේ, දැන් තිලංග සුමතිපාලට "හොරා - හොරා" කිව්වාට. එහෙම නම්, මේවා තමන්ගේ වාසියට පෙරළා ගන්න හදන්න එපා. දැන් මේ ICC matches ලංකා කණ්ඩායම දිනුවා නම් ඔබතුමන්ලා කට වහගෙන ඉන්නවා. දිනුවා නම් එහෙමයි. මොකක් හරි හොඳකට පැරදුණා වෙන්න පුළුවන්. හැබැයි, ඒ තරග දෙක ගෙන බලන්න. මා දන්නා විධියට එදා පළමුවෙනි තරගයේදී අපේ අතින් එකම එක වරදයි වුණේ. එදා අලුත්ම අලුත් pitch එකක්, කවදාවත් ක්‍රීඩා කරපු නැති pitch එකක්, drop-in pitch එකක් තිබුණේ. නමුත් toss එක දිනලා මොන හේතුවකට අපි bat කළා ද දන්නේ නැහැ. Pitch එකේ ස්වභාවය හරි පොඩ්ඩක් බලා ගන්න, අනෙක් කණ්ඩායමට bat කරන්න දුන්නා නම්, සමහර විට chance එකක් තියෙන්න ඉඩ තිබුණා.

හැබැයි, මම නොවෙයි නේ ground එක මැද ඉන්නේ. ඒ නිසා ඔවුන් ගත්ත තීරණය අනුව අපි ජාතියක් විධියට bat කරන්න වෙනවා. අපි දෙවෙනි match එක ගැහුවේ ෆ්ලොරිඩාහිද කොහේද නේ. එහෙම ගහනකොට අපි බංග්ලාදේශයට ගැහුවේ 124යි. ඒ 124 ගහලා, 19වෙනි over එක එනකම් fight කරලා, නුවන් තුෂාර bowl කරපු අන්තිම over එකේ අන්තිම බෝලයේදී විකට් එකක් ගියා නම් match එක අපි දිනුම්. ඉතින්, ඇයි අපි මේක කුහක විධියට දේශපාලනීකරණය කරගෙන තිබෙන්නේ? "අඩෝ, උඹලාට ගංවතුර ගලපං, මැරිලා පලයං, මූසලයා, බල්ලා" කියලා කියන්නේ අපි අනෙක් දවසේ කරේ තියාගෙන යන ක්‍රීඩකයන්ට. අපි හරි අමුතුම ජාතියක්. දැන් ඇෆ්ගනිස්තානයට ලකුණු 75කට New Zealand පැරදුණා. කේන් විලියම්සන්ට "තෝ මූසලයා" කියලා ඒ රටවල ජනතාව ගහනවාද? අපි හරි වෛරක්කාර, මාර keyboard warriorsලා කියලා හිතාගෙන ඉන්න, මාර පොරවල්. අපි හරි ආසයි මිනිස්සුන්ට බණින්න, මිනිස්සුන්ට චෝදනා දාන්න. ජිල් බෝලයක්වත් ගහලා නැති අය තමයි වැඩියෙන්ම ඒවා කියන්නේ.

මම විශ්වාස කරනවා, ක්‍රිකට්වල අර්බුදයක් තිබෙන බව. ඒ අර්බුදය තිබෙන්නේ administrationවල. අපේ ලංකාවේ ක්‍රිකට් ගහන්නේ කොච්චර පොඩි ප්‍රදේශයකද? මිලියන 22ක් හිටියාට ක්‍රිකට් ගහන්නේ මිලියන 4ක් ඉන්න radius එකක. අම්පාරේ ක්‍රිකට් තිබෙනවාද, මඩකලපුවේ තිබෙනවාද, වන්නියේ තිබෙනවාද, බදුල්ලේ තිබෙනවාද, බණ්ඩාරවෙල තිබෙනවාද, රත්නපුරයේ ලොකුවට තිබෙනවාද, නිවිතිගල තිබෙනවාද? ඒ ගැන කල්පනා කරලා බලන්න. *[බාධා කිරීමක්]* දැක්කාම ආදරය හිතුණා, දැක්කාම ආදරයක් හිතුණා.

ඇත්තටම කල්පනා කරලා බලපුවාම ක්‍රිකට් ගහන්නේ කොහේද? මාතර පොඩ්ඩක් තිබෙනවා. ගාල්ලෙන් තමයි ක්‍රිකට් පටන් ගන්නේ. ගාල්ල, කළුතර, මොරටුව, කොළඹ, ජා-ඇල, වත්තල ඉඳලා මීගමුවට එනකම් තිබෙනවා. හලාවතවත් නැහැ. වෙන්නප්පුවේ ජෝශප් වාස් ඉස්කෝලේ තිබෙනවා. ඒත් පිට්ටනියක් නැහැ ක්‍රිකට් ගහන්න. එතැනින් එහාට කුරුණෑගල ක්‍රිකට් ක්‍රීඩාව පොඩ්ඩක් තිබෙනවා. එතැනින් එහාට ගියාම නුවර තිබෙනවා. දැන් මාතලේ පොඩ්ඩක් තිබෙනවා. නමුත් අවශ්‍ය level එකේ නැහැ. අනෙක් කිසි පළාතක ක්‍රිකට් නැහැ. පොළොන්නරුවෙන්, අනුරාධපුරයෙන් ක්‍රීඩකයෙක් ඇවිල්ලා තිබෙනවාද? ජනාධිපතිතුමා බිලියන 13ක් සිදත් වෙත්තමුනි, අරවින්ද ද සිල්වා හරහා දුන්නේ සංවිධානය වෙලා ලංකාවේ අන්න ඒ domestic cricket structure එක හදන්නයි.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ඇමතිතුමාගේ කථාවත් එක්ක මම සියයට 100ක් එකඟයි. ක්‍රිකට් පරිපාලනයේ හිටපු සහ දැන් ඉන්න උදවිය එහෙම හිතනවාද කියලා මම දන්නේ නැහැ. පාසල් ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කරන්නේ නැතිව, ගමෙන් ගන්නේ නැතිව හොඳ ක්‍රීඩකයන් සොයන්න බැහැ. ඔබතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කරන්න ගමේ ඉන්න හැකියාව තිබෙන ක්‍රීඩකයන් හඳුනා ගන්න. Sri Lanka Cricket එකට එහෙම වුවමනාවක් තිබෙනවා කියලා තවම පේන්නේ නැහැ. ඒක කරන්න පුළුවන් නම් අපට හොඳ කණ්ඩායමක් සොයා ගන්න පුළුවන්.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
එන සතිය වෙනකොට සම්පූර්ණයෙන් හරි structure එක, වැඩ පිළිවෙළ පෙන්වයි. ඇත්ත වශයෙන්ම මම විශ්වාස කරනවා-

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
අපේ චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමාටත් අවස්ථාව දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ගරු ඇමතිතුමා, වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියා උතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රදේශයේ කොහේවත් hard ball cricket බඩු නැහැ. මම උදේ ඔබතුමාට ලියුමකුත් දුන්නා. ඒ ප්‍රදේශයේ ඉන්න ක්‍රීඩකයන් Puradchi Sports Club එකේ හොඳට play කරනවා. නමුත් ඒ ප්‍රදේශයේ බඩු නැහැ, සෙල්ලම් කරන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මට මාසයක් දෙන්න. අපට ක්‍රීඩා පිටි 3කට මුදල් ICC එකෙන් ලැබෙනවා. මම දැක්කා අපේ විපක්ෂ නායකතුමා ගිහිල්ලා අහනවා, ''යාපනයේ ලයිට් දාපු ටෙස්ට් ක්‍රීඩාංගණයක් නැද්ද?'' කියලා. ඒ එතුමාගේ දැනීම. ලංකාවේ ටෙස්ට් ක්‍රීඩාංගණ තිබෙන්නේ කිහිපයයි. SSC එක තිබෙනවා, ගාල්ලේ තිබෙනවා, සූරියවැව තිබෙනවා, අස්ගිරියේ තිබෙනවා, පල්ලෙකැලේ තිබෙනවා. ලංකාවේ Test Cricket grounds තිබෙන්නේ 5යි. පී. සරවනමුත්තු එක තමයි පරණම ටෙස්ට් ක්‍රීඩාංගණය. යාපනයේ turf එකක් තිබෙන pitch එකක්වත් නැහැ. ඒකවත් නොදැන, "R. Premadasa International Cricket Stadium වාගේ stadium එකක් නැද්ද?" අහනවා. අපි ක්‍රිකට් ක්‍රීඩාවත් එක්ක කරන්න ඕනෑ දේශපාලනය නොවෙයි. අපි ක්‍රිකට් ක්‍රීඩාවට ආදරේ නම් අපි ක්‍රිකට් ක්‍රීඩාව හදන්න ඕනෑ. ඔබතුමාගේ යෝජනාවත් එක්ක මම එකඟයි. එංගලන්තයේ ඉන්න මහත්තයෙක් එයාගේ පෞද්ගලික සල්ලිවලින් පුදුම ලස්සන stadium එකක් Batticaloaවල හදලා තිබෙනවා. අපට තව stadiums 3කට මුදල් ICC එකෙන් ලැබෙනවා. අපි කථාන හෝ ජා-ඇල ප්‍රදේශයේ international stadium එකක් හදනවා. මොකද, ඒක Airport එකට ළඟ නිසා. ඒ මගේ දිස්ත්‍රික්කය නිසා නොවෙයි. මගේ දිස්ත්‍රික්කය කොහේද කියලා මම තවම දන්නේ නැහැ, බදුල්ලෙන් ඉල්ලනවාද, ගම්පහින් ඉල්ලනවාද කියලා. ඒ නිසා නොවෙයි, ඒ ප්‍රදේශයට Expressway එකත් ළඟයි නේ. දැන් ඒ international stadium එක හදන්න මුල් ගල තියන්න ලෑස්ති කරලා තිබෙනවා. ඒ වාගේම ඒ කටයුත්ත සිදු වෙනවා. ලංකාවේ World Cup එකක් තියන්න නම් ICC level එකේ grounds 6ක් තිබෙන්න ඕනෑ. අපට එවැනි ground එකක අඩුවක් තිබෙනවා. ඒ නිසා ඒක වෙනවා. මරික්කාර් මන්ත්‍රීතුමා කිව්වා වාගේ ගම්වල හොඳ ක්‍රීඩකයෝ ඉන්නවා. වියස්කාන්ත් යාපනයෙන් එන්නේ. LPL එකක් නොතිබෙන්න වියස්කාන්ත් හඳුනා ගන්නේත් නැහැ.

මෙතුමන්ලා කියනවා, මේක හොර LPL එකක්, මේ LPL එකෙන් කිසිම ක්‍රීඩකයෙක් මතු වුණේ නැහැ කියලා. වියස්කාන්ත් ආවේත් LPL එකෙන්. ඇත්තටම, ක්‍රිකට් ගැන කථා කරන්න මම සුදුසු නැහැ. මගේ job එක ක්‍රීඩකයෝ තෝරන එක නොවෙයි. මට තිබෙන්නේ, ඒ policiesවලට ඇඟිලි ගැසීම. මම ක්‍රිකට් බලන නිසා හරි මේ ගැන දන්නවා කියමු කෝ. හැබැයි, ඒ ගැන නොදන්න කෙනෙක් ක්‍රීඩා ඇමති වුණොත් එතුමාට පුළුවන්ද directions දෙන්න? ඒක මහා විහිළුවක් නේ. ඒ නිසා මේකට හරි පරිපාලනයක් තිබෙන්න ඕනෑ. චිත්‍රසිරි කමිටුව ගැන මට විශ්වාසයි. ඒ ගැන මට ලොකු විශ්වාසයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විෂයයන් 3ක් ගැන කථා කරන්නත් ඕනෑ. මම මේවා කිව්වේ, ක්‍රිකට් ගැන ප්‍රශ්නයක් ඇදගත්ත නිසායි.

මම Annual Report එකක් දීලා තිබුණේ නැහැ, මම ක්‍රිකට්වලට වෙනම විධියකටයි සැලකුවේ කියලා හේෂා මන්ත්‍රීතුමා කිව්වා. The Annual Report was submitted to the AGM on the 28th of May and it was approved. එහෙම approve වෙලා තිබෙද්දී 31වන දාට ඉස්සෙල්ලා තමයි අපි කල් දීලා තිබුණේ. The Financial Report was submitted to the Auditor-General on the 25th of February and we were waiting for their report for queries to be clarified. Match එකක් පැරදුණාට පස්සේ "හූ" කියන නරි ඉන්න රටක් මේ. එහෙම කිව්වාට සමාවෙන්න ඕනෑ. හැබැයි දිනුවාම වෙනම විධියකට සලකන රටක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉඩම් ප්‍රශ්නය ගැනත්, සංශෝධන ගැනත් මම ඉතාම ඉක්මනින් කියන්නම්. රජයේ ඉඩම් ආඥාපනත යටතේ ආයෝජන ව්‍යාපෘති සඳහා BOI අනුමතව පැවැති තිස් අවුරුදු දීර්ඝ කාලීන බද්ද, අනුනව අවුරුදු බද්දකට දීර්ඝ කිරීමේ නියෝගයක් පැනවීම තමයි අද සිදු වෙන්නේ. ඉඩම් නිමිකම් ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ලියාපදිංචි කිරීමේ

ගාස්තුව 1998න් පසු සංශෝධනය වී නැත. කාලානුරූපීව ලියාපදිංචි කිරීමේ ගාස්තුව සංශෝධනය කිරීම සහ ලියාපදිංචි කිරීමේ නව ආකෘති පත්‍රය හඳුන්වා දී ඇත. හිමිකම් පිළිබඳව තීරණය හිමිකම් කොමසාරිස් ජනරාල්ට ගත නොහැකි අවස්ථාවලදී අධිකරණයට යොමු කිරීමට රෙගුලාසි ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ විධියට තමයි ඉඩම් සම්බන්ධ කාරණය අවසන් වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න, සංචාරක කටයුතු යටතේ ගෙනෙන නියම සම්බන්ධයෙනුත් කථා කරන්න. මේ සඳහා ගැසට් පත්‍ර පළ කරමින් අපි සංචාරක කලාප නම් කළා. ඒ අනුව සංචාරක කලාප 49ක් අපි නම් කර තිබෙනවා. මේ වෙනකොට එයින් 26ක කටයුතු අපි අවසන් කරලා තිබෙනවා. මේ සංචාරක කලාපවලින් අපි බලාපොරොත්තු වන්නේ ඒ ප්‍රදේශ දියුණු කරන්නයි. ඒ ප්‍රදේශවල මිනිස්සු සංචාරකයා වෙනුවෙන් සූදානම් වන ආකාරය සහ ඔවුන්ගේ සිතුම් පැතුම් develop කරන්නයි. Soft liquor licences ඒ ප්‍රදේශවලට වැඩි කරදෙන්න ඕනෑ. BOI approval ලබා ගත හැකි ආකාරයට හෝටල් නිර්මාණය කරමින් ඒවා සංචාරක කලාප විධියට හඳුන්වන්න ඕනෑ. අපේ tagline එක තමයි, "Sri Lanka: You will come back for more" කියන එක. හැබැයි අපි යන්නේ, මිරිස්සට, සීගිරියට, පොළොන්නරුවට, අනුරාධපුරයට විතරයි. අපි හැමදාම යන්නේ එකම තැන්වලට. ලංකාවට එන සංචාරකයෝ සියයට 33ක්ම repeatersලා. ඒ නිසා අලුත් ප්‍රදේශ, අලුත් අත්දැකීම්, අලුත් ආයෝජන ගේන්න තමයි මේ සංචාරක කලාප අපි නිර්මාණය කරලා තිබෙන්නේ. ඒ වාගේම අපි ADB එක හරහා පෞද්ගලික අංශයේ පඩි ගන්න නිර්මාණශීලී කට්ටිය ඇතුළත් කරලා අවුරුදු 3ක සැලැස්මකට අනුව ලංකාවට මිලියන 3ක සංචාරකයන් ගෙන්වීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න තමයි මේ දවස්වල සූදානම් වෙන්නේ.

හෙට අනිද්දාට අපි විශාල marine tourism project එකක් කරනවා. ලංකාව වටේම තිබෙන්නේ, මුහුදු. හැබැයි, ලංකාවේ තවම එක yacht එකක් නැහැ. ලොකු yachts නැහැ; catamarans විතරයි තිබෙන්නේ. Maldivesවල බැලුවොත් හෙලිකොප්ටර් එකක් තරම් විශාල yachts තිබෙනවා, 100කට වඩා. ලංකාව වාගේ සුන්දර රටක් මේ කලාපයේවත් නැහැ. හැබැයි, අපට ගාල්ලේ yacht marina එකක් හදන්න බැහැ; ත්‍රිකුණාමලයේ හදාගන්න බැහැ; Port City එකේ හදාගන්න බැහැ. ඒ නිසා අපි ඒ සඳහාත් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒ සඳහා එක එක බාධක තිබෙනවා. අද නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාත් ඒ ගැන කිව්වා. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කියනවා ලු කොරල් තිබෙනවා කියලා වරායක් හදන්න දෙන්න බැහැ කියලා. ඒ වාගේ inter-Ministerial කටයුතුවල පොඩි පොඩි අඩුපාඩු තිබෙනවා. අපි අද ආණ්ඩුවෙන් ගියත්, හෙට ඔබතුමන්ලා ආණ්ඩුවට ආවත් සමහර නිලධාරීන් ඉන්න තාක්කල් වැඩ කරන්න හම්බ වෙන්නේ නැහැ. Progressive දෙයක් කරන්න කවදාවත් හම්බ වෙන්නේ නැහැ. හැබැයි අපි ඒවාට නීති ගෙනැල්ලා ඒ හරහා මේ දේවල් වෙනස් කරනවා. ඒ වාගේම අපි අලුතින් වැඩසටහනක් පටන් ගත්තා. ගොඩක් තැන්වල toilets නැහැ කියලා කියනවා. Toilets වල අඩුපාඩු තිබෙනවා කියලා කියනවා. මාසයක් දෙන්න, මේ හැම තැනකම - සීගිරියෙත්, හෝර්ටන් තැන්නෙත්, වැලිගම මුහුදු ළඟ පොඩි pilot project එකක් හැටියට ඒක කරනවා. යාලත් අපි ඒවා හදනවා. ඊට පස්සේ ඒ පළාතේ සංචාරක හෝටල්වලට භාර දෙනවා, ඒවා manage කරන්න. එහෙම නොවුණොත් මොකක්ද වෙන්නේ? අපි හදනවා, ගමේ උන් ඇවිල්ලා නටලා ඒවා කඩා දමනවා. ගමේ මිනිස්සු නම් පොඩ්ඩක් හරි ආදරයක් තිබෙනවා. එතැන ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, සුද්දා යන ටොයිලට් එකටම තමයි localsලාත් යන්නෙත්. අපට ඒක වෙන් කරන්න බැහැ. ඒ නිසා මිනිස්සුත් දැනගන්න ඕනෑ මේ වාගේ දෙයක තිබෙන වටිනාකම.

ඒවාට ගිහිල්ලා ටැප් කඩලා සවුන්තු කළාම සුද්දෙක් ඒකට යන්න කැමැති නැහැ. අපි කියන්නේ මේකයි. ටොයිලට් එක සංචාරක මණ්ඩලයෙන් හැදුවත්, ටොයිලට් එක හෝදන එක අපට කරන්න බැහැ. ටොයිලට් එක සුද්ද කරන එක අපට කරන්න බැහැ. සීගිරියේ නම් සීගිරියේ හෝටල් කලාපයට භාර දෙනවා, ඒ ටොයිලට් එක සුද්ද කරලා නඩත්තු කරන්න.

මම නැවත වතාවක් මේ කාරණය කියනවා. අපි ගොඩක් හොඳ වැඩ කරලා තිබෙනවා. අද සංචාරකයන් එන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. වීසා අර්බුදය මොන තරමින් ආවත් අපි කොහොම හරි අමාරුවෙන් මේ මැව් එක ගහගෙන ඇදගෙන ගිහිල්ලා තිබෙනවා. ඔබතුමන්ලාට හෙට-අනිද්දාට මම සංඛ්‍යාලේඛන දෙන්නම්. Six-month multiple-entry visa එකයි, one-year multiple-entry visa එකයි, two-year multiple-entry visa එකයි, ten-year multiple-entry visa එකයි ඉල්ලුම් කරන ප්‍රමාණය සියයට 200කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. විශාල ප්‍රමාණයක් ඒ වීසා එකට ඉල්ලුම් කරනවා. අපි විශ්වාස කරනවා, එන සතිය වෙනකොට රටවල් 67කට free visa දෙන්න පුළුවන් වෙයි කියලා. මොන අභියෝගයක් ආවත් ඒ කටයුතු එක්ක සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්න අපි අවශ්‍ය සෑම කටයුත්තක්ම කරනවාය කියන එක මේ අවස්ථාවේ දී මතක් කරනවා.

මේ වනකොට සංචාරක ක්ෂේත්‍රය සඳහා වාහන පර්මිට් 300කට, 400කට වඩා ඉල්ලුම් කරලා තිබෙනවා. සංචාරක ක්ෂේත්‍රය වෙනුවෙන් වාහන දාහක් ගෙන්වන්න පුළුවන්. මම දැක්කා කවුද මනුස්සයෙක් පත්තරයක දාලා තිබෙනවා, ලංකාවේ හෝටල් ලක්ෂයක් වැහිලා කියලා. කවුද ඒක කිව්වේ කියලා හොයාගෙන යද්දී තනිකර දේශපාලන මතයක් දරමින් ඒ මිනියා ඒ ප්‍රකාශය කරලා තිබෙනවා. හෝටල් සම්බන්ධයෙන් ලංකාවේ තිබෙන ප්‍රධාන ආයතනයක් තමයි, හෝටල් සංගමය - THASL එක. අනෙක් එ්වා නම්, SLAITO සහ ASMET. මේ තුනම කියනවා නම් රටේ සංචාරක ක්ෂේත්‍රයේ විනාශයක් සිදු වෙලා තිබෙනවා, හෝටල් වැහිලා තිබෙනවා කියලා, මම ඒක පිළිගන්න කැමැතියි. නමුත් එක එක ඉත්තෝ දාලා සමහර විපක්ෂ දේශපාලනඥයන් කරන තුට්ටු දෙකේ වැඩ ගැන මගේ සම්පූර්ණ විරෝධය මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි. අපි අලුතින් කරපු වැඩසටහන් සියල්ල මේ අවස්ථාව වනවිට ශක්තිමත්ව ඉදිරියට යනවා.

මට මේ කාරණය කියන්න අමතක වුණා. සංචාරකයන්ට තිබෙන ලොකු ප්‍රශ්නයක් තමයි accident එකක් වෙලා තුවාලයක් වුණොත්, අසනීපයක් වුණොත් යන්න ඉස්පිරිතාලයක් නැති එක. අපි තව මාසයක් ඇතුළත සීගිරිය රෝහලේ වාට්ටුවක්, බදුල්ලේ හෝ දියතලාවේ රෝහලේ වාට්ටුවක්, දකුණේ මාතර රෝහලේ වාට්ටුවක් ඒ අයට හදන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම සංචාරකයෙකු අපේ රටට ඇතුළු වෙනකොට ඒ ගොල්ලන්ගේ කැමැත්ත මත රක්ෂණයක් කරගන්න පුළුවන්. ඒ සඳහා අපි බල කරන්නේ නැහැ. ඕනෑ නම් සංචාරක කවුන්ටරයෙන් Sri Lanka Insurance එකේ insurance එකක් ගන්න පුළුවන්. Adventure tourismවලට එන අයට ඉන්ෂුවරන්ස් එකක් ගන්න පුළුවන්. Air Force එකේ තිබෙනවා, air ambulance එකක්. ඒ ගොල්ලන්ට ඒ ගන්න insurance එකෙන් වාර්තාවක් අරගෙන පෞද්ගලික ඉස්පිරිතාලයකට යන්න පුළුවන්. අපි ඒ සියලු දේ කරනවා. අද සංචාරක ක්ෂේත්‍රය ඉතා හොඳ ප්‍රගමනයක් ලබා ගෙන තිබෙනවා. මොන අභියෝගය තිබුණත් අපි අපේ ඉලක්කයට යනවා.

ඒක නිසා අද සම්මත කරන නියම හා නියෝග එක්ක සංචාරක ක්ෂේත්‍රයේ විශාල ප්‍රගමනයක් අපි බලාපොරොත්තු

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

වෙනවා. ඒ වාගේම ආණ්ඩු මාරු වුණත්, ඇමති මාරු වුණත්, ජනාධිපති මාරු වුණත් වෙනස් නොවෙන විධියට අපි සංචාරක ප්‍රතිපත්තියක් මේ පාර්ලිමේන්තුවට තව නොබෝ දිනයකින් ඉදිරිපත් කරනවා. එහෙම තමයි මේ රට දියුණු කරන්න වෙන්නේ. ආණ්ඩු වෙනස් වුණාට, මිනිහා වෙනස් වුණාට, පාට වෙනස් වුණාට රටක ප්‍රතිපත්ති වෙනස් විය යුතු නැහැ. ස්ථීර ප්‍රතිපත්තියක් නොමැති වීම නිසා තමයි අපි අවුරුදු 75ක් දුක් විඳ්දේ. ක්‍රීඩාවටත්, ඉඩම්වලටත් ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයටත් එවැනි ප්‍රතිපත්ති තුනක්ම ඉදිරිපත් කරලා තමයි ඔබතුමන්ලා කියන විධියට අපි ගෙදර යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව දුන්නාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් තිබෙනවා.

[ප.ව. 1.59]

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(මාණ්පුමිකු සිවඥානම් සිරීතරන්)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற சுற்றுலாத்துறை, காணி மற்றும் விளையாட்டுத்துறை தொடர்பான விவாதத்தில் விடயத்துக்குப் பொறுப்பான அமைச்சர் அவர்களின் உரைக்குப் பின்னர், உரையாற்றுவதற்கு வாய்ப்பு வழங்கியமைக்கு நன்றி!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, உங்களுடைய அனுமதியோடு முதலில் ஒருசில விடயங்களை நான் இங்கு பதிவுசெய்ய விரும்புகின்றேன். யாழ்ப்பாண மாவட்டத்தின் அச்சுவேலி-பத்தமேனியைச் சேர்ந்த ஊடகவியலாளரும் முன்னாள் போராளியுமான திரு. தம்பித்துரை பிரதீபன் அவர்களது வீட்டின்மீது இனந்தெரியாத நபர்கள் தாக்குதல் நடத்தியுள்ளனர். 2024.06.12ஆம் திகதி புதன்கிழமை நள்ளிரவு அச்சுவேலியிலுள்ள அவரது வீட்டுக்குள் அடாவடியாக நுழைந்த ஐந்து பேரைக்கொண்ட கும்பல், அவரது வீட்டின் நுழைவாயில் கதவு மற்றும் யன்னல்களை ஆயுதங்களால் தாக்கிச் சேதம் ஏற்படுத்தியதோடு, வீட்டில் நிறுத்திவைக்கப் பட்டிருந்த மோட்டார் சைக்கிள், முச்சக்கர வண்டி மற்றும் வீட்டு உபயோகப் பொருட்களையும் தீக்கிரையாக்கியுள்ளனர். இதனால் பத்து இலட்சம் ரூபாய்க்கும் மேல் பொருள் இழப்பு ஏற்பட்டுள்ளது. ஊடகவியலாளரான தம்பித்துரை பிரதீபனின் ஊடகப் பணிகளுக்கு அச்சுறுத்தல் விடுக்கும் வகையிலேயே இந்த வன்முறைச் சம்பவம் திட்டமிட்டு அரங்கேற்றப் பட்டுள்ளது. நான்கு விசேட பொலிஸ் குழுக்கள் அமைக்கப் பட்டு, விசாரணைகள் மேற்கொள்ளப்படுவதாகச் செய்திகளில் கூறப்படுகின்றபோதிலும், இன்றுவரை இந்தச் சம்பவம் தொடர்பில் ஒரு சந்தேகநபர்கூட கைது செய்யப்படவில்லை. பிரதீபன் அவர்கள் யாழ்ப்பாண மாவட்டத்திலுள்ள மூத்த ஊடகவியலாளர்களில் ஒருவர். அவர் பல்வேறு இடங்களுக்கும் சென்று செய்திச் சேகரிப்பைச் சிறப்பாக ஆற்றக்கூடியவர். அவருடைய செய்திச் சேகரிப்பின்மீது பொறாமைகொண்ட படைத்துறை சார்ந்தவர்கள்தான் இந்த விடயத்தைக் கையாண்டிருக்க வேண்டும்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු සංජීව එදිරිමාන්න මහතා
(මාණ්පුමිකු සඞ්ජීව එදිරිමාන්න)
(The Hon. Sanjeeva Edirimanna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) ராஜிகா விக்கிரமசிங்ஹ)
(The Hon. (Mrs.) Rajika Wickramasinghe)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜகத் சமரவிக்ரம அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. JAGATH SAMARAWICKRAMA took the Chair.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(මාණ්පුමිකු සිවඥානම් සිරීතරන්)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தம்பித்துரை பிரதீபன் அவர்களுடைய வீட்டுக்குச் சென்று பார்த்ததன் அடிப்படையில் நான் அனுமானமாகச் சொல் கிறேன். அவருடைய வீட்டின் gateஐ கொத்திச் சேதமாக்கி அதன் வழியாக வந்து, அவருடைய வீட்டுப் பாவனைப் பொருட்களைச் சேதப்படுத்திக் கொளுத்திய அந்த ஐவரும் மோட்டார் சைக்கிள்களில் வாள்களோடு வந்திருக்கிறார்கள். படையினரின் அனுமதியில்லாமல் அல்லது ஆதரவு இல்லாமல் எப்படி நள்ளிரவுவேளையில் யாழ்ப்பாணத்தின் தெருக்களில் இவ்வாறு வர முடியும்? இலங்கையின் யாழ்ப்பாண மண்ணில் அதிகூடியளவு படைகள் குவிக்கப்பட்டிருக்கின்ற இந்தச் சூழலில், அங்கு நடைபெறுகின்ற வாள்வெட்டுச் சம்பவங் களுக்கும் வீடுகளுக்குள் நுழைந்து பொருட்களை உடைக் கின்ற சம்பவங்களுக்கும் பின்னால் படையினர் நிற்பதை எங்களால் மிகத் துல்லியமாக உணர முடிகிறது. தம்பித்துரை பிரதீபன் அவர்களின் வீட்டின்மீது மேற்கொள்ளப்பட்ட தாக்குதலுக்குப் பின்னாலும் இராணுவத்தோடு சேர்ந்த ஒட்டுக்குழுக்களுடைய மறைகரங்கள் இருக்கின்றதென்ற என்னுடைய சந்தேகத்தை நான் இந்த உயர்ந்த சபையில் வெளிப்படுத்த விரும்புகிறேன்.

அண்மையில் மாண்புமிகு ஜனாதிபதி அவர்கள் வசாவிளான், பலாலி, யாழ்ப்பாணப் பகுதிகளுக்கு வருகை தந்தபோது, அங்குள்ள மக்களுடைய காணிகள் விடுவிக்கப் பட்டிருக்கவில்லை. அங்குள்ள மக்கள் தங்களுடைய காணி களுக்காகப் போராடிக்கொண்டிருந்தார்கள். மூத்த ஊடகவிய லாளரும் சுதந்திர ஊடகவியலாளருமான தம்பித்துரை பிரதீபன் அவர்களும் 'சக்தி' தொலைக்காட்சியின் ஊடகவியலாளரான

பரதன் அவர்களும் அது தொடர்பான செய்திகளைச் சேகரித்திருந்தார்கள். இவர்கள் இருவருக்கும் அந்த இடத்தில் வைத்து இராணுவப் புலனாய்வாளர்களால் அச்சுறுத்தல் விடுக்கப்பட்டிருக்கிறது. அந்த அச்சுறுத்தல்தான் பிரதீப னுடைய வீடு அடித்து நொறுக்கப்படுவதற்கும் தாக்கப்படு வதற்கும் எரிக்கப்படுவதற்கும் காரணமாக அமைந்திருக் கின்றது. இந்தச் சம்பவம் நடந்து இவ்வளவு நாட்களாகியும் இதுவரை யாரும் கைது செய்யப்படவில்லை.

இந்தத் துர்பாக்கியத்தை எவ்வாறு சொல்வது? இச்சம்பவம் நடைபெற்று இன்றுடன் 6 நாட்களாகின்றன. ஓர் இளைஞன் இந்த நாட்டிலுள்ள ஜனாதிபதிக்கு அல்லது உயர் அதிகாரி களுக்கு அல்லது படைத்துறையினருக்கு அவதூறு ஏற்படுத்தக் கூடிய வகையில் TikTokஇல் பதிவொன்றை இட்டால், அவன் 24 மணித்தியாலத்துக்குள் கைதுசெய்யப்படுவான் அல்லது அவனது வீடு முற்றுகையிடப்படும். ஆனால், ஓர் ஊடகவிய லாளரின் வீடு தாக்கப்பட்ட சம்பவத்துடன் தொடர்புடைய யாரும் இதுவரை கைதுசெய்யப்படாமல் இருக்கிறார்கள். இந்த நாட்டில் நீதி, நிர்வாகம், பொலிஸ் எவ்வாறு செயற்படுகின்றது என்பதற்கு இது நல்லதோர் உதாரணம் என்பதை நான் இந்த உயர்ந்த சபையில் தெரிவித்துக்கொள்கின்றேன். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இவ்வாறு தாக்கப்படுகின்ற, அச்சுறுத்தப்படுகின்ற ஊடகவியலாளர் களுக்கு இந்த நாட்டில் நீதி கிடைக்குமா? என நான் இந்த உயர்ந்த சபையில் கேட்க விரும்புகின்றேன்.

இதுதவிர, யாழ்ப்பாண மாவட்டத்தின் வெவ்வேறு பகுதிகளைச் சேர்ந்த மூதாளர்களான பிரபல வர்த்தகர்கள் காரணங்களற்றுத் திடீரெனக் காணாமற்போகும் சம்பவங்களும் நடைபெற்று வருவதை அவதானிக்க முடிகிறது. இத்தகைய சம்பவங்கள் வயது மூப்பால் தன்னிச்சையாக ஏற்படும் சம்பவங்களாக அடையாளப்படுத்தப்படாத நிலையில், அவற்றின் பின்னணி குறித்து ஆராய்ந்து நடவடிக்கை எடுக்க வேண்டிய அவசியம் ஏற்பட்டுள்ளது.

முதலாவது, யாழ்ப்பாணம், காரைநகர், சடையாளி சிவன் கோயிலடியைப் பிறப்பிடமாகவும் வதிவிடமாகவும்கொண்ட பிரபல வர்த்தகரான 63 வயதுடைய திரு. வேலுப்பிள்ளை நடராசா என்பவர் 2017.07.21ஆம் திகதி வெள்ளிக்கிழமை பி.ப. 2.00 மணிக்கு மாதாந்த மருத்துவப் பரிசோதனைக்காக யாழ். போதனா வைத்தியசாலைக்குச் சென்ற நிலையில் காணாமல் போயுள்ளார். இவரது மகனான திரு. நடராசா குகராஜ் அவர்கள், சர்வதேச வலையமைப்புகளுடன்கூடிய பிரபல ஊடக நிறுவனமான 'டான்' தொலைக்காட்சி நிறுவனத்தின் ஊடகவியலாளராக யாழ்ப்பாண மண்ணில் கடமையாற்றுகிறார். இந்தச் சம்பவம் தொடர்பில் பொலிஸில் முறைப்பாடு செய்தும், பத்திரிகைகள், சமூக வலைத்தளங்கள் மூலமான விளம்பரங்கள் உள்ளிட்ட பல்வேறு வழிகளில் தேடுதல் மேற்கொள்ளப்பட்டும், ஏழு வருடங்களாகியும் எந்த முடிவும் கிட்டவில்லை. 'டான்' தொலைக்காட்சியில் ஊடகவிய லாளராகப் பணியாற்றுகின்ற குகராஜ் அவர்களுடைய தந்தை காணாமல்போய் எதிர்வரும் ஆடி மாதம் 21ஆம் திகதியோடு 7 வருடங்கள் நிறைவடைகின்றன. ஆனாலும், இன்றுவரை அவர் எங்கே என்று தெரியாது.

இரண்டாவது, யாழ்ப்பாணம், புங்குடுதீவு, 9ஆம் வட்டாரத் தைச் சேர்ந்த 63 வயதுடைய திருமதி யோகம்மா சோதிநாதன் அவர்கள் ஆறு மாதங்களுக்கு முன்னர் மர்மமான முறையில் காணாமல் போயிருக்கிறார். புங்குடுதீவு மண்ணைச் சேர்ந்த இவர் எங்கே என்று இதுவரை தெரியாது.

மூன்றாவது, அண்மையில் யாழ்ப்பாணம், புங்குடுதீவு, மடத்துவெளியைச் சேர்ந்த பிரபல கோடீஸ்வர வர்த்தகரும் வர்த்தகத்துறை சார்ந்து இலங்கை அரசால் 'தேசமான்ய' விருது வழங்கி கௌரவிக்கப்பட்டவரும் சமாதான நீதவானும் புங்குடு தீவு மக்களால் அதிகம் அறியப்பட்டவருமான 82 வயதுடைய திரு. வைத்திலிங்கம் கனகலிங்கம் அவர்கள் 2024.05.12ஆம் திகதி, மதியவேளை புங்குடுதீவு மடத்துவெளியிலுள்ள அவரது வீட்டின் முன்பாக இருந்தவேளை திடீரென காணாமற் போயுள்ளார். பிறிதொருவரது உதவியற்று நடந்து செல்லவோ, வாகனங்களில் ஏறிச் செல்லவோ முடியாத நிலையிலிருந்த அவர், திடீரென காணாமல் போயுள்ளமை மர்மம் நிறைந்ததாக உள்ளது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வைத்திலிங்கம் கனகலிங்கம் என்பவர் கொழும்பு, வவுனியா, யாழ்ப்பாணம் ஆகிய பகுதிகளில் பிரபல வர்த்தகராக இருந்த ஒருவர். இலங்கை அரசு அவருக்கு "தேசமான்ய" விருது வழங்கியிருக்கின்றது. இவ்வாறான ஒருவர் மதியவேளையில் புங்குடுதீவு, மடத்துவெளியில் தனது வீட்டுக்கு முன்னாலுள்ள gate அருகில் தெருவோரமாக இருந்தபொழுது திடீரென்று காணாமல் போயிருக்கிறார். இவர் காணாமல்போய் ஒரு மாதத்துக்கும் மேலாகின்றது. நாட்டில் பெருந்தொகை பொலிஸார் மற்றும் முப்படையினர் இருந்தும் அவரை இதுவரை கண்டுபிடிக்க முடியாமல் இருக்கின்றதே! சிங்களப் பத்திரிகைகள், தமிழ் பத்திரிகைகள் மற்றும் பல்வேறு ஊடகங்களில் இதுதொடர்பாக எத்தனையோ விளம்பரங்களை அவருடைய குடும்பத்தினர் போட்டிருக்கிறார்கள்.

அதனைவிட, பொலிஸில் முறைப்பாடு செய்திருக்கிறார் கள்; மனித உரிமைகள் ஆணைக்குழுவில் முறைப்பாடு செய்திருக்கிறார்கள். இவ்வாறு எந்தெந்த இடங்களில் முறையிட வேண்டுமோ, அந்தந்த இடங்களிலெல்லாம் அவர்கள் முறைப்பாடு செய்திருக்கிறார்கள். ஆனாலும், இதுவரை அவர் தொடர்பான எந்தத் தகவலும் கிடைக்க வில்லை. இந்த நாட்டில் வயோதிபர்கள் காணமால் போதல், இளைஞர்கள் கைதுசெய்யப்படுதல், விசாரணைக்கு அழைக்கப் படுதல், ஊடகவியலாளர்கள் தாக்கப்படுதல் என்பன தொடர்ந்தும் நடந்து கொண்டிருக்கின்றன. இதற்கு என்ன காரணம்? இந்த நாட்டினுடைய நீதி, நிர்வாகம், சிவில் நடவடிக்கைகள் எவ்வாறு இருக்கின்றன என்பதைப் பற்றி நீங்கள் சற்றுச் சிந்தியுங்கள்! இது இந்த நாட்டுக்கு உகந்ததா? இந்த நாட்டின் நேர்மையான பாதைக்கு இது சரியானதா? என நான் இந்த இடத்தில் கேட்க விரும்புகின்றேன்.

யாழ்ப்பாண மண்ணில் இந்த மூன்று வயோதிபர்களும் காணாமல் போயிருக்கிறார்கள் என்பது ஒருபுறம் இருக்கட்டும்! இன்னும் பலர் காணாமல் போயிருக்கக்கூடும். அவர்கள் பற்றிய தகவல்கள் இதுவரை வெளியில் வரவில்லை. கடத்தல்கள், கைதுகள், வாள்வெட்டுச் சம்பவங்கள் மலிந்த ஓர் இடமாக இன்று யாழ்ப்பாண மண் இருக்கின்றது. இதற்குப் பின்னால் இராணுவத்தினுடைய மறைகரம் இருக்கின்றது. அதுமாத்திரமன்றி, இதற்குப் பொலிஸாருடைய ஒத்துழைப்பும் இருக்கின்றது. இதனைக் கட்டுப்படுத்த அவர்கள் தயாரில்லை என்பதைத்தான் இந்தச் செய்திகள் மிக வெளிப்படையாகச் சொல்கின்றன. இது மிக முக்கியமானது. இந்த நாட்டில் ஓரினம் தன்னைத் தக்கவைத்துக்கொள்ள முடியாமல், தன்னுடைய இருப்பைப் பாதுகாத்துக்கொள்ள முடியாமல் திணறிக் கொண்டிருக்கின்றது என்பதைத்தான் இது வெளிப்படையாகக் காட்டுகின்றது. நாங்கள் தமிழர்கள் என்ற அடிப்படையிலும் தனியான மொழி பேசுகின்ற இனம் என்ற அடிப்படையிலும் எங்களுக்கு உரித்தான அதிகாரங்களின்

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

අඩිප්පඩையிலும் ஏன் பොලිස් අධිකාරම් තේවෛ என்பதைத் தெளිවாகக் கூறுவதற்கான காரணம், எம்மீது இன்னொரு மொழி பேசுகின்ற இராணுவத்தினர், பොලිසාර් ஊடாகப் பெரியளவில் இவ்வாறான அடாவடிகள் மேற்கொள்ளப்படுவது தான். இதற்குப் பின்னால் இராணுவப் புலனாய்வாளர் களினதும் இராணுவத்தினரதும் மறைகரம் இருக்கின்றது என்பதை நான் இந்த இடத்தில் பகிரங்கமாகச் சொல்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இச்சபையில் உரித்துப் பதிவுச் சட்டத்தின் கீழான ஒழுங்கு விதிகள் சம்பந்தமாகவும் முடிக்குரிய காணிகள் கட்டளைச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமாகவும் கௌரவ அமைச்சர் அவர்கள் பிரஸ்தாபித்திருந்தார். கிளிநொச்சி என்பது, 1930களிலும் 1950களிலும் குடியேற்றம் செய்யப்பட்ட ஒரு மாவட்டமாகும். யாழ்ப்பாண மாவட்டத்தின் பல ஊர்களிலுமிருந்து பெருமளவான மக்கள் அழைத்துவரப்பட்டு குடியேற்றப்பட்ட ஒரு மாவட்டம்தான் கிளிநொச்சி! மேலும், 1983ஆம் ஆண்டு ஏற்பட்ட வன்முறையின்போது சிங்களக் காடையர்களால் தாக்கப்பட்ட நிலையில், உடுத்த உடுப்போடு வந்து கிளிநொச்சியில் குடியேறிய அவர்கள், அங்கிருந்த காடுகளை வெட்டி கழனியாக்கி வாழ்ந்து கொண்டிருக் கின்றனர். மலையகத்திலிருந்து வந்து குடியேறிய மக்களும் இன்று கிளிநொச்சி மண்ணுக்குரிய மக்களாக இருக்கின்றார் கள். இன்று அந்த மண்ணில் மூன்றாவது தலைமுறை வாழ்ந்து கொண்டிருக்கின்றது. 1950, 1953, 1954ஆம் ஆண்டுகளில் வழங்கப்பட்ட குடியேற்றத்திட்டக் காணிகளுக்கான உறுதிகள் இதுவரை வழங்கப்படவில்லை. அதுமாத்திரமன்றி, கிளிநொச்சியில் முதன் முதல் 1930ஆம் ஆண்டு ஏற்படுத்தப்பட்ட கணேசபுரம் குடியேற்றத்திட்டம், அதற்குப் பிற்பாடு ஏற்படுத்தப்பட்ட வட்டக்கச்சி படித்தவாலிபர் குடியேற்றத்திட்டம், இராமநாதபுரம் குடியேற்றத் திட்டம், உருத்திரபுரம் குடியேற்றத்திட்டம், அக்கராயன் குடியேற்றத் திட்டம், பூநகரியிலே முழங்காவிலில் குடியேற்றப்பட்ட இடங்கள் என்பவற்றில் வாழுகின்ற மக்களுக்கான காணி உறுதிகள் இவ்வளவு காலமாகியும் வழங்கப்படாமல் இருக்கின்றது. மேலும், கிளிநொச்சி மாவட்டத்தின் நகர்ப் பகுதியிலுள்ள உதய நகர், கணேசபுரம், இரத்தினபுரம், திருவையாறு ஆகிய பகுதிகளில் வாழுகின்ற பெரும்பாலான மக்களுக்கு இன்னும் காணி உறுதி வழங்கப்படவில்லை.

இப்பொழுது காணி உறுதி வழங்குவதற்கான செயற்பாடு கள் முன்னெடுக்கப்படுகின்றன. அங்கு சாதாரணமாக ஓர் அலுவலக உதவியாளராகப் பணியாற்றுகின்ற ஒருவர் 10 ஆண்டுகளுக்கு முன்னர், 2 பரப்பு அல்லது 4 பரப்பு காணியை வாங்கி, அதனைத் தன்னுடைய பெயரில் பதிவுசெய்து, இப்பொழுது அதற்கு உறுதி பெறப்போகின்றபோது, கிட்டத்தட்ட 60 இலட்சம் ரூபாய் கட்டவேண்டும் அல்லது leasing அடிப்படையில்தான் காணியை எடுக்க வேண்டுமென நிர்ப்பந்திக்கப்படுகின்றார்.

இது மிகப் பெரியதொரு பாதிப்பு. இது ஒரு பகல் கொள்ளை. சற்று யோசித்துப் பாருங்கள்! சாதாரண ஒரு சுகாதாரத் தொழிலாளி - sanitary labourer, அலுவலக உதவியாளர், அரச உத்தியோகத்தர் என்போர் தங்களிடமிருந்த நகைகளை விற்று அல்லது வங்கியில் கடன் எடுத்துக் குறைந்த விலையில் வாங்கிய காணியில் வீடு கட்டி, தங்களுடைய பிள்ளைகளுக்கு அதை வழங்குகின்ற காலம் வருகின்ற பொழுது, அந்தக் காணியை நீண்ட காலக் குத்தகை - leasing - அடிப்படையில்தான் பெற முடியும் அல்லது அதற்கு Government Valuation Department செய்கின்ற மதிப்பீட்டின் பிரகாரம் கிட்டத்தட்ட 60 இலட்சம் வரை காசு கட்டவேண்டும் என்று சொன்னால், எவ்வாறு அவர்கள் தங்களுடைய காணிகளுக்கான உறுதிகளைப் பெற முடியும்?

இந்த நாட்டில் வாழுகின்ற மக்கள் தங்களுடைய காணிகளை வங்கியில் அடகு வைத்து கடன் பெறவோ அல்லது அவற்றைத் தங்களுடைய பிள்ளைகளுக்கு எழுதிக் கொடுக்கவோ உரித்துடையவர்களாக இருக்கின்றபொழுது, கிளிநொச்சி மாவட்டத்தில் இருக்கின்ற மக்கள் தங்களுடைய காணிகளைத் தங்களுடைய பிள்ளைகளுக்கு எழுதிக்கொடுக்க முடியாமலும், பணத் தேவைக்காக வங்கியில் அடகுவைக்க முடியாமலும், அந்தக் காணியில் அடுத்த வேலைத்திட்டத்தை மேற்கோள்ள முடியாமலும் தடுக்கப்பட்டிருக்கிறார்கள். இது மிக மோசமான காரியம்! சம்பந்தப்பட்ட அமைச்சர் அவர்கள் தற்பொழுது இச்சபையில் இல்லை. ஆனாலும், அவ்வமைச்சு சார்ந்த அதிகாரிகள் இன்று வந்திருப்பார்கள் என நான் நினைக்கின்றேன். இதற்கு நீதியான தீர்வொன்று வேண்டும். சாதாரண ஓர் உத்தியோகத்தரிடம், நீண்ட காலக் குத்தகை அடிப்படையில்தான் காணியைப் பெறமுடியும் அல்லது கிட்டத்தட்ட 60 இலட்சம் காசு கட்டித்தான் காணிக்கான உறுதியைப் பெறமுடியுமெனச் சொன்னால், அவருடைய எதிர்கால வாழ்க்கை பாதிக்கப்படும் என்பதை நான் இந்த இடத்தில் பதிவுசெய்து நிறைவுசெய்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.13]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රිකට් ක්‍රීඩාව කියන්නේ, අපේ රටේ අස්සක් මුල්ලක් නැර ඉන්න හැමෝම ආදරය කරන, හැමෝම සම්බන්ධ වන ක්‍රීඩාවක්. ක්‍රීඩා කළත්, නොකළත් මේ රටේ ජනතාව ආදරය කරන ක්‍රීඩාවක් තමයි, ක්‍රිකට්. පසුගිය කාලය තුළ අපේ ක්‍රිකට් ක්‍රීඩාවට දේශපාලන මැදිහත්වීම් සිද්ධ වුණු නිසාත්, විවිධ දේශපාලනඥයන් Sri Lanka Cricket එකට පත්වීම නිසාත් අපේ ක්‍රිකට් දේශපාලනීකරණය වුණා. අවසානයේ, රටේ සියලුදෙනාම ආදරය කරන ක්‍රිකට් ක්‍රීඩාව අපි බලාගෙන ඉන්දෙද්දී අගාධයට තල්ලු වුණා. ඒ නිසාම තමයි ගිය අවුරුද්දේ ක්‍රිකට් ක්‍රීඩාවේ විශාල අර්බුදයක් මතු වුණේ. ඒ අර්බුදය මතු වුණු වෙලාවේත් මේ පාර්ලිමේන්තුවේ වාද විවාද ගොඩක් ඇති වුණා. එතැනදී ආණ්ඩු පාර්ශ්වයෙන් සහතික වුණා, මේ ප්‍රශ්නය ඉක්මනින් නිරාකරණය කරලා, දේශපාලනයෙන් තොරව ක්‍රිකට් ක්‍රීඩාව, විශේෂයෙන්ම ක්‍රිකට් පරිපාලනය ස්වාධීනව ගෙනයන්න පුළුවන් ක්‍රමයක් හදනවා කියලා.

මට මතක හැටියට 2023 මාර්තු මාසයේදී විතර තමයි, හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු චිත්‍රසිරි මහත්මයාගේ මූලිකත්වයෙන් ක්‍රිකට් සම්බන්ධව වාර්තාවක් ඉදිරිපත් කළේ. එතකොට ක්‍රීඩා ඇමති වශයෙන් හිටියේ රොෂාන් රණසිංහ මැතිතුමා. එතුමාගේ කාලයේ ලබා දුන් ඒ වාර්තාව ඇත්තටම ක්‍රියාවට නැහුවේ නැහැ. ඒක කල් මර මරා පිටුපසට තල්ලු වුණා. ඒ අතරතුරේ Sri Lanka Cricket එකේ අර්බුදයක් මතු වුණා. ඒකත් එක්ක මුළු රටම කැලඹුණා. ඒ වෙලාවේත් නැවත මේ පාර්ලිමේන්තුවේ ඇති වෙච්ච වාද විවාද එක්ක ක්‍රිකට් ක්‍රීඩාව දේශපාලනයෙන් බේරා

ගන්නවා කියන සහතිකය ආණ්ඩු පාර්ශ්වයෙන් දුන්නා. ඒ අනුව කැබිනට් මණ්ඩලය හදිසියේ අනුකමිටුවක් - Subcommittee එකක් - පත් කළා. ඒ, Subcommittee එකත් වාර්තාවක් දීලා තිබුණා. නමුත්, අවසානයේදී කැබිනට් මණ්ඩලයම ආයෙත් තීන්දුවක් අරගෙන තිබුණා, ඒ Subcommittee එක නොවෙයි, කලින් මේ වාර්තාව ඉදිරිපත් කළ හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු චිත්‍රසිරි මහත්මයාගේ මූලිකත්වයෙන් හතරදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කරලා ඒ පිළිබඳ පනත් කෙටුම්පතක්ම හදන්න කියලා. ඒ අනුව මාධ්‍ය හරහා අපි දැක්කා, හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු චිත්‍රසිරි මහත්මයා ඇතුළු කමිටුව ක්‍රිකට් ක්‍රීඩාව දේශපාලනයෙන් බේරා ගැනීම සඳහා පනත් කෙටුම්පතක්ම හදලා දීලා තිබෙන බව. ඇත්තටම ගත්තොත්, ඊට කලින් භාර දුන්නේ වාර්තාවක් විතරයි. නමුත්, මේ පාර්ලිමේන්තුවේ සම්මත කරගත හැකි පනත් කෙටුම්පතක් - Bill එකක් - විධියටම මෙවර එය ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව වහාම කළ යුතු වෙන්නේ, ඒ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා,__එහි මොනවා හෝ අඩුපාඩු, සංශෝධන තිබෙනවා නම්, ඒවා මේ පාර්ලිමේන්තුව තුළ වාද විවාද කරලා ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය සඳහා එය සම්මත කරගන්න එක. එහෙම නොවුණොත්, නැවත අපේ ක්‍රිකට්වලට දේශපාලනය ඇතිලි ගහනවා. අපි දන්නා විධියට ඒ හදපු පනත් කෙටුම්පත අනුව ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙකුටවත් ක්‍රිකට් පරිපාලනයට සම්බන්ධ වෙන්න බැහැ. ඒක වගන්තියකින්ම නතර කර තිබෙනවා. ඒක හොඳයි. මොකද, පසුගිය කාලයේම අපි දැක්කේ මේකේ අනෙක් පැත්ත. ඒ නිසා හතරදෙනෙකුගෙන් යුත් කමිටුවෙන් ඉදිරිපත් කළ වාර්තාව මත පදනම්ව, අද වෙනකොට හදලා තිබෙන මේ පනත් කෙටුම්පත වහාම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීම ඉක්මනින් කළ යුතු වෙනවා, ක්‍රිකට් ක්‍රීඩාව මේ අර්බුදයෙන් බේරා ගැනීම සඳහා. මොකද, මේ වෙලාවේ ලංකාවේ ක්‍රිකට් කණ්ඩායම T20 ලෝක කුසලාන තරගාවලියේදී පරාජයට ලක් වීමත් එක්ක නැවතත් මේ සාකච්ඡාව රට තුළ ආන්දෝලනයට ලක් වෙලා තිබෙනවා.

ක්‍රිකට් ක්‍රීඩාවට ඇමතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ විවිධ දේශපාලන ඇඟිලි ගැසීම් තිබෙනවා වාගේම, මේකට අරක් ගත්ත විවිධ මාෆියා කල්ලි කණ්ඩායම් ඉන්නවා. ඒ නිසා අපි ආණ්ඩුවට බල කරලා කියනවා, ඒ කල්ලි කණ්ඩායම්වලින් මේ ක්‍රිකට් ක්‍රීඩාව බේරා ගන්න කියලා. ක්‍රිකට්වලට විතරක් නොවෙයි, අනෙකුත් ක්‍රීඩාවලටත් -පාපන්දු ක්‍රීඩාව ගත්තත්, එල්ලේ ක්‍රීඩාව ගත්තත්, කරාතේ ක්‍රීඩාව ගත්තත්- මෙවැනි කල්ලි කණ්ඩායම් ඉන්නවා. ක්‍රීඩා සංගම් හැම එකකටම වාගේ කාලයක් තිස්සේ අරක් ගත්ත මෙවැනි කල්ලි කණ්ඩායම් ඉන්නවා. ඒ කල්ලි කණ්ඩායම්වල මැදිහත්වීම සහ බලපෑමත් එක්ක ඒකට දේශපාලන කල්ලිත් මැදිහත්වීම නිසා අපේ රටේ ජාතික ක්‍රීඩාව ඇත්තටම අගාධයට යන තත්ත්වයකට මේ වනකොට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවට අවධාරණය කරලා කියනවා, වහාම චිත්‍රසිරි මහත්මයාගේ මූලිකත්වයෙන් හදපු ඒ පනත් කෙටුම්පත - ඒ Bill එක - පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, සම්මත කර ගැනීම කඩිනම් කරන්න කියලා. මොකද, නැත්නම් මේකට තවත් දේශපාලන මැදිහත්වීම් සිදු වෙනවා.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි, තරුෂි දියණිය ජාතික වශයෙනුත්, ජාත්‍යන්තර වශයෙනුත් ලංකාවට ලොකු කීර්තියක් අත්පත් කරලා දුන්නු බව. ඇය මේ වෙනකොටත් ආසියානු සහ විවිධ ජාත්‍යන්තර ක්‍රීඩා තරගවලට සම්බන්ධ වෙමින් ඉන්නවා. තරුෂි දියණිය කියන්නේ ඇත්තටම ජාතියේ සම්පතක්. ඇය රටට ජයග්‍රහණ විශාල ප්‍රමාණයක් ලබා දුන්නා. මෑතකදී තිබ්බිව ක්‍රීඩා තරග සියල්ලෙන්ම ඇය විශිෂ්ට ජයග්‍රහණ ලැබුවා. අද රාත්‍රියේදීත් මම හිතන්නේ ඇය සහභාගි වන තවත් තරගයක් තිබෙනවා.

පාසල් ශිෂ්‍යාවක විධියට එහෙම රටට කීර්තියක්, ගෞරවයක් ලබා දෙමින් ක්‍රීඩාවේ අතිදක්ෂතා පෙන්වපු ඒ ක්‍රීඩිකාව වෙනුවෙන් රජයේ මැදිහත්වීම ගැනත් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. අපි දැක්කා, මීට මාස හතරකට විතර කලින් තරුෂි ගෙන්වලා, ඇයගේ ක්‍රීඩාවේ උන්නතිය සඳහා රජය මඟින් රුපියල් කෝටි එකහමාරක් ලබා දෙනවා කියලා මාධ්‍ය සන්දර්ශනයක් පැවැත්වූ ආකාරය. ඒ මාධ්‍ය සන්දර්ශනය පවත්වලා අද වෙනකොට මාස හතරක්, පහක් විතර වෙනවා. හැබැයි, අද වෙනකම් ඒ ක්‍රීඩිකාවට ඒ මුදල ලබා දීලා නැහැ. ක්‍රීඩා අමාත්‍යාංශයෙන් මේ මුදල් ලබා දෙනවා කියලා මාධ්‍යවල ලොකු සන්දර්ශන පැවැත්වූවා; රටට කිව්වා. රටේ ජනතාවත් හිතුවා, ඇත්තටම ඒ දැරියට එම මුදල ලැබිලා ඇති කියලා. නමුත් අද වෙනකම් ඇයට ඒ මුදල ලැබිලා නැහැ. විවිධ පුද්ගලයන් සහ වෙනත් ආයතන මඟින් ඇයට යම් යම් උදවු කරලා තිබෙනවා. හැබැයි, රජයක් විධියට ඇයගේ ක්‍රීඩා කෞශල්‍යය නහාසිටුවීම සඳහා අවශ්‍ය දායකත්වය ලබා දිය යුතුව තිබෙනවා. එහෙම නැත්නම් එවැනි මාධ්‍ය සන්දර්ශන පවත්වන්නේ නැතුව ඉන්න ඕනෑ. මාධ්‍යවලින් පෙන්වූවා, ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ඇයට රුපියල් කෝටි එකහමාරක් දෙනවා කියලා. එහෙම කියලා මේ වෙනකොට මාස පහක් විතර වෙනවා. අද වෙනකම් ඇයට සතයක්වත් දීලා නැහැ. එහෙම කරන්න එපා. ඒක ඒ ක්‍රීඩිකාවට කරන අගෞරවයක් වාගේම අපේ රටේ ක්‍රීඩාවටත් කරන අගෞරවයක්. එහෙම දෙන්න බැරි නම් එවැනි දේවල් නොකර ඉන්න ඕනෑ.

අපේ රටේ ක්‍රීඩාවට ආදරය කරන පෞද්ගලික අංශයේ විවිධ ව්‍යාපාරිකයන්, විවිධ ව්‍යවසායකයන් ඉන්නවා. එම නිසා ඒ අයගේ මැදිහත්වීමෙන් ඇයට යම් උදවුවක් කරන්න පුළුවන්. නමුත් ඒ අයත් උදවු කරන්නේ නැහැ. මොකද, රජයෙන් සල්ලි දෙනවා කිව්වාට පස්සේ සල්ලි දෙන්න හිටපු අයත් ඒ අදහස අකුළා ගන්නවා. අන්තිමට ඇයට රජයෙන්වත්, කොහෙන්වත් සල්ලි හම්බ වෙලා නැහැ.

තරුෂි ක්‍රීඩිකාව කියන්නේ සාමාන්‍ය පවුලකින් පැවත එන කෙනෙක්. ඇය මහ ලොකු ධනයක්, දේපළක් තිබෙන පවුලක කෙනෙක් නොවෙයි. රටට, ජාතියට විශාල කීර්තියක් ගෙනාපු පාසල් ශිෂ්‍යාවක් වන එවැනි ක්‍රීඩිකාවකට ආණ්ඩුව සලකපු විධිය වැරදියි. ඇයට දෙන්න ඕනෑ දීමනා දීලා නැහැ. ඒ නිසා වහාම ඒ සඳහා මැදිහත් වෙන්න. බොරු සන්දර්ශන පවත්වන්න එපා. ක්‍රීඩාවේ උන්නතිය සඳහා අවංකව මැදිහත් වෙනවා නම්, ආපහු මේ වාගේ බොරු සන්දර්ශන කරන්න එපා කියන කාරණයත් මම අවධාරණය කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහණ දිසානායක රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.21]

ගරු රෝහණ දිසානායක මහතා (ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு றோஹண திஸாநாயக்க - விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Rohana Dissanayaka - State Minister of Sports and Youth Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරක කටයුතු පනත යටතේ ගෙනෙන නියම පිළිබඳවත් මේ උත්තරීතර සභාවේ කථා කරන මේ වෙලාවේ ඒ ගැන කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම ඉතා සතුටු වෙනවා. විපක්ෂය පැත්තෙන් විජිත හේරත් මන්ත්‍රීතුමා ක්‍රීඩාවට සිදු වන දේශපාලන ඇඟිලි ගැසීම්

[ගරු රෝහණ දිසානායක මහතා]

ගැන කථා කළා. එතුමා කියපු කාරණය සම්බන්ධයෙන් ක්‍රීඩා රාජ්‍ය ඇමතිවරයා වශයෙන් මම පැහැදිලිව කියන්න ඕනෑ, වර්තමාන ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට කිසිම දේශපාලන ඇඟිලි ගැසීමක් නොමැති බව. අතීතයේදී එහෙම තත්ත්වයක් තිබුණා. වර්තමාන විෂය භාර අමාත්‍ය හරින් ප්‍රනාන්දු මැතිතුමා ඒ තත්ත්වය හොඳින් තේරුම් බේරුම් කරගෙන, ඒ තිබුණු තත්ත්වය මහ හරවා, ඒ දේශපාලන ඇඟිලි ගැසීම් අද වනකොට නවත්වා තිබෙනවා.

අතීතයේ ඉඳලා මේ දක්වා ක්‍රිකට් ක්‍රීඩාවේ ගමන් මහ දිහා බැලුවාම පෙනෙනවා, ශ්‍රී ලංකාව පමණක් නොවෙයි, අතිදක්ෂ ක්‍රීඩකයන් සිටි ලෝකයේ බොහෝ රටවල් පවා පරාජයට පත් වෙලා තිබෙන බව. 1984 වසරේ බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම සහ එංගලන්තය අතර පැවති ටෙස්ට් තරගාවලියෙන් ශූරතාව ලබා ගත් බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම අද වනකොට ඉන්නා තැන ගැන අපි කල්පනා කරන්න ඕනෑ. මම හිතන්නේ ඔවුනුත් පරාජයට පත් වුණා. මම ඉන් අදහස් කළේ, පරාජය වෙන්න ඕනෑ කියන එක නොවෙයි. පරාජය නොවෙයි, අපට ජයග්‍රහණ අවශ්‍යයි. අපේ රටේ හැමෝම ආදරය කරන ක්‍රිකට් ක්‍රීඩාව තුළින් තවදුරටත් තරග ජයග්‍රහණ ලබමින් මේ ගමන යා යුතුයි කියලා අපි කල්පනා කරනවා. ඒ සඳහා ක්‍රීඩකයන්ට ඒ කටයුත්ත නිදහසේ කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ දැන් සකස් කරලා තිබෙනවා. අපි හිතනවා, පත්ව තිබෙන අවපාතය කෙටි කාලයකදී වෙනස් කරගෙන ක්‍රිකට් ක්‍රීඩාවේ උපරිම තැනකට එන්න අපට හැකියාව ලැබෙයි කියලා.

විශේෂයෙන් දේශපාලන ඇඟිලි ගැසීම් ගැන කථා කළොත්, cricket team එකට ක්‍රීඩකයන් තෝරනකොට, ඒ Selection Committee එකට බලපෑම් කරන බව අද වෙනකොට අපට දකින්න නැහැ. මමත් පෞද්ගලිකව දන්නා කාරණයක් ඒක. ඊයේ-පෙරේදා ඇමතිතුමා කිව්වා, මේ, මේ වයස් කාණ්ඩවල ක්‍රීඩකයෝ මේවාට ඇතුළත් විය යුතුයි කියලා. මම හිතනවා, අපේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ඉදිරියේදී නිසි පරිදි සකස් කරගෙන, ලෝකයත් සමඟ එක්ව ක්‍රිකට් ක්‍රීඩාව සංවර්ධනය කිරීම සඳහා යන ගමන සාර්ථක කර ගන්න අපට හැකියාව ලැබෙයි කියලා.

ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා සඳහන් කළා, මීටර් 800 ධාවන ඉසව්වෙන් අපේ රටට ජයග්‍රහණ ලබා දුන්නු තරුෂි කරුණාරත්න ක්‍රීඩිකාව ගැන. අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ක්‍රීඩා අමාත්‍යාංශය එම ක්‍රීඩිකාවට පොරොන්දු වුණු යම් මුදලක් නොදී රැවටීමක් කර තිබෙනවාද කියලා එම ක්‍රීඩිකාවගේ පෞද්ගලිකත්වයත් ආරක්ෂා කරමින් මම වහාම හොයා බලන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම එම ක්‍රීඩිකාව ජීවත් වන ප්‍රදේශයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කරන්න අද ක්‍රීඩා අමාත්‍යාංශය අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. එය ඇයගේ ඉල්ලීමක්. පෞද්ගලිකව මම දන්නවා, මධ්‍යම පළාතේ ආණ්ඩුකාරතුමා ඇයගේ ජයග්‍රහණය වෙනුවෙන් යම්කිසි ත්‍යාගයක් ලබා දුන් බව. ඒ පිළිබඳවත් සොයා බලා ඉදිරියේදී ගරු සභාවට වාර්තා කරන්නත් මම බලාපොරොත්තු වනවා. මලල ක්‍රීඩාවේ පමණක් නොවෙයි, ක්‍රිකට්, පා පන්දු, රග්බි ඇතුළු මේ රටේ හැම ක්‍රීඩා ක්ෂේත්‍රයකම ගැටලු තිබෙනවා. මුදල් විසින් ක්‍රීඩාව ආක්‍රමණය කිරීම නිසා ක්‍රීඩාවේ උන්නතියට අද වනකොට යම් ආකාරයක හානියක් වෙලා තිබෙනවා. හැබැයි, අපි කල්පනා කළ යුතු වනවා, ලෝකයේ පා පන්දු ක්‍රීඩාවෙන් නමක් දිනාගත් ලියොනල් මෙසී, රොනාල්ඩීනෝ හා පෙලේ වැනි ක්‍රීඩකයෝ ඒ තත්ත්වයට ආවේ කොහොමද කියලා. ඔවුන් ඒ තත්ත්වයට ඒමේදී මුදල් ප්‍රධාන හේතුවක් වුණු බව අපි දන්නවා. අපි දැක්කා, ආර්ජන්ටිනාවේ ඩියාගෝ මැරඩෝනා වාගේ ක්‍රීඩකයන් ඒ තැනට ගෙනාපු හැටි. ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව පමණක් නොවෙයි, පා පන්දු, රග්බි හා කරාතේ ඇතුළු හැම ක්‍රීඩාවක්ම සංවර්ධනය කිරීම සඳහා වර්තමාන අමාත්‍යාතුමාගේ නායකත්වයෙන් සුවිශේෂී වැඩ පිළිවෙළක් අපි අද වනකොට ක්‍රියාත්මක කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝමය එක රැයකින් හැදුණේ නැහැ නේ. ඒ සඳහා කාලයක් ගත වුණා. ඒ නිසා ලද පරාජයේ ඉඳලා ඉදිරියට එන්න පුළුවන්. ක්‍රිකට් ක්‍රීඩාවෙන් පමණක් නොවෙයි, හැම ක්‍රීඩාවකින්ම ජයග්‍රහණය කරන්න අපට අවස්ථාව තිබෙනවා. ඒ සඳහා කටයුතු කරන බවත් මේ අවස්ථාවේදී මම මතක් කරනවා.

විශාල ආර්ථික පසුබෑමකට පසු ඉතා කෙටි කාලයකින් මෙලෙස අපේ රට දෙපයින් නැඟිටුවන්නට වර්තමාන ජනාධිපතිතුමා සමත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම එතුමාට හිස නමා ආචාර කරනවා. තිබුණු පෝලිම් යුගය නැති කරලා, රට ස්ථාවර තැනකට ගෙනෙන්නට කටයුතු කරන වත්මන් ආණ්ඩුවේ ඇමතිතුමන්ලාටත්, මන්ත්‍රීතුමන්ලාටත් මගේ ස්තුතිය මේ වෙලාවේ පළ කරනවා.

සංචාරක ව්‍යාපාරය ගැන කථා කරමින් ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමා එම විෂය පිළිබඳව එතුමාගේ දැක්ම ඇතුළුව බොහෝ කරුණු - කාරණා ඉදිරිපත් කරනවා මම දැක්කා.

එතුමා අරගෙන තිබෙන පියවර පිළිබඳව බොහෝ කරුණු එතුමා ඉදිරිපත් කළා. විශේෂයෙන් IMF එකෙන් ගරු ජනාධිපතිතුමා ඇතුළු අප රජය ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් කරගන්න මේ ගෙන යන වැඩ පිළිවෙළට නිල සහයෝගය ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 336ක් ලබාදී තිබෙනවා. මේ ලබාදීම වෙනුවෙන් කළ සාකච්ඡා තුළදී අප රජය මෙරට ආර්ථිකය සවිබලගැන්වීම වෙනුවෙන් සිදු කරන වැඩසටහන් හා ප්‍රයත්නය අගය කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රජය හා ගරු ජනාධිපතිතුමාගේ නායකත්වය තුළ අප රටේ පුරවැසියා ආරක්ෂිත බව මුළු ලෝකයටම අප පෙන්වා දී තිබෙනවා. මෙවැනි නායකත්වයක් තුළ කටයුතු කිරීමට ලැබීමද අපේ භාග්‍යයක් ලෙස මා සලකනවා. මා ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යවරයා විධියට, අප රට වෙනුවෙන් ක්‍රීඩා කළ අදටත් අපි ආදරය කරන හිටපු ක්‍රීඩකයෙකු කළ කතාවක් මෙහිදී ආදර්ශයට ගන්නවා. ඒ තමයි ශ්‍රී ලංකාවේ ක්‍රිකට් කණ්ඩායමේ නායකයෙකු වශයෙන් කටයුතු කළ ඉතාම සුවිශේෂී ක්‍රීඩකයෙක් වූ මහේල ජයවර්ධන මහතා කරපු ප්‍රකාශයක්. මම දැක්කා, ඔහු සමඟ තිබුණු සාකච්ඡාවකදී ඔහු ප්‍රකාශ කර තිබුණා, "අපි ඕස්ට්‍රේලියාව, එංගලන්තය වාගේ ක්‍රීඩා නොකළ යුතුයි, අපි ක්‍රීඩා කළ යුත්තේ ශ්‍රී ලංකාව වාගේ" කියලා. එතුමා එක අවස්ථාවක එහෙම සඳහනක් කරලා තිබෙනවා. මම එතුමාගේ මේ ප්‍රකාශය මේ අවස්ථාවට ගන්නේ ඇයි? මම මේ ආදර්ශය සමාන කළේ අපේ ගරු කැබිනට් අමාත්‍ය හරින් ප්‍රනාන්දු අමාත්‍යාතුමාට. එතුමා සංචාරක ක්ෂේත්‍රය තුළ විශාල වෙනසක් හා සංවර්ධනයක් ඇති කරලා තිබෙනවා, ලාංකික ගති ලක්ෂණ හා එතුමාගේම රටාවකට අනුගත වෙමින්. එතුමා ඒ කළ කැපවීම නිසා අද සංචාරක ක්ෂේත්‍රය තුළ විශාල සංවර්ධනයක් සිදු වෙලා තිබෙනවා. අපි හැමෝටම පක්ෂ භේදයකින් තොරව අප රටේ භූමිය තුළ දැකිය හැකි මේ සංවර්ධනය අගය කළ යුතුයි. එතුමා භාර ගත්තේ වැටුණු, ප්‍රශ්න පිරුණු ක්ෂේත්‍රයක්ය යන එකත් අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම හිතන්නේ අපේ තිබුණු ආණ්ඩු අවුරුද්දෙන් අවුරුද්ද, අය වැයෙන්, අය වැය ඉලක්ක කළා, 2022දී මෙන්න මෙච්චර සංචාරකයන් ප්‍රමාණයක් එන්න ඕනෑ, 2023දී මෙච්චර ප්‍රමාණයක් සංචාරකයන් එන්න ඕනෑ, 2024දී මෙච්චර ප්‍රමාණයක් සංචාරකයන් එන්න ඕනෑ කියලා. අපට යම් විධියකට පසුබෑම් ඇති වුණා. කොවිඩ්-19, පාස්කු ඉරුදින ප්‍රහාරය වාගේ දේවල්වලින් සංචාරක ව්‍යාපාරය තාවකාලිකව නැවතුණා පමණක් නොවෙයි, අපේ සංචාරක ව්‍යාපාරයේ අනාගතයටත් කළු පැල්ලම් ඇති වුණු බව අපි මේ වෙලාවේ මතක් කරනවා. ඒ නිසා සංචාරක ව්‍යාපාරය යම් ආකාරයකින් බිඳ වැටුණු බවත්, ඒ බිඳ වැටුණු සංචාරක ව්‍යාපාරය තමයි නැවත අපට ගොඩ නැගීමට සිදුවෙලා තිබෙන්නේ කියන එකත් අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම 2024 වෙනකොට අඩුම තරමින් ඉලක්කගත සංචාරකයන් ප්‍රමාණය විධියට ලක්ෂ 24ක් එනවා නම්, අපේ රටේ සංචාරක ව්‍යාපාරයේ තිබෙන වර්තමාන ගැටලු යම් ආකාරයකින් නිරාකරණය කරන්න අපි ඒ තුළින් බලාපොරොත්තු වෙනවා. මොකද, බලාපොරොත්තු වන ඒ ඇමෙරිකානු ඩොලර් ප්‍රමාණය අපට ලබා ගන්න හැකි වෙයි කියා අපි විශ්වාස කරන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ජීවත් වෙන මාතලේ දිස්ත්‍රික්කය සුළු අපනයන භෝග විශාල වශයෙන් නිෂ්පාදනය කරන ප්‍රදේශයක්. අපි පසුගිය දවසකත් චීනයට අපේ රටේ කුළු බඩු නිෂ්පාදන යවන්නත්, ඒ වාගේම චීනයෙන් ලංකාවට දිනපතා සංචාරකයන් ගෙන්වා ගැනීම සඳහාත් වන වැඩ පිළිවෙළ මගේ සම්බන්ධතාව උඩ ක්‍රියාත්මක කරලා තිබෙනවා. දැන් එය ක්‍රියාත්මක වෙමින් පවතිනවා. විශේෂයෙන් පසුගිය කාලයේ අපි දැක්කා, සංචාරක අමාත්‍යාවරයා හැටියට ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා මේ රටේ සංචාරක ව්‍යාපාරය වර්ධනය කිරීම සඳහා වූ සුවිශේෂී වැඩපිළිවෙළ මේ රට තුළ ක්‍රියාත්මක කරන ආකාරය.

විශේෂයෙන් මාතලේ දිස්ත්‍රික්කය ගත්තොත්, රිවර්ස්ටන් - නකල්ස් වැසි වනාන්තරය, පිටවලතැන්න, ඇල්කඩුව වතු යාය, සෙම්බුවත්ත වැනි තැන් දේශීය සහ විදේශීය සංචාරකයන්ගේ වඩාත් ආකර්ෂණයට ලක් වෙලා තිබුණා. ඒ වාගේම පෞරාණික නටබුන්, රජමහා විහාර, කලාව, සංස්කෘතිය හා ඒ ආශ්‍රිතව කෙරෙන නිර්මාණ, ශ්‍රී ලංකාවේ හරි මැද යැයි සැලකෙන නාලන්දා ගෙඩිගේ වැනි ස්ථාන සංචාරක ආකර්ෂණීය ස්ථාන බවට පත් කරන්න අද අපි විශේෂ වූ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා.

ඒ වාගේම සුවිශාල අංශ ගණනාවක් මාතලේ දිස්ත්‍රික්කය ආශ්‍රිතව පෙන්වා දිය හැකියි. මා දකින්නේ, නූතන ලෝකය තුළ, නූතන ආර්ථික මොඩලය තුළ මෙවැනි සම්පත් සඳහා මිල කළ නොහැකි වටිනාකමක් සංචාරක ක්ෂේත්‍රය තුළින් ලබාදිය හැකි බවයි. ලෝකයේ වටිනා හොඳම මැණික් blue sapphire, yellow sapphire මාතලේ දිස්ත්‍රික්කයෙන් අපට ගන්න පුළුවන්, රත්නපුරයෙන් අපට ගන්න පුළුවන්. ඒ වාගේම ග්‍රැෆයිට්, ග්‍රැනයිට්, ඉල්මනයිට්, ඩොලමයිට්, ෆෙල්ඩ්ස්පාර්, සර්කෝන් වැනි ඛනිජ සම්පත් අපට තිබෙනවා. ඒවාට වටිනාකම් එකතු කරලා - value added products කරලා - සංචාරකයන්ට ලබාදීමේ මර්මස්ථාන ඉදි කළ යුතුයි කියා අපි කල්පනා කරනවා. මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල, මාතලේ-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, කාලය අවසානයි.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
ඒ වාගේම මම මේ වෙලාවේ තව කාරණයක් කියන්න ඕනෑ. අපේ සංචාරක ඇමතිතුමාගෙනුත් ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරනවා. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ ආලෝක රජමහා විහාරය තිබෙන්නේ, මහනුවර, අනුරාධපුරය, පොළොන්නරුව කියන සංස්කෘතික ත්‍රිකෝණය - Cultural Triangle එක - ඇතුළේ. හැබැයි, මාතලේ ආලෝක රජමහා විහාරය මුදුන්පත් කොටගෙන තවම ඒක සිතියමකටවත් ඇතුළත් කරලා නැහැ. සංචාරක ව්‍යාපාරයේ ඒ අදාළ නිලධාරී මහත්වරු අද මෙතැන රාජ්‍ය නිලධාරීන්ගේ මැදිරියේ ඉන්නවා නම් ඒ අයගේ අවධානය පිණිස මම මෙය කියන්න කැමැතියි. මාතලේ සංචාරක සිතියමට මෙය ඇතුළත් කර ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ මාතලේ ආලෝක රජමහා විහාරය පිළිබඳව ලෝකයට පණිවුඩයක් දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියලාත් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් අද ඇවිල්ලා පිකටිං කරන්න සූදානම් වෙනවා. ඒ අයට රැකියා ලබා දීම සඳහාත් අපට විශාල වශයෙන් අවස්ථාව තිබෙනවා. ඒ රැකියා ලබා දෙන්නේ කොහොමද කියලා ජනාධිපතිතුමා සමඟත් සාකච්ඡා කරලා, ඇමතිතුමා සමඟත් සාකච්ඡා කරලා කටයුතු කරනවා. ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය ඇමතිවරයා වශයෙන් මම කියනවා මෙය අපට නිරන්තරයෙන් බලපාන ගැටලුවක් බව. ඒ ප්‍රශ්නයටත් උත්තර ලබා දෙන්න, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. උපාධිධාරීන් සම්බන්ධයෙන් මම කියන්න බලාපොරොත්තු වුණු කරුණු ඇතුළත් ලේඛනය මම **සභාගත*** කරනවා.

ඒ වාගේම කාලය අවසන් නිසා මාගේ කථාවේ ඉතුරු කොටස **සභාගත**** කරන්න අවස්ථාව ලබා දෙන ලෙසත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. කාලය ලබා දීම පිළිබඳව ස්තුතියි.

***** සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*** சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*** Rest of the speech tabled:*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාතලේ දිස්ත්‍රික්කය මා දකින්නේ සැහවුණු සංචාරක නිධානයක් ලෙසයි. එම නිධානය තුළ ඇති සම්පත් අප රටට දායාද කිරීම වෙනුවෙන් වෙළෙඳ හා සංචාරක වැඩ පිළිවෙළක් මා මාතලේ පුරවරය වෙනුවෙන් යෝජනා කරනවා.

මාතලේ කුළුබඩු වෙනුවෙන් ජාත්‍යන්තර සංචාරක අවධානයක් ගත හැකි කලාපයක් හා මධ්‍යස්ථාන ඇති කරන්න පුළුවන්. මාතලේ සංචාරක ගමනාන්ත හඳුනා ගැනීම හා රිවස්ටන් මාර්ගය ලෝකයේ අති සුන්දරම සංචාරක මාර්ගයක් ලෙස හුවා දක්වන්න පුළුවන්. ස්විස්ටර්ලන්තයට යන්න ඕනෑ නැහැ. ඔබට ඒ සුන්දරත්වය මාතලේදී විඳින්න පුළුවන්.

මාතලේ පාරම්පරික කලාකරුවන් හා නිර්මාණකරුවන් වෙනුවෙන් වූ සංස්කෘතික ගම්මාන ඇති කරන්න පුළුවන්. සංචාරකයන්ට පැමිණ ගැමියන් සමඟ ජීවත් වී අපේ සංස්කෘතියේ අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සලසන්න පුළුවන්. මාතලේ දිස්ත්‍රික්කයේ ඇති ඛනිජ සම්පත් වෙනුවෙන්, විශේෂයෙන්ම මැණික් වෙනුවෙන් වෙළෙඳ හා සංචාරක කලාපයක් බිහි කරන්න පුළුවන්.

එම වැඩ පිළිවෙළ තුළින් මාගේ අරමුණ වන්නේ මාතලේ සංචාරක පුරවරයක්, වෙළෙඳ මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමයි. 2025 වසර අග වන විට එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට මා බලාපොරොත්තු වන අතර, ඒ හරහා අවම වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන එකක ආදායමක් අප රටට එක් කර ගත හැකි බව මා නොබියව ප්‍රකාශ කර සිටිනවා. මේ තුළින් නව ව්‍යාපාර අවස්ථා, රැකියා අවස්ථා රැසක් බිහි කිරීම මාගේ තවත් අරමුණක්.

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රෝහණ දිසානායක මහතා]

මෙලෙස මාතලේ දිස්ත්‍රික්කය සේම අප රටේ අනෙකුත් දිස්ත්‍රික්ක පිළිබඳවද නිවැරදි අධ්‍යයනයක් කර එම දිස්ත්‍රික්ක සඳහාද ඉලක්කගත ආර්ථික සැලසුමක් හා ආදායම් ඉලක්කයක් නිර්මාණය කිරීම ඉතා කාලෝචිත බව මා මෙහිදී සඳහන් කරන්න ඕනෑ. මෙවැනි ඉලක්කගගත ආදායමක් වෙනුවෙන් දිස්ත්‍රික්ක සැලසුම් කිරීම තුළ ශක්තිමත් සමස්ත ආර්ථිකයක් 2025 අග වන විට අප හට නිර්මාණය කළ හැකි බව මා තරයේ විශ්වාස කරනවා.

මා මාගේ දිස්ත්‍රික්කයේ විරුදාවලිය ලබා ඇත්තේ මාතලේ ආදරණීය මනුෂ්‍යයෙක් යන නමින්. මා එවකට මාතලේ නගරාධිපතිතුමා ලෙසින් වැඩ කළ කාලයේ ශ්‍රී ලංකාවේ හොඳම නගර සභාව ලෙසට මාතලේ නගර සභාව පත් කළා. එබැවින් කියූ දේ කළ, කළ හැකි දේ කියන ඉතිහාසයක් මාහට තිබෙනවා. මා මෙම කථාව තුළ කළ යෝජනා හා ඉලක්ක අනිවාර්යයෙන්ම සපුරන බව මින් පෙන්වා දෙනවා. මාගේ කැබිනට් අමාත්‍ය හරින් ප්‍රනාන්දු අමාත්‍යතුමාගේ සහයෝගය හා මූලිකත්වය මේ සඳහා මා බලාපොරොත්තු වෙනවා.

"නහී වේරේන වේරානි" වෛරය නවතින්නේ වෛරයෙන් නොව කරුණාවෙන් හා දයාවෙනි. මා මේ වාක්‍යය කියන්නේ, අපට මේ ගමන යාමට බාධා කළ විපක්ෂයටයි. අපි ඔබට වෛර කරන්නේ නැහැ. අපි හදන මේ ආර්ථික මොඩලය තුළ, අපි හදන මේ රට තුළ ඔබේ දරුවාද නිදහසේ හුස්ම ගනු ඇතැයි මා විශ්වාස කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ජගත් ප්‍රියංකර මන්ත්‍රීතුමා. ඔබතුමාට ගරු අතුරලියේ රතන ස්වාමීන් වහන්සේගේ වෙලාවත් ලැබෙනවා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.34]

ගරු ජගත් ප්‍රියංකර මහතා
(மாண்புமிகு ஜகத் பிரியங்கர)
(The Hon. Jagath Priyankara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ ඉඩම් ආඥාපනත, සංචාරක ක්ෂේත්‍රය සහ ක්‍රීඩා ක්ෂේත්‍රයට සම්බන්ධ අණපනත් කිහිපයක් සාකච්ඡාවට භාජන වෙන මේ අවස්ථාවේදී අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ඉඩම් සම්බන්ධව කථා කළොත්, "උරුමය" වැඩසටහන මේ දවස්වල රට පුරා ක්‍රියාත්මක වෙනවා. ඉඩම් අමාත්‍යතුමාගේ වාගේම ඒ අදාළ නිලධාරීන්ගේ අවධානයට මා මේ වෙලාවේ කාරණයක් යොමු කරනවා. "උරුමය" වැඩසටහන තුළ සමහර ප්‍රදේශවල ඉඩම් ඔප්පු ලබා දීමේ කටයුත්ත සාර්ථකව කරන්න පුළුවන් වුණත්, ඔබතුමන්ලා දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන්, ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන්, සමස්තයක් වශයෙන් ලංකාවේම වාර්තාවක් කැඳවා බලන්න, ප්‍රායෝගික එම වැඩසටහනේ යම් දුෂ්කරතා තිබෙන අවස්ථා තිබෙනවා. විශේෂයෙන්ම ස්වර්ණ භූමි, ජය භූමි ඉඩම්වල, ඒ වාගේම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති ඉඩම්වල කාලයක් තිස්සේ ජීවත් වෙන මිනිස්සු ඉන්නවා. මම ජීවත් වෙන පුත්තලම දිස්ත්‍රික්කයේ මම හඳුනා ගත්ත පවුල් 5,000ක්, 6,000ක් විතර ඉන්නවා, අවුරුදු 30ක්, 40ක් තිස්සේ ඒ ඉඩම්වල ඒ මිනිස්සු ජීවත් වෙනවා. ඒ ඉඩම ඒ පුද්ගලයාට ලැබිලා තිබෙන්නේ කලින් හිටපු කෙනෙකුගෙන්. එහිදී නීත්‍යානුකූල ඔප්පු පැවරීමක් සිදු වෙලා නැහැ. එක්කෝ කඩදාසියකින්, කුවිතාන්සියකින්, නැත්නම් නීතිඥයෙක් ලියලා තමයි එය ලැබිලා තිබෙන්නේ. ඒ නිසා අද මේ ඉඩම් පැවරීමේ කටයුත්ත කරන්න යනකොට ඒ මුල් අයිතිකරුවන් හොයා ගන්න පුළුවන්කමක් නැහැ. ඔවුන්ගේ ඥාතියෙක් හොයා ගන්න පුළුවන්කමකුත් නැහැ. මේකට මම දන්නා තරමින් අලුතෙන් නීතියක්, බලයක් දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලබා දීලා නැහැ.

දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොටෑමුල්ල කියලා ග්‍රාම නිලධාරී වසමක් තිබෙනවා. මම ඉස්කෝලේ යන කාලයේත් ඒ මිනිසුන්ට ඒ ප්‍රශ්නය තිබුණා. ඉඩමට අයිතිකාරයෙක් ඉන්නවා; පදිංචි වෙලා ඉන්නවා; ගේ හදාගෙන තිබෙනවා; ළිඳ තිබෙනවා; ළමයි ඉන්නවා; ළමයි ඉස්කෝලේ යනවා; ලයිට් අරගෙන තිබෙනවා. හැබැයි ඒ අයට ඒ ඉඩමට හිමිකමක් ගන්න බැහැ; කඩදාසි කොලයක් තිබෙනවා. ඒ කඩදාසි කොලය එක්කෙනෙක් ලියලා තිබෙනවා, එයා කොහේද කියලා හොයා ගන්න බැහැ. ඒක අවුරුදු ගණනකට කලින් සිද්ධ වෙලා තිබෙන දෙයක්. හැබැයි, අපට බැරිකමක් නැහැ ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරීන් මාර්ගයෙන් ඒක හොයා ගන්න. ඒ අය ලයිට් අරගෙන තිබෙනවා නම් විදුලි බිලෙන් කාලය ගණනය කර ගන්න පුළුවන්. බැංකු ගිණුමක් විවෘත කර තිබෙනවා නම්, ඒකෙන් අපට යම් කිසි තොරතුරක් හොයා ගන්න පුළුවන්. උයලා පිහලා කාලා පවුලක් විධියට එකට ජීවත් වෙලා තිබෙනවා නම් ඒ යම්කිසි තොරතුරක් හොයා ගන්න පුළුවන්. ඒ නිසා ප්‍රාදේශීය ලේකම්වරු, දිස්ත්‍රික් ලේකම්වරු, ග්‍රාම නිලධාරීන් මඟින් පුළුවන්කමක් තිබෙනවා නම් ඒ කෙනාමයි කියලා තහවුරු කරගෙන, ඒ අයට යම් පිළිතුරක් දෙන්න පුළුවන්. ඔය මම කියපු උදාහරණය ඇතුළේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේත් ඉඩම් තිබෙනවා, රජයේ ඒවාත් තිබෙනවා. හැබැයි අපි ඉස්කෝලේ යනකොටත් ඒ ප්‍රශ්නය එහෙමමයි; අපි විශ්වවිද්‍යාලයට යනකොටත් ඒ ප්‍රශ්නය එහෙමමයි; අපි රැකියාවට යනකොටත් එහෙමමයි; අද පාර්ලිමේන්තුවේ ඉන්නකොටත් ඒ තත්ත්වය එහෙමමයි. ඒ නිසා අපි ඒ පිළිබඳව ඉඩම් අමාත්‍යාංශයේ අවධානය යොමු කරවනවා. මම හිතනවා මේක චක්‍රලේඛයකින් කරන්න පුළුවන් කියලා. ප්‍රාදේශීය ලේකම්වරුන්ට බලය ලබා දුන්නා නම්, නිසි විමර්ශනයක් කරලා, සමීක්ෂණයක් කරලා, ඒ පුද්ගලයා ජීවත් වෙච්ච කාලය, ළමයි, ළමයි ඉස්කෝලේ ගිය තත්ත්වය හඳුනා ගත්තොත් අපට මේ ප්‍රශ්නයට උත්තරයක් ලබා දෙන්න පුළුවන්.

ඊළඟට මම අපේ දිස්ත්‍රික්කයට අදාළව ඉඩම් සම්බන්ධ තවත් කාරණයක් පිළිබඳව අවධානය යොමු කරවනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම 2002 අවුරුද්දේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ විශාල ඉඩම් ප්‍රමාණයක් ගැසට් කළා. ඒ අනුව, අද පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව පැත්තට, නවගත්තේගම පැත්තට, ආනමඩුව පැත්තට යනකොට කාපට් පාර ළඟින් තමයි වැට ගහලා තිබෙන්නේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති වුණත් ඒ ඉඩම්වල ගස් නැහැ. මිනිස්සු වගා කරමින් හිටපු ඉඩම් එතැන තිබුණා. සමහර මිනිසුන්ට ඒ ඉඩම්වලට අදාළ ඔප්පු පවා තිබෙනවා. ඒ අයිතිය පිළිගන්නේ නැතිව ඒ ඉඩම් රජයේ ඉඩම් බවට පත් කරගෙන තිබෙනවා. හැබැයි, අන්තිමට සිද්ධ වුණේ මොකක්ද? ඒ ඉඩම්වල නඩත්තුවක් සිදු වන්නේත් නැහැ. පාරට අලි එන්නත් එය එක හේතුවක් වෙලා තිබෙනවා. ලංකාවේ වැඩි ඉඩම් ප්‍රමාණයක් අයිති රජයටයි. ඒ ඉඩම් අයිති, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වෙන්න පුළුවන්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වෙන්න පුළුවන්, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වෙන්න පුළුවන්, වෙනත් වෙනත් ආයතනවලට වෙන්නත් පුළුවන්. මිනිසුන්ට අයිති වන්නේ, අල්ප ඉඩම් ප්‍රමාණයක්. එම නිසා ඉහත කී කාරණය සම්බන්ධවත් විශේෂ අවධානය යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධවත් මා කිව යුතුයි. ඒ පිළිබඳව මෙහිදී අදහස් ඉදිරිපත් වුණා. අද ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව ලොකු ලොකු මතවාද ඇති වෙන්න හේතුවක් තිබෙනවා. අපි ක්‍රිකට් තරගාවලියක් දිනුවාම නම් ලොකු ප්‍රශ්නයක් නැහැ. හැබැයි, තරගාවලියක් පැරදුණාම අපේ රටේ ලොකු ආන්දෝලනයක් ඇති වෙනවා. හැබැයි, ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් අද තිබෙන්නේ මහත් තරගකාරිත්වයක්. පසුගිය තරගාවලියේදී අපේ කණ්ඩායමට තරග හතරයි තිබුණේ. ඒ, දකුණු අප්‍රිකාව, බංග්ලාදේශය, නේපාලය සහ නෙදර්ලන්තය සමඟයි.

අපේ කණ්ඩායම මුල් තරග දෙකෙන් එකක් ජයග්‍රහණය කරලා තිබුණා නම් සහ නේපාලය සමඟ පැවැති තරගයට වැස්සෙන් බාධා වුණේ නැත්නම් අපේ කණ්ඩායම සුදුසුකම් ලබනවා.

ශ්‍රී ලංකාවේ ක්‍රිකට් සම්බන්ධයෙන් දේශපාලනය සහ පරිපාලනය අතර ප්‍රශ්නයක් ඇති. හැබැයි, T20 සහ T10 ක්‍රිකට්වල තිබෙන තරගකාරිත්වය හමුවේ තරග පරදින එක මහා අර්බුදයක් බවට පත් කර ගත්තොත්, ක්‍රිකට් ගහන අයට ක්‍රිකට් ගහන්නත් බැරි වෙයි. අද ක්‍රිකට් ක්‍රීඩාවේ මහත් තරගකාරී බවක් තිබෙන්නේ. පොඩ්ඩක් වරදින කොට match එකක් පරදිනවා. ඒ පොඩ්ඩ වැරදුණේ නැත්නම් World Cup එක ගහන්නත් පුළුවන්. ඒ නිසා මම මේ ගරු සභාවේ සිටින පක්ෂ, විපක්ෂ සියලු දෙනාගෙන් සහ විශේෂයෙන් මාධ්‍යවලින් ඉල්ලා සිටිනවා ක්‍රිකට් ක්‍රීඩාව ඉදිරියට අරගෙන යන්න නම් සාධාරණ විවේචන ඉදිරිපත් කරන්න කියලා. මම ක්‍රිකට් පරිපාලනයේ තිබෙන ප්‍රශ්න සුද්ද කරන්න යනවා නොවෙයි, මේ. දේශපාලන අත පෙවීම් තිබෙනවා නම් එය වෙනම විසඳන්න ඕනෑ ප්‍රශ්නයක්. හැබැයි, පිටිටනියේ සෙල්ලම් කරන්නේ ක්‍රීඩකයෝ 11 දෙනායි. මේ කියපු කාරණය පිළිබඳවත් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මා කරනවා.

අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාත් දැන් මේ ගරු සභාවේ සිටින නිසා මා අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. අපි පසුගිය සතියේදීත් මේ කාරණය ගැන කථා බහ කළා. විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැඩ වර්ජනය නිසා විශ්වවිද්‍යාල දරුවන්ට අධ්‍යාපනය ලබා ගන්න බැරි තත්ත්වයක් තමයි තවමත් තිබෙන්නේ. මුදල් නැති ප්‍රශ්නය තමයි රජයට තිබෙනවා ඇත්තේ. මුදල් නැත්නම්, ඒ කියන වැඩි කිරීම් දෙන්න බැරි නම් ඒ විරෝධතාවට මුහුණ දීලා මොන ආකාරයේ හෝ උත්තරයකින් විශ්වවිද්‍යාල විවෘත කරන තැනට මේ ප්‍රශ්නය ගෙන යන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගීතා සමන්මලී කුමාරසිංහ රාජ්‍ය අමාත්‍යතුමිය. ඔබතුමියට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.40]

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය (කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Geetha Samanmale Kumarasinghe - State Minister of Women and Child Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට අද දින කථා කරන්න අවස්ථාව ලැබී තිබෙනවා සංචාරක ව්‍යාපාරය ගැනත්. සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සංචාරක වැඩ පිළිවෙළ, සංචාරක ව්‍යාපාරයේ ඉදිරි අනාගතය, සංචාරකයින් මේ රටට ගෙන්වා ගැනීමට අපේ ඇති උත්සාහය හා උනන්දුව ආදිය මෙහිදී වැදගත් වනවා. එම විෂය භාරව සාර්ථකව කටයුතු කරගෙන යන අපේ ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමාට මම මගේ ස්තුතිය පළමුවෙන්ම පුද කරනවා.

මා ඉස්සෙල්ලාම කියන්න ඕනෑ ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රධාන ආකර්ෂණය වන්නේ අපේ රටේ ස්වාභාවික සෞන්දර්යය වන බව. ස්වාභාවික දිය ඇලි, ස්වාභාවික වනාන්තර යනාදී ස්වාභාවික සම්පත් අපේ රටේ තිබෙනවා. අපේ රටේ භූමිය ලෝකයේ සිටින සියලු සංචාරකයන්ගේ ආකර්ෂණය දිනා ගැනීමට සමත් වෙලා තිබෙනවා. එය ලෝක වාසින් සංචාරකයින් ලෙස අපේ රටට පැමිණීමට හේතු කාරකයක් වී තිබෙනවා. බෙහෙවින් අලංකාර රටක් වුවත් අපේ රටට සංචාරකයින්ගේ පැමිණීම එක කාලයක අඩු වුණා. ඒකට විවිධ බාහිර හේතු බලපෑවා. යුද්ධය, ලෙඩ දුක් වැනි ප්‍රශ්නවලින් අපේ රට අනාරක්ෂිත තත්ත්වයකට පත් වෙච්ච නිසා සංචාරකයින්ගේ පැමිණීමෙහි අඩුවීමක් වාර්තා වුණා.

ශ්‍රී ලංකාව ස්වාභාවික සෞන්දර්යයට අමතරව එයටම ආවේණික වූ සංස්කෘතියක් සහ ඉතිහාසයක් පවතින රටක් ලෙස ද ප්‍රසිද්ධයි. මෙය, සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනා ජාති භේදයෙන් තොරව, ආගමික වශයෙන් සහ වෙනත් අයුරකින් කිසි කෙනෙකු කොන් නොකර මිශ්‍ර සමාජ පරිසරයක් පවතින රටක්. බොහෝ විසිරී ගිය පැරණි දේවල්, ඉපැරණි දේවල් ලෝකය විසින් ආකර්ෂණය කර ගත් විහාරස්ථාන හා සිද්ධස්ථාන, ආගමික පසුබිම, දළ දා පෙරහැර ආදිය නිසා අපේ රට ලෝකයේ ආකර්ෂණය තවදුරටත් වැඩි කර ගත්තා.

ලෝක ආර්ථික සංසදයේ 2021 වසරේ සංචාරක සහ සංචාරක තරගකාරිත්වය පිළිබඳ වාර්තාව අනුව රටවල් 141ක් අතරින් ශ්‍රී ලංකාව 74 වෙනි ස්ථානයේ පසු වනවා.

2021 වසරේ මෙරටට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව ආසන්න වශයෙන් 194,500ක් දක්වා ඉහළ නංවා ගැනීමට අපි සමත් වුණා. නමුත්, රජයේ ඇස්තමේන්තුවලට අනුව 2022 වසරේ අගෝස්තු වන විට එම ප්‍රමාණය 496,400ක් දක්වා ඉහළ ගොස් තිබෙනවා. එසේ සංචාරකයින්ගේ පැමිණීමෙහි උපරිමයක් වාර්තා කරමින් අපේ රට දැන් ඉදිරියට යමින් තිබෙනවා. අපේ රටට ණය පහසුකම් ලබා දුන් IMF එක ඇතුළුව සියලු දෙනාගේ තීරණය වන්නේ මේ රට දියුණු කරන්නට නම්, මේ රට ඉදිරියට ගෙන යන්නට නම් මේ රටට සංචාරකයින් පැමිණෙන ප්‍රමාණය වැඩි කිරීම, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ව්‍යාපෘති ඉහළ නැංවීම, සංචාරක අමාත්‍යාංශය ප්‍රවර්ධනය කිරීම යනාදී සියල්ල කළ යුතු බවයි; සංචාරකයින් නිසා මේ රටට ලැබෙන මුදල අතිවිශාල විය යුතු බවයි. එය අනිවාර්යයෙන් විය යුතුයි. ඒ අනුව, අපේ රටට පැමිණි 497,000කට වැඩි සංචාරකයින් සංඛ්‍යාව පිළිබඳව අපට සැහීමට පත් වෙන්න පුළුවන්. ඒ වාගේම, දේශපාලන ස්ථාවරත්වයක්, නිවැරැදි ආර්ථික ප්‍රතිපත්තියක් සහිත සහ වසංගත තත්ත්වයක් නොමැති පසුබිම තුළ 2023 වසරේ මෙම අංශයෙහි යළි ශක්තිමත් වර්ධනයක් සිදු වූ බව ශුභවාදීව දකින කෙනෙකුට පෙනී යනවා. 2024 ජනවාරි 01 සිට 15 දක්වා විදෙස් සංචාරකයින් 101,362ක් මෙරටට පැමිණ ඇති අතර, එය පසුගිය වසරේ මෙම කාලයට සාපේක්ෂව සියයට 114ක පමණ වර්ධනයක්. මෙරට විදෙස් සංචාරකයින්ගේ සතියක සාමාන්‍ය පැමිණීම 46,000ක් පමණ වනවා. එමෙන්ම, සංචාරකයින්ගේ දෛනික පැමිණීම 6,700ක් දක්වා ඉහළ ගොස් තිබෙන බව කිව යුතුමයි.

අපේ ගුවන් තොටුපොළට එන සංචාරකයින් එතැනදී පිළිගෙන ඒ අය වෙනුවෙන් සිදු කරන කාරුණික සංග්‍රහය, ඒ අයට දක්වන කාරුණිකත්වය මේ රටේ සංචාරක පුරවරවලට සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමේ ප්‍රධානම සාධකයක් වනවා. එතැන් සිට තම ගමනාන්තය දක්වා අවශ්‍ය ආරක්ෂාව, රැකවරණය, ආහාර, හෝටල්වල ඉඳුම් හිටුම් ආදි සියල්ල අංග සම්පූර්ණ වන විට තමන්ගේ නිවාඩු කාලය යහතින් ගෙව්වා යැයි සතුටට පත්ව එම සංචාරකයින් අපේ රටේ නම ලෝකය පුරා ගෙන යෑම සිදු කරන නිසා තවදුරටත් සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට අපට හැකි වනු ඇති.

මා නියෝජනය කරන්නේ බෙන්තර ඇල්පිටිය ප්‍රදේශයයි. මා ඒ ගැන කියන්නේ සතුටින්. එය තනිකරම - සියයට 80කටත් වැඩි ප්‍රමාණය - සංචාරක පුරවරයක්. ලංකාවේ බිහි වූ පළමු සංචාරක පුරවරය බෙන්තොට නිවාඩු නිකේතනය ආශ්‍රිත ප්‍රදේශයයි.

[ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය]

බෙන්තර කියන්නේ අතිසුන්දර වෙරළ තීරයකින් සමන්විත, ලෝකයා අතර අතිශයින් ජනප්‍රිය සංචාරක පුරවරයක්. මීට සුළු මොහොතකට කලිනුත් මම අපේ ගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කළේ, ඒ සංචාරක පුරවරයේ දියුණුව උදෙසා අපට කටයුතු රැසක් කරගෙන යෑමට සිදුව තිබීම ගැනයි. බෙන්තොටට පිවිසෙන මාර්ගය, බෙන්තොටට පිවිසෙන පාලම් දෙක ඉදිරියේ ඇති දර්ශනය නිසා අපි අනාථයින් බවට පත් වෙනවා. මොකද, ඒ පාලම් දෙක ඉදිරියේ තිබෙන්නේ සම්පූර්ණයෙන් කැලෑවට ගිය, කිසිම සෞන්දර්යයක් නැති ස්වභාවයක්. ඒ නිසා අපි සංචාරක අමාත්‍යාතුමාගෙනුත් ඉල්ලා සිටිනවා ඒවා ඉක්මනින් පිළිසකර කරන්න කියලා. අපට විදුලිය පහසුකමෙහි අඩු පාඩුකම් තිබෙනවා. විදුලිය පහසුකම ලබා දෙන්න. හෙට අනිද්දා වන කොට එන සංචාරකයින් විදුලිය පහසුකම නොමැති වීමෙන් විශාල අකරතැබ්බවලට මුහුණ දෙන්න පුළුවන්. මා දන්නා පරිදි, පසුගිය දවස්වලත් එවැනි සිද්ධීන් කිහිපයක් වුණා. වාසනාවකට ඒවා විශාල වශයෙන් සමාජගත වුණේ නැහැ. මම ඒ ගැන සතුටු වෙනවා. මොකද, අඩු පාඩු නිවැරැදි කර ගන්නයි අප උත්සාහ කරන්නේ. ඒ ප්‍රදේශවල පොලිසිය සහ සංචාරක අමාත්‍යාංශය යොදවන ලද ආරක්ෂක නිලධාරීන් - security officersලා - ඉන්නවා.

ඔවුන් සිටියදීත් ඒ ප්‍රදේශයේ තිබෙන street lights අතුරුදහන් වෙනවා. ඒ වාගේම ළමුන් සඳහා playground එකක් ඒ ප්‍රදේශයේ සකසා තිබෙනවා. ඒකේ කැලිත් ගලවා ගෙන යනවා. ඒ හේතුව නිසා එම සංචාරක පුරවරයේ තිබෙන අලංකාරය එන්න එන්නම බින්දුවටම වැටී තිබෙන්නේ. ඒ නිසා ඒවා පිළිසකර කර ගැනීමට අපට ඉක්මන් සහනයක් ලබා දෙමින්, එම සංචාරක පුරවරයේ තිබෙන සතුටුදායක තත්ත්වය ඉහළ නංවා ගැනීමට කටයුතු කරන්නට අපේ ඇමතිතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇල්පිටියේ තිබෙන සුන්දර දිය ඇල්ලක් තමයි "අඩා හැලෙන දිය ඇල්ල". එතරම් සුන්දර දිය ඇල්ලක් -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමියනි, තව මිනිත්තු දෙකකින් ඔබතුමියගේ කථාව අවසන් කරන්න.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)
බෙන්තර මුහුදු වෙරළේ සිට කිලෝමීටර පහක්-හයක් යද්දී මෙම අලංකාර දිය ඇල්ල දකින්න පුළුවන්. එය නරඹන්නට සංචාරකයන් එනවා. එම දිය ඇල්ල අසලට ආරක්ෂිතව යන්න පුළුවන් බවට අපි ඔවුන්ට සහතික වෙන්න ඕනෑ. අපි දන්නවා, සංචාරක ව්‍යාපාරය ඉහළට ඔසවා තබන දිනක් දිනක් පාසා තමයි අපේ ආර්ථිකය ශතයෙන් ශතය ඉහළට නංවා ගෙන අපේ ආර්ථික කටයුතු මීට වඩා යහපත්ව, වුවමනාවෙන්, උනන්දුවෙන් කරන්නට අපට අවස්ථාව ලැබෙන්නේ කියලා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.48]

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ ක්‍රිකට් පිළිබඳව අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්නට අද දින මා බලාපොරොත්තු වෙනවා. මොකද, මේ දවස්වල අපේ රටේ ජනතාවගේ හිත් තුළ වේදනාවක් ඇති වෙලා තිබෙනවා, අපේ රටේ සියලු ජාතීන් සහ සියලු ආගම් එකතු කරපු, මේ රට ජාත්‍යන්තරයට ගෙන ගිය ක්‍රිකට් ක්‍රීඩාවට අද වෙලා තිබෙන්නේ මොකක්ද කියන කාරණය ගැන. අපි හීනෙකින්වත් හිතුවේ නැති රටවලට අපි පරාජය වෙන තැනට අද වෙනකොට කටයුතු සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම විවිධ ක්‍රීඩකයෝ හැසිරෙන ආකාරය දිහා, ඒගොල්ලන් ක්‍රීඩා කරන ආකාරය දිහා බලා ඉන්නකොට, මේ ක්‍රීඩකයෝ ක්‍රීඩා කරන්නේ ඇත්තටම රට වෙනුවෙන්ද, එහෙම නැත්නම් වෙනත් අරමුණක් වෙනුවෙන්ද කියන සිතිවිල්ල අපේ ජනතාව තුළ මේ වෙනකොට විශාල වශයෙන් ඇති වෙලා තිබෙනවා.

1996 ක්‍රිකට් ලෝක කුසලාන තරඟාවලිය පැවැති අවස්ථාවේ අපේ රටින් ඒ සඳහා හොඳ කණ්ඩායමක් ඉදිරිපත් වුණා; ඒ අය ජයග්‍රහණය ලබා ගත්තා. මේ රටේ දේශපාලන අධිකාරියේත්, මේ රටේ ජනතාවගේත් ආශීර්වාදය, ශක්තිය ඒ අයට ලැබුණා. නමුත් 1996 ලෝක කුසලානයෙන් පසුව මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව තුළට මුදල් සහ දේශපාලනය ගලාගෙන එන්නට පටන් ගත්තා. අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ එදා තිබුණු තරඟකාරීභාවය, ඒ වාගේම පරිපාලනය බිඳ වැටීමට එය හේතු වුණා. ඒ හේතු කොටගෙන මේ රටේ සාමාන්‍ය ජනතාව තුළ මතයක් ඇති වී තිබෙනවා, මුදල් සහ දේශපාලනය මිශ්‍ර වීම නිසා අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව අද වනවිට විනාශ වෙලා කියලා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවට සහ මේ රජයට වගකීමක් තිබෙනවා, මේ රටේ ජනතාව බලාපොරොත්තු වන පරිදිම ක්‍රිකට් ක්‍රීඩාව නැවත ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙන්නට; එම නීති රීති හරියට ක්‍රියාත්මක කරන්නට. මම කියන්නේ නැහැ, දේශපාලනය මුළුමනින්ම ක්‍රිකට්වලින් අයින් කරන්න ඕනෑය කියලා. දේශපාලනය හරහා ක්‍රිකට් ක්‍රීඩාව පිරිසිදුව, ඒ වාගේම නිවැරදි පරිපාලනයක් එක්ක ඉස්සරහට ගෙන යන ක්‍රමවේදයක් හරියාකාරව ක්‍රියාත්මක කරන්නට ඕනෑ.

අපි දන්නවා, මේ වෙනකොට IPL හරහා විශාල මුදල් ප්‍රමාණයක් ක්‍රිකට් ක්‍රීඩාව තුළ සැරිසරන බව. ක්‍රීඩකයෝ කොයි විධියටද ක්‍රීඩා කරන්නේ කියන එක ගැනත් තර්ක විතර්ක තිබෙනවා. මම හිතන්නේ 1980 ගණන්වල, 1990 ගණන්වල ක්‍රිකට් ක්‍රීඩාවේ තිබුණු ස්වභාවය නොවෙයි, අද ලෝකයේ තිබෙන්නේ. ඒ පිළිබඳව අපි හොඳ අධ්‍යයනයක් කරලා ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව ජාත්‍යන්තර බලපෑම්වලින් මුදා ගෙන මේ රටේ කීර්ති නාමය ලෝකයට ගෙනයන්න පුළුවන් ක්‍රීඩකයෝ මේ රටේ බිහි කරන්නේ කොහොමද කියන සංවාදය අපි මේ පාර්ලිමේන්තුව තුළත්, පිටතදීත් සිදු කළ යුතුයි. ඒ තුළින් හොඳ පරිපාලනයක් ඇති කළ යුතුයි.

ඒ වාගේම ක්‍රීඩකයන්ගේ දක්ෂකම් ගැනත් කථා කළ යුතුයි. අපේ ගම්වල සිටි දක්ෂ ක්‍රීඩකයෝ එදා ජාතික ක්‍රිකට් කණ්ඩායමට එකතු කරගත් නිසා තමයි ඒ දක්ෂතා තුළින් අපට ඉස්සරහට යන්න පුළුවන් වුණේ.

විශේෂයෙන්ම අපේ ගම්වල, නගරවල පාසල් මට්ටමින් නැඟී එන ක්‍රීඩකයන්ට හොඳ පුහුණුවක් දීලා, ඒ ගොල්ලන්ව හොඳින් තෝරා ගන්නේ කොහොමද, ඒ ගොල්ලන්ව ජාතික තලයට, ජාත්‍යන්තර මට්ටමට ගෙනියන්නේ කොහොමද කියන ඒ වැඩ පිළිවෙළ මේ වන විට බිඳවැටිලා තිබෙනවා. ඒ වාගේම, ශ්‍රී ලංකා

ක්‍රිකට් ආයතනය පිළිබඳව විශාල විවේචන තිබෙනවා. ක්‍රිකට් ආයතනයේ ඒ පරිපාලනය මෙන්ම ඒ නායකත්වය තෝරා ගන්නා ක්‍රමවේදය පිළිබඳව අපි දිගින් දිගටම කථා කළත්, ඒ සම්බන්ධයෙන් ජනතාවගේ හඬ එළියට ආවත්, යම් යම් බලවේග විසින් ඒවා යටපත් කර තිබෙනවා. එහෙම යටපත් කිරීමේ එක ප්‍රතිඵලයක් තමයි ඉතාම අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගනිමින් ක්‍රීඩා කරලා, අපි එදා සිහිනයකින්වත් හිතුවේ නැති රටවලට අපේ ක්‍රිකට් කණ්ඩායම අද පරාජය වෙලා තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම රජයෙන් අපි ඉල්ලා සිටිනවා, අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව නැවත ගොඩනැඟීම සඳහා නැවත හරි විධියට මේ වෙනුවෙන් මැදිහත් වෙන්න කියලා. එහෙම නැතිව එක එක කරුණු කියලා, එක එක පුද්ගලයන්ව බේරලා මේකෙන් පැනලා යන්න එපා. ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව ජනතාව තුළ ලොකු වේදනාවක් තිබෙන මේ වෙලාවේ, නැවත අපි මේ ක්‍රීඩාව සකස් කරලා, ඉදිරි කාලවලදී තිබෙන ලෝක කුසලාන තරග සහ අනෙකුත් තරගාවලි ජයග්‍රහණය කරන්න පුළුවන් ආකාරයට අපි නැවත ක්‍රිකට් ක්‍රීඩාව ඉහළ නංවන්න ඕනෑ කියන අදහස ඉදිරිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.54]

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරක කර්මාන්තයට අදාළ නියමයන් සහ නියෝග කිහිපයක් සාකච්ඡාවට ගන්නා මේ මොහොතේදී, මට වෙන් කර තිබෙන විනාඩි 5ක කාලය තුළ මම කැමැතියි, සංචාරක කර්මාන්තය පිළිබඳව කථා කරන්න. අද අපි රටක් හැටියට ගත්තාම, මේ මොහොතේ සංචාරකයන් වැඩි ප්‍රමාණයක් ලංකාවට පැමිණියාය කියලා සතුටු වෙනවා. ඒක හොඳයි. හැබැයි, අපේ සංචාරක කර්මාන්තයේ නියැළෙන්නන්ට තිබෙන ප්‍රශ්න විසඳීම සඳහා මේ වෙනකම් වෙච්ච අවධානය බොහොම අඩුයි කියලා තමයි අපි ගමට ගියාම තේරෙන්නේ. කොවිඩ්-19 වසංගතයත්, පාස්කු ප්‍රහාරයත් නිසා කඩා වැටිච්ච සංචාරක කර්මාන්තයේ නියැළුණු උදවියගේ ණය ගෙවීම සම්බන්ධයෙනුත් විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ මොහොතේ රජයෙන් moratorium එකක් ලබා දුන්නා. නමුත්, ඒ moratorium එක ලබා දුන්නු කාලසීමාවේදීත් බදු එකතු කරලා, පොලිය එකතු කරලා විශාල මුදල් ප්‍රමාණයක් අද ගෙවන්න කියලා තිබෙනවා.

ශ්‍රී ලංකා මහ බැංකුව ස්වාධීන ආයතනයක් බවට පත් කරන්න අපි ඡන්දය දුන්නා. අද වන විට මේ රටේ ස්වාධීන මහ බැංකුවක් තිබෙනවා. හැබැයි, මහ බැංකුව කිව්වත්, පෞද්ගලික බැංකු බොහෝ ව්‍යාපාරිකයන්ගේ ණය පොලිය අඩු කළාට, රාජ්‍ය බැංකු අද ණය පොලිය අඩු කරලා නැහැ. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තයේ නියැළෙන උදවියගේ ඒ පොලිය අඩු නොකිරීම තුළ ඒ අයට දැන් සිද්ධ වෙලා තිබෙනවා, හෝටල් කුණු කොල්ලයට විකුණලා මේ ව්‍යාපාරයෙන් ඉවත් වෙන්න. ඒ වාගේම, සංචාරකයන් හිටිහැටියේ අඩු වෙන්න ප්‍රධාන හේතුවක් වුණා, හිතුමතේට වීසා ගාස්තු පිළිබඳව ගත්ත තීන්දුව. මම යෝජනා කරනවා, පළමුවැනි වතාවට ලංකාවට දින කිහිපයකට එන සංචාරකයන්ට හැකි තරම් නොමිලේ වීසා ගාස්තු රහිතව ලංකාවට ඇතුළු වෙන්න අවස්ථාව ලබා දෙන්න කියලා. හැබැයි, මාසයකට වැඩි කාලයක් අපේ රට තුළ ඉන්න අදහස් කරනවා නම්, මාසයකට පසුව වීසා නිකුත් කරනකොට විශාල වීසා ගාස්තුවක් අය කරලා ඒ අයට අවශ්‍ය වීසා පහසුකම් ලබා දෙන්න. ඒ අය ව්‍යාපාරයක නියැළෙනවා නම්, ඒ ව්‍යාපාරයේ නියැළෙන හැම කෙනෙකුගෙන්ම බද්දක් අය කරලා, ඒ අයට අවශ්‍ය කරන පහසු බැංකු ගිණුමක් විවෘත කරලා, income tax file එකක් ඇරලා ඒ කටයුත්ත කරන්න අවස්ථාව ලබා දෙන්න. මොකද, විශාල ලෙස වාසි ලබන ව්‍යාපාරයක් බවට අද සංචාරක කර්මාන්තය පත්වෙලා තිබෙනවා. සංචාරක කර්මාන්තයේ නියැළෙන ශ්‍රී ලාංකිකයන්ට අද බොහෝ දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ සංචාරක ක්ෂේත්‍රයේ නියැළෙන උදවිය පුහුණු කිරීම සඳහා සංචාරක හෝටල් පාසල් නිසි ලෙස කළමනාකරණය කරලා, - විශේෂයෙන්ම කෙටිකාලීන පාඨමාලා සමඟ- සේවයේ නියුතුව සිටියදීම ඔවුන්ට පාඨමාලාවලට සහභාගී වෙන්නට අවශ්‍ය කරන පහසුකම් සලසා දිය යුතුයි.

මොකද, එක දිගට අධ්‍යාපනය ලබා ඉන් පසුව රැකියා ගත වෙන්නට හැකි ආර්ථිකයක් තිබෙන කණ්ඩායම් අද බොහෝ දුරට අඩු බව අපි දකිනවා. ඒ නිසා එම උදවිය පිළිබඳව අවධානය යොමු කරලා, විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රයේ ආයෝජනයට කැමැති උදවියට - එම ආයෝජකයන්ට- ඒ සඳහා අවශ්‍ය කරන අනුමැතීන් සියල්ල ලබා දී ඒ අය දිරිමත් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොකළොත් ඉහළ ආදායම් ලබන සංචාරකයන්ගේ මධ්‍යස්ථානයක් බවට අපේ රට පත් කිරීමේ සිහිනය බොඳ වී යයි කියලා මට කියන්න සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරකයෙකුට මේ රටට භය නැතිව ඇතුළු වෙන්න නම්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම අනිවාර්යයෙන්ම අවශ්‍යයි. අද මේ මොහොත වන විටත් කසු කුසු ගානවා, -මේ රටේ පාර්ලිමේන්තුව නොවෙයි- ජනාධිපතිවරයාගේ කාල සීමාව අවුරුද්දකින් දීර්ඝ කරන්න, පාර්ලිමේන්තුවේ කාල සීමාව අවුරුදු 2කින් දීර්ඝ කරන්න කියලා. ජන මතයට පටහැනිව කටයුතු කරන්න විවිධ අර ඇදීම් රජයෙන් ක්‍රියාත්මක වෙනවා කියන එක අපට දැනෙනවා, පෙනෙනවා. කරුණාකරලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන ප්‍රතිපාදන හොඳට අධ්‍යයනය කරලා පැහැදිලිව තේරුම් ගන්න, මේ ජූලි මාසයේ 17 වැනිදාට ජනාධිපතිවරණය පැවැත්වීමේ බලය මැතිවරණ කොමිසමට ලැබෙනවාමයි. ඒ බලය උදුරා ගන්නට බැහැ. අදත් මට සැකයක් ඇති වුණා. මොකද, ජනාධිපතිවරයා ඇවිල්ලා එක පැත්තකින් සුප්‍රීම් උසාවිය විවේචනය කළා. සුප්‍රීම් උසාවියේ තීන්දු ගණන් ගත යුතු නැති මට්ටමකට පත් වෙන ආකාරයේ කථාවක් කරලා, විපක්ෂයේ ලොබියට ගිහිල්ලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට වාහන පර්මිට් සිහිනයක් පෙන්වලා තුනෙන් දෙකේ බලයක් ලබා ගන්න අර අදිනවාද කියලා මට සැකයක් මතු වුණා. ජනතාවගේ ඡන්දයෙන් අපට ලබා දීපු ශක්තිය පාවා දෙන්නට මේ පාර්ලිමේන්තුවේ බහුතරය සූදානම් නැහැයි කියන එක ජනාධිපතිවරයා සහ රජය තේරුම් ගත යුතුයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා නොවුණොත් අපේ සංචාරක කර්මාන්තය දියුණු කිරීම වැනි දේවල් සිහිනයක් බවට පත් වෙනවා කියන කාරණය තේරුම් ගන්න කියලා ප්‍රකාශ කරමින්, ඒ වාගේම නිසි කලට මැතිවරණ පවත්වන්නට කටයුතු කරන්න කියන ඉල්ලීමත් මේ පාර්ලිමේන්තුවේ දී කරමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් ප්‍රනාන්දු අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.00]

ගරු නලින් ප්‍රනාන්දු මහතා (වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் பர்னாந்து - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Nalin Fernando - Minister of Trade, Commerce and Food Security)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරක කටයුතු පනත යටතේ නියමයන් 5ක්, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග සහ රජයේ ඉඩම් ආඥාපනත යටතේ නියෝග සම්බන්ධයෙන් විවාද කරන මේ වෙලාවේ මටත් ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරක ව්‍යාපාරය සම්බන්ධව අපේ රටේ මීට අවුරුදු දෙකකට විතර ඉස්සෙල්ලා තිබුණේ ඉතාම නරක තත්ත්වයක්. අද සංචාරක ව්‍යාපාරය ගැන පක්ෂ විපක්ෂ දෙගොල්ලන්ම විශාල වශයෙන් කථා කරනවා. හැබැයි, අවුරුදු දෙකකට ඉස්සෙල්ලා මේ රටේ සංචාරක ව්‍යාපාරය කියන එක නැත්තටම නැතිවෙලා තිබුණා. ඒ වෙලාවේ ලෝකයේ රටවල් සංචාරකයින්ට දීපු උපදෙස වුණේ, සංචාරය සඳහා ශ්‍රී ලංකාව තෝරා ගන්න එපා කියන එකයි. ඒ ඇයි? මේ රටේ පැය 12ක්, 13ක් විදුලිය නැහැ, සංචාරකයින් සඳහා මේ රටේ ආහාර පාන නැහැ, රට තුළ සංචාරය කරන්න ඉන්ධන නැහැ, මේ රට තුළ ප්‍රචණ්ඩත්වය තිබෙනවා, ඒ ප්‍රචණ්ඩත්වය තුළ සංචාරකයාට ආරක්ෂාව නැහැ යනාදී වශයෙන් කාරණා ගණනාවක් ලෝකයේ රටවලට පෙන්වූවා. ඉතාම කීර්තිමත් සංචාරක ඉතිහාසයක් තිබුණු රටට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා ලැබුණු සහතිකය තමයි මේ රට සංචාරක ව්‍යාපාරයෙන් ඈත් කරන්න ඕනෑ, එහෙම නැත්නම් ඉවත් වෙන්න ඕනෑ කියන එක. එවැනි මතයක් ලෝකය පුරා ගෙනිච්චා. එවැනි තත්ත්වයක් තුළ අපි නැවතත් සංචාරක ව්‍යාපාරය පටන් ගත්තේ කොහොමද කියන එක ගැන තමුන්නාන්සේලා කවුරුත් දන්නවා. කිලෝමීටරයක්, දෙකක් දුරට වාහනයක් දුවගන්න ඩීසල් පෙට්‍රල් නැති රටක, විදුලිය නැති රටක, ප්‍රචණ්ඩත්වය තිබෙන රටක සංචාරක ව්‍යාපාරය ගැන කථා කිරීම විහිළුවක්.

රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති තනතුරට පත් වෙලා, අලුත් කැබිනට් මණ්ඩලය පත් කරලා මේ සඳහා එකින් එක විසඳුම් ලබා දීලා තමයි අද තමුන්නාන්සේලා, අපි කථා කරන මේ සංචාරක ව්‍යාපාරයේ දියුණුව ඇති කරලා තිබෙන්නේ.

පසුගිය අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ අපේ රටට පැමිණි සංචාරකයින්ගේ ප්‍රමාණය වැඩි වීම නිසා සංචාරක ව්‍යාපාරය තුළින් ලැබුණු ආදායම විශාල වශයෙන් ඉහළ නංවා මේ රටේ ශක්තිමත් ආර්ථිකයක් ගොඩනඟන්න එම ව්‍යාපාරයත් හේතු වුණු බව මම මතක් කරන්න ඕනෑ. ඒක නිකම් ලබාගත්ත දෙයක් නොවෙයි. අපි ගත්ත ප්‍රතිපත්ති නිසුයි, අපේ ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළිවෙළ තුළ සංචාරක ව්‍යාපාරයට ලබා දුන් ප්‍රමුඛත්වය නිසා තමයි අද වෙනකොට මේ තැනට අපේ සංචාරක ව්‍යාපාරය දියුණු කර ගන්න හැකියාව ලැබුණේ.

සංචාරක කලාප 5ක් ආරම්භ කරලා, ඒ සංචාරක කලාප පහට සුවිශේෂ වූ පහසුකම් ලබා දීලා, සංචාරක කර්මාන්තය තුළින් ඒ ප්‍රදේශ දියුණු කරලා, සංචාරක ව්‍යාපාරය දියුණු කරලා, ඒ තුළින් මේ රටේ ආර්ථික වැඩ පිළිවෙළට ශක්තියක් ලබා දෙන වැඩ පිළිවෙළක් අද සංචාරක ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙනවා. දැන් විපක්ෂය කරුණු කාරණා කියනවා. මේ සඳහා උපදෙස් ලබා දෙනවා. හැබැයි, පසුගිය කාලයේ පැවැති තත්ත්වය තුළ මේ රට භාර ගන්න කිව්වාම, මෙවැනි කඩා වැටුණු ක්ෂේත්‍ර ගැන කථා කළාම ඒ අය එදා මේවායින් ඉවත් වුණා.

මීට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා ක්‍රියාත්මක වුණු ආනයන සීමා කිරීම සංචාරක ව්‍යාපාරයට විශාල වශයෙන් බලපෑවා. මේ රටේ සංචාරක ව්‍යාපාරයට අවශ්‍ය කරන භාණ්ඩ විශාල ප්‍රමාණයක් ආනයනය කිරීම අපි නවත්වා තිබුණා. ඒ කාලයේ කිව්වා, ටිෂූ පේපර් එකක්වත් නැති රටක සංචාරක ව්‍යාපාරය ගැන මොන කථාද කියලා. එවැනි තත්ත්වයක් තිබුණු රටක සංචාරක ව්‍යාපාරයට තිබුණු බාධා ඉවත් කරලා සියලු ආනයන සීමා ලිහිල් කරලා අපි ඒ අවස්ථාව ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය තමුන්නාන්සේටත් මතක ඇති. මේ පාර්ලිමේන්තුව තුළ පක්ෂ, විපක්ෂ සියලු දෙනා විශාල වශයෙන් මේ ගැන කථා කළා. සංචාරක ව්‍යාපාරයට තිබුණු ලොකුම ප්‍රශ්නය තමයි බැංකු ණය ගෙවා ගන්න බැරිව හෝටල් කර්මාන්තය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත කඩා වැටිලා බැංකුවලට ඔවුන්ගේ දේපළ සින්න වීම. සංචාරක ව්‍යාපාරය තමයි මේ ආර්ථික අර්බුදයෙන් වැඩිම බලපෑමට ලක් වුණේ. කොවිඩ් වසංගතයෙන් පස්සේ අවසාන සංචාරකයාත් මේ රටින් පිටත් වුණා කියලා අපි එක දවසක ප්‍රකාශ කළා මට මතකයි. ඒ කියන්නේ සංචාරකයින්ගේ පැමිණීම බින්දුවයි. අවසාන සංචාරකයාත් මේ රටින් පිටත් වුණා කියන ආරංචිය - news එක - ගියා. එහෙම තිබුණු සංචාරක ව්‍යාපාරය නැවත ගොඩනඟන වැඩ පිළිවෙළ අපි හදුනා ගත්තා. සංචාරක ව්‍යාපාරයේ කඩා වැටීම තුළ හෝටල් පද්ධතිය ආශ්‍රිතව තිබුණු තත්ත්වය තමයි මම කිව්වේ. මේ අය ලබාගත් බැංකු ණය ගෙවා ගන්න බැරිවීම තුළ ඒ දේපළ බැංකුවලට සින්න වෙන්න ගත්තා. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට අමතරව සංචාරක ව්‍යාපාරයට මුල් තැන දෙන නිසා තමයි අපි නැවත පරාටේ නීතිය වෙනස් කරලා මේ අයගේ දේපළ වෙන්දේසි කිරීම, එහෙම නැත්නම් බැංකු හෝ මූල්‍ය ආයතන විසින් මේ දේපළ අත්පත් කර ගැනීම නවත්වන්න කටයුතු කළේ. අපි ඒ අවස්ථාව සංචාරක ව්‍යාපාරයට ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි. සංචාරක ව්‍යාපාරය සඳහා අවශ්‍ය කරන මූලික දේවල් ටික ඉක්මනින් ලබා දෙන්න අපි කටයුතු කළා. බැංකු ණය ලබාගෙන තිබුණත්, මේ ආර්ථිකය කඩා වැටීම තුළ එය කළමනාකරණය කරලා ඒ අයට නැවත බැංකු ණය ලබා දීමේ වැඩ පිළිවෙළ අපි ආරම්භ කළා.

ඒ වාගේම සංචාරක ඇමතිතුමා ආයෝජන මණ්ඩලය සතු ආයෝජන කලාප තුළ තිබෙන අනුමැතිය ගත් ආයතනවල සහ ඊට පිටින් තිබෙන ආයතනවල ආදායම් වැඩි කර ගන්න beer licences වැනි දේවල් ලබා දීලා සංචාරක කර්මාන්තකරුවාව ආරක්ෂා කරන්න කටයුතු කළා. ඒ අයගේ ආදායම් වැඩි කර ගන්න කටයුතු කළා. ඒ තුළින් සංචාරක කර්මාන්තයට නැවත යම් සහනයක් ලබා දෙන්න අපට ශක්තිය ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංචාරක ව්‍යාපාරයේ තිබුණු ලොකුම ප්‍රශ්නය තමයි, ව්‍යාපාරිකයන් අසාදු ලේඛනගත වීම. ඒ කියන්නේ බැංකු ණය ගෙවා ගන්න බැරිව CRIB එකට ගිය ව්‍යාපාරිකයන් නැවත ණයක් ගන්න ගියාම ඔවුන්ට ණය ලබා නොදීම. ඔවුන් අසාදු ලේඛනගත වීම නිසා ඔවුන්ට කවදාවත් ණයක් දෙන්නේ නැහැ. පෞද්ගලික ව්‍යාපාරිකයෙකු බැංකුවකට ගියාම ඔහුගේ National Identity Card Number එක ගහලා හොයා බැලුවාම ඔහු CRIB එකේ ඉන්නවා නම්, නැවත ඔහුට කවදාවත් ණයක් ලබා දෙන්නේ නැහැ. නමුත්, ඒ තත්ත්වයෙන්

මිදීමට අවශ්‍ය සහන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා, ඒ අයට ඒ අවශ්‍ය වාතාවරණය නැවත ඇති කර, ඔවුන්ට අවශ්‍ය ණය පහසුකම් ලබා ගන්න පුළුවන් වන තත්ත්වයට කටයුතු කරන්න අපට හැකි වුණා.

අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන ප්‍රධාන කාරණා තුනෙන්, එකක් වුණු සංචාරක කර්මාන්තයෙන් අපට අවශ්‍ය ආදායම ලබා ගන්න අපි කටයුතු කළා. අපි හැමෝම දන්නවා, සංචාරක කර්මාන්තය, විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ, ඒ වාගේම අපනයනය කියන කාරණා තුන තමයි අපේ රටේ ප්‍රධාන ආදායම් මාර්ග බවට පත් වෙලා තිබුණේ කියලා. ඒ නිසා අපි අද වෙනකොට අපේ ඒ ප්‍රධාන ආදායම් මාර්ග තුනම නැවත ශක්තිමත් කරලා මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළිවෙළකට ගිහිල්ලා තිබෙනවා. එ් සඳහා අවශ්‍ය පනත් සංශෝධනය කරලා අනාගතයේදී අපේ සංචාරක ව්‍යාපාරය තවත් දියුණු කරගන්නේ කොහොමද, ඊට අවශ්‍ය වෙනස්කම් කරන්නේ කොහොමද කියන එක ගැන අපි පසුගිය කාලයේදී කථා වුණා. ඒ වාගේම අපි සංචාරක ව්‍යාපාරය වෙනස් මාවතකට ගෙන යන වැඩ පිළිවෙළක් ද ආරම්භ කළා. උදාහරණයක් ගත්තොත්, අපි අවුරුදු 25කට, 30කට කලින් සංචාරක ව්‍යාපාරය කරපු විධියට අද සංචාරක ව්‍යාපාරය කරන්න බැහැ. අද ඒ සඳහා අලුත් වෙනස්කම් කරන්න ඕනෑ. ඒ වාගේම සංචාරක ව්‍යාපාරය ගම ඇතුළට යන්න ඕනෑ. ගමේ තිබෙන ආහාර පාන ටික සංචාරක ව්‍යාපාරයට ඇතුළු වෙන්න ඕනෑ. ඒ වාගේම ගමේ සංස්කෘතිය සංචාරක ව්‍යාපාරයට ඇතුළු වෙන්න ඕනෑ. එවැනි කාරණා පිළිබඳව තමයි සංචාරක කටයුතු පනත යටතේ ඉදිරිපත් කර ඇති නියම තුළින් අද අපි සාකච්ඡා කරන්නේ. එයින් එක කාරණයක් වන ඒ ඒ ප්‍රදේශවලට ආවේණික සංචාරක කලාප ඇති කිරීම තුළින් සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නට අපට හැකියාව ලැබෙනවා කියන එකත් මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ.

ජනාධිපතිතුමාගේ 2048 වසර දක්වා වූ ආර්ථික වැඩ පිළිවෙළ ගැන දැන් සමහරුන් මොනවාද කියන්නේ? 2048 වසර වෙද්දි ඕක ඉදිරිපත් කරපු ජනාධිපතිවත්, පාර්ලිමේන්තුවේ මේ ඉන්න සියයට 50ක්, 60ක්වත් ජීවත් වෙන්නේ නැහැ ලු, එතකොට ඒ අය මැරිලා ඉවරයි ලු. මෙවැනි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරද්දි අපට කියන කථාව තමයි මේ. ආර්ථික වශයෙන් දියුණු වෙන රටකට, එහෙම නැත්නම් ඉස්සරහට යන රටකට අවුරුදු 20ක, 25ක ඉදිරි වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. එහෙම නැතිව අද කියලා ආයෙත් හෙට ඒ වැඩ පිළිවෙළ වෙනස් කරන තත්ත්වයකින් රටක් ඉස්සරයට ගෙන යන්න බැහැ. අපි ගත් එවැනි තීන්දුවල නරක ප්‍රතිඵල පසුගිය කාලයේ අපි අත්වින්දා. ඒ නිසා 2048 වසර වෙනතුරු සැලසුම් කර තිබෙන ඒ ආර්ථික වැඩ පිළිවෙළ තුළ අපි සංචාරක කර්මාන්තය දියුණු කරන්නේ කොහොමද, අපගේ අපනයන දියුණු කරන්නේ කොහොමද, අපේ විදේශ ශ්‍රමිකයන්ගෙන් එන ආදායම වැඩි කර ගැනීමට යොදන වැඩ පිළිවෙළ මොකක්ද, අපේ ශ්‍රමිකයන් අඩු පඩියකට පිට රට යවනවා ද, එහෙම නැත්නම් වැඩි ආදායම් ලබා ගන්න පුළුවන් රැකියා සඳහා පිට රට යවනවා ද, පුහුණු ශ්‍රමිකයන් යවා අපි මේ තත්ත්වය වෙනස් කර ගන්නේ කොහොමද, IT ක්ෂේත්‍රය හරහා වැඩි ආදායම් ඉපැයීම් ලබා ගන්න පුළුවන් ශ්‍රමිකයෝ යවනවා ද, එහෙම නැත්නම් වෘත්තිකයෝ යවනවා ද කියන කාරණා ගැන කල්පනා කරලා තමයි අපි 2048 වසර වෙද්දි අපේ රට කොතැනකටද අරගෙන යන්නේ කියන ආර්ථික ප්‍රතිපත්තිය හැදුවේ.

උදාහරණයක් ගත්තොත්, අපේ රටට සිදු වුණු දේවල් වාගේ දේවල් ලෝකයේ අනික් රටවලත් සිදු වෙලා තිබෙනවා. අද ලෝකයේ දියුණු වුණු සමහර රටවල් තිබෙනවා, මීට අවුරුදු 20කට, 25කට ඉස්සෙල්ලා මෙවැනි ආර්ථික පරිහානිවලට, ආර්ථික සෝදාපාළුවට ලක් වුණු. අපේ අල්ලපු රට වන ඉන්දියාවත් IMF වැඩ පිළිවෙළට සම්බන්ධ වුණු රටක්. මම උදාහරණයක් කිව්වොත්, 1998දී ඉන්දුනීසියාවට මෙවැනි ආර්ථික බලපෑමක් ආවා. ඒ නිසා ඔවුන් IMF එකෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 43ක ආධාර ලබා ගෙන නැවත ඒ රට ගොඩ නඟන වැඩ පිළිවෙළකට ගියා. අද ඉන්දුනීසියාවේ ආර්ථිකය කොයි මට්ටමකද තිබෙන්නේ? අද වනකොට ඉන්දුනීසියාවේ ආර්ථිකය විශාල වශයෙන් දියුණු වෙලා තිබෙනවා. 2045 වසර වනකොට ඉන්දුනීසියාව ඔවුන්ගේ ඒකපුද්ගල ආදායම ඩොලර් 23,000කට ඉහළ නංවන්න බලාපොරොත්තු වෙනවා.

ඔවුනුත් සැලසුම් කරලා තිබෙන්නේ, 2045 වසර තෙක් වූ විශාල කාල පරාසයක ආර්ථික දැක්මක් තිබෙන වැඩ පිළිවෙළක් පිළිබඳවයි. අද එවැනි රටවල් ඔවුන්ගේ ආර්ථික වැඩ පිළිවෙළ සාර්ථකව ඉදිරියට කරගෙන යනවා. නමුත් එවැනි මොනවා හරි දෙයක් කිව්වාම, ඉස්සෙල්ලාම අපේ රටේ විපක්ෂය ඒකට හිනාවෙන්න පටන් ගන්නවා. හිනාවෙලා කථා කරලා, පොඩි මෝඩ වූන් එකක් අරගෙන, ඒක විනාශ කරන වැඩ පිළිවෙළක් දියත් කරන එක තමයි අපේ රටේ විපක්ෂය සහ තවත් සමහර කණ්ඩායම් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ගෙනයන මේ වැඩ පිළිවෙළ අද වෙද්දි ඉතා සාර්ථක තත්ත්වයට පත්වෙලා තිබෙනවා කියන එක කාටවත් නැහැයි කියන්න බැහැ. අද ජනාධිපතිවරයා ගෙනයන මේ වැඩ පිළිවෙළ, සෑම අංශයකින්ම අපි ඉස්සරහට ගෙන යනවා. ඒ වාගේම අපේ රටේ නිෂ්පාදනය වැඩි කරන වැඩ පිළිවෙළත් අපි ඉදිරියට ගෙනයන්න ඕනෑ. උදාහරණයක් ගත්තොත්, සංචාරක ව්‍යාපාරය දියුණු වෙනවා නම්, කුකුළු මස් නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය, ඒ වාගේම මේ රටේ අනෙකුත් කෘෂි භාණ්ඩ නිෂ්පාදනයන් වැඩි වෙන්න ඕනෑ. අපි නිකම් බලලා අපට කුකුළු මස් අවශ්‍ය වෙනවා කියලා අපේ රටේ මිනිස්සුන්ට වැඩි වශයෙන් කුකුළු ගොවිපොළ දියුණු කරන්න කිව්වාට මදි. බිත්තර ගත්තත්, එවැනි තත්ත්වයක් තිබෙන්නේ. මේ වෙද්දි තවත් සංචාරකයෝ ලක්ෂ 25ක් මේ රටට එනවා. ඔවුන්ටත් මේ පහසුකම් ලබා දෙන්න ඕනෑ. ඒ නිසා මේ පහසුකම් වැඩි කරන වැඩ පිළිවෙළකට අපි යන්න ඕනෑ.

ඒ වාගේම අද තිබෙන ඉඩම් පිළිබඳ ප්‍රශ්නයත්, අපේ රටේ අවුරුදු 30ක, 40ක කාලයක ඉඳලා තිබුණු ප්‍රශ්නයක්. මේ වෙනකොට ජනාධිපතිතුමා ඔප්පු ලබා දීලා, ඒ ඉඩම්වල අයිතිය ජනතාවට ලබා දෙනවා. ඒ තුළින් මේ රටේ ඉඩම්වලට ඔප්පු හිමිකම නැතිව සිටි සියලුදෙනාට ඒ හිමිකම ලබා දෙන්න කටයුතු කරනවා. ඒ වාගේම අද ගන්න විශේෂම තීන්දුවක් තමයි, වාණිජ සහ කෘෂි කර්මාන්ත කටයුතු සඳහා ඉඩම් ලබා දීමේ බදු කාල සීමාව වැඩි කිරීම. මෙතෙක් ඒ සීමාව තිබුණේ අවුරුදු 33කට. ඒ බදු කාල සීමාව අවුරුදු 50ක් නම්, එම යෝජනාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න ඕනෑ. අවුරුදු 99කට බදු දෙන ක්‍රමයකුත් මෙතෙක් තිබුණේ නැහැ. නමුත් අද ඉඳලා අවුරුදු 50කට එවැනි ඉඩම් බදු දෙන වැඩ පිළිවෙළත්, ඒ වාගේම අවුරුදු 99කට බදු දෙන වැඩ පිළිවෙළත් අපි ආරම්භ කරලා තිබෙනවා. එහිදී ආයෝජකයෙකුට බය නැතිව තමන්ගේ ආයෝජන කිරීමේ හැකියාව ලැබෙනවා. ඒ වාගේම ඔවුන් විශාල මුදලක් ආයෝජනය කරනවා නම්, ඒ ඉඩමේ ආරක්ෂාව, එහෙම නැත්නම් ඔවුන් කොයි විධියටද මේ ඉඩම තුළ ආයෝජනය කරන්නේ, ඒක කොච්චර කාලයකටද කියන එකත් අනිවාර්යයෙන් බලනවා. ඒ වාගේම ඒ ඉඩමේ හිමිකාරිත්වයත් ඔවුන් බලනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි තත්ත්වයක් තුළ මේ ඉඩම් ප්‍රශ්නය තමයි අපේ රටේ ආයෝජන සඳහා විශාල බලපෑමක් කරලා තිබුණේ. අද ඒ ඉඩම් සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ කරලා, ඉඩම්වල අයිතිය මේ රටේ ජනතාවට ලබා දීලා, ආයෝජකයාට ඒ ඉඩම් ලබා දෙන වැඩ

[ගරු නලින් ප්‍රනාන්දු මහතා]

පිළිවෙළ හදලා, ඒ වාගේම නීතිය හා සාමය මේ රටේ ස්ථාපිත කරලා, ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න අපි කටයුතු කළා කියන එකත් මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ.

මම නැවත වාරයක් කියනවා, මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යෑම සඳහා මේ ජනාධිපතිතුමාත්, මේ කැබිනට් මණ්ඩලයත්, මේ ආණ්ඩුවත් පසුගිය අවුරුදු දෙක තුළ විශාල කැප කිරීමක් කළ බව; විශාල මහන්සියක් දැරූ බව. ඒකේ ප්‍රතිඵල අද වෙද්දි මේ රටේ ජනතාවට ලැබෙනවා. රටේ ජනතාව අද කියනවා, මේ රටේ ආර්ථිකය ඉස්සරහට ගෙනයන්න නම්, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආර්ථික ප්‍රතිපත්තිය මේ රටට අවශ්‍යයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා පක්ෂ-විපක්ෂ අප සියලුදෙනා මේ රටේ ආර්ථිකය ඉස්සරහට ගෙනයනවා නම්, ආර්ථිකයට ශක්තියක් ලබා දෙනවා නම්, ඒ සඳහා සියලු කටයුතුවලින් සහයෝගය ලබා දෙන්න ඕනෑය කියන ඉල්ලීම කරමින්, නැවත වාරයක් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නැති මොහොතකදී අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා ප්‍රධාන කාරණාවක් ගෙන ආවා, ආසියානු තරගාවලියට ගිය ක්‍රීඩිකාවකට මුදල් නොගෙවීමක් ගැන. මට ඒ සම්බන්ධයෙන් පොඩි පැහැදිලි කිරීමක් කරන්නත්, ඒ document එක සභාගත කරන්නත් අවශ්‍යයි. ඒ මුදල් ගෙවන්න ගිය සතියේ තමයි Cabinet approval එක ලැබුණේ. ඒ අනුව ආසියානු පැරා තරගාවලියට සහ ආසියානු ක්‍රීඩා තරගාවලියට ගිය කණ්ඩායම්වලට සම්පූර්ණ මුදල වශයෙන් රුපියල් මිලියන 123ක් ගෙවන්න ඕනෑ. ක්‍රීඩා සංවර්ධන අරමුදලේ රුපියලක්වත් නැහැ. ඒ නිසා ආර්ක් ක්‍රීඩා තරග postpone වීම නිසා, Cabinet approval එකක් අරගෙන ඒ සඳහා වෙන් කරපු රුපියල් මිලියන 123ක මුදල මේ සඳහා ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ හැම ක්‍රීඩක ක්‍රීඩිකාවකටම ගෙවන ගණන රුපියල් මිලියන 15 සිට විස්තර මේ ලේඛනයේ ඇතුළත් වෙනවා. ඒ විස්තර ඇතුළත් ලේඛනය මම **සභාගත*** කරනවා.

ඒ අනුව රුපියල් මිලියන 123ක් ඒ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට දෙන්න කටයුතු කරනවා. ඒ වාගේම ක්‍රීඩා තරග සම්බන්ධයෙන් කථා කරපු නිසා, ඒ සම්බන්ධයෙනුත් මම පුංචි පැහැදිලි කිරීමක් කරන්නම්. මම මේ අමාත්‍ය ධුරය භාර ගත්තේ නොවැම්බර් මාසයේ අන්තිමට. ඒ ධුරය භාර ගත්ත දවසේ ඉඳලා ඊයේ තිබුණු තරගයත් එක්ක අද වනතුරු T20 තරග දොළහක් පවත්වා තිබෙනවා. ඒ තරග දොළහෙන්, හතක් දිනලා තිබෙනවා. ශ්‍රී ලංකා ක්‍රිකට් තහනම් වෙලා තිබෙනකොට තරග හතක් දිනලා තිබෙනවා.

ශ්‍රී ලංකා පිරිමි ක්‍රිකට් කණ්ඩායම ටෙස්ට් තරග තුනකට සහභාගි වෙලා ඒ තරග තුනම ජයග්‍රහණය කර තිබෙනවා. ඒ වාගේම ODI තරග නවයක් තිබුණා. ඒ තරග නවයෙන් හයක් දිනුම්; දෙකක් පරාදයි; එකක් no result. ඒ වාගේම Sri Lanka Women's National Cricket Team එක ODI matches පහකට සහභාගි වුණා. ඒ පහෙන් තුනක් දිනුම්, එකයි පරාද. ඒ වාගේම Sri Lanka Women's National Cricket Team එක T20 matches නවයකට සහභාගි වෙලා තිබෙනවා. ඒ නවයෙන් අටක් දිනුම්; එකයි පරාද. ඒ අනුව සියයට 71කට වැඩි ජයග්‍රහණයක් ලබාගෙන තිබෙනවා. පසුගිය මාස හතර අරගෙන බැලුවොත්, පුංචි වෙනස්කම් ටිකක් කරලා තිබෙනවා. ඒක තමයි මම එදාත් කිව්වේ, short-term, medium-term and long-term කියලා සැලසුම් තුනක් තිබෙන්නට ඕනෑ බව. ඒ සැලසුම් තුන නැතුව අද මේ වාගේ සාකච්ඡා කරන එක ගැන සහ බංග්ලාදේශය එක්කයි, South Africa වැනි හොඳම side එකක් එක්කයි අලුතින්ම හදපු wicket එකක ගහලා පැරදුණාම රෙදි ගැලවෙන කථා කියන එක ගැන ලංකාවේ විපක්ෂයට මම කනගාටුව ප්‍රකාශ කරනවා. මොකද, මෙතුමන්ලා තනිකරම agendasවලට වැඩ කරන්නේ; ලංකාවේ ක්‍රීඩාව වෙනුවෙන් වැඩ කරන්නේ නැහැ. තරග ජයග්‍රහණ ගැන මම නැවත වතාවක් කිව්වොත්, ශ්‍රී ලංකා පිරිමි ක්‍රිකට් කණ්ඩායම දැනට පැවැත්වූ ටෙස්ට් තරග තුනම දිනුම්; ODI තරග නවයෙන් හයක් දිනුම්; T20 තරග දොළහෙන්, හතක් දිනුම්; ඒ අනුව matches විසිහතරෙන්, දහසයක් අපි දිනලා තිබෙනවා. කාන්තා ක්‍රිකට් කණ්ඩායම ODI matches පහෙන් තුනක් දිනුම්; T20 තරග නවයකින්, අටක් දිනුම්; ඒ අනුව matches දහහතරෙන්, එකොළහක් දිනුම්. මේක පැහැදිලි ප්‍රතිශතයක්, මේ කෙටි කාලයේදී මේ දේවල් කොහොමද වුණේ කියන එක බලන්න. එම නිසා ඔබතුමා කිව්ව එම කාරණා නිවැරදි කරන්න ඕනෑ.

ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා කිව්වා, ලංකාවේ සංචාරය කරන සංචාරකයින්ට ආරක්ෂාවක් නැහැ කියලා. එතුමා තමයි ජනාධිපතිතුමා ආණ්ඩුව ගත්ත වෙලාවේ කිව්වේ, මුදල් අව්වු ගහන්න කියලා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා මුදල් අව්වු ගහන්නේ නැතුව රට ගොඩදාලා දුන්නා. මෙතුමන්ලාට පුරුදු ඒ වාගේ මුදල් අව්වු ගහලා වැඩ කරන්න වෙන්න ඇති. ලංකාවේ සංචාරකයින්ට ආරක්ෂාවක් නැහැ කිව්වා. "Forbes" සඟරාවේ තිබෙනවා, කාන්තාවකට solo travelling සඳහා සංචාරය කරන්න හොඳම රට ලංකාව කියලා. "Forbes" කියන්නේ මගේ සඟරාවක් නොවෙයි. ඒක ලෝක ප්‍රසිද්ධ සඟරාවක්. ඒ සඟරාවේ සඳහන් කරලා තිබෙනවා, must-visit countries තුනක්; 2024 වසරේ යා යුතුම රටවල් තුනක් පිළිබඳව. ඒ රටවල් තුනෙන් එකක් තමයි ශ්‍රී ලංකාව. එම නිසා මෙච්චර කුහක වෙන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.20]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කර තිබෙන සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයට අදාළ නියම හා නියෝග පිළිබඳව කථා කරද්දී, හිටපු ඉඩම් ඇමතිවරයෙක් හැටියටත්, සංචාරක ව්‍යාපාරය ආරම්භ කරපු පුරවරය වන බෙන්තොට නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියටත් විනාඩි හතක් තුළ කථා කිරීම මට ලොකු අභියෝගයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි දැක්කා, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කළ ආයෝජන ව්‍යාපෘතිවලට ඉඩම් ලබා දීමේ බදු කාල සීමාව අවුරුදු 55 ඉඳලා

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අවුරුදු 99 දක්වා සංශෝධනය කිරීමට යෝජනා කර තිබෙන බව. ගරු ඇමතිතුමනි, ඇත්ත වශයෙන්ම ඒකට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. බ්‍රිතාන්‍ය පාලන කාලයේදී තමයි වසර 99ක් සඳහා වන බදු දීමේ ක්‍රියාවලිය ඇති කරලා තිබෙන්නේ. ඒකට හේතුව වුණේ, ඉංග්‍රීසි නීතියට අනුව වසර 100කට බදු දුන්නොත්, එතැන් පටන් සින්නක්කර අයිතිය ලැබුණා හා සමානයි කියන නිසායි. එම නිසා අවුරුද්දක් අඩු කරලා, 99 අවුරුදු බදු ක්‍රමයට ඉඩම් දෙන්න ක්‍රියා කළා. ආයෝජකයෙකුට වුණත් තමන් ආයෝජනය කරන මුදලට ප්‍රතිලාභ ලබා ගන්න දීර්ඝ කාලයක් ගත වන නිසා අවුරුදු 50, අවුරුදු 99 දක්වා දීර්ඝ කිරීමට ගත් තීරණය ආයෝජකයින් වැඩි ප්‍රමාණයක් ගෙන්වා ගන්නත් ඉවහල් වෙයි කියලා අපිත් කල්පනා කරනවා. එම නිසා එම අවුරුදු 55, අවුරුදු 99 දක්වා දීර්ඝ කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාද කරන ඉඩම් නිරවුල් කිරීම සම්බන්ධයෙන් වන නියෝග ගැන මහ ජනතාවගේ පැත්තෙන් බැලුවොත්, ජනතාවට වාසි තැන් වාගේම අවාසි තැනුත් තිබෙන බව අපි පැහැදිලිව දකිනවා. මේ නියෝග මඟින් යම් යම් කාර්යයන් සඳහා ගාස්තු අය කිරීමට යෝජනා කර තිබෙනවා. එම නියෝග ලංකාවේ සිටින ධනවත්ම පුද්ගලයාට වාගේම දුප්පත්ම පුද්ගලයින්ටත් එක හා සමානව බලපානවා. අපට සැකයක් තිබෙනවා, මේ මඟින් යෝජනා කර තිබෙන ගාස්තු දැරීමේ හැකියාවක් දුප්පත් මිනිසුන්ට තිබෙනවාද කියලා. ඒ නිසා මේ යෝජිත නියෝග හේතුවෙන් පුද්ගලයින්ට ලැබෙන වාසි වාගේම අවාසි ගැනත් අවධානය යොමු කරන මෙන් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉඩම් ඇමතිවරයා හැටියට කටයුතු කළ කෙටි කාලය තුළදී හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අත්‍යවශ්‍ය සංශෝධන යෝජනා කිරීමට කටයුතු කළා. නමුත් අවසනාවට, ආණ්ඩු පෙරළියත් සමඟ අපට ඒ වැඩ කටයුතු අවසන් කර ගන්න බැරි වුණා. මම අවස්ථා කිහිපයකදීම මේ සභාවේදී ඒ කාරණය හිටපු ඇමති එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමාගේ අවධානයට යොමු කළා. ඒත් එතුමාගේ කාලයේදී ඒවා ක්‍රියාත්මක වුණේ නැහැ. අපේ වර්තමාන ඇමතිතුමා පත් වුණාට පසුවත් මම මේ සභාවේදී ඒ ගැන අදහස් ප්‍රකාශ කරලා තිබෙනවා. නමුත් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අවශ්‍ය සංශෝධන සම්මත කර ගන්නට තවමත් නොහැකි වී තිබීම ගැන ඇත්ත වශයෙන්ම අපි කනගාටු වෙනවා. ඒ නිසා මහ ජනයා විශාල අසීරුතාවලට පත් වී තිබෙනවා. ඒ ගැනත් ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඉඩම්වල සින්නක්කර අයිතිය ලබා දෙන්න කටයුතු කරන "උරුමය" වැඩසටහන ගැන මම අවංකවම සතුටු වෙන කෙනෙක් කියන එක මේ අවස්ථාවේදීත් ප්‍රකාශ කරනවා. වර්තමාන ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යවරයා ලෙස සිටියදී මම ඉඩම් ඇමතිවරයා හැටියට කැබිනට් පත්‍රිකාවකුත් දාලා, සින්නක්කර ඉඩම් අයිතිය ලබා දීම සඳහා කැබිනට් අනුමැතියක් පවා ලබා ගත්තා. ඒක ක්‍රියාත්මක කරන්න හදනකොට උසාවි ගියා. අන්තිමට එදා අපට ඒක අකුළා ගන්න සිද්ධ වුණා. නමුත් අද එතුමා ජනාධිපති හැටියට ඒ වැඩ කටයුතු සිදු කරන්න පටන් ගැනීම ගැන, එදා අමාත්‍යවරයා හැටියට සද්භාවයෙන් කටයුතු කරලා ඒ වෙනුවෙන් මහන්සි වුණු කෙනෙකු හැටියට මගේ ප්‍රශංසාව පළ කරනවා.

ගරු ඇමතිතුමනි, මේ "උරුමය" වැඩසටහනේ ගැටලු කිහිපයක් තිබෙන බව මම දකිනවා. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බලපත්‍රයක් ලබා දුන් ඉඩමකට අදාළ පනත් සංශෝධනයකින් තොරව රජයේ ඉඩම් ආඥාපනත යටතේ දීමනා පත්‍රයක් ලබා දෙන්නේ කොහොමද කියන ගැටලුව අපට මතු වෙලා තිබෙනවා. ඒ වාගේම "උරුමය" වැඩසටහනේ අපි දකින තවත් දෙයක් තමයි, මුල් කාලයේදී දීමනා පත්‍රය ලබා දෙනකොට මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් තමයි අදාළ සැලැස්මක් -plan එකක්- ලබා දුන්නේ. ඒ වෙලාවේදී ඉඩම මැනලා තමයි ඒක ලබා දුන්නේ. නමුත් මේ වෙනකොට -මම හිතන්නේ මැතිවරණ ළඟ නිසා ඉක්මනින් දෙන්න අවශ්‍යතාව ඇති- මිනින්දෝරු දෙපාර්තමේන්තුව මීට වසර ගණනකට පෙර ලබා දුන් සැලැස්මට අනුව තමයි ඒගොල්ලන්ට ඒ plan එක දෙන්නේ, ඔප්පුව දෙනකොට. ඒ නිසා මම එහි ගැටලුවක් දකිනවා. වර්තමානය වනකොට ඒ ඉඩම්වල මායිම් වෙනස් වී තිබුණොත් ඒ බලපත්‍රලාභියාට ගැටලුවලට මුහුණපාන්න සිදු වෙනවා. අපට මතකයි, දි.මු. ජයරත්න හිටපු අගමැතිවරයා ඉඩම් ඇමතිවරයාව සිටි කාලයේ සැලැස්මක් නැතිව "ජයභූමි" ඔප්පු ලබා දුන්නා. නමුත් ඒ ඉඩම්වලට plan එකක් නැතිකම නිසා ඒ මිනිස්සු විශාල වශයෙන් ගැටලුවලට පසු කාලයේදී මුහුණ දුන්නා. ඒ නිසා මුල් කාලයේදී වාගේ ඉඩම් මැනලා plan එක එක්ක එම සින්නක්කර ඔප්පුව ලබා දෙන්න ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම බොහොම සද්භාවයෙන් ඉල්ලා සිටිනවා.

"උරුමය" වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයට සම්බන්ධ සියලු දෙනා අවධානය යොමු කර තිබෙන නිසාත්, ඉඩම් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හැමෝම ඒ කටයුත්තේම නිරත වෙලා ඉන්නා නිසාත් මහ ජනතාවගේ තිබෙන අනෙකුත් ඉඩම් ගැටලු විසඳා ගැනීමේ ප්‍රශ්නයකුත් රට තුළ මතුව තිබෙන බව මම මතක් කරන්න කැමැතියි.

අවසාන විනාඩියේදී මම කැමතියි, සංචාරක ව්‍යාපාරය ගැන කථා කරන්න. ඒ ගැන කථා කරන්න ගොඩක් දේවල් තිබෙනවා. ළඟදී මම පෞද්ගලිකව ඇමතිතුමා හමු වුණාමත් මතක් කළා, දෙද්දුව සංචාරක ව්‍යාපෘතිය ගැන. ඒක ජනාධිපතිතුමා එදා ඉඳලා උනන්දු වුණු ව්‍යාපෘතියක්. අපි ඒ සම්බන්ධව බොහොම මහන්සි වෙලා කටයුතු කළා වාගේම වන්දි මුදල් පවා ගෙවලා ඉඩම් අත්පත් කරගැනීම් ඔක්කොම කරලා තිබෙනවා. දැන් ඒකේ ප්‍රයෝජනය ගන්න උනන්දු වෙන්න කියලා මම ඔබතුමාට කියනවා.

Off-season එකක් නැතිව 365 දවසම සංචාරකයින්ට සිටීමට ගැළපෙන රටක් තමයි, අපේ රට. අපේ දකුණු පළාත කියන්නේත් off-season එකක් කියලා නැතිව හැම දාමත් සංචාරකයින්ට සිටීමට සුදුසු ප්‍රදේශයක්. ඒ නිසා ඔබතුමා උනන්දු වෙලා අලුත් ප්‍රචාරක වැඩසටහනක් ගෙනැල්ලා, මේ රට 365 දවසම සංචාරකයින්ට සිටීමට සුදුසු රටක් කියන එක ප්‍රචාරය කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ලංකාවට touristsලා ගෙන්වන ආයතනවලට VAT ගහනවා. ඒක ඒ අයට ටිකක් බලපා තිබෙනවා. වැදගත් කටයුත්තක් ඒ අය සිද්ධ කරන්නේ. ලංකාවට එන සංචාරකයන්ගෙන් සියයට 75ක් පමණ එන්නේ ඒ අය හරහා.

ඒ අය පත් වෙලා තිබෙන අපහසුතාවට යම් පිළිතුරක් දීමට උනන්දු වෙන්න කියලා මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. පසුගිය දවස්වල මේ රටේ ඇති වෙච්ච අර්බුදය නිසා, ඒ වාගේම කොවිඩ් වසංගතය නිසා සංචාරක ව්‍යාපාරයේ නිරත වෙලා ඉන්න ජනතාව විශාල අපහසුතාවකට මුහුණ දුන්නා. ඒ අයගේ ණය ප්‍රශ්න තිබෙනවා. ඒවා ගැන දිගින් දිගටම උනන්දුවෙන් කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් විනාඩි හතක් හෝ ලබා දීම ගැන ඔබතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.හා. 3.28]

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙනවා, "පිල්ලෙයාන්" හිටපු රාජ්‍ය ඇමතිතුමාට, එතුමාගේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. ඒ එක්කම ස්තුතිවන්ත වෙනවා හරින් ප්‍රනාන්දු ඇමතිතුමාට. ජිම්නාස්ට්ක් සංගමයේ සභාපතිවරයා විධියට මම කියන්න කැමැතියි, පසුගිය කෙටි කාලය තුළ අපි Junior National Gymnastics Team එක විදේශගත කළ බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජිම්නාස්ට්ක් ක්‍රීඩකයෙක් ලෝක ඔලිම්පික් ක්‍රීඩා තරගයට සුදුසුකම් ලැබුවාට පස්සේ අපේ සිහිනය තමයි ජිම්නාස්ට්ක් ක්‍රීඩාවෙන් ඔලිම්පික් සඳහා කණ්ඩායමක් ඉදිරිපත් කිරීම. මම හිතනවා අපට ඒ හැකියාව තිබෙනවා කියලා. මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මිලියන හයක් වැය කරලා අදාළ ටිකට් පත් අරගෙන දීලා අපට ඒ අවශ්‍ය පහසුකම් ලබා දීලා ජිම්නාස්ට්ක් කණ්ඩායමට අනුග්‍රහය ලබා දීම සම්බන්ධයෙන්.

විශේෂයෙන් අපි කවුරුත් කථා කරන දෙයක් තමයි, ක්‍රීඩකයන්ට ලබා දෙන දීමනා ගැන. ක්‍රීඩකයන් 875කට රුපියල් 10,000 ගණනේ ගෙවන ක්‍රීඩකයන්ගේ සංචිතයක් තිබෙනවා. ලක්ෂය ගණනේ ගෙවන වෙනම ක්‍රීඩකයෝ සංඛ්‍යාවක් ඉන්නවා. එහෙම බැලුවාම අනෙකුත් ක්‍රීඩා සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කිරීමක් කරනවා කියන කාරණය මම ක්‍රීඩා සංගමයක සභාපතිවරයෙකු හැටියට අත්දැකීමෙන් දන්නා දෙයක්.

විශේෂයෙන්ම අද දිනයේදී දිගින් දිගටම කථා කරන්න යෙදුණු කාරණාවක් වන නිවාස සම්බන්ධයෙන් බදු අය කිරීම කියන කාරණය ගත්තාම පැහැදිලිව කියන්න ඕනෑ, ඒ කාරණය මේ රටේ සියයට 90කට, සාමාන්‍ය ජනතාවට බලපාන්නේ නැහැ කියන එක. විශේෂයෙන්ම අධි සුඛෝපභෝගී සහ විශාල වශයෙන් නිවාස හිමි, විශාල වශයෙන් මුදල් උපයන, අදාළ බදුවලට හසු නොවන, බදු ගෙවන්නේ නැති අය වෙනුවෙන් තමයි මේ කියන කාරණය ඉස්මතු වෙන්නේ. ඒ නිසා සාමාන්‍යයෙන් නිවසක් හිමි; ගෙයක් තිබෙන, සාමාන්‍යයෙන් ගෙයක් කුලියට දීලා තිබෙන කෙනෙකුට ඒ සම්බන්ධයෙන් බිය වීමට අවශ්‍ය නැහැ කියන කාරණය අපි මේ අවස්ථාවේ අවධාරණය කරන්න ඕනෑ.

අද අතිගරු ජනාධිපතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් - Supreme Court Determination එකක් - සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළා. අපි කවුරුත් දන්නවා, පාර්ලිමේන්තුවේ බලය ප්‍රකාරව තමයි අධිකරණය ක්‍රියාත්මක වෙන්නේ කියන එක. ජනතාවගේ පරමාධිපත්‍ය බලය පාර්ලිමේන්තුව හරහා තමයි අධිකරණ තුළින් ක්‍රියාත්මක වෙන්නේ. එතකොට අද විපක්ෂය නියෝජනය කරන සුමන්තිරන් මන්ත්‍රීතුමා පවා ඒ අදාළ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ලබා දීපු තීන්දුව සම්බන්ධයෙන් ප්‍රකාශ කළේ, මෙතැන ගැටලුවක් තිබෙනවා කියන එකයි. ඒ ගැටලුව තුළ විශේෂ කාරක සභාවක් පත් කරනවාට වඩා මේ ගැටලුව සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරයා විමසලා ඒ ගැටලුව විසඳුවා නම් හොඳයි කියන කාරණය විපක්ෂය තුළිනුත් මතු කළා. විපක්ෂයේ සමහර අය "ශ්‍රේෂ්ඨාධිකරණයට ඇඟිල්ල දිගු කරනවා" කියන කාරණය නොදැනුවත්ව ප්‍රකාශ කළත්, නීතිය දන්නා, නීතිය ගැන පරිචයක් තිබෙන සුමන්තිරන් මන්ත්‍රීතුමා වාගේ අය පවා මේක ගොඩින් බේරා ගන්න, මේ පනත් කෙටුම්පත සම්පූර්ණයෙන් වෙනස් කිරීමට අදාළව කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් සාධනීය කාරණා එල්ල කරපු බව අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. යම් කාරණා තුළ ඔය කියන විධියට යම් අඩුලුහුඩුකම් තිබෙනවා නම් ඒ අඩුලුහුඩුකම් වෙනස් කර ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා.

අද බොහෝ දෙනෙක් ප්‍රකාශ කරන දෙයක් තිබෙනවා. වර්ගවාදය, ජාතිවාදය, නොයෙක් නොයෙක් පුද්ගල භේද කිරීම් එක්ක තමයි අද සමහර වෙලාවට දේශපාලනය කරගෙන යන්නේ. සමහරු හිතනවා, තරුණ උදව්ය එක්ක විතරක් දේශපාලනය කළාම හරි කියලා. සමහරු වයසක මිනිසුන්ව එපා කියනවා. සමහර මිනිසුන් "නාකි එළවමු" කියනවා. මේ සම්බන්ධයෙන් මම විස්තර කිරීමක් කරන්න කැමැතියි.

අපි දන්නවා ලංකාවේ ජනගහනයෙන් සියයට 20ක් වයස අවුරුදු 60ට වැඩි වැඩිහිටියෝ බව. ඒ කියන්නේ ලක්ෂ 40කට ආසන්න වශයෙන් ඉන්නේ වැඩිහිටියන් වර්ගීකරණයට වැටෙන පිරිසක්. ඔවුන් වයසට ගියේ නිකමුන් වශයෙන් නොවෙයි, මේ රටේ ආර්ථිකය ගොඩනැඟීමට සහ ඉදිරි පරම්පරාව ගොඩනැඟීම වෙනුවෙන් මේ රට දුවා-දරුවන් දායාද කළ වැදගත් පුරවැසියන් වශයෙන්. එහෙත් මාලිමාවේ, එහෙම නැත්නම් ජේවීපී එකේ දේශපාලන මතය වී ඇත්තේ රටේ වැඩිහිටි පිරිස තවදුරටත් වැඩකට ඇති පිරිසක් නොවන බවයි. ඒ ආකාරයේ තත්ත්වයක් අද ජේවීපී එකේ වේදිකාවල අපි දකිනවා. ඔවුන්ට අනුව රටේ ආර්ථික අර්බුදයට ප්‍රධාන හේතුව වී ඇත්තේ රටේ වැඩිහිටියන්. ඒ නිසා ඔවුන්ගේ ප්‍රධාන සටන් පාඨය වී ඇත්තේ "නාකි එළවමු" යන්නයි. ජේවීපී එක, එහෙම නැත්නම් මාලිමාව වශයෙන් වෙස් පෙරළුණද, ඔවුන්ගේ දේශප්‍රේමී අතීතය ගත්තාම එදා, "ජේ.ආර්. මරමු" වශයෙන් තාප්පවල සටන් පාඨ ලිව්වේද අද "නාකි එළවමු" යැයි කියන ජේවීපී විමුක්තිකාමීන් විසින්ම තමයි. එදාත් අන්තගාමී ප්‍රතිපත්තියකින් කටයුතු කළ ඒ පිරිස අදත් එවැනිම ප්‍රකාශ කරමින් ජනතාව තුළ සමාජයේ තවත් පිරිසක් සම්බන්ධයෙන් වෛරය, ද්වේෂය වපුරන්නේ කුමක් වෙනුවෙන්ද? ඔවුනට අනුව නාකි ටික එළෙව්වාම රටේ ප්‍රශ්න අවසන් වන්නේද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රකාශයේ සාමාන්‍ය අර්ථය නම් තමන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් දිනාගත හැක්කේ තවත් කොටසකගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් යටපත් කිරීමෙන් පමණක් බව මේ ප්‍රකාශය කළ කාන්තාව පිළිගන්නා බවයි.

එක් පැත්තකින් එය ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනි අන්තවාදී ප්‍රකාශයක්. ඒ නිසාම යම් දේශපාලන මතයක් ඇති තැනැත්තෙක් දේශපාලන වේදිකාවේ කරන ප්‍රකාශය එම දේශපාලන ව්‍යාපාරයට සෘජුව බලපානු ලබනවා. විශේෂයෙන්ම මේ හා සමානම කරුණක් ජාතික ජන බලවේගයට -ජේවීපී එකට- සම්බන්ධ එක්තරා නළුවෙක් මෑතකදී ප්‍රකාශ කළා. වයසක කෙනෙකුට ගෙදර යතුරක් දෙනවාදැයි ඔහු ප්‍රශ්න කළා. ඒ තුළින් ඔහු ව්‍යංගයෙන් සඳහන් කළේ වැඩිහිටි තැනැත්තන් සමාජයේ තීරණ ගැනීමේ අවස්ථාවලින් ඉවත් කළ යුතු බවයි. ජාතික ජන බලවේගයේ පිරිස් විසින් ම එවැනි අන්තවාදී ප්‍රකාශ කරනුයේ, එය ඔවුනේග් පක්ෂයේ මතය ද යන්න ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන සාමාන්‍ය ජනතාව ප්‍රශ්න කළ යුුතුයි. -මම හිතන්නේ එහෙම කිව්වාට අසල්වැසි ඉන්දියාව, ආර්ථික වශයෙන් ඉහළ නැඟලා තිබෙන ඉන්දියාව 73 වියේ පසුවෙන ඉන්දියානු අග්‍රාමාත්‍යවරයාට තුන්වැනි වතාවටත් ඒ බලය ලබා දීලා තිබෙනවා.- එම ප්‍රකාශයේ බැරෑරුම්කම නම්, ජාතික ජන බලවේගය විසින් මේ ආකාරයට සමාජයේ එක්තරා කොටසක් කෙරේ පතුරවන සමාජ වෛරය, ද්වේෂය ඉන් නොනැවතී තවත් ජන වර්ගයක් කෙරෙහි, තවත් ආගමික පිරිසක් කෙරෙහි නැතහොත් තවත් දේශපාලන ව්‍යාපාරයක් කෙරෙහිද යොමු කළහොත් ඉන් ඇතිවෙන ප්‍රතිඵලය කුමක් විය හැකිද යන්නයි. ඒ නිසාම මොන යම් හෝ දේශපාලන ව්‍යාපාරයක් විසින් මේ ආකාරයට සිදු කරන ලබන අන්තවාදී හා ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනි ප්‍රකාශ ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන ශිෂ්ට සමාජයක් විසින් මුල් අවස්ථාවේ ප්‍රතික්ෂේප කළ යුතුයි.

ජේවීපී දේශපාලන අතීතය දෙස බැලීමේදී පෙනී යන්නේ, ඔවුන්ගේ දේශපාලන මතවාදයේ පැවැත්ම වෙනුවෙන් අනෙකුත් මතවාද සහ පුද්ගලයන් මර්දනය කළ යුතු බව ඔවුන් විශ්වාස

කිරීමයි. විශේෂයෙන් "ජේ.ආර්. මරමු" යනුවෙන් එදා කළ ප්‍රකාශය තුළද ගැබ් වී තිබුණේ අනෙකා සමඟ මතවාදීව ගැටීම නොව, අනෙකා විනාශ කිරීමේ ප්‍රජාතන්ත්‍ර විරෝධී, පැසිස්ට්වාදී හැසිරීමයි. සමාජයේ කිසියම් හෝ තැනැත්තෙක්, කණ්ඩායමක් විසින් තවත් තැනැත්තෙකු හෝ කණ්ඩායමක්හට සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් යටපත් කිරීම සඳහා මෙහෙයවීම, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත - ICCPR පනත - මඟින් ද වරදක් ලෙස දක්වා ඇත. ICCPR පනතෙහි 3 (1) වගන්තිය මඟින් දක්වා ඇත්තේ, කිසිම තැනැත්තකු යුද්ධය පැතිරවීම හෝ වෙනස් ලෙස සැලකීමට, එදිරිවාදිකම්වලට හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවලට යොමු කිරීම සංයුක්ත වන ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය සඳහා පෙලඹවීම් නොකළ යුතු ය යන්නයි.

තවද, එම පනතේ 3 (2) වගන්තිය මඟින් ඉහත වරදක් සිදු කිරීමට තැත් කරන, සිදු කිරීමට ආධාර හෝ අනුබල දෙන හෝ සිදු කරන බවට තර්ජනය කිරීම පනත අනුව වරදක් බව දක්වා ඇත. එසේ නම් සමාජයේ ජීවත් වෙන වැඩිහිටියන්ගේ දේශපාලන අයිතිවාසිකම් යටපත් කිරීමට සමාජයේ අනෙකුත් පිරිස් පොලඹවන ආකාරයේ, එහෙම නැත්නම් වැඩිහිටියන්හට හිමි දේශපාලන අයිතිවාසිකම් තුළ වෙනස්කම් කිරීමට ලක් කරන ආකාරයේ ප්‍රකාශයක් කිරීමට ඉහත ප්‍රකාශය සිදු කළ දේශපාලන ක්‍රියාකාරිනිය විසින් උත්සාහ දැරුවේ නම්, ඒ පිළිබඳව නීතියේ අවධානයද යොමු විය යුතු බව මෙහිදී සඳහන් කළ යුතුයි.

කෙසේ වෙතත්, දේශපාලන ව්‍යාපාරයක් තුළින් සමාජය බලාපොරොත්තු වනුයේ සමාජ ප්‍රගමනය සඳහා ඇති දායකත්වය මිස සමාජය තුළ එක් එක් කණ්ඩායම්, කොටස් කෙරෙහි වෛරය, ද්වේෂය වපුරමින් හෝ සමාජය ගෝත්‍රික තත්ත්වයට ගෙන ඒමේ ප්‍රාථමික දේශපාලන නැඹුරුවක් නොවන බව සියලු දේශපාලන පක්ෂ, කණ්ඩායම් සිහිපත් කළ යුතුය. එහිදී තමන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීමට තවත් පිරිසකගේ අයිතිවාසිකම් යටපත් කළ යුතු යැයි කිසිවෙකු ප්‍රකාශ කරන්නේ නම්, ඒ තුළ ගොඩ නැඟෙනුයේ විසංවාදී දේශපාලනයක් නොව පැසිස්ට්වාදී දේශපාලන ස්වභාවයක් බව බුද්ධිමත් ජනතාව අවබෝධ කර ගත යුතු වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ගැන විශේෂයෙන්ම සඳහන් කරන්නට යෙදුණේ පසුගිය කාලය පුරාවටම "නාකි එළවන්න ඕනෑ, නාකි පිටමං කරන්න ඕනෑ" කියන කාරණය සම්බන්ධයෙන් දිගින් දිගටම මේ දේශපාලන ව්‍යාපාරයක් තුළින් ගොඩ නඟන සමාජ මතය සම්බන්ධව මේ ගරු සභාවේ අවධානය යොමු කිරීම සඳහායි. අපි කවුරුත් දන්නවා, මේ අමාරු කාලය තුළ අපට දේශපාලන වශයෙන් විසංවාදී වෙලා, පැසිස්ට්වාදී, යුක්ති ස්වභාව ධර්මයට අනුකූල නොවන, ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමවලට අනුගත වෙන්න පුළුවන් කමක් නැහැ කියලා. නිදහසින් පසු පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි මුහුණ පෑ ප්‍රබලම ආර්ථික අර්බුදය හමුවේ මේ කටයුතු ඉදිරියට ගෙන යන්න අපට සිදු වෙනවා. ප්‍රධාන විපක්ෂය, ආණ්ඩුව ඇතුළු සියලු දෙනාම -අවශේෂ විපක්ෂය පවා- අද මේ ආර්ථික වැඩ පිළිවෙළ තුළ ඉස්සරහට යන්න ඕනෑය කියා කියනවා.

ඒ වැඩ පිළිවෙළ තුළ අපි පසුගිය කාලය පුරාවටම සමඟර අදේශපාලනික තීන්දු තීරණවලට නායකත්වය දුන්නා. ඒ වාගේම අපි දේශපාලනමය නොවන තීන්දුවලට කැමැත්ත දුන්නා. හැබැයි, ස්ථිරසාර තීන්දුවලට යන ගමන තුළ යම් පුද්ගලයෝ අසතුටු වෙන්න පුළුවන්. නමුත්, ඉදිරියේදී ස්ථාවර රජයක් බිහි කිරීම සඳහා නැවත වතාවක් IMF එකට යන එක නවත්වන්න නම් අපට සමඟර අවස්ථාවලදී නිත්ත බෙහෙත් බොන්න සිද්ධ වෙනවා. හැබැයි, ඒ නිත්ත බෙහෙත් බීම තුළ අපි රටක් හැටියට යම් ආකාරයකට සාධනීය දියුණුවක් ලබාගෙන තිබෙනවා කියන එක අපි කවුරුත් පිළිගන්නවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.38]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අපේ රටට විදේශ විනිමය ලැබෙන ක්‍රමවේද දිහා බැලුවොත්, සංචාරක ව්‍යාපාරය විශේෂයෙන් නම් කරන්න පුළුවන්. ආර්ථික අර්බුදය හේතුවෙන් රට කඩා වැටුණු නිසා බොහෝ ක්ෂේත්‍ර තවමත් ගොඩ නහන්න බැරි වෙලා තිබෙනවා. නමුත්, සංචාරක ව්‍යාපාරය අද යම් මට්ටමකට හෝ ගොඩ නහන්නට පුළුවන් වීම ගැන පුරවැසියෙකු වශයෙන් මම සතුටට පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ සංචාරක කර්මාන්තයේ මූලික සාධක වන්නේ, වන අලින් සහ වෙරළ තීරයයි. වන අලි - මිනිස් ගැටුම නිසා අවුරුද්දකට වන අලි 450ක් පමණ විවිධ අමානුෂීය කාරණා හේතුවෙන් මිය යනවා. ඒ වාගේම, අලින්ගේ පහර දීම නිසා මිනිස් ඝාතන 177ක් වාගේ සංඛ්‍යාවක් වර්ෂයකට සිදු වෙනවා. වන අලි - මිනිස් ගැටුම හේතුවෙන් වූ හානි සඳහා වන්දි වශයෙන් 2023 වර්ෂයේදී කෝටි 25ක් ගෙවා තිබෙනවා. අපේ රටේ වන අලි - මිනිස් ගැටුම බෙහෙවින් භයානක තත්ත්වයක තිබියදී, එය අවම කරගෙන වන අලින් සංචාරක ව්‍යාපාරයේ දියුණුවට යොදා ගන්නේ කොහොමද කියන එක ගැන පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විධියට අපි වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. සංචාරක විෂය භාර ගරු ඇමතිතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාව තුළ නොසිටියත්, මම මේ කාරණය එතුමාගේ විශේෂ අවධානයට යොමු කරනවා. සංචාරක ව්‍යාපාරය කිව්වාම, සංචාරකයන් දිහාම බලාගෙන ඉන්නේ නැතිව, ඒ frame එකටම කොටු වෙන්නේ නැතිව එතැනින් ඔබ්බට ගිහින් අනෙක් ආයතනත් එක්ක එකතු වෙලා වන අලින් ආශ්‍රයෙන් ද සංචාරක ව්‍යාපාරය ගොඩ නහන්න කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. එතැනදී සමහර විට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් එක්ක එකතු වෙලා වැඩ කටයුතු කරන්න සිදු වේවි. එහෙම එකතු වෙලා සංචාරක ව්‍යාපාරය තවදුරටත් වර්ධනය කිරීමට කටයුතු කරන්න කියා මා විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

අනෙක් ප්‍රධාන සාධකය තමයි වෙරළ. අද ලෝකයේ වෙරළ ශ්‍රේණිගත කිරීමක් සිදු වනවා, Blue Flag Beaches කියලා. ඒ කියන්නේ, සංචාරක ව්‍යාපාරය සඳහා වෙරළ පාවිච්චි කරන ක්‍රමය අනුව හොඳම වෙරළට ලබා දෙන සහතිකයයි. කනගාටුවට කාරණය වන්නේ, අපේ රටේ කිසිම වෙරළකට ඒ සහතිකය තවමත් ලබාගෙන නොමැති වීමයි. ලෝකයේ රටවල් 50කට වැඩි ප්‍රමාණයක වෙරළ 4,000ක් පමණ Blue Flag Beach සහතික අරගෙන තිබෙනවා. පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට සංචාරක අමාත්‍යාංශයේ නිලධාරීන් කැඳවා අපි සාකච්ඡා කළා, Blue Flag Beach සහතිකය ශ්‍රී ලංකාවට ලබා ගැනීම ගැන. ඇත්තටම අපි අවුරුදු 10ක් තිස්සේ ඉඳන් මේ ගැන කථා කරනවා. අපේ රටේ සංචාරක ව්‍යාපාරය ගොඩනඟන කොට Blue Flag Beach status එක ඉතා වැදගත් වනවා. මොකද, ලෝකයේ විවිධ රටවල සිටින

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

සංචාරකයන් තමයි අපි අපේ රටට ගෙන්වන්නේ. එහෙම නම් Blue Flag Beach සහතිකය අපේ රටේ එක වෙරළකට අදාළව හෝ ලබා ගන්න ඕනෑ. ඒ නිසා සංචාරක අමාත්‍යාංශයත් එක්ක අපි මේ ගැන සාකච්ඡා කළා. ඒ අයත් මේකට එකඟයි. ඒ සහතිකය ලබා ගැනීම සඳහා මට මතක විධියට ඒ අය beaches 39ක් නම් කර තිබෙනවා. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මේ සඳහා නිර්ණායක නිකුත් කිරීමටත් ලැහැස්ති වෙලා ඉන්නවා. විෂය භාර ගරු ඇමතිතුමා මේ අවස්ථාවේ මේ ගරු සභාව තුළ නොමැති වීම ගැන මම ගොඩක් කනගාටු වෙනවා. මොකද, සංචාරක ව්‍යාපාරය ගැන අප කථා කරන කොට ගරු ඇමතිතුමා අහගෙන හිටියා නම් හොඳයි. එසේ නොවීම කනගාටුවට කාරණයක්. Blue Flag Beach status එක හදා ගන්න සංචාරක අමාත්‍යාංශයත් මීට වඩා වැඩි ප්‍රමුඛතාවක් දක්වන්න ඕනෑ කියා අපි විශ්වාස කරනවා. සංචාරක අමාත්‍යාංශය මේ ගැන දැඩි අවධානයක් යොමු කර නොතිබීමත් ප්‍රශ්නයක්. සමහර විට ඔවුන්ට හිතෙන්න පුළුවන්, Blue Flag Beach සහතිකය ලබා ගැනීම සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට අයත් කටයුත්තක් කියලා. නමුත් එහි ප්‍රයෝජනය ගන්නේ, සංචාරක අමාත්‍යාංශයයි. පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකයන් වශයෙන්, එම කමිටුව වශයෙන් අපි කියනවා, අප මේ සඳහා platform එකක් හදන බව. එතකොට මාස දෙකතුනක් ඇතුළත Blue Flag Beach concept එක ලංකාවට ගෙනැල්ලා ලෝකය පිළිගන්නා මුහුදු වෙරළ ලංකාවේ ස්ථාපිත කිරීම සඳහා කටයුතු කිරීමෙන් සංචාරක ව්‍යාපාරය මීටත් වඩා ඉස්සරහට ගෙන යන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

Blue Flag Beach සහතිකය දෙන කොට විශේෂයෙන් බලන්නේ, ඒ වෙරළේ -beach එකේ- තිබෙන ජලයේ ගුණාත්මකභාවය, පාරිසරික සහ අධ්‍යාපන තොරතුරු, පරිසර කළමනාකරණය සහ ආරක්ෂාවයි. ඒ නිසා ඒවා ගැන දැඩි අවධානය යොමු කරලා කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. විපක්ෂය වශයෙනුත්, කමිටුවක් වශයෙනුත් අපි සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න අවශ්‍ය සහයෝගය ලබා දෙන බව කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.43]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ වරුවේ ජනාධිපතිතුමා ඇවිල්ලා ආරෝපිත කුලී ආදායම් බද්ද ගැන ප්‍රකාශයක් කළා. මා ඒ සම්බන්ධයෙන් විශේෂයෙන් කියන්න ඕනෑ. ඒ බද්ද මොකටද ගෙනෙන්න හදන්නේ? මේ අවුරුද්දේ රාජ්‍ය ආදායම ලෙස දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13.5ක ඉලක්කයක් සම්පූර්ණ කර ගන්න පුළුවන් වන නිසා ඒ අනුව ඊළඟ අවුරුද්දේ ඉලක්ක සපුරා ගැනීම සඳහා තවත් සියයට 1.5ක් වැඩි කර ගන්නයි. ඇත්ත වශයෙන්ම මේ කියන සියයට 13.5ක ඉලක්කය සපුරා තිබෙන්නේ කොහොමද? Recovery of stolen assets සම්බන්ධ නීතිය ගෙනැල්ලා, සොරා කෑ දේපළ නැවත පවරාගෙන ද? එහෙම නැත්නම්, ධන කුවේරයන්ට පැනවීමට නියමිත ධන බද්ද ගෙනැල්ලා ද? එහෙම නොවෙයි.

එක පැත්තකින්, මේ රටේ සාමාන්‍ය අහිංසක මිනිසුන් පරිභෝජනය කරන පරිප්පු, සීනි, හාල්, තේකොළ ඇතුළු හැම ද්‍රව්‍යයකටම සියයට 18ක් දක්වා VAT වැඩි කරලා, ඒ මිනිසුන්ගේ රිරි මාංශ උරා බොනවා වාගේ තව තවත් බදු ගහමින් යනවා. අනෙක් පැත්තෙන්, මේ රටේ පෞද්ගලික අංශයේ සේවකයන්ට දෙපාරක් බදු ගෙවන්න සිදු වෙලා තිබෙනවා. එක පැත්තකින්, උපයන විට ගෙවීමේ බද්ද වැඩි කර තිබෙනවා. ඔවුන් උපයන විටම බදුවලින් මිරිකලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, ඉතිරි වන සල්ලිවලින් වෙළෙඳ පොළට ගිහින් බඩු භාණ්ඩ මිල දී ගන්න කොට ඒවාටත් වැට් එක වැඩි කර තිබෙනවා. මේ හැම දෙයකින්ම මිරිකලා තමයි බදු අරගෙන තිබෙන්නේ. තවත් පැත්තකින්, කරන්ට් බිල, වතුර බිල වැඩි කරලා මිනිසුන්ව හිර කරලා තිබෙනවා. ගෙවල් ලක්ෂ 10ක කරන්ට් කපලා තිබෙන්නේ. එහෙම තියෙද්දී තමයි ජනතාව වාසය කරන නිවාසවලට බද්දක් ගහන්න හදන්නේ. අමාරුවෙන් හරි හම්බ කරගෙන හදා ගත්තු නිවසටත් බද්දක් ගහන්න යනවා කියන්නේ, හෙණ ගහනවා වාගේ අපරාධයක්.

ජනාධිපතිතුමා මේ ගරු සභාවේදී කිව්වා, කෙනෙකුගේ පළමු දේපළ කුලී ආදායම් බද්දෙන් නිදහස් කරනවා කියලා. නමුත්, මුදල් අමාත්‍යාංශයේ නිවේදනය අනුව, ලබන අවුරුද්දට සියයට දශම දෙකක් සහ ඊළඟ අවුරුද්දට සියයට දශම හතරක් වැඩි කර ගන්න පුරෝකථනය කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියයට දශම හතරක් කියන්නේ, රුපියල් බිලියන 100ක් විතර. රුපියල් බිලියන 100ක් විතර වැඩි කර ගන්න නම්, අඩුම තරමින් එක ගෙදරකින් රුපියල් ලක්ෂයක් ගන්න ඕනෑ. ඔය කියන කථාව ඇත්ත නම් ඒ වාගේ ගෙවල් ලක්ෂ 10කට බදු ගහන්න ඕනෑ. එහෙම නම්, ඒක ලංකාවේම තිබෙන ගෙවල්වලින් කොච්චර ප්‍රතිශතයක්ද? මෙය, නිර්ණායක පෙන්වන්නේ නැතිව හංගලා ගහන්න හදන ගේමක්. මොකද, recovery of stolen assets සම්බන්ධ නීතිය සහ ධන බද්ද ගෙනැල්ලා රජයේ ආදායම වැඩි කරලා ණය ගෙවීමේ හැකියාව වැඩි කර ගත්තා නම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මේ වාගේ කොන්දේසි දමන්න වෙන්නේ නැහැ. මට පෙනෙන විධියට මේ අයට රට හීනෙන් පෙනෙන්නේත් බදු ද කොහේද. මොකද, උපයන විට ගෙවීමේ බද්ද අය කරනවා. අනෙක් පැත්තෙන්, වැට් වැඩි කරනවා. ඊළඟට, ගෙවල්වලට බද්දක් ගහන්න හදනවා. මේ විධියට ජනතාව ජීවත් කරවන්නේ කොහොමද කියලා මට නම් තේරෙන්නේ නැහැ. මම දැක්කා, "රනිල්ට ඉඩ දෙමු" කියලා තේමා පාඨයක්. ඉඩ දෙන්නේ මේ විධියට බදු ගහමින් යන්නද? ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇනගෙන ඇනගෙන යනවා වාගේ ගෝඨාභය රාජපක්ෂ රට බංකොලොත් කළාට පස්සේ ජනතාවට බදු ගහගෙන ගහගෙන යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි ඉතා පැහැදිලිව මේ කාරණය කියන්න ඕනෑ. මා හිතන්නේ නැහැ, මේක සම්මත කර ගන්න පුළුවන් වෙයි කියලා. මොකද, තව දවස් 28කින් ජනාධිපතිවරණය කැඳවීමේ බලය මැතිවරණ කොමිසමට ලැබෙනවා. එක එක සිහින කථා කියලා, සිහින ලෝකවලට ගෙනිහිල්ලා, එක එක වරදාන, වරප්‍රසාද දීලා, බාර් පර්මිට් දීලා, විමධ්‍යගත අරමුදල් ලබා දීලා ඡන්දය ගන්න හදනවා නම් ඒක හරියන්නේ නැහැ කියන එක මම

පැහැදිලිව කියන්න ඕනෑ. මොකද, මේකට අත ඔසවන එක්කෙනෙකුටවත් ඡන්දය ඉල්ලාගෙන ගමට යන්න නම් ලැබෙන්නේ නැහැ. මම ඒ බව ඉතාම පැහැදිලිව කියනවා.

අද උදේ වරුවේ ජනාධිපතිතුමා කිව්වා, කොවිඩ් වසංගතය පැවැති කාලයේ බලෙන් මෘතදේහ ආදාහනය කිරීමේ තීරණය අධිකරණ තීන්දුවකින් දුන්නා කියලා. පට්ටපල් බොරු නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවැනි අධිකරණ තීන්දුවක් දීලා නැහැ. ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුව මුස්ලිම් ජාතිකයන්ගෙන් පළිගැනීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ මත විමසීමක්වත් කරන්නේ නැතිව, කිසිදු විද්‍යාත්මක හේතුවක් නැතිව, ඔවුන් විසින් පත් කර ගත්තු බොරු කමිටුවක් හරහා තමයි ඒක කළේ. මොකද, 2019 ජනාධිපතිවරණයේදී එම ජනතාවගේ ඡන්ද තමන්ට නොලැබුණු නිසා පළිගැනීමේ චේතනාවෙන් තමයි ඒක කළේ. අපි ජනාධිපතිතුමාට, ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ දෙයක් තිබෙනවා. හොරුත් එක්ක හිටියාට කමක් නැහැ; හැබැයි, අපරාධකාරයෝ රකින්න ලෑස්ති වෙන්න එපා. ඒ මිනී මැරුම්වලට, ඒ අපරාධවලට ඒ ගොල්ලන් වග කියන්න ඕනෑ. ඊළඟට ආණ්ඩුව මාරු වුණාම ඒ තීන්දුව ගත්තේ කොහොමද, ඒ තීන්දුව ගන්න හවුල් වුණේ කවුද කියන එක ගැන පරීක්ෂණයක් කරන්න ඕනෑ. පරීක්ෂණයක් කරලා දඬුවම් දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතුරෙන් කොවිඩ් බෝ වෙනවා කියන එක බොරුවක් වන නිසාම එවකට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාට මම කථා කළා. මම කථා කරලා එතුමාගෙන් ඇහුවා, "ඔබතුමන්ලාගේ ආණ්ඩුව කියනවා, වතුරෙන් කොවිඩ් බෝ වනවා කියලා. එහෙම නම් ලංකාවේම ඉන්න කොවිඩ් රෝගීන් ඇයි IDH රෝහලට ගෙනෙන්නේ? එතකොට IDH රෝහලෙන් පිට කරන වතුර නිසා කොළොන්නාව නගරයේ වෙසෙන සියලුදෙනාටම කොවිඩ් බෝ වෙයි. ඒ වාගේම IDH රෝහලේ ඉන්න නර්ස් නෝනලා බෝඩ් වෙලා ඉන්න ගෙවල්වල උදවියටත් කොවිඩ් බෝ වේවි නේද?" කියලා. නමුත්, ඒ වෙලාවේ මහින්ද රාජපක්ෂ මැතිතුමා කිව්වේ, "පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න" කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතකද දන්නේ නැහැ පාකිස්තානයේ අගමැති ඉම්රාන් ඛාන් මැතිතුමා අපේ රටට ආපු දවස. එදා අපි උද්ඝෝෂණය කරලා, ඊට පස්සේ මම පාර්ලිමේන්තුවේදී එවකට අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් ප්‍රශ්නය අහන්න හදනකොට කථානායකතුමා මගේ කථාව බලෙන් නවත්වන්න හැදුවා. ඊට පස්සේ මහින්ද මහත්තයාට තේරිලා තමයි මට ප්‍රශ්නය අහන්න අවස්ථාව දුන්නේ. මම ප්‍රශ්නය ඇහුවාට පසුව තමයි එතුමා කොවිඩ් මෘත දේහ භූමදානය කිරීම සඳහා අවසර ලබා දෙනවා කිව්වේ. එහෙම නම් මම අහන ප්‍රශ්නය මේකයි. විද්‍යාත්මක හේතුවක් මත එවැනි තීරණයක් අරගෙන තිබුණා නම් මහින්ද රාජපක්ෂ මහත්තයා ඒ අවසරය දෙන්නේ කොහොමද? එහෙම නැත්නම්, කොවිඩ් මෘත දේහ ආදාහනය කරන්න අධිකරණ තීන්දුවක් හරහා නියෝගයක් දීලා තිබෙනවා නම්, මහින්ද රාජපක්ෂ මහත්තයා කොහොමද භූමදානය කරන්න අවසර දෙන්නේ? එම නිසා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මම කියනවා, හොරුත් එක්ක හෙළුවෙන් නටන්න එපා කියලා. හැබැයි, අපි ඉතාම පැහැදිලිව කියනවා, ජනාධිපතිතුමා ජාතිවාදියෙක් නොවෙයි. ඒක අපි දන්නවා. හැබැයි, මේ ජාතිවාදි හොර නඩය රැක ගන්න මේ වාගේ ප්‍රකාශ කරන්නේ ඇයි කියලා මට තේරෙන්නේ නැහැ. හැබැයි, එතුමාගේ ප්‍රකාශයෙන් මට එක දෙයක් තේරුණා. ඒ තමයි, එතුමා නැවත වතාවක් ඡන්දය ඉල්ලන්න බලාපොරොත්තුවක් නැහැ කියන එක. මොකද, එතුමා යාපනයට යනවා, මන්නාරමට යනවා. ඒ වාගේ හැම තැනකටම වාගේ යනවා සුළු ජාතික ඡන්ද ගන්න බලාගෙන. ගියාම වැඩේ ෆේල් බව තේරිලා ද කොහේද මේ කථාව කියන්නේ. කොවිඩ් මෘත දේහ ආදාහනය කිරීම නිසා මුස්ලිම් ජනතාව මොන තරම් වේදනාවකට පත් වුණාද කියන එක ජනාධිපතිතුමා හොඳටම දන්නවා. ඒ පිළිබඳව මුස්ලිම් ජනතාවගේ තිබෙන වෛරය, පීඩනය ජනාධිපතිතුමා හොඳටම දන්නවා. එය දැනගෙනත්, අද ඇවිල්ලා මේ වාගේ කථාවක් කියන්නේ මුස්ලිම් ඡන්ද හම්බ වෙන්නේ නැති නිසා තමයි. මෙහෙම කරනකොට ඉතින්, රාජපක්ෂලාගෙයි, චික්‍රමසිංහලාගෙයි වෙනසක් නැහැ කියන එක තමයි අපට තේරෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලාම්පුව නිවෙන්න කිට්ටු වුණාම පත්තුවෙනවා වැඩියි කියලා පැරණි සිංහල කථාවක් තිබෙනවා නේ. මේකත් ඒ වාගේද කියලා මට හිතෙනවා.

මගේ කථාව අවසන් කරන්න කලින් මම යෝජනාවක් කරන්න කැමැතියි. අද සංචාරක විෂය භාර ඇමතිතුමාගේ කථාවේදී කිව්වා, wildlife parksවල toilets ටික සකස් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා කියලා. ඒක හොඳයි. හැබැයි, ඒක කළා කියලා ඒක පුද්ගල සංචාරක වියදම - spending එක - වැඩි වෙන්නේ නැහැ. ඒ වැඩ පිළිවෙළ හොඳයි. ඒක නරකයි කියලා මම කිසිසේත්ම කියන්නේ නැහැ. ඒ වාගේම මම යෝජනාවක් කරන්න කැමැතියි. මම මීට පෙරත් අවස්ථා ගණනාවකදී පාර්ලිමේන්තුවේ මේ යෝජනාව කර තිබෙනවා. විශේෂයෙන්ම අපේ ආණ්ඩු තිබෙනකොටත් මේක යෝජනා කර තිබෙනවා. ඒ තමයි, ලංකාවේ තිබෙන wildlife parksවල තිබෙන හෝටල්වලින් අඩුම ගණනේ හෝටල් එකක් හෝ දෙකක් තෝරාගෙන ඒවා boutique hotels දක්වා develop කරන්න. එය ආණ්ඩුවට තනිව කරන්න බැරි නම් පෞද්ගලික ආයෝජන එකතු කරගෙන දියුණු කරන්න. ඒවායෙන් ඉහළ මුදලක් අය කරන්න පුළුවන්. මොකද, මේවායෙන් එන්නේ ඔක්කෝම ඩොලර්. යුරෝපීය සංචාරකයින් ඉලක්ක කරලා, pilot project එකක් විධියට ඒ කටයුත්ත ආරම්භ කරන්න කියලා මම යෝජනා කරනවා.

දැන් අපිත් එක්ක සංචාරක කර්මාන්තයේ තරගකාරීව ඉන්න අනෙකුත් රටවල් දිහා බැලුවාම ඔවුන් පොඩි දෙයත් ලොකු කරලා පෙන්වලා සංචාරකයින්ගෙන් ආදායම් උපයා ගන්නවා. නමුත්, මෙච්චර ස්වාභාවික සම්පත් තිබෙන අපේ රටේ ඒවා දියුණු කරන්න හැකියාව සහ අවස්ථාව තිබෙද්දීත් අපට ඒවා දියුණු කරන්න බැරි වීම පිළිබඳව මම කනගාටු වනවා. අපේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය තිබෙනවා. ලෝකයේ විවිධ රටවල තිබෙන travel martsවලට ගිහිල්ලා exhibitions තියන්න ඩොලර් මිලියන ගණන්වලින් මුදල් තිබෙනවා. ඒකට කමක් නැහැ. ඒක හොඳයි. හැබැයි ඒ travel mart එකේදී පෙන්වන දේ යථාර්ථයක් බව ලංකාවට ආවාම පෙනෙන්න ඕනෑ. හැම දාම මුහුදයි, නුවරඑළියයි විතරක් සංචාරකයන්ට පෙන්වලා බැහැ. ඒ නිසා wildlife tourism හරහා ඩොලර් ආදායම වැඩි කර ගැනීමට තිබෙන හැම opportunity එකක්ම පාවිච්චි කිරීම තුළින් අපට ඉදිරියේදී වාසිදායක තත්ත්වයක් අත් කර ගන්න පුළුවන්. ලෝකයේ හොඳම tourist destination එක බවට අපි තේරී තිබෙන බව කියනවා. සංචාරකයන් මෙපමණ ප්‍රමාණයක් ආවා කියනවා. ඒ ඔක්කෝම හොඳයි. හැබැයි, ඒ පැමිණෙන සංචාරකයන් වියදම් කරන මුදල් ප්‍රමාණය කොපමණද? එම නිසා ලංකාවට එන සංචාරකයින්ගෙන් wildlife tourism එක හරහා විශාල මුදලක් වියදම් කරවීමේ හැකියාව තිබෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා මම සංචාරක ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ඊළඟට ගරු ඇමතිතුමා ක්‍රිකට් ක්‍රීඩාව ගැන සඳහන් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ දුප්පත් දෙමව්පියන්ගේ දරුවන් යන පාසල්වල ලෙදර් බෝල ක්‍රීඩාව නැහැ. ඒ ළමයින්ට පුළුවන් ජාතික කණ්ඩායම ක්‍රීඩා කරනකොට අත්පුඩි ගහන්න හෝ හූ කියන්න හෝ හුරේ දාන්න විතරයි. ඒ නිසා ගමට ක්‍රිකට් ක්‍රීඩාව ගෙනියලා ඒ දරුවන්ගේ හැකියාව සහ දක්ෂතා තුළින් ජාතික කණ්ඩායමට එන්න පාර කපලා දෙන්න ඕනෑ. මොකද, පාලක මණ්ඩලවල, ක්‍රිකට් ක්ලබ්වල ඉන්නේ පොහොසත් පවුල්වල ඉපදුණු, ලොකු ඉස්කෝලවලට ගිය කට්ටිය. ඒ අයට ගමේ අය ගෙන ඒමේ වුවමනාවක් නැහැ. ඒ නිසා මම ඉතාම පැහැදිලිව කියනවා, ඒක කරන්න පුළුවන් බව. මම එක්තරා මාධ්‍ය ආයතනයක වැඩ කරනකොට ක්‍රිකට් තරගාවලියක් පැවැත්වුවා. නුවන් ප්‍රදීප් නමැති ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයාව බිහි කරන්න අපට ඒ වෙලාවේ පුළුවන් වුණා. ඒ නිසා ගරු ඇමතිතුමාට අපි කියන්න කැමතියි, අමාත්‍යාංශයයි, ක්‍රිකට් පාලක මණ්ඩලයයි එකතු වුණොත් මේ වැඩේ කරන්න පුළුවන් බව. ඒ සඳහා මූලික අත්තිවාරම දමන්න කියා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු නවයක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයකුගේ නමක් යෝජනා කරන්න.

ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(මාණ්පුමිකු සමන්පිරිය හේරත්)
(The Hon. Samanpriya Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatilleka)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு ஜகத் சமரவிக்ரம அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. JAGATH SAMARAWICKRAMA left the Chair, and THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM took the Chair.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කෞරව උරුප්පිනර් අවර්කළේ, තංකළුඩෙය උරෛයෛත් තොඩරුංකළ්!

[ப.ப. 3.53]

ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා
(මාණ්පුමිකු ඒ.එල්.එම්. අතාඋල්ලා)
(The Hon. A.L.M. Athaullah)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

நஹ்மதுஹூ வநுஸல்லி அலா ரஸூலிஹில் கரீம்.

කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, සුற்றுலாத்துறை மற்றும் காணி அமைச்சு சம்பந்தமான கட்டளைகளில் தேவையான திருத்தங்களைச் செய்வதற்காகக் கொண்டுவரப்பட்டிருக்கின்ற பிரேரணைகள் பற்றிய இன்றைய விவாதத்தில் எனக்கும் பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு மகிழ்ச்சியடைகின்றேன். குறிப்பாக, உல்லாசப் பயணத்துறை நமது நாட்டின் பொருளாதாரத்திலே பாரியதொரு பங்குவகிக்கின்ற, மிகவும் இன்றியமையாத ஒன்றாக மாறியிருக்கின்றது. அதுபோல, காணி அமைச்சைப் பொறுத்த வரை, இந்த நாட்டிலே இருக்கின்ற எல்லாக் காணிகளும் வளமுள்ளவை; இந்த நாடு ஒரு சொர்க்கபுரி என்று நாங்கள் கூறியிருக்கின்றோம். இருந்தாலுங்கூட, காணிகளை முறையாகப் பயன்படுத்துவதில் பிரச்சினைகள் இருப்பதனை நாங்கள் கண்கூடாகக் கண்டுகொண்டிருக்கின்றோம். பொதுவாக, நாட்டினுடைய மாண்புமிகு சனாதிபதி அவர்கள் காணி அற்றவர்கள் மற்றும் உறுதி வழங்கப்படவேண்டியவர்கள் தொடர்பாக இந்தச் சந்தர்ப்பத்திலே எடுத்திருக்கின்ற முயற்சியை நாங்கள் பாராட்டுகின்றோம். பொருளாதாரம் தொடர்பாகவும் காணி தொடர்பாகவும் இன்று எங்களுடைய சனாதிபதி அவர்களோடு நமது அமைச்சர் ஹரின் பர்னாந்து அவர்களும் இணைந்து முறையாகச் சில பணிகளைத் தொடர்வதையிட்டு நாங்கள் அவருக்கு வாழ்த்துகளைத் தெரிவித்திருக்கின்றோம்.

இருந்தாலும், கிழக்கு மாகாணத்திலே இப்பொழுது போலி ஆவணங்களை வைத்துக்கொண்டு காணிகளைக் கொள்ளையடிக்கின்ற ஒரு பெரும் இயக்கம் - team - உருவாகியிருக்கின்றது. பயங்கரவாதச் செயற்பாடு போன்று, போலி ஆவணங்கள் தயாரிக்கப்படுகின்ற நிலைமை உருவாகி இருப்பதனையும், அது தொடர்பாக அங்கு நடக்கின்ற விடயங்கள் சிலவற்றையும் நான் காலையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்தச் சபையிலே இருக்கின்றபோது குறிப்பிட்டிருந்தேன். மீண்டும் அவற்றை நான் இங்கு ஞாபகப்படுத்தலாம் என்று நினைக்கின்றேன்.

மூதூரிலே நடைபெற்ற ஓர் ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் ஒருவர் எழுந்து நின்று, "இங்கிருக்கின்ற எந்த வகையான காணியாக இருந்தாலும், போலி ஆவணங்களின் மூலமாக அவற்றைச் சிலர் சுவீகரித்துக் கொண்டிருக்கின்றார்கள். இந்த விடயம் தொடர்பில் அரச அதிகாரிகள் அல்லது உயர் அதிகாரிகள் விசாரிக்கின்றபொழுது, கஞ்சாவை அல்லது 'குடு'வை வைத்து அவர்களைப் பிடித்துத் தொழிலிருந்து நீக்கிவிடுவதாக அந்த அதிகாரிகள் மிரட்டப் படுகிறார்கள்" என்று பகிரங்கமாகவே தெரிவித்திருந்தார். அதுதொடர்பில் விசாரிக்கப்பட வேண்டுமென்று நான் திருகோணமலை மாவட்டத்திலுள்ள GA மற்றும் சம்பந்தப் பட்டவர்களுக்குக் கூறியிருந்தேன். நாம் முறையாக

ஆட்களுக்குக் காணிகளை வழங்கிவிட்டோம் என்று சொல்கின்ற அதேநேரம், இங்கு போலி ஆவணங்களை வைத்திருக்கின்றவர்களுக்கும் காணிகளைத் தேவையில்லாமல் சுவீகரிக்கின்ற கொள்ளையர்களுக்கும் காணிகள் கொடுப்பது தவிர்க்கப்பட வேண்டும். இதற்கானதொரு விசாரணைக் குழுவை நாங்கள் நியமிக்க வேண்டும். இதுதொடர்பில் விசாரணைகளைச் செய்து, குற்றவாளிகளைக் கண்டுபிடிப்பதற்கு நாங்கள் முயற்சி எடுக்கவேண்டும். இது அரச உத்தியோகத்தர்களைப் பயமுறுத்துகின்ற ஒரு பயங்கர வாதமாகும்.

அரச உத்தியோகத்தர்களை மாட்டிவிடுவதாகக் கூறி அச்சமூட்டி இவ்வாறு கொள்ளையடிக்கின்ற விவகாரமானது காணி சம்பந்தமான விடயங்களில் மாத்திரமல்ல; கல்வித் துறையிலும் இடம்பெறுவதுபற்றி நான் காலையில் பேசியிருந்தேன். பாடசாலைகளில் தங்களுக்குத் தேவையான விடயங்களைச் சாதகமாகச் செய்துகொள்வதற்காகத் திணைக்களத்திலுள்ள எல்லா இடங்களிலும் போலியான ஆவணங்களைத் தயாரித்து வைத்துக்கொண்டும், சில அதிகாரிகளைக் கையில் வைத்துக்கொண்டும் இவர்கள் கல்வித் துறையிலும் இவ்வாறான மோசடியான விடயங்களைச் செய்துகொண்டு வருவது தொடர்பில் நீதிமன்றங்களில் பல வழக்குகள் இருக்கின்றன. இதுதொடர்பில் முறையாக நீதிமன்றத்திற்குச் சென்று அதற்கெதிராக நீதியாக முறையிடுகின்றவர்களுக்கு எதிராக, இவர்கள் குறிப்பிட்டதுபோன்று 'குடு'வை வைத்து பொலிஸாரின்மூலம் கைப்பற்ற எடுத்த எத்தனம்கூட கிழக்கு மாகாணத்தில், அம்பாறை மாவட்டத்தில், அக்கரைப்பற்றுப் பிரதேசத்தில் இப்பொழுது ஒரு பேசுபொருளாக மாறியிருக் கின்றது. போலி ஆவணங்களைத் தயாரிக்கின்ற குற்றவாளி களான இந்தக் கொள்ளைக்காரர்கள் அரசாங்க அதிகாரிகளை மட்டுமல்ல, சமூக இயக்கங்களின் முக்கியஸ்தர்களையும் இவ்வாறு பயமுறுத்திக்கொண்டிருப்பது, நாம் இந்த நாட்டில் எந்தச் சட்டங்களை இயற்றினாலும் அதில் எந்தப் பயனும் இல்லை என்பதையே காட்டுகின்றது. நாங்கள் நீதிமன்றங் களில் மாத்திரம்தான் நம்பிக்கை வைக்க வேண்டிய நிலை இருக்கின்றது.

அதுமாத்திரமல்ல, அக்கறைப்பற்றில் இருக்கின்ற பெரிய ஆறான தில்லையாறு - உப்பாறு சுத்தப்படுத்தப்பட வேண்டும். இது கல்லோயாத் திட்டம் உருவாக்கப்பட்ட காலத்திலிருந்து சுமார் 70 ஆண்டுகளுக்கும் மேலாகச் சுத்தப்படுத்தப்படாமல் இருக்கின்றது. அதுமாத்திரமல்ல, அங்கு பயிர் செய்யப் பட்டுள்ள பல விவசாயக் காணிகள் தாழ்ந்த நிலையில் காணப்படுவதுடன், அவற்றைத் துப்புரவு செய்து அந்தக் காணிகளை மீட்க வேண்டும் என்பதற்காக அண்மையில் நீர்ப்பாசன அமைச்சினால் 30 மில்லியன் ரூபாய் பணம் ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. இந்தச் சூழ்நிலையில் காணிகளைக் கொள்ளையடிக்கின்றவர்கள், ஆவணங்களைப் போலியாக மாற்றியமைக்க நினைக்கின்றவர்கள், விவசாயக் காணிகளை முறையற்ற விதத்தில் பங்கிட நினைக்கின்ற வர்கள், பள்ளக் காணிகளை நிரப்பி மக்களிடம் ஆதாயம் பெறுகின்றவர்களுடைய தொல்லை நீண்டகாலமாக அந்தப் பிரதேசத்தில் இருந்து வருகின்றது. யாராவது அரச உத்தியோகத்தர்கள், திணைக்களத் தலைவர்கள் இதற்கு எதிராக நடவடிக்கை எடுக்க முயற்சியெடுத்தால், அவர்களை 'ரிப்பர்'ஆல் மோதுவோம்; கொல்லுவோம் என்றும், கஞ்சாவை வைத்து அல்லது இலஞ்சம் கொடுத்து பதவியை இழக்க வைப்போம் என்றும் சொல்கின்ற ஒரு நிலைமை நீண்ட காலமாக இருந்துவருகின்றது.

இந்தச் சட்டவிரோதமான செயல்களுக்கு எதிராகச் செயற்பட்ட, அக்கரைப்பற்றைச் சேர்ந்த ஆக்கில் என்ற நீர்ப்பாசனப் பொறியியலாளருக்கு இலஞ்சத்தைத் திணிக்க முயற்சித்து, அதனை அவருடைய கையில் கொடுக்க முடியாத நிலையில் அவரைக் கைது செய்விப்பதற்குச் சில குற்றவாளிகளும் வேறு சில அதிகாரிகளும் சேர்ந்து திட்டமிட்டுச் செயற்பட்டு அவரைக் கைதுசெய்வித்த ஒரு துர்ப்பாக்கியமான நிலைமை ஏற்பட்டிருக்கின்றது. இவ் வாறான செயற்பாடுகளினால் அந்தப் பிரதேச மக்கள் பயப்படுகின்றார்கள். அதுமட்டுமல்ல, கற்றவர்கள், அங்குள்ள உயர் அதிகாரிகள் தங்களால் அங்கு வேலை செய்ய முடியாதென்று கூறுகின்றார்கள். எந்தத் திணைக்களத்தின் உத்தியோகத்தர்களை எடுத்தாலும் பொறுப்பாளர்களை எடுத்தாலும், "இப்பொழுது நடக்கின்ற இந்தக் குற்றச் செயல்கள் நிறுத்தப்படாதிருந்தால் எங்களால் ஒன்றும் செய்ய முடியாது" என்று சொல்லுகின்றார்கள்.

அதுமாத்திரமல்ல, இதுதொடர்பாக முறையிடுவதற்குச் சரியான ஓரிடம் மக்களுக்கு வழங்கப்படவில்லை என்பதற்காக விசேட விசாரணைக் குழுவொன்றை அமைக்க வேண்டு மென்றுகூட நாங்கள் மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் இன்று காலையிலே கூறியிருக்கின்றோம். உண்மையாக, நேர்மையாகப் பணிபுரிகின்ற அரச உத்தியோகத்தர்களை நாம் பாதுகாக்க முடியாமற்போனால் எந்தவிதமான அரச கருமங்களையும் எம்மால் செய்துகொள்ள முடியாமற் போய்விடும். ஆகவே, போலி ஆவணங்களைத் தயாரிக்கின்ற வர்கள், தங்களுடைய வேலையை முடிப்பதற்காக அரச உத்தியோகத்தர்களுக்கு அச்சுறுத்தல் விடுப்பவர்கள் போன் றோரிடமிருந்து இந்த நாட்டை நாங்கள் பாதுகாக்க வேண்டுமென்ற செய்தியை இந்த இடத்திலே சொல்லிக் கொள்வதோடு, அரசாங்க உத்தியோகத்தர்கள் எல்லோரும் அரச நிலங்களைப் பாதுகாக்க ஒன்றுசேர வேண்டுமென்றும் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. (Dr.) Nalaka Godahewa. You have five minutes.

[අ.භා. 4.03]

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන රජය සම්බන්ධයෙන් මගේ හැම තිස්සේම තිබෙන විවේචනයක් තමයි වර්තමාන රජය සිද්ධ වෙන දේ වාර්තා කරන්න ඉතාම දක්ෂයි කියන එක. නමුත් ඉලක්කයක් ඇතිව යම් කිසි ගමනක් යන්නට මේ රජය වැඩ කරන බවක් අපට කිසි වෙලාවක පෙනෙන්නේ නැහැ. පසුගිය කාලයේ - 2022 දී - ආර්ථික අර්බුදයෙන් මේ රට කඩා වැටුණාට පස්සේ රටේ ප්‍රශ්න විසඳිලා කියලා රජය කොතරම් කිව්වත්, ඒ ආර්ථික අර්බුදයට හේතු වුණු මූලිකම ගැටලුව වන ණය අර්බුදය තවමත් විසඳිලා නැහැ. 2022 ඩොලර් බිලියන 80ක් පමණ තිබුණු අපේ ණය ප්‍රමාණය මේ වනවිට ඩොලර් බිලියන 100කට වඩා වැඩි වෙලා තිබෙනවා. එපමණක් නොවෙයි. ඒ වෙලාවේ තිබුණු බරපතළම ප්‍රශ්නය වුණේ ස්වෛරී බැඳුම්කර ප්‍රමාණයයි. 2022 අප්‍රේල් මාසය වෙනකොට ඩොලර් බිලියන 11.5ක ස්වෛරී බැඳුම්කර තිබුණා. ඒක ගෙවා ගන්න බැරිව තමයි ආර්ථිකය කඩා වැටුණේ. අද කියක් තිබෙනවාද? මහ බැංකු වාර්තාව කියවලා බලන්න. ඒක වෙබ් අඩවියේ තිබෙනවා. ඕනෑම පුරවැසියෙකුට ඒක බලන්න පුළුවන්. මේ වනවිට ගෙවන්නට තිබෙන ස්වෛරී බැඳුම්කර ප්‍රමාණය ඩොලර් බිලියන 14ත් පන්නලා තිබෙනවා. මොකද, ගෙවන්නේ නැතිව තිබුණු ණයත් එකතු වෙලා. පසුගිය කාලය තිස්සේම අපි කළේ මොකක්ද? අපි

[ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා]

ණය ගෙවන්නේ නැතිව ණය ගත්ත එක. අපි ගෙවපු නැති ණය ප්‍රමාණය ඩොලර් බිලියන හතක් පමණ වෙනවා, මේ අවුරුදු දෙක තුළ. ඊළඟට අලුතින් ගත්ත ණය ප්‍රමාණයක් තිබෙනවා. මෑතකදී ලැබුණු IMF එකේ තුන්වැනි වාරිකයත් එක්ක IMF එකෙන් පමණක් ඩොලර් බිලියනයක් ඇවිත් තිබෙනවා. ADB, World Bank සහ අනෙක් අයතනවලින් ගත්ත ණයත් එක්ක බැලුවාම ඩොලර් බිලියන තුනකට වඩා ණය අරගෙන තිබෙනවා. ඒ කියන්නේ මේ රජය ඩොලර් බිලියන 10ක් විතර අලුතින් විදේශ ණය විතරක් අරගෙන තිබෙනවා. එහෙම අරගෙන තමයි කියන්නේ සංචිත පොඩ්ඩක් ඉහළට ගිහින් තිබෙනවා කියලා. ඇත්ත වශයෙන්ම කියනවා නම් කිසිම ආකාරයකට අපේ රටේ ආර්ථිකයේ සංවර්ධනයක් සිදු වෙලා නැහැ. මම මේ කාරණය මූලිකව මතක් කළේ, මට තිබෙන්නේ විනාඩි කිහිපයක් නිසායි.

අද සංචාරක ක්ෂේත්‍රයට අදාළ රෙගුලාසි කිහිපයක් ඉදිරිපත් කර තිබෙන නිසා මම ඒ සම්බන්ධයෙන් යමක් කියන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ආර්ථික අර්බුදය දිහා බලනකොට අපට ඉතාම වැදගත් ක්ෂේත්‍රයක් තමයි සංචාරක ක්ෂේත්‍රය. මොකද, අපේ මූලික ප්‍රශ්නය තිබුණේ ගෙවුම් ශේෂය නේ. අපේ වෙළෙඳ පරතරය දිහා බැලුවාම හැම තිස්සේම කියනවා, අපට වෙළෙඳ පරතරයක් තිබෙනවා කියලා. අපි අපනයනය කරන භාණ්ඩ ප්‍රමාණයට වඩා ආනයනය කරන භාණ්ඩ ප්‍රමාණය හුඟක් වැඩියි; ආනයනය වැඩියි අපනයනයට වඩා. එතකොට මේ පරතරය -භාණ්ඩ ආනයනය හා අපනයනය අතර පරතරය- පියවා ගන්නට උත්සාහ කරන්නේ සංචාරක ව්‍යාපාරයෙන්, විදේශ ප්‍රේෂණවලින් වැනි කාරණා කිහිපයකින්.

අපිට මේ ගෙවුම් ශේෂ ගැටලුව විසඳාගන්න අවශ්‍ය නම්, විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ ක්ෂේත්‍රයක් තමයි සංචාරක ක්ෂේත්‍රය. මොකද, 2018දි සංචාරක ක්ෂේත්‍රයෙන් අපට ලැබුණා, ඩොලර් බිලියන 4කට වැඩි ආදායමක්. අපිට සංචාරක ව්‍යාපාරය යම්කිසි ඉහළ මට්ටමකට ගෙනියන්න පුළුවන් නම් මේ ප්‍රශ්නය විසඳාගන්න පුළුවන්. සංචාරක ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ. මම වර්තමාන රජයෙන් මේ කාරණය අහනවා. සංචාරක ක්ෂේත්‍රයට අදාළව මේ රජයේ ඉලක්කයක් ගැන අපි කිසිම වෙලාවක අහලා තිබෙනවාද? කිසිම ඉලක්කයක් නැහැ. එන සංචාරකයන් ගණන වාර්තා කරනවා. සංචාරකයෝ එන ප්‍රමාණය වැඩි වෙනවා කියලා කියනවා. වැඩි වෙනවා කියලා කියන්නේ මොනවාද? 2018 අපේ රටට සංචාරකයන් මිලියන 2.5ක් ආවා. දැන් සංචාරකයන්ගේ පැමිණීම යථා තත්ත්වයට එමින් පවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කළ යුත්තේ ඒක නොවෙයි. ඉලක්කයක් අනුව කටයුතු කිරීමයි.

ඉතිරි විනාඩියක කාලය ඇතුළත මම මේ කාරණයත් කියන්නම්. 2010 දී - යුද්ධයෙන් පස්සේ - සංචාරක මණ්ඩලයේ පළමුවැනි සභාපතිවරයා වුණේ මමයි. ඒ වෙලාවේ ලංකාවට ආපු සංචාරකයන් ප්‍රමාණය ලක්ෂ 4යි. ලංකාවට ආපු ගුවන් යානා ප්‍රමාණය ඉතා සීමිතයි. අපේ Airport එකේ අවශ්‍ය කරන capacity එක තිබුණේ නැහැ. හෝටල් කාමර තිබුණේ 15,000යි. ඒවාට භාරලක්ෂයකට වඩා යන්න බැහැ. අපි මොකක්ද කළේ? අපි ඉලක්කයක් දුන්නා, අවුරුදු 5ක් ඇතුළත -2016 වන විට- මිලියන 2.5ක සංචාරකයෝ මේ රටට ගෙන්වන්න ඕනෑ කියලා. ඒ වාගේම අපි තවත් ඉලක්කයක් දුන්නා, සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන්න ඕනෑ ආදායම ඩොලර් බිලියන 2.75ක් කියලා. ඊට පස්සේ අපි ඒකට වැඩ පිළිවෙළක් සකස් කළා. අපි ඒ වැඩ පිළිවෙළ සකස් කළේ හෝටල් කාමර ප්‍රමාණය 15,000 සිට 45,000ට ගෙනියන්නේ කොහොමද, ලංකාවට එන ගුවන් යානා ප්‍රමාණය වැඩි කරගන්නේ කොහොමද, ඒ දිශානති වැඩි කරගන්නේ කොහොමද, සංචාරකයන් ලංකාවට ආවාම යන්න තිබෙන සංචාරක ආකර්ෂණ ස්ථාන ප්‍රමාණය වැඩි කරගන්නේ කොහොමද කියන කරුණු මුල් කරගෙනයි.

මට වෙලාව නැහැ, සම්පූර්ණයෙන් මේ ගැන කියන්න. 2016 වෙනකොට එහි ප්‍රතිඵලය වුණේ මොකක්ද? 2016 වෙනකොට අපිට සංචාරකයන් මිලියන 2.5ක් ආවේ නැති වුණාට මිලියන 2ක් ඇවිල්ලා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන්න ඕනෑ ආදායම ඉලක්කගත ප්‍රමාණයට වඩා ඩොලර් බිලියනයකින් ඉහළ ගොස් තිබුණා. ඒ අනුව ඩොලර් බිලියන 3.5ක ආදායමක් අපි අත්පත් කරගෙන තිබුණා. එහෙමයි අපි ඉස්සරහට යන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතා සංක්ෂිප්තව කියන්න උත්සාහ කළේ අපිට සංචාරක ක්ෂේත්‍රය වැදගත් නම් කරුණාකරලා ඒකට ඉලක්කයක් දීලා ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලායි. හැබැයි මේ රජයට ඒක කරන්න හම්බ වෙන්නේ නැහැ. තව දවස් කිහිපයයි මේ රජය තිබෙන්නේ. ඉදිරියේ දී බලයට එන රජයක් සඳහායි මම මේ යෝජනාව කරන්නේ. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

අඩුත්තු, කෞරව ඉරාජාංක අමෛච්සර් සිවනේසතුරෛ චන්දිරකාන්තන් අවර්කළ්! උංකළුක්කු 09 නිමිඩංකළ් ඉරුක්කින්රන.

[ප.ව. 4.08]

ගරු සිවනේසතුරෛ චන්ද්‍රකාන්තන් මහතා (ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சிவநேசதுரை சந்திரகாந்தன் - கிராமிய வீதிகள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Sivanesathurai Santhirakanthan - State Minister of Rural Road Development)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சுற்றுலா அபிவிருத்திப் பிரதேசங்களைப் பிரகடனப்படுத்துவது தொடர்பிலான கட்டளைகள் சம்பந்தமான விவாதத்தில் நாங்கள் கலந்துகொண்டிருக்கின்றோம்.

எமது நாட்டின் சுற்றுலாத்துறை வளர்ச்சி சம்பந்தமாக நாங்கள் அனைவரும் அறிவோம். இப்பொழுது, நாட்டில் சுற்றுலாத்துறை மேம்பட்டிருக்கின்றது. முக்கியமாக, கிழக்கு மாகாணம் சுற்றுலாத்துறைக்குப் பெயர்போன ஒரு மாகாணமாக இருக்கின்றது. ஏற்கெனவே, அங்கு சுற்றுலா வலயங்கள் பிரகடனப்படுத்தப்பட்டு இருக்கின்றன. இருந்தாலும், சர்வதேச விமான நிலையத்திலிருந்து நேரடியாக அவ்வலயங்களுக்கு சுற்றுலாப் பயணிகள் வருவதென்பது மிகப்பெரிய பிரச்சினையாக மாறியிருக்கின்றது. அதற்குத் தீர்வாக அந்தப் பிராந்தியத்தில் இருக்கின்ற விமானப் போக்குவரத்து சீர்செய்யப்பட வேண்டும். சுற்றுலாப் பயணிகள் சர்வதேச விமான நிலையத்தை வந்தடைந்து, அங்கிருந்து ஓரிரு மணித்தியாலங்களுக்குள் எங்களுடைய பகுதிகளுக்கு வந்து சேராமலிருப்பது மிகப்பெரிய தாக்கத்தை ஏற்படுத்தி யிருக்கிறது. அதனைச் சீர்செய்வதற்கு கௌரவ அமைச்சர் அவர்கள் முயற்சி எடுப்பாரென நாங்கள் நம்புகின்றோம். நாங்களும் இதுதொடர்பில் கணிசமாகப் பேசியிருக்கிறோம். அந்தப் பிராந்தியங்களில் வாழுகின்ற மக்களுக்கு இருக்கின்ற சுற்றுலாத்துறையுடனான ஈடுபாட்டை இன்னும் அதிகரிக்க வேண்டும். அந்த வகையில், புதிய சுற்றுலா வலயங்களை உருவாக்கி, அங்கு அவர்களைச் சுதந்திரமாக இயங்கவிடுதல், அவர்களை வர்த்தகத்தில்

இணைத்துக்கொள்ளல், புதிய முதலீட்டாளர்களை இலகுவாக அணுகக்கூடிய வாய்ப்புகளை உருவாக்குதல், அந்தப் பகுதிகளில் வாழுகின்ற இளைஞர், யுவதிகள் இலகுவில் வேலைவாய்ப்புகளைப் பெறுவதற்கு ஊக்குவித்தல் போன்ற பணிகளைச் செய்யவேண்டுமென நான் நம்புகின்றேன்.

சுற்றுலாத்துறையுடன் ஒட்டிய பல முக்கிய விடயங்களை நான் இங்கு குறிப்பிட வேண்டும். 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலுக்குப் பின்னர், கிழக்கு மாகாணம் உட்பட முழு நாட்டிலும் சுற்றுலாத்துறை பாரிய வீழ்ச்சி கண்டு, பூச்சிய நிலைக்குச் சென்றது. இப்பொழுது மெல்ல மெல்ல சுற்றுலாத்துறை வளர்ச்சியடைந்து வருவதை நாங்கள் பார்க்கின்றோம். கிழக்கு மாகாணமானது, பல்லின மக்கள் வாழ்கின்ற ஒரு பிரதேசமாகும். அங்கு நான்கு மதங்களைச் சேர்ந்த, இரண்டு மொழிகளைப் பேசுகின்ற மக்கள் இருக்கிறார்கள். அந்த மாகாணத்தின் கலை, கலாசார அம்சங்கள், பாரம்பரிய கோவில்கள், விகாரைகள் மற்றும் மொழி, கலாசார விடயங்களைப் பார்ப்பதற்காக அங்குள்ள கிராமப் புறங்களுக்கு இப்பொழுதுதான் வெளிநாட்டு சுற்றுலாப் பயணிகள் மெல்ல மெல்ல வருகை தருகிறார்கள். யுத்தத்தின் பின்னர், அங்கு உட்கட்டமைப்பு அபிவிருத்திகள் இடம்பெற்று வந்தாலும், அங்குள்ள சுற்றுலாப் பிரதேசங்களை இன்னும் மேம்படுத்தவேண்டிய தேவை இருக்கின்றது. இதனை அரசாங்கம் மெல்ல மெல்லச் செய்து, இன்னும் உருப்படியான திட்டங்களை வகுத்துக்கொள்ள வேண்டும் என்பது என்னுடைய எதிர்பார்ப்பாகும். கௌரவ அமைச்சர் அவர்கள் coastal - கரையோர - அபிவிருத்தித் திட்டத்தில் இதற்கு முன்னுரிமை அளிப்பாரென நான் நம்புகின்றேன்.

தற்போது இச்சபையில் கௌரவ மரிக்கார் அவர்களைக் காணவில்லை. அவரைப் போன்றவர்கள் இச்சபையில் பேசும்போது, கொவிட்-19 தொற்றால் இறந்த முஸ்லிம் மக்களுடைய ஜனாஸாக்கள் மாத்திரம்தான் எரிக்கப்பட்டன என்பது போன்ற ஒரு மாயையைத் தோற்றுவித்திருந்தனர். அவர்களுடைய மதத்தின்படி, ஜனாஸாக்கள் எரிக்கப்படுவது பாவமாக இருக்கலாம். அதை நாங்களும் ஏற்றுக் கொள்கின்றோம். ஆனால், கொவிட்-19 தொற்றினால் இறந்த எல்லோருடைய உடலங்களும் ஆரம்ப காலப்பகுதியில் எரிக்கப்பட்டன என்பதை நான் இங்கு சுட்டிக்காட்ட வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த 15ஆம் திகதி வீரமுனை கிராம வீதி வரவேற்புக் கோபுரத்துக்கு அடிக்கல் நாட்டுவதற்கு என்னை அழைத்திருந்தார்கள். அந்த நேரத்தில் அங்கு மிக மோசமான, கவலையான ஒரு சம்பவம் இடம்பெற்றது. அதை நான் இங்கு சுட்டிக்காட்ட வேண்டும். நௌபர் என்ற ஒரு பொலிஸ் அதிகாரி, திட்டமிட்டு அங்கு ஒரு குழப்பம் இடம்பெறவிருப்பதாகச் சுட்டிக்காட்டியிருந்தார். வீரமுனை என்பது, 8ஆம் நூற்றாண்டில் கண்டி மன்னரின் மகாராணியான சீர்பாததேவி அவர்கள் வாழ்ந்த பிரதேசம் என்பதை அந்தப் பொலிஸ் அதிகாரியும் அம்பாறை மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் அரசியல்வாதிகளும் அறிந்துகொள்ள வேண்டும். இவ்வாறு பாரம்பரியமான, தொன்மையான ஒரு கலாசாரத்தைப் பின்பற்றி, வளைவுக் கோபுரமொன்றை அமைக்க முடியாத ஒரு சமூகமாக அந்தச் சமூகத்தைப் பின்தள்ளியிருப்பது எது? மேலும், எட்டாம் நூற்றாண்டு என்பது மக்காவில் நபிகள் (ஸல்) அவர்கள் பள்ளிவாசலை நிறுவிய காலப்பகுதியாகும். அம்பாறையில் இஸ்லாம் மதத்தைச் சார்ந்த 10க்கும் அதிகமான பெயர்ப் பலகைகளும் வளைவுக் கோபுரங்களும் இருக்கின்றன. அப்படி இருக்கையில், வீரமுனைக் கிராமத்துக்கான நுழைவாயிலில் வரவேற்புக் கோபுரத்தை - அந்த மக்களுக்கு உரித்துள்ள விடயத்தை - அமைக்க முடியாமல் இருப்பதன் பின்னணி என்ன? அன்றைய தினம் கடமையில் இருந்த பொலிஸ் அதிகாரியின் செயலைப் பார்க்கும்போது, சஹ்ரானுடைய கொள்கையை ஏற்றுக்கொண்டவர்களை இன்னும் பொலிஸ் திணைக்களம் வைத்துக்கொண்டிருக்கிறதா? என்ற பலத்த சந்தேகம் எனக்குள் எழுகிறது. ஒரு விடுமுறை தினத்தில் நீதிமன்றத்தைப் பிழையாக வழிநடத்தி, இராஜாங்க அமைச்சர் அவர்கள் இனக்கலவரம் ஒன்றை உண்டுபண்ண முனைகின்றார் என்ற தோரணையிலே அவர் தடையுத்தரவைப் பெற்றிருந்தார். வீரமுனைப் பகுதி 1990ஆம் ஆண்டு மிக மோசமாகப் பாதிக்கப்பட்ட ஒரு பகுதி என்பது உங்களுக்குத் தெரியும்! குறிப்பாக, அந்தப் பகுதியில் 'ஜிஹாத்' குழுவினரால் 400க்கும் அதிகமானவர்கள் கடத்தப்பட்டனர்; 55 பேர் சுட்டுக்கொல்லப்பட்டனர். இது போன்ற பல விஷயங்கள் அங்கு நடந்திருக்கின்றன.

யுத்தத்துக்குப் பின்னர், இந்த நாட்டில் சமூக நல்லிணக்கம், மேம்பாடு ஏற்பட வேண்டும் என்றே நானும் விரும்புகின்றேன். மாறாக, நடந்தவற்றைப் பேசிக்கொண்டிருப்பவன் நான் அல்லன். இருந்தாலும், அங்கு இன்னமும் மதத் தீவிரவாதம் ஆழமாக இருப்பதை என்னால் உறுதிப்படுத்தக்கூடியதாக இருக்கின்றது. நான் அங்கு பேசியவர்களிடம், "பெரியோர் களே! 4 கிராம சேவையாளர் பிரிவுகளை உள்ளடக்கிய, இந்துக்கள் அதிகமாக வாழ்கின்ற பகுதியில் அவர்களுடைய கலாசாரம் தாங்கிய ஒரு கோபுரத்தை அமைப்பதில் உங்களுக்கு என்ன பிரச்சினை இருக்கின்றது? என்று கேட்டேன்.

அதற்கு அவர்கள், "நாங்கள் காலையில் எழுந்து தொழிலுக்குச் செல்லும்பொழுது, அங்கிருக்கின்ற சிலைகளில் முழித்துவிட்டுச் செல்லக்கூடாது. அதுதான் எங்களுடைய பிரச்சினை" என்று மிகத் தெளிவாகச் சொன்னார்கள். இவர்களுடைய இந்தக் கோட்பாடானது, எங்களுடைய நாட்டில் இடம்பெற்ற 'ஈஸ்டர்' குண்டுவெடிப்புக்குக் காரணமான சஹ்ரான் சொன்ன ஓர் இறைக் கோட்பாட்டை வலியுறுத்துகின்றது. இந்த நாட்டில் 4 மதங்களைப் பிற்பற்றுகின்ற, 2 மொழிகளைப் பேசுகின்ற மக்கள் வாழுகின்றார்கள் என்ற அடிப்படையில், சகிப்புத் தன்மைகொண்ட ஒரு மக்கள் கூட்டத்தை உருவாக்கவேண்டிய பாரிய பொறுப்பு அனைத்துத் திணைக்களங்களுக்கும் இருக்கின்றது. நான் இந்தப் பொறுப்புமிக்க பாராளுமன்றத்தில் சொல்கின்ற விடயம் என்னவென்றால், இப்படியாக சமூகத்தைப் பிழையாக வழிநடத்துகின்றவர்கள் தொடர்பில் மீள் பரிசீலனை செய்து, அவர்களுக்குரிய இடங்களை வழங்க வேண்டும் என்றுதான். சஹ்ரானுடன் சேர்ந்து குண்டு வைத்தவர்களுக்கு மறுவாழ்வளிப்பதற்கு அல்லது அவர்களைச் சமூகத்துடன் இணைப்பதற்குப் பயிற்சிகளை வழங்காவிட் டாலும், திணைக்களத்தில் இருப்பவர்கள் நாட்டின் சட்டத்தை மதித்து நடக்கக்கூடிய அளவுக்கு திட்டங்களை வகுத்துக்கொள்ள வேண்டும் என்பது என்னுடைய வேண்டுகோளாகும். அந்த மக்களுடைய எண்ணங்களுக்கு இடங்கொடுக்கக்கூடிய வகையில், அம்பாறையில் வாழுகின்ற இஸ்லாம் மதத்தைப் பின்பற்றுகின்ற தலைவர்களும் பாராளுமன்ற உறுப்பினர்களும் மேற்குறித்த விடயத்தைச் சாதகமாகப் பரிசீலித்து, உரிய அனுமதியையும் அங்கீகாரத் தையும் வழங்க வேண்டும் என்பது என்னுடைய வேண்டுகோளாக இருக்கின்றது.

மிக நீண்ட காலமாக அழிவுகளைச் சந்தித்து வருகின்ற எமது நாடு, மீண்டும் மீண்டும் பிரச்சினைகளில் சிக்கித்

[ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා]

தடம்புரளாமல் இருப்பதற்கான ஓர் உறுதியான பொருளாதாரக் கட்டமைப்பை உருவாக்கவேண்டிய தேவை இந்த நாட்டுக்கு ஏற்பட்டிருக்கின்றது. பல்வேறு விமர்சனங்களைத் தாண்டி, மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள்தான் அதை ஓரளவேனும் ஏற்படுத்தியிருக்கின்றார். யுத்தத்துக்குப் பின்னர் பெற்ற கடன்களையெல்லாம் மீளச் செலுத்த வேண்டும். பெற்றிருக்கின்ற கடன்களை மீளச் செலுத்த வேண்டுமாக இருந்தால், உற்பத்தித் துறையை வளர்ச்சியடையச் செய்ய வேண்டும். எங்களுடைய மாகாணமான கிழக்கு மாகாணத்தில் விவசாயத்துறையையும் மீன்பிடித்துறையையும் மிக விரைவாகக் கட்டியெழுப்ப வேண்டும். எங்களுடைய இளமைப் பருவத்தில் பாசிக்குடாவில் இருந்த சுற்றுலா ஹோட்டல் ஒன்றுக்கு யப்பானியர்களும் ஜேர்மனியர்களும் அதிகமாக வந்து சென்றதாக எங்களுடைய பெற்றோர்கள் சொல்லியிருக்கிறார்கள். அந்த சுற்றுலா கலாசாரம் எல்லாம் இப்பொழுது இல்லாமல் போயிருக்கின்றது. சுற்றுலாத்துறை சம்பந்தமாகப் பேசுகின்றபொழுது, மாண்புமிகு சனாதிபதி அவர்களை மறக்க முடியாது. அப்படியான ஒருவர்தான் நாட்டின் தலைவராக இருக்கின்றார். இந்தச் சூழலில், சுற்றுலாத்துறை, காணி சம்பந்தமான பிரச்சினைகளுக்குத் தீர்வுகளைப் பெற்றுக்கொடுத்து, எங்களுடைய நாட்டை முன்னேற்றமடையச் செய்வதற்கும், எங்களுடைய பிராந்தியத்தில் இருக்கின்ற இளைஞர், யுவதிகளுக்குப் புதிய வேலைவாய்ப்புகளை ஏற்படுத்துவதற்குமான வழிவகைகள் பற்றி தலைவர்கள் சிந்திக்க வேண்டும்.

குறிப்பாக, மாகாணங்களுக்குரிய அதிகாரங்களைப் பெற்றுக்கொடுத்து, அவற்றை அதிகாரமுள்ள மையங்களாக மாற்றுகின்றபொழுது, மக்கள் நம்பிக்கைகொண்டு தங்களுடைய கலாசாரங்களையும் மத அடையாளங்களையும் பொருளாதார நிலைப்பாட்டையும் தாங்களாகவே நிர்ணயித்துக்கொள்வார்கள். அந்த அடிப்படையில், இந்த நாட்டில் ஒரு நல்ல எதிர்காலத்தை உருவாக்க நாங்கள் எல்லோரும் ஒன்றாகப் பாடுபட வேண்டும். அந்த வகையில், இதுபோன்ற சட்ட ஏற்பாடுகளை நானும் ஆதரிக்கின்றேன் எனக் கூறி, முடித்துக்கொள்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. M.S. Thowfeek. You have five minutes.

[பி.ப. 4.16]

ගරු එම්.එස්. තවිෆික් මහතා
(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)
(The Hon. M.S. Thowfeek)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சரும் விளையாட்டுத் துறை, இளைஞர் விவகார அமைச்சருமானவரினால் கொண்டுவரப்பட்ட சுற்றுலாப் பயணத்துறைச் சட்டத்தின் கீழான கட்டளை சம்பந்தமான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்கு எனக்கும் நேரம் ஒதுக்கித் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

எமது நாட்டைப் பொறுத்தவரையில் அது ஒரு தீவாக இருக்கின்றபடியால், சுற்றுலாப் பயணிகளைக் கவரக்கூடியதாகவும், சுற்றுலாத் துறைக்கு உகந்ததாகவும் அமைந்திருக்கின்றது. இன்று சில நாடுகளை எடுத்துக்கொண்டால், அங்கு செயற்கையாகச் சுற்றுலாத் துறையை மேம்படுத்துவதற்கான அபிவிருத்தி வேலைத்திட்டங்களைச் செய்வதைக் காண்கிறோம். ஆனால், எங்களுடைய நாட்டில் சுற்றுலாத் துறைக்குரிய எல்லா வளங்களும் இயற்கையாகவே அமைந்திருக்கின்றது. குறிப்பாக, கிழக்கு மாகாணத்தின் திருகோணமலை, மட்டக்களப்பு, அம்பாறை போன்ற மாவட்டங்களில் சுற்றுலாத்துறை அபிவிருத்தி வேலைத்திட்டங்களை முன்னெடுத்தால், அதன்மூலம் நாடு பாரிய வருமானத்தைப் பெறக்கூடியதாக இருக்கும். திருகோணமலை மாவட்டத்தை எடுத்துக்கொண்டால், புல்மோட்டை தொடக்கம் கரையோரப் பிரதேசங்களான நிலாவெளி, இறக்கக்கண்டி, குச்சவெளி ஈறாக கிண்ணியா முதல் மூதூர் வரையான பிரதேசங்களில் சுற்றுலாத் துறையை மேம்படுத்த முடியும். வெளிநாட்டுச் சுற்றுலாப் பயணிகள் மூலமாக மட்டுமல்லாது, நாட்டின் பிற மாவட்டங்களிலிருந்து வருகின்ற சுற்றுலாப் பயணிகள் மூலமாகவும் கூடிய வருமானத்தைப் பெறக்கூடியதாக இருக்கும். அதனால், அமைச்சு இதற்கான தகுந்த திட்டத்தை வகுத்து, உரிய நடவடிக்கைகளை எடுக்கவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, தற்போது எல்லா மாவட்டங்களிலும் காணி உறுதிப் பத்திரங்கள் வழங்கப்பட்டு வருகின்றது. திருகோணமலை மாவட்டத்தில் பல பிரதேசங்களில் காணி உறுதிப் பத்திரம் பெறாதவர்கள் இருக்கிறார்கள். அவர்களுக்கும் இத்திட்டத்தின்கீழ் காணி உறுதிப் பத்திரத்தை வழங்குவதற்கான நடவடிக்கைகளை அமைச்சு எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

இன்று நாட்டில் கிட்டத்தட்ட 35,000க்கும் மேற்பட்ட வேலையில்லாப் பட்டதாரிகள் இருந்துகொண்டு இருக்கிறார்கள். அவர்கள் கடந்த 2021, 2022, 2023ஆம் ஆண்டுக் காலப்பகுதிகளில் தங்களுடைய பட்டப்படிப்புகளை முடித்து, பல்கலைக்கழகத்திலிருந்து வெளியாகி, இன்று வரைக்கும் எந்தவிதமான நியமனமும் கிடைக்காமல் தங்களுடைய வயதைக் கழித்துக்கொண்டு இருக்கின்றார்கள். குறிப்பாக, திருகோணமலை மாவட்டத்தில் 700க்கும் அதிகமான வேலையில்லாப் பட்டதாரிகள் இருக்கின்றார்கள். எனவே, இவர்கள் தொடர்பில் அரசாங்கம் உடனடியாக ஏதாவதொரு திட்டத்தைக் கொண்டுவந்து, கடந்த 2019, 2020ஆம் ஆண்டுகளில் பட்டதாரிகளை அரசாங்க வேலைவாய்ப்புகளில் உள்வாங்கியதுபோன்று, குறித்த பட்டதாரிகளையும் அரசாங்க சேவைக்குள் உள்வாங்குவதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமென்று இந்த உயரிய சபையில் அரசாங்கத்திடம் வேண்டுகோள் விடுக்கின்றேன்.

இன்று மூதூர் பிரதேசத்தில் பாரிய ஆர்ப்பாட்டமொன்று நிகழ்ந்தது. காரணம், அந்தப் பிரதேசத்தின் பச்சனூர் பகுதியில் சாராயத் தவறணையொன்றைத் திறப்பதற்கான permit வழங்கப்பட்டு, அங்கிருக்கின்ற மக்களைத் திசை திருப்பும் வேலைகள் நடந்துகொண்டிருக்கின்றது. அந்தச் சாராயத் தவறணைக்கு அருகாமையில் கிறிஸ்தவ தேவலாயமொன்று இருக்கின்றது. அதையடுத்துள்ள இருதயபுரத்தில் பாடசாலையொன்று இருக்கின்றது. இவ்வாறான நிலையில் அங்கு ஒரு சாராயக் கடையைத் திறப்பதற்கான அனுமதி அரசாங்கத்தினால் வழங்கப்பட்டிருக்கின்றது. இது அந்தப் பிரதேசத்தில் இருக்கின்ற இளைஞர்களுக்கும் பெரியவர் களுக்கும் வழிகேட்டுக்கான ஏற்பாடாகும். இந்த

அனுமதிப்பத்திரம் கலால் திணைக்களத்தினூடாக - Excise Departmentஆல் - வழங்கப்பட்டிருக்கின்றது. அதனை உடனடியாக நிறுத்தும்வகையில் அதற்கான அனுமதியை இரத்துச் செய்யவேண்டுமென்று நான் கோரிக்கை விடுக்கிறேன்.

அடுத்து, திருகோணமலை மாவட்டத்தில் காட்டு யானைகளின் தொல்லை மிகவும் அதிகமாகக் காணப்படுகின்றது. கடந்த இரண்டு வாரங்களுக்குள் காட்டு யானை தாக்கி 3 பேர் மரணமடைந்திருக்கிறார்கள். ஆகவே, இதனைத் தடுப்பதற்கு அரசாங்கமும் Wildlife Conservation Departmentஉம் நடவடிக்கை எடுக்கவேண்டுமென்று கேட்டு விடைபெறுகின்றேன். Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ செல்வராசா கஜேந்திரன் அவர்கள். உங்களுக்கு ஐந்து நிமிடங்கள் இருக்கின்றன.

[பி.ப. 4.21]

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் சுற்றுலாப் பயணத்துறை மற்றும் காணி அமைச்சின் கீழான கட்டளைகள் தொடர்பில் விவாதம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. இந்தச் சந்தர்ப்பத்தில் நானும் ஒருசில விடயங்களைத் தமிழ்த் தேசிய மக்கள் முன்னணி சார்பாக முன்வைக்க விரும்புகின்றேன்.

இங்கே காணிச் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் கொண்டுவரப்படுகின்ற சந்தர்ப்பத்திலே மாண்புமிகு ஜனாதிபதி அவர்களால் நாட்டில் காணி உரித்து வழங்குவது தொடர்பான நடவடிக்கைகள் முன்னெடுக்கப்பட்டுக்கொண்டு இருக்கின்றது. வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள கிளிநொச்சி, முல்லைத்தீவு, வவுனியா, மன்னார் மற்றும் மட்டக்களப்பு, அம்பாறை, திருகோணமலை மாவட்டங்களிலே 50 வருடங்களுக்கும் மேலாகக் காணி உரித்துக்களைப் பெறாத பல்லாயிரக்கணக்கான தமிழர்கள் வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். இவர்களுக்குக் காணி உரித்து வழங்குவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டிருக்கவில்லை. குறிப்பாக, கிளிநொச்சி மாவட்டத்திலே நகரத்தை அண்டிய பகுதிகளில் உள்ள பெருமளவான காணிகள் நீண்ட காலமாக அனுமதிப்பத்திரக் காணிகளாகவே இருந்தன. இப்பொழுது நகர அபிவிருத்தி அதிகாரசபையினால் மேற்கொள்ளப்படுகின்ற சில நடவடிக்கைகள் காரணமாக, அந்தக் காணிகளை நீண்ட காலமாகச் சொந்தமாகக் கொண்டிருந்த மக்கள் அதற்கான அறுதி உறுதி இல்லாத நிலையில் அந்தக் காணிகளின் உரிமையை இழந்து, குத்தகைக்குக் குடியிருக்கவேண்டிய அல்லது கிட்டத்தட்ட 6,000,000 ரூபாய்க்கு மேற்பட்ட பணத்தை செலுத்த வேண்டிய ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது.

நீண்டகாலமாக அந்த இடத்தில் உரிமையோடு வாழ்ந்துவந்த அந்த மக்கள், அறுதி உறுதியைப் பெற்றுக்கொள்ளாத நிலையில், அண்மையில் கொண்டுவரப்பட்ட சட்ட நடவடிக்கைகள் காரணமாகத் தங்களுடைய உரிமையை இழந்து, அந்த இடத்தில் குத்தகைக்குக் குடியிருக்கின்றவர்களாக மாற்றப்படுவதென்பது மிகவும் கவலைக்குரிய ஒரு விடயமாகும். அவர்களுடைய அடிப்படை உரிமை மறுக்கப்படக்கூடாது. அவர்கள் அங்கு நீண்டகாலமாக வாழ்ந்து வந்தவர்கள். போர்ச் சூழல் காரணமாக அவர்களுடைய உரித்துகள் உறுதிப்படுத்தப்பட்டிருக்காத நிலையில், இப்பொழுது அவர்கள் குத்தகையாளர்களாக மாற்றப்படுவதை ஏற்றுக்கொள்ள முடியாது. ஆகவே, அவர்களுக்கு அந்தக் காணிகளைச் சொந்தமாக வழங்குவதற்குரிய நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும் என்பதை நான் இந்த இடத்தில் வலியுறுத்திக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். அத்தோடு, வடக்கு, கிழக்கில் நீண்டகாலமாக நிரந்தர உரித்தற்றவர்களாக இருக்கின்றவர்களுக்கு அனுமதிப்பத்திரக் காணிகளுக்கான காணி உறுதிகளை வழங்குவதற்குரிய நடவடிக்கைகளும் எடுக்கப்பட வேண்டும் என்பதையும் நான் வலியுறுத்திக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

காணி உரித்து வழங்குதல் என்ற பெயரிலே, முல்லைத்தீவு மாவட்டத்தில் 1984ஆம் ஆண்டு ஸ்ரீ லங்கா அரசாங்கத்தின் அறிவுறுத்தலின் அடிப்படையில் பலவந்தமாக வெளியேற்றப்பட்ட எங்களுடைய தமிழ் மக்களுடைய காணிகளை ஆக்கிரமித்து, 2008, 2009ஆம் ஆண்டுகளில் குடியேற்றப்பட்ட சிங்களவர்களுக்கும் உறுதிகள் வழங்கப்பட்டு இருக்கின்றன. மாண்புமிகு ஜனாதிபதி அவர்கள் தமிழர்களையும் சேர்த்து பொதுவாகக் காணி உறுதிகளை வழங்குகின்ற நிகழ்வுகளை நடத்துகின்றபொழுது, ஏதோ அவர் நல்லதைச் செய்வதுபோன்றதொரு தோற்றப்பாடு காட்டப்படுகின்றது. ஆனாலும், பலவந்தமாக வெளியேற்றப்பட்ட தமிழர்களின் காணிகளில் அத்துமீறிக் குடியேற்றப்பட்ட சிங்களவர்களுக்கும் உறுதிகள் வழங்கப்பட்டிருக்கின்றன. இந்தச் செயற்பாடு உடனடியாக நிறுத்தப்பட வேண்டும். குறிப்பாக, மகாவலி அபிவிருத்தி அதிகாரசபை ஊடாகவே இவ்வாறான செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டிருக்கின்றன. இவ்வாறு வழங்கப்பட்ட உறுதிகள் இரத்துச் செய்யப்பட்டு, 1984ஆம் ஆண்டு காலப் பகுதியில் போர் காரணமாக வெளியேற்றப்பட்ட தமிழ் மக்களுடைய காணிகளை அவர்களுக்கே சொந்தமாக வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டுமென்று நான் இந்த இடத்தில் வலியுறுத்திக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

நான் இன்னும் சில விடயங்களை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். கதிர்காமத்தில் தமிழர்களுடைய பூர்வீக வழிபாட்டுத் தலம் அமைந்துள்ளது. வடக்கு, கிழக்கு பகுதிகளிலிருந்து மக்கள் பாதயாத்திரையாக கதிர்காமத்துக்குச் செல்வது வழமை. அவ்வாறு செல்லும்போது, பொத்துவிலைத் தாண்டி ஒரு காட்டுப் பாதையூடாக கதிர்காமத்துக்குச் செல்ல முடியும். குறிப்பிட்ட காலத்தில் அப்பாதை திறக்கப்படுவது வழமை. ஆனால், இம்முறை அப்பாதை உரிய காலத்தில் திறக்கப்படாது என்றும் அது காலம் பிந்தித் திறக்கப்படும் என்றும் அறிவிக்கப்பட்டதால் பெரும் குழப்பம் ஏற்பட்டிருக்கின்றது. அதன் காரணமாக கதிர்காமத்துக்குச் செல்கின்ற பக்தர்கள் மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். ஆகவே, அந்தப் பாதை எதிர்வரும் 28ஆம் திகதி வழமைபோன்று திறக்கப்படுவதற்குரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டுமென நான் இந்த இடத்தில் விநயமாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, யாழ்ப்பாணம் தேசிய கல்வியியற் கல்லூரி ஆசிரிய மாணவர்கள் மிக மோசமாக உளவியல் நெருக்கடிக்கு

[ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා]

උள்ளாக்கப்பட்டிருப்பதாக அம்மாணவர்கள் தரப்பிலிருந்தும் அவர்களது பெற்றோர்கள் தரப்பிலிருந்தும் எங்களுக்குத் தகவல்கள் தெரிவிக்கப்பட்டிருக்கின்றன. யாழ்ப்பாணம் தேசிய கல்வியியற் கல்லூரிக்கு நிரந்தர பீடாதிபதி ஒருவர் நியமிக்கப்படாத நிலைமையில், பதில் பீடாதிபதியின் தலைமையில்தான் அது இயங்கிக்கொண்டிருக்கின்றது. ஏன் நிரந்தர பீடாதிபதி ஒருவரை அந்தக் கல்வியியற் கல்லூரிக்கு நியமிக்கவில்லை? என்ற கேள்வி எழுகின்றது. ஆகவே, அங்கு உடனடியாக நிரந்தர பீடாதிபதி ஒருவரை நியமிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென்றும் அங்குள்ள ஆசிரிய மாணவர்களின் பிரச்சினைகளை ஆராய்வதற்கு அவசரமாகக் குழுவொன்று அமைக்கப்பட வேண்டுமென்றும் நான் கௌரவ கல்வி அமைச்சரிடம் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, அச்சுவேலி, பத்தமேனிப் பகுதியிலுள்ள ஊடகவியலாளர் பிரதீபனின் வீட்டின்மீது இனந்தெரியாத நபர்கள் தாக்குதல் நடத்தியிருக்கிறார்கள். அவருடைய மோட்டார் சைக்கிளும் முச்சக்கரவண்டியும் வீட்டிலிருந்த உடைமைகளும் எரிக்கப்பட்டிருக்கின்றன. இந்தத் தாக்குதல் ஸ்ரீலங்கா புலனாய்வுப் பிரிவினரால்தான் நடத்தப்பட்டு இருக்கின்றது. இதுதொடர்பாக விசாரணை நடத்தப்பட்டு குற்றவாளிகள் கண்டுபிடிக்கப்பட வேண்டும். உறுதி வழங்குகின்ற நிகழ்வுக்கு ஜனாதிபதி அவர்கள் வந்தபோது, வெலிஓயா பகுதியிலிருந்து சிங்களவர்கள் ஏற்றிவரப்பட்டமை தொடர்பாக கலந்துகொண்டிருந்த சிங்கள மக்களிடம் அவர் பேட்டி எடுத்திருந்தார். அப்பேட்டி வெளிவந்ததற்குப் பிற்பாடு, ஜனாதிபதி அவர்கள் கலந்துகொள்ளும் கூட்டங்களுக்குப் பிரதீபனுக்கு அனுமதி மறுக்கப்பட்டிருக்கின்றது.

முன்னாள் போராளியான அவருக்கு ஜனாதிபதி அவர்கள் கலந்துகொள்கின்ற நிகழ்வுகளில் கலந்துகொள்ளக்கூடாது என்று தடை விதிக்கப்படுகின்றது என்று சொல்லிச் சொன்னால், இன்னமும் முன்னாள் போராளிகள் குற்றவாளிகளாகப் பார்க்கப்படுகின்றார்களா? அவர்கள் இந்த நாட்டில் தொழில் செய்ய முடியாதா? அவர்கள் இந்த நாட்டில் பாதுகாப்பாக வாழ முடியாதா? என்ற கேள்விகள் எழுகின்றன. மேற்குறித்த தாக்குதல் சம்பவத்தை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். இந்தச் சம்பவத்துடன் தொடர்புடைய குற்றவாளிகள் உடனடியாகக் கண்டறியப்பட வேண்டும். இந்தத் தாக்குதலானது, இராணுவப் புலனாய்வுப் பிரிவினரால்தான் நடத்தப்பட்டது என்பதை நான் இந்த இடத்தில் மிகத் தெளிவாகப் பதிவுசெய்கின்றேன்.

அடுத்து, கல்முனை வடக்கு (தமிழ்) பிரதேச செயலகத்துக்கு கணக்காளர் ஒருவரை நியமிக்க வேண்டும் என்றும் அங்குள்ள நிருவாகப் பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டும் என்றும் 2 மாதங்களுக்கும் மேலாக மக்கள் போராட்டம் நடத்தி வருகின்றார்கள். கடந்த மே மாதம் 13ஆம் திகதி பாராளுமன்றத்தில் பிரதமர் தினேஷ் குணவர்தன அவர்களுடைய தலைமையில் நடைபெற்ற ஒரு கூட்டத்தில், இவ்விடயம் தொடர்பில் நீண்ட கடிதம் ஒன்றை நான் சமர்ப்பித்திருந்தேன். அந்த இடத்துக்கு ஒருவரை அனுப்பி, அந்தப் பிரச்சினைகள் பற்றிக் கேட்டறிவதாகச் சொல்லப்பட்டிருந்தது. ஆனால், இன்றுவரை பிரதமர் அலுவலகத்திலிருந்து யாரும் அங்கு அனுப்பப்படவில்லை. ஆகவே, உடனடியாக அது தொடர்பாக கௌரவ பிரதமர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
இறுதியாக ஒரு விடயத்தைக் கூறி முடிக்கின்றேன்.

இழுவை மடிப் படகுகளின் பயன்பாடு மற்றும் இந்திய மீனவர்களுடைய அத்துமீறிய செயற்பாடுகளை எதிர்த்து இன்று யாழ்ப்பாணத்தில் ஒரு போராட்டம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. இந்தப் போராட்டத்தை இந்தியத் தூதரகத்துக்கு எதிராக நடத்துவதில் எந்தவிதப் பயனும் இல்லை. உண்மையிலே இந்தப் போராட்டமானது, கௌரவ அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்களுடைய அமைச்சுக்கு எதிராகவே நடத்தப்பட வேண்டும். அவர் கடற்றொழில் அமைச்சராக இருந்துகொண்டு கடற்றொழிலை அழித்துக்கொண்டு இருக்கின்றார். இந்திய மீனவர்களுடைய அத்துமீறல்களைக் கட்டுப்படுத்துவதற்கு கடற்படை உரிய நடவடிக்கைகளை எடுக்காமல் இருப்பது இந்த நாட்டு அரசின் தவறு. ஆகவே, இலங்கை அரசும் இந்திய அரசும் உடனடியாக இந்த அத்துமீறலைக் கட்டுப்படுத்தி, எங்களுடைய மீனவர்களின் கடற்றொழிலைப் பாதுகாப்பதற்கு நடவடிக்கை எடுக்கவேண்டும் என்று இந்த இடத்திலே கேட்டு, வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Hector Appuhamy. You have seven minutes.

[අ.භා. 4.30]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සංචාරක කටයුතු පිළිබඳව නියම කිහිපයක් සහ ක්‍රීඩාව සම්බන්ධයෙන් නියෝග කිහිපයක් ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ විශේෂයෙන්ම මම සිහිපත් කරන්න ඕනෑ, දැන් රටේ සංචාරක ව්‍යාපාරය කොයි ආකාරයටද පවතින්නේ කියලා. අපි දන්නවා, මේ මොහොත වෙනකොට සංචාරක ව්‍යාපාරය, එහෙම නැත්නම් සංචාරක කටයුතු සම්බන්ධව යම් විධියක පිළිගත හැකි වර්ධනයක් සිදු වෙමින් තිබෙන බව. හැබැයි, මේ මොහොතේ අපි බලන්න ඕනෑ, රටේ සංචාරක ව්‍යාපාරය මීට වඩා දියුණු කරන්නේ කොහොමද කියලා. ඒකට අවශ්‍ය කරන කටයුතු සම්බන්ධයෙන් මීට වඩා ගැඹුරින් අධ්‍යයනය කරමින්, විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරමින් ඉස්සරහට යන්න පුළුවන් කියන එක තමයි අපේ මතය.

සංචාරක කටයුතු පිළිබඳව ක්‍රියාත්මක වෙද්දී අපි දැක්කා මේ සම්බන්ධයෙන් සමහර ප්‍රදේශ වෙන් කිරීම් කරනවා; සමහර ඉඩම් වෙන් කිරීම් කරනවා. ඒ සියලු කටයුතු කරද්දී සමස්ත ශ්‍රී ලංකාවේම තිබෙන සම්පත් ටික සංචාරක ව්‍යාපාරයට අදාළව හරි විධියට පරිහරණය කරනවාද කියන ප්‍රශ්නය තිබෙනවා.

අපේ පුත්තලම දිස්ත්‍රික්කය කියන්නේ සංචාරක කටයුතුවලට, එහෙම නැත්නම් සංචාරක ව්‍යාපාරය සඳහා ඉතාම හොඳ

දිස්ත්‍රික්කයක්. හැබැයි, අපට පෙනෙන්න නැහැ පුත්තලම දිස්ත්‍රික්කය තුළ සංචාරක කටයුතු විධිමත් කරන්න, එහෙම නැත්නම් ලෝකයේ රටවල් දැනුවත් කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළක් සකස් කරන බවක්. ඊළඟට, සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න අවශ්‍ය කරන යටිතල පහසුකම් ටික නිර්මාණය කරන බවක් පෙනෙන්න නැහැ. කල්පිටිය වාගේ ප්‍රදේශයක් අරගෙන බලන්න, ලංකාවේ ඉතාම අලංකාර, එහෙම නැත්නම් දර්ශනීයම ප්‍රදේශ තිබෙන්නේ කල්පිටිය අර්ධද්වීපයේ. ඒ දූපත් ටික ඉතාම ආකර්ෂණීයයි. හැබැයි, ඒවා ලෝකයට පෙන්වන්න වැඩ පිළිවෙළක් නැහැ. ඒ ප්‍රදේශවල හෝටල් කර්මාන්තයේ යෙදෙන අයට කිසි දෙයකට පහසුකමක් නැහැ. පාරවල් හදලා නැහැ, විදුලිය ලබා දීමේ වැඩ පිළිවෙළක් නැහැ, ජලය ලබා දීමේ වැඩ පිළිවෙළක් නැහැ. මේ යටිතල පහසුකම් දියුණු කරන්නේ නැතුව ඒ ප්‍රදේශය දියුණු කරන්න බැහැ.

හැබැයි, මේ ප්‍රදේශය බොහෝ ක්‍රියාකාරකම් ඇති කරලා සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න පුළුවන් ප්‍රදේශයක්. ඔබතුමන්ලාට බැරි නම් -මම හිතන විධියට ඔබතුමන්ලාට තව මාස තුන හතරයි බලය තිබෙන්නේ- ඊට පසුව කල්පිටිය අර්ධද්වීපය ඇතුළු පුත්තලම් දිස්ත්‍රික්කය සංචාරක කර්මාන්තය අතින් ඉතාම ඉහළින් තියන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ, විධිමත් සැලැස්ම අපි ළඟ තිබෙන බව මම සඳහන් කරන්න ඕනෑ. ඔබතුමන්ලාට අවශ්‍ය නම්, ඒක පරිශීලනය කරන්න අවස්ථාවක් ලබා දෙන්න පුළුවන් කියලා විශේෂයෙන් අමාත්‍යවරයාට මම මතක් කරන්න කැමැතියි.

පසුගිය දවස්වල අපි දැක්කා, වීසා ගන්න ගියාම ගුවන්තොටුපොළේ වෙච්ච සිද්ධිය. විශේෂයෙන්ම මේ රටේ සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න, එහෙම නැත්නම් බංකොලොත් කරපු රටක් නැවත නැගිට්ටවන්න අවශ්‍ය කරන විදේශ විනිමය ලබා ගන්න, මේ රටේ සංචාරක කටයුතු දියුණු කරන්න අවශ්‍ය කරන වීසා පහසුකම් සංචාරකයන්ට සපයනවා වෙනුවට ඒ සංචාරකයන්ගෙන් යම්කිසි දෙයක් උදුරා ගන්න වැඩ පිළිවෙළ සකස් වෙලා මේ තුළ වීසා ලබාදීමේ යම්කිසි ආයතනයක් ජාවාරමක් හැටියට ක්‍රියාත්මක වුණා කියන එක තමයි අපට පසුගිය දිනවල දැන ගන්න ලැබුණේ. මේ කටයුතු සම්බන්ධයෙන් දැන් මොකක්ද සිද්ධ වෙන්නේ? අපේ සංචාරක කටයුතු දියුණු කරන්න නම්, විදේශ රටවලට නිදහස් වීසා බලපත්‍රයක් ලබාදීමේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කළ යුතුයි. එය ක්‍රියාත්මක කිරීමෙන් තමයි අපට මේ රට දියුණු කරන්න අවශ්‍ය කරන විදේශ විනිමය එකතු කරන්න අවස්ථාව ලැබෙන්නේ කියන එක විශේෂයෙන් මම මතක් කරනවා. ඒ වාගේම සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළට තානාපති කාර්යාල හරහා විදෙස්ගත ශ්‍රී ලාංකිකයාව තවමත් නිවැරදි ආකාරයෙන් අපි සම්බන්ධ කර ගන්නේ නැත්තේ ඇයි? අපි දන්නවා, ලෝකයේ වැදගත් රටවල, සංචාරකයෝ හැටියට මේ රටට එන ඒ විශේෂ රටවල අපේ ශ්‍රී ලාංකිකයෝ සිටින බව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ ශ්‍රී ලාංකිකයෝ දැවැන්ත වශයෙන් සම්බන්ධීකරණය ඇති කර ගත්ත ලෝකයේ රටවල් තිබෙනවා. විශාල වශයෙන් මුදල් තිබෙන, ඒ වාගේම පළපුරුද්ද හා දැනුම තිබෙන විදේශීය ජාතිකයන් එක්ක සම්බන්ධීකරණය වැඩි වශයෙන් ඇතිකරගෙන සිටින විදෙස්ගත ශ්‍රී ලාංකිකයෝ ඉන්නවා. ඒ රටවල තානාපති කාර්යාල හරහා මම හැමදාම කියන විධියට විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ එකමුතුවක් හදලා අපේ සංචාරක ව්‍යාපාරය මීට වඩා පස් ගුණයකින් ඉස්සරහට ගෙනියන වැඩ පිළිවෙළ අපට හදන්න පුළුවන්. ඒ වාගේම ධනවත් මිනිස්සු - rich touristsලා - අපේ රටට ගෙන්වා ගන්න පුළුවන්. මොකද, සල්ලි වැඩිපුර වියදම් කරන අය ආවොත් තමයි අපට විදේශ විනිමය වැඩියෙන් ලැබෙන්නේ. බොහෝ වේලාවට අපි දකිනවා, අපේ රටට එන සංචාරකයෝ වඩයක් කාලා, ෆුට් සයිකලයකින්, ත්‍රී-වීලර් එකකින් ගිහිල්ලා තමන්ගේ කාලය ගත කරලා - එක රවුමක් ගිහිල්ලා - අපසු යනවා. හැබැයි, ඊට වඩා රට නරඹන්න, විශේෂයෙන්ම අධ්‍යයනය කරන්න එන අය වැඩියි. ඒ අය ලෝකයේ වෙනත් රටවලටයි යන්නේ. ඉතින් ඒ අය ගෙන්වා ගන්න වැඩ පිළිවෙළ අපට හදන්න පුළුවන්. ඒක හදන්න විදෙස්ගත ශ්‍රී ලාංකිකයාගෙන් සහාය අරගෙන මේ වැඩකොටස කරන්න පුළුවන් කියා මම විශ්වාස කරනවා. මොකද, ඒ අය අපට ප්‍රකාශ කරනවා, ශ්‍රී ලංකාව අපව කිසිම ආකාරයකට සම්බන්ධීකරණයක් කර ගන්නේ නැහැ කියලා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, විදෙස්ගත ශ්‍රී ලාංකිකයා මීට වඩා ඒක රාශි කරගෙන ඒ අයගේ හැකියාව, දැනුම එක්ක ඒ වැඩ කොටස හරියට කරන්න කියලා.

ඒ වාගේම ඇයි, අපි educational hub එකක් හැටියට ලංකාව හදන වැඩ පිළිවෙළ ඉස්සරහට අරගෙන යන්නේ නැත්තේ? තවම අපි මේ ව්‍යක්තීය සමිතිවලට, එක එක ශිෂ්‍ය සංවිධානවලට බයේ හැංගිලා ඉන්නවාද? මේ රට ඉස්සරහට දියුණු කරන වැඩ පිළිවෙළ හදන්නේ කොහොමද? ඒක අපි හදන්න ඕනෑ. විශේෂයෙන් අද බංග්ලාදේශය, මියන්මාරය වාගේ රටවල් ගත්තාම, ඒගොල්ලන් අධ්‍යාපනය පැත්තෙන් ගොඩක් ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා. එයින් විදේශ විනිමය උපයන විශාල වැඩසටහන් සිද්ධ වෙලා තිබෙනවා. ඊළඟට, හුවමාරු කර ගැනීම්. මේ හුවමාරු අධ්‍යාපනය ඉතාම වටිනා දෙයක්. ඒ නිසා මම කියනවා, විශේෂයෙන්ම ඒ ගැනත් හිතන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩාව ගත්තාම, විශේෂයෙන්ම මතක් කරන්න තිබෙනවා, ග්‍රාමීය වශයෙන් අපේ හැම කෙනෙක්ම වාගේ සහභාගි වෙන එල්ලේ ක්‍රීඩාව ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දකින්නේ නැහැ, එල්ලේ ක්‍රීඩාවට රාජ්‍ය වශයෙන් කිසිම සැලකිල්ලක් දක්වන බවක්. ඒ ක්‍රීඩාවේ යෙදෙන අය ඉතාම අපහසුවෙන් තමයි සමහර වෙලාවට බෝල ටින් එකක් පවා ගන්නේ. එදිනෙදා තමන් කම්කරු සේවයේ යෙදිලා, ඒකෙන් සල්ලි ටිකක් එකතු කරලා තමයි එල්ලේ ක්‍රීඩාවට අවශ්‍ය කරන බෝල ටින් එකක් අර ගන්නේ. හැම ගමකම එල්ලේ ක්‍රීඩාව සිද්ධ වෙනවා. හරියට බැලුවොත්, ජාතික වශයෙන් එල්ලේ ක්‍රීඩාව ඉස්සරහට ගන්න පුළුවන් රටක් හැටියටත් අපේ රට නම් කරන්න පුළුවන්. මොකද, එල්ලේ ක්‍රීඩාව පහළට දාන්න ඕනෑ නැහැ, දුප්පත් අය, එහෙම නැත්නම් කම්කරුවන්, විශේෂයෙන්ම ගමේ බොහෝ දේවල් කරන කණ්ඩායම එකතු වෙලා කරන ක්‍රීඩාවක් කියලා. එල්ලේ ක්‍රීඩාව පහළට දාලා අනික් ක්‍රීඩාවන් -ක්‍රිකට්, ෆුට් බෝල්, වොලිබෝල් වැනි ක්‍රීඩා- විතරක් උඩට ගෙනැල්ලා මේ වැඩේ කරන්න අවශ්‍ය නැහැ.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

මොකද, ඒ අයත් ක්‍රීඩකයෝ. ඒ අයත් හුහක්ම මහන්සි වෙලා ක්‍රීඩා කරන අය. ඒ විතරක් නොවෙයි, කුඩු, ගංජා ආදි දේවලට ඇබ්බැහි වෙන්නේ නැතිව, ගමේ ඉන්න සමාජ සේවා කරන තරුණ කණ්ඩායම් එකට එකතු වෙලා තමයි එල්ලේ ක්‍රීඩාව කරන්නේ. ඒ නිසා මම ගරු ක්‍රීඩා අමාත්‍යතුමාට විශේෂයෙන් ආරාධනා කරනවා, එල්ලේ ක්‍රීඩාව සම්බන්ධව මීට වඩා රාජ්‍ය අනුග්‍රහය ලබා දෙන වැඩසටහන් ක්‍රියාත්මක කරන්න, මුදල් ප්‍රතිපාදන ලබා දෙන වැඩසටහන් ක්‍රියාත්මක කරන්න කියලා. එල්ලේ ක්‍රීඩාව ශක්තිමත් කරන්න, ඒ ක්‍රීඩකයන් ධෛර්යවත් කරන්න ඔබතුමා එන්න. අපිත් සූදානම් ඒ සඳහා අවශ්‍ය කරන සහයෝගය ලබා දෙන්න. බොහොම ස්තුතියි, මට අවස්ථාව ලබා දුන්නාට.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.38]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අප මේ සාකච්ඡාව කරගෙන යන වෙලාවේ විශේෂයෙන් කිව යුතු කාරණාවක් තිබෙනවා. මේ රටේ උපාධිධාරීන් විශාල සංඛ්‍යාවකට අද රැකී රක්ෂා නැහැ. හැබැයි, රැකී රක්ෂා නැති උපාධිධාරීන් පාර්ලිමේන්තු වටරවුමට ඇවිල්ලා උද්ඝෝෂණය කරන කොට, ඒ අය තමන්ගේ දුක කියන කොට ආණ්ඩුවේ පොලීසිය ජල ප්‍රහාර එල්ල කරලා ඒ ගොල්ලන්ට විශාල හානියක් සිදු කරලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, මේ රටේ විශ්‍රාමිකයන්ටත් අද වන විට විශාල වශයෙන් අර්බුද ගණනාවකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. ඒ අය තමන්ගේ දුක කියන්න පාරට බැස්සාම සලකන්නේ කඳුළු ගෑස් ගහලා. මේ ආණ්ඩුවට වුවමනා කරලා තිබෙන්නේ මිනිසුන්ගේ දුක දකින්න නොවෙයි. ඒ නිසා තමයි අම්මලා, තාත්තලාගෙන් ලැබුණු දෑවැද්දටත් බද්දක් ගහන්න මේ ආණ්ඩුව කටයුතු කරන්න උත්සාහ කරන්නේ.

මම තවත් විශේෂ කාරණාවක් කියන්න ඕනෑ. ඉතිහාසයේ කවදාවත් සිදු වුණේ නැති විධියට -අවුරුදු ගණනාවකට පස්සේ- 48වන නීතිපතිවරයාගේ සේවා කාලය තවදුරටත් දීර්ඝ කරන්න නිර්දේශ කරලා එයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ඉල්ලා තිබුණා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඒ පිළිබඳව මීට පෙර දෙවතාවක් සලකා බලා තිබුණා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අද එය තුන්වැනි වතාවටත් සලකා බැලුවා. හැබැයි, අද එය පරාජයට පත් වුණා. අපි ස්තුතිවන්ත වෙනවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට, කොන්ද කෙළින් තියාගෙන මෙවැනි තීන්දු ගැනීම ගැන. මොකද, මේ හරහා කරන්න හැදුවේ වෙනත් වැඩ පිළිවෙළක්. ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමා තවත් මාස කිහිපයකින් විශ්‍රාම යනවා. එතකොට නීතිපතිතුමාව ගෙනැල්ලා, නීතිපතිතුමාව අග්‍ර විනිශ්චයකාරවරයා බවට පත් කරලා තමන්ට අවශ්‍ය කරන නඩු ටික බේරා ගැනීම සඳහා කරගෙන යන දේශපාලනික කුමන්ත්‍රණයක් තමයි මේ පිටුපස තිබුණේ. ඒ නිසා ඒ දේශපාලන කුමන්ත්‍රණය පරාජය කරන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කටයුතු කිරීම ගැන මම ඒ අයට ස්තුතිවන්ත වෙනවා. මොකද, මේවාත් එක්ක විශාල නඩු හබ සංඛ්‍යාවක් එනවා. අද

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ට පාට් එක දැම්මා, ඊළඟට කරන්නේ මොකක්ද කියමින්. මෙය ඒ තැනට ගිහිල්ලායි තිබෙන්නේ. මොකද, ආණ්ඩුවේ ධුර කාලයට අදාළ දින දැන් කෙමෙන් කෙමෙන් අඩු වෙමින් යන්නේ. ආණ්ඩුව කැලිවලට බෙදිලා. ආණ්ඩුවේ අය දැන් යන එන මං නැති තැනට පත් වෙලා ඉන්නවා. ජනාධිපති කවුද, ඊළඟ අපේක්ෂකයා කවුද කියලා හොයා ගන්න බැරි තැනට ඒ අය පත් වෙලා තිබෙනවා. වියරු වැටිලා ඉන්නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
නැහැ, නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපේ සුසිල් ඇමතිතුමා නම් වියරු වැටිලා නැහැ. එතුමන්ලාත් කට්ටිය හොය හොයා තැන් තැන්වල රැස්වීම් පවත්වමින් යනවා. එතුමන්ලා දන්නේත් නැහැ, එතුමන්ලා කොහේද යන්නේ කියලා. කවුද, ජනාධිපති අපේක්ෂකයා කියලා දන්නේත් නැහැ. ඉතින් ඔය රැස්වීම් තිය තියා යනවා ඒකට එකතු වෙච්ච කට්ටියක් එකතු කරගෙන.

මේ අවසාන දින ගණනාව තුළ ආණ්ඩුවට සිදු වෙලා තිබෙනවා තමන්ගේ අනාගතය සර්වප්‍රකාරයෙන් සාර්ථක කර ගන්න පුළුවන් විවිධාකාරයේ වැඩ පිළිවෙළ ගැන කථා කර ගන්න.

විශේෂයෙන් සංචාරක ව්‍යාපාරය ගැන කථා කරනවා. සංචාරකයන් වැඩි වෙලා තිබෙනවා. අපි දන්නවා ඒකට හේතුව මොකක්ද කියලා. ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා ඇතුළු අයට අපි අපගේ ස්තුතිය පුද කරනවා. එතුමා විශාල කැප කිරීමක් කරනවා. මම ඒක නැහැ කියන්නේ නැහැ. හැබැයි, අද සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයත් එක්ක සිද්ධ වෙලා තිබෙන දේ කනගාටුදායකයි. බලන්න, අපේ රටේ ඉන්න සමහර ව්‍යාපාරිකයන් සංචාරකයන්ගෙන් ගසා කන හැටි, YouTuber කෙනෙකු වන සංචාරක කාන්තාවකගේ මුදල් පසුම්බිය පැහැර ගත් හැටි, රුපියල් 800කට වඩේ එකක් විකුණපු හැටි, සමහර තැන්වලට ගියාම ඒ අයට අඩන්තේට්ටම් සිදු කරන හැටි, ත්‍රීවිල් ඇතුළේ ඒ අයව දූෂණය කරන්න හදන හැටි. මේ රටට එන සංචාරකයන්ට සලකන ක්‍රමවේදය මේකද කියා මම අහන්න කැමතියි.

වැදගත් වන්නේ අපේ රටට සංචාරකයන් ආවාම ඒ අය බලා ගන්නා විධියක්, ඒ අය ආරක්ෂා කර ගන්නා විධියක්, රෑ 12.00ට 01.00ට හරි කමක් නැහැ ඒ මිනිසුන්ට නිදහසේ යන එන විධියක් ලැහැස්ති කිරීමයි. එහෙම කළේ නැත්නම් වාර්තා වන මේ සිදුවීම් කළු පැල්ලම් විධියට තමයි ජාත්‍යන්තරයට යන්නේ. ඒක මතක තියාගන්න. ඇවිල්ලා හිටපු YouTubersලා දෙදෙනෙකු ලංකාව පිළිබඳව දැම්මේ වැරදි අර්ථකථනයක්. ඒ අය ලංකාවට ආදරෙයි. හැබැයි, ඒ අයට සිද්ධ වුණා තමන්ට වුණු අකරතැබ්බය ගැන කියන්න. බස් එකේ යන කොට ඒ බස් එකේ ආපු මගියෙක් ඒ විදේශීය කාන්තාවගේ බෑගය අරගෙන ගියා. පොලීසියට පින් සිද්ධ වෙන්න ඒ කෙනා අල්ලා ගත්තා. නමුත්, ඒකෙන් මේ රටට සිද්ධ වුණු හානිය කොයි තරම් ද කියලා කල්පනා කරන්න ඕනෑ. තවත් සිද්ධියක් තමයි, රුපියල් 800කට උළුවු වඩයක් විකුණපු

සිද්ධිය. කඩේ මුදලාලි ඉන්න කොට තැරැව්කරුවෙකු ඇවිල්ලා කඩේ බඩු විකුණනවා නම් මොකක්ද මේ රටට අත් වෙලා තිබෙන ඉරණම? මේ වැරදි නිවැරදි කර ගැනීමේ වැඩ පිළිවෙළක් අපට අවශ්‍යයි.

ඒ වාගේම, සංචාරකයන් සඳහා වන පහසුකම් පිළිබඳව අපට විශාල අර්බුදයක් තිබෙනවා. අපේ රටේ සංචාරකයන්ට යන්න වැසිකිළි පහසුකම් ඇතුළු පොදු පහසුකම් කොහේවත් නැහැ. ඒ නිසා මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, ලංකාව පුරා පොදු වැසිකිළි පහසුකම් ප්‍රමාණයක් සූදානම් කරන්න කියලා. ඒවාට රුපියල් 100ක්, 200ක් දීලා ගියාට කමක් නැහැ. ඒක අලුත් සංකල්පයක් විධියට රට ඇතුළේ ක්‍රියාත්මක කරන්න. සාමාන්‍ය මිනිසුන්ට පවා යන්න එවැනි තැන් නැති තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ලංකාව පුරා පොදු වැසිකිළි පහසුකම් ප්‍රමාණයක් ඇති කරන්න අපට පුළුවන්. ලෝකයේ අනෙක් රටවලට අප ගියාම, අපට ටිකක් ගිමන් හරින්න පුළුවන් තැන් ඕනෑ තරම් ඒ ගොල්ලන් හදලා තිබෙනවා. ගිහිල්ලා ටිකක් වෙලා ඉඳගෙන ඉඳලා, ඕනෑ නම් washroom එකටත් ගිහිල්ලා, එතැන තිබෙන පොඩි කඩයකින් මොනවා හෝ දෙයක් මිල දී ගෙන යන්න පුළුවන්. ඒ වාගේ quality ක්‍රමවේදයක්, ලස්සන වැඩ පිළිවෙළක් හදන්න. මේ වාගේ අලුත් වැඩ පිළිවෙළක් තුළ තමයි සංචාරක ව්‍යාපාරය තවදුරටත් වර්ධනය කරන්න පුළුවන් වන්නේ. අනෙක් අතට අපි target එකක් හදාගෙන තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි.

Airport එකට එන මිනිස්සු එහි තැන් තැන්වල නිදි. මා ගිය සතියේ එනකොට දැක්කා, ඒ ස්ථානයට එන පාරවල් දිගේ, පාරවල් දෙපැත්තේ සංචාරකයන් නිදාගෙන ඉන්න ආකාරය. සංචාරකයින්ට ඉන්න පුටුවක්, අඩුම තරමින් නිදා ගන්න පුළුවන් පහසුකම් ටිකක් මේ Airport එක ඇතුළේ ලස්සනට හදන්න පුළුවන්. Airport එක ඇතුළේ නිදාගන්න තිබුණු කාමර දැන් නැහැ. දැන් ඒ පහසුකම් දීම නවත්තලා. මම සංචාරක ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ රටේ Airport එකේදි සංචාරකයින්ට අත් වෙලා තිබෙන ඉරණම ගැන කරුණාකර එහි ගිහිල්ලා බලන්න කියලා. වෙනත් රටවල නම් සංචාරකයින්ට රෑදී ඉන්න වෙනම ස්ථාන තිබෙනවා. පැය 3ක්, 4ක්, 5ක් පරක්කු වන කොට සංචාරකයන්ට පාඩුවේ ගිහිල්ලා පොඩ්ඩක් ඇල වෙලා නිදා ගන්න පුළුවන් ස්ථාන හදලා තිබෙනවා. සැප පහසුව ඉන්න පුළුවන් කුඩා පුටු, කකුල් දෙක massage කර ගන්න තැන් ආදිය හදලා තිබෙනවා. හැම airport එකකම වාගේ කාමර පහසුකම් තිබෙනවා. ලංකාවේ Airport එකේත් උඩ තට්ටුවේ එවැනි කාමර තිබුණා. දැන් ඒ කාමර ටික සංචාරකයන්ට දීම නවත්වා තිබෙනවා. මම දන්නේ නැහැ දැන් ඒවාට මොකද වෙලා තිබෙන්නේ කියලා. ඒවා ගැන හොයලා බලන්න.

2018 වර්ෂයේදී අපේ රටට සංචාරකයෝ ලක්ෂ 25ක් ආවා. අපට ලැබුණු ආදායම US Dollor 4.3 billion. එම ප්‍රමාණය වැඩි කරගැනීම සඳහා වන ක්‍රියා මාර්ගයක් ගන්න ඕනෑ. ඒකට target එකක් තබා ගන්න. සංචාරක ව්‍යාපාරය තුළින් වාර්ෂිකව ඩොලර් බිලියන 4ක්, 5ක්, 6ක්, 8ක් අපේ රටට සොයා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදා ගන්න.

මම ක්‍රීඩාව ගැනත් කියන්න කැමතියි. දැන් ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වය සමහර අයගේ චෝදනාවට ලක් වෙලා තිබෙනවා. Sri Lanka Cricket එකට තමයි දැන් ඔක්කොම පහර දෙන්නේ. Sri Lanka Cricket එකේත් අර්බුද තිබෙනවා; ප්‍රශ්න තිබෙනවා. ඔවුන්ගේ ප්‍රශ්න ගණනාවක් අපි දකිනවා. නමුත්, ක්‍රීඩකයින් තමයි ගිහින් ක්‍රීඩා කරන්නේ. Match එක ගහන්නේ ක්‍රීඩකයන් මිස Sri Lanka Cricket එකේ අය නොවෙයි. එහෙම නේද, ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි? ඔබතුමාත් ක්‍රීඩාව ගැන හොඳ අවබෝධයක් තිබෙන කෙනෙක්. Pitch එකට ගිහිල්ලා ක්‍රිකට් match එක ගහන්නේ ක්‍රීඩකයෝ. මා ඒ කාලයේ ඒ අයගේ fitness ගැන කථා කළාම, මට හැම තැනින්ම පහර ගැහුවා. බඩ වැඩියි කියලා මම කිව්වාම Facebook එකෙන් මට බොහෝ සෙයින් පහර ගැහුවා. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? මම එදා ක්‍රීඩාවට විද්‍යාව ගෙනෙන්න හැදුවාම, අපේ ක්‍රීඩකයන්ගේ fitness එක ගැන කථා කළාම මට පහර ගැහුවා. ලෝකයේ රටවල් කිහිපයකම ක්‍රීඩකයින්ගේ ඇඟවල්වල පින්තූර දාලා, අපේ ක්‍රීඩකයින් එක්කෙනෙකුගේ, දෙන්නෙකුගේ ඇඟවල්වල පින්තූර දැම්මාම ඒ දෙක සංසන්දනය කර බැලුවාම අපට පෙනෙනවා අපේ ක්‍රීඩකයන්ගේ තත්ත්වය මොකක්ද කියලා. එය අපේ ක්‍රීඩකයන්ගේ තිබෙන නොසැලකිල්ල. තම ශ්‍රී ලාංකීය ජාතිය වෙනුවෙන් ක්‍රීඩා කිරීම වෙනුවට ඒ අය කළේ මොකක්ද? "ජාතික ක්‍රීඩකයෙක්" කියලා තිබුණු ආඩම්බරය අද නැති කරගෙන තිබෙනවා.

අන්න ඒ ගෞරවයයි ඔවුන් නැති කරගෙන තිබෙන්නේ. ඒ ගෞරවය නැති වෙනකොට, පරාජයේ අඳුරු සෙවණැලිවලින් වැසී යනවා. ඊට පසුව දිගින් දිගටම කියන්නේ ක්‍රිකට් කඩාගෙන වැටිලා කියලා. ක්‍රිකට් කඩා වැටිවුවේ ක්‍රිකට් ක්‍රීඩා සංගමයයි කියලා ඊට පසුව කියනවා. ඔවුන්ට දෙන්න පුළුවන් සහයෝගය ඔවුන් දෙනවා. හැබැයි, ක්‍රීඩකයින් හරියට සෙල්ලම් කරන්නේ නැත්නම් සෙල්ලම් කරන්න පුළුවන් ක්‍රීඩකයන් ටිකක් එකතු කරගන්න එකයි කරන්න තිබෙන්නේ. අහස් කුරු ගහන්නේ නැතුව, වගකීමක් ඇතුව, රට වෙනුවෙන් අවංකව, අපූරුවට, හොඳට සෙල්ලම් කරන ක්‍රීඩකයෝ අනෙක් රටවල ඉන්නවා. පළමුවැනි ඕවර් දහය තුළ කොහොමද අපි ගහන්නේ, ඕවර් විස්ස තුළ ගහන්නේ කොහොමද, ඕවර් තිහ තුළ ගහන්නේ කොහොමද කියා plan එකකටයි අපි ක්‍රීඩා කළ යුත්තේ. නමුත් බලාගෙන ඉන්නකොට අපිට තේරුම් යනවා, මේ අය කිසිම වගකීමක් නැති මිනිස්සු බවට පත් වෙලා තිබෙනවා කියලා.

මම නම් චෝදනා කරන්නේ වෙන කාටවත් නොවෙයි. ක්‍රීඩකයෝ දැන ගන්න ඕනෑ, තමන්ගේ රට නියෝජනය කරනවා වාගේම, මම ගහන්නේ මොන වාගේ game එකක්ද කියලා තමන් ගහන game එක ගැන කල්පනා කරලා, ඔළුව පාවිච්චි කරලා හොඳට ක්‍රීඩා කරන්නට. එහෙම කරන්න පුළුවන් දක්ෂ ක්‍රීඩකයන් අපට ඉන්නවා, එහෙම අය නැතුවා නොවෙයි. මම ඒ අයට දොස් කියන්නේ නැහැ. ඒක තමයි ඔවුන්ගේ ආදායම් මාර්ගය, ඔවුන්ගේ වෘත්තිය. ඒ වෘත්තිය තුළ කටයුතු කරනකොට ඔවුන්ගේ fitness එක තබා ගන්න අවශ්‍යයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ බඩ ගැන කථා කළාට වැඩක් නැහැ. මොකද, බඩ තිබෙන මන්ත්‍රීවරුන්ට වුණත් කල්පනා කරලා, කියවා, ලියා, පාඩම් කරලා, සමීක්ෂණ කරලා ඇවිත් කථා කරන්න පුළුවන්. හැබැයි, ක්‍රීඩකයෙකුගේ වැදගත්කම තිබෙන්නේ ඔහුගේ වෘත්තිය තුළයි. ඔහු ක්‍රීඩකයෙක් කියා පෙන්වීමට වෘත්තිය දැනුම, වෘත්තිය ශක්තිය අවශ්‍යයි. එතැනදී fitness එකත් වැදගත් වෙනවා. ඒ නිසා ඒ සඳහා අවශ්‍ය කරන ශක්තිය ක්‍රීඩකයෝ විධියට ලබා ගන්න ඕනෑය කියන එකත් මතක් කරමින්, මේ තිබෙන චෝදනාවලට උත්තර දෙන්න පුළුවන් ශක්තිය ඔවුන්ට ලැබේවා කියාත් ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාඝමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.49]

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක කර්මාන්තය පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මා සඳහන් කළ යුතුයි, සංචාරක කර්මාන්තයත් ඒ හරහා රටට ලැබෙන ආදායම් ප්‍රමාණය ගැනත් මට ප්‍රශ්න කිහිපයක් තිබෙන බව. අද වෙනකොට සංචාරක කර්මාන්තයෙන් මේ රටට ලැබෙන ආදායම වශයෙන් සඳහන් කරන මුදල් ප්‍රමාණය හරිද, වැරදිද කියන එක ගැන විශාල ගැටලුවක් තිබෙනවා. මොකද, අපේ රටට අවුරුද්දකට, නැත්නම් මාසයකට සංචාරකයෝ මෙච්චර ප්‍රමාණයක් එනවා, ඒ හරහා ලංකාවට මෙච්චර විදේශ විනිමයක් ලැබෙනවා, මෙච්චර ආදායමක් ලැබෙනවා කියා ගණනය කරන්නේ එක සංචාරකයෙක් එක night එකකට ලංකාව තුළ වියදම් කරන මුදල් ප්‍රමාණය sample එකක් හැටියට අරගෙන, ඒ ගණන රටට එන සංචාරකයින්ගේ ප්‍රමාණයෙන් වැඩි කිරීමෙනුයි. හැබැයි, සංචාරකයෙක් වියදම් කරන මුදල් ප්‍රමාණය පිළිබඳව නිවැරදි ගණනය කිරීමක් කර තිබෙනවාද කියන පැහැදිලි ප්‍රශ්නය අද මේ සභාවේදී මතු කරන්න මම කැමැතියි. මොකද, අද වෙනකොට ලංකාවට එන සංචාරකයින්ගෙන් විශාල ප්‍රමාණයක් ඇත්තටම backpackersලා. ලංකාවේ luxury hotels, boutique hotels තිබෙනවා. නමුත් මම දන්නා විධියට අද වනවිට ගොඩක් luxury hotelsවලට bookings නැහැ. ඒකට හේතුව අපේ රටේ tourism market එක තුළ low-spending categories තිබීමයි. අද වෙනකොට සංචාරකයෝ ඇවිල්ලා ලංකාව තුළ යම් යම් වෙළෙඳාම්වල නිරත වෙන ආකාරයත් අපට දකින්න පුළුවන්. ඇත්තටම අපි ලංකාවට එන touristsලාගේ ප්‍රමාණයට වඩා touristsලාගේ quality එක පිළිබඳව මීට වඩා හොඳ අධ්‍යයනයක් කරලා, හොඳට වියදම් කරන්න පුළුවන් touristsලා අපේ රටට attract කර ගන්න පුළුවන් ක්‍රමවේදයක් වෙත යන්න ඕනෑය කියන එකයි මගේ මතය වන්නේ.

අද රට තුළ සංචාරක කර්මාන්තය develop කිරීම පිළිබඳව කථා කරනවා. හැබැයි, අද මොකක්ද වෙන්නේ? සංචාරකයින්ට ලෙහෙසි වෙන්න කියලා VFS එක හරහා ඩොලර් අරගෙන රටට ලැබෙන්න ඕනෑ ආදායමක්, පෞද්ගලික ආයතනවලට යනවා නම් මොකක්ද තත්ත්වය? සංචාරකයින්ගෙන් මුදල් අය කරගන්නවා නම් ඒවා ලැබෙන්න ඕනෑ, මේ රටට. නැත්නම් රජයට එන්න ඕනෑ, ඒ සල්ලි. නමුත් private companiesවලට VFS හරහා මුදල් උපයන්න පුළුවන් ක්‍රමවේදයක් තමයි අද හදා තිබෙන්නේ, සංචාරක කර්මාන්තය දියුණු කරලා, සංචාරකයන් වැඩිපුර මේ රටට ගෙන්වා ගෙන රටට ආදායමක් ලබා දෙනවා වෙනුවට. එම ආයතනයේ අයිතිකාරයෝ කවුද, කියන පිළිබඳ තොරතුරු මම හිතන විධියට ඉදිරි අනාගතයේදී එළියට එයි. මේ පිටුපස කවුරු හෝ ඉඳිමින් ලංකාවට හඳුන්වා දුන් මේ ක්‍රමය තුළින් බිලියන ගණනක් හොරකම් කිරීමට හොඳ ක්‍රමවේදයක් තමයි මේ හදාගෙන තිබෙන්නේ. සංචාරක ක්ෂේත්‍රය දියුණු කරනවා වෙනුවට මුදල් හොරකම් කරනවා. ආණ්ඩුවේ ඉන්න සමහර අය යම් යම් ක්‍රියා හරහා මේ විධියට මුදල් හොරකම් කරමින් ඉන්නකොට, සංචාරක කර්මාන්තය විතරක් නොවෙයි රටත් දියුණු කරන්න බැරි තත්ත්වයකටයි යන්නේ.

මොකද, අපි නිතරම සාකච්ඡාවට ලක් කරනවා, ජනාධිපතිතුමාත් කියා තිබෙනවා, අපේ රට අනාගතයේදී ඉන්දියාවත් එක්ක land connectivity එකක් ඇති කරන එක පිළිබඳව. ඇත්තටම ඉන්දියාව සමඟ land connectivity එකක් ඇති කිරීම තුළින් දකුණු ඉන්දියාවේ ඉන්න ජනගහනයෙන් සියයට එකක්, දෙකක් සංචාරකයන් හැටියට ලංකාවට ආවත්, ලංකාව තුළ තිබෙන tourism industry එක හරහා විශාල මුදල් ප්‍රමාණයක් ඉදිරි අනාගතයේදී උපයන්න පුළුවන්. ජනාධිපතිතුමාත්, මේ ආණ්ඩුවත් හොඳ විධියට, ප්‍රගතිශීලි ලෙස ඒ දිහා බලනවා කියලා මම දන්නවා. ඒ නිසා අනාගතයේදී මෙන්න මේ දේ වුණොත්, තවදුරටත් අපේ රටට පැමිණෙන touristsලා වැඩි කර ගන්න පුළුවන් කියලා මම හිතනවා.

ඊළඟට, උතුරු-නැඟෙනහිර ගත්තාම, උතුරටයි, නැඟෙනහිරටයි අද touristsලා නැහැ. උතුරු-නැඟෙනහිර පළාත්වල touristsලා දැක ගන්නවා කියන එක හරිම අමාරුයි. ඒකට හේතුව connectivity නැති එක. දැන් Jaffna International Airport එක operate වෙනවා. නමුත්, ඒ Jaffna International Airport එකට එන එකම flight එක මම හිතන විධියට නිතරම full. හැබැයි, නැඟෙනහිර පළාත ගත්තාම මඩකලපුවේ තිබෙන එකම Airport එක හරහා පසුගිය කාලයේ domestic flights හරි operate වුණා. මේ වන විට ඒ domestic flights operate වෙන්නෙත් නැහැ. මඩකලපුවට, අම්පාරට හෝ ත්‍රිකුණාමලයට හෝ යනවා නම් Cinnamon Air flight එකක විතරයි යන්න පුළුවන්. ඒකට ඩොලර් 250ක් විතර යනවා. ඒ තරම් මුදලක් වියදම් කරගෙන touristsලා නැඟෙනහිර පළාතට එන්නේ නැහැ. දකුණු පළාත වෙන්න පුළුවන්, ඇල්ල වෙන්න පුළුවන් මේ ප්‍රදේශවල tourism යම්තාක් දුරකට දියුණු වෙලා තිබෙනවා. මොකද, යන්න පුළුවන් connectivity තිබෙන නිසා. ඒ ප්‍රදේශවල ඉන්න ජනතාවටත් යම් ආදායමක් එයින් උපයා ගන්න පුළුවන්. හැබැයි, උතුරු-නැඟෙනහිර ගත්තාම මේ තත්ත්වය නැහැ. ඒ නිසා මෙන්න මේ තත්ත්වය ගැනත් සැලකිල්ලට ගන්න ඕනෑ.

வடக்கு, கிழக்கைப் பொறுத்தளவில், அங்கு வருகைதரும் சுற்றுலாப் பயணிகளின் எண்ணிக்கை மிகவும் குறைவாகவே இருக்கின்றது. கிழக்கு மாகாணத்திலுள்ள அறுகம்பே என்ற பிரதேசத்துக்கு ஒவ்வொரு வருடமும் அரசாங்கத்தின் எந்த முயற்சியும் இல்லாமல் சுற்றுலாப் பயணிகள் surfing செய்வதற்கு வருவார்கள். ஏனைய மாகாணங்களுடன் ஒப்பிடும்போது, இன்று வடக்கு, கிழக்கு மாகாணங்களில் போக்குவரத்துப் பிரச்சினை பிரதான பிரச்சினையாக மாறி இருக்கின்றது. யாழ். மாவட்டத்துக்கு பலாலி விமான நிலையத்தினூடாகச் சுற்றுலாப் பயணிகள் வரக்கூடிய சூழல் இருக்கின்றது. கடந்த காலத்தில் மட்டக்களப்பு விமான நிலையம் இயங்கும் நிலையில் இருந்ததால் அங்கு உள்நாட்டு விமானங்கள் வரக்கூடிய சூழல் இருந்தது. ஆனால், இன்று அந்த domestic airport ஊடாக ஒரு விமானம்கூட மட்டக்களப்பு மாவட்டத்துக்கு வருகை தருவதில்லை. மட்டக்களப்பிலுள்ள ஓந்தாச்சிமடம் போன்ற கரையோரப் பிரதேசங்களை சுற்றுலா மையமாக மாற்ற வேண்டுமென்ற முன்மொழிவை நாங்கள் அரசாங்கத்திடம் முன்வைத்திருக்கிறோம். குறிப்பாக, ஓந்தாச்சிமடத்தை சுற்றுலா மையமாக மாற்ற வேண்டுமென நாங்கள் கௌரவ அமைச்சர் அவர்களிடம் கோரியிருக்கிறோம். ஆனால், இதுவரை அது தொடர்பில் எந்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை.

இன்று பெருமளவில் பேசப்பட்ட ஒரு விடயம் சம்பந்தமாகச் சொல்ல வேண்டும். அதாவது, VFS என்ற தனியார் நிறுவனத்தினூடாக நிதி மோசடி நடந்துகொண்டு இருக்கின்றது. இதற்குப் பின்னால் அமைச்சர்கள் இருப்பதற்கு வாய்ப்புகள் இருக்கின்றன. சுற்றுலாப் பயணிகளாக இருக்கட்டும் அல்லது எவராகவும் இருக்கட்டும், அவர்கள் இலங்கைக்குள் வருவதற்கு visa கட்டணம் செலுத்தினால், அந்த வருமானம் VFS நிறுவனத்துக்குச் செல்கின்றது. Visa கட்டணம்மூலம் பெறப் படுகின்ற வருமானம் அரசாங்கத்துக்குக் கிடைக்காவிட்டால், ஏதோ ஓர் இடத்தில் களவு இடம்பெறுவதாகத்தான் எண்ண முடியும். சுற்றுலாத்

துறைமூலம் வடக்கு, கிழக்கைக் கட்டி யெழுப்புவது தொடர்பில் இன்றுவரை அரசாங்கம் கவனம் செலுத்தவில்லை என்பது கவலைக்குரிய ஒரு விடயமாகும்.

நாங்கள் இரண்டு வருடங்களுக்கு முன்னர் எடுத்த முயற்சியினூடாக கொழும்பிலிருந்து பொலன்னறுவை வரை இடம்பெற்ற கடுகதிப் புகையிரத சேவை - express train service - இன்று மட்டக்களப்பு வரை இடம்பெறுகின்றது. ஆனால், அந்த railway track இதுவரை புனரமைப்புச் செய்யப்படாமை யால், சாதாரண பயணிகளும் பெரும் கஷ்டத்துக்கு மத்தியிலே பயணம் செய்யவேண்டி இருக்கின்றது.

மிக முக்கியமாக, எதிர்வரும் 20ஆம் திகதி இந்திய வெளிவிவகார அமைச்சர் இலங்கைக்கு வருகைதர இருப்பதாக நாங்கள் செய்திகளினூடாக அறியக்கூடியதாக இருக்கின்றது. இந்தியாவுக்கும் இலங்கைக்கும் இடையில் நில ரீதியான தொடர்பை ஏற்படுத்துவதை அல்லது train சேவையை ஏற்படுத்துவதை நாங்கள் மிக முக்கியமானதொரு விடயமாகப் பார்க்கின்றோம். ஏனென்றால், தென்னிந்தியாவில் இருக்கும் எங்களுடைய சகோதர தமிழ் மக்களில் குறிப்பாக, தமிழ் நாட்டில் இருக்கின்ற மக்களில் சிறிய வீதத்தினர் இலங்கைக்கு சுற்றுலாப் பயணிகளாக வந்தால்கூட, வடக்கு, கிழக்கின் பொருளாதாரத்தைக் கட்டியெழுப்ப முடியும். எனவே, அரசாங்கம் இதில் கவனம் செலுத்த வேண்டும். இந்தியாவுக்கும் இலங்கைக்கும் இடையில் நில ரீதியான தொடர்பை ஏற்படுத்துவது பற்றி மாண்புமிகு ஜனாதிபதி அவர்களும் பல இடங்களில் பேசியிருக்கிறார். இதை மிக விரைவாகச் செய்ய வேண்டும் என்பதுதான் எங்களுடைய கோரிக்கையாகும்.

இலங்கையின் ஏனைய பகுதிகளிலுள்ள மக்களுடைய வாழ்வாதாரம் சுற்றுலாப் பயணத்துறையூடாகக் கட்டி யெழுப்பப்பட்டு இருக்கின்றது. அதுபோன்று எங்களுடைய தமிழ் மக்களும் சுற்றுலாப் பயணத்துறையூடாக வருமானம் உழைக்கக் கூடியதான ஒரு வழியை இந்த அரசாங்கம் ஏற்படுத்திக் கொடுக்க வேண்டும். மாகாண சபைகளுக்கு முழுமையான அதிகாரங்களை வழங்க வேண்டும் என்று நாங்கள் தொடர்ச்சியாகச் சொல்வதற்குக் காரணம், அவற்றி னூடாக நாங்களே எங்களுடைய பிரதேசங்களைக் கட்டி யெழுப்பலாம் என்பதனால்தான். அதுமாத்திரமன்றி, எங்க ளுடைய பிரதேசங்களில் சுற்றுலாப் பயணிகளுக்கான தேவை களை நாங்களே பூர்த்திசெய்யலாம்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

மாகாண சபைத் தேர்தலை நடத்துவதற்குப் புதிதாக ஒரு சட்டமூலத்தைக் கொண்டுவரத் தேவையில்லை. ஏற்கெனவே, கௌரவ சுமந்திரன் அவர்கள் அதுதொடர்பான தனியார் உறுப்பினர் சட்டமூலமொன்றைப் பாராளுமன்றத்தில் சமர்ப் பித்திருக்கிறார். அதனை நிறைவேற்றுவதன்மூலம் முன்பிருந்த முறைமூலம் மாகாண சபைத் தேர்தலை நடத்துவதற்கான சந்தர்ப்பத்தை ஏற்படுத்தலாம். மாண்புமிகு ஜனாதிபதி அவர்கள் ஜனாதிபதித் தேர்தலை நடத்துவதற்கு ஆயத்தமாக இருக்கின்றார். அத்தேர்தலில் தமிழ் மக்களுடைய ஆதரவு அவருக்குத் தேவையென்று சொன்னால், முதலில் செய்யக் கூடிய விடயங்களையாவது அவர் செய்து காட்டவேண்டும். மாகாண சபைத் தேர்தலை நடத்துவது தொடர்பான அந்தச் சட்டமூலத்தை பெரும்பான்மையுடன் நிறைவேற்றக்கூடிய ஒரு சூழல் இருக்கின்றது. மாண்புமிகு ஜனாதிபதி அவர்கள் இந்த விடயத்தைக்கூட செய்யாமல், ஜனாதிபதித் தேர்தலில் தமிழ் மக்களுடைய ஆதரவை எதிர்பார்க்கின்றார் என்று சொன் னால், அவர் தொடர்ந்தும் தமிழ் மக்களை ஏமாற்றுவதைத்தான் தன்னுடைய நோக்கமாகக் கொண்டிருக்கின்றார் என்றே நாங்கள் எண்ண முடியும்.

இன்றைய விவாதம் மிக முக்கியமானது. இங்கு சொல்லப்பட்ட சில விடயங்களை அரசாங்கம் உள்வாங்கிச் செயற்பட்டால், இந்த முன்மொழிவுகளை ஏற்றுக்கொண்டால் எங்களுடைய தமிழ் மக்களுக்கு மட்டுமல்ல, முழு இலங்கை வாழ் மக்களுக்கும் பொருளாதார ரீதியாக நல்லதோர் எதிர்காலத்தை அமைத்துக் கொள்ளக் கூடிய ஒரு சூழலை ஏற்படுத்தலாம் என்பதைச் சொல்லி, நேரம் ஒதுக்கித் தந்தமைக்கு கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களுக்கு நன்றி சொல்லி, என்னுடைய உரையை முடித்துக்கொள்கின்றேன்.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ඔක්තෝබර් 06 දිනැති අංක 2352/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ඔක්තෝබර් 06 දිනැති අංක 2352/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

IV

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව, සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 දෙසැම්බර් 01 දිනැති අංක 2360/62 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

V

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව, සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 දෙසැම්බර් 01 දිනැති අංක 2360/63 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත: නියෝග
உரித்துப் பதிவுச் சட்டம்: ஒழுங்குவிதிகள்
REGISTRATION OF TITLE ACT: REGULATIONS

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 67 වගන්තිය යටතේ හිමිකම් ලියාපදිංචි කිරීම් සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 දෙසැම්බර් 01 දිනැති අංක 2308/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.03.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ ඉඩම් ආඥාපනත: නියෝග
முடிக்குரிய காணிகள் கட்டளைச் சட்டம்: ஒழுங்குவிதிகள்
CROWN LAND ORDINANCE: REGULATIONS

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 8 සහ 22 වගන්ති සමඟ කියවිය යුතු 95 සහ 96 වගන්ති යටතේ සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් 2024 අප්‍රේල් 09 දින සාදන ලදුව, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත: නියෝග
விளையாட்டில் ஊக்குப் பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயச் சட்டம்: ஒழுங்குவிதிகள்
CONVENTION AGAINST DOPING IN SPORTS ACT: REGULATIONS

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ තහනම් ද්‍රව්‍ය ලැයිස්තු සම්බන්ධයෙන් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 පෙබරවාරි 27 දිනැති අංක 2373/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ලලිත් වර්ණ කුමාර මැතිතුමා.

හදිසි ආපදා තත්ත්වයන්ට මුහුණ දීමට සුදුසු යන්ත්‍රණයක්

அவசர அனர்த்த நிலைமைகளுக்கு முகங்கொடுப்பதற்கான பொருத்தமான பொறிமுறை

PROPER MECHANISM TO RESPOND TO EMERGENCY SITUATIONS

[අ.භා. 5.00]

ගරු ලලිත් වර්ණ කුමාර මහතා
(மாண்புமிகு லலித் வர்ண குமார)
(The Hon.Lalith Varna Kumara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"රටෙහි ඇතිවන හදිසි ආපදා තත්ත්වයන්වලදී ක්ෂණිකව මහ ජනතාවගේ සුබසිද්ධිය සඳහා කටයුතු කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අවශ්‍ය පියවර, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ප්‍රාදේශීය පරිපාලන අංශය සහ ආරක්ෂක අංශයේ සහාය ඇතිව ක්‍රියාත්මක කරනු ලබයි. නමුත්, හදිසි ආපදා තත්ත්වයන් ඇතිවූ සෑම අවස්ථාවකදීම ආපදා තත්ත්වයට පත්වූ පිරිසට සහන සැලසීමේ ක්‍රියාවලියේදී එය නිසි පරිදි සිදු නොවන බව මහජන නියෝජිතයන් ලෙස අපට හොඳින්ම පැහැදිලි විය. ඔවුන් වෙත ලබා දිය යුතු සහන ක්‍රමවත්ව හා ක්ෂණිකව නොලැබීම ආපදා සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන නිසි පරිදි පරිහරණය නොකරන බවද දක්නට ඇත. එමෙන්ම, ගංවතුර වැනි හදිසි ආපදා තත්ත්වයන්ට මුහුණදී ඇති පිරිස් මුදවා ගැනීම සඳහා අවශ්‍ය වන බෝට්ටු හා යාත්‍රා පහසුවෙන් ලබා ගත හැකි තැනක නොතිබීම මෙන්ම ඒවා නඩත්තු නොකර තිබීම බරපතළ කරුණකි. මේ සම්බන්ධයෙන් මෙම සභාවේ අවධානය යොමු කර හදිසි ආපදා තත්ත්වයකදී එයට මුහුණදීම සඳහා සිදු කරනු ලබන ක්‍රියාවලිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු යන්ත්‍රණයක් ඇති කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි නිරතුරුවම - කොයි වෙලාවෙත් - නාය යෑම්, ගංවතුර වැනි හදිසි ආපදා තත්ත්වවලට මුහුණ දෙන රටක්. එවැනි අවස්ථාවක කුමන රජයක් තිබුණත් අතිවිශාල මුදලක් ඒ වෙනුවෙන් වියදම් කරනවා. නමුත් මේ ක්‍රමවේදය හරියාකාරව පොළොවට ගලා ගෙන යනවාද කියන එක පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මීට දින කිහිපයකට පෙර ආපු ගංවතුර තත්ත්වය උදාහරණයකට ගත්තොත්, බුලත්සිංහල හා අගලවත්ත කියන ආසන දෙකේ ජනතාව එහිදී අතිවිශාල ආපදාවකට ලක් වුණා. අපේ ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා, ඒ වෙනුවෙන් මෙච්චර මෙච්චර සල්ලි දැම්මා කියලා. ගංවතුරට යට වුණු වෙලාවේ ජනතාවට කෑම ටිකක් උයා ගන්න විධියක් නැහැ. ඒ සඳහා ක්ෂණික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. නමුත් එහෙම සිද්ධ වෙන්නේ නැහැ. ඔබතුමන්ලා රජය හැටියට ඒ විධියට වියදම් කළත්, ජනතාවගෙන් ඒ පිළිබඳව ලැබෙන ප්‍රතිචාරය ගැන අපට සතුටු වෙන්න පුළුවන්කමක් නැහැ. මොකද, අපි ඒ දේවල් ප්‍රායෝගිකව අත් විඳිනවා.

අපි විශේෂයෙන්ම කර්මාන්තශාලා ඇති කරන කොට ඒක වෙන්න ඕනෑ කොහොමද කියලා බලන්න ඕනෑ. මේ කටයුතුවලදී වෙළවල් ගොඩ කරනවා, ඊළඟට ඇළ මාර්ග හරස් කරනවා, මේවා නිසාත් අපි ආපදාවට ලක් වෙලා තිබෙනවා. මේ පාර ආපු ගංවතුරට කළුතර දිස්ත්‍රික්කයේ හැම ගහක්ම යට වුණා. තේ ගස් ඔක්කෝම ටික මැරිලා ගියා. ඉතිහාසයේ කවදාවත් එහෙම වුණේ නැහැ; ගස් මැරුණේ නැහැ. නමුත් මේ අවස්ථාවේ වතුර ඒ තරම් විෂයි. ගංවතුර වෙලාවේ දී වතුරේ සිටි මාළුවෝත් මිය ගිහිල්ලා තිබුණා. ඒ නිසා අපි ඒ සඳහාත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ, කුකුලේගඟ විදුලි යෝජනා ක්‍රමය, ඒ project එක තුළ අපේ ප්‍රදේශයේ -බුලත්සිංහල ආසනයේ- ජනතාව ලොකු අසාධාරණයකට ලක් වෙනවාය කියන කාරණය. වැහැලා, වැහැලා වතුර ඇවිල්ලා කට මට්ටමට පිරෙන අවස්ථාවේ වේල්ල බේරා ගැනීම සඳහා අධිකාරිතාවෙන් යුතු වතුර ටික එළියට එවනවා. එහෙම වතුර එවන කොට රෑ නිදා ගත් කෙනා උදේට ඇඳෙන් බහින්නේ මේ වතුරටයි. සමහර වෙලාවට රාත්‍රියේ ඇඳ ළඟට වතුර එනකොට තමයි දැන ගන්නේ. පසුගිය කාලයේ රෑ 11.00ට විතර ගංවතුර සාමාන්‍ය තත්ත්වයෙන් තිබුණත් පාන්දර දෙකතුන වනකොට තත්ත්වය ඩබල් වුණා. මේ විදුලි බලාගාරය තුළින් මොනයම් හෝ ලාභයක් ලැබෙනවා ඇති. හැබැයි, ඒ ලාභය වාගේ දහ ගුණයක් ගංවතුරෙන් වන හානිය නිසා අවුරුද්දකට රජයට වියදම් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. අපි ආපදා වෙනුවෙන් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ තුළින් ජනතාවට සහනයක් ලැබෙන්නේ නැහැ. අපි ඒවාට මොන තරම් නම් දාලා තිබුණත්, මොන තරම් මුදල් වියදම් කළත්, ඒ සඳහා නිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොවන තෙක් සාමාන්‍ය ජනතාවට සහනයක් ලැබෙන්නේ නැහැ කියන එක විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ.

අපේ පැතිවලට ඔරුවක්, බෝට්ටුවක් ගත්තාම ඒක ගංවතුරට විතරයි ඕනෑ වෙන්නේ. ඒ නිසා ඒක පරිස්සම් තැනක තබන්න ඕනෑ. ඒ වාගේම ගංවතුර අවස්ථාවක වතුරෙන් යට වුණු සෑම තැනකටම යන්න පුළුවන් වෙන ආකාරයේ වැඩ පිළිවෙළක් හා ඒ සඳහා අවශ්‍ය කරන ඔරු පහසුකම් ලබා දීමේ වැඩ පිළිවෙළක් දීර්ඝ කාලීනව අපි හදා ගෙන යන්න ඕනෑ. අද ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමා ගරු සභාාවේ නැති නිසා මේ පිළිබඳව වැඩිදුර කථා කරන්න අවශ්‍ය නැහැ කියලා මට හිතුණා. කෙසේ වෙතත් කළුතර දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි, මේ රටටම හොඳ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලායි මම ඉල්ලා සිටින්නේ. අපි දන්නවා, පසුගිය කාලයේ මිලිමීටර් 400 ගණනටත් වැඩි වර්ෂාවක් පැවතුණු බව. එවැනි අවස්ථාවක ඇති වන ගංවතුර තත්ත්වය තුළ ජනතාවට සිදු වන හානිය උපරිම ලෙස අඩු කරලා, ඒ අයව බේරා ගෙන, ඒ අයව ජීවත් කරවලා -මුලින්ම ඒ අයට කන්න බොන්න ටික දීලා, සහන දීලා- ඊට පස්සේ වගාවලට වුණු පාඩුව පියවා ගැනීම සඳහා අපි මොකක් හරි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. එහෙම වුණොත් විතරයි එම ජනතාවට සහනයක් ලබා දෙන්න පුළුවන් වෙන්නේ. නැත්නම් හැමදාම එකම ජන කොටසක් තමයි දුක් විඳින්නේ. එකම කොටස තමයි හැමදාම දුක් විඳින්නේ. අපේ රාජ්‍ය ඇමතිතුමා ඒ සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරයි කියලා මම හිතනවා. එම වැඩ පිළිවෙළ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් විය යුතුයි කියා සඳහන් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු මිලාන් ජයතිලක මන්ත්‍රීතුමා.

[අ.භා. 5.06]

ගරු මිලාන් ජයතිලක මහතා
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ලලිත් වර්ණ කුමාර මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව මා ස්ථිර කරනවා. පීඩාවට පත් වෙන ජනතාවක් වාසය කරන ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මම කියන්න කැමැතියි, පසුගිය වතාවේ - මේ මෑතකදී - ආපු ගංවතුර නිසා අපේ කැලණි ගඟ ආශ්‍රිත ප්‍රදේශ සියල්ලක්ම ගංවතුර තර්ජනයට ලක් වුණු බව.

[ගරු මිලාන් ජයතිලක මහතා]

කැලණි ගඟ ආශ්‍රිතව ජීවත් වන පිරිස පමණක් නොවෙයි, අනෙකුත් ගංගා ආශ්‍රිතව ජීවත් වන පිරිසත් මේ වෙනකොට ගංවතුර තත්ත්වය නිසා විශාල පීඩාවකට පත්ව සිටිනවා. මේ වෙනකොට ලෝකය තාක්ෂණය අතින් දියුණුවෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජලාශයක වතුර අරිනවා නම්, එම ජලාශයෙන් පහළ සිටින පිරිස - ගංදෑලේ සිටින පිරිස - App එකක් මාර්ගයෙන් හෝ දැනුවත් කළ හැකි කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා.

ඒ වාගේම පසුගිය කාල සීමාවේ අපේ ප්‍රදේශ අධික ලෙස ගංවතුරින් යට වුණා. ඒ නිසා අපේ ප්‍රදේශවල තිබුණු ඇළ වේලි සියල්ලක්ම කඩාගෙන ගිහිල්ලා කෘෂි කර්මාන්තයට දැවැන්ත හානියක් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ වෙනකොට අපේ ප්‍රදේශයේ ඇති බොහෝ මාර්ග වාගේම, පාලම් සහ බෝක්කුත් ගැලවී ගිහින් තිබෙනවා. එම නිසා විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කය ඇතුළු ගංවතුරෙන් ආපදාවට ලක් වුණු සියලු ප්‍රදේශවලට තවත් වැඩි මුදල් ප්‍රමාණයක් කඩිනමින් ලබා දීලා, ජනතාවට ඒවා නැවත හදලා දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් වෙනම ව්‍යාපෘතියක් හැටියට හෝ කඩිනමින් සකස් කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. මොකද, අද වන විට ප්‍රාදේශීය සභා සහ පළාත් සභා මේ සඳහා මුදල් වියදම් කරන්න බැරි තත්ත්වයකට පත්වෙලා තිබෙන්නේ. එම නිසා මොනයම් හෝ ක්‍රමවේදයක් අනුගමනය කරලා පසුගිය වතාවේ ඇති වූ ගංවතුරෙන් විනාශ වුණු මාර්ග පද්ධතිය වාගේම විනාශ වුණු අනෙකුත් දේවල් කඩිනමින් සකස් කර දෙන්න අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම සඳහා පාර්ලිමේන්තුව හැටියට මැදිහත් වන ලෙසත් අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සඳහා අපට කඩිනමින් මුදල් ප්‍රතිපාදන ලබා දෙන්න කියලා අපි ගරු ජනාධිපතිතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගංවතුර ඇති වූ ප්‍රදේශවල ආපදා කළමනාකරණ වැඩසටහනක් නිසියාකාරව ක්‍රියාත්මක වෙනවා අපි තවම දැක්කේ නැහැ. ඒ ප්‍රදේශවලට ගිහිල්ලා බෝට්ටු, පාරු වාගේ දේවල් තියලා, හදිසි ආපදාවක් වුණොත් ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන එක පිළිබඳව පුහුණුවක් ලබා දුන් කණ්ඩායමක් ඒ තැන්වල තියන්න ඕනෑ. ප්‍රාදේශීය සභාවක වෙන්න පුළුවන්, එවැනි කණ්ඩායමක් පුහුණු කරලා තියෙන්න ඕනෑ. නමුත්, ඒ විධියේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අපට තවමත් බැරිවෙලා තිබෙනවා. ගස් කඩාගෙන වැටුණු තැන් හදන්න, යන්න බැරි තරම් අබලන් වුණු පාරවල් හදන්න යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කර දෙන්න අවශ්‍යයි. එම නිසා ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන හරහා එහි වගකීම දරන බලධාරීන් ඉදිරිපත් වෙලා, නැවත වතාවක් මෙවැනි විපතක් සිදු වුණොත් හැකි ඉක්මනින් ඊට අවශ්‍ය පිළියම් යෙදීමට කටයුතු කළ යුතුයි. ස්වභාව ධර්මයෙන් ඇති වන විපත් අපට සියයට 100ක්ම වළක්වාගන්න අමාරුයි. නමුත් අපට හැකි පමණින් අපේ ජීවිත හා දේපළ ආරක්ෂා කර ගතහැකි වැඩ පිළිවෙළක් මේ හරහා සකස් කරලා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම මම මේ මොහොතේ කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලාට හැකි නම් මේක ජනාධිපතිතුමාට දන්වා යවන හැටියට මම නැවත වතාවක් ඉල්ලා සිටිනවා. මොකද, මේ කටයුතු ක්‍රියාත්මක කරන්න අපට කඩිනමින් මුදල් ප්‍රතිපාදන අවශ්‍යයි. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කුමාරසිරි රත්නායක මන්ත්‍රීතුමා.

[අ.භා. 5.09]

ගරු කුමාරසිරි රත්නායක මහතා
(மாண்புமிகு குமாரசிறி ரத்னாயக்க)
(The Hon. Kumarasiri Rathnayaka)

මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද ගරු ලලිත් වර්ණ කුමාර මන්ත්‍රීතුමා ගෙන ආ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව කාලීන වශයෙනුත් ඉතාම වැදගත් යෝජනාවක්. පසුගිය කාලය තුළ නිරිත දිග මෝසම සක්‍රිය වීමත් එක්ක මේ රට තුළ අධික වැසි තත්ත්වයක් සහ අධික සුළං තත්ත්වයක් අපට දකින්න ලැබුණා. එම නිසා දිස්ත්‍රික්ක ගණනාවක ජනතාව ගංවතුර නිසා දැඩි පීඩාවකට පත් වුණා. එම සුළං තත්ත්වය නිසා නිවාස ගණනාවක් විනාශ වුණා වාගේම, ගස් කඩා වැටීම් සහ ගොඩනැඟිලි ආදිය කඩා වැටීම නිසාත් පසුගිය කාලය තුළ ජීවිත හානි පවා සිද්ධ වුණා. මැයි මාසයෙන් පසු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නිවේදනය කළා, පසුගිය වර්ෂවලට සාපේක්ෂව මේ වර්ෂයේ වැසි තත්ත්වයේ වැඩිවීමක් වාගේම අධික සුළං තත්ත්වයක් පවතිනවා කියලා. එම නිසා ඒ සඳහා ඔවුන්ගේ සූදානමක් තිබුණා. ඒ සඳහා නිසි දැනුවත් කිරීම් සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විධියට, අදාළ අමාත්‍යාංශය විධියට ඒ වෙනුවෙන් උපරිමයෙන් මැදිහත් වීමක් අවශ්‍යයි කියන කාරණය ඔවුන් නිරන්තරයෙන්ම සඳහන් කළා.

අපි දැක්කා, විෂය භාර අමාත්‍යාංශයේ නිලධාරිනුත්, ඒ වාගේම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරිනුත්, දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරිනුත් බොහෝ අවස්ථාවල ආපදාවලට ලක් වූ ප්‍රදේශවලට ගිහිල්ලා ඒ කටයුතුවලට මැදිහත් වෙමින්, ඒ ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දෙන්නත්, ඔවුන් ඒ තැන්වලින් මුදා ගන්නත් ලොකු කැප කිරීමක් කළ ආකාරය. ඒ හා සම්බන්ධ වුණු ගරු රාජ්‍ය ඇමතිතුමාටත්, අමාත්‍යාංශයේ නිලධාරින් සියලුදෙනාටත් මේ අවස්ථාවේදී අපේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම දිස්ත්‍රික් මට්ටමින් ගත්තාම දිසාපතිවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ආපදා කළමනාකරණ නිලධාරින්, විශේෂයෙන්ම ග්‍රාම නිලධාරින් ඇතුළු සියලුදෙනාටත් ඒ සඳහා මැදිහත්වීම සම්බන්ධයෙන් ඉතා ගෞරවයෙන් යුතුව අපේ ස්තුතිය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිස්ත්‍රික්ක විධියට ගත්තාම මම නියෝජනය කරන මොනරාගල දිස්ත්‍රික්කයේ ආපදා තත්ත්ව ඇති වුණේ ඉතාම සුළු වශයෙනුයි. ජනවාරි මාසයෙන් පටන් ගත්තාම පසුගිය මාස කිහිපය තුළ අවස්ථා දෙකකදී මොනරාගල, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්මාන දෙකක නාය යෑම් දෙකක් සිද්ධ වුණා. එයින් පවුල් 30කට වැඩි සංඛ්‍යාවක් ආපදාවට ලක් වුණා. ඔවුන් හිටපු නිවාස පවා අහිමි වුණා. ඔවුන් තවමත් ඉන්නේ තමන්ගේ ඥාති නිවෙස්වල හා පොදු ස්ථානවල. ඔවුන්ගේ නිවාස ඉදිකර ගැනීම සඳහා වන්දි මුදල් ලබා දෙන්න අවශ්‍ය ඇස්තමේන්තු සකස් කරලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින්, ඒ වාගේම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ නිලධාරින් මඟින් මේ වෙනකොට එවා තිබෙනවා. නමුත්, තවමත් විෂය භාර අමාත්‍යාංශයෙන් ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීලා නැහැ. ඒ නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා මම මේ වෙලාවේ මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආපදාවක් වූ සැනින් ඒ ආපදාවට ලක් වුණු පුද්ගලයින් සඳහා විෂය භාර අමාත්‍යාංශයෙන් රුපියල් 10,000ක මුදලක් ලබා දෙනවා. අපි පසුගිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ ගැන කථා කරද්දි දැනගන්න ලැබුණා, ඒ මුදල් පවා මේ වෙනකොට ඒ දිස්ත්‍රික් කාර්යාලවලට ලැබිලා නැහැ කියලා. ඒ නිසා විෂය භාර අමාත්‍යාංශයේ අදාළ

නිලධාරින් මේ පිළිබඳව අවධානය යොමු කරලා, ආපදාවට ලක් වුණු, උන් හිටි තැන් අහිමි වුණු පවුල් වෙනුවෙන් ලබා දිය යුතු ප්‍රතිපාදන කඩිනමින් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා මම මතක් කරනවා.

ඒ එක්කම අපට දැනගන්න ලැබුණා, රට පුරාම හදිසියේම ගස් කඩා වැටීම් සිද්ධ වුණු බව. ඒ සම්බන්ධව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදී වැඩි වශයෙන් අවධානය යොමු වුණා. ඒ අනුව ඉවත් කළ යුතු ගස් පිළිබඳව රාජ්‍ය දැව සංස්ථාවට දැනුම් දුන්නත්, ඔවුන්ට මේ වෙනකොට තිබෙන පහසුකම් ප්‍රමාණවත් නොවීම, එහෙම නැත්නම් ඔවුන්ට තිබෙන මානව සම්පත අඩු නිසා වාගේම මූල්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසාත්, ඒ ගස් ඉවත් කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ප්‍රාදේශීය සභාවලට මේ වගකීම භාර දුන්නොත් හොඳයි. ප්‍රාදේශීය සභාවලට එවැනි ගස් ඉවත් කිරීමේ බලය පනතින්ම ලැබී තිබෙනවා. නමුත්, සමහර අවස්ථාවලදී ප්‍රාදේශීය සභාවට ඒ සඳහා විශාල මුදලක් වැය කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අදාළ අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශීය සභාවලට ඒ සඳහා යම් කිසි ප්‍රතිපාදනයක් වෙන් කරලා දුන්නොත්, හදිසියේ ඉවත් කළ යුතු යැයි හඳුනා ගත් ගස් ඉවත් කරන්න පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලය තුළ පාසල්වලත් ගස් කඩා වැටීම් සිද්ධ වුණා. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශයත් ඒ පිළිබඳව දැනුවත් කරලා, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මැදිහත්වීමෙන්, ප්‍රාදේශීය සභා හෝ රාජ්‍ය දැව සංස්ථාව හෝ කිසියම් හෝ ආයතනයක් සම්බන්ධ කරගෙන, පාසල්වල තිබෙන අනතුරුදායක ගස් ඉවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළොත්, පාසල් දරුවන්ට අනතුරක් සිදු විය හැකි අවස්ථා වළක්වා ගන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මම කරනවා.

ඒ වාගේම හදිසි ආපදා තත්ත්ව හමුවේ ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නිරන්තරයෙන්ම උපදෙස් ලබා දෙනවා. එලෙස ඔවුන් උපදෙස් ලබා දුන්නත්, අනපේක්ෂිතව සිදුවන ආපදා නිසා අවස්ථා කිහිපයකදීම අපේ රටේ බොහෝ තැන්වල ජීවිත අහිමිවීම් ද වාර්තා වුණා. ඒ නිසා ඒ පිළිබඳව නැවතත් අවධානය යොමු කරමින්, පසුගිය කාලය තුළ වැඩි වශයෙන් ආපදාවට ලක් වුණු දිස්ත්‍රික්ක පිළිබඳවත් වැඩි අවධානයක් යොමු කරමින්, හැම දිස්ත්‍රික්කයකම ඒ සඳහා සුදුසු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීමත් මා කරනවා. අපේ ගරු ලලිත් වර්ණ කුමාර මන්ත්‍රීතුමා සභාව කල් තැබීමේදී මෙවැනි යෝජනාවක් ගෙන ඒම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන කිහිපය අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චින්තක අමල් මායාදුන්න මන්ත්‍රීතුමා.

[අ.භා. 5.16]

ගරු චින්තක අමල් මායාදුන්න මහතා
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ලලිත් වර්ණ කුමාර මන්ත්‍රීතුමා ගෙන ආ මෙම සභාව කල් තැබීමේ යෝජනාව ඇත්ත වශයෙන්ම ඉතාම කාලෝචිත යෝජනාවක් බව මම මුලින්ම කියන්න කැමැතියි.

පසුගිය කාල පරිච්ඡේදය තුළදී අපි මේ ලෝකයේ මින් පෙර නොදුටු හදිසි ආපදා තත්ත්වයන් කිහිපයක් දැක්කා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකට එක උදාහරණයක් තමයි කොවිඩ් වසංගතය; අපි කවදාවත් දැකලා තිබුණේ නැති සුනාමිය; අපි කවදාවත් දැකපු නැති කුණු කඳු නාය යෑම; මිලිමීටර් 450කටත් වැඩි අධික වර්ෂාව. මේ වාගේ විවිධ ව්‍යසන රාශියකට අපේ රටට මුහුණ දෙන්න සිදු වුණා. හැබැයි, ඒ ව්‍යසනවලට මුහුණ දෙන්න සිදු වුණු අවස්ථාවලදී රටක් හැටියට අපි මොකක්ද කරන්න ඕනෑ? පසුගිය දිනවල පැවති අධික වර්ෂාපතනයත් සමඟ ඇති වුණු ගංවතුර අවස්ථාවේදී ගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු සියලුදෙනා ගුවනින් ගිහිල්ලා සොයා බලලා, ඒ ජනතාවට ලබා දිය යුතු පහසුකම් ටික ලබා දෙන්න කටයුතු කළා. හැබැයි, අපි එක තැනක හිර වෙලා ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම හිර වෙලා සිටීමට බලපෑ කාරණය මොකක්ද? ඒ, සමහර අණ පනත්. අපේ ජනතාව හදිසි ව්‍යසනයකට ලක් වෙනකොට, හදිසි ආපදාවකට ලක් වෙනකොට ක්ෂණික පිළිතුරු සපයන්න අපට අවස්ථාවක් නැහැ. මොකද, අපේ රටේ ඒ සඳහා අරමුදලක් නැහැ. මේ රටේ Budget එකෙන් හදිසි ආපදා තත්ත්වයකට මුදලක් වෙන් කරනවා නම්, අපි එය අරමුදලක් බවට පත් කළ යුතුමයි. මොකද, එහෙම නැති වුණොත් කවදා හරි අපේ රටේ ජනතාවට ඒ කාරණා දිහා බලාගෙන ඉන්න බැරි අවස්ථාවක් උදා වෙනවා.

අද කාලගුණ වාර්තාව අනුව මේ මාසයේ 19වැනි දාට පසුව නැවත වතාවක් පසුගිය දිනවල වාගේම වර්ෂාව සක්‍රිය වෙනවා. එහෙම වර්ෂාව සක්‍රිය වුණාම නැවත වතාවක් මොකක්ද සිද්ධ වෙන්නේ? නැවත ගංවතුර එනවා. එහෙම නැත්නම් කාලගුණ විපර්යාස සිදු වෙලා, සුළි සුළං ඇවිල්ලා, ගස් කොළන් කඩාගෙන වැටිලා, දේපළ හානි සිදු වෙලා, නැවත වාරයක් මිනිස් ජීවිත බිලි ගන්නවා. අපි ඒ වනතුරු බලාගෙන ඉන්නවාද කියන කාරණය ගැන හිතා බලන්න ඕනෑ.

අපේ රටේ වැව් පද්ධතිය හදා ගන්න ගියාම සමහර වෙලාවට නොයෙකුත් ප්‍රශ්න ඇති වෙනවා. සමහර රාජ්‍ය නිලධාරින් කැමති නැහැ, ඒ වැව් පද්ධතිය හදනවාට; පස් ටික අයින් කරනවාට; වැලි ටික ඉවත් කරනවාට. ඒගොල්ලන්ට අවුරුදු ගණනාවක් තියා ගත්ත විධියටම ඒ මඩ ගොහොරුව එහෙමම තිබෙන්න ඕනෑ. ගමේ වැවක් ප්‍රතිසංස්කරණය කරලා, වැවට අවශ්‍ය වතුර ප්‍රමාණය එකතු කරගෙන, කෘෂි කර්මාන්තය කරගෙන යන්න දෙනවා නම් මම හිතන විධියට මේ ප්‍රශ්නවලින් එක කොටසක් හරි විසඳෙනවා. අපි දන්නවා, ප්‍රාදේශීය ලේකම්තුමා යටතේ ග්‍රාම නිලධාරිතුමා, සමෘද්ධි නිලධාරිතුමා, සංවර්ධන නිලධාරිතුමා වාගේ රාජ්‍ය නිලධාරින් රාශියක් අපේ ගම්වල ඉන්න බව. ගමේ ඉන්න මේ රාජ්‍ය නිලධාරින් සියලුදෙනාගේ ඇස් දෙක වහලා, ගමක තිබෙන වෙලක් ගොඩ කරන්න පුළුවන්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඇළ මාර්ගයක් හරස් කරන එක එහෙම නැත්නම් ස්වභාවිකව තිබෙන වැඩ පිළිවෙළ වෙනස් කරලා, වෙනත් ආකාරයේ අනවසර ඉදිකිරීම් කරන්න පුළුවන්ද? බැහැ. එහෙම නම් රාජ්‍ය නිලධාරින් තමන්ගේ මූලික වගකීම, රාජකාරිය පැහැර හැර තිබෙනවා. එලෙස රාජකාරිය පැහැර හරින කට්ටිය මේ දවස්වල නම් මහ පාරට බැහැලා පිකට්ටිං කරනවා, උද්ඝෝෂණය කරනවා, පඩි වැඩි කරන්න කියලා. හැබැයි, පඩිය වැඩි කර ගන්නවා වාගේම තමන් රටට කළ යුතු කාර්යභාරයත්, ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකමත් රාජ්‍ය සේවයේ ඉන්නා ලක්ෂ 15ම ඉෂ්ට කරන්න ඕනෑය කියන කාරණය මම විශේෂයෙන් මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඊළඟට, වැව් අමුණු හදනකොට සමහර වෙලාවට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව කියනවා, මේ වැව තිබෙන්නේ කැලේ, ඒ නිසා මේක හදන්න දෙන්න බැහැ කියලා. ඒ වාගේම

[ගරු චින්තක අමල් මායාදුන්න මහතා]

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කියනවා, මේක අපේ වැව, මේක හදන්න දෙන්න බැහැ කියලා. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව කියනවා, මේක අපේ වැව, ඒ නිසා මේක හදන්න දෙන්න බැහැ කියලා. මේ විධියට අවුරුද්දකට වෙන් කරන ප්‍රතිපාදන ජනතාවට ප්‍රතිලාභයක් විධියට ලැබෙන්න දෙන්නේ නැහැ කියමින් රාජ්‍ය යන්ත්‍රණය එක එක තැන්වල ඉඳගෙන එහාට මෙහාට කකුලෙන් අදිනවා. අපේ රටේ ඇති වෙන මේ ස්වාභාවික විපත්වලට නියම පිළිතුර සොයා දෙන්න බැරි වීම ගැන මම බොහොම කනගාටු වෙනවා. එම නිසා ඒ වෙනුවෙන් සක්‍රිය අරමුදලක් හදන්න ඕනෑ. අඩුම තරමින් ජනාධිපතිතුමාට කියලා පරිපූරක ඇස්තමේන්තුවක් ගෙනැල්ලා හෝ හදිසි ආපදා තත්ත්වයකට මුහුණ දෙන්න යම්කිසි මුදල් ප්‍රමාණයක් සංචිත විධියට වෙන් කර ගන්න ඕනෑ. ප්‍රාදේශීය සභාව, පළාත් සභාව සහ පාර්ලිමේන්තුව කියන මේ ආයතන තුන ගත්තාම අද ප්‍රාදේශීය සභාවෙන් කළ යුතු සේවාව ඉෂ්ට කර ගන්න බැහැ. සමහර වෙලාවට රාජ්‍ය නිලධාරීන් ඒ තැන්වලට ගිහිල්ලා හිර වෙලා ඉන්නවා. එදා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා, මන්ත්‍රීවරයා තමන්ගේ ප්‍රාදේශීය සභා බල සීමාව යම්කිසි ආපදාවකට ලක් වෙනකොට කිසිම නීතිමය තත්ත්වයක් ගැන හොයන්නේ නැතිව ඒ ජනතාව ගැන හැකි ඉක්මනින් සොයා බලා කටයුතු කළා. ඒ වාගේම ඒ ජනතාව වෙනුවෙන් බත් පැකට් එකක් හෝ ලබා දුන්නා; ජලය බැස යන්නේ නැතිව මාර්ග හරස් වෙලා තිබෙනවා නම් ඇළ මාර්ගයක් කපා හෝ ගංවතුර පාලනය කරන්න අවශ්‍ය කටයුතු සකස් කරලා දුන්නා.

හැබැයි, අද ඒ තත්ත්වය එහෙමපිටින්ම නැති වෙලා තිබෙනවා. ඒ නිසා මහ පාර දිගේ පිකටිං කරලා, ස්ට්‍රයික් කරලා තමන්ගේ ජීවිතය හදා ගන්නවා වාගේම මේ රටේ ජනතාව වෙනුවෙනුත් කැපවීමක් කරන්න කියන ගෞරවනීය ඉල්ලීමත් මම මේ අවස්ථාවේදී කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුත්තලම දිස්ත්‍රික්කය කියන්නේ වැස්ස නැති ප්‍රදේශයක්; වැඩි හරියක් පායන කාල පරිච්ඡේදයක් තිබුණේ. හැබැයි, දැන් පුත්තලම දිස්ත්‍රික්කය, නුවරඑළියටත් වඩා හපන්. පුත්තලම දිස්ත්‍රික්කයට දැන් හැම දාම වහිනවා. එහෙම තත්ත්වයක් අද වනකොට ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේක උතුරද, දකුණද, නැඟෙනහිරද, බස්නාහිරද කියන එකට වඩා රටේ එකම යන්ත්‍රණයක් ගෙනැල්ලා, ඒ යන්ත්‍රණයට අනුව වැඩ පිළිවෙළක් දියත් කරන ක්‍රමවේදයක් අපි අනුගමනය කළ යුතුයි. කියන්න බොහොම සතුටුයි, කාගේත් සුන්දරී වාගේ ඉන්නා යුද හමුදාව, නාවික හමුදාව ඇතුළු පොලිසිය හා සිවිල් ආරක්ෂක බලකාය තමයි මේ සිදුවීම්වල අවසානයේදී උදවුවට එන්නේ. හැබැයි, පටට යනකල් ඒ මිනිස්සුන්ට බණිනවා; අට පාස් අය කියනවා; ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම ගැන කථා කරනවා. විවිධ ආකාරයෙන් අඩන්තේට්ටම් කරනවා. එවැනි අභිංසක වීරෝදාර රණවිරුවන් පිරිසක් හිටියේ නැත්නම් අපේ රට ඇත්තටම සෙත්තපෝච්චි කියන්න තමයි සිද්ධ වෙන්නේ. ඒ නිසා අපි කියනවා, මේ කටයුතු සම්බන්ධයෙන් නිසි යන්ත්‍රණයක් හදලා එයට අවශ්‍ය කරන සංචිතයක් නිර්මාණය කරලා, රටේ සිදු වෙන ස්වාභාවික විපත්වලින් ජනතාව බේරා ගන්න කටයුතු කළ යුතුයි කියලා. බල-බලා සිටියදී අපට මේ විපත් එන්නේ නැහැ.

ලංකාව "ඉන්දියන් සාගරයේ මුතු ඇටය" කියායි හඳුන්වන්නේ. හැබැයි, මුහුදෙන් වට වෙච්ච මේ ස්වර්ණදීපය කවදා හරි දවසක මුහුදට ගිලෙන්න පුළුවන්. ස්වාභාවික විපත්වලට හසුවෙන්න පුළුවන්. ඒ නිසා ස්වාභාවික විපත්වලින් රටත්, ජනතාවත් බේරා ගැනීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීම අපි කාගේත් යුතුකමක් කියන එක මතක් කරමින්, අද දින ලලිත් වර්ණ කුමාර මන්ත්‍රීතුමා ගෙනාපු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ස්ථිර කරමින්, ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින්, ඒ සඳහා නියම වැඩ කොටසක් කරන්න කියන ගෞරවනීය ඉල්ලීමත් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අශෝක ප්‍රියන්ත රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 5.23]

ගරු අශෝක ප්‍රියන්ත මහතා (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக்க பிரியந்த - உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ashoka Priyantha - State Minister of Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. ඒ වාගේම ඉතාම වැදගත්, කාලෝචිත, අපි හැමෝම අවධානය යොමු කළ යුතු විශේෂයෙන්ම මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනයකොට හෝ විසඳා ගත යුතු ප්‍රශ්න ගණනාවක් ඇති ආපදා තත්ත්වයන් පිළිබඳව අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනා අපේ ලලිත් වර්ණ කුමාර මන්ත්‍රීතුමාටත් මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. කථිකයන් කිහිපදෙනෙකුම මේ පිළිබඳව සාධනීය කරුණු-කාරණා කිහිපයක් මතු කළා. ඒ අතර, විසඳුම් සොයන්න ඕනෑ ආකාර පිළිබඳවත් කථා කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙනදාට - මීට වසර කිහිපයකට කලින් තිබුණාට - වඩා අද අපේ රට ආපදා තත්ත්වවලට මුහුණ දෙනවා. වහිද්දී වතුරෙන් යට වෙනවා. පායද්දී රස්නෙන් මිරිකෙනවා. සුළං හමද්දී සුළඟෙන් බැට කනවා. ඒ හැම අවස්ථාවකදීම මාධ්‍ය ආයතන සහ නිවේදන නිකුත් කරන අය මරණ සහ අවතැන් වූවන්ගේ සංඛ්‍යාව පිළිබඳව විනාඩියෙන්, පැයෙන්, දවසින් නිවේදන නිකුත් කරනවා.

අද දින ලලිත් වර්ණ කුමාර මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක් බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව අපි භය නැතුව තීන්දු - තීරණ ගත යුතු අතර, ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක්ද නිර්මාණය කළ යුතුයි. විශේෂයෙන්ම මම ජීවත් වෙන පුත්තලම දිස්ත්‍රික්කය මේ ආපදා තත්ත්වයන් තුළ දැඩි ආපදාවකට ලක් නොවූවත්, ජීවිත විශාල ප්‍රමාණයක් බිලි ගත්තා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාදම්පේ ප්‍රදේශයේ කාන්තාවක් වර්ෂාවට, සුළඟට නොතෙමෙන්න ගහක් යටට ගිය වෙලාවේ ඒ කාන්තාවගේ ඔළුවට ඒ ගහ කඩාගෙන වැටුණා. ඒ, පාර අයිනේ තිබුණු ගහක්. ඒ වාගේම, නාත්තන්ඩිය සාගරගම මාර්ගයේ තාත්තයි, දුවයි ගමන් කරමින් සිටියදී දුවගේ ඔළුවට ගහක් කඩාගෙන වැටී එතැනදීම දුව මිය ගියා. මේ ගස් මීට පෙර ඉවත් කරන්න තිබුණු ඒවාද, ඉවත් කරන්න යෝජනා වෙච්ච ඒවාද, එහෙම නැත්නම් මේවා ඉවත් කරන්න යම් වැඩ පිළිවෙළක් නොතිබුණාද කියලා අපි සොයා බලන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වෙනුවෙන් තිබෙන ඒ ඒ ආයතනවල වගකීම් හා යුතුකම් අපි ඉටු කරන්නත් ඕනෑ.

විශේෂයෙන්ම ජල කළමනාකරණය සම්බන්ධයෙන් එදා තිබුණු එල්ලංගා පද්ධතිය අද වනකොට සහමුලින්ම විනාශ වෙලා තිබෙනවා.

ස්වාභාවික ඇළ මාර්ග සහමුලින්ම අහිමි වෙලා තිබෙනවා. නව ඉදිකිරීම් සහ විවිධ කර්මාන්තශාලා නිසා ඒ ස්වාභාවික මාර්ග පද්ධති - ඇළ මාර්ග, වේලි පද්ධති - අද වෙද්දී සම්පූර්ණයෙන් වහලා දාලා තිබෙනවා. සංවර්ධනය කියන වැඩ පිළිවෙළ යටතේ සංවර්ධනය මුවාවෙන් සිදු වුණු යම් යම් කාරණා නිසා අපි ඉතා දැඩි සේ පීඩාවන්ට පත් වෙන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව වැඩ පිළිවෙළක් හදන්න, යම් කතිකාවක් නිර්මාණය කරනවා නම් හොඳයි කියලා මම ගරු ජනාධිපතිතුමාටත් විශේෂයෙන්ම අපේ රජයටත්, ඒ වාගේම සමස්ත පාර්ලිමේන්තුවටත් යෝජනා කරනවා. විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, පසුගිය ආපදා තත්ත්වයේදී ජනාධිපතිතුමා, අගමැතිතුමා, කැබිනට් මණ්ඩලය, ඒ ඒ ප්‍රදේශවල මැති-ඇමතිවරු, දිසාපතිතුමන්ලා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, ක්ෂේත්‍රයේ අනෙකුත් රාජකාරි කරන නිලධාරීන් දක්වපු සහයෝගයට. නිලධාරීන් යුහුසුලුව ඒ ස්ථානවලට ගිහිල්ලා පුළුවන් ආකාරයට ඒ අවශ්‍ය කටයුතු කළමනාකරණය කර ගනිමින් ආපදාව අවම කර ගන්න කටයුතු කළා. ඒ නිසා අපට විශාල ජීවිත ප්‍රමාණයක් අහිමි වීම වළක්වන්න පුළුවන් වුණා; විශාල දේපළ ප්‍රමාණයක් අහිමි වීම වළක්වන්න පුළුවන් වුණා. පුළුවන් ආකාරයට ඔවුන් රැක බලා ගන්න පුළුවන්කම ලැබුණා. ඒ අතරතුර මේ සභාවේ සමහර මැති-ඇමතිවරු මෙන්ම මමත් කියනවා, යම් යම් විධියට අපේ අතින් වෙන්න ඕනෑ, නිලධාරීන්ගේ අතින් වෙන්න ඕනෑ වගකීම්, යුතුකම් අත් හැරුණු තැන් තිබෙන බව. ඒ අවස්ථාවේදී පීඩාවට පත් වුණු ජනතාව වෙනුවෙන් මම සමාව ඉල්ලනවා. විශේෂයෙන් සමස්ත රටේම ඒ ජීවිත අහිමි වූ ජනතාවගේ පවුල්වලිනුත් මේ අවස්ථාවේ මම සමාව ඉල්ලනවා.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ සිදු වන කටයුතුවලදී ගමේ නිලධාරියාගේ සිට ලංකාවේ ඉහළම පරිපාලන නිලධාරියා දක්වා සම්බන්ධ වෙනවා. මම යෝජනා කරනවා, අපේ මැති-ඇමතිවරුන්ගේ යෝජනා එක්ක ඒ වෙනුවෙන් ක්ෂණිකව වැඩ කරන්න ඕනෑ කියලා. ලලිත් වර්ණ කුමාර මන්ත්‍රීතුමාගේ යෝජනාවේදී මේ කාරණය කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් පාස් වෙලා ඒවා ජනාධිපති ලේකම් කාර්යාලයට ගිහිල්ලා, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගිහිල්ලා, ග්‍රාම නිලධාරි වාර්තා කැඳවලා කී දෙනෙක් ඉන්නවාද, උයනවාද, කනවාද එහෙම නැත්නම් වියළි සලාක බෙදනවාද, තව ටිකක් බලනවාද, තව ටිකක් වතුරින් යට වුණාම දෙනවාද වාගේ දේවල් කිය කියා හිටියොත් පෙරහැර ගිහිල්ලා ඉවර වෙනවා. රටේ හදුනාගත් ප්‍රදේශ තමයි ආපදා තත්ත්වයන්ට පත් වෙන්නේ. හදුනාගත් ප්‍රදේශවල ආපදා පිළිබඳව යම්කිසි විධියකට රාජ්‍ය මැදිහත් වීම ඇතුව ක්ෂණිකව පාවිච්චි කරන්න පුළුවන් විධියේ අරමුදලක් ඇති කිරීම හා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම් ආපදා තත්ත්වයට පත් වෙන ජනතාව ක්ෂණිකව ඉන් මුදා ගන්න අපට පුළුවන්කම ලැබෙනවා.

ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විෂයය අදාළ වන්නේ ආරක්ෂක අමාත්‍යාංශයට. රාජ්‍ය අමාත්‍ය ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා මේ ප්‍රශ්නවලට දීර්ඝ පිළිතුරක් එවා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාගේ දැන ගැනීම සඳහා මෙහි තිබෙනවා, දීමනා වැඩි කරපු ප්‍රමාණ, ඒ වාගේම අවශ්‍ය කටයුතු සඳහා වූ පූර්ව සූදානම, ඒ අයට පුහුණුවීම් කිරීම, ත්‍රිවිධ හමුදාව, STF එක, පොලීසිය යොදවපු ආකාරය පිළිබඳ විස්තර. විශේෂයෙන්ම ප්‍රශ්නය යොමු කරපු ගරු මන්ත්‍රීතුමා නියෝජනය කරන ප්‍රදේශය වන පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, කළුතර දිස්ත්‍රික්කය පිළිබඳව විශේෂයෙන් සඳහන් කරමින් තමයි මෙම පිළිතුර එවා තිබෙන්නේ. දීර්ඝ පිළිතුරක් තිබෙන්නේ. එම නිසා මම ඒ පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

ගැටලුව

සහන ක්‍රමවත්ව හා ක්ෂණිකව නොලැබීම, ආපදා සඳහා වෙන්කරනු ලබන ප්‍රතිපාදන නිසි පරිදි පරිහරණය නොකිරීම

පිළිතුර -01

හදිසි ආපදා අවස්ථාවන්හිදී ජනතාව වෙත සහන සැලසීම සඳහා අමප/95/1412/120/102 ලද කැබිනට් අනුමැතිය අනුව 1996.07.02 දින පිහිටුවන ලද ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් මේ දක්වා ආපදා අවස්ථාවන්හිදී පීඩාවට පත්වන ජනතාව වෙත සහන සැලසීම සිදු කරමින් පවතී. පැවති රජයන් අනුව විවිධ අමාත්‍යාංශ යටතේ පැවති ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය දැනට ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර රාජ්‍ය මුදල් ජනතාව වෙත සහන ලෙස යෙදවීම සිදු කරන පූර්ණ රාජ්‍ය ආයතනය වේ.

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් ආපදා අවස්ථාවන්හිදී ජනතාව වෙත වඩාත් කාර්යක්ෂමව සහන සැලසීම සඳහා ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සහන සේවා නිලධාරීන් අනුයුක්ත කොට ඇත. ආපදා කළමනාකරණ චක්‍රලේඛ 1/2020 හා 1/2020/1 අනුව හා පසුගිය ආපදා අවස්ථාවේ ගනු ලැබූ තීරණ අනුව දැනට සහන සැලසීමේ යන්ත්‍රණය ඉතා කාර්යක්ෂමව ක්‍රියාත්මක වේ.

ඒ අනුව ජනතාව වෙත කඩිනමින් සහන සැලසීම සඳහා 2024 වර්ෂයට අදාළ ප්‍රතිපාදන 2024 වර්ෂයේ මුල් මාසය තුළ දී සියලු දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කොට ඇති අතර අමතර ප්‍රතිපාදන ඉල්ලීම් කරන ලද සෑම අවස්ථාවකදීම ඉතා කෙටි කාලයක් තුළ (දිනක් ඇතුළත) ලබා දීම මේ දක්වා සිදු කොට ඇත.

හදිසි ආපදා අවස්ථාවන්හිදී පිසූ ආහාර, වියළි සලාක, පානීය ජලය, මරණ වන්දි, තුවාලකරුවන් සඳහා වන්දි හා නිවාස හානි වන්දි ලබා දීම සිදු කරනු ලබන අතර නාය යාම් හා නාය අවදානම හේතුවෙන් ඉවත් කරන ජනතාව නැවත පදිංචි කිරීමේ කටයුතු ද මේ දක්වා අඛණ්ඩව සිදු කරමින් පවතී.

2024.05.15 දින සිට ඇති වූ ආපදා හේතුවෙන් පවුල් 119,525ක පුද්ගලයින් 452,011ක් පීඩාවට පත්ව ඇති අතර සුරක්ෂිත මධ්‍යස්ථාන 293ක පවුල් 6,800ක පුද්ගලයින් 24,532 ක් රඳවා තබා ඇත. (සමස්ත ආපදා තත්ත්ව වාර්තාව පහත දක්වා ඇත.) ඔවුන් වෙත සහන ලබා දීම සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන හා වියදම පහතින් දක්වා ඇත.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ආපදා තත්ත්ව වාර්තාව



ප්‍රතිපාදන හා වියදම

වැය විෂය - කඩිනම් සහන - 2024						
වැය ශීර්ෂය - 103-02-18-001-1501						
2024 වර්ෂය සඳහා ලැබුණු ප්‍රතිපාදන			340M			
	පළාත		දිස්ත්‍රික්කය	ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය	2024.05.31 දිනට වියදම (ගිණුම් අංශය)	2024.06.11 දිනට ප්‍රගතිය (දිස්ත්‍රික්ක මට්ටමින්)
1	මධ්‍යම	1	මහනුවර	5,674,000.00	2,741,859.21	
		2	මාතලේ	2,500,000.00	630,785.55	
		3	නුවර එළිය	4,000,000.00	814,437.00	
2	උතුරු මැද	4	අනුරාධපුර	3,500,000.00	935,490.00	
		5	පොළොන්නරුව	5,000,000.00	1,626,470.57	
3	උතුර	6	යාපනය	2,500,000.00	667,850.00	
		7	කිළිනොච්චි	8,905,250.00	5,575,367.17	
		8	මන්නාරම	2,500,000.00	82,250.00	
		9	වව්නියා	2,500,000.00	30,800.00	
		10	මුලතිව්	2,500,000.00	239,260.50	
4	නැගෙනහිර	11	අම්පාර	9,500,000.00	7,012,815.75	
		12	මඩකලපුව	7,179,658.00	3,112,020.00	
		13	ත්‍රිකුණාමලය	3,500,000.00	1,518,196.08	
5	වයඹ	14	කුරුනෑගල	2,500,000.00	143,085.00	
		15	පුත්තලම	9,750,000.00	412,320.00	
6	දකුණ	16	ගාල්ල	12,225,000.00	358,000.00	
		17	මාතර	56,894,000.00		16,902,225.00
		18	හම්බන්තොට	5,000,000.00	2,289,445.70	
7	ඌව	19	බදුල්ල	7,799,422.20	3,768,536.82	
		20	මොනරාගල	4,500,000.00	2,236,127.40	
8	සබරගමුව	21	කෑගල්ල	2,500,000.00	215,326.34	
		22	රත්නපුර	25,872,500.00	1,951,050.00	
9	බස්නාහිර	23	කොළඹ	55,483,250.00	25,000.00	
		24	කලුතර	31,000,000.00	260,620.00	
		25	ගම්පහ	25,244,300.00	308,820.00	
10			ශ්‍රී ලංකා ආම්	325,477.00	325,477.00	
TOTAL				298,852,857.20	37,281,410.09	16,902,225.00
	2024 වර්ෂය සඳහා ලැබුණු ප්‍රතිපාදන				340,000,000.00	
	දැනට ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය				298,852,857.20	
	වැය ශීර්ෂයේ දැනට ඉතිරි ප්‍රතිපාදන				41,147,142.80	

[ඉහත වගු පුස්තකාලයේ ද තබා ඇත.]
[மேற்படி அட்டவணைகள் நூல்நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.]
[Above charts also placed in the Library.]

හදිසි ආපදා තත්ත්වයකදී විපතට පත් ජනතාවට බාධාවකින් තොරව සහන සැලසීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන දැනට ක්‍රියාත්මක ආපදා කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2020 (1)හි ඡේද අංක 05 (IV), (V) හි සඳහන් පිසු ආහාර හා වියළි සලාකවලට අදාළ උපරිම වියදම් සීමාවන්, පහත ආපදා කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2020 (II) පරිදි සංශෝධනය කර ඇත.

කාරණය	01/2020 චක්‍රලේඛය අනුව දැනට වැය කළ හැකි උපරිම සීමාවන් රු.			සංශෝධිත උපරිම සීමාවන් රු.
පිසූ ආහාර	තනි පුද්ගලයෙකු වෙනුවෙන්	දිනකට (වේල් 03)	450.00	600.00
වියළි සලාක	තනි පුද්ගලයෙකු සඳහා	සතියකට	1,350.00	1,800.00
	සාමාජිකයන් 02කින් යුතු පවුලක් සඳහා		1,800.00	2,400.00
	සාමාජිකයන් 03කින් යුතු පවුලක් සඳහා		2,100.00	2,800.00
	සාමාජිකයන් 04කින් යුතු පවුලක් සඳහා		2,400.00	3,200.00
	සාමාජිකයන් 05කින් යුතු පවුලක් සඳහා		2,700.00	3,600.00

එමෙන්ම හදිසි ගංවතුර ආපදා අවස්ථාවන්හිදී ක්‍රියාත්මක වීමට අවශ්‍ය බෝට්ටු, අඟුල් ආදිය අදාළ ස්ථාන වෙත ගංවතුර අවදානම ප්‍රකාශ කරන ලද අවස්ථාවේ සිට ලබා දීමට කටයුතු සිදු කොට ඇත. හදිසි අවස්ථාවන්හිදී වෙනත් ස්ථාන වෙත බෝට්ටු ප්‍රවාහනය කිරීමට සිදු වූ අවස්ථාවන්හිදී එම කටයුතු වෙනුවෙන් වැය වන ප්‍රතිපාදන කඩිනමින් ලබා දී ඇත.

පිළිතුර 02.

01. <u>විධායක සාරාංශය</u>

ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව යටතේ ක්‍රියාත්මක ආයතනය ලෙස, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතෙහි 13වන වගන්තිය ප්‍රකාරව මෙම ආයතනය පිහිටුවන ලදී. ජාතික ප්‍රතිපත්ති සැලසුමෙන් ක්‍රමෝපායික මහ පෙන්වීම ලබා දීම පිළිබඳ කාර්යය, ජාතික සභාව වෙත පැවරී ඇති අතර, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඒ සඳහා මහ පෙන්වීම ලබා දීම සිදු කරනු ලැබේ. මෙම පනත මඟින් පිහිටුවන ලද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වනුයේ, ආපදා අවම කිරීම, පෙර සූදානම් සැලසුම් සැකසීම, මහජන දැනුවත් කිරීම්, අවදානමට ලක්ව ඇති ජනතාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සහ අනිකුත් ප්‍රධාන ආයතන එක්ව පශ්චාත් ව්‍යසන කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම වේ. ප්‍රාදේශීය මට්ටමේ ව්‍යසන අවදානම් තත්ත්ව අවම කිරීමේ කටයුතු සියලු දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් 25ම ආවරණය වන පරිදි ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණය සහ වගකීම යටතේ පිහිටුවා ඇත. ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ නායකත්වය යටතේ අංශ හයකින් සමන්විතව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණය සකස් වී ඇත. එනම් ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය, පෙර සූදානම් හා සැලසුම් අංශය, පුහුණු හා දැනුවත් කිරීමේ අංශය, හදිසි මෙහෙයුම් හා පූර්ව අනතුරු ඇඟවීමේ අංශය, මානව සම්පත් අංශය හා මූල්‍ය අංශයයි.

02. <u>නිරිත දිග මෝසම් තත්ත්වය පිළිබඳ පුරෝකථනය</u>

නිරිතදිග මෝසම් යනු ශ්‍රී ලංකාවේ පවතින මෝසම් කාල හතරෙන් එකකි. එය මැයි සිට සැප්තැම්බර් දක්වා නිරිතදිග කොටසට බලපානු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස මධ්‍යම කඳුකරයේ පහළට යන දිස්ත්‍රික්ක 12, එනම් බදුල්ල, කොළඹ, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, කළුතර, කෑගල්ල, මාතර, නුවරඑළිය, රත්නපුර, පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි ගංවතුර නායයෑම්, අකුණු සහ අධික සුළං ඇති වේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2024.05.15 දින නිකුත් කරන ලද නිල නිවේදනය අනුව නිරිත දිග මෝසම් තත්ත්වය සක්‍රිය වී ශ්‍රී ලංකාව ආසන්න බෙංගාල බොක්ක ප්‍රදේශයේ පහළ වායුගෝලයේ පවතින කැලඹිලි ස්වභාවය තවදුරටත් වර්ධනය වීම හේතුවෙන් දිවයින පුරා වැසි තත්ත්වය තවදුරටත් බලාපොරොත්තු විය හැකි බවත් ඒ අනුව බස්නාහිර, මධ්‍යම, සබරගමුව සහ ඌව පළාත්වල ඇතැම් ස්ථානවල මි.මී. 100ක පමණ තද වැසි ඇති විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම කල්පිටිය සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. 60 -70 දක්වා වැඩි විය හැකි බවත් නිවේදනය කරන ලදී.

2024.05.15 දින සිට 2024.06.08 දින දක්වා මේ සබැඳිව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් තද වැසි පිළිබඳව සහ මුහුදු ප්‍රදේශ සඳහා අවවාදාත්මක නිවේදනද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කැලණි, කළු, ගිං, නිල්වලා යන ගංගා සඳහා ද අත්තනගලු ඔය සඳහාද ගංවතුර අවදානම් නිවේදනද, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අවදානම් සහ ඉවත්වීමේ රතු නිවේදනද නිකුත් කරන ලදී.

03. <u>අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය</u>

ප්‍රධාන මෝසම් වර්ෂා කාල පරිච්ඡේද දෙකටම අදාළ වන ලෙස දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගං වතුර අවදානමට ලක්වන ප්‍රදේශ හඳුනාගෙන එම ප්‍රදේශ සිතියම් ගතකොට එම සිතියම්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් භාවිතයට ගත හැකි වන ලෙස බෙදා හැර ඇත. (GIS Maps (as per the hazard), Risk Index for Sri Lanka)

04. <u>නිරිතදිග මෝසම් තත්ත්වය සඳහා පෙර සූදානම</u>

2024 මැයි 08වන දින ජාතික පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් නිරිතදිග මෝසම් පිළිබඳ කතිකාවත පවත්වා එහිදී අනාවරණය වූ කරුණු අනුව බස්නාහිර, දකුණ, මධ්‍යම සහ සබරගමුව පළාත්වල සාමාන්‍ය මට්ටමට වඩා වැඩි වර්ෂාපතනයක් සහ ඉතිරි ප්‍රදේශවලට සාමාන්‍ය මට්ටමට ආසන්න හෝ තරමක් වැඩි වර්ෂාපතනයක් ඇතිවීමේ වැඩි හැකියාවක් ඇති බව අනාවැකි පළ කරන ලදී.

මෝසම් කාලයට පෙර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පහත වේ.

- "Desinventar"හි පසුගිය වසර දහයේ බලපෑම් දත්ත මත පදනම්ව වියහැකි ව්‍යසන සම්බන්ධව (Scenario) පෙර සූදානම් සඳහා සූදානම් වීම.
- දිස්ත්‍රික්/ප්‍රාදේශීය මෝසම් පෙර සූදානම් රැස්වීම් පැවැත්වීම.
- මෝසම් මෙහෙයුම් සැලසුම් සමාලෝචනය කර යාවත්කාලීන කිරීම.
- ගමන් කළ නොහැකි මාර්ග හඳුනාගෙන සිතියම්ගත කිරීම.
- ත්‍රිවිධ හමුදාවේ සහ අනෙකුත් ආයතනවල කලාපීය සම්පත් මධ්‍යස්ථාන හඳුනා ගැනීම හා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ස්ථානගත කිරීම සහ සහන ද්‍රව්‍ය සම්බන්ධීකරණය කිරීම.
- හදිසි අවස්ථාවන්වලදී අවශ්‍යවන සන්නිවේදන ක්‍රමවේදයන් ස්ථානගත කිරීමත් එහි ක්‍රියාකාරිත්වය පරීක්ෂා කර බැලීම.
- නිරිතදිග මෝසම් පුරෝකථනය මත පදනම්ව සෙවීම් හා මුදවා ගැනීම් කණ්ඩායම් ස්ථානගත කිරීම.
- කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති හඳුනා ගැනීම.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

මෝසම් කාලය තුළ (ජූනි 02 දින සිට ඉදිරියට)

- බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට අවශ්‍ය ආධාර සැපයීම සඳහා විෂය භාර රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, රාජ්‍ය නොවන සංවිධාන සහ අදාළ සංවිධාන සමඟ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සම්බන්ධීකරණය කර අත්‍යවශ්‍ය සහනාධාර සැපයීමට පියවර ගන්නා ලදී.
- උදා: ගම්බූට් සහ වැහි කඳා UNFPA, Iron Man 4*4 මඟින් බලපෑමට ලක් වූ ප්‍රදේශයන්ගේ පිහිටි ආරක්ෂිත මධ්‍යස්ථානය සඳහා දින දෙකක ආහාර ලබා දෙන ලදී.
- විෂය භාර රාජ්‍ය අමාත්‍යතුමාගේ සංකල්පයකට අනුව "සුරකිමු" පාසල් ආරක්ෂණ වැඩසටහන, පාසල් පරිශ්‍රවල අවදානම ඉවත් කිරීම සහ අධ්‍යාපනයට ආපදාවලින් තොර පරිසරයක් ලබාදීම.

05. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති වගකීම් අනුව ආපදා අවදානම් කළමනාකරණය උදෙසා මහජනතාව තුළ ව්‍යසන ඇතිවීම, ඒවාහි ව්‍යාප්තිය හා හානි සම්බන්ධව දැනුම හා අවබෝධය දියුණු කිරීම මෙන්ම ආපදා කළමනාකරණ ක්‍රියාවලියට දායකවන සියලු පාර්ශ්වකාර ආයතන හා සංවිධාන සම්බන්ධීකරණය කරමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුහුණු හා දැනුවත් කිරීම් අංශය විසින් අදාළ පාර්ශ්ව හා කණ්ඩායම් පුහුණු කිරීම හා දැනුවත් කිරීම් සිදු කරනු ලැබේ.

2024 මේ දක්වා කර ඇති පුහුණු හා දැනුවත් කිරීමේ විස්තරය

අනු අංකය	වැඩසටහන	ඉලක්කගත කණ්ඩායම	ස්ථානය	සහභාගී වූ ගණන
1	ග්‍රාමීය කමිටු නිලධාරීන් සඳහා බෝට්ටු හැසිරවීමේ පුහුණු වැඩසටහන	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 25ක ග්‍රාමීය කමිටු නිලධාරීන් සඳහා	කළුතර	55
2	ග්‍රාමීය කමිටු නිලධාරීන් සඳහා ජීවිත ආරක්ෂා කර ගැනීමේ සහ ප්‍රථමාධාර පුහුණු වැඩසටහන	ග්‍රාමීය කමිටු නිලධාරීන්	කළුතර	20
3	පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති වෙනුවෙන් ජංගම දුරකථන පද්ධතිය යාවත්කාලීන කිරීම	මහ නගර සභා නිලධාරීන්, ගිනි නිවීමේ නිලධාරීන්, හෝටල් සේවකයින්, රාජ්‍ය නිලධාරීන්, පොලිස් නිලධාරීන්, යුද්ධ හමුදා නිලධාරීන්	කළුතර	767
එකතුව				842

- 2024.03.19 වන දින සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි බෝට්ටු ක්‍රියාකාරිත්වය පිළිබඳ පුහුණු වැඩසටහනක් පුද්ගලයින් 55දෙනෙකු සඳහා කළුතර නාවික හමුදා කඳවුරේදී පවත්වන ලදී.
- 2024.03.11 දින සිට 13 දින දක්වා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12ට අයත් බෝට්ටු එන්ජින් 40ක් නාවික හමුදාව සමඟ එක්වී අලුත්වැඩියා කරන ලදී. (පාලින්දනුවර - 08, බුලත්සිංහල - 07, වලල්ලාවිට- 01, අගලවත්ත - 02, කළුතර - 03, මතුගම - 01, දොඩංගොඩ - 03, මිල්ලනිය - 04, මදුරාවල - 04, බණ්ඩාරගම - 04, බේරුවල - 03)

06. හදිසි මෙහෙයුම් අංශයේ ක්‍රියාකාරිත්වය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති හදිසි මෙහෙයුම් අංශය, පැය 24 පුරා ක්‍රියාත්මක වන අතර ආපදා තත්ත්වයන් වර්ධනය වන ආකාරයත්, ප්‍රතිචාර සිදුකළ යුතු මට්ටමත් අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලබයි. ආපදාවේ ප්‍රමාණය, දිස්ත්‍රික් මට්ටමේ නියෝජිත ආයතනවලට පාලනය කිරීමට හැකි සීමාවෙන් ඔබ්බට ගියවිට, ජාතික මට්ටමේ හදිසි මෙහෙයුම් අංශය, හදිසි ප්‍රතිචාර කමිටුව සමඟ සම්බන්ධීකරණය වී සෙවීම් අවදානමේ සිටින ප්‍රජාවන් සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරනු ලබයි.

හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයේ "සූදානම්ව සිටීමේ තත්ත්වය" අඛණ්ඩව පවත්වා ගනිමින් අදාළ තාක්ෂණික, රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණය වෙමින් මෙන්ම හදිසි ඇමතුම් මධ්‍යස්ථානයේ දුරකථන අංක 117 සමඟ පැය 24 පුරා සම්බන්ධ වී කටයුතු කරනු ලබයි.

තාක්ෂණික ආයතනයන් විසින් ලබා දෙනු ලැබූ නිවේදන පදනම් කරමින් විවිධ වූ පූර්ව දැනුම්දීමේ ක්‍රමවේදයන් හරහා ප්‍රජාව දැනුවත් කර ආපදාවන්ගෙන් සිදුවන හානි අවම කර ගැනීමට හදිසි මෙහෙයුම් අංශය කටයුතු කරන ලදී. (WhatsApp, DEWN SMS, DMC Website, social media, Print and Electronic Media, Voice-cuts, TV discussions)

ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා සැලැස්ම



ජාතික, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාමීය මට්ටමින් සිටින රාජ්‍ය යන්ත්‍රණයන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් ආපදා කළමනාකරණ ක්‍රියාවලියට සම්බන්ධ කරගෙන ඇත.

[ඉහත වගුව පුස්තකාලයේ ද තබා ඇත.]
[மேற்படி அட்டவணை நூல்நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.]
[Above chart also placed in the Library.]

07. ආපදා සංක්ෂිප්තය

2024 නිරිතදිග මෝසම් තත්ත්වය හේතුවෙන් කළුතර දිස්ත්‍රික්කයේ තත්ත්ව වාර්තාව

දක්නයන්	සංඛ්‍යාව
▪ බලපෑමට ලක් වූ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව	12
▪ මිය ගිය පුද්ගල සංඛ්‍යාව	03
▪ අතුරුදහන් වූ පුද්ගල සංඛ්‍යාව	-
▪ තුවාල ලැබූ පුද්ගල සංඛ්‍යාව	02
▪ බලපෑමට ලක් වූ මුළු පවුල් සංඛ්‍යාව	8702
▪ බලපෑමට ලක් වූ මුළු පුද්ගල සංඛ්‍යාව	31887
▪ මුළු සුරක්ෂිත මධ්‍යස්ථාන සංඛ්‍යාව (2024.06.08 දිනට)	05
▪ සුරක්ෂිත මධ්‍යස්ථානයන්හි සිටින මුළු පවුල් සංඛ්‍යාව (2024.06.08 දිනට)	43
▪ සුරක්ෂිත මධ්‍යස්ථානයන්හි සිටින මුළු පුද්ගල සංඛ්‍යාව (2024.06.08 දිනට)	144
▪ මුළු නිවාස අර්ධ හානි සංඛ්‍යාව	18
▪ මුළු නිවාස පූර්ණ හානි සංඛ්‍යාව	876

මියගිය පුද්ගලයින් පිළිබඳ විස්තර

ජලගැලීම් හේතුවෙන් සිදු වූ මිය යෑම් පිළිබඳ විස්තර (2024.06.01 දින සිට 2024.06.13 දිනට 1800 පැය දක්වා)

අනු අං.	දිස්ත්‍රික්කය	දිනය	ආපදාව	ප්‍රා.ලේ.කොා	ස්ත්‍රී පුරුෂ භාවය	වයස
01	කළුතර (03)	2024.06.04	ජලයේ ගිලීම	බුලත්සිංහල	පුරුෂ	අවු.21
		2024.06.04	ජලයේ ගිලීම	මිල්ලනිය	පුරුෂ	අවු.72
		2024.06.05	ජලයේ ගසාගෙන යාම	මිල්ලනිය	පුරුෂ	අවු.17
දිස්ත්‍රික් එකතුව (03)						03
ජලගැලීම් හේතුවෙන් සිදු වූ මුළු මිය යෑම් සංඛ්‍යාව						03

නිරිතදිග මෝසම් තත්ත්වයට පෙර ස්ථිර බෝට්ටු ස්ථානගත කිරීම.

සක්‍රිය වීමට නියමිත තිබූ නිරිතදිග මෝසම් කාලයේදී ආපදාවන්ට ලක්විය හැකි ජනතාව හට සහන සැලසීම සඳහා කළුතර දිස්ත්‍රික්කය තුළ බෝට්ටු 70 ක්ද අඟුල් 134 ක් සූදානම් කර තිබුණි.

අ.අං	ස්ථානගත කර ඇති ස්ථානය	බෝට්ටු ප්‍රමාණය	අඟුල් ප්‍රමාණය
1	වලල්ලාවිට ප්‍රා.ලේ.කොා	3	15
2	බණ්ඩාරගම ප්‍රා.ලේ.කොා	5	1
3	පාලින්දනුවර ප්‍රා.ලේ.කොා	9	26
4	ඉංගිරිය ප්‍රා.ලේ.කොා	1	3
5	හොරණ ප්‍රා.ලේ.කොා	3	11
6	අගලවත්ත ප්‍රා.ලේ.කොා	2	3
7	බුලත්සිංහල ප්‍රා.ලේ.කොා	8	27
8	දොඩංගොඩ ප්‍රා.ලේ.කොා	5	13
9	මදුරාවල ප්‍රා.ලේ.කොා	8	17
10	මතුගම ප්‍රා.ලේ.කොා	6	4
11	මිල්ලනිය ප්‍රා.ලේ.කොා	1	14
12	කළුතර ප්‍රා.ලේ.කොා	3	0
13	බෙරුවල ප්‍රා.ලේ.කොා	3	0
14	පානදුර ප්‍රා.ලේ.කොා	0	0
15	Navy Camp - කළුතර	10	0
16	Army Camp -	3	0
එකතුව		70	134

[ඉහත වගු පුස්තකාලයේ ද තබා ඇත.]
[மேற்படி அட்டவணைகள் நூல்நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.]
[Above charts also placed in the Library.]

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

නිරිතදිග මෝසම් තත්ත්වය අතරතුර බෝට්ටු ස්ථානගත කිරීම - කළුතර දිස්ත්‍රික්කය

අ. කි.	දිනය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	භයිරිස් ලබාදුන් ආරක්ෂක අංශය හා ප්‍රමාණය			බෝට්ටු ප්‍රමාණය	ස්ථානගත කිරීම	සිදුකරනු ලැබූ රාජකාරි
			යුද්ධ හමුදා	නාවික හමුදා	STF			
1	2024.06.02 හා 03 (2024.06.02 දින පමණක් STF බෝට්ටු යොදවා ඇත.)	මතුගම	-	3	4	2	වැලිපැන්න පොලිසිය අසල සහ වැලිපැන්න නගරය	පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් පුද්ගලයින් 23 ක් ප්‍රවාහනය කිරීම හා පුද්ගලයින් 130 කට පමණ වේල් 02 ක් සඳහා ආහාර සහ ලීටර් 5 වතුර බෝතල් ප්‍රවාහනය කිරීම / නාවික හමුදාව විසින් පුද්ගලයින් 3 ක් ප්‍රවාහනය කිරීම හා පුද්ගලයින් 125 කට පමණ වේල් 03 ක් සඳහා ආහාර සහ වතුර බෝතල් ප්‍රවාහනය කිරීම
2	2024.06.02 හා 03	පාලින්ද නුවර	-	6	-	2	මිදලන/ ඉළුක්පොත	පුද්ගලයින් 442 ක් ප්‍රවාහනය කිරීම හා පුද්ගලයින් 230 කට පමණ වේල් 03 ක් සඳහා ආහාර සහ ලීටර් 5 වතුර බෝතල් ප්‍රවාහනය කිරීම
3	2024.06.02 සිට 04 දක්වා බොට්ටු 3 සහ 2024.06.05 සිට 07 දක්වා බොට්ටු 02 ක්	බුලත්සිංහල	-	9	-	3	පරගොඩ/ ඉහල වෙල්ගම/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	පුද්ගලයින් 325 ක් ප්‍රවාහනය කිරීම හා පුද්ගලයින් 126 කට පමණ වේල් 06 ක් සඳහා ආහාර සහ ලීටර් 5 වතුර බෝතල් ප්‍රවාහනය කිරීම හා හතර දෙනෙකුගෙන් සමන්විත වෛද්‍ය කණ්ඩායමක් ප්‍රවාහනය කිරීම
4	2024.06.02 දින සිට 06 දක්වා බොට්ටු 02 ක් 2024.06.07 සිට 08 දක්වා බොට්ටු 01 ක්	ඉංගිරිය	-	6	-	2	නමඛපාන/ කැකුළලිය	පුද්ගලයින් 394 ක් ප්‍රවාහනය කිරීම හා. පුද්ගලයින් 230 කට පමණ වේල් 12 ක් සඳහා ආහාර සහ ලීටර් 5 වතුර බෝතල් ප්‍රවාහනය කිරීම හා වෛද්‍ය කණ්ඩායමෙහි සාමාජිකයින් 08 දෙනෙකු ප්‍රවාහනය කිරීම
5	2024.06.03 සිට 06 දක්වා බෝට්ටු 03 ක් හා 2024.06.07 සිට 08 දක්වා බෝට්ටු 01 ක්	මඳුරාවල	-	9	-	3 (මතුගම යොදවා තිබූ එක් බෝට්ටුවක් ලබාදෙන ලදි)	පොලේමෝදර, මහායාල, අතුරුවාතෙට	පුද්ගලයින් 90 ක් ප්‍රවාහනය කිරීම හා පුද්ගලයින් 196 කට පමණ වේල් 6 ක් සඳහා ආහාර සහ ලීටර් 5 වතුර බෝතල් ප්‍රවාහනය කිරීම හා වෛද්‍ය කණ්ඩායමෙහි සාමාජිකයින් 08 දෙනෙකු ප්‍රවාහනය කිරීම හා කෙක්ගෝන ජල පිරිපහදුව වෙත ජලය අධිෂ්ඨාන සැපයීම සඳහා ගල්ලැක්කල සිට පොලේමෝදර දක්වා ජල සම්පාදන සේවකයින් ප්‍රවාහනය කිරීම.
6	2024.06.03 සිට 07දක්වා බෝට්ටු 02 ක් හා 2024.06.04 සිට 05 දක්වා බෝට්ටු 1ක්	මීල්ලනිය	4	6	-	3 (පාලින්දනුවර යොදවා තිබූ එක් බෝට්ටුවක් ලබාදෙන ලදි)	ගල්පාක, නාක්කිලිය	දිය තෑමට ගොස් ජල පහරට අසුවූ වයස අවුරුදු 17 ක් පමණ පිරිමි දරුවෙකුටු සෙවීම , පුද්ගලයින් 4 ක් ප්‍රවාහනය කිරීම හා පුද්ගලයින් 90 කට පමණ වේල් 8 ක් සඳහා ආහාර සහ ලීටර් 5 වතුර බෝතල් ප්‍රවාහනය කිරීම දස දෙනෙකුගෙන් සමන්විත වෛද්‍ය කණ්ඩායම් දෙකක් ප්‍රවාහනය කිරීම හා විදුලි විසන්ධි කිරීමේ කටයුතු වෙනුවෙන් විදුලි බල මණ්ඩලයේ 04 දෙනෙකු ප්‍රවාහනය කිරීම
7	2024.06.04 සිට 07 දක්වා	දොඩංගොඩ	-	3	-	1 (පාලින්දනුවර යොදවා තිබූ එක් බෝට්ටුවක් ලබාදෙන ලදි)	තෙඹුවන පොලීසිය අසල	පුද්ගලයින් 34 ක් ප්‍රවාහනය කිරීම හා පුද්ගලයින් 200 කට පමණ වේල් 9 ක් සඳහා ආහාර සහ ලීටර් 5 වතුර බෝතල් ප්‍රවාහනය කිරීම
8	2024.06.05 සිට 07 දක්වා	කළුතර	-	3	-	1 (බුලත්සිංහල යොදවා තිබූ එක් බෝට්ටුවක් ලබාදෙන ලදි)	තෝරගල්ල	පුද්ගලයින් 104 ක් ප්‍රවාහනය කිරීම හා පුද්ගලයින් 205 කට පමණ වේල් 5 ක් සඳහා ආහාර සහ ලීටර් 5 වතුර බෝතල් ප්‍රවාහනය කිරීම හා වෛද්‍ය කණ්ඩායමෙහි සාමාජිකයින් 06 දෙනෙකු ප්‍රවාහනය කිරීම
එකතුව			4	33	4	13	-	-

ඉහත දක්වා ඇති ආපදා කළමනාකරණ සහ හදිසි ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය ආපදා තත්ත්වය යථා තත්ත්වයට පත් වී මහජනතාවගේ එදිනෙදා ජීවනෝපාය සාමාන්‍ය අයුරින් පවත්වාගෙන ගියද ඉදිරියේදී ඇති විය හැකි හදිසි ඕනෑම ආපදා තත්ත්වයක් උදෙසා කාර්යක්ෂමව ඉතා කෙටි කාලයකින් ප්‍රතිචාර දැක්වීම සඳහා සූදානම්ව ඇත.

එකල්හී වේලාව අ. භා. 5.30 වූයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී. පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2024 ජූනි 19 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.

அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார். அதன்படி பாராளுமன்றம், 2024 யூன் 19, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 5.30 p.m.., THE HON. DEPUTY SPEAKER adjourned Parliament without Question put. Parliament adjourned accordingly until 9.30 a.m. on Wednesday, 19th June, 2024.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

313 වන කාණ්ඩය - 06 වන කලාපය
தொகுதி 313- இல. 06
Volume 313 - No. 06

2024 ජූනි 19වන බදාදා
2024 யூன் 19, புதன்கிழமை
Wednesday, 19th June, 2024

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2024 ජූනි 19වන බදාදා
2024 யூன் 19, புதன்கிழமை
Wednesday, 19th June, 2024

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
කථානායකතුමාගේ සහතිකය [තීරුව 1061]
ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන් [තීරුව 1061]

විගණකාධිපතිවරයාගේ වාර්තාව [තීරුව 1062]

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා [තීරුව 1070]

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තීරුව 1070]

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තීරුව 1075]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 1083-1119]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
උපාධිධාරී විරැකියාව තුරන් කිරීම සඳහා රැකියා ඉලක්කගත අධ්‍යාපනය [තීරුව 1130]
උතුරු හා නැඟෙනහිර පුරාවිද්‍යා ඉඩම් සහ වන රක්ෂිතවලට අයත් ඉඩම් [තීරුව 1144]

ආබාධ සහිත දරුවන් සඳහා අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව:
සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1147]

වරප්‍රසාද:
අංක SC FR 35/2024 දරන නඩුව සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කරන ලද අතුරු තහනම් නියෝගය [තීරුව 1151]

විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී [තීරුව 1176]

කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත:
රෙගුලාසි [තීරුව 1177-1248]

කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත:
නියමය [තීරුව 1248]

කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත:
නියෝගය [තීරුව 1249]

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත:
නියෝග [තීරුව 1249]

පරිපූරක මුදල:
අත්හිටවූ සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් නිම කිරීම [තීරුව 1250]

පොල් සංවර්ධන පනත:
යෝජනා සම්මතය [තීරුව 1251]

කල්තැබීමේ ප්‍රශ්න [තීරු 1252-1258]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
சபாநாயகரது சான்றுரை [ப: 1061]
சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள் [ப: 1061]

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 1062]

அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப: 1070]

அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை [ப: 1070]

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 1075]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1083-1119]

தனி அறிவித்தல் மூல வினா:
பட்டதாரிகளின் வேலையின்மையைத் தீர்ப்பதற்கான தொழில் நோக்குநிலைக் கல்வி [ப: 1130]
வடக்கு, கிழக்கிலுள்ள தொல்பொருள் இடங்களும் வன ஒதுக்கங்களும் [ப: 1144]

ஊனமுற்ற பிள்ளைகளுக்கான கல்வி மற்றும் தொழிற்பயிற்சி:
சமூக வலுவூட்டுகை இராஜாங்க அமைச்சரினது கூற்று [ப: 1147]

சிறப்புரிமை:
SC FR 35/2024 மீதான உயர் நீதிமன்றத்தின் இடைக்காலத் தடை உத்தரவு [ப: 1151]

வெளிநாட்டு தீர்ப்புக்களைப் பரஸ்பரம் ஏற்றங்கீகரித்தல், பதிவுசெய்தல் மற்றும் வலுவுறுத்துதல் சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1176]

சீட்டாட்டத் தொழில் (ஒழுங்குபடுத்தல்) சட்டம்:
ஒழுங்குவிதிகள் [ப: 1177-1248]

சீட்டாட்டத் தொழில் (ஒழுங்குபடுத்தல்) சட்டம்:
ஒழுங்குவிதி [ப: 1248]

சீட்டாட்டத் தொழில் (ஒழுங்குபடுத்தல்) சட்டம்:
ஒழுங்குவிதி [ப: 1249]

கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழுச் சட்டம்:
ஒழுங்குவிதிகள் [ப: 1249]

குறைநிரப்புத் தொகை:
இடைநிறுத்தப்பட்ட அபிவிருத்தித் திட்டங்களை விரைவாக முடித்தல் [ப: 1250]

தெங்கு அபிவிருத்திச் சட்டம்:
தீர்மானம் [ப: 1251]

ஒத்திவைப்பு வினாக்கள் [ப: 1252-1258]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Speaker's Certificate [Col. 1061]

Legislative Standing Committee: Additional Members [Col. 1061]

AUDITOR-GENERAL'S REPORT [Col. 1062]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 1070]

REPORT OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS [Col. 1070]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1075]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1083-1119]

QUESTION BY PRIVATE NOTICE:
Job-oriented Education to Resolve Graduate Unemployment [Col. 1130]

Archaeological Lands and Forest Reserves in North and East [Col. 1144]

EDUCATION AND VOCATIONAL TRAINING FOR CHILDREN WITH DISABILITIES:
Statement by State Minister of Social Empowerment [Col. 1147]

PRIVILEGE:
Interim Order Issued by Supreme Court on SC FR 35/2024 [Col. 1151]

RECIPROCAL RECOGNITION, REGISTRATION AND ENFORCEMENT OF FOREIGN JUDGMENTS BILL:
Read the First time [Col. 1176]

CASINO BUSINESS (REGULATIONS) ACT:
Regulations [Cols. 1177-1248]

CASINO BUSINESS (REGULATION) ACT:
Order [Col. 1248]

CASINO BUSINESS (REGULATION) ACT:
Regulation [Col. 1249]

COLOMBO PORT CITY ECONOMIC COMMISSION ACT:
Regulations [Col. 1249]

SUPPLEMENTARY SUM:
Expeditious Completion of Halted Development Programmes [Col. 1250]

COCONUT DEVELOPMENT ACT:
Resolution [Col. 1251]

ADJOURNMENT QUESTIONS [Cols. 1252-1258]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2024 ජූනි 19වන බදාදා
2024 யூன் 19, புதன்கிழமை
Wednesday, 19th June, 2024

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2024 ජූනි 18 දින "පවිත්‍රා වන්නිආරච්චි සහෘද පදනම (සංස්ථාගත කිරීමේ)", "අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය (සංස්ථාගත කිරීමේ)" සහ "රාජ්‍ය ණය කළමනාකරණ" නමැති පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

II

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්
சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள்
LEGISLATIVE STANDING COMMITTEE: ADDITIONAL MEMBERS

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

"සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම (සංස්ථාගත කිරීමේ)" පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළ වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් මවිසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු විජිත බේරුගොඩ මහතා
ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

A

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව-

- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XLIII කොටස;
- 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LIV කොටස; සහ
- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ L කොටස සහ නවවැනි කාණ්ඩයේ XXXIII හා XXXIV කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

B

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ III හා IV කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු පිරසන්න රණතුංග)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
අවසන් වාර්තාව මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
Ordered that the Report be printed.

II

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කල්)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩය - දේශීය ආදායම් දෙපාර්තමේන්තු මූලාශ්‍රයන්ට අනුව රජයට අයවිය යුතු නමුත් මෙතෙක් අය කරගෙන නොමැති එකතු කළ අගය මත බදු පිළිබඳ විශේෂ විගණන වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු පිරසන්න රණතුංග)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
අවසන් වාර්තාව මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු පිරසන්න රණතුංග)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු පිරසන්න රණතුංග)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා කළුතර, ගම්පහ, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අනුරාධපුරය දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වාර්ෂික කාර්ය සාධන වාර්තා; සහ

(ii) 2023 වර්ෂය සඳහා බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු පිරසන්න රණතුංග)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ සහ වාරිමාර්ග අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)
(මාණ්පුමිකු ටක්ලස් තේවානන්තා - කටර්ත්තොළිල් අමෙච්චර්)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)

කෞරව සභාපතිතුමනි, අරසාංක කණක්කුකළ් පර්රිය කුළුවාල් පාරාළුමන්ත්‍රත්තිල් සමර්ප්පික්කප්පට්ට අර්රික්කෛකළිල් කටර්ත්තොළිල් අමෙච්චු මර්රුම් අලංකාර මීන්කළ්, නන්නීර් මීන්කළ්, ඉර්රාල්කළ් වළර්ත්තල්, කටර්ත්තොළිල් තුරෛමුකංකළ් අපිවිරුත්ති, පලනාළ් කටර්ත්තොළිල් අළුවල්කළ් මර්රුම් මීන් ඒර්රුමති ඉරාජාංක අමෙච්චු තොටර්පිල් කුර්ප්පිපිටප්පට්ට විටයංකළ් තොටර්පාන 119(4) ආම් පාරාළුමන්ර නිලෙයියර් කට්ටළෛයින් පිරකාරම්, අවතානිප්පුකළ් මර්රුම් එටුක්කප්පට්ට නටවටික්කෛකළ් තොටර්පාන අර්රික්කෛකළෛ නාන් සමර්ප්පික්කින්රේන්.

ඉව්වර්රික්කෛකළ් අරසාංක කණක්කුකළ් පර්රිය කුළුවුක්කු ආර්රුප්පටුත්තප්පට වේණ්ටුමෙන නාන් පිරේරික්කින්රේන්.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(මාණ්පුමිකු සජිත් පිරේමතාස - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ගරු ධීවර අමාත්‍යතුමාට මට කාරණයක් යොමු කරන්න තිබෙනවා. ගරු ධීවර අමාත්‍යතුමනි, යාපනය, වැල්වැටිතුරෙයි, පොලිකණ්ඩි කියන ස්ථානයේ ධීවර බෝට්ටු නැංගුරම්පොළක් ඇත්තවශයෙන්ම නැහැ. එම ප්‍රදේශයේ ජීවත් වන විශාල පිරිසක් ධීවර කර්මාන්තයේ නියැළෙනවා. විශේෂයෙන්ම මුහුදේ ගැඹුර සකස් කර ධීවර බෝට්ටු නැංගුරම්ලෑමට ඇති ස්ථානයේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරනවා කියලා බොහෝ අවස්ථාවලදී පොරොන්දු වෙලා තිබෙනවා. නමුත්, එම කටයුතු ක්‍රියාත්මක කරලා නැහැ. ගරු අමාත්‍යතුමාට මම යෝජනා කරනවා, ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ඩக්ளஸ් தேவானந்தா)
(The Hon. Douglas Devananda)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
Hon. Minister, give me one second.

ගරු ඇමතිතුමනි, 2017 අංක 11 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත මඟින් bottom trawling තහනම් කරලා තිබෙනවා. විශේෂයෙන්ම bottom trawling ක්‍රමවේදය තුළින් මත්ස්‍ය සම්පත ඇතුළු සමුද්‍රීය පරිසරයට අතිශයින්ම හානිකර තත්ත්වයක් නිර්මාණය වෙනවා.

රටේ සෙසු ප්‍රදේශවල මේ bottom trawling ප්‍රශ්නය නතර කරන්නට ධීවර අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන කටයුතු කළත්, යාපනය ප්‍රදේශයෙන් අපට ලැබුණු පැමිණිල්ල වුණේ බොහෝ ප්‍රදේශවල මේ bottom trawling ක්‍රමවේදය ක්‍රියාත්මක වෙනවා කියන එකයි. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට සහ ආංශික අධීක්ෂණ කාරක සභාවට දැනුම් දුන්නත්, මානව හිමිකම් කොමිෂන් සභාවේ සහාය පැතුවත් ඒකට විසඳුමක් ලැබිලා නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් අහන්න කැමතියි, මේ bottom trawling යොදා ගනිමින් මසුන් ඇල්ලීම රට පුරාම තහනම් වී තිබෙන මොහොතක එය ක්‍රියාත්මක කරන්නට ඔබතුමා කටයුතු කරනවාද, යාපනය ප්‍රදේශයේ bottom trawlingවලට ඉඩකඩ ලබා දීලා තිබෙනවාද, අවසරය ලබා දීලා තිබෙනවාද සහ එය ක්‍රියාත්මක කරන මොහොතක ධීවර ක්ෂේත්‍රයේ නිලධාරීන් නිහඬව ඉන්නේ ඇයි ද කියලා. එහෙම අවසරයක් ලබා දීලා තිබෙනවා නම් මම ඉහත විධියට ඔබතුමන්ලා 2017 අංක 11 දරන ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත උල්ලංඝනය කරමිනුයි ඒ කර්තව්‍යය කරන්නේ. මම මේ පිළිබඳව ඔබතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා, ගරු ඇමතිතුමනි.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ඩக්ளஸ් தேவானந்தா)
(The Hon. Douglas Devananda)

කෞරව එදිර්ක්කට්චිත් තලෛවර් අවර්කළේ, නීංකළ් කේට්ට මුතලාවතු විනාවිල් කුරිප්පිට්ට ඉටම් එතුවෙන්රු එනක්කුච් චරියාක විළංකවිල්ලෛ. ඒනෙනිල්, උරෛපෙයර්ප්පු චරියාක අමෛයවිල්ලෛ. එංකු නංකූරත් තළම් තේවෛයෙන්රු නීංකළ් චොල්ලි ඉරුන්තීර්කළ්?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)

යාපනය, වැල්වැටිතුරෙයි, පොලිකණ්ඩි කියන ස්ථානයේ. මම ඔබතුමාට ඒ විස්තර ටික ලබා දෙන්නම්. ඇත්තවශයෙන්ම ඒක නැංගුරම් පොළක් වශයෙන් හෝ සංවර්ධනය කරන්න කියන යෝජනාව මම ඔබතුමාට ඉදිරිපත් කරනවා. මොකද, බොහෝ අවස්ථාවල බොහෝදෙනා ඒ ප්‍රදේශයට ගිහින් එවැනි පොරොන්දු වෙලා තිබෙනවා. නමුත්, ඒ පොරොන්දු ඉෂ්ට කරලා නැහැ.

අනෙක් කාරණාව මේකයි. මම සමස්ත ධීවර ප්‍රජාව ගැන නොවෙයි මේ කියන්නේ. යාපනයේ සමහර ප්‍රදේශවල - හැම ප්‍රදේශයකම නොවෙයි - අපි දන්න විධියට bottom trawling ක්‍රමවේදය බොහොම සුලභව ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම ධීවර ක්ෂේත්‍රයේ නිලධාරීන් අහක බලා ගන්නවා, bottom trawling ක්‍රියාත්මක වන මොහොතේ.

මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා ඒ සඳහා මැදිහත් වෙලා ඒක නතර කිරීමට කටයුතු කරන්න කියලා. මම කියන්නේ ඒ අයගේ ධීවර කර්මාන්තය නතර කරන්න කියලා නොවෙයි. නීත්‍යානුකූල ආකාරයට ධීවර කර්මාන්තයේ නියැළෙන්නට ඒ bottom trawling කරන කට්ටියට ලබා දිය යුතු පහසුකම් ටික ලබා දෙන්න. එහෙම නැතුව, ඒගොල්ලන්ගේ ජීවනෝපාය නතර කරන්න කියලා නොවෙයි මම යෝජනා කරන්නේ.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ඩக්ளஸ් தேவானந்தா)
(The Hon. Douglas Devananda)

කෞරව එදිර්ක්කට්චිත් තලෛවර් අවර්කළේ, යාழ්. මාවට්ට කடற්තොழිලාළර්කළ් තොடර්පිලාන උංකළුටෛය අක්කරෛක්කු නන්රි!

පොලිකණ්ඩි පකුතියිලුළ්ළ මීනවර්කළ් අප්පකුතියිල් නංකූරත් තළමෙන්රෛක් කෝරුවතාක නීංකළ් උංකළුටෛය මුතලාවතු විනාවිල් කූරියිරුන්තීර්කළ්. ඉතුවරෛ අවර්කළ් අව්වාරානතොරු කෝරික්කෛයෛ එන්නිටම් විටුක්කවිල්ලෛ. වාන් තෝණ්ටුතල් චම්පන්තමාකත්තාන් අවර්කළ් එන්නිටම් කේට්ටිරුන්තාර්කළ්. ඉම්මුරෛ මාණ්පුමිකු ජනාතිපති රණිල් වික්කිරමසිංහ අවර්කළ් වට මාකාණත්තුක්කෙන 500 මිල්ලියන් රූපාවෛයෛ විසේටමාක ඔතුක්කියිරුක්කින්රාර්. අතනටිප්පටෛයිල්, අංකු වාන් තෝණ්ටුතල් නටවටික්කෛකළ් අටුත්ත මාතමළවිල් ආරම්පික්කප්පටුම් එන්පතෛත් තෙරිවිත්තුක්කොළ්කින්රේන්.

කෞරව එදිර්ක්කට්චිත් තලෛවර් අවර්කළේ, උංකළුටෛය ඉරණ්ටාවතු විනා bottom trawling චම්පන්තමානතු.

2016ආම් ආණ්ටු අතු චාර්න්ත චට්ටත්තිරුත්තම් ඉච්චපෛයිල් තනියාර් උරුප්පිනර් චට්ටමූලමාකක් කොණ්ටුවරප්පට්ටතු. පින්නර් අතු චාර්න්ත පොරුප්පෛ කටර්තොழිල් අමෛච්චු ඒර්රුක්කොණ්ටතු. අප්පෝතු කටර්තොழිලාළර්කළ් මේර්කොණ්ට එදිර්ප්පු ආර්ප්පාට්ටඞ්කළ්, අවර්කළ් මුන්වෛත්ත කෝරික්කෛකළ් එන්පවර්රෛක් කරුත්තිර්කොණ්ටු ඔරු මුටිවු එටුක්කප්පට්ටතු. අතාවතු, NARA නිරුවනත්තින් ආය්වුකළුක්කුප් පින්නර්, අතනෛ එන්තෙන්තප් පකුතිකළිල් චෙය්යලාම් එන්රු මුටිවෙටුක්කප්පට්ටතු. අතන් අටිප්පටෛයිල් කුරිප්පිට්ට ඉටංකළිල් soft-bottom trawlingක්කු අනුමති අළික්කප්පට්ටු ඉරුක්කින්රතේ ඔළිය, එල්ලා ඉටංකළිලුම් අල්ල. ඉරුන්තාලුම්, උංකළුටෛය විනාවෛ නාන් කරුත්තිලෙටුත්තු ඉව්විටයම් තොටර්පිල් මීළාය්වු චෙය්කින්රේන්. නන්රි!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ලිපිලේඛනාදිය පිළිගැන්වීම යටතේ, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)
Hon. Speaker, I present the Annual Report of the Legal Aid Commission of Sri Lanka for the year 2022.
I move that this Report be referred to the Sectoral Oversight Committee on Just and Law-Abiding Society.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා මාධ්‍ය, කාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂාවට අදාළව මට කාරණාවක් ඉදිරිපත් කරන්න තිබෙනවා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට. ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ත්‍රිවිධ හමුදාවේත්, සිවිල් ආරක්ෂක බලකායේත්, ආරක්ෂක අංශවලත්, පොලීසියේත් විශාල ප්‍රමාණයක් මිහින්තලා රජමහා විහාරස්ථානයේ උන්නතිය වෙනුවෙන්, ඒ පුද බිම රැක ගන්නට, ආරක්ෂා කර ගන්නට, ඒ සංවර්ධන වැඩ කටයුතුවලට දායකත්වය ලබා දුන්නා. 2023 දෙසැම්බර් 10වැනි දා වෙනකල් ඔවුන් ලොකු කාර්යභාරයක් ඉෂ්ට කළා. එතැන නිලධාරීන් 286දෙනෙක් හිටියා.

අනුබුදු මිහිඳු මහා සෑය ප්‍රතිසංස්කරණය සඳහා නාවික හමුදාවේ 105දෙනකු හිටියා. ධර්මශාලා මන්දිරයේ ඉදිකිරීම් කටයුතු භාරව යුද හමුදාවේ 78දෙනකු හිටියා. ඒ වාගේම මිහින්තලා පුද භූමියේ පිරිසිදු කිරීමේ කටයුතු සඳහා සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිලධාරීන් 94දෙනකු හිටියා. ඒ වාගේම උඩ මළුවේ පිරිසිදු කිරීම් කටයුතු සඳහා සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිලධාරීන් 7දෙනෙකු හිටියා. දෛනිකව හේවිසි ශබ්ද පූජාව වෙනුවෙන් නිලධාරීන් 5දෙනෙකු හිටියා. ඒ වාගේම මිහින්තලා මහා සෑය ඇතුළු විහාරාංගයන්හි නිත්ත ආලේප කිරීම සඳහා ගුවන් හමුදාව දායකත්වය ලබා දුන්නා. ඒ වාගේම පොලීසියේ ආරක්ෂාව ඉහළින්ම තිබුණා.

ගරු කථානායකතුමනි, 18 වෙනි දා පොසොන් කලාපය ආරම්භ වුණා. පොසොන් පොහොය නිමිත්තෙන් මෙම පුදබිමේ ආගමික ක්‍රියාදාමයක් ක්‍රියාත්මක වෙනවා. නමුත්, කනගාටුදායක කාරණයක් තමයි අද ඒ සියලු නිලධාරීන් පාහේ ඉවත් කර - withdraw කර - තිබීම. ඒ තත්ත්වය තුළ ඇත්තවශයෙන්ම පොසොන් පොහොය නිමිත්තෙන් සිදු කරනු ලබන ආගමික ක්‍රියාදාමය ක්‍රියාත්මක වීම අඩපණ වෙලා තිබෙනවා. ඒ නිසා මම ගෞරවනීය ඉල්ලීමක් කරනවා, ඒ උතුම් මිහින්තලා පුදබිමේ ඒ කටයුතුවලට යොදවා සිටි එම නිලධාරීන් ඉක්මනින්ම; වහාම ක්‍රියාත්මක වන පරිදි මේ අවස්ථාවේ ලබා දෙන්න කියලා.

ගරු කථානායකතුමනි, සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්න මොහොතේ මම මේ කාරණයත් අවධානයට යොමු කරන්න කැමැතියි. විශේෂයෙන්ම මහජනතාවට වන්දනාමාන කිරීම සඳහා කිරි ආහාර පූජාවන් සකස් කරනවා. ඒ වාගේම වන්දනාමාන කරන අය ලෙඩට දුකට පත් වුණාම රෝහල්ගත කිරීම් කරනවා.

ඒ සියල්ලම ක්‍රියාත්මක කරන්නට නිලධාරීන් යෙදෙව්වත්, ගෞරවනීය නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මට ප්‍රකාශ කරපු ආකාරයට මිහින්තලය පුරාවිද්‍යා කාර්යාලයේ කලාප භාර නිලධාරී

ඩී.එම්. ගුණසේන සහ පුරාවිද්‍යා මුරකරු පී.පී. රංජිත් යන දෙදෙනා අවසරය ලබා දුන් ගොඩනැඟිල්ලක් ඉදිකිරීමේ ඉතිරි වැඩකටයුතුවලට - ඉතිරි වැඩකටයුතු කියන්නේ, ඇත්තවශයෙන්ම pavement එක හදන එක සහ වැසිකිළියට යොදන බටය දමන එක - විරුද්ධ වෙමින් කටයුතු කරනවා. විශේෂයෙන්ම රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමාගෙනුත්, ටිරාන් අලස් ඇමතිතුමාගෙනුත්, ඒ වාගේම විදුර වික්‍රමනායක ඇමතිතුමාගෙනුත් මම බොහොම කාරුණිකව ඉල්ලීමක් කරනවා, මේ අඩුපාඩුකම් ගැන සොයා බලා මිහින්තලා පුදබිම රැකගන්නට, ආරක්ෂා කරන්නට සුවිශේෂී කාර්යභාරයක් කරන අපේ ගෞරවනීය නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට ඒ සඳහා ලබාදිය යුතු පහසුකම් ටික ලබා දෙන්න කියලා. කරුණාකර මතක තබාගන්න, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බුදු දහමට ලබා දීලා තිබෙනවා විශේෂ ස්ථාවරයක්. එය අනුගමනය කරමින් මිහින්තලා පුදබිම රැක ගන්නට ඔබතුමන්ලාගේ දායකත්වය අපි බලාපොරොත්තු වෙනවා. ඒක ලබා දෙන්න කියලා මම බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

පිළිගන්වන ලද වාර්තා
சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
REPORTS PRESENTED

ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
ஷைலி கல்விசார் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
SHAILI EDUTAINMENT FOUNDATION (INCORPORATION) BILL

ගරු අජිත් රාජපක්ෂ මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)
(மாண்புமிகு அஜித் ராஜபக்ஷ - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Ajith Rajapakse - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, "ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

"වාර්තාව

'ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක සහ නීතිපති විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව විසින් සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත.

මෙම පනත් කෙටුම්පතට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබේ."

පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2024 ජූනි 20වන බ්‍රහස්පතින්දා සලකා බලනු ලැබේ.

சட்டமூலம், சட்டவாக்க நிலையியற் குழுவினால் அறிக்கை செய்யப்பட்டவாறு, 2024 யூன் 20, வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.

Bill, as reported by Legislative Standing Committee, to be considered upon Thursday, 20th June, 2024.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

Hon. Speaker, I present the Report of the Ministerial Consultative Committee on Justice, Prison Affairs and Constitutional Reforms on -

- Regulations made by the Minister of Justice, Prison Affairs and Constitutional Reforms under Section 61 read with Section 45 of the Judicature Act, No. 2 of 1978 and published in Gazette Extraordinary No. 2360/22 of 27th November, 2023; and
- Regulations made by the Minister of Justice, Prison Affairs and Constitutional Reforms under Section 61 read with Section 45 of the Judicature Act, No. 2 of 1978 and published in Gazette Extraordinary No. 2371/13 of 13th February, 2024,

which were referred to the Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை
REPORT OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS

ගරු ලසන්ත අලගියවන්න මහතා (ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - போக்குவரத்து இராஜாங்க அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - State Minister of Transport)

ගරු කථානායකතුමනි, 2022 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය අනුකූලතාවය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳව මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය -MIS- මඟින් ඇගැයීම සම්බන්ධයෙන් නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ මූල්‍ය බලය ප්‍රධාන කාරක සභා දෙකකට පැවරී තිබෙන බව අපි කවුරුත් දන්නවා. එම කාරක සභා දෙක වනුයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවයි. අපි එම බලය ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන්නේ අදාළ ආයතන එම කාරක සභා වෙත කැඳවීම තුළිනුයි.

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට අදාළව ආයතන 836ක් කැඳවන්න තිබෙනවා. නමුත් ඉතිහාසයේ කිසිදු වර්ෂයකදී පාර්ලිමේන්තුවට එම ආයතන 836ම කැඳවීමට පුළුවන්කමක් ලැබුණේ නැහැ. සමහර වර්ෂවල එක ආයතනයක්වත් කැඳවා තිබුණේ නැහැ. එක වර්ෂයකදී අපි ආයතන 236ක් කැඳෙව්වා. තිබෙන ආයතන 836න් 236ක් කැඳවා අපට එම වගකීම ඉටු කරන්න කොහෙත්ම පුළුවන්කමක් නැති නිසා තමයි 2015 වර්ෂයේ සිට මේ දක්වා අවුරුදු අටක් අඛණ්ඩව මාර්ගගත ක්‍රමය ඔස්සේ එම තොරතුරු ලබා ගෙන මේ විමර්ශන කටයුතු සිදු කරනු ලැබුවේ.

ඒ අනුව ඉතා සාර්ථකව මේ කටයුත්ත සිදු කරන්න අපට පුළුවන්කම ලැබුණා. මේ වන විටත් රාජ්‍ය ආයතනවල විශේෂයෙන් කාර්ය සාධනය පිළිබඳ ගැටලු තිබෙන්න පුළුවන්. මේ කියන ලකුණු ලබා ගත් ආයතනවලත් හෙට සමහර විට වංචාවක්, දූෂණයක් වෙන්න පුළුවන්කමක් තිබෙනවා. නමුත්, විශේෂයෙන් ගිණුම්කරණ ක්‍රියාවලිය සහ වාර්තා ඉදිරිපත් කිරීම යනාදිය දිහා බැලුවාම විශාල ප්‍රගතියක් අත්පත් කර ගන්න අපට පුළුවන් වුණා කියලා මම හිතනවා. ඒ අනුව තමයි දැන් හැම රැස්වීම් දවසකම වාගේ උදේට මේ පාර්ලිමේන්තුවේදී විෂය භාර අමාත්‍යවරුන්, එහෙම නැත්නම් එතුමන්ලා වෙනුවෙන් සභානායකතුමා හෝ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉදිරිපත් කරන වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කරන්නේ. එම සම්ප්‍රදාය ඇති වුණේ මේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් විධියටයි.

ඉතිහාසයේ අපට ප්‍රශ්න විශාල ප්‍රමාණයක් තිබුණා. අපි අවුරුදු 10ක්, 15ක් පැරණි වාර්තා තමයි විමර්ශනය කළේ. 2015 ඉඳන් මේ දක්වා ඉහත කී ක්‍රමය අනුගමනය කිරීම නිසා ප්‍රථම වතාවට 2023 වාර්තාව මේ මාසයේ නොවැම්බර් මාසයට පෙර -ආයතන 836ම- ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා. එම නිසා මේ ක්‍රියාවලිය සමස්ත රාජ්‍ය සේවයේ ගුණාත්මක වර්ධනයක් ඇති වීම සඳහා විශාල පිටිවහලක් වෙලා තිබෙනවා කියලා මම හිතනවා. මෙම වැඩ පිළිවෙළ තවදුරටත් ශක්තිමත් කිරීම මේ පාර්ලිමේන්තුවේ සියලු දෙනාගේ වගකීමක් ලෙසයි මා පෞද්ගලිකව දකින්නේ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ, පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂවල මන්ත්‍රීවරු ඉන්නවා.

ඒ සියලු දෙනා පක්ෂ භේද සියල්ල පසෙක තබා සැබෑ ලෙස කණ්ඩායමක් විධියට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතු සාර්ථකව ඉටු කරගෙන යනවා. ඒ සඳහා සියලු දේශපාලන පක්ෂවල මන්ත්‍රීතුමන්ලා -විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ- ලබා දෙන සහයෝගයත් මේ අවස්ථාවේදී කෘතවේදීව සිහිපත් කරන්න ඕනෑ. මේ කියන දත්ත පද්ධතිය සකස් කළේ පාර්ලිමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශයයි. රාජ්‍ය ආයතන රුපියල් බිලියන ගණනක් මෙවැනි දත්ත පද්ධති සඳහා අද වන කොට වියදම් කරලා තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පමණක් ඒ සඳහා රුපියල් බිලියන 17ක් වියදම් කරලා තිබෙනවා. නමුත්, අද වනකල් කිසිදු ඵලදායිතාවක් නැහැ. රාජ්‍ය ආයතනවලට දත්ත පද්ධති හඳුන්වා දීමේ දී, ශත පහක්වත් වියදම් කරන්නේ නැතිව පාර්ලිමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය මේ දත්ත පද්ධතිය ඉතා සාර්ථකව ක්‍රියාත්මක කිරීම පාර්ලිමේන්තුව ලබා දුන් මහඟු ආදර්ශයක් කියලායි මා හිතන්නේ. එම නිසා පාර්ලිමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශයටත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ලේකම්තුමිය ඇතුළු සියලුදෙනාටත්, පාර්ලිමේන්තුවේ සියලු නිලධාරීන්ටත් අපගේ ස්තුතිය පුද කරනවා. මේ වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා විශේෂයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව අපට සුවිශේෂී වූ දායකත්වයක් ලබා දෙනවා. ඒ වාගේම මුදල් අමාත්‍යාංශය අපට ලබා දෙන සහයෝගයත් මේ අවස්ථාවේදී කෘතවේදීව සිහිපත් කරනවා.

රාජ්‍ය ආයතන හරහා ලබා ගන්නා රාජ්‍ය ආදායම පිළිබඳව අපි දිගින් දිගටම කථා කරනවා. එහිදී විශේෂයෙන් තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම පිළිබඳවත් කථා කරනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ඇතුළු මූල්‍ය පිළිබඳව කටයුතු කරන කාරක සභා විශාල ප්‍රමාණයක් මේ සම්බන්ධව වැඩසටහන්, වැඩ පිළිවෙළවල් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබනවා. ඒ තුළින්, මේ සඳහා තිබෙන බාධා හඳුනා ගෙන තිබෙනවා.

අද ශ්‍රී ලංකා රේගුව සම්බන්ධයෙන් තිබෙන්නේ ආඥාපනතක්. රේගු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග මේ කමිටුවල නිර්දේශ මත ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වාගේම, අප සියලු දෙනා අවධානය යොමු කළ යුතුයි, රාජ්‍ය ආයතනවල කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහාත්, රාජ්‍ය ආයතනවල ආදායම වැඩි කර ගැනීම සඳහාත් තාක්ෂණය භාවිත කිරීම කෙරෙහි. තාක්ෂණය භාවිතයෙන් තොරව, ඒ ආයතන ඩිජිටල්කරණයෙන් තොරව මොන නීති රීති ගෙනාවත් මේ කටයුත්ත කරන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ කියලායි මා හිතන්නේ. ඒ සඳහා ඉහළම ප්‍රමුඛතාවක් ලබා දිය යුතුයි. ඒ වෙනුවෙන් ජනාධිපති කාර්යාලයේත්, අග්‍රාමාත්‍ය කාර්යාලයේත් ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් අපි පොදු කමිටුවක් හදලා, විශේෂයෙන් මූල්‍ය සම්බන්ධයෙන් කටයුතු කරන සියලු කාරක සභා ඒක රාශි වෙලා අද වන විට රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට කාරක සභාව විධියට මැදිහත් වෙලා කටයුතු කරනවා. මම මේ අවස්ථාවේදී ඒ බව විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. ඉදිරියේදීත් මේ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා කරලා මෙම වැඩසටහන ශක්තිමත්ව ක්‍රියාත්මක කරගෙන යෑම සඳහා කටයුතු කිරීම ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලුදෙනාගේ වගකීමක් වෙනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා මතු කළ මාතෘකාව සම්බන්ධයෙන් රජයෙන් ප්‍රශ්නයක් අහන්න මා කැමැතියි. විශේෂයෙන් එතුමා මතු කළා රාජ්‍ය ආදායම එකතු කර ගැනීම සම්බන්ධයෙන් තිබෙන ගැටලුව. රාජ්‍ය ආදායම් ඉලක්කවලට යා නොහැකි මේ රජය, රාජ්‍ය ආදායම ලබා ගැනීමේ ක්‍රමවේදය, ඒ කියන්නේ බදු පරිපාලනය - tax administration, ඒ වාගේම බදු දැලට හසු නොවී එයින් පිටත සිටින කණ්ඩායම් - බදු දැල ඇතුළේ සිටිය යුතු නමුත් බදු ගෙවීම පැහැර හරින අය - බදු දැල තුළට ගැනීම යනාදී කර්තව්‍යයන් ඩිජිටල්කරණය - digitalize කිරීම, බදු එකතු කිරීමේ - tax collection - වැඩසටහන් විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාත්මක කිරීම යනාදිය කරන්නේ නැතුව දේපළ බද්දක් ගහන්න යනවා කියන කාරණය දැන් ප්‍රචලිත වෙලා තිබෙනවා.

ඒකටත් කියනවා, මේ IMF නියෝග යටතේ දේපළ බද්ද ක්‍රියාත්මක කරනවාය කියලා. මොකද, රාජ්‍ය ආදායම් ඉලක්ක සම්පූර්ණ කර ගන්නට බැරි නිසායි එය කරන්නේ. පළමුවැනි කාරණාව මෙකයි. IMF එකත් එක්ක එකතු වෙලා අපේ රට වැටී තිබෙන ආර්ථික අගාධයෙන් ගොඩ එන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ කියන එක අපි පිළිගන්නවා. හැබැයි, IMF ගිවිසුම ක්‍රියාත්මක කිරීමට පෙර, ජනතාවගේ පැත්තෙන් ඒ ගිවිසුම පිළිබඳව සාකච්ඡා - negotiate - කරලා තමයි ගිවිසුම්ගත වෙන්නට ඕනෑ. ඒ නිසා කියන කියන පදයට නටන, රූකඩ රජයක් අපිට වැඩක් නැහැ නේ. ඇත්ත වශයෙන්ම රාජ්‍ය ආදායම කාර්යක්ෂමව ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කරන්නේ නැතුව, මේ දේපළ බද්ද ක්‍රියාත්මක කිරීම දැන් IMF එක මත දමලා තිබෙනවා.

බලන්න, ගරු කථානායකතුමනි, මේ රටේ ධනවතුන්, ධන කුවේරයින්, ගජ මිතුරු ධනවාදයේ නියැළෙන crony capitalistsලාගේ රුපියල් බිලියන ගණනාවක ණය කපා හැර

තිබෙනවා; ඒ මුදල රුපියල් බිලියන 800කට ආසන්න ප්‍රමාණයක්. හැබැයි, අපි රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමාගෙන් ඒ ලැයිස්තුව ඉල්ලුවාම කියනවා, "මේවා රහස්‍ය දේවල්. මේවා හෙළිදරව් කරන්න බැහැ" කියලා. හැබැයි, පරාටේ නීතිය ක්‍රියාත්මක කරනකොට නම්, ඒවා advertise කරලා එම නීතිය ක්‍රියාත්මක කරනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. ඒ විධියට ණය නොගෙවපු ධන කුවේරයින්ගෙන් -ඒ ගොල්ලන්ට රටේ පාලකයෝ එක්ක ගජ මිතුරු සම්බන්ධකම්, දේශපාලන සම්බන්ධකම් තිබෙන බව අපි දන්නවා- රටට හිමි විය යුතු සල්ලි ටික එකතු කරනවා මිස, මේ දේපළ බදු අය කරන එක අසාධාරණයි, ගරු කථානායකතුමනි. අපි මේ කාරණාවට පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, මම හිතන විධියට අපි ප්‍රශ්න පටලවා ගැනීම තමයි ප්‍රශ්නය වන්නේ. මම දැන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව සහ එහි කටයුතු පිළිබඳව පැහැදිලි කිරීමක් කළා. අපි සැබෑ ලෙස මේ ප්‍රශ්න සඳහා විසඳුම් සොයනවා නම් අපි මේක ගැනයි කථා කරන්න ඕනෑ. විපක්ෂ නායකතුමා කියපු සියලු කරුණු පිළිබඳව අපටත් ගැටලුවක් නැහැ. ගිණුම් කාරක සභාව මේ ඉදිරිපත් කළ නිර්දේශ සහ රාජ්‍ය ආදායම පිළිබඳව ගත්ත ක්‍රියාමාර්ග මම ඔබතුමාට සඳහන් කළා. මම ඩිජිටල්කරණය පිළිබඳව කථා කළා. ඒ වාගේමයි නීති රීති.

අපට මේ සභාවට ඇවිල්ලා කියන්න පුළුවන් හිඟ බදු මෙච්චරයි කියලා. ඒ, අංක ගණිතමය වශයෙන් හිඟ බදු. නමුත් ඒ හිඟ බදු කථාව පිටුපස්සේ තිබෙන දේ පිළිබඳවත් අපි අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පනතේම තිබෙනවා අවුරුදු 15ක් යනකම් බදු ගෙවන්නේ නැතිව ඉන්න පුළුවන් කියලා. ඒ අනුව තමයි අපි නිර්දේශ කරලා තිබෙන්නේ දේශීය ආදායම් පනත සහ රේගු පනත සංශෝධනය කළ යුතුයි කියලා. අපට හිඟ බදු සහ රාජ්‍ය ආදායම පිළිබඳ සංඛ්‍යාලේඛන ගැන මේ සභාවේ කථා කරලා රටට යම් පණිවුඩයක් ලබා දෙන්න පුළුවන්. හැබැයි, හැම දාම කථා කර කර ඉන්න එක තමයි කරන්න පුළුවන් වෙන්නේ.

දැන් අපි විශාල කාර්යභාරයක් කරලා තිබෙනවා. මේ අවුරුද්දේ බදු ඉලක්ක -රේගු දෙපාර්තමේන්තුව වෙන්න පුළුවන්- සියල්ල සපුරා තිබෙනවා. අපි මෙතැනින් ඉදිරියටයි යන්න ඕනෑ. මේකෙන් කියැවෙන්නේ නැහැ අඩුපාඩුකම් සිද්ධ වෙන්නේ නැහැ කියලා. හොර බොරු වංචා සිද්ධ වෙනවා, අඩුපාඩුකම් සිද්ධ වෙනවා. අපි ඒවා පිළිබඳව හරි දැක්මකින් යුතුව, ප්‍රශ්න හරියට අවබෝධ කරගෙන කථා කරලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න මැදිහත් වෙන්න ඕනෑ. එහෙම නැතුව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට කැඳවන රාජ්‍ය ආයතන 836කම වාර්තාව ඉදිරිපත් කළාට පස්සේ ඩිජිටල්කරණයයි, අර බද්දයි, මේ බද්දයි, ගජ මිතුරන් ගැනයි කථා කරන්න පුළුවන්. නමුත්, කථා කර කර ඉන්නවාද, වැඩක් කරනවාද කියන තීන්දු-තීරණ අපි ගන්න ඕනෑ.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා කථා කළා, දේපළ බද්ද ගැන. IMF ගිවිසුම පරිශීලනය කළාම අපට පෙනෙනවා, ඒ දේපළ බද්ද අය කිරීම එක ගෙයකට සීමා කරලා නැති බව. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, පෙරවරු 10.30 වෙනකොට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න අහලා අවසන් කරන්න ඕනෑ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
දේපළ බද්ද අය කිරීම එක ගෙයකට විතරක් සීමා කරලා නැහැ. සියලුම ගෙවල්වලට එම බද්ද අය කරන්න පුළුවන් කියලා තමයි IMF Agreement එකේ තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඊයේ ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට පැහැදිලි ප්‍රකාශයක් කළා. ඒක පිළිගන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එහෙම කිව්වා. හැබැයි ජනාධිපතිතුමා නේ කිව්වේ, IMF Agreement එකේ ඉස්පිල්ලක්, පාපිල්ලක්වත් වෙනස් කරන්න බැහැ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකත් එතුමාගෙන් ඊයේ අහගන්න තිබුණා නේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එතුමා නේ කිව්වේ. මුදල් රාජ්‍ය ඇමතිවරුත් කිව්වා, ඒක වෙනස් කරන්න බැහැ කියලා. එතකොට කොහොමද ඒක වෙනස් කරන්නේ?

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on the -

(i) Resolution under the Supplementary Estimate No. 1 of 2024;

(ii) Regulation under the Casino Business (Regulation) Act, No. 17 of 2010; and

(iii) Report of the Independent Remuneration Committee on the Central Bank of Sri Lanka Salary Revision 2024-2026,

which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, I need to explain very briefly the Central Bank salary matter. ගරු කථානායකතුමනි, මහ බැංකු නිලධාරීන්ගේ පඩි වැඩි කිරීම සම්බන්ධයෙන් ආන්දෝලනාත්මක විධියට මේ ගරු සභාවේත්, එළියේත් සාකච්ඡා වුණා.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් ජනාධිපතිවරයාට කිව්වා, "කරුණාකරලා මේකට ස්වාධීන කමිටුවක් පත් කරලා, පඩි වැඩි කිරීම සම්බන්ධයෙන් අදහස් විමසන්න" කියලා. එතකොට එතුමා කමිටුවක් පත් කර තිබුණා. එම කමිටුවේ සභාපති ධුරය දැරුවේ දිනේෂ් වීරක්කොඩි මහත්මයා. අර්ජුන හේරත්, ඉන්ද්‍රජිත් කුමාරස්වාමි, සුධර්මා කරුණාරත්න, නිහාල් ෆොන්සේකා, අනුෂ්ක විජේසිංහ, දුමින්ද හුලංගමුව සහ කේ.වී.ඩී. දිල්රුක්ෂි කියන මහත්ම මහත්මීන් එම කමිටුවට සභාභාගි වෙලා තිබුණා. ඔවුන්ගේ වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කළා. සංක්ෂිප්තයක් හැටියට ඔවුන් කියා සිටියා, ජනාධිපතිවරයා විසින් ඔවුන්ට දීලා තිබෙන විෂය පථය අතිශයින් පුළුල් නිසා සම්පූර්ණ විශ්ලේෂණයක් කරන්න මේ වෙලාව මදි, ඒක නිසා මේ අවස්ථාවේ දී එකඟ වෙච්ච Collective Agreement එක සම්බන්ධයෙන් විතරයි ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කරන්නේ කියලා.

ඊළඟට ඔවුන් කියා තිබෙනවා, "මූලික වශයෙන් මහ බැංකුව ඉහළ නිලධාරීන් සහ පහළ නිලධාරීන් සියලු දෙනා එක Collective Agreement එකකට ආපු එක වැරැදියි, ඉහළ නිලධාරීන්ට ඉතා විශාල පඩියක් ගෙවීම සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්න කිරීම සහ සාමාන්‍ය සහ අනෙක් නිලධාරීන්ට එවැනිම පඩි වැඩි කිරීමක් සම්බන්ධව තමයි මේ ගැටලුව මතු වෙලා තිබෙන්නේ" කියලා. ඒක දෙකට බෙදන්න ඕනෑ කියලා තිබෙනවා. Critical talent, mission-critical අය වෙනම පෞද්ගලිකව තමන්ගේ පඩිය කුමක් විය යුතුද යන්න meritocracy එක යටතේ සාකච්ඡා කරලා විසඳා ගන්න ඕනෑ කියලා තිබෙනවා. ඔවුන් කියා තිබෙනවා, Management Assistant සහ Office Assistant කියන මහ බැංකු staff එකේ අය රජයේ Management Assistant සහ Office Assistant කියන කාණ්ඩයට ඇතුළත් විය යුතුයි, මහ බැංකුවේ වැඩ කරපු පළියට ඔවුන්ට එහෙම පඩි වැඩි කිරීමක් සිදු නොවිය යුතුයි කියලා.

ඒ වාගේම මහ බැංකුවේ නිලධාරීන්ගේ පඩිය කොයි ආකාරයට ඉදිරියට ගෙන යා යුතුද කියලා 2025 අවුරුද්දේ දී අලුතින් study එකක් කරන්න, human resources manager කෙනෙක් පත් කරන්න යනාදී වශයෙන් ඔවුන් නිර්දේශ ගොඩක් දීලා තිබෙනවා. ඔවුන් විකල්ප 5ක් ඉදිරිපත් කරලා තිබෙනවා. එම විකල්ප 5න් එක් විකල්පයක් පමණයි ඔවුන් නිර්දේශ කරලා තිබෙන්නේ. ඔවුන් නිර්දේශ කර තිබෙනවා, 2024 - 2026 දක්වා එකඟ වෙච්ච Collective Agreement එක ඒ විධියටම කරගෙන යන්න. හැබැයි, අවුරුදු තුනක් නොවෙයි. අවුරුදු තුනකට පස්සේ තව අවුරුදු දෙකක් සඳහාත් - අවුරුදු පහකට - කිසිම විධියකින් පඩි වැඩි කිරීමක් සිදු නොවන විධියට ඒක ක්‍රියාත්මක කරන්න කියලා තිබෙනවා. මහ බැංකුව පැත්තෙන් ගත්තොත්, සියයට 50ක පඩි වැඩි වීමක් තමයි තිබෙන්නේ කියලා ඔවුන් කියලා තිබෙනවා. ඒ වාගේම කිසිම විධියකින් cost of living adjustment එකක් හෝ වෙනත් මොකක්වත් තව අවුරුදු පහකට සිද්ධ කරන්න හැකියාවක් නැහැ කියලාත් ඔවුන් කියලා තිබෙනවා. හැබැයි, 2025 දී කරන විශේෂ විශ්ලේෂණයෙන් යම්කිසි විධියක significant වෙනසක් කරන්න ඕනෑ කියලා හිතනවා නම්, ඒ වෙනස කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා කියලා ඔවුන් කියා තිබෙනවා. ඊට අමතරව සේවක අර්ථසාධක අරමුදල ගැනත් ඔවුන් කියා තිබෙනවා. රටේ සාමාන්‍ය සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදලින් ලැබෙන ප්‍රතිලාභයට වඩා විශාල ප්‍රතිලාභයක් මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලින් එම සේවකයන්ට ලැබෙනවා කියන එක පිළිබඳව රටේ ලොකු ආන්දෝලනයක් ඇති වුණා.

ඔවුන් කියා තිබෙනවා, ඒක කිසිසේත්ම නොකළ යුතුව තිබුණු දෙයක් කියලා. තවදුරටත් ඔවුන් කියා තිබෙනවා, සේවක අර්ථසාධක අරමුදලේ යම්කිසි මුදලක් invest කළොත් ඒකට ලැබෙන ප්‍රතිලාභය guarantee කරන්න බැහැ, ඒක සේවක අර්ථසාධක අරමුදලේ fundamentalsවලට වෙනස්, ඒක වහාම නිවැරැදි කරන්න කියලා. අවසානයේ ඔවුන් කියා තිබෙනවා, "The Committee is, however, strongly of the view that the Central Bank of Sri Lanka should have completed a formal market study and been conscious of the on-going economic challenges prior to entering into the current Collective Agreement, which would have helped the Central Bank to manage the salary increases and public sentiments more effectively" කියලා. ඒක bold කරලාත් තිබෙනවා. ඒ කියන්නේ, මේ පඩි වැඩි කිරීම කරපු අවස්ථාවේදී රටේ තිබිච්ච තත්ත්වය පිළිබඳව මීට වඩා අවධානය යොමු කළ යුතුව තිබුණා කියන කාරණය මේ අය කියා තිබෙනවා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී අපි මේ ගැන සාකච්ඡා කළා. බහුතරයක් මන්ත්‍රීවරුන් මේ වාර්තාව සමඟ එකඟ වුණා. මෙහි පළමුවැනි විකල්පය නොවෙයි, පස්වැනි විකල්පය ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා සුමන්තිරන් මන්ත්‍රීතුමා කියලා තිබුණා. පස්වැනි විකල්පයේ කියලා තිබෙන්නේ මේ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම නවත්වන්න කියලායි. හැබැයි එතැනදී මේ වාර්තාවේ කියා තිබෙනවා, එහෙම කළොත් නෛතික ප්‍රශ්න මතු වෙන්න පුළුවන්, මහ බැංකුවේ ක්‍රියා කිරීම සම්බන්ධයෙන් දේශීයව හා ජාත්‍යන්තරව ගැටලු මතු වෙන්න පුළුවන් කියලා. ඒ නිසා ඔවුන් කියා තිබෙනවා, මේ විධියට ගිහිල්ලා 2025දී කරන විශ්ලේෂණයෙන් පස්සේ පියවරක් ගන්න පුළුවන් කියලා. මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට ඒකෙන් වැළකී සිටියා. මොකද, රටේ ගැටලුවත්, මහ බැංකුවේ ගැටලුවත් විසඳාගෙන ඉස්සරහට යන්න ඕනෑ නිසා. මේ නිර්දේශ බහුතරයෙන් සම්මත වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිර්දේශ ඇතුළත් වාර්තාව මම ඔබතුමාට ඉදිරිපත් කරනවා. කරුණාකරලා මේ වාර්තාව මුදල් අමාත්‍යාංශයට යවලා, අවශ්‍ය වැඩ කටයුතු සඳහා යොමු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තූතියි, ගරු කථානායකතුමනි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, විපක්ෂය තමයි ඉස්සෙල්ලාම පෙන්නුවේ මහ බැංකුවේ සේවකයන් සියයට 70කින් පඩි වැඩි කරගෙන තිබෙනවා කියලා. ආණ්ඩුව අහක බලාගෙන හිටියා. මේ වාර්තාව අනුව, මහ බැංකු නිලධාරීන් ඉල්ලා අස්වෙන්න ඕනෑ. මොකද, අපි පාර්ලිමේන්තුවේදී කරපු චෝදනා මේ වාර්තාවෙන් ඔප්පු වෙනවා. අනෙක් එක, මහ බැංකුවේ සේවකයන් කොච්චර පඩි වැඩි කරගත්තත්, ඒවාට පාර්ලිමේන්තුවේ අනුමැතිය තිබෙන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඒක රීති ප්‍රශ්නයක් තමයි. පාර්ලිමේන්තුවට නේ, මුදල් බලය තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගරු කථානායකතුමනි, මම මේ point of Order එක raise කරන්නේ ස්ථාවර නියෝග 121 යටතේ, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වපසරිය තුළට ගැනෙන ඉතා වැදගත් කාරණයක් වන රජයේ මුදල් යෙදවීම කියන කාරණය සම්බන්ධයෙනුයි. එම කාරක සභාවේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළා, ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන අන්තර් Resolution එක, එහෙම නැත්නම් රුපියල් බිලියන 8.75ක මුදලක් වෙනත් කාරණා කිහිපයකින් මාරු කිරීමේ යෝජනාවට සම්බන්ධ කරුණු. එහි තිබෙන්නේත් අනුරාධපුර මහා විහාර විශ්වවිද්‍යාලය පිහිටුවීම ආදී වශයෙන් වූ කරුණු ගැනයි. නමුත්, මගේ ප්‍රශ්නය ගරු කථානායකතුමනි, මේකට සම්බන්ධ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය සම්බන්ධයෙන් විවාදයක් තිබෙනවා නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
නමුත්, මේක Standing Orders පිළිබඳ ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය කාරණය මේකට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. ඒකට විවාදයක් පාර්ලිමේන්තුවේ තිබෙනවා නේ.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගරු කථානායකතුමනි, 2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත අනුව මෙම කාරණය අයවැය කාර්යාලය යටතේ එන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා ඒක විවාදයේදී ගන්න.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ඒක නොවෙයි, මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න. මම කියන්නේ මේකයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, අපේ චරිත හේරත් මැතිතුමා මතු කරන්නේත් වැදගත් මාතෘකාවක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මාතෘකාව වැදගත්. නමුත්, ඒ වෙනුවෙන් විවාදයක් තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා කථා කළේ මහ බැංකුව විසින්ම තම නිලධාරීන්ගේ වැටුප් වර්ධනය කර ගැනීම සඳහා කටයුතු කිරීම ගැන. මම පැහැදිලිව මේ කාරණය අහන්න කැමැතියි. මේ වන විට විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යයන සේවකයන් වැඩ වර්ජනයක නිරත වෙලා සිටිනවා, වැටුප් ප්‍රශ්නයක් සම්බන්ධයෙන්. එම නිසා නිදහස් අධ්‍යාපනය සහමුලින්ම අකර්මණ්‍ය වෙලා, විශ්වවිද්‍යාල පද්ධතිය අකර්මණ්‍ය වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ අධ්‍යාපන සේවයේ 241,000ක් ගුරුවරු ඉන්නවා. විදුහල්පතිවරු 12,000-14,000 අතර සංඛ්‍යාවක් ඉන්නවා. අනධ්‍යයන, ගුරු, විදුහල්පති, ගුරු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

උපදේශක, ගුරු අධ්‍යාපනඥ, ගුරු සංවර්ධන නිලධාරී, අධ්‍යාපන පරිපාලන කියන මේ හැම ක්ෂේත්‍රයක්ම අද බරපතළ අර්බුදයකට ලක් වෙලා. 40,000ක ගුරු හිඟයක් තිබෙන මොහොතක සංවර්ධන නිලධාරීන් 22,000ක් විශාල කාර්යභාරයක් කළා. අධ්‍යාපනයේ මේ කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කර ගන්නේ නැතිව, මහ බැංකුව කොහොමද මේ විධියට අත්තනෝමතිකව කටයුතු කරන්නේ? මහ බැංකුවේ ස්වාධීනත්වය - independence - අපි ඇති කළේ, දේශපාලන ඇඟිලි ගැසීම් නතර කරලා, මුදල් අච්චු ගහන එක නතර කරන්නයි. හැබැයි, ඒ ස්වාධීනත්වය උපයෝගී කරගෙන තමන් තමන්ටම පඩි වැඩි කර ගන්නවා. මම අහන්න කැමැතියි, මේ ඔක්කෝම සිද්ධ වනකොට ආණ්ඩුව පඔයෙක් වාගේ හිටියේ ඇයි කියලා.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය ප්‍රශ්නය ඔතැනින් අවසන් කරලා විවාදයේදී ගන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා මොකක්ද කියන්නේ?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් වන පරිදි මහ බැංකුවේ සේවකයන් තමන්ගේ පඩි වැඩි කර ගැනීම නීත්‍යානුකූල නැහැ. ඒක පිළිගත හැකි ආකාරයෙන් සිදු වෙලා නැහැ. ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවටත් වගකීමක් තිබෙනවා, ආණ්ඩුවටත් වගකීමක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ වගකීමේ කොටසක් ඉටු වෙලා තිබෙනවා. ඒ නිසා අපි අහන්නේ, මහ බැංකුවේ නිලධාරීන් සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද කියලායි. මහ බැංකුවේ දැන් ඉන්න අධිපතිවරයා තමයි රට බංකොලොත් වෙලා කියලා අත්තනෝමතිකව ප්‍රකාශයට පත් කළේ. ඔහු ඇතුළු එම නිලධාරීන් සම්බන්ධයෙන් ගන්න පියවර මොකක්ද? ඒ ගැන අපට කරුණාකරලා මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා හෝ කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අපි ඔය කාරණය නතර කරමු. ඔබතුමන්ලා විවාදයේදී ඔය ඔක්කෝම කියන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, my name was referred to. ගරු කථානායකතුමනි, මේ කාරණය සම්බන්ධව විවාදයකට යන්න අවශ්‍යතාවක් නැහැ. පාර්ලිමේන්තුවේ සම්මත වෙලා තිබෙනවා, ශ්‍රී ලංකා මහ බැංකු පනත. ඒකට බහුතරයකගේ ඡන්දය ලැබිලා තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමා කියපු ආකාරයට fiscal dominance of monetary policy එක තිබෙන්නේ රජය සහ මහ බැංකුව සතුව. ඒ කියන්නේ, මුදල් අච්චු ගැසීම. අපේ රට බංකොලොත් වුණේ ඒ නිසා. අපි දිගින් දිගටම කිව්වා, එය නතර කරන්න කියලා. සියයට 80 දක්වා උද්ධමනය ඉහළ ගියා. සමහර දේශපාලනඥයන් විසින් මහ බැංකුවට බල කළා, සල්ලි අච්චු ගහන්න කියලා. අපි කිව්වා, ඒක නවත්වන්න කියලා. දැන් හරි ඒක නවත්වපු එක හොඳ දෙයක්. හැබැයි මෙතැන තිබෙන ගැටලුව තමයි, මහ බැංකුවේ පඩි සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට තිබෙන බලය සහ වගකීම කුමක්ද කියන එක. ඒක මට අදාළ දෙයක් නොවෙයි. හැබැයි අපේ වාර්තාවේ අපි ඉතාම පැහැදිලිව කිව්වා, මේක දෙකක් බව. පාර්ලිමේන්තුව තීරණය කරන්න වෙනවා, ශ්‍රී ලංකා මහ බැංකු පනත වෙනස් කරලා හෝ ඒ අවශ්‍ය බලය ලබා ගන්න. නමුත් දැන් තිබෙන නීතියට අනුව මහ බැංකුවට බලය තිබෙනවා, තමන්ගේ පඩිය පිළිබඳව තීරණයක් ගන්න. හැබැයි, මෙතැන තිබෙන්නේ සදාචාරාත්මක ගැටලුවක්. මේ සදාචාරාත්මක ගැටලුව පිළිබඳව තමයි කමිටු වාර්තාවේ කියලා තිබෙන්නේ. මේ වාර්තාව සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ විශ්ලේෂණයේදී අපි කිව්වා.

ගරු කථානායකතුමනි, කමිටු වාර්තාවෙන් නිර්දේශ කරලා තිබෙනවා, 2025දී නැවත study එකක් කරන්න කියලා. ඒ study එකෙන් පසුව significant වෙනසක් කරන්න ඕනෑ නම් ඒක කරන්න හැකියාව තිබෙනවා. මහ බැංකුව මේ අවස්ථාවේදී අපේ රට ගොඩගැනීමේ වැඩ පිළිවෙළේ ක්‍රියාකාරී දායකයෙක් හැටියට වැඩ කරන නිසා මේ ගැටලුව අපි ඉතාම බුද්ධිමත්ව සහ අවබෝධයෙන් සාකච්ඡා කරලා විසඳා ගනිමු. ඒ නිසා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති හැටියට මගේ නිර්දේශය වුණේ, 2025දී නැවත study එකකට ඉඩ දීලා තිබෙන නිසා එතෙක් අපි මේක මෙහෙම ගෙනියලා එතැනින් පසුව මේක ඉස්සරහට අරගෙන යමු කියන එකයි. ඒක තමයි අපේ මතය.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, මට වැදගත් කාරණයක් කියන්න තිබෙනවා. ඒ සඳහා පොඩි වෙලාවක් දෙන්න.

ගරු කථානායකතුමනි, ඊයේ දිනයේදී දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළ පරිදි, අපේ පාර්ලිමේන්තු ඉතිහාසය තුළ ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේද කියලා කිසිම භේදයකින් තොරව සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත මුදල් ලැබුණා. මේ වර්ෂයේදීත් විමධ්‍යගත මුදල් ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. නමුත්, එම කටයුතු කරලා තිබෙන්නේ ඉතාම අසාධාරණ විධියට. සමහර අයට රුපියල් මිලියන 100ක් ලැබිලා තිබෙනවා. සමහර අයට රුපියල් මිලියන 50ක් ලැබිලා තිබෙනවා. මා වාගේ, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා වාගේ, බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා වාගේ විපක්ෂයේ බහුතරයකට විමධ්‍යගත මුදල් ශතයක්වත් ලැබිලා නැහැ. ගරු කථානායකතුමනි, මේ කාරණය මම ඔබතුමා ඉදිරියේ ප්‍රකාශ කරන්නේ ඔබතුමා කථානායකවරයා හැටියට,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඊයේත් ඔය කාරණය කථා කළා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඊයේ කථා කළත්, මේක දැන් මාස ගණනක් තිස්සේ වෙන දෙයක්. ගරු කථානායකතුමනි, ඔබතුමා අපගේ ප්‍රධානියා. විපක්ෂයේ ඉන්න බහුතරයක් මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවීමක් වෙලා තිබෙනවා, මේ ප්‍රතිපාදන නොලැබීම නිසා. ඒ නිසා ඔබතුමාට වගකීමක් තිබෙනවා, මුදල් අමාත්‍යවරයා හැටියට කටයුතු කරන ජනාධිපතිවරයාට කථා කරලා කරුණාකරලා හේදයකින් තොරව මේ මුදල් ලබා දෙන්න. දැන් ඒ මුදල් ගත් අයත් අපහසුතාවට පත් වෙලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ කොහේවත් නැහැ, මන්ත්‍රීවරුන්ට ලබාදෙන විමධ්‍යගත ප්‍රතිපාදන ගැන.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඒ මුදල් ලබා ගත් මන්ත්‍රීවරුනුත් අපහසුතාවට පත් කරන්නද දන්නේ නැහැ, ජනාධිපතිතුමා මේ විධියට එම මුදල් බෙදුවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා කරුණාකරලා දැන් ඕක නවත්වන්න. මීළඟට තිබෙන්නේ පෙත්සම් පිළිගැන්වීම. *[බාධා කිරීම්]*

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, මම මේ කාරණය පැහැදිලි කරන්න ඕනෑ. නැත්නම් සමාජයට වැරදි මතයක් යනවා. විපක්ෂය ඔවුන්ගේ මතය ඉදිරිපත් කළාට ඒක වැරදියි. මොකද, විමධ්‍යගත මුදල් කියලා මුදලක් මෙවර වෙන් කළේ නැහැ. දිස්ත්‍රික් සංවර්ධන විමධ්‍යගත,- *[බාධා කිරීම්]* ඉන්න, ඉන්න. ගරු කථානායකතුමනි, ඒ ප්‍රතිපාදන වෙන් වෙන්නේ ග්‍රාමීය කමිටු හරහා ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට. මොකද, අරගලය පැවති පසුගිය කාලයේදීත් විපක්ෂයම තමයි කිව්වේ, මන්ත්‍රීවරුන්ට තමන්ගේ වුවමනා එපාකම් ඉටු කරන්න ප්‍රතිපාදන වෙන් කරනවා, ජනතාවගේ අවශ්‍යතා ඉටු වෙන්නේ නැහැ කියලා. ඒ නිසා තමයි ග්‍රාමීය කමිටු හඳුන්වා දීලා, ග්‍රාමීය කමිටුවලින් යෝජනා ටික ගෙනැල්ලා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට දාලා අනුමත කර ගත්තේ. ඒකට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ යෝජනාත් ඇතුළත් වෙලා තිබෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ නම් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඇතුළත් වෙලා තිබෙනවා. ඒක මම වගකීමෙන් කියනවා. ගරු කථානායකතුමනි, මෙතුමන්ලා ඒ කමිටුවලට එන්නේ නැහැ. මෙතුමන්ලා මිනිස්සුන්ව මහහැරලා මෙතැනට ඇවිල්ලා බොරුවට කෑ ගහනවා. *[බාධා කිරීම්]*

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මගේ නම කිව්වා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ නමක් කියැවුණේ නැහැ.

අපි දැන් න්‍යාය පත්‍රයේ ඊළඟ වැඩකටයුතුවලට යමු.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් ප්‍රනාන්දු මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හත පිළිගන්වමි.

(1) දෙනිපිටිය, උඩහගෙදර, මැදගෙවත්ත, මූනමල්පෙ යන ලිපිනයෙහි පදිංචි ඒ.ජී. සරත් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) අකුරැස්ස, පානදුගම, බෙන්ගමුව වත්ත යන ලිපිනයෙහි පදිංචි ඒ.එල්.ඒ. ප්‍රියදර්ශන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මාතර, වල්ගම දකුණ, බෝගහවත්ත, "ශාන්ති" යන ලිපිනයෙහි පදිංචි ලහිරු යසංක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) මාලඹේ, පොතුඅරාව පාර, තලංගම උතුර, අංක 1067/49/ඊ දරන ස්ථානයෙහි පදිංචි එන්.එල්.එස්. ප්‍රසන්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) මාතර, වල්ගම උතුර, විජේතිලකාරාම පාර, අංක 40/30 දරන ස්ථානයෙහි පදිංචි එස්. දහනායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) වැලිගම, කෝවිල කන්ද ළඟ යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ජී. ඥානවති මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(7) පිටබැද්දර, කිරිවැල්කැලේ, 48 හන්දිය, II පියවර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.පී.ඒ.ආර්. විජේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්ඩලික තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මැතිතුමනි, ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලැබෙනවා නේ. එතකොට ඔය ගැන කියන්න.*[බාධා කිරීම්]* කාලය නාස්ති කරන්න එපා. *[බාධා කිරීමක්]* කරුණාකර ඔබතුමා වෙලාව වෙන් කරගෙන අවස්ථාව ගන්න, ගරු උපුල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. වෙලාව වෙන් කරගෙන ඔය ගැන කියන්න, දැන් නොවෙයි.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -466/2024- (1), ගරු අජිත් මාන්නප්පෙරුම මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -511/2024- (1), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -542/2024- (1), ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -565/2024- (1), ගරු සංජීව එදිරිමාන්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -590/2024- (1), ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 -611/2024- (1), ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

රැකියා සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකිකයන්: විස්තර
வெளிநாட்டு வேலைவாய்ப்புக்காக அனுப்பப்பட்ட இலங்கையர்கள்: விபரம்
SRI LANKANS WENT ABROAD FOR EMPLOYMENT : DETAILS

636/2024

7. ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා
(මාණ්ඩලික பீ.வை.ஜீ. ரத்னசேக்கர)
(The Hon B. Y. G. Rathnasekara)
කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2023 වර්ෂයේදී රජයේ මැදිහත්වීම මත විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික සේවකයන් යොමු කර ඇති රටවල් කවරේද;

(ii) එම එක් එක් රට වෙත යොමු කර ඇති සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2023 වර්ෂයේදී රජයේ මැදිහත්වීමකින් තොරව විදේශ රැකියා සඳහා යොමු වී ඇති ශ්‍රී ලාංකික සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වර්ෂයේදී විදේශීය රැකියාවල නියුතු සේවකයන් විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර ඇති මුළු විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(v) ඉදිරියේදී විදේශීය රැකියා සඳහා ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයන් යොමු කරවීමට සකස් කර ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச் சரைக் கேட்ட வினா:

(அ) (i) 2023ஆம் ஆண்டில் அரசாங்கத்தின் தலையீட்டில் வெளிநாட்டு வேலைவாய்ப்புகளுக்காக இலங் கைத் தொழிலாளர்கள் அனுப்பப்பட்டுள்ள நாடுகள் யாவை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு நாட்டுக்கும் அனுப்பப் பட்டுள்ள தொழிலாளர்களின் எண்ணிக்கை தனித்தனியே யாதென்பதையும்;

(iii) 2023ஆம் ஆண்டில் அரசாங்கத்தின் தலையீ டின்றி வெளிநாட்டு வேலைவாய்ப்புகளுக்காகச் சென்றுள்ள இலங்கைத் தொழிலாளர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) மேற்படி ஆண்டில் வெளிநாட்டில் பணிபுரியும் இலங்கைத் தொழிலாளர்களால் இலங்கைக்கு அனுப்பப்பட்டுள்ள மொத்த அந்நியச்செலாவணி எவ்வளவு என்பதையும்;

(v) எதிர்காலத்தில் வெளிநாட்டு வேலைவாய்ப்பு களுக்காக இலங்கையைச் சேர்ந்த பயிற்சிபெற்ற தொழிலாளர்களை அனுப்புவதற்குத் தயாரிக்கப் பட்டுள்ள வேலைத்திட்டம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Foreign Employment:

(a) Will he inform this House -

(i) the countries to which Sri Lankan workers have been sent for employment in 2023 with the intervention of the Government;

(ii) the number of workers sent to each such country, separately;

(iii) the number of Sri Lankan workers who have gone for foreign employment without an intervention of the Government in 2023;

(iv) the total foreign exchange remitted to Sri Lanka by the workers engaged in foreign employment during that year; and

(v) the programme that has been devised to send skilled Sri Lankan workers for foreign employment in future?

(b) If not, why?

ගරු මනුෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara- Minister of Labour and Foreign Employment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික සේවකයන් යොමු කර ඇති රටවල් පහත පරිදි වේ.

දකුණු කොරියාව

ජපානය

ඊශ්‍රායලය

ඒ රටවල් සඳහා තමයි රජය විධියට අපි ශ්‍රී ලාංකික සේවකයන් යොමු කර තිබෙන්නේ.

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම මඟින් විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික සේවකයන් යොමු කර ඇති රටවල් පහත පරිදි වේ.

සවුදි අරාබිය

කුවේට්

ජෝර්දාන්

සිංගප්පූරුව

ජපානය

එක්සත් අරාබි එමීර් රාජ්‍යය

රුසියාව

සයිප්‍රස්

මලයාසියාව

මාලදිවයින

දකුණු කොරියාව

රුමේනියාව

සර්බියාව

මොල්ඩෝවා

(ii) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් විදේශගතව ඇති ප්‍රමාණය

රට	ප්‍රමාණය
දකුණු කොරියාව	6,377
ජපානය	601
ඊශ්‍රායලය	828
මුළු ප්‍රමාණය	**7,806**

ඒ ආදී වශයෙන් 2023 වර්ෂයේදී පිටත්කර යවා තිබෙනවා, ගරු කථානායකතුමනි.

විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම මඟින් විදේශගතව ඇති ප්‍රමාණය

රට	ප්‍රමාණය
සවුදි අරාබිය	08
කුවේටය	09
ජෝර්දාන්	46
සිංගප්පූරුව	11
ජපානය	12
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	02
රුසියාව	59
සයිප්‍රස්	253
මලයාසියාව	02
මාලදිවයින	03
දකුණු කොරියාව	221
රුමේනියාව	06
සර්බියාව	14
මොල්ඩෝවා	17
මුළු ප්‍රමාණය	**663**

(iii) 289,187ක් වේ.

(iv) 2023 වර්ෂයේදී විදේශගත ශ්‍රමික ප්‍රේෂණ ලෙස ඇමෙරිකානු ඩොලර් මිලියන 5,970ක් ලැබී තිබෙනවා. ඒ කියන්නේ US Dollars 5.9 billion. එය රුපියල් බිලියන 1,951ක් වශයෙන් සඳහන් වෙනවා.

ඊට අමතරව මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ, පසුගිය අවුරුද්දේ මම මේ අමාත්‍යාංශය භාර ගත්ත දවසේ ඉඳලා මේ වෙනකල් -පසුගිය මාසය වෙනකොට- ඇමෙරිකානු ඩොලර් බිලියන 11.3ක මුදලක් විදේශගත ශ්‍රමිකයන් අපට එවා තිබෙන බව. මේ රට අමාරුවේ වැටුණු වෙලාවේ, ගොඩක් අය සල්ලි එවන්න එපා කියපු වෙලාවේ - සල්ලි එවන්න එපා කියලා campaign කරපු වෙලාවේ- මේ රටේ මිනිසුන්ගේ දුක බලලා, විදේශගත ශ්‍රමිකයන් නිවැරදි මාර්ගයෙන් එවා තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 11.3ක මුදලක්.

(v) ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ප්‍රධාන වශයෙන් ගෘහස්ථ සහ ගෘහස්ථ නොවන රැකියා සඳහා විදේශගත වේ.

ගෘහස්ථ නොවන රැකියා සඳහා කොරියාව, ජපානය, ඊශ්‍රායලය, සිංගප්පූරුව, මලයාසියාව, මාලදිවයින සහ මැද පෙරදිග කලාපයේ රටවලට ශ්‍රී ලාංකිකයන් පිටත්ව යන අතර, ප්‍රථම වතාවට එම රැකියා සඳහා යන අයහට පහත සඳහන් පුහුණු පාඨමාලා මඟින් පුහුණුවක් ලබා දේ.

01. කොරියානු රැකියා සඳහා භාෂා පුහුණුව අත්‍යවශ්‍ය වන අතර, කොරියානු විභාගවලින් සමත්ව රැකියා සඳහා යන අය සඳහා දින 10ක නේවාසික පුහුණුවක් ලබා දේ. කොරියාවේ ධීවර කටයුතු සඳහා යන අයහට ඊට අමතරව මුහුදු ආශ්‍රිතව සහ මුහුදේදී දින 05ක පුහුණුවක් ලබා දීම තුළින් ඔවුන්ගේ කුසලතා වැඩිදියුණු කිරීම සිදු කරනු ලැබේ.

02. ඊශ්‍රායල රජය සහ ශ්‍රී ලංකා රජය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම අනුව සාන්තු සේවා ක්ෂේත්‍රයේ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන් පිටත් කර හරිනු ලැබේ.

කෘෂි ක්ෂේත්‍රයේ රැකියා සඳහා යන අයගේ කුසලතා වර්ධනය කිරීම සඳහා දින 07ක පුහුණුවක් ගොවි පොළවල් ආශ්‍රිතව ලබා දී ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

[ගරු මනුෂ නානායක්කාර මහතා]

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා සඳහා සුදුසු ශ්‍රමිකයින් තෝරා ගැනීම සඳහා ඊශ්‍රායල රජය විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයන් සමත් ශ්‍රමිකයින් එම රැකියා සඳහා තෝරා ගනු ලබන අතර, ඔවුන් සඳහා දින 02ක පෙර විගමනික නම්නීකරණ පුහුණුවක් - induction course - ලබා දෙනු ලැබේ.

ඊශ්‍රායලයේ සාත්තු සේවා රැකියා සඳහා යන අයට පළපුරුද්ද මඟින් සහ හෙද පාඨමාලාවන් හැදෑරුවාට පසු NVQ Level 3 අදියරේ සහතිකයක් ලබා දී තිබිය යුතු අතර, ඒ අය සඳහා දින 45ක පුහුණුවක් විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා ලබා දේ.

03. ජපන් රැකියා සඳහා යොමුවන අයට භාෂා පුහුණුව ලබා දී, ඔවුන් ඒ අදාළ විභාගවලින් සමත් කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ ලියාපදිංචි ආයතන 14ක් සඳහා කාර්යාංශයේ වියදමින් ජපන් භාෂා පුහුණු පාඨමාලා පවත්වාගෙන යන අතර, ජපන් භාෂා නිපුණතාව ඇති ශ්‍රමිකයින් 5,000ක් බිහි කිරීම මෙහි අරමුණු වේ.

මීට අමතරව, ජාත්‍යන්තර කම්කරු සංවිධානය -IOL-, ජාත්‍යන්තර ශ්‍රමිකයන් සඳහා වූ සංවිධානයත් සමඟ එකතු වෙලා මේ වතාවේදී ජිනීවා නුවරදී ඉල්ලීමක් කළා, සාත්තු සේවක ක්ෂේත්‍රය සඳහා දසඳහසක් පුහුණු කිරීම සඳහා උදවු කිරීමට. ඔවුන් ඒ සඳහා උදවු කරනවා. මොකද, ගෘහ සේවයට යන කාන්තා ශ්‍රමිකයන් ප්‍රමාණය අවම කරලා; නතර කරලා ඔවුන්ව සාත්තු සේවයට යොමු කරලා, අපේ රටේ care economy එකක් වෙනුවෙන් මුදල් උත්පාදනය කරන ක්‍රමවේදයකට හැරවුම් ලක්ෂ්‍යයක් අපි ආරම්භ කරලා තිබෙනවා.

04. විවිධ ක්ෂේත්‍රවල (වෑද්දුම්, සත්කාරක සේවා වැනි) පුහුණුව ලබා දෙනු ලබන ආයතන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ ලියාපදිංචි කිරීම මඟින් එම එක් එක් ක්ෂේත්‍ර සඳහා පුහුණුවක් ලබා දීම පිළිබඳ කාර්යාංශය මඟින් අධීක්ෂණය කරනු ලබන අතර, එමඟින් වඩා නිපුණතාවකින් පිරි සේවක පිරිසක් විදේශ රැකියා සඳහා යොමු කිරීමට අවස්ථාව ලැබේ.

ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණයත් පැහැදිලි කරන්න ඕනෑ. මෙච්චර කාලයක් විදේශ සේවා නියුක්ති කාර්යාංශය විතරයි පුහුණුවීම් කටයුතු කළේ. නමුත්, රජය මේ පුහුණුවීම් කටයුතු සිද්ධ කරන්න විදේශ සේවා නියුක්ති කාර්යාංශය regulator විධියට කටයුතු කරනවා. ඒක අපේ ප්‍රමුඛ කාර්යයක් නොවෙයි. නමුත්, ඒකත් අපේ කාර්යයක්. ඒ නිසා අපි නියාමනය යටතේ පෞද්ගලික අංශයටත් මේක විවෘත කරලා තිබෙනවා. ඒ අනුව ආයතන රාශියක් සම්බන්ධ කරගෙන තිබෙනවා. ඒ වාගේම රජයේ ආයතනත්; NAITA එක, වෘත්තීය පුහුණු අධිකාරිය ඇතුළු අනෙකුත් ආයතනත් අපිත් සමඟ අවබෝධතා ගිවිසුම් - MoUs - ඇති කරගෙන ඔවුන් හරහා අපට ඕනෑ කරන පුහුණු ශ්‍රමිකයන් බිහි කිරීම අපි ආරම්භ කරලා තිබෙනවා. මෙතැනදී ලෝක අවශ්‍යතාව මොකක්ද කියලා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගයත් ලබාගෙන නේල්සන් ආයතනය සමඟ එකතු වෙලා ලෝක ශ්‍රම වෙළෙඳ පොළ පිළිබඳව අපි අධ්‍යයනයක් කළා. ඒ අධ්‍යයනයේ ප්‍රතිඵලයක් විධියට ඉදිරිපත් වුණු අවශ්‍යතා අනුව තමයි අපි දැන් ඒ වෘත්තීය පුහුණු ආයතන හරහා ශ්‍රමිකයා පුහුණු කරන්නේ, නූතන ශ්‍රම වෙළෙඳ පොළට සහ අනාගත ශ්‍රම වෙළෙඳ පොළට අවශ්‍ය කරන ආකාරයට.

05. ගෘහස්ථ රැකියා සඳහා යන අයහට කාර්යාංශයට අමතරව පෞද්ගලික ආයතනවලටද පුහුණු කිරීමේ අවස්ථාව ලබා දී ඇති අතර, දින 28ක නේවාසික පුහුණුවක් තුළින් NVQ Level 3 අදියරේ සහතිකයක් ලබාගෙන විදේශ රැකියා සඳහා යාමට ඔවුන්ගේ කුසලතා වර්ධනය කරනු ලැබේ.

එසේම එම පුහුණුලාභීන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව කෙටි වීඩියෝ පටයක් විදේශ නියෝජිතයාටත්, විදේශ හාම්පුතුන්ටත් නැරඹීමට අවස්ථාව සලසා දීමට අපි කටයුතු කරලා තිබෙනවා. Online interview එකකින් පස්සේ තමන්ට කැමැති ශ්‍රමිකයාව තෝරාගන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. පුහුණුවේ වීඩියෝවක් වාගේම online interview එකක් හරහා තමන්ට සුදුසුම කෙනා තෝරා ගැනීමේ අවකාශයත් දැන් අපි සකස් කර තිබෙනවා.

06. ඊට අමතරව, ඉංග්‍රීසි භාෂා හැකියාව විදේශ රැකියා සඳහා වර්තමානයේ ඉතාම අත්‍යවශ්‍ය වන කාරණයක් බැවින් ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලා පවත්වාගෙන යනු ලබනවා.

07. එසේම, ප්‍රථම වරට විදේශගත වන ශ්‍රමිකයින් සඳහා පෙර විගමනික දින දෙකක නම්නීකරණ පුහුණුවක් ලබා දීම තුළින් ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබනවා.

08. ප්‍රථම වතාවට පිරිසිදු කිරීමේ ක්ෂේත්‍රයේ රැකියා සඳහා විදේශගත වන කාන්තාවන් සඳහා දින පහක පුහුණු පාඨමාලා පවත්වනු ලබනවා.

ඉහත සඳහන් පාඨමාලා සඳහා දැනටමත් ක්‍රියාත්මක වන අතර, එම පුහුණුව ඉදිරියේදී නවදුරටත් වැඩිදියුණු කිරීමට කාර්යාංශය කටයුතු කරන බවත් මේ වෙලාවේ මම මතක් කරනවා.

ඒ වාගේම, මේ කාරණයත් මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම ඉංග්‍රීසි භාෂා පුහුණුව ලබා දීම, ඒ වාගේම වෘත්තීය පුහුණුව ලබා දීමට අමතරව මේ දවස්වල අපි "ජයගමු ශ්‍රී ලංකා" වැඩසටහන රට පුරා කරගෙන යනවා. අපේ ශ්‍රම වෙළෙඳ පොළේ සිටින ශ්‍රමිකයින් අතර වැඩ කරන්න පුළුවන්, නමුත් සහතික නැති, අවිධිමත් ක්ෂේත්‍රයේ ශ්‍රමිකයින් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. මේ රටේ සිටින සහතික පත් නැති, අවිධිමත් ක්ෂේත්‍රයේ සියලු ශ්‍රමිකයින්ට දැන් RPL

ක්‍රමයට NVQ සහතික ලබා දීමේ වැඩ පිළිවෙළක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අරමුදල හරහා ක්‍රියාත්මක වෙනවා. ඒ කියන්නේ, විදේශගත වීමට බලාපොරොත්තු වන අයට අවශ්‍ය සහතික පත්‍ර ලබා දීමේ වැඩසටහනක්. ලංකාවේ සිටින සියලුම ශ්‍රමිකයින් යම් වෘත්තීය මට්ටමකට ගෙන ඒමේ වැඩ පිළිවෙළකුත් මේ හරහා ක්‍රියාත්මක කරනවා , ගරු මන්ත්‍රීතුමනි.

(ආ) පැන නොනඟී.

ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා
(மாண்புமிகு பீ.வை.ஜீ. ரத்னசேக்கர)
(The Hon B. Y. G. Rathnasekara)

ගරු ඇමතිතුමනි, මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා පැහැදිලි පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන්. ගරු ඇමතිතුමනි, රජයේ වැඩ පිළිවෙළ මේ ආකාරයෙන් වුණත් මේ වෙනකොටත් අපට විවිධාකාරයෙන් පැමිණිලි ලැබෙනවා. විශේෂයෙන් කුරුණෑගල, ගල්ගමුව, අඹන්පොල වාගේ ප්‍රදේශවල අය අපට ගිය සතියේත් පැමිණිලි කළා. සැලකිය යුතු පිරිසක් මේ ජාවාරම්කාර වංචනිකයින්ට හසුවෙලා තිබෙනවා. විදේශගත කරනවා කියලා විශාල මුදලක් අරගෙන අන්තිමට ඔවුන්ට විදේශගත වෙන්නත් බැහැ. ඒ වාගේම, විදේශගත වුණු අයටත් දෙනවාය කියපු රැකියාව වෙනුවට ඉතාම දුෂ්කර, කරන්න අපහසු, ලංකාවේ සිටියා නම් කරන්න හිතන්නේවත් නැති දේවල් කරන්න සිදුවෙලා තිබෙනවා. සමහර අය මේ මුදල් ගෙවලා තිබෙන්නේ තමන්ගේ ඉඩකඩම් විකුණලා, උකස් තබලා. මේ හරහා මහා විනාශයක් සිදුවෙලා තිබෙනවා. නමුත්, දැන් ඒ අය කියන්නේ, පොලීසිවලට පැමිණිලි කළත්, විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පැමිණිලි කළත් ඒ පැමිණිලි සම්බන්ධව ක්‍රියාත්මක වීමේ කිසිම ප්‍රගතියක් නැහැ, කිසිම සහනයක් ලැබෙන්නේ නැහැ කියලායි.

අපේ ගැලවීම සඳහා අපට පුළුවන් ඒ අයට කියන්න, "අපි දැනුවත් නැහැ, ඔවුන් කරගත් වැඩක්, අපට කරන්න දෙයක් නැහැ" කියලා. නමුත් මහජනතාව බලාපොරොත්තු වෙනවා විදේශගත වෙන්න. මොකද, මෙහේ ජීවත් වෙන්න බැහැ. නමුත් ඒ සම්බන්ධයෙන් විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයක් රට තුළ ක්‍රියාත්මක වන බවක් අපට පෙනෙන්න නැහැ. ඒ නිසා මිනිස්සු ජාවාරම්කාරයින්ට හසු වෙනවා. ගරු ඇමතිතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය හැටියට මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ ජාවාරම්කාර වංචනිකයන්ට හසු නොවෙන්න; එවැනි කටයුතු වළක්වන්න ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද සහ එසේ අසාධාරණයට ලක් වුණු, වංචාවලට හසු වුණු අය වෙනුවෙන් තිබෙන සහනය මොකක්ද කියලා.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු මන්ත්‍රීතුමනි, නීතිය නොදැන සිටීම සමාවට කාරණාවක් නොවෙයි. 1985 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතට අනුව රැකියාවක් සඳහා ලංකාවෙන් පිටතට යන සියලු දෙනාම ලියාපදිංචි වී යා යුතුයි. ඒ, පළමුවැනි කාරණය. දෙවැනි කාරණය, ඒ සඳහා විධිමත් ආයතන තිබෙනවා, ලංකාවේ ලියාපදිංචි, බලය ලත් ආයතන වශයෙන්. එසේ බලය ලත් ආයතනයක් හරහා හෝ රජය හරහා පමණයි විදේශගත වෙන්න පුළුවන්. විදේශ සේවා නියුක්ති කාර්යාංශය මේ පිළිබඳව 1985 ඉඳලාම දැනුවත් කිරීම් කරනවා; අද වනවිට සමාජ මාධ්‍ය හා අනෙකුත් මාධ්‍ය හරහා දැනුවත් කරනවා. ඒ වාගේම ගම්වල සිටින සංවර්ධන නිලධාරින් හරහාත් දැනුවත් කිරීම් කරන ගමන්, අපි හැම ගමකම විගමනික ශ්‍රමික කමිටුවක් පිහිටුවා රට යන්න බලාපොරොත්තු වෙන අය පවා දැනුවත් කරනවා. හැබැයි, මෙතැන තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. බොහෝ පිරිසක් විශ්වාස කරන්නේ, රජය හරහා, එහෙම නැත්නම් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ බලය ලත් ආයතනයක් හරහා විදේශගත වෙන එක නොවෙයි. කවුරු හරි බොරුකාරයෙක් කියන එක තමයි ඔවුන් විශ්වාස කරන්නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්න. මම ඒ කාරණා දෙක ගැනම කියන්නයි හදන්නේ. මෙතැන දෙපාර්ශ්වයක් තිබෙනවා. බලය ලත් ආයතන හරහා විදේශගත වෙන එකට වඩා බලය ලත් ආයතන නොවන අය හරහා, ඒ කියන්නේ "අහවලාගේ මෙයා" කියා කිව්වොත්, එහෙම නැත්නම් තව කාගේ හෝ කවුරු හරි කියා කිව්වොත්, එහෙමත් නැත්නම් මන්ත්‍රීවරයෙකුගේ කවුරු හරි කියා කිව්වොත්, අර කාර්යාලයේ ඉන්නවා කියා කිව්වොත්, එහෙම අයට හසු වෙලා සල්ලි දෙන එක සිදු වෙනවා. අපි දන්නවා, දමිතා අබේරත්න ලක්ෂ 40ක් ගත්තා කියලා නඩුවක් තිබෙන බව, රට යවන්න. දමිතා අබේරත්නට ඇති ලයිසන් එකක් නැහැ නේ. එකම සුදුසුකම සජිත් ප්‍රේමදාස මහත්තයලා එක්ක ඉන්න එක. "සජිත් ප්‍රේමදාස මහත්තයා ආවාම බලා ගනියි" කිව්වා. එහෙම නේ, කිව්වේ බන්ධනාගාරගත කරනකොට. ඒ, එක්කෙනෙක්. ඒ වාගේම ඔය වාගේ තව කට්ටිය - *[බාධා කිරීමක්]* මම මේ ගැන කියනකම් පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීමක්]* නැහැ, දමිතා නේ කිව්වේ, බස් එකට නගිනකොට. *[බාධා කිරීමක්]* දමිතා පොලීසියේ බස් එකට නගිනකොට කිව්වේ, "සජිත් ප්‍රේමදාස ආවාම මම බලා ගන්නම්" කියලා නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කොහේවත් යන ඒවාට පැටලෙන්න එපා. *[බාධා කිරීමක්]*

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ප්‍රශ්නය වෙන පැත්තකට ගෙනියන්න එපා, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. මේ කියන්නේ මිනිස්සු රවටන හැටි. එහෙම වංචාකාරයෝ ඉන්නවා. ඒ වාගේ වංචාකාරයෝ තැන් තැන්වල ඉන්නවා. අපි ඒ අයව අත්අඩංගුවට ගන්නවා. මගේ WhatsApp group එකක් තිබෙනවා, "Investigation" කියලා. අපි දවසකට මේ වාගේ පුද්ගලයින් 10ක්, 15ක් අත්අඩංගුවට අරගෙන ප්‍රවෘත්ති පළ කරනවා.

හැබැයි, අපේ මාධ්‍යයත් මේ වාගේ වංචාවකට මිනිස්සු අහු වුණාම එය මාධ්‍ය තුළින් පළ කරනවා; ඔබතුමන්ලාට කියනවා. හැබැයි, මේ විධියට දවසකට අත්අඩංගුවට ගන්නා ප්‍රමාණය, ඔවුන්ට දඩ ගහන ප්‍රමාණය, මිනිස්සුන්ගේ මුදල් නැවත අයකර දෙන එක මාධ්‍යයේ ප්‍රචාරය වෙන්නේ නැහැ. අපි දවසකට අතිවිශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගන්නවා. ඊට අමතරව කිසියම් විටෙක බලය ලත් නියෝජිත ආයතනයක් යම්කිසි වරදක් කරලා තිබෙනවා නම් ඒ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා, මේ වෙනකොට බලපත්‍ර 200කට අධික සංඛ්‍යාවක් අපි අහෝසි කරලා, නඩු දාලා තිබෙනවා. මේ හැම කෙනෙක්ම එක්කෝ බලපත්‍රයක් නැතිව ආයතන පවත්වාගෙන ගිය අය. එහෙම නැත්නම් ආයතනයක් නැහැ, නිකම් පුද්ගලයෝ විධියට ඉදිරිපත් වෙලා මේක කරනවා. ආයතන විධියට කරපු ඒවා සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න අපට ක්‍රමවේදයක් තිබෙනවා. මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. මේ ගොඩක් අය සල්ලි අරගෙන තිබෙන්නේ රට යවනවා කියලා නොවෙයි. එහෙම නැත්නම් ඒ ගොල්ලන් ගිවිසුම්ගත වෙලා තිබෙන්නේ කොළඹ ලියලා නොවෙයි. එතකොට අපට මේ දේවල් ඔප්පු කර ගැනීම පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. එතකොට විදේශ සේවා නියුක්ති

[ගරු මනුෂ නානායක්කාර මහතා]

කාර්යාංශයට, පොලීසියට හෝ අධිකරණයට ඒ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගැනීම පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. මේ කරුණු සියල්ල ඔප්පු කරලා අධිකරණයට ගිහිල්ලා බාර දුන්නත්, බොහෝ වෙලාවට ඇප හම්බ වෙනවා. ඒ තමයි නීතියේ තිබෙන තත්ත්වය. එහෙම ඇප හම්බ වුණාම ඔවුන් නැවත වතාවක් මේ කර්තව්‍යයම කරනවා. ඉතින් මේක ලේසි පහසුවෙන් කරන්න බැරි දෙයක් නිසා තමයි, 1985 දී හදපු විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත අපි යාවත්කාලීන කරමින්, නීති වැඩි කරලා, දඩුවම් වැඩි කරලා, දඩ මුදල් වැඩි කරලා සකස් කරලා දැන් එම කෙටුම්පත අවසාන මොහොතේ නීතිපති දෙපාර්තමේන්තුවේ තිබෙන්නේ. එය සම්මත වුණාම අපට ගොඩාක් දේවල් ක්‍රියාත්මක කර ගන්න පුළුවන් වෙයි.

හැබැයි, ගරු මන්ත්‍රීතුමනි, මිනිස්සු මේ දේවල්වලට අහු වෙන එක වළක්වන්නේ කොහොමද කියන ප්‍රධාන ප්‍රශ්නය තිබෙනවා නේ. 1956 දී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරනවා කිව්වාම ඒකට අහුවෙලා ඡන්දය දුන්නා. නේද? එක එක අවස්ථා ගත්තාම, එහෙම අහුවෙලා තිබෙනවා. පාන් ගෙඩිය රුපියල් 3.50ට දෙනවා කිව්වාම ඡන්දය දුන්නා. ඇට අට දෙනවා කිව්වාම ඡන්දය දුන්නා. සහල් සේරුව දෙනවා කියද්දී, නැහැ, සහල් සේරු දෙකක් දෙනවා කිව්වාම ඡන්දය දුන්නා. අපි අහුවෙන ජාතියක්. *-[බාධා කිරීමක්]* ඒක තමයි, එක එක ඒවා කිව්වාම ඡන්දය දුන්නා. ඊට අමතරව මෑත කාලීනව ගත්තාම කොහේ හරි තැනක පිරමීඩකාරයෙක් ඇවිල්ලා, මෙන්න චේන් එකෙන් මෙච්චර සල්ලි හම්බ වෙනවා කියලා කිව්වාම අපේ මිනිස්සු සල්ලි දෙනවා. ජාතියක් විධියට අපේ මිනිස්සු මේ දේවල්වලට අහු වෙනවා. හිට්ලර් කිව්වාම, ලී ක්වාන් යූ කිව්වාම එහෙමත් අහු වෙනවා. මෙන්න මේ විධියට අපි හැමදේටම අහුවෙන ජාතියක්. "වඳ කොත්තු" කියලා කිව්වාම අහු වුණා. "වද යට ඇදුම්" කිව්වාම අහු වුණා. මෙන්න මේ විධියට අහු වෙන එක වෙනස් කරන්න නම් අපේ අධ්‍යාපන ක්‍රමයේ ඉඳලාම, මුල ඉඳලාම හිතන්න පුළුවන් මිනිස්සු බිහි කරන්න ඕනෑ. එහෙම නැතිව මේ දේවල් හදන්න බැහැ. අපේ මිනිස්සු දැනුත් ඔය කයියනායකලාට අහු වෙන්නේ.

කයිය ගහන කොට, බොරු කියන කොට, මවලා දෙන කොට මිනිස්සු ඔය අහු වෙන්නේ. මිනිස්සු දැනුත් ඔය අහු වෙලා තියෙන්නේ. අන්න ඒ අහු වෙන එක වළක්වන්න කටයුතු කරනවා මිස මේ සම්බන්ධයෙන් නීති දාලා වැඩ කරන්න බැහැ.

ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා
(*மாண்புமிகு பீ.வை.ஜீ. ரத்னசேக்கர*)
(The Hon B. Y. G. Rathnasekara)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. *[බාධා කිරීමක්]* මම එක ප්‍රශ්නයයි ඇහුවේ. විශේෂයෙන් රජයේ මැදිහත් වීමෙන් ඊශ්‍රායලය, කොරියාව වාගේ රටවලට කට්ටිය යවනවා. ප්‍රාදේශීය වශයෙන් ඉන්න දේශපාලනඥයෝ -විශේෂයෙන් ප්‍රාදේශීය සභාවල හිටපු සභාපතිවරු ආදී පිරිස්- රුපියල් 41,000 ගණනේ මුදල් එකතු කරලා කොරියාවට යවන්න කට්ටිය එකතු කරනවා කියලා මේ වන කොට පැමිණිල්ලක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම හිතනවා ඔබතුමාට මේ තොරතුර ඇවිල්ලා ඇති කියලා. අනෙක් පැත්තෙන්, විවිධ අය අප ළඟට ඇවිල්ලා අහනවා -මම ඔබතුමාට දවසක් පෞද්ගලිකවත් මේ ගැන කිව්වා- ඔන්න අහවල් මන්ත්‍රීවරයා නම් ඊශ්‍රායලයට යවනවා, අහවල් මන්ත්‍රීවරයා නම් කොරියාවට යවනවා. ඇයි සර්, සර්ලා අපට මේක දෙන්නේ නැත්තේ කියලා. ඒ අය එහෙම අහන්න හේතුවක් ඇති. රජය මැදිහත් වීමෙන් කොරියාවට හා ඊශ්‍රායලයට යවන එකට මුවා වෙලා ප්‍රාදේශීය දේශපාලනඥයන් මුදල් එකතු කරමින්, යම්කිසි වංචාවක් කරමින් ඔබතුමන්ලාට අයදුම්පත් ඉදිරිපත් කරනවා ඇති. ඒවාට මොනවා වෙනවා ද දන්නේ නැහැ.

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ක්‍රියා කලාපය ගැන නම් අපට කියන්න කනගාටුයි. ඔය ආණ්ඩුව හැදුවේ අපි. ඔය ලක්ෂ 69 තුළ මගේත් ලක්ෂ එකහමාරක මිනිස්සු ඉන්නවා. *[බාධා කිරීම්]* ඔය ලක්ෂ 69 ඇතුළේ මගේත් ලක්ෂ එකහමාරක මිනිස්සු ඉන්නවා. *[බාධා කිරීම්]* අඩු ගණනේ විමධ්‍යගත අය වැයෙන් අපට රුපියලක්වත් දුන්නේ නැහැ. මා කියන්නේ ඒකයි. *[බාධා කිරීම්]* විමධ්‍යගත අයවැයෙන් අපට රුපියලක්වත් දුන්නේ නැහැ. ඔය ලක්ෂ 69 ඇතුළේ මගේත් ලක්ෂ එකහමාරක් මිනිස්සු ඉන්නවා. නමුත් විමධ්‍යගත අය වැයෙන් රුපියලක් දුන්නේ නැහැ; අඩු ගණනේ විදේශ රටකට මිනිහෙකු යවන්න අයදුම්පතක් දුන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා
(மாண்புமிகு பீ.வை.ஜீ. ரத்னசேக்கர)
(The Hon B. Y. G. Rathnasekara)

එහෙම දේවල් මන්ත්‍රීවරුන්ට දෙන්නේ නැත්නම් අප කියන්නේ, මෙන්න මෙතැනට අයදුම්පත එවන්න, මෙන්න මේ විධියට ඇඟයීම් කරනවා, මෙන්න මේ විධියට රට යවනවා කියලා එක ක්‍රමවේදයක්, විනිවිදභාවයෙන් යුත් ක්‍රමවේදයක් හදන්න කියලායි. *[බාධා කිරීමක්]* එහෙම නැත්නම් ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් යම් අවස්ථාවක් දෙන්න. මොකද, අපටත් සහය දැක්වූයේ මේ රටේ මිනිස්සු. *[බාධා කිරීම්]* මේ ආණ්ඩුව හදන්න ලක්ෂ 69ක් මිනිස්සු ඡන්දය දුන්නේ ආණ්ඩුවෙන් මේ රටට මොනවා හරි කරවාගන්න. *[බාධා කිරීම්]* විමධ්‍යගත අයවැයෙන් වෙන්න පුළුවන්, විදේශ රටවල රැකියා ලබා දීම සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, අපටත් යම්කිසි අයිතියක්, වරප්‍රසාදයක් තිබෙනවා. අප ඉල්ලන්නේ අන්න ඒ අයිතිය, ඒ වරප්‍රසාදය අපට දෙන්න කියලායි; ඔය විධියට කරන්න එපා කියලායි. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න. මේ කරුණු දෙකම අසාධාරණයි. මේ කරුණු දෙකම වැරැදියි. *[බාධා කිරීම්]*

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ විතරක් නොවෙයි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් එහෙම වරප්‍රසාද ලබා ගැනීමේ අයිතියක් තිබෙනවා කියලා ඔබතුමා දන්නවා නේ.

ඒ නිසා තමයි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට අමතරව විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීතුමන්ලාත් ගරු ජනාධිපතිතුමා මුණගැසිලා, රට භදන්න තිබෙන අවශ්‍යතාව ගැන කියලා, මුදල් ප්‍රතිපාදන ඉල්ලාගෙන තිබෙන්නේ. ඒ කියන්නේ, රට භදන්න,- *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, මේ ප්‍රශ්නයට උත්තර දෙන්න අවස්ථාව දෙන්නකෝ. මේ රට භදන්න පිරිසක් කැමතියි, රට සංවර්ධනය කරන්න පිරිසක් කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමා, ඔබතුමා ප්‍රශ්නයට උත්තර දෙන්න. එතකොට මේ ප්‍රශ්නය ඉවරයි.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ඒ ප්‍රශ්නයට තමයි උත්තර දෙන්නේ, ගරු කථානායකතුමනි. එතුමා අහපු දේට තමයි උත්තර දෙන්නේ. එතුමා එක ප්‍රශ්නයක් අහන්නයි, මම වෙනත් ප්‍රශ්නයකට උත්තර දෙන්නයි බැහැ නේ, ගරු කථානායකතුමනි. එතුමා අහපු ප්‍රශ්නවලට මම උත්තර දෙනවා. එතුමා අහපු ප්‍රශ්න එකින් එකටම මම උත්තර දෙනවා. එතුමා අහනවා, විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු විධියට ඒ ප්‍රතිපාදන ලබා ගැනීමේ අයිතියක් තිබෙනවාද, නැද්ද කියලා. ඔව්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු නම්, ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු නම්, පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ ජනතාවගේ ඡන්දයෙන් නම් ජනතාවට සේවය කරන්න අයිතියක් එතුමාට තිබෙනවා. *[බාධා කිරීමක්]* කට වහගන්නකෝ මන්ත්‍රීතුමා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

නැතුව. *[බාධා කිරීමක්]* අහගන්නකෝ පොඩ්ඩක්,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

නැතුව. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඒ අයිතිය තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව රටේ නීති පද්ධතිය සම්පූර්ණයෙන් පාහේ වෙනස් කරන්න අවශ්‍ය සහයෝගය ලබා දෙනවා. ඒ නීති පද්ධතිය වෙනස් කරගෙන සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරනවා. සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන කොට ආණ්ඩු පක්ෂයේ විතරක් නොවෙයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් එකතු වෙලා ඒ සංවර්ධන කටයුතුවලට දායකත්වය දෙන්න පුළුවන්; අණ පනත් සම්මත කරද්දී සහයෝගය දෙන්න පුළුවන්. සමහර මන්ත්‍රීවරු ජනාධිපතිතුමා හමු වෙලා, "යම් යම් සංවර්ධන කටයුතුවලට අපිත් දායකත්වය දෙන්න කැමැතියි" කියලා තමතමන්ගේ ප්‍රදේශ සංවර්ධනය කරන්න ඉදිරිපත් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙතුමන්ලාටත් එහෙම කරන්න පුළුවන්.

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඇහුවා, විදේශ රැකියා ලබා දෙන කොට කොයි විධියට ද එම රැකියා ලබා දෙන්නේ කියලා. ඒ සම්බන්ධව විශේෂ කාරණයක් සඳහන් කරන්න ඕනෑ. "ජයගමු ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ අපි ලංකාව වටේ යනවා. විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඒ විධියට සෑම දිස්ත්‍රික්කයකටම ගිහිල්ලා ඊශ්‍රායල් රාජ්‍යයේ ඉදි කිරීම් ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය තරුණ තරුණියන් ඒ ස්ථානයේදීම බඳවා ගන්නවා. දැන් ඒ අය සඳහා පුහුණුවීම් සහ පරීක්ෂණ පවත්වනවා. ඇතැම් අය රැකියා සඳහා පිටත් කර හැරීම පවා කරලා තිබෙනවා. අප දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට යනවා. මේ වන විට දිස්ත්‍රික්ක 17කට ගිහින් තිබෙනවා. ඉතිරි දිස්ත්‍රික්කවලටත් අපි යනවා. ඒ විධියට ගිහිල්ලා අවශ්‍ය බඳවා ගැනීම් සිද්ධ කරනවා.

ඊට අමතරව, ඔබතුමන්ලා විශ්වාස කරන විධියටම ගමේ හැම තැනක් එක්කම සම්බන්ධතාව තිබෙන, ගමේ අඩු පාඩු තිබෙන්නේ කොතැනද කියලා දන්නා, හැම කෙනෙකුගේම තොරතුරු දන්නා මහජන නියෝජිතයන්ටත් අපි අවකාශය ලබා දී තිබෙනවා, නාම යෝජනා ගෙනැල්ලා අපට භාර දෙන්න. ඒ නාම යෝජනා ගෙනැල්ලා භාර දීම සම්බන්ධයෙන් මම මේ පාර්ලිමේන්තුවේදී දෙවතාවක්ම කිව්වා. ඕනෑම මන්ත්‍රීවරයෙකුට නාම යෝජනා ගෙනැල්ලා භාර දෙන්න පුළුවන් බව කිව්වා. ඒ අනුව විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් බහුතරයක් අපට නාම යෝජනා ගෙනැල්ලා භාර දීලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලාට ඒක කියලා නැති එක ගැන අපට කරන්න දෙයක් නැහැ. මම පාර්ලිමේන්තුවේදී මේ ගැන කිව්වා. බහුතරයක් මන්ත්‍රීවරු නාම යෝජනා භාර දුන්නා. ඒ අයගෙන් බහුතරයක් මේ වන විට රට ගිහිල්ලාත් තිබෙනවා. ඉතින්, ඒක හංගන්න දෙයක් නැහැ.

ඊට අමතරව අපි වෙබ් අඩවියක් නිර්මාණය කරලා තිබෙනවා. ඒ වෙබ් අඩවිය access කරන්න පුළුවන් අයට ඒකට ඇතුළු වෙලා රැකියා සඳහා ලියාපදිංචි වෙන්න පුළුවන්. විභාග කරන්න ඕනෑ ඒවා තිබෙනවා. ඒ වාගේ විවිධ ක්ෂේත්‍ර තිබෙනවා. ඒවාට එකතු වෙන්න පුළුවන්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාට ඊළඟට අවස්ථාවක් තිබෙනවා නේ, ගරු මන්ත්‍රීතුමා. ඔය ප්‍රශ්නයත් ඒ වෙලාවටම අහන්න. *[බාධා කිරීමක්]* ඇයි ඔය විධියට කාලය නාස්ති කරන්නේ? *[බාධා කිරීමක්]*

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඊළඟට අවස්ථාව තිබෙනවා. *[බාධා කිරීමක්]* ඒ වෙලාවට ඔය ප්‍රශ්නයත් අහන්න. *[බාධා කිරීමක්]* දැන් ඉඳගන්න. ඔබතුමා මෙතැනට ඇවිල්ලා අවස්ථාවක් ඉල්ලුවා නේ, ගරු මන්ත්‍රීතුමා. ඒ අවස්ථාව තිබෙනවා නේ.

කිරි ගොවීන් සඳහා වන ණය යෝජනා ක්‍රම: විස්තර
பாற்பண்ணையாளர்களுக்கான கடன் திட்டங்கள்: விபரம்
LOAN SCHEMES FOR DAIRY FARMERS: DETAILS

1092/2024

8. ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 'කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය' මේ වන විට ක්‍රියාත්මක වන්නේද;

(ii) 'කිරි ගොවිපොළ 1000ක් පිහිටුවීමේ වැඩසටහන' යටතේ මේ වන විට පිහිටුවා ඇති කිරි ගොවිපොළ සංඛ්‍යාව කොපමණද;

(iii) එම කිරි ගොවිපොළවලින් වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන දියර කිරි ප්‍රමාණය කොපමණද;

[ගරු සමන්ප්‍රිය හේරත් මහතා]

(iv) මේ යටතේ ඉදිරියේදී පිහිටුවීමට නියමිත කිරි ගොවිපොළ සංඛ්‍යාව කොපමණද;

(v) මෙම වැඩසටහන සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අඛණ්ඩව ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

කමත්තොළිල් මට්‍රුම් පෙරුන්තෝට්ටක් කෛත්තොළිල් අමෛච්චරෛක් කේට්ට විනා:

(අ) (i) "පාල් උර්පත්ති අපිවිරුත්ති කටන් තිට්ටම්" තර්පෝතු නටෛමුරෛයිල් උළ්ළතා;

(ii) "1,000 පාර්පණ්ණෛකළෛ අමෛක්කුම් වේලෛත්තිට්ටම්"ඉන්කීළ් ඉන්රළවිල් අමෛක්කප්පට්ටුළ්ළ පාර්පණ්ණෛකළින් එණ්ණික්කෛ යාතු;

(iii) මේර්පඩි පාර්පණ්ණෛකළිලිරුන්තු වරුටාන්තම් උර්පත්ති සෙය්යප්පටුම් තිරවප් පාලින් අළවු යාතු;

(iv) ඉතන්කීළ් එතිර්කාලත්තිල් අමෛක්කප්පටවුළ්ළ පාර්පණ්ණෛකළින් එණ්ණික්කෛ යාතු;

(v) ඉන්ත වේලෛත්තිට්ටත්තුක්කුත් තේවෛයාන නිති ඒර්පාටුකළ් තොටර්ච්චියාක වළංකප්පටුමා;

එන්පතෛ අවර් ඉච්චපෛක්කු අර්විවිප්පාරා?

(ඇ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Will he inform this House -

(i) whether the "Milk Production Development Loan Scheme" is functional at present;

(ii) the number of dairy farms set up at present under the programme to establish 1,000 dairy farms;

(iii) the volume of liquid milk produced by those dairy farms annually;

(iv) the number of dairy farms scheduled to be established under this in future; and

(v) whether the allocations required for this programme would be disbursed continuously?

(b) If not, why?

ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Agriculture and Plantation Industries)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කිරි නිෂ්පාදනයේ යෙදී සිටින ගොවීන් සඳහා පහත සඳහන් ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කෙරේ.

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේ අරමුණින් සහනදායී පොලී අනුපාත යටතේ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 02ක් ක්‍රියාත්මක කෙරේ.

එයින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රම ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය දායකත්වය යටතේ වාණිජ බැංකු 12ක සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කෙරේ. එසේම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නැවත පණ ගැන්වීම සඳහා වන ණය යෝජනා ක්‍රමය දේශීය අරමුදල් යොදා ගනිමින් වාණිජ බැංකු 16ක සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.

(ii) කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හෝ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් 'කිරිගව ගොවිපොළ 1000ක් පිහිටුවීමේ වැඩසටහන' නමින් වැඩසටහනක් ක්‍රියාත්මක නොකෙරේ.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(v) පැන නොනඟී.

(ආ) අදාළ නොවේ.

ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

ගරු අමාත්‍යතුමනි, අපි දියර කිරි නිෂ්පාදනය පිළිබඳව හැමදාමත් කථා කරනවා. ඒ වාගේම, මේ වන විට අපට තිබෙන ප්‍රධානම ගැටලුව තමයි, කිරි පිටි ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් වැය කිරීම. මේ වෙද්දි රජයට අයත් වතු සමාගම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම, අපේ ප්‍රදේශවල නම් දියර කිරි නිෂ්පාදනය සඳහා ගොවි මහත්වරුන් යොමු වෙලා සිටියත්, ඔවුන්ට තිබෙන ගැටලුව තමයි බොහෝ වෙලාවට සාධාරණ මිලක් නොලැබෙන එක. ඒකට ප්‍රධාන හේතුව, ඔවුන් විවිධ ආයතනවලට ඒ දියර කිරි ලබා දීමයි. මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, මේ දියර කිරි ලීටරයකට ගොවියාට සාධාරණ මිලක් ලබා දීම සඳහා අමාත්‍යාංශයට මැදිහත්වීමක් කරන්න පුළුවන්ද කියලා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු මන්ත්‍රීතුමනි, උත්තරයට අදාළ පසුබිම් වාර්තාවෙත් ඔය කාරණය සම්බන්ධව තිබෙනවා. මා හිතන විධියට, 2022 වර්ෂයේ අය වැය කථාවේ සඳහන්ව තිබෙන කාරණයක් නිසා තමයි ඔබතුමාගේ ප්‍රශ්නයේදී ඔබතුමා ඔය ගැන විමසන්නේ. ඒ අය වැය කථාවට අනුව පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රුපියල් මිලියන 1,000ක ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා, "කුඩා හා මධ්‍යම පරිමාණ කිරි ගොවි සංවර්ධනය හා කිරි පොකුරු ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා" කියලා. නමුත් ඒ වෙලාවේ ඇති වුණු ආර්ථික අර්බුදය නිසා ඒ මුදල් ප්‍රමාණය ලබා දීලා නැහැ; ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණේ නැහැ. එක්‍රලේබ අනුවම ඒක නවත්වා තිබෙනවා.

අමාත්‍යාංශය දැනට පටන් ගෙන තිබෙනවා, කිරි ලීටර් 100 දක්වා වැඩි කිරීමේ ව්‍යාපෘතියක්. කෘෂි නවීකරණ ව්‍යාපෘතිය හරහා ලැබුණු මූල්‍ය ප්‍රතිපාදන උපයෝගී කරගෙන කුඩා ගොවිපොළ සංවර්ධනය කරන්න, කිරි ලීටර් 100 දක්වා වැඩි කරන්න අවශ්‍ය පහසුකම් ලබා දෙනවා.

මිල සම්බන්ධයෙන් ගොවීන්ට තිබෙන ගැටලුව ගැනත් කියන්න ඕනෑ. මීට මාස 6කට පමණ පෙර මිල්කෝ ආයතනයට ආවේ කිරි ලීටර් 65,000ක් වාගේ ප්‍රමාණයක් විතරයි. ඊට පස්සේ අපි කිරිවලට ලබා දෙන මිල වැඩි කළා. මිල වැඩි කිරීමේ ප්‍රතිඵලයක් විධියට දැනට කිරි ලීටර් ලක්ෂ 2කට අධික ප්‍රමාණයක් එන්න පටන්ගෙන තිබෙනවා. අපි ඉදිරියේදී කිරි ගොවීන් ශක්තිමත් කිරීම සඳහා SAPP එක හරහාත් වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. අපේ උත්සාහය, අපට අවශ්‍ය කිරි ටික මේ රට තුළ නිෂ්පාදනය කර ගැනීමයි. මේකට අවශ්‍ය මූල්‍ය ධනය, මූලික ප්‍රතිපාදන සොයා ගැනීමේ ගැටලුවයි අපට තිබුණේ. නමුත් දැන් ක්‍රමානුකූලව මුදල් ලැබෙමින් පවතිනවා. මම හිතනවා අපට ඉතා කෙටි කාලයක් තුළ මේ තත්ත්වය වර්ධනය කර ගන්න පුළුවන් වෙයි කියලා.

ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

ගරු අමාත්‍යතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම කිරි ගොවියාට ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනවා සිංචන සේවා සම්බන්ධව. අපි දන්නවා මේක පළාත් සභාවට අයිති විෂයක් බව. ගොවියාට ක්‍රමවත් ආකාරයෙන් සිංචන සේවා කර ගැනීම සඳහා අවශ්‍ය දායකත්වය ලබා දෙන්න බොහෝ වෙලාවට පශු වෛද්‍ය කාර්යාල හරහා උත්සාහ කරනවා. නමුත් ඒ අයත් එම සේවාව ලබා දෙන්නේ අඩු පහසුකම් යටතේ. සිංචන සේවාව නිසි වේලාවට ලබා ගන්න බැරි වුණොත් ඒ ගොවියා බැරෑරුම් ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙනවා. මම මේ ප්‍රශ්නයෙන් ඔබතුමාගෙන් අසා තිබෙනවා, වාර්ෂිකව නිෂ්පාදනය කරන දියර කිරි ප්‍රමාණය සම්බන්ධයෙන්. ගරු අමාත්‍යතුමනි, අමාත්‍යාංශයක් විධියට ඒ සම්බන්ධ ගණනය කිරීමක් තවමත් සිදු කර නැහැ කියන එකයි මගේ නම් හැඟීම.

ගරු අමාත්‍යතුමනි, කිරි ගොවීන් සඳහා අවශ්‍ය සිංචන සේවාව ලබා දීම ක්‍රමවත් කිරීම සඳහා වැඩ පිළිවෙළක් අමාත්‍යාංශය මැදිහත් වෙලා මේ වන විට ආරම්භ කරලා තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ඔබතුමා සඳහන් කළ පරිදි මේ විෂය විමධ්‍යගත වෙලායි තිබෙන්නේ. පශු වෛද්‍යවරු, ඒ වාගේම LDIලා සියලුදෙනාම සේවය කරන්නේ පළාත් සභාව යටතේ. නමුත්, මධ්‍යම රජයෙන් මේ සඳහා ගත හැකි ක්‍රියාමාර්ගවලට අපි ප්‍රවේශ වෙලා තිබෙනවා. ඒ වාගේම කෘත්‍රිම සිංචනය සඳහා අවශ්‍ය ඉතාම උසස් තත්ත්වයෙන් යුතු sexed semen ගෙනැල්ලා දෙන්න අපි කටයුතු කරනවා. දැනටමත් විදේශ රටවල සිටින හොඳ සතුන්ගෙන් ඒවා ගෙනැල්ලා මේ සතුන්ට ලබා දීම සිදු කරනවා. ඒ නිසා අපේ ගොවීන් ළඟ ඉන්න එළදෙනුන්ගේ කිරි ප්‍රමාණය දැනටමත් වැඩි වෙලා තිබෙනවා. ආරය උසස් වෙලා තිබෙනවා. මම පිළිගන්නවා, ඔබතුමා කිව්ව කාරණය. නියමිත වෙලාවට මේ කටයුතු කිරීමේ යම් ගැටලුවක් තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි, පශු වෛද්‍යවරුන්ගේ හිඟය. පශු වෛද්‍යවරුන්ගේ හිඟය නිසාත් මේ බලපෑම අපට ඇති වෙලා තිබෙනවා. නමුත්, ඒ අයව බඳවා ගැනීමට දැන් අනුමැතිය ලැබුණා. ඒ නිසා අපි ඉතා ඉක්මනින් ඔවුන් බඳවා ගන්න කටයුතු කරනවා. ඔබතුමා මුලින්ම සඳහන් කළ පරිදි මෙය පළාත් සභාවට විමධ්‍යගත වූ විෂයයක් නිසා අපට සෘජු අධීක්ෂණයක් කරන්න ටිකක් අපහසුයි. නමුත්, අපි සම්බන්ධීකරණය වෙමින් මේ කටයුත්තට ප්‍රවේශ වෙමින් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 -1127/2024- (2), ගරු ඩී. වීරසිංහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

පුරාවිද්‍යා කැණීම්/සංවර්ධන කටයුතු: විස්තර
தொல்பொருள் அகழ்வுகள்/அபிவிருத்தி நடவடிக்கைகள்: விபரம்
ARCHAEOLOGICAL EXCAVATIONS/ DEVELOPMENT ACTIVITIES : DETAILS

1154/2024

10. ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට සිදු කරනු ලබන පුරාවිද්‍යා කැණීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන කවරේද;

(iii) එම කැණීම්/සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අඛණ්ඩව ලබා දෙන්නේද;

(iv) අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් මේ වනවිට කැණීම්/සංවර්ධන කටයුතු නවතා ඇති පුරාවිද්‍යා ස්ථාන කවරේද;

(v) ඉදිරියේදී කැණීම්/සංවර්ධනය කිරීමට යෝජිත පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போது மேற்கொள்ளப்பட்டு வருகின்ற தொல்பொருள் அகழ்வுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி இடங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி அகழ்வு/அபிவிருத்தி நடவடிக் கைகளுக்குத் தேவையான நிதி ஏற்பாடுகள் தொடர்ச்சியாக வழங்கப்படுகின்றனவா என்பதையும்;

(iv) தேவையான நிதி ஏற்பாடுகள் கிடைக்காமை காரணமாக தற்போது அகழ்வு/அபிவிருத்தி நடவடிக்கைகள் நிறுத்தப்பட்டுள்ள தொல் பொருளியல் இடங்கள் யாவை என்பதையும்;

(v) எதிர்காலத்தில் அகழ்வு/அபிவிருத்தி நடவடிக் கைகளை மேற்கொள்ள உத்தேசிக்கப்பட்டுள்ள தொல்பொருளியல் இடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු නීතිඥ මධුර විතානගේ මහතා]

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) the number of archaeological excavations currently being carried out in Sri Lanka;

(ii) the aforementioned places are;

(iii) whether the allocations required for aforesaid excavations/ development activities are being provided continuously;

(iv) the archaeological sites where excavations/ development activities have been suspended due to lack of funds; and

(v) the number of proposed archaeological sites where excavations/ development activities will be carried out in the future?

(b) If not, why?

ගරු විදුර වික්‍රමනායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Vidura Wickramanayaka - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කැණීම් ස්ථාන 02කි.

(ii) අම්පාර දීඝවාපිය ස්තූප මලුව කැණීම.

වරාය බැටන් බර්ග් කැණීම.

(2024.01.01 සිට 2024.06.12 දින වන විට අවසන් කර ඇති කැණීම් පිළිබඳ විස්තර පහතින් ඉදිරිපත් කර ඇත.)

2024.01.01 සිට 2024.06.12 දින වන විට අවසන් කර ඇති කැණීම්

අනු අංකය	කැණීමේ නම	කැණීම් ස්වභාවය	ප්‍රතිපාදන මූලාශ්‍ර
01	සමංගල ස්තූප මළුව කැණීම - අම්පාර	ස්මාරකය පාදා ගැනීමේ කැණීම	විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ ප්‍රතිපාදන ලබා දී ඇත.
02	නාගදීපය පුරාවිද්‍යා ස්ථානයේ ප්‍රතිමා ගෘහය කැණීම - බදුල්ල	ස්මාරකය පාදා ගැනීමේ කැණීම	විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ ප්‍රතිපාදන ලබා දී ඇත.
03	ඔවාගිරිය රජමහාවිහාරයේ ස්තූප ගොඩැල්ල පාදා ගැනීමේ කැණීම් ව්‍යාපෘතිය - හම්බන්තොට	ස්මාරකය පාදා ගැනීමේ කැණීම	විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ ප්‍රතිපාදන ලබා දී ඇත.
04	දීඝවාපිය ඔලුවිල් මාර්ගය වතුරට සේදීයාමෙන් මතු වූ ගල් ඇතුරුමෙහි පර්යේෂණ කැණීම - අම්පාර	හානි ඇගයුම් කැණීම (AIA)	භාණ්ඩාගාර ප්‍රතිපාදන
05	ගලේවෙල පත්කොළගොල්ල ස්තූප ගර්භය හඳුනා ගැනීමේ කැණීම - මාතලේ	ස්මාරකය පාදා ගැනීමේ කැණීම	විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ ප්‍රතිපාදන ලබා දී ඇත.
06	පොදු වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම සඳහා හානි ඇගයුම් කැණීම ගාලු කොටුව - ගාල්ල	හානි ඇගයුම් කැණීම (AIA)	ගාලු උරුමය පදනම
07	දඹුල්ල ඇරැවුල හානි ඇගයුම් කැණීම - දඹුල්ල	හානි ඇගයුම් කැණීම (AIA)	ඇරැවුල හොටෙල් (පුද්) සමාගම
08	බණ්ඩාරවෙල පල්ලිය කන්ද ප්‍රාග් ඓතිහාසික භූමිය ගලවා ගැනීමේ කැණීම් - බදුල්ල	ගලවා ගැනීමේ කැණීම් (AIA)	බණ්ඩාරවෙල නගර සභාව

(iii) ඔව්.

අප විසින් සිදු කරනු ලබන කැණීම් සංරක්ෂණය සඳහා වන ප්‍රතිපාදන ඇත.

(iv) එවැනි පුරාවිද්‍යා ස්ථාන නොමැත.

(v) 2024 වර්ෂයේ වාර්ෂික සැලැස්මට අනුව යෝජිත පුරාවිද්‍යා ස්ථාන 06කි. නමුත් හදිසි කැණීම් අවස්ථා ඇති විය හැකිය.

(ආ) අදාළ නොවේ.

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, රටේ ඉතිහාසය විනාශ කර දමන සුක්ෂ්ම වැඩසටහනක් මේ වන විට ලංකාව පුරා ක්‍රියාත්මක වෙනවා.

ඒ වාගේම සමහර දේශපාලන කල්ලි මේ වනවිට ලෝකයේ රට රටවල දේශන පවත්වාගෙන යනවා, අපේ ශ්‍රී ලාංකීය ජාතිය, මේ රට පහළට දාලා අන්තවාදී කණ්ඩායම් එක්ක තමන්ගේ දේශපාලන ගේම් ගහන්න. ඒ වාගේම අද වනවිට අපේ අබෞද්ධයෝ විතරක් නොව බෞද්ධයෝ පවා, සැබෑ ශ්‍රී ලාංකිකයෝ පවා අපේ රටේ ඓතිහාසික ස්ථාන විනාශ කරන තැනකට ඇවිල්ලා. විශේෂයෙන්ම ශ්‍රී ජයවර්ධනපුර

පාර්ලිමේන්තුව පිහිටා තිබෙන ඓතිහාසික කෝට්ටේ රාජධානිය ශිෂ්‍ය නාගරික සංවර්ධනය තුළින් -අපිළිවෙළට කෙරුණු නාගරික සංවර්ධනය තුළින්- බලවත් විනාශයකට පත් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මම කනගාටු වෙනවා, මේ පාර්ලිමේන්තුව අද මේ සම්බන්ධයෙන් කිසිම අවධානයක් යොමු නොකිරීම ගැන. අපි, "ඓතිහාසික ශ්‍රී ජයවර්ධනපුර" කියලා පම්පෝරි ගහනවා විතරයි, දෙවරක් රටේ අගනගරය වූ ඓතිහාසික නගරය ආරක්ෂා කර ගන්න කිසිම වැඩ පිළිවෙළක් නැහැ. දැනට ලෝකය හොයාගෙන තිබෙන පැරණිතම, මකුළු දැලක - spiderweb එකක - ආකාරයට හදපු නගර තුනක් තිබෙනවා. චීනයේ ෂැන්ඩොන්ග් නගරය, හංගේරියාවේ බුඩාපෙස්ට් නගරය, ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර නගරය තමයි ඒ නගර තුන. ලන්ඩන්, පැරිස්, නිව්යෝර්ක් වාගේ දියුණු නගර නිර්මාණය කරන්න මෙන්න මේ ක්‍රමවේදය භාවිත කරන බව ඒ නගර නිර්මාණ ශිල්පීන් අතර කථා බහක් ඇති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් මම මේ කාරණය අහනවා. මේ ඓතිහාසික නගරය විනාශ කරන්න ජනතාව එක්ක වැඩ කරපු පුරාවිද්‍යා නිලධාරීන් ඉන්නවා. ඔබතුමා එක්ක මම අවස්ථා කිහිපයකදී ඒ ගැන කථා කළා. ඔබතුමාට අද මේ නගරය වටේ රවුමක් යන්න පුළුවන්. පැයක් ඇතුළත බලන්න පුළුවන්, මේ නගරයේ පුරාවිද්‍යා ස්ථාන මොන තරම් විනාශ කරලා තිබෙනවාද කියලා. ඒ වාගේම අපි පසුගිය දවසක දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ ගැන සාකච්ඡා කරලා ඔබතුමාගේ නිලධාරීන් ගෙන්වලා කථා කළා. ඊට පසුව ඒ නිලධාරීන් අනවසර ඉදිකිරීම් කරපු මිනිසුන්ට ගිහිල්ලා කියනවා, "අපේ ප්‍රශ්නයක් නැහැ. මන්ත්‍රීතුමාට වුවමනා නිසා තමයි අපි මේවාට මැදිහත් වෙන්නේ" කියලා. මම ඔබතුමාගෙන් පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට අහනවා, පුරාවිද්‍යා පනත යටතේ ඒ මිනිසුන්ට දඬුවම් කරන්න ඉස්සෙල්ලා ඒ වැරැදි කරපු, අල්ලස් අරගෙන අනවසර ඉදිකිරීම් කරන්න ඉඩ දුන්නු නිලධාරීන්ට විරුද්ධව ඔබතුමා නීතිය ක්‍රියාත්මක කරලා තිබෙනවාද, ඒ නිලධාරීන් හඳුනාගෙන තිබෙනවාද කියලා.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ අතුරු ප්‍රශ්නයේ පළමුවැනි කොටසට උත්තරයක් දෙන්නට අවසර දෙන්න. මේ රටේ අපේ ජාතික අනන්‍යතාව ඒ සමඟම ජාතිකත්වය විනාශ කරලා දමන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පමණද?

එසේත් නැත්නම් මුළු මහත් අධ්‍යාපන ක්‍රමය තුළත්, මාධ්‍යයත් විසින් කරන්නා වූ යම් යම් ප්‍රකාශ තුළත් අපේ රටේ අභිමානයට කැලැලක් ඇති නොවන්නේද? ඒ නිසා අපේ අධ්‍යාපන ක්‍රමවේද පිළිබඳව, විශේෂයෙන්ම විෂය මාලාවන් පිළිබඳව අපි මීට වඩා සැලකිලිමත් විය යුතුයි. ඒ විෂය මාලාවන් පටන් ගැනීම පළමුවැනි ශ්‍රේණියේ සිට දහතුන්වන ශ්‍රේණියට පමණක් සීමා නොවිය යුතුයි. පෙර පාසලත් මේකට අයිති වෙන්න ඕනෑ, විශ්වවිද්‍යාලත් අයිති වෙන්න ඕනෑ. ඒ වාගේම අනෙකුත් අධ්‍යාපන ආයතනත් මේකට අයිති වෙන්න ඕනෑ. එහෙම වුණොත් විතරයි අභිමානයක් ඇති ශ්‍රී ලාංකිකයන් බිහි වෙන්නේ. අභිමානයක් ඇති ශ්‍රී ලාංකිකයන් බිහි වුණොත් පමණයි අපට හෙට දවසේ ශ්‍රී ලංකාව ගැන අභිමානවත්ව කථා කරන්න පුළුවන් වෙන්නේ. ඒක තමයි ගරු මන්ත්‍රීතුමාගේ පළමුවන අතුරු ප්‍රශ්නයේ පළමුවැනි කොටසට උත්තරය.

එතුමාගේ අතුරු ප්‍රශ්නයේ දෙවැනි කොටසට උත්තර දෙමින් කථාව දික් ගස්සන්නේ නැතිව ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව ගරු මන්ත්‍රීතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා, අපට දවසක් ලබා දෙන්න කියලා. එතකොට අපි ඔබතුමාත් එක්ක එන්නම්, ඔය කියන ස්ථානවලට ගිහිල්ලා ඒ පුද්ගලයෝ එක්ක කථා කරලා, ඒ ස්ථානවල සිදුවෙලා තිබෙන අඩු පාඩු මොනවාද කියලා සොයලා බලන්න, ගරු මන්ත්‍රීතුමනි. එසේ නැත්නම් ඔබතුමාගේ සම්බන්ධීකරණ කමිටුවට අපිව කැඳවන්න, අපි එන්නම්.

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඓතිහාසික දීඝවාපිය පුදබිම, බුද්ධංගල ආරණ්‍ය සේනාසනය, රජගලතැන්න පුරාවිද්‍යා සංකීර්ණය, කුඩුම්බිගල තපෝවනය, තරුලෙන්ගල ආරණ්‍ය සේනාසනය, මඟුල් මහා විහාරය, මුහුදු මහා විහාරය කියන්නේ දිගාමඩුල්ල දිස්ත්‍රික්කය තුළ බෞද්ධ ප්‍රබෝධයක් තිබූ ඓතිහාසික ස්ථාන. මේ වනවිට අන්‍ය ආගමිකයින් නිසාත්, විශේෂයෙන් අෂ්රෆ් මැතිතුමා 1998 වර්ෂයේදී කරපු අනවසර පදිංචි කිරීම් සහ ඉඩම් බෙදීම් නිසාත් දීඝවාපිය පුදබිමට බලවත් හානියක් සිදුවෙලා තිබෙනවා. පසුගිය දවස්වල මේ වාගේ කාරණා ගැන කථා කිරීම නිසා, ඒවාට මැදිහත් වීම නිසා ඥානසාර හාමුදුරුවන්ටත් එරෙහිව නීතිය ක්‍රියාත්මක වුණා. ඓතිහාසික පුද බිම් ආරක්ෂා කිරීම ගැන කථා කිරීම අද නීතියෙන් දඬුවම් ලැබෙන කාරණයක් බවට පත්වෙලා තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, අන්‍ය ආගමිකයන් විසින් කරන මේ වාගේ අනවසර ඉදිකිරීම්, අයිනිවාසිකම් ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් මේ වන විට ඔබතුමාගේ අමාත්‍යාංශය ප්‍රතිපත්තියක් විධියට ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද?

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු කථානායකතුමනි, අපට තිබෙන කුරානයත්, අපට තිබෙන බයිබලයත් තමයි පුරාවස්තු ආඥාපනත. ඒ ආඥාපනත එක ඉස්පිල්ලක්වත්, පාපිල්ලක්වත් නැරව, එහාට මෙහාට කරන්නේ නැතුව ආරක්ෂා කිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ අමාත්‍යාංශය හැටියට අපි බැඳී සිටිනවා. ඒ සම්බන්ධයෙන් යම් යම් ප්‍රශ්න තිබුණා. නොතිබුණා නොවෙයි. බරපතළ ප්‍රශ්න තිබුණා. අපි මේ වෙනකොට ඒවා එකින් එක සමථයකට පත් කරගෙන යනවා. ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු මුහුදු මහා විහාරයත් එවැනි ප්‍රශ්නයක් තිබිච්ච තැනක්. ඒ වාගේම තවත් ප්‍රශ්න තිබුණු තැන් තිබුණා. කුරගලත් ඉන් එකක්. අපි මේ වෙනකොට ඒ තැන්වල තිබුණු ප්‍රශ්න විසඳලා තිබෙනවා. හැබැයි සමහර තැන්වල නැවත නැවත ප්‍රශ්න මතු වෙනවා. අමාත්‍යාංශයක් තිබෙන්නේ, රාජ්‍ය ආයතන තිබෙන්නේ නැවත නැවත ප්‍රශ්න මතු කර ගැනීමට නොවෙයි, ඒ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට සහ විසඳුම් ලබා දීමට. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මම යළිත් ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා, එවැනි අතපසුවීමක් සිද්ධ වෙලා තිබෙන යම්කිසි ස්ථානයක් තිබෙනවා නම්, කරුණාකරලා අප වෙත දැනුම් දෙන්න කියලා. වහාම ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න අප සූදානම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

පළාත් පාලන ආයතන විසින් කුණු කසළ බැහැර කරන ස්ථාන: බස්නාහිර පළාත

உள்ளூராட்சி மன்றங்களால் கழிவுகள் கொட்டப்படும் இடங்கள்: மேல் மாகாணம்

GARBAGE DUMPS USED BY LOCAL AUTHORITIES: WESTERN PROVINCE

466/2024

1. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු අජිත් මාන්නප්පෙරුම මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு அஜித் மான்னப்பெரும சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Ajith Mannapperuma)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බස්නාහිර පළාතේ, එක් එක් පළාත් පාලන ආයතනය විසින් කුණු කසළ බැහැර කරනු ලබන ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ වන විට බස්නාහිර පළාතේ විශාල වශයෙන් කුණු කසළ එක්රැස් වී ඇති ස්ථාන සංඛ්‍යාව සහ ඒවා පිහිටා ඇති ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ස්ථාන අවට ජීවත් වන ජනතාවට පාරිසරික ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වී තිබෙන බව දන්නේද;

(iv) එම ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரு மானவரைக் கேட்ட வினா:

(அ) (i) மேல் மாகாணத்தில், ஒவ்வோர் உள்ளூராட்சி மன்றத்தினாலும் கழிவுகள் கொட்டப்படும் இடங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) தற்போது மேல் மாகாணத்தில் பாரியளவில் கழிவுகள் சேகரிக்கப்பட்டுள்ள இடங்களின் எண்ணிக்கை மற்றும் அவை அமைந்துள்ள இடங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி இடங்களை அண்டியதாக வாழும் மக்களுக்குப் பல்வேறு சுற்றாடல்சார் பிரச்சினைகளுக்கு முகம்கொடுக்க வேண்டி ஏற்பட்டுள்ளது என்பதை அறிவாரா என்பதையும்;

(iv) மேற்படி பிரச்சினைகளைத் தீர்ப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he inform the House -

(i) the places where garbage is disposed of by each of the local authorities in the Western Province, separately;

(ii) the number of places in the Western Province where garbage has accumulated on a massive scale and their locations, separately;

(iii) whether he is aware that the people living in the vicinity of those places have had to face many environmental problems; and

(iv) the measures that will be adopted for solving such problems?

(b) If not, why?

ගරු අශෝක ප්‍රියන්ත මහතා (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அசோக்க பிரியந்த - உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)

(The Hon. Ashoka Priyantha - State Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) පළාත් පාලන ආයතන 49 විසින් කසළ බැහැර කරන ස්ථාන සහ කසළ කළමනාකරණය කරනු ලබන ස්ථාන පිළිබඳව සවිස්තර සටහන, උපලේඛන අංක 01** ලෙස මීට යා කර ඉදිරිපත් කරමි.

(ii) බස්නාහිර පළාතේ කුණු කසළ එක් රැස් වී ඇති ස්ථාන 07ක් හඳුනා ගෙන ඇත. එම ස්ථාන පහත පරිදි වේ.

අනු අංකය	කසළ එක් රැස් වී ඇති ස්ථාන
01	දඹුවත්ත, කලගෙඩිහේන අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය
02	කොටිකාවත්ත සුසන භූමිය පිටුපස
03	කරදියාන, මීහිසරු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය, තුම්බෝවිල, කරදියාන
04	පොහොරවත්ත, මීහිසරු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය, කළුතර
05	සුදුවැල්ල, ජාඇල නගර සභා බල ප්‍රදේශය
06	අම්බලම්මුල්ල, කටුනායක සීදුව නගර සභා බල ප්‍රදේශය
07	කොච්චිකඩේ, ඕවිටියාවත්ත (මීගමුව මහා නගර සභාව පාලනය කරනු ලබන)

(iii) ඔව්.

(iv) එකී ගැටලු අවම කර ගැනීම සඳහා පළාත් පාලන ආයතන විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර දිරන කසළ කොම්පෝස්ට්කරණය, දහනය කළ හැකි කසළ කෙරවලපිටිය ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති කසළ මඟින් විදුලිය නිපදවන (Waste to Energy) බලාගාරය වෙත යොමු කිරීම, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි තක්ත්වයේ කසළ වෙන් කර ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීම, කසළවල දුර්ගන්ධය පාලනය කිරීම සහ මැසි මදුරු නාශක භාවිත කරමින් මහජන පීඩා අවම කිරීම එසේ ගෙන ඇති ක්‍රියාමාර්ග අතරින් ප්‍රමුඛ වේ. මෙම ගැටලු විසඳීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ වැඩිදුර තොරතුරු උපලේඛන අංක 02** වශයෙන් යා කර ඉදිරිපත් කරමි.

(ආ) අදාළ නොවේ.

මැදවච්චිය වෙළඳ සංකීර්ණය: විස්තර
மதவாச்சி வர்த்தக அங்காடி: விபரம்
MEDAWACHCHIYA TRADE COMPLEX : DETAILS

511/2024

2. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Rohana Bandara)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද දිනය කවරේද;

(ii) එම වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම වෙළඳ සංකීර්ණය කඩිනමින් විවෘත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரு மானவரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுர மாவட்டத்தில், மதவாச்சி வர்த்தக அங்காடியின் நிர்மாணப் பணிகள் நிறைவு செய்யப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) மேற்படி வர்த்தக அங்காடியை நிர்மாணிப்ப தற்காகச் செலவிடப்பட்ட தொகை யாதென் பதையும்;

(iii) மேற்படி வர்த்தக அங்காடியைத் துரிதமாகத் திறந்து வைப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he inform this House of the -

(i) date of completion of the construction work of the Medawachchiya Trade Complex in Anuradhapura;

(ii) cost incurred on the construction of that Trade Complex; and

(iii) measures to be taken to open that Trade Complex soon?

(b) If not, why?

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මැදවච්චිය ප්‍රාදේශීය සභාව තුළ විදේශ ආධාර යටතේ ඉදිකරන ලද වෙළෙඳ සංකීර්ණ දෙකක් පවතින අතර ඉන් ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය (LDSP) මඟින් ඉදිකරන ලද වෙළෙඳ සංකීර්ණයේ වැඩ අවසන් කළ දිනය 2023.05.16 වන අතර උතුරු නැඟෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (NELSIP) මඟින් ඉදිකරන ලද වෙළෙඳ සංකීර්ණයේ වැඩ අවසන් කළ දිනය 2017.07.20 වේ.

(ii) ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය (LDSP) මඟින් ඉදිකරන ලද වෙළෙඳ සංකීර්ණය සඳහා වැය කළ මුදල රුපියල් 41,526,688.36 වන අතර උතුරු නැඟෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (NELSIP) මඟින් ඉදිකරන ලද වෙළෙඳ සංකීර්ණය සඳහා වැය කළ මුදල රුපියල් 51,004,800.14කි.

(iii) ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය (LDSP) මඟින් ඉදිකරන ලද වෙළෙඳ සංකීර්ණය මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා 2023.09.16 දින විවෘත කර ඇති අතර, මේ වන විට ආදායම් උත්පාදනය කරමින් සාර්ථක ලෙස ක්‍රියාත්මකව පවතී.

උතුරු, නැඟෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘති (NELSIP) මඟින් ඉදිකරන ලද වෙළෙඳ සංකීර්ණය මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා 2017 අගෝස්තු 20 දින විවෘත කර ඇති අතර මේ වන විට ආදායම් උත්පාදනය කරමින් සාර්ථක ලෙස ක්‍රියාත්මකව පවතී.

(ආ) අදාළ නොවේ.

** * පුස්තකාලයේ තබා ඇත.*
** * நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** * Placed in the Library.*

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය: ශාඛා සහ පුහුණු මධ්‍යස්ථාන

இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகம்: கிளைகளும் பயிற்சி நிலையங்களும்

SRI LANKA BUREAU OF FOREIGN EMPLOYMENT: BRANCHES AND TRAINING CENTRES

542/2024

3. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය වෙනුවට)

(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. (Mrs.) Kokila Gunawardene)

කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ශාඛා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාර්යාංශය යටතේ පවතින පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම පුහුණු මධ්‍යස්ථාන විසින් පවත්වනු ලබන පාඨමාලා කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වර්ෂ 2020 සිට මේ දක්වා විදේශ ගත වී ඇති පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට පුහුණු /නුපුහුණු ශ්‍රමිකයන් ඉල්ලුම් කර ඇති රටවල් සහ ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද; යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தின் கிளைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி பணியகத்தின் கீழுள்ள பயிற்சி நிலையங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) மேற்படி பயிற்சி நிலையங்களால் நடத்தப்படுகின்ற கற்கைநெறிகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2020ஆம் ஆண்டிலிருந்து இதுவரை வெளிநாடு சென்றுள்ள பயிற்சி பெற்ற மற்றும் பயிற்சி பெறாத தொழிலாளர்களின் எண்ணிக்கை ஒவ்வொரு வருடத்துக்கு அமைவாகத் தனித்தனியே எத்தனை என்பதையும்;

(ii) இன்றளவில் பயிற்சிபெற்ற/ பயிற்சிபெறாத தொழிலாளர்களைக் கோரியுள்ள நாடுகள் மற்றும் தொழிலாளர்களின் எண்ணிக்கை தனித்தனியே யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Foreign Employment:

(a) Will he inform the House of the -

(i) number of branches the Sri Lanka Bureau of Foreign Employment has;

(ii) number of training centres functioning under the Bureau concerned; and

(iii) courses that are conducted by the said training centres;

(b) Will he also inform the House of the -

(i) number of skilled and unskilled workers who have gone abroad in each of the years from 2020 up to now, separately; and

(ii) countries which have requested for skilled and unskilled workers at present and the number of such workers, separately?

(c) If not, why?

ගරු ප්‍රසන්න රණතුංග මහතා

(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)

(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ශාඛා සංඛ්‍යාව 19කි.

(ii) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ පවතින පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව 17කි.

(iii)
- ගෘහස්ථ ගෘහ පාලන සහකාර පාඨමාලා මැදපෙරදිග දින 28 - NVQ III
- ගෘහස්ථ ගෘහ පාලන සහකාර පාඨමාලා මැදපෙරදිග නොවන දින 28 - NVQ III
- සාත්තු සේවා සඳහා පුහුණු පාඨමාලාව දින 45 - NVQ III
- ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව දින 14
- භාෂා පුහුණු පාඨමාලා (සිංහල/දෙමළ) දින 18
- දින 07 පුහුණු පාඨමාලා (IFE) (ගෘහස්ථ රැකියා සඳහා විදේශ පළපුරුද්ද සහිත)
- පෙර විගමණික ඕශ්‍රායල් පුහුණු පාඨමාලාව දින 07
- ප්‍රථම වතාවට ගෘහස්ථ නොවන විදේශ රැකියාවට යන අය සඳහා පවත්වන දෙදින නම්නීකරණ පුහුණු පාඨමාලාව
- පෙර විගමණික කොරියානු පුහුණු පාඨමාලාව දින 10
- භාෂා පුහුණු පාඨමාලාව ජපන් භාෂා පුහුණු පාඨමාලාව N4- පැය 300
- භාෂා පුහුණු පාඨමාලාව ජපන් භාෂා පුහුණු N5 - පැය 300
- පිරිසිදු කිරීමේ වෘත්තිය සඳහා ප්‍රථමවරට විදේශගත වන කාන්තාවන් සඳහා පවත්වන ලද දින 05ක පුහුණු පාඨමාලාව

(ආ) (i)

S No	Year	Skilled	Unskilled	Total	
1	2020	39713	13985	53698	
2	2021	91023	31882	122905	
3	2022	207369	103583	310952	
4	2023	208546	89057	297603	
5	2024.01.01 - 2024.06.03	89970	35427	125397	
Total		636621	273934	910555	

(ii) ඇමුණුමෙහි** දක්වා ඇත.

(ඇ) පැන නොනඟී.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවකයන්: වැටුප් සහ දීමනා

உள்நாட்டு இறைவரித் திணைக்கள அலுவலர்கள்: சம்பளமும் கொடுப்பனவுகளும்

EMPLOYEES OF INLAND REVENUE DEPARTMENT: SALARIES AND ALLOWANCES

565/2024

4. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු සංජීව එදිරිමාන්න මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Sanjeeva Edirimanna)

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන එම දෙපාර්තමේන්තුවට අයත් සේවකයන් සංඛ්‍යාව සහ ඒකාබද්ධ සේවයට අයත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධාරීන්ට සහ කණිෂ්ඨ සේවකයන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒකාබද්ධ සේවයට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධාරීන්ට සහ කණිෂ්ඨ සේවකයන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உள்நாட்டு இறைவரித் திணைக்களத்தின் அங்கீகரிக்கப்பட்ட பதவியணி யாதென்பதையும்;

(ii) உள்நாட்டு இறைவரித் திணைக்களத்தில் பணியாற்றும் அத்திணைக்களத்துக்குரிய ஊழியர்களின் எண்ணிக்கை மற்றும் இணைந்த சேவைக்குரிய ஊழியர்களின் எண்ணிக்கை தனித்தனியே யாதென்பதையும்;

(iii) உள்நாட்டு இறைவரித் திணைக்களத்துக்குரிய நிறைவேற்றுத் தரத்திலுள்ள அலுவலர்களுக்கும், நிறைவேற்றுத் தரத்திலல்லாத அலுவலர்களுக்கும், கனிஷ்ட ஊழியர்களுக்கும் செலுத்தப்படுகின்ற மாதாந்தச் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் ஒவ்வொரு பதவிக்கும் அமைவாகத் தனித்தனியே எவ்வளவு என்பதையும்;

(iv) இணைந்த சேவைக்குரிய நிறைவேற்றுத் தரத்திலுள்ள அலுவலர்களுக்கும், நிறைவேற்றுத் தரத்திலல்லாத அலுவலர்களுக்கும், கனிஷ்ட ஊழியர்களுக்கும் செலுத்தப்படுகின்ற மாதாந்தச் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் ஒவ்வொரு பதவிக்கும் அமைவாகத் தனித்தனியே எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Economic Stabilization and National Policy:

(a) Will he inform this House of the -

(i) approved carder for the Inland Revenue Department;

(ii) the number of employees who are assigned to and employed by the Inland Revenue Department and the number of employees assigned to the Combined Services, separately;

(iii) amount of monthly salaries and allowances paid to executive grade officers, non-executive grade officers and junior employees assigned to the Inland Revenue Department according to each position, separately; and

(iv) amount of monthly salaries and allowances paid to executive grade officers, non-executive grade officers and junior employees assigned to the Combined Services according to each post, separately?

(b) If not, why?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)

(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*

*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** * Placed in the Library.*

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව ඇමුණුම 01හි සඳහන් වේ.

2024.04.30 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව

කොමසාරිස් ජනරාල්	ශ්‍රී.ලං.දේ.ආ.සේ.-විශේෂ	1	1	දෙපාර්මේන්තුගත
නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්	ශ්‍රී.ලං.දේ.ආ.සේ.-විශේෂ	9	9	
ප්‍රධාන මූල්‍ය නිලධාරී	ශ්‍රී.ලං.ග.සේ - විශේෂ	1	1	දිප ව්‍යාප්ත සේවා
ජ්‍යෙෂ්ඨ කොමසාරිස්	ශ්‍රී.ලං.දේ.ආ.සේ.-විශේෂ	22	22	දෙපාර්මේන්තුගත
කොමසාරිස්	ශ්‍රී.ලං.දේ.ආ.සේ.- I	90	90	
අධ්‍යක්ෂ (පරිපාලන)	ශ්‍රී.ලං.ප.සේ - I	1	1	දිප ව්‍යාප්ත සේවා
ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ.- I	1	1	
ප්‍රධාන අභ්‍යන්තර විගණක	ශ්‍රී.ලං.ග.සේ - I	1	1	
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්	ශ්‍රී.ලං.දේ.ආ.සේ.- I	1107	289	දෙපාර්මේන්තුගත
නියෝජ්‍ය කොමසාරිස්	ශ්‍රී.ලං.දේ.ආ.සේ.-II		6	
සහකාර කොමසාරිස්	ශ්‍රී.ලං.දේ.ආ.සේ.-III		576	
ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ.- II/III	5	5	දිප ව්‍යාප්ත සේවා
අධ්‍යක්ෂ (කො.ස.කා)	ශ්‍රී.ලං.කො.ස.කා.සේ.- I- I	2	2	ඒකාබද්ධ සේවා
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (කො.ස.කා.)	ශ්‍රී.ලං.කො.ස.කා.සේ.-I-II/III	16	9	
ඉංජිනේරු	ශ්‍රී.ලං.ඉං.සේ - II/III	1	0	දිප ව්‍යාප්ත සේවා
පරිපාලන නිලධාරී	ක.සේ.නි.සේ අධිශ්‍රේණිය	3	3	ඒකාබද්ධ සේවා
පුස්තකාලයාධිපති	පුස්තකාලයාධිපති සේවය - I	1	1	
භාෂා පරිවර්තක	භාෂා පරිවර්තක සේවය - I/II	9	9	
නිලධාරී (කො.ස.කා.)	කො.ස.කා.සේ.- 2- I/II	47	20	
සංවර්ධන නිලධාරී	සංවර්ධන නිලධාරී සේවය - I/II/III	7		
සහකාර පුස්තකාලයාධිපති	පුස්තකාලයාධිපති සේවය - II/III	1		
තාක්ෂණ නිලධාරී (සිවිල්/විදුලි)	දෙපාර්මේන්තුගත - II	2		
ප්‍රවාහන නිලධාරී	දෙපාර්මේන්තුගත - II	1		
සහකාර (කො.ස.කා.)	කො.ස.කා.සේ - 3-I/II/III	105		
කළමනාකරණ සේවා නිලධාරී	ක.සේ.නි.සේ. - I/II/III	925		
පිළිගැනීමේ නිලධාරී	දෙපාර්මේන්තුගත - I/II/III	4		
පරිවර්ෂණ සහකාර	දෙපාර්මේන්තුගත - I/II/III	10		
ගොඩනැගිලි සුපරීක්ෂක	දෙපාර්මේන්තුගත - I/II/III	1	0	
රියැදුරු	රියැදුරු සේවය - SP/I/II/III	96	78	
වඩු කාමරික	දෙපාර්මේන්තුගත - SP/I/II/III	1	1	
සංචාරක බංගලා භාරකරු	දෙපාර්මේන්තුගත - SP/I/II/III	1	0	
කාර්යාලීය කාර්ය සහායක	කා.සේ.සේ - SP/I/II/III	397	316	
මුළු ගණන		2868	2408	

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

ඇමුණුම 01

(ii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන දෙපාර්තමේන්තුගත සේවකයන් සංඛ්‍යාව සහ ඒකාබද්ධ සේවයට අයත් සේවකයන් සංඛ්‍යාව පිළිබඳව ඇමුණුම 02හි සඳහන් වේ.

ඇමුණුම 02

2024.04.30 දිනට දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව

තනතුර	සේවය හා සන්තිය	තනතුරේ පිටින සංඛ්‍යාව	
කොමසාරිස් ජනරාල්	ශ්‍රී.ලං.දේ.ආ.සේ.-විශේෂ	1	දෙපාර්තමේන්තුගත
නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්	ශ්‍රී.ලං.දේ.ආ.සේ.-විශේෂ	9	
ජ්‍යෙෂ්ඨ කොමසාරිස්	ශ්‍රී.ලං.දේ.ආ.සේ.-විශේෂ	22	දෙපාර්තමේන්තුගත
කොමසාරිස්	ශ්‍රී.ලං.දේ.ආ.සේ.- I	90	
ජ්‍යෙෂ්ඨ කොමසාරිස් කොමසාරිස්	ශ්‍රී.ලං.දේ.ආ.සේ.- I	289	දෙපාර්තමේන්තුගත
නියෝජ්‍ය කොමසාරිස්	ශ්‍රී.ලං.දේ.ආ.සේ -II	6	
සහකාර කොමසාරිස්	ශ්‍රී.ලං.දේ.ආ.සේ -III	576	
අධ්‍යක්ෂ (තො.ස.තා.)	ශ්‍රී.ලං.තො.ස.තා.සේ - 1- I	2	ඒකාබද්ධ සේවය
නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (තො.ස.තා.)	ශ්‍රී.ලං.තො.ස.තා.සේ - 1- II/III	9	
පරිපාලන නිලධාරි	ක.සේ.නි.සේ.අධි ශ්‍රේණිය	3	ඒකාබද්ධ සේවය
පුස්තකාලයාධිපති	පුස්තකාලයාධිපති සේවය - I	1	
භාෂා පරිවර්තක	භාෂා පරිවර්තක සේවය - I/II	9	
නිලධාරි (තො.ස.තා.)	තො.ස.තා.සේ. - 2- I/II	20	
සංවර්ධන නිලධාරි	සංවර්ධන නිලධාරි සේවය - I/II/III	7	
සහකාර පුස්තකාලයාධිපති	පුස්තකාලයාධිපති සේවය - II/III	1	
තාක්ෂන නිලධාරි (සිවිල්/ විදුලි)	දෙපාර්තමේන්තුගත - II	0	දෙපාර්තමේන්තුගත
ප්‍රවාහන නිලධාරි	දෙපාර්තමේන්තුගත - II	1	
සහකාර (තො.ස.තා.)	තො.ස.තා.සේ.- 3-I/II/III	94	ඒකාබද්ධ සේවය
කළමනාකරණ සේවා නිලධාරි	ක.සේ.නි.සේ - I/II/III	853	
පිළිගැනීමේ නිලධාරි	දෙපාර්තමේන්තුගත - I/II/III	3	දෙපාර්තමේන්තුගත
පර්යේෂණ සහකාර	දෙපාර්තමේන්තුගත - I/II/III	8	
ගොඩනැගිලි සුපරීක්ෂක	දෙපාර්තමේන්තුගත - I/II/III	0	
රියදුරු	රියදුරු සේවය -SP/I/II/III	78	ඒකාබද්ධ සේවය
වඩු කාර්මික	දෙපාර්තමේන්තුගත -SP/I/II/III	1	දෙපාර්තමේන්තුගත
සංචාරක බංගලා භාරකරු	දෙපාර්තමේන්තුගත - SP/I/II/III	0	
කාර්යාල කාර්ය සහායක	කා.සේ.සේ. - SP/I/II/III	316	ඒකාබද්ධ සේවය
Total		2399	

මෙම සටහනට දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත්ව නොමැත.

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

(iii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධරීන්ට සහ කණිෂ්ඨ සේවකයන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා පිළිබඳව ඇමුණුම 03හි** සඳහන් වේ.

(iv) ඒකාබද්ධ සේවයට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධාරීන්ට සහ කණිෂ්ඨ සේවකයන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා පිළිබඳව ඇමුණුම 04හි** සඳහන් වේ.

(ආ) පැන නොනඟී.

ශ්‍රී ලංකාවට කුරුල්ලන් ආනයනය කිරීම: යොදා ගන්නා නිර්ණායක

இலங்கைக்கு பறவைகள் இறக்குமதி: ஏற்றுக்கொள்ளப்பட்ட அளவுகோல்கள்

IMPORT OF BIRDS TO SRI LANKA: CRITERIA ADOPTED

590/2024

5. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Jagath Kumara Sumithraratchchi)

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාවට කුරුල්ලන් ආනයනය කිරීම සඳහා අනුමතිය ලබා දී තිබේද;

(ii) එසේ නම්, කුරුල්ලන් ආනයනය කිරීම සඳහා අනුමතිය ලබා දී ඇති රටවල් කවරේද;

(iii) එම අනුමතිය ලබා දීමේදී කුරුළු උණ රෝගයට අදාළ නිර්ණායකයන් සැලකිල්ලට ගෙන තිබේද;

(iv) එම අනුමතිය ලබා දීමේදී සලකා බලන ලද වෙනත් නිර්ණායක කවරේද;

(v) ආනයනය කරනු ලබන කුරුල්ලන්ගෙන් කුරුළු උණ රෝගය ව්‍යාප්ත වීමේ අවදානමක් තිබේ නම්, ඒ සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද; යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைக்குப் பறவைகளை இறக்குமதி செய்ய அங்கீகாரம் அளிக்கப்பட்டுள்ளதா;

(ii) அவ்வாறாயின், பறவைகளை இறக்குமதி செய்ய அங்கீகாரம் அளிக்கப்பட்டுள்ள நாடுகள் யாவை;

(iii) அத்தகைய அங்கீகாரத்தை அளிக்கும்போது, பறவைக் காய்ச்சலுடன் சம்பந்தப்பட்ட அளவு கோல்கள் கவனத்தில் கொள்ளப்பட்டுள்ளனவா;

(iv) அதற்கான அங்கீகாரத்தை அளிக்கும்போது, கவனத்தில் கொள்ளப்பட்ட ஏனைய அளவு கோல்கள் யாவை;

(v) இறக்குமதி செய்யப்படுகின்ற பறவை களிலிருந்து பறவைக் காய்ச்சல் பரவும் ஆபத்து காணப்படுமா யின், அதன்நிமித்தம் கடைப்பிடிக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Wildlife and Forest Resources Conservation:

(a) Will she inform this House -

(i) whether approval has been granted to import birds to Sri Lanka;

(ii) if so, the countries for which approval has been granted to import birds;

(iii) whether criteria relating to Avian Influenza have been considered when granting such approval;

(iv) the other criteria considered when granting that approval; and

(v) the measures that will be adopted in the event of the spread of Avian Influenza, if the birds that are to be imported pose the risk of the spreading the disease?

(b) If not, why?

ගරු ප්‍රසන්න රණතුංග මහතා

(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)

(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ඔව්. මෙරටට පක්ෂීන් ආනයනය කිරීමට ලැබෙන එක් එක් ඉල්ලීම වෙන් වෙන් වශයෙන් සලකා බලා එකී ඉල්ලීම් අනුමත කිරීමට අදාළ නිර්ණායකයන්ට අනුව අනුමැතිය ලබා දිය හැකි ඉල්ලීම් සඳහා පමණක් වෙන් වෙන් වශයෙන් කොන්දේසි පනවමින් අවසර ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(ii) නිශ්චිත ලෙස රටවල් නම් කළ නොහැක. වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වනසත්ව හා වෘක්ෂලතා විශේෂවල ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතිය (CITES) මඟින් වෙළෙඳ සම්බාධක පනවා ඇති අවස්ථාවල එවැනි රටවල්වලින් කුරුල්ලන් ආනයනය කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා නොදේ.

(iii) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන අනුමැතිය සඳහා කුරුළු උණ රෝගයට අදාළ නිර්ණායකයන් සැලකිල්ලට නොගන්නා නමුත් එම අනුමැතිය පදනම් කරගෙන සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිරෝධායන සහතික නිකුත් කිරීමේදී කුරුළු උණ රෝගයට අදාළ නිර්ණායකයන් සලකා බලනු ලැබේ.

(iv)
- වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වනසත්ව හා වෘක්ෂලතා විශේෂවල ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතිය (CITES) මඟින් අනුමත කර ඇති කුරුල්ලන් සඳහා එම සම්මුතියේ නිර්ණායකයන් සලකා බලනු ලැබේ.
- මෙරටට පළමුවරට ආනයනය කිරීමට අපේක්ෂිත කුරුල්ලන් සම්බන්ධයෙන් වනසත්ව හා වෘක්ෂලතා ආඥාපනතේ දැක්වෙන ආයතනවලින්ද පරිසර

** * පුස්තකාලයේ තබා ඇත.*

** * நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** * Placed in the Library.*

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආක්‍රමණශීලී ආගන්තුක විශේෂ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කමිටුව වෙතින්ද නිරීක්ෂණය හා නිර්දේශ ලබා ගනු ලැබේ.

(v)
- කුරුළු උණ මෙරට තුළ ව්‍යාප්ත වීම සම්බන්ධව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් දීපව්‍යාප්තව සිදු කරන සොයාබැලීම් සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සහයෝගය දක්වනු ලැබේ.
- ඊට අමතරව නිලධාරීන් පුහුණු කිරීම, වඳවීමේ තර්ජනයට ලක්ව ඇති වනසත්ව හා වෘක්ෂලතා විශේෂවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතියට (CITES) අදාළව ආනයන/අපනයන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව සිදු කරන ක්ෂේත්‍ර පරීක්ෂාවලදී අදාළ පරිශ්‍රයන්හි කුරුළු උණ පැතිරීමට ඇති වන තත්ත්වයන් නිරීක්ෂණය වී ඇත්දැයි පරීක්ෂා කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -611/2024- (1), ගරු ජයන්ත සමරවීර මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්ඩලික පුත්තික පත්තිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්ඩලික පිරසන්න රණතුංග)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාස 3ක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

විසිතුරු මත්ස්‍ය කර්මාන්තය: 2019 සිට ලැබූ ආදායම
அலங்கார மீன் உற்பத்தி: 2019 தொடக்கம் ஈட்டப்பட்ட வருமானம்
ORNAMENTAL FISH INDUSTRY: REVENUE FROM 2019

1127/2024

9. බුද්ධික පතිරණ මහතා (ගරු ඩී. වීරසිංහ මහතා වෙනුවට)
(මාණ්ඩලික පුත්තික පත්තිරණ - மாண்புமிகு டீ. வீரசிங்க சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. D. Weerasingha)
ධීවර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) විදුලි ගාස්තු ඉහළ යාම හේතුවෙන් විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් දැඩි දුෂ්කරතාවයට පත් වී ඇති බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ සිටින විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2019 සිට මේ දක්වා විසිතුරු මත්ස්‍යයන් අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மின் கட்டணம் அதிகரிக்கப்பட்டதால் அலங்கார மீன் ஏற்றுமதியாளர்கள் கடும் சிரமத்துக்கு உள்ளாகி இருப்பதை அறிவாரா என்பதையும்;

(ii) இலங்கையில் இருக்கின்ற அலங்கார மீன் ஏற்றுமதியாளர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) 2019ஆம் ஆண்டு தொடக்கம் இதுவரை அலங்கார மீன் ஏற்றுமதிமூலம் ஈட்டப்பட்ட வருமானம் ஒவ்வோராண்டு வாரியாகத் தனித்தனியாக யாது என்பதையும்;

(iv) அலங்கார மீன் வளர்ப்புத் தொழிற்றுறையைப் பாதுகாக்க நடைமுறைப்படுத்தியுள்ள வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries:

(a) Will he inform this House -

(i) whether he is aware of the fact that the ornamental fish exporters are in severe difficulty owing to the increase of electricity tariff;

(ii) the number of ornamental fish exporters in Sri Lanka;

(iii) the revenue earned through the export of ornamental fish from 2019 up to now, separately for each year; and

(iv) the programme implemented to protect the ornamental fish industry?

(b) If not, why?

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්ඩලික පිරසන්න රණතුංග)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, ධීවර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

විදුලි ගාස්තු වැඩිවීම හේතුවෙන් විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන වියදම පමණක් නොව බොහෝ කර්මාන්තවල නිෂ්පාදන පිරිවැය ද ඉහළ ගොස් ඇත. මෙම හේතුවෙන් විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් ද දුෂ්කරතාවට පත් වී ඇත.

(ii) 60 දෙනෙකි.

(iii)

වර්ෂය	විසිතුරු මත්ස්‍ය අපනයන ආදායම (ඇ.ඩො. මිලියන)	විසිතුරු මත්ස්‍ය අපනයන ආදායම ආසන්නව (රු. මිලියන)
2019	16.24	2,913.00
2020	13.03	2,409.00
2021	20.92	4,193.00
2022	21.74	7,143.00
2023	26.38	8,641.00
2024 (ජනවාරි සිට අප්‍රේල් දක්වා)	8.52	2,632.00

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

(iv)
- වගාකරුවන් සඳහා අවශ්‍ය විසිතුරු මත්ස්‍ය මව් මසුන් හා අනෙකුත් වර්ධක අවස්ථා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සතු මධ්‍යස්ථාන වෙතින් ලබා දීම.
- කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම.
- දේශීයව විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා අධ්‍යාපනික හා වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම.
- දේශීය වගාකරුවන් සඳහා අවශ්‍ය ජීවී මත්ස්‍ය ආහාර නිෂ්පාදනය කර ඔවුන් වෙත ලබා දීම.
- පාසල් ළමුන් අතර විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා පාසල් විසිතුරු මත්ස්‍ය සංගම් ස්ථාපිත කිරීම.
- වාර්ෂිකව බලපත්‍ර ලබා දීම තුළින් කර්මාන්තය නියාමනය කිරීම.
- අන්තරාදායක මසුන් ආනයනය වීම වැළැක්වීම සඳහා කටයුතු කිරීම.
- අපනයනය කිරීම සඳහා ප්‍රවණතාවක් ඇති දේශීය මසුන් අභිජනනය සඳහා කටයුතු කිරීම.
- දිස්ත්‍රික් මට්ටමින් විසිතුරු මත්ස්‍ය සංගම් ස්ථාපිත කර ඇති අතර, එමඟින් ඔවුන්ට අවශ්‍ය වෙළෙඳ පොළ සම්බන්ධීකරණය හා තාක්ෂණික උපදෙස් ලබා දීම වැනි වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මකව පවතී.

(ආ) අදාළ නොවේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. ස්වදේශ කටයුතු රාජ්‍ය ඇමතිතුමාගේ ප්‍රකාශයක් තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ ප්‍රකාශය ඉදිරිපත් කරන්න.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, මට පුංචි කාලයක් ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. ඊයේ ගරු විපක්ෂ නායකතුමා පාර්ලිමේන්තුවේ දී ප්‍රශ්නයක් නඟලා තිබුණා. ඒ ප්‍රශ්නය අවසානයේ එතුමා ඉල්ලා තිබුණා, ගරු ඇමතිතුමා විසින් මේ පිළිබඳව අදත්, හෙටත්, අනිද්දාත් ඇතුළත පිළිතුරක් ලබා දෙන්න කියලා. ගරු කථානායකතුමනි, ග්‍රාම නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාව, ග්‍රාම නිලධාරීන්ගේ දීමනා සහ අලුතෙන් බඳවා ගත් ග්‍රාම නිලධාරීන් පිළිබඳවයි එම ප්‍රශ්නයෙන් අහලා තිබුණේ. මේ අමාරු අවස්ථාව තුළ වුණත්, රාජ්‍ය පරිපාලනය තුළ තිබෙන කුඩාම ඒකකය වන ග්‍රාම සේවා වසම පුරප්පාඩු කරලා ඉදිරියට යන්න බැරි නිසා, ග්‍රාම නිලධාරීන් 1,942දෙනෙක් බඳවාගන්න අප කටයුතු කළා. ඔවුන්ගේ දීමනා පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා සාධනීය ප්‍රශ්න කිහිපයක් යොමු කරලා තිබෙනවා. එම ප්‍රශ්න යොමු කිරීම පිළිබඳව මම එතුමාට ස්තූතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මේ කාරණය පිළිබඳව පාර්ලිමේන්තුවේදී විවිධ අවස්ථාවල, නිතර නිතර ප්‍රශ්න කිරීම් කළා. ඒ හැම අවස්ථාවකදීම විෂය භාර රාජ්‍ය අමාත්‍යවරයා විධියට මම ඒ පිළිබඳව ක්‍රියා කරපු ආකාරය, ක්‍රියා කරන ආකාරය පිළිබඳව දිනෙන් දින මේ සභාව දැනුවත් කළා. විපක්ෂ නායකතුමා පවසා තිබුණා, ග්‍රාම නිලධාරී සේවා ව්‍යවස්ථාව අනුමත කරලා headlines ගහගන්නා කියලා.

ගරු විපක්ෂ නායකතුමනි, අපට ලබා දිය හැකි, රාජ්‍ය සේවා කොමිසම සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව අනුමත කරපු ව්‍යවස්ථාව අපි ලබා දුන්නා. ඒක ලබා දුන් බවත්, ඒ වාගේම ඒක රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කළ බවත්, මේ වෙද්දී ඒ ගැසට් පත්‍රය සැකසෙමින් තිබෙනවාය කියන එක ගැනත් අදාළ සංගම්, අදාළ ආයතන සහ දැනගත යුතු අයව දැනුවත් කිරීම විෂයභාර රාජ්‍ය අමාත්‍යවරයා විධියට මගේ වගකීමක්, යුතුකමක් විධියට මම දකිනවා. ඒ නිසා අමාත්‍යාංශය මඟින් ඒ පිළිබඳව මම දැනුවත්වීමක් වුණා.

ගරු විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නයේ එක තැනක තිබුණා, ග්‍රාම නිලධාරී සංගම් ඉල්ලා සිටි සහ ඊට පෙර අනුමත කළ කෙටුම්පත නොවෙයි, රාජ්‍ය සේවා කොමිසමට යවලා තිබෙන්නේ කියලා. ගරු කථානායකතුමනි, 2020.02.06වැනි දාත් මේ පිළිබඳව ග්‍රාම නිලධාරී සංගම් එක්ක කථා කරලා තිබෙනවා. ඒ වාගේම 2020.10.23 දිනත් ඔවුන් සහ අදාළ බලධාරීන්ව මේ පිළිබඳව දැනුවත් කර තිබෙනවා. එහිදී එකඟත්වය පළ කරමින් ඔවුන් එක්ක සකස් කරන ලද මෙම සේවා ව්‍යවස්ථා කෙටුම්පත 2021.06.01වැනි දා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට යොමු කර තිබෙනවා. ගරු කථානායකතුමනි, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව 2023.05.31 වන දින විසුරුවා හරිනු ලැබුවා. ඒ අවස්ථාවේ දීත් ග්‍රාම නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාව පිළිබඳව යොමු කරන ලද කෙටුම්පත සම්බන්ධයෙන් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම කිසිම නිර්දේශයක් නොදක්වා ආයතන, අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර තිබෙනවා. 2023.08.25 වන දින ආයතන අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් අපේ අමාත්‍යාංශයේ නිලධාරීන් සහ ග්‍රාම නිලධාරී වෘත්තීය සමිති එක්ක මේ පිළිබඳව කථා කරලා තීන්දුවක් ගත්තා, ඒ ඉදිරිපත් කරන ලද සේවා ව්‍යවස්ථා සංග්‍රහ කෙටුම්පත සම්බන්ධයෙන් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමෙත්, රාජ්‍ය සේවා කොමිසමෙත් එකඟත්වයක් පළ නොවන නිසා කැබිනට් පත්‍රය අනුව, "ග්‍රාම නිලධාරී සේවාව" යනුවෙන් සේවා ව්‍යවස්ථාවක් ස්ථාපිත කරන්න. ගරු විපක්ෂ නායකතුමනි, මේ පිළිබඳ ඔබතුමාගෙත් අවධානය යොමු කරන්න. මේ පිළිබඳව අවස්ථා ගණනාවක දී, එනම් 2023.10.23 දින, 2023.11.30 දින, 2023.12.20 දින, 2024.01.05 දින, 2024.02.29 දින, 2024.05.13 දින, 2024.05.15 දින සහ 2024.05.22 දින සාකච්ඡා පැවැත්වුවා. අවසානයේදී, ඉදිරිපත් කරන ලද ග්‍රාම නිලධාරී සේවය සඳහා වූ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට 2024.06.06 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී තිබෙනවා.

ඒ වාගේම මගේ අතේ තිබෙනවා, විපක්ෂ නායකතුමා කියපු, මීට පෙර වෘත්තීය සංගම් යොමු කළාය කියන ලේඛනයක්. මම මේක ඊයේ ගෙන්වාගෙන පරිශීලනය කළා. විපක්ෂ නායකතුමනි, රාජ්‍ය නිලධාරීන් කිසිවෙකු මේකට අත්සන් කරලා නැහැ. ඒ අය ඉල්ලපු එක, ඒ කියන්නේ ග්‍රාම නිලධාරී සංගම් විසින් ඉල්ලලා, ඒ අය හිතලා හදපු කෙටුම්පතක් අපේ අමාත්‍යාංශයට එවකට භාර දීලා තිබෙනවා. එවකට විෂය භාර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළේ මම නොවෙයි. ඒ භාර දුන් එක -සංගම් එවපු එක- කිසිදු රාජ්‍ය නිලධාරියෙකුගේ නිර්දේශයක්වත්, එකඟතාවක්වත්, අත්සනක්වත් නැතිව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමට යොමු කර තිබෙනවා. සංගම් එවපු කෙටුම්පත වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමට යොමු කළාට, ඒ පිළිබඳව කිසිදු එකඟතාවකට ආවේ නැහැ. ඒ නිසා සංගම් එවපු කෙටුම්පත වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම ප්‍රතික්ෂේප කරලා, කිසිදු නිර්දේශයක් ලබා නොදී නැවත ඒක ලබා දී තිබෙනවා. වමල් රාජපක්ෂ මැතිතුමාත් මේ පිළිබඳව අදහසක් පළ කර තිබෙනවා. එතුමාත් කියා තිබෙනවා, ඒ යවන ලද කෙටුම්පත නිලධාරීන් ලාච්චුවල තබාගෙන සිටියා කියලා. ඒ කාලසීමාව තුළ එහෙම වෙන්න ඇති. නමුත් අපේ කාලසීමාව තුළ අපි කළේ, ලාච්චුවේ තිබුණු ලිපිගොනු ටික එළියට අරගෙන, ග්‍රාම නිලධාරීන් දීර්ඝ කාලයක් ඉල්ලා සිටි ග්‍රාම නිලධාරී සේවය සඳහා වූ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ලබා දීමයි.

මෙතැන තිබෙන ගැටලු සහගත තත්ත්වය මේකයි, ගරු කථානායකතුමනි. ඔවුන් ඉල්ලන්නේ, MN-5 වැටුප් තලය. පරිපාලන ග්‍රාම නිලධාරීත් ඉල්ලන්නේ SL-1 කියන වැටුප් තලය. SL-1 කියන වැටුප් තලය අපි අධිශ්‍රේණියේ GN-2 කියන වැටුප් තලයකින් තමයි අනුමත කරලා තිබෙන්නේ. SL-1 කියන්නේ, ප්‍රාදේශීය ලේකම්ගේ වැටුප් තලය. මේක එක සේවාවක විසඳන්න ගියොත් තව සේවා ගණනාවක් ගැටෙනවා, ගරු විපක්ෂ නායකතුමනි. එතකොට පරිපාලන ග්‍රාම නිලධාරීන් ඉල්ලනවා, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ වැටුප් තලයේ පිහිටුවන්න කියලා. ඒකට එකඟ වෙන්නේ නැහැ. ඒ එකඟතාව දෙන්නේ නැහැ. ඔවුන්ට GN-2 වැටුප් තලය නිර්දේශ වෙලා තිබෙනවා. MN-5 කියන එකට GN-1 කියන වැටුප් තලයට එකඟත්වය ලබා දීලා තිබෙනවා. හැබැයි, මේකේ වැදගත් සහ වටිනා දෙයක් තිබෙනවා. මේ ව්‍යවස්ථාව සංශෝධනය කළ හැකි ආකාරයට තමයි සකස් කර තිබෙන්නේ. ඒ කියන්නේ, ඕනෑම වෙලාවක මෙහි තිබෙන යම් දේවල් ඉවත් කරන්න හෝ මේ ව්‍යවස්ථාවට ඒ ඒ කාලවලදී යම් යම් එකඟතා ඇතිව ඇතුළත් කිරීමක් කරන්න පුළුවන්. කවුරු හෝ ඒ පිළිබඳ අවධානයකින්, අවබෝධයකින් ඉන්නවා නම් යම් කාලයක දී කරුණු ඇතුළත් කරන්න පුළුවන්.

ඒ වාගේම ග්‍රාම නිලධාරීන්ගේ දීමනා කිසිවක් වැඩි කරලා නැහැ කියලාත් ගරු සභාව දැනුවත් කර තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමාගේ දැනගැනීම සඳහා මම කියන්න කැමැතියි, එම දීමනා ලබා දෙන්න මම කොමිසමක් පත් කළ බව. ඒ අනුව අගමැතිතුමාගේ උපදෙස් පරිදි සහ ජනාධිපතිතුමාගේ එකඟතාව මත එම කොමිසම ලබා දුන් නිර්දේශ 2024 අය වැය ලේඛනයට ඇතුළත් කරන්න මම බලාපොරොත්තු වුණා. නමුත්, එවකට අමාත්‍යාංශයේ ලේකම් විධියට හිටපු අශෝක මහතා ඒ යෝජනාවලට අවශ්‍ය නිර්දේශය මට ලබා දුන්නේ නැහැ. නමුත් අපි ජනාධිපතිතුමා එක්කත්, අගමැතිතුමා එක්කත් කථා කරලා දීමනා කිහිපයක් වැඩි කළා. ඒ අනුව සමහර දීමනා දෙගුණයකින් වැඩි කළා. කාර්යාල දීමනාවත් වැඩි කළා. විපක්ෂ නායකතුමා කියන කාරණය නිවැරැදියි. එලෙස වැඩි කළ මුදල වර්තමානයට නොගැළපුණත්, සියයට 200කින් දීමනාව වැඩි කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම මම යෝජනා කරලා තිබෙනවා, 2025 අය වැය ලේඛනයට එය ඉදිරිපත් කරන්න. අමාත්‍යාංශය ඒ සියල්ල හදලා 2025 අය වැය ලේඛනයට ඉදිරිපත් කරන්න සූදානම් කර තිබෙනවා. එතකොට සේවයේ ඉන්න අයට එය සම්මත කරන්න පුළුවන්. ඒකේ ඉතා පැහැදිලිව යෝජනා කර තිබෙනවා, නිල ඇඳුම් සඳහා වාර්ෂිකව රුපියල් 15,000කුත්, සන්නිවේදන දීමනා සඳහා රුපියල් 1,500කුත් ගෙවීමට.

ඊළඟට, මේ අයගේ ගමන් වියදම් සඳහා මෙතෙක් නොතිබුණු සාධනීය කාරණයක් මම යෝජනා කරලා තිබෙනවා. ඒ තමයි, තෙල් ලීටර් 20ක් ලබා දීම. මේ යෝජනා කොමිසම නිර්දේශ කරලා තිබෙනවා. ඒ අනුව ග්‍රාම නිලධාරීන්ට 2025 වර්ෂයේ සිට නිශ්චිත තෙල් දීමනාවක් ලබා දෙන්න -තෙල් ලීටර් 20ක් ලබා දෙන්න- යෝජනා කරලා තිබෙනවා. 2025 අය වැය ලේඛනයට ඒ යෝජනා ඇතුළත් කරලා අනුමත කරන්න පුළුවන්. ඒ වාගේම ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් වර්ෂයකට ලබා දුන් රුපියල් 1,500ක දීමනාව රුපියල් 3,000ක් දක්වා වැඩි කර තිබෙනවා. මේ වෙද්දි කාර්යාල දීමනාවත් ගෙවන්න අපි කටයුතු කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මම සියඹලා ගෙනාවේම නැති ගණනට දාලා කථා කරන්න හොඳ නැහැ. විෂය භාර රාජ්‍ය අමාත්‍යවරයා විධියට මේ කාරණාව පිළිබඳව මැදිහත් විය හැකි සාධනීයත්වයෙන් මම මැදිහත් වෙලා තිබෙනවා. නමුත්, ග්‍රාම නිලධාරීන් ඉල්ලන සියලු දේවල් දෙන්න ඔවුන්ගේ උසස් නිලධාරීන් සහ ජාතික වැටුප් කොමිසම, රාජ්‍ය සේවා කොමිසම එකඟ නොවෙනවා නම් අපට පුළුවන් වෙන්නේ ප්‍රතිපත්තිමය තීන්දු අරගෙන, කමිටු පත් කරලා, කමිටු වාර්තා කැඳවා, ඒ වාර්තාවල තිබෙන නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු අදාළ තැන්වලට යොමු කරන්න විතරයි. නමුත්, විෂය භාර අමාත්‍යවරයා විධියට ග්‍රාම නිලධාරීන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් මම මොකුත්ම කරලා නැහැ කියලා ප්‍රකාශ කරනවා නම්, ඒ ගැන මම කනගාටු වනවා.

ආර්ථික වශයෙන් අමාරු මේ මොහොතේ රාජ්‍ය සේවකයෝ බඳවා නොගත් අවස්ථාවේදීත් ග්‍රාම නිලධාරීන් 1,942ක් අපි බඳවා ගෙන තිබෙනවා. ඒ අයට මේ වෙද්දි පුහුණුවේදී දෙන්නේ රුපියල් 3,000ක මාසික දීමනාවක්. ගරු විපක්ෂ නායකතුමාගේ අවධානය යොමු වෙලා එතුමා යෝජනාවක් කර තිබෙනවා, පුහුණු දීමනාව හැටියට ඔවුන්ට මූලික වැටුප දෙන්න. ඔවුන්ට මූලික වැටුප හෝ දෙන්න පුළුවන් නම් හොඳයි කියලා මමත් හිතනවා. එයට මම එකඟ වනවා. මම ඒක යෝජනා කරලාත් තිබෙනවා. නමුත්, අමාරු අවස්ථාවක ඔවුන් රාජ්‍ය සේවයට ඇතුළු කර ගන්න නිසා අදාළ ආයතනවලින් නිර්දේශ කරලා තිබෙන්නේ පුහුණු දීමනාව විධියට රුපියල් 3,000ක් ලබා දෙන්න පමණයි. මමත් එකඟ වනවා, ගරු විපක්ෂ නායකතුමාගේ යෝජනාවට. ඔවුන්ට ලබා දෙන ඒ රුපියල් 3,000ක දීමනාව ප්‍රමාණවත් නැහැ. මම ඊයේත් මේ පිළිබඳව කථා කළා, පුළුවන් නම් ඒ මුදල වැඩි කරලා හෝ මාසික වැටුප හෝ ඒ හා සමාන දීමනාවක් හෝ ලබා දෙන්න පුළුවන් ද කියන කාරණය ගැන. එම නිසා අපි ඒ පිළිබඳවත් කටයුතු කරනවා.

ගරු කථානායකතුමනි, මේ කාරණය පිළිබඳව විපක්ෂයේ ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා මට පෞද්ගලිකව කථා කළා. එතුමා මේ කටයුත්තට මට උදව් කළා. ග්‍රාම නිලධාරී සේවා ව්‍යවස්ථාව හදනකොට එතුමා දිගින් දිගටම මාත් එක්ක එතුමාගේ දැනුම බෙදා හදා ගත්තා. ඒ වාගේම විපක්ෂයේ තවත් බොහෝ මන්ත්‍රීවරු මේ කටයුත්තට මට උදව් කළා. ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා මාත් එක්ක ඒ ගැන කථා කළා. ඒ හැමදෙනා එක්ක කථා කරමින්, ඒ හැමදෙනාගේම සහයෝගය අරගෙන වර්තමානයේ ග්‍රාම නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථාව හදලා තිබෙන වෙලාවක සමහර වෘත්තීය සංගම් මේ හරහා ඔවුන්ගේ ඉල්ලීම් දිනාගන්න උත්සාහ කරනවා. ඒ වාගේම තවත් සමහර දේශපාලන කණ්ඩායම් ද මේ අවස්ථාවේදී ඔවුන්ගේ ඉල්ලීම් දිනාගන්න උත්සාහ කරනවා. ඒ තුළ වෙන්නේ දීර්ඝ කාලයක් නිස්සේ උත්සාහ කළත්, කර ගන්න නොහැකිව තිබී විසඳා ගත් මේ ජයග්‍රහණය සමාජගත කර ගන්න නොහැකි වීම. සියලු මැති ඇමතිවරුන්ගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේකට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා. අපට පුළුවන් මේක ඕනෑම වෙලාවක වෙනස් කර ගන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න පෙර අපේ ගරු අධිකරණ ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්න මේ අවස්ථාවේ මම කාරණයක් කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව පිළිබඳව අපේ ගැටලුවක් නැහැ. ඇත්ත වශයෙන්ම අපි කවුරුවත් තීන්දු කරන්නේ නැහැ, කොයි ආකාරයට ද අපි ලොවට බිහි වෙන්නේ කියන එක. ඉපදෙන්නේ ස්ත්‍රියක් වශයෙන් ද, පුරුෂයෙක් වශයෙන් ද කියන එක අපි තීන්දු කරන දෙයක් නොවෙයි. එම නිසා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ස්ථාපනය කිරීම ගැන ඇත්තවශයෙන්ම අපට ගැටලුවක් නැහැ.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නමුත් අපට ගැටලුවක් තිබෙනවා, ගරු අධිකරණ ඇමතිතුමනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා, අපේ රටේ තිබෙන සංවරණ සහ තුලන - checks and balances - ක්‍රමවේදය ඊයේ දිනයේ විධායකය විසින් අභියෝගයට ලක් කරලා ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දෙන තීන්දු-තීරණ විශේෂ කාරක සභාවකට දමන තැනට යන එක බොහොම භයානක දෙයක් කියලායි මම හිතන්නේ. විශේෂයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පතේ සඳහන් ප්‍රතිපාදන පිළිබඳව අපේ ගැටලුවක් නැහැ. අපිත් ඒකට සහයෝගය ලබා දුන්නා. නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දෙන නිගමනයක් එහෙම අභියෝගයට ලක් කරන්න පුළුවන්ද, ගරු අධිකරණ ඇමතිතුමනි? මම ඒ කාරණය ඔබතුමාගෙන් අහන්න කැමැතියි. ඔබතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන පොත් පත් රාශියක් ලියලා තිබෙනවා. ඔබතුමා නීතිය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඒවා පරිශීලනය කරන්නට උපදෙස් දීලාත් තිබෙනවා.

මම කියන්න කැමැතියි, බලය බෙදීමේ සංකල්පය - separation of powers concept - තුළ සහ සංවරණ සහ තුලන - checks and balances - ක්‍රමවේදය තුළ, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ තිබෙන කුලුනු තුනට ආවේණික වුණු බලතල සහ ඒ ඒ කුලුනු අනෙකුත් කුලුනුවල සංවරණ සහ තුලනවලට - checks and balancesවලට - ලක් කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ තිබෙන ප්‍රධානතම ලක්ෂණයක් බව. ඒ කියන්නේ, separation of powers, checks and balances ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ තිබෙන ප්‍රධානතම ලක්ෂණයක්. මම ඔබතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. ඊයේ දිනයේ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට ඇවිත් කරපු ප්‍රකාශය මහා බරපතළ ප්‍රකාශයක්. මම පැහැදිලිව මේ කාරණය කියන්නට ඕනෑ. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පතේ අඩංගු ප්‍රතිපාදන ගැන නොවෙයි මම කියන්නේ. විවිධ පාර්ශ්ව ඇවිත් අපිත් එක්ක සාකච්ඡා කරලා මේ සම්බන්ධයෙන් එකඟ වෙලා තිබෙනවා. මම කැමැතියි, ඔබතුමාගෙන් මේ ගැන දැනගන්න. මේ නිර්මාණය වෙන්නේ භයානක trend එකක්. Judicial cannibalism, ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉන්නේ cannibalsලාද කියලා මම අහන්න කැමැතියි. කාටද cannibals කියන්නේ? මිනී මස් කන අයට. එතකොට අධිකරණ ඝාතනමය ක්‍රියාදාමයක් හැටියටයි හඳුන්වන්නේ; judicial cannibalism.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් அவர்கள්)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමනි, ඔය කාරණය වෙනම විවාදයකට ගන්න. ස්ථාවර නියෝග 27(2) යටතේ දැන් ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. මම ප්‍රශ්නයක් නේ, අහන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් அவர்கள්)
(The Hon. Speaker)
දැන් වෙලාව කීයද බලන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
හරි, හරි. වෙලාව තිබෙනවා නේ. අපට lunchtime එකත් ගන්න පුළුවන්. අපට හොඳ ප්‍රගතිශීලී සභානායකවරයෙක් ඉන්නවා. ඔබතුමා කලබල වෙන්නේ නැතිව ඉන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් அவர்கள්)
(The Hon. Speaker)
වැදගත් විවාදයකට තිබෙන කාලය නැති වෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ජනාධිපතිතුමා ගැන මොනවා හරි ප්‍රශ්න කරනකොට කරුණාකරලා මැදට පනින්න එපා. ඔබතුමා, ඔබතුමාගේ ගරුත්වය රැකගන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් அவர்கள්)
(The Hon. Speaker)
මට ඇති දෙයක් නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
කරුණාකරලා ඔබතුමාගේ ගරුත්වය රැක ගන්න. මම අධිකරණ ඇමතිතුමාගෙන් අහන්නේ ඔබතුමා මේ කාරණයට එකඟ වෙනවාද කියලායි. මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය judicial cannibalismද ක්‍රියාත්මක කරන්නේ? තරහා නැතිව මට ඒකට උත්තරයක් දෙන්න.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු කථානායකතුමනි, ඊයේ දිනයේ ගරු ජනාධිපතිතුමා සඳහන් කළ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයක් පිළිබඳව තමයි ගරු විපක්ෂ නායකතුමා මෙම ප්‍රශ්නය මතු කළේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරලා ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණයක් ලබා දීලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය හෝ වෙනත් පාර්ශ්වයක් කියපු දෙයක් හරිද, වැරදිද කියන එක පිළිබඳව නිගමනයක් දෙන්න මට සුදුසුකම් නැහැ. නමුත් මේ පිළිබඳව මහජන මතයක්, විශාල සැකයක් ගොඩ නැඟී තිබෙන නිසා ගරු විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නයට අදාළ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ හරය පිළිබඳව මේ අවස්ථාවේ යම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම සුදුසුයි කියා මම විශ්වාස කරනවා. මේ පනත් කෙටුම්පතත් අනෙකුත් පනත් කෙටුම්පත් වාගේම ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කරපු පනත් කෙටුම්පතක්. ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරලා තිබෙනවා, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය - All Ceylon Buddhist Congress - විසින්. ඊට අමතරව ගෞරවනීය බෙන්ගමුවේ නාලක අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ අපේ රටේ ගෞරවනීය ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා හතරනමක් විසින් ද මේ පනත් කෙටුම්පත අභියෝගයට ලක් කර තිබෙනවා. ඒ වාගේම සංක්‍රාන්තිකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින තවත් සංවිධානයක් විසිනුත් මේ පනත් කෙටුම්පත අභියෝගයට ලක් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙම ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ පිටු 46ක් තිබෙනවා.

මේකේ තිබෙන හරය ගත්තාම, ගැටලු දෙකතුනක් මතු වෙලා තිබෙන බව ඇත්ත. එකක් තමයි මේ පනතෙන් හඳුන්වන්නේ සංක්‍රාන්තිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න. එතකොට ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් නඩු තීන්දුවේ කියන විධියට, හඳුනා ගත්ත ප්‍රශ්නයක් තමයි සංක්‍රාන්තිකයන් කියන්නේ කවුද

කියලා මේ පනතේ අර්ථ නිරූපණයක් නැති එක; නිර්වචනයක් නැති එක. ඇත්තවශයෙන්ම ගත්තොත්, මේ "සංක්‍රාන්තික" කියන එකට ජාත්‍යන්තර අර්ථ නිරූපණයකුත් නැහැ. මොකද, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාවේ තිබෙන්නේ ස්ත්‍රී - පුරුෂ භේදය - difference of sex or whether male and female - පිළිබඳවයි. එතකොට මේ "sex" කියන එකයි, "gender" කියන එකයි ගත්තොත්, අර්ථ දෙකක් තිබෙන්නේ. "Sex" කියන එක උත්පත්තියෙන් biologically; පිරිමියෙක් වෙන්න පුළුවන්; එක්කෝ ගැහැනියෙක් වෙන්න පුළුවන්. ඒ දෙක තමයි biologically, භෞතික වශයෙන් සිද්ධ වෙන්නේ. මේ සංක්‍රාන්තික කියන එක, transgender කියන එක පසුව කෘත්‍රිමව හදා ගත්ත, අලුතෙන් නිර්මාණය වෙච්ච වචනයක්. එතකොට ස්ත්‍රී උදවිය, පුරුෂයෝ බවට පරිවර්තනය කර ගන්නවා; පුරුෂ උදවිය, ස්ත්‍රී උදවිය විධියට පරිවර්තනය කර ගන්නවා. ඒ දෙකටම නැති අයත් ඉන්නවා. ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා, ඕවා කරන විධිය. ඒ වාගේම එතුමා දන්නවා, අය කරන ගාස්තුව පවා. මේක අලුතෙන් dictionary එකට ඇවිල්ලා තවම අර්ථ නිරූපණයක් - definition එකක් - සොයා ගන්න බැරි තත්ත්වයක තිබෙන evolving subject එකක්; විකාශනය වෙමින් පවතින එකක්. ඒ තත්ත්වය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට මතු වුණු ප්‍රශ්නය මෙයයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාවේ කියන්නේ, no discrimination on the basis of sex කියලා. නමුත්, ඒ තුළ මේ "gender" කියන වචනය නැහැ. ඒක සාමාන්‍ය, ස්වාභාවික තත්ත්වයෙන් ඔබ්බට ගිය එකක්. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාවට ගැටෙනවා කියන්නේ එහෙම නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාව සංශෝධනය වෙන්න ඕනෑ කියන මතය තමයි අධිකරණයෙන් පෙන්නුම් කරලා තිබෙන්නේ.

දෙවන කාරණය මෙයයි, ගරු කථානායකතුමනි. මේකෙදි තිබෙනවා, Gender Equality Council කියලා එකක්. එතකොට ඒ Gender Equality Council එක හදන්න පනතේ විධිවිධාන තිබුණාට - ශ්‍රේෂ්ඨාධිකරණය කියන දේ මම මේ කියන්නේ - රජය ඒ පිළිබඳව policy framework එකක්, ඒ කියන්නේ ප්‍රතිපත්තිමය රාමුවක් මේ පනතේ ඉදිරිපත් කරලා නැහැ කියලා ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා. ප්‍රතිපත්තිමය රාමුවක් ඉදිරිපත් කරලා නැත්නම් Council එකක් function වෙලා කොහොමද නියෝග දෙන්නේ කියන ප්‍රශ්නය ශ්‍රේෂ්ඨාධිකරණය මතු කරලා තිබෙනවා.

ශ්‍රේෂ්ඨාධිකරණය තුන්වනුව මතු කරලා තිබෙනවා, මේ කාරණය. මේ Council එකට බලය ලැබෙනවා, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලට නියෝග නිකුත් කරන්න. උදාහරණයක් විධියට යම් ජන කොටසක පාසලක්, නැත්නම් යම් ජන කොටසක ආගමික ස්ථානයක් සම්බන්ධව ගත්තොත්, ඒ ස්ථානවලට ගන්න ඕනෑ ශිෂ්‍ය ප්‍රමාණය මෙහෙම වෙන්න ඕනෑ, පිරිමි මෙච්චර වෙන්න ඕනෑ, genders වෙනස් වෙච්ච කණ්ඩායමෙන් සංක්‍රාන්තිකයන් මෙච්චර වෙන්න ඕනෑ කියලා කියමුකෝ. එහෙම Council එකකට පෞද්ගලික අධ්‍යාපන ආයතනයකට, ආගමික ආයතනයකට, නැත්නම් පෞද්ගලික සමාගමකට වුණත් නියෝග දෙන්න පුළුවන් කියලා තමයි ඒගොල්ලන්ගේ මතය තිබෙන්නේ, මේ පනතේ තිබෙන විධියට. නමුත් එහෙම කොහොමද බලයක් ලැබෙන්නේ council එකකට පෞද්ගලික අධ්‍යාපන ආයතන, ආගමික ආයතන පාලනය කරන්න, නියෝග දෙන්න? මේ ආයතනයට එහෙම බලයක් දෙන්න බැහැ කියන ඒ පදනම තමයි ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ගරු සූරසේන විනිසුරුතුමාගේ තීන්දුවෙන් පසුවත් වෙනම තීන්දුවක් ලියලා තිබෙනවා, ගරු යසන්ත කෝදාගොඩ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමා. එතුමා පෙන්නුම් කරන්නේ මෙන්න මේ කරුණු පහක් නිසා තමයි මේ ප්‍රශ්නය මතු වෙන්නේ කියායි. ඒ පිළිබඳව මට මත ප්‍රකාශ කරන්න අයිතියක් නැහැ, ගරු කථානායකතුමනි. මේ නඩු තීන්දුව පිළිබඳව මම පැහැදිලි කිරීමක් කළා. මොකද, රටේ ජනතාවටත් මේ පිළිබඳව දැනගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(*மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல*)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මේක පොඩි පැහැදිලි කර ගැනීමක්. ගරු ඇමතිතුමා, "transgender" කියලා වෛද්‍ය සහතිකයක් නිකුත් කරන්න බැරිද? ස්ත්‍රී - පුරුෂභාවය - male or female - උත්පත්තියෙන්ම තිබෙන දෙයක්. එතකොට "transgender" කියන එක හදුනා ගන්න වෛද්‍ය සහතිකයක් නිකුත් කරලා, ඒ විධියට categorize කරන්න බැරිද?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(*மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ*)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ඒ විධියට categorize කරන්න - වර්ගීකරණය කරන්න - බාධාවක් නැහැ. හැබැයි, දැන් ඒකට රාජ්‍ය ප්‍රතිපත්තියක්, තීන්දුවක් අරගෙන, තිබෙන අණපනත් වෙනස් කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ඒක හරි. ඒක ගැන අපි මීට අවුරුදු තුනකට කලින් පවා සාකච්ඡා කළා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මම බොහොම ගෞරවයෙන් ඔබතුමාට කියන්නට ඕනෑ, මම ඇහුවේ බොහොම වැදගත් ප්‍රශ්නයක් බව. මම ඇහුවේ මේකයි. ජනාධිපතිතුමා පාවිච්චි කරපු වචනය, "judicial cannibalism". "Judicial cannibalism" කියන එකේ අර්ථය ඔබතුමා දන්නවා. ඒ කියන්නේ අධිකරණය ක්‍රියාත්මක වුණේ හරියට නිකම් අර මිනීමස් කන කණ්ඩායමක් හැටියට. මට ඒ direct translation එක හරියට කියන්න බැහැ; cannibalistic behaviour. එහෙම අධිකරණයට අපහාස කරන්න පුළුවන්ද කියලා මම මේ අහන්නේ. ඔබතුමා ලබා දුන් විග්‍රහයට බොහොම ස්තුතියි. ඒක නොවෙයි මම ඇහුවේ, ජනාධිපතිවරයා පාවිච්චි කරපු වචනය. ඒ තුළින් අධිකරණයට බලපෑමක් එල්ල කිරීම අපි තරයේ හෙළා දකිනවා. ඒක වැරදියි.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(*மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ*)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු කථානායකතුමනි, "cannibalization" කියලා සාමාන්‍ය වචනය ගත්තාම, ගරු විපක්ෂ නායකතුමා කියන අර්ථය එනවා.

නමුත් නීති glossariesවල, ඒ කියන්නේ නීති පාරිභාෂිත වචන මාලාවේදී - legal jargon එකේ- "cannibalize" කියලා පාවිච්චි කරන්නේ, "encroaching upon somebody else's authority" කියන එක. ඒ කියන්නේ ව්‍යවස්ථාදායකයේ බලය වෙත encroach කරනවා කියන එක. ඒ කියන්නේ බලහත්කාරයෙන් අපේ බලය අධිකරණය ඇද ගන්න උත්සාහයක් දරලා තිබෙනවාය කියන එක තමයි මට තේරුම් ගන්න පුළුවන් තත්ත්වය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට නීතිය ගැනවත්, ඒ ක්ෂේත්‍රය ගැනවත් උගන්වන්න එන්නේ නැහැ. හැබැයි, ඔබතුමා බොහොම පැහැදිලිව දන්නවා, Judiciary එකක් active වෙනකොට judicial activism කියලා කියන බව. Judiciary එකක් වැඩිය active නොවෙනකොට කියනවා, passive judicial decisions කියලා. සමාවෙන්න, මම මෙහෙම කියනවාට. මේ cannibalism කියන කථාවේ තිබෙනවා, වෙනත් බරපතළ අර්ථයක්. මම මේ ඔබතුමාට

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

උගන්වන්න එනවා නොවෙයි. නමුත් ඔබතුමා පිළිගන්නවා, either you have judicial activism or a passive judiciary කියන එක. ඒ කියන්නේ වැඩිය active නැති judiciary එකක්. මම මේ කියන්නේ ඇත්තවශයෙන්ම රටේ විධායකය "judicial cannibalism" කියන වචන භාවිත කිරීම වැරදියි කියන එකයි. අපටත් වැරදිලා තිබෙනවා, බොහෝ අවස්ථාවලදී. අඩුපාඩුකම් සිදු වුණාම අපි ඒවා withdraw කර ගන්නවා; sorry කියනවා; apologize කරනවා. මේ වෙලාවේදීත් "judicial cannibalism" කියන වචන භාවිතය අපි නම් තරයේ හෙළා දකිනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, ගරු අධිකරණ ඇමතිතුමා එතුමාගේ පැහැදිලි කිරීමේදී මගේ නමත් සඳහන් කළා. මම ඒ නිසායි මගේ මේ කරුණු දැක්වීම කරන්නේ. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ අධිකරණ තීන්දුවේ තිබුණු අන්තර්ගතය පිළිබඳව විස්තරාත්මක පැහැදිලි කිරීමක් කිරීම ගැන. ඇත්තටම මම හිතන්නේ නැහැ ගරු කථානායකතුමනි, උරණ විය යුතු ආකාරයේ අධිකරණ තීන්දුවක් මෙතැන තිබෙනවාය කියලා; ඒ කියන්නේ පාර්ලිමේන්තුවේ බලයට challenge කරපු අධිකරණ තීන්දුවක් තිබෙනවාය කියලා. හරිම සාධාරණ දෙයක් කියලා තිබෙන්නේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඔය කියන සංක්‍රාන්තික ලිංගිකයන් ගැන සඳහනක් නැහැ. එහෙම සඳහනක් නැති වුණාම අපි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත ඇතුළට මේක රිංගෙව්වාම ඇති වෙන අර්බුදය ගැන තමයි ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ සඳහන් වෙන්නේ. ඒක ඉතාම නීත්‍යානුකූල, සාධාරණ ප්‍රශ්නයක්. මම කියන්නේ අපේ ශ්‍රේෂ්ඨාධිකරණය,- සමහර අවස්ථාවල අපට විවිධ විධියට challenge කරන්න පුළුවන් තීරණ තිබෙන්න පුළුවන්. මම හිතන විධියට, විනිශ්චයකරුවන් ගැන අදහස් පළ කරන්න, අපහාස කරන්න බැරි වුණාට තීන්දු ගැන අපට සාකච්ඡා කරන්න පුළුවන්. ඒ අයිතිය අපට තිබෙනවා. ඔය කියන තීන්දුව ගත්තොත්, ඔබතුමා ඔය ප්‍රකාශ කළ කරුණු අනුව ඉතාම සාධාරණ, ඒ වාගේම තාක්ෂණිකව නිවැරදි එකක්. සංක්‍රාන්තික ලිංගිකයන් කියලා ස්වාභාවිකව හෝර්මෝන හේතු මත බිහි වෙන පිරිසක් ඉන්නවා. ඒ අයගේ අයිතිවාසිකම් ගැන අපි මානුෂීයව බලන්න ඕනෑ. මමත් ඒක පිළිගන්නවා. හැබැයි, ඒක ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත ඇතුළට නොවෙයි රිංගවන්න ඕනෑ. ඒ ගැන වෙනම හිතන්න ඕනෑ.

අනෙක් අතට, දැන් ඔකේ වෙන්නේ මේකයි. මම ඊයේත් මේ කාරණය ගැන කිව්වා. බටහිර රටවල ප්‍රාථමික ශ්‍රේණියේ පිරිමි දරුවන්ගෙන් අහනවා, ඔබ ගැහැනු දරුවෙක් වෙන්න කැමැතිද කියලා. ගැහැනු දරුවන්ගෙන් අහනවා, ඔබ පිරිමි දරුවෙක් වෙන්න කැමැතිද කියලා. ඒ, දෙමව්පියන්ගේ අනුමැතියකින් තොරව. මේක විශාල ව්‍යාපාරයක්. දැන් ඔබතුමා කිව්වා, මම දන්නවාය කියලා පුරුෂ ලිංගයේ ගණන. ඇත්ත කථාව, ඩොලර් 4,000යි ඔය කියන සැත්කම කරනකොට අය කරන්නේ. තව ටිකක් කල් යනකොට ඒ ගණන තවත් ටිකක් වැඩි වෙයි. ඒ සැත්කම කරලා, ප්‍රාථමික ශ්‍රේණියේ හොඳට ඉන්න පිරිමි ළමයා ගැහැනු ළමයෙක් කරන එක, ගැහැනු ළමයා පිරිමි ළමයෙක් කරන එක බිස්නස් එකක්; මේක promote කරනවා. මම දන්නවා, කැනඩා තානාපති කාර්යාලය මේ සභාවේ මන්ත්‍රීවරු ගෙන්වලා මේ වැඩේ promote කරන්න කියලා කථා කරන බව. ඒ නිසා මේක අභිංසක වැඩක්. මම ඊයේ ගීතා කුමාරසිංහ රාජ්‍ය ඇමතිතුමිය එක්කත් මේ ගැන කථා කළා. එතුමිය මට කියපු දේ මම කියන්න යන්නේ නැහැ. මොකද, එතුමියගේ රාජ්‍ය ඇමති තනතුරට තට්ටු වෙයි, මම ඒක කියන්න ගියොත්. මේ පනත් කෙටුම්පත ඇත්තටම දැන් ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියෝගයට ලක් වෙලා තිබෙනවා.

ඊයේ සරත් වීරසේකර මැතිතුමා කිව්වා, ජීව විද්‍යාත්මක කාන්තාව සම්බන්ධයෙන් එතුමන්ලා දීලා තිබෙන අර්ථ කථනය ගැන. ඔන්න ඔහොම සංශෝධන ටිකක් දීලා තිබෙනවාය කියලා එතුමා කිව්වා. මම ගීතා කුමාරසිංහ රාජ්‍ය ඇමතිතුමියගෙන් ඇහුවා, ඒ කියපු සංශෝධන පිළිගන්නවාද කියලා. එතුමිය කිව්වා, ඔක්කොම සංශෝධන ජනාධිපතිතුමාගේ කාර්යාලයට යවලා තිබෙන්නේ, එතැනින් තමයි තීරණය වෙන්නේ කියලා. එතකොට ජනාධිපතිතුමා ඊයේ කරපු ප්‍රකාශයේ හැටියට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දීපු නිර්දේශ අපි පිළිගන්නේ නැහැ වාගේ එකක් තමයි අනියමාර්ථයෙන් ගම්‍ය වෙන්නේ.

ඉතින් ඒක ඉතා බරපතළයි. ඔබතුමා ඔය තීන්දුව ගැන කරපු ප්‍රකාශය අනුව ගත්තාම ඉතාම සාධාරණ, තාක්ෂණිකව නිවැරදි තීන්දුවක් දීලා තිබෙන්නේ. අපේ රට ආසියානික රටක්; බුදු දහමත් එක්ක බැඳුණු රටක්. බුදු හාමුදුරුවෝ ඔය කියන සංක්‍රාන්තික ලිංගිකයන් ගැනත් ඉතා මානුෂීයව, සංවේදීව සලකා බලපු, අදහස් දක්වපු අවස්ථා තිබෙනවා. ඒ නිසා බටහිර රටවල් අපිට උගන්වන්න ඕනෑ නැහැ, ඒ අය ගැන හිතන්න ඕනෑ විධිය. ඒ අය ගැන මානුෂීයව හිතන්න ඕනෑ. ඒ පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ඒක නොවෙයි මේ වෙන්නේ. හොඳට ඉන්න කොල්ලා කෙල්ලෙක් කරන්න යනවා. හොඳට ඉන්න කෙල්ල කොල්ලෙක් කරන්න යනවා. ඒක ප්‍රවර්ධනය කරන්න යනවා. ඒක ප්‍රවර්ධනය කරන්න යන එකටයි අපි විරුද්ධ. ඒක බිස්නස් එකක්. ඒ බිස්නස් එක ප්‍රවර්ධනය කරන්න යන එකටයි අපි විරුද්ධ. මම කියන්නේ මේක ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ ප්‍රශ්නයක් නොවෙයි. ඔය පනතට ඔය විධියට ආවොත්, ඒකට ඡන්දය දුන්නොත්, මට කියන්න වෙන්නේ ඡන්දය දෙන හැම පිරිමියාම ලැහැස්තියි ගැහැණියෙක් වෙන්න, ඡන්දය දෙන හැම මන්ත්‍රීතුමියම -ඒ අය- ලැහැස්තියි පිරිමියෙක් වෙන්න, ඒ වාගේම අර ඩොලර් 4,000ක වැඩේ කර ගන්න ලැහැස්තියි කියලායි. එපමණයි මට කියන්න තිබෙන්නේ.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Speaker, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Hon. Speaker.

Sir, I just want to very quickly focus on an important issue, but not on the contents of the Determination on the Gender Equality Bill. That Determination has already been given.

Sir, there is a very unfortunate process that has been started in this Parliament. A few months ago, in passing

the Online Safety Bill, we saw several Clauses that were determined to be requiring a two-thirds majority being passed in Parliament with a simple majority and that Bill had been made into law. The Hon. Minister of Justice, Prison Affairs and Constitutional Reforms, in the Debate thereafter, kept on saying that there was nothing that had been breached, but I have listed, at least, six matters that had been breached. One is, for a second or a subsequent offence, the penalty was doubled. The Supreme Court said that that cannot be done and it requires a two-thirds majority. But, it had been passed like that and it is for the first time that it happened.

But, now, this has become a trend. The second time it happened was yesterday, when the President came and said, "We do not have to follow this Determination". This is a very serious trend that he is pushing for and the reason, we suspect, is that very soon, there is going to be a piece of legislation introduced to this House to amend the term of the President and that of Parliament, to extend those from five years to six years. And Article 83(b) of the Constitution, which we could not amend by the Nineteenth Amendment to the Constitution because that itself would have required a Referendum, states "over six years". But, the President is actually occupying a space to complete the term of former President Gotabaya Rajapaksa, which is for five years. Therefore, in case the Supreme Court determines that that Bill which might be brought in future also requires a Referendum in addition to a two-thirds majority, the President is now paving the way not to comply with that Determination which might come from the Supreme Court and to pass it with a two-thirds majority by bribing the MPs, allowing to complete their one full term and to have their pension et cetera. So, that is the reason why the Determination on Gender Equality Bill was taken up; it had nothing to do with gender equality. So, Sir, this is a very dangerous trend which has commenced in this Parliament and as Speaker, you need to be very careful about that.

Then, that word " cannibalism" was not about encroaching into another person's territory. I think the President said it in the context of the Supreme Court eating their own judgments; he cited some judgments and said that they were eating their own judgments. I think it is in that context that he said "cannibalism", an unfortunate use of the word, I agree. He should not have used that word. But, Parliament has to comply with the Constitution, not the President or the Judiciary. The Constitution very clearly states that once a Determination of the Supreme Court on a Bill is given, that must be complied with. Otherwise, it does not become law; even if the Hon. Speaker signs it, it does not become law.

Therefore, it is a very dangerous trend that has commenced and it had been done yesterday also with the ulterior motive of bringing in something to Parliament in the future.

Thank you.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු කථානායකතුමනි, මම කලින් කරපු ප්‍රකාශයේ තව පොඩි නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. මම සංක්‍රාන්ති කියලා කිව්වේ පසු කාලීනව කෘත්‍රිමව වෙනවා කියන කාරණය. එහෙම විතරක් නොවෙයි, ඇත්තවශයෙන්ම ස්වාභාවිකවත් සංක්‍රාන්තිය සිදු වෙනවා. ගරු විමල් වීරවංශ මැතිතුමාත් කියන විධියට මේ දෙවිධියටම වෙනවා. ඉතින් මේකට අවශ්‍ය නීති ප්‍රතිපාදනයක් සකස්වීම මේ රටේ අවශ්‍යතාවක්. මීට පෙරත් අපි මේවා ගැන සාකච්ඡා කරලා තිබෙනවා. මොකද, ගරු කථානායකතුමනි, ඒ වාගේ උදව්යට බරපතළ ගැටලු තිබෙනවා. ඔවුන්ට උප්පැන්න සහතිකය වෙනස් කර ගන්න විධියක් නැහැ. හැදුනුම්පත වෙනස් කර ගන්න විධියක් නැහැ. ආයතනයකට ගියාම, බැංකුවකට ගියාම ගනුදෙනුවක් කර ගන්න, ගිණුමක් විවෘත කර ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඇත්තවශයෙන්ම මේ පිළිබඳව මේ රටේ පුරවැසියන්ට අදාළ මූලික නීතියේ යම් කිසි වෙනසක් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. අනෙක, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා කිව්වා වාගේ "cannibalism" කියන එකට මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු 225දෙනාට අර්ථ නිරූපණ 225ක් දෙන්න පුළුවන්. ගරු ජනාධිපතිතුමා අදහස් කරපු කාරණය කුමක්ද කියන කාරණය තමයි මම මේ අවස්ථාවේදී පැහැදිලි කළේ.

දෙවැනි කාරණය මේකයි. කොයිම අවස්ථාවකවත් ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කර නැහැ කාලය දිගු කර ගැනීමක් පාර්ලිමේන්තුවේ හරි ගරු ජනාධිපතිතුමාගේ හරි. අපිට ජනතාව බලය, mandate එක දීලා තිබෙන්නේ අවුරුදු 5කට. ලබන අවුරුද්දේ අගෝස්තු මාසයේ ඒ අපි දිවුරුම් දුන්නු දිනයෙන් පස්සේ, අවුරුදු 5 ඉවර වුණාට පස්සේ එක දවසක්වත් ඒ mandate එක යටතේ මේ පාර්ලිමේන්තුවේ අපි ඉන්නේ නැහැ. මන්ත්‍රීකම්, ඇමතිකම් මොනවා නැති වුණත් අපි ඊට පස්සේ ඉන්නේ නැහැ; අපි ඒ mandate එකෙන් එහාට යන්නේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, "judicial cannibalism"කියන්නේ "අධිකරණමය මිනීමරුවාදය" යන්නයි. ඔන්න, පරිවර්තනය.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

උපාධිධාරී විරැකියාව තුරන් කිරීම සඳහා රැකියා ඉලක්කගත අධ්‍යාපනය
பட்டதாரிகளின் வேலையின்மையைத் தீர்ப்பதற்கான தொழில்நோக்குநிலைக் கல்வி
JOB-ORIENTED EDUCATION TO RESOLVE GRADUATE UNEMPLOYMENT

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

වසරින් වසර පෞද්ගලික හෝ රාජ්‍ය විශ්වවිද්‍යාල අභ්‍යන්තරව හෝ බාහිර වශයෙන් බිහි කරන උපාධිධාරීන් සංඛ්‍යාත්මකව වැඩි වුවද, ඔවුන් කොපමණ සංඛ්‍යාවක් තරගකාරී රැකියා වෙළෙඳ පොළට එකතු වේ ද යන්න අද මූලික ගැටලුවක් වී තිබෙනවා. රැකියා ඉල්ලුමට අධ්‍යාපන සුදුසුකම් නොගැළපීම, රජයේ රැකියාවක්ම අවශ්‍ය බව හා එය අනිවාර්යයෙන්ම ලැබිය යුතු බවට වන ආකල්පය, සෑම ජන කොටසක්ම ආවරණය වන විශ්‍රාම සමාජ ආරක්ෂණයක් නොමැති වීම ආදී කරුණු මෙම ගැටලුවට පදනම් වී ඇති මූලික හේතූන් වනවා. කෙසේ වුවත්, මෙම රැකියා විරහිත බව නිසා රටට අහිමි වන්නේ වටිනාම තරුණ මානව සම්පතයි. එය සැබැවින්ම මානව සම්පත් නාස්තියක්. එම නිසා උපාධිධාරී රැකියා විරහිත බව සම්බන්ධයෙන් ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කරනවා. ඒවාට රජයෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

01. මෙරට සිටින අභ්‍යන්තර හා බාහිර උපාධිධාරීන් ඇතුළුව සමස්ත රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණ ද යන්න පිළිබඳ දත්ත වාර්තා පළාත් සහ දිස්ත්‍රික්ක වශයෙන් රජය සතු වේද? එය සභාගත කළ හැකිද? එක් එක් පළාත් හා දිස්ත්‍රික්ක වශයෙන් දැනට රාජ්‍ය සේවයට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා ක්‍රියාත්මක බඳවා ගැනීමේ වැඩසටහනක් තිබේ ද?

එසේ නම්, එම එක් එක් වැඩසටහන් මඟින් බඳවා ගැනීමට අපේක්ෂිත උපාධිධාරීන් සංඛ්‍යාව කවරේද?

ඒ වාගේම, මම විශේෂයෙන්ම රජයට කියන්න කැමතියි, එක එක පළාත්වල එක එක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන බව. විනිවිදභාවයක් නොමැති වැඩ පිළිවෙළවල් ද ක්‍රියාත්මක කරනවා. ඒ පිළිබඳව උපාධිධාරීන් තුළ බරපතළ ගැටලුවක් ඇති වෙලා තිබෙනවා.

02. වාර්ෂිකව රාජ්‍ය සේවයේ විවිධ සේවාවන් සඳහා කොතරම් උපාධිධාරීන් ප්‍රමාණයක් කුමන විෂය ක්ෂේත්‍රය යටතේ අවශ්‍ය ද යන්න පුරෝකථනයක් කර තිබේද? එම මානව සම්පත් අවශ්‍යතාව සභාගත කළ හැකි ද? මෙම පුරෝකථනය සිදු කිරීම සඳහා වග කිව යුතු ආයතනය කවරේද? රාජ්‍ය සේවයට අවශ්‍ය මානව සම්පත බිහි කරන ලෙස අදාළ රාජ්‍ය ආයතනය විසින් ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය වෙත නිර්දේශ ඉදිරිපත් කර තිබේ ද? එම නිර්දේශ සභාගත කළ හැකි ද?

03. මෙරට පවතින විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය වත්මන් සහ අනාගතයේ බිහි වෙතැයි අපේක්ෂිත දේශීය, විදේශීය රැකියාවලට ගැළපෙන අයුරින් - employment-oriented - වෙනස් විය යුතු බව රජය පිළිගන්නේ ද? එසේ නම්, ඒ සම්බන්ධයෙන් රජය ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේ ද?

විශේෂයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමා හොඳින් දන්නවා ඇති, ලෝකයේ බොහෝ දියුණු රටවල curricula නිර්මාණය කරන කොට ජාත්‍යන්තර ශ්‍රම වෙළෙඳ පොළේ අවශ්‍යතාව පිළිබඳව හොඳ පරිශීලනයකුත් කරලා, curricula සහ syllabi සකස් කර ගන්න එයත් වැදගත් හේතුවක් කර ගන්නවා කියලා.

04. උපාධිධාරීන් රැකියා විරහිතභාවයේ විෂම චක්‍රයෙන් මුදාලීම උදෙසා ඔවුන් නව ව්‍යවසායකයින් වශයෙන් ගොඩ නැඟීමේ වැඩ පිළිවෙළක් දියත් කිරීම වඩාත් යෝග්‍ය වන බව රජය පිළිගන්නේ ද? එසේ නම්, උපාධිධාරීන් ව්‍යවසායකත්වයෙන් පෝෂණය කිරීම උදෙසා රජය ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද? උපාධිධාරීන් ව්‍යවසායකත්වයන් සඳහා යොමු කිරීමට සුවිශේෂී ණය පහසුකම් ලබා දීමේ වැඩ පිළිවෙළක් දියත් කළ නොහැකි ද?

ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට මම කියන්න කැමැතියි, මේ වසර අවසානයේ අපේ රජය බිහි වන කොට ව්‍යවසායකයින් ලක්ෂ 10ක් - one million new business startups and one million new entrepreneurs - බිහි කිරීමේ වැඩසටහන අපි ක්‍රියාත්මක කරනවා කියන එක. ඉතින් මේ රජයටත් බැරිද, ඒ වාගේ වැඩසටහනකට මූලික ප්‍රාග්ධනය - capital - ලබා දෙන්න, ඒ වාගේම කාරක ප්‍රාග්ධනය - working capital - ලබා දෙන්න? උපාධිධාරීන් ව්‍යවසායකයින් බවට පත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට රජයට සිතිවිල්ලක්වත් නැද්ද කියා මම අහන්න කැමතියි.

05. විශ්වවිද්‍යාලයීය අනධ්‍යයන සේවකයින් විසින් නොකඩවා සිදු කරගෙන යනු ලබන වැඩ වර්ජනය සම්බන්ධයෙන් රජය ගෙන ඇති ක්‍රියා මාර්ගවල වත්මන් ප්‍රගතිය කවරේද? ඔවුන් ඉදිරිපත් කර ඇති ගැටලුවලට රාජ්‍ය පාර්ශ්වයෙන් ඉදිරිපත් කර ඇති විසඳුම් මොනවාද? ඒ සඳහා දෙපාර්ශ්වයේ එකඟතාව කෙබඳු ද? මෙම තත්ත්වය නිසා විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කටයුතු හා අවසන් විභාග කටයුතුවලට ඇති කරනු ලබන බලපෑම් නිරාකරණය කිරීමට රජය ගනු ලබන පියවර කවරේද?

ඒ වාගේම, ගුරු හිඟය කියන ගැටලුව කෙරෙහි ද මම අවධානය යොමු කරවන්නට කැමැතියි. 40,000ක ගුරු හිඟයක් අපේ රටේ පවතින මොහොතක, එම ගුරු හිඟය මග හරවා ගන්නට සංවර්ධන නිලධාරීන් 22,000ක් කොරෝනා සමයේ සිට ඉතාම වැදගත් කාර්යභාරයක් ඉෂ්ට කළා. අද ඒ අය විශාල වශයෙන් මැසිවිලි නඟනවා ඒ අය පත් වී තිබෙන තත්ත්වය පිළිබඳව. ඒ අය ගැනත් සිතා බලා ඒ අයටත් ස්ථාවර වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට රජය කටයුතු කරනවාද කියා මම අහන්නට කැමතියි. ඒ වාගේම, මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි, මේ කාරණයත්. මා යාපනයට ගිය අවස්ථාවේ යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපිට ඒ ප්‍රදේශයේ රැකියා විරහිත උපාධිධාරීන් උද්ඝෝෂණයක නියැළී සිටියා. අපි ඒ අයත් හමු වුණා. ඒ වාගේම, මම ඔබතුමාට මතක් කරන්න කැමතියි, ගුරු ක්ෂේත්‍රයට සම්බන්ධ වුණු සංවර්ධන නිලධාරීනුත් දැන් උද්ඝෝෂණයක නියැළී සිටින බව. ඒ අයටත් සාධාරණත්වය ඉෂ්ට කරන්න. ඒ වාගේම, මේ රටේ රැකියා විරහිත උපාධිධාරීන්ටත් තිරසර වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේ යෝජනා කරනවා.

බොහොම ස්තූතියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් අසන ලද ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයේ කොටස් කිහිපයක්ම අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු වෙනවා.

එම ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න මම බලාපොරොත්තු වෙනවා. මුලින්ම කියන්න ඕනෑ කාරණය මේකයි. ගරු විපක්ෂ නායකතුමාත් මෙය මතු කළා. 2019 වර්ෂයේදී අයදුම් පත් කැඳවා "රැකියා විරහිත උපාධිධාරී" කියන කණ්ඩායමට අයත් වන උපාධිධාරීන් 52,000කට සංවර්ධන නිලධාරීන් හැටියට රාජ්‍ය සේවයේ පත්වීම් ලබා දුන්නා. එම පත්වීම් ලබා දීම සඳහා අයදුම් පත් කැඳවන කොට එදා සමහරු චෝදනා කළා, "ඔය බොරුවට කැඳවන්නේ, කවදාවත් ඔය පත්වීම් දෙන්නේ නැහැ" කියලා. එදා

පැවැති ආණ්ඩුවේම අනුප්‍රාප්තික ආණ්ඩුව තමයි තවම මේ යන්නේ. හැබැයි, එදා ඒ පත්වීම් ටික දුන්නා. දැන් ඒ සියලු දෙනා සංවර්ධන නිලධාරීන් හැටියට රාජ්‍ය සේවයට එක් වන උපාධිධාරීන්ගේ මූලික වැටුප ලබනවා. මේ පිරිසෙන් 23,000ක් රජයේ පාසල්වලට -ජාතික පාසල් ස්වල්පයක සහ පළාත් පාසල් බොහොමයක- ගුරුවරුන් හැටියට පුහුණු වෙන්න යෙදෙව්වා. හැබැයි, තනතුරු නාමය "සංවර්ධන නිලධාරී" කියන නාමයමයි.

මා මෙම අමාත්‍යාංශය භාර ගන්නා අවස්ථාව වන විට, යොමු කර තිබුණු අමාත්‍ය මණ්ඩල සන්දේශ අනුව ඒ පිරිසට අභ්‍යාසලාභී පත්වීමක් දීලා වසර තුනකින් පසුව ගුරු සේවා ව්‍යවස්ථාවට අනුව විභාගයක් පවත්වා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා බඳවා ගැනීමට තමයි යෝජනා කරලා තිබුණේ. එතැනදී ප්‍රශ්නයක් මතු වුණා. මොකද, වසර තුනකට පසුව පැවැත්වෙන එම විභාගය ඒ සියයට 100ම සමත් වෙයිද කියන්න බැහැ. කවුරුන් හෝ එය අසමත් වුණොත් මොකද කරන්නේ කියන ප්‍රශ්නය මතු වුණා. ගුරු සේවා ව්‍යවස්ථාව අනුව උපාධිධාරීන් බඳවා ගැනීමේදී ඉස්සෙල්ලාම විභාගයක් පවත්වනවා. ඒ අය වයස අවුරුදු 35ට අඩු අය විය යුතුයි. උපාධියක් තිබිය යුතුයි. මුල් අවස්ථාවේදී උපාධියේ වර්ගය සැලකුවේ නැහැ. නමුත් මේ වතාවේ අපි ඒ ගැන සඳහන් කළා. විද්‍යා ගුරුවරුන් බඳවා ගන්නවා නම්, "විද්‍යා ගුරුවරුන්" කියලා සඳහන් කළා. එතකොට විද්‍යා ගුරු පත්වීම් සඳහා වාණිජවේදී උපාධිධාරීන් ඉල්ලුම් කරන්නේ නැහැ. නමුත් මේ කියන අවස්ථාවේ එවැනි වර්ගීකරණයක් කරලා තිබුණේ නැහැ. සියලු දෙනා සම්බන්ධයෙන් එකම යෝජනාවයි තිබුණේ. එතකොට අධ්‍යාපන අමාත්‍යාංශය රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් එක්ක සාකච්ඡා කරලා තීන්දුවක් ගත්තා. ඒ අනුව රජයේ සේවයේ යෙදී සිටින අයගෙන් යම් පිරිසක් සංවර්ධන නිලධාරීන් හැටියට පාසල්වලට යොමු කළා. පාසල්වල ගුරු වෘත්තියට එන්න කැමැති තව පිරිසක් රජයේ කාර්යාලවල සේවයේ නියුතුව සිටියා. නමුත් ඒ ගොල්ලන්ට ගුරු වෘත්තියට එන්න අවස්ථාවක් තිබුණේ නැහැ. ඒ නිසා ඔක්කොටම අවස්ථාව දීම සහ හොඳ තෝරා ගැනීමක් අවශ්‍ය නිසා ඒ සියලු දෙනාට ඒ අවකාශය සලසා දුන්නා.

එම විභාගය පවත්වන්න නියමිතව තිබුණේ, 2023 මාර්තු 25 වැනි දා. නමුත් ඒ අය අතරින් කණ්ඩායම් හතරක් අධිකරණයට ගිහිල්ලා අභියෝග කළා. වයස අවුරුදු 40 සීමාව 45 දක්වා වැඩි කරන්න කියන එක එක් ඉල්ලීමක්. දෙවැනි ඉල්ලීම, "විභාගයට පෙනී ඉන්න අවශ්‍ය නැහැ. දැනට පුහුණු වන අය නිසා කෙළින්ම පත්වීම දෙන්න" කියන එක. ගුරුවරුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් එවැන්නක් කළොත් අර කැබිනට් පත්‍රිකා දෙකේම තිබෙන හරය සහ ගුරු සේවා ව්‍යවස්ථාව උල්ලංඝනය වෙනවා. හැබැයි, රජයේ පත්වීම් සම්බන්ධ එකඟතාව අවසාන වශයෙන් ලබා දෙන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවයි. අවුරුද්දයි මාස තුනක් තිස්සේ එම නඩුව අධිකරණයේ විභාග වෙමින් තිබෙනවා. හැබැයි, මේ අතරතුර ඔය 23,000න් 6,000ක පමණ පිරිසක් පළාත් මට්ටමින් පළාත් නවයේ පැවැති විභාගවලට පෙනී ඉඳලා ගුරු සේවා ව්‍යවස්ථාව අනුව පත්වීම් ලබා තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් දළ වශයෙන් ගණනය කිරීමක් කර තිබෙනවා. ඒ අනුව ඒ 23,000න් 6,000ක් විතර අඩු වෙලා තිබෙනවා. තවත් අය වෙනත් වෙනත් රැකියාවලට ගිහින් තිබෙනවා. එම නිසා අපි විශ්වාස කරනවා, 16,000ක පමණ පිරිසක් සංවර්ධන නිලධාරීන් හැටියට මේ කණ්ඩායම තුළ ඉඳියි කියලා. මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ නිසා රජයක් හැටියට මේ සඳහා විකල්ප ක්‍රියා මාර්ගයක් ගන්න අපි දැන් බලාපොරොත්තු වෙනවා. ඒ ගැන මට මෙතැනදී කියන්න බැහැ, අධිකරණයේත් නඩුවක් තිබෙන නිසා. ඒක හෙට ගැනීමට නියමිතව තිබෙනවා. ඒ නිසා අධිකරණ ක්‍රියා මාර්ගයට - *[බාධා කිරීමක්]* අධිකරණයේ එහෙම නඩුවක් පවරා තිබීමෙන් කරලා තිබෙන්නේ විභාගය අත්හිටවපු එකයි. අපේ වෙනත් කටයුතුවලට ඒක බාධාවක් ද කියන ප්‍රශ්නය වෙනම තිබෙනවා. ඒ නිසා එවැනි බාධාවක් නොවන විධියට මෙම සංවර්ධන නිලධාරීන් පාසල්වලට අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය විසඳීම සඳහා ඊළඟ සති දෙකතුන තුළ විකල්ප ක්‍රියා මාර්ගයක් ගැනීමට නියමිතව තිබෙනවා. ඒ සඳහා දැනට කටයුතු කරගෙන යනවා. මට දැනට කියන්න පුළුවන් එච්චරයි. මම විශ්වාස කරනවා, අප දෙන විසඳුම තුළින් ඒ අය බලාපොරොත්තු වන ආකාරයට එම ගැටලුව විසඳා ගන්න පුළුවන් වෙයි කියලා.

ගරු කථානායකතුමනි, උපාධිධාරීන් ඉන්නවා, පාසල්වල උගන්වන්න විෂයයක් නැති. අපේ රටේ රාජ්‍ය විශ්වවිද්‍යාල 17 තුළ සහ අනෙකුත් ආයතනවල ප්‍රථම උපාධි පාඨමාලා - degree courses - 850කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. සමහර ඒවායේ faculty එකේ සිටින faculty membersලා ගණන වැඩියි, intake එකට වඩා. ඒ ගැන අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා දවසක් මෙතැනදී කිව්වා. නමුත් දැන් තිබෙන ප්‍රශ්නය මොකක්ද? ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන ගමන් මම කියනවා අපි ඉස්සෙල්ලාම මේ ප්‍රශ්නය විසඳන බව සහ විසඳුම් ක්‍රියා මාර්ගයකට යන බව. මම හිතනවා එවිට ඒ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වේවි කියලා.

හැබැයි, ප්‍රශ්නයක් මතු වෙනවා ගරු කථානායකතුමනි, පාසලේ උගන්වන්න විෂයයක් නැති උපාධියක් කළොත්. අපි හිතමු, පුරාවිද්‍යා විෂයය කියලා. එතකොට කියාවි, ඉතිහාසය උගන්වන්න පුළුවන් නේ කියලා. එහෙම බැහැ. ගුරු සේවා ව්‍යවස්ථාව අනුවත් පාසලේ උගන්වන්න තිබෙන විෂයයන්ට අදාළව උපාධියේ transcript ටිකක් තිබෙනවා නේ. ඒක අනුව තුනෙන් එකක් ඒ විෂය උගන්වන එකෙන් ආවරණය වෙන්න ඕනෑ. නැත්නම් උගන්වන්න බැහැ නේ. දැන්, වාණිජ විද්‍යා විෂය ගුරුවරයෙකුට ගිහිල්ලා උසස් පෙළ ගණිතය උගන්වන්න බැහැ නේ. උසස් පෙළ විද්‍යා උපාධිධාරියෙකුට ගිහිල්ලා වාණිජ විෂයය උගන්වන්න බැහැ නේ. අන්න ඒ වාගේයි. ඒ විධියට, විෂයයට ගැළපෙන්නේ නැති ඒවා තිබෙනවා නම් ඒ අයටත් අපි විකල්පයක් දෙනවා. අපේ පාසල්වල මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරනකොට කාර්යාල සේවයට පිරිසක් අවශ්‍ය වෙනවා. අපි ඒ අයව පාසලෙන් එළියට දාන්නේ නැහැ. ඒ ගොල්ලන් මානව සම්පතක් හැටියට යොදවන්න පුළුවන් ආකාරයත් අපි යෝජනා කරනවා. එතකොට, විෂයයට ගැළපෙන උපාධියක් තිබෙන්න ඕනෑ. ඊළඟට, සම්මුඛ පරීක්ෂණයක් තිබෙනවා නම් එතැනදී මිනිත්තු 5ක්, 6ක් තමන්ට අදාළ විෂයයේ demonstration එකක් කරන්න ඕනෑ. ඊළඟට, Postgraduate Diploma in Education. ඒකත් ගන්න අපි කාලයක් දෙනවා. මේ ඔක්කෝම සංකලනය කරලා මේක විසඳන්න පුළුවන් ක්‍රියා මාර්ගයකට ඊළඟ සති දෙක තුළදී යනවා කියන එක මම සඳහන් කරන්න කැමැතියි. ඒ වෙනුවෙන් අපි දැන් සැලසුම් හදලා කටයුතු කරගෙන යනවා.

ඊළඟට, ගරු විපක්ෂ නායකතුමා කිව්ව පරිදි මේ වන විට 40,000ක ගුරු හිඟයක් නැහැ. මොකද, පළාත් මට්ටමින් විභාග තියලා දැන් ගුරුවරු 13,000ක් අරගෙන තිබෙනවා. එතකොට අධ්‍යාපන අමාත්‍යාංශය ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, තාක්ෂණවේදය සහ විදේශ භාෂා විෂයයන්වලට අදාළව පත්වීම් 3,000ක් දෙන්න දැන් සම්මුඛ පරීක්ෂණ තියලා ඒ ඔක්කෝම කටයුතු අවසන් කරලා තිබෙනවා. අවසාන ලකුණු ලැබුණාම ඒ පත්වීම් ටිකත් අපි දෙනවා. එතකොට අපේ ගණනය කිරීම අනුව දැන් ඔය ඉතිරිවෙලා තිබෙන පිරිසට, විෂය ගැළපෙනවා නම් ඒ අයටත් යම් විකල්පයක් දුන්නොත් සම්පූර්ණයෙන්ම ගුරු හිඟය අවසන් වෙනවා. හැබැයි, ප්‍රාථමික අංශයේ උගන්වනවා නම්, ගුරු අධ්‍යාපනඥ සේවයේ අපේ පීඨවල හෝ Training Collegesවල හෝ ගුරු මධ්‍යස්ථානවලදී වෙනම පාඨමාලාවක් කරන්න වෙනවා. ඒකත් අපි සැලසුම් කරගෙනයි යන්නේ. ඒකට පිළිතුරයි මම මේ ලබා දුන්නේ. මම හිතනවා, මේ කාරණය සම්බන්ධයෙන් සෑහීමකට පත් වෙන පිළිතුරක් මම ලබා දුන්නා කියලා.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට මම දැන් පිළිතුරු ලබා දෙන්නම්, ගරු කථානායකතුමනි.

01. මේ පිළිබඳ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශය සතුව නොමැති අතර, රැකියා විරහිත උපාධිධාරීන් පිළිබඳ තොරතුරු අනෙකුත් රාජ්‍ය ආයතන මඟින් ද ලබාගෙන සකස් කළ යුතුව ඇත.

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ තමයි මේ තොරතුරු තිබෙන්න ඕනෑ. අපට පුළුවන් UGC එකෙන් අවසාන වශයෙන් දෙන්න. අපි හිතමු, පාඨමාලා හැම එකටම අවුරුද්දකට 43,000ක intake එකක් තිබෙනවා කියලා. හැබැයි, මේකෙන් අවුරුදු 3ක පාඨමාලා තිබෙනවා. ඊළඟට, special degreesවලට අවුරුදු 4කට යන්න පුළුවන්. එහෙම pass out වෙන ගාණට අපට කියන්න පුළුවන්, මෙන්න මෙච්චර ප්‍රමාණයක් මේ මේ පීඨවලින් මෙන්න මේ විෂයයන් යටතේ pass out වෙනවා කියලා. දැන්, medical faculty එකට එන සියලුදෙනාම පාහේ ඊළඟ අවුරුද්දෙන් පස්සේ යනවා නේ. Engineering Faculty එකේ සියයට 90ක් වාගේම රැකියා ලැබෙනවා. Marketing degrees කරලා තිබෙන අයට රැකියා ලැබෙනවා. හැබැයි, රැකියා නොලැබෙන උපාධි ප්‍රමාණයකුත් තිබෙනවා. ඒ අය රැකියා විරහිත උපාධිධාරීන්. ඒක උපාධිධාරීන්ගේ වරදක් නොවෙයි. එහෙම වෙන්නේ ඒ ගොල්ලන් උපාධිය හදාරපු විෂය ධාරාවන් ගම්පළාත්වල නැති නිසා. ඒ අයට ඒ තිබෙන විෂය ධාරාව ඉගෙන ගන්න ක්‍රමයක් නැහැ. ඉතින් තිබෙන විෂය ධාරාව ඉගෙන ගන්නවා. මේ ක්‍රමය වෙනස් කරන්න තමයි අපි තාක්ෂණවේදය හදුන්වා දීලා තිබෙන්නේ. තාක්ෂණවේදයේ courses 3ක් තිබෙනවා. ජෛව තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණය, තොරතුරු තාක්ෂණය නමැති පාඨමාලාවලට අද විශාල ඉල්ලුමක් තිබෙනවා. මම හිතනවා, ඊළඟ අවුරුදු කිහිපය වෙනකොට මේ හැම එකකටම විසඳුමක් දෝන්න පුළුවන් වෙයි කියලා. කලා උපාධිධාරි ක්ෂේත්‍රයත් අවශ්‍යයි. කලා උපාධිධාරිනුත් පුරාවිද්‍යාවට අවශ්‍යයි; සෞන්දර්යයට අවශ්‍යයි. හැබැයි, ඊට වැඩිපුර එන ටික අපි උත්සාහ කරන්නේ මේ තාක්ෂණවේදය සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට යවලා ඒ පැත්තෙන් ඒ අයව ශක්තිමත් කරන්නයි. මම ඊළඟට ඒ පිළිබඳ තොරතුරු පැහැදිලි කරන්නම්. විපක්ෂ නායකතුමා අහපු පළමුවැනි ප්‍රශ්නයට පිළිතුර එයයි.

02. මේ පිළිබඳ තොරතුරු සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ඇතුළු වෙනත් ආයතනවලින් ලබා ගත යුතුයි.

ඒ වාගේම, Department of Census and Statistics එකෙන් ගන්න පුළුවන්. ගරු කථානායකතුමනි, අපි උදාහරණයක් ගත්තොත් මැලේසියාව,-*[බාධා කිරීමක්]* ගරු විපක්ෂ නායකතුමනි, ගණන් මා ළඟ නැහැ නේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ ඒ තොරතුරු නැහැ. ඒකට වෙන ඒවායින් තොරතුරු,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
රජයෙන් අහන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

රජයෙන් අහන්න පුළුවන්. නමුත්, ඊයේ ප්‍රශ්නය අහලා අද උත්තර දෙන්න බැහැ නේ. ඒක ඔබතුමාත් පිළිගන්නවා නේ. මම ඒ පිළිතුර ඉදිරි දිනයකදී ලබා දෙන්නම්. අපි කවුරුත් මේ පාර්ලිමේන්තුවේ ඉඳගෙන අපේ රටේ ප්‍රශ්නයක් ගැන නේ කථා වෙන්නේ. බලන්න, මැලේසියාව කොහොමද කරන්නේ? මැලේසියාව අවුරුදු 5න්, 5ට Human Capital Index එකක් හදලා තිබෙනවා. කම්කරුවාගේ සිට වෛද්‍යවරයා දක්වා වන සෑම වෘත්තියකම ඒ ගොල්ලන්ගේ වාර්ෂික අවශ්‍යතාව ගණනය කරලා තිබෙනවා. ඒ ගණනය කිරීම අනුව තමයි ඒ ගොල්ලන් මානව සම්පත සකස් කරන්නේ. ඒ අනුව ඔවුන් පාඨමාලා නවීකරණය කරනවා.

ගරු කථානායකතුමනි, ප්‍රථම උපාධියට පාඨමාලා 850කට වඩා තිබෙනවා කියලා මම කිව්වා. මේ පාඨමාලාවලින් කීයක් අරගෙන ගිහිල්ලා අපේ රටේ රැකියාවක් ගන්න පුළුවන් ද කියන්න.

ඊළඟ අවුරුදු 10 තුළ රැකියා වෙළඳ පොළ ශීඝ්‍රයෙන් වෙනස් වෙනවා, ලෝකයේ. අද අපට දකින්න තිබෙන රැකියා තව අවුරුදු 10කින් දකින්නට ලැබෙන්නේ නැහැ. කෘත්‍රිම බුද්ධිය, තොරතුරු තාක්ෂණය වැනි දේවල් තාක්ෂණයේ දියුණුවත් එක්ක සම්පූර්ණයෙන් වෙනස් වෙලා ගිහිල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම බැංකුවක හිටපු හින්දා තමයි මේවා දන්නේ. අපි බැංකුවට ගිය කාලයේ calculator එකෙන් තමයි ගණනය කරලා trial balance දාලා final accounts හදලා, ඒ වාගේම cash flow, fund flow ඔක්කෝම ටික කළේ. අද ඒ මොකක්වත් කරන්න ඕනෑ ද? ඒ දේවල් software එකේ තිබෙනවා. Software එකේ තිබෙන trial balance එක ටක් ගාලා තත්පර ගණනින් ගන්න පුළුවන්. Final accounts ටික තත්පර ගණනින් හදන්න පුළුවන්. එතකොට ගණකාධිකාරීන්ට කරන්න තිබෙන්නේ මොකක්ද? ඒවා check කරන එක විතරයි; හරියට enter කළා ද කියන එක විතරයි ඔවුන් බලන්න ඕනෑ. ඉතින් මෙවැනි තත්ත්වයකට අද ගිහිල්ලා තිබෙනවා. අපේ විශ්වවිද්‍යාල තුළ තිබෙන පාඨමාලා නවීකරණය විය යුතුයි. අපි මේවා ගැන සාකච්ඡා කරනවා. හැමදාම එකම විෂයයන් තුන තියාගෙන ඉඳලා බැහැ. අවුරුදු 25කට කලින් ආර්ථික විද්‍යාවේ තිබුණු ප්‍රශ්නත් අද වෙනස් වෙලා තිබෙනවා. ඒ නිසා විශ්වවිද්‍යාල පද්ධතිය දැනට ඒ සඳහා කටයුතු කරගෙන යනවා. රැකියා විරහිත උපාධිධාරීන් බිහි වෙන්නේ අධ්‍යාපන ක්‍රමයේම පවතින වරදින්. ඒකට ඒ උපාධිධාරීන්ට වරදක් කියන්න බැහැ.

හැබැයි, අනෙක් පැත්තෙන් තව කාරණයක් තිබෙනවා. ඒක ගැන දැන් සමහරු චෝදනා කරනවා. අපේ රටේත් Non-State sector එක තිබෙනවා; NIBM එක තිබෙනවා, NSBM එක තිබෙනවා. ඊළඟට CINEC එක තිබෙනවා. ඔය වාගේ තව ආයතන තිබෙනවා. මේවායේ employability එක කොහොමද? සියයට 90න් එහායි තිබෙන්නේ. සියයට 90න් එහා මේවායේ employability එක තිබෙනවා. හැබැයි ඒවාට කියන්නේ "කඩ" කියලා. හැබැයි "කඩේ" යන මිනිහාට රස්සාව තිබෙනවා. අපේ විශ්වවිද්‍යාලයට ගිහිල්ලා උපාධිය අරගෙන එන එක්කෙනාට රස්සාව නැහැ. මෙතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ ඇයි? ඒ ගොල්ලෝ රැකියා වෙළඳ පොළට ඕනෑ විධියට පාඨමාලා නවීකරණය කරනවා. මම දන්නවා, මම ඒවා නම් කරන්නේ නැහැ. මොකද, මට non-State sector එකේ promotion එකක් කරන්න බැහැ. වර්ච්‍යුසා ආයතනයෙන් marketing managersලා ඇවිල්ලා IT lectures දෙනවා. ඒ ඇයි? ඒගොල්ලන් ඒකේ ප්‍රායෝගිකව යෙදෙනවා. ඒ ගොල්ලෝ කෙළින්ම දරුවන් interact කරන්නේ ප්‍රායෝගිකව ඒවා කරන අය සමඟයි. එතකොට lecturer පවා ප්‍රායෝගිකව දන්නවා, කොහොමද application එක කරන්නේ කියලා.

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමායි, මමයි දෙන්නාම නීති ක්ෂේත්‍රයේ ඉන්නේ. නීති උපාධියක් අරගෙන ගිහිල්ලා practise කරන්න පුළුවන් ද? ඒ නිසා නේ නීති විද්‍යාලය තිබෙන්නේ. එතකොට, නීති විද්‍යාලයට ගිහිල්ලා තව මාස 6ක් apprenticeship කරලා ඊට පස්සේත් නීතිඥයෙක් වෙන්න තව අවුරුදු කීයක් යනවා ද? මෙතුමාට ජනාධිපති නීතිඥයෙක් වෙන්න කොච්චර කල් ගියා ද? උසාවිය කියන එක practice එකක් කරන තැනක්. සාක්ෂිකාරයෙකුගේ කටින් එන ඊළඟ වචනය මොකක්ද කියලා අපි දන්නේ නැහැ. කඩදාසියක ලියාගෙන ගිහිල්ලා හරස් ප්‍රශ්න අහන්න බැහැ. ඒක එක skill එකක්. එතකොට ඒ skill එක Grade 1 ඉඳලා පුරුදු කරගෙන යන්න ඕනෑ. පෙර පාසලේ ඉඳලා පුරුදු කරන්න ඕනෑ කියලා මෙතුමාගේ Report එකේ තිබෙනවා. අපි දැන් ඒ ටික කරගෙන යනවා. තමන් ඉගෙන ගන්න දේ පවා ප්‍රායෝගිකව යොදවන්නේ කෙසේද කියන කාරණය ඇතුළත් කිරීම තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ මූලික, මුඛ්‍ය හරය වන්නේ. අපි ඉදිරි කාල සීමාව තුළ ඒ ප්‍රතිසංස්කරණ ගෙනෙනවා.

03. මේ ප්‍රශ්නයට පිළිතුරක් හැටියට දැනට කරලා තිබෙන වැඩ කොටස මම කියන්නම්.

ඔව්. දැනටමත් ඒ සම්බන්ධ ක්‍රියා මාර්ග ගෙන ඇත. රාජ්‍ය විශ්වවිද්‍යාලවලට තේරී පත්වන සිසුන්ගෙන් විශේෂයෙන් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උපාධිධාරීන් රැකියාගත කිරීමේ ගැටලු මතු වන්නට විය. එම තත්ත්වය සමනය කරමින් මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා පහත සඳහන් ක්‍රියා මාර්ග ගෙන උපාධිධාරීන් රැකියාගත කිරීමේ ප්‍රතිශතය ඉහළ නංවා ඇත.

- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උපාධි පාඨමාලාවන්ගේ විෂය මාලා නූතනයට ගැළපෙන පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් සිටී.
- නව උපාධි පාඨමාලාවක් හඳුන්වා දීමේ දී වෙළඳ පොළ සමීක්ෂණයක් සිදු කර එහි ප්‍රතිඵල පදනම් කරගෙන උපාධි පාඨමාලාව හඳුන්වා දීම.
- විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ STEM education ප්‍රවර්ධනය කිරීම.
- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨවල තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය බැගින් පිහිටුවා එම විද්‍යාර්ථීන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීමට කටයුතු කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන සිසුන්ට තම අධ්‍යයන පාඨමාලාව ආරම්භ වන තෙක් ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය කර ගැනීම සඳහා "The Pre-University Online/E-Learning English Language Teaching" හඳුන්වා දී ඇත. මෙම පාඨමාලාව හරහා ඉංග්‍රීසි භාෂාවේ කථනය, කියවීම, සවන් දීම හා ලිවීම යන කුසලතාවන් වර්ධනය කර ගැනීමට විද්‍යාර්ථයාට හැකිවනු ඇත.
- කෘත්‍රිම බුද්ධිය විශ්වවිද්‍යාල විෂය ධාරාවන්ට හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී.

Employment-oriented කියන එක අපි පිළිගන්නවා. අපේ පාඨමාලාවෙන් employment-oriented වෙන්න ඕනෑ. මේ සඳහා වැඩකටයුතු කීපයක් කරලා තිබෙනවා. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උපාධිධාරීන්ගේ විෂය මාලා නූතනයට ගැළපෙන විධියට දැන් යාවත්කාලීන කරගෙන යනවා. විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ STEM - Science, Technology, Engineering and Mathematics - education ප්‍රවර්ධනය කරනවා. නව උපාධි පාඨමාලා හඳුන්වා දෙනවා. ඊළඟට, "The Pre-University Online/E-Learning English Language Teaching" කොටස දැනට කරගෙන යනවා. ඒ වාගේම, කෘත්‍රිම බුද්ධිය විශ්වවිද්‍යාල විෂය ධාරාවට හඳුන්වා දීමේ කටයුතු දැනට කරගෙන යනවා.

04. ඔව්. මේ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාල 17හි විශ්වවිද්‍යාල ව්‍යාපාර මධ්‍යස්ථාන - University Business Linkages, UBLs - පිහිටුවා උපාධි හදාරනු ලබන විද්‍යාර්ථියාට වෙළඳ පොළ, කර්මාන්ත ආශ්‍රයෙන් අත්දැකීම් ලබා ගැනීමට ඉඩ හසර සලසා ඇත. මෙම මධ්‍යස්ථාන හරහා නව නිෂ්පාදන හඳුන්වා දීම, වෙළඳ පොළ හා ගිවිසුම්ගත වීම සිදු කර උපාධිධාරී ව්‍යවසායකත්වයන් පෝෂණය කිරීමට කටයුතු කරනු ඇත. මෙම උපාධිධාරීන් ව්‍යවසායකයන් ලෙස සමාජගත කිරීමට ණය වැඩ පිළිවෙළක් සැකසීම ඉදිරියේදී සලකා බැලිය හැකිය.

මේ සම්බන්ධයෙන් ප්‍රායෝගිකව කොහොමද කටයුතු කරන්නේ, ණය ගන්නේ කොහොමද ආදී සියල්ල පිළිබඳව මේ මධ්‍යස්ථාන හරහා ඒ අයට අවබෝධය ලබා දෙනවා.

05. මේ ඉල්ලීම වෙනුවෙන් කැබිනට් පත්‍රිකා කිහිපයක් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කර ඉදිරිපත් කරන ලදී. මේ සම්බන්ධව කැබිනට් මණ්ඩලය දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව ජනාධිපතිතුමාගේ යෝජනාවක් මත පූර්ණ බලතල සහිත කමිටුවක් මඟින් ගැටලු විමර්ශනය කර මීළඟ අයවැයට පෙර අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ ලබා ගැනීමට තීරණය වී ඇත. මෙම වෘත්තීය ගැටලුවලට අදාළ තොරතුරු, දත්ත ආදිය නිවැරදිව හා කඩිනමින් කමිටුව ලබා දෙමින් මෙම ගැටලු නිරාකරණය කර ගැනීමට කටයුතු කරනු ඇත.

දැනටත් අධ්‍යයන කාර්ය මණ්ඩලය මඟින් හැකි උපරිම අයුරින් මෙම විභාග පැවැත්වීම සිදු කරනු ඇත. ප්‍රමාද වන සෑම විභාගයක්ම අනධ්‍යයන වෘත්තීය සමිති ක්‍රියා මාර්ගය අවසන් වූ වහාම ප්‍රමාද නොකර පැවැත්වීමට කටයුතු කරනු ඇත.

ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා අවසාන වශයෙන් අහන්නේ විශ්වවිද්‍යාල පිළිබඳ ප්‍රශ්නයට පරිබාහිර කාරණයක් ගැනයි. මේ ළඟදී මම ගියා චීකාගෝවලටත් කිලෝමීටර 200ක් විතර එහායින් තිබෙන Southern Illinois University එකට. අපේ මහාචාර්යවරු ඒකේ උගන්වනවා. අපේ ළමයින්ගෙන් 50කට වැඩි පිරිසක් එහි Master's Degrees, PhDs කරනවා. ඒක ග්‍රාමීය පරිසරයකයි තිබෙන්නේ.

හැබැයි, දරුවන් විශාල පිරිසක් එහි ඉගෙන ගන්නවා. ඉතාම හොඳ මට්ටමේ අධ්‍යාපනයක් ඒකේ තිබෙනවා. මම ඇමෙරිකාවට ගිය අවස්ථාවක එහි ගියාම දැක්කා, එහි යම් දෙයක් නිෂ්පාදනය කරනවා. ඒ, බෝල බෝල වාගේ දෙයක්. ඒවා පැකට්වල අසුරලා freezer එකේ දාලා තිබෙන්නේ. හැබැයි, අයිස් ක්‍රීම් නොවෙයි. ඒක එළියට ගත්ත ගමන් අයිස් ක්‍රීම් එකක් වාගේ දියවෙනවා. ගරු විපක්ෂ නායකතුමා කිව්වා වාගේ, ඒ university එකේ research centre එකට private entrepreneur කෙනෙක් ඇවිල්ලා ළමයිනුත් එක්ක research එකක් කරලා තමයි ඒ product එක හදලා තිබෙන්නේ. ඒක research finding එකක්. අද ඒක වැඩියෙන්ම අළෙවි වන භාණ්ඩයක් බවට පත් වෙලා තිබෙනවා. අපට ඒක taste කරන්නත් දුන්නා. ඔන්න බලන්න, එම විශ්වවිද්‍යාලය ගිහිල්ලා තිබෙන තැන. ඒ කියන්නේ, entrepreneursලාට විශ්වවිද්‍යාලයේ research centre එකට ඇවිල්ලා researches කරන්න පුළුවන්, තොරතුරු ලබා ගන්න පුළුවන්. මම අහන්නේ මේකයි. අපේ රටේ ව්‍යාපාර කරන අය - small industries, entrepreneursලා මොන තරම් කඩා වැටිලා තිබෙනවාද? Management Studies තිබෙන අපේ විශ්වවිද්‍යාලයකට පුළුවන්, centre එකක් හදලා, researches කරලා මෙන්න මේ ව්‍යාපාරය ගොඩනංවන්නේ කොහොමද කියලා ළමයින්ට උපදෙස් දෙන්න; ඒ consultancy එක කරන්න පුළුවන්. ඒ මඟින් විශ්වවිද්‍යාලයට

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

මුදල් උපයන්න පුළුවන්. මේක තමයි අද ලෝකයේ ප්‍රවණතාව. අපේ රටේ සමහර තැන්වල ඒක කෙරෙනවා. නමුත් ඒක ඒ විධියටම වෙන්නේ නැහැ. ඒ වෙනුවට දැන් මොකක්ද වෙන්නේ? අදත් දිනපතා පුවත් පතක් ගත්තොත්, මහාචාර්යවරයෙකුගේ ලියුමක් පිටුව පිරෙන්න තිබෙනවා. පත්තරේට ලියුම් ලියන්න පුළුවන්. හැබැයි, තමන්ගෙන් ඉගෙන ගන්න උපාධිධාරියා එළියට ඇවිල්ලා රස්සාවක් කරන්නේ කොහොමද කියන එක එතැන උගන්වන්න බැහැ නේ. ඒක වෙන්නේ නැහැ. එතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. ඕක තමයි ප්‍රධාන ප්‍රශ්නය. ඉතින්, මේ සඳහා preschool එකෙන් පටන් අරන් විශ්වවිද්‍යාල පද්ධතිය දක්වාම වෙනසකට ලක් වෙන්න ඕනෑ. මම කලින් කිව්වා වාගේ, සමහර facultiesවල intake එකට වඩා academicsලා වැඩියි. ඔන්න ඕක තමයි තිබෙන තත්ත්වය. දැන් විතරක් නොවෙයි, අනාගතයේ සැලසුම් සකස් කිරීමේ දී පවා මේක වැදගත් වෙනවා, ගරු කථානායකතුමනි.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා අහපු අවසාන ප්‍රශ්නයට මම කිහිප වතාවක් පිළිතුරු දීලා තිබෙනවා. අනධ්‍යයන සේවකයින්ගේ ප්‍රධාන ප්‍රශ්න දෙකක් තිබෙනවා. ඉන් එක් ප්‍රධාන ප්‍රශ්නයක් මෙයයි. 2018 දී මහාචාර්යවරුන්ගේ සහ ආචාර්යවරුන්ගේ වැටුප සියයට 107කින් වැඩි වුණා. අනෙක් අයගේ වැටුප වැඩි වුණේ සියයට 92කින්. එතකොට එතැන සියයට 15ක පරතරයක් තිබුණා. 2018 ඉදලා අවුරුදු 6ක් තිස්සේ තිබෙන ඒ ප්‍රශ්නය තමයි දැන් මට විසඳන්න සිදු වෙලා තිබෙන්නේ. ඒ සඳහා මම කැබිනට් පත්‍රිකා දාලා තිබෙනවා, සාකච්ඡා කරලා තිබෙනවා, මහා භාණ්ඩාගාරයට තොරතුරු යවලා තිබෙනවා. හැබැයි, මේ කණ්ඩායමේ විෂමතා ඉවත් කරනකොට තවත් පිරිසකගේ විෂමතාවක් ඇති වෙන්න බැහැ. ඒ නිසා තමයි කමිටුවක් පත් කරලා මේ පිළිබඳව සොයා බැලීම සඳහා කටයුතු කරගෙන යන්නේ.

අනධ්‍යයන සේවකයන්ගේ දෙවැනි ඉල්ලීම තිබෙන්නේ හිලව් දීමනාව - MCA එක- ගැන. Academicsලාට academic allowance එක දුන්නාට පසුව තමයි එම හිලව් දීමනාව පිළිබඳ ඉල්ලීම ආවේ. එතකොට ඒ සඳහා ප්‍රතිපාදන හදලා නැහැ. නමුත් අපි උත්සාහ කරනවා, යම් ආකාරයකින් ඒ සඳහාත් විසඳුමක් ලබා දෙන්න. ඒ ගැන ඊයේත් සාකච්ඡා කළා, අදත් සාකච්ඡාව යනවා. අපටත් ඕනෑ, කඩිනමින් මේ ප්‍රශ්නය අවසන් කර ගන්න. මොකද, ළමයින්ට lectures දුන්නත් විභාග පරක්කු වෙනවා, convocations පරක්කු වෙනවා. ඒ වාගේම registrationsවල ප්‍රශ්න තිබෙනවා. විදේශ විශ්වවිද්‍යාලවලට යෑම පිළිබඳව ප්‍රශ්න තිබෙනවා. මේ ප්‍රායෝගික ප්‍රශ්න ටික අපි කොහොම හරි විසඳාගන්න ඕනෑ. ඒ සඳහා මහා භාණ්ඩාගාරය අවධානය යොමු කර තිබෙනවා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට තිබෙන්නා වූ ප්‍රතිපාදනවලින් යම් විසඳුම් ක්‍රියාමාර්ගයකට එන්න අපට එකඟතාවක් ලැබෙනවා නම්, ඒකටත් අපි සූදානම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු අමාත්‍යතුමනි, මේ ප්‍රශ්නය විශේෂයෙන්ම ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා මීට පෙරත් ඔබතුමාගෙන් අහපු ප්‍රශ්නයක්. ත්‍රිකුණාමලයේ සහිරා විද්‍යාලයේ A/Level Exam ප්‍රතිඵල තවම ලැබී නැහැ. ඉතින්, දරුවන් 70දෙනෙකුගේ A/Level Exam ප්‍රතිඵල නිකුත් කිරීම ඉක්මනින්ම සිදු වෙන්නට ඕනෑ. ඔබතුමා කියලා තිබෙනවා, පසුගිය සතිය ඇතුළත ඒ කටයුත්ත කරනවා කියලා. ඔබතුමා කරුණාකරලා මේ ගැන සොයා බලා ඉක්මන් තීන්දුවක් ගන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, එතැන ප්‍රශ්නය තිබෙන්නේ විභාග ශාලාවට එනකොට පර්දාව පැළඳගෙන ආපු එකයි. එහෙම එනවා නම්, ඒක ඇරලා කන් දෙක පෙන්වන්න ඕනෑ. ඒවාට හේතු තිබෙනවා. මම ඒවා ප්‍රසිද්ධියේ කියන්න යන්නේ නැහැ. මේ වාගේ දේවල් සිදු වන ප්‍රදේශ තිබෙනවා. ඒවා ගැන මම කියන්න යන්නේත් නැහැ. ඒ අවස්ථාවේ ඒක සිදුවෙලා නැහැ. යම් invigilator කෙනෙක් ඒක ඕනෑවට වඩා සැලකිල්ලට අරගෙන තිබෙනවා. හැබැයි, ඒ දරුවන්ගේ ප්‍රතිඵලවලට කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. දැන් ඒ ප්‍රතිඵල නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු විභාග දෙපාර්තමේන්තුව විසින් කරගෙන යනවා. ඒ ප්‍රතිඵල නිකුත් කරාවි. එතුමා මට දුරකථනයෙන් කථා කරලා ඒ ගැන ඇහුවා. තවත් මන්ත්‍රීවරු මේ ගැන කථා කළා. දැන් ඔබතුමාත් ඇහුවා. විභාග කොමසාරිස් ජෙනරාල්තුමා ඉදිරි දින කිහිපය තුළ එම ප්‍රතිඵල නිකුත් කරාවි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

අධ්‍යාපනයේ සිදු විය යුතු වෙනස ගැන, සිදු විය යුතු පරිවර්තනාත්මක කාර්යභාරය ගැන ඔබතුමා ලොකුවට කථා කළා. ඇත්ත වශයෙන්ම ඔබතුමා අද මේ සභාවේ ඉඳගෙන අපට කියනවා, මෙන්න මේ යෝජනා අනුමත කරන්න කියලා.

ඒ අනුව, අනුරාධපුර මහාවිහාර විශ්වවිද්‍යාලය සඳහා වෙන් කරපු රුපියල් මිලියන 400ක්, අනුරාධපුර ජාත්‍යන්තර බෞද්ධ පුස්තකාලය සඳහා වෙන් කරපු රුපියල් මිලියන 300ක්, මහනුවර බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳ කෞතුකාගාරය ඉදි කිරීම සඳහා වෙන් කරපු රුපියල් මිලියන 200ක්, පළාත් සභා සඳහා වෘත්තීය අධ්‍යාපනය නහා සිටුවීමට වෙන් කරපු රුපියල් මිලියන 450ක්, ජාතික සන්නාමකරණය සඳහා වෙන් කළ රුපියල් මිලියන 100ක් එතැනින් ඉවත් කරලා ජනාධිපතිවරයා තීන්දු කරන විශේෂ සංවර්ධන වැඩසටහන්වලට යොදවන්න අනුමත කරන්න කියලා අපට කියනවා. ගරු ඇමතිතුමනි, මම අහන්නේ මෙහෙම වෙනසක් කරනවා නම්, මේ රුපියල් මිලියන 8,750ක මුදල මේ රටේ smart classrooms වෙනුවෙන් වෙන් කරන්න ඔබතුමාට බැරි ඇයි කියලායි. මේ කරන්න හදන්නේ ජනාධිපතිවරණය - Presidential Election එක - හෝ තවත් මැතිවරණයක් කේන්ද්‍ර කරගෙන, - අපි දන්නේ නැහැ, මොන මැතිවරණයක් එයිද, නැද්ද කියලා. දැන් මේ ගරු සභාවේ දී කියැවුණා, මැතිවරණය කල් දමන්නත් හදනවා කියලා. එහෙම නොවේවි කියලා අපි හිතනවා. ඇත්ත වශයෙන්ම මේ මැතිවරණය කේන්ද්‍ර කරගෙන කොන්ත්‍රාත්කාරයින්ට සල්ලි දෙනවාට වැඩිය, ඒ මුදල smart classroomsවලට වෙන් කළා නම් නරකද? ඔබතුමා අධ්‍යාපනයේ වෙනස ගැන බොහොම හොඳ සංකල්ප කථා කළා. මේ රුපියල් මිලියන 8,750ක මුදල රටේ අධ්‍යාපනයට යොදවන්න බැරි ඇයි? Smart classroomsවලට යොදවන්න බැරි ඇයි? මම ඔබතුමාගෙන් ඒ ප්‍රශ්නය අහන්න කැමැතියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon.(Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, රජයක් වුණාම රජයේ සංවර්ධන වැඩ සියල්ල තුලනාත්මකව කරන්න ඕනෑ. අපේ රටේ ගුරු වැටුප් ගෙවන්න විතරක් සියයට 90ක පුනරාවර්තන වියදමක් යනවා. එතකොට ප්‍රාග්ධන යෙදවුම් තිබෙන්නේ ඉතාම සීමිත ප්‍රමාණයයි. දැන් ඔය විෂමතාව ඉවත් කරන්න ගියොත්, ඒ ටික කරන්න ලැබෙන්නේත් නැහැ. එක පැත්තකින් දේශපාලනඥයෝ

කියනවා, විෂමතාව ඉවත් කරන්න කියලා. ඒ පැත්තට තමයි කථා කරන්නේ. ඒත් ඡන්දය වෙනුවෙන් තමයි. ඡන්ද ගන්න තමයි ඒක කථා කරන්නේත්. එහෙම නැතුව වෙන මොනවත් සඳහා නොවෙයි නේ. එතකොට, එහෙන් විෂමතාව ඉවත් කරන්න කියන ගමන් මෙහෙන් කියනවා, smart classroom එක හදන්න කියලා. ඔව්, ඒකත් හදන්න ඕනෑ. ගුරු පුහුණුව කරන්නත් ඕනෑ. ඒ සියල්ල සඳහා මේ තිබෙන මුදල් ප්‍රමාණය තමයි අපට කළමනාකරණය කර ගන්න තිබෙන්නේ; that is, financial management. ඒක නිසා ඔබතුමා කිව්වා වාගේ ඔය රුපියල් මිලියන 8,750 මට ලැබෙනවා නම් මම ඉතා කැමැතියි. එහෙම නම් මම මැතිවරණයට කලින් ඔය කටයුත්තත් කරලා, මැතිවරණ ව්‍යාපාරයටත් විශාල බලපෑමක් කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ඉතින් කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
බලපෑමක් කියන්නේ, මැතිවරණයේ ඡන්දවල කාරණාවක් නොවෙයි. මැතිවරණයක දී මතු කරන ප්‍රශ්නවලට අපට අධ්‍යාපනය පැත්තෙන් බරපතළ පිළිතුරක් දෙන්න පුළුවන්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ඉතින්, ඒක කරන්නකෝ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු විපක්ෂ නායකතුමනි, මම මේ කියන කාරණය ඔබතුමාට අදාළ වෙන්නේ නැහැ. එක්තරා මාධ්‍ය නාළිකාවක රාත්‍රී විකාශය වන ප්‍රවෘත්තිවලට කලින්, මැදින් සහ අවසානයේ දී තොරතුරු තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ දැනුම සන්නද්ධ කිරීම පිළිබඳ වෙළෙඳ දැන්වීමක් යනවා. ඔය ඔක්කොම අපි දන්නවා. ආණ්ඩුව කැසිනෝ ගහලා, කළු සල්ලි සුදු කරලා සල්ලි හොයලා නොවෙයි, මේ සල්ලි වෙන් කරන්නේ. එහෙම යන අයත් ඉන්නවා. සමහරු marketing theories දමනවා. Marketing කරලා මේ රට ඉස්සරහට හදමු කියනවා. අපි ඒවා කියන්නේ නැහැ. ඒ ඔක්කොම දේවල් ගැන කථා කරන අය තමයි පසුගිය අවුරුදු හතර පහේ දී මේ රට මෙතැනට තල්ලු කරන්න කටයුතු කළේ. කොවිඩ්-19 තිබෙන වෙලාවේ එන්නත් ගෙන්වලා ඒකෙනුත් අපටයි ප්‍රශ්න ඇති වුණේ. හෝටල්වල නිරෝධායන කටයුතු කරගෙන ගිහිල්ලා, උදේට කිරි බත් කෑල්ලක් දීලා රුපියල් 14,000ක් ගත්තා. මට ඒ ගැන පෞද්ගලිකව අත්දැකීම් තිබෙනවා. ඒ ගොල්ලෝ තමයි marketing කරලා, ජනාධිපතිවරණය දිනවන්න යන්නේ. එහෙම කොටසකුත් ඉන්නවා. හිටපු ජනාධිපතිතුමාව ඒ තැනට ඇදලා දමපු අය තමයි ඒ සමහරු.

අනෙක් අයත් එහෙමයි. මේ රටට ටයිල් ගෙන්වන එක නැවැත්වුවා. ඒක නැවැත්වුවාම පරණ ගෙනැවිත් තිබුණු ටයිල් එක්ක ඔක්කොම වැඩි ගණනට විකුණුවා. Commode එකක් කලින් රුපියල් 40,000කට තිබුණා නම්, ඒක රුපියල් 120,000කට ගන්න මේ රටේ මිනිස්සුන්ට සිද්ධ වුණා. දැන් වේදිකා ගහන්න, රැස්වීම් පවත්වන්න වියදම් කරන්නේ මේ මුදල් නොවෙයිද? මේවාත් කථා කරන්න වෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමන්ලාගේ වේදිකාවේ දී මේවා කථා වෙන්නේ නැහැ. මම ඒකයි මේවා කිව්වේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් වේලාව මධ්‍යාහ්න 12.00යි.

විපක්ෂ නායකතුමාගේ point of Order එක මොකක්ද? *[බාධා කිරීම්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න. Points of Order සියයක් මතු කළත්, මම ඒ සියයටම උත්තර දෙන්නම්. හැබැයි, අපි ඇත්ත කියන්න ඕනෑ. අපි ඔය එකකටවත් සම්මාදම් වෙලා නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට අවස්ථාව දීලා නේ තිබෙන්නේ, කථා කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந්த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒ නිසා අපට කථා කරන්න පුළුවන්. මේක විපක්ෂ නායකතුමාටත් ලොකු සහායක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මම සතුටු වෙනවා, මට සහාය ලබා දෙන්න අපේ ගරු ඇමතිතුමා ඉදිරිපත් වීම ගැන. මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, කියපු දේ කරන්න දැන් ඔබතුමා සූදානම්ද කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந්த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔව්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා සූදානම්. දැන් ඔබතුමාගේ කටින්ම කිව්වා, ඔබතුමා කැමැතියි කියලා, මේ රුපියල් මිලියන 8,750ක මුදල education වලට යොමු කරන්න. මේ න්‍යාය පත්‍රයේ තිබෙන ඒ මුදල් හුවමාරුව එලෙස සිදු නොවී, ඒ රුපියල් මිලියන 8,750ක මුදල අධ්‍යාපනයට යොදවනවා නම් අපි අත් දෙකම උස්සනවා. ඔබතුමා සූදානම්ද, ඒ සංශෝධනය කරන්න? *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඔබතුමා සූදානම්ද ඒ මුදල අධ්‍යාපනයට යොමු කරන්න?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එහෙම බැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද එහෙම බැහැ කියන්නේ? It is called walking the talk. Walk the talk, ඇමතිතුමා. *[බාධා කිරීමක්]* Okay, answer කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ වෙනකොට smart boards 1,500ක් ලබා දෙන වගකීම TRC එක භාරගෙන තිබෙනවා. *[බාධා කිරීමක්]* අහපු ප්‍රශ්නයට ප්‍රවේශ වෙන්න ඕනෑ නේ. පාසල් digitalize කරන්න මේ මුදල වියදම් කරන්න කියලා එක පාරම මෙතැනට මේ මුදල යොමු කරන්න බැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, අද ස්ථාවර නියෝග 27(2) යටතේ තව ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. වරප්‍රසාද ප්‍රශ්න 3ක් තිබෙනවා. මෙහෙම කාලය ගත්තාම එතුමන්ලාට අවස්ථාවක් ලැබෙන්නේ නැතිව යනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මේක මුදල් අමාත්‍යාංශය මඟින් හදලා තිබෙන ඇස්තමේන්තුවක්. මුදල් අමාත්‍යාංශය හදලා තිබෙන ඇස්තමේන්තුවත් ක්‍රියාත්මක වෙනවා. අපි ඒකට සහයෝගය දෙන්නත් ඕනෑ. නැත්නම් රටක පාරක යන්න බැහැ, පාලමක යන්න බැහැ. ඒ වාගේම, පාසල් ගණනාවක් ගංවතුර නිසා විනාශ වෙලා තිබෙනවා. ඒවා ඉක්මනින් හදන්න ඕනෑ. ඒවාටත් මේකෙන් ප්‍රතිපාදන යනවා. මීට අමතරව ඒ අතරතුර TRC එකෙන් smart boards 1,500ක් ගන්න වැඩේ දැන් කෙරිගෙන යනවා. චීනයෙන් ලැබෙන්න තිබෙන US Dollars 20 million grant එකට feasibility reportවල කටයුතු අවසන් කරලා, දැන් ඒකේ අවසාන අදියරට ඇවිල්ලා තිබෙනවා. මේ දෙක එකතු වෙනකොට පළමුවෙනි අදියරේදී ඔබතුමා ඔය කියන රුපියල් මිලියන 8,750ට වඩා වැඩ කොටසක් කෙරෙනවා. එතැනට මුදල් ලැබිලා තිබියදී, ඒක ක්‍රියාත්මක වෙද්දී මේ මුදල අරගෙන එතැනට දාන්න ඕනෑ නැහැ. හැබැයි, මේකේ phase I එක ඉවර වෙනකොටම මේ හා සමාන මුදලක් දෙනවා නම් ඊළඟ අවුරුද්දේ මේ වගකීම - මගේ වගකීම - භාර ගන්න කාට හරි කෙනෙකුට පුළුවන්, දෙවෙනි අදියර බොහොම සාර්ථකව ක්‍රියාත්මක කරන්න. ඒකට ඔබතුමන්ලාට උත්සාහ කරන්න පුළුවන්; you can try it.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා සියලුදෙනා වගකීමෙන් කටයුතු කරන්න. දැන් වේලාව 12.00යි. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා දැන් විනාඩිය විනාඩිය පැය දෙකක් අරගෙන තිබෙනවා. *[බාධා කිරීම්]*

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇත්තටම මේ සභාව control කරන්නේ නැද්ද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමායි යෝජනා කළේ රුපියල් මිලියන 8,750ක මුදල අධ්‍යාපනයට ලැබෙනවා නම් සතුටුයි කියලා. මම යෝජනා කරනවා, ඒ වෙනස කරන්න අදම ඔබතුමා මුල පුරන්න කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු විපක්ෂ නායකතුමනි, න්‍යාය පත්‍රයට යෝජනාවක් එන්නේ යම් ක්‍රියාදාමයක් අනුගමනය කරලායි. වැය ශීර්ෂ එක එක විධියට වෙනස් කරන්න බැහැ. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්ස, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබවහන්සේගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

II

උතුරු, නැඟෙනහිර පුරාවිද්‍යා ඉඩම් සහ වන රක්ෂිතවලට අයත් ඉඩම්
வடக்கு, கிழக்கிலுள்ள தொல்பொருள் இடங்களும் வன ஒதுக்கங்களும்
ARCHAEOLOGICAL LANDS AND FOREST RESERVES IN NORTH AND EAST

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය යොමු කරන්නේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාට. ඒ වාගේම මම හිතනවා, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියත් මේ සම්බන්ධයෙන් උත්තරයක් ලබා දෙයි කියලා.

මේ වන විට උතුර හා නැඟෙනහිර බෞද්ධ ඉඩම් දේශීය හා විදේශීය ව්‍යාපාරිකයන්ට ජාතිවාදී පදනමින්, අනාගත දේශපාලන අභිලාෂත් සමඟ ලබා දෙන බවට සමාජය තුළ මතයක් ව්‍යාප්ත වෙමින් තිබෙන බව උතුරු හා නැඟෙනහිර ස්වාමීන් වහන්සේලා සහ ඒ පළාත්වල ජීවත් වන ජනතාව අපට දැනුම් දීලා තිබෙනවා. එමෙන්ම උතුරු හා නැඟෙනහිර පුරාවිද්‍යා ඉඩම් මෙසේ සමාගම්වලට බෙදා දීමට රජය කැබිනට් මණ්ඩලය තුළ යම්කිසි තීන්දුවක් ගෙන තිබේද? එහෙම නැත්නම් එවැනි තීන්දුවක් නොගෙන කවුරුහරි අත්තනෝමතිකව කටයුතු කරනවාද? පුරාවිද්‍යා ඉඩම් සම්බන්ධව යම්කිසි ආකාරයක කැබිනට් මණ්ඩල තීරණයකින් පමණක් තීන්දු ගත හැකිද යන්න මේ ගරු සභාවෙන් මම විමසා සිටිනවා.

ඒ වාගේම වනජීවී හා වන සම්පත් සංරක්ෂණ ඉඩම්ද මෙලෙස විවිධ මට්ටම්න්, මේ ආකාරයෙන් යම් යම් අයට ලබා දීමට කටයුතු කරමින් තිබෙන බවත් අපට දැනගන්නට ලැබී තිබෙනවා. විශේෂයෙන්ම පුරාවිද්‍යා ඉඩමක් යනු, පොදු වස්තුවකි. ඒක මානව සංහතියේ උරුමයක්. එක් ජාතියකට හෝ එක් ආගමකට අයත් දෙයක් නොවෙයි. ඕනෑම පුරාවිද්‍යාත්මක ස්ථානයක් මානව සංහතියේ උරුමයක් ලෙස සලකනු ලබනවා. ඒ අනුව වර්තමාන රජය අනාගතයේදී යම් යම් කොටස්වල ඡන්ද ලබා ගැනීමේ

අරමුණින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් මෙලෙස අත්තනෝමතිකව අන්සතු කරමින් සිටින බව දැනගන්නට ලැබී ඇත. ඒ පිළිබඳව මේ ගරු සභාවෙන් මම මෙසේ ප්‍රශ්න කරනවා.

ගරු කථානායකතුමනි, ලංකාවේ ඉඩම් සම්බන්ධයෙන් කොමිෂන් සභාවක් නැහැ, ජාතික ප්‍රතිපත්තියක් නැහැ. ඒ තුළ අද අපි විශාල අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. බොරදියේ මාළු බානවා කියලා ප්‍රසිද්ධ කියමනක් තිබෙනවා නේ. මේ ව්‍යාකූලත්වය තුළ බරපතළ, විනාශකාරී තීන්දු කැබිනට් මණ්ඩලය ඇතුළත සහ ඊට පිටින් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන්ම මේ පිළිබඳව අවධානය යොමු කරනු ඇතැයි කියා මම බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින දිවා ආහාර විවේකයෙන් තොරව සභාවේ කටයුතු පවත්වාගෙන යාමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

1. උතුරු හා නැඟෙනහිර දෙපළාතේ පුරාවිද්‍යා ඉඩම් කොතරම් පවතින්නේ ද?
2. එම ඉඩම් මේ වන විට යම්කිසි සමාගමකට හෝ කණ්ඩායමකට ලබා දී තිබේ ද?
3. එසේ නොමැතිනම් එම ඉඩම් ලබා දීමට කටයුතු කරන්නේ ද?
4. එමෙන්ම, මේ වන සංරක්ෂණ හා වනජීවී ඉඩම් කුමන ආකාරයකින් හෝ විවිධ සමාගම් යටතට පවරා දීමට - විශේෂයෙන්ම උතුරු හා නැඟෙනහිර- සැලසුම් තිබේද යන්න පිළිබඳව මේ ගරු සභාව දැනුවත් කරන මෙන් පරිසර ඇමතිතුමාගෙන්ද, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ විෂය භාර ඇමතිතුමියගෙන්ද ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මම තවත් සුළු වෙලාවක් ඉල්ලා සිටිනවා. විජයදාස රාජපක්ෂ ඇමතිතුමාත් ඉන්න මේ සභාවේදී, ශ්‍රේෂ්ඨාධිකරණය දීපු තීන්දුවක් ගැන ජනාධිපතිතුමා දීර්ඝ වශයෙන් ප්‍රකාශයක් කළා. ඊට විරුද්ධව නඩු දාලා තිබෙන්නේ, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය ඇතුළු ස්වාමීන් වහන්සේලායි. මේ මඟින් අපේ බෞද්ධ නීතියටත් යම්කිසි බලපෑමක් එනවා. උදාහරණයක් හැටියට ගත්තොත් අපේ නීතියට අනුව නපුංසක - neuter - අය පැවිදි කරන්න තහනම්. උපසම්පදාව දෙන්නත් තහනම්. ඒකට හේතුවක් තිබෙනවා. ඔවුන්ගේ මානව හිමිකම් රැකගන්න පුළුවන්. නමුත් නපුංසකයෙක් විශේෂ ගෞරවාන්විත සභාවකට පත් කරන්න, ජනාධිපති කරන්න පුළුවන්ද කියලා නීතියේ තිබෙනවාද නැද්ද කියලා මම දන්නේ නැහැ, විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි. මම නම් කියන්නේ, නපුංසකයෙක් ජනාධිපති කරන්න එපා කියලායි. ඒ සම්බන්ධයෙනුත් මා මේ සභාවේ අවධානය යොමු කරවනවා. කාලය ගත වන නිසා ඒ වෙලාවේ මම ඔබතුමාට බාධා කළේ නැහැ.

මා යොමු කළ ස්ථාවර නියෝග 27(2) යටතේ වූ ප්‍රශ්නයට ගරු විදුර වික්‍රමනායක ඇමතිතුමාගෙන් තොරතුරු දැනගන්න මා කැමැතියි.

ගරු විදුර වික්‍රමනායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Vidura Wickramanayaka - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු කථානායකතුමනි, ගෞරවනීය ස්වාමීන් වහන්සේ විසින් අසන ලද ප්‍රශ්නවලට මම මෙසේ පිළිතුරු ලබා දෙනවා.

1. පුරාවිද්‍යා භූමි වශයෙන් වෙන් කරන ලද උතුරු හා නැඟෙනහිර පළාත්වල පුරාවිද්‍යා ස්ථාන පහත පරිදි වේ.

අම්පාර දිස්ත්‍රික්කය

- පුරාවිද්‍යා රක්ෂිත භූමි

අනු අංකය	ස්මාරකය පිහිටි ස්ථානය	භූමි ප්‍රමාණය
01	ඔවාගිරිය පුරාවිද්‍යා ස්ථානය	අක්.21 රූඩ්.2 පර්.19
02	මුහුදු මහා විහාරය	අක්.30 රූ.3 පර්.2
03	රත්නවෙල විහාරය (ශාස්ත්‍රවෙල)	අක්.10 රූ.3 පර්.07
04	පොල්ලෙබැද්ද (නුවරගල) පුරාවිද්‍යා ස්ථානය	අක්.674 රූ.01 පර්.22

- මායිම් කණු යොදා භූමිය වෙන් කරන ලද ස්ථාන සංඛ්‍යාව - 144යි.

මඩකලපුව දිස්ත්‍රික්කය

- පුරාවිද්‍යා රක්ෂිත - නැත
- මායිම් කණු යොදා භූමිය වෙන් කරන ලද ස්ථාන සංඛ්‍යාව - 151යි.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

- පුරාවිද්‍යා රක්ෂිත

අනු අංකය	ස්මාරකය පිහිටි ස්ථානය	භූමි ප්‍රමාණය
1	පේදුරු කොටුව	අක්.372 රූ.1 පර්.3.6
2	රන්කිරි උල්පත	අක්.5 රූඩ් 2 පර්.2
3	පන්සල් වත්ත නොහොත් ශ්‍රී රජමහා විහාරය	අක්.6 රූඩ් 3 පර්.1
4	පුලිණ්ඩිකුලම පුරාවිද්‍යා ස්ථානය	අක්.5 රූඩ් 0 පර්.17
5	අරසඩි පුරාවිද්‍යා ස්ථානය	අක්.0 රූ.0 පර්.29.67
6	ගල්මැටියාව පුරාවිද්‍යා ස්ථානය	අක්.4 රූ.3 පර්.36
7	සේරුවිල දාගැබ	අක්.84 රූ.0 පර්.29
8	තිරියාය වටදාගේ	අක්.25 රූ.1 පර්.1
9	වෙල්ගම් වෙහෙර පුරාවිද්‍යා ස්ථානය (නාටානාර් කෝවිල්)	අක්.9 රූ.1.25
10	කුරුන්දන් මලෙයි කාඩු පුරාවිද්‍යා ස්ථානය	අක්.78 රූ.2 පර්.13
11	අලුත් කුඹුර	හෙක්. 0.456
12	රිදීකන්ද පුරාවිද්‍යා ස්ථානය	හෙ.186.4811
13	විල්ගම් වෙහෙර සෝමාවතී වෙහෙර	අක්.49 රූඩ් .3 පර්.21

[ගරු විදුර වික්‍රමනායක මහතා]

- මායිම් කණු යොදා භූමිය වෙන් කරන ලද ස්ථාන සංඛ්‍යාව 31යි.

යාපනය දිස්ත්‍රික්කය

උරුදන්කෝට්ටෙ	-	රූඩ් 01 පර්.05
දඹකොළ පටුන	-	රූඩ් 01 පර්.05
කඳුරුගොඩ	-	අක්.03 පර්.33.
ඩෙල්ෆ්ට් විහාර නටබුන්	-	අක්.01 රූඩ් 02 පර්.21.7

මුලතිව් දිස්ත්‍රික්කය

කුරුන්දි විහාර පරිශ්‍රය	-	අක්.78
නයාරු පුරාවිද්‍යා ස්ථානය	-	හෙක්.26.6

- උතුරු පළාතේ වෙන් කරන ලද පුරාවිද්‍යා භූමි ප්‍රමාණය (දළ වශයෙන්) - අක්කර 175යි.

2. නැත.

3. නැත.

4. ගරු කථානායකතුමනි, අපේ අමාත්‍යාංශයේ විෂය පථයට නොවෙයි මේ කාරණය අයත් වන්නේ. ඒ නිසා අදාළ අමාත්‍යතුමිය වෙත මේ ප්‍රශ්නය යොමු කරලා උත්තර ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට අමාත්‍යාංශ නිවේදනය, ගරු අනුප පස්කුවල් රාජ්‍ය ඇමතිතුමා.

ආබාධ සහිත දරුවන් සඳහා අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව: සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

ஊனமுற்ற பிள்ளைகளுக்கான கல்வி மற்றும் தொழிற்பயிற்சி: சமூக வலுவூட்டுகை இராஜாங்க அமைச்சரினது கூற்று

EDUCATION AND VOCATIONAL TRAINING FOR CHILDREN WITH DISABILITIES: STATEMENT BY STATE MINISTER OF SOCIAL EMPOWERMENT

ගරු අනුප පස්කුවල් මහතා (සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுப பஸ்குவல் - சமூக வலுவூட்டுகை இராஜாங்க அமைச்சர்)
(The Hon. Anupa Pasqual - State Minister of Social Empowerment)

ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා විසින් 2024.06.18 වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙන්න මම බලාපොරොත්තු වෙනවා.

01. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පිළිතුරු ලබා දී ඇත.

02. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පිළිතුරු ලබා දී ඇත.

03. ආබාධ සහිත වයස අවුරුදු 16-35 අතර තරුණ ප්‍රජාවට වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් මේ වන විට දිවයින පුරා වෘත්තීය පුහුණු ආයතන 11ක් ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ. පසුගිය වසර 05 තුළ වෘත්තීය පුහුණුව නිම කළ අභ්‍යාසලාභීන් සංඛ්‍යාව 1,087කි.

ආබාධිත ප්‍රජාව වෙනුවෙන් වෘත්තීය පුහුණුව සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් "වෘත්තීය පුහුණු ආයතනයන්හි අභ්‍යාසලාභීන් සංවර්ධනය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය" නමින් 2023 වසරේ සම්පාදනය කර එළි දක්වා ඇත.

බැංකු ණය සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් යොමු කර ඇති පිළිතුර මෙසේයි.

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහාය සහිතව දේශීය අරමුදල් භාවිතයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා විශේෂ ණය යෝජනා ක්‍රම දෙකක් යෝජනා කර ඇත.

ඒ යටතේ නව ව්‍යාපාර ආරම්භ කරන ව්‍යවසායකයන් සඳහා අවධානය යොමු කර ඇත. වෘත්තීය පුහුණුවක් ලබා ගත් ආබාධිත අයටද මෙම සුළු හා මධ්‍ය පරිමාණ විශේෂ ණය යෝජනා ක්‍රමය මඟින් ණය ලබා ගත හැක. ආබාධිත වීම මෙම ණය ලබා ගැනීම සඳහා බාධාවක් නොවේ. අදාළ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වන බැංකුවලින් එවැනි අයට අවස්ථාවක් ලබා නොදෙන්නේ නම් හා බාධාවක් ඇති වෙන්නේ නම් ඒ ඒ අවස්ථාව අනුව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට ඊට මැදිහත් වී කටයුතු කළ හැකිය. එමෙන්ම බැංකු මඟින් එවැනි බාධා පමුණුවන්නේ නම් අප අමාත්‍යාංශයටද ඒ සඳහා මැදිහත් විය හැක.

04. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් යොමු කර ඇති පිළිතුර පහත පරිදි වේ.

අස්වැසුම ප්‍රතිලාභ හිමි පවුල්වල සිටින ආබාධ සහිත පුද්ගලයන්ට සහ වකුගඩු රෝගීන්ට දීමනා ලබා දීමේදී එය අස්වැසුම ප්‍රතිලාභයටම අන්තර්ග්‍රහණය කිරීමක් සිදු කරන බවට පළ කරන වාර්තා අසත්‍ය වේ. එසේ ආබාධිත ප්‍රජාව වෙනුවෙන් වෙන් කරන මුදල් අස්වැසුමට අන්තර්ග්‍රහණය කිරීමක් සිදු කරන බව ඉතා පැහැදිලියි. අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ලබන අඩු ආදායම්ලාභී ජන කණ්ඩායම්වලට අයත් පවුල්වල සිටින ආබාධිත සහිත තැනැත්තන්ට සහ වකුගඩු රෝගී පුද්ගලයන්ට මෙම දීමනා හිමි වේ. එම දීමනා ඒ පවුලේ සිටින ආබාධ සහිත පුද්ගලයන්ගේ සහ වකුගඩු රෝගී පුද්ගලයන්ගේ ගිණුමට බැර කිරීම අස්වැසුම වැඩසටහනේ IWMS පරිගණක පද්ධතිය මඟින් සිදු කෙරේ. එම පවුලේ අස්වැසුම ප්‍රතිලාභය වෙනම ගෙවන අතර එයට මෙම දීමනා අන්තර්ග්‍රහණයවීමක් සිදු වන්නේ නැත. අස්වැසුම ලබන පවුලක ආබාධ සහිත පුද්ගලයෙකු හා වකුගඩු රෝගී පුද්ගලයෙකු සිටී නම් එම දීමනා තුනම වෙන් වෙන් වශයෙන් හිමි වේ.

එමෙන්ම පුද්ගලයන්ගේ දීමනා යෝජනා ක්‍රමය පාර්ලිමේන්තුවේ අනුමත වූ පසු ආබාධ සහිත සහ වකුගඩු රෝගී පුද්ගලයන්ගේ දීමනා අස්වැසුම IWMS පරිගණක පද්ධතිය හරහා එම ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට බැර කෙරේ. මෙම ගෙවීම් ක්‍රමය 2024 වසරේ ජූනි මස පාර්ලිමේන්තුවේ අනුමත වී එම කටයුතු සිදු කරන බැවින් ජූලි මාසයේ සිට ඉහත ක්‍රමවේදය මඟින් ගෙවීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. එතෙක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් මෙම දීමනා ගෙවීමට

කටයුතු සලසා ඇත. ඒ අනුව, මේ වනවිට 2024 ජනවාරි මාසයේ සිට ජූනි මාසය දක්වා ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිකුත් කර ඇත. එබැවින් වැඩි කර ඇති දීමනා සමඟ 2024 අප්‍රේල් මාසයේ සිට එම දීමනා ප්‍රතිලාභීන්ට ගෙවන බවත්, එබැවින් වකුගඩු රෝගී දීමනා සහ ආබාධිත දීමනාවල කිසිදු අඩුවක් සිදු නොවන බවත්, එම දීමනා රුපියල් 7,500ක් වන බැවින් දැනටමත් ගෙවනු ලබන බවත් දන්වනු කැමැත්තෙමි.

05. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් යොමු කර ඇති පිළිතුර පහත පරිදි වේ.

ආබාධ සහිත පුද්ගලයන්ට රජයේ රැකියා අවස්ථා ලබා දීම සඳහා -විශේෂයෙන් සියයට තුන සම්බන්ධයෙන් තමයි ප්‍රශ්නය නඟලා තිබෙන්නේ- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 27/88 සහ 01/99 නිකුත් කර ඇත. විවෘත තරග විභාග මඟින් සමත් වී පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී පුරප්පාඩුවලින් සියයට තුනක් ආබාධිත පුද්ගලයන්ගෙන් සම්පූර්ණ කර ගැනීම සඳහා අදාළ සේවාවන්හි බඳවා ගැනීමේ පටිපාටි අනුගමනය කරමින් බඳවා ගැනීම් සිදු කරයි.

නමුත් ගරු කථානායකතුමනි, ආබාධිත ප්‍රජාවට මෙම ක්‍රියාවලිය තුළ අසාධාරණයක් සිදු වෙනවා කියලා අපි පිළිගන්නවා. මොකද, එකම ප්‍රශ්න පත්‍රයට ආබාධිත කෙනෙක් මුහුණ දීමේදීත්, සාමාන්‍ය පුද්ගලයෙකු මුහුණ දීමේදීත් එකම ආකාරයට මුහුණ දුන්නොත් ආබාධිත පුද්ගලයාට අසාධාරණයක් සිදු වෙනවා. ඒක නිසාම ඒක වෙනස් කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුවටත්, අදාළ අමාත්‍යාංශවලටත් අපි යෝජනා ඉදිරිපත් කරනවා.

06. ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත ඇත්ත වශයෙන්ම සකස් කරන්න පටන් ගත්තේ 2007 සිටයි. නමුත්, 2007 ඉඳලා විවිධ හේතු නිසා මෙම පනත් කෙටුම්පතේ වැඩ කටයුතු අවසන් කර ගන්න බැරි වුණා. නමුත්, මම අමාත්‍යාංශයේ රාජ්‍ය ඇමතිවරයා විධියට වැඩ කටයුතු ආරම්භ කළාට පස්සේ, අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මැතිතුමා සහ ජනාධිපතිතුමා මේ සඳහා විශේෂයෙන්ම මැදිහත් වුණා. ඒ වාගේම මේ වනවිට ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපති ඩලස් අලහප්පෙරුම මැතිතුමා සහ මධුර විතානගේ මන්ත්‍රීතුමා ඇතුළු විවිධ පිරිස් මේ සඳහා සහයෝගය ලබා දෙනවා. ඒ නිසා, ආබාධිත අය සඳහා වන වැඩසටහන් ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. ඒ සියලුදෙනා ලබා දෙන සහයෝගය මේ වෙලාවේදී මම ස්තුති පූර්වකව මතක් කරනවා. ඒ අනුව පනත් කෙටුම්පත සකස් කිරීම අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබනවා. එය, ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයට තව සතියක්, දෙකක් ඇතුළතදී ඉදිරිපත් කරන්න එකඟ වුණා.

- සංඥා භාෂා පනත් කෙටුම්පත පිළිබඳ අනුකූලතා සහතිකය ලබා ගැනීම සඳහා 2024.02.12වන දින නීති කෙටුම්පත් සම්පාදක විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරලා තිබෙනවා.

07. ඔව්.

- අංක 1467/15 දරන ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ ප්‍රවේශ පහසුකම් නියෝග ගැසට් නිවේදනය 2006 ඔක්තෝබර් 17වන දින නිකුත් කර ඇත.
- කෙසේ වුවද, වර්තමාන තත්ත්වයද සැලකිල්ලට ගනිමින් තවදුරටත් සංශෝධන කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර, මේ වනවිට අදාළ කමිටුව මඟින් සංශෝධන සිදු කරමින් පවතී.

ප්‍රවේශ පහසුකම් සහිතව සියයට 90ක් වාගේ බොහෝ ගොඩනැඟිලි ඒ විධියටම ක්‍රියාත්මක වෙනවා. එහි තිබෙන යම් යම් අඩු පාඩු සකස් කිරීම සඳහා තමයි අලුතින් අපි කමිටුවක් පත් කළේ. ඒකෙන් නැවතත් සංශෝධන සිදු කෙරෙනවා. පැරණි ගොඩනැඟිලි පිළිබඳව තමයි අපට ප්‍රශ්නය තිබෙන්නේ.

08. අඩුවක් පවතින බව වාර්තා වී නොමැත.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින්, ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් සුදුසු රක්ෂණාවරණයක් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ අනුව රාජ්‍ය හා පෞද්ගලික රක්ෂණ සමාගම් වෙත යෝජනාවලියක් ඉදිරිපත් කර එම යෝජනාවලිය සඳහා එකඟතාව සහ අදහස් විමසා ලිපි යොමු කර ඇත. ඒ සම්බන්ධයෙන් රක්ෂණ සමාගම් සමඟ සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් ජූලි මස පළමු සතියේදීත් රක්ෂණ ආයතන සමඟ තවත් සාකච්ඡාවක් පැවැත්වීමට සූදානම් කර තිබෙනවා. ඒ සාකච්ඡාව බොහෝ දුරට අපට සාර්ථක කර ගන්න පුළුවන්.

09. සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ සංඥා භාෂා පරිවර්තකවරු හයදෙනෙකු සේවය කරන අතර, ඔවුන් හයදෙනා විසින් රාජ්‍ය මට්ටමින් දිවයින පුරා විසිරී සිටින ශ්‍රවණාබාධිත ප්‍රජාවගේ සන්නිවේදන අවශ්‍යතා ඉටු කරනු ලබයි.

මහ ජනතාව සඳහා තොරතුරු ලබා දෙන එක් මාධ්‍යයක් වන ප්‍රවෘත්ති විකාශනයන් මඟින් ජාතික රූපවාහිනී නාළිකාවේ දහවල් 12.00 සහ රාත්‍රී 8.00 ප්‍රවෘත්ති විකාශනය සඳහා අප දෙපාර්තමේන්තුවේ සංඥා භාෂා පරිවර්තකවරු පරිවර්තක සේවය ලබා දෙන අතර, "සිරස" නාළිකාවේද රාත්‍රී 7.00 ප්‍රවෘත්ති විකාශනය සඳහා ද පරිවර්තක සේවය ලබා දෙනු ලබයි. මෙමඟින් ශ්‍රවණාබාධිත පුද්ගලයින් සඳහා තොරතුරු සන්නිවේදනය කරනු ලබයි.

ඒ අනුව, ශ්‍රවණාබාධිත ප්‍රජාවගේ අවශ්‍යතා කළමනාකරණය වෙනුවෙන් සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ඉදිරියටත් කටයුතු කරනු ලැබේ. එමෙන්ම හදිසි තත්ත්වයකදී ආබාධ සහිත තැනැත්තන්ගේ අවශ්‍යතා කළමනාකරණය සඳහා විශේෂ වැඩ පිළිවෙළක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව සකස් කළ හැකි බව ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් දැනුම් දී ඇත.

ප්‍රවෘත්ති විකාශනයේදී ආපදා තත්ත්වයක් ප්‍රකාශ කිරීමේදීත් සංඥා භාෂා ක්‍රමය ඔස්සේ එය ප්‍රකාශ කරන්න පුළුවන්ද කියලා ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධව ජනමාධ්‍ය අමාත්‍යාංශයත් එකඟතාව පළ කරලා තිබෙනවා. අපේ අමාත්‍යාංශයෙන් සංඥා භාෂා පරිවර්තකවරු ඒ සඳහා ලබා දෙන්න පුළුවන්. ඒ අනුව එම කටයුත්තත් ඉදිරියේදී කරනවා.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

වරප්‍රසාද: අංක SC FR 35/2024 දරන නඩුව සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කරන ලද අතුරු තහනම් නියෝගය

சிறப்புரிமை: SC FR 35/2024 மீதான உயர் நீதிமன்றத்தின் இடைக்காலத் தடை உத்தரவு

PRIVILEGE: INTERIM ORDER ISSUED BY SUPREME COURT ON SC FR 35/2024

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, වරප්‍රසාද උල්ලංඝනය වීම සම්බන්ධයෙන් ඔබතුමා ඇතුළු මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු සියලුදෙනාම වෙනුවෙනුයි මම මේ ප්‍රශ්නය අහන්නේ.

ගරු කථානායකතුමනි, ලංකාවේ ව්‍යවස්ථාදායකයේ, විධායකයේ සහ අධිකරණයේ බලතල අකර්මණ්‍ය කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දී ඇති නියෝගයක් හේතුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය වීමට අදාළ කාරණයයි. ගරු ජනාධිපතිතුමන් විසින් අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු බන්දුල කරුණාරත්න මහතා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයෙක් ලෙස පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වැනි පරිච්ඡේදය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ ඉල්ලා සිටියද, එම නිර්දේශය ලබා නොදීම හේතුවෙන් එම විනිසුරුතුමාගේ මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බවට ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SC FR 35/2024 යන නඩුව පවරමින් සහන අයැද සිටින ලදී. එම නඩුව තහවුරු කිරීමෙන් පසුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අතුරු නියෝගයක් නිකුත් කර ඇති අතර මෙම අතුරු නියෝගය අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුවරයා හැර අනෙකුත් විනිසුරුවරුන් විශ්‍රාම යෑම හෝ ධුරය හිස්වීම මත ඇති වන කිසිදු පුරප්පාඩුවක් සඳහා විනිසුරුවරුන් පත් කිරීම තහනම් කරමින් ජනරජයේ ජනාධිපතිවරයාට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නියෝග කර ඇති බව ප්‍රසිද්ධ මාධ්‍යයේ ප්‍රචාරය කරන ලදී.

එම නියෝගය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සමඟ ගැටෙන අතර බලතල බෙදීම් න්‍යාය මත සකසා ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලතල අනුව ව්‍යවස්ථාදායකයේ සහ විධායකයේ බලතලවලට අභියෝග කිරීමක් සිදු කොට ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පහත සඳහන් නියෝජිතයන්ගෙන් සමන්විතය.

ව්‍යවස්ථාදායකය - ගරු කථානායකතුමා, ගරු මන්ත්‍රීවරුන්
විධායකය - ගරු අගමැතිතුමා
ගරු කැබිනට් අමාත්‍යවරයා

මහජනතාව - සිවිල් සමාජය නියෝජනය කරන සාමාජිකයන් තිදෙනා

ඉහත නියෝජනය අනුව, ශ්‍රී ලංකා ජනරජයේ විධායකයේ ප්‍රධානියා සහ පළමු පුරවැසියා වන අතිගරු ජනාධිපතිතුමා, රටේ දෙවන පුරවැසියා වන ගරු අග්‍රාමාත්‍යතුමා, රටේ තෙවන පුරවැසියා වන ගරු කථානායකතුමා, රටේ හතරවන පුරවැසියා වන ගරු අගවිනිසුරුතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඉටු කළ යුතු වගකීම් ඉටු කිරීමෙන් වළක්වා ඇත.

ව්‍යවස්ථාදායක සභාවේ ස්වාධීනත්වයට බලපාන හෝ අභියෝග කරනු ලබන නියෝග නිකුත් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට පවා බලයක් නොමැති බව පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමන්ලා මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණය ද දිගින් දිගටම තීන්දු ගණනාවක් ලබා දී ඇත. මෙම ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය මඟින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුතුමන්ගේ බලය ද අභියෝගයට ලක් කර ඇත. රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සම්බන්ධව සහ නඩු ප්‍රමාදවීම් වළක්වා ගැනීම සම්බන්ධව ප්‍රධාන වගකීම් දැරූ ගරු අගවිනිසුරුතුමාට අධිකරණයට අවශ්‍ය විනිසුරුවරුන් ප්‍රමාණය නොමැතිකම නිසා සිය කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම වළක්වාලීම සඳහා එම නියෝගය බලපා ඇත. මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇබෑර්තු දෙකක් පැවතීම නිසා ශ්‍රේෂ්ඨාධිකරණය තුළ ගොඩගැසී ඇති 5,432**ක්** පමණ වූ නඩු සංඛ්‍යාවක් විසඳීම දිනෙන් දිනම ප්‍රමාද වෙමින් පැවතීමට මෙම නියෝගය බලපා ඇත. ඉදිරියේදී තවත් ඇබෑර්තු ඇතිවීමට නියමිතව පවතින අතර මෙම නියෝගයේ ක්‍රියාකාරිත්වය නිසා එක් අතකින් ගරු අධිකරණය ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයට පාර්ලිමේන්තුවෙන් පවරා ඇති අධිකරණ බලතල ක්‍රියාත්මක කරමින් යුක්තිය ඉටු කිරීමේ ක්‍රියාවලිය ඉටු කිරීමට නොහැකි වී ඇති අතර ප්‍රමාදයකින් තොරව යුක්තිය ඉටු කර ගැනීම සඳහා අධිකරණයට එන ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදු වී ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වැනි ව්‍යවස්ථාව අනුව ජනතා පරමාධිපත්‍යය හිමි වී ඇත්තේ ජනතාවට වන අතර හතරවැනි ව්‍යවස්ථාවට අනුව එම බලතල ක්‍රියාත්මක කළ යුත්තේද ජනතාවගේ ස්වාධිපත්‍යය බලය ආරක්ෂා වන ලෙසය.

ඉහත සඳහන් නියෝගයේ ප්‍රතිඵලය නම් ශ්‍රේෂ්ඨාධිකරණයට විනිසුරුවරුන් පත් කිරීම සඳහා වූ ජනාධිපතිගේ හා ව්‍යවස්ථාදායකයේ බලය එනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක vii (අ) වන පරිච්ඡේදය අත්හිටුවීමයි. මේක ඉතා බරපතළ කාරණයක්, ගරු කථානායකතුමනි. එවැනි බලයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කිසිවෙකුට හෝ ලබා දී නැත.

විශේෂයෙන් අපේ සභානායකතුමාත් දන්නවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක් අවලංගු කරන්න, ක්‍රියා කිරීම නතර කරන්න කාටවත් අයිතියක් නැහැ කියලා. ඒකට ශ්‍රේෂ්ඨාධිකරණයටවත්, කිසිම අධිකරණයකටවත් අයිතියක් නැහැ, ගරු කථානායකතුමනි. මේක බරපතළ කාරණයක්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අසූදෙවැනි ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනය කිරීමට පවා ඉතා අනම්‍ය ක්‍රමයක් හඳුන්වා දී තිබියදී ඉහත කී නියෝගය මඟින් ජනතාවගේ පරමාධිපත්‍ය බලය යම් ප්‍රමාණයකට හෝ උල්ලංඝනය කර ඇති බැවින් එය ජනතාවගේ හා මහජන නියෝජිතයන් වන පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද පමණක් නොව අයිතිවාසිකම් ද උල්ලංඝනය වීමක් බව මම සඳහන් කරමි.

මේ වන විට අභියාචනාධිකරණයේ ද විසඳීම සඳහා නඩුකර 4,141**ක්** පවතින අතර මේ වන විට ඇබෑර්තු 5ක් පවතී. මේක විශාල අර්බුදයක්. මේක නිසා දිගින් දිගටම මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයට කවුරුවත් පත් කරන්නත් බැහැ. ගරු කථානායකතුමනි, අවසානයේ ඉතුරු වෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරයා විතරයි; CJ විතරයි අවසානයේ ඉතුරු වෙන්නේ. මෙවැනි තීන්දු තුළ තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ.

එම හේතුව නිසා දිගින් දිගටම නඩු ප්‍රමාදවීම් මෙන්ම දීර්ඝ කාලයක් තිස්සේ අධිකරණයේ සේවයේ නිරත වන මහාධිකරණ විනිසුරුට දැඩි අගතියක් සිදු වී තිබෙන අතර සමහර විනිසුරුවරුන්ට අභියාචනාධිකරණයට උසස්වීම් ලැබීමට සියලු සුදුසුකම් තිබියදී උසස්වීම් නොලබා විශ්‍රාම ගැනීමට සිදුව ඇත.

ගරු කථානායකතුමනි, අභියාචනාධිකරණයේ තනතුරු 5ක පුරප්පාඩු තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ තනතුරු 2ක පුරප්පාඩු තිබෙනවා. මේ රටේ ඉන්න මහාධිකරණ විනිශ්චයකාරවරු උසස්වීම් ගන්න බලාගෙන ඉන්නවා. සමහර වෙලාවට ඒ අයගේ වයසත් පනිනවා. ඒ අයට ඉහළට යන්න දෙන්නේ නැහැ. ඊළඟට, ශ්‍රේෂ්ඨාධිකරණයට උසස්වීම් ලබා යන්න දෙන්නේ නැහැ. මේක මුළු අධිකරණ ක්ෂේත්‍රයේම විශාල අවුලක් බවට පත් වෙලා තිබෙන්නේ.

ගරු බන්දුල කරුණාරත්න විනිසුරුතුමන්ට අසාධාරණයක් වූයේය යන කරුණ මත එතුමාට සහන ලබා ගැනීම සඳහා කිසිවෙකුගේ විරෝධයක් නොමැති නමුත්, එම කරුණට මුවා වී ශ්‍රේෂ්ඨාධිකරණයේ කටයුතු අකර්මණ්‍ය කිරීමට හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉහත කී පරිච්ඡේදය අත්හිටුවීම සඳහා නියෝග නිකුත් කිරීමේ බලයක් පවතින බවට අපට කිසිසේත් පිළිගත නොහැක.

ඉහත සඳහන් කරුණු සලකා බලා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කර දෙන්න කියලා, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, මේ සම්බන්ධව අපි කථා කරන්න අවශ්‍යයි.

මට තව විනාඩි කිහිපයක් දෙන්න, ගරු කථානායකතුමනි. කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ විනිශ්චයකාරතුමාට, ඒ වාගේම කොළඹ දිසා අධිකරණයේ අංක 1හි විනිශ්චයකාරතුමාට, කොළඹ සිවිල් අභියාචන මහාධිකරණයේ විනිශ්චයකාරතුමාට, ඇපැල් උසාවියේ සභාපතිතුමාට, -මේ සියලු අයට- හැම විටම දේශපාලන වශයෙන් විශාල බලපෑම් එල්ල වනවා. හේතුව, මේ රටේ තිබෙන විවිධ දේශපාලන පක්ෂවලින් යම් යම් ප්‍රශ්න ආවාම, ඒවාට මුහුණ දීලා විසඳන්න වෙන්නේ මේ අයටයි. ඇත්ත වශයෙන්ම ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මොකක් හෝ වැඩ පිළිවෙළක් හදන්න. මේ අවස්ථාවේ අපේ විජයදාස රාජපක්ෂ ඇමතිතුමා ගරු සභාවේ ඉන්න නිසා මම මේක කියන්නේ.

ගරු කථානායකතුමනි, කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද මත්ද්‍රව්‍ය නඩු සම්බන්ධයෙන් වූ ලේඛනයක් මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

මේ සම්බන්ධ ලිපි ගණනාවක් මා ළඟ තිබෙනවා. මේ, කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ සිද්ධ වෙමින් තිබෙන කාරණය, ගරු ඇමතිතුමා. ගංජා මිලිග්‍රෑම් 780ක් ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් වූ වරදකට 2024.04.22 දින රුපියල් 1,000ක් දඩ නියම කරනවා. එම දඩය නොගෙවා හරිනවා. භවස් වෙනකොට එයාව මුදා හරින්න නියෝග කර තිබෙනවා. මේ වාගේ සිද්ධි 14ක් සම්බන්ධ විස්තර මා ළඟ තිබෙනවා, ගරු කථානායකතුමනි. මේක ඉතාම බරපතළ කාරණයක්.

හෙරොයින් සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් වූ වරදකට නඩු අංක 30771/24 යටතේ, "2024.04.22 වන දින රුපියල් 1,000ක් බැගින් දඩ නියම කරයි. නොගෙවෙයි නම් එදිනම පැය 14.00 තෙක් රඳවා තබාගෙන පසුව මුදා හරින ලෙසට නියෝග කර ඇත" යනුවෙන් මේ ලේඛනයේ සඳහන් වී තිබෙනවා. ගංජා සම්බන්ධ නඩු සඳහා උදේට රුපියල් 1,000ක් දඩ ගහලා තියාගෙන ඉන්නවා. දඩ ගෙවන්න බැරි නිසා එයාව නිදහස් කරනවා. හෙරොයින් සම්බන්ධ නඩුවලටත් රුපියල් 1,000ක් දඩ ගහනවා. මුදල් ගෙවන්න බැරි නිසා භවසට මුදා හරින්න නියෝග කරනවා. මෙහෙම බලයක් දුන්නේ කවුද? මේ වාගේ තත්ත්වයක් තමයි අද රට පුරාම ඇති වෙලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මේ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු මේ රටේ විනිශ්චයකාරවරුන්ට අපේ විශාල ගෞරවයක් තිබෙනවා. අපි ඔවුන්ට හිස නමා ආචාර කරන්නේ ඔවුන්ගේ ගෞරවය ආරක්ෂා වෙලා තිබෙන නිසා. නීතිඥයෝ විධියට අපේ පුදුම ගරුත්වයක් තිබෙන්නේ. අපි ගිහිල්ලා හැම වෙලාවකම - අපිත් හඳුනන නීතිඥවරු හැටියට හිටපු අය විනිශ්චයකාරවරු විධියට ඉන්නවා - ඒ අයට "සර්" කියලා කථා කරන්නේ. ඇයි ඒ? අපේ batchmatesලා ඉන්නවා. නමුත්, අපි එහෙම නිකම් කථා කරන්නේ නැහැ. හේතුව, අපි ඔවුන්ට විශාල ගරුත්වයක් දක්වන නිසා.

මම දන්නවා, සමහර ගරු විනිශ්චයකාරතුමන්ලා partiesවලට ආවාම අඩුම තරමේ ඒ අය දේශපාලනඥයෝ ළඟට එන්නෙත් නැහැ, කථා කරන්නෙත් නැහැ, drink එකක්වත් ගන්නේ නැහැ. එන්න කියපු නිසා ඇවිල්ලා ඉඳගෙන ඉඳලා යනවා. ඒ තරම් ගෞරවයක් තිබෙන අය මේ රටේ ඉන්නවා. අපි ඒකත් අනිවාර්යයෙන්ම කියන්න ඕනෑ.

ඒ වාගේම මතක තබා ගන්න ඕනෑ තව කාරණයක් තිබෙනවා. සමහර විනිශ්චයකාරවරු ඒ අදාළ පුද්ගලයා තමන්ගේ ගමේ - බලපිටියේ - නම්, ඇමති බලපිටියේ නම්, නීතිඥයා බලපිටියේ නම්, බලපිටියේ එක්කෙනාට අවශ්‍ය කරන තීන්දුව දෙනවා. මේක තමයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. එතකොට වෙලා තිබෙන්නේ මොකක්ද? තමන් උත්පත්තිය ලබපු ජාතකය අනුව තමයි අවසානයේ තීන්දුව ලැබිලා තිබෙන්නේ. මේ වාගේ සිද්ධි අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. මේක මම කියන කාරණයක් නොවෙයි.

ගරු කථානායකතුමනි, දැන් මාස අටහමාරක් තිස්සේ මට දේශපාලනයක් කරන්න පක්ෂයක් නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මාස 3කට කලින් අපි ඉල්ලුවා, අපේ නඩුව කථා කරන්න අපට වෙලාවක් දෙන්න කියලා. මාස තුනහමාරක් වෙනවා, මගේ නඩුව කථා කරන්න ඉඩ දෙන්නේ නැහැ. කවුද මේකට වග කියන්නේ? මම ඡන්ද 114,000ක් අරගෙන පාර්ලිමේන්තුවට ආපු කෙනෙක්. අද මට අත්වෙලා තිබෙන ඉරණම මොකක්ද? අධිකරණයට තමයි අපට යන්න තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. ඔබතුමා දන්නවා, මේ රටේ දේශපාලනඥයෙක් ගොඩනඟනවා කියන්නේ බොහොම අමාරු කටයුත්තක් බව. 225දෙනාටම බණින එක නොවෙයි, මම කියන්නේ.

මේ 225දෙනා අතර ඔය කියන විධියේ අයත් ඉන්නවා. ඒ මිනිස්සු හින්දා අපි 225දෙනාම බැණුම් අහනවා, ගරු සභානායකතුමනි. කිහිප දෙනෙකු කරන වැඩ නිසායි එහෙම වෙන්නේ. නමුත්, මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා අවුරුදු ගණනාවක් තිස්සේ අමාරුවෙන් ගොඩ නැගුණු දේශපාලන චරිත. ඒ මිනිස්සු සත පහක්වත් හොරකම් කරන්නේ නැතිව දේශපාලනය කරන අය. අම්මාගේ, තාත්තාගේ පවුල් බලය හින්දා නොවෙයි ඒ අය දේශපාලනයට ඇවිල්ලා තිබෙන්නේ. ඒ අය මෙතැනට එන්න විශාල කැප කිරීමක් කරලා තිබෙනවා. එහෙම ගොඩ නැඟුණු දේශපාලන ජීවිත, දේශපාලන චරිත මේ රටේ අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. දුන්න සමහර අධිකරණ තීන්දු නිසා වෙච්ච දේවල් බලන්න. මම උදාහරණයක් කියන්නම්. 1992 දී දුන්නු තීන්දුවක් නිසා එක්සත් ජාතික පක්ෂය දෙකට කැඩුණා. ඒ බව ඔබතුමා දන්නවා. ලලිත් ඇතුලත්මුදලි, ගාමිණී දිසානායක මැතිතුමන්ලාව පක්ෂයෙන් නෙරපුවා. ඔවුන් ගිහිල්ලා හැදුවා "රාජාලියා" ලකුණින් වෙනම පක්ෂයක්. ඒ පක්ෂය හදලා ඔවුන් දේශපාලනය කළා. අවසානයේ මොකද වුණේ? පළමුවෙන්ම අපේ ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාව ඝාතනය කළා. ඊට සති දෙකකට පසුව ආර්. ප්‍රේමදාස මැතිතුමාව ඝාතනය කළා. ඊට ටික

[ගරු දයාසිරි ජයසේකර මහතා]

දවසකට පසුව ගාමිණී දිසානායක මැතිතුමා, වින්සන්ට් පෙරේරා මැතිතුමා සහ පක්ෂයට දැවැන්ත ශක්තියක් වුණු අපේ මාවතගම ජී.එම්. ප්‍රේමචන්ද්‍ර මැතිතුමාවත් ඝාතනය කළා. ඒ විතරක් නොවෙයි, ඔසී අබේගුණසේකර වාගේ දක්ෂ කථිකයෝ ඝාතනය කළා. එසේ බොහෝදෙනෙක් ඝාතනය කළා. මේ නැති වෙන්නේ දැවැන්ත දේශපාලන පක්ෂ. ගරු කථානායකතුමනි, උසාවියකින් දුන්නු එක තීන්දුවක ප්‍රතිඵලයක් නිසා තමයි රටේ තිබුණු දැවැන්තම දේශපාලන පක්ෂය අද බිමට සමතලා වෙලා තිබෙන්නේ. දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් අත් වෙලා තිබෙන්නේ ඒ ඉරණම. අද වන කොට තහනම් නියෝග 14ක්, ගරු කථානායකතුමනි. හැබැයි, ඒ ඔක්කෝම තහනම් නියෝග ගන්න යන්නේ එකම නීතිඥයෙක්. මේ නඩුවටත් යන්නේ එකම නීතිඥයෙක්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මොකක්ද නම්? *[බාධා කිරීම්]* නම මොකක්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නම දන්නවා. ජනාධිපති නීතිඥයෙක්. *[බාධා කිරීම්]* මට නම කියන්න බැහැ. මම එතුමා ගැන කථා කරන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, අද සමහර තැන්වල සිද්ධ වන කාරණා දැක්කාම හිරිකිතයි. මම ඔබතුමාට උදාහරණයක් කියන්නම්. මේ ළඟදි National Law Conference එක තිබුණා. කලින් අපේ නීතිඥ සංගමයේ සභාපති ලෙස හිටියේ සාලිය පීරිස් මැතිතුමා. එතුමා සිටියදී ඒ සම්මේලනය තියන්න හදන කොට එතුමා කිව්වා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගෙන්වන්න එපා, මොකද එතුමාට විරුද්ධව උසාවියේ නඩු තිබෙනවා කියලා. ඒ නිසා මොකද වුණේ? එතුමා ඒ සම්මේලනය තියන්නේ නැතුව ඉවත් වෙලා ගියා. National Law Conference එකත් නැතුව ගියා. හැබැයි, ඊට පසුව කෞෂල්‍ය නවරත්න මැතිතුමාගේ සභාපතිත්වය යටතේ National Law Conference එක පැවැත්වුණා. මොකද වුණේ? එය නුවරඑළියේ තිබුණේ. දවස් දෙකක්. ඒකට මේ රටේ නීතිඥයෝ විශාල ප්‍රමාණයක් ගියා. ඒ වාගේම අධිකරණ සේවයේ විනිශ්චයකාරවරු විශාල ප්‍රමාණයක් එතැනට ගියා. තමන්ට විරුද්ධව නඩුවක් තිබෙන හිටපු ජනාධිපතිතුමා වුණත්- එතුමාට අපේ ගරුත්වයක් තිබෙනවා. ඒක වෙනම කාරණයක්. හැබැයි, එතුමා ගිහින් එතුමාගේ නඩු අහන විනිශ්චයකාරවරුන් එක්ක එතැන හිටියා. ඒ දවස් දෙකේ මොකද වුණේ? මා ළඟ තොරතුරු තිබෙනවා. දවස ගණුනේ දවල් හා රාත්‍රියේ ගිහිල්ලා එතුමා හම්බ වෙලා කථා බහ කරන්න අවස්ථාව ලබා දීලා සම්බන්ධතාව හදනවා. මේවා නීතිඥවරු කරන වැඩ. මේ රටේ, මේ ක්‍රියාදාමය තවදුරටත් සිදු වුණොත් මොකද වෙන්නේ, ගරු කථානායකතුමනි? මම ඔබතුමාට මේ කාරණයත් කියන්නම්. ගරු සභානායකතුමනි, අද නඩුව දාන්න කලින් නීතිඥවරුන් අහන්න පුරුදු වෙලා ඉන්නවා උසාවියේ ඉන්න judge කවුද කියලා. "මේ උසාවියේ නඩුව දැම්මොත් අපට කර ගන්න පුළුවන්ද, මේ උසාවියට දැම්මොත් අපට කර ගන්න බැරිද? කවුද ඉන්න judge? කොහේද එයාගේ ගම? බලපිටියේද? නැත්නම් වෙන කොහේ හරිද? " කියලා අහනවා. මෙන්න මේ තත්ත්වයට සමහර විනිශ්චයකාරවරු පත් වෙලා තිබෙනවා. මෙය සියලු දෙනාට කරන අපහාසයක් නොවෙයි. මා බොහොම ගරු කරන විනිශ්චයකාරවරු ඉන්නවා. තුන්හතරදෙනෙක් නිසා සමස්ත අධිකරණ ක්ෂේත්‍රයට මොකද වෙන්නේ? අපි අධිකරණයට කියන්නේ, දෙයියන්ගේ අඩවිය කියලා. අධිකරණය කියන්නේ දෙවියන්ගේ අඩවිය. ඒකේ පෙරේතයන්ට පිනුම් ගහන්න බැහැ, ගරු කථානායකතුමනි. ඒක සුද්ද කරන්න කියලායි අපි අග්‍ර විනිශ්චයකාරතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලන්නේ. ඒ වෙනුවෙන් තිබෙනවා, අධිකරණ සේවා කොමිෂන් සභාව. හැබැයි, පසුගිය කාලයේ මෙවැනි ප්‍රශ්න නිසා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අයින් කරපු එක විනිශ්චයකාරවරයකුගේ හෝ නමක් මට කියන්න. එහෙම සිද්ධ වුණේ නැහැ.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් interim injunction එකක් ඉල්ලන්න කලින් අපි කරුණු ගණනාවක් බලනවා. අපි පළමුව බලනවා *prima facie* case එකක් තිබෙනවාද කියලා. ඊළඟට අපි බලනවා, balance of convenience. ඊළඟට අපි බලනවා, conduct of parties. ඒ වාගේම, එම නියෝගය ප්‍රමාදයක් නැතුව ලැබෙන්න ඕනෑ. දැන් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට තීන්දුවක් දී තිබෙනවා, අවුරුදු පහකට පස්සේ. මේ අවුරුදු පහේම එම පැමිණිලිකරුවෝ එතුමාත් එක්ක කෑම කාලා, බීලා, ඇමතිකම් අරගෙන, ඒ ඔක්කෝම කරලා තිබෙනවා. අවුරුදු පහකට පස්සේ එතුමාට දෙනවා තීන්දුවක්, "ඔයා දැන් සුදුසු නැහැ" කියලා.

ඒ තීන්දුව දෙන්නේ අවුරුදු පහකට පස්සේ. අධිකරණය කියනවා, "ඉතාම ඉක්මනින් යුක්තිය සොයාගෙන එන්න, වහාම එන්න. කාලය පහු වෙනවා නම් ඒක කරන්න අමාරුයි" කියලා. හැබැයි, අද මේක තමයි සිද්ධ වෙමින් තිබෙන්නේ. මම වැඩිය කථා කරන්නේ නැහැ. මේ ඇති කියලා මම හිතනවා. මේක ඉතාම භයානක තැනකට වැටිලා තිබෙනවා. විශේෂයෙන් මම අද ගත්තු කාරණය මේකයි, ගරු කථානායකතුමනි. ඔබතුමා නායකත්වය දෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සීමා කරන්න කාටවත් බැහැ. මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදය මේ නඩු තීන්දුව නිසා සම්පූර්ණයෙන් අකර්මණ්‍ය වෙලා තිබෙනවා. ඔබතුමාට ඔබතුමාගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරුන් පත් කරන්න දැන් බැහැ. එක එක විනිශ්චයකාරවරයා අයින් වෙලා, අයින් වෙලා යන කොට අවසානයේ අගවිනිසුරුවරයා විතරක් ඉතිරි වෙනවා. එතකොට මොකක්ද මේ රටට වෙන්නේ? මේ රටේ යුක්තිය පසිඳලීමට මොකක්ද වෙන්නේ? ඒ නිසා මම අග්‍ර විනිශ්චයකාරතුමාගෙන් ඉල්ලන්න කැමතියි, මේ පිළිබඳව නිවැරදි තීන්දුවක් ගන්න කියලා. ගරු කථානායකතුමනි, ඒ වාගේම මම ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. ඔබතුමාට තමයි මේ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ගය ගන්න තිබෙන්නේ. කරුණාකර මේ සම්බන්ධයෙන් විශේෂ කාරක සභාවක් පත් කරන්න. මම ඔබතුමාගෙන් ඒ ඉල්ලීම කරනවා. අපි මේ සම්බන්ධව තීන්දුවක් ගනිමු. ගරු කථානායකතුමනි, මේ විධියට ගියොත් මේ පාර්ලිමේන්තුවයි -ව්‍යවස්ථාදායකයයි-, විධායකයයි, අධිකරණයයි තුනම අවසන් වන තත්ත්වයට මේ රට පත් වෙනවා.

අපේ ගරු අධිකරණ ඇමතිතුමා සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමතියි, ඔබතුමන්ලා මොනවාද මේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් කරලා තිබෙන්නේ කියලා. ගරු ඇමතිතුමනි, සමහර විනිශ්චයකාරවරුන් ගැන මම කියන්නම්. එකම නඩුවේ, එක් පැත්තක පැමිණිල්ල; අනෙක් පැත්තේ විත්තිය. එකම නීතිඥයා පැමිණිල්ලටත් පෙනී සිටිනවා, විත්තියටත් පෙනී සිටිනවා. කොහොමද එහෙම කරන්නේ? ඒ දෙකම වෙනුවෙන් පෙනී ඉන්න බැහැ කියලා ඔබතුමා දන්නවා. මම ඔබතුමාගෙන් අහන්න කැමතියි, මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා අරගෙන තිබෙන පියවර සහ ගන්න හදන පියවර මොනවාද කියලා. මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්න තවදුරටත් ඉඩ තියන්න බැහැ කියා මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු කථානායකතුමනි, අධිකරණය කියන්නේ බොහොම පාරිශුද්ධ දෙවොලක්. අපි දන්නවා ප්‍රජාතන්ත්‍රවාදය රැකිලා තිබෙන්නේ කොහොමද කියලා. ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය කියන කුලුනු තුන මත පවතින රන් දෙවොලට තමයි අපි ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ. ඒකේදි අපට අනන්‍ය වූ සුවිශේෂ වගකීම් පැවරිලා තිබෙනවා. ව්‍යවස්ථාදායකය ස්වාධීනයි, ව්‍යවස්ථාදායකයේ කටයුතු සම්බන්ධව. අධිකරණයත් ස්වාධීනයි, අධිකරණ කටයුතු සම්බන්ධව. ඒ එකකට එකක් යටත් නැහැ. ඔබතුමා දන්නවා "let justice be done though the heavens fall" කියන ප්‍රසිද්ධ කියමන ගැන; දිව්‍ය ලෝකය පොළොවට කඩා වැටෙද්දී වුණත් යුක්තිය ඉෂ්ට කරන්න ඕනෑ. ඒක තමයි විනිසුරුවරුන්ට පැවරිලා තිබෙන වගකීම.

මිනිස්සු අධිකරණයට යන්නේ පන්සලට, දේවාලයට, කෝවිලට ගිහිල්ලා කරන්න තිබෙන හැම දෙයක්ම කළත්, තමන්ගේ ඔළුවේ තිබෙන ගින්දර නිවෙන්නේ නැති නිසා. ප්‍රශ්නය විසඳිලා නැති නිසා තමයි අධිකරණයට යන්නේ. යුක්තිය බලාගෙනයි යන්නේ. එම නිසා අධිකරණයට යන හැම කෙනෙකුගේම හැම නඩුවක්ම වැදගත්. රුපියල් 5,000ක වටිනාකම තිබෙන නඩුවක් වුණත්, ඒක ඒ මනුස්සයාගේ එකම වත්කම. ඒක ඒ මනුස්සයාට වැදගත්. ඒ වාගේම කෝටි ගණනක් වටිනා නඩුවක් ගෙනිච්චත් ඒ මනුස්සයාට වැදගත්. ඒ නිසා විනිසුරුවරුන්ට තිබෙන්නේ යුක්තිය ඉෂ්ට කිරීමයි.

ගරු කථානායකතුමනි, දැන් ගරු දයාසිරි ජයසේකර මැතිතුමා මතු කරපු කාරණය ගනිමු. දැන් තහනම් නියෝගයක් දීලා තිබෙනවා, ඔබතුමා ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට විරුද්ධව, රටේ ගරු ජනාධිපතිතුමාට විරුද්ධව, උසාවිය නැවත නියෝගයක් දෙනකල් ශ්‍රේෂ්ඨාධිකරණයට විනිසුරුවරුන් නම් පත් කරන්න තහනම් කියලා. මෙහෙම යන්න පුළුවන්ද? ඒ ගරු මන්ත්‍රීතුමා කිව්ව එක හරි. මෙහෙම දිගින් දිගට ගිහිල්ලා සියලු විනිසුරුවරුන් අයින් වෙලා අගවිනිසුරුවරයා විතරක් ඉතිරි වන කල් යනවා. හැබැයි, අගවිනිසුරුවරයාට තනියම නඩු අහන්න බැහැ. අඩු ගණනේ විනිසුරුවරුන් තුන් දෙනෙක් ඕනෑ. විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව දෙකට බැස්සාට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණය වහලා දමනවා. මේ කියන නියෝගය ලබා දුන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන්. ගරු කථානායකතුමනි, මෙකට හේතුව මොකක්ද? ඔබතුමාගේ සභාපතිත්වයෙන් යුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගරු බන්දුල කරුණාරත්න අභියාචනාධිකරණයේ සභාපති විනිසුරුගේ උසස්වීමට අනුමැතිය දුන්නේ නැහැ. ඒක නිසා ඔබතුමන්ලාගෙන් පළිගන්න ඕනෑ. ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ තිබෙන්නේ ව්‍යවස්ථාදායකය. ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියා ඔබතුමා. විධායකයේ ප්‍රධානියා ඉන්නවා. ඒ, ගරු ජනාධිපතිතුමා. එතුමාටත් විරුද්ධව තීන්දුව දුන්නා. මේ රටේ තුන්වැනි පුරවැසියා ගරු අග්‍රාමාත්‍යතුමා. එතුමාට විරුද්ධවත් තීන්දුව දුන්නා. හතරවැනි පුරවැසියා අගවිනිසුරුතුමා. එතුමාට විරුද්ධවත් මේ තීන්දුවේ තිබෙනවා. ඒ හතර දෙනාටම විරුද්ධව මේ තීන්දුවේ තිබෙනවා.

විධායකය සහ ව්‍යවස්ථාදායකය බැඳ තබලා තිබෙනවා, අතුරු නියෝගයකින්. එතකොට එතුමාට අසාධාරණයක් වුණා නම්, එතුමාගේ මූලික අයිතිවාසිකම්වලට සාධාරණයක් විය යුතුයි. හැබැයි, එතුමාගේ ප්‍රශ්නය දාලා මුළු රටේ සමස්ත අධිකරණ පද්ධතිය අකර්මණ්‍ය කරන්න බලයක් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නම් දීලා නැහැ, ගරු කථානායකතුමනි. මේ ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොහේවත් එහෙම දීලා නැහැ. එතකොට මේක මඟින් එතුමා කිව්වා වාගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ පටන් ගන්න, VIIඅ වන පරිච්ඡේදය සම්පූර්ණයෙන් suspend කරලා තිබෙන්නේ; අත්හිටුවලා තිබෙන්නේ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කියනවා, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධව සංශෝධනයක්වත් පාර්ලිමේන්තුවට ගේන්න බැහැ කියලා. 82 ව්‍යවස්ථාව යටතේ ඒක ගේනවා වුණත්, ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කියලා විශේෂයෙන් සඳහන් කරලා, අවශ්‍ය තුනෙන් දෙකක බලය අරගෙන, අවශ්‍ය නම් ජනමත විචාරණ කියලා තමයි ඒක කරන්න පුළුවන් කියලා තිබෙන්නේ. එතකොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එක අකුරක්, එක වගන්තියක් අත්හිටුවන්න අඩු ගණනේ පාර්ලිමේන්තුවට පනතකින් බැහැ; ඒක පාර්ලිමේන්තුවට පනතකින් කරන්න බැහැ. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණය මේ Chapter VII A එකම දැන් suspend කරලා තිබෙන්නේ; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදය අත්හිටෙව්වා, සම්පූර්ණයෙන් අකර්මණ්‍ය කළා. මේ වාගේ අවස්ථා ලෝක දේශපාලන ඉතිහාසයේ මීට පෙර එක අවස්ථාවයි මම දැකලා තිබෙන්නේ. ඒක තමයි, ඇඩොල්ෆ් හිට්ලර් ජර්මනියේ තිබුණු Weimar Constitution එකේ Civil Rights Chapter එක අත්හිටෙව්වා. එතැනින් තමයි දෙවැනි ලෝක යුද්ධය පටන් ගත්තේ. ලෝක යුද්ධයේ ආරම්භය ඇති වුණේ එතැනින්. මේක දෙවැනි වෙන්නේ ඒකට විතරයි. එතකොට මේ නියෝගය මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට තිබෙන බලයක් නොවෙයි. එතුමා කිව්වා, එක නීතිඥවරයෙක් තමයි ඔය කියපු හැම නඩුවටම ගිහිල්ලා පෙනී සිටින්නේ කියලා. *[බාධා කිරීමක්]* කවුද ඔබතුමා කියන්නේ? කියන්න. ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා නේ මේක තහවුරු කළේ. මේ කියන්නේ ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා ගැන. ගරු කථානායකතුමනි, ෆයිසර් මුස්තාපා කියන්නේ අපේ රටේ ඉන්න සුවිශේෂ වරප්‍රසාද ලත් නීතිඥවරයෙක්. ඔහු විතරයි ලෝක ඉතිහාසයට එකතු වෙලා තිබෙන්නේ ඇමතිකම් දරමින්, නැත්නම් නියෝජ්‍ය ඇමතිකම් දරමින් විධායකයේ කොටසක් විධියට අධිකරණයට ගිහිල්ලා නඩුවලට පෙනී සිටින්න බලය ලබපු ලෝකයේ එකම පුද්ගලයා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පටිට පොරක්.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
පටිට පොරක් තමයි. ඔබතුමා කිව්වා හරි.

ඒ නීතිඥ මහත්තයා තමයි මේකට පෙනී සිටියේ. මේ නීතිඥ මහත්තයා එළියට ඇවිල්ලා කියනවා, මම ඉල්ලුවෙත් නැහැ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන්ලා මෙහෙම නියෝගයක් දුන්නා කියලා. අපටත් තේරෙන්නේ නැහැ මෙතැන මොකක්ද වෙන්නේ කියලා. නීතිඥ මහත්තයා කියනවා, මම ඉල්ලුවේ නැති ඒවාත් එක්කම මට තහනම් නියෝග දුන්නා කියලා.

ගරු කථානායකතුමනි, ඉතිහාසයක් තිබෙනවා නේ. අපේ ගරු සුසිල් ප්‍රේමජයන්ත සභානායකතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සභාපති වෙලා ඉන්නකොට එතුමාගේ තනතුර තහනම් කෙරුවා, ගිහිල්ලා Chamber එක ඇතුළේ කථා කරලා. එතුමා වැඩිය නඩු කථා කරන්නේ Chamber එක ඇතුළේ. එළියේ කථා කරනවා අඩුයි; ඒත් කලාතුරකින් තමයි. මැතිවරණයකට දවස් හතරකට කලින් සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ තනතුර තහනම් කළා. එදාම ගිහිල්ලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාගේ ලේකම් ධුරය නැති කළා. ඒ තරම් බලවත්. එතකොට එතුමා

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

කිව්වා, නඩු ගණනාවක් ගැන. ඇත්ත. මෛත්‍රීපාල සිරිසේන මහත්තයාටත් එතුමා පෙනී සිටිනවා; එතුමාට විරුද්ධවත් පෙනී සිටිනවා. ඒකට නඩු ගණනාවක් තිබෙනවා. මම කිව්වේ ඒක නේ. ලංකාවේ ඒක කරන්න පුළුවන් ඔහුට විතරයි. වෙන කාටවත් ඒක කරන්න බැහැ. ඒ නිසා මෙතැන ලොකු ගැටලුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. අනික් එක, එතුමා ඉන්න නඩුවල හෙට දෙන තීන්දුව මොකක්ද කියලා අලුත් කඩේ ඉන්න ඔක්කෝම නීතිඥවරු දන්නවා. අපි ළඟ තිබෙනවා, record කර ගත්ත ඒවාත්. ඔහුගේ නඩුවල සේවාදායකයා කියනවා, අපි අහවලාට කථා කරලා එතුමා නඩුවට පෙනී හිටිනවා, හෙට මෙන්න මේ තීන්දුව එනවා කියලා. එහෙමත් තිබෙනවා. මේක අධිකරණය පිළිබඳ බරපතළ ගැටලුවක්. එක අධිකරණයකින් 'මේක හරි' කියලා තීන්දුවක් දීලා තහනමක් දුන්නාම, අනික් අධිකරණයෙන් තීන්දුවක් දෙනවා, 'මේක වැරදියි' කියලා. එතකොට මිනිස්සු පිළිගන්නේ මොකක්ද?

ඊළඟට, කොළඹ දිසා අධිකරණය ගැන ඔබතුමා කිව්වා. එක නඩුවකට තීන්දුවක් දෙනවා, 'අධිකරණ බලය නැහැ, පැමිණිල්ල ගෙනියන්න බැහැ' කියලා. එහෙම නම් විසි කරන්න එපා යැ. ඒක නේ රටේ නීතිය.

මමත් අවුරුදු 40ක් ඔය විධියට තර්ක කරලා තිබෙනවා නේ. ඔය හුහක් විනිසුරුවරුන්ට මම උගන්වලාත් තිබෙනවා. එතකොට, අධිකරණ බලය නැත්නම් ඒ නඩුව ප්‍රතික්ෂේප කරන්න ඕනෑ. කියනවා, "ෆයිසර් මුස්තාපා මහත්මයා මැදිහත් වෙච්ච නිසා, මේක හෙට සංශෝධනය කරලා ගෙනෙන්නකෝ, එතකොට මම බලන්නම්" කියලා. සංශෝධනයක් ගෙනාවා නම් ඒකට විරෝධතා ඉදිරිපත් කරන්න දෙන්න ඕනෑ; විමර්ශනයක් කරන්න ඕනෑ; නියෝගයක් දෙන්න ඕනෑ. ඒ මොකුත් නැහැ. පැමිණිල්ලේ නීතිඥයා ඉල්ලනකොට මට මේක තහවුරු කරන්න ඕනෑ, වාරණ නියෝගයක් ගන්න ඕනෑ කියලා, "නැහැ, තහවුරු ඕනෑ නැහැ, මම දෙන්නම් නියෝගය" කියලා දෙනවා. එහෙම තමයි නියෝගය දෙන්නේ. ඊට පසුව ගිය සතියේ තහනම ඉවත් වෙනවා; අහෝසි වෙනවා. පැමිණිල්ල එන්නේ නැහැ. විත්තියට හොරා ගිහිල්ලා අධිකරණයේ කියලා, නැවත මතක් කරලා කැඳවලා, ආපසු ඒකපාර්ශ්විකව නියෝගයක් දෙනවා. අහෝසි වෙච්ච එක ආපසු නිකුත් කරනවා. එතකොට ඒකාධිකරණයක් නේ. මේ අධිකරණ පද්ධතිය ගැන මිනිසුන්ට බරපතළ ගැටලුවක් තිබෙනවා. කොළඹ දිසා අධිකරණයේ ප්‍රධාන දිසා විනිසුරු විධියට ඉන්නේ බොහොම ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙක්. ඉතා වැදගත්, ගාම්භීරතාවක් තිබුණු විනිසුරුවරුන් තමයි දිගටම හිටියේ, කවුරුවත් කවදාවත් ඇඟිල්ල දිගු කරලා නැහැ; පැමිණිලි කරලා නැහැ. දැන් මොකක්ද මේ වෙන්නේ, ගරු කථානායකතුමනි? මේ අධිකරණවල කෙරෙන දේවල්වලට මිනිස්සු බණින්නේ ආණ්ඩුවටයි, අධිකරණ ඇමතිටයි. ඒ ගොල්ලන් හිතාගෙන ඉන්නේ නඩුකාරවරුන් පත් කරන්න, පාලනය කරන්න, දඬුවම් කරන්න ඒ ඔක්කෝම කරන්න ඕනෑ අපි කියලා. අපට එහෙම බලයක් නැහැ.

ඊයේ පෙරේදා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ලේඛනයක් දුන්නා. ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ විදුලි වයර් එක වැරදි විධියට සම්බන්ධ කරලා, අධිකරණයෙන් මහෙස්ත්‍රාත්වරයාගේ බංගලාවට ලයිට් අරගෙන. ඊට පස්සේ එතැන කරන්ට් ලීක් එකක් වුණා. අපේ අධිකරණ අමාත්‍යාංශයේ කාර්මික ශිල්පියා ඒක හදන්න ගියා. එතකොට ඔහුට කරන්ට් එක වැදුණා. ඔහු මැරෙන්නේ නැතුව බොහොම අමාරුවෙන් තමයි බේරුණේ ICU එකට දාලා, ගරු කථානායකතුමනි. කවුද ඒක කරලා තිබෙන්නේ? මහෙස්ත්‍රාත් අධිකරණයේ ලයිට් බිලට බංගලාවේ ලයිට් බිල එකතු කරලා ලාභයක් ගන්න ඒක කරලා තිබෙන්නේ. ඒක ගැන පරීක්ෂා කරනකොට චතුර බිල ගැනත් හොයා ගත්තා. චතුර බටයටත් හොර එකක් දාලා එහෙම අරගෙන, ගරු කථානායකතුමනි. ඊට පස්සේ පරීක්ෂණයක් කරන්න කියලා, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාට මම නියෝග කළා. එතුමා පරීක්ෂණයක් කළා. කොළඹ මහාධිකරණ විනිසුරුතුමා වෙනම පරීක්ෂණයක් කළා. එහිදී පැහැදිලිවම මේ ගැන ඔප්පු වෙලා තිබෙනවා. අපි ඒ ලයිට් බිල් අරගෙන බැලුවා. ඒ අදාළ මාසවල, වැරදි විධියට විදුලිය සන්ධි කරපු මාසවල අධිකරණ ශාලාවේ විදුලි බිල වැඩි වෙලා තිබෙනවා; බංගලාවේ බිල අඩු වෙලා තිබෙනවා. එතකොට ඒ ගැන මිනිස්සු මගෙන් අහනවා. ඒක පත්තරේ පළ වුණා. කිරිඇල්ල මැතිතුමනි, ඔබතුමා දකින්න ඇති, ඒක පත්තරේ පළ වුණා. මගෙන් මිනිස්සු අහනවා, "අපි ඕක කළා නම්, සාමාන්‍ය මිනිහෙක් කළා නම්, ඒ මිනිහාට ඇප නැහැ නේද? ඔබතුමන්ලා මොනවාද කරන්නේ" කියලා. "අපි කළා නම් ඇප දෙන්නේ නැහැ නේ" කියනවා. "ඒවා අපි කරන්නේ නැහැ. නමුත් සාමාන්‍ය මනුස්සයෙක් එහෙම කළා නම් ඇප දෙන්නේ නැහැ. විනිසුරුවරුන්ට එහෙම කරන්න බලයක් දීලා තිබෙනවාද?" කියලා අහනවා. මේ පරීක්ෂණ වාර්තාව අනුව බොහොම පැහැදිලිව ඔප්පු වෙලා තිබෙනවා, එතැන අක්‍රමිකතාවක් වෙලා තිබෙනවා, විදුලි බිල අඩු කර ගැනීමේ අරමුණෙන් අධිකරණ ශාලාවේ බිලට ඔහුගේ විදුලි පරිභෝජනය -consumption of electricity- එකතු කරලා බරපතළ වරදක් කරලා තිබෙනවාය කියලා. ඒක අපරාධ නීතිය යටතේ ඉතාම බරපතළ වරදක්. එතැනදී අපට කරන්න පුළුවන් දේ මොකක්ද? අපි ඒක අධිකරණ සේවා කොමිසමට යොමු කරනවා. 2024 මැයි මාසයේ 8වැනි දා මේ ලිපිය යවා තිබෙනවා. එම ලිපිය මම අදාළ ඇමුණුම් සමඟ **සභාගත*** කරනවා, ගරු කථානායකතුමනි.

ඒ පිළිබඳව පියවර ගන්න ඕනෑ, අධිකරණ සේවා කොමිෂන් සභාව. කරුණාකරලා ඒ වගකීම් අප මත පවරන්න එපා. අපට ඒ පිළිබඳව බලයක් නැහැ. ඒ නිසා ඒ ගොල්ලන් ඒ වගකීම් ගන්න ඕනෑ.

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා නඩු ගණනාවක් පිළිබඳව කිව්වා. ගරු කථානායකතුමනි, දැන් මේ චෝදනාව ඉදිරිපත් කරන්නේ කවුද? ඒ කාර්යය කරපු විනිසුරුවරයා ස්ථාන මාරු වෙලා ගිහිල්ලා වෙනත් විනිසුරුතුමියක් පැමිණියාට පසුව එතුමිය තමයි පැමිණිලි කරන්නේ. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමා කිව්වා වැරදියි. කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය නොවෙයි, ඒ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණය. කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයට ඒ විනිසුරුවරයා එවනවා,- ගරු කථානායකතුමනි, අපි ආණ්ඩුවලට බණිනවා, පොලීසියට බණිනවා. "කුඩු අල්ලන්න ඕනෑ. මුන්ව හිරේ දමන්න ඕනෑ, දඬුවම් දෙන්න ඕනෑ" කියනවා.

ඒ මිනිස්සු මහන්සි වෙලා ඒ කාර්යය කරනවා. ඊට පස්සේ මොකක්ද කරලා තිබෙන්නේ? හෙරොයින් සන්තකයේ තබා ගැනීම. ඒ දිනයේම - නඩු අහන දිනයේම - රුපියල් 1,000ක් ගෙවන්න, නැත්නම් හවස 2.00ට නිදහස් කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Quantity එක කොච්චරද?

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

එක නඩුවක තිබෙනවා, හෙරොයින් මිලිග්‍රෑම් 240ක් ළඟ තබා ගැනීම කියලා. තවත් එකක තිබෙනවා, අයිස් මත්ද්‍රව්‍යය මිලිග්‍රෑම් 270ක් කියලා. තවත් එකක තිබෙනවා, ගංජා මිලිග්‍රෑම් 600ක් කියලා. ඊළඟ එකේ හෙරොයින් මිලිග්‍රෑම් 230යි. මා ළඟ දැනට තිබෙන මේ ලේඛනයේ ඒ විධියට දිග ලැයිස්තුවක් තිබෙනවා. මම මේ ලැයිස්තුව **සභාගත*** කරනවා, ගරු කථානායකතුමනි.

මෙහිදී මත්ද්‍රව්‍ය ප්‍රමාණය - quantity එක - මොකක් වුණත් දඩුවම රුපියල් 1,000යි. ඒ මුදල ගෙව්වොත් එවෙලේම යන්න දෙනවා. උදේ 10.00ට හෝ දවල් 12.00ට පමණ තමයි නඩුව ගන්නේ. ඒ මුදල ගෙව්වේ නැත්නම් එදිනම සවස 3.00 තෙක් රඳවා තබා ගෙන පසුව මුදා හරින ලෙස නියෝග කරලා තිබෙනවා. ඒ මිනිස්සුන්ව ගංජාකාරයෝ, හෙරොයින්කාරයෝ කරන්නේ අධිකරණය නේ. කෝ, දඩුවම්? ආණ්ඩුවටයි, අධිකරණ ඇමතිටයි මිනිස්සු පණ යනකන් බණිනවා. අපි පණ යනකන් පනත් හදනවා. ඇත්ත නේ. මිනිස්සු අපෙන් අහනවා, "ඔය ගොල්ලන් ගෙනෙන පනත්වලින් ඇති වැඩේ මොකක්ද, ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්?" කියලා.

ගරු කථානායකතුමනි, මම ඊළඟට සඳහන් කරන කරුණුවලට අදාළව තිබෙන මේ ලේඛනයත් **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, ඊළඟ කාරණය මෙයයි. කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ හිටපු විනිසුරුවරයාගේ කාලයේ රුපියල් කෝටි 20ක් වටිනා විස්කි තොගයක් අතුරුදහන් වෙලා තිබෙනවා. එතකොට පැමිණිලි කර තිබෙනවා, මේවා හොරු ගෙනිහිල්ලා කියලා; ගබඩා කඩලා ගෙනියලා කියලා. මේ සම්බන්ධව පරීක්ෂණ කර තිබෙනවා. මේ ලේඛනයේ සඳහන්ව තිබෙනවා, "රුපියල් කෝටි 20ක් පමණ වටිනා විස්කි තොගයක්" කියලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නඩු භාණ්ඩ ද?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ඔව්, නඩු භාණ්ඩ. රස පරීක්ෂක වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා, මේ ගබඩා කවුරුවත් කඩලා නැහැ, මේ ගබඩාවට දාන්න පුළුවන් යතුර දාලා තමයි දොර විවෘත කරලා නඩු භාණ්ඩ අරගෙන ගිහිල්ලා තිබෙන්නේ කියලා. කොහේද, හොරකම වෙන්නේ? එතකොට හිටපු විනිසුරුවරයා ඒ සම්බන්ධයෙන් ගත්ත පියවර මොකක්ද? ඒ අයට විරුද්ධව අධිකරණ සේවා කොමිෂන් සභාව ගත්ත පියවර මොකක්ද? ඊළඟට, මෙම ලේඛනයේ සඳහන්ව තිබෙනවා, අලුත් මහෙස්ත්‍රාත්වරයා එනකන්ම හැම දාම කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍රයේ ඔරලෝසුව පැය භාගයක් ආපස්සට කරකවලා තිබුණා කියලා. ඒ කියන්නේ, උදේ 9.00ට එන කෙනාගේ පැමිණීමේ වාර්තාව ලැබෙන්නේ 8.30ට පැමිණියා කියලායි. අලුතෙන් විනිසුරුතුමෙක් ආවාම එතුමාට මේක තේරුණා. එතුමා බැණලා, මේ ගැන හොයලා බැලුවා. එසේ සොයා බලා ප්‍රශ්න කරනකොට කියා තිබෙන්නේ මොකක්ද? "නැහැ, එහෙම තමයි. මීට පෙර හිටපු විනිසුරුතුමා ඒ ගැන දන්නවා. අපි හැම දාම මේක තමයි කරන්නේ" කියලා. මේක තමයි උත්තරය. ඉතින් රජයේ සේවයේ හැම නිලධාරියෙකුම පැය භාගයක් මෙහෙම පරක්කු වුණාම මොකක්ද තත්ත්වය? මේ අධිකරණ ක්ෂේත්‍රය. මේ සියලුදෙයටම බැණුම් අහන්න ඕනෑ අධිකරණ ඇමතියි, ආණ්ඩුවයිද? මොකක්ද, ගත්ත පියවර?

ගරු කථානායකතුමනි, ඒ වාගේ නඩු විශාල සංඛ්‍යාවක් තිබෙනවා. විදුලිය හොරෙන් ගැනීම සම්බන්ධයෙන් නඩු තිබෙනවා. ගංජා, හෙරොයින් නඩු සම්බන්ධයෙන් සලකන හැටි තිබෙනවා. මේ ලේඛන මට නිරන්තරයෙන් ලැබෙනවා. ඊට අදාළ ලේඛනත් මම සභාගත කළා, ගරු කථානායකතුමනි.

මේ ලේඛනයේම සඳහන් වෙන අනෙක් කාරණය තමයි මේ සියලු දූෂණ අධිකරණ සේවා කොමිසම හරියට පරීක්ෂා කරලා බලන්නේ නැහැ, නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැ කියන එක. එතැන ලේකම් කෙනෙක් ඉන්නවා. මෙවැනි ලේඛන මට නිරන්තරයෙන්ම ලැබෙනවා, ඔවුන් කථා කරනවා. අද විනිසුරුවරුන්ට පවා ඒ ගොල්ලන්ගේ ප්‍රශ්න කියන්න කෙනෙක් නැහැ. ඒ ගොල්ලන්ට ප්‍රවේශයක් නැහැ. ඒ නිසා අධිකරණ ඇමතිට විතරයි ප්‍රවේශය තිබෙන්නේ. ඒ නිසා ඒ ගොල්ලන් බරපතළ මානසික පීඩනයකින් ඉන්නේ. අද අධිකරණ සේවයේ බොහෝ දෙනෙක් මානසිකව කඩා වැටිලා ඉන්නේ. අධිකරණ සේවයේ මේ වාගේ වැරදි වැඩ කරන අය ඉන්නේ අතේ ඇඟිලි ගණනටයි. අනෙක් අය බොහොම ගෞරවනීයයි. වගකීම දේව කාර්යය වාගේ ඉෂ්ට කරනවා. හැබැයි, මේ අතේ ඇඟිලි ගණනට ඉන්න අය නිසා මොකද වෙලා තිබෙන්නේ? මේ ගරු සභාවෙත් ඉන්නවා නේ හොරකම් කරපු අය. ඒ නිසා 225දෙනාම හොරුයි කියලා බැණුම් අහනවා. ඒකම තමයි අද අධිකරණයට වෙලා තිබෙන්නේත්. අද මහාධිකරණයේ සිටින විනිසුරුවරුන්ට අභියාචනාධිකරණයට යන්න විධියක් නැහැ. උසස්වීම් ලැබෙන්නේ නැහැ. ඔහේ, vacancies තිබෙනවා. නඩු ගොඩ ගැහිලා තිබෙනවා, ඉවර වෙන්නෙත් නැහැ. අභියාචනාධිකරණයේ ඉන්න අයට ශ්‍රේෂ්ඨාධිකරණයට යන්නත් බැහැ. ඇයි? සුප්‍රීම් උසාවිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක් අකර්මණ්‍ය කරලා නේ තිබෙන්නේ.

දිසා අධිකරණවල, මහෙස්ත්‍රාත් අධිකරණවල විනිසුරුවරු බලාගෙන ඉන්නවා මහාධිකරණයේ උසස්වීම් ලබන්න. ඒ ගොල්ලන් අවුරුදු 15, 20, 30 මේ සේවාව වෙනුවෙන් කැප කරපු අය. හැබැයි, මේ අධිකරණ තීන්දුව නිසා මොකක්ද වෙලා තිබෙන්නේ? මේ අධිකරණ තීන්දුව එක හේතුවක්. තවත් හේතු තිබෙනවා. ඒ ගොල්ලන්ට ලැබිය යුතු උසස්වීම් ලබා දෙන්නේ නැහැ. විනිසුරුවරුන්ගේ අනෙක් ප්‍රශ්නය තමයි, ඒ ගොල්ලන් නිරන්තරයෙන්ම ඇවිල්ලා කියනවා ඒ ගොල්ලන් කාටවත් ප්‍රවේශයක් නැහැ, ඒ ගොල්ලන්ගේ ඉල්ලීමක් ඉදිරිපත් කළාට වැඩක් නැහැ කියලා. අධිකරණ සේවා කොමිසමේ ලේකම් කෙනෙක් ඉන්නවා. ඔහු තෝරලා බේරලා ඔහුට ඕනෑ ඒවා විතරයි කොමිසමට දාන්නේ. පිට රට සවාරියක් ආවොත් ඔහුට ඕනෑ අයට විතරයි ඒක දෙන්නේ. ඔහුට ඕනෑ අයට විතරයි ශිෂ්‍යත්වයක් වුණත් දෙන්නේ. අනෙක් විනිසුරුවරුන්ව කපලා පැත්තකට දාලා තිබෙනවා. මේ නිසා ඔවුන් දැඩි මානසික පීඩනයකින් ඉන්නේ. මමත් උත්සාහ කළා, මේ ප්‍රශ්න විසඳන්න. නමුත්, ඒ ප්‍රශ්න විසඳන්න බැහැ. ඒ නිසා තමයි මේ සිද්ධ වෙන දේවල් පිළිබඳව මම අද මේ සභාවේ දී රටේ ජනතාවට කියන්නේ. අධිකරණ සේවා කොමිසමේ ලේකම් කෙනෙක් එතැන ඉන්නේ අවුරුදු 3යි. ගරු කිරිඇල්ල මැතිතුමනි, ඔබතුමාත් ඒ ගැන දන්නවා නේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

විනිසුරුවරු සහ අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයා අවුරුදු තුනෙන් තුනට මාරු වෙනවා. දැන් සිටින ලේකම්වරයා අවුරුදු 9ක් තිස්සේ ඉන්නවා. ඔහුට ඕනෑ විධියට තමයි දැන් ඔක්කොම පාලනය කරන්නේ. මේක හරි බරපතළ ප්‍රශ්නයක්. හැම දාම අපේ පැත්තට ඇඟිල්ල දිගු කරනවාට අපි කැමැති නැහැ. අපෙන් කෙරෙන්න පුළුවන් දේ ඔබතුමා දන්නවා නේ. මේවා ස්වාධීන කරලා නේ තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඔබතුමන්ලාට බලයක් දුන්නා නේ, යම්කිසි තනතුරකට පත් කිරීමට අදාළව යෝජනාවක් ආවොත් එක්කෝ අනුමත කරන්න, එක්කෝ අනුමත නොකරන්න. ඔබතුමාට ඒ බලය තිබෙනවා නේ. ඉතින්, ඔබතුමන්ලා ඒ බලය ක්‍රියාත්මක කළාය කියලා ඔබතුමන්ලා එක්ක වෛර බැඳගත්ත කෙනෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා කියන්න පුළුවන්ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පරිච්ඡේදයක් අත්හිටුවන්න කියලා? ලෝකයේ මොන රටේද එහෙම වෙලා තිබෙන්නේ? ගරු දයාසිරි ජයසේකර මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මේ ප්‍රශ්නය මතු කළාට. මේවායේ අපට හංගන්න දෙයක් නැහැ. අධිකරණය කියන්නේ විවෘත ස්ථානයක්. අධිකරණයේ වෙන සියලු දේවල් විවෘත වෙන්න ඕනෑ. විවෘත අධිකරණයේ කරන්න ඕනෑ දේවල් judge's chamber එකට ගිහිල්ලා කරලා හරියන්නේ නැහැ නේ. ෆයිසර් මුස්තාපා judge's chamber එකට ගිහිල්ලා, "HEට කියලා මම ඔබතුමාට ලබන මාසේ වෙනකොට උසස්වීම අරන් දෙනවා" කියලා තීන්දුව ඉල්ලනවා. ඒක නේ ඇත්ත කථාව. අනෙක් අය බය ඇති කියන්න. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට විරුද්ධව තීන්දු ගත්තේ එහෙම නොවෙයිද? ඔබතුමා කියන්නකෝ, සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි. *[බාධා කිරීමක්]* ඒක තමයි ඉතින්. ඒ විධියට නේ ඔබතුමාට විරුද්ධවත් judge's chamber එකට ගිහිල්ලා තීන්දුව ගත්තේ. එහෙම නම්, මේ දේශපාලන පක්ෂ ටික කොළඹ දිසා අධිකරණයට භාර දෙන්න, ගරු කථානායකතුමනි. දිසා විනිසුරුතුමාට කියන්න, දේශපාලන පක්ෂවල නායකයා වෙලා මෙවා ඔක්කොම පාලනය කරන්න කියලා. ඔහු තමයි බලධාරියා. මේ විකාරය නතර වෙන්න ඕනෑ. විනිසුරුවරයෙක් වුණත් දැනගන්න ඕනෑ. අපි දන්නවා අපේ සීමාව. ඇමතිවරු විධියට අපට බලතල තිබුණාට ඒ බලතලවල සීමාව අපි හොඳට දන්නවා. අපි කවදාවත් නඩුවක් ගැන විනිසුරුවරයෙකුට කථා කරලා තිබෙනවාද, සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි? මගේ අවුරුදු 40ක සේවා කාලය තුළ එක දවසක්වත් එහෙම කථා කරලා නැහැ. කිසි බලපෑමක් කරලා නැහැ. නීතිපති දෙපාර්තමේන්තුවෙන් අහන්න පුළුවන්, අපි කවදාහරි එහෙම කථා කරලා තිබෙනවාද කියලා. මම කථා කළා නම් කථා කරලා තිබෙන්නේ ආණ්ඩුවේ නඩුවලට මෙන්න මේ ටික කරන්න කියන්නයි. නීතිපති කොහොමත් පෙනී සිටින්න එපායැ ආණ්ඩුවේ නඩුවලට. ගරු කථානායකතුමනි, ඒක නිසා කරුණාකර ඔබතුමන්ලාත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විධියට තීන්දුවක් ගන්න.

මට මතකයි, මීට පෙර යම් අවස්ථාවක මමත් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් ඉල්ලලා අතුරු තහනමක් ගත්තා, දෝෂාභියෝගයක් - Impeachment එකක් - භාරගන්න එපාය කියලා කථානායකතුමාට. එවෙලේ කථානායක වශයෙන් සිටියේ ගරු අනුර බණ්ඩාරනායක මැතිතුමා. එතුමා තීන්දුවක් දුන්නා "ඔය ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ගෙනෙන ඒවා මම භාරගන්නේ නැහැ" කියලා. අපි - ව්‍යවස්ථාදායකය - ස්වාධීනයි. මම මේක කියන්නේ ව්‍යවස්ථාදායකය සහ අධිකරණය අතර වාගේම, ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර ළඟදීම බරපතළ ගැටුමක් ඇති වෙන්න කලින් මේ ප්‍රශ්නය විසඳෙන්න ඕනෑ නිසායි. ඔබතුමාට ඒ බලතල තිබෙනවා, ගරු කථානායකතුමනි. ඔබතුමා තමයි පාර්ලිමේන්තුවේ ප්‍රධානියා. ශ්‍රේෂ්ඨාධිකරණය නොවෙයි පාර්ලිමේන්තුවේ ප්‍රධානියා. ඒ නිසා, කරුණාකර මේ ප්‍රශ්නය විසඳන්න ඔබතුමා ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සියලු දෙනා එකතු වෙලා තීන්දුවක් ගන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මැතිතුමා ඉතාම වැදගත් ප්‍රශ්නයක් මතු කළේ. එතුමා මූලික, fundamental issue එකක් ගත්තා. ඒක තමයි, අපේ රටේ මේ ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය තිබෙන්නේ Montesquieu න්‍යාය - බලතල බෙදීමේ න්‍යාය - එක්ක කියලා.

ඒ අනුව තමයි මේ ව්‍යවස්ථාව සම්පාදනය වෙලා තිබෙන්නේ. මීට කලිනුත් එහෙමයි. මම ව්‍යවස්ථාව කියවන්න යන්නේ නැහැ. ඉතාම සරලව කියනවා නම් තුන්වන ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා, "ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේ ය. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේ ය." කියලා.

ඊට පසුව හතරවන ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා, "ජනතාවගේ පරමාධිපත්‍යය ක්‍රියාත්මක වීම ද, භුක්ති විඳීම ද, මතු දැක්වෙන ආකාරයෙන් සිදු වන්නේ ය: ..." කියලා. ඒ වාගේම 4 (අ) යටතේ ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ගැන දක්වා තිබෙනවා. මම එය කියවන්න යන්නේ නැහැ. ඊළඟට, 4(ආ) යටතේ රටේ ආරක්ෂාව ඇතුළුව ජනතාවගේ විධායක බලය ගැන දක්වා තිබෙනවා. ඊළඟට, 4(ඇ) යටතේ නීතිය අනුව පාර්ලිමේන්තුව විසින් ම ක්‍රියාත්මක කළ හැකි පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර හා බලතල සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද... යනාදී වශයෙන් කියාගෙන ගිහිල්ලා, අවසානයේ සඳහන් වෙනවා, "....පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය;" කියලා. මෙහෙම තමයි තිබෙන්නේ.

දැන් ඉතාම නිවැරැදිව දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මේ කාරණය පෙන්වා දුන්නා. අපි දැන් එතුමා කියන සිද්ධියම ගනිමුකෝ. ව්‍යවස්ථාවේ VII වන පරිච්ඡේදය යටතේ විධායකය ගැන සඳහන් වෙනවා. VIIඅ වන පරිච්ඡේදය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගැන දක්වා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා තමයි එම සභාවේ සභාපති. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඉතිහාසයක් තිබෙනවා. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආවා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආවා. දැන් විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටම ඇවිල්ලා තිබෙනවා. තිබුණු ව්‍යවස්ථාවලට පොඩි පොඩි වෙනස්කම් වෙලා, සංයුතිවල වෙනස්කම් වෙලා තමයි වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනැල්ලා තිබෙන්නේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තමයි උපරිමාධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ පත් කිරීම් කරන්නේ, Schedule එකේ තිබෙන අනෙක් ඒවාත් ඇතුළුව. ඒ කියන්නේ මැතිවරණ කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සීමා නිර්ණය කොමිෂන් සභාව වැනි කොමිෂන් සභා ද ඇතුළුව. 41ඇ. යටතේ වන උපලේඛනයේ I වන කොටසේ දක්වා ඇති පරිදි අග්‍ර විනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ

සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන් පත් කිරීමත් සිදු කරනවා. ඊට පසුව එම Schedule එකේ II වන කොටස යටතේ නීතිපතිවරයා පත් කිරීම යනාදී වශයෙන් ඔය දේවල් ඔහොම ඔහොම එනවා.

දැන් මොකක්ද කර තිබෙන්නේ? මේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මඟින් අත්හිටුවා තිබෙන්නේ මොකක්ද? VIIඅ වන පරිච්ඡේදය තමයි අත්හිටුවා තිබෙන්නේ. VIIඅ වන පරිච්ඡේදය කියන්නේ විධායකයේ කොටසක්. එතකොට අධිකරණය විධායකයට ඇතුළු වෙලා නැද්ද?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ඇයි, ඒකේ ව්‍යවස්ථාදායකයත් තිබෙනවා නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔව්, මම එතැනට එන්න හදන්නේ. විධායකයේ කොටසක් හැටියට තමයි VIIඅ වන පරිච්ඡේදය තිබෙන්නේ. මේක අපි මෙතැන කියන්න ඕනෑ නැහැ. ඊයේ ජනාධිපතිතුමා කථා කළ වෙලාවේ තර්කයක් ආවා, මේකට මැදිහත් වෙලාය කියන කාරණය සම්බන්ධව. ඒක අද සභාව වෙනවා නේ, දැන් දයාසිරි ජයසේකර මැතිතුමා කියන කාරණයෙන්. ඒක වෙන සිද්ධියක්; වෙන නඩුවක්. ඒක ඒ විධියට කිව්වා. මෙතුමා කියන්නේ මේ කාරණය ගැන. ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විධායකයේ කොටසක්. ඒ තුළ කවුද නියෝජනය වෙන්නේ? අග්‍රාමාත්‍යවරයාත්, කථානායකවරයාත් ඒ තුළ නියෝජනය වෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා තමයි එම සභාවේ මූලාසනයේ ඉන්නේ. කිරිඇල්ල මැතිතුමනි, විරුද්ධ පක්ෂයේ නායකවරයාත් එම සභාව නියෝජනය කරනවා. ඊළඟට, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු විය යුතු අග්‍රාමාත්‍යවරයාගේ නාමිකයෙකු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විය යුතු විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ නාමිකයෙකු එම සභාව නියෝජනය කරනවා. ඊළඟට, අනෙක් සාමාජිකයන් තුන්දෙනා ඉන්නවා. එතකොට සිවිල් සමාජයත් - civil society එකත් - ඉන්නවා; විධායකයත් ඉන්නවා; ව්‍යවස්ථාදායකයත් ඉන්නවා. නමුත්, දැන් මේ සභාවේ ක්‍රියාකාරිත්වය අත්හිටුවලා.

ඊළඟට, අපේ දයාසිරි ජයසේකර මැතිතුමා පෙන්වා දුන් ආකාරයට අපි ගනිමු, 82 ව්‍යවස්ථාව. එහි සඳහන් වෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම ගැනයි. 82 ව්‍යවස්ථාවෙන් පැහැදිලිව කියන පරිදි පරිච්ඡින්න කරන්න හෝ අත්හිටුවන්නවත් බැහැ අපට. අපට බැරි එකක් Supreme Court එකෙන් කරලා නේ, මේ කියන විධියට. හරි නේද, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි?

දැන් තව තව කරුණු ගණනාවක් කිව්වා නේ. උපරිමාධිකරණවල විනිශ්චයකාරවරුන් පත් කරන්නේ කවුද? ගරු කථානායකතුමනි, ඔබතුමන්ලා. දැන් ඒක නවත්වලා. ඊළඟට, මේ ව්‍යවස්ථාවේ හැටියට ඒ ගැන පරීක්ෂණයක් කරන්නේ කවුද? ඒ ගැන පරීක්ෂණයක් කරන්නේ අපි. මේවාට පූර්වාදර්ශ ඉතිහාසයේ තිබෙනවා. සින්නදොරේ කියන පුද්ගලයාගේ පෞද්ගලික උත්සවයකට නෙවිල් සමරකෝන් හිටපු අග්‍ර විනිශ්චයකාරතුමා ගිය අවස්ථාවක කරපු කථාවක් සම්බන්ධව තමයි එතුමාට විරුද්ධව දෝෂාභියෝගය ගෙනාවේ, එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ජනාධිපති විධියට සිටියදී. ඇතුලත්මුදලි මැතිතුමා තමයි එදා එම Select Committee එකේ සභාපති විධියට කටයුතු කළේ. එම කමිටුවේ අනුර බණ්ඩාරනායකත් හිටියා. අන්න proceedings තිබෙනවා, මේ පාර්ලිමේන්තුවේ පුස්තකාලයට ගිහිල්ලා ගන්න. ස්ථාවර නියෝග සංශෝධනය කරමින් තමයි එතැනට ගියේ. හැබැයි, එතුමා ඊට කලින් අස් වුණා. ඊට පසුව ශිරානි බණ්ඩාරනායක අග්‍ර විනිශ්චයකාරතුමියට එරෙහි දෝෂාභියෝගය ගෙනාවා; පරීක්ෂණය කළා; ඉවර කළා. තුනෙන් දෙකකින් යෝජනාව සම්මත කරලා එතුමියව අයින් කළා.

ඒකත් කළා. කවුද කළේ? පාර්ලිමේන්තුව. එතකොට අධිකරණය සම්බන්ධයෙන් යම් කටයුත්තක් තිබෙනවා නම්, විනය කටයුත්තක් තිබෙනවා නම් ඒක කරන්න වෙන්නේ පාර්ලිමේන්තුවට. ඊයේ කථාවත්, අද ගරු අධිකරණ ඇමතිතුමා කියපු කථාවත් ගත්තාම මේ දෙකෙන්ම සනාථ වෙන කාරණයක් තිබෙනවා. දැන් අධිකරණ සේවා කොමිෂන් සභාව තමයි උපරිමාධිකරණවලට පහළින් තිබෙන අධිකරණවලට විනිශ්චයකාරවරුන් පත් කරන්නේ, විනය කටයුතු කරන්නේ, ඉවත් කිරීම් කරන්නේ. දැන් අධිකරණ ඇමතිතුමායි, ඔබතුමායි කියන කාරණාවලින්ම පැහැදිලි වෙනවා, එතැන ඒක වෙන්නේත් නැහැ කියලා. එතකොට අධිකරණ සේවා කොමිෂන් සභාවේ කවුද ඉන්නේ? අග්‍ර විනිශ්චයකාරතුමායි, ජ්‍යෙෂ්ඨ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු දෙදෙනෙකුයි. එහෙම නම් එතැන ඒක වෙන්නේත් නැහැ නේ. එහෙම නම් එතැන කාර්යභාරය හරියට සිද්ධ වෙලාත් නැහැ.

ගරු කථානායකතුමනි, මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරද්දි අද උදේත් විපක්ෂ නායකතුමා ඇහුවා, 40,000ක ගුරු හිඟයක් තිබෙනවා නේද කියලා. මම කිව්වා, එච්චර නැහැ, දැන් ඒ හිඟය අඩු වෙලා තිබෙන්නේ කියලා. සංවර්ධන නිලධාරීන් 22,000කට ආසන්න පිරිසක් දවස් ගණනාවක් තිස්සේ තවමත් කොළඹ කොටුවේ උපවාස කරනවා. ඇයි මේ? 2023 මාර්තු 25 පවත්වන්න තිබ්බිච්ච විභාගය ගැන ඔබතුමන්ලාත් දන්නවා. ඒ විභාගය පැවැත්වීම අත්හිටුවන්න තහනම් නියෝගයක් දුන්නා. මම දන්නා තරමින් නම් ගුරු සේවා ව්‍යවස්ථාව අනුව විභාගයක් පවත්වන්න ගියාම ඒක තහනම් කරපු පළමුවැනි වතාවයි මේ. මේ තහනම් නියෝගයට දැන් මාස 15යි. මොකක්ද මේ? පාසල්වලට ගුරුවරු ලබා දෙන එක නවත්වලා. ඊට පස්සේ මොකක්ද වුණේ? විනිශ්චය ආසනයේ හිටපු ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරයා විශ්‍රාම යනකම්, ඒ කියන්නේ නඩුව අහලා ඉවරවෙලා මාසයක් යනකම් Order එක ලිව්වේ නැහැ. දැන් අලුතින් constitute කළා, අලුත් Bench එක. දැන් වෙන්නේ මොකක්ද? දැන් limited submissions දෙන්න වෙලා. ඊළඟට මොකක්ද වුණේ? විපක්ෂයෙන් පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවාම, විෂය භාර ඇමතිවරයා හැටියට මම ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න ඕනෑ. මම ඒක මෙතැන කිව්වා. ඊළඟ දවසේ මොකක්ද කළේ? නඩුව ඇහුවේ නැහැ. මොකක්ද කිව්වේ? ඒ comments මම මෙතැන කියන්න යන්නේ නැහැ. මොකද, මම තවමත් අධිකරණයට ගරු කරන නිසා. ඒවා අපි දන්නවා. ඒ වෙලාවේ අධිකරණයේ හිටපු ජ්‍යෙෂ්ඨ නීතිඥවරු මේ සභාවේත් ඉන්නවා. පාර්ලිමේන්තුවේ මේ ගැන කථා කරපු එක තමයි නඩුව නොගැනීමට හේතුව. දැන් කොහේද justice? අපි දන්නා නීතිය අනුව, අපි ඉගෙන ගත්ත නීතිය අනුව, විනිශ්චයකාරවරයෙකු විනිශ්චය ආසනයේ වාඩිවුණාම මොකක්ද කරන්න ඕනෑ? මමත් 1985දී නේ දිවුරුම් දුන්නේ. ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමායි, මමයි එකට නේ 1982දී නීති උපාධිය පාස් වුණේ. අපි නිකම් ගෙදර හිටියේත් නැහැ නේ. මේ සභාවට එන්නේ නැති හැම වෙලාවේම උසාවි ගියා නේ. මේ පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු නඩුවටත් මම පෙනී සිටියා. ඒක තවත් කථාවක්. ගරු කථානායකතුමනි, මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ මෙහෙම වෙන්න බැහැ කියන එක නේ. වෙනත් පරිබාහිර දේවල් ඔළුවට ගන්න බැහැ. නඩු කටයුතු ප්‍රමාද වෙන එක ගැන පාර්ලිමේන්තුව තුළදී

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

හැර වෙන කොහේදීද අපි සාකච්ඡා කරන්නේ? ඒකට තමයි පාර්ලිමේන්තුව තිබෙන්නේ. නීති පනවන්නේ අපි නම්, ඒ සඳහා අවශ්‍ය කටයුතු ටික කරන්නේ අපි නම් අපට අයිතියක් තිබෙනවා, ජනතාවගේ අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4.(ඇ) ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව තුළින් ක්‍රියාත්මක කරන්න. දැන් මෙතැන දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියපු කාරණය අනුව විධායකයටත් අත පොවලා, ව්‍යවස්ථාදායකයටත් අත පොවලා, රටේම අධිකරණ පද්ධතිය -මේ ඔක්කෝම- අවුලක් බවට පත්වෙලා. මේ වෙනකොට ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු දෙදෙනෙක් නැහැ. අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරු තුන්දෙනෙක් නැහැ.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරු පස්දෙනෙක් නැහැ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු ඇමතිතුමා නිවැරැදි කළ ආකාරයට අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරු පස්දෙනෙක් නැහැ. එතකොට උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු හත්දෙනෙක් නැහැ. අපි විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේනකොට නඩු ප්‍රමාදය වළක්වන්න විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව වැඩි කරලා දුන්නා. කීයකින් ද වැඩි කළේ? විනිශ්චයකාරවරු 6ක් සහ 5ක් නේද, ගරු අධිකරණ ඇමතිතුමනි?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව 11 සිට 17 දක්වා වැඩි කළා, අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව 12 සිට 20 දක්වා වැඩි කළා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාවත්, අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාවත් වැඩි කළා. ඇයි ඒ? එතකොට ඔවුන් සඳහා වියදම් කරන්න වෙන්නේ රජයේ මුදල් නොවෙයි ද? එතුමන්ලාට වෙනම chambers හදන්න ඕනෑ, වෙනම staff එක දෙන්න ඕනෑ, වෙනම විනිශ්චය ආසන හදන්න ඕනෑ. මේ ඔක්කෝම බර දරාගෙන අපි මේ දේවල් කළේ නඩු ප්‍රමාදය වළක්වන්නයි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
පඩිත් වැඩි කෙරුවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මතකද? තලතා අතුකෝරල මැතිනිය ඇමතිවරිය වශයෙන් ඉන්න වෙලාවේ පත් කළ Subcommittee එකේ මමත් හිටියා. ඔබතුමන්ලා තමයි එතකොට කැබිනට් මණ්ඩලයේ හිටියේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මමයි සභානායක හැටියට එම යෝජනාව ගෙනාවේ.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මම තමයි ඒ යෝජනාව ස්ථිර කළේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
යෝජනාව දාලා allowances වැඩි කළා. නීතිපති දෙපාර්තමේන්තුවටයි, Judiciary එකටයි ඔක්කෝටම. තුන් ගුණයක් වැඩි කළා. ගරු කථානායකතුමනි, දැන් මේක විශාල ප්‍රශ්නයක්. විජයදාස රාජපක්ෂ ඇමතිතුමා කියන එක හරි. ජනතාව අධිකරණ ඇමතිටත් දොස් කියනවා, ආණ්ඩුවටත් දොස් කියනවා. කවුරු බලයේ හිටියත් එහෙමයි. මේක ලොකු ප්‍රශ්නයක්. එදා හිටපු අග්‍ර විනිශ්චයකාරවරයාට විරුද්ධව Impeachment එක ගේනකොට, ඒකට තහනම් නියෝගයක් දුන්නා. මේ තීන්දුවේ පිටපතක් පාර්ලිමේන්තු පුස්තකාලයේ තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමා කියපු එක හරි. නඩු තීන්දු ගණනාවක් පෙන්වලා එදා අනුර බණ්ඩාරනායක මැතිතුමා කිව්වේ මොකක්ද? එතුමා කිව්වා, පාර්ලිමේන්තුවේ කටයුතුවලට ඇඟිලි ගහන්න ශ්‍රේෂ්ඨාධිකරණයට බැහැ කියලා. දැන් දයාසිරි ජයසේකර මැතිතුමාත් මේ ගැන කිව්වා. අධිකරණ සේවා කොමිෂන් සභාව මොනවා කරන්න ද? එතැනත් ඉන්නේ මේ ගොල්ලෝ නේ. දැන් ඔබතුමා කිව්ව කරුණුවලට, ගරු අධිකරණ ඇමතිතුමා කිව්ව කරුණුවලට පිළියමක් තිබෙනවාද? පිළියමක් තිබෙනවා නම්, පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්න ඕනෑ නැහැ නේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු ඇමතිතුමනි, මට අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. විනාඩියක් දෙනවාද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමනි. මම කථා කරලා ඉවර වුණු ගමන් ඔබතුමාට අවස්ථාව දෙන්නම්. *[බාධා කිරීමක්]*

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු ඇමතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අයිති වෙන්නේ ව්‍යවස්ථාදායකයට නේද? නැත්නම් අධිකරණයටද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
නැහැ, ඒක විධායකයේ කොටසක්.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
විධායකයේ කොටසක්. එතකොට විධායකයේ කොටසක් අකර්මණ්‍ය කිරීමේ අරමුණින් මුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම කොටසක් අක්‍රිය කිරීම කොයි තරම් යුක්ති සහගතද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒක තමයි කරලා තිබෙන්නේ. එහෙම කරන්න බැහැ. අපිටවත් කරන්න බැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
එහෙම නම් අපි ව්‍යවස්ථාදායකය හැටියට මේ වෙනුවෙන් ගන්න ඕනෑ පියවර මොකක්ද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගන්න ඕනෑ පියවර ගැන තමයි මම කිව්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ප්‍රධානියා හැටියට ගරු කථානායකතුමාට පුළුවන්, පක්ෂ නායක රැස්වීමක් කැඳවලා මේ ගැන සාකච්ඡා කරන්න. අධිකරණ සේවා කොමිෂන් සභාවට පුළුවන්, පහළ අධිකරණවල විනය කටයුතු ආදී ඔක්කොම කටයුතු කරගෙන යන්න. නමුත් ඉහළ අධිකරණයෙන් නේ ඒවා නවත්වලා තිබෙන්නේ. ඉහළ අධිකරණයෙන් ඔබතුමාගේ ක්‍රියාකාරිත්වය නවත්වලා තිබෙන්නේ. අපි දන්නේ නැහැ, කොච්චර කාලයක් ආණ්ඩු තියෙයිද, නැද්ද කියන එක. ඒක වෙන කථාවක්. මේ නියෝගය මෙහෙමම තිබුණොත් හෙට - අනිද්දා වෙනකොට අග්‍ර විනිශ්චයකාරතුමාත් විශ්‍රාම යයි. එතකොට එතුමාව විතරයි පත් කරන්න පුළුවන්. ඊට පස්සේ ඔක්කොම අය විශ්‍රාම යනවා. එතකොට ශ්‍රේෂ්ඨාධිකරණයකුත් නැහැ; අභියාචනාධිකරණයකුත් නැහැ. අන්තිමට වෙන්නේ ඒක නේ. වාසනාවට හෙට - අනිද්දා වනකොට මැතිවරණයක් එනවා. එතකොට වෙන එකක් මොකක් හරි වෙයි නේ. මම අහන්නේ, එහෙම නැතිව මේක දිගටම ගියොත් මොකද වෙන්නේ කියන එකයි. ගරු කථානායකතුමනි, සභානායකවරයා හැටියට ඒක මගේ වගකීමක් වෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන දේ තමයි අපි දන්න දේ.

ඊළඟට, පාර්ලිමේන්තුව තමයි නීති පනවන්නේ. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟද, නැද්ද කියන එක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121වැනි ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විමසන්නේ. හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක් අත්හිටුවන ආකාරයෙන්; විධායකය අකර්මණ්‍ය කරන ආකාරයෙන්; ව්‍යවස්ථාදායකය අකර්මණ්‍ය කරන ආකාරයෙන් තීන්දුවක් දෙන්න පුළුවන්ද? මෙතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒකට තමයි අනුර බණ්ඩාරනායක මැතිතුමා පිළිතුරු දුන්නේ, මේවා මට වැඩක් නැහැ, මේක පාර්ලිමේන්තුව කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තිබෙන්නේ පාර්ලිමේන්තුවේ නම් තීන්දු ගන්න ඒක රැස් වෙන්න. අවශ්‍ය නම්, නියමිත ආකාරයට පාර්ලිමේන්තුවේ procedure එක follow කරලා, අවශ්‍ය ක්‍රියා මාර්ගය අපි පාර්ලිමේන්තුවෙන් ගනිමු.

ගරු කිංස් නෙල්සන් මහතා
(මාණ්පුමිකු கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මටත් පොඩි වෙලාවක් දෙන්න.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 254 - ග්‍රාම නිලධාරි වසම,- *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා වෙන මාතෘකාවක් ගැන නේ කථා කරන්නේ.

ගරු කිංස් නෙල්සන් මහතා
(මාණ්පුමිකු கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, අධිකරණ ඇමතිතුමාත්, අපේ සභානායකතුමාත් මේ ප්‍රශ්නයට තවමත් උත්තර දීලා ඉවර නැද්ද? *[බාධා කිරීම්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග,- *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න.

ගරු කිංස් නෙල්සන් මහතා
(මාණ්පුමිකු கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට උත්තරය දීලත් ඉවරයි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
නැහැ, නැහැ. සභානායකවරයාට පුළුවන්, ස්ථාවර නියෝග යටතේ නැතිටලා ඒ කරුණුවලට පිළිතුරු දෙන්න. ඒ අයිතිය යටතේ තමයි මම පිළිතුරු දුන්නේ.

ගරු මහින්ද අමරවීර මහතා
(මාණ්පුමිකු மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහින්ද අමරවීර ඇමතිතුමා. *[බාධා කිරීමක්]* ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා, ඔබතුමාට ඊළඟට අවස්ථාව ලබා දෙන්නම්.

ගරු මහින්ද අමරවීර මහතා
(මාණ්පුමිකු மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, මේකටම අදාළ කාරණයක් ගැන මම කියන්න ඕනෑ. අපි මහජන නියෝජිතයන් විධියට මේ ගරු සභාවේදී කියන දේවල් අහගෙන හිටියාම මිනිස්සුන්ට අධිකරණය ගැන තිබෙන විශ්වාසය නැති වෙලා තිබෙනවාය කියන එක අපට පෙනෙන්න තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයත්, අභියාචනාධිකරණයත් අඩාළ වෙලා, උසාවි පද්ධතියම ගැටලුවක් බවට පත් වෙලා කියන එක තමයි අපට දකින්න ලැබෙන්නේ. සාමාන්‍ය ජනතාවට අධිකරණය ගැන විශ්වාසයක් නැති වුණොත් එතැන ඉඳලා

[ගරු මහින්ද අමරවීර මහතා]

මොකක්ද වෙන්නේ? නඩු තීන්දු පිළිබඳව දැන් ප්‍රශ්න තිබෙනවා. නීතිඥවරු ගණනාවක් ගැන කියන්න පුළුවන්. ඒ නීතිඥයා ඇල්ලුවාම නඩු දිනනවාය කියනවා. එවැනි ප්‍රසිද්ධ නම් තිබෙනවා. ඒ නීතිඥයන් අල්ලනකොට මිලියන ගණන්වලින් තමයි මුදල් වැය වෙන්නේ. ඒගොල්ලන් බදු ගෙවනවාද කියලා මොකක්වත් සඳහනක් නැහැ; එහෙම දෙයක් පෙනෙන්නත් නැහැ. හැබැයි, මිලියන ගණනක් දීලා, නීතිඥයෙක් ඇල්ලුවොත් නඩුව දිනනවා. දැන් තිබෙන තත්ත්වය තුළ සාමාන්‍ය මනුස්සයෙකුට නඩුවකට එහෙම නීතිඥයෙක් අල්ලා ගන්න බැහැ. මේ වාගේ තත්ත්වයක් තුළ සාමාන්‍ය මනුස්සයෙකුට සාධාරණයක් ඉටු වෙන්නේ කොහොමද? මිනී මරලා හරි, ඕනෑම වැරදි වැඩක් කරලා හරි සල්ලි දීලා හොඳ නීතිඥයෙක් අල්ලා ගන්න පුළුවන් නම් ඔහුට ඒකෙන් බේරෙන්න පුළුවන්. හැබැයි, අහිංසක මිනිස්සුන්ට ඒ අවස්ථාව ලැබෙන්නේ නැහැ. මේ වාගේ තත්ත්වයක් තුළ අධිකරණ ඇමතිතුමාම කියනවා, අධිකරණ තීන්දු පිළිබඳව වුණත් එතුමා සෑහීමකට පත් වෙන්නේ නැහැ කියලා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් ඒ වාගේ කථාවක් කිව්වා. හැබැයි, ඔබතුමන්ලා චිත්තිකාරයෝ හෝ පැමිණිලිකාරයෝ වුණු නඩුවලට බලපෑමක් වෙන්න දෙන්න එපා. මොකද, තමන් චිත්තිකාරයා වුණු, එහෙම නැත්නම් වැරදිකාරයා වුණු නඩු තීන්දුවක් සම්බන්ධව හෝ නඩුකාරයෙක් සම්බන්ධව කථා කරනවා නම් ඒකත් අසාධාරණයක්.

හැබැයි, මේ වාගේ දේවල්වලදී සාධාරණයක් බලාපොරොත්තු වන සාමාන්‍ය ජනතාවට අධිකරණයෙන් ඒ සාධාරණය ඉෂ්ට වෙන්නේ නැත්නම් එතැනත් ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක පැහැදිලියි.

ගරු මහින්ද අමරවීර මහතා
(මාණ්පුමිකු මහින්ද අමරවීර)
(The Hon. Mahinda Amaraweera)
එම නිසා ඔබතුමා මැදිහත් වෙලා මේ සඳහා වැඩ පිළිවෙළක් හදන්න. ජනාධිපතිතුමාත් කියනවා, එතුමාගේ කටයුතුවලට බාධා ඇති වෙනවා කියලා. මන්ත්‍රීවරුත් ඒක කියනවා. එම නිසා පාර්ලිමේන්තුව විසින් මේ සියලු බලය සහිත කමිටුවක් හෝ පත් කරගෙන මේ සම්බන්ධ වැඩ පිළිවෙළක් හදන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, මේ කාරණය ඊළඟ පක්ෂ නායක රැස්වීමට යොමු කරලා, අපි ඒ පියවර ගනිමු. ඉතාම වැදගත් කාරණයක් ඔබතුමන්ලා අද මතු කළේ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මම පක්ෂ නායක රැස්වීමට නියෝජනය නොවන නිසායි මේ කාරණය ඔබතුමාගේ අවධානය පිණිස කියන්නේ. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වැදගත් පරිච්ඡේදයක් අක්‍රිය කිරීම මඟින් ඇති වී තිබෙන ඵල විපාක ගැන සහ ඒක නිවැරදි කරන ආකාරය පිළිබඳව වාගේම, මෙතුමන්ලා චෝදනා කරන ෆයිසර් මුස්තාපා කියන අසාමාන්‍ය බලැති; ඒ කියන්නේ විනිශ්චයකරුවන් දමනය කිරීමේ අසාමාන්‍ය බලැති නීතිඥයා සම්බන්ධයෙන් ගත යුතු පියවර ගැනද එහිදී සාකච්ඡා කරන මෙන් මම ඉතා ඕනෑකමින් ඉල්ලනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක අපි ඒ වෙලාවට බලන්නම්. දැන් මේ සභාවේ කාලය ඉක්මවා ගිහින් තිබෙන්නේ. දැන් වේලාව පස් වරු 1.30යි.

ගරු මහින්ද අමරවීර මහතා
(මාණ්පුමිකු මහින්ද අමරවීර)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, එහෙම එක නීතිඥයෙක් ගැන නොවෙයි, නීතිඥයින් ගණනාවක් ගැන අපට කියන්න තිබෙනවා. අපි මෙතැනදී ඒ නම් හෙළිදරව් කළේ නැහැ. ඒකයි මම කිව්වේ, මූල්‍යමය වශයෙන් විශාල මුදලක් අය කරගෙන මේ කටයුතු කරන, තමන් ඉදිරිපත් වුණාම නඩුව දිනනවා කියන නීතිඥවරු විශාල පිරිසක් ඉන්නවාය කියන එක. ඒ අය සම්බන්ධයෙන් කථා කරන්නත් අපට අවස්ථාව දෙන්න. නීතිඥයින්ට හෝ උසාවියට අපහාසයක් සහ බලපෑමක් වන නිසා මම මෙතැනදී ඒ ගැන කියන්නේ නැහැ. එවැනි නීතිඥයින් ගණනාවක් ගැන අපට කියන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එම ඉල්ලීම මම පක්ෂ නායක රැස්වීමට ඉදිරිපත් කරන්නම්.

ගරු මහින්ද අමරවීර මහතා
(මාණ්පුමිකු මහින්ද අමරවීර)
(The Hon. Mahinda Amaraweera)
ඒ අයට ලොකු මුදලක් දෙන්න පුළුවන් නම් නඩු දිනනවා. මේ කියන නීතිඥවරයා විතරක් නොවෙයි. එවැනි නීතිඥවරු විශාල පිරිසක් ඉන්නවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ සියල්ල ගැනම කථා කරමු.

ගරු මහින්ද අමරවීර මහතා
(මාණ්පුමිකු මහින්ද අමරවීර)
(The Hon. Mahinda Amaraweera)
එහෙම කරනවා නම්, ඒවා සම්බන්ධවත් කථා කරන්න අපට අවස්ථාව ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමන්ලා සියලුදෙනාම නියෝජනය වන සභාවක් පත් වෙනවා.

ගරු මහින්ද අමරවීර මහතා
(මාණ්පුමිකු මහින්ද අමරවීර)
(The Hon. Mahinda Amaraweera)
එක්කෙනෙකුට විතරක් ඒ අසාධාරණ කටයුත්ත කරන්න දෙන්න පුළුවන්කමක් නැහැ. තමන් දමන නඩු පැරදුණාම, ඒ නිසාවෙන් එක් නීතිඥයෙක් හෝ නඩුකාරයෙක් හෝ ඉලක්ක කරගෙන කටයුතු කරනවා නම්, ඒ ගැන අපේ බලවත් විරෝධය පළ කරනවා. ඒ නිසා අපට මේ පාර්ලිමේන්තුවේ අවස්ථාවක් දෙන්න, අපි ගෙනැල්ලා පෙන්වන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කාටත් ඒ අවස්ථාව තිබෙනවා, ගරු ඇමතිතුමා.

ගරු මහින්ද අමරවීර මහතා
(මාණ්පුමිකු මහින්ද අමරවීර)
(The Hon. Mahinda Amaraweera)
නීතිඥවරු සියලුදෙනාගේ වත්කම්වල ඉඳලාම අපි සොයාගෙන යමු, මොකක්ද වෙන්නේ කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක කරන්න.

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි පිරේම්නාත් සි. තොලවත්ත)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු දොලවත්ත මන්ත්‍රීතුමා, ඔබතුමා මොකක්ද කියන්නේ?

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි පිරේම්නාත් සි. තොලවත්ත)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අධිකරණය, ව්‍යවස්ථාදායකයේ බලය ඩැහැ ගන්නවා කියන කාරණය -ඒ ගැටලුව- සම්බන්ධයෙන් කථා කරනකොට, මූලිකවම මගේ අයිතිවාසිකම්, අපේ පාර්ලිමේන්තුවේ අයිතිවාසිකම් උල්ලංඝනය වෙනවා කියලා අපි කිව්වා. ගරු කථානායකතුමනි, සමහර වෙලාවට මෙතැන තිබෙන ගැටලුව තමයි, තමන්ට අවශ්‍ය වුණාම, තමන්ට පාඩු වුණාම මෙතැනට ඇවිල්ලා මැසිවිලි නැඟීම. හැබැයි, දිගින් දිගටම අපි මේ කාරණය නිරීක්ෂණය කළා. ඒ නිසා තමයි මේ කාරණය ගැන ගරු සභාවේ අවධානය යොමු කළේ. මම හිතන්නේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තමයි මේ කාරණය ගැන මුලින්ම කථා කළේ. ඊට පස්සේ පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය මේ අය උදුරා ගන්නවාය කියන කාරණය අපි කථා කළා. දැන් අපට මේ කාරණය දිගින් දිගටම පෙනෙන්නට තිබෙනවා. ඇත්තටම අපි පක්ෂ-විපක්ෂ භේදයක් බලන්නේ නැතුව,- ජනාධිපතිතුමා ඊයේ මේ කාරණය හෙළිදරව් කළාම අද විපක්ෂය මේ සභාවේදී කිව්වේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක් අපි අභියෝගයට ලක් කරනවාය කියායි. නමුත්, මෙතැන ඇත්ත ප්‍රශ්නයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. මම හිතන විධියට, ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා වුණත් අද බොහොම හිතේ අමාරුවෙන් කථා කළේ. මොකද, එතුමා දීර්ඝ කාලයක් මේකෙන් බැට කෑවා. එම නිසා අපි මේ වෙලාවේදී ඉල්ලීමක් කරන්නේ. මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය ගැන සුමන්තිරන් මැතිතුමා ඊයේ බොහොම පැහැදිලිව කිව්වා. එම නිසා පාර්ලිමේන්තුවක් හැටියට අපි මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඕනෑ කියලා මම හිතනවා. මොකද, ජනතාවගේ බලය උල්ලංඝනය කිරීමක් තමයි මේ සිද්ධ වෙමින් පවතින්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ කාරණය තමයි ගරු මන්ත්‍රීතුමා කරන්න යන්නේ. අපි කොච්චර කථා කළත් අද දවස තුළ මේ සඳහා ගත හැකි පියවරක් නැහැ. ඒ නිසා අපි මේක පක්ෂ නායක රැස්වීමට ඉදිරිපත් කරනවා. එතැනදී පක්ෂ නායකයින් එක්ක කථා කරලා, විශේෂ කාරක සභාව පත් කිරීමේ කටයුත්ත අපි කරගෙන යනවා.

ගරු කිංස් නෙල්සන් මහතා
(මාණ්පුමිකු කිංස් නෙල්සන්)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කලින් රීති ප්‍රශ්නයක් මතු කරන්න අවස්ථාව ඉල්ලුවා. ඒ නිසා දැන් ඒ රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවංස)
(The Hon. Wimal Weerawansa)
බොහොම ස්තූතියි, ගරු කථානායකතුමනි. මම ගරු විදේශ කටයුතු ඇමතිතුමාටයි මේ ප්‍රශ්නය යොමු කරන්න බලාපොරොත්තු වුණේ. මම හිතන විධියට එතුමා මේ අවස්ථාවේදී අමාත්‍ය මණ්ඩල රැස්වීමට සම්බන්ධ වන නිසා මේ සභාවේ නැහැ. එතුමා හෙට දිනයේදීවත් උත්තර දෙයි කියලා බලාපොරොත්තුවෙන් මම, මගේ ප්‍රශ්නය මතු කරන්නම්.

ඊළඟ ද්‍රවිඩයන් වෙනුවෙන් නිදහස් ජනමත විචාරණයක් පැවැත්විය යුතුයි කියලා පසුගිය දිනවල ඇමෙරිකානු කොංග්‍රසයට යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ යෝජනාවේ කියනවා, දකුණු සුඩානයේ වෙච්ච විධියට, මොන්ටෙග්‍රෝ රාජ්‍යයේ වෙච්ච විධියට, නැගෙනහිර ටිමෝරයේ වෙච්ච විධියට, බොස්නියාවේ, එරිත්‍රියාවේ සහ කොසෝවෝ රාජ්‍යයේ වෙච්ච විධියට මේ නිදහස් ජනමත විචාරණය පැවැත්විය යුතුයි කියලා.

ඒක ඇමෙරිකානු කොංග්‍රසයට ඉදිරිපත් වෙච්ච යෝජනාවක්. ගරු කථානායකතුමනි, මම ඒ සම්බන්ධයෙන් ගරු විදේශ කටයුතු ඇමතිතුමාගෙන් මූලිකව විමසන ප්‍රශ්නය මෙයයි. මේ විධියේ බරපතළ යෝජනාවක් ශ්‍රී ලංකාවට බලපානවා. මොකද, මොන්ටෙග්‍රෝ රාජ්‍යයේ, නැගෙනහිර ටිමෝරයේ හා බොස්නියාවේ තිබෙනවා වාගේ තත්ත්වයක් ලංකාවේ නැහැ. ඒ නිසා ඇමෙරිකානු කොංග්‍රසයට ඉදිරිපත් වෙච්ච මේ අන්තවාදී යෝජනාව සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා රජය හැටියට විදේශ අමාත්‍යාංශය ප්‍රතිචාර දක්වලා තිබෙනවාද? ඒ සම්බන්ධයෙන් ගත්ත පියවර මොනවාද කියන එක තමයි මා මතු කරන ප්‍රශ්නය වන්නේ. එතුමා හෙට දිනයේවත් ඒ ප්‍රශ්නයට උත්තර දෙයි කියලා මා බලාපොරොත්තු වෙනවා.

[ගරු විමල් වීරවංශ මහතා]

ඒ වාගේම ගරු කථානායකතුමනි, මම කලින් රීති ප්‍රශ්නයක් මතු කරපු වෙලාවේ, ඒ ප්‍රශ්නයත් මේ අවස්ථාවේදී යොමු කරන්න කියලා ඔබතුමා මට අවස්ථාව දුන්නා. ඒ ඇමතිතුමාත් මේ අවස්ථාවේදී ගරු සභාවේ නැහැ. නමුත්, මට කියන්න ඕනෑකම තිබුණේ, ගරු විදේශ රැකියා ඇමතිතුමා කිව්වා, විමධ්‍යගත මුදල් ඇතුළු ඒ දේවල් ගත්ත විපක්ෂයේ මන්ත්‍රීවරු සැලකිය යුතු පිරිසක් ඉන්නවා කියලා. ඒ පිරිසට අපි අයිති වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. හැබැයි, ගිහිල්ලා ජනාධිපතිතුමා හමු වෙලා, එතුමාට පක්ෂපාතීත්වය පුද කරන බව අංගවලනයෙන් හෝ පෙන්වලා, එතුමාගේ දේශපාලන දාසයෙක් වන බවට අංගවලනයෙන් හෝ පෙන්වලා තමයි ඒක ගන්න ඕනෑ, කියන එක තමයි එතුමා නොකියා කිව්වේ. එහෙම තමයි ඒක දෙන්නේ, නැතුව එහෙම ලැබෙන්නේ නැහැ කියලා. නමුත්, මේ රටේ අවුරුදු ගණනාවක් තිස්සේ විමධ්‍යගත මුදල් ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලැබුණේ, එහෙම ආණ්ඩුවේ ඉන්න ජනාධිපති හෝ කවුරුවත් වන්දනාමාන කරලා නොවෙයි. ඒ නිසා මේ මුදල් දෙන එක දේශපාලන ඇමක් බවට පත් කරගෙන තිබෙනවා. ඒක ඉතා සදාචාර විරෝධීයි, පිළිකුල් කටයුතුයි, ඉදිරියේ මැතිවරණයක් තිබියදී ඒ විධියට රජයේ මුදල් දේශපාලන ඇමක් වශයෙන් යොදා ගෙන මන්ත්‍රීවරුන්ට ලබා දෙන එක. අභිංසක මන්ත්‍රීවරු අමාරුවේ වැටිලා ඉන්න මේ වෙලාවේ ගිහින් ඒක හිඟා කනවා වෙන්න පුළුවන්. හැබැයි, ඒ තත්ත්වයට පත් කරන එක ඉතාම නින්දනීයයි කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යාය 7 ගම්මානයේ අද මේ වෙනකොටත් උද්ඝෝෂණයක් පැවැත්වෙනවා. මහවැලි ගම්මානයක් වන ඒ ගමේ ගොඩ ඉඩමක ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්න බලපත්‍රයක් දීලා තිබෙනවා. මේ වෙනකොට බියර් ලයිසන් එකත් දීලා, ගොඩ ඉඩමේ පවත්වන්න ඕනෑ බියර් හල මඩ ඉඩමේ තමයි පවත්වන්නේ. ගම ඇතුළේ තමයි ඒක ක්‍රියාත්මක වෙන්නේ.

ගරු කථානායකතුමනි, ඒ ගමේ පවුල් 164ක් ඉන්නවා. ඒ පවුල් 164න්, 74ක්ම සමෘද්ධිලාභී පවුල්. ඒ වාගේම බියර් ලයිසන් එක දීලා මේ ආයතනය පවත්වන ස්ථානයට එහා පැත්තෙන් පෙර පාසලක් තිබෙනවා. ඒක ඉස්සරහා පන්සල තිබෙනවා. ඒ ගමේ මිනිස්සු දිගින් දිගටම කියන්නේ, ඒක එතැනින් ඉවත් කරලා සුදුසු තැනකට ගෙනියන්න කියලායි. ඒ බියර් ලයිසන් එක දීලා තිබෙන්නේ ගොඩ ඉඩමට නේ. ඒ නිසා ඒක ගොඩ ඉඩමට ගෙනියන්න කියලා තමයි කියන්නේ, ගරු කථානායකතුමනි. මේ වෙනකොට දින 14ක් ඇතුළත ඒක ඉවත් කරන්න කියලා මහවැලි අධිකාරියෙන් නියෝග කරලා තිබෙනවා. දිසාපතිතුමාට කියලා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමාට කියලා තිබෙනවා. ඒ විධියට කියන්න තිබෙන හැම කෙනෙකුටම කියලා තිබෙනවා. අදටත් ගම ඇතුළේ උද්ඝෝෂණයක් පැවැත්වෙනවා, ගරු කථානායකතුමනි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා වහාම ඒ බියර් හල එතැනින් ඉවත් කරලා, සුදුසු ස්ථානයකට ගෙනියන්න කටයුතු කරන්න කියලා ඔබතුමාට කියනවා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව සොයා බලා, අවශ්‍ය පියවර ගන්න කියලා මම දැන්ම කියනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම, ගරු අධිකරණ ඇමතිතුමා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත
வெளிநாட்டு தீர்ப்புக்களைப் பரஸ்பரம் ஏற்றங்கீகரித்தல், பதிவுசெய்தல் மற்றும் வலுவுறுத்துதல் சட்டமூலம்
RECIPROCAL RECOGNITION, REGISTRATION AND ENFORCEMENT OF FOREIGN JUDGMENTS BILL

"වෙනත් රටවල අධිකරණවල නඩු තීන්දු ශ්‍රී ලංකාව තුළ අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා ද; (93 වන අධිකාරය වූ) විදේශ නඩු තීන්දු බලාත්මක කිරීමේ ආඥාපනත සහ (94 වන අධිකාරය වූ) නඩු තීන්දු අන්‍යෝන්‍යව බලාත්මක කිරීමේ ආඥාපනත ඉවත් කිරීම සඳහා ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසිනි.

2024 ජූලි 09වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයි ද නියෝග කරන ලදී.

නීති, සිරෙච්චාලෙකළ් අලුවල්කළ් මට්‌රුම් අරසියලමෙප්පු මරුසීරමෙප්පු අමෙච්චර් මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජපක්ෂ අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.

2024 யூலை 09, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Wijeyadasa Rajapakshe, Minister of Justice, Prison Affairs and Constitutional Reforms; to be read a Second time upon Tuesday, 09th July, 2024 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 3 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா வினவப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 6 දක්වා ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත: රෙගුලාසි
சீட்டாட்டத் தொழில் (ஒழுங்குபடுத்தல்) சட்டம்: ஒழுங்குவிதிகள்
CASINO BUSINESS (REGULATION) ACT: REGULATIONS

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 4 වගන්තිය යටතේ කැසිනෝ ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් පනවන ලද්දුව, 2024 ජනවාරි 12 දිනැති අංක 2366/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.02 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය."

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත යටතේ නියමය, විෂය අංක 3 - කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ නියෝගය, විෂය අංක 4 - කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග, විෂය අංක 5 - පරිපූරක මුදල, ශීර්ෂය 001 - වැඩසටහන 02 දරන යෝජනාව සහ විෂය අංක 6 - පොල් සංවර්ධන පනත යටතේ වූ යෝජනා සම්මතය ද මා ඉදිරිපත් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Lakshman Kiriella?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, වැදගත් රීති ප්‍රශ්නයක් මතු කරන්න තිබෙන නිසා මට පොඩි වේලාවක් දෙන්න. අවශ්‍ය නම් මට වෙන් කරලා තිබෙන වේලාවෙන් ගන්න.

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම දැන් වැය ශීර්ෂ 001හි වැඩසටහන 02 මාරු කරලා තිබෙනවා 003 උප ව්‍යාපෘතිය වෙත, මිලියන 8,750ක්. ගරු කථානායකතුමනි, මේ මුදල්, මේ වැය ශීර්ෂය මාරු කරලා පාවිච්චි කරන්නේ මොනවාටද? අපට ඉදිරිපත් කරලා තිබෙන සටහන අනුව සඳහන් වෙනවා, "ග්‍රාමීය මාර්ග, පාලම්, කුඩා වැව්, ඇළ මාර්ග වැඩි දියුණු කිරීම, ග්‍රාමීය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් මෙන්ම ග්‍රාමීය පාසල්, රෝහල්, අඩු ආදායම් නිවාස, ග්‍රාමීය ජල සම්පාදන වැනි සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් අවසන් කර දෙන ලෙස ග්‍රාමීය ජනතාව මෙන්ම විවිධ මහජන නියෝජිතයන් වෙතින් ද ඉල්ලීම් ඉදිරිපත් වෙමින් තිබේ" යනුවෙන්.

ගරු කථානායකතුමනි, මගේ තර්කය තමයි, මේක මැතිවරණ සමයක්, පළාත් පාලන මැතිවරණය කල් දාලා නැහැ, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පළාත් පාලන මැතිවරණය තියන්න කියලා නියෝගයක් දීලා තිබෙනවා. මේක මැතිවරණ කාල සීමාවක්. අනෙක, ජනාධිපතිවරණයට ඉතාම ආසන්න කාල සීමාවක්. මෙවැනි කාලවල වැය ශීර්ෂ මාරු කරලා මේ වාගේ සංවර්ධන වැඩ කිරීම මැතිවරණ නීතිය උල්ලංඝනය කිරීමක්. මම ඔබතුමාට ඒක කියන්න කැමැතියි. පළාත් පාලන මැතිවරණය කල් දාලා නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියලා තිබෙනවා ඡන්දය තියන්න කියලා. එතකොට මේක මැතිවරණ කාල සීමාවක්; this is an election period. ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කරන්න දවස් 30යි තිබෙන්නේ. එතකොට මම ඔබතුමාට කියන්නේ, මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමට කලිනුත් මැතිවරණයට බලපාන යම්කිසි ක්‍රියාවක් සිද්ධ කරනවා නම් මැතිවරණ කොමිසමට බලය තිබෙනවා මැදිහත් වෙන්න. ඔබතුමාට මතක ඇති, මාස කිහිපයකට කලින් ප්‍රජා කමිටුවලට මුදල් වෙන් කළා. ඒක මැතිවරණ කොමිසමෙන් නැවැත්වූවා. ඔබතුමා මේක පොඩ්ඩක් අහගන්න.

"කොමිෂන් සභාව හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා දී ඇති හෝ පනවා ඇති හෝ සියලු බලතල, කාර්ය, කර්තව්‍ය කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේද, ඉටු කරනු ලැබිය යුත්තේද, සිදු කරනු ලැබිය යුත්තේද වන්නේය. එවැනි ඡන්ද විමසීම්වල සහ ජනමත විචාරණවල කාර්ය සඳහා ඡන්ද හිමි නාම ලේඛන පිළියෙල කිරීම සහ ප්‍රතිශෝධන කිරීමද, එම ඡන්ද විමසීම් පැවැත්වීමට එකී බලතලවලට, කාර්යන්වලට සහ කර්තව්‍යවලට, -මේක තමයි වැදගත්- ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ."

[ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

කොමිෂන් එකට සීමා රහිත බලතල තිබෙනවා. ඉතින් මම කියන්නේ මේ වැය ශීර්ෂය මාරු කරන්න පුළුවන්, ඒක වෙනම වැඩක්. නමුත්, බෙදන්න බැහැ. මොකද, ඒ සල්ලි බෙදනකොට කවුද බොක්කු හදන්න යන්නේ? කවුද පාරවල් හදන්න යන්නේ? **නිටපු** ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, ප්‍රාදේශීය සභා අපේක්ෂකයෝ තමයි ඒකට මැදිහත් වෙන්නේ. එතකොට ඒක කෙළින්ම මැතිවරණයට බලපානවා. ඉතින් මම කියන්නේ මේකයි. වැය ශීර්ෂය මාරු කරන්න පුළුවන්, හැබැයි සල්ලි බෙදන්න බැහැ. සල්ලි බෙදීම පැහැදිලිවම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක්. මම මැතිවරණ කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කරනවා. මොකද, පාර්ලිමේන්තුවේ වෙන දේවල්, පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන දේවල් රජයේ නිලධාරීන් විතරක් නොවෙයි සෑම පුරවැසියෙක්ම දැනගෙන ඉන්න ඕනෑ. දැන් මේකෙදි පූර්ව නිගමනයක් තිබෙනවා නේ. මැතිවරණ කොමිෂන් එකේ නිලධාරීන් අද මේ කථා කරන දේ දැනගෙන ඉන්න ඕනෑ. මේකට මැදිහත් වෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේ සභාවට වැය ශීර්ෂය මාරු කරන්න පුළුවන්. ඒකටත් අපි විරුද්ධයි. නමුත්, ආණ්ඩුවට බහුතරය තිබෙන නිසා කරන්න පුළුවන්. හැබැයි බෙදන්න බැහැ. මාස දෙකකට කලින් මැතිවරණ කොමිසම එවැනි ක්‍රියාවක් නැවැත්වුවා නේ, ප්‍රජා කමිටුවලට සල්ලි වෙන් කළාම ඒක නැවැත්වුවා. ඉතින් මැතිවරණ කොමිසමට මම කියන්නේ මැදිහත් වෙලා මේ මුදල් වියදම් කිරීම වහාම නවත්වන්න කියලා. මොකද, මේ මුදල් වියදම් කරනකොට අනිවාර්යයෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ප්‍රාදේශීය සභාවල හිටපු මන්ත්‍රීවරු, අපේක්ෂකයන්, ඒ සියලුදෙනාම මේකට පාවිච්චි කරනවා. මගේ තර්කය ඒකයි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
මැතිවරණ කොමිසම නීත්‍යානුකූලව ඒ කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා.

විවාදය ආරම්භ කිරීම, ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා. ඔබතුමාට විනාඩි 22ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා] මූලාසනාරූඪ වීය.

අතන්පිටකු, මාණ්ඩලික සභානායකතුමා අක්කිරා සනත්තිනින්රු අකලවේ, කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [මාණ්ඩලික අංගජන් ඉරාමනාතන්] තලෙමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] took the Chair.

[අ.භා. 1.35]

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්ඩලික රන්ජිත් සියම්බලාපිටිය - අරස පෙරුන්තෝට්ට තොழිල් මුයර්චිකළ් මරුසීරමைප්පු අමைච්චරුම් නිති ඉරාජාඞ්ක අමைච්චරුම්)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ 2024.01.12 දිනැති 2366/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේත්, එම නියාමන පනත යටතේම 2024.02.02 දිනැති 2369/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේත්, ඒ වාගේම 2381/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේත් පළ කරන ලද නියෝග අනුමත කිරීම සඳහා අද දින ඉදිරිපත් කර තිබෙනවා. මේ සියල්ල දැනට ජනවාරි, පෙබරවාරි මාසවල සිට ක්‍රියාත්මකයි.

මේ රෙගුලාසිවලින් කරනු ලැබුවේ කැසිනෝ ව්‍යාපාර සඳහා ලබා දෙන බලපත්‍ර ගාස්තුව අතිවිශාල ලෙස වැඩි කිරීමයි. කැසිනෝ ව්‍යාපාරය ගත්තොත්, මේ වකවානුව තුළ තමයි රජය නියම විධියටම කැසිනෝ ව්‍යාපාරවලින් රාජ්‍ය ආදායම් ලබා ගන්නේ. ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනතට 1889 දක්වා ඉතිහාසයක් තිබෙනවා. එය, බ්‍රිතාන්‍ය යුගයේ කුකුළන් කොටවීම සඳහා ඇති කළ නීතියක්. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත තමයි වර්තමානයේත් බොහෝ විට බලපවත්වන්නේ. ඒ යටතේ කැසිනෝ වාගේ දෙයක් සඳහා නියාමනයක් තිබුණේම නැහැ. නියාමන පනතක් මුලින්ම ආවේ 2010 වර්ෂයේදී. නමුත් ඒ පනත ක්‍රියාත්මක කරන්න ක්‍රමයක් තිබුණේ නැහැ. ඒකට අවශ්‍ය රෙගුලාසි සකස් වුණේ නැහැ. ඒ පනතෙන් බොහෝ දේ කිව්වා. හැබැයි කර ගන්න බැරි වුණා. ඒ වාගේම 2015 දී යෝජනාවක් ගෙනාවා, අපේ රටේ කැසිනෝ ව්‍යාපාරය සඳහා යම්කිසි අයෙකු ඇතුළත් වන කොට, ඩොලර් 100ක ගාස්තුවක් ගන්න ඕනෑ කියලා. හැබැයි ඒකත් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ සියල්ල අක්‍රිය තත්ත්වයකයි පැවතුණේ. ඒවා යෝජනා පමණයි. ඉතිහාසයේ කැසිනෝවලට ලියාපදිංචියක් හැටියට කෙරුණේ, ආදායම් බදු ගෙවීම සඳහා වූ ලියාපදිංචිය පමණයි. මෙතෙක් ඉතිහාසයේ සිට 2022 වනතුරුම තිබුණේ ඒක පමණයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 2022දී 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතට අවශ්‍ය රෙගුලාසි ටික සකස් කළා. අන්න ඒ නිසා අපට පුළුවන් වුණා, කැසිනෝ සඳහා මුලින්ම වර්ෂ 5කට බලපත්‍රයක් ලබා දෙන්න. කීයද ගාස්තුව? රුපියල් කෝටි 50යි. මේක මේ රටේ ජනතාව දැන ගන්න ඕනෑ. මේ රජයෙන් තමයි කැසිනෝවලින් නියම ආදායමක් ලබා ගත්තේ. බලපත්‍රයට පමණක් කෝටි 50ක් අපි ලබා ගත්තා. ඊට අමතරව කැසිනෝ ශාලාවකින් කෝටි 50ක වාර්ෂික ගාස්තුවක් අපි ලබා ගත්තා. මෙතෙක් ඒවා එකක්වත් කෙරුණේ නැහැ. බොහෝ විට ඔවුන් ආදායම් බද්ද විතරයි ගෙව්වේ. අපි ඔවුන්ගේ දෛනික ආදායම මතත් සියයට 15ක් ගත්තා. කැසිනෝ ව්‍යාපාරයෙන් උපරිම රාජ්‍ය ආදායමක් ලබා ගත්තේ මේ යුගයේදී තමයි. මෙතෙක් කල් අක්‍රිය වෙලා තිබුණු -කැසිනෝ පරිශ්‍රයකට ඇතුළත් වීම සඳහා ශ්‍රී ලාංකික තැනැත්තෙකුගෙන් අය නොකළ- මුදල ලබා ගන්නත් අපි කටයුතු කළා. ඒ සඳහා නීතියක් තිබුණා. හැබැයි, ඒ මුදල ලබා ගත්තේ නැහැ. ගන්න අවශ්‍ය පසුබිම තිබුණේ නැහැ; අවශ්‍ය රෙගුලාසි තිබුණේ නැහැ. අපි ශ්‍රී ලාංකිකයෙකුගෙන් ඩොලර් 50ක් -රුපියල් 15,000කට ආසන්න මුදලක්- අය කළා. ඒ කටයුත්තත් අපි ආරම්භ කළා. එපමණක් නොවෙයි, ව්‍යාපාරයේ ලාභය මත කැසිනෝශාලා හිමියාගෙන් අපි සියයට 40ක ආදායම් බද්දක් ගත්තා. ඒ වාගේම, යම්කිසි අයෙකු ජයග්‍රහණය කළොත්, ඒ ජයග්‍රහණය ලක්ෂ 5ට වැඩි නම්, අපි සියයට 14ක රඳවා ගැනීමක් කරලා ඔහු බදු -tax- ගෙවන කොට එය අය කර ගැනීමට කටයුතු කරනවා. මේ යුගය තමයි කැසිනෝ ව්‍යාපාරයෙන් රාජ්‍ය ආදායම් ලබා ගන්නා යුගය. එහෙම නැත්නම් ආදායම් බද්ද හැර මේ කියපු එකක්වත් කැසිනෝ ශාලාවලින් අය කිරීමක් කලින් සිදු වුණේ නැහැ. ඒක මේ රටේ ජනතාව දැනගත යුතුයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

කැසිනෝ ගැන කථා කරන විට බොහෝ දෙනෙකු හිතන්න පුළුවන්, ඇයි මෙය ව්‍යාප්ත කරන්න හදන්නේ කියලා. අපි මෙය ව්‍යාප්ත කරන්නේ නැහැ. මෙය ව්‍යාප්ත කරන්න අපට අවශ්‍ය නැහැ.

මම බැලුවා, 2023 වර්ෂයේ කැසිනෝ ශාලාවලට සහභාගි වුණු පිරිස කවුද කියලා. එම වර්ෂය අවසාන වන විට සියයට 70කට ආසන්න ප්‍රමාණයක් සහභාගි වෙලා තිබෙන්නේ විදේශිකයන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ශ්‍රී ලාංකිකයෙකු කැසිනෝ ශාලාවකට යනවා නම් අපි ඔහුගෙන් ඩොලර් 50ක් ගන්නවා. ඒ, 2023 වර්ෂය අවසානයේ සිට. අපේ ඉලක්කය වී තිබෙන්නේ මේ ඩොලර් 50 තවත් අවුරුදු දෙකකින් ඩොලර් 200 දක්වා වැඩි කරන්නයි. ඒ කියන්නේ තවත් අවුරුදු දෙකකින් ලාංකිකයෙකු කැසිනෝ ශාලාවකට යනවා නම් ඔහු රුපියල් 60,000ක් ගෙවන්න අවශ්‍ය වෙනවා. ඒකෙන්ම පෙනෙනවා, ශ්‍රී ලාංකිකයා ඒ සඳහා යොමු කරන්න අපට අවශ්‍ය නැහැ කියන එක. හැබැයි, කැසිනෝ ව්‍යාපාරය සංචාරක කර්මාන්තයත් එක්ක බැඳුණු දෙයක්. සමහර සංචාරකයන් ලංකාවට එන්නේම කැසිනෝ ක්‍රීඩාව සඳහා. ඒකත් එක්ක තමයි අපේ රාජ්‍ය ආදායම වෙනුවෙන් අපි මෙසේ යම් කටයුත්තක් කරන්නේ. පැහැදිලිව පිළිගන්න ඕනෑ කාරණාව මෙයයි. කැසිනෝ ශාලාවලින් ඉතා අල්ප රාජ්‍ය ආදායමක් ලබපු එක අද ඔවුන් ලබන දළ පිරිවැටුමෙන් සියයට 60ක් රාජ්‍ය ආදායම හැටියට අපි ලබා ගන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒකත් මේ රටේ බදු ගෙවන ජනතාව දැන ගත යුතුයි. මේ අනුව, ලෝකයේ කැසිනෝ ශාලාවලින් ඉහළම බද්දක් ගන්නා රටක් බවට අපේ රට පත් වෙලා තිබෙනවා.

අද දවසේ මා කථා කරන්නේ ඊටත් එහා ගිය කාරණා ගැනයි. නව කැසිනෝ බලපත්‍ර ඉල්ලීම් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා අපට ප්‍රධාන වශයෙන් අවශ්‍ය වෙලා තිබෙනවා, එයින් රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමට සහ රාජ්‍ය ආදායම ඉක්මනින් ලබා ගැනීමට යම්කිසි පිටිවහලක් ලබා ගන්න පුළුවන්ද, කැසිනෝ ආයෝජකයන්ගෙන් විදේශ විනිමය සෘජුව ගන්න පුළුවන්ද, ඒ වාගේම සැබෑ ශක්තිමත් ආයෝජකයන් කැඳවා ගන්නේ කොහොමද, බලපත්‍ර ඉල්ලීම පාලනය කරන්නේ කොහොමද කියන කාරණා ගැන බලන්න. අපට අවශ්‍ය නැහැ, කැසිනෝ ශාලා ව්‍යාප්ත කරන්න. අද මා කථා කරන මෙන්න මේ කාරණාවලට අදාළ වන, මේ අවුරුද්දේ ජනවාරි මාසයේ 12 වැනි දා සිට ක්‍රියාත්මක, 2366/33 දරන ගැසට් එකේ පළ කරන ලද රෙගුලාසි අනුව අප මෙන්න මෙහෙමයි කියන්නේ. ඇමෙරිකානු ඩොලර් මිලියන 250කට වැඩි ආයෝජනයක් කරන කෙනෙකු අලුතින් කැසිනෝ බලපත්‍රයක් ඉල්ලනවා නම් ඔහු ඒ කැසිනෝ බලපත්‍රය සඳහා රුපියල් බිලියන 10ක් -රුපියල් කෝටි 1,000ක්- ගෙවන්න ඕනෑ. අපි ඒ බලපත්‍රය අවුරුදු 20කට දෙනවා. හැබැයි, ඔහු රුපියල් කෝටි 1,000ක් ඒ බලපත්‍රය සඳහා එක්වරම ගෙවන්න ඕනෑ. ඔහු නැවත ඒ බලපත්‍රය අලුත් කරනවා නම් එවිටත් රුපියල් කෝටි 1,000ක් ගෙවලා තමයි එය අලුත් කරන්න සිදු වෙන්නේ. යම්කිසි ව්‍යාපාරිකයෙකුට ආයෝජන ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 500කට වඩා ආයෝජනය කරන්න පුළුවන් නම්, අපි ඔහුට ඒ බලපත්‍රය දෙනවා රුපියල් බිලියන 5කට; රුපියල් කෝටි 500කට. එය අලුත් කිරීමේදී ඔහුගෙනුත් රුපියල් කෝටි 1,000ක් ගන්නවා. ඒක තමයි නීතිය. ඒ වාගේම, පෙර සිට කැසිනෝ ව්‍යාපාරයක් කරගෙන යන අයෙකුගෙන් ඔහුගේ නව බලපත්‍රයෙනුත් රුපියල් බිලියන 2ක් -කෝටි 200ක්- ගන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඔහුගේ බලපත්‍රය අලුත් කිරීමේදීත් අපි රුපියල් කෝටි 1,000ක් ගන්නවා. බදු කියන රාජ්‍ය ආදායම සොයන ප්‍රධාන සාධකයේ තිබෙන එක් අරමුණක් තමයි, අධෛර්යවත් කළ යුතු දේ අධෛර්යවත් කිරීම සහ ඒ තුළින් ලබා ගත හැකි උපරිම ආදායම ජනතාව වෙනුවෙන් එකතු කිරීම. මේ කැසිනෝ ව්‍යාපෘති වෙනුවෙන් අය කිරීම් කරන විට රජය හැටියට අපි ඉතා පැහැදිලිව ඒ මූලධර්මය අනුව කටයුතු කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඊළඟ එක, ඉහත කී නියාමන පනත යටතේම වන පෙබරවාරි මාසයේ 02 දිනැති අංක 2369/42 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයයි. එහිදී ඩොලර් ආයෝජනය හා බලපත්‍ර ගාස්තුව සම්බන්ධ කරලා තිබෙනවා. කැසිනෝහි ඇමෙරිකානු ඩොලර් මිලියන 30ත්, 100ත් අතර සෘජු ආයෝජනයක් කරන, මුළු ව්‍යාපෘතියට ඩොලර් මිලියන 250ට වඩා යොදවන අයෙකුගෙන් නම් බලපත්‍ර ගාස්තුව රුපියල් බිලියන 10යි; රුපියල් කෝටි 1,000යි. බලපත්‍රය අලුත් කිරීම සඳහාත් රුපියල් කෝටි 1,000යි. යම් අයෙකු කැසිනෝ ව්‍යාපාරය වෙනුවෙන් පමණක් ඩොලර් මිලියන 100ට වඩා යොදනවා නම්, ඔහුගේ මුළු ආයෝජනය ඩොලර් මිලියන 500ට වැඩි නම් ඔහුගේ ආරම්භක බලපත්‍ර ගාස්තුව රුපියල් කෝටි 500යි. හැබැයි, බලපත්‍රය අලුත් කරන කොට රුපියල් කෝටි 1,000යි. බිලියනවලින් කිව්වොත්, රුපියල් බිලියන 10යි. පෙර බලපත්‍ර නිකුත් කරපු කණ්ඩායමට මේ කාරණාවේදී කැසිනෝ බලපත්‍ර ගාස්තුව රුපියල් බිලියන 2යි; රුපියල් කෝටි 200 යි. හැබැයි, බලපත්‍රය අලුත් කරන කොට රුපියල් කෝටි 1,000 යි. මේක මේ රටේ ජනතාව විශේෂයෙන් දැන ගත යුතුයි. බොහෝ විට කියනවා නේ, "අපි හැම තැනටම බදු ගහනවා. සාමාන්‍ය අයට බදු ගහනවා" කියලා. එහෙම නැහැ. මෙවැනි ගත යුතු තැන්වලින් උපරිම වශයෙන් රාජ්‍ය ආදායම ලබා ගැනීම පිළිබඳ අවධානය යොමු කරලා තමයි සමස්ත ආදායම සෙවීමේ අනෙක් ව්‍යාපෘතිවලට යොමු වන්නේ කියන එක කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එය ඉතා වැදගත්.

නිතර අහන දෙයක් තමයි, මේවා කරන්න නිවැරැදි නියාමනයක් තිබෙනවාද කියන එක. ඔව්, ඒ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

අපේ දැනට තිබෙන නියාමන පනතේ මේවාට අවශ්‍ය ශක්තිය නැහැ, අවශ්‍ය නව තාක්ෂණය නැහැ. ඒ නිසා තමයි අපි ලඟිලඟියේ කැසිනෝ නියාමන පනතක්, සූදු නියාමන අධිකාරියක් හදන්න කටයුතු කරන්නේ. ඒ සඳහා වූ නීති කෙටුම්පත මේ වෙනකොට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යොමු කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ නීතිය ඉතා ඉක්මනින් කෙටුම්පත් කරලා මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න. ඒ නීතිය ඉදිරිපත් කිරීම තුළ අපට පුළුවන් වෙනවා, මෙතෙක් තිබුණු විවිධාකාර සිදුරු වහලා සැබෑවටම රාජ්‍ය ආදායමට කැසිනෝ ව්‍යාපෘති තුළින් උපරිම ආදායමක් ලබා ගන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඇත්තටම අපි අද පරිපූරක ඇස්තමේන්තුවක් ගැන නොවෙයි කථා කරන්නේ. මම මේ දෙවැනි කාරණාව ගැනයි කථා කරන්නේ. ජනාධිපති කාර්යාලය හරහා වියදම් කිරීමට තිබුණු වැය ශීර්ෂ කිහිපයක් තවත් වැය ශීර්ෂ කිහිපයකට මාරු කිරීමක් මේ කර තිබෙන්නේ. පරිපූරක ඇස්තමේන්තුවක් කියන්නේ අලුත් වියදමක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අලුත් වියදමක් නම්, ඒකෙන් අය වැය හිඟය වැඩි වෙන්න ඕනෑ, ප්‍රාථමික ගිණුමේ වියදම් වැඩි වෙන්න ඕනෑ. හැබැයි, මේකෙන් ඒ කිසිවක් වෙන්නේ නැහැ. රුපියල් මිලියන 8,750ක් වෙන් කරපු යෝජනාවලට මේ වර්ෂයේ දී මූල්‍යමය අවශ්‍යතාවක් නැහැ. ඒ යෝජනා ක්‍රියාත්මක කිරීමේ මූලික කටයුතු -අවශ්‍ය නීතිමය කටයුතු, දෙපාර්තමේන්තුවල අවසරය, සම්බන්ධීකරණ කටයුතු- මේ වෙනකොට කෙරීගෙන යනවා. ඒ යෝජනාවලින් බොහෝ ප්‍රමාණයකට අවශ්‍ය වෙනවා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය, පරිසර බලපත්‍ර. ඒ නීතිමය කටයුතු කරන නිසා රුපියල් මිලියන 8,750ක් අපට යෝජනා කරනවා. හරි නම් මේක තමයි ආයතනයක ගණකාධිකාරිවරයාගේ කාර්යභාරය. හැබැයි, අපි නීතිය අනුව කැබිනට් මණ්ඩලයෙන් කැබිනට් පත්‍රිකාවක් අනුමත කරගෙන, මූල්‍ය පාලකයා හැටියට මේ සභාවට අද මේක ඉදිරිපත් කරනවා.

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

මොකද, නීත්‍යානුකූලභාවය නිසායි. ඒ කිව්වා වාගේ ග්‍රාමීය පාර වෙන්න පුළුවන්, ජල යෝජනා ක්‍රමය වෙන්න පුළුවන්, පානීය ජල ව්‍යාපෘතිය වෙන්න පුළුවන්. ඒවා පසුගිය වකවානුවේ අතරමඟ නතර වෙච්ච යෝජනා. ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. ඒවාට අවශ්‍ය මූල්‍යමය පහසුකම අපි 2025 අය වැය ලේඛනයෙන් වෙන් කරලා ඒ ව්‍යාපෘති දිගටම ක්‍රියාත්මක කරගෙන යනවා. මේ වර්ෂයේ ඒවාට අවශ්‍ය නීතිමය පසුබිම හදා ගන්නවා. ඒවාට මුදල් අවශ්‍ය නැහැ. ඒවා කඩිනමින් 2025 දී ක්‍රියාත්මක කරන්න පුළුවන්. හැබැයි, ඒ ඉතිරි වෙන මුදල මේ රටේ ග්‍රාමීය ජනතාවගේ, වතුකරයේ ජනතාවගේ හදිසි අවශ්‍යතා වෙනුවෙන් යොදවන්න ඕනෑ. ඒවා නවත්වන්න කියලා ද දන්නේ නැහැ විපක්ෂය අපට යෝජනා කරන්නේ. අවුරුදු ගණනක් හදන්න බැරි වුණු කැඩිච්ච පාරවල් හදන්න අවශ්‍ය නැද්ද? අපි ඒ සල්ලි ටික තබා ගන්න එකද කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? භාගෙට කරපු පානීය ජල ව්‍යාපෘතිය ඒ ජනතාව වෙනුවෙන් නැවත ක්‍රියාත්මක කරන්න අවශ්‍ය නැද්ද? ඒකයි මට තිබෙන ප්‍රශ්නය. මෙන්න මේ වැය ශීර්ෂය මාරු කරන්නේ ජනතාවගේ අවශ්‍යතාව සඳහායි. ඒකට, ඡන්දයක් තිබුණාද, නැද්ද, කොයි අවුරුද්දේ ද මැතිවරණයක් තිබෙන්නේ කියන එක නොවෙයි අදාළ වන්නේ. එහෙම වුණොත් අපට මේ වැඩ සියල්ලම නවත්වන්න සිදු වෙනවා. එහෙම නම් අපට අස්වැසුම සහනාධාරය බෙදන්නත් බැහැ, රාජ්‍ය සේවකයාගේ පඩිය දෙන්නත් බැහැ. සංවර්ධන ව්‍යාපෘති ඔක්කෝම නවත්වලා මේ අවුරුද්දේ මැතිවරණයක් තියෙනවා කියලා බලා ඉන්නද ඔබතුමන්ලා අපට යෝජනා කරන්නේ? අපි, මේ රජය අවසාන පැය දක්වා මේ රටේ ජනතාව වෙනුවෙන් වැඩ කරන්න සූදානම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි ඒක කරනවා.

අද සමහර අය දේපළ බද්ද ගැනත් කථා කරනවා. ඊයේ ජනාධිපතිතුමාත් මේ ගැන ඉතා පැහැදිලිව සඳහන් කළා. මේ රටේ ජනතාවගෙන් සියයට 90ක් මේ බද්දට අයිති වෙන්නේ නැහැ. සියයට 10කට වැඩි,- ඒ සඳහා නිකුත් කළ මාධ්‍ය නිවේදනයේ ඉතා පැහැදිලිව තිබෙනවා, "කෙසේ වෙතත් මේ බද්ද තුළින් අවධානය යොමු කර ඇත්තේ සාමාන්‍ය ආදායම් ලබන්නන් කෙරෙහි නොවේ. ඉහළ වත්කම් සහිත පුද්ගලයන් කෙරෙහි වේ. ඉහළ වටිනාකම් සහිත දේපළ හෝ සමාජයේ ධනවත් පුද්ගලයන්ට අයත් දේපළ මත බද්ද අයවෙන බව තහවුරු වන පරිදි සුදුසු බදු නිදහස් සීමාවන්" කියලා. ඒ නිසා මේක කිසිසේත්ම සාමාන්‍ය ජනතාවට බලපාන්නේ නැහැ. ඒ වාගේම කෙනෙකුගේ පළමු දේපළට බලපාන්නෙත් නැහැ. මේක ලෝකයේ බොහෝ රටවල තිබෙනවා. අපේ රටේ ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමාගේ සමයේත් මෙවැනි බද්දක් තිබුණා. මේක ඇත්තටම මේ රටේ කථා කරන ප්‍රගතිශීලිම බද්දක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ කියන්නේ සමාජයේ ඉන්න සමස්ත ජනතාවගෙන් සියයට 10කටත් වඩා අඩු ඉතා ධනවත්ම අයගෙන් යම්කිසි සාධාරණ ප්‍රතිශතයක්, ඉතා සුළු ප්‍රතිශතයක් -ඒකත් කියන්න ඕනෑ. ඔවුන් බය වෙන්නත් අවශ්‍ය නැහැ- රාජ්‍ය ආදායමට එකතු කරගෙන සමස්ත ජනතාවට එහි ප්‍රයෝජනය ලබා දෙන්නයි මේ කටයුතු කරන්නේ. නමුත්, අපට ප්‍රශ්නයක් තිබෙනවා නේ. අපි හැමවෙලාවේම කියනවා නේ අපේ රටේ වක්‍ර බදු වැඩියි, සෘජු බදු අඩුයි කියලා. ඔව්, එතැන ප්‍රශ්නයක් තිබෙනවා.

අපි මේ තනතුරු භාර ගන්නකොට, ජනාධිපතිතුමා මුදල් ඇමති වනකොට මේ රටේ වක්‍ර බදු සියයට 80යි, සෘජු බදු සියයට 20යි වශයෙන් තිබුණේ. ඒ කියන්නේ, සමස්ත ජනතාව බර දරන බදු සියයට 80ක්. දැන් අපි සතුටු වෙනවා, ඒක සියයට 30, 70 ගණනට ගෙනෙන්න පුළුවන් වුණු එක ගැන. අපේ උත්සාහය මෙය සියයට 60, 40ට ගෙනෙන්න. සමස්ත බද්දෙන් සියයට 40ක් සෘජු බදු බවට පත් කරන්න. ඒක තමයි බදු ක්‍රමයේ ප්‍රගතිශීලිත්වය. ඒ නිසා කිසි කෙනෙක් මේ ගැන අනියත බියක් ඇති කරගත යුතු නැහැ. මේක අපි ඉතා සැලකිල්ලෙන් විශ්ලේෂණය කරලා තමයි ක්‍රියාත්මක කරන්නේ. සියයට 90ක පිරිසට මේකෙන් ලැබෙන්නේ සහනයක් පමණයි. අනෙක් අයටත් අනවශ්‍ය බරක් ඇති නොවන ආකාරයට ලෝකයේ තිබෙන ක්‍රමවේදය අනුව තමයි මේක වෙන්නේ. ඒ නිසා මේක ගැන අපි අනවශ්‍ය බියක් ඇති කර ගැනීමේ අවශ්‍යතාවක් නැහැ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ දවස්වල වැඩිපුරම කථා වෙනවා, රාජ්‍ය ණය ශේෂය පිළිබඳව. ඔව්, අපට ඒ ගැන ප්‍රශ්නයක් තිබුණා. රාජ්‍ය ණයත් එක්ක තමයි අපි යම් තැනක හිර වුණේ. 2022 අප්‍රේල් මාසයේදී අපට කියන්න සිද්ධ වුණා, තාවකාලිකව ණය ගෙවන්න අපහසුයි කියලා. අපට එහෙම කියන්න වුණේ දළ දේශීය නිෂ්පාදිතයත් එක්ක බලනකොට අපේ ණය තොගය සියයට 128ක් වුණු නිසායි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව බලනකොට වාර්ෂික ගෙවීම සියයට 34ක් වුණා. මේ තත්ත්වය රටකට දරාගන්න බැහැ. දැන් අපි යම් කිසි ඉලක්කයකට අනුව ගමන් කරනවා. අපි බලාපොරොත්තු වෙන්නේ 2032 වනකොට සියයට 128ක් වෙච්ච මුළු ණය තොගය සියයට 95කට ගෙනෙන්න, වාර්ෂික ගෙවීම සියයට 13කට ගෙනෙන්න; අපට දැරිය හැකි ප්‍රමාණයකට ගෙනෙන්න. බොහෝ අය දැන් කියන්න උත්සාහ කරනවා, අපි නැවතත් ණය ගෙවන්න වුණාම ප්‍රශ්නය එතැනටම යයි කියලා. නැහැ. අපට ගෙවන්න පුළුවන් තැනකට ගෙනෙන්න තමයි මේ ප්‍රතිව්‍යුහගත කිරීම කරන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. දැන් අපි දේශීය ණය කොහොමත් අපි ගෙනෙනවා. ද්විපාර්ශ්වික ණය සම්බන්ධයෙන් වූ ඉලක්කය ඉතා මෑතකදී නිමා කර ගන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා.

මට තව කොච්චර වෙලාවක් තිබෙනවාද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You have four more minutes.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
හොඳයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ඉතා වග කිව යුතු ආකාරයට මේ ප්‍රතිව්‍යුහගතකරණය කරගෙන යනවා. ඒ අතරේ ඇයි, අපි පසුගිය දා රාජ්‍ය ණය කළමනාකරණ පනත ගෙනාවේ? අපට අවශ්‍ය වෙලා තිබෙනවා, නැවත වරක් මේ රට මේ කියන ණය උගුලේ දිගුකාලීනව හිර නොවීමට අවශ්‍ය පසුබිම නීතිමය වශයෙනුත් නිර්මාණය කරන්න. ඒ සියල්ල කරගෙන යන අතරේ මම දැක්කා පසුගිය දිනවල නිතරම කථා කරනවා, පසුගිය වර්ෂ දෙකේ රටේ ණය ශේෂය වැඩි වුණා කියලා. ආයෙත් සඳහන් කර තිබෙනවා, -මම මේක පැහැදිලි කළා- මේ අවුරුද්දේ පළමුවෙනි මාස තුනෙත් ණය ශේෂය වැඩි වෙලා තිබෙනවා කියලා. ණය ශේෂය වැඩිවීම ගැන තමයි අපි පාර්ලිමේන්තුවේ අය වැය සම්මත කරලා කථා කළේ. 2022 වසරේ අය වැයත් හිඟ අය වැය ලේඛනයක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 2023 වසරෙත් හිඟ අයවැය ලේඛනයක්. 2024 වසරෙත් හිඟ අය වැය

ලේඛනයක්. මොකක්ද, හිඟයි කියලා කියන්නේ? ආදායමට වඩා වියදම වැඩියි. අපි කොහොමද මේක හොයා ගන්නේ? අය වැය හිඟය මේ සභාවට කියලා අපි අනුමත කරගත්තා. 2022දී අපි අවසර අරගෙන තිබෙනවා, රුපියල් බිලියන 2,460ක හිඟයක්,- මේක තමයි මූල්‍යායනය කරනවා කියන්නේ. මේ මුදල අපි ණයට ගන්න ඕනෑ. මේකේ රහසක් නැහැ. 2023දී රුපියල් බිලියන 2,402ක්, 2024දී රුපියල් බිලියන 2,851ක් ගන්න ඕනෑ. ඒ මුදල් අපේ ණය ශේෂයට එකතු වෙනවා. හැබැයි, අපි මේ වර්ෂය තුළ දේශීය ණය ඔය කියන කාලසීමාවේ ගෙවලා, විදේශ ණයවලින් බහු පාර්ශ්වීය ආයතනවලට ණය ගෙවලා, 2022 අවුරුද්දේ ඉඳලා 2024 අවුරුද්දේ මාර්තු 31 දක්වා අපේ ණය ශේෂය ඩොලර් බිලියන 7කින් වැඩි වෙලා තිබෙනවා.

විජිත හේරත් මැතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ හිටියා නම් මම සතුටු වෙනවා. එතුමා තමයි මේක දිගින් දිගටම කිව්වේ. එතුමා කිව්වා, "බිලියන 7ක් තිබුණු එක බිලියන 17ක් වෙලා ලු" කියලා. ඒ වාගේම මේ අවුරුද්දේ මුල් මාස තුනේ ඩොලර්වලින් බැලුවොත්, බිලියන දශම පහක් වැඩි වෙලා තිබෙනවා. එතුමා කියනවා, "බිලියන 4ක් වැඩි වෙලා ලු" කියලා. නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2022 ඉඳලා මේ දක්වා ඩොලර් එකට රුපියල හුවමාරු වෙච්ච ප්‍රමාණය අපි බැලුවොත්, 2022 අවුරුද්දේදී ඩොලර් එකක් මිලදී ගන්න රුපියල් 362ක් අවශ්‍ය වුණා. මේ වෙද්දී රුපියල් 62කින් ඒ ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා, ඩොලරය අවප්‍රමාණය වෙලා තිබෙනවා. මේ අවුරුද්ද පටන් ගනිද්දී රුපියල් 323.9ක් අවශ්‍ය වුණා, ඩොලරයක් මිලදී ගන්න.

අද ඩොලරය රුපියල් 301ක් වෙලා, එහි අගය රුපියල් 22.80කින් අඩු වෙලා තිබෙනවා. රුපියල්වලින් පෙන්වන ණය ශේෂය ඩොලර්වලට හුවමාරු කිරීමේ දී ඩොලර් එකක් සඳහා යන රුපියල් ප්‍රමාණය අඩු වීම නිසා පෙන්වන ණය තොගයේ වැඩි වීම අරගෙන තමයි බිලියන 7ක් වැඩි වුණු එක බිලියන 17ක් කියන්නේ; බිලියන දශම 5ක් වැඩි වුණු එක බිලියන 4ක් වැඩි වුණා කියන්නේ. අපි නැඟිටින්න උත්සාහ කරන රටක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. හැබැයි, මම ඒකෙන් කියන්නේ නැහැ හැමදේම ධනාත්මකයි, ධනාත්මකයි කියලා. ප්‍රශ්න තිබෙනවා. විසඳා ගත යුතු ගැටලු තිබෙනවා. හැබැයි, අපි ශක්තිමත්ව නැඟිටින මොහොතේ, අපි හරි දේ මොකක්ද කියා දැන ගන්න ඕනෑ. මේ රටේ මිනිසුන්ගේ මනස ශක්තිමත් කිරීමේ වගකීමක් අපේ ගරු මන්ත්‍රීවරු 225දෙනාටම තිබෙනවා. අනවශ්‍ය දේවල් කථා කරලා, මිනිසුන් බිය ගන්වන්න නරකයි. දේශපාලන ප්‍රශ්න තිබෙන්නට පුළුවන්. අර කිව්වා වාගේ, ඒදණ්ඩක් හදන්න හැදුවත් දැන් කියන්නේ, ඒක කරන්නේ දේශපාලනය වෙනුවෙන් කියලා. නැහැ. ඒක හදන්නේ මිනිසුන් වෙනුවෙන්. මිනිසුන් අවසාන තීරණය ගනීවි. හැබැයි, වතුර දෙන එක, පාර හදන එක, ඒදණ්ඩ හදන එක, ඒ ඔක්කෝම දේශපාලනය නිසා කියලා කියන කණ්ඩායම අනවශ්‍ය විධියට මිනිසුන්ගේ මනස කඩා වට්ටලා ගන්න හදන ප්‍රයෝජනය ඊට වඩා භයානකයි. මම ඉතා වුවමනාවෙන් කියනවා, දේශපාලනය කරන්න, හැබැයි, වැටුණු රටක් නැඟිටින අවස්ථාවේ දී කරුණාකරලා දේශපාලනය වෙනුවෙන් එය ප්‍රයෝජනයට ගන්න එපා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. Mujibur Rahuman. You have 11 minutes.

[අ.භා. 1.57]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම පනත් කිහිපයක් යටතේ රෙගුලාසි, නියම, නියෝග සහ යෝජනා සම්මතයක් පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ ඒ පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ දවසේ ඉතාම වැදගත් දෙයක් සිදු වුණා. ඒ තමයි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ 56 වන සැසිවාරය විවෘත කරමින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් වොල්කර් ටර්ක් මහතා ලොව පුරා මානව හිමිකම් තත්ත්වය පිළිබඳව කළ සමාරම්භක දේශනයේ දී අපේ රට ගැනත් සඳහන් කිරීම. ඔහු කියනවා, "ශ්‍රී ලංකාව සාර්ව ආර්ථික තත්ත්වයේ වර්ධනයක් අත් කරගෙන ඇතත්, ආර්ථික අර්බුදය සමඟ බැඳුණු පටු තද කර ගැනීමේ පියවර නිසා වඩාත් පීඩාවට පත් වූයේ, වඩාත් දුගී සහ ආන්තිකරණය වූ කණ්ඩායම්. 2021 - 2023 කාලය තුළ දරිද්‍රතා අනුපාතය සියයට 13.1 සිට සියයට 25.9 දක්වා දෙගුණයක් වූ අතර, ඉදිරි වසර කිහිපය තුළද එය එසේම පවතිනු ඇති බවට අපේක්ෂා කෙරේ" යනුවෙන්. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම කියනවා, අපේ රටේ හතරෙන් එකක් දුගී බවට පත් වෙලා තිබෙනවා කියලා. රටේ හතරෙන් පංගුවක් දුගියන්. දැන් අපට පෙනෙනවා ආණ්ඩුව කියන සමහර දේවල් යථාර්ථයක් බවට පත් වෙලා නැහැ කියලා. අපි ඒක පිළිගන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම IMF එක අවසාන ණය වාරිකය ලබා දෙනකොට මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වූ බව අපි දන්නවා. ඒ මාධ්‍ය සාකච්ඡාවේදී IMF එක කිව්වා, ඇත්තටම සහන ලැබිය යුතු අයට සහන ලැබී නැති බව. ඒ කියන්නේ, ආණ්ඩුවේ කළමනාකාරිත්වය පිළිබඳව ඒගොල්ලෝ ප්‍රශ්න කර තිබෙනවා. ඒක තමයි යථාර්ථය.

දැන් මේ ආණ්ඩුවේ ජනාධිපතිතුමායි, ඇමතිවරුයි නිතර නිතර මාධ්‍ය තුළින් කියනවා, ඒගොල්ලෝ තමයි පෝලිම් නැති කළේ; ඒගොල්ලෝ දැන් ආර්ථිකය හෙමින් හෙමින් හදාගෙන එනවා. ඒ නිසා ඒගොල්ලන්ටම නැවත වතාවක් ආණ්ඩු බලය දෙන්න. එහෙම නැත්නම් IMF එකත් එක්ක මේ ගනුදෙනුව කරන්න බැහැ කියලා. අපි දැක්කා පසුගිය දවස් ටිකේ එවැනි අදහසක් කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක තමයි ඇත්තටම ලොකුම විහිළුව. මොකද, IMF එක කවදාවත් - ඊයේ පෙරේදා පවත්වපු මාධ්‍ය සාකච්ඡාවලදීවත් - කියා නැහැ, මේ ආණ්ඩුව, නැත්නම් මේ රට ඉවරයි කියලා. එහෙම එකක් කියලා නැහැ. IMF එක පැහැදිලිව ඒගොල්ලන්ගේ මාධ්‍ය සාකච්ඡාවේදී කියනවා, "මෙම වැඩසටහනේ අරමුණ ඉෂ්ට කර ගන්නේ කොහොමද කියන වෙනත් අදහස්වලට කන් දෙන්න අපි සූදානම්" කියලා. ඒ කියන්නේ, "අලුත් ආණ්ඩුවක් පත් වුණොත් ඒ ආණ්ඩුව ඉදිරිපත් කරන අලුත් අදහස්වලට අපි ඇහුම්කන් දෙන්න ලෑස්තියි. ඒ අදහස් යථාර්ථවාදී නම් අපි ක්‍රියාත්මක කරන්නත් ලෑස්තියි" කියලා IMF එකේ දූත මණ්ඩල ප්‍රධානී පීටර් බෲවර් මහතා ඒ මාධ්‍ය සාකච්ඡාවේදී ප්‍රකාශ කර තිබෙනවා.

එතකොට දැන් අපට පෙනෙනවා, ආණ්ඩුව කියන දේවල් නොවෙයි IMF එක කියන්නේ කියලා. මේ ආර්ථිකය වට්ටපු අය, ආර්ථිකය විනාශ කරපු අය, වැරදි ආර්ථික තීන්දු අරගෙන මේ රටේ දරිද්‍රතාව වැඩි කරපු උදවිය දැන් රටට පෙන්වන්න උත්සහ කරනවා, අපි තමයි මේක ගොඩ නැඟුවේ කියලා. එහෙම එකක් නැහැ. ඔය ගොල්ලන් ගොඩ නඟපු දෙයක් නැහැ. ඔය ගොල්ලන් මේ රට විනාශ කරපු උදවිය; මේ රට වට්ටපු උදවිය; මේ රටේ

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

දුප්පත්කම ඇති කරපු උදවිය; මේ රටේ වංචා දූෂණ ඇති කරලා මේ රටේ ආර්ථික ක්‍රමවේදය සම්පූර්ණයෙන් අවුල් කරපු උදවිය. එහෙම අවුල් කරපු උදවිය දැන් ජනතාවට පෙන්වන්න හදනවා, අපි මේක ගොඩ නහන්න හදනවා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කාරණයත් කියන්න ඕනෑ. ජනාධිපතිතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ Technical Assistance Report එක තවම පාර්ලිමේන්තුවේ සභාගත කළේ නැහැ. ජනාධිපතිතුමා කිව්වා මාර්තු මාසයේ එය සභාගත කරනවා කියලා. නමුත් අද වෙනකම් ඒක සභාගත කළේ නැහැ. ඒක එළියට දමන්නේ නැතිව තියාගෙන ඉන්නවා. ඒ වාගේම ජනාධිපතිතුමා මැතිවරණයක් අත ළඟ තිබියදී, මැතිවරණය ප්‍රකාශ කරන්න තව දින 32ක් වාගේ කාලයක් තිබියදී රුපියල් මිලියන 8,750ක් ජනාධිපති ලේකම් කාර්යාලයට වෙන් කර ගන්න අවශ්‍ය ලියකියවිලි, යෝජනා අද ගෙනැවිත් තිබෙනවා. මැතිවරණයක් අත ළඟ තියාගෙන මොකක්ද මේ කරන්නේ? තව දින 32කින් මැතිවරණය ප්‍රකාශයට පත් කරනවා. ජනාධිපතිතුමා රුපියල් මිලියන 8,750ක් ජනාධිපති ලේකම් කාර්යාලයට වෙන් කරගෙන ඒ මුදල ඊළඟ මැතිවරණයට පාවිච්චි කරන්න හදනවාද කියන සැකය අද අපට මතු වෙලා තිබෙනවා. මැතිවරණයට දින නියම කරන්න මාසයක් තිබියදී මෙච්චර මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වෙන්නේ ඇයි? මැතිවරණයට මාසයක් තිබියදී ඒ මුදල්වලින් කරන්න පුළුවන් වැඩ පිළිවෙළ මොකක්ද ? ඒක ප්‍රායෝගිකද? ප්‍රායෝගික නැහැ. ඒ නිසා අපි මැතිවරණ කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව විමර්ශනයක් කරන්න කියලා. ජනාධිපතිතුමා මැතිවරණයක් ළංවෙලා තිබියදී රුපියල් මිලියන 8,750ක් එතුමාගේ ලේකම් කාර්යාලයට වෙන් කර ගත්තේ කුමක් වෙනුවෙන්ද කියන එක ගැන පරීක්ෂණයක් පැවැත්වීම මැතිවරණ කොමිසමේ වගකීම බව අපි කියා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව පසුගිය කාලයේ මිල සූත්‍රයක් හැදුවා. මේ ගොල්ලන් කිව්වා, සහන දෙනවා කියලා. දවස ගණනේ නොයෙකුත් ආකාරයෙන් ජනතාවගෙන් අය කරන බදු වැඩි කරගෙන වැඩි කරගෙන ගිහිල්ලා දැන් දරා ගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. අපි දැක්කා, ආණ්ඩුව දැන් ගෙවල් කුලියටත් බද්දක් ගහන්න ලැහැස්ති වෙනවා. ජනාධිපතිතුමා ඊයේ මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ කථාවත් වෙන පැත්තකට හරවන්න උත්සාහ කළා.

2023 සැප්තැම්බර් මාසයේ සිට මේ දක්වා ලෝක වෙළෙඳ පොළේ බොරතෙල් මිල සියයට 27කින් අඩු වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නමුත් ආණ්ඩුව අඩු කළේ කීයද? පෙට්‍රල් ලීටරය සියයට දෙකකින් අඩු කරන්න තමයි ආණ්ඩුවට පුළුවන්කම ලැබුණේ. ඒ වාගේම ඩීසල් ලීටරය අඩු කළේ සියයට 11කින් විතරයි. පසුගිය සැප්තැම්බර් මාසයේ සිට අද දක්වා ලෝක වෙළෙඳ පොළේ බොරතෙල් මිල සියයට 27කින් අඩු වෙලා තිබෙනවා. නමුත් තමුන්නාන්සේලා ඒකේ වාසිය ජනතාවට ලබා දුන්නේ නැහැ. ඒ වාසිය ජනතාවට ලබා දෙන්න බැරි ඇයි? මේ ගොල්ලන් මිල සූත්‍ර හැදුවා කිව්වා. මිල සූත්‍රය දින 15න් 15ට ක්‍රියාත්මක කරනවාය කියලා කිව්වා. නමුත් ඒ කිසි දෙයක් වෙන්නේ නැහැ. තවමත් ජනතාව මත අසීමිත ලෙස බර පටවලා තිබෙන බව අපට පේනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. ජනාධිපතිතුමාට අත්දැකීම් තිබෙනවා කියලා කියනවා. ජනාධිපතුමාගේ කළමනාකාරිත්වය ගැන තමුන්නාන්සේලා කථා කරනවා. හැබැයි, එතුමාගේ අමාත්‍යාංශයේ සිදුවෙන හොරකම් ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. ජනාධිපතිතුමා ඉස්සෙල්ලාම එතුමාගේ අමාත්‍යාංශය බේරා ගන්න එපායැ. එතුමාගේ අමාත්‍යාංශය යටතට වැටෙන ආයතනයක් තමයි ජාතික ලොතරැයි මණ්ඩලය. ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කරන්නේ චමීර **යාපා** අබේවර්ධන. පසුගිය මාර්තු මාසයේ 31වැනි දායින් පස්සේ ලොතරැයි ටිකට්පත් මුද්‍රණය කිරීමට, ප්‍රවාහනය කිරීමට අදාළ ටෙන්ඩරය අවසන් වුණා. ඉන් පසුව කිසිම ටෙන්ඩර් කැඳවීමක් නැහැ. එතුමාගේ Board Paper එකක් නැහැ, Board එකේ අනුමැතියක් නැහැ. ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කරලා නැහැ. ඔහු රජයේ නීති රීති, චක්‍රලේඛන කිසිම දෙයක් පිළිපදින්නේ නැතිව පසුගිය මාර්තු මාසයේ ඉඳන් මාස තුනකට ටිකට්පත් මුද්‍රණය කිරීම, ප්‍රවාහනය කිරීම භාර දීලා තිබෙනවා, Ceylon Business Appliances කියන ආයතනයට, DPJ Holdings කියන ආයතනයට සහ Printcare කියන ආයතනයට. තව එක ආයතනයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. Oracle International කියන ආයතනයටත් ලබා දීලා තිබෙනවා. මේ ගොල්ලන්ගෙන් මිල ගණන් කැඳවීම් කර තිබෙනවා.

මිල ගණන් කැඳවලා, අඩුම මිල ගණන්වලට නොවෙයි සභාපතිවරයා ටෙන්ඩරය ලබා දීලා තිබෙන්නේ. එතුමා කිසිම ආකාරයක ප්‍රසම්පාදනයක් නැතුව මම නම් කියපු වැඩිම මිල ගණන් තිබෙන ආයතන තුනට ටිකට්පත් මුද්‍රණය කිරීම, ප්‍රවාහනය කිරීම ආදිය භාර දීලා තිබෙනවා. ඒ භාර දීම තුළ ආණ්ඩුව -මුදල් අමාත්‍යාංශය- මාස තුනකට රුපියල් මිලියන 13ක් වැඩිපුර ගෙවනවා. එම අමාත්‍යාංශය ජනාධිපතිතුමා යටතේ තිබෙන්නේ. ජනාධිපතිතුමාට අත්දැකීම් තිබෙනවා නම්, එතුමා කළමනාකරණයට දක්ෂ නම් ඇයි, එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ජාතික ලොතරැයි මණ්ඩලයේ තිබෙන වංචා, දූෂණ නවත්වන්න වැඩ නොකරන්නේ? ඇයි, එතුමා මේවා බලාගෙන ඉන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික ලොතරැයි මණ්ඩලයට අදාළ 2022 අවුරුද්දේ Auditor-Generalගේ වාර්තාව මා ළඟ තිබෙනවා. Auditor-Generalගේ මේ වාර්තාවේ තිබෙනවා, 2022 අවුරුද්දේ ජාතික ලොතරැයි මණ්ඩලය ලොතරැයි මුද්‍රණය කරලා නැහැ, ලොතරැයි මුද්‍රණය නොකිරීම නිසා ම ජාතික ලොතරැයි මණ්ඩලයට රුපියල් මිලියන 872ක පාඩුවක් වෙලා තිබෙනවා කියලා. ඒ පාඩුව වෙලා තිබෙන්නේම ජාතික ලොතරැයි මණ්ඩලයේ තිබෙන අකාර්යක්ෂමතාව නිසා. විගණකාධිපතිතුමාගේ වාර්තාව අනුව ඒ පාඩුව අය කර ගන්න කියන්නේ, DPJ Holdings කියන සමාගමෙන්. එහෙම නැත්නම් ඒ සමාගම blacklist කරන්න කියලා Auditor-General මේ වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා. එහෙම කියලා තිබෙද්දී වර්තමාන සභාපතිවරයා තමන්ගේ හිතුමතයට, Auditor-Generalගේ වාර්තාවෙන් එහා ගිහිල්ලා, blacklist කරන්න කියපු කොම්පැනිවලට tender procedure එකක්වත් නැතුව ඒ කටයුතු ටික භාර දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිතුමා එක පැත්තකින් අපට කථා කරනවා, එකතු වෙන්න කියලා. එතුමා කියනවා, එකතු වෙලා කටයුතු කරමු කියලා. ජනාධිපතිතුමාගෙන් අපි අහනවා, ඔබතුමා අපට එකතු වෙන්න කියන්නේ, මේ හොරකම්වලට දායකත්වය ලබා දෙන්නද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඉක්මනින් අවසන් කරන්නම්.

ඊළඟට බලන්න, අර වීසා ප්‍රශ්නය ගැන. මොබිටෙල් ආයතනය කිව්වා, ඩොලර් එකකට මේ වීසා නිකුත් කිරීමේ කටයුත්ත කරන්නම් කියලා. ඩොලර් එකකට කරන්න පුළුවන් වැඩේ ඒ ආයතනයට නොදී, ආණ්ඩුවට ඒ ආදායම ගන්නේ නැතිව ඩොලර් 25ක් එක විදේශිකයෙකුගෙන් අය කර ගන්න එය දුන්නා, VFS කියන ආයතනයට. එතකොට මේ ආණ්ඩුවේ සැලැස්ම අපට පෙනෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වංචා, දූෂණ අවම කර ගන්නා වූ කිසිදු වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුවට නැති බව තමයි අපට පෙනෙන්නේ. අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Jeevan Thondaman. You have 12 minutes.

[2.08 p.m.]

ගරු ජීවන් තොණ්ඩමන් මහතා (ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜீவன் தொண்டமான் - நீர் வழங்கல் மற்றும் பெருந்தோட்ட உட்கட்டமைப்பு வசதிகள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Jeevan Thondaman - Minister of Water Supply and Estate Infrastructure Development)
Hon. Deputy Chairman of Committees, I would like to take this opportunity given to me to actually make a clarification. I think everyone has been aware of what took place or transpired recently at Pedro Estate under Kelani Valley Plantations. I had remained silent till now because I did not want to refute something that was already false; it is a complete falsified narrative that was sent around. Therefore, I think it is high time that I issue a clarification. I hope the Hon. Members in this House, rather than playing politics with a marginalized community, would accept the situation and come forward to find a solution collectively.

Apart from the issue at Pedro Estate managed by Kelani Valley Plantations, there was also an issue in the Uda Radella Estate, which too belongs to that plantation company. In the Uda Radella Estate, close to 298 workers were striking for 30 days because three people were stopped from work unfairly. Those 298 workers - I beg this House not to look at them as workers, but as breadwinners of 298 families who are trying to educate their children - had been striking for close to 30 days! Why was that? Because there was an issue when the company decided to plant coffee. Again, I would like to refute any claims made by the plantation companies or the Planters' Association that we were against the planting of coffee. I will assure you that being the largest tea estate union in the country, we are not against mechanization, we are not against a productivity-based model and are not against crop diversification. But, I would like to remind everyone that there are 40,000 hectares of uncultivated land in the plantations in this country. Coffee can be planted in uncultivated land. Why should tea be uprooted to plant coffee? Even if that is the case, a discussion should have taken place. Repeatedly, the workers in that estate had requested the manager for a discussion, but that discussion did not take place, and by force, the company tried to plant coffee.

For all those who may claim that, at the end of the day, it is the company's prerogative, it is their choice, I would like to remind that the tea estate is completely a different kettle of fish. When it comes to the tea estate, those people have been working there for nearly 200 years as a family, generation after generation. They educate their children with the daily wages they get from plucking tea. And the plantation company wanted to uproot the tea with the malicious intent of just depriving the workers of their Rs. 1,700 daily wage. We had requested for a meeting repeatedly; the Labour Commissioner had also requested for a meeting repeatedly to have a discussion. But, the companies refused to adhere to that and they wanted to plant coffee by force.

That is where a lot of assumptions had been made when narratives had been falsified. For example, an allegation had been made by the company against those three workers. I would like to remind everyone here that out of those three workers, only one belongs to my trade union and the other two who were also affected are not from my union. There is no politics here; there is no trade union bias here. Against those three workers, there was an allegation that they had said they would assault the backhoe driver and the Assistant Manager who were working there. And, who are the witnesses to that incident? The Assistant Manager and the backhoe driver! All we said was, there needs to be a fair inquiry. I did not say that they have to give back the workers their jobs; I said there needs to be a fair inquiry, but that was not heard upon. They sacked the workers unfairly. Which field or which industry in this country can unfairly sack whoever they want to just to teach a lesson and get away with it? Why does the Labour Law not applied to those RPCs? It is because the Agreements that had been signed back then are so weak. Those had given the companies total autonomy over the plantations. Today, if an NGO wants to go to the plantations, they require permission from the companies. Today, if the Government wants to build a toilet in a plantation, they require permission from the plantation company. Why? Are those plantation workers not citizens of Sri Lanka?

When this happened, we had a two-hour meeting at the GA's Office in Nuwara Eliya, at the Labour Commissioner's place. I would ask any Member of this House who is concerned about this matter to take the minutes of that meeting and have a look. In those minutes, you would find that, at the meeting, we had proved to the comany that all what they did was wrong and finally, when the CEO realized they are at fault, he said - it is recorded in the minutes - "We do not come under a court of law." They cannot claim that they do not come under a court of law. They are a Regional

[ගරු ජීවන් තොණ්ඩමන් මහතා]

Plantation Company that is benefitting through State land. So, that should not be encouraged. They do come under a court of law. Finally, what happened was, when we were leaving the GA's office, the manager of that particular estate had an argument with the workers. Mind you, I was not there and the CCTV camera footages of the GA's Office are there. So, there was an argument and following that argument, when those workers asked me what to do, I told them, "Please go and complain to the police. Follow the procedure." When they went to the police, they were kept out standing. Then, the CEO of the comapany had instructed 50 of his superintendents to come there. They went into the police station and lodged a complaint against those poor workers. I would like to reiterate, the Kelani Valley Plantations belong to the richest man in this country, a presidential candidate, and he is filing cases against 35 of the poorest workers in this country. Where is justice in that? Where is equity?

And as how the media had portrayed it, I did not storm the police station nor did I storm the estate. We took trade union action. After taking trade union action, when I went to that estate, it came to my notice that workers were forcibly being held inside the factory. I brought it to the notice of the Nuwara Eliya Police, but nothing was done. So, I had to go and get them out. Similarly, I did not hold any CEO hostage. I have video recordings of it; there is proof. I sat and had a civil discussion with him. He claimed that he was taking 27 pills of medicine.

First of all, why would you have somebody who is taking 27 pills of medicine, someone unfit like that running your company? I do not understand that. But, anyway I sat and had a civil discussion with that particular CEO. In fact, there is even a video recording of me telling him, "You are free to leave at any given point of time. Please do not misunderstand how this situation has come up, but we want a solution for these 298 workers". There was no holding of hostage, as the media portrayed, there was no assault that took place and there was no damage to person or property. Mind you, there were close to 600 workers standing there. Six hundred workers were standing outside the factory for nearly four to five hours, demanding justice. And, what did the Planters' Association say? They said that they were drunk, that Jeevan Thondaman was with a drunken mob. There were 600 workers, among whom there were many women. We have video proof of it all. They were standing there quietly; there was no such ruckus.

But, where the issue got out of hand, I will tell you. Sir, it is not illegal in this country to get angry, if I am not mistaken. I, with my limited experience of running trade union discussions, and the Hon. Member Sujith Sanjaya Perera, who is here - he is a planter and also a senior trade unionist - even with his experience can openly say in this House that never has the police interfered in a trade union discussion between the employers and the employees. And, while I was sitting there and a discussion was going on between the union and the employers, one Mr. Ekanayake, the Acting ASP walked in, sat on the side of the company representatives and started negotiating on behalf of the company. How fair is that? When people who are supposed to protect you start oppressing you, what can you do? There was a directive from the former IGP in 2022 that the police cannot interfere in trade union discussions unless there is a criminal issue. Police have no right to go and tell the workers, "If you do not stop your trade union action and go to work, we will arrest you". Will they say that to any other trade union, regardless of which field it belongs to? So, that is exactly what happened. Following that, yes, those three workers were reinstated, which we appreciate.

On the second day, I was told that there was a complaint filed against me. I would like to remind you, Sir, that I am a lawyer as well. I did not barge into the police station and say, "Oh, how can you file an entry against me? No, no, remove it!" I cannot say those things. I went and asked the police officer there, "Is there an entry filed against me and the other workers?" It is my right to know that as a Sri Lankan citizen. But, after that, certain media, maybe, having political bias or bias towards the companies - I say certain media and if the hat fits, they can wear it - decided to falsify the narrative and assassinate my image. I can give everyone a small example. If you look at certain newspapers, they reported "Planters were assaulted" and so on, all falsified news. Then, if you turn the pages, you would find a full-page advertisement from the Hayleys worth a few million rupees. Realistically, as a trade unionist, I am sorry, I cannot give any full-page advertisements. But, at the end of the day, I still believe in ethics of journalism and hope they are being upheld. I would just like to tell everyone that for my actions as a Minister and as a public servant, over which all those voices criticized me, I will take responsibility. But, at the same time, I would ask where were those voices which criticized me when Sahan Rathnayake, an assistant estate manager in Matale, evicted a family, breaking down their 8 x 8 temporary shed? You could hear a child screaming inside that. Where were those voices then, the voices for justice? Similarly,one Manager, Mr. Lasantha Silva, of the Agarapatana Plantations - I am going to name and shame the company because that would not bring down the quality of the "Ceylong Tea" brand, but only the poor quality of work and lack of dignity for the labourers would - had given false instructions to a worker at the Planters' Club, who refused to follow that. And, what did the Manager do when the worker refused to follow it? He took that worker, assaulted and put him in a refrigerator! Where were these voices for justice then? Similarly, the Kahawatte Plantations in Ratnapura hired 15 thugs to go and beat up one particular worker who refused to follow instructions. Once again, yesterday, the Hon. Buddhika Pathirana had also mentioned a similar situation in Galle. Where were all these voices then? Please apply the same standards to all the other incidents. Exploitation of workers must stop and I will start naming and shaming these companies because when you ask them about the Rs. 1,700 wage, they say, "No, we gave a proposal", "We gave this and we gave that." I will honestly tell everybody - the planters should know, the Colombo Tea Traders' Association should know and everyone should know - the reason for the mess we are in today. That is because of one individual, Mr. Roshan Rajadurai.

When we, as the Government, and the trade unions of the ruling party and the Opposition requested them time and time again saying, "Let us come to a productivity-based model", they kept refusing it. We have evidence of it. They refused to come for negotiations and meetings. And, when we went to the Wages Board, they refused to come for those negotiations as well. Finally, they said, "No, we are willing to raise it only to Rs. 1,200." Why did they not do it then? This is the second time it happened. At the end of the day, we would support a productivity-based model, but we cannot support exploitation of workers.

Lastly, I would just like to say that when it comes to the issue of wages of the tea estate workers, as a member of the largest trade union in the country, I do not believe in the daily-wage model. There needs to be a productivity -based model. But, right now, what is it that we are faced with? The ego of the planters. Because of that, the workers are suffering, the planters are suffering and the industry is suffering. One thing that they constantly mention is that giving a fair wage, giving Rs. 1,700 is not sustainable for the industry. If the industry has to sustain itself on poor working conditions and lack of a fair and decent wage, then we do not need that industry.

Finally, let me do some simple mathematics before I wind up my speech, Sir. If you look at their daily wage, it was increased to Rs. 1,000 in 2020, which was US Dollars 7 then and when we went through the economic crisis, that US Dollars 7 devalued to US Dollars 3. What we are saying is, give that same US Dollars 7 now. That is fair enough. So, at the end of the day, everyone knows who has profited. Therefore, I urge this House to look into that matter. Also, I will claim responsibility for my actions, provided the same degree is given to each and every stakeholder in this country.

Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. Dharmalingam Sithadthan. You have 10 minutes.

[பி.ப. 2.21]

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)

நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! நான் இந்தச் சந்தர்ப்பத்தில் இன்றைய விவாதத் தலைப்புக்கு அப்பாற்பட்ட ஒரு விடயம் சம்பந்தமாகப் பேசலாமென நினைக்கின்றேன்.

மாகாண சபைத் தேர்தல்கள் சட்டமானது திருத்தப்பட்ட மையால் அத்தேர்தல் மிக நீண்ட காலமாக நடைபெறாமல் இருக்கின்றது. இச்சட்டமானது 2017ஆம் ஆண்டு திருத்தப் பட்டது. மாகாண சபைகளின் தேர்தல் தொகுதி எல்லைகளை நிர்ணயிப்பதற்காகக் குழுவொன்று நியமிக்கப்பட்டு, அறிக்கை ஒன்றும் தயாரிக்கப்பட்டது. 2018ஆம் ஆண்டு அந்த அறிக்கை பாராளுமன்றத்துக்குச் சமர்ப்பிக்கப்பட்டது. எனினும், அது முழுமையாக நிராகரிக்கப்பட்டது. அந்த அறிக்கை நிராகரிக்கப் பட்ட காரணத்தால், இன்றுவரை மாகாண சபைத் தேர்தல் நடைபெறாமல் இருக்கின்றது. இதிலுள்ள வேடிக்கையான விடயம் என்னவென்றால், அந்த அறிக்கையைப் பாராளுமன்றத்தில் சமர்ப்பித்த அமைச்சரே அதற்கு எதிராக வாக்களித்ததுதான். அவர் மாத்திரமல்ல, முழுச் சபையும் அதற்கு எதிராக வாக்களித்தது. அதற்குப் பிறகு, எங்களுடைய கௌரவ சுமந்திரன் அவர்கள் மாகாண சபைத் தேர்தல்கள் சம்பந்தமான தனியார் உறுப்பினர் சட்டமூலமொன்றைக் கொண்டுவந்தார். அதன்படி, 2017ஆம் ஆண்டு கொண்டுவரப் பட்ட திருத்தத்தை நீக்கிவிட்டு, பழைய முறையில் மாகாண சபைத் தேர்தலை நடத்தலாம். Supreme Courtகூட, அதைச் சிறிய திருத்தத்துடன் செய்யலாமெனக் கூறியிருக்கிறது. அதுமாத்திரமல்ல, தற்போதைய பிரதமர் அவர்கள் இவ்விடயத்துக்குப் பொறுப்பான அமைச்சராக இருந்தபோது தலைமை வகித்த தெரிகுழுகூட, அதை ஏற்றுக்கொண்டு இருக்கின்றது. அதாவது, சிறியதொரு திருத்தத்துடன் மாகாண சபைத் தேர்தலைப் பழைய முறையில் நடத்தலாமென ஏற்றுக் கொண்டது.

இப்போது நல்லதொரு சந்தர்ப்பம் வந்திருக்கின்றது. எதிர்வரும் ஜனாதிபதித் தேர்தலில் போட்டியிடப்போவதாகக் கூறுகின்ற முக்கிய மூன்று வேட்பாளர்களும் மாகாண சபைத் தேர்தலை நடத்துவதற்கு அல்லது மாகாண சபை முறைமை யைத் தொடர்வதற்கு ஒத்துக்கொண்டு இருக்கிறார்கள். இந்தச் சந்தர்ப்பத்தில் இந்த மூன்று வேட்பாளர்களும் இணைந்து ஒரு திருத்தத்தைக் கொண்டுவந்து, மாகாண சபைத் தேர்தல்களை நடாத்தி, மாகாண சபைகளை இயங்கவைக்க வேண்டும்.

எங்களைப் பொறுத்தமட்டில், வடக்கு, கிழக்கில் மாகாண சபைத் தேர்தல்கள் நடத்தப்பட்டு, மாகாண சபைகள் மீள இயக்கப்பட வேண்டும். மாகாண சபை முறைமை ஒரு சிறந்த தீர்வு என்றோ, அதன்மூலம் கிடைக்கக்கூடிய அதிகாரப் பரவலாக்கல் தமிழ் மக்களுக்குப் போதுமானது என்றோ நான் கூற வரவில்லை. ஆனாலும், தற்போதைய அரசியலமைப்பில் இருக்கக்கூடிய - எழுத்தில் இருக்கக்கூடிய - இந்த விடயத்தை அமுல்படுத்த வேண்டும் என்றுதான் நான் கூறுகின்றேன். அதனைச் செய்வதன்மூலமாவது, நிச்சயமாக அதிகாரப் பரவலாக்கம் கொடுக்கப்பட வேண்டும், அது இன்னும் முன்னேற்றப்பட வேண்டும் என்ற விடயங்கள் ஓரளவுக்காவது பேசப்படும். இருப்பதையும் இல்லாமலாக்கிவிட்டு, மீண்டும் முதலிலிருந்து ஆரம்பிக்க முடியாது. ஆகவே, இந்த மாகாண சபை முறைமையை மீண்டும் அமுல்நடத்துவதற்கு இப்பொழுது நல்லதொரு சந்தர்ப்பம் கிடைத்துள்ளது. ஆகவே, இதனைச் செய்ய வேண்டும். நான் பார்த்தளவில், உலகிலேயே எங்களுடைய நாடுதான் சொந்த அரசியலமைப்பை மதிப்ப தில்லையென நினைக்கின்றேன்.

Sir, I believe the only country which does not respect its own Constitution is this country. The Thirteenth Amendment to the Constitution has been continuously refused to be implemented, not only by this Government but also by the previous Governments. They continuously refused or rejected to have the provincial councils functioning. By that, what they are doing is disrespecting the Constitution. That is what I believe; not only me, but the whole world believes that. Because of that only we had to make representations to the Governments of India and America, the UN and the

[ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා]

UNHRC. We have been going everywhere making representations because the governments of this country have been continuously refusing to have elections to allow the provincial councils to, at least, function. So, I do not think that will satisfy the aspirations of the Tamil people. Personally, I do not think so. Therefore, what I say is this.

இது ஓரளவுக்கேனும் தமிழ் மக்களுடைய கோரிக்கை களுக்குச் சமீபமாகவாவது போகும். We have continuously asked the Government to implement this. ஆனால், மாறி மாறி ஆட்சிக்கு வருகின்ற ஒவ்வோர் அரசாங்கமும் ஏதோ ஒரு காரணத்தைச் சொல்லி, இதைச் செய்யாமல் பிற்போட்டுக் கொண்டே வருகின்றது. முதலில் பதின்மூன்றாவது திருத்தச் சட்டத்தை முழுமையாகச் செயற்படுத்துவோம் என்பார்கள். பின்னர், சட்டமும் ஒழுங்கும், நிலம் சார்ந்த அதிகாரங்களைத் தரமுடியாது என்பார்கள். இவை அரசியலமைப்பில் இருக்கின்ற விஷயங்கள்! நீங்கள் ஆகக் குறைந்தது Provincial Councilsஐ இயங்கவைத்தால், சட்டமும் ஒழுங்கும், நிலம் சார்ந்த அதிகாரங்களைப் படிப்படியாகவேனும் வழங்குவதற்கு வாய்ப்பு ஏற்படும். நிலம் சார்ந்த அதிகாரங்களைத் தருவதிலோ, சட்டமும் ஒழுங்கும் சார்ந்த அதிகாரங்களைத் தருவதிலோ எந்தப் பிரச்சினையும் இல்லை.

எங்களுடைய அரசியல் யாப்பில் மாகாண சபைகளுக்கென இருக்கின்ற சட்டமும் ஒழுங்கும் என்பது, ஏதோ மற்றைய நாடுகளில் இருக்கக்கூடிய மாதிரி அல்ல. குறிப்பாக, இந்தியாவின் தமிழ் நாட்டில் இருக்கக்கூடிய பொலிஸ் மாதிரி வட, கிழக்குக்கு என்று தனியானதொரு பொலிஸ் வந்துவிடும் என்பதல்ல. வடக்கு, கிழக்குக்கு IG ஒருவர் நியமிக்கப்படுவார்; அவருக்குக்கீழ் பொலிஸ் இயங்கும் என்றுதான் அதில் இருக்கின்றது. அது இலங்கைப் பொலிஸ் படையின் ஒரு பகுதியே ஒழிய, ஒரு தனிப் படையல்ல. இதை அவர்கள் தெரிந்துதான் வைத்திருக்கிறார்கள். தமிழ் மக்களுடைய அபிலாஷைகளைப் பூர்த்திசெய்யக்கூடிய விதத்தில் அதிகாரப் பரவலாக்கலை கொடுப்பதன் மூலம்தான் இந்த நாட்டில் நாங்கள் பொருளாதார வளர்ச்சியைக் காண முடியும்.

எங்களைப் பொறுத்தளவில், வடக்கு, கிழக்கில் பொருளாதார ரீதியாகக்கூட, எந்தவொரு வளர்ச்சியையும் ஏற்படுத்த முடியாத நிலைமையே இருக்கின்றது. புலம்பெயர் தமிழர்கள் பலர் தங்களுடைய முதலீடுகளை இங்கு செய்வதற்குத் தயாராக இருந்தாலும், அவர்களுக்கு மனப்பயம் இருக்கின்றது. அதாவது, தங்களுடைய முதலீடுகளுக்கு என்னவாகும் என்ற பயம் அவர்களுக்கு இருக்கின்றது. அதுமாத்திரமல்ல, நான் அறிய, என்னுடைய நண்பர் ஒருவர் இங்கு முதலீடு செய்ய முயன்றபோது, அவருக்கு கொழும்பில் பல தடைகள் விதிக்கப்பட்டன. கடைசியில், "ஏன் இதை Southஇல் செய்ய முடியாது?" என்று அங்கிருந்த ஓர் அதிகாரி அவரிடம் கேட்டாராம். இப்படியான விஷயங்களை நிறுத்துவ தற்குரிய நடவடிக்கைகளை அரசாங்கம் எடுக்க வேண்டும். அப்போதுதான் எங்களுடைய தமிழ் மக்கள் மத்தியில் நல்லெண்ணத்தை விதைக்க முடியும்.

நான் எதைக் கூற வருகிறேன் என்றால், ஆகக் குறைந்தது மீண்டும் மாகாண சபைகளை இயக்குவதற்கான நடவடிக்கை களை மேற்கொள்ள வேண்டும் என்றுதான். கௌரவ சுமந்திரன் அவர்களால் கொண்டுவரப்பட்ட மாகாண சபை தேர்தல்கள் (திருத்தம்) சட்டமூலத்தை ஏற்று, அது தொடர்பில் இந்தச் சபையில் விவாதித்து, வாக்கெடுப்பினூடாக அதை நிறை வேற்றுவதன்மூலம் தமிழ் மக்களுக்கு உங்களால் ஒரு நம்பிக்கையைக் கொடுக்க வேண்டும். அதாவது, இந்தச் சபையிலுள்ள கட்சிகள் அனைத்தும் ஏதோவொரு வழியில் தமிழ் மக்களுடைய பிரச்சினைக்கு நியாயமான தீர்வை நோக்கி நகர்கின்றன என்ற நம்பிக்கையைக் கொடுக்க வேண்டும். அப்படிக் கொடுத்தால்தான் எதிர்வரும் ஜனாதிபதித் தேர்தலில் அந்த மக்கள் உங்களுக்கு வாக்களிப்பார்கள். இதை நீங்கள் நன்றாக உணர்ந்துகொள்ள வேண்டும்.

If you do something to make the Tamil people believe that they are also part of this country and they could trust that these candidates would do something good in future and would definitely treat the Tamil people as equals only they would happily take part in the Presidential Election campaign.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
(மாண்புமிகு தருமலிங்கம் சித்தார்த்தன்)
(The Hon. Dharmalingam Sithadthan)
Therefore, in future, you have to do that. Then only the Tamil people would feel that they are part of this country.

Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Premnath C. Dolawatte.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Kins Nelson to the Chair?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - கைத்தொழில் அமைச்சரும் சுகாதார அமைச்சரும்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Industries and Minister of Health)
Sir, I propose that the Hon. Kins Nelson do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair, and THE HON. KINS NELSON took the Chair.

[අ.භා. 2.30]

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ COPF එකේ Chairman ගරු සභාවේ ඉන්න වෙලාවේම මේ කාරණය කියන්න ලැබෙන එක සුදුසුයි. එතුමා මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කළා, එතුමාට විශාල තර්ජනයක් තිබෙනවා වාගේ කාරණයක්; අපේ Membersලාගෙන්, ඒ අදාළ අපේ සාමාජිකයන් සහ වෙනත් පාර්ශ්වයකින් යම් ආකාරයක තර්ජනයක් තිබෙනවා කියන කාරණය. ඇත්තටම එය අපටත් විශාල කම්පනයක්. අපි එතුමා එක්ක මොන විධියේ තර්ක විතර්ක කළත්, මේ රටේ දූෂණය, මේ රටේ වැරැද්ද නිවැරදි කිරීම වෙනුවෙන් අපි එතුමා එක්ක හිට ගන්නවා. එතුමා සභාපති ධුරය දරන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ විතරක් නොවෙයි, මම COPE එකේ සාමාජිකයෙක්, ඒ වාගේම මම COPA එකේ සාමාජිකයෙක්. මේ කථාව අහගෙන ඉන්න, මේක බලන අපේ රටේ සියලු ජනතාව දන්නවා, ඒ කාරක සභාවලදී අපි හරි දේ හරි ලෙසත්, වැරදි දේ වැරදි ලෙසත් කොහොමද ගන්නේ, අපි කොහොමද ඒවා ගැන ප්‍රශ්න කරන්නේ, ඒ වාගේම ඒ දේවල් සම්බන්ධයෙන් අපේ ප්‍රතිචාරය මොකක්ද කියලා. විශේෂයෙන්ම අපට තිබුණු කම්පනය තමයි යම් ප්‍රශ්නයක් තුළ එතුමාට යම් ආකාරයක ජීවිත තර්ජනයක් හෝ යම් ආකාරයක පීඩනයට ලක් කිරීමට අපිත් දායක වුණාද කියන කාරණය. ඉතින් අපි ඊයේ දිනයේදී ඒ සම්බන්ධයෙන් එතුමාගෙන් විමසුවා. එතුමා පැහැදිලිව ප්‍රකාශ කළා, අපි කිසිම කෙනෙක් මේකට සම්බන්ධ නැහැ කියන එක සහ එතුමාට එහෙම තර්ජනයක් ආවේ නැහැ කියන කාරණය. නමුත් මම දන්නේ නැහැ, බාහිර පාර්ශ්වයකින් තර්ජනයක් ඇවිල්ලා එතුමා ඒ සම්බන්ධයෙන් නිහඬව සිටිනවාද කියන එක. ඒක එතුමාට තිබෙන අයිතියක්. හැබැයි, අපි එතුමාට කියනවා අපේ සාමාජිකයෙක්ගෙන් හෝ තුන්වන පාර්ශ්වයකින් හෝ යම් ආකාරයක පීඩනයක්, තර්ජනයක් එනවා නම්, අපි හිට ගන්නේ එතුමා එක්ක බව.

අනෙක් කාරණය මේකයි. එතුමා කිව්වා, අපි අත්සන් එකතු කළා කියලා. අත්සන් තියා මට නම් මොන කොළයකටවත් අත්සන් කරන්න හම්බ වුණේ නැහැ. එහෙම අත්සන් එකතු කරලාත් නැහැ, අත්සන් කරලාත් නැහැ. විශේෂයෙන්ම අපට සිද්ධ වෙනවා, ඒ සම්බන්ධයෙන් ජනතාවට කරුණු පැහැදිලි කරන්න. මොකද, එතුමාත් කමිටුවෙන් පරිබාහිරව ජනතාවට තමයි කරුණු පැහැදිලි කළේ. මේ සම්බන්ධයෙන් එතුමා යම් තීරණයකට ඇවිල්ලා අදහස් ප්‍රකාශ කළා. අපට පැහැදිලිව කියන්න තිබෙන්නේ මේ කිසිම දේකට අපේ සම්බන්ධතාවයක් නැහැ කියන එකයි මොකද, අපි ඒ කමිටුවලට රැස්වුණාම කිසි වෙලාවක අපි දේශපාලනය කරන්නේ නැහැ. අපට දේශපාලනය කරන්න අවශ්‍යතාවක් නැහැ. මෙවර පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරයෙක් හැටියට මගේ ඒ අදාළ භාවිතය සම්බන්ධයෙන් ජනතාවට තීන්දුවක් ගන්න පුළුවන්. COPE එක තුළ මම හිටපු කාලය, COPA එක තුළ සහ COPF එක තුළ අපේ භාවිතයන් මොනවාද කියන කාරණය පිළිබඳව ජනතාව තීන්දුවක් ගනීවි. ඉතින් යම් ආකාරයේ පීඩනයක් හෝ යම් ආකාරයේ බලපෑමක් තිබෙනවා නම් අපි ඒ වෙනුවෙන් -ඒ සියලු ප්‍රධාන කාරක සභාවල ප්‍රධානීන් සම්බන්ධයෙන්- පෙනී ඉන්නවා කියන කාරණය මේ අවස්ථාවේ ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම ප්‍රකාශ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේදී විශේෂයෙන්ම සාකච්ඡා වෙච්ච කාරණයක් තමයි උසාවිය සහ ව්‍යවස්ථාදායකය කියන කාරණය. මේ සම්බන්ධයෙන් දිගින් දිගටම කාරණා මතු වුණා. ඊයේ දිනයේ ජනාධිපතිතුමා එක පැත්තකින් කාරණා මතු කළා. අද දිනයේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මතු කළා. ඉතින් මේ කාරණය සම්බන්ධයෙන් මගේ මතකයේ හැටියට, මුලින්ම කථා කළේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක වෙලා තිබෙන්නේ තම තමන්ගේ ප්‍රශ්නය ආවාම තමයි තම තමන් කථා කරන්නේ. හැබැයි, මම ස්වාධීන නිතීඥවරයෙක් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට නිරීක්ෂණය කරලා, දැකලා මේ සම්බන්ධයෙන් මගේ මතවාදය සම්බන්ධයෙන් වූ කාරණා ඉදිරිපත් කළා. එහි ප්‍රතිඵලයක් හැටියට ලංකාව පුරා උද්ඝෝෂණ තිබ්බා, විවේචන එල්ල කළා, අපි ඡන්දය කල් දාන්න කථා කළා කියලා කිව්වා. සමහර අවස්ථාවල අපි ඒ අදාළ විනිශ්චයකාරවරු සම්බන්ධයෙන් දිගින් දිගටම පැහැදිලිව කරුණු කාරණා මේ පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කළා. සමහර අවස්ථාවල සැකකාරයන්ට නෙස්ටමෝල්ට් ද, මොනවාද පෝෂණ ද්‍රව්‍ය අරන් දෙන්න විනිශ්චයකාරවරුන් ඉදිරිපත් වෙලා තිබුණා, මුදල් ලබා දෙන්න. ඊට අමතරව, පසුගිය කාලයේ අරගළය තුළ විනිශ්චයකාරවරුන්ගේ හැසිරීම් සම්බන්ධයෙන් බලන්න. මේ තිබෙන්නේ අතළොස්සක ක්‍රියාකලාපය. සමස්ත ක්‍රියාකලාපය නොවෙයි. මේ සම්බන්ධයෙන් අපි අදාළ විවේචන එල්ල කළා. නමුත් අද වෙනකොට පැහැදිලිවම ගැටලුවක් තිබෙනවා, මේ කියන කාරණය සම්බන්ධයෙන්. මොකද, බොහෝ මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් තම තමන්ගේ තරාතිරම තුළ වෙච්ච කාරණා සම්බන්ධයෙන් අද උදෑසන කරුණු කාරණා ඉදිරිපත් කළා.

නමුත් මම කියන්නේ තම තමන්ට වෙච්ච කාරණා සම්බන්ධයෙන් කථා කරනවාට වඩා ප්‍රධාන වශයෙන්ම ව්‍යවස්ථාදායකයේ බලයට, ඒ කියන්නේ ජනතාවගේ බලයට - අධිකරණය ක්‍රියාත්මක වෙන්නේත් පාර්ලිමේන්තුව තුළින්- මේ කියන කාරණා සම්බන්ධයෙන් යම් ආකාරයේ බලපෑමක් සිදු වෙනවා නම්, පක්ෂ විපක්ෂ භේදයක් නැතුව ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම අවශ්‍යයි. ඒක විධායකය සහ අධිකරණය ඝට්ටනය කිරීමක් හෝ ව්‍යවස්ථාදායකය සහ විධායකය ඝට්ටනය කිරීමක් නොවෙයි. නමුත් ඒ කාරණා අපි යම් ආකාරයෙන් බෙරුම් කර ගත යුතුයි.

ඊයේ දිනයේදී මම දැක්කා, විපක්ෂයේ සුමන්තිරන් මන්ත්‍රීතුමා වුණත් ගරු ජනාධිපතිතුමා මතු කළ කාරණය සම්බන්ධයෙන් යම් ආකාරයෙන් සාධනීය ලෙස කරුණු දැක්වීමක් කළ ආකාරය. අර හැමදාම විපක්ෂයෙන් කරනවා වාගේ ඉදිරිපත් කරන යෝජනාවලට විරුද්ධ වෙනවාට වඩා ඒ සම්බන්ධයෙන් යම් ආකාරයෙන් සාධනීය ලෙස කරුණු දැක්වීමක් එතුමා කළා. එහි ප්‍රතිඵලයක් විධියට තමයි එතුමා කිව්වේ, විශේෂ කාරක සභාවකට යනවාට වඩා අග්‍ර විනිශ්චයකාරවරයා විමසලා මේ සම්බන්ධයෙන් කරුණු විමසීම උචිතයි කියන කාරණය. එහිම දිගුවක් වශයෙන් අද දිනයේදී දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා යම් නඩු තීන්දුවක් අරගෙන එහි සම්බන්ධ කාරණා තුළ, විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ ක්‍රියාකාරිත්වය සහ විධායකයේ ක්‍රියාකාරිත්වය නවත්වන්නට යෙදුණු නඩු තීන්දුවක් සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කළා. ඒ නිසා මම හිතනවා, ව්‍යවස්ථාදායකය මේ සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කළ යුතුයි කියලා. එය කිසිසේත්ම අධිකරණයට අත පෙවීමක් නොවෙයි. නමුත් තම තම බල පරාක්‍රම යටතේ, ඒ සංවරණ හා තුලන ක්‍රමය යටතේ තම තමන් කටයුතු කළේ නැත්නම් යම් ආකාරයේ ඝට්ටනයක් ඇති වීම නොවැළැක්විය හැකියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මම විශ්වාස කරනවා, පක්ෂ දේශපාලනයෙන් ඔබ්බට ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් අපේ අවධානය යොමු කළ යුතුයි කියලා.

ඒ එක්කම මම තවත් පුංචි කාරණයක් කියන්න කැමතියි. ඒ, අද දිනයේ කථා කරන ජනාධිපති වැය ශීර්ෂය සම්බන්ධවයි. බොහෝදෙනෙක් කථා කරනවා මෙය ජනාධිපතිතුමාට එහේ

[ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

මෙහේ යන්න, එතුමාගේ සුඛ විහරණය සඳහා ඉදිරිපත් කරන යෝජනාවක් සහ අරුම පුදුම විධියේ යෝජනාවක් හැටියට. මේක අප කවුරුත් දන්නා සාමාන්‍ය ක්‍රමවේදයක්; පාර්ලිමේන්තුවේ අප අත උස්සලා සම්මත කරපු අය වැයටම අදාළ, ඒ අය වැය වෙනස් නොවන පරිදි අනුගමනය කරන ක්‍රමවේදයක්. අපට පෙනෙනවා නම් යම් කාල රාමුවක් තුළ යම් වැය ශීර්ෂයක් ක්‍රියාත්මක වන්නේ නැහැ, එය පූර්ණ වශයෙන් යොදාගෙන නැහැ කියලා, එවැනි අවස්ථාවක එම ශීර්ෂය මාරු කිරීමේ හැකියාව තිබෙනවා. අපි හොඳටම දන්නවා සමහර සංවර්ධන ව්‍යාපෘති සඳහා ජනාධිපතිතුමාගෙන් වුණත් ඉල්ලීම් කරලා අදාළ මුදල් ලබා ගැනීමේ හැකියාව අපට තිබෙන බව. අද සංවර්ධන කමිටුවලට මුදල් වෙන් කරනවා වාගේම සංවර්ධන ක්‍රියාවලිය සඳහා ඉල්ලීම් කරපු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් -අය වැයට පක්ෂව ඡන්දය නොදීපු මන්ත්‍රීවරුන්ටත්- ඒ අදාළ මුදල් ලබා දීලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් යම් ආකාරයේ විවේචන ද තිබෙනවා. මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. මේ ප්‍රතිපාදනය තුළ ඍජුවම සංවර්ධන ව්‍යාපෘති සඳහා සහ අනෙකුත් වියදම් සඳහා විශාල වශයෙන් සහයෝගය ලබා ගන්න අපට පුළුවන්. ඒත් එක්කම, උප ව්‍යාපෘතීන් අතර මෙසේ ප්‍රතිපාදන මාරු කිරීම අය වැයේ වෙනස් වීමකින් -පූර්ණ වෙනස් වීමකින්- තොරව සිදු වන ක්‍රියාවලියක් කියන කාරණය මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ජීවත් වන කඩුවෙල ප්‍රදේශයේ මුනිදාස කුමාරතුංග විද්‍යාලය පිහිටා තිබෙන්නේ මාර්ගය දෙපස. එම නිසා අපි එහි පාලමක් ඉදි කරන්න මුල් ගල තැබුවා. මුල් ගල තබන අවස්ථාවේ තිබුණු යකඩ වගයකින් - පාලමක් ගලවපු යකඩ වගයකින්- තමයි අපි ඒ කාර්යය ඉෂ්ට කරන්න ගියේ. අලුත් යකඩ යොදාගෙන කළොත් රුපියල් ලක්ෂ 410ක් වැය වන එම කටයුත්ත රුපියල් ලක්ෂ 270කින් ඉටු කරගන්න අපට පුළුවන්කම තිබුණා. හැබැයි, ඊට පසුව බැලුවාම, අර කියපු පාවිච්චි කරන ලද යකඩ ප්‍රමාණය ඒ තිබුණු තැන අද නැහැ. අවාසනාවකට, මොනයම් හෝ හේතුවක් උඩ ඒවා නැහැ. ඒ පාලම හදන්න රුපියල් ලක්ෂ 270ක් අපට තිබෙනවා. දැන් අපට පුළුවන්, මාර්ග සංවර්ධන අමාත්‍යාංශයෙන් තවත් රුපියල් ලක්ෂ 130ක් ඉල්ලා ගන්න. එහෙම නැත්නම්, ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරලා දැනටමත් රුපියල් ලක්ෂ 270ක් පාස් වෙලා තිබෙන එම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුපියල් ලක්ෂ 130 ඉල්ලා ගන්න අපට පුළුවන්. වැය ශීර්ෂවලට අදාළව උප ව්‍යාපෘතීන් අතර මෙසේ ප්‍රතිපාදන මාරු කිරීම විපක්ෂය මොන විධියට නිර්වචනය කළත් මෙය හැම දාම වෙච්ච, හැම දාම කරන, සාමාන්‍යයෙන් පළාත් පාලන ආයතනයක පවා සිද්ධ වන ක්‍රියාවලියක් කියන කාරණය මම මේ අවස්ථාවේ තහවුරු කරන්න කැමතියි.

ගරු විපක්ෂ නායකතුමා දැන් ඉතා දීර්ඝව කථා කරනවා, එතුමාගේ smart classroom සංකල්පය සම්බන්ධයෙන්. එතුමා කියනවා, smart classrooms හැම පාසලකටම ලබා දෙන්න කියලා. එතුමා කථා කරන්නේ එතුමා විතරක් මේ ක්‍රියාවලිය සිද්ධ කරනවා වාගේයි. රත්මලාන සහ දෙහිවල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයා හැටියට මම ඒ කොට්ඨාස දෙකේ පාසල් සඳහා විතරක් රුපියල් ලක්ෂ 830ක් වෙන් කරලා තිබෙනවා. එතකොට ඒ කොට්ඨාස දෙකේ තිබෙන එක පාසලකට රුපියල් මිලියන 3ක් වාගේ මුදලක් වෙන් වනවා. මටත් ඒ පාසල්වල smart classroom එකකට රුපියල් ලක්ෂ 11ක් වැය කරන්න තිබුණා. හැබැයි, smart classroom දෙනවාට වඩා ඒ පාසල්වල විසඳිය යුතු ප්‍රශ්න තිබෙනවා. සමහර පාසල්වල ගොඩනැගිලිවල වහල කඩා වැටෙන්න ඇවිල්ලා. සමහර පාසල්වල කැසිකිළි පහසුකම් නැහැ. සමහර පාසල් ගොඩනැගිලිවල බිත්ති ගරා වැටිලා. සමහර classrooms වැඩ කරන්න බැරි තත්ත්වයට පත් වෙලා. මම කිසිම වෙලාවක ගරු විපක්ෂ නායකතුමා කරන ඒ ක්‍රියාව අඩුලුහුඬු කොට කථා කරන්නේ නැහැ. මම ඒක අගය කරනවා. කොහෙන් හෝ යම් මුදලක් දරුවන් වෙනුවෙන් ලැබෙනවා නම් හොඳයි. නමුත්, අපි ආණ්ඩුව හැටියට දීර්ඝ ක්‍රියාවලියක් කරගෙන යනවා. දැන් විපක්ෂ නායකතුමා යෝජනා කරනවා මේ පරිපූරක මුදලට අදාළ මුළු මුදල් ප්‍රමාණය අධ්‍යාපනය සඳහා යොමු කරමු කියලා. ඒක හොඳයි. නමුත්, smart classroomsවලින් විතරක් අධ්‍යාපනය ගොඩ නංවන්න බැහැ. සමහර යටිතල පහසුකම් සංවර්ධනය කරන්න ඕනෑ. කොළඹ දිස්ත්‍රික්කයේ රත්මලාන, දෙහිවල යනාදී ප්‍රදේශවල පවා පාසල්වල යටිතල පහසුකම් දියුණු කරන්න තිබෙනවා. මම ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ බෝම්රිය කනිෂ්ඨ විද්‍යාලයේ උඩ තට්ටුව අපි රුපියල් මිලියන 15ක් වෙන් කරලා හදනවා. ඒ වාගේම, මා ඉහතින් කියපු මුනිදාස කුමාරතුංග විද්‍යාලයේ පාලමත් හදනවා.

අපටත් මේ විධියට කාරණා කියන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අවාසනාවට කාරණයක් වන්නේ, මා යෝජනා කරලා දෙහිවල මහ නගර සභාව තුළින් අඩු ආදායම්ලාභී දරුවන්ට ලබා දෙන්න, මැක්සිම් ගෝර්කිගේ පින්තූරයත්, මේ රටේ නිදහස් අධ්‍යාපනයෙන් නීතිඥයින් වුණු මගේ පින්තූරය සහ ජනාධිපතිතුමාගේ පින්තූරයත් යොදා print කරපු පොත් බෙදන එක නවත්වන්න, සජබ කොට්ඨාස නායකයෙක් ගිහිල්ලා මැතිවරණ කොමිසමේ පැමිණිල්ලක් දමා තිබෙනවා. අපි දැන් ඒ වෙනුවෙන් නීතිමය කටයුතු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මටත් ඉන්නවා නීතිඥ කණ්ඩායමක්. මට "සත්‍ය ගවේෂකයෝ" සංවිධානය තිබෙනවා. මටත් පුළුවන් ගිහිල්ලා පැමිණිල්ලක් දාන්න, සජීත් ප්‍රේමදාස මහත්මයා පාසල්වලට ගිහිල්ලා බස් බෙදනවා කියලා, දෙමව්පියන් ගෙන්වා දේශපාලන රැස්වීම් කරනවා කියලා. හැබැයි, අපි එහෙම කරන්නේ නැහැ. අපි එහෙම කරන්නේ නැත්තේ, ඒ බස් එකේ යන්නේ කාගේ හරි අහිංසක දරුවන් වන නිසා. අපි දේශපාලනය කරන්නේ නැහැ, පොත් බෙදන එකෙන්. අපි දේශපාලනය කරන්නේ නැහැ, බස් බෙදන එකෙන්. අපි දේශපාලනය කරන්නේ නැහැ, පාසල්වලට දීපු මුදල්වලින්. ඒ පොතේ ගහලා තිබුණේ මොකක්ද දන්නවාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මම අ.පො.ස. සාමාන්‍ය පෙළ පන්තියේ ඉගෙන ගත්තු කාලයේ මට කම්මැළි හිතුණාම කියවපු මැක්සිම් ගෝර්කිගේ "මගේ සරසවි" කියන පොතේ සඳහන්ව තිබෙනවා, "චතුරශ්‍රයකට මාව අරන් ගිහිල්ලා නිරුවත් කරලා කස පහර දුන්නා වුණත් මම සරසවි අධ්‍යාපනය ලබන්න කැමැතියි" කියලා. අධ්‍යාපනයට තිබෙන දැඩි ආශාව තමයි එයින් පිළිබිඹු කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෙදා දෙන්න සූදානම් කරපු ඒ පොතේ උඩම තිබෙනවා මැක්සිම් ගෝර්කිගේ පින්තූරය සහ එම පාඨය. ඊට පසුව ජනාධිපතිතුමාගේ සහ මගේ පින්තූර තිබෙනවා. සජබයේ කොට්ඨාස නායකයෙක් ගිහිල්ලා මැතිවරණ කොමිසමට පැමිණිලි කරලා ඔය පොත බෙදන එක නතර කරලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හැබැයි, මම එක දෙයක් කියනවා. ඔය මොන දේ කළත් අපි දරුවන් එක්ක දේශපාලනය කරන්නේ නැහැ. මේක අහගෙන

ඉන්න අපේ ආණ්ඩුවේ කිසිම මන්ත්‍රීවරයෙක්, කිසිම කෙනෙක් ඒක තමයි කරන්නේ නැත්තේ. දෙමව්පියන් රැස් කරලා ආණ්ඩුවට මොන තරම් බැන්නත්, දේශපාලනය කළත් බස් බෙදන එකට, smart classroomsවලට විරුද්ධව අපි ගිහින් පැමිණිල්ලක් දමන්නේ නැති හේතුවක් තිබෙනවා. ඒ, මේ රටේ දරුවන්ට මොකක් හෝ ලැබෙන අයිතිවාසිකම වළක්වන්න අපට ඕනෑ නැති නිසායි. හැබැයි, සජබයේ කොටියාස නායකයින්ට, මන්ත්‍රීවරුන්ට එහෙම හිතන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ නිසාම දරුවන් වෙනුවෙන් අප සූදානම් කළ ඒ පොත් ටික බෙදා දීම අදටත් පරක්කු කර තිබෙනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.44]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව දැන් දිගින් දිගටම කියනවා, කැසිනෝ ප්‍රවර්ධනය කරන්න අදහසක් නැහැ, ව්‍යාප්ත කරන්න අදහසක් නැහැ, හැබැයි වැඩිම ආදායම් සොයා ගත්තේත් මේ රෙගුලාසි ආදියෙන් කියලා. ඒ කියන්නේ, ආණ්ඩුවම පිළිගන්නවා, මේ රෙගුලාසි, නියමය සහ නියෝගය මඟින් ආදායම් වැඩි කර ගන්නවා කියලා; එහෙම කරන්න බලාපොරොත්තු වෙනවා කියලා.

මැලේසියාවටම තිබෙන්නේ එක කැසිනෝ ශාලාවයි. සිංගප්පූරුවට තිබෙන්නේ කැසිනෝ ශාලා දෙකයි. ලංකාවේ මෙතෙක් කල් කැසිනෝ ශාලා හතරක් තිබුණා. දැන් මේ ගෙනාපු රෙගුලාසි ආදිය එක්ක මේ කෙටි කාලය තුළ නෙලුම් කුලුනේ අලුතින් කැසිනෝ ශාලාවක් පටන් ගත්තා. තවත් එකක් පෞද්ගලික ආයතනයක් විසින් පටන් ගත්තා. තව applications ගණනාවක් -ගාල්ල, මහනුවර, කිලිනොච්චිය ප්‍රදේශ සඳහාත්- ඉදිරිපත් කරලා තිබෙනවා. රට පුරා කැසිනෝ ශාලා දමනවා. ඔබතුමන්ලා රටේ නිෂ්පාදනය මත ආර්ථිකය නංවනවා වෙනුවට කැසිනෝවලින් ලැබෙන බදු ආදායම්වලින් ආණ්ඩුව නඩත්තු කරගෙන යනවා. බාර් ලයිසන් 500ක් දීලා එතැනින් ආදායමක් ගන්න හදනවා. කැසිනෝ ශාලා රට පුරා ව්‍යාප්ත කරලා එතැනින් ආදායමක් ගන්න හදනවා. එතුමාගේ කථාවෙන්ම පරස්පරයක් මතු වුණා. ආණ්ඩුව එක් පැත්තකින් කියනවා, "මේවා ක්‍රියාත්මක කරන්න අපට කිසිම වුවමනාවක් නැහැ" කියලා. අනෙක් පැත්තෙන්, අණ පනත් හදලා, නීති හදලා දැන් ඉඩ දීලා තිබෙනවා, ලංකාව පුරා කැසිනෝ ශාලා දමන්න. මේක තමයි ඇත්ත කථාව. මේක වහන්න බැහැ. ඔබතුමන්ලා අපනයන ආර්ථිකයක්- export-oriented economy එකක් - ගැන කථා කළාට, ඔබතුමන්ලා ආපසු කරන්නේ අර කැසිනෝවලට තවත් ඉඩ පහසුකම් ලබා දීලා, ඒකෙන් ආදායම් අරගෙන "එදා වේල ටුවර්ස්" පවත්වාගෙන යෑමක් තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින "පරිපූරක මුදල්" යටතේ ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂයට අදාළව කෙරෙන ප්‍රතිපාදන මාරු කිරීමක් ගැනත් කථා කරනවා. දැන් කියන්න හදනවා, පාරවල් හදන්න, ගම්වලට අවශ්‍ය සංවර්ධන කටයුතු කරන්න තමයි ඒ මුදල් දෙන්නේ කියලා. එහෙම නම්, ජනාධිපති යටතට ඒක පවරන්න ඕනෑ නැහැ නේ; එම ප්‍රතිපාදන මාරු කරන්න තිබුණේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයට සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට නේ. ඒවායින් නේ පාරවල් හදන්නේ. ඒක නොවෙයි නේ මේ කරන්නේ. මේ කරන්නේ, එය ජනාධිපතිවරයා අතට ගන්නා එක. මෙතෙක් මහා විහාරයට වෙන් කරලා තිබුණු සල්ලි, අනුරාධපුරයේ බෞද්ධ කටයුතු සඳහා වෙන් කරලා තිබුණු සල්ලි දැන් මේ ජනාධිපති යටතට ගන්නවා. ජනාධිපති යටතට ගන්නේ මොකටද? මැතිවරණය සඳහා. ඒක හරිම පැහැදිලියි. කොළේ වහලා ගහන්න දෙයක් නැහැ. ඕනෑ කෙනෙකුට ඒක තේරෙනවා. දැන් එක්සත් ජාතික පක්ෂයම නඩත්තු වෙන්නේ ජනාධිපති වැය ශීර්ෂයෙන්. රුවන් විජයවර්ධනලා, අකිල විරාජ්ලා, රංගෙ බණ්ඩාරලා, සාගල රත්නායකලා කියන්නේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන තනතුරු දරන අය. එම පක්ෂයේ උපසභාපතිලා, උපලේකම්ලා, මහ ලේකම්ලා, සම්බන්ධීකරණ ලේකම්ලා විධියට ඔවුන් පත් කරලා, අමාත්‍යාංශවල තිබෙන හොඳම වාහන ටික ඒ සම්බන්ධීකරණ ලේකම්වරුන්ට ගන්නවා.

පසුගිය දවස්වල අනුරාධපුරයේ හිටපු හැරිසන් මන්ත්‍රීවරයා කෘෂිකර්ම අමාත්‍යාංශයට ඇවිල්ලා හොඳම වාහනයක් තෝරා ගෙන ගියා. ඒක දුන්නේ නැහැ කියලා නිලධාරීන් එක්කත් රණ්ඩු වුණා. මේක තමයි ඇත්ත තත්ත්වය. අද කෝටි 875ක් වෙන් කර ගන්නේත් එවැනි කටයුත්තකට. මේ කරන්නේ වෙන මොකක්වත් නොවෙයි. මැතිවරණය සඳහා හදිසියේම සල්ලි පාස් කරගන්නවා. සැලසුමකට ආර්ථිකය ගෙන යනවා නම් ගිය අය වැයේදීම මේ මුදල් වෙන් කරගන්න තිබුණා. නමුත් එහෙම කළේ නැහැ. එවැනි කටයුත්තකට නොවෙයි, මේ මුදල් වෙන් කරගන්නේ. ජනාධිපතිවරණයට මාස තුනහමාරක් පමණ තිබෙන නිසා හිතුමනාපයට සල්ලි වියදම් කරන්න මුදල් වෙන් කර ගැනීමක් මෙතැන කරන්නේ.

ඇත්තටම මේ රටේ ජනතාව බදු බරින්, බඩු මිලෙන් මිරිකී ඉන්නා වෙලාවේ, ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය ගැන කථා කරන්න ගියොත් අපට ගොඩක් දේවල් කියන්න පුළුවන්. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ කියන්නේ ජනතාව විසින් එළවා දමපු ජනාධිපතිවරයා. හරියටම ගත්තොත්, එතුමා සේවය අතහැර ගියා. අවුරුදු දෙකයි, මාස හතරයි, දින 23යි සේවය කළේ. සේවය අතහැර ගියා සේ තමයි සලකන්නේ. හැබැයි, අද වනවිට ඔහුගේ විශ්‍රාම වැටුප කීයද? මාසයක විශ්‍රාම වැටුප රුපියල් 97,500යි. ලේකම් දීමනාව රුපියල් 100,000යි. ගෝඨාභය රාජපක්ෂ දැන් රට පුරා යනවාද, රාජකාරි කටයුතු සඳහා? නැහැ. හෙණ ගහන අපරාධයක්, මේ. හිටපු ජනාධිපතිවරුන්ට ඉන්ධන දීමනාව වශයෙන් රුපියල් 704,100ක් දෙනවා. 2024 අප්‍රේල් 10 වැනි දා අපි මේ විස්තර ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබා ගත්තේ, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේයි. හිටපු ජනාධිපතිවරුන් සම්බන්ධයෙන් ඒ විධියට තමයි කටයුතු කරන්නේ. ඒ විධියේම කටයුත්තකට තමයි මේ කෝටි 875ත් අද වෙන් කරන්නේ. මෙසේ කෝටි 875ක් වෙන් කරගෙන කරන්න යන වැඩේ ඉතාම පැහැදිලියි. විපක්ෂයෙන් තෝරා ගත් මන්ත්‍රීවරුන් 19 දෙනෙකුට විමධ්‍යගත ප්‍රතිපාදන ලබා දුන්නා. ඒ වෙනුවෙන් මිලියන 1,206ක් වෙන් කළා. ඊයේ කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා, "මේක අල්ලස් දීමක්" කියලා. විපක්ෂයේ තෝරා ගත් මන්ත්‍රී කණ්ඩායමකට මේ ආණ්ඩුව හිතා මතාම අල්ලස් දෙනවා කියලා කිව්වා. එසේ අල්ලස් දෙන එක වැරදියි. අල්ලස් ගන්න එකත් වැරදියි. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් එම ප්‍රතිපාදන ගත්තා නම්, එතුමාම කියනවා නම් මේක අල්ලස් ලබා දීමක් කියලා, අල්ලස් ලබා දීමත් වැරදියි; අල්ලස් ගැනීමත් වැරදියි. ඒ දෙකම වැරදියි. මේ කරන්නේත් එවැනි සෙල්ලමක්. අද මේ කෝටි 875ක් වෙන් කරලා එතැනට පවරා

[ගරු විජිත හේරත් මහතා]

ගෙන කරන්නේත් මැතිවරණයේදී තමන්ට ඕනෑ විධියට මුදල් වියදම් කරන්නට නීතිමය ආවරණය ලබා ගන්නා එකයි. ඒ නිසා අද ඉදිරිපත් කළ එම යෝජනාවට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මා නතර වෙනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.49]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුවක්පිටිය ප්‍රදේශයේ පුද්ගලයෙක් මට කථා කරලා කිව්වා, ගංවතුරට හානි වුණු ගෙවල් ශුද්ධ පවිත්‍ර කර ගැනීම සඳහා රුපියල් 10,000ක් දෙන්න පොරොන්දු වෙලා තිබුණා, අද වනවිට දවස් 14කුත් පසු වෙලා තිබෙන්නේ, නමුත් තවම එම මුදල ලැබුණේ නැහැ කියලා. මේ වෙලාවේ ගරු සභාවේ සියඹලාපිටිය මැතිතුමාවත්, ශෙහාන් සේමසිංහ මැතිතුමාවත් නැහැ, මුදල් සම්බන්ධයෙන් කථා කරන්න. එක්කෝ, එතුමන්ලා මේ කාරණය අහගෙන ඉන්නවා නම් හොඳයි. මොකද, පුවක්පිටිය ප්‍රදේශයේ, සීතාවක ප්‍රදේශයේ අයට කිසිම විධියකින් ශතයක්වත් ලැබී නැහැ. එම නිසා කරුණාකර එම මුදල් ලබා දෙන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ, පුත්තලම දිස්ත්‍රික්කයට අදාළව. 1990 සුවසැරිය ගිලන් රථ සේවය ගැන මම කොයි වෙලාවෙත් කථා කරනවා. මොකද, අපි එම සේවාව රැක ගන්න ඕනෑ. නමුත් පුත්තලම දිස්ත්‍රික්කය තුළ එම සේවාව නවතින තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මොකද, ජූනි මාසයේ 14 වැනි දා 12.56ට දුරකථන ඇමතුමක් ලැබී තිබෙනවා, incident එකක් සම්බන්ධයෙන්. 1.00 වෙනකොට තබ්බෝව, කරුවලගස්වැවට ආසන්න ස්ථානයකට අපේ 1990 සුවසැරිය ගිලන් රථය ළඟා වෙලා තිබෙනවා. එතැන 40දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් යුත් party එකක් තිබිලා. එම party එකේ බීමත් අය ඉඳලා. ඒ අය කියා තිබෙනවා, ambulance එක reverse කරන්න කියලා. නමුත් එතැනදී reverse කරන්න බැරි වෙලා තිබෙනවා. මොකද, එතැන වාහන ගොඩක් තිබිලා. සාමාන්‍යයෙන් කරන්නේ ලෙඩාව ගෙනෙන්න stretcher එක අරගෙන ඇතුළට යන එකයි. නමුත් එහෙම යනකොට අර කට්ටිය එකතු වෙලා අපේ pilotට සහ EMTට හොඳටම ගහලා; වට කරගෙන හොඳටම ගහලා, ඒ බීපු මිනිස්සු. ඊට පසුව මේගොල්ලන් වාහනයට නැගලා කරුවලගස්වැව පොලිසියට වාහනය ධාවනය කරලා තිබෙනවා, නවත්වන්නේ නැතුව. මොකද, අරගොල්ලන් ලුහුබැඳ ඇවිල්ලා තිබෙනවා. ගිලන් රථයේ ගිය දෙදෙනා පොලීසියට ගිහිල්ලා complain කළත්, පොලීසිය ඒ සම්බන්ධයෙන් හරියාකාරව ක්‍රියාත්මක වෙලා නැති බවයි අපට ආරංචි වුණේ. එම සිද්ධියට අදාළව උසාවියට දමපු දෙදෙනෙකුට ඊයේ ඇප දීලා තිබෙනවා. හැබැයි, ඒගොල්ලන් තව නම් කියා තිබෙනවා. ඒවා එකක්වත් සඳහන් කරගෙන නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ගිලන් රථයේ ගිය අය රජයේ සේවකයෝ. රජයේ සේවකයෝ අසරණ වුණු පුද්ගලයෙකුගේ ජීවිතය බේරා ගන්න පිහිට වෙන්න ගියාම, ඒ අයට අල්ලාගෙන ගහන රටක් මේක.

ඉතින්, කොච්චර වැරදිද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අපේ සෞඛ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, අපි එක දවසකට 1,050කට වඩා Intensive Care Unit එකටයි, Emergency Treatment Unit එකටයි ගෙනියනවා. ගරු ඇමතිතුමා, මේ පහරදීම සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වෙන්න.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අපි වයඹ පළාත භාර නියෝජ්‍ය පොලිස්පතිතුමාට දැනුම් දීලා තිබෙනවා. දැනට පුද්ගලයන් දෙදෙනෙක් තමයි අත් අඩංගුවට අරගෙන තිබෙන්නේ. ඔබතුමා කියපු කාරණය ඇත්ත. අනෙක් පිරිසත් අත් අඩංගුවට ගන්න කියලා අපි දැනුම් දීලා තිබෙනවා. පුළුවන් තරම් ඉක්මනට මේ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න කියලා අපි දැනුම් දීලා තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

බොහොම ස්තූතියි, ගරු ඇමතිතුමා. මොකද, ඇත්ත වශයෙන්ම මේක වටිනා සේවයක්. මේකේ දේශපාලනයක් නැහැ. ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම ගැන මම ඔබතුමාට නැවතත් ස්තූතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ගරු සභාවට කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි සහ නියමය ඉදිරිපත් කළා. කැසිනෝ ව්‍යාපාරවලට ලයිසන් දෙන්න තමයි දැන් මේ කථා කරන්නේ. මම දැක්කා, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් කථා කරනවා. ඇත්ත වශයෙන්ම එතුමා අපේ කමිටුවට එනවා නම් මේ දේවල් ගැන කථා කරන්න පුළුවන්. මම බලාපොරොත්තු වෙනවා, විපක්ෂයේ මන්ත්‍රීවරු මේ සම්බන්ධයෙන් සාකච්ඡාවට පැමිණෙයි කියලා. එතකොට මේ ගැටලුව අපට සාකච්ඡා කරගන්න පුළුවන්. මෙතැන තිබෙන ලොකුම ගැටලුව තමයි, නියාමන ආයතනයක් නැතිකම. මම දැක්කා, රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිවරයා කියනවා, "නියාමන ආයතනයක් ගේනවා" කියලා. ඔව්, අපි දිගින් දිගටම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හරහා බල කරනවා, මේ නියාමන ආයතනය පත් කරන්න කියලා. හොඳම උදාහරණය තමයි, මේ රටේ ඔන්ලයින් කැසිනෝ තිබෙනවා කියන එක. හැබැයි, නියාමන ආයතනයක් නැති නිසා ඔන්ලයින් කැසිනෝවලින් සත 5ක්වත් බදු එකතු කරන්නේ නැහැ. මුදල් අමාත්‍යාංශය කියනවා, මෙවැනි දෙයක් තිබෙනවා කියලා ඒ ගොල්ලන් දන්නවා කියලා. හැබැයි, කරන්න දෙයක් නැහැ කියලා කියනවා. එතකොට අනෙක් පැත්තෙන් බදු ගහනවා. නොයෙකුත් බදු නීති ගේනවා නේ. මේ නියාමන ආයතනය ස්ථාපනය කරන්න බැරි ඇයි? දැන් ගිහිල්ලා mobile phone එකෙන් "Google" search කරලා බැලුවොත්, ලංකාවේ ඕනෑ තරම් ඔන්ලයින් කැසිනෝ කරන්න පුළුවන්. මම හිතන විධියට දවසකට මේ හරහා කෝටි ප්‍රකෝටි ගණන් හම්බ කරනවා. මේවායින් සත 5ක්වත් බදු අය කරන්නේ නැහැ. අනෙකුත් දේවල්වලින් බදු අය කරනවා. නමුත්, මේවායින් බදු අය කර ගන්නේ නැහැ. ඒ නිසා රජය මේ සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක විය යුතුයි. මුදල් ඇමතිවරයා හැටියට කටයුතු කරන ජනාධිපතිවරයාට මම මේ සම්බන්ධයෙන් ලියුමකුත් ලිව්වා. ඒකට තවම පිළිතුරක්වත් අපට ලැබිලා නැහැ. එම නිසා මම මේ සම්බන්ධයෙන් ජනාධිපතිතුමාට නැවතත් මතක් කරනවා. අසරණ මිනිසුන්ගෙන් බදු අය කරනවාට වඩා මේ බදු එකතු කර ගන්න.

දෙවැනි කාරණාව මෙකයි. කුලී නිවාසවලට බද්දක් අය කිරීම කියන කාරණය ගත්තොත්, ඊයේ ගරු ජනාධිපතිතුමා ලොකුවට කිව්වා, "පළමුවැනි නිවාසයට බද්ද ගහන්නේ නැහැ" කියලා. මේක නිවාස බද්දක් නොවෙයි. මේක තමන් ජීවත් වෙන නිවාසය කුලියට දුන්නොත්, ලැබෙන කුලිය ආදායමක් ලෙස සලකා අය කරන ආදායම් බද්දක්. ඒක හොඳට තේරුම් ගන්න. IMF Country Report No. 24/161හි මෙසේ සඳහන්ව තිබෙනවා.

> "Imputed rental income is the deemed income that homeowners could earn if they rented out their homes. The tax is imposed on the income of individuals (rather than real property itself) and thus raises central government revenue in accordance with the constitution."

මේක තේරුම් ගන්න මූලාඝනාරූඪ ගරු මන්ත්‍රීතුමා. මේක වරිපනම් බද්දක් නම්, ඒ බද්ද යන්නේ පළාත් සභාවට, පළාත් පාලන ආයතනයට. එතකොට ඒක මධ්‍යම රජයට ගන්න බැහැ. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන ගැටලුවක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ගැටලුව විසඳා ගන්න. ආදායම් බද්දක් හැටියට ගැහුවොත් කෙළින්ම භාණ්ඩාගාරයට මේක ගත හැකියි. මම නැවතත් කියන්නම් මේකේ තිබෙන්නේ කොහොමද කියලා. මේකේ තිබෙන්නේ, "Based on the recent IMF TA" කියලායි; මේ තිබෙන්නේ, technical assistance එක ගැන. දැන් සුමන්තිරන් මන්ත්‍රීතුමාත් මේක කථා කළා. එතකොට කෝ Technical Assistance document එක? ජනාධිපතිතුමා කිව්වා, "Technical Assistance document එක දෙනවා" කියලා. එතුමා කිව්වා, අපට මේකේ විනිවිදභාවයක් දෙනවා කියලා. එතකොට දැන් Technical Assistance document එකක් නැහැ. අපට තිබෙන්නේ හැමෝටම බලාගන්න පුළුවන් විධියට publish කරපු මෙන්න මේ Staff Report එක විතරයි. එහි මෙසේ සඳහන්ව තිබෙනවා:

> ".... an imputed rental income tax from owner-occupied and vacant residential property ...."

මූලාඝනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දන්නා ඉංග්‍රීසිවල හැටියට නම්, "owner-occupied house" කියන්නේ මොකක්ද? තමන්ට අයිති, තමන් ජීවත් වෙන ගෙදර. "owner-occupied house" කියන්නේ "තමන් ජීවත් වන ගෙදර" කියන එකයි. මේක කුලියට දුන්නොත් මේකට ලැබෙන ආදායම deemed; ඒ කියන්නේ, ආදායමක් ලැබුණු විධියට සලකලා ඒකට බද්දක් අය කරන්න කියලා කියනවා.

ආදායමට ගහන මේ බද්ද සියයට 6, 12, 18, 20, 24, 30, 36 කියන අනුපාත යටතේ තමයි පනවන්නේ. ඒක වෙනස් වෙනවා ද කියලාවත්, ආදායම හැටියට ලැබෙන කුලිය සලකලා ගහන බද්ද ගැනවත් කිසිම සඳහනක් නැහැ. ජනාධිපතිතුමා කියනවා නම් ජීවත් වෙන ගෙදරට බද්දක් ගහන්නේ නැහැ කියලා, ඒක මෙහි සඳහන් වන්නේ නැහැ. මෙහි තිබෙන්නේ ජීවත් වෙන ගෙදරට බද්දක් ගහනවා කියලායි. ඒ නිසා මේ පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍යයි. මොකද, "ජීවත් වෙන ගෙදරට බද්දක් ගහන්නේ නැහැ, සමහරුන්ට ගෙවල් එකට වඩා තිබෙනවා නම් ඒවාට තමයි බදු ගහන්නේ" කියලා ජනාධිපතිතුමා කිව්වාය කියලා දිගින් දිගටම මාධ්‍ය කියනවා. එහෙම බදු ගහලා රුපියල් බිලියන 150ක් තමයි හොයා ගන්න බලාපොරොත්තු වෙන්නේ. IMF වාර්තාවේ සඳහන්ව තිබෙනවා, රුපියල් බිලියන 150ක් හොයා ගන්න තමයි බලාපොරොත්තු වෙන්නේ කියලා. රුපියල් බිලියන 150ක් කියන්නේ PAYE Tax එක, ඒ කියන්නේ පසුගිය අවුරුද්දේ උපයන විට ගෙවීමේ බද්දෙන් ලබා ගත් මුළු මුදල් ප්‍රමාණයයි. ඒක පොඩි ගණනක් නොවෙයි. ඒ කියන්නේ ලංකාවේ වැඩ කරන, පෞද්ගලික අංශයේ පඩියක් ගන්න සියලුදෙනාට PAYE Tax එක ගහනවා. එහෙමත් නැත්නම් Advance Income Tax එක ගහනවා, මම කිව්වා වාගේ සියයට 6, 12, 18, 20, 24, 30, 36 වෙනතුරු. පසුගිය අවුරුද්දේ ඒ සියලුදෙනාගෙන්ම එකතු කරගත්ත බද්ද තමයි රුපියල් බිලියන 150 කියන්නේ. මේ රුපියල් බිලියන 150 හොයා ගන්න තමයි මේ බද්ද ගහලා තිබෙන්නේ. හැබැයි හතර, පස් දෙනෙකුට ගෙවල් දෙකකට වඩා තිබෙනවා නම්, ඒ දෙවැනි ගෙදරට බදු ගහලා රුපියල් බිලියන 150ක් හොයා ගන්න පුළුවන් කියලා මම විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා තමයි අපි කිව්වේ, අපි මේ බද්දට විරුද්ධයි කියලා. අපි මේ බද්දට විරුද්ධ වන්නේ ඒක අසාධාරණ බද්දක් නිසා.

මූලාඝනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෝට්ටේ ආසනය තමයි මම නියෝජනය කරන්නේ. නාවල වාගේ පැත්තක් ගත්තොත්, එහෙම නැත්නම් පිටකෝට්ටේ, රාජගිරිය වැනි ප්‍රදේශවල සාමාන්‍ය, මැද පන්තියේ පුද්ගලයන් ජීවත් වෙන ගෙවල් තමයි තිබෙන්නේ. මූලාඝනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ඉන්නේ නාවල නේ. නාවල තිබෙන ගෙයක් කුලියට දෙන්න පුළුවන් කීයටද? අපි හිතමු, පර්චස් අටක ගෙයක් තිබෙනවා කියලා. ඒක අවම වශයෙන් රුපියල් ලක්ෂයකට කුලියට දෙන්න පුළුවන්. එතකොට ඒ රුපියල් ලක්ෂය තමන්ගේ ආදායමට ලැබුණා කියලා තමයි සලකන්නේ. ගොඩක් ගෙවල් ඊට වඩා ගාණකට දෙන්න පුළුවන්. උදාහරණයක් හැටියට ගත්තොත්, නාවල ප්‍රදේශයේ ගෙවල්වල ජීවත් වෙන කට්ටියට රුපියල් 150,000කට වඩා මාසික ආදායමක් තිබෙනවා. අපි රුපියල් 150,000ක් කියමුකෝ. රුපියල් 150,000ක ආදායමක් තිබෙන කෙනෙකුට මාසයකට ආදායම් බදු වශයෙන් ගෙවන්න වෙන්නේ රුපියල් 3,500යි. මොකද, අර 6, 12 ආදී වශයෙන් ගන්නකොට පළමුවැනි ලක්ෂයට බදු වැදෙන්නේ නැති නිසා. හැබැයි රුපියල් ලක්ෂයක ආදායමක් ලැබුණා කියා සැලකුවොත්, තමන්ගේ ආදායම රුපියල් 150,000 සිට රුපියල් 250,000ට යනවා. රුපියල් 250,000ට ගියොත් එය ආදායමක් හැටියට සලකා - deemed or notional - ඔය තිබෙන ආදායම් ප්‍රතිශතවලට බද්ද එකතු කළොතින් මාසයකට රුපියල් 21,000ක් ගෙවන්න සිදු වෙනවා. එතකොට ඇත්තටම ආදායම තිබෙන්නේ රුපියල් 150,000යි. නමුත් බද්ද රුපියල් 3,500 සිට රුපියල් 21,000ට වැඩි වෙනවා.

ගරු මූලාඝනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

කාලය අවසන් නිසා මම මීට වඩා කථා කරන්නේ නැහැ. මම ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, වහාම මේ සම්බන්ධයෙන් හොයන්න කියලා. ඒ වාගේම මම මුදල් ඇමතිවරයාටත් මේ පිළිබඳව කියනවා. මම කලිනුත් මේ කාරණය ගැන කිව්වා. පසුගිය දිනවල ඇති වුණු ආපදා තත්ත්වය නිසා සීතාවක, පුවක්පිටිය ප්‍රදේශයේ පුද්ගලයන්ගේ ගෙවල් ගහගෙන ගියා, ගැලවිලා ගියා. එක ගෙයක තුන්දෙනෙක් නැති වුණා. එච්චර දරුණු ලෙස මේ ආපදා තත්ත්වය බලපෑවා. අපි එදා එතැනට බලන්න ගියා. ඒ සම්බන්ධව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. අපි රත්නපුරයට යන ගමන් තමයි එතැනට ගියේ. සිද්ධ වෙලා නිබුණු විනාශය අපි දැක්කා. ඒ සඳහා වහාම ක්‍රියාත්මක වෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම බදු ගහනකොට සාධාරණව බදු ගහන්න. Tax එකතු කර ගන්න පුළුවන් කට්ටියගෙන් tax එකතු කරගන්න. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.01]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත යටතේ රෙගුලාසි, නියමය සහ තවත් පනත් කිහිපයක් යටතේ නියෝග සහ යෝජනා සම්මතයක් ඉදිරිපත් කර තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ විජිත හේරත් මන්ත්‍රීතුමා ඒවා පිළිබඳව කථා කරලා මේ විවාදය ඉවර වෙන්නත් කලින් නැඟිටලා යන්න ගියා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා මේ ඉදිරිපත් කර තිබෙන පරිපූරක මුදල පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවට පැමිණිලි කරනවා කියලා. විපක්ෂයට සාමාන්‍ය දැනීමක්වත් නැති වීම පිළිබඳව අපි කනගාටු වෙනවා. මේ සියලු මුදල් පාර්ලිමේන්තුව විසින් සම්මත කරපු දේවල්. අපේ ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාගෙන් ඇහුවා නම්, මේ පිළිබඳව කිරිඇල්ල මහත්මයාට කියලා දෙයි. මේක වෙලා තිබෙන්නේ, මේක අහන්නේ ගම්පහෙන් නේ. ඒකයි ප්‍රශ්නය. එතුමාගෙන් ඇහුවා නම්, එතුමා ඒක කිරිඇල්ල මන්ත්‍රීතුමාට කියලා දෙනවා. මේවා පාර්ලිමේන්තුවෙන් සම්මත කරපු මුදල්. එම ප්‍රතිපාදන මේ වසරේ වැය ශීර්ෂවලින් වියදම් කර ගන්න බැරි නිසා, එම වැය ශීර්ෂ වෙනස් කරලා තිබෙනවා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා ඊයේ මුදල් අමාත්‍යාංශය කැඳවලා පැහැදිලි කරගෙන එම කාරක සභාවෙන් මේක සම්මත කළා. ඒක දැන දැනත් කිරිඇල්ල මහත්මයා මොනවාද මේ කියන්නේ? මොකද, එතුමාට, විජිත හේරත් මැතිතුමාට තිබෙන ප්‍රශ්නය තමයි මේ මුදල් ගමට යන එක, ඒ මුදල් මිනිස්සුන්ට යන එක. ඒක එතුමන්ලාට ප්‍රශ්නයක්. මොකද, මන්ත්‍රීවරුන්ට සල්ලි දීලා තිබෙනවා. සජිත් ප්‍රේමදාස මහත්මයාගේ මන්ත්‍රීවරු 17දෙනෙක් ඇවිල්ලා සල්ලි අරගෙන තිබෙනවා. ඒක තමයි කිරිඇල්ල මහත්මයාට තිබෙන ප්‍රශ්නය. හෙට අනිද්දා වෙනකොට තව හතර පස්දෙනෙක් එනවා. ඊළඟට මේ මාසය අග වෙනකොට 25ක් විතර එළියට එනවා. ඉතින්, මේවාට තිබෙන බය, මේ. එම නිසා නීති විරෝධී ලෙස කිසිදු මුදලක් අරගෙන නැහැ. හැම ආණ්ඩුවක්ම මේ පාර්ලිමේන්තුවේ දී වැය ශීර්ෂ මාරු කිරීමක් කරලා තිබෙනවා.

විජිත හේරත් මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභාවේ සිටියා නම් මම හරි කැමැතියි. මම දැක්කා, කැනඩාවේ තිබුණු එතුමන්ලාගේ රැස්වීමක දී බත් පැකට් බෙදනවා. ඒ බත් පැකට්වල ගහලා තිබුණා, "මාලිමාව" කියලා. මාලිමාවෙන් තමයි දවල් කෑම. ඉතින්, අපි හරි කැමැතියි. ඒ ගොල්ලෝ බස් දෙනවා, බත් පැකට් එක දෙනවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට කැමැතියි කියනවා. ඉතින්, අපි කැමැතියි. අපි කැමැතියි, ජනතා විමුක්ති පෙරමුණට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් සම්බන්ධ මේ අණපනත් සියල්ල නීත්‍යානුකූලව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ඒවා බව මම ඔබතුමාට කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම මතක් කරන්න කැමැතියි, මීට වසර එකහමාරකට කලින් මේ රට තිබුණු තැන පිළිබඳව. මට මතකයි, 2022 වර්ෂයේ මැද භාගය වන විට සියයට 7.8ක ඍණ ආර්ථික වර්ධන වේගයක් තමයි අපේ රටේ තිබුණේ. 2023 වසර මුල වෙනකොට ආර්ථික වර්ධන වේගය සියයට ඍණ 10.7ක් වුණා. 2023 වසර අග වන විට ආර්ථික වර්ධන වේගය සියයට ධන 4.5 දක්වා ගෙනෙන්න හැකියාව ලැබුණා. වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රට භාර ගන්නකොට සියයට ඍණ 10.7ක ආර්ථික වර්ධන වේගයක් තිබුණේ. එය සියයට 4.5ක ධන ආර්ථික වර්ධන වේගයක් දක්වා පරිවර්තනය කර තිබෙනවා. මේ වෙනකොට තත්ත්වය පිළිබඳව සංඛ්‍යාලේඛන තවම එළියට ඇවිල්ලා නැහැ. නමුත් මේ වෙනකොට ඊටත් එහාට ගිහිල්ලා මේ රටේ ආර්ථිකය සුබවාදී තැනකට ගෙනෙන්න රජයට හැකියාව ලැබී තිබෙනවා. ඒ පිළිබඳව රජයට, ජනාධිපතිතුමාට අපේ ස්තුතිය පුද කරන්නට ඕනෑ. රජයට ඒ සියල්ල කරන්න හැකියාව ලැබුණේ වෙන කිසි දෙයක් නිසා නොවෙයි, දැඩි විනයක් සහිතව රජය ක්‍රියාත්මක කළ නිසි ආර්ථික කළමනාකරණය නිසායි. මේ සියලු දේ ලබාදෙන ගමන්, පවුල් ලක්ෂ 35කට සහනාධාර දීලා, ඒ වාගේම නියමිත වෙලාවට විදුලිය දීලා, ජලය දීලා, ඒ සියලු දේ ලබා දීලා තමයි ඍණ වේගයක් තිබුණු ආර්ථිකය ධන ආර්ථික වර්ධන වේගයක් දක්වා පරිවර්තනය කරන්න රජයට හැකියාව ලැබුණේ.

මේ විධියට දිගින් දිගටම මිනිසුන්ට බදු ගහලා, මිනිසුන් පිට බදු බර පටවන එක නොවෙයි අපේ බලාපොරොත්තුව. අපේ රටේ අපනයන වර්ධනය කර ගැනීම තමයි අපේ බලාපොරොත්තුව. අපේ රටේ අපනයන මීට වඩා වර්ධනය කරන්න මේ වෙනකොට අපේ කලාපය තුළ හොඳ අවස්ථාවක් ලැබී තිබෙනවා. එම නිසා අපේ රටේ අපනයන වැඩි කර ගන්න රජයේ අවධානය යොමුවෙලා තිබෙනවා.

ඊළඟට අපේ සංචාරක ව්‍යාපාරය ගත්තොත්, සංචාරකයන්ට ගමන් කරන්න පුළුවන් ලෝකයේ සුරක්ෂිතම රටවල් තුන අතරට අද ශ්‍රී ලංකාව ඇතුළත් වෙලා තිබෙනවා. එම නිසා අද ලෝකය තුළ ශ්‍රී ලංකාව පිළිබඳව පැහැදීමක් ඇතිවෙලා තිබෙනවා. ඒ හේතුවෙන් අද සංචාරකයන් දිගින් දිගටම ශ්‍රී ලංකාවට එමින් සිටිනවා. සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කරගෙන ආර්ථිකය ශක්තිමත් කර ගැනීම තමයි අපේ බලාපොරොත්තුව.

ඒ වාගේම දැනට අපේ විදේශ ශ්‍රමික වෙළෙඳ පොළ තිබෙන්නේ ඩුබායි, කුවේට් වාගේ රටවල්වලට කම්කරුවන් විධියට යැවීම සඳහායි. ඒ විධියට ගිය අයගෙන් තමයි අපට විශාල විදේශ විනිමයක් එන්නේ. හැබැයි මේ වෙනකොට අපේ රටේ පුහුණු ශ්‍රමිකයන් සඳහා ජපානය, යුරෝපය වගේ රටවලින් විශාල ඉල්ලුමක් තිබෙනවා. එම නිසා විශේෂයෙන්ම පරිගණක ක්ෂේත්‍රය ඇතුළු විවිධ ක්ෂේත්‍රවල පළපුරුද්ද සහිත ශ්‍රමිකයන් විදේශගත කරලා රටට ලැබෙන විදේශ ප්‍රේෂණ ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා රජයේ අවධානය යොමුවෙලා තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකාවට එන විදේශ ආයෝජන වැඩි කර ගැනීම පිළිබඳවත් රජයේ අවධානය යොමුවෙලා තිබෙනවා. අද වන විට ශ්‍රී ලංකාව ලෝකයේ සුරක්ෂිත රටක් බව මුළු ලෝකයම පිළිගෙන තිබෙනවා. මේ සියලු කටයුතු කරනවාත් එක්කම, ඍණ වර්ධන වේගයක තිබුණු ආර්ථිකය ධන වර්ධන වේගයකට ගෙනැල්ලා ජනතාව මත පැටවිලා තිබෙන බදු බර අඩු කරන්නත් අපට පුළුවන්කම තිබෙනවා. මේ බදු බරත් එක්ක මිනිසුන්ට ජීවත් වෙන්න අමාරු බව අපි පිළිගන්නවා. ඒ පිළිබඳව කිසිම තර්කයක් නැහැ. මා මිත්‍ර ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා දේපළ බද්ද පිළිබඳව කිව්වා. එතුමා කිව්වා, නාවල ප්‍රදේශයේ සිටින එතුමාගේ ඡන්ද දායකයන්ගේ ප්‍රශ්න පිළිබඳව. ඒවා අපිත් පිළිගන්නවා. ඊයේ ජනාධිපතිතුමාත් පැහැදිලි කිරීමක් කළා, යම් කෙනෙකුට දෙමව්පියන්ගෙන් ලැබුණු ගෙදරට බදු අය කරන්නේ නැහැ කියලා. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා අද නම් ඒක කිව්වේ හොඳින්. හැබැයි මම දැක්කා, එතුමා කොළ පාට ෂර්ට් ඇඳපු, කොළ පාට තොප්පි දමා ගනිපු කණ්ඩායමක් පිටුපස තියාගෙන TV එකේ කථා කරනවා, එතුමන්ලා මේකට විරුද්ධයි කියලා. මේකට අපිත්

විරුද්ධයි. මෙහෙම දේපළ බදු ගහනවා නම්, ඔබතුමන්ලා පමණක් නොවෙයි, ආණ්ඩුවේ ඉන්න අපිත් ඒකට විරුද්ධයි. මා මිත්‍ර ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, අමතක කරන්න එපා, ලංකාවේ apartments ලක්ෂ දෙකක් තිබෙනවා කියන එක. ඒකෙන් එක්ලක්ෂ විසිපන්දහසක් තිබෙන්නේ කොළඹ. ඒ එක්ලක්ෂ විසිපන්දහසක හිමිකරුවන්ගෙන් කීදෙනෙක් ද ආණ්ඩුවට බදු ගෙවන්නේ? ඔබතුමා බලන්න, අද කොළඹ Galle Face එක අවට තිබෙන apartment එකක මාසික කුලිය රුපියල් ලක්ෂ 12යි. ඒ apartment එකක් maintain කරන්න maintenance fee එක විධියට රුපියල් 50,000ක් ගෙවනවා. හැබැයි, ශත පහක් බදු ගෙවන්නේ නැහැ. ඒ නිසා තිබෙන මිනිස්සුන්ගෙන් බදු අය කරන්න ඕනෑ. අපි කියන්නේ නැහැ, මාලිගාවත්තේ flat එකක ඉන්න මිනිහාගෙන් බදු ගන්න කියලා. අපි කියන්නේ නැහැ, තමන්ගේ දෙමව්පියන්ගෙන් උරුම වෙච්ච ගෙදරට බදු ගහන්න කියලා. හැබැයි, සමහරුන්ට apartments 5ක් තිබෙනවා, සමහරුන්ට 6ක් තිබෙනවා. ඒවා කුලියටත් දීලා තිබෙනවා. ඒවා maintain කරන්න මාසයකට රුපියල් 30,000ක්, 40,000ක් දෙනවා. හැබැයි, රජයට බදු වශයෙන් ශත පහක්වත් ගෙවන්නේ නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාවෙන් ගන්න එපා; do not take my time. විපක්ෂයෙන් වෙලාව ගන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මා ඉන්න ස්ථාවරයටම ආපු එක ගැන මම සන්තෝෂ වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තිබෙන ගැටලුව මොකක්ද කියලා දන්නවාද? IMF Country Report එකේ තිබෙන්නේ, "owner-occupied" home කියලායි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Right. But, Hon. Member, the President gave you an assurance.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
"Owner-occupied" home කියන්නේ කුලියට දීපු එකක් නොවෙයි; ඒකෙන් කියන්නේ තමන් ජීවත් වෙන ගෙදර ගැන.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හරි, හරි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
කුලියට දුන්නොත්, ඒ කුලියට කොහොමත් බද්දක් ගෙවන්න ඕනෑ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මා මිත්‍ර ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා එක කොටසක් අල්ලා ගෙන ඒකේ එල්ලෙන්න එපා. රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක මේ ගැන සාකච්ඡා කරනවා. ඊයේ ජනාධිපතිතුමාත් මේ පිළිබඳව ප්‍රකාශයක් කළා. මොකද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අවශ්‍යයි, දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව රාජ්‍ය ආදායම සියයට 15කට ගේන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ ඒ සියයට 1.5ක අඩුව පුරවන්න තමයි මේ දේපළ බද්ද අය කරන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, අපි රජයට දිගින් දිගටම දෙයක් කිව්වා. මම ඉන්නේ PAYE Tax එක අය කරන්නත් එපා කියන මතයේ. PAYE Tax එක අය කරන සීමාව රුපියල් ලක්ෂයේ සිට ලක්ෂ දෙක කරන්න කියන මතයේ මම ඉන්නේ. අපි කිව්වා fixed depositsවලින් බදු අය කරන්න එපා කියලා. අපේ ස්ථාවරය ඒකයි. මේ ප්‍රශ්න විසඳා ගනිමින් යන නිසා අපි ජනාධිපතිතුමාව ලොකුවට හිර කරන්නේ නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට මේ කාරණයත් කියන්න ඕනෑ. මේ වෙනකොට සමහර රාජ්‍ය ආයතන ඇතුළේ තිබෙන හොරකම්, බදු වංචා අපි හරියට එළියට ගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, භාණ්ඩ ආනයනය සඳහා විවිධ සමාගම්වලට ශ්‍රී ලංකා රේගුව temporary VAT සහනයක් දෙනවා. ඒ තුළ තිබෙන වංචාව රුපියල් බිලියන 300ක්. භාණ්ඩ ආනයනය කරන මහා පරිමාණ ආනයනකරුවන් තමන්ගේ ලොරියේ driverගේ නමට කොම්පැනියක් හදලා, ලොරියේ cleanerගේ නමට කොම්පැනියක් හදලා, driverගේ නෝනාගේ නමට කොම්පැනියක් හදලා, containers ගණනාවක් ගෙනාවාට පස්සේ ඒ කොම්පැනිය වහනවා.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මම සභාපතිත්වය දරන ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ගත් තීරණයක් අනුව අපි ලොකු සටනක් කරලා, ඒ temporary VAT සහනය ලබා දීම අහෝසි කරන්න අවශ්‍ය කටයුතු මේ වෙනකොට කරලා තිබෙනවා. මේ temporary VAT එක අහෝසි කිරීමෙන් විතරක් රුපියල් බිලියන 300ක් ආණ්ඩුවට ලබා ගන්න පුළුවන්. PAYE Tax එකෙන් රජය බලාපොරොත්තු වෙන්නේ රුපියල් බිලියන 150යි. Temporary VAT සහනය අහෝසි කළොත්, රුපියල් බිලියන 300ක් ආණ්ඩුවට ලබා ගන්න පුළුවන්. ඒ නිසා අපි රජයට කියනවා, ඒ කටයුත්ත කරන්න කියලා.

ඊළඟට, බදු අභියාචනා ක්‍රමවේදය දිහා බලන්න. දේශීය ආදායම් පනත හදලා තිබෙන්නේ බදු ගෙවන්න නොවෙයි, නොගෙවන්න. ඒ නිසා ලංකාවේ ඕනෑම කෙනෙකුට අභියාචනා හතරක් ඉදිරිපත් කරලා, අවුරුදු 30ක් බදු නොගෙවා සිටීමේ හැකියාව තිබෙනවා. ඔවුන්ට පුළුවන්, මුලින්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අභියාචනයක් ඉදිරිපත් කරන්න.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ඊළඟට, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. ඊළඟට, බදු අභියාචනා කොමිසමට අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. ඊළඟට, අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. ඊළඟට, ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න පුළුවන්. මේ සඳහා ගතවන කාලය අවුරුදු 30ක්. අද වෙනකොට ඒ අභියාචනා නිසා හිර වෙච්ච මුළු මුදල රුපියල් බිලියන 950ක් වෙනවා. ඒ නිසා මේ ක්‍රමය අපි වෙනස් කරන්න ඕනෑ. ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් මේ වෙනකොට දේශීය ආදායම් පනත සංශෝධනය කරලා, අවුරුදු දෙකක් ඇතුළත අභියාචනා දෙකක් ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් හදලා තිබෙනවා. ඒ නිසා අපි ජනාධිපතිතුමාට කිව්වේ, මේ විධියේ බදු ගහන්න ඕනෑ නැහැ කියන එක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කියන්න කියලායි. දැනට පවතින බදු අය කරන ක්‍රමය වෙනස් කිරීමෙන් රජයේ බදු ආදායම වැඩි කර ගැනීමේ හැකියාව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තිබෙනවා, RAMIS කියන පරිගණක පද්ධතිය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව digitalize කරන්න, RAMIS කියලා පරිගණක පද්ධතියක් ගෙනාවා. ඒක ගෙනැල්ලා දැන් අවුරුදු 12ක් වෙනවා, නමුත් ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඇයි? ඒ පද්ධතිය ක්‍රියාත්මක කරපු ගමන් ඒ ආයතනය ඇතුළේ ඉන්න අයට අත යට සල්ලි ගන්න බැරි වෙනවා. ඒකට නීතියක් තිබුණා. RAMIS පද්ධතිය හරහා ප්‍රධාන ආයතන 6ක් digitalize කිරීමට - පරිගණකගත කිරීමට - එකතු කරන්න කිව්වා. ඒ තමයි රේගුව, වරාය, සුරාබදු දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව - RMV එක. අද වෙනකම් මේ ප්‍රධාන ආයතන 6න් එකක්වත් digitalize කරලා නැහැ. වෙන මොකුත් ඕනෑ නැහැ, සුරාබදු දෙපාර්තමේන්තුවේ වයස අවුරුදු 120යි. එය අද වෙනකම් digitalize කරලා නැහැ. ඔවුන් එතැනට යන්න තවම සූදානම් නැහැ. අද වරායට wharf clerksලා දාලා තිබෙනවා, එතැන තමයි ලොකුම වංචාව වෙන්නේ. අද wharf clerk කෙනෙක් ඕනෑ නැහැ, digitalize කරලා ඒ සියලු කටයුතු කර ගන්න පුළුවන්. හැබැයි, මේ රාජ්‍ය නිලධාරීන් එතැනට යන්න දෙන්නේ නැහැ. ඒ සම්බන්ධව විමසන්න ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අපේ කමිටුවට ගෙනාවා. ඇහුවාම කියනවා, digitalize කරන්න තියා ඔවුන්ට laptop එකක්වත් නැහැ කියලා. ඔවුන් laptops ගන්න ලැහැස්ති නැහැ, ඔවුන් digitalization එකකට යන්නේ නැහැ. ඇයි? හැම ඉඩමක්ම විකුණනකොට අඩු මිල ගණන් දාලා, හොරට අත යට ගනුදෙනු කරනවා. අපි වාහන ආනයනය නවත්වලා මේ වෙනකොට අවුරුදු දෙකක් වෙනවා. නමුත්, මේ වෙනකොට වාහන 4,000ක් හොරෙන් ගෙනැල්ලා තිබෙනවා. RMV එක digitalize කළොත් මේවා අහු වෙනවා. ඒ නිසා මේ ආයතනවල නිලධාරීන් කැමැති නැහැ, ඒක කරන්න. ඒ නිසායි ජනාධිපතිතුමාට අපි කිව්වේ මේ සම්බන්ධව දැඩි තීන්දුවක් ගන්න කියලා. සුරාබදු කොමසාරිස් ජනරාල්තුමා වෙන්න පුළුවන්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්තුමා වෙන්න පුළුවන්, ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්තුමා වෙන්න පුළුවන්, රේගු අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙන්න පුළුවන්, රජයට යම් මුදලක් අහිමි කළා නම් ඔවුන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. අල්ලස් සම්බන්ධව තිබෙන අලුත් පනතේ ඒ සඳහා ඉඩ තිබෙනවා. මේ ආයතන එක්කහු කරන්නේ නැත්නම්, ඒ සඳහා අවශ්‍ය අණ පනත්, නීති ගේන්න අපි කටයුතු කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිනිස්සුන්ට තිබෙන බදු බර වැඩියි කියලා අපි පිළිගන්නවා. හැබැයි අපි වගකීමෙන් කියනවා, තව මාස දෙක තුනක් යනකොට මේ ඍණ ආර්ථිකය ධන ආර්ථිකයට ගෙනාවාම ජනතාවට දැනෙන විධියට බදු සහන ලැබෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අවුරුද්දේ සංචාරකයින්ගෙන් මේ රටට ලැබුණු මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 1,100යි. 2023 අවුරුද්ද වෙනකොට මේ ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 2,068ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. 2024 අවුරුද්දේ පළමුවෙනි කාර්තුවේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,025ක් සංචාරක ව්‍යාපාරයෙන් මෙරටට ලැබිලා තිබෙනවා. අපි හිතනවා, මේ වසරේ අඩුම ගණනේ ඇමෙරිකානු ඩොලර් මිලියන 3,000ක් සංචාරක ව්‍යාපාරයෙන් විතරක් රටට ලබා ගන්න පුළුවන් වෙයි කියලා. අපට 2022දී විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබුණේ ඇමෙරිකානු ඩොලර් මිලියන 3,789යි. 2023 අවුරුද්ද වෙනකොට මේ ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 5,969ක් වුණා. අපි විශ්වාස කරනවා, 2024 අවුරුද්ද වෙනකොට ඇමෙරිකානු ඩොලර් මිලියන 7,000කට එහා මුදලක් විදේශ ශ්‍රමිකයන්ගෙන් අපට ලබා ගන්න හැකියාව තිබෙනවා කියලා. අපි ඇමෙරිකානු ඩොලර් මිලියන 18,291ක අපනයන - imports - කළා. හැබැයි, 2023 අවුරුද්ද වෙනකොට මේ ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 16,811 දක්වා අඩු වෙලා තිබෙනවා.

මේ වෙනකොට ආර්ථිකය සුබවාදී මාවතකට එළඹෙමින් යනවා. විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ වැඩි වෙනවා, මෙරටට පැමිණෙන සංචාරකයෝ වැඩි වෙනවා, විදේශ ආයෝජකයින් ලංකාවට එනවා, සංචිත වැඩි වෙනවා, ඩොලරයේ වටිනාකම අඩු වෙනවා. ඒ නිසා අපට දැනෙනවා, රට තුළ දැවැන්ත ආර්ථික පරිවර්තනයක් සිද්ධ වෙමින් තිබෙන බව. ආණ්ඩුව මේ රටේ මිනිස්සුන්ට බදු ගහන්නේ කැමැත්තෙන් නොවෙයි, මේ බදු සංශෝධනවලට පක්ෂව අපි අත උස්සන්නේ කැමැත්තෙන් නොවෙයි, මිනිස්සුන්ගේ අමාරුව නොදැන නොවෙයි, අපි බොහොම අමාරුවෙන් තමයි මේ සංශෝධනවලට පක්ෂව අත උස්සන්නේ. හැබැයි ආණ්ඩුවට සල්ලි අව්වු ගහන්න බැරි නම්, ආණ්ඩුවට ණය ගෙවන්න බැරි නම්, මිලියන 22ක මිනිස්සු ජීවත් කරවන්න මොකක්ද කරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ළඟ තිබෙනවා, මහ බැංකුව විසින් ගිය අවුරුද්දේ ලබා දුන් මුදල් ගැන විස්තරයක්. මට මතකයි, 2001 අවුරුද්ද වෙනකොට මහ බැංකුවේ සංචිත විධියට ඇමෙරිකානු ඩොලර් මිලියන 10ක්වත් තිබුණේ නැති බව. දැන් අපි ඉන්ධනවලට විතරක් ඇමෙරිකානු ඩොලර් මිලියන 2,190ක් දීලා තිබෙනවා, ගල් අඟුරුවලට විතරක් ඇමෙරිකානු ඩොලර් මිලියන 361.8ක් දීලා තිබෙනවා, ගෑස් සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 112.8ක් දීලා තිබෙනවා, අනෙක් කටයුතු සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 37.5ක් දීලා තිබෙනවා. මේ, ඇමෙරිකානු ඩොලර් මිලියනයක් තිබුණේ නැති මහ බැංකුව අද ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා සඳහා කටයුතු කරන ආකාරය.

අද හර්ෂ ද සිල්වා මැතිතුමා ඇතුළු සියලුදෙනා පිළිගන්නවා, ආර්ථිකය සුබවාදී පැත්තකට, හොඳ පැත්තකට එනවා කියලා. ඒ නිසා තමයි ජනාධිපතිතුමා ආවාම එතුමන්ලා ගිහිල්ලා කථා කරන්නේ. අපේ ගරු රවුෆ් හකීම් මැතිතුමා ජනාධිපතිතුමා එක්ක කථා කරනවා. නිස්ස අත්තනායක මැතිතුමා ඒකට එච්චර කැමැති නැහැ. එතුමා කැමැති නැහැ, එතුමා තනි අලියා. පැරදුණත් සජිත් මහත්තයා එක්ක ඉන්නවා. එහෙම පිරිසකුත් ඉන්න ඕනෑ. කිරිඇල්ල මහත්තයා, අත්තනායක මහත්තයා වාගේ අයත් ඉන්න ඕනෑ. සජිත් ප්‍රේමදාස මහත්තයාට නින්ද යනකම් එතුමාගේ තනියට කවුරු හරි ඉන්නත් එපායැ, ගොරවනකොට තට්ටු කරන්න.

අන්න සභාවට එනවා, කෑගල්ලේ අපේ වීරයා වන ගරු සුජීත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා සහ කුරුණෑගල වීරයා ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඒ සියලුදෙනා අද පිළිගෙන තිබෙනවා, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ ආර්ථික වැඩ පිළිවෙළ සුබවාදීයි කියලා. *[බාධා කිරීමක්]* ඉතින් ඔබතුමා කලබල වෙන්න එපා, ගම්පහින් අපි ඔබතුමාව ගන්නේ නැහැ, හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. අපි ඒකට වෙන දෙන්නෙක් හඳුනාගෙන තිබෙනවා. අපට තේරෙනවා, රාජකරුණා මන්ත්‍රීතුමාට එන්න කියන්නේ නැති නිසා දුකක් ඇති වෙලා කියලා. ඔබතුමාව ගන්නේ නැහැ, ඒ අය. ඉතින් කලබල කර ගන්න එපා. හැබැයි අමතක කරන්න එපා, මේ ආර්ථික වැඩ පිළිවෙළ සුබවාදීයි කියන පිරිසක් ඉන්න බව, මා මිත්‍ර මන්ත්‍රීතුමනි. අද ආර්ථිකය සුබවාදී කියන 17දෙනෙකු ජනාධිපතිතුමා හම්බ වෙලා රුපියල් මිලියන 600, 700 අරගෙන තිබෙනවා. එතුමන්ලා අද ගම්වලට ගිහිල්ලා වැඩ කරනවා. අද ඔබතුමන්ලාගේ පැත්තේ ඉන්න කට්ටිය රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා අපට සල්ලි දුන්නා කියලා එතුමාගේ ෆොටෝ එක ගහගෙන ගම්වලට ගිහිල්ලා, ඒ වැඩ කටයුත්ත කරනවා. තිස්ස අත්තනායක මැතිතුමා දන්නවා, අපේ වේලු කුමාර් මන්ත්‍රීතුමා කෝවිල්වලට ගිහිල්ලා, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා සල්ලි දුන්නාය කියලා අද කථා කරන බව. ඒක වෙන්න ඕනෑ. එතුමාට සල්ලි දුන්නාම ඒවා කියන්නත් එපා යැ. මේ රට සුබවාදී මාවතකට අද වෙනකොට එළඹෙමින් තිබෙන බව අපි දන්නවා.

බදු පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන බව අපි පිළිගන්නවා. බදු ගෙවීමට තිබෙන අමාරුවත් අපි පිළිගන්නවා. හැබැයි, අපි ආණ්ඩු පක්ෂය හැටියට සහතිකයක් දෙනවා, මේ බදු බර අඩු කරන්න ඉදිරි කාලයේදී කටයුතු කරන බවට. *[බාධා කිරීම්]* ඇයි, ඔබතුමන්ලා කියන්නේ රාජකරුණා මන්ත්‍රීතුමාට මොනවා හරි කියන්න කියලා? එතුමාට මොනවත් කියන්න අවශ්‍යතාවක් නැහැ. එතුමාට චූටි හිතේ අමාරුවක් තිබෙනවා. මොකද, ජනාධිපතිතුමා එතුමාට සල්ලි දුන්නේ නැහැ. ගම්පහ දිස්ත්‍රික්කයේ හතරදෙනෙකුට සල්ලි දීලා තිබෙනවා. හැබැයි, රාජකරුණා මන්ත්‍රීතුමාට සල්ලි දීලා නැහැ. ඒක වැරැදියි. එතුමා මගෙත් මිත්‍රයා. හරි නම් රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඔබතුමාටත් සල්ලි දෙන්න ඕනෑ, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි. එහෙම සල්ලි නොදී ඉන්න එක හරි වැරැදියි. *[බාධා කිරීමක්]* එතුමන්ලාගේ නම් මම කිව්වේ නැහැ. මම කිව්වේ, ඔබතුමාටත් සල්ලි දෙන්න ඕනෑය කියායි. හැබැයි, ගම්පහ දිස්ත්‍රික්කයේ තුන්දෙනෙක් ඔබතුමාට සල්ලි දෙනවාට කැමැති නැහැ. *[බාධා කිරීමක්]* මම දන්නවා. ඔබතුමාගේ ඇක්ටින් ගැන මම ඒ ප්‍රදේශයට ගියාම කට්ටිය කිව්වා. මම ඒ ගැන මේ ගරු සභාවේදී කථා කරන්නේ නැහැ. අපි ඒ ගැන රණ්ඩුවකට යන්නේ නැහැ. බොහොම හොඳයි. එහෙම ඩබල් ඇක්ටින් කරන්න එපා. මොකද, විපක්ෂ නායකතුමාගේ තනියට කවුරු හරි ඉන්න ඕනෑ. ඔක්කොම ගියොත් එහෙම හරි ප්‍රශ්නයක් වෙනවා. එතුමාට ආතතියක් හරි හැදිලා මොනවා හරි ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. ඒ නිසා එතුමාත් එක්ක යම් පිරිසක් අනිවාර්යයෙන්ම ඉන්න ඕනෑ. *[බාධා කිරීමක්]* මම ඉන් එහාට ඒ ගැන කථා කරන්නේ නැහැ. මට තේරෙනවා, ඔබතුමාට මුදල් නොලැබීම නිසා ඔබතුමා දැඩි අපහසුතාවට පත් වෙලා කියලා. මට තේරෙනවා, ඔබතුමාගේ වේදනාව. *[බාධා කිරීමක්]* මට තේරෙනවා, ඔබතුමාගේ වේදනාව. ඒ ගැන ඔබතුමාගේ කථාවේදී කියන්න. ඒ කාරණය ගැන කියන්න මම ඊට වඩා මගේ කාලය ගන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගොඩක් අය අපට කථා කරලා කියනවා, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට අපි දොස් කිව්වාය, නමුත් අද අපි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා වෙනුවෙන් කථා කරනවාය කියලා. ඔව්, අපි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා වෙනුවෙන් කථා කරනවා. අපි එතුමා වෙනුවෙන් කථා කරන්නේ වෙන දෙයක් නිසා නොවෙයි. අපි එතුමා ගැන කථා කරන්නේ රට වෙනුවෙන්. අපට දේශපාලන න්‍යාය පත්‍රයක් වැඩක් නැහැ. අපි හිතනවා, මේ රටේ ආර්ථිකය ගොඩ දමන්න පුළුවන් නායකයෙක් ඉන්නවා නම් ඒ රනිල් වික්‍රමසිංහ මහත්තයා විතරයි කියලා. අපි ඒ අවස්ථාව සජිත් ප්‍රේමදාස මහත්තයාට, අනුර දිසානායක මහත්තයාට ලබා දුන්නා. නමුත්, ඒ දෙදෙනාටම තිබෙන බැරිකම -බැරිබැරියාව- නිසා තමයි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ඒ වගකීම භාරගෙන මේ වෙනකොට රටේ ආර්ථිකය සුබවාදී තැනකට ගෙනැල්ලා, මිනිස්සුන්ට මෙවර සිංහල අලුත් අවුරුද්ද, වෙසක් උත්සවය වාගේම පොසොන් උත්සවය සමරන්න අවශ්‍ය පසුබිම හදා තිබෙන්නේ. ඒ නිසා තමයි එතුමා ගෙනියන මේ වැඩ පිළිවෙළට අපි සහාය දෙන්නේ. ඔබතුමන්ලා අපට කියන්න, රනිල් වික්‍රමසිංහ මහත්තයා මේ ගෙනියන ප්‍රතිපත්තිවලට එහා ගිය හොඳ ප්‍රතිපත්තියක් සජිත් ප්‍රේමදාස මහත්තයා ළඟ තිබෙනවා, අනුර කුමාර දිසානායක මහත්තයා ළඟ තිබෙනවාද කියලා. අද ජේනවා නේ, ජවිපෙ කටයුතු කරන ආකාරය.

පසුගිය කාලයේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේනකොට ඒ වෙනුවෙන් විරුද්ධ වුණු ජනතා විමුක්ති පෙරමුණ අද කියනවා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂයි කියලා. එහෙම කියනවාට අපිත් කැමැතියි. මේ ගැන කථා කරන එක නොවෙයි කළ යුත්තේ. මේවා කරලා බලන්න ඕනෑ. ඒ නිසා අපි ඔබතුමන්ලාට කියන්නේ, මේ ආර්ථිකය සුබවාදී මාවතකට ඇවිල්ලා තිබෙන වෙලාවේ ඒක තවත් ඉස්සරහට ගෙනියන්න කටයුතු කරන්න කියායි.

TNA එකේ නායකතුමා මාත් එක්ක කිව්වා, ජනාධිපතිතුමා දැන් උතුරේ වැඩ කටයුතු කරන්න අපට සල්ලි දීලා තිබෙනවා, ඒ නිසා අපි දැන් උතුරේ සංවර්ධන වැඩ කටයුතු කරනවාය කියලා. දැන් එතුමන්ලා බොහොම සතුටෙන් උතුරේ වැඩ කටයුතු කරනවා. TNA එකේ අය බොහොම සතුටෙන් ජනාධිපතිතුමාත් එක්ක දැන් වැඩ කරනවා. එමෙන්ම එතුමන්ලාගේ දිස්ත්‍රික්කයේ වැඩ කරන්න අද එතුමන්ලාට සල්ලි තිබෙනවාය කිව්වා.

ඒ වාගේම නැහෙනහිර පළාතේ මන්ත්‍රීවරුන්ට අද වැඩ කරන්න සල්ලි දීලා තිබෙනවාය කිව්වා. ඒ නිසා අද ඒ දිස්ත්‍රික්කවල විශාල සංවර්ධනයක් සිද්ධ වෙන බව එතුමන්ලා කියා තිබෙනවා. අද හැම කෙනෙක්ම සතුටෙන් වැඩ කරනවා, මේ ආර්ථිකය සුබවාදී මාවතකට ඒමත් එක්ක. අද යම් යම් ප්‍රදේශවල සංවර්ධන කටයුතු ආරම්භ වෙලා, මිනිස්සුන්ගේ ජීවන බර අඩු වෙලා, නැවතත් රැකියා අවස්ථා ලබා දීම ආරම්භ කරලා, මේ රට යථා තත්ත්වයට පත් වෙමින් තිබෙනවා. මේ වෙලාවේ අපි පෞද්ගලික න්‍යාය පත්‍රවලට අනුව කටයුතු නොකළ යුතුයි. හැමදාම විපක්ෂය ඕක තමයි කළේ. මට මතකයි, අපි යුද්ධය දිනාගෙන එනකොට කිරිඇල්ල මහත්තයා කිව්වා, කිලිනොච්චියට යනවා කියලා මැදවච්චියට ගියා, ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන් කියලා. එහෙම තමයි තමුන්නාන්සේලා කිව්වේ. ඒක තමයි විපක්ෂය හැම දාම කළේ. කොරෝනා වසංගතය අවසන් කරන්න ගෝඨාභය රාජපක්ෂ මහත්තයා නායකත්වය ගන්නකොට තමුන්නාන්සේලා මොනවාද නොකිව්වේ? තමුන්නාන්සේලා කරන්න ඕනෑ සියලු විවේචන කළා. කොරෝනා වසංගතය වළක්වන්න කටයුතු කරනකොට තමුන්නාන්සේලා වෘත්තීය සමිති සාමාජිකයන් දාලා ඒවා විවේචනය කළා. හැබැයි, එතුමා ලෝකයේ හැම රාජ්‍ය නායකයෙකුටම කථා කරලා, මේ රටේ ජනතාවට එන්නත් එකක්, දෙකක්, තුනක් නොවෙයි, එන්නත් හතරක්ම ගහන්න කටයුතු කළා. අනුර කුමාර දිසානායක මහත්තයා එන්නත් ගහගන්නේ නැහැ කිව්වා; හැබැයි, හොරෙන් ගිහිල්ලා එන්නත් ගහගත්තා. සජිත් ප්‍රේමදාස මහත්තයා එන්නත් ගහගන්නේ නැහැ කිව්වා; හොරෙන් ගිහිල්ලා එන්නත් ගහගත්තා. ඒ නිසා අද මේ රටේ

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

මිනිස්සු ජීවත් කරවපු ගෞරවය රාජපක්ෂවරුන්ට ලැබෙනවා. යුද්ධය පැවති අවස්ථාවේදී වාගේම කොවිඩ් වසංගතය පැවති අවස්ථාවේදීත් මහින්ද රාජපක්ෂ මැතිතුමා වාගේම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ මිනිස්සුන්ට දෙවරක් ජීවිත දානය ලබා දුන්නා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ තිබුණු ඍණ ආර්ථිකය, ධන ආර්ථිකයක් බවට පත් කර, ආර්ථික අර්බුදයෙන් රට ගොඩ අරගෙන මේ වැඩ පිළිවෙළ අද වෙනකොට ඉදිරියට ගෙනියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනතට මම ඉතාම කැමැතියි. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, මේ කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත ගැන. හැබැයි, ඔබතුමා අමාත්‍ය ධුරයේ ඉන්නකොට කැසිනෝ බලපත්‍රයකට අය කළේ කීයද? අද බලපත්‍ර ගාස්තුව විතරක් මිලියන 50ක්. අමතර සේවා ගාස්තුව හදනවා, තව මිලියන 50ක්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා නියාමන අධිකාරියක් ගැන. දැන් කැසිනෝ නියාමන අධිකාරිය ස්ථාපිත කරන්න අවශ්‍ය සියලු වැඩ කටයුතු අවසන්. ඒ නිසා ඉතා කඩිනමින් අපි කැසිනෝ නියාමන අධිකාරිය පිහිටුවනවා. හැම රජයක්ම කැසිනෝකාරයන්ට යට වෙලා හිටියා; හැම රජයක්ම කැසිනෝකාරයන්ගෙන් සල්ලි ගත්තා. හැබැයි, පළමුවැනි වතාවට කැසිනෝකාරයන්ට බදු ගෙවන්න අවශ්‍ය වටපිටාව අපි හැදුවා. කැසිනෝ බලපත්‍රය විතරයි ගත්තේ. කැසිනෝ ගහන්න එන කෙනෙකුගෙන් ඩොලර් කීයක් ගන්නවාද? ඒ කිසිවක් සඳහා බදු අය කළේ නැහැ. අපි ඒ සියලු බදු අය කරන්න කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා හොඳ පනත් කිහිපයකට අදාළ රෙගුලාසි, නියමය, නියෝග සහ යෝජනා සම්මතයකුත්, පරිපූරක මුදල පිළිබඳ යෝජනාවත් තමයි අද සම්මත කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් කථා කිරීමට මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු කිංස් නෙල්සන් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු මයන්ත තිසානායක අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.
Whereupon THE HON. KINS NELSON left the Chair, and THE HON. MAYANTHA DISSANAYAKE took the Chair.

[අ.භා. 3.24]

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Casino Business (Regulation) Act එක යටතේ රෙගුලාසි, නියමය හා නියෝගයකුත්, Colombo Port City Economic Commission Act එක යටතේ නියෝගයකුත්, ජනාධිපතිවරයාට විශේෂ ඉදිරිපත් කිරීමක් සඳහා, නැත්නම් එතුමාට අලුත් අය වැයෙන් යම් මුදලක් ලබා ගැනීම සඳහා වූ යෝජනාවකුත්, තවත් පනතක් යටතේ යෝජනා සම්මතයකුත් අද දින සම්මත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම මේ කාරණය කියන්න කැමැතියි. මේ රටේ කැසිනෝ ව්‍යාපාරය - casino business එක- සම්බන්ධ රෙගුලාසි හදන්න රජයන් හැම එකක්ම හුහක් පමා වුණා. ඒකට හේතුව, මේ රටේ කැසිනෝ ව්‍යාපාරයේ ඉන්න ප්‍රධානීන්, දේශපාලනඥයන් එක්ක විවිධ සම්බන්ධතා පැවැත්වීම. ඒක අපි පිළිගන්න ඕනෑ. එක කාලයක ඒගොල්ලන්ට මේ රටේ කරන්න බැරි දෙයක් තිබුණේ නැහැ. ඒක නිසා කැසිනෝ ව්‍යාපාරය regulate කරන්න අපේ රටට හුහක් කල් ගියා. තවමත් ඒක යන්නේ ඉබාගාතේ. සමහර අවස්ථාවල ඉබි ගමනේ. ඒක නිසා අපි මේ වෙලාවේදී කියන්න කැමැතියි, ඒ ව්‍යාපාරය සම්බන්ධව නිශ්චිතව රෙගුලාසිකරණයකට යන්න අවශ්‍යයි කියලා. ඒක නිසා මේ රෙගුලාසි සම්බන්ධව අපේ ධනාත්මක හැඟීමක් තිබෙනවා.

ගරු ජනාධිපතිතුමා අය වැයෙන් එතුමාට වෙන් වුණු මුදලට Supplementary Sum එකක් විධියට අද විශේෂ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, රුපියල් මිලියන 8,750ක් - රුපියල් බිලියන 8.75ක් - අලුතින් එතුමාගේ වැය ශීර්ෂයකට ජාතික ප්‍රමුඛතාවන් සඳහා ජාතික මට්ටමින් විශේෂයෙන්ම ඉදිරිපත් කරන ව්‍යාපෘති සඳහා යොදන්න වෙන් කරන්න කියලා. ඒක නිසා ඒ "ජාතික ප්‍රමුඛතාවයන් සඳහා ජාතික මට්ටමේ මහපෙන්වීම සහ සම්බන්ධීකරණය" කියන ශීර්ෂය යටතේ මේ මුදල් එතුමා ඉල්ලා තිබෙනවා. ඊට ඉස්සෙල්ලා අය වැය ප්‍රකාශයේදී එතුමා කිව්වා, මහනුවර බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳව කෞතුකාගාරයක් ඉදිකරනවා කියලා. ඒ වෙනුවෙන් වෙන් කරපු මිලියන 200ම මේ වෙනුවෙන් දාලා තිබෙනවා. ඒ වාගේම අනුරාධපුරයේ ජාත්‍යන්තර බෞද්ධ පුස්තකාලයක් පිහිටුවනවා, අනුරාධපුර මහා විහාර විශ්වවිද්‍යාලයක් පිහිටුවනවා වාගේ ලොකු කතන්දර එතුමාගේ Budget Proposalsවලදී කිව්වා. එහෙම කියලා දැන් ඇවිල්ලා නැවතත් කියනවා, ඒ එකක්වත් කරන්නේ නැහැ, ඒ සල්ලි ටික ඔක්කොම අරගෙන මැතිවරණය කාලයේ තමන්ගේ මන්ත්‍රීවරුන්ට දෙන සන්තෝසම් වාගේ වෙනම යම්කිසි වැඩසටහනකට යොදන්න ඕනෑ කියලා. ඒක නිසා මේ කාරණය අපි එළියේදී කියන්න ඕනෑ. අය වැය ප්‍රකාශය ඇතුළේ යම් mileage එකක් ගන්නවා, බෞද්ධ විශ්වවිද්‍යාලය හදනවා, මහා විහාරයට මෙච්චර දෙනවා, මහනුවරට මෙච්චර දෙනවා කියලා. එවැනි ප්‍රකාශ කරලා ඊට පස්සේ ඒ මුදල් තමන්ගේ මන්ත්‍රීවරුන්ට බෙදන්න දැන් අතිරේක වැය ශීර්ෂයක් ඉදිරිපත් කරලා තිබෙනවා.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න කැමැතියි. අපේ රටේ ජනාධිපතිතුමාම හදලා මේ පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගත්තා, 2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත කියලා පනතක්. මේ පනත හැදුවේම ප්‍රධාන අය වැය යටතේ ඉදිරිපත් වන යම්කිසි ව්‍යාපෘතියක්, යම්කිසි යෝජනාවක්

අලුතින් බලනවා නම් ඒක නැවත වතාවක් සොයා බලන්නයි. ඒ කියන්නේ, මේ රටේ පරණ අය වැයවලදී ඒ හිටපු එක එක ජනාධිපතිවරු, ඇමතිවරු තමන්ට කැමැති පරිදි ඒක වෙනස් කරන්න කටයුතු කළ හින්දා අය වැය කාර්යාලයක් හදන්න, 2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත ගෙනාවා. දැන් ඒ පනත යටතේ අය වැය කාර්යාලය පිහිටුවන්නේ නැතිව, ඒකට හොරෙන් මේක ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා මේක විශාල ප්‍රශ්නයක්.

මම අවසාන විනාඩියේදී විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න කැමැතියි. අද උදේ හර්ෂ ද සිල්වා මැතිතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරද්දී, මහ බැංකුවේ නිලධාරීන්ගේ වැටුප් වැඩි වීමේ ප්‍රශ්නය ගැන වාර්තාවේ සටහනක් ඉදිරිපත් කළා. මහ බැංකුවේ මේ ප්‍රශ්නය අපේ රටේ ආර්ථිකයේ බරපතළ කාරණා කිහිපයක් මතු කරනවා. පළමුවැනි කාරණය තමයි, මහ බැංකු පනතින් මහ බැංකුවට ස්වාධීනත්වය ලැබී තිබෙන්නේ, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා මිස, රාජ්‍ය යන්ත්‍රණයට පිටින් වැටුප් වැඩි කිරීම සඳහා නොවෙයි කියන ස්ථාවරය අපි නැවත පිහිටුවන්න අවශ්‍යයි. ඒ නිසා මේ වැටුප් ගැටලුව සම්බන්ධ ප්‍රශ්නය විමසන්න, විශේෂ කාරක සභාවක් මේ පාර්ලිමේන්තුවෙන් පත් කළ යුතුයි කියලා මම යෝජනා කරන්න කැමැතියි. විශේෂයෙන් මේ වැටුප් ප්‍රශ්නය හරහා අපේ රටේ සමස්ත වැටුප් පටිපාටියට විශාල ගැටලුවක් ඇති කරලා තිබෙනවා. ඒ වාගේම මේ වාර්තාවේ numbering නැහැ; වාර්තාවකුත් නොවෙයි මේක. මේක ඇත්තටම යම්කිසි සටහනක්. මේ සටහන ඇතුළේ ඒ අය කියන්නේ මොකක්ද? තමන් ගත්ත තීරණය නිවැරදියි කියන්න තමයි බොහෝ විට මේකෙන් උත්සාහ කර තිබෙන්නේ. ඒ වාගේම මේ Committee එකෙත් Governing Board එකේ නිලධාරීන් දෙදෙනෙකු ඉන්නවා. Governing Board එක තමයි මේ ප්‍රශ්නය ඇති කළේ. ප්‍රශ්නය ඇති කරපු අයම තමයි අද උත්තරය හදලා දෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
රජයේ සාමාන්‍ය, වෙනත් ආයතනයක සේවය කරන රියදුරෙක් පාගන brake එකම තමයි මහ බැංකුවේ සේවය කරන රියදුරුත් පාගන්නේ. සාමාන්‍ය රියදුරෙක් දමන ගියර් එකම තමයි මහ බැංකුවේ රියදුරුත් දමන්නේ. හැබැයි, මහ බැංකුවේ සේවය කරන රියදුරෙකුට රුපියල් ලක්ෂ එකහමාරක, දෙකක එහෙමත් නැත්නම් ලක්ෂ දෙකහමාරක, තුනක වැටුපක් ලැබෙන පරිදි වැටුප් වැඩි කරලා තිබෙනවා. සාමාන්‍ය සමාජයට මේක බරපතළ වැරැද්දක් බවට පත් වෙලා තිබෙනවා. මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, මේ මහ බැංකුවේ වැටුප් සම්බන්ධ ප්‍රශ්නය හුදු මේකෙන් පාස් කරන්නේ නැතිව, මේ පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් ඇතුළේ මෙය යළි විමර්ශනය කරන්න ඕනෑ කියලා. එහෙම නොකර මේකට ඉඩ දීම තුළ අපේ රටේ වැටුප් කොමිසමට සහ වැටුප් පටිපාටියට විශාල ප්‍රශ්නයක් ඇති වෙන බව ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය නිමා කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.බී. හේරත් රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 3.30]

ගරු ඩී.බී. හේරත් මහතා (පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு டீ.பீ. ஹேரத் - கால்நடை வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. D.B. Herath - State Minister of Livestock Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද පාර්ලිමේන්තුවේ මුදල් සම්බන්ධයෙන් වන පනත් කිහිපයකට අදාළ කාරණා විවාද කරන මොහොතේදී විශේෂයෙන්ම රටේ ආර්ථිකයට බලපාන කාරණා, ඒ වාගේම සංවර්ධන ක්‍රියාකාරකම් වෙනුවෙන් අපි කොයි විධියටද මැදිහත් වෙන්න ඕනෑ කියන කාරණා එක්ක ක්‍රියාත්මක වන වකවානුවකයි අපි ඉන්නේ කියන එක මම මතක් කරන්න ඕනෑ.

පොල් සංවර්ධන පනත යටතේ යෝජනා සම්මතයක්ද අද ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම පොල් සංවර්ධන පනතට අදාළ යෝජනා ඉදිරිපත් කරද්දී, පොල් ත්‍රිකෝණයට අයත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ අය හැටියට අපි විශේෂයෙන් කියන්න කැමැතියි, මෙය රටේ ආර්ථිකයට ලොකු වටිනාකමක් එකතු කරන මාතෘකාවක් බව. අපි මෙතෙක් කල් පිටරටට විකුණන්න කටයුතු කළේ පොල් ආශ්‍රිත නිෂ්පාදන. මෑත භාගය ගත්තාම එතැනින් එහා ගිය, පොල් සංවර්ධන අධිකාරියට අදාළ හුඟක් දේවල් මේකට එකතු වෙලා තිබෙනවා. කොහුබත් කර්මාන්තය ගත්තොත්, එය රටට විදේශ විනිමය වැඩියෙන් ලැබෙන මාතෘකාවක් බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසාම අපි යෝජනා කරනවා, විශේෂයෙන් පොල් වගාකරුවන්ට වැඩියෙන් සහන ලබා දෙන්න කියලා. දැනටමත් ලබා දෙන සහනාධාර එක්ක ගත්තාම, පොල් වගාව පිළිබඳව දැඩි උනන්දුවක් දක්වන අයට ඒ පහසුකම් ලැබීමත් එක්ක මේ සඳහා විශාල පිරිසක් එකතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොල් වගාව පිළිබඳව වෙනදාට වඩා ප්‍රශ්න තිබෙනවා. පොල් කුරුමිණියන්ගෙන්, සුදු මැස්සාගෙන් පොල් වගාවට සිදුවෙන හානිවලට විසඳුම් සොයන්න අපට වැඩ පිළිවෙළක් හදන්න සිදුවෙලා තිබෙනවා. දැනටමත් පොල් සංවර්ධන අධිකාරිය, කෘෂිකර්ම අමාත්‍යාංශය මැදිහත් වෙලා පොල් වගාවට සිදුවෙන හානිවලට එරෙහිව සිදු කරන ක්‍රියාකාරකම් එක්ක තවදුරටත් මෙය වර්ධනය කරන වැඩ පිළිවෙළක් දක්වා යන්න අවශ්‍යයි.

ඒ වාගේම, පොල් වගා කරන ගොවීන්ට සහන ලබා දෙන ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරන්න ඕනෑ කියලා අපි කල්පනා කරනවා. අනෙක තමයි, විශේෂයෙන් මුදල් සම්බන්ධ පනත් පිළිබඳව කථා කරනකොට, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයට අදාළ මුදල් වැඩියෙන් වෙන් කරනකොට ඒ මුදල් වෙන් කරන්නේ ඇයිද කියන කාරණාව ගැනත් කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුදු දෙකක කාලය තුළ සංවර්ධන වැඩ කරන්න අපට මුදල් තිබුණේ නැහැ. අපිට විමධ්‍යගත මුදල් හම්බ වුණේ නැහැ. අමාත්‍යාංශවල වැඩ කරන්න තිබ්බ මුදල් ප්‍රමාණය අවම වෙලා තිබුණා. ඒකට හේතුවක් තිබුණා. කොරෝනා වයිරසයත් එක්ක ඇති වෙච්ච ආර්ථිකයේ කඩාගෙන වැටීම ලංකාවට විතරක් බලපෑ කාරණාවක් නොවෙයි. විදේශීය රටවල් ගත්තොත් එංගලන්තයේ පවා තෙල් පෝලිම් තිබුණා. ඒ වාගේම, කඩාගෙන වැටුණු ඒ ආර්ථිකය නැවත වතාවක් යථාවත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ගනිද්දී අපේ රටට තිබුණා, සුවිශේෂ කාරණාවක්. ඒ තමයි, විදේශ ණය ගෙවන්න තිබෙන අභියෝගය.

[ගරු ඩී.බී. හේරත් මහතා]

අපි රටක් හැටියට විදේශ රටවලින් ගත්ත ණය බොහෝ විට හරි විධියට ආයෝජනය නොකිරීමේ ස්වභාවයත් එක්ක මේ රටේ ආර්ථිකය කඩාගෙන වැටුණා. අපි දැක්කා, විදේශීය රටවලින් අපි අරගෙන ආපු මුදල් සමහර වෙලාවලදී පාඩු ලබන ආයතන නඩත්තු කරන්න පාවිච්චි කළා. සමහර අවස්ථාවලදී පරිභෝජනය වෙනුවෙන් පාවිච්චි කළා. කොටසක් තමයි සංවර්ධනය වෙනුවෙන් පාවිච්චි කළේ. මේ මුදල් සංවර්ධනය වෙනුවෙන් හරි විධියට පාවිච්චි කළා නම්, ඒවා නිවැරදිව ආයෝජනය කළා නම්, අපේ භාණ්ඩාගාරයට මීට වඩා මුදල් එන්න ඉඩකඩ තිබුණා. මේ කාරණාව අපි තේරුම් ගන්න ඕනෑ. ඒ තත්ත්වයත් එක්ක විදේශ ණය කියන ගැටලුවට විසඳුමක් ලබා දෙන්න යන ගමනේදී මුළු ලෝක ආර්ථිකයත් කඩාගෙන වැටුණාම අපිට සිද්ධ වුණා, අපේ භාණ්ඩාගාරය ශක්තිමත් කරන්න, රජය ඉදිරියට ගෙනියන වැඩ පිළිවෙළ සාර්ථක කරගන්න විදේශීය රටවල සහයෝගය ලබාගන්න. ඒ නිසා තමයි අපි IMF එකත් එක්ක එකට එක්කහු වෙන්නේ. මේ තත්ත්වයත් එක්ක අපිට ජාත්‍යන්තර සහයෝගය ලබා ගන්න, විශ්වාසය දිනාගන්න සිද්ධ වුණා. ඒකට ස්ථාවර දේශපාලන පදනමක් පෙන්වන්න අපිට සිද්ධ වුණා. ඒ අනුව රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ නායකත්වය තුළ වර්තමාන ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය -ආණ්ඩු පක්ෂය- ස්ථාවරව ඉඳගෙන මේ කඩාගෙන වැටුණු රට ගොඩගැනීමේ අභියෝගයට මුහුණ දෙන්න රජයක් හැටියට සූදානම් වෙලා හිටියා.

ඒ කාරණාවේදී ඒ විධියට කටයුතු කරද්දී, අපිට අවුරුදු දෙකක කාලයක් සංවර්ධන ක්‍රියාකාරකම් කරන්න බැරි වෙනකොට ඒ කාල වකවානු තුළත් හැම වෙලාවකම අපි උත්සාහ ගත්තා, මහජනතාවගේ සුබසාධන කටයුතු කරගෙන යන්න. වර්තමානය වන විට ආර්ථිකය කිසියම් තැනකට ඇවිල්ලා තිබෙනවා. ආර්ථික වර්ධන වේගය ධනාත්මක වෙලා තිබෙනවා. අපි ඍණ ආර්ථිකයක හිටියේ. එතකොට ධනාත්මක ආර්ථිකයක් තිබෙන වෙලාවක රටේ සංවර්ධනය පිළිබඳව කථා කරනකොට වර්තමානයේ පෞද්ගලික අංශය, රාජ්‍ය අංශය, ආයෝජන ක්‍රියාකාරකම් ශක්තිමත් වෙලා තිබෙනවා. ඒ කාරණාවත් එක්ක අපිට නැවත වතාවක් ජනතාවට වැඩ කරන්න පුළුවන් පදනමක් හැදිලා තිබෙනවා. ඒ අනුව අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා මහජන නියෝජිතයෝ හැටියට අපට විමධ්‍යගත අරමුදල් ලබා දුන්නා, අමාත්‍යාංශ ප්‍රතිපාදනවලට අමතරව. අපි ඒ මුදල් ටික අරගෙන ගිහිල්ලා ගම්වල විවිධ සංවර්ධන වැඩ කරනවා.

අපි දැක්කා විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිව්වා, "මේ මුදල් ජනාධිපති වැය ශීර්ෂයට වෙන් කරන්නේ ඇයි, ඕනෑ නම් අමාත්‍යාංශවලට වෙන් කරන්න තිබුණා" කියලා. නමුත් අපි මේ කාරණය මතක් කරන්න ඕනෑ. ජනාධිපති වැය ශීර්ෂයෙන් මේ ලැබෙන මුදල් උදාහරණයක් වශයෙන් ගත්තාම සෞඛ්‍ය කටයුතුවලට, කෘෂිකර්මයට, සමාජ යටිතල පහසුකම් වෙනුවෙන්, සුබසාධන ක්‍රියාකාරකම් වෙනුවෙන් -මේ ඕනෑම එකකට- පාවිච්චි කරන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයක් හැටියට අය වැය ලේඛනයට එරෙහිව ඡන්දය දුන්න අයටත්, විපක්ෂයේ මන්ත්‍රීවරු 17දෙනෙකුට ජනාධිපතිතුමා මේ සල්ලි දීලා තිබෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, ඒ සල්ලි ලබාගත්ත මන්ත්‍රීවරුන්ට මේ පරිපූරක මුදලට එරෙහි වෙන්න බැහැ කියන එක. මොකද, ඔවුන්ට මේ සල්ලි හම්බ වෙන්නේ ජනාධිපති වැය ශීර්ෂයෙන්. ජනාධිපතිතුමා ඒ පිළිබඳ තීන්දුවක් ගත්තා. අපි කවුරුත් ඒකට එරෙහි වුණේ නැහැ. පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයන්ට සල්ලි තිබෙන්න ඕනෑ, ජනතාවට වැඩ කරන්න. ඒ අනුව ජනාධිපතිතුමා ඒ අවසරය දීලා තිබෙනවා. ඒ කාරණාවේදී ආණ්ඩු පක්ෂයේ වෙන්න පුළුවන්, විපක්ෂයේ වෙන්න පුළුවන්; හැමෝම වැඩ කරන්නේ මේ රටේ ජනතාවට. රටේ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් තමයි ඔවුන් පෙනී සිටින්නේ. ඒ කාරණාව වෙනුවෙන් කාට මුදල් දුන්නත් ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් ඒවා පාවිච්චි කරනවා නම්, කොහෙත්ම ඒවාට එරෙහි වෙන්න අපට පුළුවන්කමක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්කා-

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද point of Order එක, ගරු මන්ත්‍රීතුමා?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කියනවා මහජන නියෝජිතයෝ හැටියට වැඩ කරන්න සල්ලි තිබෙන්න ඕනෑ කියලා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපි මහජන නියෝජිතයෝ නොවෙයිද? තමුන්නාන්සේලා වෙන තැනකින් ඇවිල්ලාද, අපි වෙන තැනකින් ඇවිල්ලාද? එතකොට අපිට අපේ ගම්වල-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු ඩී.බී. හේරත් මහතා
(மாண்புமிகு டீ.பீ. ஹேரத்)
(The Hon. D.B. Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාවේ රීතියක් නොදන්නා මන්ත්‍රීවරයෙකුගේ ප්‍රශ්නයකට උත්තර දෙන්න යන්න තරම් මම බොළඳ වෙන්නේ නැහැ. එතුමා සභා රීති දන්නේත් නැහැ. එතුමාගේම ප්‍රශ්නයක් තිබෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන එතුමාට සල්ලි නොලැබුණාට කුරුණෑගල දිස්ත්‍රික්කයේ එතුමාත් එක්ක දේශපාලන කඳවුරේ ඉන්න අනෙක් අයට සල්ලි හම්බ වෙලා තිබෙනවා. එතුමන්ලා ගම්වල වැඩ කරනවා. *[බාධා කිරීමක්]* අපේ ගම්වලට ඇවිල්ලා වැඩ කරනවා. *[බාධා කිරීමක්]* ඒක ඔබතුමාගේ කණ්ඩායමෙන් අහගන්නකෝ. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේලාගේ ප්‍රශ්නවලට උත්තර දෙන්න මම බැඳිලා නැහැ නේ. ගිහිල්ලා අහගන්න, ඔබතුමන්ලාගේ කණ්ඩායමේ මන්ත්‍රීවරුන්ගෙන්. ඒ ගැනවත් එතුමාට විශ්වාසයක් නැහැ. එතුමාට තමන්ගේ කණ්ඩායමේ ඉන්න මන්ත්‍රීවරයෙකුගෙන්වත් ප්‍රශ්නයක් අහලා ඒක විසඳාගන්න හැකියාවක් නැහැ. ඒ තරම් දුරස්ථ වෙලා. ඒවාට පිළිතුරු අපෙන් අහනවා. අපිට වැඩිය සල්ලි හම්බ වෙලා තිබෙනවා, ඒ අයට. සංවර්ධන කමිටුවල සභාපතිවරු හැටියට අපි කිසිසේත් ඒවාට විරුද්ධ වුණේ නැහැ. ඇයි? අපිට අවශ්‍යයි, මේ රටේ ජනතාවට සේවය කරන්න. අපි එහිදී පක්ෂ, පාට බලන්නේ නැහැ. ඡන්දය දෙන කොට මිනිස්සු ඒ අදාළ අයට ඡන්දය දෙයි. සමහර මන්ත්‍රීවරුන් දේශපාලන රැස්වීම් තියන්න ගියාම මොකද වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඒවාට ගම්වල සෙනඟ එකතු වුණාම පටු දේශපාලන කතන්දර ටිකක් කියලා වෛරය වපුරනවා. එහෙම කියලා ජනතාව රවටන්න උත්සාහ කරනවා. හැබැයි, ඒක සමහර දේශපාලන කලාප තුළට නොගැළපෙන දේශපාලන සංස්කෘතියක්. සමහරුන්ට මේකවත් තේරුම් ගන්න පුළුවන්කමක් නැහැ.

අපි අතිශය සතුටට පත් වෙනවා, ගරු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය ශක්තිමත් වෙලා, තවදුරටත් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව වැඩ කරන්න හැමෝටම මේ සල්ලි ටික දීලා වැඩ කරන්න අවස්ථාව ලැබෙනවා නම්. අපි දැක්කා ගරු ජනාධිපතිතුමා උතුරට යනවා; නැඟෙනහිරට යනවා; ලංකාවේ විවිධ ප්‍රදේශවලට ගිහින් සංවර්ධන කටයුතු කරනවා. ඒ හැම වෙලාවකම පාට, පක්ෂ භේදයකින් තොරව අපි එකට එක්කහු වෙලා හිටියා. මේක තමයි අරමුණ. අවුරුදු ගණනාවක් තිස්සේ බෙදිලා කරන මේ රාජකාරිය හේතුවෙන් මේ රට අගාධයට ඇදී ගියා මිස රටේ සංවර්ධනයක් වුණේ නැහැ කියන එක මේ රටේ බුද්ධිමත් ජනතාව දන්නවා. ඒ නිසා පක්ෂවලට බෙදිලා -මේ පාර්ලිමේන්තුව වෙන්න පුළුවන්, වෙනත් ස්ථානවල වෙන්න පුළුවන්- මේ කරන රාජකාරිය රටේ බුද්ධිමත් ජනතාව නිවැරදිව විනිශ්චයකට භාජන කරනවා. ඒකට හොඳම වෙලාව තමයි, ජනාධිපතිවරණය. ඒ වෙලාවේදී මේ රාජකාරිය ගැන ජනතාව නිවැරදිව තීන්දු කරයි. ඒ අවස්ථාවත් එක්ක කටයුතු කරන කොට ඒ හැම කෙනාගේම දේශපාලන පැටිකිරිය විනිශ්චයට භාජන කරයි. කවුද රට වෙනුවෙන් පෙනී සිටියේ, අවුරුදු 30ක් පැවති යුද්ධය වළක්වන්න කටයුතු කරන කොට ඒකට එරෙහි වෙච්ච පිරිස කවුද කියලා බලයි. ඊළඟට, කොරෝනා වයිරසයෙන් රට බේරා ගන්න කටයුතු කළ වෙලාවේ ඊට එරෙහි වෙලා පැවති රජය නොමඟ යවන්න උත්සාහ දැරුවේ, කටයුතු කළේ කවුද කියන එක ජනතාව දන්නවා. ඒ වාගේම, මේ රටේ තෙල් පෝලිම්, ගෑස් පෝලිම් හැදෙන කොට "අරගළය" නිර්මාණය කරලා ආණ්ඩු බලය ලබා ගැනීමට කටයුතු කළ උදවිය පිළිබඳව ජනතාව විනිශ්චය කරයි. තෙල් නැවක් ආවාම ඒ නැවට මුදල් ගෙවා ගැනීමට නොහැකිව මහ මුහුදේ නැවතිලා තිබුණු කාලයක් තිබුණා. අද එහෙම නැහැ. අද තෙල් නැවක් ආවාම කිසි ප්‍රශ්නයක් නැතිව අපේ ගබඩාවලට තෙල් ටික යවනවා. ඒ වාගේම ගෑස් ඇතුළු අනෙකුත් දේවල් ටික ගෙනෙනවා. ඒ විතරක් නොවෙයි, අද වන කොට රුපියලේ අගය ශක්තිමත් වෙලා, ඩොලරයේ අගය අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම, මිනිසුන්ගේ මිල දී ගැනීමේ හැකියාව වැඩි වෙලා, මිනිසුන්ගේ ආර්ථිකය ශක්තිමත් මට්ටමකට ඇවිත් තිබෙනවා. තවදුරටත් සුබසාධන ක්‍රියාකාරකම් එක්ක, සංවර්ධන ක්‍රියාකාරකම් එක්ක ආණ්ඩුව ඉස්සරහට යනවා. ඒ නිසා දේශපාලන භේදයකින් තොරව මේ රටේ බුද්ධිමත් ජනතාව ජනාධිපතිවරණයේදී තීන්දුවක් ගනියි, මේ රට භදන්න පුළුවන් කාටද, ඒ ලබපු අත්දැකීම් එක්ක ගොඩ නඟන ක්‍රියාවලියට හයිය දෙන්න ඕනෑ කාටද කියන එක පිළිබඳව.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා.

[අ.භා. 3.41]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. මේ ජනාධිපතිවරයා මුදල් එකතු කරමින් යනවා. අපි කවුරුත් දන්නවා, ඔක්තෝබර් 17 වැනි දාට කලින් ජනාධිපතිවරණයක් තිබෙනවා කියන එක. එම ජනාධිපතිවරණය නිමිති කරගෙන අද ජනාධිපතිවරණ රේස් එක පටන් අරගෙන තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් ඒ රේස් එකේ ඉන්න දමන්න පුළුවන් හැම වෙට්ටුවක්ම දමන්න උත්සාහ කරනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ ප්‍රතිපාදනය ඇතුළු හැම දෙයක්ම ක්‍රියාත්මක කරන්නේ, මේ මුදල් එකතු කරන්නේ ඇත්තටම ඒ මැතිවරණය ඉලක්ක කරගෙන.

ඉතාම කනගාටුයි කියන්න, මේ වන කොටත් මැතිවරණයක් ප්‍රකාශයට පත් කර තිබෙන බව. ඒ, පළාත් පාලන මැතිවරණයයි. පළාත් පාලන මැතිවරණය ප්‍රකාශයට පත් කරලා තිබෙන කොට නොකළ යුතු දේ මොකක්ද? මැතිවරණ වාසි උදෙසා මුදල් වෙන් කිරීම තහනම්. රනිල් වික්‍රමසිංහ මැතිතුමා නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරු මේ වනකොට ගමින් ගමට යනවා. මොකද, සෙනහ එකතු කර ගන්න තිබෙන එකම විධිය තමයි, මොකක් හරි බෙදනවා කියන එක. දැන් මා ළඟ තිබෙනවා එහෙම බෙදපු ණය ඉල්ලුම් පත්‍රයක්. මේ ෆෝම් එකේ සඳහන්ව තිබෙන දේ මම කියන්නම්. මම මේ අවස්ථාවේ මෙය **සභාගත*** කරනවා.

දැන් ණය බෙදන්න පටන් අරගෙන තිබෙනවා. සාමාන්‍යයෙන් ණය බෙදන්නේ දේශපාලන පක්ෂයක සංවිධායකවරයා නොවෙයි නේ. නමුත් දැන් ණය බෙදන්න පටන් අරගෙන තිබෙන්නේ, දේශපාලන පක්ෂවල සංවිධායකවරු. දැන් එය කරන්නේ බැංකු නොවෙයි; බැංකු නිලධාරීන්, සේවකයන්, කළමනාකරුවන් නොවෙයි. පක්ෂ සංවිධායකවරුන් දැන් මෙහෙම ණය ෆෝම් බෙදන්නේ ඇයි? මෙය ඉතා පැහැදිලිව මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක්. මම ඉල්ලා ගත්තා, ඒ ෆෝම් එකක්. මේ තිබෙන්නේ ඒක. මේ ෆෝම් එකේ සඳහන් කර තිබෙන්නේ මොකක්ද? මේකේ ඉහළින්ම සඳහන් කර තිබෙන්නේ, "ගරු ජනාධිපතිතුමාගේ ආර්ථික දැක්ම අනුව ක්‍රියාත්මක කරනු ලබන ග්‍රාමීය ව්‍යාපෘතීන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය" කියලායි. ඊට පහළින් සඳහන්ව තිබෙනවා, "ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය - ගම්පහ දිස්ත්‍රික්කය" කියලා. මේ ෆෝම් එක ගම්පහ දිස්ත්‍රික්කයටයි දීලා තිබෙන්නේ. මේ ෆෝම් එකේ සම්පූර්ණ විස්තර ඉල්ලා තිබෙනවා. දැන් හැම ගමකටම ඇවිල්ලා මේ ෆෝම් එක දෙනවා. මේ ෆෝම් එක දුන්නාම අපේ අභිංසක ප්‍රදේශවාසීන්, අනේ ණයක් හෝ අරගෙන මේ ආර්ථික ගැටලුවෙන් බේරෙන්න ඕනෑ කියා හිතලා, තමන් උගුලකට වැටෙනවාද කියලාවත් හිතන්නේ නැතුව ගිහින් ඒ ණය ලබා ගන්න උත්සාහ කරනවා. මේවා ටික එකතු කරගෙන ගියාට ඒ ණය ලැබුණු අය ඉන්නවාද කියලා මම නම් දන්නේ නැහැ. නමුත්, ඒ අය කරන්න උත්සාහ දරන්නේ තනිකර දේශපාලන කුමන්ත්‍රණ වැඩසටහනක්.

මැතිවරණයකට මාස කිහිපයක් තිබියදී අද මේ පරිපූරක මුදල් වෙන් කර ගැනීම සඳහා යෝජනා ගෙනැල්ලා රුපියල් කෝටි ප්‍රකෝටි ගණනක් එකතු කර ගන්නේ වෙන මොනවත් සඳහා නොවෙයි, මැතිවරණය සඳහායි. එහෙම කරන්නේ සංවර්ධන ව්‍යාපෘති සඳහායි කියන්න පුළුවන්, වෙනත් වැඩසටහන් සඳහායි කියන්න පුළුවන්. නමුත් ඉතා පැහැදිලිව මේ වෙන්නේ, මැතිවරණයට මුදල් වියදම් කිරීමක්. ඒ නිසා ඉතා පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ, මෙය නීති විරෝධී කටයුත්තක් බව සහ මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක් වන බව. ඒ වාගේම, අපි මැතිවරණ කොමිසමටත් කියනවා, මැතිවරණ කොමිසම කරුණාකර මේ පිළිබඳව ක්‍රියා මාර්ග ගන්න කියලා; මේ නීති විරෝධී කටයුත්තට එරෙහිව කටයුතු කරන්න කියලා. අද අපේ රටට අවශ්‍ය වෙලා තිබෙන්නේ ජනාධිපතිතුමාගේ **වැය** ශීර්ෂයට මුදල් එකතු කිරීම ද?

අපි දන්නවා මීට සති කිහිපයකට කලින් ගංවතුර ඇති වුණු බව. ගංවතුර නිසා විශාල හානියක් සිදු වුණා. ගංවතුර නිසා වුණු ඒ හානිය සම්බන්ධයෙන් මොනවාද ආණ්ඩුව විසින් කරලා තිබෙන්නේ? අපට දැන ගන්න ලැබී තිබෙනවා, සමහර තැන්වල

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

නිවාස පිරිසිදු කර ගැනීමට රුපියල් 10,000වත් ලබා දෙන්න කටයුතු කරලා තිබුණේ නැති බව. ඒ විතරක් නොවෙයි. දැඩි ලෙස හානියට පත් වුණු ව්‍යාපාර තිබෙනවා; නිවාස තිබෙනවා. සම්පූර්ණයෙන් විනාශ වෙච්ච නිවාස තිබෙනවා. අර්ධ වශයෙන් විනාශ වෙච්ච නිවාස තිබෙනවා. ඒ විතරක් නොවෙයි, විශාල මුදලක් ආයෝජනය කරලා ආරම්භ කරපු, සංවර්ධනය කරන්නත් කෝටි ප්‍රකෝටි ගණනක් වියදම් කරපු ඇතැම් ව්‍යාපාර පැය කිහිපයකින් විනාශ වුණා. මමත් පෞද්ගලිකව දන්නා එවැනි ව්‍යාපාර තිබෙනවා. විශේෂයෙන් පුවක්පිටිය ප්‍රදේශයේ එවැනි දේ විශේෂයෙන් සිදු වුණා. එලෙස ආපදාවට ලක් වූ අයට ලබා දීලා තිබෙන වන්දිය මොකක්ද? අපි 2016, 2017 වර්ෂ දෙකේම ගංවතුරට ලක් වුණා. රක්ෂණය කිරීමක් කරලා ඒ රක්ෂණය තුළින් කෝටි ගණන් වන්දි මුදල් ලබා දුන්නා. හැබැයි අද මම අහන්න කැමැතියි, ඒ සඳහා යම්කිසි වන්දියක් ගෙවා තිබෙනවාද, වන්දියක් ගෙවා නැත්නම් රජය මැදිහත් වෙලා යම් සාධාරණයක් සිදු කරනවාද කියලා. මම මේ ප්‍රශ්නය මීට කලිනුත් පාර්ලිමේන්තුවේදී ඇහුවා. නමුත්, එයට තවම පිළිතුරක් නැහැ. හැබැයි, අද ජනාධිපතිවරයා මුදල් එකතු කර ගන්නවා මාසයෙන් මාසය, සති කිහිපයෙන් කිහිපය රට සංචාරී යන්න; ඒ වාගේම තමන්ගේ දේශපාලන කටයුතුවලට අවශ්‍ය මුදල් ලබා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලොකු අසාධාරණයක් සිදුව තිබෙනවා. ඒ තමයි, විමධ්‍යගත මුදල් ඒ මන්ත්‍රීවරුන්ට නොලැබීම. පාර්ලිමේන්තුවේ දවස් ගණනක ඉඳලා මේ ගැන කථා කරනවා. මේ රටේ ඉතිහාසයේ ඉඳලා පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයටත් විපක්ෂයටත් එක හා සමානව විමධ්‍යගත මුදල් ලබා දුන්නා. නමුත්, අද විපක්ෂයේ මන්ත්‍රීවරුන් විශාල පිරිසකට විමධ්‍යගත මුදල් ලැබිලා නැහැ. ඒක ඉතාම අසාධාරණයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දන්නවා ඔබතුමාටත් ලැබිලා නැති බව. ඒ වාගේම මෙතැන ඉන්න විශාල පිරිසකට ඒ මුදල් ලැබිලා නැහැ. එය, මේ වෙලාවේ ඒ අයට කරන ලොකු අසාධාරණයක්. මෙය ඉතා පැහැදිලිව, ජනාධිපතිවරයා ඒ මුදල් ලබාගත් අයත් අපහසුතාවට පත් කරන්න හිතාමතා කරපු දෙයක්. එක්කෙනෙකුට රුපියල් මිලියන 50ක්, තව එක්කෙනෙකුට රුපියල් මිලියන 100ක් වශයෙන් තෝරා ගත් කිහිප දෙනෙකුට ලබා දෙන්න හොඳ නැහැ. ඒ මුදල් ගත්ත අය වැරදි චේතනාවකින් ඒවා ගත්තා කියලා අපි කියන්නේ නැහැ. නමුත් ඉතාම පැහැදිලිව මෙහිදී කථානායකවරයාට වගකීමක් තිබෙනවා. මම අද උදේ කථානායකවරයාගෙන් ඒ ඉල්ලීම කළා. ඊටත් වඩා, ජනාධිපතිවරයා - රනිල් වික්‍රමසිංහ මැතිතුමා - අවුරුදු හතළිස් ගණනක් පාර්ලිමේන්තුවේ හිටපු, පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන අපි ඔක්කොටම වඩා හොඳින් දන්න කෙනෙක් නේ. එහෙම දන්න පුද්ගලයා මෙහෙම දේශපාලනික වශයෙන් ඉතාම අසාධාරණ ලෙස කටයුතු කරන්නේ ඇයි? එහෙම විය යුතු නැහැ. එතුමා එක හා සමාන මුදලක් හැමෝටම ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ. ඒ කටයුත්ත කරන්න,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසන්.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු හර්ෂන රාජකරුණා)
(The Hon. Harshana Rajakaruna)
මොකද, අපි හැමෝම මේ පාර්ලිමේන්තුවට ආවේ ජනතා ඡන්දයෙන්. මම ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරනවා නම්, මම නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට ඒ ප්‍රතිපාදන මුදල් ලබා දීලා ඒ අයට සේවාවක් කරන්න මටත් අවශ්‍යතාව තිබෙනවා. ඒ සේවාව සිදු කරන්න කිහිප දෙනෙකුට විතරක් අවස්ථාව ලබා දීම ඉතාම අසාධාරණයි.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අහට්‍රප්පට්ටුළ්ළතු.]
[Expunged on the order of the Chair.]

ඕනෑකමින්ම, ඉතාම නින්දිත විධියට තමයි මේ කටයුත්ත කරන්නේ. ඒ නිසා මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපි මේ කරන්නේ ඉල්ලීමක්. හැමෝටම එක හා සමානව මේ මුදල් ලබා දුන්නේ නැත්නම් විපක්ෂයේ මේ ප්‍රතිපාදන ලබා ගත්, නොගත් සියලු මන්ත්‍රීවරු ඊළඟ පාර්ලිමේන්තු රැස්වීම් සතියේදී මීටත් වඩා දරුණු ක්‍රියාමාර්ගයක් ගන්නා බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා.

[ප.ව. 3.50]

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(මාණ්පුමිකු වඩිවේල් සුරේෂ්)
(The Hon. Vadivel Suresh)
කෞරව තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළේ, இன்றைய விவாதத்தில் என்னுடைய மலையக மக்கள் சார்பாகக் கலந்துகொள்வதையிட்டு நான் பெருமகிழ்ச்சி அடைகின்றேன். நிதி சம்பந்தப்பட்ட விடயம் பற்றிக் கதைக்கும்போது, அதிலும் டொலர் சம்பந்தமாகக் கதைக்கும் போது, நாங்கள் மலையக மக்களை மறக்க முடியாது. ஏனெனில், அவர்கள்தான் இந்த நாட்டுக்கு டொலரின் பெறுமதியை உணர்த்தியவர்கள்! அவர்களுக்கு நாட்சம்பள மாக 1,700 ரூபாய் வழங்கப்பட வேண்டுமென்பதை மேன் முறையீட்டு நீதிமன்றம் உறுதிசெய்திருந்தபோதிலும்கூட, "வேதாளம் முருங்கை மரம் ஏறியதுபோல" பெருந்தோட்டக் கம்பனிகள் அந்தத் தீர்ப்பை எதிர்த்து உயர் நீதிமன்றத்தில் appeal செய்திருக்கின்றன. இன்று எனக்கு நீதிமன்றம் அழைப்பாணை விடுத்திருக்கின்றது. இது கவலைக்குரிய விடயம் என்பதை நான் இந்த உயரிய சபையில் தெரிவிக்க விரும்புகின்றேன். எது எவ்வாறு இருப்பினும், எமது மக்கள் இந்த நாட்டை நேசித்தவர்கள் என்ற வகையிலே, மாண்புமிகு ஜனாதிபதி அவர்கள் மலையகத்தில் பல அபிவிருத்தித் திட்டங்களை மேற்கொண்டிருக்கிறார். அதற்காக அவருக்கு எங்களுடைய மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றோம். மலையகத்தில் கடந்த 3 வருட காலமாகத் தடைப்பட்டிருந்த பல அபிவிருத்தித் திட்டங்களை நாங்கள் மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்களுடைய தலைமையில் ஆரம்பித்திருக்கின்றோம்.

மாண்புமிகு ஜனாதிபதி அவர்கள் இந்த நாட்டில் ஏனைய மக்களுக்கு எவ்வாறு காணி உறுதிகளை வழங்கிக்கொண்டு இருக்கின்றாரோ, அதேபோன்று மலையக மக்களுக்கும் காணி உறுதிகளை வழங்க வேண்டும். பெருந்தோட்டக் கம்பனிகள் எமது பெருந்தோட்டத் தொழிலாளர்கள்மீது எந்த அளவுக்கு அக்கறைகொண்டு இருக்கின்றன என்பதை இந்தச் சம்பள உயர்வு விவகாரத்திலிருந்து மாண்புமிகு ஜனாதிபதி அவர்களும் அரசாங்கமும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சும் தொழில் அமைச்சும் தெரிந்துகொள்ள வேண்டும்.

பெருந்தோட்டக் கம்பனிகள் அரசாங்கத்துக்கு challenge பண்ணுகின்றன; தொழில் அமைச்சுக்கு challenge பண்ணுகின்றன; பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சுக்கு challenge பண்ணுகின்றன; தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு தொடர்பில் ஜனாதிபதியின் ஆலோசனையின் பேரில் வெளியிடப்பட்ட வர்த்தமானி அறிவித்தலுக்கு challenge பண்ணுகின்றன. இவ்வாறு பெருந்தோட்டக் கம்பனிகள் challenge பண்ணுகின்றன என்றால், இந்த நாட்டில் எனதும் எங்களுடைய மக்களினதும் எதிர்காலம் எவ்வாறு இருக்கப் போகின்றது என்பது கேள்விக்குறியாகும். இதற்கு முடிவு கட்டப்பட வேண்டும். வர்த்தமானியில் குறிப்பிடப்பட்டுள்ள நாட்சம்பளத்தைக் கொடுக்காத கம்பனிகளுடைய குத்தகை உடன்படிக்கை இரத்துச் செய்யப்படும் என்று அன்று மாண்புமிகு ஜனாதிபதி அவர்கள் தெளிவாகக் கூறியிருந்தார்.

ஓரிரு கம்பனிகளுக்காவது அவ்வாறு செய்ய வேண்டும். அவ்வாறு செய்தால்தான் ஒரு மாற்றம் வரும். மலையக மக்களைப் பெருந்தோட்டக் கம்பனிகள் நிர்வகிப்பதற்கு இடமளிக்காதீர்கள். அவர்களும் இந்த நாட்டின் பிரஜைகள்! அவர்களுடைய வாழ்வாதாரம், கலை, கலாசாரம், பண்பாடு, பொருளாதாரம் என அனைத்துக்கும் பெருந்தோட்டக் கம்பனி களை நம்பியிருக்க முடியாது. பெருந்தோட்டக் கம்பனிகள் என்பது, நாடும் அல்ல; அரசாங்கமும் அல்ல. அவை அரசாங்கத்தின் காணிகளைக் குத்தகைக்குப் பெற்று நிர்வகித்துக் கொண்டு இருக்கின்றன. இன்று அவை அரசாங்கத்தின் வர்த்தமானி அறிவித்தலையும் மீறி நீதிமன்றம் மூலமாக எமது மக்களை வஞ்சிக்குமேயானால், எங்களுடைய மக்களின் அன்றாட வாழ்வாதாரம் எப்படி இருக்குமென்று நீங்கள் தெரிந்துகொள்ளலாம்.

பெருந்தோட்டக் கம்பனிகள் சிறு சிறு பிரச்சினைகளுக் கெல்லாம் பொலிஸ் நிலையத்தை அணுகி, எமது மக்களை வஞ்சித்துக்கொண்டு இருப்பதை நான் இந்தச் சபையில் பல முறை தெரிவித்திருக்கின்றேன். தற்பொழுது, இச்சபையில் கௌரவ அமைச்சர் ஜீவன் தொண்டமான் அவர்கள் இருக்கின்றார். அவருடைய சில செயற்பாடுகளை ஜீரணித்துக் கொள்ள முடியாவிட்டாலும், தோட்டக் கம்பனிகள் விடயத்தில் அவர் தனது அமைச்சுப் பதவியை மறந்துகூட செயற்பட்டிருந் ததை நான் நேரடியாக அவதானித்திருக்கின்றேன். இவ்வாறு எமது மக்கள் பெருந்தோட்டக் கம்பனிகளின் நிர்வாகம் மூலமாக வஞ்சிக்கப்பட்டுக் கொண்டு இருக்கின்றார்கள். இதனை நாங்கள் தொடர்ந்து பார்த்துக் கொண்டிருக்க முடியாது. கௌரவ அமைச்சர் அவர்களே, பெருந்தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 ரூபாய் நாட்சம்பளமாக வழங்கப்பட வேண்டுமென Appeal Court வழங்கிய தீர்ப்புக்கு எதிராக பெருந்தோட்டக் கம்பனிகள் Supreme Courtஇல் மேன்முறையீடு செய்திருக்கின்றன. உங்களுக்கும் ஐலை வந்திருக்குமென நான் நினைக்கின்றேன். பெருந்தோட்டக் கம்பனிகள் எவ்வாறு எமது மக்களை அணுகுகின்றன; எவ்வாறு மதிக்கிறன என்று பாருங்கள்! இதற்கு ஒரு முடிவு கட்டப்பட வேண்டும்.

பெருந்தோட்டக் கம்பனிகள் என்பது அரசாங்கம் அல்ல. மலையக மக்களும் இந்த நாட்டின் பிரஜைகள் என்ற வகையில், இதற்கு அரசாங்கம் பொறுப்புச் சொல்ல வேண்டும். எங்களுடைய மக்கள் இந்த நாட்டில் நடைபெறுகின்ற ஜனாதிபதித் தேர்தல்களில் வாக்களிக்கின்றார்கள்; பாராளு மன்றத் தேர்தல்களில் வாக்களிக்கின்றார்கள்; மாகாண சபைத் தேர்தல்களில் வாக்களிக்கின்றார்கள். அப்படி இருக்கும்போது, ஏன் அவர்களுடைய வாழ்வாதாரத்தை மட்டும் பெருந்தோட்டக் கம்பனிகளிடம் பாரம் கொடுத்திருக்கின்றீர்கள்? அவர்களும் இந்த நாட்டுப் பிரஜைகள் என்று சொன்னால், அவர்கள் அனைத்துக்கும் உகந்தவர்கள் என்று சொன்னால், ஏன் அவர்களுடைய வாழ்க்கையை மட்டும் பெருந்தோட்டக் கம்பனிகளிடம் ஒப்படைக்கின்றீர்கள்? பெருந்தோட்டக் கம்பனிகளுக்குப் தோட்டங்களை குத்தகைக்குக் கொடுத்தது உண்மை! ஆனால், எங்களுடைய மக்களைக் குத்தகைக்குக் கொடுக்கவில்லை. நாங்கள் இந்த நாட்டில் 200 வருட காலமாக, 5 பரம்பரையாக வாழ்ந்துகொண்டு இருக்கின்றோம். ஆனால், எங்களுடைய மக்களையும் சேர்த்து குத்தகைக்குக் கொடுத்திருப்பதாக பெருந்தோட்டக் கம்பனிகள் நினைக்கின் றன. எங்களுடைய மக்கள் வாழ்கின்ற வீடு, அவர்கள் அனுபவித்த காணி என்பவற்றைக் குத்தகைக்குக் கொடுக்க வில்லை. பெருந்தோட்டக் காணிகள்தான் குத்தகைக்குக் கொடுக்கப்பட்டு இருக்கின்றன. எங்களுடைய மக்களையும் குத்தகைக்குக் கொடுத்திருப்பதாக ஒரு மனநிலையை பெருந்தோட்டக் கம்பனிகள் ஏற்படுத்திக் கொண்டு, மிக மோசமான முறையில் அவர்களைக் கையாள்கின்றன. ஆகவே, மாண்புமிகு ஜனாதிபதி அவர்களும் கௌரவ பிரதம மந்திரி அவர்களும் இது தொடர்பில் உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும்.

Hon. Prime Minister, the other day, the Rs. 1,700 daily wage published in the Gazette Notification had been ordered by the Court of Appeal to be given to the estate workers. Today, the RPCs have gone to the Supreme Court against that Order. So, this is the way they are treating our people. We are Sri Lankan citizens; we are under this Government. The Government leased out only State lands to the RPCs, but the RPCs think that the workers had also been leased out to them. They are treating the workers in a different manner. So, against that, you all - the Hon. President, the Hon. Prime Minister and the Cabinet - have to take some action. It is a huge problem because they are giving our people not only stepmotherly treatment, but are also ill-treating them.

எங்களுடைய கௌரவம் பாதிக்கப்பட்டிருக்கிறது. இன்று பெருந்தோட்டங்களில் தோட்டத் தொழிலாளர்கள் மட்டுமல்ல, படித்தவர்களும் இருக்கின்றார்கள்; அரசாங்கத் தொழில் செய்பவர்களும் இருக்கின்றார்கள். அவ்வளவு பேருடைய மானமும், மரியாதையும் பெருந்தோட்டக் கம்பனிகளால் இழக்கப்படுகின்றது. ஆகவே, பெருந்தோட்டக் கம்பனிகளுக்கு எதிராக அரசாங்கம் சட்ட நடவடிக்கை எடுக்க வேண்டும்.

Sir, only five people have been ruling the estates in ten districts. Those estates are in Avissawella, Kegalle, Ratnapura, Monaragala, Badulla, Matale, Nuwara Eliya, Kandy, Kalutara, Deniyaya and Nakiyadeniya in Galle. They are being managed by 22 plantation companies in name only, but only five people are there in their director boards; only five gentlemen or "*mudalalis*" are handling the estates in those areas and one of the "*mudalalis*" is already here as a Member of Parliament. Sir, 16,000 hectares of land in those estates, government property, have been abandoned by those companies. So, please try to do something for that. The steps you have already taken, we appreciate and thank you for that; you all have been doing a lot. Even my brother, the Hon. Jeevan Thondaman could not tolerate certain things that were happening in the estates. There are matters which we

[ගරු වඩිවේල් සුරේෂ් මහතා]

have to discuss and sort out, but now, the situation has gone beyound that. Those companies are penalizing our people. So, I humbly request you all to take this matter up at the next Cabinet Meeting and also take some action against the RPCs. We have to cancel their leases also because we cannot work with them. All the industrial disputes are now being settled by the police stations. Now, industrial disputes are not being handled by the ACLs and the DCLs; those have gone to the police stations. So, Hon. Prime Minister, please take necessary action.

ஆகவே, எமது மக்களுடைய பாதுகாப்பு, அவர்களுடைய தொழில் பாதுகாப்பு, அவர்களுடைய இருப்பு, அவர்களுடைய சம்பள உயர்வு என்பன தொடர்பில் உரிய நடவடிக்கைகளை அடுத்த அமைச்சரவைக் கூட்டத்தில் கௌரவ பிரதம மந்திரி அவர்களும் அரசாங்கமும் எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொண்டு, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, நிறைவுசெய்கின்றேன்.

Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have two more minutes left.

ගරු ජීවන් තොණ්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Sir, can I take those two minutes?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, you can.

ගරු ජීවන් තොණ්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Thank you, Sir.

Hon. Member, since you made a request to the Hon. Prime Minister, I would like to tell you that that Rs. 1,700 wage, the land rights, housing for the estate sector and the Rs. 2 billion Development Fund, all that has come about because the 29-year old Jeevan Thondaman, backed by the Ceylon Workers' Congress, is supporting the Government. So, I am just suggesting - you have a powerful union, the LJEWU and you can convince the other unions also - why do you all, too, not come and support the Government? Then, we can do much more. More than giving it protection, we can develop the sector. Is it not correct, Hon. Member? Your smile says it all.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සුජීත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා.

[අ.භා. 4.00]

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කර තිබෙන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත යටතේ රෙගුලාසි, නියමය සහ නියෝගය සම්බන්ධව අදහස් දක්වන්නට මටත් අවස්ථාව සලසා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා විශේෂ පැහැදිලි කිරීමක් කළා, කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත ගැන. ඒ හරහා විශාල බදු ආදායමක් අපේ රජයට, භාණ්ඩාගාරයට ලබා ගන්න පුළුවන් කියලා එතුමා සඳහන් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට ඉස්සෙල්ලාත් මේ වාගේ මුදල් පනත් වාගේම බදු අය කර ගැනීමේ පනත් රාශියක් මේ පාර්ලිමේන්තුවේ සම්මත කරලා තිබෙනවා. නමුත් අපි දන්නා තරමින් තමුන්නාන්සේලා කියන ඔය සුන්දර ආකාරයට මේ බදු ටික අය කර ගන්න පුළුවන්කම තිබුණා නම්, මීට වඩා සාර්ථක ආර්ථිකයක් අපට ලබා ගන්න පුළුවන්කම තිබුණා. නමුත් මේ කියන ආකාරයට බදු අය කර ගත්තත්, හුඟක් වේලාවට පාර්ලිමේන්තුවේ විවිධ පක්ෂ බලයට පත් වුණාම, ඒ වාගේම නායකයෝ පත් වෙච්ච අවස්ථාවල දී ඒවා වෙනස් කරන්නත් කටයුතු කරලා තිබෙනවා. හොඳම උදාහරණය තමයි අපේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බලයට පත් වුණාට පස්සේ රුපියල් බිලියන 600ක බදු මුදල් කපා හරින්න කටයුතු කළාය කියන කාරණය. ඒක අපි කාටත් මතක තිබෙනවා. මම හිතන විධියට ඒක තමයි ආර්ථිකය කඩා වැටීමේ මූලාරම්භය. එතුමා එදා ගත්ත එම ක්‍රියාමාර්ගය ආර්ථික අර්බුදයේ මූලාරම්භය හැටියට මේ අවස්ථාවේ දී අපි සඳහන් කරන්නට ඕනෑ.

පසුගිය දවස්වල මාධ්‍ය මඟින්, ඒ වාගේම ප්‍රවෘත්ති මඟින් වංචා දූෂණ සම්බන්ධව හෙළිදරව් කරනවා අපි දැක්කා. තමුන්නාන්සේ දන්නවා, අපට බදු ආදායම් ලබාදෙන මාර්ග ප්‍රධාන වශයෙන් තුනක් තිබෙන බව. එකක් තමයි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව. අනෙක් එක ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව. ඉතින් හුඟක් අවස්ථාවලදී මේවායේ තිබෙන වංචා දූෂණ සහ නිසියාකාරයෙන් බදු අය කර ගැනීමට අපොහොසත්වීම පිළිබඳව ප්‍රවෘත්ති නිවේදන තිබුණා. ඉතින් මේවා සම්බන්ධව රජයේ අවධානය යොමු කරන්නට ඕනෑ. රජයේ අවධානය නිසියාකාරව යොමු කරලා, නිසියාකාරව බදු ටික අය කර ගන්න ඕනෑ. අද හුඟක් වේලාවට සිද්ධ වෙන්නේ මොකක්ද? අපි දන්නවා, බදු ප්‍රමාණයන් තිබෙනවා. රජය පැත්තෙන් ගත්තොත්, ඍජු බදු සම්බන්ධව දරන ආකල්පය එහෙමත් නැත්නම් ඒ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධව අපට සතුටු වෙන්න පුළුවන්කමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, අපි දන්නා විධියට රජය වක්‍ර බදු ටික තමයි හුඟක් වෙලාවට ජනතාව පිට පටවන්න කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා මේ රටේ සාමාන්‍ය ජනතාවට විශාල පීඩනයක්, ඒ වාගේම වැය බරක් දරන්න අද සිද්ධ වෙලා තිබෙනවා කියන එක මම කියන්න ඕනෑ. මා දන්නා තරමින් ඊයේ පෙරේදාත් විශේෂයෙන්ම දේපළ බදු සම්බන්ධව අලුත් කුලී ආදායම් බද්දක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ වුණා. IMF එක පිනවන්න හෝ රජයේ වෙනත් වියදම් පියවා ගන්න හෝ දවසින් දවස ජනතාව පෙළන ආකාරයට මේ වාගේ බදු අය කර ගැනීම් සිද්ධ වෙනවා. ඉතින් නියමානුකූලව හෝ නොයෙකුත් ආකාරයෙන් හෝ බදු අය කර ගැනීම තමයි අද සිද්ධ වෙන්නේ කියන එක මම තමුන්නාන්සේට කියන්න ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. ඉතින්, ජනතාව පැත්තෙනුත් බලන්න කියන එකයි මම ඉල්ලා සිටින්නේ.

මම එක උදාහරණයක් දෙන්නම්. විදුලි බිල බලන්න. ගරු අගමැතිතුමනි, පසුගිය කාලසීමාව තුළ ජලාශ විශාල ප්‍රමාණයකට වර්ෂාව ලැබුණා. මේ වසරේ ගෙවුණු මාස 6 තුළ කොයිම කාලයකටත් වඩා විශාල වශයෙන් ජල විදුලිය නිෂ්පාදනය කරන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. ජූනි මාසයේ 15වැනිදාට පසුව විදුලි බිල අඩු කරන්න රජය යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්නවා කියලා තමයි කියන්නේ. නමුත් මේක කලින් ගත යුතුව තිබුණු ක්‍රියාමර්ගයක්. ජනතාවට දැන් විදුලි බිල ගෙවා ගන්න හැකියාවක් නැති වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක වෙළෙඳපොළේ බොර තෙල් මිල සියයට 27කින් අඩු වෙලා තිබුණා, අපි දැක්කා. නමුත් අපට දීලා තිබෙන සහනය සියයට 2ක්වත් නැහැ, ගරු අගමැතිතුමනි. ඉතින් මේවා අතින් ගත්තොත්, විශේෂයෙන්ම අපේ පාරිභෝගික ද්‍රව්‍යවල මිල ගණන්, ඒ වාගේම උද්ධමනය යම්කිසි ප්‍රමාණයකට අඩු කරන්න අවස්ථාව තිබෙනවා. නමුත් ඒ සම්බන්ධව සොයා බලලා නැහැ.

විශේෂයෙන්ම අපේ ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමාත්, ගරු ජීවන් තොණ්ඩමන් අමාත්‍යතුමාත් වතු කම්කරු වැටුප් සම්බන්ධව කථා කළා. අපි දන්නවා නේ, වතු කම්කරුවන්ගේ වැටුප සම්බන්ධව ජනාධිපතිතුමා කරපු ප්‍රකාශය. මැයි 01 වෙනිදා -මැයි දිනයේ- එතුමා ප්‍රකාශයට පත් කළා, වතු කම්කරුවන්ට රුපියල් 1,700ක් දක්වා වැටුප් වැඩි කරනවා කියලා. ඉතින්, මොන පදනමකින් ගරු ජනාධිපතිතුමා ඒ ප්‍රකාශය කළාද කියලා මම දන්නේ නැහැ. කවුද, එතුමාට ඒ සඳහා උපදෙස් දුන්නේ කියලා මම දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රාදේශීය වැවිලි සමාගම් 22ක් තිබෙනවා.

ඒවා සමඟ සාකච්ඡා වට දෙකක් තිබුණා. මමත්, වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමාත් ඒවාට සම්බන්ධ වුණා. ජීවන් තොණ්ඩමන් මහත්මයාත් සම්බන්ධ වුණා. එම සාකච්ඡාවලදී කිසිම ප්‍රාදේශීය වැවිලි සමාගමක් ඒ මුදල ගෙවන්න එකඟතාව පළ කළේ නැහැ. වතු කම්කරුවන්ට රුපියල් 1,700ක් ගෙවන්න ඕනෑ කියන එක ගැන කිසිම තර්කයක් නැහැ. නමුත් ප්‍රාදේශීය වැවිලි සමාගම් එක්ක කිසිම එකඟතාවක් ඇති කර කරගන්නේ නැතිව තමයි ජනාධිපතිතුමා මේ ගැසට් නිවේදනය නිකුත් කළේ කියන එකයි මම කියන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම හිතන විධියට ඒකෙන් අද වතුකරය නොසන්සුන් වෙලා තිබෙනවා. අදට මාස එකහමාරක් ගත වෙලා තිබෙනවා. වතු කම්කරුවන් බොහොම බලාපොරොත්තු තියාගෙන ඉන්නවා, මේ රුපියල් 1,700 අද ලැබෙයි, හෙට ලැබෙයි කියලා. නමුත් පෙනෙනතෙක් මානයකවත් ඒ සම්බන්ධව විසඳුමක් නැහැ. ප්‍රාදේශීය වැවිලි සමාගම් කියලා තිබෙනවා, කිසිසේත්ම මේ මුදල දෙන්න පුළුවන්කමක් නැහැ කියලා. ඉතින්, ඔබතුමන්ලා ප්‍රකාශ කරපු ආකාරයට මොන යම් හෝ ආකාරයක සහනයක් සලසලා මේ මුදල ලබා දීමට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා අපි රජයෙන් ඉල්ලා සිටින්න කැමතියි. අද තිබෙන උද්ධමනයත් එක්ක මේ ලැබෙන වැටුපෙන් වතු කම්කරුවන්ට ජීවත් වෙන්න විධියක් නැහැ. එම නිසා ඒ සම්බන්ධව දැඩි ක්‍රියාමාර්ගයක් ගන්න කියලා තමයි මට කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් පැත්තෙන් අද වතුකරයේ නොසන්සුන්කාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා කියලා අපි දන්නවා. වතු කම්කරුවන්ට මේ බලාපොරොත්තුව දුන්නාට පස්සේ ඒ අය පාලන අධිකාරියත් එක්ක, කළමනාකාරිත්වයත් එක්ක තමයි ගැටුම් ඇති කර ගන්න හදන්නේ. මම හිතන විධියට ඒක හොඳ වැඩක් නොවෙයි. අපි දන්නා තරමින් වැවිලි කර්මාන්තය පැත්තෙන් ගත්තාම අපට ප්‍රධාන වශයෙන් විදේශ විනිමය උපයා දෙන අංශයක් තමයි තේ කර්මාන්තය. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ගත්ත තීන්දුත් එක්ක -පොහොර තහනමත් එක්ක, පළිබෝධ නාශක තහනමත් එක්ක- දැනටමත් තේ කර්මාන්තය ප්‍රපාතයට ගිහින් තිබෙන බව අපි දන්නවා. අපි දන්නා තරමින් එදා ලැබුණු තේ නිෂ්පාදනය නොවෙයි, අද ලැබෙන්නේ. ඊයේ පෙරේදා මාධ්‍ය මඟින් කියලා තිබෙනවා අපි දැක්කා, තේ අපනයනය කිලෝග්‍රෑම් මිලියන 5,000ක් අඩු වෙලා තිබෙනවා කියලා. අපි කල්පනා කරලා බැලුවොත්, මේක විදේශ විනිමය අවශ්‍ය වෙලාවක්; ඩොලර් අවශ්‍ය වෙලාවක්. අපට ඩොලර් අවශ්‍ය වෙලා තිබෙන අවස්ථාවක තේ කර්මාන්තය මෙහෙම ප්‍රපාතයට යන්න ගියොත් මොකද වෙන්නේ? කළමනාකාරිත්වයයි, වෘත්තීය සමිතියි අතර නොසන්සුන්කාරී තත්ත්වයක් ඇති වුණොත් ඒකත් තේ කර්මාන්තයට හිතකර තත්ත්වයක් නොවෙයි කියන එක මම කියන්නට ඕනෑ.

රංජිත් සියඹලාපිටිය රාජ්‍ය අමාත්‍යතුමාත් ඔය සම්බන්ධව ප්‍රකාශයක් කරලා තිබුණා, වැවිලි සමාගම් පවරා ගන්නවා කියලා. ඒ වාගේම කම්කරු ඇමතිතුමා කියලා තිබුණා, මේකට එකඟ වුණේ නැත්නම් අපි වැවිලි සමාගම් පවරා ගන්නවා කියලා. මම කියන්නේ එහෙම පවරාගෙන තවත් අර්බුදයකට යවන්න බැහැ කියන එකයි. මේ ප්‍රශ්නයට නිසියාකාරව හොඳ විධියට අවතීර්ණ වෙලා සාකච්ඡාවක් කරලා විසඳුමක් ගන්න ඕනෑ. එහෙම නැතිව තර්ජන කරලා, වහසිබස් දොඩවලා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් කියලා මම කිසිසේත්ම විශ්වාස කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි ඉල්ලීමක් කරන්න කැමැතියි. දැන් කියනවා නේ වතු පවරා ගන්නවා කියලා. ගරු අග්‍රාමාත්‍යතුමනි, රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විධියට අපේ රංජිත් සියඹලාපිටිය මැතිතුමා යටතේ වැවිලි සමාගම් 5ක් තිබෙනවා. ඒ තමයි ජනතා වතු සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය වැවිලි සංස්ථාව, ඇල්කඩුව වැවිලි සමාගම, හලාවත වැවිලි සමාගම, කුරුණෑගල වැවිලි සමාගම.

ඉතින් එතුමාට පුළුවන් නේ, අනෙක් වැවිලි සමාගම්වලට ආදර්ශයක් දෙන්න. අපි මේ සමාගම් පහ යටතේ වැඩ කරන කම්කරුවන්ට රුපියල් 1,700ක වැටුප් වැඩි වීමක් ලබා දෙනවා, ඒ නිසා ඔබතුමන්ලාත් ඒ විධියට කරන්න කියලා කියන්න පුළුවන් නේ. නමුත්, එතුමන්ලාට එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. මොකද, ඒ වතු සමාගම් ඔක්කෝම පාඩුවට යන්නේ. දැන් මම දන්නා තරමින් Elkaduwa Plantations Limited විතරක් මේ වැටුප් වැඩි කිරීම කරන්න එකඟ වෙලා තිබෙනවා. Elkaduwa Plantations Limited මේ වැටුප් වැඩි කිරීම කළාම වෙන්නේ මොකක්ද? මේ වතු සමාගම සාමාන්‍ය ලාභයක් යටතේ ක්‍රියාත්මක වෙන එකත් නැති වෙන තත්ත්වයක් තමයි මේ තුළින් අපට පෙනෙන්නේ. මොකද, අපි දන්නා තරමින් ඒ අයගේ ETF, EPF ඔක්කෝම රජයෙන් ගෙවන්නේ. මේ අය ලාභ පෙන්වනවා. ලාභ පෙන්වූවාට ETF, EPF එකතු කළොත් එහෙම, ඒ ටික ගෙවන්න තිබෙන මුදල ගත්තොත් එහෙම ලාභදායී තත්ත්වයට ඒ ආයතන ක්‍රියාත්මක වෙන එක නැති වෙනවා. එහෙම වුණොත් ඒ වතු ටිකත් විකුණන්නයි සිද්ධ වෙන්නේ.

අපි දන්නවා, මා නියෝජනය කරන යටියන්තොට මැතිවරණ කොට්ඨාසයේ තිබෙන ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් නාගස්තැන්න වත්ත පෞද්ගලික ආයෝජකයන් ගෙන්වාගෙන නොයෙකුත් ආකාරයේ දේශපාලන හිතවතුන්ට විකුණන්න හදන බව. ඉතින් ඒක තමයි අවසාන ප්‍රතිඵලය වෙන්නේ. මේ වතු පාඩුවට ක්‍රියාත්මක වෙනවා; පාඩුයි කියනවා; ඊට පස්සේ විකුණනවා. ඒක තමයි මෙතැන තිබෙන ආර්ථික න්‍යාය. ඒ නිසා මම විශේෂයෙන්ම මේ වෙලාවේ මේ කාරණයත් කියන්න ඕනෑ. වතු කම්කරුවන් දැන් බොහෝ බලාපොරොත්තු තියාගෙන ඉන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වැවිලි සමාගම් එක්ක

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

ප්‍රායෝගිකව ඵලදායී සාකච්ඡාවක් කරලා මෙතුමන්ලා කිව්වා වාගේ වතු කම්කරුවන්ට රුපියල් 1,700ක වැටුප ලබා දීමේ වැඩ පිළිවෙළ කඩිනම් කරන්න. නිකම් වහසි බස් දොඩලා තර්ජනය කරලා මේක කරන්න පුළුවන්කමක් නැහැ. ඒ ගොල්ලන්ටත් දෙන්න පුළුවන් විධියට, වතු කම්කරුවන්ටත් අසාධාරණයක් නොවන විධියට ඒ කටයුත්ත කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිමින්, මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පි.ව. 4.08]

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் இந்தச் சந்தர்ப்பத்தில் கௌரவ பிரதமர் அவர்களிடம் ஒருசில விடயங்களைக் கேட்கலாமென நினைக்கின்றேன்.

Hon. Prime Minister, the people of the Kalmunai North Divisional Secretary's Division have been deomonstrating for the last 65 days, demanding that an Accountant be appointed to their Divisional Secretariat. On the 13th of May, I handed over a letter to you, Hon. Prime Minister, at the Ministerial Consultative Committee requesting to intervene immediately and settle that problem. Now, 35 days had passed, but still, nothing has happened and people are continuing with their demonstration. Therefore, we kindly request you, Hon. Prime Minister, to intervene immediately and settle this problem of the Kalmunai North Divisional Secretariat.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையிலுள்ள சிறைச்சாலைகளில் 15 - 29 வருடங்களாகத் தடுத்துவைக்கப்பட்டு இருக்கின்ற 11 தமிழ் அரசியல் கைதிகள் இருக்கின்றார்கள். அவர்கள் அனைவரும் சர்வதேச சட்டங்களுக்கு முரணாக மிகக் கொடூரமான பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ்தான் கைதுசெய்யப்பட்டு இருக்கின்றார்கள். தங்களை உடனடியாகப் பிணையிலேனும் விடுவிப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்குமாறு அவர்கள் தொடர்ச்சியாக கோரி வருகின்றபோதிலும், இன்னமும் அவர்களை விடுவிப் பதற்கான நடவடிக்கைகள் எடுக்கப்படவில்லை. மகசீன் சிறைச்சாலையில் இருக்கின்ற கிருபாகரன் என்பவர் கைதுசெய்யப்பட்டு 15 வருடங்களாகின்றன. கடந்த வாரம் அவருக்கு எதிராகப் புதிதாக ஒரு வழக்கு தாக்கல் செய்யப்பட்டு இருக்கின்றது. இது அவர்கள் சிறைச்சாலையிலேயே உயிர்விட வேண்டும் என்பதற்காக மேற்கொள்ளப்படுகின்ற நடவடிக்கையா? என்ற கேள்வி எழுகின்றது. அதேபோல், 19 வயதில் கைதுசெய்யப்பட்ட நபர் தண்டனை விதிக்கப்பட்ட பிற்பாடு, இரண்டு ஆயுள் தண்டனைக் காலத்தைக் கடந்திருக்கிறார். ஆனாலும், அவர் இன்னும் விடுதலை செய்யப்படவில்லை. ஆகவே, இவர்கள் இருவரும் உடனடி யாக விடுவிக்கப்பட வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, திருகோணமலை மாவட்டத்தின் மூதூர் பிரதேசத் திலுள்ள பச்சனூர் என்ற கிராமத்தில் பாடசாலைகள், தேவாலயங்கள், ஆலயங்கள், சந்தைகள் அமைந்திருக்கின்ற பகுதியில் மதுபானசாலை ஒன்று அமைக்கப்பட்டு இருக் கின்றது. அதற்கு எதிராக அங்குள்ள மக்கள் தொடர்ச்சியாகப் போராடிக்கொண்டு இருக்கின்றார்கள்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have one minute left.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
நான் முடிக்கிறேன்.

அந்த மதுபானசாலை உடனடியாக மூடப்பட வேண்டு மென்று நான் இந்த இடத்தில் வலியுறுத்திக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். அந்த மதுபானசாலை காரணமாக அந்தச் சமூகத்தில் பாரிய குழப்பங்கள் ஏற்பட்டுக்கொண்டு இருக் கின்றன. எனவே, உடனடியாக அந்த மதுபானசாலையை நிரந்தரமாக மூடுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும்.

அடுத்து, வடக்கு, கிழக்கில் கிட்டத்தட்ட 12,000 வேலை யில்லாப் பட்டதாரிகள் இருக்கின்றார்கள். தங்களுக்கு உடனடி யாக அரச நியமனம் வழங்க வேண்டுமென்று அவர்கள் தொடர்ச்சியாகப் போராடிக்கொண்டு இருக்கின்றார்கள். அவர்களுக்கு நியமனங்களை வழங்குவதற்குரிய நடவடிக் கைகள் உடனடியாக மேற்கொள்ளப்பட வேண்டும். போரால் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்குப் பகுதிகளில் வேறு வேலை வாய்ப்புகள் எதுவும் இல்லாத நிலைமையில், தனியார் துறைக்குள் நுழைவதற்கு ஏற்றவிதமாகத் தயார்படுத்தப் பட்டிராத நிலைமையில், அரச துறைக்குள்தான் அவர்களுக்கு வேலைவாய்ப்புகள் வழங்கப்பட வேண்டியதொரு தேவை இருக்கின்றது. ஆகவே, உடனடியாக அவர்களுக்கு வேலை வாய்ப்புகளை வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
முடித்துக் கொள்கிறேன்.

அடுத்து, பல்கலைக்கழக கல்விசாரா ஊழியர்களின் போராட்டம் தொடர்ந்துகொண்டு இருக்கின்றது. அதனால் பல்கலைக்கழக மாணவர்கள் பாரியளவில் பாதிக்கப்பட்டுக் கொண்டு இருக்கிறார்கள். எனவே, உடனடியாக அவர்களுடைய கோரிக்கைகள் ஏற்றுக்கொள்ளப்பட்டு, அவர்களுடைய போராட்டம் முடிவுக்குக் கொண்டுவரப்பட்டு, பல்கலைக்கழக கல்வி நடவடிக்கைகளை ஆரம்பிப்பதற்குரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதமர் அவர்களே, தற்பொழுது இச்சபையில் கௌரவ சாணக்கியன் அவர்கள் இருக்கின்றார். அவரும் கல்முனை வடக்குப் பிரதேச செயலகம் தொடர்பாகப் பல தடவை உங்களிடம் கோரிக்கை முன்வைத்திருக்கிறார். எனவே, நீங்கள் இவ்விடயம் தொடர்பில் உடனடியாக கவனம் செலுத்த வேண்டுமென நான் விநயமாகக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද point of Order එක, ගරු මන්ත්‍රීතුමා?

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, he mentioned my name.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Okay, go on.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Prime Minister, you are walking out. I must clarify this issue in the Kalmunai North Divisional Secretariat. The Hon. Member also mentioned my name. So, I want to clarify that.

කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිළිබඳ ප්‍රශ්නය ගැන මාස තුනක් තිස්සේ දිගින් දිගටම උද්ඝෝෂණ සිදු වෙනවා. ගරු අගමැතිතුමනි, මේ සම්බන්ධව ඔබතුමාට දුරකථනයෙනුත් කථා කළා, ඔබතුමාගේ කාර්යාලයටත් පැමිණ අපි කථා කළා. ඔබතුමා කිව්වා, අම්පාර දිස්ත්‍රික්කයේ GA එතැනට ඇවිල්ලා ඒ ගැන බලාවි කියලා. අම්පාර දිස්ත්‍රික්කයේ GA අද වෙනකල් ඒ පිළිබඳව මොනවත් බලලා නැහැ. ඉතින් රටේ අග්‍රාමාත්‍යතුමා කියලාත් අම්පාරේ GA ගණන් ගන්නේ නැත්නම්, ජනතාව මීට වඩා උද්ඝෝෂණ කරන්න ඕනෑ කියන එකද අගමැතිතුමාගේ මතය කියන එක විතරක් පොඩ්ඩක් කියන්න. ඒනෙන්නේ, ඒනෙන්නේ, අන්න මක්කල් කිට්ටත්තට්ට 2 - 3 මාතඞ්කලාකප් පෝරාට්ටත්තිල් ඊටුපටුකින්රාර්කල්. කෞරව පිරතමර් අවර්කල් සොල්ලියුම් අම්පාරෙ මාවට්ට අරසාඞ්ක අතිපර් ඉව්විටයත්තිල් කවනම් සෙලුත්තවිල්ලෙ එන්රාල්, ඉතර්කුප් පිරකු නාඞ්කල් යාරිටම් සොල්වතු?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you are making the same point again in Tamil.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am mentioning it again because the Hon. Prime Minister was not in his chair. கௌரவ பிரதமர் அவர்களே, the GA of the Ampara District must go there and at least ask them what the problem is.

கௌரவ பிரதமர் அவர்களே, இதுதொடர்பில் உங்களுடைய பதிலை நான் எதிர்பார்க்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you, Hon. Member. If the Prime Minister wishes to answer, you can do so.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரும்)
(The Hon. Dinesh Gunawardena - Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලා දෙදෙනා විසින් කියපු කාරණය සත්‍යයයි. එතුමන්ලා මාව හමු වුණා. ඒ අනුව අම්පාර දිසාපතිතුමාට මේ සම්බන්ධව අපි අවශ්‍ය උපදෙස් දීලා තිබෙනවා. ඒ වාගේම ගණකාධිකාරිවරයෙක් ඒ කාර්යාලයට යොමු කර, මහජනයා එක්ක අවශ්‍ය කටයුතු සිදු කිරීමට දිසාපතිතුමා කටයුතු කරලා තිබෙනවා.

ඒ වාගේම කල්මුණේ ප්‍රදේශයේ යම් උද්ඝෝෂණයක් පවතින බවත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබෙන බවත් ඔබතුමන්ලා දෙදෙනාම දන්නවා. ඒ අනුව අපට ඒ ප්‍රදේශයේ ප්‍රතිසංවිධාන කටයුතු ගැන ගැටලු තිබෙනවා. ඉතින් අපි ඒ පිළිබඳව සාකච්ඡා කරලා ඒ ප්‍රශ්නය විසඳීමට එදා එකඟ වුණා, ගරු මන්ත්‍රීතුමනි. කල්මුණේ ප්‍රදේශයට අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාත් ගිහිල්ලා මේ සම්බන්ධව අදාළ පාර්ශ්ව සමඟ සාකච්ඡාවක් පවත්වා එම ප්‍රශ්නයට විසඳුමක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. අපි ප්‍රශ්නය ප්‍රතික්ෂේප කරලා නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තාරක බාලසූරිය රාජ්‍ය අමාත්‍යතුමා.

[4.15 p.m.]

ගරු තාරක බාලසූරිය මහතා (විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு தாரக்க பாலசூரிய - வெளிநாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Tharaka Balasuriya - State Minister of Foreign Affairs)
Hon. Presiding Member, I think the Opposition is making a lot of noise about nothing as usual without focusing on what is before the House today: two Regulations and an Order under the Casino Business (Regulation) Act, No. 17 of 2010, Regulations under the Colombo Port City Economic Commission Act, No. 11 of 2021, a Supplementary Sum and a Resolution under the Coconut Development Act, No. 46 of 1971.

The Hon. Member who spoke before me, the Hon. Sujith Sanjaya Perera, also spoke of the proposed wealth tax. I, too, agree with him; I do not think the wealth tax is the most appropriate mechanism to tax people. But, why is a wealth tax needed? We know that there is wealth being created in the country; when we look around the country, we see new houses, buildings and institutions being put up daily. But, when we really look at the tax income or when do an analysis to see whether people are paying taxes for those, we see they are not. For example, if you are building a house or a building worth Rs. 30 million or Rs. 40 million, then you should have paid taxes at some time or the other in your life. But, unfortunately, in Sri Lanka, we have built a culture of not paying taxes. So, I think a wealth tax is indeed needed and that it is a very fair tax because the first house or the house in which

[ගරු තාරක බාලසූරිය මහතා]

a person is living would not be taxed, but only any other houses he has.

Then, as for the two Regulations under the Casino Business (Regulation) Act, No. 17 of 2010, I think a lot of Members from the Opposition, especially those from the SJB and the NPP spoke about it. We heard a former Member of Parliament referring to an *"aarthika gathakaya"*. I think Mr. James Packer was also mentioned. Perhaps, Mr. George Soros can be attributed as an *"aarthika gathakaya",* but just because someone owns a casino, I do not think it would make him an *"aarthika gathakaya"*. So, I think we need to stop this nonsense and understand that casinos have a place in the economy.

Particularly countries like Singapore, for the longest time, refused to have casinos. Lee Kuan Yew refused to have casinos, but his son, later on, took a conscious decision that economically it makes more sense for Singapore also, which is a wealthy country, to have casinos.

So, what is wrong in Sri Lanka having casinos? We have four casinos operating in Sri Lanka and we know that John Keells has invested US Dollars 1 billion in the integrated project "City of Dreams Sri Lanka". And, to whom are we trying to market it? We are trying to get down the Indian customers. As India does not have any casinos, we want to get down the Indian tourists to Sri Lanka and through that, to have economic growth. I think the Members of the Opposition are getting a little bit weary and worried that the economy, in the first quarter, has grown at a 5.3 per cent rate and it is to be expected that such economic growth would follow because the President has been very mindful and taken the correct steps at the correct time. I must say that no government wants to increase taxes; every government wishes that it could reduce taxes. But, we have to face the economic reality. Once the Government increases its revenue to a certain extent, then, we could certainly ease up on taxes, but I do not think we have come to that point as of yet.

Sir, that Hon. Member from the Opposition also made reference to the President spending money. What is wrong with that? Then, he also said that Members of Parliament have not been given adequate sums from the Decentralized Budget. We must understand that the President is part of the Executive and that it is well within his right to spend money. Certainly, when the country has recorded a 5.3 per cent growth in the first quarter, I think a certain amount of money can be attributed to him in order to expedite development work. We must also understand that the Decentralized Budget - I believe it was introduced by the Hon. (Dr.) N.M. Perera in the 1970s - is necessarily not a part of the Legislature, but a part of the Executive. Although every Member of this House seems to have enjoyed that, we must understand that it is not a part of the Legislature, but a part of the Executive. While the Hon. Member makes the argument that the President is spending money, he also pleads his case that the Decentralized Budget should be given to Members of Parliament, which does not make sense. I think, this year, the distribution of money from the Decentralized Budget has been carried out in a very non-political way, if I may say so. The money did not go to the Members of Parliament, but rather, first, to the districts and from the districts, to the AGA Offices. By the AGA Offices, it is decided what development works should be carried out. I certainly think that these measures which the President has taken has steadied the ship. So, I think this is not the time to make false accusations, have fearmongering among the public and say that these policies adopted by the President are doomed for failure.

And as you know, Hon. Member, I myself have been one of the Members in the Opposition during the last tenure who criticized the current President overwhelmingly. But, we also need to appreciate that the measures he has taken have borne fruit and that the country is well on its way to economic growth. With regard to that, I think it is time that the Opposition matures up and joins with the Government. Everybody should come together to determine what the best policies are for this country. I do not think, now, people are going to accept us when we say, "we are UNPers", "we are SLFPers", "we are SLPPers" or "we are SJBers" because people are quite sick of the party politics, Sir.

Sir, you and I work very well together in a bipartisan manner when it comes to certain issues pertaining to politics and the House and I see no reason why the other MPs cannot work in the same manner. Also, I see no reason why the Leader of the Opposition, who has worked with the current President for the longest period of time, cannot work with him anymore; if the Hon. Mahinda Rajapaksa can work with the current President, I see no reason why the Hon. Sajith Premadasa cannot do that. So, I think, the time has come for us to put the country before all else and work together to make sure that this country develops.

I am glad the SJB accepts, at least on policy terms, that the policies adopted by the Hon. President are in the right direction. Unfortunately as for our Friends representing the NPP, I believe they still have a lot to learn. Perhaps, in their visits overseas, to the United Kingdom and other countries, they will see how the other countries have developed. We cannot live in the 1970s anymore, Sir. We need to move forward with time; we need to bring our policies in line with the current practices.

Sir, I want to conclude my speech by saying that those steps, although they might have been very harsh, are bearing fruits. I believe that through those steps that have been undertaken, we have been able to develop some of the rural sectors with funds allocated from the Decentralized Budget and by other means. I am certain that the momentum of the 5.3 per cent growth in the first quarter could be continued for the rest of the year. Also, I am optimistic that with the current policies which are being carried out by the President, by the end of this year, we would have an economic growth rate of more than 6 per cent.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා.

[අ.භා. 4.26]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පනත් කිහිපයක් යටතේ වන රෙගුලාසි, නියමයන් හා නියෝග සම්බන්ධයෙනුත් අද විවාද කරනවා. ඒ අතර කැසිනෝ සම්බන්ධයෙනුත් යෝජනා තිබෙනවා. මම හිතන විධියට, ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුව දවස ගණනේ කැසිනෝ ශාලා වැඩි කරමින් ඉන්නවා. සුරාසැල් සම්බන්ධයෙන් කථා කළොත්, බාර් පර්මිට් 500ක් දුන්නා. දවස ගණනේ කැසිනෝ පර්මිට් එහෙමත් වැඩියෙන් දෙනවා. ඉතින්, සුරාව සහ සූදුව මූලික කරගත් ආර්ථිකයක් අපි දකිනවා. ඒ ගැනත් මම වචනයක් කථා කරන්නට ඕනෑ.

ඒ එක්කම, ජනාධිපතිතුමාගේ මේ පරිපූරක ඇස්තමේන්තුව ගැනත් අපි වචනයක් කථා කරන්න ඕනෑ. මේක එතුමා මේ රටේ ජනතාව කෙරෙහි සද්භාවයෙන් කරගන්නා මුදල් අනුමත කර ගැනීමක්ද කියන එක කවුරුත් දන්නවා. මේක සම්පූර්ණයෙන් තමන්ගේ ප්‍රතිරූපය ගොඩනංවා ගැනීම සඳහා, එළියට බහින්න බැරුව ඉන්න මේ ආණ්ඩුවේ නියෝජිතයින්ට ආපසු ජනතාව අතරට යෑමට උපයෝගී කරගන්නා කාරණයක් බවටයි පත් වෙන්නේ.

දැන් ඇඩ්‍රස් නැති ආණ්ඩු පක්ෂයේ දේශපාලකයින් මේ දවස්වල ඉතාම වේගයෙන් -කඩිනමින්- විදේශ රැකියා සඳහා අයදුම්පත් එකතු කරනවා. අපේ ශාන්ත බණ්ඩාර මහත්මයලා ඇතුළු කණ්ඩායම මේ දවස්වල ණය පත්‍රිකා බෙදා හරිනවා ස්වයං රැකියා සඳහා ණය දෙන්න. හැබැයි, මේ වෙනකොට කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත 240,000ක් වැසී ගොස් තිබෙනවා. තව 50,000ක්, 60,000ක් වැසීමට නියමිත වෙලා තිබෙනවා. රෝගීන්ට ආධාර ටික තවම ලැබෙන්නේ නැහැ. වැඩිහිටියන්ට ලබාදෙන වැඩිහිටි දීමනාව පිළිබඳ බරපතළ ප්‍රශ්න තිබෙනවා. ඔවුන්ට වැඩිහිටි දීමනාව ලබා දීමේ කටයුත්තේ අකාර්යක්ෂමතා තිබෙනවා. එතකොට උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයින්ට මහපොළ ශිෂ්‍යත්ව අරමුදල නොලැබෙද්දී, රෝහල්වල පිළිකා රෝගීන්ට බෙහෙත් ටික නැති වෙද්දී, සමහර රෝහල්වල ගෝස් කැල්ලක්, කතුරක් පවා නැති වෙද්දී ජනාධිපතිතුමා පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කරගන්න උත්සාහ කරනවා. එතුමාගේ දේශපාලන සුබසිද්ධිය සඳහාත්, එතුමාට ශක්තිය දෙන කණ්ඩායමේ සුබසිද්ධිය සඳහාත් එතුමා ඒ කටයුත්ත කරනවා. මේවා කොයි තරම් දුරට සදාචාරාත්මකද කියන කාරණය අපි අහනවා.

මම දැක්කා, උදේ ඉඳලාම අපේ වැවිලි කර්මාන්ත ඇමතිතුමා මේ සභාවේ වාඩිවෙලා ඉන්නවා. බොහොම උනන්දුවෙන් හිටියේ එතුමා විතරයි. ඒ නිසා මම අපේ වැවිලි කර්මාන්ත ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා, විශේෂයෙන් පොල් කර්මාන්තය සම්බන්ධව. මොකද, අද ඒ හා සම්බන්ධ පනතක් යටතේ වන කාරණයකුත් කථාබහට ලක්වන නිසා. මේ වසරේ පොල් නිෂ්පාදනය අතිශයින්ම අඩු වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒකට හේතුව තමයි වසර දෙකක් තිස්සේ පොල් සඳහා අවශ්‍ය වන පොහොර ටික නොලැබීම. ඒ එක්කම සුදු මැස්සාගේ හානිය නිසා පොල් නිෂ්පාදනය විශාල වශයෙන් පහළ බැහැලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුද්දකට රුපියල් බිලියනයක විතර අපනයන ආදායමක් පොල්, පොල් මද, කුඩුබත් සහ පොල් ආශ්‍රිත සියලුම නිෂ්පාදනවලින් අපි ලංකාවට ගෙනෙනවා. හැබැයි, ලංකාවට වසරකට පොල්තෙල් මෙට්‍රික්ටොන් 141,000ක් විතර අවශ්‍ය වෙනවා.

එතකොට, අද අපිට ලැබෙන සියලු පොල් ටික අරගෙන පාවිච්චි කළත් අපට නිෂ්පාදනය කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ මෙට්‍රික්ටොන් 35,000ක් විතර ප්‍රමාණයක්. අපේ තිබෙන සියලු පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා, අපේ තිබෙන ඒ කර්මාන්තශාලාවලට පොල් ගෙඩි බිලියන 5ක පමණ අවශ්‍යතාවක් තිබියදී, අපේ රටේ මේ වෙනකොට වාර්ෂිකව නිෂ්පාදනය වෙන්නේ පොල් ගෙඩි බිලියන 2.8ක වාගේ ප්‍රමාණයක්. මෙහි තිබෙන විශේෂ කාරණය ඒක නොවෙයි. දේශීය පරිභෝජනයට පමණක්, ඒ කියන්නේ අපේ එදිනෙදා ඉවුම් පිහුම් කටයුතු ඇතුළු පරිභෝජනයට පමණක් මේ නිෂ්පාදනය වන පොල් ගෙඩි බිලියන 2.8න් බිලියන 2ක් විතර යොදා ගන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
හොඳයි.

එතකොට, අපේ සියලු පොල් ආශ්‍රිත කර්මාන්තශාලා සඳහා පොල් ගෙඩි බිලියන 5ක් අවශ්‍ය වුණත්, **ලැබෙන ඵලදාව** පරිභෝජනයෙන් පසු ඉතිරි වෙන්නේ පොල් ගෙඩි බිලියන දශම 8ක ප්‍රමාණයක්. ඒ නිසා අපි නිෂ්පාදන ආර්ථිකයකට යන්න ඕනෑ, අපේ පොල් ඵලදාව වැඩි කර ගන්න ඕනෑ, කුඩා හා මහා පරිමාණ පොල් ඉඩම්වල ඵලදායීතාව වැඩි කර ගන්න ඕනෑ, ඒ වාගේම වතු හිමියන්ට අවශ්‍ය පොහොර ලාභ මිලකට දෙන්න ඕනෑ.

පොල් ඉඩම් හිමියන් දැන් සම්පූර්ණයෙන්ම තමන්ගේ වතු පිටි අතහැර දමන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. පසුගිය වසර දෙකකට ඉස්සෙල්ලා වතු හිමියෙකුට පොල් ගෙඩියක් නිෂ්පාදනය කරන්න දළ වශයෙන් රුපියල් 40ක් විතර වැය වුණා. හැබැයි, දැන් තිබෙන අධික පොහොර වියදම සහ ඒ යෙදවුම්වල වියදමත් එක්ක පොල් වතු හිමියෙකුට අද පොල් ගෙඩියක් නිෂ්පාදනය කරන්න රුපියල් 60ක විතර වියදමක් යනවා. ඒ නිසා අපි කුඩා හා මහා පරිමාණ පොල් වතු හිමියන් ආරක්ෂා කර ගත්තේ නැත්නම්, ඔවුන්ට පහසුකම් දුන්නේ නැත්නම්, ඔවුන්ව දිරි ගැන්වුවේ නැත්නම්, අපේ රටේ පොල් කර්මාන්තය සහ පොල් නිෂ්පාදනය බරපතළ ලෙස කඩා වැටෙනවා කියන කාරණයත් මම මතක් කරන්න ඕනෑ.

ඒ එක්කම, රාජ්‍ය වතු ටික ගැනත් මම කථා කරන්න ඕනෑ. ගරු කංචන විජේසේකර ඇමතිතුමා වැවිලි කර්මාන්ත ඇමතිතුමාට අහගෙන ඉන්න දෙන්නේම නැහැ නේ. මම මෙච්චර දේවල් කියනවා, එතුමා මොනවත් අහගෙන ඉන්නේ නැහැ. ඔය වැවිලි කර්මාන්ත ඇමතිතුමාට මම මේ කියනවා, කියනවා,-

ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)
(මාණ්පුමිකු කඤ්චන විජේසේකර - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)
එතුමා සෞඛ්‍ය ඇමති.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
සමාවෙන්න. මම එතුමා දිහා බලාගෙන කිව්වේ. *[බාධා කිරීමක්]* එතුමා කලින් ඇමති. සමාවෙන්න, සමාවෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
හොඳයි.

මම හිතන විධියට, වාමාංශිකයෝ කරපු තවත් එක දෙයක් තමයි, අපේ රටේ තිබුණු මහා පරිමාණ පොල් වතු ටික, පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය සම්බන්ධ වෙලා නඩත්තු කරපු පොල් වතු ටික ආණ්ඩුවට ගැනීම. ඒවා ආණ්ඩුවට අරගෙන නඩත්තුව අතහැරියා. අද වෙනකොට සම්පූර්ණයෙන්ම කණාටු වෙච්ච ගස් ටික විතරයි රාජ්‍ය වතු සමාගම්වලට අයත් පොල් වතුවල තිබෙන්නේ. ඒ වාගේම ඒ වතුවල හොරකම ඉහළ සිට පහළටම ගිහිල්ලා තිබෙනවා. මේ තත්ත්වය තුළ අපේ පොල් නිෂ්පාදනය දිරිමත් කරන්නේ කොහොමද කියන කාරණය අපි නැවත නැවත සලකා බලන්න ඕනෑ.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ තිබෙනවා, පොල් ගෙඩි ගණන් කිරීමේ ක්‍රමයක්. 2022 වසරේ තමයි ලංකා ඉතිහාසයේ වැඩිම පොල් නිෂ්පාදනය සිදු වුණේ. එම වසරේ ගෙඩි බිලියන 3.2ක නිෂ්පාදනයක් තිබුණා. ඒක වාර්තාගත අංකයක්. එම නිසා නාස්ති වෙලා කියලා ඔබතුමාට කියන්න බැහැ. ඉතිහාසයේ වැඩිම පොල් ගෙඩි ගණන නිෂ්පාදනය වුණේ 2022 වසරේ. ඒ, පොල් ගෙඩි බිලියන 3.2ක්.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අවුරුදු දෙකක ඉඳලා ඒ පොල් වගාවට පොහොර නොලැබීම නිසා මේ වෙනකොට පොල් නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම බිඳ වැටිලා තිබෙනවා, ගරු ඇමතිතුමනි.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ගරු මන්ත්‍රීතුමනි, පොල් ඵලදාව සඳහා වැදගත්ම කාරණය පොහොර නොවෙයි, වතුර. ඉතිහාසය පුරාම මහා පරිමාණයෙන් පොහොර යෙදීමක් කරලා නැහැ. නමුත් වැස්ස තමයි වැදගත්ම කාරණය. වතුර වැඩි වුණු නිසා තමයි 2022 වසරේ ඵලදාව ඉතාම වැඩි වුණේ. ගිය අවුරුද්දේත් ඉතා හොඳ ඵලදාවක් ලැබුණා. පොහොර එක්ක නොවෙයි, ඒක වර්ෂාවත් එක්කයි සම්බන්ධ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු ඇමතිතුමනි, මට සමාවෙන්න ඕනෑ. තමුන්නාන්සේ දැන් වැවිලි කර්මාන්ත ඇමති නොවෙයි නේ. හැබැයි, තමුන්නාන්සේගේ,- *[බාධා කිරීමක්]* ඔව්, ඒක තමයි. නමුත්, වැවිලි කර්මාන්ත ඇමතිතුමා කෝ? මහින්ද අමරවීර ඇමතිතුමා කෝ? එතුමා අද නැහැ. ඇත්තටම කනගාටුයි. මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු දිලුම් අමුණුගම රාජ්‍ය අමාත්‍යතුමා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(මාණ්පුමිකු சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி - வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry, PC - Minister of Foreign Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු මයන්ත දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. MAYANTHA DISSANAYAKE left the Chair, and THE HON. HESHA WITHANAGE took the Chair.

[අ.භා. 4.35]

ගරු දිලුම් අමුණුගම මහතා (ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු திලුම் அமுணுகம - முதலீட்டு மேம்பாடு இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilum Amunugama - State Minister of Investment Promotion)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ සාකච්ඡාවට භාජන කරන කරුණු අතරින් මම විශේෂ අවධානය යොමු කරන්නේ අද අප අනුමත කරන්න බලාපොරොත්තු වන කොළඹ වරාය නගරයේ තීරු බදු රහිත මෙහෙයුම් සම්බන්ධයෙන් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝග සම්බන්ධවයි. කොළඹ වරාය නගරයේ තීරු බදු රහිත වෙළඳ සංකීර්ණයේ සියලු කටයුතු මේ වන විට අවසන් කර තිබෙනවා. විශේෂයෙන් අද දිනයේ මෙම නියෝග අනුමත වුණාට පසුව එය විවෘත කරන්න සූදානමින් තිබෙනවා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේ වෙලාවේ ගරු සභාවේ නොසිටියත් මම මේ අවස්ථාවේ එතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හරහා කඩිනමින් -අනෙක් ඒවාට වඩා යම් ඉක්මනකින්- මේ යෝජනා අපට සම්මත කර දුන්නා. ඒ සම්බන්ධයෙන් එතුමාට මගේ ස්තුතිය පළ කරනවා.

මොකද, එහෙම නොවුණා නම් අපට නියමිත දිනයට එම වෙළෙඳ සංකීර්ණය විවෘත කර ගන්න හැකියාව ලැබෙන්නේ නැහැ.

විශේෂයෙන් තීරු බදු රහිත සාප්පු සංකීර්ණ මෙහෙයුම්වල අවම ආයෝජන වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන හතක් වනවා. එම මුදල තමයි අවම ආයෝජනය. ඒ වාගේම තීරු බදු රහිත සිල්ලර වෙළෙඳ මෙහෙයුම්වල - retail trade වල- අවම ආයෝජන වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන පහක් වනවා. මේ වන කොට Flemingo, One World Duty Free, China Duty Free කියන සමාගම් තුන අපේ වරාය නගරයේ තීරු බදු රහිත සාප්පු සංකීර්ණ මෙහෙයුම්වලට ඇතුළත් වෙලා තිබෙනවා. එම ඉදිකිරීම් කටයුතු සියල්ල සිදු කර තිබෙනවා. මේ ගැසට් නිවේදනයේ සඳහන් නියෝග අද සම්මත වනකල් ඒ අය බලාගෙන ඉන්නවා. ලබන මාසයේ මුල එම සංකීර්ණය විවෘත කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

මෙහිදී විශේෂයෙන් විදේශගතව සිට පැමිණෙන කෙනෙකුට මේ රටට පැමිණ දවස් හතරක් ඇතුළත මේ සංකීර්ණයට යෑමේ හැකියාව තිබෙනවා. ඒ දවස් හතර ඉක්මවා ගියොත් ඒ අවස්ථාව අහිමි වෙනවා. ඒ වාගේම, කුමන අවස්ථාවේ විදේශගතව පැමිණියත් වසරකට එක අවස්ථාවයි ඒ තැනැත්තාට හිමි වන්නේ. ඒ වාගේම වසරකට ඩොලර් 2,000ක සීමාවකුත් අපි යොදා තිබෙනවා. මේ හරහා කොළඹ නගරයේ තිබෙන වෙනත් ව්‍යාපාරවලට යම් බලපෑමක් ඇති වෙයි ද කියා ප්‍රශ්නයක් නැහුවා. ඒ සඳහා මෙම ක්‍රියා මාර්ග ගෙන තිබෙනවා කියන කාරණයත් අපි මතක් කරන්නට අවශ්‍යයි.

මෙම කටයුත්ත සඳහා දායක වුණු සියලු දෙනාට අපේ ස්තුතිය පුද කරනවා. විශේෂයෙන් මේ වන කොට වරාය නගරයට අදාළ රෙගුලාසි -බැංකු රෙගුලාසි ද ඇතුළුව- සියල්ල පාහේ සකස් කර අවසන් වෙලා තිබෙනවා. බැංකු රෙගුලාසි සකස් කරන්න අපට වසරක පමණ කාලයක් ගත වුණා. මේ වන කොට එම රෙගුලාසි සකස් කර අවසාන කර ඒවා පාර්ලිමේන්තුවේ අනුමැතියටත් ඉදිරිපත් කර තිබෙනවා.

මේ වන කොට කොළඹ වරාය නගරයේ authorized personsලා වීමට ආයෝජන 70ක් සඳහා -ව්‍යාපෘති 70ක් සඳහා- අපට අයදුම් පත්‍ර ලැබී තිබෙනවා. මේ සභාවෙන්ම අනුමත කළ රෙගුලාසි අනුව මේ වන කොට එම කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කරගෙන යනවා. විශේෂයෙන් එම ව්‍යාපාරික මධ්‍යස්ථානයේ - Business Centre එකේ - කටයුතුවල වත්මන් තත්ත්වය ඔබතුමන්ලා එහි ගියොත් බලා ගන්න පුළුවන්. මේ වන කොට එහි තුන්වන තට්ටුව දක්වා ඉදිකිරීම් අවසන් කර තිබෙනවා. නුදුරු දිනයකදී - කඩිනමින් - Business Centre එකත් විවෘත කරන්න අප බලාපොරොත්තු වෙනවා කියන කාරණයත් මතක් කරන්නට අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝගවලට අමතරව ඉදිරිපත් කර තිබෙන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත යටතේ රෙගුලාසි, නියමය සහ නියෝගය ගැනත් අපි විවාද කරනවා. අපි දැක්කා, ඒවා සම්බන්ධයෙන් විශේෂයෙන් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කථා කළ ආකාරය. රජය ආදායම් උපයන්න හදන කොට, බදු වැඩි කරන කොට චෝදනා කරනවා, "ජනතාව පිට බදු පටවනවා" කියලා. හැබැයි, බදුවලින් එහාට ගිහිල්ලා රජය ආදායම් උපයන්න උත්සාහ කරන කොට ඒකට කියනවා, "මෙය සුරාව සහ සූදුව පිරුණු ආණ්ඩුවක්" කියලා. නමුත් බදු ආදායම ලබා ගන්නේත් නැතුව, රාජ්‍ය ආදායම වැඩි කර ගන්නේත් නැතුව මේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යන්න බැරි බව අපි ඉතාම හොඳින් දන්නවා. මීට වසර දෙකකට පමණ ප්‍රථමයෙන් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මතට එම දෝෂය වැටුණාට, එතුමාගේ අතට පත් වුණේ pin එක ගලවපු hand grenade එකක් වැනි රටක්. එම දෝෂාරෝපණය එතුමා මතට වැටුණත් එතුමාගේම අතේ එය පුපුරා ගියා මිස, එතුමා මේ ප්‍රශ්නයට කිසිම විධියකින් දායකත්වයක් සැපයූ නායකයෙක් නොවෙයි.

වසර ගණනාවක් තිස්සේ රජයවල් ප්‍රමාණය ඉක්මවා ණය ලබා ගැනීමේ ප්‍රතිඵලයක් හැටියට අවසාන විත්තිකාරයා බවට පත් වෙන්න එතුමාට සිදු වුණා. හරියටම මීට අවුරුදු දෙකකට කලින් රටේ තිබුණු තත්ත්වය ගැන අපි කල්පනා කර බලමු. අපේ රට ඇතුළු ලෝකයේ රටවල් ආර්ථික අර්බුදයටත්, කොවිඩ්-19 වසංගත තත්ත්වයටත් මුහුණ දුන්නා. ඒකේ ප්‍රතිඵලය තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරය දරද්දී පුපුරා ගියේ.

මීට වසර දෙකකට ප්‍රථමයෙන් රටේ තිබුණු තත්ත්වය ගැන කල්පනා කරලා බලන්න. වරායට ආපු තෙල් නැවට සල්ලි ගෙවා ගන්න බැරි තත්ත්වයකට මේ රටේ ආර්ථිකය පත් වුණා. අද අපේ ගරු විපක්ෂ නායකතුමා කොපමණ දේශනා පැවැත්වුවත්, විපක්ෂයෙන් කුමන චෝදනා ඉදිරිපත් කෙරුවත්, අර්බුදකාරී තත්ත්වය යටතේ එදා අගමැති ධුරය භාර ගන්න කියලා පළමුවැනි දුරකථන ඇමතුම ගියේ එතුමාටයි. වෙන කාටවත් නොවෙයි. එදා පළමුවැනි දුරකථන ඇමතුම ගියේ එතුමාටයි. අපි ඒ වෙලාවේ ජනාධිපති මන්දිරයේ හිටපු අය. ගරු රමේෂ් පතිරණ ඇමතිතුමාත් ඒ වෙලාවේ මාත් එක්ක එතැන හිටියා. අපි දන්නවා, පළමුවැනි දුරකථන ඇමතුම ගියේ කාටද කියලා. ඒ, රනිල් වික්‍රමසිංහ මැතිතුමාට නොවෙයි. පළමුවැනි දුරකථන ඇමතුම ගියේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාට. එතුමා ඒ වගකීම බාර ගත්තේ නැහැ. සාකච්ඡා කරන්න ජනාධිපති මන්දිරයට පැමිණියේවත් නැහැ. පැමිණියේ දෙදෙනායි. එක්කෙනෙක් තමයි, සරත් ෆොන්සේකා මැතිතුමා. එතුමා ඔබතුමන්ලාගේ කණ්ඩායමේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. එතුමා පමණයි පැමිණියේ. අගමැතිකම බාර ගන්නවාද, නැද්ද කියලාවත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් එක්ක සාකච්ඡා කරන්න ජනාධිපති මන්දිරයට පැමිණියේ එතුමා විතරයි. වෙනත් කවුරුවත් පැමිණියේ නැහැ. අනතුරුව, අවසාන දුරකථන ඇමතුම තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමාට දුන්නේ. ඒ, අනෙක් සියලු දෙනාට කථා කෙරුවාට පස්සේයි. ඒ දුරකථන ඇමතුමට පමණයි ප්‍රතිචාරයක් ලැබුණේ. එතුමා පමණයි සාකච්ඡාවට පැමිණිලා මේ බාරදුර කාර්යය බාර ගන්න, අගමැති ධුරය බාර ගන්න ඉදිරිපත් වුණේ. එහි ප්‍රතිඵලයක් හැටියට අවසානයේදී එතුමා නතර වුණේ මේ පාර්ලිමේන්තුව තුළින් අප එතුමාව ජනාධිපතිවරයා හැටියට පත් කිරීමෙනුයි. එතුමා එම ධුරයට පත් වෙච්ච අවස්ථාවේ රටේ තිබුණු තත්ත්වය පිළිබඳව අපි කවුරුත් දන්නවා. අපේ රටට ආපු තෙල් නැවට සල්ලි ගෙවා ගන්න බැරි තත්ත්වයක් තමයි එදා තිබුණේ. අපේ භාණ්ඩාගාරයේ බොහොම දරුණු වාතාවරණයක් තමයි ඒ අවස්ථාවේදී තිබුණේ. කුමන චෝදනා ඉදිරිපත් කළත් අප බලන්න ඕනෑ, වසර දෙකක් ගත වූ තැන අද ඇති වෙලා තිබෙන තත්ත්වය දෙසයි. පරණ කාරණාවලට චෝදනා කරන්න පුළුවන්. නමුත්, එතුමා මේ රට බාර ගත් දින සිට අද දක්වා රජය මෙහෙයවපු ආකාරය ගැන කල්පනා කරලා බැලුවොත්, එය හොඳ බව කියන්න වෙනත් කොහෙන්වත් සාක්ෂි අවශ්‍ය නැහැ; විපක්ෂයෙන් ඉදිරිපත් කරපු සාක්ෂි ටිකම ඇති.

අද විපක්ෂයෙන් චෝදනා කරනවා, මන්ත්‍රීවරුන්ට DCB funds දීලා තිබෙනවා කියලා. මන්ත්‍රීවරුන්ට DCB funds දීගන්න පුළුවන් වෙච්ච එකම කොච්චර ලොකු දෙයක් ද? පසුගිය කාලයේ ඒක දෙන්න බැරිව නේ තිබුණේ. අද වන විට ඔබතුමන්ලාගේ විපක්ෂය පැත්තේ ඇතැම් මන්ත්‍රීවරුන්ටත් DCB funds දීලා තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයේ සිටින ඔබතුමන්ලාගේ විපක්ෂය පැත්තේ මන්ත්‍රීවරුන්ට අපට වඩා DCB funds දීලා තිබෙනවා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
හැමෝටම දෙන්න.

ගරු දිලුම් අමුණුගම මහතා
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)
ඔබතුමන්ලා ඉල්ලුවොත් දෙයි. මා හිතන විධියට, ඉල්ලපු අයට දීලා තිබෙනවා. අපි දැන් ඒ අයත් එක්ක තර්ක කරනවා DCB funds බෙදා ගන්න. මොකද, ඒ අයටයි වැඩියෙන් ලැබිලා තිබෙන්නේ. ඒ කෙසේ වෙතත්, ජනතාවට වැඩ කරන්න අවශ්‍ය මුදල් මන්ත්‍රීවරුන්ට දෙන්න පුළුවන් තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා.

අපේ ආණ්ඩුව යටතේත් ක්‍රියාත්මක වෙච්ච සමෘද්ධි වැඩසටහන අද "අස්වැසුම" නමින් ක්‍රියාත්මක වෙනවා. ඉස්සර දීමනාව වශයෙන් මාසයකට රුපියල් 5,000ක් ලැබිච්ච කෙනාට, අස්වැසුම ප්‍රතිලාභය යටතේ අද එය රුපියල් 15,000 දක්වා වැඩි වෙලා තිබෙනවා. එකී ප්‍රතිලාභ ලබන සංඛ්‍යාවත් වැඩි කර තිබෙනවා. අපේ ගරු තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා කිව්වා, වැඩිහිටි දීමනාව දෙන්නේ නැහැ කියලා. එහෙම නොදෙන බවක් නම් මම දන්නේ නැහැ. අපේ පළාත්වල නම් ඒ දීමනා ලබා දෙනවා; ඒ දීමනා වැඩි කරලාත් තිබෙනවා. වකුගඩු රෝගීන්ට අදාළ දීමනාව ලබා දෙනවා. ඒ රෝගීන්ගේ ලැයිස්තුවේ ඉන්න අයට වාගේම පොරොත්තු ලේඛනයේ ඉන්න අයටත් දෙනවා. විශාල පිරිසකට ඒ සහන ලබා දෙනවා. අද ඔබතුමන්ලා බදු වැඩියි කියලා චෝදනා කරන අතරේ, කාට හරි නිවාස ණයක් දෙන්න ඉදිරිපත් වුණාම කියනවා, "මෙන්න, නිවාස ණය දෙන්න forms බෙදනවා" කියලා. නිවාසයක් හදා ගන්න කෙනෙකුට ණයක් දෙන්න පුළුවන් තත්ත්වයක් එදා අපට තිබුණේ නැහැ. නමුත්, දැන් ඒ තත්ත්වයට මේ රටේ ආර්ථිකය ගොඩ නැඟිලා තිබෙනවා. Forms ලබා දෙනවා විතරක් නොවෙයි, ඔබතුමන්ලා සොයා බලන්න, forms ලබා දෙන අයට සුදුසුකම් තිබෙනවා නම් ඒ අයට ණයත් ලැබෙනවා. ඒ අයගේ ඒ කටයුතු ඉදිරියට කෙරීගෙන යනවා. හැබැයි, දෙබිඩි ප්‍රතිපත්තියක් අනුගමනය කරලා, නොවෙන කොට එකක් කියන්නයි, වෙනකොට තව පැත්තක් පෙන්වන්නයි ගියොත්, අපේ ගරු තාරක බාලසූරිය මැතිතුමා කිව්වා වාගේ හැමදාම අපට මේ වළේ වැටිලා එකම දේ මඩේ දදා සෝද සෝද ඉන්න වෙනවා. ඒ මිස, මෙතැනින් එහාට ගමනක් ඇත්තේ නැහැ කියන කාරණය අපි මතක තියා ගන්න අවශ්‍යයි.

අපි අද සුරාවයි, සූදුවයි ගැන කියනවා. කැසිනෝ ව්‍යාපාරය පිළිබඳව ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා පැහැදිලි කළා. ඒ වෙනුවෙන් වන ගාස්තුව හැටියට රුපියල් බිලියන 10ක් රජයට අය කෙරෙනවා. වෙනත් ව්‍යාපෘතියකින්, වෙනත් ආයෝජනයකින් රුපියල් බිලියන 10ක් හොයනවා කියන එක කොයි තරම් අමාරු කාර්යයක් ද? නමුත් ඒ මුදල ලබාගෙන වසර 20ක් සඳහා නීත්‍යනුකූලව ඒ බලපත්‍ර ලබා දීම සිදු කරනවා. කවුරු හරි කියන්න පුළුවන් කැසිනෝ සෙල්ලම් කරන එක හොඳ නැහැ කියලා. ගමේ බූරුව ගහන එකත් හොඳ නැහැ කියනවා; අවුරුද්දට බෙල්ලෝ දමන එකත් හොඳ නැහැ කියනවා.

නමුත් ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා කිව්වා, මේක පටන් ගත්තේ කුකුළන් කෙටවීමෙන් කියලා. කුකුළන් කෙටවීමත් හොඳ නැහැ, හවසට තිබෙන අපේ TV programmes වාගෙයි. කුකුළන් කෙටවීමත් හොඳ නැහැ. හැබැයි රජයේ ආදායම වැඩි කර ගන්නට අවශ්‍ය නම්, ඒ සඳහා යම් යම් ක්‍රියා මාර්ග අරගෙන රාජ්‍ය ආදායම වැඩි කරගන්න වෙනවා. එහෙම නේද, ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ රාජ්‍ය ඇමතිතුමනි? ලංකාවේ මිනිහෙක් ගිහිල්ලා කැසිනෝ සෙල්ලම් කරනවා නම් තිබෙන ප්‍රශ්නය මොකක්ද? ඒකේ ප්‍රශ්නයක් නැහැ. සල්ලි නැති මිනිහෙකුට ගිහිල්ලා සෙල්ලම් කරන්න බැහැ නේ. සල්ලි තිබෙන කෙනෙක් තමයි ගිහිල්ලා සෙල්ලම් කරන්නේ. එයින් ලැබෙන බදු මුදලෙන් දුප්පත් ජනතාවට යමක් ලබා දෙන්න පුළුවන් නම්, ඒක තමයි අපි ලබන ජයග්‍රහණය කියන කාරණයත් අපි මතක් කරන්නට අවශ්‍යයි.

අද වනකොට ආයෝජන පිළිබඳ තත්ත්වය ගැන බැලුවොත්, මුදල් අමාත්‍යාංශය විසින් මේ වසර සඳහා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයට ලබා දුන් target එක, BOI එකට ලබා දුන් target එක ඩොලර් බිලියන එකයි. මම කියන්න කැමැතියි, අපි මේ වෙනකොට ගිවිසුම්ගත වෙමින් ඉන්න බව. මේ වසරේ මුල් කාර්තුවේදී -පළමුවැනි මාස තුනේදී- ව්‍යාපෘති 35ක් අපි අත්සන් කරලා තිබෙනවා. මේ ව්‍යාපෘති 35න්ම ඩොලර් බිලියන එකක මුදල පළමුවැනි කාර්තුවේදීම -මේ වෙනකොට- අපට සම්පූර්ණ කරගන්න පුළුවන්. මට පෙනෙන හැටියට වසරේ ඉතිරි මාස ගණනත් ගත වෙනකොට, -මැතිවරණය මැදින් ආවොත් අපට ඒ ගැන කියන්න බැහැ- ඩොලර් බිලියන 3 දක්වා, ඒ කියන්නේ ලබා දුන් ඉලක්කය තුන් ගුණයකින් විතර ඉක්මවා යෑමේ හැකියාවක් තිබෙනවා. ඒක අපේ දක්ෂතාවක් නිසා සිදු වුණු දෙයක් කියලා මම සඳහන් කරන්නේ නැහැ. ආයෝජකයන් තුළ රටේ ආර්ථිකය පිළිබඳව යම් විශ්වාසයක් ඇති වෙලා තිබෙන නිසා ඒ අය ඇවිල්ලා ගිවිසුම්ගත වෙනවා. එහෙම නම් ජනාධිපතිතුමා සහ රජය කරගෙන යන වැඩ පිළිවෙළ කොච්චර නරකයි කිව්වත්, එහි යම් නිවැරදිභාවයක් තිබෙන්නට අවශ්‍යයි. එහෙම නැත්නම් විදේශ ආයෝජකයෝ ඇවිල්ලා මේ රටේ ඒ අයගේ මුදල් ආයෝජනය කරලා -පළමුවැනි කාර්තුව වෙනකොටම ඩොලර් බිලියනයක් ආයෝජනය කරලා- ඒ අය කටයුතු කරගෙන යන්නේ නැහැ කියන කාරණය මම මතක් කරන්නට ඕනෑ.

අනෙකුත් අංශ ගැන කල්පනා කර බැලුවොත්, අපි දන්නවා, ඉතිහාසයේ පළමුවැනි වතාවට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සමයේ විභාග අසමත් ලක්ෂයකට රැකියා දුන් බව. හිටපු ජනාධිපතිතුමා හා පසුගිය රජය මහ ලොකු සද්දයක් ඇති නොකළාට, අද මේ ලක්ෂයම ස්ථිර සේවයට බඳවා ගෙන ඉවරයි. අද ඒ සියලුදෙනා ස්ථිර සේවකයන් හැටියට රජයේ සේවයට බඳවා ගෙන තිබෙනවා.

ඊළඟට, අද වනකොට වැඩ වර්ජන සහ උද්ඝෝෂණ වගයක් පවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හේතුව මොකක්ද? ඒ, පඩි වැඩි කිරීම නිසායි. එහෙම නැතුව පඩි වැඩි නොකිරීම නිසා නොවෙයි. මොකද, දොස්තර මහත්වරුන්ට පඩි වැඩි කළ නිසා nursesලා strike කරනවා. ඔවුන්ට පඩි වැඩි කළාම TO මහත්වරු සහ ඉංජිනේරු මහත්වරු strike කරනවා. හැබැයි මෙතෙක් strike කළේ පඩි වැඩි කරලා දෙන්න කියලායි. පඩි වැඩි කළ නිසා දැන් strike කරනවා. ඉතින් ඒක හොඳක් ද, නරකක් ද කියලා මම දන්නේ නැහැ. නමුත් එවැනි තත්ත්වයක් තමයි දැන් පවතින්නේ. අනෙක් අයටත් පඩි වැඩි කරන්න පුළුවන් නම් හොඳයි. අපි හිතනවා, රජයට පුළුවන් අවස්ථාවේදී ඒ කටයුතු ක්‍රියාත්මක කරයි කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු හේෂා විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. HESHA WITHANAGE left the Chair and DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] took the Chair.

ගරු දිලුම් අමුණුගම මහතා
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ අපට තිබුණු ප්‍රධාන ප්‍රශ්නය මොකක්ද? මේ රටට ආනයනය කරන ගොඩක් දේවල් ලැයිස්තුවක්ම තහනම් කරන්න අපට සිදු වුණා. අපට negative list එකක් භාර දෙන්න වුණා. අද බැලුවොත්, ඒ ලැයිස්තුවේ තිබුණු ඒවාවලින් මෝටර් රථ හැරෙන්න අනික් සියල්ලේම ආනයන සීමා මේ වෙනකොට ලැයිස්තුවෙන් ඉවත් කරලා තිබෙනවා. මේ රටට කලින් ආනයනය කළ, නමුත් තහනම් වෙලා තිබුණු දේවල් නැවත ආනයනය කරන්න පුළුවන් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ කාලයේ ඩොලර් එක රුපියල් 400, රුපියල් 450, රුපියල් 490 දක්වා ඉහළ ගියත්, දැන් ඩොලර් එක රුපියල් 290 සහ රුපියල් 300 සීමාවේ රඳවා ගන්න හැකි වීම නිසා ආනයනය විවෘත කරන්න හැකියාව ලැබී තිබෙනවා කියන කාරණයත් මතක් කරන්නට අවශ්‍යයි.

ඊළඟට මම කැමැතියි, වතුකරය ගැන කථා කරන්න. අපේ තොණ්ඩමන් ඇමතිතුමාත් මේ ගැන කථා කළා. වතුකරයේ අද නිවාස වැඩසටහන ක්‍රියාත්මක වෙනවා. ඒ විතරක් නොවෙයි, "උරුමය" වැඩසටහන හරහා ලක්ෂ ගණනකගේ ඔජ්පු, විශේෂයෙන්ම උතුරු-නැගෙනහිර ප්‍රදේශවල ජීවත් වන අයට අවුරුදු 70ක විතර ඉඳන් සිහිනයක් වෙලා තිබුණු තමන්ගේ ඉඩමේ උරුමය ලබා දීමේ වැඩ කටයුත්ත මේ වෙනකොට ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ඔබතුමන්ලා දන්නවා, රටේ සියලු ව්‍යාපෘති නතර වුණ බව. අපේ කිරිඇල්ල මැතිතුමාත් ගරු සභාවේ ඉන්නවා. එතුමා මහනුවර අධිවේගී මාර්ගය පිළිබඳව උනන්දුවක් දක්වපු කෙනෙක්. මේ රටේ කරගෙන ආ සියලු මහාමාර්ග ව්‍යාපෘති එක තැන නතර වුණා, පසුගිය කාලයේ. දැන් ඒ සියල්ලම ආරම්භ වෙලා නැහැ. නමුත් ගම්මාන තුළ මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘති සහ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති ක්‍රම ක්‍රමයෙන් ආරම්භ කරලා දැන් යම් වැඩ ප්‍රමාණයක් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

විශේෂයෙන්ම රජයේ සේවය ගත්තොත්, මෙතෙක් කල් ස්ථිර පත්වීමක් නොමැතිව රටට සේවය කළ ශ්‍රී ලංගම සේවකයින් 26,500ක් පසුගිය දිනවල ස්ථිර සේවකයින් බවට පත් කරලා තිබෙනවා. උතුරු, නැගෙනහිර ප්‍රදේශවල දෛනිකව රුපියල් 50ට, 60ට, නැත්නම් රුපියල් 1,000ක පඩියට වැඩ කරපු සේවකයෝ, ඒ විතරක් නොවෙයි පළාත් පාලන ආයතනවල සේවකයෝ ලක්ෂ ගණනකට හෙට අනිද්දා වෙනකොට ස්ථිර පත්වීම් ලබා දීමට නියමිතව තිබෙනවා. ඊළඟට, අපේ මධ්‍යම පළාතේ ගුරුවරු විශාල පිරිසකට පත්වීම් ලබා දෙනවා. ඒ වාගේම රටේ සෑම පළාතකම සිටින ගුරුවරුන්ට එම පත්වීම් ලබා දෙනවා.

ඒ වාගේම ග්‍රාම නිලධාරීන් නොමැතිකම නිසා එක් අයෙක් වසම් තුන හතරක් ගැන බැලුවා. එම නිසා පසුගිය කාලයේ ග්‍රාම නිලධාරීන්ගේ පත්වීම් ලබා දුන්නා. රජයේ ආයතනවලට නැවත සේවකයින් බඳවා ගැනීම සඳහා මේ වෙනකොට පුවත් පත්වල දැන්වීම් පළවෙමින් තිබෙනවා අපි දකිනවා. අඩුම තරමින් අපට security guard කෙනෙක්වත් ගන්න බැරි වන විධියට පසුගිය කාලයේ මුදල් අමාත්‍යාංශය හරහා නීති රීති වැටිලා තිබුණා. හැබැයි, දැන් ඒවා එකින් එක ලිහිල් වෙන්නේ ආර්ථිකයේ යම් කිසි වර්ධනයක් තිබෙන නිසා කියන කාරණය අපි මතක් කරන්නට අවශ්‍යයි.

මම මීට වඩා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ රජයෙන් සහ ජනාධිපතිවරයාගෙන් යමක් වෙන්නේ නැහැයි කියලා විපක්ෂය කොපමණ චෝදනා කරන්න හැදුවත්, මම එක කාරණයක් කියන්න ඕනෑ. හරියටම මීට වසර දෙකකට කලින් මේ රට භාර ගන්න කියලා මේ සියලුදෙනාටම ආරාධනයක් තිබුණා. කිසි කෙනෙක් ඒ ආරාධනය භාර ගත්තේ නැහැ. ඒ ආරාධනය භාර ගත්තේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා විතරයි. එතුමා ආරාධනය භාර ගත්තා විතරක් නොවෙයි, වසර දෙකක් ගතවෙන කොට IMF programme එකට ඇතුළත් වෙලා, ඒ වාගේම ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහනට ඇතුළත් වෙලා, මම සඳහන් කරපු සියලුම කරුණු කාරණා අද දිනය වෙනකොට ක්‍රියාත්මක කරලා තිබෙනවා. විශේෂයෙන්ම කැසිනෝ ව්‍යාපාරය ඇතුළු විශාලම ආයෝජන ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කරලා, වරාය නගරයේ තීරු බදු රහිත මෙහෙයුම් ආරම්භ කිරීමට සහ ජනාධිපතිතුමාගේ ඉදිරි කටයුතු කරගෙන යෑම සඳහා යම් අතිරේක මුදලක් වෙන් කිරීම පිළිබඳවත් අපි සාකච්ඡා කරනවා. එතකොට,-

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මට කථාවක් කරන්නත් කාලය වෙන්වෙලා තිබුණා. නමුත් මම අද පාර්ලිමේන්තුවට එන්න ටිකක් ප්‍රමාද වුණා. එම නිසා මම මේ අවස්ථාවේ ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, මේ විධියට ආරම්භ කරන කැසිනෝ දේශීය වශයෙන් තිබෙන කැසිනෝවද, නැත්නම් විදේශීය සමාගම් අලුතින් ගෙන්වනවාද කියලා.

ගරු දිලුම් අමුණුගම මහතා
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)

ගරු ස්වාමීන් වහන්ස, ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමා අද උදේ වරුවේ ඒ පිළිබඳව පැහැදිලි කළා. නමුත් ඔබවහන්සේ සභාවේ වැඩසිටියේ නැහැ. අලුතින් ආරම්භ කරන කැසිනෝශාලා බහුතරයක් විදේශීය සමාගම් සතු ඒවා. ජෝන් කීල්ස් එක ගත්තොත්, ඕස්ට්‍රේලියානු සමාගමක් තමයි ඒක විවෘත කරන්නේ. ඔය කියන මුදල ගෙවන්න පුළුවන් දේශීය ආයතන එකක් දෙකක් තිබෙන්නට පුළුවන්, නමුත් ගොඩක් නැහැ. බලපත්‍රය අලුත් කිරීමේදී දැනට කැසිනෝ ව්‍යාපාරයේ සිටින අයගෙන් අය කරන බදු මුදලත් වැඩි කර තිබෙනවා. ඒ වාගේම අලුතින් එන අය ඉන්නවා නම්, ඒ අයගෙන් රුපියල් බිලියන 10ක මුදලක් අය කරලා තමයි එම බලපත්‍රය ලබා දෙන්නේ. ඒක දේශීයද, විදේශීයද කියලා නැහැ, දේශීය සමාගමක් වුවත් එම ගණන ගෙවලා අලුත් එකක් ආරම්භ කිරීමේ හැකියාව තිබෙනවා. හැබැයි, ඔය කියන මුදලට යටත්ව පැමිණෙන ආයෝජන බොහෝමයක් විදේශීය සමාගම්.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙම සියලුම කැසිනෝශාලා විදේශීය කැසිනෝ සමාගම් සතු ඒවා කියලා තමයි අපට දැන ගන්නට ලැබී තිබෙන්නේ. ඒ වාගේම ඔබතුමා දන්නවා ඇති, දකුණු මෙක්සිකෝව ගත්තොත්, මේ වාගේ කැසිනෝ ව්‍යාපාරවලින් ඒ

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

රට තුළ මාෆියා කල්ලි බිහිවෙලා, ඔවුන්ගේ ආර්ථිකය බිඳ වැටිලා, ඒ රටේ කැසිනෝ ජාවාරම අද වෙනකල් සුවපත් කරන්න බැරි ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මගේ කථාව කරන්න බැරි වුණු නිසා මට විනාඩියක කාලයක් දෙන්න. මේ අවස්ථාවේ මම ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේක ඔබතුමාට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. මේක පොල් සම්බන්ධ කාරණයක්. ඇත්ත වශයෙන්ම පොල් සංවර්ධන පනත යටතේ අද ගෙනාපු යෝජනා සම්මතය ගැන මගේ ප්‍රසාදය මම මුලින්ම පළ කරනවා. ඒ විෂය භාර ඇමතිතුමා අද මෙතැන ඉන්නවා. අද අපි පොල් කිනිත්තකින් ගන්නේ පොල් ගෙඩි දෙකයි, තුනයි. අපි නිවැරදිව ප්‍රතිකර්ම ටික කරනවා නම් ඒ ප්‍රමාණය පොල් ගෙඩි 10කට පරිවර්තනය කරන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් ගත් ස්ථාවරයට අපි අපේ ප්‍රශංසාව පිරිනමනවා. නමුත් ගරු දිලුම් අමුණුගම රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ ස්ථාවරය සම්බන්ධයෙන් නම් අපට එකඟ වෙන්නට බැහැ. විශේෂයෙන්ම තීරු බදු රහිතව මේ බලපත්‍ර දීම දේශීය ආර්ථිකයට කොයි තරම් බලපෑමක් කරාවිද? සාමාන්‍යයෙන් විදේශවල ඉඳලා එන ආයෝජකයින්ට නේ මේ සඳහා වන බලපත්‍රය ගන්න පුළුවන්. හැබැයි, මේක රට ඇතුළේ කොයි විධියට ක්‍රියාත්මක වෙයිද කියන කාරණය ගත්තොත්, අද තිබෙන ආර්ථික අර්බුදයත් එක්ක අපට වාසි සහගත තත්ත්වයක් අත් වෙන්නේ නැහැයි කියන එක තමයි අපේ ස්ථාවරය, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු දිලුම් අමුණුගම මහතා
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන විධියට අපේ ස්වාමීන් වහන්සේ වැඩ නොසිටි නිසා, මම කියපු කාරණය ඇහුණේ නැතුව ඇති. අපේ හාමුදුරුවනේ, ඒ duty-free එකෙන් ආර්ථිකයට කිසිම බලපෑමක් වෙන්නේ නැහැ. කිහිප වරක් විදේශගත වෙලා පැමිණියත් අවුරුද්දකට එක්වරයි ඇතුළත් වෙන්න පුළුවන්. ඒ වාගේම, අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් 2,000ක සීමාවක් පනවා තිබෙනවා. පැමිණිලා දවස් හතරක් ඇතුළත ඒක පාවිච්චි කළේ නැත්නම්, ඒක අවලංගු වෙනවා. මේ downtown duty-free කියන සංකල්පය ලෝකයේ ඕනෑම රටක තිබෙනවා. ඒකෙන් මිලදී ගන්නා භාණ්ඩ එතැනින් එළියට අරගෙන එන්න බැහැ. අපි කටුනායක ඒ අයට ස්ථානයක් ලබා දීලා තිබෙනවා. භාණ්ඩ මිලදී අරගෙන ඒ අය සතු එම භාණ්ඩ එම ස්ථානයේ තැබිය යුතුයි. විදේශිකයෙකු ආපහු පිටරට යනකොට, කටුනායකදී තමයි ඒ බඩු භාර ගන්න පුළුවන් වෙන්නේ. එතැනින් අරගෙන තමයි ඒ අය විදේශගත වෙන්නේ. ඒ නිසා දේශීය වෙළෙඳ පොළට ඒවා ඇතුළත්වීමේ හිඩැස් සියල්ල අපි අහුරා තිබෙනවා කියන කාරණය මතක් කරන්න ඕනෑ.

කැසිනෝ සම්බන්ධ කාරණයේ දී ඔබවහන්සේ කිව්වා වාගේ මෙක්සිකෝවේ එහෙම වුණා වෙන්න පුළුවන්. නමුත්, ඔය කියන විධියේ කැසිනෝ ශාලා විශාල ප්‍රමාණයක් දමන්න, ලංකාවේ කැසිනෝ ව්‍යාපාරයේ යෙදෙන අයට බිස්නස් තිබෙන්නේ නැහැ. ජොන් කීල්ස් සමාගම බැලුවොත්, ඕස්ට්‍රේලියාවේ මෙල්කෝ කියන කැසිනෝ සමාගම තමයි මහා පරිමාණයේ ආයෝජන සමඟ එතැනට එන්නේ. අපේ හාමුදුරුවනේ, එහි ආයෝජනය ඇමෙරිකානු ඩොලර් බිලියනයක්.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ඇමෙරිකානු ඩොලර් බිලියනයක් දීලා කොච්චර අරගෙන යනවාද?

ගරු දිලුම් අමුණුගම මහතා
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)

අපේ හාමුදුරුවනේ, ඒකට අවශ්‍ය ප්‍රමාණයට බදු ගන්නවා නේ. ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමා ඉස්සෙල්ලාත් මේ ගැන කිව්වා. මෙච්චර කාලයක් අරගෙන ගියා, ඒකට කිසිම පාලනයක් තිබුණේ නැහැ. නමුත්, මේකෙන් රුපියල් ලක්ෂ පහක් දිනුවොත්, ඒ ලක්ෂ පහේ දිනුමටත් අපි බදු අය කරනවා. ඒ විධියට බදු අය කර ගෙන තමයි ඒක අරගෙන යන්න දෙන්නේ. ඒ නිසා හැම දෙයකින්ම වාසියක් සහ අවාසියක් තිබෙනවා. නමුත්, රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා අපට මේවා කරන්න වෙනවා කියන කාරණය මතක් කරන්න වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කථාව අවසාන කරන්න පෙර කියන්න ඕනෑ, මේ රජයේ සීමාව තුළ, නැත්නම් ජනාධිපතිතුමාගේ සීමාව තුළ රටට වැදගත් වෙන පනත් කිහිපයක් සම්මත කරන්න හැකියාව ලැබුණු බව. ඒ අතරින් විශේෂයි ශ්‍රී ලංකා විදුලිබල පනත. ගරු කංචන විජේසේකර ඇමතිතුමා මේ ගරු සභාවේ හිටියා. කවදාවත් හදන්න බැරිව තිබුණු ආයතනයක් තමයි, ලංකා විදුලිබල මණ්ඩලය. අද ශ්‍රී ලංකා විදුලිබල පනත ගෙනැල්ලා ඒ ආයතනය හදලා තිබෙනවා.

අද වෙනකොට ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතට - Economic Transformation Bill - විරුද්ධව අධිකරණයේ නඩු 20ක් දාලා තිබෙනවා. ඒකේ ප්‍රධානම අරමුණ වන්නේ ආනයන ආර්ථිකය, අපනයන ආර්ථිකයක් බවට පත් කිරීමයි. ඒකේ රටට ගන්න පුළුවන් උපරිම ණය සීමාවක් තිබෙනවා. රටට අවශ්‍ය දේවල් තමයි ඒ පනත් කෙටුම්පතේ තිබෙන්නේ. ඒ නිසා විපක්ෂය කොයි විධියට චෝදනා කළත්, වසර දෙකක් ඇතුළත මේ ප්‍රධාන පනත් කෙටුම්පත් ටික තමයි හදුන්වා දුන්නේ. අපි මේවා කියන්නේ නැහැ. අපි මාධ්‍යයට ගිහිල්ලා කියන්නේත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දවස්වල මාධ්‍යයට කියලා වැඩක් නැහැ. මොකද, මාධ්‍ය නොයෙකුත් න්‍යාය පත්‍රවලට වැඩ කරන්නේ. මාධ්‍ය ආයතනයේ අයිතිකරුවන්ට ඕනෑ විධියට තමයි, ඒවා ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා ජනතාවට දැනුවත්වීම සඳහා තමයි අපි මේ ගැන පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශ කරන්නේ. සමස්තයක් හැටියට ගත්තාම, මේ අවුරුදු දෙක තුළ රටේ ආර්ථිකය නඟා සිටුවීම සඳහා රජය, ජනාධිපතිතුමා, ඒ වාගේම මුදල් අමාත්‍යාංශය සහ මහ බැංකුවේ නිලධාරි කණ්ඩායම් පුළුවන් ආකාරයට කටයුතු කරලා තිබෙනවා කියන කාරණය මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත: නියමය
சீட்டாட்டத் தொழில் (ஒழுங்குபடுத்தல்) சட்டம்: ஒழுங்குவிதி
CASINO BUSINESS (REGULATION) ACT: ORDER

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 4 වගන්තිය යටතේ කැසිනෝ ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 පෙබරවාරි 02 දිනැති අංක 2369/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.02 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත: නියෝගය
சீட்டாட்டத் தொழில் (ஒழுங்குபடுத்தல்) சட்டம்: ஒழுங்குவிதி
CASINO BUSINESS (REGULATION) ACT: REGULATION

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 4 වගන්තිය යටතේ කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර නියෝග සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 අප්‍රේල් 22 දිනැති අංක 2381/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.18 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත: නියෝග
கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழுச் சட்டம்: ஒழுங்குவிதிகள்
COLOMBO PORT CITY ECONOMIC COMMISSION ACT: REGULATIONS

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 අප්‍රේල් 22 දිනැති අංක 2381/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පරිපූරක මුදල: අත්හිටවූ සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් නිම කිරීම
குறைநிரப்புத் தொகை: இடைநிறுத்தப்பட்ட அபிவிருத்தித் திட்டங்களை விரைவாக முடித்தல்
SUPPLEMENTARY SUM: EXPEDITIOUS COMPLETION OF HALTED DEVELOPMENT PROGRAMMES

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2024 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන අටදහස් හත්සිය පනහක් (රු. 8,750,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළයුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය		
ශීර්ෂය 001	-	අතිගරු ජනාධිපති
වැඩසටහන 02	-	සංවර්ධන වැඩසටහන
මූලධන වියදම්		රු. 8,750,000,000
මුළු වියදම		**රු. 8,750,000,000**

වැය ශීර්ෂ 001හි, වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහනෙහි, ව්‍යාපෘති අංක 06 - "ජාතික ප්‍රමුඛතාවයන් සඳහා ජාතික මට්ටමේ මහපෙන්වීම සහ සම්බන්ධීකරණය" ව්‍යාපෘතිය යටතේ වන අංක 024, 025, 026, 027, 028 සහ 032 උප ව්‍යාපෘතීන්හි උපයෝජනය නොවෙයැයි අපේක්ෂිත ප්‍රතිපාදන, අංක 003 උප ව්‍යාපෘතිය වෙත මාරු කිරීමෙන්, මෙම රුපියල් මිලියන අටදහස් හත්සිය පනහක (රු.8,750,000,000) ප්‍රතිපාදන සලසනු ලැබේ.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විෂය අංක 05 සභාව එකඟද?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඡන්දයක් ඉල්ලන්නේ නැහැ. අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විරෝධතාව සටහන් කර ගන්නවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පොල් සංවර්ධන පනත: යෝජනා සම්මතය
தெங்கு அபிவிருத்திச் சட்டம்: தீர்மானம்
COCONUT DEVELOPMENT ACT: RESOLUTION

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මෙහි උප ලේඛනයේ දැක්වෙන සංයෝජන වර්ගීකරණ සංකේත 1404-90-93 දරන HS කේතයෙන් අපනයනය කරනු ලබන I වැනි තීරුවෙහි සඳහන් සම්පීඩනය නොකරන ලද හා සම්පීඩනය කරන ලද කොහුබත් වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවෙහි දැක්වෙන ප්‍රමාණය මත සෙස් බද්දක් අයකළ යුතු බවට, පැනවිය යුතු බවට සහ ගෙවිය යුතු බවට 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 33වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

උපලේඛනය

	I වැනි තීරුව	*II වැනි තීරුව*
ශීර්ෂ අංකය	සංයෝජිත වර්ගීකරණ සංකේතය (HS කේතය)	පොල් නිෂ්පාදනය
1404-90-93	සකසන ලද කොහු බත්(සම්පීඩිත හෝ සම්පීඩිත නොවන)	සෙස් බදු ප්‍රමාණය කිලෝග්‍රෑමයට ශත 10

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න.

කල්තැබීමේ ප්‍රශ්න
ஒத்திவைப்பு வினாக்கள்
ADJOURNMENT QUESTIONS

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය මා යොමු කරන්නේ ගරු ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙතටයි.

(අ) i. 2019 වර්ෂයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයින් පිරිසකගේ තනතුරු උසස් කිරීම සඳහා පත්වීම් ලබා දී ඇති බවත්, එම උසස්වීම් නිසි පරිදි ක්‍රියාත්මක කර බලාත්මක නොකිරීම හේතුවෙන් ඔවුන් විසින් අභියාචනාධිකරණයේ නඩුවක් පවරා ඇති බවත් එතුමා දන්නේද?

ii. එසේ නම්, 2019 වර්ෂයේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ උසස්වීම් ලබා දුන් සේවක පිරිස සිටියදී වෙනත් පිරිසකට උසස්වීම් ලබා දීමට කටයුතු කළේ කුමන පදනමක් මතද?

iii. එසේ පත්වීම් ලබා දීමෙන් 2019 උසස්වීම් ලබා දුන් පිරිසට සිදු වී ඇති අසාධාරණයට ලබා දෙන විසඳුම් මොනවාද යන්න පිළිබඳවත් ඔබතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු අමාත්‍යතුමාගෙන් දැනගන්න බලාපොරොත්තු වන කාරණා කිහිපයක් තිබෙනවා. 2019 වසරේ පත්වීම්, උසස්වීම් ලැබුණු අය මාස 10ක කාලයක් අදාළ තනතුරුවල වරප්‍රසාද භුක්ති විඳිමින් සිටියා. මම ඒ පත්වීම් ලිපියක් Annexe 1 හැටියට **සභාගත*** කරනවා.

2020 මහ මැතිවරණයෙන් පසුව ලංකා ගමනාගමන මණ්ඩලය චක්‍රලේඛයක් නිකුත් කර 2019 දී උසස්වීම් ලැබූ අයව එම තනතුරුවලින් නීති විරෝධීව ඉවත් කර තිබෙනවා. සාමාන්‍යයෙන් පත් කිරීමේ ලිපිය නිකුත් කරන්නේ ප්‍රධාන මානව සම්පත් කළමනාකරු. හැබැයි, ඉවත් කිරීමේ ලිපිය නිකුත් කරලා තිබුණේ සභාපතිවරයා. ඒ අනුව 2019 දී උසස්වීම් ලබා දුන් අය ඉවත් කර තිබෙන්නේ නීති විරෝධී ලෙසයි. ඒ අය ඉවත් කරලා ඉන් පසුව 2020 දී සම්පූර්ණ දේශපාලනීකරණයක් කරමින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සාමාජිකයන්ට සහ ගෝලබාලයන්ට එම තනතුරු සහ උසස්වීම් ලබා දීලා, ඔවුන්ව ස්ථාපනය කරන්න කටයුතු කරලා තිබෙනවා. 2024දී නිකුත් කළ එම ලිපිය මම Annexe 2 ලෙස **සභාගත*** කරන්න කැමැතියි.

මේ ඉවත් කළ සේවකයින් ඒ සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ නඩුවක් දාලා තිබියදී අමාත්‍යවරයා තවදුරටත් කොටසකට උසස්වීම් දීලා, එම තනතුරුවලට

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කළමනාකරණ සේවා අනුමැතිය ගන්න උත්සාහ කිරීම නීති විරෝධී බවත්, අධිකරණයට අපහාස කිරීමක් හැටියටත් සැලකිය හැකියි කියලා අපි හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කළමනාකරණ සේවා අධ්‍යක්ෂතුමා ඇතුළු නිලධාරීන් මෙම නීති විරෝධී ක්‍රියාවට පාර්ශ්ව වුණා නම්, නැත්නම් හරිහැටි කරුණු නොසලකා තීන්දු තීරණවලට එළැඹ තිබුණා නම් ඔවුනුත් නීති විරෝධී ලෙස කටයුතු කර ඇති බවත්, අභියාචනාධිකරණයට අපහාස කිරීමක් කළ බවත් සැලකිය හැකියි. ඒ අනුව ගරු අමාත්‍යවරයාගෙන් මම පැහැදිලි උත්තරයක් බලාපොරොත්තු වෙනවා.

ගරු අමාත්‍යවරයා දැන් තමයි සභාවට ආවේ. එතුමා ප්‍රශ්නය අහගෙන ඉඳලා ඇති, කියවලා ඇති. අපට පැහැදිලි උත්තරයක් ඕනෑ. 2019 දී ඒ තනතුරුවලට උසස්වීම් දීපු අයව ඉවත් කළේ කෙසේද? ඒක වැරදියි. ඒ අය ඉවත් කිරීම සම්බන්ධව අභියාචනාධිකරණයේ නඩුවක් තිබියදී තව කණ්ඩායමක් එම තනතුරුවල ස්ථාපනය කිරීම තවදුරටත් නීති විරෝධී ලෙස කටයුතු කිරීමක් බවයි අපේ හැඟීම. ඒ ගැන පැහැදිලි උත්තරයක් බලාපොරොත්තු වෙනවා, ගරු ඇමතිතුමනි. ඒ වාගේම ඒවා නිවැරදි කරන්න කටයුතු කරනවාද කියලාත් මම දැනගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)

(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ උගත් මිත්‍ර කබීර් හෂීම් මන්ත්‍රීතුමා වැදගත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා තිබෙනවා. එතුමා අසා තිබෙන ප්‍රශ්නයට පිළිතුර මෙයයි.

2018.10.01 දිනෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව, නියමිත උසස්වීම් පටිපාටිවලින් තොරව පිරිසකට උසස්වීම ලබා දීම සම්බන්ධයෙන් අගතියකට පත් වුණු පාර්ශ්ව අධිකරණයට ගොස් තිබෙන බව දන්නවා. ඊට පෙර ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝගයක් දීලා තිබෙනවා කළමනාකරණ සේවා අනුමැතියකින් තොරව උසස්වීම් ලබා නොදිය යුතුයි කියලා. එසේ නිබිදී, උසස්වීම් ලබා දුන්නා කියලා අගතියට පත් වුණු අය නඩුවක් ගොනු කරලා තිබෙනවා. ඒ නඩුව තිබෙන බව දන්නවා. පටන් ගත්ත දවසේ ඉඳලා සේවා ව්‍යවස්ථාවක් නැතිව ගිය පුදුම ආයතනයක් තමයි ලංකා ගමනාගමන මණ්ඩලය. පුදුමයි, ඒත් ඇත්තයි.

හැමදාම වෙලා තිබෙන්නේ ඒ විධියටයි. අපි කවුරුත් දන්නවා, මැතිවරණයක් නිම වුණාම SLTB ඩිපෝ තුළ දිනපු පාර්ශ්වය විසින් පැරදිච්ච පාර්ශ්වයේ අය එළවන බව. ඉන් පසු දේශපාලන බලය මත ඒ ඒ තනතුරුවලට කවුරු හෝ පත් වෙනවා. ඒවා මතක තියාගෙන හිටපු අය ඔවුන් පරාජය වෙලා වෙන පාර්ශ්වයක් බලයට පත් වුණාමත් අර පිරිස එළවනවා. එළවලා ඔවුන් ඒ තනතුරුවලට පත් වෙනවා. හැබැයි, ඒ තනතුරුවලට තිබෙන සුදුසුකම්, ඒවායේ ශ්‍රේණි, වැටුප්, උසස්වීම් පිළිබඳව කිසිම ක්‍රමවේදයක් නැහැ. මම මේ වගකීම භාර ගත්තාට පස්සේ වෘත්තීය සමිති විසින් මා සමඟ දිගින් දිගටම මේ ගැන සාකච්ඡා කළා. ඉන්න සේවකයන්ට වැඩ කරගෙන යන්න විධියක් නැහැ, තනතුරුවලට සුදුසු අය නැහැ, සුදුසු අය බඳවා ගන්න ක්‍රමවේදයක් නැහැ, ඉතාම පහළ වැටුප් මට්ටම් යටතේ තමයි ඔවුන් කටයුතු කරන්නේත්. හැබැයි, මම එක දෙයකට ගරු කරනවා. මොනම හේතුවක් තිබුණත්, ඔවුන් මේ පිළිබඳව දිගටම සාකච්ඡා කළත්, කවදාවත් වර්ජනය කළේ නැහැ. එහෙම වර්ජනය කළා නම්, උදේ පාන්දර නැඟිටලා ඩිපෝවෙන් බස් එක අරගෙන ගිහිල්ලා ඇත එපිට ගම්මානවලින් පාසල් යන දරුවන් ගෙනාවේ නැත්නම්, ඒ දරුවන්ට පාසල් යන්න විධියක් නැති වෙනවා. රැකියාවලට යන අයට, ජීවනෝපාය සලසාගන්න අයට එහෙම නම් ඒ ඒ තැන්වලට යන්න විධියක් නැති වෙනවා.

ලංගම සේවකයන්ගේ මේ ප්‍රශ්නය දීර්ඝ කාලයක් තිස්සේ කැකෑරෙමින් තිබුණා. මේ ප්‍රශ්නයට කිසිම ආකාරයකින් විසඳුමක් ලැබුණේ නැති නිසාත්, අධිකරණ තීන්දුව ලැබෙන තෙක් ඔවුන්ට කටයුතු කළ නොහැකි නිසාත් ඔවුන් විසින් දිගින් දිගටම මේ සම්බන්ධව මට විශාල පීඩනයක් එල්ල කළා. හැබැයි, වැඩ වර්ජනය නොකර. ඉතින් මම මානුෂික වශයෙන් කල්පනා කරලා, කැබිනට් ප්‍රතිකාවක් ඉදිරිපත් කරලා ලංකා ගමනාගමන මණ්ඩලය තුළ ඇති වෙලා තිබෙන මේ අභිතකර තත්ත්වය නැති කරන්න සේවා ව්‍යවස්ථාවක් හැදුවා. එම සේවා ව්‍යවස්ථාව සඳහා විශාල කාල පමාවන් තිබිලා ඒවා පිළිබඳ අරගළ පවා කළා. මම ඔබතුමාට දැනුම් දෙන්න කැමැතියි, මේ සම්බන්ධව committee එකකුත් establish කරලා තිබෙන බව. ඒ, රජයේ ආයතනවල කටයුතු පිළිබඳ කාරක සභාවක්. ඒ කාරක සභාව රැස්වෙන්නේ, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙනුයි. මම ඒකේ සාමාජිකයෙක්. මෙතැන ඉන්න රාජ්‍ය නිලධාරීන් ඔක්කෝම එතැනට ආවත්, අපි අනෙක් රාජ්‍ය සේවකයන්ගේ ප්‍රශ්න, ඒ රාජ්‍ය ආයතනවලදීම විසඳුවත්, දවස ගානේ ගොඩ නැඟිලා මට තෙරපුම දෙන මේ ප්‍රශ්නයට නිසි විසඳුමක් දෙන තාක්කල් මම ඒ කමිටුවට එන්නේ නැහැයි කියලා තීරණය කරලා මම ඒ කමිටුවට සහභාගි වීමත් වර්ජනය කළා. ඒක හොඳ පිළිවෙතක් නොවෙයි. නමුත්, ඒ තරම් විශාල පීඩනයක් මේ ලංගම සේවකයන් තුළ තිබුණා. කැබිනට් පත්‍රිකා හා අනෙක් ඒවාට අතිරේකව මේ වාගේ ගැටලු විසඳීම සඳහා අපේ රජය යටතේ -ජනාධිපතිතුමාගේ විශේෂ මහ පෙන්වීම් හා නීත්‍යානුකූල වැඩ පිළිවෙළක් යටතේ- අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් විශේෂ කමිටු පවා පත්කර තිබෙනවා. ඒ කමිටුවටත් මේ ප්‍රශ්නය යොමු කරලා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරලා කිසිදු උසස්වීමක් නොදී, ඉන්න අයට ඒ තනතුරු දෙන තෙක් සේවා ව්‍යවස්ථාවක් හදලා අන්තර්ග්‍රහණය කිරීමක් පමණක් කරලා තිබෙනවා. ඒ නිසා කිසිදු උසස්වීමක් දීලා නැහැ. එලෙස අන්තර්ග්‍රහණය කරලාත් අවුරුදු 66ක් වෙනවා. ඉතිහාසයේ ප්‍රථම වතාවට ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන්ට සේවා ව්‍යවස්ථාවක් ඇති කරලා, ඒ අනුව තනතුරු ඇති කරලා, ඒ තනතුරුවලට සුදුසුකම් ඇති කරලා උසස්වීම් ක්‍රමවේදය සකස් කිරීමේ ජාතික වගකීමක් හා යුතුකමක් මම ඉෂ්ට කරලා තිබෙනවා. මින් පසුව කවර රජයක් දිනුවත්, කවුරු ආණ්ඩුව ගත්තත්, SLTB එකේ ඉන්න අයට ගහලා එළවලා කාටවත් පත්වීම් ගන්න බැහැ. පත්වීමක් ලබන්න, උසස්වීමක් ලබන්න තිබෙන්න ඕනෑ සුදුසුකම් අපි දැන් හරියටම සකස් කරලා තිබෙනවා. ඒකට සියලුදෙනා එකඟ වෙලා තිබෙනවා; කිහිප දෙනෙක් හැර අනෙක් සියලුම වෘත්තීය සමිති එකඟ වෙලා තිබෙනවා. ඒ අය කිව්වා, ලංගමයේ ස්වර්ණමය යුගය කියලා දැනට සඳහන් වෙලා තිබෙන්නේ අනිල් මුණසිංහ යුගය වුණත්, දැන් ස්වර්ණමය යුගය වෙන්නේ අනිල් මුණසිංහ යුගය නොවෙයි, බන්දුල ගුණවර්ධන අනුගමනය කරපු මේ ක්‍රියාවෙන් පසුව බිහිවන යුගයයි කියලා.

මම දන්නේ නැහැ, මම නොවෙයි ඒ අයයි ඒක කිව්වේ. මම ඒ සඳහා මහන්සි වෙලා තිබෙනවා. මගේ උගත් මිත්‍රයා සඳහන් කළ පරිදි, 2019දී කාට හරි අසාධාරණයක් වෙලා තිබෙනවා නම්, අපි මේ අරගෙන තිබෙන ක්‍රියාවලිය වැරැදියි නම් ඒ ඕනෑම කෙනෙකුට පුළුවන්, අධිකරණයට යන්න. නමුත්, අපි කිසිම වැරැද්දක් කරලා නැහැ. කිසිම උසස්වීමක් දීලා නැහැ.

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා අනෙකුත් කමිටුවල නිර්දේශ හරියටම නීත්‍යානුකූලව ක්‍රියා කරලා ඒ අනුව අන්තර්ගතය කිරීමක් පමණයි කරලා තිබෙන්නේ. අගතියට පත් වෙච්ච තවත් පාර්ශ්ව ඉන්නවා නම්, ඒ පිළිබඳවත් අර විධියටම සාකච්ඡා කරලා ඒකට විසඳුම් දෙන්න පුළුවන්. මහජන නියෝජිතයන් ලෙස අපි හැම දෙනාම මේ ඇති වෙච්ච වෙනසට කැමැති වෙන්න ඕනෑ. මොකද අපි කවුරු ජයග්‍රහණය කළත්, කවුරු පරාජය වුණත් තනතුරුවලට කිසිදු ක්‍රමවේදයක් නැතුව මාරු වෙන්නේ නැතුව පළමුවැනි වතාවට සේවා ව්‍යවස්ථාවක් ඇති කිරීමේ කාර්යභාරය අපි ඉෂ්ට කරලා තිබෙනවා. ඒ අනුව අපි ඉදිරියට කටයුතු කරමු. කාට හරි අගතියක් වෙලා තිබෙනවා නම් ඔබතුමා එය ඉදිරිපත් කරන්න. ඒ පිළිබඳව සෑහීමකට පත් වෙන්නේ නැත්නම් ඕනෑම කෙනෙකුට අධිකරණයට යන්න අයිතිය තිබෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවන ප්‍රශ්නය, ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මන්ත්‍රීතුමා.

[பி.ப. 5.11]

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சபை ஒத்திவைப்பு நேரத்தின் போதான வினாவைக் கேட்பதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு முதற்கண் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அந்த வினாவைக் கேட்பதற்கு முன்னர், இதன் பின்னணியைச் சொல்வது பொருத்தமென்று நினைக் கின்றன்.

இன்று பிரதேச செயலகம் மற்றும் மாவட்டச் செயலகங் களில் ADPயினரின் பற்றாக்குறை கணிசமாக நிலவுகின்றது. இதனால் இன்று பல்வேறு பிரதேச செயலகங்களில் பதில் ADPயினர் பணிபுரிகின்ற ஒரு சூழல் காணப்படுகின்றது. இந்நிலையில், இதற்கு ஒரு மாற்றுத் தீர்வு கிடைக்கும் என்ற அடிப்படையில்தான் நான் இந்த வினாவைக் கேட்கின்றேன்.

2005ஆம் ஆண்டு பட்டதாரிகள் நிகழ்ச்சித்திட்டத்தின்கீழ் அபிவிருத்தி உதவியாளர்களாக - Development Assistants - நியமிக்கப்பட்டு, பிரதேச மற்றும் மாவட்ட செயலகத் திட்டமிடல் பிரிவுகளில் - Planning Divisions - கடமை யாற்றும் அபிவிருத்தி உத்தியோகத்தர்களைப் பதவிநிலை உத்தியோகத்தர்களாகத் தரமுயர்த்த வேண்டும் என்பதற்கான பின்வரும் நியாயப்படுத்தல்களை முதலில் நான் முன் வைக்கலாமென நினைக்கின்றேன்.

1. மேற்படி பட்டதாரி ஆட்சேர்ப்பு நிகழ்ச்சித் திட்டத்தின் கீழ் நியமனம் பெற்ற அபிவிருத்தி உதவியாளர்களை ஆட்சேர்ப்புச் செய்வதற்கான நியமனக் கடிதத்தில் நியமன அதிகாரியாக அமைச்சின் செயலாளர் ஒப்ப மிட்டிருந்தமை பதவிநிலை உத்தியோகத்தர்களை நியமிப்பதற்கான ஓர் அடிப்படையாக அமைந்திருக் கின்றது.

2. 1999இல் இவ்வாறு நியமிக்கப்பட்ட அபிவிருத்தி உதவியாளர்கள், நியமனத் திகதியிலிருந்து 06 மாதங்களின் பின்னர் செயற்றிட்ட அமுலாக்கல் உத்தியோகத்தர்களாகத் தரமுயர்த்தப்பட்டு, பின்னர் பிரதேச செயலகங்களில் நிலவும் உதவித் திட்டமிடல் உத்தியோகத்தர்களுக்கான வெற்றிடங்களைக் கருத்திற் கொண்டு மிகை ஆளணி ஆட்சேர்ப்பு நிகழ்ச்சித் திட்டத்தின் கீழ் உதவித் திட்டமிடல் பணிப்பாளர்களாக நியமிக்கப்பட்டுள்ளமையானது, அதே அடிப்படையில் ஆட்சேர்ப்புச் செய்யப்பட்ட 2005 அபிவிருத்தி உதவியாளர்களையும் உள்வாங்க முடியும் என்பதற்கான ஓர் எடுத்துக்காட்டாகும்.

3. 2005 பட்டதாரி ஆட்சேர்ப்பு நிகழ்ச்சித்திட்டத்தின் கீழ் ஆட்சேர்க்கப்பட்ட அபிவிருத்தி உதவியாளர் களை ஆட்சேர்ப்பதற்கான கல்வித் தகைமையாக வகுப்புடன் கூடிய - class - விசேட பட்டம் போன்ற தகைமைகள் கோரப்பட்டு, நேர்முகப் பரீட்சையில் அவற்றுக்குப் புள்ளி வழங்கப்பட்டு, அபிவிருத்தி உதவியாளர்களாக நியமிக்கப்பட்டமை பதவிநிலை உத்தியோகத்தர்களின் ஆட்சேர்ப்பு நடைமுறை யாகும்.

4. 2005 பட்டதாரி ஆட்சேர்ப்பு நிகழ்ச்சித்திட்டத்தின் கீழ் ஆட்சேர்க்கப்பட்ட அபிவிருத்தி உதவியாளர் களுக்கான வினைத்திறமைகாண் - EB - தடை தாண்டல் பரீட்சையானது, இதே நிகழ்ச்சித் திட்டத்தின் கீழ் பல்வேறு திணைக்களங்களுக்கும் ஆட்சேர்க்கப்பட்ட உத்தியோகத்தர்களுக்கு நடாத் தப்பட்ட வினைத்திறமைகாண் பரீட்சைக்கு மேலதி கமாக ஆங்கிலப் பாட வினாத்தாள் ஒன்றையும் உள்ளடக்கி நடாத்தப்பட்டமையானது, உதவித் திட்டமிடல் பணிப்பாளர்களின் பரீட்சையை ஒட்டிய ஒரு நடைமுறையாகக் காணப்படுகின்றமை குறிப்பிடத்தக்கதாகும்.

5. மேலும், 2005 பட்டதாரி நிகழ்ச்சித்திட்டத்தின்கீழ் உள்வாங்கப்பட்ட அபிவிருத்தி உதவியாளர்களுக்கான கடமைப்பட்டில் - List of Duties - திட்டமிடல் மற்றும் அபிவிருத்தி சார்ந்து வடிவமைக்கப்பட்டதோடு, கடந்த 19 - 20 வருடங்களாக பிரதேச மற்றும் மாவட்ட செயலகத் திட்டமிடல் பிரிவுகளில் தொடர்ச்சியாக இவர்கள் பணிக்கு அமர்த்தப்பட்டிருக்கிறார்கள்.

6. 2005 பட்டதாரி நிகழ்ச்சித்திட்டத்தின்கீழ் மாகாண சபைகளின்கீழ் உள்வாங்கப்பட்ட நிகழ்ச்சித்திட்ட உதவியாளர்கள், குறித்த திணைக்களங்களில் காணப் படும் பதவிநிலைத் தரங்களுக்கு உள்ளீர்க்கப் பட்டுள்ளனர் என்பதும் குறிப்பிடத்தக்கதாகும்.

மேலும், இந்த நாட்டின் பிரதேச செயலகங்கள் உள்ளிட்ட பல அலுவலகங்களுக்கு 2005ஆம் ஆண்டில் ஆட்சேர்ப்புச் செய்யப்பட்ட அபிவிருத்தி உத்தியோகத்தர்கள் தற்போது அபிவிருத்தித்துறையில் சுமார் 20 வருட காலமாகப் பணியாற்றி வருவதுடன், அவர்கள் தேர்ச்சி பெற்ற, அனுபவமிக்க உத்தியோகத்தர்களாவர். இந்த உத்தியோகத்தர் களின் பதவி உயர்வு தொடர்பான பிரச்சினைகள் நிலவுவதாக அறியக்கூடியதாக உள்ளது. 1999ஆம் ஆண்டில் ஆட்சேர்ப்புச் செய்யப்பட்ட அபிவிருத்தி உத்தியோகத்தர்கள் விசேட எழுத்துமூலப் பரீட்சை ஒன்றின்மூலம் திட்டமிடல் சேவைக்கு இணைப்புச் செய்யப்பட்டுள்ளனர். இந்தப் பின்னணிகளை அடிப்படையாகக் கொண்டு இன்றைய சபை ஒத்திவைப்பின்

පෝතාන විනාවෙ නාන් තොටුක්කින්රේන්. අතන්පටි, පින්වරුම් විනාක්කළුක්කාන පතිලෙ නාන් කෙළරව අමෙච්චර් අවර්කළිටමිරුන්තු එතිර්පාර්ක්කින්රේන්.

1. තිට්ටමිටල් සේවෙයිල් තර්පෝතු එත්තනෙ වෙර්රිටඞ්කළ් නිලවුකින්රන?
2. 2005ආම් ආණ්ටිල් ආට්සේර්ප්පුච් සෙය්යප්පට්ට පට්ටතාරි අපිවිරුත්ති උත්තියෝකත්තර්කළෙ විසේට එළුත්තුමූලප් පරීට්සෙ ඔන්රින්මූලම් තිට්ටමිටල් සේවෙක්කු උළ්ළීර්ප්පුච් සෙය්වතර්කාන නටවටික්කෙ කළෙ එටුක්ක මුටියුමා?
3. ඉන්ත උත්තියෝකත්තර්කළුක්කු 1ආම් තරත්තුක්කු මේල් තොටර්න්තුම් පතවි උයර්වු පෙරුවතර්කාන මුරෙමෙ ඔන්රෙ ඒර්පාටු සෙය්ය මුටියුමා?
4. ඉන්රෙල්, ඒන්?

සුමාර් 20 වරුට අනුපවම් මික්ක, මිකවුම් තිරමෙයාන පල උත්තියෝකත්තර්කළ් මිකවුම් ආර්වත්තෝටු පතවි උයර්වුක් කාකක් කාත්තිරුක්කිරාර්කළ්. ඉන්රු DS Officeඉල් Development Officers - අපිවිරුත්ති උත්තියෝකත්තර්කළ් - ඉරුක්කිරාර්කළ්. 2005ආම් ආණ්ටු ආට්සේර්ප්පුච් සෙය්යප්පට්ට මේර්කුරිත්ත උත්තියෝකත්තර්කළේ Development Assistant එන්ර අටිප්පටෙයිල් මිකුතියාක උළ්ළාර්කළ්. 20-25 වරුට කාලම් තිට්ටමිටල් පිරිවුකළිල් පණියාර්රිය අනුපවත්තෝටු අවර්කළ් පතවි උයර්වුක්කාකක් කාත්තුක් කොණ්ටු ඉරුක්කින්රාර්කළ්. එමතු මාවට්ටත්තිල්කූට, පල පිරතේස සෙයලකඞ්කළිල් ADP ඉල්ලාමෙයාල්, ADPමාර්කළ් 2 - 3 පිරතේස සෙයලකඞ්කළිල් පණියාර්ර වේණ්ටි ඉරුක්කින්රාර්කළ්. අවර්කළුටෙය තාමතත්තාල් පල්වේරු අපිවිරුත්තිත් තිට්ටඞ්කළෙ උරිය මුරෙප්පටි, උරිය නේරත්තිල් මේර්කොළ්ළ මුටියාත නිලෙමෙ කාණප්පටුකින්රතු. ඉව්වාරාන වෙර්රිටඞ්කළ් නාටු මුළුවතුම් කාණප්පටුවතාක නාන් නම්පුකින්රේන්. ඉතනෙ නිවර්ත්ති සෙය්වතර්කු මිකවුම් විනෙත්තිරනාන, 20 වරුට කාල අනුපවම් මික්ක ඉන්ත Development Assistantsඐ ADPsආකත් තිට්ටමිටල් සේවෙක්කුළ් උළ්වාඞ්කුවතු පොරුත්තමානතාක ඉරුක්කුම්. එනවේ, එන්නුටෙය විනාක්කළුක්කුත් තිරුප්තිකරමාන පතිල්කළෙ නාන් කෙළරව අමෙච්චරිටමිරුන්තු එතිර්පාර්ක් කින්රේන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු ජානක වක්කුඹුර රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 5.18]

ගරු ජානක වක්කුඹුර මහතා (පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර - මාකාණ සපෙකළ්, උළ්ළූරාට්සි මර්රුම් සුර්රාටල් ඉරාජාඞ්ක අමෙච්චර්)
(The Hon. Janaka Wakkumbura - State Minister of Provincial Councils, Local Government and Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා. අපේ මුෂාරෆ් මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරපු ප්‍රශ්නය සම්බන්ධයෙන් ගත්තොත්, ඒ නිලධාරීන් ගෙන්වලා, අපි අමාත්‍යාංශයේත් සාකච්ඡාවක් පැවැත්වුවා. එතුමා කියනවා වාගේ ගැටලුවක් තිබෙනවා. මට මතක හැටියට 264දෙනෙකුට අධිශ්‍රේණි පදනම මත අපි සැලසුම් සේවයේ තනතුරු ලබා දුන්නා.

1. සේවයේ නිවැරදි නාමය ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය වේ. මේ වනවිට ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 264කි.
2. විශේෂ ලිඛිත විභාගයක් පවත්වා නිලධාරීන් බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සැලසී නොමැති අතර එවැනි අවශ්‍යතාවක්ද නොමැත.
3. මෙම නිලධාරීන්ද ඇතුළුව රජයේ ඕනෑම නිලධාරියෙකුට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත්නම් දීප ව්‍යාප්ත සේවාවන්ට සීමිත පදනමින් අයදුම් කිරීමේ හැකියාවක් පවතී.

අපි ඒ ගැන අවශ්‍ය කටයුතු කරන්නත් බලාපොරොත්තු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ ඉන්න අයට වාගේම අධිශ්‍රේණි පදනම මත උසස්වීම් දීපු අයගේත් දැන් ගැටලුවක් තිබෙනවා. ඒ අයට අපි පත්වීම ලබා දෙනකොට කිසිම දීමනාවක් දෙන්නේ නැහැ කියන එකඟතාව අරගෙන තමයි අධිශ්‍රේණි පදනම මත ඒ උසස්වීම ලබා දුන්නේ. දැන් ඒ අය කියනවා, අවුරුදු ගණනාවක් ඒ සේවයේ ඉන්න නිසා ඒ දීමනා සියල්ල අධිශ්‍රේණි පදනම මත හිටියත් දෙන්න කියලා. ඒකේ පොඩි සාධාරණීකරණයක් තිබෙනවා, ඔවුන් අවුරුදු ගණනාවක් වැඩ කරපු නිසා. අපි යම් කොන්දේසියක් මත රාජ්‍ය සේවයේ උසස්වීම දුන්නත් ඉදිරි කාලයේදී ඒ කොන්දේසිය නැතුව නැවත ඒ දීමනා ඇතුළු හැම දෙයක් ගැනම ඉල්ලීම් කරනවා.

ඒකත් සාධාරණ වෙන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවත් එක්ක. අපි දන්නවා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සැලසුම් අංශයේ නිලධාරීන් මේ දවස්වල විශාල වැඩ කොටසක් කරන බව. තමන්ට රජයෙන් ලබා දෙන සංවර්ධන ව්‍යාපෘති ඇතුළු සියලු දේවල්වල කටයුතු ඒගොල්ලන් කාර්යක්ෂමව ඉටු කරනවා.

ගරු මුෂාරෆ් මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳ ප්‍රශ්නයක් ඇහුවේ. අපි ඉදිරි කාලයේදී ඒ ගැන සලකා බලා අවශ්‍ය කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

4. අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.20ට, 2024 ජූනි 20වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.
අතන්පටි පි. ප. 5.20 මණික්කු පාරාළුමන්රම්, 2024 යූන් 20, වියාළක්කිළමෙ මු.ප. 9.30 මණිවරෙ ඔත්තිවෛක්කප්පට්ටතු.
Parliament adjourned accordingly at 5.20 p.m. until 9.30 a.m. on Thursday, 20th June, 2024.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

313 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 313 - இல. 7
Volume 313 - No. 7

2024 ජූනි 20වන බ්‍රහස්පතින්දා
2024 யூன் 20, வியாழக்கிழமை
Thursday, 20th June, 2024

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)
பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)
PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

2024 ජූනි 20වන බ්‍රහස්පතින්දා
2024 யூன் 20, வியாழக்கிழமை
Thursday, 20th June, 2024

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
කථානායකතුමාගේ සහතිකය [පිටුව 1259]
ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [පිටුව 1263]
ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 1274-1318]
වරප්‍රසාද:
ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කමිටු වාර්තාවේ සඳහන් කරුණු [පිටුව 1318]
ආගමන පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී [පිටුව 1325]
යෝජිත 'ව්‍යාපාර සූදානම් (B-READY) දර්ශකය' සඳහා සූදානම් වීමේ දී මතු වන ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව:
කාලය දීර්ඝ කිරීම [පිටුව 1325]
පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය (සංස්ථාගත කිරීමේ) - [ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා] - පළමුවන වර කියවන ලදී [පිටුව 1326]
කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [පිටු 1336-1454]
යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [පිටු 1455-1457]
කල් තැබීමේ යෝජනාව:
e-Motoring ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම [පිටු 1458-1465]
ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [පිටු 1466-1470]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
சபாநாயகரது சான்றுரை [ப: 1259]
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 1263]
வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1274-1318]
சிறப்புரிமை:
ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவின் அறிக்கையில் உள்ளடங்கியுள்ள விடயங்கள் [ப: 1318]
குடிவரவு சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1325]
இலங்கையில் முன்மொழியப்பட்ட "வணிக தொழில் முயற்சிகளுக்கான தயார்நிலை (B-READY) சுட்டெண்" பற்றிய தயார்படுத்தல் தொடர்பில் எழுந்துள்ள நடை முறைச் சிக்கல்களையும் சிரமங்களையும் ஆய்வு செய்வதற்கும் அது தொடர்பில் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு:
கால நீடிப்பு [ப: 1325]
தனி உறுப்பினர் சட்டமூலங்கள்:
கொழும்பு மொழித் திறன்கள் மற்றும் நாடகக் கலைச் சங்கம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1326]
பெண்களின் வலுவூட்டல் சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 1336-1454]
யுனெஸ்கோவிற்கான இலங்கை தேசிய ஆணைக்குழு சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 1455-1457]
ஒத்திவைப்புப் பிரேரணை:
e-Motoring கருத்திட்டத்தை விரைவாகச் செயற்படுத்தல் [ப: 1458-1465]
வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப: 1466-1470]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 1259]
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1263]
ORAL ANSWERS TO QUESTIONS [Cols. 1274-1318]
PRIVILEGE:
Matters Expressed in Report of Committee on Ethics and Privileges [Col. 1318]
IMMIGRATION BILL:
Read the First time [Col.1325]
SELECT COMMITTEE TO STUDY THE PRACTICAL PROBLEMS AND DIFFICULTIES IN RELATION TO PREPARATION FOR THE PROPOSED 'BUSINESS READY (B-READY) INDEX' IN SRI LANKA AND MAKE ITS PROPOSALS AND RECOMMENDATIONS:
Extension of Time [Col. 1325]
PRIVATE MEMBERS' BILLS:
Colombo Association of Language Skills and Dramatic Art (Incorporation) - [The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam] - Read the First time [Col. 1326]
WOMEN EMPOWERMENT BILL:
Read a Second, and the Third time, and passed as amended [Cols. 1336-1454]
SRI LANKA NATIONAL COMMISSION FOR UNESCO BILL:
Read a Second, and the Third time, and passed as amended [Cols. 1455-1457]
ADJOURNMENT MOTION:
Expeditious Implementation of e-Motoring Project [Cols. 1458-1465]
WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 1466-1470]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2024 ජූනි 20වන බ්‍රහස්පතින්දා
2024 ஜூன் 20, வியாழக்கிழமை
Thursday, 20th June, 2024

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, ගරු කථානායකතුමා විසින් 2024 ජූනි 19 දින "ශ්‍රී ලංකා වරලත් නැවි තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)" සහ "දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා පරිසර අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවසරය ඇතිව මම මේ කාරණය අහන්න කැමැතියි. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, 2020, 2021, 2022 අධ්‍යයන වර්ෂවල රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සුදුසුකම් නොලද ශිෂ්‍යයන්ට පෞද්ගලික විශ්වවිද්‍යාලවල උසස් අධ්‍යාපනය හැදෑරීමට ලබා දෙන පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අදාළ ගැසට් පත්‍රය මෙතෙක් නිකුත් වෙලා නැහැ. මේක නිකුත් වන්නට තිබුණේ පසුගිය වසරේ දෙසැම්බර් මාසයේ. එම ගැසට් නිවේදනය නිකුත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් අද වන විට පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ උපාධිය හැදෑරීමට අපේක්ෂාවෙන් සිටින දරුවන්ට පෞද්ගලික විශ්වවිද්‍යාලවල ඒ සඳහා ලියාපදිංචි වන්න බැරි වෙලා තිබෙනවා. සියලු පාඨමාලා ගාස්තු ගෙවීමට හැකි සිසු දරුවන් විසින් දැනටමත් අදාළ ගාස්තු ගෙවා ඊළඟ කණ්ඩායම් සඳහා ලියාපදිංචි වෙලා තිබෙන මොහොතක, රජයෙන් සිදුවන මෙම ප්‍රමාද දෝෂය නිසා අනෙක් සිසුන්ගේ අපේක්ෂා බිඳ වැටීමක් සිදු වෙලා තිබෙනවා. මේ හේතුවෙන් බොහෝ සිසුන් දැඩි මානසික පීඩනයකින් පසුවන නිසා අඩුම තරමින් ඔක්තෝබර් මස වන විට ආරම්භ වීමට නියමිතව ඇති පෞද්ගලික විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා සඳහා පිවිසීමට මේ සිසුන්ට තිබෙන පොලී රහිත ණය යෝජනා ක්‍රමය සක්‍රිය කරවලා එය ක්‍රියාත්මක කරන්න කියලා අධ්‍යාපන ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. මොකද, ඔබතුමා මීට පෙරත් අපි අදහස් ඉදිරිපත් කරනකොට මේ දේවල්වලට මැදිහත් වෙලා ඒවා ක්‍රියාත්මක කළා. ගරු ඇමතිතුමනි, මේක අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා නිලධාරීන්ට මාස් පතා කියව කියවා ක්‍රියාත්මක කරන්න ඕනෑ දෙයක් නොවෙයි. ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, මේක ක්‍රියාත්මක කරන්න අවශ්‍ය systemඑක හදන්න කියලා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මටත් අධ්‍යාපන ඇමතිතුමාගෙන් කෙටියෙන් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
තවම අපි ප්‍රශ්නවලට ආවේ නැහැ නේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
නැහැ, අධ්‍යාපනයට අදාළ කාරණයක් ගැන මම අහන්නේ.

අද විශ්වවිද්‍යාල 17හිම සේවකයන් පාරට බැහැලා. අනධ්‍යයන සේවකයන් විතරක් නොවෙයි. රටේම තිබෙන විශ්වවිද්‍යාල 17හිම සේවකයන් අද වැඩ වර්ජනයක යෙදෙනවා. ආණ්ඩුව බංකොලොත්. මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා ගන්න පියවර මොකක්ද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ඔක්කෝටම උත්තර දෙන්නම්. ඉස්සර වෙලා අපි න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරගෙන යමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔව්, න්‍යාය පත්‍රය අනුව කටයුතු කරගෙන යමු. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔබතුමන්ලාට ප්‍රශ්න අහන්න මම වෙලාව දෙන්නම්. *[බාධා කිරීමක්]* පොඩි පොඩි ඒවා අහන්න බැහැ නේ, ගරු මන්ත්‍රීතුමා. පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය අනුව වැඩ කටයුතු කරන්න පුරුදු වෙන්නකෝ. මරණාධාර සමිතියක්වත් මේ විධියට ගෙනියන්න බැහැ නේ. ගරු විපක්ෂ නායකතුමනි, මම ඔබතුමාගේ ප්‍රශ්නයටත් උත්තර දෙන්නම්. ඒ සියලු හේතු මම කියන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අපි නැවතත් ලිපිලේඛනාදිය පිළිගැන්වීමට යොමු වෙමු. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2021 සහ 2022 වර්ෂ සඳහා ජාතික ක්‍රීඩා අරමුදලේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පිළිගන්වන ලද වාර්තා
சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
REPORTS PRESENTED

සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
சமாதி தியான மற்றும் யோகாசன நிலையம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
SAMADHI MEDITATION AND YOGA CENTRE (INCORPORATION) BILL

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, "සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් ඉදිරිපත් කරමි.

"වාර්තාව

'සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක සහ නීතිපති විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත.

මෙම පනත් කෙටුම්පතට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබේ."

පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2024 ජූලි 09වන අඟහරුවාදා සලකා බලනු ලැබේ.

சட்டமூலம், சட்டவாக்க நிலையியற் குழுவினால் அறிக்கை செய்யப்பட்டவாறு, 2024 யூலை 09, செவ்வாய்க்கிழமை பரிசீலிக்கப் படவிருக்கிறது.

Bill, as reported by Legislative Standing Committee, to be considered upon Tuesday, 09th July, 2024.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)

Sir, on behalf of the Chairman of the Sectoral Oversight Committee on Children, Women and Gender, I present the Report of the Sectoral Oversight Committee on Children, Women and Gender on -

(i) Performance Report of the Department of Samurdhi Development for the year 2022; and

(ii) Annual Report of the National Child Protection Authority for the year 2020,

which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

Sir, I present the Report of the Sectoral Oversight Committee on Education on a Bill to provide for the establishment of the National Commission for the United Nations Educational, Scientific and Cultural Organization (UNESCO) and for matters connected therewith or incidental thereto, which was referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, භාණ්ඩ හා සේවා අපනයනය ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව, එම කාරක සභාවේ සභාපති ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා විසින් පිළිගැන්වීම.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, භාණ්ඩ හා සේවා අපනයනය ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2022 වර්ෂය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(iv) 2020 සහ 2021 වර්ෂ සඳහා තලවකැලේ - ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තා;

(v) 2017, 2018 සහ 2019 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තා;

(vi) 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(vii) 2012, 2013, 2014, 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගමේ වාර්ෂික වාර්තා; සහ

(viii) 2020/2021 වර්ෂය සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු බුද්ධික පතිරණ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී මම මේ කාරණයත් කිව යුතුයි. මේකෙදි ඉතා බරපතළ තත්ත්වයක් මට නිරීක්ෂණය වුණා. මම අද උදේ නියෝජ්‍ය මහ ලේකම්තුමාවත් හමු වුණා, මේ සම්බන්ධව දැනුම් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත සහ ඊට පසුකාලීනව ඉදිරිපත් කරපු සංශෝධන දෙක අනුවත්, මහා භාණ්ඩාගාරය යටතේ තිබෙන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබෙන චක්‍රලේඛ අනුවත්, අපේ 111වන ස්ථාවර නියෝගය අනුවත් - මේ අංශ තුන යටතේ - සාමාන්‍යයෙන් විගණනය නිම වෙලා, පළමුවැනි අවුරුද්ද තුළදී හෝ දෙවැනි අවුරුද්ද තුළදීවත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් වෙන්නට ඕනෑ.

මෙහිදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය කියන ආයතන වාර්ෂික වාර්තා හොඳට ඉදිරිපත් කර තිබෙනවා. අපි හොඳ දේ අගය කරන්න ඕනෑ. නමුත් අවාසනාවට මම දැන් ඉදිරිපත් කරන ලද සමහර වාර්ෂික වාර්තා - විශේෂයෙන් සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම වාගේ ආයතනවල - 2012, 2013, 2014, 2015, 2016 සහ 2017 වාගේ අවුරුදුවල ඒවා. ඔවුන් දැන් තමයි 2012, 2013 වර්ෂවල වාර්ෂික වාර්තා ඉදිරිපත් කරන්නේ. මේ සමහර වාර්තා 2020 වර්ෂයේ ඒවා.

ඊළඟට, තලවකැලේ - ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය ගත්තොත්, ඒගොල්ලන්ට 2022 වාර්තාවත් ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් ඔවුන් ඒ වාර්තාව ඉදිරිපත් කරලා නැහැ. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ගත්තොත්, 2017, 2018 සහ 2019 වර්ෂ සඳහා තමයි වාර්ෂික වාර්තා තිබෙන්නේ. ඔවුන් 2019 වනතුරු විතරයි වාර්ෂික වාර්තා ඉදිරිපත් කරලා තිබෙන්නේ. 2020, 2021, 2022 කියන අවුරුදු තුනක වාර්තා ඔවුන් ඉදිරිපත් කරලා නැහැ. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම ගත්තොත්, ඔවුන් ඉදිරිපත් කර තිබෙන්නේ දැනට අවුරුදු 12කට කලින් වාර්තා. 2017ට පසුව 2018, 2019, 2020, 2021, 2022 කියන වර්ෂ පහට අදාළ වාර්තා සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම ඉදිරිපත් කරලා නැහැ.

විගණන ප්‍රශ්නත් එක්ක මේ වාර්තා ඉදිරියට යෑම සම්බන්ධයෙනුත් අපට බරපතළ තත්ත්වයක් තිබුණා. ඒ නිසා මම මේ කාරණය ගැන ඔබතුමාගේ අවධානයත්, පාර්ලිමේන්තුවේ අවධානයත් යොමු කරවනවා. ගොඩක් රාජ්‍ය ආයතන විශේෂයෙන්ම අර්ධ රාජ්‍ය ආයතන මේ පිළිබඳව තඹ දොයිතුවකටවත් සලකන්නේ නැහැ. මට තේරෙන්නේ නැහැ, මේ අයට මේ ගැන අවබෝධයක් නැද්ද, එහෙම නැත්නම් නොසලකා හරිනවාද කියලා.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඇතුළු සමහර ආයතන ඉතා විධිමත්ව වාර්ෂික වාර්තා ඉදිරිපත් කරන අතරේ, ජනතා වතු සංවර්ධන මණ්ඩලය වැනි ආයතන ඉතා දුර්වල මට්ටමකයි තිබෙන්නේ. මේ සියලු කරුණුත් එක්ක මම කියනවා, ගරු කථානායකතුමා, ලේකම් මණ්ඩලය, සමස්ත පාර්ලිමේන්තුව මේ ගැන අවධානය යොමු කරන්න ඕනෑය කියලා. මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත වෙනස් වුණත් අලුත් පනතක් එනවා නේ. ඒ තුළත් මේ කාරණය තිබෙනවා. මේ කාරණයේදී ඉතා නරක තත්ත්වයක් තිබෙන්නේ. සමහර ආයතන මූල්‍ය කළමනාකරණ පනත් සියල්ල බිඳ දමමින්, මේ වාර්තා ඉදිරිපත් කිරීම වාර්ෂිකව සිද්ධ කරන්නේ නැහැ. එය නොසලකා හරිනවා. ඒ නිසා මම කියන්නේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියත් මුල් වෙලා, මේ ආයතනවල ප්‍රධානීන් ගෙන්වලා, COPE, COPA දෙක හරහා හෝ එක දවසක වැඩ මුළුවක් තියලා මේ කාරණය පැහැදිලි කරන්න ඕනෑ කියායි. මේක සෙල්ලමක් නොවෙයි, බරපතළ තත්ත්වයක්.

මේක ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් කියන කාරණය පිළිබඳව මේ ප්‍රධානීන්ට අවබෝධයක් ලබා දෙන වැඩ පිළිවෙළකුත් අවශ්‍යයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සඳහන් කරපු කාරණය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් ඉතා බරපතළ විධියට සලකන්න ඕනෑය කියලා මේ අවස්ථාවේදී මම සඳහන් කරනවා.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - கடற்றொழில் அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மட்டக்களப்பு, பார் வீதி, 607ஆம் இலக்கத்தில் வதியும் திரு. கோபால கிருஷ்ணன் அவர்களிடமிருந்து கிடைக்கப்பெற்ற மனுவை நான் சமர்ப்பிக்கின்றேன்.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නාකුළුගමුව, රෝහල අසල, "උදය" යන ලිපිනයෙහි පදිංචි යූ.කේ. රත්නවීර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට මත්තෙන්, රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවල පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂා කරන - උසස් පෙළ ප්‍රතිඵල මත ඒවාට ඇතුළත් වෙන්න අපේක්ෂා කරන - දරුවන් සම්බන්ධයෙන් ගරු විපක්ෂ නායකතුමා යොමු කළ ප්‍රශ්නයට මම උත්තරයක් දෙන්න ඕනෑ. සාමාන්‍යයෙන් වාර්ෂිකව 4,000කට වැඩි ප්‍රමාණයකට පෞද්ගලික විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන්න ණය ලබා දෙනවා. මෙහි 7 වැනි කණ්ඩායමේ ඒ කටයුතුවල යම් ප්‍රමාදයක් වුණා. ඒ ප්‍රමාදය වුණේ විශේෂයෙන්ම ලංකා බැංකුවෙන්. දැන් 8 වැනි කණ්ඩායමටත් ණය දෙන්නේ ලංකා බැංකුවත්, මහජන බැංකුවත් කියන බැංකු දෙකෙන්. මේකෙදි මහජන බැංකුවේ කිසිම ගැටලුවක් නැහැ. නමුත්, ලංකා බැංකුව කල් මරමින් ඉන්නවා, Credit Committee එකට දමනවාය කියමින්. මම දන්නේ නැහැ, එහි කාර්යක්ෂමතාව කොහොමද කියලා. මම පෞද්ගලිකව කථා කළා එහි සාමාන්‍යාධිකාරිවරයාට, පෙරේදා. එහිදී කිව්වා Board Meeting එකක ඉන්නවාය කියලා. එච්චරයි. අඩු ගණනේ call

එකක් return කරන්න තේරෙන්නේ නැහැ. ඊළඟට, ලංකා බැංකුවේ දැන් අලුත් සභාපතිවරයෙක් ඉන්නේ. සභාපතිවරයාටත් මම මේ ගැන කිහිප වතාවකදී කිව්වා; ගෙන්වලාත් කිව්වා. මේක ලංකාවේ තිබෙන ප්‍රධාන රාජ්‍ය බැංකුව. ඔය දැන් ඉන්න අය ඉපදෙන්නත් කලින් මම ඒකේ වැඩ කළා, අවුරුදු අටක්. ඒ කාලයේ ඔහොම තිබුණේ නැහැ. දැන් මේ ළමයින්ගේ loan එක පරක්කු වෙන්නේ ලංකා බැංකුව කල් මැරීම නිසා. ඒක මම පැහැදිලිව කියනවා. ඇමතිවරයෙකුගේ කාර්යභාරයක් නොවෙයි, වෙන ආයතනයක ප්‍රධානීන් ගෙන්වලා මේවා කියන එක. මේක රජයේ ප්‍රතිපත්තියක්.

වර්තමාන ජනාධිපතිතුමා තමයි 2016දී -ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන්, එදා ඔබතුමාත් හිටියා- රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් මේ ණය යෝජනා ක්‍රමය ආරම්භ කළේ. දැන් ඒක වර්ධනය වෙලා,-

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඒක උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ යෝජනාවක්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එතකොට ඔබතුමා නේ හිටියේ. මේ ආපු එක ඉදිරියට ගෙනයන්න බැංකු ප්‍රධානීන් දන්නේ නැද්ද? කල් මර මරා ඉන්නේ ඇයි? ගරු විපක්ෂ නායකතුමනි, මම දන්නවා ඔබතුමා ඔය ප්‍රශ්නය අහන බව. මොකද, ඔබතුමාට ඒ දරුවන් එවපු ඉල්ලීමේ පිටපතක් මගේ WhatsApp එකටත් ආවා. මම ස්තුතිවන්ත වෙනවා, ඔබතුමා මේ ප්‍රශ්නය මතු කිරීම පිළිබඳව. අඩුම ගණනේ පාර්ලිමේන්තුවේ කථා කරන දේ ඇහිලාවත් ලංකා බැංකුවේ ප්‍රධානීන් ඇහැරෙන්න ඕනෑ. මේක මට විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නම් මම විසඳනවා. මේකට අධ්‍යාපන අමාත්‍යාංශය මැදිහත් වෙන්න ඕනෑකමක් නැහැ. බැංකුවක් කියන්නේ ලෙහෙසි පහසු තැනක් නොවෙයි නේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
It is a loan.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Yes, it is a loan. අනික, සම්පූර්ණ බර ඒ ගොල්ලන්ට ගිහිල්ලාත් නැහැ. දැන් ඒක බෙදිලා එන්නේ.

ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාධාකෘෂ්ණන් මන්ත්‍රීතුමනි, කෙටියෙන් කියලා අවසන් කරන්න.

ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
ගරු ඇමතිතුමනි, මේ loan එක ගන්න ගියාම නීති රීති, conditions ගොඩක් දමනවා. ඒ conditions අනුව loan එක ගන්නම බැහැ. සිය දෙනෙක් ගියොත් දෙන්නෙකුට, තුන් දෙනෙකුට තමයි ලැබෙන්නේ. 97ක්, 98ක් return වෙනවා. ඒ නිසා මේකේ conditions පොඩ්ඩක් ලිහිල් කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමා කියන කථාවේ ඇත්තක් තිබෙනවා. නමුත් මුලින්ම පළමුවැනි, දෙවැනි කාණ්ඩවලට දුන්න loanවලින් 200කට වැඩි ප්‍රමාණයක් ආපසු ගෙවීම පැහැර හැර තිබෙනවා. ඒකට හේතු තිබෙන්න පුළුවන්. ඒ ළමයි උපාධිය අවසන් කළත් කොවිඩ්-19 වසංගතය ආපු නිසා රැකියාවක් සොයා ගැනීම සම්බන්ධයෙන් ප්‍රශ්න තිබෙන්න ඇති. දැන් ඒ අයත් ගෙවන්න පටන් අරගෙන තිබෙනවා. ඒකට අපේ අමාත්‍යාංශයේ non-State Higher Education Division එක සෘජුවම මැදිහත් වෙලා ඒ අදාළ විශ්වවිද්‍යාලවලට කථා කරලා ඒ කටයුතු කරගෙන යනවා.

හැබැයි, බැංකු විසින් අලුතෙන් යෝජනාවක් කළා, තව guarantor කෙනෙක් වැඩි කරලා දෙන්නය කියලා. *[බාධා කිරීමක්]* ඉන්නකෝ, මම මේක කියනකල්. *[බාධා කිරීමක්]* නැහැ, මම දන්නවා. මෙහෙමයි, බැංකුව සාමාන්‍ය විධියට guaranteed loans දෙනවා. එතකොට, මේ loan එක interest free. පොලිය ගෙවන්නේ භාණ්ඩාගාරයෙන්; පොලිය භාණ්ඩාගාරයෙන් ගෙවන්නේ, මුදල් ඒ ගොල්ලන් recover කරන්න ඕනෑ. බැංකුවකට මුදල් recover කරන ක්‍රමයක් තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කරන safety net එකක් තමයි ඒ ගොල්ලන් හදාගන්නේ. හැබැයි, අපි කිව්වා, මේකෙන් ළමයි අධෛර්යවත් කරන්න යන්න එපා කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මේ විවාදයකට යනවා නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් ගරු ඇමතිතුමාගේ මුවින් නිකුත් වුණේ බොහොම බරපතළ ප්‍රකාශයක්. ඒ කියන්නේ, ගරු ඇමතිතුමා ආමන්ත්‍රණය කරලා කියද්දීත්, මේක රාජ්‍ය ප්‍රතිපත්තියක් වුණත්, මේ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ගරු අමාත්‍යතුමනි, ඒකෙන් මට ගම්‍ය වෙන්නේ, policy paralysis එකක් වෙලා තිබෙනවා කියලායි; ප්‍රතිපත්ති අංශභාගයක් රජය තුළ ක්‍රියාත්මක වෙනවා. ජනාධිපතිවරයාගේත්, ආණ්ඩුවේත්, ඔබතුමන්ලාගේත් ප්‍රතිපත්තිය මෙය නම්, මෙය ක්‍රියාත්මක කරන්නට ඒ නිලධාරීන් කටයුතු කරන්නේ නැත්නම්, ඒ කියන්නේ ජනාධිපතිටත් වඩා ඉහළින්, අධ්‍යාපන ඇමතිටත් වඩා ඉහළින් ඉන්නවා, නිලධාරීන්. මේ විධියට රටක් ගෙනයන්න පුළුවන්ද?

ඊළඟට, මම ඔබතුමාට කාරුණිකව ප්‍රශ්නයක් යොමු කරන්න කැමැතියි. ඔබතුමා දන්නවා, ලොකු ආන්දෝලනයක් නිර්මාණය වුණු බව මේ ආරෝපිත කුලී ආදායම් බද්ද - imputed rental income tax - එහෙම නැත්නම් දේපළ බද්ද - property tax එක - ගැන.

ගරු ඇමතිතුමනි, මේ රටේ බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන කොට, එයට පදනම් වුණු මූල්‍ය දත්ත, ඒ වාගේම තොරතුරු ඉදිරිපත් කරනවා කියලා ජනාධිපතිවරයා බොහොම පැහැදිලිව

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

එළිපිටම කියා තිබෙනවා. එතකොට මේකට අවශ්‍යයි, Technical Assistance Reports. ඒ කියන්නේ දේපළ බද්ද ද, වැට් එක ද, ආදායම් බද්ද ද කියන ඒවා වැඩි කරන කොට ඒවාට අදාළව තිබෙනවා, Technical Assistance Reports. එම තාක්ෂණ සහයෝගිතා වාර්තා ටික මේ පාර්ලිමේන්තුවේ සභාගත කරනවා කියලා කිව්වා. නමුත් ඒක කෙරිලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමා, කෙටියෙන් කියලා අවසන් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
විටෙක ජනාධිපතිවරයා කියනවා, IMF ගිවිසුම වෙනස් කරන්න බැහැ කියලා. හැබැයි, IMF delegation එකේ ප්‍රධානියා වන පීටර් බෲවර් කියනවා, "ඒ ඒ වෙලාවට, ඒ ඒ අවස්ථාවලට අනුරූපීව IMF Agreement එක සංශෝධනය කරන්න පුළුවන්" කියලා. අපි සාකච්ඡා පවත්වපු අවස්ථාවේත් අපි බොහොම පැහැදිලිව කිව්වා, "IMF එකේ සහභාගිත්වය අපි පිළිගන්නවා. හැබැයි, අපි මේ IMF ගිවිසුම සංශෝධනය කරනවා" කියලා. ඒකට එතුමා එකඟ වුණා. මෙම ගිවිසුම සංශෝධනය කරන්න පුළුවන් කියන කාරණාව පීටර් බෲවර් කියා තිබියදීත්, නැහැ, මේක ගලේ කෙටුවා හා සමානයි, මේක ආයෙත් වෙනස් කරන්න බැහැ කියලා ජනාධිපතිවරයා කියනවා. මේ දේපළ බද්ද, මේ ආරෝපිත කුලී ආදායම් බද්ද ක්‍රියාත්මක කරන්න කටයුතු කරන කොට අඩුම ගණනේ මේ පාර්ලිමේන්තුවට ඊට අදාළ තාක්ෂණ සහයෝගිතා වාර්තා - Technical Assistance Reports - ටික ඉදිරිපත් කළ යුතුයි. ඒ නිසා කරුණාකර එම වාර්තා ටික ඉදිරිපත් කරන්න.

ඔබතුමන්ලා පොඩ්ඩක් බලන්න, Verité Research ආයතනයේ නිශාන් ද මැල් මහත්මයා දත්ත කේන්ද්‍රීයව ඉදිරිපත් කර තිබෙන දෙය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක ඇති කරගෙන තිබෙන ගිවිසුම රටේ ප්‍රගතියට බාධාවක් වෙන්න බැහැ. මේක මේ රටේ ඉදිරි ගමන නතර කරන වැඩ පිළිවෙළක් වෙන්න බැහැ. ඒ වාගේම, ඒ විවිධ ආයතනවලට ඕනෑ ඕනෑ වෙලාවට මේ රටේ ජනතාවගේ කරපිට, හිස මත බදු බර පටවන්න පුළුවන්ද? එහෙම කොහොමද වෙන්නේ? ඒ නිසා මම මේ රජයෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර තාක්ෂණ වාර්තා ටික සභාගත කරන්න කියලා; මේ ආකාරයට බදු අය කරන කොට, ඒ බදු අය කිරීමට පදනම් වුණු කරුණු කාරණා ටික ඉදිරිපත් කරන්න කියලා. මේ බදු ආදායම වැඩි කර ගැනීමට විකල්ප මාර්ග තිබෙනවා. බදු පරිපාලනය, digitalize කිරීම, බදු දැලට හසු විය යුතු සියලුදෙනා ඇතුළත් කර ගැනීම කියන කරුණු කාරණා පිළිබඳවත් රජයේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මම නැවතත් ඉල්ලා සිටිනවා, IMF එකේ රූකඩයක් බවට පත් වෙන්නේ නැතිව, IMF එකත් එක්ක සහයෝගිතාවෙන් රට වෙනුවෙන් ප්‍රශස්ත ගනුදෙනුවකට, ගිවිසුමකට ප්‍රවේශ වෙන්න කියලා; ජනතාවගේ පැත්තෙන් හිතන්න කියලා.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි චන්දිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමා, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා නේ ඉස්සර වෙලා නැඟී සිටියේ. ඔබතුමා කියන්න. න්‍යාය පත්‍රයේ වැඩ කටයුතුවලට යන්න අවශ්‍ය නිසා කෙටියෙන් කියන්න. *[බාධා කිරීම්]* හැමෝටම අවස්ථාව දෙන්න අමාරුයි.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාල හා සම්බන්ධ ප්‍රශ්නය මතු කරපු නිසායි මම මේ ගැන අහන්නේ, අධ්‍යාපන ඇමතිතුමාගෙන්. ගරු ඇමතිතුමනි, මේ වන විට සියලු විශ්වවිද්‍යාල වසා තිබෙන්නේ. අනධ්‍යයන කාර්ය මණ්ඩලයත්, පරිපාලන කාර්ය මණ්ඩලයත්,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔය ප්‍රශ්නයට ඊයේත් උත්තර දුන්නා නේ.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)
මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් මේක අහන්නේ. අපි හැම වෙලාවේම කරදර කරන්නේ නැහැ නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමා මොකක්ද කියන්නේ?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එතුමාට අහන්න කියන්න.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)
ගරු අධ්‍යාපන ඇමතිතුමනි, මේ තත්ත්වය නිසා එම ආචාර්ය මණ්ඩලය ඇතුළු සියලු දෙනාට වැටුප් නැතිව ඉන්නවා. විශ්වවිද්‍යාල වහලා දැන් දීර්ඝ කාලයක් වෙනවා; මාස දෙකකට ආසන්න කාලයක් වෙනවා. ඒ නිසා මේ සඳහා අවශ්‍ය පියවර ගන්න.

එක්කෝ, වැඩකටයුතු කඩාකප්පල් කිරීමේ අදහසින් කවුරු හරි මේ වැඩ පිළිවෙළ කරනවා. *[බාධා කිරීමක්]* එහෙම නැත්නම්- *[බාධා කිරීමක්]* ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් පියවරක් ගන්න. *[බාධා කිරීමක්]*

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමනි, ඔබතුමාත් අහන්න යන්නේ අධ්‍යාපනයට සම්බන්ධ ප්‍රශ්නයක් නම්, කෙටියෙන් අහලා අවසන් කරන්න. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්නකෝ. එක පාර ඔක්කෝටම උත්තර දෙන්න බැහැ නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔය අනධ්‍යයන කාර්ය මණ්ඩල සියලු වෘත්තීය සමිති එක්ක මම භාණ්ඩාගාරයේ සාකච්ඡාවලට පසුගිය මාස තුන ඇතුළත දෙවතාවක් සම්බන්ධ වුණා. ඒ වාගේම UGC එකත් එක්ක වට කිහිපයක් සාකච්ඡා කළා. ඊළඟට ආචාර්ය මණ්ඩල සමිතිත් එක්කත් සාකච්ඡා කළා. මේ ප්‍රශ්නයට ඉතාම පැහැදිලිව මට කියන්න තිබෙන්නේ එකම උත්තරයයි. මම මේ ප්‍රශ්නයට පසුගිය කාලයේම උත්තර දුන්නා. ඔතැන තිබෙන්නේ ප්‍රශ්න දෙකක්. පළමුවැනි ප්‍රශ්නය මේකයි. 2018 වර්ෂයේදී අධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් සම්බන්ධයෙන් සියයට 107ක වැඩි වීමක් ලබා දුන්නා. ඒ වෙලාවේ අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට ලබා දුන්නේ සියයට 92යි. සියයට 92 හා සියයට 107 අතර සියයට 15ක වෙනසක් තිබෙනවා. මෙන්න මේ වෙනස නිම කළ යුතුයි කියන එක තමයි 2018 වසරේ සිට අවුරුදු 6ක් තිස්සේ අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වෘත්තීය සමිතිවල ඉල්ලීම වුණේ. මා මෙම අමාත්‍ය ධුරයට ආවාට පස්සේ මේ ප්‍රශ්නය අරගෙන සාකච්ඡා කළා. මේ සම්බන්ධයෙන් තමයි මම කිව්වේ, දෙවතාවක් Treasury එකත් එක්ක සාකච්ඡා කළා කියලා. මම සාකච්ඡා කරපු වාර අනන්තයි. UGC එක සමඟත් සාකච්ඡා කළා. හැබැයි, ඒ සාකච්ඡාවලදී යම් මූලික එකඟතාවකට ආවා, ඒ විෂමතාව, වෙනත් ඒවාට බලපෑමක් නොවන ආකාරයට ඊළඟ අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කරලා ලබන අවුරුද්දේ ජනවාරි මාසයේ සිට ඒ ගොල්ලන්ගේ ප්‍රශ්නය විසඳන්න. *[බාධා කිරීමක්]* ගරු මරික්කාර් මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. මේක අහගන්නකෝ. මම තවම උත්තරය දීලා ඉවර නැහැ. එහෙම තිබෙන අතරතුර අධ්‍යයන කාර්ය මණ්ඩලවලට අධ්‍යයන දීමනාව සියයට 25කින් වැඩි කළා. අධ්‍යයන දීමනාව වැඩි කළාට පස්සේ තමයි අනධ්‍යයන කාර්ය මණ්ඩලවලින් දෙවැනි ඉල්ලීම ආවේ, ඒ ගොල්ලන්ටත් ගැළපුම් දීමනාව දෙන්න කියලා.

එම දෙවැනි ඉල්ලීම තමයි, ඒ ගැළපුම් දීමනාව ලබා දෙන්න කියන එක. ඔය ඉල්ලීම් දෙක තමයි තිබෙන්නේ. පළමුවැනි ඉල්ලීමට එකඟ වෙලා අපි සාකච්ඡා කරලයි තිබුණේ. දැන් අනධ්‍යයන කාර්ය මණ්ඩලය ඉල්ලන්නේ, අධ්‍යයන කාර්ය මණ්ඩවලට වැඩි කළා වාගේ, වැටුප් වැඩි කරන අවස්ථාවකදී ඒ අයටත් ගැළපුම් දීමනාවක් අවශ්‍යයි කියායි. ඒ සඳහා අතිරේක ප්‍රතිපාදන අවශ්‍ය වෙනවා. අපි ඒ පිළිබඳව දැනුම් දීලා තිබෙනවා. ඒ වාගේම දැන් ඒ සඳහා කමිටුවක් පත් කරලා තිබෙනවා. මේ වාගේ තිබෙන හැම එකක්ම ඒ කමිටුවට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ සඳහා දැන් අපි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වෘත්තීය සමිතිවලට පුළුවන්, මුලින්ම උදය සෙනෙවිරත්න මහත්මයාගේ කමිටුවට ගිහිල්ලා දින කිහිපයක් තුළදී කරුණු ටික ඉදිරිපත් කරලා ඉක්මනින් ඒ ඉල්ලීම් ඉටු කර ගන්න. UGC එකේ ස්ථාවරය තමයි, මහා භාණ්ඩාගාරය එකඟතාව පළ කරනවා නම්, UGC එකේ ඉතිරිව තිබෙන මුදලකින් මේ ප්‍රශ්නයට යම් ආකාරයක විසඳුමක් දෙන්න පුළුවන් කියන එක. ඒකට ඒ අය සූදානම්. නමුත් ඒක අපට තනිවම කරන්න බැහැ. ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් මතු කරපු ප්‍රශ්නයට අදාළව ගරු ඇමතිතුමා නොසඟවා ඇත්ත කාරණාව හෙළිදරව් කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, මෙතැන තිබෙන ගැටලුව තමයි, රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවලට වාර්ෂිකව බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා සිසුන් ප්‍රමාණයෙන් හරි අඩක් පමණ වීම. එයිනුත් හයෙන් එකකට පමණයි මේ ණය පහසුකම ලැබී තිබෙන්නේ. මේ ණය ක්‍රමය පළමුවෙන් ආරම්භ කරනකොට එක බැංකුවකින් තමයි පටන් ගත්තේ. දැන් බැංකු දෙකකින් ඒක ක්‍රියාත්මක වෙනවා. මම ඔබතුමාට යෝජනා කරන්නේ මෙයයි. දැනට ක්‍රියාත්මක වන මෙම යෝජනාව මෑත කාලීනව ගෙනාපු ඉතාම වැදගත් යෝජනාවක්. එම නිසා පෞද්ගලික බැංකු එක්කත් සාකච්ඡා කරලා මේක මීට වඩා පුළුල් කර ගන්න පුළුවන් නම් ඉතාම වැදගත්.

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, අ.පොෂ. උසස් පෙළ විභාගය සමත් වන අයගෙන් සියයට 50කටවත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබා ගැනීමේ හැකියාවක් නැති අවස්ථාවක් තුළ මෙය ඉතාම වැදගත් විධියට ක්‍රියාත්මක වුණු යෝජනාවක් බව. එය තව විවෘත කරන්න, පුළුල් කර ගන්න මම මේ යෝජනාව කරනවා. ඔබතුමාගේ නායකත්වයෙන් සියලු බැංකු කැඳවලා මෙය ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් හොඳයි. මේක විෂය පථයට පරිබාහිර කාරණාවක්. හැබැයි, දරුවන්ගේ අනාගතය වෙනුවෙන් එවැනි වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන් නම්, ඉතා වැදගත් කියන එකයි මම ඔබතුමාට යෝජනා කරන්නේ.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන්නේත් ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයටම අදාළ කාරණයක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්නයටම අදාළද? *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඒකට අදාළ නැත්නම්, මම ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට උත්තර දීලා ඉන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පෞද්ගලික බැංකු කැඳවුවේ නැහැ. හැබැයි, ජාතික ඉතිරිකිරීමේ බැංකුව ඇතුළු බැංකු ගෙන්වුවා. "බැංකුව" යන්නෙහි නිර්වචනය ගත්තාට පස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙනත් කාර්යයක් සඳහා තමයි පිහිටුවා තිබෙන්නේ. එතකොට ඒ ගොල්ලන්ට ගැටලුවක් එනවා. වාණිජ බැංකුවල තිබෙනවාට වඩා, මේකේ guarantorsලා ගන්න ක්‍රමය එහෙම සම්පූර්ණයෙන් වෙනස්. ඒක නිසා ජාතික ඉතිරිකිරීමේ බැංකුව මේ කටයුත්තට සම්බන්ධ වුණේ නැහැ. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ යෝජනාව හොඳයි. අපි අනෙක් පෞද්ගලික බැංකුවලත් සහයෝගය ගන්න කටයුතු කරන්නම්. ඒ අය එකඟ වෙනවා නම්, අපිට මේ ගණන වැඩි කරන්න පුළුවන්. හැබැයි, interest free එක, ඒ කියන්නේ interest එක සියයට 11ට නම් තිබෙන්නේ, ඒ සියයට 11 භාණ්ඩාගාරයෙන් ගෙවන්න ඕනෑ. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඇති වෙලා තිබෙන ප්‍රශ්නයක් පිළිබඳවයි මම අධ්‍යාපන ඇමතිතුමාගෙන් අහන්නේ. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවසන් කරපු ගමන්ම ඒ ළමයින්ට උසස් පෙළ හදාරන්න දැන් අවස්ථාව දීලා තිබෙනවා. ඒක හොඳ තීන්දුවක්. අපි ඒක අගය කරනවා. නමුත්, ඒකෙදි ප්‍රායෝගික ගැටලු තිබෙනවා. මොකද, ඒ කලාපයේම පාසලකට තමයි යන්න කියලා තිබෙන්නේ. අපේ සමහර ප්‍රදේශවල ඒ කලාපයේම පාසලකට යන්න අමාරුයි. උදාහරණයක් ලෙස හබරාදුව, අහංගම ශාරිපුත්‍ර විද්‍යාලයේ ඉඳලා ඒ කලාපයේ පාසලකට යනවා නම් දික්කුඹුරට යන්න ඕනෑ. උදේට ඒ පැත්තට බස් නැහැ. හැබැයි, අහංගම ඉඳලා ගාල්ලට යන්න බස් තිබෙනවා. ඒ වාගේ ප්‍රායෝගික ගැටලු පිළිබඳ අවධානය යොමු කරලා ඒ ළමයින්ට අධ්‍යාපනය ලබන්න ඉඩ දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණයත් අධ්‍යාපනයට අදාළයි. ගාල්ල කොටුවේ සවුත්ලන්ඩිස් විද්‍යාලයේ සහ ඕල්සෙන්ට්ස් විද්‍යාලයේ ළමයි 7,000ක් ඉන්නවා. සංචාරක විෂය භාර අමාත්‍යතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, හදිසියේම ගාල්ල කොටුවේ පාර one-way කරලා. කිසිම ගැසට් එකක් ගහලා නැහැ, තීන්දුවක් නැහැ, හිටි හැටියේ එහෙම කරලා තිබෙනවා. ඒකෙන් දරුවන්ට වාගේම සංචාරකයන්ටත් විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරලා නීත්‍යානුකූලව වෙනසක් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන ඔක්කෝම කරුණු සලකා බලා තමයි ඔය තීන්දු ගත්තේ. අද උදේ 8.30ට මම අමාත්‍යාංශයට ගිහිල්ලා පස්වැනි වතාවටත් සතිපතා පැවැත්වෙන Zoom meeting එකට පළාත් 9ම සම්බන්ධ කරගෙන, සියලු තොරතුරු අරගෙනයි මම ආවේ. උසස් පෙළ තිබෙන පාසල් සියයට 100ක්ම මේ වන විට ආරම්භ කර තිබෙනවා. Paper marking කරන centresවල first stage එක ඊයේ වෙද්දී ඉවරයි. දැන් ඒවාත් පටන් අරගෙන තිබෙනවා. ඔබතුමා කියන ප්‍රශ්නයට විසඳුම ඒ චක්‍රලේඛයේම තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. තමන් ඉන්න පර්ෂදය තුළ හදාරන්න බලාපොරොත්තු වෙන විෂය ධාරාව සහිත පාසලක් නැත්නම් ආසන්නම පර්ෂදයට යන්න පුළුවන්. හැබැයි, අපි හිතුවොත්, උඩුගම වාගේ ප්‍රදේශයක ඉඳලා ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයට එන්න බැහැ නේ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. එවැනි ප්‍රශ්නයක් තිබෙන කිහිපදෙනෙක් ඉන්න පුළුවන්. ඒ ගොල්ලන් තමන් අයිති කලාප අධ්‍යක්ෂ හම්බ වුණාම ඒ වැඩ පිළිවෙළ හදා දෙනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ගරු සභානායකතුමාගෙන් පොඩි පැහැදිලි කරගැනීමක් කරගන්න අවශ්‍යයි. ගරු සභානායකතුමනි, ආරෝපිත කුලී ආදායම් බද්ද මුදල් අමාත්‍යාංශයේ නිවේදනය අනුව 2026දී සියයට දශම 4කින් වැඩි කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ අනුව දළ වශයෙන් රුපියල් බිලියන 100ක් වැඩි කර ගන්න ඕනෑ. එතකොට ගෙදරකින් ලක්ෂයක් ගත්තොත්, ගෙවල් ලක්ෂ 10කටවත් බදු ගහන්න ඕනෑ.

ඒ සම්බන්ධයෙන් නිර්ණායකයක් හදලා තිබෙනවාද? ජනාධිපතිතුමා මේ සභාවේදී කට වචනයෙන් කිව්වා, පළමුවැනි ගේ exempt කරනවා කියලා. නමුත් මුදල් අමාත්‍යාංශයේ නිවේදනය අනුව ඒක පැහැදිලි නැහැ. ඒ බද්ද ගහන්නේ මොන නිර්ණායකයක් මතද? මොකද, stolen assets recovery සඳහා වූ Act එකයි, ධන බද්දයි ගෙනාපු නැති නිසා නේ මේ ආරෝපිත කුලී ආදායම් බද්ද ගහන්න වෙලා තිබෙන්නේ. මේක සාමාන්‍ය ජනතාවට බලපාන්නේ මොන ආකාරයෙන්ද, මොකක්ද නිර්ණායකය කියලා පැහැදිලි කිරීමක් කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජය විසින් යම්කිසි බද්දක් පනවනවා නම් එක්කෝ එය අය වැය යෝජනාවක් හැටියට එන්න ඕනෑ. එහෙම නැත්නම් වෙනත් යෝජනාවක් හැටියට අතරමැද වෙනවා නම්, අදාළ පටිපාටිය අනුගමනය කරලා පාර්ලිමේන්තුවේ අනුමැතිය ගන්න ඕනෑ. මේ ප්‍රශ්නය තවම ඒ තරම් දුරට ඇවිල්ලා නැහැ. යම් යම් අය ඉල්ලීම් කළා, එයට අදාළ තාක්ෂණ තොරතුරු ටික ලබා දෙන්න කියලා. ඒ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය හරහා සියලුදෙනාම දැනුවත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 1 -1248/2024 - (1), ගරු ඉරාන් වික්‍රමරත්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -1252/2024- (1), ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

කුරුණෑගල දිස්ත්‍රික්කයේ රජයේ රෝහල්: මානව හා භෞතික සම්පත් හිඟය

குருநாகல் மாவட்ட அரசாங்க வைத்தியசாலைகள்: மனித மற்றும் பௌதிக வள குறைபாடுகள்

GOVERNMENT HOSPITALS IN KURUNEGALA DISTRICT: SHORTAGE OF HUMAN AND PHYSICAL RESOURCES

1283/2024

3. ගරු අසංක නවරත්න මහතා
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ රජයේ රෝහල්වල මේ වනවිට පවතින මානව සම්පත් හා භෞතික සම්පත් ඌනතා සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(ii) එම ඌනතා සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்தின் அரசாங்க வைத்திய சாலைகளில் இன்றளவில் காணப்படும் மனித வள மற்றும் பௌதிக வள குறைபாடுகள் தொடர்பில் முழுமையான அறிக்கையொன்றைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(ii) மேற்படி குறைபாடுகளை நிவர்த்தி செய்வதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iii) ஆமெனில், அதன் பொருட்டு இன்றளவில் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) whether a comprehensive report be submitted regarding the current shortages of human resources and physical resources in the government hospitals of Kurunegala District;

(ii) whether steps will be taken to address the above deficiencies; and

(iii) if so, the steps taken so far in that regard?

(b) If not, why?

ගරු (වෛද්‍ය) සීතා අරඹෙපොළ මහත්මිය (සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சீதா அரம்பேபொல - சுகாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Seetha Arambepola - State Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ශික්ෂණ රෝහල් 02ක් ද, මූලික රෝහල් 4ක් ද, ප්‍රාදේශීය රෝහල් 40ක් ද, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 31ක් ද, ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක 54ක් ද, සෞඛ්‍ය සේවා සැපයීම සිදු කරනු ලබයි. මෙම රජයේ රෝහල්වල මේ වන විට පවතින මානව සම්පත් හා භෞතික සම්පත් ඌනතාවන් සම්බන්ධයෙන් සලකා බැලීමේදී, කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් රෝහල්වල පවතින තනතුරු පුරප්පාඩු සම්බන්ධ සවිස්තර වාර්තාවක් ඇමුණුම 01 සහ 02 මඟින් දක්වා ඇත.

ඇමුණුම 01 සහ 02 **සභාගත*** කරමි.

භෞතික සම්පත් ඌනතා වශයෙන් හඳුනාගෙන ඇති, නිකවැරටිය මූලික රෝහල මානෘ සංකීර්ණයක අවශ්‍යතාවත්, දඹදෙණිය මූලික රෝහල නව වාට්ටු සංකීර්ණයක අවශ්‍යතාවත්, පොල්පිතිගම මූලික රෝහලේ හදිසි අනතුරු ඒකකය සඳහා නව ගොඩනැඟිල්ලක් සහ වෛද්‍ය නිල නිවාසයේ වැඩ අවසන් කිරීමත්, ගල්ගමුව මූලික රෝහලේ වෛද්‍ය සහ හෙද නිල නිවාසයෙහි වැඩ අවසන් කර ගැනීමත් කළ යුතුව ඇත. කුරුණෑගල දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය ආයතන තුළ පවතින වාහන බොහොමයක් වසර 20කට පෙර නිෂ්පාදිත වාහන වන බැවින් නිරන්තරයෙන් මෙම වාහන අලුත්වැඩියා කිරීමට සිදු වේ. එබැවින් නව වාහන ලබා ගැනීමේ අවශ්‍යතාව ද පවතී.

(ii) ඔව්.

(iii) ඒ පිළිබඳව අවධානය යොමු කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය මේ වනවිටත් පියවර ගෙන තිබෙනවා. ඒ අනුව මානව සම්පතට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමෙන් පසුව 2023.11.01 වන විට සීමාවාසික පුහුණුව අවසන් කර ඇති වෛද්‍ය නිලධාරීන් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සේවයට යොදවනවා.

ඊට අමතරව භෞතික සම්පත් වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි කුරුණෑගල ශික්ෂණ රෝහල සියලු පහසුකම්වලින් සමන්විත රෝහලක් බවට පත් කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වනවිටත් ලැබී අතර, ඒ යටතේ වයඹ විශ්වවිද්‍යාල නව වෛද්‍ය පීඨය සඳහා නව මහාචාර්ය ඒකකයක්, නව හදිසි අනතුරු ඒකකයක්, නිල නිවාස සහ සේවා ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට යෝජිතව පවතී.

ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව අපි හඳුනාගත් අඩු පාඩු පිළිබඳව -මුලින් සඳහන් කරපු ඒ අඩු පාඩු- සකස් කර ගැනීම සඳහා ඊළඟ අයවැයට යෝජනා මේ වනවිටත් සකස් කර තිබෙනවා. ඊට අමතරව ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ තව වසර පහකට ප්‍රාථමික සෞඛ්‍ය සේවය වර්ධනය සඳහා අනුමැතිය ලැබිලා තිබෙනවා. ඒ තුළින් ප්‍රාථමික සෞඛ්‍ය සේවයට අවශ්‍ය වන අඩු පාඩු සකස් කර ගැනීමේ යෝජනා අමාත්‍යාංශයේ සංවර්ධන අංශය විසින් සකස් කර තිබෙනවා.

(ආ) පැන නොනඟී.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු අසංක නවරත්න මහතා
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිළිතුරු ලබා දීම සම්බන්ධව ගරු රාජ්‍ය අමාත්‍යතුමියට මම ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ජාතික ලැයිස්තුවෙන් පත් වුණත්, ඔබතුමිය නියෝජනය කරන්නේත් කුරුණෑගල දිස්ත්‍රික්කය. ඔබතුමියත් දන්නවා, මේ වන විට පළාත් සභා අකර්මණ්‍ය වෙලා, ආණ්ඩුකාරතුමාගේ පාලනය යටතේයි තිබෙන්නේ කියලා. පළාත් සභාවල මහජන නියෝජිතයෝ නැහැ. ඒ වාගේම අපට අවස්ථාවකුත් නැහැ, පළාත් සභා යටතේ තිබෙන රෝහල්වල තිබෙන අඩු පාඩු සම්බන්ධයෙන් යම් මැදිහත්වීමක් කරන්න. මීට මාස දෙකකට පෙර ගරු අමාත්‍යතුමා ආණ්ඩුකාරතුමා සමඟ වයඹ පළාතේ මන්ත්‍රීවරුන් සහ නිලධාරීන්ව හමු වුණා. ඒ සාකච්ඡාවේදීත් අපි මේ කාරණා මතු කළා. විශේෂයෙන්ම ඔබතුමියට මතක් කරන්න ඕනෑ, මේ වෙනකොට ප්‍රාදේශීය රෝහල් ගණනාවකට අවශ්‍ය මූලික මානව සම්පත්, භෞතික සම්පත් සපයා දීමට නොහැකිව පළාත් සභාව බොහොම අසරණ තත්ත්වයකට පත්වෙලා තිබෙනවා කියලා. විශේෂයෙන්ම වෛද්‍යවරුන්ගේ සහ හෙද කාර්ය මණ්ඩලයේ විශාල හිඟයක් තිබෙනවා. ප්‍රාදේශීය රෝහල්වලට සාමාන්‍ය රෝගී තත්ත්ව යටතේ වුණත් ඇතුළු වන රෝගීන්ව කුරුණෑගල ශික්ෂණ රෝහලට ගිලන් රථයකින් මාරු කර යවනවා. මේ වෙනකොට ඒක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. කුරුණෑගල ශික්ෂණ රෝහලටත් මේක දරාගන්න බැහැ. රෝගීන්ගේත් විශාල තදබදයක් මේ වෙනකොට එම රෝහලේ තිබෙනවා. අපි මේ කාරණාව දිගින් දිගටම මතු කළා. ඒ නිසා අපි විශේෂයෙන් ඉල්ලීමක් කරනවා, ප්‍රාදේශීය රෝහල්වල සහ මූලික රෝහල් කිහිපයේ පවතින භෞතික සම්පත්වල අඩු පාඩු ටික ඉතා ම ඉක්මනින් සම්පූර්ණ කර දෙන්න කියලා. මානව සම්පත සම්බන්ධයෙන් තිබෙන ගැටලුව අපි දන්නවා. පසුගිය කාලයේ වෛද්‍යවරු රට හැර ගියා. විශාල වශයෙන් බුද්ධිගලනයක් ඇති වුණා. ඒ විධියටම හෙද කාර්ය මණ්ඩලයත් නිවාඩු ලබාගෙන හෝ නොගෙන විදේශගත වීමේ ප්‍රවණතාවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරනවාද කියලා මම ඔබතුමියගෙන් දැනගන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) සීතා අරඹෙපොළ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சீதா அரம்பேபொல)
(The Hon. (Dr.) (Mrs.) Seetha Arambepola)
ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා යටතේ තිබෙන සියලු ආයතනවල කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ සහ භෞතික සම්පත් දියුණු කිරීමේ බලතල මේ වෙනකොට පළාත් සභාව යටතේ ආණ්ඩුකාරතුමාට පැවරී තිබෙනවා. ඔබතුමා මතු කළේ, රටක සෞඛ්‍ය සම්බන්ධයෙන් තිබෙන ගැටලුවක්. ඒ සම්බන්ධයෙන් පළාත් සභාවලට අයත් ආයතනවල නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අවධානය යොමු කරවන්නම්. ගරු අමාත්‍යතුමා පැමිණියොත් ඔබතුමා අවධානයට ලක් කරපු කාරණාව පිළිබඳව නැවත සිහි ගැන්වීමක් කරන බවටත් මම ඔබතුමාට පොරොන්දු වෙනවා.

ගරු අසංක නවරත්න මහතා
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාට අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
බොහොම ස්තුතියි, ගරු අසංක නවරත්න මන්ත්‍රීතුමනි.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, 2023 ජූලි මාසයේදී වාගේ කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලේදී "හම්දි" කියන අවුරුදු තුනක් වයසැති දරුවාගේ වකුගඩුවක් ඉවත් කිරීමේ සැත්කමේදී නීරෝගීව තිබුණු වකුගඩුවත් ඉවත් කරලා තිබෙනවා.

ඒ නරක් වුණු වකුගඩුවයි, නීරෝගීව තිබුණු වකුගඩුවයි - වකුගඩු දෙකම- ඉවත් කරපු නිසා ඒ ළමයාගේ ජීවිතය අහිමි වුණා. ඒක කරපු වෛද්‍යවරයාත් ඉතා ඉක්මනින් රටින් පිට වෙලා ගියා. 2023 අගෝස්තු මාසයේදී රවුල් හකීම් මැතිතුමා පාර්ලිමේන්තුවේදී හිටපු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් මේ ගැන කරුණු විමසීමේදී හිටපු සෞඛ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා, සෞඛ්‍ය අමාත්‍යාංශය මේ පිළිබඳව පරීක්ෂණයක් කරනවා, ඒ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා කියලා. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, තවම ඒ වාර්තා ඉදිරිපත් වෙලා නැහැ. ඒ මරණය සිද්ධ වෙලා දැන් අවුරුද්දක කාලයක් ගත වෙලා තිබෙනවා. මම ඔබතුමියගෙන් අහනවා, ඒ පරීක්ෂණ පිළිබඳ තත්ත්වය මොකක්ද, ඒ වාර්තා පාර්ලිමේන්තුවට දෙන්නේ කවදාද කියලා.

ගරු (වෛද්‍ය) සීතා අරඹෙපොළ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சீதா அரம்பேபொல)
(The Hon. (Dr.) (Mrs.) Seetha Arambepola)
ඒවා සෞඛ්‍ය ලේකම්තුමා හරහා අවශ්‍ය විධියට නිල වශයෙන් පාර්ලිමේන්තුවට ලබා දෙනවා. අද දවසේදී මා අවධානය යොමු කරන්නම්, ඒවා ලබා ගැනීමට අවශ්‍ය නිලධාරීන් සහ ඒ පර්යේෂණ වාර්තා පිළිබඳව. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ඒ පිළිබඳව දැනුම් දෙන්නම්.

ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා.

ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම වටිනා කාරණයක් සම්බන්ධව ගරු රාජ්‍ය ඇමතිතුමියගේ අවධානය යොමු කරන්නයි මම අවස්ථාවක් ඉල්ලා ගත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන්නේ සෞඛ්‍යයට අදාළ ප්‍රශ්නයක්ද?

ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

ඔව්, සෞඛ්‍යයට අදාළ ප්‍රශ්නයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ දවස්වල ජපානයේ වේගයෙන් ව්‍යාප්ත වෙනවා, ශරීරයට ඇතුළු වුණාට පස්සේ පැය 48ක් ඇතුළත මරණය ගෙනෙන බැක්ටීරියාවක් ගැන. ලංකාවටත් ඒකේ අවදානම තිබෙනවා කියන එක ඊයේ දින පුවත් පත්වල ප්‍රධාන මාතෘකාව බවට පත් වෙලා තිබුණා. මේ වෙද්දි සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ සඳහා මොන වාගේ සූදානමක් තිබෙනවාද කියලා අපි ගරු රාජ්‍ය ඇමතිතුමියගෙන් දැනගන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) සීතා අරඹෙපොළ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சீதா அரம்பேபொல)
(The Hon. (Dr.) (Mrs.) Seetha Arambepola)

ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව විශාල වශයෙන් ලෝකයේ අවධානය යොමු වෙලා තිබෙනවා. නමුත්, ගෝලීය තත්ත්වයකට යන්න තරම් ලෝක සෞඛ්‍ය සංවිධානය එම බැක්ටීරියාව හඳුනාගෙනත් නැහැ. එය බැක්ටීරියා ආසාදනයක් බැවිනුත්, බොහෝ වෙලාවට ප්‍රතිජීවක ඖෂධ මඟින් වයිරසයකට වඩා හොඳින් පාලනය කළ හැකි නිසාත් ඒ අදාළ රටවල් මේ වන විටත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙමින් සිටිනවා. ලංකාවට එම වයිරසය ඇතුළු වීම වළක්වා ගන්න අවශ්‍ය උපදෙස් දීලා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියන කාරණය ගුවන් තොටුපොළ ඇතුළු සියලු තැන්වලට සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් දැනුම් දී තිබෙනවා. එය කොවිඩ් වසංගතය වාගේ ගෝලීය වංසගතයක් බවට පත් වෙන්නේ නැහැ. මොකද, එය බැක්ටීරියා ආසාදනයක් බැවින් බොහෝ විට ඒ ඒ රට තුළදීම එය පාලනය කරගන්න පුළුවන් තත්ත්වයක් පවතිනවා. නමුත් සෞඛ්‍ය ලේකම්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඇතුළු සියලුදෙනා මේ වන විට ඒ පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි වෙලාවක් ලබා දෙන්න.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, මාධ්‍ය කිහිපයකින් අපට දැනගන්න ලැබුණා අරණායක ප්‍රදේශයේ, ඉපදුණු මොහොතේ සිට එකට බද්ධ වුණු දරුවන් දෙපළක් ඉන්න බව.

මම හරියටම දන්නේ නැහැ. මට දැනගන්න ලැබුණු ආකාරයට ඒ දරුවන් දෙදෙනාටම තිබෙන්නේ වකුගඩු දෙකක්. ඒ දරුවන් දෙදෙනා එකට බද්ධ වෙලා ඉන්නේ. වෛද්‍යවරුන්ගේ උපදෙස තමයි, ඒ දරුවන් දෙදෙනාට වයස අවුරුදු 4ක් වීමට පෙර ඔවුන්ගේ ශරීර දෙක වෙන් කරන්න ඕනෑ, ඒ සඳහා බොහොම සංකීර්ණ ශල්‍යකර්මයක් කරන්නට සිදු වෙනවා කියන කාරණාව. මේ වන විට අවුරුදු 3කට ආසන්න කාලයක් එම දරුවන් දෙදෙනා ශරීරවලින් එකිනෙකාට බද්ධ වෙලා ඉන්නවා. එම දරුවන් වෙනුවෙන් ඒ ශල්‍යකර්මය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය මැදිහත් වෙලා, විශේෂිත වෛද්‍ය කණ්ඩායමක් අරණායක ප්‍රදේශයට යවලා, ඒ දරුවන්ට ලබා දිය යුතු සෞඛ්‍ය පහසුකම් සහ ඒ දරුවන් දෙදෙනාගේ ජීවිත බේරා ගැනීම සඳහා කළ යුතු ශල්‍යකර්මය රජයේ මැදිහත්වීමෙන් කළ යුතුයි කියන එකයි අපේ යෝජනාව. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඒ දේ ඉෂ්ට කරන්න ඔබතුමිය මැදිහත් වෙනවාද?

ගරු (වෛද්‍ය) සීතා අරඹෙපොළ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சீதா அரம்பேபொல)
(The Hon. (Dr.) (Mrs.) Seetha Arambepola)

මීට දවස් දෙකකට පෙර ඒ පිළිබඳ දර්ශන මමත් නැරඹුවා, ඒ පිළිබඳව දැනගත්තා. මම හිතන විධියට, ඒ බද්ධ වීම සංකීර්ණ තත්ත්වයක්. එහිදී අවයව පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, එය සාමාන්‍ය ශල්‍යකර්මයකට වඩා සංකීර්ණයි. එම නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මම පෞද්ගලිකවත් විමසීමක් කළා, එයට මැදිහත්විය හැකි ආකාරය සහ ඊට අවශ්‍ය ප්‍රවීණත්වය තිබෙන, සුදුසුකම් ලත් වෛද්‍යවරුන් සිටිනවාද, ඒ සඳහා පහසුකම් තිබෙන ශල්‍යාගාර තිබෙනවාද කියන එක. ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය මට අද දවසේ දැනුම් දෙන්නම් කියලා තිබෙනවා. ඒ පිළිබඳව දැනගත් පසු ඔබතුමාට පෞද්ගලිකවත්, අවශ්‍ය නම් මේ සභාවට ඊට පසුවත් දැනුම් දෙන්නම්. ඒ පිළිබඳව කරුණු මතු කිරීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන: විස්තර

பொலன்னறுவை மாவட்ட உள்ளூராட்சி நிறுவனங்கள்: விபரம்

LOCAL GOVERNMENT INSTITUTIONS IN POLONNARUWA DISTRICT: DETAILS

1286/2024

4. ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තිබෙන පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) වර්ෂ 2018 සිට මේ දක්වා එම එක් එක් පළාත් පාලන ආයතනයේ වාර්ෂික ආදායම හා වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන අතරින් මූල්‍ය හා භෞතික සම්පත් හිඟ පළාත් පාලන ආයතන නගා සිටුවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருமான வரைக் கேட்ட வினா:

(அ) (i) பொலன்னறுவை மாவட்டத்திலுள்ள உள்ளூராட்சி நிறுவனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அந்நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) 2018ஆம் ஆண்டு முதல் இதுவரை மேற்படி ஒவ்வோர் உள்ளூராட்சி நிறுவனத்தினதும் வருடாந்த வருமானம் மற்றும் செலவினம் தனித்தனியே யாதென்பதையும்;

(iv) பொலன்னறுவை மாவட்டத்திலுள்ள உள்ளூராட்சி நிறுவனங்களுக்கு மத்தியில் நிதி மற்றும் பௌதிக வளங்கள் குறைந்த உள்ளூராட்சி நிறுவனங்களைக் கட்டியெழுப்புவதற்காக மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු කිංස් නෙල්සන් මහතා]

asked the Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he inform this House of the -

(i) number of local government institutions in the Polonnaruwa District;

(ii) names of those institutions;

(iii) annual income and expenditure of each of the said institutions from 2018 up to now, separately; and

(iv) steps taken to uplift the local government institutions with financial and physical resource shortages, out of the local government institutions in the Polonnaruwa District?

(b) If not, why?

ගරු අශෝක ප්‍රියන්ත මහතා (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அசோக்க பிரியந்த - உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)

(The Hon. Ashoka Priyantha - State Minister of Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) පළාත් පාලන ආයතන සංඛ්‍යාව 08කි.

(ii) 1. පොළොන්නරුව මහ නගර සභාව
2. පොළොන්නරුව ප්‍රාදේශීය සභාව
3. ඇලහැර ප්‍රාදේශීය සභාව
4. හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව
5. මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව
6. ලංකාපුර ප්‍රාදේශීය සභාව
7. දිඹුලාගල ප්‍රාදේශීය සභාව
8. වැලිකන්ද ප්‍රාදේශීය සභාව

(iii) ඇමුණුමෙහි දක්වා ඇත.

(iv) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන නහාසිටුවීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය, ස්වයං උත්පාදන ආදායම් ප්‍රවර්ධනය සහ කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2024 වර්ෂයට පහත සඳහන් පරිදි මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමට නියමිතව ඇත.

I. ලෝක බැංකු ණය ආධාර සහ යුරෝපා ආධාර යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය - LDSP - මඟින් 2024 වසරේ රුපියල් මිලියන 680ක පමණ ප්‍රතිපාදන යොදා ගනිමින් උප ව්‍යාපෘති යෝජනා 53ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

II. ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක පළාත් පාලන ආයතන ධාරිතා සංවර්ධන වැඩසටහන - CDLG - යටතේ පළාත් පාලන ආයතන 8හි නිලධාරීන් හා සේවකයින්ගේ ධාරිතා සංවර්ධන කටයුතු සඳහා 2024 වසරට රුපියල් මිලියන 08ක මුදලක් වෙන් කර ඇත.

III. CDLG වැඩසටහන මඟින් ප්‍රාදේශීය සභාවල දියුණු ගම් ප්‍රදේශ -වරිපනම් ප්‍රදේශ- හඳුනාගෙන ඒවා ගැසට් නිවේදන මඟින් පළ කර පළාත් පාලන ආයතනවල ආදායම් වැඩි කර ගැනීමට කටයුතු සම්පාදනය කරමින් පවතී.

IV. දේශීය අරමුදල් මඟින් මහා භාණ්ඩාගාරය සපයා ඇති මූල්‍ය ප්‍රතිපාදන මඟින් 2024 වසරේදී පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතරම අර්ධ වශයෙන් නිමකර ඇති එම ව්‍යාපෘතිවල ඉතිරි වැඩ නිම කිරීමට රුපියල් මිලියන 83.641ක් වෙන් කර ඇත.

- දියබෙදුම සතිපොළ සංවර්ධනය, බකමූණ ළමා උද්‍යානය අසල කඩ කාමර ඉදිකිරීම, අත්තනකඩවල පොළ භූමිය සංවර්ධනය කිරීම - රුපියල් මිලියන 34.64

ඇමුණුම

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනයන්හි 2018 වසරේ සිට 2023 වර්ෂය දක්වා වාර්ෂික ආදායම හා වියදම (ක්ෂයවීම් හැර)

රු.මි.

පළාත් පාලන ආයතනය	2018 වර්ෂය		2019 වර්ෂය		2020 වර්ෂය		2021 වර්ෂය		2022 වර්ෂය		2023 වර්ෂය	
	ආදායම	වියදම	ආදායම	වියදම	ආදායම	වියදම	ආදායම	වියදම	ආදායම	වියදම	ආදායම	වියදම
පොළොන්නරුව මහා නගර සභාව	94	99	154	130	217	205	189	155	228	211	238	186
ලංකාපුර ප්‍රාදේශීය සභාව	45	40	42	41	55	45	82	60	61	49	62	49
හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව	153	143	168	142	99	95	141	131	219	211	195	191
ඇලහැර ප්‍රාදේශීය සභාව	50	46	58	50	49	43	99	96	68	50	74	44
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව	85	82	58	57	82	48	93	75	80	59	96	53
දිඹුලාගල ප්‍රාදේශීය සභාව	76	79	90	90	78	78	125	113	124	97	128	134
පොළොන්නරුව ප්‍රාදේශීය සභාව	53	40	228	215	63	58	105	102	74	61	48	46
වැලිකන්ද ප්‍රාදේශීය සභාව	99	87	58	54	53	38	152	128	64	48	58	52
එකතුව	655	616	856	779	696	610	986	860	918	786	899	755

1. 2018 වර්ෂයේ දී පොළොන්නරුව මහා නගර සභාව සහ පොළොන්නරුව ප්‍රාදේශීය සභාව ආරම්භ කිරීමේදී පොළොන්නරුව මහා නගර සභාවට රු.මිලි.12 ක වටිනාකමකින් යුත් අත්තිකාරම් මුදලක් පුනරාවර්ථන වියදම් සඳහා ලැබී ඇති අතර එම මුදල ආදායම් ලැබීම් වශයෙන් සටහන් කර නොමැතිව මුදල් පොතේ පමණක් සටහන් කර වියදම් දරා තිබීමෙන් 2018 වර්ෂයේ පොළොන්නරුව මහා නගර සභාවේ ආදායමට වඩා වියදම වැඩිවීමට හේතු වී ඇත.

2. 2018-2020 වර්ෂවල ණයගැති හා ණයකිම් ගුද්ධ මුදල් ප්‍රවාහය තුළින් මූල්‍යනය කිරීම දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ ආදායමට සාපේක්ෂව වියදම වැඩි වීමට හේතු වී ඇත.

- සුංගාවිල සතිපොළ සංවර්ධනය කිරීම - රුපියල් මිලියන 18.87
- හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට පානීය ජල පෙරණ යන්ත්‍ර ලබා දීම - රුපියල් මිලියන 11.228
- පොළොන්නරුව මහ නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා - රුපියල් මිලියන 15.103
- වෙහෙරගල ජල ව්‍යාපෘති ගොඩනැඟිල්ල අලුත්වැඩියාව - රුපියල් මිලියන 3.8

V. 2024 වසරේ අය වැය යෝජනා අංක 81 යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සඳහා සංචාරක කර්මාන්තය ආශ්‍රයෙන් ආදායම් උත්පාදනය සඳහා රුපියල් මිලියන 31.5ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජිතව ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විෂය භාර රාජ්‍ය ඇමතිතුමා ගරු සභාවට පැමිණ සිටිනවා. එතුමා අතුරු ප්‍රශ්නවලට උත්තර ලබා දෙයි. ඉතා අමාරු කාලයක පොළොන්නරුවේ මෙපමණ ව්‍යාපෘති ප්‍රමාණයක් ක්‍රියාත්මක වීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා සතුටු වෙන්න ඕනෑ.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තිබෙන පළාත් පාලන ආයතන සියල්ල එකතු කරනු ලබන දිරන කසළ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුංගාවිල කියන ගම්මානයේ තිබෙන මධ්‍යස්ථානයකට ගෙන යනවා. "Kawashima" කියන නමින් 2020 ජූනි මාසයේ මේ සම්බන්ධයෙන් ව්‍යාපෘතියක් ආරම්භ කළා. එහිදී සිදු වන්නේ දිරන කසළ එකතු කරලා කාබනික පොහොර නිෂ්පාදනය කිරීම. එය ඉතා සාර්ථකව කාබනික පොහොර හදන මධ්‍යස්ථානයක් විධියට පවත්වාගෙන ගියා. 2021 වසරේදී මෙම පොහොර විකුණා රුපියල් ලක්ෂ 27ක ආදායමකුත් ලැබුවා. දැන් එන්න එන්නම එම ආයතනය කඩා වැටෙමින් තිබෙනවා. ඒ ව්‍යාපෘතිය වෙනුවෙන් විශාල මුදලකුත් වැය කර තිබෙනවා. ඒ මැෂින් එකට රුපියල් කෝටි 8ක් වියදම් කර තිබෙනවා. තවත් යන්ත්‍රෝපකරණ අරගෙනත් තිබෙනවා. ඒ වාගේම ඒ ගොඩනැඟිල්ලටත් රුපියල් කෝටි 7ක් වැය කර තිබෙනවා. මේ වනකොට එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අඩපණ වෙලා තිබෙනවා. එය පළාත් පාලන ආයතනවලට ආදායමක් ලැබුණු ව්‍යාපෘතියක්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, එම ආයතනය නැවත පණ ගන්වනවාද, ඒ වාගේම ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් මේ සඳහා ලබා දෙන දායකත්වය මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු ජානක වක්කුඹුර මහතා (පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜானக வக்கும்புர - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura - State Minister of Provincial Councils, Local Government and Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "Kawashima" ව්‍යාපෘතිය යටතේ අපි ලංකාවේ කිහිප ස්ථානයක මේ වාගේ මධ්‍යස්ථාන පටන් අරගෙන තිබුණා. ඇතැම් මධ්‍යස්ථාන දැන් අඩපණ වෙලා තිබෙන බව අපි පිළිගන්නවා.

අපේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමියත්, අපිත් දැන් මේ සියලුම දේවල් ගැන සොයා බලනවා. මේ කටයුත්ත ලංකාවේ හොඳටම කරපු දඹුල්ලෙත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගැන සොයා බලා අවශ්‍ය කටයුතු කරගෙන යනවා. අපි ඉතා ඉක්මනින් අමාත්‍යාංශයේම කණ්ඩායමක් යවලා ඔබතුමා කියපු කාරණය පිළිබඳව සොයා බලන්න අවශ්‍ය කටයුතු කරනවා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් ගරු රාජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, පොළොන්නරුව මහ නගර සභාව විසින් තමන්කඩුව නගරයේ පර්චස් 60ක ඉඩමක් අරගෙන මම හිතන විධියට රුපියල් ලක්ෂ 800ක් විතර වියදම් කරලා, කඩ කාමර අටක් හැදුවා. මෙතැන පර්චසයක වටිනාකම රුපියල් ලක්ෂ 30ක් විතර වෙනවා. පොළොන්නරුව මහ නගර සභාවෙන් රුපියල් ලක්ෂ 800ක් විතර වැය කරලා හදපු මේ කඩ කාමර අට යම්කිසි පුද්ගලයෙක් විසින් රුපියල් ලක්ෂ 350ක් ගෙවලා, අවුරුදු 30ක බදු ක්‍රමයකට ලබාගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ වෙනකොට එතැන මත්පැන් විකුණන්න බලපත්‍රයකුත් අරගෙන තිබෙනවා. මේ නිසා දැන් නගරයේ ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. නගරයේම විහාරස්ථානයක් තිබෙනවා. ඒ පන්සලේ ස්වාමීන් වහන්සේත් මේ සම්බන්ධව කථා කළා. ග්‍රාම නිලධාරිතුමන්ලා ඊට සම්බන්ධ වුණා. මෙච්චර මුදලක් වැය කරලා, පොළොන්නරුව මහ නගර සභාව හදපු මේ ගොඩනැඟිල්ල කිසිම කථාවක්වත් නැතිව වෙළෙඳුන්ට වෙන්දේසි කරන්න ඉඩ දීලා තිබෙනවා. මේ ඉඩමේ වටිනාකම විතරක් රුපියල් ලක්ෂ 2,000ක් විතර වෙනවා. ගොඩනැඟිල්ලට රුපියල් ලක්ෂ 800ක් වැය කරලා තිබෙනවා. යම් පුද්ගලයෙක් මේක අරගෙන තිබෙනවා. නමුත්, රුපියල් ලක්ෂ 350න්, සියයට 50යි ගෙවලා තිබෙන්නේ. මේ වෙනකොට ඒක අවුරුදු 30කට බදු දීලා, අරක්කු ලයිසන් එකකුත් දීලා. මේ සම්බන්ධව ඔබතුමන්ලා දැනුවත්ද, මේක වුණේ කොහොමද කියන එක ගැන පොඩ්ඩක් පැහැදිලි කරලා දුන්නොත් හොඳයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු මුල් ප්‍රශ්නයේ මේ කාරණය පිළිබඳව සඳහන් වෙලා තිබුණේ නැහැ. එහෙම මේ කාරණය ගැන සඳහන් වෙලා තිබුණා නම් අපි ඒ පිළිබඳව සොයා බලනවා. මම මේ පිළිබඳව නගර සභාවෙන් සම්පූර්ණ වාර්තාවක් ගෙනැත් ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. සාමාන්‍යයෙන් අපි මොනම හේතුවක් නිසාවත් ටෙන්ඩර් පටිපාටියෙන් පිටත දෙන්න කටයුතු කරන්නේ නැහැ. මම හිතන හැටියට ටෙන්ඩර් පටිපාටියට අනුව තමයි දෙන්න ඇත්තේ. හැබැයි, ක්‍රමවේදයෙන් පිට දීලා තිබෙනවා නම්, අපි ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කරනවා. ඒ වාගේම ඔබතුමා කිව්වා, බාර් ලයිසන් එකකුත් අරගෙන තිබෙනවාය කියලා. ඒක නීත්‍යානුකූලව ලබා දෙන එක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කටයුත්තක්. ඒ පිළිබඳව යම් ගැටලුවක් තිබෙනවා නම්, එය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට තමයි දැනුම් දෙන්න ඕනෑ. මොකද, අපි ඒ බලපත්‍ර සම්බන්ධව කටයුතු කරන්නේ නැහැ. අපේ ආයතනයෙන් ලබා දෙන්නේ කඩ කාමර විතරයි.

එතකොට ලයිසන් එක ලබා දෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙක අහලා ඉවරයි.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක පොඩි පැහැදිලි කර ගැනීමක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
තව ප්‍රශ්නයක්ද?

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
නැහැ, ප්‍රශ්නයක් නොවෙයි. පොඩි පැහැදිලි කර ගැනීමක්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමා කිව්වා, ඒ විධියට වෙනවා නම්, ඒක ටෙන්ඩර් පටිපාටියෙන් තමයි ක්‍රියාත්මක වෙන්නේ කියලා. නගරයේ ඉන්න කිසිම වෙළෙන්දෙක් මේ ගොඩනැඟිල්ල අවුරුදු 30කට බදු දුන්නේ කොහොමද කියලා කිසිම දෙයක් දන්නේ නැහැ. නමුත්, දැන් අවුරුදු 30කට බදු දීලා ඉවරයි. මේ කාරණය සම්බන්ධව පත්තරේක පළ වුණේවත් නැහැ; පොළොන්නරුව මහ නගර සභාවේවත් මේ ගැන ප්‍රදර්ශනය වුණේ නැහැ. ඒ නිසා මේ සම්බන්ධව සොයා බලා මේ කටයුත්ත නවත්වන්න වෙනවා, ගරු රාජ්‍ය ඇමතිතුමනි. මේක ලොකු අසාධාරණයක්. අනෙක, නගරයේ කෙනෙකුටවත් නොවෙයි මේ දීලා තිබෙන්නේ; පොළොන්නරුවේ කෙනෙකුටවත් නොවෙයි දීලා තිබෙන්නේ; පිට පළාතක කෙනෙකුට තමයි දීලා තිබෙන්නේ.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැන විශේෂයෙන්ම සොයා බලනවා. අපි කිසිම මොහොතක කියලා නැහැ, ටෙන්ඩර් පටිපාටියෙන් තොරව කිසිම කෙනෙකුට දෙන්න කියලා. එහෙම දීලා තිබෙනවා නම්, එය අවලංගු කරන්නත් කටයුතු කරනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අශෝක ප්‍රියන්ත රාජ්‍ය ඇමතිතුමාගෙන් මට ඉතාම කෙටි පැහැදිලි කර ගැනීමක් කරගන්න අවශ්‍යයි. ඒ සඳහා පොඩි වෙලාවක් ලබා දෙන්න.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, 2020.07.17වෙනි දා රාජ්‍ය කළමනාකරණ සේවා (විවෘත) තරග විභාගය සඳහා අයදුම් පත් කැඳෙව්වා. නමුත් මේ දක්වාම ඒ විභාගය පවත්වා නැහැ. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය කළමනාකරණ සේවා ව්‍යවස්ථාව යටතේ සියයට 70ක් විවෘත විභාගයෙනුත්, සියයට 30ක් සීමිත විභාගයෙනුත් බඳවා ගැනීම තමයි ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ. හැබැයි, 2020 ඉඳලා මේ දක්වා ඒ බඳවා ගැනීම කරලා නැහැ. සීමිත බඳවා ගැනීම සිද්ධ වුණා. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මොකද, දැන් අවුරුදු හතරකට ආසන්න කාලයක් තිස්සේ තරුණ, බුද්ධිමත් දරුවෝ බලාගෙන ඉන්නවා, මේ විභාගයට මුහුණ දෙන්න.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ ඒ ඉල්ලීම සහ පැහැදිලි කිරීමට පිළිතුරු වශයෙන් මම මේ කාරණය ප්‍රකාශ කරනවා. ගරු අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් තිබෙනවා, රාජ්‍ය නිලධාරීන් බඳවා ගැනීම පිළිබඳව සොයා බැලීම සහ ඒ පිළිබඳව වැඩ පිළිවෙළ කිරීම නමින්. එතුමා ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේදීත් මට සහයෝගය ලබා දුන්නා. මම ඊයේ එතුමා සභාවේ හිටියේ නැති වුණත් එතුමාට ස්තුති කළා. අපේ අග්‍රාමාත්‍යතුමාගේ වැඩ පිළිවෙළට එතුමා සහයෝගය ලබා දුන්නා. මේ කාරණාව සම්බන්ධයෙනුත් මම ගරු අග්‍රාමාත්‍යතුමාව දැනුවත් කරලා, අග්‍රාමාත්‍ය ලේකම්තුමාගෙන් සැදුම්ලත් කමිටුවටත් මේ වාර්තාව ඉදිරිපත් කරලා, ඉතාම ඉක්මනින් මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්නම්.

නිවාස තුළ සිදුවන ස්වාභාවික මරණ: ග්‍රාම නිලධාරි සහ රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යභාරය

வீடுகளில் நிகழும் இயற்கை மரணங்கள்: கிராம உத்தியோகத்தர் மற்றும் பதிவாளரது பொறுப்புகள்

NATURAL DEATHS OCCURRING AT HOME: ROLE OF GRAMA NILADHARI AND REGISTRAR

1701/2024

5. ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නිවාස තුළ සිදු වන ස්වාභාවික මරණ ලියාපදිංචි කිරීමේදී, මරණය සිදු වන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයාගේ හා රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ස්වාභාවික මරණයකදී, මරණයට පත් වූ පුද්ගලයාගේ මරණයට හේතුව තහවුරු කර ගනු ලබන නීත්‍යනුකූල ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පිරතම අමைச්சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருமான வரைக் கேட்ட வினா:

(அ) (i) வீடுகளில் நிகழும் இயற்கை மரணங்களைப் பதிவுசெய்கையில், மரணம் நிகழும் பிரிவின் கிராம உத்தியோகத்தர் மற்றும் பதிவாளரது பணிப் பொறுப்புகள் வெவ்வேறாக யாவை;

(ii) இயற்கை மரணமொன்றின்போது, மரண மடைந்த நபரின் மரணத்துக்கான காரணத்தை உறுதிப்படுத்தும் சட்டரீதியான முறையியல் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the role and function of the Grama Niladhari and that of the Registrar in registering the natural deaths occurring at home, separately; and

(ii) the legally prescribed method in ascertaining the cause of death of the deceased in the case of a natural death?

(b) If not, why?

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) නිවාස තුළ සිදුවන ස්වභාවික මරණ ලියාපදිංචි කිරීමේදී 1951 අංක 17 දරන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 46(1) වගන්තිය යටතේ තම කොට්ඨාසය තුළ සිදුවන මරණ පිළිබඳව දින හතක් ඇතුළත එම පනතේ පළමුවන උපලේඛනයේ "ම" ආකෘතිය (බී 24) -ඇමුණුම Iහි දක්වා ඇත- මඟින් අදාළ රෙජිස්ට්‍රාර්වරයාට වාර්තා කිරීම ග්‍රාම නිලධාරීන්ගේ වගකීම වේ.

නිවාස තුළ සිදුවන හදිසි මරණ නොවන ස්වභාවික මරණ ලියාපදිංචි කිරීමේදී ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන බී 24 වාර්තාව මරණය දැනුම්දීමේ ලියවිල්ලක් වශයෙන් භාරගෙන, 1951 අංක 17 දරන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 31 වගන්තිය ප්‍රකාරව මියගිය තැනැත්තා අවසන් වරට රෝගීව සිටියදී ප්‍රතිකාර කළ වෛද්‍යවරයෙකු සිටී නම් එම වෛද්‍යවරයා විසින් පනතේ පළමුවන උපලේඛනයේ "ඔ" ආකෘතියට (බී 12) -ඇමුණුම IIහි දක්වා ඇත- අනුකූල වූ සහතිකයක් මඟින් හෝ (බී 155) - ඇමුණුම IIIහි දක්වා ඇත- මරණයට හේතුව දැක්වෙන ප්‍රශ්නාවලිය මඟින් එම මරණයට හේතුව පැහැදිලිව ලබාගෙන එම මරණය ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්ය භාරය වේ.

එසේම, රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතෙහි IV කාණ්ඩයෙහි XI පරිච්ඡේදයෙහි අංක 186-196 දක්වා වගන්තිවලද -ඇමුණුම IVහි දක්වා ඇත- නිවාස තුළ සිදුවන ස්වභාවික මරණ ලියාපදිංචි කිරීමට අදාළව එම කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීන්ගේ සහ රෙජිස්ට්‍රාර්වරුන්ගේ කාර්ය භාරය දක්වා ඇත.

ඇමුණුම් I, II, III සහ IV **සභාගත*** කරමි.

(ii) 1951 අංක 14 දරන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 31 වගන්තිය අනුව මියගිය තැනැත්තා අවසන් වරට රෝගීව සිටියදී ප්‍රතිකාර කළ වෛද්‍යවරයෙකු සිටී නම්, එම වෛද්‍යවරයාට පනතේ පළමුවන උපලේඛනයේ "ඔ" ආකෘතියට (බී12) අනුකූල වූ සහතිකයක් නිකුත් කළ හැකි අතර, එමඟින් මරණයට හේතුව නිශ්චිතව ලබා ගත හැකිය. එසේම 31 වන වගන්තියට අනුකූල වූ වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් නොකරන අවස්ථාවලදී මරණයට හේතුව දැක්වෙන ප්‍රශ්නාවලියක් අඩංගු බී155 වන මරණයට හේතුව දැක්වෙන ප්‍රශ්නාවලිය මඟින් තොරතුරු ලබාගෙන මරණයට හේතුව පැහැදිලිව සටහන් කළ හැකිය.

(ආ) අදාළ නොවේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මගේ ප්‍රශ්නයට අදාළව ගරු රාජ්‍ය ඇමතිතුමා සභාගත කළ ඇමුණුම්වල හරි උත්තරයක් තිබෙනවාය කියලා මම හිතන්නේ නැහැ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙතැන තිබෙන ගැටලුව මේකයි. කොවිඩ් වසංගත කාලයේ -2020 දී- එවකට හිටපු පොලිස්පතිවරයාත්, එවකට හිටපු වැඩ බලන රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාත් යවපු චක්‍රලේඛයක් තිබෙනවා. මෙහිදී ග්‍රාම නිලධාරිවරු කරන්නේ පදිංචිය තහවුරු කිරීම විතරද, එහෙම නැත්නම් JMOගේ job එකයි, coronerගේ job එකයි ඔක්කොම කරනවාද කියන එක පොඩ්ඩක් කෙටියෙන් පැහැදිලි කරන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි. මොකද, 2023.07.26වැනි දා ආපු චක්‍රලේඛයත් අපභ්‍රංශයක්. ඒක හරියට පැහැදිලි නැහැ. පැහැදිලි කිරීමක් තමයි අපි ඉල්ලන්නේ.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන කාරණය මට පැහැදිලියි. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. මේ එවලා තිබෙන පිළිතුර, වගන්ති සහ රෝම ඉලක්කම් ටිකත් මේ සභාවට එච්චර රසවත් ඒවා නොවෙයි. ඒකත් මම පිළිගන්නවා. නමුත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් මෙතුමා යොමු කළ ප්‍රශ්නයට පිළිතුරක් විධියට ඒවා තමයි නීත්‍යානුකූලව එවා තිබෙන්නේ. මෙතුමා අහලා තිබෙන්නේ නිවාස තුළ සිදු වන ස්වාභාවික මරණ ලියාපදිංචි කිරීමේදී, මරණය සිදු වන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයාගේ හා රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද කියලායි. ඒක මගෙන් අහුවා නම් මට ටිකක් සොයා බලා ඒක කියන්න තිබුණා. නමුත් අපේ මන්ත්‍රීතුමා ප්‍රශ්නය ඇහුවාම, ඒක අමාත්‍යාංශයට යොමු කළාම රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් එවලා තිබෙන පිළිතුර තමයි මේක. ඔබතුමා කියන විධියට මීට වඩා සරල පිළිතුරක් ලබා දෙන්න වුවමනා නම් මට පුළුවන් ඒ පිළිබඳව අධ්‍යයනය කරලා පිළිතුරක් ලබා දෙන්න. මේ එවා තිබෙන පිළිතුර පිළිබඳව මටත් ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු රාජ්‍ය ඇමතිතුමාටම තේරෙනවා නේ මම කියන කථාව මොකක්ද කියලා. අමාත්‍යාංශයෙන් ලබා දෙන පිළිතුර තමයි ඔබතුමාට ලබා දෙන්න වෙන්නේ. මම කියන්නේ ඔබතුමා රාජ්‍ය ඇමතිවරයා හැටියට මේ ගැන සොයා බලන්න කියලායි. මිනිස්සු මැරුණාට පස්සේ මාර කරදරයක් වෙලා තිබෙන්නේ. පවුලේ කෙනෙක් මැරුණාට

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

පස්සේ දුක් වෙන ඥාතීන්ට මරණය ලියාපදිංචි කරන්න ගියාම මාර කට්ටක් කන්න වෙලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම මේක ඇතුළේ අත යට ගනුදෙනුත් සිදු වෙනවා, රාජ්‍ය ඇමතිතුමනි. ඒකයි මම කියන්නේ. ඔබතුමාට පැහැදිලියි නේ මම කියන්නේ මොකක්ද කියලා. මම යෝජනා කරන්නේ මොකක්ද කියන එකත් පැහැදිලියි නේ. මේ කටයුත්ත සරල කරන්න අවශ්‍ය කටයුතු කරන්න පුළුවන් නේ, ඔබතුමාට.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොවිඩ් වසංගත තත්ත්වයත් එක්ක ග්‍රාම නිලධාරීන්ගේ සහ රෙජිස්ට්‍රාර්වරුන්ගේ ප්‍රශ්න සාකච්ඡා කළ අවස්ථා කිහිපයකදී මම විෂය භාර රාජ්‍ය ඇමතිවරයා විධියට ඒ පිළිබඳව, සාකච්ඡා කළා. විශේෂයෙන් ජානක වක්කුඹුර රාජ්‍ය ඇමතිතුමාත් මේ සම්බන්ධයෙන් මට උදව් කළා. අපි දෙදෙනාම එකතු වෙලා එක මෙසයක ඉඳලා සාකච්ඡා කළා. මේ ගැන ඔබතුමාත් දන්නවා. ඔබතුමාත් මේ පිළිබඳව කථා කරලා තිබෙනවා. ඒ කාල වකවානුවල උද්ගත වුණු ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා. ඒ වාගේම ඒ පිළිබඳ වැඩ පිළිවෙළක් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නත් කටයුතු කර තිබෙනවා. හැබැයි, අපේ මරික්කාර් මන්ත්‍රීතුමාගේ මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන කාරණය ගැන මට අධ්‍යයනය කරන්න කියලා එතුමා කිව්වා නේ. ඉතින්, මමත් එතුමාගේ ප්‍රශ්නය ගත්තා. ඒ ප්‍රශ්නයට පිළිතුර වශයෙන් මේක තමයි මට දෙන්න වෙන්නේ. ඒ අහලා තිබෙන ප්‍රශ්නයට පිළිතුර මේ විධියට වගන්තිවලින් දෙන්න වෙනවා.

මොකද, කොහොමද මේක කරන්නේ කියලා ඇහුවාම කරන විධියත් කියන්න එපායැ. හැබැයි, ඔබතුමා දැන් කියන දේ මට පැහැදිලියි. ඒ නිසා රටේ උපදිනවා වාගේම ජීවත්වෙලා, මිය ගියාමත්, මිය ගිය තැනැත්තාගේ අනන්‍යතාව පිළිබඳව මේ රටේ ජීවත් වන මිනිස්සුන්ට අයිතියක් තිබෙනවා. මම ඒ පිළිබඳව මැදිහත් වෙලා අමාත්‍යාංශය තුළින් අවශ්‍ය වැඩ පිළිවෙළක් හදන්නම්. ඔබතුමා කියපු අනික් කාරණා පිළිබඳව නැවත ප්‍රශ්නයක් යොමු කළොත්, මට පුළුවන් අමාත්‍යාංශයෙන් උත්තරයක් අරගෙන දෙන්න.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ සම්බන්ධව වාදයක් ඇති කරගන්න මට ඕනෑ නැහැ. මෙතැන අවුලක් තිබෙනවා. ඒක හදන්න කියලායි මම ඉල්ලීමක් කරන්නේ.

රජයේ පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩලය : විස්තර
அரச பாடசாலைகளில் கடமையாற்றும் கல்விசாரா ஊழியர்கள்: விபரம்
NON-ACADEMIC STAFF IN GOVERNMENT SCHOOLS: DETAILS

1703/2024

6. ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල සේවය කරනු ලබන අනධ්‍යයන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ තනතුරු නාම කවරේද;

(iii) නිශ්චිත රාජකාරි ලැයිස්තුවකින් ඔවුන්ට රාජකාරි පවරා දී තිබේද;

(iv) ඉහත සේවකයන් සඳහා උසස්වීම් පටිපාටියක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත සේවකයන් අතරින් මේ වනවිට උපාධිය සම්පූර්ණ කර ඇති සේවකයන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) උපාධිය හා පළපුරුද්ද සැලකිල්ලට ගෙන ඔවුන් ගුරුවරුන් ලෙස බඳවා ගැනීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் அரச பாடசாலைகளில் கடமையாற்றும் கல்விசாரா ஊழியர்களின் எண்ணிக்கை யாது;

(ii) அவர்களின் பதவிப் பெயர்கள் யாவை;

(iii) திட்டவட்டமான கடமைப் பட்டியல்மூலம் அவர்களுக்குக் கடமைகள் பொறுப்பளிக்கப் பட்டுள்ளனவா;

(iv) மேற்படி ஊழியர்களுக்குப் பதவி உயர்வு வழங்குவதற்கான நடவடிக்கை முறையொன்று உள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி ஊழியர்களில் தற்போது பட்டப் படிப்பைப் பூர்த்திசெய்துள்ள ஊழியர்கள் தொடர்பில் மேற்கொள்ளும் நடவடிக்கை யாது;

(ii) பட்டம் மற்றும் அனுபவம் என்பவற்றைக் கவனத்திற்கொண்டு அவர்களை ஆசிரியர் சேவைக்கு ஆட்சேர்ப்புச் செய்ய நடவடிக்கை மேற்கொள்ளப்படுமா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of non-academic staff employed in public schools in Sri Lanka;

(ii) their designations;

(iii) whether duties have been assigned to them from a specific list of duties; and

(iv) whether there is a promotion procedure for the above employees?

(b) Will he also inform this House -

(i) the measures that will be taken regarding the graduated employees among the said employees; and

(ii) whether steps are taken to recruit them as teachers, considering their degree and experience?

(c) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල සේවය කරනු ලබන අනධ්‍යයන සේවකයින් සංඛ්‍යාව පහත පරිදි වේ.

	අනධ්‍යයන සේවකයින් සංඛ්‍යාව
ජාතික පාසල්වල	12,173
පළාත් පාසල්වල	25,279
එකතුව	37,452

(ii) ඒකාබද්ධ සේවය
සේවක සංඛ්‍යාව තනතුරු නාම 05ක් යටතට අයත් වේ.

අනු අංකය	තනතුර	වැටුප් පරිමාණය
01	සංවර්ධන නිලධාරි	MN-4
02	කළමනාකරණ සේවා නිලධාරි	MN-2
03	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	MN-6
04	පුස්තකාලයාධිපති	MN-7/ MN-3
05	රියදුරු	PL-3

<u>ඒකාබද්ධ නොවන සේවා</u>

සේවක සංඛ්‍යාව තනතුරු නාම 16ක් යටතට අයත් වේ.

අනු අංකය	තනතුර	වැටුප් පරිමාණය
01	සංවර්ධන සහකාර	MN-4
02	සැලසුම්/මූල්‍ය සහකාර	MN-4
03	පාසල් කළමනාකරණ සහකාර	MN-4
04	ලේඛන සහකාර	MN-1
05	රසායනාගාර සහකාර	MN-1
06	තාක්ෂණ පීඨ සහකාර	MN-1
07	ශිෂ්‍ය නිවාසාධිකාරි (ගැහැනු/පිරිමි)	MN-1
08	සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරි (ගැහැනු/පිරිමි)	MN-1
09	ක්‍රීඩා පුහුණුකරු	MN-1
10	අරක්කැමි	PL-2
11	සේවා සහායක - රසායනාගාර	PL-1
12	සේවා සහායක - පුස්තකාල	PL-1
13	සේවා සහායක - (පාසල්/උද්‍යාන කම්කරු)	PL-1
14	සේවා සහායක - තාක්ෂණ පීඨ	PL-1
15	සේවා සහායක - සනීපාරක්ෂක	PL-1
16	සේවා සහායක - ආරක්ෂක	PL-1

(iii) ඔව්.

අදාළ සේවා ව්‍යවස්ථා/බඳවා ගැනීමේ පටිපාටිවල එම තනතුරුධාරීන් වෙත පවරනු ලබන රාජකාරි පිළිබඳව සාරාංශයක් ඇතුළත් කර ඇත. එම සේවා වාර්ඩස්ථාවට/ බඳවා ගැනීම් පටිපාටියට අනුකූලව ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් විසින් ඔවුන්ට රාජකාරි ලැයිස්තු ලබා දේ.

ඒකාබද්ධ සේවා හා අනධ්‍යයන ඒකාබද්ධ නොවන සේවා ව්‍යවස්ථා/බඳවා ගැනීමේ පටිපාටි පහත දක්වා ඇත.

<u>ඒකාබද්ධ සේවා ව්‍යවස්ථා</u>

සංවර්ධන නිලධාරි - වැඩසටහන් නිලධාරි සේවා ව්‍යවස්ථාව

කළමනාකරණ සේවා නිලධාරි - රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාව

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර - ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව

පුස්තකාලයාධිපති - ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ සේවා ව්‍යවස්ථාව

රියදුරු - රාජ්‍ය සේවයේ මෝටර් රථ රියැදුරන් සඳහා ඒකාබද්ධ රියැදුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

<u>ඒකාබද්ධ නොවන සේවා බඳවා ගැනීමේ පටිපාටි</u>

PL-1 ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටි

PL-2 වැටුප් ක්‍රම සඳහා අදාළ බඳවා ගැනීම් පටිපාටි

PL-3 වැටුප් ක්‍රමය සඳහා වන උසස්වීම් පටිපාටි

MN-1 වැටුප් ක්‍රමය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය

ක්‍රීඩා පුහුණුකරු තනතුර (MN-1 වැටුප් ක්‍රමය සහිත තනතුරකි.)

MN-4 වැටුප් ක්‍රමය සඳහා වන උසස්වීම් පටිපාටි

(iv) ඔව්.

<u>ඒකාබද්ධ සේවය</u>

ඒකාබද්ධ සේවයට අයත් අනධ්‍යයන කාර්ය මණ්ඩල ශ්‍රේණිගත හා අනෙකුත් උසස්වීම් අදාළ සේවා ව්‍යවස්ථාව අනුව සිදු කරනු ලබයි.

<u>ඒකාබද්ධ නොවන සේවා</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 යටතේ සකස් කරන ලද මෙම තනතුරුධාරීන්ගේ බඳවා ගැනීම් පටිපාටිවල ශ්‍රේණි උසස්වීම් සඳහා විධිවිධාන ඇතුළත් වේ.

ඊට අමතර වශයෙන් PL-1 (ප්‍රාථමික ශිල්පීය නොවන), PL -2 (ප්‍රාථමික අර්ධ ශිල්පීය) සහ PL-3 (ප්‍රාථමික ශිල්පීය) තනතුරුධාරීන්ට සීමිත පදනමින් MN-1 වැටුප් පරිමාණය හිමි තනතුරු සඳහා පත්වීම් කිරීමට විධිවිධාන MN-1 බඳවා ගැනීමේ පටිපාටියට ඇතුළත් වේ.

තවද, ජාතික පාසල්වල සේවය කරනු ලබන අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ඒකාබද්ධ සේවයේ තනතුරු සඳහා ද සීමිත තරග විභාග මඟින් උසස්වීමට අවස්ථාව සලසා තිබේ. (උදාහරණ වශයෙන් පුස්තකාලයාධිපති සේවය, කළමනාකරණ සේවා නිලධාරි සේවය වැනි සේවා)

(ආ) (i) උපාධිය සම්පූර්ණ කර ඇති ඒකාබද්ධ නොවන සේවයට අයත් PL හා MN කාණ්ඩයේ සේවකයින් සඳහා පාලන සහකාර වශයෙන් MN-4 වැටුප් පරිමාණය යටතේ තනතුරක් ඇති කිරීමට 2023.08.24 දිනැතිව අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා 2023.10.09 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අදහස් දැක්වීම්වල අවධාරණය කරනු ලැබ ඇති කරුණු සැලකිල්ලට ගෙන එම සන්දේශයේ සඳහන් නිර්දේශ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම යෝග්‍ය නොවන බවට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයක් ලබා දී ඇත.

(ii) දිවයිනේ ජාතික හා පළාත් පාසල්හි පවතින ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (අ)

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

> ශ්‍රේණියට බඳවා ගැනීමට අංක අපම/22/1357/607/026, 2022.10.31 හා අංක අමප/22/2021/607/026 - II හා 2022.12.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව නිකුත් කරන ලද අංක 2317 හා 2023.01.27 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව අයදුම් පත් කැඳවන ලද අතර, ඒ අනුව බඳවා ගැනීමේ තරග විභාගය 2023.03.25 දිනැතිව පැවැත්වීමට නියමිතව තිබුණ ද, ශ්‍රේෂ්ඨාධිකරණයේ වාරණ නියෝගය නිසා කල් ගොස් ඇත. මූලික අයිතිවාසිකම් නඩු හතරක් ගොනු කර තිබෙනවා. සියලුම සංවර්ධන නිලධාරීන්ට මේ සඳහා විකල්ප විසඳුමක් දෙන්න ඊළඟ සති දෙක තුළදී කටයුතු කරනු ලබනවා.
>
> ඒ අනුව එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු එසේ පවතින අතර, ඊට විකල්ප වූ පිළිතුරක් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

(ඇ) අදාළ නොවේ.

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

ගරු ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය ඇසීමට ප්‍රථමයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, ඔබතුමා අධ්‍යාපනය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කරනවා. ඒ ගැන කිසිම විවාදයක් නැහැ. අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට ඔබතුමා විශාල මෙහෙයක්, විශාල කාර්යභාරයක් ඉටු කරනවා, අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය නහා සිටුවන්න සහ දියුණු කරන්න.

ගරු ඇමතිතුමනි, එම අනධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගන්නේ අ.පොෂ. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන 2ක් සහිතව විෂයයන් 6කින් සමත් වීම කියන අධ්‍යාපන සුදුසුකම යටතේ බව අපි දන්නවා. හැබැයි, සමහර පාසල්වල විදුහල්පතිවරු තමන්ගේ ආධිපත්‍යය පතුරවලා ඒ අයට පහත් විධියට සලකනවා. එවැනි විදුහල්පතිවරුන් ඉන්නවා. ඒ වාගේම, ඒ අයට බොහොම ගෞරවයක් දීලා සලකන විදුහල්පතිවරුත් ඉන්නවා. ඒ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සමහර පාසල්වල තේ ටික හදනවා; වැසිකිළි හෝදනවා; අතුපතු ගානවා. ඔවුන් ඒ සියලු කාර්යයන් කරනවා, ගරු ඇමතිතුමනි. ඒ කටයුතු කරන අතරේ පුස්තකාල ඩිප්ලෝමාධාරීන් හැටියට එම විභාගය සමත් වෙච්ච, මා දන්නා ළමයින් විශාල පිරිසක් ද ඉන්නවා. හැබැයි, පුස්තකාල තිබෙන පාසල් අතර පුස්තකාලයාධිපතිවරුන් නැති පාසල් තිබෙනවා; පුස්තකාල සහායකයන් නැති පාසල් තිබෙනවා. හැබැයි, විදුහල්පතිවරු මා ඉහත කී පුස්තකාල ඩිප්ලෝමාධාරීන් එම සේවය සඳහා යොදවා ගන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, යම් වැඩ පිළිවෙළක් හදලා, එම පුස්තකාල ඩිප්ලෝමාධාරීන්ට අඩුම තරමින් පුස්තකාල සහායක හැටියටවත් පාසල්වල රාජකාරි කරන්න අවසර දෙන්න පුළුවන්ද? එයයි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා සඳහන් කරපු ශ්‍රේණිවලින් එකක් තමයි ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන "සේවා සහායක - පුස්තකාල; PL-01" කියන එක. දැන් ඒ අයට උසස්වීම දෙන්න තිබෙන්නේ, "සේවා සහායක - පුස්තකාල" තනතුරට ඉහළින් තිබෙන "පුස්තකාල සහායක" හැටියටයි. එතැනට ඩිප්ලෝමාධාරියෙකු ඉන්න එක හොඳයි. හැබැයි, එතැනට යන්න ඕනෑ, උසස්වීම් පරිපාටිය අනුවයි. ඒ සඳහා අවශ්‍ය උපදෙස් පළාත් සභාවලට ලබා දෙනවා. ජාතික පාසල්වලට අදාළ කටයුතු පමණයි අපේ අමාත්‍යාංශයෙන් කරන්නේ. අනෙක් සියල්ල පළාත් සභා මඟින්නුයි කරන්නේ. ළඟදීම මේ සම්බන්ධව වැඩමුළුවක් පවත්වනවා. අපි දැන් ඒ අයට -පළාත් බලධාරීන්ට; එකී කටයුතු මෙහෙයවන අයට- උපදෙස් දීලා තිබෙනවා, මේ වාගේ තනතුරුවල පුරප්පාඩු තිබෙනවා නම්, සුදුසුකම් ලබා තිබෙනවා නම් උසස්වීම් පරිපාටිය ක්‍රියාත්මක කරන්න කියලා.

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

ගරු ඇමතිතුමනි, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයන් නිවාඩු දිනවල සේවයේ යොදවා ගැනීම සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. සමහර විදුහල්පතිවරු වැඩ තිබුණත් නැතත් නිවාඩු දිනවල ඒ අය අනිවාර්යයෙන් ගෙන්වා ගන්නවා. ඔබතුමාත් දන්නවා, ඒ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැඩිපුරම ඉන්නේ කාන්තාවන් බව.

ගරු ඇමතිතුමනි, අපට පෞද්ගලිකව දුරකථනයෙන් කථා කරලා කියා තිබෙනවා, ඒ කාන්තාවන්ට වන අඩන්තේට්ටම් පිළිබඳව. මම කියන්නේ නැහැ සියලු විදුහල්පතිවරුන් එහෙමයි කියලා. හැබැයි සමහර විදුහල්පතිවරු වැඩ නැති වුණත් ඒ කාන්තාවන් නිවාඩු දිනවල පාසල්වලට ගෙන්වා ගන්නවා. එසේ ගෙන්වා ගෙන අනීතික විධියට, අනිසි විධියට යම් යම් බලපෑම් කරනවා, ගරු අමාත්‍යතුමනි. ඒ අය නිවාඩු දිනවල කැඳවීම සම්බන්ධයෙන් ඔබතුමා යම් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවාද? මම ඔබතුමාට විශේෂයෙන් මේ කාරණයත් සිහිපත් කරන්න ඕනෑ. මාතර දිස්ත්‍රික්කයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාකච්ඡාවේදී ඔබතුමා ප්‍රකාශයක් කරලා තිබෙනවා, මේ සඳහා වන වැඩ පිළිවෙළක් සම්බන්ධව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා කියලා. ඔබතුමා ඒ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා තිබෙනවා ද? ඒ අය නිවාඩු දිනවල කැඳවන එක පිළිබඳව යම් වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන් ද කියන ප්‍රශ්නය මම ඔබතුමාගෙන් අහනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මුලින් සඳහන් කළා වාගේ මෙහි කොටස් දෙකක් ඉන්නවා, ඒකාබද්ධ සේවයට අදාළ සහ ඒකාබද්ධ සේවයට අදාළ නැති යනුවෙන්. ඒ මොකක් වුණත් MN ශ්‍රේණිය අනුව ඒ ගොල්ලන්ට පැවරුණු රාජකාරියක් තිබෙනවා. පාසල්වල ගුරුවරුන්ට දින 210ක් පමණක් පාසල් පැවැත්වූවාට අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අදාළ වන්නේ දින 210 නොවෙයි. ඒ ගොල්ලන්ට අදාළ වන්නේ රජයේ සාමාන්‍ය සේවකයන්ට අදාළ වන නීති රීතිමයි. හැබැයි, ආයතන ප්‍රධානීන්ට ඉඩ කඩ දීලා තිබෙනවා ඔවුන් සේවයට කැඳවීමට හෝ නොකැඳවීමට. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. ඒක වැඩි හරියක් සිදු වෙලා තිබෙන්නේ ජාතික පාසල්වල නොවෙයි, පළාත් පාසල්වලයි. ඒ නිසා පළාත් බලධාරීන් දැනුවත් කරලා ඒ සඳහා ප්‍රායෝගික විසඳුමක් තමයි ලබා දෙන්න තිබෙන්නේ.

පුත්තලම දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කොට්ඨාස: ගුරු පුරප්පාඩු

புத்தளம் மாவட்ட கல்விக் கோட்டங்கள்: ஆசிரியர் வெற்றிடங்கள்

EDUCATION DIVISIONS IN PUTTALAM DISTRICT: TEACHER VACANCIES

1728/2024

7. ගරු ජගත් ප්‍රියංකර මහතා
(மாண்புமிகு ஜகத் பிரியங்கர)
(The Hon. Jagath Priyankara)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ ඇති ජාතික පාසල් හා පළාත් සභා පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂයය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்திலுள்ள கல்விக் கோட்டங்களின் எண்ணிக்கை எத்தனை;

(ii) அவற்றின் பெயர்கள் யாவை;

(iii) மேற்படி ஒவ்வொரு கல்விக் கோட்டத்திலுமுள்ள தேசிய பாடசாலைகளினதும் மாகாண சபை பாடசாலைகளினதும் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் வெவ்வேறாக யாவை;

(iv) மேற்படி ஒவ்வொரு கல்விக் கோட்டத்திலும் காணப்படுகின்ற ஆசிரியர் வெற்றிடங்களின் எண்ணிக்கை ஒவ்வொரு பாடத்தின் அடிப்படையில் வெவ்வேறாக யாது;

(v) மேற்படி ஆசிரியர் வெற்றிடங்களை நிரப்புவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of Education Divisions located in the Puttalam District;

(ii) the names of those Education Divisions;

(iii) separately, the number of National Schools and the number of Provincial Council schools located in each of those Education Divisions and the names of those schools;

(iv) separately, the number of teacher vacancies existing for each subject in each of the said Education Divisions; and

(v) the steps that will be taken to fill those teacher vacancies?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කොට්ඨාස සංඛ්‍යාව 9කි.

(ii) 1. ආණමඩුව
2. ආරච්චිකට්ටුව
3. හලාවත
4. කල්පිටිය
5. නාත්තන්ඩිය
6. පල්ලම
7. පුත්තලම උතුර
8. පුත්තලම දකුණ
9. වෙන්නප්පුව

(iii) එම එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ ඇති පළාත් පාසල් හා ජාතික පාසල් සංඛ්‍යාව පහතින් දක්වා ඇති අතර ඒවායේ නම් වෙන් වෙන් වශයෙන් පිළිවෙළින් ඇමුණුම 01 හා ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

අනු අංකය	කොට්ඨාසය	ජාතික පාසල්	පළාත් සභා පාසල්	එකතුව
1	ආණමඩුව	-	41	41
2	ආරච්චිකට්ටුව	-	21	21
3	හලාවත	2	45	47
4	කල්පිටිය	1	43	44
5	නාත්තණ්ඩිය	1	47	48
6	පල්ලම	-	30	30
7	පුත්තලම උතුර	2	53	55
8	පුත්තලම දකුණ	-	43	43
9	වෙන්නප්පුව	1	42	43
මුළු එකතුව		7	365	372

(iv) එම එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු එක් එක් විෂය අනුව ඇමුණුම 03 මඟින් ද, ජාතික පාසල්වල පවතින ගුරු පුරප්පාඩු එක් එක් විෂය අනුව ඇමුණුම 04 මඟින් ද ඉදිරිපත් කර ඇත.

ඇමුණුම් 01, 02, 03 සහ 04 **සභාගත*** කරමි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(v) I. අංක අමප/23/1139/607/096 හා 2023.07.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ජාතික හා පළාත් පාසල්වල අ.පොස.ස. උසස් පෙළ ගණිතය, විද්‍යාව, තාක්ෂණවේදය, විදේශ භාෂා, විශේෂ අධ්‍යාපනය හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ වූ අත්‍යවශ්‍ය විෂයයන් 46ක පවතින පුරප්පාඩු 5,450ක් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට අනුමැතිය ලැබිණ.

- ඒ අනුව ඊට අදාළව ජාතික පාසල්වල ගුරු පුරප්පාඩු සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට 2024.03.02 දින පවත්වන ලද ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය 2024.04.30 දින සිට 2024.05.09 දින දක්වා අමාත්‍යාංශයේදී පැවැත්වූ අතර, ඊට අදාළ බඳවා ගැනීම් කටයුතු කඩිනමින් අවසන් කිරීමට නියමිත ය. එම බඳවා ගැනීම යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ජාතික පාසල්වල පවතින පුරප්පාඩු සඳහා ද ගුරුවරුන් ස්ථානගත කිරීමට නියමිතය.

- උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ පළාත් පාසල්හි පුරප්පාඩු 2,969ක් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට සියලු පළාත් සභා විසින් අයදුම්පත් කැඳවා ඇත. මේ වන විට පළාත් සභා කිහිපයක බඳවා ගැනීම් සිදු කර ඇති අතර, අනෙකුත් පළාත් සභා විසින් ඉදිරියේදී ගුරුවරුන් බඳවා ගැනීමට නියමිතය. ඒ යටතේ වයඹ පළාතේ පළාත් පාසල්වල පවතින පුරප්පාඩු 393ක් සඳහා බඳවා ගැනීමේ නිවේදනය 2023.09.01 දින නිකුත් කර ඇත. ඊට අදාළ බඳවා ගැනීමේ තරග විභාගය ද 2023.11.11 දින පවත්වා ඇත.

II. අංක අමප/23/1573/607/124 හා 2023.09.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විශ්‍රාම යෑම, ඉල්ලා අස්වීම, සේවය අතහැර යෑම යන හේතූන් මත දිවයිනේ පළාත් පාසල්වල ඇති වූ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව සියලු පළාත් සභා විසින් ඊට අදාළ බඳවා ගැනීම් නිවේදන නිකුත් කර ඇති අතර, එම බඳවා ගැනීම් ද ඉදිරියේදී සිදු කිරීමට නියමිතය. ඒ යටතේ වයඹ පළාතේ පළාත් පාසල්වල පවතින පුරප්පාඩු 665ක් සඳහා බඳවා ගැනීමේ නිවේදනය 2023.10.20 දින නිකුත් කර ඇත.

III. 2018/2020 අධ්‍යයන වර්ෂයේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් අතුරින් ඌන සාමාර්ථලාභීන් 303 දෙනෙකු ජාතික පාසල්හි ප්‍රාථමික සහ 6-11 ශ්‍රේණිවල පවතින ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අදාළව 2024.03.27 දිනැතිව ගුරු පත්වීම් ලබා දීමට කටයුතු සිදු කළ අතර, ඒ අතුරින් ද පුත්තලම දිස්ත්‍රික්කයේ පුරප්පාඩු පැවැති පාසල් සඳහා ගුරුවරුන් අනුයුක්ත කරන ලදී.

IV. අංක අමප/23/1568/607/121 හා 2023.10.09 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ජාතික හා පළාත් පාසල්වල පවතින ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීමට අදාළව සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය 2024 මැයි මස 10, 11, 12 සහ 20 දිනවලදී අමාත්‍යාංශයේදී පැවැත්වූ අතර, ඊට අදාළ බඳවා ගැනීම් කටයුතු ද කඩිනමින් අවසන් කිරීමට නියමිතය. එම බඳවා ගැනීම යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ජාතික හා පළාත් පාසල්වල පවතින පුරප්පාඩු සඳහා ද ගුරුවරුන් ස්ථානගත කිරීමට නියමිතය.

V. 2023.11.16 දිනැතිව ශ්‍රී ලංකා ගුරු සේවයේ සිටින ගුරු භවතුන් අතුරින් 4,672 දෙනෙකු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමට කටයුතු සිදු කර ඇති අතර, ඒ හේතුවෙන් පාසල් පද්ධතිය තුළ ඇති වූ ගුරු පුරප්පාඩු සඳහා විවෘත පදනමින් ගුරුවරුන් බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ සඳහා අනුමැතිය ලද පසු එම පුරප්පාඩු සඳහා ද ඉදිරියේදී ගුරු පත්වීම් ලබා දීමට නියමිතය.

VI. තවද, අංක අමප/22/1357/607/026 හා 2022.10.31 දිනැති සහ අමප/22/2021/607/026-II හා 2022.12.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය 2023.03.25 දිනැතිව පැවැත්වීමට සංවිධානය කර තිබූ නමුත්, පාසල්වලට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරීන් විසින් ගොනු කරන ලද අංක 77/2023, 78/2023, 88/2023 හා 95/2023 දරන මූලික අයිතිවාසිකම් පෙත්සම් සලකා බලා ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් මේ සම්බන්ධයෙන් අතුරු තහනම් නියෝගයක් පනවා ඇත. එම නඩුව මේ වන විටත් අවසන් වී නොමැත. ඒ අනුව මෙම නඩු කටයුතු අවසන් වීමෙන් පසුව මෙම බඳවා ගැනීම් ද ඉදිරියේදී සිදු කිරීමට නියමිතය.

මෙම ප්‍රශ්නයට අදාළව ඉතාම කෙටියෙන් පිළිතුරක් දුන්නොත්, පසුගිය කාල සීමාව තුළ නඩු සියල්ල විසඳාගෙන මේ වන කොට වයඹ පළාතේත්, සෙසු පළාත්වලත් පළාත් මට්ටමින් පවත්වපු උපාධිධාරී ගුරු විභාගය අනුව පත්වීම් ලබා දෙමින් පවතිනවා. මැයි 31වන දා දක්වා ඇති වී තිබෙන පුරප්පාඩු සඳහාත් පත්වීම් ලබා දීමට මම අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව අපි ඊළඟ සති කිහිපය තුළ එම පුරප්පාඩු ටිකත් සම්පූර්ණ කරනවා.

විශේෂයෙන්ම වයඹ පළාතේ සංවර්ධන නිලධාරීන් විශාල පිරිසක් ඉන්නවා. ඒ අයගෙන් කොටසයි මේ විභාගය පාස් වෙලා ගිහින් තිබෙන්නේ. සමහරු දැන් උපවාස කරමින් ඉන්නවා. මේ වාගේ පිරිස් පිළිබඳ සියලු තොරතුරු අද දවස තුළ අපට ලැබෙනවා. ඒ අනුව විභාගය පැවැත්වීම සහ වයස් සීමාව පිළිබඳ විකල්ප විසඳුමකුත් එක්ක මම අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරනවා. ඒ අනුව ඊළඟ සති දෙක තුළ ඔබතුමන්ලාගේ ප්‍රදේශයේ ගුරු පුරප්පාඩු සංඛ්‍යාවත් සම්පූර්ණ කර ගන්න පුළුවන් වෙයි.

(ආ) අදාළ නොවේ.

ගරු ජගත් ප්‍රියංකර මහතා
(*மாண்புமிகு ஜகத் பிரியங்கர*)
(The Hon. Jagath Priyankara)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා පසුගිය කාලය තුළ වාගේම ඉදිරි කාලය තුළ සැලසුම් කරගෙන ඇති ආකාරයට අපේ දිස්ත්‍රික්කයේ ගුරු පුරප්පාඩු සහ අධ්‍යාපන ගැටලු විසඳීම සඳහා ලබා දෙන දායකත්වය පිළිබඳව අපේ ප්‍රසාදය පළ කරනවා. ඒ වාගේම මම මේ කාරණය කෙරෙහිත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මාරුවීම් සඳහා සුදුසුකම් ලබා සිටින අතිවිශාල පිරිසකුත් දිස්ත්‍රික්කය ඇතුළේ ඉන්නවා. ඒ අය දුෂ්කර ව්‍යායාමයක තමයි පසුගිය කාලයේ නිරත වෙලා සිටියේ. අපි ඒක පිළිගන්න ඕනෑ. ඒක නිසා මේ ලැබෙන අවස්ථාවේදී -මේ පුරප්පාඩු සංඛ්‍යාව පුරවන කොට- ඒ අය ගැනත් සලකා බලන්න. මට මතක හැටියට පුත්තලම කලාපයේ විතරක් දහසකට වැඩි පිරිසක් සිටියා, මාරුවීම් සඳහා සුදුසුකම් ලබලා. එතකොට ගරු අමාත්‍යතුමනි, බඳවා ගන්නා ක්‍රමවේදය ඇතුළේ වයඹ පළාත් සභාව විධියට ගැසට් කරලා අපි පළාත් මට්ටමින් බඳවා ගන්න කොට ඉතිහාසයේ ඉඳලාම අපේ පුත්තලම දිස්ත්‍රික්කයෙන් අඩු ප්‍රමාණයක් තමයි සුදුසුකම් ලබන්නේ. ඒ සඳහා අධ්‍යාපන පදනම හෝ වෙනත් සාධක ප්‍රමාණයක් බලපානවා ඇති.

එන අයත් බලා ගෙන ඉන්නේ කවදාද යන්නේ කියලා. ඒක නිසා මම ඔබතුමාට යෝජනාවක් කරන්න කැමැතියි. මම දන්නේ නැහැ, මේකට නීතිමය වශයෙන් හැකියාවක් තිබෙනවාද කියලා. හැබැයි, පළාත් සභා මට්ටමින් එක් අවස්ථාවක මේක කළා වාගේ මතකයක් මට තිබෙනවා. ඔය බඳවා ගැනීම්වලදී -අඩුම තරමින් පළාත් සභා මට්ටමින් කරන ඒවායේදී හෝ- පුත්තලම දිස්ත්‍රික්කයේ තිබෙන පුරප්පාඩු ප්‍රමාණයට පුත්තලම දිස්ත්‍රික්කයේ උපාධිධාරීන් බඳවා ගන්න යම් නීතිමය ක්‍රමයක් හදා ගන්න පුළුවන් නම්, ඒ අය පුත්තලමෙන් යන්න උත්සාහ කරන එකක් නැහැ කියලා අපි විශ්වාස කරනවා. ඒ පිළිබඳව ඔබතුමාගෙන් අදහසක් දැන ගන්න කැමැතියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(*மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த*)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක කාලාන්තරයක් තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. අපි හිතමු, විද්‍යාපීඨවලට ඔය විධියට merit basis එකට තිබුණු ගණන සියයට 80ට අඩු කරලා, අනෙක් පැත්තෙන් දිස්ත්‍රික් පදනමේ ගණන වැඩි කළා කියලා. එතකොට කොළඹ ඉන්න එක්කෙනෙක් merit basis එකෙන් උසස් පෙළ Z-score එක 1.2 ගන්න කොට, පුත්තලම දිස්ත්‍රික්කයෙන් ගත්තේ දශම හය ගත්ත එක්කෙනෙක්. ඒකෙන් වෙච්ච එකම දේ තමයි, පුත්තලම දිස්ත්‍රික්කයේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය අඩුවීම. මොකද, merit basis එකෙන් වැඩිම ලකුණු ගත්ත එක්කෙනාට පත්වීමක් ගන්න බැහැ නේ. ඔහුට පත්වීම දෙන්න තිබුණා නම්, අපට පුත්තලමට යවලා අවුරුදු පහක් තියන්න තිබුණා. හැබැයි, ඒක කරන්න බැහැ. ඒක මුළු ලංකාවේම සිද්ධ වුණා. විද්‍යාපීඨ පටන් ගත්ත දවසේ ඉඳන් අවුරුදු ගණනාවක් තිස්සේ මුලින් තිබුණේ සියයට 80ක් merit basis එකෙන් සහ සියයට 20යි දිස්ත්‍රික්කයට දුන්නේ. එතකොට පළාත්වලින් ඉල්ලීම් ආවා, පළාතේම පත්වීම් දෙන්න, එතකොට ඒ ගොල්ලෝ ඉදීවි කියලා. එහෙම වෙන්නේ නැහැ. ඒ ගොල්ලෝ විද්‍යාපීඨයට ගිහිල්ලා එතැනදී යාළු වෙලා, පුත්තලමේ එක්කෙනා නුවරඑළියේ එක්කෙනෙකුට සම්බන්ධ වෙනවා. එතකොට මහත්මයා නුවරඑළියේ, නෝනා පුත්තලමේ. එහෙම වුණාම ඉන්නේ නැහැ නේ. එක්කෝ, මහත්තයා නුවරඑළියේ ඉඳලා පුත්තලමට එන්න ඕනෑ, නැත්නම් පුත්තලමේ ඉන්න නෝනා නුවරඑළියට යන්න ඕනෑ. මේක තමයි මේ ක්ෂේත්‍රය තුළ තිබෙන ප්‍රායෝගික තත්ත්වය.

ඊළඟ කාරණය මේකයි. ඒ කාලයට සාපේක්ෂව ගත්තාම අද පුත්තලමේ ඉඳන් ඕනෑම තැනකට cell phone එකෙන් කථා කරන්න පුළුවන් නේ. ඉස්සර ගුරුවරු ගියාම telephone එකක් සොයා ගෙන කිලෝමීටර 10ක විතර දුර යන්න වුණා. අද එහෙම නැහැ. ඉතින්, මේ දුෂ්කරයි කියන කාරණය යොදා ගන්නේ තමන්ගේ පහසුවටයි. අධ්‍යාපන අමාත්‍යාංශයේ අරමුණ තමයි, ළමයින්ට ගුණාත්මකභාවයෙන් යුත් ගුරුවරයෙක් දෙන එක. පත්වීම භාර ගන්න පුළුවන්, නැත්නම් නොගෙන ඉන්න පුළුවන්. ඉදිරියේදී පත්වීම් දෙනකොට, තමන්ගේ පළාත තුළ දෙන ඕනෑම තැනකට යන්න ඕනෑ කියන එක අමාත්‍ය මණ්ඩල සන්දේශයේම කියනවා. එහෙම නැත්නම් පත්වීම භාර නොගෙන ඉන්න පුළුවන්. ඊට අමතරව, ගුරුවරුන් අතිරික්තව සිටින පළාත් තිබෙනවා නම්, ඕනෑම පළාතක තිබෙන ඌනතාවකට යවන්න අපට බලය පැවරෙනවා. එහෙම ගත්තොත්, උතුරු පළාතේ මුලතිව් දිස්ත්‍රික්කයේ වැලිඔය ප්‍රදේශයට කවදාවත් සිංහල ගුරුවරු දෙන්න බැහැ. ඇයි, උතුරු පළාතෙන් සිංහල උපාධිධාරී ගුරුවරුන් බිහි වෙන්නේ නැහැ නේ; වවුනියාව දකුණට දෙන්න බැහැ, මඩුකන්දට දෙන්න බැහැ. ඉතින්, මේක හරි ප්‍රශ්නයක්.

කවදාවත් මේ ළමයින්ට ගුරුවරු දෙන්න හම්බ වෙන්නේ නැහැ. ගුරුවරුන්ට මාරු වෙන්නත් ඕනෑ. හැබැයි, අනිවාර්යයෙන් අවුරුදු 5ක් සේවය කරන්න ඕනෑ. ඒ නිසා ඔබතුමන්ලාගේ ප්‍රශ්න වාගේම ප්‍රශ්න පොළොන්නරුවේත් තිබෙනවා, ත්‍රිකුණාමලයේත් තිබෙනවා, අම්පාරෙත් තිබෙනවා, වවුනියාවේත් තිබෙනවා, මුලතිව්වලත් තිබෙනවා. දමිළ මාධ්‍ය ගුරුවරුන්ගේ ප්‍රශ්නයත් එහෙමයි. යාපනයේ ගුරුවරු මන්නාරමට යන්නේ නැහැ . හැබැයි ඉගෙන ගන්න දරුවෝ මන්නාරමෙත් ඉන්නවා නේ. ජාතික පාසල් 4ක් තිබෙනවා. මේක දැන් විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. මොකද, කිලෝමීටර එකසිය ගණනක දුර. මේවා ප්‍රායෝගික ප්‍රශ්න. ඒ නිසා ප්‍රායෝගික විසඳුමක් තමයි දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අලුතෙන් දෙන පත්වීම් සියල්ලම දෙන්නේ ගුරු ඌනතා තිබෙන පාසල්වලට. ඔබතුමන්ලා කියන විධියට විශාල පිරිසක් ඉන්නවා නම්, ඒ ගොල්ලන් හදන්නේ සේවා කාලය අවුරුදු 5 සම්පූර්ණ වෙනකොටම මාරුවීමක් අරගෙන යන්න. එහෙම කරන්න බැහැ. එහෙම මාරුවීම් දුන්නොත් ළමයින්ට ගුරුවරු නැහැ. ඔවුන්ට මාරුවීම් ලැබෙයි. හැබැයි, ඒ ගුරු මාරුවීම් දෙනකොට අපට සලකා බලන්න වෙනවා, දරුවන්ට ප්‍රමුඛතාව දෙන්න.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(*மாண்புமிகு கெவிந்து குமாரதுங்க*)
(The Hon. Gevindu Cumaratunga)
ගරු ඇමතිතුමා,- [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)

ගරු ජගත් ප්‍රියංකර මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(*மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த*)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් පසුව ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ගරු ජගත් ප්‍රියංකර මහතා
(*மாண்புமிகு ஜகத் பிரியங்கர*)
(The Hon. Jagath Priyankara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

[ගරු ජගත් ප්‍රියංකර මහතා]

ගරු අමාත්‍යතුමනි, අපි අධ්‍යාපන ක්ෂේත්‍රයේ දිගටම දකින දෙයක් තමයි වැටුප් ඇතුළු විෂමතා පදනම් කරගෙන විටින් විට විවිධ වෘත්තීය අරගළ මතුවෙන එක. දැන් සිදු වෙන කාරණය ගැන මම නැවත අහන්නේ නැහැ. මොකද, දිගින් දිගටම ඔබතුමා ඒ සම්බන්ධයෙන් පැහැදිලි කළා.

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ කුසලතා පදනම මත අධ්‍යාපන පරිපාලන සේවයේ පත්වීම් ලැබූ 103දෙනෙකු හිටියා. *[බාධා කිරීමක්]* ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරන්න. විශ්‍රාම යාම නිසා දැන් ඒ අයගෙන් 75දෙනෙක් විතර තමයි සේවයේ ඉන්නේ. පරිපාලන සේවයේ අයට වඩා විදුහල්පතිවරුන්ගේ වැටුප් වැඩියි. ඒ, අපි දැකපු එක කාරණයක්.

ගරු අමාත්‍යතුමනි, තවත් කාරණයක් කියන්න තිබෙනවා. 2019දී විදුහල්පති පත්වීම් දෙනකොට ලකුණු වැඩි අයට මුලින්ම පත්වීම් ටික දුන්නා. ඊට පස්සේ ඒ මැද්දේ වැටුප් අරගළයක් ආවා. වැටුප් වැඩිවීමකින් පස්සේ දෙවැනි සහ තුන්වැනි අදියරවලට ආපහු විදුහල්පති පත්වීම් දුන්නා. පළමුවැනි විදුහල්පති පත්වීම් සහ දෙවැනි හා තුන්වැනි අදියරේ අය අතරත් වෙනසක් තිබෙනවා. මේක සංකීර්ණ ක්‍රියාවලියක් බව මගේ අවබෝධයේ තිබෙනවා. මම ඔබතුමාගෙන් විමසන්න කැමැතියි අපට මේ සමස්තය නිරාකරණය කර ගන්න හැකිද කියලා. මොකද, මේ කාලයේ නේ වැඩ වර්ජන එන්නේ. මම අද දැක්කා, රජයේ විධායක නිලධාරි සංගමය 24වෙනි දා ඉඳලාද කොහේද වැඩ කටයුතු නවත්වනවා කියලා තිබෙනවා. ඒක නිසා විධිමත් සැලැස්මක් යටතේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලු වැටුප් විෂමතා කළමනාකරණය කර ගන්න යම් වැඩ පිළිවෙළක් ඔබතුමා සූදානම් කරගෙන තිබෙනවාද කියලා මම විමසන්න කැමැතියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

දැන් අපි අධ්‍යාපන ක්ෂේත්‍රයේ විෂමතා පියවරෙන් පියවර නිරාකරණය කරගෙන යනවා. ගුරු වැටුප් විෂමතාවක් ආවේ 1995 ඉඳලා. ඒ වෙලාවේම විදුහල්පති වැටුප් විෂමතාවකුත් ආවා. ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව විසඳනකොට අනිවාර්යයෙන්ම විදුහල්පති වැටුප් විෂමතාවක් එනවා. Grade I ගුරුවරයකුගේ වැටුප Grade IIIවලින් පටන් ගන්න විදුහල්පතිවරයකුට වඩා වැඩියි. එදා රිවර්ඩ් පතිරණ ඇමතිතුමා ගුරු සේවා ව්‍යවස්ථා හැදුවේම දක්ෂ -ප්‍රවීණ- ගුරුවරයෙක් ගුරු සේවයේ තියා ගන්න.

හැබැයි, ඒ ගොල්ලන් විදුහල්පති සේවයට එනවා. එන්නේ වැටුප අඩු බව දැනගෙන. ඇවිල්ලා සටන් කරනවා, වැටුප් විෂමතාව වෙනස් කරන්න කියලා. එතකොට, ඒ සේවයේ වැටුප් විෂමතාව වෙනස් කරනකොට ගුරු අධ්‍යාපනඥ සේවයේ වැටුප් විෂමතාවක් එනවා. ඒක වෙනස් කරනකොට පරිපාලන සේවයේ වැටුප් විෂමතාවක් එනවා. පරිපාලන සේවය සමාන්තරයි රාජ්‍ය පරිපාලන සේවය හා වෙනත් සේවාවන් එක්ක. එතකොට මේ විෂමතාව හදන්නම බැහැ නේ. මේක තේරුම් ගන්න ඕනෑ. ගුරු කාර්යසාධනයත් එක්ක තමයි වැටුප් දෙන්නේ. ඒ නිසා කාර්යසාධනය පැත්තකින් තියලා වැටුප විතරක් බලන්න අපට බැහැ.

උසස්පෙළ විභාගයෙන් "A" සාමර්ථ 3ක් ගත්ත ළමයි ටික ගත්තොත්, උපකාරක පන්තිවල උගන්වන ගුරුවරු පත්තරවල දැන්වීම් දානවා, "මේ ළමයා මගේ, මේ ළමයා මගේ" කියලා. එතකොට එතැන අපේ ළමයි කවුරුවත් නැහැ නේ. ඒ ගොල්ලන් තමයි ඔක්කොම උගන්වලා තිබෙන්නේ. ඒක තමයි ප්‍රශ්නය. මේක දැන් විෂම චක්‍රයක් වෙලා තිබෙනවා. අපි ඔක්කොම එකතු වෙලා මේ ප්‍රශ්නය විසඳන ගමන් මේ ප්‍රතිපත්ති පැහැදිලිව අනුගමනය කරන්න වෙනවා. මොකද, ගුරුවරයාටත් යම් කාර්යභාරයක් තිබෙනවා. හුදෙක් දැනුම විතරක් නොවෙයි නේ පන්ති කාමරය තුළ දෙන්නේ. කුසලතා, ආකල්ප මේ ඔක්කොම හදනවා. හැබැයි ඒක හැදෙන්නේ නැහැ නේ උපකාරක පන්තිවලට ගියාම. ඉතින්, ඇයි ළමයි ඒ තැන්වලට යන්නේ? පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙක් පෙරේදා "අරුණ" පත්තරේ ලිපියක් පළ කර තිබුණා, අපේ රටේ දෙමව්පියෝ ටියුෂන් පන්තිවලට වර්ෂයකට රුපියල් බිලියන දෙසීයක් වියදම් කරනවා කියලා. මම හිතන විධියට ඊටත් වඩා වැඩි ඇති. මෙතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේක විසඳන්න නම් ගුණාත්මකභාවයෙන් යුත් ගුරුවරයෙක් පන්තියේ ඉන්න ඕනෑ. ඔහුගේ කාර්යසාධනයක් තිබෙන්න ඕනෑ. කාර්යසාධනය සමඟ වැටුප ගැටගැහෙන්න ඕනෑ. එහෙම නැතුව මේ ප්‍රශ්නය කවදාවත් විසඳන්න බැහැ. ඒ ප්‍රශ්නය විසඳීමේ ක්‍රියාමාර්ගයට දැන් අපි ඇවිල්ලා තිබෙනවා.

වෘත්තීය සමිති කණ්ඩායමක් මීට සති 2කට කලින් අසනීප වුණා. ඒ ගොල්ලන් අසනීප වෙනකොට අනෙක් කණ්ඩායම අසනීප වුණේ නැහැ. 2වැනි දා වෙනකොට තව වෙනස් වුණා. තව කණ්ඩායමක් ලබන සතියේ අසනීප වෙන්න හදනවා. එතකොට අනෙක් කණ්ඩායමට සනීප වෙලා. මතක තියාගන්න, මේ කාටත් අසනීප වෙලා ඒවා හොඳ වෙනකල් ළමයි බලාගෙන ඉන්නේ නැහැ. අද වෙලා තිබෙන්නේ මේකයි. ගුරුවරු උගන්වන්න ගියාට උසස්පෙළ පන්තිවල ළමයි නැහැ. ඒ ළමයි හිතනවා, "ඔයගොල්ලන් අසනීප වෙන්න. අපට උපකාරක පන්ති තිබෙනවා. අපි ඒවාට ගිහිල්ලා ඉගෙන ගන්නවා. විභාගය නේ පාස් වෙන්න ඕනෑ. අපි පාස් වෙන්නම්" කියලා. මේක මතක තියාගන්න. මෙහෙම ගියොත්, තව අවුරුදු 5ක් යනකොට - එතකොට අපිත් මේ තනතුරුවල නැති වෙයි. හැබැයි, අපේ වගකීම් ටික අපි ඉටු කරනවා- උගන්වන්න ගුරුවරු ගියත් පාසල්වල ළමයි නැති වෙයි. එහෙම වුණොත්, ගුරු අතිරික්තයක් ඇතිවෙයි. මේවා තේරුම්ගන්න ඕනෑ, මේ කටයුතු මෙහෙයවන අය. තමන්ගේ වයස යනතුරු, තමන්ගේ කාලය නාස්ති වෙනතුරු ළමයි බලාගෙන ඉන්නේ නැහැ. මොකද, ළමයි මීට වඩා ඉදිරියෙන් ඉන්නවා.

ඉන්ටර්නෙට් එකෙන් ගූගල් එක පරීක්ෂා කළාම ලෝකයේ අධ්‍යාපනයේ සිදුවන වෙනස්කම් දැන ගන්න පුළුවන්. ලෝකය කොතැනට ද යන්නේ, රැකියා ඉල්ලුම කොතැනද කියන එක අද අපේ ළමයි දන්නවා. මේ ප්‍රශ්න ඔක්කෝම මැද්දේ අපි ඒකටත් හැඩ ගැහෙන්න ඕනෑ. මේ පද්ධතිය සකස් වෙන්න ඕනෑ. දෙමව්පියන් ප්‍රශ්න තියාගෙන නේ ළමයින්ට උගන්වන්නේ; ඔවුන්ට කන්න දෙන්නේ. දෙමව්පියන් බලාගෙන ඉන්නවාද, "මගේ පඩිය වැඩි කරලා දෙනකල් මම ඉන්නවා, ළමයාට කන්න දෙන්න" කියලා? නැහැ, එහෙම ඉන්නේ නැහැ. අපි හැමෝටම වගකීමක් තිබෙනවා.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මටත් පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අතුරු ප්‍රශ්න දෙක අහලා ඉවරයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා කැමතිද එතුමා ප්‍රශ්නයක් අහනවාට?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඉක්මනට අහන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කෙටියෙන් අහන්න. දැන් වැඩිපුර පැය භාගයක් ගත වෙලා තිබෙනවා.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(මාණ්පුමිකු வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
තත්පර 30යි මම ප්‍රශ්නය අහන්න කාලය ගන්නේ.

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමා ගුරුවරුන් බඳවා ගැනීම සහ ගුරු පුරප්පාඩු පිරවීම සම්බන්ධව දැවැන්ත ක්‍රියාමාර්ගයක් ගන්නවා. ඒක සාර්ථකව පළාත් මට්ටමින්, ජාතික මට්ටමින් ක්‍රියාත්මක වෙනවා. අපට දැන ගන්න තිබෙන විධියට, ජාතික පාසල්වල ගුරු පුරප්පාඩු පුරවන්න කටයුතු කරනවා. ඒ වෙනුවෙන් අපේ ගෞරවය ඔබතුමාට පුද කරනවා. අනෙක් පැත්තෙන් බැලුවොත්, දෙමළ මාධ්‍ය වතු පාසල් සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් පසුගිය ඉතිහාසයේම තිබුණා. ඒ කාරණයේදී මා නියෝජනය කරන දකුණු පළාතේ ඒ පාසල් පහේ බරපතළ ගුරු හිඟයක් තිබෙනවා. මේ ක්‍රමවේදය තුළ ඒ අයව බඳවා ගන්න බැරි නිසා ගුරු සහායකයන් කියන ක්‍රමවේදය තුළ බඳවා ගන්න කටයුතු කරනවා. මට ඔබතුමාගෙන් දැන ගන්න අවශ්‍ය වෙන්නේ, දෙමළ මාධ්‍ය වතු පාසල් සඳහා ගුරු පුරප්පාඩු පිරවීමේ කටයුත්ත ඉසුරුපායෙන් කරනවාද, නැත්නම් පළාත් මට්ටමෙන් කරනවාද, කවදාද එය කරන්නේ කියලායි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මධ්‍යම, සබරගමුව, ඌව, බස්නාහිර, දකුණ කියන පළාත්වල තිබෙන පුරප්පාඩු සඳහා විකල්ප ක්‍රියාමාර්ගයක් හැටියට අපි ගැසට් නිවේදනය නිකුත් කළා. ඒ අනුව ගුරු සේවයේ මූලික සුදුසුකම් තිබෙන අයට මේ සඳහා ඉල්ලන්න පුළුවන්. ඊට පසුව විභාගයක් තිබෙනවා. ඒ ඔක්කෝම කරන්නේ මධ්‍යම රජයෙන්. ඒ අය තියාගන්නේ ගුරු සහායකයන් හැටියට. ඒ ගොල්ලන් අවුරුදු තුනක් ඇතුළත Postgraduate Diploma in Education - PGDE - ලබා ගත්තාට පස්සේ තමයි ගුරු සේවයට අන්තර්ග්‍රහණය වෙන්නේ. එහෙම නැතුව පළාත් සභාවලට අන්තර්ග්‍රහණය කරන්න බැහැ. ඒ සියලු කටයුතු මධ්‍යම රජයෙන් කරනවා. හැබැයි, ඒ අතරතුර අපට වාර්තා වෙලා තිබෙනවා ඌව, මධ්‍යම සහ සබරගමුව පළාත්වල දෙමළ මාධ්‍ය උපාධිධාරීන් සංඛ්‍යාවක් ඉන්නවා කියලා. අපි ඒ තොරතුරු ඉල්ලුවා. ඒ තොරතුරු ලැබුණාට පස්සේ අපට ඒක ගළපා ගන්න පුළුවන්.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා, කෙටියෙන් අහන්න.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු ඇමතිතුමාට අපි පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. දෙමව්පියන් මොන දුෂ්කරතා තිබුණත් දරුවන්ට උගන්වනවා කියලා කිව්වා වාගේ අපි පිළිගන්නවා ඒක ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ ප්‍රශ්නයක් නොවෙයි, ගුරුවරුන්ගේ පරම යුතුකම පළමුවෙන් දරුවන්ට ඉගැන්වීම කියලා. ඒක කරන්නේ නැත්නම් ඔහු ගුරුවරයෙකු වෙන්න සුදුසු නැහැ. විශ්වවිද්‍යාලය වෙන්න පුළුවන්, පාසලක වෙන්න පුළුවන්, ඒ ගැන එකඟ වෙමින් ඒ සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා ප්‍රයත්නයට අපේ කෘතඥතාව පළ කරනවා. ගරු ඇමතිතුමනි, මම මේ කාරණය මීට කලිනුත් ඇහුවා. උතුරු පළාතේ උපාධිධාරීන් ගුරුවරුන් හැටියට බඳවා ගැනීම සඳහා කටයුතු කෙරෙමින් තිබෙනවා. උතුරු පළාතේ සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම සඳහා ගුරු පුරප්පාඩු 18ක් තිබේද්දී ඒ අදාළ විෂයයට උපාධිය තිබෙන, උතුරු පළාතේ පදිංචි අයදුම්කරුවන් පහළොස්දෙනායි ඉල්ලුම් කර තිබෙන්නේ.

ඒ පහළොස්දෙනාගෙනුත් තුන්දෙනෙක් විවිධ හේතූන් නිසා ඉවත් කෙරුණාම සුදුසුකම් සපුරා තිබෙන්නේ දොළොස්දෙනායි. ඒ අතරතුර ඔවුන්ට තරග විභාගයක් -බුද්ධි පරීක්ෂණයක්- පවත්වා තිබෙනවා. එහි ලකුණු මත එක්කෙනෙක් හැරෙන්න ඉතුරු සියලු දෙනාම ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා. ඔවුන් කරපු පැමිණිල්ල මත රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පරීක්ෂණයක් කර තිබෙනවා. එහි සභාපති නීතිඥ ඩී. කලන්සූරිය මහතාගේ අත්සනින් යුතුව, "රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීම" කියලා ලිපියක් නිකුත් කරලා තිබෙනවා, අර ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ගණනාවක් සිංහල භාෂාවට පරිවර්තනය කරද්දී දෝෂ සහිතයි කියලා. ඒක දරුවන්ට තේරෙන්නේ නැහැ. බුද්ධි පරීක්ෂණයක් කරන්න බැහැ නේ, ප්‍රශ්නය වැරදි නම්. ඒ නිසා අපි ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා. මීට පෙර සබරගමුව පළාතට දෙමළ මාධ්‍යයෙන් උගන්වන්න අවශ්‍ය ගුරුවරුන්ගේ පුරප්පාඩු සංඛ්‍යාවට දෙමළ මාධ්‍යය උපාධිධාරීන්ගෙන් ඉල්ලුම්පත් නොලැබුණු නිසා ඉල්ලුම් කරපු අයව තරග විභාගයකින් තොරව බඳවාගෙන තිබෙනවා. ඔබතුමා දන්නවා, උතුරු පළාතේ සිංහල මාධ්‍ය ගුරුවරුන්ගේ විශාල හිඟයක් තිබෙන බව. ඒ අය උතුරු පළාතේ පදිංචිකරුවන්. ඒ නිසා අපි කියනවා, කරුණාකරලා අදාළ විෂය උපාධියට හදාරලා සමත්වෙලා තිබෙනවා නම් මෙකී දෝෂ සහිතයි කියන අභියෝග්‍යතා පරීක්ෂණය නොසලකා හැරලා, සිංහල මාධ්‍යයට අදාළ පත්වීම් ටික ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම්කිසි පළාතකින් උපාධිධාරී ගුරුවරුන් බඳවා ගන්න විෂය වර්ගය අනුව අයදුම්පත් කැඳෙව්වාම පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු සංඛ්‍යාවක් නම් අයදුම්පත් ලැබුණේ, නැවත විභාගයක් පැවැත්වීමේ අවශ්‍යතාවක් නැහැ. මට මේ ගැන වාර්තා වුණා. උතුරු පළාතේ සහ නැඟෙනහිර පළාතේ ඉතා සීමිත පිරිසක් තමයි ඉන්නේ. මම ඒ අයගේ තොරතුරු කැඳෙව්වා. ඒකට අපි සබරගමු පළාතට කළා වාගේ ක්‍රියා මාර්ගයක් ගන්න උපදෙස් ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ප්‍රශ්න අංක 8.

උතුර සහ නැඟෙනහිර පළාත්: රජය විසින් ඉඩම් අත්පත් කරගැනීම

வடக்கு, கிழக்கு மாகாணங்கள்: அரசாங்கத்தால் காணிகள் சுவீகரிக்கப்படுதல்

NORTHERN AND EASTERN PROVINCES: ACQUISITION OF LANDS BY GOVERNMENT

1738/2024

8. ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උතුර හා නැඟෙනහිර පළාත්වල ඇති ඉඩම් මැනක සිට රජය මඟින් අත්පත් කර ගනු ලබන බවත්;

(ii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉරක්කක්කණ්ඩි, පුල්මුඩේ, කින්නියා, මුතූර් සහ තෝප්පූර් යන ප්‍රදේශවල ඉඩම්, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ඒවායේ හිමිකරුවන්ගේ අවසරයකින් තොරව මැනුම් කටයුතු සිදු කරනු ලබන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත මැනුම් කටයුතු සිදු කිරීමට හේතුව කවරේද;

(ii) ඉහත සඳහන් පරිදි ඉඩම් අත්පත් කර ගැනීම, එම ඉඩම්වල පාරම්පරිකව කෘෂිකාර්මික කටයුතු සිදු කරනු ලබන ගොවීන්ගේ ජීවනෝපායට අහිතකර ලෙස බලපාන බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුර්‍රුලාත්දුරෙ මර්රුම් කාණි අමෙච්චරෙයිරෙ කේට්ට විනා:

(அ) (i) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களிலுள்ள காணிகள் அண்மைக்காலமாக அரசாங்கத்தால் சுவீகரிக்கப்பட்டு வருகின்றன என்பதையும்;

(ii) இலங்கை நில அளவைத் திணைக்களம் திருகோணமலை மாவட்டத்தின் இறக்கக்கண்டி, புல்மோட்டை, கிண்ணியா, மூதூர் மற்றும் தோப்பூர் ஆகிய பிரதேசங்களிலுள்ள காணிகளை அவற்றின் உரிமையாளர்களின் அனுமதியின்றி அளவீடு செய்து வருகின்றது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி அளவீட்டு நடவடிக்கைகளை மேற் கொள்வதற்கான காரணம் யாதென்பதையும்;

(ii) மேற்கூறப்பட்ட வகையில் காணிகளைச் சுவீகரிப்பதானது, அக்காணிகளில் பரம்பரை பரம்பரையாக விவசாய நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்ற விவசாயிகளின் சீவனோபாயத்துக்குப் பாதகமான தாக்கத்தை ஏற்படுத்தும் என்பதை அறிவாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Tourism and Lands:

(a) Is he aware that -

(i) the lands in the Northern and Eastern Provinces have recently been acquired by the Government; and

(ii) the lands in Irakkakkandi, Pulmude, Kinnia, Mutur and Toppur in the Trincomalee District are being surveyed by the Survey Department of Sri Lanka without the permission of their owners?

(b) Will he inform this House -

(i) the reason for carrying out the above survey; and

(ii) whether he is aware that the acquisition of lands as mentioned above, will adversely affect the livelihood of the farmers who have been traditionally engaged in agricultural activities on those lands?

(c) If not, why?

ගරු හරින් ප්‍රනාන්දු මහතා (සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஹரின் பர்னாந்து - சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சரும் விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சரும்)
(The Hon. Harin Fernando - Minister of Tourism and Lands and Minister of Sports and Youth Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. උතුර හා නැඟෙනහිර පළාත්වල සිදුවන ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් සාරාංශයක් ඇමුණුම 01හි දක්වා ඇත.

ගරු මන්ත්‍රීතුමනි, මේ ඇමුණුම දීර්ඝ එකක්. එම ඇමුණුම මම **සභාගත*** කරනවා. ඉඩම් ගත් හේතුව ඇතුළු සියලු විස්තර මේකේ තිබෙනවා. මම එය ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්.

(ii) සෑම මැනුම් කටයුත්තක්ම ක්‍රියාත්මක කිරීමේ දී අත්කර ගැනීමේ පනතට අනුව අදාළ ඉඩම් හිමිකරුවන් දැනුවත් කිරීමෙන් පසුව සිදු කරනු ලැබේ.

(ආ) (i) ඉල්ලුම්කාර අමාත්‍යාංශය විසින් යොමු කරනු ලබන අත්කර ගැනීමේ යෝජනා ප්‍රකාර ඉඩම් අත්කර ගැනීමේ පනතේ ප්‍රතිපාදන මත මැනුම් කටයුතු සිදු කරනු ලබයි.

(ii) ඉඩම් අත්කර ගැනීමේ පනතේ නියෝග 248 ප්‍රකාර ඉඩම් අත්කර ගැනීමේ අයදුම් පත්‍රයක් යොමු කිරීමට ප්‍රථම, ඉල්ලුම්කාර ආයතනය විසින් මූලික විමර්ශනයක් පවත්වා, එම ප්‍රදේශයේ ඉඩම් පිළිබඳ සංඝන්දනාත්මක විමසුමක් සිදු කිරීමෙන් අනතුරුව අදාළ අත්කර ගැනීමේ අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි.

(ඇ) අදාළ නොවේ.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

නන්දි, කෞරව ප්‍රතිච් සභානායකර් අවර්කළේ! එන්නුඩෙය මුතලාවතු මේලතික විනාවෛක් කේට්කින්‍රේන්.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වට, කිළක්කුප් පිරතේසංකළිල් කාණි සම්පන්තමාන විටයම් මිකවුම් පිරච්සිනෙක්කුරිය ඔරු විටයමාකක් කාණප්පටුකින්රතු. එංකළුටෙය තිරුකෝණමලෙ මාවට්ටත්තිල් කුරිප්පාක, කුච්චවෙළි, ඉරක්කක්කණ්ටි, පුල්මෝට්ටෙ, කිණ්ණියා, මූතූර්, තෝප්පූර්, තම්පලකාමම් පෝන්ර පකුතිකළිල් මක්කළ් නීණ්ට කාලමාකක් කුටියිරුක්කින්ර කාණිකළෙ අළවෙ සෙය්තු, අවර්රෛච් චුවීකරිප්පතර්කාන නටවටික්කෙ එටුක්කප් පටුවතාකවේ මක්කළ් කරුතුකින්රාර්කළ්. මක්කළ් පරම්පරෙයාකක් කුටියිරුක්කින්ර කාණිකළෙ, විවසායම් සෙය්තු වරුකින්ර කාණිකළෙ අළවිටුම්පෝතු, අවර්රෛච් චුවීකරිප්පතර්කාන නටවටික්කෙ ඒතාවතු මේර්කොළ්ළප්පටප් පෝකින්රතා එන්ර අච්චම් ඉන්රු අම්මක්කළ් මත්තියිල් කාණප්පටුකින්රතු. කුරිප්පාක, තිරුකෝණමලෙ මාවට්ටත්තිල් තනියාර් කම්පනිකළින් වරුකෙ කාරණමාකවුම් මුතලීට්ටාළර්කළුටෙය නලන් කාරණමාකවුම් පොතු මක්කළිටමිරුන්තු කාණිකළෙප් පෙරුවතර්කාන නටවටික්කෙයාක ඉතු ඉරුක්කුමෝ? එන්ර අච්චම් කාණප්පටුකින්රතු. ඉව්විටයම් තොටර්පිල් ක්රව අමෛච්චර් අවර්කළින් කරුත්තු එන්නවෙන නාන් කේට්කින්රේන්.

මේලුම්, අන්තප් පිරතේසත්තිල් ඉරුක්කින්ර මක්කළුක්කු ඉන්නමුම් උරුතිප්පත්තිරම් අල්ලතු permit වළංකප්පටාත නිලෛප්පාටු කාණප්පටුකින්රතු. කුච්චවෙළිප් පිරතේසම් එන්පතු, තොටර්ච්චියාක කාණි සම්පන්තමාන පිරච්සිනෙකළෙ එතිර්නෝක්කික්කොණ්ටු ඉරුක්කින්ර ඔරු පිරතේසමාකුම්. අන්තප් පිරතේසත්තිල් සිලරුක්කු permits මර්රුම් උරුතිකළ් වළංකප් පට්ටිරුක්කින්රන. එනිනුම්, ඉන්නුම් කූටුතලානෝරුක්කු permits මර්රුම් උරුතිකළ් වළංකප්පටවේණ්ටි ඉරුක්කින්රතු. ඉන්ත විටයත්තිල් ක්රව අමෛච්චර් අවර්කළින් නිලෛප්පාටු එන්නවෙනක් කේට්කින්රේන්.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(මාණ්පුමිකු හරින් පර්නාන්තු)
(The Hon. Harin Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට මාස 6කට විතර ඉස්සෙල්ලා මම කුච්චවේලි ප්‍රදේශයට ගියා. මීට පෙර වතාවකත් ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නයම ඇහුවා. ඒ වෙලාවේ දීත් මම එතුමාට ආරාධනා කළා, ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා එක්ක විශේෂ සාකච්ඡාවක් පවත්වලා ඒ සම්බන්ධයෙන් විසඳුමක් ලබා ගනිමු කියලා. සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධව නඩුවක් පවරා තිබුණා. ඒ නඩුවෙන් විශාල ඉඩම් ප්‍රමාණයක් සංචාරක මණ්ඩලයට අයිති වුණා. දිගටම පෝලිමේ බලාගෙන යනකොට මම දැක්කා වැටවල් ගහලා, "සංචාරක මණ්ඩලයට අයිති ඉඩමක්" කියලා තිබෙනවා. පාර අයිනේ ඉඳලා අක්කර ගණනාවක් ඒ ඉඩම් තිබෙනවා. මට මතක හැටියට මුස්ලිම් ව්‍යාපාරිකයෙකුගේ නමට තමයි ඒ ඔප්පු ඔක්කෝම තිබිලා තිබෙන්නේ. ඔහු අයිතියක් නැතිව ඒ ප්‍රදේශයේ වෙනත් මිනිසුන්ට ඒ ඉඩම් දීලා තිබුණා. මම දන්නා විධියට ඒවා වෙන්න ඇති නඩුවෙන් පස්සේ අත්පත් කරගෙන තිබෙන ඉඩම්. ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නය අනුවයි මම අර උත්තරය දුන්නේ. එදා කිව්වා වාගේ මම නැවත වතාවක් ඔබතුමාට ආරාධනා කරනවා.

ඔබතුමා මගෙන් ඔප්පු ගැනත් ඇහුවා. යම්කිසි කෙනෙකුට ස්වර්ණ භූමි, රන් භූමි, ජය භූමි ඔප්පු තිබෙනවා නම්, බලපත්‍රයක් තිබෙනවා නම් "උරුමය" වැඩසටහන යටතේ ඒ ගොල්ලන්ට ඔප්පුවලට ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ හැකියාව තිබෙනවා. අපි මේ දවස්වල අඩුවෙන් ඉල්ලුම්පත්‍ර ලැබුණු පළාත්වලට ජංගම බස් රථ සේවාවක් යොදවා උරුමය වැඩසටහන ගම් මට්ටමින් ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. ඒ තුළින් මේවා ගැන සොයා බලන්න පුළුවන්. කුච්චවේලි ප්‍රදේශය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා කියන්නේ, නඩුවෙන් අත්පත් කර ගත් ඉඩමක් ගැන වෙන්න ඕනෑ. ඒකේ අතිවිශාල භූමි ප්‍රමාණයක් තිබෙනවා. ඒක ඇත්තටම සංචාරක මණ්ඩලයේ තබාගෙන වැඩක් නැහැ. ඒකට එක්කෝ ආයෝජකයෙක් හොයා ගන්න ඕනෑ. අපි ඔබතුමන්ලාගේ දිස්ත්‍රික් සභාවට ඒ ගැන ඉදිරිපත් කරලා, එහෙම නැත්නම් ඔබතුමාට ලබන සතියේ දිනයක එන්න පුළුවන් නම්, අපි මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා එක්ක සාකච්ඡා කරලා ඒ අර්බුදය විසඳන්න උත්සාහ ගනිමු.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(මාණ්පුමිකු ඉම්රාන් මහ්රූප්)
(The Hon. Imran Maharoof)

නන්දි, ක්රව අමෛච්චර් අවර්කළේ! එන්නුටෙය ඉරණ්ටාවතු මේලතික විනාවෛක් කේට්කින්රේන්.

ඉන්රු එංකළුටෙය නාට්ටිල් සුට්රුලාත්තුරෙ සම්පන්ත මාන විටයංකළ් කූටුතලාකප් පේසප්පටුකින්රන. කුරිප්පාක, තර්පෝතු සුට්රුලාත්තලමාක මාරියුළ්ළ තිරුකෝණමලෙ මාවට්ටත්තිල් උළ්නාට්ටු මර්රුම් වෙළිනාට්ටු සුට්රුලාප් පයණිකළ් තංකුවතර්කාන අති සොකුසු තංකුමිට වසතිකළ් ඉල්ලාත නිලෛ කාණප්පටුකින්රතු. ඉතු තොටර්පිල් අරසාංකම් කවනත්තිර්කොණ්ටු ඉරුක්කින්රතා? ආමෙනිල්, සුට්රුලාත්තුරෙක්කුප් පොරුප්පාන අමෛච්චර් එන්ර වකෛයිල්, උංකළාල් ඉතු සම්පන්තමාක එන්න නටවටික්කෙකළ් මේර්කොළ්ළප්පටුකින්රන එන්පතෙ ඉන්තච් සපෛයිල් තෙළිවුපටුත්ත මුටියුමා?

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(මාණ්පුමිකු හරින් පර්නාන්තු)
(The Hon. Harin Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඇහුවේ හොඳ ප්‍රශ්නයක්. මොකද, ත්‍රිකුණාමලය කියන්නේ seasonal area එකක්. මේ කාලය දකුණු මුහුදේ වාරකන් කාලය. එතකොට මේ කාලයේ සංචාරකයන් සංක්‍රමණය වෙන්නේ අරුගම්බේ ප්‍රදේශයට සහ ත්‍රිකුණාමලයට. කාලාන්තරයක් තිස්සේ බලාගෙන යනකොට පෙනී යනවා, මේ අය මාස 5ක් විතර මේ බිස්නස් එක කරලා වහන බව. ඊට පස්සේ ඔවුන් දකුණට යනවා. දකුණු පැත්තේ වාරකන් තිබෙන කාලයේදී ඔවුන් ත්‍රිකුණාමලය පැත්තට එනවා. ඒ නිසා දීර්ඝව ලොකු investment එකක් කරපු ආයතන පසුගිය කාලයේදී දැක්කේ නැහැ. ඒ වාගේම 2019න් පස්සේ රටේ තිබුණු කොවිඩ් ප්‍රශ්නයත්, ආර්ථික අර්බුදයත් එක්ක ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් කඩා වැටුණා. මම දන්නා තරමට ඒ ප්‍රදේශයේ Uga Jungle Beach කියලා හොඳ හෝටලයක් තිබෙනවා. ඒ වාගේම, නිලාවෙලි ප්‍රදේශය ආශ්‍රිතවත් හෝටල් කිහිපයක් තිබෙනවා. ත්‍රිකුණාමලය Air Force කඳවුර ඇතුළේ 18-hole golf course එකක් තිබෙනවා, China Bay Airport එක තිබෙනවා. ඒ නිසා Trincomalee develop කිරීම අපේ road map එකේ තිබෙන important දෙයක්.

ලබන අගෝස්තු 2, 3 සහ 4 යන දිනයන්හි අපි විශාල marine tourism launch එකක් කරනවා. එහි තිබෙන promotional activities මොනවාද කියලා ඔබතුමා ඇහුවා. අපි ඒක කරන්නේ Trincomalee base කරලා. දෙවැනි ලෝක යුද සමයේ ගිලිච්ච නැව් 143ක් ලංකාවේ මුහුදු වටේ තිබෙනවා. මේ නැව් 143 පිළිබඳව ලෝකයට කියන්නත්, ලෝකයේ ඉන්න best diversලා ගෙනෙන්නත්, world එකේ තිබෙන bestම සහරා ඇතුළු සියලු දේවල් ගෙනෙන්නත්, high-end touristsලා ගෙනෙන්නත් මාලදිවයිනත් එක්ක සාකච්ඡා කරලා ලෝකයේ තිබෙන ප්‍රධාන, හොඳම yachts 10ක් ගෙනෙන්නත් ලබන අගෝස්තු 2, 3 සහ 4 යන දිනවල China Bay එක ඇතුළේ විශාල promotional activity

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

එකක් කරන්න අපි සූදානම් කරලා තිබෙනවා. ඒකෙන් පස්සේ Sri Lanka Tourism Promotion Bureau එක "Sri Lanka" කියන brand එක යටතේ තිබෙන brands විධියටම Trinco, අරුගම්බේ යන ප්‍රදේශ අපේ roadshowsවල වෙනම highlight කරන්න plan එකක් හදලා තිබෙනවා. ලබන සුමානයේ තමයි, අවුරුදු 15කට පස්සේ ලෝකයම එකතු කරගත් tourism promotional campaign එකක් සිදු වෙන්නේ. It is about a US Dollars 4 billion campaign. That will be a big boost for Trincomalee.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 9 -1750/2024- (1), ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 -1877/2024- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

පෞද්ගලික අංශයේ සේවක වැටුප් වැඩි කිරීම: ගත් පියවර
தனியார்துறை ஊழியர்களின் வேதனத்தை அதிகரித்தல்: நடவடிக்கை
INCREASE OF WAGES IN PRIVATE SECTOR: STEPS TAKEN

1248/2024

1. ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා (ගරු ඉරාන් වික්‍රමරත්න මහතා වෙනුවට)
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி - மாண்புமிகு இரான் விக்கிரமரத்ன சார்பாக)
(The Hon. K.P.S. Kumarasiri on behalf of the Hon. Eran Wickramaratne)

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඉහළ යන ජීවන වියදමට සමගාමීව පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට ගෙන ඇති පියවර;

(ii) තවමත් එවැනි පියවර ගෙන නොමැති නම් ඊට හේතු; කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පවතින ආර්ථික අර්බුදවලදී කාන්තා ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති විශේෂ ක්‍රියාමාර්ග;

(ii) වත්මන් ආර්ථික අර්බුදයට මුහුණ දීම සඳහා කාන්තාවන් ශ්‍රම බලකායට එක්වීමේ ප්‍රවණතාවක් පවතින බැවින්, කාන්තා ශ්‍රමිකයින්ගේ දරුවන්ට ළමා ආරක්ෂණය, පෝෂණය සහ එවැනි සහාය ලබා දීමට ගෙන ඇති ක්‍රියාමාර්ග;

(iii) විදෙස්ගත ගෘහ සේවිකාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවර;

(iv) තවමත් එවැනි පියවරක් ගෙන නොමැති නම් ඊට හේතු; කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அதிகரித்து வரும் வாழ்க்கைச் செலவுக்கு அமைவாகத் தனியார்துறை ஊழியர்களின் வேதனத்தை அதிகரிப்பதற்கு எடுக்கப்பட்ட நடவடிக்கைகளையும்;

(ii) அவ்வாறான நடவடிக்கைகள் இதுவரை எடுக்கப்படாமல் இருந்தால் அதற்கான காரணங்களையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) நிலவுகின்ற பொருளாதார நெருக்கடியின்போது பெண் தொழிலாளர்களின் உரிமைகளைப் பாதுகாப்பதற்கு எடுக்கப்பட்ட விசேட நடவடிக்கைகளையும்;

(ii) தற்போதைய பொருளாதார நெருக்கடிக்கு ஈடுகொடுக்கும் முகமாகப் பெண்கள் தொழிற் படையில் இணைவதற்கான எத்தனிப்புக் காணப்படுவதால், பிள்ளைப் பராமரிப்பு, போஷாக்கு மற்றும் அவை போன்ற உதவியைப் பெண் தொழிலாளர்களின் பிள்ளைகளுக்கு வழங்குவதற்கு எடுக்கப்பட்ட நடவடிக்கைகளையும்;

(iii) வெளிநாடுகளில் வீட்டுப் பணிப்பெண்களாகத் தொழில்புரியும் பெண் தொழிலாளர்களின் உரிமைகளைப் பாதுகாப்பதற்கு எடுக்கப்பட்ட நடவடிக்கைகளையும்;

(iv) அவ்வாறான நடவடிக்கைகள் இதுவரை எடுக்கப்படாமல் இருந்தால் அதற்கான காரணங்களையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Foreign Employment:

(a) Will he inform this House -

(i) the steps taken to increase the wages of private sector employees in line with the increasing cost of living; and

(ii) the reasons, if such steps have not been taken yet?

(b) Will he also inform this House -

(i) the special measures taken to protect the rights of female workers during the prevailing economic crises;

(ii) the measures taken to provide childcare, nutrition and similar support to the children of female workers, as there is a tendency for women to join the workforce in order to cope with the current economic crisis;

(iii) the steps taken to protect the rights of overseas domestic female workers; and

(iv) the reasons if such steps have not been taken yet?

(c) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට අදාළව මේ වන විට පියවර දෙකක් ගෙන ඇත.

- තේ වැවීමේ හා සැකසීමේ කර්මාන්තයට සහ රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තයට අදාළව 2024.05.21වන දින කම්කරු කොමසාරිස් ජනරාල් විසින් පඩිපාලක සභා ආඥාපනතේ 33(1) (B) යටතේ තීරණය කරන ලද රුපියල් 1,700ක දෛනික වැටුප, අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2024.05.21 දිනැති අංක 2385/4 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව වර්තමානයේ මෙම සේවකයන්ට අදාළ දෛනික වැටුප රුපියල් 1,700ක් වේ.
- 2016 අංක 3 දරන ජාතික අවම වේතනය පනත යටතේ නියමිත ජාතික අවම මාසික වේතනය රුපියල් 12,500ක හා ජාතික අවම දෛනික වේතනය රුපියල් 500ක සිට ජාතික අවම මාසික වේතනය රුපියල් 17,500 හා ජාතික අවම දෛනික වේතනය රුපියල් 700ක් දක්වා වැඩි කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන පනත සංශෝධනයට පියවර ගෙන ඇත.

ඒ අනුව මෙකී පනත සංශෝධනය සමඟ පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත යටතේ ගෙවිය යුතු රුපියල් 1,000ක මුදල සහ 2016 අංක 04 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත යටතේ ගෙවිය යුතු රුපියල් 2,500ක මුදල සමඟ රුපියල් 21,000ක් දක්වා වැඩිවීමට නියමිත වේ.

(ii) අවශ්‍ය පියවර ගෙන ඇත.

කෙසේ නමුත් 2024.05.21 දිනැති අංක 2385/4 දරන ගැසට් පත්‍රය මඟින් තේ වැවීමේ හා සැකසීමේ කර්මාන්තයට සහ රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තයට අදාළ සේවකයන්ගේ දෛනික වැටුප රුපියල් 1,700ක් දක්වා වැඩි කිරීමට ගත් තීරණයට එරෙහිව වතු සමාගම් විසින් එම තීරණය සමාලෝචනය කර ගැනීම සඳහා CA (Writ) 329/2024 යටතේ රිට් අයදුම්පතක් ගොනු කිරීමට කටයුතු කරන ලදී.

මෙම රිට් අයදුම්පත පිළිබඳ 2024.06.03 දින support කිරීමට කැඳවූ අවස්ථාවේදී වගඋත්තරකරුවන් වෙත නොකිසි නිකුත් කිරීමට කටයුතු කළද, ප්‍රශ්නගත ගැසට් පත්‍රය බල රහිත කිරීමට හෝ ක්‍රියාත්මක කිරීම නැවැත්වීමට හෝ අතුරු තහනම් නියෝගයක් ලබා දීමට ගරු අභියාචනාධිකරණය විසින් කටයුතු නොකරන ලදී. ඒ අනුව 2024.05.21 දින තේ වැවීමේ හා සැකසීමේ කර්මාන්තයට සහ රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තයට අදාළව නිකුත් කරන ලද ගැසට් නිවේදනය මේ වන විට බලාත්මකව පවතින අතර, එබැවින් සේවායෝජකයන් මෙම වැඩි වූ දෛනික වැටුප ගෙවීමට බැඳී සිටී.

(ආ) (i) කාන්තා ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන පනත් වශයෙන් පනත් 04ක් ක්‍රියාත්මක කරනු ලබයි.

- 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) ආඥාපනත.
- 1939 අංක 32 දරන සූතිකාගාර ආඥාපනත.
- 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත.
- 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත.

1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) ආඥාපනතේ ප්‍රතිපාදන අනුව ඕනෑම කාන්තාවක් සේවයේ යෙදවිය හැකි වන්නේ, පැයක විවේක කාලය ද ඇතුළත්ව පැය 09ක සේවා කාලයක් පමණි.

එසේම සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) ආඥාපනත යටතේ පූර්ව භාග 6ට ප්‍රථමයෙන් හෝ අපර භාග 8න් පසුව සේවයේ යෙදවිය හැකි වන්නේ හෝටලයක හෝ හෝජනාගාරයක හෝ නේවාසික හෝටලයක පමණක් වන අතර ඒ සඳහා ද අවසර ඇත්තේ වයස අවුරුදු 18ට පැමිණි කාන්තාවන්ට පමණි. තවද, සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) ආඥාපනතේ 10(1) වගන්තිය මඟින් ස්ත්‍රීන් හා වයස අවුරුදු 18ට අඩු පුද්ගලයන් සේවයේ යෙදවීම සම්බන්ධව වැඩිදුරටත් විධිවිධාන පනවා ඇත.

සූතිකාගාර ආඥාපනත අනුව ගැබ් ගැනීම හෝ ප්‍රසව අවස්ථාවේ ප්‍රතිඵලයක් වශයෙන් සැදෙන යම් අසනීපයක් හේතුවෙන් පමණක් කාන්තාවකගේ සේවය අවසන් නොකළ යුතු බවටත්, ප්‍රසූත නිවාඩු ලබා සිටින අවස්ථාවක සේවයෙන් ඉවත් කිරීමේ දැන්වීමක් භාර නොදිය යුතු බවටත් ප්‍රතිපාදන පවතී.

ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත යටතේ කාන්තාවක් රාත්‍රී සේවයේ යෙදවීමට පෙර එම කාන්තාවගේ කැමැත්ත ලබා තිබිය යුතු අතර, කම්කරු කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරයද ලබා තිබිය යුතු වේ. එක් මාසයක් තුළදී කිසිම කාන්තාවක් දින 10ට වඩා රාත්‍රී සේවයේ නියුක්ත නොකරනු ලැබිය යුතු බවට ද එහි සඳහන් වේ.

සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) ආඥාපනතට අදාළව කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සම්බන්ධයෙන් සංශෝධනයන් ගෙන ඒමට 2024 අංක 28 දරන සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත මඟින් පියවර ගෙන ඇත. එමඟින් සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) ආඥාපනතේ 10වන වගන්තිය සඳහා උප වගන්තියක් හඳුන්වා දී තොරතුරු තාක්ෂණය හා දැනුම හෝ ව්‍යාපාර ක්‍රියාවලීන් බාහිරින් යොදවා ගැනීම - outsourcing -, පරිපාලන කටයුතු, ගණකාධිකාරී වැනි අදාළ කාර්යයන් සඳහා වන ව්‍යාපාරයක පිටරට පිහිටුවා ඇති ආයතනයක කාර්යාලයන්ට අදාළ කටයුතු සඳහා පෙර වරු 6ට පෙර හා පස් වරු 6ට පසු වයස අවුරුදු 18ට එළැඹී කාන්තාවන් සේවයේ යොදවා ගැනීම සඳහා අවසර ලබා දීමට පියවර ගෙන ඇත. එනම් වර්තමානයට ගැළපෙන අයුරින් පනත සංශෝධනය කරමින් කාන්තාවන් සඳහා සම අයිතිවාසිකම් ලබා දීම සඳහා අවස්ථාව සලසා ඇත.

එලෙසම එම පනතෙහිම සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනතේ 66වන වගන්තියට උප වගන්තියක් හඳුන්වා දෙමින් පස් වරු 10න් පසු හා පෙර වරු 6ට පෙර සේවාවේ යොදවනු ලබන කාන්තාවන් සඳහා ආරක්ෂාව, ප්‍රවාහන පහසුකම් සහ විවේක ගැනීම සඳහා පහසුකම් ලබා දිය යුතු බවට ද දක්වා ඇත.

තවද, මීට අමතරව දැනට ක්‍රියාත්මක වන ප්‍රධාන පනත් වන සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත, පඩිපාලක සභා ආඥාපනත, ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත, කර්මාන්තශාලා ආඥාපනත ඇතුළත්ව පනත් 13ක සඳහන් නීතිමය මූලධර්ම ද ඇතුළත්ව නව රැකියා පනතක් ගෙන ඒමට අවශ්‍ය පියවර ගනිමින් ඇත. විශේෂයෙන්ම කාන්තා සේවකයන්ට අදාළව වැඩපළ තුළ ලිංගික හිංසනය වැළැක්වීම සහ ගෘහ සේවයේ නියුතු කාන්තාවන්ගේ කම්කරු අයිතිවාසිකම් සම්බන්ධව එහිදී අවධානය යොමු කර ඇත.

මීට අමතරව දැනට පවතින කාන්තාවන්ට අතිකාල සේවයේ සහ රාත්‍රී සේවයේ නිරතවීමට පවතින බාධා ඉවත් කිරීම. අර්ධකාලීන - part time - රැකියාවල නියුතුවීමට අවශ්‍ය ප්‍රතිපාදන ගෙන ඒම මෙන්ම නිවසේ සිට වැඩ කිරීමට අදාළ නෛතික ප්‍රතිපාදන ද මෙම නව නීතිය යටතේ හඳුන්වා දීමට නියමිතය.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(ii) කම්කරු දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් නොවන කාරණා බැවින් ඒ පිළිබඳව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයෙන් විමසීම සුදුසු බව සඳහන් කරනු කැමැත්තෙමි.

(iii) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියාවක් සඳහා විදේශගත වන කාන්තා ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් පහත සඳහන් ක්‍රමවේද සුරක්ෂිත කර ඇත.

01. මැද පෙරදිග කලාපයේ ගෘහස්ථ අංශයේ රැකියාවක් සඳහා විදේශ ගත වන කාන්තාවන්ගේ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා විදේශ රක්ෂණාවරණය ක්‍රියාත්මක කිරීම හා සෙසු කාන්තා ශ්‍රමිකයන්ගේ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා දේශීය රක්ෂණාවරණය මඟින් රැකවරණය සැලසීම.

02. විදේශ රැකියාවෙහි නිරතව සිටියදී කාන්තා ශ්‍රමිකයන් මුහුණ දෙන ගැටලු සඳහා විසඳුම් ලබා දීමට විදේශ දූත මණ්ඩල කාර්යාලවල කම්කරු හා සුබසාධන අංශයන්හි සේවයෙහි නියුතු නිලධාරීන් මැදිහත් වීම.

03. විදේශ රැකියාවෙහි නිරතව සිටියදී ගැටලුවලට මුහුණ දෙන කාන්තා ශ්‍රමිකයන් හට රැකවරණය සැලසීම සඳහා දූත මණ්ඩල කාර්යාලවල සුරක්ෂා නිවාස පවත්වාගෙන යාම.

04. ගෘහ සේවය සඳහා යන කාන්තාවන්ට විදේශ ගතවීමට පෙර පුහුණුවක් ලබා දීම.

05. විදෙස්ගත වීමට පෙර දරුවන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් හරහා පවුල් පසුබිම් වාර්තා ලබා ගැනීම.

06. අවුරුදු 02ට අඩු දරුවන් ඇති කාන්තාවන් විදෙස්ගත නොකිරීම.

07. විදෙස්ගත වීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වන අවස්ථාවේදී පවුලේ සාමාජිකයන් වෙනුවෙන් වියළි ආහාර ලබා ගැනීම සඳහා රුපියල් 10,000ක සතොස වවුචර්පත් ලබා දීම.

08. විදෙස්ගත වන දෙමව්පියන්ගේ දු දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම, පාසල් උපකරණ ලබා දීම.

09. විදෙස්ගතව පූර්ණ ආබාධිත තත්ත්වයට පත්ව ලංකාවට පැමිණෙන ශ්‍රමිකයන් සඳහා නිවාස ඉදිකර දීම.

10. විදෙස්ගත කාන්තාවන්ගේ දු දරුවන්ගේ විශේෂ දක්ෂතා ඇගැයීමට මූල්‍යමය දායකත්වය ලබා දීම.

11. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශගතව සිටින විට හෝ ලංකාවට පැමිණි පසු විදේශ රක්ෂණාවරණය මඟින් රක්ෂණ ප්‍රතිලාභ ලබා දීම.

12. විදේශගතව සිටියදී කාන්තාවන්ට සිදුවන හිරිහැර, අතවර සම්බන්ධව අදාළ රටෙහි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලයේ රැකීරක්ෂා හා සුබසාධන අංශයේ නිලධාරීන්ගේ නිරන්තර සොයාබැලීම් සිදුකර ගැටලු නිරාකරණය කිරීම.

13. රක්ෂණාවරණ මඟින් කාලය ඉකුත් වී ඇති බැවින් ප්‍රතිලාභ ලබා දිය නොහැකි අවස්ථාවල කාර්යාංශයේ සේවක සුබසාධන අරමුදල මඟින් ප්‍රතිලාභ ලබා දීම.

14. විදේශගත කාන්තාවන් ලංකාවට පැමිණ හෝ සිටියදී පවුලේ සාමාජිකයන් විසින් ඉදිරිපත් කරන පැමිණිලි සමථයකට පත් කිරීම සඳහා කාර්යාංශයේ සමථ අංශය මඟින් කටයුතු කිරීම.

15. කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ගැටලු විසඳා ගැනීම සඳහා විගමනික සංගම් පිහිටුවා ගැනීම.

16. "මනුසවි" බහුවිධ ණය යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියාවක් සඳහා විදේශගතව සිටින ශ්‍රමිකයන් හට රුපියල් 2,000,000ක ණය මුදලක් කාර්යාංශයේ නිර්දේශය මත සියයට 8ක පොලියට ලබා දීම.

17. විදේශ රැකියාවක නිරතව සිටි විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වැඩිම වාර ගණනක් ලියාපදිංචි වී ඇති ශ්‍රමිකයන් හට සතොස වවුචර්පත් ලබා දීම.

ලියාපදිංචි වාර ගණන	වවුචර් පතෙහි වටිනාකම
06	7,500
07	12,500
08 හා 09	20,000
10 හෝ 10ට වැඩි	25,000

18. නිවාස ණය ලබා දීම.

කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශගතව සිටින ශ්‍රමිකයන්හට නිවාස සිහිනය සැබෑ කර ගැනීම සඳහා රුපියල් මිලියන 10ක් දක්වා නිවාස ණය ලබා ගැනීමේ හැකියාව පවතින අතර අදාළ පොලී මුදලින් කොටසක් කාර්යාංශය මඟින් ප්‍රතිපූරණය කිරීම.

19. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියාවක නියුතු ශ්‍රමිකයන්ගේ කලත්‍රයාහට දිවිමහ සාර්ථක කිරීමේ අරමුණින් ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට රුපියල් 100,000ක් දක්වා ආධාර සැපයීම.

20. විදේශ රැකියාවක නිරතව සිට මෙරටට පැමිණි විදේශ ශ්‍රමිකයන්ට ස්වයං රැකියා ආරම්භ කිරීමට රුපියල් 100,000ක් දක්වා ආධාර සැපයීම.

21. විදේශ රැකියාවෙහි යෙදී සිට මෙරටට පැමිණි ශ්‍රමිකයන්ට ව්‍යවසායකයන් බවට පත් කිරීම සඳහා කාර්යාංශයෙහි මූල්‍ය අනුග්‍රහය ලබා දීම.

22. විදේශ රැකියාවෙහි නිරතව සිටින ශ්‍රමිකයන්ගේ විශ්‍රාම දිවිය සාර්ථක කර ගැනීම සඳහා මනුසවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

(iv) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

පෞද්ගලික බටහිර වෛද්‍ය අධ්‍යාපනය: ප්‍රවර්ධනය

தனியார் மேற்கத்தேய மருத்துவக் கல்வி: ஊக்குவித்தல்

PRIVATE WESTERN MEDICAL EDUCATION: PROMOTION

1252/2024

2. ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා (ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා වෙනුවට)

(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி - மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன சார்பாக)

(The Hon. K.P.S. Kumarasiri on behalf of the Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

අධ්‍යාපන අමාත්‍යාතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ලෝකයේ බොහෝ රටවල් මේ වන විට පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය කරනු ලබන බව දන්නේද;

(ii) බටහිර වෛද්‍ය අධ්‍යාපනය ලබා දෙනු ලබන ශ්‍රී ලංකාවේ ඇති පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපන ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල නම් කවරේද;

(iv) ඉහත සඳහන් පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපන ආයතනවල ඉගෙනුම් ලබන සිසුන්ට අවශ්‍ය සායනික පුහුණුව සඳහා පවතින රජයේ ශික්ෂණ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(v) එම රෝහල්වල නම් කවරේද;

(vi) ශ්‍රී ලංකාවේ පෞද්ගලික බටහිර වෛද්‍ය අධ්‍යාපනය දියුණු කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට ගනු ලබන පියවර කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කල්වි அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உலகத்திலுள்ள பெரும்பாலான நாடுகளால் இன்றளவில் தனியார் மருத்துவக் கல்வி ஊக்குவிக்கப்படுவதை அறிவாரா என்பதையும்;

(ii) இலங்கையில் மேற்கத்தேய மருத்துவக் கல்வியை வழங்கும் தனியார் மருத்துவக் கல்வி நிறுவனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) அந்த நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி தனியார் மருத்துவக் கல்வி நிறுவனங்களில் கல்வி பயிலும் மாணவர்களுக்குத் தேவையான மருத்துவப் பயிற்சியைப் பெறுவதற்காக உள்ள அரசாங்க போதனா வைத்தியசாலைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(v) அவற்றின் பெயர்கள் யாவையென்பதையும்;

(vi) இலங்கையில் தனியார் மேற்கத்திய மருத்துவக் கல்வியை விருத்தி செய்யவும் ஊக்குவிக்கவும் எடுக்கவிருக்கும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) whether he is aware of the fact that many countries in the world are promoting private medical education as of now;

(ii) the number of private medical educational institutions in Sri Lanka which provide western medical education;

(iii) the names of such institutions;

(iv) the number of government teaching hospitals available for the clinical training required by the students studying in the above-mentioned private medical educational institutions;

(v) the names of such hospitals; and

(vi) the steps that would be taken to improve and promote private western medical education in Sri Lanka?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම සභාගත* කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දැනුවත්ව සිටිමි.

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වන වගන්තිය යටතේ බටහිර වෛද්‍ය අධ්‍යාපනය ලබා දීම සඳහා පිළිගත් උසස් අධ්‍යාපන ආයතන නොමැත.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(v) පැන නොනඟී.

(vi) යම්කිසි උසස් අධ්‍යාපන ආයතනයක් බටහිර වෛද්‍ය උපාධි පිරිනැමීමට අදහස් කරන්නේ නම් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තියෙහි ප්‍රතිපාදන අනුව විෂය සමාලෝචන යෝජනා ඉදිරිපත් කර එම සමාලෝචනයෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ වෛද්‍ය සභාවේ එකඟතාව

ඇතිව උපාධි පිරිනැමීම සඳහා අවස්ථාව පවතී. ඒ අනුව මේ වන විට රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක් මඟින් බටහිර වෛද්‍ය උපාධි පිරිනැමීම සඳහා ඉදිරිපත් කර ඇති යෝජනාවක් සමාලෝචන අවස්ථාවේ පවතී.

(ආ) පැන නොනඟී.

මන්නාරම සුළං විදුලි බලාගාරය: විස්තර
மன்னார் காற்றாலை மின் உற்பத்தி நிலையம்: விபரம்
MANNAR WIND POWER STATION: DETAILS

1750/2024

9. ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)
(The Hon. K.P.S. Kumarasiri on behalf of the Hon. Ishak Rahuman)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මන්නාරම සුළං විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම බලාගාරය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල කොපමණද;

(iii) එම බලාගාරයෙන් ජාතික ජාලයට එකතු කිරීමට අපේක්ෂා කරනු ලබන විදුලි ප්‍රමාණය මෙගා වොට්වලින් කොපමණද;

(iv) එම විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද;

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மன்னார் காற்றாலை மின் உற்பத்தி நிலையத்தின் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப் பட்ட திகதி யாதென்பதையும்;

(ii) மேற்படி மின் உற்பத்தி நிலையத்தை நிர்மாணிப் பதற்காக மதிப்பீடு செய்யப்பட்ட தொகை எவ்வளவென்பதையும்;

(iii) மேற்படி மின் உற்பத்தி நிலையத்திலிருந்து தேசிய மின் கட்டமைப்புடன் இணைப்பதற்கு எதிர்பார்க்கப்படும் மின்சாரத்தின் அளவு மெகா வோட்களில் எவ்வளவென்பதையும்;

[ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා]

(iv) மேற்படி மின் உற்பத்தி நிலையத்தின் நிர்மாணப் பணிகள் பூர்த்தி செய்யப்படுவதற்கு எதிர் பார்க்கப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he inform this House of -

(i) the date on which the construction activities of the Mannar Wind Power Station were commenced;

(ii) the amount of money estimated as the cost of construction of the said power station;

(iii) the number of megawatts expected to be added to the National Grid from the aforesaid power station; and

(iv) the date on which it is expected to complete the construction activities of the aforesaid power station?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ලංවිම. ට අයත් මන්නාරම තම්බපවනී සුළං විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද්දේ 2019 මාර්තු මස 04වන දිනයි.

(ii) එම බලාගාරය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 157.6කි. (ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර අංක 3585-SRI ට අදාළ වේ)

ඉදිකිරීම් සඳහා පමණක් වියදම් වූ මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 123.1කි. (2024 අප්‍රේල් 22 දිනට)

(iii) බලාගාරයෙන් වාර්ෂිකව ගිගාවොට් පැය 400 (400 GWh) ජාතික ජාලයට එකතු කිරීමට අපේක්ෂිතයි.

(iv) විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලැබුවේ 2021 මාර්තු මාසයේදීය. මන්නාරම නඩුකුඩා ග්‍රිඩ් උපපොළේ ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු 2021 මැයි මස 18වන දින සිට බලාගාරයේ මෙහෙයුම් කටයුතු ආරම්භ විය.

(ආ) සියලු තොරතුරු ඉහත දක්වා ඇති බැවින් අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 10 -1877/2024- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමා.

වරප්‍රසාද: ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කමිටු වාර්තාවේ සඳහන් කරුණු
சிறப்புரிமை: ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழுவின் அறிக்கையில் உள்ளடங்கியுள்ள விடயங்கள்
PRIVILEGE: MATTERS EXPRESSED IN REPORT OF COMMITTEE ON ETHICS AND PRIVILEGES

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා
(மாண்புமிகு இம்தியாஸ் பாக்கிர் மாக்கார்)
(The Hon. Imthiaz Bakeer Markar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

පාර්ලිමේන්තුවේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ මුද්‍රිත පිටපතක් පසුගිය අභහරුවාදා දිනයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතට පත් කරනු ලැබුවා.

එම වාර්තාවේ සඳහන් තුන්වැනි කාරණය, මා විසින් ඉදිරිපත් කරන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී තරුණ නියෝජනය අනිවාර්ය කිරීම සඳහා වන පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සම්බන්ධව ක්‍රියා කිරීමේදී බරපතළ ලෙස වරප්‍රසාද උල්ලඝනය වී තිබීම පිළිබඳව වූ කාරණයයි. මේ කාරණය සම්බන්ධව අසාධාරණයක් සිදුව ඇති බව කාරක සභාවේ නිරීක්ෂණයෙන් පෙනී යන බව මෙම වාර්තාව ඍජුවම සඳහන් කර තිබෙනවා.

මේ අසාධාරණය සිදුව ඇත්තේ වාර්තාවේ සිරස්තලයේ සඳහන් කොට ඇති අයුරින් උදාසීන ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීම හේතුවෙන් නොව සිතාමතාම මා ඉදිරිපත් කළ පනත් කෙටුම්පත පිළිබඳව වගකීම් ඉටු කිරීම ප්‍රමාද කිරීම නිසා බව සිදුව ඇති සිදුවීම් එකිනෙක ගෙන පරීක්ෂා කර බලන විට ඕනෑම කෙනෙකුට තේරුම් යන්නක් බව මම විශ්වාස කරනවා.

පෞද්ගලික මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් සම්බන්ධව අනුගමනය කළ යුතු පැහැදිලි ක්‍රියා පටිපාටියක් තිබියදී වුවමනාවෙන්ම එම ක්‍රියාමාර්ග ගැනීම පැහැර හැරීම හේතුවෙන් මේ අසාධාරණය සිදුව ඇති බව පැහැදිලිවම දැකගන්න පුළුවන්.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති වාර්තාවේ නවවන පිටුවේ අවසන් ඡේදය සහ දහවන පිටුවේ පළමු ඡේද දෙකටද ඔබතුමාගේ ගෞරවනීය අවධානය විශේෂයෙන් යොමු කළහොත් හිතාමතාම සිදු කර ඇති අසාධාරණයන් කිහිපයක් ඔබතුමාට සහ මෙම සභාවට පැහැදිලිවම තේරුම් ගත හැකි වේවි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කැමැතියි, එම පරිච්ඡේදයන්ගෙන් වාක්‍ය කිහිපයක් උපුටා දක්වන්න. ඒ සඳහා මට අවසර දෙන්න.

උපුටා දැක්වීම මෙසේයි: "2024 ජනවාරි 11වන දින කාරක සභාව විසින් එම කරුණ නැවත සලකා බැලූ අතර පාර්ලිමේන්තුවේදී පනත් කෙටුම්පත් කාර්යාංශයේ නිලධාරීන් කාරක සභාවට හමුවට කැඳවන ලදී. නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලැබුණු නිර්දේශ සම්බන්ධයෙන් සභාපතිවරයා විමසා සිටියේය..."

පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ පරිපාලන ජනකාන්ත සිල්වා මහතා තම පැහැදිලි කිරීම ආරම්භ කරමින් සඳහන් කළේ, "ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතාගේ භාෂා තුනෙන්ම යුතු පෞද්ගලික මන්ත්‍රී කෙටුම්පත, පනත් කෙටුම්පත් කාර්යාලයට 2022 ජනවාරි 06 වන දිනත්, ගරු ප්‍රේමිනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමාගේ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සම්බන්ධ යෝජනාව 2022.06.03වන දින සිංහල භාෂාවෙන් පමණක් ලැබුණු බවත්, ගරු දොලවත්ත මන්ත්‍රීතුමාගේ සම්පූර්ණ කරන ලද භාෂා ත්‍රිත්වයෙන්ම වූ පනත් කෙටුම්පත 2022 අගෝස්තු මස 22වන දින ලැබුණු බවත්ය" යනුවෙනි. ඒ කියන්නේ, මගේ යෝජනාව ඉදිරිපත් කරලා මාස 7කුත් දින 16ක් ගත වුණාට පස්සේ.

එතුමා තවදුරටත් සඳහන් කළා, "2022.03.02 දින ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතාගේ පනත් කෙටුම්පතට නිර්දේශ ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යවන ලද අතර, ගරු ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතාගේ භාෂාත්‍රයෙන්ම යුතු වූ පනත් කෙටුම්පත 2022.08.26වන දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ කර යවන ලදී" යනුවෙන්.

ඒ කියන්නේ, මා ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත ලැබී මාස 2කට ආසන්න කාලයක් ගත වුණාට පස්සේයි මේක නීතිපති දෙපාර්තමේන්තුවට යවන්නේ. දෙවැනි යෝජනාව, එනම් මා ඉදිරිපත් කරන ලද යෝජනාවට මාස 7කට පස්සේ ලැබුණු යෝජනාව දවස් 4ක් ඇතුළත නීතිපති දෙපාර්තමේන්තුවට යවන්න තරම් පාර්ලිමේන්තුව කාර්යක්ෂම වුණා. මම ඉදිරිපත් කළ යෝජනාව යවන්න මාස දෙකක් ගත වුණා. මේ යෝජනාව දවස් හතරකින් නීතිපති දෙපාර්තමේන්තුවට යැව්වා.

නීතිපති දෙපාර්තමේන්තුවට මගේ යෝජනාව යැවීම සිදු කරන්නේ මාස දෙකක් ප්‍රමාද කරමින්. එහෙත් පසුව ලැබුණු පනත් කෙටුම්පත භාෂා තුනෙන්ම ලැබී දින 4කින් නීතිපති දෙපාර්තමේන්තුවට යවනවා. මේ අනුව මන්ත්‍රීවරුන් දෙදෙනෙකුගේ පනත් කෙටුම්පත් සම්බන්ධව කටයුතු කිරීමේදී පාර්ලිමේන්තුවේ වග කිව යුතු බලධාරීන් දක්වා ඇති වෙනස්කම් සහිත සැලකිල්ල උදාසීන ක්‍රියා පටිපාටියක් ද, විෂම ක්‍රියා පටිපාටියක් ද යන්න මේ අනුව අපේ රටේ ඕනෑම පුරවැසියෙකුට අවබෝධ කර ගැනීම අපහසු කාර්යයක් වන්නේ නැහැ.

දෙමළ භාෂා පරිවර්තකයෙකු නොසිටීම සහ මගේ සෞඛ්‍ය තත්ත්වයක් ගැන එක්තරා නිලධාරියෙකු විසින් කළ ප්‍රකාශයක් මේ වාර්තාවේ සඳහන් වනවා. මේ වාර්තාවට අනුව, ඒ නිලධාරියා කී බව කියන මගේ සෞඛ්‍ය තත්ත්වය මේ ක්‍රියා පටිපාටිය ප්‍රමාදවීමට කිසිසේත් හේතුවක් නොවනවා පමණක් නොව, එවැනි අසනීප තත්ත්වයක් ගැන මා ප්‍රකාශ කළ බව කීම ද සම්පූර්ණයෙන්ම සත්‍ය නොවන ප්‍රකාශයක් බව ද කිව යුතුයි.

පාර්ලිමේන්තුවට පළමුවර කියවීම අවසන් වීම සහ භාෂා තුනෙන්ම මගේ පනත් කෙටුම්පත, පනත් කෙටුම්පත් කාර්යාලයට භාර දීම තුළින් මම මගේ වගකීම නිසි ලෙස, නිසි කලට හරියාකාරව ඉටු කර තිබෙන බව මේ වාර්තාවේ සඳහන් දින වකවානු බලන විට හොඳින්ම පැහැදිලි වෙනවා. මේ වගකීම් නිසි ලෙස ඉටු කර තිබියදී, මගේ පනත් කෙටුම්පත ඉදිරි කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යැවීම සිදු කිරීමට මාස 2කට ආසන්න කාලයක් ගත වුණද, අනෙක් යෝජනාව ලැබී දින 4ක් ගත වන්නට පෙර නීතිපති දෙපාර්තමේන්තුවට යවනු ලබන්නේ දෙමළ භාෂා පරිවර්තන හිඟය එම පනත් කෙටුම්පතට පමණක් බල නොපාන නිසා ද යන්න ප්‍රහේළිකාවක්.

අනෙක, නීතිපති දෙපාර්තමේන්තුව මගේ පනත් කෙටුම්පත ගැන වාර්තාව එවීම සිදු කරන්නේ, ආසන්න වශයෙන් මාස 6ක පමණ කාලයක් ප්‍රමාද කරමින්. ඒ එවන්නේත් මාස 6කට පසුව ලැබුණු අනෙක් පනත් කෙටුම්පත හා සම්බන්ධ කරමින් දෙකටම එක වාර්තාවක් ලෙසින්. මෙය පුදුමසහගත තත්ත්වයක්. මේ අසාධාරණයන් සිදු කිරීම ගැන වගවීමක් තිබිය යුතුයි, වගකීමක් තිබිය යුතුයි. පාර්ලිමේන්තුවේ කටයුතු ගැන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පමණක් නොව මුළු රටේම වග කිව යුතු පුරවැසියන් ද අවදියෙන් බලා සිටිනවා.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු පමණක් නොව, පාර්ලිමේන්තුව වෙනුවෙන් හෝ කථානායකතුමා වෙනුවෙන් හෝ විවිධ කාර්යයන් ඉටු කරන බලධාරීන් ද යුක්ති ධර්මය අනුව විනිවිද පෙනෙන අයුරින් ඒ කටයුතු ඉමහත් පාරිශුද්ධභාවයකින් සිදු කළ යුතුව තිබෙනවා. ඔවුන් කිසිදු බලයකට හෝ බලපෑමකට හෝ වහල් නොවී මේ රටේ ජනතාව පාර්ලිමේන්තුව කෙරෙහි තබා ඇති විශ්වාසයට ද්‍රෝහී නොවී කටයුතු කළ යුතුව තිබෙනවා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති කමිටු වාර්තාව අනුව අසාධාරණයක් සිදුව ඇති බව පැහැදිලිව කමිටුව සඳහන් කර තිබෙනවා. මෙවැනි සිදුවීම් ඉදිරියට වළක්වා ගැනීමට නිසි ක්‍රියා පටිපාටියක් සකස් කිරීමේ අවශ්‍යතාව සහ ඒ සඳහා වෙනත් රටවල පවතින ක්‍රියා පටිපාටි ගැන සැලකිල්ල යොමු කිරීම ආදිය ගැන කමිටුව නිර්දේශ කර තිබෙනවා. ඒ සියල්ල ගැන මගේ විරුද්ධත්වයක් නැහැ.

එහෙත් කළු සුදු මෙන් සිදුව ඇති මේ අසාධාරණය සිදු කිරීම සඳහා චේතනාන්විතව කටයුතු කළ, සහාය දුන් අය හඳුනාගෙන ඔවුන් එල්ලුම් ගස් යැවීමට මම යෝජනා කරන්නේ නැහැ. මෙවැනි දෑ ඉදිරියේදී සිදු කර, පාර්ලිමේන්තුව කෙරෙහි ජනතාව තුළ ඇති විශ්වාසය බිඳෙන ලෙසින් මෙන්ම, යුක්ති ධර්මයට විරුද්ධව කටයුතු සිදු කිරීම වළක්වා ගැනීමට නම්, මේ අසාධාරණය සිදු කළ අයවලුන්ට තරාතිරම නොබලා ඔවුන්ට ලෙහෙසියෙන් නිදහස් වන්නට ඉඩ නොදී ඔවුන් නිසි ලෙස හඳුනාගෙන, ඔවුන්ට යම් අවවාද කිරීමක් හෝ අවම වශයෙන් සිදු කිරීමට ගරු කථානායකතුමා කටයුතු කිරීමේ අවශ්‍යතාව මම දැඩි ලෙස අවධාරණය කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා හොඳාකාරව දන්නවා, පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තුව පිළිගත් ක්‍රියා පටිපාටියක් අපේ පාර්ලිමේන්තුවට දැනටමත් තිබෙන බව. ඒ ක්‍රියා පටිපාටිය අනුවයි මේ පනත් කෙටුම්පත මම ඉදිරිපත් කෙළේ.

[ගරු ඉමතියාස් බාකීර් මාකාර් මහතා]

ඒ අනුව, ඒ ඉදිරිපත් කිරීම අඩුපාඩුවකින් තොරව සිදුව ඇත්නම්, එය පළමු කියවීමෙන් පසු අමාත්‍යවරයාට පාර්ලිමේන්තුව විසින් යොමු කරනු ලබනවා. ඒ යොමු කිරීම පාර්ලිමේන්තුව වෙනුවෙන් මහ ලේකම් විසින් 2022 ජූලි මස 14වන දින විෂය භාර ගරු අමාත්‍යවරයාට -ලේකම් හෝ වෙනත් නිලධාරියෙකුට නොව ඇමතිවරයාට සෘජුව අමතන ලිපියක් මඟින් - යොමු කර තිබෙනවා.

පළාත් පාලන පමණක් නොව පළාත් සභා සහ පාර්ලිමේන්තු ඡන්ද විමසීම් සංශෝධන සඳහා ද මා ඉදිරිපත් කළ පනත් කෙටුම්පත් තුනම එම දින දාතම ලිපිවලින් විෂය භාර අමාත්‍යවරයාට යොමු කර තිබෙනවා. ඒ ලිපි තුනේම ඡායා පිටපත් මා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ සම්බන්ධ වාර්තා පාර්ලිමේන්තුව වෙත කඩිනමින් ලබා දෙන ලෙස ඉල්ලමින් මා විසින් ගරු ඇමතිවරයා වෙත දෙවරක්ම යවන ලද සිහිපත් කිරීමේ ලිපිවල ඡායා පිටපත්ද, මේ ගැන කටයුතු කඩිනම් කරගැන්මට මැදිහත් වන ලෙස ඉල්ලා පාර්ලිමේන්තු මහ ලේකම් වෙත මා විසින් යවන ලද ලිපියේ ඡායා පිටපතද මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

අවසන් වශයෙන් කමිටුව අසාධාරණයක් සිදුවී ඇති බව නිගමනය කර ඇති හෙයින් සහ මේ සඳහා වගවීමක් තිබිය යුතු හෙයින් ඉදිරියේදී පාර්ලිමේන්තුවේ ගෞරවයට කැලැල් සිදු වන මෙවැනි සිදුවීම් සිද්ධ වීම වැළැක්වීම සඳහා මෙම අසාධාරණය සිදු කිරීමට මුල් වූ සහ ඊට සහාය වූ සියලුදෙනා හඳුනාගෙන ඕන් මතු එවැනි ක්‍රියාදාමයන්ගෙන් වැළකී සිටීම සඳහා අවම වශයෙන් තරයේ උපදෙස් දීමක් හෝ සිදු කිරීමට මම යෝජනා කර සිටිනවා.

අධිකරණයේ ස්වාධීනත්වයට තර්ජන මෙන්ම නීතිපති දෙපාර්තමේන්තුව තමන්ට අවශ්‍ය ලෙසින් හසුරුවා ගැන්මට බලපෑම් කිරීමේ ප්‍රයත්න සිදු වෙමින් පවතින වාතාවරණයක් තුළ ඒ ගැන මේ රටේ ජනතාව අවධානයෙන් බලා සිටින මෙවන් යුගයක පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය, පාර්ලිමේන්තුවේ අභිමානය සහ පාර්ලිමේන්තුවේ බලය හෑල්ලු කරන, කැලැල් කරන මෙවැනි ක්‍රියාදාමයන්හි වගවීමෙන් ගැලවී යාමට කිසිවෙකුට ඉඩ නොදීමට කටයුතු කිරීම තුළිනුයි මෙවැනි ක්‍රියාවන් අනාගතයේදී සිදු වීම වළක්වා ගත හැකි වන්නේ යන කරුණ ගරු කථානායකතුමන්ට අවධාරණය කර සිටින්න මම කැමැතියි. මේ ගැන ගරු කථානායකතුමන්ගේ බැරෑරුම් සැලකිල්ල යොමු කර සුදුසු ක්‍රියා මාර්ග ගැනීම තුළින් පාර්ලිමේන්තුවේ ගෞරවය, අභිමානය මෙන්ම ස්වාධීනත්වය ආරක්ෂා කර දීමට කටයුතු කරන ලෙසත්, පාර්ලිමේන්තුවේ එම ගෞරවය, අභිමානය සහ ස්වාධීනත්වය හෑල්ලු කර, කැලැල් කර, ගැලවී යාමට කිසිවෙකුට ඉඩ නොතබන ලෙසත්, ගරු කථානායකතුමන්ගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ කාරණය සම්බන්ධයෙන් නිලධාරීන්ගෙන් යම් අතපසුවීමක් හෝ යම් කටයුත්තක් සිදු වෙලා තිබෙනවාද කියා සොයා බලා ඒ ගැන අවශ්‍ය කටයුතු කරන්නම්.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ප්‍රේමිනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තෙන්ම මම මේ ගරු සභාවේ හිටපු නිසා තමයි ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය ගැන උත්තර දෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මෙය විවාදයක් කර ගන්න ඕනෑ නැහැ.

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මම විවාදයකට යන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ කාරණය කියලා මම නවත්වනවා. එතුමාත් නවත්වයි. හැබැයි, එතුමා කරපු දීර්ඝ විග්‍රහයට උත්තර දීමට මට අවස්ථාවක් ලැබිය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එතුමා මතු කළේ වරප්‍රසාද ප්‍රශ්නයක්. එය විවාද කරන්න මෙය අවස්ථාවක් කර ගන්න එපා.

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. පොඩි කාරණයක් මම මේ කියන්නේ. මෙයට උත්තර නොදුන්නොත් ඒක මට විශාල ගැටලුවක්. ඒකයි මම උත්තර දෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම පනත් කෙටුම්පත අපි ඉදිරිපත් කරලා,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ ගැන කියන්න අවශ්‍ය නැහැ, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මෙතුමාට උත්තර දෙන්න අවසර දුන්නොත් මමත් කථා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙම නම් සියලුදෙනාම නිශ්ශබ්ද වෙන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිධි) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි පිරේම්නාත් සි. තොලවත්ත)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීම්]* මෙතුමා තමයි ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු වරප්‍රසාද කමිටුවට යොමු කෙරුවේ.

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි පිරේම්නාත් සි. තොලවත්ත)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු දොලවත්ත මන්ත්‍රීතුමා, ඔය කාරණය කියා අවසන් කරන්න.

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි පිරේම්නාත් සි. තොලවත්ත)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම පනත අපි 2023 දෙසැම්බර් මාසයේදී සම්මත කළා. ඒ කිසිම වෙලාවක අපි අනීතික ලෙස කටයුතු කරලා නැති බව මම මේ අවස්ථාවේදී කියනවා. තරුණයන්ට අපි සියයට 25ක අවස්ථාව ලබා දීලා තිබෙනවා. එච්චරයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිධි) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

මහජන ආරක්ෂක ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්න අවස්ථාවේදී,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතු ටික අවසන් කරලා ඉදිමු.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිධි) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
ඊයේ මම වැදගත් කාරණාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
එතුමා ගරු සභාවේ ඉන්නවා නේ. න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතු කිහිපයක් තිබෙනවා. ඒවා අවසන් කරලා ඉදිමු.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිධි) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කමිටුව,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
සියලුදෙනා කමිටු ගැන හිතලා කටයුතු කරනවා නම් අපටත් පහසුයි. මොකද, න්‍යාය පත්‍රයේ කටයුතු ආරම්භ නොකර අමතර විනාඩි 40ක් ගත වෙලා තිබෙනවා, යම් යම් කාරණා වෙනුවෙන්.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි වසන්ත යාප්පාපණ්ඩාර)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි වසන්ත යාප්පාපණ්ඩාර)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මියන්මාරයේ පරිගණක අපරාධකරුවන්ගේ ග්‍රහණයේ සිටින ශ්‍රී ලාංකික තරුණයන් සහ රුසියාව හා යුක්‍රේනය අතර යුද්ධයට මැදිවී සිටින ශ්‍රී ලාංකික සොල්දාදුවන් බේරා ගැනීම පිළිබඳව සවිස්තර වාර්තාවක් සකස් කිරීමට විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා අපට විශාල අනුග්‍රාහකත්වයක් ලබා දුන්නා. ඒ අනුව ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා, ගරු සුජීත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරු මේකට විසඳුම් ලෙස විකල්ප යෝජනාවලියක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාර්තාව ගරු කථානායකතුමාට භාර දීම සඳහා අපි අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. කරුණාකරලා මෙය විදේශ කටයුතු අමාත්‍යාංශයට ලබා දීලා, මේ නිගමන ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියා විමසා බලන ලෙසයි අපි ඉල්ලා සිටින්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
මීළඟට, පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, අපි ප්‍රධාන වැඩ කටයුතු අවසන් කරලා ඉදිමු.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

ආගමන පනත් කෙටුම්පත
குடிவரவு சட்டமூலம்
IMMIGRATION BILL

"ශ්‍රී ලංකාවට තැනැත්තන් ඇතුළු වීම සහ ශ්‍රී ලංකාවෙන් තැනැත්තන් පිට වීම පාලනය කිරීම සඳහා ද; ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම පාලනය කිරීම සඳහා ද; ගමන් ලේඛන නිකුත් කිරීම සඳහා ද; (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනත සහ 1971 අංක 53 දරන විදේශ ගමන් බලපත්‍ර (විධිමත් කිරීමේ) සහ පිට වීමේ අවසර පත්‍ර පනත් ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි. "

පිළිගන්වන ලද්දේ මහජන ආරක්ෂක අමාත්‍ය ගරු ටිරාන් අලස් මහතා විසිනි.

2024 ජූලි 09 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் மாண்புமிகு டிரான் அலஸ் அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2024 யூலை 09, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Tiran Alles, Minister of Public Security; to be read a Second time upon Tuesday, 09th July and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

ශ්‍රී ලංකාවේ යෝජිත 'ව්‍යාපාර සූදානම් (B-READY) දර්ශකය' සඳහා සූදානම් වීමේදී මතු වන ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව
இலங்கையில் முன்மொழியப்பட்ட "வணிக தொழில்முயற்சிகளுக்கான தயார்நிலை (B-READY) சுட்டெண்" பற்றிய தயார்படுத்தல் தொடர்பில் எழுந்துள்ள நடைமுறைச் சிக்கல்களையும் சிரமங்களையும் ஆய்வுசெய்வதற்கும் அது தொடர்பில் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு
SELECT COMMITTEE TO STUDY THE PRACTICAL PROBLEMS AND DIFFICULTIES IN RELATION TO PREPARATION FOR THE PROPOSED 'BUSINESS READY (B-READY) INDEX' IN SRI LANKA AND MAKE ITS PROPOSALS AND RECOMMENDATIONS

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"යෝජිත 'ව්‍යාපාර සූදානම් (B-READY) දර්ශකය' සඳහා සූදානම් වීමේදී මතු වන ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2024 මාර්තු 22 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබාදී ඇති කාල සීමාව, 2024 ජූලි 22 දින දක්වා දීර්ඝ කළ යුතුය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2024 ජූලි 09 අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

කොළඹ භාෂා කුසලතා සහ නාට්‍ය කලා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
கொழும்பு மொழித் திறன்கள் மற்றும் நாடகக் கலைச் சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
COLOMBO ASSOCIATION OF LANGUAGE SKILLS AND DRAMATIC ART (INCORPORATION) BILL

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Speaker, I move,

"That leave be granted to introduce a Bill to incorporate the Colombo Association of Language Skills and Dramatic Art."

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

ඛණා විධුක්කප්පට්ටු, එට්‍රුක්කොள්ளප්පට්ටது.

இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி கல்வி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.

Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Education for report.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඊයේ වැදගත් කාරණයක් සම්බන්ධයෙන් මේ ගරු සභාවට කරුණු ඉදිරිපත් කළා. පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව පොලිස් ස්ථානයේ තිබුණු 1990 සුවසැරිය ගිලන් රථය තබ්බෝව ප්‍රදේශයට ගියාම එම ගිලන් රථයේ සිටි නිලධාරීන්ට බීමත්ව සිටි පිරිසක් පහර දීලා තිබෙනවා. සෞඛ්‍ය ඇමතිතුමා කිව්වා, ඒ සම්බන්ධයෙන් පුත්තලමේ DIGට දැනුම් දීලා සොයා බලන්න ඕනෑය කියලා. හැබැයි, එවැනි කිසිම දෙයක් වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි අද කරුවලගස්වැව 1990 සුවසැරිය ගිලන් රථ සේවය අයින් කරනවා. රජයේ සේවකයින්ට මෙහෙම බීමත්ව සිටින මිනිස්සු ගහනවා නම්, ජීවිතයක් බේරා ගන්න යන අයට මිනිස්සු එකතු වෙලා තඩිබානවා නම්, මරන්න හදනවා නම් මේක කරන්න බැහැ. අපි එක දවසකට පුත්තලම දිස්ත්‍රික්කයේ 38දෙනෙක් Emergency Treatment Unit එකට ගෙනිහින් තිබෙනවා. අපට පුත්තලම දිස්ත්‍රික්කයෙන් මේ සේවය අයින් කර ගන්න සිද්ධ වුණොත් 1,200 ගණනකට ගැටලු ඇති වෙනවා. ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නා වෙලාවේ මම මේ කාරණය කිව්වේ මේ පිළිබඳව ක්‍රියාත්මක වෙන්න ඕනෑ නිසායි. දැන් "බී" වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවාය කියනවා. හැබැයි, ඒක දියාරු වෙච්ච එකක් කියලා තමයි කියන්නේ. මොකද, bail දීලා නඩුව අහන එක අවුරුද්දකට කල් දාලා තිබෙනවා. අවුරුද්දකට කල් දාලා කියන්නේ ඕනෑකමක් තිබෙන බවක් පෙනෙන්නේ නැහැ කියන එකයි. මේ රටේ මිනිසුන්ට 1990 සුවසැරිය ගිලන් රථ සේවය ගැන යම්කිසි විශ්වාසයක් තිබෙනවා. හැබැයි, අපේ කට්ටියට මේ තැන්වලට යන්න හැකියාවක් තිබෙන්න ඕනෑ. ඒ නිසා මම නැවතත් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, වහාම මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා. ඒ ගැන අවධානය යොමු කරන්නම්.

ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමාගේත් අවසරය ඇතිවයි මම මේ කරුණු දෙක ඉදිරිපත් කරන්නේ. පළමුවෙන්ම මම ගරු සභානායකතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි, පිටකොටුව පාවෙන වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර යළි පවරා ගැනීමේ ප්‍රශ්නය සම්බන්ධව. ඇත්තටම නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මාසික කුලී පදනම මත හෝ බදු පදනම මත ලබා දී ඇති පිටකොටුව පාවෙන වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර 2024.07.15වැනි දින වනවිට ඒ අධිකාරියට භාර දෙන්න කියන නියෝගය ඇවිත් තිබෙනවා. ආරම්භයේදී කඩ කාමර 92ක් සහ බෝට්ටු 6ක් පැවතියත් මේ වනවිට ව්‍යාපාර කටයුතු සිදු වන්නේ කඩ කාමර 28ක් වැනි සුළු ප්‍රමාණයකයි.

හැබැයි, ගරු සභානායකතුමනි, හදිසියේම මේ කඩ කාමරවල ඉන්න අයට ඉවත් වෙලා යන්න කියලා මේක විදේශ සමාගමක් එක්ක යම් වැඩසටහනකට යන්නට කටයුතු කරලා තිබෙනවා. අපි පැහැදිලිව යෝජනා කරන්නේ, මේ කඩ කාමර 28ක් තුළ ඉන්න අයත් එක්ක සාකච්ඡා කරලා, ඒ අයටත් අගතියක් සිදු නොවන ආකාරයට වැඩ පිළිවෙළකට යන්න කියායි. ඒ වාගේම විදේශ සමාගමක් එක්ක ඒකාබද්ධ ව්‍යාපෘතියකට ප්‍රවේශ වෙනවා නම්, ඒකෙදි ටෙන්ඩර් ක්‍රමවේදය හරහා, ප්‍රසම්පාදන ක්‍රමවේදය හරහා විනිවිදභාවයෙන් යුක්ත වූ ගනුදෙනුවකට, වැඩ පිළිවෙළකට රාජ්‍ය - පෞද්ගලික එකාබද්ධ ව්‍යාපෘතියකට යන්න කියන එකයි අපේ යෝජනාව.

ඒ වාගේම මම ගරු සභානායකතුමාගේ අවධානය තවත් කාරණයක් කෙරෙහි යොමු කරවන්නට කැමැතියි. විශේෂයෙන්ම 2019 ජනාධිපතිවරණයෙන් පසුව අපේ රටේ ක්‍රියාත්මක වුණු නිවාස වැඩසටහන් විශාල ප්‍රමාණයක් එකවරම නතර කරනු ලැබුවා. ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයකට ඒ නිවාස සාදා ගන්නට දෙන්නට තිබුණු හිඟ වාරික ඔක්කෝම නතර කළා. 10, 15කට නොවෙයි, ලක්ෂ ගණනකට. ඉතින් මෙයින් මුළු රටේම නිවාස ව්‍යාපෘතිවල කටයුතු නතර කළා. උදාගම්මාන, උදා කළ ගම්මාන, නිවාස ව්‍යාපෘතිවල ඒ සියලු ආධාර වැඩසටහන් පවා නතර කරලා දැම්මා. ඉන්දියාවෙන් ලැබුණු ආධාර ටිකවත් බෙදලා දුන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ සමයේ මේ සිද්ධ වුණේ දේශපාලන පළිගැනීමක්.

විශේෂයෙන්ම මම උතුරු, නැඟෙනහිර බල ප්‍රදේශයේ සංචාරය කරනකොට බොහොම පැහැදිලිව උතුරු, නැඟෙනහිර බල ප්‍රදේශයේ ජනතාවගෙනුත් මේ මැසිවිල්ල ඉහළ මට්ටමකින් ඉදිරිපත් වුණා. මොකද, ඉතුරු වාරික ටික නොලැබී නිවෙස් සම්පූර්ණ කර ගන්නට බැරුව අතරමං වුණු විශාල පිරිසක් උතුරු, නැඟෙනහිර ඇතුළුව අපේ රටේ පළාත් 9හිම සිටිනවා. ඒ නිසා විශේෂයෙන්ම මම මේ පිළිබඳව රජයේ අවධානය යොමු කරවන්නට කැමැතියි. ඊයේත් පරිපූරක ඇස්තමේන්තු අනුමත කර ගත්තා. සමාවෙන්න, පරිපූරක ඇස්තමේන්තු නොවෙයි, එක subject එකකට වෙන් කරලා තිබුණු මුදල් මාරු කර ගත්තා. ඉතින් ඔය මුදලවත් යොදවලා මේ හිඟ වාරික ටික ලබා දීලා මේ ගෙවල් හදාගෙන ආපු මනුෂ්‍යයන්ට -අපේම රටේ පොදු ජනතාවට - ඒ වාරික ටික නිකුත් කරන්න කටයුතු කරන්න. කොහොම වුණත්, මේ වසර අවසානය වෙනකොට අපි අනිවාර්යයෙන්ම ඒ කඩාකප්පල් කරපු වැඩසටහන, ගෝඨාභය රාජපක්ෂ රජය විසින් කඩාකප්පල් කරපු ඒ වැඩසටහන උතුරු, නැඟෙනහිර බල ප්‍රදේශ ඇතුළුව පළාත් 9හිම ක්‍රියාත්මක කරන්නට කටයුතු කරනවා.

ගරු සභානායකතුමනි, අවසාන වශයෙන් තව කාරණාවක් මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්නට කැමැතියි. අන්තර්ජාලය

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ප්‍රචලිතවීමට සමගාමීව වසර 2000න් පසු තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ශීඝ්‍රයෙන් දියුණු වන්නට පටන් ගෙන තිබෙනවා. ඔබතුමාත් දන්නවා, 3G, 4G, 5G වැනි තාක්ෂණය යොදා ගත් සුහුරු දුරකථන - smartphones - භාවිතය ජනප්‍රිය වීමට පටන් අරගෙන ලොව පුරාම සෑම රටක්ම ශීඝ්‍ර ඩිජිටල් පරිවර්තනයකට යොමු වෙමින් සිටින බව. මේ හරහා තාක්ෂණය වාගේම ආර්ථිකයත් ඩිජිටල්කරණයකට ලක් වෙලා එහි ප්‍රතිඵලයක් හැටියට ඩිජිටල් තාක්ෂණය යොදා ගත් ඉල්ලුම මත පදනම් වේදිකා - on-demand platforms - මඟින් රැකියා සහ රැකියා ආකෘති නිර්මාණය වෙලා තිබෙනවා. මේ හරහා බිහි වුණු ඩිජිටල් ආර්ථික ප්‍රවේශය කොවිඩ් 19 වසංගතය ජය ගැනීමේ අභියෝගවලට මුහුණ දීමටත් ප්‍රයෝජනවත් වුණු අතර ඩිජිටල් ආර්ථිකයට ප්‍රවේශවීම වඩාත් වේගවත් වුණා. ගරු සභානායකතුමනි, මෙහි ප්‍රතිඵලයක් හැටියට විවිධ මාර්ගගත වේදිකා- online platforms - සහ මාර්ගගත ගනුදෙනු - online payments - මත පදනම්ව භාණ්ඩ වෙළඳාම වාගේම සේවා සැපයීම ඉතා ශීඝ්‍රයෙන් ප්‍රචලිත වෙලා තිබෙනවා. ජාත්‍යන්තරව මේක හඳුන්වන්නේ ගිග් ආර්ථිකය - gig economy - නමින්.

ඒ වාගේම මේ ක්ෂේත්‍රයට සම්බන්ධ ශ්‍රම බලකාය ගිග් ශ්‍රම බලකාය - gig workforce - හැටියට හඳුන්වනවා. පාරිභෝගික පහසුව සහ මිල තරගකාරිත්වය වාගේම සේවා ගුණාත්මකභාවය මත පදනම්ව සාර්ථකව ක්‍රියාත්මක වෙන මෙම සේවාවන්වලට පූර්ණකාලීන සේවකයන් වෙනුවට අර්ධ කාලීන හෝ ස්වාධීන, කොන්ත්‍රාත් සේවා සැපයුම්කරුවන් වශයෙන් සේවකයන් බඳවා ගැනීමට මෙම සේවා සපයන්නන් මුල සිටම යොමු වුණා. බොහෝ විට යම් කොටසකට තම ප්‍රධාන රැකියාවට අමතරව මාර්ගගත වේදිකා මත පදනම්ව ක්‍රියාත්මක වන විවිධ ප්‍රවාහන සේවා, කුලී රථ, යතුරු පැදි, ත්‍රී රෝද රථ, ලොරි රථ යනාදී ඒ වාගේම අධ්‍යාපන සේවා, වෙනත් ඩිජිටල් සේවා සැපයීම මඟින් වඩාත් පහසුවෙන් අමතර ආදායම් උත්පාදනය කර ගැනීමට අවස්ථාව වාගේම යම් කොටසක් ප්‍රධාන රැකියාව වශයෙන්ද මේ ක්ෂේත්‍රයට යොමු වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතය නිසා රැකියා අහිමි වුණු අවුරුදු 18-30 අතර තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් තම සුපුරුදු රැකියාවට නැවත නොයා මාර්ගගත සේවා සැපයීමට ස්ථිරව යොමු වෙලා තිබෙනවා. මෙම පරිවර්තනය ඉතා හොඳ ප්‍රවණතාවක් වුවත් සේවකයන්ගේ ආරක්ෂාව සහ සේවක අයිතිවාසිකම් උල්ලංඝනය වන ලෙස ස්ථිර සේවකයන් නොවන ස්වාධීන කොන්ත්‍රාත් සේවා සැපයුම්කරුවන් වශයෙන් සේවකයන් බඳවා ගැනීම මෙම ගිග් ආර්ථිකයේ ප්‍රධාන දුර්වලතාවක් වශයෙන් හඳුනාගෙන තිබෙනවා. මේ තත්ත්වය මහහරවා ගැනීමට ලෝකයේ දියුණු රටවල් අදාළ කම්කරු නීති වෙනස් කිරීමට වහ වහා ක්‍රියාත්මක වෙලා තිබෙනවා. කෙසේ වුවත්, ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවල අදාළ කම්කරු නීති රීති වෙනස් කිරීම ප්‍රමාද වීම නිසා සේවා සපයන ආයතන විසින් ජාත්‍යන්තර යහපත් භාවිතය නොසලකා හරිමින් වැඩි ලාභ උදෙසා අර්ධ කාලීන හෝ ස්වාධීන කොන්ත්‍රාත්තු සේවා සැපයුම්කරුවන් වශයෙන් සේවකයන් බඳවා ගැනීම සිදු කරන අතර, සේවකයන්ගේ ආරක්ෂාව සහ සේවක අයිතිවාසිකම් නොසලකා හැරීමට කටයුතු කරන බව පෙනෙනවා. මේ තත්ත්වය දීර්ඝ කාලීනව රටට ඉතා අහිතකර ලෙස බලපානවා. මෙවැනි අවිධිමත් ක්ෂේත්‍රවල සේවය කරන අය ජීවිතයේ සෑදෑ සමයේදී කිසිම මූල්‍ය ශක්තියක් නොමැතිව අසරණභාවයට පත් වෙනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ කුලී රථ රියදුරන් සහ බෙදා හැරීමේ රියදුරන් මේ නිසා වඩාත් බරපතළ බලපෑමට ලක් වෙලා තිබෙනවා. දැනට කාර් රථ, වෑන් රථ, ලොරි රථ, ත්‍රී රෝද රථ සහ යතුරු පැදි සේවාවල යෙදෙන කුලී රථ රියදුරන් අවිධිමත් සේවා සපයන්නන් ලෙස සැලකෙනවා. ඔවුන් ස්වාධීන කොන්ත්‍රාත්තු සේවා සැපයුම්කරුවන් වශයෙන් සලකන අතර, ඔවුන්ට කම්කරු නීති යටතේ අවශ්‍ය ආරක්ෂාව නොලැබෙන අතර, ඔවුන් කිසිදු විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂික දීමනාවක් ලබා දීමේ ක්‍රමවේදයකට යටත් වෙන්නේ නැහැ. ඔවුන්ට විශේෂ රක්ෂණ ආවරණයකුත් නැහැ. මෙවන් තත්ත්වයක් තුළ මහා බ්‍රිතාන්‍යයේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සියලුම උබර් කුලී රථ රියදුරන් විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායකත්වය සැපයීම සිදු කළ යුතු බවට උබර් සමාගමට නියෝග කරලා තිබෙනවා. ඒක ආදර්ශයට අරගෙන සිංගප්පූරුවත් 2024 වසරේ මුල සිට ගිග් ශ්‍රම බලකායද විශ්‍රාම වැටුප් හිමි විය යුතු කණ්ඩායමක් වශයෙන් නිර්වචනය කර අදාළ කම්කරු නීති හඳුන්වා දීලා තිබෙනවා. ඒ නිසා ශ්‍රී ලංකාවේත් ප්‍රධාන පෙළේ පෞද්ගලික ආයතන කිහිපයක් විසින් මාර්ගගත වේදිකා හරහා කුලී රථ සේවා සපයන අතර, බෙදා හැරීමේ ජාල පවත්වාගෙන යන අතර, එම ආයතනවලට සේවා සපයන සියලුම කාර් රථ, වෑන් රථ, ලොරි රථ, ත්‍රී රෝද රථ සහ යතුරු පැදි සේවාවල යෙදෙන කුලී රථ රියදුරන් සියලුදෙනා සේවක අයිතිවාසිකම් හිමි දායක විශ්‍රාම වැටුප් හිමිකම් ලැබිය යුතු බව නිර්වචනය කරන්නට අපි පියවර ගන්න ඕනෑ. කුලී රථ රියදුරන්ට පමණක් නොව, ගිග් ආර්ථිකය තුළ නිර්මාණය වන අනෙකුත් සෑම ක්ෂේත්‍රයකම මාර්ගගත වේදිකා ඔස්සේ සේවා සපයන්නන්ගේ රැකියාවල සේවා අයිතිවාසිකම් ආරක්ෂා කරන්නට ඔවුන්ට විශ්‍රාම වැටුප් හිමිකම්, පාරිතෝෂික දීමනාවක් ලැබෙන ලෙස සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දෙපාර්ශ්වය විසින්ම දායකත්වය දැක්වීම අනිවාර්ය කිරීමට වාගේම සේවාදායකයාටත් වඩා ගුණාත්මක සහ කාර්යක්ෂම සේවයක් ලබා දීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමට විශේෂ නියාමන අධිකාරියක් පිහිටුවන්න කියලා මම ගරු සභානායකතුමාට යෝජනා කරනවා.

මහා බ්‍රිතාන්‍යයට මේ ගිග් ආර්ථිකයේ, ගිග් ශ්‍රම බලකායට යම් කිසි විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දෙන්නට, සමාජ ආරක්ෂණ ක්‍රමයක් ලබා දෙන්නට පුළුවන් නම්, එය අනුගමනය කරමින් සිංගප්පූරුවට මේ සමාජ ආරක්ෂණ ක්‍රමය ලබා දෙන්නට පුළුවන් නම් අපේ රටෙත් කම්කරු නීතිය සංශෝධනය කරලා ගිග් ආර්ථිකයේ ගිග් ශ්‍රම බලකාය වෙනුවෙනුත් -ලක්ෂ ගණනක් ඉන්නවා- යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම ගරු සභානායකතුමාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

නැඹි සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විමල් වීරවංශ මැතිතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැදගත් කාරණයක් කෙරෙහි ගරු සභානායකතුමාගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. පැය කිහිපයකට පමණක් රැඳී සිටීම සඳහා ඉන්දීය විදේශ අමාත්‍ය ජයශංකර් මෙනන් මහත්මයා අද ශ්‍රී ලංකාවට පැමිණෙනවා. අපට දැන ගන්න තිබෙන ආකරයට එතුමා

පැමිණෙන්නේ අපේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට නියමිතව තිබූ, විශේෂ හැඳුනුම්පත -ජීව දත්ත සියල්ල ඇතුළත් විශේෂ හැඳුනුම්පත- පිළිබඳ කොන්ත්‍රාත්තුව ඇතුළුව, අදානි මහත්මයාට අදාළ විදුලිබල ව්‍යාපෘති රැසකුත් ඇතුළුව ව්‍යාපෘති 10ක් හෝ 12ක් වැනි ප්‍රමාණයක් පිළිබඳව ශ්‍රී ලංකාවට බලකොට එකඟතාව ඇතිකර ගැනීම සඳහායි. ඒකේ දිගුවක් හැටියට අගෝස්තු මාසයේදී ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ශ්‍රී ලංකාවට පැමිණෙන බවත් අපට දැන ගන්නට ලැබී තිබෙනවා.

ඉන්දීය විදේශ අමාත්‍ය ජයශංකර් මෙනන් මහත්මයා පැය කිහිපයකට ලංකාවට එන්නේ මොකටද කියලා දැන ගැනීමට මේ සභාවට යුක්ති සහගත අයිතියක් තිබෙනවා කියලා අපි හිතනවා. එතුමා පැය කිහිපයකට ලංකාවට එන්නේ මොකටද, ඇවිල්ලා සාකච්ඡා කරන්න යන්නේ මොන ව්‍යාපෘති 10, 12 ගැන ද, ඒ ව්‍යාපෘති 10, 12 බල කර ඉටු කරවා ගැනීමට දරන ප්‍රයත්නය පිළිබඳව අපට ලැබී තිබෙන තොරතුරු සම්බන්ධයෙන් ආණ්ඩුව පාර්ශ්වයෙන් මේ සභාවට අනාවරණය කරන්නේ මොකක්ද යනාදිය ගැන දැන ගැනීමට අපි කැමැතියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ මතු කරන ලද ප්‍රශ්නයේ අංක 01 හා 02 ප්‍රශ්න නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයටයි අදාළ වෙන්නේ. ඒ ප්‍රශ්න දෙක එම අමාත්‍යාංශයට යොමු කරලා පිළිතුරක් ලබා දෙන්නම්.

ඊළඟට, 03වැනි ප්‍රශ්නයෙන් එතුමා අහලා තිබෙන්නේ gig economy එක ගැනයි. කම්කරු නීති සංශෝධනය කරන්න තිබෙන බැවින් ඒ ප්‍රශ්නය අදාළ වන්නේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයටයි. එම නිසා මම ඒ ප්‍රශ්නය එම අමාත්‍යාංශයට යොමු කරන්නම්.

ඊළඟට, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නය වූ ඉන්දීය විදේශ ඇමතිවරයාගේ පැමිණීම සහ අනාගතයේදී ඉන්දීය අගමැතිවරයාගේ පැමිණීම යන කරුණු සම්බන්ධයෙන් මා තොරතුරු දන්නේ නැති නිසා මට මේ අවස්ථාවේ ඒ ගැන යමක් කියන්න බැහැ. එම ප්‍රශ්නය විදේශ කටයුතු අමාත්‍යාංශයට යොමු කරලා එම අමාත්‍යාංශය හරහා අද දවස ඇතුළත ඒකට පිළිතුරක් දෙන්න මම උත්සාහ කරන්නම්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු සභානායකතුමනි, මට ලැබී තිබෙන තොරතුරු අනුව එතැන තිබෙන බරපතළ කාරණය තමයි, එම ව්‍යාපෘති 10 හෝ 12 අතර තිබෙන හැඳුනුම්පත හා සම්බන්ධ ප්‍රශ්නය. එහෙම වුණොත්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සතුව තිබිය යුතු සියලු දත්ත ඉන්දියානු සමාගමක් අතට යනවා. ඒක විතරක් නොවෙයි, එහි තිබෙන බරපතළකම. මා කියන්නේ, අප ආර්ථික වශයෙන් එක්තරා ආකාරයක අර්බුදයකට ඇද වැටිලා සිටින මේ වෙලාවේ අපේ අසල්වැසියා මේ රටට තදබල ලෙස බලපෑම් කොට අපේ බෙල්ල මිරිකා එවැනි ව්‍යාපෘති ඉටු කරවා ගැනීමට බලපෑම් සහගත මෙහෙයුමකට උත්සාහ දරනවා නම්, ඒක ඉතාම අයුක්ති සහගත බවයි. ගරු සභානායකතුමනි, ඔබතුමා කියූ පරිදි ඊළඟ පාර්ලිමේන්තු සතියේ හෝ විදේශ කටයුතු ඇමතිතුමාගෙන් මේ පිළිබඳව පැහැදිලි කිරීමක් මම බලාපොරොත්තු වෙනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ජාතික හැඳුනුම් පත් සම්බන්ධයෙන් වන ප්‍රශ්නයට පිළිතුරක් සැපයීම සඳහා මම එය මහජන ආරක්ෂ ඇමතිතුමාටත් යොමු කරන්නම්.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. මම විනාඩියක කාලයක් පමණයි ගන්නේ. ගරු සභානායකතුමා මේ වෙලාවේ ගරු සභාවේ සිටින නිසා අපේ නායකතුමා අහපු නාගරික සංවර්ධන අධිකාරියටම අදාළ ප්‍රශ්නයක් මම අහන්නේ.

ගරු ඇමතිතුමනි, Floating Market එක ඉස්සරහ තමයි මැනිං මාර්කට් එක තිබුණේ. කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු හැටියට ඔබතුමාත් දන්නවා, ඒ මැනිං මාර්කට් එක දැන් පැලියගොඩට ගෙන ගිහින් තිබෙන බව. අද වන කොට නාගරික සංවර්ධන අධිකාරිය විසින් කලින් මැනිං මාර්කට් එක තිබුණු ස්ථානයේ රථ ගාලක් පවත්වාගෙන යන්න යම් පුද්ගලයෙකුට අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ රථ ගාල පවත්වාගෙන යන්න අවස්ථාව ලබා දී තිබෙන්නේත් කිසිම ටෙන්ඩර් ක්‍රියා පටිපාටියක් නොමැතිව යම් සම්බන්ධයක් උඩ. ඊට අදාළ අනෙක් කාරණය මේකයි, ගරු ඇමතිතුමනි. විශේෂයෙන් බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ තිබුණු පෞරාණික ගල් වගයක් ඒ මැනිං මාර්කට් එක ඇතුළේ පොළොවේ සිටුවා තිබෙනවා. ඒ එක ගලක වෙළෙඳ පොළ වටිනාකම රුපියල් 700යි. රුපියල් 700ක් වටිනාකම ඇති ගල් 150,000ක් මැනිං මාර්කට් එක ඇතුළේ තිබෙනවා. රුපියල් 700ක් වටිනාකම ඇති එම ගල් අද වන කොට නාගරික සංවර්ධන අධිකාරිය විසින් වාහන රථ ගාල පවත්වාගෙන යන පුද්ගලයාට රුපියල් 145 ගණනේ ලබා දී තිබෙනවා. ජනතාවගේ මුදල් මහ දවල් අවභාවිත කිරීමක් තමයි එතැන වෙන්නේ. ඒක අපට තේරෙන්නේ නැහැ. එම නිසා මම මේ ප්‍රශ්නය ඔබතුමාට යොමු කරනවා, මේ පිළිබඳව වහාම සොයා බලා සුදුසු ක්‍රියා මාර්ගයක් ගන්න කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ කාරණයත් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට යොමු කරනවා.

මම ඉල්ලීමක් කළා, විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයත්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයත් සමඟ සාකච්ඡා කරලා අනධ්‍යයන තනතුරුධාරීන් සම්බන්ධ තත්ත්වය පැහැදිලි කරලා දෙන්න විනාඩි කිහිපයක් දෙන්න කියලා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

අධ්‍යාපන අමාත්‍යාංශයේ පත්වීම් බලධාරියා ළඟ ඇති තොරතුරු අනුව අනධ්‍යයන කාර්ය මණ්ඩල අනුමත සේවක සංඛ්‍යාව 16,080ක් ඉන්නවා. ඒ වාගේම මම අද මීට කලින් පිළිතුරු දෙනකොට කිව්වා, සම්පූර්ණ අනධ්‍යයන සේවක සංඛ්‍යාව 37,000ක් පමණ වෙනවා කියලා. ඒවායේ බඳවා ගැනීමේ පරිපාටි සහ උසස්වීම් පරිපාටි තිබෙනවා. ඒවා තුළ ඒකාබද්ධ සේවයට අයත් තනතුරු තිබෙනවා, ඒකාබද්ධ සේවයට අයත් නොවන තනතුරු ද තිබෙනවා. ඒවා අනුව තමයි කටයුතු කරගෙන යන්නේ. අදාළ බඳවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටිය පිළිබඳව ද යමක් කිව යුතුයි. විශේෂයෙන්ම පුරප්පාඩු වුණු "සේවා සහායක - සනීපාරක්ෂක", කාර්ය සහායක සහ පාසල් ආරක්ෂක තනතුරු සම්පූර්ණ කරන්න කටයුතු කර තිබෙනවා.

ඒ අනුව තනතුරු 727ක් පුරවන්න කටයුතු කරලා තිබෙනවා. ලබා දී තිබෙන තනතුරු සංඛ්‍යාව, සේවා සහායක 131ක්, කාර්ය සහායක 368ක් සහ පාසල් ආරක්ෂක 227ක් සමඟ එකතුව 726ක් වනවා. සහකාර නේවාසිකාගාර පාලක/පාලිකා තනතුර සඳහාත් ඉල්ලුම් පත් කැඳවා 2024.03.07 වැනි දින ගැසට් නිවේදන පළ කරලා තිබෙනවා. එම පරිපාටිය ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබෙනවා. පුස්තකාල සේවක තනතුර සම්බන්ධයෙන් නව ලකුණු පරිපාටියක් අනුව ඉදිරියේදී කටයුතු කරන්න නියමිතයි. මොකද, 2019දී දුන් පත්වීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට වෙනස් මතයක් තිබෙනවා. අනෙකුත් උසස්වීම් නියමිත පරිදි කරන්න මේ වන කොට කටයුතු කරගෙන යනවා.

ස්ථාන මාරු, අනුයුක්ත කිරීම් සම්බන්ධව ගත්තොත්, වාර්ෂික ස්ථාන මාරුවීම් මණ්ඩල ක්‍රියාත්මක වෙනවා. ඒවා වෙබ් අඩවියේ සඳහන් කර තිබෙනවා. වාර්ෂික නොවන ස්ථාන මාරුවීම් සහ අනුයුක්ත කිරීම් ගත්තාම, ජාතික පාසල්වල ඒවා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කරනවා, පළාත් පාසල්වල ඒවා පළාත් සභා මඟින් කරනවා. කාර්යක්ෂමතා කඩඉම් විභාග ගත්තාම, ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2023.05.17 වන දින පවත්වා තිබෙනවා. ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවක ගණයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2024.02.27 සහ 28 යන දිනවල පවත්වා තිබෙනවා. ක්‍රීඩා පුහුණුකරුවන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග ද පවත්වා තිබෙනවා. 2024.06.06 ප්‍රතිඵල නිකුත් කර තිබෙනවා. 2019 පත්වීම් ලැබූ ඒ අයගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ ප්‍රතිඵල අනුව අවශ්‍ය කටයුතු, ක්‍රියා මාර්ග ගනිමින් තිබෙනවා.

ඊළඟ එක, තනතුරු නාම සංශෝධනය. කලින් තිබුණු තනතුරු නාම සංශෝධනය වෙලා තිබෙනවා. "සේවා සහායක" තනතුරට දැනට අනුමත තනතුරු නාමය -සංශෝධිත නව තනතුරු නාමය- කාර්ය සහායක PL1. "සේවා සහායක - රසායනාගාර" තනතුර "රසායනාගාර සහායක" හැටියට, "සේවා සහායක - පුස්තකාල" තනතුර "පුස්තකාල සහායක" හැටියට, "සේවා සහායක - තාක්ෂණ පීඨ" තනතුර "තාක්ෂණ පීඨ සහායක" හැටියට, "සේවා සහායක - ආරක්ෂක" තනතුර "පාසල් ආරක්ෂක" හැටියට, "සේවා සහායක - ගිලන්හල්" තනතුර "ගිලන්හල් සහායක" හැටියට, "සේවා සහායක - වැඩපල" තනතුර "වැඩපළ සහායක" හැටියට තනතුරු නාම වෙනස් කරලා තිබෙනවා, ඒ ඒ තනතුරට අගතියක් නොවන ආකාරයට.

ඊළඟට, ඌන සේවා උපාධිධාරීන් ගැනත් කිව යුතුයි. අපට තිබෙන තොරතුරු අනුව හඳුනා ගත් ඌන සේවා උපාධිධාරීන් 284ක් ඉන්නවා. ඒ අයට රුපියල් මිලියන 71.8ක් අතිරේකව වියදම් වෙනවා. මේ කරුණු ඇතුළුව සේවා අවශ්‍යතාව අනුව මේ අය පාලන සහකාර තනතුරු 396ක් සඳහා යෝජනා කරලා, ඒ යෝජනා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යවලා තිබෙනවා, ඒ අදහස් සැලකිල්ලට අරගෙන ඉදිරි කටයුතු කරන්න කියලා.

ඊළඟට, අන්තර්ග්‍රහණ ගැටලු. මේවා පළාත් සභා අතර වෙන්නේ. පළාත් සභා දෙකක් අතර අන්තර්ග්‍රහණයක් සිදු වෙනවා නම්, එක් පළාත් රාජ්‍ය සේවයකින් නිදහස් කරලා අනෙක් පළාත් රාජ්‍ය සේවයෙන් ගන්න ඕනෑ. ඒක තමයි සාමාන්‍යයෙන් පළාත් සභා පිහිටවපු දවසේ ඉඳලා තිබෙන කාර්ය පටිපාටිය.

ඊළඟ කාරණය, වාරාන්තර නිවාඩු. වාරාන්තර නිවාඩු කාලවලදී රසායනාගාර සහකාර, ක්‍රීඩා පුහුණුකරු, රසායනාගාර සහායක, පුස්තකාල සහායක සහ තාක්ෂණ පීඨ සහායක කියන තනතුරු සඳහා පමණක් ආයතන ප්‍රධානීන්ගේ අභිමතය පරිදි වාරාන්තර නිවාඩු ලබා දීමට හැකියාව තිබෙනවා. අද උදේත් ඔය ගැන ප්‍රශ්නයක් ඇහුවා.

ඊළඟ කාරණය, විභාග රාජකාරී. විභාග කොමසාරිස්ට දැනුම් දීලා තිබෙනවා එම සේවය අනධ්‍යයන සේවකයින්ගෙන් ලබා ගන්න කියලා.

ඊළඟ කාරණය, අතිකාල දීමනා. අතිකාල දීමනා සම්බන්ධයෙන් ගත්තාම, විශේෂයෙන් අරක්කැමි තනතුරුධාරීන්ගේ අරක්කැමි දීමනාව සම්බන්ධයෙන් කටයුතු කරලා සියලු පීඨාධිපතිවරුන්ට 2024.05.02 වැනිදා උපදෙස් දීලා තිබෙනවා, කරන්න අවශ්‍ය දේ කුමක්ද කියන එක ගැන.

පරිවාස කාලය තුළ පසු වන සේවකයින් වෙනත් සමාන්තර තනතුරුවලට පත් කිරීම මත සේවය ස්ථීර කිරීමේදී කාලය ගණනය කිරීමේ ගැටලු නිරාකරණය කර ගන්න දැනට කටයුතු කරලා තිබෙනවා.

ඊළඟ එක, ආයතන කටයුතු. 2022-2024 කාලය තුළ ඉටු කරන ලද ආයතන රාජකාරී මේ ආකාර වෙයි. පරිවාස කාලය සම්පූර්ණ කර සේවය ස්ථීර කිරීම් 2,214යි; ශ්‍රේණිගත උසස්වීම් 1,971යි; විශ්‍රාම ගැන්වීම් 471යි; සේවයෙන් මුදා හැරීම් 101යි; කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා දීම 1,750යි; නව පත්වීම් 726යි; කාර්යක්ෂමතා කඩඉම් ප්‍රතිඵල නිකුත් කිරීම් 5,400යි. නැවත සේවයේ පිහිටුවා තිබෙනවා 18දෙනෙක්. නව තනතුරු අනුමත කර ගැනීම සඳහා අදාළ අංශ වෙත යොමු කරලා තිබෙනවා. පළාත් රාජ්‍ය සේවයේ සහ මධ්‍යම රජයේ ආයතන සඳහා බඳවා ගැනීම් දැනට නවත්වා තිබෙන නිසා ඒ සඳහා විකල්ප යෝජනා ක්‍රම අනුගමනය කරලා තිබෙනවා.

අනධ්‍යයන සේවකයින්ගේ යම් යම් ගැටලු තිබෙනවා නම්, ජාතික පාසල්වල තිබුණු එම ගැටලු අමාත්‍යාංශයෙන් විසඳා තිබෙනවා. හැබැයි, අපි මේකත් මතක තබා ගන්න ඕනෑ. එක්තරා වකවානුවක එක දිස්ත්‍රික්කයකින් මුළු ලංකාවටම අනධ්‍යයන සේවක පත්වීම් 3,000ක් ලබා දුන්නා.

ඒ 3,000ම එම දිස්ත්‍රික්කයටම එන්න හදනවා. පත්වීම් දීමේදී ඒ ප්‍රශ්නය තිබෙන්නේ. 3,000ක් කොහොමද, එක දිස්ත්‍රික්කයකට යන්නේ? ඒක ගැන අපෙන් ප්‍රශ්න කරලා වැඩක් නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, ඒක පුරප්පාඩු එන හැටියට තමයි දෙන්න තිබෙන්නේ. සියලු දොම කුරුණෑගල දිස්ත්‍රික්කයට දමන්න බැහැ නේ. ඒක තේරුම් ගන්න ඕනෑ.

මේ සියලු කාරණා එකතු කරගෙන ලබන සුමානයේ සඳුදා සහ අඟහරුවාදා අනධ්‍යයන සේවකයෝ ලෙඩ වෙනවාය කියලා අමාත්‍යාංශයට දැනුම් දී තිබෙනවා කියා පුවත් පත් නිවේදනයක් තිබෙනවා මම දැක්කා. ඒ කියන්නේ, පොසොන් පෝයට පසුව එන සතියේ 24 සහ 25 කියන දවස් දෙකේ. සියලුම පළාත්වලට අයත් කලාප කාර්යාල මඟින් මේ සම්බන්ධයෙන් විදුහල්පතිවරුන් දැනුවත් කරන්න කියලා අපි දැනුම් දීමක් කළා. අවුරුදු 28ක පමණ කාලයක් තිස්සේ මේ රටේ යුද්ධය පැවැතුණා. යුද්ධයේ අවසාන භාගය වෙනකොට දෙමව්පියන් තමයි පාසල් ආරක්ෂා කළේ; දෙමව්පියන් තමයි පාසල් පිරිසිදු කළේ. ආදි ශිෂ්‍යයොත් ඒකට සම්බන්ධ වුණා. එතැන විශාල ශ්‍රම බලකායක් තිබුණා. ඒ නිසා මේ කියන දවස් දෙකේත් අසනීප වෙන අයට අසනීප

වෙන්න හැර -ඒවා අපට නවත්වන්න බැහැ නේ- ඒ වෙනුවට දෙමව්පියන්, ආදි ශිෂ්‍යයන් සහ පාසල් සංවර්ධන සමිති එකතු වෙලා පාසල්වල ආරක්ෂාව සලසාගෙන ඒ කටයුතු ටික කරන්නය කියලා අපි උපදෙස් දීලා තිබෙනවා. එවැනි වෘත්තීය ක්‍රියාමාර්ග නිසා අපට ලක්ෂ 41ක් පමණ වන පාසල් දරුවන්ගේ අධ්‍යාපනය අඩාළ කරන්න බැහැ. ඒක මතක තබා ගන්න ඕනෑ. මෙතැන මුදල් ප්‍රශ්නයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විසඳපු ප්‍රශ්න ටික ගැන කලින් කිව්වා. දැන් මේක රැල්ලකට ගිහිල්ලා. ඉස්සරහට මැතිවරණ එන නිසා, විවිධ දේශපාලන අවශ්‍යතා මුදුන් පමුණුවා ගන්නට මේ අනධ්‍යයන සේවකයින් ලෙඩ වෙනවා නම්, ඒ සම්බන්ධයෙන් විකල්ප ක්‍රියාමාර්ග ගන්නට අපි උපදෙස් දීලා තිබෙනවා. ඒ වාගේම මම ඉල්ලීමක් කරනවා, ඒගොල්ලන්ට තිබෙන ප්‍රායෝගික ගැටලු පළාත් බලධාරීන් සමඟ සාකච්ඡා කොට විසඳා ගන්නා ලෙසට. ඒ සඳහා අවශ්‍ය උපදෙස් පළාත් බලධාරීන්ට ලබා දීලා තිබෙනවා.

අපි විසඳපු ප්‍රශ්න ටික ගැන අද මම මේ සභාවේදී සඳහන් කළා. ඒ ගැන අවධානය යොමු කරන්නය කියලා අපි කාරුණිකව ඉල්ලීමක් කරනවා. දරුවන්ගේ අධ්‍යාපනයට වැදගත් වෙන්නේ පාසලේ සිදු වෙන කටයුතුයි. ඒවාට බාධා කරන්න අපට පුළුවන්කමක් නැහැ.

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දොලවත්ත මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නයක් ද?

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදෙනෙක් කිහිප වතාවක් මගේ නම සඳහන් කළා. ඔබතුමාට ඉතාම ගෞරවයෙන් මම මේ කාරණය කියන්නේ. මමත් මහජන නියෝජිතයෙක්. මම නිකරුණේ නැඟිටලා, නිකරුණේ කථා කරලා කවදාවත් මේ ගරු සභාවට කරදර කරලා නැහැ. එතුමන්ලා සඳහන් කළ කාරණය ප්‍රවෘත්තිවල පළ වුණාම මට විශාල අගතියක් වෙනවා. ඒ නිසා මට විනාඩි තුන හතරක් දෙන්න, මේ කාරණය කියන්න. මම මේ කථාව අවසන් කරන්නම්. මම මේ ගරු සභාවට කවදාවත් වදයක් වෙලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී තරුණ නියෝජනය අනිවාර්ය කිරීම සඳහා ඉදිරිපත් කළ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සම්බන්ධව දිගින් දිගටම කථා කළා. ඒ සම්බන්ධයෙන් කාරක සභා වාර්තාවක් ලැබුණා කියන කාරණය තමයි කිව්වේ. හැබැයි, ඔය කියන කාරණය සම්බන්ධයෙන් වාර්තාවක් තිබුණා නම් අපි ඒක දැනගෙන ඉන්න ඕනෑ. ඊට අදාළ පනත් කෙටුම්පත අපි පාර්ලිමේන්තුවේ සම්මත කර ඉවරයි. පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද පනතක ඇතුළත් කාරණයක් වන තරුණ කෝටාව සම්බන්ධයෙන් තව වාර්තාවක් ආවේ කොහොමද කියන ප්‍රශ්නය මෙතැන තිබෙනවා.

ඊළඟ කාරණය මෙකයි. ඔය කියන ආකාරයේ වාර්තාවක් තිබුණා නම්, ඔය වාර්තාව සකසන කණ්ඩායම මාව කැඳවන්න ඕනෑ. නමුත් අද වෙනකම් මාව කැඳෙව්වේ නැහැ. ඒක මම දන්නේත් නැහැ. ඒ නිසා මට විශාල ගැටලුවක් තිබෙනවා. මොකද, සමාජයට යන්නේ වෙනත් අර්ථකථනයක්. ඔබතුමා දන්නවා, පළාත් පාලන මැතිවරණය පවත්වන්න හදපු වෙලාවේ තරුණ කෝටාවට අදාළව ඔය කියන පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මට බැන්නා, මම ඡන්දය කල්දමන්න යනවා කියලා. එය ඉතා වැරදි කථාවක්. මොකද, අපි තරුණ නියෝජනයට අවශ්‍ය කෝටාව ලබා දීලා තිබෙනවා; එය නීතිය වෙලා තිබෙනවා. ඒ නිසා, ප්‍රවීණ මන්ත්‍රීවරයෙක් ඒ විධියට හැසිරුණේ ඇයි කියන ප්‍රශ්නය තිබෙනවා.

ඊළඟ කාරණය මෙයයි. කිරිඇල්ල මහත්මයා කිව්වා, මම විනිශ්චයකාරවරුන් පාර්ලිමේන්තුවට ගෙනෙන්න උත්සාහ කළා කියලා. ඊයේ දිනයේදී පාර්ලිමේන්තුව තුළ කථා කළ ඔක්කොම අය කිව්වේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ගැටලුවක් තිබෙනවා කියලායි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් මතු වුණු වරප්‍රසාද ප්‍රශ්නයක් නිසා තමයි මම එහෙම සිදු කළේ. වරප්‍රසාද කමිටුවට මේ රටේ ඕනෑම පුද්ගලයෙක් ගෙන්වන්න පුළුවන්. අග්‍ර විනිශ්චයකාරවරයෙකුත් ගෙන්නුවා නේ.

ඊළඟට, ගරු ජනාධිපතිතුමා පෙරේදා සිදුකළ ප්‍රකාශය සම්බන්ධයෙන් නොයෙක් මත පළ කරනවා. එතුමා කිව්වේ ඔය විධියේ ප්‍රකාශ කරන්න ගියොත්, තීන්දු දෙන්න ගියොත්, පිරිවෙන් පවා වහන්න වෙයි කියායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා හොඳටම දන්නවා මේ වරප්‍රසාද කමිටුවට ගෙන්වපු එක විනිශ්චයකාරවරයෙක් තමයි සූරසේන විනිශ්චයකාරතුමා. එතුමාට අයිතිය තිබෙනවා, ඕනෑම ආගමක් අදහන්න. එතුමා "බෝර්න් අගේන්" ආගමික කණ්ඩායමට යොමු වෙලා කියා මිනිස්සු කියනවා. නමුත් අපට ප්‍රශ්නයක් නැහැ. අද එක එක කණ්ඩායම් එක එක ආගමික කණ්ඩායම්වලට යනවා. ඒකේ ගැටලුවක් නැහැ. ඒක ඒගොල්ලන්ගේ අයිතියක්. නමුත් මම කියන්නේ මේකයි. ඊයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඔක්කොම කථා කළේ මේ කාරණය තුළ ගැටලුවක් තිබෙනවා කියායි. නීත්‍යානුකූල ක්‍රමවේද තුළ තමයි වරප්‍රසාද කමිටුවට ගෙන්වන්න කියලා මම ඉල්ලුවේ. ඒ නිසා කරුණාකර හුදෙකලා ප්‍රකාශ කරන්න එපා කියන කාරණය තමයි මට කියන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 1- කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත පිළිබඳ කල්තබන ලද විවාදය සහ විෂය අංක 2- යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම.

කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත
பெண்களின் வலுவூட்டல் சட்டமூலம்
WOMEN EMPOWERMENT BILL

කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.

ඊට අදාළ ප්‍රශ්නය - [ජූනි 04]

"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ඉදිරිවෛක්කප්පට්ට විවාදම් මීளத් தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது. சம்பந்தப்பட்ட வினா - [யூன் 04]

"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக". - [மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த]

வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.

Order read for resuming Adjourned Debate on Question - [04th June]

"That the Bill be now read a Second time".- [The Hon. (Dr.) Susil Premajayantha]

Question again proposed.

[පූ.භා. 11.50]

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත පිළිබඳ කල්තබන ලද විවාදය නැවත පවත්වන අද දිනයේ, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත ද මා ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මුලින්ම කැමැතියි යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න. යුනෙස්කෝ සංවිධානය කියන්නේ United Nations Educational, Scientific and Cultural Organization. එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමෙන් පස්සේ මුලින්ම ඇති කරන ලද අනුබද්ධ ආයතනයක්, ඒජන්සියක්, සංවිධානයක් තමයි, යුනෙස්කෝ සංවිධානය. ශ්‍රී ලංකාව 1949 දී තමයි යුනෙස්කෝ සංවිධානයේ සාමාජිකත්වය ගත්තේ. හැබැයි, 2024 වෙනකම් අවධානය යොමු වුණේ නැහැ, යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව නමැති පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න. විශේෂයෙන්ම ජාතික කොමිෂන් සභාවේ ලේකම්තුමිය, නිලධාරීන්, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, නීති නිලධාරීන් ඒ වාගේම ආංශික අධීක්ෂණ කාරක සභාව කියන සියල්ල ඒක රාශි වෙලා මේ පනත් කෙටුම්පත සකස් කරලා, අදාළ කාර්ය පටිපාටි අනුගමනය කරලා, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා තමයි අද එම පනත් කෙටුම්පත මේ විවාදයට ගන්නේ. මීට පෙර -පසුගිය සතියේ- පැවැත්වූ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී මේ සම්බන්ධයෙන් ප්‍රධාන සංශෝධන දෙකක් ආවා. ඒ සංශෝධන දෙක තිබුණේ, in page 09, Clause 05 and in page 13, Clause 11 විධියටයි. ආංශික අධීක්ෂණ කාරක සභාවේදී යෝජනා කරපු ඒ සංශෝධන දෙකටත් අපි එකඟ වෙලා, ඒ සංශෝධන දෙක නීති කෙටුම්පත් සම්පාදක විසින් නැවත සංශෝධනය කරලා, නීතිපතිතුමාගේ නිෂ්කාසනය ලබාගෙන, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අරගෙන අද ඒකත් සභාගත කරලා, ගරු මන්ත්‍රීතුමන්ලාගේ මේස මත තිබෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පත සම්මත කිරීමේ සියලුම ක්‍රියාදාමයන් ටික අපි ඉටු කරලා තිබෙනවා.

යුනෙස්කෝ සංවිධානයේ අරමුණුවලට ගැළපෙන ආකාරයෙන් තමයි මේ කොමිෂන් සභාව පිහිටුවීමට පනත් කෙටුම්පතේ අවශ්‍ය කටයුතු යොදා තිබෙන්නේ. මේකේ සඳහන් වන්නේ, "එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) සඳහා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි" යනුවෙන්. මෙහි සඳහන් පූර්විකාව මම කියවන්න යන්නේ නැහැ. යුනෙස්කෝ සඳහා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම යටතේ අනෙක් කරුණු ටික වගන්තියෙන් වගන්තිය අපි සඳහන් කරලා තිබෙනවා. ඒකේ 3වන වගන්තියේ තිබෙනවා, කොමිෂන් සභාවේ පරමාර්ථ. ඒවා මම එකින් එක කියවන්න යන්නේ නැහැ. පනත් කෙටුම්පතේ ඒ සම්බන්ධයෙන් කියලා තිබෙනවා. ඒවා යුනෙස්කෝ සංවිධානයේ පරමාර්ථත් එක්ක ගළපා ගනිමින් තමයි සිදු වන්නේ. මේ පනත් කෙටුම්පත මඟින් කිසිදු ආකාරයකින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කටයුතුවලට එවැනි බැඳීමක් අපි ඇති කරලා නැහැ. අන්තර්ජාතික සම්මුතීන්වලට තිබෙන්නා වූ, එකඟ වන්නා වූ පනත් ඕනෑ තරම් ගේනවා. පරිසරය පිළිබඳව ගත්තොත්, Basel Convention, Rotterdam Convention සහ Minamata Convention on Mercury වැනි සම්මුතීන් තිබෙනවා. පරිසර අමාත්‍යාංශය ඒකට අදාළ වන්නා වූ පනත් හෝ ඊට ආනුෂංගික වන්නා වූ නියෝග හදනවා. ඒක තමයි සාමාන්‍යයෙන් ප්‍රතිපත්තිය සහ සම්ප්‍රදාය. ඒකට අනුගත වෙමින් තමයි මේ පනත් කෙටුම්පතත් අපි ගෙනැල්ලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුනෙස්කෝ සංවිධානයේ අධ්‍යක්ෂ මණ්ඩලයට කිහිප වතාවක් අපි තේරිලා තිබෙනවා. අවසාන වතාවට පසුගිය වර්ෂයේ පැවැති ඡන්ද විමසීමේදී සාමාජික රටවල් 194න්, රටවල් 144ක ඡන්දය ලබා ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ හරහා අපට ඉදිරි අවුරුදු 4 සඳහා යුනෙස්කෝ සංවිධානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය හිමි කර ගන්නත් පුළුවන්කම ලැබුණා. යුනෙස්කෝ සංවිධානයේ ප්‍රධාන කාර්යාලය ප්‍රංශයේ පැරිස් නුවරයි පිහිටුවා තිබෙන්නේ. යුනෙස්කෝ සංවිධානයේ ප්‍රාදේශීය හෝ ක්ෂේත්‍ර කාර්යාල තිබෙනවා. ඒ වාගේම, පළමුවැනි කාණ්ඩය - Category 1 Institutes and Centres - යටතේ ලෝකය පුරා කාර්යාල 9ක් පිහිටුවා තිබෙනවා. ඒ වාගේම, දෙවන කාණ්ඩය යටතේ ආයතන 100කට වැඩි ප්‍රමාණයක් පිහිටුවා තිබෙනවා.

මේ සඳහා උදාහරණයක් තමයි, 2014 වර්ෂයේ දී එවකට හිටපු අධ්‍යාපන ඇමති බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ යෝජනාවක් අනුව ඉදිරිපත් කළ, මීපේ පිහිටුවා තිබෙන South Asian Centre for Teacher Development - SACTD. දකුණු ආසියාතික රටවල ගුරු සංවර්ධනය සහ අධ්‍යාපන සංවර්ධනයට අදාළ සංවර්ධන කාර්යන් කිරීම සඳහා එම මධ්‍යස්ථානය පිහිටුවා තිබෙනවා. යුනෙස්කෝ සංවිධානයෙන් කාණ්ඩ II යටතේ ආයතනයක් හැටියට ඒක පිළිගෙන තිබෙනවා. මම දන්නා තරමින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ ඊට අනුබද්ධ සංවිධානවල තිබෙන්නා වූ එකම කාර්යාලය තිබෙන්නේ මේ මධ්‍යස්ථානයේ විතරයි. අපේ රටෙන්, වෙනත් රටවලත් ඒ විධියේ කාර්යාල ගණනාවක් තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, UN Environment Programme - UNEP - එකට අදාළ වන්නා වූ පරිසර මූලස්ථානය තිබෙන්නේ කෙන්යාවේ. එහි වාර්ෂික සමුළු තිබෙනවා. ඉතින් ඒ රටවලට විශාල ආර්ථික ප්‍රතිලාභයකුත් ලැබෙනවා. ඊළඟට, ප්‍රංශයේ පැරිස් නුවර මූලස්ථානය තිබෙනවා. මේ ආදී වශයෙන් විවිධ රටවල එම මධ්‍යස්ථාන තිබෙනවා. ඉතින්, අපේ රටේ තිබෙන එකම ආයතනය SACTD එකයි. පසුගිය කාලයේ ඒක හරියාකාරව ක්‍රියාත්මක නොවීම නිසා ප්‍රශ්න මතු වුණා. අපි දැන් ඒකත් යථා තත්ත්වයට පත් කරගෙන තිබෙනවා. .

ඒ වාගේම තව ප්‍රධානම කාරණයක් තමයි, යුනෙස්කෝ සංවිධානය මඟින් අපේ රටේ මහාවංශය පිළිගෙන තිබීම. ඒක දැනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආරක්ෂා සහිතව තිබෙනවා. ඒ වාගේම පොළොන්නරුව ඓතිහාසික නගරය, සීගිරිය, ඉහළ තෙත්බිම්, ගාල්ලේ පැරණි ලන්දේසි කොටුව, රන්ගිරි දඹුල්ලෙහි පිහිටි cave temple එක, අනුරාධපුර ශුද්ධ නගරය, මහනුවර ගෞරවනීය ශුද්ධ නගරය, සිංහරාජ වනාන්තරය වැනි ස්ථාන ලෝක උරුමයන් - world heritage sites - හැටියට පිළිගෙන තව යෝජනා කීපයකුත් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. යුනෙස්කෝ සංවිධානය ඒවා ලෝක උරුමයන් හැටියට පිළිගත්තාම ඒවායේ සංස්කෘතික කටයුතු හා යම් යම් නඩත්තු කටයුතු සඳහා අපට එම සංවිධානයෙන් යම් මූල්‍ය දායකත්වයක් ලැබෙනවා. අපට තාක්ෂණික සහයත් ලබා ගන්න පුළුවන්. ඒ වාගේම මේවා ලෝක උරුමයන් හැටියට ප්‍රකාශයට පත් වුණාම මේවා ඉලක්ක කරගෙන ඒ තැන්වල සංචාරය කරන්න සංචාරකයෝ මේ රටට එනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විවිධ ව්‍යාපෘතීන් යටතේ අධ්‍යාපන ක්ෂේත්‍රයට, විද්‍යාත්මක ක්ෂේත්‍රයට හා සංස්කෘතික ක්ෂේත්‍රයට යුනෙස්කෝ සංවිධානය මඟින් අපට ආධාර ලබා දෙනවා. මේ අනුව අපේ සාමාජිකත්වය තබා ගන්නට එම සංවිධානයෙන් ලබා දුන් ආධාර සම්පිණ්ඩනය කර බැලුවොත්, 2022 - 2024 වර්ෂවලදී අපට ඇමෙරිකානු ඩොලර් 328,651.32ක් ලැබී තිබෙනවා. ඒ වාගේම සාමාජික රටවල් විසින් ගෙවිය යුතු මුදල් හැටියට අපි ඩොලර් 157,255ක් ගෙවන්න කටයුතු කර තිබෙනවා.

යුනෙස්කෝ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය දැනට දරන්නේ ප්‍රංශයේ හිටපු සංස්කෘතික ඇමතිතුමියයි. ජූලි මාසයේ මැද භාගයේ දී දින තුනක සංචාරයක් සඳහා එතුමිය ලංකාවට පැමිණීමට නියමිතව තිබෙනවා. මේ කියන ක්ෂේත්‍ර තුනට - අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ක්ෂේත්‍රවලට- එහිදී අවධානය යොමු වෙනවා. අපේ සංස්කෘතික අංශය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වෙනවා. අනෙක් විෂයන් දෙක අධ්‍යාපන අමාත්‍යාංශය යටතේයි තිබෙන්නේ. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විශාල වපසරියක් තුළ මේ කටයුතු සිදු වෙනවා. ඒ සඳහා "SchoolNet" එක හදලා තිබෙනවා.

ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමනි, ආදි ආනන්දීය විද්‍යාඥයෙකු වුණු ඇමෙරිකාවේ Virgin Islandsවල සිටින Prof. Harith Wickrema ඔබතුමාගේ කාලයේ හිටපු school head prefect. එතුමා සඳහන් කළා, කර්නල් රාජපක්ෂ විදුහල්පතිතුමාගේ කාලයේ එතුමා school head prefect විධියට හිටියා කියලා. එතුමා ඇමෙරිකාවේ ප්‍රසිද්ධ විද්‍යාඥයෙක්. එතුමාගේ පෞද්ගලික ධනයෙන් සහ ආධාරකරුවන්ගේ සහයෝගයෙන් රුපියල් මිලියන 150ක් වටිනා පරිසරය හා සම්බන්ධ ලංකාවේ පිහිටුවන පළමුවැනි හරිත විද්‍යාගාරය ආනන්ද විද්‍යාලයේ ඉදි කිරීම සඳහා ඊයේ මුල් ගල තැබුවා.

ඒ සඳහා රජයේ වියදමක් නැහැ. යුනෙස්කෝ සංවිධානයේ දිල්ලිවල සිටින එම අංශයේ ආචාර්යවරයෙක් ඒකට සහයෝගය දෙනවා. ඒක ලංකාවේ ඇති කරන එබඳු ස්වරූපයේ පළමුවැනි හරිත විද්‍යාගාරය බවට පත් වෙනවා. මොකද, ලෝක පරිසර විපර්යාසයන් එක්ක අද යුනෙස්කෝ සංවිධානයේ ප්‍රධාන මාතෘකාවක් වෙලා තිබෙනවා, සිදු වන පරිසර හානි වළක්වා ගැනීම වාගේම, පරිසර විපර්යාස - climate changes - මඟින් ඇති වන බලපෑම්, ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම වගේ දේවල් පළමුවැනි ශ්‍රේණියේ ඉඳලා ඉහළට ක්‍රමානුකූලව පාලනය කර ගැනීම. මේ අධ්‍යාපන ක්ෂේත්‍රයත් එක්ක ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමුවෙලා තිබෙනවා. අපි ඒ කටයුතු කරනවා.

දැනට විද්‍යා විෂය ධාරාවන් උගන්වන පාසල් පද්ධතිය සම්බන්ධ කරගෙන, ඒ වාගේම තවත් විශේෂ වැඩසටහන් මඟින් STEM අධ්‍යාපනය දියුණු කිරීම සඳහාත් අපේ ජාතික විද්‍යා පදනම අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. ඒ වාගේම ලාංකික විද්‍යාඥයින් විශාල පිරිසක් පිට රටවල ඉන්නවා. ඒ ගොල්ලන්ගේ website එකක් හදලා, ඔවුන්ගේ සහයෝගයත් ඇතිව STEM අධ්‍යාපනය දියුණු කිරීම සඳහාත් අපි විශාල වැඩ කොටසක් කරගෙන යනවා. එතකොට, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තිබෙන මේ කොටස් දෙකත්, ඒ වාගේම බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ තිබෙන්නා වූ ලෝක උරුමයන් හැටියට ප්‍රකාශයට පත් කර තිබෙන දේවලුත්, -සිංහරාජ වනය ගත්තොත්, ඒක වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය යටතට එන්නේ- කියන සියල්ලම එකට සම්බන්ධීකරණය වෙනවා. මෙතෙක් කාලයක් මේ සඳහා පනතක් තිබුණේ නැහැ. දැන් අපි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා තිබෙනවා. යුනෙස්කෝ සංවිධානයේ පරමාර්ථවලට අනුරූප වන්නා වූ, අපට ක්‍රියාත්මක කළ හැකි පනත් කෙටුම්පතක් ගෙනැල්ලා සම්මත කරලා ඒක නීත්‍යානුකූල කිරීම තමයි මෙතැනදී වෙන්නේ. මේ පනත් කෙටුම්පත ගෙනෙන්න අපි නියමිත ක්‍රියා පටිපාටිය අනුගමනය කරනකොට ඒක කවුරුවත් ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කළේ නැහැ. නමුත් ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත ඉදිරිපත් වුණු සංශෝධන දෙකම අපි කමිටු අවස්ථාවේ දී ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටිය අනුගමනය කරලා, නීතිපතිගේ නිෂ්කාසනය ලබාගෙන තිබෙනවා. ඒ, ඔබතුමන්ලාගේම යෝජනා දෙකක්.

මෙහිදී තව යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබුණා. නමුත්, මට පෙනෙන හැටියට ඒ යෝජනාව කමිටු අවස්ථාවේ ගැනීම මේ වෙලාවේ දුෂ්කරයි. මොකද හේතුව, මේ කොමිෂන් සභාවේ තිබෙන්නා වූ අරමුදල්වල යම් ඉතිරියක් යම් ව්‍යාපෘතියකින් වෙනවා නම්, ඒක වෙනත් විෂය ක්ෂේත්‍රයකට මාරු කරන්න බැහැ. එහෙම දෙන්න පුළුවන්කමක් නැහැ. එහෙම කළොත් එහි පරමාර්ථවලින් පිටට යනවා. ඒක ප්‍රතිපත්තිමය කාරණයක්. නමුත්, ආංශික අධීක්ෂණ කාරක සභාවේ දී යෝජනා වුණු සංශෝධන දෙකම අපි නියමිත ආකාරයෙන් කමිටු අවස්ථාවේ දී ගෙන ඒමට කටයුතු කරනවා. එම නිසා මම ඉල්ලීමක් කරනවා. රජයේ මුදල් භාවිතයකින් තොරව අනුග්‍රාහකයින්ගෙන් මුදල් ලබාගෙන තමයි අපි පසුගිය වතාවේ ඡන්දයෙන් ජයග්‍රහණය කරන්න පත්‍රිකා මුද්‍රණය කළේ. ඒ සියලු කටයුතු කළේ පැරිස් නගරයට ගිහිල්ලා, අදාළ ආයතනවලට දීලා. ඒකෙන් ශ්‍රී ලංකාවට විශාල කීර්තියක් අත් වුණා. මොකද, රට බංකොලොත් වෙලා තිබෙන වෙලාවක යුනෙස්කෝ සංවිධානයේ රටවල් 144ක ඡන්දය අපට ලැබුණා. ඒ ලබා ගත් ජයග්‍රහණය ඉදිරියට පත් වන ඕනෑම අධ්‍යාපන ඇමතිවරයෙකුට බුක්ති විඳගෙන යන්න පුළුවන්. එම නිසා ශ්‍රී ලංකාවට කුඩා රටක් හැටියට; දූපත් රාජ්‍යයක් හැටියට යුනෙස්කෝ සංවිධානය වාර්ෂිකව පවත්වන සමුළුවලදී, ඒ වාගේම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ඒවාට සම්බන්ධ වෙන්න, යෝජනා ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අනුබද්ධ ආයතනයක් වන යුනෙස්කෝ සංවිධානයේ ක්‍රියාකාරී ලෙස සිටින රටක් හැටියට ලංකාව මෙතැනට ගෙන එන්නට ඒ සියලුදෙනාගේම සහයෝගය ඇතිව අපට පුළුවන්කම ලැබුණා.

මේ පනත් කෙටුම්පත සම්මත කළාම, අවුරුදු 75ක් පුරා කරන්න බැරි වුණු ඒ නීතිගත කිරීමේ වැඩ පිළිවෙළ අපි සම්පූර්ණ කරනවා. ඒ සම්බන්ධයෙන් මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ සියලු අදහස්වලට අපි ගරු කරනවා. මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා ඔබ සියලුදෙනාගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින්, මගේ ආරම්භක කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[ප.ව. 12.04]

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, ஐக்கிய நாடுகள் கல்வி, அறிவியல் மற்றும் பண்பாட்டு ஒழுங்கமைப்புக்கான (யுனெஸ்கோ) தேசிய ஆணைக்குழுவைத் தாபிப்பதற்கும் அதனோடு தொடர்புபட்ட அல்லது அதன் இடைநேர்விளை

[ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා]

වාන කරුමංකලුක්කු ඒර්පාටු සෙය්වතර්කුමාන චට්ටමූලම්, 2024.02.20ආම් තිකති පාරාළුමන්රත්තිල් චමර්ප්පික්කප්පට්ටු, පින්නර් අතු කල්වි පර්රිය තුරෛචාර් මේර්පාර්වෛක් කුළුවුක්කු ආර්රුප්පටුත්තප්පට්ටු, ඉන්රු ඉච්චපෛයිල් ඉරණ්ටාම් මතිප් පීට්ටුක්කාකච් චමර්ප්පික්කප්පට්ටු ඉරුක්කින්රතු. ඉච්චට්ටමූලම් චම්පන්තමාන පල කූට්ටංකළුක්කු එංකළුටෙය අංකත් තවර්කළ් චමුකමළිත්තු, චිල පිරේරණෛකළෛයුම් මුන් වෛත්තිරුන්තාර්කළ්. ඉතිල් පල්වේරු අමෛප්පුකළ් ඉරුන්තාලුම්, මත්තිය කලාචාර නිතියම්, වන වළත් තිණෛක්කළම්, වන චීවරාචිකළ් පාතුකාප්පුත් තිණෛක්කළම් පෝන්රවර්රෛයුම් උළ්ළටක්ක වේන්ටුමෙන අවර්කළ් චොල්ලියිරුන්තාර්කළ්. මේලුම්, ඉන්ත ආණෛක්කුළුවින් කූට්ටංකළෛ නටත්තුවතර්කාන තේර්න්තෙටුක්කප්පටුකින්ර උරුප්පිනර්කළිල් මූන්රිල් ඔරු පකුතියිනර් - quorum 9 පේර් - ඉරුන්තාල් පෝතුමෙන නාංකළ් චොල්ලියිරුන්තෝම්. අතෛ කෞරව අමෛච්චර් අවර්කළුම් ඒර්රුක්කොණ්ටාර්. අන්ත වකෛයිල්, ඉතෛ ඉන්තච් චපෛ ඒර්රුක්කොළ්ළ වේන්ටුමෙන්ර මුන්මොළිවෛ නාන් මුන්වෛක්කින්රේන්.

ඉන්රු ඉන්ත නාට්ටිල් පෙණ්කළ් තොටර්පාන පිරච් චිනෛකළ් අතිකමාක ඉරුක්කින්රන. පාලින චමත්තුවම් තොටර්පිල් ඉන්ත නාට්ටිලුම් පේචප්පටුකින්රතු; උලකත්තිලුම් පේචප්පටුකින්රතු. පෙණ්කළින් වලුවූට්ටල් චට්ටමූලම් ඉන්තච් චපෛයිල් චමර්ප්පික්කප්පට්ටු, පෙණ්කළුක්කු ඒර්පටු කින්ර අනීතිකළ් මර්රුම් පිරච්චිනෛකළ් තොටර්පිල් ඉරණ්ටාවතු නාළාකවුම් විවාතික්කප්පටුකින්රතු. පෙණ් කළුටෙය උයර්වුක්කාක ඉන්ත නාට්ටිල් එන්නෙන්න විටයංකළෛච් චෙය්යලාම් එන්පතු පර්රි නාන් ඉංකු පේචලාමෙන නිනෛක්කින්රේන්. ඉන්ත නාට්ටින් චනත්තොකෛයිල් 52 චතවීතත්තිනර් පෙණ්කළාවර්. Out of Sri Lanka's population, 52 per cent are women. ආනාලුම්, ඉන්තප් පාරාළුමන්රත්තිල් 12 පෙණ් උරුප්පිනර්කළේ ඉරුක්කින් රාර්කළ්. එනවේ, ඉන්තප් පාරාළුමන්රත්තිලුම් මාකාණ චපෛකළිලුම් පිරතේච චපෛකළිලුම් පෙණ්කළින් පිරතිනිතිත් තුවත්තෛ අතිකරික්ක වේන්ටුමෙන නාංකළ් කේට්ටුක් කොළ්කින්රෝම්. මේලුම්, ඉන්තප් පාරාළුමන්රත්තින් Secretary-Generalආක ඔරු පෙණ්මණි ඉරුක්කිරාර්. අතේ පෝන්රු, ඉන්ත නාට්ටිල් අතියුයර් පතවිකළෛ පෙණ් කළුක්කු වළංකුවතර්කුම් මුන්වර වේන්ටුම්.

මහ ලේකම්තුමියනි, ඔබතුමිය තමයි දැන් මේ පාර්ලිමේන්තුවේ ප්‍රධානියා හැටියට කටයුතු කරන්නේ. ඒ ගැන අපි බොහොම සන්තෝෂ වෙනවා. කාන්තාවක් හැටියට ඔබතුමියට මේ තනතුර ලැබීම ගැන අපි ඉතාම සතුටු වෙනවා. අනෙක් ආයතනවලත් මේ වාගේ තනතුරු කාන්තාවන්ට ලැබෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා, ඒ වාගේම අපි යෝජනා කරනවා. සාමාන්‍යයෙන් කාන්තාවක් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ DIG වෙනවා නම්, ඒකට අපි කැමැති වෙන්න ඕනෑ. ඒ වාගේම අනෙක් ආයතනවලත් ප්‍රධානියා හැටියට කාන්තාවක් පත් වෙනවා නම්, අපි ඒකට සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. දැනට අවුරුදු 50කට ඉස්සෙල්ලාත් කාන්තා නියෝජනය තිබුණේ මේ ප්‍රමාණයම තමයි. මම හිතන විධියට, කාන්තා නියෝජනය සියයට 1යි, 2යි තිබුණේ. අවුරුදු 50ක් ගිහිල්ලාත් ඒ ප්‍රමාණයම තමයි තිබෙන්නේ. ඒ නිසා කාන්තා නියෝජනය වැඩි කරන්න කටයුතු කරන්න ඕනෑ කියලා මගේ අදහසක් තිබෙනවා.

නාන් එන්නුටෙය යෝචනෛයෛත්තාන් චොල්කින්රේන්. ඉන්රු පෙරුන්තෝට්ටප් පකුතිකළිල් 50 චතවීතත්තුක්කුම් මේල් පෙණ්කළ් වාළුකින්රාර්කළ්. අවර්කළුටෙය වාළ්ක්කෛයිල් පල්වේරු චික්කල්කළ් ඒර්පට්ටිරුප්පතෛ නාංකළ් කාණක් කූටියතාක ඉරුක්කින්රතු. තොළිල්පුරියුම් පෙණ්කළින් 0-5 වයතුක්කු ඉටෛප්පට්ට පිළ්ළෛකළින් පාතුකාප්පු මර්රුම් කවනිප්පු මීතාන චික්කල්කළ් කුරිත්ත විතප්පුරෛකළ් පර්රිය අර්රික්කෛ, 2024 චනවරි 09ආම් තිකති ඉන්තප් පාරාළුමන්රත්තිල් චමර්ප්පික්කප්පට්ටු ඉරුක්කින්රතු. අතාවතු, ඉන්තු වයතුක්කුක් කුරෛන්ත පිළ්ළෛකළුටෙය තාය්මාර් වෙළිනාටුකළුක්කුත් තොළිල් නිමිත්තම් පෝක මුටියාතු එන්රු චොල්ලප්පට්ටිරුක්කිරතු. ආනාලුම්, ඉන්රු අතෛ මීරිච් චෙයර්පටුවතාක නාංකළ් අර්රියක්කූටියතාක ඉරුක්කින්රතු. පෙරුන්තෝට්ටප් පකුතිකළිල් ඉව්වාරාන නිලෛමෛකළාල් කුටුම්පප් පිරච්චිනෛකළ් ඒර්පටුවතර්කාන චන්තර්ප්පම් අතික මාක ඉරුක්කින්රතු. අවර්රෛත් තීර්ප්පතර්කු කුරිත්ත විතප්පුරෛකළෛ උරිය විතත්තිල් අමුල්පටුත්ත වේන්ටුම්. වෙළිනාටුකළුක්කු වේලෛවාය්ප්පුක්කාකච් චෙල්කින්ර චිල පෙණ්කළින් උටල්කළ් ඉන්රු පිණමාක නාට්টුක්කු වරුකින්රන. ඉතු මෝචමානතොරු නිලෛමෛ එන්පතෛ නාංකළ් ඉංකු චුට්ටික්කාට්ට වේන්ටුම්.

වේලෛක්කුප් පෝකුම් පෙණ්කළුටෙය පිළ්ළෛකළෛප් පරාමරිප්පතර්කෙන මුරෛයාන පරාමරිප්පු නිලෛයංකළ් ඉල්ලෛ එන්පතෛයුම් නාංකළ් ඉංකු චුට්ටික්කාට්ට වේන්ටුම්. පෙණ්කළ් වේලෛක්කුච් චෙල්ල වේන්ටුමානාල්, කට්ටායම් අවර්කළුටෙය පිළ්ළෛකළෛප් පරාමරිප්පතර්කෙන මුරෛ යාන පරාමරිප්පු නිලෛයංකළ් ඒර්පටුත්තප්පට වේන්ටුම්. ඉන්රු ඉලංකෛයිල් ඔව්වොරු තුරෛයිලුම් තොළිල් පුරිකින්ර පෙණ් ඌළියර් පටෛයෛප් පර්රි නාන් ඉංකු චොල්ල විරුම්පුකින්රේන්. අරච තුරෛයිල් 590,514 පේර් ඉරුක්කිරාර්කළ්. තනියාර් තුරෛයිල් 1,074,607 පේර් ඉරුක්කිරාර්කළ්. චුයතොළිල් චෙය්කින්රවර්කළ් 703,290 පේර් ඉරුක්කිරාර්කළ්. පෙරුන්තෝට්ටත්තුරෛයිල් 170,788 පේර් ඉරුක්කිරාර්කළ්. තොළිලුක්කාක වෙළිනාටු චෙන්රුළ්ළ පෙණ්කළින් එණ්ණික්කෛයානතු, 2020ආම් ආණ්ටු 21,211 එනවුම් 2021ආම් ආණ්ටු 41,154 එනවුම් 2022ආම් ආණ්ටු 124,091 එනවුම් පුළ්ළිවිපරම් චොල්කින්රතු.

ඉව්වාරු පෙණ්කළ් වේලෛක්කුච් චෙල්ලුම්පොළුතු, අවර්කළුටෙය පිළ්ළෛකළෛප් පරාමරිප්පතර්කෙන මුරෛ යාන වේලෛත්තිට්ටංකළ් නාට්ටිල් ඉරුක්ක වේන්ටුම්. තර්පොළුතු නාට්ටිල් ඉතු තොටර්පිල් මේර්කොළ්ළප්පටු කින්ර වේලෛත්තිට්ටංකළ් පෝතුමානතාක ඉල්ලෛ එන්පතෛ නාන් ඉංකු චුට්ටික්කාට්ට විරුම්පුකින්රේන්. විචේටමාක, නාන් මේර්කෝළ් කාට්ටිය අර්රික්කෛයින්පටි, පෙරුම්පාලාන මාවට්ටංකළිලුළ්ළ පකල්නේර චිරුවර් නිලෛයංකළින් එණ්ණික්කෛ ඔන්රු අල්ලතු ඉරණ්ටු එන්රේ කුරිප්පිටප් පට්ටු ඉරුක්කින්රතු. අම්පාරෛ මර්රුම් ඉරත්තිනපුරියිල් තලා ඉරණ්ටු නිලෛයංකළ් ඉරුක්කින්රන. අතේපෝල්, පතුළෛ මර්රුම් අනුරාතපුරත්තිල් තලා මූන්රු නිලෛයංකළ් ඉරුක්කින් රන. එනෛය මාවට්ටංකළිල් පෙරුම්පාලුම් තලා ඔරු නිලෛයම්තාන් ඉරුක්කින්රතු. එනවේ, ඔව්වොරු මාවට්ටත් තිලුම් ඉරුක්කින්ර චිරුවර් පරාමරිප්පු නිලෛයංකළින් එණ්ණික්කෛ අතිකරික්කප්පට වේන්ටුම්. විචේෂමාක, පෙරුන්තෝට්ටප් පකුතිකළිල් 125 පකල්නේර චිරුවර් පරාමරිප්පු නිලෛයංකළ් ඉරුප්පතාකප් පුළ්ළිවිපරම් චොල්කින්රතු. ඉතු වරවේර්ක්කත්තක්ක විෂයමාකුම්. ඉරුන්තාලුම්, අවෛ ඉන්නුම් අතිකරික්කප්පට වේන්ටුමෙන නාංකළ් කේට්ටුක් කොළ්කින් රෝම්.

නාංකළ් කටන්ත 'නල්ලාට්චි' අරචාංකත්තිල් ඉරුක්කුම් පොළුතු, පෙරුන්තෝට්ටංකළිල් වේලෛචෙය්කින්ර පෙණ්කළ්

சுத்தமாக இருப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கோரியிருந்தோம். அதன் விளைவாக, பெருந்தோட்டங்களில் வேலைசெய்கின்ற பெண்கள் ஓர் இடத்தில் உட்கார்ந்து நிம்மதியாகச் சாப்பிட்டுவிட்டு, மீண்டும் வேலைக்குச் செல்வதற்கான கட்டிடம் ஒன்றை அமைப்பதற்குரிய நிதியை அப்போதிருந்த நிதி அமைச்சர் அவர்கள் ஒதுக்கிக் கொடுத்திருந்தார். நாங்கள் அக்கட்டிடங்களை அமைப்பதற்கான நடவடிக்கைகளை எடுத்தோம். ஆனாலும், அப்பணிகள் முற்றுமுழுதாக நிறைவடையாமல் இருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது.

அடுத்து, பாடசாலைப் படிப்பை முடித்துவிட்டு, புதிதாக தொழில்களை ஆரம்பிப்பவர்களுக்கு 5 இலட்சம் ரூபாய் loan கொடுப்பதாக அரசாங்கம் சொல்கின்றது. இது வரவேற்கக் கூடிய விடயமாகும். ஆனாலும், அந்த loanஐப் பெறுவதற்குப் பல நிபந்தனைகள் - conditions - விதிக்கப்படுகின்றன. இதனால் அவர்களுக்கு அந்த loan கிடைக்காமலே போகின்றது. எனவே, நிபந்தனைகளைத் தளர்த்தி, இலகுவாக அந்த loanஐப் பெறுவதற்கான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென நான் கௌரவ அமைச்சரிடம் காலையில் கேட்டுக்கொண்டேன். அதை இப்போது அவருக்கு ஞாபமூட்டிக் கொள்கின்றேன். இன்று நுண்நிதி நிறுவனங்கள் பெண்களுக்கு micro-loanஐக் கொடுத்து, அவர்களை மிகவும் துன்பமான நிலைக்கு ஆளாக்குகின்றன. ஆகவே, இத்தகைய நுண்நிதி நிறுவனங்கள் தொடர்பான சட்டதிட்டங்களை மாற்றி, பெண்களைக் காப்பாற்றுவதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அண்மையில் புரூக்சைட் தோட்டத்திலுள்ள, railwayக்குச் சொந்தமான கட்டிடம் ஒன்றை தனியார் ஒருவர் பலவந்தமாகப் பெற்றுக்கொண்டு, அதில் வேறு நடவடிக்கைகளில் ஈடுபடுவதாக நாங்கள் அறிகின்றோம். கடந்த வாரம் அங்கு picketing - எதிர்ப்பு ஆர்ப்பாட்டம் - நடந்தது. ஆனாலும், இதுவரை இவ்விடயம் தொடர்பில் எந்தவிதமான நடவடிக்கையும் எடுக்கப்படவில்லை. நேற்று நான் இது தொடர்பில் கௌரவ அமைச்சர் பந்துல குணவர்தன அவர்களிடம் சொன்னேன். அவர் இது தொடர்பில் உடனடியாக அக்கறை செலுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

இந்த நாட்டிலுள்ள இளைஞர்களை - youth - ஊக்குவிக்க வேண்டியது கட்டாயமாக இருக்கின்றது. அந்த வகையில், நோர்வூட் பகுதியிலுள்ள இளைஞர்களுக்குக் கொடுக்கப்பட்ட இரண்டு ஏக்கர் காணியைப் பலவந்தமாக எடுத்து, அவற்றை வேறு விடயங்களுக்குக் கொடுப்பதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுவதாக நாங்கள் அறிகின்றோம். எனவே, அதனைத் தடுத்து நிறுத்துவதற்கான நடவடிக்கைகள் இச்சபை மூலமாக எடுக்கப்பட வேண்டும். அங்குள்ள இளைஞர்கள் மத்தியில் விளையாட்டை ஊக்குவிப் பதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். இல்லாவிட்டால், மலையக இளைஞர்கள் வேறு விடயங்களில் ஈடுபடுவதற்கான வாய்ப்புகள் அதிகமாக இருக்கின்றன என்பதை நான் இங்கு தெரிவித்துக் கொள்வதோடு, பெண்களின் சுகாதார விடயத்திலும் அதிக அக்கறைகொள்ள வேண்டுமென நாங்கள் வலியுறுத்துகின்றோம்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

හොඳයි.

யுத்தத்தால் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்குப் பகுதி களிலுள்ள பெண்களின் நிலைமை இன்று மிகமோசமாக இருக்கின்றது. அங்குள்ள பெரும்பாலான பெண்கள் தங்களுடைய கணவன்மாரை விட்டுப் பிரிந்துசென்று, இன்னுமொரு கலியாணம் செய்து வாழ்கின்ற சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது. அதேபோல், அவர்களுடைய கணவன்மாரும் இன்னுமொரு கலியாணம் செய்து வாழ்கின்ற சூழ்நிலை ஏற்பட்டிருகின்றது. இதனால் குடும்பங்கள் பிரிகின்றன; குடும்பங்களில் பல்வேறு குழப்பங்கள் ஏற்படுகின்றன. இப்பிரச்சினைகள்மூலம் சமூகப் பிரச்சினைகள் ஏற்பட்டு, பொருளாதாரத்திலும் சிக்கல் ஏற்பட்டு, அவர்களுடைய பிள்ளைகள் பிச்சை எடுக்க வேண்டிய நிலைக்குத் தள்ளப்பட்டிருக்கிறார்கள். எனவே, இவற்றைத் தவிர்த்துக் கொள்வதற்கான நடவடிக்கைகளை அரசாங்கம் எடுக்க வேண்டுமெனக் கேட்டு, எனது பேச்சை நிறைவு செய்கின்றேன்.

நன்றி!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුප පස්කුවල් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.16]

ගරු අනුප පස්කුවල් මහතා (සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுப பஸ்குவல் - சமூக வலுவூட்டுகை இராஜாங்க அமைச்சர்)
(The Hon. Anupa Pasqual - State Minister of Social Empowerment)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත පිළිබඳවත් විවාද කරන මේ මොහොතේදී ඒ සඳහා සමාජය තුළ කුමන ආකාරයේ අවශ්‍යතාවක් තිබෙනවාද කියන කාරණය පිළිබඳව අපි පළමුව විමසා බැලිය යුතුයි. පළමුවැනි කාරණය හැටියට ගත්තොත් "සවිබලගැන්වීම" යනුවෙන් අපි අදහස් කරන්නේ කාන්තාවගේ හෝ පුරුෂයාගේ හෝ ළමයෙකුගේ තීන්දු-තීරණ ගැනීමේ හැකියාව වර්ධනය කිරීමයි. තීන්දු-තීරණ ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා කාන්තාවගේ පෝෂණය, අධ්‍යාපනය, ස්වයං රැකියාව සහ සමාජ ආරක්ෂණය කියන හතර වැදෑරුම් ක්ෂේත්‍ර ඔස්සේ අපි සිතිය යුතුයි. කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත අරගෙන බැලුවොත්, මේ තුළින් පළමුව කාන්තාවන්ගේ අයිතිවාසිකම් වාගේම කාන්තාවන්ට සිදුවන නිරිහැර පිළිබඳව සඳහන් වෙනවා.

කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; කාන්තාවන්ගේ අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිණිස ද; කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද; කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යන්ත්‍රණ පිහිටුවීම සහ එකී අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට එරෙහිව නඩු පැවරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වෙන්නේ.

[ගරු අනුප පස්කුවල් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාව විවිධාකාර හිංසනයන්ට ලක් වෙනවා කියන එක ප්‍රකට කරුණක්. ඈත අතීතයේ මීට වඩා බලවත් විධියට ඒ හිංසන සිද්ධ වුණා. ඒ, ගෘහස්ථ හිංසනය, සමාජය තුළදී සිද්ධ වුණු හිංසනය, ලිංගික හිංසනය ආදී වශයෙන්. ඒ තත්ත්වය ක්‍රමානුකූලව සමනය වෙමින් කාන්තාව සහ පුරුෂයා යන දෙදෙනාම ලෝකය පුරාත්, ලංකාවේත් රැකියා ක්ෂේත්‍රය තුළ, දේශපාලන ක්ෂේත්‍රය තුළ, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ, සටන් ක්ෂේත්‍රය තුළ වාගේම අයිතිවාසිකම් තුළින් ක්‍රමක්‍රමයෙන් ඉදිරියට පැමිණියා. කාන්තා අයිතිවාසිකම් නෛතිකව -නීත්‍යානුකූලව- තහවුරු කිරීම සඳහාත්, තමන්ට අසාධාරණයක් සිදු වෙනවා නම් ඒ අසාධාරණය ඉදිරිපත් කිරීම සඳහා නීතිමය ප්‍රවේශයක් ලබා දෙන්නත් ඇති කර ගන්නා එකක් තමයි කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව කියන්නේ. ඒ කොමිෂන් සභාවට සාමාජිකයන් හත්දෙනෙකු ඇතුළත් වෙනවා. ඒ හත්දෙනාගෙන්, පස්දෙනෙකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නිර්දේශ කර ජනාධිපතිතුමා විසින් පත් කරනවා. අනෙක් දෙදෙනා කථානායකතුමා විසින් පත් කළ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදයේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කරනවා. ඒ හත්දෙනාගෙන් තමයි මේ කොමිෂන් සභාව සමන්විත වෙන්නේ. ඊට අමතරව ඒ කොමිෂන් සභාවට නිලධාරීන් ඇතුළත් වෙනවා. ඒ වාගේම කාන්තා අයිතිවාසිකම් සඳහා වන පාර්ලිමේන්තු කොමසාරිස් කෙනෙක් ඇතුළත් වෙනවා, සුදුසුකම් සහිත. එමෙන්ම මේ කොමිසමේ සභාපති බවට පත් වෙන්නේත් කාන්තාවක්. මේ කොමිසමට ඕනෑම කාන්තාවකට සිදු වුණු අසාධාරණයක් පිළිබඳව, යුක්තිය කඩවීමක් පිළිබඳව, දැනටමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර තිබෙන යම්කිසි කඩවීමක් පිළිබඳව පැමිණිලි ඉදිරිපත් කරන්න පුළුවන්. එවිට මේ කොමිෂන් සභාවට පුළුවන්, ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න, අධිකරණය හා සමාන බලතල සහිතව. ඒ පරීක්ෂණයේ අවසාන ප්‍රතිඵලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන්නත් පුළුවන්; එහෙම නැත්නම් කාන්තා කාර්යාංශය මඟින් අධිකරණය වෙත යොමු කරන්නත් පුළුවන්; එහෙමත් නැත්නම් සමථ මණ්ඩලයක් සකස් කරලා, සමථ මණ්ඩලය හරහා මේක සමථකරණයකට යොමු කරන්නත් පුළුවන්. ඒ සියලු කටයුතු මසක් තුළ සිදු විය යුතුයි. බොහෝ වෙලාවට ප්‍රශ්නවලට සහ පීඩනයන්ට ලක් වුණු සමාජ තලවල සිටින කාන්තාවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම තමයි මෙහි බලාපොරොත්තුව.

සමහර වෙලාවට තරුණ කාන්තාවක් විවාහයකින් තොරව ගැබ් ගන්න පුළුවන්. එවැනි අවස්ථාවක පුරුෂයා විසින් ඇයව දාලා යන්න පුළුවන්. එවැනි කාන්තාවන් සවිබලගැන්වීමේ වගකීම පැවරී තිබෙන්නේත් මේ කොමිෂන් සභාවටයි. විශේෂයෙන් මෙහි තිබෙන ප්‍රධානම කාරණය තමයි අයිතිවාසිකම් වෙනුවෙන් පැමිණිලි ඉදිරිපත් කරලා, විසඳුමක් ලබා ගැනීම. එහෙම නැත්නම් ඒගොල්ලන්ට අධිකරණයට යන්නත් පුළුවන්. අන් සියලු දේවලට වඩා වැදගත් කාරණය තමයි, කාන්තා අභිවෘද්ධිය සහ සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමේ බලය සහ එය ක්‍රියාත්මක කිරීමේ බලය මේ කොමිෂන් සභාවට ලබා දීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක්ද "සවිබලගැන්වීම" කියන්නේ? මීට මොහොතකට පෙර සජිත් ප්‍රේමදාස මැතිතුමා කියා සිටියා, එංගලන්තයේයි, සිංගප්පූරුවේයි ඩිජිටල් ක්ෂේත්‍රයේ ඉන්නා සේවකයන්ට, ක්‍රියාධරයන්ට pension ක්‍රමයක් හෝ EPF, ETF නැහැ, ඒගොල්ලන්ට ඒවා දෙන්න ඕනෑ කියලා එංගලන්තය කියා තිබෙනවා, ඒ නිසා ඒක අපේ රටේත් ක්‍රියාත්මක කරන්න ඕනෑය කියලා. නමුත් කියන්න කනගාටුයි, එංගලන්තයෙන් ඒක ගේන්න අවශ්‍ය නැහැ; සිංගප්පූරුවෙන් ගේන්න අවශ්‍ය නැහැ. මේ රටේ අපේ සිතුවිලිදාමයෙන්, ජාතික චින්තනයෙන් ඒ ගැන හිතන්න.

අපේ කාන්තාවන් ළඳරු පාසල්වල -පෙර පාසල්වල- ගුරුවරු හැටියට කටයුතු කරනවා. මට පුංචි කාලයේ උගන්වපු පෙර පාසල් ගුරුවරියට pension scheme එකක්වත්, EPF එකක්වත් තිබුණේ නැහැ; දායකත්ව pension ක්‍රමයකුත් නැහැ. ස්වයං රැකියා කරන කිසිම කාන්තාවකට කිසිදු රක්ෂණයක්, සමාජ ආරක්ෂණයක් නැහැ. ගමේ තේ දලු නෙළන කාන්තාවටත් කිසිම සමාජ ආරක්ෂණයක් නැහැ; පෙර පාසල් ගුරුවරියටත් සමාජ ආරක්ෂණයක් නැහැ. මට උගන්වපු "සොබනා මිස්" පවා අවසාන කාලයේදී කිසිම රැකවරණයක්, කිසිම ආදායමක් නැතුවයි හිටියේ. අවුරුදු 60, 65 වුණාට පස්සේ ඔවුන්ට ඒ වෘත්තිය කරන්න බැහැ. එතුමිය අව්වාහකයි. සමහර අය විවාහ වුණත් දරුවන් අව්වාහකව සිටිනවා. ඔවුන්ට කිසිම යැපීම් මාර්ගයක් නැහැ. ඒ නිසාම සමස්ත ලංකා පෙර පාසල් ගුරු සංගමය -එහි සභාපති අසංක මහතා- මගෙන් ඉල්ලීමක් කළා පෙර පාසල් ගුරුවරුන්ටත් අනිවාර්ය විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කර දෙන්න කියලා. ඒ අනුව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය වාගේම අධ්‍යාපන අමාත්‍යාංශයත් ඒකාබද්ධව මේ අනිවාර්ය pension ක්‍රමය හඳුන්වා දෙන්න අපි දැන් කටයුතු කරගෙන යනවා. මේක තමයි සවිබලගැන්වීමේ ප්‍රඥප්තිය තුළින් සිදු වෙන්න ඕනෑ. කාන්තාවන් සවිබලගැන්වීම ගැන කථා කළොත්, අනිවාර්ය pension ක්‍රමයක් නැතුව උසාවි විතරක් ගිහිල්ලා කාන්තාව සවිබලගන්වන්න පුළුවන්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් කාන්තාවක් අවුරුදු 18දී ස්වයං රැකියාවක් කරන්න පටන් ගන්නවාය කියා අපි හිතමු. අවුරුදු 25, 30, 35, 40, 45 වෙනකල් ඇය ශක්තිමත්. ඒ කාලය තුළදී ඔවුන් ලබන ආදායම හොඳයි. හැබැයි, ඔවුන් වෙනුවෙන් pension ක්‍රමයක් නැහැ. Pension ක්‍රමය රාජ්‍ය සේවයට තිබෙනවා; පාර්ලිමේන්තු සේවයට තිබෙනවා. ඒ වාගේම පෞද්ගලික අංශයේ සේවකයන්ට EPF, ETF තිබෙනවා. නමුත් ස්වයං රැකියා කරන කාන්තාවන්ට pension එකක් කෝ? කාන්තාවන්ට විතරක් නොවෙයි, අනෙක් අයටත් එහෙමයි. එංගලන්තයේ තිබෙන GIGA ක්ෂේත්‍රය වාගේම අපේ රටේත් දැවැන්ත ක්ෂේත්‍රයක් තිබෙනවා, කාන්තාවන් සහ පුරුෂයන් වැඩ කරන. මේ අය වෙනුවෙන් අනිවාර්ය pension ක්‍රමය සකස් කිරීම සඳහා අපි මුදල් අමාත්‍යාංශයට යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම දැන් අපට ඒ සඳහා අවස්ථාවක් ලැබී තිබෙනවා. ජනාධිපතිතුමා මේ පනත ඉදිරිපත් කරන්න බොහෝ වෙහෙසුණා. මේ තුළින් කාන්තාවන් සවිබල ගැන්වීම, අනිවාර්ය pension ක්‍රමය ක්‍රියාත්මක කරනවා.

ඊළඟට, අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තොත් සාමාන්‍ය පෙළ විභාගයේදී දරුවන්ගෙන් සියයට 30ක් ෆේල් කරනවා. සියයට 30ක් ෆේල් කියන එක යුක්ති සහගතද? 10 පන්තිය සමත් වෙච්ච ළමයෙක් කියන්නේ, ඒ ළමයා අවුරුදු 10ක්, 15ක් අධ්‍යාපනයට කාලය කැප කරපු කෙනෙක්. ඒ ළමයාට ෆේල් කියලා කිසිම දවසක කියන්න බැහැ. සමහරු කියනවා, ගණිතයයි, භාෂාවයි, ආගමයි ෆේල් නම් ඔබ ෆේල් කියලා. මොන යුක්තියක්ද ඒ තුළ තිබෙන්නේ? ඒ තුළින් කුසලතාව මනිනවාද? ඔහු හොඳ වඩු කාර්මිකයෙක් කරන්න බැරිද? හොඳ චිත්‍ර ශිල්පියෙක් කරන්න බැරිද? අපේ රටේ හොඳ චිත්‍ර ශිල්පීන් ඉන්නවා; හොඳ වඩු කාර්මිකයන් ඉන්නවා. විවිධ ක්ෂේත්‍රවල නිරත වෙච්ච පුද්ගලයන් ඉන්නවා. හැබැයි, ඒ අය ඔක්කොම ෆේල්. කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත හරහා අපි අනිවාර්යයෙන් මේ පිළිබඳවත් අවධානය යොමු කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශය මේ පිළිබඳව දැනටමත් අවධානය යොමු කරලා තිබෙන්නේ.

ලක්ෂ ගණනක් කාන්තාවන් ගෘහ සේවය සඳහා අරාබියට යනවා. ඒක ලජ්ජාසහගතයි. ඒගොල්ලන්ට නිසි වෘත්තීය පුහුණුවක් ලබා දීලා, ඒ ක්‍රියාවලිය මේ කාන්තාවන් සවිබල

ගැන්වීමේ පනත හරහා ජාතික ප්‍රඥප්තියට, ජාතික ප්‍රතිපත්තියට අනිවාර්යයෙන්ම ඇතුළු කළ යුතුයි. එය මේ තුළින් අනිවාර්ය කර තිබෙනවා.

කොමිෂන් සභාව මඟින් කාන්තාවන් සවිබලගැන්වීමේ ජාතික ප්‍රතිපත්තිය සකස් කරලා, එයට අනුමැතිය ලබාගෙන කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළාම කැබිනට් මණ්ඩලයට පුළුවන්, අවශ්‍ය නම් ඒකට සංශෝධන ඉදිරිපත් කරන්න. ඉන් අනතුරුව ගැසට් කරලා පාර්ලිමේන්තුවට මසක් ඇතුළත ඒක ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ වාගේම කොමිෂන් සභාව තහවුරු කරන්න ඕනෑ, මේ පනත අනුව සියලුම අමාත්‍යාංශ මේ සවිබලගැන්වීමේ ප්‍රතිපත්තියට එකඟද, නැද්ද කියන එක. ඒ සඳහා නීත්‍යානුකූලව කැමැත්ත ලබා ගැනීමේ වගකීමක් අදාළ කොමිෂන් සභාවට මෙන්ම අදාළ අමාත්‍යවරයාටත් තිබෙනවා. මේ තුළ ඉතාම වැදගත් දේ තමයි, සමාජ සවිබලගැන්වීම හා පෝෂණය. සමාජ සවිබලගැන්වීමේදී වාගේම කාන්තාව සවිබලගැන්වීමේදී පෝෂණය අතිශයින්ම වැදගත්. අද තිබෙන්නේ, පාන් පිටි පෝෂණයක්. පාන් පිටි කාලා තමයි අධිරාජ්‍ය විරෝධී කටයුතු කරන්නේ. පාර්ලිමේන්තුවේත් පාන් පිටි; අමාත්‍යාංශවලත් පාන් පිටි; දේශපාලන පක්ෂවලත් පාන් පිටි.

අපි පාන් පිටි කකා අධිරාජ්‍ය විරෝධී අරගළය කරනවා. ඉතින් කොහොමද අපේ අම්මලාට - කාන්තාවන්ට - පෝෂණය ලැබෙන්නේ? චීනය, ජපානය වාගේ රටවල තිබෙනවා වාගේ ඉතා හොඳ පෝෂණ ආහාර අපේ අවට පරිසරය තුළ තිබෙනවා. සත්ව ප්‍රෝටීන් වාගේම ශාක ප්‍රෝටීන්; ඒ ආහාර ඕනෑ තරම් තිබෙනවා. සවිබලගන්වන්න නම්, කාන්තාවගේ පෝෂණය වාගේම ගර්භාෂයේ සිටම දරුවාගේ පෝෂණයත් අවශ්‍යයි. දරුවාව සවිබලගැන්වීම සඳහා ඒ ප්‍රතිපත්තියට අනිවාර්යයෙන්ම ජාතික ආහාර ප්‍රතිපත්තියක් ඇතුළත් වෙන්න ඕනෑ. මානසික සවිබලගැන්වීම ශක්තිමත් වුණේ නැත්නම් පෝෂණය නිසියාකාරව දුන්නේ නැත්නම්, මේ විධියට සියයට අටක් මන්දපෝෂණය තිබෙනවා නම් අනිවාර්යයෙන්ම නිරෝගි සම්පන්න දරුවෙකු, නිරෝගි සම්පන්න කාන්තාවක්, අහ පසහවලින් සපිරි කාන්තාවක් අපට ලැබෙන්නේ නැහැ; දරුවෙකු ලැබෙන්නේ නැහැ. හොඳ නිරෝගී දරුවන් හදන්න පුළුවන් කාන්තාවන් අපට ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපේ පෝෂණ ප්‍රතිපත්තිය සඳහා මේ කෂඩ ආහාර ක්‍රමය ඉවත් කරලා හොඳ පෝෂණයක් සහිත, අපේ ගහ කොළේ තිබෙන, කොස් ගෙඩියේ තිබෙන, දෙල් ගෙඩියේ තිබෙන, වැවේ තිබෙන, දොළේ තිබෙන, ඇළේ තිබෙන, වනාන්තරයේ තිබෙන සත්ව සහ ශාක ප්‍රෝටීන් පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. සවිබල ගැන්වීමේ ප්‍රඥප්තියේදී ඒක ඉතාම වැදගත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කාලය අවසන්, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු අනුප පස්කුවල් මහතා
(மாண்புமிகு அனுப பஸ்குவல்)
(The Hon. Anupa Pasqual)
අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙච්චරයි. අද ඉදිරිපත් කරලා තිබෙන්නේ ඉතා වැදගත් පනත් කෙටුම්පතක්. මේ දේ සිදු වේවි කියලා දීර්ඝ කාලයක සිට රටේ ජනතාව බලාගෙන හිටියා; කාන්තාව බලාගෙන හිටියා. ඔවුන්ට සිදුවන අසාධාරණය වෙනුවෙන් පෙනී ඉන්න කොමිෂන් සභාවක් මේ පනත සම්මත වීමෙන් පසු ලැබෙනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු වෙනවා. ඒක අපේ ජයග්‍රහණයක්. මේක ඒ වෙනුවෙන් ආපු පනතක්. ඒ නිසා මේ පනත සම්මත වීමත් සමඟ කාන්තාවගේ අභිවෘද්ධිය වෙනුවෙනුත්, ඔවුන් සවිබලගැන්වීම වෙනුවෙනුත් ඉදිරියට යමු. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනවා

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ [ගරු අංගජන් රාමනාදන් මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පඩි, අමර්වු පි.ප. 1.00 මණිවරை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. S. Noharathalingam. You have eight minutes.

[පි.ප. 1.00]

ගරු සු. නෝගරාදලිංගම් මහතා
(மாண்புமிகு சு. நோகராதலிங்கம்)
(The Hon. S. Noharathalingam)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, முதலில் இன்றைய விவாதத் தலைப்புக்கு அப்பாற்பட்ட இரண்டு விடயங்களைக் கூறிவிட்டு விடயத் தலைப்புக்கு வரலாமென நினைக்கின்றேன்.

இந்திய வெளியுறவுத்துறை அமைச்சர் ஜெய்சங்கர் அவர்கள் இன்று எமது நாட்டுக்கு ஒரு நாள் விஜயத்தை மேற்கொண்டிருக்கிறார். அவருடைய விஜயத்தைக் கண்டு இந்தப் பாராளுமன்றத்திலுள்ள சிலர் அச்சப்படுகின்ற, சந்தேகப்படுகின்ற நிலையை இன்றைய காலை அமர்வின் போது நாங்கள் அவதானிக்கக் கூடியதாக இருந்தது. "வேண்டாப் பொண்டாட்டி கைபட்டால் குற்றம், கால்பட்டால் குற்றம்" என்று தமிழில் ஒரு பழமொழி இருக்கின்றது. இனவாதக் கண்ணோட்டத்துடன் பார்க்கின்ற ஒவ்வோர் அரசியல்வாதியும் இந்தியாவை அதுபோன்றுதான் பார்க்கின்றார்கள். அதனால் அவர்கள் கொக்கரிக்கத் தொடங்கி இருக்கிறார்கள். ஜெய்சங்கர் அவர்களின் விஜயத்தைக் கண்டு அவர்களுக்கு இப்படி ஓர் அச்சம் ஏற்படுகின்றது என்றால், விரைவில் எமது நாட்டுக்கு வருகைதர இருக்கின்ற இந்தியப் பிரதமர் நரேந்திர மோடி அவர்களின் வருகையால் எப்படிப் பட்ட அச்சம் ஏற்படும் என்று நாங்கள் சொல்லத் தேவை யில்லை.

இந்தியா என்பது, எமது அயல் நாடு; ஆபத்தின்போது உதவிய, உதவிக்கொண்டிருக்கின்ற நாடு; எந்த ஆபத்தின் போதும் எதிர்காலத்தில் உதவி செய்யக்கூடிய நாடு! அந்த நாட்டின் பிரதிநிதிகள் இங்கு வருகின்றபோது, இவர்கள் என்ன நோக்கத்துக்காக இப்படிக் கூக்குரல் இடுகின்றார்கள்? அயலில் இருக்கின்ற வளர்ச்சியடைந்து வருகின்ற நாட்டுக்கு உதவ வேண்டும், அதற்குப் பக்கபலமாக இருக்க வேண்டு மென்ற ஓர் உயர்ந்த நோக்கத்தோடு அவர்கள் வருகின்ற போது, அதனை வேறு கண்ணோட்டத்தில் பார்க்கின்ற நிலைமைதான் இங்கு காணப்படுகின்றது. இதனால்தான் இந்த நாட்டில் பெரும்பான்மையாக இருக்கின்ற சிங்கள மக்கள்கூட, இந்தியாவை ஓர் எதிரி நாடு போன்று பார்க்கின்ற நிலை

[ගරු සු. නෝගරාදලිංගම් මහතා]

ඒත්පට්ටිරුක්කින්රදු. இந்திய வெளியுறவுத்துறை அமைச்சர் ஜெய்சங்கர் அவர்கள் எதற்காக இங்கு வருகின்றார்? என்ன நோக்கத்துக்காக வருகின்றார்? இதில் மறைகரங்கள் இருக்கின்றதா? என்று கௌரவ விமல் வீரவங்ஸ அவர்கள் பேசுகின்ற, நினைக்கின்ற அளவுக்கு நிலைமை இருக்கின்றது. இவ்வாறானவர்கள் சிங்கள மக்களைத் தவறாக வழிநடத்து வதன் காரணமாகவே இன்று அம்மக்கள் அயல் நாடான இந்தியாவை ஓர் எதிரி நாடு போன்று பார்க்கின்ற நிலைமை ஏற்பட்டு இருக்கின்றது. உண்மையிலே இது மாற்றப்பட வேண்டும்.

எங்களைப் பொறுத்தவரையில், இந்தியாவை மீறி எந்தவொரு நாடும் இலங்கையின் பிரச்சினையில் தலையிடக் கூடாது. அது தமிழ் மக்களுடைய இனப்பிரச்சினை சார்ந்த விடயமாக இருக்கலாம் அல்லது அபிவிருத்தி சார்ந்த விடயங்களாக இருக்கலாம் அல்லது பொருளாதார ரீதியான முன்னேற்றங்களாக இருக்கலாம். எதுவாக இருந்தாலும், இந்தியாவுக்குப் பிறகுதான் ஏனைய நாடுகள் என்ற நிலைமை இருக்கின்றது. அதாவது, India first - இந்தியாவுக்குத்தான் முதல் இடம். இந்தியாவை மீறி இங்கு எதுவுமே அசையாது என்ற நிலைமை இருக்கின்றது. இதுதான் உண்மை! இதுதான் யதார்த்தம்! இதைப் புரிந்துகொள்ள வேண்டும். ஆகவே, இப்படியான ஓர் அயல் நாட்டின் முக்கியஸ்தர் வரும்போது, அதற்கு எதிராக கருத்துகள் சொல்வதை அல்லது அதைச் சந்தேகிப்பதை நிறுத்திக்கொள்ள வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, ஊடகவியலாளர் தம்பித்துரை பிரதீபனின் அச்சுவேலிப் பகுதியிலுள்ள வீட்டை வன்முறைக் கும்ப லொன்று தாக்கியிருக்கிறது. அதுமாத்திரமன்றி, அவருடைய வீட்டிலிருந்த வாகனம் மற்றும் ஏனைய உடைமைகளுக்கு சேதம் ஏற்படுத்தப்பட்டிருக்கிறது. இதனால் ஏறக்குறைய 15 இலட்சம் ரூபாய் பெறுமதியான சொத்து இழப்பு ஏற்பட்டிருக் கிறது. இந்த நாட்டில் ஊடகவியலாளர்கள் தாக்கப்படுகின்ற சம்பவங்கள் தொடர்ந்துகொண்டுதான் இருக்கின்றன. பிரதேச ரீதியாகவோ, இன ரீதியாகவோ அல்லாமல், கடந்த காலங்களைப்போல் இப்பொழுதும் ஊடகவியலாளர்கள் தொடர்ச்சியாகத் தாக்கப்பட்டுக்கொண்டு இருக்கின்றார்கள். கருத்துகளைக் கருத்துக்களால் தோற்கடிக்க முடியாதவர்கள், தங்களுடைய விருப்பத்துக்கு மாறாகச் செயற்படுகின்றவர் களை அல்லது தங்களுடைய கருத்துகளுக்கு மாற்றமான கருத்துகளைத் தெரிவிப்பவர்களைத் தாக்குகின்ற மிக மோசமான இழிசெயல் தொடர்ந்தும் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. இது உடனடியாக நிறுத்தப்பட வேண்டும்; அதற்குரிய நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். ஊடகவிய லாளர்கள் மீது தாக்குதல் நடத்துபவர்களுக்கு அதியுச்ச தண்டனை வழங்கப்பட வேண்டும். இவ்வாறான செயல்களில் ஈடுபடுபட்ட சிலர் கைதுசெய்யப்பட்டு, பிணையில் விடுவிக்கப் பட்டு இருக்கிறார்கள் என நான் நினைக்கின்றேன். உண்மை யான குற்றவாளிகளுக்கு அதியுச்ச தண்டனை வழங்கப்பட வேண்டுமென நான் இந்த நேரத்தில் மீண்டும் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

பெண்கள் சம்பந்தமான விடயம் இன்றைய விவாதத்தின் கருப்பொருளாக இருக்கின்றது. இன்று இச்சபையில் பெண் களின் வலுவூட்டல் சட்டமூலம் நிறைவேற்றப்பட இருக்கின் றது. எல்லாத் துறைகளிலும் பெண்களின் பிரதிநிதித்துவம் இருக்க வேண்டும். பாராளுமன்றத்தில் பெண்களின் பிரதிநிதித் துவத்தை அதிகரிப்பது தொடர்பான முன்மொழிவொன்று கௌரவ சுதர்ஷினி பர்னாந்துபுள்ளே அவர்களைத் தவிசாள ராகக் கொண்ட பெண் பாராளுமன்ற உறுப்பினர்களின் ஒன்றியத்தால் கொண்டுவரப்பட்டிருப்பதாக நாங்கள் அறிகின்றோம். தேசியப் பட்டியலில் 50 சதவீத ஒதுக்கீடு பெண்களுக்கு வழங்கப்பட வேண்டுமென்ற நியாயமான கோரிக்கை முன்வைக்கப்பட்டு இருக்கின்றது. உண்மையிலே இது ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு முன்மொழிவாகும். விகிதாசார அடிப்படையில் அமைந்த பாராளுமன்றத் தேர்தலில் போட்டியிடுகின்ற அரசியல் கட்சிகளாக இருக்க லாம் அல்லது சுயேட்சைக் குழுக்களாக இருக்கலாம், எதுவாக இருந்தாலும் தேசியப் பட்டியலில் 50 சதவீதத்தைப் பெண்களு க்கு வழங்க வேண்டும். இதனூடாக பாராளுமன்றத்தில் பெண்களின் பிரதிநிதித்துவத்தை இயலுமானவரை உறுதிப் படுத்த முடியும். இது பெண்களுக்குக் கொடுக்கின்ற அதியுச்ச கௌரவமாகும். அதேபோல், உள்ளூராட்சி மன்றத் தேர்தல் வேட்பாளர் பட்டியலில் பெண்களுக்கான ஒதுக்கீடானது, 50 சதவீதமாக அதிகரிக்கப்பட வேண்டும்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

ගරු සු. නෝගරාදලිංගම් මහතා
(மாண்புமிகு சு. நோகராதலிங்கம்)
(The Hon. S. Noharathalingam)
Give me one more minute, Sir.

முன்பள்ளிகளில் ஆசிரியர்களாக இருப்பவர்கள் பெண் களே! அவர்கள் அர்ப்பணிப்புடன் சேவை செய்து கொண்டு இருக்கின்றார்கள். எனினும், அவர்களை நிரந்தரமாக ஆசிரியர் சேவைக்குள் உள்வாங்காத நிலைமை தொடர்ந்துகொண்டு இருக்கின்றது. அவர்களுக்கு உரிய ஊதியம் வழங்கப்படுவ தில்லை. அதுமாத்திரமன்றி, அவர்களுக்கு ஓய்வூதியமும் இல்லை. இவ்வாறு அவர்கள் புறக்கணிக்கப்படுகின்றார்கள். அவர்கள் ஒரு தாதி போன்று செயற்பட்டு, சிறார்களுக்கான ஆரம்பக் கல்வியை வழங்கிக்கொண்டு இருக்கின்றார்கள். அவர்கள் ஆற்றுகின்ற சேவையின் முக்கியத்துவத்தை நாங்கள் உணராமல் இருந்துகொண்டு இருக்கின்றோம். அவர்களுக்கு உரிய கௌரவம் வழங்கப்பட வேண்டும்; அவர்கள் நிரந்தர சேவையில் இணைத்துக் கொள்ளப்பட வேண்டும்; அவர்களுக் கான ஓய்வூதியம் வழங்கப்பட வேண்டும். பெண்களுக்கான கௌரவம் முன்பள்ளி ஆசிரியர்கள் ஊடாக வழங்கப்பட வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின் றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Jayantha Weerasinghe. You have 11 minutes.

[අ.භා. 1.09]

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉතා වැදගත් පනත් කෙටුම්පත් දෙකක් ගැන සාකච්ඡා වෙනවා. මම මුලින්ම බලාපොරොත්තු වෙනවා, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත ගැන කථා කරන්න. ඒකේ මාතෘකාවෙන්ම තේරෙනවා, මොහොතරම් වැදගත් ක්‍රියා පටිපාටියක්ද ඒකෙන්

ස්ථාපිත වෙන්නේ කියන එක. එම නිසා කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත මේ අවස්ථාවට බොහොම කාලෝචිත පනත් කෙටුම්පතක් හැටියට පෙන්වන්න පුළුවන්. මේකට නීතිපති අනුමැතිය ලැබුණා. ඊට පස්සේ ඒක කෙටුම්පත් කරන්න යැව්වා. බොහොම මෑතකදී 2024.02.22වැනි දා නීතිපති නිෂ්කාසන සහතිකයත් ලැබුණා. ඒකත් ලැබුණා. ඒ අනුව තමයි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන්නේ.

මේ පනත් කෙටුම්පත අධ්‍යයනය කරලා බලනකොට පැහැදිලිව පෙනෙනවා, ස්ත්‍රී පුරුෂ භේදයක් නැතුව සමාජ සමානාත්මතාව ඇති කරන්න මේ පනත් කෙටුම්පතෙන් පැහැදිලිව කටයුතු කර තිබෙන බව. මම හිතනවා, ලංකාවේ පළමුවැනි සැරේට වෙන්න ඕනෑ, කාන්තාවන් පිළිබඳව, ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව ජාතික කොමිෂන් සභාවක් පත් කරන්න යෝජනා වුණේ කියලා. කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරන්න පත් කරන ජාතික කොමිෂන් සභාව පිහිටුවීම පිළිබඳව මේ පනත් කෙටුම්පතේ තුන්වැනි වගන්තියෙන් ඔබබට සඳහන්ව තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ පූර්විකාව බැලුවොත් පැහැදිලිවම පෙනෙනවා, මේ පනත් කෙටුම්පත කාන්තා අභිවෘද්ධියට මොනතරම් කැප වෙච්ච පනත් කෙටුම්පතක්ද කියන එක.

මානව හිමිකම් පිළිබඳ විශ්වීය ප්‍රකාශනය මඟින් වෙනස්කොට නොසැලකීමේ මූලධර්මය තහවුරු කරනු ලබන හෙයින් සහ සියලු මිනිස් ප්‍රජාව නිදහස් සහ සමාන අභිමානයකින් සහ අයිතිවාසිකම් සහිතව උපත ලබන බවට සහ ඒ නිසාම ස්ත්‍රී පුරුෂභාවය කියලා වෙනසක් ඇති කරලා කාන්තාවට අඩුලුහුඩුකමක් ඇති වෙන්න ඉඩ නොතබන බව තමයි මේ පනත් කෙටුම්පතෙහි පූර්විකාවෙන්ම කියලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා, කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම, කොන් කිරීම, ලිංගික හිංසනය සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා පියවර ගැනීම සහ ඊට අදාළ ක්‍රියා හෝ නොකරහැරීම් සම්බන්ධයෙන් නඩු පැවරීම සහ දඬුවම් කිරීම සඳහා ක්‍රමයක් ශක්තිමත් කිරීම ගැන.

ජනාධිපති නීතිඥවරු හැටියට අපි දන්නවා, කාන්තාවන් මොනතරම් ප්‍රශ්නවලට මැදි වෙනවාද කියන එක. එහෙම ප්‍රශ්නවලට මැදි වුණාම නීතියේ පිළිසරණක් හොයාගන්න අමාරුවෙන් නොයෙක් කටුක අත්දැකීම්වලට ඔවුන් භාජන වෙනවා. මේ පනත් කෙටුම්පතෙහි මම කියවපු විකෙන් පැහැදිලිව පෙනෙනවා, අන්න එවැනි අවස්ථාවලදි පවා කාන්තාවගේ අයිතිවාසිකම් ස්ථාපනය කිරීමටත්, නෛතික අයිතිවාසිකම් පවා ඔවුන්ට ලබා දෙන්නටත් මේ තුළින් කටයුතු කර තිබෙන බව.

මේ පනත් කෙටුම්පතේ සඳහන් කර තිබෙන මේ කොටස් ටික සම්බන්ධව ඔබතුමන්ලාගේ අවධානය තවදුරටත් යොමු කරවන්න ඕනෑ. පනත් කෙටුම්පතේ 2වන වගන්තියේ (උ) හි මෙසේ සඳහන් වෙනවා:

"(උ) ආබාධ සහිත කාන්තාවන්ට විශේෂ සැලකිල්ලක් දක්වමින් කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය සවිබල ගැන්වීම තහවුරු කිරීම;"

මට මේක දැක්කාම හිතෙනවා, මෙච්චර කාලයක් මෙවැනි වැදගත් කරුණු කාරණාවලට අපේ අවධානය යොමු නොවුණේ මන්ද කියලා. මේ පනත් කෙටුම්පතෙන් ආබාධ සහිත කාන්තාවන්ට පවා සහන, සරණ සලස්වා තිබෙනවා. ඊළඟට 2වන වගන්තියේ (එ) හි මෙසේ සඳහන් වෙනවා:

"(එ) කාන්තාවන් සවිබල ගැන්වීමේ සියලු පැතිකඩවලට සම්බන්ධ පොදු අධ්‍යාපන වැඩසටහන් මෙහෙයවීම."

අන්න ඒ පදනම මත පිහිටුවලා තමයි 3වන වගන්තියෙන් යෝජනා කර තිබෙන කොමිසම පිහිටුවන්නේ. ඒ පත්වෙන කොමිසමේ අන්තර්ගතය මම මෙතැන කියන්න අවශ්‍ය නැහැ.

මම ඊළඟට මේ පනත් කෙටුම්පතේ තිබෙන ඉතා වැදගත් කාරණා කිහිපයකට අවධානය යොමු කරන්න කැමැතියි. පනත් කෙටුම්පතේ 5වන වගන්තියේ (ඊ) හි මෙසේ සඳහන් වෙනවා:

"(ඊ) කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමකට හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකට අදාළව නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක් විසින් සිය මෙහෙයවීමෙන් නඩු පැවරීම;"

මේකෙන් පැහැදිලිවම කියනවා, කාන්තාවකට ප්‍රශ්නයක් වුණොත් සුදුසු අධිකරණයක නඩු පවරන්න මේ කොමිසමට පුළුවන් කියලා.

ඊළඟට මේ කාරණයත් වැදගත් වෙනවා. පනත් කෙටුම්පතේ 5වන වගන්තියේ (උ) හි මෙසේ සඳහන් වෙනවා:

"(උ) උපරිමාධිකරණයක් විසින් හෝ වෙනත් යම් අධිකරණයක් විසින් සඳහන් කරනු ලැබ ඇති කාන්තා අයිතිවාසිකම්වලට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් එකී අධිකරණය විසින් විධානය කරනු ලැබිය හැකි යම් පියවර ගැනීම;"

කාන්තාවන්ගේ අභිවෘද්ධිය සඳහා පත් කරන කොමිසම හරහා අධිකරණ කටයුතුවලදී පවා කාන්තාවන්ට සහාය වීමට ප්‍රතිපාදන හදලා තිබෙනවා. තවදුරටත් මේකේ සඳහන් කරලා තිබෙනවා මේ කාරණයත්. පනත් කෙටුම්පතේ 5වන වගන්තියේ (ඔ) හි මෙසේ සඳහන් වෙනවා:

"(ඔ) කොමිෂන් සභාවේ ප්‍රාදේශීය සහ පළාත් කාර්යාල විවෘත කිරීම;"

මේවා එක පළාතකට, එහෙම නැත්නම් අගනුවරට විතරක් සීමා වෙච්ච කරුණු කාරණා නොවෙයි. සෑම පළාතකටම සුදුසු පරිදි ඒ කාර්යාල පිහිටුවීමට මේ කොමිසමට බලය තිබෙනවා. මම හිතනවා, මේක ඉතා සාධනීය වැදගත් පියවරක් කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කොමිසම හරහා කාන්තාවන්ගේ අයිතිවාසිකම් සඳහා ක්‍රියාත්මක වෙනකොට මෙන්න මේ කරුණු කෙරෙහි අවධානය යොමු කර තිබීමත් ඉතා වැදගත්. පනත් කෙටුම්පතේ 5වන වගන්තියේ (ඡ) හි මෙසේ සඳහන් වෙනවා:

"(ඡ) වෙනස් කොට සැලකීමට සහ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ කාන්තාවන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනයන් අතර සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් නීති ප්‍රතිපත්ති සහ භාවිතයන් ඇගයීම සහ අදාළ ආයතනයන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;"

අපි දන්නවා, කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරන්න පුළුවන් පොඩි පොඩි සංවිධාන තිබෙනවා කියලා. එවැනි සංවිධාන හවුල් කරගෙන තනිකරම කාන්තාවන්ගේ අභිවෘද්ධියට කටයුතු කරන්නට හැකිවන පරිදි මේ පනත් කෙටුම්පත සකස් කර තිබීම ලොකු සතුටක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ තිබෙන 16.(1) වගන්තිය බොහොම වැදගත්. මෙම පනත් කෙටුම්පතේ 16. (1) වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

"16. (1) ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක නඩු විභාගය අතරතුර උද්ගත වන, කාන්තා අයිතිවාසිකම්

[ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා]

උල්ලංඝනය වීමකට හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකට අදාළ යම් කරණක් පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සිදු කළ හැකි ය."

සාමාන්‍යයෙන් කියනවා නේ, "අතැන නඩුවක් තිබෙනවා, මෙතැන නඩුවක් තිබෙනවා, ඒ නිසා මොකුත් කරන්න බැහැ" කියලා. එවැනි තත්ත්ව නොසලකා හැර, නඩු පැවරිලා තිබෙනකොටත් කාන්තාවන් සඳහා කරන්න පුළුවන් කටයුතු කිරීමේ සම්පූර්ණ බලය මේ පනත යටතේ පිහිටුවන කොමිෂන් සභාවට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ ඉතා වැදගත් කොටසකට ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට ඕනෑ. මෙහි 25වැනි වගන්තිය (1) (ඇ) යටතේ මෙසේ සඳහන් වෙනවා:

"සාක්ෂි ආඥාපනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් සාක්ෂියක් ප්‍රශ්නගත ආරවුල සඳහා වැදගත් වන්නේ නම්, සිවිල් හෝ අපරාධ නඩුවල පිළිගැනීමට නොහැකි විය හැකි එකී සාක්ෂිය ලිඛිතව හෝ වාචිකව පිළිගැනීම; සහ"

අපි දන්නවා ජනාධිපති නීතිඥවරු, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)
Sir, I will wind up as soon as I can. Please give me just a few moments.

සාක්ෂි ආඥාපනතේ යම් වගන්ති තිබෙනවා. එතකොට කියනවා, "මේ සාක්ෂිය ගෙනෙන්න බැහැ" කියලා. එවැනි දේවල් අබිබවා ගොස් කාන්තා අභිවෘද්ධිය සඳහා ගතයුතු සියලු පියවර ගන්න මේ පනතින් ප්‍රතිපාදන සලස්වා තිබෙනවා.

මගේ අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. (Dr.) (Ms.) Harini Amarasuriya. You have eight minutes.

[අ.භා. 1.21]

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
ගරු නියෝජ්‍යය කාරක සභාපතිතුමනි, අද දින විවාදයට ගන්නා කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත පිළිබඳව ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ දීර්ඝ වශයෙන් සාකච්ඡා වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වූ සංශෝධන කිහිපයක් Committee Stage එකේ දී ඉදිරිපත් කරන්නත් අපි බලාපොරොත්තු වනවා. නමුත්, කිසි තර්කයක් නැහැ. මේක අවශ්‍ය පනතක්. ඒක හරියට සිද්ධ විය යුතුයි කියන ස්ථාවරයේ තමයි අපි ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අද මේ කාරණය සම්බන්ධයෙන් කථා කරන්න අවශ්‍යයි. මේ කාලය තුළ ආණ්ඩුව ක්‍රියාත්මක කරන පනත් කෙටුම්පත් ක්‍රියාවලිය තුළින් අර්බුද රාශියක් රට තුළ නිර්මාණය කරමින් යනවා. විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව පිළිබඳ පනත් කෙටුම්පත මේකට හොඳම උදාහරණයක්.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඉතාම උද්ධච්ච විධියට විධායක බලය පාවිච්චි කරමින්, නිසි සංවාදයක් නැතිව, මෙවැනි සංවේදී මාතෘකා පිළිබඳ අවශ්‍ය සමාජ සංවාදය ගොඩ නඟන්නේ නැතිව එතුමාගේ කුඩා කණ්ඩායමක් විසින් මේ පනත් කෙටුම්පත් සකස් කර ඉදිරිපත් කිරීම තුළින් අර්බුද රාශියක් නිර්මාණය කර තිබෙනවා. එකක්, ජනතා වරමක් නැති විධායක ජනාධිපති කෙනෙක් මේවා ඉතාම පරිස්සමෙන් ඉදිරිපත් කළ යුතුයි කියන එක එතුමා තේරුම් ගත යුතුයි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ සංකල්ප පිළිබඳ ඇති තරම් සංවාදයක් ආණ්ඩුව තුළවත් ඇති වෙලා තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. ඒ වෙනුවෙන් කථා කරන අයවත් ඒ පිළිබඳව හරියට කථා කළා ද කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසාම තමයි ඒ පනත් කෙටුම්පත දුර්වල පනත් කෙටුම්පතක් වෙන්නේ. එහි තිබෙන වාක්‍ය, එහි තිබෙන වගන්ති දුර්වලයි. ඒ වාගේම පැහැදිලි නැහැ. ඒ නිසා තමයි මේ පනත් කෙටුම්පත උසාවියේ දී අභියෝගයට ලක් වනකොට උසාවිය මේ විධියේ තීරණයකට එන්නේ. එවැනි vague සහ දුර්වල legislations ඉදිරිපත් කළාම අධිකරණය හැටියට ඒකට ස්ථාවරයක් ගත්තාම, අධිකරණයට බැණලා හෝ අධිකරණය ප්‍රතික්ෂේප කරලා විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි, මේක.

අනෙක් එක, මෙතැන තව කාරණයක් තිබෙනවා. මේ විධියට දුර්වල කෙටුම්පත් ඉදිරිපත් කිරීම තුළින්; ප්‍රතික්ෂේප වන මට්ටමේ දුර්වල පනත් කෙටුම්පත් ඉදිරිපත් වීම තුළින්, ආරක්ෂා විය යුතු කණ්ඩායම් තවත් අවදානමකට පත් කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අද සිද්ධ වෙලා තිබෙන්නේ, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතා දරන කොටස්, පුද්ගලයන් තවත් අවදානමකට පත් වෙලා තිබෙන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතා පිළිබඳව මේ වනකොටත් ඉතා අවාසනාවන්ත විධියට ප්‍රතිගාමී සහ ඍණාත්මක සංවාදයක් සමාජය තුළ නිර්මාණය වෙලා තිබෙනවා. ඒ ගැන සමාජය තුළ ක්‍රමානුකූලව ගොඩනැඟිය යුතු ශිෂ්ටසම්පන්න සංවාදය වෙනුවට ඉතාම ඍණාත්මක සංවාදයක් ඇති කරලා තිබෙනවා. ඒකට වුවමනා කොන්දේසි දැන් මෙම පනත් කෙටුම්පත තුළින් නිර්මාණය වෙලා තිබෙනවා. මැතිවරණයක් කිට්ටු කරගෙන මෙවැනි සංවේදී පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම නිසා, සමහර පුද්ගලයන් මේ තුළින් මැතිවරණයට වාසි ලබා ගැනීම සඳහාත් ඉතාම අවාසනාවන්ත විධියට මැදිහත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාව කියන එක විද්‍යාත්මකව සහ සමාජ විද්‍යාව තුළිනුත් පිළිගත්ත සංකල්පයක්. ඒ නිසා අපේ අධිකරණය තුළත්, අපේ

ව්‍යවස්ථාදායකය තුළත් මේ පිළිබඳව කථා බහක්, දියුණු සාකච්ඡාවක් ඇති වීම අවශ්‍යයි. නමුත්, ඒ විවාදය හෝ සංවාදය ක්‍රමානුකූලව සහ දැනුවත්භාවය තුළින් සිදු විය යුතුයි. නමුත් සාකච්ඡා නොකර, ඇත්තටම අපේ Sectoral Oversight Committee on Children, Women and Genderහි අදහස්වත් නැතිව මේ විධියට හදිසියේ දුර්වල පනත් කෙටුම්පත් ඉදිරිපත් කරලා, ඊට පස්සේ අධිකරණයෙන් ඒවා ප්‍රතික්ෂේප වුණාම අධිකරණයට දොස් කියලා හරියන්නේ නැහැ. ඒකට අධිකරණයට වග කියන්න බැහැ. එහෙම නම් ඒ කෙටුම්පත් හරි විධියට ඉදිරිපත් විය යුතුයි. ඇත්තටම ජනාධිපති මේකට ප්‍රතිචාරයක් හැටියට යෝජනා කරනවා, විශේෂ කාරක සභාවක් - Select Committee එකක් - පත් කරලා මේ Supreme Court Determination එක විභාග කළ යුතුයි කියලා. ඒක අතිශයින්ම භයානක පියවරක්. අපි නම් කිසිසේත්ම හිතන්නේ නැහැ, ඒ විශේෂ කාරක සභාව පත් කරන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව පිළිබඳව තිබෙන ආකල්පයක් නිසා හෝ එම පනත් කෙටුම්පත ගැන තිබෙන ආකල්පයක් නිසා කියලා. එම පනත් කෙටුම්පත පිළිබඳව තිබෙන අවධානය හෝ උනන්දුව නිසා නොවෙයි, මේ විධියට විශේෂ කාරක සභාවක් පත් කිරීමේ යෝජනාවක් ජනාධිපති ඉදිරිපත් කරන්නේ. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වන විධිය සහ Supreme Court Determination එකට ජනාධිපතිගේ ප්‍රතිචාරය අනුව අපට ඉතා සාධාරණ සැකයක් මේ වනකොටත් මතු වනවා, එම පනත් කෙටුම්පත පාවිච්චි කරන්නේත් වෙන මොකක් හෝ සැලැස්මක් වෙනුවෙන්ද කියලා. මොකද, අධිකරණයෙන් එන Determinations ගැන පාර්ලිමේන්තුවේ අදහස හරියට විමසන්න හෝ පාර්ලිමේන්තුවේ බලය පිළිබඳව ජනාධිපති එච්චර උනන්දු නම්, මීට පෙරත් පාර්ලිමේන්තුවේ අදහස්වලට පටහැනි, නොගැළපෙන Determinations ආපු අවස්ථා ඕනෑ තරම් තිබිලා තියෙනවා. හැබැයි, ඒ අවස්ථාවල දී මේ ස්ථාවරය ජනාධිපති ගත්තේ නැහැ. උදාහරණයක් හැටියට ගනිමු EPF Act එක. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරනකොට ආපු ඒ Determination එක පාර්ලිමේන්තුවේ විවාදයට ලක් වුණා. නමුත් එතැනදී ජනාධිපති ඉදිරිපත් වුණේ නැහැ, ඒ Determination එක ගැන පාර්ලිමේන්තුවේ අදහස් සලකා බැලිය යුතුයි කියලා. ඊටත් එහා උදාහරණ තිබෙනවා. ඇත්ත වශයෙන්ම Online Safety Bill එක අධිකරණයෙන් දුන්න නියෝගවලටත් පටහැනිව තමයි draft වුණේ. ගරු ටිරාන් අලස් ඇමතිතුමා පොරොන්දු වුණා, සතියක් ඇතුළත Amendments ගෙනෙනවා කියලා. නමුත් අද වන කල් ඒ Amendments ගෙනැල්ලා නැහැ. එම නිසා අධිකරණය දුර්වල කරන, අධිකරණය අභියෝගයට ලක් කරන තීරණ අරගෙන ව්‍යවස්ථාව සහ අධිකරණය අතර සටිටනයක් ඇති කරන්නේ මොන හේතුවක් නිසා ද කියලා අපට බරපතළ සැකයක් ඇති වෙලා තිබෙනවා. මේක අභිංසක දෙයක් නොවෙයි. මේක

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

අතිශයින්ම උද්ධච්ච, අත්තනෝමතික හා ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවක්. එය පාර්ලිමේන්තුවත්, අධිකරණයත් අතර සටිටනයක් ඇති කරන්න ගන්න උත්සාහයක් කියන එක අපට නම් පැහැදිලියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have 10 minutes.

[பி.ப. 1.29]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Chairman of Committees, இன்றைய தினம் இச்சபையில் women empowerment சம்பந்தமான மிக முக்கியமானதொரு சட்டமூலம் மீதான விவாதம் நடைபெற்றுக் கொண்டு இருக்கின்றது. இந்த நாட்டில் யுத்தம் முடிவடைந்து 15 வருடங்கள் பூர்த்தியாகியுள்ள நிலையில், எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங்களில் யுத்தத்தால் பாதிக்கப்பட்ட பெண்களுக்கென இதுவரை விசேட வேலைத்திட்டம் எதுவும் நடைமுறைப்படுத்தப்படவில்லை. குறிப்பாக, கணவனை இழந்த பெண்களின் வாழ்வாதாரத்தைக் கட்டியெழுப்பக்கூடிய எந்தவொரு வேலைத்திட்டத்தையும் நாங்கள் இதுவரைக்கும் காண முடியாத ஒரு சூழலிலே இருக்கின்றோம். மிக முக்கியமாக, காணாமல் ஆக்கப்பட்டவர்களுடைய உறவுகள் வருடக் கணக்கில் ஆர்ப்பாட்டத்தில் ஈடுபடுகின்றார்கள். பெண்களை வலுவூட்டல் சம்பந்தமான சட்டமூலங்களைக் கொண்டு வருவது போல, வடக்கு, கிழக்கில் யுத்தத்தால் பாதிக்கப்பட்ட பெண்களுக்கென ஒரு விசேட திட்டத்தை எதிர்வரும் காலங்களில் அரசாங்கம் முன்னெடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

கடந்த வாரம் மட்டக்களப்பு மாவட்டத்தில் பெண் ஒருவரைக் குறிவைத்து நடந்த சம்பவம் பற்றி இந்தச் சபையில் சொல்லலாமென நினைக்கின்றேன். 14.06.2024 அன்று காத்தான்குடியைச் சேர்ந்த ஸித்தீக் ஷிபானி என்ற பெண்மீது துப்பாக்கிச் சூடு நடத்தப்பட்டது. ஐந்து நாட்களுக்கு முன்னர் நடந்த இந்தச் சம்பவம் பற்றி "Shakthi TV"ஆனது, "காத்தான்குடியில் துப்பாக்கிச் சூடு நடத்திவிட்டு தப்பி ஓடிய நபர்" என்ற தலைப்பில் அதன் CCTV காட்சியை வெளியிட்டிருந்தது. மட்டக்களப்பு மாவட்டத்தில் இராணுவப் புலனாய்வுத்துறையுடன் சம்பந்தப்பட்ட Tripoli Platoon தொடர்ச்சியாக இவ்வாறான விடயங்களைச் செய்து வருகின்றது. இந்த Tripoli Platoonக்கு 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலுடன் என்னென்ன தொடர்புகள் இருந்தன என்பது பற்றி நான் பல தடவை இந்தச் சபையில் சொல்லியிருக்கின்றேன். கடந்த ஏப்ரல் மாதம் 25ஆம் திகதிய என்னுடைய பாராளுமன்ற உரையில், இந்த Tripoli Platoon பற்றி மிக விளக்கமாகச் சொல்லியிருக்கிறேன். 2008ஆம் ஆண்டு சாந்தன் என்ற தமிழ் மக்கள் விடுதலைப் புலிகள் கட்சியின் ஆரையம்பதிப் பொறுப்பாளர் எவ்வாறு சுடப்பட்டார்? என்பது பற்றியும் அதற்குப் பின்னணியில் 'பொலிஸ் பாயிஸ்', ஸித்தீக் மற்றும் இப்போது ஹுசைன் என்னும் பெயரில் முஸ்லிமாக மாறியிருக்கின்ற குகன் ஆகியோர் இருப்பது பற்றியும் மிகத் தெளிவாகச் சொல்லியிருந்தேன். ஆனாலும், இதுவரை இந்த விடயம் தொடர்பில் எந்தவொரு விசாரணையும் ஆரம்பிக்கப்படவில்லை. இந்த நிலையில், அண்மையில் மீண்டும் காத்தான்குடியில் துப்பாக்கிச் சூட்டுச் சம்பவமொன்று நடந்திருக்கிறது. இந்த விடயம் பற்றி சிங்கள மொழியில் சொன்னால்தான், சிங்கள மக்களுக்குப் புரியும். இந்த நாட்டில் இராணுவப் புலனாய்வுத் துறையுடன் சம்பந்தப்பட்டவர்களுக்கு எவ்வாறு அரசாங்கம் பாதுகாப்பு வழங்குகின்றது என்பதை சிங்கள சமூகமும் அறிந்துகொள்ள வேண்டும். அதனால் இந்த விடயத்தைச் சிங்கள மொழியில் சொல்லலாமென நினைக் கின்றேன்.

පසුගිය 14වැනි දා කාත්තන්කුඩිවලදී සිද්දික් ෂිහානි කියන කාන්තාව වෙඩි තබා ඝාතනය කරන්න උත්සාහ කරලා තිබෙනවා. කාත්තන්කුඩිවලට කණ්ඩායමක් ගිහිල්ලා උදේ 10.30ට සිද්දික් ෂිහානි කියන කාන්තාවට වෙඩි තියන්න උත්සාහ කරලා

[ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

තිබෙනවා. ඒ අවස්ථාවේ ඔවුන්ට ඉලක්කය miss වෙලා තිබෙනවා. ඊට පසුව තුවක්කුවෙන් ඒ කාන්තාවගේ ඔළුවට පහර දීලා තිබෙනවා. ඊට පසුව මේ කාන්තාව මඩකලපුව රෝහලට ඇතුළත් කරලා තිබෙනවා.

මම පසුගිය අවුරුද්ද තුළ Tripoli Platoon කියන කණ්ඩායමට පාස්කු ප්‍රහාරයත් එක්ක තිබුණු සම්බන්ධතා මොනවාද කියන එක, Tripoli Platoon කණ්ඩායම 2004 වසරේ සිට ලසන්ත වික්‍රමතුංග, ප්‍රගීත් එක්නැලිගොඩ, ජෝසප් පරරාජසිංහම් වැනි අයගේ ඝාතනවලට සම්බන්ධ වෙච්ච හැටි දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේදී කියලා තිබෙනවා. ඒවා පිළිබඳව කිසිදු පරීක්ෂණයක් මේ වනතුරු කරලා නැහැ. මම 2024.04.25වැනි දා ඉතා පැහැදිලිව මේ කණ්ඩායම පිළිබඳව මේ පාර්ලිමේන්තුව තුළ කිව්වා. දැනට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් ඉන්නවා. ආරයම්පති ප්‍රදේශයේ තිබෙන TMVP - තමිල් මක්කල් විඩුදලෙයි පුලිගල් කියන පක්ෂයේ - office එක භාරව හිටපු ඝාන්තන් කියන පුද්ගලයාට එකම දවසේ වාර 22කදී වෙඩි තියන්න උත්සාහ කරලා පසුව කාත්තන්කුඩිවල සපත්තු කඩයක් අස්සේදී වෙඩි තබා තිබෙනවා.

මේ වෙඩි තැබීමට සම්බන්ධ වෙච්ච අය කවුද කියලා මම ඒ අවස්ථාවේ මේ පාර්ලිමේන්තුව තුළ කිව්වා. හමීඩ් ලෙබ්බේ මොහොමඩ් සහීඩ් කියන පුද්ගලයායි, පොලිස් ෆායිස් කියන පුද්ගලයායි, කුහන් කියන පුද්ගලයායි ගැන මම මේ පාර්ලිමේන්තුවේදී සඳහන් කළා. ඒ අවස්ථාවේ මම මේ කුහන් කියන පුද්ගලයාගේ National Identity Card number එකත් කියලා, දැන් මේ කුහන් කියන පුද්ගලයා "හුසේන්" නමින් මුස්ලිම් ජාතිකයෙකු බවට මාරු වෙලා ඉස්ලාම් ආගම අදහමින් ඉන්න පුද්ගලයෙක් කියලාත් කිව්වා. මම මේ පාර්ලිමේන්තුවේදී එහෙම ප්‍රකාශ කළාට පස්සේ මේ හුසේන් කියන පුද්ගලයා මානව හිමිකම් කොමිසම, UN එක වැනි ගොඩක් තැන්වලට ගිහින් ප්‍රකාශ කරලා තිබෙනවා, 2008දී සිදු වූ ඝාන්තන්ට වෙඩි තැබීමට ඔහුගේ සම්බන්ධයක් නැහැ කියලා. හැබැයි, මේ වෙඩි තැබීමට සම්බන්ධ වෙලා හිටපු අය වෙන්නේ පොලිස් ෆායිස් සහ හමීඩ් ලෙබ්බේ මොහොමඩ් සහීඩ් කියලා. 2024 ජූනි මාසයේ 14වැනි දා සිද්දික් ෂිෆානි කියන කාන්තාවට උදේ 10.30ට කාන්තන්කුඩිවලදී වෙඩි තබන්න ගිහිල්ලා දැනට පොලිස් අත්අඩංගුවේ -arrest කරලා- ඉන්නේ මම එදා සඳහන් කරපු මොහොමඩ් සහීඩ් කියන පුද්ගලයා තමයි. අවශ්‍ය නම් ඔහුගේ National Identity Card number එකත් ලබා දෙන්න අපට පුළුවන්. ඔහු දැන් පොලීසිය භාරයේ ඉන්නවා. හැබැයි, ඔහුගෙන් ප්‍රශ්න කරන්න විධියක් නැහැ කියලා කියනවා. මොකද, පොලීසිය ඔහු අත්අඩංගුවට ගන්න යනකොට ඔහුගේ ඔළුවට යකඩ පොල්ලකින් පහර දීමක් සිදු කරපු නිසා දැනට ඔහුගෙන් කටඋත්තරයක් ගන්න බැහැ කියලා සඳහන් කරලා තිබෙනවා. මේ පුද්ගලයා කාත්තන්කුඩිවල හිටපු ප්‍රාදේශීය ලේකම් කෙනෙකු වූ ෆලීල් කියන පුද්ගලයාත් පසුගිය කාලයේ ඝාතනය කරලා තිබෙනවා. මේ කණ්ඩායම පැහැදිලිවම බුද්ධි අංශත් එක්ක අවුරුදු ගණනක් තිස්සේ වැඩ කරන කණ්ඩායමක්. මේ වෙඩි තැබීම කරන්න ගියේ මොකටද කියලා අපි දන්නේ නැහැ. මේ වෙඩි තැබීම කරන්න හේතුව මොකක්ද කියන එකත් අපි දන්නේ නැහැ. හැබැයි, උදේ 10.30ට කාන්තන්කුඩිවල සිදු වූ මෙම සිද්ධියේ CCTV දර්ශන තිබෙනවා. බැම්මක් උඩින් පැනලා ගිහිල්ලා වෙඩි තියලා යන්න හදන හැටි CCTV දර්ශනවල තිබෙනවා. ඉතින්, අපි කියන මේ දේවල් ගැන ප්‍රශ්න කරන්නේ නැතිව මේ ආණ්ඩුව බලාගෙන ඉන්නවාද? තව කොච්චර කාලයක් මේ රටේ ඉන්න ජනතාව අනතුරේ දමනවාද? බුද්ධි අංශයත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරපු අය ආරක්ෂා කරන්න ඕනෑ නිසා මේ කණ්ඩායම් තව කොච්චර මිනී මැරුම් කරනකම් බලාගෙන ඉන්නවාද? මම හිතනවා, මේ නිසා මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන්ගේත් ජීවිත අවදානමේ තිබෙනවා කියලා. මහ දවල් කෙනෙකුට වෙඩි තියලා පැනලා යන්න පුළුවන් නම් මොකක්ද මේකේ තේරුම?

ඊට අමතරව මේ කුහන් කියන පුද්ගලයා නැත්නම් හුසේන් - මම දන්නේ නැහැ, ඔහුගේ ඇත්ත නම මොකක්ද කියලා- කියන පුද්ගලයා පිළිබඳව මම 2024.04.25වැනි දින මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළාට පසු ඔහු UN එකට ගිහින් තිබෙනවා. මම දන්නේ නැහැ, ඔහු තව කොයි කොයි තැන්වලට ගියාද කියලා. අපි සතුව ඒ සමහර සටහන් තිබෙනවා. ඔහු දැන් කටඋත්තර දීලා තිබෙනවා. 2008දී T-56 අවියෙන් වෙඩි තියපු එක ගැන, ඒ වෙඩි තැබීම කළාට පසුව පොලිස් ෆායිස්, කුහන් නැත්නම් හුසේන් නැත්නම් මේ සහීඩ් - මේ වෙඩි තැබීමට සම්බන්ධ තුන්දෙනා - ඒ වෙඩි තැබීම සිදු වෙච්ච ආකාරය පිළිබඳව - කොතැන ඉඳන්ද වෙඩි තිබ්බේ, කොහොමද ඒක plan කළේ - මානව හිමිකම් කොමිසම ඉදිරියේ කථා කරන්න ලෑස්තියි. ඔවුන් කථා කරපු වීඩියෝ පටත් අප සතුව තිබෙනවා. ඝාන්තන් කියන පුද්ගලයා අපාවි මෝටර් බයිසිකලයෙන් ආ හැටි, ඔහුට වෙඩි තියපු හැටි, සල්ලි ගත්ත හැටි, ඔහුගේ ඉණේ තිබුණු පිස්තෝලය ගත්ත හැටිත් කියලා තිබෙනවා. මීට කලින් 2004-2005 කාලයේදී ජෝසප් පරරාජසිංහම් කියන මඩකලපුවේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට වෙඩි තබා ඝාතනය කිරීමට සම්බන්ධ වෙච්ච කණ්ඩායම තමයි මේ කණ්ඩායම. මේ Tripoli Platoon කියන කණ්ඩායම ඇතුළේ ඉන්න අය තමයි මේ මිනී මැරුම්වලට සම්බන්ධ වුණේ.

ඒ තුවක්කුවයි, දැන් පාවිච්චි කරන තුවක්කුවයි දෙකම එකක්ද කියන්නත් අපි දන්නේ නැහැ. ඒ වාගේ ඉතා බැරෑරුම් ප්‍රශ්නයක් අද රට තුළ තිබෙනවා. අපි පාස්කු ඉරුදින ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණයක් ඉල්ලනවා. "කුකුල් වමින්ද" කියලා පුද්ගලයෙක් දරුවෙකුට කනට පහර ගහපු එකට ඔහුව arrest කරලා, ප්‍රශ්න කරලා දඬුවම් දෙනවා. අනිවාර්යයෙන්ම ඔහුට දඬුවම් දෙන්න ඕනෑ. දරුවන්ට එවැනි දෙයක් කළ කෙනෙකුට ඊට වඩා වැඩි දඬුවම් දෙන්න ඕනෑ. හැබැයි, "කුකුල් වමින්දට" එරෙහිව පරීක්ෂණ පවත්වලා අත්අඩංගුවටත් ගන්න පුළුවන් රටක, මෙච්චර බැරෑරුම් දේවල් අපි පාර්ලිමේන්තුවේ හෙළිදරව් කරලාත්, මෙච්චර බැරෑරුම් දේවල් අපි පාර්ලිමේන්තුව ඇතුළේ කියලාත් අද වෙනතුරු ඒ පිළිබඳ පරීක්ෂණයක් නැත්තේ ඇයි? මම මේ කියන හමීඩ් ලෙබ්බේ මොහොමඩ් සහීඩ් කියන පුද්ගලයා මේ වන විට පොලිස් අත්අඩංගුවේ ඉන්නේ. හැබැයි, ඔහු පහර කෑමකට ලක් වෙලා තිබෙන නිසා ඔහුගෙන් ප්‍රශ්න කරන්න බැහැයි කියනවා. ඔහු කාගේ වුවමනාවටද වෙඩි තියන්න ගියේ, ඔහු අත් අඩංගුවට ගන්න ගිය වෙලාවේ පහර දුන්නේ ඔහු ඊට පස්සේ කථා කරන්න ඕනෑ නැති නිසාද? මේක ඉතා බැරෑරුම් ප්‍රශ්නයක්.

මා ළඟ ලිපියක් තිබෙනවා. ඒ ලිපිය මට දීලා තිබෙන්නේ කාත්තන්කුඩිවල ඉන්න මොහොමඩ් තම්බි උවයිස් කියන පුද්ගලයා. මොහොමඩ් තම්බි උවයිස් කියන පුද්ගලයා ජනාධිපති කොමිසම ඉදිරියට ගිහිල්ලා, බුද්ධි අංශත් එක්ක එකතු වෙලා මේ මිනී මැරුම්වලට - ඝාතනවලට - සම්බන්ධ වෙච්ච අය පිළිබඳ ප්‍රකාශ රාශියක් දීලා තිබෙනවා. Presidential Commission එක ඉස්සරහට ගිහිල්ලා ඔහු ඒ තොරතුරු දීලා තිබෙනවා. Thusitha Halloluwa, Director-General - Public Relations ජනාධිපති ලේකම් කාර්යාලයට යවපු ලියුමක් මා ළඟ තිබෙනවා. ඒ ලියුම ජනාධිපති ලේකම් කාර්යාලයෙන් IGPට forward කරලා තිබෙනවා. ඒ ලියුමේ තිබෙනවා, "Regarding a complaint on life threatening and some offences" කියලා.

තුසිත හල්ලොලුව කියන පුද්ගලයාගේ අත්සන සහිතව ජනාධිපති ලේකම් කාර්යාලයට යවපු ලිපිය, ජනාධිපති ලේකම් කාර්යාලයෙන් IGPට forward කරලා තිබෙනවා. නමුත් මේ ලියුමේ සඳහන් කරලා තිබෙන දේ පිළිබඳවවත් පරීක්ෂණයක් කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
I am winding up, Sir.

හැබැයි, අද වෙනකොට මේ මොහොමඩ් තම්බි උවයිස් කියන කාත්තන්කුඩිවල ඉන්න පුද්ගලයා ගැන එරාවූර් සහ කාත්තන්කුඩි පොලීසිවලින් සොයා බලන්න. ඔහු ආරක්ෂා කිරීමේ safety net එකක් සාදා දී තිබෙනවා. මොකද, Presidential Commission එකට පාස්කු ප්‍රහාරය පිළිබඳ තොරතුරු දුන් නිසා ඔහුට යම් safety net එකක් හදා දීලා තිබෙනවා. නමුත් අද වෙනකොට ඒකත් අයින් කරන්න කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් හෝ ඉල්ලන්නේ මේකයි. මේකෙදි මන්ත්‍රීවරුන්ගේ ජීවිතවලටත් අවදානමක් තිබෙනවා. This is a risk for all of us. If people can get away with attempts on murder like this and if all these are going to go unquestioned, it would be a serious threat, not just to the public but to us as well. So, I would like to ask the DCC to, at least, refer this matter to the Hon. Speaker and please initiate an investigation on matters like this.

Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, I will refer this to the Hon. Speaker.
The next speaker is the Hon. Field Marshal Sarath Fonseka. You have 16 minutes.

[අ.භා. 1.40]

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මීට දවස් තුනකට කලින් මම අද කථාව පවත්වන්නට විපක්ෂයේ ප්‍රධාන සංවිධායකගෙන් වේලාව ඉල්ලුවා. එතකොට එතුමා මට දුන් උත්තරය තමයි, "මට කථා දෙන්න එපා" කියලා එතුමාට උපදෙස් ලැබී තිබෙනවා කියන එක. ඊළඟට එතුමා මගෙන් ඇහුවා, මම ජනාධිපතිවරණයට සජිත් ප්‍රේමදාසට වැඩ කරනවාද කියලා. කෙසේ නමුත් මට එතුමාගෙන් වේලාව හම්බ වුණේ නැහැ. අපි දන්නවා, මේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු වෙලා අප ඇවිල්ලා තිබෙන්නේ ජනතා නියෝජිතයෝ හැටියට බව. මම විපක්ෂයේ ඉන්න, දෙවැනියට වැඩි ඡන්ද ලබා ගත් ජනතා නියෝජිතයා. මම 113,000ක් ඡන්ද ගත්තා. නමුත් මට කථාව දෙන්න බැහැ කිව්ව පුද්ගලයා මම හිතන හැටියට ඡන්ද 70,000ක් අරගෙනයි ආවේ.

අපි මෙතැනට එනකොට බලාපොරොත්තු වෙන්නේ ජනතාව වෙනුවෙන් සේවය කරන්නයි. නමුත්, "එක එක්කෙනාට කඩේ ගියොත් තමයි කථාවක් පවත්වන්න පුළුවන්" කියනවා වාගේ මතයක ඉඳගෙන තමයි විපක්ෂයේ ප්‍රධාන සංවිධායක කථා කළේ. නමුත් මමත් ඒ අදහස අත්හැරියේ නැහැ. ඒ අනුව මම මේ අවස්ථාවේදී මගේ කථාව කරන්න රාජ්‍ය අනුග්‍රහය ඇතිව වේලාව ලබාගෙන තිබෙනවා. මට ඒ අවස්ථාව ලබා දුන් අයට මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමන්ලා විපක්ෂයටත් වේලාව වෙන් කරනවාය කියා මම හිතනවා. එහෙම වේලාව වෙන් කරන්නේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු සංඛ්‍යාව අනුව ප්‍රතිශතයක් ලෙස. එහෙම නම් අපට කථාවක් ලැබෙනවාය කියන එක සනාථ කර ගන්න ඔබතුමන්ලාට යම්කිසි ක්‍රමයක් හදන්න සිද්ධ වෙනවා. එලෙස වෙන් කරන වේලාවෙන් විපක්ෂයේ ඉන්න එක් කෙනෙක් විතරක් දවසකට විනාඩි 40 ගණනේ කථා කරනවා. *[බාධා කිරීමක්]* ඔව්, විනාඩි 30ක්. ඒ වාගේ වේලාවක් කථා කරනවා; පාර්ලිමේන්තු රැස්වීම් පැවත්වෙන හැම දිනයකදීමත් කථා කරනවා; හැම පාර්ලිමේන්තු රැස්වීම් දවසකම කථා කරනවා. මම කථා කරන්නේ පාර්ලිමේන්තු රැස්වෙන අවස්ථා තුනකට එක වතාවයි. අපට ලැබෙන වේලාවත් එක් කෙනෙක් විතරක් පාවිච්චි කළත්, අපි ඒ පුද්ගලයාට කඩේ යන්නේ නැහැ කියලා අපට කථා නොදී ඉන්නවා නම්, එතැන වරදක් තිබෙනවා. මේ වරද තමුන්නාන්සේලා නිවැරදි කරන්න ඕනෑ. තමුන්නාන්සේලා මේකට හරි ක්‍රමයක් සොයා ගන්න, අපට අසාධාරණයක් නොවන විධියට. මොකද, අපි වැදගත් විධියට දේශපාලනය කරනවා. අපි මිනිස්සුන්ට අරක්කු දීලා දේශපාලනය කරන්නේ නැහැ. අපි පගා ගහලා නැහැ. මහාමාර්ග ඇමති වෙලා ඉඳගෙන අධිවේගී මාර්ගවලින් පගා ගහලා, අධිවේගයේ තුනෙන් එකක් විතරක් හදලා, එහෙම හදපු එකේත් බීම්, කොන්ක්‍රීට් කඩාගෙන වැටෙන තත්ත්වයට පත් වෙලා, මගේ දුවත් එක්ක එකතු වෙලා පගා ගහලා නොවෙයි මම දේශපාලනය කරන්නේ. එහෙමත් නැත්නම් මම කොළඹ ඉන්න කැසිනෝකාරයන්ගෙන්, ජාවාරම්කාරයන්ගෙන් සල්ලි අරගෙන පාසල්වලට, ඉස්පිරිතාලවලට ගිහිල්ලා බඩු බෙදමින් යන්නේ නැහැ. මම කෙනෙකුට අරක්කු වීදුරුවක්වත් දෙන්නේ නැතුවයි දේශපාලනය කරන්නේ. ඒ හින්දා අපට මේ වරප්‍රසාදය ලැබෙන්න ඕනෑ. මේ දවස්වල මගේ ආසනයටත් දිස්ත්‍රික් සංවිධායක කියලා කෙනෙක් කොහෙන්ද ගෙනැල්ලා දාලා තිබෙනවා. ඔහු මගේ ආසනයේ ඔක්කොටම අරක්කු බෙදනවා. මම, මගේ ආසනයේ දේශපාලනය කරපු අවුරුදු 7ට අරක්කු වීදුරුවක් කාටවත් දුන්නෙත් නැහැ, කවුරුවත් මගෙන් ඉල්ලුවේත් නැහැ. දැන් වෙසක් එකට දන්සැලක් දාලා, එතැන නූඩ්ල්ස් බෙදනවා. ඒ දන්සැල පිටිපස්සේ තියාගෙන ඒ දිස්ත්‍රික් සංවිධායකවරයා අරක්කු බෙදනවා. ඒ කසිප්පු වෙන්නත් පුළුවන්. මේ වාගේ දේවල් වෙනකොට අපට මේ රටේ අනාගතය ගැන කනගාටුවක් ඇති වෙනවා. මොකද, අපි එක එක්කෙනාගෙන්, ජාවාරම්කාරයන්ගෙන්, කැසිනෝකාරයන්ගෙන් මුදල් එකතු කරගෙන ගිහිල්ලා, එක එක තැන්වල බඩු බෙදලා ඊට පසුව ජනතාවගෙන් අහන්නේ නැහැ, "මේක නේද, ඔයගොල්ලන් බලාපොරොත්තු වෙන වෙනස?" කියලා. මමත් හිටියා, ඔය වාගේ බඩු බෙදන රැස්වීමක. බඩු බෙදලා, බඩු ලැයිස්තුව කියවලා ඉවර වෙලා අහනවා, "මේ රටේ ජනතාව වෙනසක් ඉල්ලනවා, මේක නේද ඔයගොල්ලන් බලාපොරොත්තු වෙන වෙනස?" කියලා.

ඒ වාගේ තකතීරු දේශපාලනඥයෝ මේ රටේ අනාගත නායකයන් වෙන්නත් බලාගෙන ඉන්නවා. මේ රටේ ජනතාව මේවා තේරුම් ගන්න ඕනෑ. පක්ෂ නායකයන් කියන පලියට මිනිස්සු මේ රටේ නායකයන් කර ගත්තොත්, මේ රට මේ තිබෙන තත්ත්වයෙන් නැවත ගොඩ එන්නේ නැහැ. මේවා තමයි මේ තිබෙන දූෂිත දේශපාලන සංස්කෘතියේ ආදීනව. අපේ නායකයෝ

[ෆීල්ඩ මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා]

පත් වෙන්නේ කොහොමද? එක එක පක්ෂවල ඉන්නවා, ප්‍රබලයෝ කියලා කට්ටියක්. ඒ ප්‍රබලයෝ කියන අයගෙන් භාගයක් -සියයට 50ක්- දූෂිතයි. තවත් සියයට 15ක්, 20ක්, 25ක් විතර ඉන්නවා, දූෂිත නැති වුණත් දැක්මක් නැති. ඒගොල්ලන් ඇවිල්ලා තිබෙන්නේ දේශපාලන ප්‍රභූවරු වෙන්න. ඒ අය එකතු වෙලා තමයි පක්ෂ නායකයෝ පත් කර ගන්නේ. ඒ පක්ෂ නායකයෝ ජනාධිපතිවරණවලට ගියාම රටේ ජනතාවට විකල්පයක් නැහැ. ඒ, එක්කෙනෙකුට කතිරය ගහන්න ඕනෑ. එතකොට ආපහු මේ රට මේ විධියටම පාලනය කරන්න ගැළපෙන, මෙලෝ රහක් නැති, දැක්මක් නැති අය මේ රටේ නායකයෝ වෙනවා. ඒ ගැන දැනුවත් වෙන්න කියලා මම ජනතාවගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ වරද දිගින් දිගටම වෙනකල් ඕනෑ දෙයක් වුණාවේ කියලා ජනතාව බලාගෙන හිටියොත් මේ රට කවදාවත් මේ අපායෙන් ගොඩ එන්නේ නැහැ. ඒක නිසා මේ රටේ ජනතාව මේ ප්‍රශ්නය තේරුම් ගන්න ඕනෑ. මේ රට භදන්න නම්, අනිවාර්යයෙන් මේ රටට හොඳ නායකයෙක් ඕනෑ. මේ පාර්ලිමේන්තුවෙන් මේ රට භදන්න බැහැ. මේ පාර්ලිමේන්තුවේ සියයට 50ක් දූෂිතයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. රටට හරි නායකයෙක් එන්න ඕනෑ. පක්ෂ නායකයෙක් වුණු පලියට හරි, නැත්නම් තාත්තා ජනාධිපති වෙලා හිටපු පලියට හරි, නෑකම් තිබුණු පලියට හරි, පක්ෂවල උරුමය තිබුණු පලියට හරි ඒ මිනිසුන්ට මේ රටේ ජනතාව නැවතත් මේ රට භාර දුන්නොත් මේ රට අනිවාර්යයෙන් විනාශය කරා ගමන් කරනවා. ඒක ඉතා කනගාටුදායක තත්ත්වයක්. මම ජනතාවගෙන් බැගෑපත්ව ඉල්ලා සිටිනවා, මේ තත්ත්වය තේරුම් ගන්න කියලා. මේ රට ගොඩනඟා ගන්න ඕනෑ නම් බුද්ධිමත්, දැක්මක් තිබෙන, අරහේ මෙහේ ගිහිල්ලා අරවා මේවා බෙදලා කයිවාරු ගහන මිනිස්සු නොවෙයි අවශ්‍ය වෙන්නේ. එලෙස බෙදන්නේ කාගේ සල්ලිද? කැසිනෝකාරයන්ගේ සල්ලි. ජාවාරම්කාරයන්ගේ සල්ලි. ඒ සල්ලිවල පිහිටෙන් මේ රටේ නායකයන් වෙන මිනිසුන්ට ඡන්දය දෙන්න එපා. එහෙම ඡන්දය දුන්නොත් තමුන්නාන්සේලා, තමුන්නාන්සේලාගේම අනාගත පරම්පරාවට ද්‍රෝහී වෙනවා කියන එක මම මේ රටේ ජනතාවට මතක් කරලා දෙන්න ඕනෑ.

ඊළඟට, අද කාන්තාවන් සවිබලගැන්වීම ගැන කථා කළා. මම හිතනවා, කාන්තාවන් සවිබලගන්වන්න නම් ඉස්සෙල්ලාම පවුල් සංස්ථාව ශක්තිමත් වෙන්න ඕනෑය කියලා. ඒක කර ගන්න බැරි නම්, අපට කාන්තාවන් සවිබලගන්වන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, කාන්තාව තමයි නිවසේ ලිප ගිනි මොළවන්නේ. ඇය තමයි ගෙදර පවත්වාගෙන යන්නේ. ගෘහ මූලිකයා පිරිමියා කිව්වාට ඇත්තටම ගෘහය run කරන්නේ කාන්තාවක් තමයි. එහෙම පවුල් සංස්ථාව ශක්තිමත් වෙන්න නම් අපි රජයක් හැටියට ඒ යුතුකම ඉෂ්ට කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මම පිළිගන්නවා, 2022දී තිබුණාට වඩා ඉහළ තත්ත්වයකට අද රටේ ආර්ථිකය ඇවිල්ලා තිබෙනවා කියලා. නමුත් මේ රටේ ජනතාවගේ සාක්කුව, කුස්සිය, පෞද්ගලික ජීවිතය ගැටගසා ගන්න අවශ්‍ය ක්‍රමය තවම හරියට පෙළගැහිලා නැහැ. තවම මේ රටේ ජනතාවගෙන් සියයට 70කට තුන්වේල කන්න නැහැ; එදිනෙදා වියදම් දරා ගන්න බැහැ; විදුලි බිල ගෙවා ගන්න බැහැ; ගෑස් එකක් ගන්න විධියක් නැහැ; ජල බිල ගෙවා ගන්න බැහැ; ළමයාට පොත් ටික අරගෙන දෙන්න බැහැ. ඒ වාගේ ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ඒ වාගේ ප්‍රශ්න ඉදිරියේ ජනතාව දුක් විඳිනකොට අපේ රටේ ආර්ථිකය ගොඩ ගියා කියලා අපට සතුටු වෙන්න බැහැ. එම නිසා ඒ ගැටලු සියල්ල අපි අනිවාර්යයෙන්ම විසඳා ගන්න ඕනෑ.

ඊළඟට, ජනතාව බලාපොරොත්තු වෙනවා, ඉදිරි මැතිවරණ. අනිවාර්යයෙන්ම ජනාධිපතිවරණයක් එන්න ඕනෑ. ජනාධිපතිවරණයට යන්න භය සමහරු හැම දාම අඬනවා. අඬෝවැඩියාව, මහ මැතිවරණය ඉල්ලලා. මොකද, ජනාධිපතිවරණයට යන්න භයයි. අපි පසුගිය දවස්වල දැක්කා, සමහරු මේ පාර්ලිමේන්තුවේදී ජනාධිපති තෝරනකොටත් නාම යෝජනා දෙන්න භයේ හැංගිලා ඉඳගෙන එක එක අයගේ නම් යෝජනා කරනවා. ජනාධිපතිවරණයක් තිබෙන්න ඕනෑ. ජනාධිපතිවරණයෙන් හරි නායකයෙක් එන්න ඕනෑ. ඊට පස්සේ තමයි අපි මහ මැතිවරණයකට යන්න ඕනෑ. මහ මැතිවරණයේදී මේ රටේ නායකයා වෙන පුද්ගලයාට පුළුවන් වෙන්න ඕනෑ, නිවැරැදි මිනිස්සු පාර්ලිමේන්තුවට එන ක්‍රමයක් හදන්න. එහෙම නැත්නම් අවුරුදු 75ක් තිස්සේ වෙව්ව දෙයම කැරකි-කැරකි නැවත වුණොත් මේ රට ගොඩ යන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ ජීවිත ගොඩනඟා ගන්න ලැබෙන්නේත් නැහැ. එක එක්කෙනා ගිහිල්ලා අරවා, මේවා බෙදුවා කියලා දුප්පත්කම නැති වෙන්නේ නැහැ. දුප්පත්කම නැති කරන්න බැහැ, එහෙම කරලා. දුප්පතුන් ඒවා භාර ගත්තාට කමක් නැහැ. ඒවා සතුටෙන් භාර ගන්න. හැබැයි, ඒවා බෙදන අයට ඡන්දය දෙන්න එපා. එහෙම කළොත් තමුන්නාන්සේලා අනිවාර්යයෙන්ම සදාකාලිකව දුප්පතුන් විධියට ඉන්නවා. නමුත් ඒ මිනිස්සු විතරක් රජ වෙනවා. ඒ මිනිස්සු විතරක් සැප විඳිනවා. මේ රටේ ජනතාව ඒක තේරුම් ගන්න ඕනෑ. එහෙම තේරුම් නොගෙන මේ 225දෙනාම එපා, මේ 225දෙනා රට කනවා කියලා මේ පැත්තට හැරිලා බැණ-බැණ හිටියාට සත පහකවත් වැඩක් නැහැ. ඒ නිසා අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, මේ තත්ත්වය තේරුම් ගන්න කියලා.

ඊළඟට, තවත් කනගාටුදායක තත්ත්වයක් තිබෙනවා. ජනාධිපති ධුරය ගන්න හීන දකින කට්ටිය මේ දවස්වල උතුරට යනවා. උතුරට ගිහිල්ලා පොරොන්දු දෙනවා. "දහතුන දෙනවා" කියනවා; "දකුණේ කවුරු එපා කිව්වත් මම දහතුන දෙනවා" කියනවා. එහෙම දෙන්න මේක අප්පොච්චිගේ බූදලයද? අපි දන්නවා, රණ විරුවෝ හැටියට අපි කොච්චර ලේ, දහඩිය, කඳුළු හෙළලාද මේ රට එකට තියා ගන්න උත්සාහ කළේ කියලා. අපට ඕනෑ මේ රට එකට තියා ගන්න; උතුරේ, දකුණේ සියලු දෙනා සමගියෙන් ඉන්න. සමහර වෙලාවට දකුණේ දේශපාලනඥයන්ට ඕනෑ උතුරේ ඡන්ද ලක්ෂ 5 ගන්න. ඉතින් එහාට ගිහිල්ලා මේක පොරොන්දු වෙනවා. උතුරේ සමහර දේශපාලනඥයෝ ඒ ගොල්ලන්ගේ මිනිස්සුන්ට පොරොන්දු වෙනවා, මේක අරගෙන දෙනවා කියලා. ඒ ගොල්ලන්ට පාර්ලිමේන්තු එන්න ඕනෑ හින්දා. අතීතයේත් මේ ප්‍රශ්න ඇති කළා, අමිර්තලිංගම් මැතිතුමා වාගේ අය. අන්තිමේ ඒ ගොල්ලන් විසින් නිර්මාණය කරපු ත්‍රස්තවාදීන්ගෙන්ම ඒ ගොල්ලන් මැරුම් කෑවා. ඒ නිසා මේ දහතුන දෙනවා කියලා ඡන්දය ඉල්ලන මිනිස්සුන්ට දකුණේ ඡන්ද දෙන්නත් එපා; උතුරේ ඡන්ද දෙන්නත් එපා. උතුරේ ජනතාවයි, දකුණේ ජනතාවයි සමගියෙන්, එකමුතුව, ළෙන්ගතුව ජීවත් වෙනවා දකින්න කැමැති කට්ටිය ගිහිල්ලා ඔය වාගේ කථා කියලා ඡන්දය ඉල්ලන්නේ නැහැ. මේ රටේ ජනතාව මේවා තේරුම් ගන්න ඕනෑ. මොකද, ඒ ගොල්ලන් තමයි නියම ජාතිද්‍රෝහියෝ. අතීතයෙත් අපි දැක්කා, එක පුද්ගලයෙක් හිටියා රණ විරුවන් 600කට භාරවෙන්න කිව්වා, ත්‍රස්තවාදීන්ට. ත්‍රස්තවාදීන් ඒ රණ විරුවන් 600 මරලා දමනතුරු උඩ බලාගෙන හිටියා. මේ වාගේ තක්කඩි, දූෂිත, මන්දබුද්ධික ජාතවලින් ජීවත් වෙනකොට ඒ වාගේ දේවල් ඔළුවට එනවා. ඒ වාගේ දේවල් පොරොන්දු වෙන්න හදනවා. නමුත් මේවා නිසා රටට, රටේ ජනතාවට -උතුරේ දකුණේ හැමෝටම- විනාශය ළං වෙනවා; අසමගිය වැඩි වෙනවා; වෛරය, ක්‍රෝධය, සැකය වැඩි වෙනවා. ඒක හන්දා මේවා වෙන්න ඉඩ දෙන්න එපා. ජනතාව මේවා හොඳින් තේරුම් ගන්න කියලා මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මම තව කරුණක් කියන්න ඕනෑ. මේක ජාතික ප්‍රශ්නයක්. අපි දකිනවා, දවස් දෙක තුනක් වැස්සාම රටෙන් භාගයක් ගං වතුරෙන් යට වෙන ආකාරය. මේ උවදුර මේ විධියටම අතීතයේ තිබුණේ නැහැ. මේ තත්ත්වය මගේ ආසනයට කෙළින්ම බලපානවා. කොළොන්නාව පැත්තට කෙළින්ම බලපානවා. රත්නපුර, අනුරාධපුරය, ගාල්ල, මාතර ආදී වශයෙන් ගත්තොත්, ගං වතුරට ගොදුරු නොවන පළාතක් දැන් මේ රටේ නැහැ. අපේ රටේ ගරු ජනාධිපතිතුමා මේ ජාතික ව්‍යසනය ගැන හොඳින් අවබෝධ කරගෙන, මේ සම්බන්ධයෙන් මොන තරම් මුදල් යට කරන්න වුණත්, මේකට තිරසර විසඳුමක් ගේන්නම ඕනෑ කියා මා විශ්වාස කරනවා. මෙය ඉතා වැදගත් කරුණක්. මේ ගැන අවධානය යොමු කරන්න කියලා අපි ගෞරවයෙන් එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මට තව එක් කරුණක් කියන්න තිබෙනවා. මට ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා, අධිකරණවල සේවය කරනු ලබන නිලධාරී මහත්වරු පිරිසක්. ඒ ගොල්ලන්ගේ දුක් ගැනවිල්ලක් තිබෙනවා. අධිකරණවල සේවය කරන මේ නිලධාරී මහත්වරු තමයි ලේඛන භාර සේවකයෝ හැටියට වැඩ කරන්නේ; ලේඛනාගාර භාර සේවකයෝ. නඩු භාණ්ඩ භාරව කටයුතු කරන්නේ ඒ ගොල්ලන්; මුදල් අය කරන අංශයේ වැඩ කරන නිලධාරීන් ඒ ගොල්ලන්; අධිකරණ නීත්‍යනුකූල, නියෝග ක්‍රියාත්මක කරන නිලධාරීන් ඒ ගොල්ලන්. ලේඛන සැකසීම කරන නිලධාරීන් ඒ ගොල්ලන්. නොයෙක් දුෂ්කර ප්‍රදේශවල, නොයෙක් දුෂ්කරතා මධ්‍යයේ සේවය කරන්න මේ ගොල්ලන්ට සිද්ධ වෙනවා. මේ ගොල්ලන් කරන දුක් ගැනවිල්ල තමයි, -ඒ ගොල්ලන් කියනවා ඒ අයට අසාධාරණයක් වෙනවා කියා- අධිකරණ සේවා කොමිසම යටතේ වැඩ කරන නිලධාරීන්ට ලැබෙන යම්කිසි දීමනාවක් මේ ගොල්ලන්ට ලැබෙන්නේ නැහැ කියලා. මේ ගොල්ලන් වැඩ කරන තැනකට මම එක දවසක් රාජකාරියකට ගියා. ඒ ස්ථානවල මේ ගොල්ලන්ට අඩු ගණනේ කැන්ටීන් පහසුකම්වත් නැහැ. අපි දන්නවා, උසාවිවල නඩුකාර උන්නාන්සේලාට, නීතිඥ මහත්වරුන්ට ගොඩක් පහසුකම් තිබෙන බව. නමුත් මේ නිලධාරීන්ට ඒ පහසුකම් නැහැ. මේ ගොල්ලන්ගේ ඉල්ලීම තමයි අර අධිකරණ සේවා කොමිෂන් සභාව යටතේ සිටින නිලධාරීන්ට දෙන විධියට වැටුපෙන් හතරෙන් එකක් ඒ ගොල්ලන්ට දීමනාවක් හැටියට වැඩිපුර ලබා දෙන්න ක්‍රියාකරන්න කියන එක, මේ රටේ තිබෙන ආර්ථික ප්‍රශ්නය නිසා. මේක සාධාරණ ඉල්ලීමක්. මේ ඉල්ලීම ගැන කටයුතු කරන්න කියලා මම ඒ විෂය භාර ගරු ඇමතිතුමාගෙනුත්, තමුන්නාන්සේලාගේ රජයෙනුත් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Eran Wickramaratne. You have 12 minutes.

[අ.භා. 1.54]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත සම්බන්ධයෙනුත් සාකච්ඡා කරනවා. මම දන්නේ නැහැ, අවුරුදු 75ක් වෙනතුරු හිටියේ ඇයි කියලා මේක ගේන්න.

මොකද, ලෝකයේ රටවල් 194කම මේ කොමිෂන් සභාව පත් කරලා තිබෙනවා. 1942 දී තමයි UNESCO එක පිහිටෙව්වේ. ඒ, දෙවන ලෝක යුද්ධය කාලයේදී. අධ්‍යාපනික, සංස්කෘතිකමය, සමාජයීය, මානව සම්පත් වාගේ සේවා ශක්තිමත් කිරීම සහ ගොඩනැඟීම තමයි එහි අරමුණ වෙලා තිබෙන්නේ. ඉතින්, මෙහෙම ප්‍රමාදයක් ඇති වුණේ ඇයි කියන එකයි මම අහන්නේ.

ඒ වාගේම, ඊයේ කළ කථා අහනකොට මට පොඩ්ඩක් හිතුණා ආණ්ඩුවේම ලොකු ගැටලුවක් තිබෙනවා කියලා. මොකද, මම අහගෙන හිටියා අපේ විජයදාස රාජපක්ෂ අධිකරණ ඇමතිතුමා කිව්වා, "විවෘත අධිකරණයේ කරන්න ඕනෑ දේවල් judge's chamber එකේ ගිහිල්ලා කරලා හරියන්නේ නැහැ නේ." කියලා. එතුමාගේ කථාවෙන් මම මේ කියවන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. (Major) Sudarshana Denipitiya to the Chair?

ගරු ජානක වක්කුඹුර මහතා (පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර - මාකාණ සපෙකළ්, උළ්ළූරාට්චි මර්රුම් සුර්රාඩල් ඉරාජාංක අමෙච්චර්)
(The Hon. Janaka Wakkumbura - State Minister of Provincial Councils, Local Government and Environment)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)

විසින් ස්ථිර කරන ලදී
ආමොතිත්තාර්.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනාරූඪ විය.
අතන්පිරකු, මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු (මේජර්) සුතර්ෂන තෙනිපිටිය අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.
Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair, and THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA took the Chair.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ඊයේ කරපු කථාව මම මේ කියවන්නේ. මම එය නැවත කියවන්නම්. "අධිකරණයේ වෙන සියලු දේවල් විවෘත වෙන්න ඕනෑ. විවෘත අධිකරණයේ කරන්න ඕනෑ දේවල් judge's chamber එකේ ගිහිල්ලා කරලා හරියන්නේ නැහැ නේ. Judge's chamber එකට ගිහිල්ලා කියපුවාම ෆයිසර් මුස්තාපා, 'මම ඔබතුමාට HEට කියලා ලබන මාසේ වෙනකොට උසස්වීම් අරන් දෙනවා' කියලා තීන්දුව ඉල්ලනවා" කියා එතුමා සඳහන් කළා. මට ටිකක් පුදුමයි, රටේ

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

අධිකරණ ඇමතිතුමා ඇත්තටම රටේ ජනාධිපතිතුමාට විරුද්ධව මෙහෙම ප්‍රකාශයක් කරනවා කියලා. ඒ වාගේම, අපට ලොකු ගැටලුවක් තිබුණා, පක්ෂ වාරණ නියෝග මේ ටිකේම දීගෙන යනකොට; ජනාධිපතිතුමාට විරුද්ධව, අධිකරණ ඇමතිතුමාට විරුද්ධව, හිටපු ජනාධිපතිට විරුද්ධව, හිටපු ඇමතිවරුන්ට විරුද්ධවත් මේ වාරණ නියෝග දීගෙන දීගෙන යනකොට ඒ අය මේ සභාවේ නැහිටලා සඳහන් කරගෙන කරගෙන ගියා මේකේ තිබෙන ප්‍රශ්නය, ගැටලුව පිළිබඳව. මොකද, ඒ අයට වාරණ නියෝග දීලා තිබෙනවා. ඒ අය ඇවිල්ලා මෙතැන අධිකරණය පහළට දමා හෙළා දකිනවා. දැන් මේ UNESCO එකට අදාළ පනත් කෙටුම්පත පිළිබඳව නම් ගැටලුවක් වුණේ නැහැ. මොකද, ඒ පනත් කෙටුම්පත සම්බන්ධව අධිකරණයට යන්න හේතුවක් තිබුණේ නැහැ. මොකද, ඒකේ අරමුණු එක්ක ආණ්ඩු පක්ෂයේ වෙන්න පුළුවන්, විපක්ෂයේ වෙන්න පුළුවන්, හැමෝම එකඟ නිසා ගැටලුවක් වුණේ නැහැ. හැබැයි, මේ අනික් පනත් කෙටුම්පත් පිළිබඳ විශාල ගැටලු, ප්‍රශ්න තිබෙනවා. අධිකරණයට කරන අපහාසය විශේෂයෙන්ම අපි හෙළා දකින්න ඕනෑ. ඒක නොකළ යුතුමයි කියන එක සඳහන් කරන්නට ඕනෑ.

ඒ වාගේම, 18 වැනිදා ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා කථා කළා. මම ඒ ගැනත් යමක් කියන්න කැමැතියි. ජනාධිපතිතුමා කථා කළේ ඉංග්‍රීසි භාෂාවෙන්. ඒ නිසා මමත් හිතුවා මේක ඉංග්‍රීසි භාෂාවෙන්ම කියන්න ඕනෑ කියලා. මම ටිකක් පුදුම වුණා,-

He said, “I just want to raise a point of Order. The Determination violates the powers of this House given under Article 4 of the Constitution" and was referring mainly to the Determination on the Gender Equality Bill and some of the provisions therein. Thereafter, he said, “The Supreme Court cannot rule on a Bill; they can only advise us”. Then, he also referred to the 1972 Constitution, which really surprised me - referring to history is fine - and said how the 1978 Constitution came up from it. But, if you all are looking at a precedent, then you should go beyond that, not just look at a precedent which is only there.

Then, he basically went on to, I would use the word denigrate, the highest court in the country, which I think he should not have actually done being the Chief Executive Officer of the country. If we take court verdicts, we know they are not always perfect. Neither are Parliamentary decisions. We know that as well. But, there is a way of correcting Parliamentary decisions. That is how you go forward. When there was an issue in the country, through an “*aragalaya*”, some people mobilized people around Parliament, thought they could burn Parliament and that was the solution. That is nonsense! We may not be suitable in some of the things we do and as has been referred to in the House today, some of the people sitting here may also not be suitable and I agree with that. But then, that has to be corrected using the democratic process and not by burning Parliament. Similarly, denigrating the judicial system and the Supreme Court, putting them down and trying to stamp them out is not possible; that is wrong. We may not agree with every judgment. That is a separate issue and that needs to be looked into. We have sworn to uphold the Constitution; that is the role we have.

Then, it goes without saying that when a pre-enactment review of a Bills is needed, it is referred to the Supreme Court and they review it, look at it constitutionally to see whether it is in line with the Constitution or not and gives its Constitutional interpretation. Any perceived, genuine issue in the Determination in terms of accuracy must necessarily be undertaken through an appropriate reference to the court and not through a Select Committee of Parliament. The President wants to refer it to a Select Committee of Parliament. We should go through the legal process, use the system that is there. Taking any other step would be contrary to the due respect of the Judiciary or for judicial independence, and that is what a responsible Legislature should avoid. So, it is very unfortunate that the President came and said such a thing here in this House.

Anyone is free to express disagreement with a court finding in a reasonable manner. That is fine. In a lot of countries, you can do that openly. However, no one may seek to usurp or relocate the constitutional jurisdiction of the Supreme Court. That is prohibited by the Constitution and is also against the doctrine of separation of powers. Our Constitution very clearly states that, but, sometimes, we misrepresent what the Constitution actually states. I think I had better quote Article 3 of the Constitution.

> “In the Republic of Sri Lanka sovereignty is in the People and is inalienable. Sovereignty includes the powers of government, fundamental rights and the franchise.”

Then, the Article 4. (c) states, I quote:

> “the judicial power of the People shall be exercised by Parliament ..."

But, that should be,

> "...through courts, tribunals and institutions created and established, or recognized, by the Constitution, ….”

So, I think this balance needs to be understood; for sure, it needs to be understood and needs to be upheld. We must not go on undermining it in anyway. Therefore, it is pertinent for us to remind ourselves that we have a responsibility. We look to the Supreme Court to get the constitutionality of issues properly considered and determined. That is what it is there for and that role cannot be taken over by the Legislature. There is separation of powers and we must maintain that. So, it is really worrying that the President said that. We know that there are the concepts of Parliamentary supremacy and constitutional supremacy.

In Sri Lanka, even though Parliament has the power to change the Constitution with the consent of the people through a Referendum, to institute laws and to set up tribunals, courts and other instutions, once they are set up, we cannot interfere in their processes and that is very critical.

Unfortunately, Sri Lanka does not have post-enactment judicial review. The President, the other day, referred to the process of creating the 1978 Constitution and said that two Hon. Members who are in this House

were also in that Parliament. Then, he referred to the 1972 Constitution and the transition that took place. I want to ask those two Hon. Members who were in that Parliament, why they did not think of that deficiency in the 1972 Constitution and include post-judicial review in the 1978 Constitution. We saw it being hijacked recently in passing the Online Safety Bill. That Bill was presented and the Supreme Court had given its Determination, specifying what Clauses could be passed and what could not be passed without a two-thirds majority. However, at the Committee Stage, the Government basically pushed through their Amendments, passing even Clauses which required a two-thirds majority with a simple majority, violating the Supreme Court Determination and the Constitutional process of this country. We must not let that happen. That is why those two Hon. Members should have thought about post-judicial review then and brought it in because when a constitutional change takes place, you can do or push for anything which may or may not be in line with the Constitution. So, breach of the rule of law or disregard of the constitutional provisions is a bad precedent.

In addition to that, there is also the breach of the social contract people have made, surrendering their power to Parliament and the Judiciary to act on their behalf. Human morality was shaped in the course evolution over millions of years, dealing with social and ethical dilemmas which cropped up in the lives of the hunters and gatherers. Most of the injustices in the contemporary world result from large-scale structural biases rather than individual prejudices. But, the hunter-gatherer brain did not evolve to detect those structural biases.

Judgments could be wrong and be biased, but maintaining the structural safeguards such as separation of powers among the Executive, Judiciary and the Legislature is paramount rather than thinking of individuals. Then, what should we do? Should we adopt the liberal dogma and trust the aggregate of individual voters, that voters would decide everything and reduce the justice system to majoritarianism? What kind of nonsense and crap is that? Then, you do not need the Judiciary and we can vote on everything in Parliament.

We now face global problems without having a global community. Neither the Facebook, nationalism nor religion is near creating a global community anywhere. That is the truth. The human quest to understand the truth and find justice has been failed. If you are in government and take the view that Parliamentary supremacy supersedes judicial supremacy, we are bound to fail, as we have already seen.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
I am concluding, Sir.

Majoritarianism in judicial decision-making replaces justice based on the established truth. Laws and internationally accepted conventions and practices must be upheld. So, it is the law, the philosophy and the international conventions and practices that must be upheld. Therefore, I would say to the House that we must ensure that we build up the judicial institutions of the country rather than denigrate them, even though we know they have weaknesses, just like Parliament also has weaknesses. Let us uphold the rule of law in this country. Thank you.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, Hon. Field Marshal Sarath Fonseka?

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(The Hon. Field Marshal Sarath Fonseka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට කලින් මගේ කථාව කළා. ඒ කථාවේදී මම අධිකරණයේ සේවය කරන නිලධාරීන්ගේ ගැටලු වගයක් සඳහන් කළා. ඒ සම්බන්ධයෙන් ඔවුන් මට ඉදිරිපත් කළ ලියවිල්ලක් තිබෙනවා. මම එම ලියවිල්ල මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. (Dr.) Suren Raghavan. You have 12 minutes.

[2.07 p.m.]

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon.(Dr.) Suren Raghavan - State Minister of Higher Education)
Hon. Presiding Member, today, we are debating two important Bills that have been presented to this House and to the people, I would say, because this House still represents the sovereignty and the will of the people of this country. The decision-making process of the 22 million people of this country is entrusted by their own will to the elected Hon. Members of Parliament, who will debate, decide and create laws empowering other institutions to enforce those laws according to the accepted Constitution.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා]

නමුත් මට කලින් කථා කළ ඇතැම් කථිකයන් මෙන්න මේ ප්‍රශ්නය ගැන කථා කළේ මොනවාද? මම දන්නේ නැහැ, ඒවා කවුද ලියා දුන්නේ කියලා. තමන් අයිති වන මැද පන්තියේ අයට සහ ජාත්‍යන්තර ප්‍රජාවට ගැළපෙන විධියට, සමාජ සම්මුතීන් - social contracts - සහ hunter-gatherer සමාජය පිළිබඳව එතුමන්ලා කථා කළා. ඉතාම පැහැදිලියි, බැංකුකරණය හා නීතිය අතර තිබෙන වෙනස. බැංකු ක්ෂේත්‍රයේ නිපුණත්වය තිබෙන කෙනෙක් දේශපාලන ක්ෂේත්‍රයේ නිපුණත්වය ගැන කථා කරන්න ගියාම ඔහොම පැටලිලි වෙනවා. නමුත්, මා කැමැතියි, පාර්ලිමේන්තු සම්ප්‍රදාය අපි ඉගෙන ගත්තේ බ්‍රිතාන්‍යයෙන් නම්, බ්‍රිතාන්‍යය නම් වූ පාර්ලිමේන්තු සම්ප්‍රදායේ මහ ගෙදර තමන්ගේ පාර්ලිමේන්තුව ගැන -බ්‍රිතාන්‍යය පාර්ලිමේන්තුව ගැන- කියන්නේ කුමක්ද යන්න සිංහලෙන් කියන්නට. එතකොට මේ රටේ පරිධිගත ජනතාවට තේරුම් ගන්නට පුළුවන් මේ මවන්නට උත්සාහ ගන්නා බිල්ලා හඳුනා ගන්න. ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ කළ කථාව හරහා උසාවියට අපහාසයක් වෙනවාය, උසාවියේ බලතල අඩු කරන්නට යනවාය කියා නාගරික මැද පන්තියට ඉංග්‍රීසි භාෂාවෙන් කථා කරමින් ඒ ගෝණි බිල්ලා මවන අයට අපට කියන්න තිබෙන්නේ, එක්සත් රාජධානිය ඒ අයගේ පාර්ලිමේන්තුව තුළ තමන් නිර්වචනය කරන්නේ කෙසේද කියා සොයා බලන්න කියලායි.

Sir, I would like to say how the UK Parliament define themsleves. They say, "Parliamentary sovereignty is a principle of the UK constitution." That is number one. පාර්ලිමේන්තුව උත්තරීතරයි. අන්න එයයි ව්‍යවස්ථාවේ අඩිතාලම හෙවත් අත්තිවාරම. එහි එක අහලක්වත් වෙනස් කරන්නේ නැති බව කියනවා. They further say, "It makes Parliament the supreme legal authority in the UK which can create or end any law." ඒ කියන්නේ, නීති සම්පාදනය කිරීමේදී උපරිම බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට වන බවයි. එසේ නම්, පාර්ලිමේන්තුවට තමයි අයිතිය තිබෙන්නේ නීති සම්පාදනය කරන්නත්, සම්පාදනය කර තිබෙන නීති සංශෝධනය කරන්නත්, අලුත් නීති සහ පවතින නීති අවශ්‍ය වන ආකාරයට සංස්කරණය කරමින් ඉදිරියට යන්නත්. එසේ කළ හැකි බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට බව පාර්ලිමේන්තුවේ මහ ගෙදර වන මහා බ්‍රිතාන්‍යය කියා සිටිනවා. Also they say, "Generally, the courts cannot overrule its legislation and no Parliament can pass laws that future Parliaments cannot change. Parliamentary sovereignty is the most important part of the UK constitution." මෙන්න මෙයයි අපේ මහ ගෙදර වන, අප පාර්ලිමේන්තු සම්ප්‍රදායය ඉගෙන ගත් බ්‍රිතාන්‍යය කියා සිටින්නේ. එය පොඩි දරුවෙකුට වුණත් පැහැදිලි වෙනවා. මහජන නියෝජිතයා යනු කවුද කියා හරි පැහැදිලියි.

මම දකිනවා, මේ සබා ගැබ තුළ චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා ඉන්නවා. එතුමා මන්නාරම ද අයත් වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයේ නියෝජිතයෙක්. එතුමා වන්නි දිස්ත්‍රික්කයේ ඡන්ද දායකයන් විසින් තෝරා පත් කර එවන කොට, එතුමාගේ අධ්‍යාපනය ගැන අහන්නේ නැහැ; එතුමා නීතිය දන්නවාද කියලා අහන්නේ නැහැ; එතුමා ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයට ගියාද කියලා අහන්නේ නැහැ. එහෙම අහන්නේ නැහැ.

එතුමා පාර්ලිමේන්තුවට එවන්නේ ඒ දුගී ජනතාවගේ, ඒ ධීවර ජනතාවගේ, ඒ කතෝලික ජනතාවගේ මන්නාරමේ නියෝජිතයකු හැටියටයි. එහෙම නම් එතුමා මෙතැන කථා කරද්දී කථා කරන්නේ සර්වබල පුරවැසියාගේ අයිතිය පිළිබඳවයි. එතුමා වෙන පක්ෂයක ඉන්න පුළුවන්. ඒක වෙනම ගැටලුවක්. නමුත්, එතුමා නියෝජනය කරන්නේ, එතුමාගෙනුත් සංයුක්ත වුණු මේ පාර්ලිමේන්තුව අවසානයේදී නියෝජනය කරන්නේ මහජනයා හා සම්මුතිය, පුරවැසියා අතර තිබෙන ඒ බලතුලනයයි. අන්න ඒ නිසා තමයි අපි කියන්නේ පාර්ලිමේන්තුවට එවද්දී නිවැරදි අය එවන්න, ඒ අය මේ පාර්ලිමේන්තුවේදී විනීතව හැසිරෙන්න, මේ පාර්ලිමේන්තුවේදී සභ්‍යත්වය හා බුද්ධිය තියාගෙන සාකච්ඡා කරන්න, විවාද කරන්න කියලා. මන්ද, මේ පාර්ලිමේන්තුව උසාවියටත් වඩා උත්තරීතරයි. අන්න ඒ උත්තරීතරභාවය රැක ගන්න ඕනෑ නිසා තමයි මේක කියන්නේ. එය ඉතාම පැහැදිලියි.

දෙවැනි කාරණය හැටියට කිව්වා, විශේෂයෙන්ම කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත පිළිබඳව. යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත සාකච්ඡාවට එතරම් අවශ්‍ය වන්නේ නැති පනත් කෙටුම්පතක්. නමුත්, ඒකත් අත්‍යවශ්‍ය පනත් කෙටුම්පතක්. නමුත්, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ලෝකයේ ප්‍රථම අගමැතිනිය විධියට බිහි කරපු මේ රට, ඉන් අවුරුදු 64ක් ඉක්ම ගියාට පසුව තමයි දැන් කාන්තාවන් සවිබල ගැන්වීම් ගැන කල්පනා කරලා තිබෙන්නේ. පරක්කු වෙලා හරි යහපත් දේ කරන එක හොඳයි. අපේ රටේ ජනගහනයෙන් සියයට 52ක් කාන්තාවන් වෙලා තිබියදී, හැම උදෑසනකම අම්මා බුදුවේවා කියන සංස්කෘතියක අපි ජීවත් වෙද්දී, විශ්වවිද්‍යාලවල ඉන්න දුවා දරුවන්ගෙන් සියයට 70ක් දැන් කාන්තාවන් වෙලා තිබියදී, මේ පනත් කෙටුම්පත මෙතෙක් කල් ප්‍රමාද කරපු එක පිළිබඳව අපි කනගාටු විය යුතුයි. මැද පෙරදිග රටවලින් සියයට 65ක, 70ක ආදායමක් ලැබෙන්නේ මධ්‍යම වයසේ කාන්තාවන්ගෙන්. තමන්ගේ ආදරණීය දුවා දරුවන්, තමන්ගේ ස්වාමිපුරුෂයා ගෙදර තියලා මේ ආර්ථිකය ගොඩ නහන්නට ඔවුන් යන්නේ කාන්තාවන් හැටියට, කාන්තා ශ්‍රමය හැටියටයි. රජය ආර්ථික වශයෙන්, සමාජීය වශයෙන්, සංස්කෘතික වශයෙන් කඩා වැටී, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ අර්බුදය අත්තිවාරම දක්වා ගිය මොහොතක බාර ගත්ත මේ රජය පසුගිය මාස 22ක් තුළ අණ පනත් 60 ගණනක් මේ සභාවට ගේන්නේ කල් ගිහින් හෝ නිවැරදි දේ කළ යුතු නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පතේ යම් යම් සංශෝධන කළ යුතු බව මමත් තරයේ විශ්වාස කරනවා. උදාහරණයක් වශයෙන් දැනට නිර්දේශ කර ඇති ප්‍රධාන දෙයක් විධියට, පනත් කෙටුම්පතේ දෙවැනි පිටුවේ 13වැනි ජේළියේ තිබෙන "ස්ත්‍රී පුරුෂභාවය සහ ලිංගික දිශානතිය..." යන වදන ඉවත් කළ යුතුයි කියලා මමත් විශ්වාස කරනවා. ඒ මන්ද යත්, අද බටහිර ලෝකය තමන්ගේ ශිෂ්ටාචාරයේ මුල් ගල් ගලවමින් තිබෙන විවාදය මොකක්ද? How to define a woman? Who has the right to define a woman? That has become an epicentric argument of the western media and western politics.

2016දී ස්කොට්ලන්තයේ පුරුෂයෙක් කාන්තාවක් දූෂණය කළා. ඒ පුරුෂයා වරදකරු හැටියට සිටියදීම අවුරුදු 3කින් පස්සේ 2019දී තවත් කාන්තාවක් දූෂණය කරනවා. නමුත්, ඒ නඩුවේ නිත්දුව එන්න යන කාලය තුළදී ඔහු ලිංගිකත්වය මාරු කර ගන්නවා; කාන්තාවක් බවට පත් වෙනවා. අධිකරණය මොකක්ද කරන්නේ? අධිකරණය මේ ස්ත්‍රී දූෂකයා ස්ත්‍රී බන්ධනාගාරයකට යවනවා. මේවා ඇත්ත, සත්‍ය. මෙවැනි වූ විකාරරූපී තීරණ එන්න පුළුවන් වන්නේ කොහොමද? මේක 2016දී සහ 2019දී ස්කොට්ලන්තයේ සිදු වූ සිදුවීමක්. එවැනි සිදුවීමක් ඇමෙරිකාවේත් සිදු වුණා. ළඟදී ඔලිම්පික් උළෙල තිබුණා. එතිදී තරග පටන් ගන්නකොට පිරිමියෙක් ඇවිල්ලා කියනවා, "මම ඊයේ සිට කාන්තාවක්ය, එම නිසා කාන්තා තරගයකට මට ඇතුළත් විය යුතුය. ඒකට මට අයිතිය තිබෙනවා" කියලා.

So, the whole argument of who has the right to define a woman and how to define a woman has become an epicentric argument in the West. We should enter into that argument, Hon. Mujibur Rahuman, with the realization and remembering that this country has a rich culture, values and nuances of social contracts, individually and institutionally, that without following those, if we try to adopt the things in the faeries of the West, we will have a broken society even greater than this. I know, Hon. Rahuman, that you belong to a community which places supreme value on men and women and their cultural aspects. So, how can we do these?

Therefore, this Bill needs to be debated further in a more deeply contextualized manner. But, on the whole, this Bill argues for empowering women; it argues for giving them more recognition and it argues for giving them their due place, which is overdue. Therefore, I, as the first Tamil Governor of the Northern Province, want to reiterate that in the North and the East, we have 16,000 war widows and war-disabled women. You know that, Hon. Charles Nirmalanathan. We did this calculation.

ඒ නිසා මේ පනත් කෙටුම්පතේ තිබිය යුතුයි, උතුරේත් දකුණේත් යුද්ධය නිසා ආබාධිත වුණු, යුද්ධය නිසා වැන්දඹු වුණු කාන්තාවන්ට විශේෂ අවස්ථා ලබා දෙන්නට ඕනෑය කියන එක. මන්ද යත්, ඒ අය ආබාධිත වුණේ, ඒ අය වැන්දඹු වුණේ ඒ අයගේ වරදක් නිසා නොවෙයි, අපි මතවාදී යුද්ධයකට ගිහින් එය දරුණු ආයුධ යුද්ධයකට හැරුණු නිසායි. ඒ නිසා මේ රටේ ඉපදුණු ඒ කාන්තාවන් වෙනුවෙන් අපි කළ යුත්තයි මේ පනත් කෙටුම්පත යටතේ අපි ගෙනෙන්න ඕනෑ. යුද්ධය නිසා වැන්දඹු වුණු කාන්තාවන්ට, යුද්ධය නිසා ආබාධිත වුණු කාන්තාවන්ට සහ ඔවුන්ගේ දරුවන්ට ලබා දෙන සහනය පිළිබඳ වගන්තියක් මේ පනත් කෙටුම්පත තුළට අපි ඇතුළු කළ යුතුයි කියා මා යෝජනා කරනවා. එය හුදෙක් උතුරේ කාන්තාවන් ගැන පමණක් නොව, 1971 වසරේ සිට යුද්ධය නිසා ආබාධිත වුණු අය, වැන්දඹු වුණු අය, 1988 - 1989 කාලයේ එසේ සිදු වුණු අය, කොළඹදී සිදු වූ මහා ප්‍රහාරවලට හසු වුණු අය වෙනුවෙනුත් කථා කළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත ඉතා වැදගත් පනත් කෙටුම්පතක්. ඒ නිසා අපි මේ පනත් කෙටුම්පතේ තිබෙන අඩු පාඩුකම් මඟ හරවන්නට කටයුතු කිරීම අවශ්‍යයි.

ශ්‍රී ලාංකිකයන් වන අපි දැන් එක්කොට බුදුන්ට, ජේසුට වැන්දාට පස්සේ අපි වඳින්නේ අපේ අම්මාට. ඒ නිසායි කාන්තාවට හිමිවිය යුතු ඒ තත්ත්වය සුරක්ෂිත කරන්නට ඕනෑ. කාන්තාවන් පවා දෙවිවරුන් හැටියට සලකා වඳින්නේ දකුණු ආසියාවේ පමණයි. සරස්වතී දේවියටත්, ලක්ෂ්මී දේවියටත් මාතාව හැටියට සලකා වඳින්නේ දකුණු ආසියානු සංස්කෘතිය තුළයි. ඒ සංස්කෘතික රටාව තුළ ලබා ගත්තා වූ පෝෂණයෙන් අපේ සියයට 52ක් වන කාන්තා ජනගහනය සහ ඉදිරිය ජය ගන්නට ඉන්න කාන්තාවන් බලමුළු ගැන්වීම ජාතියක් හැටියට අපේ වගකීමක් වනවා. ජාතියක් හැටියට අපි ඒ අයගේ අනාගතය සුරක්ෂිත කරන බවට සහතික වන්නට ඕනෑ.

නමුත් 138 මාර්ගයේ බස් එකේ නම් තවම කාන්තාවන්ට යන්න බැහැ. මම ඒ ගැන දන්නවා. ළමයි විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු ඉවර වුණාම කලින් යනවා. මම ඇහුවා, "ඒ ඇයි" කියලා. "නැහැ, සර්. යන්න බැහැ. බස් එකේ 4.30න් පස්සේ යන්න බැහැ" කියලා ළමයි කියනවා. ඇයි, ඒ? එක එකා ඇහේ නඟිනවා. 138 මාර්ගයේ බස් එකේ යන විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබන ළමයි යකඩ කූරක් අරගෙන යනවා. Hon. (Dr.) Sarath Weerasekera, they carry iron rods. ඇයි, ඒ? ඇහේ නඟින එක්කෙනාට අනින්න. ඉතින් මේ පනත් ගෙනැල්ලා වැඩක් නැහැ, කාන්තාවකට ආරක්ෂා සහිතව බස් එකේවත් යන්න පුළුවන් සමාජයක් අපට බිහි කරන්න බැරි නම්. ඒ නිසා භාෂාවලින් පෝෂණය වුණු, ආගම්වලින් පෝෂණය වුණු මේ මගේ මව්බිම තුළ කාන්තාවට ගරු කරන රටක් මෙවර බිහි වෙන්නට මේ පනත ද පාදක වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. J.C. Alawathuwala. You have eight minutes.

[අ.භා. 2.20]

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත පිළිබඳවත් කථා කරනවා. මේක ඉතාම වැදගත්. මේ පනත් කෙටුම්පත ප්‍රමාද වෙලා හරි ඉදිරිපත් වීම ගැන අපි සතුටු වෙනවා.

පැහැදිලිවම, අපේ රටේ ජනගහනයෙන් සියයට 52ක් කාන්තාවන්. සමාජය තුළ නොයෙකුත් අවස්ථාවලදී කාන්තාවන්ට යම් යම් අසාධාරණකම් දිගින් දිගටම සිද්ධ වෙනවා කියලා අපි දකිනවා. අපේ සමාජය එතැනින් එහාට, ඉස්සරහට යන්න ඕනෑ. විශේෂයෙන් දෛනිකව ලිංගික වශයෙන් කාන්තාවන් දූෂණයට ලක් වීම මාධ්‍ය තුළින් අපට දිගින් දිගටම අහන්න, දකින්න ලැබෙන දෙයක්. ඒක බොහොම කනගාටුදායක තත්ත්වයක්. මොකද, අම්මා කියන්නේ කාන්තාවට. අපි හැම කෙනාටම අම්මා කෙනෙක් ඉන්නවා. ඒ වාගේම අපට සහෝදරියන් ඉන්නවා. හැබැයි එහෙම හිටියාට, ඒ අය ගැන මොන තරම් නීතිරීති ගෙන ආවත් මේ සමාජය තුළ අද වනකොට ඉතාම භයානක විධියට කාන්තා හිංසනය වර්ධනය වෙනවාය කියන එක අපි දකිනවා. ඒක අපට දිගින් දිගටම දකින්න ලැබෙන දෙයක්. පසුගිය දිනවල රටේ තිබූ ආර්ථික තත්ත්වය තුළත්, අපි බංකොලොත් වීම තුළත් වැඩි බලපෑම තිබුණේ කාන්තාවටයි, අම්මාටයි කියන එක අපි පැහැදිලිවම කියන්න ඕනෑ. මොකද, තමන්ගේ දරුවන්ට හොඳ ආහාර වේලක් දෙන්න බැරිව ආර්ථික අපහසුතා ගණනාවකට අම්මා, එහෙම නැත්නම් කාන්තාව පත් වෙලා තිබුණා. පසුගිය වසර දෙක -2021, 2022-- තුළ අපි බංකොලොත් වීම නිසා ආර්ථික අපහසුතා මත කාන්තාවට හිංසන විශාල ගණනාවකට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ නිසා කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම තුළින් අද අපේ සමාජය තුළ කාන්තාව සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන අවාසනාවන්ත තත්ත්වය තුරන් කර ගන්න පුළුවන්. ඒක අපට තිබෙන අභියෝගයක්.

මීට පෙර කථා කළ හැම කෙනාම කිව්වා, ලෝකයේ පළමුවැනි අගමැතිතුමිය බිහි වුණේ අපේ රටෙන් කියලා. ඒ, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියයි. ඒක කාන්තාවන් හැටියටත්, අනෙකුත් අපි සියලුදෙනාත් ආඩම්බර වෙන්න ඕනෑ කාරණාවක්. ඒ වාගේම පසුගිය කාලයේ අපේ රටෙන් ජනාධිපතිවරියකුත් පත් වුණා. ඒ තමයි, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

හැබැයි දැන් බලන්න, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන කාන්තාවන්ගේ ප්‍රතිශතය දිහා බැලුවාම අපට සෑහීමට පත් වෙන්න පුළුවන්ද? බැහැ නේ. ඇත්තටම අපි සම තැන ගැන, එහෙම නැත්නම් කාන්තා අයිතිවාසිකම් ගැන කථා කළාට, අපි මේ පාර්ලිමේන්තුවෙන්ම ඒක පටන්ගත යුතුව තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
NPP එක ආවොත් කාන්තාවන්ට ඉඩ දෙන්නේ නැහැ.

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
නමුත්, අපි දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත කියලා අපි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළාට, අද මේ සමාජය තුළ, රට තුළ ප්‍රායෝගිකව ඒක සිදු වෙනවාද? ඒකයි මම මේ පාර්ලිමේන්තුව සම්බන්ධ කරගෙන කථා කළේ. අපි දකුණු ආසියාවේ පුරුෂාධිපත්‍යය සම්බන්ධයෙන් කථා කරනවා. නමුත් අපි වෙනත් බොහෝ රටවල් ගත්තාම, විශේෂයෙන්ම දකුණු ඇමෙරිකාවේ පාර්ලිමේන්තුව ගත්තාම සියයට 49ක්, 50ක් කාන්තාවෝ ඉන්නවා. ඔවුන්ට ඒ අවස්ථාව ලැබී තිබෙනවා. එම නිසා මම විශ්වාස කරනවා, අපට මේ පාර්ලිමේන්තුව තුළින්ම කාන්තාවන්ට වෙනසක් නොකර සිටීම වැදගත් බව. මේ පනත් කෙටුම්පතේත් තිබෙනවා නේ, ස්ත්‍රී, පුරුෂ කියලා වෙනසක් නොකර සමානව අයිතිවාසිකම් දෙන්න කියලා. එහෙම නම් මේ පාර්ලිමේන්තුවේ නියෝජනය දිහා බැලුවාම මන්ත්‍රීවරු 225දෙනාගෙන් අද කාන්තාවන් කී දෙනාද ඉන්නේ? අපි ඉතිහාසයේ ඉඳලා අරගෙන බැලුවොත්, අනේ ඇඟිලිවලින් ගණන් කරන්න පුළුවන් ප්‍රමාණයක් තමයි කාන්තාවන් පාර්ලිමේන්තුව නියෝජනය කළේ. එම නිසා විශේෂයෙන්ම අපි පක්ෂවලට කියනවා, කාන්තාවන් වැඩි ප්‍රමාණයක් පාර්ලිමේන්තුවට ගෙනෙන්න කියලා. කාන්තාවන් මේ රටේ පාලනයට සම්බන්ධ කරන්න අවශ්‍ය පියවර ගන්න ඕනෑ.

අනෙකුත් ආයතනත් ඒ වාගේමයි. අපි දැක්කා, පළාත් පාලන ආයතනවල නම් සියයට 25ක කාන්තා නියෝජනයක් ඇතුළත් කරලා තිබුණා. ඇත්තටම ඒක තුළ යම් සාර්ථකත්වයක් අපි දැක්කා. කාන්තාවන්ට ඒ නියෝජනය ලැබුණා. ඊට ඉස්සෙල්ලා කවදාවත් කාන්තාවන්ට ඒ අවස්ථාව ලැබුණේ නැහැ. ඒ සියයට 25 ඇතුළත් කිරීම නිසා විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරියන් හැටියට, සභිකයන් හැටියට කටයුතු කරන්න කාන්තාවන්ට අවස්ථාව ලැබුණා. ඒ වාගේම අඩු ගණනේ අපේ රටේ ඊළඟට තිබෙන පළාත් සභාව තුළත් ඒ තත්ත්වය ඇති කළොත්, ඒ වාගේම අනාගතයේ දී මේ රටේ පාලන ක්‍රියාවලියට, මේ පාර්ලිමේන්තුවට කාන්තාවන් යම් ප්‍රතිශතයක් එකතු කර ගන්න පුළුවන් වුණොත්, කාන්තාවන්ට සිදු වන ගොඩක් හිංසන වළක්වා ගැනීම සඳහා අපට යම් වැඩ පිළිවෙළක් හදන්න අවස්ථාව උදා වෙයි. එහෙම නැතුව අපි කොච්චර දේවල් කථා කළත්, කාන්තාවන් සවිබල ගන්වනවා කියලා මොන දේවල් කථා කළත් වැඩක් නැහැ.

උදේට මාධ්‍යවල කියවන දේවල් දැක්කාම, - මුද්‍රිත මාධ්‍ය වාගේම television එකේ - කාන්තාවන්ට දෛනිකව හිරිහැර ගණනාවක් සිදු වන බව පෙනෙනවා. එක පැත්තකින් අපේ සමාජය මොන තරම් කුරිරු තැනකට, ඉතාම පහත් තැනකට ගිහිල්ලාද කියලා අපට ඒකෙන් පෙනෙනවා. අපි දියුණුයි කියලා කිව්වත්, මේ සම්බන්ධයෙන් අපි දියුණුවක් ලබලා තිබෙනවාද? මේ තත්ත්වය තුළ කාන්තාවන්ට විශාල අසාධාරණකම් සිද්ධවෙලා තිබෙනවා අපි දැකලා තිබෙනවා. එම නිසා සමාජයක් වශයෙන් අපට සෑහීමකට පත් වෙන්න බැහැ කියන එක අපි පැහැදිලිවම කියනවා. මේ විධියේ ඉතාම අවාසනාවන්ත තැනකට මේ සමාජය වැටිලා තිබෙනවා. ඉතින්, අපි මෙතැනදී පැහැදිලිව මේ කාරණය කියන්න ඕනෑ. අපේ සංස්කෘතිය අතින් බැලුවත්, මොන අංශයෙන් බැලුවත්, මොන ආගමක් පැත්තෙන් බැලුවත් කාන්තා හිංසනය අනුමත කරන්නේ නැහැ. විශේෂයෙන්ම බෞද්ධ සමාජය තුළ තමයි රටේ ජනතාවගෙන් වැඩි ප්‍රතිශතයක් ඉන්නේ. ඒ වාගේම අපේ රටේ අනෙකුත් ආගම් අදහන අයත් ඉන්නවා. ඒ මොන ආගමකවත් කාන්තා හිංසනය අනුමත කරන්නේ නැහැ. මේ හැම අංශයකම තිබෙන්නේ කාන්තාව සමානව සලකා කටයුතු කළ යුතුයි කියන එකයි. මව් පදවිය කියන එක උතුම් පදවියක් හැටියට සලකා කටයුතු කරන්න ඕනෑ. නමුත් සමාජය තුළ ප්‍රායෝගිකව මේක සිදු වෙන්නේ නැහැ. ඒ නිසා තමයි මට පෙර කථා කරපු රාජ්‍ය ඇමතිවරයා කිව්වේ, කාන්තාවකට බස් එකේ යනකොටත් හිරිහැරවලට ලක් වෙන්න සිද්ධවෙලා තිබෙනවා කියලා. අද නොවෙයි, ඒක සෑහෙන්න කාලයක ඉඳලා සිදු වන දෙයක්. ඉතින්, මේ තත්ත්වය තුළ ඕනෑම තැනක, වැඩ කරන කාර්යාලය තුළ වෙන්න පුළුවන්, ඉගෙන ගන්නා පාසලේ වෙන්න පුළුවන්, ඉගෙන ගන්නා විශ්වවිද්‍යාලයේ වෙන්න පුළුවන්, ඒ හැම තැනකදීම කාන්තාව නොයෙකුත් ආකාරයෙන් හිංසනයට ලක් වෙනවා අපි දැකලා තිබෙනවා.

දැන් බලන්න, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කාන්තාවන්ට ලබා දෙන රැග් එක, ඒ හිංසනය පිරිමින් ලක් කරන හිංසනයට වඩා වෙනස්. ඒක ඉතාම භයානක තැනකට යනවා අපි දැකලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ කාන්තාව මේ සමාජයේ සම ස්ථානයේ තබා සලකන්න, එහෙම නැත්නම් පුරුෂයන් හා සමානව සලකා කටයුතු කරන්න අපි මෙවැනි නීති රීති ගෙනෙන්න ඕනෑ.

එතැනදී ප්‍රධානම කාරණයක් හැටියට අපි දකිනවා, රටේ නීතිය නිසියාකාරව ඉහළින්ම ක්‍රියාත්මක වෙනවා නම්, මේ ගොඩක් දේවල් සඳහා හැම කෙනාටම යම් සහනයක් ලබා දෙන්න අපට පුළුවන් වෙන බව. අපි දැකලා තිබෙනවා, සමහර තැන්වලදී නීතිය හරියාකාරව ක්‍රියාත්මක වෙන්නේ නැති බව. එයත් මේ හිංසනය, එහෙම නැත්නම් කාන්තාවන්ට සිදුවන අසාධාරණය වැඩි වෙන්න බලපා තිබෙනවා.

මේ ඉදිරිපත් කර තිබෙන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පතට අපේ මන්ත්‍රීතුමියලා නොයෙකුත් සංශෝධන ඉදිරිපත් කර තිබෙන බව අපි දැක්කා. ඒවාත් සලකා බලා, මේ පනත් කෙටුම්පත සම්මත කරන්න අපේ සහාය ලැබෙනවාය කියන එක මතක් කරමින්, මට මේ කාලය ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Ishak Rahuman. You have 11 minutes.

[අ.භා. 2.30]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ කාන්තා අයිතීන් සම්බන්ධව කථා කරන්න ලැබිලා තිබෙන මේ අවස්ථාවෙන් මා ඉතා සතුටින් ප්‍රයෝජන ගන්නවා. අපේ රටේ වැඩි කොටසක් ඉන්නේ කාන්තාවන්. හැබැයි, ඒ කාන්තාවන්ගේ අයිතිය ගැන කථා කරනකොට, අපි මේ වාගේ දවසක් වෙන් කරලා, ඒ දවසට පමණක් සීමා වෙන්නේ නැතිව, ඉදිරියේදී කාන්තාවන්ගේ අයිතිය ලබා ගන්න පුළුවන් විධියට අවස්ථාව ඇති කරන්න ඕනෑ කියලා තමයි මම පළමුවෙන්ම ප්‍රකාශ කරන්නේ.

අපි දන්නවා, කාන්තාවන් කියන්නේ ඉතිහාසයේ සිට ලංකාවේ ආර්ථිකයට විශාල ශක්තියක් දීපු කණ්ඩායමක් බව. ඒ වාගේම අධ්‍යාපනය වෙන්න පුළුවන්, සෞඛ්‍යය වෙන්න පුළුවන්, රටේ හැම අංශයකට විශාල කටයුත්තක් කරපු අය තමයි කාන්තාවන් කියන්නේ.

මම විතරක් නොවෙයි, ලංකාවේ ඉන්න හැම එක්කෙනාටම මොන්ටිසෝරියට ගියාම පළමුවෙන්ම "අ" කියන අකුර කියලා දෙන්න ඇත්තේත් කාන්තාවක් තමයි. අපි දන්නවා, ලංකාවේ Montessori teachersලා විශාල පිරිසක් ඉන්නවා, ඒ අයට කිසිම සහනයක් අද වෙනතුරු ලබා දීලා නැහැ කියලා. ඒ අයට ලබා දෙන්නේ පොඩි වැටුපක්. අපි හැම එක්කෙනාම දන්නවා, ඒ Montessori teachersලා අම්මාටත් එහා ගිහිල්ලා තමන්ගේ රාජකාරිය ඉතා වුවමනාවෙන් කරන බව. අපි මොන්ටිසෝරි ගිය කාලයේ ඒ Montessori teachersලාට දීපු වධ වාගේම, ඒ Montessori teachersලා අපි වෙනුවෙන් කරපු යුතුකම් අද දවසේ මේ කථා කරන වෙලාවේත් මට මතක් වෙනවා. ඒ නිසා මම ගරු ජනාධිපතිතුමාගෙන් මේ ගුරුවරු ගැන යම් ඉල්ලීමක් කරනවා. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා වැටිච්ච රට ගොඩ ගත්ත නායකයෙක්. ඒ නිසා මේ Montessori teachersලා වෙනුවෙන් සාමාන්‍යයෙන් දෙන පඩියට වඩා වැඩි පඩියක් දීමටත්, ඒ වාගේම ඒ අයට pension එකක් හදන්න කියලාත් මම ඉල්ලනවා. ඒක කරන්න යද්දී සමහර කුහකයෝ ඇවිල්ලා කඩා පැනලා, එහෙම දෙන්න එපා කියලා ඔබතුමාට තර්ජනය කරයි. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා කොන්ද කෙළින් තියාගෙන ඉන්න නායකයෙක්. ඒ නිසා ඔබතුමා ඊළඟ මැතිවරණයට යන්න පෙර මේක ඉෂ්ට කරන්න ඕනෑ කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඊයේ-පෙරේදා දවසක මේ පාර්ලිමේන්තුවේදී රහපෑමක් වුණා. රහපෑමක් වුණා කියන්නේ, මේ මන්ත්‍රීවරුන්ට DCB funds දීලා තිබෙනවා කියන එක සම්බන්ධයෙන්. ඒකට සම්බන්ධ මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ නම් විතරයි මෙතැනදී කියැවුණේ. හැබැයි, මම දන්නා විධියට TNA එකේ එක මන්ත්‍රීවරයෙක් හැර, අනෙක් සියලු මන්ත්‍රීවරුන් මේ ජනාධිපතිතුමා එක්ක සම්බන්ධ වෙලා වැඩ කරනවා. ඒ වාගේම SJB එකේ මන්ත්‍රීවරුන් විශාල පිරිසක් ගිහිල්ලා එතුමා එක්ක සම්බන්ධ වෙලා වැඩ කරනවා. හැබැයි ඒ අයගේ නම් කියන්නේ නැතුව, මුස්ලිම් මන්ත්‍රීවරුන් හතර පස්දෙනාගේ පමණක් නම් කියපු එක ගැන මට ලොකු වේදනාවක් ඇති වෙනවා, මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීතුමන්ලා අපේ නම් කිව්වේ ඇයි කියලා.

මට මතක් වෙනවා, මීට අවුරුදු දෙකකට පෙර කුලියාපිටිය, නාත්තණ්ඩිය ප්‍රදේශයේ ජාතීන් අතර ප්‍රශ්නයක් ඇති වුණු වෙලාවේ ඒ මන්ත්‍රීතුමා තමයි කඩා පැනලා ඉස්සරහට ගියේ කියලා. මම දන්නේ නැහැ, කවුරු වෙනුවෙන් එතුමා කඩේ ගියාද කියලා. මගේ හිතට ඒ ගැන සැකයක් තිබෙනවා.

මම විතරක් නොවෙයි. පක්ෂ කිහිපයක මන්ත්‍රීවරු ජනාධිපතිතුමාගේ වැඩසටහන අනුමත කරනවා. ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබයි මමයි දන්නවා, මේ රට වැටුණු වෙලාවේ භාර ගන්න කෙනෙක් හිටියේ නැහැ කියලා. ඔබට මතක ඇති, මීට අවුරුදු දෙකකට පෙර අපේ රටේ තිබුණු තත්ත්වය. 1970 ඉඳලා 1977 දක්වා තිබුණු පෝලිම් ගැන මට මගේ ආච්චිලා, සීයලා, අත්තලා, කිරිකිත්තලා කියලා දුන්නා. හැබැයි මම ඒවා දැක්කේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, 2019 ඉඳලා 2022 දක්වා පෝලිම් මම දැක්කා. පෝලිම් එකයිද, දෙකයිද? දවසයිද, දෙකයිද? ඒ පෝලිම් මාස ගණන් තිබුණා. පෙට්‍රල් ලීටරයක් ගන්න අපේ රටේ ජනතාව දවසක් දෙකක් පෝලිමේ හිටියා නම් කමක් නැහැ. දවස් 150ක් පෝලිමේ හිටියා. අපේ පළාත්වල පොහොර හොණ්ඩරයක් ගන්න තිබුණේ නැහැ. රුපියල් 50,000ක් දීලාවත් ගන්න පොහොර තිබුණේ නැහැ. ගොවියෝ උදැල්ල කර තියාගෙන පෝලිමේ හිටියා. ඒ වාගේම ධීවරයෝ තෙල් නැතිව පෝලිමේ හිටියා. ඉස්පිරිතාල තිබුණා, බෙහෙත් තිබුණේ නැහැ. පාසල් තිබුණා, ගුරුවරු විතරයි හිටියේ දරුවෝ පාසලට ගියේ නැහැ. එහෙම තත්ත්වයක් තිබියදී ඔබයි, මමයි ඇතුළු මේ පාර්ලිමේන්තුවේ 225දෙනාම බලාගෙන හිටියා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

රටේ ආදරණීය ජනතාව -ලක්ෂ 200ම- මහ පොළොවේ අරගළ කළ වෙලාවේ අපි අරගළයට ගියේ නැහැ. අපි අරගළයට ගියා නම් ගුටිකන බව දන්නවා. අපි මොනවාද කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අපි හැංගිලා හිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හිනා වෙනවා. මතකයි නේද? ඒ වෙලාවේ මේ පාර්ලිමේන්තුවේ හිටපු 225දෙනාටම ආගමික නායකයෝ -කතෝලික නායකයෝ, බෞද්ධ නායකයෝ, මහනුවර මල්වත්තේ සහ අස්ගිරියේ ස්වාමීන් වහන්සේලා- ඇතුළු හැමෝම කිව්වා, මේ වැටුණු රට ගොඩ ගන්න රට භාර ගනිල්ලා කියලා. ඒ වෙලාවේ මොනවාද කිව්වේ? නිකම් දුන්නු මල් වට්ටියට අත ගැහුවේ නැහැ. අපි මග හැරියා. එහෙම වැටුණු රට ගොඩ ගත්ත එකම නායකයා, ලෝකය පිළිගත්ත නායකයා, ලංකාවේ ඉදිරි අනාගතය භාර ගන්න ඉන්න නායකයා, එඩිතරව තීන්දු ගන්න පුළුවන් නායකයා වෙන කවුරුවත් නොවෙයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමායි.

ඒ වෙනකොට ලංකාවේ ඩොලර් සංචිත තිබුණේ නැහැ. අද ලංකාවේ ඇමෙරිකානු ඩොලර් බිලියන 9ක සංචිත තිබෙනවා. එදා රටේ ජනතාව කිව්වේ හුස්ම ගන්න අවස්ථාව ලබා දෙන්න කියලා. අපි සතුටු වෙනවා, පාර්ලිමේන්තුවේ ප්‍රධාන මන්ත්‍රීවරු ඔක්කෝම ගිහිල්ලා එතුමාගෙන් මුදල් අරගෙන වැඩ කරන එක ගැන. මට රුපියල් මිලියන 100ක් දුන්නා කිව්වා. නැහැ, මට දීලා තිබෙන ගාන කිව්වොත් ඒ කියන මන්ත්‍රීවරුන්ට ක්ලාන්තේ හැදෙනවා. පසුගිය අවුරුදු හතරහමාරට පෙර අනුරාධපුර දිස්ත්‍රික්කයේ කළ සංවර්ධනයට වඩා විශාල සංවර්ධනයක් පසුගිය මාස තුන හතරේ මම කරලා තිබෙනවා. පල්ලි වෙන්න පුළුවන්, පන්සල් වෙන්න පුළුවන්, කෝවිල් වෙන්න පුළුවන්, පාසල් වෙන්න පුළුවන්, මම ඒවා සංවර්ධනය කරලා තිබෙනවා. එදා මිනිස්සු ඉල්ලුවේ ඔවුන්ට හුස්ම ගන්න අවස්ථාව ලබා දෙන්න කියලා.

අපේ ජනාධිපතිතුමාගේ සංකල්පය අනුව එතුමා මට විශාල ශක්තියක් දුන්නා. හැබැයි, මම එතුමාගේ පක්ෂයේ නොවෙයි. මම අදත් විපක්ෂයේ. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට, වැඩ කරන්න හැකියාව තිබෙන ඕනෑම කෙනෙකුට එතුමා අත දෙනවා. හැබැයි, වැඩ නොකරන කයිවාරුකාරයන්ට අවස්ථාව දෙන්නේ නැහැ. සමහර මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට ඇවිල්ලා කටින් බනල හිටවනවා. සමහර අය කටින් වඩේ පුච්චනවා. ජනාධිපතිතුමා ළඟට ගිහිල්ලා, සර්, අපේ දිස්ත්‍රික්කයේ මෙහෙම වැඩක් තිබෙනවා, මුදල් ලබා දෙන්න කිව්වොත් කුහක නොවී එතුමා

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

මුදල් දෙනවා. එතුමා අනෙක් නායකයෝ වාගේ කුහක නැහැ.එතුමා සිංහයෙක්. එතුමා ඕනෑම කෙනෙකුට එන්න කියලා, මුදල් දීලා අත දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have two minutes more.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මට තව two minutes දෙන්න. එතකොට ඔක්කොම විනාඩි හතරයි.

ජනාධිපතිතුමා ඕනෑම කෙනෙකුට උදව් කරනවා. එතුමා උදව් කරන්නේ වෙන කාටවත් නොවෙයි, මේ රටේ දරුවන්ට. දරුවන්ට හොඳ අධ්‍යාපනයක් දෙන්න, ආගමික ස්ථාන දියුණු කරන්න, ගොවි බිම් දියුණු කරන්න තමයි එතුමා උදව් කරන්නේ. එහෙම නැතිව එතුමාගේ සාක්කුව තරකර ගන්න නොවෙයි. ඒ නිසා මේ රටේ ඉන්නා ආදරණීය ජනතාවගෙන් මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලා ඡන්දය දීලා බලන්න. එක වතාවක් දීලා වරද්දා ගත්තේ නැද්ද? ඒවා අපි හැම එක්කෙනාටම මතකයි නේද? හැබැයි, කරලා පෙන්වපු එක්කෙනා දක්ෂයෙක්ද, කරලා පෙන්වන්නම් කියන එක්කෙනා දක්ෂයෙක්ද කියන එක අපි තීන්දු කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඕනෑම කෙනෙකුට පුළුවන්, "මම ආවා නම් කරනවා" කියන්න. පිනට දීපු අවස්ථාවත් භාර ගත්තේ නැතුව බලෙන් ඉල්ලුවාට ජනතාව ඡන්දය දෙන්නේ නැහැ. ජනතාව එදා වාගේ මෝඩ නැහැ. බුද්ධිමත් ජනතාව ලංකාවේ ඉන්නවා. ඒ නිසා මම ඔවුන්ට කියනවා, ඔබේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න, කෘෂිකර්මයේ දියුණුවක් ඇති කරන්න, සෞඛ්‍යයේ දියුණුවක් ඇති කරන්න නම් මේ පවතින ක්‍රමයට වඩා වෙනත් ක්‍රමයක් නැහැ කියන එක. හැබැයි, වෙනත් ක්‍රමයකට යනවා නම් ඒ අය පෝලිම්වල ඉන්නත් ලෑස්ති වෙන්න ඕනෑ. පෝලිමක් ඕනෑ නම් වෙන නායකයෙකුට ඡන්දය දීලා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, IMF එකට ලංකාව ඕනෑ නැහැ. හැබැයි, ලංකාවට තමයි IMF එක ඕනෑ. අපි මේ දේවල් change කරනවා - වෙනස් කරනවා - කියලා මොන්ටිසෝරි යන ළමයි කියන කථා IMF එකට කියලා හරියන්නේ නැහැ. IMF එක කියන්නේ මොකක්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපට තමයි IMF එක ඕනෑ. හැබැයි, IMF එකට අපි අවශ්‍ය නැහැ. සමහරු කියනවා, IMF එකට ගිහිල්ලා අපි මේ දේවල් වෙනස් කරනවා කියලා. අනේ, ඒක විහිළුවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ බුද්ධිමත් ජනතාවට මම කියනවා, රටේ අනාගතය ගැන, කෘෂිකර්මය ගැන, සෞඛ්‍ය ගැන, ආරක්ෂාව ගැන හොඳ තීන්දුවක් බලාපොරොත්තු වෙනවා නම්, මේ පවතින ක්‍රමයට වඩා වෙන ක්‍රමයක් ඉදිරි අවුරුදු කිහිපයේදීම අපිට දකින්න බැහැ කියලා. අනාගතයේදී ඔබේ දරුවන්ට හොඳ රටක් ඇති කරන්න නම්, මේ ක්‍රමය තමයි සුදුසුම ක්‍රමය.

මට වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, Hon. Lakshman Kiriella?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට මොහොතකට කලින් අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා ගැන මේ ගරු සභාවේදී යම් යම් විවේචන ඇති වුණා. ඔබතුමාත් ඒ වෙලාවේ මේ සභාවේ හිටියාද? මම හිතන විධියට, ඔබතුමාත් හිටියා. ඒවාට මම උත්තරයක් දෙන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම සජිත් ප්‍රේමදාස මැතිතුමා කියන්නේ මේ පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක. පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව මුළු රටේම ප්‍රශ්න එතුමා ළඟටත් එනවා. එතුමා මේ සභාවේදී උදේ නැඟිටලා කථා කරන්නේ බලහත්කාරයෙන් නොවෙයි, මූලාසනයේ අවසරය ඇතිව. එතුමාට බලහත්කාරයෙන් කථා කරන්න බැහැ නේ. එතුමා කථා කරන හැම අවස්ථාවකදීම මූලාසනයේ අවසරය ඇතිව තමයි කථා කරන්නේ. ඒ හැම අවස්ථාවකදීමත් මූලාසනයෙන් එතුමාට අවසර දී තිබෙනවා. එතුමා කාලය කනවා, කාලකණ්ණියෙක් කියලා කවුරු හරි කියනවා නම්, ඒක වැරදියි. මොකද, එතුමා විපක්ෂ නායක. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව විපක්ෂ නායකතුමාට යම් යම් බලතල තිබෙනවා. එතුමාට ඕනෑම වෙලාවක මේ සභාවේ නැඟිටලා කථා කරන්න පුළුවන්. එහෙම කථා කරන්නේ ජනතාව වෙනුවෙන්. මේ පාර්ලිමේන්තුවට ඉඳලා හිටලා එන අය ඒක දන්නේ නැහැ.

ඒ වාගේම මගේ නම නොකිව්වාට මා ගැනත් ව්‍යංගෝක්තියෙන් යම් යම් අදහස් පළ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ක්ෂේත්‍රයෙන් මමත්, මගේ භාර්යාවත් විශ්‍රාම යනකොට අපේ බැංකු ගිණුම්වල රුපියල් මිලියන 400ක් තිබුණා.

මම 2017 වර්ෂයේ ඒ විස්තර පාර්ලිමේන්තුවට හෙළිදරව් කළා. අපි ආදායම් බදු ගෙව්වා. මගේ වත්කම් හෙළිදරව් කළා. අපි මහනුවර අධිකරණයේ වැඩ කරපු කාලයේ සමහර වර්ෂවල රුපියල් මිලියන පහක් ආදායම් බදු වශයෙන් ගෙව්වා.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න ඕනෑ. Transparency International එක පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් 225දෙනාගෙන් ඉල්ලීමක් කළා, තමන්ගේ වත්කම් පිළිබඳ විස්තර website එකට දාන්න කියලා. අපි කථානායකතුමාටත් ඒ විස්තර

දෙනවා නේ. ඒවා කථානායකතුමා ළඟ තිබෙනවා. නමුත් Transparency International එකෙන් කිව්වා, අපේ වත්කම් පිළිබඳ විස්තර website එකකට දාලා ලෝකයටම පෙනෙන්න ඒ website එක මොකක්ද කියන්න කියලා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 20දෙනායි ඒ website එකට තමන්ගේ වත්කම් පිළිබඳ විස්තර දාලා තිබෙන්නේ. මගේ වත්කම් පිළිබඳ විස්තර මම website එකට දාලා තිබෙනවා. බැංකුවල තිබෙන මගේ මුදල් පිළිබඳ විස්තර මම ඒ website එකට දාලා තිබෙනවා. මම Income Tax ගෙවලා තිබෙන විස්තර දාලා තිබෙනවා. මහනුවර අධිකරණයේ අවුරුදු 20ක් වැඩ කරලා මමයි, මගේ භාර්යාවයි ගත්ත ඉඩම් ගැන විස්තර දාලා තිබෙනවා. ඕනෑම කෙනෙකුට ඒවා බලන්න පුළුවන්. නමුත්, අපට ඇඟිල්ල දිගු කරන අය එහෙම විස්තර දාලා නැහැ. අද උදේ එක්කෙනෙක් මේ සභාවේදී නැඟිටලා මගේ වත්කම් ගැන කිව්වා. හැබැයි, ඒ පුද්ගලයාගේ වත්කම් ලෝකයට පෙනෙන්න ඒ website එකට දාලා නැහැ.

අපට ඇඟිල්ල දිගු කරන අයගෙන් මම ඉල්ලීමක් කරනවා, තමන්ගේ වත්කම් Transparency International එකේ website එකට දාලා ප්‍රදර්ශනය කරන්න කියලා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 20දෙනායි ඒ අභියෝගය භාරගෙන ඒ විස්තර දාලා තිබෙන්නේ. මම ඒ අය අතුරින් එක්කෙනෙක්. එච්චරයි මට කියන්න තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Next, the Hon. Charles Nirmalanathan. You have six minutes.

[பி.ப. 2.45]

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු චාල්ස් නිර්මලනාදන්)
(The Hon. Charles Nirmalanathan)
නන්දි, කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ!

இன்றைய தினம் இச்சபையில் பெண்களின் வலுவூட்டல் சட்டமூலம் இரண்டாம் மதிப்பீட்டுக்காகச் சமர்ப்பிக்கப்பட்டு இருக்கின்றது. இந்தச் சட்டமூலம் மிகவும் அவசியமானதாகக் கருதப்படுகின்றது. இங்கு உரையாற்றிய ஆளுங்கட்சி, எதிர்க்கட்சி உறுப்பினர்கள் அனைவரும் இந்தச் சட்ட மூலத்துக்கு ஆதரவாகக் கருத்துகளைத் தெரிவித்திருந்தார்கள். இருந்தபோதிலும், இந்தச் சட்டமூலத்தைப் பாராளுமன்றத்தில் நிறைவேற்றுவதனூடாக மாத்திரம் பெண்களை வலுவூட்டு கின்ற விடயம் நடைமுறைக்கு வராது என்பது எனது கருத்தாகும்.

நாட்டுக்காகவும் வீட்டுக்காகவும் அதிக சிந்தனையுடன் உழைப்பவர்களாகப் பெண்களே இருக்கிறார்கள். குறிப்பாக, இலங்கைக்கு அதிக வருமானத்தை ஈட்டிக்கொடுக்கின்ற ஏற்றுமதிப் பொருட்களை உற்பத்தி செய்கின்ற நிறுவனங்களில் பணிபுரிந்தும், மத்திய கிழக்கு நாடுகளுக்குப் பணிப் பெண்களாகச் சென்றும், எமது நாட்டுக்கு அதிகளவு அந்நியச் செலாவணியைக் கொண்டு வருகின்றவர்களாகப் பெண்கள் தான் இருக்கின்றார்கள். அதுமாத்திரமன்றி, அவர்கள் தமது குடும்பத்தைச் சரியான முறையில் நெறிப்படுத்தி, கணவருடைய, பிள்ளைகளுடைய சிந்தனையுடன் வீட்டுக் காகவும் அதிகமாக உழைக்கின்றார்கள். பெண்களை வலுப்படுத்துவது தொடர்பான இந்தச் சட்டமூலம் ஏன் இவ்வளவு காலதாமதமாகிக் கொண்டுவரப்பட்டு இருக்கின்றது? அதற்குக் காரணம், மனதில் இருக்கின்ற சிந்தனையின் அடிப்படையில் பெண்களுக்கு முக்கியத்துவம் கொடுக்கப் படாமைதான்.

பெண்களுக்கு முழுமையான பாதுகாப்பு வழங்கப்பட வேண்டும். தமிழீழ விடுதலைப் புலிகளுடைய ஆட்சிக் காலத்தில் எங்களுடைய பகுதியிலுள்ள பெண்கள் தங்களு டைய பாதுகாப்பை முழுமையாக உணர்ந்தவர்களாக இருந்தார்கள். அவர்களுடைய கட்டுப்பாட்டுப் பிரதேசத்தில் வசித்தவன் என்ற வகையில், நான் இதனை அறிவேன். அந்தக் காலத்தில் பெண்களுக்கு இருந்த பாதுகாப்பு தற்பொழுது நாட்டின் எந்தப் பகுதியிலும் இல்லை.

பத்திரிகைகளிலும் சரி, சமூக வலைத்தளங்களிலும் சரி, பெண்கள் மீதான வன்கொடுமைகள், அவர்கள் மீதான ஒடுக்குமுறைகள் பற்றிய செய்திகள் வெளிவராத நாட்களே இல்லை. இந்த நாட்டில் பெண்களுக்கு முழுமையான பாதுகாப்பு இல்லை என்பது சகலரும் அறிந்த உண்மையாக இருக்கின்றது. எனவே, முதலில் எண்ணங்களில் மாற்றங் களைக் கொண்டுவர வேண்டும். எண்ணங்களில் மாற்றங் களைக் கொண்டுவராமல், வெறுமனே பாராளுமன்றத்தில் சட்டத்தை இயற்றிவிட்டு, இலங்கையில் பெண்களுக்குச் சம உரிமை வழங்கப்படுகின்றது என்று கூறுவதில் அர்த்தமில்லை. பெண்களுக்குரிய கௌரவத்தை வழங்க வேண்டும். இந்தச் சட்டத்தின் மூலமாவது அவர்களுக்கு நன்மை கிடைக்க வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டில் எங்களுடைய மக்கள் இனரீதியாக ஒடுக்கப் பட்டதனால் யுத்தம் மூண்டது. அதன் விளைவாக, வடக்கு, கிழக்கில் கணவன்மாரை இழந்த பல்லாயிரக்கணக்கான பெண்கள் இருக்கின்றார்கள்; அங்கவீனமான பெண்கள் இருக்கின்றார்கள். அதுமாத்திரமன்றி, இறுதி யுத்தத்தின்போது கணவன்மாரைச் சோதனைச் சாவடிகளிலும் இராணுவ முகாம் களிலும் நேரடியாக ஒப்படைத்த பெண்கள் இருக்கின்றார்கள்.

யுத்தம் காரணமாகப் பாதிக்கப்பட்ட பல்லாயிரக்கணக்கான பெண்கள், தங்களுடைய வாழ்க்கையைக் கொண்டுசெல்ல முடியாத நிலையில் மன விரக்தியுடன் இன்று எம் மத்தியில் வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். அந்தப் பெண்களுக்கென இந்த அரசாங்கம் என்ன திட்டங்களை நடைமுறைப்படுத்தி இருக்கின்றது? எங்களுடைய வடக்கு, கிழக்குப் பகுதியில் யுத்தத்தால் அங்கவீனமான பெண்கள் இருக்கின்றார்கள்; கணவன்மாரை இழந்த பெண்கள் இருக்கின்றார்கள்; இறுதி யுத்தத்தின்போது இராணுவத்தினரிடம் தங்கள் கணவன்மாரை நேரடியாக உயிரோடு ஒப்படைத்த பெண்கள் இருக்கின் றார்கள். என்னைப் பொறுத்தவரையில், அவர்களுக்கு மன நிம்மதியைக் கொடுக்கக்கூடிய விடயத்தில் அரசாங்கம் தோல்விகண்டு இருக்கின்றது. நல்லிணக்கம் ஏற்படுவதற்குரிய வாய்ப்பை அவர்களிலிருந்து ஆரம்பிக்க வேண்டும் என்பது என்னுடைய கருத்தாக இருக்கின்றது. இலங்கையில் யுத்தம் முடிவுற்று 15 ஆண்டுகளாகியும், தாங்கள் ஒப்படைத்த கணவன்மாருக்கு என்ன நடந்ததென்று தெரியாத நிலையில், அது பற்றி தெரியப்படுத்துமாறு இன்றும் அப்பெண்கள் அரசாங்கத்திடமும் சர்வதேசத்திடமும் மனித உரிமைகள் அமைப்புகளிடமும் தொடர்ச்சியாகக் கோரிக்கைகளை முன்வைத்தும், போராட்டங்களை நடத்தியும் வருகின்றார்கள்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු චාල්ස් නිර්මලනාදන්)
(The Hon. Charles Nirmalanathan)
මට තව්පරයක් දෙන්න.

[ගරු වාල්ස් නිර්මලනාදන් මහතා]

பெண்களை வலுவூட்ட வேண்டும் என்ற நோக்கில் கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்தச் சட்டமூலத்தின்மூலம் அவர்கள் எவ்வாறு நன்மை பெறுவார்கள், அவர்களுக்கென எவ்வாறான நல்ல திட்டங்களை வகுக்க முடியும், அவர்கள் விடயத்தில் உண்மையைக் கண்டறிவதற்கு என்ன செய்ய வேண்டும் என்பது தொடர்பில் அரசாங்கம் சிந்திக்க வேண்டும். அதன் அடிப்படையில் நல்லிணக்கம் உருவாக்கப்பட வேண்டும். மூல காரணத்தை விட்டுவிட்டு, நல்லிணக்கத்தை ஏற்படுத்த முடியாதென்பதை இந்தச் சந்தர்ப்பத்தில் கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Imran Maharoof. You have ten minutes.

[பி.ப. 2.53]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று எங்களுடைய திருகோணமலை மாவட்டம் சார்ந்த சில விடயங்களை இந்தச் சபையில் பேசலாமென நினைக்கின்றேன். அதிலும் குறிப்பாக, திருகோணமலை கல்வி வலயத்திலுள்ள ஸாஹிரா கல்லூரி மாணவிகளுடைய GCE A/L பரீட்சைப் பெறுபேறுகள் இன்னமும் வெளிவராமை தொடர்பில் பேசலாமென நினைக்கின்றேன்.

இந்தச் சபையில்கூட, இவ்விடயம் சம்பந்தமாகப் பல தடவை பேசப்பட்டன. நேற்றுக்கூட, என்னுடைய வேண்டுகோளுக்கு இணங்க, எதிர்க்கட்சித் தலைவர் கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் இந்தச் சபையில் கௌரவ கல்வி அமைச்சரிடம் அந்த மாணவிகளுடைய பெறுபேறுகளை மிக விரைவில் வெளியிட வேண்டுமெனக் கோரிக்கை விடுத்தார். அதன்போது கௌரவ அமைச்சர் அவர்கள், அம்மாணவிகளுடைய பரீட்சைப் பெறுபேறுகளை இன்னும் 2 - 3 நாட்களுக்குள் வெளியிடுவதாகக் கூறியிருந்தார். சம்பந்தப்பட்ட பரீட்சை நிலையத்தில் கடமையாற்றிய அதிகாரியின் விசேட முறைப்பாடு காரணமாகத்தான் அந்த மாணவிகளுடைய பெறுபேறுகளை வெளியிடுவதில் காலதாமதம் ஏற்பட்டிருக்கிறது என்றும் மாணவிகளுடைய பெறுபேறுகளில் எவ்வித மாற்றமும் நடைபெறாது என்றும் அவர் கூறியிருந்தார்.

பரீட்சைப் பெறுபேறுகள் வெளிவராமையானது, அந்த மாணவிகளுக்கும் அவர்களுடைய பெற்றோருக்கும் மிகவும் கவலையை ஏற்படுத்தியிருக்கிறது. ஏனெனில், 12 வருடங்கள் பாடசாலையில் கல்வி கற்ற அந்த மாணவிகள், தங்களுடைய எதிர்காலத்தைத் திட்டமிடுவதற்காக க.பொ.த. உயர் தரப் பரீட்சைப் பெறுபேறுகளை எதிர்பார்த்துக் காத்திருந்த சந்தர்ப்பத்திலே இவ்வாறான நிகழ்வு நடைபெற்றிருக்கிறது. ஆகையால், அந்த மாணவிகளுடைய, அவர்களது பெற்றோருடைய மன உளைச்சலையும் அவர்களுடைய தற்போதைய நிலைப்பாட்டையும் அவர்களுடைய எதிர்காலத்தையும் கருத்திற் கொண்டு, மிக விரைவில் அவர்களுடைய பரீட்சைப் பெறுபேறுகளை வெளியிடுவதற்கான நடவடிக்கைகளை உரிய அதிகாரிகள் எடுக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக்கொள்கின்றேன். க.பொ.த. உயர் தரப் பரீட்சைப் பெறுபேற்றை மீளாய்வு செய்வதற்கு - re-correctionக்கு - விண்ணப்பிப்பதற்கான கால அவகாசம் கடந்த 19ஆம் திகதியுடன் அதாவது நேற்றுடன் நிறைவடைந்து விட்டது. ஆனால், இந்த மாணவிகள் இன்னும் பெறுபேறுகளை எதிர்பார்த்தவர்களாக இருக்கின்றார்கள். அவர்களுடைய பெறுபேறுகள் வெளிவந்ததன் பின்னர், அவர்களுக்கு re-correctionக்கு விண்ணப்பிப்பதற்கான விசேட ஒழுங்கொன்றை செய்துதர வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். பல்கலைக்கழக அனுமதிக்கான செயற்பாடுகள் எதிர்வரும் 05ஆம் திகதி ஆரம்பிக்கப்பட இருக்கின்றன. அந்த விடயத்திலும் அந்த மாணவிகளுக்கு எந்தவொரு பாதிப்பும் ஏற்படாமல், அவர்கள் தங்களுடைய கற்றல் செயற்பாடுகளை சிறந்த முறையில் முன்னெடுப்பதற்கான நடவடிக்கைகளை உரிய அதிகாரிகள் எடுக்க வேண்டுமெனவும் நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய பிரதேசம் கல்வியில் பின்தங்கிய ஒரு பிரதேசமாக இருந்தாலும், இன்று எங்களுடைய மாணவ, மாணவிகள் கல்வியில் ஓரளவுக்கு முன்னேறி வருகின்றார்கள். இச்சந்தர்ப்பத்தில் இவ்வாறான செயற்பாடுகள் இடம்பெறுவது உண்மையிலேயே எங்களுடைய பிரதேசத்தில் இருக்கின்ற மக்களுக்குக் கவலையை அளிக்கின்றது. ஆகையால், எதிர்காலத்தில் இவ்வாறான செயற்பாடுகள் இடம்பெறாமல் தடுப்பதற்குரிய அல்லது இவ்வாறான விடயங்கள் இனிமேலும் நடக்காமல் இருப்பதற்கான நடவடிக்கைகளை கல்வி அமைச்சு உரிய முறையில் மேற்கொள்ள வேண்டும் என்பது எங்களுடைய கோரிக்கையாகும். எனவே, இந்த விடயத்துக்குப் பொறுப்பான அனைத்து அதிகாரிகளும் இதில் கவனம் செலுத்தி, மிக விரைவில் சிறந்ததொரு தீர்வைப் பெற்றுத்தர வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அண்மைக்காலமாக எங்களுடைய திருகோணமலை மாவட்டத்தில் மக்கள் போராட்டங்கள் இடம்பெற்று வருகின்றன. இன்று எங்களுடைய பிரதேசத்திலுள்ள மக்கள் தங்களுடைய உரிமை சம்பந்தமான விடயங்களுக்காகவும் பாதுகாப்பு சம்பந்தமான விடயங்களுக்காகவும் வாழ்வாதாரம் சம்பந்தமான விடயங்களுக்காகவும் போராடவேண்டி இருக்கிறார்கள். அண்மையில் மூதூர், இருதயபுர பகுதியில் இடம்பெற்ற போராட்டமானது, எல்லோராலும் கவனிக்கப்பட வேண்டிய தொன்றாகும். அப்பகுதியில் மதுபானசாலை திறக்கப்படுவதற்கு எதிர்ப்புத் தெரிவித்தே அந்தப் போராட்டம் இடம்பெற்றிருக்கிறது. அந்த ஆர்ப்பாட்டத்தில் அப் பிரதேசத்தில் இருக்கின்ற பொதுமக்கள், சமூக ஆர்வலர்கள், மாணவர்கள், சமயத் தலைவர்கள் எனப் பலரும் கலந்து கொண்டு, தங்களுடைய எதிர்ப்பை வெளியிட்டிருந்தார்கள். நாங்கள் இந்த விடயத்தில் கவனம் செலுத்த வேண்டும். இவ்வாறான பின்தங்கிய கிராமங்களில் மதுபானசாலைகளைத் திறப்பதால் எவ்வாறான தாக்கங்கள் ஏற்படும் என்பது பற்றி நாங்கள் சிந்திக்க வேண்டும். இன்று எல்லா விடயங்களிலும் பின்தங்கிய நிலையில் இருக்கின்ற கிராமங்களில் இதுபோன்ற விடயங்களை முன்னெடுக்கின்றபொழுது, கல்வி உட்பட ஏனைய விடயங்களில் இன்னுமின்னும் பின்தள்ளப்படக்கூடிய நிலையே ஏற்படும். ஆகையால், தயவுசெய்து இவ்வாறு புதிதாக மதுபானசாலைகள் திறக்கப்படுவதை நிறுத்துவது தொடர்பில் உரிய நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டுமென நாங்கள் இந்த உயரிய சபையில் கேட்டுக்கொள்கின்றோம். அந்த மதுபானசாலைகளுக்கு அண்மையில் பாடசாலைகள், மதஸ்தலங்கள் போன்ற முக்கிய பல இடங்கள் காணப்படு கின்றன. அவ்வாறான இடங்களுக் கருகாமையில் மதுபான சாலைகள் திறக்கப்படுகின்றபொழுது, அவை எவ்வாறான தாக்கத்தை ஏற்படுத்தும் என்பது பற்றி நாங்கள் சிந்திக்க வேண்டும். இவ்விடயம் பிரதேச செயலாளர்

මත්‍රුම් අරසාඞ්ක අතිපරිඞ්ගේ කවනත්තුක්කුක් කොණ්ටුවරප් පට්ටු, තත්කාලිකමාක *[ඉටෙයීටු]* කොටුත්තිරුක්කිරාර්කළ් එන්‍රුතාන් නාඞ්කළුම් සොල්කිරෝම්. *[බාධා කිරීමක්]* ඒ සම්බන්ධ විස්තර ටික අපි DS එකට දීලා තිබෙනවා. දැනට තාවකාලිකව නවත්වලා තිබෙනවා. පාසල තිබෙනවා, church එක තිබෙනවා. ඒ වාගේ තවත් ස්ථාන තිබෙනවා.

තත්පොළුතු, අඞ්කු මදුපානසාලෙ තිරක්කප්පටුවතු තත්කාලිකමාක නිරුත්තප්පට්ටාලුම්, අතු මුළුමෙයාක නිරුත්තප් පට වේණ්ටුම් එන්පතු අඞ්කුළ්ළ මක්කළුටෙය කෝරික්කෙ යාකුම්. අන්තප් පිරදේසත්තිල් ඉරුක්කින්‍ර මක්කළ් ඉන, මත, පිරදේස වේරුපාටුකළුක්කු අප්පාල් ඔන්‍රුපට්ටු, තඞ්කළුටෙය උරිමෙක්කාකප් පෝරාටුකින්‍රාර්කළ්. එනවේ, ඉන්ත විටයත්තිල් අරසාඞ්කම් කවනම් සෙලුත්ති, උරිය නටවටික්කෙ කළෙ එටුක්ක වේණ්ටුමෙන නාන් ඉන්ත ඉටත්තිල් කේට්ටුක් කොළ්කින්‍රේන්.

කෞරව තලෙමෙතාඞ්කුම් උරුප්පිනර් අවර්කළේ, කිණ්ණියා, පාලත්තටියිල් ඉම්මාතම් 12ආම් තිකති මීනවර්කළින් ආර්ප්පාට්ටමොන්‍රු නටෙපෙට්‍රතු. මීනවර්කළ් පල්වේරු කෂ්ටඞ්කළෙයුම් පිරච්සිනෙකළෙයුම් එතිර්නෝක්කු කින්‍රාර්කළ් එන්පතු උඞ්කළුක්කුත් තෙරියුම්! පල්වේරු කෂ්ටඞ්කළුක්කුම් පිරච්සිනෙකළුක්කුම් මත්තියිල් තොළිලුක්කුච් සෙල්කින්‍ර මීනවර්කළුටෙය boats, වලෙකළ් පෝන්‍ර සොත්තුක්කළ් කෛප්පට්‍රප්පටුකින්‍රන. කුරිප්පාක, අනුමති වළඞ්කප්පට්ටිරුක්කින්‍ර සුරුක්කු වලෙ මීන්පිටියිල් ඊටුපටු කින්‍ර මීනවර්කළුටෙය උටෙමෙකළ් Navyආල් කෛප් පට්‍රප්පටුකින්‍ර නිලෙප්පාටු කාණප්පටුකින්‍රතු. ඉතනාල් අන්ත මීනවර්කළ් මේලතික කට්ටණඞ්කළෙච් සෙලුත්තවේණ්ටි ඒට්පටුකින්‍රතු. මේලුම්, අවර්කළ් තඞ්කළුටෙය තොළිලෛත් තොටර්න්තු පල නාට්කළුක්කුච් සෙය්ය මුටියාත නිලෙක්කුත් තළ්ළප්පටුකින්‍රාර්කළ්. අතුමාත්තිරමන්‍රි, කාලතාමතඞ්කළුම් ඒට්පටුකින්‍රන. සිල නේරඞ්කළිල් තඞ්කළුටෙය උටෙමෙ කළෙ මීළප්පෙර මුටියාත නිලෙක්කුම් අවර්කළ් තළ්ළප්පටු කින්‍රාර්කළ්. නාඞ්කළ් ඉන්ත විටයත්තෛ කෞරව අමෙච්චර් අවර්කළුටෙය කවනත්තුක්කුක් කොණ්ටුවන්තෝම්. අතන් විළෙවාක, අවර් එඞ්කළුටෙය පිරදේසත්තුක්කු වරුකෛ තන්තු, නිලවරඞ්කළෙ නේරටියාක අවතානිත්තුවිට්ටු, උරිය අතිකාරිකළුටන් කතෛත්තිරුන්තාර්. ආනාලුම්, ඉතුවරෛ අතර්කාන දීර්වු කිටෙක්කාත නිලෙප්පාටේ කාණප්පටු කින්‍රතු. එනවේ, එඞ්කළුටෙය පිරදේසත්තිලුළ්ළ මීනවර් කළුටෙය උටෙමෙකළෙප් පාතුකාත්තු, අවර්කළ් තඞ්කළතු තොළිලෛච් සිරන්ත මුරෙයිල් මේට්කොළ්වතර්කුරිය සූළලෙ උරුවාක්ක වේණ්ටුමෙන නාන් ඉන්ත ඉටත්තිල් තයවාකක් කේට්ටුක්කොළ්කින්‍රේන්.

කිණ්ණියා කුරිඤ්සාක්කේණි පටකු විපත්තු ඉටම්පෙට්‍රු මූන්‍රු වරුටඞ්කළාකින්‍රතු. ඉන්ත විපත්තිල් පලර් උයිරිළන්තාර්කළ්. ඉරණ්ටු උයිර්කළෙ ඉළන්ත කුටුම්පඞ්කළුම් කාණප්පටුකින්‍රන. එනිනුම්, ඉතුවරෛ අන්ත විපත්තිල් උයිරිළන්තවර්කළින් කුටුම්පත්තිනරුක්කු නෂ්ටඊටු වළඞ්කප් පටවිල්ලෛ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(මාණ්පුමිකු ඉම්රාන් මහ්රූප්)
(The Hon. Imran Maharoof)
Okay.

ඉතු පත්‍රික් කේට්ටාල්, ඉප්පොළුතු ඉව්විපත්තු සම්පන්තමාන වළක්කු නටෙපෙරුවතාකවුම්, වළක්කු මුටින්ත පිරකුතාන් අවර්කළුක්කාන නෂ්ටඊට්ටෛක් කොටුක්ක මුටියු මෙන්‍රුම් සොල්කින්‍රාර්කළ්. අන්ත වළක්කු එප්පෝතු මුටිවටෙයුම්? අවර්කළුක්කාන නෂ්ටඊටු එප්පෝතු වළඞ්කප්පටුම්? එන නාඞ්කළ් කේට්කින්‍රෝම්. තයවුසෙය්තු අන්ත විපත්තිල් උයිරිළන්තවර්කළින් කුටුම්පත්තිනරුක්කුම් කායප්පට්ටවර්කළුක්කුමාන නෂ්ටඊටුකෛළෛ මික විරෛවිල් වළඞ්කුවතර්කුරිය නටවටික්කෛකළෛ අරසාඞ්කම් එටුක්ක වේණ්ටුමෙනක් කේට්ටු, එනතු උරෛයෛ නිරෛවු සෙය්කින් රේන්. නන්‍රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Next, the Hon. (Dr.) Sarath Weerasekera. You have ten minutes.

[අ.භා. 3.02]

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
(මාණ්පුමිකු (කලානිති) චරත් වීරචේකර)
(The Hon. (Dr.) Sarath Weerasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත සහ කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත ගැන තමයි අද අප කථා කරන්නේ.

යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පිහිටුවීමේ පරමාර්ථ ගැන අපි දන්නවා. ශ්‍රී ලංකාව තුළ යුනෙස්කෝ එක විසින් අරමුදල් සපයන ලද හෝ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සියල්ල මෙහෙයවීම සඳහා, යුනෙස්කෝහි සියලු තීරණ ආදිය සහ වෙනත් සාධන පත්‍ර සම්බන්ධයෙන් මුල පිරීම, සම අනුග්‍රහය දැක්වීම සහ අනුමත කිරීම සඳහා, කිසිදු වෙනස්කමකින් තොරව ශ්‍රී ලාංකිකයන්ගේ යහපත සහතික කිරීමෙහි ලා උපකලාපීය, කලාපීය සහ ජාත්‍යන්තර යුනෙස්කෝ කටයුතුවලදී ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සහභාගිත්වය සඳහා වගකීම භාර ගැනීම ආදි වශයෙන් පරමාර්ථ කිහිපයක් තිබෙනවා. ඇත්ත වශයෙන් ඒ පරමාර්ථ හොඳයි. ඒවා සම්බන්ධයෙන් අපට කිසිදු ගැටලුවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කරුණාකර අවස්ථාව දෙන්න, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත ගැන යමක් වැඩිදුර කියන්න. මේකට ඡන්දයක් තියාවිද නැද්ද කියා මා දන්නේ නැහැ. නමුත් අප ඉදිරිපත් කරපු සංශෝධන තවමත් මේ ගරු සභාවට ඉදිරිපත් කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ඒ සංශෝධනවලින් කිව්වේ, "කාන්තාව" කියන තැනැත්තිය -"කාන්තාව" යනු කවරෙක්ද කියන එක- අර්ථකථනය කළ යුතුය, නිර්වචනය කළ යුතුය කියලායි. ඇත්ත වශයෙන්ම කාන්තාව යනු කවරෙක්ද? කාන්තාව කියන්නේ, ජීව විද්‍යාත්මකව මව් කුසකින් ඉපදුණු තැනැත්තියක්. එතකොට ශල්‍ය කර්මවලින්, තමන්ගේ ඕනෑකමට, විලාසිතාවක් වශයෙන් කාන්තාවක බවට පරිවර්තනය වන අයට කාන්තාවන්ට සමාන අයිතිවාසිකම් ලැබෙන්නේ නැහැ. එහෙම ලබා දුන්නොත් සිදු වන්නේ, අප ඒ ක්‍රියාවලිය වක්‍රව අනුමත කිරීමක්. ඒ වාගේම තමයි "විවාහය" කියන එකත්. අප දන්නා පරිදි, බටහිර රටවල කාන්තාවන් කාන්තාවන් සමඟ විවාහ වෙනවා; පිරිමි පිරිමි සමඟ විවාහ වෙනවා. ඒවා වළක්වා අපේ සංස්කෘතිය ආරක්ෂා කර ගන්න ඕනෑ නම්, "විවාහය" කියන එකත් නිර්වචනය කළ යුතුයි. ඇත්ත වශයෙන්ම ජීව විද්‍යාත්මකව

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

ඉපදුණු පිරිමියෙකු සහ ජීව විද්‍යාත්මකව ඉපදුණු ගැහැනියක අතර සිදු වන සාම්ප්‍රදායික විවාහය තමයි විවාහයක් වෙන්න ඕනෑ. ඒ වාගේම ගර්භිණී කාන්තාව, මව් පදවිය, මව් කුසේ කලලය කියන මේ දේවල් ද අර්ථ දක්වන්න ඕනෑ. එහෙම නැත්නම් වෙන්නේ කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත මඟින් නීති විරෝධී ගබ්සාව, ගණිකා වෘත්තිය වාගේ දේවල් වක්‍රව අනුමත කිරීමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සභාපතිතුමා වන වන්දු නිමල් වාකිෂ්ඨ මැතිතුමා - හිටපු DIG- මේ සම්බන්ධයෙන් ඉතා පැහැදිලි ලිපියක් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාට ඉදිරිපත් කර තිබෙනවා. ඒ ලිපියේ සඳහන් කරුණු මම ඉතා කෙටියෙන් කියන්නම්. එහි සඳහන් වනවා, "මෙම කාන්තා සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පතේ සමහර විධිවිධාන මෑතකදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්ත්‍රී-පුරුෂ සමානතා පනත් කෙටුම්පත සම්බන්ධව දෙන ලද විශේෂ තීන්දුකරණයේ -ඒ කියන්නේ, SC SD 54/2024 සහ SC SD 55/2024 හි- අඩංගු කාරණාවලට ඉදුරාම ඍණාත්මක බලපෑමක් ඇති කරන බව නිරීක්ෂණය වේ... මෙහි 'සවිබල ගැන්වීම' යන වචනයම ව්‍යවස්ථා විරෝධී වේ. ඊට හේතුව නම් 12 (4) ව්‍යවස්ථාව අනුව කළ හැක්කේ කාන්තාවන් 'සවිබල ගැන්වීම' නොව කාන්තාවන්ගේ 'ප්‍රගතියට' රජය විසින් අවශ්‍ය පියවර ගැනීම වේ." යනුවෙන්. "ප්‍රගතිය" කියලායි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන්ව තිබෙන්නේ. එහෙම නැතිව "සවිබල ගැන්වීම" යන්න නොවෙයි.

ඊළඟට එහි සඳහන් වනවා, "මෑතකදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්ත්‍රී-පුරුෂ සමානාත්මතා - Gender Equality Bill - පනත් කෙටුම්පතට එරෙහිව දෙන ලද SC SD 54/2024 සහ SC SD 55/2024 දරන ඉහත නඩු තීරණයේදී ශ්‍රේෂ්ඨාධිකරණය අවධාරණය කළේ 12 (4) ව්‍යවස්ථාව 'කඩුවක්' නොව 'පලිහක්' ලෙස භාවිත කළ යුතු බවයි. එනම්, රජය විසින් 12 (4) ව්‍යවස්ථාව භාවිත කළ යුත්තේ කාන්තාවන්ගේ 'ප්‍රගතිය' සඳහා මිස 'සවිබල ගැන්වීමක්' සිදු කිරීමට නොවේ" යනුවෙන්. 'සවිබල ගැන්වීමක්' සිදු කළ හොත් එය අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (4) ව්‍යවස්ථාව සමඟ කියවන ලද 12 (1) හා 12 (2) ව්‍යවස්ථාවට සම්පූර්ණයෙන් පටහැනි වන බව තමයි සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය ඉතා පැහැදිලිව කියා සිටින්නේ.

ඒ වාගේම ඔවුන් කියා සිටිනවා, "පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත හා සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේදී අධිකරණය පවසා සිටියේ, 12 (4) ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමේදී 12 (1) ව්‍යවස්ථාවේ සමානාත්මතාව - right to equality - යන මූල ධර්මයට පටහැනිව රජය විසින් ක්‍රියා කළ නොහැකි බවයි" යනුවෙන්. කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම මේ යටතේ පිහිටුවනවා.

මෙම පනත් කෙටුම්පත මඟින් ස්ථාපනය කෙරෙන කොමිසම මඟින් එම කෙටුම්පතේ 16 සිට 27 දක්වා වගන්තිවලට අනුව කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් දැනට ස්ථාපිත මානව හිමිකම් කොමිෂන් සභාවේ බලතල අමු අමුවේ උල්ලංඝනය කරන බවත්, ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1), 12 (2) ව්‍යවස්ථා උල්ලංඝනය කරමින් පුරුෂයන්ගේ සමානතාව උල්ලංඝනය කරමින් පිරිමින්ට වෙනස් කොට සැලකීමක් ද මෙයින් සිදු වන බවත් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය පැහැදිලිව කියා සිටිනවා, ගරු රාජ්‍ය අමාත්‍ය ගීතා කුමාරසිංහ මැතිනියනි.

ඒ වාගේම, එම ලිපියේ සඳහන් වනවා, "කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ව්‍යවස්ථාවේ 126වන ව්‍යවස්ථාව යටතේ මෙවන් කොමිසමක් පිහිටුවීම සම්පූර්ණයෙන්ම ව්‍යවස්ථා විරෝධී වේ. කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩ කිරීම විමසීම සඳහා 126 වන ව්‍යවස්ථාව යටතේ දැනටමත් ශ්‍රේෂ්ඨාධිකරණයට අමතරව මානව හිමිකම් කොමිෂන් සභාවක් ස්ථාපිත කර ඇත" යනුවෙන්.

ඒකටත් අමතරව තමයි කාන්තාවන් සම්බන්ධයෙන් මේ කොමිසම පිහිටුවන්න යන්නේ.

එම ලිපියෙහි තවදුරටත් සඳහන් වනවා, "තවද ඉහත කෙටුම්පතේ 16 සිට 27 දක්වා වගන්ති ව්‍යවස්ථාවේ 126වන ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් උල්ලංඝනය කරමින් රජයට එරෙහිව පමණක් නොව තනි පුද්ගලයෙකුට එරෙහිව වුවද මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට ඉහත කී කාන්තාවන් සඳහා වූ ජාතික කොමිෂන් සභාවට බලය ලබා දී ඇත.

කෙටුම්පතේ ස්ත්‍රී - පුරුෂභාවය සහ 'ලිංගික දිශානතිය' යන වචන ව්‍යවස්ථා විරෝධී වේ. මෙම පනත් කෙටුම්පතේ බොහෝ වගන්තිවල ස්ත්‍රී - පුරුෂභාවය; gender හෝ 'ලිංගික දිශානතිය' - sexual orientation - යන වචනය සඳහන් වේ. අපගේ ව්‍යවස්ථාව මෙම සිද්ධාන්තය පිළිගන්නේ නැත" යනුවෙන්.

"මෑතකදී තීරණය කළ .... ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පනත් කෙටුම්පත - Gender Equality Bill - නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණ ගරු විනිසුරු ප්‍රීති පද්මන් සූරසේන මහතා කියා සිටියේ, 'ස්ත්‍රී - පුරුෂභාවය' -'gender'- යන්න ස්ත්‍රී - female - සහ පුරුෂ - male - යන කොටියාසවලට වෙනස් බව ය. අපගේ ව්‍යවස්ථාව අනුව පිළිගෙන ඇත්තේ ස්ත්‍රී - female - සහ පුරුෂ - male - යන කොටියාස දෙක පමණි. ඒ අනුව 'ස්ත්‍රී - පුරුෂභාවය' හෝ 'ලිංගික දිශානතිය' 12 (2) ව්‍යවස්ථාවේ සැලකිල්ලට භාජන කළ නොහැක. එතුමා තවදුරටත් කියා සිටියේ, 'ස්ත්‍රී - පුරුෂභාවය' යන්න ස්ත්‍රී හෝ පුරුෂ යන කොටියාස දෙකට පරිබාහිරව විය හැක. මෙය ව්‍යවස්ථාවට මෙන්ම අපගේ සංස්කෘතියට ද පටහැනිය. මෙරට අදහන සියලු ආගම් ඉහත සංස්කෘතියෙන් බැහැරව ක්‍රියා කර නොමැත. එනම් ඉහත සංස්කෘතිය හා ආගම් මෙරට මහ ජනතාවගේ ගුණාංග මෙන්ම හැසිරීම් රටාව ද වේ. රටක මහ ජනතාවගේ සංස්කෘතික සහ ආගම් සම්බන්ධ හැසිරීම් රටාව එම රටේ නීතියෙන් වෙනස් විය නොහැකිය යන්නයි. ගරු විනිසුරුතුමා තවදුරටත් පැවසීය.

කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පතේ 8 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවේ ප්‍රධානියා ලෙස කාන්තාවක් පමණක් පත් කිරීමට හැකි වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) සහ 12 (2) ව්‍යවස්ථා උල්ලංඝනය කරයි. මෙමඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ස්ත්‍රී හා පුරුෂ යන දෙපාර්ශ්වයටම සහතික කර ඇති සමානාත්මතාවයේ අයිතිය - right to equality - උල්ලංඝනය වේ. කොමිසමේ ප්‍රධානියා ලෙස කාන්තාවක් පමණක් පත් කිරීමට හැකිවීම පුරුෂ පාර්ශ්වයට වෙනස් කොට සැලකීමක් ද වේ.....

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන වගන්තිවලට අමතරව තවත් වැදගත් කරුණක් වන්නේ මෙම LGBTQ මතවාදය බටහිර සංස්කෘතික ආක්‍රමණයේ කොටසක් බව අවබෝධ කර ගැනීමයි. මෙම ලිපියේ ඇමුණුම් මඟින් ළමයින් සහ වැඩිහිටියන් යන දෙපිරිසගේම ලිංගිකත්වය වෙනස් කිරීම,

මෙම 'ලිංගභේදය' අත්හදා බැලීම ක්‍රියාත්මක වූ ආකාරය සහ දැන් බටහිර රටවල දෙමවුපියන් විරුද්ධ වී පාරට බැස ඇති ආකාරය දක්නට ලැබේ" යනුවෙන් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය එම ලිපියෙන් තවදුරටත් සඳහන් කරනවා.

බටහිර රටවල එය අසාර්ථක වූ තැන නීති සම්පාදනය හරහා එම වැරැද්දම කිරීමට ශ්‍රී ලංකාව මෝඩ නොවිය යුතු බවට අප වග බලා ගත යුතු ය. මෙම කෙටුම්පත පූර්වගාමී ජනාධිපතිවරයාට ඡන්දය ලබා දුන් මිලියන 6.9ක ඡන්ද දායකයන්ගේ හා ඉන් අනතුරුව පැවැත්වූ මහ මැතිවරණයේදී ව්‍යවස්ථාදායකයට තුනෙන් දෙකක බලයක් ලබා දුන් ඡන්ද දායකයන්ගේ ජන වරමට සම්පූර්ණයෙන්ම පටහැනි වේ. එම මැතිවරණවලදී පොරොන්දු වූ "එක රටක්- එක නීතියක්" යන සංකල්පය මෙම කෙටුම්පත මඟින් සම්පූර්ණයෙන්ම උල්ලංඝනය වේ.

ඒ වාගේම, මෙම කෙටුම්පත දැනට ඇති ආකාරයට නීතිගත කිරීම ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කිරීමක් මෙන්ම ජනතා පරමාධිපත්‍යය හාස්‍යයට ලක් කිරීමකි. එසේ වුවහොත්, මේ පිළිබඳව දැනුවත් වූ වහාම මෙරට ජනතාව ද රජය දැඩි පිළිකුලකට ලක් කරමින් මෙතෙක් නොවූ ආකාරයට මෙවැනි ව්‍යවස්ථා විරෝධී අණපනත් නීතිගත කිරීම සම්බන්ධයෙන් රජය මහජනතාවට වග විය යුතු බවට දැඩි ලෙස රජයට බලපෑම් එල්ල කරනු ඇති බව නොකිවමනාය.

තවදුරටත් මින් ඉදිරියේදී මේ හා සමාන අණපනත් ඉදිරිපත් කිරීමට ප්‍රථම ලාංකික ජනතාවගේ ඓතිහාසික උරුමයන්ට, සභ්‍යත්වයට, සංස්කෘතික හා ආගමික පරිසරයට, දේශීය ආර්ථිකයට, සාමය හා පැවැත්මට හානි නොවන බවට හා මෙම රටේ භූමිපුත්‍රයන්ගේ අයිතිවාසිකම්, විදේශිකයන්ට හා ජාත්‍යන්තර න්‍යාය පත්‍රවලට පාවා නොදෙන බවට සහතික කිරීම පිණිස ප්‍රමාණවත් කාලසීමාවක් මහජනතාවට සහ ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදකවරුන්ට සුපරීක්ෂාකාරී අධ්‍යයනයක් කිරීම සඳහා ලබා දිය යුතු බවටත්, කඩිමුඩියේ මෙවැනි පනත් කෙටුම්පත් නීති බවට පත් කිරීමේ ක්‍රියාවලියෙන් බැහැර වන ලෙසත් ඉල්ලා සිටී.

අවසාන වශයෙන්, "ඉහත සඳහන් කරුණු අවධානයට ලක්කොට ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය නොවන අයුරින් අවශ්‍ය සංශෝධන සිදු කරන මෙන් සමස්ත බෞද්ධ හා ලාංකික ප්‍රජාව වෙනුවෙන් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සමස්ත සාමාජිකත්වය වෙනුවෙන් ඉතා කරුණාවෙන් හා ගෞරවයෙන් ඉල්ලා සිටිමු." කියලා තමයි සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් විතර තිබෙනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්.

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පෙර දී කිව්වා වාගේ අවුරුදු 2500ක ඉතිහාසයක් තිබෙන අපේ රට භෞතික වශයෙන් ඉන්දියාවේ ආක්‍රමණ 17කට ලක් වුණා. ඒ වාගේම පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි කියන බටහිර ජාතීන් අපේ රට තුන් වතාවක් ආක්‍රමණය කළා. ඒ භෞතික ආක්‍රමණ සියල්ලක්ම අපේ මුතුන් මිත්තන් ඉතා හොඳින් පරාජය කරලා, අපේ රටේ ඒකීයභාවය ආරක්ෂා කළා. දැන් මේ කරන්න හදන්නේ, ඒ භෞතික ආක්‍රමණ පරාජය කරපු නිසා සංස්කෘතිකමය වශයෙන් මේ විධියට අපේ රට ආක්‍රමණය කරන්නයි. අපට හොඳ බෞද්ධ සංස්කෘතියක් තිබෙනවා. අපේ පැවැත්මක් තිබෙනවා, අපේ අනන්‍යතාවක් තිබෙනවා. ඒ අනන්‍යතාව ඇත්ත වශයෙන්ම අහෝසි වුණොත්, අපේ රට ජාතියට පැවැත්මක් නැති වෙනවා. ඒ නිසා කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත මඟින් වක්‍රව කරන්න යන දේ ඇත්ත වශයෙන්ම අපි හෙළා දකිනවා.

ඒ වාගේම, "කාන්තාව" යන්න නිර්වචනය කිරීමේදී ඒ තුළ තිබෙන විවාහයෙන් පසු ගර්භිණී මාතාව, මව් කුසේ වැඩෙන කලලය, මව් පදවිය කියන කාරණා පිළිබඳව සලකා බලා ඉතා පැහැදිලිව කාන්තාවන්ට සම තැන දීමට අපි කැමැතියි. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත්, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත තුළින් වක්‍රව කෙරෙන කටයුතු තමයි අපි හෙළා දකින්නේ. ඒකට අපි ඉඩ නොදිය යුතුය කියන එකයි මේ අවස්ථාවේදී මා කියා සිටින්නේ. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Patali Champika Ranawaka. You have eight minutes.

[අ.භා. 3.15]

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කාන්තාවන් පිළිබඳව ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම සම්බන්ධයෙන් වන, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත පිළිබඳවත්, යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත පිළිබඳවත් සාකච්ඡා කෙරෙනවා. පසුගිය දින කිහිපය තුළ මේ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීන්දුව ගැන ජනාධිපතිතුමාත්, ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුත් විවිධ අදහස් පළ කළා. ශ්‍රේෂ්ඨාධිකරණය මේ පාර්ලිමේන්තුවට යටත්ව පවතින බව ඇත්තක්. මේ පාර්ලිමේන්තුව තමයි නීති තනන ප්‍රධාන ස්ථානය. කෙසේ නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණය බොහෝ දුරට තමන් ඉදිරියේ තිබෙන නීති තර්ක, දැනට තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, පවතින නීතිය සහ අතීත තීන්දු කියන කරුණු සලකා බලා තමයි යම් යම් නිගමනවලට එළැඹෙන්නේ. අපේ යම් දාර්ශනික අදහස් තිබෙන්න පුළුවන්. යම් දේශපාලනික අදහස් තිබෙන්න පුළුවන්. යම් සංස්කෘතික හා ආගමික අදහස් තිබෙන්න පුළුවන්. නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණයට ඒවා වැදගත් නැහැ.

ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීන්දු, තීරණ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයෙන්ම යම් විමසීමක් කරලා ඒවා වෙනස් කරන්න උත්සාහ කරනවා මිසක්, පාර්ලිමේන්තුව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට බලපෑම් කිරීම කිසිසේත් සුදුසු නැහැ. අතීතයේ ඉඳන් පාර්ලිමේන්තුවේ අවස්ථා ගණනාවක එවැනි සිදුවීම් අපි දැක්කා. ඒ සම්බන්ධයෙන් විවිධ කථානායකවරු ක්‍රියා කරපු ආකාරයක් තිබුණා. ඒ වාගේම පාර්ලිමේන්තුව හැසිරුණු ආකාරයක් තිබුණා. අතීතයේ තිබුණු ඒ යම් අවිනීත, අශීලාචාර, නීති විරෝධී, ජුගුප්සාජනක හැසිරීම්වලින් නොරව යම් විනයානුකූල තත්ත්වයකට පාර්ලිමේන්තුව පත් කර ගත යුතුයි. රජයට අවශ්‍ය නම් මේ පනත් කෙටුම්පත පිළිබඳව යම් වෙනස්කමක් කරන්න, නැවත ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා යම් විමසීමක් කරලා ඒක කරනවා මිසක්, පාර්ලිමේන්තු කමිටු පත් කිරීම මඟින් ව්‍යවස්ථාවට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය විමසීමට තිබෙන බලය අභියෝගයට ලක් කළ යුතු නැහැ කියන එක තමයි අපගේ මතය.

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

කාන්තාවන් සවිබල ගැන්වීම කියන අදහස මතු වන්නේම කාන්තාවක් වීම නිසා යම් සමාජයක ඇයට අවස්ථා අහිමි කරලා තිබෙනවා ද, ඇයට කිසියම් ආකාරයක අසාධාරණ සිදු වනවා ද, ඒ වාගේම ඇය කිසියම් ආකාරයක අනාරක්ෂිතභාවයකට පත්වනවා ද, එහෙම නම් නීතියෙන් ඇයට යම් රැකවරණයක් අවශ්‍ය වනවා ද කියන පදනම මත. නමුත්, ලංකා ඉතිහාසයේ යම් යම් ප්‍රශ්න විශේෂයෙන් කාන්තාවට මතු වුණු අවස්ථා තිබුණත්, අපගේ නිදහස් අධ්‍යාපන පනත තුළ, ඒ වාගේම 1952 සම්මත කළ අපගේ නිදහස් සෞඛ්‍ය පනත තුළ පාර්ලිමේන්තුව විසින් කිසිම ආකාරයක කාන්තා පිරිමි භේදයකින් තොරව ඒ අවස්ථාව කාන්තාවට ලබා දීලා තිබෙනවා. අද හුඟ දෙනෙක් අවුරුදු 76ක ඒ අතීතයේ සිදු වුණු කරුණු ශාපයක් හැටියට දක්වනවා. නමුත්, ගත වූ අවුරුදු 76 ඇතුළත මේ රටේ අවුරුදු 50ක පමණ සීමාවේ තිබුණු අපගේ ආයු අපේක්ෂාව අද අවුරුදු 80 කිට්ටුවට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම කාන්තාවන්ගේ ආයු අපේක්ෂාව පිරිමින්ට සාපේක්ෂව සියයට 5කින් පමණ වැඩියි. ඒක මේ රටේ විතරක් නොවෙයි, ඒක මේ මුළු ලෝකයේම ප්‍රවණතාවක්. ඒකට පරිණාමවාදී හේතුවකුත් තිබෙනවා. මොකද, කාන්තාව තමයි මනුෂ්‍ය පරපුර ඉදිරියට ගෙන යෑමේ ප්‍රධාන වගකීම තිබෙන ප්‍රාථමික සත්වයා. එම නිසා මේ පරිණාමය විසින්ම කාන්තාවන්ට ඒ අතිරේක ජීව කාලය ලබා දීලා තිබෙනවා, අපේ පරපුර ඉදිරියට ගෙන යන්න. ඒක මේ රටේත් ඒ විධියටම ස්ථාපිත වෙලා තිබෙනවා. කාන්තාවන්ගේ ආයු කාලය සාමාන්‍යයක් වශයෙන් ගත්තාම පිරිමින්ට වඩා අවුරුදු තුනකින් පමණ වැඩියි. ඒ වාගේම අධ්‍යාපනයේ කිසිම තැනක කිසිම ආකාරය අයුක්තියක් කාන්තාවක් වීම නිසා ඇති වෙලා නැහැ. අද රටේ ඕනෑම අධ්‍යාපන ක්ෂේත්‍රයක, අධ්‍යාපන පීඨයකම ඒ අයිතිය කාන්තාවන්ට දීලා තිබෙනවා.

නිදහස් අධ්‍යාපනය ආරම්භ වුණු මුල් කාලයේ විශ්වවිද්‍යාලවල හිටියේ කාන්තාවන් සියයට 30ක් පමණ. අද විශ්වවිද්‍යාලවල ඒ ප්‍රමාණය සියයට 70ක්. රාජ්‍ය සේවයේත් එක්තරා කාලයක යම් ආකාරයක ප්‍රශ්න තිබුණාට, අද රාජ්‍ය සේවයේත් සියයට 60ක් පමණ ඉන්නේ කාන්තාවන්. හැබැයි, සියයට 48ක් තිබුණු කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය අද සියයට 32 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ ඇයි? දරුවන් ලැබීමේ ක්‍රියාවලියත් එක්ක ලංකාවේ, ඉන්දියාවේ මෙන්ම හැම රටකම වාගේ දක්නට තිබෙන දෙයක් තමයි පෞද්ගලික අංශය වර්ධනය වෙද්දී පෞද්ගලික අංශය කාන්තාවන් සේවයට බඳවා ගැනීමට මැළිකමක් දක්වන එක. රාජ්‍ය අංශයේ ඕනෑම පදවියකට -ශ්‍රේෂ්ඨාධිකරණය, අධිකරණ සේවය, වෛද්‍ය සේවය, ඉංජිනේරු සේවය, කළමනාකරණ සේවය ඇතුළු රාජ්‍ය සේවයට- කාන්තාවන් පත් කර ගත්තා. එපමණක් නොවෙයි, රටේ ජනාධිපති ධුරයටත් පත් කර ගත්තා. අග්‍රාමාත්‍ය ධුරයටත් පත් කර ගත්තා. එවැනි භේදයක් නැහැ. නමුත්, මේ රටේ පෞද්ගලික අංශය කාන්තාවන් සේවයට බඳවා ගැනීමේදී කාන්තාවන්ට තිබෙන මේ ප්‍රාථමික තත්ත්වය -ඒ කියන්නේ දරුවන් උත්පාදනය කිරීමේ හැකියාව- ඇයට එරෙහිව තීරණ ගැනීමට ඉතාම බරපතළ විධියට පාවිච්චි කරලා තිබෙනවා. මේ නිසා රටට අද නීතියක් අවශ්‍යයි. පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා විවෘත කරනකොට මේ කරුණ ගැන අවධානය යොමු කරලා කාන්තාවන්ට ඒ අවස්ථාව දෙන්න. එහෙම නොවුණ නිසා තමයි අපේ කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය සියයට 48 ඉඳලා සියයට 32 දක්වා අඩු වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ලෝකය පුරාම ඇවිල්ලා තිබෙනවා ලිංගික දිශානතිය පිළිබඳ විවාදයක්. ලිංගිකත්වය ඇති වන්නේ ජීව විද්‍යාත්මකව ද, එහෙම නැත්නම් සංස්කෘතිකමව ද කියන විවාදය මේ ලෝකය පුරාම පවතිනවා. ප්‍රංශයේ දැන් මැතිවරණයක් තිබෙනවා. ඒ වාගේම එංගලන්තයේත් දැන් මැතිවරණයක් තිබෙනවා. මෙතැනදී තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි ලිංගික දිශානතිය වෙනස් වීම. කාන්තාවක් හැටියට ජීව විද්‍යාත්මකව උපත ලැබුවත්, "නැහැ, මම පිරිමියෙක් වාගේ" කියලා හිතන අය මෙන්ම, පිරිමියෙක් හැටියට උපත ලැබුවත්, "නැහැ, මම කාන්තාවක් වාගේ" කියලා හිතන අයත්, එහෙම නැත්නම්, "මම කාන්තා, පිරිමි කියන ද්විත්ව ආකාරයටම" කියලා හිතන අයත් ඉන්නවා. ඒ සංස්කෘතිකමය ප්‍රශ්නය පිළිබඳව ගන්න දේශපාලන තීරණය පිළිබඳව අද ලෝකයේ විවාදයක් තිබෙනවා.

විවිධ ආගමික කණ්ඩායම් -බෞද්ධ, ක්‍රිස්තියානි, ඉස්ලාම්- තමන්ගේ දාර්ශනික මතවලට අනුව මේ ගැන විවිධ විවරණ ලබා දීලා තිබෙනවා. විශේෂයෙන් ලිංගික දිශානතියේ අයිතිය පිළිගන්නවාද, ගබ්සාවේ - abortion එකේ - අයිතිය පිළිබඳ කාරණය පිළිගන්නවාද, ඒක කාන්තාවන්ට අයිති දෙයක්ද, සමාජයට අයිති දෙයක්ද, එය කළ යුතුද නැද්ද, එතැන ප්‍රාණඝාතයක් සිදුවෙනවාද, එය ජීවය ලබා දුන් දෙවියන් වහන්සේට එරෙහි දෙයක්ද යන කරුණු පිළිබඳ ලෝකය පුරා විශාල විවාදයක් පවතිනවා. ඒ වාගේ මේ රටේත් ඇති වෙච්ච, මේ පාර්ලිමේන්තුවේත් මතු කරපු ප්‍රශ්නයක් තමයි කාන්තාවන් කය විකිණීම, එනම් ගණිකා වෘත්තිය පිළිබඳව අපි කටයුතු කරන්නේ කොහොමද කියන එක. මේවා ලෝකය පුරාම තිබෙන විවාදාත්මක කරුණු. මේවා එක නීතියකින්, කලබලයෙන්, කිසියම් තැනක බලහත්කාරයකින්, තමන්ගේ පෞද්ගලික කැමැත්තෙන් ඉෂ්ට කරන්න පුළුවන් දේවල් නොවෙයි. මේ දේවල් සමාජයේ පුළුල් සාකච්ඡාවකින් පස්සේ, ඒ සමාජයීය මතයට ඉඩ කඩ ලබා දීලා කරන්න ඕනෑ දේවල්. ලෝකයේ දියුණු යැයි සම්මත රටවලවත් මේවා සම්බන්ධයෙන් එහෙම තීරණ ඇවිත් නැහැ. අද ප්‍රංශයේ මහ මැතිවරණය ගත්තාම, ප්‍රධාන දේශපාලන පක්ෂ අතර මේ කරුණු තුන මත විශාල විවාදයක් පවතිනවා.

අපි විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. කාන්තාවන්ගේ ක්‍රියාකාරිත්වය මනිනකොට පන්ති භේදය කියලා එකක් ලෝකයේ තිබුණා. ධනපති පන්තිය, කම්කරු පන්තිය, එහෙම නැත්නම් වැඩ කරන ජනතාව, පරපුටු පන්තිය ආදි වශයෙන් පන්ති තිබුණා. නමුත් අද මේ ලෝකයේ පන්ති මනින්නේ නිර්මාණශීලි පන්තිය හා සාමාන්‍ය පන්තිය හැටියටයි. ඒ කියන්නේ creative class එකයි, එසේ නොවන පිරිසයි. මේ නිර්මාණශීලි පන්තිය අතරේ සමහරවිට තාක්ෂණවේදීන්, නව තාක්ෂණ නිර්මාණ කරන අය, නව වාස්තු නිර්මාණ කරන අය, නව කලා නිර්මාණ කරන අය, ගායන වෘත්තියේ නියැළි අය, design කරන අය, fashion design කරන අය ඉන්න පුළුවන්. මේ සියලුදෙනාම නිර්මාණශීලි පන්තියට අයිතියි. අද නගරවල තත්ත්වය මනින්නේ, නාගරිකත්වය මනින්නේ එම නගරයේ තට්ටු ගොඩනැඟිලි කීයක් තිබෙනවාද කියන එක මත නොවෙයි, මේ නිර්මාණශීලි පන්තිය වැඩ කරන පන්තියෙන් කොච්චර ප්‍රතිශතයක්ද කියන එක මත. අන්න ඒක අනුව බැලුවාම අපට පේනවා, මේ රටේ කාන්තාවත් ඒ නිර්මාණශීලි පන්තිය පැත්තෙන් ඉදිරියෙන් සිටින බව. මේ පනත් කෙටුම්පත පිළිබඳ මගේ අදහස වන්නේ, මීට වඩා පුළුල් සංවාදයක් ඇති කරගතයුතු මානෘකාවක් කඩිමුඩියේ, කලබලයේ, තව මාස කිහිපයකින් ජනාධිපතිවරණයට යන්න ඉන්න ආණ්ඩුවක් ඉදිරිපත් නොකළ යුතු බවයි. ඒ සඳහා පුළුල් සංවාදයක් අදාළ ආගමික හා අනෙකුත් සංස්කෘතික කණ්ඩායම් එක්ක ඇති කරලා සමාජ මතයක් එක්ක මේ කටයුත්ත කළ යුතු බවයි. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Dayasiri Jayasekara. You have four minutes.

[අ.භා. 3.24]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඉතාම කෙටි කාලයක් ලැබී තිබෙන්නේ. අද කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත ගැනත් කථා කරනවා. මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් කථා කරලා අපේ රටට අවශ්‍ය පරිදි කෙටුම්පතක් ගෙන ඒම ගැන අපේ ගීතා කුමාරසිංහ මැතිනියටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයටත් අපි ස්තුතිවන්ත වෙනවා. අපේ චම්පික රණවක මැතිතුමා කිව්වා වාගේ පනත් කෙටුම්පත් ගෙන ඒමේදී මේ ආණ්ඩුවට වුවමනා වෙලා තිබෙන්නේ, පුළුවන් තරම් ඉක්මනින් දවස ගණනේ පනත් කෙටුම්පත් පුළුවන් තරම් ප්‍රමාණයක් ගෙනෙන්නයි. ඒ නිසාම ජනාධිපතිතුමා කියනවා, අපි ගිය මාසය වෙනකොට පනත් කෙටුම්පත් 75ක් ගෙනාවා, ඊළඟ මාසය වෙනකොට තව 75ක් ගේනවා, ඊළඟ මාසය වෙනකොට තව 75ක් ගේනවා, පනත් කෙටුම්පත් 100ක්, 150ක් ගෙනෙනවා කියලා. මෙහෙම පනත් කෙටුම්පත් ගෙනැල්ලා දැන් පනත් එපා වෙන තැනට තල්ලු වෙලා තිබෙනවා. මොකද, දවසට පනත් කෙටුම්පත් තුන හතර මේ පාර්ලිමේන්තුවට ගේනවා. නමුත් ඒවා ගැන කිසිම සාකච්ඡාවක් නැහැ. ඒවායේ තිබෙන ප්‍රශ්න ගැන කථා කරන්න ඉඩක් දෙන්නේ නැහැ. විදුලිබල පනත් කෙටුම්පත ගැන අපි කථා කරලා, කථා කරලා ගෙනාවා. ඒකේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පනත් කෙටුම්පත් සකස් කරලා ඉදිරිපත් කරනවා. ඊට පසුව ඒ ගැන කරුණු විමසන්න ශ්‍රේෂ්ඨාධිකරණයට යනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ ඒ නඩුව අහනකොට පනත් කෙටුම්පත නිර්දේශ කළ නීතිපති දෙපාර්තමේන්තුවම ශ්‍රේෂ්ඨාධිකරණයට සංශෝධන 40ක් විතර ගේනවා. තව සංශෝධන කොච්චර තිබෙන්න පුළුවන්ද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරනකොට? හැබැයි, අපි පාර්ලිමේන්තුවේ ඒ ගැන සාකච්ඡා කරනකොට ඒ වැඩ පිළිවෙළට අවශ්‍ය සංශෝධන ටික ගේන්න අපට ඉඩක් දෙන්නේ නැහැ.

අද තිබෙන මේ ප්‍රශ්නය දෙස බැලුවාම එක පැත්තකින්, අපේ සිංහල බෞද්ධකම, අපේ උරුමයන්, අපේ ජාතිකත්වය, අපට තිබෙන සංස්කෘතික උරුමයන් පිළිබඳව යම් මතවාද තිබෙන කොටස් අපේ රටේ ඉන්නවා. මේ ගැන මේ අයත් එක්ක යම් සාකච්ඡාවක් සිද්ධ වෙන්න ඕනෑ. හැබැයි, ඒවා පැත්තකින් තියලා ඒ මිනිස්සුන්ට පහර ගහලා මේ ක්‍රියාදාමය ක්‍රියාත්මක කරන්න හදපුවාම ඇති වන අර්බුදය තමයි මේ තිබෙන්නේ.

මම හැම වෙලාවේම කියනවා වාගේ මේ රටේ අද වැඩි ප්‍රමාණයක් කාන්තාවන් තමයි ඉන්නේ. අද හැම තැනකම, අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල කාන්තාවන් විශාල ප්‍රමාණයක් ඉන්න බව අපි දකිනවා. කාන්තාවන් ප්‍රධානීන් හැටියට කටයුතු කරන සමහර දෙපාර්තමේන්තු, කාන්තාවන් ලේකම් ධුරය දරන සමහර අමාත්‍යාංශ කඩා වැටිලා තිබෙනවා. ඒ වාගේම පිරිමින් ලේකම් ධුර දරන තැන්වලත් ඒ ආයතන කඩා වැටිලා තිබෙනවා. ඒවා ඊට වැඩිය හොඳට කාන්තාවන් කරන අවස්ථා තිබෙනවා. එහෙම එකකුත් තිබෙනවා. නමුත් සමහර කාන්තාවන් තීරණ ගන්නේ නැහැ. සමානාත්මතාව පිළිබඳ විශාල ගැටලු තිබෙනවා. නමුත් ඇත්ත කථාව නම් ඔවුන්ට එහෙම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, තවදුරටත් ඔවුන්ගේ ඒ අයිතිය ආරක්ෂා කරලා දෙන එක අපේ යුතුකමක්. කාන්තාවන් රැක ගැනීම, ඔවුන් බලා ගැනීම, සවිබලගැන්වීම අපේ රට ඇතුළේ සිද්ධ වෙන්න ඕනෑ කාරණයක්. අපි දන්නා විධියට අද ගම් ඇතුළේ ගුටි කකා ඉන්න කාන්තාවන් කොච්චර ඉන්නවාද පොලීසියකට යන්නේ නැතුව.

අද විශාල අර්බුදවලට මුහුණ දීලා ඒවා ගිලගෙන ඉන්න කාන්තාවන් කොයිතරම් ප්‍රමාණයක් ඉන්නවාද? ඒ අයට වන අසාධාරණය කියන්න තැනක් නැද්ද? අන්න ඒ වාගේ වාතාවරණයක් තුළ තමයි ඔවුන් රැක ගන්න, ඔවුන්ට ශක්තියක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු ටික කරන්නේ. මේක කුඩා දැරියන්, කුඩා දරුවන් දූෂණය වෙන රටක්. සිය ගණනක් දූෂණය වෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමිය ළඟ සංඛ්‍යාලේඛනත් එක්ක ඒ විස්තර ඇති. කාන්තාවන් දූෂණය වනවා, රට ඇතුළේ. මේක විශාල අර්බුදයක්. කවුරුත් මේවා ගැන කථා කරන්නේ නැහැ. මේවා හැංගිලා තිබෙන්නේ. දූෂණය වෙච්ච දරුවෝ, කාන්තාවෝ ඒවා එළියට දාන්නේ නැහැ. මොකද, ආපසු ගිහිල්ලා ඔවුන්ට සමාජයට මුහුණ දෙන්න බැරි නිසා. එවැනි වාතාවරණයක් තිබෙනවා. ඒ නිසා, මේ ක්‍රියාවලිය තුළ මෙය අත්‍යවශ්‍ය පනතක් බව මම කිව්වේ ඒකයි. හැබැයි, මෙහි තිබෙන කාරණා පිළිබඳව මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගෙනැල්ලා තිබෙන යෝජනා ගැනත් සානුකම්පිතව සලකා බලන්න කියා මම ඔබතුමියගෙන් ඉල්ලනවා.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත ගෙනාපු වෙලාවේ අර උන්මාදයෙන් නැත්නම් උද්ධච්ච කමින් - arrogant වෙලා - ඒ සංශෝධන අල්ලලා විසි කරපු ඒ ඇමතිවරයා කරපු වැඩේ ඔබතුමිය කරන්න යන්න එපා. අද මේ රටේ සංඝ සමාජය, මේ රටේ සිංහල බෞද්ධ ව්‍යාපාරය ගත්තොත්, ඒ අයගේත් යම් යම් අදහස් මේ සම්බන්ධයෙන් තිබෙනවා. ඒ නිසා ඒවාට ඉඩ දෙන්න. ඒවාටත් ඇහුම්කන් දෙන්න. ඇහුම්කන් දීලා අපි මේ පනත් කෙටුම්පත සම්මත කරමු. තවදුරටත් මේ වාගේ හදිසි පනත් කෙටුම්පත් තව සිය ගණනක් එයි; ප්‍රශ්න වැඩි වෙයි. හැබැයි, මේ පනත් තව මාස තුන හතරකින් ආපසු මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සංශෝධනය කරන්න සිද්ධ වෙන තත්ත්වයක් ඇති වෙනවා. ඒ නිසා ඒක නතර කරන්න අවශ්‍ය කටයුතු ටික කරන්න කියා මා ඉල්ලනවා.

මට තව එක විනාඩියක් ඉල්ලනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තව අය නැහැ කථා කරන්නත්. ඒ නිසා මට තවත් විනාඩියක් දෙන්න. අපේ ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා මෙතැනට ඇවිල්ලා කියලා තිබෙනවා, මම ඒ මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ නම් ටික විතරයි කිව්වේ කියලා. මගේ තර්කය වුණේ මේකයි. මම කිව්වේ, විමධ්‍යගත අරමුදල් දෙනවා නම් ඔක්කෝටම දෙන්න කියලායි. මෙතැන ඉන්න දහදෙනෙකුට විතරක් දෙන්න එපා. රනිල් වික්‍රමසිංහ මහත්මයා මේ දවස්වල T20 team එකක් හදාගෙන යනවා, විපක්ෂයෙන්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
T20 team එකේ captain කවුද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
T20 team එකේ captain කවුද කියලා මම දන්නේ නැහැ. ඒක ඔබතුමන්ලා දන්වා ඇති නේ. *[බාධා කිරීමක්]* නමුත් T20 team එකක් හදාගෙන යනවා. දැන් දීලා තිබෙනවා, 19දෙනෙකුට. තව එක්කෙනයි මදි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කෝ ලැයිස්තුව?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ලැයිස්තුව මම ඉදිරිපත් කරලා තිබෙනවා. සභාගත කරලාත් තිබෙනවා. හැන්සාඩ් ගත කරලාත් තිබෙනවා. *[බාධා කිරීමක්]* මුස්ලිම් මන්ත්‍රීවරු ගැන විතරක් නොවෙයි මම කිව්වේ. සමගි ජන බලවේගයේ 19දෙනෙකුටත් දීලා තිබෙනවා. *[බාධා කිරීමක්]* මා ළඟ මෙතැන ලැයිස්තුව තිබෙනවා. *[බාධා කිරීමක්]* ඉතින් ඔබතුමා ඒ ලැයිස්තුව අරගන්න. ඒ 19දෙනාගේ නම් අතරින් මම කිව්වේ ඇත්තටම මිලියන 100ක් ගත්ත මුස්ලිම් මන්ත්‍රීවරු ගැන. ඒක කිව්වාම තමයි රවුෆ් හකීම් මන්ත්‍රීතුමා නැඟිටලා කිව්වේ, ඒ ගොල්ලන්ගේ කට්ටියත් ඒක අරන් තිබෙනවා කියන එක එතුමා දන්නේ අදයි කියලා. *[බාධා කිරීමක්]* ඉතින් ඒක මම මැරෙන්න දෙයක් නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෙතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up now.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
මට විනාඩියක් දෙන්න. *[බාධා කිරීමක්]* එහෙම නම් එතුමාගේ වෙලාවෙන් විනාඩියක් දෙන්න.

මම කියන්න කැමැතියි, T20 කණ්ඩායමක් හදන වැඩේ තමයි මේ කරන්නේ. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනාටම විමධ්‍යගත අරමුදල් දෙන්නේ නැතුව T20 team එකක් හදලා, ඒ T20 team එකට සල්ලි දීලා ඒ අය ඒ පැත්තට බා ගන්න, 150ක බහුතරය හදා ගන්න, ජනාධිපතිතුමාට තව අවුරුද්දක් කාලය දීර්ඝ කර ගන්න, ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමා මාරු කරලා නීතිපති ගෙනැල්ලා අග්‍ර විනිශ්චයකාරවරයා බවට පත් කරලා, එතුමාට ඕනෑ කරන තීන්දුව ගන්න මෙහෙම T20 teams හදන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෙතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා කථාව අවසන් කරන්න. වේලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා කරුණාකරලා සාධාරණය ඉෂ්ට කරන්න කියන කාරණයත් මතු කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෙතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Next, the Hon. Gevindu Cumaratunga. You have 12 minutes.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙවින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කළා වාගේ ඔබතුමා මටත් වැඩිපුර විනාඩි ගණනක් ලබා දෙයි කියලා බලාපොරොත්තු වෙනවා. විනාඩිය විනාඩිය ඉල්ලුවාම, මූලාසනයෙන් එහෙම කටයුතු කරන්න. එතකොට හොඳයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෙතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට දැන් විනාඩි 12ක් තිබෙනවා.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙවින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ඔව්. එතකොට අර විධියටම - දැන් එතුමා දෙගුණයක් විතර වැඩිපුර කථා කළා නේ - එහෙමම කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෙතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
නැහැ, එහෙම දෙයක් වුණේ නැහැ.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙවින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
එහෙම දෙයක් කෙරුණා නේ දැන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෙතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
එතුමා විනාඩියක විතර කාලයක් වැඩිපුර ගත්තා.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙවින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ඔබතුමා ළඟ තිබෙන්නේ පුදුම ඔරලෝසුවක් නේද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෙතාංකුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 12ක් තිබෙනවා. ඔබතුමා කථා කරන්න.

[අ.භා. 3.31]

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙවින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
හොඳයි, බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මූලික වශයෙන්ම කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරන්න පෙර කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ අවස්ථාවේ සභානායකතුමා සභාවේ හිටියා නම් හොඳයි. ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත පිළිබඳ විවාදය එක් දිනකට විතරක් සීමා කළාම එතුමා මේ සභාවට උදාහරණයක් දුන්නා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කළේත් එක දවසකින් කියලා. මම අහන්න හැදුවාම ඒක හොඳ

උදාහරණයක්ද, යහපත් උදාහරණයක්ද කියලා, එතුමා ඒකට බොහොම ආවේගශීලි වුණා. එහෙම නම් කාන්තාවන්ට ඡන්ද බලය නොතිබුණු ඉතිහාසයකුත් මේ රටේ තිබෙනවා නේ. අපි උදාහරණ ගන්නවා නම්, ඒවාද ගන්න ඕනෑ? බලහත්කාරයෙන් එක දවසකින් එක පනත් කෙටුම්පතක් සම්මත කර ගන්ත හින්දා අනෙක් පනත් කෙටුම්පත් ද ඒ විධියට සම්මත කර ගන්න එකද ආදර්ශය?

ඒ ගැන කථාව එතැනින් නවත්වලා කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත දිහාවට හැරෙමු. කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත ගැන සමාජයේ විශාල කුකුසක් ඇති වෙලා තිබෙනවා. ඒ සඳහා විශාල වශයෙන් බලපා තිබෙන්නේ, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳව එදා ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දුන් ඉතාම විචක්ෂණ තීන්දුවක් විවේචනය කරමින් කරපු ප්‍රකාශය තමයි. මේ කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පතේ දෙවැනි පිටුවේ එක්තරා වගන්තියක් යටතේ සඳහන්ව තිබෙනවා, "ස්ත්‍රී පුරුෂභාවය සහ ලිංගික දිශානතිය මත පදනම්ව සිදුවන සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම්වලින් කාන්තාවන් ආරක්ෂා කිරීම" කියලා. දැන් සමාජයෙන් මතුවන ප්‍රශ්නය තමයි, කාන්තාවන් සවිබල ගැන්වීමට නම් මේ පනත ගෙනාවේ, ස්ත්‍රී පුරුෂභාවය සම්බන්ධයෙන්, ලිංගික දිශානතිය සම්බන්ධයෙන් වැරදි අර්ථ කථන ලැබිය හැකි කරුණු මේ පනත් කෙටුම්පතට ඇතුළත් කෙරෙන්නේ ඇයි කියන එක. මේ පනත් කෙටුම්පතට වැරදි අර්ථ කථන ඇතුළත් වෙන්න පුළුවන්. මොකද, අවසාන වශයෙන් මේ බලය හිමි වෙන්නේ අධිකරණයටත් නොවෙයි, මේ සඳහා පත් කරන කොමිෂන් සභාවට. ඒ නිසා වැරදි අර්ථ කථන ලැබිය හැකි කරුණු ඇතුළත් කෙරෙන්නේ ඇයි කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා අපි සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා, ඒ වගන්තියට. කරුණාකරලා ඒක කාන්තාවන්ට, නැත්නම් ස්ත්‍රීන්ට සීමා කරන්න. "ස්ත්‍රීන්ට සිදුවන ලිංගික අපහරණවලට විරුද්ධව කටයුතු කිරීම" කියන එක ඇතුළත් කරන්න. නැත්නම් අපි දන්නේ නැහැ, අවසාන වශයෙන් ලිංගිකත්වය සම්බන්ධයෙන් අද විවිධ මතවාද ප්‍රකාශ වෙන නිසා මේක වෙනත් විකෘතීන් සඳහා යොදා ගැනීමට කටයුතු කරයිද කියලා.

ඒ වාගේම තවත් පුදුම දෙයක් තිබෙනවා. මම දන්නේ නැහැ, කොතැනටද මේ නීති සම්පාදනය යන්නේ කියලා. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් පත් කර ගත්තා, ඇමතිවරයා කරන පත්කිරීම් සුදුසුද කියලා පරීක්ෂාවට ලක් කරලා අනුමත කරලා ජනාධිපතිතුමාට යැවීම සඳහා පෙරනයක් ලෙස. දැන් මේ පනත් කෙටුම්පතේ තිබෙන්නේ, කොමිෂන් සභාවේ සාමාජිකයන් හත්දෙනායි, ඒකෙන් පස්දෙනෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් යෝජනා කරන්න ලු. තවත් දෙදෙනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයෙන් යෝජනා කරන්න ලු. මෙහෙම පනත් කෙටුම්පත් ගෙනෙනවා නම් මේක කොහෙන්ද නවතින්නේ? විවිධ අයට ඒ යෝජනා ගෙනෙන්න අවස්ථාව දෙන එක හරි. හැබැයි මොකක් හරි ආයතනයක් තිබෙන්න ඕනෑ නැද්ද, අවසාන වශයෙන් සුදුස්සන් කවුද කියලා ජනාධිපතිතුමාට පෙරළා යෝජනා කරන්න? ඒ නිසා අපි හිතනවා, ඒ කාරණයත් නිවැරදි විය යුතුයි කියලා. ඒ නිසා ඇමතිතුමා වෙන්න පුළුවන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය වෙන්න පුළුවන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙන්න පුළුවන්, ඒවා මඟින් සුදුසුම නම් තෝරලා එම පත් කිරීම් සඳහා ජනාධිපතිතුමාට නිර්දේශ යවන ලෙස අපේ සංශෝධනයෙන් ඉල්ලා තිබෙනවා.

ඊළඟට මම කැමැතියි, අද කථා කරන අධ්‍යාපන අමාත්‍යාංශය හා බැඳුණු, යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත දෙසට හැරෙන්න. යුනෙස්කෝ සම්මුතියේ එක වැදගත් දෙයක් ගැන මම කථා කරන්න කැමැතියි. යුනෙස්කෝ සංවිධානයේ ප්‍රඥප්තියේ වැදගත්ම කරුණක් තමයි, දරුවන්ට මව් භාෂාවෙන් කටයුතු කරන්න අවස්ථාව ලබා දීම. මම පසුගිය දවසක ප්‍රශ්නයක් ඇහුවා, 1983න් පස්සේ උතුරු පළාතේ හා නැඟෙනහිර පළාතේ සිංහල මාධ්‍ය පාසල්වලට අත්වෙච්ච ඉරණම ගැන. මම ඇහුවා, පසුගිය අවුරුදු පහ තුළ පහේ ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල, සිංහල මාධ්‍යයෙන් මොන මොන දිස්ත්‍රික්කවල ප්‍රකාශිතද, දෙමළ මාධ්‍යයෙන් මොන මොන දිස්ත්‍රික්කවල ප්‍රකාශිතද කියලා.

කියන්න ආඩම්බරයි, මුළු රටේම තිබෙන දිස්ත්‍රික්ක විසිපහේම ශිෂ්‍යත්ව විභාගයේ දෙමළ මාධ්‍ය කඩඉම් ලකුණු ප්‍රකාශිතයි. හැබැයි 2019 වසර ගත්තොත්, මෙතැනින් අවුරුදු 5කට ඉස්සර වෙලා, ත්‍රස්තවාදය - යුද්ධය - නිම කරලා අවුරුදු 10කට පස්සේ 2019 වසරේ ශිෂ්‍යත්ව විභාගයේ යාපනය දිස්ත්‍රික්කයේ සිංහල මාධ්‍ය කඩඉම් ලකුණු නැහැ. ඒ කියන්නේ ළමයි නැහැ. ළමයින්ට පහේ පන්තිය වෙනකල් සිංහලෙන් උගන්වන්නේ නැහැ. කිලිනොච්චිය දිස්ත්‍රික්කයේත් නැහැ. මන්නාරම දිස්ත්‍රික්කයේත් නැහැ. මඩකලපුව දිස්ත්‍රික්කයේත් නැහැ. අපි අහන්න කැමැතියි, අපේ දෙමළ සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් ඔබතුමන්ලාට හෘදය සාක්ෂියක් නැද්ද කියලා. ත්‍රස්තවාදින් බෝම්බ පුපුරවද්දීත් අපි රාජකීය විද්‍යාලයේ දෙමළ මාධ්‍ය පන්ති පවත්වාගෙන ගියා. ත්‍රස්තවාදය ඉවර වෙලා දැන් අවුරුදු 15ක්. එහෙම වෙලාත්, 2023 වසර ගත්තත් යාපනයේත් නැහැ, කිලිනොච්චියේත් නැහැ, මඩකලපුවේත් නැහැ, ළමයින්ට පහේ පන්තිය වෙනකල් සිංහලෙන් උගන්වන්නේ. පියසේන කහඳගමගේ විසින් ලියපු පොත් කියවලා බලන්න, මඩකලපුව දිස්ත්‍රික්කයේ ගම්මාන කොච්චර තිබෙනවාද කියලා, සිංහල දෙමළ අය එකට ජීවත් වෙච්ච. ප්‍රභූන් විසින් ගොඩනැඟූ සිංහල විද්‍යාල කොච්චර තිබෙනවාද නැඟෙනහිර පළාතේ? මෙහෙමද, අපි ජාතික සමඟියක් ගොඩනඟන්න කටයුතු කරන්නේ?

ඊළඟට, දැන් මේ අලුත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව නම්නුත් අප හමුවේ තබා තිබෙනවා, අධ්‍යාපන අමාත්‍යාංශය හඳන්න උත්සාහ කරන අනාගත අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව. කියන්න කනගාටුයි, ඒ තුළත් අවධාරණය කරලා තිබෙන්නේ ඕනෑම පාසලක් ආශ්‍රිතව ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව සිසුන්ට සහතික කිරීම. මේක කරන්න පුළුවන්ද අපේ රටේ? ඊට අවශ්‍ය සම්පත් තිබෙනවාද? අවසාන වශයෙන් මේ තුළින් බිහි වෙන්නේ ඉංග්‍රීසිත් නොදන්නා, විෂයයත් නොදන්නා දරුවන්. එවැනි දරුවන් බිහිවෙලා අවසානයේ වෙන්නේ අපේ රටේ ගම්වල දරුවන් අසරණ වෙලා, මේ අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවට පිටින් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර පාසල් හරහා නැවතත් බමුණු කුලයක් අනට අපේ රටේ පාලනය පත් කිරීමේ, අපේ රටේ වගකීම් ලබා දීමේ කුමන්ත්‍රණකාරී, නැත්නම් විජාතික ක්‍රියාවලියක් නොවෙයිද? මේ සම්බන්ධයෙන් අපි රජයට විතරක් නොවෙයි චෝදනා කරන්නේ. අපට උදේ හවස ඇහෙනවා, අපේ විපක්ෂ නායකතුමාත් එකේ පන්තියේ ඉඳලා ඉංග්‍රීසියෙන් ඉගැන්වීම ගැන කථා කරන එක. දැන් මේ ජනතා විමුක්ති පෙරමුණ හා බැඳුණු ජාතික ජන බලවේගයේ මහාචාර්ය වසන්ත සුබසිංහ 2023.08.06 දින රැස්වීමකදී කියනවා, "ලෝකයේ ප්‍රධානම මිනිසුන් මුණගැසෙන සන්නිවේදන අවිය තමයි ඉංග්‍රීසි භාෂාව, ඒ නිසා එක වසරේ සිට ඉංග්‍රීසි උගන්වන්න නොවෙයි, ඉංග්‍රීසියෙන් උගන්වන්න අප තීරණය කළා" කියලා. දැන් කොහේටද මේ රට යන්නේ? ආණ්ඩුවයි, සජබයයි, ජාතික ජන බලවේගයයි එකයිද? අඩුම තරමින් අපේ රටට විකල්පයක්වත් නැද්ද? මේ ඉංග්‍රීසි අධිරාජ්‍යයේ හිරු බැස යන මොහොත. යුරෝපයට ගිහිල්ලා බලන්න. අද යුරෝපය නැහැ. එංගලන්තය නොවෙයි, යුරෝපය කියන්නේ. උසස් අධ්‍යාපනයට ජර්මනියට ගියොත් ජර්මානු භාෂාව ඉගෙන ගන්න වෙනවා. ප්‍රංශයට ගියොත් ප්‍රංශ භාෂාව ඉගෙන ගන්න වෙනවා. නෙදර්ලන්තයට ගියොත්

[ගරු ගෙවිඳු කුමාරතුංග මහතා]

ඔවුන්ගේ භාෂාව ඉගෙන ගන්න වෙනවා. යන්න ජපානයට, මෝටර් කාර්මික විද්‍යාව හදාරන්න. ජපන් බස ඉස්සෙල්ලා ඉගෙන ගන්න වෙනවා. යන්න චීනයට. චීන බස ඉස්සෙල්ලා ඉගෙන ගන්න වෙනවා. කොරියාවේ රස්සාවක් කරන්නත් ඔබට කොරියානු භාෂා ප්‍රවීණතා විභාගය සමත් වෙන්න වෙනවා. අද ඉදිවෙන්නේ බහු භාෂා සහිත ලෝකයක්. මේ ලෝකය සම්බන්ධයෙන් ඉතා ම වැදගත් යෝජනාවලියක් පසුගිය දා චීනය එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කළා. මගේ මිත්‍ර කසුන්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ඒ සඳහා අවධානය යොමු කළාට. චීනය එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කරනවා, සභ්‍යත්ව සංවාද දිනයක්. අනාගත ලෝකය ඉදිවෙන්නේ සභ්‍යත්ව රාජ්‍යයන් අතර සාමූහිකත්වය මත, ඒ සමගිය වෙනුවෙන්. සභ්‍යත්ව සංවාද ජාත්‍යන්තර දිනයක් චීනය යෝජනා කරනවා. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය ඒකමතිකව එය අනුමත කරනවා. එතැනටයි ලෝකය යන්නේ. ඒ නිසා කරුණාකරලා මේ පරණ අධිරාජ්‍යවාදී, හණමිටි අදහස් බිමින් තියන්න කියලා අපි ආණ්ඩුවට චිතරක් නොවෙයි, ආණ්ඩු ගන්න බලාපොරොත්තු වෙන අනෙක් පක්ෂවලටත් කියා සිටින්න කැමැතියි.

දැන් අපි මේ පනත් කෙටුම්පතට පොඩ්ඩක් යොමු වෙමු. මේ පනත් කෙටුම්පත ගත්තොත් එහෙම, වලිසිංහ හරිශ්චන්ද්‍ර මැතුමාගේ "සිතියම් සහිත පුරා විද්‍යාව" කෘතියේත් තිබෙනවා, මේ ගැටුම එදාත් තිබුණු බව.

දැන් මේ යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පතට පිවිසෙනකොටත් අපි පරිස්සම් වෙන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපේ පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය කරනකොට කුරුන්දි විහාරය ගත්තොත්, ඒක පුරාවිද්‍යා ස්ථානයක්ද, අපි වඳින පුදන තැනක්ද කියන ප්‍රශ්නය මතු වුණා. එදා රුවන්වැලි මහා සෑය සම්බන්ධයෙනුත් මේ ප්‍රශ්නය මතු වුණා. පිරමීඩ සම්බන්ධයෙන් බැලුවාම මේ කාරණය නිවැරදියි. අද මිසරයේ ජනතාව පිරමීඩ එක්ක අධ්‍යාත්මිකව බැඳිලා නැහැ, ඒක පුරාවිද්‍යාවට අදාළයි. හැබැයි, රුවන්වැලි මහා සෑයට අපි අදත් මල් පූජා කරනවා. අපි අදත් අධ්‍යාත්මිකව එතැනට බැඳිලා ඉන්නවා. ඔව්, අපි එම ස්ථානය ආරක්ෂා කරන්නත් ඕනෑ, සංරක්ෂණය කරන්නත් ඕනෑ. ඒ එක්කම ඒක ජීවමාන සංස්කෘතියක් කියන එකත් අවබෝධ කරගෙන කටයුතු කරන්න ඕනෑ. කුරුන්දි විහාරය පුරාවිද්‍යා ස්ථානයක් විතරක් නොවෙයි. ඒක මේ රටේ ජනතාව ගිහිල්ලා වඳින පුදන අපේ ආගමික සිද්ධස්ථානයක්.

දැන් අපි මේ පනත් කෙටුම්පත ගැන බලමු. මට තව කෙටි වෙලාවයි තිබෙන්නේ. ඒ නිසා මම ඉක්මනින් කථාව අවසන් කරනවා. අපි දැන් අහන්නේ අපට දෙන්න පුළුවන් දායාදය සම්බන්ධයෙන්. මම සභ්‍යත්ව සංවාදය ගැන කිව්වා. යුනෙස්කෝ සංවිධානයේ මූලික කරුණු පහෙන් එකක් තමයි සංස්කෘතිය, සංස්කෘතික සංවිධාන කියන කාරණය. අද ලෝකයේ ඒ සංස්කෘතිය කියන කාරණය සභ්‍යත්වය පිළිබඳ සංවාදයක් කරා විකාශනය වෙලා තිබෙනවා. මෙහි මූලික කාරණයක් තමයි සාමය කියන කාරණය. මට අද වාගේ මතකයි, ජේ.ආර්.ජී. සූරියප්පෙරුම කියන දේශපාලන චින්තකයා කියනවා, යුද්ධයේ තුවක්කු නිහඬ වුණායින් පස්සේ ඒ සුසාන භූමියේත් සාමය තිබෙනවා කියලා. අපට ඕනෑ ඒකද? අපට ඕනෑ ඒ සාමයද නැත්නම් සමගියද? අපට ඕනෑ විවිධත්වය තුළ එකතු වන සමගියක් මිසක් විවිධත්වය මරා, වළලා ඇති කරන සාමයක් නම් නොවෙයි. ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ නොසිටීම පිළිබඳව අපි කනගාටු වෙනවා. අපි හිතනවා, සාමයට වඩා සමගියේ තිබෙන ගැඹුර යුනෙස්කෝ සංවිධානය වෙත ගෙන යා යුතුයි කියලා.

ඒ වාගේම මම තව එක් කාරණයක් විතරක් කියන්න කැමැතියි. මම කලින් කිව්ව පනත් කෙටුම්පතේ වාගේම, මේ පනත් කෙටුම්පතේත් යම් තාක්ෂණික දෝෂ තිබෙන බව අපි දකිනවා. මුලින්ම මේ කොමිෂන් සභාව පත් කරනකොට එහි සාමාජිකයන් වෙන්නේ, අධ්‍යාපනය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ රාජ්‍ය අමාත්‍යවරයා. මම හිතන විධියට, එතැනත් පිළිවෙළ වැරදියි. රාජ්‍ය අමාත්‍යවරයා දෙවැනියට පැමිණිය යුතුයි. එය සඳහන් වන්නේ පනත් කෙටුම්පතේ හත්වැනි පිටුවේ. හැබැයි, එතැනින් පසු මෙහි එන සියලු වගන්තිවල තිබෙන්නේ අමාත්‍යවරයා කියලා විතරයි. ඒ අමාත්‍යවරයා කියන්නේ කැබිනට් අමාත්‍යවරයාද නැත්නම් අමාත්‍යවරයා යන්නට,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ගැන මම ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ කියන බෙදීමකින් තොරවයි කථා කරන්නේ. මම ආණ්ඩු පක්ෂයේ ඉන්දැද්දීත් කාරක සභාවලදී බොහෝ පනත් නිවැරදි කරගන්න අඩුපාඩු පෙන්වා දීලා තිබෙනවා. මම දන්නේ නැහැ, නීතිපති දෙපාර්තමේන්තුව කරන්නේ කුමක්ද කියලා. Online Safety Bill එක නීතිපතිගේ සහතිකයක් එක්ක එන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟයි කියලා. Online Safety Bill එකේ වගන්ති 55යි තිබුණේ. මේ රටේ පුරවැසියන් අධිකරණයට ගියාම, අධිකරණය ඒ නඩුව අහන්න ඉස්සෙල්ලා නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටිනවා වගන්ති 33ක් සංශෝධනය කරන්න ඕනෑ කියලා. ඒ කියන්නේ, නීතිපති දෙපාර්තමේන්තුව දැන-දැනම වගන්ති 55න්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධ වගන්ති 33ක් එව්වා නම් -ඒ ප්‍රමාණය සියයට 50කට, 60කට වැඩියි- නීතිපතිතුමා හෝ කවුරු හෝ නිලධාරියෙක් එහි වගකීම භාර ගන්න ඕනෑ. ඒ වගකීම භාර අරගෙන අදාළ පුද්ගලයා අස් වෙන්න ඕනෑ. අස් වෙන්නේ නැත්නම් මේ ගැන සොයා බලා ඔහු අස් කරන්න ඕනෑ. මොකද, නීතිපති දෙපාර්තමේන්තුවටත් බැරි නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සම්බන්ධ කරුණු සම්බන්ධයෙන්වත් තමන්ගේ නිවැරදි මතය දෙන්න, ඒක හොඳ දෙයක් නොවෙයි. එක තැනක, දෙකක අතපසුවීමක් වෙන්න පුළුවන්. නමුත්, සියයට 60කට වඩා එහෙම වෙනවා නම් ඒක ප්‍රශ්නයක්. ඉතින්, නීති සම්පාදනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ, නීතිපති දෙපාර්තමේන්තුවේ වගකීම හරියට ඉෂ්ට කෙරෙනවාද කියන කාරණය අප හමුවේ තිබෙනවා. මේ ගැන බැරෑරුම්ව හිතන ලෙස ඉල්ලා සිටිමින්, මට අමතර කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Mahindananda Aluthgamage. You have 17 minutes.

[අ.භා. 3.46]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ කාන්තාවන් වෙනුවෙන් ගෙනෙන සුවිශේෂී පනත් කෙටුම්පතක් ගැන පාර්ලිමේන්තුවේ විවාද කරනවා. මේ පනතේ හොඳ සහ නරක තිබෙන්නට පුළුවන්. අපි මේ වෙලාවේ පාර්ලිමේන්තුව හැටියට කළ යුත්තේ මේකේ වැඩි හොඳ ගැන කථා කරන ගමන් නරක යමක් තිබෙනවා නම් ඒවාට සංශෝධන ගෙනැල්ලා, මේ පනත් කෙටුම්පත සම්මත කිරීමයි.

ලංකා දේශපාලන ඉතිහාසයේ කාන්තාවන් වෙනුවෙන් මෙවැනි සුවිශේෂී පනත් කෙටුම්පතක් ඉදිරිපත් වුණු පළමු අවස්ථාව මෙයයි. ඒ ගැන අපේ ගරු ගීතා කුමාරසිංහ රාජ්‍ය අමාත්‍යතුමියට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එතුමියගේ අමාත්‍යාංශය යටතේ තමයි ජනාධිපතිතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ. ඒ නිසා මේ සුවිශේෂී පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම පිළිබඳව, ඒ වාගේම මේ පනත් කෙටුම්පතේ හොඳ පිළිබඳව තමයි මම මේ කියන්නේ. මේ රටේ කාන්තාවන් වෙනුවෙන් මෙවැනි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම ගැන මා නැවත නැවතත් ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ පළමු අගමැතිතුමිය තමයි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය. එතුමිය තමයි ලෝකයේත් පළමු අගමැතිතුමිය.

හැබැයි, එතුමියගේ කාලයේදීවත් කාන්තාවන් වෙනුවෙන් මෙවැනි පනතක් ඉදිරිපත් වෙලා නැහැ. මම බොහොම ගෞරව කරන නායිකාවක්, එතුමිය. මම එතුමියට අගෞරවයක් නොවෙයි, මේ කරන්නේ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය මේ රටේ ජනාධිපතිනිය හැටියට කටයුතු කළා. හැබැයි, කාන්තාවන්ගේ සුරක්ෂිතභාවය වෙනුවෙන්, කාන්තාවන් සවිබලගැන්වීම වෙනුවෙන්, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව වෙනුවෙන් මෙවැනි පනත් කෙටුම්පතක් එතුමියගේ කාලයේදීවත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා නැහැ. ඒ නිසා මෙවැනි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම මේ රටේ සමස්ත කාන්තාවන්ට කරන ගෞරවයක් ලෙස සලකන්න පුළුවන්. අද වනවිට රටේ සිටින ජනගහනයෙන් වැඩි පිරිස කාන්තාවන්. පිරිමි අයට වඩා කාන්තාවන් වැඩියි. ඒ නිසා ඔවුන් වෙනුවෙන්, ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් මෙවැනි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම පිළිබඳව අපි රජයට ස්තුතිවන්ත වෙනවා.

මෙම පනත් කෙටුම්පත තුළ යම් යම් ප්‍රශ්නගත කාරණා තිබෙනවාය කියන එකත් මම කියන්න ඕනෑ. ඒ නිසා ඒවා පිළිබඳවත් රජයේ අවධානය යොමු කර, අනවශ්‍ය දේ ඉවත් කරලා මේ තුළ තිබෙන හොඳ දේ මේ රටේ කාන්තාවන්ට ලබා දෙන්න කටයුතු කිරීම තමයි අපි කළ යුතුව තිබෙන්නේ.

මම අහගෙන හිටියා, අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ කථාව. එතුමා කිව්වා, මේ ආණ්ඩුව පුදුම විධියට පනත් ඉදිරිපත් කරනවා කියලා. පනත් දමලා, දමලා මේ පාර්ලිමේන්තුව පුරවන්න හදනවා කිව්වා. අපි තමයි නීති සම්පාදකයෝ. පාර්ලිමේන්තුව කියන්නේ නීති සම්පාදකයෝ. එතකොට රටට අවශ්‍ය නීති අණපනත් ගෙනෙන්න ඕනෑ අපි තමයි. අපි මේක වසා තබනවා නම් වැඩක් නැහැ. ඒ නිසා සමාජයට අවශ්‍ය නීති, අණපනත් හදලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන එක රජයේ වගකීමක්.

මට මතකයි, මෑත කාලයේ මේ පාර්ලිමේන්තුවට ඓතිහාසික අණපනත් ගණනාවක් ඉදිරිපත් කළා. ඒ අතර අල්ලස් (සංශෝධන) පනත, දූෂණ විරෝධී පනත, මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත, ජාතික ජලශාස්ත්‍රීය පනත, නොතාරිස් (සංශෝධන) පනත, අන්තිම කැමති පත්‍ර (සංශෝධන) පනත, ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත, අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම පනත, අපරාධවලින් උපයාගත් ආදායම් පිළිබඳ සොයා බැලීමට අදාළ පනත් කෙටුම්පත -දැනට ඒක කැබිනට් මණ්ඩලය අනුමත කර තිබෙනවා, තවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැහැ- ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) පිළිබඳ පනත, ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පනත වැනි ඓතිහාසික අණපනත් ගණනාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. නමුත් එතුමන්ලා ඒවා ගැන කියන්නේ නැහැ. හැබැයි, පනත් 100ක් ඉදිරිපත් කරද්දී එක පනතක අඩු පාඩුවක් වුණොත් ඒ ගැන කියලා අර ඉදිරිපත් කළ පනත් ඔක්කොම විවේචනය කරනවා.

වත්මන් අධිකරණ ඇමතිතුමාට කලින් හිටපු අධිකරණ ඇමතිතුමා වන අලි සබ්රි ඇමතිතුමාට අපි විශේෂ ස්තුතියක් පළ කරන්න ඕනෑ, වත්මන් අධිකරණ ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙන ගමන්ම. අපි එම දෙපොළටම ස්තුති කරන්න ඕනෑ. මම හිතන විධියට අලි සබ්රි ඇමතිතුමා තරම් පනත් කෙටුම්පත් සකස් කරලා, ඉදිරිපත් කරන්න කටයුතු කරපු අධිකරණ ඇමතිවරයෙක් මේ පාර්ලිමේන්තු ඉතිහාසයේම ඉඳලා නැහැ. එතුමා ඉතා කාලෝචිත අණපනත් ගණනාවක් ඉදිරිපත් කළා. එම අණපනත් අතරට ඉදිරිපත් කළ තවත් පනත් කෙටුම්පතක් හැටියට තමයි අපි මේ පනත් කෙටුම්පතත් දකින්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙම පනත් කෙටුම්පත සම්මත වීම හරහා මේ රටේ කාන්තාවන්ට ලැබෙන දේවල් ගැන අපි කියන්න ඕනෑ. කාන්තාවන් සවිබලගැන්වීම, කාන්තා අයිතීන් ආරක්ෂා කර ගැනීම ඇතුළු කරුණු-කාරණා ගණනාවක් මෙම පනත් කෙටුම්පතට ඇතුළත් වෙලා තිබෙනවා. මේ රටේ ඉතිහාසය දිහා බැලුවාම, කාන්තාවන්ට විශාල අසාධාරණයක් සිදු වී තිබෙන බව අපි දන්නවා. කාන්තාවන්ට බරපතළ හිංසා සිදු වුණා. කාන්තාවන්ට සමාජයේ නිසි තැන ලැබුණේ නැහැ. හැබැයි, මෑත කාලය වෙනකොට ඒ තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් වෙලා, කාන්තාවන්ට නිසි තැන ලැබී තිබෙනවා. අද වනවිට නියෝජ්‍ය පොලිස්පති තනතුරු, හමුදාවේ ඉහළ තනතුරු, අමාත්‍යාංශ ලේකම් තනතුරු, ආයතනවල ප්‍රධාන තනතුරු මේ රටේ කාන්තාවන්ට ලැබී තිබෙනවා. චම්පික රණවක මැතිතුමාත් කිව්වා වාගේ අද වනවිට රාජ්‍ය සේවය තුළ සියයට 55ක්ම ඉන්නේ කාන්තාවන්. ඒ නිසා අද වනවිට කාන්තාවන්ට නිසි තැන ලැබෙමින් පවතින අතර තමයි මේ පනත් කෙටුම්පතත් ඉදිරිපත් කර තිබෙන්නේ. හැබැයි, කාන්තාවන්ට නිසි තැන ලැබුණත්, ඊට අවශ්‍ය නීතිමය රාමුව සකස් වෙලා තිබුණේ නැහැ. ඒ නිසා මේ පනත් කෙටුම්පත සම්මත වීම හරහා කාන්තාවන්ට නීතිමය රැකවරණයක් ලැබෙන බවත් අප සඳහන් කළ යුතුයි.

ගරු රාජ්‍ය ඇමතිතුමියනි, මෙය කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත යනුවෙන් හැඳින්වූවාට, කාන්තා සවිබලගැන්වීමක් සැබැවින්ම මේ තුළින් සිද්ධ වෙනවාද කියලා මට පැහැදිලි නැහැ. මේ රටේ කාන්තාවන් සවිබලගැන්වීම කියන කාරණය පිළිබඳව කථා කිරීමේදී මා සඳහන් කළ යුතුයි, අපේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමේදී අපි ජනාධිපතිතුමාගෙන් ඊට අදාළ ඉල්ලීමක් කළ බව. මේ රටේ කාන්තාවන්ට රුපියල් 50,000ක, 100,000ක පොලී රහිත ණයක් දෙන්න කියලා අපි ඉල්ලීමක් කළා. ණයක් ලබා දීලා කාන්තාවන්ට මොනවා හෝ දෙයක් පටන් ගන්න උදව් කරන්නය කියලා අපි කිව්වා. ඒ වෙලාවේදීම ජනාධිපතිතුමා එය අනුමත කළා. ඒ අනුව පොලී රහිත රුපියල් 50,000ක ණයක් කාන්තාවන්ට ලබා දීමට කටයුතු

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

කරනවා. ආණ්ඩුවෙන් එම පොලිය ගෙවනවා. හෙට-අනිද්දා වෙනකොට එම කටයුතු ආරම්භ කරනවා. ඒක තමයි විය යුත්තේ. කාන්තාවන්ගේ ආර්ථිකය හදා ගන්න වාගේම, තැනකට ගියාම ඔවුන්ට අසාධාරණයක් නොවෙන විධියට කටයුතු කරන්න අවශ්‍ය වටපිටාවත් සැකසිය යුතුයි.

මෙතෙක් කාලයක් සම තැන හැදෙමින් තිබුණත්, නීතියෙන් ඔවුන් ආරක්ෂා නොවෙච්ච නිසා ගැටලු තිබුණා. නමුත් මේ පනත හරහා කාන්තාවන් ආරක්ෂා වීමේ, සවිබල ගැන්වීමේ දැවැන්ත වැඩසටහනක් සිද්ධ වෙනවා. අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය නියෝජනය කරමින් මන්ත්‍රීවරියන් පිරිසක් ඉන්නවා. ඒ මන්ත්‍රීවරියන් මේ පනත ගේන්න විශාල කැප කිරීමක් කළා. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරියන් එකතු වෙලා, මේ රටේ කාන්තාවන් වෙනුවෙන් මේ ඓතිහාසික කටයුත්ත සිදු කිරීම පිළිබඳව අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය නියෝජනය කරන මන්ත්‍රීවරියන්ට ස්තුතිවන්ත වෙනවා.

මේ පනත් කෙටුම්පත ගැන කථා කරන ගමන්, වතුකරය නියෝජනය කරන මහජන නියෝජිතයකු හැටියට මම විශේෂයෙන් වතුකරයේ ජීවත් වන කාන්තාව ගැනත් කියන්න ඕනෑ. වතුකරය නියෝජනය කරන කාන්තාවන්ට අදටත් විශාල අසාධාරණයක් සිද්ධ වෙනවා. අපේ ගම්වල ඉන්න කාන්තාවන්ට වඩා, වතුකරයේ ජීවත් වන කාන්තාවන්ට විශාල අසාධාරණයක් සිද්ධ වෙනවා. අද වෙලා තිබෙන්නේ මොකක්ද? වතුකරයේ ජීවත් වන කාන්තාවන්ට කවදාවත් රාජ්‍ය සේවයේ රැකියාවකට යන්න බැහැ. වතුකරයේ කාන්තාව හැමදාම එක්කෝ ගෙදරක බැලමෙහෙවරකම් කරන්න ඕනෑ. එහෙම නැත්නම්, කඩයක රෙදි විකුණන්න යන්න ඕනෑ. එහෙම නැත්නම්, ඒ හා සමාන දෙයක් තමයි ඒ කාන්තාවන්ට කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එහෙම නැතිව රාජ්‍ය සේවයට වතුකරයේ කාන්තාවන්ට එන්න පුළුවන් වැඩ පිළිවෙළක් නැහැ. රාජ්‍ය සේවයට සිංහල කාන්තාවන් එනවා වාගේ, වතුකරයේ කාන්තාවන්ට එන්න අවස්ථාවක් නැහැ. ඒ නිසා වතුකරයේ කාන්තාවන්ටත් අනෙකුත් කාන්තාවන් වාගේම ඉදිරියට යන්න වැඩ පිළිවෙළක් හැදෙන්න ඕනෑ, ගරු රාජ්‍ය ඇමතිතුමියනි.

ඒ විතරක් නොවෙයි. අපේ ගමේ කාන්තාවක් විවාහ වුණාම ගෙයක් හදාගෙන, ඒ ගෙදර ස්වාමිපුරුෂයාත් එක්ක තනියම ඉන්න පුළුවන්. හැබැයි, වතුකරයේ කාන්තාවට එවැනි පහසුකමක් නැහැ. වතුකරයේ අඩි 10 x 10 ලැයිම් කාමරයක තමයි අම්මයි තාත්තයි ඉන්නේ. ඔවුන්ගේ දරුවා විවාහ වුණාට පස්සේ ඒ අය ඉන්නේත් ඒ ලැයිම් කාමරයේමයි. ඒ දරුවාගේ දරුවා විවාහ වුණාම ඉන්නේත් ඒ කාමරයේ. පවුල් 4ක් එක කාමරයේ ජීවත් වෙන්නේ. ඒ නිසා වතුකරයේ කාන්තාවන්ට විශාල අසාධාරණයක් සිද්ධ වෙනවා. වතුකරයේ කාන්තාවන්ගේ රැකියාව පැත්තෙන් ගත්තත් ඒ වාගේයි. උදේ පාන්දර වතුවලට ගිහිල්ලා, කූඩැල්ලෝ කද්දී දළු කඩලා ජීවත් වෙන වතුකරයේ අනිංසක කාන්තාව වෙනුවෙන් නියමිත පඩියක් ගෙවන්නේ නැහැ. ඒ අයට කරදරයක් වුණොත් සොයා බලන්න කවුරුවත් නැහැ. වතුවල වැඩ කරනකොට පොළඟුන් දෂ්ට කරනවා; වෙනත් සතුන්ගෙන් කරදර වෙනවා. නමුත්, ඒ අය වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් නැහැ. ඒ නිසා මේ වතුකරයේ කාන්තාව වෙනුවෙන් ගරු රාජ්‍ය ඇමතිතුමියගේ දැඩි අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

මම කලිනුත් කිව්වා වාගේ අපේ ගමේ කාන්තාවට වඩා වතුකරයේ කාන්තාව දුක් විඳිනවා. වතුකරයේ කාන්තාවටත් අනෙක් කාන්තාවන්ට මෙන් සමාන අයිතිවාසිකම් තිබෙන්න ඕනෑ. කාන්තාව කිව්වාම, ගමේ කාන්තාව සහ වතුකරයේ කාන්තාව කියලා වෙනසක් නැහැ. ගමේ කාන්තාවට වාගේම වතුකරයේ කාන්තාවටත් ආරක්ෂා වීම සඳහා, සවිබල ගැන්වීම සඳහා, ජීවිත සුරක්ෂිත කිරීම සඳහා කටයුතු කළ යුතු වෙනවා.

වතුකරයේ කාන්තාවන් විශාල පිරිසක් වස පානය කරලා මිය යනවා. ස්වාමිපුරුෂයෝ මත්පැන් බීලා ඇවිල්ලා වතුකරයේ කාන්තාවන්ට පහර දෙනවා. වතුකරයේ අධ්‍යාපනය ගත්තත්, ගමේ අධ්‍යාපනය වාගේ නොවෙයි, වතුකරයේ අධ්‍යාපනය විශාල ලෙස කඩා වැටිලා. වතුකරයේ තරුණියන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්නේ නැහැ. වතුකරයේ තිබෙන පාසල්වල ගුරුවරුන්ගේ විශාල හිඟයක් තිබෙනවා. ඒ නිසා වතුකරයේ කාන්තාවන්ටත් මේ ක්‍රියාවලිය ඇතුළේ දැවැන්ත වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා මම රාජ්‍ය ඇමතිතුමියට යෝජනා කරනවා.

විශේෂයෙන් අපේ ගරු ජනාධිපතිතුමා පසුගිය කාලයේ වතුකරයේ ජනතාව වෙනුවෙන් දැවැන්ත වැඩ කොටසක් කළා. ඒ වෙනුවෙන් අපි එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. වතු කම්කරුවාගේ දෛනික වැටුප රුපියල් 1,000යි තිබුණේ. එය රුපියල් 1,700 දක්වා වැඩි කරන්න කියලා අද වන විට රජය තීන්දු කරලා තිබෙනවා. වතු සමාගම් මේකට එරෙහිව අද ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමාට කියන්න ඕනෑ, මේ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න, ඒ වාගේම, මේ වතු ඒ අයට කරන්න බැරි නම් එම වතු රජයට පවරා ගන්න කියලා. ඒ සමාගම් ඒ වතුවලින් විශාල ලෙස ලාභ ලබනවා. Management fees කියලා කෝටි ගණන් ගේනවා. මේ වතු සමාගම් රජයට ගෙවන්නේ අවුරුද්දකට අක්කරයකට රුපියල් 500යි. අක්කරයකට රුපියල් 500ක් අවුරුද්දක් වෙනුවෙන් ගෙවලා වතුවල තිබෙන විශාල ගස් ටික කපනවා; සංචාරක ව්‍යාපාරය කරනවා; මැණික් ගරනවා; කරන්න තිබෙන සියලු පහත් වැඩ කරනවා. හැබැයි, ඒ ගොල්ලන් ජීවත් කරවන වත්තේ කම්කරුවාගේ වැටුප වැඩි කරන්න කටයුතු කරන්නේ නැහැ. ඒ නිසා අද රජය තීන්දුවක් අරගෙන තිබෙනවා, වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,700 දක්වා වැඩි කරන්න. ඒකට විරුද්ධව අද වතු සමාගම් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා අපි රජයට කියනවා, මේ සම්බන්ධයෙන් ස්ථාවරව ඉන්න කියලා. ඒ වැඩි කළ දෛනික වැටුප ගෙවන්න බැරි වතු සමාගම් ඉන්නවා නම්, ඒ වතු රජයට පවරාගෙන වෙනත් සමාගම්වලට හරි දීලා, වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කරන්න කටයුතු කරන්න කියලා අපි කියනවා.

වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් අපි ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ වාගේම තව කාරණයක් කියන්න ඕනෑ. ජනතා වතු සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ඇල්කඩුව වැවිලි සමාගම කියලා රජය සතු වතු තිබෙනවා. මේ රාජ්‍ය වතු සමාගම් තුනේ ETF, EPF - සේවක අර්ථසාධක අරමුදල් - ඒ කිසිවක් අවුරුදු 30කින් මිනිසුන්ට හම්බ වෙලා නැහැ. රුපියල් බිලියන 5.7ක් මේ වතු සමාගම්වල හිරවෙලා තිබුණා. මේ මුදල් ලැබිය යුතු සමහර මිනිස්සු මිය ගිහිල්ලා. නමුත්, ඒ මිනිස්සුන්ගේ EPF එක, ETF එක ගන්න බැහැ. ඒ නිසා අවුරුදු 20ක්, 30ක් ඒ සේවක අර්ථසාධක අරමුදල් ගන්න බැරි වෙච්ච මිනිස්සු වෙනුවෙන් රජය පසුගිය සතියේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා, රුපියල් බිලියන 5.7ක් භාණ්ඩාගාරයෙන් දීලා සෑම වතු කම්කරුවකුටම සේවක අර්ථසාධක අරමුදල් ගෙවන්න රජය තීරණය කළා. ඒ පිළිබඳව අපි රජයට ස්තුතිවන්ත වෙනවා.

ඒ විතරක් නොවෙයි, වතු කම්කරුවන්ට ඉඩම් නැහැ. මම ඔබතුමන්ලාට කිව්වා, ඔවුන් අඩි 10 x 10 කාමරවලයි ඉන්නේ කියලා. ඒ නිසා සෑම කම්කරුවෙකුටම පර්චස් 7ක් නොවෙයි පර්චස් 10ක් ලබා දෙන්න රජය තීන්දු කළා. වතු කම්කරුවාට

විතරක් නොවෙයි වත්තේ ජීවත් වෙන දමිළ ජනතාවටත් ඉඩම් ලබා දීම සඳහා රජය තීරණය කළා. කෙටි කාලයක් තුළ වතුකරයේ ජනතාව වෙනුවෙන් මෙවැනි තීන්දු ගත් තවත් කිසිම රජයක් නැහැ. වතුකරයේ කම්කරුවාගේ වැටුප් වැඩි කිරීම, වතු කම්කරුවන්ට පදිංචි වෙන්න ඉඩමක් ලබා දීම, ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ගෙවන්න කටයුතු කිරීම වැනි සුවිශේෂී කටයුතු ගණනාවක් වත්මන් ජනාධිපතිතුමා කළා. වතුකරය නියෝජනය කරන, වතු වෘත්තීය සමිතියක සභාපතිවරයකු හැටියට කටයුතු කරන, ලංකාවේ සිංහල පුද්ගලයකු හැටියට වතු වෘත්තීය සමිතියක් නියෝජනය කරන පුද්ගලයා මම විතරයි. මහනුවර දිස්ත්‍රික්කයේ වැඩිම සාමාජික සංඛ්‍යාවක් ඉන්නේ අපේ වෘත්තීය සමිතියේ. ඒ දමිළ ජනතාවගේ දුක, වේදනාව අපි හොඳට දන්නවා. ඒ නිසා මේ වැඩසටහන යටතේ වතුකරයේ ඒ අහිංසක ජනතාව වෙනුවෙනුත්, අපේ ගමේ කාන්තාවන්ට වාගේම යම්කිසි දෙයක් කරන්නට ඕනෑ. මොකද, ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඒ පැත්ත බැලෙන්නේ නැහැ. අපි රටේ අධ්‍යාපනය ගැන බැලුවාට වතුකරයේ අධ්‍යාපනය ගැන බලන්නේ නැහැ. ගමේ අනෙකුත් කාන්තාවන් ගැන බැලුවාට වතුකරයේ කාන්තාව ගැන බලන්නේ නැහැ. ඒ නිසා ඔවුන්ට ලොකු අසාධාරණයක් සිදු වෙලා තිබෙන නිසා ඒ අය වෙනුවෙනුත් දැවැන්ත වැඩ පිළිවෙළක් මේ පනත් කෙටුම්පත් මඟින් ඉටු කරන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Wasantha Yapabandara, please. You have nine minutes.

[3.59 p.m.]

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
Thank you very much, Hon. Presiding Member, for giving me this opportunity to speak about two very important Bills - the Sri Lanka National Commission for UNESCO Bill and the Women Empowerment Bill.

අද දවසේ මේ පනත් කෙටුම්පත් පිළිබඳව සාකච්ඡා කරද්දී අපි දන්නවා, කාන්තා අයිතිවාසිකම් පිළිබඳව, ඒ අයිතීන් තහවුරු කිරීම වෙනුවෙන් පාර්ලිමේන්තුව තුළත්, පිටතදීත් අපි විශාල වශයෙන් සාකච්ඡා කරන බව. පසුගිය දවස්වල මේ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අධිකරණයට ගියා. ඒ අනුව අධිකරණය සංශෝධන කීපයක් කරන්න කියලා පාර්ලිමේන්තුවට වාර්තා කරලා තිබෙනවා.

අපි අධිකරණය අගය කරන ගමන්, අධිකරණය තමන්ට එරෙහිව ලබා දෙන තීන්දුවකදී අනවශ්‍ය විධියට අධිකරණය විවේචනය කිරීම පිළිබඳව අපි මධ්‍යස්ථව බලනවා. විශේෂයෙන් නීතිඥයකු විධියටත්, ඒ වාගේම පාර්ලිමේන්තුවේ, ව්‍යවස්ථාදායකයේ සාමාජිකයකු විධියටත් මේ සංවේදී කරුණ පිළිබඳව ඉතාම ප්‍රවේශමෙන් අවධානය යොමු කරන්න කියලා වග කිව යුත්තන්ගෙන් මා ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ අධිකරණ අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා මේ පාර්ලිමේන්තුව අමතා විශේෂ ප්‍රකාශයක් කළා. ව්‍යවස්ථාදායකයට කරන අනවශ්‍ය බලපෑම් පිළිබඳව එතුමා විවේචනාත්මකව තමයි කරුණු ඉදිරිපත් කළේ. එතුමා සඳහන් කළා නමින්ම. ෆයිසර් මුස්තාපා නීතිඥවරයා අධිකරණ තීන්දුවලට බලපෑම් කරනවා කියලා ආණ්ඩුව නියෝජනය කරන අමාත්‍යවරයෙක් ප්‍රසිද්ධියේ ප්‍රකාශයක් කළා. මේ කථාව ඉතාම ආන්දෝලනාත්මක කථාවක්. අධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය වැනි ලංකාවේ ඉහළම අධිකරණවල විනිශ්චයකාරතුමන්ලාගේ තීන්දුවලට බලපෑමක් කරනවාය කියන තැනට අධිකරණ අමාත්‍යවරයා කරුණු ඉදිරිපත් කරද්දී, අපට අධිකරණ ඇමතිතුමාගෙන් විමසන්න වෙනවා, ඔබතුමා අධිකරණ අමාත්‍යාංශයේ අවස්ථා කීයකදී වැඩ කළාද කියලා. ඔබතුමා මෙතරම් කාලයක් අධිකරණ අමාත්‍යවරයා විධියට අධිකරණ අමාත්‍යාංශයේ වැඩ කරන ගමන්, නව තත්ත්වයක් පැහැදිලි කරනවා. අධිකරණයේ සිදු වෙන්නේ කිසියම් ආකාරයක දූෂණයට තුඩු දෙන කාරණාවක් කියලායි ඔබතුමා ප්‍රසිද්ධියේ මේ ව්‍යවස්ථාදායක සභාව අමතා කියන්නේ.

අපි කියනවා, සත්‍ය වශයෙන්ම එහෙම යම්කිසි පාර්ශ්වයකට bias වෙලා - බර වෙලා - කටයුතු කරනවා නම්, තීන්දු දෙනවා නම්, අප ඒක කිසිසේත් අනුමත කරන්නේ නැහැ කියලා. හැබැයි අපි දන්නවා, පසුගිය කාලයේ සිදු වෙච්ච සමහර කරුණු කාරණා ගැන. ඒවා සම්බන්ධයෙන් අපට විවේචනයක් තිබෙනවා.

නීතියේ දෙවඟනගේ කුමරි බඹසර ආරක්ෂා කිරීම පිළිබඳව අප සියලුදෙනාට වගකීමෙන් බැඳී සිටින්න සිදු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ලසන්ත අලගියවන්න රාජ්‍ය අමාත්‍යවරයා, දුමින්ද දිසානායක මන්ත්‍රීවරයා සහ මහින්ද අමරවීර අමාත්‍යවරයා කොළඹ දිසා අධිකරණයේ නඩුවක් -DSP/207/2024 දරන නඩුව- ගොනු කරනවා. එම නඩුවේ තුන්වැනි විත්තිකරු තමයි විජයදාස රාජපක්ෂ අධිකරණ අමාත්‍යවරයා. ඇත්තටම අපි දන්නවා, මේ රට දන්නවා, ඒ තිදෙනා විසින් මේ නඩුවේදී අතුරු තහනම් නියෝගයක්, වාරණ නියෝගයක් ඉල්ලූ බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිසා අධිකරණය විසින් අතුරු තහනම් නියෝගයක් දුන්නාට පසුව, වාරණ නියෝගයක් දුන්නාට පසුව සාමාන්‍ය ක්‍රමය තමයි එම නියෝගයට එරෙහිව පළාත්බද සිවිල් අභියාචනාධිකරණයට ගිහින් ප්‍රතිශෝධන ඉල්ලීමක් කරන්න කටයුතු කිරීම. නමුත් අපි දන්නවා, මෙතැනදී සිද්ධ වුණේ කිසියම් කාරණාවක් පදනම් කරගෙන අභියාචනාධිකරණයට යෑමයි කියන එක. මුල් අවස්ථාවේදී, අධිකරණ තීන්දුව පිළිබඳව අතෘප්තියට පත් වන පාර්ශ්වයට සිවිල් අභියාචනාධිකරණයට යෑම සඳහා අවස්ථාව තිබුණත්, මේ කාරණය කෙළින්ම අභියාචනාධිකරණයට ගෙන ගියා. අන්න එතැනදී ඒක ප්‍රතික්ෂේප වුණා කියලා අපි දන්නවා. එසේ ප්‍රතික්ෂේප වීම මත පදනම්ව අධිකරණ අමාත්‍යවරයා අධිකරණයේ තීන්දු පිළිබඳව දැඩි විවේචනයක් එල්ල කරනවාද කියන සාධාරණ සැකය අපට ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණය පිළිබඳව කිසියම් විවේචනයක් ඉදිරිපත් කරනවා නම්, සාධාරණව, යුක්ති යුක්තව, හේතු සාධක සහිතව, නීතියේ සිද්ධාන්ත අනුවයි එය කළ යුතු වන්නේ. එහෙම නැතිව, අධිකරණ අමාත්‍ය ධුරය වැනි වැදගත්ම තනතුරක සිටින කෙනෙකු ඒ විධියට අනවශ්‍ය ප්‍රමාණයේ විවේචනයක් කරනවා නම්, ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය පිළිබඳව සාමාන්‍ය මහ ජනතාවගේ විශ්වාසය බිඳ වැටෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා ප්‍රවේශමෙන් විවේචනය කළ යුතු සිද්ධාන්තයක් සම්බන්ධයෙන් නේද මේ විධියේ අනවශ්‍ය විවේචනයකට යන්නේ කියා සිතෙන අපට භයක් දැනෙනවා. මොකද අපි දන්නවා, ඉදිරි කාලයේදී මේ රටේ තීරණාත්මක මැතිවරණයක් පැවැත්වීමට නියමිතව තිබෙන බව. මෙය, ඒ තීරණාත්මක මැතිවරණය පිළිබඳ අපේ රටේ ජනතාව බොහෝ විවේචන එල්ල කරන, ආන්දෝලනාත්මකව සාකච්ඡා කරන මොහොතක්. නීතිපතිවරයාගේ සේවා කාලය දීර්ඝ කිරීම වෙන්න

[ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා]

පුළුවන්, එසේත් නැතිනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීන්දු තීරණ පිළිබඳව වෙන්න පුළුවන්, එහෙමත් නැත්නම් අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දු පිළිබඳව වෙන්න පුළුවන්, තමන්ගේ සිතැඟි ආකාරයට ඒ තීන්දු නොලැබුණාට පසු විවේචනයක් ගෙන එනවා නම්, එමඟින් නීතියේ ආධිපත්‍යය බිඳ හෙළනවා නම්, පාර්ලිමේන්තුවේ - ව්‍යවස්ථාදායකයේ- සාමාජිකයන් විධියට අපට ඒකට කිසිසේත් එකඟ වෙන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉදිරියේදී මේ රටේ මහ ජනයා අධිකරණ ක්‍රියාමාර්ගවලට පිවිස යුක්තිය ඉල්ලා සිටින වෙලාවකදී, මහ ජනතාව තුළ අධිකරණය පිළිබඳ අවිශ්වාසයක් ඇති කරලා, 'අධිකරණයට යෑමෙන් එලක් නැහැ' කියන මතවාදය ගෙනැල්ලා, අධිකරණය විනිළුවට, අවඥාවට ලක් කරලා ඡන්ද කල් දමා ගන්නා උප්පරවැට්ටියක් හැටියට මේක පාවිච්චි කරන්න සමහරු කල්පනා කරනවා නම්, රටට, ජාතියට මේ මර උගුලේ වැටෙන්න ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ කියා අපි කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ කිව යුතු තවත් කාරණාවක් තිබෙනවා. ඔබතුමා දන්නවා, පසුගිය කාලයේ මහත් ආන්දෝලනයට ලක් වෙච්ච කාරණාවක් වන විරංජිත් තාඹුගල කියන තැනැත්තා පිළිබඳ කාරණය. ඒ සිද්ධිය පිළිබඳව ලංකාවේ කථා නොකරපු තැනක් නැහැ. විරංජිත් තාඹුගල කියන තැනැත්තා සම්බන්ධයෙන් පසුගිය දිනක අධිකරණයේ නඩුවක් විභාග වුණා. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ ඔහුට එරෙහිව එල්ල වුණු චෝදනාවට අදාළ නඩුව පිළිබඳ කථාව අපි මේ වෙලාවේ මතක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ඉතාම ප්‍රබල කාරණාවක්. මෙන්න, අධිකරණය පිළිබඳව නැවතත් වෙනම කියැවෙනවා කාරණාවක්. විරංජිත් තාඹුගල කියන තැනැත්තා පිළිබඳව මම මේ පාර්ලිමේන්තුවේදී විවේචනාත්මකව කථා කළා, අවස්ථා ගණනාවකදී.

නමුත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ ඒ පුද්ගලයාට විරුද්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හරහා පරීක්ෂණයක් කළ යුතු වෙලාවේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඒ පුද්ගලයාගෙන් කෝටි 30ක කප්පම් මුදලක් ඉල්ලා තිබෙනවා කියලා ඒ පුද්ගලයා අධිකරණයට වාර්තා කර තිබෙනවා. කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ අංක 05 ශාලාවේදී ඔහු ඉල්ලීමක් කර තිබෙනවා, ඒ කප්පම් ඉල්ලීමට අදාළව රහස්‍ය ප්‍රකාශයක් කරන්න ඕනෑ කියලා. නඩු අංකය, බී 14546/2024. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127(1) වගන්තිය යටතේ රහස්‍ය ප්‍රකාශයක් කරන්න ඉඩ දෙන්න කියා ඔහු ඉල්ලීමක් කර තිබෙනවා. පෙරේදා ඒ රහස්‍ය ප්‍රකාශය කරන්න අධිකරණය ඉඩ දෙනවා. මේ රටේ අමාත්‍යවරුන් ගණනාවක් පිළිබඳව ඒ නඩුවේ චිත්තිය පාර්ශ්වයෙන් කරුණු ඉදිරිපත් වෙනවා. අභ්‍යන්තර ආරක්ෂක ඇමතිතුමනි, ඒ නඩුවේදී තමුන්නාන්සේලාගේ නම් ප්‍රකාශයට පත් වෙනවා නම් අධිකරණය පිළිබඳව, යුක්තියේ දෙවඟනයට ගල් ගසන ස්වභාවයෙන් කථා කරන තමුන්නාන්සේලාට අපි කාරණයක් කියන්න ඕනෑ. මේ කප්පම් සිද්ධියේදී රුපියල් කෝටි 30ක් තාඹුගලගෙන් ගැනීම සඳහා ඉල්ලීමක් කර තිබෙනවා නම් අපි එම ක්‍රියාව තරයේ ප්‍රතික්ෂේප කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සිද්ධිය සාමාන්‍ය සිද්ධියක් නොවෙයි. මේවා තමයි ව්‍යවස්ථාදායකය විධියට මේ පාර්ලිමේන්තුවේදී යුක්තිය වෙනුවෙන් අප කථා කරන්න ඕනෑ දේවල්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සිද්ධියට සම්බන්ධ පුද්ගලයා අපරාධකරුවෙකු යැයි තවමත් ඔප්පු නොවුණත්, ඔහු චෝදනා ලබා තිබෙනවා. ඔහුගෙන් කප්පම් ගන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පුළුවන්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඒ නිසා රටේ යුක්තිය පිළිබඳව, නීතිය පිළිබඳව කථා කරන මේ අයගෙන් අපි ඉල්ලීමක් කරනවා. සියල්ලන්ම නීතියට වඩා පහළින් ඉන්නේ. කිසිවෙකුට බලයක් නැහැ නීතිය තමන්ගේ අතට ගන්න. අභ්‍යන්තර ආරක්ෂක අමාත්‍යතුමනි, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ එල්ල කරන චෝදනාව පිළිබඳව ඔබතුමා ඊළඟ රැස්වීම් සතියේදී පාර්ලිමේන්තුව දැනුවත් කරන්න කියලා මම අභියෝග කරනවා. එහෙම නැති නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගැනත්, වීදුරු ගෙවල්වල ඉඳලා ගල් ගසන ඔබ ගැනත් අපි හෙළිදරව් කරනවා කියන එක මේ වෙලාවේ මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. H.M.M. Harees. You have 12 minutes.

[ප.ව. 4.09]

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நேற்றையதினம் இந்தச் சபையில் என்னுடையதும், சகோதர உறுப்பினர்களான மாண்புமிகு பைஸால் காசிம், மாண்புமிகு இஷாக் ரஹ்மான், மாண்புமிகு றிஸாட் பதியுதீன் ஆகியோர்களதும் பெயர்களைச் சம்பந்தப்படுத்தி கௌரவ உறுப்பினர் தயாசிறி ஜயசேகர அவர்கள் சில விடயங்களைப் பேசியிருந்தார். அதாவது, அரசாங்கத்திடமிருந்து நாங்கள் நிதியைப் பெற்றோமென்ற போர்வையில் அவர் பேசியிருந்தார். ஏதோ நாங்கள் அரசிடமிருந்து எங்களுடைய தனிப்பட்ட தேவைகளுக்காக, எங்களுடைய சொந்தச் செலவுக்காக பணத்தைப் பெற்றோமென்ற வகையிலான ஒரு பொருள்கோடலில் ஊடகங்களில் வெளிவந்த அந்தச் செய்தி இன்று பேசுபொருளாக மாறியிருக்கின்றது.

மக்களுடைய கல்விக்கான தேவைகள், சுயதொழிலுக்கான தேவைகள், விளையாட்டுத்துறையை ஊக்குவித்தல், உட்கட்டமைப்பு அபிவிருத்திக்கான நடவடிக்கைகளை மேற்கொள்ளல், மதஸ்தலங்களுக்கான தேவைகள், மீனவர்களுடைய தேவைகள், விவசாயத்துறையை முன்னேற்றல் போன்ற விடயங்களைச் செய்வது அரசினதும் மக்கள் பிரதிநிதிகளினதும் கடமையாக இருக்கின்றது. கொவிட்-19 தொற்று ஏற்பட்டமை மற்றும் நாட்டின் பொருளாதாரப் பிரச்சினை காரணமாக நாங்கள் பிரதிநிதித்துவப்படுத்துகின்ற மாவட்டங்களில் எங்களுடைய மக்களின் தேவைகளை நிறைவேற்ற முடியாமல் இருந்தது. மாண்புமிகு ஜனாதிபதி அவர்கள் 4 வருடங்களின் பின்பு பன்முகப்படுத்தப்பட்ட நிதியொதுக்கீட்டின் ஊடாக மக்களுடைய தேவைகளை நிறைவேற்றுவதற்கான நடவடிக்கையெடுக்கின்றபோது, அதற்கான நிதியைக் கோரி, அந்த நிதியைக் கொண்டுபோய் மக்களிடம் சேர்ப்பதற்கிடையில், அது சர்ச்சைக்குரிய ஒரு விடயமாக, இனவாத விடயமாக இந்த உயரிய சபையில் பேசப்பட்டிருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! Will an Hon. Member propose the Hon. Wasantha Yapabandara to the Chair?

ගරු නලින් ප්‍රනාන්දු මහතා (වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் பர்னாந்து - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Nalin Fernando - Minister of Trade, Commerce and Food Security)

Sir, I propose that the Hon. Wasantha Yapabandara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வசந்த யாப்பாபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA left the Chair, and THE HON. WASANTHA YAPABANDARA took the Chair.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையில் அந்த நிதியானது எங்களுடைய சொந்தத் தேவைக்காக எடுத்துச் செல்லப்பட்ட நிதி அல்ல. கிழக்கு மாகாணமும் வடக்கு மாகாணமும் கிட்டத்தட்ட 40 வருடங்கள் யுத்தத்தினால் பாதிக்கப்பட்ட இரு மாகாணங்களாகும். அதிலும் நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற கிழக்கு மாகாணத்தின் அம்பாறை மாவட்டத்தில் சுனாமியினால் பாதிக்கப்பட்ட பகுதிகள் இன்னும் முழுமையாக சீர்படுத்தப்படாத நிலையில் உள்ளது.

அதேபோன்று, யுத்தத்தின் காரணமாக ஏற்பட்ட அழிவு களை இன்னமும் எங்களால் நிவர்த்திசெய்ய முடியாமல் இருக்கின்றது. இவ்வாறான ஒரு நிலைமையில், அபிவிருத்திக் காக வெறுமனே 100 மில்லியன் நிதியை நாங்கள் பெற்றமை யானது, நண்பர் தயாசிறி ஜயசேகர அவர்களுடைய பார்வை யில் இனவாதமாகப் பார்க்கப்படுகின்றது. எதிர்க்கட்சியில் இருக்கின்ற ஐக்கிய மக்கள் சக்தியின் பாராளுமன்ற உறுப்பினர்கள் பலர் இவ்வாறு நிதி பெற்றிருக்கின்றார்கள். அந்தக் கட்சியின் நிழல் நிதி அமைச்சரான கௌரவ ஹர்ஷ த சில்வா உட்பட பல பாராளுமன்ற உறுப்பினர்கள் அவ்வாறு நிதியைப் பெற்றிருக்கின்றார்கள். அதேபோன்று, தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினர்களும் அவ்வாறு நிதியைப் பெற்றிருக்கின்றார்கள். மாண்புமிகு சனாதிபதி அவர்களிடம் நிதியைக் கேட்ட பாராளுமன்ற உறுப்பினர்களுக்கு அவர் வழங்கியிருக்கின்றார். மாண்புமிகு சனாதிபதி அவர்கள் யாருடைய கோரிக்கையையும் மறுக்க வில்லை. இந்த விடயத்தில் அவர் நியாயமாக நடந்திருக் கின்றார். முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் மட்டும்தான் இந்த நிதியைப் பெற்றிருக்கின்றார்கள் என்பதாக இந்த உயரிய சபையில் இனவாதக் கண்ணோட்டத்தில் பேசியதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கிழக்கு மாகாணத்தில் நாங்கள் பல்வேறு விதத்திலும் பல தேவை களைக் கொண்டிருக்கின்றோம். இங்கு பாராளுமன்ற உறுப்பினர்கள் பல்வேறு பிரச்சினைகளைப் பற்றிப் பேசுகின்றார்கள். ஆனால், கிழக்கு மாகாணத்தில் இருக்கின்ற பிரச்சினைகள் வித்தியாசமானவை. தெற்கிலே கடுகதிப் பாதைகள் இருக்கின்றன; Flyovers இருக்கின்றன. மேலும், துறைமுகங்கள் என்றும் தொழிற்பேட்டைகள் என்றும் IT பூங்காக்கள் என்றும் தென் பகுதியைச் சுற்றி பாரிய அபிவிருத்திகள் மில்லியன் டொலர் செலவில் நடைபெறு கின்றன.

ஆனால், யுத்தத்தினால் அழிவுற்றிருக்கின்ற கிழக்கு மாகாணத்தில் expresswaysக்கான திட்டமிடல்கள் இன்னும் இல்லை. மேலும், அம்பாறை மாவட்டத்தில் மீன்பிடித் துறைமுகம் செயலிழந்து காணப்படுகின்றது. அதனால் பல்லாயிரக் கணக்கான மீனவர்கள் இன்று அநாதரவான நிலையில் இருந்து கொண்டு இருக்கிறார்கள். அதுமட்டுமல்ல, அங்கு கடந்த வெள்ளத்தில் பாதிக்கப்பட்ட விவசாயிகளுக்கு இன்னும் நஷ்டஈடு கொடுக்க முடியாதவொரு துர்பாக்கிய நிலைமை இருக்கின்றது. இதுதொடர்பில் அமைச்சர் உத்தர விட்டாலும் அதிகாரிகள் அதனை நிறைவேற்றாத சூழ்நிலை அங்கு காணப்படுகின்றது.

கிழக்கு மாகாணத்திலே மட்டக்களப்பு போதனா வைத்தியசாலைக்கு வரவேண்டிய இருதய நோயாளிகளுக்கு சத்திரசிகிச்சை அளிக்கின்ற cardiac catheterization lab என்ற இயந்திரம் மாற்றாந்தாய் மனப்பான்மையால் வேறொரு வைத்தியசாலைக்கு மாற்றப்பட்டிருக்கின்றது. இவ்வாறு கிழக்கு மாகாணத்தினுடைய தேவைகள் பல்வேறு விதமாக இருக்கின்றபொழுது, வெறுமனே பாராளுமன்றத்தில் சவால் விடுவதனூடாக, வீராப்புப் பேசுவதனூடாக ஒரு சமுதாயத் தினது- ஒரு மக்கள் கூட்டத்தினது - தேவைகளை நிறைவேற்ற முடியாது. யுத்தத்தினால் பாதிக்கப்பட்ட ஆயிரக்கணக்கான விதவைகள் அங்கு இருக்கின்றார்கள். அவர்கள் வருமானம் இல்லாமல் அவதிப்படுகின்றார்கள். அதுமட்டுமல்ல, அங்கு ஆயிரக்கணக்கான இளைஞர்கள் தொழில்வாய்ப்புகளின்றி இருக்கின்றார்கள். அவர்களுக்குத் தேவையான தொழிற் பேட்டைகள் இல்லை. இவர்களுக்கான விமோசனம் என்ன வென்பதைப் பற்றிச் சிந்திக்காமல், வெறுமனே பாராளுமன்றத் தில் பேசுவதுதான் அரசியல் என்றும் மக்கள் பிரதிநிதிகளின் கடமை என்றும் கூறுவதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. மக்களினுடைய குறைகளைத் தீர்க்கவேண்டிய பொறுப்பு ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினருக்கும் இருக்கின்றது என்பதை நான் இந்தச் சபையில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அந்த வகையில், எங்களுடைய மக்களின் தேவைக்காகவும், எங்களுடைய மண்ணின் தேவைக்காகவும் யாருடைய காலைப் பிடித்தாவது மன்றாடுவோம்.

என்னுடைய பல்கலைக்கழக நண்பர் மதுர விதானகே அவர்கள், அம்பாறை மாவட்டத்திலே ஒலுவில் பிரதேசத்தில் மறைந்த தலைவர் அஷ்ரப் அவர்கள் தீகவாபியைச் சுற்றி ஒரு குடியேற்றத்தை அமைத்தாரென்ற பொய்யான குற்றச்சாட்டை முன்வைத்திருக்கின்றார். வீணான இனவாத அரசியலுக்காக, தீகவாபி பிரதேசத்தில் அமைதியாகவும் ஒற்றுமையாகவும் வாழ்ந்து கொண்டிருக்கின்ற சிங்கள, முஸ்லிம் மக்கள் மத்தியில் பிரச்சினைகளைத் தோற்றுவிக்க முயல்கிறார். இன்று, நேற்று அந்தப் பிரதேசத்தில் குடியேற்றம் வந்ததுபோல் அவர் பேசுகின்றார். தொல்பொருள் சட்டத்தின்படி சட்டரீதியாக gazette பண்ணப்பட்ட இடத்தில்தான் அந்த மக்கள் வாழ்ந்து கொண்டு இருக்கின்றார்கள். அந்தக் குடியேற்றத்தினால்

[ගරු එච්.එම්.එම්. හරීස් මහතා]

தீகவாபி விகாரைக்கோ அல்லது அங்குள்ள மதஸ்தலங்களுக்கோ எந்தவித இடையூறுமில்லை என்று அங்கிருக்கின்ற அதிகாரிகள் சாட்சி கூறியிருக்கின்றனர். இவ்வாறு இருக்கும் பொழுது, தேர்தலை எதிர்நோக்கிக் கொண்டு இனவாதம் கட்டவிழ்த்தப்படுகின்றது.

அம்பாறை மாவட்டத்தின் இதயமாக இருக்கின்ற சம்மாந்துறைத் தொகுதி மக்களினுடைய உரிமைகள் இன்று பந்தாடப்படுகின்றன. வரலாற்றிலே சுதந்திரத்துக்குப் பின்பு காலங்காலமாக ஒரு பாராளுமன்றப் பிரதிநிதித்துவத்தைப் பெற்றுவந்த சம்மாந்துறை மண் இன்று அதனை இழந்து நிற்கின்றது. எல்லோரும் பந்தாடுகின்ற இடமாக இன்று அது மாறி வருவதையிட்டு நாங்கள் வேதனையடைகின்றோம். அம்பாறை மாவட்டத்திலுள்ள மக்களின் வாக்குகளைப் பெற்ற பாராளுமன்ற உறுப்பினர் என்ற ரீதியில் அவர்களுக்கு நடக்கின்ற அநியாயங்களைப் பற்றி சம்பந்தப்பட்டவர்களுடன் நாங்கள் பேசியிருக்கின்றோம். இந்த நிமிடம்வரை அதற்கான எந்த நியாயமுமில்லை. அவர்களுடைய நிர்வாகப் பதவிகளிலே அவர்களுக்கு மிகப்பெரிய அநியாயம் நடந்துகொண்டு இருக்கின்றது.

பிரதேசசபை, உள்ளூராட்சி மற்றும் நகர அபிவிருத்தி அதிகாரசபை போன்றவற்றின் சட்டங்களை மீறி, எந்த அனுமதியுமில்லாமல் அங்கு சில கட்டுமானப் பணிகளைச் செய்ய முற்படுகின்றபொழுது, சட்டரீதியாக அணுகுமாறு நாங்கள் கூறினால் அதனை இனவாதக் கண்ணோட்டத்தில் இச்சபையில் பேசுகின்றார்கள்.

வரலாறுகளைப் பிழையாகக் கூறி, சம்மாந்துறை முஸ்லிம் சமூகத்தின்மீது இனவாதக் கண்ணோட்டத்தில் கருத்துகள் முன்வைக்கப்பட்டிருக்கின்றன. ஏற்கெனவே அநீதிக்குள்ளான மக்களை மேலும் அநீதிக்குள்ளாக்குகின்ற வகையில், இனவாத அடிப்படையில் சித்தரித்துப் பேசுகின்ற விடயத்தை அந்தப் பிராந்தியத்தின் பாராளுமன்ற உறுப்பினர் என்ற ரீதியில் என்னால் ஏற்றுக்கொள்ள முடியாது. 1985ஆம் ஆண்டு காரைதீவுப் பிரதேசத்தில் வன்முறை மூண்டபொழுது, பல்லாயிரக் கணக்கான தமிழர்களுக்கு அடைக்கலம் கொடுத்து, உதவிக்கரம் நீட்டியவர்கள் சம்மாந்துறை முஸ்லிம் சமூகத்தவர்கள் என்பதை மறந்துவிடக் கூடாது. அப்பேற்பட்ட மக்கள்மீது இனவாதமாகக் கைநீட்டுவதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. அவர்களுக்கு காணிப் பிரச்சினை இருந்து கொண்டிருக்கின்றது; அவர்களுடைய பிரதேச சபையானது, நகர சபையாகத் தரமுயர்த்தப்படாமல் இருக்கின்றது; நிருவாக அதிகாரிகள் விடயத்தில் அவர்களுக்கு அநீதி நடைபெற்றிருக்கின்றது. அவர்கள் உரிமைகளை இழந்து நிற்கின்றார்கள். இப்படியாக கிழக்கு மாகாணத்தில் முஸ்லிம் சமூகம் பிரச்சினைகளை எதிர்நோக்குகின்றது. இவையனைத்தும் நிவர்த்திக்கப்பட வேண்டும் என்பதை இந்தச் சபையில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இறுதியாக, கிழக்கு மாகாணத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற முஸ்லிம் கட்சிகள் அவசரமாக ஒன்றிணைந்து, முஸ்லிம் சர்வகட்சி மாநாட்டைக் கூட்டி, இனப் பிரச்சினைக்கான தீர்வு, நிருவாக அதிகாரப் பரவலுக்கான தீர்வு, அதேபோன்று நிலையான அபிவிருத்திக்கான திட்டம் என்பவற்றைப் பெறுவதற்கான முயற்சிகளைச் செய்ய வேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. S.M.M. Muszhaaraff. You have 10 minutes.

[பி.ப. 4.21]

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இச்சபையில் இரண்டு - மூன்று தினங்களாக இனவாதம் மேலோங்கியிருப்பதைப் பார்க்கும்போது, மன வேதனையாக இருக்கின்றது. தேர்தல்கள் நெருங்கும்போது, அதனை வெற்றி கொள்வதற்கு இனவாதத்தை முதன்மைப்படுத்துகின்ற போக்கு இந்த நாட்டிலிருந்து ஒழிய வேண்டும் என்ற பிரார்த்தனைதான் இளம் பாராளுமன்ற உறுப்பினர்களாகிய எம் மத்தியில் இருக்கின்றது. குறிப்பாக, எதிர்க்கட்சியில் இருந்துகொண்டு கௌரவ தயாசிறி ஜயசேகர அவர்கள் கூறிய கருத்துத் தொடர்பில் என்னுடைய நிலைப்பாட்டை இங்கு தெரிவிக்க விரும்புகின்றேன்.

நேற்று முன்தினம் அவர் இச்சபையில் பேசுகின்றபோது, முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் சிலருடைய பெயர்களைக் குறிப்பிட்டு, இவ்வளவு இவ்வளவு தொகை நிதி பெற்றிருக்கிறார்கள் என்று கூறியிருந்தார். சமூக வலைத்தளங்கள் உட்பட அனைத்துப் பிரதான தொலைக்காட்சி மற்றும் வானொலி செய்திகளிலும்கூட, எதிர்க்கட்சியில் இருந்து கொண்டு பணம் பெற்ற 19 பேருடைய பெயர்ப் பட்டியல் வெளியிடப்பட்டது எல்லோருக்கும் தெரியும்! அந்தப் 19 பேரில் முஸ்லிம் சமூகத்தைச் சார்ந்தவர் அல்லாத ஒருவருடைய பெயரைக் குறிப்பிட்டு, அவரும் பணம் பெற்றிருக்கிறார் என்று சொல்லும் அளவுக்கு கௌரவ தயாசிறி ஜயசேகர அவர்களுடைய மனம் இடங்கொடுக்காத நிலையில், அவருக்குள் இருக்கும் இனவாத முகம் மிகக் கொடூரமானது என்பதை நான் இங்கு பதிவுசெய்ய விரும்புகின்றேன்.

இன்று உலகத்தின் பல இடங்களிலும் பயங்கரவாதச் செயற்பாடுகள் நடக்கின்றன. இன்று உலகில் அதிகமாக போதைவஸ்தைக் கடத்துபவர்கள் முஸ்லிம் நாட்டைச் சேர்ந்தவர்களா என்றால், இல்லை! உலகத்தில் அதிகளவு கற்பழிப்புச் சம்பவங்கள் இடம்பெறுவது முஸ்லிம் நாடுகளிலா என்றால், இல்லை! உலகத்தில் வன்முறைகள் அதிகமாக நிகழ்வது முஸ்லிம் நாடுகளிலா என்றால், இல்லை! இப்படியான பெரும் குற்றங்களும் சிறு குற்றங்களும் அதிகளவு நடப்பது முஸ்லிம் நாடுகளிலா என்றால், இல்லை! ஒரு பயங்கரவாத நிகழ்வானது, முஸ்லிம் நபர் அல்லாத வேறு எந்த நபரால் நடத்தப்பட்டாலும், அவரை அவருடைய சமயம் சார்ந்த அல்லது அவருடைய இனம் சார்ந்த அடையாளப் படுத்தலோடு சொல்வது கிடையாது. ஆனால், அந்நிகழ்வை நடத்தியவர்கள் முஸ்லிம் சமூகத்தைச் சேர்ந்தவர்களாக இருந்தால், 'முஸ்லிம் பயங்கரவாதிகள்' என்ற கருத்து மேலோங்கி நிற்கும். இதுபோலத்தான் கௌரவ தயாசிறி ஜயசேகர அவர்களுடைய கருத்தும் அமைந்திருக்கிறது. எதிர்க்கட்சியில் இருந்து கொண்டு பிரதேச அபிவிருத்திக்காகப் பணத்தைப் பெற்றுக்கொண்ட முஸ்லிம் உறுப்பினர்களுடைய பெயர்களை மட்டும் இங்கு குறிப்பிட்டு, அவர்கள் இவ்வளவு இவ்வளவு தொகையை மாண்புமிகு ஜனாதிபதியிடமிருந்து பெற்றிருக்கிறார்கள் என்று சொல்லியிருந்தார்.

கௌரவ தயாசிறி ஜயசேகர அவர்கள் ஐக்கிய மக்கள் சக்தியுடன் இணைந்து கொள்ளப் போவதாக அண்மையில் ஒரு செய்தி வெளிவந்திருந்தது. இவ்வாறான நிலையில், ஐக்கிய மக்கள் சக்தியைச் சார்ந்த ஏனையவர்களுடைய பெயரைக் கூற முடியாதென்ற சங்கோஜத்தில், அவர் அவர்களை விட்டுவிட்டு, முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களைக் கருத்தில் எடுத்தாரோ தெரியவில்லை. இவ்வாறு பிரித்துப் பார்க்கின்ற மனோநிலை கௌரவ தயாசிறி ஜயசேகர போன்றோரிடம் இருக்கக்கூடாது என்பது என்னுடைய அபிப்பிராயமாகும். இன்றும் அந்த விடயம் இந்தச் சபையில் பேசப்பட்டு, கௌரவ மஹிந்தானந்த அலுத்கமகே அவர்களுடன் முரண்பட்டுக் கொண்ட சமயத்திலும்கூட, அவர் அந்த 19 பேரில் முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் அல்லாத ஒருவருடைய பெயரைச் சொல்வதற்கு விரும்பாத நிலையில், அந்த விடயத்தை இனவாத ரீதியாக முன்வைத்ததை நான் எதிர்க்கின்றேன்.

அடுத்து, நேற்றைய தினம் கௌரவ மதுர விதானகே அவர்கள் இங்கு பேசும்போது, தீகவாபியை மையப்படுத்திச் சொன்ன கருத்துக்கும் நாம் பதிலுரைக்க வேண்டிய தேவைப்பாடு இருக்கின்றது. தீகவாபி பிரச்சினையானது, ஒரு காலகட்டத்தில் சமூகங்களுக்கு இடையில் முரண்பாட்டைத் தோற்றுவித்திருந்தது. சமூகங்களுக்கு இடையில் பிளவை ஏற்படுத்தக்கூடிய பிரச்சினைகளைத் தீர்க்கக்கூடிய ஆளுமை தலைமைத்துவத்திடம் இருக்க வேண்டுமென்று சொல்வார்கள். அந்த வகையில், மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரப் அவர்கள் இத்தகைய மிகவும் சிக்கலான பிரச்சினைகளை மிகவும் சாதுரியமாகத் தீர்த்து வைத்தார். முஸ்லிம் சமூகத்துக்குள் மாத்திரமல்ல, இலங்கையின் அரசியல் தலைமைகளில் தன்னிகரற்ற ஒரு தலைவராக அன்றும் இன்றும் என்றும் போற்றப்படுகின்றவர்தான் மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரப் அவர்கள்! அன்றைய காலகட்டத்தில் தீகவாபி பிரச்சினையை மிக இலகுவாகவும் அழகாகவும் அவர் தீர்த்து வைத்தார்.

தீகவாபிக்குச் சொந்தமாக 85 ஏக்கர் காணி அங்கு குடியேற்றிய மக்களுக்காக வழங்கப்பட்டிருந்தது. சி.பி.டி. சில்வா அவர்கள் காணி அமைச்சராக இருந்தபொழுது அவர்களுக்கு மேலும் 500 ஏக்கர் காணி வழங்கப்பட்டது. அப்போது புனர்வாழ்வு விடயத்துக்குப் பொறுப்பான அமைச்சராக இருந்த மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரப் அவர்கள், அந்தக் காணிகளைச் சுற்றிலும் யானை வேலிகளை அமைத்தது, modern village என்ற திட்டத்தின்கீழ் புதிய நகரங்களை உருவாக்கியது, பௌத்த விகாரைகளை அமைத்துக் கொடுத்தது எனப் பல்வேறு விடயங்களை மிகச் சிறப்பாகச் செய்தார் என்பது மிக முக்கியமான ஒரு விடயமாகும். அதன் காரணமாக அன்றைய காலகட்டத்தில் மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரப் அவர்களுக்கு சிங்கள சமூகத்தைச் சார்ந்தவர்களுடைய வாக்குகள் கிடைத்தன. அவருக்கு மாத்திரமல்ல, அவருடைய மனைவிக்குக்கூட, அன்றும் இன்றும் என்றும் சிங்கள சமூகத்தைச் சார்ந்தவர்களுடைய வாக்குகள் இருக்கின்றன என்பது முக்கியமான ஒரு விடயமாகும். இப்படியான சூழலில், இந்த விவகாரத்தை மையப்படுத்தி, இனவாத ரீதியாக கருத்துச் சொன்ன கௌரவ உறுப்பினர் மதுர விதானகே அவர்களிடம் நான் ஒரு வேண்டுகோளை விடுக்கின்றேன். அடிப்படைகள் புரியாது, சில பிராந்தியங்களினுடைய பிரச்சினைகளின் ஆழம் தெரியாது, எங்கோ தூரத்திலிருந்து இந்தப் பிரச்சினைகளை வளர்த்தெடுக்கின்ற உங்களுடைய பாணியிலிருந்து உங்களை விடுவித்துக்கொள்ளுங்கள்! உங்களுடைய பிரதேசம் சார்ந்த அறிவு உங்களுக்கு இருக்கக்கூடும். உங்களுடைய பிரதேசம் சாராத விடயங்கள் சம்பந்தமாக யாராவது நுனிப்புல் மேய்ந்து தருகின்ற தகவல்களைக்கொண்டு, இந்த உயர் சபையில் ஒரு விவாதத்தை உருவாக்கி, சமூகங்களுக்கிடையில் பிளவை உண்டாக்கும் நடவடிக்கைகளிலிருந்து தவிர்ந்துகொள்ளுங்கள்!

அம்பாறை மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் என்ற அடிப்படையில், நான் ஒரு விடயத்தைக் குறிப்பிட விரும்பு கின்றேன். மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரப் அவர்களுடைய காலத்தில் பொன்னன்வெளியில் காணிப் பிரச்சினையொன்று இருந்தது. பொன்னன்வெளியிலுள்ள காணிகள் முஸ்லிம் சமூகத்தைச் சேர்ந்த பலருக்கு உரித்தாக இருந்தது. அவற்றை வழங்குவதற்கான நடவடிக்கை எடுக்கப்பட்டபோது, அதை ஓர் இனவாத நடவடிக்கையாக மாற்றி, அவற்றை வழங்குவது மறுக்கப்பட்டது. அந்த நிலை இன்றும் தொடர்கின்றது. இன்றும் அவர்கள் எங்களிடம் filesஐத் தூக்கிக்கொண்டு வந்து, பொன்னன்வெளிக் காணியை மீட்டுத் தருமாறு கேட்கின் றார்கள். பொன்னன்வெளியில் மாத்திரமல்ல, வெள்ளைக்கல் தோட்டம், குடுவில், அஷ்ரப் நகரின் சில பகுதிகளில் பாரம்பரியமாக முஸ்லிம் சமூகத்தவர்களால் செய்கை பண்ணப்பட்ட காணிகள்கூட இன்னும் விடுவிக்கப்படாமல் இருக்கின்றன.

மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் பதவியேற்ற பிறகு, Department of Wildlife Conservation, Department of Forest Conservation, Department of Archaeology ஆகியவற்றால் வட, கிழக்கு மாகாணங்களில் சுவீகரிக்கப்பட்ட 70,000 - 100,000 ஏக்கர் காணிகள் உரியவர்களிடம் மீளக் கையளிக்கப்பட வேண்டும் என்ற போராட்டம் நடக்கின்றது. அதில் கிட்டத்தட்ட அரைவாசி அளவு காணிகள் அம்பாறை மாவட்டத்திலுள்ள மக்களுடைய காணிகள் என்பதை நான் இங்கு வேதனையுடன் சொல்லிக் கொள்கின்றேன். இவற்றை மீட்பதற்கான ஒரு வழியை மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் இப்பொழுது உருவாக்கியிருக்கிறார். 1985ஆம் ஆண்டுக்குப் பின்னர் சுவீகரிக்கப்பட்ட காணிகளை விடுவிப்பதற்கான ஓர் ஏற்பாட்டை அவர் செய்திருக்கிறார். அதன் பிரகாரம், இப்பொழுது உரிய அதிகாரிகளோடு நாமும் சேர்ந்து பயணித்து, Department of Wildlife Conservationஆலும் Department of Forest Conservationஆலும் அபகரிக்கப்பட்ட வட்டமடு, வேகாமம், கிரான்கோவை, கிரான்கோமாரி, கச்சக்கொடி, ஆமைவெட்டுவான் பகுதிகளிலுள்ள பல காணிகளை விடுவிப்பதற்கான ஏற்பாடுகளைச் செய்து வருகின்றோம். விரைவில் அந்தக் காணிகள் விடுவிக்கப்பட வேண்டும். இதற்காகப் பாடுபடுகின்ற மாண்புமிகு ஜனாதிபதி அவர்களுக்கும் அதிகாரிகளுக்கும் நான் நன்றி கூறக் கடமைப்பட்டு இருக்கின்றேன்.

Department of Archaeology, Department of Forest Conservation, Department of Wildlife Conservationஆல் அபகரிக்கப்பட்ட காணிகள் இப்பொழுது மீளக் கிடைப் பதற்கான சந்தர்ப்பம் உருவாகியிருக்கின்றது. ஆனாலும், இனவாத ரீதியாக அத்துமீறி அபகரிக்கப்பட்ட காணிகளின் நிலை என்ன? என்பது பற்றிய கேள்வி அம்பாறை மாவட்டத்தில் இன்னும் தொடர்கின்றது என்பதை நான் இங்கு மிகவும் கண்டிப்போடு சொல்லிக்கொள்கின்றேன்.

குறிப்பாக, 2014ஆம் ஆண்டு "தயட்ட கிருல" என்ற வேலைத்திட்டம் மேற்கொள்ளப்பட்டபோது, ஒரு போகம் செய்கைபண்ணக்கூடிய வளத்தாப்பிட்டியிலுள்ள கரங்கா வட்டை என்ற காணி செய்கை பண்ணப்படாத சூழலில், அதை வாகன parkingக்குத் தருமாறு கேட்கப்பட்டது. அப்போது அந்த மக்கள் நல்லதோர் அபிப்பிராயத்தோடு அந்தக் காணியைக் கொடுத்தார்கள். அவ்வாறு பெறப்பட்ட அந்தக் காணியில் கட்டிடங்களை அமைத்து, பயிர்ச்செய்கையை மேற்கொண்டு, விடாப்பிடியாக அபகரித்து வைத்திருக் கின்றார்கள். இவ்வாறான நிகழ்வு இன்றும் அம்பாறை மாவட்டத்தின் பல இடங்களில் இடம்பெறுகின்றன. அதே

[ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා]

නිලෙමෙතාන් ඉප්පොළුතු පෙන්නන්වෙලි කාණික්කුම් ඒර්පට්ටු ඉරුක්කින්රතු. පොන්නන්වෙලි කාණියානතු, Department of Wildlife Conservationඉනාලෝ, Department of Forest Conservationඉනාලෝ අපකරික්කප්පට්ටු ඉරුක්කු මානාල්, අතනෛප් පෙට්රුක්කොටුප්පතර්කාන මුයර්සියිල් ඉප්පොළුතු ඔරළවුක්කු වෙට්රි කණ්ඩිරුක්ක මුඩියුම්. ආනාල්, එන්තවිත අඩිප්පටෛයුම් ඉල්ලාමල් පලාත්කාරමාක අපකරිත්තු වෛත්තිරුක්කින්ර කාණිකළෛ විටුවිප්පතු එන්පතු ඉන්රු කේල්වික්කුරියාක මාරියිරුක්කින්රතු.

නේට්රෛය තිනම් කෞරව පාරාළුමන්ර උරුප්පිනර් අවර්කළ් පේසිය පිරතේසත්තිලුළ්ළ විටයඞ්කළෛ නාම් පේස ආරම්පිත්තාල්, පල්වේරු පිරච්සිනෛකළ් පට්රිප් පේසලාම්. අඞ්කු ආරම්පත්තිල් කල්ලෝයාත් තිට්ටම් මේර්කොළ්ළප්පට්ටතු. අතන් පිර්පාටු, අඞ්කු අපිවිරුත්ති නටවටික්කෛකළ් එන්ර අඩිප්පටෛයිල් පුතිය කුටියේර්රඞ්කළ් ඒර්පටුත්තප්පට්ටන. අතර්කුප් පින්නර්, අඞ්කු කරුම්පුච් සෙය්කෛයෛ මේර්කොළ් වතර්කාන තොළිර්පේට්ටෛකළෛ අමෛප්පතු එන්ර අඩිප්පටෛයිල් මුස්ලිම් සමූකත්තුක්කුච් සොන්තමාන කාණිකළ් වාඞ්කප්පට්ටන. අවර්කළුක්කු මාර්රුක් කාණිකළ් තරුවතාක වම් සොල්ලප්පට්ටතු. ඉරණ්ටු, මූන්රු තසාප්තඞ්කළ් කටන්තුම් මාර්රුක් කාණිකළ් කිටෛක්කප්පෙරාතවර්කළ් ඉන්රුම් ඉරුක්කිරාර්කළ්. කරුම්පුච් සෙය්කෛයෛ මේර්කොළ්කින්ර මක්කළුක්කු අතන්මූලම් ඉලාපම් කිටෛක්කුමාක ඉරුන්තාල්, අන්තක් කම්පනික්කුක් කොටුක්කුම් කරුම්පින්මූලම් අතික වරුමානම් කිටෛක්කුමාක ඉරුන්තාල් එන්තප් පිරච්සිනෛයුම් ඉල්ලෛ. නෙර්සෙය්කෛමූලම් කිටෛක්කුම් වරුමානත්තෛවිට, මිකවුම් නෂ්ටප්පට වේණ්ටියතොරු සූළල් කරුම්පුච් සෙය්කෛයාල් සිල ඉටඞ්කළිල් ඒර්පටුකින්රතු. ඉතනාල් අවර්කළ් කරුම්පුච් සෙය්කෛයෛ පුතිය තොළිල්නුට්පත්තුටන් වෙර්රිකරමාකච් සෙය්යක්කූටියතොරු නිලෛක්කු මාර්රුමාරු අල්ලතු කරුම්පුච් සෙය්කෛක්කුප් පතිලාක නෙර්සෙය්කෛ සෙය්වතර්කාන අනුමතියෛ වළඞ්කුමාරු කෝරික්කෛ විටුකිරාර්කළ්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, you have one more minute.

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
(මාණ්පුමිකු එස්.එම්.එම්. මුස්සාරප්)
(The Hon. S.M.M. Muszhaaraff)
Sir, I am going to wind up now.

ඉන්රු අඞ්කු තෝණික්කල් තෝට්ටම් උට්පට ඉන්නුම් පල කාණිකළ් ඉරුක්කින්රන. නීත්තෛප් පිරතේසත්තු මක්කළ් කරුම්පුච් සෙය්කෛයෛ මේර්කොළ්වතිල් පල්වේරු පිරච්සිනෛකළෛ එතිර්නෝක්කුකිරාර්කළ්. ඉවෛ නීණ්ට කාලමාකප් පුරෛයෝටිප්පෝය් ඉරුක්කින්ර පිරච්සිනෛකළ්! ඉවර්රෛප් පේසිත් තීර්ක්ක වේණ්ටුම් එන්ර නිලෛප්පාට්ටිල් නාම් ඉරුක්කින්රෝම්. Department of Wildlife Conservation ඉනාලුම්, Department of Forest Conservationඉනාලුම් අපකරික්කප්පට්ට ඒරත්තාළ 15,000 ඒක්කර් කාණිකළ් මක්කළුක්කු විටුවික්කප්පටප් පෝකින්රන එන්ර සන්තෝසත්තිල් ඉරුක්කින්ර නාම්, අටුත්ත කට්ටමාක කරුම්පුච් සෙය්කෛ උට්පට ඉන්නුම් පල තේවෛකළුක්කාක එන්තවෝර් අඩිප්පටෛයුම් ඉල්ලාමල් පලාත් කාරමාකක් කෛයකප්පටුත්තප්පට්ටු ඉරුක්කින්ර කාණිකළෛ විටුවිප්පතර්කාකප් පෝරාටවේණ්ටිය මික මුක්කියමානතොරු කාලකට්ටත්තිල් ඉරුක්කින්රෝම්. ඉව්වාරාන සූළලිල්, අඞ්කු තොල්ලියල් ඉටඞ්කළ් ඉරුන්තතාකවුම් අව්විටඞ්කළ් අපකරික්කප්පට්ටු ඉරුප්පතාකවුම් පොය්යාන, අඩිප්පටෛ යර්ර කරුත්තුකළෛක් කූර්, මීණ්ටුම් ඉන්ත නාට්ටුක්කුළ් ඉනවාත විෂෙත්තෛ යාරුම් කක්ක වේණ්ටාමෙන නාන් තාළ්මෛයුටන් කේට්ටුක්කොළ්කින්රේන්.

අණ්මෛයිල් නාන් කෞරව පුත්තසාසන, සමය මර්රුම් කලාසාර අලුවල්කළ් අමෛච්සර් මර්රුම් පෞත්ත පික්කුකළ් සකිතම් පාකිස්තානුක්කු විජයම් සෙය්තිරුන්තේන්. අඞ්කුළ්ළ සිරුපාන්මෛච් සමූකත්තුක්කුච් සොන්තමාන පෞත්ත තොල්ලියල් අටෛයාළඞ්කළෛ අන්නාට්ටු අරසාඞ්කම් පාතුකාක්කින්රතු. ඉතුවොරු පෙරුම් උතාරණම්! ආනාල්, එමතු නාට්ටිලුළ්ළ අරසාඞ්කම් සිරුපාන්මෛ මක්කළින් තොල්ලියල් ඉටඞ්කළ් පර්රි එන්තක් කරිසනෛයුම් ඉල්ලාමල් ඉරුක්කින්රතු. තොල්ලියල් සට්ටත්තින්පටි, 1815ආම් ආණ්ටුක්කු මුන්නර් ඉරුන්ත පොරුට්කළේ තොල්ලියල් පොරුට්කළ් එනච් සොල්ලප්පටුකින්රතු. ඉඞ්කුළ්ළ සිරුපාන්මෛච් සමූකත්තින් තොල්ලියල් ඉටඞ්කළ් පාතුකාක්කප් පටුකින්රතෝ ඉල්ලෛයෝ, තොල්ලියල් ඉටම් එන්පතු සිරුපාන්මෛච් සමූකත්තෛ නසුක්කුවතර්කාන ඔර් ආයුතම් එන්ර පොරුළ්කෝටලිල් ඉරුන්තු නාම් අනෛවරුම් විටුපට වේණ්ටුමෙනක් කේට්ටු, විටෛපෙරුකින්රේන්. නන්රි!

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුෂාරෆ් මන්ත්‍රීතුමාත්, හරීස් මන්ත්‍රීතුමාත් දෙපාරක්, තුන්පාරක්ම මගේ නම සඳහන් කළා. මේ කාරණය මුස්ලිම් මන්ත්‍රීවරු වැරදියට වටහාගන්න හොඳ නැහැ. ආණ්ඩුවේ අනෙක් මන්ත්‍රීවරු ගිහිල්ලා ඒ ඒ ප්‍රදේශවල වැඩ කරනකොට එතුමන්ලාට ප්‍රශ්න මතු වෙනවා. එතුමන්ලාට වැඩ කරපු, ඡන්දය දීපු මිනිස්සුන්ටත් උදව් කරන්න ඕනෑ. අපටත් ඔය ප්‍රශ්නයම තමයි තිබෙන්නේ. මුෂාරෆ් මන්ත්‍රීතුමා කලින්ම ආණ්ඩුවට පැනගත්තා. අනෙක් මුස්ලිම් මන්ත්‍රීවරුත් මේ පැත්තේ ඉඳගෙනම ආණ්ඩුවට සහයෝගය දෙනවා. දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු සමහර වෙලාවට ඡන්දය දෙන්න එන්නේ නැහැ. හැබැයි එතුමන්ලා ආණ්ඩුවෙන්, රනිල් වික්‍රමසිංහ මහත්තයාගෙන් හොඳට තමන්ගේ දිස්ත්‍රික්කවල වැඩ කරන්න සල්ලි ගන්නවා. මම වෙන කථාවක් නොවෙයි කිව්වේ. මම කිව්ව කාරණය බොහොම පැහැදිලියි. ඒක මුස්ලිම් මන්ත්‍රීවරු වෙනම ගන්න දෙයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජබයේ මන්ත්‍රීවරු 19දෙනෙක් මෙතැන ඉන්නවා, විමධ්‍යගත ප්‍රතිපාදන ලබා ගත්ත. ඒක ගත්තාට මට ප්‍රශ්නයක් නැහැ. ඒවා අරගෙන පෞද්ගලිකව ඔවුන්ගේ සාක්කුවලට දමා ගත්තේ නැහැ නේ. මුස්ලිම් මන්ත්‍රීවරුත් ඒ සල්ලි සාක්කුවලට දමා ගත්තේ නැහැ. එතුමන්ලාත් ඒ මුදල්වලින් තමන්ගේ ප්‍රදේශවලට වැඩ කර තිබෙනවා. මම ඇහුවේ මෙයයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් අයිතිය තිබෙනවා, මටත් අයිතිය තිබෙනවා විමධ්‍යගත ප්‍රතිපාදනවලට. ඒ නිසා පෞද්ගලිකව මෙය මුස්ලිම් මන්ත්‍රීවරුන්ට පමණක් එල්ල කළ චෝදනාවක් නොවෙයි. මම ජාතිවාදියෙක් නොවෙයි, ආගම්වාදියෙකුත් නොවෙයි. මම ඒ විධියට වැඩ කරන කෙනෙක් නොවෙයි. ඒ නිසා ඒක වැරදියට තේරුම් ගන්න එපා. තමන්ට ඡන්දය දුන්න පක්ෂය මොකක්ද, ඒ පක්ෂයත් එක්ක ඉන්න. මට වැදගත් වෙන්නේ ඒක. විපක්ෂයේ නම් එතුමන්ලා ඉන්නේ, ඔක්කෝම විපක්ෂයේ ඉන්න ඕනෑ. හැබැයි එතුමන්ලාට ආණ්ඩුවෙන් සල්ලි ගන්නයි, සල්ලි අරගෙන ගිහිල්ලා තමන්ගේ ප්‍රදේශවල වැඩ කරන්නයි, පාර්ලිමේන්තුවේදී ඡන්දය නොදී ඉන්නයි, විපක්ෂයේ ඉඳගෙන සල්ලි ගත්තා කිව්වාම රිදෙන්නයි අවශ්‍යතාවක් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේ වෙලාවේ පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ නිසා ඒ වැඩේ කළා නම් ඒක කරගෙන යන්න. අපට ප්‍රශ්නයක් නැහැ. මම කියන්නේ, මේ 225දෙනාටම විමධ්‍යගත ප්‍රතිපාදන ලබා දෙන්න කියලායි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු බී.වයි.ජී. රත්නසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක් තිබෙනවා.

ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා
(மாண்புமிகு பீ.வை.ஜீ. ரத்னசேக்கர)
(The Hon B. Y. G. Rathnasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පතත්, යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පතත් පිළිබඳව සාකච්ඡා කරනවා.

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, අපි ඔබතුමාට ගරු කරනවා. මගේ නම ඔබතුමා ඊයේ කිව්වේ නැහැ. නමුත්, එතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ලැයිස්තුවේ 19දෙනෙකුගේ නම් තිබුණා. සජබයේ මන්ත්‍රීවරුන්ගේ නම් පවා තිබුණා. ඔබතුමා ඒක කියනකොට, මුස්ලිම් මන්ත්‍රීවරු ගැන වෙනම කිව්වා. දැන් අපේ රටේ විතරක් නොවෙයි, මුළු ලෝකයේම තිබෙන ප්‍රශ්නය,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණය සම්බන්ධයෙන් විවාදයකට යන්න අවස්ථාව දෙන්න බැහැ. ගරු බී.වයි.ජී. රත්නසේකර මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 4.35]

ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා
(மாண்புமிகு பீ.வை.ஜீ. ரத்னசேக்கர)
(The Hon B. Y. G. Rathnasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පිහිටුවීම සම්බන්ධයෙන් අපට කිසිම ගැටලුවක් නැහැ. කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පතත් මම කියෙව්වා. මට තේරෙන්නේ නැහැ, ඒ තුළින් කාන්තාවන් සවිබල ගැන්වෙන්නේ කොහොමද කියලා. කෙසේ වෙතත්, ගීතා කුමාරසිංහ රාජ්‍ය ඇමතිතුමියට අපි ස්තුතිවන්ත වෙනවා, එතුමියගේ මූලිකත්වයෙන් කාන්තාවන් වෙනුවෙන් වැදගත් පනත් කෙටුම්පතක් ගෙන ඒම පිළිබඳව. මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සරත් වීරසේකර මැතිතුමාත් කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. ඒ වාගේම ගෙවිදු කුමාරතුංග මැතිතුමා කාරක සභා අවස්ථාවේදී, මේ පනත් කෙටුම්පතට සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒවා අපේ මෙස උඩ තිබෙනවා. ඒවාත් සැලකිල්ලට ගන්න. ආණ්ඩු පක්ෂය වෙන්න පුළුවන්, විපක්ෂය වෙන්න පුළුවන්, මේ සංශෝධන ගේන්නේ, පෞද්ගලිකව තමන්ට ප්‍රතිලාභයක් ගන්න නොවෙයි. මේ තුළ මොනවා හරි අර්බුදයක්, ගැටලුවක් දකින නිසායි ඒ විධියට සංශෝධන ගේන්නේ. නමුත් අපේ පාර්ලිමේන්තු සම්ප්‍රදායේම තිබෙන ගැටලුව මෙයයි. යම් පනත් කෙටුම්පතකට විපක්ෂයෙන් සංශෝධනයක් ගෙනාවොත්, ඒක කොයි තරම් ලස්සන වුණත්, ආණ්ඩුවට පේන්නේ, මහ වස කැතට. සාමාන්‍යයෙන් මොන සංශෝධනයක් ගෙනාවත් එයට ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා අපි ඉල්ලනවා, ඒ සංශෝධන ටික ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න කියලා.

එතකොට තමයි සාධාරණත්වය ඉෂ්ට වෙන්නේ. මම නම් පෞද්ගලිකව දකින්නේ, මේ පනත් කෙටුම්පත් සම්මත කරන ක්‍රියාවලියම වැරැදිසහගත බවයි. ඒකට හේතුව තමයි, පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ අපේ මෙසය උඩට එන්නේ, ඒ පනත් කෙටුම්පත සම්පූර්ණයෙන් හැදුවාට පස්සේ. එතකොට ඒ ගැන සාකච්ඡා කිරීමේ ඉඩකඩක් නැහැ. හැබැයි, අපට උසාවි යන්න පුළුවන්. එතකොට ඒ පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලද, නැද්ද කියන තීන්දුව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දෙනවා. ඒ වාගේම අවශ්‍ය තැන් සංශෝධනය කරන්න කියනවා. ඇතැම් විට කාරක සභා අවස්ථාවේදී ඒ කියන සංශෝධනත්, ඒ කියන විධියට නොකර පනත් කෙටුම්පත සම්මත වෙනවා. ඇත්තටම ආණ්ඩු පක්ෂයේ වෙන්න පුළුවන්, විපක්ෂයේ වෙන්න පුළුවන්, කවුරුවත් මේ පනත් කෙටුම්පත් හදන්නේ රටේ උන්නතියට මිස අපේ උන්නතියට නොවෙයි. ඒ විධියට රටේ උන්නතියට පනත් කෙටුම්පතක් හදන කොට, කවුරු හරි ඒ පනත් කෙටුම්පතේ දෝෂයක් දැකලා ඒ දෝෂය නිදොස් කරන්න යම් සංශෝධනයක් කරන්න කියනවා නම් ඒකට ඉඩ තිබෙන්න ඕනෑ. ඒ නිසා, හරි නම් මේ පනත් කෙටුම්පත් විවාදයට ගන්න කලින් මේ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන අයට, ඒ පිළිබඳ විශේෂඥතාවක් දක්වන අයට, ඒ අයගේ අදහස් හා යෝජනා දෙන්න අවස්ථාවක් දෙන්න ඕනෑ. නාමිකව එහෙම අවස්ථාවක් තිබෙනවා කිව්වාට, ප්‍රායෝගිකව එහෙම අවස්ථාවක් නැහැ. අපි ඉන්න මේ උත්තරීතර පාර්ලිමේන්තුව තමයි නීති සම්පාදනය කරන තැන. හැබැයි, අපි ඒ නීති සෑදීමේදී හදිසියේ නීතියක් හැදුවාට, ඒකේ අපට නොපෙනෙන දේවලුත් තිබෙනවා. ඒ වාගේම ඒ නීති හදනකොට කුමන්ත්‍රණකාරීන් ඒ නීති හදන ක්‍රියාවලියට යම් යම් ආකාරවලින් රිංගනවා.

උදාහරණයක් හැටියට ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත ගන්න. ඒ ගැන ගරු සරත් වීරසේකර මැතිතුමා ඉතාම හොඳින් පැහැදිලි කළා. අපේ රටේ පැවැත්ම තිබෙන්නේ අපේ සංස්කෘතිය මත, අපේ ජාතිකත්වය මත, අපේ දේශීය අගනාකම් කියන දේවල් මත. එතකොට යුද්ධවලින් කරන්න බැරි වුණු බොහෝ දේවල්, සමහර වෙලාවට පනතක තිබෙන එක වගන්තියකින් කරන්න පුළුවන්. පනතක තිබෙන එක වගන්තියකින් අපේ සමස්ත සංස්කෘතියම බිඳ වැටෙන්න පුළුවන්. සංස්කෘතිය වැටෙනවා කියන්නේ රට වැටෙනවා කියන එකයි. ඒ වාගේම කුමන්ත්‍රණකාරී ලෙස ඇතැම් අය මේක ඇතුළට රිංගනවා. හැබැයි, ඒ කටයුත්තට මුල් වෙලා

[ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා]

වැඩ කරන අයට ඒක සමහර වෙලාවට තේරෙන්නේ නැහැ. ඒ නිසා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව පිළිබඳ පනත් කෙටුම්පත ගැන ජනාධිපතිතුමා මොනවා හරි හේතුවකට උදහස් වෙලා ඉන්නවා. අපේ විශ්වාසය නම් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දුන් තීන්දුව හරි කියන එකයි. අධිකරණ ඇමතිතුමා පවා ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු විනිශ්චයකාරවරුන්ගේ තීන්දු සම්බන්ධ ගැටලු තිබෙන බවට හා ඒ පිළිබඳව චෝදනාත්මකව හා ආන්දෝලනාත්මකව යම් යම් ප්‍රකාශ නිකුත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාවේදීත් කිව්වා වාගේ, බොහෝ කාලයක් අධිකරණ ඇමති ධුරය දරමින් ඉඳලාත්, එතුමන්ලාට මේ අධිකරණ පද්ධතිය හඳා ගන්න බැරි වෙලා තිබෙනවා. කෙසේ වුවත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීන්දුව නිවැරැදියි කියා මා විශ්වාස කරනවා.

ජනාධිපති හැටියට විධායක බලය පාවිච්චි කරලා, මේ පනත් කෙටුම්පතට එරෙහිව විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්න එතුමාට අයිතියක් තිබෙනවා. ඒක හරි. හැබැයි, ඒ අයිතිය තිබුණාට ශ්‍රේෂ්ඨාධිකරණය ඒ තීන්දුව දුන්නේ ඇයි කියලා සොයා බලා, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය කියන මේ රාජ්‍ය ගොඩනැඟිලා තිබෙන කුලුනු තුනම රැකගෙන සහයෝගයෙන් යුතුව කටයුතු කරගෙන යෑමේ අවශ්‍යතාවක් තිබෙනවා.

ජනාධිපති, විධායකය හැටියට අධිකරණය කියන දේ සම්පූර්ණයෙන් බැහැර කරලා පූර්වාදර්ශයක් දෙන්න හොඳ නැහැ. මීට කලින් බොහෝ අවස්ථාවලදී ඒ වාගේ තීන්දු දෝෂ සහිතයි, නැත්නම් නොගැළපෙනවා වාගේ දේවල් කියනකොට ඒක අධිකරණයට අපහාස කිරීමක් කියලා බොහෝ විට මේ සභාවේදී කථා වෙලා තිබෙනවා. ඒ නිසා එක අවස්ථාවකදී අධිකරණය කියන දේ විවේචනය කිරීම අධිකරණයට අපහාසයක් වෙන්නත්, ජනාධිපතිතුමා කියනකොට ඒක අපහාසයක් නොවෙන්නත් හේතුවක් නැහැ. ඒක වැරදියි. අපි අධිකරණය දෙන තීන්දුව, ශ්‍රේෂ්ඨාධිකරණය දෙන තීන්දුව වැරදියි කියලා විශ්වාස කරනවා නම් ඒක නැවත ශ්‍රේෂ්ඨාධිකරණයට ගෙනිහින් හෝ යම් සාධාරණ විධියකට විසඳා ගන්නවා හැර, ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා ඒක වැරදියි, ඒ සඳහා විශේෂ කාරක සභාවක් පත් කරන්න ඕනෑ, ශ්‍රේෂ්ඨාධිකරණය වැරදියි කියන එක වැරැද්දක් හැටියටයි අපි දකින්නේ. ඒවා මේ සභාව තුළ නොවිය යුතු දේවල්.

කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පතේ බොහෝ තැන්වල තිබෙනවා, වෙනස් සේ සැලකීම නොකළ යුතු දෙයක් හැටියට. ඇත්තටම මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරු සියලුදෙනාම පිළිගන්නවා, කාන්තාවන්, කාන්තාවන් වීම නිසා ඔවුන්ට වෙනස් සේ සැලකීම නොකළ යුතු දෙයක් කියලා. ඒ නිසා ඔවුන්ට සමාන ලෙස සැලකීම අවශ්‍යයි. වෙනස් සේ සැලකීම නොකළ යුතු දෙයක්. මම හිතන විධියට, ඒක ගැන විවාදයක් නැහැ. එලෙස වෙනස් සේ සැලකීම - discrimination - කියන එක හැම තැනකදීම වැරදියි.

අපි දිගටම කථා කරනවා, විමධ්‍යගත ප්‍රතිපාදන ලබා දීම සම්බන්ධව. ලංකා ඉතිහාසයේ හැම දාම පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ සහ විපක්ෂ මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත ප්‍රතිපාදන සමානව ලැබුණා. ඒ, ඒ අයගේ සාක්කුවේ දමා ගන්න නොවෙයි, ඒ අයගේ දේශපාලන හිතවාදීන්ට බෙදන්නත් නොවෙයි, ඒ අයගේ ගම් ප්‍රදේශවල මිනිස්සුන්ට යම්කිසි සහනදායී වැඩ පිළිවෙළක් කරන්නයි, සංවර්ධනයට යම් දායකවීමක් දෙන්නයි. ඒක පාර්ලිමේන්තු ක්‍රමය. ජනතා බලයක් තිබුණු ආණ්ඩු පවා මේ විමධ්‍යගත ප්‍රතිපාදන ආණ්ඩු පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් දෙගොල්ලන්ටම දීලා තිබෙනවා. හැබැයි, මෙවර නරක පූර්වාදර්ශයක් දුන්නා. මම හිතන්නේ නැහැ, මීන් පසුව කිසිදු ආණ්ඩුවක් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත ප්‍රතිපාදන දෙයි කියලා. විමධ්‍යගත ප්‍රතිපාදන විපක්ෂයට දෙන්නේ නැහැ කියන තීන්දුවේ හිටියා නම්, ඒත් කමක් නැහැ. නමුත් එහෙමත් නැහැ. අදත් විමධ්‍යගත ප්‍රතිපාදන දුන්නු විපක්ෂයේ 19දෙනෙකුගේ ලැයිස්තුවක් ගැන කථා වුණා. ඒ කියන්නේ යම් කොටසකට දීලා. මේක වෙනස් සේ සැලකීමක් නොවෙයිද? කාන්තාවන්ට වෙනස් සේ නොසැලකිය යුතුයි කියලා පනත් කෙටුම්පතක් ගේනවා. හැබැයි, ජනතා බලයෙන් තේරී පත් වුණු අපේ මන්ත්‍රීවරුන්ට මේ පාර්ලිමේන්තුවේදීම වෙනස් සේ සලකනවා. මම ඊයේත් ප්‍රකාශ කළා, මමත් ලක්ෂ එකහමාරකට ආසන්න ඡන්ද ප්‍රමාණයක් අරගෙන පාර්ලිමේන්තුවට ආපු කෙනෙකු බව. "ලක්ෂ 69" ගොඩනඟන්න අපිත් දායක වෙලා තිබෙනවා. ලක්ෂ 69 ඡන්ද ගන්න අපිත් දායක වෙලා තිබෙනවා. නමුත් අපට ඔය පැත්තේ ඉන්න බැරි වුණේ ජනතාව විසින් පරාජය කළ නායකයා ජනාධිපති කරන්න ඔබතුමන්ලා ලෑස්ති වුණු නිසායි. අපට ඒක අනුමත කරන්න බැහැ. ලක්ෂ 69ක ජනතාව ඒක අනුමත කළේ නැහැ. අපි ලක්ෂ 69ක් ජනතාවගේ පැත්තේ තමයි හිටගත්තේ. ඒ නිසා ජනතාවගේ පැත්තේ හිටගත්ත අපට ජනාධිපතිතුමාගේ සාක්කුවෙන් විමධ්‍යගත ප්‍රතිපාදන දෙනවා නොවෙයි නේ.

ඊයේත් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළා. මේවා මහජන මුදල්. අපට විමධ්‍යගත ප්‍රතිපාදන දුන්නා නම් අපි ජනතාවගේ සංවර්ධන කටයුතු සඳහා ඒ මුදල් යොදවනවා. ආණ්ඩු පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරු භේදයක් නැතිව වෙන දා ඒ විමධ්‍යගත ප්‍රතිපාදන ලබා දුන්නා. ඒ නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලනවා, ඒ වෙනස කරන්න එපා කියලා. කාන්තාවන්ට වෙනසක් කරනවාටත් වඩා අපට වේදනායි, පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන්ට ඒ වෙනස්කම කිරීම ගැන. ඒක නොකළ යුතුයි.

විදේශ රැකියාවලට යැවීමේදීත් ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ට අයදුම් පත්‍ර 200, 300 දීලා කියලා සමහරු කියනවා. හැබැයි, විපක්ෂයේ අපි ඒ නාම යෝජනාවක් දුන්නාම මොකද වෙන්නේ? අදත් මට එක්කෙනෙක් පැමිණිලි කළා, ඔහු නාම යෝජනාව දීලා, විභාගයත් ලියලා, ඒකත් පාස් ලු. හැබැයි, ඊට පස්සේ ඒවා ලොතරැයි ක්‍රමයකට දානවා ලු. ඔහු ඒ ලොතරැයි ක්‍රමයෙන් තේරිලා නැහැ. එහෙම වෙනකොට ඒක අසාධාරණයි. ඒ නිසා මේ තුළින් සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ. මේ සභාවේදීත් ඒ සාධාරණය ඉෂ්ට වෙන්නේ නැත්නම්, මේ සභාවේදීත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටවත් වෙනස් සේ සැලකීමෙන් වළකින්නේ නැත්නම් කාන්තාවන්ට වෙනස් සේ සැලකීම නොකළ යුතුයි කියලා පනත් ගෙනාවාට වැඩක් නැහැ. මේවා කඩිමුඩියේ ගෙනෙන පනත් කෙටුම්පත්.

මැතිවරණයක් ආසන්න අවස්ථාවකදී මෙවැනි පනත් කෙටුම්පත් ගෙන ඒම සාපේක්ෂ වශයෙන් නොකළ යුතු වැඩක් කියායි මම හිතන්නේ. කෙසේ වෙතත්, මේ පනත් කෙටුම්පත වැදගත් පනත් කෙටුම්පතක් නිසා අපි මේකට සහයෝගය ලබා දෙනවා. මේ පනත ගෙන ඒම ගැන රාජ්‍ය ඇමතිතුමියටත් අපි ස්තුතිවන්ත වෙනවා. හැබැයි, මේ රටේ සංස්කෘතිය විනාශ කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දුවට ගරු කරලා, ඒක අකුළාගෙන තියා ගන්න කියන ඉල්ලීම අපි කරනවා. ඒ පනත් කෙටුම්පතට අපි විරුද්ධයි. ඒ පනත් කෙටුම්පතේත් ඇතැම් හොඳ දේවල් තිබෙනවා. ඒ දේවල් ගන්න පුළුවන්. නමුත් සාධාරණ සාකච්ඡාවකින්, සාධාරණ විවාදයකින්, අදහස් ගැනීමකින් තොරව මෙවැනි පනත් කෙටුම්පත් සම්මත කර ගැනීම

මේ රටට හිතකර නැහැ. ජනතා බලයකින් ආණ්ඩුවක් පත් වෙලා, ඒ ආණ්ඩුවෙන් මේ නීති සම්පාදනය කරන තෙක් මේ වාගේ බරපතළ නීති සම්පාදනය සඳහා යම්කිසි කාලයක් ගැනීම අවශ්‍යයි කියන යෝජනාව කරමින්, වෙනස් සේ සැලකීම වළක්වා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් සාධාරණ ලෙස සලකන්න කියන ඉල්ලීමත් කරමින් මගේ කථාව සමාප්ත කරනවා.

මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට මේ කාලය ලබා දීම වෙනුවෙන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next speaker is the Hon. Chandima Weerakkody. You have five minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு வசந்த யாப்பாபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. WASANTHA YAPABANDARA left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.

[අ.භා. 4.46]

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාවන් සවිබලගැන්වීම වෙනුවෙන් වැදගත් වූ පනත් කෙටුම්පතක් ඉදිරිපත් වෙන මේ මොහොතේ අපේ කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය ඇමතිතුමිය අපේ දිස්ත්‍රික්කය නියෝජනය කිරීම පිළිබඳව අපි සතුටු වෙනවා. අපි කාන්තාවන් වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. මොකද, අපේ රට ලෝකයේ පළමුවැනි අගමැතිනිය බිහි කරපු රට; කාන්තාවක් දෙවරක් ජනාධිපති ධුරය හොබවපු රට. නමුත් තවමත් අනිශය කුඩා ප්‍රතිශතයකින් කාන්තාවන් පාර්ලිමේන්තුව නියෝජනය කරන රටක් හැටියට කාන්තාව ගැන අවධානය යොමු වීම පිළිබඳව අපි සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අදෝනාව, අඬෝවැඩියාව තිබෙන්නේ කාන්තාවගෙන් කියලා තමයි අපේ ගැමි ජන වහරේ තිබුණේ. නමුත් අද වැඩිම අඬෝවැඩියාව, අදෝනාව කරන්නේ රටේ ජනාධිපති. නඩුවක් පැරදුණු ගමන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා අධිකරණයට එරෙහිව, විනිශ්චයකරුවන්ට එරෙහිව එතුමාගේ අදෝනාව කරනවා. රටේ මුළු පද්ධතියම කඩාගෙන වැටුණත් තමන්ගේ අභිමතාර්ථ ඉටු කර ගැනීම වෙනුවෙන් කටයුතු කිරීම ආරම්භ කරලා තිබෙනවා. ඒක අපි පිළිගන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව අපේ ස්ථාවර නියෝගවල ඉතා පැහැදිලි ලෙස සඳහන් වෙනවා, අධිකරණයේ විනිශ්චයකාරවරයෙකුගේ ක්‍රියා කලාපය පිළිබඳව කථා කරනවා නම් ඒක කථා කළ යුත්තේ වෙනමම යෝජනාවක් ගෙනැල්ලා කියලා, that only upon a Substantive Motion, the conduct of a judge could be discussed in Parliament. නමුත්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඇස් බැඳපු ගල් ගෙඩියක් වාගේ මූලාසනයේ වාඩි වෙලා හිටියා. ඊයේ අධිකරණ ඇමතිවරයා, ජනාධිපති නීතිඥවරයකු හැටියට මොකක්ද කිව්වේ? එතුමාගේ කටින් කියවුණා, නඩුකාරවරයෙකුට promotion එකක් ඕනෑ නම් ජනාධිපති ළඟට යන්න ඕනෑ කියලා. ජනාධිපති ළඟට ගියාම අධිකරණයේ නඩුකාරයන්ට promotion දෙනවා කියන එක රටේ අධිකරණ ඇමති කියනවා. මොකක්ද මේ රටේ අධිකරණයට තිබෙන ස්වාධීනත්වය? මොකක්ද මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව මිනිසුන්ගේ තිබෙන විශ්වාසය? මට ඒක තේරෙන්නේ නැහැ. ඒ කථාව වෙන කෙනෙකු කිව්වා නම් කමක් නැහැ. ඒ වාගේ තත්ත්වයකට අද මේ රට ඇද දාලා තිබෙනවා. කාට හරි, මොනවා හරි ඕනෑ නම් මොකක්ද කරන්න ඕනෑ? අපේ රත්නසේකර මන්ත්‍රීතුමා කිව්වා වාගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපට හිමිකමක් හැටියට ලැබිය යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ විමධ්‍යගත ප්‍රතිපාදන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලැබෙන්නේ නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ජනාධිපතිගෙන් ඉල්ලුවොත් විතරයි විමධ්‍යගත ප්‍රතිපාදන දෙන්නේ. මේක අමුතු රටක් නේ. මොකක්ද මේ කථා කරන system change එක? කොතැනටද අපි මේ රට ගෙන යන්නේ? වෙන වෙන දේවල් වුණත්, ජනාධිපති ළඟට ගියොත් විතරක් විමධ්‍යගත ප්‍රතිපාදන ලබා දෙන ක්‍රමයක් හදනවා.

මේක ප්‍රජාතන්ත්‍රවාදය ද, ඒකාධිපතිවාදය ද එහෙම නැත්නම් වෙනත් ක්‍රමයේ රාජ්‍ය පාලනයක්ද කියන එක පිළිබඳව පළමුකොටම අපේ අවධානය යොමු කළ යුතුයි. ස්වාධීන අධිකරණයක් තිබෙන රටක අපේ කථාව අපට කියන්නත්, විරුද්ධ පාර්ශ්වයේ කථාව ඒ අයට කියන්නත්, මෑද ඉඳගෙන යුක්තිය ඉටු කරන්නත් අවස්ථාව ලබා දිය යුතුයි. එහෙම තත්ත්වයක් අද මේ රටේ නැති බව අධිකරණ ඇමතිතුමා කියනවා නම්, ජනාධිපතිතුමා කියනවා නම් භයානක තත්ත්වයක් තමයි ඇතිවෙලා තිබෙන්නේ.

පළාත් පාලන මැතිවරණය කල් යෑම පිළිබඳ නඩුවේදී අධිකරණය කරන්න ඕනෑ නීතිමය submission එක ජනාධිපති පාර්ලිමේන්තුවට ඇවිල්ලා කළා, අධිකරණ කටයුතුවලට බලපාන ආකාරයට. පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ කථාව කළා පමණක් නොවෙයි, එතුමාගේ මතයට පක්ෂව සහයෝගය දීපු මැතිවරණ කොමිසමේ සාමාජිකාව උතුරේ ආණ්ඩුකාර හැටියට පත් කරලා, අමු අමුවේ නීතිය උල්ලංඝනය කළොත්, තමන්ගේ කැමැත්තට කටයුතු කළොත් වරප්‍රසාද ලැබෙන බවට සහතික කරනු ලැබුවා, එදාත්. ඒ නිසා මේ තත්ත්වය මේ රටේ වළක්වා ගැනීම සඳහා අවශ්‍ය වෙනසකට ජනතාව පෙළ ගැසිය යුතුයි කියන එක මට ප්‍රකාශ කරන්න සිද්ධවෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම හිතනවා, ඔබතුමාත් එතැනට එකතු වෙයි කියලා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.52]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අද මේ විවාදයේ කරුණු ගැන කථා කරනවාට වඩා, අද මේ පාර්ලිමේන්තුව තුළ සමගි ජන බලවේගයේ සභාපතිවරයා කරපු කථාවටත් උත්තරයක් දෙන්න වෙනවා. මොකද, එතුමා ඉතා අසාධාරණ ලෙස පක්ෂයේ නායකතුමාව විවේචනය කරමින් කථා කළා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉස්ලාම් භක්තිකයෙක් වුණත්, ආරම්භක අධ්‍යාපනය බෞද්ධ පාසලක ලබපු නිසා බුදු දහම පිළිබඳවත් මට යම් දැනුමක් තිබෙනවා. බුදුරජාණන් වහන්සේ කෘතවේදීත්වය හා කෘතගුණය ගැන බුදු දහම තුළ මහ පෙන්වීම් කර තිබෙනවා. ඒ වාගේම උන්වහන්සේ දේශනා කර තිබෙනවා, ඒ කෘතවේදීත්වය හා කෘතගුණය අපට බලාගන්න තිබෙන අවස්ථා ලෝකයේ ඉතා දුර්ලභයි කියලා. ඉතින් ඒ කෘතගුණය හා කෘතවේදීත්වය කියන දෙකම අද කථා කරපු ගරු සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමාගේ චරිතය තුළ නැහැයි කියන එක මම මුලින්ම කියන්න ඕනෑ. මොකද, එදා එක්සත් ජාතික පක්ෂය තුළ තිබුණු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ගැටලුවක් උඩ, පක්ෂ නායකත්වය තේරීම පිළිබඳ ගැටලුවක් උඩ, අලුත් දේශපාලන පක්ෂයක් හා දේශපාලන ව්‍යාපාරයක් පටන් ගැනීම සඳහා, මෙරට අලුත් දේශපාලන පරිවර්තනයකට නායකත්වය ලබා දීම සඳහා එක්සත් ජාතික පක්ෂය තුළ හිටපු ජ්‍යෙෂ්ඨ නායකයෝ බහුතරයක් එකතුවෙලා සමගි ජන බලවේගය හැටියට අලුත් දේශපාලන පක්ෂයක් ගොඩ නැඟුවා. සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වය යටතේ ඒ අලුත් දේශපාලන මතවාදයක් එක්ක ඒ ව්‍යාපාරය ගොඩ නැඟුවා.

එතැනදී පක්ෂයේ ඉහළ, ජ්‍යෙෂ්ඨ නායකයෝ, කැප කිරීම් රාශියක් කරපු නායකයෝ ඉඳිද්දී තමයි පක්ෂයේ නායකතුමා ගරු සරත් ෆොන්සේකා මැතිතුමා පක්ෂයේ සභාපති හැටියට පත් කළේ. ඒ පත් කිරීම නිසා අපේ පක්ෂයේ එවකට හිටපු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා, මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා -දැන් ඇමතිවරු වශයෙන් ඉන්න- වැනි අය විශාල විරෝධයක් පෑවා. නමුත් පක්ෂ නායකතුමා, යම් යම් දක්ෂතා නිසා එතුමාට ඒ තැන ලබා දුන්නා. නමුත් කාලයක් යනකොට ගරු සරත් ෆොන්සේකා මැතිතුමාට ජනාධිපති අපේක්ෂකයා වෙන්න ආසාව ඇති වුණා. ඒක පක්ෂයට කරන්න බැරි දෙයක්. අපි සරත් ෆොන්සේකා මැතිතුමාටත් කියලා තිබෙනවා, සමගි ජන බලවේග සන්ධානයේ ජනාධිපති අපේක්ෂකයා ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමායි කියලා. ඒක සමගි ජන බලවේග සන්ධානයේ ඉන්න අනෙකුත් දේශපාලන පක්ෂත් පිළිගෙන තිබෙනවා.

එතුමාට ඒක උහුලා ගන්න බැරුව ගියා. ඒක උහුලාගන්න බැරුව එතුමා අද ආණ්ඩුවත් එක්ක එකතු වෙලා විවේචන කරනවා. අපි සියලුදෙනාම දන්නවා, සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ චරිතය ඝාතනය කරන්න මේ වෙලාවේ විශාල මෙහෙයුමක් යනවාය කියන එක. ඒ මෙහෙයුමේදී විරුද්ධ පක්ෂයේ යම් යම් පක්ෂත් ආණ්ඩුවත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරනවා. ඒක අපි දන්නවා. ඒ කරුණු අද වෙනකොට හෙළිදරව් වෙලාත් තිබෙනවා. මොකද, සජිත් ප්‍රේමදාස මැතිතුමා වාගේ පහළ ඉඳන් උඩට ආපු නායකයෙක් මේ රටේ ජනාධිපති වෙනවාට කැමැති නැති අය හුඟක් ඉන්නවා. ඒ තත්ත්වය ප්‍රේමදාස මැතිතුමාටත් තිබුණා. ප්‍රේමදාස මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා හැටියට එන එක නවත්වන්න ඒ කාලයේ හිටපු සමහර ප්‍රභූ නායකයෝ විශාල උත්සාහයක් දැරුවා. නමුත් එදා ප්‍රේමදාස මැතිතුමාට තිබුණු හැකියාව හා දක්ෂතාව මත ඒ ගමන නවත්වන්න බැරි වුණා. ඒ ප්‍රභූ පෙළැන්තියේ මෙහෙයුමක් අපේ රටේ තවම තිබෙනවා. සජිත් ප්‍රේමදාස වාගේ පහළ පන්තිය, නිර්ධන පන්තිය නියෝජනය කරන, සාමාන්‍ය පවුලකින් ආපු නායකයෙක් ඉහළ පුටුවට යනවාට අකැමැති අය ඉන්නවා. ඒ අකැමැති උදවිය ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා පාවිච්චි කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එතුමා කියනවා, මත්ද්‍රව්‍ය ව්‍යාපාරවලින්, අරක්කු ව්‍යාපාරවලින් ලැබෙන මුදල්වලින් බස් අරගෙන දෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, සජිත් ප්‍රේමදාස මැතිතුමාට ව්‍යාපාරිකයන් එක්ක තිබෙන සම්බන්ධකම්. අපි දන්න තරමින් නම් එතුමාට කිසිම ආකාරයකින් කැසිනෝ ව්‍යාපාරිකයන් එක්ක, මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයන් එක්ක සම්බන්ධයක් නැහැ. ඔවුන්ගෙන් ආධාර මුදල් ලබා ගන්නේත් නැහැ. ජනතාවට සේවය කරන්න තිබෙන ආශාව, වුවමනාව නිසා එතුමා විපක්ෂ නායකවරයා හැටියට ඉඳගෙනත් එතුමාට පුළුවන් පුළුවන් විධියට බස් රථ අරගෙන දෙනවා, සුභුරු පන්ති කාමර ලබා දෙනවා. අද වෙනකොට පාසල් විශාල ප්‍රමාණයකට ඒවා ලබා දීලා තිබෙනවා. ඒක ඇගැයීම වෙනුවට මෙතැනට ඇවිල්ලා එතුමාට ගරහලා පෙන්වූයේ තමන්ගේ චරිතයේ තිබෙන ගුණාංගයි කියන එක අපි මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම මම තව එක කාරණයක් සරත් ෆොන්සේකා මැතිතුමාට මතක් කරන්න කැමැතියි, ඒ එතුමා හෙට අනිද්දා යන්න ඉන්න සන්ධානය ගැන. කැසිනෝකාරයෝ හදන, මත්ද්‍රව්‍යකාරයෝ හදන ඒ සන්ධානයට තමයි එතුමා මෙතැනින් ඉවත් වෙලා එකතු වෙන්න යන්නේ. ඒ හින්දා අපි එතුමාට කියනවා, එතුමා මොන දේ ප්‍රකාශ කළත්, මේ රටේ නිර්ධන පන්තිය, දුප්පත් ජනතාව, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු ජන කොටස් අද සමගි ජන බලවේගයත් එක්ක එකතු වෙලා ඉන්නවාය කියන එක. එතුමන්ලාගේ ව්‍යාජ - බොරු - වාග් ප්‍රහාරවලින් ඒ ගමන නවත්වන්න බැහැ කියන එකත් අපි එතුමාට මතක් කරලා දෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! විවාදයේ කටයුතු අවසාන වනතෙක් කාලය ලබා දීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පිළිතුරු කථාව, ගරු ගීතා කුමාරසිංහ රාජ්‍ය අමාත්‍යතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.59]

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය (කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Geetha Samanmale Kumarasinghe - State Minister of Women and Child Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත ගැන විවාද කරන අද දවසේ මා මෙය අවස්ථාවක් කරගන්නවා, මෙම සුවිශේෂ වූ පනත් කෙටුම්පත ගෙන ඒමට උදවු කරමින්, මේ පනත් කෙටුම්පත ගැන

සෑහීමට පත් වෙමින් කථා කළ විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත් මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාට මාගේ ස්තුතිය පුද කරන්න. කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත ගැන කථා කරද්දී හැම මන්ත්‍රීවරයෙකුම කිව්වා, වසර ගණනාවක -අවුරුදු හැත්තෑ ගණනක- ඉතිහාසයක් ඇති අපේ දේශපාලන භූමිකාව තුළ පළමුවැනි අග්‍රාමාත්‍යතුමිය අපේ රටින් බිහි වුණා කියලා. ඔව්, සිරිමාවෝ ආර්.ඩී. බණ්ඩාරනායක මැතිනිය අපේ රටේ පළමුවැනි අග්‍රාමාත්‍යතුමිය හැටියට බිහි වුණා. ඒ වාගේම, ජනාධිපතිතුමියකුත් බිහි වුණා. ඇය දෙවරක් මේ රටේ ජනාධිපතිතුමිය හැටියට පත් වුණා. අපි ඒ සියල්ල ගැන උදාන් අනන අවස්ථාවක අපේ එකම ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මේ රටේ කාන්තාවන්ට සම අයිතිවාසිකම් තවමත් තිබෙනවාද කියන එකයි. ඒ නිසාම තමයි කොතරම් කාලයක් පහු වෙලා හරි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට සිදු වෙලා තිබෙන්නේ. වැඩි ඈතකට යන්න අවශ්‍ය නැහැ. මේ පාර්ලිමේන්තුව දිහා බැලුවාම ඔබ සියලුදෙනාටම ඒක බලාගන්න පුළුවන් කාරණයක් තිබෙනවා. ලංකාවේ ජනගහනයෙන් සියයට 53කට වඩා සිටින්නේ කාන්තාවන්. මේ තරම් කාන්තාවන් පිරිසක් නියෝජනය කරන්නට පාර්ලිමේන්තුවේ සිටින්නේ මන්ත්‍රීතුමියලා ඉතා ස්වල්ප පිරිසක්.

ඔබතුමන්ලා දන්නවා, ඇයි මෙහෙම වෙලා තිබෙන්නේ කියලා. කාන්තාවක් වීම හේතුවෙන් ඇයට නාම යෝජනා ලබා දීමේ පටන් මහ මැතිවරණයට තරග කර මේ පාර්ලිමේන්තුවට එනතුරු සමානතාවෙන් තොර අකටයුතුකම් මොන තරම් නම් සිද්ධ වනවා ද කියා කාන්තාවක් විධියට මම අත්දැකීමෙන් දන්නවා. මොකද, මම දේශපාලන පවුලකින් ආවේ නැහැ. තනිවම දේශපාලන ජීවිතය ගොඩ නහාගෙන අවුරුදු 14කට පසුවයි අද මම මේ කථා කරන්නේ. මගේ ජීවිතයේ බොහෝ වටිනා දේවල් අත් හැරලා මම දේශපාලනයට ආවා. එහෙත්, අපහාස කිරීම්, අවලාද කිරීම් කොයි තරම්ද කියලා, සම තැනකට එන්න තිබුණු අපහසුව කොයි තරම්ද කියලා මම දන්නවා. මට දේශපාලන පවුල් පසුබිමක් තිබුණේ නැහැ. මගේ පියා හෝ සැමියා දේශපාලනයේ සිටියේ නැහැ. මම විශ්වාස කරනවා, ඉදිරි කාලය තුළ අඩුම තරමින් කාන්තාවන් සියයට 50ක්වත් පාර්ලිමේන්තුව නියෝජනය කිරීම සඳහා ගෙන ආ යුතුයි කියලා. පාර්ලිමේන්තුව මඟින් අපි ඔප්පු කරන්න ඕනෑ, අපට සමානතාවක් තිබෙනවා කියලා. කොයි තරම් අණ පනත් ගෙනාවත්, අපට විශ්වාස කරන්න පුළුවන් වෙයි ද ඒ මඟින් මේ පාර්ලිමේන්තුව හොබවන්නට කාන්තාවන්ට ඉඩ දෙයි කියලා? මා එම අවිශ්වාසය පළ කරන්නේ මට තිබෙන අත්දැකීම් තුළින්. ජාතික ලැයිස්තුවෙන් කවුරුන් හෝ කාන්තාවක් පාර්ලිමේන්තුවට ආවොත් ඇයට එතරම් අමාරුවක් දැනෙන්නේ නැති වෙයි. නමුත්, ඊට වඩා ගොඩක් අමාරුයි, පාර්ලිමේන්තු මැතිවරණයට තරග කරලා -එක වතාවක් නොවෙයි, දෙවතාවක්, තුන්වතාවක් තරග කරලා- පාර්ලිමේන්තුවට එන එක. පළාත් සභාවටත් තරග කරලා පළාත් සභා මට්ටමේ ඉඳලා පාර්ලිමේන්තුවට එන කොට කාන්තාවකට කොයි තරම් නම් අකටයුතුකම් සිදු වනවාද. ඒ කෙසේ වෙතත්, ඒ පිළිබඳව කථා කිරීම නවතා දැන් මම අපේ පනත් කෙටුම්පත ගැන කරුණු දක්වන්නම්.

මානව හිමිකම් පිළිබඳ විශ්වීය ප්‍රකාශනය අනුව, මිනිස් ප්‍රජාව නිදහස් හා සමාන අභිමානයකින් හා අයිතිවාසිකම් සහිතව උපත ලබන බැවින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ විශේෂත්ව ඇතුළුව, භේදයකින් තොරව සියලු අයිතිවාසිකම් සහ විවිධාකාර නිදහස සඳහා හිමිකම් කියන බව සඳහන් වනවා.

මෙම අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා කාන්තා කටයුතු විෂය භාර අමාත්‍යාංශය ලෙස මෑත කාලීනව කාන්තාවන් හා ගැහැනු දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වැදගත් වැඩ පිළිවෙළ රාශියක් ගෙන තිබෙනවා. ඒ අතර පසුගිය වසරේ කාන්තාවන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට හැකි වුණා. අපි එම ප්‍රතිපත්තිය "ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය හා කාන්තාවන් සවිබලගැන්වීමේ ජාතික ප්‍රතිපත්තිය" ලෙස නම් කර තිබෙනවා.

තවද, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා අංක 1325ට අනුව කාන්තාව, සාමය හා ආරක්ෂාව සඳහා වන පස් අවුරුදු ජාතික සැලැස්ම (2023-2027) සකස් කර ඒ සඳහා ද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් තිබෙනවා.

ඊළඟට, කාන්තාවන් බහුලව මුහුණ දෙන මානව හිමිකම් උල්ලංඝනය වීමක් වන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා වන දෙවන පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම මේ වන විට අමාත්‍යාංශය විසින් සකස් කර ඇති අතර, එය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා නුදුරේදී ම ඉදිරිපත් කිරීමට නියමිතයි.

මීට අමතරව, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අයවැයකරණය ක්‍රියාත්මක කිරීම සඳහා වන පනත් කෙටුම්පතක් සකස් කිරීමට අවශ්‍ය මූලික පියවර මේ වන විට අමාත්‍යාංශය විසින් ගනු ලබමින් තිබෙනවා. එසේම, කාන්තා අභිවෘද්ධිය උදෙසා නීති සහ අනුනීති සම්පාදනය කිරීමට විශේෂ විධිවිධාන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පවතින බැවින්, ඊට අනුකූලව ශ්‍රී ලංකාව තුළ කාන්තාවන් සවිබල ගැන්වීම පිණිස අද දින විවාදයට ගනු ලබන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත සකස් කර තිබෙනවා.

මෙහි අරමුණු වන්නේ, කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විධිවිධාන සැලැස්වීම, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව හා කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම, -මෙය ඉතාම වැදගත් දෙයක් - කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යන්ත්‍රණ පිහිටුවීම සහ එකී අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට එරෙහිව නඩු පැවරීම හා ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමයි.

එසේම කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම තුරන් කිරීම පිළිබඳ සම්මුතිය ප්‍රකාරව කාන්තාවන්ට අදාළව ශ්‍රී ලංකා රජය විසින් භාර ගනු ලැබ ඇති බැඳීම් බලාත්මක කිරීම සඳහා යන්ත්‍රණ හඳුන්වා දීමත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යන්ත්‍රණ හඳුන්වා දීමත් මඟින් කාන්තාවන්ගේ අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම සඳහා විධිවිධාන සැලැස්වීමත් මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වනවා.

එසේම මෙම පනත් කෙටුම්පත තුළ අන්තර්ගත වන ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම මඟින් කාන්තාවන් සවිබල ගැන්වීම තහවුරු කිරීම සඳහා ඵලදායි, විධිමත් යන්ත්‍රණයක් සකස් වනු ඇති. මෙමඟින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමේදී එම පැමිණිලි භාර ගැනීම, පරීක්ෂා කිරීම හා විමර්ශනය කිරීම සිදු කරයි. තවද කාන්තාවන් සමථකරණය වෙත යොමු කිරීම, නීති සම්බන්ධ ප්‍රතිසංස්කරණ සඳහා අදාළ ආයතන වෙත නිර්දේශ සැපයීම ද මෙම කොමිෂන් සභාව සතු බලතල අතර වනවා. මීට අමතරව, කාන්තා අයිතිවාසිකම් සඳහා වන පාර්ලිමේන්තු කොමසාරිස්වරයකු ද මෙමඟින් පත් කිරීමට නියමිතයි.

[ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සරත් වීරසේකර මැතිතුමා යෝජනා කළා, මෙහිදී "කාන්තාව" යන්න පැහැදිලිව නිර්වචනය කර මෙයට ඇතුළත් කළ යුතුය කියලා. එසේ නොකළහොත් විය හැකි ගැටලු කීපයක් ද එතුමා සඳහන් කළා. අප ඒ සියල්ල ඉදිරිපත් කරන්නට සූදානම් ඉදිරි කාලයේදී. මම දන්නේ නැහැ ඒ පිළිබඳ සලකා බලන්න වෙන්නේ කොහොමද කියලා. නමුත් ඒවා ඇතුළත් කිරීමට සිද්ධ වෙයි.

ගරු ගෙවිඳු කුමාරතුංග මැතිතුමා, ගරු විමල් වීරවංශ මැතිතුමා ඇතුළු බොහෝ දෙනෙක් මීට සම්බන්ධ එතුමන්ලාගේ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. මම පෞද්ගලිකව විශ්වාස කරනවා, ඒ යෝජනාවල ලොකු හරයක් තිබෙන බව සහ ඒ යෝජනාවලට අප හිස නැමිය යුතු බව. විශේෂයෙන් ස්වාභාවික කාන්තාව හා පුරුෂයා යනු කවරෙක්ද කියන කාරණය වැදගත්. එනම්, ස්වාභාවිකව කාන්තාවක් ලෙස උත්පත්තිය ලබන අයෙකු කාන්තාවක් ලෙස ඉදිරියට යෑම සහ අස්වාභාවික ක්‍රම භාවිත කරමින් කාන්තාවක් බවට පත් වන සමහර පිරිමින් පිළිබඳව ඇති වන ගැටලුසහගත තත්ත්වය පිළිබඳ කිසියම් නිරාකරණයක් කරගත යුතු බව මට වැටහෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමිය දන්නවාද, ලිංගික දිශානතිය කියන්නේ මොකක්ද කියලා?

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) කීතා සමන්මලී කුමාරසිංහ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)
කාන්තාවකගේ හෝ පිරිමියෙකුගේ ලිංගිකත්වය පිළිබඳව කියන වචනයක්. කාන්තාවක් සහ පිරිමියෙකු වෙනස් කොට සලකන නිර්වචනයක්.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු රාජ්‍ය ඇමතිතුමිය, එය ඔබතුමිය ඔය හිතාගෙන ඉන්න එක නම් නොවෙයි. ලිංගික දිශානතිය කියන්නේ වෙන එකක්. *[බාධා කිරීමක්]* කරුණාකර ඒකේ තේරුම හරියට දැනගෙන ඉන්න. අප මේ සංශෝධන ඉදිරිපත් කරලා තිබෙන්නේ ඒ අනුව.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) කීතා සමන්මලී කුමාරසිංහ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)
ඉදිරිපත් කරපු සංශෝධන තමයි අපි මේකට ඇතුළත් කරන්නට යැව්වේ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
සංශෝධනයක් භාර ගන්නවා කියන එක එච්චර අමාරු වැඩක් නොවෙයි නේ, ගරු රාජ්‍ය ඇමතිතුමිය. ඔබතුමිය නේ මෙතැන දැන් ඉන්න බලධාරියා. අර රාජ්‍ය නිලධාරී මැදිරිය ඇතුළේ ඉන්න නිලධාරීන්ට අනුව තීරණ ගන්න එපා. බොහොම සරල සංශෝධනයක් අප භාර දීලා තිබෙන්නේ. මම නොවෙයි, ගරු ගෙවිඳු කුමාරතුංග මැතිතුමා එය භාර දුන්නේ.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) කීතා සමන්මලී කුමාරසිංහ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)
ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමාගේ සංශෝධනය present කරලා තිබුණා මෙතැන. සෑම මන්ත්‍රීවරයෙකුටම එය ලැබුණා කියලායි මා හිතන්නේ. අනිවාර්යයෙන් ඒක ඇතුළත් වේවි.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ඒක අද කරනවාද?

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) කීතා සමන්මලී කුමාරසිංහ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)
ඒක අද කරනවාද කියන එක මට නිශ්චිතව කියන්න බැහැ. නමුත් එය ඇතුළත් කරන්න අපි ඉල්ලීමක් කරලා තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි එය ඉදිරිපත් කළා. හැන්දෑ වෙලා තිබියදීත් අප මේ රැඳී ඉන්නේ ඒ සංශෝධනය ඔබතුමිය භාර ගන්නවාද, නැද්ද කියන එක දැන ගැනීම සඳහායි, ගරු රාජ්‍ය ඇමතිතුමියනි.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) කීතා සමන්මලී කුමාරසිංහ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)
ඒක අපි භාර ගත්තා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
භාර ගත්තාට වැඩක් නැහැ. ඒ සංශෝධනය ඔය පනත් කෙටුම්පතේ සංශෝධනයක් හැටියට මේ වෙලාවේ පිළිගන්නවාද කියන එකයි අපි අහන්නේ.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) කීතා සමන්මලී කුමාරසිංහ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)
එම සංශෝධනය මෙතැන present කරලා තිබුණා. මීට කලින් අපට ඒ පිළිබඳ සාකච්ඡා කරන්න කිසිම අවස්ථාවක් ලැබුණේ නැහැ. ගරු ජනාධිපතිවරයා මේ පිළිබඳ කැබිනට් ඇමතිවරයා බැවින් මම මේ සංශෝධනය එතුමාට ඉදිරිපත් කරන්නම්, ඒ තීරණය මට ගන්න බැරි නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, සංශෝධන ඉදිරිපත් කරනකොට ඒක පිළිගන්න විධිය බලමු.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙවින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙවින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමිය දැන් කිව්වේ අද සංශෝධන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් නේ. ඉතින් දෙයියනේ, විදුලිබල පනතයි, අනෙක් පනත්වලටයි එක දවසයි නේ විවාදය තිබුණේ. ඒවාට සංශෝධන විසි ගණන්, තිස් ගණන් දුන්නෙත් මෙහෙම නේ. මෙය කාන්තාවන් සවිබල ගැන්වීම සම්බන්ධයෙන් වන පනතක් නිසා කරුණාකරලා ලිංගිකත්වය හා සම්බන්ධ කාරණය කාන්තාවන්ට සීමා කරන්න, වෙනත් අර්ථකථනවලට ඉඩ තියන්න එපා කියලායි අපි කියන්නේ. ඒකයි අපේ සරල ඉල්ලීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා. සංශෝධන ඉදිරිපත් කරන වෙලාවේදී ඒ ගැන සභාව ක්‍රියා කරන විධිය බලමු.

බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමියනි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.
වීනා විධුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.
අතන්පඩි, චට්ටමූලම් ඉරණ්ටාම් මුරෙ මතිප්පිටප්පට්ටතු.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]
තීර්මානික්කප්පට්ටතු:
"චට්ටමූලම් මුළුප් පාරාළුමන්ත්‍රක් කුළුවුක්කුච් චාට්ටප්පඩුමාක." - [මාණ්පුමිකු (කලානිති) චුසිල් පිරේමජයන්ත]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Susil Premajayantha]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
කුළුවිල් ආරායප්පට්ටතු.
[මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ් තලෙමෛ වකිත්තාර්කළ්.]
Considered in Committee.
[THE HON. DEPUTY SPEAKER in the Chair.]

1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1 ආම් වාසකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clause 1 ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
2 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු වන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා.

2 වන වගන්තිය.- (පනතේ අරමුණු)
வாசகம் 2.- (சட்டத்தின் குறிக்கோள்கள்)
CLAUSE 2.- *(Objects of the Act)*

ගරු නීතිඥ වන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි චන්තිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය වෙනුවෙන් මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

" 3 වන පිටුවේ 5 වන පේළියෙන් අනතුරුව පහත පරිදි උපවගන්තියක් එක් කරන්න:

'(ඒ) සමාන වටිනාකමකින් යුත් රැකියා සඳහා ස්ත්‍රීන් හා පුරුෂයන් අතර සමාන වේතනයක් ලබාදීම තහවුරු කිරීම සඳහා නීති හා ක්‍රියාමාර්ග සංශෝධනය කිරීම ප්‍රවර්ධනය කිරීම.' "

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
එම සංශෝධනයට එකඟද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) චුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Aye.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
2 වන වගන්තියට තවත් සංශෝධනයක් ඉදිරිපත් කිරීම, ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙවින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"2 වන පිටුවේ 13 වන පේළියේ 'ස්ත්‍රී පුරුෂභාවය සහ ලිංගික දිශානතිය' යන වදන් ඉවත් කර, 'කාන්තාවන්ගේ ලිංගිකත්වය' යන වදන් ආදේශ කරන්න."

එතකොට කියැවෙන්නේ, "කාන්තාවන්ගේ ලිංගිකත්වය මත පදනම්ව සිදුවන සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම්වලින් කාන්තාවන් ආරක්ෂා කිරීම" කියලා. ඒ ආකාරයට වගන්තිය සංශෝධනය කරන්න කියලායි ඉල්ලන්නේ.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
එම සංශෝධනයට එකඟද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) චුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
විරුද්ධයි. *[බාධා කිරීම්]*

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Divide!

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the Division Bells -

ගරු සභාපතිතුමා
(මාණ්ඩලික තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
දැන් ගරු මන්ත්‍රීවරු සියලු දෙනා තමන්ගේ ආසනවල ඉඳගන්න.

ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනයට පක්ෂ මන්ත්‍රීතුමන්ලා කොළ පාටිනුත්, විරුද්ධ මන්ත්‍රීතුමන්ලා රතු පාටිනුත් ඡන්දය පාවිච්චි කරන්න. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, දැන් අපි ඡන්ද විමසීම සිදු කරන්නේ ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ සංශෝධනයට.

දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්ඩලික සට්ටත්තරණි සන්තිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මම ඉදිරිපත් කරපු සංශෝධනයට "Aye" කියලා කිව්වා. ඒක පිළිගත්තා. ඒ පිළිගත්ත එක "පිළිගත්තේ නැහැ" කියලා ආපසු කියන්න බැහැ. ඡන්දයක් තියනවා නම් ඉස්සෙල්ලා ඒකට ඡන්දයක් තියන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්ඩලික සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒක මම මේ ඡන්ද විමසීම ඉවර වුණාම කියන්නම්. Standing Order No. 64 යටතේ සඳහන් වන කාරණය කියන්නම්.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)
(At this stage, the Voting commenced.)

ගරු සභාපතිතුමා
(මාණ්ඩලික තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
සියලුදෙනාම නිවැරදිව ඡන්දය ප්‍රකාශ කළාද? ආණ්ඩු පාර්ශ්වය පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් නැඟී සිට දන්වන්න.

ගරු මංජුලා දිසානායක මහත්මිය
(මාණ්ඩලික (තිරුමති) මඤ්සුලා තිසානායක්ක)
(The Hon.(Mrs.) Manjula Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(මාණ්ඩලික තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ඡන්දය ප්‍රකාශ කරන්නේ කොයි ආකාරයෙන්ද?

ගරු මංජුලා දිසානායක මහත්මිය
(මාණ්ඩලික (තිරුමති) මඤ්සුලා තිසානායක්ක)
(The Hon.(Mrs.) Manjula Dissanayake)
විරුද්ධයි.

ගරු සභාපතිතුමා
(මාණ්ඩලික තවිසාළර් අවර්කළ්)
(The Hon. Chairman)
ආණ්ඩු පාර්ශ්වය පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ තවත් ගරු මන්ත්‍රීවරු සිටිනවාද?

කිසිවෙකු නැති බවයි පෙනෙන්නේ.

විරුද්ධ පාර්ශ්වය පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වුණු ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

කිසිවෙකු නැති බවයි පෙනෙන්නේ.

දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය අවසානයි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

(මේ අවස්ථාවේ පහත සඳහන් නම් සහ ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.)
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 05; විරුද්ධව 13; වැළකී සිටි 03 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 05; எதிராக 13; விலகியிருந்தோர் 03.
According to Electronic Voting, Parliament divided: Ayes 05; Noes 13; Abstain 03.

G 006. Susil Premajayantha	No
G 026. Mohan Priyadarshana De Silva	No
G 027. Janaka Wakkumbura	No
G 030. Thenuka Vidanagamage	No
G 032. Lasantha Alagiyawanna	No
G 033. Rohana Dissanayaka	No
G 036. Vijitha Berugoda	No
G 054. Geetha Samanmale Kumarasinghe	No
G 058. Anupa Pasqual	Abstain
G 070. Sarath Weerasekara	Yes
G 083. Sanjeeva Edirimanna	No
G 091. Kulasingam Dhileeban	No
G 092. Sudarshana Denipitiya	No
O 017. A. L. M. Athaullah	No
O 054. Wimal Weerawansa	Yes
O 057. Harini Amarasuriya	Abstain
O 075. Chandima Weerakkody	Abstain
O 088. Sudarshini Fernandopulle	No
O 090. Jayantha Samaraweera	Yes
O 106. Wasantha Yapabandara	Yes
O 109. Gevindu Cumaratunga	Yes

Electronic Voting Result:

Participants:	
Present	21
Votes:	
Yes	5
No	13
Abstain	3

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා විසින් කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පතෙහි 2 වන වගන්තියට ඉදිරිපත් කරන ලද සංශෝධනයට විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 05යි; විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 13යි. ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 03යි.

නැඟී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව විරුද්ධව මුළු ඡන්ද සංඛ්‍යාව 14යි.

ඒ අනුව, එකී සංශෝධනය වැඩි ඡන්ද 9කින් ප්‍රතික්ෂේප වෙනවා.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)
ගරු සභාපතිතුමනි, ස්ථාවර නියෝග 64හි සඳහන් වෙනවා, "පනත් කෙටුම්පතක් කාරක සභාවක දී සලකා බලා අවසන් වීමෙන් අනතුරුව, පනත් කෙටුම්පත කාරක සභාවේ ම තිබිය දී යම් මන්ත්‍රීවරයකු විසින් සභාපතිවරයාගේ අවසරය ඇතිව, එවකටත් සම්මත වූ වගන්තියකට සංශෝධනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය" කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, - *[බාධා කිරීම්]*

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, - *[බාධා කිරීම්]*

ගරු සභානායකතුමනි, ඔබතුමා නොවෙයි සභාව මෙහෙයවන්නේ, සභාපතිතුමා. ගරු සභාපතිතුමනි, කාන්තාවන් - *[බාධා කිරීම්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න. සභානායකවරයා නැඟී සිටිනවා නම් ඒකට ප්‍රමුඛතාව දෙන්න ඕනෑ. ඒකයි ස්ථාවර නියෝගවල තිබෙන්නේ. ඔබතුමා වාඩි වෙන්න.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ස්ථාවර නියෝගවල එහෙම එකක් නැහැ. නැඟිටලා කථා කරන මන්ත්‍රීවරයෙකුගේ කට වහන්න බැහැ, ගරු සභාපතිතුමනි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මම කරුණු පැහැදිලි කළාට පසුව ඔබතුමා කියන්න.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, -

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
I am on my feet!

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
I am also on my feet!

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
You cannot speak now, because I am the Leader of the House. You are not the Leader of the House. You keep that in your mind. - [Interruption.] No, I am making my submissions. - [Interruption.] No, you cannot. You had better go through the Standing Orders. - [Interruption.] I know those better than you. I came to Parliament before you. Keep that in your mind.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු සභානායකතුමනි, ගරු රාජ්‍ය අමාත්‍යතුමිය සඳහන් කළ පරිදි ස්ථාවර නියෝග 64 අනුව - *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමාට කියන්න තිබෙන දෙයක් මට පසුව කියන්න, ගරු මන්ත්‍රීතුමා. - *[බාධා කිරීමක්]* I am on my feet!

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
I am also on my feet!

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
But, you cannot. I am the Leader of the House. Keep it in your mind. You had better go through the Standing Orders. - *[Interruption.]*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

ගරු රාජ්‍ය අමාත්‍යතුමිය විසින් ඉදිරිපත් කරන ලද පරිදි ස්ථාවර නියෝග 64 අනුව, ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනයට සභාව එකඟද? *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, ගීතා කුමාරසිංහ රාජ්‍ය ඇමතිතුමිය ස්ථාවර නියෝග යටතේ යම් කරුණක් ඉදිරිපත් කළා. චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා ගෙනාපු සංශෝධනය සම්බන්ධයෙන් ස්ථාවර නියෝගවල තිබෙන කාරණය තමයි එතුමිය කිව්වේ. ඒ කියන්නේ, එතුමිය ඒකට එකඟ නැහැ.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

එහෙම කියන්න බැහැ නේ. එතුමිය එකඟ නැහැ කියලා ඔබතුමාට කියන්න බැහැ නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

එතුමිය නොවෙයි, අපි එකඟ නැහැ. ඒකට එකඟ නැති බව තමයි එතුමිය ප්‍රකාශ කළේ. චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා, ඔබතුමාගේ සංශෝධනයට එකඟද, නැද්ද කියලා දැන් අහන්න.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මගේ සංශෝධනය සමාන රැකියා කරනකොට කාන්තාවන්ට සමාන වේතනයක් ලැබිය යුතුයි කියන අයිතිය ස්ථාපිත කිරීම සඳහා ගෙනාපු එකක්. ආණ්ඩු පක්ෂය කලින් ඒකට එකඟ වුණා. නමුත් මේ මොහොතේ ජනාධිපතිවරයාගේ හෝ කාගේ හෝ පිටත බලපෑමක් නිසා ඒකට හදිසියේ විරුද්ධ වෙනවා නම්, ඒක වැරදියි. පාර්ලිමේන්තුවට විධායකය තනිකර බලපෑම් කරන බව ඔප්පු වෙනවා, මේ නිසා. ස්ථාවර නියෝගවල තිබෙන්නේ මොකක්ද? ස්ථාවර නියෝග 64හි තිබෙන්නේ ගැළපෙන සංශෝධනයක් ගැන. මේ කියපු එක සංශෝධනයක් නොවෙයි නේ. ගරු සභාපතිතුමනි, මේ ස්ථාවර නියෝගය හොඳට කියවන්න. මේ ස්ථාවර නියෝගයේ තිබෙන්නේ,- *[බාධා කිරීමක්]*

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු සභාපතිතුමනි, යම් කිසි සංශෝධනයක් පිළිගත්තාට පස්සේ ඊළඟ සංශෝධනය ප්‍රතික්ෂේප වුණා. ඒ පිළිබඳව ඡන්ද විමසීමකුත් කළා. දැන් ආයෙත් අර කලින් පිළිගත්ත සංශෝධනය පිළිගන්නේ නැහැ කියලා කියනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු මන්ත්‍රීතුමනි, පනත් කෙටුම්පතේ දෙවන වගන්තිය ගැන තවම මේ කථා කරන්නේ. ඊළඟ වගන්තියට ගියේ නැහැ. *[බාධා කිරීමක්]* දෙවන වගන්තිය අවසන් කළේ නැහැ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

එම වගන්තිය අවසන් කරලා නැහැ, ගරු සභාපතිතුමනි. වගන්තිය අවසන් කරලා නැත්නම්, ඒ යටතේ සංශෝධන ගෙන එන්න පුළුවන්. ඒක තමයි දැන් කළේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා, ඔබතුමාගේ සංශෝධනය ඉදිරිපත් කරන්න.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 64 යටතේ තමයි මේ යෝජනාව කරන්නේ. ස්ථාවර නියෝග 64හි තිබෙන්නේ, "පනත් කෙටුම්පතක් කාරක සභාවක දී සලකා බලා අවසන් වීමෙන් අනතුරුව, පනත් කෙටුම්පත කාරක සභාවේ ම තිබිය දී යම් මන්ත්‍රීවරයකු විසින් සභාපතිවරයාගේ අවසරය ඇතිව, එවකටත් සම්මත වූ වගන්තියකට සංශෝධනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය" කියලා.

නමුත්, මේ ඉදිරිපත් කරන්නේ සංශෝධනයක් නොවෙයි. මේ, එකඟ වෙලා සම්මත වුණු දේ නැවත ඉවත් කර ගැනීම සඳහා වූ සංශෝධනයක්. එකඟ වුණු දේ තනිකර ප්‍රතික්ෂේප කරන්න, විරුද්ධ වෙන්න කියන එකක් නොවෙයි, මේකෙන් අදහස් කරන්නේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

නැහැ, ගරු මන්ත්‍රීතුමා. සංශෝධනයක් තමයි. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

මේ, පනතේ පරමාර්ථ සම්පූර්ණයෙන්ම වෙනස් වෙන දෙයක්. අපි මේකට විරුද්ධයි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ඔව්, කිරිඇල්ල මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ස්ථාවර නියෝග 64හි තිබෙන්නේ සංශෝධනයක් ගැන. දැන් ගරු සභානායකතුමා කරන්න හදන්නේ එම වගන්තිය සම්පූර්ණයෙන්ම ඉවත් කරගන්න හදන එකයි. ඒක කරන්න බැහැ. *[බාධා කිරීම්]* ඒක කරන්න බැහැ. *[බාධා කිරීම්]* ඒක තමයි කරන්නේ. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

සංශෝධනයට සංශෝධනයක්.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon.(Mrs.) Geetha Samanmale Kumarasinghe)

ගරු සභාපතිතුමනි, චන්දිම වීරක්කොඩි මැතිතුමාගේ යෝජනාවට අපි එකඟ වෙන්නේ නැහැ. එම සංශෝධනයට එකඟ නැහැ. *[බාධා කිරීම්]*

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
එහෙම කරන්න බැහැ. එම සංශෝධනයට එකඟ වෙලා ඉවරයි. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමනි, ඉක්මනින් ඔය කාරණය අවසන් කරන්න. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, ඔබතුමාත් හොඳට අහගෙන හිටියා නේ. ගරු රාජ්‍ය ඇමතිතුමිය මොකක්ද කිව්වේ? මගේ යෝජනාවට එකඟ නැහැ, විරුද්ධයි කිව්වා. ස්ථාවර නියෝග 64 යටතේ පැහැදිලිව තිබෙන්නේ සංශෝධනයක් ඉදිරිපත් කළ හැකියි කියලා. එකඟ වුණු දෙයක්, සම්මත වුණු දෙයක් ආපසු හැරවීමේ බලතල නැහැ. ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඒක කළ නොහැකියි. ඒ නිසා වැරදි දේ කරන්න ඉඩ දෙන්න එපා. පාර්ලිමේන්තුවට කටයුතුවලට ඇඟිලි ගහන්න ඉඩ දෙන්න එපා, පිටින් එන අයගේ නියෝගවලට. ඔක්කෝම එකඟ වෙලා, පසුව ඒකට එකඟ නැහැ කියන්න දැන් අවස්ථාවක් නැහැ.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, රාජ්‍ය ඇමතිතුමිය ඉදිරිපත් කරන්නේ සංශෝධනයක්.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඉක්මනින් කියන්න, ගරු මන්ත්‍රීතුමා. තව කාරණා ගොඩක් තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු සභාපතිතුමනි, මේ සභාවට වැරදි පූර්වාදර්ශ දෙන්න එපා. ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා ගෙනා සංශෝධනයට එකඟයි කියලා ගරු සභානායකතුමා කිව්වා. ඒක පටිගත වුණා. දැන් ආයෙත් රාජ්‍ය ඇමතිතුමිය කියනවා, ඒකට විරුද්ධයි කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒකට සංශෝධනයක් ගේන්න ඕනෑ - *[බාධා කිරීම්]*

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ඔබතුමා කියන දේ හරි. හැබැයි, - *[බාධා කිරීම්]*

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
නමුත් දැන් රාජ්‍ය ඇමතිතුමිය කියනවා, ඒකට විරුද්ධයි කියලා. එහෙම අතීතයට යන්න බැහැ; ආපස්සට යන්න බැහැ.

ගරු ලසන්ත අලගියවන්න මහතා (ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු லசந்த அலகியவன்ன - போக்குவரத்து இராஜாங்க அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - State Minister of Transport)
ගරු සභාපතිතුමනි, අපිට මේ ප්‍රශ්නය විසඳා ගන්න නේ අවශ්‍ය වෙන්නේ. මට පෙනෙන විධියට මෙතැන සම්බන්ධීකරණයේ පොඩි ප්‍රශ්නයක් තිබෙන්නේ. මම දන්නා තරමින් ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමාගේ යෝජනාව හැරෙන්න අනෙක් සංශෝධනවලට විෂය භාර අමාත්‍යවරයා විධියට ජනාධිපතිතුමාගේ එකඟතාව තිබෙනවා. -ජනාධිපතිතුමා පිට කෙනෙක් නොවෙයි නේ, මෙම අමාත්‍යාංශය භාර ඇමතිවරයා විධියට ඉන්නේ ජනාධිපතිතුමා.- දැන් අවශ්‍ය වෙන්නේ එම එකඟතාවලට නීතිපතිතුමාගේ අනුමැතිය ගන්න එකයි. ඉතින් පරිපාලනමය වශයෙන් -*[බාධා කිරීම්]* නැහැ, නැහැ. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමාගේ සංශෝධනයට නීතිපතිතුමා එකඟද?

ගරු ලසන්ත අලගියවන්න මහතා
(මාණ්පුමිකු லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ඒක තමයි දැන් - *[බාධා කිරීම්]* ප්‍රායෝගිකව, ස්ථාවර නියෝග අනුව පුළුවන්කමක් තිබෙනවාද, මේ වගන්තිය පොඩ්ඩක් කල් තබා අනික් එක ගන්න? *[බාධා කිරීම්]* පුළුවන්ද කියලායි මම ඇහුවේ. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මෙතුමා කියනවා නේ, නීතිපතිතුමාව consult කරන්න කියලා. එහෙම consult කරන්න. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
ගරු සභාපතිතුමනි, -

ගරු සභාපතිතුමා
(මාණ්පුමිකු தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
ගරු සභාපතිතුමනි, මෙය වැදගත් සංශෝධනයක්. කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පතට අදාළව ගෙනා මෙම සංශෝධනයට ඉඩ දෙන්න කියලා මම බොහොම ගෞරවයෙන් ඉල්ලනවා. *[බාධා කිරීම්]*

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
ගරු සභාපතිතුමනි, මේ සංශෝධනය මේ පනත් කෙටුම්පතේ අන්තර්ගතයට අනුකූලව කෙරෙන සංශෝධනයක්. එක වෙලාවක "හා" කියලා දැන් කොහොමද ඒක ආයෙත් වෙනස් කරන්නේ?

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, දැන් ලඝන්ත අලගියවන්න මැතිතුමා කියනවා, ජනාධිපතිවරයා මේකට එකඟයි කියලා. ඉතින් ජනාධිපතිවරයාත් එකඟ නම්, අපි දැන් පාර්ලිමේන්තුව තුළ සම්මත කරලාත් නම්, විය යුත්තේත් මේක නම්, ඇයි පාර්ලිමේන්තු සම්ප්‍රදායට එරෙහිව මේක ආපසු ඉවත් කරගන්න හදන්නේ?

කාටද, මේකෙන් වාසියක් වෙන්නේ? අපි මේ පනත ගෙනාවේ කාන්තාවන්ට යහපතක් කරන්න. පනතේ අරමුණු කරා ගෙන යෑමට අවශ්‍ය වන සංශෝධනයක් අපි ඉදිරිපත් කළේ, කාන්තාව ශක්තිමත් කරන්න. ඉතින්, මේකට අවස්ථාව ලබා දෙන්න. ඔබතුමා සතුවයි තින්දුව තිබෙන්නේ, ගරු සභාපතිතුමනි. පාර්ලිමේන්තු සම්ප්‍රදාය විකෘති කරන්න එපා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (3) ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

"පනත් කෙටුම්පතකට පාර්ලිමේන්තුව තුළ දී යෝජනා කරනු ලබන යම් සංශෝධනයක් ඒ පනත් කෙටුම්පතේ හරයට සහ මූලධර්මවලට පරිබාහිර සංශෝධනයක් නොවිය යුත්තේ ය."

එතකොට මේ සංශෝධනය අනුව එසේ වෙනවාද, නැද්ද කියන එක තමයි අතැන රාජ්‍ය නිලධාරි මැදිරියේ ඉන්න නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කියන්න ඕනෑ කරන්නේ. ඒක කියන්න බැරිද?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
ගරු සභාපතිතුමනි, කාන්තාවන් සවිබල ගන්වන්න ගෙනෙන පනතකට කාන්තාවන්ගේ වැටුප් සමතලයක තිබිය යුතුයි කියන එක ඇතුළත් කිරීම පටහැනි වන්නේ කොහොමද?

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
කාන්තාවන්ට සමාන වැටුප් දෙනවාට විරුද්ධයි ද කියන්න?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
අපි එකඟයි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එකඟයි, fine.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒ අනුව, ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනය සහිතව දෙවන වගන්තියට සභාව එකඟ ද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Aye. *[Interruption.]* සංශෝධන සහිතව. ඒක සංශෝධනයක් නේ. ඒකයි "Aye" කිව්වේ.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මගේ සංශෝධනය සහිතවද?

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
සහිතව.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
හරි නේ. ඔබතුමා ගෙනාපු සංශෝධනය සහිතව තමයි එම වගන්තියට එකඟයි කිව්වේ.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
බොහොම ස්තුතියි, ඔබතුමාට.

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 2, as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
3ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 3 ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
හතරවන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු සභාපතිතුමනි, 4 වන වගන්තියට මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"3 වන පිටුවේ, 20 වන පේළියේ සිට 25 වන පේළිය තෙක් (ඒ පේළි ද සමඟින්) ඉවත්කොට ඒ වෙනුවට,

'(අ) ඇමතිතුමා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් පස් දෙනෙකු ද;

(ආ) කථානායකවරයා විසින් පත් කරන ලද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංඝදයෙන් සාමාජිකයන් දෙදෙනෙකු ද යෝජනා කළ යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිතුමා විසින් අදාළ පත්වීම් කළ යුතු ය.'"

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඒ සංශෝධනය හරියට කියන්න.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
නැවත කියන්නද? හොඳයි. මේ පනත් කෙටුම්පතේ තිබෙන්නේ, මේ පත් කරන කොමිෂන් සභාවට ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සභාවෙන් සාමාජිකයන් පස් දෙනෙකු පත් කරන්න සහ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංඝදයෙන් සාමාජිකයන් දෙදෙනෙකු පත් කරන්න කියලායි. අපි දකින ආකාරයට නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන්නේ, යම්කිසි කෙනෙක් සුදුසු ද කියා සොයා බලා අනුමත කරන්න තිබෙන තැනක්. මේ සංශෝධනය මම නැවත කියවන්නම්.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ සංශෝධනයේ අන්තිම පේළිය කියැවුණේ නැහැ, "යන වගන්ති ඊට එකතු කළ යුතු ය" කියන කොටස.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මම නැවත කියවන්නම්කෝ, ඒ සංශෝධනය. එය මෙසේයි:

"3 වන පිටුවේ, 20 වන පේළියේ සිට 25 වන පේළිය තෙක් (ඒ පේළි ද සමඟින්) ඉවත්කොට,

'(අ) ඇමතිතුමා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් පස් දෙනෙකු ද;

(ආ) කථානායකවරයා විසින් පත් කරන ලද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංඝදයෙන් සාමාජිකයන් දෙදෙනෙකු ද යෝජනා කළ යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිතුමා විසින් අදාළ පත්වීම් කළ යුතු ය.'

යන වගන්තිය ඊට එකතු කළ යුතු ය."

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒ අනුව, ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනය සහිතව 4වන වගන්තියට සභාව එකඟ ද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එකඟ නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒ අනුව, 4වන වගන්තිය ඇති සැටියෙන් සංශෝධන රහිතව,-

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කියන්න, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
මොකක්ද, මේ කරන්නේ? ගරු සභාපතිතුමනි, මීට කලින් කිව්වා, ගෙවිඳු කුමාරතුංග මැතිතුමා කලින් ගෙනාපු සංශෝධනයට හැර අනෙක් සියලුම සංශෝධනවලට එකඟයි කියලා.

කිව්වේ නැද්ද? *[බාධා කිරීම්]* එම වගන්තියට විතරක් නොවෙයි, සමස්ත,- *[බාධා කිරීමක්]* එහෙම තමයි තමුන්නාන්සේලා කිව්වේ. මම අහන්නේ මේකයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන්නේ තනතුරු යෝජනා කරන, ඒ කියන්නේ පුද්ගලයින් යෝජනා කරන තැනක් නොවෙයි. ජනාධිපතිවරයා හෝ කවුරු හෝ යෝජනා කරන නම් සුදුසුද, නැද්ද කියා පරීක්ෂා කර බලා අනුමත කරන තැනක්, ඒක. මෙම පනත් කෙටුම්පතේ වගන්තිවල තිබෙන විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට බලය දෙනවා, කොමිෂන් සභාවට සාමාජිකයන් නිර්දේශ කරන්න. එතකොට එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවීමේ පරමාර්ථයට පටහැනියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ භූමිකාව වන්නේ ජනාධිපතිවරයා විසින් යෝජනා කර එවන නම් හොඳ නම් අනුමත කිරීම හෝ නරක නම් ප්‍රතික්ෂේප කිරීමයි. ඒ නිසා තමයි මෙම සංශෝධනයෙන් කියන්නේ ඇමතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් පස්දෙනෙකු නම් කර එවිය යුතු බව. ඒ නම්, සුදුසු නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් අනුමත කරනවා නැත්නම් ප්‍රතික්ෂේප කරනවා. ඒ වාගේම පනත් කෙටුම්පතෙහි සඳහන් ආකාරයට කථානායකතුමා විසින් පත් කරන ලද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංඝදයෙන් නිර්දේශ කර එවන නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යන්නේ නැහැ. ඒක කෙළින්ම යනවා. ඒ නිසා අපි කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ භූමිකාව විකෘති කරන්න එපා කියන එකයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට අයිති භූමිකාව හැර, එයින් පිටස්තර භූමිකාවක් එයට දෙන්න එපා. අපි කරන්නේ එම ඉල්ලීමයි. එය සාධාරණ නැද්ද? මේකට විරුද්ධ වෙන්න තිබෙන තර්කය මොකක්ද? *[බාධා කිරීමක්]* අපි කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ භූමිකාව විකෘති කරන්න එපා කියන එකයි. එහෙම නැතුව මේකේ වෙන කිසිම අර්ථයට හානියක් නැහැ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා,- *[බාධා කිරීම්]* ඒ අනුව ගරු ගෙවිඳු කුමාරතුංග මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනවලට සභාව එකඟද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එකඟ නැහැ කියලා නේ කිව්වේ.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එකඟ නැහැ. ඒ අනුව 4 වන වගන්තිය ඇති සැටියෙන්,- *[බාධා කිරීමක්]*

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
බෙදීමක් අවශ්‍යයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
හොඳයි. බෙදුම් සීනුව නාද කරන්න. *[බාධා කිරීම්]*

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the Division Bell -

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාම තමන්ට නියමිත ආසනවල ඉඳගන්න.

ඡන්දය ප්‍රකාශ කිරීමේදී ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සංශෝධනයට පක්ෂ උදවිය කොළ පාටත්, සංශෝධනයට විරුද්ධ උදවිය රතු පාටත් භාවිත කරන්න.

දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)
(At this stage, the Voting commenced.)

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවෙහි නිවැරදිව සටහන් වී ඇත්දැයි බලන්න.

ආණ්ඩු පාර්ශ්වය පැත්තේ ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

කිසිවෙකු නැති බවයි පෙනෙන්නේ.

විරුද්ධ පාර්ශ්වය පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

ගරු ජගත් ප්‍රියංකර මහතා
(மாண்புமிகு ஜகத் பிரியங்கர)
(The Hon. Jagath Priyankara)
නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ජගත් ප්‍රියංකර මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ කොයි ආකාරයෙන්ද?

ගරු ජගත් ප්‍රියංකර මහතා
(மாண்புமிகு ஜகத் பிரியங்கர)
(The Hon. Jagath Priyankara)
පක්ෂයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ තවත් ගරු මන්ත්‍රීවරු ඉන්නවාද?

කිසිවෙකු නැති බවයි පෙනෙන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 10; විරුද්ධව 14; වැළකී සිටි 01 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 10; எதிராக 14; விலகியிருந்தோர் 01.
According to Electronic Voting, Parliament divided: Ayes 10; Noes 14; Abstain 01.

G 006. Susil Premajayantha	No
G 026. Mohan Priyadarshana De Silva	No
G 027. Janaka Wakkumbura	No
G 030. Thenuka Vidanagamage	No
G 032. Lasantha Alagiyawanna	No
G 033. Rohana Dissanayaka	No
G 036. Vijitha Berugoda	No
G 054. Geetha Samanmale Kumarasinghe	No
G 058. Anupa Pasqual	No
G 070. Sarath Weerasekara	Yes
G 083. Sanjeeva Edirimanna	No
G 091. Kulasingam Dhileeban	No
G 092. Sudarshana Denipitiya	Abstain
G 095. Muditha Prishanthi	No
G 110. Manjula Dissanayake	No
O 006. Gayantha Karunatilleka	Yes
O 007. Lakshman Kiriella	Yes
O 017. A. L. M. Athaullah	No
O 054. Wimal Weerawansa	Yes
O 057. Harini Amarasuriya	Yes
O 075. Chandima Weerakkody	Yes

O 088. Sudarshini Fernandopulle	Yes
O 090. Jayantha Samaraweera	Yes
O 106. Wasantha Yapabandara	Yes
O 109. Gevindu Cumaratunga	Yes

Electronic Voting Results:

Participants:

Present	25

Votes:

Yes	10
No	14
Abstain	01

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 10යි; විරුද්ධව 14යි; වැළකී සිටි 01යි.

නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව, පක්ෂව ඡන්දය දුන් මුළු සංඛ්‍යාව 11යි. විරුද්ධව ඡන්ද 14යි.

ඒ අනුව, ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනය වැඩි ඡන්ද 3කින් ප්‍රතික්ෂේප වෙනවා. මේ අනුව 4 වන වගන්තිය ඇති සැටියෙන් සම්මත වූ බව සඳහන් කරමි.

4 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
4ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 4 ordered to stand part of the Bill.

5 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
5ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 5 ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

6 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය.

6 වන වගන්තිය.- (කාන්තා අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම)

வாசகம் 6.- (பெண்கள் முன்னேற்றம் மற்றும் வலுவூட்டுகை பற்றி தேசியக் கொள்கையை வகுத்தமைத்தல்)

CLAUSE 06.- *(Formulation of the National Policy on advancement and empowerment of women)*

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)

ගරු සභාපතිතුමනි, මෙම සංශෝධනය ගෙනෙන්නේ කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට වඩාත් ස්වාධීනත්වය දෙන්නයි. ඒ කියන්නේ ප්‍රතිපත්ති සම්පාදනය කරන කොමිෂන් එකම ඒක නියාමනය කරන්න බැහැ. ඒ නිසා එම වගකීම් දෙක වෙන් විය යුතුයි. ඒ සඳහා තමයි මෙම සංශෝධනය ගෙනෙන්නේ. මම මේ සංශෝධනය ඉදිරිපත් කරන්නේ, අධීක්ෂණ කාරක සභාව වෙනුවෙන්.

ඒ අනුව, 6 වන වගන්තියට මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"7 වන පිටුවේ, 29 වන පේළිය ඉවත් කොට පහත පරිදි ආදේශ කරන්න:

'කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කොට අමාත්‍යවරයා විසින් අනුමත කරගනු ලැබිය යුතුය' "

ඒ අනුව 6 වගන්තියේ (1), (2), (3), (4), (5), (6), (7) උපවගන්ති උක්ත සංශෝධනය අනුව අවශ්‍ය ගැළපීම් සිදුකිරීම.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එම සංශෝධනයට එකඟද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එකඟයි.

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසා ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 6, as amended, ordered to stand part of the Bill.

7 සිට 9 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
7ஆம் வாசகத்திலிருந்து 9ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 7 to 9 ordered to stand part of the Bill.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

ගරු සභාපතිතුමනි, *[බාධා කිරීම්]* මම ඔබතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා, 6වැනි වගන්තිය සභාව එකඟ ද, 7වැනි වගන්තිය සභාව එකඟ ද කියලා අහන්නේ නැතිව අහවල් වගන්තියට රාජ්‍ය නිලධාරීන්ගේ කුටියේ ඉන්න අය එකඟ ද කියලා අහන්න කියලා. *[බාධා කිරීම්]*

10 වන වගන්තිය.- (සාමාජිකයන් ඉවත්කිරීම සහ ඉල්ලා අස්වීම)

வாசகம் 10.- (உறுப்பினர்களை பதவியிலிருந்து அகற்றுதல் மற்றும் அவர்களின் பதவிவிலகுகை)

CLAUSE 10.- *(Removal and resignation of members)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

"10 වන පිටුවේ, 28 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'මන්ත්‍රීවරු ද ඇතුළුව) බහුතර ඡන්දයෙන් සම්මත' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විඩුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Amendment put, and agreed to.

10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

10ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.
Clause 10, as amended, ordered to stand part of the Bill.

11 සිට 16 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

11ආම් වාසකත්තිලිරුන්දු 16ආම් වාසකම් වරෙ චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.
Clauses 11 to 16 ordered to stand part of the Bill.

17 වන වගන්තිය.- (කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාඝන්න උල්ලංඝනය වීමක් විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවට ඇති බලය)

வாசகம் 17.- (பெண்களின் உரிமைகளின் மீறுகையை அல்லது நிகழவுள்ள மீறுகையை புலனாய்வு செய்வதற்கு ஆணைக்குழுவுக்கு தத்துவமளிக்கப்படல்)

CLAUSE 17.- *(Commission empowered to investigate the infringement or imminent infringement of women's rights)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"14 වන පිටුවේ, 7 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'එසේ වුව ද තවදුරටත්, කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ අත්‍යාඝන්න උල්ලංඝනය වීම සම්බන්ධයෙන් 29 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තු කොමසාරිස් විසින් දැනටමත් පරීක්ෂණයක් පවත්වා ඇත්නම් එකී උල්ලංඝනය වීම සම්බන්ධයෙන් වන ඉල්ලීමක් කොමිෂන් සභාව විසින් පරීක්ෂා කිරීම නොකළ යුතු අතර, කොමිෂන් සභාව විසින් එම වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විඩුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Amendment put, and agreed to.

17 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

17ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.

Clause 17, as amended, ordered to stand part of the Bill.

18 වන වගන්තිය.- (කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය වීම විමර්ශනය කිරීමට ඉල්ලීම් කිරීම)

வாசகம் 18.- (பெண்களின் உரிமைகளின் மீறுகையை புலனாய்வு செய்வதற்கான விண்ணப்பம்)

CLAUSE 18.- *(Application to investigate infringement of women's rights)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"15 වන පිටුවේ, 13 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'හැකි මාසයක කාලසීමාව සම්පූර්ණ කිරීමේ දී සලකා බලනු නොලැබිය' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විඩුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Amendment put, and agreed to.

18 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

18ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.
Clause 18, as amended, ordered to stand part of the Bill.

19 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

19ආම් වාසකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.
Clause 19 ordered to stand part of the Bill.

20 වන වගන්තිය.- (විමර්ශනය අවසන් වීමෙන් පසු ගනු ලැබිය යුතු පියවර)

வாசகம் 20.- (புலனாய்வு முடிவுற்றதன் பின்னர் நடவடிக்கைகள் எடுக்கப்படுதல் வேண்டும்)

CLAUSE 20.- *(Steps to be taken after conclusion of investigation)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"16 වන පිටුවේ, 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අතර, පාර්ශ්වයන්ට 22 වන වගන්තිය යටතේ පත්කරන ලද සමථ මූල මණ්ඩලය ඉදිරියේ' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විඩුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Amendment put, and agreed to.

20 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

20ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.
Clause 20, as amended, ordered to stand part of the Bill.

21 වන වගන්තිය.- (සමථකරණය)
வாசகம் 21.- (மத்தியஸ்தம்)
CLAUSE 21.- *(Mediation)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "16 වන පිටුවේ, 19 වන පේළිය සහ 20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'කරනු ලබන අවස්ථාවක දී, 22 වන වගන්තිය යටතේ පත් කරන ලද සමථ මූල මණ්ඩලය විසින් පහත සඳහන් දෑ' "

(2) "16 වන පිටුවේ, 27 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ඇ) සමථ මූල මණ්ඩලය වෙත ආරවුල යොමු කරනු ලැබූ දිනයේ' "

(3) "17 වන පිටුවේ, 1 වන පේළියේ සිට 6 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

21 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
21ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 21, as amended, ordered to stand part of the Bill.

22 වන වගන්තිය.- (සමථකරණය අවසන් කිරීමෙන් පසු කාර්ය පටිපාටිය)
வாசகம் 22.- (மத்தியஸ்தம் முடிவுறுவதன் மீதான நடவடிக்கைமுறை)
CLAUSE 22.- *(Procedure upon conclusion of Mediation)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "17 වන පිටුවේ, 9 වන පේළිය සහ 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ලද බෙරුම් කිරීමේ කොන්දේසි සමථ මූල මණ්ඩලය විසින්, ගිවිසුමක' "

(2) "17 වන පිටුවේ, 13 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යුතු ය. සමථ මූල මණ්ඩල විසින් ගිවිසුමේ පිටපතක් කොමිෂන් සභාව' "

(3) "17 වන පිටුවේ, 23 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සමථ මූල මණ්ඩලය විසින් තත්ත්වය කොමිෂන් සභාව වෙත වාර්තා කළ' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

22 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
22ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 22, as amended, ordered to stand part of the Bill.

23 සිට 28 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
23ஆம் வாசகத்திலிருந்து 28ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 23 to 28 ordered to stand part of the Bill.

29 වන වගන්තිය.- (කාන්තා අයිතිවාසිකම් සඳහා පාර්ලිමේන්තු කොමසාරිස්වරයකු පත් කිරීම)
வாசகம் 29.- (பெண்களின் உரிமைகளுக்கான பாராளுமன்ற ஆணையாளர் ஒருவரை நியமித்தல்)
CLAUSE 29.- *(Appointment of an Ombuds for Women's Rights)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "23 වන පිටුවේ, 17 වන පේළිය සහ 18 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වීමකට හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකට සම්බන්ධ අගතියට පත් පාර්ශවයක් විසින් ඔහු වෙත යොමු කරනු ලබන පැමිණිල්ලක් හාර ගැනීමේ වගකීම දරනු ලැබිය යුතු කාන්තා' "

(2) "23 වන පිටුවේ, 20 වන පේළිය සහ 21 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'හදුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය' "

(3) "24 වන පිටුවේ, 16 වන පේළියේ සිට 18 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

29 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
29ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 29, as amended, ordered to stand part of the Bill.

30 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
30ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 30 ordered to stand part of the Bill.

31 වන වගන්තිය.- (කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය)
வாசகம் 31.- (ஆணைக்குழுவின் பணியாட்டொகுதியினர்)
CLAUSE 31.- *(Staff of the Commission)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

"25 වන පිටුවේ, 20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යම් සුබසාධක සහ ආරක්ෂක ක්‍රම ඇති කිරීම සහ නියාමනය' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම විධුක්කප්පට්ටු ඏට්රුක්කොළ්ළප්පට්ටදු.
Amendment put, and agreed to.

31 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

31ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 31, as amended, ordered to stand part of the Bill.

32 වන වගන්තිය.- (කාන්තාවන් සඳහා වූ ජාතික අරමුදල පිහිටුවීම)

வாசகம் 32.- (பெண்களுக்கான தேசிய நிதியத்தைத் தாபித்தல்)

CLAUSE 32.- *(Establishment of the National Fund for Women)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"26 වන පිටුවේ, 20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'32 (1) මේ පනතේ කාර්ය සඳහා (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන)' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම විධුක්කප්පට්ටු ඏට්රුක්කොළ්ළප්පට්ටදු.
Amendment put, and agreed to.

32 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

32ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 32, as amended, ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

33වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා.

33 වන වගන්තිය.- (කොමිෂන් සභාව විසින් මුදල් ආයෝජනය කළ හැකි බව)

வாசகம் 33.- (ஆணைக்குழு அதன் பணத்தை முதலீடு செய்யலாம்)

CLAUSE 33.- *(Commission may invest its money)*

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය වෙනුවෙන් මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"27 වන පිටුවේ, 15 සිට 17 දක්වා පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කොට පහත පරිදි ආදේශ කරන්න:

'කොමිෂන් සභාව විසින් අරමුදලේ පවත්නා ඊට වහාම අවශ්‍ය නොවන මුදල් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි කාන්තාවන් සවිබල ගැන්වීමට සහාය වන්නා වූ වැඩසටහන්වල ආයෝජනය කරනු ලැබිය හැකිය.' "

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

එම සංශෝධනයට එකඟද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, එම වගන්තියේ, "කොමිෂන් සභාව විසින් අරමුදලේ පවත්නා ඊට වහාම අවශ්‍ය නොවන මුදල් කොමිෂන් සභාව විසින්...,-

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි,-

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. එක වගන්තියක් එතැනට ඇතුළත් කරන්න කියලායි අපි ඉල්ලන්නේ.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා ඉල්ලන්නේ-

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔබතුමා ඉස්සෙල්ලා අහගෙන ඉන්නකෝ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ සංශෝධනයේ සඳහන්, "කොමිෂන් සභාව විසින් අරමුදලේ පවත්නා ඊට වහාම අවශ්‍ය නොවන මුදල් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන" යන්නට පසුව, "මුදල් අමාත්‍යවරයා විමසා" කියන කොටස ඇතුළත් කරන්න කියලායි අපි කියන්නේ.

එතකොට, ඔබතුමාගේ සංශෝධනයේ "පරිදි" කියන වචනයට ඉනික්බිතිව එම කොටස ඇතුළත් කළාම, "මුදල් අමාත්‍යවරයා විමසා කාන්තාවන් සවිබල ගැන්වීමට සහාය වන්නාවූ වැඩසටහන්වල ආයෝජනය කරනු ලැබිය හැකිය" යනුවෙන් තමයි තිබෙන්න ඕනෑ.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

මගේ යෝජනාවේ තිබෙන්නේ "... මුදල් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි" කියලායි. "මුදල් අමාත්‍යවරයා විමසා" කියන එක ඇතුළත් වුණත් ප්‍රශ්නයක් නැහැ. අපට අවශ්‍ය කරන්නේ කාන්තාවන් සවිබල ගැන්වීමට සහාය වන්නා වූ ව්‍යාපෘති සඳහා ආයෝජනය කරන්නයි. එහෙම නැත්නම්, බොහෝ තැන්වල සල්ලිවලට කළා වාගේ දෙයක් - stock market එකේ හරි, වෙනත් කොහේ හරි දාලා - මේ සල්ලිවලටත් කරන්න පුළුවන්. ඒක වළක්වා ගැනීම සඳහායි මේ සංශෝධනය ගෙනෙන්නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, දැන් තීරණය කරන්න තිබෙන්නේ මෙච්චරයි. ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා යෝජනාවක් ඉදිරිපත් කළා. ඒකට අපි විරුද්ධ නැහැ. නමුත් එම යෝජනාවේ, "පරිදි" කියන වචනයට පසු "මුදල් අමාත්‍යවරයා විමසා" යන්න ඇතුළත් විය යුතුයි.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ඒක හරි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මොකද, මුදල් අමාත්‍යවරයාගෙන් විමසන්න අවශ්‍යයි නේ. ඒකට එකඟද, ගරු මන්ත්‍රීතුමා?

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒ සංශෝධනයට එකඟද?

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, අපි ඒකට එකඟයි. Standing Order 64 යටතේ කරන්න පුළුවන් දෙයක්, ඒක.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ඒ අනුව, 33 වන වගන්තියට අදාළව ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා ගෙන ආ සංශෝධනයට, ගරු සභානායකතුමා විසින් කරන ලද එකතු කිරීමට සභාව එකඟද?

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

33 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
33ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 33, as amended, ordered to stand part of the Bill.

34 සහ 35 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
34ஆம், 35ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 34 and 35 ordered to stand part of the Bill.

36 වන වගන්තිය.- (මේ පනත යටතේ අමාත්‍යවරයා සතු විශේෂ බලතල)
வாசகம் 36.- (இச்சட்டத்தின்கீழ் அமைச்சரின் விசேட தத்துவம்)
CLAUSE 36.- *(Special Power of the Minister under this Act)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"30 වන පිටුවේ, 11 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(4) (3) වන උපවගන්තිය යටතේ සමථකරණය වෙත යොමු කරන ලද කරුණක් සඳහා, 21 වන වගන්තිය (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල විධිවිධාන අදාළ විය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

36 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
36ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 36, as amended, ordered to stand part of the Bill.

37 සිට 41 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
37ஆம் வாசகத்திலிருந்து 41ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 37 to 41 ordered to stand part of the Bill.

42 වන වගන්තිය.- (කොමිෂන් සභාවේ රීති)
வாசகம் 42.- (ஆணைக்குழுவின் விதிகள்)
CLAUSE 42.- *(Rules of the Commission)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"32 වන පිටුවේ, 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ එහි නිශ්චිතව දක්වා ඇති වෙනත් දිනයක දී බලාත්මක විය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

42 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
42ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 42, as amended, ordered to stand part of the Bill.

43 සහ 44 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
43ஆம், 44ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 43 and 44 ordered to stand part of the Bill.

අලුත් වගන්ති
புதிய வாசகங்கள்
NEW CLAUSES

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් අලුත් වගන්ති ඉදිරිපත් කරනවා:

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(1) "3 වන පිටුවේ, 5 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුරක්ෂිත කිරීම	3. සෑම කාන්තාවක් ම කාන්තා අයිතිවාසිකම් සඳහා හිමිකම් ලැබිය යුතු අතර, කිසිදු කාන්තාවක් එම අයිතිවාසිකම් ප්‍රතික්ෂේප නොකළ යුතු ය.' "

(2) "17 වන පිටුවේ, 6 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'සමඨ මූල මණ්ඩල පත් කිරීම	22. (1) 20 වන, 21 වන සහ 36 වන වගන්තිවල කාර්ය සඳහා නීතිය, පරිපාලනය, අධ්‍යාපනය හෝ කාන්තාවන් සවිබල ගැන්වීම යන විෂයය ක්ෂේත්‍ර වල ප්‍රගුණ කරන ලද දැනුම, පළපුරුද්ද සහ විශිෂ්ටත්වය සහිත තැනැත්තන් අතරින් පස් දෙනෙකුගෙන් සමන්විත සමඨ මූල මණ්ඩලයක් කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබිය යුතු ය. (2) සමඨ මූල මණ්ඩලය සඳහා වන චර්යා ධර්ම පද්ධතිය, ධුර කාලය සහ සමඨ මූල මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික නියම කරනු ලබන පරිදි විය යුතු ය. (3) කොමිෂන් සභාව විසින් සමඨකරණ නීති කෘත්‍ය පැවැත්වීමට අදාළ වන පටිපාටීන් දක්වමින් රීති සාදනු ලැබිය හැකි ය. ' "

ඉදිරිපත් කරන ලදින්, පළමුවන වර කියවන ලදී.
කොණ්ඩුවරප්පට්ටු මුතන්මුරෙ මතිප්පිටප්පට්ටු.
Brought up, and read the First time.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, "අලුත් වගන්ති දැන් දෙවන වර කියවිය යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටු.
Question put, and agreed to.

අලුත් වගන්ති පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අලුත් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පුතිය වාසකඞ්කළ් සට්ටමූලත්තිල් සේර්ක්කප්පට වේණ්ටුමෙන්ර විනා විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටු.

පුතිය වාසකඞ්කළ් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටු මෙනක් කට්ටළෛයිටප්පට්ටු.

Question, that the New Clauses be added to the Bill, put and agreed to.

New Clauses ordered to stand part of the Bill.

පූර්වීකාව පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

මුන්නුරෛ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටු.

Preamble, ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

සට්ටමාකු වාසකම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටු.

Enacting Clause ordered to stand part of the Bill.

දීර්ඝ නාමය
விரிவுப் பெயர்
LONG TITLE

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"දීර්ඝ නාමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; කාන්තාවන්ගේ අභිවෘද්ධිය සහ සවිබල ගැන්වීම පිළිබඳ ශ්‍රී ලංකා ජාතික පුතිපත්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිණිස ද; කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද; කාන්තා අයිතිවාසිකම් සඳහා වන පාර්ලිමේන්තු කොමසාරිස්වරයකු පත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යාන්ත්‍රණ පිහිටුවීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටු.
Amendment put, and agreed to.

දීර්ඝ නාමය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
විරිවුප් පෙයර් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටු.
Long Title, as amended, ordered to stand part of the Bill.

නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
තලෛප්පු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටු.
Title ordered to stand part of the Bill.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.
සට්ටමූලම් තිරුත්තඞ්කළුටන් අරික්කෛ සෙය්යප්පට්ටු.
Bill reported with Amendments.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

විනා විටුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටු.

අතන්පඩි, සට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්‍රාම්මුරෛ මතිප්පිටප්පට්ටු නිරෛවේර්ත්‍රප්පට්ටු.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත
யுனெஸ்கோவிற்கான இலங்கை தேசிய ஆணைக்குழு சட்டமூலம்
SRI LANKA NATIONAL COMMISSION FOR UNESCO BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]
தீர்மானிக்கப்பட்டது:
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Susil Premajayantha]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[THE HON. DEPUTY SPEAKER in the Chair.]

***1 සිට 4** තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
1ஆம் வாசகத்திலிருந்து 4ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 1 to 4 ordered to stand part of the Bill.

5 වන වගන්තිය.- (කොමිෂන් සභාවේ සංයුතිය)
வாசகம் 5.- (ஆணைக்குழுவை அமைத்துருவாக்குதல்)
CLAUSE 5.- (*Constitution of the Commission*)

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"9 වන පිටුවේ, 12 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(xiv) වන සංරක්ෂණ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරනු ලබන ඔහුගේ නාමිකයකු;

(xv) වනජීවී සංරක්ෂණ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරනු ලබන ඔහුගේ නාමිකයකු;

(xvi) සංස්කෘතික විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධරයකු;

(xvii) (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 58 වන වගන්තිය යටතේ පත් කරනු ලැබ ඇති වන සංරක්ෂක ජනරාල්වරයා;

(xviii) (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 68 වන වගන්තිය යටතේ කරනු ලැබ ඇති වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා;' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

***5** වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 5, as amended, ordered to stand part of the Bill.

***6** සිට **10** තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
6ஆம் வாசகத்திலிருந்து 10ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 6 to 10 ordered to stand part of the Bill.

11 වන වගන්තිය.- (ගණපූරණය සහ කොමිෂන් සභාවේ රැස්වීම්)
வாசகம் 11.- (ஆணைக்குழுவின் கூட்டநடப்பெண்ணும் கூட்டங்களும்)
CLAUSE 11.- (*Quorum and the Meetings of the Commission*)

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"13 වන පිටුවේ, 3 වන සහ 4 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' 11.(1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා වන ගණපූරණය එහි මුළු සාමාජිකත්වයෙන් තුනෙන් එකකට අඩු නොවිය යුතු අතර, සභාපතිවරයා කොමිෂන් සභාවේ' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

***11** වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 11, as amended, ordered to stand part of the Bill.

***12** සිට **37** තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
12ஆம் வாசகத்திலிருந்து 37ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 12 to 37 ordered to stand part of the Bill.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

පූර්වීකාව පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

முன்னுரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Preamble ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා හා මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිකාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ජගත් ප්‍රියංකර මන්ත්‍රීතුමා.

e-Motoring ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම
e-Motoring கருத்திட்டத்தை விரைவாகச் செயற்படுத்தல்
EXPEDITIOUS IMPLEMENTATION OF E-MOTORING PROJECT

[අ.භා. 6.13]

ගරු ජගත් ප්‍රියංකර මහතා
(மாண்புமிகு ஜகத் பிரியங்கர)
(The Hon. Jagath Priyankara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අපේ රටේ වංචාව, දූෂණය පිළිබඳව සාකච්ඡා කිරීමේදී රාජ්‍ය දෙපාර්තමේන්තු අතර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවටද සෑම වසරකම ඉහළ ස්ථානයක් හිමි වේ. එයට ඇති එක් කදිම උදාහරණයක් වන්නේ වංචාව හා දූෂණය දෙපාර්තමේන්තුව තුළ අවම කිරීම සඳහා හඳුන්වා දුන් ඊ-මෝටරින් ව්‍යාපෘතිය 2018 වසරේදී හඳුන්වා දුන්නද, එම ව්‍යාපෘතිය මෙතෙක් ආරම්භ වී නොමැත. මෙම ව්‍යාපෘතිය ප්‍රමාද වීම නිසා මේ වන විට බිලියන 12ක් පමණ නැති වන බවට පුරෝකථන ඉදිරිපත් වී තිබේ. එම නිසා ඊ-මෝටරින් ව්‍යාපෘතිය සම්බන්ධව මතුව තිබෙන ගැටලු කඩිනමින් විමසා එම ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කිරීමට පියවර ගත යුතු බවට මෙම ගරු සභාව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, අපේ රටේ වාහන විශාල ප්‍රමාණයක් තිබෙනවා. 2023දී ලංකාවේ වාහන 8,380,103ක් නිබුණු බව වාර්තා වෙනවා. ඉතින්, මේ වාගේ විශාල වාහන ප්‍රමාණයක් රටේ තිබෙනකොට තමන්ගේ සේවා කටයුතු සාර්ථකව පවත්වා ගෙන යෑම සඳහාත්, මිනිස්සුන්ට මේ කටයුතු කාර්යක්ෂමව ඉෂ්ට කර දීම සඳහාත් මේ e-Motoring ක්‍රමය, e-licence ක්‍රමය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ඉතාම ඉහළින් ඉවහල් වෙනවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ගත්තොත්, ඉතිහාසයේ නිබුණු තත්ත්වය අද නැහැ. එය සාධනීය තැනකට අද ගමන් කරමින් ඉන්නවා. මේ e-Motoring වැඩසටහන ක්‍රියාත්මක වුණොත්, ඒ කටයුත්ත තවත් කාර්යක්ෂමව ඉදිරියට පවත්වා ගෙන යන්න පුළුවන් කියලා මම හිතනවා.

වාහන ලියාපදිංචිය, පැවරීම ආදී සියලු කටයුතුවලින් කරන්නේ, එක පැත්තකින් ඒ කටයුතු විධිමත් කරන එක. අනෙක් පැත්තෙන් රජයට බදු මුදලක් අය කරන එක. ඒ කටයුතු විධිමත්ව කරගෙන යෑමේ හැකියාව මේ තුළින් ලැබෙනවා කියලා අපි විශ්වාස කරනවා. විශේෂයෙන්ම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට විද්‍යුත් ලිපිගොනු පද්ධතියක් සකස් කර ගන්න, වර්තමාන ලියාපදිංචි ක්‍රියාවලිය වඩාත් වැඩි දියුණු කරන්න, සන්නිවේදන ජාලය වැඩිදියුණු කරන්න, මිනිස්සුන්ට අවශ්‍ය පහසුකම් කාර්යක්ෂමව සපයන්න තමයි මේ වැඩසටහන හඳුන්වා දුන්නේ. ඒ නිසා මේ වැඩසටහන නැවත ආරම්භ කිරීම සුදුසුයි කියලා අපි යෝජනා කරනවා.

ඒ වාගේම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ගැන අවධානය යොමු කිරීමේදී අපි ඉස්සර අත්වින්ද තත්ත්වයට වඩා වර්තමාන සේවා තත්ත්වය ගැන අපට සතුටට පත් වෙන්න පුළුවන්. නමුත්, ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී eRL2.0 ක්‍රමය අනෙක් පළාත්වල ක්‍රියාත්මක වුණත්, බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ සඳහා online register වෙන්න හදනකොට අපට දැනුම් දෙනවා, "2024.06.03 සිට බස්නාහිර පළාත හැර දිවයිනේ සෙසු පළාත්වල ලියාපදිංචි වාහන සඳහා වාහන ආදායම් බලපත්‍ර බස්නාහිර පළාතෙන් හැර ඕනෑම පළාතකින් ලබාගත හැකිය" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බස්නාහිර පළාත කියන්නේ සුවිශේෂ පළාතක්. වාහන ලියාපදිංචිය ගත්තොත්, මම ජීවත් වෙන වයඹ පළාත වෙන්න පුළුවන්, වෙනත් පළාතක් වෙන්න පුළුවන්, රටේ තිබෙන වාහනවලින් වැඩි ප්‍රමාණයක් ලියාපදිංචි වෙලා තිබෙන්නේ, බස්නාහිර පළාත තුළ. බස්නාහිර පළාතේ වාහන බස්නාහිර පළාත තුළම ලියාපදිංචි කරන්න සිදු වෙලා තිබෙනවා. අපට දැන් පුළුවන් උතුරු මැද පළාතේ වාහන වයඹ පළාතේදී ලියාපදිංචි කරගන්න. ඒක ඉතාම හොඳ තත්ත්වයක්. හැබැයි අපට පුළුවන්කම ලැබුණොත් බස්නාහිර පළාතේ තිබෙන වාහන වෙනත් පළාතකින් ලියාපදිංචි කරගන්න, ඒකත් හොඳයි. මම ඉන්නේ දංකොටුවේ. මගේ මෝටර්සයිකලය ලියාපදිංචි වෙලා තිබෙන්නේ දිවුලපිටියේ නම්, ඒකේ ලියාපදිංචිය අපට දංකොටුවෙන් කරගන්න බැහැ, බස්නාහිර පළාතටම එන්න ඕනෑ. එතකොට අපට තිබෙන ගැටලුව මෙයයි. අනෙක් සියලු පළාත්වල මේ *e*RL2.0 ක්‍රමය ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙනකොට, රටේ ප්‍රධානතම පළාත වෙච්ච, රටේ අග නගරය පිහිටා තිබෙන බස්නාහිර පළාත තුළ මේ ක්‍රමය ක්‍රියාත්මක කරන්න අපට බැරි වෙලා තිබෙන්නේ ඇයි? ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. රටේ ලක්ෂ ගණනක් වාහන තිබෙනවා. ඒකෙන් තුනෙන් එකක් විතර බස්නාහිර පළාතේ තිබෙන්නේ. ඒ නිසා ජනතාවට ලොකු සහනයක් වේවි, බස්නාහිර පළාත් සහාව මේ eRL2.0 ක්‍රමයට ගියොත්.

ඒ වාගේම, e-licence වැඩසටහනේ එක කාරණයක් ගැනත් ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ අවධානය නැවත වතාවක් මම යොමු කරවනවා. එකක් තමයි, අර eRL2.0 ක්‍රමය බස්නාහිර පළාතේ නැති නිසාත්, eRL1.0 ක්‍රමය බස්නාහිර පළාතේ ක්‍රියාත්මක වෙන නිසාත් එතැනදී online apply කළාම බස්නාහිර පළාතේ අයගේ error එකක් පෙන්වන්නේ නැහැ, online apply කරන්න ඉඩකඩ දෙනවා. හැබැයි තොරතුරු වසර 2කට වඩා පැරණි නම්, online apply කළාම බලපත්‍ර ගන්න ලැබෙන්නේ නැහැ, ආපහු manual ක්‍රමයෙන් තැපෑලෙන් ගන්න ඕනෑ. ඒ ගැන System එකෙන් මොනවත් කියන්නේත් නැහැ. හැබැයි, තැපැල් ගාස්තුව විධියට මිනිස්සුන්ගෙන් රුපියල් 200ක් අය කරනවා. තවත් පැත්තකින් පහසුකම් ගාස්තුව වාගේ මුදලකුත් අය කරනවා. ඒ දෙකම පළාත් සභා අරමුදලට යනවා. ඒක ආපහු ඒ මනුස්සයාට ලැබෙන්නෙත් නැහැ. ඒ පිළිබඳවත් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා. අනෙකුත් පළාත්වල, විශේෂයෙන්ම eRL2.0 ක්‍රමය ක්‍රියාත්මක වෙන තැන්වල සාධනීය වශයෙන් මේ කටයුතු ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා e-motoring ක්‍රමයේ තිබෙන අඩුපාඩු හා තිබෙන ප්‍රායෝගික බාධා පිළිබඳ සමාලෝචනයක් කර අපේ රටේ ජනතාවට හඳුන්වා දුන්නොත්, ඒකෙන් ලොකු සේවයක් ගන්න පුළුවන් වෙයි. ඒ වාගේම eRL2.0 ක්‍රමය බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කිරීමෙන් ජනතාවටත් විශාල පහසුවක් ඇති වේවි. මොකද, මේ තුළින් අපි ලබා ගන්නේ බදු. බදු ආදායම රටට ඕනෑ. බදු ආදායම රටට ඕනෑ වෙනකොට, බදු ගෙවන මිනිස්සුන්ට අපි පහසු ක්‍රම හදලා දෙන්නත් ඕනෑ.

බස්නාහිර පළාතේ දී වෙන්නේ, ප්‍රමාද වෙච්ච එකක් apply කළොත් තැපෑලෙන් එන්නේ නැති නිසා online එනකල් බලාගෙන ඉන්න වෙන එක. ඒක නිසා නැවත කාර්යාලයට ගිහිල්ලා රස්තියාදු වෙන්නත් ඕනෑ. ඒක ඒ කාර්යාලයට ගිහිල්ලා ගන්නත් ඕනෑ. තමන් ගෙවපු මුදල ලැබෙන්නේත් නැහැ. ඒක නිසා පරිපාලන වශයෙන් යම් තාක්ෂණික ප්‍රශ්න තිබෙනවා නම්, සියලුදෙනා දායක වෙලා ඒවා නිරාකරණය කරගෙන මේ කාරණා දෙකට අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා.

[අ.භා. 6.19]

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී ගරු ජගත් ප්‍රියංකර මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

අපේ ගරු ජගත් ප්‍රියංකර මන්ත්‍රීතුමා අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ ඉතා වැදගත් යෝජනාවක්. e-Motoring ව්‍යාපෘතිය පිළිබඳව එතුමා මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න උත්සාහ කරන්නේ මොකක්ද? ඕනෑම කෙනෙකුගෙන් ඇහුවොත් කියන කථාවක් තමයි, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව කියන්නේ දූෂණය, අක්‍රමිකතාව ඉහවහා ගිය ආයතනයක් කියන එක. ගරු අමාත්‍යතුමනි, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඉදිරිපසින් වෙන ගමනක් ගියත්, ලයිසන් එකක් අලුත් කර ගන්න ඕනෑද, වාහන පිළිබඳ වෙනත් කාර්යයක් කර ගන්න ඕනෑද කියා අසමින් මහජනතාවගෙන් විවෘතව, ප්‍රසිද්ධියේ අල්ලස් ඉල්ලන තැනක් බවට කාලාන්තරයක් තිස්සේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පත් වෙලා තිබුණා. ඒ පිළිබඳව මැසිවිලි ගොඩනැගුණාට පස්සේ, එක්තරා අවස්ථාවක දී හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට පෞද්ගලිකව පිවිසිලා ඒ වංචා, දූෂණ වැළැක්වීම සඳහා යම් කිසි උත්සාහයක් ගන්න හැදුවා මට මතකයි. නමුත් අපි දන්නා විධියට තවමත් පෙර පරිදිම ඒවා සිදු වෙනවා.

බොහෝ දියුණු රටවල විද්‍යුත්, ඩිජිටල් ක්‍රමයට තමයි, double lines කපනවාද, වාහන ගමන් කරන්නේ නීතියට අනුකූලව නොවෙයිද, මාර්ගවල ප්‍රවාහන කටයුතු ක්‍රමානුකූලව කෙරෙනවාද කියන කාරණා සොයා බලන්නේ. නමුත් ඇත්තටම අපේ රටේ ට්‍රැෆික් පොලිස් නිලධාරීන් හුහක් වෙලාවට ගස් යට හැංගිලා ඉඳලා තමයි වේග සීමා බලන්නේ, double lines කපනවාද කියලා බලන්නේ. මේ සිද්ධිය වෙන්නේ පොලිස් නිලධාරියා සහ ඒ රථය පදවපු පුද්ගලයා සම්මුඛව. ඒ දෙදෙනා අතර සිදු වෙන ගනුදෙනුව අවසානයේ කෙළවර වෙන්නේ අල්ලසකින්. බොහෝ විට එය සිදු වෙන්නේ කොහොමද කියලා අපි දන්නවා. මම හැම පොලිස් නිලධාරියෙකුටම ඒ චෝදනාව එල්ල කරනවා නොවෙයි. ලෝකයේ දියුණු රටවල double lines කපන වෙලාවේම වාහනයේ අංකය සමඟ දඩ මුදලත් සටහන් වෙනවා. රියදුරන්ගේ විනයගරුකභාවය නිසා නොවෙයි, ඩිජිටල් ක්‍රමය නිසා, එයට අනුගත විය යුතු නිසා ලෝකයේ දියුණු රටවල රියදුරන් ක්‍රමානුකූලව වාහන පැදවීම කරනවා. මේ තිබෙන ආර්ථික තත්ත්වයත් එක්ක ලංකාවේ ඒ දේවල් කරන්න අසීරු බව අපි පිළිගන්නවා. නමුත් අවම වශයෙන් අපට කරන්න පුළුවන් දේවල් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

2021.01.01 වැනි දින, රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීම ශ්‍රී ලංකා යුද හමුදාවට භාර දුන්නා, පවතින ක්‍රමය අනිශය දූෂිතයි කියලා. විශේෂයෙන්ම චෝදනාවක් එල්ල වුණා, ලොකු විවේචනයක් එල්ල වුණා, මෙට්‍රොපොලිටන් ආයතනය ඒ සම්පූර්ණ ලාභය පැහැර ගන්නවා කියලා. ඒක නිසා තමයි ඒ බලපත්‍ර මුද්‍රණය කිරීම ශ්‍රී ලංකා යුද හමුදාවට භාර දුන්නේ. මට මතකයි, එම වර්ෂයේ දී ශ්‍රී ලංකා යුද හමුදාව රුපියල් මිලියන 810ක ලාභයක් ආණ්ඩුවට උපයා දුන්න බව. හැබැයි, පසුව මොකක්ද වුණේ? 2023.09.13 වැනි දින රියදුරු බලපත්‍ර මුද්‍රණ ව්‍යාපෘතිය යුද හමුදාවෙන් අරගෙන නැවත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට පවරනවා. එතැනදී ඒ ගොල්ලන් ගණන් හදලා පෙන්වනවා, යුද හමුදාව මැදිහත් වීම නිසා බලපත්‍රයක් මුද්‍රණය කරන්න රුපියල් 4,710ක් වැය වෙනවා, ඒක ඉතා විශාල මුදලක්, ඒ නිසා ඒක යළි ලබා දිය

[ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා]

යුතුයි කියලා. ඒ අනුව අර පරණ මෙට්‍රොපොලිටන් ආයතනයටම ඒ බලය ලැබෙන විධියට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව රියදුරු බලපත්‍ර ලබා දීමේ කටයුත්ත භාර ගත්තා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම කියනවා නම් 2021දී ඒ සඳහා යුද හමුදාවට වැය වුණේ රුපියල් 722යි. 2023දී වැය වුණේ රුපියල් 638යි. ඒක දෙපාර්තමේන්තුවට පැහැර ගන්න ඕනෑ නිසා, පෞද්ගලික ආයතනවලින් ඒ නිලධාරින්ට අල්ලස් ගන්න ඕනෑ නිසා බොරු අංක ගණිතයක් පෙන්වලා, යුද හමුදාව ඉවත් කරලා ඒ කාර්යය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පවරා ගත්තා.

මේ වෙනකොට ඒ කටයුතුවල විශාල backlog එකක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රියදුරු බලපත්‍ර ලබා දීමේ දී ප්‍රමාදයක් ඇතිවෙන කොට රටේ මහ ජනතාවට විශාල පීඩනයක් ඒ නිසා ඇති වෙනවා. ඒක පදනම් කරගෙන සමහර නිලධාරීන් අහිංසක, දුප්පත් මිනිස්සුන්ගෙන් අල්ලස් ගන්නවා. රියදුරු බලපත්‍ර, වාහන බලපත්‍ර හා සම්බන්ධිත දේවල් ලබා දීම හරහා අල්ලස් ගනුදෙනු බරපතළ ලෙස සිද්ධ වෙනවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ නිසා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සිද්ධ වෙන බරපතළ අල්ලස් ගනුදෙනු නතර කරන්න ඔබතුමා වහාම පියවරක් ගන්න. කොයි ආයතනයටද ප්‍රබල විධියට අල්ලස් චෝදනා තිබෙන්නේ කියලා ලංකාවේ පාසල් ළමයෙකුගෙන් ඇහුවොත්, පොලීසිය ගැන නොවෙයි කියන්නේ. ඒ චෝදනාව එල්ල වෙන්නේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට. ඒක සමස්ත නිලධාරින්ටම හොඳ නැහැ. ඒක මේ රාජ්‍ය ව්‍යුහයට හොඳ නැහැ. මේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව කළා වූ කර්තව්‍යය ඇත්තටම දැන් කරන්නේ මෙට්‍රොපොලිටන් එක නම්, මෙට්‍රොපොලිටන් එක හරහා සිද්ධ වෙන්නේ අල්ලස් ගනුදෙනුවක් නම්, ආර්ථික ව්‍යසනයකින් පීඩා විඳින රටක මහ ජනතාවගේ ප්‍රවාහන අයිතිය වෙනුවෙන් ඔබතුමා වැදගත් කටයුත්තක් ක්‍රියාත්මක කරයි කියලා අපි විශ්වාස කරනවා. ඔබතුමා පාර්ලිමේන්තුවේ කමිටු ගණනාවකම වගකිවයුතු තනතුරු දැරුවා. ඒ වාගේම අමාත්‍යාංශවල තනතුරු දැරුවා. ඒ නිසා කරුණාකරලා මේ රටේ ජාතිය වෙනුවෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිරිසිදු කර දෙන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ කාලය ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

[අ.භා. 6.26]

ගරු ලසන්ත අලගියවන්න මහතා (ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு லசந்த அலகியவன்ன - போக்குவரத்து இராஜாங்க அமைச்சர்)

(The Hon. Lasantha Alagiyawanna - State Minister of Transport)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව ගෙනා ජගත් ප්‍රියංකර මන්ත්‍රීතුමාටත්, වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමාටත් මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වන අතර, ඔබතුමන්ලා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිළිබඳව කියපු සියලු කරුණු බොහොම පැහැදිලිව මමත් අනුමත කරනවා. එම ආයතනය භාරව කටයුතු කරන රාජ්‍ය අමාත්‍යවරයා විධියට මම, එම ප්‍රශ්න සඳහා අපි කොපමණ ආකාරයෙන් කටයුතු කර තිබෙනවාද කියා පැහැදිලි කරන්නම්.

වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ හිටපු ජනාධිපතිතුමා වේරහැරට ගිහිල්ලා ඒ කටයුතුවලට පෞද්ගලිකව මැදිහත් වුණත් ප්‍රතිඵලයක් ලබා ගැනීමට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ සඳහා ස්ථිරසාර විසඳුම් ලබා ගැනීමට නම්, නවීන තාක්ෂණය භාවිත කරලා නිලධාරින්ට වාගේම යම් යම් අයට ඒ කටයුතුවලට සම්බන්ධ වෙන්න තිබෙන අවස්ථාව තුරන් කළ යුතුයි. නවීන තාක්ෂණය තුළින් පමණයි ඒ සඳහා ස්ථිරසාර විසඳුම් ලබා ගැනීමට පුළුවන්කම ලැබෙන්නේ.

අපේ රටේ තොරතුරු තාක්ෂණය පිළිබඳව වගකිව යුතු ආයතනයක් තමයි ICTA එක. මම පෞද්ගලිකව දකින දෙයක් තිබෙනවා. අපේ රටේ තොරතුරු තාක්ෂණය රාජ්‍ය ආයතනවල ක්‍රියාත්මක කිරීමට බාධාවක් වෙලා තිබුණු එකම ආයතනයත් ICTA එක තමයි. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි සියලු වාහනවල දුම් සහතික ලබා දෙන්නේ පෞද්ගලික ආයතන. ඒ දුම් සහතිකවල තොරතුරු ICTA එකේ තමයි තිබෙන්නේ. පළාත් 9 තුළ තිබෙන සියලු වාහනවල තොරතුරු -දත්ත- සියල්ලක්ම තිබෙන්නේත් ඒ අයතනයේ. ඒ අය ඒ දත්ත තබාගෙන ඉන්නවා. නමුත් අපි පසුගිය කාල සීමාව තුළ වායු විමෝචන අංශයේ සියලු දත්ත ලබා ගත්තා. එයින් නිසි ප්‍රයෝජනයක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු අපි දැන් කරගෙන යනවා.

ඒ වාගේම මෝටර් වාහන සම්බන්ධ දත්ත පළාත් සභා 9 තුළම තිබෙනවා. නමුත් මම හිතන විධියට නවීන තාක්ෂණය භාවිත කරනවා නම්, අද වාහන කීයක් ලියාපදිංචි කළ යුතුව තිබුණා ද, කීයක් ලියාපදිංචි කරලා නැද්ද කියලා අපට බලාගන්න පුළුවන්කමක් තිබෙන්න ඕනෑ.

නමුත්, එහෙම ක්‍රමයක් මේ දත්ත පද්ධති තුළ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, එම නිසා තමයි ඔබතුමා කිව්වා වාගේ ඒ විධියට ඒ කටයුතු සිද්ධ වෙලා තිබෙන්නේ. අපි මේ සියලු කරුණු ගැන අවධානය යොමු කරලා කටයුතු කරනවා. අපි දන්නවා, වාහනයක දුම් සහතිකය ගන්න යම් ආයතනයකට යන්න ඕනෑ බව. දුම් සහතික දෙන ආයතන සියල්ලක්ම සෙනසුරාදා වරුවක් සහ ඉරිදා දින සම්පූර්ණයෙන්ම වහලා. මම ඇහුවා, රාජ්‍ය සේවකයන්ට නිවාඩු දවසේ ඉරිදා දවසම මේ ආයතන වහලා තිබෙන්නේ ඇයි කියලා. ඒකට හේතුව විධියට ඔවුන් කිව්වා, දුම් සහතිකය අරගෙන, රක්ෂණ සහතිකයත් ගන්න ඕනෑ, ආදායම් බලපත්‍රය ගන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත් යන්න ඕනෑ කියලා. ඒ අනුව තැන් තුනකට යන්න ඕනෑ. අපි දැන් බොහොම පැහැදිලිව ඒ සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව දුම් සහතිකය ගන්න වෙලාවේදීම ඉතුරු සහතික දෙකත් ගන්න පුළුවන්. ඉදිරි මාස කිහිපය තුළදී මේ සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න තමයි ගරු අමාත්‍යතුමාත්, අපේ අමාත්‍යාංශයත් දැන් කටයුතු කර තිබෙන්නේ. මේ කටයුතුවලදී නවීන තාක්ෂණය අනිවාර්යයෙන්ම භාවිත කළ යුතුව තිබෙනවා.

ඒ වාගේම වාහන බලපත්‍ර සම්බන්ධව ගත්තොත්, ඒ සම්බන්ධව සිදුවන ගනුදෙනු ගැන විතරක් නොවෙයි, වාහන 1,000ක විතර තොරතුරුත් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ලැබිලා තිබෙනවා. ඒ කියන්නේ තොරතුරු නැතිව වාහන 1,000ක් විතර අපේ රටට ඇතුළු වෙලා තිබෙනවා. ඒ දවස්වල අපේ රටට විශේෂ කාර්ය වාහනයක් ආනයනය කළොත් රුපියල් ලක්ෂ 10ක් බදු ගෙවන්න ඕනෑ. ඒ කියන්නේ deep freezer එකක් තිබෙන මාළු ප්‍රවාහනය කළ හැකි වාහන වාගේ ඒවා. ඒවා විශේෂිත වූ කාර්ය සඳහා වන වාහන. නමුත්, ද්විත්ව කාර්ය වාහනයක් ගෙනාවොත් රුපියල් ලක්ෂ 45ක බද්දක් අයකර ගන්නවා. දැන් මොකක්ද කළේ? වැන් වාගේ ඒවා අරගෙන ඒවා ඇතුළේ පොඩි fridge එකක් තියලා විශේෂිත වූ කාර්ය වාහන විධියට Sri Lanka

Customs එකෙන් එළියට ගන්නවා. ඊට පස්සේ අර fridge එක එහෙම්මම විසි කරලා දාලා වාහනය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනවා, ද්විත්ව කාර්ය වාහනයක් විධියට. එතකොට රේගුව රුපියල් ලක්ෂ 35 බැගින් වාහන 1,000ක බදු අහිමි කරලා තිබෙනවා. විගණකාධිපති බොහොම පැහැදිලිව මේ කරුණු ඉදිරිපත් කළා. එම නිසා තමයි e-Motoring ව්‍යාපෘතිය ආරම්භ කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, e-Motoring ව්‍යාපෘතිය ආරම්භ කරලා 2018දී ගිවිසුම් අත්සන් කළා. ගිවිසුම් අත්සන් කළත්, ඒ සඳහා පහසුකම් ලබා දුන්නේ නැහැ. අපේ රටේ ප්‍රධාන රාජ්‍ය ආයතන මේ තොරතුරු තාක්ෂණය හඳුන්වා දීමට එච්චර උනන්දුවක් දක්වන්නේ නැහැ. ඒකට හේතුව කියන්න අවශ්‍යතාවක් නැහැ. ඒ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙන්න පුළුවන්, රේගුව වෙන්න පුළුවන්, අනෙකුත් ආයතන වෙන්න පුළුවන්. අපි උත්සාහ කරන්නේ ආදායම් වැඩි කර ගැනීමට සහ වංචා, දූෂණ අවම කර ගැනීමට. ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමාත් පාර්ලිමේන්තුවේ කමිටු ගණනාවකට දායකත්වය ලබා දෙනවා. රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහාත්, වංචා, දූෂණ අවම කර ගැනීම සඳහාත් අනිවාර්යයෙන්ම තාක්ෂණය භාවිත කළ යුතුව තිබෙනවා. නමුත් 2018 වසරේ ඉඳන්ම මේ කටයුත්ත ආරම්භ කරන්න බැරි වුණා. ඊට පස්සේ අපි ඇවිල්ලා තමයි නැවත වතාවක් මේ කටයුත්ත ආරම්භ කරන්න කටයුතු කළේ. ඒකටත් නඩුවක් තිබුණා. ශ්‍රේෂ්ඨාධිකරණය ඒ නඩුව නිශ්ප්‍රභ කළා. ඒ ආයතනයේත් යම් යම් පරිපාලන ප්‍රශ්න තිබිලා දැන් ඒවා විසඳාගෙන ඉදිරි මාස තුන ඇතුළත මේ e-Motoring ව්‍යාපෘතිය ආරම්භ කිරීම තමයි දැනට ඉලක්ක කරගෙන තිබෙන්නේ. මේ e-Motoring ව්‍යාපෘතිය ආරම්භ කළාට පස්සේ මේ දත්ත පද්ධතියට සියලු වාහන ආනයනකරුවෝ ඇතුළත් වෙන්න ඕනෑ; සම්බන්ධ වෙන්න ඕනෑ. ඒ වාගේම මේකට බැංකුත් සම්බන්ධ වෙන්න ඕනෑ, රක්ෂණ සමාගම් සම්බන්ධ වෙන්න ඕනෑ. ඒ වාගේම ඒකට අනුබද්ධිත අනෙකුත් ආයතන සියල්ලත් සම්බන්ධ වෙන්න ඕනෑ.

මම වාහනයක් ගන්නවා නම්, මුලින්ම මේ දත්ත පද්ධතියට ඇතුළත් වෙලා වාහනය ඇණවුම් කිරීමේ කාර්යය අනිවාර්යයෙන්ම සිද්ධ කරන්න ඕනෑ. ඊට පස්සේ මේ වාහනය ආනයනය කරනකොට ඒ දත්ත පද්ධතියම තමයි රේගුවෙන් පාවිච්චි කරන්නේ. ඒ දත්ත පද්ධතියේම තිබෙන තොරතුරු තමයි වාහනය ලියාපදිංචි කිරීමේදීත් පාවිච්චි කරන්නේ. එතකොට විශේෂිත වාහනයක් ගෙනැල්ලා fridge එක ගලවලා අයින් කරලා ද්විත්ව කාර්ය වාහනයක් විධියට ලියාපදිංචි කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. එවැනි වැළැක්වීම් තමයි e-Motoring ව්‍යාපෘතිය හරහා විශේෂයෙන්ම සිද්ධ වෙන්නේ. මේ ක්‍රියාවලිය සිද්ධ කළායින් පස්සේ පුද්ගලයන් මැදිහත් වෙලා එන වාහන මොනවාද කියලා බලන්න මොනම ආකාරයකවත් අවශ්‍යතාවක් නැහැ. ඒ තුළින් කාර්යක්ෂම සේවාවක් ඇති කරගන්න පුළුවන්කමක් ලැබෙනවා වාගේම, මේ සිදුවන අක්‍රමිකතා අවම කරගන්නත් පුළුවන්කම ලැබෙනවා.

නැවතත් මම ජගත් ප්‍රියංකර මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ කටයුත්තේ වැදගත්කමට අවධානය යොමු කරලා, මෙවැනි සභාව කල්තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව.

රියදුරු බලපත්‍ර ලබා දීම පිළිබඳවත් අපේ වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා සඳහන් කළා. ඒ කියපු කරුණු ඇත්ත. පසුගිය කාලයේ මේ කටයුත්ත යුද හමුදාවට භාර දුන්නා. ඒක ඇත්ත. යුද හමුදාව ඒ කටයුත්ත සාර්ථකව ඉටු කළා. හමුදාපතිතුමාගේ පැත්තෙනුත් මෙවැනි කටයුතුවලින් හමුදාව ඉවත් කර ගැනීම පිළිබඳව සාකච්ඡා වෙලා තිබුණා. මීට කලින් ඒ පෞද්ගලික ආයතනය විසින්මයි ඒ කාඩ්පත් ආනයනය කරලා ඒ මුද්‍රණ කටයුතු කරලා තිබුණේ. මේ කටයුත්ත යුද හමුදාව භාර ගන්නා විට backlog එකක් තිබුණේ නැහැ. යුද හමුදාව භාර ගත්තාට පස්සේ තමයි ලක්ෂ 9කට ආසන්න ප්‍රමාණයක කාඩ්පත් තිබුණේ. ඒක යුද හමුදාවේ වරදකුත් නොවෙයි. විදේශ විනිමය ප්‍රශ්නයක් නිසා කාඩ් ආනයනය කිරීමේ ප්‍රධාන ප්‍රශ්නයකට මුහුණ පෑවා. ඒ කාඩ් ආනයනය කරගන්න පුළුවන්කමක් නැති නිසා ලක්ෂ නවයහමාරකට ආසන්න කාඩ් ප්‍රමාණයක හිඟයක් ඇති වුණා. රියදුරු බලපත්‍ර ගන්න එන අය කාඩ් එකක් ගන්න තමයි සල්ලි ගෙවන්නේ. නමුත්, අද ඒ අයට දෙන්නේ කොළයක්. මේ ලක්ෂ නවය අද වන විට 425,000කට අඩු වෙලා තිබෙනවා. ලබන අගෝස්තු මාසය වනකොට මේ අපහසුතාව නැති වේවි. අදත් ඕනෑම කෙනෙකුට එක්දින සේවාවකින් මෙය ලබා ගන්න පුළුවන්. වේරහැර කාර්යාලයට ඇවිල්ලා එක්දින සේවාවෙන් ලබා ගන්නේ නැති අයට තමයි මේ කටයුත්ත බලපාන්නේ. විශේෂයෙන්ම අනුරාධපුරය, කොළඹ, හම්බන්තොට වැනි කාර්යාලවලින් රියදුරු බලපත්‍ර ලබා ගන්න පුළුවන්කමක් තිබෙනවා, එක්දින සේවාවලින්. අනෙක් කාර්යාලවලින් ලබා දෙන අයදුම් පත්‍ර දැනට ප්‍රමාද වනවා. නමුත්, අගෝස්තු මාසයෙන් පස්සේ මේ තත්ත්වය අවම කරගන්න පුළුවන්කමක් ලැබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු එක ඇත්ත. යුද හමුදාව මේ කටයුත්ත කරද්දී ඒ ගණන පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරපු කමිටුම තමයි අවධානය යොමු කරලා, අධ්‍යයනය කරලා වාර්තා ඉදිරිපත් කළේ. මේ කරුණු ඉදිරිපත් වුණාම ඒ පිළිබඳව අපි සොයා බැලුවා. මේ එක කාඩ්පතකට රුපියල් හාරදහස් ගණනක් වැය වෙන්නේ නැහැ. ඒක ඇත්ත. හැබැයි, ඒ කටයුතුවලට එකසිය ගණනක් හිටියා. ඒ අයගේ වැටුප්, නවාතැන්, අනෙක් සියලු කටයුතු එක්ක බලද්දි, පෞද්ගලික සමාගමෙන් අපි මේ කාඩ් ගන්නකොට ඒ සඳහා මූලික වියදමක් දරන්න අවශ්‍යතාවක් නැහැ. ඒ වාගේම සියයට 10ක් විතර කාඩ් reject වෙනවා. ඒ reject වෙන ඒවාට අපි ගෙවන්නේත් නැහැ. මේ ගණන් ටික එක්කහු කළාම මූල්‍යමය වශයෙන්, ආර්ථිකමය වශයෙන් පාඩුවක් මොනම ආකාරයකටවත් සිද්ධ වෙන්නේ නැහැ. අර කිව්ව ආකාරයට වැඩි ගණනක් යන්නේත් නැහැ. ඒක අපි බොහොම පැහැදිලිව නිහතමානීව පිළිගත යුතුව තිබෙනවා. කෙසේ හෝ දැන් ඒ ප්‍රශ්නය නිරාකරණය කරලා ඒ කටයුත්ත සඳහා ස්ථිරසාර විසඳුම් මේ වන විට අපි අරගෙන තිබෙනවා.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සේවය කරන අවුරුදු 10ට වැඩි සේවකයන් මාරු කරනවා. මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයටත් ගියා. අවුරුදු පහක් විතර ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ නඩුව විභාග වුණා. මාරු කරන්න අවශ්‍ය නියෝග ලබා දුන්නා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙනුත් ඒ සඳහා නියෝග ලබා දුන්නා. ඊට පස්සේ තමයි, මේ අය ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා පිහිට පැතුවේ. මේ අය මාරු කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. නමුත්, දැන් ශ්‍රේෂ්ඨාධිකරණය ඒ නඩුව නිෂ්ප්‍රභ කර තිබෙනවා. දැන් තමයි නීතිමය වශයෙන් පුළුවන්කමක් ලැබෙන්නේ මේ අයගේ ස්ථාන මාරුවීම් කරන්න. නමුත්, මේවා එකක්වත් ස්ථිරසාර විසඳුම් නොවෙයි. අලුත් අය ආවාම සතියකින් ඒ අයත් ඒකම කරනවා. ඒ නිසා අපි කොච්චර මොනවා කිව්වත්, නවීන තාක්ෂණය භාවිත කිරීමකින් තොරව අපට මේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුම් මොනම ආකාරයකටවත් ලබා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. නවීන තාක්ෂණය හඳුන්වා දීමේදීත් විශාල වශයෙන් ප්‍රශ්න තිබෙනවා. අපි දන්නවා, නවීන තාක්ෂණ දත්ත පද්ධති ලබා ගැනීමේදී උපදේශන සේවාවක් ලබා ගන්න ඕනෑ කියලා. මේ සඳහා බොහෝ විට විශ්වවිද්‍යාලවල ඉන්න අයගේ දායකත්වය තමයි ලබා ගන්නේ.

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

නමුත්, කනගාටුවට කාරණය මෙයයි. විශාල මුදල් ප්‍රමාණයක් වැය කරලා ඒ අයගේ දායකත්වය තුළින් තාක්ෂණ ඇගැයීම් කමිටු ඇතුළු සියලු කමිටුවලින් හදපු දත්ත පද්ධතියේ සියයට 90කට ආසන්න වැඩ කොටසක් අද වනකොට අවසන්ව තිබෙනවා. නමුත්, ඒවායින් ප්‍රයෝජන ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒක තමයි තිබෙන ප්‍රධාන ප්‍රශ්නය.

ඊළඟ ප්‍රශ්නය තමයි, අද ආයතන අතර විශාල මෙන්ම අනවශ්‍ය තරගකාරිත්වයක් තිබීම. විශේෂයෙන්ම පාස්පෝර්ට් වෙන්න පුළුවන්, ජාතික හැඳුනුම්පත් වෙන්න පුළුවන්, රියදුරු බලපත්‍ර වෙන්න පුළුවන්, ඒවා ලබා දීමේදී තාක්ෂණය භාවිත කිරීම පිළිබඳ ගැටලුවේදීත්, ආයතන - ආයතන අතර ඇති වෙලා තිබෙන අනවශ්‍ය තරගකාරී තත්ත්වයත් මේ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී විශාල බාධාවක් බවට පත් වෙලා තිබෙනවා. එම නිසා ආයතන මැළිකමක් දක්වනවා, තාක්ෂණය වැලඳගන්න. එම නිසා ආයතනවලට තාක්ෂණය හඳුන්වා දෙන්න පසුපස පන්නන්න ඕනෑ. දින වකවානු නියම කරන්නත් ඕනෑ. ඒ ආයතනවලට මේ වගකීම තිබුණත් ඒ සෑම ආයතනයක්ම නවීන තාක්ෂණය ඒ ආයතනවලට හඳුන්වා දීමට කොහෙත්ම කැමැත්තක් දක්වන්නේ නැහැ. එම නිසා පාර්ලිමේන්තුව හැටියට අපට විශාල වගකීමක් තිබෙනවා, මේ අභියෝගයට මුහුණ දීමට ඔවුන් යොමු කිරීමට. මේ අභියෝගයට අප සියලුදෙනාම එකතු වෙලා මුහුණ දුන්නොත් තමයි රටක් විධියට අපට මේ ජයග්‍රහණ අත්පත් කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ.

මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සහ ස්ථිර කිරීම පිළිබඳව ගරු ජගත් ප්‍රියංකර මන්ත්‍රීතුමාටත්, ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමාටත් මම නැවතත් ස්තුතිවන්ත වෙනවා. ඔබතුමන්ලා කියපු සියලු කරුණු ගැන මේ වන විටත් ගරු අමාත්‍යතුමා ප්‍රමුඛ අපේ අමාත්‍යාංශයේ අවධානය යොමු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ කියපු කරුණු නිවැරැදි කිරීම සඳහා නවීන තාක්ෂණය කඩිනමින් හඳුන්වා දීමට අප කටයුතු කරනවා. සිදුවන අක්‍රමිකතා හා වංචනික ක්‍රියා වළක්වා ගනිමින්, ජනතාවට සිදුවන අපහසුතා අවම කර ජනතාවට කාර්යක්ෂම සේවාවක් ලබා දීමට ගත යුතු ඉහළම ක්‍රියාමාර්ග ගන්නවා කියන එකත් සඳහන් කරමින්, මා නිහඬ වෙනවා.

එකල්හී වේලාව අ. භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 6.40ට, අද දින සභා සම්මතය අනුව, 2024 ජූලි 09 වන අඟහරුවාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

අප්පොழුது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 6.40க்கு, பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2024 யூலை 09, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.30 p.m., THE HON. DEPUTY SPEAKER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.40 p.m. until 9.30 a.m. on Tuesday, 09th July, 2024 pursuant to the Resolution of Parliament of this Day.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

2024 වර්ෂය සඳහා ජනාධිපති ලේකම් කාර්යාල වැය ශීර්ෂය යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන: පුත්තලම දිස්ත්‍රික්කය
2024க்கான சனாதிபதி செயலகத்தின் செலவுத் தலைப்பின்கீழான ஒதுக்கீடு: புத்தளம் மாவட்டம்
ALLOCATIONS FOR 2024 UNDER HEAD OF PRESIDENTIAL SECRETARIAT: PUTTALAM DISTRICT

2141/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024 වර්ෂය සඳහා ජනාධිපති ලේකම් කාර්යාල වැය ශීර්ෂය යටතේ විමධ්‍යගත අය වැය වැඩසටහන සහ ඒ හා සමාන වෙනත් වැඩසටහන් යටතේ පුත්තලම දිස්ත්‍රික්කය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත සඳහන් විමධ්‍යගත අය වැය වැඩසටහන සහ ඒ හා සමාන වෙනත් වැඩසටහන් යටතේ ව්‍යාපෘති යෝජනා ලබා දී ඇති එක් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ නම, ලබා දී ඇති ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව, එම එක් එක් යෝජනාව ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා ග්‍රාම නිලධාරී වසම සහ එම එක් එක් ව්‍යාපෘති යෝජනාව සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත වැඩසටහන් යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන වෙන් කිරීමේදී අනුගමනය කරන ලද නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

නිති, පොරුளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரைக் கேட்க வினா:

(அ) (i) 2024ஆம் ஆண்டுக்காக சனாதிபதி செயலகத்தின் செலவுத் தலைப்பின்கீழ் பன்முகப்படுத்தப்பட்ட வரவு செலவுத்திட்ட நிகழ்ச்சித்திட்டத்தினதும் அதற்குச் சமமான வேறு நிகழ்ச்சித்திட்டங்களின் கீழும் புத்தளம் மாவட்டத்துக்கு ஒதுக்கப் பட்டுள்ள நிதி ஏற்பாடுகளின் அளவு யாதென் பதையும்;

(ii) மேற்படி பன்முகப்படுத்தப்பட்ட வரவு செலவுத் திட்ட நிகழ்ச்சித்திட்டம் மற்றும் அதற்குச் சமமான வேறு நிகழ்ச்சித்திட்டங்களின்கீழ் கருத்திட்ட முன்மொழிவுகளை வழங்கியுள்ள ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினரினதும் பெயர், வழங்கியுள்ள கருத்திட்ட முன்மொழிவு களின் எண்ணிக்கை, மேற்படி ஒவ்வொரு முன்மொழிவும் நடைமுறைப் படுத்தப்படும்

பிரதேச செயலாளர் பிரிவு மற்றும் கிராம அலுவலர் பிரிவு மற்றும் மேற்படி ஒவ்வொரு கருத்திட்ட முன்மொழிவுக்கும் ஒதுக்கப்பட்டுள்ள நிதி ஏற்பாடுகளின் அளவு தனித்தனியே யாதென்பதையும்;

(iii) மேற்படி நிகழ்ச்சித்திட்டங்களின்கீழ் பாராளுமன்ற உறுப்பினர்களுக்கு நிதி ஒதுக்கும்போது பின்பற்றப்பட்ட தகவுதிறன்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Economic Stabilization and National Policies:

(a) Will he inform this House of the -

(i) amount of allocation set aside for the Puttalam District under the Decentralized Budget Programme and other similar programmes under the Expenditure Head of the Presidential Secretariat for the year 2024;

(ii) name of each Member of Parliament who has submitted project proposals under the aforementioned Decentralized Budget Programme and other similar programmes, the number of project proposals submitted, the Divisional Secretary's Division and Grama Niladhari Division implementing each of the said proposals and the amount of allocation set aside for each project proposal, separately; and

(iii) criteria followed in setting aside allocations to Members of Parliament under the above programmes?

(c) If not, why?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා)

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரும்)

(The Hon. Ranil Wickremesinghe - President, Minister of Defence and Minister of Finance, Economic Stabilization and National Policies)

(අ) (i) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 2024 අය වැය යෝජනා අනුව විමධ්‍යගත අය වැය වැඩසටහන යෙන රුපියල් මිලියන 11,250ක ප්‍රතිපාදන වෙන් කර ඇත. 2023.12.29 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක MF/02/2023 අනුව මෙම ප්‍රතිපාදන ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා වෙන් කර දී තිබේ. ඒ අනුව පුත්තලම දිස්ත්‍රික්කය සඳහා රුපියල් මිලියන 459ක් වෙන් කර ඇත.

මීට අමතරව ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද "ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් කඩිනම් කිරීම" යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 24/0544/601/036 සඳහා ලද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව තවත් රුපියල් මිලියන 2,000ක ප්‍රතිපාදන විමධ්‍යගත අය වැය වැඩසටහන යෙන වෙන් කර ඇත. අදාළ විස්තර **ඇමුණුම 01කි*** දක්වා ඇත.

(ii) 2024 වර්ෂය සඳහා ක්‍රියාත්මක කරනු ලබන විමධ්‍යගත අය වැය වැඩසටහනේ චක්‍රලේඛයට අනුව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කරනු නොලබන අතර, එම චක්‍රලේඛයට අනුව වෙන් කරන ලද ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබා දී ඇත. ඒ අනුව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් එම චක්‍රලේඛයේ සඳහන් අංක 1 හා 2 යටතේ ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති යෝජනා අදාළ පාර්ශ්ව වෙතින් ලබාගෙන ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සහිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ. එබැවින් විමධ්‍යගත අය වැය වැඩසටහන යටතේ ලබා දී ඇති ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව, එම එක් එක් යෝජනාව ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, ග්‍රාම නිලධාරී වසම සහ එම එක් එක් ව්‍යාපෘති යෝජනාව සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය පිළිබඳ තොරතුරු පුත්තලම දිස්ත්‍රික් ලේකම් වෙතින් ලබා ගත හැකිය. අදාළ විස්තර **ඇමුණුම 02*** සහ **ඇමුණුම 03*** මඟින් දක්වා ඇත.

(iii) 2024 විමධ්‍යගත අය වැය වැඩසටහන යටතේ නිකුත් කර ඇති චක්‍රලේඛය ප්‍රකාරව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර නොමැත.

(ආ) පැන නොනඟී.

(அ) (i) 2024ஆம் ஆண்டுக்காகப் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்ட வரவு செலவுத்திட்ட முன்மொழிவில் பன்முகப்படுத்தப்பட்ட வரவு செலவுத் திட்டத்துக்காக ரூபாய் 11,250 மில்லியன் ஒதுக்கப்பட்டுள்ளது. 2023.12.29ஆம் திகதிய நிதி அமைச்சின் சுற்றறிக்கை இல. MF/02/2023 இன்படி, இத்தொகை அந்தந்த மாவட்டங்களுக்கு மீள் ஒதுக்கீடு செய்யப் பட்டுள்ளது. அதன்படி, புத்தளம் மாவட்டத்துக்கு ரூபாய் 459 மில்லியன் ஒதுக்கப்பட்டுள்ளது.

இதற்கு மேலதிகமாக, மாண்புமிகு சனாதிபதி அவர்களால் முன்வைக்கப்பட்ட "கிராம அபிவிருத்தி நிகழ்ச்சித்திட்டங்களைத் துரிதப் படுத்துதல்" தொடர்பான அமைச்சரவை விஞ்ஞாபன இல. 24/0544/601/036க்கான அமைச்சரவைத் தீர்மானத்தின்படி, பன்முகப்படுத்தப்பட்ட வரவு செலவுத்திட்டத்துக்காக ரூபாய் 2,000 மில்லியன் ஒதுக்கப்பட்டுள்ளது. இது தொடர்பான விபரம் இணைப்பு 01*இல் தரப்பட்டுள்ளது.

(ii) 2024ஆம் ஆண்டுக்காக நடைமுறைப் படுத்தப்படுகின்ற பன்முகப்படுத்தப்பட்ட வரவு செலவுத்திட்ட நிகழ்ச்சித்திட்டத்தின் சுற்றறிக் கையின்படி, கௌரவ பாராளுமன்ற உறுப்பினர்

** පුස්තකාලයේ තබා ඇත.*

** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

களுக்கு நிதி ஒதுக்கீடு செய்யப்படுவதில்லை என்பதுடன், அந்தச் சுற்றறிக்கையின்படி ஒதுக்கப்பட்ட நிதி ஒதுக்கீடு மாவட்ட செயலாளர் களுக்கு வழங்கப்பட்டுள்ளது. அதன்படி, மாவட்டச் செயலாளர்கள் அந்தச் சுற்றறிக்கை யில் குறிப்பிடப்பட்டுள்ள இலக்கம் 1 மற்றும் 2 இன்கீழ் செயல்படுத்தக் கூடிய கருத்திட்ட முன்மொழிவுகளைத் தொடர்புடைய தரப்பினரிட மிருந்து பெற்று, பிரதேச மற்றும் மாவட்ட ஒருங்கிணைப்புக் குழுவின் அங்கீகாரத்துடன் நடைமுறைப்படுத்துவார்கள். எனவே, பன்முகப் படுத்தப்பட்ட வரவு செலவுத்திட்ட நிகழ்ச்சித் திட்டத்தின் கீழ் வழங்கப்பட்ட கருத்திட்ட முன்மொழிவுகளின் எண்ணிக்கை, ஒவ்வொரு முன்மொழிவும் நடைமுறைப்படுத்தப்படும் பிரதேச செயலகப் பிரிவு மற்றும் கிராம உத்தியோகத்தர் பிரிவு, ஒவ்வொரு கருத்திட்ட முன்மொழிவுக்கும் ஒதுக்கப்பட்ட தொகை பற்றிய தகவல்களைப் புத்தளம் மாவட்டச் செயலாளரிடமிருந்து பெற்றுக்கொள்ள முடியும். இது தொடர்பான விபரம் இணைப்பு 02* மற்றும் 03*இல் தரப்பட்டுள்ளது.

(iii) 2024ஆம் ஆண்டுக்கான பன்முகப்படுத்தப்பட்ட வரவு செலவுத்திட்ட நிகழ்ச்சித்திட்டத்தின்கீழ் வெளியிடப்பட்ட சுற்றறிக்கையின்படி, கௌரவ பாராளுமன்ற உறுப்பினர்களுக்கு நிதி ஒதுக்கீடு செய்யப்படவில்லை.

(ஆ) ஏற்புடையதன்று.

(a) (i) Rs. 11,250 million has been allocated for the Decentralized Budget, which is a Budget Proposal submitted to the Parliament for the year 2024. This amount has been reallocated to respective districts as per the Ministry of Finance Circular No. MF/02/2023 dated 29.12.2023. Accordingly, Rs. 459 million has been allocated to the Puttalam District.

In addition to that, Rs. 2,000 million has been allocated for the Decentralized Budget Programme as per the decision of the Cabinet of Ministers on the Cabinet Memorandum No. 24/0544/601/036 titled "Acceleration of Rural Development Programmes" presented by the Hon. President. The relevant details are given in Annex 01*.

(ii) According to the Circular of the Decentralized Budget Programme to be implemented for the year 2024, provisions will not be allocated for Hon. Members of Parliament, and the provisions allotted as per the said Circular have been given to the District Secretaries. Accordingly, the District Secretaries will get project proposals which could be implemented under numbers 1 and 2 mentioned in the Circular from the relevant parties and the projects will be implemented with the approval of the Regional and District Coordination Committee. Therefore, information about the number of project proposals made under the Decentralized Budget Programme, the Divisional Secretary's Divisions and Grama Niladhari Divisions where each proposal is to be implemented and the amount of provisions allocated for each project proposal can be obtained from the District Secretary of Puttalam. The relevant details are given in Annexes 02* and 03*.

(iii) In terms of the Circular issued under the Decentralized Budget Programme - 2024, provisions have not been made for Hon. Members of Parliament.

(b) Does not arise.

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

313 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 313 - இல. 8
Volume 313 - No. 8

2024 ජූලි 02වන අඟහරුවාදා
2024 யூலை 02, செவ்வாய்க்கிழமை
Tuesday, 02nd July, 2024

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2024 ජූලි 02වන අඟහරුවාදා
2024 யூலை 02, செவ்வாய்க்கிழமை
Tuesday, 02nd July, 2024

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
පාර්ලිමේන්තුව කැඳවීම [පිටුව 1471]

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:
මහජන ආරක්ෂක ප්‍රකාශනය [පිටුව 1472]

නිවේදන:
ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය [පිටු 1472-1514]
රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය [පිටු 1514-1537]
කථානායකතුමාගේ සහතිකය [පිටුව 1538]
විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [පිටුව 1538]
ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතාගේ අභාවය [පිටුව 1538]

ගරු ජනාධිපතිතුමාගේ විශේෂ ප්‍රකාශය [පිටු 1539-1549]

නොපැමිණීමේ අවසරය:
ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා [පිටුව 1561]

වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී [පිටුව 1561]

වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී [පිටුව 1562]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
பாராளுமன்றத்தைக் கூட்டல் [ப: 1471]

சனாதிபதியிடமிருந்து வந்த செய்தி:
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம் [ப:1472]

அறிவிப்புகள்:
பொருளாதார நிலைமாற்றம் சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு [ப:1472-1514]
பகிரங்க நிதிசார் முகாமைத்துவம் சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு [ப:1514-1537]
சபாநாயகரது சான்றுரை [ப:1538]
வெளிநாட்டு தீர்ப்புக்களைப் பரஸ்பரம் ஏற்றங்கீகரித்தல், பதிவுசெய்தல் மற்றும் வலுவுறுத்துதல் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப:1538]
மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தனினது மரணம் [ப:1538]

மாண்புமிகு சனாதிபதியினது விசேட கூற்று [ப:1539-1549]

வராதிருக்க அனுமதி:
மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம் [ப:1561]

மருத்துவம் (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது [ப:1561]

மருத்துவம் (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது [ப:1562]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Summoning of Parliament [Col. 1471]
MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation [Col. 1472]
ANNOUNCEMENTS:
Economic Transformation Bill: Determination of the Supreme Court [Cols. 1472-1514]
Public Financial Management Bill: Determination of the Supreme Court [Cols. 1514-1537]
Speaker's Certificate [Col. 1538]
Reciprocal Recognition, Registration and Enforcement of Foreign Judgments Bill: Petition to the Supreme Court [Col. 1538]
Death of Hon. Rajavarothiam Sampanthan [Col. 1538]

SPECIAL STATEMENT BY HONOURABLE PRESIDENT [Cols. 1539-1549]

LEAVE OF ABSENCE:
Hon. G.G. Ponnambalam [Col. 1561]

MEDICAL (AMENDMENT) BILL:
Read the First time [Col. 1561]

MEDICAL (AMENDMENT) BILL:
Read the First time [Col. 1562]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2024 ජූලි 02වන අඟහරුවාදා
2024 யூலை 02, செவ்வாய்க்கிழமை
Tuesday, 02nd July, 2024

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තුව කැඳවීම
பாராளுமன்றத்தைக் கூட்டல்
SUMMONING OF PARLIAMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුව කැඳවීමේ ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් දැන් සභාවට කියවනු ලැබේ.

අනතුරුව පහත සඳහන් ගැසට් නිවේදනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් කියවන ලදී:

அதன்பிறகு, பாராளுமன்றச் செயலாளர் நாயகம் பின்வரும் வர்த்தமானி அறிவித்தலை வாசித்தார்:

Whereupon the Secretary-General of Parliament read the following Gazette Notification.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

ඇංක 2390/07 - 2024 ජූනි මස 25 වැනි අඟහරුවාදා - 2024.06.25

(රජයේ බලපතිර ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

කථානායකවරයාගේ නිවේදනය

2024 ජූලි 02 වැනි අඟහරුවාදා පූර්ව භාග 9.30 ට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ රැස්වීමක් කැඳවීම

ගරු අග්‍රාමාත්‍යතුමාගේ ඉල්ලීම පරිදි පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල 16 ස්ථාවර නියෝගය ප්‍රකාරව 2024 ජූලි 02 වැනි අඟහරුවාදා පූර්ව භාග 9.30 ට රැස්වන ලෙස පාර්ලිමේන්තුව මා විසින් කැඳවන ලද බව පාර්ලිමේන්තුවේ කථානායක මහින්ද යාපා අබේවර්ධන විසින මම මෙයින් දනුම්දෙමි.

මහින්ද යාපා අබේවර්ධන,
කථානායක.

2024 ජූනි මස 25 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ දී ය.

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
சனாதிபதியிடமிருந்து வந்த செய்தி
MESSAGE FROM THE PRESIDENT

මහජන ආරක්ෂක ප්‍රකාශනය
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
PUBLIC SECURITY PROCLAMATION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත සඳහන් සන්දේශය ගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පිඑස්/සිඑස්ඒ/00/4/S/1

2024 ජූනි මස 22 වන දින

ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා විනා අවධ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ සමූදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රහේදයවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවිය බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමඟ කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

ඒනිදු විතුමසිංහ
ජනාධිපති

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
பொருளாதார நிலைமாற்றம் சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
ECONOMIC TRANSFORMATION BILL: DETERMINATION OF THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to inform Parliament that I have received the Determination of the Supreme Court in respect of the Bill titled “Economic Transformation”, which was challenged in the Supreme Court in terms of Article 121(1) of the Constitution.

[ගරු කථානායකතුමා]

The Determination of the Supreme Court as to the constitutionality of the Bill concludes and upon careful consideration have suggested Amendments that will render the provisions of the Bill consonant with the Constitution as follows:

(1) Clause 8 of the Bill should be amended by deleting Article 4 contained therein, as Parliamentary supervision is adequately covered by Article 43 and 148.

(2) Clause 13 (b) requires to be deleted as the creation of an independent regulator could be established by an amending legislation.

The learned Deputy Solicitor General submitted that an amendment shall be moved at the Committee Stage of Parliament by inserting the words, '*subject to the provisions of the Constitution and the approval of the Cabinet of Ministers*' at the beginning of Clause 63(2), and that Clause 63(2) shall thereafter read as follows:

> *"Subject to the provisions of the Constitution and the approval of the Cabinet of Ministers, the responsibilities of the Minister of Finance with regard to cadre management, shall include the determination of the salaries and wages and other payments, to the officers and other employees of public entities"*

We are of the view that the said inconsistency shall cease and Clause 63 may be passed by a simple majority of Parliament if Clause 63(2) is amended as proposed by the learned Deputy Solicitor General.

Clause 68

In terms of Clause 68(1), "*The Secretary to the Treasury may issue directives deemed as necessary for the purpose of implementing the provisions of this Act.*" However, this Clause does not specify the persons to whom such directive may be issued and is therefore vague and inconsistent with Article 12(1). The learned Deputy Solicitor General

submitted that an amendment shall be moved at the Committee Stage of Parliament to Clause 68(1) by inserting the words, *'to the public entities and persons referred to in subsection 2 of Section 3'* after the word, 'issue', and that Clause 68(1) shall thereafter read as follows:

> *"The Secretary to the Treasury may issue to the public entities and persons referred to in subsection 2 of Section 3 directives deemed as necessary for the purpose of implementing the provisions of this Act."*

We are of the view that the said inconsistency shall cease and Clause 68 may be approved by the simple majority of Parliament if Clause 68 is amended as proposed by the learned Deputy Solicitor General.

Clause 69

Clause 69 provides as follows:

> *"(1) If any difficulty arises when implementing the provisions of this Act, or any regulation made thereunder, the Minister may, by Order published in the Gazette make such provisions not inconsistent with the provisions of this Act or any other written law, as appears to the Minister to be necessary or expedient for removing the difficulty.*
>
> *(2) Every Order made under this section shall be published in the Gazette and may be laid before Parliament not later than three months of the date of publication in the Gazette."*

Mr. Corea, PC submitted that in implementing the provisions of any Act of Parliament, difficulties may arise for a variety of reasons, and that in such an eventuality, the appropriate course of action would be to move the legislature to amend the statute as necessary to obviate such difficulties. He submitted that instead, permitting the Minister to make any Order circumventing such difficulties is likely to result in the Minister exercising legislative power over and above what is permissible in terms of Article 76 of the Constitution and has the likely potential effect of eroding Article 3 read with Article 4(a). He submitted further that Clause 69 does not contain adequate safeguards and can result in an arbitrary exercise of power. We are in agreement with the submission of Mr. Corea, PC and are of the view that Clause 69 is violative of Article 4(a) read together with Article 3 and Article 76 and hence, needs to be approved by the special majority of Parliament and by the People at a Referendum.

A similar clause but much wider in scope, was considered by this Court in its Determination on the **Sri Lanka Electricity Bill** [SC (SD) No. 42-53/2024] where it was held as follows:

> *"Quite apart from the strong propensity for the abuse of such provisions and hence the justification and the need for safeguards, its legality must be considered from the perspective of Articles 3, 4 and 76 of the Constitution. In terms of Article 3, sovereignty is in the People and is inalienable. Article 4 provides the manner in which the Sovereignty of the People shall be exercised and in Article 4(a) provides that the legislative power of the People shall be exercised by Parliament. In terms of Article 75, Parliament shall have power to make laws as stipulated therein.*
>
> *Thus, while delegated legislation is permissible in terms of Article 76, and while Parliament may empower the Minister to make subsidiary legislation, such power is subject to the limitation that the subsidiary legislation must be for a prescribed purpose, or in other words, the enabling law must prescribe the purpose for which subsidiary legislation can be made. We are of the view that Clause 48 does not contain a prescribed purpose within the contemplation of Article 76(3). The failure to prescribe the purpose leads to a situation beyond what is permissible under Article 76(3) and will result in the alienation of legislative power to the executive."*

The learned Deputy Solicitor General submitted that this Clause shall be deleted at the Committee Stage of Parliament.

Clause 71 – definition of State owned Enterprises

State Owned Enterprises play a critical role in the country's economy, and it is through such enterprises that key sectors in the Country, such as ports, power, water, banking and insurance are managed. However, it is common knowledge that not all such State Owned Enterprises are profit making ventures. The Parliamentary Committee on Public Finance has time and again highlighted the serious irregularities that take place in such institutions, primarily with procurement and financial management.

It is in this background that Mr. Corea, PC drew our attention to a report titled, "The State of State Enterprises in Sri Lanka – 2019 (Systemic misgovernance: a discussion)" which contains the findings of a study into the activities of State Owned Enterprises in Sri Lanka carried out by a non-profit organisation registered under the Companies Act No. 7 of 2007.

The said report contains the following salient information about the status of State Owned Enterprises:

(a) There are 527 State Owned Enterprises but financial information is available only in respect of 10.4% of such State Owned Enterprises;

(b) The Ministry of Finance has classified 55 such State Owned Enterprises as strategically important, with the cumulative profit of such State Owned Enterprises for 2006 – 2017 being Rs. 964 billion while the cumulative losses for the said period being Rs. 795 billion;

(c) Weak governance has increased political and agency costs of state enterprises;

(d) Inefficiency is a common feature in all Sri Lankan State Owned Enterprises, across all organisational categories;

(e) Greater efficiency can only be expected through better governance and therefore a comprehensive system of corporate governance for state enterprises must be adopted.

The critical role performed by State Owned Enterprises and the need to improve its corporate governance structure and make such entities answerable to Parliament has received special mention in Part XII of the Bill comprising Clauses 55 – 61. These clauses contain provisions including the procedure that should be followed in their incorporation, issuing corporate governance guidelines aimed at enhancing their performance and exercising financial oversight over such Enterprises. **Clause 57(2) also provides that it shall be the responsibility of the relevant Minister to ensure that the annual budget of State Owned Enterprises is in line with the fiscal strategy statement of the Government and that it reflects the risk factors and the strategies to mitigate those risks**. Towards achieving such objectives, Clause 58(1) empowers the Secretary to the Treasury to issue directives on policy matters for State Owned Enterprises covering accountability and governance requirements, review of their financial performance and any other matters including administration, budgeting, procurement, investment, finance and reporting, subject to relevant written laws. Thus, Part XII places significant importance on regulating State Owned Enterprises and ensuring that they fall in line with the public financial management framework of the Government.

When examining Part XII, it is clear that the Minister of Finance has significant power over these enterprises. According to Clause 57, other Ministers also can propose the establishment of State-Owned Enterprises. Clause 59(2) indicates that some of these enterprises are funded directly by the annual budget. In this backdrop, the submission of Mr. Corea PC that *"Despite being ultimately owned by citizens, State Owned Enterprises are managed by officials controlled by politicians"* is not an exaggeration.

While welcoming the provisions of Part XII, the learned Counsel for the Petitioners however submitted that in view of the definition of a State Owned Enterprise in Clause 71 set out below, the detailed provisions in Part XII and other provisions of the Bill will not apply to some State Owned Enterprises that play a critical role in the financial and insurance sector in this Country.

Clause 71 of the Bill defines a 'State Owned Enterprise' as follows:

> *"State-Owned Enterprise" means –*
>
> *(a) a public corporation within the meaning of the Constitution;*

(b) *entities established and operated under the Companies Act, No.07 of 2007 in which the State has direct or indirect controlling interest by virtue of its shareholding; or*

(c) *State-Owned Corporations, converted in terms of the Conversion of Public Corporations or Government Owned Business Undertakings into Public Companies Act, No.23 of 1987, or such other Acts in terms of which any business entity has been vested with the Government,*

***with the exception of** the Central Bank of Sri Lanka and financial institutions including insurance and lending companies part or all of whose business is to lend or borrow."*

We must observe that in terms of Section 5(1) of the Central Bank Act, No. 16 of 2023, the Central Bank shall have administrative and financial autonomy. While Part XIV of the Act contains detailed provisions setting out the relationship that the Central Bank shall have with Parliament, the Government and the Public, Part XVI provides for the financial reporting framework of the Central Bank including the requirement to prepare the financial statement for each financial year and to present such statements before Parliament.

The exclusion of insurance, financial and lending institutions which are almost entirely owned by the Government effectively negates the extensive provisions that the Bill seeks to introduce in order to ensure better public financial management and corporate governance of State Owned Enterprises. The gravity of such exclusion becomes even more critical when one considers that the People's Bank has 11 subsidiaries, the Bank of Ceylon has 7 subsidiaries, the National Savings Bank has one and Sri Lanka Insurance Corporation, quite apart from having extensive shareholdings in multiple sectors has several subsidiaries including Lanka Hospitals Limited, Litro Gas Lanka Limited and Litro Gas Terminal Lanka (Pvt) Limited.

This exclusion has a significant impact on procurement carried out by such State Owned Enterprises and on Clause 17 which specifies that Government Guarantees, which in terms of the Foreign Loans Act are given on behalf of Public Corporations and Public Enterprises as defined in such Act, shall not exceed 7.5% of the average gross domestic product of the relevant financial year and the preceding two years.

It is perhaps relevant to refer to Chapter 3 of the report titled "*Confronting corruption in sectors and functions*" published by the World Bank, where it emphasises that:

(a) *"State-owned enterprise corruption has gained prominence in recent years;*

(b) *Corruption is most rampant where State Owned Enterprises operate as monopolies or have exclusivity rights;*

(c) *Statutory loopholes and vagueness in legal and regulatory frameworks are an underlying theme to nearly all the risks."*

The exclusion is also significant when one considers the fact that Clause 70 of the Bill seeks to repeal Sections 8 and 14 of the Finance Act No. 38 of 1971, which contain detailed provisions relating to the preparation of its annual budget by State Owned Enterprises and the presentation of the annual accounts of such Enterprises to Parliament. Thus, in spite of Article 154 in terms of which the Auditor General shall audit *inter alia* all public corporations, business and other undertakings vested in the Government under any written law and companies registered or deemed to be registered under the Companies Act, No. 7 of 2007 in which the Government or a public corporation or local authority holds fifty per centum or more of the shares of that company, and the definition of 'auditee entity' in the National Audit Act, No. 23 of 2018, the exempted State Owned Enterprises shall not be directly responsible to Parliament. The result is the erosion of the control that Parliament has over such Enterprises in terms of Article 148.

We examined the Cabinet Memorandum dated 20th February 2024 to ascertain if the policy considerations for the above exclusion have been set out therein and/or have been considered by the Cabinet of Ministers. While Paragraph 3 of the said Memorandum refers to the salient features of the Bill and emphasises that the said features have been incorporated *'with a view to improving good governance practices of State Owned Enterprises.'*, the said Memorandum does not set out any basis for the said exclusion.

Although we requested the learned Deputy Solicitor General to provide us the rationale for the said exclusion or else to apprise this Court the laws that would govern such excepted Enterprises in respect of the matters set out in the Bill, no explanation or clarification on the object or purpose of this provision was provided.

In the above circumstances, we are of the view that there is no rational basis to exclude financial institutions including insurance and lending companies, part or all of whose business is to lend or borrow. Such an exclusion is arbitrary, defeats the objects of the Bill and is inconsistent with Article 12(1) and Article 148 of the Constitution. The definition of 'State Owned Enterprises' in Clause 71 shall therefore be passed with the special majority of Parliament. Such inconsistency shall however cease if the said definition is amended by deleting the words that appear after *'Central Bank of Sri Lanka'*.

Summary

(1) Clause 3(2)(b)(iv) and the definition of *'members of the judicial service'* are inconsistent with Article 4(c) read with Article 3, Article 12(1) and Article 108 and shall only be passed by the special majority of Parliament and be approved by the People at a Referendum. Such inconsistency shall however cease if, (a) the definition of *'members of the judicial service'* in Clause 71 is deleted, and (b) Clause 3(2)(b) is deleted and substituted with the following new sub-clause:

"officers and employees of public entities to whom a power or duty is conferred, delegated or assigned under this Act or any regulation made thereunder, including a Chief Accounting Officer, Accounting Officer or a competent authority referred to in Part VI of this Act."

(2) Clause 5(2)(f) is violative of Articles 12(1), 43(1) and 52(2) and hence, Clause 5(2)(f) shall only be passed with the special majority of Parliament. The said inconsistency shall however cease if Clause 5(2)(f) is amended to read as follows:

"subject to the approval of the Cabinet of Ministers, formulate policies and strategies for the effective management and overall supervision of State-Owned Enterprises".

(3) Clause 32(3) is violative of Article 3 and Article 12(1) of the Constitution and shall be passed by the special majority of Parliament and shall be approved by the People at a Referendum. The said inconsistency shall however cease if Clause 32(3) is amended to read as follows:

"The National Procurement Commission may, if it deems necessary, formulate and publish in the Gazette specific guidelines for State Owned Enterprises."

(4) Clause 32(4) is inconsistent with Articles 3, 12(1), 148 and 156C of the Constitution and shall only be passed by the special majority of Parliament and be approved by the People at a Referendum. The said inconsistency shall however cease if Clause 32(4) is amended to read as follows:

"The National Procurement Commission may, if it deems necessary, formulate and publish in the Gazette specific guidelines for Provincial Councils."

(5) Clause 34(2) is violative of Article 149 of the Constitution and shall only be passed with the special majority of Parliament. The said inconsistency shall however cease if Clause 34(2) is amended as follows:

"There shall be a treasury single account to maintain the revenue and expenditure of the Consolidated Fund which shall be an integrated system of bank accounts, into which all Government cash including moneys received by the public entities referred to in sub-paragraphs (i) and (ii) of paragraph (a) of subsection (2) of section 3 shall be deposited and from which expenditure of the Government and such public entities shall be made to enable public funds to be managed in a consolidated manner."

(6) Clause 38(3) is inconsistent with the provisions of Articles 12(1) and 148 of the Constitution and shall only be passed with the special majority of Parliament.

(7) Clause 39(1) is inconsistent with Article 12(1) and shall only be passed by the special majority of Parliament. The said inconsistency shall however cease if Clause 39(1) is amended to read as follows:

"The Secretary to the Treasury shall supervise, examine, and monitor all statutory funds and may issue directives on statutory funds in respect of which any other written law does not provide for such matters."

(8) Clause 63 is inconsistent with Article 4(c) read with Article 3, Article 12(1), Article 55(1), Article 55(3), Article 108, Article 111H(1)(b), Article 148, Article 153C, Article 155G(1) and Article 156F and of the Constitution, and shall be passed by the special majority of Parliament and shall be approved by the People at a Referendum. The said inconsistency shall however cease if Clause 63(2) is amended to read as follows:

"Subject to the provisions of the Constitution and the approval of the Cabinet of Ministers, the responsibilities of the Minister of Finance with regard to cadre management, shall include the determination of the salaries and wages and other payments, to the officers and other employees of public entities"

(9) Clause 68 is inconsistent with Article 12(1) of the Constitution and shall only be passed with the special majority of Parliament. The said inconsistency shall however cease if Clause 68(1) is amended to read as follows:

"The Secretary to the Treasury may issue to the public entities and persons referred to in subsection 2 of Section 3 directives deemed as necessary for the purpose of implementing the provisions of this Act."

(10) Clause 69 is violative of Article 4(a) read together with Articles 3 and 76 and hence, needs to be approved by the special majority of Parliament and by the People at a Referendum.

(11) The definition of 'State Owned Enterprise' is inconsistent with Article 12(1) and Article 148 of the Constitution and shall only be passed with the special majority of Parliament. Such inconsistency shall however cease if the said definition is amended to read as follows:

" 'State-Owned Enterprise' means –

(a) a public corporation within the meaning of the Constitution;

(b) entities established and operated under the Companies Act, No.07 of 2007 in which the State has direct or indirect controlling interest by virtue of its shareholding; or

(c) State-Owned Corporations, converted in terms of the Conversion of Public Corporations or Government Owned Business Undertakings into Public Companies Act, No.23 of 1987, or such other Acts in terms of which any business entity has been vested with the Government,

with the exception of the Central Bank of Sri Lanka."

We place on record our appreciation of the assistance given by the learned Deputy Solicitor General who represented the Hon. Attorney General, the learned President's Counsel and the learned Counsel who appeared for the Petitioners.

JAYANTHA JAYASURIYA, PC
CHIEF JUSTICE

MAHINDA SAMAYAWARDHENA, J
JUDGE OF THE SUPREME COURT

ARJUNA OBEYESEKERE, J
JUDGE OF THE SUPREME COURT

IV

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව මවිසින් 2024 ජුනි 27 දින "ශ්‍රී ලංකා විදුලිබල" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

V

විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
வெளிநாட்டு தீர்ப்புக்களைப் பரஸ்பரம் ஏற்றங்கீகரித்தல், பதிவுசெய்தல் மற்றும் வலுவுறுத்துதல் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
RECIPROCAL RECOGNITION, REGISTRATION AND ENFORCEMENT OF FOREIGN JUDGMENTS BILL: PETITION TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ" පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත 2024.07.01 දින ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

VI

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතාගේ අභාවය
மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தனினது மரணம்
DEATH OF HON. RAJAVAROTHIAM SAMPANTHAN

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ත්‍රිකුණාමලය මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතාගේ අභාවය හේතුකොට ගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2024 ජුනි 30 දින සිට මෙම පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

එතුමාගේ අභාවය මෙම පාර්ලිමේන්තුවට මා දන්වා සිටින්නේ බලවත් කනගාටුවෙනි. මේ පිළිබඳව අප දැඩි සේ කනගාටු වන අතර, ගරු මන්ත්‍රීවරයාගේ පවුලේ අය වෙත අපගේ සානිශය සංවේගය ප්‍රකාශ කරන බව පාර්ලිමේන්තුව වෙනුවෙන් දන්වනු කැමැත්තෙමි.

මේ පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව මතු දිනයකදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත. තවද, අවසන් ගෞරව දැක්වීම සඳහා එතුමාගේ දේහය 2024 ජූලි 03, එනම් හෙට දින පාර්ලිමේන්තුවේ ප්‍රධාන ද්වාරය අසල උත්සව ශාලාවේ අපර භාග 2.00 සිට අපර භාග 4.00 වන තෙක් තැන්පත් කර තැබෙන බව ද තවදුරටත් සියලු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වෙත කාරුණිකව දැනුම්දීමට කැමැත්තෙමි.

VII

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සහ තේරීම් කාරක සභාවේ රැස්වීම්

பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டமும் தெரிவுக் குழுக் கூட்டமும்

MEETINGS OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS AND COMMITTEE OF SELECTION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2024 ජූලි 03වන බදාදා, එනම් හෙට දින අපර භාග 1.00ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් සහ එය අවසන් වූ වහාම තේරීම් කාරක සභාවේ රැස්වීමක් කාරක සභා කාමර අංක 2හිදී පැවැත්වීමට නියමිත බැවින් අදාළ රැස්වීම් සඳහා පැමිණ සහභාගි වන ලෙස සියලු සාමාජික මන්ත්‍රීවරයන්ට දැනුම්දීමට කැමැත්තෙමි.

මීළඟට, ගරු ජනාධිපතිතුමාගේ විශේෂ ප්‍රකාශය.

ගරු ජනාධිපතිතුමාගේ විශේෂ ප්‍රකාශය

மாண்புமிகு சனாதிபதியினது விசேட கூற்று

SPECIAL STATEMENT BY HONOURABLE PRESIDENT

[පූ.භා. 9.50]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - President, Minister of Defence and Minister of Finance, Economic Stabilization and National Policies)

ගරු කථානායකතුමනි, 2022 වසරේ ණය ගෙවාගන්නට බැරිවුණු රටකට යළිත් ආර්ථික ශක්තිය ලබාදීමේ අභියෝගාත්මක ගමනේ තවත් වැදගත් සන්ධිස්ථානයකට අපට ගිය සතියේ එළැඹෙන්නට හැකි වුණා. පසුගිය ජූනි 26වැනි දා අපේ නිල ණය හිමියන් සමඟ ණය ආපසු ගෙවීම පිළිබඳව එකඟතාවලට එළැඹීමට අපට පුළුවන් වුණා. කැබිනට් මණ්ඩලය විසින් බලය පවරන ලද නිලධාරීන් අපේ රට නියෝජනය කරමින් මෙම එකඟතාවලට සහ ගිවිසුම්වලට අත්සන් කළා. එදිනම රාත්‍රියේ මම විද්‍යුත් මාධ්‍ය ඔස්සේ මුළු මහත් ජාතියටම ඒ පිළිබඳ කරුණු පෙන්වා දුන්නා. ආර්ථිකය යළි ගොඩනැංවීමේ අභියෝගාත්මක ගමන ආරම්භ වූ දවසේ පටන් මම විටින් විට පාර්ලිමේන්තුව හමුවේ කරුණු ඉදිරිපත් කළා. මුලින්ම, අප අනුගමනය කරන සැලසුම් ගැන පාර්ලිමේන්තුව හමුවේ විස්තර කළා. ඉන් පසුව අප ලබා ඇති ප්‍රගතිය ගැන කරුණු පැහැදිලි කළා. ඒ අනුව යමින් මම අද මේ සභාව හමුවේ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු අනාවරණ කරන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, මීට අවුරුදු දෙකකට පමණ කලින්, රටේ ආර්ථිකය යළි නංවාලීමේ අභියෝගය මම බාර ගත්තාට පස්සේ අපේ සිව් වැදෑරුම් වැඩ සැලැස්ම මේ පාර්ලිමේන්තුව හමුවේ තැබුවා. එය මෙසේයි.

1. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා කොට විස්තීර්ණ ණය පහසුකම් ලබා ගැනීම සහ රට තුළ මූල්‍ය විනයක් ඇති කිරීම.
2. ජාත්‍යන්තර මූල්‍ය හා නීති විශේෂඥයන් වන ලසාර්ඩ් සහ ක්ලිෆර්ඩ් චාන්ස් ආයතන සමඟ එක්වී IMF සම්බන්ධීකරණය ඇතිව ණය ස්ථාවර කරලීමේ සැලසුම සකස් කිරීම හා ණය හිමියන් සමඟ සාකච්ඡා කොට එකඟත්වයකට එළැඹීම.
3. විදේශ ආයෝජන තහවුරු කර ගැනීම හා අපනයන ආර්ථිකය ශක්තිමත් කරලීමට අවශ්‍ය ප්‍රතිපත්ති, නීති රීති සහ වැඩසටහන් සම්පාදනය කිරීම සහ ඩිජිටල් හරිත ආර්ථිකයක් නිර්මාණය කිරීම. රටේ ආර්ථිකය ප්‍රවර්ධනය පිණිස අවශ්‍ය ප්‍රතිසංස්කරණ සකස් කර ඉදිරිපත් කිරීම.
4. මේ වැඩ පිළිවෙළ ඔස්සේ 2048 වෙද්දී මේ රට ණය බරින් තොර දියුණු ආර්ථිකයක් ඔස්සේ සංවර්ධිත දේශයක් බවට පත්වීම.

එතැන් පටන් අප දුෂ්කර, කටුක ගමනකට මුල පිරුවා. අනාගතය සාර්ථක කර ගැනීමට හැකි වෙන්නේ ඒ ගමන ඔස්සේ බව අප දැන සිටියා. පියවරින් පියවර අප ඉදිරියට ගියා. 2023 සහ 2024 අය වැය ලේඛන මඟින් මේ වැඩ පිළිවෙළ තවදුරටත් ශක්තිමත් කළා.

2023 මාර්තු මාසය වෙද්දී IMF විස්තීර්ණ ණය පහසුකම සඳහා එකඟත්වය ලබා ගැනීමට අප සමත් වුණා. එහි පළමු වාරිකය 2023 මාර්තු 20වැනි දා ලබා ගැනීමට අප සමත් වුණා. අප ලබාගෙන තිබූ ප්‍රගතිය සමාලෝචනය කිරීමෙන් අනතුරුව දෙවැනි වාරිකය 2023 දෙසැම්බර් 12වැනි දාත්, තුන්වැනි වාරිකය 2024 ජූනි 12වැනි දාත් අපට ලැබුණා. IMF වැඩ පිළිවෙළ පටන් ගත් දා සිටම අප ණය ප්‍රතිව්‍යුහගත කිරීම ගැන සාකච්ඡා ආරම්භ කළා.

මෙවැනි කාර්යයක් සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම ලබා ගැනීම උදෙසා ලසාර්ඩ් සහ ක්ලිෆර්ඩ් චාන්ස් යන අන්තර්ජාතික ආයතනවල සහාය අප දිගින් දිගටම ලබා ගත්තා.

අපේ විදේශීය ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 37යි. එයින් ඩොලර් බිලියන 10.6ක් ද්විපාර්ශ්වීය ණය. ඩොලර් බිලියන 11.7ක් බහු පාර්ශ්වීය ණය. ඩොලර් බිලියන 14.7ක් වාණිජ ණය. ඒ අතරින් බිලියන 12.5ක් ස්වෛරී බැඳුම්කර.

ණය කපා හැරීම, ණය සහන කාලය, ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කර ගැනීම හෙවත් ප්‍රතිව්‍යුහගත කිරීම සහ ඊට අදාළ කරුණු සම්බන්ධයෙන් මේ සභාව තුළත්, ඉන් පිටතදීත් විවිධ අය විවිධ අදහස් ප්‍රකාශ කළා. ඒ සමහර කරුණු සත්‍යතාවෙන් තොරයි. සමහර කරුණු අර්ධ සත්‍යය. ඒ නිසා ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ ජාත්‍යන්තර පිළිවෙත සහ සත්‍ය කරුණු මම මේ අවස්ථාවේ පැහැදිලි කරන්න කැමතියි.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

මොනවාද මේ විදේශ ණය කියන්නේ? ඒ ඒ රටවල් ණය දෙන්න සල්ලි කොහෙන්ද ලබා ගන්නේ? අපට ඔවුන් ණයට දෙන්නේ ඒ රටවල ජනතාවගේ බදු මුදල්. ඒ වාගේම ඒ රටවල ජනතාවගේ ඉතුරුම්.

අපේ රටේ බොහෝ දෙනා යෝජනා කරන්නේ, කිසිම කැපවීමක් නොකර අපේ විදේශ ණය සඳහා සහන ලබා ගත යුතු බවයි. නමුත්, එහෙම වෙන්නේ නැහැ. එය ප්‍රායෝගික නැහැ. ජාත්‍යන්තර පිළිවෙත්වලට අනුව එහෙම කරන්නත් බැහැ. වෙනත් රටවල ජනතාවගේ බදු මුදල් වාගේම, ඒ අයගේ ඉතුරුම් සම්බන්ධ තීරණ ගැනීමේදී අපටත් කැපවීමක් කරන්න සිද්ධ වෙනවා. අප කැපවීමක් කරන්නේ නැත්නම්, ඒ රටවල ජනතාවත් අප වෙනුවෙන් කැපවීමක් කරන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. ණය ප්‍රතිව්‍යුහගත කිරීම අසීරු ව්‍යායාමයක්. ජාත්‍යන්තර ආර්ථික විශේෂඥයන් කියන්නේ මේ කාර්යය අසීරු සහ වේදනාකාරී කාර්යයක් බවයි. එය ණයහිමියන්ටත්, ණයගැතියන්ටත්, ණයගැති රටේ පුරවැසියන්ටත්, මැදිහත්කරුවන්ටත් වේදනාකාරී ක්‍රියාවලියක්.

නිල ද්විපාර්ශ්වික ණයහිමියන් මූලික ණය මුදලෙහි කප්පාදුවක් කිසි විටෙක සිදු කරන්නේ නැහැ. අපට ලබා ගන්න පුළුවන් සහන පමණයි. ණය ගෙවීමේ කාලය දීර්ඝ කිරීම, ණය සහන කාල සීමා, පොලී අනුපාතය අඩු කිරීම් ආදියෙන් තමයි මේ සහන ලබා දෙන්නේ. නමුත්, මේ යථාර්ථය නොදැන සමහරු මූලික ණය කපා හැරීමක් සඳහා ශ්‍රී ලංකා රජය ඉල්ලීම් කළේ නැහැ කියා දොස් කියනවා. තවත් සමහරු කියනවා, ඔවුන්ට බලය ලැබුණාම මූලික ණය මුදලින් සියයට 50ක් කපා හැරීමට ණයහිමි රටවල් සමඟ සාකච්ඡා කරන බව. මෙවැනි කාර්යයක් සඳහා දෙපාර්ශ්වයම එකඟ විය යුතු බව අප අවබෝධ කර ගත යුතුයි. අප කියන දේම කරන්න ණයහිමියන් කටයුතු නොකරන බවත් අප අවබෝධ කර ගත යුතුයි. එවැනි ප්‍රකාශවලින් පෙනෙන්නේ ජාත්‍යන්තර ආර්ථික ක්‍රම ගැන ඔවුන්ට කිසිදු අවබෝධයක් නැති බව පමණයි.

ණය ප්‍රතිව්‍යුහගත කිරීම කවර මට්ටමකින් සිදු කළ යුතු ද යන්න පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලය තිබෙන්නේ ණයහිමියාටවත්, ණයගැතියාටවත් නොවෙයි. ඒ පිළිබඳ තීරණය ගන්නේ IMF එකයි. රටක ණය තිරසරභාවය ඇති කරලීම පිණිස අවශ්‍ය ප්‍රතිව්‍යුහගත සැලැස්ම කවරක්ද කියා තීරණය කරන්නේ ඔවුන්. ඒ ඒ රටවල ආර්ථික ශක්තිය පිළිබඳව ස්වාධීන තක්සේරුවකින් පසු ඔවුන් ඒ තීරණය ගන්නවා.

අපේ රටේ ණය තිරසරභාවයක් නොමැති බව IMF එක අපට දැන්වූයේ 2022 වසරේ අප අමාරුවේ වැටෙන්නට බොහෝ කාලයකට කලින්. ඒ වාගේම IMF එක අනුගමනය කරන ක්‍රමය රටකින් රටකට වෙනස්. අඩු ආදායම් රටවලට එක ක්‍රමයක්; මැදි ආදායම් රටවලට තවත් ක්‍රමයක්. මම එක් උදාහරණයක් දක්වන්නම්. ශ්‍රී ලංකාව මැදි ආදායම් ගණයට වැටෙන රටක්. මැදි ආදායම් රටවල් සඳහා හඳුන්වා දී ඇති නව ණය තිරසර විශ්ලේෂණ රාමුව භාවිත කර, ණය ප්‍රතිව්‍යුහගත කළ මුල්ම මැදි ආදායම් ලබන රටවල් අතරින් එකක්, ශ්‍රී ලංකාව. ශ්‍රී ලංකාව සඳහා ඔවුන් ඉදිරිපත් කළ සැලැස්ම අනුව 2032 වෙද්දී රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95කට වඩා අඩු කර ගත යුතු වෙනවා. අඩු ආදායම් රටක් වූ ඝානාව සඳහා ඔවුන් ඉදිරිපත් කළ සැලැස්ම මීට වෙනස්. ඒ සැලසුම අනුව 2028 වෙද්දී ඔවුන්ගේ රාජ්‍ය ණයෙහි වර්තමාන වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 55කට වඩා අඩු කර ගත යුතුයි.

ඝානාවත් ලංකාව වාගේම මේ ගිවිසුමට අත්සන් කළා. ඒ රටේ ජනාධිපති නානා අකුෆෝ ඇඩෝ සහ ශ්‍රී ලංකාවෙන් මමත් මේ ගැන විටින් විට සාකච්ඡා කරලා තිබෙනවා. අපි කියනවා නේ, emerging market economy එකක් ගැන. නමුත්, ඒ අය තවම අඩු ආදායම් රටක්.

ඒත් අපට පොදු කාරණාත් තිබුණා. අපට වෙනස් වෙනස් කාරණා තිබිලාත්, අපේ රටවල් දෙකටම පුළුවන් වෙලා තිබෙනවා මේ වැඩ කටයුත්ත කරගෙන යන්න.

මේ පසුබිම මත අපට නිල ණයහිමි කමිටුවේ සාමාජිකයන් ලෙස පැරිස් සමාජය සහ ඉන්දියාව සමඟත්, චීනයේ එක්සිම් බැංකුව සමඟත් වෙන වෙනම සාකච්ඡා කිරීමට සිදු වුණා. හැබැයි, මේ පාර්ශ්ව එකකටවත් සුවිශේෂයක් කිරීමට අපට අවසරයක් නැහැ. ඔවුන් දෙපාර්ශ්වයටම සමානව සැලකෙන පොදු කොන්දේසි මාලාවක් සකස් කිරීම තමයි අප ඉදිරියේ තිබුණු දැවැන්ත අභියෝගය. මේ සංකීර්ණ අභියෝගයට අප මුහුණ දුන්නේ වර්තමානයේ පවත්නා භූ දේශපාලනික ප්‍රවණතා මධ්‍යයේයි. ඒ නිසා අපේ ඉලක්කය වෙත ගමන් කිරීම ලේසි පහසු වුණේ නැහැ. ගරු කථානායකතුමනි, ඒක හරියට වෙස් නැටුමයි, වඩිග පටුනයි දෙකම එක විධියට කරන්න යනවා වාගෙයි. එහෙත්, කරන්න බැරි වැඩක් අපි කළා.

මේ සියලු දුෂ්කරතා සහ අභියෝග මැද IMF වැඩසටහන ආරම්භ වී මාස 15ක පමණ කෙටි කාලයක් තුළ විදේශීය ද්විපාර්ශ්වික නිල ණයහිමියන් සමඟ එකඟතාවකට පැමිණීමට අපට පුළුවන් වුණා. මේ සා කෙටි කාලයක් තුළ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථක කරගත් මැදි ආදායම් ලබන රටවල් අතර අපි ඉදිරියෙන්ම සිටිනවා. මෙය සුවිශේෂී ජයග්‍රහණයක්; සුබ ආරංචියක්.

ගරු කථානායකතුමනි, ඉන්දියාව, ජපානය සහ ප්‍රංශය සම සභාපතිත්වය දරන නිල ණයහිමි කමිටුව සහ චීන එක්සිම් බැංකුව සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් ඇති කරගත් එකඟතා ගැන මම දැන් මේ සභාව දැනුවත් කරන්න කැමතියි.

- මූලික ණය ආපසු ගෙවීම සඳහා 2028 වසර දක්වා සහන කාලයක් අපට ලැබෙනවා.
- පොලී අනුපාතය සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ දමා තිබෙනවා. ඒ අනුව පොලී අනුපාතය සියයට 2.1ක හෝ ඊට අඩු මට්ටමක පවත්වාගෙන යන්නට අවසර ලැබෙනවා.
- ණය සම්පූර්ණයෙන් ගෙවා අවසන් කිරීමේ කාලය වසර අටකින් දීර්ඝ කර තිබෙනවා. තවත් ලෙසකින් කිවහොත්, අපේ ණය ගෙවා අවසන් කළ යුත්තේ 2043 වසරේදී. ඒ අනුව, දීර්ඝ කර තිබෙනවා වසර 8ක කාලයක්.
- ණය සේවාකරණ වියදම් කල් දැමිය හැකි පරිදි මූලික ණය මුදල ආපසු ගෙවීම ක්‍රමිකව වැඩි කරන්නට හැකි වෙනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඩොලර් බිලියන පහක ණය සේවාකරණයක් ශ්‍රී ලංකාවට ඉතිරි වෙනවා. ණය ගෙවීමේදී මූලික මුදල නොවෙයි, අපට ගෙවන්නට තිබෙන පොලියෙන් ඩොලර් බිලියන පහක් මේකෙන් ඉතුරු කර ගන්නට පුළුවන්.
- මේ නිසා ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම, සංචිත යළි ගොඩනැඟීම, රාජ්‍ය මූල්‍ය ස්වරක්ෂකයන් ඇති කිරීම සහ ණය ආපසු ගෙවීමේ හැකියාව වැඩි කිරීම මඟින් අනාගතයේදී ශක්තිමත් ස්ථාවරයක සිට ණය ගෙවීමට අවකාශ ලැබෙන පරිදි ආර්ථිකය වර්ධනය කර ගැනීමට අපට පුළුවන් වෙනවා. ඒ වාගේම, සැලකිය යුතු මූල්‍ය අවකාශයක් උදා වෙනවා.

ගරු කථානායකතුමනි, 2023 වසරේදී අපි දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යය අවසන් කළා. මේ ක්‍රියාවලියේදී අපි ඉතා පරිස්සම් සහගතව කටයුතු කළා. අපේ රටේ මූල්‍ය ආයතන දුර්වල නොවන ආකාරයට, ඒ ඒ ආයතනවලට ප්‍රශ්න ඇති නොවන ආකාරයට වාගේම, අපේ තැන්පත්කරුවන් අවදානමකට ලක් නොවන ආකාරයට තමයි අපි දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යය කළේ.

දැන් අපි ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක් වූ විදේශීය ද්විපාර්ශ්වීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යය සාර්ථක කර ගත්තා. ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිවලට අනුව බහුපාර්ශ්වීය ණය මේ වැඩ පිළිවෙළට අදාළ නැහැ. ඇත්ත වශයෙන්ම බහුපාර්ශ්වීය ණය කොහේවත් අඩු කරන්න යන්නේ නැහැ. ඒවා IMF එක, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව දීලා තිබෙන ණය.

ඊළඟට, අපට ඇත්තේ ඇමෙරිකානු ඩොලර් බිලියන 14.7ක් වූ වාණිජ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම අවසන් කර ගැනීමයි. මේ පිළිබඳ සාකච්ඡා දැනට සාර්ථක අන්දමින් පවත්වාගෙන යනවා. තව නොබෝ දිනකින් මේ සියලු කාර්යයන් නිම කර ගැනීමට අප අපේක්ෂා කරනවා. ඉන් පසු ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සියලු ගිවිසුම් හා ලියවිලි මම පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරනවා.

අපි බලාපොරොත්තු වුණේ පළමුවෙනි ගිවිසුම් දෙක විතරක් ඉදිරිපත් කරන්න. දැන් අපි පෞද්ගලික බැඳුම්කරුවන් සමඟ සාකච්ඡා කරනවා. ඒ වැඩ කටයුත්තත් තිබෙනවා. ඒ වාගේම මේ කටයුතු දවස් කිහිපයක් කල් දාන්න කියලා OCC එක මගෙන් ඉල්ලා තිබුණා. ප්‍රංශයේ ආණ්ඩු මාරුවක් වෙන නිසා මම ඒකට එකඟ වුණා. නමුත් අපට ඒකෙන් හානියක් වෙන්නේ නැහැ. ඝානාවයි, ලංකාවයි දෙකම ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. මේ ගැන දැනුවත් කරන්න වුවමනා නම් ඒ අවස්ථාව අපි ලබා දිය යුතුයි. ඒ වාගේම තවත් කරුණු ගණනාවක් ඇති, ප්‍රංශයේ නව ආණ්ඩුව එක්ක සාකච්ඡා කරන්න.

ඉන් පසු ඒ පිළිබඳ ගැඹුරු හා පුළුල් අවධානයක් යොමු කරන්න කියා මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් ඉල්ලා සිටිනවා. මම එහි සභාපතිතුමා වන ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා සමඟ මේ ගැන සාකච්ඡා කළා, මේ කරුණු ඔක්කෝම ලබා දීලා. කරුණාකරලා මේ ගැන සම්පූර්ණ, ගැඹුරු විග්‍රහයක් කරන්න. මෙක අපේ අනාගතය. හැම එක්කෙනාම මේ ගැන විග්‍රහයක් කළ යුතුයි.

ගරු කථානායකතුමනි, මෙතෙක් අප පැමිණි නිවැරදි මඟ නිසා කෙටි කාලයක් තුළ එවැනි ප්‍රගතියක් අත්පත් කර ගන්න අපට පුළුවන් වුණා. දැනට අපි ලබාගෙන ඇති සාර්ථක ප්‍රතිඵල නිසා රටට ලැබෙන ප්‍රතිලාභ ගැන මම මේ ගරු සභාව ඉදිරියේ කරුණු දක්වන්න කැමැතියි. ණය ගෙවන්න හැකියාව නැති බව 2022 අප්‍රේල් මාසයේ ප්‍රකාශයට පත් කිරීමත් සමඟ කිසිදු විදේශ රටක් අපට ණය ආධාර දුන්නේ නැහැ. නීත්‍යානුකූලව ඔවුන්ට එවැනි පසුබිමක ණය දෙන්නත් බැහැ. මේ අවස්ථාවේදී මිත්‍ර රටවල් දෙකක් හැටියට ඉන්දියාව සහ බංග්ලාදේශය අපට කෙටි කාලීන ණය ආධාර ලබා දුන්නා. ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව වැනි ජාත්‍යන්තර සංවිධාන විවිධාකාරයෙන් සහන ණය, ආධාර ලබා දුන්නා. ඒ හැරුණු විට වෙනත් කිසිදු රටකට අපට දීර්ඝ කාලීන ණය ලබාදීමට හැකියාවක් සහ අවසරයක් තිබුණේ නැහැ.

සමඟර දේශපාලන කණ්ඩායම් සමාජ මාධ්‍ය ඔස්සේ අපේ විදේශ ණය ගැන බොරු ආරංචි පතුරුවනවා. අපේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ අනුගාමිකයෙක් දාපු පෝස්ටුවක මෙහෙම තිබුණා, "ආරංචිය සුබයි. පිනා රට ගන්නකොට සමස්ත විදේශ ණය ඩොලර් බිලියන 71යි. දැන් 100යි" කියලා. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා සමඟ අපි වාද විවාද කරලා තිබෙනවා, හැප්පිලා තිබෙනවා. හැබැයි, එතුමා කවදාවත් මට මෙහෙම තුන්වෙනි පන්තියේ අපහාස කරලා නැහැ. හැබැයි ඔබතුමාගේ සමඟර අනුගාමිකයන් කටයුතු කරන්නේ ඔබතුමාත් විනාශ කරන්නයි.

මම මේ පෝස්ටුවෙන්ම ඊට අදාළ කරුණු ගෙන හැර දක්වන්නම්.

අපේ රටේ සමස්ත විදේශ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 37යි. හැබැයි මේ පුද්ගලයා බිලියන 71ක් කියා බොරු සංඛ්‍යාවක් කියනවා. ඊළඟට බිලියන 100ක් දක්වා පසුගිය අවුරුදු දෙක තුළ අපි ණය ගත්ත බවකුත් කියනවා. හැබැයි ණය ගෙවන්න බැරි බව ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව කිසිදු රටක් අපට ණය දුන්නේ නැති බව ඕනෑම කෙනෙක් දන්නවා. කිසිදු රටකට අපට ණයක් දීමට නීත්‍යානුකූල අයිතියක් නැහැ. ඉතින් මේ බොරු සමාජගත කිරීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද? කිසිම රටක් අපට ණය දෙන්නේ නැත්නම්, අපි කොහොමද ණය ගන්නේ? මම එංගලන්තයේ මහ බැංකුව කඩන්නද? ඒක මම දන්නේ නැහැ. පෝස්ටුව දැම්ම පුද්ගලයාට මට වඩා පළපුරුද්දක් තිබෙනවා, බැංකු කඩන එක ගැන. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, මේ අවබෝධතා ගිවිසුමෙන් පසුව අපට ද්විපාර්ශ්වීය විදේශ ණය ලබා ගැනීමේ අවකාශය යළිත් උදා වී තිබෙනවා. අපේ නිල ණය හිමියන් වන පැරිස් සමාජය, චීනයේ එක්සිම් බැංකුව ආදියෙන් යළිත් ණය ආධාර ලබා ගැනීමට අපට අවස්ථාව සැලසෙනවා.

ඒ වාගේම විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක වී අතරමඟ නැවතුණු ව්‍යාපෘති ගණනාවක් යළි ආරම්භ කරන්නට හැකි වෙනවා. ණය ගෙවීමට නොහැකි රටක් ලෙස නම් කෙරුණු නිසා, ඒ ඒ රටවල් ලබා දුන් මුදල් නැතිවීමෙන් අපේ සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් අතරමඟ නැවතුණා; විශේෂයෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ව්‍යාපෘති. ඒ සියල්ල යළි ආරම්භ කරන්න අපට හැකි වෙනවා. මෙය අපේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෝධ පිම්මක් වෙනවා. ඒ නිසාම ආර්ථිකයට විශාල ශක්තියක් ලැබෙනවා. රැකියා, ආදායම් මාර්ග වැඩි වෙනවා. නුවර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතුත් නිම කළ හැකියි.

විදේශ ව්‍යාපෘති අතරමඟ නැවතීමේ තවත් ප්‍රතිඵලයක් වුණේ අපේ ආර්ථික සංවර්ධන වේගය පහළ වැටීමයි. මේ වන විට අප ප්‍රගතියක් ලබා තිබෙනවා. යළිත් ලෝක ආධාර මත ව්‍යාපෘති ක්‍රියාත්මක වෙද්දී සංවර්ධන වේගය තව තවත් ඉහළ නංවා ගැනීමට අපට හැකි වෙනවා.

ගරු කථානායකතුමනි, විදේශ ණය සම්බන්ධයෙන් සමාජයේ පතුරවන මිථ්‍යාව පිළිබඳවත් කරුණු කීපයක් අවධාරණය කරන්න මම කැමැතියි.

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටකට තනිව යැපෙන්න බැහැ. තනිව යැපෙන්න තරම් ආදායමක් අප තවම උපදවා ගෙන නැහැ. ඒ නිසා අපට ණය සහ ආධාර ලබා ගන්න සිද්ධ වෙනවා. හැබැයි, ඒ ණය සහ ආධාර අප ආයෝජනය කළ යුත්තේ එදිනෙදා කන්න බොන්න, පඩි වැඩි කරගන්න වාගේ කාර්යයන් සඳහා නොවෙයි. නිදහසින් පසුව අප රට වරද්දා ගත් ප්‍රධාන දෙයක් තමයි ඒ. පඩි වැඩි කරන්න ණය යොදා ගත්තා. ආණ්ඩුවේ රස්සා දෙන්න ණය යොදා ගත්තා. ආහාර නොමිලේ

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

දෙන්න ණය යොදා ගත්තා. ආහාර ද්‍රව්‍ය, ඉන්ධන, විදුලි බලය වාගේ දේ අඩුවට දෙන්න ණය යොදා ගත්තා. රාජ්‍ය ව්‍යවසායවල පාඩු පියවන්න ණය යොදා ගත්තා. මේ ඔක්කොම නොකර අස්වැසුම දෙන්න අපට පුළුවන් වුණා. ඒ සංඛ්‍යාව වැඩි කරන්න පුළුවන් වුණා. හාල් කිලෝ 10 ගණනේ මාස දෙකකට දුන්නා. අපි "උරුමය" වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යනවා. දැන් නිවාසවලට සින්නක්කර ඔප්පු ලබා දෙනවා. මේ ඔක්කොම අපි කරලා තිබෙනවා, පිටරට සල්ලි ගන්නේ නැතුව.

සමහර දේශපාලන කණ්ඩායම් ඉදිරියටත් මේ ආකාරයටම ක්‍රියා කරන බවට ජනතාවට පොරොන්දු වෙනවා. "අපි ආවාම පඩි වැඩි කරනවා. අපි ආවාම බදු අඩු කරනවා. අපි ආවාම සහන දෙනවා" කියමින් දහසකුත් එකක් පොරොන්දු දෙනවා. හැබැයි ඒ සඳහා මුදල් උපදවා ගන්නා ක්‍රමය ගැන ඔවුන් වචනයක් කථා කරන්නේ නැහැ. හැබැයි, මම මේ වගකීම භාර ගත්තාට පස්සේ ආණ්ඩු ගණනාවක් කළ ඒ වැරදි වැඩේ නැවැත්තුවා.

ගරු කථානායකතුමනි, මීළඟට මම පෙන්වා දෙන්න යන්නේ විදේශ ණය ප්‍රතිව්‍යුහගතකරණය නිසා අපට ලැබෙන මූල්‍යමය ප්‍රතිලාභ පිළිබඳවයි. 2022 වන විට විදේශ මුදලින් නාමනය කළ ණය ගෙවීම සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.2ක් අප වැය කළ යුතුව තිබුණා. 2027 සිට 2032 දක්වා කාලය තුළ එය සියයට 4.5 දක්වා අඩු කරගත යුතුයි. 2022 වෙද්දී දළ මූල්‍යයන අවශ්‍යතා සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 34.6ක්. 2027 සිට 2032 දක්වා කාලය තුළ එය සියයට 13කට අඩුවෙන් පවත්වා ගත යුතුයි. මේ මඟින් රාජ්‍ය සේවය සඳහා වැඩි මුදලක් වෙන් කිරීමට අවකාශය සැලසෙනවා. ඒ වාගේම දේශීය පොලී අනුපාතික තවදුරටත් පහළ හෙළීමටත් ඉඩකඩ ලැබෙනවා.

ගරු කථානායකතුමනි, අගාධයකට වැටී තිබුණු අපේ රටේ ආර්ථිකය යළි ගොඩනැංවීමේ වෑයමට පක්ෂ භේදයකින් තොරව සහාය දක්වන්න කියා මම මේ සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් දිගින් දිගටම ඉල්ලා සිටියා. දීර්ඝ කාලයක් තිස්සේ මට දේශපාලන වශයෙන් එරෙහිව කටයුතු කළ අය පවා රට ගැන හිතලා මේ කාර්යයට ප්‍රසිද්ධියේම සහාය දැක්වූවා. තවත් සමහරු නිහඬව සහාය දැක්වූවා. තව පිරිසක් දිගින් දිගටම බාධා කළා; විවේචනය කළා.

මේ ආර්ථික අර්බුදය ඇති වූ අවස්ථාවේ මම දැරූ ස්ථාවරය වුණේ වහාම IMF සහාය ලබා ගත යුතු බවයි. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා කැඳවූ සර්ව පාක්ෂික සාකච්ඡාව විපක්ෂයේ යම් යම් කණ්ඩායම් වර්ජනය කරද්දී, මම තනි මන්ත්‍රීවරයෙකු ලෙස ඊට සහභාගි වුණා. මගේ මතය මම පැහැදිලිව ප්‍රකාශ කළා.

අපට යන්න තිබෙන එකම මාර්ගය IMF සහාය ලබා ගැනීම බව මම කිව්වා. ඊට මාස කීපයකට පස්සේ රටේ ආර්ථිකය ගොඩනැංවීමේ අභියෝගය කිසිවෙකුත් භාර නොගත් පසුබිමක මම මෙකට බෙල්ල තිබ්බා. ඒ අනතුරුදායක අභියෝගය මම භාර ගත්තේ මගේ රට වෙනුවෙන්; මගේ මව්බිම වෙනුවෙන්; ලක් මාතාව වෙනුවෙන්. ලක් මාතාව අනතුරුදායක වැල් පාලමෙන් කෙසේ හෝ එගොඩ කරන බව ජනතාව ඉදිරියේ සපථ කරමින් මම මේ අභියෝගය භාර ගත්තා. සියලු ජන කොටස් මේ වැඩ පිළිවෙළට සහාය දුන්නා. ඒ අයට මගේ ස්තුතිය යළිත් පුද කරන්නට කැමැතියි.

විවිධ දුෂ්කරතා මැද IMF සාකච්ඡා අප ඉදිරියට ගෙන ගියා. ඒ අවස්ථාවේ විවේචකයන් කිව්වේ කිසි දිනෙක IMF සාකච්ඡා සාර්ථක කර ගැනීමට හැකි වෙන්නේ නැහැ කියලායි. හැබැයි අපි ඒ සාකච්ඡා සාර්ථක කරගත්තා. එතකොට විවේචකයන් පිල්ල මාරු කළා. IMF සහයෝගයෙන් ගොඩ ගිය කිසිම රටක් නැති බව එක කණ්ඩායමක් කිව්වා. තමන් බලයට පත් වුණාම IMF එකඟතාවලට ගරු කරන්නේ නැති බව තවත් අය කිව්වා. හැබැයි අපි සාර්ථකව ඉදිරියටම ගියා. විවේචකයන් ආයෙම පීලි මාරු කළා. IMF කොන්දේසි සපුරන්න අපට බැරි වෙලා තිබෙන බව සමීක්ෂණ වාර්තා උපුටා දක්වමින් ඔවුන් පෙන්වා දුන්නා. ඒ නිසා අපේ වැඩ පිළිවෙළ අසාර්ථක බව කිව්වා. පළමු වාරිකය ලැබුණාට දෙවැනි එක ලැබෙන්නේ නැහැ කිව්වා. හැබැයි දෙවැනි වාරිකයත් අපිට ලැබුණා. ඒ පාර ආපහු විවේචකයන්ගේ පීලි මාරු වුණා. IMF කොන්දේසිවලින් සියයට අච්චරක්, මෙච්චරක් සපුරන්න අපි අසමත් වෙලා කියලා අහවල් සමීක්ෂණ ආයතනය කියා තිබෙනවා, දැන් ඉතින් තුන්වැනි වාරිකය ගැන බලාපොරොත්තු තියන්න බැහැ කියමින් ඒ අය රටම බය කරන්න උත්සාහ කළා. හැබැයි තුන්වැනි වාරිකයත් අපට ලැබුණා. පීල්ල නැවතත් මාරු වුණා. තුන්වැනි වාරිකය ලැබුණත් කිසි ලෙසකින් ණය ප්‍රතිව්‍යුහගතකරණය සාර්ථක කරගන්නට අපට ලැබෙන්නේ නැහැ කිව්වා. ඒ විතරක් නොවෙයි, මේ ප්‍රතිව්‍යුහගතකරණයට එකඟ වෙන්න එපා කියලා අපේ ණය හිමි රටවලට විවිධාකාරයේ බලපෑම් කරන්නටත් උත්සාහ කළා. හැබැයි ණය ප්‍රතිව්‍යුහගතකරණය අප සාර්ථක කරගත්තා. ඒ පාර ආයෙම පීලි මාරු කළා. දැන් කියන්නේ "ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවිලා නැති නිසා ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පලක් නැහැ. ඒ නිසා තවමත් අපි බංකොලොත් රටක්" කියලායි. මම ඒ ගැනත් යමක් කියන්න කැමැතියි.

2019 වෙද්දි අපි හිටියේ ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම්වල "බී" මට්ටමේ. 2020දී ශ්‍රී ලංකාව "සී" මට්ටමට පහත දැම්මා. ඒ කියන්නේ, ණය ගෙවාගන්න බැරි බව ප්‍රකාශ කරන්න බොහෝ කාලයකට කලින්. අපි පහළම මට්ටමට වැටුණේ ණය ගෙවන්න බැරි වුණාට පස්සේ නොවෙයි. එයින් අපට පැහැදිලි වෙන්නේ ශ්‍රේණිගත කිරීම් සඳහා පදනම් කරගන්නා වෙනත් නිර්ණායක ගණනාවක් තිබෙන බවයි. දැන් අප සාර්ථක ප්‍රතිඵල ගණනාවක් පෙන්වා තිබෙනවා. දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය සාර්ථකව නිම කළා. විදේශීය ද්වීපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගතකරණය සාර්ථක කර ගත්තා. ඉතිරිව ඇති වාණිජ ණය ප්‍රතිව්‍යුහගත කිරීමද කඩිනමින්ම නිම කර ගැනීමට අපට හැකි වේවි.

මේ සියල්ල සමඟ අපේ ආර්ථික දර්ශක ඉහළ නැංවෙනවා. අපේ ආර්ථික දර්ශක පදනම් කරගෙන නිසි අවස්ථාවේ ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ දැමීමට ජාත්‍යන්තර මූල්‍ය ආයතන කටයුතු කරාවි. අපේ විවේචකයන්ට ආපහු පීලි මාරු කරන්න සිද්ධ වෙන්නේ අන්න එතකොටයි. ගරු කථානායකතුමනි, ආණ්ඩුවේ අපි සහ මේ විවේචකයන් අතර වෙනසක් තිබෙනවා. ආණ්ඩුවේ අපි සහ මේ කයිවාරුකරුවන් අතර වෙනසක් තිබෙනවා. ආණ්ඩුවේ අපි සහ මේ පම්පෝරිකරුවන් අතර වෙනසක් තිබෙනවා. අපි රට වෙනුවෙන් නිවැරදි ප්‍රතිපත්තියක, නිවැරදි මාර්ගයක ඉදිරියට යනවා. ඔවුන් බලය වෙනුවෙන් දවසින් දවස එක එක කථා කියනවා. මේ සියල්ල දෙස අවධානයෙන් සහ සීරුවෙන් බලා සිටින කණ්ඩායමක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. විවිධ දේශපාලන පක්ෂවලට අයත් ඔවුන් මේ සියල්ලම ස්වාධීනව හා අපක්ෂපාතීව නිරීක්ෂණය කරනවා. ඔවුන් ඉවසිලිවන්තව මේ සියල්ල බලා සිටිනවා. පක්ෂයක් වෙනුවෙන් හෝ පුද්ගලයෙක් වෙනුවෙන් හෝ පෙනී සිටිනවාද, එහෙමත් නැත්නම් රට වෙනුවෙන් පෙනී සිටිනවාද යන්න ගැන ඔවුන් දැඩි ලෙස අවධානය යොමු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මීට අවුරුදු දෙකකට කලින් තිබුණු තත්ත්වය මොකක්ද? අපට ඒ තත්ත්වය අමතක කරන්න

පුළුවන්ද? ආර්ථික පැත්තෙන් පමණක් නොවෙයි, සමාජයීය, දේශපාලනික පැතිවලින් පවා ඒ තත්ත්වය වෙනස් වී ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සුබ ආරංචි එද්දි සමහරු කලබල වුණු විධිය අප දැක්කා. භූමිතෙල් ගෑවුණු ගැරඬියන් වාගේ ඒ අය හැසිරුණේ. Social media භාෂාවෙන් කියනවා නම් ඒ අයගේ ඇහේ ඉත්තෑවන් දිව්වා. ඇයි ඒ? IMF වැඩ පිළිවෙළ සාර්ථක වීම සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද?

තෙල් පෝලිම්, ගෑස් පෝලිම්, භූමිතෙල් පෝලිම්වල දවස ගණන් රස්තියාදු වෙන එක අවසන් වීම සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද? සියයට 30කට වඩා ඉහළ නැඟ තිබුණු බැංකු පොලිය සියයට 9ක් පමණ දක්වා පහළ වැටීම සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද? සියයට 70ක් වාගේ ඉහළ අගයකට ගිය උද්ධමනය පසුගිය මාසය අවසානයේදී සියයට 1.7ක් දක්වා අඩුවීම සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද?

එක දිගටම කාර්තු 6ක් හැකිළෙමින් තිබුණු අපේ ආර්ථිකය යළි වර්ධනය වෙන්න පටන් ගැනීම සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද? 2022 මැයි මාසය වෙද්දී පත්ලටම හිඳී නන්නත්තාරව තිබුණු අපේ විදේශ සංචිත දැන් ඩොලර් මිලියන 5,410ක් දක්වා ඉහළ නැංවීම සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද? රුපියල ශක්තිමත් වීම සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද? ප්‍රාථමික ගිණුමේ හිඟය, අතිරික්තයක් ලෙස පරිවර්තනය වීම සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද? සල්ලි අච්චු ගහන්නේ නැතිව අය වැය හිඟය පියවා ගැනීම සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද? විදේශ ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ අතිරික්තයක් ඇති කර ගැනීම සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද? ගාලු මුවදොර පිටටනියටවත් ගුටි නොකා යන්න නිදහසක් නොතිබුණු පක්ෂ නායකයන්ට රටේ දකුණු කෙළවරේ සිට උතුරු කෙළවරට යන්න පුළුවන් වීම සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද? පාර්ලිමේන්තුවට එන්නට තියා තම තමන්ගේ ගෙවල්වල ඉන්නවත් බැරි තරම් භීෂණයක් තිබුණු රටක්, කිසිවෙකුට බයක් හැකක් නැතුව ජීවත් වෙන්න පුළුවන් තැනකට ගෙන ඒම සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද? රටට යහපතක් වෙන එක සුබ ආරංචියක්ද, අසුබ ආරංචියක්ද?

ගරු කථානායකතුමනි, මෙතැනින් ඉදිරියට යන්න අපට ඇති එකම මාර්ගය මෙයයි. මේ සුබ ආරංචිය අනාගතය දක්වා රැගෙන යන්නට හැකි එකම මාර්ගය මෙයයි. පසුගිය කාලය තුළ අප ලැබූ ජයග්‍රහණ මඟින් එය යළි යළිත් තහවුරු වී තිබෙනවා. වැල් පාලමේ අසීරු ගමන අප ඉදිරියටම යා යුතුයි. කවුරු බලයට ආවත් ආපසු හැරීමක් අපට නැහැ. ආපසු හැරී වෙන පාරක ගියොත් මාසයක් දෙකක් යන්න කලින් ඉන්ධන නැහැ, ගෑස් නැහැ, විදුලි බලය නැහැ. මහා ව්‍යසනයකට රට ඇද වැටෙනවා. වසර 25කට 30කට යළි ගොඩ එන්නට බැරි ඛේදවාචකයකට මේ රට ඇද වැටෙනවා.

ගරු කථානායකතුමනි, හුණුවටයේ කතාව නාට්‍යයේ ගෲෂා දරුවා වඩාගෙන වැල් පාලමේ යන්න තීරණය කරනවා. ඒ අවස්ථාවේ වෙන විකල්පයක් නැහැ. ඒ වෙලාවේ ළඟ ඉන්න කෙනෙක් ගෲෂාගෙන් මෙහෙම අහනවා.

"මැරෙන්න හදනවාද? පේනවාද හෙළ..! පාතාල ලෝකේ වාගේ...!!"

ඒත් ගෲෂා අවදානම් තීරණය ගන්නවා. ඇය දරුවාත් වඩාගෙන කොහොම හරි වැල් පාලම තරණය කරනවා. හැබැයි, හුහක් දෙනා බලන් ඉන්නේ ගෲෂා වැල් පාලමෙන් පහළට වැටෙයි කියලා. ඒත් අන්තිමේදී ඇය දරුවාවත් රැගෙන ආරක්ෂිතව වැල් පාලමෙන් එගොඩ වෙනවා. බලන් හිටපු කෙනෙක් කේන්තියෙන් කියනවා, මෙන්න මෙහෙම.

"මම උන්නේම වැටෙයි කියලා... අපරාදේ...."

අන්න එහෙම කාලකණ්ණි සිතුවිලි තිබෙන අය අදත් මේ සමාජයේ ඉන්නවා. මම ඒ අයටත් කියන්නේ, රට වෙනුවෙන්, රටේ අනාගතය වෙනුවෙන් ඒ සිතුවිල්ල වෙනස් කර ගන්න කියලායි. වැටෙන තුරු බලා නොසිට අපි රට ගොඩ නංවන විධිය ගැන හිතමු. ඒ වෙනුවෙන් වෙහෙසෙමු.

ගරු කථානායකතුමනි, මට කැමැති-අකැමැති, මට ගරු කරන-මට නිගරු කරන මේ ගරු සභාවේ සියලු සාමාජිකයන්ගෙන් යළි යළිත් ඉල්ලා සිටින්නේ රට ගැන සිතන්න කියායි. එකක් මතක තබා ගන්න. මම තීන්දු-තීරණ ගන්නේ දේශපාලන බලය වෙනුවෙන් හෝ දේශපාලන ජනප්‍රියතාව වෙනුවෙන් නොවෙයි. මම තීන්දු-තීරණ ගන්නේ රට වෙනුවෙන්. තරුණයන්ගේ අනාගතය වෙනුවෙන්. පසුගිය අවුරුදු දෙක පුරා මම දේශපාලනය කළේ නැහැ. දේශපාලන වාසි ලබා ගැනීම සඳහා තීන්දු ගත්තේ නැහැ.

මේ ගරු සභාවේ මම වාගේම රටට ආදරය කරන තවත් බොහෝ අය ඉන්නවා. තම තමන්ගේ පෞද්ගලික ලාභ ප්‍රයෝජනවලට වඩා රට ගැන හිතන බොහෝ අය ඉන්නවා. ඒ සියලුදෙනාගෙන්ම මම ඉල්ලා සිටින්නේ, රට යළි ගොඩ නැංවීමේ අභියෝගාත්මක ව්‍යායාමයට එක් වෙන ලෙසයි. මේ මල් වට්ටියට අත ගසන ලෙසයි. එන්න. අපි එකට එක් වී අපේ මව්බිම යළිත් ඉහළට ඔසවා තබමු.

Hon. Speaker, I would also like to say a few words in English. I will not go over what I have said, but will talk of what we have to do in the future.

The efforts taken to restructure our debt provide Sri Lanka with the necessary breathing space to transform the economy into a resilient and stable economy. That could manage the lighter burden of debt service in the future. This breathing space should not be wasted. In the past, Sri Lanka's economic growth was dominated by the non-tradable sector. During this period, particularly the post-war period, the economy expanded, but the tax revenue and exports, as a share of GDP, declined and the capacity to service debt continued to diminish. To reverse the trend, we must transform Sri Lanka into an economy where growth is driven by non-debt creating foreign exchange inflows. Export of goods, export of services and foreign direct investment must be the leading drivers of growth in the economy. Parallely, the fiscal and monetary reforms, reforms to State-owned enterprises and other reforms must continue to ensure that fiscal and external buzzers remain robust. A combination of strong revenues and robust foreign exchange balances are critical to ensure that Sri Lanka has a capacity to service the debt.

The Economic Transformation Bill embodies all of these critical factors. It provides the institutional framework to support the growth of exports and FDI in the economy. The Bill also provides the macroeconomic targets which will enable continued economic stability and sustainable, inclusive economic growth. Purposeful implementation of measures incorporated in the Economic Transformation Bill will create the required economic conditions that enable Sri Lanka to truly benefit from relief created by restructuring of debt. But, a failure to do so would mean that we would swiftly fall back into

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

trouble. The breathing space provided by debt restructuring will go on for two years.

What Sri Lanka requires now is a high-growth trajectory of 7 per cent GDP per annum. It may be high by Sri Lankan standards. We have stayed at a growth rate of 4 per cent or 5 per cent GDP, but Vietnam and some other countries have showed that you can go up to 7 per cent. If we maintain a 7 per cent growth for two decades, our GDP would grow from about US Dollars 85 billion to about US Dollars 350 billion, by four times. Are we always going to stay poor? Is our policy to stay poor? Should we not have policies which would make us, not us, the future generation, rich? In two decades, we would not be here, but the future generation would. We have to make them rich. So, that is certainly what we should follow and I ask this House and all political parties to get into high-growth policies and let us compete with each other on that. We cannot go on with a slow growth; we cannot go on this journey any further.

Therefore, while today is a major landmark and a cause for celebration, by no means, does it allow us to be complacent as a nation. The successful conclusion of the official debt restructuring should give us the confidence and encouragement to move forward on this path of economic recovery, towards the goal of a prosperous, inclusive and sustainable economy, a high-growth economy with a minimum of 7 per cent growth per year.

Sir, I am sorry that when I am making this Statement, one of my Colleagues or the only Colleague who came to Parliament with me, the Hon. Rajavarothiam Sampanthan, is no longer here with us. He passed away on Sunday. He and I have worked together through difficult times and I know the contribution he had made. One thing, I must say. Though he was in the TULF and the TNA, he steadfastly stood for the territorial integrity of Sri Lanka. He asked me, "Do you think, Ranil, that I will divide the country? As a small boy, I went to see the Independence in 1948". None of us has seen that. We, most of us, were not even born then. Anyway, he had his own views on how power should be shared. There is no reason to fight over that, but I think he had done a sufficient amount of work, that we have only a little more to finish and the best contribution we could make for him is to finish that work on devolution and decentralization.

Thank you.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේදී එකඟ වුණු ආකාරයට, මටත් කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි ජනාධිපතිතුමාගේ කථාව හොඳින් අසා සිටියා. විශේෂයෙන් මම එක දෙයකට එකඟ වෙනවා. කාර්යය අසීරු බව අපි අවබෝධ කරගෙන තිබෙනවා. ඒක ලේසි පහසු කාර්යයක් නොවෙයි, අසීරු කාර්යයක්. හැබැයි, මේ අසීරු කාර්යය ක්‍රියාත්මක කිරීමේදී අපි විශ්වාස කරන ආකාරයට රටේ ජනතාව සත්‍යය අවබෝධ කර ගැනීම අතිශයින්ම වැදගත් වෙනවා. ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව සහ ගිවිසුම් පිළිබඳව ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් වුණා. ඒ ගැන දැන් අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. එක වෙලාවකදී ප්‍රකාශ කළා, ලංකාව තමයි ලෝකයේ අනෙක් රටවලට වඩා ඉතා ඉක්මනින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමට ලක් වුණේ කියලා. ඒක සත්‍යයෙන් තොරයි. ඝානාව, ආර්ජන්ටිනාව, ඉක්වදෝරය, බෙලීස්, මොංගෝලියාව, බාර්බේඩෝස්, චැඩ් රාජ්‍යය වැනි රටවල් අපේ රටට පෙර සීමාසහිත කාල වකවානුවක් තුළ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම් ක්‍රියාත්මක කරන්නට සමත් වුණා.

බලන්න, ඝානාව debt restructuring පටන් ගත්තේ 2023 ජනවාරි මාසයේදී. ඔවුන්ගේ Sovereign Bonds, US Dollars 13 billion තිබුණා. නමුත්, 2023 මාර්තු මාසයේ creditor committee එක ඔවුන්ට financing assurances දුන්නා. 2024 මාර්තු මාසයේ ඝානාව bilateral creditorලා සමඟ MoU එක අත්සන් කළා. 2024 ජූනි මාසයේ ඝානාව principal bondholdersලා එක්ක එකඟතාවකට ආවා. ඒ විතරක් නොවෙයි. ඝානාවට හැකියාව ලැබුණා, තමන්ගේ ණය සහ පොලිය කියන දෙකම සියයට 37ක් අඩු කර ගන්න. ඝානාව එහෙම කරනකොට ආර්ජන්ටිනාව මොකක්ද කළේ? ආර්ජන්ටිනාවත් ණය සාකච්ඡා ආරම්භ කළා, 2019 දෙසැම්බර් මාසයේ. Debt exchange එක ක්‍රියාත්මක වුණා, 2021 සැප්තැම්බර් මාසයේ. Defaulting පටන් ගත්තා, 2021 මාර්තු මාසයේ. මේ සියලු දේ සිද්ධ වෙලාත් ආර්ජන්ටිනාවට පුළුවන්කම ලැබුණා, Net Present Value එක පදනම් කරගෙන සියයට 36ක ණය අඩු කිරීමක් කර ගන්නට. ඒ වාගේම market value haircut එක ලෙස සියයට 56ක් ලබා ගන්නට පුළුවන්කම ලැබුණා.

ඊළඟට, ඉක්වදෝරය අරගෙන බලන්න. ඉක්වදෝරය ණය සාකච්ඡා ආරම්භ කළේ 2020 මාර්තු මාසයේ. ඒ අය debt exchange ක්‍රියාත්මක කළේ 2020 සැප්තැම්බර් මාසයේ. ඉක්වදෝරයට හැකියාව ලැබුණා, සියයට 42.2ක Net Present Value haircut එකක් ලබා ගන්නට. ඇත්ත වශයෙන්ම තවම අපට දැනගන්නට ලැබිලා නැහැ අපේ සංඛ්‍යාලේඛන, දත්ත පිළිබඳව. අපි බලාපොරොත්තුවෙන් හිටියා, ජනාධිපතිතුමා ජාතිය අමතනකොට, රැස්වීම් ආමන්ත්‍රණය කරනකොට වාගේම අද දවසේ පාර්ලිමේන්තුවට මේ සංඛ්‍යාලේඛන ටික ඉදිරිපත් කරයි කියලා. නමුත් හදිසියේම පාර්ලිමේන්තු පක්ෂ නායකයන්ගේ රැස්වීමක් කැඳවලා අදයි, හෙටයි විවාදයක් කරනවා කියලා ඔක්කොම සැලසුම් කරලා, හිටි හැටියේම ඊයේ දවසේ ඒක withdraw කළේ ඇත්තටම තවමත් අංග සම්පූර්ණ ගිවිසුමකට ප්‍රවේශ වෙලා නැති නිසායි. ආර්ජන්ටිනාව, ඉක්වදෝරය, ඝානාව ලබා ගත්ත ණය අඩු කිරීමට සමානව හෝ ඊට වැඩි ප්‍රමාණයකින් අපේ ශ්‍රී ලංකාවේ වර්තමාන රජයටත් ණය අඩු කර ගැනීමකට හැකියාවක් ලැබිලා තිබෙනවාද කියන එක අපි බලා සිටිනවා. ඒ, පළමුවැනි කාරණාව.

දෙවැනි කාරණාව මෙකයි. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා ජාතිය අමතනකොට බොහොම පැහැදිලිව කිව්වා, නැවත ණය ගෙවීමේ කාර්යය ගිවිසුම්ගත වුණා කියලා 2028 සිට ක්‍රියාත්මක කරන්න.

හැබැයි, 2023 මාර්තු මාසයේ IMF එක කරපු ඒ debt sustainability analysis එකට අනුව ආපසු ණය ගෙවීම කරන්න පුළුවන් 2033 සිට කියලා IMF එක කියන බව ඔබතුමා දන්නවාද? 2033 සිට ණය ගෙවීමේ ක්‍රියාවලිය ආරම්භ වන්නට තිබියදීත්, ඇයි රජයට බැරි වුණේ ඒ වසරේදීම එය ක්‍රියාත්මක කරන්නට ගිවිසුම්ගත වෙන්නට? මොකද, 2033 දැන් 2028 වෙලා. අපි දකිනවා, රජයේ සාකච්ඡාමය ක්‍රියාදාමය තුළ ඇති වුණු දුර්වලතාව නිසා තමයි එසේ සිදු වුණේ කියලා. මොකද, IMF එක කියද්දීත් ණය ගෙවීම් කටයුතු 2033 සිට ක්‍රියාත්මක කරන්න කියලා, ඇත්තටම 2028 සිට එය ක්‍රියාත්මක කරන්නට ගිවිසුම්ගත වෙලා.

ඒ වාගේම ජනාධිපතිතුමාගේ ප්‍රකාශයේ විවිධ අවස්ථාවලදී කියැවුණා, China's EXIM Bank debt එක ඇමෙරිකානු ඩොලර් බිලියන 3.9කට එකඟ වුණා කියලා. හැබැයි, කිසිම සඳහනක් නැහැ, ඇමෙරිකානු ඩොලර් මිලියන 13.8ක Chinese Government debt එක ගැන. ඒ වාගේම China Development Bank debt එක ඇමෙරිකානු ඩොලර් මිලියන 538යි. ඒක ගැනත් සඳහනක් නැහැ. අපි බොහොම පැහැදිලිව කියනවා, යම් යම් තොරතුරු, කරුණු-කාරණා රටට අනාවරණ කරන්නේ නැතුව තමයි ජනාධිපතිතුමා මේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ සාර්ථකත්වය ගැන කථා කරන්නට උනන්දු වෙලා තිබෙන්නේ කියලා.

මේ අවස්ථාවේදී මම පැහැදිලිව මේ කාරණයත් කියන්නට ඕනෑ, ගරු කථානායකතුමනි. මේ රජය දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී අනුගමනය කරපු ක්‍රියාවලිය, විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වන අවස්ථාවේදීත් ඇත්තටම ජාත්‍යන්තර බැඳුම්කර ණයහිමිකරුවන්ට යටත් වෙලා කටයුතු කරනවාය කියන එක අපට මේ අවස්ථාවේදී පෙනෙනවා. මම ඒ සඳහා උදාහරණ කිහිපයක් කියන්නම්. විශේෂයෙන්ම 2022දී බොහොම පැහැදිලිව රජය ප්‍රකාශ කළා, දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් කෙරෙන්නේ නැහැ කියලා. හැබැයි, international sovereign bondholdersලා තර්ජනය කරන්නට හදනකොට අනිවාර්යයෙන්ම දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම ක්‍රියාත්මක කළා. ඒකෙන් කළේ මොකක්ද? Primary bond dealersලා කියන සුපිරි පෝසතුන් පැත්තකින් තියලා, ඔවුන්ට අතවත් තියන්නේ නැතුව, මේ රටේ වැඩ කරන ජනතාවගේ විශ්‍රාමික අරමුදල්වලට - EPF/ETF එකට - පික්පොකට් ගැහුවා කියන එක තමයි අපට බොහොම පැහැදිලිව පෙනෙන්නේ. ඒ වාගේම 2023 ඔක්තෝබර් මාසයේදී රජය කිව්වා, value recovery instruments ක්‍රියාත්මක කරන්නේ නැහැ කියලා. හැබැයි, එහෙම කියලා ඉන්පසුව bondholdersලාට, international sovereign bondholdersලාට macro-linked bonds වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට ඒ අයගේ පීඩනය සහ තර්ජනය මත රජය එකඟ වුණා. ඒ කියන්නේ ණය අඩු කිරීම තීන්දු වෙන්නේ GDP එක අනුව. දැන් GDP එක recover වෙනකොට ණය අඩු කිරීම සීමා කරන්නට මේ රජය මේ macro-linked bonds හරහා එකඟ වෙලා තිබෙනවා. අපි හිතනවා, ඒක ඇත්ත වශයෙන්ම රටට අසුබවාදී බව. විශේෂයෙන්ම ජනාධිපතිතුමා ප්‍රකාශ කර තිබෙනවා, විනිවිදභාවය සහ comparability කියන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා කියලා domestic bondholdersලා සම්බන්ධව. ඒ කියන්නේ සමබර ආකාරයට පීඩනය බෙදා හදා ගන්නවා කියලා; equal burden sharing එකක්. ඒ වාගේම විනිවිදභාවය. නමුත් මේවා ගැන රජය හුහක් කථා කළත්, පැහැදිලිව රජය අනුගමනය කරලා තිබෙන්නේ ද්විත්ව ප්‍රතිපත්තියක්. ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් වෙත එක ප්‍රතිපත්තියකුත්, මේ රටේ වැඩ කරන ජනතාවගේ pension fundsවලට පික්පොකට් ගසමින් මේ රටේ ජනතාවට වෙනස් ප්‍රතිපත්තියකුත් තමයි ක්‍රියාත්මක කරලා තිබෙන්නේ.

මම ජනාධිපතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි, විශේෂයෙන්ම ජැමෙයිකාව දෙසට. බලන්න, ජැමෙයිකාව දිහා. Domestic debt restructuringවලදී value recovery and inflation -hedged bonds ක්‍රියාත්මක කරලා රටටත්, ජනතාවටත් වාසිදායක ආකාරයට value එක recover කරන ක්‍රියාදාමයක් ක්‍රියාත්මක කරන්නට ජැමෙයිකාවට පුළුවන්කම ලැබුණා. හැබැයි, ජැමෙයිකාවට පුළුවන්කම ලැබුණාට ඔබතුමාගේ රජයට ඒ කර්තව්‍යය කරන්නට හැකියාව ලැබිලා නැහැ.

වැඩ කරන ජනතාවගේ සම්පත් ටික කප්පාදු කිරීමක් තමයි ඔබතුමා කළේ. ඒ වාගේම අපට තිබෙනවා ජනාධිපතිතුමාගෙන් ප්‍රශ්න කරන්න, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් සමඟ කළ සාකච්ඡා ඇත්තටම ප්‍රශස්ත හා ප්‍රබුද්ධ ආකාරයට ක්‍රියාත්මක වුණාය කියලා ඔබතුමා විශ්වාස කරනවා ද කියලා. එය එසේ ක්‍රියාත්මක වුණා නම් කවදාවත්, විශේෂයෙන්ම ඒ ස්වෛරී බැඳුම්කර හිමියන් නියෝජනය කරන කණ්ඩායම් - bondholder groups - ප්‍රකාශ නිකුත් කරන්නේ නැහැ, ඒ අයගේ ඒ ගමනේ ප්‍රගතිය ක්‍රියාත්මක නොවීම පිළිබඳව. ඇත්තටම ශ්‍රී ලංකා රජයේ උනන්දුවක් නැතිකම පිළිබඳව ඒ international sovereign bondholdersලා 2024 ජනවාරි 31වන දා බොහොම පැහැදිලි statement එකක් ඉදිරිපත් කරලා රටට කරුණු පෙන්වා දීලා තිබෙනවා.

මම ජනාධිපතිතුමාට තව කාරණයක් කියන්න කැමැතියි. දැන් ඔබතුමාත් බොහෝ විදේශ සංචාරවල නිරත වෙනවා. ඒ විදේශ සංචාරවලදී ඔබතුමා ජාත්‍යන්තර ප්‍රජාව, ජාත්‍යන්තර නායකයන් හමු වනවා. ඔබතුමා දන්නවා ද, සානාවට පුළුවන්කම ලැබුණා කියලා සියයට 37ක ණය කප්පාදුවක් ගන්න? සානාවේ මොහොමඩ් අමීන් ආදම් කියන මුදල් ඇමතිතුමා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් - international sovereign bondholdersලා - සමඟ සෘජුවම සාකච්ඡා කරලා, විශ්වාසයක් දිනාගෙන, පිළිගැනීමක් ලබාගෙන, රට වෙනුවෙන් සියයට 37ක පමණ haircut එකක්, ණය අඩු කිරීමකට යොමු වුණා. ඉතින්, ඇත්ත වශයෙන්ම විදේශ සංචාර රැසක නිරත වුණු ඔබතුමාටත් පුළුවන්කම තිබුණා, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් සමඟ සෘජුව කථා කරලා මේ රටේ මුදල් ඇමතිවරයා හැටියට අපේ රට වෙනුවෙන් වාසිදායක ගිවිසුමකට ප්‍රවේශ වෙන්න.

මම තව උදාහරණයක් කියන්නම්. ආර්ජන්ටිනාවේ මුදල් ඇමති මාර්ටින් ගුස්මාන් මැතිතුමා 2021 මොකක්ද කළේ? එතුමාත් කළේ අර දේමයි. මුදල් ඇමතිවරයා හැටියට ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් එක්ක සෘජුව සාකච්ඡා කරලා, විශ්වාසය දිනාගෙන ආර්ජන්ටිනාව වෙනුවෙන් ඉතා විශාල ණය කප්පාදුවක් ලබා ගන්නට එතුමාට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම ඉක්වදෝරයේ රිවඩ මාර්ටිනෙස් කියන හිටපු මුදල් ඇමතිවරයා කළේ මොකක්ද? එතුමා කළේත් ඒ දේමයි. එතුමාත් ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් සමඟ සෘජුව සාකච්ඡා කරලා ඉක්වදෝරය වෙනුවෙන් විශාල ණය අඩු කර ගැනීමක්, එහෙම නැත්නම් ණය කප්පාදුවක් ලබා ගත්තා.

මුදල් ඇමතිවරයා වන ගරු ජනාධිපතිතුමාගෙන් මම විශේෂයෙන්ම මේ කාරණය අහන්න කැමැතියි. පිට රට සංචාර ගණනාවක නිරත වන අවස්ථාවක ඔබතුමාටත් හැකියාව තිබුණා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් එක්ක සෘජුව මුහුණට මුහුණ සාකච්ඡා පවත්වා රට වෙනුවෙන් විශ්වාසයක් නිර්මාණය කරලා, විශ්වාසය දිනාගෙන, ඒ විශ්වාසය මත අපේ රටට ගන්න

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

පුළුවන් හොඳම පැකේජ් එක, හොඳම ඩීල් එක, හොඳම ගිවිසුම ලබා ගන්න. ඒ අවස්ථාව ඔබතුමාට ලැබුණා. නමුත්, ඔබතුමා අපොහොසත් වුණා ඒ කාර්යය ඉෂ්ට කරන්න.

ඒ වාගේම මම ඔබතුමාට තව කාරණයක් මතක් කරන්න කැමැතියි. අවස්ථා ගණනාවකදී ඔබතුමා රටටත් ප්‍රකාශ කරලා තිබෙනවා, මම හිතන විධියට මේ ගරු සභාවේදීත් ප්‍රකාශ කරලා තිබෙනවා, මුදල් අමාත්‍යාංශයේ නිලධාරිනුත් ප්‍රකාශ කරලා තිබෙනවා, IMF එක කරලා තිබෙන Technical Assistance Reports ටික ගරු සභාවට ලබා දෙනවා කියලා. අද වන කල් එකම Report එකක්වත් සභාගත කරලාත් නැහැ, අපට ලබා දීලාත් නැහැ. මට මතකයි, ඔබතුමා විපක්ෂයේ ඉන්නකොට එවකට මුදල් ඇමතිවරයා ලෙස හිටපු බැසිල් රාජපක්ෂ මහතාට ඇහිල්ල දිගු කරලා චෝදනා කළා, IMF එකත් එක්ක කරන සියලු සාකච්ඡාවල ඒ සියලු වාර්තා ගරු සභාවට ලබා දෙන්න කියලා. දැන් අවස්ථාව එළඹිලා තිබෙනවා ඔබතුමාටත් ඒ Technical Assistance Reports ටික සභාගත කරන්න. එතකොට අපටත් පුළුවන් ඒවා පරිශීලනය කරලා අපේ අදහස් හා යෝජනා ටිකත් ඉදිරිපත් කරන්න.

ගරු ජනාධිපතිතුමනි, අපි පැහැදිලිව කියනවා, -

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I never interrupted you, Hon. President. I will take just a few minutes.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
Give me time to reply. Otherwise, I will have to walk away halfway through.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Give me just a few more minutes from your time, please.

ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා සඳහන් කළා මේ රටට මේ කරපු ක්‍රියාදාමය ඇත්ත වශයෙන්ම ඉතාම විශිෂ්ට ක්‍රියාදාමයක් හැටියට.

මූල්‍ය විනය ගැන ඔබතුමා කථා කළා. පූනකරි ව්‍යාපෘතිය ගැන ඔබතුමා ඇවිල්ලා මේ සභාවේ කථා කරලා, 700 megawatt plant එකක් ක්‍රියාත්මක කරනවා කිව්වා. අවසානයේ unsolicited proposal එකක් හරහා ඒ ව්‍යාපෘතිය ලබා දීලා තිබෙන්නේ වෙනත් රටක solar panels distribute කරන ආයතනයකට. ඒ පුද්ගලයන්ට අවස්ථාව දීලා තිබෙනවා, ඒ permit එක අරගෙන, ඒ permit එක විකුණාගෙන කන්න. මේකද මූල්‍ය විනය කියලා මම අහන්න කැමැතියි.

ඒ වාගේම තමයි සුළං විදුලි බලාගාර පිළිබඳ කාරණයත්. Unsolicited proposal එකකින් 500 megawatt plant එකක් කරනවා. CEB එක 50 megawatt plant එකක් ක්‍රියාත්මක කරනවා, ප්‍රසම්පාදන ක්‍රමය තුළ. CEB එකේ tariff rate එක, ඒ මිල ඇවිල්ලා තිබෙනවා, ඩොලර් ශත 4.8යි කියලා. හැබැයි, අර unsolicited proposal එක අනුව යෝජිත 500 megawatt plant එකේ ගණන ඩොලර් ශත 8.2යි. මම අහන්න කැමැතියි ගරු ජනාධිපතිතුමනි, මේකද මූල්‍ය විනය, මේකද සත්‍යය, මේකද කරපු කැප කිරීම කියලා.

ඒ වාගේම මම ඔබතුමාට කියන්න කැමැතියි, - හර්ෂ ද සිල්වා මැතිතුමාත් මට ප්‍රකාශ කර සිටියා - ඔබතුමා පසුගිය සිකුරාදා දුරකථනයෙන් එතුමා අමතා යෝජනා කර තිබෙනවා, සඳුදා දවසේ Public Finance Committee එක කැඳවලා කොහොම හරි මේ යෝජනාව Public Finance Committee එකෙන් අනුමත කරලා - *[බාධා කිරීමක්]* ඔබතුමා උත්තර දෙන්න, ඔබතුමාගේ වෙලාවෙදි. 2වැනි දා සහ 3වැනි දා විවාදයේදී මේ යෝජනාව සම්මත කර ගත හැකි ආකාරයට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී මේ යෝජනාව ගැන සාකච්ඡා කරලා, අනුමත කරලා දෙන්න කිව්වාම, හර්ෂ ද සිල්වා මැතිතුමා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා, "ඔව්, අපට සාකච්ඡා කරන්න පුළුවන්. කරුණාකරලා ගිවිසුම් ටික ලබා දෙන්න" කියලා. එතකොට ඔබතුමා කියලා තිබෙනවා, තවමත් ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් සමඟ සාකච්ඡා පවතින නිසා bilateral creditorsලා එක්ක ඇති කර ගත්ත ගිවිසුම විතරක් ලබා දෙන්න බැහැ කියලා. ඉතින් ඇත්ත වශයෙන්ම මම අහන්න කැමැතියි සභානායකතුමාගෙන්, හදිසියේ පක්ෂ නායක රැස්වීමක් කැඳවලා, 2වැනි දා සහ 3වැනි දා විවාද කරනවාය කියලා කියනකොට ඔබතුමාවත් දැනගෙන හිටියේ නැද්ද, -ඒ කියන්නේ ඔබතුමා personally නොවෙයි- අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයවත් දැනගෙන හිටියේ නැද්ද, මේ ගිවිසුම් ටික සම්පූර්ණයෙන්ම අවසන් කළේ නැති බව? ඒකෙන් අපට පැහැදිලිවම පෙනෙනවා, රජයේ මධ්‍යම ස්නායු පද්ධතිය වැඩ කරන්නේ නැති බව. ඔළුව දන්නේ නැහැ, කඳ කරන දේ; කඳ දන්නේ නැහැ, කකුල් දෙක කරන දේ; කකුල් දෙක දන්නේ නැහැ, අත් දෙක කරන දේ. කිසිම coordination එකක් නැහැ. ඒ නිසා තමයි ඊයේත් පක්ෂ නායක රැස්වීමක් කැඳවලා, න්‍යාය පත්‍රය සහමුලින් වෙනස් කරන්න සිදු වුණේ.

ගරු ජනාධිපතිතුමනි, අවසාන වශයෙන් මම මේකයි කියන්නේ. මම දන්නවා, ඔබතුමා කැමැති නැහැ, මම කියන දේවල් අහගෙන ඉන්න. කමක් නැහැ. මම කෙටියෙන් කියන්නම්. අවසාන වශයෙන් දැන් ඔබතුමා කාරණා කීපයක් කියමින් ඇහුවා සුබද, අසුබද කියලා. මම අහන්න කැමැතියි ගරු ජනාධිපතිතුමාගෙන්, මන්දපෝෂණය වැඩි වීම සුබද, අසුබද? රැකියා අහිමි වීම සුබද, අසුබද? රටේ උගතුන්, බුද්ධිමතුන් රට අත්හැර යෑම සුබද, අසුබද? දුප්පත්කම වැඩි වීම සුබද, අසුබද? ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත ලක්ෂ ගණනින් වැසී යෑම, ව්‍යවසායකයන් සහමුලින් ව්‍යාපාරවලින් ඉවත් වීම සුබද, අසුබද? පාසල් දරුවන් පන්තියේදී ක්ලාන්තය හැදිලා වැටෙන එක සුබද, අසුබද? ඉදිකිරීම් කර්මාන්තය කඩා වැටෙන එක සුබද, අසුබද? වේල් තුන කාපු අය වේල් දෙක කන කොට, වේල් දෙක කාපු අය එක වේල කන කොට, එක වේල කාපු අය එකම ආහාර වේලක්වත් ගන්නේ නැති කොට ඒක සුබද, අසුබද ගරු ජනාධිපතිතුමනි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා මාතෘකාවෙන් පිට යන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒවා සුබද, අසුබද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක වෙනම අහගන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉතින් මම එතුමාට කියන්න කැමැතියි, පැහැදිලිවම-*[බාධා කිරීමක්]* මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට අවස්ථාව දීලා තිබෙන්නේ ඇති වෙන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අවසන් කරනවා.

ගරු ජනාධිපතිතුමාට පැහැදිලිවම මම එක දෙයක් කියන්න කැමැතියි. තවමත් ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් සමඟ සාකච්ඡා යනවාය කියන තත්ත්වය තුළ, අපි ඔබතුමාට අවසරය දෙන්නම්, දැන්ම ම රට යන්න. ගිහිල්ලා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් හමු වෙලා සාකච්ඡා කරලා, ඉක්වඩෝරයේ, ආර්ජන්ටිනාවේ, ඝානාවේ මුදල් ඇමතිවරු රට වෙනුවෙන් ලබා ගත්ත ඒ සහනය, ඒ ණය කප්පාදුව, ඒ haircut එක ලබා ගන්න. අපි ඕනෑ තරම් ආශීර්වාද කරනවා, ඔබතුමාට. රට ගිහිල්ලා ඉතා ඉක්මනින් සාකච්ඡා පවත්වලා, සාකච්ඡා සාර්ථක කරගෙන කොහොම හරි-

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මට දෙකෙන් එකක් කරන්න දෙන්න. [බාධා කිරීම්] එක්කෝ මම පිළිතුරු දෙනවා. එහෙම නැත්නම්, මට මෙතැනින් පිට වෙලා යන්න සිදු වෙනවා. [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Let me finish.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You have finished now.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
එතුමාට වුවමනා නැත්නම් මම යන්නම්. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජනාධිපතිතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්න. *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Let me finish.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂ නායකතුමා, ඔබතුමාට මොනවාද තවත් කියන්න තිබෙන්නේ? *[බාධා කිරීම්]*

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර ගරු ජනාධිපතිතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්න. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා විනාඩි 20ක් කථා කළා. *[බාධා කිරීමක්]* හොඳයි, ඉක්මන් කරලා කියන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කථානායකතුමාට පුදුම රුචිකත්වයක් තිබෙනවා නේ, මගේ mike එක off කරන්නයි, ජනාධිපතිතුමාගේ mike එක on කරන්නයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වෙනත් දේවල් ගැන කථා කරන්නේ නැතුව ඔබතුමා කියන්න හදන දේ කියන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම අවසන් කරන්නයි හදන්නේ.

ගරු ජනාධිපතිතුමාට මේ අවස්ථාවේ මම පැහැදිලිව කියනවා, කරුණාකර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය දේශපාලනීකරණය කරන්නට එපා කියලා. ඔබතුමාගේ දේශපාලන න්‍යාය පත්‍රය අනුව ලක්ෂ 220ක් වන මේ රටේ ජනතාව බිල්ලට තියන්න එපා. දේශපාලන කාල සටහන අනුව කටයුතු කරන්න ගිහිල්ලා රටට නරක ගිවිසුමකට - bad deal එකකට, raw deal එකකට- ප්‍රවේශ වෙන්න එපා කියන එකයි මම ජනාධිපතිතුමාගෙන් ඉල්ලන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. දේශපාලනය වේදිකාවේදී කරමු.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, එතුමා පළමුවෙන්ම අපෙන් ප්‍රශ්නයක් ඇහුවා, මන්දපෝෂණය, ළමයින් පාසලේ පන්ති කාමරවලදී ක්ලාන්ත වෙලා වැටෙන එක සුබද, අසුබද කියලා. ඒක අසුබයි. ඒ නිසා තමයි "අස්වැසුම" ගෙනාවේ. ඒ නිසා තමයි හාල් කිලෝ 10 ගණනේ මාස දෙකක් දුන්නේ. ඒ නිසා තමයි ඇමතිතුමා ආහාර දෙන්න පටන් ගත්තේ. දුප්පත්කම අසුබ ද, සුබ ද කියලාත් ඇහුවා. දුප්පත්කම අසුබයි. ඒකයි ලක්ෂ 20කට "උරුමය" යටතේ ඉඩම් අයිතිය දෙන්නේ. ඒකයි ලක්ෂ දෙකහමාරකට අපි ගෙයක් බැගින් දෙන්නේ. තව මොනවාද ඕනෑ? විරැකියාව සුබද, අසුබද කියලා ඇහුවා. විරැකියාව අසුබ නිසා තමයි දැන් කර්මාන්තශාලා පටන් ගන්නේ; ආයෝජන ගෙනෙන්නේ.

මම තව එකක් අහනවා. මේ රටේ ආර්ථිකය කඩා වැටිලා මිනිස්සු හාමතේ ඉන්න කොට අගමැතිකම ගන්නේ නැතිව බයේ දුවන එක සුබද, අසුබද? *[සෝෂා කිරීම්]*

ගරු කථානායකතුමනි, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට හිඟ තිබූ රුපියල් බිලියන 200ක් ගෙවා අවසන්. දැන් ආපහු ආධාර එනකොට නුවර පාර ඇතුළු අනෙක් වැඩ කටයුතු සියල්ලම ආරම්භ කරන්න අපට පුළුවන්. *[බාධා කිරීම්]* දුකද? මම අහන්නේ ඒකයි.

ගරු කථානායකතුමනි, මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. මට අවස්ථාව දෙන්න. මම හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට කිව්වේ, "අපි මේ ගිවිසුම් දෙක දෙන්න බලාපොරොත්තු වෙනවා" කියලායි. මම කබීර් හෂීම් මැතිතුමාටත් ඒ බව කියලා තිබෙනවා. දැන් අපට අවස්ථාව ලැබී තිබෙනවා, විශේෂයෙන්ම පෞද්ගලික බැඳුම්කර හිමියන් එක්ක සාකච්ඡා කරන්න. ඒ අවස්ථාවේ ක්ලිෆර්ඩ් චාන්ස් සමාගම කිව්වා, මේ කරුණු දැන් හෙළි කරන්න එපා කියලා. එතකොට ඒ අය දන්නවා අපි අනෙක් අය එක්ක ඇති කරගත් කොන්දේසි. ඒක සාමාන්‍ය දෙයක්. ඒ නිසා ඒ තුනම ඉදිරිපත් කරන්න කියලා කිව්වා. ඒවා ඉදිරිපත් කරන්න තමයි මම කියලා OCC එකටත් ටිකක් වෙලාව දුන්නේ. වෙන එකක් නොවෙයි, තවම සානාවේ කොන්දේසිවත් පිට කරලා නැති බව මෙතුමා දැනගන්න ඕනෑ. මෙතුමා කොහෙන් තොරතුරු ගන්නවාද කියලා මම දන්නේ නැහැ. විශේෂයෙන් ඒ ගැන කියලා- *[බාධා කිරීමක්]* මම දැන් කියන්නේ මේ කරුණු ඔක්කොම හර්ෂ ද සිල්වා මැතිතුමාගේ කමිටුවට දෙන්න කියලායි. එතැනදී ඔබතුමන්ලා ඔක්කෝම සාකච්ඡා කරලා ඕනෑ වාර්තාවක් ලියන්න. ඔබතුමා හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට ඊර්ෂ්‍යා කරනවා ද? එතුමා ඒ කටයුත්ත කරන එකට අකමැති ද? ඒ නිසාද, දැන් මෙතැනට ඇවිත් මෙහෙම කථාවක් කරන්නේ? එහෙම නැත්නම් එතැනට ගිහින් කථා කරන්න ඕනෑ. අපි දෙපැත්තම එකඟයි, හර්ෂ ද සිල්වා මැතිතුමාගේ කමිටුවට. එතුමා මොනවා ලියයි ද කියලා මම දන්නේ නැහැ. අපට පක්ෂව ලියයි ද, විරුද්ධව ලියයි ද කියලා මම දන්නේ නැහැ. ඒ වාර්තාව ලිව්වාට පස්සේ ඒ ගැන විවාද කරන්න. මොනවාටද ඒ ගැන දැන් විවාද කරන්නේ? මෙතැන ප්‍රශ්නයක් තිබෙනවාද, හර්ෂ ද සිල්වා ආචාර්යතුමා ගැන? ඒ වෙනුවෙන් විවාදයක් ඕනෑ නම් මට කියන්න, "මට විශ්වාසයක් නැහැ, හර්ෂ ද සිල්වා ගැන. කරුණාකරලා දැන්ම විවාදයක් දෙන්න" කියලා. නාලක ගොඩහේවා ද දමන්න ඕනෑ, විපක්ෂයේ උපදේශක හැටියට? මට කමක් නැහැ. එක සැරයක් වළේ වැටිලා දෙවනුවත් වැටෙනවාද? මේ එකකින්වත් වැඩක් නැහැ නේ.

ගරු කථානායකතුමනි, ගුස්මාන් ගැන මම අලුතින් කියන්න හොඳ නැහැ. ගුස්මාන් කොච්චර හොඳට වැඩ කළා ද කිව්වොත්, එයාගේ පක්ෂය පැරදිලා විපක්ෂයේ කෙනා ආවා. ඔහුගේ පක්ෂය අලුත් ජනාධිපතිතුමාගේ යෝජනා සියල්ලම අනුමත කළා. ඒක තමයි ගුස්මාන් කළේ. ඔය පැත්තේත් ඕනෑ තරම් ගුස්මාන්ලා ඇති. මම දන්නේ නැහැ, ගුස්මාන්ලා ගැන.

මට නම් වැඩක් නැහැ ගුස්මාන්ලා. ඒ ගොල්ලෝ ලංකාවට එන්නේ කථාවක් කරන්න, එතැන කථා කරන්න බැරි නිසා නේ; ටිකට් එකක් දුන්නු නිසා නේ. මම ඔය ගැන ආපහු කියන්න ඕනෑ ද? මම ඔය ගැන කථා කරන්න ඕනෑ ද? මොකක්ද ඔහු කරලා තිබෙන්නේ? ආර්ජන්ටිනාවේ ජනාධිපතිතුමා ඉතා දරුණු ලෙස වියදම් කප්පාදු කරලා තිබෙනවා. ආර්ථිකය හරි තැනකට ඇවිල්ලා තිබෙනවා. දැන් එතුමා කියන්නේ පෙසෝ එක වෙනුවට ඩොලර් එක දාන්න කියලා. Double currency දාලා ඊට පස්සේ පෙසෝ එක අයින් කරලා dollarize කරන්න කියලායි එතුමා කියන්නේ. ඒකට IMF එකත් විරුද්ධයි. දැන් එතැන සට්ටනයක් තිබෙන්නේ.

සානාව ගැනත් එතුමා කථා කළා. එහේ මුදල් ඇමති නොවෙයි ඒ වැඩ කටයුතු කළේ. ඒ වැඩ කටයුතු ඔක්කෝම කළේ ජනාධිපති නානා ඇඩෝ ඩන්ක්වා. මුදල් ඇමතිවරයා නොවෙයි, ඒක අපේ රාජ්‍ය ඇමතිවරයා කළා. මුදල් ඇමතිවරයා කරන්න අවශ්‍ය නැහැ. අපේ රාජ්‍ය ඇමතිවරයා ගිහිල්ලා කථා කරලා ඒක කළා. ඉතින්, තව මොනවාටද මම වෙනත් අය යවන්නේ? තමුන්නාන්සේලා එතුමා එක්ක කථා කරලා ටිකක් ඉගෙන ගන්න, කොහොමද ඒ කටයුතු කරන්නේ කියලා. එතුමාට ඕනෑ නම් President Nana Addo Dankwa එක්ක කථා කරන්න, මම එතුමාට කියන්නම්. මම එතුමා හොඳට දන්නවා. අපි අපේ රටවල් දෙක ගැන කථා කරනවා. අපි අදහස් හුවමාරු කර ගන්නවා, ඒ කටයුතු ටික කරගෙන යන්න. එතුමා හොඳ පුද්ගලයෙක්. එතුමා ව්‍යාපාරිකයෙක්. ඒ නිසා තමන්ගේ අතට අරගෙන ඒ වැඩ කළා; එතැන පාලනය ගෙන ගියා. මුදල් ඇමති සහ අගමැති එතුමා කියපු දේ කළා. එහේ යන්න කැමති නම් මම ටිකට් එකක් දෙන්නම්. එහෙම නම් airplane එකේ යන්න ඕනෑ. එහෙම යන්න ඕනෑ නම් මට කියන්න.

මම කියන්නේ මේකයි. IMF එකත් එක්ක අපි මේකට එකඟ වෙලා තිබෙනවා. එහෙත් හර්ෂ ද සිල්වා මැතිතුමාට මේක භාර දෙන්න ඔබතුමා කැමති නැත්නම්, අගමැතිතුමාට කියලා විවාදයක් යොදා ගන්න. මට ප්‍රශ්නයක් නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரும்)
(The Hon. Dinesh Gunawardena - Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, අපි දැන් පාර්ලිමේන්තුව කල් තබන්න ඕනෑ නේ. [බාධා කිරීම්] අපි න්‍යාය පත්‍රයේ ඊළඟ කාරණයට යමු. [බාධා කිරීම්]

ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා. ඔබතුමාට ඔච්චර අවස්ථාව දීලාත් තවත් කියන්න දේවල් ඉතුරු වෙලා තිබෙනවාද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා ජනාධිපතිතුමාට අවස්ථාව ලබා දුන්නා, සම්පන්දන් මැතිතුමාගේ අභාවය ගැන ශෝකය ප්‍රකාශ කරන්න. ඒ අවස්ථාව විපක්ෂ නායකවරයාට ලබා දෙන්නේ නැද්ද? *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක වෙනම යෝජනාවක් හැටියට එනවා නේ, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ අවස්ථාව විපක්ෂ නායකවරයාට ලබා දෙන්නේ නැද්ද? සම්පන්දන් මැතිතුමා ගැන කථා කරන්න පුළුවන් ජනාධිපතිවරයාට විතරද? මට ඒ සඳහා අවසරය නැද්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාගේ අභාවය සම්බන්ධයෙන් අපි වෙනම ශෝක ප්‍රකාශ යෝජනාවක් ඉදිරිපත් කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සම්පන්දන් මැතිතුමාගේ අභාවය ගැන කථා කිරීමට පෙර මම මේ අවස්ථාවේ විශේෂයෙන් කියන්නට ඕනෑ- *[බාධා කිරීමක්]* ජනාධිපතිවරයා තමයි හර්ෂ ද සිල්වාට Public Finance Committee එකේ Chairman තනතුර නොදී අවුරුදු ගණනාවක් තියාගෙන සිටියේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඔබතුමා අවස්ථාව ඉල්ලුවේ ඒක කියන්න නොවෙයි නේ.

ලිපිලේඛනාදිය පිළිගැන්වීම, ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற் கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)
ගරු කථානායකතුමනි, -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක? *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Please, give me time.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට අවස්ථාව දීලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ රටේ භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් පෙනී සිටි,- *[බාධා කිරීමක්]* ඇයි, මට සම්පන්දන් මැතිතුමා ගැන කථා කරන්න අයිතියක් නැද්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඒකට වෙලාව නොවෙයි.

ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමා ලිපි ලේඛනාදිය ඉදිරිපත් කරන්න.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2024 ජූනි 29 දිනැති අංක 2390/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරමින් කරන ලද ප්‍රකාශනය.- [අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු ප්‍රසන්න රණතුංග මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගරු සම්පන්දන් මැතිතුමාගේ අභාවය ගැන මට කථා කරන්න අවශ්‍යයි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
මේ කටයුතු අවසන් වුණාට පසුව ඔබතුමා අවස්ථාව ගන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කටයුතු අවසානයේ ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

නොපැමිණීමේ අවසරය පිළිබඳ යෝජනාව, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

නොපැමිණීමේ අවසරය: ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
வராதிருக்க அனுமதி: மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்
LEAVE OF ABSENCE: HON. G.G. PONNAMBALAM

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66(ඊ) ව්‍යවස්ථාව යටතේ, යාපනය මැතිවරණ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජී.ජී. පොන්නම්බලම් මහතාට 2024 ජූලි 02 දින සිට මාස තුනක කාලයක් තුළ පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතු ය."

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත
மருத்துவம் (திருத்தம்) சட்டமூலம்
MEDICAL (AMENDMENT) BILL

"(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසිනි.

2024 ජූලි 23වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

சுகாதார அமைச்சர் சார்பாக மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2024 யூலை 23, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Susil Premajayantha on behalf of the Minister of Health; to be read a Second time upon Tuesday, 23rd July, 2024 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

වෛද්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත
மருத்துவம் (திருத்தம்) சட்டமூலம்
MEDICAL (AMENDMENT) BILL

"(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසිනි.

2024 ජූලි 23වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

சுகாதார அமைச்சர் சார்பாக மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2024 யூலை 23, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Susil Premajayantha on behalf of the Minister of Health; to be read a Second time upon Tuesday, 23rd July, 2024 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ගරු විපක්ෂ නායකතුමා කථා කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවේ කටයුතු කළ, සැම විටම රටේ ඒකීයභාවය වෙනුවෙන්, භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් පෙනී නිටපු ගරු සම්පන්දන් මැතිතුමාගේ අභාවය පිළිබඳව මේ අවස්ථාවේ දී අප සියලු දෙනාගේ බලවත් ශෝකය සහ සංවේගය පළ කර සිටිනවා.

I would like to take this opportunity to express our heartfelt sympathies and condolences regarding the sudden demise of the Hon. Rajavarothiam Sampanthan, who was vocal about unity and protecting Sri Lanka's territorial integrity. He was always championing the course of national reconciliation, amity, comity and good relations between ethnic groups, religious groups and people of all denominations in our country. I would also like to take this opportunity to express that the Hon. Sampanthan's demise is a great loss for the country and for national reconciliation. He was always a progressive national leader. While speaking on behalf of the people he represented, he spoke of championing the course of Sri Lankanism. He was never a caste-oriented, creed-oriented, religion-oriented or ethnic-oriented politician.

Sir, I would like to take this opportunity to, once again, express our deepest sorrow and sympathies to everyone in the Sampanthan family and we all commemorate his laudable services to our motherland.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Speaker, on behalf of the Tamil National Alliance, I would like to express my gratitude to the Hon. President and the Hon. Leader of the Opposition for their sentiments with regard to the late Hon. Rajavarothiam Sampanthan. The Hon. President was pleased to remark that the Hon. Sampanthan and he entered Parliament in 1977 together. He had repeatedly said that during the Hon. Sampanthan's lifetime, the Tamil national question should be resolved. Unfortunately, the Hon. Sampanthan has now passed away and I wish to appeal to the President and the Government that before the President's term ends in October this year, that issue must be resolved to the satisfaction of all the people of this country.

Thank you.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ඊයේ පෙරේදා එකඟ වුණු ගිවිසුම් ගැන අහද්දි පසුගිය පක්ෂ නායක රැස්වීමට කලින් පැවති පක්ෂ නායක රැස්වීමේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු අපට කිව්වා, "සියලු ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. ඒවා Internet එකේ දමලා තිබෙනවා" කියලා. අපි ගිවිසුම කෝ කියලා ඇහුවාම ඒ අය කිව්වා, "Internet එකේ දමලා තිබෙනවා" කියලා. නමුත් Internet එකේ එහෙම දෙයක් නැහැ. ඒකේ තිබෙන්නේ පරණ ගිවිසුම්. එහෙම කියලා සම්පූර්ණයෙන්ම අප නොමඟ යැව්වා. ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා, ඒවා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරනවා කිව්වා. ඊට පස්සේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරනවා කිව්වා. ගරු කථානායකතුමනි, මම ඔබතුමාට ඊයෙත් මේ ගැන කිව්වා. මාතර රැස්වීමේදී ජනාධිපතිතුමා කියලා තිබෙනවා, "ගිවිසුම් 3ක් තිබෙනවා. ඒකෙන් දෙකක් අත්සන් කරලා තිබෙනවා. එකක් අත්සන් කරලා නැහැ" කියලා. ඒක අත්සන් කරන තුරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බැහැ. එක තමයි ඇත්ත. නමුත් පක්ෂ නායක රැස්වීමේදී අපට කිව්වා, "සියලු ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. Internet එක බලන්න" කියලා. එතැන නීතිඥ මහත්වරුත් හිටියා. ඒ විධියට සම්පූර්ණයෙන්ම අප නොමඟ යැව්වා. ඒ වාගේම අපේ නිලධාරි මණ්ඩලයත් නොමඟ යවලා Order Paper එකටත් යෝජනාව දැම්මා. ගරු සභානායකතුමනි, අත්සන් නොකරපු ගිවිසුමක් Order Paper එකට දැම්මා. මම හිතන විධියට, සභානායකතුමා එදා හිටියේ නැහැ. ඊයේ නොවෙයි. කලින් දවසේ ඔබතුමා හිටියේ නැහැ. අත්සන් නොකරපු ගිවිසුමක් Order Paper එකට දැම්මා. එ් සම්බන්ධයෙන් අපේ බලවත් කනගාටුව ප්‍රකාශ කරනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා ඉදිරියේදීවත් මේ ගැන බලන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීම කැඳවන්නේ ඔබතුමා. පක්ෂ නායක රැස්වීම කැඳවලා අපි කරන්නේ, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය සකස් කිරීම පිළිබඳව යම්කිසි එකඟතාවක්, අවබෝධතාවක්, සම්මුතියක් ඇති කර ගැනීමයි. එතකොට පක්ෂ නායක රැස්වීමේදී වැරදි තොරතුරු මත, බොරුව -මුසාව- මත, නොමඟ යැවීම මත, ඇන්දවීම මත මේ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය සකස් වෙනවා නම් මම ඔබතුමාට යෝජනා කරනවා, මින් ඉදිරියට මේ වාගේ යෝජනාවක් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට පෙර, ජනාධිපතිවරයා ගිවිසුම් අත්සන් කළා කියලා කියනවා නම් ඒ ගිවිසුමේ පිටපතකුත් පක්ෂ නායක රැස්වීමට ගෙන්වා ගන්න කියලා. එතකොට අපට පුළුවන්කම ලැබෙනවා, සත්‍ය මත පදනම්ව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය සකස් කරන්න. ගරු කථානායකතුමනි, මේක බරපතළ වරදක්. මේක අපේ වරප්‍රසාද අභිමීවීමක්. පාර්ලිමේන්තු පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී බොරුව මත, රැවටිල්ල මත, බොරු ප්‍රචාර මත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය සකස් වෙනවා නම් ඒක බරපතළ කාරණාවක්.

ඔබතුමාත් ඒකට වග කියන්න ඕනෑ. මොකද, ඔබතුමා තමයි අපි හැම දෙනාගේම වරප්‍රසාද රැකගන්නට සිටින ප්‍රධානියා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඇයි ජනාධිපතිවරයා රටට එකක් ප්‍රකාශ කරලා, පක්ෂ නායක රැස්වීමේදී තව එකක් ප්‍රකාශ කළේ කියලා. රටට කියනවා, ගිවිසුම් අත්සන් කළාය කියලා. පක්ෂ නායක රැස්වීමේදී කියනවා, "ඔව්, අපි ගිවිසුම් අත්සන් කළා" කියලා. හැබැයි, ආයෙත් පක්ෂ නායක රැස්වීමක් කැඳවා කියනවා, "නැහැ අනේ, විවාදය පවත්වන්න බැහැ. මොකද වැරදි යෝජනාව දාලා තිබෙන්නේ" කියලා. මේක පාර්ලිමේන්තුවත් නොමඟ යැවීමක්, රටටත් බොරු කිරීමක්. ඒ ගැන මම කනගාටු වෙනවා. ජනාධිපතිවරයා හැම දාම මෙතැනට ඇවිල්ලා කථා කරලා, මගේ කථාවට බාධා කරලා, නැඟිටලා යනවා. එතුමා මේවාට සවන් දෙන්නට ඕනෑ; සවන් දීමේ හැකියාවක් නැහැ. ඔබතුමාත් මගේ mike එක off කරන්න හරි දක්ෂයි. එහෙම කරන්න එපා. ඒක වැරදියි. මොකද, ඔබතුමා මූලාසනයේ ඉඳගෙන අපක්ෂපාතී වන්නට ඕනෑ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා කාලය අනවශ්‍ය ලෙස ගන්නකොට මට එහෙම කරන්න සිද්ධ වෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට ඔබතුමාගෙන් උත්තරයක් ඕනෑ. බොරු කියලා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය සකස් වුණේ කොහොමද කියන එකට ඔබතුමා උත්තරයක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, න්‍යාය පත්‍රය සකස් කිරීම මගේ කාර්යයක් නොවෙයි. එය පක්ෂ නායකයින්ගේ වැඩක්. මට තිබෙන්නේ පක්ෂ නායක රැස්වීම කැඳවන එක පමණයි. ඔබතුමන්ලා ඒක ඒ වෙලාවේ කථාබහ කරලා විසඳාගන්න ඕනෑ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, එහෙම කියන්න එපා. ඔබතුමා තමයි මූලාසනයේ ඉඳගෙන පක්ෂ නායක රැස්වීම මෙහෙයවන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
රැස්වීම මෙහෙයවීමේ රාජකාරිය කළාය කියලා න්‍යාය පත්‍රය සකස් කිරීමට අවශ්‍ය වෙන්නේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මේ නිලධාරින්ට දොස් කියන්නේ නැහැ. පැහැදිලිවම ඔබතුමා ජනාධිපතිතුමාගේ වචනය පිළිගෙන ගිවිසුමේ පිටපතක්වත් ඉදිරිපත් කරන්නේ නැතිව පක්ෂ නායක රැස්වීමේදී පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය සකස් කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ජනාධිපතිතුමා මට කථා කළේ නැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පාර්ලිමේන්තුව නොමඟ යැව්වා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඕනෑ එකක් කියන්න.

ගරු සභානායකතුමනි, න්‍යාය පත්‍රයේ යෝජනා අංක 4 ඉදිරිපත් කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම හිතන විධියට, න්‍යාය පත්‍රය අද සහ හෙටට සකස් කිරීම සම්බන්ධයෙන් සහ ගිවිසුම් සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාගේ කථාවේදී එතුමා පැහැදිලි ප්‍රකාශයක් කළා. ඒ නිසා මම ඒ ගැන නැවත කියන්න යන්නේ නැහැ. ගිවිසුම් දෙකක් අත්සන් කර තිබෙනවා. තව ගිවිසුමක් සම්බන්ධව සාකච්ඡා කරගෙන යනවා, sovereign bond holdersලා එක්ක. ඒක අවසන් වුණාට පස්සේ තමයි එකඟතාවකට එන්නේ, ඒකට අදාළ අංශ මඟින් ලබාගත් යම් යම් තොරතුරුත් එක්ක.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභානායකතුමනි, මට ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මම මෙය බොහොම පැහැදිලිව ඔබතුමාගෙන් අහන්නම්කෝ. මම දන්නවා, ඔබතුමා එදා පක්ෂ නායක රැස්වීමේ නොසිටි බව. ගිවිසුම් දෙකක් අත්සන් කළාය කියලා, ඒ අත්සන් කරපු ගිවිසුම් මත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය සකස් කරලා තිබෙනවා. බැලින්නම් ගිවිසුම් අත්සන් වෙලා නැහැ. එක් ගිවිසුමයි අත්සන් වෙලා තිබෙන්නේ. මම අහන්නේ බොහොම වැදගත් කාරණාවක්. අත්සන් නොකරපු ගිවිසුම් පිළිබඳව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට එන්නේ කොහොමද? ඒක බොරුවක් නොවෙයිද? රැවටිල්ලක් නොවෙයිද? වංචාවක් නොවෙයිද? ඇන්දවීමක් නොවෙයිද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම ගරු විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වෙනවා, අද දින පැයක් ඇතුළත හතරවැනි වතාවට එකම ප්‍රශ්නය ඉදිරිපත් කිරීම ගැන. ඔබතුමා එහෙම කළේ, එහි තිබෙන වැදගත්කම නිසා වෙන්න ඇති. ඔය ප්‍රශ්නයම විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත් ඉදිරිපත් කළා. මගේ උත්තරය තමයි, අපි ඊළඟ අවස්ථාවේ න්‍යාය පත්‍රය සකස් කිරීමේදී ඒ සඳහා අවශ්‍ය වන්නා වූ, සාධනය කළ හැකි ලිපිලේඛන සියල්ල ඉදිරිපත් කරලා න්‍යාය පත්‍රය සකස් කරනවා කියන එක.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ යෝජනා අංක 4.

II

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2024 ජූලි 09 අහඹරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, පූ.භා. 11.06ට, අද දින සභා සම්මතිය අනුව, 2024 ජූලි 09වන අහඹරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அதன்படி மு.ப.11.06 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க, 2024 யூலை 09, செவ்வாய்க் கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 11.06 a.m. until 9.30 a.m. on Tuesday, 09th July, 2024, pursuant to the Resolution of Parliament of this Day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

313 වන කාණ්ඩය - 09 වන කලාපය
தொகுதி 313 - இல. 09
Volume 313 - No. 09

2024 ජූලි 09 වන අඟහරුවාදා
2024 யூலை 09, செவ்வாய்க்கிழமை
Tuesday, 09th July, 2024

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2024 ජූලි 09 වන අඟහරුවාදා
2024 யூலை 09, செவ்வாய்க்கிழமை
Tuesday, 09th July, 2024

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රතිඥාව:
ගරු කදිරවේලු ඝන්මුගම් කුහදාසන් මහතා [පිටුව 1567]
නිවේදන:
කථානායකතුමාගේ සහතිකය [පිටුව 1567]
විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [පිටුව 1568]
ආගමන පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [පිටුව 1568]
2024.06.25 දින ලැබුණු පැමිණිල්ල පිළිබඳ අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඇතුළත් වාර්තාව [පිටුව 1572]
විගණකාධිපතිවරයාගේ වාර්තාව [පිටුව 1573]
රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [පිටුව 1576]
ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 1578-1603]
පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
විශ්‍රාම වැටුප් විෂමතා විසඳීම සහ වැඩිහිටියන් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමයක් [පිටුව 1619]
මන්දපෝෂණය සහ දරිද්‍රතාව [පිටුව 1622]
නොපැමිණීමේ අවසරය:
ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා [පිටුව 1632]
වරප්‍රසාද:
2024.06.19 දින පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශය පිළිබඳව අධිකරණ සේවා සංගමයේ සභාපති සහ ලේකම් නිකුත් කළ මාධ්‍ය නිවේදනය [පිටුව 1633]
ආංශික අධීක්ෂණ කාරක සභා [පිටුව 1639]
අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා [පිටුව 1640]
පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
ඉසිවර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු මධුර විතානගේ මහතා] - පළමුවන වර කියවන ලදී [පිටුව 1640]
මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) - [ගරු මධුර විතානගේ මහතා] -පළමුවන වර කියවන ලදී [පිටුව 1641]
ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [පිටුව 1642-1760]
ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගම:
වාර්ෂික වාර්තාව (2021) [පිටුව 1761]
ටවර් හෝල් රහභල පදනම:
වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ (2021) [පිටුව 1761]
ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය:
වාර්ෂික වාර්තාව (2022) [පිටුව 1762]
මාතර සමය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:
සලකා බලා තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [පිටුව 1762]
ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:
සලකා බලා තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [පිටුව 1763]
සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:
සලකා බලා තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [පිටුව 1764]
ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:
දෙවනවර කියවා ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී [පිටුව 1764]
කල්තැබීමේ යෝජනාව:
පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය කිරීම [පිටුව 1765-1780]

பிரதான உள்ளடக்கம்

உறுதிப்பிரமாணம்:
மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன் [ப: 1567]
அறிவிப்புகள்:
சபாநாயகரது சான்றுரை [ப: 1567]
வெளிநாட்டு தீர்ப்புக்களைப் பரஸ்பரம் ஏற்றங் கீகரித்தல், பதிவுசெய்தல் மற்றும் வலுவுறுத்துதல் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 1568]
குடிவரவு சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு[ப: 1568]
2024.06.25ஆம் திகதிய முறைப்பாடு தொடர்பில் நீதிச் சேவைகள் ஆணைக்குழுவின் அவதானிப்புகள் அடங்கிய அறிக்கை [ப: 1572]
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை [ப: 1573]
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 1576]
வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1578 – 1603]
தனி அறிவித்தல் மூல வினா:
ஓய்வூதிய முரண்பாடுகளுக்கு தீர்வும் முதியோருக்கான சமூக பாதுகாப்பு முறைமையும் [ப: 1619]
ஊட்டச்சத்து குறைபாடு மற்றும் வறுமை [ப: 1622]
வராதிருக்க அனுமதி:
மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண [ப: 1632]
சிறப்புரிமை:
2024.06.19ஆம் திகதி பாராளுமன்றத்தில் கூறிய கூற்று தொடர்பான நீதிச் சேவைகள் சங்கத்தின் தலைவர் மற்றும் செயலாளரின் ஊடக அறிக்கை [ப: 1633]
துறைசார் மேற்பார்வைக் குழுக்கள் [ப: 1639]
அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள் [ப: 1640]
தனி உறுப்பினர் சட்டமூலங்கள்:
இசிவர அபிவிருத்தி, சமூக சேவைகள், அறக்கட்டளை மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு மதுர விதானகே] – முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1640]
மனித வளங்கள் துறைசார் வல்லுனர்களின் சங்கம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு மதுர விதானகே]- முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1641]
இலங்கைத் தொலைத்தொடர்பு (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப் பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 1642-1760]
ஜீ.எஸ்.எம்.பீ. தொழில்நுட்ப சேவைகள் (தனியார்) கம்பனி:
வருடாந்த அறிக்கை (2021) [ப: 1761]
டவர் மண்டப அரங்கம்:
வருடாந்த அறிக்கை மற்றும் நிதிக் கூற்றுகள் (2021) [ப: 1761]
தேசிய போக்குவரத்து வைத்திய நிறுவனம்:
வருடாந்த அறிக்கை (2022) [ப: 1762]

"மாத்தறைப் பருவம்" அமைப்பு (கூட்டிணைத்தல்) சட்டமூலம்:
பரிசீலிக்கப்பட்டுத் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 1762]

ஷைலி கல்விசார் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:
பரிசீலிக்கப்பட்டுத் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 1763]

சமாதி தியான மற்றும் யோகாசன நிலையம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:
பரிசீலிக்கப்பட்டுத் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 1764]

இலங்கை வரைதல் தொழினுட்பவியலாளர்கள் நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:
இரண்டாம் முறை மதிப்பிடப்பட்டு, சட்டவாக்க நிலையியற் குழுவுக்குச் சாட்டப்பட்டது [ப: 1764]

ஒத்திவைப்புப் பிரேரணை:
முன்பிள்ளைப் பருவ அபிவிருத்தி நிலையங்களை ஒழுங்குறுத்தல் [ப: 1765-1780]

PRINCIPAL CONTENTS

AFFIRMATION:
The Hon. Kathiravelu Sanmugam Kuhadasan [Col.1567]

ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 1567]
Reciprocal Recognition, Registration and Enforcement of Foreign Judgments Bill: Petitions to the Supreme Court [Col. 1568]
Immigration Bill: Petition to the Supreme Court [Col. 1568]

REPORT CONTAINING OBSERVATIONS OF JUDICIAL SERVICE COMMISSION ON COMPLAINT RECEIVED ON 25.06.2024 [Col. 1572]

AUDITOR-GENERAL'S REPORT [Col. 1573]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1576]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1578-1603]

QUESTION BY PRIVATE NOTICE:
Resolution of Pension Anomalies and Social Security System for Elders [Col. 1619]
Malnutrition and Poverty [Col. 1622]

LEAVE OF ABSENCE:
Hon. (Prof.) Tissa Vitarana [Col. 1632]

PRIVILEGE:
Press Release by Chairman and Secretary of Judicial Service Association Regarding Comments in Parliament on 19.06.2024 [Col. 1633]

SECTORAL OVERSIGHT COMMITTEES [Col. 1639]

MINISTERIAL CONSULTATIVE COMMITTEES [Col. 1640]

PRIVATE MEMBERS' BILLS:
Isiwara Development, Social Services and Charity Foundation (Incorporation) - [The Hon. Madhura Withanage] - Read the First time [Col. 1640]
Association of Human Resources Professionals (Incorporation) - [The Hon. Madhura Withanage] - Read the First time [Col. 1641]

SRI LANKA TELECOMMUNICATIONS (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended [Cols. 1642-1760]

GSMB TECHNICAL SERVICES (PVT.) LTD.:
Annual Report (2021) [Col. 1761]

TOWER HALL THEATRE FOUNDATION:
Annual Report and Financial Statements (2021) [Col. 1761]

NATIONAL TRANSPORT MEDICAL INSTITUTE:
Annual Report (2022) [Col. 1762]

"MATARA SEASON" ORGANIZATION (INCORPORATION) BILL:
Considered, read the Third time, and passed as amended [Col. 1762]

SHAILI EDUTAINMENT FOUNDATION (INCORPORATION) BILL:
Considered, read the Third time, and passed as amended [Col. 1763]

SAMADHI MEDITATION AND YOGA CENTRE (INCORPORATION) BILL:
Considered, read the Third time, and passed as amended [Col. 1764]

INSTITUTE OF DRAFTING TECHNOLOGISTS SRI LANKA (INCORPORATION) BILL:
Read a Second time, and allocated to Legislative Standing Committee [Col. 1764]

ADJOURNMENT MOTION:
Regulation of Early Childhood Development Centres [Cols. 1765-1780]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2024 ජූලි 09 වන අඟහරුවාදා
2024 யூலை 09, செவ்வாய்க்கிழமை
Tuesday, 09th July, 2024

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

ප්‍රතිඥාව: ගරු කදිරවේලු සන්මුගම් කුහදාසන් මහතා
உறுதிப்பிரமாணம்: மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்
AFFIRMATION: THE HON. KATHIRAVELU SANMUGAM KUHADASAN

ගරු කදිරවේලු සන්මුගම් කුහදාසන් මහතා නීති ප්‍රකාර ප්‍රතිඥාව දී මේසය මත තිබූ පොතෙහි අත්සන් කළේය.

மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன் சட்டத்தினால் வேண்டப்பட்டவாறு உறுதிப்பிரமாணம் செய்து, சபாபீடத்திலுள்ள புத்தகத்தில் கையொப்பமிட்டார்.

The Hon. Kathiravelu Sanmugam Kuhadasan made and subscribed the Affirmation required by Law; and signed the Book at the Table.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2024 ජූලි 02 දින "කාන්තාවන් සවිබල ගැන්වීමේ" සහ "යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව" නමැති පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

II
විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
வெளிநாட்டு தீர்ப்புக்களைப் பரஸ்பரம் ஏற்றங்கீகரித்தல், பதிவுசெய்தல் மற்றும் வலுவுறுத்துதல் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
RECIPROCAL RECOGNITION, REGISTRATION AND ENFORCEMENT OF FOREIGN JUDGMENTS BILL: PETITIONS TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2024 ජූලි 02 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සමට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ" පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් 2024.07.02 දින ලැබුණු අතර, තවත් පෙත්සමක පිටපතක් 2024.07.04 දින මා වෙත ලැබී ඇති බවත් පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

III
ආගමන පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
குடிவரவு சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
IMMIGRATION BILL: PETITION TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව "ආගමන" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් 2024.07.03 දින මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

මීළඟට, මවිසින් පිළිගන්වනු ලබන ලිපිලේඛන.

ගරු අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් 2024.06.19 දින, අධිකරණ පද්ධතිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශය සහ එතුමාගේ බලතල උල්ලංඝනය කිරීම පිළිබඳව ගරු අග්‍ර විනිශ්චයකාරතුමාට පිටපතක් සහිතව මා වෙත යොමු කර ඇති පැමිණිල්ල සම්බන්ධයෙන් එවන ලද වාර්තාව සහ ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගෙන් ලැබුණු ලිපිය,-

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Lakshman Kiriella, what is your point of Order?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, දැන් ඔබතුමා ගරු අධිකරණ ඇමතිතුමා එවපු ලිපියක් ගැන සඳහන් කරනවා; අග්‍ර විනිශ්චයකාරතුමා එවපු ලිපියක් ගැන සඳහන් කරනවා. මෙහෙම ඔබතුමාට ලියන ලිපි පාර්ලිමේන්තුවේ හෙළිදරව් කිරීම හරිද? මොකද, ගරු අධිකරණ ඇමතිතුමා තවම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරලා නැහැ. ඔබතුමාට එවන ලියුම් මෙහෙම හෙළිදරව් කිරීම හරි නැහැ නේ, ගරු ගරු කථානායකතුමනි. ඔබතුමාට හැම පැත්තෙන්ම ලියුම් එවනවා. ඔබතුමා හැමදාම උදේට ඒවා කියෙව්වොත් මොකක්ද තත්ත්වය? වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා තිබෙනවා නම් ඔබතුමා ඕක ඉදිරිපත් කළාට කමක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ වරප්‍රසාද ප්‍රශ්නය මත නොවෙයි, මේ යම්කිසි පැහැදිලි කිරීමක් කරලා තිබෙන්නේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
තවම වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා එදා පාර්ලිමේන්තුව තුළ කරපු කථාව සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් තමයි මේකේ කරලා තිබෙන්නේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා අද එය ඉදිරිපත් කරනවා ද?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)
ඔව්. ඒක අද ඉදිරිපත් කරන බව Order of Businessහි සඳහන් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද එතුමා වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. අග්‍ර විනිශ්චයකාරතුමා පැහැදිලි කරලා තිබෙන්නේ එදා ගරු ඇමතිතුමා කරපු කථාව පිළිබඳව එතුමාගේ අදහස.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම කියන්නේ මේකයි. වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා නම් ඔය ලිපිය කියෙව්වාට කමක් නැහැ. නමුත් මෙතෙක්, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක වරප්‍රසාද ප්‍රශ්නයට අදාළ නැහැ. වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි, එතුමා මේ ඉදිරිපත් කළේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඒක අදාළයි නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අදාළ නැහැ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මේක ගරු ඇමතිතුමා ඔබතුමාට ලියපු පෞද්ගලික ලියුමක්. අග්‍ර විනිශ්චයකාරතුමාත් උත්තරයක් එව්වා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක මට පෞද්ගලිකව එවපු ලියුමක් නොවෙයි. මේක ගරු කථානායකවරයාට එවපු ලියුමක්.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඒවා ඔබතුමාට එවපු පෞද්ගලික ලිපි. ඒවා මෙතැනදී කියවන එක වැරැදියි නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලිකව නොවෙයි, මේවා කථානායකවරයාට එවපු ලියුම්. මම ඔබතුමන්ලාට මේක කියවන්න යන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු කථානායකතුමනි, මම වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා කියලා ඔබතුමාට ලිඛිතව දැනුම් දීලා තිබෙනවා. ඒ පිළිබඳව මාධ්‍යයෙනුත් ප්‍රචාරය වුණා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කියපු දේ නිවැරැදියි. මම තවම වරප්‍රසාද ප්‍රශ්නය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන තෙක්, ඒකට පිළිතුරු ලෙස යම් ලේඛනයක් කියවන්න හෝ ඉදිරිපත් කරන්න කාටවත් අයිතියක් නැහැ. ඒක පාර්ලිමේන්තු සම්ප්‍රදාය නොවෙයි. මගේ කිසි විරෝධතාවක් නැහැ, ඒක නිසි පරිදි ඉදිරිපත් කිරීම පිළිබඳව. නමුත්, ඒ ක්‍රමවේදය අනුගමනය කරන්න ඕනෑය කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ලිපියක් ඉදිරිපත් කරන්නේ නැහැ. ලිපියක් ලැබුණු බව දැන්වීම තමයි මේ කරන්නේ. ඒකෙන් ඔබතුමාට කොයි විධියට හානි වෙනවාද කියලා මම දන්නේ නැහැ.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු කථානායකතුමනි, ඒක වුණත්, මගේ වරප්‍රසාද ප්‍රශ්නයට අදාළ නිසා, මේ පාර්ලිමේන්තුවට ඒ පිළිබඳව ලිපියක් ඉදිරිපත් කරන්න හෝ කියවන්න හෝ බලය ලැබෙන්නේ අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ස්ථාවර නියෝග අනුවයි. හැබැයි, එහෙම කියවන්න ඒවායේ ප්‍රතිපාදන නැහැ. එහෙම ඉදිරිපත් කිරීමටත් ප්‍රතිපාදන නැහැ. එහෙම නැති වුණත්, ඒක නිසි පරිදි නම් ඉදිරිපත් කරන්නේ මගේ විරෝධයක් නැහැ. අපි පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුගමනය කරලායි ඒ කටයුත්ත කරන්නට ඕනෑ කියන එක මා ඔබතුමාට ගෞරවයෙන් සඳහන් කරනවා.

එහෙම ලිපියක් කියවන්න ප්‍රතිපාදන නැහැ. එහෙම ඉදිරිපත් කිරීමටත් ප්‍රතිපාදන නැහැ. හැබැයි එහෙම නැති වුණත් මගේ විරෝධයක් නැහැ, ඒක නිසි පරිදි ඉදිරිපත් කරනවා නම්. අපි පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුගමනය කරලායි ඒ කටයුත්ත කරන්නට ඕනෑ කියන එක මා ඔබතුමාට ගෞරවයෙන් සඳහන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නමුත්, මට වගකීමක් තිබෙනවා, මෙහෙම ලිපියක් ලැබුණු බව සභාවට දැන්වීමට. මම මේ කරන්නේ ඒ කටයුත්ත තමයි.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Speaker, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Sumanthiran?

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
At the Committee on Parliamentary Business, you assured us that you will table the letter; not just inform the House of its receipt, but that you will table the letter. So, we expect you to table the letter of the Chief Justice for the information of all the Members of Parliament.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, that will be done.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Right. Thank you.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Mujibur Rahuman?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මම අහන්නෙත් ඒ සම්බන්ධව තමයි. මේ පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාව ඔබතුමාට වාර්තාවක් එවලා තිබෙනවා. ඔබතුමා ඒ වාර්තාව සභාගත කරනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ඒක දැන් මම table කරන්නම්.

2024.06.25 දින ලැබුණු පැමිණිල්ල පිළිබඳ අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඇතුළත් වාර්තාව

2024.06.25ஆம் திகதிய முறைப்பாடு தொடர்பில், நீதிச் சேவைகள் ஆணைக்குழுவின் அவதானிப்புகள் அடங்கிய அறிக்கை

REPORT CONTAINING OBSERVATIONS OF JUDICIAL SERVICE COMMISSION ON COMPLAINT RECEIVED ON 25.06.2024

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් 2024.06.19 දින අධිකරණ පද්ධතිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී සිදු කරන ලද ප්‍රකාශය හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් එතුමාගේ වරප්‍රසාද, පරිහාර සහ බලතල උල්ලංඝනය කිරීම පිළිබඳව ගරු අග්‍ර විනිශ්චයකාරතුමාට පිටපතක් සහිතව මා වෙත යොමු කර ඇති 2024.06.25 දිනැති පැමිණිල්ල සම්බන්ධයෙන්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඇතුළත් එම කොමිෂන් සභාවේ ගරු සභාපති සහ සාමාජික ගරු විනිශ්චයකාරවරුන් දෙදෙනාගේ අත්සනින් යුතු 2024.06.26 දිනැති වාර්තාව සහ එම වාර්තාව සමඟ ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගෙන් ලද 2024.06.26 දිනැති ලිපිය, එම ලිපිය ලැබී ඇති භාෂාව වන සිංහල භාෂාවෙන් පමණක් සභාවේ විශේෂ අවසරය ඇතිව මම **සභාගත*** කරමි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LVIII කොටස;
- 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XL කොටස;
- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LI හා LII කොටස් සහ නවවැනි කාණ්ඩයේ XXXV හා XXXVI කොටස්; සහ
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ I හා II කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවල මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

- 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2024 ජූලි 04 දිනැති අංක 2391/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරමින් කරන ලද ප්‍රකාශනය;
- 1974 අංක 35 දරන රේගු (සංශෝධන) පනතින් සහ 1988 අංක 83 දරන රේගු (සංශෝධන) පනතින් සංශෝධිත රේගු ආඥාපනතේ (235 අධිකාරය වන) 19(අ) වගන්තිය යටතේ රේගු ආනයන තීරු බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලද්දව, 2024 ජූනි 18 දිනැති අංක 2389/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ
- 2023 අංක 34 දරන විසර්ජන පනතේ 6 (1) වගන්තිය යටතේ 2024.05.01 සිට 2024.06.07 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ සංවර්ධන වැඩසටහන සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන.- [අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු ප්‍රසන්න රණතුංග මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන - පෝක්කුවරත්තු මර්‍රුම් නෙටුඤ්චාලෙකළ් අමෛච්චරුම් වෙකුචන ඌටක අමෛච්චරුම්)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු සනාතිපති චට්ටත්තරණි (කලානිති) විජයතාස රාජපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු පිරසන්න රණතුංක)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම, 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය සහිතව, සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 දෙසැම්බර් 28 දිනැති අංක 2364/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරමි.

මෙම නියමය සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයිය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රමේෂ් පතිරණ - කෛත්තොළිල් අමෛච්චරුම් සුකාතාර අමෛච්චරුම්)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Industries and Minister of Health)

ගරු කථානායකතුමනි, 2021 වර්ෂය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රමේෂ් පතිරණ)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)
(මාණ්පුමිකු කඤ්චන විජේසේකර - මින්සක්ති මර්‍රුම් වලුසක්ති අමෛච්චර්)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය;

(ii) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත යටතේ නිවේදන; සහ

(iii) ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
සභාපීඨත්තිල් ඉරුක්කක් කට්ටළෛයිටප්පට්ටතු.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி நிமல் சிறிபால த சில்வா - துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva, Attorney-at-Law - Minister of Ports, Shipping and Aviation)

ගරු කථානායකතුමනි, ගනේමුල්ල, ගලහිටියාව, අංක 139 දරන ස්ථානයෙහි පදිංචි එච්.ඒ. රංජිත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අශෝක් අබේසිංහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු නිමල් පියතිස්ස මහතා
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගම්පොල, කොබ්බෑවල, අංක 54/බී දරන ස්ථානයෙහි පදිංචි ඊ.ඩබ්ලිව්.ඩී.පී.එස්.බී. රඹුක්වැල්ල මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මහනුවර, වටපුළුව, මේජර් සමන් කුමාර රණවීර මාවත, අංක 94/12 දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ.ටී.බී. මඩුවෙආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

ගරු කථානායකතුමනි, රදාවෙල, පල්ලාවෙල, "නිසල්" ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඩබ්ලිව්. තමරසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
රීති ප්‍රශ්නයක්ද, ගරු මන්ත්‍රීතුමියනි?

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මේ වනකොට නීතිපති තනතුර පුරප්පාඩු වෙලා තිබෙනවා. ජොෂ්ඨත්වය මත ඊළඟට ඒ සඳහා සුදුසුකම තිබෙන්නේ කාන්තාවක් වන අයේෂා ජිනසේන මහත්මියට. නමුත්, මේ වනකොට පාරින්ද රණසිංහ මහතා වැඩබලන නීතිපති ලෙස පත් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, හැබැයි, මට තිබෙන ප්‍රශ්නය මේකයි. තවම සති දෙකක් ගත වුණේ නැහැ, කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත සම්මත කරලා. ලෝකයට පෙනෙන්න පනත් ගෙනෙනවා. හැබැයි, ක්‍රියාවෙන් කාන්තාවන්ට තැනක් දෙන්න මේ ආණ්ඩුව කැමැති නැහැ. මට දැනගන්න ඕනෑ, එම කාන්තාවගෙන් ඒ තනතුර ගිලිහිලා වෙනත් කෙනෙකුට ඒ තනතුරේ වැඩ බලන්න ලබා දෙන්නේ මොන පදනමක් මතද කියන කාරණය.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමනි, ඉක්මනින් කියන්න.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)

ගරු කථානායකතුමනි, දැන් අපට ලේඛනයක් බෙදාගෙන ගියා, ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය අග්‍ර විනිශ්චයකාරතුමා විසින් ඔබතුමාට එවන ලද. ඔබතුමා එම ලිපිය table කළා. ඒකේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සියලුදෙනා ගැන කථා කර තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔය ප්‍රශ්නය වෙන අවස්ථාවකදී ඉදිරිපත් කරන්න. මේ ඒ ගැන කථා කරන්න වේලාව නොවෙයි.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)

ගරු කථානායකතුමනි, ඒ හරහා, ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරු විධියට අපට තිබෙන වරප්‍රසාද උල්ලංඝනය වෙලා තිබෙන බව පෙනෙන්න තිබෙනවා. මේ පිළිබඳව අපට පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. එම නිසා ඔබතුමා කරුණාකරලා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔය ප්‍රශ්නය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළාට පසුව ඔබතුමා ඒ පැහැදිලි කර ගැනීම කර ගන්න.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -1909/2024- (1), ගරු තිස්ස අත්තනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -1913/2024- (1), ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3-1917/2024- (2), ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -1942/2024- (1), ගරු මිලාන් ජයතිලක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -1969/2024- (1), ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 -1995/2024- (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, වාරිමාර්ග අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

තේ නිෂ්පාදනය සහ අපනයනය: විස්තර
தேயிலை உற்பத்தியும் ஏற்றுமதியும்: விபரம்
PRODUCTION AND EXPORT OF TEA: DETAILS

2008/2024

7. ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ තේ වගා කරනු ලබන මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම භූමි ප්‍රමාණයෙන් රජය සහ පෞද්ගලික අංශය සතු භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) තේ නිෂ්පාදනය තුළින් උපයනු ලබන වාර්ෂික ආදායම කොපමණද;

(iv) මේ වනවිට කාබනික පොහොර යොදා ගනිමින් තේ වගා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(v) කාබනික පොහොර භාවිතයෙන් ලබා ගනු ලබන වාර්ෂික තේ අස්වැන්න කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාව තේ අපනයනය කරනු ලබන රටවල් කවරේද;

(ii) වාර්ෂිකව අපනයනය කරනු ලබන තේ ප්‍රමාණය කොපමණද;

(iii) එම අපනයනයෙන් උපයනු ලබන වාර්ෂික විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ තේ සඳහා ලෝක තේ වෙළඳපොළේ නිමි වී ඇති ස්ථානය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தேயிலைப் பயிர்ச்செய்கை மேற்கொள்ளப்படும் நிலப்பரப்பின் மொத்த அளவு யாதென்பதையும்;

(ii) மேற்படி நிலப்பரப்பில் அரச மற்றும் தனியார் துறைக்குச் சொந்தமான நிலப்பரப்பின் அளவு வெவ்வேறாக யாதென்பதையும்;

(iii) தேயிலை உற்பத்திமூலமாக ஈட்டப்படும் வருடாந்த வருமானம் எவ்வளவு என்பதையும்;

(iv) இன்றளவில் சேதனப் பசளையைப் பயன்படுத்தி தேயிலைப் பயிர்ச்செய்கை மேற்கொள்ளப்படும் பிரதேசங்களின் பெயர்கள் யாவையென்பதையும்;

(v) சேதனப் பசளையைப் பயன்படுத்துவதன்மூலம் வருடாந்தம் பெற்றுக்கொள்ளப்படும் தேயிலை அறுவடையின் அளவு யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கை தேயிலையை ஏற்றுமதி செய்யும் நாடுகள் யாவையென்பதையும்;

(ii) வருடாந்தம் ஏற்றுமதி செய்யப்படும் தேயிலையின் அளவு யாதென்பதையும்;

(iii) மேற்படி ஏற்றுமதிமூலமாக ஈட்டப்படும் வருடாந்த அந்நியச் செலாவணியின் அளவு எவ்வளவு என்பதையும்;

(iv) உலக தேயிலைச் சந்தையில் இலங்கையின் தேயிலைக்குக் கிடைத்துள்ள இடம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Will he inform this House -

(i) the total area of land where tea is cultivated in Sri Lanka;

(ii) separately, the extent of land owned by the State sector and the private sector, out of the said area;

(iii) the annual income earned from tea production;

(iv) the names of the areas where tea is cultivated using organic fertilizer; and

(v) the annual yield of tea obtained using organic fertilizer?

(b) Will he also inform this House of the -

(i) names of the countries to which Sri Lanka exports tea;

(ii) quantity of tea exported annually;

(iii) annual amount of foreign exchange earned from the said exportation; and

(iv) ranking for Ceylon Tea in the world tea market?

(c) If not, why?

ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture and Plantation Industries)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) හෙක්ටෙයාර 269,875.64කි.

(ii) ප්‍රාදේශීය වැවිලි සමාගම් සතු භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 70,446.64

පෞද්ගලික අංශය සතු භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 199,429

(iii)

2023 වර්ෂය සඳහා වාර්ෂික අපනයන ආදායම	රු.බිලියන 428.29
2024 වර්ෂයේ ජනවාරි මස සිට අප්‍රේල් මස (අවසානය) දක්වා අපනයන ආදායම	රු. බිලියන 139.49

(iv) මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල, රත්නපුර, ගාල්ල, මාතර, කළුතර යන දිස්ත්‍රික්කයන්හි වගා කරනු ලැබේ.

(v) කාබනික පොහොර භාවිතයෙන් තේ වගා කරනු ලබන භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 1,582.88යි. තවත් විධියකින් කිව්වොත් දළ වශයෙන් අක්කර 3,911ක්.

2023 වර්ෂයට අදාළ නිමි තේ නිෂ්පාදනය (කාබනික පොහොර භාවිතයෙන්) කිලෝ මිලියන 1.071	තේ අස්වැන්න (අමු තේ දලු ප්‍රමාණය) කිලෝ මිලියන 4.98
2024 වර්ෂයේ ජනවාරි මස සිට අප්‍රේල් මස (අවසානය) දක්වා නිමි තේ නිෂ්පාදනය (කාබනික පොහොර භාවිතයෙන්) කිලෝ මිලියන 0.307	තේ අස්වැන්න (අමු තේ දලු ප්‍රමාණය කිලෝ මිලියන 1.43)

(ආ) (i) ශ්‍රී ලංකාව විසින් තේ අපනයන කරන ප්‍රධානතම රටවල් 20 වනුයේ, ඉරාකය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, රුසියාව, තුර්කිය, ඉරානය, චීනය, සවුදි අරාබිය, අසර්බයිජාන්, ජර්මනිය, චිලී රාජ්‍යය, සිරියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, ජෝර්දානය, ලිබියාව, ජපානය, පෝලන්තය, තායිවානය, හොංකොං, බෙල්ජියම සහ ඉතාලියයි.

(ii)

2023 වර්ෂය	කිලෝ මිලියන 241.91
2024 වර්ෂයේ ජනවාරි මස සිට අප්‍රේල් මස (අවසානය) දක්වා	කිලෝ මිලියන 78.70

(iii)

2023 වර්ෂය	රු. බිලියන 428.29
2024 වර්ෂයේ ජනවාරි මස සිට අප්‍රේල් මස (අවසානය) දක්වා	රු. බිලියන 139.49

(iv) සිව්වන ස්ථානය (2023 - වර්ෂය)

(ඇ) අදාළ නොවේ.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය යටතේ මම අහන්නේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිළිබඳවයි. ගරු ඇමතිතුමනි, අපි දැක්කා, 2023 වසරේදීත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් ප්‍රවර්ධන කටයුතු කළ බව. මේ අවුරුද්දේත් ඒ හා සමානව ප්‍රවර්ධන කටයුතු කරනවාද, ඒ සඳහා වියදම් කරන මුදල කොපමණද?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන මුල් ප්‍රශ්නයෙන් අහපු නැති නිසා මට මේ වෙලාවේ මූල්‍යමය වශයෙන් හරියට ගණන් හිලව් ගැන දැනුම් දෙන්න අමාරුයි. නමුත් සෑම වර්ෂයකම ප්‍රවර්ධන කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදනයක් වෙන් කරලා තිබෙනවා. ඒ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක වෙනවා. මේ වර්ෂයේත් ඒ කටයුත්ත ඒ ආකාරයෙන්ම සිදු වෙනවා. පසුගිය දිනවල ජාත්‍යන්තර තේ දිනය වෙනුවෙනුත් ඒ වාගේම ප්‍රවර්ධන කටයුත්තක් තානාපතිවරු ඇතුළු විදේශීය අයගේ සම්බන්ධීකරණයෙන් සිදු වුණා. අඛණ්ඩවම ඒ කටයුත්ත සිදු වෙනවා.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ RPCs පිළිබඳවයි. ගිවිසුම අනුව නම් RPCs හැම අවුරුද්දේම වාගේ අලුතෙන් තේ වගා කරන්න ඕනෑ. මේ අවුරුද්දේත් ඒ වාගේ දේවල් කරනවාද? මම දන්නවා, ආර්ථික ගැටලු තිබෙන බව. එහෙම කරනවා නම්, ප්‍රතිශතයක් වශයෙන් අලුතෙන් කොච්චර තේ වගා කරනවාද?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, තේ වගාවේ ඵලදායිතාවයේ අඩුවක් සහ මුදල් වශයෙන් ලැබෙන අගයේ යම් අඩුවක් පෙනෙන්න තිබෙන නිසා අපි මේ සම්බන්ධයෙන් අදාළ පාර්ශ්ව සමඟ අවස්ථා ගණනාවකදී දීර්ඝ සාකච්ඡාවක් සිදු කළා. එහිදී අපි හඳුනා ගත්තා, මේ සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන වශයෙන් සැලැස්මක් සකස් කරන්න ඕනෑ කියලා. ඒ අනුව තේ අස්වැන්න වැඩි කර ගැනීම සඳහා කෙටි කාලීන සැලැස්මක් විධියට ක්‍රියාත්මක කළ කාරණා මම කියන්නම්. මොකද, පොහොර භාවිතය ඉතා අඩුයි. ඒකට හේතුව තමයි පොහොර මිල ඉහළ යාම.

අප පසුගිය වතාවල සමහර වෙලාවල වී ගොවීන් වෙනුවෙන් මඩ පොහොර නොමිලේ දුන්නත්, පොහොර අඩු මිලට දුන්නත් තේ ගොවීන්ට ඒ සහනය නොලැබුණු නිසා ඒ අය පොහොර පාවිච්චිය අඩුවෙන් සිදු කර තිබුණා. පොහොර සමාගම් දෙකම තිබෙන්නේ මගේ අමාත්‍යාංශයේ කෘෂිකර්ම විෂය පථය යටතේ. ඒ නිසා අපි එම සමාගම් දෙකෙහිම නිලධාරීන් ගෙන්වා වෙළෙඳ පොළේ පවතින මිලට වඩා භාගයකට ආසන්න මුදලකට පොහොර ලබා දෙන එක පිළිබඳව සාකච්ඡා කළා. ඒ අනුව ගොවීන් මිල දී ගන්නා සෑම පොහොර හොණ්ඩරයක් වෙනුවෙන්ම රුපියල් 2,000ක සහනාධාරයක් - subsidy එකක් - අපි ලබා දෙනවා. ඊට අමතරව, රාජ්‍ය අංශය මැදිහත් වෙලා අවම ලාභයක්

සහිතව පොහොර නිෂ්පාදනය කිරීමේ කටයුත්ත කරගෙන යන නිසා පොහොර මිල දැන් අඩු කර තිබෙනවා. මේ සහනාධාරය තවත් වැඩි කිරීම සඳහා අපි නැවත සාකච්ඡා කරගෙන යනවා.

ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ක්ෂේත්‍රය පිළිබඳව දන්නවා කියා මා හිතනවා. කෙටි කාලීනව -මාස ගණනක් ඇතුළත- තේ අස්වැන්න වැඩි කර ගන්න අපට තිබෙන බාධාව තමයි, පොහොර. ඒ නිසා අපි ඉදිරි සතිය දෙක ඇතුළත තේ ගොවීන් වෙත මීටත් වඩා වැඩි ප්‍රමාණයකින් පොහොර සහනාධාරය ලබා දී පොහොර භාවිතය වැඩි කිරීම තුළින් තේ අස්වැන්න වැඩි කර ගන්න කටයුතු කරනවා. මම දැනටමත් ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා.

ඊට අතිරේකව මා තවත් කරුණක් කිව යුතුයි. ගොඩක් තේ ඉඩම්වල හිස්තැන් තිබෙනවා. මම ගිය සති අන්තයේත් නුවරඑළිය, නුවර, කෑගල්ල ආදි ප්‍රදේශවලට ගියා. ඒවායේ තේවතුවල හිස්තැන් සහිත ඉඩ කඩ විශාල ප්‍රමාණයක් තිබෙනවා. එම හිස්තැන්වල වගා කටයුතු කිරීම සඳහාත් වෙනම ආධාර ක්‍රමයක් අපි මේ වන විට ක්‍රියාත්මක කරමින් සිටිනවා. ඒ වාගේම අධිනාක්ෂණය යටතේ, අධිසනත්වය යටතේ තේ වගා කිරීම සිදු කළ යුතුයි. අලුතින් වගා කරන අයට ඒ අවස්ථාව ලබා දෙනවා. ඒ හරහා දැන් වාගේ තුන්ගුණයක පමණ අස්වැන්නක් ලබා ගන්න පුළුවන්; ඒ වාගේම පැළ ප්‍රමාණය වැඩි කර ගන්නත් පුළුවන්. එම තාක්ෂණය දැන් අපේ රටට ඇවිත් තිබෙනවා. එම තාක්ෂණය දැන් අපේ රටේ භාවිත කරනවා. Drip irrigation කට්ටල ලබා දීමටත්, ජල පහසුකම් වැඩිදියුණු කිරීමටත් අවශ්‍ය මුදල් ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු අරමුදලින් ලබා දීලා එම තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා අපි අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා. ඒ නිසා තේ කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ඇති වෙලා තිබෙන මේ පසුබෑම කෙටි කාලයක් ඇතුළත - මා හිතන විධියට මාස තුනකින් පමණ පසුව - යථා තත්ත්වයට පත් වීම ආරම්භ වෙයි. ඒ අනුව ඉදිරි අවුරුද්ද දෙක යනකොට පෙර තිබුණු තත්ත්වයටත් වඩා ඉහළ මට්ටමකට තේ කර්මාන්තය ගෙන එන්න අපට පුළුවන්කම ලැබෙනවා.

ආර්ථික අර්බුදය මැද්දේ වුණත් ගරු ජනාධිපතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් ඒ සඳහා අපට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සලස්වා තිබෙනවා. ඒ සියලු මුදල් වෙන් කර දී තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -2024/2024- (1), ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, මීට මාසයකට පෙරත් මම මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ප්‍රශ්නයක් අහලා තිබුණා. පළමු වටයේදී එ් ප්‍රශ්නය අහපු අවස්ථාවේ මම හිටියේ නැහැ. දෙවැනි වටයේදී ඒ ප්‍රශ්නය ඇහුවාම ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කිව්වා, එම පිළිතුර සභාගත කරනවා කියලා. මම පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ සභාගත කරපු පිළිතුර ගැන සොයා බැලුවා. නමුත් ඒක සභාගත කරලා නැහැ. ඊට පස්සේ කිව්වා, කල් ඉල්ලනවා කියලා.

මට මහජන ආරක්ෂක ඇමතිතුමා සමඟ පෞද්ගලිකව කිසිම ගැටලුවක් නැහැ. එතුමාට අද වෙනත් රාජකාරි තිබෙන්න පුළුවන්. හැබැයි, රාජ්‍ය ඇමතිතුමාට හරි මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න පුළුවන් නේ. මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ 2020දී. දැන් අවුරුදු 4කට පස්සේ මේ ප්‍රශ්නය ඇහුවාම, පිළිතුර ලබා දෙන්න කල් ඉල්ලනවා. ගරු කථානායකතුමනි, අපටත් උදේට කරන්න වෙනත් වැඩ තිබෙනවා. අපි උදේම ඇඳගෙන කරගෙන පාර්ලිමේන්තුවට එන්නේ අපි අහපු ප්‍රශ්නයට පිළිතුරක් ලැබේවි කියලායි. පාර්ලිමේන්තුවට සහභාගි වෙන්න කොළඹට එන සතියේ කර ගන්න අපට තවත් වැඩ තිබෙනවා. ගරු කථානායකතුමනි, මේකට මොකක් හරි දෙයක් කරන්න. එහෙම නැත්නම් මෙහෙම අපි ඇඳගෙන උදේට පාර්ලිමේන්තුවට එන එකේ වැඩක් නැති වෙනවා. අපට එළියේ තවත් රාජකාරි තිබෙනවා. මේ බවක් දන්නවා නම්, ඒවා අවසන් කරගෙන මෙහේට එන්න අපට පුළුවන් නේ. මට සවස 5.00 වනතුරු පාර්ලිමේන්තුවේ ඉන්න සිදු වෙලා තිබෙනවා. නමුත්, අපට වෙනත් වැඩ තිබෙනවා නේ. මම උදේ 9.00 ඉඳන් සවස 5.00 වනකල් ඉන්න ඕනෑ. ඇමතිවරයා නැත්නම් රාජ්‍ය ඇමතිවරයා ඉන්නවා නේ. එතුමාට හරි පිළිතුර දෙන්න කියන්න. එහෙම නැත්නම්, ගිය පාර සභාගත කරපු පිළිතුර ලබා දෙන්න කියන්න. සභාගත කරනවා කිව්වාට ඒකත් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ඉල්ලීම කරන්නම්.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, ගරු ෂානක්කියන් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය පළමුවර ඇසීම තමයි මේ පාර්ලිමේන්තුවේදී දැන් සිද්ධ කළේ. ඒ නිසා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා කල් ඉල්ලන්න ගරු අමාත්‍යතුමාට අවස්ථාව තිබෙනවා. එතුමා පිළිතුර දීම සඳහා මාස දෙකක් කල් ඉල්ලා තිබෙනවා. ඒ මාස දෙක ඇතුළත පිළිතුර ලබා දීමට කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩිය மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -2042/2024- (2), ගරු ලලිත් එල්ලාවල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 -2055/2024- (2), ගරු වේලු කුමාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ගල්කිස්ස බස් නැවතුම්පොළ: ඉවත් කිරීමට හේතු
கல்கிஸ்சை பேருந்துத் தரிப்பிடம் : அகற்றுவதற்கான காரணம்
MOUNT LAVINIA BUS STATION: REASONS FOR REMOVAL

1909/2024

1. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු තිස්ස අත්තනායක මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Tissa Attanayake)

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්මලාන ඩිපෝව මඟින් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබූ ගල්කිස්ස ප්‍රධාන බස් නැවතුම්පොළ, එම ස්ථානයෙන් ඉවත් කිරීමට බලපාන ලද හේතු කවරේද;

(ii) එම ප්‍රධාන බස් නැවතුම්පොළ ස්ථාපිත කිරීම සඳහා අත් පත් කර ගන්නා ලද ඉඩමේ මුල් අයිතිකරුගේ නම සහ ඉඩමේ පිඹුරුපත් අංකය කවරේද;

(iii) එම ඉඩමේ විශාලත්වය කොපමණද;

(iv) එම ප්‍රධාන බස් නැවතුම්පොළ ස්ථාපිත කිරීම සඳහා භාවිත කර තිබූ ඉඩමේ ප්‍රමාණය කොපමණද;

(v) ප්‍රධාන බස් නැවතුම්පොළ ස්ථාපිත කිරීම සඳහා එම ඉඩම අත් පත් කර ගන්නා ලද වර්ෂය කවරේද;

(vi) මේ වන විට ඉහත ඉඩම අයත් ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்மலானை டிப்போவால் தொழிற்பாட்டு நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்ட கல்கிஸ்சை பிரதான பேருந்துத் தரிப்பிடத்தை, அவ்விடத்திலிருந்து அகற்றுவதற்குத் தாக்கம் செலுத்திய காரணங்கள் யாவையென்பதையும்;

(ii) மேற்படி பிரதான பேருந்துத் தரிப்பிடத்தை நிறுவுவதற்குக் கையகப்படுத்தப்பட்ட காணியின் ஆரம்ப உரிமையாளரின் பெயர் மற்றும் நில வரைபட இலக்கம் யாவையென்பதையும்;

(iii) மேற்படி காணியின் விஸ்தீரணம் யாதென்பதையும்;

(iv) மேற்படி பிரதான பேருந்துத் தரிப்பிடத்தை நிறுவுவதற்குப் பயன்படுத்திய காணியின் அளவு யாதென்பதையும்;

(v) பிரதான பேருந்துத் தரிப்பிடத்தை நிறுவுவதற்கு மேற்படி காணியைக் கையகப்படுத்திய வருடம் யாதென்பதையும்;

(vi) தற்போது அக்காணி எந்த நிறுவனத்துக்கு உரித்தானது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Highways:

(a) Will he inform this House -

(i) the reasons for the removal of the Mount Lavinia main bus station, where operations were carried out by the Ratmalana Depot;

(ii) name of the original owner and the plan number of the land acquired for establishing the aforesaid main bus station;

(iii) the extent of the aforesaid land;

(iv) the extent of the land used for establishing the aforesaid main bus station;

(v) the year in which the land was acquired for establishing the main bus station; and

(vi) the institution which owns the aforesaid land, at present?

(b) If not, why?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ගල්කිස්ස දිසා අධිකරණයේදී පැවැති නඩු අංක 1319/00/ඉඩම් නඩුවේ තීන්දු ප්‍රකාශ පරිදි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ඉඩම හිමි නැති බවට තීරණය වීම.

(ii) පැන නොනඟී.

(උක්ත නඩු තීන්දුවට අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත අදාළ ඉඩම අත් පත් කරගෙන නොමැති බව තහවුරු වී ඇති බැවිනි.)

(iii) අක්කර බින්දුවයි, රූඩ් එකයි, පර්චස් 2.38යි.

(අක්කර 0, රූඩ් 1, පර්චස් 20.38)

(iv) අක්කර බින්දුවයි, රූඩ් එකයි, පර්චස් 2.38යි.

(අක්කර 0, රූඩ් 1, පර්චස් 20.38)

(v) පැන නොනඟී.

(උක්ත නඩු තීන්දුවට අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත අදාළ ඉඩම අත් පත් කරගෙන නොමැති බව තහවුරු වී ඇති බැවිනි.)

(vi) ඔව්.

සීමාසහිත හෙට්ටිගොඩ ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම.

(ආ) අදාළ නොවේ.

රාජ්‍ය ඖෂධ සංස්ථාවේ ඔසුසල්: කොළඹ දිස්ත්‍රික්කය

அரச மருந்தகக் கூட்டுத்தாபன மருந்தகங்கள்: கொழும்பு மாவட்டம்

PHARMACIES OF STATE PHARMACEUTICALS CORPORATION: COLOMBO DISTRICT

1913/2024

2. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ ඇති රජයේ ඔසුසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ඔසුසල පිහිටුවා ඇති ස්ථානයේ ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) කොළඹ දිස්ත්‍රික්කය තුළ රජයේ ඔසුසල් ශාඛා ජාලය තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு மாவட்டத்திலுள்ள அரச மருந்தகங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி ஒவ்வொரு மருந்தகமும் அமைந்துள்ள இடத்தின் முகவரி வெவ்வேறாக யாது;

(iii) கொழும்பு மாவட்டத்தில் அரச மருந்தகக் கிளை வலையமைப்பை மேலும் விஸ்தரிப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) the number of pharmacies owned by the State Pharmaceuticals Corporation in the Colombo District;

(ii) the address of each of the said pharmacy, separately; and

(iii) the actions that will be taken to expand the network of State Pharmaceutical Corporation pharmacies in the Colombo District?

(b) If not, why?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)

(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) 16කි.

(ii)

	රාජ්‍ය ඔසුසල	ලිපිනය
1	අවිස්සාවේල්ල	නො.40, කොළඹ පාර, අවිස්සාවේල්ල.
2	බොරැල්ල	ළමා රෝහල පරිශ්‍රය, බොරැල්ල.
3	කොළඹ 01	නො. 63, සර් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.
4	කොළඹ 04	නො. 85, ගාලු පාර, කොළඹ 04. (අලුත්වැඩියා කටයුතු සඳහා තාවකාලිකව වසා ඇත)
5	කොළඹ 07	නො. 255, ධර්මපාල මාවත, කොළඹ 07.
6	කොළඹ කොටුව දුම්රියපොළ	දුම්රියපොළ පරිශ්‍රය, කොළඹ කොටුව.
7	වෙරහැර	විශ්වවිද්‍යාල රෝහල - කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රාජ්‍ය ඔසුසල KDU, වෙරහැර, බොරලැස්ගමුව.
8	මහරගම	නො. 71/A, අල්විස් ප්ලාසා, පරණ පාර, මහරගම.
9	නාරාහේන්පිට	ආර්ථික මධ්‍යස්ථානය, කිරිමණ්ඩල මාවත, නාරාහේන්පිට.
10	නුගේගොඩ	නො. 151, ඩී.එස්. ජයසිංහ මාවත, නුගේගොඩ.
11	පිළියන්දල	නො. 1A/21, විද්‍යාල මාවත, පිළියන්දල.
12	පිටකෝට්ටේ	නො. 326, කෝට්ටේ පාර, පිටකොට්ටේ.
13	රත්මලාන	මෙගා සතොස, ගොඵමඩම හන්දිය, ගාලු පාර, රත්මලාන. (ගොඩනැඟිල්ල මාරු කිරීම සඳහා තාවකාලිකව වසා ඇත)
14	ශ්‍රී ජයවර්ධනපුර	ශ්‍රී ජයවර්ධනපුර ජාතික රෝහල, ජයවර්ධනපුර, තලපත්පිටිය, නුගේගොඩ.
15	හෝමාගම	නො. 130A, හයිලෙවල් පාර, හෝමාගම.
16	වැල්ලවත්ත	නො. 153, ගාලු පාර, වැල්ලවත්ත.

(iii) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කොළඹ දිස්ත්‍රික්කය තුළ නව ඔසුසල් 14ක් විවෘත කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දී ඇති අතර, මේ සඳහා සුදුසු ගොඩනැගිලි පරීක්ෂා කිරීමේ කටයුතු දැනටමත් සිදු කරමින් පවතී. ඒ අනුව ගොඩනැගිලිවල අනුකූලතාව මත කඩිනමින් මෙම ඔසුසල් පහත සඳහන් ස්ථානවල ස්ථාපිත කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.

1. මට්ටක්කුලිය
2. මෝදර
3. කොට්ටාව
4. තලවතුගොඩ
5. බත්තරමුල්ල
6. කිරිබත්ගොඩ
7. මාලඹේ
8. කොටහේන
9. ග්‍රෑන්ඩ්පාස්
10. අතුරුගිරිය
11. කොල්ලුපිටිය
12. දෙහිවල
13. මරදාන
14. දෙමටගොඩ

(ආ) පැන නොනඟී.

කම්කරු දෙපාර්තමේන්තුව: කම්කරු ආරාවුල් පිළිබඳ පැමිණිලි

தொழில் திணைக்களம்: தொழில் பிணக்குகள் தொடர்பான முறைப்பாடுகள்

DEPARTMENT OF LABOUR: COMPLAINTS REGARDING LABOUR DISPUTES

1917/2024

3. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය වෙනුවට)

(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு (திருமதி) ராஜிகா விக்கிரமசிங்ஹ சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. (Mrs.) Rajika Wickramasinghe)

කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වර්ෂ 2020 සිට මේ දක්වා කම්කරු ආරාවුල් සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම පැමිණිලි අතරින් මේ වන විට නිරවුල් කර ඇති සහ නිරවුල් කර නොමැති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හරහා වන්දි ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச் சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு தொடக்கம் இதுவரை தொழில் பிணக்குகள் தொடர்பில் தொழில் திணைக்களத் துக்குக் கிடைத்துள்ள முறைப்பாடுகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) மேற்படி முறைப்பாடுகளில் இன்றளவில் தீர்க்கப் பட்டுள்ள மற்றும் தீர்க்கப்படாதுள்ள முறைப் பாடுகளின் எண்ணிக்கை தனித்தனியாக எத்தனையென்பதையும்;

(iii) தொழில் நட்டஈட்டு ஆணையாளர் அலுவலகம் மூலமாக நட்டஈடு வழங்கப்பட்டுள்ள ஆட்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Foreign Employment:

(a) Will he inform this House-

(i) the number of complaints received by the Department of Labour regarding labour disputes from the year 2020 to date;

(ii) the number of settled and unsettled complaints, separately; and

(iii) the number of persons who have received compensation through the Office of the Commissioner for Workmen's Compensation?

(b) If not, why?

ගරු මනුෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)

(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)

(The Hon. Manusha Nanayakkara- Minister of Labour and Foreign Employment)

ගරු කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මැතිතුමාට වැඩිපුර වාර ගණනක් ආසනයෙන් නැඟී සිටීම සඳහා අවස්ථාව ලබා ගෙන, කුමක් හෝ වෙබ් අඩවියක ඉහළට යන්නත් අවස්ථාව ලබා දෙමින් -

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பத்திரண)

(The Hon. Buddhika Pathirana)

Thank you.

ගරු මනුෂ නානායක්කාර මහතා

(மாண்புமிகு மனுஷ நாணாயக்கார)

(The Hon. Manusha Nanayakkara)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) 2020 වර්ෂයේ සිට 2024.04.30 දක්වා කම්කරු ආරාවුල් සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 62,620ක් වේ.

(ii) 2020 වර්ෂයේ සිට 2024.04.30 දක්වා කම්කරු ආරාවුල් සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් ලැබී, නිරවුල් කර ඇති පැමිණිලි සංඛ්‍යාව 60,355ක් වේ. 2024.04.30 දිනට නිරවුල් කිරීම සඳහා ඉතිරිව තිබූ පැමිණිලි සංඛ්‍යාව 12,847ක් වේ.

වර්ෂය	ලද පැමිණිලි සංඛ්‍යාව	නිරවුල් කර ඇති පැමිණිලි සංඛ්‍යාව
2020	15,927	12,661
2021	12,482	12,148
2022	12,959	16,107
2023	16,340	15,885
2024.01.01 දින සිට 2024.04.30 දක්වා	4,912	3,554
මුළු එකතුව	62,620	60,355

(iii) 2020 වර්ෂයේ සිට 2024 මාර්තු මාසය දක්වා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හරහා වන්දි ලබා දී ඇති පුද්ගලයින් සංඛ්‍යාව පහත පරිදි වේ.

වර්ෂය	වන්දි ලබා දී ඇති පුද්ගලයින් සංඛ්‍යාව
2020	298
2021	277
2022	385
2023	470
2024.03.31 දක්වා	86
මුළු එකතුව	1,516

(ආ) පැන නොනඟී.

2015 සිට මේ දක්වා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සහ නිෂ්පාදනය: විස්තර

2015இலிருந்து இதுவரையான பாலுற்பத்திப் பொருட்களின் இறக்குமதியும் உற்பத்தியும்: விபரம்

IMPORT AND PRODUCTION OF DAIRY PRODUCTS FROM 2015: DETAILS

1942/2024

4. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු මිලාන් ජයතිලක මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு மிலான் ஜயதிலக்க சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Milan Jayathilake)

කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂික කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ වාර්ෂික කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය, ශ්‍රී ලංකාවට අවශ්‍ය වාර්ෂික කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) කිරි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය වැඩිම පළාත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම කිරි නිෂ්පාදනය කරනු ලබන ප්‍රදේශය කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட பாலுற்பத்திப் பொருட்களின் அளவு ஒவ்வோர் ஆண்டின் அடிப்படையில் தனித்தனியாக யாதென்பதையும்;

(ii) இலங்கையில் ஆண்டொன்றில் உற்பத்தி செய்யப்படுகின்ற பாலுற்பத்திப் பொருட்களின் அளவு யாதென்பதையும்;

(iii) இலங்கையில் ஓர் ஆண்டில் உற்பத்தி செய்யப்படுகின்ற பாலுற்பத்திப் பொருட்களின் அளவானது, ஆண்டொன்றில் இலங்கைக்குத் தேவையான பாலுற்பத்திப் பொருட்களின் அளவில் எத்தனை சதவீதம் என்பதையும்;

(iv) பாலுற்பத்திப் பொருட்கள் அதிகளவில் நுகரப்படும் மாகாணம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கையில் அதிகளவு பாலுற்பத்தி செய்யப் படுகின்ற பிரதேசம் யாதென்பதையும்;

(ii) இலங்கையில் பாலுற்பத்தியை அதிகரிக்கச் செய்வதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Will he inform this House -

(i) separately, the volume of dairy products imported to Sri Lanka from the year 2015 to date, according to each year;

(ii) the annual volume of dairy production in Sri Lanka;

(iii) the annual volume of dairy production in Sri Lanka, as a percentage of the volume of dairy production required by Sri Lanka annually; and

(iv) the province that has recorded the highest consumption of dairy products?

(b) Will he also inform this House -

(i) area that has recorded highest dairy production;

(ii) measures that will be taken to increase the dairy production of Sri Lanka?

(c) If not, why?

ගරු මහින්ද අමරවීර මහතා

(மாண்புமிகு மஹிந்த அமரவீர)

(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

[ගරු මහින්ද අමරවීර මහතා]

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය

(මෙට්‍රික් ටොන්)

අයිතමය	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
කිරි සහ කිරි යොදය Milk and Milk Cream	292.93	431.26	490.40	557.63	411.32	312.23	289.37	217.17	243.71
කිරි යොදය (මේදය 1.5% ට අඩු) Milk Cream Fat<1.5%	9,271.19	9,436.67	8,578.07	11,799.32	8,314.04	8,705.06	11,052.41	12,117.56	6,219.16
කිරි යොදය (මේදය 1.5% ට වැඩි) Milk Cream Fat>1.5%	72,487.82	84,578.45	84,548.91	87,228.39	85,434.94	88,558.22	71,971.99	37,407.97	61,320.87
උකු කළ කිරි Condensed Milk	49.71	76.47	125.55	31.24	22.73	166.26	351.94	1.85	1.39
චීස් සහ මී කිරි Cheese and Curd	2,361.30	1,521.83	2,866.04	3,274.64	2,663.91	2,843.75	2,966.23	2,207.64	1,765.22
බටර් සහ වෙනත් මේද Butter and Other Fats	544.97	996.19	683.39	619.09	583.18	547.38	431.19	314.10	278.35
බටර් මිල්ක් සහ කර්ඩිල්ඩ් මිල්ක් Butter Milk and Curdled Milk	25.78	28.09	66.96	72.36	38.50	26.93	41.89	8.10	27.84
වේ ප්‍රෝටීන් සහ වේ ප්‍රෝටීන් කුඩු Whey and Whey Powder	1,293.78	1,524.00	1,504.56	1,279.12	1,369.15	1,195.70	1,376.81	1,523.46	1,323.65
මුළු එකතුව	**86,327.48**	**99,592.96**	**98,863.88**	**104,861.79**	**98,837.77**	**102,355.53**	**88,481.83**	**53,797.85**	**71,180.19**

(ii) ප්‍රධාන කිරි ආශ්‍රිත නිෂ්පාදකයින් වෙතින් ලබාගත් දත්ත අනුව 2023 වසරේදී කිරි ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම සඳහා කිරි ලීටර් මිලියන 128.44ක් යොදාගෙන ඇත.

මීට අමතරව සුළු පරිමාණ හා මධ්‍යම පරිමාණ කිරි ආශ්‍රිත නිෂ්පාදකයින් සැලකිය යුතු ප්‍රමාණයක් ඇත. ඔවුන් විසින් නිපදවන කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණය ද සැලකූ විට ඉහත අගය මීට වඩා වැඩි වේ.

(iii) සියයට 19.8ක් පමණ වේ.

(iv) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව දිස්ත්‍රික් මට්ටමින් හා පළාත් මට්ටමින් කිරි නිෂ්පාදනය පිළිබඳව දත්ත එකතු කරනු ලබන නමුත්, කිරි නිෂ්පාදන පරිභෝජනය පිළිබඳව දත්ත රැස් කිරීමක් සිදු නොකරයි.

(ආ) (i) 2022 හා 2023 වාර්ෂික දත්ත අනුව ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම කිරි නිෂ්පාදනය කරනු ලබන ප්‍රදේශය වන්නේ මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයයි.

(ii) කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

- කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් කිරි ගව කර්මාන්තයට අදාළ සියලු පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගනිමින් ඉදිරි දශකය සඳහා කිරි ගව කර්මාන්තයට අදාළ ප්‍රතිපත්ති මාලාවක් සම්පාදනය කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කර ඇත.
- මෙම ජාතික ප්‍රතිපත්තිය පාදක කර ගනිමින් ඉදිරි වසර 5ක කාලය සඳහා ජාතික කිරි නිෂ්පාදන උපායමාර්ගික සැලැස්ම සහ පළාත් කිරි නිෂ්පාදන උපායමාර්ගික සැලසුම් සකස් කර ඇත.
- සත්ත්ව අභිජනන ගොවිපොළ පිහිටු වීමේ ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතේ තිරප්පනේ ගොවිපොළේ සහිවාල් අභිජනන ඒකකය පිහිටුවීම හා කෘත්‍රිම සිංචන සේවාව ශක්තිමත් කිරීම සහ බස්නාහිර පළාතේ කොටදෙණියාවේ පිහිටි ගව අභිජනන ගොවිපොළ ශක්තිමත් කිරීම.
- උසස් ආරයේ ගව ශුක්‍ර ආනයනය කර දේශීය ගව වර්ගවල ආරය උසස් කිරීමට කටයුතු කිරීම.
- ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් මෙන්ම කිරි ගොවීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- තෝරාගත් කිරි ගොවිපොළ දෛනිකව කිරි ලීටර් 100ක් නිෂ්පාදනය කරන ගොවිපොළ දක්වා වැඩිදියුණු කිරීම.
- ගව / මී ගව අභිජනන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සත්ත්ව සෞඛ්‍ය කළමනාකරණ හා රෝග පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දිස්ත්‍රික් පශු විමර්ශන මධ්‍යස්ථාන හා පශු පර්යේෂණ ආයතනය හරහා නිරන්තර රෝග විමර්ශන කටයුතු හා රෝග ආවේක්ෂණ කටයුතු සිදු කිරීම හා අවශ්‍ය විද්‍යාගාර පහසුකම් සැපයීම.
- දිවයින පුරා විසිරී ඇති පශු වෛද්‍ය කාර්යාල 337ක් මඟින් රෝග විනිශ්චය, ප්‍රතිකාර හා අවශ්‍ය පශු වෛද්‍ය උපදේශන සේවාවන් ලබා දීම.
- තෘණ වගාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. දෙමුහුම් නේපියර් වර්ග (උදා: පැවෝන්, රෙඩ් නේපියර්, CO4, CO5,) ගොවීන් වෙත හඳුන්වා දීම සහ වැඩිදියුණු කළ තෘණ දඬු බෙදා දීම මඟින් අඩු භූමි ප්‍රමාණයකින් වැඩි තෘණ අස්වැන්නක් ලබා ගැනීමට කටයුතු කිරීම.

(ඇ) අදාළ නොවේ.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සේවකයන්: වැටුප් සහ දීමනා
இலங்கை சுங்கத் திணைக்கள ஊழியர்கள்: ஊதியமும் கொடுப்பனவுகளும்
EMPLOYEES OF THE SRI LANKA CUSTOMS: SALARIES AND ALLOWANCES

1969/2024

5. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. U.K. Sumith Udukumbura)

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) රේගු දෙපාර්තමේන්තුවේ සේවකයන් සංඛ්‍යාව සහ ඒකාබද්ධ සේවයේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රේගු දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරීන්ට හා කනිෂ්ඨ නිලධාරීන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒකාබද්ධ සේවයේ විධායක නිලධාරීන්ට හා කනිෂ්ඨ නිලධාරීන්ට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை சுங்கத் திணைக்களத்தின் அங்கீகரிக்கப்பட்ட பதவியணி யாதென்பதையும்;

(ii) சுங்கத் திணைக்களத்தின் ஊழியர்களின் எண்ணிக்கையும் இணைந்த சேவையின் ஊழியர்களின் எண்ணிக்கையும் வெவ்வேறாக எத்தனையென்பதையும்;

(iii) சுங்கத் திணைக்களத்தின் நிறைவேற்று அலுவலர்களுக்கும் கனிஷ்ட அலுவலர்களுக்கும் செலுத்தப்படுகின்ற மாதாந்த ஊதியம் மற்றும் கொடுப்பனவுகள் ஒவ்வொரு பதவிக்கமைய வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(iv) இணைந்த சேவையின் நிறைவேற்று அலுவலர்களுக்கும் கனிஷ்ட அலுவலர்களுக்கும் செலுத்தப்படுகின்ற மாதாந்த ஊதியம் மற்றும் கொடுப்பனவுகள் ஒவ்வொரு பதவிக்கமைய வெவ்வேறாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Economic Stabilization and National Policies:

(a) Will he inform this House -

(i) the approved cadre of the Sri Lanka Customs;

(ii) separately, the number of employees of the Sri Lanka Customs and the number of employees of the Combined Service;

(iii) the amount of monthly salary and allowances paid to the executive officers and junior officers of the Sri Lanka Customs, separately according to each position; and

(iv) the amount of monthly salary and allowances paid to the executive officers and junior officers of the Combined Service, separately according to each position?

(b) If not, why?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව ඇමුණුම 01හි** සඳහන් වේ.

(ii) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන එම දෙපාර්තමේන්තුවට අයත් සේවකයන් සංඛ්‍යාව සහ ඒකාබද්ධ සේවයට අයත් සේවකයන් සංඛ්‍යාව පිළිබඳව ඇමුණුම 02** සහ 03**හි සඳහන් වේ.

(iii) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධාරීන්ට සහ කනිෂ්ඨ නිලධාරීන්ට තනතුරට අනුව හිමි වන මාසික වැටුප් හා දීමනා පිළිබඳ තොරතුරු ඇමුණුම 04හි** සඳහන් වේ.

(iv) ඒකාබද්ධ සේවයට අයත් විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට, විධායක ශ්‍රේණියේ නොවන නිලධාරීන්ට සහ කනිෂ්ඨ නිලධාරීන්ට තනතුරට අනුව හිමි වන මාසික වැටුප් හා දීමනා පිළිබඳ තොරතුරු ඇමුණුම 05හි** සඳහන් වේ.

(ආ) පැන නොනඟී.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

විශ්‍රාමික රාජ්‍ය සේවකයන්: විශ්‍රාම වැටුප් ගෙවීම
ஓய்வுபெற்ற அரச ஊழியர்கள்: ஓய்வூதியம் செலுத்தல்
RETIRED PUBLIC SERVANTS: PAYMENT OF PENSION

2042/2024

9. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ලලිත් එල්ලාවල මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு லலித் எல்லாவல சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Lalith Ellawala)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රජයේ සේවයෙන් විශ්‍රාම ගැන්වීමෙන් පසු රජයේ සේවකයන්ට මාසික විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කිරීමට මාස දහයකට අධික කාලයක් ගතවන බවත්;

(ii) එම ප්‍රමාදය හේතුවෙන් ඇතැම් රජයේ සේවකයන් සිය ප්‍රථම විශ්‍රාම වැටුප ලැබීමට පෙර මිය යන අවස්ථා ඇති බවත්;

(iii) එම ප්‍රමාදය රජයේ සේවකයන්ට කරනු ලබන දැඩි අසාධාරණයක් බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) ඉහත සඳහන් ප්‍රමාදයට හේතු කවරේද;

(ii) එම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා මේ වන විට ගෙන ඇති පියවර කවරේද;

(iii) එම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருமான வரைக் கேட்ட வினா:

(அ) (i) அரச சேவையிலிருந்து ஓய்வு பெற்றதன் பின்னர் அரச ஊழியர்களுக்குரிய மாதாந்த ஓய்வூதியம் செலுத்துவதை ஆரம்பிக்க சுமார் பத்து மாதங் களுக்கும் அதிகமான காலம் எடுக்கப்படுகின்றது என்பதையும்;

(ii) இத்தாமதம் காரணமாக சில அரச ஊழியர்கள் தமது முதலாவது ஓய்வூதியத்தைப் பெறுவதற்கு முன்னர் மரணிக்கும் சந்தர்ப்பங்களும் காணப்படு கின்றன என்பதையும்;

(iii) மேற்படி தாமதமானது அரச ஊழியர்களுக்கு இழைக்கப்படும் பாரிய அநீதியாகும் என்பதை யும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) மேற்படி தாமதத்துக்கான காரணங்கள் யாவை யென்பதையும்;

(ii) குறித்த தாமதத்தைத் தடுப்பதற்காக இன்றளவில் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை யென்பதையும்;

(iii) மேற்படி தாமதத்தைத் தடுப்பதற்கு முறையான வேலைத்திட்டமொன்று நடைமுறைப்படுத்தப்படுமா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி வேலைத்திட்டம் நடை முறைப்படுத்தப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he admit that -

(i) it takes over ten months to commence the payment of monthly pension to public servants after their retirement from the Public Service;

(ii) there are instances of certain public servants passing away before receiving their first pension owing to the said delay; and

(iii) the said delay is a severe injustice to the public servants?

(b) Will he inform this House-

(i) the reasons for the said delay;

(ii) the steps taken by now to avoid the said delay;

(iii) whether a proper programme will be implemented to avoid the said delay; and

(iv) if so, the date on which such programme will be implemented?

(c) If not, why?

ගරු අශෝක ප්‍රියන්ත මහතා (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக்க பிரியந்த - உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ashoka Priyantha - State Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, අපි ප්‍රශ්නවලට උත්තර දෙන්න එනවා. ප්‍රශ්න අහන මන්ත්‍රීතුමන්ලාත් එම ප්‍රශ්න අහන්න පාර්ලිමේන්තුවට එනවා නම් හොඳයි කියන කාරණය කියමින්, මේ පිළිතුර මා ඔබතුමන්ලා හැම දෙනාටම පෙන්වනවා.

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i), (ii) සහ (iii)

පිළි නොගනිමි.

රජයේ සේවයෙන් විධිමත් පරිදි විශ්‍රාම ගන්වනු ලැබූ නිලධරයකු වෙනුවෙන් විශ්‍රාම වැටුපක් ගෙවීම සඳහා එම නිලධාරියා අවසන් වරට සේවය කරන ලද ආයතනය විසින්

නිලධරයාට අදාළ විශ්‍රාම වැටුප් අයදුම්පත මාර්ගගතව (online) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2015 හා එහි සංශෝධන අනුව ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන සමඟ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නේ නම්, එම අයදුම්පත දින 03ක් ඇතුළත පරීක්ෂා කර අනුමත කිරීමෙන් පසුව විශ්‍රාම වැටුප සක්‍රිය කිරීමේ සම්මුඛ පරීක්ෂණයට විශ්‍රාමිකයා කැඳවීම සිදු කරනු ලබයි. සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ මාසයට පසු මාසයේ සිට විශ්‍රාමිකයාට විශ්‍රාම වැටුප ගෙවීමට හැකි වන පරිදි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමවේදය විධිමත්ව සැලසුම් කර ඇත. මෙම අයදුම්පත විශ්‍රාමිකයා විශ්‍රාම යෑමේ දිනට පෙර, දින 90 සිට ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි මාර්ගගත (online) පද්ධතිය සකස් කර පහසුකම් සලසා ඇති බැවින්, අයදුම්පත අප්‍රමාදව ඉදිරිපත් කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීමකි.

විශ්‍රාමික නිලධාරින්ට අදාළ විශ්‍රාම වැටුප් අයදුම්පත් එම නිලධරයන් අවසන් වරට සේවයේ යෙදී සිටි ආයතන විසින් නියමිත ලිපි ලේඛන සමඟ නිවැරදිව ඉදිරිපත් නොකරන අවස්ථාවලදී පමණක් අදාළ අඩු පාඩු සම්පූර්ණ කර ගැනීමෙන් පසුව විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අමතර කාල සීමාවක් ගතවීම සිදු වේ. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය කඩිනමින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ක්‍රියා කිරීමට උපදෙස් නිකුත් කර ඇති බැවින්, එවැනි ප්‍රමාදවීම් සම්බන්ධයෙන් කිසිදු වගකීමක් භාර ගැනීමට හැකියාවක් නොමැත.

(ආ) (i) 2022 වර්ෂයේදී රජයේ ප්‍රතිපත්ති තීරණ අනුව අනිවාර්ය විශ්‍රාම යෑමේ වයස අවුරුදු 65 දක්වා ඉහළ දැමීම සහ නැවත අවුරුදු 60 දක්වා පහළ දැමීම සිදු විය. ඒ හේතුවෙන් 2022.12.31 දිනට විශාල පිරිසක් විශ්‍රාම යාම සඳහා ඉල්ලුම් කරන ලදී. එකවර රාජ්‍ය සේවයෙන් විශාල පිරිසක් විශ්‍රාම ගැනීම හේතුවෙන් හා ඔවුන්ගේ අයදුම්පත් විශාල ප්‍රමාණයක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු වීම හේතුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා යම් ප්‍රමාදයක් පසුගිය මාස කිහිපය තුළ සිදු වූ බව නිරීක්ෂණය වී ඇත.

ඊට අමතරව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර වූ පහතින් සඳහන් කරන කරුණු විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාද වීම සඳහා හේතු වන බව නිරීක්ෂණය වී ඇත.

- නිලධරයා අවසන් වරට සේවය කළ ආයතනය මඟින් විශ්‍රාමිකයාගේ අයදුම්පත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම ප්‍රමාද වීම.
- විශ්‍රාමිකයන්ගේ පෞද්ගලික ලිපිගොනු යථාවත් නොකිරීමත්, වැටුප්, උසස්වීම්, අන්තර්ග්‍රහණ ගැටලු නිරාකරණය කිරීම විශ්‍රාම යෑමෙන් පසුව සිදු කිරීම හේතුවෙන් අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම.
- විශ්‍රාමිකයාගේ විශ්‍රාම අයදුම්පත හා අදාළ ලියකියවිලි මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ඉදිරිපත් කිරීමේදී විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2015 හා එහි සංශෝධන මඟින් දැනුම් දී ඇති විධිවිධානයන්ට පටහැනිව අඩු පාඩු සහිතව ඉදිරිපත් කිරීම හේතුවෙන් අයදුම්පත් වරින් වර ප්‍රතික්ෂේප කිරීමට සිදු වීම.

(ii)
- විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා සිදු වන ප්‍රමාදයන් අවම කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් පාලන ආයතනයන්හි විෂය භාර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ හා ආයතනගතව පැවැත්වීමට කටයුතු කර ඇත.
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත විමධ්‍යගත ක්‍රමවේදය ඔස්සේ ලැබෙන අයදුම්පත් කඩිනමින් පරීක්ෂා කර අවසන් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ වෙනත් අංශවල නිලධරයන්ගේ සහභාගිත්වයෙන් අභ්‍යන්තර වැඩ පිළිවෙළක් සකස් කර ඇත.
- ප්‍රථම විශ්‍රාම වැටුප සක්‍රිය කිරීමේ සම්මුඛ පරීක්ෂණය මාලිගාවත්ත පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව අනුරාධපුරය, කුරුණෑගල, මහනුවර, මාතර හා බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි පිහිටි සත්කාර පියස ප්‍රාදේශීය මධ්‍යස්ථාන මඟින්ද පැවැත්වීම මඟින් විශ්‍රාමිකයන්ගේ ප්‍රථම විශ්‍රාම වැටුප සක්‍රිය කිරීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට පියවර ගෙන ඇත.

(iii) ඉහත (ආ) (ii) යටතේ සඳහන් කර ඇති සියලු කටයුතු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

(iv) මේ වන විටත් ක්‍රියාත්මක කර ප්‍රමාදවීම් අවම කර ඇත.

(ඇ) අදාළ නොවේ.

මහනුවර ලෝක උරුම නගරය: විස්තර
கண்டி உலக மரபுரிமை நகரம்: விபரம்
KANDY WORLD HERITAGE CITY: DETAILS

2055/2024

10. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු වේලු කුමාර් මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு வேலு குமார் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Velu Kumar)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) යුනෙස්කෝ සංවිධානය විසින් මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බවත්;

(ii) ශ්‍රී ලංකාවට ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන රාශියක් එම නගරයේ පිහිටා ඇති බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) මහනුවර නගරයේ පිහිටි ලෝක උරුමයන් ලෙස හඳුනා ගෙන ඇති පූජනීය ස්ථාන සහ ගොඩනැඟිලි කවරේද;

(ii) ඒවා ආරක්ෂා කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානය විසින් මූල්‍යාධාර ලබා දෙන්නේද;

(iii) එසේ නම්, ලබා දෙනු ලබන වාර්ෂික මූල්‍යාධාරය කොපමණද;

(iv) මහනුවර නගරයේ පිහිටි ලෝක උරුමයන් ලෙස හඳුනා ගෙන ඇති පෞද්ගලික ගොඩනැඟිලි කවරේද;

(v) එම ගොඩනැඟිලි හිමිකරුවන්ටද කිසියම් මූල්‍යාධාරයක් ලබා දෙන්නේද;

(vi) එසේ නම්, එම මූල්‍යාධාරය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ඉහත (ආ) (i) හි සඳහන් ස්ථාන ඒ අයුරින්ම පවත්වාගෙන යන්නේද;

(ii) ඒවායේ වෙනස්කම් සිදු කිරීමට අවසර ලබා දී තිබේද;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) මහනුවර නගරය ලෝක උරුම නගරයක් ලෙස පවත්වාගෙන යාම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யுனெஸ்கோ அமைப்பால் கண்டி நகரம் உலக மரபுரிமை நகரமாக அறிவிக்கப்பட்டுள்ளதென்பதையும்;

(ii) இலங்கைக்கு வரலாற்று ரீதியில் முக்கியத்துவம் வாய்ந்த பல இடங்கள் மேற்படி நகரில் அமைந்துள்ளதென்பதையும்;

அவர் ஏற்றுக்கொள்கின்றாரா?

(ஆ) (i) கண்டி நகரில் அமைந்துள்ள உலக மரபுரிமை களாக அடையாளம் காணப்பட்டுள்ள புனித இடங்களும் கட்டடங்களும் யாவை என்பதை யும்;

(ii) அவற்றைப் பாதுகாப்பதற்கு யுனெஸ்கோ அமைப்பு நிதியுதவி அளிக்கின்றதா என்பதையும்;

(iii) ஆமெனில், அளிக்கப்படுகின்ற வருடாந்த நிதி யுதவி எவ்வளவென்பதையும்;

(iv) கண்டி நகரில் அமைந்துள்ள உலக மரபுரிமை களாக அடையாளம் காணப்பட்டுள்ள தனியார் கட்டடங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி கட்டடங்களின் உரிமையாளர்களுக்கும் யாதேனும் நிதியுதவி வழங்கப்படுமா என்பதை யும்;

(vi) ஆமெனில், மேற்படி நிதியுதவி எவ்வளவென்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி (ஆ) (i) இல் குறிப்பிடப்பட்ட இடங்கள் உள்ளபடியே பேணப்படுமா என்பதையும்;

(ii) அவற்றில் மாற்றங்கள் செய்வதற்கு அனுமதி வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) கண்டி நகரை உலக மரபுரிமை நகரமாகப் பேணிச் செல்வதற்கு நடைமுறைப்படுத் தப்பட்டுள்ள வேலைத்திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he admit that -

(i) the Kandy City has been declared as a world heritage site by the UNESCO; and

(ii) numerous historically important places of Sri Lanka are located in the aforementioned city?

(b) Will he inform this House -

(i) the sacred places and buildings situated in Kandy City which have been recognized as the world heritages;

(ii) whether financial aid will be granted by the UNESCO to protect the aforesaid places;

(iii) if so, the total amount of financial aid granted annually;

(iv) the private buildings situated in Kandy City which have been recognized as the world heritages;

(v) whether any financial aid will be granted for the owners of the said buildings; and

(vi) if so, the amount of the financial aid mentioned above?

(c) Will he also inform this House -

(i) whether places mentioned in above (b)(i) will remain the same;

(ii) whether approval has been granted for any renovation made in them; and

(iii) the programmes that have been implemented to keep/continue the Kandy City as a world heritage site?

(d) If not, why?

ගරු විදුර වික්‍රමනායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Vidura Wickramanayaka - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) මහනුවර පූජනීය නගරය ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේදී අදාළ නිර්ණායක අනුව මහනුවර පූජනීය නගරය සම්පූර්ණයෙන් එහි ඇති පූජනීය ස්ථාන, වීථි, උද්‍යාන, ජලාශ, පෞද්ගලික ගොඩනැඟිලි ආදී පෞරාණික හා පූජනීය ලක්ෂණ ඇති සියලු දේ එහි කැපී පෙනෙනසුලු විශ්වීය උරුමය තීව්‍ර කිරීමේ අංගයන් ලෙස හඳුනාගෙන ඇත. මේ අතරින් පූජනීය ගොඩනැඟිලි 17ක්, රාජ්‍ය ආයතන 30ක් හා පෞද්ගලික ගොඩනැඟිලි 471ක්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් කළමනාකරණ පහසුව සඳහා විශේෂයෙන් හඳුනාගෙන ඇති අතර, එකී ගොඩනැඟිලි ආරක්ෂා කරගත යුතු ගොඩනැඟිලි වශයෙන් ලාංඡනයක් සවි කර පෙන්වා දී ඇත.

(ii) ඒවා ආරක්ෂා කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානය විසින් මූල්‍යාධාර ලබා දෙන්නේ නැත. නමුත් අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා මුදල් ඉල්ලීමේ හැකියාව ඇත.

(iii) අදාළ නොවේ.

(iv) ලෝක උරුමයක් ලෙස පෞද්ගලික ගොඩනැඟිලි හඳුනාගෙන නැත. නමුත් ලෝක උරුම නගරය තුළ ඉහත (ආ) (i) පරිදි පෞද්ගලික ගොඩනැඟිලි 471ක් ඇත.

(v) නැත.

(vi) අදාළ නොවේ.

(ඇ) (i) ඔව්.

(ii) සංරක්ෂණ ප්‍රතිපත්තිවලට අදාළව ඒවායේ ස්ථානය වෙනස් නොවන පරිදි නූතන අවශ්‍යතා අනුව වෙනස්කම් සිදු කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දීමට ලෝක උරුම සැලසුම් අනුකමිටුවේ නිර්දේශ මත මහනුවර මහ නගර සභාවට බලය ඇත.

(iii) 1. මහනුවර මහ නගර සභාවේ ලෝක උරුම සංරක්ෂණ තාක්ෂණික අනුකමිටුව පවත්වාගෙන යෑම.

2. පාසල් ලෝක උරුම කමිටු පැවැත්වීම (දැනට නැවතී ඇත)

3. ජයිකා ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඈ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කලින් අමතර කරුණු දෙකක් මතු කරන්න ගරු සභානායකතුමා මට අවසර දුන්නා. විශේෂයෙන්ම මම ගරු සභානායකතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි මේ කාරණයට. මා පසුගිය දින කිහිපය තුළ උතුරු හා නැඟෙනහිර පළාත්වලට ගිය වෙලාවේ උතුරු පළාතේ හා නැඟෙනහිර පළාතේ - විශේෂයෙන්ම මඩකලපුව දිස්ත්‍රික්කයේ- රැකියා විරහිත උපාධිධාරීන් ඒ අයගේ දුක් ගැනවිලි ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම, ඒ අය මහ පාරේ උද්ඝෝෂණයක නිරතයේ. ඒ අය සමඟ සාකච්ඡා කරනකොට අපි දැන ගත්තා, එක කාරණයක්. ඒ අයගේ යෝජනාවක් තිබෙනවා, රැකියා විරහිත උපාධිධාරීන් සම්බන්ධ රජයේ ප්‍රතිපත්තිය, රජයේ වැඩ පිළිවෙළ මොකක්ද කියන එකට ආණ්ඩුව පිළිතුරු දෙන්න ඕනෑ කියලා. මේ අයට පත්වීම් ලබා දීමක් කෙරෙනවාද, ගරු සභානායකතුමනි? මොකක්ද ඒ අයගේ අනාගතය? විශේෂයෙන්ම ඒ උපාධිධාරීන්ගේ සුදුසුකම්වලට අනුව රජයේ විවිධ ක්ෂේත්‍රවල අත්‍යවශ්‍යම පුරප්පාඩුවලට ඒ අය බඳවා ගැනීමක් සිදු නොකරන්නේ ඇයි ද කියන එක ගැන ඒ අය ප්‍රශ්න කරනවා. ඒ නිසා මම මේ අවස්ථාවේ දී විශේෂයෙන්ම ඒ ගැන සඳහන් කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, උතුරු පළාතේත්, ඒ වාගේම මඩකලපුව දිස්ත්‍රික්කයේත් උපාධිධාරීන්ගේ ඉල්ලීම් ඇතුළත් ලේඛනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු සභානායකතුමනි, ඔබතුමාටත් එම ලේඛනයේ පිටපතක් එවන්න පුළුවන්. ගරු සභානායකතුමනි, කරුණාකරලා රජයේ පැත්තෙන් කියන්න, ඒ අය පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා. මම හිතන විධියට, මේ වන විට රැකියා විරහිත උපාධිධාරීන් ප්‍රමාණය 50,000කට ආසන්නයි. ඒ තරම් විශාල ප්‍රමාණයක් සිටිනවා. අපේම නිදහස් අධ්‍යාපනයෙන් අධ්‍යාපන ආලෝකය ලබලා, ඒ අධ්‍යාපනයෙන් පස්සේ කෙළින්ම ඒ අය යන්නේ විරැකියා පෝලිමට ද කියලා මම අහන්න කැමතියි. ඒකට මම ඔබතුමාගෙන් විධිමත් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. රැකියා විරහිත උපාධිධාරීන් 50,000කට ආසන්න ප්‍රමාණයක් අද රටේ සිටිනවා. ඒ අයගේ අනාගතය වෙනුවෙන් රජය ගන්නා තීන්දුව මොකක්ද කියන එකට ඔබතුමා පිළිතුරක් ලබා දෙන්න.

ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි, මේ කරුණු කෙරෙහිත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි. අධ්‍යාපන ඇමතිතුමා හැටියට ඔබතුමා දන්නවා, 2020 වර්ෂයේ ඉඳලා සංවර්ධන නිලධාරීන් -මම හිතන විධියට 22,000කට ආසන්න ප්‍රමාණයක්- අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ 40,000ක ගුරු හිඟයක් තිබෙන අවස්ථාවක ඒ ගුරු හිඟය මහඟරවා ගන්නට විශාල කාර්යභාරයක් ඉෂ්ට කළ බව.

ඇත්ත වශයෙන්ම ඒ සංවර්ධන නිලධාරීන් ගුරු ක්ෂේත්‍රයේ නියැළුණා. කොරෝනා -කොවිඩ්-19- සමයේ මාර්ගගත අධ්‍යාපනය, දුරස්ථ අධ්‍යාපනය ක්‍රියාත්මක වෙන කාල වකවානුව තුළ උපකරණ නැති නිසා දරුවෝ 15ක්, 20ක්, 25ක්, 30ක් එකතු වෙලා එක උපකරණයක් පාවිච්චි කරගෙන දුරස්ථ අධ්‍යාපනය, මාර්ගගත අධ්‍යාපනය ලබන හැටි අපි දැක්කා. ඒ වාගේම දරුවෝ signal නැති නිසා වහල උඩ නැග්ගා, ගස් උඩ නැග්ගා, පර්වත උඩ නැග්ගා. ඒ වාගේ බොහොම අමාරු කාලයක, 40,000ක ගුරු හිඟයක් තිබුණු කාලයක 22,000ක් වූ සංවර්ධන නිලධාරීන් විශිෂ්ට සේවාවක් ඉෂ්ට කළා. ඒ අයගේ ඉල්ලීමක් තිබෙනවා, අමාරු කාලයේදී දූ දරුවන්ට ඉගැන්වීම් කටයුතු කරන්නට මේ සංවර්ධන නිලධාරීන් 22,000 හොඳ වුණා නම්, ඒ අය වෙනුවෙන් නිශ්චිත, ස්ථාවර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැත්තේ ඇයි කියන කාරණාව සම්බන්ධයෙන්. ඒ නිසා මේ අවස්ථාවේ මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා ඒ කැප කිරීම් කරපු සංවර්ධන නිලධාරීන් 22,000ක පිරිසට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ නියම ස්ථාවරයක් ලබා දෙන්නට කටයුතු කරන්න කියලා. අපි මේ ප්‍රශ්නය නිතර නිතර ඉදිරිපත් කළා.

ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි, ඔබතුමාට හිටි හැටියේ පොඩ්ඩක් තරහත් යනවා. මොකද, අපි මේ ප්‍රශ්නය ගැන දිගින් දිගටම අහන හින්දා. තරහා ගන්න එපා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. තවම ඉවර නැහැ. තවම ඉවර නැහැ. ඔබතුමා තරහා ගන්න එපා. දැනුත් පොඩ්ඩක් තරහා ගියා වාගෙයි. තරහා ගන්න එපා. අපට මේ සඳහා විසඳුමක් තමයි අවශ්‍ය වන්නේ. මොකද, කොරෝනා සමයේ 40,000ක ගුරු හිඟය පියවා ගෙන දූ දරුවන්ට ඉගැන්වීම් කටයුතු කරන්න මේ 22,000 හොඳ වුණා නම්, දැන් අවශ්‍ය නැද්ද? ඔබතුමාම දන්නවා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින අනධ්‍යයන, ගුරු, විදුහල්පති, ගුරු උපදේශක, ගුරු අධ්‍යාපනඥ, ගුරු සංවර්ධන නිලධාරීන් 22,000ත්, අධ්‍යාපන පරිපාලන කියන මේ කොටියාස -අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න ක්‍රියාකාරී නිලධාරීන්- නිසා තමයි අධ්‍යාපනයේ මේ ටිකවත් ආරක්ෂා වෙලා තිබෙන්නේ කියලා. මේ සංවර්ධන නිලධාරීන්ට සාධාරණයක් ඉෂ්ට වෙන්නේ කවදා ද? ඒ අයට ඉටු කළ යුතු සාධාරණය ගැන කථා කරන අතරතුර, අර මා සඳහන් කළ සියලු කොටස් තුළ බරපතළ අඩුපාඩුකම්, ඌනතා, විෂමතා, ගැටලු තිබෙනවා. ඒවා පිළිබඳවත් විධිමත් ලෙස සොයා බලලා උත්තරයක් දෙන්න.

ඒ වාගේම ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි, පළාත් මට්ටමින් ගුරුවරුන් බඳවා ගැනීමේදී පුදුමාකාර

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ව්‍යාකූලත්වයක් තමයි ඇති වෙලා තිබෙන්නේ කියලා. රජය හොඳක් කරන්නට ගිහිල්ලා අව්චාරුවක් කරගෙනයි තිබෙන්නේ. මම අහන්න කැමැතියි, පළාත් මට්ටමේ බඳවා ගැනීම් නියමාකාරයෙන් ක්‍රියාත්මක නොවන්නේ ඇයි කියලා.

ඒ නිසා විශේෂයෙන්ම මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ සංවර්ධන නිලධාරීන්ගේ ගැටලුවට ඔබතුමාගේ අවධානය යොමු කරනවා සේම පළාත් මට්ටමින් සිදු වන බඳවා ගැනීමේ ක්‍රියාදාමයේ දී මේ වාගේ ඉතාම ව්‍යාකූල ලෙස, අවිධිමත් ලෙස ඒ උපාධිධාරී දු දරුවන් තුළ අවිශ්වාසයක් නිර්මාණය වෙන ආකාරයට කටයුතු කරන්න එපා කියලා. සමහර තැන්වල results publish කරන්නේ නැහැ. සමහර තැන්වල ඒ පත් කිරීමේ පදනම කියන්නේ නැහැ. ඔක්කෝම හොරාට කරන්නේ; හංගාගෙන කරන්නේ. මේ, මගේ වචන නොවෙයි, මේ උපාධිධාරීන්ගේ අදහස. ඒ නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, මේ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කරනකොට විනිවිදභාවයෙන් යුක්තව, වගකියන ආකාරයට; වගවෙන ආකාරයට මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්න කියලා.

විශේෂයෙන්ම අවසාන කාරණාව හැටියට මම මේ කාරණයත් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. මේ බඳවා ගැනීමේ දී පළාත් මට්ටමින් ඇති වී තිබෙන ව්‍යාකූලත්වය ගැන; ඒ ගැටලුව ගැන දැන් මම කිව්වා. හැබැයි, මම ඔබතුමාට මේ කාරණයත් කියන්නට ඕනෑ. ආණ්ඩුකාරවරයා එක් එක් අය බඳවාගෙන, ඔහුගේ හිතුමතේට පළාත් පාලන ක්ෂේත්‍රයේ පත් කිරීම් කරන එක නම් බොහොම ක්‍රමවත්ව සිදු වෙනවා; ඒක බොහොම ලස්සනට වෙනවා. මම අහන්නේ මේකයි. බංකොලොත් රටක පළාත් පාලන මැතිවරණය පවත්වන්නේ නැති වෙලාවක, ඒ පළාත් පාලන ආයතනවල හිටපු සමහරුත්, තවත් සමහර දේශපාලන අතකොළුත්, පළාත් පාලන ආයතන නිසි බලධාරීන් හැටියට වෙනම කාර්යාල වෙන් කරලා එහෙම පත් කිරීම් කරන්නේ කොහොමද? ඒක අනීතිකයි; වැරදියි. ඒ නිසා, කරුණාකරලා මේ වැරදි ක්‍රියාවේ නිරත වෙන්නට එපා කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ආණ්ඩුකාරවරුන්ටත් මම කියන්න කැමැතියි, අනිවාර්යයෙන්ම මේ වසර අවසන් වෙනකොට ඔබ මේ කරන වැරදි ක්‍රියාවට උත්තර බඳින්න සිද්ධ වෙන බව. සම්පූර්ණයෙන්ම වැරදි ක්‍රියාවක් මේ කරන්නේ. අනිවාර්යයෙන්ම මේ වැරදි ක්‍රියාව ආපහු හරවා ගන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ උත්තරවලින් පසුව මම ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නම්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමාගේ පළමුවැනි ප්‍රශ්නය තමයි, උතුරු පළාතේ සහ නැගෙනහිර පළාතේ රැකියා විරහිත උපාධිධාරීන් පිළිබඳ කාරණය. ගරු කථානායකතුමනි, පසුගිය රජයන් විසින් ප්‍රධාන වශයෙන් අවස්ථා දෙකකදී රැකියා විරහිත උපාධිධාරීන් කොටස් දෙකක් බඳවා ගත්තා. 2015ට පෙර මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය තිබුණු කාලයේ රැකියා විරහිත උපාධිධාරීන් 40,000ක් එකවර බඳවාගෙන විවිධ ආකාරයෙන් රාජ්‍ය ආයතනවලට ස්ථානගත කිරීම කරනු ලැබුවා. ඒ, එක කොටසක්. ඊට පස්සේ, නැවත වතාවක් 2019දී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා පත් වුණාට පස්සේ සියලුම රැකියා විරහිත උපාධිධාරීන්ගේ තොරතුරු ලබාගෙන, "සංවර්ධන නිලධාරීන්" යනුවෙන් පොදු වචනයක් යොදලා 52,000ක් රජයේ ආයතනවලට ස්ථානගත කළා.

එම 52,000න් 23,000ක් රජයේ පාසල්වල ගුරු පුහුණුව සඳහා ස්ථානගත කළා. පළාත් මට්ටමින් වැඩි ප්‍රමාණයක් හා ජාතික පාසල්වලට සුළු ප්‍රමාණයක් වශයෙන් රජයේ පාසල්වල ගුරු පුහුණුව සඳහා මේ අයව ස්ථානගත කළා. මම මේ අමාත්‍යාංශය භාර ගන්නා අවස්ථාව වෙනකොට තිබුණු තත්ත්වය තමයි ඒ කිව්වේ.

අවසාන වශයෙන් අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරලා තිබුණා. ගරු විපක්ෂ නායකතුමනි, දැන් ඔය පැත්තේ වාඩි වෙලා ඉන්න ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් හිටපු ඇමතිතුමා තමයි ඒක ඉදිරිපත් කරලා තිබුණේ. මේ සංවර්ධන නිලධාරීන් 23,000ක පිරිස ගුරු අභ්‍යාසලාභීන් හැටියට බඳවා ගෙන, වර්ෂ තුනකට පස්සේ විභාගයක් පවත්වලා ඒ අයව ගුරු සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගන්න කියලා එතුමා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරලා තිබුණා. ගුරු සේවා ව්‍යවස්ථාවේ තිබෙන්නේ, උපාධිධාරීන් බඳවා ගැනීමේ දී පළාත් මට්ටමින් හෝ ජාතික මට්ටමින් තරග විභාගයක් පවත්වා එම විභාගයේ pass marks අනුව සමත්වීම පදනම් කරගෙන, විෂය වර්ගයේ ගැළපීම අනුව ගුරුවරුන් හැටියට පත්වීම් ලබා දෙන්න කියලායි. ඒ අයට වෙනම පුහුණුවක් දෙනවා. හැබැයි, මෙම කැබිනට් පත්‍රිකාවේ තිබෙන්නේ ඒකේ අනෙක් පැත්ත. ඒ කියන්නේ විභාගය පවත්වන්නේ පස්සේ. ඉස්සෙල්ලා බඳවා ගන්නවා. ඒ තීන්දුව ඒ වෙලාවේ කොයි ආකාරයෙන් ගත්තාද කියලා මම දන්නේ නැහැ. කිසිම තැනක බඳවා ගෙන ඉවර වෙලා විභාග පවත්වන්නේ නැහැ. විභාග පවත්වලා ඉවර වෙලා තමයි බඳවා ගන්නේ.

ඒ අවස්ථාවේ මම කළේ, කලින් කියපු කැබිනට් පත්‍රිකාව යටපත් කරලා, ගුරු සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගැනීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම. ඒ අනුව අයදුම්පත් කැඳෙව්වා. ඒ අනුව ඒ වෙනකොට රජයෙන් සංවර්ධන නිලධාරීන් ලෙස බඳවා ගෙන සිටි 52,000ම වාගේ පාසල්වල පුහුණුව ලැබුවා හෝ නොලැබුවා හෝ මේ විභාගයට අයදුම් කළා. ඒ විභාගය පවත්වන්න තිබුණේ 2023 මාර්තු මාසයේ 25වැනි දා. හැබැයි, 2023 මාර්තු මාසයේ 23වැනි දා තිස්තුන්දෙනෙක් පෙත්සම් හතරක් ඉදිරිපත් කරලා අධිකරණයට ගියා. ඒ පෙත්සම් හතරෙන් ප්‍රධාන කරුණු දෙකක් පෙන්වූවා. පළමුවැනි කරුණ තමයි "අපිව පුහුණුවට දැම්මා නම්, විභාග පවත්වන්න එපා, පත්වීම් දෙන්න" කියන එක. දෙවැනි කරුණ තමයි වයස් සීමාව නොතකා, අවුරුදු 45 දක්වා පත්වීම් දෙන්න කියන එක. හැබැයි, ගුරු සේවා ව්‍යවස්ථාවේ තිබෙන්නේ, අවුරුදු 35ට අඩු උපාධිධාරීන් බඳවා ගන්න කියලායි. එතකොට ඒ IQ test එකේ ලකුණු අනුව පාස් වීම මත විෂය ගැළපීමත් එක්ක තමයි පත්වීම් ලබා දෙන්නේ.

ගරු කථානායකතුමනි, මම උදාහරණයක් කියන්නම්. මම 1982දී නීති උපාධිය ලබා ගත්ත කෙනෙක්. එදා ඉඳලා අද දක්වා මට පාසලක ගුරු පත්වීමක් ගන්න බැහැ. ඒ ඇයි? නීති උපාධිධාරියෙකුට උගන්වන්න විෂයක් පාසලේ නැහැ. අපි හිතමු, එය logistics කියලා.

දැන් logistics සම්බන්ධව අලුත් පාඨමාලා තිබෙනවා. හැබැයි, logistics සම්බන්ධ උපාධිධාරියෙකුට පාසලේ උගන්වන්න විෂයක් නැහැ. එහෙම නම් උපාධිධාරියාගේ උපාධි සහතිකයත් එක්ක සම්මුඛ පරීක්ෂණයට ගෙන්වන්න වෙනවා, transcript එක. ඒ කියන්නේ, එයා පළමුවෙනි වසර, දෙවෙනි වසර, තුන්වෙනි වසර ආදී වශයෙන් විභාගයට පෙනී සිටීමේදී ගත්ත විෂයයන් මොනවාද කියන එක. ඒකේ core subjects තිබෙනවා, අනුවිෂයයන් තිබෙනවා. එතකොට සමස්ත පාඨමාලාවේ transcript එකේ තිබෙන විෂයන්ගෙන් තුනෙන් එකක් පාසලේ උගන්වන විෂය ධාරාවට අදාළ වෙන්න ඕනෑ. නැත්නම් කොහොමද ළමයින්ට උගන්වන්නේ? ඒක ගුරු සේවා

ව්‍යවස්ථාවේත් තිබෙනවා. එතකොට ඒ තිබෙන සීමාවලට යටත්ව තමයි ගුරුවරු බඳවා ගන්නේ. හුදු උපාධිධාරියෙක් ගෙනිහිල්ලා පන්ති කාමරයේ තිබ්බාට විෂයයක් නැතිව උගන්වන්න බැහැ. ඒක එයාටත් අසාධාරණයක්, දරුවන්ට ඊට වඩා අසාධාරණයක්.

ගරු කථානායකතුමනි, ගුරු විභාගය තියලා ඒ අයට ලකුණු දුන්නාට, විභාගයේ ලකුණු ප්‍රසිද්ධ කරන්නේ නැහැ. ප්‍රසිද්ධ කරන්නේ පසුව. ඒකට හේතුව විභාගයේ pass marks අනුව interview කළාම, interview එකේ දීත් ලකුණු දෙනවා. එහිදී යම් විනාඩි ගණනක demonstration එකක් කරන්න ඕනෑ, තමන් උගන්වන්න යන විෂය ගැන. අපි හිතමු, ඒ ආර්ථික විද්‍යාව කියලා. අපේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ. එතුමා හිටියා නම් හොඳ දේශනයක් දෙනවා. අපි හිතමු, කාලීන ප්‍රශ්නයක් තිබෙනවා කියලා. උදාහරණයක් වශයෙන්, debt restructuring ගැන විනාඩි පහක demonstration එකක් කරන්න දෙනවා කියලා හිතමු. ඒ විධියට තමන්ගේ විෂයට අදාළව demonstration එකක් කරන්න ඕනෑ. ඒකෙන්, උගන්වන්න පුළුවන්ද කියන කාරණය බලනවා. ඊට පස්සේ ඒ ලකුණු යවනවා, විභාග දෙපාර්තමේන්තුවට. විභාග දෙපාර්තමේන්තුව විසින් විභාග ලකුණයි, interview එකේ ලකුණයි එකතු කරලා සාමාන්‍ය අගය එවනවා. ඒ සාමාන්‍ය අගය අනුව, විෂයට තිබෙන පුරප්පාඩු අනුව පත්වීම් දෙනවා. ඒක තමයි ගුරු සේවා ව්‍යවස්ථාවේ ක්‍රියාදාමය. දැන් අපෙන් ඉල්ලන්නේ ගුරු සේවා ව්‍යවස්ථාවේ තිබෙන ඒ ක්‍රියාදාමයට පිටින් ගිහිල්ලා, එදා පාසල්වල ස්ථානගත කළ සියලුදෙනා ගුරු සේවයට බඳවා ගන්න කියලායි. ඕකට තමයි මාස 15ක් නඩු කිව්වේ. මම හිතන විධියට ඒ නඩුව ප්‍රමාදවීම ගැන මේ පාර්ලිමේන්තුවේ 15 වතාවක්, 20 වතාවක් විතර කථා කළා. හැබැයි දැන් අවසාන වශයෙන් අද මෝසමක් ඉදිරිපත් කරලා ඒ නඩුව ගන්නවා.

ගරු විපක්ෂ නායකතුමනි, මේකට ප්‍රායෝගික විසඳුමක් දීම සඳහා අපි යෝජනාවලියක් ඉදිරිපත් කළා. කැබිනට් පත්‍රිකාව දාන්න කලින් ශ්‍රේෂ්ඨාධිකරණයේ එකඟතාව ගන්න ඕනෑ. මොකද, ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ නඩුවේ meritsවලට ගිය කරුණු, ඒ කියන්නේ විෂය මූලයටම ගිය කරුණුවලට තමයි අපි Cabinet Paper එකක් දාලා අනුමැතිය ගන්න හදන්නේ. ඒ විකල්ප යෝජනාව මේ වෙනකොට අධිකරණයේ තිබෙනවා. අද ඒ මෝසම ගැනෙනවා. පෙත්සම්කරුවන් මේ සඳහා එකඟතාව දක්වනවා නම්, ඊළඟ සතියේ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරලා නැවත උසාවියට දැනුම් දෙන්න අපට පුළුවන්, උසාවියට ඒ පිළිබඳව තීරණයක් ගැනීම සඳහා.

ඒ නිසා අසාධාරණයක් නොවන ආකාරයට මේ ප්‍රශ්නය විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයකට අපි ගිහින් තිබෙනවා. ඒකේ details ගැන මම කථා කරන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ගරු විපක්ෂ නායකතුමනි, ඒ 22,000න් මේ වෙනකොට 6,000ක් පත්වීම් ලබා තිබෙනවා. ඒ කියන්නේ, පළාත් මට්ටමින් තිබුණු විභාගවලින් ලකුණු අරගෙන ඔවුන් සම්මුඛ පරීක්ෂණවලට ගිහිල්ලා තිබෙනවා. තව ඉතිරි වෙලා ඉන්නේ 16,000ක් විතරයි. ඒ 16,000ක පිරිසගේ වයස් සීමාව තමයි ප්‍රධාන ප්‍රශ්නය වශයෙන් තිබෙන්නේ. ඒකටත් අපි විසඳුමක් ලබා දුන්නා. ඒ වයස් සීමාව අවුරුදු 35ක් ලෙස තිබුණත්, විභාගය කැඳවන්න රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය ගත්තේ වයස අවුරුදු 40ට අඩු අයට. ඒ නිසා නැවත වතාවක් රාජ්‍ය සේවා කොමිසමට යන්න බැහැ. නමුත් පළාත් රාජ්‍ය සේවයට පුළුවන්, ඒ අය පත්වීම් දීලා තිබෙන සහ පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් දෙන වයස් සීමාව අවුරුදු 45 දක්වා වන නිසා ඒ අනුව කටයුතු කරන්න.

ගරු කථානායකතුමනි, අද මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනවා නම්, ඒක ඉතාම සාධාරණයි. ඒ කණ්ඩායම් ඇවිල්ලා මාව හමුවුණා. දකුණු පළාතේ අය ආවා. ඊයේ මධ්‍යම පළාතේ අය ආවා. සංවර්ධන නිලධාරීන් ලෙස පත් වෙලා දැනට ගුරුවරුන් ලෙස පුහුණු වන විවිධ පළාත්වල අය මාව හමුවන්න ආවා. ඔවුන්ගෙන් සියයට 99.9ක්ම මේකට එකඟයි. අද මේ කාරණය සමථයකට පත් වුණොත්, ඊළඟ සති දෙක තුළ මම අමාත්‍ය මණ්ඩලයට මේ කරුණු ඉදිරිපත් කරලා මේ සඳහා එකඟතාව අරගෙන එය ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දෙනවා. ඒකෙන් අසාධාරණයක් වෙන්නේ නැහැ, අනාගතයේ ගුරු සේවයට එන්න බලාපොරොත්තු වෙන උපාධිධාරීන්ට. මොකද, ඔවුන්ගේ විභාග අපි වෙනම පවත්වනවා.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මට පැහැදිලි කර ගැනීමක් කරගන්න අවශ්‍යයි.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ කාරණය පිළිබඳව නම්‍යශීලි වීම ගැන. ඒ වාගේම මේ කාරණයත් මම ඔබතුමාට කියන්න ඕනෑ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ අද ඇති වෙලා තිබෙන ව්‍යාකූලත්වයට මේ පාර්ලිමේන්තුවත් අඩු වැඩි වශයෙන් වගකියන්න ඕනෑ. ඒ කාරණයේදී මම ඔබතුමාත් එක්ක එකඟ වෙනවා. ඒ වරද්දපු තැන් තමයි අද ඔබතුමාට නිවැරැදි කරන්න වෙලා තිබෙන්නේ. ඒක සංවර්ධන නිලධාරීන්ගේ වැරැද්දකුත් නොවෙයි, උපාධිධාරීන්ගේ වැරැද්දකුත් නොවෙයි, දරුවන්ගේ වැරැද්දකුත් නොවෙයි. මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, ඔබතුමන්ලා ඉදිරිපත් කරන මෝසමේ වයස් සීමාව මොන විධියටද තිබෙන්නේ කියලා. ඒ, අවුරුදු 45ද, 40ද? එහෙම නම් ඒ වයස තිබෙන්න ඕනෑ පත්වීම ගන්න දවසටද, එහෙම නැත්නම් ඔබතුමන්ලා Cabinet Paper එක ඉදිරිපත් කරන දවසටද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ඔය ප්‍රශ්නය අද උදේත් මම ජනාධිපති නීතිඥ මහත්මයෙකුට දැනුම් දුන්නා. යම් පත්වීමක් රජයෙන් ලබා දෙන දිනය තමයි, ඒ සේවකයා ස්ථිර ලෙස රජයේ පත්වීම ලබන දිනය වෙන්නේ. එතකොට එදා ඉඳලා අවුරුදු 10ක් රාජ්‍ය සේවය කරන්න ඕනෑ, අවුරුදු 55ට පෙරාතුව. එතකොට පත්වීම දෙන දවසට ඒ පුද්ගලයාගේ වයස අවුරුදු 45ට වැඩි වුණොත්, රාජ්‍ය සේවයේ පත්වීමක් ලබන්න ඒ පුද්ගලයාට බැහැ. එම නිසා ඒ කරුණ ආවරණය වෙන ආකාරයට අපි පත්වීම් දීලා තිබෙනවා. පළාත් මට්ටමේදී ඔවුන්ට පුළුවන්, අවුරුදු 45 දක්වා යන්න. රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික මට්ටමින් විභාගය පවත්වන්න නිර්දේශ කරපු වයස් සීමාව අවුරුදු 40 නිසා ඒක වෙනස් කරන්න බැහැ. හැබැයි, මේ සියලුදෙනාටම පළාත් මට්ටමින් පත්වීම් ලබා ගන්න පුළුවන්.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, අද ඔබතුමාගේ කැබිනට් පත්‍රිකාව දාලා සංවර්ධන නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම හෝ මොකක් හරි කරන්නේ පළාත් සභා මට්ටමින්ද, නැත්නම් මධ්‍යම රජය යටතේද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම මුලින් කිව්වා වාගේ මේ අයගෙන් සියයට 95ක්ම ඉන්නේ පළාත් සභා පාසල්වල. ඒ නිසා ඔය වයස් ගැටලුව එන්නේ නැහැ. එතකොට ඔවුන්ගේ ප්‍රශ්නය විසඳෙනවා. යම්කිසි විධියකින් ජාතික පාසල්වල මේ අයගෙන් සුළු පිරිසක් හරි ඉන්නවා නම්, අපි ඒ පිරිස පළාත් සභා පාසල්වලට දීලා ඒ ප්‍රශ්නය විසඳනවා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

2012 වසරේ ඉඳලා ඉන්න කණ්ඩායමකුත් මේකට මැදිහත් වෙලා ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඔවුන් පිළිබඳවත් පොඩ්ඩක් අවධානය යොමු කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අධිකරණය වෙත යොමු වෙලා තිබෙන කාරණයක් සම්බන්ධයෙන් තමයි සමථකරණය එන්නේ. අපි මේක විසඳුණාට පස්සේ අනෙක් අයගේ ප්‍රශ්නය වෙනම විසඳන්න ඕනෑ. අපි ඒකට පියවර ගනිමු, මේ ප්‍රශ්නය විසඳලා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මහින්ද අමරවීර ඇමතිතුමා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා මේ පිළිබඳ විශාල උනන්දුවක් දැක්වීම ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා. අපිත් මේ ගැන වරින් වර කරුණු ඉදිරිපත් කළා. මේ කාරණය ඉතාම වැදගත්. මේ අය දුෂ්කර පාසල්වලට ගිහිල්ලා උගන්වමින් දැනටමත් දරුවන්ට අධ්‍යාපනය ලබා දෙනවා. ඒ නිසා අපිත් ඉල්ලා සිටින්නේ මේ තිබෙන බාධා ඉවත් කරගෙන මේ කටයුත්ත කඩිනම් කරන්න අවශ්‍ය පියවර ගන්න කියලායි. මේ සඳහා ඔබතුමාට පූර්ණ වශයෙන් කැබිනට් මණ්ඩලයේත් සහයෝගය තිබෙනවා. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මනුෂ නානායක්කාර ඇමතිතුමා.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු කථානායකතුමනි, මෙතැනදී පාසල්වලට ගිහින් අධ්‍යාපනය ලබා දෙන උපාධිධාරීන් පිළිබඳව කථා කළා වාගේම, සමස්ත උපාධිධාරීන්ගේ ප්‍රශ්නය පිළිබඳවත් අපි සෑම අවස්ථාවකම කථා කරනවා. අපේ සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා සඳහන් කළා වාගේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අවස්ථා දෙකකදී උපාධිධාරීන්ට පත්වීම් ලබා දුන්නා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාත් උපාධිධාරීන්ට පත්වීම් ලබා දුන්නා. මේ පත්වීම් ලබා දෙන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එක පුටුවක දෙන්නා, තුන්දෙනා වාඩි කරවලා පත්වීම් ලබා දුන්නා. එහිදී රජයේ අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳව තැකීමක් නොකර රාජ්‍ය සේවය ලක්ෂ 17 දක්වා ඉහළට ගෙන ගියා. සත්‍ය වශයෙන්ම මේ වෙලාවේ රාජ්‍ය සේවකයන් ලක්ෂ 10කින් රාජ්‍ය සේවයේ කටයුතු කරන්න පුළුවන් බව තමයි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අදහස වෙලා තිබෙන්නේ.

විපක්ෂ නායකවරයා විධියට සජිත් ප්‍රේමදාස මහත්මයා දැන් කථා කරනවා, එතුමාගේ ප්‍රතිපත්ති ගැන. මම දැනගන්න කැමැතියි, රජයේ අවශ්‍යතාව පසෙක ලා ඉදිරියේදී එතුමාගේ ප්‍රතිපත්තිවලදී මේ රටේ විශ්වවිද්‍යාලවලින් බිහිවෙන, බාහිර උපාධිධාරීන් විධියට බිහිවෙන සියලු උපාධිධාරීන්ට රස්සාවල් දෙනවාද කියලා.

මේක රාජ්‍යයට කොච්චර බරක්ද? Cadre එකට අවශ්‍යද නැද්ද කියලා බලන්නේ නැතිව සියලුදෙනාට රස්සා දෙනවාද? උපාධිධාරීන් නම් ඔවුන්ට රස්සා දෙනවාද? විපක්ෂයේ ඉඳගෙන දැන් අහනවා, රජයේ රස්සා දෙනවාද කියලා. අපි අහන්නේ එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයකින් ඒක ප්‍රකාශ කරනවාද, එහෙම නැත්නම් මේ පාර්ලිමේන්තුවේදී ඒක කියනවාද කියලායි. කවදා හෝ දවසක එතුමාට බලයක් හම්බ වුණොත්, සිහිනෙන් හෝ බලයක් හම්බ වුණොත්, රජයේ අනුමත cadre එක නොතකා, එහෙම නැත්නම් රජයේ අවශ්‍යතාව නොතකා සියලු උපාධිධාරීන්ට රජයේ රස්සා දෙනවාද කියා මම දැනගන්න කැමැතියි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, උපාධිධාරීන්ගේ ප්‍රශ්නය පිළිබඳව දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේදී අපි කථා කරනවා. මම දන්නවා, පසුගිය කාල සීමාවේ මේ උපාධිධාරීන් බඳවා ගැනීමට විරුද්ධව යම් යම් කණ්ඩායම් උසාවි ගිහිල්ලා නියෝග ලබා ගැනීම නිසා අද පාසල්වල විශාල ගුරු හිඟයක් ඇති වෙලා තිබෙන බව. මේ ගුරු හිඟය වැඩියෙන්ම තිබෙන්නේ බස්නාහිර පළාතේ. බස්නාහිර පළාතේ ගුරු විභාගයක් පවත්වා එම බඳවා ගැනීම් කළත්, විෂයානුබද්ධව බඳවා ගැනීම් කෙරෙනකොට සමහර අය අත් හැරිලා තිබෙනවා. අපි ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කරලා ඒ සම්බන්ධ තීන්දු-තීරණ ගන්නවා. බස්නාහිර පළාතේ තිබෙන පුරප්පාඩු ප්‍රමාණයට වඩා උපාධිධාරීන් සංඛ්‍යාව වැඩි නිසා තමයි විභාගයක් පවත්වන්න වෙලා තිබෙන්නේ. වෙනත් පළාත්වල උපාධිධාරීන් ප්‍රමාණයට වඩා පුරප්පාඩු සංඛ්‍යාව වැඩි නිසා ඒ සියලුදෙනාම බඳවා ගන්නවා. උපාධියක් ගත්ත කෙනෙකුට පුහුණුවක් ලබා දීලා හෝ ඒ සේවයට අන්තර්ග්‍රහණය කරලා ඒ අයට අවස්ථාවක් ලබා දෙනවා නම් මේ ප්‍රශ්නය විසඳෙනවා. මට මතකයි, මම බස්නාහිර පළාතේ ප්‍රධාන ඇමතිවරයා හැටියට කටයුතු කරද්දී අපි විභාගය පවත්වා ඊළඟට ඉන්න උපාධිධාරීන් ස්වේච්ඡාවෙන් පාසල්වලට යොමු කළ බව. ඒ අය පුහුණුවක් හැටියට ඒ කටයුතු කළා. දැන් ගොඩක් දුරට බස්නාහිර පළාතේ තිබෙන ගුරු හිඟය විසඳීගෙන එනකොට රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව වැඩි වෙනවා. මේ වනකොට ඒ පිළිබඳව බස්නාහිර පළාතේ දිසාපතිතුමන්ලා දැනුවත් කරලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ඒ අයගේ තොරතුරු ලබා ගැනීමක් කළා. මම සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාත් එක්ක කථා කළාම එතුමා කිව්වේ, මේ ගුරු පුරප්පාඩු සඳහා ඇතුළේ ඉන්න අය බඳවා ගත්තාට පස්සේත් ඇතිවන පුරප්පාඩු සඳහා වයස් සීමාව ඉක්ම වූ නමුත්, වයස අවුරුදු 45ට අඩු උපාධිධාරීන් බඳවා ගැනීමට පළාත් සභාවලට අවස්ථාව ලබා දෙන බවයි. ඒ වැඩ පිළිවෙළත් මේ වනකොට අපි යෝජනා කර තිබෙනවා. මම විශ්වාස කරනවා, ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා ඒ පිළිබඳව පැහැදිලි කරයි කියලා.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ වන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අගමැතිතුමා ගරු සභාවේ ඉන්න නිසා මේ අවස්ථාවේ මා වැදගත් ප්‍රශ්නයක් යොමු කරනවා. සියයට 20ක, 25ක ආබාධිත තත්ත්වයට පත් වෙච්ච අපේ රටේ රණ විරුවන්ට හමුදාවේ නිල ක්‍රියාදාමයට අනුව වන්දි ලබා දීම සුදුසුයි කියලා තීන්දු කර තිබෙනවා.

එවැනි අය 81දෙනෙකුට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. එම යෝජනා හමුදාවෙන්, ආරක්ෂක ලේකම්ට යවලා තිබෙනවා. නමුත් ඒ යෝජනා තවමත් අනුමත වෙලා නැහැ. ඒ යෝජනා ඇතුළත් ලේඛන මාස ගණනක් තිස්සේ ආරක්ෂක ලේකම්ගේ මේසය උඩ තිබෙනවා. ගරු අගමැතිතුමනි, කරුණාකරලා අපි වෙනුවෙන්, රට වෙනුවෙන් සටන් කරපු ඒ විරුවන් කණ්ඩායමට නිර්දේශ වෙච්ච සහනය -හමුදා උසාවිය විසින් තීරණය කරපු වන්දි සහ සහන- ලබා දෙන්න කටයුතු කරන්න කියා මම ඉල්ලා සිටිනවා. ඒ කාරණය මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, අපේ ගරු මනුෂ නානායක්කාර ඇමතිතුමා විපක්ෂ නායකතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. දැන් එතුමන්ලා ආණ්ඩුවේ නේ. ඒ නිසා ආණ්ඩුව කරන වැඩ ටික මොනවාද කියලා රටට කිව්වොත් හොඳයි. විපක්ෂ නායකතුමා වැඩ කරන විධිය සහ අනාගතයේ මොකක්ද කරන්නේ කියන එක අපි රටේ ජනතාවට කියනවා. මෙතුමා විපක්ෂයේ ඉඳලා ඡන්ද අරගෙන විපක්ෂයෙන් කටයුතු කරගන්න බැරිව අද ආණ්ඩුවෙන් අනාථ වෙලා අපේ වැඩ ගැන අහනවා.

අනෙක් කාරණය මේකයි. පාර්ලිමේන්තු සම්ප්‍රදාය වෙනස් වෙලාද කියා මම ගරු කථානායකතුමාගෙන් දැනගන්න කැමතියි. විපක්ෂ නායකතුමාගෙනුත් ප්‍රශ්න අහන්න තිබෙනවා නම්, ඒක Order Paper එකට ඇතුළත් කරලා අරගෙන එන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අනවශ්‍ය ප්‍රශ්නයක් මතු කළා, හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමා පිළිතුරු දීලා මේ කාරණය අවසන් කරන්න, ගරු ඇමතිතුමනි.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු කථානායකතුමනි, අපෙන් ප්‍රශ්න ඇහුවාම අපි උත්තර දෙන්න කටයුතු කරනවා. උත්තර දෙන්න බැඳිලා ඉන්නවාද, නැද්ද කියන එක නොවෙයි, විපක්ෂ නායකවරයා හෝ කවුරු හෝ මේ ගරු සභාවේ ප්‍රශ්නයක් ඇහුවොත් අපි - ඇමතිවරු - උත්තර දෙනවා. ගරු කථානායකතුමනි, අපි සරල ප්‍රශ්නයක් ඇහුවේ. ඒකට හේෂා විතානගේ මන්ත්‍රීතුමා තමයි උත්තර දුන්නේ.

මනුෂ නානායක්කාර ඇමතිතුමා ඇහුවේ රාජ්‍ය සේවයට බඳවා ගන්නවාද, නැද්ද කියලායි. දැන් එතුමාගෙන් ඇහුවේ රාජ්‍ය සේවයට මේ සියලුදෙනා බඳවාගෙන තව බරක් එකතු කරන්න මේ සියලුදෙනාට පොරොන්දුවක් දෙනවාද කියලායි. දැන් එක පැත්තකින් රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කරන්න කියලා ඉල්ලනවා. එතකොට මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා ඇවිත් කියනවා, දැන් ඉන්න රාජ්‍ය සේවයට වැටුප් වැඩි කරන්න නම් සියයට තුනකින්, සියයට හතරකින් VAT හෝ තවත් බද්දක් වැඩි කරන්න වෙනවා කියලා. එතකොට එතුමන්ලාට ඒකට තිබෙන වැඩසටහන මොකක්ද? එතුමන්ලා බලය ගන්න බලාගෙන ඉන්නවා නම්, රාජ්‍ය සේවයට එකතු වන ඒ පිරිසට කොහොමද පඩි ගෙවන්නේ, දැන් ඉන්න පිරිසට පඩි වැඩි කරන්න ඕනෑ නම් ඒක කොහොමද කරන්නේ කියලා අපි දැනගන්න කැමතියි, ගරු කථානායකතුමනි. එතකොට එතුමන්ලාගේ අදහස් අරගෙන හෝ අපට ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන් නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු අධ්‍යාපන ඇමතිතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාත් එනවා නේ, මේ ප්‍රශ්නය තවත් අවුල් කරන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මෙහෙම හිටපු ගමන් නැඟිටලා උත්තර දෙන්න බැහැ. *[බාධා කිරීම්]* පොඩ්ඩක් අහගෙන ඉන්න. *[බාධා කිරීම්]* ඔබතුමා ප්‍රශ්නය Order Paper එකට ඇතුළත් කරන්න. එතකොට අපි උත්තර දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධ්‍යාපන ඇමතිතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මට විනාඩි පහක් දෙන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඊයේ ගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ තව ලේකම්වරු කිහිපදෙනෙක් එක්ක ඉන්න රූප රාමු TV එකේ පෙන්නුවා. එහිදී ජනාධිපතිතුමා කිව්වා, මේ දීමනාව ගෙවන්න බැහැ කියලා. ඒ ගැන තමයි අද මේ අහන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔය කාරණය දැන් නවත්වලා අපි දිනට නියමිත කටයුතුවලට යොමු වෙමු. [බාධා කිරීම්] දැන් න්‍යාය පත්‍රයේ කටයුතුවලට යමු. [බාධා කිරීම්] ඔබතුමන්ලා ප්‍රශ්නය ආපසු මතු කරනවා නේ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I am on a point of Order.

ගරු කථානායකතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා දැන් කිව්වා, Order Paper එකේ සඳහන්ව නැති කාරණා ගැන අහන්න එපා කියලා. එම නිසා ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් මේ ඉල්ලීම කරනවා. Order Paper එකේ නැති කාරණා ගැන හැම දාම ප්‍රශ්න අහන පිරිසක් මෙතැන ඉන්නවා නේ. එහෙම නම් ඒ අවස්ථාවත් නැති කරන්න. හැම දාම Order Paper එකේ නැති ප්‍රශ්න ඇහුවාමත් අපි උත්තර දෙනවා. උත්තර දුන්නේ නැති වුණාම එළියට ගිහිල්ලා කියනවා, අහන ප්‍රශ්නවලට උත්තර දෙන්නේ නැහැ කියලා. ඉතින්, අපි අහන එක ප්‍රශ්නයකට මෙතුමන්ලාට උත්තර දෙන්න බැරි නම් මෙතුමන්ලාගේ -විපක්ෂයේ- ක්‍රියා කලාපය මොකක්ද කියන එක අපට තේරුම් ගන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධ්‍යාපන ඇමතිතුමනි, විපක්ෂ නායකතුමා අහපු ප්‍රශ්නවලට උත්තර දීලා මේ කාරණය අවසන් කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා අහපු ප්‍රශ්න දෙකෙන් කාලීන ප්‍රශ්නයක් වූ දෙවැනි ප්‍රශ්නයට මම පිළිතුරු දීලා සෑහීමකට පත් වන මට්ටමකට දැන් ගෙනැල්ලා තිබෙනවා. ඒකටම අදාළයි පළමු ප්‍රශ්නයත්. රැකියා විරහිත උපාධිධාරීන්ගේ ප්‍රශ්නය කාලාන්තරයක් තිස්සේ තිබුණු එකක්. මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතියට අපි ඇතුළු කර ගන්නා සිසුන් සංඛ්‍යාව විශේෂයෙන්ම පසුගිය වකවානුව තුළ කිහිප ගුණයකින් වැඩි කළා. උදාහරණයක් වශයෙන් කිව්වොත්, මේ අවුරුද්දේ intake එක රාජ්‍ය විශ්වවිද්‍යාල 17ට 43,000යි. වැඩ වර්ජනය නිසා මෙවර online තමයි අයදුම් පත් කැඳෙව්වේ. Online call කළාම පසුගිය A/L Exam එකේ results අනුව මේ වනකොට 90,000ක් register වෙලා ඉවරයි. ඒ කියන්නේ, කලින් අවුරුද්දට වඩා මේ අවුරුද්දේ 10,000ක් වැඩිපුර ඉල්ලුම් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ රැකියා විරහිත උපාධිධාරීන්ගේ ප්‍රශ්නය සරලව මේ විධියට සාකච්ඡා කරලා විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මේක කාලාන්තරයක් තිස්සේ තිබුණු ප්‍රශ්නයක්; අනාගතයේ මීට වඩා උග්‍ර වන ප්‍රශ්නයක්.

පුරාවිද්‍යා උපාධිධාරියෙකුට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ ඊට අදාළ ආයතනවල හැරුණාම වෙන කොහේද දැන් පත්වීම දෙන්නේ, ගරු කථානායකතුමනි? ජනමාධ්‍ය උදාහරණයකට ගන්න. අද දරුවෝ බොහෝදෙනෙක් ජනමාධ්‍ය විෂය හදාරනවා. ඒකට හේතුවක් තිබෙනවා. ඒ හේතුව තමයි, ග්‍රාමීය ප්‍රදේශවල විද්‍යාව, තාක්ෂණය හා විදේශ භාෂා වැනි විෂයයන්වලට ගුරුවරු නොමැතිකම. ඒ දරුවන්ට තිබෙන විෂය ධාරාව ඒ දරුවෝ හදාරනවා. හදාරලා උසස් පෙළ කරලා, මොකක් හෝ පාඨමාලාවකට යොමු වනවා. හැබැයි, ඒ අය යොමු වන්නේ මේ රටේ රැකියා වෙළෙඳ පොළේ ඉල්ලුම තිබෙන පාඨමාලාවලට නොවෙයි. මේක සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රයේම තිබෙන ගැටලුවක්. එම නිසා තමයි 1 ශ්‍රේණියෙන්, 6 ශ්‍රේණියෙන්, 10 ශ්‍රේණියෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා කරගෙන එන්නේ, රැකියා විරහිත උපාධිධාරීන් බිහිවීම වැළැක්වීම අවසාන ඉලක්කය කරගෙන. මේ වනකොට එහි pilot project එක කරලා තිබෙන්නේ. ඒක දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක්.

ගරු කථානායකතුමනි, මෙතැනදී තව ප්‍රශ්නයක් මතු වුණා. මම ඒකත් සඳහන් කරන්න ඕනෑ. ඒක ක්ෂණිකව පිළිතුරු දෙන්න පුළුවන් කාරණයක් නොවෙයි. දෙවැනි කාරණය තමයි පළාත් මට්ටමින් මේ අය බඳවා ගැනීම. පළාත් මට්ටමින් බඳවා ගන්න දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව බලතල තිබෙනවා, පළාත් සභාවලට. එම නිසා උපාධිධාරීන් සහ අදාළ ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීමට පළාත් සභා කටයුතු කරනවා, මුදල් කොමිසම මඟින් භාණ්ඩාගාරයෙන් මුදල් වෙන් කර ගැනීම මත. මෙහිදී interview කරනතුරු විභාගයේ ලකුණු දෙන්නේ නැහැ. මොකද, ඒ තුළින් බලපෑමක් කරන්න පුළුවන් නිසා. ඒ නිසා interview කළාට පසුව ඒ interview එකේ ලකුණ exam marksවලට එකතු කළාට පසුවයි අවසාන අදියරේදී ලකුණු සමස්තය ඉදිරිපත් කිරීමට නියමිතව තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, අපි ගුරුවරු නැති පාසල්වලට නේ ගුරුවරු දෙන්නේ. අද උදේ මාව හම්බ වෙන්න ආවා, පත්වීම් ලබා දීපු විද්‍යා උපාධිධාරීන් පිරිසක්. ඔවුන් ඊයේ පාසලට report කළ යුතුව තිබුණා. විෂය, සංයුක්ත ගණිතය; පත්වීම පොළොන්නරුවට. නමුත් මේ අය අපිව සොයාගෙන එනවා, පත්වීම මාරු කර ගන්න. සංයුක්ත ගණිතය විෂයට අදාළ උපාධිධාරීන් පොළොන්නරුවෙන් බිහි වෙන්නේ නැත්නම් ඒ ප්‍රදේශයේ උසස් පෙළ කරන දරුවන්ට අපි ගුරුවරු ලබා දෙන්නේ නැද්ද? කොළඹ ඉන්න කෙනෙකුට පොළොන්නරුවට ගිහිල්ලා අවුරුදු පහක් උගන්වන්න බැරි මොකද? ගරු කථානායකතුමනි, මේවා ප්‍රායෝගික ප්‍රශ්න. මේ ප්‍රායෝගික ප්‍රශ්නත් එක්ක උදේ ඉඳලා සවස් වෙනතුරු පොරබදිමින්, රජය ඉනා අමාරුවෙන් මුදල් සොයාගෙන තමයි මේ පත්වීම් ටික දෙන්නේ.

ඊළඟට, ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමා කිව්වා වාගේ ඉතුරු වෙලා සිටින අනික් උපාධිධාරීන් සම්බන්ධයෙනුත් අපි දැනට වැඩ සැලැස්මක් සකස් කරගෙන යනවා. අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරලා, පාසල්වල ඉගැන්වීමේ කාර්යයේ නියුක්ත

නොවන පිරිස සඳහා කාර්යාල සේවාවක් ආරම්භ කිරීමටත් අපි දැනට යෝජනා කර තිබෙනවා. යම්කිසි විධියකින්, වයස් සීමාව හෝ විෂය නොගැළපීම මත කාට හෝ පත්වීමක් නොලැබෙන්නේ නම් ඒ අය බැහැර කරන්නේ නැහැ. ඒ අය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ රඳවාගෙන කටයුතු කිරීමේ වැඩ පිළිවෙළකුත් යෝජනා කර තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටදී, මාණ්ඩලික සභානායකයා අක්කිරාසනත්තිණින්රු අකලවේ, පිරිතිච් සභානායකයා [මාණ්ඩලික අජිත් රාජපක්ෂ] තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] took the Chair.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික පිරිතිච් සභානායකයා)
(The Hon. Deputy Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්ඩලික සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න ඉස්සෙල්ලා, අද මගෙන් පිළිතුරක් බලාපොරොත්තු වුණු නිසා විශේෂයෙන්ම මම ඒ ගැන සඳහන් කරන්න කැමැතියි. ඇත්ත වශයෙන්ම මම සන්තෝෂ වෙනවා. මොකද, සාමාන්‍යයෙන් ප්‍රශ්න අහන්නේ විපක්ෂය; පිළිතුරු සපයන්නේ ආණ්ඩුව. නමුත් ළඟදීම සිදු වෙන හැරවුම් ලක්ෂ්‍යය දිහා බලාගෙන දැන් අපෙන් ප්‍රශ්න අහනවා. අපි සූදානම්, උත්තර දෙන්න. පැහැදිලිව මම කියන්න ඕනෑ, උපාධිධාරීන්ගේ රැකියා ගැටලුව පිළිබඳව පවතින යථාර්ථය, සත්‍යය තමයි රැකියා විරහිත උපාධිධාරීන්ගේ මෙම ප්‍රශ්නය රාජ්‍ය අංශයෙන්ම පමණක් විසඳන්නට බැහැ කියන එක. ඒ සඳහා රාජ්‍ය ක්ෂේත්‍රය, පෞද්ගලික ක්ෂේත්‍රය, බහුජාතික සමාගම් ක්ෂේත්‍රය, විදේශ රැකියා යනාදී විකල්ප ගණනාවකට යන්න වෙනවා.

ඒක තමයි මහ පොළොවේ සත්‍යය. ඒක තමයි අපි ලබා දෙන විසඳුම. හැබැයි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. ආණ්ඩුකාරවරයාට පුළුවන්, මැතිවරණය නොපවත්වන හැම පළාත් පාලන ආයතනයකටම තමන්ගේ අතකොළුවන්, තමන්ගේ ගෝල බාලයන් සඳහා දේශපාලන පත්වීම් දෙන්න. හැබැයි, උපාධිධාරීන්ගේ ප්‍රශ්නය විසඳා ගන්නට බැහැ.

ගරු කථානායකතුමනි, බොහොම පැහැදිලිව මම කියන්නට කැමැතියි, උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුම තිබෙන්නේ රාජ්‍ය අංශය තුළ පමණක් නොවෙයි කියන එක. රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, විදේශ රැකියා ක්ෂේත්‍රය තුළ අපට පුළුවන්, ඒ අයගේ රැකියා ප්‍රශ්නයට විසඳුම් ලබා දෙන්න. ඇත්තටම අපේ වැඩසටහනක් තිබෙනවා, one million new business startups, one million new entrepreneurs සඳහා. ගලේ කොටලා කියලා නැහැ නේ, හැමෝම රජයේ රැකියා කරන්නට ඕනෑය කියලා. නමුත් ඒ,- *[බාධා කිරීමක්]* ඔව්, බොහොම පැහැදිලිව කියනවා. මම ආඩම්බර වෙනවා, අනාගත රජයෙන් -අපෙන්- පරදින්න බලාපොරොත්තුවෙන් ඉන්න ආණ්ඩුව උත්තර ඇසීම සම්බන්ධයෙන්. ඒක තමයි මේ සිදු වෙලා තිබෙන්නේ.

ගරු මනුෂ නානායක්කාර මහතා
(මාණ්ඩලික මනුෂ නාණායක්කාර)
(The Hon. Manusha Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි සාමාන්‍යයෙන් ඔය ප්‍රශ්නය අහන්නේ අනාගත ආණ්ඩුව කියලා නොවෙයි. හැමදාම බොරු පොරොන්දු දීලා, මුළාවේ දාලා, තරුණයන් වෙන වෙන තැන්වල අතරමං කරලා, ඒගොල්ලන් තරුණ අසහනයක් දක්වාම ගෙන යන්නේ මෙන්න මේ වාගේ පොරොන්දු දීලා තමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමාගෙන් මම ඇහුවේ මේකයි. මෙතුමා මීට කලිනුත් අපේ ආණ්ඩුවෙන් ඇහුවා, විශ්වවිද්‍යාල වරම් ලබපු රැකියා විරහිත උපාධිධාරීන් රජයට බඳවා ගන්නවාද, නැද්ද කියන ප්‍රශ්නය. ඒ අයව රජයේ රැකියා සඳහා බඳවා ගන්නවාද, නැද්ද කියලා එතුමා ඇහුවේ අපේ පැත්තෙන්, අපේ රජය අපහසුතාවට පත් කරන්න. මේ, දේශපාලන ගේම් එකක්. ඒ ප්‍රශ්නයම එතුමාගෙන් ඇහුවාම එතුමා කියනවා, මේ අය රජයටම බඳවා ගැනීමේ අවශ්‍යතාවක් නැහැ කියලා. අන්න ඒක තමයි අපට ගන්න ඕනෑ වුණු උත්තරය. මොකද, ආණ්ඩුවට එක දෙයක් කියලා, තමන් මේ හැම ක්ෂේත්‍රයක් සම්බන්ධවම කථා කරනවා. ව්‍යවසායකයන් ගැන කථා කරනවා. එක එක දේවල් කියනවා. දැන් රජය ව්‍යවසායකයන් නහාසිටුවන්න වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, තරුණ ව්‍යවසායකයන්ට ඕනෑ කරන සහයෝගය ලබා දෙන්න, ණය පහසුකම් ලබා දෙන්න, AI තාක්ෂණය ලබා දෙන්න සියල්ල සූදානම් කර තිබෙනවා.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා කියනවා ආණ්ඩුකාරතුමා පත්වීම් දෙනවා කියලා. ආණ්ඩුකාරතුමා කොහේද පත්වීම් දීලා තිබෙන්නේ? මොන ආණ්ඩුකාරතුමාද, පඩි ලබා දෙන පත්වීම් ලබා දීලා තිබෙන්නේ? පත්වීම් දෙන්න පුළුවන්; තනතුරු දෙන්න පුළුවන්. හැබැයි, කොහේද රජයෙන් වියදමක් දරලා තිබෙන්නේ? වැරදි චෝදනා නහලා, තමන්ගේ දේශපාලන නිරුවත වසා ගන්න හදනවා.

එහෙම නැතුව විපක්ෂ නායකවරයා විධියට වැඩ පිළිවෙළක් තිබෙනවා නම් බොරුවට අරක කරන්නම්, මේක කරන්නම්- *[බාධා කිරීමක්]* "මේ වෙලාවේ රනිල් තමයි" කියලා කියනකොට, මේ වෙලාවේ වැඩ පිළිවෙළක් තිබෙන්නේ සජිත්ට තමයි කිය කියා, මැදින් කොපි ගහලා - *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික පිරිතිච් සභානායකයා)
(The Hon. Deputy Speaker)

ගරු ඇමතිතුමා, අපි ඔය ගැන වෙන දවසක විවාද කරමු. දැන් අවසන් කරන්න. *[බාධා කිරීම්]*

ගරු මනුෂ නානායක්කාර මහතා
(මාණ්ඩලික මනුෂ නාණායක්කාර)
(The Hon. Manusha Nanayakkara)

අපි රජය විධියට අද වතු කම්කරුවන්ට වතුවල අයිතිය දෙනකොට අපිට කියනවා, සැලසුම් තිබෙන්නේ සජිත්ට විතරයි කියලා. අද අපි පාසල් දැරියන්ට සනීපාරක්ෂක තුවා - sanitary pads - දෙනකොට, ඒවා දෙන්න සැලසුම් තිබෙන්නේ සජිත්ට විතරයි කියනවා. අනේ, සැලසුම් නොවෙයි, ආණ්ඩුව විධියට අපි ඒවා කරනවා. ඒ ගැන දැනුවත් කරන්නයි මම මේ කිව්වේ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට ඉස්සර වෙලා මට පොඩි කාරණයක් කියන්න තිබෙනවා. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නිශ්ශබ්ද වෙන්න, ගරු මන්ත්‍රීතුමන්ලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මෙහෙම ගාථාවක් තිබෙනවා.

"න ජච්චා වසලෝ හෝති - න ජච්චා හෝති බ්‍රාහ්මණෝ,
කම්මනා වසලෝ හෝති - කම්මනා හෝති බ්‍රාහ්මණෝ"

යම් පුද්ගලයෙක් පිළිබඳව නිගමනයකට එන්නේ; තමන්ගේ වසලකම එළිදැක්වෙන්නේ; තමන්ගේ උත්පත්තියෙන් නොවෙයි, ක්‍රියාවෙන්. මට එච්චරයි කියන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය- *[බාධා කිරීම්]*

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, දැන් ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න තිබෙනවා. *[බාධා කිරීම්]*

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
මට පොඩි කොටසක්-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමා, දැන් විවාදයක් කරන්න බැහැ. කාලය ඉක්ම ගොස් තිබෙන්නේ. *[බාධා කිරීම්]*

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
Sir, I rise to a point of Order. මට පොඩ්ඩක් ඉඩ දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, කියන්න.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
සාමාන්‍යයෙන් උත්පත්තියෙන් වසලයෙක් හෝ බ්‍රාහ්මණයෙක් නොවුණාට, සමහරුන්ගේ උත්පත්තිය නිසාම සමහර දේවල් කියා පානවා; තමන්ගේ තිබෙන inferiority complex ඇතුළු අනෙක් හැම දේම කියා පානවා. ඒ නිසා අද තමන්ගේ පියාණෝ පියාණෝ කියමින්,- *[බාධා කිරීම්]* පියානෝ ගහන්නේත් ඔය උත්පත්තියේ ප්‍රශ්නයක් නිසා තමයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ පැරණි කියමනක් කිව්වේ. ඇයි, මේ එක එක්කෙනා තොප්පි දමා ගන්නේ? ඇයි, මේ තොප්පි දමා ගන්නේ? මම එතුමා ඉලක්ක කරගෙන නොවෙයි, ඒක කිව්වේ. *[බාධා කිරීම්]* අනේ, ඇයි තොප්පිය දමා ගත්තේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
බණ පදයක් නේ කිව්වේ. [බාධා කිරීම්] බණ පදයක්වත් කියන්න බැහැ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම බණ පදයක් කිව්වේ. තොප්පිය දමා ගත්තා නේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගැළපෙන නිසා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නිශ්ශබ්ද වෙන්න, ගරු මන්ත්‍රීතුමන්ලා. *[බාධා කිරීම්]* ගරු විපක්ෂ නායකතුමා, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ප්‍රශ්නය ඉදිරිපත් කරන්නම්. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මුජිබුර් මන්ත්‍රීතුමා කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]* ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. අනෙක් අයගේ කථා ඔබතුමා අදාළ කර ගන්න එපා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

විශ්‍රාම වැටුප් විෂමතා විසඳීම සහ වැඩිහිටියන් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමයක්
ஓய்வூதிய முரண்பாடுகளுக்கு தீர்வும் முதியோருக்கான சமூக பாதுகாப்பு முறைமையும்
RESOLUTION OF PENSION ANOMALIES AND SOCIAL SECURITY SYSTEM FOR ELDERS

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

සිය විශ්‍රාමික දිවිය සැහැල්ලුවෙන් ගත කිරීම සෑම විශ්‍රාමිකයෙකුගේම අරමුණ වෙනවා. කෙසේ නමුත්, ඒ සඳහා තමන් විසින් උපයා ගත්, තමන්ට හිමි විශ්‍රාම වැටුප නිසි පරිදි හිමි නොවීම සහ රජයේ විවිධ ප්‍රතිපත්ති නිසා අද විශ්‍රාමික ප්‍රජාව දැඩි ලෙස පීඩාවට පත්ව තිබෙනවා. එසේ හෙයින් වෘත්තීමය කේවල් කිරීමට අපොහොසත් කණ්ඩායමක් ලෙස හඳුනා ගන්නා විශ්‍රාමිකයින්ගේ දුක්ගැනවිලි පිළිබඳ සංවේදී වීම අත්‍යවශ්‍ය සමාජ වගකීමක් වෙනවා. මේ සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු කරලීම උදෙසා මා පහත සඳහන් ප්‍රශ්න ඉදිරිපත් කරනවා.

01. මෙරට වැඩිහිටි ජනගහනයේ වර්ධනය කොපමණද? එයින් කොපමණ ප්‍රමාණයක් දරිද්‍රතා ඉමෙන් පහළ ආර්ථික පසුබිමක ජීවත් වන්නේද? සෑම වැඩිහිටියෙක්ම යම් හෝ සමාජ ආරක්ෂණ ක්‍රමයක රැකවරණයකට යටත් බවට රජයට සහතික විය හැකිද? එසේ නොවන පිරිසක් සිටීද? වැඩිහිටි ජීවන තත්ත්වය පිළිබඳ විධිමත් සමාජ සමීක්ෂණයක් මෑතකදී සිදුකර තිබේද?

විශේෂයෙන්ම මම මතක් කරන්න කැමැතියි, වැඩිහිටියන්ට ඔවුන්ගේ ඖෂධ සහ ගමන් බිමන් සඳහා වැයවෙන වියදම බොහොම අධිකයි කියලා. ඒ නිසා සෑම වැඩිහිටියෙක්ම යම් හෝ සමාජ ආරක්ෂණ ක්‍රමයක රැකවරණයකට යටත් කළ හැකි වන්නේ නම් එය ඔවුන්ට වඩාත් උපකාරී වෙනවා වාගේම සහනයක් වෙනවා.

02. අද වන විට මෙරට සමස්ත රාජ්‍ය විශ්‍රාමික ප්‍රජාව කොපමණද? 2024, 2030 සහ 2035 වර්ෂවල පුරෝකථනය කර ඇති සමස්ත විශ්‍රාමික සංඛ්‍යාව හා සමස්ත විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය වන ගෙවීම් වියදම් කොපමණද? රාජ්‍ය විශ්‍රාමිකයින් සඳහා ලබා දෙන ජීවන වියදම් දීමනාව ප්‍රමාණවත් බවට රජය සැහීමකට පත් වන්නේද? එම දීමනාව ඉහළ නැංවිය නොහැකිද?

03. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේදී රාජ්‍ය විශ්‍රාමිකයින්ට ණය පහසුකම් ලබා ගැනීමේ ක්‍රමවේදයක් දියත් කෙරුණා. කෙසේ නමුත්, විවිධාය පොලී අනුපාත මත මෙම ණය ලබා ගත් නිසා බොහෝ විශ්‍රාමිකයින් පිරිසක් දැඩි ණය බරතාවකට හසු වී තිබෙනවා.

මේ සඳහා රජයේ අවධානය යොමු වී ඇත් ද? එසේ නම්, මේ ගැටලුව සඳහා රජය ලබා දෙන විසඳුම කුමක් ද?

04. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා පොලී අනුපාතය සියයට 15 සිට සියයට 7.5 දක්වා අඩු කර තිබෙනවා. එසේම, ඇතැම් බැංකු විසින් ඔවුන්ගේ ස්ථාවර තැන්පතු පොලී මත බදු මුදල් අය කර ගනු ලබන බවට වාර්තා වෙනවා.

ඒ කියන්නේ, ලැබුණු පොලියත් අඩු වෙලා, ඒ මුළු පොලී ආදායමින් ඇත්ත වශයෙන්ම යම්කිසි ප්‍රතිශතයකුත් - සියයට 5ක් වැනි ප්‍රමාණයක් - බදු හැටියට කපා ගන්නවා.

මෙම බදු මුදල් යළිත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ලබා ගත හැකි බව රජය විසින් සඳහන් කළ ද, එහි පවතින සංකීර්ණ සහ ව්‍යාකූලත්වය නිසා බොහෝ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ඒ සඳහා අයදුම් නොකරන බවට වාර්තා වෙනවා. මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට වෙනත් පහසු ක්‍රමයක් දියත් කළ නොහැකි ද? ඒ සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද? ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු සඳහා යළිත් සියයට 15ක පොලී අනුපාතයක් ලබා දිය නොහැකි ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මම මතක් කරන්න කැමැතියි, සණස සංවර්ධන බැංකුව ලබා දෙන ස්ථාවර තැන්පතු පොලී අනුපාතය, සියයට 8.25යි, at maturity. සියයට 7.75යි මාසිකව. ලංකා බැංකුව දැනට ලබා දෙන ස්ථාවර තැන්පතු පොලී අනුපාතය සියයට 8.25යි. මීට පෙර සියයට 15ක පොලී ප්‍රතිශතයක් ගෙවලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම අපි අහන්න කැමැතියි, ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු සඳහා යළිත් සියයට 15ක් දක්වා පොලී අනුපාතයක් ලබා දිය නොහැක්කේ කුමන හේතුවක් නිසාද කියන කාරණය.

දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළ යටතේ සේවක අර්ථසාධක අරමුදල රජයේ සුරැකුම්පත්වල කර ඇති ආයෝජන සඳහා ගෙවන පොලී ප්‍රතිශතයේ වෙනසක් සිදුව ඇත් ද? ඒ කොපමණ ද?

05. නොවිසඳී පවතින විශ්‍රාම වැටුප් විෂමතා අතර 2016-2020 අතර විශ්‍රාම ගනු ලැබූවන්ගේ, ඒ වාගේම 2016ට පෙර විශ්‍රාම ගනු ලැබූවන්ගේ හා ගුරු විදුහල්පති සේවයේ වැටුප් වැඩිවීම් නොලද විශ්‍රාමික ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් විෂමතා ප්‍රමුඛව පවතිනවා. මේවාට විසඳුම් ලබා දීම දිගින් දිගටම කල් යන බව පෙනෙන හෙයින්, එතෙක් මොවුන් සඳහා අඩුම ගානේ අන්තර් දීමනාවක් හෝ ගෙවීමට රජයට නොහැකි ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පොඩි විග්‍රහයක් කරන්නට අවසර ඉල්ලනවා. විශේෂයෙන්ම 2016-2020 කාලය තුළ විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයේ ගෙවීම් ලබා දුන්නා කොටස් දෙකකට. ඒ, 2016-2020, 2017-2020, 2018-2020, 2019-2020 යනාදී වශයෙන්. හැබැයි, ගරු සභානායකතුමනි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පත් වුණු හැටියේම කරපු පළමු දේ තමයි මේ ක්‍රියාදාමය වහාම නැවැත්වීම. 2020දී බලයට පත් වූ හැටියේම කළ දේ ඒක. එයින් මේ වන විට 120,000ක් විශ්‍රාමිකයන් අගතියට පත් වෙලා තිබෙනවා. දැන් ඒ දහස් ගණනක් මිය ගිහිල්ලා තිබෙනවා. මහා ජාතික අපරාධයක් කළේ. මේක ශාපයක්. විශ්‍රාමිකයන්ට කරපු ශාපයක්. *[බාධා කිරීමක්]* මොකක්ද කිව්වේ? *[බාධා කිරීමක්]* අන්න, සුසිල් ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කියනවා, "ඒක නේ යන්න වුණේ" කියලා. මට ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මේක අහන්නේ පෞද්ගලිකව ඔබතුමා එල්ල කරගෙන නොවෙයි. ඒවා කරනකොට ආණ්ඩු පක්ෂයේ හිටපු කට්ටිය ඇයි නිහඬව හිටියේ? ඇයි කථා කළේ නැත්තේ? ඇයි මේකට විරුද්ධව කටයුතු කළේ නැත්තේ?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

කථා කරන්න ගියාම-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කියනවා, කථා කරන්න ගියාම එතුමා දොට්ට දැම්මා කියලා.

මම පැහැදිලිව මේ අවස්ථාවේ කියන්න කැමතියි, දැන් ඔබතුමාට අවස්ථාව තිබෙනවා මේක නිවැරදි කරන්න. නමුත්, ඇයි එසේ නොකරන්නේ?

රටේ ආර්ථිකය ස්ථායීකරණයට ලක් වෙලා නම්, stabilization එක වෙලා නම්, රටේ ආර්ථික පුනර්ජීවනයක් නිර්මාණය වෙලා තිබෙනවා නම් විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් මේ යුතුකම ඉෂ්ට නොකරන්නේ ඇයි?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණය තවදුරටත් පැහැදිලි කරන්න කැමැතියි. අද වන කොට විශ්‍රාමික ප්‍රජාව දළ වශයෙන් ලක්ෂ 7ක් ඉන්නවා. 2004දී 1996 වැටුපට ගැළපුවා. 2006 වසරේදී එය 1997 ප්‍රමාණයට ගෙන ආවා. කරන ලද ගැළපීම් ගැනයි මම මේ කියන්නේ. 2015දී 2006 ගැළපුමට ගෙන ආවා. 2019දී 2017 ගැළපුමට ගෙන ආවා. මම මේ කියන්නේ විශ්‍රාම වැටුප් විෂමතාව - pension anomaly එක - ඉවත් කරන්නට ගත් පියවර ගැනයි. මේ වැටුප් විෂමතාවෙන් පීඩා විඳින 480,000ක් පමණ පිරිසක් දැන් ඉන්නවා. ඒ අය වෙනුවෙන් රජය ලබා දෙන විසඳුම මොකක්ද? මම රජයෙන් ඉල්ලා සිටිනවා, මේ වැදගත් ප්‍රශ්නයෙන් පැනලා යන්න එපා, කරුණාකර මේ සඳහා සෘජු පිළිතුරක් ලබා දෙන්න කියලා.

06. තිරසර විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීම සඳහා රටේ සමස්ත වැඩ කරන ජනතාව ආවරණය වන "සැමට විශ්‍රාම" වැඩ පිළිවෙළක් ඇති කිරීම අත්‍යවශ්‍ය කරුණක්. දැනට යම් ආකාරයක දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට යෝජිත බව වාර්තා වෙනවා. එහිදී රාජ්‍ය පාර්ශ්වයෙන් දක්වන දායකත්වය කුමක්ද? සේවක පාර්ශ්වයෙන් දක්වන දායකත්වය කුමක්ද? යෝජිත ක්‍රමය යටතේ විශ්‍රාමිකයෙකුට උපයා ගත හැකි විශ්‍රාම වැටුප් ප්‍රතිශතයේ යම් වෙනසක් සිදු වේද? ඔබතුමා හොඳාකාරව දන්නවා, සාමාන්‍යයෙන් වසර 30ක සේවාවක් ඉෂ්ට සිද්ධ කළොත්, ඒ විශ්‍රාමික ප්‍රජාවට සියයට 85ක විශ්‍රාම වැටුපක් ලැබෙනවා කියලා. මේ අලුත් ක්‍රමය යටතේ ඒ විශ්‍රාම වැටුප්වල කප්පාදුවක් සිදු වෙනවා ද? කප්පාදුවක් සිදු වෙනවා නම්, විශ්‍රාම වැටුප් ප්‍රතිශතයේ වෙනසක් සිදු වෙනවා නම් ඒ කොපමණ ප්‍රමාණයකින් ද? මේ වන විටත් පවතින වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල, අරමුදලක් ලෙස කළමනාකරණය නොවන හෙයින් යෝජිත දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලක් වෙනුවෙන් රජයේ අඛණ්ඩ දායකත්වය ලැබෙන බව සහතික වීමට රජය සතු යෝජනා කවරේ ද?

මේ රටේ ලක්ෂ ගණනක් සිටින විශ්‍රාමික ප්‍රජාවගේ උන්නතිය උදෙසා ඉදිරිපත් කරපු මේ ප්‍රශ්නයට පිළිතුරු මම මේ අවස්ථාවේදී රජයෙන් බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු සභානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා ද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෙට දිනයේදී ඒ සඳහා පිළිතුර ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ දෙවන ප්‍රශ්නය, ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ.

II

මන්දපෝෂණය සහ දරිද්‍රතාව
ஊட்டச்சத்து குறைபாடு மற்றும் வறுமை
MALNUTRITION AND POVERTY

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම අහන ප්‍රශ්නය මෙයයි.

අද ශ්‍රී ලංකාවේ ජීවන වියදම ඉතා ඉහළ මට්ටමක තිබෙන බව ඔබතුමන්ලා හැම දෙනා පිළිගන්නවා ඇතැයි මම හිතනවා. විශේෂයෙන් එදිනෙදා පරිභෝජනයට ගන්නා සෑම එළවලු වර්ගයක්ම රුපියල් 500ත්, 1,000ත් අතර මිලක් දක්වා අද ඉහළ ගිහින් තිබෙනවා. ඒ වාගේම, මුං ඇට, කවුපි, කුරක්කන් ආදි සියලු ධාන්‍ය වර්ගවල මිල වැඩි වෙලා තිබෙනවා. ඇත්තවශයෙන් මේ සඳහා තිබෙන එකම විසඳුම මුං ඇට, කවුපි, කුරක්කන් ආදි ධාන්‍ය වර්ග ලංකාව තුළ වගා කිරීමයි. මේක එක් කන්නයකින් විසඳා ගන්න පුළුවන් ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එය කළ හැකි වන්නේ ජනතාව තුළ විශාල බලගැන්වීමක් සිදු කිරීමෙනුයි. මා ඒ කාරණය කෙරෙහි මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි. හමුදාව, පාසල් දරුවෝ, රටේ පොදු ජනතාව සියලුදෙනා දැවැන්ත මෙහෙයුමකට ගියොත් එය කළ හැකියි. අද සාමාන්‍යයෙන් හැම එළවලුවක්ම ග්‍රෑම් 100ටයි මිල කරලා තිබෙන්නේ. ග්‍රෑම් 100ක් රුපියල් 100යි. එතකොට කිලෝවක් රුපියල් 1,000ක් වෙනවා. මේ මිල වැඩි වීම හේතුවෙන්, මාසිකව රුපියල් 40,000ක්, රුපියල් 50,000ක් වැටුප් ගන්නා රජයේ ගුරුවරුන්, clerksලා, රජයේ රස්සාවක් කරන සාමාන්‍ය පුද්ගලයන් ඉතාම දුෂ්කර තත්ත්වයකට මුහුණ දී සිටිනවා. විශේෂයෙන් මධ්‍යම පන්තියේ ජනතාව - කොළඹ නාගරික ප්‍රදේශවල පවා - මේ අවස්ථාව වන විට තමන් වේලක්, දෙවේලක් නොකා තමන්ගේ දරුවන්ට යන්තම් කන්න දීලා ජීවත් වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම, මේ අවස්ථාවේදී මම තවත් කාරණයක් කියන්න කැමැතියි. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා මේ ගැන දන්නවා. 2022 ඔක්තෝබර් හා දෙසැම්බර් මාසවල කරපු දෙයක් ගැනයි මම මේ කියන්නේ. ඒ කාලයේ පවුල් සෞඛ්‍ය සේවිකාවක් අපට දැනුම් දුන්නා, ඔබේසේකරපුර අවට මවුවරුන්ට තම දරුවන්ට කිරි දෙන්න කිරි නැහැ කියලා, ඒ වාගේම ඉතාම අඩු බර දරුවන් උපදිනවා කියලා. ඊට පස්සේ අපි අපේ පන්සලේ දායකයන්ට සහ තවත් අයට කථා කරලා, මාස දෙකක් එක දිගට පවුල් සිය ගණනකට පන්සලෙන් ආහාර ලබා දුන්නා. හැබැයි, ඒක

තනියෙන්, පෞද්ගලිකව කරන්න බැහැ. ඊට පස්සේ රට ටිකෙන් ටික සාමාන්‍යකරණයට පත් වුණා; ත්‍රී රෝද රථ ආදිය ගමන් කරන්න පටන් ගත්තා. ඒ අමාරුම කාලයේ අපේ පන්සල කේන්ද්‍ර කරගෙන අපි ඒ කටයුත්ත කළා.

අපේ ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා දන්නවා, තුන්වැනි පෙළ පාසල් කියලා වර්ගයක් තිබෙන බව. ඒවාට යන්නේ ජාති, ආගම් භේදයකින් තොරව දුප්පත් දරුවන්. ඒ කාලයේ ඒ පාසල්වල දරුවන් පාසල් යෑමේ ප්‍රතිශතය සියයට 50කින් අඩු වෙලා තිබුණා. මොකද, වයස අවුරුදු 14දී online ඉගැන්වීම් පටන් ගත්තා. නමුත්, ඒ පාසල්වලට යන දරුවන්ගේ ගෙවල්වල smartphone එකක් නැහැ. ඒ නිසා ඒ ළමයි කිසිම අධ්‍යාපනයක් ලැබුවේ නැහැ. ඊට පස්සේ ඒ අය මත් ද්‍රව්‍යවලට - drugsවලට - යොමු වුණා. එසේ මත් ද්‍රව්‍යවලට යොමු වූ ප්‍රමාණය කොච්චරද කියනවා නම්, අප අවට ප්‍රදේශවල පවුල් 3,000කින් පවුල් 1,000ක අය මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තිබෙනවා. මෙසේ ඉතා බරපතළ සදාචාරාත්මක කඩා වැටීමක්, දැවැන්ත දුගී බවක් අපේ සමාජයේ දකින්නට ලැබෙනවා. ආණ්ඩුව මේ කෙරෙහි කිසිම අවධානයක් යොමු කරන බවක් පෙනෙන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ වැඩ පිළිවෙළ මොකක්ද?

ඔබතුමන්ලාත් පාර්ලිමේන්තුවේ මේ දේවල් ගැන කථා කරනවා නේ. මේ කොළඹ නගරය ගත්තොත්, මෙහි දුප්පත් ප්‍රදේශ කියලා හඳුන්වන ප්‍රදේශ තිබෙනවා. ඒ ප්‍රදේශවල තිබෙන ගෙයක දිග, පළල අඩි 10ක්, 8ක් තරම් කුඩායි. ඒ ගෙදරක සමහර විට සාමාජිකයෝ හත්අටදෙනෙක් ජීවත් වෙනවා. ඒ වාගේ blocks තිබෙනවා. ඒ ප්‍රදේශයකට ගිහිල්ලා ඇහුවා නම් එහි මිනිසුන් කියාවි, සමෘද්ධිලාභීන්ගේ ප්‍රශ්නය විසඳිලා තිබෙන්නේ කොහොමද, දැන් අලුතින් හදපු සැලසුම යටතේ වෙච්ච අසාධාරණය මොකක්ද කියලා. මේ පීඩිත සමාජය ඉදිරියට යන්න බැරි තරම් ප්‍රශ්නයකට අද මුහුණ දීලා තිබෙනවා.

දිනෙන් දින වැඩි වන ආහාර මිල අඩු කර ගන්න පුළුවන් එකම ක්‍රමය තමයි, රට තුළ ආහාර සුලභතාවක් ඇති කිරීම. ඒක කරන්න ලෝක බැංකුවේ ආධාර හෝ වෙන කාගේවත් ආධාර ඕනෑ නැහැ. අපි උදාහරණයක් විධියට ගෙවතු වගාව ගනිමු. ගෙවතු වගා කරන්න කියලා අපි මිනිසුන් පොලඹවන්න යනවා. ස්වේච්ඡා සංවිධානයක් හැටියට විශේෂයෙන් Matha Foundation එක යටතේ අපිත් ඒ සඳහා සෑහෙන ප්‍රයත්නයක් දැරුවා. හැබැයි, ඇත්ත තත්ත්වය මොකක්ද? කොතරම් උත්සාහ දැරුවත්, විශේෂයෙන් ඉඩම් තිබෙන ප්‍රදේශවල, ගොවි කලාපවල - අක්කර කාලක්, භාගයක් තිබෙන ගෙවල්වල පවා - මිනිස්සු තම ගෙවත්තේ වගා කරන්නේ නැහැ. ඒකට හේතුව තමයි, වඳුරන්, රිළවුන්, දඩුලේනුන් ආදි සතුන්ගේ ප්‍රශ්නය. අපි මේ ගැන පාර්ලිමේන්තුවේ විවාදයකුත් කළා. අපට මේක නොසලකා හරින්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. අද තිබෙන ආහාර අහේනිය, ආහාර මිල ඉහළ යෑම කෙරෙහි වගා නොකිරීම වාගේම ඉහත කී පරිදි සතුන්ගෙන් වගාවන්ට වන හානිය ද විශාල වශයෙන් හේතු වෙලා තිබෙනවා. අපි මේ ගැන මීට පෙර කථා කළා; ඒ වාගේම, පාර්ලිමේන්තුවේ විවාදයක් ද කළා. පාර්ලිමේන්තුවේ පුස්තකාල පර්යේෂණ අංශයට අනුව, ඉඩම් අක්කර ලක්ෂ තුනක වගාව සම්පූර්ණයෙන් හානියට පත් වෙලා තිබෙන බව වාර්තා කරලා තිබුණා. මෙම ගැටලුව විසඳීම සඳහා මිනිසුන් ධෛර්යවත් කිරීම හා දැනුවත් කිරීම අපි කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, මේ වාගේ අර්බුදයක් තුළ මිනිසුන්ගේ සහභාගිත්වය අප ලබා ගන්නේ කොහොමද, මිනිසුන් බලගන්වන්නේ කොහොමද කියලා ඇහුවොත්, එයට උත්තරය වශයෙන් දේශපාලන කා කොටා ගැනීමක් මිස ප්‍රායෝගික වැඩ පිළිවෙළක් අපට නැහැ. මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ කථා කරනවා වාගේම, විපක්ෂය ඇතුළු මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වන අප හැමෝටම දේශපාලන පක්ෂ භේදයෙන් තොරව මේ ප්‍රශ්නයට උත්තරයක් සොයන්න අවංක ප්‍රයත්නයක් දරන්න පුළුවන්. ඒකට ආණ්ඩුව අවශ්‍යම නැහැ. අපි අද එවැනි දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ, අද රට ඉතාම බරපතළ තත්ත්වයක තිබෙන නිසායි.

මම මේ ප්‍රශ්නය කිහිපවරක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ කෙරෙහි කිසිම අවධානයක් මේ ආණ්ඩුව යොමු කරලා නැහැ. ඇහුවාම උත්තර දෙනවා, අර ආධාර දෙනවා, මේ සහනාධාර දෙනවා කියලා. හැබැයි, බිම් මට්ටමට ගිහිල්ලා ඇහුවාම පෙනෙනවා, ප්‍රශ්නය ඉතා බරපතළ බව.

අද රටේ සෑම තැනකම වාගේ වර්ජන රැල්ලක් ඇති වෙලා තිබෙනවා. "ඒවා දේශපාලන කුමන්ත්‍රණ" කියලා අයින් වෙන්න අපට බැහැ. මිනිසුන්ගේ ජීවන තත්ත්වයේ ඇති වෙලා තිබෙන අර්බුදයක් නිසා තමයි එවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. කවුරු හරි ඒකට මූලිකත්වය ගන්නවා ඇති; දේශපාලන නායකත්වයක් දෙනවා ඇති. නමුත්, එසේ දේශපාලන නායකත්වයක් දෙන තරමේ බරපතළ පසුබිමක් රටේ අද ඇති වෙලා තිබෙනවා. මිනිසුන් අද ඇත්තටම අමාරුවෙන් ජීවත් වන බව අපි තේරුම් ගන්න ඕනෑ. මිනිසුන්ගේ ඉවසීම යම්කිසි සීමාවකට චිතරයි තිබෙන්නේ.

ඒ ඉවසීම ඇත්ත මහජන ව්‍යාපාරයක්, පක්ෂ දේශපාලනයෙන් තොරව බහුජන ව්‍යාපාරයක් වෙලා මතු වුණොත් ඊළඟට ඇති වෙන කැරැල්ල ඉතාම දරුණු වෙන්න පුළුවන්. මිනිස්සු දැන් ඒවාට පෙළ ගැහෙන්නේ නැත්තේ, මිනිස්සුන්ට එහෙමවත් පණක් කඳක් නැති නිසා. ඒ නිසා ආණ්ඩුව මේක මර්දනය කිරීම නොවෙයි කළ යුත්තේ. මේ සඳහා විසඳුමක් කල්පනා කරන්න කියලා මම කරුණාවෙන් රජයෙන් ඉල්ලා සිටිනවා.

උදාහරණයක් හැටියට ගත්තොත්, මේ වෙලාවේ ආණ්ඩුවට වැදගත් ප්‍රශ්න මොනවාද? Transgender අයට rights දෙන එක. ඒ වෙනුවෙන් ජනාධිපතිවරයා Supreme Court එක විවේචනය කරනවා. එතුමාට තිබෙන ප්‍රශ්න ඒවා. ඒවාද ප්‍රශ්න? සමලිංගිකයන්ගේ අයිතිවාසිකම්ද ප්‍රශ්න, ඒවාට පනත් ගේන එකද ප්‍රශ්න? මොනවාද මේ කථා කරන්නේ? රටේ මිනිස්සු හිනා වෙනවා, මිනිස්සුන්ට ඒවා විහිළු බවට පත් වෙලා තිබෙනවා. කිසිම හිතක් පපුවක් නැතිව, ආණ්ඩුවේ සාමූහික ප්‍රයත්නයක් නැතිව වැඩ කරන තත්ත්වයට අද ආණ්ඩුව පත්වෙලා තිබෙනවා.

මේ මොහොතේ රජයට වැදගත් වෙලා තිබෙන්නේ රටේ තිබෙන ප්‍රශ්න නොවෙයි, වෙනත් වෙනත් ප්‍රශ්න. වෙනත් වෙනත් කාරණා වෙත තමයි ආණ්ඩුවේ අවධානය යොමු කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම අපි රජයට යෝජනා කරලා තිබෙනවා රටේ ප්‍රශ්නවලට ප්‍රමුඛතාවක් දෙන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉල්ලා සිටින්නේ දේශපාලන පක්ෂ භේදයෙන් තොරව මිනිසුන්ගේ දුගීකම අරබයා විශේෂ සාකච්ඡාවක් සඳහා රජය මුල් වෙන්න ඕනෑ කියලා. අපට ස්වතන්ත්‍රව, ස්වාධීනව කටයුතු කරන්නත් පුළුවන්. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට මම ගිහින් කිව්වාම පාසල්වල මෙහෙම ප්‍රශ්නක් තිබෙනවා කියලා, මම විපක්ෂයේ හිටියත් එතුමා සෑහෙන උත්සාහයක් දැරුවා අපිත් එක්ක එකතු වෙලා ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන්නේ කොහොමද කියලා. මම විපක්ෂයේ හිටියත්, අධිකරණ විෂය භාර ඇමතිවරයා වන විජයදාස රාජපක්ෂ ඇමතිතුමාට මම කිව්වා, "මත් ද්‍රව්‍ය ප්‍රශ්නය විශේෂ ප්‍රශ්නයක්. අත්හදා බැලීමක් හැටියට බන්ධනාගාර ඇතුළේ පුනරුත්ථාපනයක් කරමු" කියලා. එතුමා ඒකට අවශ්‍ය පහසුකම මට ලබා දුන්නා. අපි

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

ඒක සාර්ථකව අවසන් කළා. නමුත්, ඒවා තනි පුද්ගලයන් හැටියට රතන හාමුදුරුවන්ට හෝ එක්කෙනෙකුට දෙන්නෙකුට කරන්න පුළුවන් දේවල් නොවෙයි. මේ සමාජයේ බරපතළකම තේරුම් අරගෙන, දේශපාලන භේදවලින් තොරව ඒ සඳහා ඉක්මන් සාකච්ඡාවක් අවශ්‍යයි. එහෙම නැත්නම් ඉක්මන් ජනාධිපතිවරණයකින් ජනතාවට තීරණයක් ගන්න අවස්ථාව ලබා දෙන්න අවශ්‍ය වෙනවා.

මම විශේෂයෙන්ම ප්‍රශ්න කිහිපයක් අහලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, poverty කියන එක යටතේ, websites විසින් ලෝකයේ දුප්පත්කම පිළිබඳව විමර්ශනය කළාම ලංකාවේ නම top ten countriesවලට දාලා තිබෙනවා. මම ඒක පිළිගන්නේ නැහැ. නමුත් එතැනට ඇවිල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය සකස් කළ මගේ නිලධාරියා වැරදීමකින් "UNESCO" කියලා ලියලා තිබෙනවා, නමුත් එය "UNICEF" විය යුතුයි. මම ඒක නිවැරදි කරලා එව්වත් ඔබතුමාට ලැබෙන්න ඇත්තේ කලින් එක වෙන්න පුළුවන්. රජය පිළිගන්නවාද UNICEF එකේ මේ වාර්තාව? මම ඒ වාර්තාවේ අන්තර්ගත කරුණු ඔබතුමාට මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමතියි. UNICEF එකෙන් දීපු ඒ වාර්තාවේ අඩංගු කරුණු මම අරගෙන ආවා. ඒක ඉතාම වැදගත් වෙනවා, මේ සභාවේ අවධානයට. ඒ අය කියන විධියට මිලියන 3.9ක්, ඒ කියන්නේ මිලියන 4ක් පමණ, - ලක්ෂ 40ක්- සාමාන්‍ය වැඩිහිටි ජනතාව ආහාර නොමැති තත්ත්වයෙන්, ඒ කියන්නේ කුසගිනිකාර තත්ත්වයෙන් පෙළෙනවා. ඒ වාගේම පවුල් 10,000ක් දරුණු විධියට ආහාර අහේනියෙන් පෙළෙනවා. පාවිච්චි කරලා තිබෙන්නේ "severe food insecurity" කියලා. ඒ වාගේම සාමාන්‍ය දරුවෝ ලක්ෂ 30ක් පාසල් යන්නේ නැහැ, කන්න නැති නිසා. අපි මොකක්ද මේ කරන්නේ? මොනවාද අපි කථා කරන්නේ? දැන් gender ප්‍රශ්නයද තිබෙන්නේ? සමලිංගිකයන්ගේ ප්‍රශ්නයද රජයට විසඳන්න තිබෙන්නේ? මොකක්ද මේ කරන්නේ?

අද මිනිස්සුන්ට ජීවත් වෙන්න විධියක් නැහැ. කාලගුණ විපර්යාසවලින් ගොවිතැනට විශාල හානි සිදු වෙනවා. විශේෂයෙන්ම ගොවි කලාපවලටත් වඩා දැන් අනෙක් පැතිවලට විශාල හානි සිද්ධ වෙනවා. ඒ නිසා ලෝකයේ ඇති වෙලා තිබෙන මේ තත්ත්වයත්, රට තුළ ඇති වෙලා තිබෙන අනාරක්ෂිත තත්ත්වයත් තේරුම් අරගෙන රජය මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි. අපට රට ගැන හිතට අමාරුයි. රජය කුමක් වුණත් ඒක රජය. නීත්‍යානුකූලව ඔබතුමන්ලා තමයි ආණ්ඩුව. මොන ප්‍රශ්න තිබුණත් මේ වාගේ බරපතළ ගැටලු සම්බන්ධයෙන් හරි එකතුවක් කරන්න. ඔබතුමන්ලාට හරි වැඩ පිළිවෙළක් තිබෙනවා නම් මම හිතන විධියට විපක්ෂයේ අය වුණත් සහයෝගය දෙයි, විශේෂයෙන්ම මිනිසුන්ගේ බඩගින්න සම්බන්ධයෙන්, මිනිසුන්ගේ දරිද්‍රතාව සම්බන්ධයෙන්. දත්ත, සංඛ්‍යාලේඛන ඇතිව, හිතක් පපුවක් තිබෙන මිනිස්සු හැටියට මේ පාර්ලිමේන්තුවේ මේ ප්‍රශ්නය ගැන හරියට කථා කරනවාද කියලා මම දන්නේ නැහැ.

UNICEF එකේ වාර්තාව ඔබතුමන්ලා පිළිගන්නවාද? ඒ වාගේම අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යාම පිළිබඳව යම්කිසි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවාද කියලා මේ සභාව දැනුවත් කරන ලෙස මම ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තූතියි.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අගමැතිතුමාගෙන් තමයි මේ ප්‍රශ්නය අහලා තිබුණේ. *[බාධා කිරීමක්]* ඊයේ හැන්දෑවේ තමයි අපේ අමාත්‍යාංශයට මේ ප්‍රශ්නය ලැබුණේ. දැනට ලැබුණු තොරතුරු අනුව මම මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙනවා. අමාත්‍යවරු මේ සම්බන්ධයෙන් වැඩිමනත් කරුණු එකතු කරාවි.

ගරු ස්වාමීන් වහන්සේ ඉදිරිපත් කළා, ආහාර අර්බුදය සහ මිල ගණන් ඉහළ යෑමේ ප්‍රශ්නය. මේ ප්‍රශ්නය කෙටි කාලීනව මාසයක්, මාස දෙකක් ඇතුළත විසඳන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ. ඒ වාගේම මෙය කෙටි කාලයක් තුළ ඇති වුණු ප්‍රශ්නයකුත් නොවෙයි. මේක, අපේ රටේ ඇති වුණු කොරෝනා වසංගතය නිසාත්, ඊට පස්සේ ඇති වුණු අරගළය නිසාත්, ඒ වාගේම කාබනික පොහොර ප්‍රතිපත්තිය නිසාත් ඇති වුණු ප්‍රශ්නයක්. කාබනික ප්‍රතිපත්තිය සියයට 100ක් ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා තමයි මේ ආහාර අර්බුදයට අපි සම්පූර්ණයෙන්ම මුල පුරන්නේ. මට මේ වගකීම පැවරෙනකොට සහල් නිෂ්පාදනයෙන් ගොවීන් ඈත් වෙලා හිටියේ. ගොවීන් හිටියේ ගොවි බිම්වල නොවෙයි, විරෝධතාවල, මහ පාරවල්වල. අපි ක්‍රමානුකූලව රසායනික පොහොර ලබා දීලා, කාබනික පොහොරත් ඒ ආකාරයෙන්ම ලබා දෙමින් මේ කටයුත්ත ආරම්භ කළා. ඒ අවස්ථාව වෙනකොට ගොවීන්ට කුඹුර සී සාන්න තෙල් ටිකවත් තිබුණේ නැහැ. ඔබවහන්සේ පිළිගන්න. සී සාන්න ඔවුන්ට තෙල් ටිකවත් තිබුණේ නැහැ. ඒ වැඩ කරගන්න ඔවුන්ට කිසිම ආකාරයකින් ශක්තියක් තිබුණේ නැති වෙලාවක තමයි අපි මේ අභියෝගය භාරගත්තේ. හැබැයි, අද ඒ තත්ත්වය අද යම් මට්ටමකට ගෙනැල්ලා තිබෙනවා.

2022 වර්ෂයේ අපේ සහල් අවශ්‍යතාවෙන් තුනෙන් එකක් අපි රට සහල් තමයි කෑවේ. සහල් මෙට්‍රික්ටොන් 24 ලක්ෂයක් විතර අපට ඕනෑ. අපි අට ලක්ෂ ගණනක් රටින් ගෙනැල්ලා තිබෙනවා, ආධාර විධියට වෙනම හම්බ වෙලාත් තිබෙනවා. එවැනි තත්ත්වයක් මත තමයි අපි මේ අභියෝගයට මුහුණ දුන්නේ. හැබැයි, අපි ක්‍රමානුකූලව ගොවීන්ට අවශ්‍ය පොහොර ටික දුන්නා, තෙල් ටික දුන්නා. ගොවීන්ට අවශ්‍ය අනෙක් පහසුකම් ටිකත් ලබා දුන්නා. ඒ වාගේම මම කියන්න කැමැතියි 2023 දී අපේ රටේ ජනතාවට අවශ්‍ය සහල් ටික අපි නිෂ්පාදනය කරලා දුන්න බව. 2024 වර්ෂයේත් එහෙමයි. අක්කර ලක්ෂ ගණනක් නියඟයෙන් විනාශ වුණත්, අක්කර ලක්ෂ ගණනක් ගංවතුරෙන් විනාශ වුණත්, අපට අවශ්‍ය සහල් ටික 2024 වර්ෂයේත් අපේ රටේ නිෂ්පාදනය වෙනවා. ඒ විතරක් නොවෙයි, සත්ව ආහාර සඳහාත් සහල් විශාල ප්‍රමාණයක් යොදා ගන්නවා. ඒක නීතියෙන් තහනම් වුණත්, ඒක අපි එව්වර සැලකිල්ලට ගත්තේ නැහැ. එහෙම නොවුණොත්, ඒවාටත් රටින් ගෙනැල්ලා දෙන්න වෙනවා. දැන් අපේ රටේ ජනතාවට විතරක් නොවෙයි, සතුන්ට අවශ්‍ය ආහාර ටිකත් අපි සැලකිය යුතු මට්ටමින් රට තුළ නිෂ්පාදනය කරගෙන යනවා. අපේ ගොවි ජනතාව අපේ කීම විශ්වාස කරලා, අපි දුන්නු සහනත් ප්‍රයෝජනයට අරගෙන ඒ අයගේ කැපවීම මත කුඹුරු අස්වද්දන්න පටන්ගෙන තිබෙනවා. දැන් හෙක්ටෙයාරයකින් ලැබෙන අස්වනු ප්‍රමාණයත් වැඩි වෙලා තිබෙනවා. අපේ දෙපාර්තමේන්තුවේ ඉන්න විශේෂඥයන්ගේ අඩු පාඩු තිබෙන්න පුළුවන්. මම පිළිගන්නවා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වුණත් තවම ඒ නියමිත මට්ටමට සකස් වෙලා නැති බව. ඒ ගොල්ලන්ගේත් අයිතිවාසිකම්, වැඩ වර්ජන, ඉල්ලීම් තිබුණා වුණාට, මේ වෙනුවෙන් තිබෙන කැපවීම මීට වඩා වැඩි වෙන්න ඕනෑ කියන එක මම පිළිගන්නවා. මේ තත්ත්වය තුළ වුණත් අක්කරයකින් ලැබෙන අස්වැන්න අද වැඩි වෙලා තිබෙනවා. කාලගුණික වශයෙන් මේ හානි ටික සිද්ධ වුණේ

නැත්නම්, මේ වන විට සහල් අතිරික්තයකට අපට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. කොහොම වුණත් අපි මේ කටයුත්ත කරනවා. හැබැයි, බාස්මති සහ කීරි සම්බාවලට ආදේශක විධියට පොඩි ප්‍රමාණයක් අපට පිටරටින් ගේන්න වෙනවා. මොකද, සංචාරක ව්‍යාපාරයේ විශාල දියුණුවක් ඇති වෙලා තිබෙන නිසා.

ඒ වාගේම ඔබවහන්සේ මෙහි කියා තිබුණා, එළවලු කිලෝව රුපියල් 500යි, 1,000යි කියලා. ඔව්, සමහර අවස්ථාවලදී කැරට් කිලෝව රුපියල් 3,000ටත් ඉහළ ගියා. ඒ වාගේම රුපියල් 150ටත් අඩු වෙලා තිබෙනවා. මේක ඉල්ලුම සහ සැපයුම අතර ක්‍රියාවලියක්. අපට හරි ලේසියි, මේ ගැන එළියේ ඉඳන් විවේචනය කරන්න. හරි ලේසියි, මේ ගැන පත්තරවලට ලියන්න. මේ සම්බන්ධයෙන් මාධ්‍යවලට කථා කරන්න ලේසියි. නමුත්, සුදුසු ක්‍රමයක් හදාගන්න ගියාම ඒක බොහොම අමාරුයි. ඉතින් ඒ නිසා මම ඔබවහන්සේටත් ආරාධනා කරනවා, මේ ගැන සාකච්ඡා කරන්න අපිත් එක්ක එකතු වෙන්න කියලා. ඔබවහන්සේ ඉල්ලන ඕනෑම වෙලාවක අපි ඒ අවස්ථාව දෙන්න සූදානම්. ඔබවහන්සේ එක්කත් කණ්ඩායමක් කටයුතු කරන බව අපි දන්නවා. අපි ඒක අවතක්සේරු කරන්නේ නැහැ. මේ පිළිබඳ යම් උනන්දුවක් දක්වන ස්වාමීන් වහන්සේ නමක් විධියට මේ ගැන සාකච්ඡා කරන්න ඔබවහන්සේ ඉල්ලන ඕනෑම වෙලාවක අපි අවස්ථාව ලබා දෙන්න කැමැතියි. විශේෂඥයන් කැඳවලා අපි මේ පිළිබඳව කථා කළා. විශ්වවිද්‍යාලවල කට්ටිය ගෙන්වලා කථා කළා. බාහිර සමාජයේ අය -පත්තරවලට ලියන අය- ගෙන්වලා මේ ගැන කථා කළා. ඒ කාටත් යම් යම් දේවල් ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ විවේචන තිබුණාට, සාර්ථක ක්‍රියාවලියකට අදහස් දුන්නේ බොහොම සුළු දෙනෙක් පමණයි. අපි ඒ සියලු අදහස් ප්‍රයෝජනයට ගත්තා. ඔබවහන්සේගෙන් මම දැනුත් කථා කරලා ඇහුවා නේ, "හාමුදුරුවනේ, එළවලුවල මිල මේ විධියට කොහේ හරි තිබෙනවාද?" කියලා. සාමාන්‍ය සිල්ලර කඩයකත්, රුපියල් 200ට 250ට තමයි එළවලු කිලෝවක් මේ වෙලාවේ විකිණෙන්නේ. එතකොට ගොවියාට ලැබෙන්නේ, රුපියල් 100ක වාගේ ලාභයක්. එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. එක පැත්තකින් ගොවියා ශක්තිමත් කරන්න යනකොට පාරිභෝගිකයා අමාරුවේ වැටෙනවා.

පාරිභෝගිකයන්ට සහන මිලට එළවලු දෙන්න ගත්තොත්, ඒකෙන් ගොවියා අමාරුවේ වැටෙනවා. ඒ නිසා මේක balance කරගන්න අපිත් විවිධ උත්සාහ දරනවා. අපි දෙපාර්තමේන්තුවලට, මේ ඉන්න විශේෂඥයෝ ඔක්කෝටම කිව්වා මේ සම්බන්ධව වැඩ පිළිවෙළක් හදන්න කියලා. මේක දේශපාලනඥයන්ට කරන්න පුළුවන් දෙයක් නොවෙයි. අපි ඒ අයට ඒ සඳහා සම්පූර්ණ නිදහස දුන්නා. අපි කිව්වා, "අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනත් හොයලා දෙන්නම්, මේකට ක්‍රමයක් හදන්න" කියලා. මෙතැනදි ගොවීන්ගේ විනය පිළිබඳවත් යම් ප්‍රශ්නයක් තිබෙනවා. එක සැරයක් මිල වැඩිවීමක් වුණොත් කොච්චර එපා කිව්වත්, ඊළඟ අවස්ථාවේ ඒ දේම වගා කරන්න ඒ අය කටයුතු කරනවා. ඒක තමයි තත්ත්වය.

ගරු (සූජ්‍ය) අතුරලියේ රතන හිමි
(මාණ්පුමිකු (ඛණ.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු එක කාරණයක් තමයි වස විසෙන් තොර ගොවිතැනට තීරණයක් ගත්ත නිසා තමයි මේක වුණේ කියන එක. ඒ තීරණය ගත්තේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව; ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලය. බැසිල් රාජපක්ෂ මහත්මයා ඇතුළු 45දෙනෙක් සභාපති කළා. එවකට අපි ආණ්ඩුවේ හිටියේ නැහැ. නමුත් ඒ චෝදනාව අපට දාලා තිබෙනවා, අපි ඒ විෂය භාරව හිටපු නිසා. ගරු ඇමතිතුමනි, 2017-2018 ඔබතුමා විෂය භාර ඇමතිව සිටි කාලයේ අපි ඔබතුමාත් එක්ක වැඩ කළා. අපි රසායනික පොහොර භාවිතය නැවැත්වුවේ නැහැ. අපි ඒවාට උපදෙස් දුන්නේත් නැහැ. රසායනික පොහොර භාවිතය නවත්වපු එක ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ සල්ලි නැති නිසා ගත්ත වල්බුරු තීරණයක්. ඒකට අපිත් පටලවලා වෙනම කථාවක් යනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන කාරණය මම පිළිගන්නවා. අපිට 2022 වර්ෂයේ හුහක් අමාරු කාලයක් තිබුණා. ඒක පියමං කරන්න ඔබතුමන්ලා සාමූහිකව ගත්ත ප්‍රයත්නය අපි අගය නොකරනවා නොවෙයි. රජයක් විධියට ඒ කෙටි කාලය තුළ රට අස්ථාවර නොවී පවත්වාගෙන යන්න ඒ ගත්ත තීරණ අපි අගය කරනවා. ඔබතුමා ධාන්‍ය උදාහරණයට අරගෙන බලන්න. මුං ඇට, කවුපි, කුරක්කන් ඇතුළු කිසිම දෙයක් කිලෝවක් රුපියල් 800ට වඩා අඩුවෙන් ගන්න බැහැ. ඇයි මේ රටේ මුං ඇට වවන්න බැරි? ඔබතුමාට මතක ඇති, කහ ගැන කියද්දි-

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු ස්වාමීන් වහන්ස, මම පිළිතුරු දුන්නාට පස්සේ ඔබවහන්සේ නැවත ප්‍රශ්න ඇහුවොත් හොඳයි කියලා මම හිතනවා. මම මේ සඳහා තිබෙන වැඩ පිළිවෙළ ඉදිරිපත් කරලා, ඕනෑ නම් ඔබවහන්සේට නැවත උත්තර දෙන්නම්. මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. අපට පළමුවැනි අභියෝගය තිබුණේ වී සම්බන්ධයෙන්. ඒ කියන්නේ බත් ටිකට. ගරු ස්වාමීන් වහන්ස, හාල් කිලෝව රුපියල් 500ට, 1,000ට කන්න වෙයි කියලා මාධ්‍යවල පළ වුණා ඔබවහන්සේට මතක ඇති. කෘෂිකර්ම විශේෂඥයෝ පවා එහෙම කිව්වා. බෙන්ස් කාර්වලින් හම්බන්තොට ගිහිල්ලා කිලෝව රුපියල් 200ට විතර කොළඹට වී අරගෙන ආවා. එහෙම යුගයක තමයි අපි මේ වගකීම භාරගත්තේ. එක පොහොර නැවක්වත් ගෙනෙන්න අපට සල්ලි තිබුණේ නැහැ. පළමුවැනි වතාවට ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ අපි පොහොර නැවක් ගෙන්වා ගත්තේ ඕමාන්වලින්. මේ දේශපාලන ව්‍යාපාරයේ ඉන්න සමහර කට්ටිය ඒක කඩාකප්පල් කරන්න ඇහුවා, Indian Credit Line එක ඕමාන් පොහොරවලට පාවිච්චි කරන්නේ කොහොමද කියලා. මම ඔබතුමන්ලාට චෝදනා කරන්නේ නැහැ. නමුත් ඒ අය ඉන්දියාවෙනුත් ප්‍රශ්න කරන්න ගත්තා. අපි සාමාන්‍ය සම්ප්‍රදායෙන් පිට ගිහිල්ලා ඕමාන් පොහොර ගෙනාවේ Indian Credit Line එකෙන්. එහෙමයි අපි මේ වැඩේ අමාරුවෙන් පටන් ගත්තේ. අපි - ආණ්ඩුව - එහෙම තමයි මඩ පොහොර ටික නොමිලේ දීලා, සුළු ගොවීන්ට පොහොර සහනාධාර දීලා, පොහොර මිල අඩු කරලා රට අමාරු තත්ත්වයකින් මේ තත්ත්වයට ගෙනාවේ. හැබැයි එදා මිලට අද භාණ්ඩ මිලදී ගන්න පුළුවන් කියනවා නම්, ඒක බොරුවක්. එතකොට ඩොලරයේ අගය තිබුණේ රුපියල් එකසිය ගණනට, දෙසීයට. ඊට පස්සේ ඩොලරයේ අගය තුන්සිය ගණන්වලට වැඩි වෙලා තිබිය දී අර පරණ මිලටම ආහාර ටික ගන්න පුළුවන් වේවි කියලා තවම හිතනවා නම්, ඒක එහෙම වෙයි කියලා මම නම් හිතන්නේ නැහැ. අපි ගොවියාත් ආරක්ෂා කරගෙන, පාරිභෝගිකයාත් ආරක්ෂා කරන්න ඕනෑ.

පළමුවැනි සහල් අභියෝගය අපි ජයග්‍රහණය කරලා තිබෙනවා. ගරු ස්වාමීන් වහන්ස, ඔබවහන්සේ කිව්වා වාගේ ඊළඟට මුං ඇට සහ අනෙකුත් වගාවලට අපේ අවධානය යොමු කර තිබෙනවා. මේ කන්නයේම අතරමැදි කන්නයත්, ඒ කියන්නේ කන්න තුනක් වගා කරන වැඩසටහන ආරම්භ කරනවා. අපි ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර දී තිබෙනවා. මූලිකම අවශ්‍යතාව විධියට ගොවීන්ගේ ඉල්ලීම වෙලා තිබෙන්නේ මුං ඇට බීජ ටික නොමිලේ ලබා දෙන්න කියන එකයි. එක්කෝ නොමිලේ හරි, බැරිම වුණොත් සියයට 50ක සහනාධාරයක් යටතේ හරි අපි ඒ බීජ ටික ලබා දෙනවා. ඒ අනුව මේ රටට අවශ්‍ය මුං ඇට ප්‍රමාණය පිළිබඳව තක්සේරුවක් කරලා, ඒ සඳහා අවශ්‍ය මුළු භූමි ප්‍රමාණය තුළ මුං ඇට වගා කරන්න ඊළඟ මාසය ඇතුළත අපි ඒ සහනය ලබා දෙනවා. ගරු ස්වාමීන් වහන්ස, මුං ඇට කවුපි වැනි බෝග වගා කරන්න වැස්ස වැඩි වුණත් අමාරුයි, වැස්ස නැති

[ගරු මහින්ද අමරවීර මහතා]

වුණත් අමාරුයි කියන එක ඔබවහන්සේත් දන්නවා. ඒ වාගේම එවාට දිලීර රෝග හැදෙන්න ඉඩ තිබෙනවා. අපට එහෙම හානියක් නොවේවායි කියන ප්‍රාර්ථනයයි මට තිබෙන්නේ. එහෙම ආපදාවක් නොවුණොත් අපි සහලින් ස්වයංපෝෂිත වුණා වාගේම මුං ඇටවලින් ස්වයංපෝෂිත වෙන වර්ෂයක් බවට මේ වසර පත් කරනවා. ගොවි ජනතාව වෙනුවෙන් ගිය සතිය වෙනකොට අනුමැතියක් අරගෙන ගොවි භාර අරමුදලේ සල්ලිවලින් ඒකට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න අපි කටයුතු කළා. අතුරු කන්නයේ; තුන්වැනි කන්නයේ අනෙකුත් වගාවන් කරන්න කවුරු හරි ඉන්නවා නම්, අපි ඒ ආකාරයෙන්ම ඒ අයටත් එම සහනය ලබා දෙන්න කටයුතු කරනවා.

ඊට අතිරේකව අපි ගෙවතු වගාව ප්‍රසිද්ධ නොකළාට, ගෙවතු ලක්ෂ තුනක් හදන වැඩ පිළිවෙළට මේ වන විටත් අධාර දීගෙන යනවා. ඒක ගම් මට්ටමින් ක්‍රමානුකූලව ක්‍රියාත්මක වෙනවා. ඒවායේ මෙතෙක් තිබුණු අසාර්ථකත්වය සම්බන්ධයෙන් ප්‍රචාරයක් ගියා, "ඇට ටිකක් දුන්නා. පැළ ටිකක් දුන්නා. එතැනින් නතර වුණා" කියලා.

දැන් එහෙම නොවෙයි. තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන 160ක් දැන් හදනවා. මම පසුගිය දවස් තුනේම කෑගල්ල, නුවර, නුවරඑළිය වැනි ප්‍රදේශවල හිටියේ. මම මේ හැම තැනම දවස් හතරක් ඇවිද්දා. ඒකයි මම කිව්වේ ඒ පැතිවල ගොවීන්ට එළවලු මිල අඩුයි කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ කියලා. සමහර කට්ටියට මිලක් තිබෙනවා. අපි ඒ කාරණයට ප්‍රවේශ වෙනවා. දැන් එළවලු වගාව සාමාන්‍ය මට්ටමට ඇවිල්ලා තිබෙනවා. අපට තිබෙන ප්‍රශ්නය මෙකයි. මිල වැඩි වුණොත් ඒකේ වාසිය යන්නේ ගොවියාට. හැබැයි, මිල අඩු වුණොත් ගොවියා ගොවිතැනෙන් අයින් වෙනවා. ඒ අභියෝගය තමයි මට ප්‍රධාන වශයෙන්ම තිබෙන්නේ. අපි ඒකට දැනටමත් මුහුණ දෙමින් සිටිනවා. ඒ වාගේම පිට රටින් එළවලු ගෙනැල්ලා අපි කන්න දෙන්නේ නැහැ. මේ රටේම එළවලු තමයි අපි ජනතාවට කන්න දෙන්නේ.

ඊළඟට, රිළා ප්‍රශ්නය සහ වඳුරන්ගේ ප්‍රශ්නය ගැන ඔබවහන්සේ කිව්වා. මේ පිළිබඳව අපි ඇති වෙන්න කථා කරලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ මමත් මේ ගැන කථා කරලා තිබෙනවා; හැමෝම කථා කරලා තිබෙනවා; සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, මේකට නිවැරදි විසඳුමක් අපට දීලා තිබෙන්නේ කවුද? මේකට විසඳුම් හොයා ගෙන අපට ඉදිරිපත් කරන්න කියලා අපි වෙනම කමිටුවක් පත් කළා. 2018දී මම මාස ගණනක් කෘෂිකර්ම ඇමති විධියට කටයුතු කළා. හෙක්ටර් කොඹඹැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයෙන් වාර්තාවක් දීලා තිබෙනවා, ඒ කරපු සමීක්ෂණය අනුව ඒ ප්‍රදේශවල විතරක් පොල් ගෙඩි මිලියන 200ක් වර්ෂයකට අහිමි වෙනවා කියලා. මුළු ලංකාව පුරා බැලුවොත්, එතකොට ඊටත් වඩා වැඩි වෙන්න පුළුවන්. මේ සත්ව හානිය කියන එක බරපතළ හානියක්. මේ ගැන ඔබවහන්සේත් කථා කරනවා; මමත් කථා කරනවා; මේ ඉන්න හැමෝම කථා කරනවා. එහෙත් අද වනතෙක් කිසිම කෙනෙක් ක්‍රියාත්මක කරන්න පුළුවන් විසඳුමක් ලබා දීලා නැහැ. මේ වෙනුවෙන් පෙනී සිටින්න කණ්ඩායම් ඕනෑ තරම් ඉන්නවා. ඒ කියන්නේ, මේ සත්තු වෙනුවෙන් පෙනී හිටින.

ඔබවහන්සේත් දන්නවා ඇති, එක වතාවක් චීනය රිළවි ලක්ෂයක් ඉල්ලපු බව. චීන සමාගමකින් ඇවිල්ලා ඒ ගැන කථා කළා. චීනයේ සත්වෝද්‍යාන 18,000ක් විතර තිබෙනවා. මේවාට ගෙනියන්න තමයි ඒ ඉල්ලුවේ. හැබැයි, කිව්වේ මොකක්ද? ඒ වෙලාවේ මාධ්‍ය හැම තැනම ප්‍රචාරය කළේ ඒ සතුන්ගේ මොළ කන්න ගෙනියනවා, මස් කන්න ගෙනියනවා කියලායි. මේ සත්ව හානිය පිළිබඳව කණ්ඩායම් ඇවිල්ලා හැම තැනම කථා කරන්න ගත්තා. ඒ විතරක් නොවෙයි, අධිකරණයටත් ගියා. අධිකරණයට ගිහිල්ලා දැන් ඒක නතර කරලා තිබෙනවා. මම ඒ සංවිධාන වෙනම ගෙන්වලා ඒ අයත් එක්ක කථා කළා. එතකොට මම වනජීවී හා වන සම්පත් සංරක්ෂණ ඇමති විධියට තමයි කටයුතු කළේ. ඇත්තටම එතැනට තමයි මේ කාරණය වඩාත් අදාළ වන්නේ. මොකද, කෘෂිකර්මයට හානි සිද්ධ වුණාට ඒ ගොල්ලන් තමයි ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ වෙලාවේ සත්ව හිංසාව වෙනුවෙන් පෙනී සිටින සංවිධාන ඔක්කොම ගෙන්වලා කථා කළා. මොකක්ද ඒ අය කියන්නේ? එක්කෙනෙක් කිව්වා, අක්කර 5ක් වගා කරනවා නම් භාගයක් සත්තුන්ට ඉතුරු කරන්න කියලා. මේක කරන්න පුළුවන්ද? එතකොට මම ඇහුවා, ඒ භාගය විතර ද සත්තු කන්නේ කියලා. තව කෙනෙක් කිව්වා, වටේට සාරි එල්ලන්න කියලා. තව කෙනෙක් කිව්වා, පොල් ගස්වලට තහඩු බඳින්න කියලා. තව කෙනෙක් කිව්වා, ඉටි රෙදි අදින්න කියලා. මේ වාගේ ඒවා ඇරෙන්න කිසිම සාධනීය යෝජනාවක් ඉදිරිපත් වුණේ නැහැ.

හාමුදුරුවනේ, මේ සත්ව ගහනය අඩු කරන්නම වෙනවා. ලෝකයේ රටවල් එහෙමයි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ; එහෙමයි ක්‍රියා කරලා තිබෙන්නේ. ලෝකයේ රටවල සත්තු වැඩි වෙනකොට ඒ ප්‍රමාණය අඩු කරලා තිබෙනවා. ඔබවහන්සේ දන්නවා, තල්මසුන් අපට ආරක්ෂිත සත්වයෙක් බව. ඒ වුණාට නෝර්වේ රාජ්‍යයේ එක කාලයට තල්මසුන් මරන්න ඉඩ දෙනවා. ඕස්ට්‍රේලියාවේ ජාතික සත්වයා කැන්ගරුවා. ඔවුන් කැන්ගරුවන් මිලියන ගණනක් මරලා දැම්මා. ඒ විධියට සත්තු මරනවා. ජර්මනියේ මුවෝ, ෆෝන්නු වැඩි කාලයට ලයිසන් දීලා මරනවා. එහෙම තමයි ඒ රටවල් මේවා පාලනය කර ගත්තේ. ඒවා තාක්ෂණය පැත්තෙන් කොච්චර දියුණු වෙච්ච රටවල්ද? අපේ රටේ සත්තු රට යවන්න හැදුවාම ඒකට ඉඩ දෙන්නෙත් නැහැ. සත්ව හානි සිදු වෙනවාය කියලා ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. මේ සඳහා මම යෝජනාවලියක් හදලා තිබෙනවා. ඒක මේ පාර්ලිමේන්තුවේවත්, එළියේවත් මට කියන්න පුළුවන්කමක් නැහැ. මොකද, ආයෙත් නඩු දාලා මේක නවත්වා ගන්න නිසා. මේ සතුන් වෙනුවෙන් පෙනී සිටිනවා වාගේම මේ සතුන්ගෙන් වන හානිය නිසා ඕනිස්සු විඳින කරදරය, වේදනාව ඒ ප්‍රදේශවල ඇවිදින කෙනෙක් විධියට මම හොඳටම දන්නවා. ඒ වෙනුවෙන් මම යෝජනාවලියක් සකස් කරමින් තිබෙනවා. ඉදිරි දිනවල මම ඒක කැබිනට් මණ්ඩලයට යොමු කරලා අවශ්‍ය අනුමැතිය ගන්නවා. මම මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටින්නේ, ඒ වාගේ දේවල දී අපට සහයෝගය දෙන්න කියලායි. මම දන්නවා, ගිය වතාවේ වුණත් අපි ඒ කරන කටයුතුවලට විරුද්ධ පක්ෂයෙන් අපට විරුද්ධත්වයක් එල්ල වුණේ නැති බව. මොකද, ඒ අයටත් මේ කාරණය වැටහෙනවා. කෙසේ හෝ මගේ ඊළඟ ප්‍රධාන උත්සාහය අපි අලුතින් වගා නොකළත්, මේ සතුන්ගෙන් - රිළවා, වඳුරා, ඉත්තෑවා, දඩුලේනා, මොනරා, වල් ඌරා ආදී සතුන්ගෙන්- වන හානිය වළක්වා ගත්තොත් අපට අවශ්‍ය ආහාර ප්‍රමාණය අපේ රට තුළම නිෂ්පාදනය කරගන්න පුළුවන් වෙනවා. අපට අපනයනය කරන්න පුළුවන් තත්ත්වයට ආහාර නිෂ්පාදනය කරගන්නත් පුළුවන්කම ලැබෙනවා.

ඔබවහන්සේගේ ප්‍රශ්නයට මීට වඩා පිළිතුරක් දෙන්න මම අපේක්ෂා කරන්නේ නැහැ. මට තව ගොඩක් වෙලාව තිබෙන නිසා අවශ්‍ය නම් පිළිතුරු දෙන්නත් පුළුවන්. අපි පිළිගන්නවා, දුප්පත්කම තිබෙනවා කියලා. අපේ රටේ මන්දපෝෂණ තත්ත්වයේ වැඩිවීමක් තිබුණා. ජනතාවට කන්න නැති තත්ත්වයට පත් වුණා. ඒ නිසා තමයි මේ වගකීම භාරගෙන කටයුතු කරගෙන යන්නේ. දැන් ඒ තිබුණ තත්ත්වය ක්‍රමානුකූලව යම් මට්ටමකට පත් වෙලා තිබෙනවා.

දැන් රුපියල් 500ට හාල් ගන්න ඕනෑ නැහැ. ඒ තත්ත්වයට අපි දැන් රට ගෙනැත් තිබෙනවා. ඒ නිසා අපි ඉදිරි කාලය තුළ අනෙකුත් වගා පිළිබඳවත් අවධානය යොමු කරනවා. සහලින් ස්වයංපෝෂිත වෙනකොට ධාන්‍ය වර්ග, අර්තාපල්, ලූනු වගාව කෙරෙහිත් අපේ අවධානය යොමු කරනවා. විශේෂයෙන් රතු ලූනු වගාව ව්‍යාප්ත කරන වැඩ පිළිවෙළ අපි දියත් කරනවා. බී ලූනු වගාව ව්‍යාප්ත කිරීම ටිකක් අමාරුයි. අර්තාපල් වගාව වැඩිදියුණු කරන්න පුළුවන්. අල වර්ග 100ක් විතර අපට හදාගන්න පුළුවන්. ඒවා කෙරෙහි තමයි දැන් අපි අවධානය යොමු කරන්නේ. අපි මූලිකම දේ ඉෂ්ට කළා. මේ දේත් අපි ඉෂ්ට කරනවා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
යුනිසෙෆ් වාර්තාවේ කියන්නේ ලක්ෂ 30ක් කියලා. ඔබතුමන්ලා ඒක පිළිගන්නවාද?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
වාර්තා සහ ගණන් හිලව් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ, හාමුදුරුවනේ. හැම කෙනෙක්ම දන්නවා, මිනිස්සුන්ට අමාරුයි කියලා. කාලයක් තිබුණා, තුන්වේල කාපු අය දෙවේල කාපු. ඒ වාගේම දෙවේල කාපු අය එක වේල කෑවා. ඒක ඇත්ත. ඒ තත්ත්වයෙන් මිදිලා ක්‍රමානුකූලව ඉදිරියට යන්න තමයි අපි මේ හදන්නේ. අපි මේ වාර්තාව පිළිගන්නවා. අපි පිළිගන්න සමහර වාර්තා තිබෙනවා. ඒවායේ තිබෙන සමහර කාරණා අපි පිළිගන්නවා. හැබැයි, ඒවාට විසඳුම් තමයි අපි සොයන්න ඕනෑ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනටම සෑහෙන කාලයක් ගතවී තිබෙනවා. ඒ නිසා දිවා ආහාර විවේකය සඳහා තිබෙන වේලාවත් විවාදයට ලබා දෙන්න කියා අපි ගරු සභානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දිවා ආහාර විවේකයෙන් තොරව විවාදයේ කටයුතු පවත්වාගෙන යාමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අහන ලද ප්‍රශ්නයට අදාළව ඔය කියන යුනිසෙෆ් වාර්තාව ඉදිරිපත් කළේ මගේ ප්‍රධානත්වයෙන් BMICH එකේදී. ඒ වාර්තාවේ තිබෙන පාසල් දරුවන් හා සම්බන්ධ වැඩ පිළිවෙළ අපි අද ක්‍රියාත්මක කරලා තිබෙනවා. මේ අවුරුද්දේ ප්‍රාථමික අංශයේ දරුවන් මිලියන 1.7කට අපි දිවා ආහාරය ලබා දෙනවා. අපි ඒක ලබන අවුරුද්දේ තවත් වැඩි කරනවා. ඒකත් ඒ වාර්තාවේ තිබෙන එක කාරණාවකට අපේ අවධානය යොමු කිරීමක් හැටියට සලකන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිස්ස විතාරණ මැතිතුමාගේ නොපැමිණීමේ අවසරය පිළිබඳ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

නොපැමිණීමේ අවසරය: ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
வராதிருக்க அனுமதி: மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண
LEAVE OF ABSENCE: HON. (PROF.) TISSA VITARANA

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66(ඊ) ව්‍යවස්ථාව යටතේ, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතාට 2024 ජූලි 09 දින සිට මාස තුනක කාලයක් තුළ පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතු යැයි මම යෝජනා කරමි. "

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ ඇමතිතුමා.

වරප්‍රසාද: 2024.06.19 දින පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශය පිළිබඳව අධිකරණ සේවා සංගමයේ සභාපති සහ ලේකම් නිකුත් කළ මාධ්‍ය නිවේදනය

சிறப்புரிமை: 2024.06.19ஆம் திகதி பாராளுமன்றத்தில் கூறிய கூற்று தொடர்பான நீதிச் சேவைகள் சங்கத்தின் தலைவர் மற்றும் செயலாளரின் ஊடக அறிக்கை

PRIVILEGE: PRESS RELEASE BY CHAIRMAN AND SECRETARY OF JUDICIAL SERIVICE ASSOCIATION REGARDING COMMENTS IN PARLIAMENT ON 19.06.2024

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)

(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - *நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்*)

(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන ගමන්ම මම සිහිපත් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් එවපු ලිපිය සභාගත කිරීම සම්බන්ධ කාරණය මතු කරද්දී මම එතුමාත් එක්ක එකඟ වුණා. මොකද, පාර්ලිමේන්තු සම්ප්‍රදාය වාගේම ඕනෑම ආයතනයක පවතින සම්ප්‍රදාය තමයි, ප්‍රශ්නයක් ඉදිරිපත් කළාට පසු උත්තරයක් ඉදිරිපත් කිරීම. කොහොම නමුත් දැන් උත්තරය ඉදිරිපත් කරලා තිබෙනවා. ඊට පසුව තමයි මම දැන් ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ. ඒ උත්තරය ඉදිරිපත් කිරීම ගැන මම සතුටු වෙනවා. හේතුව මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ඉදිරිපත් කරපු වරප්‍රසාද ප්‍රශ්නය රහසිගත ලේඛනයක් නොවෙයි. මම මෙහි පිටපතක් අධිකරණ සේවා කොමිෂන් සභාවට යැව්වා. ඒ වාගේම ගරු ජනාධිපතිතුමාටත් යැව්වා. ඒකට කොමිෂන් සභාව ප්‍රතිචාර දක්වපු නිසා වඩාත් පැහැදිලිව කරුණු අවබෝධ කර ගැනීමට ජනතාවට අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ ස්තුතිය මේ අවස්ථාවේ කොමිෂන් සභාවට පළ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන අතර, 2024 ජූනි 19වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දයාසිරි ජයසේකර මහතා විසින් අධිකරණයට අදාළව නඟන ලද ප්‍රශ්න කිහිපයක් අලලා පිළිතුරු දෙමින් පහත සඳහන් කරුණු පිළිබඳ තොරතුරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළෙමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණයෙන් අහන්න බැරි ප්‍රශ්න ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා අහන්නේ අධිකරණ ඇමතිතුමාගෙන්. ඒ නිසා අධිකරණ අමැතිතුමාගේ වගකීමක් ඉටු කිරීමක් විධියට තමයි මම මීට පිළිතුරු ලබා දුන්නේ. මම ඉදිරිපත් කළ කරුණු අතර පහත සඳහන් කරුණු ද සඳහන් කළෙමි.

1. ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුවරයා හැර අනෙකුත් විනිසුරුවරුන් සඳහා වන ඇබෑර්තුවක කිසිදු තනතුරක් පිරවීමෙන් ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා සහ ගරු කථානායකවරයාගේ සභාපතිත්වයෙන් යුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සියලු සාමාජිකයන් වළක්වාලමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කර ඇති අතුරු නියෝගය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් පත් කිරීම සම්බන්ධව වන 41අ. ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අත්හිටුවීමක් වන බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුළුමනින්ම හෝ එහි කොටසක් හෝ අත්හිටුවීම සඳහා නියෝගයක් ලබා දීමට කිසිදු අධිකරණයකට අධිකරණ බලයක් නොමැති බවත් මම සඳහන් කළා.

මීට පෙර එවැනි අවස්ථාවක් වූයේ දෙවන ලෝක යුද්ධය ආරම්භයේ ජර්මනියේ ඇඩොල්ෆ් හිට්ලර් වේමර්ස් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිවිල් අයිතිවාසිකම් පරිච්ඡේදය අත්හිටුවීමයි කියන කාරණයත් මා සඳහන් කළා.

2. වර්තමාන ගරු දිසා විනිසුරුතුමිය ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ පිහිටි නිල නිවසට පැමිණීමට පෙර එහි සිටි මහෙස්ත්‍රාත්වරයා එම අධිකරණයේ නිල නිවසට අධිකරණ ආරක්ෂක මුර කුටියේ පැවති විදුලි රැහැන්වලින් නීති විරෝධී ලෙස විදුලිය සැපයීමක් සිදු කර ඇති බවට පැමිණිලිකොට ඇත. ඊට පෙර එම අනවසර විදුලි රැහැන්වලින් විදුලි කාර්මිකයෙකුට විදුලි සැර වැදී බරපතළ ජීවිත අනතුරකට පත්ව අපහසුවෙන් ජීවිතය බේරාගත් බව ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ කාර්ය මණ්ඩලය 2024.04.16වන දින මා වෙත දන්වා සිටින ලදී. එකී කාරණා ගරු දිසා විනිසුරුතුමිය කොළඹ මහාධිකරණ විනිසුරුතුමාට දන්වා සිටියත්, ඒ පිළිබඳ විමර්ශනය කිරීමේ බලයක් එතුමාට නොතිබූ බව දන්වා එම බලය ඇත්තේ අධිකරණ අමාත්‍යාංශයට බව දන්වා ඇත.

ඒ පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා, අතිරේක ලේකම් (පාලන), අතිරේක ලේකම් (ඉංජිනේරු) යන නිලධාරීන් පත්කොට ලබාගත් වාර්තා අනුව අධිකරණ සංකීර්ණයේ විදුලි පද්ධතියේ විදුලි රැහැන්වලින් නීති විරෝධී ලෙස විනිසුරු බංගලාවට විදුලිය ලබාගෙන ඇති බවත්, එම ආකාරයෙන්ම අධිකරණ සංකීර්ණයේ ජල ටැංකියට ද සූක්ෂ්ම ලෙස විදුලි රැහැන් ඇද සම්බන්ධකොට තිබූ බවත් වාර්තාකොට ඇත. තවද, අධිකරණ පද්ධතියේ ජල නළ පද්ධතියෙන් ද එම ආකාරයෙන්ම නීති විරෝධී ලෙස ජල නළයක් සවිකොට ජලය ලබාගෙන තිබූ අයුරු තහවුරුකොට ඇත.

අදාළ සියලු ලිපිලේඛන 2024.05.03වන දින අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට භාර දුන් නමුත්, ඔහු කිසිදු පියවරක් ගෙන නොතිබූ අතර එම සිද්ධිය අලලා අධිකරණය බරපතළ ලෙස මාධ්‍ය තුළින් විවේචනයට ලක් විය. එසේ හෙයින් එම කාරණය පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කිරීම මාගේ යුතුකමක් වූ හෙයින් මම එම ප්‍රකාශය සිදු කළෙමි.

3. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 වසරේ මැද භාගයේ සිට 2024 වසර දක්වා කාලය තුළ කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ කාමරයේ තිබූ රුපියල් කෝටි 20ක් පමණ වටිනා විස්කි තොගයක් නඩු භාණ්ඩ කාමරය හොරුන් කඩා ඉවත් කරගෙන ගොස් ඇති බවට නිලධාරීන් පැමිණිලිකොට තිබුණත්, එම දොර විවෘත කර ඇත්තේ එම දොරේ සවිකර තිබූ ලොක් එකේ නියමිත යතුරෙන් බව රජයේ රස පරීක්ෂකවරයා වාර්තාකොට ඇත. එහි බරපතළ වංචාවක් සිදු වී ඇති නමුත් එහි සිටි විනිසුරුවරයා හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව කිසිදු පියවරක් නොගෙන ඇති අතර එය අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයා විසින් යටගසා ඇති බව එහි සේවය කරන නීතිඥ කණ්ඩායමක් මා වෙත ලිඛිතව දැනුම් දී ඇත.

4. කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ අභිනවයෙන් වැඩ භාරගත් මහෙස්ත්‍රාත්තුමා සොයාගෙන තිබුණේ එහි පවතින සේවකයින් විසින් රාජකාරි වාර්තා කිරීම සඳහා පවත්වාගෙන යන ඇඟිලි සලකුණු යන්ත්‍රයේ වෙලාව පැය භාගයක් අඩුකොට වංචනික ලෙස සකස් කර ඇති බවය. ඒ පිළිබඳව ජනමාධ්‍යයෙන් ද විශාල ප්‍රචාරයක් ලැබුණි.

5. කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නීතිඥවරු ජනාධිපති ලේකම්තුමාට භාර දී ඇති ලේඛනයේ සඳහන් පරිදි හෙරොයින්, අයිස්, ගංජා වැනි මත් ද්‍රව්‍ය ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් නඩු 16ක තොරතුරු අනුව එම වැරදිවලට දඬුවම් ලෙස රුපියල් 1,000ක දඩයක් නියමකොට එය නොගෙවුවහොත් එදිනම සවස 2ට හෝ 3ට මුදා හරින ලෙස නියෝගකොට ඇත. ගල්කිස්ස අධිකරණයේ අනවසරයෙන් විදුලිය සහ ජලය ගැනීම සම්බන්ධව චෝදනා ඇත්තේ ද එම විනිසුරුවරයාට එරෙහිවය.

මෙම කාරණය මා විසින් ඉදිරිපත් කළ අතර එහි සඳහන් යම් කාරණා සම්බන්ධව නීතිමය තත්ත්වය පැහැදිලි කිරීමක් සභානායක සහ අධ්‍යාපන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා විසින් ද සිදු කරන ලදී.

එකී ප්‍රකාශය සම්බන්ධව අධිකරණ සේවා සංගමයේ සභාපති ලෙස දිසා විනිසුරු ගරු රුවන් දිසානායක මහතා සහ ලේකම් ලෙස ගරු ඉසුරු නෙත්තිකුමාරගේ මහතා විසින් 2024 ජූනි 24වන දින නිකුත් කර ඇති මාධ්‍ය නිවේදනය අනුව මා විසින් එය වගකීම් විරහිතව, වෛරී සහගතව සිදු කරන ලද්දක් බව සඳහන් කර ඇත. තවද එය අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයා ඉවත් කිරීම සඳහා සිදු කළ ව්‍යාපෘතියක් ලෙස ද හඳුන්වා ඇත.

ඉහත කී චෝදනාවලට එම කොමිසමේ ලේකම්වරයාගේ යම් රැකවරණයක් ලැබී ඇති බව එම නිවේදනය මඟින්ම තහවුරු කර ඇත. එම මාධ්‍ය නිවේදනයේ පිටපතක් " X 1" ලෙස මීට අමුණා ඉදිරිපත් කරමි.

2010 සැප්තැම්බර් 01 දින අධිකරණ සේවා කොමිෂන් සභාව නිකුත් කළ අංක 328 දරන චක්‍රලේඛය මඟින් සියලුම දිසා අධිකරණ විනිසුරුවරු සහ මහෙස්ත්‍රාත්වරු වෙත දන්වා ඇත්තේ ප්‍රසිද්ධ ප්‍රකාශ සිදු කිරීමෙන් එම විනිසුරුවරුන් වැළකී සිටිය යුතු බවත්, එය උල්ලංඝනය කළහොත් විනයානුකූල පියවර ගන්නා බවත් ය.

2016 සැප්තැම්බර් 30 දින එවකට අගවිනිසුරුවරයා විසින් නිකුත් කර ඇති 2016 අංක 02 දරන චක්‍රලේඛයේ 05 වන සහ 06 වන වගන්තිවල මෙසේ සඳහන්ය.

> “05. Every High Court Judge shall not appear or release any statement to the print or electronic media including social media network.
>
> 06. Every High Court Judge shall not make unnecessary or irrelevant comments/utterances/ statements during court proceedings”

එය උල්ලංඝනය කළහොත් විනයානුකූල පියවර ගන්නා බව ද සඳහන්ව ඇත.

ඉහත කී චක්‍රලේඛන දෙකෙහි පිටපත් "X 2" සහ "X 3" ලෙස මීට අමුණා ඇත.

මා විසින් සඳහන් කළ ඉහත කී සාපරාධී ක්‍රියා සම්බන්ධව මේ වනවිටත් පරීක්ෂණ ආරම්භ කර තිබියදී එම පරීක්ෂණ ක්‍රියාවලිය කඩාකප්පල්කොට යුක්තිය ඉටු කිරීමේ ක්‍රියාවලිය අඩපණ කිරීමේ උත්සාහයක් එම මාධ්‍ය නිවේදනය නිකුත් කළ විනිසුරුවරුන් දෙදෙනා විසින් සිදු කරමින් සිටී.

මීට පෙරද අවස්ථා ගණනකදී නෙත්තිකුමාරගේ විනිසුරුවරයා ඉහත කී සිද්ධිවලට අදාළ විමර්ශන කඩාකප්පල් කිරීම සඳහා මාධ්‍ය නිවේදන නිකුත් කළ අතර ඔහු අධිකරණ සේවා කොමිසමට ලියන ලද ලිපි කොමිසමට භාර දීමට පෙර එක් දේශපාලන පක්ෂයක් විසින් ඔවුන්ගේ මාධ්‍ය සාකච්ඡාවලදී පෙන්වා සිටියේය.

ඉහත කී ගරු ඉසුරු නෙත්තිකුමාරගේ මහතා ගාල්ල මහෙස්ත්‍රාත්වරයා ලෙස සිදු කරන ලද නීති විරෝධී ක්‍රියාවන් රාශියක් ගාල්ල අධිකරණයේ නීතිඥවරුන් අධිකරණ සේවා කොමිෂන් සභාවට පැමිණිලි කළ නමුත් කොමිෂන් සභාව කිසිදු පියවරක් නොගත් බවත් මා වෙත දන්වා ඇත.

ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියෙකු වන භාරත තෙන්නකෝන් මහතා විසින් "සුදුපාට ගැන්ස්ටර්ස්" නමින් සමාජ මාධ්‍යයට මුදාහළ විනාඩි 30යි තත්පර 56ක වීඩියෝ පටය පසුගිය ජනවාරි මාසයේ සිට සමාජ මාධ්‍යයේ සංසරණය වේ. කරාපිටිය මහ රෝහලේ ඉතා ගෞරවනීය විශේෂඥ පිළිකා ශල්‍ය වෛද්‍යවරයෙකු වන ක්‍රිෂාන්ත පෙරේරා මහතා එම රෝහලේ ජවිපෙ වෘත්තීය සමිති සාමාජිකයෙකු වන කම්කරුවෙකුගේ හැසිරීම පිළිබඳව පැමිණිල්ලක් කළ නමුත් වෛද්‍යවරයා වූදිතයෙකුකොට ඔහු එම සුළු සේවකයා හට පහර දුන් බවට සුළු පැමිණිල්ලක් ඉදිරිපත් වූ බවත්, එය සමථ මණ්ඩලයකින් පවා සමථ කළ හැකිව තිබූ බවත් සඳහන් කරයි. එහෙත් ගාල්ල මහෙස්ත්‍රාත්වරයා අංක 23835 දරන එම නඩුව විමසුමට ගත් අවස්ථාවේදී කටයුතු කරන ලද්දේ විනිසුරුවරයෙකු ලෙස නොව වණ්ඩියෙකු ලෙසින් මුළුමනින්ම යුක්තිය අපගමනය වන ලෙස බව සඳහන්කොට ඇත. විනිසුරුවරයා එම වෛද්‍යවරයා අමතමින් "මම තමුසෙට පාඩමක් උගන්නන්නම්, තමුසෙට මේ නඩුව ඇපිල් කරන්නත් බෑ" යනුවෙන් පවසා වෛද්‍යවරයා සිරගතකොට ඇත. ඉහළ අධිකරණය එම තීන්දුව නීති විරෝධී බවට තීන්දුකොට අවලංගු කර ඇත. එම වෛද්‍යවරයාට අධිකරණයේදී සිදු වූ නින්දා අපහාස නිසා කලකිරී රජයේ සේවයෙන් විශ්‍රාමගෙන ඇත. එම වීඩියෝව YouTubeහි මාස හයකටත් වැඩි කාලයක් සංසරණය වෙමින් පවතින අතර විශාල ජනකායක් එය අසා නරඹා ඇත. එහෙත් එම විනිසුරුවරයා අද දක්වාම අඩු තරමින් එය බොරුවක්යයිවත් පවසා නැත. අධිකරණ සේවා කොමිසමට පැමිණිල්ලක්වත් කර නොමැති බව මගේ විශ්වාසයයි. එය අධිකරණය පිළිබඳ ජනතා විශ්වාසය බරපතළ ලෙස බිඳ වැටුණු අවස්ථාවකි.

එම වීඩියෝවේ සංයුක්ත තැටියක් "X 4" ලෙස සලකුණු කර මම මේ සමඟ ඉදිරිපත් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ශ්‍රී ලංකා ජනරජයේ ජනතාවගේ අධිකරණ බලය පිළිබඳ අවසාන වගකීම පැවරී ඇත්තේ පාර්ලිමේන්තුවටය. පාර්ලිමේන්තුව විසින් නිශ්චිතව පවරා දෙනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම අධිකරණය විසින් සිදු කරනු ලබයි. එම අධිකරණ ක්‍රියාවලිය අනීතික ලෙස සිදු කරනු ලබන්නේ නම් හෝ අයුතු ලෙස යොදා ගනු ලබන්නේ නම් ඒ පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කරමින් ඒ හරහා ජනතාවට දැනුවත්වීමට අවස්ථාව ලබා දීම අධිකරණ අමාත්‍යවරයා ලෙස මා වෙත පැවරී ඇති අනුල්ලංඝනීය වගකීමක් වේ.

ඉහත කී කාරණා පිළිබඳව සත්‍ය සොයා බලා නීතිමය පියවර ගැනීමට කටයුතු කිරීම අධිකරණ ක්ෂේත්‍රයේ සියලු විනිසුරුවරුන්ගේ සහ නිලධාරීන්ගේ වගකීමක්ව තිබියදී එම කරුණු හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් ද්වේෂසහගතව මාධ්‍යයට ප්‍රකාශයක් නිකුත් කිරීමට කිසිවෙකුටත් අයිතිවාසිකමක් නොමැත.

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

අද අධිකරණයේ පවතින මෙම තත්ත්වය පිළිබඳව රට දැනුවත් කිරීම සඳහා මා කටයුතු කිරීම සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ ක්‍රියා කලාපය නිසා දැඩි ලෙස පීඩාවට පත්ව සිටින ගරු විනිසුරුවරුන් තිස්දෙනෙකුට වැඩි ප්‍රමාණයක් මාහට කථාකොට මා කළ ප්‍රකාශය සම්බන්ධව මාහට ස්තුතිය පළ කරන ලද්දේ එම සියල්ල සත්‍ය නිසා බවත්, ඔවුන් සත්‍ය ලෙසින්ම පීඩාවට පත්ව සිටි නිසා බවත් මම සඳහන් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනවිට එම විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව 50කට වඩා වැඩියි.

තවද, ඉහත ප්‍රකාශය නිකුත් කිරීම විනිසුරුවරුන්ගේ කාර්යයට පරිබාහිරව ඔවුන්ට තහනම්කොට ඇති ක්‍රියාවක් වන අතර, එම ප්‍රකාශය මඟින් 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 3 වන වගන්තිය අනුව මාගේ පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද උල්ලංඝනයවීමක් බවත්, පුළුල් අර්ථයෙන් ගත් කළ පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද සහ අවසන් වශයෙන් ශ්‍රී ලංකාවේ සමස්ත ජනතාවගේ වරප්‍රසාද උල්ලංඝනයක් සිදුව ඇත. මා දිගින් දිගටම අධිකරණයේ සහ විනිසුරුවරුන්ගේ අයිතිවාසිකම් සහ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට කටයුතු කළ ආකාරය ජනතාවට රහසක් නොවේ. අතළොස්සක් වූ විනිසුරුවරුන්ගේ ක්‍රියා කලාපය නිසා ගෞරවනීය ලෙස කටයුතු කරන විනිසුරුවරුන්ගේ අභිමානය කෙලෙසීමට ඉඩ නොතැබීම අපේ යුතුකම වේ. ඉතා සුළු දෙයකට පවා සමහර විනිසුරුවරුන්ගේ සේවය අත්හිටුවමින් ගජ මිතුරන්ගේ වැරදි සහවා තැබීම යුක්තිසහගත නොවේ.

පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 3 වන වගන්තිය මෙසේය:

> "3. පාර්ලිමේන්තුවේදී භාෂණයේ, විවාද කිරීමේ හා කටයුතුවල නිරත වීමේ නිදහස තිබිය යුතු අතර, ඒ භාෂණයේ, විවාද කිරීමේ හෝ කටයුතුවල නිරත වීමේ නිදහස පාර්ලිමේන්තුවෙන් පිටස්තර වූ යම් අධිකරණයකදී හෝ ස්ථානයකදී දෝෂාභියෝගයට හෝ ප්‍රශ්න කිරීමට භාජනය කළ නොහැකි වන්නේ ය."

එම පනතේ 9 වන වගන්තිය මෙසේය:

> "9. පාර්ලිමේන්තුවේ සියලුම වරප්‍රසාද, පරිහාර සහ බලතල ශ්‍රී ලංකාවේ සාමාන්‍ය හා පොදු නීතියේ කොටසක් විය යුතු අතර ඒවා ආයාචනා වශයෙන් ඉදිරිපත් කිරීම අනවශ්‍ය වන්නේ ය. එහෙත් ශ්‍රී ලංකාවේ සියලුම අධිකරණයන් හි දී ඒවා අධිකරණාත්මක ලෙස පිළිගත යුතු ය."

පනතේ 22 සහ 23 වන වගන්ති අනුව පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කරනු ලබන තැනැත්තෙකුට වසර දෙකක් නොඉක්මවන සිර දඬුවම් සහ/හෝ දඩයකට හෝ ඒ දෙකටම යටත් වන්නේය.

ඉහත ප්‍රකාශය නිකුත් කර ඇත්තේ අධිකරණමය විෂය පථයේ කොටසක් ලෙස නොව පෞද්ගලික හෝ පෞද්ගලික මට්ටමෙන් ඇති කර ගත් බැඳියාවක් මත වන නිසා එම ක්‍රියාව පැහැදිලි ලෙසම පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත උල්ලංඝනය කිරීමකි.

පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද සම්බන්ධ නඩු තීන්දු වන Stockdale Vs. Hansard (1839(9) Ad & 14 East 1, 104), Pepper Vs. Hart 1993(1) All ER 42)හිදී පිළිගත් මූලධර්මය වන්නේ, "The whole of the law and custom of Parliament has its origin from this on maxim, 'that whatever matters arises concerning either House of Parliament, ought to be examined, discussed and adjudged in that House to which it relates and not elsewhere' " යන්නයි.

මෙම නීතිමය මූලධර්මය එච්.එන්.ජී. ප්‍රනාන්දු විනිසුරුතුමා විසින් නීතිපති එදිරිව සමරක්කොඩි - 57 නව නීති වාර්තාව - නඩු තීන්දුවෙන්ද පිළිගෙන ඇත. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව මේ වනවිටත් උත්තරයක් ලබා දීපු නිසා පහත සඳහන් කරුණු කිහිපය ඉදිරිපත් කරන්නට මා අවසර ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ නිලධාරීන්ගේ සංගමය නිකුත් කර ඇති නිවේදනය, එම සංගමයේ නිවේදනයක් නොවන බව එම සංගමයේ සාමාජික විනිසුරුවරුන් රාශියක් මා වෙත දැනුම් දී ඇති අතර, එය එම නිලධාරීන් දෙදෙනාගේ හුදු ප්‍රකාශයක් ලෙස ඔවුන් මට දැනුම් දී තිබෙනවා. මහාධිකරණ විනිසුරුවරුන්ගේ සංගමය මේ පිළිබඳව සාකච්ඡා පැවැත්වූවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මහාධිකරණ විනිසුරුවන් දෙදෙනෙකු මේ පිළිබඳව මාධ්‍ය නිවේදනයක් නිකුත් කිරීම සඳහා යෝජනා කළාට, අනෙකුත් සියලුම විනිසුරුවරුන් ඊට විරුද්ධවීම නිසා ඔවුන්ට එවැනි ප්‍රකාශයක් නිකුත් කිරීමට නොහැකි තත්ත්වයට පත් වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රකාශය සිදු කළාට පසුව කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ විස්කි සොරකම පිළිබඳ පරීක්ෂණය ඉක්මන් වෙලා තිබෙනවා. එහි මූලික සැකකරුවෙක් මේ වනවිට අත්අඩංගුවට අරගෙන තිබෙනවා. එම සැකකරු හරහා මීට දායක වුණු උදවියගේ තවත් තොරතුරු එමින් පවතින නිසා මම ඒ පිළිබඳව වැඩි විස්තර කථා කරන්නේ නැහැ.

අනෙක් කාරණය මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම එම සිද්ධිය සම්බන්ධව කිසිදු විනිසුරුවරයෙකුගේ නම කීමක් හෝ චෝදනා කිරීමක් කළේ නැහැ. නමුත් කොළඹ අධිකරණයේ සේවය කරන නීතිඥ ගුණරත්න වන්නිනායක මහතා නීතිඥවරුන් 20දෙනෙකු පමණ එකතුව ඒ පිළිබඳව ප්‍රකාශයක් කරමින් යම් යම් විනිසුරුවරුන්ගේ නම් පවා ඊට පටබැඳීම හරහා එම ප්‍රශ්නය බරපතළ තත්ත්වයට පත් කර තිබෙනවා. ඇත්තවශයෙන්ම එම නීතිඥවරයා එම අධිකරණයේ සේවය කරන නීතිඥවරයෙක් විධියට මේ සොරකම පිළිබඳව සියලු තොරතුරු දැනිමින්ම ඔහු එය කඩාකප්පල් කිරීම සඳහා කටයුතු කිරීම, උද්ඝෝෂණය කිරීම හරහා ඔවුන් එම අපරාධ විමර්ශනය අඩපණ කිරීමට හෝ නැත්නම් අපරාධකරුවාට සහාය ලබා දීම සඳහා කටයුතු කළා කියා මම විශ්වාස කරනවා. ඔහු මට අභියෝගයකුත් කර තිබුණා, මේ ප්‍රකාශයට විරුද්ධව නීතිඥවරුන් 20,000ක් පාරට බස්සනවා කියලා. හැබැයි, 20දෙනෙක් පමණයි ඔහුට ගෙනෙන්න හැකියාව ලැබී තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණයට අපහාස වුණු අවස්ථාවලදී, අධිකරණයට අභියෝග ඇති වුණු වෙලාවලදී **ඒවාට** එරෙහිව නායකත්වය දුන් කෙනෙක් මම. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා විධියට එදා මම කටයුතු කරද්දී, ගරු ශිරානි බණ්ඩාරනායක මැතිනියට එරෙහිව දෝෂාභියෝගය ආපු වෙලාවේ මුළු රටේම අධිකරණ පද්ධතිය දින භයක් අපි අකර්මණ්‍ය කර තිබුණා. නඩු විශාල සංඛ්‍යාවක් පැවරුවා. අධිකරණයේ විනිසුරුවරුන්ගේ ගෞරවය ආරක්ෂා කරන්න ඕනෑ නිසා, ඒගොල්ලන්ගේ අභිමානය රකින්න ඕනෑ නිසා එදා මම අධිකරණ ඇමතිවරයා විධියට - ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා දන්නවා- අවුරුදු දෙකක් තිස්සේ කැබිනට් මණ්ඩලයට පවා කරුණු ඉදිරිපත් කරමින් දීර්ඝ වශයෙන් කටයුතු කර තමයි බොහොම අමාරුවෙන් භාණ්ඩාගාරයෙන් අනුමැතිය අරගෙන නීතිපති දෙපාර්තමේන්තුවේත්, විනිසුරුවරුන්ගේත් වැටුප් තුන්ගුණයකින් වැඩි කරන්න සියලු කටයුතු සම්පාදනය කර දුන්නේ. අපි එසේ කටයුතු කළේ අධිකරණයේ ගෞරවය සහ ස්වාධීනතාව ආරක්ෂා කරන්න ඕනෑ නිසාය කියන එකත් මේ අවස්ථාවේදී මම මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණා ටික ඉදිරිපත් කළේ වෙන කුමන හේතුවක් නිසාවත් නොවෙයි. විශේෂයෙන්ම මේ අතළොස්ස හැර අධිකරණයේ ගෞරවනීය විනිසුරුවරුන් අතිවිශාල සංඛ්‍යාවක් ඉතාම ගෞරවනීය විධියට සේවය කරන නිසා, මේ අතළොස්සකගේ ක්‍රියාකලාපයෙන් අනෙක් විනිසුරුවරුන්ගේ ගෞරවයට හානි වන නිසා, ඔවුන්ට අවමානයක් වන නිසා ඒක වළක්වා ගැනීමේ අවශ්‍යතාවත් අපට තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ සේවා කොමිෂන් සභාව ඉදිරිපත් කළ එම ලේඛනය මම සම්පූර්ණයෙන් අධ්‍යයනය කළේ නැහැ. ඒ පිළිබඳව මම අධ්‍යයනය කර අවශ්‍ය වුණොත්, වැඩිදුරටත් පිළිතුරු දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විනිසුරුවරුන්ට සහ අධිකරණ සේවා කොමිසමේ සේවකයින්ට ඔවුන්ගේ ප්‍රශ්න ඉදිරිපත් කරන්න තැනක් නැති වුණාම තමයි මගේ ළඟට එන්නේ. මේ වනවිට බරපතළ අර්බුදයක් තිබෙනවා, අධිකරණ ක්ෂේත්‍රයේ. 2018 ඉඳලා අධිකරණ ක්ෂේත්‍රයේ නිලධාරීන්ට අතිරේක දීමනාවක් අනුමත කර තිබෙනවා. ඒ, වැටුප වාගේ සියයට 25ක ප්‍රමාණයක්. ඔවුන්ගේ අවදානම් දීමනාවක් විධියට තමයි ඒක ඔවුන් ඉල්ලා ලබා ගෙන තිබෙන්නේ. නමුත් 2018 ඉඳලා අද වෙනතෙක් ඒ සියයට 25 දීමනාව ගෙවන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව ඇතුළේ ඉන්නා අයට විතරයි. අධිකරණවල සේවය කරන අනිබහුතරයක් සේවකයින්ට එම වරප්‍රසාදය, එම ගෙවීම කරන්නේ නැහැ.

ඔවුන් අවුරුදු 6ක් තිස්සේ එම වරප්‍රසාදය ඉල්ලනවා. ඇත්ත වශයෙන්ම අවදානම තිබෙන්නේ අධිකරණය තුළ සේවය කරන නිලධාරීන්ට මිසක්, කොමිෂන් සභාව ඇතුළේ සේවය කරන අයට නොවෙයි. ඒක නිසා ලොකු විෂමතාවක් නිර්මාණය කරලා තිබෙනවා. ඒක අපි අමාත්‍යාංශයෙන් කරපු එකක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ ප්‍රශ්නය නිසා තමයි මේ කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න මට සිද්ධ වුණේ. ඒ පිළිබඳව පියවර ගතයුතු අයගේ ඇස් අරවලා, තීන්දු තීරණ අරගෙන ක්‍රියාත්මක කරවීම සඳහා තමයි මේක ඉදිරිපත් කළේ.

මම මගේ වරප්‍රසාද ප්‍රශ්නයේ ඉදිරිපත් කරලා තිබෙනවා අර මාධ්‍ය ප්‍රකාශය නිකුත් කරපු විනිසුරු දෙපළ වරප්‍රසාද කමිටුවට කැඳවන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ සේවා කොමිසම මේ වන විටත් ඒ පිළිබඳව ප්‍රතිචාර දක්වලා තිබෙන නිසා මේ මොහොතේ මම එවැනි ඉල්ලීමක් කරන්නේ නැහැ. නමුත්, ඉදිරියේදී මෙම විමර්ශන කටයුතු සහ පියවර ගැනීම් සලකා බලා අවශ්‍ය වුවහොත්, ඒ අවස්ථාවේදී ඒ ඉල්ලීම ඉදිරිපත් කරන්න මම ඔබතුමාගෙන් අවසරය ඉල්ලනවා. මේ අවස්ථාවේදී ඔවුන් කැඳවන්න ඕනෑය කියන ඉල්ලීම මම කරන්නේ නැහැ. ඔබතුමාට බොහොම ස්තුතියි.

ආංශික අධීක්ෂණ කාරක සභා
துறைசார் மேற்பார்வைக் குழுக்கள்
SECTORAL OVERSIGHT COMMITTEES

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111 හි විධිවිධානවල සහ 2022 නොවැම්බර් 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2024 ජූලි 03 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරයන් විසි දෙදෙනෙකුගෙන් (22) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අමාත්‍යාංශගීය උපදේශක කාරක සභා
அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்
MINISTERIAL CONSULTATIVE COMMITTEES

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 හි විධිවිධානවල සහ 2024 පෙබරවාරි 09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2024 ජූලි 03 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි සෞඛ්‍ය පිළිබඳ අමාත්‍යාංශගීය උපදේශක කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරයන් විසි දෙනෙකුගෙන් (20) සමන්විත විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ඉසිවර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
இசிவர அபிவிருத்தி, சமூக சேவைகள், அறக்கட்டளை மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
ISIWARA DEVELOPMENT, SOCIAL SERVICES AND CHARITY FOUNDATION (INCORPORATION) BILL

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"ඉසිවර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

ගරු යදාමිණී ගුණවර්ධන මහතා
(மாண்புமிகு யதாமிணீ குணவர்தன)
(The Hon. Yadamini Gunawardena)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විවාදයේ, ඒකමතිකව පිළිගනු ලැබිණි.

ඒ අනුව, පළමුවන වර කියවීමට ගෙන, මුද්‍රණය කරන ලෙස නියෝග කරන ලදී.

ස්ථාවර නියෝග අංක 52(6) යටතේ, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙත වාර්තා කිරීම සඳහා පවරන ලදී.

විනා විවාදයේ, ඒකමතිකව පිළිගනු ලැබිණි.

ඒ අනුව, පළමුවන වර කියවීමට ගෙන, මුද්‍රණය කරන ලෙස නියෝග කරන ලදී.

ස්ථාවර නියෝග අංක 52(6) යටතේ, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙත වාර්තා කිරීම සඳහා පවරන ලදී.

මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

மனித வளங்கள் துறைசார் வல்லுனர்களின் சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

ASSOCIATION OF HUMAN RESOURCES PROFESSIONALS (INCORPORATION) BILL

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

ගරු යදාමිණී ගුණවර්ධන මහතා
(மாண்புமிகு யதாமிணீ குணவர்தன)
(The Hon. Yadamini Gunawardena)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විවාදයේ, ඒකමතිකව පිළිගනු ලැබිණි.

ඒ අනුව, පළමුවන වර කියවීමට ගෙන, මුද්‍රණය කරන ලෙස නියෝග කරන ලදී.

ස්ථාවර නියෝග අංක 52(6) යටතේ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙත වාර්තා කිරීම සඳහා පවරන ලදී.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දිනට නියමිත ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත

இலங்கைத் தொலைத்தொடர்பு (திருத்தம்) சட்டமூலம்

SRI LANKA TELECOMMUNICATIONS (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විවාදය ආරම්භ කිරීම, ගරු කනක හේරත් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 30ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 11.46]

ගරු කනක හේරත් මහතා (තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கனக ஹேரத் - தொழில்நுட்ப இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanaka Herath - State Minister of Technology)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේ අපි 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතට සංශෝධන ගෙන එනවා. 1996 දී පමණයි ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතට සංශෝධන ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඉන් පසුව මේ දක්වා අවුරුදු 28ක් වනකල් එම පනතට සංශෝධන ඉදිරිපත් කරලා නැහැ. ලෝකයේ තාක්ෂණය දිනෙන් දින දියුණු වෙනවා. නමුත්, එම පනතට සංශෝධන ඉදිරිපත් කිරීමට යෑමේදී විශාල අභියෝග රාශියක් මතු වුණා. කලින් කලට එක එක කණ්ඩායම් ඉදිරිපත් වුණත් වසර ගණනාවක් යන තෙක් එම පනතට සංශෝධන ඉදිරිපත් කර ගන්න හැකියාවක් ලැබුණේ නැහැ. එම නිසා අපි සතුටු වෙනවා, මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දෙවන වර කියවීමට ඉදිරිපත් කරන්න අද හැකි වීම පිළිබඳව.

2022 වර්ෂයේදී අප රටේ ඩිජිටල්කරණය ශීඝ්‍ර කිරීම සඳහා ඉතා වේගවත් සහ කඩිනම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න

ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා බලාපොරොත්තු වුණා. පසුගිය වර්ෂ 10, 15 පිළිබඳව කථා කරන කොට අප කිව යුතුයි, කාලයෙන් කාලයට පත් වුණු ආණ්ඩු ඩිජිටල්කරණය සඳහා වන විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබූ බව. නමුත් මේ ක්ෂේත්‍රය ශීඝ්‍රයෙන් දියුණු කළේ නැත්නම්, අපේ රට ඩිජිටල්කරණයට ශීඝ්‍රයෙන් පරිවර්තනය වුණේ නැත්නම් ලෝකයේ නව තාක්ෂණයත් සමඟ ඉදිරියට යන්න අපට බැරි වෙනවා. එම නිසා 2023 වර්ෂයේදී ලෝක බැංකුවේ සහයෝගයත් ඇතිව අපි ඩිජිටල් ආර්ථික සැලැස්ම -ඩිජිටල් උපාය මාර්ගය- 2030 දක්වා වන වසර 7ට අදාළව ඉදිරිපත් කළා. ඒකට මාර්තු මාසයේදී අනුමැතිය ලැබුණා. එයට අනුව කුලුනු 6ක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM took the Chair.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2030 ඩිජිටල් ආර්ථික උපාය මාර්ගයට අනුව තිබෙන පළමුවැනි කුලුන තමයි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, සම්බන්ධතාව සහ ප්‍රවේශය. ඒවා නැතිව ඩිජිටල්කරණයක් ගැන කථා කරන්න අපට හැකියාවක් නැහැ. ඒ සඳහා තමයි අපි අද දිනයේදී මේ පනත් කෙටුම්පත තුළින් ශක්තියක් ලබා දෙන්නේ. අපේ අවසාන ඉලක්කය වන්නේ, 2030 වනකොට අපේ ඩිජිටල් ආර්ථිකය තුළින් දළ දේශීය නිෂ්පාදනයට ඇමෙරිකානු ඩොලර් බිලියන 15ක දායකත්වය ලබා දීමයි. ඒ සඳහා තමයි මේ සැලැස්ම ඉදිරිපත් කරලා තිබෙන්නේ. විෂය භාර අමාත්‍යාංශය කාලයක් තිස්සේ විවිධ යෝජනා ඉදිරිපත් කළත්, අද වන කොට වසර 7ක් දක්වා වන නියත සැලැස්මක් තිබෙනවා. ඒක රජයක් හැටියට අපි ඉදිරිපත් කරපු සැලැස්මක් නොවෙයි. විශේෂයෙන් ලෝක බැංකුව, මෙම කර්මාන්තයේ යෙදෙන සියලු දෙනා, වෘත්තිකයන් සහ අමාත්‍යාංශයේ සියලු දෙනා එකතු වෙලා සහයෝගයෙන් කටයුතු කරලා තමයි මේ සැලැස්ම ඉදිරිපත් කළේ. ඒ නිසා අද දිනයේ ඉදිරිපත් වන මේ ප්‍රතිසංස්කරණවලට මුල පුරන්න එක පැත්තකින්, IMF එකේ ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු ද ඉවහල් වුණා. මේ සඳහා අවශ්‍ය කරන ප්‍රතිසංස්කරණ ටික සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ලෝක බැංකුවේ සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් ඒකකයට අනුව තමයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම තුළින් අප විශේෂයෙන් බලාපොරොත්තු වන්නේ පාරිභෝගිකයා ආරක්ෂා කිරීමයි. පාරිභෝගිකයාට සාධාරණ සේවාවක් ලබා දීම තමයි මෙහි ප්‍රධාන අරමුණ වෙලා තිබෙන්නේ. ඊට අමතරව, තවත් අරමුණු කීපයක් ද තිබෙනවා. විදුලි සංදේශ ක්ෂේත්‍රයට දිනෙන් දින -දවසින් දවස- නව තාක්ෂණය එකතු වෙනවා. එම නව තාක්ෂණයට ගැළපෙන ආකාරයේ රෙගුලාසි සකස් කිරීම සහ ප්‍රතිපත්ති ගොඩ නැඟීම තමයි මේ තුළින් බලාපොරොත්තු වන දෙවැනි කාරණය. ඒ වාගේම, අපේ රටේ ඉන්න දුරකථන ක්‍රියාකරුවන් අතර සාධාරණ තරඟකාරිත්වයක් ඇති කිරීමටත් බලාපොරොත්තු වෙනවා. එක සමාගමකට වැඩි බලයක් ලබා දෙන්නේ නැතිව සියලු දෙනාට එක හා සමානව, සාධාරණත්වයෙන් ඒ පහසුකම් ලබා දීමට මේ තුළින් බලාපොරොත්තු වෙනවා. මෙය ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුව තමයි ක්‍රියාත්මක කරන්නේ. ඒ කියන්නේ, international best practicesවලට අනුව. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන සියල්ලේ සහයෝගය ඇතිව, නිසි පරිචයන්ට අනුකූලව තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

මීට අදාළ අත්‍යවශ්‍ය සංශෝධන කිහිපයක් පිළිබඳව ඉතා කෙටියෙන් සඳහන් කරන්න මම මේ වෙලාවේ බලාපොරොත්තු වෙනවා.

මේ ක්ෂේත්‍රයට අදාළව සාධාරණ වෙළෙඳ පොළක් ඇති කිරීම ඉතා වැදගත්. අවසානයේදී, අපේක්ෂිත සහන ටික පාරිභෝගිකයාට ලැබෙන්නේ සියලු සමාගම් අතර සාධාරණ තරඟකාරිත්වයක් ඇති කිරීම තුළිනුයි. සංඛ්‍යාත ලබා දෙන ක්‍රමවේදය ඉතාම හොඳ ආකාරයෙන්, ඵලදායිතාවක් ඇති වන ආකාරයෙන් සකස් කරලා එය කළමනාකරණය කිරීමත් මෙම සංශෝධන තුළින් අපි බලාපොරොත්තු වෙනවා.

දැන් බොහෝ දෙනෙක් කථා කරනවා දුරකථන අංක භාවිතය ගැන. දුරකථන අංක ආරම්භ කරන නොම්මර අතර "071" කියන්නේ, 'මොබිටෙල්'; "077" කියන්නේ, 'ඩයලොග්'. ඒ ඛේත - codes - නීතිමය බලයක් අනුව ලබා දෙන්න ඕනෑ. කලින් මේ සඳහා නීතිමය බලයක් තිබුණේ නැහැ. නමුත්, මේ සංශෝධන සමඟ ඒ නීතිමය බලය ලැබී තිබෙනවා. වෙනත් රටවල තිබෙනවා වාගේ "800" numbers හඳුන්වා දෙන්නත් අපට පුළුවන්. ඒ toll-free numbers හඳුන්වා දීමේ හැකියාව අපට තිබෙනවා. එමඟින් කටයුතු තවත් ශක්තිමත් කරන්න පුළුවන්. එය පාරිභෝගිකයාට තවත් සහනයක් ලබා දීමක් ද වනවා. එවැනි ආකාරයේ වැඩ කටයුතු කිරීමට පනතේ 10වන වගන්තියට කරනු ලබන සංශෝධන යටතේ අපි බලාපොරොත්තු වෙනවා.

දඩ මුදල් සම්බන්ධයෙන් හරියාකාර ක්‍රමවේදයක් තිබුණේ නැහැ. බලපත්‍රලාභීන් සමඟ වෙලාවට කොන්දේසි කඩනවා. එසේ කොන්දේසි කැඩුවාම බොහෝ වෙලාවට නීතිය අතට අරගෙන ක්‍රියා කරලා කෙළින්ම අවලංගු කිරීම සිදු කරනවා. ඒ වෙනුවට දණ්ඩන මුදලක් ගෙවන්න හැකියාවක් දැන් ලබා දී

[ගරු කනක හේරත් මහතා]

තිබෙනවා. එසේ ක්‍රියා කිරීමේ අවස්ථාව දැන් උදා වෙලා තිබෙනවා. ඒකත් ඉතා වැදගත් සහ ඉදිරියේදී ප්‍රගතියක් ලබා ගත හැකි කාරණාවක් වනවා.

තවත් ප්‍රධාන, ඉතා විශේෂ සංශෝධනයක් තමයි 13වන වගන්තිය යටතේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. දැනට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතට අනුව ක්‍රියාත්මක වෙමින් ලබා දෙන බලපත්‍රයේ තිබෙන්නේ, Telecommunication System Licence කියන එකයි. එහෙම නැත්නම්, විදුලි සංදේශ පද්ධති බලපත්‍රයක් පමණයි මෙතෙක් කාලයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. මෙහි 13වන වගන්තියෙන් කෙරෙන නව සංශෝධන අනුව, 17වන වගන්තියට අනුකූලව බලපත්‍ර 3ක් අලුතින් හඳුන්වා දෙන්න කටයුතු කරනවා. එකක්, යටිතල පහසුකම් සේවා -infrastructure services - සැපයීම සඳහායි. අපි උදාහරණයක් ගනිමු. මුළු රටටම 4G අන්තර්ජාල පහසුකම් -එම තාක්ෂණික පහසුකම්- ලබා දෙන්න අප අද වන විට කටයුතු කරගෙන යනවා. එහිදී රජයෙන් සියයට 50ක දායකත්වයක් ලබා දීලා, දුරකථන සමාගම්වලිනුත් සියයට 50ක දායකත්වයක් ලබා දීලා තමයි කුලුනු - towers - ඉදිකරන්නේ. ඉතින් ඒක ඉතාම අපහසු කාර්යයක්. විශේෂයෙන් දුරකථන සමාගම්වලින් කරපු ඉල්ලීමකට අනුව ඒක තුන්වැනි පාර්ශ්වයකට ලබා දෙන්න හැකියාවක් ලැබෙන ආකාරයෙන් යටිතල පහසුකම් සේවාවන් ලබා දීම සඳහා නව බලපත්‍රයක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. එහිදී ෆයිබර් තාක්ෂණය කෙරෙහිත් අවධානය යොමු වනවා. බොහෝ දුරට එම connection එක දෙන්නේ මොබිටෙල් එකෙන්. ඒකත් අරගෙන වෙනත් සමාගමකට දෙනවා. ඉතින් මෙහිදී තුන්වැනි පාර්ශ්වයකට හැකියාව තිබෙනවා මේ සේවාව වෙනම ලබා දෙන්න. මොකද, අපේ බලාපොරොත්තුව වී තිබෙන්නේ, අපේ ඉලක්කය වී තිබෙන්නේ 2025 වන කොට මුළු රටටම - සියයට සියයක් හෝ සියයට 95ක්වත් - 4G තාක්ෂණය ඉතා කඩිනමින් ලබා දීමයි. තුන්වැනි පාර්ශ්වයකට අවස්ථාව ලබා දුන්නාම ඒ කාර්යය ඉතා කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ඒ අය කටයුතු කරනවා. ඒ සඳහා ඉදිරිපත් වෙන්න ආයෝජකයෝ - විදේශ ආයෝජකයෝ - දැනටමත් බලාපොරොත්තුවෙන් ඉන්නවා. මේක අනෙක් අතට අපේ රටට විදේශ ආයෝජකයන් ගෙන එන වැඩ පිළිවෙළක් ද වනවා.

දෙවැනි බලපත්‍රය ලබා දෙන්නේ විදුලි සංදේශ සේවා - telecommunication services - සැපයීම වෙනුවෙන්. ඒ කියන්නේ, විදුලි සංදේශ සේවා සැපයීම සඳහා බලපත්‍රයක් ලබා දෙනවා. අපි උදාහරණයක් ගනිමු. පසුගිය දවස්වල - මේ වර්ෂයේ මාර්තු මාසයේ - ස්ටාර්ලින්ක් සමාගම එවැනි බලපත්‍රයක් සඳහා ලංකාවෙන් ඉල්ලීමක් කර තිබුණා. ඒ සඳහා මෙතෙක් අපට රෙගුලාසි තිබුණේ නැහැ; අවශ්‍ය කරන ප්‍රතිපත්තිය තිබුණේ නැහැ. නමුත්, අද මේ සංශෝධන පනත් කෙටුම්පත සම්මත කිරීමත් සමඟ ඒ සේවාවන් කෙළින්ම ලබා දෙන්න අපට හැකියාව ලැබෙනවා. එමඟින් ස්ටාර්ලින්ක් සමාගමට පමණක් නොවෙයි, විදුලි සංදේශ සේවාවන් ලබා දෙන ඕනෑම සමාගමකට අවස්ථාව උදා වෙනවා, තමන්ගේ සේවාවන් ක්‍රියාත්මක කිරීමට. ඒ සඳහා වන බලපත්‍රය ලබා දීම තුළින් ඒ සේවාව ලබා ගන්න අපට පුළුවන්. අනෙක් අතට, අපේ රටේ අන්තර්ජාල පහසුකම් ඉතාම කඩිනමින් ලබා දෙන්න අපට පුළුවන්. කඳුකර ප්‍රදේශ සහිත ප්‍රදේශවල -අපේ දිස්ත්‍රික්කය වැනි දිස්ත්‍රික්කවල- තිබෙන ගැටලුවක් තමයි ඒවායේ කුලුනු - towers - ගොඩ නඟන්න ඉතාම අපහසු වීම. ඒක අපට තිබෙන ප්‍රධාන අභියෝගයක්.

ඒ වාගේම මෙහිදී ආයතන 18කින් පමණ අවසර ගන්න තිබෙනවා. ඒ අවසරය අරගෙන, ඉඩමේ අයිතිය ලබා ගෙන ඒ සියල්ලම කරන්න වර්ෂයක් විතර යනවා. චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ අන්තර්ජාල පහසුකම් ලබා දෙනවා නම් ඕනෑම අවස්ථාවක අපට ඕනෑ තැනකට ගිහිල්ලා මේ කටයුතු කරන්න පුළුවන්. ඒ සඳහා වැය වන මුදල ගණනය කරන්න බැහැ. ඒක සමහර වෙලාවට ලොකු මුදලක් වෙන්න පුළුවන්. අපි ඉතා දුෂ්කර ප්‍රදේශයක, අන්තර්ජාල පහසුකම් නැති ප්‍රදේශයක සංචාරක හෝටලයක් හදනවා නම් අපට ඒ තුළින් සංචාරක කර්මාන්තයට සහයෝගය ලබා දෙන්න පුළුවන්; වෙනත් කර්මාන්තවලට සහයෝගය ලබා දෙන්න පුළුවන්. ඒ වාගේම අධ්‍යාපනයට සහයෝගය ලබා දෙන්නත් පුළුවන්. විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමා ස්ටාර්ලින්ක් සමාගමත් සමඟ ඒ සාකච්ඡාව පවත්වන වෙලාවේදී එතුමාගේත් ඉල්ලීමක් වෙලා තිබුණා, අපේ පාසල්වලට අන්තර්ජාල පහසුකම් ලබා දීම අත්‍යවශ්‍ය කාරණාවක් බව. අපට සමහර දුෂ්කර පාසල්වලට ෆයිබර් තාක්ෂණය, ෆයිබර් සම්බන්ධතාව ලබා දීමට නොහැකි වෙලා තිබෙනවා. එම නිසා එවැනි දුෂ්කර ප්‍රදේශවල තිබෙන පාසල් සඳහා අපට අඩු මුදලකට ඒ සම්බන්ධතාව ලබා දෙන්න කියලා ජනාධිපතිතුමා ඉල්ලීමක් කර තිබුණා. මේ පහසුකමත් සමඟම ඉදිරියේදී අපට ඒකත් කර ගන්න හැකියාව ලැබෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම තුන්වැනි එක තමයි cable landing station facility කියන එක. ඒ කියන්නේ, සමුද්‍ර කේබල් සම්බන්ධ සේවාව. ඒක දැනට ලංකාවේ ක්‍රියාත්මක වෙනවා. අද මේක ඉතාම වැදගත් කාරණාවක් බවට පත් වෙලා තිබෙනවා. අද ලෝකයේ තිබෙන නව තාක්ෂණයත් සමඟ මේක තමයි නව යුද ක්‍රමයක් බවට පත් වෙලා තිබෙන්නේ. මේකට හානි කළොත් මුළු රටම අඳපණ වෙනවා. මෙය ආරක්ෂා කිරීම, නියාමනය කිරීම, රෙගුලාසි පැනවීම සහ පාලනය කිරීම සඳහා තමයි මේ බලපත්‍රය ලබා දෙන්න කටයුතු කරන්නේ. ඊට පස්සේ ඕනෑ කෙනෙකුට ඒ සඳහා ආයෝජනය කරන්න පුළුවන්. ආයෝජනය කරනවා වාගේම අනෙක් පැත්තෙන් මේ කටයුතු නියාමනය කිරීමත් කරලා රටට එන්න ඕනෑ ආදායම; රජයට ලැබිය යුතු ආදායම ලබා ගැනීමටත්, ඒක ආරක්ෂා කිරීමටත්, පාලනය කිරීමටත් මේ තුළින් අපට හැකියාවක් ලැබෙනවා.

මීට අමතරව 13වැනි වගන්තිය යටතේ බලපත්‍ර ලබා ගන්නේ නැතිව විදුලි සංදේශ සේවාවන් සපයන කණ්ඩායම් ඉන්නවා. 13වැනි වගන්තියට ගෙන එන සංශෝධන අනුව මේ වාගේ අයට නීතිමය ක්‍රියා මාර්ගයක් ගැනීමට අපට හැකියාව තිබෙනවා.

ඊළඟට 16වැනි වගන්තිය අනුව මහජන පැමිණිලි රාශියක් එන ගැටලුවක් තමයි, -ඔබතුමන්ලා, අපි සියලුදෙනාටම මේ ප්‍රශ්නයට, ගැටලුවට මුහුණ දෙන්න සිදු වෙලා ඇති- එක දුරකථන සම්බන්ධතාවකින් තවත් දුරකථන සම්බන්ධතාවකට ඇමතුමක් ගත්තාම ඒ සම්බන්ධතාව බිඳ වැටීම. සමහර වෙලාවට පාරිභෝගිකයන් චෝදනා කරනවා, ඒක ඒ සමාගම බලෙන් කරන දෙයක් කියලා. 16වැනි වගන්තිය යටතේ ගෙනෙන සංශෝධනය තුළින් මේක නියාමනය කරන්න අපට හැකියාවක් ලැබෙනවා. පාරිභෝගිකයාට සපයන සේවාවේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම තමයි මේ තුළින් බලාපොරොත්තු වෙන්නේ.

ඊළඟට, 17වැනි වගන්තියට අදාළ සංශෝධනය ගැන බලමු. වෙළඳ බලපත්‍ර ගන්නේ නැති බවට ගොඩක් අයගේ චෝදනා තිබෙනවා. අපේ රටට ඇවිල්ලා ආයෝජනය කරපු ජාත්‍යන්තර සමාගම්වලට මේ චෝදනාව තිබෙනවා. ඉස්සර මේ සඳහා අය කළේ රුපියල් 10,000යි. රුපියල් 10,000 නේ කියලා ඒ වැඩේ ඉවර කරලා නැවතත් ඒකම කරන්න තමයි ඒ අය බලන්නේ. ඒ නිසා ඒ මුදල මිලියනයක් දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම සංඛ්‍යාත නිකුත් කිරීම ගත්තොත්, transmit කරන්න ඉස්සෙල්ලා ඒ සඳහා අවශ්‍ය කරන සියලු උපකරණවලට ඒ බලපත්‍රය ලබා ගත යුතුයි.

ඊළඟට, 18වැනි වගන්තියට අදාළ සංශෝධනය ගත්තොත්, එහි තිබෙන්නේ විදුලි සංඛ්‍යාත භාවිතය සඳහා ඇති බලපත්‍ර අහෝසි කිරීම ගැන. ඒ කියන්නේ මේ තුළින් සමහර විදුලි සංඛ්‍යාත අහෝසි කිරීමට හැකියාව තිබෙනවා. දැනට තිබෙන පනත අනුව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ඕනෑම වෙලාවක විදුලි සංඛ්‍යාත කෙළින්ම cancel කිරීමේ, භාවිතය නතර කිරීමේ හැකියාවක් තිබෙනවා. නමුත් මේ පිළිබඳව ජාත්‍යන්තරයේ තිබෙන ප්‍රතිපත්තිවලට අනුව අපට නිර්දේශ කරපු කාරණයක් තමයි, මොනවා හරි දෙයකදි මොනවා හරි ගැටලුවක් වෙලා එසේ අවලංගු කිරීමට පෙර කොමිෂන් සභාව විසින් සාධාරණ හේතු දැක්විය යුතුයි කියන එක.

ප්‍රථමයෙන්ම සාධාරණ හේතුවක් දක්වන්න ඕනෑ, මෙන්න මේ හේතුව නිසා තමයි, ඔය ගොල්ලන්ගේ සංඛ්‍යාත භාවිතය නතර කරන්නේ කියලා. ඒ හේතුව දක්වලා, ඊට පස්සේ ඒ දිහා case by case බලලා ඒ සඳහා සාධාරණ කාලයක් වෙන් කරන්න ඕනෑ. ඊළඟට තුන්වැනි කාරණය තමයි, බැරි වෙලාවත් කොමිෂන් සභාව වරදක් කර ඇත්නම්, ඒ වෙනුවෙන් වන්දි ගෙවන්නත් කොමිෂන් සභාවට සිදු වෙනවා. ඇත්තටම ඒක නව සංශෝධනවලට අනුව ක්‍රියාත්මක වෙන එකක්.

ඊළඟට, අවසාන වශයෙන්, මෙතැනදී ඉදිරිපත් කරන ඕනෑම අලුත් සංශෝධනයක්, - බලපත්‍ර ඉදිරිපත් කිරීම, ඒ වාගේම නීතිය ක්‍රියාත්මක කිරීම - අභියෝගයට ලක් කරන්න හැකියාවක් තිබෙනවා. ඒ අනුව ඕනෑම කෙනෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්.

ඒ වාගේම, පනත් කෙටුම්පතේ 22 වන වගන්තිය යටතේ සඳහන් වෙන්නේ රජයට අය විය යුතු බද්ද නොගෙවීම සම්බන්ධවයි. සමහර අවස්ථාවලදී ඒ බද්ද ගෙවන්නේ නැහැ. ගෙවන්නේ නැතුව ඉඳලා මාස තුනකින් ගෙවනවා. ඒ නිසා අපේ රජයට ලැබිය යුතු ආදායම වශයෙන් ලොකු මුදලක් නැති වෙනවා. ඒ සඳහා මාස තුනක් හෝ යම් කාල සීමාවක් වෙන් කරලා, අධිභාර එකතු කිරීමට හැකියාවක් තිබෙනවා. ඇත්තටම ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ, මේ බදු ගෙවීම හරියාකාරව ක්‍රියාත්මක කරන්නේ නැති නිසා නියාමනය කිරීමයි. ඒ වාගේම අපේ රජයට ලැබිය යුතු ආදායම ලබා ගැනීම තමයි බලාපොරොත්තුව.

ඊළඟට, පනත් කෙටුම්පතේ 30 වන වගන්තිය යටතේ, සාවද්‍ය තොරතුරු ලබා දීම ගැන සඳහන් වෙනවා. ඒක දැන් තිබෙන ලොකුම ගැටලුවක්. මේ ගැන කාලයෙන් කාලයට පාර්ලිමේන්තුවේත් සමහර මන්ත්‍රීවරුන් කථා කළා. ඒ තමයි SIM card එකක් ගන්න එක පිළිබඳව. මේ සඳහා 2018දී නව නීතියක් ගෙනැල්ලා, SIM card එකක් මිලදී ගැනීමේදී අනිවාර්යයෙන්ම හැඳුනුම්පත ලබා දෙන්න ඕනෑ. එහෙම නැතුව සිම් කාඩ් එකක් දෙන්නේ නැහැ. නමුත්, කලින් ලබා ගත් SIM card මිලියන දෙකක් පමණ තිබෙනවා. ඒවා කිසිම හැඳුනුම්පතක් නැතුව, කවුද ගත්තේ කියන එක දන්නේ නැතුව තමයි දීලා තිබෙන්නේ. ඒවා භාවිත කරමින් ලොකු වංචා, දූෂණ හා විශාල අපරාධ වෙනවා. ඒ නිසා ඒ අපරාධ පිළිබඳ සොයා ගන්න, කවුද ඒ අපරාධවලට සම්බන්ධ වුණේ කියන එක සොයා ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා සාවද්‍ය තොරතුරු ලබා දීලා SIM card එකක් ලබා ගත්තොත්, ඒකට නීතිමය ක්‍රියා මාර්ග ගන්න මේ පනත් කෙටුම්පතේ 30වන වගන්තිය තුළින් හැකියාව තිබෙනවා.

ඊළඟට, නීතිවිරෝධීව භාවිත කරන විදුලි සංදේශ උපකරණ. නීතිවිරෝධී විධියට භාවිත කරන උපකරණ රාජසන්තක කරන්න හැකියාව තිබෙනවා. මෙහිදී බොහෝදෙනෙක් කරන චෝදනාවක් තිබෙනවා. අද දරුවන්ගේ සෙල්ලම් බඩු හැටියට භාවිත කරන walkie-talkie තිබෙනවා. ඒ වාගේම, ඩ්‍රෝන යන්ත්‍ර තිබෙනවා. ඒ සමහර ඒවා commercial කටයුතු සඳහා පාවිච්චි කරන ඒවාත් නොවෙයි, professional කටයුතු සඳහා පාවිච්චි කරන ඒවාත් නොවෙයි. ඒවා දරුවන් පාවිච්චි කරන ඒවා. ඒ වාගේ අවස්ථාවලදී ඒකේ තිබෙන frequency එක අනුව, රජය ඒවා රාජසන්තක කරන්නේ නැහැ. ඒවාට බලපත්‍රයක් ලබා ගන්න අවශ්‍යතාවක් නැහැ. එහෙම ඒවා නැතුව walkie-talkies හා වෙනත් උපකරණ රජයෙන් අවසරයක් ගන්නේ නැතුව භාවිත කළොත්, ඒවා රාජසන්තක කරන්න විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට හැකියාවක් තිබෙනවා.

කාරක සභා අවස්ථාවේදී කළ යුතු සංශෝධන වශයෙන් ඉදිරිපත් කරපු සංශෝධන, බොහොමයක් ඇතුළත් කරලා තමයි අද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒක නිසා විපක්ෂයේ සියලු මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රශ්නවලට අවශ්‍ය උත්තර ඉදිරියේදී ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම මෙය රටට ඉතාම වැදගත්, විශේෂයෙන්ම නාක්ෂණයට, ඩිජිටල්කරණයට වැදගත් සංශෝධන පනත් කෙටුම්පතක්. ඒ සඳහා සියලුදෙනාගේම සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. කාලයෙන් කාලයට මේ සඳහා නොයෙකුත් අභියෝග තිබුණත්, අපි ඒ සියල්ල ජයග්‍රහණය කරලා, මේ කෙටි කාලය තුළදී අනෙකුත් ප්‍රතිපත්ති, ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළා වාගේම, අපේ අමාත්‍යාවරයා හැටියට ගරු ජනාධිපතිතුමා නායකත්වය දීලා තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. ඒ නිසා මේ පනත් කෙටුම්පත සම්මත කරන්න ඔබ සියලුදෙනාගේ සහයෝගය ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.06]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත විවාදයට ගන්නා අවස්ථාව. අද උදෑසන අධිකරණ ඇමතිතුමා නැවත මතක් කරපු කාරණාවට විශේෂයෙන්ම මෙම සභාවේ අවධානය යොමු කරවන්නට මා කැමැතියි. ගරු අග්‍ර විනිශ්චයකාරතුමා විසින් එවා ඇති ලිපිය සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති ජයන්ත ජයසූරිය අග්‍ර විනිශ්චයකාරතුමා සහ අධිකරණ සේවා සංගමයේ සාමාජික විජිත් කේ. මලල්ගොඩ, ඊ.ඒ.ජී.ආර්. අමරසේකර යන විනිශ්චයකාරවරුන් දෙදෙනාගේ අත්සනින් යුතුව එවා තිබෙන වාර්තාව ගරු කථානායකතුමා සභාගත කළා. ඇත්තටම එම වාර්තාවෙන් සහ ලිපියෙන් ඇමතිතුමා මතු කරපු කරුණු බොහොමයක් නිෂේධ වෙලා තිබෙනවා. හැබැයි, එහෙම නිබියදී එතුමා නැවත ඒ කාරණය මතු කළා.

මුල්ම කාරණාව මේකයි. මේ ඉදිරිපත් කර තිබෙන ලිපියේ ඉතා පැහැදිලිව තිබෙනවා, උපරිමාධිකරණවල පවතින පුරප්පාඩු සම්බන්ධයෙන්. ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩු දෙකක්, අභියාචනාධිකරණයේ පුරප්පාඩු පහක් තිබෙනවා. මේ ලිපියේම සඳහන් වෙනවා, අභියාචනාධිකරණයේ පුරප්පාඩු ඇති වෙලා

[ගරු විජිත හේරත් මහතා]

තිබෙන්නේ 2023 සැප්තැම්බර් මාසයේ සිට කියලා. මේ වෙනකොට 2023 සැප්තැම්බර් මාසයේ ඉඳලා 2024 ජූලි මාසය දක්වා කාලය ගතවෙලා තිබෙනවා. අභියාචනාධිකරණයේ තිබෙන පුරප්පාඩු පහ පුරවන්න කිසිදු නෛතික බාධාවක් නැහැ. ඊට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අතුරු නියෝගයක් දීලා නැහැ. Appeal Court එකේ තිබෙන ඒ පුරප්පාඩු සඳහා නිර්දේශ වුණු නම් පහකුත් යවලා තිබෙනවා. එසේ තිබියදී අභියාචනාධිකරණයට අවශ්‍ය විනිශ්චයකාරවරු පස්දෙනා පත් කරන්න ආණ්ඩුව සමත් වෙලා නැහැ. ඒක ආණ්ඩුවේ වරදක් මිසක් කාගේවත් වරදක් නොවෙයි. ඒකට අධිකරණ සේවා කොමිසමේ ලේකම්ට බැණලා වැඩක් නැහැ. ඒකට ඇමතිතුමා සහ ආණ්ඩුව වග කියන්න ඕනෑ. ජනාධිපතිවරයා ඒ පත්වීම්වලට අදාළ නම් යවන්න ඕනෑ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඒවා අනුමත කරලා එවන්න ඕනෑ. එහෙම නොවීම ආණ්ඩුවේ නොහැකියාව. ඒකට කාගේවත් පිට වරද පටවන එක සම්පූර්ණයෙන් වැරැදියි.

ඊළඟට, ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩු දෙක ගැන කිව්වොත්, පළමු පුරප්පාඩුව ඇති වෙලා තිබෙන්නේ 2023 නොවැම්බර් 15වන දින කියලා මේ ලිපියේ ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා. මේ අතුරු නියෝගය නිකුත් කරන්නේ 2024 අප්‍රේල් 30වැනි දා. එතකොට නොවැම්බර් මාසයේ 15වැනි දා ඉඳලා 2024 අප්‍රේල් 30වැනි දා දක්වා මාස පහමාරක කාලයක් තිබිලා තිබෙනවා. ඒ මාස පහමාරක කාලය ඇතුළත ආණ්ඩුව ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩු දෙක පුරවලා නැහැ නේ. ඒකට හේතුව මේ අතුරු නියෝගය නොවෙයි. මේ අතුරු නියෝගය පිළිබඳව අපටත් ප්‍රශ්නයක් තිබෙනවා. බන්දුල කරුණාරත්න විනිශ්චයකාරතුමාගේ පත්වීම පිළිබඳව ලබා දීපු අතුරු නියෝගයත් එක්ක ශ්‍රේෂ්ඨාධිකරණයේ ඒ පුරප්පාඩු පිරවීම පිළිබඳව ගැටලුවක් තිබෙනවා. හැබැයි, ඊට කලින් මේ vacancies ඇතිවෙලා ලොකු කාලයක් ගතවෙලා තිබෙනවා. නමුත්, ඒ සඳහා පත් කිරීම් කරලා නැහැ. ඒකට අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයාට තඩි බාලා හරියන්නේ නැහැ. ඒක ආණ්ඩුවේ වැරැද්ද. තමන්ගේ වැරැද්ද වහගෙන නේ වෙනත් අයට අභූත චෝදනා ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ ලිපියේ ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා, "තවද ගරු අමාත්‍යතුමාගේ ප්‍රකාශය තුළදී ගරු අමාත්‍යතුමා ද පාර්ශ්වකරුවකු වන්නා වූ කොළඹ දිසා අධිකරණයේ පවත්නා නඩු කටයුත්තකදී ලබා දුන් නියෝග සම්බන්ධයෙන් ගරු කොළඹ දිසා විනිසුරුතුමා නම් කරමින් දෝෂ දර්ශනයට ලක්වීමක් සිදු වී ඇත" යනුවෙන්. මේක පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 91.(ඊ) යටතේ ප්‍රශ්නසහගතයි. ඒක මේ වාර්තාවේ සඳහන්ව තිබෙනවා. ඒ පිළිබඳව කිසිදු සඳහනක් කළේ නැහැ. ඒක ඉතාම බරපතළයි. ඉතින්, අධිකරණ ඇමතිතුමා දාපු නඩුවකට එරෙහිව දිසා විනිසුරුවරයෙක් තීන්දුවක් දුන්නාය කියලා මේ කොහේවත් සිටින අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයාට බැණලා හරියන්නේ නැහැ.

මා දන්නා විධියට නම් අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයා පත් කිරීමේදී අවුරුදු 3ක කාලයක් සඳහා විතරයි පත් කරන්නේ කියලා ව්‍යවස්ථාවේ කොහේවත් නැහැ. එහෙම අවුරුදු 3ක කාල සීමාවක් පමණක් කවුරුවත් ඉඳලාත් නැහැ. හැමෝම ඊට වඩා කාලයක් ඉඳලා තිබෙනවා. දැන් සිටින ලේකම්වරයාත් අවුරුදු 6ක කාලයක් ඉඳලා තිබෙනවා. ඇත්ත, 2018 තමයි ඔහු පත් කරලා තිබෙන්නේ. හැබැයි, අනිවාර්යයෙන් අවුරුදු තුනෙන් යන්න ඕනෑ කියලා ව්‍යවස්ථාවේ කොහේවත් නීතියක් නැහැ. එතකොට එතැන වැරැද්ද තිබෙන්නේ කොහේද? වැරැද්ද තිබෙන්නේ හදපු නීතියේ නේ. ඒක නේ වෙනස් කරන්න ඕනෑ. ඒකට ලේකම්වරයාට බැණලා හරියන්නේ නැහැ නේ. ඇත්තටම ගත්තොත්, මෙතැන මේ චෝදනා එකින් එක පිළිබඳව පැහැදිලි කරලා තිබෙනවා. එකක් තමයි ලොකු ආන්දෝලනයකට ලක් වෙච්ච මේ පුරප්පාඩු පිරවීම පිළිබඳ ප්‍රශ්නය. ඉතා පැහැදිලිව අභියාචනාධිකරණයේ තිබෙන පුරප්පාඩු පහ පුරවන්න දැන් වුණත් කිසිදු නෛතික බාධාවක් නැහැ. ජනාධිපතිවරයාට කරන්න තිබෙන්නේ අදාළ නම් නිර්දේශ කරන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට එවන්නයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් ඒවා අනුමත කරලා සතියක් දෙකක් ඇතුළත පත් කරන්න පුළුවන්. එහෙම හැකියාව තිබියදී පත් නොකර ඉන්නවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩු දෙක පිරවීම දැනට ප්‍රමාද වැඩියි. හැබැයි, මාස පහමාරක් තිබිලා තිබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩු දෙක පුරවන්නේ නැතිව. ඒකත් ආණ්ඩුවේ නොහැකියාව. ආණ්ඩුව ඒක හිතාමතා නොසලකා හැර තිබෙනවා. ඒ නිසා විශේෂයෙන් අපේ රටේ උපරිමාධිකරණවල නඩු කල් යන්න හේතු වන මේ පුරප්පාඩු නොපිරවීමේ වැරැද්ද සිදු කර තිබෙන්නේ ආණ්ඩුව මිසක් වෙන කවුරුවත් නොවෙයි. ඒක පළමුවැනි කාරණාව.

දෙවැනි කාරණාව, උසාවියේ තිබුණු කෝටි ගණනක් වටිනා විස්කි බෝතල් පිළිබඳ ප්‍රශ්නය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා පැහැදිලිව මේ වාර්තාවේ ඒ ගැන තිබෙනවා. 2023 ජනවාරි මාසයේ 2වැනි දා ප්‍රසන්න අල්විස් විනිශ්චයකාරතුමා වැඩ බාර ගත්තාට පස්සේ, ඒ උසාවියේ තිබුණු භාණ්ඩ පිළිබඳ වාර්තාවක් ගත්තාට පස්සේ මේ තොරතුරු අනාවරණ වෙනවා. ඒ පිළිබඳව පරීක්ෂණයක් ආරම්භ කරලා දෙදෙනෙකුගේ වැඩ තහනම් කරලාත් තිබෙනවා. අධිකරණ ඇමතිතුමා කියන්න කලින් තමයි ඒ පරීක්ෂණ සිද්ධ වෙලා තිබෙන්නේ. ඊයේ පෙරේදා තමයි ඒ එක්කෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ. ඊට කලින් දෙන්නෙකුගේ වැඩ තහනම් කරලා තිබෙනවා. මේ වාර්තාවේම කියනවා, 2023 නොවැම්බර් මාසයේ 16වන දා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මේ පරීක්ෂණයට අදාළ නියෝගයක් නිකුත් කළාය කියලා. එතකොට, මේ ගැන කථා කළාට පස්සේ ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පටන් අරගත්තා නොවෙයි. මේ ගැන අවුරුද්දකට විතර කලින් පරීක්ෂණයක් පටන් අරගෙන තිබෙනවා. ඒ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම සිදු වෙමින් තිබෙනවා.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ කාර්යභාරය වන්නේ විනිශ්චයකාරවරුන් ස්ථාන මාරු කිරීම නොවෙයි. විනිශ්චයකාරවරුන් ස්ථාන මාරු කිරීම සහ විනය පරීක්ෂණ කිරීමේ වගකීම තිබෙන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවට. ඒ ලේකම්වරයාගේ වගකීම තමයි ඒ අදාළ පැමිණිලි, ලේඛන, ලිපි කොමිෂන් සභාව වෙත යොමු කරන එක. මේ වාර්තාවේ ඉතා පැහැදිලිව තිබෙනවා, ලේකම්වරයා ඒ කාර්යභාරය මැනවින් ඉටු කරලා තිබෙන බව. ඒ ආපු ලියුම් කියුම් ඔක්කෝම ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා එක එක්කෙනා නිර්නාමිකව එවන පෙත්සම් අරගෙන මේ සභාවට ඇවිල්ලා චෝදනා නහන එක සාධාරණ නැහැ, යුක්තිසහගත නැහැ. හොරට ලයිට් ගත්තා, වතුර ගත්තා කියලා චෝදනා තිබෙනවා. ඒවා ගැන පරීක්ෂණයක් තිබෙනවා කියලා මේ වාර්තාවේ තිබෙනවා. ඒ ගැන පරීක්ෂණයක් වෙනවා. ඒ අයට අදාළ දඩුවම් ලබා දීම කළ යුතුයි. ඒ පරීක්ෂණයත් ආරම්භ වෙලා තිබෙන්නේ ජූනි මාසයේ 19වන දා, මේ සභාවේ දී කථා කරන්න කලින්. ඒ නිසා මේ වාර්තාව අනුව අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයා මේ සියල්ලට වග කිව යුතුයි කියලා චෝදනා කරන එකේ කිසිදු සාධාරණත්වයක් නැහැ.

යම්කිසි චූදිතයක් අධිකරණ භූමිය තුළ රඳවාගෙන නිදහස් කිරීමේ බලය විනිශ්චයකාරවරයකුට තිබෙනවා. ඒක අපරාධ නඩු විධාන සංග්‍රහයේ 15 (2) වගන්තියේ හරි පැහැදිලිව තිබෙනවා. මම ඒ කොටස කියවන්නම්:

"දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් හෝ නො එසේ ව හෝ වරදකරුවකු බන්ධනාගාරගත කිරීමට යම් ලිඛිත හෝ වෙනත් නීතියකින්

යම් අධිකරණයකට බලය ලැබී ඇති අවස්ථාවක, බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීම වෙනුවට, ඒ අධිකරණය විසින් ආඥාවක් කිරීමෙන්, ඒ ආඥාව කරන දිනයේ අපරාධ 8 නොඉක්මවන්නා වූ, ඒ අධිකරණය විසින් ඒ ආඥාවෙහි නියම කරනු ලබන කාලයක් ඒ වරදකරු ඒ අධිකරණයේ සීමාව තුළ රඳවා තැබිය යුතු බවට ආඥාවක් කරනු ලැබිය හැකි ය."

ඒක තමයි නීතිය. එතකොට අපරාධ නඩු විධාන සංග්‍රහයේ 15 (2) වගන්තියේ තිබෙනවා, යම්කිසි අඩු වැරැද්දක් සම්බන්ධයෙන්, සුළු වැරැද්දක් සම්බන්ධයෙන් ඒ වරදකරු අධිකරණ භූමියේ රඳවාගෙන රාත්‍රී 8.00ට කලින් නිදහස් කරන්න විනිශ්චයකාරවරයාට පුළුවන් කියලා. එහෙම නම් ඒ නීතිය වෙනස් කරන්න ඕනෑ. ඒ විනිශ්චයකාරවරයා වැරදි නැහැ. එවැනි පුද්ගලයෙක් මාස තුනක් විතර බන්ධනාගාරගත කරලා, දහස් ගාණක් වියදම් කරලා එයා නඩත්තු කරන්න තවත් වැය බරක් දරනවා වෙනුවට, ඒ චෝදනාවට දඬුවමක් විධියට දවසක් අධිකරණ භූමියේ රඳවාගෙන නිදහස් කරන්න තමයි ඒ විනිශ්චයකාරවරයා එවැනි තීන්දුවක් දෙන්නේ. නීතිය අනුව තමයි ඒ විනිශ්චයකාරවරයා කටයුතු කරලා තිබෙන්නේ. නීතිය හදලා තිබෙන්නේ එහෙම. නමුත් ඒ විනිශ්චයකාරතුමා එක්ක පෞද්ගලික හේතුවක් මත මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒක වෙනම බෙරා ගන්න ඕනෑ. එහෙම නම් ඒ නීතිය වෙනස් කරන්න. ඒ නීතිය වෙනස් කළා නම් විනිශ්චයකාරවරුන්ට හැකියාව ලැබෙන්නේ නැහැ, අධිකරණ සීමාව තුළ රෑ 8.00 වෙනකම් පුද්ගලයෙක් තියාගෙන නිදහස් කරන්න. මේ වාර්තාව සභාගත කරලා තිබෙනවා. එය රටේ ජනතාවට දැක බලාගන්න පුළුවන්.

අපි ඉතා පැහැදිලිව කියනවා, අධිකරණයේ ස්වාධීනත්වයට මේ විධියට බලපෑම් කරන්න එපා කියලා. තමන්ගේ පෞද්ගලික හේතුවක් මත, තමන්ට එරෙහිව ලැබුණු අධිකරණ තීන්දුවක් මත පදනම්ව බලය පාවිච්චි කරලා අධිකරණයේ ස්වාධීනත්වයට මේ විධියට චෝදනා නහන එක වැරදියි. ඉතා පැහැදිලිව අපේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කළ යුතුයි. නීතීඥවරු ඒ වෙනුවෙන් තමයි හඬ නැඟුවේ. අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් කෑ ගහපු නීතීඥවරු තමන්ගේ පෞද්ගලික දෙයක් වෙනුවෙන් නොවෙයි උද්ඝෝෂණය කළේ. ඒ නිසා ඒ ගොල්ලන්ට චෝදනා කරලා මේ චෝදනාවෙන් බැහැර වෙන්න බැහැ. ඇත්තටම අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න නම් පෞද්ගලික, පටු චුවමනා පැත්තක තියලා අධිකරණයේ ස්වාධීනත්වයට ඇහිලි නොගසා ඉන්න ඕනෑ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා කිසිදු දේශපාලනඥයකුගේ කීම්වලට අවනත වෙන්නේ නැහැ, ඒවාට අනුව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය. ඒක තමයි මේ රිදිලා තිබෙන්නේ. ඒ නිසා අපි එවැනි ස්වාධීන නිලධාරීන්ට භයියක් විය යුතුයි. එහෙම නැති වුණොත් ඒ වගකීම භාර ගන්න තවත් ලේකම්වරයෙක් එන්නේ නැහැ. ඒ නිසා අධිකරණයේ ස්වාධීනත්වය, ඒ නිලධාරීන්ගේ අයිතිය වෙනුවෙන් මේ පාර්ලිමේන්තුව පෙනී ඉන්න ඕනෑ කියලා අපි කියනවා. මේ රටේ ජනතාව ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. ඒ නිසා මෙවැනි ප්‍රකාශවලට භය නොවී කොන්ද කෙළින් තියාගෙන තමන්ගේ රාජකාරිය ඉටු කරන්න කියමින්, මා නතර වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Mujibur Rahuman. You have 15 minutes.

[අ.භා. 12.16]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපි විවාද කරන්නේ ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවයි. අප සියලුදෙනා අතරම පසුගිය කාලය පුරාම විශාල කසුකුසුවක් තිබුණා, මේ රටේ ජනාධිපතිවරණය පවත්වනවාද, නැද්ද කියලා. ජනතාව අතරත් එවැනි සැකයක් තිබුණා. එහෙම සැකයක් ඇති වුණේ ජනාධිපතිතුමාගේ හැසිරීමත්, ජනාධිපතිතුමාගේ පක්ෂයේ මහ ලේකම්තුමායි, එතුමා වටේ ඉන්න ගෝල බාලයෝයි මාධ්‍යයට ඇවිල්ලා ජනාධිපතිවරණය අවුරුද්දකින් කල් දාගන්න ඕනෑය කියලා කරපු ප්‍රකාශත් නිසායි. මේ ජනාධිපතිතුමාගේ ධුර කාල සීමාව පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් වුණා. එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්වරයාගේ ඒ කථාවේ ඉඳන්, ඒ සභාපතිවරයාගේ කථාවේ ඉඳන් ජනාධිපතිවරණය අවුරුද්දකින් කල් දාන්න ඕනෑය කියලා ඇති කරපු විවාදයක දිගුවක් හැටියට තමයි ශ්‍රේෂ්ඨාධිකරණයට ඒ පෙත්සම ඉදිරිපත් වුණේ. ඒ නිසා මේක අහඹු සිදුවීමක් නොවෙයි. ඒ පෙත්සම්කරු රෑ නිදාගෙන ඉඳලා උදේ නැඟිටලා ගිහිල්ලා ඉදිරිපත් කරපු පෙත්සමක් නොවෙයි, මේක. සංවිධානාත්මක අපරාධ කියන්නේ මේවාට තමයි. සංවිධානාත්මක වෙලා තමයි මේවා කළේ. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඊයේ ඒ පෙත්සම ප්‍රතික්ෂේප කළා. ඒ පෙත්සම ප්‍රතික්ෂේප කරලා ශ්‍රේෂ්ඨාධිකරණය පැහැදිලිව කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයාගේ කාල සීමාව පිළිබඳව පැහැදිලිව කියා තිබෙනවා කියලා. ඒ කාලය, අවුරුදු 5යි. අපි ස්තුතිවන්ත වෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයට, ඒ විනිශ්චයකාරවරුන්ට. මේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ආරක්ෂා කරන්න ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ආවා. ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ඒම තුළින් -ඊයේ ලබා දුන් ඒ තීන්දුව තුළින්- නැවතත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා ජනතාවගේ ඡන්ද අයිතිය ආරක්ෂා කරගන්න අපට පුළුවන්කම ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්වරයා කිව්වා, ජනාධිපතිවරණය අවුරුද්දකින් කල් දාගන්න ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ගේනවා කියලා. කැබිනට් ඇමතිවරු මේ සභාවේ ඉන්නවා. ඒ ඇමතිවරුන්ගෙන් මම අහනවා, ජනාධිපතිතුමා එහෙම යෝජනාවක් ගෙනාවාද කියලා. එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්වරයා කිව්ව ඒ කථාවේ සත්‍යතාව පිළිබඳව මේ පාර්ලිමේන්තුවට පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මොකද මේ රටේ ජනතාව රවටිටන්න, ජනාධිපතිවරණය නොපවත්වනවා කියලා රට තුළ මතයක් ඇති කරන්න මේ දවස්වල විශාල මෙහෙයුමක් දියත් වෙනවා. මේ දවස්වල එක එක්කෙනා එක එක දේවල් කියලා බලනවා, මේ ජනාධිපතිවරණය නොපවත්වා ඉදිරියට යන්න පුළුවන්ද කියලා. මේ පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වුණාම ජනාධිපතිවරයා එක පාරටම ඇවිල්ලා කිව්වා, අවුරුදු පහ ඉවරවෙනකොට ජනාධිපතිවරණය තිබෙනවා කියලා. ජනාධිපතිතුමා එහෙම කිව්වාට, එතුමාගේ ධුර කාලය අවුරුදු 6යි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය නිකම් හරි කියා තිබුණා නම්, එතකොට ජනාධිපතිතුමා කියාවි, "මට කරන්න දෙයක් නැහැ, ධුර කාලය අවුරුදු 6ක් කියලා අධිකරණය කියා තිබෙනවා, ඒ නිසා මම තව අවුරුද්දක් ඉන්නවා" කියලා. ජනාධිපතිතුමා බැලුවේ, ඔරුව මොන අතට පෙරළුණත්, ඒකෙන් ගොඩ යන්න පුළුවන්ද කියලායි. ඒක තමයි ජනාධිපතිතුමාගේ අදහස වුණේ. නමුත්, එහෙම යන්න බැහැ කියලා අපි කලින්ම කිව්වා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයට තිබෙන ඒ අයිතිය පිළිබඳව පසුගිය කාලය පුරාම ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශ රාශියක් ඉදිරිපත් කළා. ඒ විතරක් නොවෙයි. පළාත් පාලන මැතිවරණය සම්බන්ධ නඩුව අධිකරණයේ විභාග වෙනකොට එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, කොහේද ඡන්දයක් තියන්නේ කියලා. ඒ වාගේම එතුමා කිව්වා, තියන්න ඡන්දයකුත් නැහැයි කියලා. නඩු අහන්නේ මොකටද කියලාත් ඇහුවා. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලායි එතුමා එහෙම කිව්වේ. ජනාධිපතිවරයා පසුගිය කාලය පුරාම අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑම් කරන්න පුළුවන් ප්‍රකාශ රාශියක් කළා.

මේ මෑතකදී ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා LGBTQ+ community එක පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය දීපු පැහැදිලි කිරීමට, නිර්වචනයට එරෙහිව "judicial cannibalism" කියලා කිව්වා. ඒ කියන්නේ, මිනී මස් කෑම. එහෙමයි ජනාධිපතිතුමා ඇවිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණය දීපු නිර්වචනය පිළිබඳව පාර්ලිමේන්තුවේ කථා කළේ. එසේ කථා කළා වාගේම එතුමා එදා මේ පාර්ලිමේන්තුවම නොමහ යැව්වා. අපට මතකයි, කොවිඩ්-19 ආසාදනය වෙලා මිය ගිය මුස්ලිම් අයගේ මෘතදේහ ආදාහනය කරනවාද, භූමදානය කරනවාද කියන ප්‍රශ්නය ආවාම එදා ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ බව. ඒ පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළාම ශ්‍රේෂ්ඨාධිකරණය එය විභාග කළේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය ඒ පෙත්සම විභාග කරන්නේ නැතුව ප්‍රතික්ෂේප කළා. ශ්‍රේෂ්ඨාධිකරණය එම පණිවුඩය දුන්නේ කොවිඩ්-19 ආසාදිත මුස්ලිම් අයගේ මෘතදේහ ආදාහනය කරනවාද, භූමදානය කරනවාද කියන තීන්දුව ජනාධිපතිවරයාටයි, පාර්ලිමේන්තුවටයි -ව්‍යවස්ථාදායකයටයි- ගන්න කියලායි. නමුත්, ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මොකක්ද කිව්වේ? ජනාධිපතිතුමා කිව්වා, ශ්‍රේෂ්ඨාධිකරණය එදා විරුද්ධ වුණා, ඒ හින්දා රාජපක්ෂලාගේ ආණ්ඩුවට ශ්‍රේෂ්ඨාධිකරණය ගත්ත ඒ තීන්දුවට එරෙහිව යන්න බැහැ කියලා. ජනාධිපතිතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කිව්වා. ශ්‍රේෂ්ඨාධිකරණය ඒ සම්බන්ධයෙන් තීන්දුවක් දුන්නේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය ඒ පෙත්සම විභාග කළේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය ඒ පෙත්සම විභාග කරන්නේ නැතුව කිව්වා, විධායකයයි, පාර්ලිමේන්තුවයි -ව්‍යවස්ථාදායකයයි- ඒ ගැන තීන්දුවක් ගන්න කියලා.

බලහත්කාරයෙන් ඒ මරණ ගෙනැල්ලා ආදාහනය කිරීමේ පාපකර්මයට හවුල් වෙච්ච ඒ ආණ්ඩුව -රාජපක්ෂලා- බේරාගන්න රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා පසුගිය දිනක පාර්ලිමේන්තුවට ඇවිල්ලා පොඩි උත්සාහයක් දැරුවා. දැන් එතුමාගේ උත්සාහය තමයි, රාජපක්ෂලා බේරාගන්න එක. අපි දැක්කා නේ, එතුමා කළුතර ගිහිල්ලා කරපු කථාව. එතුමා කරන කථා අපට ජේනවා නේ. එතුමාගේ nomination එක සහතික කරගන්න රාජපක්ෂලා බේරාගන්න කථා තමයි මේ දවස්වල කියන්නේ. කොවිඩ්-19 ආසාදිත මුස්ලිම් අයගේ මෘතදේහ ආදාහනය කරනවාද, භූමදානය කරනවාද කියන ප්‍රශ්නයේදීත් එතුමා කිව්වේ ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන්නා කියලා. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන්නේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය එම නඩුව අහන්න බැහැ කියලා ප්‍රතික්ෂේප කළා. ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වා, ව්‍යවස්ථාදායකයට හරි විධායකයට හරි ඒ ගැන තීන්දුවක් ගන්න කියලා. එදා ව්‍යවස්ථාදායකයයි, විධායකයයි -ඒ කියන්නේ ගෝඨාභය රාජපක්ෂලාගේ ආණ්ඩුව, මේ කැබිනට් මණ්ඩලයේ ඉන්න උදවිය- බලහත්කාරයෙන් ඒ මරණ ටික පුච්චන තීන්දුව ගත්තා. ඒ හින්දා අපි ජනාධිපතිතුමාට කියනවා, ඒ පාපකර්මයට හවුල් වෙච්ච උදවිය බේරාගන්න එපා කියලා. ඒ පාපකර්මයට හවුල් වෙච්ච උදවියට සමාවක් ලැබෙන්නේ නැහැ කියන එකත් අපි කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි කියන්න ඕනෑ තව එක දෙයක් තිබෙනවා. අධිකරණය පසුගිය කාලයේ දීපු තීන්දු අනුව, අධිකරණය ජනාධිපතිතුමාට පක්ෂව තීන්දු දුන්නාම අධිකරණයේ ස්වාධීනත්වය තිබෙනවා. ජනාධිපතිතුමාට විරුද්ධව තීන්දු දුන්නාම අධිකරණයේ ස්වාධීනත්වය නැහැ. එතකොට judicial cannibalism තමයි තිබෙන්නේ. මිනී මස් කන අය. කන්න ඕනෑ වුණාම කබරගොයාත් තලගොයා කරගන්න ප්‍රතිපත්තිය තමයි, අධිකරණය පිළිබඳව ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ ප්‍රතිපත්තිය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම දැන් මැව් එක ගහන්නත් ලෑස්ති වෙලා තිබෙන බව අපි කියන්න ඕනෑ. දැන් මැව් එක නොගහා ඉන්න නේ, ජනාධිපතිතුමා හදන්නේ. එතුමා ground එකට එන්නේ නැතුව එක එක්කෙනා ලවා ground එකට එක එක දේවල් හරහා බලපෑම් කරලා බලනවා. ජනාධිපතිතුමාට අපි එදාත් කිව්වා, මැව් එක ගහමු, හැබැයි umpire වෙන්න එපා කියලා. දැන් එතුමා බලනවා, ground එකෙන් එළියේ ඉඳගෙන අඩුම ගණනේ "ඩක්වර්ත්-ලුවිස්" ක්‍රමයට හරි මැව් එක දිනන්න. එතුමා දැන් උත්සාහ කරන්නේ ඒකට. නමුත්, ඒක කරන්න බැහැ. ඒක කරන්න මේ රටේ ජනතාව ඉඩ දෙන්නේත් නැහැ. ඒ හින්දා අපි මේ ආණ්ඩුවට කියනවා, වහාම ඔය ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාදාමය නවත්වන්න කියාත්, අධිකරණයට තමන්ගේ ඉත්තන් යවලා තමන්ට අවශ්‍ය දේ අධිකරණයෙන් කරගන්න බලපෑම් කරන එක නවත්වන්න කියාත්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න කියාත්, ජනතාවගේ ඡන්ද අයිතිය ආරක්ෂා කරන්න කියාත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි අපි දැක්කා, ඊයේ-පෙරේදා හිරුණිකා ප්‍රේමචන්ද්‍ර හිටපු මන්ත්‍රීතුමියට අධිකරණයෙන් ලබා දීපු තීන්දුව.

ඒ තීන්දුවට එරෙහිව එතුමිය ඉහළ උසාවියට යනවා. ඒ හින්දා මම ඒ තීන්දුව ගැන කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත්, හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මැතිනියට එල්ල කළ චෝදනාවම එල්ල කරමින් පසුගිය කාලයේ මේ රටේ පැවරූ නඩු ටිකක් තිබෙනවා. තාජුඩීන් පැහැරගෙන ගිහිල්ලා ඝාතනය කළා. පෝද්දල ජයන්ත පැහැරගෙන ගිහිල්ලා කකුල් කඩලා දැම්මා. කීත් නොයාර් පැහැරගෙන ගිහිල්ලා වධ හිංසා කළා. එක්නැලිගොඩ පැහැරගෙන ගිහිල්ලා අතුරුදහන් කළා. නමුත්, ඒ නඩු වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව ඇයි ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ? ඇයි, නීතිපති දෙපාර්තමේන්තුව හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඒ නඩු සම්බන්ධව තමන්ගේ හැකියාව හා තමන්ගේ ක්‍රියාශීලිත්වය පෙන්වන්නේ නැත්තේ? අපි දන්නවා, හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මැතිනිය මේ ආණ්ඩුවට විශාල හිසරදයක් වෙලා තිබුණු බව. කොහොම හරි එතුමිය අල්ලාගෙන ඇතුළට දමන්න ඕනෑ කියලා නීතිපති දෙපාර්තමේන්තුව ඉතා වේගයෙන් වැඩ කරලා, අන්තිමට දැන් එතුමියට ඇප දෙනවාටත් විරුද්ධ වෙලා තිබෙනවා. ඒ හින්දා තමයි නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කෙනෙක් ඉඳිද්දී, ඊට වඩා පහළින් ඉන්න -කනිෂ්ඨ- කෙනෙක් නීතිපතිතුමා හැටියට පත් කර ගත්තේ. ඒ, රනිල් වික්‍රමසිංහ මැතිතුමාටයි, ආණ්ඩුවටයි ඕනෑ විධියට නීතිපති දෙපාර්තමේන්තුව හසුරුවන්න පුළුවන් නිසා. නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කෙනෙක් ඉන්නවා. ඒ, කාන්තාවක්. ඇයි, එතුමියට ඒ පත්වීම දෙන්න බැරි? එතුමියට නැති සුදුසුකම්

මොකක්ද? එතුමියට සුදුසුකම් ඔක්කොම තිබෙනවා. හැබැයි, එතුමියට එක සුදුසුකමයි නැත්තේ. ඒ තමයි, ආණ්ඩුව කියන දේවල් කරන්න එතුමිය ලෑස්ති නැති එක. ඒ හින්දා තමයි එතුමියට ඒ තනතුර නොදී තමන්ගේ වුවමනා ඉෂ්ට කරගන්න පුළුවන් කෙනෙක් අද නීතිපතිවරයා හැටියට පත් කරගෙන ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ටිරාන් අලස් ඇමතිතුමාගේ උපදෙස් මත "යුක්තිය" මෙහෙයුම ක්‍රියාත්මක වෙනවා. ඒ යුක්තිය මෙහෙයුමට මේ රටේ ඉන්න පොඩි-පොඩි අය, ලොකු-ලොකු අය, සාමාන්‍ය උදවිය ඔක්කොම අහු වෙනවා.

මෑතකදී ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දුන්නා, මේ රටේ පුරවැසිකමක් නැතිව පාර්ලිමේන්තුවේ සිටීම නීති විරෝධී බව සඳහන් කරමින්. එම තීන්දුව ලැබුණු කෙනා දැන් එළියේ ඉන්නවා. නමුත් එතුමිය අත්අඩංගුවට ගන්නේ නැහැ. එතුමියට වීසා එකකුත් නැහැ; පුරවැසිකමකුත් නැහැ. ඇයි, එතුමිය අත් අඩංගුවට ගන්නේ නැත්තේ? යුක්තිය මෙහෙයුම ක්‍රියාත්මක කරන පොලිස්පතිතුමාගෙනුයි, ඇමතිතුමාගෙනුයි අපි අහනවා, ඩයනා අහු වෙන්නේ නැත්තේ ඇයි කියලා. සමහර විට ඒ Lady Diana කියලා හිතාගෙන ඉන්නවාද දන්නේ නැහැ. ඒ හින්දා ද දන්නේ නැහැ, ඒගොල්ලන්ගේ මෙහෙයුම්වලට එතුමිය අහු වෙන්නේ නැත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිව මේ කාරණය ආණ්ඩුවට කියනවා. අද වාගේ දවසක තමයි මේ රටේ නීතිය, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න ජනතාවගේ විශාල නැඟී සිටීමක් ඇති වුණේ. ඒ නැඟිටීම හරහා මේ රටේ ජනතාව ඉල්ලුවේ නීතියේ ආධිපත්‍යය ඇති කරන්න, වංචා, දූෂණ නවත්වන්න, මේ රටේ විනිවිදභාවයකින් යුතු රාජ්‍ය පාලනයක් ඇති කරන්න කියායි. අද වාගේ දවසක තමයි ඒ වෙනුවෙන් මේ රටේ ජනතාවගේ විශාල නැඟී සිටීමක් සිද්ධ වුණේ. එදා මේ රටේ ජනතාව පාලන බලයේ හිටපු පාලකවරයා පලවා හැරලා විශාල පරිවර්තනයක් ඉල්ලුවා. නමුත්, අපට පෙනෙනවා, ඒ ජනතාවගේ නැඟිටීම හරහා බලයට ආපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඒවාට ඇහුම්කන් නොදී නැවත වතාවක් මේ රටේ අන්ත දූෂිත, නීතියේ ආධිපත්‍යයෙන්, පාලනයෙන් තොර ප්‍රජාතන්ත්‍ර විරෝධී කටයුතු මෙහෙයවමින් අද වනකොට ඒ බලය නැවත තහවුරු කර තිබෙන බව. ඒ පැත්තට තමයි මේ රට නැවතත් ගමන් කරන්නේ. මේ රට විනාශ කළ උදවියත් එක්ක එකතු වෙලා, මේ රටේ ආර්ථිකය විනාශ කළ උදවියත් එක්ක එකතු වෙලා, මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය ආර්ථික ඝාතකයන් කියලා -මේ රට විනාශ කළ උදවිය ශ්‍රේෂ්ඨාධිකරණය නම් කළා- නම් කරපු උදවියත් එක්ක එකතු වෙලා, අද වනකොට ජනාධිපතිතුමා විශාල ජනඟමු පවත්වනවා. ලජ්ජයි! මොකද, මේ රටේ උත්තරීතර අධිකරණය කිව්වා, මේ රටේ ආර්ථිකය නිකම් වැටුණේ නැහැ, ස්වභාව ධර්මයෙන් ආර්ථිකය පහළට වැටුණේ නැහැ කියලා. මේ රටේ ආර්ථිකය වටිටන්න තීන්දු ගත්ත උදවිය කවුද කියලා ශ්‍රේෂ්ඨාධිකරණය නම් කරලා කිව්වා. ඒ උදවියත් එක්ක ජනාධිපතිවරයා එකට රැස්වීම් තියන තත්ත්වයක් අද වනකොට ඇති වෙලා තිබෙනවා. එවැනි ජනාධිපතිවරයෙකුගෙන් අපි කොහොමද බලාපොරොත්තු වෙන්නේ, මේ රටේ වංචා, දූෂණ නවත්වයි, මේ රටේ ආර්ථිකය ගොඩ දමයි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරයි කියලා? ඒ හින්දා අපි ආණ්ඩුවටයි, ජනාධිපතිවරයාටයි මේ කාරණය කියනවා. ලබන සතිය වනකොට ජනාධිපතිවරණයට දින නියම කරනවා. මැතිවරණ කොමිසමට ඒ බලතල සියල්ල ලැබෙනවා. ඒ අනුව මේ රටේ ජනතාවට කැමැති ජනාධිපතිවරයෙක් පත් කරගැනීමේ අවස්ථාව තව සති කිහිපයකින් උදා වෙනවා.

විශාල නැඟිටීමක් හරහා මේ රටේ ජනතාව අපට ලබා දීපු ඔවුන්ගේ බලාපොරොත්තු ටික ඉෂ්ට කිරීමේ වගකීම ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වයත් එක්ක සමගි ජන බලවේගය හැටියට අපි භාර ගන්නවාය කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Jayantha Weerasinghe. You have 17 minutes.

[අ.භා. 12.31]

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන සිටියාම මට හිතුණා, අපි දැන් මේ කථා කරන්නේ මොන පනතක් ගැනද කියලා. ඒ නිසා මම ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතට පමණක් අවධානය යොමු කරලා කථා කරනවා. ගරු කනක හේරත් රාජ්‍ය ඇමතිතුමාට මම මුලින්ම ස්තුතිවන්ත වනවා, මේ වාගේ ඉතාම වටිනා, කාලෝචිත පනතක් ගෙන ඒම ගැන. මෙම පනත ගෙන ඒමට මෙච්චර පරක්කු වෙච්ච එකයි පුදුමය.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order please! Will an Hon. Member propose the Hon. Imran Maharoof to the Chair?

ගරු රෝහණ දිසානායක මහතා (ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு றோஹண திஸாநாயக்க - விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Rohana Dissanayaka - State Minister of Sports and Youth Affairs)
Sir, I propose that the Hon. Imran Maharoof do now take the Chair.

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

වීසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM left the Chair, and THE HON. IMRAN MAHAROOF took the Chair.

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් සෑම දෙයම වෙනස් වුවත් ගත වූ අවුරුදු 28 තුළ මේ පනත හෙල්ලුනේවත් නැහැ. අපි කවුරුත් දන්නවා, මෙම පනත දැන් නීතිපති දෙපාර්තමේන්තුවට ගිහිල්ලා, එතැනිනුත් නියම අභිමතය - approval - ලැබිලා තිබෙන බව. මෙම පනතින් ඇත්තටම මෙච්චර කල් අඩු පාඩුවක්ව තිබුණු විශාල පරාසයක වැඩ කොටසක් සිද්ධ වනවා. මේකෙන් රටට යහපතක් සිද්ධ වනවා; තාක්ෂණය නැතුව දුක් විඳින පාසල් දරුවන්ට ඒ අවස්ථාව ලැබෙනවා. එම නිසා නැවතත් ගරු කනක හේරත් රාජ්‍ය ඇමතිතුමාට මගේ ස්තුතිය පුද කරනවා. මම ඉස්සෙල්ලාම පෙන්වන්න ඕනෑ, ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥවරයකු හැටියට ඇහැට දකින මෙන්න මේ දේ මේ වගන්තිවල තිබෙන බව.

මම පටන් ගන්නේ පනතේ 30වන වගන්තියෙන්. 30වන වගන්තිය දාලා තිබෙන්නේ "වංචනික හෝ අපරාධ ක්‍රියා සිදු කිරීම සඳහා සාවද්‍ය තොරතුරු ලබා දීමේදී සිම් කාඩ්පත් ලබා ගැනීම වරදක් ලෙස ස්ථාපිත කරමින් ඊට එරෙහිව නීති පියවර ගැනීමට ප්‍රතිපාදන ඇතුළත් කර ඇත" කියලා. ඒ කාරණය ලියපු ගරු ඇමතිතුමාගේ කටේ මසුරන් දාන්න ඕනෑ. ජනාධිපති නීතිඥවරයකු හැටියට මම අදත් දකිනවා - අපි මේ කථා කරන මොහොතෙත් - විශේෂයෙන් මත් කුඩු වරද සම්බන්ධ නඩු තිබෙන අය, එහෙම නැත්නම් අපරාධ නඩු තිබෙන අය අද තිබෙන සිම් එක නොවෙයි හෙට පාවිච්චි කරන්නේ කියන එක. අද තිබෙන සිම් එක නොවෙයි ලබන සුමානයේ පාවිච්චි කරන්නේ. මේ විධියට සිම් මාරු කර කර රටේ අපරාධ කරනවා. එවැනි දේවල් වනවා අපි දැකලා තිබෙනවා. ඒක අපි දන්නවා. අන්න එවැනි තත්ත්වයක් වළක්වාලීමට මෙම පනතින් පැහැදිලිව ප්‍රතිපාදන හදලා තිබෙනවා.

ඊළඟට තිබෙනවා, "රට තුළ සිදු වන අපරාධමය ක්‍රියා අවම කිරීමට දායකත්වය සැපයීමට ලැබෙනු ඇත" කියලා. හරියට හරි. මේ වාගේ සිම් කාඩ් මාරු කර කර, හොර නොම්මර අරගෙන අපරාධ කරන අය අල්ලන්න ක්‍රමයක් නැහැ. එම නිසා තමයි මේ පනත ගෙනැල්ලා තිබෙන්නේ. මේ පනතින් තමයි ඒගොල්ලන් කොටු වනවා නම් කොටු වෙන්නේ. මම පනතේ 30වන වගන්තියෙන් පටන් ගත්තේ ඒ දේ සිද්ධ වන නිසායි. අවනීතිය සිදු වන බව මම දිනපතා දකිනවා, අපරාධ නීතිය සම්බන්ධයෙන් කථා කරන ජනාධිපති නීතිඥයකු වශයෙන්. එම නිසා ගරු කනක හේරත් රාජ්‍ය ඇමතිතුමනි, බොහොම ස්තුතියි මෙන්න මේ වගන්තිය ගෙනාවාට.

කරුණු රාශියක්, අඩු ලුහුඬුකම් රාශියක් තිබෙන අවස්ථාවක ඒ සියල්ලම ඉවත් කරන්නයි මේ පනත ගෙනෙන්නේ. මේ පනතින් ඒ වැඩ කටයුතු හරියාකාරව ඉෂ්ට වෙනවා.

දැන් ඔබතුමාගේ අවධානය මම මේ කරණයට යොමු කරනවා. ඒ නීතිමය තත්ත්වය ක්‍රියාත්මක කරනකොට මේ පනතේ ප්‍රතිපාදන බලපාන යම්කිසි කෙනෙකුට අසාධාරණයක් නොවෙන්නත් මේ පනතේ කටයුතු යොදලා තිබෙනවා. මෙහි 18වැනි වගන්තිය අනුව, යම්කිසි කෙනෙකුට විරුද්ධව තීරණයක් ගන්නවා නම් ඒ සඳහා කොමිෂන් සභාව සාධාරණ හේතු දැක්වීමක් කළ යුතුයි. අනික, යම්කිසි කෙනෙකුගේ බලපත්‍ර අවලංගු කරනවා නම් සාධාරණ කාලයක් ලබා දිය යුතුයි කියා සඳහන් කර තිබෙනවා. ඒ වාගේම වන්දි ගෙවීමටත් ප්‍රතිපාදන සලසා තිබෙනවා. අනෙක් අතට යම් බලපත්‍රයක් අවලංගු කළොත් ඒකට විරුද්ධව අභියාචනාධිකරණයට යෑමට තිබෙන ප්‍රතිපාදන වෙනස් නොකර ඒ ආකාරයටම තබා තිබෙනවා. ඉතින් කිසි කෙනෙකුට කියන්න බැහැ, මේකෙන් අහවලාට අසාධාරණයක් වෙනවා, මේකෙන් නීතිය තද වෙනවා කියලා. දැනට නීතියේ තිබෙන බරපතළ අඩු ලුහුඬුකම් මේ පනතින් නිවැරදි කරන අතර, අනෙක් අයටත් පාඩුවක්, අලාභයක් සිදු නොවන ලෙස සර්ව සාධාරණ ලෙස මේ පනත ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි ප්‍රධානම කාරණයක් තිබෙනවා. මෙච්චර කල් සමුද්‍රාන්ත කේබල් - submarine cables - සම්බන්ධයෙන් නිසි නියාමනයක් තිබුණේ නැහැ. මෙච්චර කල් තිබුණු ඒ අඩු පාඩුව මේ පනතින් පැහැදිලිව ඉවත් කරලා තිබෙනවා. මේ කටයුත්ත කිසිම අවස්ථාවක කිසිම රජයකින් මෙච්චර කල් සිදු කළේ නැති දෙයක්. ඒක මේ පනතින් පැහැදිලිව සිද්ධ වෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමා කථා කරනකොට මම අහගෙන හිටියා. එතුමා කිව්වා, මේ පනතින් දුෂ්කර පාසල්වලට සේවා සපයන්නත් හැකි වෙනවා කියලා. ඒක හරියට හරි. ඒ නිසා මේ පනත මේ අවස්ථාවේ ඉතාම කාලෝචිත පනතක් හැටියට මම දකිනවා.

பாராளுமன்றத்தில் பெருந்தோட்டத் தொழிலாளர்களைப் பற்றிப் பேசும்போது, "பாம்புக் கடியிலும் அட்டைக்கடியிலும் அவர்கள் கஷ்டப்படுகின்றார்கள்" என்று எல்லோரும் சொல் கின்றார்கள். உண்மையான அட்டை எதுவென்றால், அந்த பெருந்தோட்ட நிறுவனம்தான்! தோட்ட முகாமையாளர்கள் தான்! நாங்களும் பொறுத்திருந்து பார்த்துவிட்டோம். இன்றைக்கு கிட்டதட்ட ஆயிரக்கணக்கானோர் தலைநகர் கொழும்புக்கு வந்து முதலாளிமார் சம்மேளன அலுவலகத்தின் முன் ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டிருக்கிறார்கள். அதுமாத்திர மல்லாமல் நான் குறிப்பிட்ட ஜனாதிபதி வேட்பாளராக வரவிருப்பவரின் வீட்டுக்கு முன்னாலும் ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டிருக்கிறார்கள். அதை ஆர்ப்பாட்டம் என்று சொல்ல முடியாது. அவர் முதலாளிதானே! தொழிலாளர்கள் முதலாளி யைச் சந்திக்கப் போயிருக்கிறார்கள். நான் இன்னொரு விடயத்தையும் சொல்ல வேண்டும். இன்றைக்கு 1,000 பேர் வந்திருக்கிறார்கள். இப்படியே பெருந்தோட்ட நிறுவனங்கள் அந்த மக்களைத் துன்புறுத்திக்கொண்டு இருந்தால், நாளைக்கு 100,000 தொழிலாளர்கள் தலைநகருக்கு வந்து ஆர்ப்பாட்டத் தில் இறங்குவார்கள்.

இந்த நாட்டைப் பொறுத்த வரைக்கும் இங்கே இருக்கின்ற மாற்றுச் சமூகத்தைச் சார்ந்த இலங்கையர்களுக்குப் பெருந் தோட்ட மக்களைப் பற்றி தொிவதில்லை. அந்த மக்கள் யார் என்று புரிவதில்லை. நான் மறுபடியும் சொல்கிறேன். இன்று மலையக மக்கள் என்றால், அவர்கள் தோட்டத் தொழிலாளர் கள் என்றுதான் எல்லோரும் நினைக்கிறார்கள். இன்றைக்கு மலையகத்தில் 115,000 தோட்டத் தொழிலாளர்கள் இருக்கிறார் கள். அவர்களை நம்பி 800,000 பேர் இருக்கிறார்கள். அவர்கள் பல்வேறு இடங்களில் சாதனை செய்திருக்கிறார்கள். ஆனால், அவர்களுக்கு அங்கீகாரம் கிடைக்கவில்லை. ஏனென்றால், இந்த நாட்டைப் பொறுத்தவரைக்கும் இவர்கள் தோட்டத் தொழிலாளர்கள் என்றுதான் முத்திரை குத்தப்பட்டிருக்கின்றது. அதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது.

அதைவிட, இன்றைக்கு பெருந்தோட்ட நிறுவனங்கள் வெறும் தேயிலைத் தொழிலை மட்டும் நம்பி இருக்கவில்லை. அங்கு பல்வேறு பங்களாக்கள் இருக்கின்றன. அவை அரசாங்கத்திற்குச் சொந்தமான காணிகளில் இருக்கின்றன. அது அரசாங்கத்தின் சொத்தாகும். ஆனால், அவர்கள் இந்த பங்களாக்களை ஹோட்டல்களாக மாற்றி ஒவ்வோர் அறைக்கும் 2,000, 3,000 டொலர் எனச் சம்பாதிக்கின்றார்கள். ஆனால், ஓர் ஏக்கருக்கு 500 ரூபாய் மட்டும்தான் வரி செலுத்துகின்றார்கள். அதுமட்டுமல்லாமல் இன்றைக்கு இந்த நிறுவனங்களில் எவ்வளவு பெரிய அநீதி நடக்கின்றதென்று எல்லோரும் தெரிந்தும் தெரியாததுபோல் இருக்கிறார்கள். அன்றைக்கு நான் ஒரு estateஇல் பிரச்சினை பண்ணினேன் என்று எல்லோரும் பேசினார்கள். அதேநேரம் அக்கரபத்தன யில் உள்ள ஒரு தொழிலாளர் அடிவாங்கியபோது யாரும் அது தொடர்பில் பேசவில்லை. அவருக்கு யார் அடித்தது? தோட்ட முகாமையாளர். கஹவத்தை தோட்டத்தில் ஒரு வீட்டை 10 ரவுடிகளைக்கொண்டு சேதப்படுத்தினார்கள். யார் அந்த 10 ரவுடிகளுக்கும் பணம் கொடுத்தது? தோட்ட முகாமையாளர்! மாத்தளையில் உள்ள ஒரு தோட்டத்தில் இருந்த குடும்பத்தை கத்தியைக் காட்டி அடிக்கப் பார்த்திருக்கிறார்கள். அதைப் பண்ணியது யார்? அதுவும் அந்தத் தோட்ட முகாமையாளர் தான். என்னைக் குறை சொல்பவர்கள் ஏன் அவர்களைக் குறை சொல்கிறார்கள் இல்லை? நான் யார்மீதும் கை வைத்தேனா? ஏதாச்சும் propertyக்குச் சேதம் விளைவித்தேனா? எதுவுமே செய்யாமல் ஜீவன் தொண்டமான் தப்புப் பண்ணிவிட்டார் என்று சொல்கிறார்கள். ஆனால், மற்றவர்கள்!

சென்றவாரம் இரத்தினபுரியில் ஒரு பெண் தொழிலாளி வேலைக்குப் போகவில்லை என்பதால் அந்தப் பெண்ணின் கணவரின் தலையில் ஒரு போத்தலை உடைத்திருக்கிறார்கள். அதைப் பண்ணியது யார்? அந்தத் தோட்ட முகாமையாளர் தான். ஏன் யாருமே அது சம்பந்தாகப் பேசுவதில்லை? இங்கே இருக்கின்ற அரசியல்வாதிகளைப் பொறுத்தவரை பெருந் தோட்ட மக்களுடைய வாக்குகளைப் பெற்றுக்கொள்வதற்காக அவர்களிடம் போய், நான் உங்களுக்கு 1,500 ரூபாய் சம்பளம் பெற்றுக் கொடுப்பேன், 2,000 ரூபாய் பெற்றுக் கொடுப்பேன், 2,500 ரூபாய் பெற்றுக் கொடுப்பேன் என்று வாக்குறுதிகளை வழங்குகின்றார்கள். ஏன் இந்த சமூகத்தை எல்லோரும் ஏலம் போட்டுக்கொண்டிருக்கின்றீர்கள்? உண்மையான நிலைவரம் மக்களுக்குத் தெரிய வேண்டும். இந்தப் பெருந்தோட்ட நிறுவன ங்கள் அனைத்தும் முழுமையான இலாபத்தைச் சம்பாதித் திருக்கின்றன. ஆனால், இந்த இலாபத்தில் ஒரு சத வீதம் கூட அந்த மக்களுக்குப் போய்ச் சேர்வதில்லை.

காணி உரிமை வழங்குவது சம்பந்தமாக மாண்புமிகு சனாதிபதியவர்கள் 4,000 மில்லியன் நிதி ஒதுக்கீடு செய்திருந்தார். அது சம்பந்தமாக நாங்கள் ஒரு Committeeஐ appoint பண்ணியது மட்டுமல்லாமல், ஒரு survey எடுப்ப தற்கும் மிகவும் முயற்சித்தோம். ஆனால், அதற்குத் தடங்கல் செய்தது யாரென்றால், இந்தப் பெருந்தோட்ட நிறுவனங்கள் தான். ஏனென்றால், அந்த நிறுவனங்களைப் பொறுத்த வரைக்கும், தோட்டப்புறப் பிரதேசங்களில் பிறந்தால் மட்டும் அங்கு ஏற்றுக்கொள்ளப்படமாட்டாது. அவர்கள் தோட்டத்தில் வேலை செய்தாக வேண்டும். அவ்வாறு தோட்டத்தில் வேலை செய்தால் மட்டும்தான் அங்கே இருக்க முடியும். அறுபது வயதானால் line roomஐ விட்டு வெளியேறச் சொல்கிறார்கள். இதேபோன்று, 20 வயதுப் பையன் அங்கு வந்து கல்யாணம் கட்டி இருந்தாலும் அதுதான் அவனுடைய சொந்த ஊர் என்றுகூட அவனால் சொல்ல முடியாது. ஏனென்றால், இன்றைக்குப் பெருந்தோட்ட நிறுவனங்களைப் பொறுத்த வரைக்கும், தோட்டத் தொழில் செய்தால் தோட்டங்களில் தங்கலாம். மாறாக, அங்கே குடியிருந்துகொண்டு அந்தக் குடும்பத்தைச் சேர்ந்த பையனோ, பெண்ணோ வேறு வேலை பார்த்தால் அவர் வெளி ஆள்! அப்படியான ஒரு தவறான கருத்தைத்தான் மக்கள் மத்தியில் கொண்டு போயிருக் கின்றார்கள். அந்த மக்களுக்குக் காணி உரிமை வழங்குகின்ற விஷயத்தில்கூட அவ்வளவு தடங்கல்கள்!

அப்படியிருக்கின்றபோது, இன்றைக்கு எனக்குக் கொஞ்சம் சந்தோசமாக இருக்கின்றது. ஏனென்றால், கொஞ்ச நேரத்திற்கு முன்னர் முடிவடைந்த அமைச்சரவைக் கூட்டத்தில் ஒரு முக்கியமான தீர்மானம் எடுக்கப்பட்டிருக்கிறது. எங்களுடைய ஆலோசனைக்கமைய மாண்புமிகு சனாதிபதியவர்கள் சமர்ப் பித்த ஓர் ஆவணத்துக்கு அனுமதி கிடைத்திருக்கிறது. அதன் படி, இன்றைக்குப் பெருந்தோட்ட நிறுவனங்களின் கட்டுப் பாட்டுக்குள் இருக்கின்ற மக்கள் வாழுகின்ற இடங்களைக் கிராமங்களாக Gazette பண்ணுவதற்கான அனுமதியை நாங்கள் பெற்றிருக்கின்றோம். வெறுமனே பெயரில் மட்டும் 'கிராமம்' என்று சொல்லவில்லை. அவற்றைக் கிராமங்களாக Gazette பண்ணி, காணி உரிமையை நாங்கள் கட்டாயம் அந்த மக்களுக்குப் பெற்றுக்கொடுப்போம்.

அதுமட்டுமில்லாமல், இன்னும் சில விஷயங்களை நான் எல்லோருக்கும் இங்கே தெளிவுபடுத்தியாக வேண்டும். பெருந்தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 ரூபாய் சம்பளம் வழங்கப்பட வேண்டும் எனக் கோரி, பெருந்தோட்டத் தொழிலாளர்கள் சார்பாகக் கொழும்புக்கு வந்து பலரும் தங்களுடைய அதிருப்தியை வெளிப்படுத்தி, ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டார்கள்; ஏன் ஒன்றுமே நடக்கவில்லை என்று நிறையப் பேர் நினைக்கின்றார்கள். இன்றைக்கு காலை 11.00 மணிக்குத் தோட்டத் துரைமார் சம்மேளத்தின் கட்டடத்திற்கு முன்பாகக் கூடி அவர்கள் ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டிருந்தார்கள். நண்பகல் 12.30 மணிக்கு 7 பெருந்தோட்ட நிறுவனங்கள் சம்பளத்தை அதிகரித்துக் கொடுப்பதற்கு ஒத்துக்கொண்டிருக்கின்றன. அடிமேல் அடி அடித்தால் அம்மியும் நகரும். அதனால்தான் நாம் ஒற்றுமையாக இருந்தாக வேண்டும் என்று நான் சொல்கின் றேன். இது இலங்கைத் தொழிலாளர் காங்கிரஸைச் சார்ந்த வர்களுக்குக் கிடைக்கின்ற சம்பளமாகக் கருத முடியாது என நான் ஏற்கெனவே சொல்லியிருக்கின்றேன். ஆகவேதான், மக்களைத் திசை திருப்பாமல், நாங்கள் ஒழுக்கமாகவும் கட்டுக் கோப்பாகவும் இருந்தால் கட்டாயம் நினைத்ததை எங்களால் சாதிக்க முடியும் என நான் சொல்கின்றேன். நான் மறுபடியும் சொல்கின்றேன், இந்த நாட்கூலி முறைமையை நாங்கள் எதிர்க்கின்றோம். அதேநேரத்தில், இன்னொரு தவறான முறைமையை மக்கள் மத்தியில் கொண்டுவந்து திணிக்க நினைப்பது தப்பு.

இன்றைக்கு சில பெருந்தோட்ட நிறுவனங்கள் outgrower system என்ற ஒரு புதிய முறைமையை அறிமுகம் செய்திருக் கின்றன. அது ஒரு புதிய முறைமையாக இருந்தாலும், அதற்குக் கட்டாயம் விதிமுறைகள் இருக்க வேண்டும். இன்றைக்கு இந்த outgrower systemஇனால் மக்கள் ஏமாற்றப்படுகின்றார்கள். இந்த outgrower systemஇல் உள்ளடக்கப்பட்ட எந்தத் தொழிலாளிக்கும் EPF, ETF பணம் கிடைப்பதில்லை; அவர்களுடைய EPF, ETF பணம் கொள்ளையடிக்கப்படு கின்றது. அதேமாதிரி, மலையக மக்களுக்குக் காணி உரிமையைக் காணி அளவில் கொடுக்கச் சொல்லி நாங்கள் சொன்னோம். ஆனால், காணி அளவில் கொடுக்காமல் மரக்கன்று அளவில் கொடுக்கின்றார்கள். அப்படியென்றால், அவர்கள் அந்தக் காணிக்கு உரிமையாளர் கிடையாது; அவர்கள் இன்னமும் தோட்டத் தொழிலாளர்கள்தான். அதேமாதிரி, இன்றைக்கு outgrower systemஇற்குக்கீழ் உள்ளடக்கப்பட்டு தோட்டத் தொழிலில் ஈடுபடுகின்ற மலையக மக்கள் தாராளமாகத் தோட்டத்தைச் சுத்தமாக்கி, தயார் செய்து, உரம்போட்டு தேயிலைக் கன்றுகளை நாட்டி, நன்றாகப் பராமரித்து, அவற்றைப் பறிக்கப் போகின்ற நேரத்தில் அங்கிருக்கின்ற முகாமையாளர் நினைத்தால் அவர்களை எந்தவிதமான noticeஉம் இல்லாமல் அங்கிருந்து அகற்ற முடியும். இவற்றைத்தான் நாங்கள் தவறு என்று சொல்கின்றோம். புதிய முறைமைகளைக் கொண்டு வாருங்கள், எங்களுக்குப் பிரச்சினை இல்லை! ஆனால், அதற்கு உரிய விதிமுறைகள் இருக்க வேண்டும். தோட்டத் தொழிலாளர்களைத் சிறு தோட்ட உரிமையாளர்களாக ஆக்க வேண்டும் என்று இப்போது நிறையப்பேர் சொல்கின்றார்கள்; கௌரவ எதிர்க்கட்சித் தலைவர் அவர்களும் இதுபற்றிச் சொல்லியிருந்தார். அப்படியென்றால், அதனைச் செயற்படுத்து வதற்கான முறைமையை முன்வையுங்கள்! ஏனென்றால், எங்களைப் பொறுத்தவரைக்கும், அந்தத் தோட்டத் தொழிலாளர்களைச் சிறுதோட்ட உரிமையாளர்களாக்குவது ஒரு நாளில் சாத்தியமாகின்ற விஷயம் கிடையாது என்பதை நான் மறுபடியும் சொல்கின்றேன். அதற்காக, அடுத்த 5 வருடங்களுக்கு அந்தத் தொழிலாளர்களை அதே 1,000 ரூபாய் சம்பளத்தில் வைத்திருக்க முடியாது. அதனால்தான் நாங்கள் இந்த "1,700 ரூபாய்" கோரிக்கையை முன்வைத்தோம். இந்தக் கோரிக்கை ஒரு நியாயமான கோரிக்கை என்று நாங்கள் நம்புகின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எல்லோரும் ஒரு விஷயத்தைப் புரிந்துகொள்ள வேண்டும். அதாவது, ஒவ்வொருவரும் நான் இந்த சமூகத்தைச் சார்ந்தவன், நான் இந்த மதத்தைச் சார்ந்தவன் என்று சொல்ல முடியும். அப்படிச் சொல்லிச் சொல்லித்தான் இந்த நாட்டைக் கொஞ்சம் கொஞ்சமாக அழித்திருக்கின்றார்கள். என்றைக்கு "நாங்கள் எல்லோரும் இலங்கையர்" என்ற உணர்வு எங்களிடையே வருகின்றதோ அன்றைக்குத்தான் எங்களால் முன்னேற முடியும்.

மலையக மக்களைப் பொறுத்தவரை, அவர்கள் இந்த நாட்டில் சரிசமமாகப் பார்க்கப்படுவதில்லை என்பதுதான் உண்மை. அவர்களும் இந்த நாட்டில் சரிசமமாகப் பார்க்கப்பட வேண்டும் என்றால், அது மலையக மக்களுடைய தவறல்ல; பார்க்கின்றவர்களின் கண் பார்வையில்தான் தப்பு. இன்று நாங்கள் மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் பேசி மலையக மக்களுக்காக 2,000 மில்லியன் ரூபாய் நிதியை ஒதுக்கீடு செய்திருக்கின்றோம். இத்தடவைதான் நாங்கள் வரலாற்றிலே மிக அதிகளவான நிதியை மலையக மக்களுக்காக ஒதுக்கீடு செய்திருக்கின்றோம். அதிலும் நாங்கள் மலையகத்தில் கல்விக்கு முக்கியத்துவம் கொடுத்து, 'அறிவெழுச்சி'

[ගරු ජීවන් තොණ්ඩමන් මහතා]

என்றதொரு திட்டத்தைக் கொண்டுவந்து அதற்கான அனுமதி யையும் அமைச்சரவையில் பெற்றிருக்கின்றோம். அதற்காக நான் இந்திய அரசாங்கத்திற்கு நன்றி தெரிவித்துக்கொள்ள வேண்டும். ஏனென்றால், இந்தியாவிலிருந்து கிட்டத்தட்ட 30 ஆசிரியர்களை STEM educationஇற்காக மலையத்திலிருக் கின்ற 2,200 teachersக்கு training கொடுப்பதற்கு அனுப்பி வைத்திருக்கிறார்கள். அதேபோல், நாங்கள் மலையத்திலுள்ள பாடசாலைகளுக்கு அதிகளவான நிதி ஒதுக்கீடு செய்திருக்கின் றோம். இன்றைக்கு இருக்கின்ற சூழ்நிலையில் நாம் குழந்தைகளைப் பாதுகாத்தாக வேண்டும். அதற்குக் கட்டாய மாக ஒரு திட்டம் தேவை. அதனால் நாங்கள் அடுத்த இரண்டு வருடங்களுக்கு அவர்களுக்கென்று புதிய திட்டமொன்றைக் கொண்டு வந்திருக்கின்றோம். அதாவது, மலையத்திலுள்ள 1,197 சிறுவர் பராமரிப்பு நிலையங்களில் இருக்கின்ற குழந்தை களுக்கு இலவச காலை உணவு வழங்கும் திட்டத்தைக் கூடிய விரைவில் நாங்கள் அறிமுகப்படுத்த இருக்கின்றோம்.

இறுதியாக, நான் ஏற்கெனவே முன்வைத்த வேண்டு கோளை மீண்டும் இங்கு முன்வைக்கின்றேன். 'நாங்கள் எல்லோரும் சமம்' என்று அரசியல் ரீதியாக வாயால் சொன்னால் மட்டும் போதாது. அது நமது உணர்விலும் இருக்க வேண்டும். இன்று மலையக மக்கள் ஏன் முன்னேறவில்லை? என்று பலரும் கேட்கிறார்கள். அவர்களை முன்னேற விடவில்லை. அதுதான் உண்மை! நான் வெளிப்படையாகவே சொல்கின்றேன், இன்று மலையக மக்களை எடுத்துக் கொண்டால், அவர்கள் தோட்டத்தொழில் செய்பவர்களாக அல்லது வீட்டு வேலைக்குப் போகின்றவர்களாக இருக்கின் றார்கள். அப்படி இருக்கும்போது அவர்கள் எப்படி முன்னேற முடியும்? இன்று நாங்கள் குழந்தைகளின் படிப்புக்காகத்தான் அதிகம் செலவு செய்யவேண்டும். சலுகை அரசியலில் ஈடுபடுவதை என்னால் அனுமதிக்க முடியாது. அதுமாத்தி ரமல்ல, பின்தங்கியதொரு சமூகத்திற்கு மத்தியில் இவ்வாறு அரசியல் செய்வது மிகப்பெரிய தவறு. அதனால், தயவுசெய்து நாங்கள் ஒருவரை ஒருவர் விமர்சிப்பதற்குப் பதிலாக எல்லோரும் ஒன்றிணைந்து அவர்களுக்கான தீர்வைப் பெற்றுக் கொடுப்போம்! இதில் பெயர் போடுவதற்கு ஒன்றுமில்லை. நாளைக்கு மலையக பெருந்தோட்ட மக்களுக்கு 1,700 ரூபாய் சம்பளம் கிடைத்தால், அவர்கள் இப்போது இருக்கின்ற நிலையைவிட நல்லதொரு நிலைமையில் இருப்பார்கள். அதுதான் உண்மை. அப்படி இருக்கும்போது, 1,700 ரூபாய் சம்பளம் தொடர்பில் நீதிமன்றத்தினால் இடைக்காலத் தடை உத்தரவு கொடுக்கப்பட்டது தொடர்பில் ஏன் சிலருக்கு அவ்வளவு சந்தோசம்? நான் அவர்களுக்குக் கூற விரும்புவது, உங்களால் உதவி செய்யமுடியுமென்றால் செய்யுங்கள்! உபத்திரவமாக இருக்க வேண்டாம் என்பதைத்தான்.

Hon. Presiding Member, I would also like to say a few words in relation to the plantation companies constantly saying that they are making losses, they would not be able to sustain the industry, that the industry would collapse and constantly threatening the Government and the people in Sri Lanka that if a wage increase is given to the workers, the industry would not be sustainable and would collapse. That is utter nonsense! In my hand, I have a document showing the profits and losses of those companies. Of the 19 companies, just to name a few, the Agarapatana Plantations Limited has made a profit of Rs. 1.782 billion. Similarly, the Kelani Valley Plantations has made a profit of Rs. 2.087 billion, the Kotagala Plantations, Rs. 252 million, the Hapugastenna Plantations, Rs. 159 million, the Elpitiya Plantations, Rs. 1.8 billion and the Talawakale Plantations, Rs. 2.57 billion. With these profits, are you telling me that the industry would collapse?

The sustainability of an industry should not be based on the exploitation of labour working there. If that is the case, then let the industry collapse. We are very confident that it would not. Those companies cannot constantly make empty threats like that. At the end of the day, if they are not able to look after their workers and if there is a worker shortage today, it is purely because of the inefficiency of the administration in those companies. There were 535,000 workers 20 years ago. Why is there only 115,000 right now? It is because there is no dignity in that labour; there is no recognition and respect for that labour. That is why I stand before this House and urge this House that when it comes to a marginalized community, do not to look at them as a mere political vote bank but as a marginalized community who need equitable access to justice. Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.47]

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත කෙටුම්පත පිළිබඳව අපට ප්‍රතිපත්තිමය ගැටලුවක් නැහැ. හැබැයි, මේ පනත් කෙටුම්පතින් ස්ථාපිත කරන්න යන කොමිෂන් සභාවට ඉතා පුළුල් බලතල පවරා තිබෙනවා. එතකොට යම්කිසි අවදානමක් තිබෙනවා අපේ රටේ ජනතාවගේ භාෂණ නිදහසට මේකෙන් යම්කිසි අගතියක් සිදු වෙයිද කියලා. ඒ වාගේම මාධ්‍ය ආයතනවලට විරුද්ධව මේ අතිශයින් පුළුල් බලතල අවභාවිත කිරීමේ - බලපත්‍ර අහෝසි කිරීම වැනි දේවල් සිදු කිරීමේ - යම්කිසි අවදානමකුත් තිබෙනවා. එම නිසා ඒ අවදානම වැළැක්වීම හෝ අවම කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය යෝජනා කර තිබෙනවා සංශෝධන කිහිපයක්. සංශෝධන 9ක් යෝජනා කර තිබෙනවා. ඒ වාගේම, ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කර තිබෙනවා මේ පනත් කෙටුම්පතේ අන්තර්ගත වගන්ති 7ක් සම්මත කිරීම සඳහා තුනෙන් දෙකක බහුතරයක් අවශ්‍යයි කියලා. ඒවා සරල බහුතරයකින් සම්මත කරන්න නීත්‍යානුකූලව බැහැ කියලා තිබෙනවා. එහෙම නම්, ශ්‍රේෂ්ඨාධිකරණයේ නිර්දේශවලට මේ ගරු සභාව අනිවාර්යයෙන් අනුගත විය යුතුයි. ඒවා කැමති නම් පිළිගැනීමට හෝ අකමැති නම් ප්‍රතික්ෂේප කිරීමට පාර්ලිමේන්තුවට කිසිසේත් බලයක් නැහැ.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීති පද්ධතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන්නේ යම්කිසි පදනමක් මත. ඒ පදනම තමයි, පාර්ලිමේන්තුව හා අධිකරණය එකිනෙකාට ගරු කළ යුතුය කියන එක. පාර්ලිමේන්තුවට යම්කිසි බල ක්ෂේත්‍රයක් තිබෙනවා වාගේම, අධිකරණයටත් යම්කිසි භූමිකාවක් තිබෙනවා. එහෙම නම්, අන්‍යෝන්‍ය ගරුත්වයෙන් සහ අවබෝධයෙන් තමයි අප කටයුතු කළ යුත්තේ.

මේ රටේ අධිකරණයට යම් යම් අවස්ථාවලදී සංවේදී කරුණු පිළිබඳව තීරණ දීමට සිදු වෙනවා. එම නිසා අපි අධිකරණයට අවශ්‍ය පහසුකම් සපයා දෙන්න ඕනෑ, අධිකරණයේ කාර්යභාරය සුදුසු වාතාවරණයක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා. අපට කරන්න පුළුවන් සියලු දෑ කරන්න ඕනෑ, අධිකරණයට ඒ ශක්තිය, ධෛර්යය ලබා දීමට. මම එක උදාහරණයක් කියන්නම්. ඊයේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉතාම වැදගත් නඩු තීන්දුවක් ප්‍රකාශ කළා. ඒ, ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගේ ප්‍රධානත්වයෙන් විනිශ්චයකාරවරුන් පස් දෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මඩුල්ලක් විසින්. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක නොයෙක් නොයෙක් කරුණු පිළිබඳ විවිධත්වයක් තිබෙන්න ඕනෑ. ඒක ස්වාභාවික දෙයක්, ඒක යහපත් දෙයක්. හැබැයි, ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ සමහර දේවල් පිළිබඳව නිශ්චිතභාවයක් තිබෙන්න ඕනෑ. ඒවා විවාදයට, අවිනිශ්චිතභාවයට ලක් වෙන්න බැහැ. මැතිවරණ පවත්වන්නේ කවදාද, අනුපිළිවෙළ මොකක්ද කියලා ජනතා මනසේ අවුල්සහගත ස්වභාවයක් තිබෙනවා නම්, මැතිවරණය පවත්වන්නේ කවදාද කියලා කවුරුවත් දන්නේ නැත්නම්, ඒක ප්‍රජාතන්ත්‍රවාදයට ඉතාම අහිතකර තත්ත්වයක්. ජනාධිපතිවරණය පවත්වනවාද නැද්ද, මොකක් හරි ක්‍රමයක් පාවිච්චි කරලා ඒක වළක්වන්න හෝ ප්‍රමාද කරන්න උත්සාහයක් දරයිද කියන එක ජනතාව තුළ තිබුණු කතිකාවක්. කොහේ ගියත් මේ පිළිබඳව නොයෙක් නොයෙක් කථා ඇහුණා. හැබැයි, ඊයේ ශ්‍රේෂ්ඨාධිකරණය දුන් බලාත්මක නඩු තීන්දුවෙන් පසුව දැන් ඒ සැක සංකා සියල්ල අවසානයි.

මීට පසුව ඒ කිසිම සැක සංකාවකට කොහෙත්ම ඉඩක් නැහැ. දැන් එහි නීතිමය තත්ත්වය ඉතාම පැහැදිලියි. වැඩි කලකින් නොවෙයි, තව දවස් 8කින්, ඒ කියන්නේ ජූලි 17වන දා මැතිවරණ කොමිෂන් සභාවට පූර්ණ බලය ලැබෙනවා, ජනාධිපතිවරණය පිළිබඳ ප්‍රකාශනය නිකුත් කිරීමට. මැතිවරණ කොමිෂන් සභාව නිකුත් කරන ඒ ප්‍රකාශනයෙන් තමයි, ජනාධිපතිවරණය පිළිබඳ සමස්ත ක්‍රියාදාමය ආරම්භ වන්නේ. එය මැතිවරණ කොමිෂන් සභාවට අයිති කාර්යයක්.

ජනාධිපති කාර්යාලය නොයෙක් නොයෙක් අවස්ථාවලදී ප්‍රකාශ නිකුත් කරනවා. හැබැයි, ජනාධිපතිවරයා ඉදිරි ජනාධිපතිවරණයට තරග කරනවා නම්, එතුමා එක අපේක්ෂකයෙකු පමණයි. වෙනත් අපේක්ෂකයන්ට නැති වරප්‍රසාද හෝ බලයක් එතුමාට කිසිසේත් අයිති වන්නේ නැහැ. ඒ පිළිබඳ තීරණ ගැනීමේ හුදු බලය තිබෙන්නේ මැතිවරණ කොමිෂන් සභාවටයි. ජූලි 17වන දාට පසුව ඕනෑම අවස්ථාවකදී මැතිවරණ කොමිෂන් සභාවට පුළුවන්, ඒ බලය භාවිත කරලා ඒ ප්‍රකාශනය නිකුත් කිරීමට. මැතිවරණ කොමිෂන් සභාව දැනටමත් ප්‍රකාශයක් කර තිබෙනවා, මේ මාසය -ජූලි මාසය- අවසානයට පෙර ඒ ප්‍රකාශනය නිකුත් කරනවා කියලා. ඊට පස්සේ ඒ වැඩ පිළිවෙළ අබාධව ඉදිරියට යනවා. එය නවත්වන්න, වළක්වන්න මේ රටේ කිසිම කෙනෙකුට, කිසිම ආයතනයකට බලයක් නැහැ. ඒ ප්‍රකාශනය නිකුත් කළාට පස්සේ, ඊළඟට තිබෙන පියවර තමයි නාම යෝජනා කැඳවීම. ඒ දින වකවානු ශ්‍රී ලංකාවේ නීතියට අනුව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතාම පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. නාම යෝජනා භාර ගන්නවා, 16 වන සහ 21 වන දින අතර. ඉන්පසු ඡන්ද ව්‍යාපාරය පටන් ගන්නවා. ජනාධිපතිවරණය සඳහා ඡන්ද ව්‍යාපාරය පැවැත්වීමට තිබෙන අවම කාලය දින 28යි; උපරිම කාලය දින 42යි.

ඊයේ ප්‍රකාශ වෙච්ච ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව අනුව ලංකාවේ ජනතාව දැන් නිශ්චිත වශයෙන් දන්නවා -සියයට සියයක් පැහැදිලිව දන්නවා- ජනාධිපතිවරණය පැවැත්වෙනවා පමණක් නොව, එය පැවැත්වෙන්නේ කොයි කාල වකවානුවේද කියන එකත්. මේ අවුරුද්දේ සැප්තැම්බර් 17 සහ ඔක්තෝබර් 16 අතර අනිවාර්යයෙන්, අවිවාදයෙන්, නිසැකයෙන් ජනාධිපතිවරණය පැවැත්වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු නිමල් පියතිස්ස මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු මොහමඩ් මුසම්මිල් මහතා
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු නිමල් පියතිස්ස මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு றோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නිමල් පියතිස්ස මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு நிமல் பியதிஸ்ஸ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. IMRAN MAHAROOF left the Chair and THE HON. NIMAL PIYATHISSA took the Chair.

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් එම නඩු තීන්දුව අපි අගය කරනවා. ජනාධිපතිවරණය සම්බන්ධයෙන් ඇති වෙච්ච නොයෙක් නොයෙක් කට කථා ඒ තීන්දුවත් සමඟම අවසාන වෙනවා.

ශ්‍රේෂ්ඨාධිකරණය බොහොම වැදගත් නඩු තීන්දු මෑතකදීත් ප්‍රකාශයට පත් කර තිබෙනවා. ගරු ජනක් ද සිල්වා විනිශ්චයකාරතුමා මෑතකදී දුන් නඩු තීන්දුවක ප්‍රකාශ කරනවා, යුක්තියේ දෙවඟනගේ ඇස් බැඳලා තිබෙනවා, අධිකරණය ඉදිරියේ ඉන්නේ බලවත් පුද්ගලයෙක්ද නැද්ද, ධනවත් පුද්ගලයෙක්ද නැද්ද යනාදි කිසිවක් බලපාන්නේ නැහැ, සෑම දෙනාට එක සමාන විධියට යුක්තිය ලබා ගැනීමේ අවකාශය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා නීතියෙන් ලැබී තිබෙනවා කියලා. ගරු ජනක් ද සිල්වා විනිශ්චයකාරතුමා එසේ ප්‍රකාශ කළා. දේශපාලනඥයෙකුට වඩා, මේ රටේ තරුණ පරම්පරා දෙකකට නීති අධ්‍යාපනය ලබා දුන් නීති මහාචාර්යවරයෙකු හැටියට එතුමා දුන් එවැනි නඩු තීන්දුවලට අපි ගරු කරනවා. ඒවාට නිස නමා ආචාර කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණය නිර්දේශ කරපු ඒ සංශෝධන අද කාරක සභා අවස්ථාවේදී මේ පනත් කෙටුම්පතට අනිවාර්යයෙන් ඇතුළත් කරන්න ඕනෑ.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ කාර්යභාරය තමයි නීති සෑදීම; නීති සම්පාදනය කිරීම. හැබැයි ඕනෑම නීතියක් හැදීමට මේ ගරු සභාවට අයිතියක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැහැදිලිව සඳහන් කරනවා, යෝජිත

[ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා]

නීතියක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ ගැටෙනවා නම්, ඒක ඒ විධියට සම්මත කර ගන්න බැරි බව. පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ ජනතාවයි. ජනතාවගේ පරමාධිපත්‍යය සමඟ ගැටෙන විධියට කිසිම පනත් කෙටුම්පතක් සම්මත කරන්න පාර්ලිමේන්තුවට බැහැ.

ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණය නිර්දේශ කරන සංශෝධන අනිවාර්යයෙන් මේ පනත් කෙටුම්පතට ඇතුළත් කළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම 1994 සිට මෙම ගරු සභාවේ සිටියා. නමුත්, මේ ගරු සභාව තුළ ඉතාම අවාසනාවන්ත දෙයක් සිදු වෙනවා. ඉතාම තර්ජනාත්මක ලෙස මේ ගරු සභාව තුළ විනිශ්චයකාරවරු විවේචනය කිරීමේ සම්ප්‍රදායයක් පවතින බව මම දැකලා තිබෙනවා. ඒක ඉතාම වැරදියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

සමහර මන්ත්‍රීවරු කියලා තිබෙනවා, "අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු විමර්ශනය කළ යුතුයි. අවශ්‍ය තැන්වල දී ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු වරප්‍රසාද ප්‍රශ්න ඉදිරියේ පාර්ලිමේන්තුවට කැඳවන්න ඕනෑ" කියලා. ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් ඒ විධියේ ආකල්පයක් අනුගමනය කරනවා නම්, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩිතාලම දෙදරන තත්ත්වයක තිබෙන්නේ. ඒක ඉතාම නරකයි. අපි එහෙම කරන්න හොඳ නැහැ. අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගරු කරන්න ඕනෑ. අන්න ඒ සම්ප්‍රදායය තවදුරටත් ආරක්ෂා කිරීම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට අත්‍යවශ්‍ය බව සඳහන් කරමින් ඔබතුමාට ස්තුතිය ප්‍රදානය කරමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් ප්‍රනාන්දු අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 21ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.57]

ගරු නලින් ප්‍රනාන්දු මහතා (වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் பர்னாந்து - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Nalin Fernando - Minister of Trade, Commerce and Food Security)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව අදහස් දැක්වීමට කාලය ලබා දීම ගැන මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මට ඉස්සෙල්ලා කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරයකු වන මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා අපේ රටේ සිටින ඉතා කීර්තිමත් දේශපාලනඥයෙක් වාගේම නීති සම්පාදකයෙක්.

එතුමාගේ කථාවෙන් පසුව අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳවත් මම සන්තෝෂ වෙනවා. එතුමා මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඉතාම වැදගත් කාරණා කිහිපයක් සඳහන් කළා. මේ පනත් කෙටුම්පත පිළිබඳව එතුමාට ප්‍රතිපත්තිමය වශයෙන් විරෝධතාවක් නැති වුණත්, මේක තුළින් ඉදිරියේදී යම් ප්‍රශ්නගත තත්ත්වයක්, එහෙම නැත්නම් අර බලපත්‍රලාභීන් වාගේ අයට දේශපාලන වශයෙන් යම් ආකාරයක පළිගැනීම් වාගේ සිදුවීම් ඇති වීමෙන් ගැටලු පැන නඟින්න පුළුවන් කියන එක එතුමා සඳහන් කළා. මමත් ඒ ස්ථාවරයේම ඉන්නවා.

රටේ සංවර්ධනයට මෙන්ම, රටේ ජනතාවගේ අයිතිවාසිකම් රකින්න, රටේ ජනතාවට පහසුකම් ලබා දෙන්න පනත් වෙනස් කරලා රජයක් අවශ්‍ය තීන්දු ගනිද්දි අපි කොයි වෙලාවකවත් ඒවා දේශපාලන දඬයම් කර ගැනීමේ අරමුණින් නොකළ යුතුයි කියන එක මේ සභාවේ සිටින අපි සියලුදෙනා පිළිගන්නවා. අපේ රටේ ඉතිහාසය තුළ අපි දේශපාලන වශයෙන් කොච්චර කථා කරලා පනත් කෙටුම්පත් අනුමත කරගෙන වෙනස්කම් කළත්, එවැනි ක්‍රියාකාරකම් තුළින් සමහර වෙලාවට මේ රටේ ජනතාවට වාගේම සමහර ආයතනවලටත් ඒවායේ බලපෑම් ඇති වුණාය කියන එක අපි පිළිගන්න ඕනෑ. ඒ නිසා අපි පනතක් වෙනස් කරන, පනතක් සංශෝධනය කරන හැම වෙලාවකම ඒක මහජනතාවගේ සුබසිද්ධියත්, රටේ සුබසිද්ධියත් වෙනුවෙන්ම පාවිච්චි කරනවා ද කියලා අපි බලන්න ඕනෑ. අදාළ ආයතන වගකීමක් සහිතව ඒ කටයුතු කරනවා නම් තමයි අපි මේ වෙනස් කරන පනත්වල අවසාන ප්‍රතිඵලය ලැබෙන්නේ. ඒ කාරණය මතු කිරීම ගැන මම විශේෂයෙන්ම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි පසුගිය කාලය තුළ මේ රටේ පනත් විශාල ප්‍රමාණයක් වෙනස් කළා. එහෙම නැත්නම් මේ රටට අලුත් පනත් ගෙනාවා. පසුගිය කාලය තුළ අපි මේ රටේ ආර්ථික අර්බුදයට විසඳුම් සොයන වෙලාවේ ආර්ථිකයට අවශ්‍ය පනත් කොච්චර ප්‍රමාණයක් වෙනස් වෙලා නැද්ද කියන එකත්, ලෝකයේ ආර්ථිකය දියුණු වීම තුළ අපේ රටේ ආර්ථිකය ඉස්සරහට ගෙන යන්න නම් අපේ රටට අවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් තිබෙන නීති හා සියලු දේ අපි වෙනස් කර නොගැනීම නිසා අපේ ආර්ථිකයට විශාල බලපෑමක් සිදු වුණාය කියන එකත් අපි පසුගිය කාලයේදී දැක්කා. ඒ නිසා අපි මේ රටේ ආර්ථික වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යද්දීත්, IMF සංවිධානය සමඟ වැඩකටයුතු කරද්දීත්, මේ රටේ පනත් වෙනස් කරන්නත්, ඒ අවශ්‍ය ප්‍රතිසංස්කරණ කරන්නත් අපට විශාල අවශ්‍යතාවක් ඇති වුණා. පක්ෂ විපක්ෂ සියලුදෙනා ඒ කටයුතුවලදී සියයට 75ක, 80ක එකඟතාවකට පැමිණියා. මොකද, පසුගිය කාලය තුළ අපට අවශ්‍ය වෙනස්කම් කළේ නැහැ කියන එක අපි සියලුදෙනා පසුව දැන ගත්ත නිසා.

උදාහරණයක් ගත්තොත්, ලංකාව ආසියාවේ ලොකුම විදුලි බිල ගෙවන රට බවට පත් වෙලා පාරිභෝගිකයන් අසරණ වෙලා, පාරිභෝගිකයන්ට විදුලි බිල දරා ගන්න බැරි තත්ත්වයක් එද්දි තමයි අපේ රටේ සියලු බලධාරින් ඒවා ප්‍රතිව්‍යුහගත කරන්න අවධානය යොමු කළේ. අවුරුදු 10ක්, 15ක් තිස්සේ ඒ සඳහා අවශ්‍ය පියවර ගත්තු නැති එකෙන්, ඒ විදුලි පනත්වල තිබුණු අඩු පාඩු වෙනස් කරලා ඉස්සරහට යන රටක් සඳහා වෙනස් කරන්න ඕනෑ දේවල් වෙනස් කර නොගැනීමෙන්, අපි ගන්න ඕනෑ තීන්දු නොගත් එකෙන්, විදුලි බලාගාර අලුතින් හදපු නැති එකෙන් සහ අලුත් ප්‍රභව පාවිච්චි කරලා විදුලිය නිෂ්පාදනය කරන වැඩ පිළිවෙළකට අපි නොගිය නිසා අවසාන ප්‍රතිඵලය වුණේ මොකක්ද? ඒ නිසා අපේ රටට ආසියාවේ විශාලම විදුලි බිල තිබෙන රට බවට පත් වෙන්න සිදු වුණා. අපේ රටේ කර්මාන්තකරුවා, අපේ රටේ නිෂ්පාදකයා, අපේ රටේ අපනයනකරුවා කියන මේ සියලුදෙනාට එහි එල විපාක භුක්ති විඳින්න සිදු වුණා. අද මේ රටට ආයෝජකයෙක් එද්දි ඔවුන් පළමුවෙන්ම බලන දේ තමයි මේ රටේ තිබෙන කම්කරු නීතිය මොකක්ද, අවශ්‍ය යටිතල පහසුකම් ඉක්මනින් ලබා ගන්න

පුළුවන් ද, ඒ සඳහා වැය වන වියදම එහෙම නැත්නම් ආයෝජකයන්ට ඒ සඳහා ගෙවන්න තිබෙන මිල ගණන් කොහොමද කියන එක.

ඒ වාගේම, සලකා බලන අනෙක් කාරණය තමයි මේ රටේ තිබෙන සන්නිවේදනය. ඒ අයට අවශ්‍ය යටිතල පහසුකම් සඳහා සන්නිවේදන පහසුකම් කොච්චර දුරට මේ රටේ තිබෙනවාද කියන එක. ඒ නිසා ඉදිරියේදී අපේ රටේ ආර්ථික සැලසුම් සකස් කිරීමේදී සන්නිවේදන විෂය පිළිබඳ විශාල ප්‍රමුඛත්වයක්, එහෙම නැත්නම් වෙනසක් කරන්න ඕනෑ කියන එක අපි දකිනවා. ඇත්තටම අද මම මේ ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත බලද්දි හිතුවා, මීටත් වැඩිය වෙනස්කම් කරන්න අවශ්‍යතාවක් තිබෙනවා කියලා. මේ පනත් කෙටුම්පතේ කාරණා ගණනාවක් යම් ප්‍රමාණයකට වෙනස් කරලා, ඉක්මනින් මේ සඳහා විසඳුම් ලබා දෙනවා වාගේම, අපිට දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම මේ පනත් කෙටුම්පත තවත් විශාල වශයෙන් සංශෝධනය වෙන්න ඕනෑ. එහෙම නැත්නම් රටේ ආර්ථිකයට ශක්තියක් වෙන්න පුළුවන් ආකාරයට ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත තවත් වෙනස් කරන්න හැකියාව තිබෙනවා නම් ඒක හොඳයි කියන එක මට හැඟෙනවා.

අපි පසුගිය කාලය තුළ මේ රටේ මුදල් සම්බන්ධ පනත් විශාල ප්‍රමාණයක් සංශෝධනය කළා. ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත අපි මේ පාර්ලිමේන්තුවට අලුතින් ගෙන ආවා. ඒ වාගේම, බැංකු පනතට සංශෝධන ගෙන ආවා. ආයෝජකයෝ පිළිබඳ ලිහිල් ප්‍රතිපත්ති ඇතුළත් ආයෝජකයන්ට මේ රටේ ආයෝජනයට අවශ්‍ය කරන පහසුකම් ලබා දෙන පනත් ගෙන ආවා. ඒ අනුව අවසානයේදී ඉතාම වැදගත් අංගයක් වන සන්නිවේදනය විෂය පිළිබඳ ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත අද අපි පාර්ලිමේන්තුවට ගෙන ආවා.

මෙහිදී අපි විශේෂයෙන්ම බලන්න ඕනෑ, ලෝකයේ අනෙක් රටවල් සන්නිවේදනය පැත්තෙන් කොච්චර ඉස්සරහට ගිහිල්ලාද කියන එක. ලෝකයේ දියුණු වෙච්ච රටවල අද සන්නිවේදන ක්ෂේත්‍රය දියුණු වෙලා තිබෙනවා. ඒ අනුව අපි ඉන්නේ කොච්චර පිටුපසින්ද කියන එක. අපි මේ කථා කරන්නේ, විශේෂයෙන් සන්නිවේදන බලපත්‍රයක් ලබා දුන්නාම ඒ බලපත්‍රලාභියා මේ රටට ඒ පහසුකම ලබා දෙනවාද, ඔහුගෙන් ගන්න මුදල කීයද, ඔහු අපි ලබා දුන් බලපත්‍රයට එහා ගිහිල්ලා යම් දෙයක් කරනවාද, ඒ බලපත්‍රලාභියා අපිට විරුද්ධ වෙනවාද, ඒ බලපත්‍රලාභියා අපිට පක්ෂ වෙනවාද, ඒ සන්නිවේදනය තුළින් ආණ්ඩුවට සහයෝගය ලැබෙනවාද, එහෙම නැත්නම් ආණ්ඩුවට විරුද්ධ මතයක් දරනවාද, කියන කාරණයි. නමුත්, ඒ කියපු කාරණාවලට වඩා ලෝකයේ අනෙක් රටවල මේ සන්නිවේදනය කියන විෂය විශාල පරාසයක් තුළට ගිහිල්ලා, ඒ රටවල දියුණුවේ ප්‍රධාන කාර්යභාරය කරපු අංගයක් විධියට සන්නිවේදනය කියන විෂය උඩට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා හැම තිස්සේම අපි කල්පනා කරලා බලන්න ඕනෑ, අපි මේ ගන්නා තීන්දු තව අවුරුදු කීයකටද ගන්නේ කියන කාරණය; තව අවුරුදු පහකටද, දහයකටද, විස්සකටද, විසි පහකටද කියන කාරණය.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! නිවේදනයක් කරන්න තිබෙනවා.

මේ අවස්ථාවේ කථානායක ගැලරියේ රැඳී සිටින නවසීලන්ත නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ කථානායක ගරු ජෙරී බ්‍රවුන්ලි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් නවසීලන්ත නියෝජිත පිරිස මෙම සභාව විසින් සාදරයෙන් පිළිගන්නා බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

ගරු ඇමතිතුමනි, කථා කරන්න.

ගරු නලින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)

මම කථා කරමින් හිටියේ අපි මේ ගන්නා තීන්දු, තව අවුරුදු කීයකින් මේ රටේ ආර්ථිකය ඉස්සරහට ගෙනියන වැඩ පිළිවෙළට අවශ්‍ය කරන තීන්දු ද කියන එක. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් 2048 වර්ෂය දක්වා ආර්ථික ප්‍රතිපත්තියක් මේ රටට හඳුන්වා දුන්නාම, අපේ රටේ විපක්ෂය ඇහුවේ 2048 වනතුරු ජීවත් වෙන මිනිස්සු මේ පාර්ලිමේන්තුවේ කී දෙනෙක් ඉන්නවාද කියන එකයි. ඉතාම සරල ප්‍රශ්නය, අහන්න පුළුවන් ගොන්ම ප්‍රශ්නයක් තමයි විපක්ෂයෙන් ඇහුවේ. 2048 වර්ෂය වනතුරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉන්නවාද කියලා ඇහුවා. ඒ වාගේම මේ අනෙක් අයගේ වයස දිහා බලලා ඇහුවා, තව අවුරුදු විස්සක් ඉන්න අය කී දෙනෙක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවාද කියලා. මේක තමයි අපේ රටේ විපක්ෂය හැමදාම බලපු විධිය. රටට ආර්ථික ප්‍රතිපත්තිය අවුරුදු විස්සකට හෝ විසිපහකට හදනවා නම්, ඒක හදපු මිනිහා ඒ වනතෙක් ජීවත් වෙන්න ඕනෑ නැහැ. ඒ අය ඒ කාලය තුළ බලයේ ඉන්න ඕනෑත් නැහැ. නමුත්, රටේ අනාගතය වෙනුවෙන් එවැනි ප්‍රතිපත්තියක් අපි සකස් කිරීමේදී ඒකට සහයෝගය ලබා දෙන එක තමයි පක්ෂ-විපක්ෂ සියලුදෙනා කරන්න ඕනෑ. ඒ නිසා ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන මේ වෙලාවේ මම කියන්නේ, අපි ඈත කාලයක් සඳහා විශාල වැඩ පිළිවෙළක් මේ තුළින් දකින්න ඕනෑ කියන එකයි.

ඒ තුළ මේ රටේ සම්පූර්ණ වෙළෙඳ ප්‍රජාව, සුළු පරිමාණයේ ව්‍යාපාර, ඉතාම කුඩා ව්‍යාපාරවල ඉඳලා මහා පරිමාණයේ විශාල සමාගම්, බහුජාතික සමාගම් යන මේ සියල්ලම අද තාක්ෂණය සහ සන්නිවේදනය ඉහළට ගෙනයන්න කටයුතු කර තිබෙනවා කියලා වෙළෙඳ අමාත්‍යවරයා වශයෙන් මම කියනවා. හැබැයි ඒ පහසුකම් ලබා දෙන ආයතන, මහජනතාව ආරක්ෂා කරගන්න තිබෙන කොමිෂන් සභාව ඒ කටයුතු කරලා තිබෙනවාද, ඒක කරන්න ඔවුන්ට වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන එක තමයි අපට තිබෙන ගැටලුව. ඒ නිසා මම කියන්නේ මේ සඳහා විශාල වශයෙන් මහන්සි වෙන්න ඕනෑ කියන එකයි. ඒ සඳහා වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මොකද, මේ රටේ සන්නිවේදනය පිළිබඳවත්, ඒ තුළ පාරිභෝගිකයාට ඇති වන විශාල ප්‍රශ්න පිළිබඳවත්, ඒ ප්‍රශ්නවලට විසඳුම් නැතිවීම පිළිබඳවත් විශාල පැමිණිලි ප්‍රමාණයක් අපට එනවා. අපි සමහර වෙලාවට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ඒවා යොමු කළාම, ඒ අයටත් ඒ සඳහා අවශ්‍ය නීති නැහැ. මේවාට විරුද්ධව ගන්න පුළුවන් නීතිමය පියවරවලදී ඒ අය ඉන්නේ ගොඩක් පිටිපස්සෙන්. ඒ අවශ්‍ය පියවර ගන්න තමයි අද මෙවැනි පනත් කෙටුම්පතක් තුළින් ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත වෙනස් කරන්නේ. මගේ දැනුම අනුව, මට තිබෙන පළපුරුද්ද එක්ක මේ පනතේ මීටත් වැඩිය එහා ගිය වෙනස් කිරීමකට අපට යන්න වෙනවා කියලා මම මුලින්ම කිව්වේ ඒකයි. ඒ නිසා මේ පනතේ තිබෙන කාරණා කිහිපයකට වැඩිය විශාල වශයෙන් වෙනස් වෙච්ච, පුළුල් වෙච්ච පනතක් සඳහා අවධානය යොමු කරන්න කියන එක මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි.

මම ඉස්සෙල්ලා සඳහන් කළා වාගේ සන්නිවේදන කටයුතු කරන මාධ්‍ය ජාල, ගුවන් විදුලි මාධ්‍ය හෝ රූපවාහිනී මාධ්‍ය හෝ වෙනත් මාධ්‍යයකට බලපත්‍රයක් ලබා දීලා ජනතාවට පහසුකම් ලබා දෙන්න කටයුතු කරද්දි බලපත්‍රලාභියා පාලනය කරන්න උත්සාහ කරනවා වාගේම, ඒකෙන් සේවා ලබාගන්න පාරිභෝගිකයා ආරක්ෂා කරන වැඩ පිළිවෙළකුත් අපි ළඟ තිබෙන්න ඕනෑ. අපි යම් තැනැත්තෙකුට හෝ සමාගමකට බලපත්‍රයක් ලබාදුන් පසු ඒ තැනැත්තා හෝ ඒ සමාගම විසින් සේවා සැපයීමේ දී පාරිභෝගිකයාට යම් අසාධාරණයක් වෙනවා

[ගරු නලින් ප්‍රනාන්දු මහතා]

නම්, ඒ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් කඩ කරනවා නම්, ඒ අයගේ ජන ජීවිතයට බලපෑමක් වන අයුරින් මේ බලපත්‍රලාභීන් හෝ ඒ සමාගම් කටයුතු කරනවා නම්, ඒ බලපත්‍රය ලබාදුන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ඒ පිළිබඳ වගකීමක් තිබෙනවා. ඒ බලපත්‍රය ගත්ත සමාගම හෝ ඒ පුද්ගලයා ඒ අනුව කටයුතු කරනවාද, ඒකෙන් මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම්වලට බලපෑමක් වෙනවාද කියන එක සොයා බැලීමේ වගකීමක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට තිබෙනවා. මෙහිදී මහජන පැමිණිලි පිළිබඳව ඇහුම්කන් දෙන්න, මහජන පැමිණිලි වෙනුවෙන් පියවර ගන්න මේ පනත වෙනස් කරලා තිබෙන බව මම දැක්කා. ඒක ඉතාම හොඳ කාරණයක්. මොකද, මේක තමයි අපට විශාල වශයෙන් තිබුණු ගැටලුව. නිකුත් කරන බලපත්‍රයක්, එහෙම නැත්නම් නිකුත් කරන ලයිසන් එකක් තුළින් පාරිභෝගිකයාට යම් අසාධාරණයක් වෙනවා නම්, ඒ සම්බන්ධයෙන් පැමිණිලි කිරීමේ හැකියාව පාරිභෝගිකයාට ලබා දීලා, ඒක නිවැරදි කිරීමේ හැකියාව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට තිබෙන්න ඕනෑ. මේ පනත එක පැත්තකට විතරක් සහන ලබා දෙන, එක පැත්තක් විතරක් බලන පනතක් විධියට පසුගිය කාලයේ සමහර තැන්වලදි මම දැක්කා. ඒ නිසා මේ පනත සේවා සපයන සහ සැපයුම් ලබන දෙගොල්ලන්ටම සාධාරණයක් ඉෂ්ට කරන්න පුළුවන් පනතක් බවට පත් කරගන්න කටයුතු කිරීම පිළිබඳව මම විශේෂයෙන්ම සතුටු වෙනවා.

විශේෂයෙන්ම පසුගිය කාලය තුළ මේ ක්ෂේත්‍රය තුළ තිබුණු තරගකාරිත්වය අපි දැක්කා. සන්නිවේදන ක්ෂේත්‍රය තුළ බලපත්‍ර ලබා ගත් බලපත්‍රලාභීන්, බලපත්‍රලාභී සමාගම්, සියලු ජනමාධ්‍ය ආයතන හෝ වේවා ඒවාට සම්බන්ධ අනෙකුත් ආයතන හෝ වේවා ඒවා අතර විශාල තරගයක් තිබෙනවා අපි දැක්කා. මේ තරගය තුළ මේ රටේ ජාතික ආරක්ෂාව, මේ රටේ ආර්ථිකය, මේ රටේ ජීවත් වෙන මිනිස්සුන්ගේ අයිතිවාසිකම්, මේ රටේ පාරිභෝගිකයාගේ අයිතිවාසිකම්, මේ රටේ ආර්ථික මර්මස්ථානවලට තිබෙන අයිතිවාසිකම් අමු අමුවේ උල්ලංඝනය වෙන ආකාරය සමහර අවස්ථාවලදි අපි දකිනවා. හැබැයි ඒවා ගැන කථා කරන්න කවුරුත් නැහැ. ඒවා ගැන කථා කළොත් අවසාන ප්‍රතිඵලය වන්නේ ඒ කථා කරන පුද්ගලයන්ගේ ගිණුමට ඒවා බැරවීම් තුළින් ඒ අයට වෙනත් තර්ජන සහ වෙනත් ප්‍රශ්න ඇති වෙන එකයි. මේ රටේ පාරිභෝගිකයා තමයි ඉහළින් ඉන්නේ කියලා අපි කියන්නේ ඒ නිසායි. අපි පනත් හදලා, කොමිෂන් සභා දාලා, ආයතන පිහිටුවලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හදලා ඒ සියල්ල කරන්නේ මේ රටේ ජනතාව වෙනුවෙන්. මේ රටේ පාරිභෝගිකයා වෙනුවෙන්. ඒ නිසා මේ සියලු ආයතන පාරිභෝගිකයාට, එහෙම නැත්නම් එම සේවා ලබා ගන්නා අයට අවසානයේ දී වග කියන්න ඕනෑ. මොකද, ඒ අයගේ මුදල් අරගෙන තමයි ඒ සමාගම් දියුණු වෙන්නේ. ඒ සමාගම් ව්‍යාපාර කරන්නේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වැනි ආයතන ඒ සමාගම්වලට බලපත්‍ර ලබා දීලා, ඒ සමාගම්වලට අවශ්‍ය පහසුකම් ලබා දීලා, ඒ අයගේ ආදායම වැඩි කළාම, ඒවා නැවතත් ආයෝජනය කිරීම තුළින් මේ රටේ සන්නිවේදනය හෝ අනෙකුත් සියලු දේ සඳහා ඒ මුදල් වියදම් කරනවා.

මේ පනත වෙනස් කිරීමේදී පාරිභෝගිකයා, එහෙම නැත්නම් රටේ ජනතාවගේ පැත්තට විශාල වශයෙන් අවධානය යොමු කිරීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. අද ලෝකයේ රටවල ආර්ථිකය වෙනස් වෙලා තිබෙන්නේ. ලෝකයේ වෙළෙඳාම් ක්‍රම වෙනස් වෙලා. අපේ රටට එන විදෙස් ආයෝජකයෝ බලාපොරොත්තු වෙන්නේ, ඉල්ලන්නේ වෙනස් දේවල්. ඒ නිසා අපි රටක් වශයෙන් ඉස්සරහට ගන්න තීන්දුවලදී මෙම පනත්වලට කරන වෙනස් කිරීම් මේ රටේ ආර්ථිකයට විශාල වශයෙන් වැදගත් වෙනවා.

අපි දන්නවා, e-commerce ගැන. අපි පුළුවන් තරම් සන්නිවේදන ක්‍රම පාවිච්චි කරන්න ඕනෑ. ඒ කියන්නේ, ප්‍රායෝගිකව පුද්ගලයෙක් ගිහිල්ලා දෙයක් මිලදී ගන්නවාට වඩා, online හරහා අවශ්‍ය දේ තෝරාගෙන online හරහා ම මුදල් ගෙවලා භාණ්ඩ ලබා ගැනීමට අද රටේ, ලෝකයේ ඉන්න පුද්ගලයන් විශාල වශයෙන් පෙලඹී තිබෙනවා. ඒ සඳහා විශාල වශයෙන් උනන්දු වෙනවා. ඒ වාගේම ඒ සඳහා වැඩි අවස්ථාද තිබෙනවා. නමුත්, ලෝකයේ අනෙකුත් රටවල් දිහා බැලුවාම අපේ රටේ ඒ තත්ත්වය දකින්න ලැබෙන්නේ අඩුවෙන්. යටිතල පහසුකම් උපයෝගී කරගෙන රට හදනවාට වඩා, මේ සන්නිවේදන ක්‍රම තුළින් දියුණු ශීඝ්‍ර ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළක් ඇති කරන්න පුළුවන් කියා මම හිතනවා.

ලංකාවේ තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, ආදායම් එකතු කර ගැනීමේ ප්‍රශ්නය. එහෙම නැත්නම් බදු එකතු කර ගැනීමේ ප්‍රශ්නය. සියලුදෙනා ව්‍යාපාර කරන්න කැමැතියි. සියලුදෙනා ලාභ උපයන්න කැමැතියි. නමුත් කිසිම කෙනෙක් කැමැති නැහැ, රජයට බදු ගෙවන්න. බදු අඩුවෙන් ගෙවන්න තමයි බලන්නේ. මෙවැනි සන්නිවේදන ක්‍රම හරහා කෙරෙන වෙළෙඳාම් තුළින් විශාල වශයෙන් බදු අයකර ගැනීමේ පහසුකම් ලැබෙනවා. එ් සඳහා අලුත් වැඩ පිළිවෙළ අපට හඳුන්වා දෙන්න පුළුවන්. ඒ ගැන අපි අවධානය යොමු කරන්න ඕනෑ. ආර්ථික වැඩ පිළිවෙළ තුළට සන්නිවේදනය බද්ධ කරලා අපේ රටේ ආදායම වැඩි කරගන්න අවශ්‍ය වැඩ පිළිවෙළකටත් මෙය සම්බන්ධ කර ගන්න පුළුවන්.

අද මේ පනත වෙනස් කිරීම සඳහා කටයුතු කළ කොමිෂන් සභාවේ නිලධාරීන් ඇතුළු සියලුදෙනාට මම ස්තුතිවන්ත වෙනවා, මේ රටේ ආර්ථික වැඩ පිළිවෙළට ශක්තියක් වෙන්න පුළුවන්, ඒ සඳහා අවශ්‍ය පනත්වල වෙනස්කම් කරලා ඒ සහයෝගය ලබා දීම ගැන.

මම මුලින්ම කිව්වා වාගේ නැවත වරක් මේ කාරණය කියනවා. අපේ මේ ආර්ථික වැඩ පිළිවෙළට, මේ රට 2048 වර්ෂය දක්වා ගෙන යන වැඩ පිළිවෙළට අවශ්‍ය මට්ටමේ සන්නිවේදන වැඩ පිළිවෙළක් ද අප ළඟ තිබෙන්නේ කියලා අපි නැවත කල්පනා කරන්න ඕනෑ. මම හිතන විධියට, ඒ වෙනුවෙන් අපට විශාල ගැම්මක්, විශාල පියවරක් ඉස්සරහට තබන්න වෙනවා. ඒ ගැම්ම, ඒ පියවර කොච්චරදුරට සාක්ෂාත් කරගන්න, එහෙම නැත්නම් ළඟා කරගන්න පුළුවන්ද කියන එක ගැන අපි අවධානය යොමු කරන්න ඕනෑ. එ සඳහා පසුගිය අවුරුදු 10ක, 15ක කාලය තුළ නොගත් තීන්දු අපට ඉදිරියේදී ගන්න වෙනවා. ඉස්සරහට ගන්න යන ඒ තීන්දුත්, අතීතයේ නොගත් තීන්දුත් යන දෙකම අපට එක වතාවේ ගන්න වෙලා තිබෙනවා. ඒ නිසා මා හිතන හැටියට මේ වැඩ පිළිවෙළ තුළින් අපේ රටේ ආර්ථිකයට අත්‍යවශ්‍ය ලෝකයේ පවතින ආර්ථික මෙවලමක් වෙච්ච සන්නිවේදනය හරහා අපට ලබා දෙන්න යන මේ සහයෝගය වෙනුවෙන් අප ඒ සියලුදෙනාටම ස්තුතිවන්ත වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (මහාචාර්ය) වරිත හේරත් මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.19]

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප හමුවේ තිබෙන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධ විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

විශේෂයෙන්ම මේ විෂයය අපේ රටේ තීරණාත්මක, එහෙම නැත්නම් ඉතා වැදගත් අනාගත කාර්යයකට සම්බන්ධ විෂයයක්. රටේ විදුලි සංදේශ යටිතල පහසුකම් කියන ඒවා, telecommunication කියන subject එක ගැන මීට වඩා වැඩි අවධානයක් රට තුළ, ව්‍යවස්ථාදායකය තුළ ලබා දිය යුතුව තිබෙනවා.

TRC Act එක අනුමත කළාට පසු අපේ කලාපයේ අනෙක් රටවලට වඩා telecommunication පැත්තෙන් ඉහළ සාක්ෂරතාවක් අපේ රටට ලැබිලා තිබෙනවා. ඒ නිසා මෙම පනත සංශෝධනය කිරීමට මැදිහත් වීම ගැන මම සතුටට පත් වනවා. ඒ වාගේම මෙම විෂය ගැන පුළුල් අවබෝධයකින් අප කටයුතු කළ යුතුව තිබෙනවා. සරල, එහෙම නැත්නම් දේශපාලන අවශ්‍යතා වෙනුවෙන් telecommunication නීති රීති එහා මෙහා කරන්න අපි නොයා යුතුව තිබෙනවා. අපි දන්නවා, විශේෂයෙන්ම සමහර දේශපාලන කටයුතුවලදී සමහර අය එක එක විධියට රූපවාහිනී channels එක්ක රණ්ඩු වෙනවා, ගුවන් විදුලි channels එක්ක රණ්ඩු වෙනවා කියලා. ඒ වාගේම සමහර මාධ්‍ය ආයතන එක්කත් රණ්ඩු වෙනවා. එම නිසා තම තමන්ගේ හිතු මනාපයට මේවා පාලනය කරන්න නීති හදන්න ඕනෑ කියලා සමහර වෙලාවට සමහරු කල්පනා කරනවා. ඒක වැරදියි. හැබැයි, රටක telecommunication infrastructure එක ශක්තිමත්ව පිහිටෙව්වේ නැත්නම් වර්තමාන ලෝකය තුළ පැවැත්මක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනය කරන අයත් මේක හොඳට දැනගන්න ඕනෑ.

ඉස්සර පුද්ගලයෙකුගේ භෞතික පැවැත්ම - physical presence - තමයි වැදගත් වුණේ. දැන් නම් ඩිජිටල් පැවැත්ම - digital presence - කියන එක ව්‍යාපාරයක් ගත්තත්, පුද්ගලයෙකු ගත්තත් ඉතාම වැදගත් අවශ්‍යතාවක් විධියට තිබෙනවා. ඒ නිසා branding කරද්දීත්, දේශපාලන වශයෙන් අපි යම්කිසි මතයක් සමාජගත කරද්දීත් ඉස්සර පොදු ජනයා වෙත mass media හරහා ඒවා යන්න තිබුණු ඉඩ අද වනකොට digital media ඇතුළේ විශාල විප්ලවයක් බවට පත් වෙලා තිබෙනවා. ඒක දේශපාලනය කරන ඔක්කෝම දන්නවා ඇති. ඊළඟට එන ජනාධිපතිවරණයේදී, මහ මැතිවරණයේදී එය හොඳට බලාගන්න පුළුවන්. Budget එක දිහා බැලුවත් එය පෙනෙනවා, සමාජයේ හැසිරීම දිහා බැලුවත් පෙනෙනවා, මේ digital infrastructure එක ඇතුළේ තමයි decision-making process එකට විශාල ශක්තියක් ලැබිලා තිබෙන්නේ කියලා. එම නිසා මේ සම්බන්ධ හොඳ නීති රටට ගෙනෙන්න ඕනෑ. හොඳ නීති, ධනාත්මක නීති හා ඉදිරිගාමී නීති අපි ගේන්න ඕනෑ. Digital infrastructure සම්බන්ධ regulatory mechanism එක මීට වඩා වැඩි වෙන්න ඕනෑ. මම අදටත් කනගාටු වෙන කාරණයක් තිබෙනවා. මේ සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදයක් මා යෝජනා කළා. නමුත්, එදා සිටි පක්ෂ නායකයන්ට ඒක තේරුණේ නැහැ. පක්ෂ නායක රැස්වීමේ ඉඳගෙන හිටපු නායකයන්ට වයස වැඩියි, ඒ ප්‍රශ්නය තේරුම් ගන්න. ඒ නිසා ඔවුන් එය ප්‍රතික්ෂේප කළා. ඔවුන් හිතුවා, මා ප්‍රතික්ෂේප කළා කියලා. නමුත්, ඒක නොවෙයි සිදු වුණේ.

පසුගිය කාලයේ මේ රටේ විප්ලවයකින් වාගේ විශාල බල වෙනසක් සිදු වුණා. ඒක පිටුපස තිබෙනවා එක්තරා grammar එකක්. අපි තේරුම් ගන්න ඕනෑ, සමාජය තවදුරටත් තනි මනසක් ඇතුළේ නොවෙයි හිතන්නේ කියලා. මේකට අපි කියනවා, extended mind කියලා. පුද්ගලයාගේ mind එක විස්තාරණය කරපු තැනකට ඩිජිටල් අවකාශය ඇතුළේ අපි ගිහින් තිබෙනවා. ඒ නිසා හැම කෙනෙක්ම තමන්ගේ මනසින් කල්පනා කරනවා වාගේම extended mind එකක් සාක්කුවේ දමාගෙනයි ඉන්නේ. එහෙම සමාජයක තමයි අපි ඉන්නේ. එහෙම සමාජයක ඉන්නකොට ඒ පිළිබඳව regulatory මැදිහත් වීම ශක්තිමත් කරන්න ඕනෑ. මා ඒ සඳහා පාර්ලිමේන්තු caucus එකක් යෝජනා කළේ, ඒකට ජනතාවගේ තිබෙන සම්බන්ධතාව වැඩි කරන්නයි; like-minded පුරවැසියන්ගේ සම්බන්ධතාව පාර්ලිමේන්තුවට වැඩි කරන්නයි. මේ වාගේ පනත් කෙටුම්පතක් ගෙනෙනකොට විශාල consultative process එකක් හදන්න පුළුවන් වෙයි කියලා තමයි ඒක මම යෝජනා කළේ. නමුත්, පක්ෂ නායක රැස්වීමේ හිටපු අය හිනා වෙලා බොහොම sarcastic විධියට ඒක පැත්තකට දැම්මා. අපේ සමහර අය කල්පනා කරන්නේ සමාජය තිබෙන තැනට වඩා හුගක් පස්සට ගිහිල්ලායි. ඒ ගැන හරිම කනගාටුදායකයි. අපි අතීතය ගැන උජාරුවෙන් කථා කරනවා විතරක් නොවෙයි, අපි තීරණ ගන්නකොටත් අතීතයේ ඉඳලා තමයි තීරණ ගන්නේ. ඒක වැරදියි. ඒ නිසා තමයි සමහර ප්‍රශ්නවලට අපට උත්තර නැති වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම සංශෝධනය පිළිබඳව කථා කරද්දි විශේෂයෙන්ම spectrum එක, නැත්නම් frequencies සම්බන්ධ ප්‍රශ්නය ගැන කථා කරලා තිබෙනවා. අපි දන්නවා, එක ආණ්ඩුවක් පමණක් නොවෙයි, එක එක කාලවල පැවති බොහෝ ආණ්ඩු මේ frequency holdersලා එක්ක රණ්ඩු වුණු බව. සමහර වෙලාවට ඒ අයත් එක්ක වෛරයෙන් වැඩ කරනවා. රූපවාහිනී නාළිකාවලට වැරදි අන්දමේ බලපෑම් කරන්න යනවා. ඒ නාළිකාවල අයිතිකරුවන් සහ කළමනාකරුවන්ටත් මේ පිළිබඳ විශාල වගකීමක් තිබෙනවා. එම නිසා digital infrastructure ක්ෂේත්‍රයේ ඇති ප්‍රධාන වචන තුනක් ගැන මේ සභාවේත්, ඒවාට සම්බන්ධ අයගේත් අවධානය යොමු කළ යුතුයි කියලා මා යෝජනා කරනවා.

එක පැත්තකින්, නියාමනය - regulation - ගැන වැරදියට තේරුම් ගන්න එපා. Regulation කියන එක අවශ්‍යයි, මේ digital infrastructure development එකේ එක කොටසක් විධියට. ඒ වාගේම digital media ethics සම්බන්ධව අලුත් කතිකාවක් අපේ රටේ හදන්න සිදු වෙලා තිබෙනවා. Media ethics ගැන අපේ තිබෙන කතිකාව ඉතාම පරණයි. නමුත් මේ digital media ethics ඇතුළේ අපි අලුත් එකඟතාවලට යන්න ඕනෑ. Regulationsවලින් කරන්න බැරි දේවල්, නීතියෙන් කරන්න බැරි දේවල් මාධ්‍ය සදාචාරය තුළිනුත් කරන්න පුළුවන්. සමහර දියුණු රටවල් එවැනි තැනකට ගිහින් තිබෙනවා. මම ගරු සභාවේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරවනවා. European Union එකේ මේ වෙනකොට "right to be forgotten" කියලා නීතියක් සම්මත කරලා තිබෙනවා. ඩිජිටල් විෂය භාර රාජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. 'Right to be forgotten' කියන්නේ යම් පුද්ගලයෙකුට තමන් සම්බන්ධව ඉදිරිපත් වුණු අදහසක් ඉවත් කරන්න අවශ්‍ය නම්, ඒ අදාළ පුද්ගලයාට ඒ පිළිබඳ අයිතිය දෙන්න ඕනෑ කියන එකයි. අපි මේ කාරණය ගැන කල්පනා කර බලමු. යම්කිසි පුද්ගලයෙක් එක දේශපාලන පක්ෂයක ඉඳලා, එහෙම නැත්නම් එක ව්‍යාපාරයක් කරලා ඒ ව්‍යාපාරයෙන් අයින් වෙලා වෙන ව්‍යාපාරයකට ගියාට පස්සේ අර පරණ ව්‍යාපාරය ඔහුගේ identity එකත් එක්ක යන ගමන නවත්වන්න ඔහුට අයිතියක් තිබෙනවා. ඒ වාගේ අලුත් නීති European Union එක හදලා තිබෙනවා. "Right to be forgotten" කියන්නේ එහෙම නීතියක්. ඒ වාගේ, අපිත් මේ digital infrastructure ඇතුළේ ඉදිරියට යා යුතුව තිබෙනවා.

ඒ වාගේම competitive market එකක් මේක ඇතුළේ තිබෙනවා. මේ, ලංකාව ඇතුළේ තිබෙන පොඩි market එකක්

[ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා]

විතරක් නොවෙයි. අපේ වෙළෙඳ පොළ ආර්ථිකය ඉදිරියේදී වර්ධනය කරන්න බැරි වෙනවා.

අපි Port City කියලා මුහුදු පස්වලින් පුරවලා, නගරයක් හදලා ඒකට නීතියක් හදා තිබෙනවා. හැබැයි, අපට තවම බැරි වෙලා තිබෙනවා, attractive විධියට, package එකක් විධියට ජාත්‍යන්තර මූල්‍ය ක්ෂේත්‍රයේ හෝ වෙනත් වෙළෙඳ ක්ෂේත්‍රයක අය එතැනට ගෙන්වන්න. මේ digital infrastructure සම්බන්ධව අපි ඉන්නේ පරණ තැනක නම්, හොඳ මූල්‍ය නගරයක් හදන්න කියලා මුහුදු පස්වලින් පිරෙව්වාට අපට කොළඹ නගරයේ මූල්‍ය නගරයක් හදන්න බැහැ. ඒකට මෙය එක හේතුවක් විය හැකියි. මම ඒ ගැන දන්නේ නැහැ. මම ආණ්ඩුවේ නොවෙයි ඉන්නේ. මෙම කාරණය ඒකට එක හේතුවක් විය හැකියි. වේගවත්ව වැඩ කරන, නිදහසේ තිබෙන නියමාකාර නියාමනයක් සහිත digital infrastructure එකක් නැතිව වරාය නගරය ඉදිරියට ගෙනයන්න බැහැ. මම මේ උදාහරණයක් විතරයි කිව්වේ. මේ කාරණයට අපේ අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

ඒ වාගේම global examples ගැන අධිකරණ තීන්දුවේත් තිබෙනවා. මම මේ වෙලාවේ මතක් කරන්න කැමතියි, යම්කිසි appreciation එකක් එක්ක සමහර රාජ්‍ය නොවන ආයතන මේකට මැදිහත් වුණ බව. මගේ මිත්‍ර මහාචාර්ය රොහාන් සමරජීව මැතිතුමා මේ විෂය ගැන දන්න කෙනෙක්. එතුමා ඉතාම හොඳ යෝජනා කිහිපයක් ඉදිරිපත් කරලා ශ්‍රේෂ්ඨාධිකරණයේ Determination එකේදී ඒ මතයට එකඟ වෙලා තිබෙනවා. ඒ ගැනත් අපි සතුටට පත් වනවා. එහෙම තමයි මෙවැනි නීතියක් හදනකොට අපි වැඩ කරන්න ඕනෑ. පාර්ලිමේන්තුව විධියට මේ වාගේ ඉතාම සංකීර්ණ විෂයයක් ගැන කථා කරනකොට ඒ ගැන දන්න අය සමඟ consultative process එකකට යන්න ඕනෑ. අපේ රටේ පනත් කෙටුම්පත් හදනකොට අනුගමනය කළ යුතු කාරණාවලදී, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරණ Standing Ordersවල ඇතුළත් විධිවිධානවල ප්‍රශ්නයක් තිබෙනවා. අද මේ රටේ ජනතාව දැනගන්න ඕනෑ, පනත් කෙටුම්පතක් හදනකොට අනුගමනය කරන ක්‍රියා මාර්ගය ගැන. මුලින්ම concept note එකක් Cabinet එකට දාලා, Cabinet එකෙන් draft එකක් හදලා, ඒක Legal Draftsman එක්ක deal කරලා, Legal Draftsman හදන ඒ draft එක නීතිපති දෙපාර්තමේන්තුවට - Attorney-General's Department එකට- යවලා ඊට පසුව ඒ දෙක නැවත Cabinet එකට දාලා පාර්ලිමේන්තුවේ present කරන එක තමයි කරන්නේ. හැබැයි, මේ කොතැනකවත් ඉඩක් නැහැ, for like-minded and a known group of people to engage with that process. That is a very important thing. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතාම වැදගත් කාරණයක්. ඒ නිසා මේ රටේ ජනතාවට නීති හදන ආකෘතියට ඇතුළත් වෙන්න පුළුවන් ඉඩ අපි හදන්න ඕනෑ. පාර්ලිමේන්තු caucuses හරහා හෝ එහෙම නැත්නම් පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් හරහා නීති හැදීමේදී ජනතාවට අපේ පාර්ලිමේන්තුව එක්ක එකතුවීමේ ඉඩක් හදන්න ඕනෑ. එතකොට අපට ජේනවා, සමහර වැරදි වෙන්නේ නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල ගෙනාපු බොහෝ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය නීතිය පැත්තෙන් පිටු 60, 70 දිග Determinations එවලා තිබෙනවා, එහි තිබෙන වැරදි කියලා. හැබැයි, ඒ වෙලාවේ කියන්නේ ව්‍යවස්ථාවට අනුව සහ පවතින නීතිවලට අනුව මේ draft එක වැරදියි කියායි. හැබැයි, දැනුමට අනුව, නැත්නම් බිස්නස්වලට අනුව, ලෝකයේ අනෙක් examplesවලට අනුව මේක කොච්චර වැරදිද කියලා එතැනදී බැලෙන්නේ නැහැ. ඒකට හොඳම උදාහරණය තමයි Online Safety Bill එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Online Safety Bill එක ගත්තොත්, ඒ සම්බන්ධව තිබුණු ව්‍යවස්ථාමය ගැටලු පමණයි අපට ගේන්න පුළුවන් වුණේ.

නමුත් මේකේ content එකේ විශාල ප්‍රශ්නයක් තිබුණා; මේ සංකල්පයේ විශාල ප්‍රශ්නයක් තිබුණා. මොකද, ඒවා ගැන දන්නා අයට ඒ සඳහා මැදිහත් වෙන්න එතැන ඉඩක් තිබුණේ නැහැ. ඒ නිසා අපේ රටේ මේ නීති හදන ව්‍යාපෘතිය ගැන අපි මීට වඩා බුද්ධිමත්ව සහ මීට වඩා මැදිහත්ව වැඩ කළ යුතුයි කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ මේ frequencies හරහා යන මාධ්‍ය ගත්තොත්, එක පැත්තකින් localize වෙච්ච domestic නැත්නම් රට තුළ පවතින මාධ්‍ය අවකාශයක් තිබෙනවා, රූපවාහිනිය, ගුවන් විදුලිය වශයෙන්. ඊට අමතරව ඩිජිටල් spectrum හරහා යන, online තාක්ෂණය හරහා යන විශාල මාධ්‍ය යන්ත්‍රණයක් අද වෙනකොට හැදිලා තිබෙනවා කියන එකත් අපි දන්නවා. ඒ නිසා මේවා ගැන හිතන්න අවශ්‍යයි. අනාගතයේ මේ රටේ පාලන බලය ගන්න සිටින ඕනෑම කෙනෙකුට මම කියන්නේ Ministry of Mass Media කියන එක දැන් ඉවරයි කියන එකයි. දැන් Ministry of Communication කියලා මේ digital infrastructure ආවරණය වෙන අලුත් Ministry එකක් අපේ රටට අවශ්‍යයි. පරණ Department of Government Information එකේ කාලය දැන් ඉවරයි. Photographer කෙනෙක් දාලා පින්තූරයක් ගහලා, ඒක develop කරලා පත්තරවලට යවන Department of Government Information එකේ කාර්යය දැන් ඉවරයි. ඒ නිසා දැන් Ministry of Communication කියන අලුත් ස්ථාවර තැනකට මේ ක්ෂේත්‍රය රැගෙන යන්න අවශ්‍යයි කියා මම හිතනවා. ඒ ගැන අනාගතයේදී පත් වන ආණ්ඩුවල අයගේ අවධානය යොමු කරන්න කියා ඉතාම ගෞරවයෙන් මා ඉල්ලා සිටින්න කැමැතියි.

ඒ වාගේම මේ TRC Act එකේ තවත් වෙනස් විය යුතු පැති ගණනාවක් තිබෙනවා. මේවා සම්බන්ධව අපේ අවධානය යොමු කරන්න ඕනෑ. TRC එක ජනාධිපතිවරයා යටතේ තිබෙන එක නවත්වන්න ඕනෑ. මම මේක හැමදාම කියන එකක්. මම ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි, TRC එක රටේ ජනාධිපතිවරයා යටතේ තියන්න හොඳ එකක් නොවෙයි කියන එක. TRC එක Ministry of Mass Media ඇතුළට ගේන්න ඕනෑ. TRC එකේ හිටපු අය සමහර කාලවල වැඩ කළේ වෙන ග්‍රහලෝකයකින් ආපු අය වාගේයි. මම TRC එකත් එක්ක වැඩ කරලා තිබෙනවා, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ හිටපු ස්ථිර ලේකම්වරයා වශයෙන්. TRC එක සමහර කාලවලදී ගත්ත තීරණ වැරදියි. අපි නෙළුම් කුලුන හදන්න තීරණය කළ අවස්ථාවේ අපේ රටේ රූපවාහිනී terrestrial ඩිජිටල් කරන්න ඒ කුලුන උඩ ඇන්ටෙනාව සවි කරන්න අවශ්‍ය වුණා. නමුත් TRC එක ඇන්ටෙනාව සවි කරන්නේ නැතුව කුලුන ගැහුවා. අද වෙනකොට අපි සතුව නෙළුම් කුලුන තිබෙනවා, restaurant එකක් run කරන්න. නමුත් ඇන්ටෙනාව නැහැ. එහෙම වුණේ TRC එකේ සමහර අය තීරණ ගන්නකොට ඒ ගැන පුළුල් විධියට කල්පනා කෙරුවේ නැති නිසායි. ඒක ජනාධිපතිතුමා යටතේ තිබෙන විෂයක් නිසා උඩින් ආපු අය වාගේ, වෙන ලෝකයකින් ආපු අය වාගේ කල්පනා කරපු කාල වකවානු තිබුණා. ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් මේ කාරණය කියන්න කැමැතියි. මම මේ කියන්නේ ඒක නෙළුම් කුලුන හදපු අයගේ වැරද්දක් කියලා නොවෙයි. මම කියන්නේ මේ සංකල්පයේ වරදක් තිබෙනවා කියන එකයි.

මගේ යෝජනාව වන්නේ TRC එක ජනාධිපතිතුමා යටතේ තිබෙන මේ දේශපාලනය නවත්වන්න ඕනෑ කියන එකයි. අපේ රටේ ආරක්ෂක හමුදා ජනාධිපතිතුමා යටතේ තිබෙන්න ඕනෑ.

හැබැයි, පත් වෙන හැම ජනාධිපතිම කාටවත් දෙන්නේ නැතුව TRC එක අතේ තියා ගන්නවා. අතේ තියාගෙන මේ රූපවාහිනී channels කළමනාකරණය කරනවා වාගේම, web එක කළමනාකරණය කරන්න පුළුවන් කියා හිතනවා. නමුත් එහෙම කළමනාකරණය කරන්න බැහැ. අද වෙනකොට පැය 24ක් ඇතුළත රටක මතය සම්පූර්ණයෙන් අනික් පැත්තට හරවන්න පුළුවන් digital infrastructure එකක් රට තුළ හැදිලා තිබෙනවා. හුහක් අයට ඒක තේරෙන්නේ නැහැ. රෑට නිදියනකොට දාලා යන tweet එක නිසා පසුව දා උදේට පාරට මිනිස්සු ලක්ෂ 20ක්, 30ක් ගේන්න ලෝකයේ බොහෝ රටවලට හැකි වෙලා තිබෙනවා. අපේ රටෙත් එහෙම කරන්න හැකි වුණා. ඒ නිසා මේ digital infrastructure කියන එක කවුරු හරි ජනාධිපතිවරයෙකුගේ පසුපස ඉන්න උපදේශකවරු කිහිපදෙනෙකු යටතේ තිබෙන එකක් නොවෙයි. එය වෙනම science එකක් තිබෙන, වෙනම දැනමුත්තන් ඉන්න, වෙනම අමාත්‍යාංශයක් යටතේ කල්පනා කරන්න ඕනෑ විෂයක් බවට පත් වෙලා තිබෙන බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව අපේ රටේ telecommunication industry එක අනාගත වෙළෙඳ පොළ ආකෘතියත් එක්ක එකට ගැට ගැහිලා යන ව්‍යාපෘතියක් බවට පත් වෙන්න ඕනෑ. අපේ රටේ telecommunication regulatory mechanism එක අනාගතයේ අලුත් වෙන රාජ්‍ය යන්ත්‍රණය එක්ක එකට යන විෂයක් බවට පත් වෙන්න ඕනෑ.

දැන් Digital ID එක ගැන කියනවා. එහෙම නැත්නම් RAMIS system එක ගැන කියනවා. තවත් විවිධ දේවල් කියනවා. මේ අවස්ථාවේ ගරු ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා. එතුමා මේ වෙනුවෙන් මහන්සි වෙනවා. මම ඒ ගැන සතුටු වෙනවා වාගේම මගේ ශුභාශිංසන එතුමාට පිරිනමනවා. නමුත් අපේ රටේ digital infrastructure development රාජ්‍යයයි, වෙළෙඳ පොළයි කියන දෙකම එක්ක ඉස්සරහට යන පුළුල් වැඩසටහනක් බවට පත් කරන්න අවශ්‍යයි. එය පැත්තකින් තියලා තිබෙන විෂයයක් නොවෙයි කියන බවත් ප්‍රකාශ කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිය පිරිනමමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.35]

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 20ක් තිබුණා. නමුත් දැන් ඒ ප්‍රමාණය අඩු වෙලා නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුවිශාල වශයෙන් වැදගත් වන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත ගැන තමයි අද අපි සාකච්ඡා කරන්නේ. මා ඒ සම්බන්ධයෙන් කථා කරන අතරම, අද සාකච්ඡා කළ කාරණා ගණනාවක් එක්ක තිබෙන යම් ආකාරයේ කාලීන කාරණා කිහිපයක් මගේ කථාව තුළ ගෙනහැර දක්වන්නත් අවශ්‍යතාව තිබෙනවා.

විශේෂයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත අද මේ සංශෝධනය වෙන්නේ දශක දෙකකටත් අධික කාලයකට පස්සේ. දුරකථනය වෙනස් වෙනකොට එතැනින් එහාට ගිහිල්ලා අද වෙනකොට අපේ ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රම කොහොමද වෙනස් වෙලා තිබෙන්නේ, මොන තත්ත්වයටද දියුණු වෙලා තිබෙන්නේ කියලා අපි දන්නවා. හැබැයි, ඒ දුවන වේගයත් එක්ක දුවන්න තවම අපට බැරි වෙලා තිබෙනවා. ඒක ඇත්ත. ඒ නිසා ඒකට අවශ්‍ය තාක්ෂණය, භාවිතාව, සැකැස්ම හදා ගන්න අපි නව අණ පනත් එක්ක ඉස්සරහට යන්න ඕනෑ. මනුෂ්‍ය චර්යා වෙනස් වෙනකොට ඒවාත් එක්ක අපි කටයුතු කරන්න ඕනෑ.

අද ජී.එල්. පීරිස් මැතිතුමාගේ කථාවේදී එතුමාට යම් සැකයක් තිබෙන බවක් පෙන්නුම් කළා, මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වන ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයට අපි අනුගත වෙන්නේ නැද්ද කියලා. නමුත් මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට සහ තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මා පැහැදිලිව කියන්න ඕනෑ, මේ ශ්‍රේෂ්ඨාධිකරණ නියමයට පරිබාහිරව යන්න අපට කිසිම අවශ්‍යතාවක් නැති බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවටත් මේ අදාළ කාරණාව ඉදිරිපත් වුණා. ඒ අවස්ථාවේදීත් අපි ඉතා පැහැදිලිව කිව්වා. සුමනි ධර්මවර්ධන මැතිතුමා කියන්නේ අපේ පාසලේ මගේ මිත්‍රයෙක්. ඒ වාගේම මනෝහර මැතිතුමා. අපි ඔක්කෝම මිත්‍රයෝ හැටියට, නීති ක්ෂේත්‍රය නියෝජනය කරන අය හැටියට පැහැදිලිව මේ වෙලාවේ කියන්න ඕනෑ, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට හිස නමා, වෙනසක් නැතුව ඒ කියන පරිදි තමයි අපි මේ පනත් කෙටුම්පත සම්මත කරන්නේ කියන එක. අද දිගින් දිගටම සමාජයට කියන්න උත්සාහ කරනවා, සමාජ මාධ්‍ය නියාමන පනත හරහාත් අපි අපට ඕනෑ දේවල් කළාය කියලා. නමුත් පැහැදිලිව කියන්න ඕනෑ, කිසිම වෙලාවක ශ්‍රේෂ්ඨාධිකරණය කියපු කාරණාවලට පරිබාහිරව ගිහිල්ලා පනත් සංශෝධනය කරන්න අපේ බලාපොරොත්තුවක් නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හැම දාම විශ්වාස කරන දෙයක් තමයි frequency right එක රටක ජනතාවට තිබෙන්න ඕනෑය කියන එක. Frequency right එක පුද්ගලානුබද්ධව බෙදා වෙන් කිරීමේ ප්‍රතිඵල අපි අදටත් දකිනවා. අපට කිසිම අවස්ථාවක භාෂණයේ නිදහස හෝ අදහස් පළ කිරීමේ නිදහස පාලනය කරන්න අවශ්‍යතාවක් නැහැ, අණ පනත් ගෙනැල්ලා. මේ පනත් කෙටුම්පතේ ප්‍රධාන අරමුණ වුණේ මොකක්ද? මේ දුවන ලෝකයත් එක්ක, වේගයෙන් ඉදිරියට යන ලෝකයත් එක්ක අපට ගාටමින් යන්න බැහැ. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපයන්න, තාක්ෂණික දියුණුව ඇති කරන්න, ඒ සඳහා වෙනස් කළ යුතු දේවල් වෙනස් කරන්න තමයි අද අපි මේ සංශෝධන ගෙනැල්ලා, මේ විදුලි සංදේශ පනත යාවත්කාලීන කරන්න උත්සාහ කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිසිම අවස්ථාවක සියලු මනුෂ්‍ය ක්‍රියාකාරකම්, සියලු හැසිරීම් ආවරණය වන පරිදි නීති හදන්න බැහැ. හැබැයි, මේ පනත හරහා යම් ආකාරයකට සාධනීය වශයෙන්, වර්තමාන තත්ත්වයට ගැළපෙන ලෙස ඩිජිටල් තාක්ෂණය, ඩිජිටල් යටිතල පහසුකම් දියුණු කරන්න අවශ්‍ය ක්‍රමය ගෙන එන්න ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ රාජ්‍ය අමාත්‍ය කනක හේරත් මැතිතුමා ඉතා උනන්දුවෙන් වැඩ කටයුතු කරනවා. පසුගිය කාලයේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී හර්ෂ ද සිල්වා මැතිතුමාත් මේ සම්බන්ධයෙන් බොහොම සාධනීය ලෙස අදහස් ඉදිරිපත් කළා අපි දැක්කා.

විශේෂයෙන් යටිතල පහසුකම් සේවා සැපයීම, විදුලි සංදේශ සේවා සැපයීම, සමුද්‍රීය කේබල් ගොඩබිමට සම්බන්ධ කරන ස්ථාන සඳහා පහසුකම් සැපයීම කියන කාරණාවලදී, බලපත්‍ර නිකුත් කිරීම කියන කාරණාව ගත්තොත්, සුවිශේෂී වෙනස්කමක් මේ පනත් කෙටුම්පත තුළ ගැබ් වෙලා තිබෙනවා කියලා මම හිතනවා. ඉතින් අපි වෙනස් වන ලෝකයත් එක්ක මේ කටයුතු

[ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

පිළිබඳව වෙනස් විධියට හිතලා වෙනස් ආකාරයට කටයුතු කරගෙන යන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් මගේ ශුභාශිංසන එක් කරනවා, අපේ ආණ්ඩුවේ ඇමතිවරුන්ට සහ ඒ වෙනුවෙන් කටයුතු කළ සියලු රාජ්‍ය නිලධාරීන්ට.

මේ මොහොතේ අපි තාක්ෂණික ක්‍රම හරහා ඉදිරියට යන්න ඕනෑ. අපට ලෝකයත් එක්ක ගමන් කරන්න පුළුවන් වෙන්නේ, අපට දියුණු වෙන්න පුළුවන් අවස්ථාවක් නිර්මාණය කරන්න පුළුවන් වෙන්නේ ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත වාගේ පනත් කෙටුම්පත් සම්මත කර ගැනීම හරහා ලෝකයත් එක්ක එකට වැඩ කරන්න පුළුවන් ආකාරයට වෙනස් වීම් ඇති කිරීම තුළින් බව මගේ අදහසයි.

අද අපේ රටේ Colombo Port City එක හදලා තිබෙනවා. Colombo Port City එක හරහා අපි ලෝකයත් එක්ක ගමන් කරන්න ආයෝජන ගෙනෙනකොට, එම ආයෝජනවලට ගැළපෙන පරිදි පවතින තාක්ෂණයත් වෙනස් වෙන්න ඕනෑ. එහෙම කරන්න පුළුවන් වෙන්නේ මේ ආකාරයට යටිතල පහසුකම් වෙනස් කිරීම හරහායි. දැන් අපේ මන්ත්‍රීවරයෙක් චෝදනා මුඛයෙන් කථා කළා, මෙම අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජනාධිපතිතුමා යටතේ තිබෙනවා කියලා. ජනාධිපතිතුමා සේනාධිනායකයා හැටියට අත් නොහළ යුතු අයිතියක් තමයි රාජ්‍ය ආරක්ෂාව කියන කාරණය. මම හිතන විධියට මේ පනත් කෙටුම්පතට විරුද්ධව, මේ පනත් කෙටුම්පත වෙනස් වෙන්න ඕනෑය කියලා පෙත්සම් ඉදිරිපත් කරපු අය ශ්‍රේෂ්ඨාධිකරණයේදී ඒ අයගේ submissionsවලදී කෙස් පැළෙන තර්ක ගෙනාවා මේ විධියට කටයුතු කරන එක රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් කියලා. එහෙම බැලුවාම, ජනාධිපතිතුමා මේ කාරණය සම්බන්ධයෙන් වගකීම දැරීම දේශපාලන අවශ්‍යතාවක් කියා මම හිතන්නේ නැහැ. රාජ්‍ය ආරක්ෂාව කියන එක අත් හැරීමේ හැකියාවක් ජනාධිපතිතුමාට නැහැ කියන කාරණය ව්‍යවස්ථානුකූලව -ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ- අපි දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙහිවල-රත්මලාන සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හැටියට මම මෙය අවස්ථාවක් කරගන්නවා, හිටපු අමාත්‍යවරයකු වන සී.වී. ගුණරත්න මැතිතුමා පිළිබඳ මගේ මතකය අවධි කරන්න. එතුමා උපත ලැබුවේ 1935 අප්‍රේල් 17වැනි දා, දෙහිවලදී. අපි කවුරුත් දන්නවා, 2000 ජුනි 07වැනි දා රණවිරු දිනය නිමිත්තෙන් රත්මලාන-බොරුපන හන්දිය පසු කර යනකොට, එතුමාගේ බිරිඳ ඇතුළු තවත් 24දෙනෙකු සමඟ කුරිරු බෝම්බ ප්‍රහාරයකට හසු වෙලා එතුමා මිය ගිය බව. මම මෙය අවස්ථාවක් කරගන්නවා, එතුමා ස්මරණය කරන්න. ඒ වාගේම එතුමාගේ දේශපාලන හිතවතුන්ට, එතුමාගේ පවුලේ සියලුදෙනාට ශෝකය පළ කරන්නත් මම මෙය අවස්ථාවක් කරගන්නවා. එතුමා මිය ගොස් අවුරුදු 24ක් පිරෙනවා, පසුගිය ජුනි 07වැනි දාට. ඒ එක්කම, එතුමා කළ සේවා ගැනත් සඳහන් කළ යුතුයි. එතුමා කළ ඉතා වැදගත් සේවයක් තමයි අවුරුදු ගණනාවක් තිස්සේ එම ප්‍රදේශයේ පැවැති ගංවතුර ප්‍රශ්නය විසඳීම සඳහා ලුනාව ඇළ මාර්ග ව්‍යාපෘතිය ආරම්භ කිරීම. අද වෙනකොට එම ඇළ පද්ධතියේ, ඒ කානුවල ඒ තිබෙන බට දිරා තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සතුටු වෙනවා අද විමධ්‍යගත අය වැය තුළින් මගේ ප්‍රතිපාදන යොදා ගනිමින් එම ඇළ සංවර්ධනය වෙමින් පැවතීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වනවිට පවතින දේශපාලන තත්ත්වය ගැන කථා කරනකොට, බොහොමයක් දෙනා සඳහන් කළ කාරණාවක් තමයි ජනාධිපතිවරණය කල්දමන්න යනවාය කියන එක. ඒ කාරණය ජනාධිපතිතුමාගේ ගිණුමට දැම්මා. සාමාන්‍ය පුරවැසියෙක් ගිහිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කළොත් ඒකත් ජනාධිපතිතුමාගේ account එකට දමන්න උත්සාහ කරනවා. සමහරු කිව්වා, එම පෙත්සම්කරු යම් දේශපාලන පක්ෂයක ජාතික ලැයිස්තුවක ඉන්නවා කියලා. හැබැයි, ඉතින් එහෙම කියනවා නම්, පාස්කු ප්‍රහාරයේදී කථා කළ ඊබ්‍රාහිම් කියන පුද්ගලයාත් ජනතා විමුක්ති පෙරමුණේ ජාතික ලැයිස්තුවේ සිටියා. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන්ම ලජ්ජාවක් නැතුව කියනවා, මේකත් මේ ජනාධිපතිතුමාගේ කාර්යයක් ද කියලා. අපි පැහැදිලිවම කියන්න ඕනෑ එතුමාට එසේ චෝදනා එල්ල කළ බව. හැබැයි, අද වනවිට ශ්‍රේෂ්ඨාධිකරණය ඒ ගැන පැහැදිලි තීන්දුවක් දීලා තිබෙනවා.

මේ රටේ ඕනෑම පුරවැසියෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කරන්න අයිතිය තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සම්බන්ධව තීන්දු-තීරණ ගන්න, ඒක නිෂ්ප්‍රභ කරන්න පුළුවන්. දැන් ගැටලුව වෙලා තිබෙන්නේ මේකයි. විරුද්ධ පක්ෂය සමහර වෙලාවට තමන්ට වාසි වෙනකොට, අධිකරණය හොඳයි කියනවා. අවාසි වෙනකොට නරකයි කියනවා. විනිශ්චයකාරවරු මේ කමිටුවලට ගෙනෙන්න කටයුතු කරනවාය කියන කාරණය කථා කරන සමහර මන්ත්‍රීවරුන්ට මතක නැහැ, මේ රටේ හිටපු අග්‍ර විනිශ්චයකාරවරයෙක් ඉවත් කරන්නත් ඒ ක්‍රියාදාමය ක්‍රියාත්මක වුණාය කියන එක. ඒක අමුතු දෙයක් නොවෙයි. ඒක අපි අධිකරණයට කරන බලපෑමක්වත්, වෙන මොනවාවත් නොවෙයි. ඒ සාමාන්‍ය ක්‍රමය බව අපි කවුරුත් දන්නවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, ජනතාවගේ අධිකරණ බලය තමයි පාර්ලිමේන්තුව තුළින් අධිකරණය හරහා ක්‍රියාත්මක වෙන්නේ. එතකොට අධිකරණ බලය හෝ යම් බලයක් අභිභවා යනවා නම්, මේ ආයතන එකිනෙකා අභිභවා යනවා නම්, ඒවා නියමාකාරයෙන් පාලනය කිරීම සඳහා අවශ්‍ය සංවරණ හා තුලන - checks and balances - ක්‍රමයක් තිබෙනවා. එහි එක් ප්‍රතිඵලයක් තමයි ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, අධිකරණය සම්බන්ධයෙන් මැදිහත්වීමේ හැකියාව ව්‍යවස්ථාදායකයට තිබීම. ඒ කෙසේ වෙතත්, මම ඒ කාරණය ගැන කථා කිරීම මෙතැනින් නවත්වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන කොට ලංකාව පුරා තිබෙන සමහර ත්‍රස්තවාදී, ෆැසිස්ට්වාදී දේශපාලන යන්ත්‍රණ උත්සාහ කරනවා, මේ පවතින තත්ත්වය හමුවේ මේ රට ආර්ථිකමය වශයෙන් කෙළින් කටින් යන්තම් ඉස්සරහට එනකොට එය ආපස්සට හරවන්න. ඒ අය ත්‍රස්තවාදීන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අය පැහැදිලිවම ආර්ථික ත්‍රස්තවාදීන්. මේ රට අමාරුවෙන් ඉස්සරහට යන කොට, IMF එකට ගිහිල්ලා ගිවිසුම්ගත වීම් එක්ක රටක් හැටියට අපි ඉස්සරහට යනකොට ඒ අය අද උත්සාහ කරනවා කකුලෙන් අදින්න. අපි IMF එක හරහා ලබාගෙන තිබෙන සාර්ථකත්වය ගැනවත් අවංකව සතුටු වෙන්න ඒ අයට බැහැ. සමහර රටවල් ගැන ඒ අය නිතරම කියනවා. එම රටවල වර්තමාන තත්ත්වය හා සම්බන්ධ කරුණු ගොනු කරපු පුංචි සටහනක් මා ළඟ තිබෙනවා. ඒ සටහනෙහි සඳහන් රටවල් කීපයක් පිළිබඳව මම දැන් කථා කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෙබනනය ගත්තොත්, 2020 මාර්තු මාසයේ තමයි ණය අත්හිටුවන්නේ. ඒ අයට IMF එකේ අනුමැතිය ලැබිලා නැහැ. 2023දී ඒ රටේ උද්ධමනය සියයට 268 යි. 2024 මැයි වන කොට උද්ධමනය සියයට 51.6යි. 2022 දෙසැම්බර් වන කොට ඩොලරයක අගය ලෙබනන් පවුම් 1,500ක් වුණා. 2024 ජුනි වන කොට ඩොලරයක අගය ලෙබනන් පවුම් 89,500ක් වුණා.

සානාව ගත්තොත්, ණය අත් හිටුවන්නේ 2020 දෙසැම්බර් මාසයේ. 2023 වසරේ IMF අනුමැතිය ලැබෙනවා. උද්ධමනය 2022 සියයට 54යි, 2024 මැයි වන කොට සියයට 23යි.

සැම්බියාව ගත්තොත්, 2020 ජූලි මාසයේ තමයි ණය අත්හිටුවන්නේ. 2022 අගෝස්තු මාසයේදී IMF එකේ අනුමැතිය ලැබෙනවා. උද්ධමනය 2022 ජුනි වන කොට සියයට 29.8යි. 2024 ජුනි වන කොට සියයට 15.2යි.

චැඩ් රාජ්‍යය ගත්තොත්, 2021 වර්ෂයේ තමයි ණය අත්හිටුවන්නේ. තවමත් IMF එකේ අනුමැතිය ලැබී නැහැ. උද්ධමනය 2020 අගෝස්තු වන විට සියයට 8යි. 2024 මාර්තු වන කොට එය සියයට 6 දක්වා අඩු වෙලා තිබෙනවා. 2022 සැප්තැම්බර් වන විට ඩොලරයක අගය CFA Franc 676.9ක් වෙලා තිබෙනවා. අද වන කොට එම අගය CFA Franc Franc 611ක් වෙලා තිබෙනවා.

ශ්‍රී ලංකාව ගත්තොත්, 2022දී තමයි ණය අත්හිටුවන්නේ. 2023 මාර්තු මාසයේ අපට IMF අනුමැතිය ලැබුණා. 2022 සැප්තැම්බර් වන විට අපේ රටේ උද්ධමනය සියයට 69.8ක් වුණා. හැබැයි, වර්තමානය වන කොට -2024 ජුනි වන කොට- උද්ධමනය සියයට 1.7යි. 2022 නොවැම්බර් මාසය වන කොට ඩොලරයක අගය ශ්‍රී ලංකා රුපියල් 367.40ක් වුණා. 2024 ජුනි වන කොට ඩොලරයේ අගය රුපියල් 305 දක්වා පහළ බැස තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි තත්ත්වයක් තිබියදී, ආර්ථිකමය වශයෙන් ගොඩනැඟිලා අපි මේ විධියට ඉස්සරහට යද්දී අද වන කොට සමහර අය වර්ජන රැල්ලක් ක්‍රියාත්මක කරනවා. ඔය කියන වර්ජන රැල්ල පිටුපස කවුද ඉන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය හා පළාත් රාජ්‍ය වෘත්තීය සමිති එකමුතුව ඉන්නවා. ඒ අය ඉල්ලන්නේ රුපියල් 25,000ක දීමනාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 25,000ක දීමනාවක් දෙන්න ගියොත්, VAT තවත් සියයට 3කින් වැඩි කරන්න වෙනවා. අපි කොහොමද ඒක කරන්නේ? ඊට අනුබද්ධ වෘත්තීය සමිති 101ක් තිබෙනවා. ඒ වෘත්තීය සමිති එකමුතුවේ කවුද ඉන්නේ? ප්‍රධානියා තමයි, ජේවීපී එකේ මධ්‍යම කාරක සභික වන්දන සූරියආරච්චි, ජේවීපී ක්‍රියාකාරී යූ. පලිහවඩන සහ ජේවීපී එකේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චාමර මද්දුමකළුගේ. තවත් එකක් තමයි, කළමනාකරණ සේවා වෘත්තීය සමිති එකමුතුව. එයට අනුබද්ධ වෘත්තීය සමිති 10යි. ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරී යූ. පලිහවඩන තමයි එහි කැඳවුම්කරු. තවත් එකක් තමයි, ගුරු විදුහල්පති වෘත්තීය සමිති සන්ධානය. ඔවුන්ගේ ඉල්ලීම තමයි, වැටුප් විෂමතා ඉවත් කරන්න කියන එක. එහි කැඳවුම්කරුවන් තමයි, ජවිපෙ මධ්‍යම කාරක සභික මහින්ද ජයසිංහ, ජවිපෙ ජාතික භික්ෂු පෙරමුණේ පූජ්‍ය වකමුල්ලේ උදිත හිමි, ජවිපෙ ක්‍රියාකාරී සුනිල් ප්‍රේමතිලක සහ පෙරටුගාමී පක්ෂයේ වාස් ගුණවර්ධන.

තවත් එකක් තමයි, ඒකාබද්ධ තැපැල් වෘත්තීය සමිති පෙරමුණ. එහි කැඳවුම්කරු ජවිපෙ ක්‍රියාකාරී ජගත් මහින්ද. රාජ්‍ය සේවා වෘත්තීය සමිති සන්ධානයේ කැඳවුම්කරුවන් වන පූජ්‍ය ටැම්පිටියේ සුගතානන්ද හිමි සහ ධම්මික මුණසිංහ පෙරටුගාමීන්. ඒකාබද්ධ සෞඛ්‍ය සේවක සංගමයේ කැඳවුම්කරු වන්නේ, පූජ්‍ය ටැම්පිටියේ සුගතානන්ද හිමි. මේ සියලුදෙනා අද ජවිපෙ හෝ ජවිපෙන් කැඩිච්ච දේශපාලන සංවිධාන. එහෙම නැත්නම් ෆැසිස්ට්වාදී දේශපාලන සංවිධාන. මා කලින් සඳහන් කරපු ලෝකයේ බංකොලොත් වුණු රටවල් එක්ක අපි කොහොමද ඉස්සරහට ආවේ කියලා හිතන්නේ නැතිව, අපි ඉදිරියට යන අතරතුර පෙන්නුම් කරන ජයග්‍රහණ හමුවේ මේ අය අද කකුලෙන් අදිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු කෘෂිකර්ම අමාත්‍යවරයෙකු වන අනුර කුමාර දිසානායක මහත්මයා තව පෝය තුනකින් මේ රටේ ජනාධිපති වෙනවා නම්, ඒ පෝය තුන යනකල් ඉවසන්න බැරි ඇයි? හිටපු අමාත්‍ය අනුර කුමාර දිසානායක මහතාට එහෙම විශ්වාසයක් තබන්න පුළුවන් නම්, මේ රටේ දරුවන්ගේ ඉගෙනීම, අනාගතය උකස් කරන්නේ ඇයි කියලායි මා ප්‍රශ්න කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් කලක් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කළා. ඔබතුමා මූලාසනයේ ඉන්න මේ වෙලාවේ ඒ ගැන කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. මොකද, ඔබතුමා එම සංවිධානය ගැන හොඳ අවබෝධයක් තිබෙන කෙනෙක්.

ඊළඟට, දැන් මේගොල්ලන් කියනවා, අවුරුදු 75ක ශාපයක් ගැන. 1965 ඉඳලා අද වනකල්ම මේ අය සෑම ආණ්ඩුවකටම මුක්කු ගහලා සෑම පාලන තන්ත්‍රයකටම සම්බන්ධ වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ලියාගෙන ආපු කාරණා ටිකක් තිබෙනවා. මම දැන් ඒ ටික කියවන්නම්.

1965දී ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ චීන පිලෙන් රෝහණ විජේවීර නෙරපා හැරීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ වෛරී දේශපාලන සම්ප්‍රදාය ආරම්භ විය. දේශපාලන වශයෙන් ප්‍රතික්ෂේප වීමේ මානසික පීඩනය විජේවීර මුදා හැරියේ සමාජ වෛරයකිනි. සමාජ වෛරය නමැති ගර්භාෂයේ "ජනතා විමුක්ති පෙරමුණ" නම් දේශපාලන පක්ෂය බිහි විය. එම ගර්භාෂයෙන් උපත ලද මෙම දේශපාලන පක්ෂය තම වෛරී දේශපාලන රික්තකය, නැතිනම් ඇරියස් එක කවර් කර ගත්තේ මර්දනය මුදා හැරීමෙනි. ඒ සඳහා ඔවුන් විසින් අපූරු න්‍යායක් ඉදිරිපත් කරන ලදී. එසේ කරන ලද්දේ, එය ධනපති පන්තියට එරෙහි පීඩිතයන්ගේ සටන ලෙස සාධාරණීකරණය කරමිනි. ඒ සඳහා ඔවුන් විසින් පන්ති 5ක් හඳුන්වා දෙන ලදී.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩි 2ක කාලයක් දෙන්න. එය අපේ ආණ්ඩුව පැත්තේ වෙලාවෙන් අඩු කර ගන්න. මොකද, මට මේ ටික කියවා අවසන් කරන්න ඕනෑ. මම කථා කරලා ආණ්ඩුවෙන් වෙලාව අරගෙන දෙන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පන්ති 5 තමයි, ලංකාවේ ධනේශ්වර අර්බුදය, නිදහස, ඉන්දියානු ව්‍යාප්තවාදය, ලංකාවේ වාමාංශික ව්‍යාපාරය, ලාංකේය විප්ලවයේ උපාය උපක්‍රම සහ ගත යුතු මඟ. හැබැයි, මම Facebook එකෙන් දැකලා තිබෙනවා, 6 වන පන්තියක් ගැනත්. ඒක තමයි "තමන්ගේ ඥාතීන්ට හා බිරිඳට වත්කම් උපයා ගැනීමේ මඟ" කියන එක. Facebook එකේ තමයි එහෙම තිබුණේ.

එම පන්ති 5න් ඇස් නිලංකාර කරගත් තරුණ තරුණියෝ දේශපාලන විප්ලවයක් සඳහා තම ජීවිත කැප කළහ. හුදෙක් එම පන්ති 5 සමාජ විරෝධී ආකල්පවල ප්‍රතිඵලයක් මිස ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහා වූ ධනාත්මක ප්‍රවේශයක් නොවේ. ජනතා විමුක්ති පෙරමුණේ ද සහාය ඇතිව 1970දී

[ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

පිහිටුවා ගනු ලැබූ සමගි පෙරමුණ ආණ්ඩුවට එරෙහිව 1971දී කැරැල්ලක් දියත් කරන්නේ රෝහණ විජේවීරයන්ගේ සමාජ, දේශපාලන වෛරය සන්සිඳුවා ගැනීමට ය. මැතිනිය ඝාතනය කර ආණ්ඩු බලය ලබා ගැනීමට ඔවුහු උත්සාහ දැරූහ. 6,000ක පමණ තරුණ තරුණියන් ඝාතනය වූ අතර, මැතිනියගේ ජාතික සමගි පෙරමුණ ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරන්නට යෙදුණු දේශීය ආර්ථිකය පදනම් කරගත් ආර්ථික වැඩ පිළිවෙළ කඩාකප්පල් විය. මේ හේතුවෙන් භාණ්ඩ හිඟයක් ඇති වී පෝලිම් යුගයක් නිර්මාණය විය. මැතිනියගේ "හත් අවුරුදු ශාපය" ලෙස දේශපාලන සටන් පාඨයක් සමාජගත කළ ජනතා විමුක්ති පෙරමුණ ජේ.ආර්. ජයවර්ධන බලයට ගෙන ඒම සඳහා රොනී ද මැල් සමඟ කුමන්ත්‍රණ කළේ ය.

1977දී ජේ.ආර්. ජයවර්ධනට 5/6ක දේශපාලන බලයක් හිමි වූයේ විජේවීර විසින් මැතිනියට එරෙහිව ක්‍රියාත්මක කළ අරගළවල හා කැරලිවල ප්‍රතිඵලයක් වශයෙනි. 1977දී ජේ.ආර්. ජයවර්ධන නව ආර්ථික වැඩ පිළිවෙළක් රටට හඳුන්වා දුන් අතර, එය "විවෘත ආර්ථිකය" නම් විය. එයින් භාණ්ඩ හිඟය නිමා වී පෝලිම් යුගය ද අවසන් විය.

1971 දී මෙන්ම 1977 දී බලයට පැමිණි ආණ්ඩු "ධනපති ආණ්ඩු" ලෙස හංවඩු ගසා නැවත ආණ්ඩුවල ක්‍රියාකාරිත්වය කඩාකප්පල් කිරීමට ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කළේ ය. 1982 මහා වැඩ වර්ජනය පිටුපස සිටියේ ජනතා විමුක්ති පෙරමුණයි. 1983 ජූලි මස දමිළ ජනතාවට එරෙහිව දකුණේ ක්‍රියාත්මක වූ මිලේච්ඡ ප්‍රහාරයට ජනතා විමුක්ති පෙරමුණ ද රහසිගතව ක්‍රියාත්මක විය. "කළු ජූලිය" ලෙස ප්‍රසිද්ධ වූ එම ත්‍රස්තවාදී ක්‍රියාව නිසා ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුව විසින් දේශපාලන පක්ෂ ගණනාවක් තහනම් කරන ලදී. තහනම් කරන ලද දේශපාලන පක්ෂ බොහොමයක් තම නිර්දෝෂීභාවය අධිකරණයට ඉදිරිපත් කර යළි ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට එක් විය. වාසුදේව නානායක්කාර, වික්‍රමබාහු කරුණාරත්න එවන් දේශපාලන පක්ෂ නායකයන් ය. එහෙත් විජේවීර ඇතුළු ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් සැහවී, බිම්ගතව, ආයුධ සන්නද්ධව ජේ.ආර්. ජයවර්ධන පාලනයට එරෙහිව භීෂණය ඇති කරන ලදී. ඒ සඳහා එවක අගමැතිවරයා වූ ප්‍රේමදාස මහතාගේ ආශීර්වාදය ජනතා විමුක්ති පෙරමුණට හිමි විය. ජේ.ආර්. බලයෙන් පහ කිරීම සඳහා ප්‍රේමදාස හා විජේවීර අතර රහසිගත ගිවිසුමක් තිබිණි.

උතුරේ ප්‍රභාකරන්ගේ ඊළාම් යුද්ධයට අමතරව දකුණේ සිවිල් යුද්ධයක් හා සමාන භීෂණයක් පැවැතිණි. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයා දෙකොන පත්තු වෙන විලක්කුවක් තමන් භාරගත් බව ප්‍රකාශ කළේ මේ නිසාය. රෝහණ විජේවීර, මැතිනියට එරෙහිව ජේ.ආර් ගෙනාවා වාගේම ජේ.ආර්ට එරෙහිව ප්‍රේමදාස බලයට ගෙන ඒමට භීෂණය හේතු විය. එහි ප්‍රතිඵලයක් වූයේ ප්‍රේමදාස පාලනය තුළදීම විජේවීර ඝාතනයට ලක්වීමයි.

ජනතා විමුක්ති පෙරමුණ කලින් කලට දේශපාලන පක්ෂ බලයට ගෙන ඒමට කටයුතු කළ අතරම, එම පක්ෂ බලයෙන් පහ කිරීමට ද කටයුතු කළේ ය. මේ නිසා රටේ දේශපාලන අස්ථාවරභාවය නිරන්තරයෙන්ම ඇති විණි.

1994 දී චන්ද්‍රිකා මැතිනිය බලයට ගෙන ඒමට කටයුතු කළ ජනතා විමුක්ති පෙරමුණ චන්ද්‍රිකාට එරෙහිව මහින්ද රාජපක්ෂ බලයට ගෙන ඒමට කටයුතු කළේ ය. මහින්ද රාජපක්ෂ බලයට ගෙනා ජනතා විමුක්ති පෙරමුණ මහින්ද රාජපක්ෂට එරෙහිව සරත් ෆොන්සේකා බලයට ගෙන ඒමට උත්සාහ දැරීය. එම උත්සාහය අසාර්ථක වූ කළ කුමන්ත්‍රණයකින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් මෛත්‍රීපාල සිරිසේන මහතා බලයට ගෙන ඒමට නායකත්වය ගත්තේය. ජනතා විමුක්ති පෙරමුණේ රූකඩයක් වූ මෛත්‍රීපාල සිරිසේන මහතා රාජපක්ෂවරුන් හිර ගෙවල් තුළ ගාල් කිරීමට ජනතා විමුක්ති පෙරමුණේ ඉල්ලීම මත දූෂණ විරෝධී කමිටුවක් පිහිටුවා නීත්‍යානුකූල බලයක් ලබා දෙන ලදී.

ජාතික ආරක්ෂාව දුර්වල වී පාස්කු බෝම්බ ප්‍රහාරය සිදු වූයේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ යහ පාලන කාලය තුළදීය. සංචාරක කර්මාන්තය බිඳ වැටී ආර්ථිකය යළි දණින් වැටෙන තැනකට මස්තබාල්දු වන්නේ මෙම පාලන කාලය තුළයි. පාස්කු බෝම්බ ප්‍රහාරයට ඍජුව වග කිවයුතු ස්වයං ඝාතකයන් දෙදෙනෙකු ජනතා විමුක්ති පෙරමුණේ ජාතික ලැයිස්තුවේ අපේක්ෂක ඊබ්‍රාහිම් මහතාගේ පුතුන් දෙදෙනෙකි.

දුර්වලව තිබුණු ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා කටයුතු කරද්දී කොවිඩ් වසංගතයට රට මුහුණ දෙන්න සිදු වූයේ අවාසනාවන්ත තත්ත්වයක් තුළය. ආනයන හා අපනයන සීමා වී මුළු ලෝකයම අගුළු ලා තිබූ තත්ත්වයක් තුළ ලංකාවේ ආර්ථිකය ද දුර්වල තත්ත්වයකට පත් විය. ජීවිත ද, ආර්ථිකය ද කියන ප්‍රශ්නය තුළ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ජීවිත ආරක්ෂා කරන්න තීරණය කළ අතර, එන්නත් තුනම ලබා දී මිනිස් ජීවිත කොවිඩ් වසංගතයෙන් ආරක්ෂා කර ගන්නා ලදී. මේ නිසා විදේශ විනිමයේ හිඟයක් ඇති වූ අතර, ඒ හේතුවෙන් ඉන්ධන, ගෑස්, විදුලිය වැනි අත්‍යවශ්‍ය සේවා සපයා ගැනීමට රජය අපොහොසත් විය.

අත්‍යවශ්‍ය සේවා අහිමි වීමෙන් පීඩනයට පත් සාමාන්‍ය ජනතාව සාමකාමී අරගළයකට වීදි බැස්සත් එය දේශපාලන අරගළයක් දක්වා රැගෙන ඒමට ජනතා විමුක්ති පෙරමුණ සූක්ෂම විය. එහි ප්‍රතිඵලයක් විධියට 1971, 1988 මෙන් භීෂණයක් නිර්මාණය කර බලය අත්පත් කර ගැනීමට ජනතා විමුක්ති පෙරමුණ උත්සාහ දැරීය.

ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ මහජන ඡන්දයකින් පත් වූ ජනාධිපතිවරයෙක් ධුරයෙන් ඉල්ලා අස් වූ අතර, ඔහුගේ අනුප්‍රාප්තිකයා ලෙස රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති ධුරයේ වැඩ භාර ගත්තේ රටේ ආර්ථිකය කඩා වැටී රට බංකොලොත් වී නීතියේ ආධිපත්‍යය ද බිඳ විටුණු අවස්ථාවකය. අනුප්‍රාප්තික ජනාධිපති ධුරයට පත් රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරියේ තිබුණේ නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීමේ ප්‍රමුඛ කාර්යයයි. නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කළ රනිල් වික්‍රමසිංහ මහතා බංකොලොත් ආර්ථිකය යළි යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කළේය.

76 වසරක සාපයක් පිළිබඳ මහජන මත හා රැලි හඳන ජනතා විමුක්ති පෙරමුණ 1965 සිට මේ දක්වා බලය ලබා ගැනීම සඳහා භීෂණය හා මර්දනය ක්‍රියාත්මක කළ අතර, ඉන් නොනැවතී රට අස්ථාවර කිරීම සඳහාත්, ආර්ථිකය කඩාකප්පල් කිරීම සඳහාත්, විවිධ උද්ඝෝෂණ හා අරගළ ක්‍රියාත්මක කරන දේශපාලන පක්ෂයකි. ආර්ථික සංවර්ධනය පිළිබඳ කිසිදු වැඩ පිළිවෙළක් නොමැති ජනතා විමුක්ති පෙරමුණ ජනතාව අතර වෛරය සමාජගත කරමින් දේශපාලන බලය ලබාගත හැකි බව විශ්වාස කරන කණ්ඩායමකි. බලය ලැබීමට පෙර කියන කථා බලය ලැබුණු පසු ක්‍රියාත්මක කරගත නොහැකි ළඳරු දේශපාලන සංවිධානයකි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු කෘෂිකර්ම අමාත්‍ය ගරු අනුර කුමාර දිසානායක මහත්මයා මේ වෙනකොට අපේ ප්‍රදේශවල දේශපාලන ක්‍රියාකාරීන්ගේ ගෙවල්වලට ගිහිල්ලා

බලපෑම් කරනවා. මේ කථාව මම කියන්න හේතුව මෙන්න මේ කාරණයයි. කැස්බෑවේ සිටින කාන්තාවක් මට කථා කරලා කියනවා, "සර්, අපට ඡන්ද කොළයක් දීලා යනවා නම් ප්‍රශ්නයක් නැහැ. අපි ඡන්දය දෙන්නේ කාට ද කියලා වරු ගණන් ගත කර කර අපට කරදර කරනවා" කියලා. ඒ වෙලාවේ මම එම තැනැත්තියගෙන් ඇහුවා, "ඔබතුමියට අවශ්‍ය නීත්‍යානුකූලව පියවරක් ගන්න ද?" කියලා. ඒ තැනැත්තිය කිව්වා, "නැහැ. අපි තව චතාවක් බලමු සර්. තවත් චතාවක් ඇවිල්ලා බලපෑමක් කළොත් මම පොලීසියේ පැමිණිල්ලක් දානවා. මොකද, මට දේශපාලන තීන්දුවක් ගන්න අයිතියක් තිබෙන්න ඕනෑ" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අසංක නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.58]

ගරු අසංක නවරත්න මහතා
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත ගැන විවාද කරන අවස්ථාවේ මටත් අදහස් දැක්වීමට වෙලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කරමින් අපේ රටේ විදුලි සංදේශ ක්ෂේත්‍රයට නව වැඩ පිළිවෙළක් යෝජනා කරලා තිබෙනවා. පසුගිය කාලය පුරාම සමාජයේ කථා වුණු කාරණා අපි දන්නවා. මේ ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා අවශ්‍ය නීතිමය රාමුවක් සැකසීමේ වුවමනාව මේ පනත් සංශෝධනය හරහා ඉදිරිපත් කරලා තිබෙනවාය කියන කාරණාව මම සඳහන් කරන්න කැමතියි.

ඒ වාගේම මේ පනත් කෙටුම්පතේ ප්‍රධාන අරමුණ වෙලා තිබෙන්නේ විදුලි සංදේශ සේවා ක්‍රියාකරුවන්ට මෙන්ම විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන්ටත් ඔවුන්ගේ සේවා ව්‍යාප්ත කිරීම, කොමිෂන් සභාවේ බලතල හා කාර්යයන් පුළුල් කිරීම, ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කලාපවලට වෙන් කර දීම හා ඒ සඳහා බලපත්‍ර ලබා දීම, බලපත්‍ර කොන්දේසිවලට අනුව ක්‍රියා නොකරන බලපත්‍රධාරීන්ට දණ්ඩන නියම කිරීමයි. මේ ආදී කරුණු කාරණා ගණනාවක් මේ සංශෝධන පනත් කෙටුම්පතේ සඳහන් වෙලා තිබෙනවා. මේ සංශෝධන වහා වහා ගෙනෙන්නේ දේශපාලන අරමුණු ඉටු කර ගන්නට නොව, අනාගතයත් එක්ක ගැළපෙන ආකාරයට, ලෝකයේ අනෙක් රටවල් එක්ක සමගාමීව යන්න පුළුවන් වන ආකාරයට අවංකවම අපේ රටේ මේ ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා තමයි කියන කාරණාව ජනගත කිරීම අවශ්‍ය වෙලා තිබෙනවා. අපි ඒ සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක්, පාරදෘශ්‍ය වැඩ පිළිවෙළක් ආණ්ඩුවෙන් බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අපි පසුගිය කාලයේ අත් විඳපු, මෙයට සම්බන්ධ කාරණා කීපයක් මතු කරන්න කැමැතියි. විශේෂයෙන්ම 2021 වසරේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව "ගමට සන්නිවේදනය" වැඩසටහන ආරම්භ කළා. ඒ වැඩසටහන හරහා දිස්ත්‍රික්ක විසිපහේ ග්‍රාම නිලධාරි වසම් 14,000ක් ආවරණය වන පරිදි පාසල් දහසක ෆයිබර් තාක්ෂණයත් එක්ක අන්තර්ජාල පහසුකම් ලබා දෙන වැඩ පිළිවෙළක් ආරම්භ කළා. කොවිඩ්-19 වසංගතයත්, ඊට පස්සේ ඇති වුණු ආර්ථික අර්බුදයත් එක්ක මේ ව්‍යාපෘති අඩාළ වුණු බව අපි දන්නවා.

අපේ කනක හේරත් රාජ්‍ය ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්නවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේත් විදුලි සංදේශ කුලුනු 40ක් අලුතින් ඉදි කිරීම සඳහා යෝජනා වෙලා තිබුණා. ඒ වෙලාවේ අග්‍රාමාත්‍යවරයා විධියට සිටි අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ සඳහාම සාකච්ඡාවක් කැඳවලා මේ ව්‍යාපෘතිය භාරව සිටි අධ්‍යක්ෂවරිය ගෙන්වලා එහි ප්‍රගතිය පිළිබඳව දිගින් දිගටම සාකච්ඡා කළා. නමුත් අද වෙනකොට බොහොම ශෝචනීය තත්ත්වයක් තමයි තිබෙන්නේ. අපේ රාජ්‍ය ඇමතිතුමාත් 2023 වසරේ අග භාගයේදී ඒ ව්‍යාපෘතිය නැවත බල ගැන්වීම සඳහා එතුමාගේ කථාවක ඒ ව්‍යාපෘතිය පිළිබඳව කරුණු කාරණා ගණනාවක් සඳහන් කරලා තිබෙන බව මම දැක්කා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම නියෝජනය කරන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ බොහොම දුෂ්කර ආසනයක් වන ගල්ගමුව ආසනය. මේ වෙනකොට ගල්ගමුව ආසනයේ අතිබහුතරයක් ප්‍රදේශ සාමාන්‍ය දුරකථන සංඥාවලින්වත් ආවරණය කරගන්න බැරි වෙලා තිබෙනවා. මහව අධ්‍යාපන කලාපයේ පාසල් 188ක් තිබෙනවා. මේ පාසල් 188න් අතිබහුතරයක් පාසල් සඳහා මේ තාක්ෂණ පහසුකම් ලබා දෙන්න අපට බැරි වෙලා තිබෙනවා. අපි දන්නවා, ලෝකයත් එක්ක හරි හරියට අපි තරග කරන්න අවශ්‍ය බව.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ "ගමට සන්නිවේදනය" වැඩසටහන මේ වන විටත් ක්‍රියාත්මක වෙනවා. ඒ වැඩසටහන ඊට වඩා කඩිනම් කරලා ඒ වෙනුවට අපි අලුත් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකත් දැනට ක්‍රියාත්මක වෙනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කාලයෙන් පස්සේ, ඒ කියන්නේ පසුගිය වර්ෂය බලද්දි මුළු රටේම විදුලි සංදේශ කුලුනු 276ක අවශ්‍යතාවක් තිබුණා. පසුගිය වර්ෂයේ විතරක් මුළු රටේම ඒ කුලුනු 276න්, 50ක් අවසන් කළා. කුරුණෑගල කුලුනු 34ක් තිබෙනවා. ඒකෙන් මම හිතන විධියට දැන් 12ක් හරි, 16ක් හරි වැඩ අවසන් වෙලා තිබෙනවා. මේ වර්ෂයේ කුලුනු 150ක වැඩ ඉවර කරන්නත්, ලබන වර්ෂය වෙද්දි සියල්ලේම වැඩ ඉවර කරන්නත් තමයි මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ. එහිදී අභියෝග කීපයක් තිබුණා. එක අභියෝගයක් තමයි, මේ සඳහා ආයතන 18කින් විතර අවසර ගන්න තිබෙන එක. ඒක එක කාරණාවක්. අපි සංවර්ධන කමිටුවට ඒ කරුණ ඉදිරිපත් කරලා එ් කටයුතු කඩිනම් කරලා තිබෙනවා.

ඊළඟ කාරණාව මෙකයි. විදුලි බිල ඉහළ යෑමත් එක්ක එක් එක් ආයතනවලට ලොකු විදුලි බිලක් ලැබුණා. ඒ සඳහා අපි තවත් සහනයක් දීලා ඒ විදුලි බිලෙනුත් සියයට 50ක් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ගෙවනවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළ දැන් කඩිනම් වෙලා තිබෙනවා.

ඊට අමතරව මේ පනත් කෙටුම්පත මඟින් servicesවලට, එහෙම නැත්නම් පහසුකම් සැපයීම සඳහා බලපත්‍රයක් ලබා දෙනවා. ඒ පහසුකම් සැපයීමට බලපත්‍ර ලබා දීමෙන් පසු තුන්වැනි පාර්ශ්වයකට ඒ කටයුතු කරන්න පුළුවන්. දැනට කරන්නේ ඩයලොග් ආයතනය වෙන්න පුළුවන්, මොබිටෙල් ආයතනය හෝ හච් ආයතනය වෙන්න පුළුවන්. ඒ ආයතන තුන විතරයි. මේකෙන් පස්සේ තවත් පාර්ශ්වයකට ඇවිල්ලා ඒ ගොල්ලන්ටත් ඒක කරන්න පුළුවන්. ඇත්තටම මේ ඉල්ලීම කළේ දුරකථන සමාගම්වලින්. මොකද, ඒ ගොල්ලන්ට තිබෙන වැඩවලට තවත් වැඩක් එකතු වෙලා තිබෙනවා, මේ කුලුනු හදන එක. ජාත්‍යන්තර සම්මුතිවලට අනුව අපි ඒක තුන්වැනි පාර්ශ්වයකට දුන්නාම, ඒක තවත් කඩිනම් වෙනවා.

[ගරු කනක හේරත් මහතා]

ඒ වාගේම, පාසල් 1,000 වැඩසටහනේ දෙවැනි අදියරත් මේ අවුරුද්දේ ඇවිල්ලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රදේශයේ අඩු පාඩු තිබෙන පාසල් තිබෙනවා නම් මා දැනුවත් කරන්න. ඒ දෙවැනි අදියර හැටියට අන්තර්ජාල පහසුකම් තිබෙන IT, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අසංක නවරත්න මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු අසංක නවරත්න මහතා
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමා ගන්න කාලය මගෙන් අඩු කරන්න එපා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාව මගේ කාලයෙන් අඩු කරගන්න. IT පහසුකම් තිබෙන පාසල්වලට මෙවර අපි ස්මාර්ට් පන්ති කාමර ලබා දෙනවා. ඒ ව්‍යාපෘති දෙකම ක්‍රියාත්මක වෙනවා.

ගරු අසංක නවරත්න මහතා
(மாண்புமிகு அசங்க நவரத்ன)
(The Hon. Asanka Navarathna)
බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ඇත්තටම ඒක හොඳ ආරංචියක්; සුබ ආරංචියක්. අපි පසුගිය කාලය පුරාම විශාල අරගළයක් කළා. මේ වෙනකොටත් අපේ කලාපයේ ගල්ගමුව, නිකවැරටිය, යාපහුව වාගේ දුෂ්කර ආසන්නවල අතිබහුතරයක් ප්‍රදේශවලට සාමාන්‍ය ආවරණයක්වත් නැහැ. ඔබතුමා නැවත මේ ව්‍යාපෘතිය කඩිනම් කරලා, ඒ කටයුතු බොහොම කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ගන්නා වූ උත්සාහයට අපි ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම මම කියන්න කැමැතියි, කෘත්‍රිම බුද්ධිය ගැනත්. අපි ඒ ගැන කථා වෙනවා. ඒ වාගේම, ඩිජිටල් ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් ගැන කථා වෙනවා. ඒ වාගේම, තාක්ෂණික වෘත්තිකයන්ට digital nomad visa වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කථා වෙනවා. විද්‍යුත් ගෙවීමේ ක්‍රම පුළුල් කිරීමක් ගැන කථා වෙනවා. ඒ සියල්ල අපි ලෝකයත් එක්ක සමගාමීව යා යුතු කාරණා. අපි මේ කටයුතු කඩිනම් කිරීම අවශ්‍යයි. ඔබතුමා රාජ්‍ය අමාත්‍යවරයා විධියටත්, විදුලි සංදේශ නියාමන කොමිසම මීට මැදිහත් වෙලා කටයුතු කිරීම පිළිබඳවත් ස්තුතිවන්ත වෙනවා. මේ පනත හරහා, ඔබතුමන්ලා මෙතෙක් මුහුණ දීපු ගැටලු නිරාකරණය කර ගෙන, මේ කටයුතු කඩිනම් කරන්න අවස්ථාව ලැබෙයි කියන විශ්වාසයත් අපට තිබෙනවා. දැන් ජනාධිපතිවරණයක් බොහොම අභිමුඛව තිබෙන වෙලාවක්. අපි මේ වෙනකොට විපක්ෂයේ ඉන්නේ. ඔබතුමන්ලා ආණ්ඩුවේ වග කිව යුතු පිරිසක් විධියට ජනතාව හමුවට යනකොට, මේ කියන කාරණාවලට නැවත මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

අපි 2019 ජනාධිපතිවරණය වෙලාවේ කියපු කාරණා තවමත් අපේ ප්‍රදේශවල ඉෂ්ට කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ, මේ ප්‍රශ්න කඩිනමින් විසඳන්න කියලායි. මහව කලාපයේ පමණක් 56,000කට වැඩි ළමයින් පිරිසක් මේ පාසල් 188 තුළ ඉගෙන ගන්නවා. ඒ දරුවන් මුහුණ දෙන ගැටලු විසඳන්නට අවශ්‍යයි. අපට ලෝකයත් එක්ක සමගාමීව යන්නට නම්, අපේ ප්‍රදේශයේ වන්නියෙන් එන දරුවන් ඒ සඳහා යොමු කරවන්න අපි වැඩිපුර අවධානයක් යොමු කරන්නට ඕනෑ.

කුරුණෑගල අපේ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් මෙතැන ඉන්නවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කිව්ව කුලුනුවලින් එකක්වත් අපේ කලාපයේ නම් හැදුණේ නැහැ. සමස්තයක් හැටියට ගත්තාම ඔබතුමා කිව්ව කාරණා හරි වෙන්න ඇති. නමුත්, අපේ ප්‍රදේශ කඩිනමින් ආවරණය කිරීම සඳහා මැදිහත්වීමක් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත හරහා ඔබතුමන්ලා බලාපොරොත්තු වෙන ක්ෂේත්‍ර දියුණු කරන්න, ඒ සඳහා මැදිහත්වීමක් කරන්න, ඒ සඳහා අවශ්‍ය කඩිනම් ක්‍රියා මාර්ග ගන්න අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම මිනිසුන් මුහුණ දීලා තිබෙන ගැටලු විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග කඩිනමින් ගන්න කියන කාරණාවත් මතක් කරමින්, මේ වේලාව ලබා දීම ගැන මූලාසනයට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.08]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කර තිබෙන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත ඉතා කාලෝචිත පනත් කෙටුම්පතක්. රජය පසුගිය කාලයේ ඉතා ඵලදායී පනත් කෙටුම්පත් ගණනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ වාගේම අද ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනවා. වසර 28කට පස්සේ තමයි මේ පනත් කෙටුම්පත ගැන හිතන්න පටන් ගෙන තිබෙන්නේ. එතෙක් මේ විෂය භාරව හිටපු අමාත්‍යවරුන්, ලේකම්වරුන්, රාජ්‍ය ආයතනවල ඒ නිලධාරීන් හිටියාද කියන එක මම දන්නේ නැහැ.

කෙසේ වෙතත්, 1991 දී තමයි මේ පනත මුලින්ම ඉදිරිපත් වෙන්නේ. 1996 දී එම පනත සංශෝධනය කළාට පසුව මේ කාරණය තේරුම් අරගෙන අවුරුදු 28කට පසුව අද තමයි මේ පනතට නැවත සංශෝධනයක් ගෙනෙන්නේ. ලෝකයේ අනෙකුත් රටවල් තාක්ෂණයෙන් ඉදිරියට යනකොට, අද අපි ඉන්න තැන ගැන ඉතාම කනගාටු වෙන්නට ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ සංශෝධන කිරීමේ මූලික අරමුණ තමයි පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීම, දූෂණය අවම කර ගැනීම, නිබුණු ඒකාධිකාරය බිඳ දැමීම, නව තාක්ෂණ රෙගුලාසි සහ සමාගම් අතර තරගකාරිත්වය ඇති කිරීම. මෙවැනි කරුණු ගණනාවක් මේකට ඇතුළත් වෙලා තිබෙනවා.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, අපි අද ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ගැන කථා කරනකොට ලෝකයේ අනෙකුත් රටවල් තාක්ෂණය අතින් ඉදිරියට ගිහින් තිබෙන්නේ කොහොමද කියන එක ගැනත්

මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඉන්දියාවේ තිබෙනවා, Direct Benefit Transfer - DBT - කියලා system එකක්. මේ වැඩසටහන හරහා තුන්වැනි පාර්ශ්වයක් නොමැතිව සෘජුව බැංකු හරහා ගනුදෙනු කිරීමේ අවස්ථාව පාරිභෝගිකයාට ලැබී තිබෙනවා. අද අපේ රටේ විශාල වශයෙන් වංචා සිදු වෙන්නේ මූල්‍ය ගනුදෙනු - cash transactions - කරන නිසායි. ලෝකයේ අනෙක් රටවල ලක්ෂයකට, දෙකකට වැඩි cash transactions කරන්න බැහැ, Direct Bank Transfers කරන්න ඕනෑ. හැබැයි, අපේ රටේ රුපියල් කෝටියක් හරි **c**ash transactions කරන්න පුළුවන්. රුපියල් බිලියනයක් වුණත් බෑග්වල දමාගෙන ගිහිල්ලා මුදල් ගනුදෙනු කරන්න පුළුවන්. ඉඩමක් විකුණනකොට, වාහනයක් විකුණනකොට බෑග් එකේ සල්ලි ටික දමාගෙන ගිහිල්ලා මුදල් හුවමාරු කර ගන්නවා. හැබැයි, ඉන්දියාවේ පවතින ක්‍රමය තුළ ඒ කිසිවක් කරගන්න බැරි වෙලා තිබෙනවා.

ඊළඟට, බ්‍රසීලය ගත්තොත්, "Transparency Portal" කියලා online platform එකක් තිබෙනවා. ඒ හරහා ඒ රටේ ජනතාවට ඔවුන්ගේ වියදම්, රජයේ වියදම් සියල්ල බලාගන්න හැකියාව තිබෙනවා. ඒ රජයේ වියදම් මොනවාද, ඔවුන් මොනවාද කරන්නේ කියලා ඕනෑ කෙනෙකුට online ගිහිල්ලා බලන්න පුළුවන්. හැබැයි, අපේ රටේ එහෙම ක්‍රමයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එස්ටෝනියාවල තිබෙනවා, e-governance system එකක්. ඒ ගොල්ලන්ගේ රටේ තිබෙනවා Digital Identity Card එක. අපි තවම එතැනට ගිහිල්ලා නැහැ. ඒ විතරක් නොවෙයි, e-residency, online voting තිබෙනවා. ඒ රටවල digitalization කොච්චර ඉදිරියට ගිහිල්ලා තිබෙනවාද? හැබැයි, අපි තවම සිටින්නේ ඊට වඩා පිටුපසින්. ඊළඟට, අපි South Koreaවල e-procurement system එක ගත්තොත්, ඒ සියලු ටෙන්ඩර් ගනුදෙනු කරන්නේ procurement system එකකින්. ඒ තුළින් විශාල වශයෙන් සිදු වන දූෂණ, අක්‍රමිකතා අවම කරගන්න පුළුවන්, නැති කරගන්න පුළුවන්. අපටත් online procurement system එකකට යන්න පුළුවන් නම් මේ රටේ සිදු වන දූෂණ, අක්‍රමිකතා සියල්ල නතර කරන්න කටයුතු කරන්න පුළුවන්. ඒ ක්‍රම නිසා අද South Korea වාගේ රටවල් දියුණු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. අපි රුවන්ඩාව ගත්තොත්, "Irembo" කියලා platform එකක් තිබෙනවා. ඒ මඟින් වාහන බලපත්‍ර ඇතුළු විවිධ බලපත්‍ර නිකුත් කිරීම වැනි රාජ්‍ය සේවා බොහොමයක් online හරහා කරනවා. අද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අය strike කරනවා. ඔය strike කරනකොට හොඳම දේ තමයි ඒ කටයුතු online කරන එක. නිකම් බොරුවට රාජ්‍ය සේවයට ලක්ෂ ගණනක් බඳවා ගෙන නිකම් පඩි ගෙවනවා, කිසිම වැඩක් නැහැ. දවසකට ලියුම් දෙකක් ගහන්නේ නැහැ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල. මේවා online කර ගත්තා නම් මිනිස්සුන්ට ගෙදර ඉඳලා තමන්ගේ බදු ටික ගෙවාගන්න, බලපත්‍රය ගන්න හැකියාව ලැබෙනවා. එවැනි දේවල් රුවන්ඩාව වාගේ ලෝකයේ අනෙක් රටවල කරනවා.

ඊළඟට අපි කෙන්යාව ගත්තොත්, Integrated Financial Management Information System කියලා එකක් ඒ රටේ තිබෙනවා. ඒ තුළින් ජනතාවට මූල්‍ය විනිවිදභාවය පිළිබඳ ඕනෑ විධියකට බලාගන්න පුළුවන්. අපි යුක්රේනය ගත්තොත්, "Prozorro" කියලා public procurement system එකක් Ukraineවල තිබෙනවා. අද අනෙකුත් රටවල මේ සියලු ටෙන්ඩර් ක්‍රම procurement system එකකට දාලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Singaporeවල Corrupt Practices Investigation Bureau එකේ system එකක් තිබෙනවා. සිදු වන දූෂණ, අක්‍රමිකතා පිළිබඳව මේ corresponding system එකට ගිහිල්ලා ඕනෑම කෙනෙකුට පැමිණිලි කරන්න පුළුවන්. ඒ පැමිණිලි පිළිබඳව සොයා බලනවා. අඩුම ගණනේ අපේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිසමට පැමිණිල්ලක් කළත්, නියම හොරකම් පිළිබඳව කථා කළත් ඒ ගැන හොයන්නේ නැහැ. දේශපාලන අධිකාරියේ කවුරුහරි එවැනි දෙයක් කළොත් විතරයි ඒවා ගැන හොයන්නේ. ඒ අතින් බලන්න, අපි කොහෙද ඉන්නේ කියලා.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, අපේ රටට වැඩිම ආදායම් ගෙනෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අපි RAMIS කියලා digital platform එකක් දෙන්න රුපියල් බිලියන 10ක් සල්ලි බැඳලා, අද වෙනකොට අවුරුදු 12ක් ගත වෙලා තිබෙනවා කියන එක ඔබතුමාත් දන්නවා. අවුරුදු 12ක් ගත වුණත් තවම මේ කටයුත්ත කරන්න දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බැරි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් බිලියන 12ක් වැය කරලාත් අපේ රජයට වැඩිම ආදායම් ලබා දෙන ආයතනය digitalize කර ගන්න තවම බැරි නම් අපි කොහේද ඉන්නේ? ජනාධිපතිතුමා විශ්වාසය තියලා තරුණ රාජ්‍ය ඇමතිවරයෙකුටයි මේ විෂයය භාර දුන්නේ. ගරු කනක හේරත් රාජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා අපි ඔබතුමාට කියනවා, මේ ගැන අවශ්‍ය තීන්දු ගන්න කියලා.

අපේ සුරාබදු දෙපාර්තමේන්තුවේ වයස අවුරුදු 27යි. නමුත්, තවම එ් දෙපාර්තමේන්තුවේ system එකට දත්ත ඇතුළත් කරන්නේ අතින්, online system එකක් නැහැ. අපේ රටට තුන්වෙනියට වැඩිම ආදායම ගෙනැල්ලා දෙන්නේ සුරාබදු දෙපාර්තමේන්තුව. ඒ ආයතනයේ කටයුතු තවම digitalize කර ගන්න බැරි වෙලා තිබෙනවා. මේ ළඟදී මම දැක්කා, digitalization එකට යන්න රුපියල් බිලියන 3ක් ඔවුන් ඉල්ලා තිබෙනවා. සුරාබදු දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තවම තිබෙන්නේ එක තැන. රේගුව ගත්තත් බාගෙට වැඩ. රේගුවේ තොරතුරු සියල්ල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දෙන්නේ නැහැ. ඒ වාගේම අද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සම්බන්ධව දූෂණ, අක්‍රමිකතා ගණනාවක් වාර්තා වෙනවා. මේ වෙනකොට ලංකාවට වාහන ගෙන්වන එක නවත්වලා තිබෙන්නේ. හැබැයි වාහන 4,000ක්, 5,000ක් ලියාපදිංචි වෙලා එළියට ඇවිල්ලා තිබෙනවා. අපේ කාරක සභාවලට මේ ආයතනවල නිලධාරීන් ගෙන්වා මේ ගැන කථා කළා. හැබැයි ඒ කිසිම නිලධාරියෙක් කැමති නැහැ, digitalizationවලට යන්න. මම ඔබතුමාට වගකීමෙන් කියනවා, මේ රටේ රාජ්‍ය නිලධාරීන් කැමති නැහැ කියලා digitalization system එකට යන්න; එම ආයතනවල කටයුතු digitalize කරන්න. මොකද, ඒ දේ කරපු ගමන් හොරකම නවතිනවා, දූෂණය නවතිනවා, අත යට ගනුදෙනු නවතිනවා. ඒ නිසා වත්මන් ජනාධිපතිවරයා පැහැදිලි තීන්දුවක් ගත්තා, රජයේ ප්‍රතිපත්තියක් හැටියට සියලු රාජ්‍ය ආයතන අනිවාර්යයෙන් digitalize කරන්න ඕනෑය කියලා.

අද ඔබතුමා Immigration and Emigration Department එකට ගිහිල්ලා බලන්න. මම දැන් බැලුවා, මගේ ටෙලිෆෝන් එකෙන් මේ විස්තර. මිනිස්සු බණිනවා, අම්මා මුත්තා නැතිව. ඇයි? Strike කරලා. ලෝකයේ අනෙක් රටවලට යන්න ඕවා කරන්න ඕනෑ නැහැ. මේ ආයතන ඔක්කෝම digitalize කරන්න ඕනෑ. එතකොට පාස්පෝර්ට් ගන්න පෝලිමේ යන්න ඕනෑ නැහැ. අපි අද National Identity Card එක ගන්න මාස ගණන් පෝලිමේ ඉන්නවා. මේවා ඔක්කෝම online කළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඔබතුමාට ලෝකයේ අනෙක් රටවල උදාහරණ ගණනාවක් කියන්න පුළුවන්. අද digitalization මොන තරම්

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ඉදිරියට ගිහිල්ලාද? අද තාක්ෂණය කොච්චර ඉදිරියට ගිහිල්ලාද? තාක්ෂණය ඉදිරියට යෑම තුළ දූෂණ, වංචා මොන තරම් අවම වෙලා තිබෙනවාද? අද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගිහිල්ලා බැලුවාම 200ක් විතර ඉන්නවා. ඒ හැමෝම කොළ පුරවනවා, පොත් පුරවනවා. ඒ මොකටද? ඒ සියල්ල digitalize කරන්න ඕනෑ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු ඒ සියලු ආයතනවල කටයුතු digitalize කරන්න ඕනෑ. මම නම් කියන්නේ මේක කරන්න එක අවුරුද්දක් රටේ සංවර්ධනය ඔක්කෝම නැවැත්වුවත් කමක් නැහැ කියලායි. රටේ පාරවල් හදන එක නවත්වන්න, විදුලිය දෙන එක නවත්වන්න, ඒ ඔක්කෝම නවත්වන්න. ඒ සල්ලි ටික digitalization සඳහා දාන්න. එහෙම කරලා හැම එකකටම platform එකක් හදන්න ඕනෑ. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒක තමයි විය යුත්තේ.

මේ පාර්ලිමේන්තුවේ සිටින අපි 225දෙනාම එක්කහු වෙලා කරන්න ඕනෑ මෙන්න මේ දේ තමයි. සමහර දේශපාලනඥයන්, බොහෝ රාජ්‍ය නිලධාරීන් කැමැති නැහැ, digitalizationවලට. ඒ මොකද? එහෙම කළාම ඔවුන්ට බැහැ, දූෂණ-වංචා කරන්න. අපි හැම දාම කියනවා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ගැන. මිලියන 22ක ජනතාවක් ඉන්න රටේ ආදායම් බදු ගෙවන්නේ 31,000යි. බලන්න, මොන තරම් අවාසනාවන්ත තත්ත්වයක්ද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් ලක්ෂ 5කට වැඩිය බදු ගෙවන අය 5,000ක් නැහැ. රුපියල් මිලියන 10ට වඩා බදු ගෙවන අය 2,000ක් නැහැ. ඉතින් බලන්න, අපි කොහේටද යන්නේ කියලා. ලංකාවට බිලියනයකට වැඩි වටිනාකමින් ආනයනය කරන අය විශාල පිරිසක් ඉන්නවා. අඩු ගානේ ඒ මිනිස්සුවත් බදු ගෙවන්නේ නැහැ. මේකට පිළියමක් ලෙස වත්මන් ජනාධිපතිවරයා රජයේ ප්‍රතිපත්තියක් හැටියට තීන්දු කරලා තිබෙනවා, රාජ්‍ය ආයතන සියල්ල අනිවාර්යයෙන් digitalize කරන්න ඕනෑය කියලා. මේ රාජ්‍ය ආයතන digitalize කරන්නේ නැත්නම්, එය කරන්නේ නැති නිලධාරීන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පනත් කෙටුම්පතක් මේ පාර්ලිමේන්තුවට ගේන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි. අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, තරුණ රාජ්‍ය අමාත්‍යවරයෙකු හැටියට ඔබතුමා ඒ වගකීම අරගෙන සියලු රාජ්‍ය ආයතන digitalize කරන්න කියලා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, අඩුම ගානේ ප්‍රධාන ආයතන ටික වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව, රේගුව, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව digitalize කරන්න. අපි එදා අපේ කමිටුවට කැදෙව්වා, Land Registry Office එකේ නිලධාරීන්. අද එතැන විශාල වශයෙන් වංචා සිදු වෙනවා. ඒ, ඇයි? අද රුපියල් කෝටි ගණනක් වටිනා ඉඩම් විකුණලා අඩු ගණනකට ඔප්පු ලියනවා. අපි ඇහුවා, ඇයි ඒ ආයතනයේ කටයුතු digitalize කරන්නේ නැත්තේ කියලා. ඇහුවාම කියනවා, නීතිඥයෝ උසාවියට ගිහිල්ලා නඩුවක් දැම්මාලු, ඒක digitalize කරනවාට විරුද්ධව. ඉතින් බලන්න, කාටද කථා කරන්නේ? දේශීය ආදායම් දෙපාර්තමේන්තුව digitalize කරන්න යනකොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති ඒකට විරුද්ධ වෙනවා. අපි කොහේද යන්නේ? නමුත් මේ 225දෙනාට බණිනවා. රටේ වැඩිම රාජ්‍ය ආදායම ලබන ආයතනය digitalize කරන්න යනකොට වෘත්තීය සමිති ඒකට විරුද්ධ වෙනවා නම්, මේ රටේ Land Registry Office එක digitalize කරන්න යනකොට මේ රටේ නීතිඥයෝ විරුද්ධ වෙනවා නම්, අපි කොහේටද යන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

ඒ නිසා අපි පෞද්ගලික න්‍යාය පත්‍රවලින් බැහැරව කටයුතු කරන්න ඕනෑ. අපට හැමදාම බණිනවා. මම මේ මතය ගැන අවුරුද්දක් තිස්සේ කථා කරනවා. මේ digitalizationවලට යන්න ඕනෑ, මේ දේවල් අපි නවත්වන්න ඕනෑය කියන එක ගැන මම හැම දාම කථා කරනවා. හැබැයි, ඒක එතැනින් එහාට යන්නේ නැහැ. අපි එදා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට කථා කරලා කිව්වා, RAMIS එකට තාක්ෂණ අමාත්‍යාංශයේ සහාය ගන්න කියලා. එදා අපි තාක්ෂණ අමාත්‍යාංශයට කථා කළාම කිව්වා, අඩු ගණනේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඒ ගැන ඔවුන් එක්ක කථා කරන්නේවත් නැහැ කියලා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒවා කරන්න කථා කරනකල් ඉන්න එපා, කියනකල් ඉන්න එපා. ඔබතුමා මැදිහත් වෙලා මේ ප්‍රධාන ආයතන පහවත් digitalize කරන්න. ඔබතුමාට පුළුවන් ඒක කරන්න. තව තිබෙන්නේ මාස 3යි. කනක හේරත් රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ රටේ ජාතික නායකයෙක් වෙන්න නම්, ඔබතුමා වැඩෙක් කියලා රටේ ජනතාව දැනගන්න නම්, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඉදිරි දවස් කිහිපය තුළ මේ ආයතන ටික digitalize කරන්න කියලා. අවශ්‍ය අණ පනත් ගෙනැල්ලා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, Land Registry Office එක, RMV එක කියන ප්‍රධාන වශයෙන් ආදායම් ලැබෙන මේ රාජ්‍ය ආයතන 4 digitalize කරන්න. එහෙම නොකරන නිලධාරීන් ගෙදර යවලා දැඩි තීරණයක් ගන්න පුළුවන් නම්, එය තමුන්නාන්සේ මේ රටට කරන සුවිශාලම සේවයක් වෙනවා.

අපේ රටේ රාජ්‍ය ආදායමින් තුනෙන් එකයි අපි එකතු කර ගන්නේ. තුනෙන් දෙකක්, අත යට ගනුදෙනු, එහෙම නැත්නම් ඩීල්. ඒ නිසා මේ කටයුත්ත ක්‍රියාත්මක කළොත්, මේ සියල්ල නවත්වන්න පුළුවන්. අපේ රටේ සියලු ටෙන්ඩර් කැඳවීම් online ක්‍රමයට කරන්න ඕනෑ. ටෙන්ඩර් කැඳවීම සඳහා tender forms අරගෙන අත යට ගනුදෙනු කරන ක්‍රමය නවත්වන්න ඕනෑ. අපි එතැනට ගිය දවසට තමයි මේ රට හදන්න පුළුවන්. Online systems හදන්න ලෝකයේ අනෙක් රටවලට පුළුවන් නම්, ඇයි අපට බැරි? අපි එතැනට නොයන්නේ හොරකමට අපි අත දෙන හින්දායි. ඒ නිසා ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, එතැනට යන්න නම්, මේ රටේ දූෂණය, අක්‍රමිකතාව තුරන් කරන්න ඕනෑ. අපටත් පුළුවන්, ඔය ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක මහත්තයලා වාගේ විවිධ මිනිස්සු ගෙනැල්ලා පොර ටෝක් දෙන්න, කතන්දර කියන්න. හැබැයි වැඩක් නැහැ. විසිල් විතරයි, බල්ටි නැහැ. කියන්න පුළුවන්, හැබැයි කරන්න බැහැ. මහ ලොකුවට ජනතා විමුක්ති පෙරමුණ කියනවා, ඇමතිවරුන්ට කොළඹ ගෙවල් දෙන එක නවත්වනවා ලු, හිටපු ජනාධිපතිවරු බලාගන්න එක නවත්වනවා ලු, මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප නවත්වනවා ලු. ඔය තුන නවත්වලා මොකක්ද කරන්න පුළුවන්? ඔය තුන නවත්වලා පාන් රාත්තලක් අඩු කරන්න පුළුවන්ද, ශත 50කින්? බැහැ. ඒ නිසා අපි ජනතා විමුක්ති පෙරමුණට කියනවා, පුළුවන් නම් මෙතැනට යන්න කියලා. මෙන්න මේවාට තමයි යන්න ඕනෑ. රටම digitalize කරන්න. සියලු රාජ්‍ය ආයතන digitalize කරන්න. අඩු ගානේ රටට ආදායම් ලබා දෙන ප්‍රධාන ආයතන 6වත් digitalize කරන්න. අපි ලජ්ජා වෙන්න ඕනෑ. දශක ගණනක් අපි මේ පාර්ලිමේන්තුවේ කථා කරනවා, වැඩ කරනවා, නමුත් අද වෙනකල් අපට බැරි වුණා, මේ කටයුත්ත කරන්න. මේ සඳහා විෂයය භාර කැබිනට් ඇමතිවරයෙක් ඉන්න ඕනෑ. මේ සඳහා විශාල මුදලක් වෙන් කරන්න ඕනෑ. මේ සඳහා උගතුන්, විද්වතුන් ඉන්න ඕනෑ.

කෘෂිකර්ම ඇමතිවරයා විධියට කටයුතු කළ කාලයේ මම දැක්කා, අපේ අමාත්‍යාංශයේ වෙලා තිබෙන දූෂණ, අක්‍රමිකතා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඉන්නකොට වගා හානි ගෙවීම සඳහා මම platform එකක් හැදුවා. අපි රුපියල් බිලියන 8ක් ගෙවලා තිබුණා, මේ platform එක හදන්න කලින්. මේ platform එක හැදුවාට පස්සේ, රුපියල් බිලියන 8 අඩු වුණා, රුපියල් මිලියන 300ට. ඒ කියන්නේ, රුපියල් මිලියන 7.6ක් හොරකම් කරලා.

ගොවීන්ට දෙන පොහොර සහනාධාරය ගත්තොත්, ඒ සඳහාත් digital platform එකක් හදන්න මම උත්සාහ කළා. හැබැයි, මම ඒ අමාත්‍යාංශයේ ඉන්නකල් මට ඒක හරියට හදාගන්න දුන්නේ නැහැ. අපි දැක්කා, පොහොර සහනාධාරයෙන් සියයට 60ක් අත යට යනවා. ගොවීන් නැහැ, හැබැයි සහනාධාරය දෙනවා. අස්වැසුම දැන් online හරහායි ක්‍රියාත්මක වෙන්නේ. දැන් අස්වැසුම මුදල් යන්නේ බැංකු ගිණුමට. ඒක තමයි වෙන්න ඕනෑ. ඒක ඉතාම හොඳයි. එහෙම නැත්නම් විවිධ පුද්ගලයන්ගේ නම් දාලා සල්ලි ගන්නවා. පසුගිය කාලයේ ආණ්ඩුවෙන් රුපියල් 5,000 ගානේ බෙදුවා. ගන්න මිනිස්සු නැහැ. හැබැයි රුපියල් 5,000 බෙදලා. ඒ නිසා මේ ඔක්කෝම දේවල් digitalize වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මේක අනිවාර්යයෙන් කළ යුතු දෙයක්. මම ඔබතුමාට කියන්න ඕනෑ, කෘෂිකර්ම අමාත්‍යාංශයේ මේ online system එක හදන්න මම උත්සාහ කළ බව. මට proposals වගයක් ආවා, රුපියල් බිලියනය ගණනේ ඉල්ලුවා. මම පත්තරයේ advertisement එකක් දැම්මා, මේ රටට ආදරය කරන කවුරු හරි ඉන්නවා නම්, මේ සඳහා අපට උදවු කරන්න කියලා. මම බොහොම ගෞරවයෙන් සිහිපත් කරන්න ඕනෑ, ඇමෙරිකාවේ ඉඳලා සුරේෂ් සුබසිංහ කියලා මහත්මයෙක් මට දුරකථනයෙන් කථා කළා. එතුමා Google එකේ Director කෙනෙක්. එතුමා American Airlines එකේ Director කෙනෙක්. එතුමා මට කථා කරලා කිව්වා, එතුමන්ලා මේක නොමිලේ කරලා දෙන්න ලෑස්තියි කියලා. මට එතුමා හඳුන්වා දුන්නා, ශ්‍රී ලාංකිකයන් 4දෙනෙක්. ඒ, Canadian Airlines එකේ IT Director, American Airlines එකේ IT Director, Hyatt Hotel එකේ IT Director. ගරු රාජ්‍ය ඇමතිතුමනි, තාක්ෂණය පිළිබඳ දැනුම තිබෙන ශ්‍රී ලාංකිකයෝ විශාල පිරිසක් ලෝකයේ බොහෝ රටවල ඉන්නවා.

ඒ අය කැමැතියි, ලංකාවට ඇවිල්ලා මේ සහාය නොමිලේ ලබා දෙන්න. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේකට ඔබතුමාට උදවු කරන්න ඕනෑ තරම් මිනිස්සු ඉන්නවා. ඒ අයට වැටුප් අවශ්‍ය නැහැ. ඒ අය කැමැතියි, ඇවිල්ලා ඔබතුමාට නොමිලේ උදවු කරන්න. මට මතකයි, ඒ සුරේෂ් සුබසිංහ කියන මහත්මයා එතුමාගේ මිතුරන් එක්ක ඇවිල්ලා මේ system එක අපට නිකම් හදලා දුන්නා. එවකට හිටපු ජනාධිපතිතුමාට ඒක පැහැදිලි කළාම එතුමා බොහොම සතුටින් ඒක පිළිගත්තා. අපි ඒක මුදල් දීලා කළා නම් රුපියල් බිලියන ගණනක් වැය වෙනවා. මේ තාක්ෂණය පිළිබඳ දැනුම තිබෙන උගතුන්, විද්වතුන් විශාල පිරිසක් අපේ රටේ ඉන්නවා, ලෝකය වටේ ඉන්නවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ අයගේ සහාය අරගෙන මේ වැඩේ ඔබතුමාගේ අතට ගන්න. මේ වැඩේ ඔබතුමාගේ අතට අරගෙන මේ කටයුත්ත කරලා ඔබතුමාට පුළුවන් නම් මේ තාක්ෂණික අමාත්‍යාංශය හරි මාවතකට යොමු කරලා, මේ ආයතන සියල්ල digitalize කරලා, online platforms හදලා ඒ කටයුතු ටික කරන්න.

මට තව වෙලාව නැති නිසා මම ඔබතුමාට වැඩි විස්තර කියන්නේ නැහැ. මා ළඟ තිබෙනවා, රටවල් 42ක තොරතුරු. ඒ රටවල් දූෂණය අවම කරලා විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරලා හදලා තිබෙන platformsවලින් ලබා තිබෙන ලාභ පිළිබඳව, කරලා තිබෙන කටයුතු පිළිබඳව මට ඕනෑ තරම් උදාහරණ දෙන්න පුළුවන්. ඒ නිසා අපිත් මේ online system එකට යන්න ඕනෑ, මේ තාක්ෂණය ගෙනෙන්න ඕනෑ. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශය මැදිහත් වෙන්න. අවුරුදු 29කට පස්සේ හරි මේ පනත සංශෝධනය කරලා යම්තාක් දුරකට එන්න ඔබතුමා කටයුතු කිරීම ගැන අපි සතුටු වෙනවා. හැබැයි ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, එතැනින් නැවතිලා බැහැ. ඔබතුමාගේ අමාත්‍යාංශය නොවෙයි කියලා නැවතිලා වැඩක් නැහැ. මේ සියලු රාජ්‍ය ආයතනවල නිලධාරීන් කැඳවා මේ ආයතනවල තිබෙන ප්‍රශ්නවලට විසඳුම් ලබා දීලා, මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනයන්න කටයුතු කරන්න කියන ඉල්ලීම ඔබතුමාගෙන් කරමින් මම නිහඬ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා නියමිත වෙලාවටම කථාව අවසන් කළා.

මීළඟට, ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[ප.ව. 3.26]

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் இலங்கைத் தொலைத்தொடர்பு திருத்தச் சட்டமூலம் தொடர்பான விவாதம் நடைபெற்றுக் கொண்டு இருக்கின்றது. இந்த வேளையில், நான் எங்களுடைய பிரதேசத்தில் கொதிநிலையில் இருக்கின்ற மிக முக்கியமானதொரு பிரச்சினை தொடர்பில் இங்கு பிரஸ் தாபிக்க விரும்புகின்றேன். யாழ்ப்பாண மாவட்டத்தில் நேற்றைய தினம் பாரியதொரு போராட்டம் நடைபெற்றது. அங்கு இரண்டு - மூன்று நாட்களாக கொதிநிலை காணப்படு கின்றது. குறிப்பாக, யாழ்ப்பாண மாவட்டத்திலுள்ள சாவகச்சேரி ஆதார வைத்தியசாலையில் தங்களுக்குச் சிறப்பான சேவைகளோ, உரிய சேவைகளோ கிடைப் பதில்லை எனக்கூறி, அந்தப் பிரதேசத்திலுள்ள ஆயிரக் கணக்கான மக்கள் ஒன்றுதிரண்டு, வீதியை மறித்து மாபெரும் எதிர்ப்புப் போராட்டத்தில் ஈடுபட்டார்கள்.

அந்த வைத்தியசாலையின் பணிப்பாளராகப் பொறுப் பேற்றிருந்த பதில் வைத்திய அத்தியட்சகர் அவர்கள், அங்கு இருக்கக்கூடிய பிரச்சினைகள் தொடர்பாகவும் அங்கு நடைபெற்றதான ஊழல்கள் தொடர்பாகவும் பல்வேறு விடயங்களை வெளிப்படுத்தி இருந்தார். அதைத் தொடர்ந்து, நீண்ட காலமாக மனவிரக்தி அடைந்திருந்த அப்பிரதேச மக்கள் போராட்டத்தில் ஈடுபட்டார்கள். இந்த விடயம் தொடர்பாக உடனடியாக சுகாதார அமைச்சு உரிய நடவடிக்கைகளை எடுத்து, சாவகச்சேரி ஆதார வைத்தியசாலையைச் சிறந்த முறையில் இயக்குவதற்கும் அங்குள்ள மக்களுக்குத் தேவைப்படுகின்ற மருத்துவ சேவைகளை அங்கேயே பெற்றுக் கொடுப்பதற்குமான சூழலை உடனடியாக உருவாக்க வேண்டியது கட்டாயத் தேவையாக இருக்கின்றது.

சாவகச்சேரி ஆதார வைத்தியசாலைக்குச் சிகிச்சைக்காகச் செல்கின்ற பெருமளவான நோயாளர்கள் அநாவசியமாக அங்கிருந்து யாழ். போதனா வைத்தியசாலைக்கு அனுப்பப் படுவதாக அப்பகுதி மக்களால் குற்றச்சாட்டு முன்வைக்கப் பட்டு இருக்கின்றது. அதுமட்டுமல்ல, அந்த வைத்திய சாலையில் எல்லா நேரமும் வைத்தியர்கள் இருப்பதில்லை என்ற குற்றச்சாட்டு அங்குள்ள பொதுமக்களால் முன்வைக்கப் பட்டு இருக்கின்றது. குறிப்பாக, இரவு வேளைகளில் அங்கு வைத்தியர்கள் இருப்பதில்லை என்ற குற்றச்சாட்டு முன்வைக்கப்பட்டு இருக்கின்றது.

[ගරු සෙල්වරාජා කෝන්දුන් මහතා]

පත්තු වருடங்களுக்கு முன்னர், அந்த வைத்தியசாலையில் விபத்து மற்றும் அவசர சிகிச்சை அலகு ஒன்று நிர்மாணிக் கப்பட்டது. ஆனாலும், அதற்கான பணியாட்டொகுதியினர் நியமிக்கப்படவில்லை. அதுமாத்திரமல்ல, அதற்குத் தேவை யான இயந்திர உபகரணங்களும் வழங்கப்படவில்லை. இந்த நிலையிலே, தென்மராட்சி அபிவிருத்தி ஒன்றியம் புலம் பெயர்ந்த தமிழ் மக்களின் நிதிப் பங்களிப்போடு, 1.7 கோடி ரூபாய் - 17 மில்லியன் ரூபாய் - பெறுமதியுடைய பெருமளவான உபகரணங்களை அந்த வைத்தியசாலைக்குக் கையளித்து இருக்கின்றது. ஆனாலும், பல வருடங்களாகியும் அவை பயன்பாடு இல்லாமல் பழுதடைகின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. அந்த அலகு சரியாக இயக்கப்படவில்லை. அந்த அலகில் செய்யப்படவேண்டிய சிகிச்சைகள் தனியார் வைத்திய நிலையங்களுக்கு நகர்த்தப்படுவதான பாரியதொரு குற்றச்சாட்டு பொதுமக்களால் முன்வைக்கப்பட்டு இருக் கின்றது. குறித்த பதில் வைத்திய அத்தியட்சகரும் அவ்வாறான மிகக் கடுமையானதொரு குற்றச்சாட்டை முன்வைத்திருக் கிறார்.

மேலும், அந்த வைத்தியசாலையில் மேற்கொள்ளப்பட்ட கட்டட நிர்மாணிப்பின்போது, பாரிய ஊழல் இடம்பெற் றிருப்பதாகவும் குறித்த பதில் வைத்திய அத்தியட்சகரால் பாரியதொரு குற்றச்சாட்டு முன்வைக்கப்பட்டு இருக்கின்றது. அந்த வைத்தியசாலைக் கட்டடங்களுக்கு வெளித் தரப்புகளைப் பயன்படுத்தி paint பூசப்பட்டிருக்கிறது. எனினும், அதற்கான நிதி வைத்தியசாலையால் செலவிடப்பட்டதாக கணக்குக் காட்டப்பட்டிருப்பதான ஒரு குற்றச்சாட்டும் அந்த வைத்திய சாலைத் தரப்பால் முன்வைக்கப்பட்டு இருக்கின்றது. அதைவிட, வைத்தியசாலைக்குரிய மருந்துகள் பாதுகாப்பற்ற களஞ்சியங்களில் வைக்கப்பட்டு, அவை செயலிழந்துபோன நிலையில் நோயாளர்களுக்கு வழங்கப்பட்டுள்ளன. அந்த மருந்துகளால் எந்தவித நன்மையும் அந்த நோயாளர்களுக்கு ஏற்படாத நிலைமையில், "இந்த ஆஸ்பத்திரி மருந்துகள் சரியில்லை; நீங்கள் தனியார் வைத்தியசாலைகளுக்குச் சென்று மருந்துகளை எடுங்கள்! " என்று அந்த நோயாளர்கள் தனியார் வைத்தியசாலைகளை நோக்கிச் செல்வதற்கு ஊக்கப்படுத்தப் பட்டதாக பாரியதொரு குற்றச்சாட்டும் சாவகச்சேரி பதில் வைத்திய அத்தியட்சகரால் முன்வைக்கப்பட்டு இருக்கின்றது. இந்தக் குற்றச்சாட்டு மிகப் பாரதூரமான ஒரு குற்றச்சாட்டாகும்.

மேலும், வைத்தியர்கள் கடமை நேரத்தில் வைத்தியசாலை யில் இருப்பதில்லை என்றும் அவர்கள் தனியார் வைத்திய சாலைகளில் இருப்பதான குற்றச்சாட்டும் அங்கே முன்வைக்கப் பட்டு இருக்கின்றது. அதேபோன்று, மாதத்தில் ஓரிரண்டு நாட்கள்தான் அவர்கள் கடமைக்குச் செல்கிறார்கள் என்றும் ஏனைய நாட்களில் அவர்கள் தனிப்பட்ட வேலைகளைச் செய்துகொண்டிருப்பதான ஒரு குற்றச்சாட்டும் முன்வைக் கப்பட்டு இருக்கின்றது. இவற்றைவிட, யாழ். பிராந்திய சுகாதார சேவைகள் பணிப்பாளர் போதை மருந்துகளை மாணவர்களுக்கு விநியோகித்தார் என்ற மிகப் பயங்கரமான ஒரு குற்றச்சாட்டும் குறித்த பதில் வைத்திய அத்தியட்சகரால் முன்வைக்கப்பட்டு இருக்கின்றது. அதேபோன்று, அங்கு JMOஆக இருக்கின்ற டாக்டர் வைத்தியசாலையில் இறக்கின்றவர்களுடைய உடல்களைப் பிரேத பரிசோதனை செய்து, உரிய நேரத்துக்குள் கையளிப்பதில் இழுத்தடிப்பு களைச் செய்வதாகவும், அந்தப் பகுதியில் இருக்கக்கூடிய அந்தியகால சேவை நிறுவனமொன்றுடன் தொடர்பு கொண்டால் ஒரு மணி நேரத்துக்குள், - 5.00 மணிக்கு இறந்தால் 6.00 மணிக்குள் - அந்த உடல்கள் கையளிக்கப் படுவதாகவும், அதற்காகப் பெருந்தொகைப் பணம் கைமாற்றப் படுவதாகவும் பாரிய குற்றச்சாட்டு முன்வைக்கப்பட்டு இருக்கின்றது. எனவே, இந்தக் குற்றச்சாட்டுகள் தொடர்பாக முழுமையான, பக்கச்சார்பற்ற ஒரு விசாரணை நடத்தப்பட வேண்டும். இந்தக் குற்றச்சாட்டுகளில் உண்மை இருக்குமாகவிருந்தால், சம்பந்தப்பட்டவர்களுக்கு எதிராக நடவடிக்கை எடுக்கப்பட வேண்டும். இந்த வைத்தியசாலை சரியான முறையில் சேவைகளை வழங்கவில்லை என்றும் அங்குள்ள வைத்தியர்கள் மருத்துவ சேவையில் அக்கறை யில்லாமல் இருந்தார்கள் என்றும் எழுந்த குற்றச்சாட்டின் காரணமாக நீண்டகாலமாகப் பாதிக்கப்பட்ட மக்கள் மனவிரக்தியடைந்து, ஒட்டுமொத்த வைத்தியர்கள்மீதும் கோப மடைந்து இருக்கிறார்கள்; வைத்தியத்துறைமீது நம்பிக்கை இழந்திருக்கிறார்கள். ஆகவே, மக்களிடம் நம்பிக்கை கட்டியெழுப்பப்பட வேண்டும்.

அர்ப்பணிப்புடன் சேவைசெய்த வைத்தியர்கள் மிக மோசமாக மனம் நொந்துபோய் இருக்கிறார்கள். அவர்களுக்கு ஏற்பட்ட இந்த மனஉளைச்சல் இல்லாமலாக வேண்டுமாக விருந்தால், குற்றம் செய்தவர்கள் கண்டறியப்பட வேண்டும். இந்த விடயங்களை அம்பலப்படுத்திய காரணத்தால், தான் அச்சுறுத்தப்பட்டதாக குறித்த பதில் வைத்திய அத்தியட்சகர் முறைப்பாடு ஒன்றைச் செய்திருக்கிறார். குறிப்பாக, யாழ் மாவட்ட அரச மருத்துவ அதிகாரிகள் சங்கத்தின் தலைவரால் தான் தாக்கப்பட்டதாகவும் தன்னுடைய கைத்தொலைபேசி, பணம் என்பன பறிக்கப்பட்டதாகவும் அதுதொடர்பாக பொலிஸாரிடம் முறையிட்டபோது, பொலிஸார் பக்கச்சார்பாக நடந்துகொண்டதாகவும் அவரால் ஒரு முறைப்பாடு செய்யப் பட்டு இருக்கின்றது. ஆகவே, இந்த விடயங்கள் தொடர்பாக உடனடியாக நடவடிக்கை எடுக்கப்பட வேண்டும்.

இந்த வைத்தியசாலை மக்களுக்குப் போதியளவு சேவை களை வழங்கவில்லை என்பது, ஒட்டுமொத்த தென்மராட்சி மக்களால் பொதுவாக முன்வைக்கப்படுகின்ற ஒரு குற்றச் சாட்டு! அதைச் சுகாதார அமைச்சு முழுமையாக ஏற்றுக்கொள்ள வேண்டும். ஏனென்றால், இந்த அமைச்சு செய்யவேண்டிய கடமைகளைச் செய்யாத காரணத்தினாலே, குறிப்பாக நிதி ஒதுக்கீடுகளைச் செய்யாத காரணத்தினாலும் மருத்துவ நிபுணர்களை நியமிக்காத காரணத்தினாலும் அந்த வைத்தியசாலையில் சத்திரசிகிச்சைக் கூடங்களுக்குத் தேவைப்படுகின்ற அலகுகளை முழுமையாகப் பூர்த்திசெய்து கொடுக்காத காரணத்தினாலும் மக்கள் நீண்டகாலமாகப் பாதிக்கப்பட்டு, விரக்தியடைந்த நிலையில் இன்று வீதிக்கு வந்திருக்கிறார்கள். இதற்குரிய முழுப் பொறுப்பையும் கௌரவ அமைச்சர் அவர்களும் அமைச்சின் செயலாளரும் ஏற்றுக் கொள்ள வேண்டும். அது தமிழர் பிரதேசம் என்பதால், போருக்குப் பின்னரான கடந்த 15 ஆண்டுகளாக அரசாங் கத்தால் வேண்டுமென்றே முற்றாகப் புறக்கணிக் கப்படுகின்றது. அந்தப் பிரதேசத்து மக்கள் மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்ற காரணத்தினால், அவர்கள் வீதியில் இறங்கிப் போராடவேண்டிய நிலைமைக்கு வந்திருக்கிறார்கள்.

அங்கு மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்கள் 15 வருடங்களாக நடைபெறுகின்றன. ராஜபக்ஷக்கள் பதவியில் இருந்த காலத்திலும் அங்கு அபிவிருத்திக் குழுக் கூட்டங்கள் நடைபெற்றன. 'நல்லாட்சி' அரசாங்க காலத்திலும் அங்கு அபிவிருத்திக் குழுக் கூட்டங்கள் நடைபெற்றன. கோட்டாபய ராஜபக்ஷ ஆட்சிக் காலத்திலும் அங்கு அபிவிருத்திக் குழுக் கூட்டங்கள் நடைபெற்றன. இப்பொழுது ரணில்

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයාට අපි කියනවා, මධ්‍යම පළාතේ සැබෑ ප්‍රශ්න හඳුනාගන්න ඕනෑය කියන කාරණය. ඒ වාගේම සැබෑ ප්‍රශ්න වෙනුවෙන් එතුමාට මුහුණ දෙන්න පුළුවන් වෙලාවක් ඇවිල්ලා තිබෙනවා.

අපි දන්නවා, සේවා ව්‍යවස්ථාවක් අනුමත නොකිරීම නිසා මධ්‍යම පළාතේ ග්‍රාම නිලධාරී මහත්වරු ඇතුළුව රටේම ග්‍රාම නිලධාරී මහත්වරු අද වෙනකොට විශාල අර්බුදයකට මුහුණ දී තිබෙන බව. මධ්‍යම පළාතේ ග්‍රාම නිලධාරීවරුන්ගේ ප්‍රශ්නය වාගේම ලංකාවේ අනෙකුත් පළාත්වල ග්‍රාම නිලධාරීවරුන්ගේ ප්‍රශ්න කෙරෙහි ජනාධිපතිවරයාගේ ඇස් අරවන්න ආණ්ඩුකාරවරුන්ට පුළුවන්කමක් නැත්තේ ඇයි? තමන්ට ලැබී තිබෙන මස් කට්ට කන වෙලාවේ මේ වාගේ අයුතු විධියට ආණ්ඩුවට කත් අදින්න එපා කියායි අපි කියන්නේ.

ඒ වාගේම ගුරු-විදුහල්පති ප්‍රශ්නය ගත්තොත්, ඔවුන්ට වැඩි කළ වැටුපෙන් තුනෙන් එකක් පමණක් ලබා දීම තුළින් මේ වෙනකොට ඒ ගුරුවරු සහ විදුහල්පතිවරු ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙන බව අපි දන්නවා. එම නිසා මධ්‍යම පළාත තුළ මේවා සම්බන්ධයෙන් කටයුතු කරන්න ඔබතුමන්ලාට වගකීමක් තිබියදී මෙවැනි පත් කිරීම් කරන්නේ, පළාත් පාලන ආයතනවල ඉතුරු වෙලා තිබෙන අන්තිම රුපියලත් දේශපාලන න්‍යාය පත්‍රවලට වැය කරන්න නේද? මේකද ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

ඒ වාගේම අපි ඔබතුමාට තවත් කාරණයක් කියනවා. හාරිස්පත්තුව ආසනය ගැන ඔබතුමා දන්නවා. මීට මොහොතකට කලින් හලිම් මන්ත්‍රීතුමා මට කිව්වා, මේ වෙනකොට බාර් ලයිසන් 11ක් දීලා තිබෙනවා කියලා. මේ කාරණය ගැන කල්පනා කරලා බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දළදා වහන්සේ වැඩවසන මේ වාගේ භූමියකට, දිගන, හාරිස්පත්තුව, පොත්තපිටිය වාගේ හැම තැනකටම කිසිම ජුගුප්සාවක් නැතුව බාර් ලයිසන් දෙනකොට ආණ්ඩුකාරවරු මුනිවත රකිනවා. ඔවුන් ඒවා ගැන කථා කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය අර්බුදයකට මුහුණ දී සිටිනවා. එම අර්බුදය නිසා අද වනකොට ඒ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ට අධ්‍යාපන කටයුතු කරන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ වුණත් විශ්වවිද්‍යාල සේවක අනධ්‍යයන කාර්ය මණ්ඩලවල ප්‍රශ්නය අවධානයට ගන්න ආණ්ඩුකාරවරුන්ට වුවමනාවක්, හැකියාවක්, ඕනෑකමක් නැහැ කියන එකත් අපි කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම මධ්‍යම පළාතේ, මහනුවර තැපැල් කන්තෝරුව තිබෙනවා. ඒ තැපැල් කන්තෝරුවේ වැඩ කරන අනියම් සේවකයන් සහ තාවකාලික සේවකයන් ස්ථීර නොකිරීමේ ප්‍රශ්නයත් එක්ක ඒ අය ලොකු අර්බුදයකට ලක් වෙලා තිබෙනවා. තාවකාලික පත්වීම් ලබාගෙන සෑහෙන කාලයක් දුක් විඳින අය වෙනුවෙන් කථා කරන්න ආණ්ඩුකාරවරුන්ට කිසිම රුදාවක් ඇත්තේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, ඇත්තටම මේ වෙනකොට ග්‍රාම නිලධාරී මහත්වරුන්ට ගමන් වියදම විධියට ලැබෙන්නේ රුපියල් 600ක් බව. අඩු ගණනේ පෙට්‍රල් ලීටර් 20ක් දෙන්න කියලා ඒ අය ඉල්ලනවා. ඔවුන් බොහොම අභිංසක ඉල්ලීමක් කරන්නේ. මම කියන්නේ මෙකයි. පළාත් පාලන ආයතනවලට ආණ්ඩුකාර සම්බන්ධීකරණ නිලධාරිවරු පත් කරන්න ඒ අයට පුළුවන්. හැබැයි, සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රශ්නය, ග්‍රාම නිලධාරීන්ගේ ප්‍රශ්නය, තැපැල් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ප්‍රශ්නය කියන මේ එකකටවත් උත්තර දෙන්න නම් පුළුවන්කමක් ලැබිලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන විෂයයත් භාරව සිටින ආණ්ඩුකාරවරයා යටතේ පාසල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. මහනුවර ගෝතමී විද්‍යාලය ගහට කඩාගෙන වැටීමේ අවදානමක තිබෙන්නේ. ඒ වාගේම තමයි කැප්පෙටිපොල පාසල ගත්තත්, නගරය මැද තිබෙන හැම පාසලක්ම ගත්තත්, ඒ සියල්ලම කූඩු ගැහිලා තිබෙන්නේ. ඉතින්, මේ දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව, අර නිලධාරීන්ගේ ප්‍රශ්න පිළිබඳව කටයුතු කරන්නේ නැතුව විමධ්‍යගත මුදල් කොල්ලකන්න ඉඩ දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහනුවර ඇතුළු මධ්‍යම පළාතේ ජනතාවට විතරක් නොවෙයි, මේ රටේ සමස්ත ජනතාවටයි මම මේ කාරණය කියන්නේ. පොදුවේ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් විමධ්‍යගත මුදල් උදුරාගෙන ආණ්ඩු පක්ෂයට කත් අදින කණ්ඩායමට දීලා තිබෙනවා. ඒවා ගැන ආණ්ඩුකාරවරු කථා කරන්නේ නැහැ. ඒ නිසා බදු ගෙවන මහ ජනතාවගේ සල්ලිවලින්, විමධ්‍යගත මුදල් බෙදලා ඊළඟ ආණ්ඩුවක් බිහි කරන්න කවුරු හරි හිතනවා නම්, ඒ විමධ්‍යගත මුදල් දෙන ඒවා ගන්න, අරගෙන මේ ආණ්ඩුව කුජීත කරන්න

ඔබගේ ඡන්දය මේ අයට විරුද්ධව පාවිච්චි කරන්න කියන ඉල්ලීම කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.35]

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔය විමධ්‍යගත අරමුදල් කියන ඒවා සමඟි ජන බලවේගයේ මන්ත්‍රීවරුනුත් 25දෙනෙකු පමණ දැනට අරගෙන තිබෙනවා. මගේ ආසනයේ -කෝට්ටේ ආසනයේ- ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාත් ලොකු ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් මිලියන 50කට වඩා යොදා තිබෙනවා. සමඟි ජන බලවේගයේ මන්ත්‍රීවරුනුත් ගොඩාක් මේ වෙලාවේ ඒ මුදල් අරගෙන වැඩ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගෙන තිබෙන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත ඉතා වැදගත් පනත් කෙටුම්පතක්. පළාත් පාලන හෝ පළාත් සභා සම්බන්ධයෙන් මොකක් හරි සංශෝධනයක් නොවෙයි අද කෙරෙන්නේ. මම හිතන විධියට, පොඩි පටලැවිල්ලක් වෙලා තිබෙනවා. මොකද, "යන්නේ කොහේද? මල්ලේ පොල්" කියනවා වාගේයි සමහරු කථා කරන්නේ. ඡන්දය කිට්ටු වෙනකොට පොඩ්ඩක් මොකක් හරි අවුලක් ඇති වෙලා තිබෙනවා. අවුල් කියන්නේ හොඳටම අවුල්. මට තේරෙන්නේ නැහැ, මේ වාගේ අවුලක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 28ක් තිස්සේ සංශෝධනය කරන්න බැරි වුණු පනතක් තමයි අද මේ සංශෝධනය කරන්නේ. මම කනගාටු වෙනවා, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ රටේ වැදගත් පනත් පිළිබඳව කිසිම අවබෝධයක් නැති එක ගැන. මේ රටේ ප්‍රගමනයට, සංවර්ධනයට අදාළ නීති රීති යාවත්කාලීන කිරීම පිළිබඳව කිසිම දැනුමක්, අවබෝධයක් නැතුව එතුමන්ලා අනවබෝධයෙන් කථා කිරීම පිළිබඳව මම ඉතා කනගාටු වෙනවා. මොකද, ජාතික වශයෙන් වැදගත් අණ පනත් ගැන, නීති රීති ගැන රටේ ජනතාව අවදියෙන් ඉන්නවා. මම මාධ්‍යයෙනුත් ඉල්ලා සිටිනවා, අද දවසේ ප්‍රස්තුත කාරණාවට අදාළ කාරණා ප්‍රචාරය කරන්න, මෙතැනදී කළ තේරුමක් නැති වල්පල් කථාවලට ප්‍රමුඛතාවක් දෙන්න එපා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සන්නිවේදනය කියන්නේ රටක සංවර්ධනයට අත්‍යවශ්‍ය දෙයක්. මේ වනවිට මේ කලාපයේ ඉතා ප්‍රබල සන්නිවේදන බලයක්, හැකියාවක් අපේ රට අත්කර ගෙන තිබෙනවා. ඒ වාගේම "75 වසරක ශාපයක්" කියලා කිව්වාට, මේ සභාවේ සියලුදෙනාගෙන්, මේ රටේ ජනතාවගෙන් මම ඉල්ලා සිටිනවා සොයා බලන්න කියලා, මේ කලාපයේ ප්‍රබල සන්නිවේදන හැකියාවක් තිබෙන රටවල් අතරින් අපේ ලංකාව ඉදිරියෙන් ඉන්නවා. අද වෙනකොට රීලෝඩ් කිරීම මේ රටේ ප්‍රබල පාරිභෝගික සේවාවක් විධියට වෙළෙඳ පොළ අත්පත් කරගෙන තිබෙනවා. එදා ඕනෑම පෙට්ටි කඩයක, ගම් දනව්වල ඕනෑම කඩයක තිබුණු දෙයක් තමයි පැනඩෝල් පෙත්ත; එය ඕනෑම තැනකින් ගන්න පුළුවන්කම තිබුණා; පාරට බැස්සොත් අවට තිබෙන ඕනෑම කඩයකින් එය ගන්න පුළුවන්. හැබැයි, ඒ පැනඩෝල් පෙත්තටත් වඩා අද මේ සන්නිවේදනයට තිබෙන පහසුකම් මුළු ලංකාවම ආක්‍රමණය කර තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම මතක් කරනවා, පසුගිය කාලයේ මේ රට පාලනය කළ සෑම රජයක්ම මොන බාධක ආවත් සන්නිවේදන කටයුතුවලට අවශ්‍ය වැඩ කටයුතු කර තිබෙන බව.

ප්‍රධාන වශයෙන්ම මෙතැනදී රජයට නියාමන බලයක් තිබෙන්න ඕනෑ. රජය නියාමන බලයක් තියාගෙන, මේ ව්‍යාපාර කටයුතු, සන්නිවේදන කටයුතු මීට වඩා පුළුල්ව කරන්න පෞද්ගලික අංශයට අවස්ථාව දෙන්න ඕනෑ. අපි දන්නවා, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය තමයි එදා දුරකථන දුන්නේ. අපට මතකයි, අපි කුඩා කාලයේ ගමටම තිබුණේ ටෙලිෆෝන් දෙකයි තුනයි. ගමේ ප්‍රභූවරයකුගේ ගෙදර, එහෙම නැත්නම් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ ගෙදර සහ තැපැල් කන්තෝරුවේ විතරයි ටෙලිෆෝන් එකක් තිබුණේ. ඒ වාගේම ටෙලිෆෝන් එකක් ගන්න අවුරුදු ගණන් පොරොත්තු ලේඛනයේ ඉන්න වුණා. ඒ වාගේම දුරකථන ඇමතුමක් ගන්න අවශ්‍ය නම් තැපැල් කන්තෝරුවට ගිහිල්ලා වෙලාවක් බුක් කරන්න වුණා. වෙලාවක් බුක් කරලා, ඒ වෙලාවට ගිහිල්ලා තමයි telephone call එක ගන්න වුණේ. ඒ වාගේ ඉතා දුර්වල තැනක තිබුණු මේ රටේ සන්නිවේදනය අද ඉතා විප්ලවකාරී තැනකට පත්වෙලා තිබෙනවා. හැබැයි එහෙම වුණත් අපි බලන්න ඕනෑ ඉදිරියේදී මීටත් වඩා මේ කලාපයේ, ඒ වාගේම ගෝලීය වශයෙන් මේ සන්නිවේදන ධාරිතාව, සන්නිවේදන හැකියාව ඉහළ තැනකට ගෙනැල්ලා, නවීන තාක්ෂණය ගෙනැල්ලා, රාජ්‍ය මැදිහත්වීම තුළින් ආයෝජන නියාමනය, කළමනාකරණය කරන්නේ කොහොමද කියලා.

අපට හොඳ උදාහරණයක් තිබෙනවා. පසුගිය කාලයේ නෙළුම් කුලුන හදනකොට සමහරුන්ට ඇහේ ඉත්තෑවෝ දුවනවා වාගේ ලොකු අමාරුවක් හැදුණා, නෙළුම් කුලුනට විරුද්ධව. හැබැයි, නෙලුම් කුලුන සංකල්පය ඒ කාලයේ හැටියට HD තාක්ෂණය, 5G තාක්ෂණය වාගේ කාලයට අදාළ තාක්ෂණ හැකියාව උපයෝගි කරගෙන පුළුල්ව සකස් කරලා කලාපයේ සන්නිවේදන බලවතා වීමට තමයි රජයේ අපේක්ෂාව වුණේ. නමුත්, අවසානයේදී ගෝලීය දේශපාලනය තුළ මේ ව්‍යාපෘතිය ප්‍රබල විධියට කඩාකප්පල් කළා. විශේෂයෙන් වෙනත් රටවල සබ්මැරීන්වල, ඒ ආරක්ෂක අංශවල, ගුවන් යානාවල තිබෙන ආරක්ෂක තොරතුරු ගන්නවා, ඒක ඒ රටවල රාජ්‍ය ආරක්ෂාවට බලපෑමක්, ඒ තොරතුරු ලබා ගැනීමට යම්කිසි ක්‍රමයක් චීන රජයත් එක්ක එකතුවෙලා කටයුතු කරනවා කියලා වැරදි මතවාද හදලා ඒ ව්‍යාපෘතිය කඩාකප්පල් කරන්න කටයුතු කළා. මෙන්න මේ වාගේ කාලෙන් කාලෙට ආණ්ඩු මාරු වෙනකොට ඒ ඒ රජයන් විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති, කළ යෝජනා, ව්‍යාපෘති කඩාකප්පල් කරලා රට අනාථ කරන දේශපාලනයෙන් අපි ඉවත් වෙන්න ඕනෑ. වර්තමානයට ගැළපුණේ නැතත්, නෙළුම් කුලුන ආරම්භක අවස්ථාවේ ඒ යෝජිත වැඩසටහන කර ගන්න පුළුවන් වුණා නම් අපි රටක් විධියට මීටත් වඩා සන්නිවේදනය පැත්තෙන් උඩින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්කා පසුගිය දවසක "දෙරණ 360^{o}" වැඩසටහනට සහභාගි වුණු ජනතා විමුක්ති පෙරමුණේ හඳුන්නෙත්ති මහත්මයා සන්නිවේදනය ගැන කියපු කථාව. එතුමා කිව්වා, අපට Internet එක ගැන ලොකු විශ්වාසයක් නැහැ, Internet "හොස්" ගාලා ගියොත් අපි මොකද කරන්නේ, ඒ නිසා අපට පොත්වල print කරන එක තමයි විශ්වාස කියලා. ජනතා විමුක්ති පෙරමුණ තවමත් ඒ වාගේ පුස්කොළ පොත් යුගයට, ගල් යුගයට අයත් දේශපාලන මතවාදයක් විශ්වාස කරනවා නම්, කාරණය පැහැදිලියි. ජනතා විමුක්ති පෙරමුණ

[ගරු නීතිඥ මධුර විතානගේ මහතා]

පස්සේ යන තරුණ - තරුණියන් සියලුදෙනාගෙන් මා ඉල්ලා සිටිනවා ඒ "දෙරණ 360°" වැඩසටහන බලන්න කියලා. එතකොට බලාගන්න පුළුවන්, සන්නිවේදනය ගැන, එහෙම නැත්නම් නවීන තාක්ෂණය ගැන, එහෙම නැත්නම් Starlink තාක්ෂණය ගැන, එහෙමත් නැත්නම් චන්ද්‍රිකා තාක්ෂණයත් එක්ක ගෝලීය වෙනස් වීමට අදාළව කොහොමද රටවල් සන්නිවේදනයත් එක්ක සම්බන්ධ වෙන්නේ කියන කාරණාවේදී ජනතා විමුක්ති පෙරමුණේ -මාලිමාවේ- අදහස මොකක්ද කියලා. අපි කනගාටු වෙනවා, මේ වාගේ සිතුවිලි තිබෙන පිරිස් මේ පාර්ලිමේන්තුවේ, එහෙම නැත්නම් දේශපාලනයේ ඉන්න එක ගැන. ඒ වාගේම Starlink වැඩසටහනේ, ඒ ව්‍යාපෘතියේ ප්‍රධානියා විධියට ලෝකයම පිළිගත් සහ ලෝකයේ තරුණ තරුණියන්ගේ සිහින ව්‍යවසායකයා විධියට හඳුන්වන ඊලෝන් මස්ක් මහතාට කියනවා ආර්ථික ඝාතකයෙක් කියලා. ලෝකයට සන්නිවේදනය හඳුන්වා දීපු කෙනාට කියනවා ආර්ථික ඝාතකයෙක් කියලා. ඒ වාගේ අපහාසාත්මක දේවල් තමයි අපි එතුමන්ලාගේ පක්ෂයේ අයගෙන් දැක්කේ.

අද විරුද්ධ පක්ෂය මේ පනත් කෙටුම්පතට අදාළව කථා කරන්නේ නැතිව වෙනත් වල්පල් කථා කරනවා. ඒ වාගේම තවත් කට්ටියක් කියනවා, තාක්ෂණය හඳුන්වා දෙන මිනිස්සුන්ට ආර්ථික ඝාතකයෝ කියලා. එහෙම නැත්නම්, "අපට Internet ගැන විශ්වාසයක් නැහැ, අපි තවමත් පුස්කොළ පොත්වලට, ගල් යුගයට තමයි කැමති" කියනවා වාගේ අදහස් ප්‍රකාශ කරනවා. එහෙම කට්ටියක් එක්ක තමයි අපි මේ උඩුගං බලා යනවා වාගේ කටයුතු කරමින් මේ අදහස් ඉදිරිපත් කරන්නේ. සමහර අයට මේ අලුතින් ඉදිරිපත් කරන පනත් කෙටුම්පත ගැන, එහි කාරණා ගැන කිසිම දැනුමක්, අදහසක් නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමාත් සභාවේ ඉන්න වෙලාවේ මම කැමැතියි මේ කාරණයත් කියන්නට. මේ පනත් කෙටුම්පතේ 13 වන වගන්තියේ සඳහන් කර තිබෙනවා යටිතල පහසුකම් පුළුල් කිරීම ගැන. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ වෙනකොට බලපත්‍ර ලබා නොගෙන, ඒ වාගේම පළාත් පාලන ආයතනවලින් සහ අනෙකුත් ආයතනවලින් කිසිම අවසර පත්‍රයක් නැතිව සමහර සන්නිවේදන සමාගම්, දුරකථන සමාගම් අනීතිකව දුරකථන කුලුනු සවි කරමින් යනවා. ඒ වාගේම යම් යම් යටිතල පහසුකම් පුළුල් කරමින් යනවා. ඒ නිසා මේ සියල්ලම මෙවැනි පනතක් යටතට ගෙනැල්ලා නියාමනය කිරීම ඉතා වැදගත් වාගේම, කාලෝචිත කාරණාවක් හැටියට මම දකිනවා. මේ වෙනකොට දුරකථන සමාගම් ගෝලීය ආර්ථික දේශපාලන වාණිජ හැකියාවත් එක්ක - monopoly එකක් - ඒකාධිකාරයක් ගොඩ නහන්න උත්සාහ කරනවා.

පසුගිය කාලයේත් අපි දැක්කා ශ්‍රී ලංකාවේ දුරකථන සමාගම් කිහිපයක් එකට එකතු වෙලා එක සමාගමක් විධියට කටයුතු කළ ආකාරය. මේ වාගේ තත්ත්ව මේ සන්නිවේදන ක්ෂේත්‍රයට අනතුරුදායකයි. එම නිසාම සන්නිවේදනයේදී නියාමන බලය, නියාමන හැකියාව -විශේෂයෙන් දත්ත හා තොරතුරු පිළිබඳ නියාමනය- රාජ්‍යය සතු විය යුතුයි කියා අපි කියනවා. ඒ සියලු සංඛ්‍යාත රාජ්‍ය දේපළ විධියට තමයි අපි සලකන්නේ. නමුත්, අද ඒ සමහර ආයතන, සමහර සමාගම්වලට දීපු බලපත්‍ර ඒ අයගේ පෞද්ගලික බූදලයක් විධියට කළමනාකරණය කරන බවක් අපට පෙනෙනවා. විශේෂයෙන් ඒ දුරකථන සමාගම්වල ඒකාධිකාරයක් ඇති වුණොත්, අපි රට ඇතුළේ සන්නිවේදන හැකියා කොපමණ පුළුල් කළත් ඒ අයට ඕනෑ විධියට පාරිභෝගිකයන් ගසා කෑමට, පාරිභෝගිකයන්ට පීඩනයක් ඇති කිරීමට ඒ අය අනීතිකව කටයුතු කරාවි. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී මෙන්න මේ කාරණාවලට විශේෂ අවධානයක් යොමු කරාවි කියලා මම බලාපොරොත්තු වෙනවා, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි.

මේ පනත් කෙටුම්පතේ "නීතිය බලපෑමේ ප්‍රකාශය" කියන කොටසේ 3 වන වගන්තිය යටතේ සඳහන් වනවා, "වෙළඳපොළ විශ්ලේෂණය කිරීමට, සුවිශේෂී වෙළඳපොළ බලය වැළැක්වීමට සහ සාධාරණ තරගකාරිත්වය ප්‍රවර්ධනය කිරීමට..." යනාදි වශයෙන් කාරණා කිහිපයක්. මෙන්න මේ කියන "සාධාරණ තරගකාරිත්වය ප්‍රවර්ධනය කිරීම" කියන කාරණාව ඉෂ්ට කර ගන්න බැරි වෙනවා, එවැනි සමාගම් ටිකක් එකතු වෙලා කටයුතු කළොත්. විශේෂයෙන් ගෝලීය වශයෙන් ව්‍යාප්තව තිබෙන එම සමාගම් අපේ පාලනයෙන් තොරයි. එම නිසා "අපි ඔක්කොම සමාගම් ටික merge වෙනවා" කියලා ඒ ගොල්ලන් ඔක්කොම එකට එකතු වෙලා වැඩ කරන්න පටන් ගත්තොත්, අපි කොහොමද තරගකාරිත්වයක් ඇති කරන්නේ? ඒ ගැටලුවට අපි මේ පනත් කෙටුම්පතින් හඳුන්වා දෙන විසඳුම මොකක්ද? ඒකට provision එකක් තිබෙනවාද කියලා මම විශේෂයෙන් දැන ගන්න කැමැතියි.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, 2025 වසරේ සිට ඉදිරි කාලය තාක්ෂණය සම්බන්ධයෙන් ඉතාම තීරණාත්මක කාලයක්. මේ වන විට විශේෂයෙන් කෘත්‍රිම බුද්ධිය - AI - ඉතා ප්‍රබල විධියට සමාජගත වෙලා තිබෙනවා. කෘත්‍රිම බුද්ධිය සම්බන්ධයෙන් කථා කිරීමට එක් දින විවාදයක් බ්‍රහස්පතින්දාට ලබා දෙන්න කියා මම මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලීමක් කර තිබෙනවා. මට දැන ගන්න ලැබුණා සියලු පක්ෂ නායකයන් එය අනුමත කර තිබෙනවා කියලා. ඒ ගැන පක්ෂ නායකයන් සියලුදෙනාටත්, පාර්ලිමේන්තුවටත් මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

කෘත්‍රිම බුද්ධිය හරහා සමාජයට වන බලපෑම නියාමනය කරන්නේ කොහොමද, කෘත්‍රිම බුද්ධිය හරහා, එහෙම නැත්නම් ඒ තාක්ෂණය හරහා මේ සමාජයට වන පීඩනය, ජාතික ආරක්ෂාවට වන බලපෑම, ජාතික ආර්ථිකයට වන බලපෑම මොකක්ද යනාදි කාරණා පිළිබඳව අපි විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. මේ වන විටත් සමාජයේ විශාල අවුලක් ඇති වේගෙන එනවා, කෘත්‍රිම බුද්ධිය හා සම්බන්ධ තාක්ෂණය නිසා. රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන්, රටේ ආර්ථිකයේ ප්‍රගමනය වෙනුවෙන්, රටේ දියුණුව වෙනුවෙන්, රටේ අධ්‍යාපනය වෙනුවෙන්, ඒ වාගේම රටේ, සමාජයේ පරිවර්තනය වෙනුවෙන් ඒ තාක්ෂණය ඉතා යහපත් විධියට යොදා ගැනීම තමයි කාලෝචිත වෙන්නේ. අන්න ඒකට අවශ්‍ය නීති රීති සකස් කිරීම අපි කඩිනමින් කළ යුතුයි. ගොඩක් වෙලාවට අපි කරන්නේ අශ්වයා පැනලා ගියාට පස්සේ ඉස්තාලය වහන එක; වැඩේ වුණාට පස්සේ තමයි අපි නීති රීති ගෙනෙන්නේ. නමුත්, අපි පාර්ලිමේන්තුවේ අණ පනත් සම්මත කරනවාට වඩා ඉතා වේගයෙන් මේ තාක්ෂණය වෙනස් වේගෙන යනවා; දැවැන්ත තාක්ෂණික විප්ලවයක් ලෝකය පුරා සිදු වෙමින් යනවා. මෙන්න මේ තාක්ෂණික විප්ලවයට රටක් විධියට අප මුහුණ දෙන්නේ කොහොමද, ඒ තාක්ෂණ විප්ලවය හමුවේ රටේ මෙහෙයුම් කටයුතුවලට, රටේ දේශපාලන කටයුතුවලට, රටේ කළමනාකරණ කටයුතුවලට ප්‍රශ්නයක් නොවන විධියට තාක්ෂණය පාවිච්චි කරන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන් අපි නීති රීති සකස් කළ යුතුයි. මොකද, මේ වන විට විදුලි සංදේශ කර්තව්‍යය, මේ ක්‍රියාවලිය දැවැන්ත ලෙස ලෝකය පුරා ක්‍රියාත්මක වෙනවා. රටවල් අතර සන්නිවේදනය අද ඉතා ප්‍රබල අවශ්‍යතාවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම, රටවල් අතර තොරතුරු හුවමාරු කර ගැනීමට, රටවල් අතර වාණිජ මෙහෙයුම් කටයුතුවලට, රටවල් අතර රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධකම්වලට මේ කාරණාව වැදගත්.

ගෝලීය දේශපාලන බල ව්‍යාපෘතිය තුළ අද අපි රටක් විධියට විශාල පීඩනයකට ලක් වෙලා තිබෙනවා. එක් පැත්තකින්, ඉන්දු-පැසිෆික් බල ව්‍යාපෘතිය යටතේ බටහිර මූලික කරගත් රටවල්, ඉන්දියාව ප්‍රධාන රටවල්, Belt and Road Initiative යටතේ

චීනය ප්‍රධාන රටවල් අතර තිබෙන බල අරගළය වාගේම, විවිධ සංවිධාන හරහා වන බලපෑම ආදි වශයෙන් ඇති ගෝලීය බලපෑම් හමුවේ අපේ සන්නිවේදන කටයුතු කරන්නේ කොහොමද කියන එක ගැනත් අපේ අවධානය යොමු කරන්න ඕනෑ. එය ඉතා වැදගත්.

මොකද, පසුගිය කාලය පුරාවට අපේ රටේ සන්නිවේදන ක්ෂේත්‍රය වර්ධනය කරන්න, එහෙම නැත්නම් සන්නිවේදන ක්ෂේත්‍රය පුළුල් කරන්න හදන කොට ඒ ඇතැම් ගෝලීය බලවේග තුළින් ඍජුව සහ වක්‍රව අපට පීඩනයක් එල්ල වුණා. ඒකට හොඳම උදාහරණය තමයි නෙලුම් කුලුන ව්‍යාපෘතිය. ඒ ව්‍යාපෘතිය ඉතා සියුම්ව, ඉතා උපක්‍රමශීලීව කඩාකප්පල් කිරීම තුළින් අපට පෙනෙනවා, ගෝලීය පීඩනය, ගෝලීය අර්බුදය හමුවේ අපේ රටේ යම් යම් සංවර්ධන ව්‍යාපෘතිවලට -විශේෂයෙන් සන්නිවේදන තාක්ෂණය දියුණු කිරීම වැනි සංවර්ධන ව්‍යාපෘතිවලට- එල්ල වන බලපෑම කොතෙක්ද කියලා. ආයෝජනය කිරීම සඳහා පෞද්ගලික අංශය මේ රටට පැමිණීමේදී රාජ්‍යය විධියට අපි ඉතා ප්‍රබල තැනක ඉඳගෙන එම කටයුතු නියාමනය කළ යුතුයි. එසේ නියාමනය නොකළොත්, එම නියාමන කටයුත්ත අපේ ග්‍රහණයෙන් මිදුණොත් එය අනිවාර්යයෙන් අපේ රට ඉතා අනාරක්ෂිත තැනකට ඇද දැමීමක් වෙනවා. එය අනාගතයේදී අපේ රටට ප්‍රබල අභියෝගයක් වෙන්න පුළුවන්. එම නිසා මම විශේෂයෙන් රජයට ස්තුතිවන්ත වෙනවා, අවුරුදු 28ක් ගිහිල්ලා හෝ පවතින පනත සංශෝධනය කරලා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ කලාපයේ දැවැන්තම, ප්‍රබලම රට බවට අපේ රට පත් කිරීමට ගන්නා උත්සාහය වෙනුවෙන්.

මේ සංශෝධන පනත් කෙටුම්පතට සහාය ලබා දෙන බව නැවත වරක් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.52]

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සාකච්ඡා කරන මේ පනත් කෙටුම්පතට ඇත්ත වශයෙන් අපේ විරුද්ධත්වයක් නැහැ. ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පතට අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා. හැබැයි, ඊට වඩා වැදගත් තත්ත්වයක් රටේ උද්ගත වෙලා තිබෙනවා, අධිකරණයේ ස්වාධීනත්වය ගැන. ඉතින් අපි ඊයේ අපගේ කණ්ඩායම් රැස්වීමේදී තීරණය කළා, අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරන්න ඕනෑ කියලා.

ගරු සභානායකතුමනි, බලන්න අද උදේ වෙච්ච දේ. ගරු කථානායකතුමා ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා එවපු ලිපියත් කියෙව්වා; අග්‍ර විනිශ්චයකාරතුමා එවපු ලිපියත් කියෙව්වා. මම විජයදාස රාජපක්ෂ ඇමතිතුමාගෙන් ඇහුවා, ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවාද කියලා. මොකද, ඒ ලියුම් දෙක ඉදිරිපත් කරන්න තිබුණේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කළාට පසුවයි. කථානායකතුමාට එවන හැම ලිපියක්ම එතුමා මෙතැනට ඇවිල්ලා කියවන්නේ නැහැ නේ. විජයදාස රාජපක්ෂ මැතිතුමා කිව්වා, "මම වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා" කියලා. ඒක Order of Business එකටත් ඇතුළත් කරලා තිබෙනවා. හැබැයි, එතුමා එය ඉදිරිපත් කළා ද? ඉදිරිපත් කළේ නැහැ. එතුමා කථාවක් පවත්වලා අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ ලේකම්වරයාට චෝදනා ඉදිරිපත් කරලා අන්තිමට මොකක්ද කිව්වේ? "මේ දෙන්නා පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කමිටුවට ගෙනෙන්න අවශ්‍ය නැහැ" කිව්වා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි,-

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න, please!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
වරප්‍රසාද ප්‍රශ්නය ගෙනාවා. නමුත්, ඒක වරප්‍රසාද කමිටුවට ගෙනෙන්න අවශ්‍ය වුණොත් කියන්නම් කිව්වා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
හරි. එතුමා කථාවක් කළා. දෝෂාරෝපණය කළා අධිකරණයේ විනිශ්චයකාරවරුන් දෙදෙනෙකුට. අවසාන වශයෙන් මොකක්ද කිව්වේ? ඒ දෙදෙනා මෙතැනට ගෙනෙන්න අවශ්‍ය නැහැ කියලායි කිව්වේ. මේවා, කොළඹ වහලා කරන වැඩ නේ. වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා කියලා විනිශ්චයකාරවරුන් දෙදෙනෙකුට චෝදනා කළා. එතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන බව කිව්වේ නැත්නම් එහෙම චෝදනා කරන්න පුළුවන් ද? මම අහන්නේ ඒකයි. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, please! වරප්‍රසාද ප්‍රශ්නයක් ගෙනෙන්නේ නැහැ කියලා එතුමා කිව්වා නම්, එහෙම චෝදනා කරන්න බැහැ නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මේ දිනට නියමිත වැඩ පිළිවෙළ අනුවයි මා කටයුතු කරගෙන යන්නේ. ඒ වැඩ පිළිවෙළේ සඳහන්ව තිබෙනවා, එතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් පිළිබඳව. එතුමා වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරනවා ද, නොකරනවාද කියන එක එතුමාගේ වැඩක්.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොඳින් අහගෙන ඉන්න.

වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන බව එතුමා කිව්වා. නමුත්, අන්තිමේදී එතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළේ නැහැ. විනිශ්චයකාරවරුන් දෙදෙනාට චෝදනා එල්ල කරලා එතුමා කිව්වා, ඒ විනිශ්චයකාරවරු දෙදෙනා වරප්‍රසාද කමිටුවට ගෙනෙන්න ඕනෑ නැහැ කියලා. මේවා අධිකරණයට ව්‍යංග්‍යාර්ථයෙන් එල්ල වන චෝදනා.

[ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ඇත්ත වශයෙන්ම මම අධිකරණයට ස්තුතිවන්ත වෙනවා. ජනාධිපතිගේ ධුර කාලය දීර්ඝ කර ගැනීම සඳහා ඉල්ලමින් ඊයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබුණා. ජනාධිපතිතුමාගේ කාලය අවුරුද්දකින් දීර්ඝ කර ගන්න මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කරලා තිබුණා. මේ පෙත්සම ඉදිරිපත් කරන්න කලින් ආණ්ඩු පක්ෂයේ ප්‍රබල අය, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල අය කිව්වේ මොකක්ද? ජනාධිපතිතුමාට තව අවුරුද්දක් තිබෙනවා. අපි එ් අවුරුද්ද ලබා දෙන්න ඕනෑ කියලා ආණ්ඩු පක්ෂයේ අය නිරන්තරයෙන්ම කිව්වා. ආණ්ඩුව උත්සාහයක් ගත්තා, තව අවුරුද්දක් වැඩිකර ගන්න. අපි ශ්‍රේෂ්ඨාධිකරණයට හිස නමා ආචාර කරනවා. මොකද, ශ්‍රේෂ්ඨාධිකරණය ඒ උත්සාහය ව්‍යර්ථ කළා. ව්‍යර්ථ කළා කියන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඒ පෙත්සම්කරුට දොස් කිව්වා. අධිකරණයේ වටිනා කාලය නාස්ති කරන්න එපා කියලා ඒ විනිශ්චයකාරතුමන්ලා පෙත්සම්කරුවන්ට දොස් කිව්වා. නඩු ගාස්තු වශයෙන් ලක්ෂයක් ගෙවන්න කියලාත් ඔවුන්ට කිව්වා.

මම ගරු සභානායකතුමාගෙන් කාරණයක් අහන්න කැමැතියි. දැන් හැම තැනම ආරංචියක් යනවා, අලුත් පනතක් ගෙනෙන්න කැබිනට් මණ්ඩලය සාකච්ඡා කළා කියලා. ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5 සිට අවුරුදු 6 දක්වා දීර්ඝ කරන්න පනතක් ගෙනෙන්න කැබිනට් මණ්ඩලය සාකච්ඡා කළා ද ගරු සභානායකතුමනි?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමා කථා කරලා ඉවර වුණාම මම උත්තර දෙන්නම්.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එහෙම සාකච්ඡාවක් කළේ නැද්ද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
අවුරුදු 5ක් ලෙස තිබෙන ධුර කාලය අවුරුදු 6ක් කරන්න සාකච්ඡා කළේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන යම් ව්‍යවස්ථාවක් අනුව අවුරුදු පහ කියන එක එලෙසින්ම තියන්න ඕනෑ කියන එක තමයි මතය වුණේ. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එහෙම නම් හොඳයි. *[බාධා කිරීම්]* මොකද, ආණ්ඩු පක්ෂයේ සමහර අය, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I will take some more time. Do not worry. I am the Chief Opposition Whip. මට ඕනෑ තරම් කාලය ගන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම වුණොත් අනෙක් මන්ත්‍රීතුමන්ලාගේ කාලයෙන් අඩු කරන්න වෙනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
කමක් නැහැ. කමක් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකද, ඔබතුමාට කථා කරන්න කාලය වෙන් කරලා නැහැ. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම කථා කරනවා. පොඩ්ඩක් අහගෙන ඉන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට කොපමණ කාලය ඕනෑ ද?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මමයි අපේ පැත්තේ වෙලාව වෙන් කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒක දන්නේ නැද්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අනෙක් ගරු මන්ත්‍රීතුමන්ලාගේ කාලයෙන් තමයි මේ වෙලාව අඩු කරන්න වෙන්නේ. ඒ නිසා ඔබතුමාට කොච්චර කාලයක් ඕනෑ ද?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඒක මම දන්නවා. *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට කාලය කොපමණ ඕනෑ ද? *[බාධා කිරීම්]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக්ෂ්මන් கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම ඒක කියන්නම්කෝ. *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඉම්රාන් මහරූෆ් මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக්ෂ්මන් கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
නැහැ, මම කථා කරලා ඉවර නැහැ. I need more time. *[බාධා කිරීම්]* මමයි විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක. ඔබතුමා එ්ක දන්නේ නැද්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මම ඔබතුමාගෙන් ඇහුවා කාලය කොපමණ ඕනෑ ද කියලා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරියෙල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
I can take time from the Opposition. I am the Chief Opposition Whip.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මම ඔබතුමාගෙන් ඇහුවා, කාලය කොපමණ ඕනෑ ද කියලා. ඔබතුමා ඒකට පිළිතුරු දුන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඒ නිසා මම ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමාට අවස්ථාව දුන්නා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරියෙල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
I will take two more minutes.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
හොඳයි, ඔබතුමා විනාඩි දෙකක් කථා කරන්න. *[බාධා කිරීම්]*

අද දින විවාදයේ වැඩ කටයුතු අවසාන වනතෙක් අවශ්‍ය කාලය ලබා දීමට සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරියෙල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එහෙනම් විවාදය කල් දමන්න. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා විනාඩි දෙකක් කථා කරන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරියෙල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
විවාදය කල් දමන්න. කල් දමන්න. [බාධා කිරීමක්] තමන්ගේම පනත් කෙටුම්පත කල් දමන්න හදනවා. මේ අයගේ දැනුම පෙනෙනවා නේ. මේ ආණ්ඩුව පළාත් පාලන ඡන්දය කල් දැම්මා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු ජගත් සමරවික්‍රම අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. JAGATH SAMARAWICKRAMA left the Chair, and DEPUTY SPEAKER took the Chair.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරියෙල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවේ පැටිකිරිය දිහා බැලුවාම ඡන්දය තිබෙන තුරු විශ්වාසයක් නැහැ. මොකද, පළාත් පාලන ඡන්දය කල් දැම්මා. ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වා, ඡන්දය පවත්වන්න කියලා. ආණ්ඩුව තමයි කිව්වේ ඒකට සල්ලි නැහැ කියලා. අපි කිව්වා, පළාත් සභා ඡන්දය තියන්න, අපි ඒකට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලය දෙන්නම් නීතිය වෙනස් කරන්න කියලා. ඒ අවස්ථාව දුන්නේත් නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ජනාධිපතිවරණය කල් දාන්න හැදුවා. ඒක හරි ගියේත් නැහැ. අපි කියන්නේ, මේ වාගේ ගේම් ගහන්නේ නැතුව ඡන්දය තියන්න. ලජ්ජා නැද්ද, බලෙන් ඉන්න? රට බංකොලොත් කරලා, රට වාගේම හැම ක්ෂේත්‍රයක්ම විනාශ කරලා කූඩැල්ලෝ වාගේ තවම එල්ලිලා ඉන්නවා. ලජ්ජා නැද්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන් වෙනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි ලක්ෂ්මන් කිරියෙල්ල)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඡන්දයක් තියන්න. මිනිසුන්ට ඡන්දය පාවිච්චි කරන්න අවස්ථාවක් දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු ඉම්රාන් මහරූෆ් මැතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[ප.ව. 5.01]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(මාණ්පුමිකු ඉම්රාන් මහ්රූප්)
(The Hon. Imran Maharoof)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று இச்சபையில் விவாதிக்கப்படுகின்ற விடயங்கள் முக்கியம் வாய்ந்தவைகளாக இருந்தாலும், இன்று இந்த நாடு இருக்கின்ற நிலைப்பாட்டில் எவ்வாறான சட்டங்களை அல்லது எவ்வாறான விடயங்களை முன்னிலைப்படுத்த வேண்டும் என்பதை நாங்கள் புரிந்து செயற்படவேண்டிய ஒரு சூழலிலே இருந்துகொண்டு இருக்கின்றோம். குறிப்பாக, பல வருடங்களாகக் கிடப்பிலிருந்த சட்டமூலங்களைக் கொண்டுவரும்பொழுது ஏன் எதிர்க் கட்சியினர் எதிர்க்கின்றார்கள்? என ஆளும் தரப்பிலிருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் கேட்கின்றார்கள். இந்த நாட்டில் ஏற்பட்டிருக்கின்ற சூழலிலிருந்து விடுபட்டு, மக்கள் மீண்டும் சுமுகமாக வாழுகின்ற நிலைக்குச் செல்லக்கூடிய சட்டமூலங்களையா இப்பொழுது கொண்டுவருகிறார்களென்பதைச் சிந்திக்க வேண்டும்.

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று இந்த நாட்டில் எல்லாப் பகுதிகளிலும் மீண்டும் ஆர்ப்பாட்டங்கள் -போராட்டங்கள்- ஆரம்பித்திருக்கின்றன. குறிப்பாக, எல்லாத் துறைகளைச் சேர்ந்த அரச ஊழியர்களும் இன்று வீதிக்கு இறங்கி இருக்கின்றார்கள். ஆசிரியர்கள், அதிபர்கள், கிராம சேவையாளர்கள், முன்பள்ளி ஆசிரியர்கள், வைத்தியர்கள், சுகாதாரத்துறை சார்ந்தவர்கள் எனப் பலரும் தங்களுடைய சம்பளப் பிரச்சினை சம்பந்தமான விடயங்களையும், தாம் வாழ முடியாத ஒரு சூழலில் இருப்பதையும் போராட்டத்தின்மூலம் வெளிப்படுத்திக்கொண்டு இருக்கின்றார்கள். இந்த நேரத்தில் எதை முன்னிலைப்படுத்த வேண்டும் என்பதை நாங்கள் விளங்கிக்கொள்ள வேண்டும். சில வாரங்களுக்கு முன்னர், மாண்புமிகு சனாதிபதி அவர்கள் நாட்டு மக்களுக்கு உரையாற்றும்பொழுது, இந்த நாட்டை வங்குரோத்து நிலையிலிருந்து காப்பாற்றிவிட்டதாகச் சொல்லியிருந்தார்.

அதற்குப் பின்னர், பாராளுமன்றத்திலும் அவ் வாறானதொரு பேச்சை மீண்டும் பேசியதை நாங்கள் அவதானித்தோம். நாடு வங்குரோத்து நிலையிலிருந்து விடுபட்டு மீண்டும் பழைய நிலைக்குத் திரும்பியிருக்கிறது என்றால், நாட்டு மக்களுக்கு எல்லாம் கிடைக்கிறது என்றால், நாட்டு மக்கள் சந்தோஷமாக வாழ்கிறார்கள் என்றால், தேர்தலைப் பிற்போடுவதற்கான காரணம் என்ன? என்பது எங்களுடைய கேள்வியாகும். இன்று எதிர்த்தரப்பில் இருக்கின்றவர்கள் மாத்திரமல்ல, அரசாங்கத் தரப்பில் இருக் கின்றவர்களும் தேர்தலை நடத்துவதற்கு விருப்பப் படுகின்றார்கள். இந்த நாட்டில் ஏற்பட்டிருக்கின்ற அரசியல் குழப்பத்தைத் தீர்க்க வேண்டுமென்றால், தேர்தலை நடத்த வேண்டும். இன்று நாங்கள் தேர்தலுக்கு முகங்கொடுக் கவேண்டிய ஒரு சூழலில் இருந்துகொண்டு இருக்கின்றோம். ஆகையால், தேர்தலைச் சரியான தேதியில் நடத்த வேண்டுமென்பது எங்களது வேண்டுகோளாகும்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று எங்களுடைய பிரதேசத்தில் முன்பள்ளி ஆசிரியர்கள் பல கோரிக்கைகளை முன்வைத்து ஆர்ப்பாட்டம் செய்கின்றார்கள். உண்மையிலே அந்த ஆர்ப்பாட்டத்தில் ஒரு நியாயம் இருக்கின்றது. அந்த ஆசிரியர்கள் 4,000 ரூபாய் கொடுப்பனவைப் பெறுகின்றார்கள். அவர்கள் முள்பள்ளிச் சிறார்களுக்கு ஆரம்பக் கல்விச் செயற்பாடுகளை மிகவும் சிறப்பாகச் செய்வதனால்தான் இன்று பாடசாலைக்குச் செல்கின்ற மாணவர்கள் கல்வியில் சிறந்து விளங்குகிறார்கள். இவ்வாறு சிறந்த முறையில் கற்றுக்கொடுக்கின்ற இந்த முன்பள்ளி ஆசிரியர்களுக்கு 4,000 ரூபாய் சம்பளமே வழங்கப்படுகின்றது. இது, இப்போது இருக்கின்ற சூழலில் போதுமானதா? என்பதை விளங்கிக்கொள்ள வேண்டும். 4,000 ரூபாயால் தங்களது சம்பளம் அதிகரிக்கப்பட வேண்டும் என்பதே அவர்களுடைய பிரதான கோரிக்கையாகும். ஆகையால், இந்த விடயத்தில் கவனம் செலுத்தி, அவர்களுக்கான சம்பள உயர்வை வழங்குவதற்கு அரசாங்கம் முன்வர வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

திருகோணமலையில் காணப்படுகின்ற மக்கெய்ஸர் மைதானத்தின் ஒரு பகுதியில் தேசிய கிரிக்கெட் மைதானமென்று அமைப்பதற்குச் சில ஆண்டுகளுக்கு முன்னர் நிதி ஒதுக்கீடு செய்யப்பட்டது. பின்னர் அந்த நிதி ஒதுக்கீடு இடைநிறுத்தப்பட்டது. இதனால் அந்த மைதானத்தின் எல்லாச் செயற்பாடுகளும் முடக்கப்பட்டன. ஆகையால், அந்த மைதானத்தை உருவாக்குவதற்குரிய நடவடிக்கைகளை அரசாங்கம் முன்னெடுக்க வேண்டும். அந்த மைதானத்தின் நிர்மாண வேலைகளை ஆரம்பித்து முன்னெடுத்துச் செல்கின்றபொழுது, அந்த இடத்தில் மனித எச்சங்கள் கண்டுபிடிக்கப்பட்டன. அதன் காரணமாக அங்கு நிர்மாண வேலைகள் இடைநிறுத்தப்பட்டன. இன்று இவற்றுக்கான தீர்வுகள் வந்திருக்கின்றன. இவ்விடயம் சம்பந்தமான கடிதங்கள் என்னிடம் இருக்கின்றன. அவற்றை **ஹன்சாட்டில்*** பதிவுசெய்யுமாறு கேட்டு, நேரத்தைக் கருத்திற்கொண்டு எனது உரையை முடிக்கின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.06]

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று இங்கு இலங்கைத் தொலைத்தொடர்பு திருத்தச் சட்டமூல விவாதம் நடைபெற்றுக் கொண்டிருந்தபோதிலும், இன்று காலை இந்தச் சபையில் எங்களுடைய பெருந்தோட்டச் சமூகம் தொடர்பாக கௌரவ அமைச்சர் அவர்கள் முன்வைத்த சில கருத்துகள் தொடர்பாக சில விடயங்களைக் கூற வேண்டியிருக்கிறது. பெருந்தோட்ட மக்களைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற அமைச்சர் அவர்கள் குறிப்பிட்ட சில விடயங்களை நாங்கள் கேட்டோம். அந்த மக்களின் நிலைமை தொடர்பாக வாடி வதங்கி, உருகிப் பேசியதை நாங்கள் காணக்கூடியதாக இருந்தது. மலையக சமூகம் திரும்பிப் பார்க்கவேண்டிய விடயங்கள் தொடர்பாக அல்லது அச்சமூகம் யோசிக்க வேண்டிய விடயங்கள் தொடர்பாக அவர் கூறியதை மீண்டும் சொல்ல வேண்டியிருக்கின்றது.

குறிப்பாக, அவருடைய உரையிலே இரண்டு விடயங்களை அவதானிக்கக்கூடியதாக இருந்தது. மலையக சமூகமானது இன்றும் இந்த நாட்டிலே ஏனைய சமூகங்களின் அங்கீகாரத்தைப் பெறவில்லையென்றும் மலையகப் பெருந்தோட்டத்தில் உள்ளவர் தோட்ட வேலையில் அல்லது வீட்டு வேலையில் இருக்கின்ற நிலைமைதான் இருக்கின்றதென்றும் அவர் கூறினார். அவருடைய கருத்திலிருந்து அந்த மக்களின் சமூக நிலைமையை இந்த இடத்திலே அவர் ஒப்புக்கொண்டதைக் காணக்கூடியதாக இருந்தது. பெருந்தோட்ட சமூகம் இந்த நிலைமையில் இருப்பதற்கான காரணம் யாரென்று நான் அவரிடம் கேட்க விரும்புகிறேன். பெருந்தோட்ட சமூகத்தில் இருக்கின்ற இளைஞர், யுவதிகள் இது பற்றி யோசிக்க வேண்டுமென்றும் நான் கேட்டுக்கொள்கிறேன்.

இந்த நாட்டில் பெருந்தோட்ட சமூகத்தைப் பிரதிநிதித்துவப்படுத்தி தொழிற்சங்கத் தலைவர்களாக கடந்த 60 ஆண்டுகளுக்கும் மேலாக யார் யார் இருந்தார்களென்பதை நான் இங்கு கேட்கவேண்டி இருக்கிறது. கடந்த 30 ஆண்டுகளுக்கும் மேலாக இந்தப் பாராளுமன்றத்தைப் பிரதிநிதித்துவப்படுத்தி, பச்சைக் கட்சியின் அரசாங்கத்திலும்,

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

'நீல' கட்சியின் அரசாங்கத்திலும், மாறி மாறி அமைச்சர்களாக யார் இருந்தார்களென நான் கேட்க விரும்புகின்றேன். அவர்கள்தான் எங்களுடைய சமூகத்தின் இன்றைய நிலைக்குக் காரணம் என்பதை நான் மீண்டும் அவருக்குத் தெரியப்படுத்த விரும்புகின்றேன். மேலும், அவர் சலுகை அரசியல் பற்றியும் குறிப்பிட்டிருந்தார். சலுகை அரசியல் தொடர்பாக நாங்கள் அவர்களிடம் பாடம் கற்றுக்கொள்ள வேண்டும். அன்று 540,000ஆக இருந்த தோட்டத் தொழிலாளர்களின் எண்ணிக்கை இன்று 150,000ஆகக் குறைந்து விட்டதென அவர் ஆதங்கப்படுகின்றார். இந்த நிலைமையை உருவாக்கியவர்கள் யார் என்பதைத் திரும்பவும் மீட்டிப் பார்க்க வேண்டும்.

கடந்த 60 ஆண்டுகளாக அவர்கள்தான் தொழிற்சங்கத் தலைவர்களாக இருந்தார்கள். இன்று வாடி வதங்குகின்ற பெருந்தோட்டங்களை 1992ஆம் ஆண்டு அராஜகக் கம்பனிகளுக்குக் கொடுக்கும்போது, அப்போதைய அரசாங்கத்தின் பிரதிநிதியாக இருந்தது யார்? அப்போது ஒப்பந்தங்களில் கையொப்பமிட்டது யார்? அதன் பிறகு, கூட்டு ஒப்பந்தத்தின் மூலமாகத்தான் தோட்டத்தொழிலாளர்களின் சம்பளத்தைத் தீர்மானிப்போம் என்றும், இரண்டு தசாப்தங்களுக்கும் மேலாக தாங்கள்தான் அதற்கான ஏகபோக உரிமையாளர்கள் என்றும் கூறி அந்த ஒப்பந்தத்தில் யார் கையொப்பம் இட்டார்களோ, அவர்களிடம் போய் இந்த மக்களின் இன்றைய நிலைமைக்குக் காரணம் என்ன என்பதைக் கேளுங்களென்பதை நான் இந்தச் சபையிலே கூறிவைக்க விரும்புகின்றேன். இந்த நாடு ஒரு குடும்பத்தால் வங்குரோத்து நிலைக்குச் சென்றது. அதேபோல, இன்று பெருந்தோட்ட சமூகமும் ஒரு குடும்பத்தால் வங்குரோத்து நிலைக்குள்ளாக்கப்பட்டு இருக்கின்றது. இதனால் இன்று அந்தச் சமூகம் வாடி வதங்கிய நிலையில் இருக்கின்றது.

மேலும், 'கொவிட்' தொற்றின் ஆரம்பத்தில் மலையகத்தில் வறுமை நிலை 23 சதவீதமாக இருந்ததென அவர் இங்கு குறிப்பிட்டிருந்தார். 'கொவிட்' தொற்றின் ஆரம்பத்தில் அல்ல, நாங்கள் 'நல்லாட்சி' அரசாங்கத்தை உங்களிடம் பாரம்கொடுக்கும்போதே அது 23 சதவீதமாகத்தான் இருந்தது. ஆனால், இன்று மலையகத்தில் வறுமை நிலை 60 சதவீதமாகக் காணப்படுகின்றது. இதற்குப் பொறுப்புக்கூறவேண்டியவர், இன்று எதிர்க்கட்சியினரைப் பார்த்து, 23 சதவீதமாக இருந்த வறுமை நிலை 60 சதவீதமாகிவிட்டது என்று முதலைக் கண்ணீர் வடிக்கின்ற வேடிக்கையான நிலைமையை இந்தச் சபையில் காணக்கூடியதாக இருந்தது.

கடந்த மே மாதம் 1ஆம் திகதி மேடை அமைத்து, பட்டப்பகலில் பட்டாசு கொளுத்தி, பாற்சோறு சமைத்து, மாண்புமிகு ஜனாதிபதி அவர்களும் cabinet அமைச்சர்கள் சிலரும் ஒன்றாகச் சேர்ந்து, 1,700 ரூபாய் நாட்சம்பளத்தை பெருந்தோட்டத் தொழிலாளர்களுக்குப் பெற்றுக்கொடுத் துவிட்டோமென அங்குள்ள மக்களை அப்பட்டமாக ஏமாற் றினார்கள். முடிவில் என்ன நடந்தது? குறித்த வர்த்தமானி அறிவித்தல் வெளியிடப்பட்ட முறை தவறானதென இன்று நீதிமன்றம் கூறியிருக்கின்றது. தொட்டிலையும் ஆட்டிவிட்டு, குழந்தையையும் கிள்ளிவிடுகின்ற வேலையை இந்த அரசாங்கத்தோடும் பெருந்தோட்டக் கம்பனிகளோடும் சேர்ந்து இந்த அமைச்சர்கள் செய்துகொண்டு நாடகமாடியிருக் கிறார்கள். தோட்டத் தொழிலாளர்களுக்கான 1,700 ரூபாய் நாட்சம்பளம் தொடர்பில் வெளியிடப்பட்ட வர்த்தமானி அறிவித்தல் பிழையென்றும் அரசாங்கமும் பெருந்தோட்டக் கம்பனிகளும் மக்களை ஏமாற்றுகின்றதென்றும் தமிழ் முற்போக்குக் கூட்டணியின் தலைவர் மனோ கணேசன் அவர்கள் சொன்னபோது, பெருந்தோட்டக் கம்பனிகளுக்கும் அரசாங்கத்துக்கும் ஆதரவு தெரிவித்து நாடகம் ஆடியவர்கள் அவருக்கு எதிராகத் தங்களுடைய கைக்கூலிகளை வைத்து போராட்டம் செய்கின்ற வேடிக்கையானதொரு நிலைமையை இன்று நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
මම ඉක්මනින් අවසන් කරනවා. මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

இன்று பெருந்தோட்ட மக்கள் தங்களுடைய 1,000 ரூபாய் நாட்சம்பளத்தை உயர்த்திக்கொள்ள முடியாமல் வாடி வதங்கி பட்டினியில் இருக்கும்போது, மத்திய மாகாண ஆளுநரின் இணைப்பாளர்களாக உங்களுடைய கட்சியின் பிரதிநிதிகளான ராஜமணி பிரசாத், வேலு யோகராஜன், கோவிந்தன், ரவி குழந்தைவேல், சச்சிதானந்தன் ஆகியோர் நியமிக்கப்பட்டிருக்கிறார்கள். அப்படி நியமிக்கப்பட்டவர்கள் உள்ளூராட்சி மன்ற வாகனங்களையும் அதற்குத் தேவையான எரிபொருளையும் பெற்றுக்கொண்டு சலுகை அரசியல் செய்கிறார்களென்பதை அவர் புரிந்துகொள்ள வேண்டும்.

பெருந்தோட்டத் தொழிலாளர்களின் 1,700 ரூபாய் நாட்சம்பள விடயம் தொடர்பில் கடந்த 04ஆம் திகதி நீதிமன்றத்தால் தடை உத்தரவு பிறப்பிக்கப்பட்டது. அதற்கு மறுதினம் 05ஆம் திகதி CLF premisesஇல் இருக்கக்கூடிய பங்களாவுக்குத் தோட்ட முகாமையாளர்கள் அழைக்கப்பட்டு, அவர்களுக்கு அங்கு விருந்துபசாரம் அளிக்கப்பட்டு இருக்கிறது. இதன்மூலம் இந்தக் காட்டிக்கொடுப்பைச் செய்தவர்கள் யார்? என்பது இன்று அம்பலமாகி இருக்கிறது. இந்தச் சபையில் முதலைக் கண்ணீர் வடித்து, ஏதோ தாங்கள் அந்த மக்களுடைய கஷ்டத்தில் பங்காளிகளாக இருப்பதுபோல சிலர் நாடகமாடுகிறார்கள். இவ்வாறு நாடகமாடி மக்களைத் திசைதிருப்ப இனியும் முடியாதெனக் கூறிக்கொள்வதோடு, இந்தக் காட்டிக்கொடுப்புகளுக்கு எல்லாம் நாங்கள் எங்களுடைய அரசாங்கத்தில் முற்றுப்புள்ளி வைப்போமெனக் கூறி, எனது உரையை முடிக்கின்றேன். நன்றி!

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ විවාදය පැවැත්වෙන්නේ එක විෂයයක් සම්බන්ධයෙන්. ඒ තමයි ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදය. නමුත්, මේ අවසාන භාගයේ සිදු වුණු කථා කිහිපයකට මම සවන් දීගෙන හිටියා. - *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

පොඩ්ඩක් මම කියන එක අහගෙන ඉන්න, යන්න එපා. ඔහොම ඉන්න. ඔබතුමා දන්නේ නැහැ, මේ රටේ ඉතිහාසය. පොඩ්ඩක් වාඩි වෙන්න. මම කියන එක අහගෙන ඉන්න. ඒ නිසා මම කල්පනා කළා, විනාඩි දෙක තුනකින් මෙතුමන්ලාට ඒ ඉතිහාසය ගැන කියා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ රටේ වතු ආරම්භ වුණේ මොන අවුරුද්දේද? ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්න. පළමුවැනි තේ ගස සිටුවලා මේ රටේ පළමුවැනි තේ කර්මාන්තශාලාව පටන් ගත්තේ කොහේද, කවුද?

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
1815දී.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
1815දී? උඩරට ගිවිසුම අත්සන් කළේත් 1815දී නේ. දන්න තරම තමයි.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ලූල්කඳුර වත්තේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමා මගෙන් අහගන්න. ජේම්ස් ටේලර් තමයි පටන් ගත්තේ.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ලූල්කඳුර වත්තේ. මහනුවර දිස්ත්‍රික්කයේ තිබෙන්නේ. ඔබතුමා ආවා නම් ගිහිල්ලා බලාගන්න පුළුවන්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමා 1815දී කියලා කියනවා. 1815දී තමයි උඩරට ගිවිසුම අත්සන් කළේ. එතකල් කොහේද ඒ අය ලංකාවට ආවේ? දන්න දෙයක් කියන්න. *[බාධා කිරීමක්]* දැන් වාඩි වෙලා අහගෙන ඉන්න. *[බාධා කිරීමක්]* I am on my feet. You had better listen to me. Do not mislead the people and this august House!

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉංග්‍රීසින් මේ රට අල්ලාගෙන, 1815දී තමයි මුළු රටම ඉංග්‍රීසින් යටතට - *[බාධා කිරීමක්]* කරුණාකරලා වාඩි වෙලා අහගෙන ඉන්න. සිංහල දන්නේ නැත්නම් interpretation එක අහගෙන ඉන්න, මිනිසුන් රවටන්නේ නැතුව. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්නකෝ, මම කථා කරනකල්. *[බාධා කිරීමක්]* ඒක නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉංග්‍රීසින් මේ රට අත්පත් කර ගත්තාට පසුව, උඩරට ගිවිසුමෙන් පසුව තමයි මේ රටට තේ ගෙනාවේ. ඔවුන් මුඩුබිම් පනත ගෙනාවා. මුඩුබිම් පනත ගෙනැල්ලා මොකක්ද කළේ? ආණ්ඩුවේ ඉඩම්ද ගත්තේ, තේ වවන්න? මේ රටේ උඩරට සිංහල ජනතාවගේ පාරම්පරික ඉඩම් තමයි මුඩු ඉඩම් කියලා රජයට පවරා ගත්තේ. ඒ ඉඩම් ටික අරගෙන තමයි තේ වවන්න බ්‍රිතාන්‍යයන්ගේ කොම්පැනිවලට දුන්නේ. ඒ තේ වතුවල වැඩ කරන්න තමයි දකුණු ඉන්දියාවෙන් කම්කරුවන් ගෙන්වුවේ, මෙහේ කම්කරුවන් මදි වුණාම. මෙතුමාම කියනවා, ලක්ෂ පහක් ඉඳලා දැන් ලක්ෂ දෙකකට අඩු වෙලාය කියලා. කොහොමද ඒක වුණේ? 1987දී දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවාට පසු සියලු තේවතුවල ඩිස්පැන්සරි සහ පාසල් පළාත් සභා යටතට පවරා ගත්තා. එතෙක් තේ වත්ත අයිති සමාගමෙන් තමයි පාසල් සහ රෝහල් ක්‍රියාත්මක වුණේ. ලැයිම් කාමර තිබුණේ. ඒ ආණ්ඩුත් මේ ආණ්ඩුත් ඔක්කෝම එකතු වෙලා ඒවායේ ගම්මාන හැදුවා; පාරවල් කොන්ක්‍රීට් කළා; කාපට් කළා. ඒ පාසල්වලට දැන් ගුරුවරු දෙන්නේ රජයෙන්. වත්තේ මහත්තයා නොවෙයි. එදා ඒ කම්කරු ජනතාවට බෙහෙත් දුන්නේ ඩිස්පැන්සරියෙන්; අද දෙන්නේ රජයෙන්. ඒ ඔක්කෝටම වැය වෙන්නේ මේ රටේ සමස්ත ජනතාවගේ බදු මුදල්. එතකොට දැන් ලක්ෂ පහ, ලක්ෂ දෙකට අඩු වෙලා තිබෙන්නේ ඇයි? ඇයි, අඩු වුණේ? අධ්‍යාපනය දුන්නා; විදුලිය දුන්නා; නිවාස පහසුකම් දුන්නා. ඒවා කරගෙන යනකොට ඔවුන් අධ්‍යාපනය ලැබුවා. අධ්‍යාපනය ලැබුවාට පසුව ඔවුන් තේ වතුවල වැඩ කළේ නැහැ. ඒ ගොල්ලන් ආවා මෙහේ. කොළඹ ගත්තොත්, වටේ තිබෙන ඔක්කෝම restaurantsවල, "Food City" supermarketsවල, John Keells Holdings එකේ supermarketsවල countersවල ඉන්නේ ඒ ගොල්ලන්. එතකොට එහේ කම්කරුවන් නැහැ. වැඩ පඩියට ඒ ළමයි මෙහේ ආවා. දැන් ඒ ගැන චෝදනා කරන්නේ කාටද, අපටද? එහේ කම්කරු ජනතාව අඩු වුණේ ඒ නිසා.

අද ඒගොල්ලන්ට ඒ මිනිස්සුන්ගෙන් ලැබෙන සාමාජික මුදල් නැතුව තමයි ඔය කෑ ගහන්නේ. දැන් කියනවා, 1992දී තමයි ලු, මේ විනාශය වුණේ. 1992දී මේ රටේ ජනාධිපති කවුද? අපිද, මහින්ද රාජපක්ෂ මහත්මයාද, වෙන කෙනෙක්ද? නැහැ, ඔබතුමන්ලාගේ ජනාධිපතිවරයෙක් තමයි 1992දී හිටියේ. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය "රන් පවුම් වතු" කියලා වතු ටික එදා රජයට පවරා ගත්තා. "ජනවසම" හැදුවා. "උසවසම" හැදුවා. Plantations හැදුවා. ඒ ටික බදු දුන්නේ කවුද? අපිද? මේගොල්ලන්ම ඒ ටික සමාගම්වලට අවුරුදු 30ට, 35ට, 50ට බදු දීලා දැන් මෙතැනට ඇවිල්ලා අර අහිංසක මිනිස්සුන්ගේ ඡන්ද ටික ගන්න හිතාගෙන බෙරිහන් දෙනවා. ඒ නිසා තමයි මම කිව්වේ, මුළා කරන්න එපා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපති ධුරයේ කාලය දීර්ඝ කර ගන්න රජයටත් අවශ්‍ය නැහැ, ජනාධිපතිතුමාටත් අවශ්‍ය නැහැ. මේ රට භාර ගන්න බැහැයි කියලා හැමෝම පැනලා දුවනකොට තමයි වර්තමාන ජනාධිපතිතුමා සහ අපි මේ රට භාරගෙන අද මේ තත්ත්වයට ගෙනාවේ. අද වැඩ වැටුප් ඉල්ලනවා. ආර්ථිකය හොඳ ලු. ආර්ථිකය හොඳ වෙමින් යනවා. අද රට මේ තත්ත්වයට ගෙනාවාට, එදා තෙල් පෝලිම් තිබුණා. එදා ගෑස් තිබුණේ නැහැ. පැය 14ක් විදුලිය කැපුවා. තෙල් ගේන්න ඩොලර් එකක්වත් තිබුණේ නැහැ. තෙල් නැව් තෙල් ටික ගොඩබාන්නේ නැතුව මුහුදේ කැරකුණා. ගෑස් ගෙනාපු නැව් මුහුදේ කැරකුණා, ගෑස් ගොඩබෑවේ නැහැ. කොළඹ සුපර්මාර්කට්වලත් දර මිටි විකුණන තත්ත්වයක් ආවා. එහෙමයි මේ රට තිබුණේ. මම දැක්කා, අපේ ගරු රෝහිත අබේගුණවර්ධන මැතිතුමාගේ රැස්වීමකදී හොඳ කථාවක් කියා තිබෙනවා. මම කියනවා, මේ රටේ ජනතාව මෑත කාලීනව ඉස්සෙල්ලාම ණයගැති වෙන්න ඕනෑ මහින්ද රාජපක්ෂ මහත්මයාට කියලා. මේ ඔක්කෝටම අද කෑ ගහන්න පුළුවන් වුණේ ප්‍රභාකරන් නැති

නිසායි. ප්‍රභාකරන් හිටියා නම් මේ කිසි කෙනෙක් උතුරට යන්නේත් නැහැ. නැහෙනහිරට යන්නේත් නැහැ. Smart boards බෙදන්න යන්නේත් නැහැ. කොහොමද යන්නේ? බෝම්බ පුපුරනවා.

ඊළඟට, ණයගැති වෙන්න ඕනෑ කාටද? වර්තමාන ජනාධිපතිතුමා පසුගිය අවුරුදු දෙකේදී මේ රට මේ තත්ත්වයට නොගෙනාවා නම්, එක්කෙනෙකුටවත් පෙට්‍රල් ෂෙඩ් එකක් ළඟින් යන්න බැහැ. හැංගිලා හිටියේ. අද එළියට ඇවිල්ලා. අද පණ ගහලා. මොනවාටද? බලය ගන්න. දැන් මේ රට හදලා නේ. අද ඇමෙරිකානු ඩොලර් බිලියන 5.6ක විදේශ සංචිතයක් තිබෙනවා. Interest rate එක සියයට 9ට අඩු වෙලා තිබෙනවා. උද්ධමනය සියයට 76 ඉඳලා පසුගිය මාසයේ සියයට 5න් පහළට, ඒ කියන්නේ සියයට 1.7ට ආවා. අද ඒ තැනට මේ රට ගෙනැල්ලා තිබෙනවා. පළමු මාස හයේදී විතරක් විදේශ සංචාරකයෝ මිලියනයක් ලංකාවට ආවා. එදා හිටපු සංචාරකයිනුත් එළෙව්වා. Remittances එවන්න එපා කිව්වා.

දැන් මොනවාද කරලා තිබෙන්නේ? විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට රුපියල් 25,000ක දීමනාවක් දුන්නාම, පහළම ශ්‍රේණියේ සේවකයාත් රුපියල් 20,000ක් ඉල්ලනවා. එහෙම නම් අර මනුස්සයා ඉගෙන ගන්න ඕනෑ නැහැ නේ. 8වන ශ්‍රේණියෙන් නැවතුණාම ඇති. ඔක්කෝම අය කම්කරුවෝ වෙලා ඉදිමුකෝ. මොනවාටද ඉගෙන ගන්නේ? මිටි අය කම්කරු, උස අය සිකියුරිටි. මේ රට එතැනටද ගේන්න කියන්නේ? ඒවා නිකම් මෝඩ කථා. මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ වැදගත් දෙයක් සාකච්ඡා කරන්න. අද ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පත ගැන නොවෙයි නේ කථා කළේ. මම මේ නැඟිටලා උත්තර දුන්නේ ඔය ප්‍රශ්න ටිකට. ඒ නිසා මම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ දැනගැනීමට කියනවා, කැබිනට් මණ්ඩල තීන්දුව ගත්තේ ජනාධිපති ධුර කාලය අවුරුදු පහ කියන එක seal කරන්න කියලා. ඒකට ඔබතුමන්ලාත් සම්මාදම් වෙලා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක අනුමැතිය ගන්න ඡන්දය දෙන්න කියා ඉල්ලමින්, මගේ පැහැදිලි කිරීම අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කනක හේරත් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.21]

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ පනත් කෙටුම්පත සඳහා සහයෝගය ලබා දුන්, ඒ පිළිබඳව කථා කරපු පක්ෂ-විපක්ෂ සියලු මන්ත්‍රීතුමන්ලාට මම ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම අපේ ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා සඳහන් කරපු ආකාරයට අද විපක්ෂය කථා කළේ නැත්තේ මේ පනත් කෙටුම්පත ගැන විතරයි. එතුමන්ලා හැම කුණු ගොඩක් ගැනම කථා කළා, මේ පනත් කෙටුම්පත ගැන කථා කළේ නැහැ. කෙසේ වෙතත්, මේ පනත් කෙටුම්පතට සහයෝගය ලබා දීම පිළිබඳව මම එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. මේ පනත් කෙටුම්පතට ඇත්තටම බොහෝදෙනෙක් සංශෝධන ඉදිරිපත් කළා. ඒවා කාරක සභා අවස්ථාවේදී තීරණය කරයි. ඒ සියලුදෙනාට මම ස්තුතිවන්ත වෙනවා. දුරකථන සමාගම්, ඒ වාගේම මහාචාර්ය රොහාන් සමරජීව මැතිතුමා මේ සම්බන්ධව ඉල්ලීම් කරලා තිබුණා. ඒවායෙන් බොහෝ සංශෝධන ගැන අපි සලකා බලා කටයුතු කළා. ඒ වාගේම ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය ඇතුළු ජාත්‍යන්තර යහ පරිවයන්ට අනුව ලෝක බැංකුවේ උපදෙස් මත ඒ සියලු යෝජනා ඉදිරිපත් කළා කියන එක මේ අවස්ථාවේදී මා සඳහන් කරනවා. ඒ වාගේම වසර 28කට පස්සේ හෝ මේ පනත් කෙටුම්පත ගෙන එන්න හැකියාවක් ලැබුණේ ගරු ජනාධිපතිතුමා නිසායි. එතුමාට ස්තුතිය පුද කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා. එතුමා මෙය අත්‍යවශ්‍ය කාරණාවක් හැටියට සලකා ලෝක බැංකුව සඳහන් කරපු ආකාරයට වාගේම, සියලුදෙනා ඒක රාශි කරලා ඒ අදහස් අරගෙන මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න කටයුතු කළා.

මේ අවස්ථාවේදී, ගරු ජනාධිපතිතුමාට සහ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිතුමා ලෙස කටයුතු කරන අපේ ලේකම්තුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලේකම්තුමිය වන රුවනි ගුණරත්න මහත්මිය, තාක්ෂණ කමිටුව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් සුමනි ධර්මවර්ධන මැතිතුමා, නීති කෙටුම්පත් සම්පාදකතුමිය ඇතුළු සියලු නිලධාරීන්ට මගේ ස්තුතිය පුද කර සිටිනවා. මේ සංශෝධනය අපේ රටේ ආර්ථිකයටත්, ඒ වාගේම ඩිජිටල්කරණය සඳහාත් විශාල වශයෙන් බලපාන බව සඳහන් කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

විනා විවිදක්කප්පට්ටු, ඒற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

තීරමානික්කප්පට්ටது:
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Susil Premajayantha]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[THE HON. DEPUTY SPEAKER in the Chair.]

1 සිට 7 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ஆம் வாசகத்திலிருந்து 7ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 1 to 7 ordered to stand part of the Bill.

8 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 9අ වන වගන්තිය ඇතුළත් කිරීම)

වාසකම් 8.- (முதன்மைச் சட்டவாக்கத்தில் 9அ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்)

CLAUSE 8.- *(Insertion of new section 9A in the principal enactment)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, 19 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'දිය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

8 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
8ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 8, as amended, ordered to stand part of the Bill.

9 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම)

වාසකම් 9.- (முதன்மைச் சட்டவாக்கத்தின் 10ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 9.- *(Amendment of section 10 of the principal enactment)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"8 වන පිටුවේ, 9 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ යහපත උදෙසා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ හෝ ජාත්‍යන්තර යහ පරිචයන් මත පදනම් ව' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
9ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 9, as amended, ordered to stand part of the Bill.

10 සහ 11 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
10ஆம், 11ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 10 and 11 ordered to stand part of the Bill.

12 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම)

වාසකම් 12.- (முதன்மைச் சட்டவாக்கத்தின் 17ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 12.- *(Amendment of section 17 of the principal enactment)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "13 වන පිටුවේ, 26 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ක්‍රියාකරු විසින් භාවිත කළ යම් යටිතල පහසුකමක් කොමිෂන්' "

(2) "13 වන පිටුවේ, 29 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'නියෝග මගින් නිශ්චිතව දක්වන ලද යම් නියම සහ' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

12 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
12ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 12, as amended, ordered to stand part of the Bill.

13 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 17අ වන සහ 17ආ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම)

වාසකම් 13.- (முதன்மைச் சட்டவாக்கத்தில் 17அ மற்றும் 17ஆ என்னும் புதிய பிரிவுகளை உட்புகுத்துதல்)

CLAUSE 13.- *(Insertion of new sections 17A and 17B in the principal enactment)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "14 වන පිටුවේ, 7 වන පේළියේ සිට 9 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' කඩ කිරීම මත, ඒ සඳහා හේතු දක්වා' "

(2) "15 වන පිටුවේ, 25 වන පේළියේ සිට 28 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

සහ යම් ගාස්තු ගෙවීමක් මත විය යුතු ය; සහ' "

(3) "16 වන පිටුවේ, 6 වන සහ 7 වන පේළි ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(6) බලපත්‍රලාභියා විසින් අනුකූල වීමට නියමිත' "

(4) "16 වන පිටුවේ, 34 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'බලපත්‍රයක් අලුත් කරන ආකාරය,' "

(5) "17 වන පිටුවේ, 1 වන සහ 2 වන පේළි ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකළ් විටුක්කප්පට්ටු ඒර්ට්රුක්කොළ්ළප්පට්ටතු.
Amendments put, and agreed to.

13 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

13ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළైයිටප්පට්ටතු.
Clause 13, as amended, ordered to stand part of the Bill.

14 සිට 17 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

14ආම් වාසකත්තිලිරුන්තු 17ආම් වාසකම් වරై සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළైයිටප්පට්ටතු.
Clauses 14 to 17 ordered to stand part of the Bill.

18 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 18.- (முதன்மைச் சட்டவாக்கத்தின் 22ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 18.- *(Amendment of section 22 of the principal enactment)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "23 වන පිටුවේ, 27 වන පේළියේ සිට 33 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(3අ) සමස්ත ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සැලසුම් කිරීමේ දී සහ කළමනාකරණය කිරීමේ දී, කොමිෂන් සභාවට-

(අ) මහජන යහපත පිණිස ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කාර්යක්ෂමව භාවිත කිරීම සඳහා නව තාක්ෂණය සමඟ අනුකූල වන ලෙස හා නව තාක්ෂණය යොදා ගන්නා ලෙස (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු වෙත විධාන කිරීම; සහ

(ආ) යම් ගුවන්විදුලි සංඛ්‍යාතයක් වෙනස් කිරීමට පෙරාතුව ම වූ සාධාරණ කාල සීමාවක දී අදාළ තැනැත්තාට ලිඛිත දැන්වීමක් ලබා දීමෙන් පසුව, ඒ සඳහා හේතු දක්වමින් ගුවන්විදුලි සංඛ්‍යාත වෙනස් කිරීම,

සඳහා බලතල තිබිය යුතු ය.

(3ආ) (3අ) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ සඳහන් ගුවන්විදුලි සංඛ්‍යාත වෙනස් කිරීමෙන් අගතියට පත් යම් තැනැත්තකු විසින් ඒ ඡේදයේ සඳහන් එකී දැන්වීම ලැබීමෙන් සති තුනක් ඇතුළත කොමිෂන් සභාව වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(3ඇ) කොමිෂන් සභාව විසින්, එම අතෘප්තියට පත් තැනැත්තාගේ එකී වෙනස් කිරීම සම්බන්ධයෙන් වන යම් විරෝධතාවක් සඳහා කරුණු කියාපෑමට සාධාරණ අවස්ථාවක් ලබා දීමෙන් පසු, කොමිෂන් සභාව වෙත අභියාචනය කරනු ලැබූ තැනැත්තා වෙත එකී අභියාචනය ලැබුණු දින සිට සති තුනක් ඇතුළත ස්වකීය තීරණය සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(3ඈ) (3අ) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ සංඛ්‍යාත බලපත්‍රය වෙනස් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුගේ ද එම අදාළ තැනැත්තාට යම් වන්දියක් ගෙවීමට කොමිෂන් සභාව විසින් සලකා බලනු ලැබිය හැකි ය.' "; සහ

(2) "24 වන පිටුවේ, 1 වන පේළියේ සිට 23 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(6) එහි (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

(4අ) මේ වගන්තියේ (3ඇ) වන උපවගන්තියේ සඳහන් තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, කොමිෂන් සභාවේ තීරණය සන්නිවේදනය කරනු ලැබූ දින සිට මාසයක් ඇතුළත අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(4ආ) අභියාචනාධිකරණය විසින් එම අභියාචනයේ අවසන් තීන්දු ප්‍රකාශය අවසන් නොවී පවතින විට දී එම අතෘප්තියට පත් තැනැත්තා වෙත අතුරු සහනයක් ප්‍රදානය කළ හැකි ය.' "

(3) "25 වන පිටුවේ, 14 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යටතේ සාදන ලද නියෝග මඟින් ප්‍රසිද්ධියට පත් කරනු' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකළ් විටුක්කප්පට්ටු ඒර්ට්රුක්කොළ්ළප්පට්ටතු.
Amendments put, and agreed to.

18 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

18ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළైයිටප්පට්ටතු.
Clause 18, as amended, ordered to stand part of the Bill.

19 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

19ආම් වාසකම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළైයිටප්පට්ටතු.
Clauses 19 ordered to stand part of the Bill.

20 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 22අඅ, 22අආ, 22අඇ සහ 22අඈ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම)

வாசகம் 20.- (முதன்மைச் சட்டவாக்கத்தில் 22அஅ, 22அஆ, 22அஇ மற்றும் 22அஈ என்னும் புதிய பிரிவுகளை உட்புகுத்துதல்)

CLAUSE 20.- *(Insertion of new sections 22_{AA}, 22_{AB}, 22_{AC} and 22_{AD} in the principal enactment)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "26 වන පිටුවේ, 10 වන පේළියේ සිට 13 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියට 22අඅ සහ 22අආ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම	20. ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 22අඅ සහ 22අආ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය.' "

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(2) "29 වන පිටුවේ, 30 වන පේළියේ සිට 33 වන පේළිය දක්වා වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

(3) "30 වන පිටුවේ, 1 වන පේළියේ සිට 30 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

(4) "31 වන පිටුවේ, 1 වන පේළියේ සිට 36 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

(5) "32 වන පිටුවේ, 1 වන පේළියේ සිට 17 වන පේළිය දක්වා වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

20 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

20ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 20, as amended, ordered to stand part of the Bill.

21 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

21ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 21 ordered to stand part of the Bill.

22 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට IIඇ වන අලුත් කොටස ඇතුළත් කිරීම)

வாசகம் 22- (முதன்மைச் சட்டவாக்கத்தில் புதிய பாகம் IIஇ ஐ உட்புகுத்துதல்)

CLAUSE 22.- *(Insertion of new Part II_C in the principal enactment)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"33 වන පිටුවේ, 16 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වන අවස්ථාවක හෝ යම් ක්‍රියාකරුවකු හෝ සැපයුම්කරුවකු විසින් 22ල' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

22 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

22ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 22, as amended, ordered to stand part of the Bill.

23 සිට 27 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

23ஆம் வாசகத்திலிருந்து 27ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 23 to 27 ordered to stand part of the Bill.

28 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 28.- (முதன்மைச் சட்டவாக்கத்தின் 43ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 28.- *(Amendment of section 43 of the principal enactment)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"37 වන පිටුවේ, 22 වන පේළියේ සිට 26 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

28 වන වගන්තිය, පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.

28ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 28, ordered to be left out of the Bill.

29 සිට 32 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

29ஆம் வாசகத்திலிருந்து 32ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 29 to 32 ordered to stand part of the Bill.

33 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 59අ වන සහ 59ආ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම)

வாசகம் 33.- (முதன்மைச் சட்டவாக்கத்தில் 59அ மற்றும் 59ஆ என்னும் புதிய பிரிவுகளை உட்புகுத்துதல்)

CLAUSE 33.- *(Insertion of new sections 59_A and 59_B in the principal enactment)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண්புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "41 වන පිටුවේ, 23 වන පේළියේ සිට 33 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස් ආදේශ කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියට 59අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම	33. ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියටඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය මේ ප්‍රඥප්තියේ 59අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.' "

(2) "42 වන පිටුවේ, 1 වන පේළියේ සිට 12 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අසත්‍ය තොරතුරු ආදිය	59අ. දැනුම්වත්ව- (අ) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමට' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

33 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

33ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 33, as amended, ordered to stand part of the Bill.

34 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

34ආම් වාසකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 34 ordered to stand part of the Bill.

35 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම)

වාසකම් 35.- (මුතන්මෛච් චට්ටවාක්කත්තින් 68ආම් පිරිවෛත් තිරුත්තුතල්)

CLAUSE 35.- *(Amendment of section 68 of the principal enactment)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) චුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"44 වන පිටුවේ, 5 වන පේළියේ සිට 16 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, අදාළ ක්‍රියාකරුවන්ට, සැපයුම්කරුවන්ට සහ බලපත්‍රලාභීන්ට අදාළ විය යුතු වර්යා සංග්‍රහ සකස් කිරීම සඳහා කොමිෂන් සභාවට බලතල තිබිය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විට්ටුක්කප්පට්ට ඒත්රුක්කොළ්ළප්පට්ටතු.

Amendment put, and agreed to.

35 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

35ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 35, as amended, ordered to stand part of the Bill.

36 සහ 37 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

36ආම්, 37ආම් වාසකංකළ් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 36 and 37 ordered to stand part of the Bill.

අලුත් වගන්තිය

පුතිය වාසකම්

NEW CLAUSE

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) චුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් අලුත් වගන්තිය ඉදිරිපත් කරනවා:

"32 වන පිටුවේ, 28 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඵ වන වගන්තිය සංශෝධනය කිරීම	22. ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඵ වන වගන්තිය, එහි(1) වන උපවගන්තියේ "ක්‍රියාකරුගේ" යන වචනය වෙනුවට "ක්‍රියාකරුගේ හෝ සැපයුම්කරුගේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.' " ; සහ

ඉදිරිපත් කරන ලදින්, පළමුවන වර කියවන ලදී.

කොණ්ටුවරප්පට්ටු මුතන්මුරෛ මතිප්පිටප්පට්ටතු.

Brought up, and read the First time.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) චුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, "අලුත් වගන්තිය දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විනා විට්ටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටතු.

Question put, and agreed to.

අලුත් වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පුතිය වාසකම් චට්ටමූලත්තිල් චේර්ක්කප්පට වේණ්ටුමෙන්ර විනා විට්ටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටතු.

පුතිය වාසකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Question, that the New Clause be added to the Bill, put and agreed to.

New Clause ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

චට්ටමාකු වාසකමුම් තලෛප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

චට්ටමූලම් තිරුත්තංකළුටන් අරික්කෛ චෙය්යප්පට්ටතු.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) චුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත රීට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

විනා විට්ටුක්කප්පට්ටු, ඒත්රුක්කොළ්ළප්පට්ටතු.

අතන්පඩි, චට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්රාම් මුරෛ මතිප්පිටප්පට්ටු නිරෛවේර්ර්පප්පට්ටතු.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සිට 4 දක්වා ඉදිරිපත් කිරීම.

ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගම: වාර්ෂික වාර්තාව (2021)

ஜீ.எஸ்.எம்.பீ. தொழில்நுட்ப சேவைகள் (தனியார்) கம்பனி: வருடாந்த அறிக்கை (2021)

GSMB TECHNICAL SERVICES (PVT.) LTD.: ANNUAL REPORT (2021)

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 154(6) වගන්තිය යටතේ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමෙහි 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසර, ස්වභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.02.08/2024.02.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.03.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ටවර් හෝල් රඟහල පදනම: වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ (2021)

டவர் மண்டப அரங்கம்: வருடாந்த அறிக்கை மற்றும் நிதிக் கூற்றுகள் (2021)

TOWER HALL THEATRE FOUNDATION: ANNUAL REPORT AND FINANCIAL STATEMENTS (2021)

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 1 දරන ටවර් හෝල් රඟහල පදනම පනතේ 12(5) වගන්තිය යටතේ 2023.10.06 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ටවර් හෝල් රඟහල පදනමෙහි 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, කාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.01.10 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.01.23 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය: වාර්ෂික වාර්තාව (2022)

தேசிய போக்குவரத்து வைத்திய நிறுவனம்: வருடாந்த அறிக்கை (2022)

NATIONAL TRANSPORT MEDICAL INSTITUTE: ANNUAL REPORT (2022)

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2023.12.13 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.01.23 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2024.03.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 5 සිට 8 දක්වා ඉදිරිපත් කිරීම.

මාතර සමය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

"மாத்தறைப் பருவம்" அமைப்பு (கூட்டிணைத்தல்) சட்டமூலம்

"MATARA SEASON" ORGANIZATION (INCORPORATION) BILL

පනත් කෙටුම්පත (ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවෙහිදී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.

[சட்டவாக்க நிலையியற் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்டமூலத்தைப் பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.

Order for consideration of Bill, as amended (in the Legislative Standing Committee), read.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මාතර සමය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව පිළිගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
ஷைலி கல்விசார் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
SHAILI EDUTAINMENT FOUNDATION (INCORPORATION) BILL

පනත් කෙටුම්පත (ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවෙහිදී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.

[சட்டவாக்க நிலையியற் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்டமூலத்தைப் பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for consideration of Bill, as amended (in the Legislative Standing Committee), read.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව පිළිගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
சமாதி தியான மற்றும் யோகாசன நிலையம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
SAMADHI MEDITATION AND YOGA CENTRE (INCORPORATION) BILL

පනත් කෙටුම්පත (ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවෙහිදී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.

[சட்டவாக்க நிலையியற் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்டமூலத்தைப் பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for consideration of Bill, as amended (in the Legislative Standing Committee), read.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව පිළිගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
இலங்கை வரைதல் தொழினுட்பவியலாளர்கள் நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
INSTITUTE OF DRAFTING TECHNOLOGISTS SRI LANKA (INCORPORATION) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත්

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයේ පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 53(3) වන ස්ථාවර නියෝගය යටතේ, ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.
චෝදනාවක් ඉදිරිපත් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 53(3) වන ස්ථාවර නියෝගය යටතේ, ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.
*චෝදනාවක් ඉදිරිපත් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 53(3)ඉන්පසු

විෂය ධාරාව අපේ අධ්‍යාපන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා යටතේ තිබෙනවා. එතුමා මේ සම්බන්ධයෙන් ලොකු වගකීමක් ඉටු කර තිබෙනවා. එය තවත් ඉතා හොඳින් ඉටු කර ගැනීම තමයි මේ යෝජනාවෙන් අපි බලාපොරොත්තු වෙන්නේ. අපි දන්නවා, හැම වර්ෂයකම දරුවෝ 287,000ක් පමණ අපේ රටේ පළමුවන වසරට ඇතුළත් වන බව. මේ දරුවා පාසලට ඇතුළත් වෙන්න ඉස්සෙල්ලා යන්නේ පෙර පාසලට. පෙර පාසලෙන් තමයි මේ දරුවා පාසලකට යන්න සුදුසු දරුවෙක් බවට පරිවර්තනය වෙන්නේ.

පෙර පාසල් අද තිබෙන තත්ත්වයට වඩා උසස් කරන්න නම්, මේ ගුරුවරුන්ගේ අධ්‍යාපනය සැලකිල්ල ලක් කරලා දැනට ඉන්න අය කොහොමද මේ අධ්‍යාපන ක්‍රමයට ඇතුළත් කරගන්නේ, ඔවුන්ට නිසි වැටුපක් ලබා දෙන්නේ, ඔවුන්ට ඩිප්ලෝමාවක් කරන්න අවශ්‍යතාව ඇති කර දෙන්නේ? මේ සියල්ලම ලබා දීම වැදගත් කියලායි මම හිතන්නේ.

පළමුවන වසරට ඇතුළත් වෙලා, ඊට පස්සේ පහේ ශිෂ්‍යත්වය, අපොස සාමාන්‍ය පෙළ, අපොස උසස් පෙළ සහ අවසානයේ විශ්වවිද්‍යාල මට්ටම දක්වා ගිහිල්ලා අධ්‍යාපනය හදාරන දරුවෙකුගේ පළමුවැනි තැන පෙර පාසල කියන එක අපි දන්නවා. අපි දකින විධියට පෙර පාසල කියන්නේ, ගෙදරක් හදනවා නම් ඒ ගෙදර අත්තිවාරම. ශක්තිමත් අත්තිවාරමක් දැම්මොත් තමයි ඒක ශක්තිමත් ගෙයක් බවට පරිවර්තනය කරන්න පුළුවන් වෙන්නේ. අධ්‍යාපනයේ මේ අත්තිවාරම දමන තැන පෙර පාසල නම්, අපි අනිවාර්යෙන්ම පෙර පාසල් පද්ධතිය දියුණු කළ යුතු වෙනවා. ඒ නිසා මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. අපි හැමෝම රජය නියෝජනය කළත් මේක අපි කාටත් මහ හැරිච්ච තැනක්. රටේ අනාගත පරපුර කියන්නේ දරුවෝ. ඒ දරුවෝ වෙනුවෙන් මේ වගකීම අපි ඉටු කරන්න ඕනෑ.

අපි දන්නවා, රාජ්‍ය සේවකයෝ 16 ලක්ෂයක් අද අපේ රටේ ඉන්න බව. මේ 16 ලක්ෂයක් වූ රාජ්‍ය සේවකයන්ගෙන් ලොකු සේවයක් අපේ රටට සිද්ධ වෙනවා. හැබැයි, සමහර රාජ්‍ය ආයතන ගත්තාම, ඒ රාජ්‍ය ආයතනවල ඉන්න සංඛ්‍යාව වැඩියි. සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉන්න නිලධාරියාට වාඩි වෙන්න පුටුවක් නැහැ. ඒ තරමට රාජ්‍ය සේවයට පුරවලා. ඇත්ත වශයෙන්ම සේවයක් වෙන්නේ නැති ආයතන තිබෙනවා.

මේ 34,000ක් වන පෙර පාසල් ගුරුවරු ඇගැයීමක් කරලා, ඔවුන්ට නිසි වැටුපක් ලබා දෙන්න ඕනෑ. ඔවුන්ගේ රැකියාව රාජ්‍ය සේවයත් එක්ක බැඳුණු වැඩ පිළිවෙළක් බවට පත් කරන්න පුළුවන් නම් ඉතාම ඵලදායී කාරණාවක් ලෙසයි අපි ඒක දකින්නේ.

අද මේ රටේ හැම ක්ෂේත්‍රයකම ඉන්න අය කුඩා කල පෙර පාසල් අධ්‍යාපනය ලබා තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගෙන් සහ විෂය භාර ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගෙන් මා මේ ඉල්ලීම කරනවා. අධ්‍යාපන ඇමතිවරයා හැටියට මේ විෂය ධාරාව ගැන එතුමාට ඉතා හොඳ අවබෝධයක් තිබෙනවා. මම හිතනවා පිළිතුරු කථාවේදී එතුමා මේ ගැන පැහැදිලි කරයි කියලා. මගේ තර්කය, මම කියන්නේ, අනාගතයට ඔබින බුද්ධිමත් දරුවෙක් හදන වැඩ පිළිවෙළේදී එහි මූලික පුරුක ගැන අපි හිතලා තිබෙනවා මදි කියන එකයි. දරුවකුගේ දෙවන අම්මා වන පෙර පාසල් ගුරුවරිය රාජ්‍ය සේවය එක්ක අපි සම්බන්ධ කර ගන්නේ කොහොමද, ඒ වෙනුවෙන් අපි කළ යුත්තේ මොනවාද කියන කාරණා ගැන සාකච්ඡා කරලා, මේ රටේ ඉන්න 34,000ක් වන පෙර පාසල් ගුරුවරියන්ගේ සේවය ශක්තිමත් කළ යුතුයි. අද රුපියල් 5,000කින් කරන්න පුළුවන් මොකක්ද? අඩු ගණනේ ඒ අයට සාරියක්වත් ගන්න බැහැ. ඒ වාගේම ඒ අය විශ්‍රාම වැටුපකට කොහොමද දායක කර ගන්නේ කියලාත් සලකා බැලිය යුතුයි. අද ඉන්නවා වයස අවුරුදු 60 පසු කරලාත් තමන්ගේ යුතුකම හා වගකීම ඉටු කරන පෙර පාසල් ගුරු මහත්මීන්. ඉතින් මේ අය ගැන බැලිය යුතුයි. විශේෂයෙන් අනාගත දරු පරපුර ආරක්ෂා කර ගන්න නම්, හොඳ, මානව හිතවාදී, උගත්, බුද්ධිමත් දරුවෝ හදන්න නම් මූලික වශයෙන්ම පෙර පාසල ආරක්ෂා කර ගන්න කටයුතු කළ යුතුයි. ඒ වෙනුවෙන් කැප වන පෙර පාසල් ගුරුතුමියන්ලා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින්, මෙම යෝජනාව පිළිබඳව මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.45]

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා වැදගත් මෙන්ම කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මුලින්ම මම එතුමාට ස්තුතිවන්ත වනවා. මේ යෝජනාව පිළිබඳව ඉතා පැහැදිලිව එතුමා අදහස් ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම කිව්වොත්, අද වනකොට පෙර පාසල්, නැතහොත් පූර්ව ළමාවිය සංවර්ධනයෙ කියන ඒ කාරණාවට ලොකු අවධානයක් අපේ රටේ යොමු වෙලා තිබෙනවා. වර්තමානයේ පවතින ඉතා කාර්ය බහුලත්වය නිසා අපේ ජනතාව විශේෂයෙන්ම පෙර පාසලට දරුවන් යොමු කරන්න කටයුතු කරනවා. දෙමාපියන් රැකියාවට යෑමට ප්‍රථම කුඩා දරුවන් යොමු කරන ස්ථානය බවට අද පෙර පාසල පත් වෙලා තිබෙනවා. ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා වාගේ, දරුවාගේ දෙවැනි අම්මා බවට පත් වෙන්නේ පෙර පාසල් ගුරුවරිය. එම නිසා පෙර පාසල් ගුරු සේවය පිළිබඳව රජයේ අවධානය මීට වඩා යොමු කළ යුතුයි. දරුවන් වඩා හොඳින් සමාජගත කරන්න නම් පෙර පාසල් අධ්‍යාපනය අවශ්‍ය බව අපට පෙනෙනවා. ගෙදරක ඇති වන අඩු පාඩුත් නිවැරදි කරන්න පුළුවන් තැන තමයි පෙර පාසල. දෙමව්පියන්ගේ අතින් යම් අඩු පාඩුවක් වනවා නම්, දරුවා ජීවත් වන සමාජය තුළ යම් අඩු පාඩුවක් වනවා නම්, දරුවාගේ ඒ වැඩෙන මනසට -වැඩෙන මොළයට- නිවැරදි තොරතුරු ලැබෙන්නේ නැහැ. විශේෂයෙන්ම පූර්ව ළමා වියේදී ලබා ගන්නා තොරතුරු නිවැරදි විය යුතුයි. ඒ නිසා එම තොරතුරු නිවැරදි වෙන්න දරුවා මූලිකව යොමු කරන, දරුවා බලා ගන්න, දරුවා හදන ඒ ක්‍රියාවේ යෙදී සිටින පිරිස අපි මීට වඩා සවිබල ගන්වන්න ඕනෑ, ඒ අයට නව ලෝකයේ දැනුම ලබා දෙන්න ඕනෑ, යම්කිසි විෂය මාලාවක් සම්බන්ධ කරගෙන ඒ අය වෙනුවෙන් වැඩ පිළිවෙළක් කළ යුතු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන්නේ තව මිනිත්තු 2ක් පමණයි.

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)
මට තව ටිකක් කාලය දෙන්න.

එවැනි වැඩ පිළිවෙළ ලෝකයේ දියුණු රටවල ක්‍රියාත්මක වන බව අපි දකිනවා. විශේෂයෙන්ම අපේ අධ්‍යාපන බලධාරීන් හැම දාම සංචාරය කරන රටක් තමයි ෆින්ලන්තය. ෆින්ලන්තයේ තිබෙන අධ්‍යාපන ක්‍රමය ලංකාවටත් ගෙනෙන්න ඕනෑ වාගේ අදහසක් තිබෙනවා. එය කෙසේ වෙතත් ගරු ඇමතිතුමනි, අපේ ඉතිහාසයේ තිබුණු ඉතා විනයගරුක දරුවන් හදන ක්‍රියාන්විතයවත් යම්කිසි මට්ටමකට හෝ ස්ථාපනය කරන්න අපට සිදු වනවා.

මොකද, දරුවන් ඒ විධියට හදන්න බැරි වීමේ ප්‍රතිඵල අද අපට පෙනෙන්නට තිබෙනවා. අද පාසලට ඇතුළත් කරන දරුවා පාසලේ තිබෙන වැසිකිළියට යන්න දන්නේ නැහැ. වැසිකිළියට යන දරුවා එක්කෝ එහි තිබෙන දේවල් කඩා බිඳ දමනවා. පාසල්වල විතරක් නොවෙයි, විශ්වවිද්‍යාලවල පවා අද එවැනි දේවල් දකින්නට ලැබෙනවා. මූලිකම අවස්ථාවේදී, මූලිකම වටයේදී ළමයා හැදිය යුතු ස්ථානයේදී හරියාකාරව, නිවැරදිව, විනයගරුකව නොහැදීමේ වැරැද්ද නිසා අද සමස්ත සමාජයම විශාල අභියෝගයකට ලක් වෙලා තිබෙනවා.

හිටපු අමාත්‍ය ගරු රෝහිත අබේගුණවර්ධන මැතිතුමා අද සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාවේ සඳහන් කාරණා කඩිනමින් ඉටු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. ඉතාම කටුක විධියට, මහත් අභියෝග හමුවේ තමන්ගේ කාර්යය කරන පෙර පාසල් ගුරුවර ගුරුවරියන් -විශේෂයෙන් පෙර පාසල් ගුරුවරියන්- විශාල පිරිසක් මේ රටේ ඉන්නවා. ඒ අය තමන්ට ලැබිය යුතු වරප්‍රසාද, එහෙම නැත්නම් පහසුකම් ගැන හිතලා නොවෙයි කටයුතු කරන්නේ. සමහර පෙර පාසල් ගුරුවරියන් තමන්ගේ පෞද්ගලික ධනය, එහෙම නැත්නම් තමන්ගේ මුදල් යොදවා දරුවන් රැක බලා ගන්නවා. අප දන්නා එවැනි පෙර පාසල් තිබෙනවා.

ආර්ථිකය අපහසු දරුවන් විශාල ප්‍රමාණයක් පෙර පාසල්වලට එනවා. ඒ අය රැක බලා ගනිමින් විශාල මෙහෙයක් කරන පිරිසක් තමයි, පෙර පාසල් ගුරුවරියන්. ඒ නිසා ඒ අයගේ වෘත්තීය ගරුත්වය රැකෙන විධියට, ඒ අයට ඉතා ගෞරවනීය ලෙස තම සේවය ලබා දෙන්න පුළුවන් වන විධියට ඒ අයට අවශ්‍ය පහසුකම් ලබා දෙන වැඩ පිළිවෙළකට යා යුතුයි කියන එක තමයි මගේ අදහස. ගරු රෝහිත අබේගුණවර්ධන මැතිතුමා ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව යළිත් ස්ථිර කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.50]

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. ගරු රෝහිත අබේගුණවර්ධන මැතිතුමා ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගරු මධුර විතානගේ මැතිතුමා ස්ථිර කළා. මුලින්ම ඒ පිළිබඳව මම එතුමන්ලාට ස්තුතිය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා 41ක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ ගැන අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා දන්නවා. හැබැයි, මා කියවපු විධියට, මා අවබෝධ කර ගත්තු විධියට ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලවත් පූර්ව ළමා විය අධ්‍යාපනය ලබා දෙන ගුරු භූමිකාව පිළිබඳව නිසි අවධානයක් යොමු වෙලා නැහැ කියන කාරණය ගැන මම චෝදනා මුඛයෙන් කථා කරනවා.

පූර්ව ළමාවිය කියන එකත් එකී අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කාර්යාවලියට ඇතුළත් කර ගත යුතුය කියා මම විශ්වාස කරනවා. එහෙම කියන්න හේතුවක් තිබෙනවා. කලින් කථා කළ මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේම පූර්ව ළමාවියේදී තමයි ශිෂ්‍යයෙකුගේ, දරුවකුගේ පදනම පළමුවෙන්ම සකස් වෙන්නේ. ඇත්තටම සමාජානුයෝජන ක්‍රියාවලිය ශ්‍රී ලංකාව වැනි සමාජයක නිසි පරිදි සිදු නොවන බව තමයි ලෝකයේ බොහෝ රටවල් එක්ක බලන කොට අපට පෙනෙන්නට තිබෙන්නේ. ජපානයේ අවුරුදු දෙකහමාරක දරුවෙකු නිසියාකාරව ලබා දෙන පූර්ව ළමාවිය අධ්‍යාපනයට ඇතුළත් වනවා. ඉන් පසුව එම දරුවා නිසි පාසල් අධ්‍යාපනයට, විධිමත් අධ්‍යාපන ක්‍රමවේදයට යොමු වෙනවා. එම දරුවා නිවෙස තුළ, පසු කාලයක විශ්වවිද්‍යාලය තුළ, සමාජය තුළ, තමන්ගේ සේවා ස්ථානය තුළ සිටිය යුතු ආකාරය පිළිබඳ සමාජානුයෝජන ශක්තිය උකහා ගන්නේ කුඩාම අවධියේ පූර්ව ළමාවිය අධ්‍යාපනයේදී ලැබූ අත්දැකීම් එක්කයි. එහෙම නම්, අපේ රටෙත් පූර්ව ළමාවිය පිළිබඳ අධ්‍යාපන ප්‍රතිපත්තිය කෙරෙහි සේම එම අධ්‍යාපනය ලබා දෙන ගුරුවරයා කෙරෙහිත් අපගේ නිසි අවධානය යොමු වෙන්න ඕනෑ. රජය ඒ අයට කිසියම් දීමනාවක් ලබා දෙන එක ඇත්ත. නමුත්, කොවිඩ් වසංගතය කාලයේදී එම ගුරුවරුන් අනුපමේය මෙහෙයක් කළාය කියන එක අප හැම කෙනාම අවිවාදයෙන් පිළිගන්නා කාරණාවක්.

පෙර පාසල් දරුවන්ගේ අධ්‍යාපනය ගැන කියන කොට අපි හොඳින්ම දන්නවා, එම ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ළමයාට විවිධ ක්‍රම හරහා ලබා දෙන්නේ ළමා මනෝවිද්‍යාව කියන ඉතාම බැරෑරුම් විෂය බව. නමුත්, මෙය කෙතරම් විද්‍යාත්මක විධියට, පුළුල් විධියට රට තුළ ක්‍රියාත්මක වනවාද කියන එක ලොකු ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කථා කරන්නට ලැබෙන කාලය සීමිත නිසා පූර්ව ළමා විය අධ්‍යාපන විෂය ගැන කථා කරන මේ මොහොතේ මා තවත් කරුණු දෙකක් ඉදිරිපත් කරනවා. එකක්, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිසි අධීක්ෂණය නොමැති ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල category එකේ තිබෙන විද්‍යාල සම්බන්ධයෙන්. ඒවා පසුගිය කාලයේ සමාගම් පනත යටතේ ඇතුළත් කර තිබුණා. ඒවා එසේ ක්‍රියාත්මක වුණාට අපේ අධ්‍යාපන ඇමතිතුමා අවස්ථා ගණනාවකදී කිව්වා ඒවා සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිසි අවධානය යොමු කරනවා කියලා. ඒ නිසා අපි ඒ පිළිබඳවත් කෙටි පැහැදිලි කිරීමක් හෝ බලාපොරොත්තු වෙනවා.

ඒත් එක්කම මම ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා, ගරු අධ්‍යාපන ඇමතිතුමනි. මෙය, මධ්‍යම පළාතේ ලොකු ගුරු හිඟයක් පවතින වෙලාවක්. මේ ගැන ඔබතුමාට කියන්න අපට වෙනත් අවස්ථාවක් නැහැ. 5,217ක් වූ උපාධිධාරීන්ගෙන් 378 දෙනෙකු පමණයි බඳවා ගන්න පුළුවන් වුණේ. එසේ සීමාසහිත පිරිසක් බඳවා ගන්නට ඇත්තේ පවතින ආර්ථික තත්ත්වය නිසා වෙන්නට ඇති. අපි ඒ බව දන්නවා. හැබැයි, මෙබඳු දරුණු ගුරු හිඟයක් තිබෙන ප්‍රදේශයක බඳවා ගැනීම් මීට වඩා සාධාරණ ප්‍රමාණයකින් ඉහළ දැමිය යුතුයි. ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, අදාළ විභාගය සහ සම්මුඛ පරීක්ෂණ සමත් වූ බොහෝදෙනා කෙසේ වෙතත්, සැලකිය යුතු ප්‍රමාණයක්වත් බඳවා ගන්න කියන ඉල්ලීම මේ අතර වාරයේම මා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් ලැබෙනවා.

[පි.ප. 5.54]

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, காலத்துக்கு மிகவும் பொருத்தமானதொரு விடயத்தைச் சபை ஒத்திவைப்புப் பிரேரணையாகக் கொண்டுவந்திருக்கின்ற முன்னாள் அமைச்சர் கௌரவ ரோஹித்த அபேகுணவர்தன அவர்களுக்கு முதலில் என்னுடைய மனமார்ந்த நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

முன்பள்ளிகள் எதிர்நோக்குகின்ற பிரச்சினைகளும் முன் பள்ளி ஆசிரியர்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகளும் மிகவும் கவனத்துக்கு உட்படுத்தப்பட வேண்டும். "ஐந்தில் வளையாதது ஐம்பதில் வளையுமா?" என்று ஒரு பழமொழி இருக்கின்றது. அதுபோல், "இளமையில் கல்வி சிலையில் எழுத்து" என்றும் ஒரு பழமொழி இருக்கின்றது. சிறுவயதுப் பிள்ளைகள் வெள்ளைக் காகிதம் போன்றவர்கள். சிறுவயதுப் பிள்ளைகளால் வெள்ளைக் காகிதத்தில் மிக அழகான சித்திரங் களும் வரையப்படுகின்றன; கிறுக்கலான சித்திரங்களும் வரையப்படுகின்றன. அந்தப் பிள்ளைகளைச் சூழவுள்ள பெற்றோராலும் முன்பள்ளி ஆசிரியர்களாலும் அவர்கள் உருவாக்கப்படுகின்றார்கள். சிறு பிள்ளைகளை மிகவும் அழகான சித்திரங்களாக, எதிர்காலத்தில் பெரும் ஆளுமை களாக வளர்த்தெடுப்பதில் முதல் ஆசானாக இருப்பவர்கள் இந்த முன்பள்ளி ஆசிரியர்களே! எனவே, இந்த முன்பள்ளி ஆசிரியர்கள் தொடர்பில் மிகுந்த கவனம் தேவை.

இங்கு உரையாற்றிய கௌரவ உறுப்பினர் ஒருவர், Finlandஇலுள்ள education முறைமை பற்றிச் சொல்லியிருந் தார். அங்குள்ள கல்வி முறைமையானது, ஒரு modern முறைமை! அவ்வாறான முறைமை எமது நாட்டிலும் கொண்டுவரப்பட வேண்டும் என்ற எண்ணம் எல்லோரிடமும் இருக்கின்றது. Finland என்பது பரீட்சை மையக் கல்வி முறையைக்கொண்ட ஒரு நாடு அல்ல. அங்கு முன்பள்ளி என்ற அமைப்பே கிடையாது. எனவே, நாம் இந்த விடயத்தில் Finlandஐ உதாரணமாகக் கொள்ளமுடியாது. எமது தேசம் பரீட்சை மையக் கல்வி முறையைக் கொண்டதாக இருக்கின்றது. இங்கு முன்பள்ளியின் பணிகள் மிகவும் மகத்தானவையாக இருக்கின்றன. முன்பள்ளியில் கல்வி கற்கின்ற மாணவர்கள் பலரும், அங்கு பெறுகின்ற ஆரம்பக் கல்வியைக்கொண்டு சிறந்ததொரு நிலையை எய்துகிறார்கள். எனவே, ஆண்டாண்டு காலமாகப் பழக்கப்பட்ட இந்த முன்பள்ளி முறைமையை நாம் சரியானதொரு முறைமைக்குள் கொண்டுவர வேண்டும்.

முன்பள்ளி ஆசிரியர்களின் வேதனம் தொடர்பான பிரச்சினை தொடர்ந்தேர்ச்சியாகப் பேசப்பட்டு வருகின்றது. ஒவ்வொரு மாகாணத்திலும் வெவ்வேறு தொகையே முன்பள்ளி ஆசிரியர்களுக்கு அரசாங்கத்தால் கொடுக்கப் படுகின்றது. சிலருக்கு 3,000 ரூபாய் கொடுக்கப்படுகின்றது. இன்னும் சிலருக்கு 4,000 ரூபாய் கொடுக்கப்படுகின்றது. மேல் மாகாணம், ஊவா மாகாணங்களில் அதைவிட அதிகமான தொகை கொடுக்கப்படுகின்றது என்றே நான் நினைக்கின் றேன். சில முன்பள்ளிகள் வீடுகளில் நடத்தப்படுகின்றன. இன்னும் சில முன்பள்ளிகள் பாடசாலைகளில் நடத்தப்படு கின்றன. இப்படி ஒவ்வொருவரும் தங்களுடைய வசதிக்கு ஏற்ற விதத்தில் முன்பள்ளிகளை நடத்துகின்றார்கள். சிறார்களின் கல்விச் செயற்பாடு மிகச் சரியான முறையில் கொண்டு செல்லப்படுவதற்கு அவர்களுடைய பாடசாலை வகுப்பறைச் சூழல் மிகவும் முக்கியமானது.

கல்வித்துறையில் மேம்பட்ட நாடுகளை எடுத்துப் பார்த்தால், அங்கு சிறுவர்களுக்கு கல்வி புகட்டும் விடயத்தில் அவர்களுடைய சுகாதாரம், அவர்களுடைய பாடசாலைச் சூழல், ஆசிரியர்களின் தகைமை உள்ளிட்ட பல்வேறு விடயங்கள் கருத்திற்கொள்ளப்படுகின்றன. எனவே, இந்த முன்பள்ளி ஆசிரியர்களின் விடயத்தில் கவனத்தைச் செலுத்தி, அவர்களுக்கான வேதனத்தை அதிகரிக்கச் செய்து, அவர் களுக்கு மேலதிக வசதிகளையும் செய்து கொடுக்கும் வகையில் நல்லதொரு சட்டத்தை அரசாங்கம் நிறைவேற்ற வேண்டும் என்ற கோரிக்கையை விடுத்து, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.57]

ගරු මංජුලා දිසානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රෝහිත අබේගුණවර්ධන හිටපු අමාත්‍යතුමා සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙනවා. අද මේ ගැලරියේ සිටින පෙර පාසල් පාලිකාවන් සේම, රටේ ඉන්න සමස්ත පෙර පාසල් පාලිකාවන් කරන්නා වූ මහත් මෙහෙවර මා අගය කරනවා කාන්තාවක විධියට, අම්මා කෙනෙකු විධියට වාගේම ගුරුවරියක විධියට. මෙතෙක් කාලයක් කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ තිබුණු පෙර පාසල් විෂය -පූර්ව ළමා විය සංවර්ධනය- වර්තමානය වන විට අධ්‍යාපන අමාත්‍යාංශය යටතට ගෙනැල්ලා තිබෙනවා. මම හිතන විධියට අපි ගොඩක් අවස්ථාවල මේ කාරණය ගැන කථා කළා.

මේ විෂය අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂයයන් යටතට ගෙනැල්ලා කටයුතු කිරීම වැදගත්. මොකද, මව් කුසින් බිහි වෙච්ච දරුවා අම්මා, තාත්තා යටතේ හැදිලා ඊට පසුව නිවසින් එළියට යන්නේ පෙර පාසල් පාලිකාව ළඟට. ඒ පෙර පාසල් පාලිකාව ළඟට අඬ අඬා යන දරුවා නැවත පෙර පාසලෙන් එළියට යන්නේත් අඬ අඬා, ඒ අම්මා දාලා එන්න බැහැ කියලා. මම හිතන විධියට මේ ගැලරියේ සිටින පෙර පාසල් පාලිකා මහත්මීන් සියලුදෙනා ඒ අත්දැකීම විඳින අය. ඒ වාගේමයි මෙතෙක් වේලා කථා කරපු සියලුදෙනා කිව්වා වාගේම, මේ පෙර පාසල් අධ්‍යාපන ක්‍රමය දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් පළාත් සභාවට වෙන් වෙච්ච වැඩ විෂයයක් විධියට පළාත් සභා තුළ ක්‍රියාත්මක වනවා. ඒ සඳහා එක එක පළාත් සභා ඒ අයට අනන්‍ය වෙච්ච ක්‍රම සකස් කරගෙන තිබෙනවා. ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, අපි නිතර ඔබතුමා එක්ක සාකච්ඡා කරලා ඉල්ලා සිටියේ, මේ අධ්‍යාපනය එක වහලක් යටට ගේන්න වැඩ පිළිවෙළක් හදන්න කියන එක. ඔබතුමා අලුත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ මේ සඳහා වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙනවා. ඒකට අවශ්‍ය වැඩසටහනට අපි සියලුදෙනා පූර්ණ සහයෝගය දෙනවා.

මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, අපේ පෙර පාසල් පාලිකාවන් අන්කවිධ දුක්ඛ වේදනා විඳිනවාය කියන කාරණය. ඔවුන්ගේ මුළු ජීවිතයම කැප කරලා තිබෙන්නේ අපේ රටේ අනාගතය සකස් කරන්නයි. අපේ අනාගතය කියන්නේ අපේ මේ

[ගරු මංජුලා දිසානායක මහත්මිය]

දරුවෝ ටික. ඒ දරුවෝ විධිමත් අධ්‍යාපනය ලබන්න පාසල්වලට යනකොට ඒකට අවශ්‍ය වටපිටාව හදලා දෙන්නේ අපේ පෙර පාසල් පාලිකාවන්. නමුත් මේ වෙනතුරුම ඒ අයට නිසි වටිනාකමක් ලැබිලා නැහැ. ඒ වටිනාකම ලබා දෙන්නට අවශ්‍යයි. ඒ අය අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කරලා තිබෙනවා නම්, ඒ අයට රජය යටතේ වටිනාකමක් තිබෙන ආකාරයට, ඒ අයගේ ජීවන තත්ත්වය නහාසිටුවන්න පුළුවන් වෙන ආකාරයට ඒ අයට දීමනාවක් ලබා දීම නොවෙයි කළ යුත්තේ. ඒක වැටුපක් බවට පත් කරන්න අවශ්‍යයි. අපේ රටේ තිබෙන ග්‍රාම නිලධාරි වසම් 14000 ගණන ඇතුළත පෙර පාසල් පාලිකාවන් ඉන්නේ 35000ක් විතර. මේ පිරිසට සාධාරණයක් ඉටු කරන්නට අපේ ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට වාගේම වර්තමාන රජයට හැකියාව ශක්තිය ලැබෙන්න ඕනෑ, තිබෙන්න ඕනෑ, තිබෙනවා කියා මා විශ්වාස කරනවා. සුදුසු වෙලාවේ මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය ශක්තිය ලැබේවායි කියා කාන්තාවක් විධියට මම මේ අවස්ථාවේදී අපේ සමස්ත පෙර පාසල් පාලිකාවන් වෙනුවෙන් පෙනී සිටිමින් ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා. අපේ රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා, මේ කාලෝචිත යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.00]

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව ඉතා කාලීන, වැදගත් යෝජනාවක්. පූර්ව ළමා විය සංවර්ධනය කියන්නේ ඉතා sensitive කාරණයක්; පරිස්සමෙන් කටයුතු කරන්න ඕනෑ කාරණයක්. එය කරන්නේ අපේ ගුරු මෑණිවරු. පූර්ව ළමා විය සංවර්ධනය කියන්නේ දරුවෙකුගේ මොළයට වැටෙන foundation එක. ඒ foundation එක හරි පරිස්සමෙන් දමන්න ඕනෑ. ඒ foundation එක මත තමයි ඒ ළමයාගේ අනාගතය තීරණය වෙන්නේ. ගෙදරින් එළියට එන දරුවා අපි ඉස්සර වෙලාම යොමු කරන්නේ පෙර පාසලට. කොච්චර අමාරුද, ගෙදරත් එක්ක තිබෙන attachment එක කඩලා ගෙදරින් එළියට දරුවෙක් යොමු කරන්න? හැබැයි පෙර පාසල් ගුරුතුමිය හෝ පාලිකාව හරියට ඒ දේ කරලා, දරුවා තැනකට ගෙනෙන්න අවශ්‍ය කටයුතු සියල්ල සිදු කරනවා. ඒක කොච්චර අමාරු දෙයක්ද? ඒ දරුවන්ට කන්න බොන්න උගන්වනවා; washroom එකට යනකොට බලා ගන්නවා. මේවා කොච්චර අමාරුද? මේ විධියට දරුවන් 40ක්, 50ක් සමහර වෙලාවට බලා ගන්නවා; සමහර වෙලාවට දරුවන් 10ක්, 15ක් වෙන්නත් පුළුවන්. ඒක කොච්චර අමාරුද? අපට ගෙදරක චූටි දරුවෙක් බලා ගන්න කොච්චර අමාරුද? හැබැයි ඒ දේ හරියටම කරනවා, පෙර පාසල් ගුරුතුමිය. අපේ පෙර පාසල් ගුරුවරු සමහර වෙලාවට අවුරුදු 40-50 වැඩ කළ අය. අද ඔවුන් ඉතා බේදජනක තත්ත්වයක ඉන්නේ. ඒ අයට කිසිම හවිහරණක් නැහැ. සමහර අයට කර ගන්න දෙයක් නැහැ. කන්න බොන්නවත් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. පෙර පාසලෙන් ඉවත් වෙලා ඔවුන් ගෙදර නැවතුණාට පසුව, විශ්‍රාම ගියාට පසුව කිසිම කෙනෙක් ඔවුන් ගැන බලන්නේ නැහැ. ඔවුන්ට ආදායමක් නැහැ. මම දන්නවා, ලුණුගල ප්‍රදේශයේ පෙර පාසල් කිහිපයක්ම තිබෙනවා, රුපියල් 3,000කවත් ආදායමක් නැහැ. හරිම අමාරුවෙන් ඒවා කරගෙන යන්නේ. ඒ අයට ඒවා කර ගන්න බැහැ. ඒගොල්ලන්ට ජීවත් වෙන්න ක්‍රමයක් නැහැ. ඒගොල්ලන්ට ඒක කරගෙන යන්න ක්‍රමයක් නැහැ. හැබැයි දරුවන් වෙනුවෙන් කැප වෙලා ඔවුන් පුදුම කාර්යයක් කරනවා. ඒක මහා පුදුම දෙයක්; ඇත්තටම පුදුම දෙයක්.

ගරු අමාත්‍යතුමනි, මේ අය සඳහා කොහොම හරි pension scheme එකක් හදලා, රජයේ ක්‍රමවේදයකට අනුගත කරලා ඒ කටයුතු streamline කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම ක්ෂේත්‍රයට ඔරොත්තු නොදෙන ප්‍රමාණයක් ඩිප්ලෝමාධාරීන් දැන් බිහි වෙනවා. ඒකේ control එකක් නැහැ. ඒක හරි ප්‍රශ්නයක්. පෙර පාසල් ගුරු ඩිප්ලෝමා දෙනවා කියන ස්ථානත් තිබෙනවා. ඒවාත් control කරලා අපි මොකක් හරි නිසි ක්‍රමවේදයක් හදන්න ඕනෑ. Qualified නැති, ඩිප්ලෝමා දෙන ස්ථාන තිබෙනවා නම් ඒවාත් control එකකට යටත් කරලා අපි හරි ක්‍රමවේදයක් හදන්න ඕනෑ. මොකද, ළමයින්ට ප්‍රථම වතාවට ශක්තිය දෙන්නේ පෙර පාසල් ගුරුතුමිය. පෙර පාසල් ගුරුතුමිය දෙන ඒ ශක්තිය පුදුම දෙයක්. ඉතින්, ඒ අය සතුටෙන් තිබ්බොත්, ඒ අයට හරි පාරක් කියා දුන්නොත්, ඒ අය ශක්තිමත් කළොත්, රජයෙන් හරි ඒ අය බලා ගන්නවා නම් තමයි දරුවාට හරියාකාරයෙන් foundation එක දෙන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, අපේ රෝහිත අබේගුණවර්ධන මැතිතුමා ගෙනා යෝජනාවට අපි ශක්තිමත්ව පෙළ ගැහිලා, මේ සඳහා කෙසේ හෝ ක්‍රමවේදයක් හදලා, අපේ පෙර පාසල් ගුරු මෑණිවරු පියවරු රැක ගෙන ඉස්සරහට යමු. ඔවුන්ට ඒ ශක්තිය ලබා දීලා කටයුතු කරන්න පුළුවන් නම්, ඒක මේ රටේ අනාගතය භාර ගන්න ඉන්න දරුවන්ට ඒක ලොකු ආශීර්වාදයක් වෙනවා.

මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.04]

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාවේ මූලික හරය වන්නේ පූර්ව ළමා විය සංවර්ධනය දරුවෙකුගේ මූලික බුද්ධි වර්ධනයේ අඩිතාලම බැවින් ඒ සඳහා කැප වී කටයුතු කරන මේ රටේ 34,000ක් පමණ වන පූර්ව ළමා අවධි සංවර්ධන මධ්‍යස්ථානවල සේවය කරන පාලිකාවන්, සහායකයන් ඇතුළු සියලුදෙනාගේ සුබසිද්ධිය වෙනුවෙන් කටයුතු කර, ඒ තුළින් පූර්ව ළමා අවධි සංවර්ධනය විධිමත් කිරීම කියන කාරණාවයි. අපේ වසන්ත යාපාබණ්ඩාර මැතිතුමා කියපු කාරණය හරි; අපේ ප්‍රතිපත්ති රාමුවේ

- framework එකේ - යෝජනා 41හි මේ ගැන සඳහන් වෙලා තිබුණේ නැහැ. හැබැයි දැන් මාසයකට පමණ පෙර, අපේ මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය කිව්වා වාගේ ප්‍රාථමික අධ්‍යාපනය ගැසට් කළා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ. ප්‍රාථමික අධ්‍යාපනය යටතේ මේ කාරණයත් ආවරණය වෙනවා. යුනෙස්කෝ සංවිධානය තමයි අධ්‍යාපනය, විද්‍යාව සහ සංස්කෘතිය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිබෙන ප්‍රථම සංවිධානය. ඒකේ අධ්‍යාපනය කියන එක ඔය අවධි තුනටම අරගෙන තිබෙනවා. එතකොට පූර්ව ළමා අවධිය තමයි ප්‍රාථමික අවස්ථාව. ඊළඟට middle school එක. ඊළඟට high school එක. එතැනින් එහාට වෘත්තිය අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනය කියන මේ සෑම දේකටම නිර්වචනයක් තිබෙනවා. එතකොට අපේ අධ්‍යාපන සැලසුම් සකස් කිරීමේදී ජාත්‍යන්තරව තිබෙන ප්‍රමිතියට අනුගතව තමයි සකස් කළ යුත්තේ.

මෙතැනදී සමහරු කථා කළා, ෆින්ලන්තයේ අධ්‍යාපනය ගැන. අපේ රටේ ජනගහනය මිලියන 22.5යි. ෆින්ලන්තයේ ජනගහනය මිලියන එකහමාරයි-දෙකයි. ඒ රටේ සමස්ත ශිෂ්‍ය ජනගහනය ලක්ෂ දෙකහමාරයි-තුනයි. ෆින්ලන්තයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පටන් ගත්තේ 1972දී. නවවන ශ්‍රේණිය දක්වා විභාග නැහැ. විභාගවලින් නොවෙයි තක්සේරු කරන්නේ. පන්ති කාමරයේ තක්සේරුව ගුරුවරයා විසින් කරනවා. හැබැයි, ෆින්ලන්තයේ සමස්ත ජනතාවම පන්ති කාමරයේ ගුරුවරයාගේ තක්සේරුව ගැන විශ්වාසය තබනවා. අපේ රටේ නම් මොකද වෙන්නේ? දැන් අනුන්ගේ වැඩවලටත් අපේ ගුරුවරු ඇදලා ගන්නවා, ලෙඩ නිවාඩු දමන්න. මේ, අපේ රට. ඒ, ෆින්ලන්තය. ඒ නිසා ඒ ගැන අපට සංසන්දනයක් කරන්න බැහැ. මේවාත් අපි කියන්න එපායැ. හැබැයි, අපේ රටේ අධ්‍යාපනය තුළ අපි ක්‍රමානුකූලව ජාත්‍යන්තර ප්‍රමිති පවත්වා ගෙන ගියා. අදටත් අපේ රට තුළදී ප්‍රථම උපාධිය අරගෙන, කැප වෙලා කටයුතු කරන උපාධිධාරීන් පශ්චාත් උපාධියට, PhD එකට ලෝකයේ රටවලට ගිහිල්ලා ශිෂ්‍යත්ව දිනාගෙන ඒගොල්ලන්ගේ වැඩ කටයුතු කරනවා. හැබැයි, අපට අවශ්‍ය වෙන්නේ ඒක නොවෙයි. සමස්ත අධ්‍යාපනයම සකස් කරන්නයි අපට අවශ්‍ය.

පූර්ව ළමා අවධිය ගැන කථා කරද්දී මම මේ ගැනත් සඳහන් කළ යුතුයි. විශේෂයෙන්ම 1987 පළාත් සභා පනත ගෙනෙන අවස්ථාව වෙනකොට, දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ ප්‍රාථමික අධ්‍යාපනය පළාත සභාවලට බෙදුණු විෂයයක් විධියට පැවතුණා. හැබැයි, දැන් අධ්‍යාපන අමාත්‍යාංශය යටතට ප්‍රාථමික අධ්‍යාපනය ගැසට් කර තිබෙන නිසා ජාතික ප්‍රතිපත්තිය හදන්න අපට පුළුවන්. අපි කළේ ඒකයි. මුල් ළමාවිය සංවර්ධන ජාතික ලේකම් කාර්යාලයෙන් මට සටහනක් එවා තිබෙනවා. එක්තරා අවධියක දී එම කාර්යාලය හරහාත් මේ සම්බන්ධයෙන් යම් වැඩ කොටසක් සිදු වුණා. 1996දී මා බස්නාහිර පළාතේ මහ ඇමතිවරයා හැටියට කටයුතු කරනකොට, පූර්ව ළමාවිය ප්‍රඥප්තිය ගෙනාවේ මමයි. පළාත් නවයේම දැන් ඒ වාගේ ප්‍රඥප්ති නවයක් තිබෙනවා. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හෝ පෙර පාසල් පාලනය පිළිබඳව කටයුතු සිදු වන්නේ එම ප්‍රඥප්ති එක්ක.

මේ වෙලාවේ අපි අධ්‍යාපන වෙනසකට යනවා. ප්‍රතිසංස්කරණයෙන් එහාට - ඔබ්බට - යනවා. අධ්‍යාපනයේ transformation එකක්, සම්පූර්ණ පරිවර්තනීය වෙනසක් කරන්න අද අපට සිදුවෙලා තිබෙනවා. ඒ පරිවර්තනීය වෙනස කරනකොට, සාමාන්‍ය අධ්‍යාපනයට පූර්ව ළමාවිය සංවර්ධනය ගළපන්න ඕනෑ. නැත්නම් එතැන පරතරයක් ඇති වෙනවා. ඊළඟට, සාමාන්‍ය අධ්‍යාපනය අවසන් වෙනකොට, වෘත්තිය අධ්‍යාපනයට සහ උසස් අධ්‍යාපනයට ගළපන්න ඕනෑ. මේ සඳහා තමයි අපි කටයුතු කරගෙන යන්නේ. එය විශාල කාර්යභාරයක්. ඒ නිසා තමයි ප්‍රාථමික අධ්‍යාපනයත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතට ගැසට් කර තිබෙන්නේ. මේ සඳහා මූල්‍යමය දායකත්වය දැක්වීමට මේ වෙනකොට යුනිසෙෆ් එක ඉදිරිපත් වෙලා තිබෙනවා. මමත් ඒ වැඩ මුළු කිහිපයකට ගියා. ඒ අයගේ සමීක්ෂණය අනුව පසුගිය වර්ෂයේ අවුරුදු හතර සම්පූර්ණ දරුවන්ගෙන් සියයට 20ක් පෙර පාසල්වලට ඇතුළත් කර නැහැ. ඒකට ප්‍රධාන හේතුවක් වෙන්න පුළුවන් දරිද්‍රතාව, දුර වැඩිකම සහ දෙමව්පියන්ගේ නොදැනුවත්කම. ඒක වෙන්න පුළුවන්. හැබැයි, ප්‍රාථමික සෞඛ්‍යය පැත්ත ගත්තොත් පවුල් සෞඛ්‍ය සේවිකාව දන්නවා, තමන්ගේ වසමේ සිටින සෑම ගර්භිණී මවකගේම විස්තර. යම් කාන්තාවක් ගර්භිණී තත්ත්වයට පත් වුණු දවසේ ඉඳලා ඇයට දරුවා ඉපදුණාට පසුව එම දරුවාට වයස අවුරුදු පහ වෙනකම් සියලු තොරතුරු palmtop එකේ තිබෙනවා. ඒ අනුව මේ සමීක්ෂණය කරන්න හරි ලේසියි. සෞඛ්‍ය අමාත්‍යාංශයට බොහොම ලේසියෙන් ඒක කරන්න පුළුවන්. අනෙක් පැත්තෙන්, පසුගිය වර්ෂයේ පළමුවැනි ශ්‍රේණියට - Grade 1වලට - කර තිබෙන admissions ප්‍රමාණයත් අවධානයට ගන්න ඕනෑ. යාපාබණ්ඩාර මැතිතුමනි, එම ප්‍රමාණය 287,000යි. මීට අවුරුදු දහයකට කලින් 330,000යි. කෙනෙක් කියන්න පුළුවන්, ආර්ථික බංකොලොත්භාවය නිසා දෙමව්පියන් දරුවන් පාසල් යවන්නේ නැහැ කියලා. හැබැයි, හේතුව ඒක නොවෙයි. අද උපත් වේගය අඩු වෙලා තිබෙනවා. අපේ රටේ උපත් වේගය සියයට එකට උඩින් තිබුණා. නමුත් අද වෙනකොට උපත් වේගය සියයට එකෙන් පහළට ගිහින් තිබෙනවා. ජපානයේ මට්ටමට ගිහිල්ලා. මෙහෙම දිගටම වුණොත් 2050 වෙනකොට මේ රටේ අවුරුදු 50ට වැඩි ජනගහනය අවුරුදු 18-35 තරුණ ජනගහනය අභිභවා යනවා. අවුරුදු 50ට වැඩි වයස්ගත පිරිස සියයට 50කට වඩා වැඩි වෙනවා. එතකොට මොකද වෙන්නේ? අපට ශ්‍රමිකයෝ ඕනෑ වෙනවා. එතැනට තමයි මේ එමින් පවතින්නේ. අපි නොවෙයි මේකට වගකියන්න ඕනෑ. අපේ කාලයේ අපි වගකිව්වා, නේද? දැන් ඉන්න පරම්පරාව ඒක බලාගන්න ඕනෑ. ඒකට අපට කරන්න දෙයක් නැහැ. ඒකත් සැලකිල්ලට ගන්න. UNICEF එකේ වාර්තාවට අනුව දැන් සියයට 20ක් පෙර පාසල් යන්නේ නැත්නම්, ඒ පිළිබඳ කරුණු කිහිපයක් සඳහන් කරලා මම කැබිනට් පත්‍රිකාවක් දැම්මා. ඒ කැබිනට් පත්‍රිකාවෙන් කියලා තිබෙනවා, වයස අවුරුදු 4 සම්පූර්ණ වූ හැම දරුවෙකුම ලබන අවුරුද්දේ ජනවාරි ඉඳලා පෙර පාසල්ගත කරන්න ඕනෑ කියලා. ඒ සඳහා වන නිරීක්ෂණ අපි යවලා තිබෙනවා. ඒ නිසා තමයි අපි ඒ විෂයය ගැසට් කළේ.

ඊට සමගාමීව අපි පෙර පාසල් සඳහා එකම විෂය නිර්දේශය, එකම වැඩසටහන සකස් කරලා තිබෙනවා. අද පෙර පාසල් වර්ග 5ක් විතර තිබෙනවා. ඒ තමයි, ජාත්‍යන්තර පාසල්වලින් පවත්වාගෙන යන පෙර පාසල්, පෞද්ගලික පාසල් ආශ්‍රිතව තිබෙන පෙර පාසල්. St. Bridget's Convent එකේත් තිබෙනවා. ඒ වාගේ පෞද්ගලික පාසල්වලත් තිබෙනවා. ඒ වාගේම international schoolsවලත් තිබෙනවා. ඒ අනුව පෙර පාසල් වර්ග දෙකයි. ඊට අමතරව පළාත් පාලන ආයතනවලින් පවත්වාගෙන යන පෙර පාසල් තිබෙනවා. ඊළඟට වෙනත් ස්වේච්ඡා සංවිධානවලින් පවත්වාගෙන යන පෙර පාසල් සහ තනිව පවත්වාගෙන යන පෙර පාසල් තිබෙනවා. මෙම වර්ග පහ තුළ අද වන විට පාලිකාවන් සහ සහකාර පාලිකාවන් 34,000ක් පමණ ඉන්නවා. මේ රට තුළ පෙර පාසල් 19,000ක් පමණ තිබෙනවා. එතකොට, මේ පෙර පාසල් සියල්ල අපි එක රාමුවකට ගෙනෙන්න ඕනෑ. ඒ නිසා තමයි මේ වගකීම පවරලා තිබෙන්නේ. එම නිසා අපි UNICEF සංවිධානයත් එක්ක එකතුවෙලා මේ programme එක හැදුවා. මේ සඳහා පළාත් නවයම සම්බන්ධ කර ගත්තා. පළාත් නවයේම අධිකාරි සම්බන්ධ කර ගත්තා, primary directorsලා සම්බන්ධ කර ගත්තා, මනෝ විශේෂඥයන් සම්බන්ධ කර ගත්තා. ඒ ඔක්කෝම කට්ටිය එකතු කරගෙන මේ වන විට ඒ programme එක හදලා ඉවරයි. ඒක ජාතික අධ්‍යාපන ආයතනයේ

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ඊළඟ Academic Affairs Committee එකෙන් අනුමත කරන්න ඕනෑ. ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒ අය train කරන්න මනෝ විද්‍යාව ඇතුළු හැම දේ ගැනම දන්නා පිරිසක් අවශ්‍යයි තේ. එතැන ගුරු අධ්‍යාපනඥ සේවයේ අය ඉන්නවා, ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂකවරු ඉන්නවා. ඒ ගොල්ලෝ හරහා අපි trainersලා ජාතික අධ්‍යාපන ආයතනය තුළදී train කරලා, සියලු පෙර පාසල් පාලිකාවන් ඊළඟ මාස තුන හතර ඇතුළත පුහුණු සැසියකට කැඳවනවා. සති අන්තවල හෝ පහසු දිනවල කලාප මට්ටමින් තමයි එම පුහුණු සැසි පවත්වන්නේ. එතකොට දුර ඉන්න අය මෙහාට එන්න ඕනෑ නැහැ. කොළඹ ඉන්න අයට කොළඹ කලාපය තුළ පවත්වනවා. තව අවශ්‍ය නම් ඒවා කෑගල්ල මට්ටමට කුඩාකර ගන්නත් පුළුවන්. ඉස්සෙල්ලාම trainersලා train කරනවා. එම trainersලා මාර්ගයෙන් පාලිකාවන් පුහුණු කරනවා. ඊට සමගාමීව අපි සහතික පත්‍ර පාඨමාලාවක් - certificate course එකක් - හදනවා. ඒ සඳහා වන basic qualification එක ලොකු ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. දැන් සිටින ඕනෑම කෙනෙකුට ඒකට සම්බන්ධ වෙන්න පුළුවන්. අ.පොෂ. සාමාන්‍ය පෙළ සමත්ද, අ.පොෂ. උසස් පෙළ සමත්ද කියන එක ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඒ certificate course එකෙන් පස්සේ ඒ ගොල්ලන්ට diploma course එකට යන්න පුළුවන්. Diploma course එකෙන් පස්සේ degree එකට යන්නත් පුළුවන්. දිස්ත්‍රික්ක 25 තුළ අපේ විවෘත විශ්වවිද්‍යාල ශාඛා 26ක් තිබෙනවා. ඒවා හරහා ඩිප්ලෝමා එකක් දෙන්නත් පුළුවන්, උපාධිය දෙන්නත් පුළුවන්. දැනට ඒ අයට ලබා දෙන්නේ රුපියල් 2,500ක දීමනාවක්. ඒකේත් සීමාවක් තිබුණා. එක දරුවෙකුගෙන් අය කරන ගණන රුපියල් 2,500ට වඩා වැඩි වුණොත් දීමනාව දෙන්නේ නැහැ. ඒ වාගේ සීමාවක් තිබෙනවා. නමුත් මට ඒක හරියටම මතක නැහැ. ළමා ලේකම් කාර්යාලයයි, පළාත් සභා ටිකයි තමයි ඒක දන්නේ. එම දීමනාව වැඩි කරන්න කියලා අපි කිව්වා. ගිය මාසයේ එම දීමනාව වැඩි කළා. එතකොට, රුපියල් 5,000 දක්වා වැඩි කරපු දීමනාව වැඩි දෙනෙකුට ලබා දෙන්න පුළුවන්. ගරු අනුප පස්කුවල් මැතිතුමා රාජ්‍ය අමාත්‍ය ධුරය දරන සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය හරහා තමයි ඒක ලබා දෙන්නේ. දැන් ඒක ලබා දෙන්න කටයුතු කරගෙන යනවා. ඒක දීමනාවක් විතරයි. නමුත් ඒකෙන් යැපෙන්න බැහැ.

ඊළඟට, පෙර පාසල්වලට අවශ්‍ය වන්නා වූ සම්පත් තිබෙනවා. ඒවාට අවශ්‍ය වන්නා වූ උපකරණ සහ විවිධ මෙවලම් තිබෙනවා. එක එක කාලවල අපේ මන්ත්‍රීවරුන් විසිනුත් විමධ්‍යගත අරමුදල්වලින් ඒවා ලබා දෙනවා. නමුත් ඒක ප්‍රමාණවත් නැහැ. හැමෝටම එක විධියට ලැබෙන්න ඕනෑ. ඒ වාගේම මේවා තුළ එකම වැඩසටහනක් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. එහෙම නැති වුණොත් වෙන්නේ මොකක්ද? එක පෙර පාසලක එකේ ඉඳලා දහය දක්වා උගන්වනවා. තවත් පෙර පාසලක එකේ ඉඳලා සියය දක්වා උගන්වනවා. එතකොට දෙමව්පියෝ මොකක්ද කරන්නේ? එතැන උගන්වන්නේ නැහැ කියලා ළමයා එකේ ඉඳලා සියය දක්වා උගන්වන පෙර පාසලට ඇදගෙන යනවා. මේ ක්‍රමය අනුව ඒක කරන්න බැහැ. එකම වැඩසටහන තමයි හැම තැනම ක්‍රියාත්මක වෙන්නේ.

කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ජපානය ගැන කිව්වා. ජපානය ගත්තොත්, ජපානයේ පෙර පාසල් ළමයින් වාහනයෙන් එක්ක යන්න බැහැ. ජපානයේ ළමයින් පෙර පාසලට එක්කගෙන යන්න ඕනෑ පයින්. එතකොට, කොච්චර දුර පයින් යන්න පුළුවන්ද? කිලෝමීටර ගණනක් යන්න නැහැ. කිලෝමීටරයක්, හමාරක් ඇතුළත පෙර පාසලක් තිබෙනවා. එතකොට දරුවෝ කොහොමද යන්නේ? දරුවන් කණ්ඩායම එකට එකතුවෙලා කුඹි රැළ වාගේ පාර අයිනෙන් යනවා. දෙමව්පියෝ හන්දියක් ගානේ ඉන්නවා, හරියට පාර පෙන්වලා දෙන්න. ඒ ළමයි පාර දිගේ ඇවිදගෙන යන්නේ. පාරේ ගමන් කරන පැත්ත දන්නවා, ආචාර කරන හැටි දන්නවා, එක්කෙනා පස්සේ එක්කෙනා යන හැටි දන්නවා. ඒ විධියට අවුරුදු දෙකහමාරේ, තුනේ දරුවන් පෙර පාසලට ගිහිල්ලා එනවා. පෙර පාසලට ගියාම මොනවාද උගන්වන්නේ? අකුරු උගන්වනවාද? නැහැ. ලියන්න උගන්වනවාද? නැහැ. එහෙනම් මොනවාද උගන්වන්නේ? ඉස්සෙල්ලාම උගන්වන්නේ සිරිත් විරිත්. ඊළඟට වටිනාකම්, values. ඒක තමයි ජපානයේ මිනිස්සු දකින දකින තැන නැවෙන්නේ. අපි හිතනවා, ඒ අපට තිබෙන භයට කියලා. එහෙම දෙයක් නොවෙයි. ඒ ඔවුන් ආචාර කරන විධිය.

ජපානයේ ටෝකියෝවලට කිලෝමීටර 20ක් විතර ඇතින් තිබෙන ඩිස්නිලන්තයට මම ඉරිදා දවසක ගියා. දරුවෝ ලක්ෂ පහකට වඩා එතැනට එනවා. එක තැනක් නරඹන්න විනාඩි 45ක්, පැයක් විතර යනවා. ඒ යන පෝලිම ගැරඬියා ගියා වාගේ කැරකි-කැරකී යනවා. හැබැයි, එක ළමයෙක්වත් ඒ පෝලිම පනින්නේ නැහැ. ටොපියක් කෑවත් ඒ කොළය එළියට විසි කරන්නේත් නැහැ. ඒ වෙලාවේ dustbin එකක් ළඟ නැත්නම් ටොපි කොළය සාක්කුවේ දමාගෙන dustbin එකක් තිබෙන තැනකදී ඒක දමනවා. අපේ දරුවන්ගේ හැසිරීම කොහොමද? වෙනස් නේ. ඒ විධියට තමයි වටිනාකම් හදලා තිබෙන්නේ. අපේ දරුවන් කොහොමද පෙර පාසලට එන්නේ? යමක් කමක් තිබෙන අය දරුවා කෙළින්ම කාර් එකේ සීට් එකේ වාඩි කරවනවා. ලේන්සුවත් ඇඳුමේ ගහලා දෙමව්පියන්ම බෑග් එකයි, වතුර බෝතලයයි, කෑම පෙට්ටියයි අරගෙන ගිහිල්ලා දරුවා පෙර පාසලට ඇරලනවා. මම උදේට එනකොට එවැනි සිදුවීම් දැකලා තිබෙනවා. ගේට්ටුවේ ඉඳලා පෙර පාසලට අඩි 10යි තිබෙන්නේ. හැබැයි, ඒ දුරත් දරුවා උස්සාගෙන ගිහිල්ලා පුටුවෙන් වාඩි කරවනවා. එතකොට ඒ ළමයාට ඇවිදින්නත් නැහැ, දුවන්නත් නැහැ, නටන්නත් නැහැ. වැටෙන්න ගියොත් ඒකටත් ඉඩ දෙන්නේ නැහැ. ඒක තමයි වෙලා තිබෙන්නේ. ස්වාභාවික පරිසරයෙන් ඈත් කරලා කෘත්‍රිම සත්වයෙක් බවට පත් කරලා. ඉතින්, මනස වර්ධනය වෙන්නේ කොහොමද? මනසේ වැඩිම වර්ධන වේගය තිබෙන්නේ අවුරුදු 3යි, 5යි අතර කාලයේ. එතැන පරිසරයෙන් ඉගෙන ගන්නා දෙයින් තමයි දරුවාගේ මුළු ජීවිතයම හැඩ ගැහෙන්නේ. මම ඇහුම්කන් දුන්නා, මනෝ විශේෂඥයන්ගේ දේශන කිහිපයකට. ඒක වෛද්‍ය විද්‍යාත්මකව තාක්ෂණික වශයෙනුත් පෙන්වනවා. මේ කිසිම අවස්ථාවක් අපේ රටේ සමහර දරුවන්ට ලැබෙන්නේ නැහැ. මේ රටවල් අතර වෙනස සංස්කෘතියත් එක්ක බද්ධ වෙලා තිබෙනවා. එම නිසා ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව, UNICEF එකේ ආධාර ඇතිව, තාක්ෂණික සහයෝගයත් එක්ක මේ ඔක්කෝටම හැඩ ගැහෙන ආකාරයට තමයි මේ වැඩසටහන අපි හදලා තිබෙන්නේ. එම නිසා තමයි අපි පාලිකාවන් පුහුණු කරන්නේ. ඒකට අය කිරීමක් නැහැ. දැන් අපි ඉන්නේ ජූලි මාසයේ. සැප්තැම්බර් මාසය වෙනකොට අපි මුළු රටේම ඒ පුහුණුව පටන්ගෙන සහතිකයකුත් ලබා දෙනවා. ඊට පස්සේ ඒ අයට අවශ්‍ය නම් ඉන් එහාට යන්න පුළුවන්. හැබැයි, අපි නිශ්චිත දිනයක් ලබා දෙනවා. ඒක අවුරුදු 3ක් වාගේ යම්කිසි කාලයක් වෙන්න පුළුවන්. ඒ කාලයේදී අඩු තරමින් certificate course එකක්වත් කරලා තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේ programme එක කරන්න බැහැ. ඒක දැන් ඉන්න ඕනෑම කෙනෙකුට කරන්න පුළුවන්. අලුතින් එන අයටත් කරන්න පුළුවන්.

ඊළඟට කිව්වා, දරුවන්ගෙන් සියයට 20ක් පාසල් යන්නේ නැහැ කියලා. දැන් අපි ඒකටත් ක්‍රමයක් හැදුවා. අලුතින් ගොඩනැඟිලි හදලා ඒක කරන්න වෙලාවක් නැහැ. හැබැයි, අපේ රටේ තිබෙන පාසල් 10,026න් ළමයි 100කට වඩා අඩුවෙන් ඉන්න පාසල් 5,000ක් තිබෙනවා. ඒවායේ වැසීගෙන යන ගොඩනැඟිලි ඕනෑ තරම් තිබෙනවා. අපි පන්ති කාමරයක් repair කරලා දෙනවා. පළාත් සභාවලට දැනටත් අපි එවැනි ගොඩනැඟිලි දීලා තිබෙනවා. ඒ අනුව අපි නියමු ව්‍යාපෘතිය ආරම්භ කරලා

තිබෙනවා. ඒකේ අපේ ගුරුවරු උගන්වන්නේ නැහැ. එහෙම නැත්නම් ඉන්න අයටම එවැනි තැනක ඉඩ දෙනවා. අලුතින් එන අයට වුණත් අපි එවැනි තැනක් දෙනවා. ඒ දුර ළමයින්ට දෙමව්පියන් එක්ක පයින් යන්න පුළුවන්. වැහෙන්නේ ගමේ පාසල් නේ. අපි ඒ සම්පත හදලා දෙනවා. ඔන්න ගොඩනැඟිල්ල තිබෙනවා, ඔන්න සෙල්ලම් මිදුල තිබෙනවා, වටේට ලොකු ළමයිනුත් ඉන්නවා. උදේ පැය 4 දරුවන් තබාගෙන වැඩ කරන්න. එතැන අපේ ගුරුවරු උගන්වන්නේ නැහැ. අපේ ගුරුවරු ඉන්නේ පෙර පාසල් ළමයින්ට උගන්වන්න නොවෙයි. ඒ ගොල්ලන්ගෙන් යමක් ඇහුවොත් කියලා දෙයි. හැබැයි, පාලිකාවන්ට තමයි ඒ කටයුත්ත භාර දෙන්නේ. එතකොට තැනකට කුලී ගෙවන්න ඕනෑත් නැහැ, වෙන මොනවත් ඕනෑ වෙන්නේත් නැහැ. ඔවුන්ට තිබෙන්නේ ඒ දෙමව්පියන්ගෙන් ගාස්තුවක් අය කරනවා නම් ඒක අය කරගෙන, ලබා දෙන පරිශ්‍රය භාවිත කරලා ඒ කටයුත්ත කරන්න.

ඊළඟ ප්‍රශ්නය, මේ අය හඳුනා ගන්නේ කොහොමද කියන එක. ඒකටත් අපි චක්‍රලේඛයක් නිකුත් කරනවා, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හරහා. ගම් මට්ටමින් නිලධාරීන් 6දෙනෙක් ඉන්නවා. ග්‍රාම නිලධාරි ඉන්නවා, midwife ඉන්නවා, සංවර්ධන නිලධාරීන් ඉන්නවා. මේ නිලධාරීන්ට midwivesලා මාර්ගයෙන් වයස අවුරුදු 4 සම්පූර්ණ වෙන දරුවන් කවුද කියලා බලාගන්න පුළුවන්. එතැන ඉන්න පුළුවන්, මන්ද මානසික දරුවන්. Autistic දරුවන් ඉන්න පුළුවන්. Mentally retarded දරුවන් ඉන්න පුළුවන්. කන් ඇහෙන්නේ නැති, ඇස් පෙන්නේ නැති දරුවන් ඉන්න පුළුවන්. ඒක දන්නේත් නැහැ, ගම්වල ඉන්න දෙමව්පියන්. එතකොට ඒකත් හඳුනා ගන්න පුළුවන්. එතකොට පෙර පාසල් ගුරුවරුන්ට ඒවා හඳුනා ගන්නත් අපි පුහුණුවක් ලබා දෙනවා. ළමයා අවුරුදු තුනෙන් පෙර පාසලට දමනවා. අර රෝග ලක්ෂණ තිබෙනවාද කියලාවත් දෙමව්පියෝ දන්නේ නැහැ. ඒක හොයා ගන්නේ පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් කරනකොට. එතකොට කල් ගිහින් වැඩියි. අද ඕස්ට්‍රේලියාවේ කන් ඇහෙන්නේ නැති එක ළමයෙක්වත් නැහැ. මොකක්ද ඒකට කරලා තිබෙන්නේ? අවුරුදු 12කට කලින් හොයා ගත්තා, cochlear implant එක. ලංකාවේ නම්, එක කනකට ඒක කරන්න රුපියල් ලක්ෂ 25ක් යනවා. හැබැයි, ඒ ගොල්ලන් මුළු රටේම සිටින උපතින්ම බිහිරි ළමයින්ට cochlear implants කරනවා. එතකොට ඒ දරුවන් අවුරුදු පහක් වෙනකොට සාමාන්‍ය ළමයෙකුගේ තත්ත්වයට පත්වනවා. අපේ රටේත් දැනට cochlear implants 1,000ක් කරලා තිබෙනවා. මාස තුනකට කලින් මම එතැනට ගියා. ඒ නිසා ඒ වැඩ පිළිවෙළටත් අපට යන්න පුළුවන්. ඒ දරුවන් හඳුනාගැනීම කරන්න පුළුවන් විශේෂඥයෙකු වෙත යොමු කරලා ඒකට අවශ්‍ය පුහුණුවත් අපි ලබා දෙනවා. MOH මාර්ගයෙන් ඒ ටික කරන්නත් පුළුවන්. ඒ වාගේ විශාල කාර්යභාරයක් මෙතැනට ගන්න පුළුවන්. අපි මෙන්න මේ මට්ටමින් පෙර පාසල් පද්ධතිය තුළ මානව සම්පත සකස් කරන්න ඕනෑ. ඊට අවශ්‍ය වැඩසටහන අපි හදලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න ඕනෑ. ඒ අය පුහුණු කරන්න ඕනෑ. එතකොට තමන් යටතේ ඉන්න දරුවන් සංඛ්‍යාව මෙතැනට ගෙන යෑමේ මූලික වගකීම ඔවුන්ට ප්‍රීතිමත්ව ඉටු කරන්න පුළුවන්. ඒක හරියට match වෙන්න ඕනෑ, අපේ Grade 1වලට. මොකද, අවුරුදු හතරේදී මේ ළමයි ටික හරියට හදලා මෙතැනට ගෙනෙන්න ඕනෑ. නැත්නම් Grade 1 සඳහා ළමයි 40ක් ගන්නකොට පෙර පාසල් පහකින් එක එක වර්ගයේ ළමයි තමයි ඇවිල්ලා තිබෙන්නේ. උදාහරණයක් ගත්තොත්, ඒ එක දරුවෙකුට 1 සිට 10 දක්වා ගණන් කරන්න පුළුවන්. අනික් කෙනාට 100 දක්වා පුළුවන්. තව කෙනෙකුට මොකුත්ම බැහැ. තවත් කෙනෙකුට යම් ඌනතාවක් තිබෙන නිසා මොකුත් දන්නේ නැහැ. එහෙම වුණොත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සාර්ථක කරන්න බැහැ. 01 ශ්‍රේණියෙන් පටන් ගන්නා අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල pilot project එක දැන් පාසල් ගණනාවක ක්‍රියාත්මක වෙනවා. එතැන තිබෙන්නේ මොඩියුල. මොඩියුල මාර්ගයෙන් තමයි මේක කරන්නේ. හැම මොඩියුලයක් අවසානයේම තක්සේරුවක් තිබෙනවා. ඉස්සරහට primary education සඳහා term tests නැහැ. ඒ, මෙම ක්‍රමය පටන් ගන්නකොට. වර්ෂය අවසානයේ තක්සේරුවක් තිබෙනවා. හැබැයි, පාඩමෙන් පාඩමටත් තක්සේරුවක් තිබෙනවා. යම් පාඩමක් ධාරණය කරගන්න බැරි වුණා නම් ඒ පාඩම අවසානයේදීම ගුරුවරයාට දැනගන්න පුළුවන් මේ ළමයා මේක ධාරණය කර ගත්තාද, නැද්ද කියලා. අවුරුද්දකට පසුව ඒක කියනකොට පහුවෙලා වැඩියි නේ. මේ ක්‍රමය අපි පටන් අරගෙන ඉස්සරහට යනවා. 06 ශ්‍රේණියෙන් ඉස්සරහටත් ඒක යනවා. සාමාන්‍ය පෙළ, උසස් පෙළ පිළිබඳව ඉන් එහාට තීන්දු කරාවි. ඒකට තව කල් තිබෙනවා.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට ගැළපෙන ආකාරයට තමයි අපි පූර්ව ළමා අවධිය සූදානම් කරන්නේ. මේ සඳහා වෛද්‍යවරුන්ගේ, වෛද්‍ය විශේෂඥයන්ගේ, අධ්‍යාපනඥයන්ගේ අදහස් අරගෙන තිබෙනවා. සමාජයේ අදහස් අරගෙන තිබෙනවා. ඒ අනුව මේ කටයුත්ත කරනවා. ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කියපු ආකාරයට එතකොට ඔබතුමන්ලාගේ වගකීම තවත් වැඩිවෙයි. ඔබලාගේ පුහුණුව හොඳට ලබා දෙන්නම්; සහතික ලබා දෙන්නම්. අර දීමනා ටික ලබා දීම සහතිකයටයි, ඩිප්ලෝමාවටයි, උපාධියටයි ගැට ගහන්න අපි බලාපොරොත්තු වෙනවා. එතකොට හරි නේ. සුදුසුකම් ලබා ගන්න විධියට අපට ඒ දේවලුත් වැඩිකරගෙන යන්න පුළුවන්. යම් නිශ්චිත දවසකදී ඔක්කෝටම එක මට්ටමකට එන්න පුළුවන්. ඒක තව අවුරුද්දකින් කරන්න බැරි වෙයි. අවුරුදු පහක්, දහයක් යයි. ප්‍රශ්නයක් නැහැ. ආරම්භයක් අවශ්‍ය වන්නේ නිවැරැදි තැනකින් නිවැරැදි දිශාවට යන්නයි. ඊට පසු අවශ්‍ය වෙනස්කම් කරගෙන ඉස්සරහට යයි. ක්‍රියාකාරකම් පදනම් කරගත් පූර්ව ළමා අවධි සංවර්ධනයක් ඇති කිරීම අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ අරමුණ හැටියට අරගෙන, ගැළපෙන ආකාරයට ඒක ඉදිරියට ගෙන යෑමයි අපේ බලාපොරොත්තුව වෙන්නේ. ඒ නිසා මේ අයගේ සේවය අගය කරමින්, නව ප්‍රතිසංස්කරණවලට ගැළපෙන ආකාරයට ඔබගේ මානව සම්පත සකස් කරමින්, ඒකට මූල්‍යමය සහයෝගයත් ලබා දෙමින්, භෞතික සම්පත් ලබා දීමේ වැඩ පිළිවෙළකටත් යමින්, මේ කටයුත්ත කිරීමට දැනට කටයුතු කරගෙන යනවා කියන කාරණය සඳහන් කරමින්, ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට සම්බන්ධ මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

එකල්හි වේලාව අ. භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 6.23ට, 2024 ජූලි 10 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 6.23க்கு, பாராளுமன்றம் 2024 யூலை 10, புதன்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.23 p.m. until 9.30 a.m. on Wednesday, 10th July, 2024.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

313 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 313 - இல. 10
Volume 313 - No. 10

2024 ජූලි 10වන බදාදා
2024 யூலை 10, புதன்கிழமை
Wednesday,10th July, 2024

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2024 ජූලි 10වන බදාදා
2024 யூலை 10, புதன்கிழமை
Wednesday,10th July, 2024

අන්තර්ගත ප්‍රධාන කරුණු

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [තිරුව 1788]

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තිරුව 1790]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තිරු 1792-1818]

2015-2019 කාලය තුළ ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘති:
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තිරුව 1819]

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී [තිරුව 1824]

රජය විසින් ප්‍රකාශයට පත් කළ මූල්‍ය බංකොලොත්භාවයට හේතු පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව:
කාලය දීර්ඝ කිරීම [තිරුව 1825]

ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ සිදු වූ නිව් ඩයමන්ඩ් සහ එක්ස්ප්‍රස් පර්ල් යන නෞකා අනතුරු පිළිබඳව කරුණු සොයාබලා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන විශේෂ කාරක සභාව:
කාලය දීර්ඝ කිරීම [තිරුව 1826]

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) - [ගරු සමන්ප්‍රිය හේරත් මහතා] - පළමුවන වර කියවන ලදී [තිරුව 1826]

සුරාබදු ආඥාපනත:
නිවේදන [තිරු 1827-1939]

ආනයන හා අපනයන (පාලන) පනත:
රෙගුලාසි [තිරුව 1939]

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත:
නියමය [තිරුව 1940]

අත්‍යවශ්‍ය මහජන සේවා පනත:
යෝජනා සම්මතය [තිරුව 1940]

කල් තැබීමේ ප්‍රශ්න [තිරු 1941-1952]

பிரதான உள்ளடக்கம்

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 1788]

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 1790]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1792-1818]

2015-2019 காலப்பகுதியில் நடைமுறைப்படுத்தப்பட்ட வீடமைப்புக் கருத்திட்டங்கள்:
நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரினது கூற்று [ப: 1819]

குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1824]

அரசாங்கத்தினால் பிரகடனப்படுத்தப்பட்ட நிதி வங்குரோத்து நிலைக்கான காரணங்களை ஆராய்ந்து பாராளுமன்றத்திற்கு அறிக்கையிடுவதற்கும் அது தொடர்பில் தமது முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு:
கால நீடிப்பு [ப: 1825]

இலங்கைக் கடற்பரப்பில் நிகழ்ந்த நியூ டயமன்ட் மற்றும் எக்ஸ்பிரஸ் பேர்ள் ஆகிய கப்பல்களின் விபத்துக்கள் தொடர்பாக ஆராய்ந்து தேவையான விதப்புரைகளைச் சமர்ப்பிப்பதற்கான தெரிகுழு:
கால நீடிப்பு [ப: 1826]

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
சிறுவர்களுக்கான மஹாவிலச்சிய கல்வி நிலையம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு சமன்பிரிய ஹேரத்] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1826]

மதுவரிக் கட்டளைச் சட்டம்:
அறிவித்தல்கள் [ப: 1827-1939]

இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டம்:
ஒழுங்குவிதிகள் [ப: 1939]

செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டம்:
கட்டளை [ப: 1940]

அத்தியாவசிய பொதுமக்கள் சேவைச் சட்டம்:
தீர்மானம் [ப: 1940]

ஒத்திவைப்பு வினாக்கள் [ப: 1941-1952]

PRINCIPAL CONTENTS

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1788]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1790]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1792-1818]

HOUSING PROJECTS IMPLEMENTED DURING 2015-2019:
Statement by Minister of Urban Development and Housing [Col. 1819]

CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL:
Read the First time [Col. 1824]

SELECT COMMITTEE TO INVESTIGATE CAUSES FOR FINANCIAL BANKRUPTCY DECLARED BY THE GOVERNMENT AND TO REPORT TO PARLIAMENT AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THIS REGARD:
Extension of Time [Col. 1825]

SELECT COMMITTEE TO INVESTIGATE INTO AND TO MAKE SUITABLE RECOMMENDATIONS RELATING TO THE DISASTERS CAUSED BY NEW DIAMOND AND X-PRESS PEARL VESSELS IN THE MARITIME ZONE OF SRI LANKA:
Extension of Time [Col. 1826]

PRIVATE MEMBERS' BILLS:
Mahawilachchiya Education Centre for Children (Incorporation) – [The Hon. Samanpriya Herath] – Read the First time [Col. 1826]

EXCISE ORDINANCE:
Notifications [Col. 1827-1939]

IMPORTS AND EXPORTS (CONTROL) ACT:
Regulations [Col. 1939]

STRATEGIC DEVELOPMENT PROJECTS ACT:
Order [Col. 1940]

ESSENTIAL PUBLIC SERVICES ACT:
Resolution [Col. 1940]

ADJOURNMENT QUESTIONS [Cols. 1941-1952]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2024 ජූලි 10වන බදාදා
2024 யூலை 10, புதன்கிழமை
Wednesday,10th July, 2024

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2024 ජූලි 10 බදාදා, එනම් අද දින පූ.භා. 11.00ට කාරක සභා කාමර අංක 02හි දී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගී වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2020 වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව;

(ii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව;

(iii) 2022 වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව;

(iv) 2022 වර්ෂය සඳහා කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික අර්බුදයේ බලපෑම් සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

මෙම වාර්තාව විවෘත සහ වග කිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, අපව හමු වන්නට විදේශ අමුත්තෙක් පැමිණෙන නිසා, මේ අවස්ථාවේ අධ්‍යාපනය යටතේ කාරණාවක් ඉදිරිපත් කරන්නට ගරු සභානායකතුමාගෙන් මම අවසර ඉල්ලුවා. ඒ සඳහා ඔබතුමාගේත් අවසරය පතනවා. මම බොහොම කෙටියෙන් කාරණාව ඉදිරිපත් කරන්නම්.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, විදුහල්පතිවරුන්ගේ උද්ඝෝෂණයක් - protest එකක් - මේ මොහොතේත් පොල්දුව හන්දියේ පැවැත්වෙනවා. අපේ රටේ විදුහල්පතිවරු 12,000ත්, 13,000ත් අතර ප්‍රමාණයක් සිටින බව ඔබතුමා දන්නවා. වැටුප් විෂමතා ප්‍රශ්නයත්, විදුහල්පති දීමනා හා සන්නිවේදන දීමනා ප්‍රශ්නයත්, ගමන් වියදම් ප්‍රශ්නයත් ඇතුළුව අඩු පාඩුකම් රැසක් පිළිබඳව දැවැන්ත උද්ඝෝෂණයක් පැවැත්වෙනවා. ඔබතුමා දන්නවා ද දන්නේ නැහැ, විදුහල්පතිවරයෙක් II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් වනකොට රුපියල් 3,000ත්, රුපියල් 6,000ත් අතර මුදලක් වැටුපෙන් කැපෙන බව. ඒ වාගේ බරපතළ විෂමතා රැසක් තිබෙනවා. මාණ්ඩලික සේවාවලට ලැබෙන කිසිම පහසුකමක් විදුහල්පතිතුමන්ලාට ලැබෙන්නේ නැහැ. හැබැයි ඒ ගොල්ලන්ට කියනවා, මාණ්ඩලික සේවාවේ නිරත වූ අය කියලා. දුරකථන දීමනාව, නිල ඇඳුම් දීමනාව, සංග්‍රහ දීමනාව කියන මේ කිසිම දීමනාවක් ඒ විදුහල්පතිවරුන්ට ලැබෙන්නේ නැහැ.

ඒ නිසා ඒ ගැටලුව නිරාකරණය කරන්න මේ මොහොතේ Cabinet Paper එකකුත් දාලා තිබෙනවා. හැබැයි, ඒක Subcommittee එකේ හිර වෙලා තිබෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා ඒ Cabinet Paper එක හෙට දිනයේ සභාගත කරන්න කියලා. එතකොට අපටත් පුළුවන් ඔබතුමාට උදව්වක් හැටියට රජය උනන්දු කරවන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Cabinet Paper එකක් නොවෙයි, -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

එහෙම නම් ඔබතුමා තොරතුරු ටිකවත් දෙන්න. ඇත්ත වශයෙන්ම විදුහල්පතිවරුන්ගේ මේ ප්‍රශ්න ටික විසඳුවේ නැත්නම් අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය කඩා වැටෙනවා. ඒක නිසා මම බොහොම ගෞරවයෙන් මේ ඉල්ලීම කරනවා. පොල්දුව හන්දියේ උද්ඝෝෂණය කරන විදුහල්පතිවරුන්ට පණිවුඩයක් යවලා ඒ ගොල්ලන්ගේ නියෝජිත කණ්ඩායමක් හරි ඔබතුමාගේ කාර්යාලයට ගෙන්වා ගෙන -

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
අපි දෙන්නාත් එක්ක යමු.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

දෙන්නාත් එක්ක යමු. මම ජනාධිපති වුණාම ඔබතුමාට මාත් එක්ක එන්න පුළුවන්. ගැටලුවක් නැහැ.

අපි වැටුප් විෂමතා ප්‍රශ්නයත්, විදුහල්පති දීමනා ප්‍රශ්නයත්, සන්නිවේදන දීමනා ප්‍රශ්නයත්, ගමන් වියදම් ප්‍රශ්නයත් ගැන සාකච්ඡා කරමු. ඒ වාගේම අර, ශ්‍රේණිය -මේකත් හරි විහිළු සහගත කාරණයක් නේ, ගරු ඇමතිතුමනි. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් වෙනකොට මූලික පඩිය රුපියල් 3000ත්, 6000ත් අතර ප්‍රමාණයකින් අඩු වෙනවා- පිළිබඳ ප්‍රශ්නයත් විසඳන්න බලමු.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒ, ගුරු වැටුප් විෂමතාව නිසා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මොකක් නිසා ද කියන එක නොවෙයි, මේක හරිම විහිළුවක් නේ, ගරු ඇමතිතුමා. මම බොහොම ගෞරවයෙන් මේ ඉල්ලීම කරනවා. කවුරු හරි උසස් වෙනකොට මූලික වැටුප කැපෙනවා නම්, ඒ ක්‍රමයේ ලොකු වරදක් තිබෙනවා. කරුණාකරලා විදුහල්පතිවරුන්ගේ මේ ගැටලුවට මාණ්ඩලික සේවා පහසුකම් සහිතව තිරසර විසඳුමක් ලබා දෙන්න. ඔබතුමා Cabinet Paper එකක් දාලා තිබෙනවා; Subcommittee එකේ ඒක හිරවෙලා තිබෙනවා. ඒ හිර වෙච්ච එකත් බුරුල් කරලා ඉක්මනින්ම කැබිනට් අනුමැතියක් ලබා ගන්න ඔබතුමා කටයුතු කරන්න. පෞද්ගලික න්‍යාය පත්‍රවලටත් දැන් කැබිනට් අනුමැතිය දෙනවා නේ. එහෙම එකක් නොවෙයි, ජාතික ප්‍රශ්නයක්; ජාතික වගකීමෙන් යුත් ප්‍රශ්නයක් හැටියට මම මේක ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, මට තව එක දෙයක් කියන්න අවස්ථාව දෙන්න. ගරු අමාත්‍යතුමනි, මියන්මාරයට ගිහිල්ලා අනාථ වුණු දරුවෝ වෙනුවෙනුත් පොල්දුව හන්දියේම ලොකු උද්ඝෝෂණයක් මේ වෙලාවේ පැවැත්වෙනවා. මේ කරුණත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. ඇත්ත

වශයෙන්ම විපක්ෂයේ අපි, සමගි ජන බලවේගයේ, සමගි ජන සන්ධානයේ ගරු වසන්ත යාපාබණ්ඩාර මැතිතුමාත්, ගරු සුජීත් සංජය පෙරේරා මැතිතුමාත්, ගරු ජේ.සී. අලවතුවල මැතිතුමාත්,- *[බාධා කිරීම්]* මේ කථා කරන්නේ මියන්මාරයේ අනාථ වුණු දරුවෝ ගැන. ඒ වෙනුවෙන් කථා කරන්න මට විනාඩියක් දෙන්න, disturb කරන්න එපා.

ගරු ඇමතිතුමනි, මේකයි ප්‍රශ්නය. මියන්මාරයේ ත්‍රස්ත කඳවුරු දෙකක අපේ රටේ සහ ඉතියෝපියාවේ දරුවන් විතරක් දැනට රඳවාගෙන සිටිනවා. මම ඔබතුමාට කියන්න කැමැතියි, දැන් දින 252ක් තිස්සේ මේ අය රඳවාගෙන සිටින බව. ඉන්දියාව, නේපාලය, උගන්ඩාව සහ මොරොක්කෝව කියන රටවල් කොහොම හරි රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධකම් හරහා ඒ රටවල දරුවෝ ටික මේ ත්‍රස්ත කඳවුරුවලින් මුදාගෙන තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා.

මේ සංගමයේ සභාපති සහ උප සභාපති වන අජන්ත කුමාරසිරි සහ එස්. කොඩිතුවක්කු යන අයත් මේ වෙලාවේ පොල්දූව හන්දියේ ඉන්නවා. ඒ අය ළඟ මේ සම්බන්ධයෙන් අදාළ පින්තූර තිබෙනවා. ඒ දරුවන් අමානුෂික ලෙස වධහිංසාවලට ලක් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා, ඔබතුමාත් ඒ පින්තූර ගෙන්වාගෙන බලන්න කියලා. ඇත්ත වශයෙන්ම මේ සම්බන්ධයෙන් මීට වඩා ශක්තිමත් රාජ්‍ය මැදිහත්වීමක් අවශ්‍යයි. මේ දරුවෝ ගිහිල්ලා තිබෙන්නේ ඩුබායිවල සිට ක්‍රියාත්මක වුණු online visa හොර රැකියා ජාවාරමක් හරහායි. ඒ හරහා තමයි ඔවුන් මේ ජාවාරමට හසුවෙලා තිබෙන්නේ. ඒ නිසා මම රජයෙන් බොහොම කාරුණිකව ඉල්ලීමක් කරනවා, රාජ්‍ය තාන්ත්‍රික ලෙස මේ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න කියලා. අපේ මන්ත්‍රීවරු තුන්දෙනෙකුත් පසුගිය දවස්වල මේ පිළිබඳව සොයා බලන්න මියන්මාරයට ගියා. ඒ, ගරු වසන්ත යාපාබණ්ඩාර මැතිතුමා, ගරු ජේ.සී. අලවතුවල මැතිතුමා සහ ගරු සුජීත් සංජය පෙරේරා මැතිතුමා. නමුත්, මේ ප්‍රශ්නයට තවම විසඳුමක් ලැබිලා නැහැ. මියන්මාරයේ අනාථ වී සිටින ඒ දරුවන් වෙනුවෙන් කරුණාකරලා මැදිහත් වෙන්න, ඒ ගැන සොයා බලන්න කියලා මම රජය අවදි කරවනවා. තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරලා ඒ දරුවෝ ටික බේරලා දෙන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නය පිළිබඳව අපි දැඩි ලෙස අවධානය යොමු කරලා තිබුණා. ඒ අයත් එක්ක නිරන්තරයෙන් සාකච්ඡා කරලා, රජයේ විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් සමන්විතව මහාචාර්ය ගුණපාල නානායක්කාර මහතාගේ සභාපතිත්වයෙන් යුතුව කමිටුවක් පත් කරලා, ඒ ඔස්සේ සියලු පාර්ශ්වයන්ට අවස්ථාව දීලා වාර්තාවක් හැදුවා, විදුහල්පතිවරුන්ට තිබෙන සමස්ත ප්‍රශ්නය විසඳන්න. විදුහල්පතිවරුන්ගේ වැටුප පිළිබඳ විෂමතාව ඇවිල්ලා තිබෙන්නේ ගුරු සේවාවේ තිබෙන වැටුප් විෂමතාව නිසායි. ගුරු සේවාවේ ඉන්න ගුරුවරයෙක් Grade I එකට එනකොට තිබෙන වැටුපට වඩා, ගුරු සේවයේ ඉඳලා ආපු III ශ්‍රේණියේ විදුහල්පතිවරයෙකුගේ වැටුප අඩුයි. මේ විෂමතාව එදා ඉඳලාම තිබෙන ආවේණික ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මේ කාරණා දෙකටම විසඳුම් දෙන්න නම්, විදුහල්පතිවරුන්ව මාණ්ඩලික සේවයට ගන්න ඕනෑ. මොකද, මාණ්ඩලික සේවයේ තිබෙන්නා වූ වරප්‍රසාද ඒ අයට දෙනකොට, ගුරුවරයාට වඩා ඉහළින් ඒ අය ඉන්නවා. හැබැයි, ගුරු සේවයේ වැටුප් විෂමතාව ඉවත් කරන්න කියලා කෑගහන පිරිස නිසා ඒක කරනකොට, විදුහල්පතිවරුන්ගේ විෂමතාව නැවත ඇති වෙනවා. විදුහල්පතිවරුන්ගේ විෂමතාව ඇති වෙනකොට, ගුරු අධ්‍යාපනඥ සේවයේ විෂමතාව ඇති වෙනවා; ගුරු උපදේශක සේවයේ විෂමතාව ඇති වෙනවා; පරිපාලන සේවයේ විෂමතාව ඇති වෙනවා. මේක විෂම චක්‍රයක්. එම නිසා මේ ප්‍රශ්නය විසඳන්න නම් මේ සියලු පාර්ශ්ව ගෙන්වා ගෙන එක තැනක වාඩි වෙලා, බරපතළ ලෙස සලකා බලා එකවර මේ වැටුප් සියල්ල හදන්න ඕනෑ. එහෙම නැත්නම් කවදාවත් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ.

එදා රිවර්ඩ් පනිරණ හිටපු ඇමතිතුමා ගුරු සේවාවක් හැදුවේ, දක්ෂ ගුරුවරයෙක් කාර්ය සාධනයත් සමඟ ගුරු සේවයේ තබා ගන්නයි. එහෙම තිබෙන ගුරු සේවයෙන් ඉහළට ගිය අය, විදුහල්පති වෙන්න ගිය ගමන් වැටුප අඩු වෙනවා. ඒකයි තිබෙන ප්‍රශ්නය. මේක ක්ෂණිකව දවසකින් දෙකකින් විසඳන්න බැහැ. මේක දීර්ඝ කාලයක් තිස්සේ ආ ප්‍රශ්නයක්. ඒ නිසා සියලු ශ්‍රේණිවල විෂමතා එකවර හදන්නයි සිදු වෙලා තිබෙන්නේ.

ඊළඟට මම කියන්න කැමැතියි, මේ සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශය මා ඉදිරිපත් කළ බව. අමාත්‍ය මණ්ඩල තීන්දුවක් ඇවිල්ලා තිබෙනවා, communication allowance සහ transport allowance ගැන භාණ්ඩාගාරයත් එක්ක කථා කරලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න කියලා. දැන් ඒක තිබෙන්නේ භාණ්ඩාගාරයත්, අපේ ලේකම්තුමියත් සාකච්ඡා කරලා විසඳුමක් දෙන තැන. ඒ කියන්නේ දැන් ඒක අවසාන අදියරට ගෙනැල්ලා තිබෙනවා. විදුහල්පතිවරුන්ගේ දීමනාව වැඩි කරන්න කියන යෝජනාවත් අපි ගෙනැල්ලා තිබෙනවා. ඒක සෙසු දීමනාත් සමඟ කමිටුව මඟින් සලකා බලන බවට දැනුම් දීලා තිබෙනවා. ඒක තමයි විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් තත්ත්වය.

විදුහල්පතිවරු 16,000ක් ඉන්න ඕනෑ. මම මේ අමාත්‍යාංශය භාර ගන්නකොට හිටියේ 9,000යි. කලින් හිටපු ඇමතිවරු අවුරුදු 5ක්ම පියවර අරගෙන තිබුණේ නැහැ, විදුහල්පතිවරු පත් කරන්න. හැබැයි, මම 4,672කට පත්වීම් දුන්නා. ඒ නිසා අද යන්තම් පාසල් ටික පවත්වාගෙන යන්න අවශ්‍ය විදුහල්පතිවරු සංඛ්‍යාව ඉන්නවා. ශ්‍රේණි එක්ක ගත්තොත්, තව පිරිසක් පත් කරන්න තිබෙනවා. ඉතින් මේ හැම කාරණයකදීම අපි නිකම් හිටියේ නැහැ. මේ අවුරුදු දෙකයි මාස තුනක කාලයේ අධ්‍යාපනය යථා තත්ත්වයට ගේන්න දරන පරිශ්‍රමයත් එක්කම, අවුරුදු ගාණක් තිස්සේ තිබුණු වැටුප් විෂමතා සහ ඒ ප්‍රශ්න විසඳීමට අපේ මැදිහත්වීම කරලා තිබෙන බවත් මම දැනුම් දෙන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපි නැවත ලිපිලේඛනාදිය පිළිගැන්වීමේ අවස්ථාවට යොමු වෙමු.

ගරු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா வினவுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2021 වර්ෂය සඳහා ලංකා ඕතරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මම ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මහජන ආරක්ෂක අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124(6) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පිළිගන්වන ලද වාර්තා
சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
REPORTS PRESENTED

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
தண்டனைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
PENAL CODE (AMENDMENT) BILL

ගරු අජිත් රාජපක්ෂ මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)
(மாண்புமிகு அஜித் ராஜபக்ஷ - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Ajith Rajapakse - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, "දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

"වාර්තාව

'දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක සහ නීතිපති විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත.

මෙම පනත් කෙටුම්පතට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබේ."

පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2024 ජූලි 11වන බ්‍රහස්පතින්දා සලකා බලනු ලැබේ.

சட்டமூலம், சட்டவாக்க நிலையியற் குழுவினால் அறிக்கை செய்யப்பட்டவாறு, 2024 யூலை 11, வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.

Bill, as reported by Legislative Standing Committee, to be considered upon Thursday, 11th July, 2024.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2020 හා 2021 වර්ෂ සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තා;

(iii) 2021 හා 2022 වර්ෂ සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තා;

(iv) 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 13 වගන්තිය අනුව, 2022 අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව;

(v) 2020 හා 2021 වර්ෂ සඳහා සීමාසහිත ලංකා සතොස සමාගමේ වාර්ෂික වාර්තා;

(vi) 2021 වර්ෂය සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්;

(vii) 2020 වර්ෂය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව;

(viii) 2022 වර්ෂය සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ix) 2018 හා 2019 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Health on -

(i) Annual Report of the Sri Jayewardenepura General Hospital and Postgraduate Medical Training Centre for the year 2021;

(ii) Annual Report of the Ayurveda Medical Council for the year 2022;

(iii) Annual Report of the National Authority on Tobacco and Alcohol for the year 2022; and

(iv) Performance Report of the Department of Ayurveda for the year 2022,

which were referred to the said Committee.

ගරු කථානායකතුමනි, අපි - සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව - බලාපොරොත්තු වෙනවා අවුරුද්දක් වැනි කෙටි කාලයක් තුළ මෙම වාර්ෂික වාර්තා අප වෙත ඉදිරිපත් කරයි කියලා. ඒ පිළිබඳව ගරු ඇමතිතුමා අපට දක්වන සහයෝගයට මේ අවස්ථාවේ එතුමාට ස්තුතිවන්ත වෙනවා.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු නාලක බණ්ඩාර කෝට්ටෙගොඩ මහතා
(மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட)
(The Hon. Nalaka Bandara Kottegoda)

ගරු කථානායකතුමනි, බලශක්තිය හා ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2021 වර්ෂය සඳහා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ වාර්ෂික වාර්තාව;

(iii) 2021 වර්ෂය සඳහා ලංකා ගල් අඟුරු සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා එනර්ජිස් පුද්ගලික සමාගමේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, මෙම වාර්තා අතර තිබෙනවා, 2022 වර්ෂය සඳහා වූ ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ වාර්ෂික වාර්තාව. මෙම වාර්තාව සමාලෝචනය කිරීමේදී කමිටුවට හෙළි වුණා, 2022 අර්බුද සමය, බලශක්ති අර්බුදය ආරම්භ වීමත් සමඟ මෙම ගබඩා පර්යන්තයේ තිබෙන දත්ත පද්ධතිය සම්පූර්ණයෙන්ම මැකිලා ගිහින් තිබෙනවා කියලා. මේ පිළිබඳව ගරු පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. ඒ වාගේම මහා පරිමාණ වශයෙන් ඛනිජ තෙල් තොග අතුරුදහන් වෙලා එම සංඛ්‍යාලේඛන පවා සොයා ගන්න නැති වෙලා තිබෙනවා, 2022 බලශක්ති අර්බුදය ආරම්භ වීමට පෙර. ඒ නිසා මේ පිළිබඳව මම පාර්ලිමේන්තුවේ සහ අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරවනවා. ස්තුතියි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මේ ගැන මම කෙටි පැහැදිලි කිරීමක් කරන්නම්. Tourism industry එකට වාහන අවශ්‍යයි. ඒ වාහන ගෙන්වන්න දැන් තහනමක් තිබෙන නිසා ඒකට special Gazette එකක් නිකුත් කර තිබෙනවා. ඒ හරහා වාහන 1,000ක් ගෙනෙන්න අනුමැතිය ලබා දීලා තිබෙනවා. කුඩා coaches හා බස් රථ 250ක් සහ වෑන් රථ 750ක් මේකට ඇතුළත් වෙනවා. ඒ සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා. Brand new වාහනවලට තමයි ඒ අවසරය ලබා දීලා තිබෙන්නේ. ඒ අනුව, ඒ වාහන සංචාරක කර්මාන්තය සඳහා අවශ්‍ය බව අපේ කාරක සභාව අනුමත කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒත් එක්කම ගැටලුවක් මතු වෙලා තිබෙනවා. මේ ඉලෙක්ට්‍රික් වාහන ආනයනය සම්බන්ධයෙන් පිට රට වැඩ කරන පුද්ගලයන් මුදල් ප්‍රේෂණය කළාම ඒ පිළිබඳ ගැටලු ඇවිල්ලා තිබුණා. මේක under-invoice වෙලා තිබෙනවාද, හරියට tax ගෙවලා තිබෙනවාද, මේ වාහන නවසිය ගණනෙන් සියයට 68ක් කොහොමද ආයතන දෙකකින් පමණක් ගෙනාවේ, ඇයි මේකට online system එකක් නැත්තේ, ඇයි මේ facilitatorsලා පත් කරලා තිබෙන්නේ ආදී වශයෙන් ගැටලු ගොඩක් මතු වුණා.

එම නිසා කාරක සභාව හැටියට අපි joint committee එකක් පත් කළා, මේ ගැන හොයා බලන්න. ඒකට මුදල් අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය, මහ බැංකුව, Fiscal Policy Department,

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

Sri Lanka Customs සහ Immigration and Emigration Department කියන ආයතනවල නිලධාරීන් පත් කළා. කමිටුව ඒ ගැන හොයා බලා අපට වාර්තාවක් ලබා දුන්නා. ඒ වාර්තාව මා සභාගත කරන්නම්. ඒ වාර්තාවේ කාරණා කිහිපයක්ම සඳහන් කර තිබෙනවා. වාර්තාවේ මෙසේ සඳහන් වනවා:

> "It cast a doubt that the scheme has been misused by limited number of individuals."

ඒ කියන්නේ, අවභාවිත කර තිබෙන බවක් පෙනෙනවාය කියා තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධව comprehensive investigation එකක් කරන්න කියලා තිබෙනවා. ඒ අතරවාරයේ මේ scheme එක හරහා තවදුරටත් වාහන ගෙනෙන්න බැහැ. නමුත්, දීලා තිබෙන permitsවලට වාහන ගෙනාවාම ඒ අයගෙන් අය කරන Luxury Tax එක මිලියන 6 සිට මිලියන 12 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒක තවදුරටත් මිලියන 6 සිට මිලියන 12 දක්වා වැඩි කරන්න අපෙන් අනුමැතිය ඉල්ලුවා. නමුත්, ඒ අනුමැතිය ලබා දෙන්න කාරක සභාව එකඟ වුණේ නැහැ. මම තීරණය කළා, අනුමැතිය නොදෙනවා වෙනුවට මෙය නැවතත් මුදල් අමාත්‍යාංශයට යොමු කරලා, ලේකම්වරයාගෙන් සෘජු පිළිතුරක් ලබා ගන්න. මොකද, එම වාහන මිලියන 70, මිලියන 100 හා මිලියන 120 වැනි ලොකු ගණන්වලට විකුණන්නේ. හැම දෙයකටම බදු ගහන වෙලාවේ මිලියන 2ක බද්දක් ඔවුන්ට ගෙවන්න වන එක අයින් කළ යුතුද කියන ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, එම නිසා නැවත මුදල් අමාත්‍යාංශයට මෙම ප්‍රශ්නය යොමු කරලා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ලබන සතියේ තීරණයක් ගන්න තීන්දු කළා.

මේ සියලු වාර්තා මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

අපි මේක මුදල් අමාත්‍යාංශයට යොමු කරනවා. මුදල් අමාත්‍යාංශය මේ පිළිබඳව thorough investigation එකක් කරලා ගත යුතු ක්‍රියාමාර්ග ගනියි කියා අපි බලාපොරොත්තු වෙනවා.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු නලින් ප්‍රනාන්දු මහතා (වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் பர்னாந்து - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Nalin Fernando - Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, ඒකල, මිනුවන්ගොඩ පාර, අංක 125/2 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ජී.එම්. ප්‍රේමකුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පිළිමතලාව, ගඩලාදෙණිය, අංක 333 දරන ස්ථානයෙහි පදිංචි කේ.ජී. සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කුරුණෑගල, උඩබදලව යන ලිපිනයෙහි පදිංචි බී.බී.එම්. සුනිල් අතපත්තු මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගම්පොළ, මහඋඩගම, හුණුකොටුගම යන ලිපිනයෙහි පදිංචි ජේ.බී. මන්තිලක ආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු කථානායකතුමනි, හෙයියන්තුඩුව, ඔබවත්ත අංක 545/5 දරන ස්ථානයෙහි පදිංචි වයි.ආර්. වජිර ප්‍රේමවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ඩී. වීරසිංහ මහතා
(மாண்புமிகு டீ. வீரசிங்க)
(The Hon. D. Weerasingha)

ගරු කථානායකතුමනි, හිඟුරාන සීනි කම්හල් පෙදෙස, අංක 54/බී දරන ස්ථානයෙහි පදිංචි එස්.එච්.එන්.ආර්. සමරතුංග මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ජගත් සමරවික්‍රම මහතා
(மாண்புமிகு ஜகத் சமரவிக்ரம)
(The Hon. Jagath Samarawickrama)

ගරු කථානායකතුමනි, පොළොන්නරුව, කුරුජ්පු හන්දිය, අංක 595/146/1 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එල්.ඩබ්ලිව්.කේ. අමරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ත්‍රිරෝද රථ සේවාව: නියාමනය
முச்சக்கரவண்டிச் சேவை: ஒழுங்குறுத்தல்
THREE-WHEELER SERVICE: REGULATION

4/2024

1. ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ත්‍රිරෝද රථ සේවාව තුළින් ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා ඉටු කරනු ලැබුවද, එම සේවාව නියාමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති බවත්;

(ii) ත්‍රිරෝද රථ රියදුරන් විසින් අක්‍රමවත් පරිදි මුදල් අයකිරීම හේතුවෙන් මගීන් අපහසුතාවට පත්වන බවත්;

එතුමා දන්නේද?

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(ආ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ත්‍රිරෝද රථ අතරින් මහනුවර දිස්ත්‍රික්කයේ ඇති ත්‍රිරෝද රථ සංඛ්‍යාව කොපමණද;

(ii) ත්‍රිරෝද රථ සේවාව නියාමනය කිරීම සඳහා මේ වනවිට විධිමත් ක්‍රමවේදයක් තිබේද;

(iii) ත්‍රිරෝද රථ රියදුරන් හඳුනාගැනීම සඳහා හැඳුනුම්පතක් හා නිල ඇඳුමක් හඳුන්වා දීමටත්, ත්‍රිරෝද රථයට මීටරයක් සවි කිරීමටත් යෝජනා කර තිබේද;

(iv) එසේ නම්, ඉහත යෝජනා ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පෝක්‍රුවරත්තු මට්රුම් නෙඩුඤ්චාලෙකළ් අමෛච්චරෙක් කේට්ට විනා:

(අ) (i) මුච්චක්කරවණ්ඩිච් චේවෛමූලම් මක්කළින් පෝක්‍රුවරත්තුත් තේවෛකළ් පූර්ත්ති චෙය්‍යප්පට්ටු කින්‍ර පෝතිලුම්, අච්චේවෛයෛ ඔළුංකුපටුත්තු වතර්කු මුරෛයාන පොරිමුරෛයොන්‍රු ඉල්ලෛ එන්පතෛයුම්;

(ii) මුච්චක්කරවණ්ඩිච් චාරතිකළ් මුරෛකේටාකප් පණම් අරවිටුවතන් කාරණමාකප් පයණිකළ් චිරමංකළුක්කු උළ්ළාකින්‍රනර් එන්පතෛයුම්;

අවර් අරිවාරා?

(ආ) (i) ඉලංකෛයිල් පතිවුචෙය්‍යප්පට්ට මුච්චක්කර වණ්ඩිකළිල් කණ්ඩි මාවට්ටත්තිලුළ්ළ මුච්චක්කර වණ්ඩිකළින් එණ්ණික්කෛ එත්තනෛ එන්පතෛයුම්;

(ii) මුච්චක්කරවණ්ඩිච් චේවෛයෛ ඔළුංකුපටුත්තු වතර්කාක තර්පෝතු මුරෛයාන පොරිමුරෛයොන්‍රු උළ්ළතා එන්පතෛයුම්;

(iii) මුච්චක්කරවණ්ඩිච් චාරතිකළෛ අටෛයාළම් කාණ්පතර්කාක අටෛයාළ අට්ටෛ මට්රුම් චීරුටෛයෛ අරිමුකප්පටුත්තුවතර්කුම් මුච්චක්කර වණ්ඩික්කු කට්ටණමානි ඔන්‍රෛප් පොරුත්තු වතර්කුම් මුන්මොළියප්පට්ටුළ්ළනවා එන්පතෛයුම්;

(iv) ආමෙනිල්, මේර්පඩි මුන්මොළිවුකළ් අමුල් පටුත්තප්පටුම් තිකති යාතෙන්පතෛයුම්;

අවර් ඉච්චෛක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්‍රේල්, ඒන්?

asked the Minister of Transport and Highways:

(a) Is he aware that -

(i) although the three-wheeler services fulfil the transportation needs of the people, there is no formal system in place to regulate that service; and

(ii) the passengers are inconvenienced by irregular charging practices of three-wheeler drivers?

(b) Will he inform this House -

(i) the number of registered three-wheelers in Kandy District, out of the total number in Sri Lanka;

(ii) whether there is a formal system to regulate the three-wheeler service;

(iii) whether it has been proposed to introduce an identity card and a uniform for the identification of three-wheeler drivers and to install a meter on three-wheelers; and

(iv) if so, the date on which the above proposals will be implemented?

(c) If not, why?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අපි ඉතා බරපතළ ලෙස පිළිගන්නවා, ත්‍රිරෝද රථ විශාල ලෙස මහජන සේවාවක් කරන අතර, එය අවශ්‍යයෙන්ම නියාමනය කළ යුතු බව. නමුත් ඒ සඳහා අවශ්‍ය බලතල නැති නිසා මම දැනට තිබෙන තත්ත්වය වෙනස් කරන්න ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සම්පූර්ණයෙන් සංශෝධනය කරලා, නීතිපති දෙපාර්තමේන්තුවට යවලා, නීතිපති නිශ්කාශනය ලැබී තිබෙනවා. ඒ කියන්නේ දැනට ජාතික ගමනාගමන කොමිසමට බස් ගාස්තු සම්බන්ධයෙන් පමණයි මැදිහත් වෙන්න පුළුවන්කම තිබෙන්නේ. පාසල් වෑන් රථ, ත්‍රිරෝද රථ හා අනෙකුත් ඒවා සඳහාත් ජාතික ගමනාගමන කොමිසමට නියාමනයක් කරන්න අවසරය ලැබෙන පරිදි පනත සංශෝධනය කර කෙටුම්පත් කරලා නීතිපති දෙපාර්තමේන්තුවට යවලා, නිශ්කාශන ලබාගෙන තිබෙනවා. ඉතා නුදුරේදී එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා ගැසට් කරලා, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. එවිට ඔබතුමා අසා තිබෙන සියලු ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙනවා. ඔබතුමා දක්වා තිබෙන අදහස් පිළිගන්නවා.

(ii) මගීන් අපහසුතාවට පත්වීම වැළැක්වීම සඳහා මෝටර් වාහන පනත යටතේ 2035/51 හා 2017.09.08 දිනැති මෝටර් වාහන (මෝටර් ට්‍රයිසිකල්) නියෝග මඟින් ත්‍රිරෝද රථ නියාමනයට අදාළ රෙගුලාසි මාලාවක් හඳුන්වා දී ඇත.

ඒ අනුව කුලී මගී ප්‍රවාහනයේ යෙදෙන ත්‍රිරෝද රථ සඳහා සියලු අවස්ථාවල ක්‍රියාත්මකව පවතින ටැක්සි මීටරයක් තිබිය යුතු වන අතර, ගාස්තු ගෙවීමෙන් පසු මගියාගේ ඉල්ලීම මත රිසිට්පතක් නිකුත් කළ යුතු ය. එම රිසිට් පතෙහි, ගමන් කළ දුර, වාහන ලියාපදිංචි අංකය, අය කළ ගාස්තුව හා දිනය ඇතුළත් විය යුතු ය.

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

(ආ) (i) 91,615යි.

මා මුලින් සඳහන් කළ ආකාරයට අදාළ පනත යටතේ වන නියෝග මඟින් නියම කර තිබෙන ආකාරයට ත්‍රිරෝද රථවල මීටරයක් සවි කළ යුතුයි. ඒ වාගේම අය කරන ගාස්තුවට අදාළව මගියා විසින් රිසිට් පතක් ඉල්ලා සිටියහොත් එය නිකුත් කිරීම ද කළ යුතුයි. ඒ බව සඳහන් නියෝග 2017 ඉඳලා බලාත්මකව තිබුණා. නමුත්, එම නියෝග ප්‍රායෝගිකව යථාර්ථයක් විධියට මහ පොළොවේ ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ සියල්ල ක්‍රියාත්මක කිරීම නිසි ලෙස කරන්න පුළුවන්කම ලැබෙනවා, ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කළාම.

(ii) ත්‍රිරෝද රථ නියාමනය කිරීම සඳහා මේ වන විට 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කොට, එම කොමිෂන් සභාවට එකී නියාමන බලතල ඇතුළත් කර ඇති අතර, එම පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමට හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

(iii) මෝටර් වාහන පනත යටතේ 2035/51 හා 2017.09.08 දිනැති මෝටර් වාහන (මෝටර් ට්‍රයිසිකල්) නියෝග අනුව, මගීන්ට පැහැදිලිව පෙනෙන පරිදි රියැදුරු අසුන පිටුපස ලියාපදිංචි අංකය, රියැදුරුගේ නම හා රියැදුරු බලපත්‍ර අංකය, මිලිමීටර 65x50 ප්‍රමාණයේ රියැදුරුගේ ඡායාරූපයක් ප්‍රදර්ශනය කළ යුතු අතර, සියලු අවස්ථාවල ක්‍රියාත්මකව පවතින ටැක්සි මීටරයක් සවි කර තිබිය යුතු ය.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නයේ සඳහන් කර ඇති ආකාරයට මම පිළිගන්නවා, ත්‍රිරෝද රථයක ගමන් කරන ඕනෑම කෙනෙකුට එහි රියැදුරු කවුද යනාදි තොරතුරු දැන ගන්න හැකි විය යුතු බව. ඒ වාගේම, රියැදුරුගේ ඡායාරූපය ද ප්‍රදර්ශනය කළ යුතුයි. සිංගප්පූරුව වාගේ දියුණු රටවල ඕනෑම කෙනෙකුට තමන් ගමන් කරන ත්‍රිරෝද රථයේ ලියාපදිංචි අංකය, එහි රියැදුරුගේ නම යනාදිය පිළිබඳව සටහන් කර ගන්න පුළුවන්. ඒ නිසා මගීන්ට ආරක්ෂාව සැලසෙනවා.

(iv) මෝටර් වාහන පනත යටතේ පළ කරන ලද රෙගුලාසි ක්‍රියාත්මක වන්නේද යන්න මහාමාර්ගයේ පරීක්ෂා කිරීම හා නීතිමය පියවර ගැනීම ශ්‍රී ලංකා පොලිසිය මඟින් සිදු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් පොලිස්පතිවරයා දැනුවත් කර ඇත.

තවද, ත්‍රිරෝද රථ නියාමනයට අදාළ විධිවිධාන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතට ගෙන ඒමට නියමිත සංශෝධන පනත් කෙටුම්පතට ඇතුළත්ව ඇති අතර, එය සම්මත වූ පසුව එම විධිවිධාන අනුව කටයුතු කිරීමට අපේක්ෂිත ය.

ඒ සියලු විධිවිධාන ඇතුළත් කරනවා, නියාමන බලය ජාතික ගමනාගමන කොමිසමට ලැබුණාට පසුව. තවත් මාසයක් දෙකක් ඇතුළත එම කටයුතු අවසන් කරන්න අපට පුළුවන් වෙයි.

(ඇ) අදාළ නොවේ.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ගරු ප්‍රවාහන හා මහාමාර්ග ඇමතිතුමාට මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, විශේෂයෙන්ම ජාතික ගමනාගමන කොමිසම පුළුල් කිරීම, ඒ හරහා ත්‍රිරෝද රථ නියාමනය කියන කාරණා සම්බන්ධයෙන් ප්‍රබල විධියට අවධානය යොමු කර කඩිනමින් ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරගෙන යෑම පිළිබඳව.

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ත්‍රිරෝද රථ ධාවනය කරන්නන්ගේ -අයිතිකරුවන් හෝ ඒවා කුලියට පාවිච්චි කරන අයගේ- සුරක්ෂිතතාව වාගේම එම රථවල ගමන් කරන මගීන්ගේ සුරක්ෂිතතාව ද ඇති කිරීම වෙනුවෙන් අපි කඩිනමින් ක්‍රියා මාර්ග ගත යුතුයි. මා විශ්වාස කරනවා, ඔබතුමා ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතට ගෙන එන සංශෝධන පනත් කෙටුම්පතට මේ පිළිබඳ කාරණා -මීටරය සවි කිරීම වාගේ කාරණා- සහ නෛතික තත්ත්වයන් ඇතුළත් කරාවි කියලා.

කුලී රථ හිමිකරුවන් වාගේම කුලී රථ ධාවකයන් සේවක අර්ථසාධක අරමුදල් ක්‍රමයකට හෝ රක්ෂණ ක්‍රමයකට කිසිම දායකත්වයක් දීලා නැහැ. ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් අපි ඔබතුමාට යෝජනාවක් කරන්න කැමැතියි.

විවෘත ආර්ථිකයත් එක්ක අද වන විට එවැනි ධාවකයන් ලක්ෂ 12කට අධික පිරිසක් ශ්‍රී ලංකාව පුරා සිටිනවා. මේ ත්‍රිරෝද රථ ධාවකයන් අපේ ආර්ථිකයේ ප්‍රධාන කොටස්කරුවන් පිරිසක්. ගරු ඇමතිතුමනි, එම නිසා අපි ඔබතුමාට යෝජනා කරනවා, රජය මැදිහත් වෙලා එම පිරිස සේවක අර්ථසාධක අරමුදල් ක්‍රමයකට සහ රක්ෂණ ක්‍රමයකට දායක කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය කියලා. ඒ සම්බන්ධයෙන් අපහසුතාවක් තිබෙනවා ද?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ඒ යෝජනාව පිළිබඳවත් අවධානය යොමු කරවන්නම්.

ජාතික ගමනාගමන කොමිසමට අමතරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසිනුත් මගීන්ගේ ආරක්ෂාව සඳහා ත්‍රිරෝද රථවල පැවැතිය යුතු අංග පිළිබඳ උපදේශාත්මක සේවා සැපයීමක් සිදු කරනවා. පොසිල ඉන්ධන භාවිත කරන ත්‍රිරෝද රථ විදුලි ත්‍රිරෝද රථ බවට පරිවර්තනය කරන්න අපි විශාල උත්සාහයක් දරනවා. ඒ පරිවර්තන කාර්යය දැනට ලංකාවේ කරගෙන යනවා. සියයට 100ක්ම දේශීය නිෂ්පාදනයක් වශයෙන්, ලෝකයේ කොහේවත් නැති විධියේ නවෝත්පාදනයක් "වේගා" ආයතනයේ ආචාර්ය හර්ෂ සුබසිංහ මහත්මයලා කර තිබෙනවා. පරිසර සංරක්ෂණය සඳහාත්, පොසිල ඉන්ධන භාවිතයෙන් ඉවත්ව ධරණීය ප්‍රවාහන ප්‍රතිපත්තියක් ඇති කිරීම සඳහාත්, ත්‍රිරෝද රථ පමණක් නොව, පොදු ප්‍රවාහන රථ ඇතුළුව සියලු මෝටර් වාහන ලෝකයේ අනෙක් රටවල මෙන් විදුලියට පරිවර්තනය කර ගැනීම සඳහාත් අපි ප්‍රමුඛතාව ලබා දෙනවා.

එහිදී මගී ආරක්ෂාව සඳහාත් අවශ්‍ය කටයුතු කරනවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළව e-Motoring ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නත්, එහි සිදු වන වංචා, දූෂණ, අක්‍රමිකතා නැති කරන්නත් අපි කටයුතු කරනවා. අවුරුදු ගණනක් තිස්සේ කරන්න දෙන්නේ නැති e-Motoring ව්‍යාපෘතිය මේ අවුරුද්ද තුළ ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කටයුතු ඩිජිටල්කරණය කිරීමත්, සියලු මෝටර් වාහන විදුලියට පරිවර්තනය කිරීමත්, ඒවාට අදාළව ගමනාගමන කොමිෂන් සභාව වෙනස් කිරීමත් කියන කටයුතු සිදු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, එහිදී ඔබතුමන්ලාගේ අදහස්වලටත් ගරු කරලා ඒවාත් ඇතුළත් කරනවා.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, අපට ලැබෙන්නේ ඉතා සීමිත කාලයක් නිසා මේ ප්‍රශ්නයටත් කාරුණිකව පිළිතුරක් ලබා දෙන්න. විශේෂයෙන් ගම්පොළ සහ කඩුගන්නාව යා කරන මාර්ගයත්, වයඹ පළාත සහ මධ්‍යම පළාත යා කරන අලදෙනිය-පොල්ගහමුල මාර්ගයත් මහනුවර වාහන තදබදය ඉවත් කිරීම සඳහා අතිශයින් වැදගත් ප්‍රධාන මාවත් දෙකක්. ගරු ඇමතිතුමනි, එය ඔබතුමාගේ අනාගත සංවර්ධන සැලැස්මට ඇතුළත් කර තිබෙනවාද කියා මම දැනගන්න කැමැතියි. අපි දන්නවා, මේ පවතින ආර්ථික අර්බුදය පිළිබඳ ප්‍රශ්නය.

මා ඉහතින් කී පරිදි මහනුවර වාහන තදබදය ඉවත් කිරීම සඳහා දායක කර ගත හැකි ප්‍රබලම මාර්ග දෙකෙන් එකක් තමයි ගම්පොළ සහ කඩුගන්නාව යා කරන මාර්ගය. ඒක ඉතාම අබලන් තත්ත්වයේ තිබෙන්නේ. ඊළඟ එක, මා කලිනුත් කියපු අලදෙනිය-පොල්ගහමුල මාර්ගය. මේ මාර්ග දෙක සම්බන්ධයෙන් ඉදිරියේදී ගන්නා ක්‍රියා මාර්ග පිළිබඳව ඔබතුමාට අවබෝධයක් තිබෙනවාද? ඒ පිළිබඳව ඔබතුමාගේ පිළිතුර මොකක්ද?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

අවබෝධයක් තිබෙනවා. කඩුගන්නාව නාය යන ස්ථානයට මෙහායින් කිලෝමීටර 2ක විතර අතුරු මාර්ගයක් සකස් කරලා තිබෙනවා, ගල විදපු ස්ථානයට උඩින්. අපි මේ පිළිබඳ වාර්තාවක් ඉල්ලා තිබෙනවා කෙටි කාලයක් තුළ පටන් ගන්න. ණය ප්‍රතිව්‍යුහගතකරණය කරන තෙක් මහනුවර වෙනුවෙන් හදලා තිබෙන සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්න බැහැ,

බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය - Multimodal Transport Hub එක - කෝටි 3,000ක ලෝක බැංකු ආධාර යටතේ පටන් අරගෙන තිබෙනවා. ලෝක බැංකුව එකඟ වෙලා තිබෙනවා මහනුවර නගරය digital smart city එකක් බවට පරිවර්තනය කරන්න. Electric buses 200ක් ලබා ගැනීම සඳහා සාකච්ඡාව මම ලෝක බැංකුව සමඟ ආරම්භ කර තිබෙනවා. ණය ප්‍රතිව්‍යුහගතකරණ ගිවිසුම අත්සන් කළාට පසුව අපට පුළුවන්කම ලැබෙයි මේ ටික ලබාගන්න. ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් තොරව කිසිම ව්‍යාපෘතියකට මුදල් ලැබෙන්නේ නැහැ. ඒක ඔබතුමාත් දන්නවා, විෂයානුබද්ධ අවබෝධයක් තිබෙන කෙනෙක් විධියට. දැන් ඒ පිළිබඳ සාකච්ඡා ආරම්භ කර තිබෙනවා. අපේ විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්‍රි මැතිතුමා මේ දිනවල ජපානයේ සංචාරයක යෙදෙනවා. මේ ගිවිසුම අත්සන් කළාට පසුව මේ නතර වෙලා තිබෙන ව්‍යාපෘති ටික ආරම්භ කිරීම සඳහා කටයුතු කරනවා.

සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතයට අවට රක්ෂිත වනාන්තර එකතු කිරීම: ගැසට් නිවේදනය

சிங்கராஜ உலக மரபுரிமை வன ஒதுக்கத்தைச் சுற்றியுள்ள வன ஒதுக்கங்களைச் சேர்த்தல்: வர்த்தமானி அறிவித்தல்

ADDITION OF SURROUNDING FOREST RESERVES TO SINHARAJA WORLD HERITAGE FOREST RESERVE: GAZETTE NOTIFICATION

43/2024

2. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතය වටා පිහිටි රක්ෂිත වනාන්තර 13ක් සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතයට ඇතුළත් කර එම වන රක්ෂිතයේ භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 30,000ක් දක්වා ඉහළ නැංවීමට අදාළ ගැසට් නිවේදනයකට හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 2019 වර්ෂයේදී අත්සන් තබා ඇති බවත්;

(ii) එහෙත්, එම ගැසට් නිවේදනය මේ වනතෙක් ප්‍රකාශයට පත් කර නොමැති බවත්;

එතුමිය දන්නේද?

(ආ) (i) ඉහත ගැසට් නිවේදනය අනුව සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතයට ඇතුළත් කිරීමට යෝජිතව තිබූ එක් එක් රක්ෂිත වනාන්තරය සහ ඒවායේ භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් අක්කරවලින් කොපමණද;

(ii) එම ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීම ප්‍රමාද වීමට බලපාන ලද හේතු කවරේද;

(iii) ඉහත සඳහන් ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிங்கராஜ உலக மரபுரிமை வன ஒதுக்குப் பிரதேசத்தைச் சுற்றி அமைந்துள்ள 13 ஒதுக்குக் காடுகளை சிங்கராஜ உலக மரபுரிமை வன ஒதுக்குப் பிரதேசத்துக்குள் உள்ளடக்கி, அந்த வன ஒதுக்கத்தின் விஸ்தீரணத்தை 30,000 ஹெக்டெயர் வரை அதிகரிப்பதற்கான வர்த்தமானப் பத்திரிகையில் முன்னாள் சனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் 2019ஆம் ஆண்டில் ஒப்பமிட்டுள்ளார் என்பதையும்;

(ii) ஆயினும், இவ்வர்த்தமானப் பத்திரிகை இது வரை பிரகடனப்படுத்தப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வர்த்தமானப் பத்திரிகைக்கு அமைவாக, சிங்கராஜ உலக மரபுரிமை வன ஒதுக்குப் பிரதேசத்துக்குள் உள்ளடக்குவதற்கு உத்தேசிக்கப்பட்டிருந்த ஒவ்வொரு ஒதுக்குக் காடும் அவற்றின் நில விஸ்தீரணம் ஏக்கர் களிலும் தனித்தனியே யாதென்பதையும்;

(ii) மேற்படி வர்த்தமானப் பத்திரிகை வெளியிடப்படுவது தாமதமடைவதற்கு ஏதுவாக அமைந்த காரணங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி வர்த்தமானப் பத்திரிகையைப் பிரகடனப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iv) ஆமெனில், அத்திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු බුද්ධික පතිරණ මහතා]

asked the Minister of Wildlife and Forest Resources Conservation:

(a) Is she aware that -

(i) former President Maithripala Sirisena signed the Gazette Notification in 2019 for the inclusion of 13 forest reserves located around the Sinharaja Forest Reserve, which is a World Heritage, into the Sinharaja Forest and for increasing the area of the Sinharaja Forest Reserve up to 30,000 hectares; and

(ii) however, the said Gazette Notification has not been published so far?

(b) Will she inform this House -

(i) separately, the acreage of each of the aforesaid forest reserves which had been proposed to be included into the Sinharaja World Heritage Forest Reserve, as per the above Gazette Notification;

(ii) the reasons behind the delay in publishing the aforesaid Gazette Notification;

(iii) whether steps will be taken to publish the aforesaid Gazette Notification; and

(iv) if so, the date on which the said Gazette Notification will be published?

(c) If not, why?

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (වනජීවී හා වන සම්පත් සංරක්ෂණ සහ වාරිමාර්ග අමාත්‍යතුමිය)
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னி ஆரச்சி - வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரும் நீர்ப்பாசன அமைச்சரும்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law - Minister of Wildlife and Forest Resources Conservation and Minister of Irrigation)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2150/31 හා 2019 නොවැම්බර් 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් හෙක්ටෙයාර 36,474.93ක විශාලත්වයෙන් යුතු සිංහරාජ වනාන්තරය 2019 නොවැම්බර් 11 වන දින සිට සිංහරාජ රක්ෂිත වනාන්තරය ලෙස ප්‍රකාශයට පත් කර අදාළ ගැසට් නිවේදනය නිකුත් කර ඇත.

(ii) අංක 2150/31 හා 2019 නොවැම්බර් 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇත.

(ආ) (i) සිංහරාජ වනාන්තර සංකීර්ණයට ඇතුළත් වනාන්තරවල භූමි ප්‍රමාණය පහත පරිදි වේ.

වනාන්තරයේ නම	භූමි ප්‍රමාණය (අක්කර)	භූමි ප්‍රමාණය (හෙක්ටෙයාර)
වලන්කන්ද	2319.18	938.94
මාදම්පේ	613.86	248.53
නාහිටිමූකලාන	459.66	186.10
පන්නිල	333.45	135.00
සිංහරාජ ජාතික උරුම වන භූමිය	28227.38	11428.09
මොරපිටිය රූන කන්ද	15281.59	6186.88
දෙල්ගොඩ	2503.32	1013.49
දෙල්ලව	5513.95	2232.37
වරතල්ගොඩ	3039.06	1230.39
වේවැල් කඳුර	1001.33	405.40
රම්මල කන්ද	937.51	379.56
මාදම්පේ	78.74	31.88
එකතුව	**60309.03**	**24416.63**

(ii) ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීම ප්‍රමාද වී නොමැත.

(iii) ප්‍රකාශයට පත් කර ඇත.

(iv) ඉහත (iii) හි සඳහන් පරිදි දැනටමත් කටයුතු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමාත්, මමත් නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කයත්, ඒ වාගේම ගාල්ල දිස්ත්‍රික්කයත්, රත්නපුර දිස්ත්‍රික්කයත් කියන දිස්ත්‍රික්ක තුනට මායිමව තමයි සිංහරාජ වනාන්තරය පිහිටා තිබෙන්නේ. ලංකාවේ තිබෙන එකම ප්‍රාථමික නිවර්තන වැසි සදාහරිත වනාන්තරය සිංහරාජ වනාන්තරයයි. ගරු ඇමතිතුමියනි, ඔබතුමිය කියන විධියට සිංහරාජ වනාන්තරයේ ඒ හෙක්ටෙයාර 36,000ට, මේ මොහොත වන විට අලුතෙන් එකතු කරපු භූමි ප්‍රමාණයත් එක්ක ඒ සියල්ල සමස්තයක් විධියට පිළිගන්න පුළුවන් නෛතිකමය තත්ත්වය නිර්මාණය වෙලා තිබෙනවා ද?

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)
නෛතිකමය තත්ත්වය නිර්මාණය වෙලා තිබෙනවා. ඒ ගැසට් එක නිකුත් කර තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමියනි, මම පසුගිය දවස්වල -දැනට මාස 8කට විතර කලින්- සිංහරාජ වනාන්තරයට මාතර දිස්ත්‍රික්කයෙන් ගිහිල්ලා අපිට ප්‍රවේශ වෙන්න පුළුවන් ස්ථානයට පවා ගියා. එහෙම නෛතිකමය තත්ත්වය නිර්මාණය වෙලා තිබෙනවාය කියලා ඔබතුමිය කිව්වත්, මේ පවරා ගන්නා වතුවල තවමත් සමහර අය තේ වවනවා, සමහර අය එන්සාල් වවනවා. ඒ වාගේම විවිධ මානව ක්‍රියාකාරකම් සිද්ධ වෙනවා. විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරයට බද්ධ වෙලා තිබෙන මේ ප්‍රදේශවල පර්යේෂණ කටයුතු සඳහා යොමු කරන්න වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අඩුයි. මේ ප්‍රදේශවල එම නිලධාරීන්ගේ හිඟයක් තිබෙනවා. ඉතින්, ඒ අයට ඉන්න සීමිත නිලධාරීන් ප්‍රමාණය එක්ක මේ පිළිබඳව විධිමත්ව පර්යේෂණ කරන්න බැරි නිසා අපේ සමහර ඒකදේශික ශාක, ඒක දේශික සත්වයන්, ඒ වාගේම රතු දත්ත පොතට ඇතුළත් වෙලා තිබෙන තර්ජිත ශාක සහ තර්ජිත සත්වයන්,ඒ වාගේම ජලවාංග යනාදී දේවල් ඒ ප්‍රදේශවලින් එකතු කරගෙන යනවා, ගරු කථානායකතුමනි.

සමහර ඒවා පර්යේෂණවලට ගෙන යනවා කියන මුවාවෙන් තමයි අරගෙන යන්නේ. ගරු ඇමතිතුමියනි, මේ කරන්නේ ජාන මංකොල්ලයක් ද කියලාත් බලවත් සැකයක් තිබෙනවා.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මම ඔබතුමියගෙන් අහන්නේ ප්‍රශ්නයක් විධියටම නොවෙයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් යම් යම් නීති පනවා තිබුණත්, මෙවැනි කටයුතු සඳහා අවශ්‍ය නිලධාරීන් ප්‍රමාණය බඳවා ගන්න ඔබතුමිය අවසර දෙන්න. අධ්‍යාපනයට, සෞඛ්‍යයට වාගේම අපේ ඓතිහාසික උරුම රැක ගැනීමටත්, මෙවැනි ජාන මංකොල්ලයන් වැනි ඒවා වැළැක්වීමටත් අපට අවශ්‍ය කරන නිලධාරීන් බඳවා ගැනීමට ඔබතුමිය කැබිනට් පත්‍රිකාවක් හරහා අවසර ඉල්ලුවොත් අනිවාර්යයෙන්ම ඊට අනුමැතිය ලබාගන්න පුළුවන්.

ඊළඟට, සිංහරාජය මායිම් වන ප්‍රදේශවල අනවසර ඉදිකිරීම්, අනවසර වගා කිරීම්, ශාක, සත්ව සහ ජලවාංග ඇතුළු අපේ සම්පත් එළියට අරගෙන යන වැඩ පිළිවෙළ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරලා ඒ දේවල් වළක්වන්න කටයුතු කරන්න පුළුවන්ද, ඒ පිළිබඳව ක්‍රියා මාර්ග ගන්න පුළුවන්ද කියන එකත් මම ඔබතුමියගෙන් දැන ගන්න කැමැතියි.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ප්‍රදේශ ගැන මම විශේෂයෙන් බලන්නම්. ඒ ප්‍රදේශ තිබෙන්නේ කොයි හරියේද කියන එක ඔබතුමා මට පසුව දැනුම් දෙන්න. මොකද, සිංහරාජය ගැසට් කරලා ඉවර වුණාට පස්සේ ඒක ලෝක උරුමයක් බවට පත් කරනකොට තවත් විශාල ප්‍රදේශයක් නැවත ගැසට් කළා. සමහර ස්ථාන ඒ කැලෑ ආරක්ෂා කරපු මිනිස්සුන්ගේ ඉඩම්. ඒ මිනිස්සු තමන්ගේ ඉඩම තුළ තිබෙන කැලෑව ආරක්ෂා කළා. ඒ ඉඩම්වල කැල්ලක තේ තිබෙනවා, කැල්ලක කැලෑව තිබෙනවා. ඒ මිනිස්සු කැලෑවට ආදරය නිසා කැලෑව තියා ගත්තා. සිංහරාජය ලෝක උරුමයක් කරන්නට දෙවැනි වතාවේ ගැසට් කරනකොට සමහර ප්‍රදේශවල මිනිස්සුන්ගේ තේ ඉඩම් එක්කම, ඔවුන් වගා කර තිබෙන සමහර පෞද්ගලික ඉඩම් විශාල ප්‍රමාණයකුත් ගැසට් කළා. එහෙම දෙයක් කරලා තිබෙනවා. සිංහරාජය කියලා කලින් ගැසට් කරපු වෙලාවේත්, ඒක ලෝක උරුමයක් ලෙස අමතරව ගැසට් කරපු වෙලාවේත් මිනිස්සු වගා කරගෙන හිටපු සමහර ප්‍රදේශවල ඉඩම්, මිනිස්සු කැලෑ විධියට ආරක්ෂා කරගත් ඉඩම් ඒ කාලයේ සිංහරාජය යටතේ ගැසට් කරගෙන තිබෙනවා. සමහර වෙලාවට ඒ තුළින් ජන ජීවිතයට විශාල පීඩාවන් ඇති වෙනවා. තමන්ගේ පෞද්ගලික ඉඩමේ කැලෑව සුද්ද කරලා තේ වවපු මනුස්සයාට ප්‍රශ්නයක් නැහැ. කැලෑව රැකපු මනුස්සයා tourism කරනවා නම් ඒ මනුස්සයාට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඉතින් ගැසට් කරන කොට මේ වාගේ තත්ත්වයකුත් ඇති වෙනවා. සමහර වෙලාවට මේවා ගැසට් කරගෙන, කරගෙන යනවා. ඒ ආකාරයට ඉතිහාසයේ ගැසට් කරලා තිබෙනවා. මම ඇමති ධුරයේ හිටියත් එහෙමයි. එහෙම ගැසට් කළාට පස්සේ degazette කරන එකත් හරි අමාරුයි. හැබැයි ඒවා මිනිස්සු පෞද්ගලිකව ප්‍රයෝජනයට ගත් ඉඩම්. නමුත් සමහර ඒවා අත්‍යවශ්‍යම නොවෙන්නත් පුළුවන්. මොකද, සිංහරාජයේ මායිම් ඉතිහාසය පුරාම තිබුණා.

මේ පසුකාලීනව ගැසට් කරන ඒවා. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්වරුන් එක්කත් මම මේ ගැන කථා කළා. මම හැම වෙලාවේම කියන්නේ මේකයි. කැලෑවට කියලා මිනිස්සුන්ගේ තිබෙන තරම් ඉඩම් ගැසට් කරන්න පුළුවන්. හැබැයි, මිනිස්සු ගැනත් බලන්න ඕනෑ. අලුතින් ඉඩම් ගැසට් කරනකොට මිනිස්සු භාවිත කරන, භුක්ති විඳින ඉඩම් ගැනත් බලලා ඉතාම කල්පනාකාරීව ඒක කළ යුතුයි කියන එකයි මම කියන්නේ. අපිට ඕනෑම ඉඩමක් නම් කරලා ගැසට් කර ගන්න එක ලෙහෙසියි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ප්‍රදේශය මොකක්ද කියලා මට පොඩ්ඩක් දැනුම් දෙන්න. මම එතකොට ඒ ගැන වෙනම පෞද්ගලිකව බලන්නම්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, වේලාව ගත වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා වේලාව පරිහරණය කරන හැටි තමයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමියනි, 2004 අගෝස්තු මස 04වැනි දා, ඒ කියන්නේ මීට අවුරුදු 20කට කලින්, සිංහරාජ ජාතික උරුමය රක්ෂිතයට මායිම්ව හෝ මායිමේ සිට මීටර 500ක් ඇතුළත පිහිටි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වනාන්තර ඉඩම් සියල්ල පසුව වන්දි ගෙවීමේ පදනම මත සිංහරාජ ජාතික උරුමයට පවරා ගන්න කියලා කැබිනට් මණ්ඩලය නිර්දේශයක් ලබා දීලා තිබෙනවා. ඒ අනුව හෙක්ටෙයාර 2,490ක් ඇස්තමේන්තු කරලා තිබෙනවා, පවරා ගන්න. ඔබතුමිය ඔය වගා කරලා තිබෙනවා කියලා කියන්නේත්, ඇත්තටම වනයට අයිති සහ buffer zone එකේ ඉඩම්. ඒවා ඉතා නරක විධියට වගා කරනවා. මම මේ ගැන ඔබතුමියට කියන්නම්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔව්, ගරු ඇමතිතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට කාලය වෙන් කරලා තිබෙන්නේ පැයයි. දැන් මෙතැන යන්නේ සංවාදයක්. ප්‍රශ්නවලට උත්තර දීමක් නොවෙයි, මේ සිදු වෙන්නේ. මෙහෙම ගියොත් මේක කරන්න බැරි වෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
බොහොම නිවැරැදියි.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පත්තිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු අධ්‍යාපන ඇමතිතුමනි, මම ඔබතුමාට ගරු කරනවා. ගරු ඇමතිතුමිය කිව්වා ඒ තොරතුරු ලියලා දෙන්න කියලා. ගරු ඇමතිතුමියනි, ඒ තොරතුරු මා ළඟ තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ මුර කැලේ වත්ත හෙක්ටෙයාර 50.4යි. මාතර දිස්ත්‍රික්කය ගත්තොත්, එන්සාල් වත්ත හෙක්ටෙයාර 436යි. ඒ විධියට මට පෙන්වා දෙන්න පුළුවන්. මම ඔබතුමියට කියන්නේ මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලායි. මා ළඟ තිබෙන තොරතුරු දෙන්නම්. ඇත්තටම නීති විරෝධී විධියට වගා කරපු භූමි තමයි මේ වගා කරලා තිබෙන පෞද්ගලික ඉඩම් විධියට පෙන්වන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමිය මුණ ගැහිලා ඔය ගැන කථා කර ගන්න.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(මාණ්පුමිකු සට්ටත්තරණි (තිරුමති) පවිත්‍රාදේවි වන්නිඇරච්චි)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, ඔය කාරණය ඔබතුමා අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට යොමු කරන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කාරක සභාවලට යන්නේ නැතිව මෙතැනට ඇවිල්ලා නිකම් කාලය නාස්ති කරනවා නේ.

මීළඟට, ප්‍රශ්න අංක 03.

2015 සිට සේවක අර්ථසාධක අරමුදලේ සක්‍රිය ගිණුම්: ගෙවන ලද පොලී අනුපාතය

2015 முதல் ஊழியர் சேமலாப நிதியத்தில் இயங்குநிலையிலுள்ள கணக்குகள்: செலுத்தப்பட்ட வட்டி வீதம்

ACTIVE ACCOUNTS IN EMPLOYEES' PROVIDENT FUND FROM 2015: INTEREST RATE PAID

2077/2024

3. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,- (1):

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා සේවක අර්ථසාධක අරමුදලේ සක්‍රියව පැවැති ගිණුම් සංඛ්‍යාව සහ එම ගිණුම් සඳහා ගෙවන ලද පොලී අනුපාතය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පොලී අනුපාත තීරණය කිරීමේ දී සලකා බලන ලද නිර්ණායක කවරේද;

(iii) මේ වනවිට පවතින උද්ධමනය අනුව ඉහත පොලී අනුපාත ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை ஊழியர் சேமலாப நிதியத்தில் இயங்குநிலையிலுள்ள கணக்குகளின் எண்ணிக்கை மற்றும் மேற்படி கணக்குகளுக்குச் செலுத்தப்பட்ட வட்டி வீதம் வருடாந்த அடிப்படையில் தனித்தனியே யாது என்பதையும்;

(ii) மேற்படி வட்டி வீதங்களைத் தீர்மானிக்கும்போது கவனத்தில் கொள்ளப்பட்ட அளவுகோல்கள் யாவை என்பதையும்;

(iii) தற்போது நிலவும் பணவீக்கத்துக்கு அமைய, மேற்படி வட்டி வீதங்கள் போதுமானதல்ல என்பதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) ஆமெனில், அது தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Finance, Economic Stabilization and National Policies:

(a) Will he inform this House -

(i) the number of active accounts which have existed in the Employees' Provident Fund from 2015 to date and the interest rate paid for those accounts, separately according to each year;

(ii) the criteria considered in determining the aforesaid interest rates;

(iii) whether he admits that the above interest rates are not sufficient, given the current inflation; and

(iv) if so, the action will be taken in that regard?

(b) If not, why ?

ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i)

වර්ෂය	දායක මුදල් එවන ලද සාමාජික ගිණුම් සංඛ්‍යාව	මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව	සාමාජිකයන් සඳහා ගෙවන ලද පොලී අනුපාතය (%)
2015	2,569,069	16,860,334	10.50
2016	2,609,665	17,314,362	10.50
2017	2,765,304	18,032,464	10.50
2018	2,849,621	18,704,574	9.50
2019	2,914,493	19,385,104	9.25
2020	2,610,562	19,759,373	9.00
2021	2,535,254	20,344,869	9.00
2022	2,671,904	20,986,186	9.00
2023	2,635,392	21,526,244	13.00

(ii) අරමුදල විසින් සාමාජිකයන් සඳහා ගෙවිය යුතු පොලී අනුපාතය තීරණය කරනුයේ අරමුදලෙහි වාර්ෂික ලාභය / (පාඩුව) මත පදනම්වය.

(iii) නැත. එම පොලී අනුපාත ප්‍රමාණවත් වේ.

(iv) අදාළ නැත.

(ආ) පැන නොනඟී.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සේවක අර්ථසාධක අරමුදලේ තිබෙන මුදල් විවිධ අවස්ථාවල විවිධ සමාගම්වල ආයෝජනය කරනවා. පසුගිය කාල පරිච්ඡේදයේ විටින් විට අපට සුලබව අහන්න ලැබුණු කාරණයක් තමයි, ඒ සමාගම්වල කරන ආයෝජනවලින් ලාභයක් නොවෙයි පාඩු ලැබුණු අවස්ථා තිබුණාය කියන එක. එතකොට, සමස්ත සේවකයින් පිරිසකට අයිති අරමුදල් ඒ විධියට පාඩු ලබන ආකාරයට ආයෝජනය කිරීමෙන් ඇති වෙන අවාසිය, පාඩුව බරපතළයි. එතකොට, එවැනි තීන්දු තීරණ ගැනීම සම්බන්ධයෙන් එම තීන්දු තීරණ ගන්නා අයට වගකීමක් දරන්න වෙන්නේ නැද්ද? ඔවුන් සම්බන්ධයෙන් අවශ්‍ය යම් ක්‍රියාමාර්ගයක් නොගන්නවාද, ඒ පිළිබඳව තිබෙන විනිවිදභාවය මොකක්ද කියලා මම දැනගන්න කැමතියි.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, සේවක අර්ථසාධක අරමුදල සියයට 90කට වඩා ආයෝජන කරලා තිබෙන්නේ Government Securitiesවල, ඒ කියන්නේ රජයේ බැඳුම්කර හෝ බිල්පත්වල. එය කළමනාකරණය කරලා තමයි මේ ලාභය ලබන්නේ. රටක පවතින ආර්ථික තත්ත්වයන් උඩ යම් යම් අවස්ථාවල ලබන ප්‍රතිලාභය උච්චාවචනය වෙන්න පුළුවන්. ගරු කථානායකතුමනි, වර්තමානය ගත්තොත්, සේවක අර්ථසාධක අරමුදල තමයි වැඩියෙන්ම විපක්ෂයේ විවේචනයට ලක් වුණු තැන. ඒ කියන්නේ රජය ගත්ත ක්‍රියාමාර්ග තුළ වැඩියෙන්ම විවේචනය කළේ සේවක අර්ථසාධක අරමුදල පිළිබඳවයි.

ගරු කථානායකතුමනි, මොනතරම් විවේචනයක් රජයට එල්ල කළත් අපට පුළුවන් වුණා, 2023 අවුරුද්දේ සේවක අර්ථසාධක අරමුදලට සියයට 13ක පොලියක් දෙන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කියන ආයෝජන සම්බන්ධයෙන් මා ළඟ දැනට තොරතුරු නැහැ. ඔබතුමා වෙනම ප්‍රශ්නයක් ඉදිරිපත් කළොත් ඒ පිළිබඳව තොරතුරු ලබා දෙන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, මතුපිටින් කිව්වාට අහවල් තැන ආයෝජනය කරලා තිබෙනවාද, නැද්ද කියන එක මේ ප්‍රශ්නයට අදාළ නැති හින්දා මට දැනට පිළිතුරක් දෙන්න බැහැ. ඒ investment portfolio එක මොකක්ද කියලා ඔබතුමා ඇහුවොත් අපි ලබා දෙනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දැන් සාමාන්‍ය සේවකයන්ගේ සේවක අර්ථසාධක අරමුදලට සියයට 9ක පොලියක් තමයි ලැබෙන්නේ. හැබැයි, අපි දන්න විධියට මහ බැංකුවේ සේවකයන්ගේ අර්ථසාධක අරමුදලට සියයට 29ක පොලියක් එකතු වෙනවා. මම අහන්නේ, මහ බැංකුවේ ඉන්නේ අමුතු සේවකයන් ජාතියක්ද, අමුතු ජීවීන් කොට්ඨාසයක්ද, ඒ අයට දැනෙන්නේ අමුතු බඩගින්නක්ද, මේ සාමාන්‍ය සේවකයන් වෙනම ජන කොට්ඨාසයක්ද, ඔවුන්ට දැනෙන්නේ වෙනම බඩගින්නක්ද, ඔවුන්ගේ දරු පවුල් වෙනස්ද කියලායි. කණ්ඩායමකට සියයට 9ක පොලියක් ගෙවද්දි එක්තරා විශේෂ කණ්ඩායමකට සියයට 29ක පොලියක් ගෙවන්නේ කොහොමද? ඒක බරපතළ අසාධාරණයක්. සාමාන්‍ය සේවකයන්ගේ අර්ථසාධක අරමුදලට අඩු පොලියක් ලැබෙනකොට, ඊට දෙගුණයකටත් එහා ගිය, තුන් ගුණයකටත් එහා ගිය සියයට 29ක පොලියක් මහ බැංකු සේවකයන්ගේ අර්ථසාධක අරමුදලට ලැබෙන්නේ කොහොමද, ගරු රාජ්‍ය ඇමතිතුමනි?

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, මහ බැංකුවේ අධිපතිතුමාත්, මුදල් මණ්ඩලයත් මේ පිළිබඳව අවධානය යොමු කරලා, මේ වෙනකොට ඒ ඇති වෙච්ච තත්ත්වය සමාලෝචනය කරලා සාමාන්‍ය පරිදි කටයුතු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී මූලිකම ප්‍රශ්නය ආවේ මහ බැංකුවේ පොලී අනුපාතය පිළිබඳව නොවෙයි. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන සම්පූර්ණ කරන්න අපට දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට යන්න වෙච්ච අවස්ථාවේ ඔබතුමන්ලා ඊට විරුද්ධව ඡන්දය දුන්නා. ණය ප්‍රතිව්‍යුහගත කිරීම හොඳයි කියලා කිව්වාට ඒක ක්‍රියාත්මක කරද්දි කකුලෙන් අදින්න, අඩපණ කරන්න ඔබතුමන්ලාගේ පාර්ශ්වය කටයුතු කළා. එතකොට අපි යම්කිසි පොරොන්දුවක් දුන්නා. ජනාධිපතිතුමා විශේෂයෙන්ම කිව්වා, සේවක අර්ථසාධක අරමුදලට අනිවාර්යයෙන්ම සියයට 9ක පොලියක් ලබා දෙනවා, යම්කිසි හෙයකින් මේ දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම තුළ ආයෝජනවලින් ඒ සියයට 9 ලබා ගන්න බැරි වුණොත්, ඒ හිඟ මුදල් මහා භාණ්ඩාගාරය මඟින් පියවීමට පවා කටයුතු කරනවා කියලා.

උදාහරණයක් විධියට අපට පෙන්වන්න පුළුවන්, ආයෝජනවලින් සියයට 8ක පොලියක් ලැබුණොත් -සියයට 9කට රජය එකඟ වුණා- ඒ සියයට එක මහා භාණ්ඩාගාරය මඟින් පියවන්න කටයුතු කරනවා කියන කාරණය. ඒ අනුව අපේ රටේ සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ට අසාධාරණයක් නොවෙන්න අපි කටයුතු කරනවා. හැබැයි, අවසාන ප්‍රතිඵලය විධියට සියයට 9ක් අපි බලාපොරොත්තු වුණත්, සියයට 13ක ප්‍රතිලාභයක් සේවක අර්ථසාධක අරමුදලට ලැබුණා. මේක තමයි ඔබතුමන්ලා මුලින් මතු කළ කාරණය. දෙවනුව මතු කළ කාරණය සම්බන්ධයෙනුත් මහ බැංකුව අවධානය යොමු කරලා, ඒ අවශ්‍ය කටයුතු මේ වෙනකොට ම සිදු කරලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, සේවක ප්‍රජාව ගැන කථා කරන මේ අවස්ථාවේ මේ පාර්ලිමේන්තුවේ ප්‍රධානියා වන ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ බහුතර සේවක සේවිකාවන් මුහුණ දී ඇති කරුණක් සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. මේ වන විට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ වැටුප් ප්‍රතිව්‍යුහගතකරණයකට අවධානය යොමු වෙලා තිබෙනවා. මම ඔබතුමාගෙනුත්, ගරු මහ ලේකම්තුමියගෙනුත් ඉල්ලීමක් කරනවා, මේ වැටුප් තලවල වැඩි කිරීම් කරනකොට සියලු සේවක පාර්ශ්වයන්ට, සියලු කොට්ඨාසවලට සාධාරණයක් ඉෂ්ට වන ආකාරයට එය ක්‍රියාත්මක කරන්න කියලා.

ඒ වාගේම තව පුංචි කාරණයක් මට කියන්න තිබෙනවා. විශේෂයෙන්ම මේ කාරණය කෙරෙහි ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. ගරු ඇමතිතුමනි, මෙම කරුණ කෙරෙහි මම විනාඩියකට ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. පාසල් පද්ධතියට යනකොට අපි දකින බරපතළ අඩුපාඩුවක් තිබෙනවා. පාසල් පුස්තකාලවල අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිටපතක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් නැහැ. ඒ සම්බන්ධව මම යෝජනාවක් කරනවා. ඒක මහ ලොකු දෙයක් නොවෙයි. Government Printing Department එකට කියලා print කරලා, මේ රටේ සෑම පාසල් පුස්තකාලයකටම අනිවාර්යයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිටපතක් යවන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

අවසාන වශයෙන්, අපේ ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමාට මම මේ කාරණය කියන්න කැමැතියි. අපි දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයට විරුද්ධ වුණේ අනුගමනය කළ ක්‍රමවේදයේ වරද නිසායි. වැඩ කරන සේවක ප්‍රජාවගේ අර්ථසාධකයට පික්පොකට් ගහලා primary bond dealersලාව බේරුවා. මේ රටේ සුපිරි පෝසතුන්ට කිසිම බරක් ලබා නොදී දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදාමය තුළ සල්ලිකාරයෝ ටික බේරුවා, කෝටිපතියන් ටික බේරුවා. වැඩ කරන ජනතාවගේ pension funds පික්පොකට් ගැහුවා. ඒකයි අපි දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට විරුද්ධ වුණේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, අතිශයින් වැදගත් කාරණා දෙකක් මතු කරන්න මට අවස්ථාව දෙන්න. ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා දැන් කිව්වා, සියයට 9ක් තමයි දෙන්න තිබෙන්නේ, නමුත් ඊට වඩා දෙන්න පුළුවන් නම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒක දෙනවා කියලා. ඇත්තවශයෙන්ම ඔබතුමන්ලා කිව්වේ සියයට 9ක් දෙනවා කියලා නොවෙයි. ආණ්ඩුව කිව්වේ 2024ටයි, 2025ටයි සියයට 12ක් දෙනවා කියලායි. මොකක්ද, සියයට 9ක් කියන්නේ? සියයට 12ක් කියලා තමයි යෝජනාව ඉදිරිපත් කළේ. ගරු කථානායකතුමනි, එතකොට ඒක සියයට 12 ඉඳලා සියයට 9ට අඩු කරලා තිබෙනවා නම් ඒ ගැන අපව දැනුවත් කරන්න. ඒකට වෙනම විවාදයක් පවත්වන්න ඕනෑ. *[බාධා කිරීමක්]* Let me finish, please. අපි මෙතැනදී විරුද්ධව ඡන්දය දුන්නේ අර crisis bondsවලට සියයට 29.7ක් වාගේ ගණනක් ගෙවන අවස්ථාවේදී අර්ථසාධකයට විතරක් පහර ගහපු නිසායි. එහෙම නැතුව අපි මේකට විරුද්ධ වුණේ නැහැ. අපි විරුද්ධ වුණේ ක්‍රියාදාමයට. අපි දැනුවත් කළේ 2024ටත්, 2025ටත් සියයට 12ක් ගෙවනවා කියලායි. 2026 වර්ෂයේ ඉඳලා 2038 වර්ෂය දක්වා තමයි සියයට 9 ගෙවනවා කිව්වේ. ඒ, පළමුවැනි වරද.

ඊළඟට දෙවනුව මෙන්න මේ කාරණය මම නිවැරැදි කරන්න ඕනෑ. අපි කමිටුවක් පත් කළා, මහ බැංකු සේවකයන්ගේ වැටුප් සම්බන්ධයෙන් හොයා බලන්න. එතැනදී අපි නිර්දේශයක් දුන්නා, ඒ අයගේ අර්ථසාධක අරමුදලට ලැබෙන මේ සියයට 29ක් වූ පොලී අනුපාතය වහාම වෙනස් කරන්න ඕනෑය කියලා. ඒක ඔවුන් පිළිගත්තා. එම නිසා අපි කැමැතියි ඔබතුමාට දන්වන්න, ඒ වාර්තාවට අනුව ඔවුන් ඒක දැනටමත් කරයි කියලා අපට වාර්තා කර තිබෙන බව. එහෙම වෙලා නැතුව තවමත් ඒ සම්බන්ධයෙන් හොයා බලනවා නම් එතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා කියලායි අපි කියන්නේ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු කථානායකතුමනි, මා මිත්‍ර හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට සියයට 13ද විශාල, සියයට 12ද විශාල කියන කාරණාව තේරුම් ගන්න බැරි නම් ඒක මට තවදුරටත් පැහැදිලි කරන්න බැහැ. ගරු මන්ත්‍රීතුමනි, මුදල් කාරක සභාව හැටියට ඔබතුමාගේ කමිටුව නොයෙක් අවස්ථාවලදී අපට සහයෝගය ලබා දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය තීන්දුවක් ගන්නේ ජනවාරි මාසයේදීයි. අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් තීන්දුවක් ගන්නේ මේ කමිටු නිර්දේශය මත නොවෙයි. 2024 ජනවාරි මාසය වෙද්දී ඔවුන් ඒ තීන්දුව ගන්නවා. මේ කමිටුව පත් වෙන්නේ ඊට පස්සේ. යම් යම් තැන්වල සිදු වෙලා තිබෙන කාරණා නිවැරැදි කිරීමට සහ අවධානය යොමු කරන්න අවශ්‍ය නම් ඒ අවධානය යොමු කරලා නිවැරැදි කිරීම් සිදු වෙලා තිබෙනවා. මම හිතන විධියට, කමිටුවෙනුත් මේ සම්බන්ධව නිර්දේශයක් ගියා නම් හොඳයි. හැබැයි, කමිටුවේ නිර්දේශය යන්න ඉස්සෙල්ලා මහ බැංකුවේ අධිපතිතුමා සහ මුදල් මණ්ඩලය ඒ පෙන්වා දීපු කාරණය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මට තත්පරයක් දෙන්න. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට මම ඒ සම්බන්ධව වචනයක් කියන්න ඕනෑ.

ගරු අගමැතිතුමනි, ඔබතුමාත් සභාවේ ඉන්න වෙලාවේයි මම මෙය කියන්නේ. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු යෝජනාවේ කිසිම තැනක සියයට 13ක් සම්බන්ධයෙන් සඳහන් වෙන්නේ නැහැ. ඒකේ තිබෙන්නේ සියයට 9යි කියලා. දැන් ප්‍රශ්නය අහපු ගරු මන්ත්‍රීතුමා කිව්වේත් සියයට 9යි කියලා. සියයට 9 නොවෙයි, 2025 වසර දක්වා සියයට 12ක් දෙනවා කියලා පාර්ලිමේන්තුවේදී එකඟ වුණා. එම නිසා සියයට 9 දක්වා වැඩි කළා කියන්න බැහැ. 2024ටත්, 2025ටත් සියයට 12ක් ලැබෙන්නම ඕනෑ. සියයට 13ක් ගැන කිසිම තැනක සඳහන් වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, දිගින් දිගටම මේ කාරණය කථා කරලා පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කරන්න බැහැ. සියයට 12ක් නම් බලාපොරොත්තු වෙන්නේ, අපි එය කළමනාකරණය කරලා සියයට 13ක් ලබා දීලා තිබෙනවා නම් අපි පොරොන්දු වෙච්ච දේ ඉෂ්ට කරලා තිබෙනවා නේ. හැබැයි, එතුමන්ලා ණය ප්‍රතිව්‍යුහගතකරණයට විරුද්ධව ඡන්දය ලබා දීම පිළිබඳවත් අද කනගාටු වෙන්න ඕනෑ, ගරු කථානායකතුමනි. එසේ විරුද්ධ වෙලා තිබියදීත්, අපි රට බේරා ගන්න කටයුතු කළා.

ගරු නිමල් ලාන්සා මහතා
(මාණ්පුමිකු නිමල් ලාන්සා)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි, මමත් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙක්. කාරක සභාවේදී අපේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා මහ බැංකු අධිපතිතුමාට මේ ගැන මතක් කළාම අපේ ගරු රාජ්‍ය ඇමතුමා කියපු දේ තමයි, මහ බැංකුවේ අධිපතිතුමා කිව්වේ, සියයට 13 ගණනේ එම අවුරුදු ගණනට දෙනවා කියලා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී පැහැදිලිවම සියයට 13 ගැන කථා කළා. හැබැයි ගරු කථානායකතුමනි, කමිටුවේ සභාපතිතුමා දැන් කියනවා, නැහැ කියලා. මම එතුමාට යෝජනා කරනවා, කමිටුවේ notes ටික අරගෙන බලන්න කියලා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මහ බැංකු අධිපතිතුමාට ඔබතුමා පුන පුනා මේ කරුණ මතු කළා, සියයට 9 මදි, එය වැඩි වෙන්න ඕනෑය කියලා. සියයට 12ක් බලාපොරොත්තු වුණාම අද සියයට 13ක් දෙනවා නම් සහ මමත් සාමාජිකත්වය දරන කාරක සභාවේදී සියයට 13ක් ගැන සාකච්ඡා කළා නම්, අද ගරු සභාවේදී ඔබතුමා එය නැහැයි කියන එක වැරදියි කියන එකයි මම කියන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔය argument එක වෙනම කරනවා ද?

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු පිරසන්න රණතුංග)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, මේක දැන් මරණාධාර සමිතියක් වාගේයි. ඔබතුමා සභාව පාලනය කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මේ ගැන කථා කිරීම ගැන. ඔව්, අපි දිගින් දිගටම කිව්වා සියයට 13ක් ගෙවන්න කියලා. මම කියන්නේ මෙච්චරයි. එහෙම නම් එම යෝජනාව amend කරලා සියයට 12 කියන එක සියයට 13 කරන්න. ඒ යෝජනාවේ කොතැනකවත් සියයට 13ක් ගැන සඳහන් වෙන්නේ නැහැ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දැන් උත්තරයක් දුන්නා. ඒ ඇති නේ.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු පිරසන්න රණතුංග)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, ඔබතුමා මේ සභාව පාලනය කළේ නැත්නම් මේක දැන් මරණාධාර සමිතියක් වාගේ වෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි ඊළඟ ප්‍රශ්නයට යමු.

ප්‍රශ්න අංක 04 -2085/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා මහ බැංකුවේ නිලධාරීන් හොඳට බෙදා ගත්තා කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එතැන point of Order එකක් නැහැ. කරුණාකරලා අපි ඊළඟ ප්‍රශ්නයට යමු.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමාට තරහ යනවා නේ. තරහ ගන්න එපා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
බොරුවට කාලය නාස්ති කරනවා නේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මේක කාලය නාස්ති කිරීමක් නොවෙයි. මොකද, පස්සේ කමිටුවක් පත් කෙරුවා නේ, මහ බැංකුවේ හිටපු සභාපති,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතැන රීති ප්‍රශ්නයක් නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඒ කමිටුවෙන් කිව්වා, මේ පඩි වැඩි කිරීම අසාධාරණයි කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක අසාධාරණයි. ඒ කාරණය දැන් පැත්තකින් තියන්න.

දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සහ ධර්මාචාර්ය විභාගය: ශ්‍රේණිගත කිරීම

அறநெறிப் பாடசாலை இறுதிப் பரீட்சையும்

தர்மாசார்ய பரீட்சையும்: தரப்படுத்தல்

DHAMMA SCHOOL FINAL CERTIFICATE EXAMINATION AND DHARMACHARYA EXAMINATION: RANKING

2143/2024

5. ගරු උදය ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දහම් පාසල් අවසන් විභාගය සහ ධර්මාචාර්ය විභාගය ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව යටතේ ශ්‍රේණිගත කර තිබේද;

(ii) එසේ නම්, එම ශ්‍රේණිගත කිරීම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அறநெறிப் பாடசாலை இறுதிப் பரீட்சை மற்றும் தர்மாசார்ய பரீட்சை என்பன இலங்கை தகைமைகள் சட்டகத்தின்கீழ் தரப்படுத்தப் பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி தரப்படுத்தல்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education -

(a) Will he inform this House -

(i) whether the Final Certificate Examination of Dhamma schools and Dharmacharya Examination have been ranked under the Qualification Framework of Sri Lanka; and

(ii) if so, the said level of grading?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) දහම් පාසල් අවසන් විභාගය සහ ධර්මාචාර්ය විභාගය ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව යටතේ මේ වනතුරු ශ්‍රේණිගත කිරීමක් සිදු කර නොමැත.

(ii) ඉදිරියේදී බුද්ධශාසන අමාත්‍යාංශය ඇතුළු ඊට සම්බන්ධිත ආයතන සමඟ ඒකාබද්ධව ඉහත විභාගවල ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව යටතේ ශ්‍රේණිගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ගරු උදය ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, 1990 ඉඳන්ම දහම් පාසල් ගුරුවරුන්ට කරන ඇගැයීමක් විධියට ගුරු ක්ෂේත්‍රයට එකතුවීමට අවස්ථාවක් දුන්නා. 2019දී පවත්වපු, දහම් පාසල් ගුරුවරු රජයේ ගුරුවරු විධියට බඳවා ගැනීමේ විභාගයේ ප්‍රතිඵල ලබා නොදී තිබියදී දහම් පාසල් ගුරුවරු ලොකු උත්සාහයක් දරලා මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ එහි ප්‍රතිඵල නිකුත් කරවා ගත්තා. නමුත්, ඔවුන්ට මේ දක්වා සම්මුඛ පරීක්ෂණ පවත්වා නැහැ. අපි ජනමාධ්‍ය හරහා දකිනවා, ඔබතුමන්ලා ගුරුවරු බඳවා ගන්න බව. මේ වනවිටත් පාසල්වල ගුරු පුරප්පාඩු තිබෙනවා. ඒ නිසා මේ අය බඳවා ගැනීමට ඔබතුමා කටයුතු කරනවාද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එතුමා කියන ආකාරයටම 2019දී තමයි මෙම විභාගය පවත්වා තිබෙන්නේ. 2019දී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරයට පත් වෙලා හදපු ආණ්ඩුවේ ජී.එල්. පීරිස් මැතිතුමා තමයි අධ්‍යාපන ඇමතිවරයා හැටියට කටයුතු කළේ. මම අධ්‍යාපන ඇමති වෙලා එනකම් 2019දී පවත්වපු විභාගයේ ප්‍රතිඵල නිකුත් කරන්න බැරි වුණා. මම බුද්ධශාසන කාර්යසාධක මණ්ඩලයත් එක්ක සාකච්ඡා කරලා, එහි ප්‍රතිඵලයක් හැටියට ඒ කටයුත්ත කඩිනම් කරලා, විභාග එකින් එකට, එකින් එකට කල් ගිහිල්ලා තිබෙන වෙලාවේ තමයි ඉතාම ලොකු ප්‍රයත්නයක් දරලා මේ ප්‍රතිඵල නිකුත් කළේ. ඒ නිසා දැන් අඩුම ගණනේ ප්‍රතිඵලවත් නිකුත් කරලා තිබෙනවා.

ඔබතුමා අහපු ප්‍රශ්නයට පිළිතුර මෙකයි, ගරු මන්ත්‍රීතුමා. ගුරුවරු බඳවා ගන්නවා. ගුරුවරු බඳවා ගන්න ක්‍රම දෙකයි තිබෙන්නේ. එක ක්‍රමයක් තමයි විද්‍යාපීඨවලින් බඳවා ගැනීම. අනෙක් ක්‍රමය තමයි උපාධිධාරීන් බඳවා ගැනීම. විද්‍යාපීඨවලට අපි වාර්ෂිකව බඳවාගැනීම් කරගෙන යනවා. මේ වනවිට ප්‍රමාද වෙලා තිබෙන බඳවාගැනීම් කටයුතු online ක්‍රමය අනුව සිදු කරමින් 16වැනි දා 2021-2022 batch එකත් ගන්නවා. ඒකට ප්‍රතිපාදන හැම දාම භාණ්ඩාගාරයෙන් වෙන් කරනවා, ඒ ඉවත්ව යන සංඛ්‍යාව වෙනුවට.

ඊළඟට, සංවර්ධන නිලධාරීන් 23,000ක් පාසල්වලට යොමු කළේත් ඒ කාලයේදීම තමයි. ඒ කාලයේදී ජී.එල්. පීරිස් මැතිතුමා තමයි අධ්‍යාපන ඇමතිතුමා වශයෙන් කටයුතු කළේ. ඔබතුමන්ලා

බොහොම ප්‍රමෝදයට පත් වෙනවා, ඒක කියනකොට. *[බාධා කිරීමක්]* හැබැයි, දැන් එතුමා ඔය පැත්තේ ඉන්නේ. එතුමා ඔය පැත්තේ ඉන්න නිසා ඒ ගැන කියන්න. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්නකෝ. මම මේ ටිකේ arrears clear කරනවා. අහන්නකෝ, ඒ ගැන ඩලස් අලහප්පෙරුම මැතිතුමාගෙන්. එතුමා නම් අධ්‍යාපන ඇමතිතුමා වශයෙන් හිටියේ මාස කිහිපයයි. මේක තමයි, දුන්නු දායාදය.

ඊයේ මගෙන් සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය ඇහුවා. ඔව්, මාස 15ක් තිස්සේ නඩුව ප්‍රමාද වුණා. බැරිම තැන අපි යෝජනාවක් කළා. දැන් නඩුව අහන්නේම නැහැ නේ. දැන් නඩුව කල් දමමින් යනවා. ඒ Bench එක වෙනස් වෙනවා. අලුතින් constitute කරනවා; යනවා. ඊයේ අපි යෝජනාවලිය දුන්නාම ඒකටත් සතියක් කල් ගත්තා. මෙහෙම කරන්න බැහැ නේ. ඒකට එහෙමයි වුණේ. සංවර්ධන නිලධාරීන් බඳවා ගන්න තීන්දු කළේ ඒ අය රජයේ වැටුපක් ලබන නිසායි. ඒ නිසා අලුතින් වැටුප්වලට කියා මුදල් වෙන් කරන්න ඕනෑ නැහැ. වැටුප්වලට මුදල් වෙන් කරන්න ඕනෑ වෙන්නේ ගුරු සේවයට ස්ථිරව බඳවා ගන්න දවසට. බංකොලොත් වෙච්ච රටේ ඒ අවුරුදු දෙකට ප්‍රතිපාදන වෙන් නොවුණු නිසා තමයි ඒක කළේ. ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔය බඳවා ගැනීම් සියල්ලම පළාත් මට්ටමින් කරන්නේ, විශ්‍රාම ගිය අයගේ සහ සේවය හැර ගිය අයගේ ඉතුරු වුණු වැටුපට. අපි ඒ ආකාරයට තමයි තිබුණු ගුරු හිඟය අද වනකොට පළාත් මට්ටමින් අඩු කරගෙන තිබෙන්නේ.

රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ගණිතය, තාක්ෂණවේදය, විදේශ භාෂා යන විෂයයන් සඳහා අවුරුදු ගණනකින් ගුරුවරු බඳවාගෙන නැහැ. දැන් දරුවන්ට තිබෙන මේ පාඨමාලා අනුව තමයි ඒගොල්ලන් ගම් මට්ටමින් තර්ක ශාස්ත්‍රය, ජනමාධ්‍ය වැනි විෂයයන් හදාරමින් එන්නේ. එහෙම උපාධි ගත්තාම රැකියා වෙළඳ පොළේ රැකියා නැහැ. ඊයේ අහපු ප්‍රශ්නය ඒ කාරණයට සම්බන්ධයි. දැන් මොකක්ද කරන්න තිබෙන්නේ? 1AB පාසල් තිබෙන්නේ 925යි. එහෙම නම් අපි විද්‍යා, ගණිත ගුරුවරු ලබා දීලා, ගමේ දරුවන්ටත් මේ විෂයයන් ඉගෙන ගන්න අවස්ථාව ලබා දෙන්න ඕනෑ. දැන් ඔබතුමා අහන ප්‍රශ්නයට අදාළව ගත්තොත්, බුද්ධ ධර්මය විෂයය උගන්වන්න අපේ පාසල්වල ඇති තරම් ගුරුවරු ඉන්නවා. සංවර්ධන නිලධාරීන්ගෙන් පාසල්වලට ආපු සියයට 75ක් කලා උපාධිධාරීන්. මේ අය අතුරින් බහුතරයක් බෞද්ධ ශිෂ්ටාචාරය කරලා තිබෙනවා; බෞද්ධ දර්ශනය කරලා තිබෙනවා. මේ සියලුදෙනාටම ඒ සුදුසුකම් තිබෙනවා. හැබැයි, මම ඒ විභාගය බැහැර කරන්නේ නැහැ. පැවැත්වූ විභාගයේ ප්‍රතිඵල අනුව යම් පිරිසක් බඳවා ගන්න පුළුවන් නම් අපි ඒ සඳහා ප්‍රයත්න දරනවා. භාණ්ඩාගාරය මුදල් වෙන් කළාම ඒ පිරිස බඳවා ගැනීමටත් අවශ්‍ය පියවර ගන්නවා.

ගරු උදය ගම්මන්පිල මහතා
(*மாண்புமிகு உதய கம்மன்பில*)
(The Hon. Udaya Gammanpila)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීම සඳහා මම ජයන්ත සමරවීර මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

ගරු ජයන්ත සමරවීර මහතා
(*மாண்புமிகு ஜயந்த சமரவீர*)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමාට යොමු කරන දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පිරිවෙන් අධ්‍යාපනයේ ඉතාම වැදගත්, බලවත් තනතුර තමයි පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර, ගරු අමාත්‍යතුමනි.

මේ වෙනකොට අපේ රටේ පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර හිස් වෙලා තිබෙන්නේ. ඒ සඳහා කැබිනට් සන්දේශ දෙකක් ඔබතුමන්ලා ඉදිරිපත් කරලා තිබෙනවා. අවසාන කැබිනට් සන්දේශයෙන් කියන්නේ රාජ්‍ය සේවා කොමිසමේ නිර්දේශ මත පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර ස්ථාපිත කරන්න කියලා. රාජ්‍ය සේවා කොමිසම කියන්නේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මහපෙන්වීම මත පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර ස්ථාපිත කරන්න කියායි. පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර කියලා එක තනතුරයි තිබෙන්නේ. මේ තනතුර දැන් හිස් වෙලා තිබීම නිසා පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය රැස් වෙන්නේ නැහැ. මොකද, පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ තමයි පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලයේ ලේකම්වරයා හැටියටත් කටයුතු කරන්නේ. ඒ නිසා පෙබරවාරි 10වැනි දා තමයි පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය අවසාන වශයෙන් රැස් වුණේ. පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය රැස් නොවීම නිසා පිරිවෙන්වල පරිපාලන, මූල්‍යමය, විනය ගැටලු විශාල ප්‍රමාණයක් මේ වෙනකොට ඇති වෙමින් තිබෙන බව අපට වාර්තා වෙමින් තිබෙනවා.

ඒ වාගේම ගරු අමාත්‍යතුමනි, පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම් ලැබූ හිමිවරු හය නමක් දැනට අධ්‍යාපන අමාත්‍යාංශයේ විවිධ රාජකාරිවල නියැළී ඉන්නවා. විශේෂයෙන්ම අධ්‍යක්ෂ ධුරවල නියැළී ඉන්නවා. සම්මුඛ පරීක්ෂණයක් කැඳවා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කියන පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙන නිර්දේශය පරිදි, මේ හයදෙනා අතුරින් සුදුසු හිමිනමක් පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ධුරයට පත් කර ගැනීම සඳහා ඔබතුමා කවදාද කටයුතු කරන්නේ? ඒ සඳහා කඩිනමින් කටයුතු කරනවාද, එය කිරීමට බාධාවක් තිබෙනවාද? පිරිවෙන් අධ්‍යාපනය බරපතළ වියවුල් සහගත තත්ත්වයකට ඇද වැටිලා තිබෙන නිසා ඉතාම කඩිනමින් සුදුසුකම් ලබපු හිමිවරු හයදෙනා අතුරින් සුදුසු හිමිනමක් කඩිනමින් පත් කරලා, මේ පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමට කටයුතු කරන්න කියන ඉල්ලීමත් මේ ගමන්ම මම කරනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(*மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த*)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, උත්තරය දෙන්න කලින් මම ඔබතුමාගෙන් එක ප්‍රශ්නයක් අහන්නද? ඔබතුමා කියන ඔය හයදෙනාගෙන් කාට හරි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා සුදුසුකම තිබෙනවාද?

ගරු ජයන්ත සමරවීර මහතා
(*மாண்புமிகு ஜயந்த சமரவீர*)
(The Hon. Jayantha Samaraweera)
මා දන්නා තරමින්,-

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(*மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த*)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
කාටවත් නැහැ. *[බාධා කිරීමක්]* මම ඒකට උත්තරය දෙන්නම්.

ගරු කථානායකතුමනි, මගේ විෂයය පිළිබඳව පූර්ණ අවබෝධයෙන් තමයි මම උත්තර දෙන්නේ. පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ධුරයේ කලින් හිටපු ස්වාමීන් වහන්සේත් අවුරුදු ගණනක් ඒ ධුරයේ හිටියා. නමුත් ඒ ස්වාමීන් වහන්සේත් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ කෙනෙක් නොවෙයි. එතකොට කවුරුවත් ඔය ප්‍රශ්නය ඇහුවේ නැහැ. ඔය ස්වාමීන් වහන්සේලා හයදෙනා ඇහුවේත් නැහැ. ඔය ස්වාමීන් වහන්සේලා හයදෙනා සහ ඔබතුමා කිව්ව හිටපු පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේත් කියන ඒ ඔක්කොම එකට තමයි අවුරුදු ගණනාවක්ම එතැන හිටියේ. නමුත්, කවුරුවත් ඔය ප්‍රශ්නය ඇහුවේ නැහැ. මම මීට පෙර අධ්‍යාපන ඇමති වෙලා ඉන්නකොට ගිහියෙක් පිරිවෙන්

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

අධ්‍යාපන අංශයේ අධ්‍යක්ෂ වෙලා හිටියා. එතුමා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ I තනතුර දරපු කෙනෙක්.

ස්වාමීන් වහන්සේලා නොවන පිරිවෙන් අධ්‍යක්ෂවරු ඉතිහාසයේ මේ රටේ ඉඳලා තිබෙනවා. ඒ අය ඉතා සාර්ථකව ඒ තනතුරේ කටයුතු කරලා තිබෙනවා. ඊට පස්සේ සම්පූර්ණයෙන් පිරිවෙන් අංශය අවුලක් බවට පත් වුණා, ඔය හේතුව නිසා. කිසිම කෙනෙක් ඔය පිරිස අතර නැහැ, අධ්‍යාපන පරිපාලන සේවයේ. දමා ගත්ත නම්වලින් තමයි ඔය ඉන්නේ. අපි මේක නියමානුකූල කරන්න DMS එකෙන් අවසර ඉල්ලුවා. නමුත්, ඒ අවසරය ඔය කියන ආකාරයට ලැබුණේ නැහැ. ඊට පස්සේ අපි එපිට අවුරුද්දේ, දැන් ඉන්න පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේ ඒ නිකායන්වල එකඟතාවත් ඇතුව වැඩ ආවරණය කිරීම සඳහා තාවකාලිකව පිරිවෙන් අධ්‍යක්ෂ ධුරයට පත් කළා, කැබිනට් පත්‍රිකාවක් මඟින්. ඊට පසුව ඒ කාලය අවසන් වුණා. කාලය අවසන් වුණාම නැවත ගැටලුවක් ආවා. අවසාන වශයෙන් දැන් අවසර දීලා තිබෙනවා, මාස හයක කාලයක් සඳහා, DMS එකත් එක්ක කථා කරලා අවශ්‍ය තනතුරු සංඛ්‍යාව නිර්මාණය කරගෙන සුදුසුකම් තිබෙන අය බඳවා ගන්නා තෙක් ඒ ඉන්න ස්වාමීන් වහන්සේට පිරිවෙන් අධ්‍යක්ෂ ධුරයේ කටයුතු කරගෙන යන්න. පිරිවෙන් මණ්ඩලය රැස්වෙන්න බැරි වෙලා තිබෙන්නේ පිරිවෙන් අධ්‍යක්ෂ ධුරයේ ප්‍රශ්නය නිසා නොවෙයි. පිරිවෙන් මණ්ඩලය ස්ථාපනය කිරීමේදී වැඩිපුර එක්කෙනෙක් හිටියා. Board එකක ඉන්න පුළුවන් 12දෙනෙක් නම්, 13දෙනෙක් ඉඳලා ගන්නා තීන්දු බල රහිතයි. ඊට පසුව මොකක්ද කළේ? පිරිවෙන් මණ්ඩලය ස්ථාපනය කිරීම සඳහා -පිරිවෙන් මණ්ඩලයට පත් කරන ක්‍රමවේදයක් තිබෙනවා. මම මෙතැනදී ඒ ගැන කියන්න යන්නේ නැහැ, තවත් ප්‍රශ්න ගණනාවකට මුල පුරන්න පුළුවන් නිසා- මෙන්න මේ සුදුසුකම් තිබෙන අය නියෝජනය හැටියට එවන්නය කියලා අදාළ සියලු පාර්ශ්වයන්ට ලිඛිතව දැනුම් දුන්නා. දැන් ඒ විස්තර ටික ලැබී තිබෙනවා. ඒ සියල්ල දැන් මේ වෙනකොට අත්සන් කරලා යවා තිබෙනවා. පිරිවෙන් මණ්ඩලය තවත් සතියකින් කැඳවන්න පුළුවන්. පිරිවෙන් මණ්ඩලය සහ පිරිවෙන් අධ්‍යක්ෂ කියන්නේ දෙකක්. පිරිවෙන් මණ්ඩලය ස්ථාපනය වෙනවා. පිරිවෙන් අධ්‍යක්ෂත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාව ඇතුව දැන් පත් කරලා තිබෙනවා. දැන් එයට රැස් වෙන්න පුළුවන්. ඊළඟ මාස හය ඇතුළත අපි DMS එකෙන් අවසර ගන්නවා, ඉතුරු ටික කරන්නේ කොහොමද කියන කාරණයට අදාළව.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු டலஸ் அழහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා, මොකක්ද කාරණය? ඔබතුමන්ලා කාලය පිළිබඳව අවධානය යොමු කරන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු டலஸ் அழහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)

ගරු ඇමතිතුමනි, උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා ගුරු හිඟය පිළිබඳව මතු කළ ප්‍රශ්නයට අදාළවයි මම මේ කාරණය අහන්නේ. පළමුවෙන්ම මම ස්තුතිවන්ත වෙනවා, විශාල බාධාවන් මැද 40,000කට ආසන්න ගුරු හිඟය පියවන්න කටයුතු කිරීම පිළිබඳව. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ, ගරු ඇමතිතුමනි. මා දන්නා තරමින් පාසල් 498ක පමණයි උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාව තිබෙන්නේ. හැබැයි දැන් තිබෙන බරපතළ ගැටලුව, ඒ පාසල්වලත් තාක්ෂණවේදය උගන්වන්න ගුරුවරු නැහැ. මේ බඳවා ගන්නා ගුරුවරු අතරේත්, සංවර්ධන සහකාරවරුන් වශයෙන් හිටපු අය අතරේත් තාක්ෂණ විෂයය උගන්වන්න සුදුසුකම් තිබෙන අය ඉතා අවම සංඛ්‍යාවක් ඉන්නේ.

ඒ වාගේම අනෙක් පැත්තෙන් උසස් පෙළ විෂයයක් විධියට තාක්ෂණවේදය හදාරන්න ශිෂ්‍යයන් තුළ විශාල උනන්දුවක් තිබෙනවා. නමුත් තාක්ෂණවේදය ඉගැන්වීමට අවශ්‍ය ගුරුවරු නිහයි. එය උග්‍ර තත්ත්වයක පවතින නිසා එම තත්ත්වය ආවරණය කරන්නේ කොහොමද කියන කාරණය පුළුවන් නම් පැහැදිලි කරන්න, ගරු ඇමතිතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පත්වීම් 2,300න් 1,780ක් දුන්නේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ගණිතය සහ තාක්ෂණවේදය කියන විෂයයන්ට අදාළවයි. එසේ පත්වීම් ලබා ගත් අය 08 වැනි දා වාර්තා කරන්න ඇති. ඒ මඟින් සෑහෙන ප්‍රමාණයක් ආවරණය වෙනවා. විශේෂයෙන්ම ජාතික පාසල්වලට තාක්ෂණවේදය සඳහා -එම විෂය ධාරාවලට- අවශ්‍ය ගුරුවරුන් සෑහෙන ප්‍රමාණයක් ලබා දුන්නා. හැබැයි, තව පිරිසක් ඉන්නවා. ඒ අයගේ සහතික පරීක්ෂා කෙරෙමින් යනවා. විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලවල තිබෙන ප්‍රශ්න නිසා transcript එක ගන්න බැරි ප්‍රශ්නය තිබෙන්නේ. අපි ඒ ටිකත් දෙනවා. මේ, අලුතින්ම දෙන පත්වීම්. ගරු මන්ත්‍රීතුමනි, භාණ්ඩාගාරයෙන් වෙනම මුදලක් වෙන් කර දුන්නා, මේ පිරිස බඳවා ගන්න, ඔබතුමා කියපු ප්‍රශ්නය නිසා. ඊළඟ මාස කිහිපය තුළ එම ගැටලුව විසඳා ගන්න පුළුවන් වෙයි කියා මම හිතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

පානීය ජල පහසුකම් නොමැති ගම්මාන: වයඹ පළාත
குடிநீர் வசதிகளில்லாத கிராமங்கள்: வடமேல் மாகாணம்
VILLAGES WITHOUT DRINKING WATER FACILITIES: NORTH-WESTERN PROVINCE

2085/2024

4. ගරු දයාසිරි ජයසේකර මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Dayasiri Jayasekara on behalf of the Hon. Nalin Bandara Jayamaha)

ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) වයඹ පළාතේ -

(i) පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති ගම්මාන සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති පවුල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව, එම එක් එක් ව්‍යාපෘතියේ නම, ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல் மற்றும் பெருந்தோட்ட உட்கட்டமைப்பு வசதிகள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) வடமேல் மாகாணத்தில் -

(i) சுத்தமான குடிநீர் வசதிகளில்லாத கிராமங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) சுத்தமான குடிநீர் வசதிகளில்லாத குடும்பங்களின் எண்ணிக்கை ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவுக்கமைவாகத் தனித்தனியாக எத்தனை என்பதையும்;

(iii) சுத்தமான குடிநீரை வழங்குவதற்காக இன்றள வில் செயற்படுத்தப்பட்டுள்ள கருத்திட்டங்களின் எண்ணிக்கை, அவ்வொவ்வொரு கருத்திட்டத் தினதும் பெயர், பயனாளிக் குடும்பங்களின் எண்ணிக்கை தனித்தனியாக எத்தனை என்பதையும்;

(iv) சுத்தமான குடிநீர் வசதிகளில்லாத மக்களுக்குச் சுத்தமான குடிநீர் வசதியை வழங்குவதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply and Estate Infrastructure Development:

(a) Will he inform this House -

(i) the number and the names of the villages which are lacking clean drinking water facilities;

(ii) separately, the number of families who do not have access to clean drinking water facilities in each Divisional Secretary's Division;

(iii) separately, the number of ongoing projects to provide clean drinking water facilities, the name of each project and the number of families that will be benefitted; and

(iv) the measures that will be taken to provide clean drinking water facilities for people who do not have access to clean drinking water facilities;

(v) in the North-western Province?

(b) If not, why?

ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා (වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சஷீந்திர ராஜபக்ஷ - நீர்ப்பாசன இராஜாங்க அமைச்சர்)
(The Hon. Shashindra Rajapaksa - State Minister of Irrigation)

ගරු කථානායකතුමනි, ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වයඹ පළාතේ පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති ගම්මාන සංඛ්‍යාව 1,632කි.

පුත්තලම දිස්ත්‍රික්කයේ ගම්මාන සංඛ්‍යාව	-	319
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම්මාන සංඛ්‍යාව	-	1,313
එකතුව	-	**1,632**

ඒවායේ නම් ඇමුණුම 01** මඟින් දක්වා ඇත.

(ii) වයඹ පළාතේ පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති පවුල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව ඇමුණුම 02** මඟින් දක්වා ඇත.

(iii)
- ජාතික ජල සම්පාදන මණ්ඩලය මඟින් වයඹ පළාතේ පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව, එම එක් එක් ව්‍යාපෘතියේ නම, ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 03** මඟින් දක්වා ඇත.
- ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මඟින් වයඹ පළාතේ පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා මේ වනවිට ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව, එම එක් එක් ව්‍යාපෘතියේ නම, ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 04** මඟින් දක්වා ඇත.

(iv)
- ජාතික ජල සම්පාදන මණ්ඩලය මඟින් වයඹ පළාතේ පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග ඇමුණුම 05** මඟින් දක්වා ඇත.
- ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මඟින් වයඹ පළාතේ පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග ඇමුණුම 06** මඟින් දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා.

***** පුස්තකාලයේ තබා ඇත.***
** * நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

2015-2019 කාලය තුළ ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘති: නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගේ ප්‍රකාශය

2015-2019 காலப்பகுதியில் நடைமுறைப்படுத்தப்பட்ட வீடமைப்புக் கருத்திட்டங்கள்: நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரினது கூற்று

HOUSING PROJECTS IMPLEMENTED DURING 2015 -2019: STATEMENT BY MINISTER OF URBAN DEVELOPMENT AND HOUSING

ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු කථානායකතුමනි, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා පසුගිය ජූනි 20වැනි දා විශේෂ ප්‍රකාශයක් කළා. එහිදී එතුමා චෝදනා කිහිපයක් කළා, මගේ අමාත්‍යාංශයටත්, අමාත්‍යාංශය හා සම්බන්ධ ආයතනවලටත්. එහිදී ප්‍රධාන චෝදනාව එල්ල වුණේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියට. එතුමා කිව්වා 2019 ජනාධිපතිවරණයෙන් පසුව, අපේ රටේ ක්‍රියාත්මක වුණු නිවාස වැඩසටහන එකවරම නතර කළා කියලා. එතුමා ඉල්ලීමක් කළා, නතර කර තිබෙන හිඟ වාරික ගෙවන්න කියලා. ගරු කථානායකතුමනි, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මේ සම්බන්ධව මට පැහැදිලි කිරීමක් එවා තිබෙනවා.

විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා නිවාස අමාත්‍යවරයා විධියට කටයුතු කළ 2015 සිට 2019 දක්වා වූ කාලය තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නිවාස ව්‍යාපෘති හතක් ක්‍රියාත්මක කර තිබෙනවා. ආදර්ශ ගම්මාන, විසිරි ණය, විසිරි ණය ආධාර, වකුගඩු ආධාර, විරු සුමිතුරු ආධාර, ග්‍රාම ශක්ති විසිරි ආධාර, ගංවතුර ආධාර කියන ව්‍යාපෘති තමයි එසේ ක්‍රියාත්මක වුණේ. මේ ව්‍යාපෘති බොහොමයක් නිවාස සංවර්ධන අධිකාරිය ආරම්භ කළ දවසේ ඉඳලා ක්‍රියාත්මක කර තිබෙනවා.

එතුමාගේ කාල සීමාවේදී පවුල් 341,510කට නිවාස ඉදිකිරීමට සහ නිවාස අලුත්වැඩියා කිරීමට වැඩ ආරම්භ කර තිබුණා, ගරු කථානායකතුමනි. ඒ සඳහා අවශ්‍ය වුණු මුදල රුපියල් මිලියන 57,428යි. නමුත් මේ සඳහා වෙන් කර තිබුණේ රුපියල් මිලියන 46,265යි.

ඒ වෙන් කළ මුදල අනුව අලුතින් ඉදි කළ හැකිව තිබුණේ නිවාස දෙලක්ෂ තිස්හත්දහස් ගණනක්. ඒ කියන්නේ මුදල් නොමැතිව සාමාන්‍යයෙන් ගෙවල් ලක්ෂයකට වැඩි ප්‍රමාණයක වැඩ ආරම්භ කර තිබෙනවා. 2015-2019 කාලයේ තමයි මේක සිදුවෙලා තිබෙන්නේ. එම තොරතුරු සම්බන්ධයෙන් මම දැන් පැහැදිලි කරන්නම්.

වෙන් කර තිබෙන මුදලට වඩා වැඩි ප්‍රමාණයක් පොරොන්දු වෙලා ගෙවල් හදන්න පටන් අරගෙන තිබෙනවා. හැබැයි, ඒ පොරොන්දු වුණු අතිරික්තයට වැඩිපුර මුදලක් භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට නොහැකි වීම නිසා නිවාස විශාල ප්‍රමාණයක් හාගෙට ඉදිකරලා නවත්වලා තිබුණා. එම නිවාස වැඩසටහන සඳහා යෙදවිය හැකිව තිබුණේ රුපියල් මිලියන 36,996.286ක් පමණයි. මෙපමණ මුදලක් වැය කරලාත් වසර 5ක් තුළ **එතුමාට** හදන්නත්, අලුත්වැඩියා කරන්නත් පුළුවන් වුණේ නිවාස 238,702යි. ගෙවල් විශාල ප්‍රමාණයක් හදන්න තමයි සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාට වුවමනාව තිබුණේ.

ගරු කථානායකතුමනි, ලක්ෂ 10ක ව්‍යාපෘතියක් ගත්තොත්, ලක්ෂයේ ගෙවල් 10ක් හදන්නත් පුළුවන්, ලක්ෂ 10ට එක නිවසක් හදන්නත් පුළුවන්, රුපියල් 50,000 නිවාස 20ක් හදන්නත් පුළුවන්. පොඩි පොඩි ගණන් දීලා වැඩ ආරම්භ කරලා තිබුණා. වැඩ අවසන් කරන්න ඊළඟ වාරික ගෙවන්න තිබුණේ ඊළඟට එන කාල සීමාවේදීයි. කොහොම හරි, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්තාවලට අනුව, මෙම නිවාස ණය ලබා දීම අවිධිමත් ලෙසයි සිදු වෙලා තිබෙන්නේ. සමහර අයගේ ලිපිනයක්වත් නැහැ, සමහර අය ණය අරන් තිබෙන්නේ වෙනත් දේවල්වලට. ඒ මුදල්වලින් නිවාස හැදිලා නැහැ. එම නිසා 2020 දී, ඒ කියන්නේ මම මේ අමාත්‍යාංශය භාර ගන්න ඉස්සෙල්ලා මේ පිළිබඳව සොයා බලන්න දිස්ත්‍රික් මට්ටමින් පරීක්ෂණයක් ආරම්භ කරලා තිබුණා. මම විෂය භාර අමාත්‍යවරයා හැටියට පත් වුණාට පස්සේ අවසන් නොකළ ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඒක රාශි කර බැලුවාම, එවැනි ගෙවල් විශාල ප්‍රමාණයක් හඳුනාගෙන තිබෙනවා, ගරු කථානායකතුමනි. ලබා දුන් ණය මුදල් පිළිබඳ පරීක්ෂණ වාර්තාව ලැබුණාට පස්සේ, නුසුදුස්සන් 53,709දෙනෙක් ණය ලබාගෙන තිබෙන බව එම පරීක්ෂණ වාර්තාව මඟින් තහවුරුවෙලා තිබෙනවා. ඒ ගොල්ලන් වෙනත් වෙනත් දේවල්වලට තමයි ණය අරගෙන තිබෙන්නේ. ඊට පස්සේ මොකද කරලා තිබෙන්නේ? ඒ 53,709දෙනාත් එක්ක සාකච්ඡා කරලා, වාරික වශයෙන් ගෙවීමට ඇති ඊළඟ වාරික ටික අත්හිටුවන්න කටයුතු කරලා තිබෙනවා. ඒ එකඟතා අනුව තමයි මෙහෙම කටයුතු කරලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

මම මේ අමාත්‍යාංශය භාර ගන්නකොට 2015 ඉඳලා මම භාර ගත් දවස දක්වා කාලය තුළ, වැඩ පටන් අරගෙන අවසන් නොකළ නිවාස ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් තිබුණා. මම මේ වනතුරු -මේ අවුරුද්දේ තමයි අපි පටන් ගත්තේ- හැම අවුරුද්දකම ලැබුණු ප්‍රතිපාදන යොදාගෙන අර පැරණි **ව්‍යාපෘතිවල** -මිනිසුන්ගේ නිවාසවල- කටයුතු අවසන් කරන්න කටයුතු කළා. උතුරු, නැඟෙනහිර ප්‍රදේශවල තිබෙන ඒ ගෙවල් බලන්න මම ගියා. ඒ ගෙවල් හදන්න පටන් අරගෙන අවුරුදු 4ක්, 5ක් වැස්සට තෙමීම නිසා හදපු ටිකත් දැන් කඩා වැටිලා තිබෙනවා.

ඒ මිනිස්සු විශාල ලෙස අසරණ වෙලා හිටියා. ඊට පසුව මම කළේ මොකක්ද දන්නවාද? අලුතින් එවපු ව්‍යාපෘති එකක්වත් මම පටන් ගත්තේ නැහැ. සාමාන්‍යයෙන් ඇමතිවරු පත් වුණාම අලුත් ව්‍යාපෘති හදලා ලොකු ප්‍රසිද්ධියක් ලබා ගන්නවා. මම අලුත් ඒවා මොකුත් පටන් ගන්නේ නැතිව පරණ ඒවායේ කටයුතු අවසන් කරගෙන ආවා, ගරු කථානායකතුමනි.

2015 ඉඳලා 2019 වනතුරු හාගෙට හදලා තිබුණු ඒවාට අවශ්‍ය ප්‍රතිපාදන අප ළඟ තිබුණේ නැහැ. ඒ සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා මම ඉල්ලීමක් කළා, ඒ මිනිසුන්ට අසාධාරණයක් වෙන්න බැහැ, මෙච්චර ගෙවල් ප්‍රමාණයක් තිබෙනවා, ඒ නිසා ඒ ගෙවල් ටික හදන්න සල්ලි දෙන්න කියලා. මුදල් ඇමතිවරයා වන ගරු ජනාධිපතිතුමා එක්ක ඒ ගැන සාකච්ඡා කළා. මේ අවුරුද්දේ යම් ප්‍රතිපාදනයක් කරන්න -යම් මුදල් ප්‍රමාණයක් ලබා දෙන්න- කටයුතු කරන්නම් කිව්වා. ඉතිරි ටික ඊළඟ අවුරුද්දේ කරන විධියට වෙන් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙහිදී මා කනගාටු වන කාරණයක් තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා මේ කාරණය කථා කරපු එක හොඳයි. අපි ඒ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළාට පස්සේ - කැබිනට් මණ්ඩලයට එවැනි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරපු එක කියන්නේ නැතිව- ඊළඟ පාර්ලිමේන්තු වාරයේදී ඔබතුමා ඉල්ලීමක් කළා ඒ කටයුතු ටික කරලා දෙන්න කියලා. ගරු කථානායකතුමනි, දින වකවානු හරියටම ගත්තොත්, ඒ Cabinet Paper එක ඉදිරිපත් කරලා අනුමත වුණාට පස්සේ තමයි එතුමා මේ සභාවේදී ඒ ගැන ප්‍රකාශ කළේ. ඒක කවුරු කළත් කමක් නැහැ. ඒ සම්බන්ධ ලොකු පරීක්ෂණ වාර්තාවකුත් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ අධිකාරියට වෙච්ච පාඩුව පිළිබඳවත් සඳහන්ව තිබෙනවා. ඒකේ ලොකු කාරණා තිබෙනවා. කොළඹ ඉඩමක් විකුණලා, ඒ ගත්තු මුදල් සම්පූර්ණයෙන් අරගෙන ගිහිල්ලා තිබෙනවා. ඒවා දීපු මිනිසුන්ගේ නම්, ගම් හොයා ගන්නත් නැහැ. ඒවා ගත්තු කෙනෙකුත් නැහැ. ඒ වකවානුවේ සමහර නිලධාරීන් interdict වෙලා තිබෙනවා. ඒ කාලයේ -එතුමා නොවෙයි- හිටපු නිලධාරීන් හෝ කවුරුන් හෝ කරපු දේවල ප්‍රතිඵලය තමයි මම මේ කිව්වේ. අවධිමත්ව කළ දේ විධිමත් කරපු එක තමයි අපි පසුගිය කාලයේ කළේ. එහෙම නැතිව පක්ෂ, පාට බලලා අපි කාටවත් අසාධාරණයක් කළේ නැහැ. අපි ඒ හැමෝගේම දේවල් ඉදිරියටත් කරනවා.

ගරු කථානායකතුමනි, පාවෙන වෙළඳ සංකීර්ණය පිළිබඳවත් මෙහිදී කථා කළා. අපි ඒ ව්‍යාපෘතිය 2013 දී ආරම්භ කරලා තිබෙනවා. එහි කඩ කාමර අසූ ගණනක් දීලා තිබෙනවා. 2015 වන කොට ඒ කඩ ප්‍රමාණය 28කට අඩු වෙලා තිබෙනවා. ඊට පස්සේ ඒ මිනිස්සු එක්ක කථා කළාම බොහෝ දෙනෙක් ඒ කඩ ආපහු භාර දීලා තිබෙනවා. ඒවා මේ වනතුරු පාවිච්චි කරන්නේ නැතිවයි තිබුණේ. අවසානයේදී, ඊයේ පෙරේදා වන කොට කඩ 28කට අඩු වෙලා තිබුණා. ඒ අතරතුර සංචාරක අමාත්‍යාංශය හරහා - BOI එකේ ආයෝජන අවස්ථා එක්ක - ඉදිරිපත් වෙච්ච යෝජනාවක් පරිදි ඉදිරිපත් කළ කැබිනට් යෝජනාවක් අනුව public-private partnership එකක් අරගෙන ඒගොල්ලන්ගේ ඉදිරිපත් කිරීමක් කරලා තිබෙනවා. ඒ ගැන මේ වන කොට evaluation එකක් කරනවා. ඒ evaluation එක කරන කොට දැනට සිටින කඩ හිමියන් 28 දෙනා ගැනත් සාකච්ඡා කරලා තිබෙනවා. ඒ අය අතරින් වෙනත් තැන්වලට යන්න එකඟ වුණු අයටත්, එතැන ඉන්න ඕනෑ අයටත් අසාධාරණයක් නොවන විධියට කටයුතු කිරීම පිළිබඳව සාකච්ඡා කරලා තිබෙනවා.

යෝජනාවට අදාළව සියයට 5ක මුදලක් UDA එක ඔහුගෙන් අරගෙන තිබෙනවා. Evaluation Committee එක මේ කාරණය සාකච්ඡාවට ගත්තාට පසුව තමයි Board එකට ගිහිල්ලා, Cabinet එකට ගිහිල්ලා මේකට අනුමැතිය දෙනවාද, නැද්ද කියලා තීන්දු කරන්නේ. ඒ අනුව විධිමත් විධියට ඒ කටයුත්ත සිදු කරලා තිබෙනවා.

ඒ වාගේම, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඒ දවසේම ප්‍රකාශ කරලා තිබෙනවා, කොළඹ පැරණි මැනිං වෙළඳ පොළ භූමියේ ගල් ඉවත් කිරීමක් සම්බන්ධව. ආයෝජකයෙකුට ඉඩ දීලා තිබෙනවා, freezer trucks ටික ගාල් කරන්න පුළුවන් parking එකක් එතැන හදන්න. ඒ සීමාව තුළ ඇති ගල් ඉවත් කිරීමක් තමයි කරලා තිබෙන්නේ. ඒක කරලා ඔහු එම භූමිය යථා තත්ත්වයට පත් කර ගන්න කටයුතු කරමින් තිබෙනවා. UDA එකේ නිලධාරීන් පස්දෙනෙකුගේ අධීක්ෂණය යටතේ ඒ කටයුත්ත සිදු වෙමින් පවතිනවා. මට පුළුවන් ඒ සම්බන්ධ පූර්ණ වාර්තාවක් ඉදිරි කාලයේදී සභාගත කරන්න. එහෙම නැත්නම්, ඒ ගැන දිගින් දිගටම මේ ගරු සභාවේදී කියැවෙනවා. ඒ කටයුත්තත් විධිමත් ලෙස, නීත්‍යානුකූලව, විනිවිදභාවයෙන් යුතුව කෙරෙනවා කියන එක තමයි ඒ ආයතනවලින් කියන්නේ. ඔබතුමන්ලාට ඒ සම්බන්ධව ගැටලුවක් තිබෙනවා නම් එය ඉදිරිපත් කරන්න. එසේ ඉදිරිපත් කළොත් මට උත්තර දෙන්න පුළුවන්.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)

ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධව ගැටලුවක් තිබෙනවා. ඔබතුමා ඒ පිළිබඳව දැනුවත් ද කියා මම දන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔය කියන රථ ගාල - car park එක - හදන්න දීලා තිබෙන්නේ අක්කර 5ක වාගේ ඉඩමක්. ස්විස් ලංකා කොමෝඩිටීස් (පුද්ගලික) සමාගම, සෙන්ට් ඇන්තනීස් මාවත, කොළඹ 03 කියන එක තමයි ඒ ආයතනය ලියාපදිංචි කරලා තිබෙන address එක. එහෙම ආයතනයක් ඒ address එකේ නැහැ.

ගරු ඇමතිතුමනි, ඊළඟ ප්‍රශ්නය මේකයි. Chalmer's Car Park එක දීලා තිබෙනවා රුපියල් ලක්ෂ 75ක මාසික කුලියකට. Manning Market එක පිහිටි භූමියෙන් ඒ හා සමාන ඉඩකඩ ප්‍රමාණයක් තමයි රුපියල් ලක්ෂ 25කට දීලා තිබෙන්නේ. Manning Market එක කියන්නේ පිටකොටුවේ ප්‍රධානම ස්ථානයක තිබෙන එකක්. ඒ Manning Market එක පිහිටි භූමියේ අක්කර 5ක විතර ඉඩමක් රුපියල් ලක්ෂ 25ක් වාගේ අඩු ගණනකට දීලා තිබෙනවා. Chalmer's Car Park එක රුපියල් ලක්ෂ 75කට දීලා, Manning Market එක පිහිටි භූමියේ කොටසක් රුපියල් ලක්ෂ 25කට දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, අනෙක් ප්‍රධානම ගැටලුව තමයි ඊට අදාළව කිසිම ටෙන්ඩර් ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකිරීම. නිලධාරීන්ගේ කැමැත්ත මත ද මම දන්නේ නැහැ, යම් පුද්ගලයෙකුට ඒ අවසරය දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වාගේ, පැරණි Manning Market එක පිහිටි භූමියේ තිබෙනවා, පෞරාණික ගල්; හිටවපු කළුගල්. මා හිතන විධියට ඒවා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ හිටවපු ගල්. නාගරික සංවර්ධන අධිකාරියේ අය ඒ ගල් ගලවන්න ඒ ගොල්ලන්ට ඉඩ දීලා තිබෙනවා. එතැන ගල් ලක්ෂයක් තිබෙනවා කියලා කිව්වත්, මගේ දැනුම අනුව නම් එතැන ගල් 150,000ක් තිබෙනවා. ඒ ගොල්ලන් ඒ ගලක වටිනාකම තක්සේරු කරලා තිබෙන්නේ රුපියල් 180ක් හැටියටයි. නමුත්, Manning Market එකේ තිබෙන ඒ කළුගලක් රුපියල් 750ක් වෙනවා, ගරු ඇමතිතුමනි. මම දන්නේ නැහැ, ඒ ගොල්ලන් ඒ පිළිබඳව ඔබතුමාව දැනුවත් කරලා තිබෙනවාද, ඔබතුමාට දන්වා තිබෙනවාද කියලා. ඉතා විශාල වංචාවක් ඒ සිද්ධ වෙලා තිබෙන්නේ.

එය ඇත්තටම නාගරික සංවර්ධන අධිකාරියට එන්න ඕනෑ ආදායමක්. නමුත්, මේ රටේ ජනතාවගේ ඒ මුදල් යම් යම් පුද්ගලයෝ මෙසේ හම්බ කර ගන්නවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු මන්ත්‍රීතුමා, මා යම් විමසීමක් කරලා ඒ ගැන තොරතුරු ලබා ගත්තාම මට කියපු දේ මේකයි. ගල් 150,000ක් ගැන ඔබතුමා කිව්වාට, එතැන ඒ ගොල්ලන්ට ඉවත් කරන්න පුළුවන් ගල් ප්‍රමාණය වන්නේ ඉදි කිරීම් කරන ප්‍රමාණය තුළ තිබෙන ගල් ටික විතරයි. අපි ගල් 100,000කට මුදල් අය කරලා තිබුණත්, එතැනින් ගැලවිලා තිබෙන්නේ ගල් 30,000ක් වාගේ ප්‍රමාණයක් කියන එක තමයි අර නිලධාරීන් පස්දෙනාගේ කමිටුවට වාර්තා වෙලා තිබෙන්නේ. ඒ ගොල්ලන් තමයි මේ වාර්තා දෙන්නේ. මම දන්නේ නැහැ. මම ඒවා හොයන්නේ නැහැ. හැබැයි, එහිදී එම ගලක වටිනාකම ලෙස ගණන් හදලා තිබුණේ රුපියල් 92ක් වාගේ ප්‍රමාණයක්. හැබැයි, මට ඒ ගණන් හරියටම මතක නැහැ. කියපු විධියට එය ඉතා අඩු ගණනක්. හැබැයි, ඒ කටයුත්ත කරන අයට ඒවා ඉවත් කරන්න ඉඩ දීලා තිබෙන්නේ ඊට වඩා වැඩි මුදලකටයි. ඒ දෙන්නේත් ඔහු විසින් එය යථා තත්ත්වයට පත් කරනවා කියන කාරණයත් එක්කයි. ඊටත් වඩා වැඩි ගණනකට දුන්නා කියන කාරණාව තමයි කියන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණාව සම්බන්ධව මට සොයා බලන්න පුළුවන්. එතැන කමිටුවේ බෝඩ් එකකින් පත් කරපු කණ්ඩායමක් විසින් මේ

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

කාරණාව evaluate කරලා තිබෙනවා කියලායි මාව දැනුවත් කරලා තිබෙන්නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු මුජිපුර් රහූමාන්)
(The Hon. Mujibur Rahuman)
ගරු ඇමතිතුමනි, මම කිව්වේ මේකයි. Chalmer's Car Park එක දීලා තිබෙනවා රුපියල් ලක්ෂ 75ක මාසික කුලියකට. Manning Market එක කියලා කියන්නේ Chalmer's Car Park එක තිබෙන තැනට වඩා රථ වාහන ඉතා බහුලව ගැවසෙන ස්ථානයක්. ඒක දීලා තිබෙන්නේ රුපියල් ලක්ෂ 25කට. ඉඩම් ප්‍රමාණය බැලුවොත්, අක්කර 5ක, 6ක වාගේ ප්‍රමාණ තමයි ඒ ස්ථාන දෙකේම තිබෙන්නේ. Manning Market එක පිහිටි ඔය කියන ස්ථානය රුපියල් ලක්ෂ 100ක විතර මාසික කුලියකට දෙන්න පුළුවන්, ගරු ඇමතිතුමා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ ගැන විමර්ශනයක් කර බලන්න කියලා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු පිරසන්න රණතුංක)
(The Hon. Prasanna Ranatunga)
මම ඒ පිළිබඳව සොයා බලන්නම්. හැබැයි මේ ඉඩම් සත පහකවත් ආදායමක් නැතිව අවුරුදු ගණනක් තිස්සේ තිබුණු ඉඩම්. ඒකට හොඳම උදාහරණයක් තමයි, තලවතුගොඩ කිල්ස් එක ළඟ තිබුණු ඉඩම. ඒ මුළු ඉඩමම දීලා තිබුණේ, රුපියල් 50,000කට.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු මුජිපුර් රහූමාන්)
(The Hon. Mujibur Rahuman)
එක ගැලවීමක්වත් කරලා නැහැ.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු පිරසන්න රණතුංක)
(The Hon. Prasanna Ranatunga)
ඊයේ පෙරේදා ඒ සම්බන්ධව තොරතුරක් ඇවිල්ලා කරුණු හෙව්වාම තමයි දැන ගත්තේ දැන් එය රුපියල් ලක්ෂ දෙකහමාර දක්වා වැඩි කරලා තිබෙන්නේ කියලා. ඒ කාලයේ ඉඳන්ම මේ ආයතන ගෙන ගිය ක්‍රමවේදය ඒකයි. නමුත් සියලු ඉඩම් නොමිලේ දෙන එක අපි නැවැත්තුවා. අද ඔබතුමන්ලා මේවා ගැන කථා කරන්නේ අපි මේ ඉඩම් මේ ආකාරයට දීපු නිසායි. කාටවත් නොදී හිටියා නම් කාටවත් ආදායමකුත් නැතිව ඒ ඉඩම් ඔහේ නිකම් තිබෙනවා. ඔබතුමා කියපු ඒ car park එකට දුන්නු ඉඩම දුන්නු ක්‍රමවේදය හොයලා අනාගතයේ දී ඔබතුමන්ලාට කියන්නම්. ඔබතුමන්ලාට පුළුවන් අපේ අමාත්‍යාංශයිය උපදේශක කාරක සභාවට ඇවිල්ලා ඒ සම්බන්ධව කෙළින්ම විමසීමක් කරන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මීළඟ අමාත්‍යාංශ නිවේදනය, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු අශෝක ප්‍රියන්ත මැතිතුමා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු අසෝක්ක පිරියන්ත - උළ්නාට්ටලුවල්කළ් ඉරාජාඞ්ක අමෛච්චර්)
(The Hon. Ashoka Priyantha - State Minister of Home Affairs)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ඉල්ලීමක් කරලා තිබුණා මේක වෙනත් දවසකට ඉදිරිපත් කරන්න කියලා. උත්තරය මා ළඟ තිබෙනවා. ඔබතුමා එක්ක කථා කරලා හෙට දවසට යොදා ගන්න- *[බාධා කිරීමක්]* මේ අවස්ථාවේ උත්තරය නම් තිබෙනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
හෙට කියලා කිව්වා නේ දැන්. ඒක හින්දා හෙට ඉදිරිපත් කරන්න, ගරු රාජ්‍ය ඇමතිතුමා.

හෙට Adjournment Debate එක තිබෙන්නේ. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මැතිතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවාය කිව්වා. එතුමාත් ගිහිල්ලා නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු චජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු සභානායකතුමා, මියන්මාරය සම්බන්ධ ප්‍රශ්නයට උත්තරයක් දෙනවාද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජූයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒක මගේ විෂයයට අදාළ එකක් නොවෙයි. එම නිසා අදාළ විෂය භාර අමාත්‍යතුමාගෙන් අහලායි උත්තරය දෙන්න ඕනෑ. එතුමන්ලාගෙන් අහලායි ඒ උත්තරය දෙන්න ඕනෑ.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL

"1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසිනි.

2024 ජූලි 24වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர் சார்பாக மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2024 யூலை 24, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Susil Premajayantha on behalf of the Hon. Minister of Justice, Prison Affairs and Constitutional Reforms; to be read a Second time upon

Wednesday, 24th July, 2024 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 6 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජය විසින් ප්‍රකාශයට පත් කළ මූල්‍ය බංකොලොත්භාවයට හේතු පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව
அரசாங்கத்தினால் பிரகடனப்படுத்தப்பட்ட நிதி வங்குரோத்து நிலைக்கான காரணங்களை ஆராய்ந்து பாராளுமன்றத்திற்கு அறிக்கையிடுவதற்கும் அது தொடர்பில் தமது முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு
SELECT COMMITTEE TO INVESTIGATE CAUSES FOR FINANCIAL BANKRUPTCY DECLARED BY THE GOVERNMENT AND TO REPORT TO PARLIAMENT AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THIS REGARD

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"රජය විසින් ප්‍රකාශයට පත් කළ මූල්‍ය බංකොලොත්භාවයට හේතු පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2024 මාර්තු 22 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබා දී ඇති කාලසීමාව, 2024 ඔක්තෝබර් 18 දින දක්වා දීර්ඝ කළ යුතුය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ සිදු වූ නිව් ඩයමන්ඩ් සහ එක්ස්ප්‍රස් පර්ල් යන නෞකා අනතුරු පිළිබඳව කරුණු සොයාබලා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන විශේෂ කාරක සභාව
இலங்கைக் கடற்பரப்பில் நிகழ்ந்த நியூ டயமன்ட் மற்றும் எக்ஸ்பிரஸ் பேர்ள் ஆகிய கப்பல்களின் விபத்துக்கள் தொடர்பாக ஆராய்ந்து தேவையான விதப்புரைகளைச் சமர்ப்பிப்பதற்கான தெரிகுழு
SELECT COMMITTEE TO INVESTIGATE INTO AND TO MAKE SUITABLE RECOMMENDATIONS RELATING TO THE DISASTERS CAUSED BY NEW DIAMOND AND X-PRESS PEARL VESSELS IN THE MARITIME ZONE OF SRI LANKA

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ සිදු වූ නිව් ඩයමන්ඩ් සහ එක්ස්ප්‍රස් පර්ල් යන නෞකා අනතුරු පිළිබඳව කරුණු සොයාබලා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2024 මැයි 14 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබාදී ඇති කාලසීමාව, 2024 ඔක්තෝබර් 20 දින දක්වා දීර්ඝ කළ යුතුය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
சிறுவர்களுக்கான மஹாவிலச்சிய கல்வி நிலையம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
MAHAWILACHCHIYA EDUCATION CENTRE FOR CHILDREN (INCORPORATION) BILL

ගරු සමන්ප්‍රිය හේරත් මහතා
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(මාණ්පුමිකු කේ.පි.එස්. කුමාරසිරි)
(The Hon. K.P.S. Kumarasiri)

විසින් ස්ථිර කරන ලදී.
ඇමෝතිත්තාර්.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විදුක්කප්පට්ටු, ඒත්‌රුක්කොළ්ළප්පට්ටදු.
ඉදන්පඩි, චට්ටමූලම් මුදන්මුර෈ මදිප්පිඩප්පට්ටු, අච්චිඩප්පඩක් කට්ටළෛයිඩප්පට්ටදු.
චට්ටමූලම් නිලෛක්කට්ටළෛ ඉල. 52(6)ඉන්පඩි කල්වි අමෛච්චරුක්කු අදික්කෛ සෙය්‌යප්පඩුදර්කාකච් චාට්ටප්පට්ටදු.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Education for report.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දිනට නියමිත ප්‍රධාන වැඩ කටයුතු. ගරු සභානායකතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිදි) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, න්‍යාය පත්‍රයේ විෂය අංක 4 - ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2) - අද දින ඉදිරිපත් කරන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3 සහ 5 ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

සුරාබදු ආඥාපනත: නිවේදනය
மதுவரிக் கட்டளைச் சட்டம்: அறிவித்தல்
EXCISE ORDINANCE : NOTIFICATION

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිදි) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 12 දිනැති අංක 2366/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.18 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 01/2024 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - සුරාබදු ආඥාපනත යටතේ ගෙනෙන තවත් නිවේදනයක්, විෂය අංක 3 - ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1), විෂය අංක 5 - ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ගෙනෙන නියමය ද මා ඉදිරිපත් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එටුත්තියම්පප්පෙට්‌රදු.
Question proposed.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
විවාදය ආරම්භ කිරීම, ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය අමාත්‍යතුමා.

[පූ.භා. 10.56]

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු රන්ජිත් සියම්බලාපිටිය - අරස පෙරුන්තෝට්ට තොළිල් මුයර්සිකළ් මරුසීරමෛප්පු අමෛච්චරුම් නිදි ඉරාජාංග අමෛච්චරුම්)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)
ගරු කථානායකතුමනි, අද දිනට නියමිත කටයුතු යටතේ න්‍යාය පත්‍රයේ සඳහන් විෂය අංක 1 සහ 2 දරන යෝජනා පිළිබඳව මම මුලින්ම මේ ගරු සභාවට කරුණු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. ඊට අමතරව විෂය අංක 3 සහ 5 යෝජනා පිළිබඳවත් කරුණු ඉදිරිපත් කරනවා. විෂය අංක 1 සහ 2 යටතේ, 52වැනි අධිකාරය වූ සුරාබදු ආඥාපනත යටතේ නිවේදන දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ තමයි 2024.01.12 දිනැති අංක 2366/38 සහ 2024.02.01 දිනැති අංක 2369/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදන. ගරු කථානායකතුමනි, මෙයින් බලාපොරොත්තු වෙන්නේ සුරාබදු බලපත්‍ර පිළිබඳ වූ ගාස්තු සංශෝධනය කිරීම, එහෙම නැත්නම් වැඩි කිරීමයි. මෙහි අවසාන වතාවට ගාස්තු සංශෝධනයක් කර තිබුණේ 2017.12.11 දිනැති අංක 2049/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය යටතේයි. අපි එය 2024 ජනවාරි මස 12වැනි දා 2366/38 දරන ගැසට් පත්‍රය යටතේ සංශෝධනය කළා. අපි මෙහිදී මූලික තැන්පතු සහ වාර්ෂික ගාස්තුවල තමයි වෙනසක් සිදු කළේ. ඒ වාර්ෂික ගාස්තු වෙනස් කිරීමේදී වාර්ෂික ගාස්තුවට එක්වර ගෙවන මුදලකුත් ඇතුළත් කිරීම නිසා එහි යම්කිසි සංකීර්ණතාවක් ඇති වුණා. ඒ නිසා අපට සිද්ධ වුණා, ඒ ගැසට් පත්‍රය තවත් ගැසට් එකක් මඟින් වෙනස් කරලා මේ ව්‍යාකූලතාව නැති කරන්න. ඒ නිසා අපි 2024.02.01 දිනැති අංක 2369/32 දරන ගැසට් පත්‍රය නිකුත් කළා. අපි මෙයින් සුරාබදු බලපත්‍ර සඳහා ඇති වාර්ෂික ගාස්තුව වැඩි කිරීමත්, තැන්පතු ගාස්තුව වැඩි කිරීමත් සිදු කළ අතර එක්වර ගෙවන ගාස්තුවකුත් අලුතෙන් හඳුන්වා දුන්නා. මේ යටතේ වාර්ෂික ගාස්තුව සාමාන්‍යයෙන් සියයට 100කට ආසන්න ප්‍රමාණයකින් වැඩි කළා, ගරු කථානායකතුමනි. ඇප තැන්පතු සියයට 2,000ක විතර ප්‍රමාණයකින් වැඩි වුණා.

මම උදාහරණයක් පෙන්වා දෙන්නම්. ර.බි. 4 බලපත්‍රය ගත්තොත්, මේක තමයි රට බීමහල් කියලා බොහෝ අය කථා කරන බලපත්‍රය. අපේ මහ නගර සභා සීමාවට තිබුණු වාර්ෂික ගාස්තුව රුපියල් ලක්ෂ හයයි. ඔවුන් අවුරුද්දකට රුපියල් ලක්ෂ හයක් ගෙවන්න ඕනෑ. අපි දැන් ඒ මුදල රුපියල් ලක්ෂ 10ක් දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ කියන්නේ වාර්ෂික ගාස්තුව සියයට 67කින් වාගේ වැඩි කරලා තිබෙනවා. මීට පෙර මහ නගර සභා

බල ප්‍රදේශයක ර.බි. 4 බලපත්‍රයකට ඇපය තිබුණේ රුපියල් 25,000යි. ඒ මුදල දැන් රුපියල් ලක්ෂ 5ක් දක්වා -සියයට 2,000කින්- වැඩි කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඊට අමතරව අපි එක්වර ගෙවන ගාස්තුවක් හදුන්වා දීලා තිබෙනවා. කවුරු හරි බලපත්‍රයක් ගන්නවා නම්, ඔහු කෝටි එකහමාරක ගාස්තුවක් එක්වර ගෙවිය යුතුයි.

ඒ වාගේම නගර සභා ප්‍රදේශයක වාර්ෂික ගාස්තුව කලින් තිබුණේ රුපියල් ලක්ෂ 4යි. දැන් ඒක රුපියල් ලක්ෂ 8ක් කරලා තිබෙනවා. එ් මුදල සියයට 100කින් වැඩි වෙලා තිබෙනවා. තැන්පතුව හැටියට තිබුණේ රුපියල් 25,000යි. අද ඒ මුදල රුපියල් ලක්ෂ 5ක් කරලා තිබෙනවා. ඒ කියන්නේ ඒක සියයට 2,000කින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම රුපියල් මිලියන 12.5ක ගාස්තුවකුත් එක්වර ගෙවිය යුතුයි.

නගර සභා නොවන අනෙකුත් ප්‍රදේශවල මීට පෙර වාර්ෂික ගාස්තුව ලෙස තිබුණේ රුපියල් ලක්ෂ 3යි. අපි ඒ මුදල රුපියල් ලක්ෂ 6ක් දක්වා වැඩි කළා. ඒ කියන්නේ, ඒක සියයට 100ක් වැඩි කළා. ඒ වාගේම තැන්පතුව විධියට තිබුණේ රුපියල් 25,000යි. ඒක රුපියල් ලක්ෂ 5ක් දක්වා වැඩි කළා. ඒ කියන්නේ, ඒ මුදල සියයට 2,000කින් වැඩි කළා. ඒ වාගේම රුපියල් කෝටියක එක්වර ගෙවීමක් තිබෙනවා. ගරු කථානායකතුමනි, සුපිරි වෙළඳ සැල් සංකල්පය ගත්තොත්, සමහරු සුපිරි වෙළඳ සැල් දැමීමේ අරමුණ වුණේ රට බීමහල් බලපත්‍රයක් ගැනීමයි. මෙය මෙතෙක් තිබුණු ක්‍රමය අනුව, ඒ ව්‍යාපාරයේ මුළු අවුරුද්දේම පිරිවැටුම - turnover එක - රුපියල් මිලියන 72ක් නම් රට බීමහල් බලපත්‍රයක් ගන්න ඔහු සුදුසුකම් ලැබුවා. අපි ඒක වැඩි කළා. රුපියල් මිලියන 1,000ක පිරිවැටුමක් තිබෙන සුපිරි වෙළඳ සැලකට පමණයි මේ ඉල්ලුම කරන්න පුළුවන් වන්නේ. හැබැයි ඔවුන් බලපත්‍රයක් ගන්නවා නම් රුපියල් කෝටි එකහමාරක එක්වර ගෙවීමක් කරන්න අවශ්‍යයි. ඔවුන්ගේ වාර්ෂික ගාස්තුව ලෙස තිබුණේ රුපියල් ලක්ෂ 10යි. ඒක රුපියල් ලක්ෂ 15ක් බවට පත් කළා. ඔවුන්ගේ තැන්පතුව විධියට තිබුණේ රුපියල් 25,000යි. ඒක රුපියල් පන්ලක්ෂයක් බවට පත් කළා.

ගරු කථානායකතුමනි, මේ තුළින් හොඳටම සනාථ වෙනවා, අපට සුරාව ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවක් නැහැ කියලා. හැබැයි මේ තුළින් ගත් ආදායම වැඩි කර ගැනීමේ අවශ්‍යතාවක් අපට තිබෙනවා. ඒ වාගේම නීත්‍යානුකූල නොවන සුරාව පාලනය කිරීමේ අවශ්‍යතාවකුත් තිබෙනවා.

කැපී පෙනෙන විශාල ගාස්තු වැඩි කිරීමක් කරලා තිබෙන්නේ, රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමේ දැඩි අවශ්‍යතාවක් අපට තිබෙන නිසායි. ඒ වාගේම තිබුණු විවිධ උපක්‍රමවලට අපි පිළියම් හොයලා තිබෙනවා. දැන් බොහොම ජනප්‍රියයි, ර.බී. 4 කියන බලපත්‍රය. මේ හැම බලපත්‍රයක් සඳහාම අපි එක්වර කෝටි ගණනක් අය කරනවා. ඒ වාගේම සුපිරි වෙළෙඳ සැල් මාර්ගයෙන් සුරා බලපත්‍ර ගැනීම් ආදියට අපි ඉතා පැහැදිලිව වැට බැඳලා තිබෙනවා. රුපියල් මිලියන 72ක පිරිවැටුමක් ඇති කියපු එක අපි රුපියල් මිලියන 1,000ක් කරලා තිබෙනවා. සුපිරි වෙළෙඳ සැලක් දැමීමෙන් සුරා බලපත්‍රයක් ගැනීමට යම් අයෙක් අදහස් කරනවා නම්, ඒකට බාධකය අපි පැහැදිලිව යොදා තිබෙනවා, ගරු කථානායකතුමනි.

ඊළඟට, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ 2024.05.17 දිනැති 2384/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කළ රෙගුලාසිත් අද විවාදයට ගැනෙනවා. 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ තමයි අද මේ රෙගුලාසි අපි ඉදිරිපත් කරන්නේ. අපි දන්නවා, මේ රටේ ඇති වෙව්ව විනිමය හිඟය මර්දනය කර ගැනීම සඳහා-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා
(மாண்புமிகு சஷீந்திர ராஜபக்ஷ)
(The Hon. Shashindra Rajapaksa)
ගරු කථානායකතුමනි, "ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. SAMANPRIYA HERATH took the Chair.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කථා කරන්නේ, 2024 මැයි මාසයේ 17 වැනි දා ඉදිරිපත් කළ 2384/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කළ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි පිළිබඳවයි. අපි මේ රටේ ඇති වුණු උග්‍ර විනිමය හිඟය මර්දනය කර ගැනීම සඳහා භාණ්ඩ 2,000කට ආසන්න ප්‍රමාණයක් ආනයනය නැවැත්වූවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් ඒ සීමාවන් වරින් වර විවෘත කරගෙන ඇවිල්ලා, දැන් අපි නවත්වා තිබෙන්නේ වාහන ආනයනය පමණයි. හැබැයි, අපි රටේ වාහන අවශ්‍යතාව හඳුනාගෙන අවශ්‍ය ආකාරයට නිදහස් කිරීම් දැනට කරගෙන යනවා. ඒ අනුව සංචාරක අමාත්‍යාංශය කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා, 2024.04.01 වන දින, සංචාරක ව්‍යාපාරය සඳහා අවශ්‍ය වාහන ආනයනය කිරීමට අවස්ථාවක් දෙන්න කියලා. මොකද, සාමාන්‍යයෙන් අවුරුදු හයකට වඩා පැරණි වාහනයක් සංචාරකයන් සඳහා භාවිත කිරීම ජාත්‍යන්තර රීතිවලට පටහැනියි. ඉතින් සංචාරක කර්මාන්තය තමයි අපේ රටේ විශාල බලාපොරොත්තුවක්, ලොකු ඉඩක්, ලොකු විභවයක් තිබෙන කර්මාන්තය. ඒක පෙනෙනවා, 2022 දී තිබුණු දැවැන්ත පරිහානියත් එක්ක දැනට තිබෙන වර්ධනය බැලුවාම. අද ඉතා පැහැදිලි වර්ධනයක් තිබෙන්නේ, සංචාරක කර්මාන්තයේ. සංචාරක අමාත්‍යාංශයේ අවසරය පරිදි සංචාරක කර්මාන්තයට අවශ්‍ය බස් රථ 250ක් සහ ආසන 6-15 වැන් රථ 750ක් ආනයනය කිරීමට අවසර දීමට අදාළ ඒ කැබිනට් පත්‍රිකාව කැබිනට් මණ්ඩලය විසින් පිළිගත්තා. ඔවුන් විසින් ලබා දෙන බලපත්‍රයක් අනුව ආනයන හා අපනයන පාලකවරයා ඒ සඳහා අවශ්‍ය අවසරය ලබා දෙනවා. සංචාරක අමාත්‍යාංශය බැඳිලා ඉන්නවා, හැබෑවටම සංචාරක කර්මාන්තයටද ඒ වාහන ගෙනෙන්නේ කියන කාරණාව පිළිබඳව වගකීමෙන් සොයා බලා නිශ්චිත තොරතුරු මත බලපත්‍රය ලබා දීමට. දැනට ඒ බලපත්‍ර එකක්වත් නිකුත් කරලා නැහැ; වාහන ආනයනය කරලාත් නැහැ. ඔවුන් ඒ සඳහා ඉදිරිපත් කර තිබෙන ඉල්ලීම් සමාලෝචනය කරමින් පවතින බව යාවත්කාලීන තත්ත්වය පිළිබඳව සොයා බැලීමේදී මට දැන ගන්න ලැබුණා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට පොඩි ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ පිළිබඳව ගැටලුවක් නැහැ. මේ කාරණයට අදාළ නැති චුණත් මම විනාඩියක් ගන්නවා මේ ප්‍රශ්නය අහන්න. අපේ කමිටුවට ඉල්ලීමක් ඉදිරිපත් කර තිබුණා, අපේක්ෂා රෝහල ළඟ පන්සලේ ස්වාමීන් වහන්සේ නමක්. අපේක්ෂා රෝහලේදී මිය යන දුප්පත් පිළිකා රෝගීන්ගේ මෘතදේහ ගෙන යන්න ක්‍රමවේදයක් නැහැ කියලා එතිදී අතිශයින් සංවේදී තොරතුරක් ලැබුණා. ජපානයේ ඉන්න කණ්ඩායමක් ඒ සඳහා වාහනයක් -වෑන් එකක්- දන් දීලා තිබෙනවා. ඒක වරායේ හිර වෙලා තිබෙනවා. මිලියන 30ක duty එකක් ගෙවන්න කියලා තිබෙනවා, ඒක release කරන්න.

ඒ පිළිබඳව සලකා බලා, අසරණ මිනිසුන්ගේ මෘතදේහ ඒ අයගේ ගමට අරගෙන යන්න ලබා දුන් මේ වාහනය මුදා ගැනීම සඳහා මුදල් අමාත්‍යවරයාට අනුමැතිය ලබා දෙන්න පුළුවන්ද කියලායි උන්වහන්සේ අහලා තිබුණේ. මම ඒක කමිටුවට ගෙනාවාම කමිටුව කිව්වා, ඔවුන්ට කරන්න බැහැ කියලා. මම කිව්වා, ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා සමඟ මම මේ ප්‍රශ්නය කථා කරන්නම් කියලා. කරුණාකරලා ඒ පිළිබඳව පොඩ්ඩක් සංවේදීව සොයා බලන්න පුළුවන්ද කියලා අහන්නයි මම මේ ප්‍රශ්නය මතු කළේ.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම කාරණය ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. එතුමා කියපු කාරණය මම පිළිගන්නවා. එතුමා කියපු මේ ස්වාමීන් වහන්සේ පිළිකා රෝහල අසල විහාරස්ථානයක හිඳිමින් සුවිශේෂී සමාජ සේවාවක් කරනවා. උන්වහන්සේට අපි විවිධාකාරයෙන් උදව් ලබා දීලාත් තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ, අවමංගල රථයක් විධියට නම් කරලා වෑන් රථයක් ලංකාවට ගෙන්වලා මේ ඉල්ලීම කරලා තිබෙන එකයි. ඒ වෑන් රථය අයිති වෙන්නේ සුඛෝපභෝගී ගණයට. ඒක තමයි ප්‍රශ්නය. ගිය සතියේ තමයි මට මේ ඉල්ලීම ආවේ. ඊට පස්සේ මම අපේ නිලධාරීන්ට කිව්වා, අපි මේකට උදව් කරන්නේ කොහොමද කියලා බලලා, මට ඉක්මන් වාර්තාවක් දෙන්න කියලා. එම වාර්තාවෙන් පස්සේ, මුදල් අමාත්‍යවරයා වන ජනාධිපතිතුමාට මේ කාරණාව ඉදිරිපත් කරලා නීත්‍යානුකූලව අපට ලබාදිය හැකි උපරිම සහන ඒ සඳහා ලබා දෙන්න මම බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාහන ගැන කථා කරද්දී හැම කෙනෙකුම අහන ප්‍රශ්නයක් තමයි අනෙකුත් වාහන ගෙන්වන්නේ නැද්ද කියන එක. සංචාරක කර්මාන්තයට වාහන 1,000ක් ගෙන්වන්න අපි ඉඩදීලා තිබෙනවා. අනෙකුත් වාහන ගෙන්වීම සඳහා අපි සුවිශේෂී කමිටුවක වාර්තාවක් මුදල් අමාත්‍යවරයාට ඉදිරිපත් කරලා, මේ කටයුත්ත ප්‍රායෝගිකව කරන්නේ කොහොමද කියලා සොයා බලනවා. මේකට අදාළ පාර්ශ්ව රාශියක් ඉන්නවා. මුදල් අමාත්‍යාංශයට, මහ බැංකුවට, ප්‍රවාහන අමාත්‍යාංශයට, කර්මාන්ත අමාත්‍යාංශයට, වාහන එකලස් කරන්නන්ගේ සංගමයට, සෘජුව අලුත් වාහන ආනයනකරුවන්ට, පාවිච්චි කළ වාහන ආනයනකරුවන්ට, වාහන ආනයනය විවිධාකාර විධියට බලපානවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපි මේ සියලුදෙනාම එකතු කරලා කමිටුවක් හැදුවා. සියලුදෙනාටම වඩාත් ප්‍රයෝජනවත් වන ආකාරයට, සමස්ත රටටම වඩාත් ප්‍රයෝජනවත් වන ආකාරයට, යම් පාර්ශ්වයකට අඩුම අගතියක් සිදුවන ආකාරයට, ප්‍රශ්න අඩුම වන ආකාරයට වාහන ආනයනය කිරීම පිළිබඳ වැඩ පිළිවෙළක් හදන්න කියලා අපි ඒ කමිටුවට දන්වා සිටියා. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලටත් කථා කරලා මේ බව දැනුම්දීලා තිබෙනවා. අගෝස්තු මාසයෙන් පස්සේ පොදු ප්‍රවාහන සේවා, භාණ්ඩ ප්‍රවාහන සේවා, අනෙකුත් ප්‍රවාහන සේවාවලට භාවිත කරන විකල්ප වාහන, ඉන් පස්සේ සාමාන්‍ය වාහන, luxury වාහන වශයෙන් යම්කිසි අනුපිළිවෙළකට වාහන ගෙන්වන්න වැඩ පිළිවෙළක් හදනවා කියලා අපි ඔවුන්ට දැනුම් දීලා තිබෙනවා. ඒ අනුව මේ කමිටුව ජූලි මස 4වැනි දා රැස් වුණා. ඒ කමිටුව අමාත්‍ය මණ්ඩලයට මාසයක් ඇතුළත, ඒ කියන්නේ අගෝස්තු මාසයේ දෙවැනි සතිය වෙනකොට ඔවුන්ගේ වාර්තාව ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ අනුව යම්කිසි සුවිශේෂී අනුපිළිවෙළක් ඇතිව මේ කටයුත්ත කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි වාහන ආනයනය නැවත ආරම්භ කරන්නේ මේ රටට ප්‍රශ්නයක් ඇති නොවන ආකාරයටයි.

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு சட்டத்தரணி அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa, Attorney-at-Law)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම මේ වාහන පිළිබඳව කථා කරද්දී ලංකාවේ වාහන fleet එක, ඒ කියන්නේ ගමනාගමනයට යොදා ගන්න ඕනෑම වාහනයක් ගත්තොත් දැන් ඒවා ක්‍රමානුකූලව වියපත් වෙමින් තිබෙනවා. එතකොට ආණ්ඩුවට සමහර වෙලාවට වියපත් වෙමින් තිබෙන වාහන තොගය නඩත්තු කරන්න ඊට වඩා ලොකු මුදලක් spare partsවලට වියදම් කරන්න සිදු වෙන්න ඉඩ තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමාත් දන්නවා, අද පවතින වාහන අවුරුදු 5ක වාගේ ආයු කාලයකට තමයි හදලා තිබෙන්නේ කියන එක. ඒ කාලයටත් එහා එම වාහන පාවිච්චි කරනවා නම් ඇත්තටම පාවිච්චි කරන්නේ අසීරුවෙන්. එවැනි අවස්ථාවක මේ වාහන සම්බන්ධයෙන් යම් ආකාරයක නිදහසක් දෙන්න පුළුවන් ද කියලායි මම අහන්නේ. මම කියන්නේ සුඛෝපභෝගී වාහන ගැන නොවෙයි. ඒවා පැත්තකින් තියන්නකෝ. මොකද, අද වාහන මිල විශාල ලෙස වැඩිවෙලා තිබෙනවා. අද සාමාන්‍ය මනුස්සයෙකුට වාහනයක් මිලදී ගන්න බැහැ. ඒ නිසා මේ ගමනාගමනයට අවශ්‍ය පෞද්ගලික වාහන සහ අනෙකුත් වාහන සම්බන්ධයෙන් යම්කිසි රටක් එක්ක හරි කථා කරලා ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් ඇති කරන්න ඔබතුමන්ලා ක්‍රියා කරනවාද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට එතුමා අහපු ප්‍රශ්නයට පිළිතුර මගේ කථාවේම තිබුණා. අපට ප්‍රශ්නයක් තිබුණේ විනිමය ගැන. අපි වාහන ආනයනය සීමා කළා. හැබැයි, අත්‍යවශ්‍ය දේට දැනටමත් අපි දොර විවෘත කරලා තිබෙනවා. සංචාරකයන් සඳහා වර්ෂ 6කට වඩා පැරණි වාහන පාවිච්චි කරන්න බැරි නිසා අපි දැන් ඒ වාහන ගෙන්වීමට දොර විවර කළා. හැබැයි, එතැනින් අපි නවතින්නේ නැහැ. අපි පැහැදිලිවම මේ ගැන කියා තිබෙනවා. මේ වර්ෂයේ තුන්වැනි කාර්තුවේදී

ආරම්භ කරලා, පොදු ප්‍රවාහන සේවා, භාණ්ඩ ප්‍රවාහන සේවා, අනෙකුත් ප්‍රවාහන සේවාවලට භාවිත කරන විකල්ප වාහන, සාමාන්‍ය වාහන ගෙන්වීම දක්වා ගිහිල්ලා ඉන් එහාටත් යනවා කියලා අපි කියා තිබෙනවා. හැබැයි, ඉතාම පිළිවෙළකට මේ වාහන ආනයනය කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. සාමාන්‍ය ජනතාවට, නැත්නම් පාරිභෝගිකයාට ඒ අවශ්‍යතාව තිබෙනවා වාගේම, මේ තුළින් තවත් අලුත් ප්‍රශ්නයක් ඇති නොවන විධියට, මේ රටේ ඩොලර් එකක්වත් නැති තත්ත්වයට නැවත පත් නොවන විධියට ඉතාම ගැළපෙන ක්‍රමයක් තුළ වාහන ආනයනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ ගැන තමයි මම කිව්වේ. මේ හැම අංශයක්ම නියෝජනය කරන කමිටුව ජූලි මාසයේ 04වැනි දා රැස් වුණා. ඔවුන් අගෝස්තු මාසයේ දෙවැනි සතියට පෙර, මේක විවෘත කරන්නේ කොහොමද කියලා කැබිනට් මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කරනවා. කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලද වහාම යම් කිසි ක්‍රමානුකූල ක්‍රමයකට ඒ කාරණාව ඉෂ්ට කරන්න අපට පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අනෙක් රෙගුලාසිය ඇතුළත් අතිවිශේෂ ගැසට් පත්‍රය තමයි 2024 මැයි 17 දිනැති අංක 2384/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය. මෙය 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන රෙගුලාසි පිළිබඳ ගෙනාපු අතිවිශේෂ ගැසට් පත්‍රයක්.

ඒ වාගේම, මුලින් HS codes 217ක් යටතේ ආනයනය කළ භාණ්ඩ වර්ග 102ක් ලංකාවට ගොඩබාන්න, නැත්නම් ලංකාවේ වෙළෙඳ පොළට යන්න පෙර සෞඛ්‍යය සහ පරිසර අවශ්‍යතාව මත අනිවාර්යයෙන්ම තත්ත්ව පාලන සහතිකයක් ලබා ගත යුතුයි කියලා අපේ නීතියක් තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තවදුරටත් සෞඛ්‍ය සහ පරිසර හිතකාමීභාවය වාගේම ආරක්ෂාව අවශ්‍ය නිසා, අපි ඒකට අලුතින් භාණ්ඩ 34ක් එකතු කළා. ඒ අනුව මම දැන් කියපු 2024 මැයි මස 17 දිනැති අංක 2384/35 දරන ගැසට් පත්‍රය මඟින් ඇති වුණු අලුත් තත්ත්වයත් එක්ක පැරණි HS codes ප්‍රමාණයත් එක්ක අලුතින් HS codes 274ක් යටතේ භාණ්ඩ 161ක් ලංකාවට ආනයනය කිරීමේදී ලංකාවේ වෙළෙඳ පොළට ගෙන ඒමට පෙර තත්ත්ව පාලන බලපත්‍ර ඉදිරිපත් කිරීමේ වගකීමක් ආනයනකරුවාට පැවරෙනවා. මෙතැනදී වෙළෙඳ පොළට අනවශ්‍ය අපහසුතාවක් ඇති නොකිරීම සඳහා විදේශ රටක පිළිගත් තත්ත්ව සහතිකයක් තිබෙනවා නම්, ඒකත් පිළිගන්න පුළුවන් කියලා මේ ගැසට් පත්‍රයේ තිබෙනවා. අපට අවශ්‍ය කරන්නේ අනවශ්‍ය විධියට වෙළෙඳ පොළට වැට බඳින්න නොවෙයි. හැබැයි, රටේ වෙළෙඳ පොළ, අපේ පාරිභෝගිකයා, අපේ පරිසරය හා අපේ රටේ ජනතාවගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නයි මේ කටයුත්ත කළේ. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සහ පරිසර අමාත්‍යාංශයෙන් අපට තවත් මේ වාගේ යෝජනා රාශියක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි අනාගතයේදීත් තවදුරටත් මේ වාගේ ප්‍රමිතිකරණය අවශ්‍ය ආනයන සඳහා අවශ්‍ය නියෝග ලබා දීලා, මේ රටේ වෙළෙඳ පොළ හා මේ රටේ පාරිභෝගිකයා ආරක්ෂා කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, එතැන ගැටලුවක් තිබෙනවා. ඒ ගැන පාර්ලිමේන්තුවෙන් ඔබතුමා දැනුවත් කළේ නැද්ද දන්නේ නැහැ. අංක 2384/35 දරන ගැසට් පත්‍රය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් object කළා. මොකද, ඒ සඳහා අනුමැතිය ලබා දීම ඒ ගොල්ලන්ගෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් ගැටලුවක් ඇති වුණා. ඒ නිසා අපි ඒ ගැසට් පත්‍රයට ඊයේ අනුමැතිය ලබා දුන්නේ නැහැ. අපි ඒකට නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලුවා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(මාණ්පුමිකු රන්ජිත් සියම්බලාපිටිය)
(The Hon. Ranjith Siyambalapitiya)

හැබැයි අද න්‍යාය පත්‍රයේ ඒක තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, අංක 2384/35 දරන ගැසට් පත්‍රයට නම් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුමැතිය ලැබිලා නැහැ. මොකද, WTO එකේ undertakingsවලටත් මේක බලපානවා කියලා ඒගොල්ලන් කිව්වා. ඒ නිසා අපි අංක 2384/35 දරන ගැසට් පත්‍රය සම්බන්ධව නීතිපතිවරයාගෙන් උපදෙස් ඉල්ලුවා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(මාණ්පුමිකු රන්ජිත් සියම්බලාපිටිය)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු මන්ත්‍රීතුමනි, මම මේ ගැන සොයා බලා පැහැදිලි කරන්නම්. දැනට ඔබතුමන්ලා එකඟතාව ලබා නොදුන්නේ වාහන සඳහා වන Luxury Tax එකට පමණයි කියලා තමයි මට දැන ගන්න ලැබුණේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)

අපි food itemsවලටත් අනුමැතිය ලබා දුන්නේ නැහැ. අංක 2384/35 දරන ගැසට් පත්‍රයට අනුමැතිය ලබා දුන්නේ නැහැ. එහෙම නම් ඒ ගැන සොයා බලන්න.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(මාණ්පුමිකු රන්ජිත් සියම්බලාපිටිය)
(The Hon. Ranjith Siyambalapitiya)
හොඳයි.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාරණයක් මතක් කරන්න තිබෙනවා. අපි දැන් ලංකාවට ගෙන්වන්න හදන්නේ විදුලියෙන් ධාවනය වන වාහන නේ. නමුත්, එතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ විදුලි වාහනවල එන්ජිමක් නැහැ. ඒකේ තිබෙන්නේ බැටරිය විතරයි. ඒ බැටරිය විනාශ වුණොත්, කාර් එකට වැඩිය මුදලක් බැටරියට වැය කරන්න වෙනවා. ඒක නිසා මහජනතාව අතර විදුලි වාහන ගෙන්වීම සාර්ථක කර ගන්න ඕනෑ නම්, ඒකේ duty එක අඩු කරන්න කියලා මම තමුන්නාන්සේලාට කියනවා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(මාණ්පුමිකු රන්ජිත් සියම්බලාපිටිය)
(The Hon. Ranjith Siyambalapitiya)

ඔබතුමාගේ අදහසත් ඉදිරි කටයුතුවලදී එකතු කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කථා කරන හැම ගැසට් පත්‍රයකින්ම පැහැදිලි වෙන කාරණාව තමයි, අපි යම්කිසි ධනාත්මක ගමනකට ප්‍රවේශ වෙලා තිබෙන බව.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් debate එක පටන් අරගෙනද තිබෙන්නේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, පටන් අරගෙන තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇමතිතුමා Debate එක පටන් අරගෙනද ඔය කථාව කරන්නේ? මම හිතුවා, කරුණු පැහැදිලි කිරීමක් කියලා. නැහැ නේද?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මොකක්ද ඔබතුමා අහන්නේ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඇහුවේ මේකයි. මෙතැන සිටි මන්ත්‍රීවරු කිව්වා, Debate එක තවම පටන් ගත්තේ නැහැ, අහපු වෙනත් ප්‍රශ්නයකට ඔබතුමා කරුණු පැහැදිලි කිරීමක් කරනවා කියලා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
නැහැ, නැහැ, Debate එක පටන් ගත්තා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි, හොඳයි. කරගෙන යන්න.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සියලුදෙනාම සභාවේ කටයුතු ගැන අවධානයෙන් ඉඳලා නැහැ. මම කනගාටු වෙනවා, සුවිශේෂී, රටට වැදගත් වෙන විවාදයකදී සභාව ඒ ගැන අවධානයෙන් ඉඳලා නැතිව දැන් ඒ ගැන විමසීම ගැන. කමක් නැහැ, මේ සම්බන්ධව දැන් හෝ විමසීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම දැන් කථාව අවසන් කරන්නයි යන්නේ.

මේ හැම එකකින්ම පෙන්වන්නේ, අපි ඉතාම දරුණු ආර්ථික අර්බුදයක ඉඳලා දැන් යම් තැනකට එන බවයි. අපි දැන් ඒ හැම ප්‍රශ්නයකටම ක්‍රම ක්‍රමයෙන් පිළිතුරු සොයමින් යනවා. දැන් හර්ෂ ද සිල්වා මැතිතුමා මුදල් කමිටුවේ සභාපතිවරයා හැටියට බොහෝ කරුණු පෙන්වා දෙනවා. අපි ප්‍රජාතන්ත්‍රවාදීව ඒ කරුණු පිළිගනිමින් මේ රටේ අවශ්‍යතාව වන ආර්ථිකය යථා තැනට, නැත්නම් අවශ්‍ය තැනට යොමු කිරීමට කටයුතු කරගෙන යනවා. අන්න ඒ පිළිබඳව හොඳ නිදර්ශනයක් තමයි, අද ඉදිරිපත් කරලා තිබෙන අති විශේෂ ගැසට් පත්‍ර හතරේම ඇතුළත් කරුණු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

ගරු ඇමතිතුමනි, මම දැන් ලේකම් කාර්යාලයෙන් check කළා. එතකොට ලේකම් කාර්යාලයෙන් කියලා තිබෙනවා, පාර්ලිමේන්තුවේ මොකක් හරි අතපසුවීමක් නිසා මම කලින් සඳහන් කළ food items තිබුණු ගැසට් එකට අනුමැතිය ලැබිලා නැහැ කියලා. මම හිතන විධියට අද ඒ ගැන විවාද කරන්න බැරි වෙයි.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඒ ගැන සොයා බලා එය නිවැරදි කරන්න කටයුතු කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු ඇමතිතුමනි, දැන් අවුරුදු 3ක් තිස්සේ වරායේ අතිසුඛෝපභෝගී වාහන 700ක් විතර හිරවෙලා තිබෙනවා. දැන් ඒවා පාවිච්චි කරන්නත් බැරි තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. Sensors තිබෙන වාහන සම්පූර්ණයෙන්ම විනාශ වෙලා ගිහිල්ලා තිබෙනවා. අවශ්‍ය බදු මුදල් ලබා ගෙන එක්කෝ මේවා ඒ අයට ලබා දෙන්න, නැත්නම් වෙන්දේසි කරන්න. අපි මේ ගැන දිගින් දිගටම ඇහුවා. ගරු ඇමතිතුමනි, මේවා සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ගැන සනිපතා විමසීම් කරනවා. මේ වැඩි ප්‍රමාණයක් දීර්ඝ කාලීන නඩුවලට අදාළ වාහන. යම්කිසි ප්‍රමාණයක් තිබෙනවා, ඒවා වෙන්දේසි කරන්නත් බැහැ. ඒවාට ශ්‍රී ලංකාවේ මහා මාර්ගවල ධාවනය කිරීමට අවශ්‍ය ප්‍රමිතිය ලබා දීමට කිසිදු ක්‍රමයක් නැහැ. එවැනි වාහන ප්‍රමාණයකුත් තිබෙනවා. අනෙකුත් සියල්ලම දීර්ඝ කාලීන නඩුවලට අදාළ වාහන. ඒ නිසා තමයි අපි වෙනස්කම් තුනක් යෝජනා කරලා තිබෙන්නේ. යම්කිසි වාහනයක් රඳවා ගත්තාට

පස්සේ ඒ ගෙනාපු කෙනාට ඒ සඳහා දිගින් දිගටම අභියාචනා කරන්න සහ විවිධාකාර උසාවිවලට යන්න අවසරයක් තිබෙනවා. මේක ඒකත් එක්ක යන ප්‍රශ්නයක්. හැබැයි, නීතියෙන් ඔහුට තිබෙන අභියාචනාත්මක අයිතිය නැති කරන්න අපට බැහැ. හැබැයි, මේවා වඩාත් සරල කරන්න, තොරතුරු දීමේ බැඳියාව වැඩි කරන්න අවශ්‍ය කටයුතු අපි කරගෙන යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විපක්ෂය වෙනුවෙන් ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 11.20]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව විවිධ අවස්ථාවලදී අලුතින් විවිධ බදු පනවන්න අවශ්‍ය යෝජනා පාර්ලිමේන්තුවට ගෙනැල්ලා කියනවා, මේවා සුබවාදී යෝජනා, මේවා හරහා ආර්ථිකය ශක්තිමත් වෙනවා, මේකෙන් ආර්ථික වර්ධනයක් ඇති වෙනවා කියලා. ඒක තමයි පසුගිය අවුරුදු දෙකක කාලය තුළ අපි දිගින් දිගටම දැක්කේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මේ ජනාධිපතිවරයා ජාත්‍යන්තර සබඳතා තිබෙන, ජාත්‍යන්තර පිළිගැනීමක් තිබෙන, ජාත්‍යන්තර ආකර්ෂණයක් ගත හැකි ජනාධිපතිවරයෙක් කියලා තමයි හැමදෙනාම කියන්නේ. පසුගිය අවුරුදු දෙකක කාලය තුළ එතුමා විවිධ යෝජනා අත්සන් කරලා තිබෙන බවත් කියනවා. හැබැයි, ඒ මගින් එක ඩොලරයක්වත් ඍජු විදේශ ආයෝජන විධියට මේ රටට ලැබිලා නැහැ. ස්වාභාවිකව grow වෙන අපනයන වෙළෙඳ පොළ තුළින්, ප්‍රේෂණවලින් හෝ සංචාරක කර්මාන්තයෙන් වැඩි ඩොලර් ප්‍රමාණයක් ආවාම, ඒක සාර්ථකයි, අලුත් ආදායම් මාර්ගයක් හෙව්වා කියලා ඒකට කියන්න බැහැ.

ඇත්ත වශයෙන්ම මේ රටේ අපනයන වෙළෙඳ පොළ වැඩි කිරීම සඳහා ගත්ත පියවරක් නැහැ. උදාහරණ වශයෙන් ගත්තොත්, අපි ඉන්දියාවට අපනයනය කරනවා වාගේ භය ගුණයක් විතර ඉන්දියාවෙන් ආනයනය කරනවා. චීනයට අපනයනය කරනවා වාගේ පස් ගුණයක් විතර චීනයෙන් ආනයනය කරනවා. ඇමෙරිකාවට අපනයනය කරනවා වාගේ තුන් ගුණයක් විතර ඇමෙරිකාවෙන් ආනයනය කරනවා. ඒ නිසා වර්තමාන ආණ්ඩුව ආනයන, අපනයන පරතරය අඩු කරලා, අපනයනය වැඩි කරලා ඩොලර් ආදායම හොයන්න අවශ්‍ය දීර්ඝ කාලීන ඉලක්කවලට යන්න කිසිම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළේ නැති එක ගැන තමයි අපේ කනගාටුව තිබෙන්නේ.

තොරතුරු තාක්ෂණ වෙළෙඳ පොළ දැන් ලෝකයේ අලුත් වෙළෙඳ පොළක් බවට පරිවර්තනය වෙමින් පවතිනවා. ඒ තුළ විශාල ඉඩ ප්‍රස්ථා තිබෙනවා. තොරතුරු තාක්ෂණ වෙළෙඳ පොළට ඇතුළු වෙන්න අය වැය යෝජනාවල වෙන් කර තිබුණේ රුපියල් මිලියන 50යි. දැන් සවුදි අරාබිය තෙල්වලින් හොයන මුදල හා සමාන මුදලක් ඉන්දියාව තොරතුරු තාක්ෂණ වෙළෙඳ පොළෙන් හොයනවා. එතකොට අපි ඒ සඳහා ගත්ත පියවර කුමක්ද කියන එක ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. මේ වාගේ බංකොලොත් ආර්ථිකයක් තිබෙනකොට ඩොලර්වලින් අලුත් ආදායම් මාර්ග හොයන්න පුළුවන් ක්‍රම අනුගමනය කළ යුතුයි.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා කියපු කාරණාව මම පිළිගන්නවා. 2024.05.17 දිනැති 2384/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ තත්ත්ව පාලනය පිළිබඳව තවදුරටත් කථා කළ යුතු බව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව දැනුම් දීලා තිබෙනවා. එතැනදී වෙලා තිබෙන්නේ සන්නිවේදනයේ අඩුපාඩුවක්. ඒ නිසා එම ගැසට් පත්‍රය යටතේ ඉදිරිපත් කරන ලද රෙගුලාසි අද විවාදයට භාජන වෙන්නේ නැහැ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිය කියා හිටියේ මේකයි. මේ ආණ්ඩුව අලුත් වෙළෙඳ පොළවලට ඇතුළත් වෙලා ඩොලර්වලින් ආදායම් හොයාගන්න පුළුවන් එක ක්‍රමයක් හරි අලුතින් හඳුන්වා දුන්නාද කියන ගැටලුව අපට තිබෙනවා. මොකද, බංකොලොත් රටක් විධියට, ණය නොගෙවන රටක් විධියට සිටින අපි ණය ප්‍රතිව්‍යුහගත කිරීම අවසාන වුණාම නැවත ණය ගෙවන්න වෙනවා. ඒ ණය ගෙවන්න වෙන්නේ රුපියල්වලින් නොවෙයි. දේශීය ණය රුපියල්වලින් ගෙවන්න පුළුවන්. හැබැයි, අපට ජාත්‍යන්තර ණය ඩොලර්වලින් ගෙවන්න වෙනවා. එතකොට ඩොලර් ආදායම වැඩිකර ගැනීම සඳහා නිර්මාණශීලි වෙළෙඳ වටපිටාවක් හොයා ගත්තාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. මේ වාගේ තත්ත්වයක් තමයි 1988දී ප්‍රේමදාස ජනාධිපතිතුමා මේ රට භාර ගනිද්දි තිබුණේ. එවකට උතුරේ යුද්ධයක් තිබුණා; දකුණේ භීෂණයක් තිබුණා. ඒ නිසා මහා භාණ්ඩාගාරය හිස්ව තිබුණේ. ඒ වෙලාවේ එතුමා මොකක්ද කළේ? එතුමා මහ ලොකු ආර්ථික ඔස්තාර් කෙනෙක් නොවුණාට විවිධ අපහාස -අවලාද- උපහාස මැද ඇඟලුම් කර්මාන්තශාලා 200ක් හදලා රටේ අපනයන ආදායම වැඩි කිරීමට, ඩොලර්වලින් ආදායම වැඩි කිරීමට කටයුතු කළා. ඒ නිසා තමයි ඒ කාලයේ ලෝක බැංකුව එතුමාට ජනසවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආධාර උපකාර ලබා දුන්නේ. ඒ නිසා අපි ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ, ජාත්‍යන්තර බැඳුම්කර නිමියන් සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව සාකච්ඡා කරමින් යන වෙලාවේ එම මුළු ණය මුදලින් සියයට 28ක් කපා හරින්න ආණ්ඩුව ඉල්ලා තිබෙන බව. එසේ සියයට 28ක් කපා හරින්න කියලා ඉල්ලා තිබෙන්නේ රුපියල් බිලියන 92ක ආදායමක් පෙන්වලා. නමුත් දැන් බදු ගැහිල්ල වැඩි නිසාම එය රුපියල් බිලියන 92 නොවෙයි, රුපියල් බිලියන 105ක් දක්වා වැඩි වෙමින් පවතිනවා. ඒක යම් ආකාරයකට බලපාන්න පුළුවන්, අපට ලැබෙන haircut එක - කපා හරින්න ඉල්ලපු සියයට 28 - ඊට වඩා අඩු ප්‍රමාණයකට එන්න. ඒ කෙසේ වෙතත් ණය ගෙවීම ආරම්භ කරනකොට ඩොලර් බිලියනයකට වැඩි ප්‍රමාණයක් ණය පොලිය විධියට ගෙවන්න වෙනවා. අපි මේ ගෙව්විව කාලය තුළ මේ ණය පොලිය ගෙවන්න අවශ්‍ය ඩොලර් ආදායම වැඩි කර ගැනීම සඳහා ගත්ත පියවර මොකක්ද? අපි පැහැදිලිවම කියන්න කැමැතියි, මේ ඩොලර් ආදයම වැඩි කර ගත්තේ නැත්නම් අනිවාර්යයෙන්ම බදු ආදායම තව වැඩි කරන බව. මේ ආණ්ඩුවේ බදු ගැහිල්ලේ සෙල්ලම කොච්චරද කියනවා නම්, උපයන විට ආදායම් බද්ද වැඩි කරලා ගිය අවුරුද්දේ බලාපොරොත්තු වුණේ රුපියල් බිලියන 100ක්. හැබැයි, ඒ බදු වැඩි කරපු විධියට ගිය අවුරුද්දේ රුපියල් බිලියන 150ක් හොයලා තිබෙනවා. එතකොට රුපියල් බිලියන 50ක අතිරික්ත ආදායමකුත් තිබෙනවා.

ඒ අතරවාරයේ පෙරේදා ජනාධිපති මන්දිරයේ නාට්‍යයකුත් දැම්මා. මේ තිබෙන උද්ඝෝෂණ, වැඩවර්ජන අපි සම්පූර්ණයෙන්ම අනුමත කරන්නේ නැහැ. හැබැයි, වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නැඟීමේ අවම අවස්ථාව ලබා දිය යුතුයි. එහෙම

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

නොකර ඔවුන් බය කරන්නේ කොහොමද? මුදල් අමාත්‍යාංශයේ ලේකම් ඇවිල්ලා කියනවා, රාජ්‍ය සේවකයෝ ඉල්ලන පඩි වැඩි කිරීම කළොත් එහෙම VAT එක සියයට 21 දක්වා වැඩි කරන්න ඕනෑ කියලා. ඒ මොකක්ද කරන්නේ? යම් ගෙදරක රාජ්‍ය සේවකයෙක් ඉන්නවා නම් ඔහුත් එක්ක අල්ලපු ගෙදර ඉන්න කෙනා තරහ කරන්නයි හදන්නේ. මොකද අල්ලපු ගෙදර ඉන්න කෙනා හිතනවා, මේ මනුස්සයාගේ පඩි වැඩි කළොත් එහෙම පරිප්පු ටික, සීනි ටික ඇතුළු අපි කන බොන දේවල්වල බඩු මිල තමයි වැඩි වෙන්නේ කියලා. ඒ නිසා මේ වාගේ උප්පරවැට්ටි දාලා වැඩක් නැහැ. මේ වාගේ උප්පරවැට්ටි දැම්මාම වෙන්නේ තවත් ප්‍රශ්න ඇතිවන එක.

දැන් අන්තිම උප්පරවැට්ටියක් දාලා බැලුවා නේ. පෙරේදා ශ්‍රේෂ්ඨාධිකරණය ඒ පෙත්සම reject කළා නේ. හැම දෙයටම භය නැති මේ ආණ්ඩුව, හැම එකටම උත්තරයක් තිබෙන මේ ආණ්ඩුව අන්තිම උප්පරවැට්ටියත් දාලා බැලුවා. නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණය ඒ පෙත්සම reject කළා. ඇත්ත වශයෙන්ම මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා 2015දී පත් වුණේම අවුරුදු භයකට. නමුත්, එතුමා පත් වුණාට පස්සේ තමයි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා ධුර කාලය අවුරුදු පහකට අඩු කළේ. ඒ වෙලාවේ යම් මත විමසීමක් කර තීන්දුවක් දීලා තිබෙද්දී, අවුරුදු පහකටම පත් වුණු කෙනා නැවත උසාවි යනවා කියලා කියන්නේ, මේ මැතිවරණයට තිබෙන භය. මොකද මැතිවරණයට භය? මැතිවරණයට භය වෙන මුකුත් නිසා නොවෙයි. අපනයන ආදායම වැඩි කරලා නැහැ. ඍජු විදේශ ආයෝජන ඇවිල්ලා නැහැ. නමුත්, බදු ආදායම් වැඩි කරලා තිබෙනවා. හෙණ ගහනවා වාගේ බදු ගහලා බදුවලින්, බඩු මිලෙන්, බිල්වලින් මිනිස්සුන්ව හිර කරලා තිබෙන්නේ. මේ දේවල්වලින් හිර වෙලා ඉන්න ජනතාව අරගළ කරන්නේ නැති වුණාට, උද්ඝෝෂණ, වැඩවර්ජන කරන්නේ නැති වුණාට, ප්‍රජාතන්ත්‍රවාදීව අවස්ථාව ලැබුණාම තමන්ගේ පීඩනය අනිවාර්යයෙන්ම පිට කරනවා. ඒ පීඩනය පිට කරනකොට මේ කට්ටිය අනිවාර්යයෙන්ම දන්නවා, මේ රටේ ග්‍රාමීය දුප්පත් ජනතාවගේ සහයෝගය ලැබෙන්නේ නැහැ කියලා.

දැන් පොහොට්ටුව දෙකට කැඩිලා තිබෙන්නේ. කමක් නැහැ, එකතු කරගෙන යන්න. ප්‍රශ්නයක් නැහැ; ගැටලුවක් නැහැ. ඔබතුමන්ලා බෙදිලා ආවත්, එකතු වෙලා ආවත් පරද්දනවා. දෙකම එකට තියලා පරද්දනවා. භය වෙන්න එපා, ඒ ගැන. *[බාධා කිරීමක්]* මෙහෙම නේ. බෞද්ධ ධර්මය අනුව ඔබතුමන්ලාට කර්මය පටිසන් දීලා තිබෙන්නේ. මහින්ද මහත්මයා නේ, ඉස්සෙල්ලාම පක්ෂ කඩන්න පටන් ගත්තේ; මහින්ද මහත්මයා තමයි පක්ෂ කඩන්න පටන් ගත්තේ. දැන් ඔබතුමන්ලාගේ පක්ෂය දෙකට කැඩිලා තිබෙන්නේ. අපි පුදුම වෙන්නේ,- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, කමක් නැහැ. මම ඒ ගැන කිව්වා නේ. ඒ නිසා මම දැන් ඒක කියලා ඉවර කරන්නම්. ඔබතුමන්ලා එකට ආවත්, බෙදිලා ආවත් දෙකම එකට තියලා පරද්දනවා. එච්චරයි, මම ඒ ගැන කියන්නේ.

මේ රටේ ජනතාව විඳින පීඩාව ගැන මේ ආණ්ඩුවට කිසිම තැකීමක් නැහැ. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට අද හම්බ කරන මුදලින් ඉස්සෙල්ලාම වතුර බිලයි, විදුලි බිලයි ගෙවන්න ඕනෑ. විදුලි බිලයි, වතුර බිලයි ගෙව්වාට පස්සේ කන්නේ මොනවාද, ළමයෙක් ට්‍යුෂන් යවනවාද, එහෙම නැත්නම් අලුත් ඇඳුමක් ගන්න පුළුවන්ද, මොන ජාතියේ බෙහෙත්ද බොන්න වෙන්නේ කියන එක තීරණය කරන්නේ දේශපාලනය බව අද ජනතාවට තේරිලා තිබෙන්නේ. අලුත් ආදායම් ලබා නොගනිමින් කුඩුකාරයෝ කරනවා වාගේ වැඩ නේ මේ කරන්නේ. ණය ගන්නවා; බදු ගහනවා; අහු වෙච්ච, අහු වෙච්ච දේ විකුණනවා. මේකට අලුත් ආර්ථික ඔස්තාර්ලා ඕනෑද? කුඩුකාරයොත් එහෙම නේ කරන්නේ. ණයට අරගෙන කුඩු ටිකක් ගහනවා; එක්කෝ හම්බ වෙච්ච දෙයක් උස්සනවා; ඒ උස්සපු දේ විකුණනවා. ඒ වාගේ තමයි ආණ්ඩුවේ ආයතන ඔක්කොම sale එකට දාලා, බදු ගහනවා ණය අරගෙන.

බලන්න, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා පැනලා ගියාට පස්සේ වර්තමාන ජනාධිපතිතුමා රට භාර ගන්නකොට ඩොලර් මිලියන 83,000 ණය තිබුණේ. මේ විදේශ ණය නොවෙයි, සමස්ත ණය. අද එය ඩොලර් මිලියන ලක්ෂයක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මේගොල්ලන් ණය ගෙවන්නෙත් නැතිව ණය බර වැඩි වෙලා තිබෙන එකෙන්ම ඒක පෙනෙනවා. දන්නේ එච්චරයි. ණය ගන්න දන්නවා; බදු ගහන්න දන්නවා; විකුණන්න දන්නවා. පොහොට්ටුවේ කට්ටිය දන්නේ නැහැ, ජනාධිපතිතුමා කරන්නේ මේ සෙල්ලමම තමයි කියන එක. යහ පාලන ආණ්ඩුව කාලයේදීත් ඩොලර් මිලියන 12,000ක් ණය ගත්තා. මේගොල්ලන් දැන්,- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ, අහගෙන. ඒක නේ අපි පැරදුණේ. ඔබතුමන්ලාත් පරදින්නේ ඒ හින්දා තමයි. අපි පැහැදිලිව කියන්නේ මේකයි. ජනාධිපතිතුමාගේ මේ ක්‍රමය තේරෙනවා. සාමාන්‍යයෙන් ගමේ ඕනෑ කෙනෙකුට මේක කරන්න පුළුවන්. පොලී මුදලාලිගෙන් ණය ගන්නවා. ඊට පස්සේ ඒ ණය ගෙවන්න තව කෙනෙකුගෙන් ණය ගන්නවා. ඒ ණය ගෙවන්න තවත් කෙනෙකුගෙන් ණය ගන්නවා. ඒ ණය ගෙවන්න වෙනත් කෙනෙකුගෙන් ණය ගන්නවා. අන්තිමට දන්නේම නැතිව ගේ සින්න වෙලා යනවා. ඒ වාගේ තත්ත්වයක් නේ ඇති වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පැහැදිලිව කියන්න ඕනෑ, ණය ප්‍රතිව්‍යුහගතකරණය කරගෙන යම් මට්ටමකට ගොඩ ආවත් මේ තත්ත්වය යටතේ ගියොත් -මෙහෙම ණය ගන්න ගියොත්- තව අවුරුදු දෙකක් යනකොට පිපිරෙන බව; මෙහෙම ණය ගන්න ගියොත් තව අවුරුදු දෙකක් යනකොට පිපිරෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවට අන්තිම මොහොතේදීත් යෝජනා කරන්නේ - ඔබතුමන්ලා තව මාස දෙකයි ඉන්නේ. මාස දෙකෙන් ඉවරයි - රාජ්‍ය ආදායම ඩොලර්වලින් වැඩි කර ගැනීම සඳහා වූ ඍජු විදේශ ආයෝජන ගෙනෙන්න කටයුතු කරන්න කියායි. ඍජු විදේශ ආයෝජන එන්නේ නැත්තේ ඇයි? මේ ජනාධිපතිතුමායි, පොහොට්ටුවයි එකට එකතු වෙලා ඉන්නකොට ඍජු විදේශ ආයෝජන එන්නේ නැහැ. මොකද, ආයෝජකයන්ට විශ්වසනීය පරිසරයක් අපේ රටේ නැහැ. දූෂණය, වංචාව, නාස්තිය ඉහ වහා ගිහිල්ලා ඒවාට දඬුවම් ලැබෙන්නේ නැහැ කියන එක තමයි ආයෝජකයන්ගේ ඔළුවේ තිබෙන්නේ. ඒ නිසා තමයි මේ ගෙවුණු අවුරුදු හතරේ රුපියලක්වත් ආයෝජන ආවේ නැත්තේ. රුපියලකවත් ආයෝජන ආවේ නැහැ නේ. ඒ නිසා සේවා වෙළෙඳ පොළක් සහ නිෂ්පාදන වෙළෙඳ පොළක් නිර්මාණය කරන්න නම් අනිවාර්යයෙන්ම ආයෝජකයාට විශ්වාසයක් තිබෙන්න ඕනෑ. ආයෝජකයාට විශ්වාසයක් තිබුණොත් තමයි ආයෝජකයා එන්නේ. ඒ වාගේම ලෝකයේ බිහි වෙලා තිබෙන අලුත් වෙළෙඳ ප්‍රවණතාවලට ඇතුළුවීම හරහා පමණයි අපට ඩොලර් ආදායම වැඩි කරගන්න පුළුවන් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී අපි පෙන්වලා තිබෙන්නේ අපේ haircut එක ආදායමට සාපේක්ෂව ලබා දෙන්න කියන එකයි. ඇත්තටම රුපියල් ආදායමට සාපේක්ෂව haircut එක ඉල්ලපු එකම වැරදියි. මොකද, ණය ගෙවන්න තිබෙන්නේ ඩොලර්වලින් නම් අපට ඉල්ලන්න තිබුණේ ඩොලර් ආදායමට සාපේක්ෂව නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමතියි. අපි දැන් මොන කයිවාරු ගැහුවත්

අපේ ආර්ථිකය ක්‍රමානුකූලව, අපනයනය මත පදනම් වෙච්ච ආර්ථිකයක් බවට පරිවර්තනය කර ගත්තේ නැත්නම්, ඩොලර් ආදායම වැඩි වන ආර්ථිකයක් බවට පරිවර්තනය කර ගත්තේ නැත්නම් මේ උගුලෙන් අපට ගැලවෙන්න බැරි වෙයි. රැකියා බිහි කරන්නත් බැහැ; ණය ගෙවන්නත් බැහැ; ඒ වාගේම අලුත්, අලුත් අවස්ථාවලට ඇතුළත් වන්නත් බැහැ. ඒ නිසා මම ඉතා පැහැදිලිව කියනවා, සේවා සහ නිෂ්පාදන ආර්ථිකයක් කරා යන්නත්, අපනයනය මත පදනම් වූ සහ ඩොලර් ආදායම වැඩි කරන ආර්ථිකයක් නිර්මාණය කිරීමටත් අවශ්‍ය පියවර ගත යුතු බව. ඒ කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithreepala Sirisena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SAMANPRIYA HERATH left the Chair and THE HON. MAYANTHA DISSANAYAKE took the Chair.

[පූ.භා. 11.33]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පනත් කිහිපයක් යටතේ නිවේදන 2ක්, රෙගුලාසි සහ නියමයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කථා කිරීමට පෙර, මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා ඊයේ පාර්ලිමේන්තුවේදී මතු කරපු ප්‍රශ්නයක් පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න මා බලාපොරොත්තු වෙනවා. එතුමා මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයාව දැඩි ලෙස විවේචනය කරමින් බොහොම පහත් සහ නින්දිත අන්දමින් කථා කරලා තිබුණා. පාර්ලිමේන්තුවේ කථා කරන්න බැරි, උත්තර දෙන්න බැරි කෙනෙක්ව එලෙස විවේචනය කරපු නිසා එය නිවැරදි කිරීම මගේ යුතුකමක් වෙනවා. එතුමා අවධානයට යොමු කළේ, පළාත් පාලන ආයතන සඳහා ආණ්ඩුකාරතුමන්ලා විසින් පත් කර තිබෙන ආණ්ඩුකාර සම්බන්ධීකරණ ලේකම්වරුන් පිළිබඳවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට පළාත් පාලන මැතිවරණය කල් දමා තිබෙනවා. මේ නිසා පළාත් පාලන මැතිවරණයේ වැඩකටයුතු සම්පූර්ණයෙන් ඇනහිට තිබෙනවා. ජනතාවගෙන් ආණ්ඩුකාරවරුන්ට සහ රජයට විශාල ලෙස පැමිණිලි ලැබිලා තිබෙනවා, ඔවුන්ගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන්න පළාත් පාලන ආයතනවල කවුරුවත් නැහැ කියලා. වසර ගණනක සිට රාජ්‍ය නිලධාරීන් තමයි ඒ සභාවල කටයුතු පවත්වාගෙන යන්නේ. එතකොට ඒ සභාවේ ලේකම්තුමාට හෝ ලේකම්තුමියට සභාවේ පරිපාලනයත් එක්ක ඒ කටයුත්ත කර ගන්න බැහැ. ඒ නිසා කැළි කසළ ප්‍රශ්න, විදුලි බලය සම්බන්ධ ප්‍රශ්න, එහෙම නැත්නම් පාරවල් කැඩී යෑම වැනි එදිනෙදා පවතින ප්‍රශ්නවලට ඇහුම්කන් දෙන්න කෙනෙක් නැහැ කියන චෝදනාව ජනතාව තුළ තිබෙනවා. මේ නිසා පනතින් ආණ්ඩුකාරවරයාට පැවරී තිබෙන බලතල අනුව ආණ්ඩුකාරවරයා විසින් ආණ්ඩුකාර ලේකම්වරයෙක් පත් කරලා තිබෙනවා, මේ පළාත් පාලන ආයතනවල කටයුතු සම්බන්ධයෙන් සොයන්න. ඒ අය පත් කිරීමේදී ආණ්ඩුකාරවරයා විසින් පැහැදිලිව සඳහන් කර තිබෙනවා, ඒ ආණ්ඩුකාර ලේකම්වරයා ආණ්ඩුකාරවරයාට වග කියන්නේ කොහොමද කියලා. මේ වනකොට බස්නාහිර පළාත, දකුණු පළාත, මධ්‍යම පළාත, නැගෙනහිර පළාත ඇතුළු සියලු පළාත්වලට මේ ආණ්ඩුකාර ලේකම්වරු පත් කරලා තිබෙනවා. මොකද, පළාත් පාලන ආයතන කියන්නේ ජනතාවට ඉතාම සමීප ආයතන. මිනිසුන්ට වැඩියෙන්ම ප්‍රශ්න තිබෙන්නේ පාරවල් සම්බන්ධවයි. මා නියෝජනය කරන දිස්ත්‍රික්කය ගත්තොත්, වැහැපු ගමන් ඒ පැත්තේ පාරවල් විස්සක් විතර කැඩෙනවා. ඉස්සර නම් පළාත් පාලන ආයතනයේ සභාපතිතුමාට කියපු ගමන් සභාපතිතුමා සේවකයන් යවලා මැෂින් එකෙන් ඉතා ඉක්මනින් පාරවල් ටික සුද්ද කරනවා. ගමේ වීථි ලාම්පු ටික පිච්චුණාම සභාපතිතුමාට කියපු ගමන් වීථි ලාම්පු ටික සවි කර දෙනවා. හැබැයි, දැන් තිබෙන ප්‍රශ්නය මෙකයි. රාජ්‍ය නිලධාරීන්ට මේ ගැටලු ගැන කිව්වාම ඒවා සොයා බලලා, නීතිය අනුව කටයුතු ක්‍රියාත්මක කරන්න බොහෝ කාලයක් ගන්නවා. මේ පිළිබඳව සියලු ආණ්ඩුකාරවරුන්ට පැමිණිලි ඇවිල්ලා, පළාත් පාලන කොමසාරිස්වරු හරහා ආණ්ඩුකාරවරුන් විසින් ඒ අනුවයි මේ පත්වීම් කළේ. මම පසුගිය කාලයේ දැක්කා, ඒ පත්වීම් කරනවාත් එක්කම සමගි ජන බලවේගය සහ විවිධ දේශපාලන පක්ෂ ගිහිල්ලා,-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට point එකක් තිබෙනවාද? මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමාගේ,-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාට වඩා point එකක් මගේ ළඟ තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳ අදහසක් කියන්නේ. එවැනි ප්‍රමාදයක් තිබුණු බව මමත් පිළිගන්නවා. අපි දන්නවා, අද සියලු පළාත් සභා, ප්‍රාදේශීය සභා කිසිම පාලනයක් නැති තැනකට තල්ලු වෙලා තිබෙන බව. අද පළාත් සභාත් ඉවරයි, ප්‍රාදේශීය සභාත් ඉවරයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට මේ කාරණය කියන්න විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම කියන්නේ මෙකයි. ඔය ඔක්කොම හරි, ගරු මන්ත්‍රීතුමා. හැබැයි, තිබෙන ප්‍රශ්නය මෙකයි. පළාත් පාලන මැතිවරණයක් කැඳවලා තිබියදී එහි සම්පූර්ණ බලය තිබෙන්නේ මැතිවරණ කොමිසමට. මැතිවරණ කොමිසම කියනවා, ඡන්දය ඉල්ලන අපේක්ෂකයන් මේ තනතුරට පත් කරන්න එපා කියලා. ඔබතුමන්ලා ඒක පිළිගන්නවාද, නැත්නම් ප්‍රමාදය ගැන කියලා ඒ කාරණය වහන්න හදනවාද කියන එකයි මම අහන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ආණ්ඩුකාරවරයාට පනතින් ලැබී තිබෙන බලතල අනුවයි ක්‍රියා කරලා තිබෙන්නේ. ඕනෑ කෙනෙකුට challenge කරන්න පුළුවන්. අපි කරලා තිබෙන පත්වීම වැරැදියි නම් ඔබතුමා උසාවි යන්න. තමුන්නාන්සේ පක්ෂයේ සභාපතිතුමාට විරුද්ධව උසාවි ගියා නේ. ඒ වාගේ, තමුන්නාන්සේ ප්‍රාදේශීය සභාවේ සභාපතිට විරුද්ධව උසාවි යන්න. පනත අනුව ආණ්ඩුකාරවරයාට බලයක් තිබෙනවා. මගේ ප්‍රශ්නය මෙකයි. අපේ ගම් පළාත්වල පාර කැඩිලා, අරවා කැඩිලා, මෙවා කැඩිලා. ඒවා ගැන ඇහුම්කන් දෙන්න මිනිහෙක් නැහැ. බල්බ් එකක් දමාගන්න මනුස්සයෙක් නැහැ. පාරක් නාය ගියාම බලන්න මිනිහෙක් නැහැ. ආණ්ඩුකාරවරයාට තමයි සම්පූර්ණ බලය තිබෙන්නේ. නමුත්, ආණ්ඩුකාරවරයාට බැහැ, පළාත් පාලන ආයතන ගණනාවක් බලන්න. ඒ නිසා තමයි ආණ්ඩුකාරවරයා විසින් එතුමාගේ නියෝජිතයෙක් පත් කරලා තිබෙන්නේ.

දැන් තමුන්නාන්සේලා කියනවා, පළාත් පාලන මැතිවරණයේ අපේක්ෂකයන් මේ තනතුරුවලට පත් කරපු එක වැරදියි කියලා. එහෙම නම් මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා පත් කරපු එක හරිද? මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා කවුද? එතුමා පළාත් පාලන ඡන්දයේ අපේක්ෂකයෙක්. ජාතික ලැයිස්තුවෙන් පත් වුණු ඛයනා මන්ත්‍රීතුමිය අයින් වුණාට පසුව ඒ වෙනුවට ඡන්දයෙන් ආපු කෙනා දමන්නේ කොහොමද? ජාතික ලැයිස්තුව වෙනුවට ඡන්දයෙන් ආපු කෙනෙක් පත් කරපු එක හරිද? තමුන්නාන්සේලාගේ ඒ නීතිය හරිද? එතුමා ගිහින්ලා සජිත් ප්‍රේමදාස මහත්තයාගේ ප්‍රවර්ධන කටයුතු කරන එක හරිද? ඒක නීතියද? නැහැ. එහෙම නම් ඒකත් වැරදියි නේ. එතකොට මැතිවරණ කොමිසම බුදි. මේ වෙලාවේ විතරක් මැතිවරණ කොමිසම කථා කරනවා. ඛයනා මන්ත්‍රීතුමිය ඉවත් වුණා නම් ජාතික ලැයිස්තුවෙන් වෙනත් කෙනෙක් පත් කරන්න ඕනෑ. ජාතික ලැයිස්තුවේ කෙනා පත් කරන්නේ නැතිව කොළඹ දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා ඇවිත් පසුව ඉල්ලා අස්වෙච්ච පළාත් පාලන ඡන්දයේ අපේක්ෂකයෙක් ඒකට දමනවා. එහෙම කරලා එතුමා ජනාධිපති අපේක්ෂකයා ප්‍රවර්ධනය කරනවා. එතකොට මැතිවරණ කොමිසමට හොඳයි. නැත්නම් හොඳ නැහැ.

ඔබතුමන්ලා කරුණාකරලා මේ කාරණය මතක තියාගන්න. පළාත් පාලන ආයතනය කියන්නේ ගමේ තැන; ගමේ පොඩි මිනිහාගේ ප්‍රශ්න විසඳන තැන. ඒ නිසා මිනිසුන්ට ඇහුම්කන් දෙන මිනිහෙක් එතැන ඉන්න ඕනෑ. මිනිසුන්ගේ දුක දන්න මිනිහෙක් ඉන්න ඕනෑ. ඒ නිසා තමයි ආණ්ඩුකාරවරු මේ පත්කිරීම කරලා තිබෙන්නේ. පනතට අනුව ආණ්ඩුකාරවරයාට නීත්‍යානුකූලව මේ පත් කිරීම කරන්න පුළුවන්. ඒ නිසා ආණ්ඩුකාරවරයා සමබන්ධීකරණ ලේකම් පත් කරලා තිබෙනවා. මැතිවරණ කොමිසම අපට ඒ විස්තර එවලා තිබෙනවා; මැතිවරණ කොමිසම අපිව දැනුවත් කරලා තිබෙනවා. එක එක පක්ෂවලට ඕනෑ විධියට මැතිවරණ කොමිසමට තීරණ ගන්න බැහැ. එක එක පක්ෂවලට ඕනෑ විධියට මැතිවරණ කොමිසමට නටන්න බැහැ. මම නම් කියන්නේ, මේ කොමිෂන් සභා දාලා තමයි අපි විනාශ වුණේ. මේ කොමිෂන් දාලා තමයි මේ රට ඉවර වෙන්නේ. මේ රට වැටෙන්නේ මේ කොමිෂන් සභා නිසයි. ස්වාධීන කොමිෂන් සභා කියලා පත් කරලා, ඒ ඉන්න සාමාජිකයින්ට මනුස්සයෙකුට ඡන්දයක් දෙන්න බැරිනම්, -අපට මතකයි නේ, පොලිස්පතිවරයා පත් කරන්න යනකොට ඒ ස්වාධීන කොමිෂන් සභාවේ සමහර සාමාජිකයෝ ඡන්දය දුන්නේ නැති බව- ඒවාට කොන්දක් නැති සාමාජිකයන් පත් කරනවා නම්, ස්වාධීන කොමිෂන් සභා මොකටද?

මම මේ කාරණය පැහැදිලිව කියන්න ඕනෑ. ආණ්ඩුකාරවරයාට පනතේ 13(4) වගන්තිය අනුව -මගේ මතකයේ හැටියට, නිවැරදි කිරීමට යටත්ව- නීත්‍යානුකූලව ලැබී තිබෙන බලතල අනුව තමයි එතුමා තමන්ගේ නියෝජිතයා පත් කරලා තිබෙන්නේ. ඒ අයට කියලා නැහැ, ප්‍රාදේශීය සභාවල නිලධාරීන් කැඳවලා රැස්වීම් තියන්න කියලා. ඒ අයට කියලා නැහැ, මෙහි පරිපාලනයට මැදිහත් වෙන්න කියලා. ඒ අයට කියලා තිබෙන්නේ ඒ ගොල්ලන්ගේ පළාත් පාලන ආයතනයේ තැනක වාඩිවෙලා කැළි කසළ බැහැර කිරීම පිළිබඳව, මහජන විමසීම් පිළිබඳව, ප්‍රාදේශීය සභාවේ සංවර්ධන වැඩ ටික හරියට වෙනවාද කියන එක පිළිබඳව -මිනිසුන්ගේ අවශ්‍යතා ටික- සොයා බලා ආණ්ඩුකාරවරයාට වාර්තා කරන්න කියලායි. ඒ නිසා ඒ පත් කිරීමේ කිසිම වරදක් නැහැ. හෙට අනිද්දා වෙනකොට ඉතිරි පළාත්වලත් අපි මේ පත් කිරීම කරනවා. මේකෙදි කිසිම වැරැද්දක් කරලා නැහැ. නීත්‍යානුකූලව තමයි පත් කිරීම කරලා තිබෙන්නේ. කවුරු කිව්වත් අපි මේක අයින් කරන්නෙත් නැහැ. අපි නීත්‍යානුකූලවයි පත්කිරීම කරලා තිබෙන්නේ. ගමේ පොඩි මිනිහාගේ ප්‍රශ්න විසඳීම වෙනුවෙන් තමයි අපි මේ පත්කිරීම කරලා තිබෙන්නේ. මේකෙන් තමුන්නාන්සේලාට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මේ පත් කරලා තිබෙන කිසිවෙක් අඩු ගණනේ පළාත් පාලන ආයතනයක වාහනයක්වත් පාවිච්චි කරලා නැහැ. රාජ්‍ය දේපළ භාවිත කරලා දේශපාලනය කරනවා නම් ඒක වැරදියි. ඒ අයට පළාත් පාලන ආයතනයේ තැනක් දීලා තිබෙනවා. ඒ තැන ඉඳගෙන මිනිසුන්ගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දීලා ආණ්ඩුකාරයාට වාර්තා කිරීම පමණයි මේ පත් කරන සම්බන්ධීකරණ ලේකම්වරයාට කරන්න තිබෙන්නේ.

වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා ඉතාම පහත් විධියට මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා ගැන කථා කළා. මම දැක්කා එතුමා ඊයේ ඉංග්‍රීසි භාෂාවෙන් කථා කරනවා. හරියට නුවර සුද්දන්ගෙන් ඡන්දය අරගෙන පාර්ලිමේන්තුවට ඇවිල්ලා වාගේ. මම එතුමාට මේ කාරණය කියනවා. අපට මධ්‍යම පළාතේ ගෞරවනීය ආණ්ඩුකාරවරයෙක් ඉන්නවා. එතුමා ඉතාම හොඳින් වැඩ කටයුතු කරනවා. පළාත් පාලන ආයතනවලට කරන මේ පත්කිරීම නීත්‍යානුකූලයි. පනතට අනුව තමයි අපි කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා අපි මැතිවරණ කොමිසමට කියනවා, කරුණාකරලා එක එක පක්ෂවලට අනුව කටුතු කරන්න එපා කියලා. සජිත් ප්‍රේමදාස මහත්මයාට ඉස්කෝල ගානේ ගිහිල්ලා බෝර්ඩ් බෙද බෙදා මැතිවරණ කටයුතු කරන්න පුළුවන්. එතකොට කොමිසම බුදි. කොමිසට ඒවා ගැන කථා කරන්නේ නැහැ. වෙනත් ඒවාට විතරක් කොමිසම කථා කරනවා. කොමිසම කියන්නේ ස්වාධීන ආයතනයක්. ඒ නිසා මැතිවරණ කොමිසම ස්වාධීනව කටයුතු කරන්න කියන ඉල්ලීමත් අපි කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.41]

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථා කරන්නේ අද විවාදයට ගැනෙන රෙගුලාසි සහ අනෙකුත් කාරණා ගැන නොවෙයි, අද රටට අවශ්‍ය කරන මූලික දෙයක් ගැනයි. මේ රටේ ජනාධිපතිවරණය තව මාස කිහිපයකින් පවත්වනවා. මේ ජනාධිපතිවරණය පවත්වනකොට මේ රටේ මිනිස්සු ඉල්ලන්නේ කිසිම හොරකමක් නොකරපු මිනිස්සු පත් කරන්න කියලා. මේ, මිනිස්සු කියන දේවල්. අරගළය ආවෙත් ඒකයි. අපේ පක්ෂය එපා කියද්දීත්, රනිල් වික්‍රමසිංහ මහත්තයාට මම ඡන්දය දුන්නා. මොකද, ඒ වෙලාවේ මම හිතුවා මේ ඉල්ලපු අනික් අයට වැඩිය රනිල් වික්‍රමසිංහ මහත්තයා සුදුසුයි කියලා. ඇත්තටම එතුමා ඒ කාර්යය පෝලිම් නැතුව කරගෙන යනවා. අපි ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. නමුත් ආර්ථිකය ගැන මම දන්නේ නැහැ. මට ලොරියක් දුන්නොත්, ඒ ලොරිය ගලවලා සවි කරන්න පුළුවන්. රබර් ගසක් දුන්නොත්, රබර් ගස කපන්න පුළුවන්. ආර්ථිකය ගැන දන්නේ අපේ හර්ෂ ද සිල්වා මැතිතුමා.

ඉතින් මම ජනාධිපතිතුමාට කියන්නේ, ඔබතුමා කරුණාකරලා ප්‍රවේසමෙන් කටයුතු කරන්න කියලායි. මොකද, ආර්ථිකය හරියට හසුරුවයි කියලා වැරදි මිනිස්සු ළඟ තියා ගත්තොත්, අනිවාර්යයෙන්ම ඡන්දය දෙන්නේ නැහැ. ඇයි, මම එහෙම කියන්නේ? මම එහෙම කියන්නේප මේ නිසා. මේ ළඟදී රැස්වීමක් තිබුණා කළුතර. ඒ, ජූලි 7 වෙනිදා. ජූලි 7 කියන්නේ ප්‍රසන්න රණවීර මැතිතුමනි, බොහොම භයානක දවසක්. ජූලි 7යි. ඒ රැස්වීමේදී රනිල් වික්‍රමසිංහ මහත්තයාත් කථා කළා. රනිල් වික්‍රමසිංහ මහත්තයා මේ සභාවේදී කිව්වා, එතුමාට මේ පාලනය හරියට ගෙනියන්න නම්, "එහෙම නම් අපට සිද්ධ වෙනවා, එංගලන්තයේ මහ බැංකුවත් කඩන්න" කියලා. අපි ඔය පැත්තේ ඉන්නකොට කෑ ගැහුවා නේ, රනිල් වික්‍රමසිංහ මහත්තයා මහ බැංකුව කැඩුවා කියලා. එතකොට ඒකෙන් ප්‍රයෝජනය ගත්තේ අපි නොවෙයි, මේ පැත්තේ ඉන්න අය. ඒ ගොල්ලන්ට තමයි ප්‍රයෝජනය ලැබුණේ. ඒත් මැතිවරණයක් වේලාවේ. මැතිවරණයක් වෙලාවේදී ඒ දේ කළා. මම කියන්නේ නැහැ ඔක්කෝම හොඳයි කියලා. අපි ඔක්කෝම හොරු. ඒක කියන්න එපා යැ. බොරුවට "මම හොඳයි, මම සුදනා" කියන්න බැහැ. අපි ඔක්කෝම හොරු. මම කියන්නේ පරණ හිටපු ඇමතිවරු, ජනාධිපතිවරු, ඒ ඔක්කෝම මාටියා පාර ගහලා තිබෙනවා.

මම කියන්නේ මෙච්චරයි. රනිල් වික්‍රමසිංහ මහත්තයාට එදා වේදිකාවේ හිටියා, විශාල පිරිසක්. මහින්ද රාජපක්ෂ මහත්තයා මගේ හදවතේ නායකයා. එතුමාට මම ගෞරව කරනවා. එතුමා නොහිටින්න යුද්ධය අවසන් කරන්න බැහැ. කිසි කෙනෙක් ඒ වාගේ තීන්දු ගන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ මහත්තයාට ඕනෑම දේකට මම බෙල්ල දීලා, එතුමා ගැන කථා කරන්නේ. එතුමා මේ රටට විශාල සේවයක් කළා. Supreme Court එකෙන් නඩු තීන්දුවක් දුන්නා, මේ ආර්ථිකය නැති කළේ රාජපක්ෂවරු තුන්දෙනෙක් කියලා. ඒ තුන්දෙනාත් **ඒ** වේදිකාවේ හිටියා. මම කිව්වා, ගෝඨාභය මහත්තයාට ජනාධිපති අපේක්ෂකකම දෙන්න එපා කියලා. නමුත් මේ ඉන්න අය දුන්නා. අන්තිමට මොකද, වුණේ? කැරැල්ල එනකොට පැනලා දිව්වා. රටෙත් හිටියේ නැහැ. ඒ මහත්තයාත් හිටියා. තව, එංගලන්තයේ ඉස්පිරිතාලවල කුණු වීසි කරන්න තැනක් නැති වුණාම ඒ ගොල්ලන් දුන්නා ලංකාවේ එක්තරා ව්‍යාපාරිකයෙකුට ඒවා ගේන්න. එයා එංගලන්තයේ ඉස්පිරිතාලවල කුණු ලංකාවට ගෙනාවා. ඒ කාලයේ අර කුණු කන්දක් ගහගෙන තිබුණා මතකයි නේ. කොච්චර මිනිස්සු මැරුණාද? ඒ කුණු මෙහාට ගෙනාවා. ඒ වාගේ මුදල්වලට කෑදර මිනිස්සු පිටරට ඉස්පිරිතාලවල කුණු ලංකාවට ගෙනාවා. එයාත් ඒ වේදිකාවේ ඉස්සරහා හිටියා. තව හොඳ මහත්වරුත් හිටියා. මම දන්නවා, ගාල්ල දිස්ත්‍රික්කයේ අපේ කාරියවසම් මහත්තයලාගේ පවුලේ කෙනෙක් හිටියා. ඒ වාගේ හොඳ මහත්වරු හිටියා. ඒ වාගේම රෝහිත අබේගුණවර්ධන මහත්තයා හිටියා. රෝහිත අබේගුණවර්ධන මහත්තයාට මේ පාර්ලිමේන්තුවේ කථා කරන්නේ, "පාර්ලිමේන්තු මන්ත්‍රී" නැත්නම් "ඇමති රෝහිත අබේගුණවර්ධන" කියලා.

අපේ දිස්ත්‍රික්කයේ විදුර වික්‍රමනායක මහත්තයා ඉන්නවා. එතුමා අපේ රත්නසිරි වික්‍රමනායක හිටපු අගමැතිතුමාගේ පුතා. එතුමාට කියන්නේ, "විදුර වික්‍රමනායක ඇමතිතුමා" කියලා. නමුත් දැන් තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමා කියනවා, "රත්තරන්ගෙන් අවසරයි!" කියලා. බලන්න, ඒකට දාලා තිබුණු comments. හොරු ඔක්කෝම එක්කාසු වෙලා මේ රට විනාශ කරන්න හදනවා කියලා දාලා තිබුණා. "රත්තරන්" කියලා හොරෙක් කළුතර දිස්ත්‍රික්කයේ හිටියා. මෙහේ "රත්තරන්" නොවෙයි. ඒ, මාල කඩපු හොරෙක්. එස්.බී. දිසානායක මහත්මයාත් දවසක් කිව්වා. ඕනෑ නම් අහන්න. මේ සභාවේ ඕනෑ තරම් ඒ ගැන කථා කරලා තිබෙනවා. කළුතර ඉඳන් අලුත්ගමට යනකල් මාල කඩපු හොරු හිටියා. නමුත් "රත්තරන්" කිව්වාම අපට මතක් වෙන්නේ, අර හොරා. එතකොට ඒ වාගේ හොරු කණ්ඩායමක් ද එම වේදිකාවේ ඉස්සරහින් හිටියේ? ඉතින් බලන්න, ඊළඟට රට පාලනය කරන්න යන්නේ ඒ අයද? මේක කාටත් පොදුයි. අපේ අනුර කුමාර දිසානායක මහත්මයාටත් මම කියනවා, "එය ඔබතුමාටත් පොදුයි" කියලා. මේක අපේ "දියසෙන් කුමාරයාටත්" අපේ සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාටත් පොදුයි. මේ රට පාලනය කරන්න කවුරු හරි ඉදිරිපත් වෙනවා නම්, කරුණාකර හොරුන් ගාවා ගන්න එපා. ලබන වතාවේ election එක එනකොට බලන්න, ඔක්කෝම වේදිකාවල ඉන්නේ, හොරු. ඉතින් ඒ වාගේ අයත් එක්ක මේ රට ඉදිරියට ගෙන යන්න බැහැ. සිංගප්පූරුව කොහොමද දියුණු වුණේ? ලී ක්වාන් යූ කිව්වා, හොරකම් කරන්න නම් එන්න එපා කියලා. එතුමා බලයට ඇවිල්ලා ඉස්සර වෙලාම එතුමාගේ යහළුවා තමයි හොරකම් කළාට හිරේට දැම්මේ. Honesty මේ රටටත් අවශ්‍යයි. ශ්‍රේෂ්ඨ නායකයෝ මේ රටෙත් හිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පියා ශ්‍රේෂ්ඨ නායකයෙක්. ලලිත් ඇතුලත්මුදලි මහත්මයාත් ශ්‍රේෂ්ඨ නායකයෙක්. අපේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ශ්‍රේෂ්ඨ නායිකාවක්.

[ගරු කුමාර වෙල්ගම මහතා]

හොරු අල්ලලා හිරේ දමන්නේ නැත්නම්, වැඩ කරන්නේ හොරු එක්ක නම් මේ රට දියුණු කරන්නේ කොහොමද? ජූලි 7වන දා මධුර විතානගේ මන්ත්‍රීතුමා අපේ ගමේදි කළේ අපහාසයක්. එතුමා ඒ කථාව කිව්වේ අපේ කළුතර දිස්ත්‍රික්කයේ ඉඳන්. අපට ලොකු අපහාසයක් කළේ. ඒ නිසා මගේ නම් එකම අරමුණ, ලබන වතාවේ හොරුත් එක්ක මේ ගමන යන නායකයන් ඉන්නවා නම්, ඒ නායකයන් පන්නන්න, මේ හොරකම් නවත්වන්න, කළුතර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට නැකම් කියන හොඳ මහත්මයෙක් නව ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරිපත් කිරීමයි.

හොරකම් කරපු ඕනෑ කෙනෙක් හිරේ දමන්න අපි බලාගෙන ඉන්නවා. මිනිස්සු කෑ ගහලා හිටපු සෞඛ්‍ය ඇමතිතුමා හිරේ දැම්මා. ලබන වතාවේ ආණ්ඩුව තුළ සෙල්ලම් කරන්න එන්න එපා. ලබන වතාවේ මමත් කොහොම හරි පාර්ලිමේන්තුවට එනවා. කරුණාකර සෙල්ලම් කරන්න ලැහැස්ති වෙන්න එපා. ඉදිරි මැතිවරණයේදී කළුතර දිස්ත්‍රික්කයෙන්, පාර්ලිමේන්තුවට නැකම් කියන හරියාකාර අපේක්ෂකයෙකු අපි ඉදිරිපත් කරනවා. කළුතර දිස්ත්‍රික්කයට අපහාස කරපු නිසා ඒ අපහාසය නැති කරන්න ඊළඟ ජනාධිපතිවරයා කළුතර දිස්ත්‍රික්කයෙන් පත් වෙයි කියලා මම තමුන්නාන්සේලාට කියනවා. මම මීට වඩා කථා කරන්නේ නැහැ.

බොහොම ස්තුතියි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු මුජිපුර් රහ්මාන්)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ සභාවේ හිටපු නැති වෙලාවේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීවරයා මගේ නම සඳහන් කරලා, මම පාර්ලිමේන්තුවට පැමිණීම ගැන කථා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පළාත් පාලන මැතිවරණය කැඳෙව්වේ, ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවයි. අපි සියලුදෙනාම මේ පාර්ලිමේන්තුවේදී දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය දුන්නා; විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය දුන්නා. ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවෙන් තමයි ඒ මැතිවරණය කැඳෙව්වේ. ඒ මැතිවරණයට තරග කරන්න තමයි මම පාර්ලිමේන්තුවෙන් අයින් වුණේ. නමුත්, එතුමා නියෝජනය කරන, අද එතුමා සභයෝගය දෙන, අද එතුමා පෙනී සිටින ජනාධිපතිතුමාත්, එතුමන්ලාගේ ආණ්ඩුවත් තමයි පළාත් පාලන මැතිවරණය පවත්වන්න නොදී, මුදල් නොදී මැතිවරණය කල් දැම්මේ. මම මැව් එක ගහන්න ලැහැස්ති වෙලා තමයි පාර්ලිමේන්තුවෙන් එළියට ගියේ. මම අවුරුදු එකහමාරක් එළියේ බලාගෙන හිටියා, මැව් එක ගහන්න. එතුමන්ලා මැව් එක ගහන්න ආවේ නැහැ. ඉතින් මම අවුරුදු එකහමාරක් එළියේ බලාගෙන ඉඳලා බැරිම තැන ආයෙත් පාර්ලිමේන්තුවට ආවා. මොකක්ද තිබෙන ප්‍රශ්නය? ප්‍රශ්නයක් තිබෙනවා නම්, යන්න පුළුවන් ශ්‍රේෂ්ඨාධිකරණයට.

මැතිවරණ කොමිසම මාව පත් කළේ ඇයි කියලා අහලා වැඩක් නැහැ. මාව පත් කරන්න අයිතිය තිබෙනවා. පාර්ලිමේන්තුට එන්න මට අයිතිය තිබෙනවා, පළාත් පාලන මැතිවරණය පවත්වන්නේ නැත්නම්; පළාත් පාලන මැතිවරණය පවත්වන්න ලැහැස්ති නැත්නම්. ජනාධිපතිතුමා හැම දාම කියනවා, "ඡන්දය තියන්නේ නැහැ" කියලා. "කොහේද ඡන්දයක් තියන්නේ?" කියලා අහනවා. ඒ නිසා තමයි මම නැවත පාර්ලිමේන්තුවට ආවේ. මාව පත් කිරීම ගැන මොනවා හෝ ගැටලුකාරී තත්ත්වයක් තිබෙනවා නම් එතුමන්ලාට යන්න පුළුවන්, ශ්‍රේෂ්ඨාධිකරණයට. එහෙම කරන්නේ නැතුව මෙතැනට ඇවිල්ලා මැතිවරණ කොමිසමට බලපෑම් කරලා, මැතිවරණ කොමිසමේ ක්‍රියාදාමය නවත්වන්න ඒගොල්ලන්ට බැණ වදින්න යන්න එපා. ඒ වැඩේ කරන්න එපා. ඒගොල්ලන් නීති විරෝධී වැඩක් කරලා තිබෙනවා නම් ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න. එහෙම නැතුව මගේ පත්වීම ගැන මේ පාර්ලිමේන්තුව ඇතුළේ කථා කරලා වැඩක් නැහැ. රටේ ව්‍යවස්ථාවට අනුකූලවයි, නීත්‍යානුකූලවයි මම පත් වෙලා ඇවිත් ඉන්නේ. එහෙම වුණේ ඔබතුමන්ලා පළාත් පාලන මැතිවරණය කල් දමපු නිත්දා. එහෙම නැත්නම්, මම පළාත් පාලන මැතිවරණයට තරග කරන්න එළියේයි හිටියේ. එළියේ අවුරුදු එකහමාරක් බලාගෙන ඉඳලා බැරිම තැන තමයි මම නැවත පාර්ලිමේන්තුවට පත් වෙලා ආවේ.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා.

[ම.ප. 11.53]

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(මාණ්පුමිකු වඩිවේල් සුරේෂ්)
(The Hon. Vadivel Suresh)
කෞරව තලෛමෛතාංගුම් උறුප්පිනර් අවර්කළේ, නිති අමෛච්සුඩන් සම්බන්ධපට්ට මදුවරික් කට්ටළෛච් චට්ටත්තින් කීළාන අරිවිත්තල්කළ්, ඉරක්කුමදි මර්රුම් ඒර්රුම්දි කට්ටුප්පාට්ටුච් චට්ටත්තින් කීළාන ඔළුංකුවිදිකළ් එන්පන තොටර්පාන ඉන්රෛය විවාදත්තිල් කලන්දුකොණ්ඩු එන්නුටෛය තොප්පුල්කොඩි උරවුකළාකිය මලෛයක මක්කළ් චාර්පාකච් චිල කරුත්තුකළෛ මුන්වෛප්පතෛයිට්ටු මකිළ්ච්චි යටෛකින්රේන්. අතේනේරත්තිල්, එන්නුටෛය මලෛයක මක්කළුක්කු නන්රියෛයුම් තෙරිවිත්තුක් කොළ්කින්රේන්.

නිති අමෛච්චානතු, ඒර්රුම්දි මර්රුම් ඉරක්කුමදි විටයත්තිල් මලෛයක මක්කළෛප් පුරන්තළ්ළි නටක්ක මුටියාතු. ඉන්රු එමතු මලෛයක මක්කළ් පල්වේරුපට්ට තුන්පංකළුක්කු ආළාකි, පොරුළාතාර රීතියිල් පාතික්කප්පට්ටු, උෛප්පුක් කේට්ර ඌතියම් ඉල්ලාමල් තවිත්තුක්කොණ්ඩු ඉරුක්කින්ර නිලෛමෛයිලේ, නාන් ඉංකු අම්මක්කළින් පිරතිනිතියාකප් පේසික්කොණ්ඩු ඉරුක්කිරේන්. මලෛයක මක්කළින් චම්පළ උයර්වු චට්ටපූර්වමාක වර්ත්තමාණියිල් වෙළියිටප්පට්ටු ඉරුන්තාලුම්, අන්ත වර්ත්තමාණියෛ එතිර්ත්තුප් පෝරාටක් කූටිය චක්ති ඉන්ත නාට්ටිලිරුක්කින්ර තනියාර් තුරෛයාන මුතලාළිමාර් චම්මේලනත්තුක්කු ඉරුක්කින්රතු එන්පතෛප් පාර්ක්කුම්පෝතු ආච්චරියමාක ඉරුක්කින්රතු. ඉලංකෛ ජනනායක චෝචලිච කුටියරචිල් අරචාංකම්, පාරාළුමන්රම්, ජනාතිපති, පිරතම මන්තිරි, අමෛච්චරවෛ එන්පන ඉරුක්කුම් පෝතු, පතුළෛ, මොනරාකලෛ, කණ්ටි, නුවරෙලියා, මාත්තළෛ, ඉරත්තිනපුරි, කේකාලෛ, කළුත්තුරෛ, කාලි, මාත්තරෛ, කොළුම්පු ආකිය 11 මාවට්ටංකළිල් වාළුකින්ර එමතු පෙරුන්තෝට්ට මක්කළින් වාළ්වාතාරම් කේල්වික් කුරියාකි උළ්ළතු.

පෙරුන්තෝට්ටක් කම්පනිකළ් වෙට්කිත් තලෛකුනිය වේණ්ටුම්. ඉන්ත නාට්ටින් මුතුකෙළුම්පාකච් චෙයර්පට්ටු, පොරුළාතාරත්තෛයුම් තනියාර්තුරෛයාකිය පෙරුන්තෝට්ටක් කම්පනිකළින් පොරුළාතාරත්තෛයුම් පලප්පටුත්තික්කොණ්ඩු

இருக்கின்ற ஒரு சமூகத்தினது உழைப்புக்கேற்ற ஊதியத்தை உயர் நீதிமன்றம் வரை சென்று தடுத்து நிறுத்தக்கூடிய மனப்பான்மையில் பெருந்தோட்ட நிர்வாகம் இருக்குமேயானால், அந்த நிர்வாகம் எவ்வளவு கேவலம் கெட்டது என்பதை நாங்கள் சிந்தித்துப் பார்க்க வேண்டும். இதுவொரு கேவலமான நிர்வாகம்; மக்களை அச்சுறுத்துகின்ற நிர்வாகம்; எமது மக்களைப் பல்வேறு துன்பங்களுக்கு ஆளாக்கிக் கொண்டு இருக்கின்ற நிர்வாகம்! இதில் சில மாற்றங்களைக் கொண்டுவரவேண்டிய நிலைமைக்கு இன்று நாங்கள் தள்ளப்பட்டு இருக்கின்றோம். பெருந்தோட்டக் கம்பனி உரிமையாளர்களே, நீங்கள் மாறுங்கள்! இல்லையேல், நாங்கள் உங்களை மாற்றுவோம். பெருந்தோட்ட மக்களின் வாழ்வாதாரத்துடன் சம்பந்தப்பட்ட விடயங்களில் உடனடியாக அரசாங்கம் மாற்றங்களைக் கொண்டுவர வேண்டு மெனக் கேட்டுக்கொள்கின்றேன். இல்லையேல், நாங்கள் அதனைச் செய்ய வைப்போம். வண்ணங்கள் எதுவாக இருந்தாலும், சின்னங்கள் எதுவாக இருந்தாலும், என்னுடைய மலையக மக்களின் எண்ணங்கள் ஒன்றாகத்தான் இருக்கின்றது.

இந்த நாட்டுக்கு எந்தவொரு தொந்தரவும் இல்லாது வாழ்ந்த ஒரு சமூகம், இன்று காணிப் பிரச்சினை, வீட்டுப் பிரச்சினை, பெருந்தோட்டக் கம்பனிகளின் பிரச்சினை எனப் பல்வேறு பிரச்சினைகளை எதிர்நோக்கிக்கொண்டு இருக்கின்றது. இதனை என்னுடைய பாஷையில் சொல்வ தென்றால், பெருந்தோட்டக் கம்பனிகளுடன் அக்கப்போர் நடக்கிறது. ஒவ்வொரு பிரச்சினையின்போதும் எமது மக்களை அவை வஞ்சித்துக்கொண்டு இருக்கின்றன. அதனால் என்னுடைய சமூகம் மனரீதியாகவும் உளரீதியாகவும் பாதிக்கப்பட்டுக்கொண்டு இருக்கின்றது. இதற்கு ஒரு முடிவு காண வேண்டும்; இதற்கு ஒரு விடிவு காலம் வர வேண்டும். அதற்குரிய ஏற்பாட்டை நாங்கள் செய்ய வேண்டும். பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை 1,700 ரூபாவாக அதிகரிப்பது தொடர்பான வர்த்தமானி அறிவித்தலுக்கு எதிராக முதலாளிமார் சம்மேளனம் உயர் நீதிமன்றத்தில் வழக்கு தொடர்ந்தது. குறித்த மனுவை எதிர்வரும் ஆகஸ்ட் 28ஆம் திகதி விசாரணைக்கு எடுத்துக் கொள்ளத் தீர்மானிக்கப்பட்டிருக்கிறது. இரண்டு வருடங் களுக்கு ஒரு முறை அதிகரிக்கப்படவேண்டிய பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பளம், இன்று 04 வருடங்களாகியும் அதிகரிக்கப்படாத நிலையில், பாட்டி வடை சுட்ட கதையைக் கதைத்துக்கொண்டு இருக்கிறார்கள். பாட்டி வடை சுட்ட கதை எங்களுக்குத் தேவையில்லை. அது பழைய கதை! இன்று எங்களுடைய மக்களுக்குத் தேவை, உழைப்புக்கேற்ற ஊதியமும் கௌரவமான தொழிலும்தான். மலையக மக்களுக்கு மானம், மரியாதை, கௌரவம் என எல்லாம் இருக்கின்றது. நாங்கள் எல்லோரும் தோட்டத் தொழிலாளர்கள் அல்லர். அப்படி யாராவது எங்களை எடைபோட்டால் அது முற்றிலும் பிழை! எல்லாத் துறைகளிலும் வெற்றிகரமாகச் செயற் பட்டுக்கொண்டு இருக்கின்ற ஒரு சமூகமாக இன்று நாங்கள் இருக்கின்றோம். இந்த நாட்டை நேசிக்கின்றவர்கள் எங்களுடைய மக்கள்!

பெருந்தோட்டக் கம்பனிகள் தோட்டங்களைத் தொடர்ந்து நடத்த வேண்டும் என்றால், சமரசப் பேச்சுவார்த்தை ஒன்றின் மூலம் இன்றைய வாழ்க்கைச் செலவுக்கு ஏற்றவகையிலான சம்பளத்தை தோட்டத் தொழிலாளர்களுக்கு வழங்க வேண்டும். இது தொடர்பில் மாண்புமிகு சனாதிபதி அவர்களுடைய தலைமையில் பேச்சுவார்த்தை நடத்தி, எங்களால் ஒரு முடிவுக்கு வரமுடியும் என்றால் நாங்கள் அதனை வரவேற்கின்றோம். அதற்கு எங்களுடைய முழுமையான ஆதரவைக் கொடுப்பதற்குத் தயாராக இருக்கின்றோம். இல்லையேல், எமது மக்களை வஞ்சிக்காமல், கசப்பான முடிவுகளை எடுக்கவேண்டிய நிலைக்கு நாங்கள் ஆளாக்கப் படுவோம் என்பதை நான் இந்த உயரிய சபையில் கூறிவைக்க விரும்புகின்றேன்.

அடுத்து, இந்த நாட்டின் ஏனைய பகுதிகளுக்கு ஆசிரியர் நியமனம் வழங்கப்படும்போது, எங்களுடைய மலையகத்துக்கு மட்டும் உதவி ஆசிரியர் நியமனம் வழங்கப்படுகின்றது. ஆசிரியர் நியமனம் வழங்கப்பட வேண்டும். அதேபோல், உதவி ஆசிரியர் நியமனமும் வழங்கப்பட வேண்டும். அவற்றை வழங்குங்கள்! இன்று மலையகத்தில் பட்டதாரிகள் இருக்கிறார்கள். அவர்களுக்கான நியமனங்கள் எவ்வாறு வழங்கப்படப் போகின்றது? இந்த நாட்டில் இருக்கின்ற ஏனைய சமூகங்களின் பிரச்சினைகளைவிட, என்னுடைய மலையகச் சொந்தங்களுடைய பிரச்சினை வேறு என்பதை தயவுசெய்து அனைவரும் புரிந்துகொள்ள வேண்டும். இந்த நாடு 1948ஆம் ஆண்டு சுதந்திரம் அடைந்தாலும்கூட, 1977ஆம் ஆண்டுக்குப் பிறகுதான் என்னுடைய மலையகத்துக்கு சுதந்திரம் கிடைத்தது. காரணம் என்ன? 1977ஆம் ஆண்டுக்குப் பிறகுதான் எங்களுக்கு வாக்குரிமை, பிறப்பு அத்தாட்சிப் பத்திரம், தேசிய அடையாள அட்டை என்பன கட்டங்கட்டமாக வழங்கப்பட்டன. 2002ஆம் ஆண்டுக்குப் பிறகுதான் மலையகத்திலுள்ள அனைவரும் இந்த நாட்டுப் பிரஜைகள் என்ற கூற்று இந்தப் பாராளுமன்றத்தில் எடுத்துரைக்கப்பட்டு, அது வெற்றிகரமாக முன்னெடுக்கப்பட்டது. 1948ஆம் ஆண்டுக்குப் பின்னர், இலங்கையில் ஏனைய சமூகங்கள் அனுபவித்த சலுகைகளை நாங்கள் 1977ஆம் ஆண்டுக்குப் பிற்பாடுதான் கட்டங்கட்டமாக அனுபவித்தோம். இதனால் நாங்கள் கல்வி, கலை, கலாசாரம், பொருளாதாரம் என அனைத்துத் துறைகளிலும் பின்னடைந்து இருக்கின்றோம். நீங்கள் இதன் தாற்பரியத்தைப் புரிந்துகொள்ள வேண்டும்.

நேற்று இச்சபையில் சிலர் பேசியதை நான் கேட்டுக் கொண்டு இருந்தேன். மலையகத்தவன் என்ற வகையில், மலையகத்தின் மண் வாசனையை நுகர்ந்தவன் என்ற வகையில், அங்குள்ள யதார்த்தத்தை அனுபவ ரீதியில் புரிந்தவன் என்ற வகையில், நான் கேட்டுக்கொள்வது என்னவென்றால், ஏனைய சமூகங்களுடன் எமது சமூகத்தை ஒப்பிடாமல், எமது சமூகத்தின் நிலைமைகளைப் புரிந்து கொண்டு, எங்களுக்கு விசேட சலுகைகளை வழங்க வேண்டும் என்றுதான். பெருந்தோட்டக் கம்பனிகளின் கெடுபிடியிலிருந்து எமது சமூகத்தைக் காப்பாற்றுவதற்குரிய நடவடிக்கைகளை அரசாங்கமும் பாராளுமன்றமும் மேற்கொள்ள வேண்டும். நான் பிரதிநிதித்துவப்படுத்தும் பதுளை மாவட்டத்தின் அபிவிருத்திக் கென மாண்புமிகு சனாதிபதி அவர்கள் பெருந்தொகை நிதியைக் கொடுத்திருக்கிறார். அங்குள்ள பாடசாலைகள், ஆலயங்கள், பள்ளிவாசல்கள் உட்பட பல்வேறு உட் கட்டமைப்பு வசதிகளைச் செய்வதற்கான சூழ்நிலையை ஏற்படுத்திக் கொடுத்திருக்கிறார். அதற்காக நான் அவருக்கு என்னுடைய மக்கள் சார்பாக நன்றி தெரிவிக்கிறேன். மாண்புமிகு சனாதிபதி அவர்கள் அபிவிருத்தி நடவடிக்கை களுக்காக காசு கொடுத்தார். அதை இல்லை என்று சொல்ல முடியாது! ஆளும் கட்சியில் உள்ளவர்களுக்கும் அவர் காசு கொடுத்தார்; எதிர்க்கட்சியில் உள்ளவர்களுக்கும் காசு கொடுத்தார். அதன்மூலம் அபிவிருத்திச் செயற்பாடுகள் வெற்றி கரமாக நடைபெற்றன. அதற்காக மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு எங்களுடைய நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றோம்.

[ගරු වඩිවේල් සුරේෂ් මහතා]

අදුත්තු, පෙරුන්තෝට්ටක් කම්පනිකළින් තීවිරවාතස් සෙයර්පාට්ටිලිරුන්තු එමතු මක්කළෛප් පාතුකාක්ක වේන්ටුම්. අතුමාත්තිරමන්රි, අවර්කළුටෙය සම්පල උයර්වෛ උටනටියාක වළුන්ක වේන්ටුම්. එතිර්වරුම් ආකස්ට් මාතම් 28ආම් තිකති සම්පන්තප්පට්ට මනු විසාරණෛක්කු එටුත්තුක් කොළ්ළප්පට ඉරුක්කින්රතු. අතුවරෛ තොෂිල් අමෛච් සිනාල් එන්කළුටෙය මක්කළුක්කු arrears උටන් සම්පලම් වළුන්කප්පට වේන්ටුම්. අතාවතු, කටන්ත මේ මාතම් මුතලාම් තිකතියිලිරුන්තු එන්නුටෙය සොන්තන්කළුක්කුරිය සම්පල මානතු, arrears උටන් වළුන්කප්පට වේන්ටුම්. අවර්කළුටෙය සම්පල උයර්වුක්කු එතිරාක උයර් නීතිමන්රම් සෙන්ර පෙරුන්තෝට්ටක් කම්පනිකළ්, එව්වාරු එමතු මක්කළෛ වළිනටත්තුම්? එව්වාරු එමතු මක්කළෛක් කවනිත්තුක් කොළ්ළුම්? එන්පතෛ ඉන්තප් පාරාළුමන්රමුම් ඉන්ත නාටුම් ඉන්ත අරසාන්කමුම් පුරින්තුකොළ්ළ වේන්ටුම්. පෙරුන්තෝට්ට නිරුවනන්කළ් එන්කළුටෙය මක්කළෛත් තුන්පුරුත්ති නිරුවාකම් සෙය්යුමේයානාල්, අතර්කු නාන්කළ් ඉටමළිප්පතර්කුත් තයාරිල්ලෛ! නීන්කළ් මාරුන්කළ්; ඉල්ලෛයේල්, නාන්කළ් මාර්රුවෝම්! එනක් කූරි, සන්තර්ප්පත්තුක්කු නන්රි තෙරිවිත්තු, විටෛපෙරුකින්රේන්.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි වසන්ත යාප්පාපණ්ටාර)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මොකක්ද point of Order එක, ගරු මන්ත්‍රීතුමා?

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි වසන්ත යාප්පාපණ්ටාර)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම Committee on Ways and Means එකේ සිටි වෙලාවේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මගේ නම කිහිප වතාවක් සඳහන් කරමින් ප්‍රකාශයක් කර තිබුණා. ඒකට මම පිළිතුරක් දෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයාව නින්දිත විධියට විවේචනය කළාය කියා එතුමා කියා තිබෙනවා. මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයාත්, තවත් ආණ්ඩුකාරවරුත් ප්‍රාදේශීය සභා ආඥාපනතේ 9 (3) වගන්තිය උල්ලංඝනය කරමින් නින්දිත විධියට කටයුතු කරනවා. පළාත් පාලන මැතිවරණය ප්‍රකාශයට පත් කර තිබෙන වෙලාවේ ප්‍රාදේශීය සභාවල, නගර සභාවල ලේකම්වරුන්ට තමයි බලය පැවරී තිබෙන්නේ. එසේ බලය පැවරී තිබෙන වෙලාවේ ආණ්ඩුකාරවරයාගේ සම්බන්ධීකරණ නියෝජිතයා විධියට නිලධාරියෙක් පත් කර තිබෙනවා. ඒ පත් කර තිබෙන නිලධාරින්ගෙන් සමහර අය පළාත් පාලන මැතිවරණයට අපේක්ෂකයන් විධියට නාම යෝජනා භාර දුන් අයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ව්‍යවස්ථාවට අනුව මැතිවරණයක් ප්‍රකාශයට පත් කර තිබෙන අවස්ථාවකදී ක්‍රියාත්මක වෙන්නේ මැතිවරණ නීතිය බව ඔබතුමා දන්නවා. ඒ අනුව අපේක්ෂකයෙකු ප්‍රචාරණය කරන ආකාරයට පත් කිරීම්, උසස් කිරීම් කිසිසේත්ම කරන්න බැහැ. ඒ නිසා අමාත්‍යවරයෙකු විධියට කටයුතු කරපු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට නීතිය දැනගෙන කථා කරන්න ඕනෑ. ආණ්ඩුකාරවරුන් මේ විධියට කරන මුරණ්ඩු ක්‍රියා සම්බන්ධව අපි පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන්. කිසි කෙනෙකුට පුළුවන්කමක් නැහැ, අපේක්ෂකයෙකු ප්‍රචාරණය කරන මෙවැනි දේ කරන්න. ඒ නිසා මධ්‍යම පළාතේ ආණ්ඩුකාරතුමාට අපි කියපු කථාව නැවත සිහි ගන්වනවා, සියලු ආණ්ඩුකාරවරුන්ට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන මැතිවරණයට නාම යෝජනා දුන් අපේක්ෂකයන් ප්‍රචාරණය කරන්න, පත්වීම් දෙන්න කිසිසේත්ම හැකියාවක් නැහැ. ඒ නිසා එවැනි නින්දිත වැඩ අපි තරයේ හෙළා දකිනවා කියන කාරණය මම මතක් කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු සිසිර ජයකොඩි රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 12.04]

ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා (දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු සට්ටත්තරණි සිසිර ජයකොඩි - සුදේස වෛත්තිය ඉරාජාංක අමෛච්චර්)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law - State Minister of Indigenous Medicine)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන රෙගුලාසි ද පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට මට කාලය ලබා දීම පිළිබඳව.

අපි දන්නවා, අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අලුත් රෙගුලාසි රාශියක් ඉදිරිපත් කර තිබෙන බව. විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රචාරණයට අදාළව පහසුකම් සැපයීම සඳහා එම ක්ෂේත්‍රයේ නියැළෙන්නන් වෙත ලබා දෙන විවිධ සහනදායී පියවර රාශියක් තිබෙනවා. ඒ අතරින් සංචාරක ක්ෂේත්‍රයට අදාළ ප්‍රවාහන කටයුතු සඳහා අවශ්‍ය වාහන ගෙන්වීමට අනුමැතිය ලබා ගැනීමට අද මේ ගරු පාර්ලිමේන්තුවට රෙගුලාසියක් ඉදිරිපත් වෙලා තිබෙනවා.

මෑත ඉතිහාසයේ ඇති වුණු කොවිඩ් වසංගතය හා ආර්ථික අර්බුදයෙන් පසුව අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය නැවත වතාවක් හිස ඔසවා ජාතික ආර්ථිකය ශක්තිමත් කරන්න ප්‍රබල උත්සාහයක් දරනවා. සංචාරකයින් එන වෙලාවටම සැලසුම් කරපු උද්ඝෝෂණ පවත්වපු රටක්, මේක. සංචාරකයින් බදුල්ලට, ඇල්ලට, එහෙම නැත්නම් දෙමෝදරට යන වෙලාවට එම සංචාරකයින්ගේ පැමිණීම අඩපණ කිරීම සඳහා සමහරු පටු දේශපාලන අරමුණු ඇතිව හිතාමතාම වැඩ වර්ජන, උද්ඝෝෂණ සිදු කර රටේ ජාතික ආර්ථිකය විනාශ කරන අවස්ථාවේ, මෙවැනි රෙගුලාසි මඟින් එම ක්ෂේත්‍රය ප්‍රචාරණය කිරීම සඳහා මේ දරන උත්සාහය අපි අගය කරනවා.

හැබැයි, සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ සංචාරක අමාත්‍යාංශයටත්, ඊට සම්බන්ධ ආයතනවලටත් අපි මතක් කරන්න ඕනෑ කරුණක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔවුන් -සංචාරක අමාත්‍යාංශයේ අය- මේ සංචාරක ක්ෂේත්‍රය හරියට හඳුනාගෙන නැහැ. අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය හරහා විදේශ විනිමය උත්පාදනය කිරීම සඳහාත්, ජයග්‍රහණ ලබා ගැනීම සඳහාත් අපේ දේශීය වෛද්‍ය ක්‍රමය සහ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සම්බන්ධ කර ගන්න සංචාරක අමාත්‍යාංශය හෝ එහි බලධාරින් තවමත් උත්සාහයක යෙදෙන්නේ නැහැ.

විදේශිකයන් ලංකාවට එනවා කියලා අපි දන්නවා. ඔවුන් සීගිරියට යයි, යාලට යයි, දකුණු මුහුදු තීරයට යයි, ඒ වාගේම සිද්ධස්ථාන වැඳ පුදා ගන්න යයි. හැබැයි, ඒ එන ඕනෑම සංචාරකයෙක් එවැනි ස්ථාන නැරඹීම සඳහා පැමිණෙන්නේ වරක් හෝ දෙවරක් පමණයි. නමුත් ඔවුන් යම් ආයුර්වේද ප්‍රතිකාර ක්‍රමයකට හුරු කළොත්, ප්‍රතිකාර ලබා ගැනීම සඳහා යම් වෙදකමක නිවැරදි මහ පෙන්වීම කළොත් ඒ අයට හත් අට වතාවක් අපේ රටට එන්න වෙනවා. අපි දන්නවා, දකුණු මුහුදු තීරයේ තිබෙන සමහර ආයුර්වේද රෝහල් පද්ධති ගැන. සංචාරක ක්ෂේත්‍රය තුළින් දින 10ක් තුළ මිලියන 1.5කට වැඩි ආදායමක් එක සංචාරකයෙකුගෙන් උත්පාදනය කරනවා. ඒ නිසා විදේශ විනිමය උත්පාදනය කළ හැකි හොඳම මාර්ගය තමයි දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සහ සංචාරක ක්ෂේත්‍රය ඒකාබද්ධ කිරීම. අවාසනාවකට අපේ සංචාරක අමාත්‍යාංශයේ ඉන්න කිසිම නිලධාරියෙකුට මේ පිළිබඳ හැඟීමක් නැහැ. ගරු අමාත්‍යතුමා හමුවෙලා අපි මේ අදහස් ඉදිරිපත් කළා. එතුමා මේ පිළිබඳව ඉතා හොඳ අවබෝධයකින් ඉන්නවා. අද ලෝකයේ දියුණු සංචාරක ගමනාන්තයක් තමයි ඉන්දියාවේ කේරළ ප්‍රාන්තය. අපි ඉන්දියාවේ ගෝවා ප්‍රාන්තයේ තිබුණු වැඩසටහනකට ගියා. ඒ අවස්ථාවේ ඉන්දියාවේ අග්‍රාමාත්‍යතුමා ඇවිල්ලා කාමර 5,000කින් යුක්ත ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක් විවෘත කළා. අද ඉන්දියාව යෝග ව්‍යායාම හඳුන්වා දෙමින්, ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම හඳුන්වා දෙමින් සංචාරක ක්ෂේත්‍රය තුළින් සුවිශාල ජයග්‍රහණයක් ලබනවා. ඒ නිසා අපේ මේ ආසියානු කලාපයට, දේශීය චිකිත්සක ක්‍රමවලට අලුත් විනිමය උත්පාදනය කිරීමේ මාර්ගයක් තිබෙන බව අපට පෙනෙනවා. ඒවා ලබා ගැනීම සඳහා අපි අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගවලට පසුපසින් තමයි අපි තවමත් සිටින්නේ.

ලෝකයේ හෘදයාබාධ වැළඳෙන අයගෙන් සියයට 40ක් අංශභාග රෝගයට ගොදුරු වෙනවා. ඔවුන්ට බටහිර වෛද්‍ය ක්ෂේත්‍රය තුළ ප්‍රතිකාර ක්‍රම නැහැ. එවැනි අංශභාග රෝගීන් නිවසේ තබා ගැනීම වෛද්‍ය විද්‍යාත්මක ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි, දරුවන්ට සමාජ විද්‍යාත්මක ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ නිසා ඒ අය සුවපත් කිරීම සඳහා නිවැරදි ක්‍රම අපේ පාරම්පරික වෙදකමේත්, ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේත් තිබෙනවා. ඒ සඳහා සංචාරකයන්, විශේෂයෙන්ම විදේශිකයන් අපේ රටට ආකර්ෂණය කර ගැනීමේ මාර්ගයට අපේ සංචාරක ක්ෂේත්‍රය ගමන් කළ යුතුයි කියන විශ්වාසය අපට තිබෙනවා. අපේ රටේ ඉතිහාසයේ පැවති සාම්ප්‍රදායික දැනුම් පද්ධතිය සහ ආයුර්වේද විද්‍යාත්මක දැනුම් පද්ධතිය උපයෝගී කරගෙන සිදු කරන ප්‍රතිකාර වැඩසටහන්වලින් සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයක් ලබා ගැනීම සඳහා කටයුතු කළ හැකිය කියන මතය අපි ඉතාම ඕනෑකමින් ඉදිරිපත් කරනවා.

අද සුරාබදු ආඥාපනත යටතේත් යම් යම් රෙගුලාසි ඉදිරිපත් කරලා තිබෙනවා. අපි මත්පැන් සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් නොකළත්, අපට එක කරුණක් සිහිපත් කරන්න වෙනවා. ඒ මත්පැන්වලින් වැළකී සිටීම ගැන. ඒ සඳහා අද මිල බලපා තිබෙනවා. මූලික්ම ආගමික සහ අනෙකුත් ප්‍රතිපත්තිමය කරුණු මත තමයි මත්පැන්වලින් වැළකීමේ කාරණය ගොඩ නැඟිලා තිබුණේ. නමුත්, අද මත්පැන්වල මිල සම්බන්ධ කාරණයේ දී, මත්පැන් සීමා කිරීම පිළිබඳ කාරණයේ දී, විශේෂයෙන්ම නීත්‍යානුකූල මත්පැන් සම්බන්ධ කාරණයේ දී IMF එක සරණ යන්න සිදුවෙලා තිබෙනවා. විශේෂයෙන්ම අද IMF කොන්දේසි මත අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සඳහා මිල අඩු නොකළ යුතුයි කියන ප්‍රතිපත්තිය අනුව කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ආගමික සදාචාරාත්මක සිද්ධාන්තවලට වඩා එහාට ගිහිල්ලා, විවිධ මූල්‍ය අරමුදල්වලින් සහ ජාත්‍යන්තර ආයතන විසින් පනවන ලද රෙගුලාසිවලට යටත් වෙන්න තමයි අද සිද්ධ වෙලා තිබෙන්නේ.

ඒ වාගේම අපේ රටේ, අපේ සමාජය තුළ අද ගොඩනැඟී තිබෙන වියවුල් තත්ත්වය ගැනත් අපි දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊයේ දවසේ අපේ රටේ ප්‍රධාන රාජ්‍ය ආයතනයකට ගියා. කැලණි රජමහා විහාරය ඉදිරිපිට, ගඟ අසබඩ, ගං ඉවුර සංවර්ධනය කිරීමේ වැඩසටහනක් අපි දියත් කර තිබෙනවා. එය රුපියල් මිලියන 10ක ව්‍යාපෘතියක්. එම ව්‍යාපෘතියේ කටයුතු සඳහා තමයි අපි ඒ රාජ්‍ය ආයතනවලට ගියේ. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යද්දී ඒ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ විවිධ ආයතනවල අනුමැතිය ගන්න මාස 4ක් තිස්සේ අපි උත්සාහ කරනවා. අපේ නිලධාරීන් කිහිප වතාවක්ම ඒ සඳහා විවිධ ආයතනවලට ගමන් කළා. ඊයේ, මම එක් ආයතනයකට ගිහිල්ලා යම් ලිපියක් ගැන එම ආයතනයේ ප්‍රධානියාගෙන් විමසුවාම කියනවා, එහෙම ලියුමක් ගැන දන්නේ නැහැ කියලා. හැබැයි, එම දෙපාර්තමේන්තුවේ අනෙක් සේවකයෝ ඔක්කෝම කිව්වා, අවසර දීමේ ලිපිය අපි ප්‍රධාන නිලධාරියෙක් ළඟට යවලා තිබෙන්නේ කියලා. පසුව මම ඒ නිලධාරියා ළඟට ගිහිල්ලා බොහොම චුවමනාවෙන් කිව්වා, මාස 3ක් තිස්සේ තමුන්නාන්සේගේ මේසය උඩ මේ ලියුම තිබෙනවා, පුළුවන් නම් අනුමැතිය දෙන්න; පුළුවන් කියලා හෝ බැහැ කියලා හෝ ලියුම දෙන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර නිලධාරීන් සමාජයට යහපතක් වන වැඩක් කරන්නේ නැතුව ඉතා නිතුවක්කාර ලෙස කටයුතු කරනවා. අවසානයේ මම ඒ ලියුමට අත්සන ලබා ගත්තා. පහළ නිලධාරියෙක් කිව්වා, "ගණන් ගන්න එපා ඇමතිතුමා, ඔය ඉන්නේ ගදයෙක්" කියලා. මම ඇහුවා, "ගදයෙක්" කියන්නේ කවුද කියලා. ඔවුන් දේශපාලනමය වශයෙන් එක් එක් මතවලයි ඉන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔවුන් මිනිසුන්ගේ වැඩක් කරලා දෙන්නේ නැහැ, මිනිසුන්ට උදව් කරන්නේ නැහැ. හැබැයි, දේශනාව නම් දෙනවා.

අද අපේ රටේ පාසල් පද්ධතිය ගැන කථා කළොත්, කොවිඩ් වසංගතය නිසා අපේ රටේ පාසල් මාස ගණනක් වසා දමා තිබුණා. ඒ කාලයේ ආර්ථික අර්බුදයක් ඇති වන බව ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කිව්වා. ඒ වාගේම රට වහලා තැබුවොත් ආර්ථිකමය ප්‍රශ්න ඇති වෙනවා කියලා එතුමා කිව්වා. "කමක් නැහැ, මැරුණාවේ. බඩගින්නේ මැරුණාවේ. නමුත් අපට ජීවත් වෙන්න ඕනෑ. ඒ නිසා ආර්ථික අර්බුද ප්‍රශ්නයක් නැහැ, රට වහන්න" කියලා ඉල්ලුවා. ඊට පස්සේ ආර්ථිකමය වශයෙන් ප්‍රශ්න රාශියක් ඇති වුණා. ඒ කාල පරිච්ඡේදය තුළදීත්, විවිධ අර්බුද ඇති වූ අවස්ථාවලදීත් මේ රටේ අධ්‍යාපනය ලබන දරුවන්ට ඇති වුණු විනාශය ගැන ඔබතුමන්ලා දන්නවා. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මෙවැනි දැවැන්ත විනාශයක් ඇති වෙද්දී, අපේ සහෝදර මැති ඇමතිතුමන්ලා කියනවා, මේ ඉල්ලීම් සාධාරණයි කියලා. මම දැක්කා, ඊයේ වෘත්තීය සමිති නායක ලාල් කාන්ත මැතිතුමා කියනවා, මේ ඉල්ලීම් අසාධාරණයි කියලා. හැබැයි, මහින්ද ජයසිංහයි, ජෝශප් ස්ටාර්ලිනුයි "පාසල් වසව්!" කියලා බෝඩ් අරගෙන යනවා. මොකක්ද, මේ දෙබිඩි රංගනය? නම්, ගම් සහ හේතු සාධක සහිතව මම මේවා ප්‍රසිද්ධියේ කියන්නේ ප්‍රත්‍යක්ෂ කර ගත් දැක්මකින් යුතුවයි.

ලංකා ගුරු සංගමයේ ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංවිධායකතුමාගේ දරුවෝ දෙදෙනා ඉගෙන ගන්නේ ඕස්ට්‍රේලියාවේ. දරුවෝ ඕස්ට්‍රේලියාවේ ඉගෙන ගත්තාට අපට කමක් නැහැ. දරුවන්ට පිට රටවලට ගිහිල්ලා අධ්‍යාපනය ලැබීමේ අයිතිය තිබෙනවා. නමුත්, මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය කරන පරිසරය හදන්න ඉඩ දෙන්න, අවශ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය බිහි කරන්න ඉඩ දෙන්න. අපි විශ්වවිද්‍යාලවලට ශිෂ්‍යයින් 41,000ක් බඳවා ගන්න කටයුතු කරනවා. නමුත් ඒ පරිසරය ඇති කරන්න අපට තවමත් හැකියාව ලැබී නැහැ. තවමත් ඒ පටු සීමාවල ඉඳගෙන ද්වේශය, වෛරය, ක්‍රෝධය පතුරුවමින් සිටිනවා.

[ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා]

මම නැවත කියන්න කැමැතියි, මේ තමයි සංචාරක ක්ෂේත්‍රයේ අපි ලැබූ ජයග්‍රහණයක් විධියට වැඩිම විදේශ සංචාරකයින් පිරිසක් පැමිණි අවස්ථාව. අවුරුදු 4කට පස්සේ මාස 6ක් තුළ විදේශ සංචාරකයින් මිලියනය ඉක්මවා පැමිණි අවස්ථාවේ ඇල්ලට යන කෝච්චිය - ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා නියෝජනය කරන ප්‍රදේශයට යන කෝච්චිය - ස්ට්‍රයික් එකක් නිසා දැන් නැවතිලා තිබෙනවා. ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීම තමයි, "නිල ඇඳුම දෙනු!" කියන එක. එක් අවස්ථාවක දුම් වැටියක් පිළිබඳ ප්‍රශ්නයකටත් - සිගරට් එකකට - දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයෝ උද්ඝෝෂණයක් සහ වැඩ වර්ජනයක් කළා. මේ විධියට රටක් ඉස්සරහට ගෙන යන්නේ කොහොමද?

අපි කථා කළා, වියට්නාමය අපනයනය තුළින් ඩොලර් බිලියන 335ක විදේශ විනිමය උත්පාදනය කරනවා කියලා. වියට්නාමයේ උද්ඝෝෂණ නැහැ, වැඩවර්ජන නැහැ. අපේ තිබෙන වෘත්තීමය අයිතිවාසිකම්වලට වඩා වෙනස් අයිතිවාසිකම් වියට්නාමයේ තිබෙන්නේ. ඔවුන් ආයෝජන ප්‍රවර්ධනය සඳහා අවස්ථාව සපයලා තිබෙනවා. අපි ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් ගොඩනඟපු මහා ජාතික වැඩසටහනක් තිබුණා, පෝර්ට් සිටි ව්‍යාපාරය කියලා. අපි දන්නවා, ඒක කඩාකප්පල් කරපු හැටි. ඒ තුළින් ඩොලර් බිලියන 4ක විදේශ විනිමය උත්පාදනය කිරීම සඳහා අපට ඉඩකඩ තිබුණා. විවිධ හේතු මත අපි ඒක නවත්වා දැමුවා. අදත් මෙවැනි උද්ඝෝෂණ සහ වැඩ වර්ජන හමුවේ හෝ මේ ස්ථානයට ලබා දෙන නිර්වචන ගත්තොත් එහෙම ආයෝජකයෝ එයිද? පෝර්ට් සිටි එකට ආයෝජකයෝ එයිද? අද ඒ පිළිබඳව සමහරු දක්වන ආකල්ප එක්ක, ඉදිරිපත් කරන ප්‍රකාශ එක්ක ඔවුන්ට මේ සම්බන්ධව වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. ගරු රාජ්‍ය ඇමතිතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ. ඊට පසුව ඔබතුමාගේ කාරණය ඉදිරිපත් කරන්න.

ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
මට නියමිත කාලය අවසන් ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු රාජ්‍ය ඇමතිතුමා.

ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවදුරටත් පක්ෂ, පාට භේදයකින් තොරව, රට ගැන හිතන ජාතික වැඩ පිළිවෙළක් කරා අපි ගමන් කරමු කියන ආරාධනය කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීමට ආයුර්වේදය දායක කර ගැනීම ගැන කිව්වා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමා සමඟ මේ ගැන කථා කළා. දැන් නැඟෙනහිර පළාතේ Ayurvedic doctorsලා 45ක පමණ කණ්ඩායමක් ඉන්නවා. ඔවුන්ට පළාත් සභාව හරහා තාවකාලිකව පත්වීම් ලබා දෙන්න කියලා අපි ඉල්ලුවා. මොකද, ගොඩක් රෝහල්වල අද Ayurvedic doctorsලා නැහැ. එක්කෝ, ඒ doctorsලා රටින් ගිහිල්ලා, එහෙම නැත්නම් no-pay leave දාලා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා මේ doctorsලාව පළාත් සභාව යටතේ හෝ තාවකාලිකව බඳවාගන්න මොනවා හෝ ක්‍රමවේදයක් අපට තිබෙනවාද කියන එක තමයි මම අහන්නේ. උතුරු පළාතේත් එහෙම පුරප්පාඩු තිබෙන බව අපේ ගරු සෙල්වම් මන්ත්‍රීතුමාත් කියනවා.

ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
ඇත්තෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ ප්‍රශ්නය මතු කිරීම පිළිබඳව. අපි ඒ ප්‍රශ්නය ගැන ඉතාම හොඳින් දන්නවා. ඔබතුමා ඉදිරිපත් කරන අදහස්වලට අපි ගරු කරනවා. අපේ උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරු 1,800ක් රැකියා නැතිව ඉන්නවා. ඔවුන්ට රැකියා ලබා දිය යුතුයි කියන දැඩි ස්ථාවරයේ තමයි අපි ඉන්නේ. සීමාවාසික පුහුණුව ඉදිරිපත් කරන්න බැරි වුණු උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරු 400කට අපි ගිය සතියේ ඒ සඳහා අවස්ථාව සැලසුවා. ඒ සඳහා රුපියල් මිලියන 3,700ක මුදලක් වැය කරන්න සිදු වුණා. අපට පොරොන්දුවක් දුන්නා. අපි අවස්ථා කිහිපයකදී ගරු අග්‍රාමාත්‍යතුමාත් මූලික කරගෙන මේ සම්බන්ධව සාකච්ඡා රාශියක් කළා, පළාත් සභා හරහා ඉල්ලීම පවා කළා. රටේ පවතින මුදල් තත්ත්වයත් එක්ක උපාධිධාරීන් බඳවාගැනීම පිළිබඳ ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා. නමුත්, ඔබතුමා කියනවා වාගේම පළාත් සභා හරහා හෝ ඒ කටයුත්ත කරන්න අපි දැඩි ලෙස මැදිහත් වෙනවා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියන්නේ දැන් ඔය internship ඉවර කරන්න ඕනෑ අය ගැන නේ. මම කියන්නේ ඒවා ඔක්කෝම ඉවර කරපු අය ගැනයි. ඒ අයට පත්වීම් විතරයි දෙන්න තිබෙන්නේ. ඒ සඳහා කිසිම වියදමක් යන්නේ නැහැ.

ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරු 1,800ක් රැකියා විරහිතව ඉන්නවා. ඒක විශාල ගැටලුවක්. උතුරු-නැඟෙනහිර පමණක් නොවෙයි, රට පුරා රැකියා විරහිත උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරු 1,800ක් ඉන්නවා. ඒ අය පිළිබඳව අපි නිරන්තරයෙන් කටයුතු කරනවා. ඒ සඳහා අපි වෙනම විකල්ප වැඩ පිළිවෙළක් සංචාරක ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා අපි දැඩි උත්සාහයක නියැළෙනවා. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයක් ඇති කරමින් අපට රාජ්‍ය අංශයේ විතරක් නොවෙයි, පෞද්ගලික අංශයේත් රැකියා සපයන්න පුළුවන්. ඒ සඳහා තමයි අපි උත්සාහ දරන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව කරන්න.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මට කොපමණ වෙලාවක් තිබෙනවාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
You have nine minutes. But out of that, about two minutes have already gone.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
But, that was from the Hon. State Minister's time.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. State Minister's time was over by then.

[12.20 p.m.]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, Hon. Presiding Member.

මම කැමැතියි, අද විවාදයට පිවිසෙන්න කලින් ඒ ප්‍රශ්නය අවසන් කරපු තැනින්ම පටන්ගන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා එතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා, වියට්නාමයේ උද්ඝෝෂණ කරන්නේ නැහැ කියලා. ඒක සාධාරණයි. වියට්නාමයේ උද්ඝෝෂණ කරන්නේ නැත්තේ වියට්නාමයේ තිබෙන ආර්ථික තත්ත්වය අනුව, ඒ කණ්ඩායම්වලට තමන්ගේ ජීවිතය ගෙනයන්න තිබෙන වාතාවරණය නිසා. IMF එක එක්ක දැන් තිබෙන Agreement එක හරහා අනාගතයේදී අපි රට තුළට ආයෝජන ගෙනෙන්නේ කොහොමද? පසුගිය සතියේ කළ විශේෂ ප්‍රකාශයේදී ජනාධිපතිතුමා කිව්වා, IMF එක එක්ක දැන් තිබෙන Agreement එක අනුව අනාගතයේදී අපට ණය ගන්න පුළුවන්, ආධාර ලබා ගන්න පුළුවන් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඉතින් මේ ආධාර හා ණය වාගේ දේවල් ලබා ගන්නවා නම් රට තුළ ස්ථාවරභාවයක් තිබෙන්න ඕනෑ. අද මේ උද්ඝෝෂණ කරන කණ්ඩායම් ගත්තොත්, ඔවුන් මේ රට කඩාකප්පල් කරන්න උද්ඝෝෂණ කරනවා කියනවාට වඩා එතුමන්ලාගේ ජීවිතය ඉදිරියට ගෙන යන්න බැරි ගැටලුවක් නිසා තමයි මේ උද්ඝෝෂණවල නිරත වෙලා තිබෙන්නේ කියන එක අපට පෙනෙනවා.

මම අද උදේ ග්‍රාම සේවක මහත්වරුන්ගේ ඉල්ලීම් අරගෙන බැලුවා. ජූලි මාසයේ පළමුවෙනි දා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබිලා තිබෙනවා, ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ දිසාපතිවරුන්ට - ඒ grade එකේ ඉන්න අයට - රුපියල් 25,000ක දීමනාවක් දෙන්න. ඒ කණ්ඩායමට රුපියල් 25,000ක දීමනාවක් ලබා දෙන එකට මම විරුද්ධ නැහැ. හැබැයි, ඔවුන්ට ඒ දීමනාව ලබා දෙනකොට, අද ග්‍රාම සේවක මහත්වරුන් ඉල්ලන්නේ මොනවාද කියන එකත් බලන්න අවශ්‍යයි. ග්‍රාම සේවක මහත්මයෙකුට ඇඳුමක් මහගන්න අවුරුද්දකට දෙන්නේ රුපියල් 5,000යි. දවස් 6ක් මේ ග්‍රාම සේවක මහත්තයා වැඩ කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, රුපියල් 5,000කට එක කලිසමක් මහගන්නත් අමාරු බව. රුපියල් 5,000කට මහපු කලිසමක් ග්‍රාම සේවක මහත්තයා ඇඳ ගත්තා නම් ඒ කලිසම මාසයකින් විසි කරන්න වෙන තත්ත්වයක් තමයි තිබෙන්නේ. රුපියල් 5,000ක දීමනාව සම්බන්ධව ඔවුන් ඉල්ලන්නේ සාධාරණ ඉල්ලීමක්. ඒ දීමනාව රුපියල් 15,000ක් දක්වා වැඩි කරන්න කියලායි ඔවුන් ඉල්ලන්නේ. ඒත් කලිසම් තුනයි මහගන්න පුළුවන් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ග්‍රාම සේවක මහත්වරුන්ට කාර්යාල දීමනාව විධියට ගෙවිවේ රුපියල් 1,500යි. දැන් ඔවුන්ගේ ඒ දීමනාව රුපියල් 3,000කට වැඩි කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රුපියල් 3,000කට කාර්යාලයක් දාන්න පුළුවන් කොහේද? ගමක් ඇතුළේ වුණත් මේ මුදලට කවුරුන් හෝ තැනක් දෙයි ද මේ නිලධාරින්ට කාර්යාලයක් පවත්වාගෙන යන්න? ඒ දීමනාව ග්‍රාම සේවක මහත්වරු ඉල්ලන්නේ ඔවුන්ට නොවෙයි, ඒ ගම තුළ මිනිස්සුන්ට වැඩ කරන්න කාර්යාලය දමා ගන්නයි. ඒ සඳහා ඔවුන් ඉල්ලන්නේ රුපියල් 4,000ත්, 6,000ත් අතර දීමනාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි ඔවුන්ගේ ගමන් වියදම් සඳහා දෙන මුදලත්. ගමන් වියදම්වලට වසම තුළ රුපියල් 600යි දෙන්නේ. වසමෙන් පිටත නම් රුපියල් 1,000යි. අද පෙට්‍රල් ලීටරයක මිල කීයද කියලා ඔබතුමාත් දන්නවා. ඉන්ධන අඩුවෙන්ම පාවිච්චි වන මෝටර් බයිසිකලය භාවිත කළත් පෙට්‍රල් ලීටරයකින් කිලෝමීටර 60කට, 70කට වඩා යන්න බැහැ. ඉතින් මම නියෝජනය කරන දිස්ත්‍රික්කයේ සමහර ග්‍රාම සේවා වසම් තිබෙනවා, සමහර කොට්ඨාස තිබෙනවා, එක කොනක ඉඳන් අනෙක් කොනට කිලෝමීටර 30ක, 40ක පමණ දුරක් තිබෙන. මෙන්න මේ වාගේ සාධාරණ ඉල්ලීම් තමයි මේ ග්‍රාම සේවක මහත්වරු ඉල්ලන්නේ. එහෙම නැතුව මේ රට කඩාකප්පල් කරන්න ඔවුන් පෙනී ඉන්නවා කියලා කියන එක පිළිගත නොහැකි දෙයක්. ඇත්ත වශයෙන්ම මේ අවස්ථාවේ දී ජනාධිපතිතුමන්ගෙන් අපි ඉල්ලන්නේ, මේ කාරණා ගැන සලකා බලන්න කියන එකයි. අද බලන්න, ඔවුන්ට ලිපි ද්‍රව්‍ය දීමනාව වශයෙන් වාර්ෂිකව ලබා දෙන්නේ රුපියල් 1,500යි. රුපියල් 1,500කින් වර්ෂයකට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ගන්නේ කොහොමද? අද පැනක මිල කීයද බලන්න. ඉතින් ඒ නිසා මේ ග්‍රාම සේවක මහත්වරුන්ගේ ඉල්ලීම් ගැන අපි බලන්න ඕනෑ.

රාජ්‍ය අමාත්‍ය ගරු අශෝක ප්‍රියන්ත මැතිතුමා මේ අවස්ථාවේ දී සභාවට ඇවිල්ලා ඉන්නවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය පිළිබඳවයි මම මේ කථා කරන්නේ. මේවා සාධාරණ ඉල්ලීම්. ඔබතුමන්ලා ජූලි 01වෙනි දා සිට රුපියල් 25,000ක දීමනාවක් දිසාපතිවරුන්ට සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ට ලබා දීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය දීලා තිබෙනවා. මේ ග්‍රාම සේවක මහත්වරු උත්සාහ කරන්නේ එය කඩාකප්පල් කරන්න නොවෙයි. ගමේ මිනිස්සුන් එක්ක හැම දාම මුහුණට මුහුණ වැඩ කරන්නේ ග්‍රාම සේවක මහත්වරු.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අශෝක ප්‍රියන්ත රාජ්‍ය ඇමතිතුමා නැඟී සිටිනවා, යම් පිළිතුරක් දෙන්න. එතුමාට අවස්ථාව දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අශෝක ප්‍රියන්ත රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන කාරණය ඇත්ත. මේ අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ මේ කාරණා සම්බන්ධයෙන් අපි අවබෝධයෙන්, අවධානයෙන් කටයුතු කළා. ඒ සම්බන්ධව committee එකකුත් පත් කළා. ඒ අනුව මේ වෙද්දි අපි ඔවුන්ගේ නිල ඇඳුම් දීමනාව රුපියල් 15,000ක් බවට පත් කරන්නත්, ඔවුන්ට ගමන් වියදම් විධියට තෙල් ලීටර් 20ක් සඳහා වූ දීමනාවක් ලබා දෙන්නත්, කාර්යාල දීමනා සහ ලිපි ද්‍රව්‍ය දීමනාත් මේ වෙද්දි තිබුණු ප්‍රමාණයට වඩා දෙගුණයකින් වැඩි කරන්නත් කටයුතු කරලා තිබෙනවා. මේ තත්ත්වය තුළ සමස්ත පද්ධතියේ ඉන්න සියලු ග්‍රාම නිලධාරීන් ඇත්තටම මේ වෘත්තීය ක්‍රියාමාර්ගයේ නියැළෙන්නේ නැහැ. ඔවුන් ගම් බිම්වල වැඩ. මේ දීමනා ලැබෙන බව වෘත්තීය සමිති දැනගෙන, ඒ දීමනා ලබා දෙන්න කියමින් අරගළයක යෙදෙන්නේ ඔවුන්ගේ "එකවුන්ට්" එකකට මේ සියල්ල දමා ගන්නයි. ඔබතුමා මතු කරන කාරණාව ඇත්ත. ඒ පිළිබඳව අපි අවබෝධ කරගෙන තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මම මුලින් කිව්වා වාගේ ඔවුන්ට ඉන්ධන ලීටර් 20ක් සඳහා දීමනාවක් ලබා දෙන්නත්, නිල ඇඳුම් සඳහා රුපියල් 15,000ක දීමනාවක් සහ ඔවුන්ගේ සේවා ව්‍යවස්ථාවේ සාධනීය තත්ත්වයන් හඳුනා ගෙන වැටුප් තලයන් හතරක් ඉහළ නංවන්නත් අපි කටයුතු කර තිබෙනවා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ඇත්තටම මේ පිළිබඳව Grama Niladhari Union එක නම් කියන්නේ 2025 වර්ෂයේ අය වැය හරහා තමයි මේ යම් දේවල් ලබා දෙන්න එකඟත්වය පළ කරලා තිබෙන්නේ කියලායි. මගේ ඉල්ලීම වෙන්නේ ජූලි පළමුවෙනි දා කැබිනට් මණ්ඩලය විසින් තීරණයක් ගත්තා වාගේ මේ අය සම්බන්ධයෙනුත් යම් තීරණයක් ගන්න කියලායි. මොකද, මේ නිලධාරීන් යම් යම් කටයුතු කඩාකප්පල් කරන්න යනවා කියන මතයට වඩා, මම නම් කියන්නේ මේ අය කරන්නේ සාධාරණ ඉල්ලීමක් බවයි. මම මේක කියන්නේ මේ රට වෙනුවෙන්. රටේ දේශපාලන ස්ථාවරභාවයක් තිබුණොත් තමයි ආයෝජකයෝ පවා මේ රටට එන්නේ. රටේ මිනිස්සු විවිධ උද්ඝෝෂණ කරනවා. නමුත්, ඔවුන්ගේ සාධාරණ ඉල්ලීම් ඉෂ්ට කරනවා නම් ඔවුන් ඒ උද්ඝෝෂණ පවත්වන්නේ නැහැ කියලායි මම නම් හිතන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම Development Officersලා ගැන කථා කරන්න කැමැතියි. Development Officersලා 110,000ක් ඉන්නවා. ඔවුන්ගෙන් 90,000කට කිට්ටු ප්‍රමාණයක් පසුගිය දිනවල පැවති වැඩ වර්ජනයේ නිරත වුණා. ඔවුන්ගේ සාධාරණ ඉල්ලීමක් තිබෙනවා, මූලික වැටුප රුපියල් 2,000කින් වැඩි කරන්න කියලා. රුපියල් 2,000ක මුදලක් දෙන්න බැරි නම්, යම් කිසි මුදලක් හෝ දෙන එක ගැන සලකා බලනවා වෙනුවට, ඒ දිනවල රාජකාරියට වාර්තා කරපු පුද්ගලයන්ට සහතික පත්‍ර සහ දීමනා ලබා දෙන්න ප්‍රවේශයක් ගන්න එක කොච්චරදුරට සාධාරණයි ද කියලා අපට හිතන්න වෙනවා.

මොකද, වෘත්තීය සමිතියක් වශයෙන් ඔවුන් ගන්නා වෘත්තීය ක්‍රියාමාර්ග ඒක ඇතුළෙන්ම කඩාකප්පල් කරන්න උත්සාහ කරනවා වෙනුවට වෙනත් යමක් අපි කරන්න ඕනෑ. මේ Development Officersලා අපේ රටට විශාල මෙහෙයක් කරනවා. ඒ Development Officersලා ඉස්කෝලවල උගන්වන එකත් කරනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කරන්න අමාරු හැම වැඩක්ම DOsලාට තමයි කරන්න දෙන්නේ. අපි ඒ ගැන දන්නවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී මොනයම් හෝ ගැටලුවක් ආවාම DO කෙනෙක් දාලා ඒ ප්‍රශ්නය විසඳන්න කියලා අපිත් කියනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්. නමුත්, මට තව මිනිත්තුවක් ඔබතුමාට දෙන්න පුළුවන්.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔවුන් උසස්වීමේ ක්‍රමවේදයක් ඉල්ලා සිටිනවා. ඒ වාගේම තමයි ගුරුවරුන්ගේ ප්‍රශ්නයත්. ගුරු වැටුප්වල හිඟ මුදල තමයි ඔවුන් ඉල්ලන්නේ. ඒ විෂමතාවේ ඉතුරු තුනෙන් දෙක ලබා දෙන්න කියලායි ඔවුන් ඉල්ලා සිටින්නේ. ඒ ඉල්ලීම් ඉෂ්ට කරන්න කියන එක තමයි ඔවුන් ඉල්ලන්නේ.

අඳුමයිල් මාණ්පුමිකු සනාතිපති අවර්කළෙච් චන්තිත්තුප් පේසියපොළුතු, මාකාණ සපෙයිත් තේර්තලෙ නටත්තුවතර්කු එන්තත් තටෙයුම් ඉල්ලෙයිනාල්, මාකාණ සපෙකළින් තේර්තල් තොකුති එල්ලෙකළෙ නිර්ණයම් සෙය්වතිල් ඒර්පට්ට කුළුප්පකරමාන නිලෙමෙ තර්පොළුතුම් නිලවික්කොණ්ටු ඉරුක්කින්රතු. ඉතෙ නිවර්ත්ති සෙය්යුම් වකෙයිල්, කෙළරව සුමන්තිරන් අවර්කළාල් තනි උරුප්පිනර් චට්ටමූලමොන්රු ඉන්තප් පාරාළුමන්රත්තිල් සමර්ප්පික්කප්පට්ටු, ඔරු වරුටත්තුක්කුම් මේලාකිවිට්ටතු. අන්ත Private Members' Billඑ චට්ටමාක නිරෙවේර්රුවතර්කුරිය නටවටික්කෙකළෙ මුන්නෙටුක්කුමාක ඉරුන්තාල්, මාකාණ සපෙත් තේර්තලෙ නටත්තුවතර්කු අරසාන්කම් ඉණක්කුකිරතු එන්රු සොල්ලලාම්. අතාවතු, මාණ්පුමිකු සනාතිපති අවර්කළ් මාකාණ සපෙත් තේර්තලෙ නටත්තුවතර්කු ඉණක්කම් තෙරිවික්කිරාරෙන්ර සෙය්තියෙ ඉලංකෙයිල් වසික්කුම් තමිල් මක්කළුක්කු අතන්මූලම් උණර්ත්තලාම්. සනාතිපතිත් තේර්තලිල් පෝට්ටියිට ඉරුක්කුම් ඒනෙය වේට්පාළර්කළ් තංකළුතෙය නිලෙප්පාට්ටෙ මට්ටුම්තාන් සොල්ලලාම්. අතාවතු, එතිර්කාලත්තිල් තාංකළ් සනාතිපතියාක වන්තාල් ඉන්න ඉන්න විටයංකළෙච් සෙය්වෝම් එන්ර වාක්කුරුතිකළෙ මට්ටුම්තාන් වළංකලාම්. ආනාල්, තර්පොළුතු නාට්ටින් සනාතිපතියාක ඉරුප්පවර්, සෙයලිනුටාකච් සිල විටයංකළෙච් සොල්ලාම්.

අටුත්තු, මාකාණ සපෙකළිටමිරුන්තු පරික්කප්පට්ට අතිකාරංකළෙප් පර්රි ආරාය්වතර්කාක කෙළරව පිරතමරුටෙය තලෙමෙයිල් කුළු ඔන්රු නියමික්කප්පට්ටතු. අතුමාත්තිරමන්රි, තෙන් මාකාණ සපෙයින් මුන්නාළ් මුතලමෙච්චර්කළ් තයාරිත්ත ඔර් අරික්කෙයුම් ඉරුක්කින්රතු. තෙන් මාකාණත්තිල් ඉරුක්කින්රවර්කළේ ඉණංකිය විටයංකළ් ඉරුක්කින්රන. තර්පෝතෙය සනාතිපති අවර්කළ් පතවි ඒර්ර පින්නර්, 100ක්කුම් අතිකමාන චට්ටමූලංකළෙප් පාරාළුමන්රත්තිල් සමර්ප්පිත්තු, නිරෙවේර්රි ඉරුක්කිරාර්

என்றே நான் நினைக்கின்றேன். அதுபோல, இந்த நாட்டிலுள்ள தமிழ் மக்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்குக் கொண்டுவரவேண்டிய சட்டமூலங்களையும் மிக விரைவாக சனாதிபதி அவர்கள் பாராளுமன்றத்துக்குக் கொண்டுவந்தால், தான் அதிகாரத்தில் இருக்கும்பொழுதே தமிழ் மக்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்குத் தயாராக இருக்கின்றேன் என்ற செய்தியைச் சொல்லலாம்.

இறுதியாக, ஒரேயொரு விடயத்தை மட்டும் சொல்லலாமென நினைக்கின்றேன். இது விவசாயிகள் நெல் அறுவடை செய்யும் காலமாகும். இன்று மட்டக்களப்பு மாவட்டத்திலுள்ள விவசாயிகளுக்கு ஒரு கிலோகிராம் நெல்லை உற்பத்தி செய்வதற்கு 145 ரூபாய் தேவைப்படுகின்றது. மாண்புமிகு சனாதிபதி அவர்கள் மட்டக்களப்புக்கு வந்தபொழுது, அவரிடம் நேரடியாக எங்களுடைய விவசாயிகள் ஒரு கோரிக்கையை முன்வைத்தார்கள். அதாவது, தாங்கள் உற்பத்தி செய்கின்ற நெல்லை Paddy Marketing Board ஊடகக் கொள்வனவு செய்ய வேண்டும் என்ற கோரிக்கையை முன்வைத்தார்கள். எனினும், இன்று வரை அதற்கான எந்தவொரு நடவடிக்கையும் எடுக்கப்படவில்லை. இதனால் இந்த முறையும் மட்டக்களப்பில் இருக்கும் விவசாயிகள் கடனாளிகளாக மாறக்கூடிய ஒரு சூழல் உருவாகி இருக்கின்றது. எனவே, மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்த விடயத்தில் விசேட கவனம் செலுத்தி, இதற்கொரு தீர்வைக் காண வேண்டும் என்ற கோரிக்கையை முன்வைத்து, என்னுடைய உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி! வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම රීට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ [ගරු අංගජන් රාමනාදන් මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. Vijitha Herath. You have nine minutes.

[අ.භා. 1.00]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික ආර්ථිකය ශක්තිමත් කරනවා කියලා ආණ්ඩුව දිගින් දිගටම කථා කළා. නමුත් නිතිරීති සකස් කරද්දි ජාතික ආර්ථිකය බිඳ වැටීමක් තමයි සිද්ධ වෙන්නේ. අද ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසිත් අනුමත කිරීම සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම පසුගිය ජූනි මාසයේ 28වැනි දා ජනාධිපතිවරයා මුදල් අමාත්‍යවරයා විධියට අංක 2390/19 යටතේ ගැසට් නිවේදනයක් නිකුත් කරලා තිබුණා. ජූනි 28වැනි දා ඉදිරිපත් කළ එම ගැසට් එක කැබිනට් මණ්ඩලය අනුමත කරලාත් තිබුණා. ඒ ඉදිරිපත් කළ ගැසට් නිවේදනය අනුව මෙතෙක් කල් ආනයනය නතර කර තිබුණු කවුපි, මුං ඇට, කුරක්කන්, උඳු කියන සියල්ල ආනයනය කරන්න ඉඩ දීලා තිබෙනවා. මේ තුළින් විශේෂයෙන්ම අපේ රටේ - දේශීය - හේන් ගොවීන් විශාල අර්බුදයකට ලක් වෙනවා. ඔවුන්ගේ අස්වැන්න නෙළන කොට ඒවා විකුණා ගන්න බැරි වෙනවා. පිට රටින් කවුපි, මුං ඇට, කුරක්කන් ගෙනෙන්න ඕනෑ නැහැ. අපේ රටේ වියළි කලාපවල සිටින හේන් ගොවීන් අපේ රටට අවශ්‍ය කරන කවුපි, මුං ඇට, කුරක්කන් ටික වගා කරනවා. ඉතින් ඇයි, මේවා ආනයනය කරන්නේ?

පසුගිය කාලයේ කෘෂිකර්ම ඇමතිතුමා මේ සභාවට සහතිකයක් දුන්නා, පුන පුනා කිව්වා, "නැහැ, අපේ කෘෂිකර්ම අමාත්‍යාංශය ඒකට ඉඩ දෙන්නේ නැහැ, අපි එහෙම අනුමැතියක් කිසිසේත්ම දීලා නැහැ" කියලා. ඒ වෙලාවේත් මම එතුමාට අවධාරණය කළා, කොටුවේ තොග වෙළඳ පොළට -මාර්කට් එකට- ගිහිල්ලා බලන්න, වෙනත් ක්‍රමවලින් ගෙනාපුවා ඕනෑ තරම් තිබෙනවා කියලා. හැබැයි දැන් ඒ සඳහා නීත්‍යානුකූලවම අවසරය දීලා තිබෙනවා. මේ ගැසට් එකෙන් පැහැදිලිව HS code 1206.42 හා 1106.10.10 වැනි HS codes කීපයක් යටතේ කවුපි, මුං ඇට, කුරක්කන්, උඳු පිට රටින් ඕනෑ තරම් ආනයනය කරන්න දැන් අවසර දීලා තිබෙනවා. ඒ සඳහා බලපත්‍ර දෙන්න පුළුවන්. ඕනෑ කෙනෙකුට මේවා ආනයනය කරන්න පුළුවන්. දැන් මේවා ආනයනය කළාම අපේ රටේ ගොවීන්ට කවුපි, මුං ඇට වගා කරලා අස්වැන්න ලැබුණාම ඒවා විකුණා ගන්න බැරි වෙනවා. විකුණා ගැනීමට අස්වැන්න ලැබෙනකොට මේවා තොග පිටින් පිට රටින් ගෙනෙන්න ගන්නවා. එතකොට අපේ ගොවීන් අනාථ වෙනවා.

කෘෂිකර්මය ශක්තිමත් කරනවා කිව්වා. ජාතික ආර්ථිකය ශක්තිමත් කරනවා කිව්වා. හැබැයි මේ සිද්ධ කරන්නේ අපේ රටේ කෘෂි කර්මාන්තය තවත් පියවර ගණනාවකින් වළ පල්ලට ඇද වැටීමයි. ඒ නිසා මේ ගැසට් නිවේදනය කියන්නේ අපේ රටේ ජාතික ආර්ථිකයට එල්ල කළ මරු පහරක්, අපේ රටේ කෘෂි කර්මාන්තයට, විශේෂයෙන්ම හේන් ගොවීන්ට එල්ල කළ විශාල මරු පහරක්. දුක් මහන්සි වෙලා හේන් වගා කරලා කවුපි, මුං ඇට ටික විකුණලා යන්තම් කීයක් හරි හොයා ගන්න ඉන්නවා නම් ඒ සියල්ලම මේ තුළින් අපතේ යනවා, වතුරේ යනවා. මොකද, පිට රටින් මේවා ගෙනාපු ගමන් අපේ රටේ අස්වැන්න විකුණා ගන්න බැහැ. වෙළඳ පොළෙන් මේවා තුට්ටු දෙකට තමයි ගන්නේ. අන්තිමට අපේ කවුපි, කුරක්කන්, මුං ඇට වගාකරුවන්ට යන එන මං නැති වෙනවා. ගොවියා අසරණභාවයට පත් වෙනවා. එවැනි වැරදි තීන්දු-තීරණත් මේ අස්සේ අරගනිමින් තිබෙනවා. මේවා ගෙන්වන අය කවුද, ගෙන්වන අයගෙන් කොපමණ කොමිස් මුදලක් ලැබෙනවාද කියන කාරණා අපි හොයන්න ඕනෑ. මේවා ගෙන්වන අය එක එක ඇමතිවරයාට පඩුරු පාක්කුඩම් දෙන විධිය ගැන අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. අපේ රටේ ගොවිතැන විනාශයට පත් කරන මෙවැනි මෝඩ තීන්දු-තීරණ ගන්න එක තමයි ආණ්ඩුවේ අද වැඩ පිළිවෙල බවට පත් වෙලා තිබෙන්නේ.

ඊළඟට, මුදල් රාජ්‍ය අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මැතිතුමා වාහන ගෙන්වීම පිළිබඳව කථා කළා. ඒ සඳහා කමිටුවක් පත් කරලා තිබෙනවා කියලා එතුමා කිව්වා. ඔව්, 15දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒක හොඳයි. ඒ කමිටුව රැස් වෙලා තිබුණා. එහිදී වැදගත් යෝජනා සාකච්ඡා වෙලා තිබුණා. ඉස්සරහට තව දින ගණනාවක් රැස් වීමට යොදාගෙනත් තිබෙනවා. කමිටුව තුළ විවිධ පාර්ශ්ව නියෝජනය වෙනවා. ඒ කමිටුවේ වාර්තාව මත වාහන ආනයනය කිරීමට ඉඩප්‍රස්තාව ලබා දෙන එක හොඳයි. හැබැයි ඒ කමිටුව පත් කළාට ඔබතුමන්ලා මීට කලින් කැබිනට් මණ්ඩලයෙන් තීන්දුවක් ගත්තා. ඒ තීන්දුව මහ අමුතු, අරුම පුදුම තීන්දුවක්.

[ගරු විජිත හේරත් මහතා]

සාමාන්‍යයෙන් අපේ රටට වාහන ගෙන්වන ක්‍රම 3ක් තිබෙනවා නේ. පළමුවැනි එක, original වාහන, ඒ කියන්නේ brand-new වාහන ගෙන්වීම. දෙක, පාවිච්චි කරපු, reconditioned වාහන ගෙන්වන එක. තුන් වැනි එක තමයි assemble කරන්න වාහන කොටස් ගෙන්වීම. Assemble කරද්දී කොන්දේසියක් තිබෙනවා, ලංකාවේදී අගය එකතු කිරීමක් - value-addition එකක් - කරන්න ඕනෑ කියලා. අගය එකතු කිරීමක් කරලා assemble කළාම තමයි ඒකට යම් duty-free සහනයක් ලබා දෙන්නේ. හැබැයි පසුගිය කාලයේ මේ ක්‍රම තුනටම පටහැනි විධියට කැබිනට් මණ්ඩලයෙන් යෝජනාවක් සම්මත කළා. ඒක මුදල් අමාත්‍යාංශයටත් අදාළ නැහැ, කර්මාන්ත අමාත්‍යාංශයටත් අදාළ නැහැ. ඒක කෙලින්ම ආයෝජන මණ්ඩලය හරහා ආවා. ඒ මොකක්ද? ඒ තමයි, ඩොලර් මිලියන 50ක ආයෝජනයක් කියන පදනම යටතේ වාහන ගෙන්වන්න අවසර ලබා දීම.

ඒ ගෙන්වන්නේ සම්පූර්ණ වාහනය නොවෙයි. හැබැයි, වාහනය කොටස්වලට, කෑලිවලට කඩලා වාහනය ගේනවා. හැබැයි, HS code එකත් අර වාහනවලට දෙන HS code එකම තමයි. එතකොට වාහනය කෑලිවලට ගලවලා shipment එක එනවා. මෙහේදී වාහනයේ කෑලි ටික ආපහු එකතු කරනවා. සුපුරුදු විධියට වාහනය එළියට දානවා. ඒකට සියයට 70ක duty-free සහනයක් දෙනවා. ඒක දෙන්නේ එක ආයතනකට විතරයි. ඒ කැබිනට් පත්‍රිකාවට අනුව ඉතා පැහැදිලිවම Eastern Automobile කියන ආයතනයට විතරක් මේ සහනය දෙනවා. එතකොට ඒ ගොල්ලන්ට පුළුවන් වාහන ගෙන්වන්න. දැන් අපට ආරංචි විධියට පළමුවැනි shipment එක එනවා. ඒ shipment එක ආවාම වාහන ආනයනය කරන වෙන කාටවත් ඒ අවස්ථාව නැති වෙනවා. එතකොට සාධාරණ වශයෙන් වාහන රටට ගෙන්වන අයට ඒ අවස්ථාව එන්නේ නැහැ. ලංකාවේ value addition කිරීමක් නැහැ. එහෙම කළා නම් කර්මාන්ත අංශයෙන් අපට යම් පුංචි හරි ආදායමක් එනවා. ඒකත් නැහැ. හැබැයි, තෝරා ගත්ත එක සමාගමකට විතරක් කැබිනට් අනුමැතියකින් වාහන ගෙන්වන්න දීලා තිබෙන එකෙන් මොකද වෙන්නේ? ඒ අනුමැතිය දීලා තිබෙනවා විතරක් නොවෙයි, ඒ අයට සියයට 70ක duty-free සහනයකුත් දෙනවා. එතකොට සියයට 30යි ගෙවන්න තිබෙන්නේ. සියයට 30යි, VAT එකයි තමයි ගෙවන්න තිබෙන්නේ. එතකොට මොකක්ද වෙන්නේ? ඒ අය අසීමිත ලාභයක් හොයනවා. අඩුම ගාණේ කැබිනට් මණ්ඩලයට තීන්දුවක් ගන්න තිබුණා, ඒ වාහන ගෙන්වලා වෙළෙඳ පොළට විකුණද්දී profit margin එක limit කරන්න. සියයට 10කට හෝ සියයට 20කට profit margin එක limit කරන්න පුළුවන්. ඊට වඩා බැහැ. හැබැයි, එකම ආයතනය විතරක් නම් වාහන ගෙන්වන්නේ, ඒ ආයතනයට පුළුවන් තමන්ට හිතූ මනාපයට වාහනයේ මිල වැඩි කරන්න. ලාභය ඕනෑ තරම් අසීමිත විධියට වැඩි කරන්න ඒ අයට පුළුවන්. ඒක කාටවත් පාලනය කරන්න බැහැ.

දැන් ඔබතුමන්ලා කියනවා, "අපි වාහන ගෙන්වන්නේ නැහැ, වාහන ගෙන්වන එක සීමා කරලා තිබෙනවා, දැනට ගෙන්වන්නේ සංචාරක ක්ෂේත්‍රයට අදාළ වාහන විතරයි" කියලා. හැබැයි, මේ කැබිනට් තීන්දුව අනුමත වුණා නේ. ඒ අනුමත වෙච්ච එක දැන් ක්‍රියත්මක වෙනවා නේ. දැන් නැවේ බඩු ටික එන්න ලැහැස්තියි නේ. එතකොට ඒක කොහොමද ගත්තේ? එතැන බරපතළ වැරැද්දක් තිබෙනවා නේ. අසමානව සැලකීමකුත් තිබෙනවා. අනෙක් පැත්තෙන්, එක ආයතනයක් නේ තෝරාගෙන තිබෙන්නේ. ඒ ආයතනය තෝරා ගත්තේ මොන පදනම යටතේ ද? එවැනි ආකාරයට එක ආයතනයකට විතරක් වාහන ගෙන්වන්න දෙන්නේ කොහොමද? එහෙම ගෙන්වන අයටත් අසීමිත duty-free සහනයක් දෙන්නේ කොහොමද? සියයට 70ක duty-free සහනයක් දෙන්නේ කොහොමද? එතැන බරපතළ වැරැද්දක් තිබෙනවා. ඒ නිසා ඒක නිවැරදි කරන්න කියන එක මේ සභාවට අවධාරණය කරනවා.

ඒ වාගේම, මත්පැන් අළෙවි සැල්වලට ඒ තිබෙන ගාස්තු වැඩි කිරීම පිළිබඳව ගැසට් කර තිබෙන නිවේදනත් අද ඉදිරිපත් කරලා තිබෙනවා. පසුගිය කාලයේම සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම් පිළිබඳ විවිධ ගැටලු මතු වුණා. අර හොර ස්ටිකර් එකත් එක්ක, ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වුණා. ඒ වාගේම තමයි, තවමත් අපේ රටේ බදු නොගෙවන ප්‍රධාන ආයතනවලින් ඉහළින්ම ඉන්නේ මේ ඉස්කාගාර හිමි මත්පැන් නිෂ්පාදන ආයතන. ඒවාත් ප්‍රධාන වශයෙන්ම දේශපාලන හිතවත්කම්, ඥාතිකම් තිබෙන ආයතන. මෙන්ඩිස් සමාගම තමයි තවම රුපියල් කෝටි 341ක් බදු ගෙවලා නැත්තේ. රුපියල් කෝටි 676ක් ගෙවන්න තිබෙන ආයතන කිහිපයෙන් ඉහළින්ම ඉන්නේ ඒ සමාගම. ඒවා අය කර ගන්නවා, අය කර ගන්නවා කියලා කිව්වාට තවමත් අය කර ගන්නේ නැහැ. නඩු withdraw කර ගත්තා. නැවත නිෂ්පාදනය කරන්න අයිතිය දුන්නා. අදත් ඒ අය බදු ගෙවන්නේ නැතිව යනවා. ඒක එකක්. අනෙක් කාරණය මේකයි. දැන් සාමාන්‍යයෙන් රුපියල් 3,500කට මත්පැන් බෝතලය විකුණනකොට රුපියල් 2,800ක්ම බදු. හැබැයි, ඒ නිෂ්පාදන ආයතන තමන්ගේ නිෂ්පාදන බාර් එකට දාන්නේ අත්පිට මුදලට නොවෙයි, ණයට. ඒ කියන්නේ, ආණ්ඩුවට ගෙවන්න තිබෙන බදු ටිකට බාර් එකට ණයට දෙනවා. ණයට දුන්නාම බාර් හිමිකරුවා බෝතලය රුපියල් 3,500ට විකුණලා තමයි ඒ මුදල් ගෙවන්නේ. හැබැයි, ඒ ගෙවීම් ප්‍රමාද වෙනවා. බොහෝ අවස්ථාවලදී ගෙවන එක කල් යනවා. එතකොට, ඒක ලබා ගන්න ක්‍රියාවලියක් නැහැ. නිෂ්පාදන ආයතන ආණ්ඩුවට බදු ටික ගෙවන්න ඕනෑ. හැබැයි, බදු ගෙවන්න බාර් එකෙන් සල්ලි එන්න ඕනෑ. බාර් එකෙන් සල්ලි එන්න ප්‍රමාද වෙනවා. ගොඩක් ඒවා ගෙවන්නේ නැහැ, පැහැර හරිනවා. එතකොට මොකද වෙන්නේ? නිෂ්පාදකයා ආණ්ඩුවට, සුරාබදු දෙපාර්තමේන්තුවට ගෙවන්න තිබෙන බද්ද ගෙවන්නේ නැහැ.

අද හැමදාම කථා කරනවා, සුරාබදු දෙපාර්තමේන්තුවේ බදු එකතු කර ගැනීම නිවැරදිව වෙන්නේ නැහැ, එහි බලාපොරොත්තු වෙච්ච ඉලක්කවලට යන්න බැහැ කියලා. කොච්චර බදු වැඩි කළත්, ගාස්තු වැඩි කළත් අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 40යි යන්නේ කියලා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ම පසුගිය කාලයේ කිව්වා. එතැන සිදුරක් තිබෙනවා. මොකද, මේ ණයට දීමත් එක්ක ඒ මුදල් ලබා ගන්නා ක්‍රමවේදයක් හදලා නැහැ. ඒ නිසා මම රාජ්‍ය ඇමතිතුමාට අවධාරණය කරනවා, රජයට ඒ ආදායම ලබා ගන්න නම් එතැනින් එහාට තිබෙන ක්‍රියාවලියටත් විධිමත් යන්ත්‍රණයක් සකස් කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේත්, අදත් කථා වුණා ආණ්ඩුකාරවරුන්ගේ මැදිහත්වීම පිළිබඳව. දකුණු පළාතේ සහ මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරු තමන්ගේ අත්තනෝමතික බලය පාවිච්චි කරලා උපදේශකවරු පත් කරලා තිබෙනවා.

ඒ වාගේම, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා මේ අන්තිම වෙලාවේත් - මේ ආණ්ඩුවේ අවසාන කාලයේදීත් - කිසිදු චක්‍රලේඛයක්, නීතියක් සලකන්නේ නැතිව අත්තනෝමතික විධියට නියෝග දීලා නිලධාරිනුත් අමාරුවේ වැටෙන තීන්දු තීරණ ගන්නවා; කිසිදු ක්‍රියා පටිපාටියක් නැතුව ලක්ෂ ගණන් එක එක දේවලට වියදම් කරනවා. ආණ්ඩුකාරවරුන්ගේ මේ අත්තනෝමතික ක්‍රියා මාර්ග වහාම නතර කළ යුතුයි. වාහන දීලා තිබෙනවා; වාහනවලට ලොකු වියදමක් දරලා තිබෙනවා; පොසොන් කලාප, වෙසක් කලාප ආදියට පළාත් සභාවේ සල්ලි ලක්ෂ ගණන් වියදම් කරලා තිබෙනවා. එහෙම කරන්න බැහැ.

ඒවා ගැන විගණනයේ සඳහන්ව තිබෙනවා. ඒ ක්‍රියාවලියත් වහාම නවත්වන්න ඕනෑ. එහෙම නැති වුණොත් ආණ්ඩුකාරවරුන්ට ඒවා සම්බන්ධයෙන් මේ සභාවට උත්තර බඳින්න අනිවාර්යයෙන් සිදු වෙනවා කියන කාරණයත් මා අවධාරණය කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Kabir Hashim. You have nine minutes.

[අ.භා. 1.11]

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. අද අපනයනය, ආනයනය සහ උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව ගැසට් නිවේදන මඟින් පළ කරන ලද රෙගුලාසි සහ නියමය පිළිබඳවත් විවාදයට ගැනෙනවා. මම මේ අවස්ථාවේ ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

රට ආර්ථික අර්බුදයෙන් ගොඩ ගන්න නම්, අප කවුරුත් දන්නා පරිදි ණය ප්‍රතිව්‍යුහගත කිරීම පළමුවැනි ඉලක්කය හැටියට ගන්න පුළුවන්. ඊළඟ එක, රටේ ආර්ථික ස්ථාවරත්වය ඇති කිරීම. ඊළඟ එක, ආර්ථික වර්ධනය වැඩි කිරීම. මේවා හරියාකාරව ඉලක්ක කර ගත්තේ නැත්නම් අපට ඉස්සරහට යන්න අමාරුයි.

රජය ගිය සතියේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමට ලක් කළා. එහිදී අපට ආරංචි වුණා, macro-linked bonds කියන සංකල්පය භාවිත කරලා දළ දේශීය නිෂ්පාදනය වැඩි වන කොට ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල - ISBsවල - වට්ටම, එහෙම නැත්නම් haircut එක අඩු වන කොන්දේසිවලට රජය බැඳී සිටිනවා කියන එක. අපි දිගටම යෝජනා කළා, විපක්ෂයක් හැටියට සති තුනකට කලින් මාධ්‍යයට ගිහිල්ලා කිව්වා, MLBsවල - macro-linked bondsවල - වට්ටම ඒ විධියට අඩු කරනවා නම් එය සියයට 20කට වඩා අඩු වෙන්න දෙන්න එපා කියලා. මොකද, ඒ බැඳුම්කර හිමියන්ම එක වෙලාවක සියයට 20කට එකඟ වෙලා තිබුණා. හැබැයි, රජය සියයට 15ක වට්ටමට -පහළ මට්ටමකට- එකඟ වෙලා තිබෙන බව අපට ආරංචි මාර්ග අනුව දැන ගන්නට ලැබිලා තිබෙනවා. ඒ වාගේම ඒ ඉහළම වට්ටම - haircut එක - සියයට 30කට වඩා අඩු කරන්න එපා කියලා කිව්වත්, රජය සියයට 28කට එකඟ වෙලා තිබෙන බව අපි දන්නවා. ඒ සාකච්ඡාව පිළිබඳව අපි කනගාටු වෙනවා. මොකද, ආණ්ඩුව විපක්ෂයට ඇහුම්කන් දුන්නේ නැහැ. අපි දිගටම මේ ගැන කිව්වා. ඒත් ඇහුම්කන් දුන්නේ නැහැ.

උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව දේශපාලන අභිමතය පාවිච්චි කරමින් විවිධ සහන දෙන බව අපි මේ සභාවේදී දිගටම කියා තිබෙනවා.

එවැනි එක් අවස්ථාවක් මා කියන්නම්. අදානි සමාගමත් එක්ක සුළං බල ව්‍යාපෘතිය ලබා දීමට ගිවිසුමකට ගිහින් ඇමෙරිකානු ඩොලර් ශත 8.2ක ගණනකට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ගත්තාට පස්සේ, අපි දිගටම මේ ගරු සභාවේදී ඇමතිවරයාට කිව්වා, ඒකට එකඟ වෙන්න එපා, ඊට වඩා අඩු ගණනකට යන්න අදානි සමාගම එක්ක සාකච්ඡා කරන්න පුළුවන් කියලා. හැබැයි, කනගාටුයි කියන්න, ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය භාවිත නොකර කටයුතු කරපු නිසා, විපක්ෂය කියපු දෙයට ඇහුම්කන් දුන්නේ නැති නිසා, රජය ඒක අනාගෙනයි තිබෙන්නේ. රජය විපක්ෂයට ඇහුම්කන් දුන්නේ නැහැ. ඒ, එක කාරණාවක්.

උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති යටතේ ගත්තාම, දේශපාලන බලය සහ දේශපාලන අභිමතය අනුව සහන දෙන අවස්ථා කිහිපයක් තිබෙනවා. එවැනි අවස්ථා ඕනෑ තරම් පෙන්වා දෙන්න අපට පුළුවන්. ඒ සහන දිගටම විදේශ ආයෝජකයන්ට, එක එක ව්‍යාපෘතිවලට ලබා දීලා තිබෙනවා. ඒකෙන් ඇති වන පාඩුව විශාලයි. එක පැත්තකින්, තෝරා ගත්තු සමාගම්වලට විතරක්, එක එක්කෙනා -සමහර විට අමාත්‍යවරයා, එහෙම නැත්නම් ජනාධිපතිවරයා- දීපු සහන තිබෙනවා. සමහර වෙලාවට විදේශ ව්‍යාපෘතිවලට විදේශ සේවකයන් ආවාම, ඒ ගොල්ලන්ගේ පඩි නඩි හා ගෙවීම්වලට කිසිම බද්දක් අය කරන්නේ නැහැ; යෙදවුම්වලට බද්දක් අය කරන්නේ නැහැ; ඒ ගොල්ලන්ගේ ලාභවලට බද්දක් අය කරන්නේ නැහැ. හැබැයි, ඔවුන්ට ඒ අවස්ථාව දුන්නාට, දේශීය නිෂ්පාදකයන්ගෙන්, දේශීය අපනයනකරුවන්ගෙන් හැම බද්දක්ම අය කරනවා. එහෙම කරන්න එපා කියලා විපක්ෂය හැමදාම කිව්වත් ආණ්ඩුව ඇහුම්කන් දෙන්නේ නැති එක ගැන කනගාටුයි.

මේ උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති කියන නීතිය තවම ඉවත් කරලා නැහැ. IMF එක කියලා තිබෙනවා, මේ SDPs - Strategic Development Projects - කියන නීතියම ඉවත් කර දමන්න කියලා. අපිත් දිගටම එය කියා තිබෙනවා. හැබැයි, තවම ඒක කරලා නැහැ. රජය අවංක නොවීම නිසාත්, යටි අභිප්‍රායයෙන් කටයුතු කරන නිසාත් ඒකෙන් මහත් අවාසිදායක ප්‍රතිඵල මේ රටට අත් වෙලා තිබෙන බව සහතික කරන්න පුළුවන්. එකක් තමයි, මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද tax expenditure statement එක. 2024 මාර්තු මස 31වන දා නිකුත් කරපු ඒ වාර්තාවෙන් මුදල් අමාත්‍යාංශය විසින්ම කියනවා, 2022-2023 මූල්‍ය වර්ෂය ගත්තාම නොයෙක් අවිධිමත් බදු සහන නිසා රජයට අහිමි වූ බදු ප්‍රමාණය රුපියල් බිලියන 978ක් කියලා. ඒ කියන්නේ, අවිධිමත් විධියට බදු සහන දීපු නිසා 2022-2023 මූල්‍ය වර්ෂයට රුපියල් බිලියන 978ක් අපට අහිමි වෙලා තිබෙනවා. කොටින්ම කියනවා නම්, ඒ වර්ෂයේ තිබුණු බදු ආදායමෙන් සියයට 56ක්, මේ අවිධිමත් බදු සහන දීමෙන් අපට අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම, ආණ්ඩුව "අස්වැසුම" ප්‍රතිලාභ සඳහා වර්ෂයකට උපරිම වශයෙන් භාවිත කරන්නේ රුපියල් බිලියන 200ක් පමණයි. අද තිබෙන ආර්ථික තත්ත්වය මිනිසුන්ට අමාරුයි. හැබැයි, මේ බදු සහන නැවැත්වුවා නම්, අස්වැසුම ප්‍රතිලාභය පස්ගුණයකින් වැඩි කරලා මේ රටේ දුප්පත් මිනිසුන්ට දෙන්න පුළුවන්. එතකොට බලන්න, this document actually reports, Hon. Member, how the Government's estimates of total revenue have been foregone due to specially targeted tax concessions that have been given without any relevance. So, it looks absurd.

රජය IMF එක සමඟත් එකඟ වුණා, SDPs කියන, ඒ කියන්නේ උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති සහ BOI එක හරහා දෙන බදු සහන පිළිබඳව මාස හයකට වරක් ප්‍රසිද්ධියට පත් කරනවා කියලා; වාර්තා කරනවා කියලා. අද වනකල් කොහේටවත් ඒක නිකුත් කරලා නැහැ; ප්‍රසිද්ධියේ පෙන්වලාත් නැහැ; දෙන සහන මොනවාද කියලා කවුරුවත් දන්නේත් නැහැ. ඒකෙන් පෙනී යන්නේ, එක් එක් තෝරා ගත් ව්‍යාපෘතිවලට, විදේශ ආයෝජකයින්ට ආණ්ඩුවේ අභිමතය අනුව මේ වාගේ සහන දෙනවා කියන එකයි.

ආර්ථික වර්ධනය ඉස්සරහට ගෙන යන්න නම් අපි ඇත්තටම කරන්න ඕනෑ මොකක්ද? දේශීය ආර්ථිකයට උත්තේජනයක් ලබා දෙන්න ඕනෑ. ආර්ථික වර්ධනය වැඩි කරන්න නම්, ඒ උත්තේජනය ලබා දීමට යම් යම් පියවර ගත යුතුයි. හැබැයි, රජය ඒ වෙනුවෙන් කරන්නේ මොකක්ද? දේශීය ආර්ථිකය සංකෝචනය කරන්න, යම් යම් තීන්දු ගන්නවා. අද කුඩා සහ

[ගරු කබීර් හෂීම් මහතා]

මධ්‍යම පරිමාණයේ කර්මාන්ත අංශය ගත්තාම, දේශීය අපනයනකරුවන්ට විදුලි ගාස්තුව වැඩි වෙලා තිබෙනවා; ඉන්ධන ගාස්තු වැඩි වෙලා තිබෙනවා; බදු අය කිරීම වැඩි වෙලා තිබෙනවා; අමුද්‍රව්‍ය මිලත් වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව ඒ අයට ලබා දිය යුතු බදු සහන කිසි දෙයක් ලබා දීලා නැහැ. දැන් මේ තෝරා ගත් මහා පරිමාණයේ විදේශ ආයෝජකයන්ට බදු සහන ලබා දෙන කොට, දේශීය මට්ටමේ කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයන් නහා සිටුවූයේ නැත්නම්, මේ ආර්ථිකය උත්තේජනය කරන්නේ කොහොමද?

මම සතුටු වෙනවා මුදල් රාජ්‍ය අමාත්‍යතුමා සහ ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා මේ මොහොතේ සභාවට පැමිණ සිටීම ගැන. SDPsවලට දෙන බදු සහන ගැනයි මම කථා කරමින් සිටියේ. ඒකෙන් අපට රුපියල් බිලියන 954ක් විතර අහිමි වුණා කියලා මුදල් අමාත්‍යාංශයෙන්ම කියනවා.

මම මුදල් රාජ්‍ය ඇමතිවරයාගේ අවධානයට යොමු කරන්න කැමතියි කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට තිබෙන ප්‍රශ්න. මම උදාහරණයක් කියන්නම්. මගේ දිස්ත්‍රික්කයේ ඉන්නවා තරුණ ව්‍යාපාරිකයෙක්. කොවිඩ් වසංගතය හේතුවෙන් ඇති වුණු ආර්ථික බංකොලොත්භාවය නිසා ඔහුගේ ව්‍යාපාරය කඩාගෙන වැටුණා. ඔහු HDFC බැංකුවෙන් සියයට 14 පොලියට ණයක් අරගෙන තිබුණා; ඒ, ලක්ෂ 15ක ණයක්. ඒ බැංකුව සියයට 14 පොලිය අඩු කරන්නේ නැතිව, ඒකට සහනයක් දෙන්නේ නැතිව ඒ ගාණම ඉල්ලනවා. වාරිකය අඩු කරන්නෙත් නැහැ. හැබැයි, එතුමා ඉල්ලීමක් කළා පොලිය සහ වාරිකය අඩු කරන්න, මම ගෙවන්නම් කියලා. නමුත් එහෙම ඉඩ දෙන්නේ නැහැ. හැබැයි, බැංකුව සුපිරි ලාභ ලබනවා. ඒ වාගේ අයට උදව් නොකරනවා නම් කොහොමද මේ ආර්ථිකය උත්තේජනය කරන්නේ? අනෙක් පැත්තෙන් මේ අයට බදු සහනයක් ලබා දෙන්නෙත් නැහැ.

මුදල් රාජ්‍ය ඇමතිතුමනි, මේ වාගේ තත්ත්වයක් තුළ මේ දවස්වල සමහර ඇමතිවරු, මන්ත්‍රීවරු දිස්ත්‍රික්කවලට ගිහිල්ලා රජයෙන් සහන පොලියට ලක්ෂ 10ක ණයක් දෙනවා කියලා, සමහර අයට ඒක ලබා දෙනවා. ඒක දේශපාලන වැඩසටහනක් අනුවද කරන්නේ? මේ ආර්ථික කඩා වැටීමෙන් යම් යම් බලපෑම්වලට ලක් වුණු කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන්ට සහන පොලියට දෙන ඒ ණය වැදගත් කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් කරන්න කැමතියි.

අපේ ධීවර කර්මාන්තයටත් ප්‍රශ්න තිබෙනවා. ගරු ආයෝජන ප්‍රවර්ධන ඇමතිතුමනි, අපේ ධීවර ක්ෂේත්‍රයේ දේශීය අපනයනකරුවන් අමු ද්‍රව්‍ය සහ යෙදවුම් ආනයනය කරනකොට රේගුවෙන් බදු අය කරනවා. ඒ අයට කිසිම සහනයක් නැහැ. සියයට 100ක value addition එකක් මේ රටේ සිද්ධ වෙනවා, කිසිම සහනයක් නැහැ. හැබැයි, විදේශ ආයෝජකයෙක් ආවාම කෙළින්ම සහන දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාලය අවසාන වන නිසා මම කථාව අවසන් කරන්නම්. මම කනගාටු වෙනවා, විපක්ෂයක් හැටියට අපි බිරි ආණ්ඩුවකට තමයි මේ කථා කරන්නේ. මේ සභාවේ කථා කරනකොට හරියට සුසාන භූමියක කථා කරනවා වාගෙයි. මොකද, සුසාන භූමියක කථා කරනකොට කාටවත් ඇහෙන්නේ නැහැ. මේ සභාවේදී ආණ්ඩුවට කොච්චර කථා කළත්, විපක්ෂය කොච්චර කිව්වත් ඔබතුමන්ලාට ඇහෙන්නේ නැහැ. ඒක තමයි ප්‍රධාන ප්‍රශ්නය. මූලාසනයේ ඉන්න නියෝජ්‍ය කාරක සභාපතිතුමාටවත් ඇහෙන්නේ නැහැ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කබීර් හෂීම් මන්ත්‍රීතුමා මතු කළ කාරණයට මම පිළිතුරක් දිය යුතුයි. මේ වෙනකොට විශේෂයෙන්ම තරුණ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අඩු පොලියට සහන ණය ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා, රාජ්‍ය බැංකු හරහා. ඒ වාගේම තමයි ඔබතුමා කියපු අනෙක් කාරණය. ඔබතුමා එක්තරා බැංකුවක් ගැන කියලා, ඒ බැංකුව පොලී සහනයක් ලබා දෙන්න කටයුතු කරන්නේ නැහැ කියලා කිව්වා. ඇත්තටම අපි ඒක දන්නේ නැහැ. ඒ ඔබතුමාට කියන කාරණය නේ. අපි ළඟටත් ඔය වාගේම දේවල් එනවා. ඇත්තටම අපි දන්නේ නැහැ, අභ්‍යන්තරයේ ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන. මහ බැංකුව මැදිහත් වෙලා restructure කළ loans තිබෙනවා. හැබැයි, ඒ restructure කළ loans එක සැරයක් නොවෙයි දෙ තුන් සැරේ restructure කරලා තිබෙනවා. But unfortunately, ඒ ගොල්ලන් ඒක follow කරලා නැහැ. ඔබතුමා කිව්වාට ඇහෙන්නේ නැහැ කියලා, අපට හොඳට ඇහෙනවා. ඔබතුමන්ලාට වෙලා තිබෙන්නේ, ඔබතුමන්ලා දකින්න කැමති නැති එක. අපට ඇහෙනවා, අපි ඒකට ක්‍රියාමාර්ගත් ගන්නවා. කබීර් හෂීම් මැතිතුමා ඒක දකින්නයි, බලන්නයි කැමති නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපි දෙපාර්ශ්වයම මේ වගකීම අරගෙන, මේක ගොඩ ගනිමු. මම දන්නවා ඔබතුමාට, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට මේ යන වැඩ පිළිවෙළට, IMF programme එකට උදව් කරන්න ඕනෑ බව. හැබැයි සජිත් ප්‍රේමදාස නායකතුමා ඔබතුමන්ලාට ඒකට ඉඩ දෙන්නේ නැහැ. IMF programme එකට සහයෝගය නොදීම, ඊළඟට debt restructuringවලට සහයෝගය නොදීම ගැන ඔබතුමාගේ හෘදය සාක්ෂියෙන් අහන්න, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ හෘදය සාක්ෂියෙන් ඇහුවොත්, ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාගේ හෘදය සාක්ෂියෙන් ඇහුවොත්, දේශපාලන හේතු මත විරුද්ධ වීමක් මිසක්, ඔබතුමන්ලා කවදාවත් ඒවාට විරුද්ධ වෙන්නේ නැහැ. ඔබතුමන්ලාගේ නායකතුමාත් ඒ මාර්ගයට ගත්තොත් සමහරවිට ඔබතුමන්ලාට මීට වඩා යම් ධනාත්මක විධියකට මේ දෙස බලන්න පුළුවන් වෙයි.

ගරු දිලුම් අමුණුගම මහතා (ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திலும் அமுணுகம - முதலீட்டு மேம்பாடு இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilum Amunugama - State Minister of Investment Promotion)

මමත් පොඩි පැහැදිලි කිරීමක් කරන්නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මම කබීර් හෂීම් මන්ත්‍රීතුමා කියපු එක කාරණයකට පිළිතුරක් දෙනවා. ඔබතුමා ඉස්සර හිටපු ආයෝජන විෂය භාර අමාත්‍යවරයෙක්, ගරු මන්ත්‍රීතුමනි. ඉස්සර current operatorsලාට BOI යන්න බැහැ. දැන් අපි ඒක සංශෝධනය කරලා තිබෙනවා. දැනට ව්‍යාපාරයක් පවත්වා ගෙන යනවා නම් - දේශීය වුණත් කමක් නැහැ - ඒ කියන investment threshold එකට එනවා නම් ඒ අයටත් Section 16 යටතේ, -මොකද ඒවා අළෙවි කරන්නේ දේශීයව නිසා, අපනයනය නොකරන නිසා- ඇතුළත්වීමේ හැකියාව තිබෙනවා. ඒ threshold එක සම්පූර්ණ කරනවා නම්, ඒ අයටත් විදේශ අයට ලැබෙන සහනයම ලැබෙන තත්ත්වයට දැන් කටයුතු සකස් කර තිබෙනවා.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පොඩි ප්‍රශ්නයක් අහනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, SDP නීතිය අවලංගු කරලා නැත්තේ ඇයි? ඒක IMF එකෙනුත් කරන ලද ඉල්ලීමක්.

ගරු දිලුම් අමුණුගම මහතා
(මාණ්පුමිකු තිලුම් අමුණුකම)
(The Hon. Dilum Amunugama)

අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක වැඩ කරනකොට SDP නීතිය අවලංගු කරන්න කියලා ඔවුන් අපිට කියලා තිබෙනවා. අපි දැන් ඒක අවලංගු කරලා තිබෙනවා. ඒ නිසා පසුගිය නොවැම්බර් මාසයේ සිට කිසිම අලුත් SDP එකක් එන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා Eravur Zone එකට ඇතුළත් වුණොත් SDPs ලැබෙන තත්ත්වයක් තිබුණු බව. ඒ සංශෝධනය නිසාම ඒකේ තිබුණා Zone එක SDP එකක් වුණත් එන එන හැම එකටම වෙන වෙනම SDP සම්බන්ධ අනුමැතිය ගන්න ඕනෑ කියලා. IMF එක නිසා SDPs අලුතෙන් දෙන්න බැරි නිසා ඒ Zone එකට ඇතුළත් වෙන ඒවාට විතරක් SDPs ලැබෙන විධියට තමයි අද මේ ගැසට් නිවේදනය මඟින් සංශෝධනය කර තිබෙන්නේ. මෙතැනදි correction එකක් තමයි කරලා තිබෙන්නේ. අලුතෙන් වෙන මොකුත් කරලා නැහැ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)

Hon. Deputy Chairman of Committees, could I make a further clarification on this?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Shehan Semasinghe, let us not make this a debate.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)

No, it is just to make a further clarification, Sir.

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරපු කාරණය සම්බන්ධයෙනුයි මම කරුණු දක්වන්නේ. SDPsවලට - Strategic Development Projectsවලට - ඔබතුමන්ලාත් දිගින් දිගටම විවේචන එල්ල කර තිබෙනවා. අපි විපක්ෂයේ ඉද්දිත් විවේචන එල්ල කර තිබෙනවා, විශේෂයෙන්ම බදු විරාම සම්බන්ධයෙන් සමානාත්මතාවක් නැති, විනිවිදභාවයක් නැති යම් යම් පහසුකම් සලසන්නේ ඇයි කියලා. අපේ රටේ ඒ සම්බන්ධයෙන් ක්‍රමයක් තිබුණේ නැහැ, හිටපු ගරු ඇමතිතුමනි. ඔබතුමා ඒක පිළිගනීවි. එක එක්කෙනාගෙන් එක එක්කෙනාට එය වෙනස් වුණා. ඒ හින්දා අපි SDP Act එක repeal කරනවා. දිලුම් අමුණුගම රාජ්‍ය ඇමතිතුමා කියපු කාරණය ඇත්තක්. අපි දැන් ඒක පාවිච්චි කරන්නේ නැහැ. ඒක repeal වුණා සේ සලකලා තමයි කටයුතු කරන්නේ. නමුත් මේක repeal වෙනවා. මේක repeal වෙන්න අවශ්‍ය rule-based system එකක් අපි ඉදිරි මාසය කිහිපය තුළ ඉදිරිපත් කරනවා. එතකොට හැම කෙනෙකුටම සමානාත්මතාවක් තියෙයි, විනිවිදභාවයක් තියෙයි, investment promotionsවලට ගන්න ඕනෑ පියවර මොකක්ද කියන එකත් තියෙයි, incentives මොනවාද කියලාත් තියෙයි. හැබැයි අපි ඒ ඔක්කෝටම level playing field එකක් හදලා දෙනවා. ඒකෙදි අපි දැනට SDPs ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ අනුව කිසිම ආයෝජනයක් ගන්න අපි කටයුතු කරන්නේ නැහැ. හැබැයි අපි ඉදිරියේදී rule-based system එකක් හදුන්වලා දෙනවා, හැමෝටම විනිවිදභාවයකින් කටයුතු කරන්න.

[பி.ப. 1.26]

ගරු එම්. රාමේෂ්වරන් මහතා
(மாண்புமிகு எம். ராமேஷ்வரன்)
(The Hon. M. Rameshwaran)

நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே!

மதுவரிக் கட்டளைச் சட்ட அறிவித்தல் மற்றும் இறக்குமதி எற்றுமதிச் சட்ட ஒழுங்குவிதிகள் தொடர்பான விவாதம் இன்று நடைபெற்றுக் கொண்டிருந்தாலும், பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினை ஒரு பாரிய பிரச்சினையாக இருக்கின்ற நிலைமையில் நான் இங்கே அது பற்றிக் கூறியாக வேண்டும். நேற்று எங்களுடைய கௌரவ அமைச்சர் ஜீவன் தொண்டமான் அவர்கள் பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வுப் பிரச்சினை சம்பந்தமாக இந்தச் சபையிலே விளக்கமாக எடுத்துக் கூறியிருந்தார். அதற்குப் பிற்பாடு பேசிய கண்டி மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கௌரவ வேலு குமார் அவர்கள், "அரசாங்கமும் அமைச்சர்களும் நாடகமாடுகிறார்கள்" என்று குறிப்பிட்டுப் பல குற்றச்சாட்டுகளை முன்வைத்திருந்தார். யார் நாடகமாடுகின்றார்கள், யார் நடிக்கின்றார்கள்? என்று அவரிடம்தான் கேட்க வேண்டும். எமது இலங்கைத் தொழிலாளர் காங்கிரஸைப் பொறுத்தவரை அது ஒரு பொறுப்புவாய்ந்த தொழிற்சங்கம்; அதனுடைய தலைமைத்துவம் பொறுப்புவாய்ந்தது.

பெருந்தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 ரூபாய் சம்பளம் கொடுக்க வேண்டும் என்பதில் நாட்டினுடைய மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்களும் கௌரவ தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர் மனுஷ நாணாயக்கார அவர்களும் எங்களுடைய கௌரவ அமைச்சர் ஜீவன் தொண்டமான் அவர்களும் உறுதியாக இருக்கின்றார்கள்; இது மக்களுக்குத் தெரியும். இந்தச் சம்பளப் பேச்சுவார்த்தைக்காகப் பலமுறை தொழில் அமைச்சர் அவர்கள் கம்பனிக்காரர்களை அழைத்திருக்கின்றார். ஆனால், அவர்கள் செல்லவில்லை. அதன் பிற்பாடுதான் அடிப்படைச் சம்பளம் 1,700 ரூபாய் என்பதை வர்த்தமானியிலே அவர் பிரசுரித்திருந்தார். அதில் சின்னத் திருத்தம் மேற்கொள்ள வேண்டுமென்பதற்காக அந்த அறிவித்தலுக்கு உயர் நீதிமன்றம் இடைக்காலத் தடையுத்தரவு வழங்கியிருக்கின்றது. மாண்புமிகு ஜனாதிபதி அவர்கள் தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 ரூபாயை அடிப்படைச் சம்பளமாகக் கொடுக்க வேண்டுமென்று கூறி வர்த்தமானி அறிவித்தல் செய்தபோது, கம்பனிக்காரர்கள் யாரும் தாம் courtஇற்குப் போவதாகச் சொல்லவில்லை. ஆனால், "ஜனாதிபதி அவர்கள் அடிப்படைச் சம்பளமாக 1,700 ரூபாயை அறிவித்திருக்கின்றார்; இதற்கெதிராகக் கம்பனிக்காரர்கள் courtஇற்குப் போவார்கள்" என்று எதிரணியில் இருக்கின்றவர்கள் கூறி அவர்களைத் தூண்டிவிட்டு, அவர்கள் உயர் நீதிமன்றத்திற்குச் செல்வதற்கான சந்தர்ப்பத்துக்கு வழியமைத்தார்கள். இதைப் பார்க்கின்றபோது யார் நாடகமாடுகின்றார்கள் என்று தெரியும்.

இலங்கைத் தொழிலாளர் காங்கிரஸைச் சேர்ந்தவர்கள் ஒவ்வோர் அரசாங்கத்திலும் அமைச்சராக இருந்தபொழுதும் அரசாங்கத்திற்கு எதிராக மக்களுக்காகப் பல போராட்டங்களைச் செய்து, பல வெற்றிகளைப் பெற்றுக்கொடுத்திருக்கின்றார்கள். அந்த வகையில், நேற்றும் மலையகத்திலிருந்து கொழும்புக்கு வருகைதந்து முதலாளிமார் சம்மேளனத்தின் காரியாலயத்திற்கு முன்பு பாரிய போராட்டம் நடத்தப்பட்டது. அந்தத் தொழிலாளருக்கு 1,700 ரூபாய் கிடைக்க வேண்டு

[ගරු එම්. රාමේශ්වරන් මහතා]

මෙන්று பெருந்தோட்ட மக்களும் ஏனையவர்களும் அக்கறை யாக இருக்கின்றார்கள். ஆனால், சிலருக்கு இது பொறாமை யாக இருக்கின்றதென்று நான் நினைக்கிறேன். அதனால்தான் அவர்கள் "1,700 ரூபாய் கிடைக்காது, ஜனாதிபதியின் வாக்குறுதி பொய்! அமைச்சரின் வாக்குறுதி பொய்!" என்று கூறுகின்றார்கள். இவர்கள் தங்களது காலத்தில் கூறிய 100 ரூபாய், 50 ரூபாய் அதிகரிப்புக்களைப் பெற்றுக் கொடுக்காமல் இருந்திருக்கலாம். ஆனால், எங்களுடைய காலத்தில் கௌரவ ஜீவன் தொண்டமான் அவர்கள் அமைச்சராக இருந்து முன்வைத்த பல்வேறு கோரிக்கைகள் வெற்றியளித்திருக் கின்றது.

அதுபோல், மாண்புமிகு ஜனாதிபதி அவர்களோடு பேசியதன் விளைவாக, பெருந்தோட்டக் குடியிருப்புப் பிரதேசங்களைக் கிராமங்களாக மாற்றுவதற்காக அவரால் சமர்ப்பிக்கப்பட்ட அமைச்சரவைப் பத்திரத்துக்கு நேற்று அனுமதி கிடைத்திருக்கின்றது. 10 'பேர்ச்சஸ்' காணி கொடுப்பதற்காக நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. இவ்வாறு கௌரவ ஜீவன் தொண்டமான் அவர்கள் பெருந்தோட்ட மக்கள்மீது கொண்டுள்ள அக்கறையினால் அரசாங்கத்தோடும் ஜனாதிபதி அவர்களோடும் பேசிப் பல்வேறு வேலைத்திட்டங்களைச் செய்துவருகிறார். இதிலிருந்து ஜனாதிபதிக்கும் இலங்கைத் தொழிலாளர் காங்கிரஸுக்கும் இடையில் இருக்கின்ற தொடர்பு எவ்வாறானதென்று அந்த மக்களுக்குத் தெரிகின்றது. இதைப் பொறுத்துக்கொள்ள முடியாதவர்கள் எதை வேண்டுமானாலும் கூறிவிட்டுப் போகலாம். நாடகமாடுபவர்கள் இங்கே இல்லை, அங்கேதான் இருக்கின்றார்கள். அவர்களைப் பார்த்து அவர்களே கேட்டுக்கொள்ள வேண்டும்.

குறித்த வர்த்தமானி அறிவித்தல் தொடர்பான நீதிமன்றத் தின் இடைக்காலத் தடையுத்தரவு கடந்த 4ஆம் திகதி பிறப்பிக்கப்பட்டது. 5ஆம் திகதி துரைமாரை அழைத்துக் கொட்டகலை சி.எல்.எப் வளாகத்தில் விருந்துபசாரம் நடத்த பட்டதென்று கூறியிருந்தார்கள். கொட்டகலை சி.எல்.எப் என்பது தினந்தோறும் மக்கள் வந்து செல்லும் ஓர் இடம். இவர்களுக்கு அங்கு அவ்வாறான கட்டிடங்கள், பின்புலங்கள் இல்லாமல் இருக்கலாம். ஆனால், இலங்கைத் தொழிலாளர் காங்கிரஸைப் பொறுத்தளவில் அது ஒரு பொ ிய தொழிற்சங்கம். பெருந்தோட்ட மக்கள் தமது அன்றாடப் பிரச்சினைகள் சம்பந்தமாக கொட்டகலை சி.எல்.எப் வளாகத்திற்கு வந்து பேச்சுவார்த்தை நடத்திவிட்டு, அங்கு உணவு சாப்பிட்டுவிட்டுச் செல்வது வழக்கம். இந்த நடைமுறை இன்று நேற்றல்ல, சௌமியமூர்த்தி தொண்டமான் ஐயாவின் காலந்தொட்டே அங்கு அது இருக்கின்றது. கடந்த 5ஆம் திகதி பல பெருந்தோட்டக் கம்பனிகளின் துரைமார் அங்கு வருகை தந்துள்ளார்கள்.

எங்களுடைய பொதுச் செயலாளர் ஜீவன் தொண்டமான் அவர்கள் அங்கிருந்தார். அங்கு பெருந்தோட்டக் கம்பனி களுடைய துரைமாரின் பேச்சுவார்த்தை நடந்தது. அவர்கள் வழமையாக அங்கே வருவது வழக்கம். அதை யாரும் குறைசொல்ல முடியாது. இவர்களுக்கென அவ்வாறான பின்புலம் இல்லாவிட்டால் நாங்கள் அதற்கு ஒன்றும் செய்ய முடியாது. இதனைக் கூறிய கௌரவ உறுப்பினர் அவர்களும் நுவரெலியாவுக்குச் சென்றபோது கௌரவ அமைச்சர் ஜீவன் தொண்டமான் அவர்களுடனிருந்து விருந்துபசாரத்தில் கலந்து விட்டுத்தான் சென்றிருக்கின்றார். ஆகவே, அவரைப் பற்றிக் குறைசொல்ல முடியாது. அவர் அவரது கட்சியைக் காட்டிக் கொடுத்தார் என்று சொல்லமுடியாது. எனவே, இவற்றைப் பேசுவதற்கு முன்பு பின்புலத்தில் யார் இருக்கிறார்கள், என்ன நடக்கின்றது என்று பார்க்க வேண்டும்.

கடந்த காலத்தில் அரசாங்கத்தில் இருந்தபோது சிலருக்கு அவர்கள் கூறிய வாக்குறுதிகளை அவர்களால் நிறைவேற்ற முடியாமல் இருந்திருக்கலாம். இலங்கை தொழிலாளர் காங்கிரஸைப் பொறுத்தளவிலே சௌமியமூர்த்தி தொண்டமான் ஐயாவினுடைய காலத்திலென்றாலும் சரி, ஆறுமுகன் தொண்டமான் ஐயாவினுடைய காலத்திலென் றாலும் சரி, இன்றைய ஜீவன் தொண்டமான் அவர்களுடைய காலத்திலென்றாலும் சரி, அரசாங்கத்தோடு இருக்கின்ற நேரம் அரசாங்கத்தோடு பேச்சுவார்த்தை நடத்தி நாங்கள் இவற்றைச் செய்துகொடுத்திருக்கின்றோம். கம்பனிகளோடு இன்று நாங்கள் முட்டி மோதிக் கொள்ளுவோம். நாளைக்கு பெருந்தோட்டத் தொழிலாளர்களுக்குப் பிரச்சினை ஏற்படும் என்றால் நாங்கள் அவர்களை அழைத்துப் பேச்சுவார்த்தை நடத்துவோம். அவ்வாறுதான் அந்தப் பெருந்தோட்டங்கள் இன்றுவரை பாதுகாக்கப்பட்டிருக்கின்றன. இலங்கை தொழிலாளர் காங்கிரஸும் தொண்டமான் என்கின்ற நாமமும் இல்லாவிட்டால் இன்று பெருந்தோட்டங்களின் காணியே பறிபோயிருக்கும். அது அவர்களுக்கும் தெரியும். தெரிந்து கொண்டுதான் ஏதோ அரசியல் நடந்த வேண்டும் என்பதற்காக இலங்கைத் தொழிலாளர் காங்கிரஸையும் தொண்டமானையும் குறைகூறிக் கொண்டிருக்கிறார்கள். இவர்களுக்கு நான் கூற விரும்புவது என்னவென்றால், குறைகூறுவதை நிறுத்திக் கொள்ளுங்கள் என்றுதான். மக்களுக்கு என்ன சேவை செய்ய வேண்டியிருக்கின்றதோ அதைச் செய்யுங்கள்! இலங்கைத் தொழிலாளர் காங்கிரஸ் அரசாங்கத்தோடு இருந்தாலும்சரி, எதிர்க்கட்சியில் இருந்தாலும்சரி, மக்களுக்கு ஏதாவது சேவை செய்யவேண்டுமென்ற நோக்கத்தோடுதான் நாங்கள் இருக்கின்றோம். அந்த அடிப்படையில், அரசாங்கத்தோடு பேசி வேலைகளைச் செய்கின்றோம். நீங்களும் அந்தத் திட்டத்திற்கு வாருங்கள்! எந்தநாளும் குறைகளைக் கூறிக்கொண்டிருப்ப தால் எதுவுமே நடக்கப்போவதில்லை.

அதற்குப் பிற்பாடு அவர், ஆளுநருடைய சிபாரிசின்பேரில் நுவரெலியா மாவட்டத்தில் இருக்கின்ற உள்ளூராட்சி மன்றங்களின் அபிவிருத்தி நடவடிக்கைகளை மேற்பார்வையிட நியமிக்கப்பட்ட இலங்கை தொழிலாளர் காங்கிரஸின் உறுப்பினர்கள் 7 பேரின் பெயர்களைக் கூறியிருந்தார். நுவரெலியா மாவட்டத்தில் 12 உள்ளூராட்சி மன்றங்கள் இருக்கின்றன. மிகுதி 5 பேருடைய பெயர்களையும் சொல்லியிருக்கலாமே! அவர்களின் பெயரைச் சொல்லப் பயம்! அதாவது, நுவரெலியாவில் 12 சபைகள் இருக்கின்றன. அதில் 7 சபைகள் இலங்கைத் தொழிலாளர் காங்கிரஸ் வசம் வருகின்றன; 5 சபைகள் மற்றைய பெரும்பான்மையினத்தவர் கள் வசம் உள்ளன. அவர்களின் பெயரை சொல்லமாட்டார்கள். ஆகவே, அதிலிருந்தே இவர்களுக்கு இலங்கைத் தொழிலாளர் காங்கிரஸ் ஏதாவது செய்தால் எவ்வளவு காழ்ப்புணர்ச்சி இருக்கின்றது என்பதை மக்கள் தெரிந்துகொள்ள வேண்டும்.

Governorஐப் பொறுத்தளவில் ஒவ்வொரு சபைக்கும் போய் அங்கு நடக்கின்ற வேலைகளைப் பார்க்க முடியாது. அதனால்தான் அவருடைய ஆலோசனைக்கு அமைவாக ஒவ்வொரு சபைக்கும் தலா ஒரு பிரதிநிதி நியமிக்கப்பட்டிருக் கின்றார். இந்த நியமனங்கள் அரசியல் நோக்கங்களுக்காக இல்லை. அவர்களுக்கு வாகனம் கொடுக்கவில்லை; எரிபொருள் கொடுக்கவில்லை. சம்பளம் கொடுக்கவில்லை. அவர்களை அங்கு நடைபெறுகின்ற அபிவிருத்தித்

திட்டங்களையும் மக்களுக்கு அன்றாடம் ஏற்படுகின்ற பிரச்சினைகளைப் பார்ப்பதற்காகவே நியமித்திருக்கின்றார். இதற்காக இவர்கள் அவர்களை வாழ்த்த வேண்டும். இன்றைக்குள்ள சூழ்நிலையில் இவ்வாறான நியமனங்கள் வழங்குகின்றபொழுது இவர்களும் சேர்ந்து ஒத்துழைக்க வேண்டும். இன்றைக்குப் பெருந்தோட்டத் தொழிலாளர்கள் 1,700 ரூபாய் சம்பளத்திற்குப் போராடுகின்றார்கள். Courtஇற்குப் போகுமாறு கம்பனிக்காரர்களுக்குச் சொல்லாமல், இவர்கள் ஒத்துழைக்க வேண்டும். அதைவிடுத்து, இலங்கைத் தொழிலாளர் காங்கிரஸ் ஏதாவது வாங்கிக் கொடுத்துவிட்டால், இவர்களுக்கு அது ஒரு பிரச்சினையாக இருக்கின்றது. அப்படியென்றால், எப்படி இந்த மக்கள் முன்னேறுவார்கள்? எப்படி இந்த மக்களைப் பற்றிப் பேசுவது?

நேற்று கௌரவ அமைச்சர் ஜீவன் தொண்டமான் அவர்கள் தோட்டத் தொழிலாளர்களைச் சிறுதோட்ட உரிமையாளர் ஆக்கவேண்டுமென்று சொன்னார். அவர் மாண்புமிகு ஜனாதிபதி அவர்களோடு பேசி அங்கு கிராமங்களை உருவாக்குவதற்கான ஒரு சந்தர்ப்பத்தை ஏற்படுத்தியிருக்கின்றார். அதற்கு எல்லோரும் சேர்ந்து ஒத்துழைக்காமல், ஐயோ! ஜீவன் தொண்டமான் வாங்கிக் கொடுத்தால், எங்களுடைய எதிர்கால அரசியல் எப்படிப் போகப்போகின் றது? என்று நினைக்கிறார்கள். பாராளுமன்றத்தில் பேசுவதாலோ, இலங்கைத் தொழிலாளர் காங்கிரஸைக் குறை சொல்வதாலோ மக்கள் வாக்களிக்கப்போவதில்லை. தேர்தல் வருகின்ற வேளை பாராளுமன்றத்திற்கோ, மாகாண சபைக்கோ, உள்ளூராட்சி மன்றங்களுக்கோ தாங்கள் தீர்மானித்து வாக்களித்தே மக்கள் ஒவ்வொருவரையும் அனுப்புகின்றார்கள்.

நான் ஏற்கெனவே குறிப்பிட்டதுபோல, கொட்டகலை சி.எல்.எப். வளாகம் என்பது யார் வேண்டுமானாலும் வந்து போகக்கூடிய இடம். எத்தனை கட்சித் தலைவர்கள் அங்கு வந்துபோயிருக்கிறார்கள்! எத்தனை துரைமார் வந்து போயிருக்கிறார்கள்! எத்தனை வெளிநாட்டுத் தூதுவர்கள் வந்து போகிறார்கள்! என்று அங்கிருக்கின்ற மக்களுக்குத் தெரியும். அதனால் துரைமாரைக் கூப்பிட்டு உங்கள் கட்சிக்காரரும் விருந்துபசாரம் செய்யலாம். பேச்சுவார்த்தை யென்றால் உங்களுடைய unionஇல் நூறு பேர்கூட இருக்க மாட்டார்கள். இலங்கைத் தொழிலாளர் காங்கிரஸைப் பொறுத்தமட்டில், ஆயிரக்கணக்கானவர்கள் இருக்கிறார்கள். அவர்களுக்கு அன்றாடம் பல பிரச்சினைகள் இருக்கும். நாங்கள் கொட்டகலையில் இருந்தால் கொட்டகலையில் பேச்சுவார்த்தை நடக்கும்; கொழும்பில் இருந்தால் தலைமைக் காரியாலயத்தில் பேச்சுவார்த்தை நடக்கும்; கண்டிக்குப் போனால் கண்டி மாவட்டத்தில் நடக்கும்; பதுளைக்குப் போனால் பதுளையில் நடக்கும். இதையெல்லாம் காழ்ப்புணர்ச்சியோடு பார்க்காமல், மக்களுக்குச் சேவைசெய்ய வேண்டும். மக்களுக்குச் செய்வதற்கு நிறைய வேலைத்திட்டங் கள் இருக்கின்றன. தோட்டத் தொழிலாளர் தொடர்பாக பாராளுமன்றத்தில் பேசுவதற்கு நிறைய விடயங்கள் இருக்கின் றன. இனிமேலாவது ஒருவரையொருவர் குறைசொல்லி அரசியல் நடத்துவதை விடுத்து, எல்லோரும் சேர்ந்து மக்களுக்குச் சேவை செய்ய வேண்டும். அப்போதுதான் எங்களுடைய மக்கள் முன்னேறுவார்கள் என்று கூறி, சந்தர்ப்பத்துக்கு நன்றிகூறி விடைபெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Dilip Wedaarachchi. You have seven minutes.

[අ.භා. 1.35]

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පළමුවෙන්ම මුදල් අමාත්‍යතුමාට යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමැතියි. බහුදින ධීවර යාත්‍රා 7,000ක් පමණ, ඒ වාගේම කුඩා outboard motor boats 60,000ක් පමණ යොදාගෙන මහ මුහුදේ ධීවර කර්මාන්තය කරන අපේ රටේ ධීවරයන් පිරිසගේ ආරක්ෂාව උදෙසා අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය දවසක වුණු මේ සිද්ධිය නැවත මම ඔබතුමන්ලාට මතක් කර දෙන්න කැමැතියි. පසුගිය දිනක තංගල්ල ධීවර වරායෙන් මුහුදු ගිය ඩෙල්ෆ්ට් 5 බහුදින ධීවර යාත්‍රාව ඒ.එස්.පී. ඩිලාන් සච්න්ත නැමති අයට අයිති ධීවර යාත්‍රාවක්. එම ධීවර යාත්‍රාවෙන් මුහුදු ගිය පිරිස මුහුදේ පාවෙමින් තිබූ යම් බෝතලයක තිබූ දියරයක් පානය කිරීම හේතුවෙන් අසාධ්‍ය තත්ත්වයට පත්වුණා. 2024.06.07වන දා තමයි මේ පිරිස ධීවර කටයුතු සඳහා මුහුදු ගියේ. 2024.06.28වන දින තමයි මේ සිද්ධිය සිදු වුණේ. මේ පිළිබඳව පසුවදා උදේ පාන්දර තංගල්ල රේඩියෝ මධ්‍යස්ථානයට දුරකථන පණිවුඩයක් ලැබුණා. ඒ අවස්ථාවේ බෝට්ටු හිමියන් සියලුදෙනාම ධීවර අමාත්‍යාංශයට මේ බව පැමිණිලි කළා. ධීවර ඇමතිතුමා එදා නිල්වැල්ලේ හිටපු නිසා එතුමාවත් හම්බ වෙන්න ගියා. මමත් එදා තංගල්ල දිස්ත්‍රික්කය ඇතුළේ හිටියේ. මමත් ධීවර ඇමතිතුමාට කථා කරලා මේ ප්‍රශ්නය ගැන කියලා, මේ අය ගෙන්වාගන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා ඉල්ලීමක් කළා. නමුත්, ඒ කිසි දෙයක් සිද්ධ වුණේ නැහැ. හතරදෙනෙක් ඒ ධීවර යාත්‍රාව තුළ මිය ගිහිල්ලා තිබුණා. ඒ ආසන්නයේ ගමන් කළ වෙළෙඳ නෞකාවකින් ඉතිරි ධීවරයන් දෙදෙනා බේරා ගෙන මහදී නාවික හමුදාවේ නෞකාවකට භාර දීමෙන් අනතුරුව හම්බන්තොට වරායට රැගෙන ආවා. එහිදීත් එක් අයෙකු මිය ගියා. එක් අයෙකුගේ විතරක් ජීවිතය බේරුණා. මේ සිදුවීම නිසා ධීවරයන් හය දෙනෙකුගෙන් පස් දෙනෙකුම ජීවිතක්ෂයට පත් වුණා.

පසුගිය යහ පාලන කාලයේ දී නම් මෙවැනි ආපදාවක් වුණාම අපි කථා කරලා නාවික හමුදාවේ නැවක් ඒ ස්ථානයට යැව්වා. කුඩා බෝට්ටුවක් මුහුදේ දී අසරණ වුණු වෙලාවලදී අපි හෙලිකොප්ටරයක් යවලා, ඒ ගැන සොයා බලා ඒ බෝට්ටු ගොඩබිමට ගෙනෙන්න අවශ්‍ය කටයුතු කළා. ඒ ජීවිත බේරා ගන්න උත්සාහ කළා. නමුත්, අද ඒ කිසිම දෙයක් මේ රජයෙන්, ධීවර අමාත්‍යාංශයෙන් ඉෂ්ට වුණේ නැහැ. මහ මුහුදේ බෝට්ටු 7,000ක විතර -5,000කට වඩා- ධීවර කර්මාන්තය කරන ධීවරයෝ ඉන්නවා. මේ අයගේ ජීවිත ආරක්ෂා කර ගන්න ඕනෑ. ඔවුන්ට හදිසි ආපදාවක් සිදු වුණාම ගොඩබිමට රැගෙන එන්න විධියක් නැහැ. ඔවුන් හෘදයාබාධවලට ලක් වෙන්න පුළුවන්; මීමැස්මෝරය, වලිප්පුව වැනි රෝගී තත්ත්වයන්ට ලක් වෙන්න පුළුවන්. මුහුදේදී තවත් බෝට්ටු එක්ක ආරවුල් ඇති කර ගන්නවා. විදේශීය නැව්වලින් ඇවිල්ලා අපේ බෝට්ටුවලට ගහනවා. තුවාල වුණාම ඒ මිනිස්සු ගොඩබිමට ගෙනෙන්න විධියක් නැහැ. මෙම සිද්ධිය සිදු වූ බෝට්ටුව නාවික සැතපුම් 350කටත් එපිට මුහුදේ තිබුණේ. නාවික හමුදාවට අයිතිය තිබෙන ශ්‍රී ලංකාවේ මුහුදු සීමාව සැතපුම් 200යි. ඒ නිසා අපට මොවුන්ව ගෙන්වා ගන්න බැරි වුණා.

යහ පාලන ආණ්ඩුව කාලයේ දී මේ සම්බන්ධයෙන් අපි යෝජනාවක් ඉදිරිපත් කළා. අපේ ධීවර ජනතාව ගලවා ගැනීම සඳහා high-speed ambulance boats දෙකක් ධීවර අමාත්‍යාංශයට

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

ලබා දීලා නාවික හමුදාව හරහා ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න මුදල් වෙන් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේ සඳහා ධීවර අමාත්‍යාංශයට මුදල් වෙන් කර නැහැ, ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි.

මේ high-speed ambulance boats දෙක තිබුණා නම් පසුගිය දිනවල නැති වූ ජීවිත බේරා ගන්න අපට අවස්ථාවක් තිබුණා. සාමාන්‍යයෙන් එම යාත්‍රාවක් පැයට සැතපුම් 40ක පමණ වේගයෙන් යනවා. එහෙම නම් ඒ නාවික සැතපුම් 350 යන්න පැය 7ක් පමණ තමයි ගත වෙන්නේ. අපට ඒ රෝගීන් අරගෙන ඇවිල්ලා ප්‍රතිකාර කරලා ඔවුන් බේරා ගන්න තිබුණා. නමුත්, ඔවුන් බේරා ගන්න අපට බැරි වුණා. යහ පාලන ආණ්ඩුව කාලයේ එවැනි යාත්‍රා තුනක් ගන්න මම යෝජනාවක් ඉදිරිපත් කළා. එතකොට ගරු මහින්ද අමරවීර මැතිතුමා ධීවර විෂයය භාරව හිටියේ නැහැ. එතකොට කැබිනට් ඇමතිවරයා හැටියට හිටියේ ගරු පී. හැරිසන් මැතිතුමා. කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය ධුරය දැරුවේ පී. හැරිසන් මැතිතුමා. එතුමා මේවා ගැන දන්නේ නැහැ. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට ඇස්තමේන්තු ඉදිරිපත් කරලා ඩොලර් මිලියන 24කට එම බෝට්ටු තුන ගන්න සැලසුම් කරලා තිබුණේ. එතකොට NARA එකේ හිටියේ එම්.කේ. රණවක කියලා මගේ හිතවතෙක්. එතුමා සැලසුම් කළා, ඩොලර් මිලියන 10කට එම ආයතනයෙන් බෝට්ටු දෙකක් හදන්න. නමුත්, ඒ බෝට්ටු දෙක හදන්න අපට ඉඩ දුන්නේ නැහැ, නොතේරෙන ඇමතිවරයෙක් හිටපු නිසා. ඒ නිසා තමයි අද මහ මුහුදේ ධීවරයෝ මැරෙන්නේ.

මේ වන විට හම්බන්තොට වරායෙන් මුහුදු ගිය පොඩි බෝට්ටුවක් දින තුන හතරක් ගත වෙලාත් තවම ඇවිල්ලා නැහැ. අද වෙනකොටත් ඒ බෝට්ටුව හොයා ගන්න බැහැ. මහ මුහුදේ ඉන්න අතරේ හදවත් රෝගය හැදුණාම, ගොඩබිමට ගේන්න විධියක් නැතිකම නිසා මාසයකට ධීවරයන් එක්කෙනෙක්, දෙන්නෙක් මැරෙනවා. ඒ වාගේ තත්ත්වයක් අද තිබෙනවා. රජයෙන් ඒ ගැන බලන්නේ නැහැ. ධීවර කර්මාන්තය කියන්නේ, රටට ආදායම් උත්පාදනය කර දෙන කර්මාන්තයක්. ඒ වාගේම රටේ ජනතාවට ප්‍රෝටීන් බහුල ආහාරයක් වන මසුන් පරිභෝජනයට ලබා දෙන කර්මාන්තයක්. මහ මුහුදේ බහුදින ධීවර යාත්‍රා 7,000ක් පමණ ධීවර රැකියාව කරනවා. ඒ හැම බෝට්ටු හිමියාගෙන්ම බදු - tax - අය කරනවා. ඒ වාගේම වරාය බදු ඇතුළු සෑම බද්දක්ම ධීවරයන්ගෙන් අය කරනවා. එහෙම නම් ධීවරයන්ට මේ සහනය ලබා දෙන්න බැරි ඇයි? මහ මුහුදත් එක්ක සටන් කරන ධීවරයන් හදිසි ආපදාවකදී ගොඩබිමට ගෙනෙන්න high-speed ambulance boats දෙකක් ලබා දෙන්න කියලා මුදල් ඇමතිවරයා වන ජනාධිපතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. අහිංසක ධීවරයන් වෙනුවෙන් මේ දේ ඉෂ්ට කරලා දෙන්න. ඒ යාත්‍රා තිබුණා නම් පසුගිය දිනවල නැති වූ අහිංසක ධීවරයන්ගේ ජීවිත අපට බේරා ගන්න තිබුණා. අද නාවික හමුදාවට කිව්වාට ඔවුන් යාත්‍රා යවන්නේත් නැහැ, ධීවර අමාත්‍යාංශයට කිව්වාට ඔවුන් යවන්නේත් නැහැ, ගුවන් හමුදාවට කිව්වාට ඔවුන් යවන්නේත් නැහැ. මේවාට උපදෙස් දෙන්න, අනුබල දෙන්න බලධාරියෙක් නැහැ, නායකයෙක් නැහැ. ඒ නිසා තමයි ධීවරයන් මහ මුහුදේ ඉන්න අතර අසනීප වුණාම මැරෙන්නේ. ඊට පස්සේ ගොඩබිමට ගෙනෙන්නේ ඔවුන්ගේ මළ කඳන්. දවස් 7ක් ගියා, ඒ මරණ ගොඩබිමට ගෙනෙන්න. අපට high-speed ambulance boats තිබුණා නම් පැය 7න් ගොඩබිමට රැගෙන ඇවිත් ඒ ජීවිත බේරාගන්න තිබුණු අවස්ථාව නැති වුණා. මළ කඳන් හතර බෝට්ටුවේ දාගෙන තංගල්ලට අරගෙන එන්න දවස් 7ක් ගත වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

රටේ දියුණු තත්ත්වයක් තිබෙන අවස්ථාවකදීත්, ලංකාව හතර වටේම මහ මුහුදු තිබුණත්, ආපදාවකදී ධීවරයන්ව බේරාගන්න ගැලවුම් යාත්‍රාවක් අපට නැහැ කියනකොට අපි මොනවා කරන්නද? ගරු මුදල් ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, සල්ලි වෙන් කරලා මේ යාත්‍රා දෙකක් ලබා ගන්න කියලා. එහෙම නැත්නම් විදේශීය රටවල් එක්ක සාකච්ඡා කරලා හෝ ඒවා ලබා ගන්න කියලා. විදේශීය රටවලින් මේවාට ආධාර ලබා දෙනවා; යාත්‍රා ලබා දෙනවා. මොන යම් ක්‍රමයකින් හෝ ඒ යාත්‍රා ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේදී කාරුණිකව ඉල්ලා සිටිනවා. මිය ගිය අපේ ධීවරයන් සියලුදෙනාට නිවන් සුව අත්වේවා කියා මා මේ වෙලාවේ ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Shehan Semasinghe. You have 19 minutes.

[අ.භා. 1.43]

ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයත්, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයත් විසින් ඉදිරිපත් කරන ලද නිවේදන, රෙගුලාසි සහ නියම පිළිබඳව අපි සාකච්ඡා කරනවා. ඒ පිළිබඳව අදහස් දක්වන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම අද උදේ මේ ගරු සභාවේදී මතු වුණු කාරණයක් පිළිබඳව පැහැදිලි කරන්න මා බලාපොරොත්තු වෙනවා. උදේ ප්‍රශ්නයක් මතු කළා, මේ සමස්ත ආර්ථික ක්‍රියාවලිය තුළ විශ්‍රාම අරමුදල්වලට ප්‍රතිලාභ ලබා දෙන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව. විශේෂයෙන්ම එතැනදී කිව්වේ, දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය හරහා සියයට 12ක් ලබා දෙන්න කටයුතු කරනවා කියලා රජය හැටියට අපි පොරොන්දුවක් වුණා කියලායි. අපි සියයට 12ක් ලබා දෙන්න පොරොන්දු වුණා නම්, මේ වෙනකොට ඒ පොරොන්දුව ඉටු කරලා තිබෙනවා. අපි එය සියයට 13ක් දක්වා පරිවර්තනය කරලා තිබෙනවා. ඒක තමයි මුලින්ම මට කියන්න ඕනෑ වුණේ. මා මිත්‍ර ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේ වෙලාවේ ගරු සභාවේ නැහැ. නමුත්, මම මේ කාරණා කියන්න ඕනෑ.

ඊළඟට එතුමා කිව්වා, සියයට 9ක් නොවෙයි, සියයට 12ක් රජය ලබා දෙන්න කටයුතු කරනවා කියන එක ගැන. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරන අවස්ථාවේ මේ රටේ ණය තිරසරභාවයක් ඇති කරන්න - ණය ගෙවන්න පුළුවන් පරිසරයක් හදාගන්න- අවශ්‍ය වාතාවරණය ගොඩ නඟද්දී ඉදිරිපත් කරපු යෝජනාවලිය මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශ්‍රාමික අරමුදල්වලට - superannuation fundsවලට - මේ ප්‍රතිව්‍යුහගතකරණය ප්‍රධාන වශයෙන් ආකාර තුනකින් සම්බන්ධ වීම ගැන කථා කළා. එකක් තමයි, යෝජනා කරපු ණය ප්‍රතිව්‍යුහගතකරණයට එකඟතාව පළ කිරීම. එහෙම වුණා නම් සියයට 9.1ක් තමයි ඒ අරමුදල්වලට පොලිය හැටියට ලැබෙන්නේ. එහෙම සම්බන්ධ නොවුණොත් ඇති වන තත්ත්වය අපි බලමු. සම්බන්ධ නොවුණොත් ආදායම් බදු ගෙවන ප්‍රමාණය සියයට 30 දක්වා වැඩි වෙනවා. ඒ අනුව ඔවුන්ට ලැබෙන පොලී අනුපාතය සියයට 7.7 දක්වා අඩු වෙනවා. තුන්වැනි ආකාරය තමයි, මේ තිබෙන ආකාරයටම සියයට 14ක ආදායම් බදු ප්‍රමාණය රඳවා ගෙන යෑම. එහෙම වුණොත් සියයට 9.4ක පොලියක් ලැබෙනවා. මේ කාරණාව තමයි මේ පාර්ලිමේන්තුව අනුමත කළේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මීට අදාළ ලේඛනය සභාගත කළා. මේ විධියට හැම දෙයම පෙනෙන්න තිබියදී, ලේඛනගත වෙලා තිබියදී මේ රටේ ජනතාව නොමඟ යවන්න කටයුතු කිරීම වැරදියි. මම දන්නේ නැහැ, මගේ මිත්‍රයා කොහොමද ඒකට සම්බන්ධ වුණේ කියලා. මේ විධියට ඇත්ත දැක දැක, ඇත්ත පෙනි පෙනී ඒක බොරුවක් හැටියට දකින මිනිස්සුන්ට ගමේ ගොඩේදි නම් කියනවා, මොළේ කුලප්පු වෙච්ච අය කියලා. මම දන්නේ නැහැ, ආර්ථිකය පිළිබඳව දැනුමක් තිබෙන සමහර උගත් මන්ත්‍රීතුමන්ලා මොළේ කුලප්පු වෙච්ච විධියට කථා කරන්නේ ඇයි කියලා. එතැන ප්‍රශ්නය තිබුණේ සියයට 9යි, සියයට 13යි අතර කියන පිළිගැනීම ගැන නොවෙයි. ඔවුන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනට මේ සහාව තුළ එකඟතාව පළ නොකිරීම, ඒ වෙලාවේ ඊට පක්ෂව ඡන්දය ලබා නොදීම සම්බන්ධයෙන් ඔවුන්ගේ හෘදය සාක්ෂිය අද ඔවුන්ට වෛර කරනවා. 2022දී සිදු වූ කඩා වැටීමේ ඉඳලා 2024 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ -අවුරුදු දෙකයි, මාස දෙකක් ඇතුළත- මේ රට ආර්ථිකමය වශයෙන් යථා තත්ත්වයට පත්වීම සම්බන්ධයෙන් ගතයුතු නිවැරැදි ක්‍රියාමාර්ගවලට අනුමැතිය දීමට ඡන්දය ලබා නොදුන් මන්ත්‍රීවරුන්ගේ වෛරී දේශපාලනයට විරුද්ධව අද ඔවුන්ගේ හෘදය සාක්ෂියම කථා කරනවා.

අපි දේශීය ණය ප්‍රතිව්‍යුහගත නොකළා නම් අපට විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයකට යන්න බැහැ. එතැනදීත් මෙතුමන්ලා දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයට විරුද්ධව ඡන්දය දුන්නා. ඇයි, එහෙම කළේ? ඔවුන්ගේ දේශපාලන අරමුණක් ඉටුකර ගන්න මේ රටේ ජනතාව අවුරුදු දෙකහමාරක් ගින්දරේ තියන්නයි ඔවුන් කටයුතු කළේ; සැලසුම් කරගෙන හිටියේ. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා සහ රජය පත්වන්නේ ජූලි මාසයේදී විතර. තවම මේ රටේ ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත් වෙලා නැහැ. තෙල් නැති, විදුලිය නැති, බෙහෙත් නැති, උයාගන්න ගෑස් ටික නැති, සංචාරකයන් එන්නේ නැති රටක් බවට 2022දී ලංකාව පත් වෙනවා. ඩොලරය එක්තරා මට්ටමකට තීන්දු කරලා, ඒ අනුව මේ රටට විදේශ විනිමය එන්නේ නැති වෙන්න, ඩොලරයට සාපේක්ෂව රුපියල 450, 550 දක්වා කඩා වැටෙන්න, සියයට 70ක උද්ධමනයක් පවත්වාගෙන යන්න උදවු කරපු අයගේ හෘදය සාක්ෂිය අද ඔවුන්ටම විරුද්ධව ක්‍රියාත්මක වෙන්න පටන් අරගෙන තිබෙනවා.

ඒකයි එදා විරුද්ධ වුණත්, විරුද්ධ නොවුණා සේ අද මේ පාර්ලිමේන්තුව තුළ රහ දක්වන්න උත්සාහ කරන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ මේ වැඩ පිළිවෙළට සහයෝගය නොදක්වපු අය තමයි අද මේ එක එක දේවල් කියන්නේ. ඇත්තටම මම මේ කථාව හදවතින්ම කරන්නේ මෙතැනට එන්න, රට ගොඩනහන්න කොච්චර අමාරු වුණාද කියන කාරණය පිළිබඳ අවබෝධයත් එක්කයි. මේ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ ඉඳලා හැම දෙයටම විරුද්ධවීම රටක් පාලනය කිරීමේදී දක්වන දක්ෂතාවක්වත්, වීරත්වයක්වත් නොවෙයි. ඒ අයගේ බියගුලුභාවය තමයි මේ අවස්ථාවේදී පෙන්නුම් කළේ. රටේ කිසිම දෙයක් සිදු වෙලා නැහැ. සිද්ධිය වෙලා ඉවරයි. ඒකට කවුද වග කියන්න ඕනෑ කියන කාරණය වෙනම දෙයක්. හැබැයි, රටේ මිලියන 22ක ජනතාව ජීවත් කරන්න තීන්දු-තීරණ ගත යුතුයි. තමන්ගේ නිරුවත අත් දෙකෙන් වහ ගන්න උත්සාහ කරපු විපක්ෂයක් තමයි මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ. මම මීට කලිනුත් මෙක කියා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාත්‍යන්තර වශයෙන් ගත්තාම හැම රටක්ම අපේ රටට උදවු කළා. එක රටකට නොදෙවැනි වෙන්න හැම රටක්ම ශ්‍රී ලංකාව වෙනුවෙන් සහ මේ රටේ ජනතාව වෙනුවෙන් පෙරට ආවා. හැබැයි, කනගාටුවට කාරණය මෙයයි. තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය පැත්තකින් තියලා, තමන් ඇතුළුව සමස්ත රටේම ජනතාව දුක් විඳිද්දී, මෙන්න මේ ගරු සභාවට ඇවිල්ලා කෙටි කාලීනව මේ ආර්ථික අර්බුදයෙන් ගොඩගන්න රටට උදවු කරන්න අපේ රටේ විපක්ෂයට බැරි වුණු බව මම නැවතත් කියනවා. ඒක නොකර අද ඔවුන්ගේ හෘදය සාක්ෂිය ඔවුන්ට විරුද්ධව වෛර කරනකොට ඒකට මේ ගරු සභාවට ඇවිල්ලා අසත්‍ය කියලා හරියන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ණය ප්‍රතිව්‍යුහගතකරණයකට ගියා. ණය ප්‍රතිව්‍යුහගතකරණය අත්‍යවශ්‍ය කාරණයක්. ඒ සම්බන්ධයෙන් තර්ක දෙකක් නැහැ. ණය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා අපි නිල ණය හිමියන් සමඟ ජූනි මාසයේ 26වෙනි දා ප්‍රංශයේ පැරිස් නුවරදී අවබෝධතා ගිවිසුම් අත්සන් කරන්න පටන් ගත්තා. ඒ අවබෝධතා ගිවිසුම් අත්සන් කරලා ඔවුන් විසින් විශේෂයෙන්ම OCC - Official Creditor Committee - එක ගත යුතු පරිපාලනමය කටයුතු අවසාන වුණාට පස්සේ ජනාධිපතිතුමා පොරොන්දු වුණා වාගේ අපි ඉක්මනින්ම ඒ ගිවිසුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. හැබැයි, අපට තව සම්පූර්ණ කළ යුතු, නිල ණය හිමියන්ගේ කම්ටුව සම්පූර්ණ කළ යුතු ඔවුන්ගේ අභ්‍යන්තර පරිපාලනමය කටයුතු කිහිපයක් තිබෙනවා. ඒ කටයුතු අවසාන වුණාම අපට ඒ ගිවිසුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන්. අපට හංගන්න දෙයක් නැහැ. ද්විපාර්ශ්වික ණය හිමියන් කටයුතු කරන්නේ එක විධියකට; වාණිජමය ණය හිමියන් කටයුතු කරන්නේ තව විධියකට. අපි අඩු ආදායම්ලාභී රටක් හැටියට නොවෙයි, ණය ප්‍රතිව්‍යුහගතකරණයකට යන්නේ. මැදි ආදායම්ලාභී රටක් හැටියටයි අපි ණය ප්‍රතිව්‍යුහගතකරණයකට යන්නේ. එතකොට ඇති වන ක්‍රියාකාරිත්වය වෙනස්. අපට පුළුවන් වුණා, 2023 මාර්තු මාසයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතියත් එක්ක ප්‍රථම වතාවට ඉදිරිපත් කරපු ණය තිරසරභාවය සම්බන්ධයෙන් වූ විශ්ලේෂණය පදනම් කරගෙන පළමුවෙනි review එකට පස්සේ ඒකේ සිදුවෙන upgrade වීම සලකා බලා හැමෝම පිළිගන්නා පොදු රාමුවකට එකඟ වෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුව ණය ප්‍රතිව්‍යුහගතකරණයකට නොගියා නම්, අනුමැතිය ලබා නොදුන්නා නම්, මේ රටේ තත්ත්වය 2022ට වඩා බොහොම බරපතළ තැනක තිබෙන්න තිබුණා. අපි මේ ණය ප්‍රතිව්‍යුහගතකරණය ඇතුළු සමස්ත වැඩසටහන ක්‍රියාත්මක කරද්දී අපට චෝදනා කළා.

මේ චෝදනාව එල්ල කරපු අයගෙන් මම මේ කාරණය අහන්න කැමතියි. අපි මේ සම්පූර්ණ ආර්ථිකය යාවත්කාලීන කරලා, ගුණාත්මක ක්‍රමවේද තුළ ඉස්සරහට යද්දී, මේ ප්‍රතිසංස්කරණ - මේ reform agenda එක - හරහා ඇති වෙන පීඩනය පිළිබඳව තමයි ඔවුන් අපට මේ චෝදනාව එල්ල කළේ. එවැනි පීඩනයක් තිබෙන බව අපි පිළිගත්තා. අවුරුදු 20කට කලින් කරන්න ඕනෑ ආර්ථිකමය සහ අනෙකුත් ප්‍රතිසංස්කරණ,

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

විශේෂයෙන්ම පාලනය, දූෂණය නැවැත්වීම වාගේ ප්‍රතිසංස්කරණ, 2000 අවුරුද්දේ මුල වෙන්න ඕනෑ දේවල් 2024දී අපි හොඳටම කඩාගෙන වැටිලා සිටියදී නම් වෙන්නේ, එයින් ඇති වෙන පීඩනය පිළිබඳව අප රටට කිව්වා; ජනතාවට කිව්වා. හැබැයි, ඒ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අවතක්සේරු කරපු විපක්ෂය අපට උත්තරයක් දෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. සියයට 70ක උද්ධමනයක් රටක තිබෙද්දී රටේ ජනතාවගේ වත්කම්වලට මොකක්ද වෙන්නේ? මොකක්ද රටේ ජනතාවගේ වත්කම්වල වටිනාකමට වෙන්නේ? සියයට 70-80 උද්ධමනය සියයට 90-100ට ගියොත් එහෙම වත්කම්වලට ඇති වෙන බලපෑම මොන වාගේද? මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හරහා අද වනකොට සියයට 1.7ක් දක්වා ශ්‍රී ලංකාවේ ආර්ථික උද්ධමනය පාලනය කර ගන්න මහ බැංකුවටත්, රජයටත් පුළුවන් වුණු බව මම කියන්න ඕනෑ. අමතක කරන්න එපා, එදා උද්ධමනය සියයට 70ක් බව. අපි ඒ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට නොගියා නම් අද වනකොට මේ රටේ උද්ධමනය අහස උසට ගිහින්. එහෙම වුණා නම් මොකක්ද වෙන්නේ, තමන් ගන්නා වැටුපට? එහෙම වුණා නම් මොනවාද වෙන්නේ, තමන් සතු දේපළවලට? තමන් කරන ව්‍යාපාරයට මොකද වෙන්නේ? තමන්ගේ ආදායමට මොකද වෙන්නේ? මෙන්න මේ ගැන කල්පනා කරන්න. එදා සියයට 70ක පැවති උද්ධමනය සියයට 1.7ට ගෙනෙන්න, එහෙම නැත්නම් වාර්ෂිකව සියයට 5ක මට්ටමේ පවත්වාගෙන යන්න තමයි මේ ප්‍රතිසංස්කරණ කළේ. ඒකේ ප්‍රතිඵල අද වනකොට ලැබෙනවා. හැබැයි, තවත් ප්‍රතිඵල ලැබෙන්න යම්කිසි කාල පරිච්ඡේදයක් ගත වෙනවා.

මේ පාර්ලිමේන්තුවේදී දිගටම කිව්ව කාරණා කිහිපයක් තිබුණා. ඝාතාව දෙස බලන්න කිව්වා, උදාහරණයක් හැටියට. ඝාතාව මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළා; ආර්ථික පරිවර්තනයකට ගියා; ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මැයි මාසයේදී ඝාතාවේ උද්ධමනය සියයට 23යි. ජූනි මාසයේදී සැම්බියාවේ උද්ධමනය සියයට 15.2යි. සුරිනාම්හි උද්ධමනය සියයට 23යි. ඒ රටවලට බැරි වෙලා තිබෙනවා, අපි ලබා ගත්තා වාගේ කෙටි කාලයක් තුළ ප්‍රගතියක් ලබා ගන්න. හැබැයි, ඔවුනුත් ප්‍රගතියක් ලබාගෙන තිබෙනවා. ඊළඟට, උපරිම උත්සාහයක් දැරුවත් ලෙබනනයේ තවම උද්ධමනය සියයට 52යි. වෙනිසියුලාවේ උද්ධමනය සියයට 59යි, මැයි මාසය වෙද්දී. ඊළඟට, ආර්ජන්ටිනාව ගැන තමයි වැඩියෙන්ම කථා කළේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආර්ජන්ටිනාවේ උද්ධමනය සියයට 276යි. ඔවුන් කෙටි කාලයක් තුළ වාණිජමය ණය හිමියන් සමඟ ප්‍රතිව්‍යුහගතකරණයකට එකඟ වුණාට, ඔවුන්ට අවුරුදු තුනකට ආසන්න කාලයක් ගත වුණා, Paris Club එකත් එක්ක - පැරිස් සමාජයේ රටවල් එක්ක - ඒ ප්‍රතිව්‍යුහගතකරණයේ එකඟතාවලට පැමිණෙන්න. නමුත්, අපට ගත වුණේ මාස 15ක කාලයක්, Debt Sustainability Analysis එක ඉදිරිපත් කළාට පස්සේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට, නිල ණය හිමියන්ගේ කමිටුව - OCC එක - ණය හිමියන් අතර සමානාත්මතාව පිළිබඳ අවශ්‍ය විශ්ලේෂණයන් කිරීමට නිල වශයෙන් ඉල්ලුවා. අද වනවිට ඒ වැඩ කටයුතු සිදු වෙමින් පවතිනවා. අපට පුළුවන් වෙයි, ඒ පිළිබඳව ඔවුන්ගේ අදහස් දැනගන්න. ඊළඟට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ණය තිරසරභාවයේ විශ්ලේෂණයට අදාළව කොතෙක් දුරට පෞද්ගලික බැඳුම්කර හිමියන් එක්ක ඇති එකඟතා ගැළපෙනවාද කියන කාරණය විශ්ලේෂණය කරලා, අපට ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළ යුතුයි. එහෙම වුණාම තමයි අපට අවසාන වශයෙන් ප්‍රතිපත්තිමය එකඟතාවකට - Agreement in Principle - එන්න පුළුවන් වන්නේ. අපි මූලික එකඟතාවලට ඇවිල්ලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, you have two more minutes.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I might need another two minutes. You can reduce that from the time allotted to our side.

මේ අතරතුර තමයි මහ විශාල වැඩ වර්ජන රැල්ලක් රටේ ක්‍රියාත්මක කරන්නේ. ඒක පැහැදිලිවම ජනතා විමුක්ති පෙරමුණත්, සමගි ජන බලවේගයත් නායකත්වය දීලා සිදු කරනවා. මේ රටේ වැඩ වර්ජන රැල්ල පිටුපස ඉන්නේ සමගි ජන බලවේගය හා ජනතා විමුක්ති පෙරමුණයි. මේ කරන්නේ මේ ගොඩනැඟෙන ආර්ථිකයේ කඩා වැටීමක් අරගෙන ඔවුන්ට දේශපාලන වාසියක් ගන්න පුළුවන් ද කියලා බලන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කරන ඉල්ලීම් ලබා දෙන්න නම්, අපට වාර්ෂිකව බිලියන 275-300 අතර ප්‍රමාණයක් අමතරව ඕනෑ වෙනවා. අපි කොහෙන්ද, මේක පියවා ගන්නේ? එක විකල්පයක් තමයි VAT වැඩි කිරීම. එහෙම වුණොත් VAT සියයට 21ක්, 22ක් දක්වා වැඩි කරන්න ඕනෑ. මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළත්, මේ ආර්ථික කඩා වැටීම තුළත් VAT සියයට 22ක් දක්වා වැඩි කරන්න මේ රටේ ජනතාව සූදානම්ද? ඒ අයට පුළුවන්ද, මේක උහුලා ගන්න? ඒ අයට ඒක කරන්න බැහැ. මේ රටේ ජනතාවට ඒක විඳගන්න බැහැ. අනෙක් විකල්පය තමයි ආයතනික බද්ද - Corporate Tax එක - සියයට 42ක් කරන එක. එය සියයට 30 සිට 42 දක්වා වැඩි කරන්න ඕනෑ. එහෙම වුණොත් මේ රටේ පෞද්ගලික අංශයක් ඉතුරු වෙන්නේ නැහැ නේ; රැකියාත් නැති වෙනවා නේ. කරන්න පුළුවන් දෙයක් ද, මේක? මේ රටේ ජනතාව තවදුරටත් මේවා විඳ දරා ගන්න සූදානම්ද? ඒ නිසා තමයි මේක අපි ඊට කලින් දැක්කේ. ජනාධිපතිතුමා මේ සම්බන්ධයෙන් විශේෂයෙන් මේ අවුරුද්දේ මුල සිටම වැඩ කටයුතු කරමින් පවතින්නේ. මේ අය ඒකත් දන්නවා. ලබන අවුරුද්ද වනවිට වැටුප් විෂමතා ඉවත් කරන්න, ඊළඟට සාධාරණ වැටුපක් වෙනුවෙන් රාජ්‍ය සේවය අරගෙන යන්න රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා කටයුතු කරනවා කියන එක හොඳටම දන්නවා. ඒක ක්‍රමවත්ව සිදු විය යුතුයි. ඒක මෙතෙක් වුණා වාගේ මේ රටේ *ad hoc* විධියට වෙන්න බැහැ. එහෙම *ad hoc* විධියට කරන්න ගිහිල්ලා, එක එක්කෙනාගේ බලපෑම් මත කරන්න ගිහිල්ලා තමයි අපි 2022දී අර්බුදයකට මුහුණ දුන්නේ. ඒ නිසා නැවත අර්බුදයකට යන තීන්දු ගන්න අපට බැහැ. මේ වැටුප් පිළිබඳ වර්තාව එයි. ඒක සමාලෝචනය කරලා, ඒ පිළිබඳ අවශ්‍ය තොරතුරු ටික රැස්කරලා, විෂමතා ඉවත් කරලා ලබන අවුරුද්දේ නැවත රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීමක් පිළිබඳව එතුමා කථා කරනවා. එහෙම නැත්නම් අනෙක් විකල්පය තමයි අපේ රාජ්‍ය සේවය rightsize කරන එක.

අපේ රාජ්‍ය සේවය rightsize කළොත් මොකද වෙන්නේ? මොකද, විපක්ෂයත්, ජනතාවත් කියනවා, අපේ රාජ්‍ය සේවයේ සිටින පිරිස වැඩියි කියලා. අපි මේ ප්‍රමාණය අඩු කරන්න ගියොත් මොකද වෙන්නේ? කීදෙනෙකුගේ රක්ෂා නැති වෙනවාද? එතකොට මොකක්ද මේ විපක්ෂය එකතු වෙලා කරන්නේ? ජනතා විමුක්ති පෙරමුණයි, සමගි ජන බලවේගයයි එකතු වෙලා කරන්නේ මොකක්ද? එකක් තමයි, දැනට සිටින රාජ්‍ය සේවකයන්ගෙන් කොටසකට රැකියා අහිමි කරන්නයි යෝජනා කර තිබෙන්නේ. දෙවනුවට මේ රටේ පෞද්ගලික අංශය සම්පූර්ණයෙන්ම හාන්සි කරලා, විනාශ කරලා Corporate Tax එක සියයට 42ට වැඩි කරන්න තමයි යෝජනා කර තිබෙන්නේ.

ඊළඟට, මේ රටේ හැම කෙනාටම බලපෑමක් ඇති වන VAT එක සියයට 22 දක්වා වැඩි කරලා ජනතාවට ජීවත් වෙන්න තවත් අමාරු පරිසරයක් හදන එක කරන්නේ. මේ සම්බන්ධව රජයට වගකීමක් තිබෙනවා. ජවිපෙටයි, සමගි ජන බලවේගයටයි ඕනෑ විධියට ආණ්ඩුවක් කරන්න බැහැ. එහෙම කරන්න ඕනෑ නම්, ඒ අය එදා පැනලා දුවන්නේ නැතුව, බලය නොගන්නට නිදහසට කරුණු කියන්නේ නැතුව බලය ගන්න තිබුණා. එහෙම අරගෙන මේවා කරන්න තිබුණා. අපි බලය ගත්තා විතරක් නොවෙයි, ඒ හරහා ජනතාව බලාපොරොත්තු වුණු දේ ඉටු කළා. ඒ අනුව අද වනවිට ණය ප්‍රතිව්‍යුහගතකරණය අවසාන වෙනවා; ව්‍යාපෘති ආරම්භ වීම සිදු වෙනවා. පහළම තලයට ඒ ආදායම් ගලා යාම සිදු වේවි, අපේ ගම් මට්ටමේ ආර්ථිකය මීට වඩා ශක්තිමත් වීම ආරම්භ වේවි. මේවා තමයි මේ නවත්වන්න යන්නේ. සාමාන්‍ය ජන ජීවිතයකට ජනතාව යොමු වීම මැතිවරණය තෙක් කඩාකප්පල් කිරීමේ කුහක, ඒ වාගේම දේශද්‍රෝහී අරමුණු ඔස්සේ තමයි සමගි ජන බලවේගයයි, ජනතා විමුක්ති පෙරමුණයි කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඉතාම අවංකවයි මේවා කියන්නේ. අපිට මෙතැනට එන එක ලෙහෙසි වුණේ නැහැ. මේ වෙනුවෙන් පෙනී සිටි මන්ත්‍රීවරුන්ට මොනවාද නොකිව්වේ? ඒ හැම මන්ත්‍රීවරයෙකුටම තර්ජනය කළා, ඔවුන්ගේ ජීවිතයෙන් පවා වන්දි ගෙවන්න වෙයි කියලා.

හැබැයි, වාසනාවකට මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 115ක්, 120ක් සිටියා, මේ පරිවර්තනය සඳහා අවශ්‍ය අණපනත් සම්මත කරලා, ක්‍රියාවලිය සම්මත කරලා මේ රටේ ජනතාවට ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් හදන්න.

ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත ද අපි හැකි ඉක්මනින් පාර්ලිමේන්තුවට ගේන්න කටයුතු කරන බවත් මම කියන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආර්ථික පරිවර්තන පනතේ අවශ්‍ය කොටස් අපේ රටේ ආර්ථික විද්‍යාව පිළිබඳ විෂය ධාරාවලට ඇතුළත් කිරීමත් මේ රට තුළ නැවත ආර්ථික පරිහානියක් ඇති නොවෙන්න ප්‍රධාන හේතුවක් බවට පත් වෙයි කියලා මම හිතනවා. ඒ තුළින් අපේ තරුණ පරම්පරාවට, ශිෂ්‍ය පරම්පරාවට ඒ පිළිබඳව පුළුල් අවබෝධයක් ලැබේවි. අපි ඒ වෙනස්කම් ටික කරමු. ඡන්දය එනවා, එතකොට අපි දේශපාලන වශයෙන් බෙදෙමු; අපි එක එක පක්ෂවලට බෙදිලා තරග කරමු. එතෙක් මේ රට වෙනුවෙන් ප්‍රමුඛතාව දීලා රට වෙනුවෙන් කටයුතු කරමු කියා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Dayasiri Jayasekara.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, how much time do I have?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You have seven minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. S.M.M. Muszhaaraff to the Chair?

ගරු දිලුම් අමුණුගම මහතා
(மாண்புமிகு திலும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)
Sir, I propose that the Hon. S.M.M. Muszhaaraff do now take the Chair.

ගරු අනුප පස්කුවල් මහතා (සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுப பஸ்குவல் - சமூக வலுவூட்டுகை இராஜாங்க அமைச்சர்)
(The Hon. Anupa Pasqual - State Minister of Social Empowerment)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair, and THE HON. S.M.M. MUSZHAARAFF took the Chair.

[අ.භා. 2.06]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද මේ වැදගත් විවාදයේදී ඉතා වැදගත් කරුණු කිහිපයක් මතු කරන්න මම බලාපොරොත්තු වෙනවා. ඇත්තවශයෙන්ම මේ රටේ ක්‍රියාත්මක වන ආර්ථික වැඩ පිළිවෙළ යටතේ සුරාබදු දෙපාර්තමේන්තුව සුරාබදු බලපත්‍ර අතිවිශාල සංඛ්‍යාවක් ලබා දීමේ ක්‍රියාවලියක් මේ රට තුළ සිද්ධ කරමින් තිබෙනවා. ඒ පිළිබඳව අද යම් අදහසක් ඉදිරිපත් වුණා. පළමුවැනි කාරණය තමයි, මිනිසුන්ට බොන්න විධියක් නැහැ. ගල් බෝතලය රුපියල් තුන්දාහද, හාරදාහද කියලා මම දන්නේ නැහැ. ගරු අනුප පස්කුවල් රාජ්‍ය ඇමතිතුමනි, දැන් ගල් බෝතලයක් කීයද? *[බාධා කිරීමක්]* දන්නේ නැද්ද? මම හිතුවා ඔබතුමා දන්නවා ඇති කියලා. මිනිස්සු අමාරුවේ වැටිලා සිටින වෙලාවේ; විශාල අර්බුදයකට වැටිලා සිටින වෙලාවේ ගල් බෝතලය ඒ වාගේ ගණනක් වෙද්දී බලපත්‍ර කොපමණ ප්‍රමාණයක් නිකුත් කරලා තිබෙනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2008 අප්‍රේල් 10වැනි බ්‍රහස්පතින්දා මුදල් අමාත්‍යාංශය විසින් නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා. එහි සඳහන්ව තිබෙනවා, එක් එක් දිස්ත්‍රික්කවලට, නැත්නම් පළාත්වලට මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර කොපමණ සංඛ්‍යාවක් ලබා දෙන්න පුළුවන්ද කියලා. ඒ පිළිබඳ කරුණු මම ඔබතුමාට කියන්නම්. මේ වෙනකොට -2024.05.10වන දා වෙනකොට- රට බීමහල් සඳහා බලපත්‍ර 1,028ක් නිකුත් කර තිබෙනවා. ඒ කියන්නේ වයින් ස්ටෝර්ස් බලපත්‍ර 1,028ක් නිකුත් කර තිබෙනවා. උතුරු පළාතට බලපත්‍ර 52ක් නිකුත් කර තිබෙනවා; නැඟෙනහිර පළාතට 57ක් නිකුත් කර තිබෙනවා; මධ්‍යම පළාතට 214ක් නිකුත් කර තිබෙනවා. මේ විධියට ගත්තාම අතිවිශාල බලපත්‍ර ප්‍රමාණයක් නිකුත් කර තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කය ගත්තාම, කොළඹ

[ගරු දයාසිරි ජයසේකර මහතා]

දිස්ත්‍රික්කයට පමණක් අලුතින් බලපත්‍ර 137ක්, ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයට අලුතින් බලපත්‍ර 128ක් නිකුත් කර තිබෙනවා. ඊළඟට වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කය ගත්තොත්, අලුතින් බලපත්‍ර 33ක් දීලා තිබෙනවා. ඒ වාගේම කුරුණෑගල දිස්ත්‍රික්කයට අලුතින් බලපත්‍ර 58ක් දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ආපනශාලාවලට මත්පැන්හල් බලපත්‍ර 1,089ක් දීලා තිබෙනවා. කොළඹට 110ක් දීලා තිබෙනවා, ඒ වාගේම ගම්පහට 149ක්, ගාල්ලට 132ක්, මහනුවරට 78ක් වශයෙන් බලපත්‍ර දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, සුපර්මාර්කට්වලටත් මත්පැන් හල් බලපත්‍ර දීලා තිබෙනවා. ඒ විධියට, කොළඹ දිස්ත්‍රික්කයට 133ක්, ගම්පහ දිස්ත්‍රික්කයට 72ක් දීලා තිබෙනවා. මේ විධියට ගත්තාම හැම තැනකටම දුන් බලපත්‍ර සංඛ්‍යාව ගත්තොත්, සුපර්මාර්කට්වලට පමණක් මත්පැන්හල් බලපත්‍ර 306ක් දීලා තිබෙනවා.

ඊළඟට, රෙස්ටුරන්ට්වලට - කෑම කන තැන්වලට - බලපත්‍ර 765ක් දීලා තිබෙනවා. කොළඹට 284ක් සහ ගම්පහට 128ක් දීලා තිබෙනවා. මෙහෙම අරගෙන බැලුවාම, හෝල්සේල් දීලා තිබෙන්නේ. ඊළඟට, බියර් බලපත්‍ර 447ක් දීලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු පෞද්ගලිකව ගිහිල්ලා ජනාධිපතිතුමාට වැඳ වැටිලා කථා බහ කරලා බලපත්‍ර අතිවිශාල සංඛ්‍යාවක් අරගෙන තිබෙනවා. ඒ නම් ලැයිස්තුව මම කියන්නම්. ඒ විතරක් නොවෙයි. සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුත්තුන්ටත් මේවා දීලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න සමහර මන්ත්‍රීවරු, ඇමතිවරුත් අරගෙන තිබෙනවා. මම දන්නා ඇමතිවරයෙකුත් ඉන්නවා. සාමාන්‍යයෙන් මේ සඳහා deposit එකක් විධියට රුපියල් එක්කෝටි විසිපන්ලක්ෂයක් නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරන්න ඕනෑ.

ඊළඟට, අවුරුද්දකට ලක්ෂ පහක් ගෙවන්න ඕනෑ. ඒ එක්කෝටි විසිපන්ලක්ෂය ගෙවලා ඉවර වෙලා ඇමතිවරයාගේ අතට ගිහින් දීලා තිබෙනවා, රුපියල් කෝටි තුනක්. ඒක මතක තබා ගන්න. *[බාධා කිරීමක්]* සබරගමුව පළාතේ කෙනෙක්. මම එහෙම කියන්නම්කෝ. ඇමතිවරයෙකුගේ අතට ගිහින් දීලා තිබෙනවා, රුපියල් කෝටි 3ක්; ලක්ෂ 300ක්. එය ගන්න කලින් ලක්ෂ 100ක් දුන්නා. ඊට පස්සේ ගිහින් ඉතුරු ලක්ෂ 200 දුන්නා. රට බීමහල් 1,028කට F.L 4 බලපත්‍ර දීලා තිබෙනවා. නිකමට හිතලා බලන්න, රුපියල් කෝටි තුන ගණනේ මන්ත්‍රීවරුන් අතර එසේ මුදල් හුවමාරු වුණා නම්, ඒ මුළු මුදල කීයක්ද කියලා. මම මේ කථාව ආණ්ඩුවේ ඉන්න හැම කෙනෙකු සම්බන්ධයෙන්ම කියන්නේ නැහැ. නමුත් මේක දවස ගණනේ සිද්ධ වෙනවා. ඒක මතක තියා ගන්න. ඒ 1,028ටම අදාළව රුපියල් කෝටි තුන ගණනේ දුන්නා නම්, මුළු මුදල කීයක්ද කියලා තමුන්නාන්සේලා හිතලා බලන්න. එසේ රට බීම හල් බලපත්‍ර නිකුත් කිරීම තුළ රුපියල් කෝටි 3,000කට වැඩි මුදලක් මේ රටේ මන්ත්‍රීවරුන් අතර හුවමාරු වෙලා තිබෙනවා. මේක තමයි ඇත්ත කථාව, ගරු ඡාණක්කියන් මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට මන්නාරම ගැනත් කියන්නම්. ඒ ගණන් හිලව් ඔක්කෝම මා ළඟ තිබෙනවා. මන්නාරම දිස්ත්‍රික්කයට රට බීම හල් බලපත්‍ර 4ක් දීලා තිබෙනවා. ඒවා මොන මොන මන්ත්‍රීවරයාට දීලා තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. කිලිනොච්චිය ගත්තත් එහෙමයි. කිලිනොච්චියට බලපත්‍ර 7ක් දීලා තිබෙනවා. යාපනයට 30ක් දීලා තිබෙනවා. මම දන්නේ නැහැ එතරම් රට බීමහල් සංඛ්‍යාවකින් බොන්න, යාපනයේ එච්චර සෙනඟක් ඉන්නවාද කියලා. මෙන්න මේකයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. මේ බලපත්‍ර අරගෙන අනෙක් පැත්තට අත යට විකුණනවා; අත යට හුවමාරු කර ගන්නවා. සමහර තැන්වලට ප්‍රමාණය ඉක්මවා බලපත්‍ර දීලා තිබෙනවා. බස්නාහිර පළාතට මත්පැන් සඳහා සිල්ලර බලපත්‍ර 312යි දෙන්න පුළුවන්. හැබැයි, බස්නාහිරට දැනටම බලපත්‍ර 289ක් දීලා තිබෙනවා. ඒ, මෙතෙක් දීලා තිබෙන ඒවා හැර. ඒ කියන්නේ දිය යුතු ප්‍රමාණයත් ඉක්මවා තමයි සමහර තැන්වල බලපත්‍ර දීලා තිබෙන්නේ. දකුණු පළාතට බලපත්‍ර 104යි දෙන්න පුළුවන්. දැනටමත් දකුණු පළාතට බලපත්‍ර 100කට වඩා දීලා තිබෙනවා. මධ්‍යම පළාතට දැනටමත් බලපත්‍ර 214ක් දීලා තිබෙනවා. දෙන්න පුළුවන් 223යි. ඊට කලින් කොච්චර දීලා තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ. නියමිත ප්‍රමාණයට වැඩිපුර තමයි දීලා තිබෙන්නේ. ඒ නිසා තමයි මා කියන්නේ මේක ඇතුළේ දැවැන්ත හොරකමක් සිදු වෙනවා කියලා. ඊළඟ ජනාධිපතිවරණයට -ඡන්දයට- ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට වියදම් කරන්න අවශ්‍ය කරන සල්ලි හොයන වැඩේ තමයි මුදල් අමාත්‍යාංශයෙන් මේ කරන්නේ. මේවා කරන්න එපා. මොකද, අපි හොරු නොවෙයි. නමුත්, "හොරු" කියලා මේ 225දෙනාටම ඇඟිල්ල දිගු කරනවා. මොකක් හරි වැඩ වර්ජනයක් කරන කොට -ඊයේත් එහෙමයි- හැම මිනිහෙක්ම කියන්නේ 225දෙනාම වග කියන්න ඕනෑ කියලායි. අපි වග කියන්න ඕනෑ නැහැ. මොකද, අපි හොරු නොවෙයි, මංකොල්ලකාරයෝ නොවෙයි. හොරකම් කළා කියලා, මංකොල්ල කෑවා කියලා, ජාතික ධනය කොල්ල කෑවා කියලා අපට ඇඟිල්ල දිගු කරන්න කාටවත් බැහැ. අපි අවංකව වැඩ කරලා තිබෙනවා. ඒ නිසා මතක තබා ගන්න, මේ වැඩේට විරුද්ධව අපට ගන්න පුළුවන් උපරිම පියවර අප ගන්නා බව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon Member, your time is over.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩියක් දෙන්න.

මේවා කිව්වාම සමහරුන්ට හරි අමාරුයි. මොකද, සමහර අයට හිතා ගන්න බැහැ, මෙහෙම දෙයක් සිදු වෙලා තිබෙනවාද කියලා. මේ ආණ්ඩුව විශ්‍රාමිකයන්ට -ඒ අහිංසක මිනිසුන්ට- අද සත පහක් වැඩි කරලා නැහැ. රාජ්‍ය සේවයේ ඇතැම් නිලධාරීන්ගේ වැටුප් වැඩි කිරීම නිසා අද ඊට පහළ සේවකයෝ දසදහස් ගණනක් එළියට බැහැලා තිබෙනවා. කිසිම කාර්යාලයක වැඩ කෙරෙන්නේ නැහැ. විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රශ්නය දැන් අවසානයේ හිර වෙලා තිබෙන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ළඟ. අපි එතුමාට කියනවා, කරුණාකර ඒ සේවකයන්ගේ ප්‍රශ්නය විසඳන්න කියලා. මොකද, මේ රටේ විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්නා අභිංසක ශිෂ්‍යයන්ගේ ඉගෙනීමේ කාලය අවුරුදු ගණනක් විනාශ වෙලායි තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අ.පොස. සාමාන්‍ය පෙළ ශිෂ්‍යයින්ගේ සහ A/L ශිෂ්‍යයින්ගේ ඉගෙනුම් කාලය කොවිඩ් වසංගතය නිසා විනාශ වුණා. අනෙක් අතට, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ කාලය අවුරුදු 4ක් නොවෙයි, අවුරුදු 5ක්, 6ක් පමණ විනාශ වෙලා තිබෙනවා.

ඒ වාගේම ගුරුවරුන් පාරට බැහැලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අය පාරට බැහැලා තම ඉල්ලීම් ඉල්ලන තැනට වැඩ කටයුතු ලෑස්ති කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please wind up. Your time is over.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපේ රාජ්‍ය ඇමතිවරයෙක් කිව්වා, JVP එකයි සජබයයි තමයි මේ එළියට බැහැලා තිබෙන්නේ කියලා. එක එක පක්ෂවලට ඇඟිල්ල දිගු කරන්න එපා. තමුන්නාන්සේලා මේ ගැටලුව විසඳන්න. තමුන්නාන්සේලා ඇති කරපු ප්‍රශ්නවලින් තමයි මේ ගැටලුව වැඩි වෙලා තිබෙන්නේ. විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්ගේ පඩිය සියයට 105කින් වැඩි කරන කොට විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පඩිය සියයට 70කින් වැඩි කරන්න ගිවිසුම් ගහලා තිබෙනවා. ඉතින් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉල්ලීම් ඉටු කිරීමේ කටයුත්ත කෙරෙන්නේ නැත්නම්, පාරට බහිනවා හැර වෙනත් කරන්න දෙයක් ඔවුන්ට නැහැ. මේ ප්‍රශ්න විසඳන්න කියන ඉල්ලීමත් කරමින්, මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. (Dr.) Bandula Gunawardana. You have 20 minutes.

[අ.භා. 2.15]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ උගත් මිත්‍ර, නීතිඥ ගරු දයාසිරි ජයසේකර ශූරීන්, මත්පැන් බලපත්‍ර ලබා දීම පිළිබඳව විශාල චෝදනාවක් එල්ල කළා. ගරු මන්ත්‍රීතුමනි, කවුරු හරි මන්ත්‍රීවරයෙකු, රාජ්‍ය අමාත්‍යවරයෙකු හෝ අමාත්‍යවරයෙකු පගාවක්, අල්ලසක් අරගෙන තිබෙන බව හොඳාකාරව ඔප්පු කළ හැකි ආකාරයේ තොරතුරු ඔබතුමා දන්නවා නම්, මගේ නිර්දේශය තමයි අල්ලස් කොමිසමට ගිහිල්ලා ඒ පිළිබඳ ලියවිල්ල භාර දීලා විභාගයක් කරන්න කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් 1989 සිට මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. මම කලක් නියෝජ්‍ය මුදල් ඇමති ලෙස සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ ඇමති ලෙස භාණ්ඩාගාරය සමඟ වැඩ කරලා තිබෙනවා. ඒ කාලයේ සුරාබදු දෙපාර්තමේන්තුව මගේ යටතේ තිබුණේ. නමුත්, මම මගේ සංසාර ගමන තුළ කිසි දවසක මට හෝ මගේ දරුවෙකුට හෝ ඥාති හිත මිත්‍රාදි කෙනෙකුට සුරාබදු බලපත්‍රයක් දෙන්න කියලා මේ ඇඟිලි දෙකෙන් කවදාවත් අත්සන් කරලා නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා මට දැන් කිව්වා, අල්ලස් කොමිසමට ගිහිල්ලා පැමිණිල්ලක් දමන්න කියලා. ගරු ඇමතිතුමනි, අල්ලස් කොමිසම හරහා එහෙම දාපු පැමිණිලි ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් කොච්චරක් නම් අයින් කරගත්තාද කියලා මට කියන්න. ඉතින්, අපි කොහොමද දැන් වුණත් අල්ලස් කොමිසමට ගිහිල්ලා පැමිණිල්ලක් දමන්නේ? ඒ ගැන මට කියන්න. අල්ලස් කොමිසමෙන් ඇවිල්ලා නඩු 44ක් ඉල්ලා අස් කර ගත්තා, ඒවායේ technical issues තිබෙනවා කියලා. Technical issues තිබෙනවා නම් ඒ technical issue එක හදලා නැවත ඒ නඩුව පවරන්න ඕනෑ. නමුත්, ඒ නඩු නැවත පැවරුවේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලාට තිබුණු නඩු ටික ඔක්කොම දැන් නිදහස්. දැන් හොරු නිදහස්. ජනාධිපතිතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අහற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

හොරු සමඟ හෙලුවෙන්. එච්චරයි!

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
හොරු නිදහස් වෙනවා නම්, නඩුව ඉල්ලා අස් කර ගන්නේ තාක්ෂණික කරුණක් නිසා නොවෙයි නම්, ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය ගැනත් - ඊට වඩා ඉහළ තැනකට යන්නේ කෙසේද කියලා - නීතිඥයෙකු විධියට ඔබතුමා දන්නවා නේ. අපි දූෂණයට,- *[බාධා කිරීමක්]*

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපට එපා වුණා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
නැහැ, නැහැ, එපා වෙන්න එපා; අත් හරින්න එපා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, මට බාධා කරන්න එපා. මගේ කාලය ගත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජය මේ සියලු ආකාරයට කටයුතු කරමින් දහලන්නේ, උත්සාහ දරන්නේ, මහන්සි වෙන්නේ, බර පටවන්නේ ඇයි? මේ රජය ගත්තත්, මීට පෙර රජයක් ගත්තත් -ඕනෑම රජයක්- ආණ්ඩුවක් එදිනෙදා පවත්වාගෙන යෑමේ කටයුතුවලදී දරන වියදමේ ප්‍රතිඵලය එම වියදම දරන කාලයට විතරක් සීමා වන, නැවත නැවතත් දරන්න අවශ්‍ය වන ස්වරූපයේ වියදම් -පුනරාවර්තන වියදම්- දරන්න ප්‍රමාණවත් ආදායමක් නැහැ. රජයේ ආදායමෙන් විශාලම කොටස යන්නේ මොනවාටද? කවුරු ආණ්ඩුව භාර ගත්තත් රාජ්‍ය සේවයේ ඉඳලා විශ්‍රාම ගිය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට මාසයේ 10වන දාට විශ්‍රාම වැටුප ගෙවන්න ඕනෑ. ඒ වාගේම, මාසයේ අන්තිමට රාජ්‍ය සේවකයන්ට වැටුප් ගෙවන්න ඕනෑ. ඊළඟට, "සමෘද්ධි" හා "අස්වැසුම" ඇතුළු කුටුම්භ පැවරුම් සහනාධාර ගෙවන්න ඕනෑ. මේවා කරන්න ආදායමක් නැති නිසා සෑම ආණ්ඩුවක්ම ණය අරගෙන තිබෙනවා. ඒ නිසා ණය පොලී ගෙවන්න සිදු වෙලා තිබෙනවා. මේ පුනරාවර්තන වියදම පියවන්න ආණ්ඩුවට ආදායමක් නැහැ.

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමන්ලා දැන් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ තමයි, "අය වැය තත්ත්වය පිළිබඳ වාර්ෂික වාර්තාව - 2023" කියන එක. එය මේ ගරු සභාවට පිළිගන්වා තිබෙනවා. පසුගිය වර්ෂයේ රාජ්‍ය සේවක වැටුප්, විශ්‍රාම වැටුප්, රාජ්‍ය ණය සඳහා ගෙවන පොලී, සහනාධාර ආදී සියල්ලට වැය වෙලා තිබෙන පුනරාවර්තන වියදම රුපියල් ට්‍රිලියන 4.7යි. බිලියන 1,000ක් ට්‍රිලියන එකයි. සුරාබදු පනවා, බලපත්‍ර දීලා, දේශීය ආදායම් බදු පනවා, VAT සියයට 18 දක්වා වැඩි කරලා - මේ ඔක්කෝම කරලාත්- ඒ සියලු මාර්ගවලින් බදු හා බදු නොවන ආකාරයෙන් ලැබිලා තිබෙන්නේ, රුපියල් ට්‍රිලියන 3යි. එහෙම නම්, විවිධ විවේචන, විචාර කරන සියලු දෙනාගෙන් මට ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. රුපියල් ට්‍රිලියන 3ක ආදායමක් ලැබිලා, එදිනෙදා කටයුතු පවත්වා ගෙන යන්න ආණ්ඩුව රුපියල් ට්‍රිලියන 4.7ක් වියදම් කරනවා. මහ බැංකුව සෑම සතියකම භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි කරලා රුපියල් ට්‍රිලියන 1.7ක් ණයට අරගෙන තමයි ඒ වියදම් සිදු කර තිබෙන්නේ. මේක තමයි ඉලක්කම. කාගේ ආණ්ඩුව තිබුණත් කළේ මේකයි. කිසිවක් කරන්න බැරිව සිටිද්දී වේදිකාවලට ගිහිල්ලා ඉර දෙන්නම්, හඳ දෙන්නම්, සුරබිදෙන දෙන්නම් කිය කියා පට්ටපල් බොරු කියනවා; බොරු පොරොන්දු දෙනවා.

"රුපියල් ලක්ෂ 10ක සුභුරු පන්නි කාමරයක් දුන්නා" කියනවා. "රුපියල් ලක්ෂයක් දුන්නා" කියනවා. එහෙම කොහෙන් දෙන්නද, ආණ්ඩුවක් අරගෙන? රටේ ජනතාවට ඇයි මේ බොරුව කරන්නේ. මේ කරන බොරුව කවදාහරි පුපුරනවා. අද මම රජයේ බදු ආදායම ඉලක්කම් එක්ක කියන්න කැමතියි. රාජ්‍ය සේවක වැටුප් ගෙවීම සඳහා දරන වියදම ගත්තොත්, එය උසුලා ගන්න පුළුවන් වියදමක් නොවෙයි. සෑම වර්ෂයකම වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩි වුණාම, අපි බදු ආදායම ලබා ගත්තාම ඒකෙන් හරි අඩකට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය සේවක වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා යොදා ගන්නවා. 2020 වර්ෂයේ ආදායම වැටිලා. ඒ වුණාට වැටුප් අඩු කරලා නැහැ. වැටුප් ඒ ප්‍රමාණයෙන්ම ගෙවා තිබෙනවා. 2020 වර්ෂයේ රාජ්‍ය ආදායමෙන් සියයට 86ක් රාජ්‍ය සේවක වැටුප් හා විශ්‍රාම වැටුප් ලෙස ගෙවා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2014 සිට 2023 දක්වා ගෙවන ලද රාජ්‍ය සේවක වැටුප් හා වේතන සහ විශ්‍රාම වැටුප් වියදම රජයේ බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස සඳහන් වන දත්ත ලේඛනය මේ අවස්ථාවේ මම **සභාගත*** කරනවා.

මොකද, අපි බදු ගෙවන්නේ මොකටද යන්න පිළිබඳව රටේ බදු ගෙවන ජනතාව දැන ගන්න ඕනෑ. මේ රටේ ඉන්න අතිමහත් බහුතර ගුරුතුමන්ලා, ගුරුතුමියලා, විදුහල්පතිතුමන්ලා, ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන්, පොලිසියේ රාළහාමිලා, දිසාපතිතුමන්ලා, උප දිසාපතිතුමන්ලා යනාදී වශයෙන් රාජ්‍ය අංශයේ ඉන්න මේ ලක්ෂ 14ක, 15ක පවුල් නඩත්තු කිරීම වෙනුවෙන් සමස්ත ලාංකීය ජනතාව මේ බර දරා ගෙන ඉන්නවා. ලෝක ජනගහනය ගත්තාම පුද්ගලයෝ 100කට රාජ්‍ය සේවයේ මෙතරම් පිරිසක් කොහේවත් නැහැ. ඒක නිසා ආණ්ඩුවකට මේ වියදම දරමින් කටයුතු කරන්න අමාරුයි.

සෑම වර්ෂයකදීම රජයේ බදු ආදායම කීයද, 2014 ඉඳන් විශ්‍රාම වැටුප් සඳහා දරපු වියදම කීයද යනාදී වශයෙන් දත්ත ඇතුළත් ලේඛනය මම දැන් සභාගත කළා. රජය ගන්නා මුළු බදු ආදායමෙන් සියයට 75කට වඩා යන්නේ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප්වලට. බදුවලට කේක් ගෙඩියක් හැදුවොත්, ඒ කේක් ගෙඩියෙන් හතරෙන් තුනක් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප්වලට වියදම් කළාම, ඉතිරි හතරෙන් එකෙන් මං මාවත් හදන්න, විදුලිය දෙන්න, ජලබස්නා ස්ථාන සහ ජලාපවහන ක්‍රමවලට වාගේම ණය ගෙවන්න ගියාම ඒ ආණ්ඩුව ගෙන යන්නේ කොහොමද? විපක්ෂ නායකතුමා හරි, තව කුමාරයෙක් හරි, වෙනත් ඕනෑම කෙනෙක් රටේ ජනයාට කියන්න ඕනෑ තමන් ආණ්ඩුව ගත්තාම මෙහෙම වැටුප් ගෙවන්න, විශ්‍රාම වැටුප් ගෙවන්න, සමෘද්ධි සහනාධාර දෙන්න සල්ලි හොයන්නේ කොහොමද කියන එක. එතුමන්ලා සල්ලි හොයන ක්‍රමය කියන්න. දැන් දශක කිහිපයක් තුළ සිටම මේක කිරීමට නොහැකිව ඉඳලා "වැටුප් වැඩියෙන් දියව්!" කියලා උද්ඝෝෂණය කරනකොට හැම දාම කරලා තිබෙන්නේ, "හිටපියව්!" කියලා ආණ්ඩුව පරිපූරක ඇස්තමේන්තු දාලා මහ බැංකුවෙන් සල්ලි අව්වු ගහලා දීපු එක. මීට ඉස්සෙල්ලාත් හැම ආණ්ඩුවම සල්ලි අව්වු ගැස්සෙව්වා. නමුත්, මීට පස්සේ හැම ආණ්ඩුවකටම සල්ලි අව්වු ගහන්න බැහැ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තහනම් කරලා තිබෙනවා, මහ බැංකුව ලවා ලංකා ආණ්ඩුවට සල්ලි අව්වු ගහන්න බැහැ කියලා. ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා නැති වෙලාවක මහා භාණ්ඩාගාරයේ ලේකම්ව අල්ලා ගන්නවා. උද්ඝෝෂකයෝ ගිහිල්ලා මහ භාණ්ඩාගාරයේ ලේකම්ගේ ඔළුව අල්ලාගෙන බිත්තියේ ගහලා කුඩු කළත් ඒ මනුස්සයා මේක දෙන්නේ කොහෙන්ද? මේ උද්ඝෝෂණය කරන ප්‍රමාණයට අනුව පුළුවන්ද ඉබ්බන්ට පිහාටු දෙන්න?

විශේෂයෙන් දුම්රිය දෙපාර්තමේන්තුව ගැන බලන්න. මේ රටේ ලක්ෂ ගණන් අන්ත අසරණ ජනයා දිනපතා වැඩට යන්නේ, දරුවෝ පාසලට යන්නේ දුම්රිය සේවයෙන්. මම වැඳලා කිව්වා, "ඉල්ලීම් තිබෙනවා නම් කරන්න පුළුවන් හැම එකක්ම කරලා දෙන්නම්. වර්ජනය කරන්න එපා. මේ මිනිස්සු සීසන් ටිකට් එක අරගෙන අතේ සතයක්වත් නැතිව ඇවිල්ලා අතරමං වෙන අතරමංවිල්ලට තමුන්නාන්සේලාට සහගහනවා, මේක කරන්න එපා" කියලා. හැම දාම කියලා කියලා පරම්පරා ගණනක් තිස්සේ තිබුණ ගැටලු විසඳන්න කැබිනට් පත්‍රිකා 60ක් විතර දාලා විසඳන්න පුළුවන් හැම ගැටලුවක්ම විසඳලා තිබෙනවා. පසුගිය කාලයේ locomotive රියදුරෝ අවුරුදු 10න්, 10ට උසස්වීම් දෙන්න කියලා හැම දාම වර්ජනය කළා. ඒක වෙනස් කරන්න රාජ්‍ය සේවා කොමිසමෙන් අවසර ගන්න ඕනෑ. කැබිනට් අනුමැතිය දුන්නාට එහෙම කරන්න බැහැ. එහෙම කියලා, බොහොම අමාරුවෙන් රාජ්‍ය සේවා කොමිසමට කියලා engine driversලා රේල්පීලි උඩ දුම්රිය නතර කරලා බැහැලා ගියාම ලක්ෂ ගණන් මිනිස්සු අතරමං වෙන නිසා මම බොහොම අමාරුවෙන් ඒ අයට අවුරුදු 5න්, 5ට උසස්වීම් දෙන්නට සම්බන්ධයක් හදා ගත්තා.

ඊට පස්සේ station mastersලා ඇවිල්ලා කිව්වා, "මේක හරියන්නේ නැහැ, engine driversලාට වාගේම අපටත් අවුරුදු පහෙන් පහට උසස්වීම් ඕනෑ" කියලා. මම කිව්වා, ඒක එක පැන් පහරින් කරන්න පුළුවන් දෙයක් නොවෙයි කියලා. මම ඒ සඳහා - මේ අයටත් අවුරුදු පහෙන් පහට උසස්වීම් දෙන්න කියලා- කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. අපි ඒ අවස්ථාවේම රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලිපියක් ලිව්වා, දුම්රිය ස්ථානාධිපතිවරුන්ටත් අවුරුදු පහෙන් පහට උසස්වීම් දෙන්න කියලා. අපේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ ඊයේ ඒ පිළිබඳව සාකච්ඡාව පැවැත්වුවා. සාකච්ඡාවට 20දෙනෙක් විතර සහභාගි වුණා. සුමේධ මහත්තයා තමයි එහි සභාපතිතුමා. අපට හිතවත් මනුස්සයෝ. ඒ විසිදෙනා ඇවිල්ලා සාකච්ඡා කළා. ලේකම්වරයා අහලා තිබෙනවා, ඇමතිවරයා පාර්ලිමේන්තුවේ ඉන්නවා, රාජ්‍ය

** පුස්තකාලයේ තබා ඇත.*

** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

සේවා කොමිෂන් සභාවේ ලිපිය එනතුරු මේක අත්සන් කරලා දැන්මම Cabinet Paper එක දාන්න ද කියලා. එතකොට ඒ අය කිව්වා ලු, "නැහැ, නැහැ. මුකුත් දාන්න ඕනෑ නැහැ, Cabinet Paper එක දාලා තව දවසක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යනවාට වඩා හොඳයි රාජ්‍ය සේවා කොමිෂන් සභාවට දාලා ඊළඟ සුමානයේ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න" කියලා. එහෙම කියලා ගිහිල්ලා රාත්‍රී 7.00 වෙනකොට දුම්රිය වර්ජනය කළා.

පාර්ලිමේන්තුවට ගිනි තියන්න ආපු කණ්ඩායම තමන්ගේ පරාජයෙන් වියරු වැටිලා මේ රට අරාජික කරන්න අඩියෙන් අඩිය වර්ජන රැල්ලක් ගෙනැල්ලා, 1988දී අපි අත් දැකපු සෙල්ලම නැවත වතාවක් කරන්න සැලසුම් කරලා තිබෙනවා කියලා අපි දන්නවා. මේ අන්තවාදීන්ගේ හා ප්‍රචණ්ඩකරුවන්ගේ කුමන්ත්‍රණය පිළිබඳව දැනගෙන, මම විෂය භාර ඇමතිවරයා වශයෙන් ජනාධිපතිතුමාට ලිපියක් ලිව්වා, ජන ජීවිතය කඩාකප්පල් වෙන නිසා දුම්රිය සහ බස් රථ ඇතුළු අනෙකුත් ප්‍රවාහන සේවා සියල්ල අත්‍යවශ්‍ය සේවා ලෙස ගැසට් කරන්න කියලා. රටේ ජනතාවගේ එදිනෙදා ජීවිතය කඩාකප්පල් නොවී පවත්වාගෙන යාම සඳහා දුම්රිය, බස් රිය ඇතුළු මහාමාර්ග ප්‍රවාහන සියල්ල අත්‍යවශ්‍ය සේවා ලෙස ජනාධිපතිතුමා ගැසට් කළා. එහෙම ගැසට් කරලා දැන් සති දෙකක් විතර වෙනවා. මම ඊයේ උදේත් වෘත්තීය සමිති නායකයාට කිව්වා, විධායක ජනාධිපතිවරයාට තිබෙන බලතල අනුව, ප්‍රවාහන සේවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කරලා තිබෙන නිසා මොනම හේතුවක් නිසාවත් වර්ජනය කරන්න එපා කියලා. ඔහු මට කිව්වා, "සර්, මම සභාපති වුණාට පිටිපස්සෙන් කරන තෙරපුමට මට ඔරොත්තු දෙන්න පුළුවන්කමක් නැහැ" කියලා. එතකොට මම කිව්වා, ඒක නැතත් ඔබ නීතියට ගරු කරන්න, නීතිය රකින්න, රටේ නීතියට පටහැණිව කටයුතු කරන්න එපා කියලා. එහෙම කිව්වාට සීසන් ටිකට්, අරවා, මේවා ගත් අය අතරමං වෙන විධියට ඊයේ රාත්‍රියේ සිට ඔවුන් වැඩ වර්ජනය කළා. Stations ඔක්කෝම lock කළා. Stationsවලට ඉබි යතුරු දාලා වහලා station mastersලා එළියට ආවා. මම ආරක්ෂක අමාත්‍යවරයා වශයෙන් සිටින ගරු ජනාධිපතිතුමාට කියලා පොදු ජනතාවගේ වත්කම්, දේපළ තිබෙන දුම්රිය ස්ථානවලට හමුදාව යෙදෙව්වා. එහෙම හමුදාව යොදවලා දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා නිවේදනයක් නිකුත් කළා, රටේ මූලික නීතිය උල්ලංඝනය කර තිබෙන නිසා අද දවල් 12.00ට පෙර සේවයට වාර්තා නොකළොත් සේවය අත හැර ගියා ලෙස සලකනවා කියලා. ඒ අය දවල් 12.00ට පෙර සේවයට වාර්තා කළා ද කියලා මම තවම දන්නේ නැහැ. රාජ්‍ය ත්‍රස්තවාදය පාවිච්චි කිරීම, ඒ කියන්නේ රජයේ මූලික නීතියට ගරු නොකිරීම, විධායක ජනාධිපතිවරයාගේ ගැසට් නිවේදනය තුට්ටුවට දැමීම, රටේ නීතියේ ආධිපත්‍යය පිළි නොගැනීම, රටේ විනය නීතිරීතිවලට ගරු නොකිරීම වැනි කරුණු නිසා දුම්රිය ස්ථානාධිපතිවරු ඇතුළු සියලුදෙනාගේ දරු පවුල්වලට අත් වන ඉරණම කුමක් වුවත් ඔවුන් සේවයට වාර්තා කර නැත්නම් සේවය හැර ගියා ලෙස සලකනවා. එහෙම නැත්නම් රටක ආණ්ඩු කරන්න හම්බ වෙන්නේ නැහැ.

මම එනකොට ලේකම්තුමාට කථා කරලා කිව්වා, දුම්රිය රියදුරු මහත්වරුන්ටයි, ඉන්න අනෙකුත් සියලු සේවකයන්ටයි කියන්න කියලා, "රටේ මූලික නීතියක් තිබෙනවා. ඒ නීතියට බන්දුල ගුණවර්ධනත් ගරු කරන්නට ඕනෑ, ඔබතුමන්ලාත් ගරු කරන්නට ඕනෑ" යනුවෙන්. ඒ නීතිය අනුව යමක් අත්‍යවශ්‍ය සේවාවක් ලෙස පවරා තිබෙන විට කවුරු වර්ජනය කළත් තීන්දුව තමයි යම් නිශ්චිත සමාවක් දීලා, නැවත වැඩකටයුතු පටන් ගන්න එක. ඔවුන් ඊයේ රෑ වනතුරු වර්ජනය කළා. අද දවල් 12.00 වෙනතුරු සමාවක් දුන්නා. සමාව දීලා කිව්වා, සේවයට වාර්තා කරන්න කියලා. සේවයට වාර්තා කරන්නේ නැත්නම් ඔවුන්ගේ රැකියාව අහිමි වෙනවා.

සේවයට වාර්තා කරන්නේ නැත්නම් සේවය අත්හැර ගියා සේ සලකා, ඊට පස්සේ ගන්න තිබෙන ක්‍රියාමාර්ග අඩියෙන් අඩිය අපි ගන්නවා. මොන අපරාධයක් ද, මේ? පාසල් දරුවෝ ලක්ෂ 44ක් ඉන්නවා. ජීවත් වීම සඳහා ජීවිතයත් සමඟ අරගළයක යෙදෙන, එදිනෙදා වේල ගැටගහන්න බැරි, බිත්ති හතරකින් වට වෙච්ච තමන්ගේ කියලා නිවහනක් නැති, කුසට සම්පූර්ණ ආහාර වේලක් නැති, විලි වසා ගන්න වස්ත්‍රයක් නැති සියලු ළමයින්ගේ බලාපොරොත්තුව නිදහස් අධ්‍යාපනය ලබාගෙන තමන්ගේ ජීවිතයෙන් ඉහළට යන එක. පෞද්ගලික පාසල්වල කිසි ප්‍රශ්නයක් නැහැ. ජාත්‍යන්තර පාසල්වල කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ පාසල්වල ඉන්න දරුවන් හැමෝම ඇති හැකි අයගේ දරුවන්. ඒ කවුරුත් තමන්ගේ දරුවන් රජයේ පොදු පාසලට එවන්නේ නැහැ. නැති බැරි මිනිසුන්ගේ ළමයාට උගන්වන්න තිබෙන එක නැති කරනවා නම්, ඒක මොන තරම් අපරාධයක්ද? බැරිම තැන ඊයේ කැබිනට් මණ්ඩලය තීන්දු කළා, අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහනය වාගේ දේවල් කඩාකප්පල් කිරීම නීතියෙන් තහනම් කිරීම සඳහා පාර්ලිමේන්තුවෙන් -ව්‍යවස්ථාදායකයෙන්- නීතියක් පනවන්න කියලා. නැත්නම් මේ රටේ කාටවත් ආණ්ඩු කරන්න හම්බ වෙන්නේ නැහැ.

එදා ගිනි ගත් රටක් තිබුණේ. තෙල් කඳුළක්වත් නැතුව මිනිස්සු පැය ගණන් තෙල් පෝලිම්වල සිටියා. තෙල් පෝලිම්වල මිනිස්සු මැරුණු රටක්, මෙක. උයන්න ගෑස් නැතුව රට පුරාම ගෑස් හොයාගෙන ගියා. පැය 12ක්, 14ක් විදුලිය කපලා තට්ටු නිවාසවල උඩ ඉන්න බැරිව මිනිස්සු පහළට බැහැලා වියරු වැටෙන කොට අන්තවාදීන් සියලුදෙනා කිව්වා, "රාජපක්ෂවරුන් හොරකම් කරපු නිසා තමයි මෙහෙම වෙලා තිබෙන්නේ" කියලා. එහෙම කියලා මේ ව්‍යවස්ථාදායකය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරයෙක් පාරේ තළලා තළලා මරලා දැම්මා. අද වෙනකල් ඒ ගැන නඩු අහලා ඉවර නැහැ. ව්‍යවස්ථාදායකය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් මහ පාරේ මරා දැමුවා. පැය 12ක් ඇතුළත ව්‍යවස්ථාදායකය නියෝජනය කරන මහජන නියෝජිතයන්ගේ ගෙවල් 72ක් ගිනි තියලා උන්හිටි තැන් නැති කරපු රටක් ලෝකයේ වෙන කොහේවත් නැහැ. ඒ ම්ලේච්ඡත්වය, මිනී මැරුම සිදු කළේ අපේ රටේ විතරයි. අපි ඒක අත්දැකලා තිබෙනවා. 1989 භීෂණ කාලයේ නිරායුධ අහිංසක මිනිස්සු ලක්ෂ ගණනින් මරලා දැම්මා. ඒ අයගේ මිනී දණහිසෙන් පහළට වන සේ අරගෙන ගිහිල්ලා, පාරේ ඇදගෙන ගිහිල්ලා වළලන්න කියපු ප්‍රචණ්ඩ, නරුම දේශපාලන හස්ත තමයි මේ රට පුරා ක්‍රියාත්මක වෙන්නේ. නැවත ඒකට තමයි මේ සූදානම් වෙන්නේ. තව මාස හයකින් තමන්ට ආණ්ඩුව එනවා කියලා ඒ අය කියනවා නම්, පඩි වැඩි කරන එක ගැන තව මාස හයක් උහුලාගෙන ඉන්න ඒ අයට පුළුවන් නේ. ඒ අයගේ ආණ්ඩුවක් ආවාම පඩි වැඩි කළ හැකි නේ. වැටුප් වැඩි කරන්නේ කොහොමද? එහෙම නම්, ඒ අය කරන්නේ මොකක්ද?

ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා දන්නවා රුපියල් 20,000කින් පඩිය වැඩි කරන්න බිලියන 400ක් ඕනෑ කියලා. මම ඊයේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. නාය ගිහිල්ලා, ගංවතුර ඇවිල්ලා, පස් කඳු කඩා වැටිලා, පාරවල්වල මනුස්සයන්ට යන්න බැහැ. පාලම් කඩා වැටෙන තත්ත්වයක තිබෙනවා. තමන් යන පාර අබලන් වෙලා, මොනම විධියකින්වත් ඒ පාරවල යන්න බැහැ. ඒවා අලුත්වැඩියා කිරීම සඳහා මම කැබිනට් පත්‍රිකාවක් දාලා රුපියල් බිලියන 29ක අතිරේක ඇස්තමේන්තුවක් ඉල්ලුවා. මගේ අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙන මුදලට අතිරේකව මේ නාය ගිහිල්ලා, පාරවල් කැඩිලා, පාලම් කඩා වැටුණු ඒවා ප්‍රතිසංස්කරණයට රුපියල් බිලියන 29ක් දෙන්න කියලා මම ඉල්ලුවා. මහා භාණ්ඩාගාරය විසින් මුදල් ඇමතිතුමාට - ජනාධිපතිතුමාට- දැනුම් දුන්නාම එතුමා කිව්වා, රුපියල් බිලියන 29ක් දෙන්න භාණ්ඩාගාරයට කොහොමටවත් ක්‍රමයක් නැහැ

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

කියලා. රුපියල් බිලියන 29ක් නැති රටක රුපියල් 20,000කින් පඩි වැඩි කරන්න රුපියල් බිලියන 400ක් හොයන්නේ කොහෙන්ද? එහෙම හොයන්න කාගේවත් පෞද්ගලික සල්ලි තිබෙනවාද? රනිල් වික්‍රමසිංහ මැතිතුමා පෞද්ගලිකව ගෙදරින් මුදල් ගෙනෙන්නද? මහින්ද රාජපක්ෂ හිටපු මුදල් ඇමතිවරයා ගෙදරින් ගෙනාවාද? නැහැ, මිනිසුන්ගෙන් ගන්න සල්ලි; මිනිසුන්ගෙන් ගන්න බදු මුදල් තමයි මේ හැම දෙයකටම යොදවන්නේ. මේ රටේ ජනතාවට මීටත් වඩා බදු බරක් දරන්න පුළුවන්ද? ඔබතුමන්ලා ආණ්ඩුවක් ගන්න යනවා නම් ආණ්ඩුව අරගෙන කරන විධිය රටට කියන්නකෝ, "මෙහෙමයි කරන්නේ" කියලා. අසත්‍ය කියන්න එපා, සහගහනවා. දශක ගණනාවක් තිස්සේ මේ අසත්‍යම කියලා කියලා, ඒක මාධ්‍ය ආයතන ප්‍රචාරය කරනවා. මේ රටේ තිබෙන ඇත්ත මිනිසුන්ට කියන්නේ නැතුව මේ ගිනි පත්තු කිරීම පිළිබඳව, මාධ්‍ය ඇමතිවරයා ලෙස මම ලජ්ජා වෙනවා. මේ තරම් අසත්‍යයක් සමාජගත වෙන්න ඉඩ ඇරලා ඉන්නේ ඇයි කියලා මම මිනිහෙක් විධියට ලජ්ජා වෙනවා.

මේ තර්ජන, ගර්ජන සියල්ලට බය නැතුව විවිධ අභියෝග යටතේ වැඩ කරපු විධායක නොවන ශ්‍රේණියේ නිලධාරීන්ට වැටුප් වර්ධකයක් ලබා දෙන්න ඊයේ කැබිනට් මණ්ඩලය තීන්දු කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට මොකද දන්නවාද වෙන්නේ? ගුරු සේවයේ 3 - II ශ්‍රේණියේ අයගේ පඩිය රුපියල් 445කින් වැඩි වෙනවා.

2 - I ශ්‍රේණියේ අයගේ වැටුපට රුපියල් 1,335ක් වැඩි වෙනවා. වහාම ක්‍රියාත්මක වන පරිදි ඒ මුදල වැටුපට එකතු වෙනවා. ගුරු සේවයේ I වන ශ්‍රේණියට රුපියල් 1,630ක් වැටුප වැඩි වීමක් වෙනවා. එයා ඉහළට යනවා. ගුරු සේවයේ I වන ශ්‍රේණියේ අයගේ වැටුප රුපියල් 1,630කින් උඩට යනවා. ඇයි? මේ තර්ජනයට, ගර්ජනයට, බිය වැද්දීමට, දේශපාලන න්‍යාය පත්‍රයට විරුද්ධව මේ රටේ සුවහසක් දරුවන් වෙනුවෙන්, ඒ දරුවන්ගේ පැත්තේ හිටගත්ත එකට අපේ ගෞරවය, රජයේ ගෞරවය පළකිරීම සඳහා ඔවුන්ට වැටුප් වර්ධකයක් ලබා දෙන්නත්, ඒ අයගේ පෞද්ගලික ලිපි ගොනුවට ප්‍රශංසා කිරීමේ සහතිකයක් නිකුත් කරලා, උසස්වීම් යනාදිය ලබා දීමේ දී එය සැලකිල්ලට ගන්නත් කැබිනට් මණ්ඩලය තීරණය කළා. රටක් මෙහෙම අරාජික වුණොත්, පාර්ලිමේන්තුවට ගිනි තිබ්බොත්, පාර්ලිමේන්තුව දියවන්නා ඔයේ ගිල්ලුවොත්, ශීලාචාර සමාජයක නීතිය, සාමය ආරක්ෂා කරන්න බැරි නම්, නීතියට ගරු කරන්නේ නැත්නම්, අත්‍යවශ්‍ය සේවයක් බවට පත්කළ පසුවත් වර්ජනය කරනවා නම් මොකද වෙන්නේ? එතකොට මේ රටේ අධ්‍යාපනය, සෞඛ්‍ය, නිවාස, ප්‍රජා සේවා ගෙනියන්න බැරිව මිනිස්සු උනුන් මරා ගන්නා තත්ත්වයක් ඇති වෙනවා.

අපි දැනගන්න ඕනෑ, කවුරු ආණ්ඩු කළත් මේ හුස්ම ගන්නේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා නිසාය කියන එක. මොකද, අපේ කාලයේ දී යන්න ඉඩ නොදී හිටපු IMF එකට ගිහිල්ලා මේ විස්තීර්ණ ණය ගිවිසුම ඇති කර ගත්තේ එතුමා. තව මාස කිහිපයකින් අය වැය හදන්න ඕනෑ. ඒ හදනකොට මේ විස්තීර්ණ ණය ගිවිසුමට අනුව external resource gap එක ලබන අවුරුද්දට එනවා, මිලියන 1,508ක්. බාහිරින් රටේ මුදල් පරතරයක් එනවා, ඩොලර් මිලියන 5,018ක. ඒ කියන්නේ, ඩොලර් බිලියන 5ක්. අපට විදේශ වත්කම් තිබෙන්නේ ඩොලර් බිලියන 5.6යි. ලබන අවුරුද්දේ හිඟය එනවා ඩොලර් බිලියන 5.6ක්. කොහොමද මේ මුදල් ප්‍රමාණය දෙන්න පොරොන්දු වෙලා තිබෙන්නේ? IMF එක ඩොලර් මිලියන 663ක් Extended Fund Facility එක යටතේ දෙනවා. ඩොලර් මිලියන 700ක් ඒ අය වැය හදන කෙනාට දෙනවා. World Bank එක ඩොලර් මිලියන 400ක් දෙනවා. Asian Development Bank එක ඩොලර් මිලියන 300ක් දෙනවා. ඒ හරහා ඩොලර් මිලියන 3,855ක් හෝ 3,655ක ණය සහනයක් ලැබෙනවා. දැන් මට අහන්න තිබෙනවා ප්‍රශ්නයක්. ලබන අවුරුද්ද වෙනකොට කාගේ හෝ ආණ්ඩුවක් එනවා නේ. මේ අවුරුද්දේ මැතිවරණයක් තිබෙනවා නේ. ජනාධිපතිවරණය තිබෙනවා; පාර්ලිමේන්තු මැතිවරණය තිබෙනවා. ඒ එන එක්කෙනා රටට කියන්න ඕනෑ, IMF එකෙන් දෙන ඩොලර් මිලියන 663 ගන්නේ නැද්ද, Budget එක හදන්න ඩොලර් මිලියන 700 ගන්නේ නැද්ද, World Bank එකේ ඩොලර් මිලියන 400 ගන්නේ නැද්ද, Asian Development Bank එකෙන් ඩොලර් මිලියන 300 ගන්නේ නැද්ද, ණය ගිවිසුම අනුව සහන නැද්ද කියලා. එතකොට ඔහු කොහොමද රට ගෙනියන්නේ? ඒ නිසා තමයි මම කියන්නේ, IMF ගිවිසුමේ කොන්දේසි ඒ ආකාරයෙන්ම රැක්කේ නැත්නම්, ලෝකයට තිබෙන ණය ගෙවීම එලෙසින්ම කරනවා කියලා දිවුරා පොරොන්දු වුණේ නැත්නම්, කවුරු ආණ්ඩුව ගත්තත් ඒ ආණ්ඩුව තිබෙන වැඩිම කාලය සති දෙකයි. එහෙම වුණොත් මේ ගෙනාපු තෙල් ටික විතරයි. ලෝකයේ වෙන කවුරුවත් තෙල් ගෙනෙන්න ණයවර ලිපියක් - LC එකක් - පිළිගන්නේ නැහැ. ගෙනාපු තෙල් ටික විතරයි, ඊට පස්සේ තෙල් නැහැ. ගෙනාපු ගෑස් ටික විතරයි, ඊට පස්සේ ගෑස් නැහැ. ගෙනාපු බෙහෙත් ටික විතරයි, ඊට පස්සේ බෙහෙත් නැහැ. ගෙනාපු අල, ලූනු ටික විතරයි, ඊට පස්සේ ඒ දේවලුත් නැහැ. එතකොට ලංකාව ඇතුළේ ඉන්න අපට කරන්න තිබෙන්නේ ඇෆ්ගනිස්ථානය, ලිබියාව වාගේ උනුන් මරාගෙන තව අවුරුදු 25කට විතර කුජීත වෙලා ඉන්න එක විතරයි. ඒ නිසා මේ අවදානම දැනගෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධානියා ලංකාවෙන් යනකොට මාධ්‍යවේදීන් සියලු දෙනාට කිව්වා, "ලංකාවට ඉදිරියේ ගමන් කරන්න සිදුවෙලා තිබෙන්නේ පිහි තල අතුරපු මාවතක" කියලා. පිහි තල අතුරපු මාවතේ සෙල්ලම් දදා යන්න ගියොත් අබ්බගාත වෙලා තමයි නතර වෙන්නේ. රට අබ්බගාත නොකර අපි සියලුදෙනා එකතු වෙලා මේ යථාර්ථය තේරුම් අරන් හරියට රට කරන්න පුළුවන් භය නැති, නැවෙන්නේ නැති, හයිය තිබෙන, පණ තිබෙන ජනාධිපතිවරයෙක් පත්කර ගනිමින් මේ රට බේරා ගැනීම සඳහා කටයුතු කරමු, ඒ වෙනුවෙන් එකතු වෙමු කියන කාරණය මතක් කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Patali Champika Ranawaka. You have eight minutes.

[අ.භා. 2.39]

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ දී සුරාබදු ආඥාපනත යටතේ ගෙනෙන නිවේදන ගැනත්, තවත් රෙගුලාසි සහ නියමයක් සම්බන්ධයෙනුත් සාකච්ඡා කරනවා. අපේ ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා ඇතුළු බොහෝ දෙනෙක් ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් ලෙස ඉන්නවා. මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමාත් එම කාරක සභාවේ ඉන්නවා. අද මේ රටේ මහජනයා වැටුප් ඉල්ලා වැඩ වර්ජන රැල්ලක් පටන් ගෙන තිබෙනවා. පසුගිය දා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දරුවෙක් සියදිවි නසාගෙන තිබෙනවා අපි දැක්කා. මගේ දරුවාත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්නේ. මේ අනධ්‍යයන කාර්ය මණ්ඩල වැඩ වර්ජනයත් එක්ක දිග්ගැසුණු ක්‍රියාවලියක් තිබෙනවා. අපේ මේ වැඩ කරන ජනතාවට වෙලා තිබෙන්නේ මොකක්ද?

අපි දොස් කිව්වාට වැඩක් නැහැ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියලා තිබෙනවා, අපේ රටේ පවුල්වලින් සියයට 60ක ආදායම අඩු වෙලා තිබෙනවා, පවුල් සියයට 90කට මේ වියදම පාලනය කරන්න බැරි වෙලා තිබෙනවා කියලා. ඒ වාගේම මේ බදු එකතු කිරීමේ යන්ත්‍රණය නිසියාකාරයෙන් ක්‍රියාත්මක වෙනවාද, ඒක යුක්තිසහගතව වෙනවාද කියන ප්‍රශ්නය මේ ජනතාව අහනවා.

අපි ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව උදාහරණයක් ලෙස ගත්තොත්, පසුගිය වසරේ නොවැම්බර් මාසයේ 01වැනි දා වෙනකොට විශාල බදු ප්‍රමාණයක් සුරාබදු දෙපාර්තමේන්තුවට ගෙවලා තිබුණේ නැහැ කියන එක අපි දැක්කා. සුරාබදු දෙපාර්තමේන්තුවට රුපියල් බිලියන 7ක -කෝටි 700ක- බදු පොලු තියලා තිබුණා. අපේ රටේ සුරාබදු ආඥාපනතට අනුව කිසිම කෙනෙකුට අත්පිට මුදලට මිසක් ණයට මත්පැන් විකුණන්න බැහැ. ඒ අනුව බදු පොලු තැබීමේ කිසිම හැකියාවක්, අවස්ථාවක් ඒ සමාගම්වලට නැහැ. අපි නියෝගයක් දුන්නා, ඒ වාගේම නිර්දේශයක් කළා, ඒ බදු පොලු තියපු සමාගම් පහේ බලපත්‍ර තාවකාලිකව නවත්වා ඒ බදු අය කර ගන්න කියලා. ඒ අනුව සුරාබදු දෙපාර්තමේන්තුව 2023 නොවැම්බර් 01වැනි දා සිට ඒ බලපත්‍ර නැවැත්වුවා. ඒ වාගේම දවස් හතරකට පස්සේ ගිවිසුම් අත්සන් කරලා, 2023 දෙසැම්බර් 31වැනි දා වෙනකොට ඒ අයකර නොගත් සියලු බදු අය කර ගන්න එකඟතාවකට ආවා. හැබැයි, දෙසැම්බර් 04වැනි දා ඉඳන් නැවත ඒ බදු ගෙවීම පැහැර හැරියා. ඒ පැහැර හැරියාට කිසිම විධියකට ඔවුන්ගේ බලපත්‍ර තාවකාලිකව ඉවත් කළේ නැහැ. අදටත් ඒ ක්‍රියාවලිය සිද්ධ වෙනවා. අද තත්ත්වය මොකක්ද? පසුගිය අප්‍රේල් මාසයේදී අපට දැනුම් දුන්නා, තවම ඒ බදු ගෙවීම කරලා නැහැ කියලා. ඒ අනුව අපි දැනුම් දුන්නා, මේ වසරේ 06වැනි මාසයේ 30වැනි දා වෙනකොට ඒ සුරාබදු අය කර ගැනීම සඳහා අලුත් ගිවිසුම්වලට එළඹිලා එම කටයුත්ත කරගෙන යන්න කියලා.

මුදල් රාජ්‍ය ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්න මේ වෙලාවේ මම මේ කාරණය කියන්න ඕනෑ. අද සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇවිල්ලා කියනවා, මේවා අය කර ගැනීම සඳහා ක්‍රියාමාර්ගයක් ගන්න, මේ බලපත්‍ර තහනම් කරලා හෝ ඒ ක්‍රියාමාර්ගය ගන්න කියලා මුදල් අමාත්‍යාංශයෙන් ඔවුන්ට දැනුම් දීලා නැහැ කියලා. ඒක තමයි, සුරාබදු දෙපාර්තමේන්තුවේ උත්තරය. හැබැයි, මුදල් අමාත්‍යාංශයෙන් ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවට දැනුම් දීලා තිබෙනවා, ඒවා අය කර ගැනීම සඳහා වූ නිවේදනය ඔවුන් ලබා දුන්නා කියලා. අද තත්ත්වය මොකක්ද? 2024 වර්ෂයේ සමාගම් හතරක් රුපියල් මිලියන 978ක් බදු ගෙවලා නැහැ. ඒ අතුරින් එක ප්‍රධාන සමාගමක් තමයි, ඒ බදු ප්‍රමාණයෙන් සියයට 90කට වග කිව යුත්තේ. ඒ වාගේම, 2023 වර්ෂයේ ඉඳන් ඒ විධියට එකතු වෙච්ච බදු ප්‍රමාණය රුපියල් මිලියන 1,878ක් වෙනවා. එම නිසා අපි, "රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩි කරන්න කියලා ඉල්ලීම් කරන්න එපා, මේ වෙලාවේ රටේ තත්ත්වය හිතන්න" කියලා කිව්වාට, ඒ දේම මත්පැන් නිෂ්පාදකයන්ටත් කියනවා නම්, ඔවුන්ටත් නීතිය ක්‍රියාත්මක වෙනවා නම් තමයි ජනතාවගේ පැත්තෙන් ඒක යුක්ති සහගත වෙන්නේ. එහෙම නැතුව ඔවුන්ට එක නීතියක් ක්‍රියාත්මක කරලා බදු නොගෙවා ඉන්න ඔවුන්ට පුළුවන් වෙනකොට අනෙක් අයට ඒකේ ප්‍රතිඵලවලට මුහුණ දෙන්න වෙනවා. අද සෑම ලූනු කිලෝවකින්ම රුපියල් 10ක් බදු ගන්නවා. සීනි කිලෝවකින් රුපියල් 50ක් බදු ගන්නවා. මේ වාගේ, කිරිපිටි ඇතුළු හැම දෙයකින්ම බදු ගන්නවා. හැබැයි, මත්පැන් නිෂ්පාදකයන්ට ඒ සහනය ලබා දීලා තිබෙනවා. ඔවුන් ඉන්නේ නීතියට ඉහළින්ද, පාර්ලිමේන්තුවට ඉහළින්ද කියන ගැටලුව පැන නැඟිලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මුදල් අමාත්‍යාංශයේ හා ජනාධිපතිතුමාගේ අවධානය මේ ගැන දැඩිව, ඍජුව ක්‍රියාත්මක වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. එහෙම ක්‍රියාත්මක නොවෙනවා නම් අපට හිතන්න සිද්ධ වෙනවා, දැන් මේ ක්‍රියාත්මක වෙන්නේ ඒ වාගේ ජාවාරම්කාරයන්ගේ ක්‍රියාවලියක් ද කියන එක.

ඊයේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා කියා තිබුණා, මේ ඉල්ලා තිබෙන පඩි වැඩි කිරීම කරන්න නම් සියයට 3කින් පමණ VAT වැඩි කරන්න වෙනවා කියලා. ඔබතුමන්ලා මේකත් මතක තබා ගන්න. 2023 වර්ෂයේදී ලබා දුන් බදු සහන පිළිබඳව මුදල් අමාත්‍යාංශයෙන් ලේඛනයක් ඉදිරිපත් කළා. ඒ අනුව කොපමණ බදු සහන දීලා තිබෙනවාද? රුපියල් බිලියන 978ක බදු සහන දීලා තිබෙනවා. ඒකෙන් VAT එක රුපියල් බිලියන 543ක් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ රජයේ සේවකයෝ ඉන්නේ ලක්ෂ 14යි. මේ VAT සහනය නොදුන්නා නම්, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් මාසයකට රුපියල් 30,000කින් වැඩි කරන්න පුළුවන්. ඒක තමයි ඇත්ත. *[බාධා කිරීමක්]* ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමනි, මුදල් අමාත්‍යාංශය ගිය අවුරුද්දේ බදු සහන ලැයිස්තුව පිළිබඳව නිවේදනයක් නිකුත් කළා නේ. ඔබතුමා ගිහිල්ලා ඒක කියවන්නකෝ. ඒ බදු සහන ලැයිස්තුවේ රුපියල් බිලියන 978ක ප්‍රමාණයක් තිබෙනවා.

ඒකෙන් රුපියල් බිලියන 543ක්ම VAT. තව Custom Duty තිබෙනවා, individual tax තිබෙනවා, Corporate Tax තිබෙනවා. ඒක කියවන්න, මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ තිබෙනවා. මේ රුපියල් බිලියන 543 සහනය නොදුන්නා නම් රුපියල් 30,000කින් රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කරන්න පුළුවන්. අන්න ඒකයි රාජ්‍ය සේවකයාගේ ප්‍රශ්නය. ආණ්ඩුව ඒ සෑම ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන්ම එක ආකාරයට, සමාන ආකාරයට ක්‍රියා කරනවා නම් රාජ්‍ය සේවකයන්ගේ වර්ජනයට, එහෙම නැත්නම් පාසල් අධ්‍යාපනය කඩාකප්පල් වීමට, උසස් අධ්‍යාපනය කඩාකප්පල් වීමට, මහ ජනතාවගේ මේ වේදනාවට යම්කිසි ආකාරයක යුක්ති යුක්තභාවයක් ඇති කර ගන්න ආණ්ඩුවට පුළුවන් වෙනවා. ඒක මම කියන්න ඕනෑ.

මේ ණය සහනය ගැනත් මම කියන්න ඕනෑ. අපට සියයට 28ත්, 30ත් අතර ණය සහනයක් ලැබිලා තිබෙන බව කියනවා. ඒකේ discount rate එක සියයට 11යි කියලා තමයි ගණන් හදලා තිබෙන්නේ, OCC එකේ. ඒ ප්‍රමාණය සියයට 5 වුණොත්, ඒ discount rate එක සියයට 5 කියලා දැම්මොත් කිසිම ණය සහනයක් නැහැ. ඊට අඩු වුණොත් අපි වැඩියෙන් ගෙවන්න ඕනෑ. අර කිව්වා වාගේ අපි තවම අතුරේ යමින් ඉන්නේ. මේක බොහොම පරිස්සමින් යන්න ඕනෑ ගමනක්. මේ තිබෙන තාවකාලික ස්ථාවරත්වය රැක ගන්න නම් අපි මේ ගමන පරිස්සමින් යන්න ඕනෑ. 2028 අවුරුද්ද වෙනකම් අපට තව අවුරුදු තුනක කාලයක් තිබෙනවා. ඒ අවුරුදු තුන තුළ රටේ නිෂ්පාදනය වැඩි කරලා අපට එක පාරම 2028දී රුපියල්වලින් ණය ගෙවන්න තිබෙනවා. ඒ වාගේම ඩොලර්වලිනුත් ණය ගෙවන්න තිබෙනවා, මේ සැප්තැම්බර් මාසයේ ඉඳලා. ඒ තත්ත්වයට රට සූදානම් කළ යුතුයි. නමුත්, එවැනි ආර්ථික වර්ධන ක්‍රියාවලියක් අපට පෙනෙන්න නැති බව කනගාටුවෙන් වුණත් මා ප්‍රකාශ කරනවා. ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, the Hon. Nalin Bandara Jayamaha.

Order, please! Will an Hon. Member propose the Hon. Premnath C. Dolawatte to the Chair?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. S.M.M. MUSZHAARAFF left the Chair, and THE HON. PREMNATH C. DOLAWATTE took the Chair.

[අ.භා. 2.46]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඉතාම වැදගත් අවස්ථාවක වචන කිහිපයක් කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රාජ්‍ය සේවකයෝ ගණනාවක් උද්ඝෝෂණවල යෙදී ඉන්නවා. ඒ වාගේම ගුරුවරුනුත් වැඩ වර්ජනවල යෙදී ඉන්නවා. එවැනි වෙලාවක ජනාධිපතිතුමා මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ලවා කියවනවා අපි දැක්කා, වැටුප් වැඩි කරන්න නම් රුපියල් බිලියන මෙච්චරක් ඕනෑ, අච්චරක් ඕනෑ කියලා. හැබැයි, එහෙම කියන ගමන් ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවෙන් අතිරේක ඇස්තමේන්තුවක් වෙන් කරගෙන ජනාධිපතිවරණය ඉලක්ක කර ගත් එතුමාගේ campaign එකට බඩු බෙදන්න, අරවාට මේවාට මුදල් වෙන් කර ගත්තා.

අපි පසුගිය දවස්වල දැක්කා, ජනාධිපතිතුමා රැස්වීම් තියන විධිය. පොලීසිය භාර ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ හිටියා නම් හොඳයි. ජනාධිපතිතුමා දැන් රැස්වීම් තියන්න පාවිච්චි කරන්නේ පොලීසියේ සිවිල් ආරක්ෂක කමිටු. එතුමාට රැස්වීම් තියන්න සෙනඟ නැහැ නේ, ඒක අපි දන්නා කාරණයක් නේ. පොලීසියේ සිවිල් ආරක්ෂක කමිටුවලට කියනවා, පස්දෙනෙක් අරගෙන එන්න, දහදෙනෙක් අරගෙන එන්න කියලා. ඊයේ-පෙරේදා වැල්ලවායේ තිබුණු රැස්වීමත් එහෙම තමයි පවත්වලා තිබුණේ. ගම්පොල රැස්වීමක් තිබුණා, ඒකත් එහෙම තමයි පවත්වලා තිබුණේ. මේ අන්තිම මාස දෙක තුනේ ආණ්ඩුවේ බංකොලොත්භාවය තවත් වැඩි වෙලා, ආණ්ඩුව තවදුරටත් ජනතාවගේ ඇත් වෙමින් ඉන්න බව අපට පෙනෙනවා. ඒකට ප්‍රධානම හේතුවක් වුණා, ඊයේ-පෙරේදා අපි දැකපු හොඳ පින්තූරයක්.

කළුතර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා මේ වෙලාවේ නම් සභාවේ පෙනෙන්න නැහැ. පසුගිය දිනයක හොඳ පින්තූරයක් අපි කළුතරදී දැක්කා. ඒ පින්තූරයේ, රට බංකොලොත් කළ ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ඉන්නවා, රට ණය උගුලක හිර කරලා රට ණය කන්දක් බවට පත් කළ මහින්ද රාජපක්ෂ මහත්තයා ඉන්නවා, ඒ වාගේම ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ ඉතුරු කොටේ අදින, එතුමා බැටින් එක බිම දාලා ගියාට පස්සේ බැටින් එක අතට ගත්ත වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් ඉන්නවා. ඒ සේරම කට්ටිය එතැන හිටියා. සේරම ටික එක පින්තූරයක් ඇතුළේ හිටියා. අපි දැක්කා, රෝහිත අබේගුණවර්ධන මැතිතුමා විශාල මුදලක් වියදම් කරලා එතුමාගේ සංවත්සරය කළුතරදී දැවැන්ත ලෙස පැවැත්වූ ආකාරය. අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ සෙට් එකම එකට ඉන්නවා කියන එක පෙන්වන ඒ ඡායාරූපය ගන්න අවස්ථාව උදා කර දීම සම්බන්ධව. මේ රටේ ජනතාව එදා ගෝඨාභය රාජපක්ෂ ඇතුළු ඒ පිරිසවම තමයි එළෙව්වේ. අද රනිල් වික්‍රමසිංහ මහත්තයා තවදුරටත් ඒ පිරිසත් එක්ක තමයි ඉන්නේ කියන එක පෙන්වන ඒ පින්තූරය ගන්න විශාල මුදලක් වියදම් කරලා රෝහිත අබේගුණවර්ධන මැතිතුමා පැවැත්වූ උත්සවයට අපේ ආචාරය, ගෞරවය සහ ස්තුතිය එතුමාට අපි පුද කරන්න ඕනෑ.

ඒ වාගේම කියන්න ඕනෑ තවත් වැදගත් කාරණයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නවා, දැන් රුසියාවේ යුද්ධයක් තිබෙන බව. එම නිසා රුසියාවට ආර්ථික සම්බාධක පනවා තිබෙනවා. අපි තේ අපනයනය කරන දෙවැනි ලොකුම වෙළෙඳ පොළ - second largest market එක - තමයි රුසියාව. මුදල් රාජ්‍ය ඇමති ශෙහාන් සේමසිංහ මැතිතුමාත් මේ වෙලාවේදී ගරු සභාවේ ඉන්න එක හොඳයි. අපි රුසියාවට යවන තේවලට ලැබෙන ඩොලර් ටික ආපහු අපේ රටට ගෙන්වා ගන්න විධියක් නැහැ, මේ ආර්ථික සම්බාධක හේතු කරගෙන. හැබැයි, රුසියාව චීනය එක්කත්, ඉන්දියාව එක්කත් බැංකු හරහා මූල්‍ය ගනුදෙනු කරනවා. අපේ තේ ආර්ථිකයට, තේ අපනයනකරුවන්ට, තේ කර්මාන්තයට බලපාන මේ කාරණය පිළිබඳව ඔබතුමන්ලා අවධානය යොමු කරලා තිබෙනවාද? අපිට රුසියාව සමඟ සෘජුව මූල්‍ය ගනුදෙනු කරන්න බැරි නම්, ඉන්දියාව එක්ක රාජ්‍ය තාන්ත්‍රිකව කථා කරලා, චීනය එක්ක රාජ්‍ය තාන්ත්‍රිකව කථා කරලා යම්කිසි ක්‍රමවේදයක් සකස් කරන්න ඔබතුමන්ලාට කටයුතු කරන්න බැරිද, එහෙම නැත්නම් දැනට ඒ සම්බන්ධව යමක් කරගෙන යනවාද කියන ප්‍රශ්නය මම ආණ්ඩුවේ අවධානයට යොමු කරනවා.

අපේ රටේ ආර්ථිකය බංකොලොත් වෙලා තිබෙන වෙලාවක අපේ අපනයනකරුවන් ගෙනෙන ඩොලර් ටිකෙන් තමයි ඔබතුමන්ලා යන්තම් දනිපනි ගහලා ඉන්නේ. මොකද, අපිට ඩොලර් එනවා. නමුත් අපිට තවම ඩොලර් ණය ගෙවන්න සිද්ධ වෙලා නැහැ. එම නිසා ඒ ඩොලර් ටික ගෙන්වා ගන්න එක අපේ තේ ආර්ථිකය තුළ සිටින අපනයනකරුවා, වැවිලිකරුවා, කුඩා තේ වතු හිමියාගේ ඉඳන් සියලුදෙනාටම අදාළයි. ඒ වාගේම, තේ අපනයනයෙන් ලැබෙන ආදායම රටේ සමස්ත ආර්ථිකයට අදාළ වෙනවා. හොඳ වෙලාවක තමයි මම මේ ගැන කථා කරන්නේ. මොකද, මුදල් රාජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. ඔබතුමන්ලා වහාම මේ ගැන අවධානය යොමු කරලා, ඉන්දියාව හා චීනය සමඟ සාකච්ඡා කරලා, මේ ඩොලර් ටික අපේ රට ඇතුළට ගෙනෙන කටයුත්තට දායක වුණොත් හොඳයි කියන එක මම අවධාරණය කරනවා.

ඊළඟට, ජනාධිපතිවරණය ගැන කථා කරද්දි අපි දැක්කා ඒ සඳහා නොයෙක් උප්පරවැට්ටි යොදන්න කටයුතු කරමින් හිටපු බව. ඒගොල්ලන් කියනවා, ඒගොල්ලන්ගේ කෙනෙක් නොවෙයි, මේ ලේනව ඒගොල්ලන්ගේ නොවෙයි, ලේනව අහවල් අයගේ කියලා. අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් මේවාට හිනා, නේද? හැබැයි, කොහොම වුණත් සියලු ප්‍රයත්න අසාර්ථක වෙලා, මේ එළඹෙන 17වැනි දායින් පස්සේ මැතිවරණ කොමිසමට පූර්ණ බලය හිමි වෙනවා, මැතිවරණය සඳහා වූ දින වකවානු නම් කරන්න. අපේ රටේ ජනතාව ඉතාම අවධානයෙන් ඉන්නවා, මේ මැතිවරණය ගැන. මොකද, මේක තීරණාත්මක මැතිවරණයක්. මේ තීරණාත්මක මැතිවරණයේදී නිවැරදි තීන්දුව ගත්තොත් රට ගොඩ. මොකද, අද රටට අවශ්‍ය වැඩ කරන නායකයෙක් මිස

කයිවාරු ගහන නායකයෙක්වත්, බොරු කරන නායකයෙක්වත්, හොරකම් කරන නායකයෙක්වත් නොවෙයි. රටට ඕනෑ වැඩ කරන නායකයෙක්; කඩිසරව වැඩ කරන නායකයෙක්; වේගයෙන් වැඩ කරන නායකයෙක්; හොඳ team එකක් ඉන්න නායකයෙක්. ඒ නායකයා ඉන්නේ වෙන කොහේවත් නොවෙයි. ඒ නායකයා සමඟි ජන බලවේගයේ සජිත් ප්‍රේමදාස මැතිතුමාය කියන එක අද රට පිළිගෙන ඉවරයි. ඒ නිසා අපේ රටේ සියලුදෙනාටම මේ වැඩේට ඒක රාශි වෙන්න කියලා අපි කියනවා.

කටෛසියාක ඔරු විෂයත්තෛච් චොල්ල විරුම්පුකින්‍රේන්. ඉන්තච් චම්පළප් පිරච්සිනෛ මුටිවුක්කුක් කොණ්ටුවරප්පට වේණ්ටුම් එන්‍රුතාන් නාංකළ් නිනෛක්කින්‍රෝමේ තවිර, ඉතෛ වෛත්තු අරසියල් සෙය්ය වේණ්ටුම් එන්‍ර කීළ්ත්තරමාන යෝසනෛ එංකළුක්කුක් කිටෛයාතු! තංකළුටෛය පිරච්සිනෛකළෛප් පර්‍රිප් පේසුවතර්කාකවේ මක්කළ් එංකළුක්කු වාක්කළිත්තු ඉන්තප් පාරාළුමන්‍රත්තුක්කු අනුප්පි ඉරුක්කිර්‍රාර්කළ්. කුර්පිත්ත උරුප්පිනරුක්කු එන්මීතු අව්වළවු අක්කරෛ ඉරුන්තාල්, නේරුක්කුනේර් පේසලාම්තානේ! ඒන් අවර් ඉන්තච් සපෛයින් සිර්පුරිමෛකළුක්කුළ් මරෛන්තු පේස වේණ්ටුම්? නාන් ඔරු විෂයත්තෛ වෙළිප්පටෛයාකච් චොල්කින්‍රේන්. අතාවතු, අනෛවරුම් ඔන්‍රිණෛන්තු චෙයර්පට්ටාල් එමතු මක්කළින් චම්පළප් පිරච්සිනෛක්කු ඔරු තීර්වෛප් පෙර්‍රුක් කොළ්ළ මුටියුම්. ඉතෛ නාන් නේර්‍රෛය එන්නුටෛය උරෛයිලුම් තෙළිවාකච් චොල්ලියිරුන්තේන්. අතෛවිටුත්තු, එංකළුටෛය මක්කළෛ වෛත්තු අරසියල් සෙය්ය නිනෛත්තාල්, මක්කළේ අවර්කළෛ ඉල්ලාමල් ආක්කිවිටුවාර්කළ් එන්‍රු කූර්, නිර්වුසෙය්කින්‍රේන්. නන්‍රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.57]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමිය ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

විශේෂයෙන්ම සුරාබදු ආඥාපනත යටතේ ඉදිරිපත් කර තිබෙන නිවේදන ගැනත් සාකච්ඡා වෙන මේ විවාදයේදී අවධානය යොමු කරන්න ඕනෑ කරුණු - කාරණා කිහිපයක් තිබෙනවා. පසුගිය කාලයේ ආණ්ඩුව අපේ රටේ රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමට වැටි එක විශාල වශයෙන් වැඩි කරනවා අපි දැක්කා. ඒ වාගේම අනෙකුත් සියලු දේවල - අත්‍යවශ්‍ය භාණ්ඩවල පවා - බදු වැඩි කරලා, ජනතාවට විශාල පීඩනයක් එල්ල කර තිබෙනවා. ඒ එක්කම අනෙක් පැත්තෙන් විශාල වශයෙන් තිබෙන බදු අය කර ගැනීම ආණ්ඩුව මඟ හැරලා තිබෙනවා. ගණන් හදලා බැලුවාම අපට පෙනෙනවා මේ වනකොට රුපියල් බිලියන 750කට වැඩි බදු ප්‍රමාණයක් ආණ්ඩුවට අය විය යුතුව තිබෙන බව. නමුත්, රජය තවම ඒ බදු ප්‍රමාණය අය කරගෙන නැහැ. ඒවා අයකර ගන්න ආණ්ඩුව වැඩ පිළිවෙළක් හදලාත් නැහැ. බදු ගෙවන සාමාන්‍ය ජනතාවට තමයි හැම පැත්තෙන්ම බදු බර පටවා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒකට අද තිබෙන හොඳම උදාහරණය මේකයි. මත්පැන් නිෂ්පාදකයන් බදු ගෙවීම පැහැර හැරීම රුපියල් බිලියන 7ක් කියලා අද වෙනකොට පාර්ලිමේන්තුවේදී හෙළිදරව් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අද වනකොට මත්පැන් නිෂ්පාදනය කරන ආයතනවලින් රුපියල් බිලියන 7ක් බදු වශයෙන් අය කර ගන්නේ නැතිව ඒ කටයුත්ත පැහැර හැර තිබෙනවා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඒකට හේතුවක් හොයාගෙන තිබෙනවා. සුරාබදු නිලධාරීන්ගේ අක්‍රමිකතාත් මේකට හේතුවක් කියලා අද වනකොට පාර්ලිමේන්තුවේදී හෙළිදරව් වෙලා තිබෙනවා. ඒකට හේතුව හොයා බැලුවාම අපට පෙනුණා, මෙන්න මේ කාරණය. විශේෂයෙන්ම සුරාබදු දෙපාර්තමේන්තුවේ ඉන්න ඉහළ නිලධාරීන් මත්පැන් නිෂ්පාදනය කරන ආයතනත් එක්ක දූෂිත ගනුදෙනුවල යෙදිලා තිබෙනවා කියලා හෙළිදරව් වෙලා තිබෙනවා. පසුගිය කාලයේදී විශාල ආන්දෝලනයකට තුඩු දුන් කාරණාවක් තමයි මත්පැන් නිෂ්පාදනය කරන ආයතනයක් විසින් ව්‍යාජ ස්ටිකර් සකස් කිරීම. ඒ සම්බන්ධයෙන් එම ආයතනයට විශාල චෝදනාවක් එල්ල වුණා. ඒ ආයතනයේ දැන් ප්‍රධාන ගණකාධිකාරිනිය වශයෙන් සේවය කරන්නේ සුරාබදු දෙපාර්තමේන්තුවේ හිටපු ගණකාධිකාරිතුමිය. එතුමිය තමයි අර චෝදනාව එල්ල වෙච්ච මත්පැන් නිෂ්පාදන ආයතනයේ ගණකාධිකාරිතුමිය හැටියට වැඩ කරන්නේ. එතුමිය කලින් හිටියේ සුරාබදු දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරිතුමිය හැටියටයි. ඒ ගණකාධිකාරිතුමිය දැන් ව්‍යාජ ස්ටිකර් හැදුවා කියලා චෝදනාව ලබපු මත්පැන් නිෂ්පාදනය කරන ආයතනයේ ගණකාධිකාරිනිය බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊළඟ කාරණාව මෙයයි. ව්‍යාජ ස්ටිකර් සම්බන්ධ චෝදනාවකට ලක් වෙලා වැරදිකරු වෙච්ච ඒ සුරාබදු නිලධාරියා තමයි සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම් අංශයේ ප්‍රධානියා බවට පත් වෙලා තිබෙන්නේ. ඉතින්, මේ බදු එකතු කරන්නේ කොහොමද? ඔහු ව්‍යාජ ස්ටිකර් හැදීමේ චෝදනාවකට ලක් වෙලා වැරදිකරුත් වෙලා තිබෙනවා. නමුත් ඔහුව සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම් අංශයේ ප්‍රධානියා බවට පත් කරලා තිබෙනවා. මේක මහ පුදුම ආණ්ඩුවක්. ඒකයි අපි මේ කියන්නේ. ජනාධිපතිතුමාට මුදල් අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන ටිකවත් හරියට මෙහෙයවන්න බැහැ. එවැනි චෝදනා තිබෙන අයව ඉහළ තනතුරුවලට පත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේකට ප්‍රධාන හේතුව, සුදුසුකම් නැති අයව ඉහළ තනතුරුවලට පත් කිරීමයි. ඩී.ජී.එම්.වී. හපුආරච්චි මහතා සුරාබදු කොමසාරිස් හැටියට ඉන්නකොට, ඔහුගේ පාලන කාලයේදී තමයි මේ කටයුත්ත සිද්ධ වෙලා තිබෙන්නේ.

ඔහුගේ පාලන කාලයේ තරග විභාගයක් තිබුණා මේ ඉහළ තනතුරුවලට බඳවා ගන්න. ඒ තරග විභාගයේ ප්‍රශ්න පත්‍රවල උත්තර බලන්නත් නිලධාරීන් පත් කළේත් හපුආරච්චි මහත්මයාම තමයි. අන්තිමට ඔහුට ඕනෑ කට්ටියව සමත් කරලා සුරාබදු අධිකාරිවරු හැටියට, වැඩබලන සහකාර කොමසාරිස්වරු හැටියට, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරු හැටියට ඔවුන්ව පත් කළා. ඒ අවිධිමත් විභාගයෙන් සමත් වුණු; හිටපු සුරාබදු කොමසාරිස් ජනරාල් හපුආරච්චි මහතා පත් කරපු අය තමයි මේ ඉහළ තනතුරුවල ඉන්නේ. මේ පිළිබඳව අධිකරණයේ නඩුවකුත් යනවා. ඒ විතරක් නොවෙයි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට මේ පිළිබඳව අභියාචනාවක් ඉදිරිපත් කරලා, ඒ අය එය විභාග කරලා, පැහැදිලි තීන්දුවක් ලබා දීලා තිබෙනවා මේ විභාගය අනීතිකව පවත්වපු විභාගයක් කියලා. මෙන්න මේ විධියට සුදුසුකම් නැති උදවිය, දූෂණ චෝදනාවලට ලක් වෙච්ච උදවිය මේ ඉහළ තනතුරුවලට පත් වුණාම කොහොමද මේ සුරාබදු දෙපාර්තමේන්තුව තමන්ට ලැබෙන්න ඕනෑ ආදායම අය කරගන්නේ? රුපියල් බිලියන 7ක් අය කරගෙන නැහැයි කියලා අපේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී හෙළිදරව් වෙලා තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුව මේ සුරාබදු නිලධාරීන් කියලා හඳුනාගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ මත්පැන් නිෂ්පාදනය කරන බොහෝ ආයතන, සුරාබදු නිලධාරීන් එක්ක දූෂිත ගනුදෙනු පවත්වනවාය කියන එකත් හෙළිදරව් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක ජනාධිපතිතුමා යටතේ තිබෙන ප්‍රධාන ආයතනයක්. මේ රටේ බදු මුදල්වලින් විශාල ප්‍රමාණයක් එකතු කරන ආයතනයක් මේක. අද වෙනකොට ආණ්ඩුව මේ ආයතනවල තිබෙන අකාර්යක්ෂමතාව, මේ ආයතනවල සිටින නිලධාරීන්ගේ දූෂිතභාවය සම්බන්ධව ඔවුන්ට එරෙහිව පියවර ගන්නේ නැතිව, ඒ දූෂිත නිලධාරීන් අයින් කරන්නේ නැතිව රාජ්‍ය ආදායම වැඩි කරගන්න හැම බද්දක්ම ගෙනැල්ලා ජනතාව පිට පටවනවා; හැම බද්දක්ම ජනතාවගේ ඇඟට දමනවා. මොකද, ලෙහෙසියෙන් කරන්න පුළුවන් ඒ දේ තමයි. ජනතාවගේ බදු බර වැඩි කිරීම පමණයි ලෙහෙසියෙන් කරන්න පුළුවන්. ඒ ලෙහෙසියෙන් කරන්න පුළුවන් දේ කරලා අද ජනතාව මත විශාල බදු බරක් පටවලා තිබෙනවා. ඒ නිසා අපි රජයෙන් ඉල්ලනවා, සුරාබදු දෙපාර්තමේන්තුව තුළ සිටින මේ දූෂිත නිලධාරීන් සම්බන්ධව වහාම ක්‍රියා මාර්ග ගන්න කියලා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චාමර සම්පත් දසනායක රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.03]

ගරු චාමර සම්පත් දසනායක මහතා (ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க - ஆரம்பக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Chamara Sampath Dasanayake - State Minister of Primary Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද විවාදයේදී සුරාබදු ආඥාපනත යටතේ ගෙනෙන නිවේදන දෙකක් පිළිබඳවත් කථා කරනවා. අද උදේ ඉඳලා මේ පාර්ලිමේන්තුවේ හැමෝම කථා කළේ සුරාබදු සම්බන්ධයි. සුරාබදු ගැන කථා කරනකොට අද සුරාසැල් බලපත්‍ර දීමවත්, සුරාසැල් බලපත්‍ර cancel කිරීමවත් නොවෙයි රටේ ආර්ථිකය දියුණු කරන්න බාධා වෙලා තිබෙන්නේ. රුපියල් බිලියන 50ක පාඩුවක් තිබෙනවා මේ මත්පැන් මිල ඉහළ යෑම නිසා. මොකද, මිනිස්සු දැන් කසිප්පුවලට ඇබ්බැහි වෙලා තිබෙනවා. මම මේ ගැන දිගින් දිගටම පාර්ලිමේන්තුවේදී කිව්වා, හැම දාම කිව්වා. මම අද අවසාන වතාවට තමයි ගල් බෝතලය ගැන කථා කරන්නේ. හැබැයි, මම කියපු කාරණය ගැන දැන් පොඩ්ඩක් තේරුම් ගිහිල්ලා තිබෙනවා. පසුගිය දවසක ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගේ රැස්වීමේදීත් ඒ ගැන කථා වුණා. දැන් ඒ ගැන ජනාධිපතිතුමාගේ අවධානය යොමු වෙලා තිබෙනවා. රාජ්‍ය සේවකයින්ගේ දීමනා ගෙවන්න රුපියල් බිලියන 280ක් අඩුයි කියලා එදා මුදල් අමාත්‍යාංශයේ ලේකම් කිව්වා. හැබැයි, අධික ලෙස මත්පැන් මිල ඉහළ යෑම නිසා, සාමාන්‍ය කම්කරුවන්, සාමාන්‍ය ජනතාව පාවිච්චි කරන මේ ගල් බෝතලයේ මිල ඉහළ යෑම නිසා රුපියල් බිලියන 50ක පාඩුවක් සිදු වෙලා තිබෙනවා. ඡන්ද දායකයෝ ලක්ෂ 170ක් ඉන්නවා. මම විශ්වාස කරනවා එයින් ලක්ෂ 60කට වැඩි ප්‍රමාණයක් ඇහේ අමාරුවට, හිතේ අමාරුවට, දුකට, බිරිඳගේ ප්‍රශ්නවලට, නැත්නම් තිබෙන ප්‍රශ්නයක් නිරාකරණය කර ගැනීම සඳහා වැනි හැම දෙයකටම මත්පැන් පාවිච්චි කරනවා කියලා. මේ රටේ හේනේ, කුඹුරේ, ගොවිපොළේ, කර්මාන්තශාලාවේ, අනෙකුත් සියලුම ආයතනවල මහන්සි වෙලා වැඩ කරන අයට පුංචි සහනයක් හැටියට තිබෙන එකම දේ ගල් බෝතලය විතරයි. නමුත්, අද වෙනකොට අධික මිල නිසා රටේ කසිප්පු, නැත්නම් හොර මත්පැන් භාවිතය වැඩිවෙලා තිබෙනවා. මම දන්නා විධියට මේ වෙනකොට 50කට වැඩි සහෝදරයන්ගේ ජීවිත ඒ හේතුවෙන් නැතිවෙලා තිබෙනවා. දඹුල්ලේ ජීවිත නැති වුණා, ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගමත් ජීවිත නැති වුණා. පසුගිය දවසක මුහුදේ තිබ්ලා බෝතලයක් අහුලාගෙන බීලා ජීවිත 5ක් නැති වුණා. මේ ඔක්කොටම හේතුව මත්පැන් මිල අධික වීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට ආරංචි වුණා, IMF එක එක්ක කථා කරන්න ඕනෑ, IMF එකත් එක්ක කථා කරලා තමයි බදු අඩු කරන්නේ කියලා. IMF එකත් එක්ක කථා කරලා බදු අඩු කරන්න දෙයක් නැහැ.

ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම මැතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, IMF එකක් ගැන කථා කරන්න ඕනෑ නැහැ. දැන් එතනෝල් දකුණු අප්‍රිකාවෙන් රුපියල් 20ට ගෙනෙන්න පුළුවන්. ලංකාවට ගෙනැල්ලා දෙන්න පුළුවන් රුපියල් 20ට. හැබැයි, ඒවා import කරන්නේ නැති හේතුව නිසා අද සෙවණගල, පැල්වත්ත, ඇතිමලේ කියන සීනි කර්මාන්තශාලාවල එතනෝල් මිල ශීඝ්‍රයෙන් ඉහළ දාලා තිබෙනවා; ලීටරය රුපියල් 1,000කට වැඩි මිලකට ඉහළ දාලා තිබෙනවා. ඒ රුපියල් 1,000 අඩුවෙන් ගත්තා නම් මම හිතනවා මත්පැන් මිල රුපියල් 750ක්, රුපියල් 800ක් අඩු කර ගන්න පුළුවන් වෙයි කියලා.

ගරු දිලුම් අමුණුගම මහතා
(மாண்புமிகு திளும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒක නොවෙයි ප්‍රධාන හේතුව. දැන් එතනෝල් මිලත් බොහොම පහළට දාලා තිබෙනවා. අද රුපියල් 575ට තමයි විකිණුනේ. හැබැයි, ඔබතුමා බලන්න, එතනෝල් ලීටරය රුපියල් 900ට දෙනකොටත් ඒ ගණනටමයි විකුණන්නේ, රුපියල් 500ට දුන්නත් ඒ ගණනටමයි විකුණන්නේ, රුපියල් 400ට දුන්නත් ඒ ගණනටමයි විකුණන්නේ. මේවායේ මිල අඩු කළා කියලා මත්පැන් නිෂ්පාදකයින් මිල අඩු කරන්නේ නැහැ. ඇත්තටම මේකට අපි දැන් ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, කලින් ඔබතුමා යටතේ තමයි මේ ආයතන තිබුණේ. දැන් නම් මම හිතන විධියට පැල්වත්ත, සෙවණගල නැහැ. තිබෙනවා නම්, ඔබතුමන්ලා ඒ නිෂ්පාදන ආයතනවලට ඒවා විකුණනවා නම්, රුපියල් 900ට දෙනවා නම්, රුපියල් 400ට දෙනවා නම්, රුපියල් 500ට දෙනවා නම්, ඒ අනුව මිල නියම කරන්න ඕනෑ. රජය දැන ගන්න ඕනෑ, මුදල් අමාත්‍යාංශය දැන ගන්න ඕනෑ, පැල්වත්ත, සෙවණගල, ඇතිමලේ කියන කර්මාන්තශාලාවල එතනෝල් ලීටරයක මිල රුපියල් 500කින් අඩු කරනවා නම්, රුපියල් 500කින් මත්පැන් මිල අඩු කරන්න. අපේ ආණ්ඩුවට බාධාවක් නැතිව, ආණ්ඩුවේ බදු කපන්නේ නැතිව, IMF එක ගැන සාකච්ඡා නොකර රුපියල් 700කින් අඩු කරන්න පුළුවන් මම දන්නා විධියට. ඔබතුමන්ලාගේ ආයතනයේ තිබෙන එතනෝල් රුපියල් 300කට විතර අඩු කරන්න. රුපියල් 20යි දකුණු අප්‍රිකාවේ. ලංකාවට ගෙනෙන්න පුළුවන් රුපියල් 15ට. දකුණු අප්‍රිකාවේ තිබෙනවා රුපියල් 20ට. මම කියන්නේ, import කරන්න අවසරය දෙන්න ඕනෑ. Import කරන්න අවසරය දුන්නොත් සෑහෙන ප්‍රමාණයකට මේක අඩු කර ගන්න පුළුවන්. පැල්වත්ත ඇතුළු ඒ සීනි කර්මාන්තශාලා දියුණු වෙන්න ඕනෑ. ඒක වෙනම කථාවක්. නමුත්, ජන ජීවිතයත් ආරක්ෂා වෙන්න ඕනෑ. ජන ජීවිතයට මේක පහරක් වෙලා තිබෙනවා.

ඒ එක්කම මම මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් සමහර අය මේ දවස්වල කථා කරනවා, උසාවි ගිහිල්ලා තිබෙනවා, මත්පැන් හල් සඳහා බලපත්‍ර දෙනවා කියලා. හැබැයි, මම දන්නවා ප්‍රේමදාස මහත්තයාගේ කාලයේ ජම්පටාවීදිය, වෙල්ලවීදිය, කෙසෙල්වත්ත, පිටකොටුව, කොටුව ප්‍රදේශවල බාර් එකකටවත් ලයිසන් තිබුණේ නැති බව. කොළඹ මැද තිබුණු එක බාර් එකකටවත් කිසිම ලයිසන් එකක් තිබුණේ නැහැ ප්‍රේමදාස මහත්තයාගේ කාලයේ. පෝය දවසටත් ඒවා විවෘත කරලා තිබුණේ. ඒ කාලයේ මට අවුරුදු 22ක් වාගේ වුණේ. මමත් ඒ වාගේ තැන්වලින් ගිහිල්ලා බීලා තිබෙනවා. ජම්පටාවීදිය, වෙල්ලවීදිය, කෙසෙල්වත්ත ඒ අවට තිබුණු කිසිම බාර් එකකට ඒ කාලයේ ලයිසන් එකක් තිබුණේ නැහැ. හැබැයි, දැන් නීත්‍යානුකූලව ලයිසන් එකක් දීලා තිබෙනවා. දැන් නීත්‍යානුකූලව ලයිසන් දීපු අයගේ ඒවාත් උසාවියෙන් නවත්වන්න යනවා. මම කියන්නේ නැහැ විපක්ෂ නායකතුමා දන්නවා කියලා. මොකද, විපක්ෂ නායකතුමා ගල් දන්නෙත් නැහැ, පොල් දන්නෙත් නැහැ. හැබැයි, ලාල්කාන්ත නම් ගල් ගැනත් දන්නවා, පොල් ගැනත් දන්නවා. ඔක්කෝම දන්නවා. හැබැයි, ලාල්කාන්ත පාර්ලිමේන්තුවේ නැහැ. ඒකත් මම මේ වෙලාවේ දී කියන්න ඕනෑ. විපක්ෂ නායකතුමා දන්නේ නැහැ. හැබැයි, විපක්ෂ නායකතුමාගේ තාත්තා නම් දන්නවා. ජම්පටාවීදිය, වෙල්ලවීදිය, කෙසෙල්වත්ත යන ඔක්කෝම ප්‍රදේශවල ලයිසන් නැතිව තමයි ඒ කාලයේ ඒ දේවල් විකුණුවේ. හැබැයි, දැන් ලයිසන් දීලා විකුණන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධිකරණයට අත තියන්න පුළුවන් ඒවාත් තිබෙනවා, බැරි ඒවාත් තිබෙනවා. මේ නීති සම්පාදනය කරන්නේ පාර්ලිමේන්තුව. පාර්ලිමේන්තුවෙන් කරන්න ඕනෑ කාරණාත් තිබෙනවා. එහෙම නොවේ නම්, පාර්ලිමේන්තුවේ බලයත් අධිකරණයට දෙන්න. හැබැයි, මම විපක්ෂයේ අයටත් මේ කාරණය කියනවා. ඔබතුමන්ලාත් කවදා හෝ ආණ්ඩුවේ ඉඳියි. ආණ්ඩුවේ ඉඳගෙන වැඩ කරන්න යනකොට තමයි ඔය ගොල්ලන්ට අමාරු වෙන්නේ. සමහරු හැම දාම හැම එකටම අධිකරණයට යනවා. බාර් ලයිසන් එකක් දුන්නත් අධිකරණයට යනවා, වෙනත් මොනවා හරි දුන්නත් අධිකරණයට යනවා. හැම එකකටම අධිකරණයට යනවා. අධිකරණය විසඳන්න ඕනෑ ඒවාත් තිබෙනවා, පාර්ලිමේන්තුවෙන් කරන්න ඕනෑ ඒවාත් තිබෙනවා. එහෙම නොවේ නම්, පාර්ලිමේන්තුවෙන් වැඩක් නැහැ; මේ මන්ත්‍රීවරු 225දෙනාගෙන් වැඩක් නැහැ. මේ මන්ත්‍රීවරු 225දෙනාට සල්ලි වියදම් කරන එක, යාන වාහන දෙන එක වැඩක් නැහැ. කෝටි ගණන්, බිලියන ගණන් මුදල් වියදම් කරන එක අපරාධයක්. ජනතාවට හැම එකක්ම අධිකරණයට ගිහිල්ලා විසඳා ගන්න පුළුවන්. මොනවා හරි තිබුණොත් හැම එක්කෙනාම උස්සා ගෙන දුවන්නේ අධිකරණයට. ඒකත් අපි කියන්න ඕනෑ. නීති සම්පාදනය කරලා, නීති හදන තැන පාර්ලිමේන්තුව. මෙතැනින් කරන්න බැරි දේවල් තිබෙනවා. මෙතැනින් අසාධාරණයක් වෙනවා නම්, ඒවා අධිකරණයට විසඳන්න පුළුවන්.

මම තවදුරටත් කියනවා, සුරාබදුවලින් දැනට රුපියල් බිලියන 50කට වැඩි පාඩුවක් තිබෙන බව. මොකක්ද හේතුව? ගරු දිලුම් අමුණුගම රාජ්‍ය ඇමතිතුමනි, 2022 සහ 2024 වර්ෂයේ මේ දක්වා දත්ත අරගෙන බලන්න. මත්පැන් මිල වැඩි කරපු හින්දා රුපියල් බිලියන 50ක පාඩුවක් තිබෙනවා. මේවා පිළිබඳව IMF එකට නොවෙයි කොයි එකට හරි පැහැදිලි කරන්න. ගණන් ඉලක්කම් ඇතිව IMF එකට කියන්න.

බොහොම අමාරුවෙන් ගල් බෝතලය බොන මිනිස්සු මේ රටේ ඉන්නවා. හැබැයි මම එක දෙයක් කියන්න කැමැතියි. මේ රටේ ලක්ෂ 60කට වැඩි ඡන්ද දායකයන් පිරිසක් ගල් බෝතලය පාවිච්චි කරනවා. ඡන්ද අපේක්ෂකයෝ ඊළඟ මාස දෙකේ තුනේදී ඒ ජනතාවගෙන් ඡන්දය ඉල්ලා ගෙන එයි; මාසයකට විතර ගල් අරක්කු ටිකක් දෙයි. එහෙම නොවෙයි කරන්න ඕනෑ. අපේ රටේ, අපේ පළාත්වල ඉන්නවා බොන කන මිනිස්සු. මම කියන්නේ ගල් බෝතලයේ මිල අඩු කරන්න කියලායි. එහෙම කරන්න බැරි නම්, සුරා සැල් වහන්න. සුරා සැල් වැහුවාට අපට ප්‍රශ්නයක් නැහැ. සුරා සැල් තිබෙන අයගෙන් මම ඉල්ලා සිටිනවා, ගල් බෝතලයේ මිල අඩු කරන්න කියලා; අහිංසක මිනිසුන්ගේ බීමවල මිල අඩු කරන්න කියලා. එහෙම මිල කරන්න පුළුවන්කමක් තිබියදී තමයි මිල අඩු කරන්නේ නැත්තේ. මිල රුපියල් 1,000කින්, රුපියල් 1,200කින්, රුපියල් 1,300කින් අඩු කරන්න පුළුවන්. එහෙම අඩු කළොත්, ලබන අවුරුද්දේ අය වැයට රුපියල් බිලියන 50ක් හොයා ගන්න පුළුවන්. එතකොට මේ අවුරුද්දට -2024ට- වඩා ලාභ ගන්න පුළුවන් බව මම මේ අවස්ථාවේ ආණ්ඩුවට කියනවා. ආණ්ඩුවට හොයා ගන්න පුළුවන් ආදායම අපි සොයා දෙන්න ඕනෑ. අපි කියනවා නේ, රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට රුපියල් බිලියන 280ක් ඕනෑ කියලා. ඒ රුපියල් බිලියන 280 හොයා ගන්න අපට පුළුවන්. මා ඉහතින් කියපු පරිදි මිල අඩු කිරීමක් කළොත්, එයින් රුපියල් බිලියන 50ක් හොයා ගන්න පුළුවන්. එතකොට තවත් රුපියල් බිලියන 230යි හොයන්න තිබෙන්නේ. හොයන්න පුළුවන් ආදායම් හොයන්නේ නැතිව ඉන්නේ ඇයි?

සුරාබදු licence එකක් දුන්නා කියලා ඒක නතර කරන්න උසාවියට අයිතියක් නැහැ. සුරාබදු බලපත්‍ර දෙන්න ඕනෑ. අපේ ආණ්ඩුවෙන් බදු එකතු කරන්න ඕනෑ. එහෙම නැත්නම්, සුරා බදු එකතු කිරීමත් අපි උසාවියට **භාර** දෙන්න ඕනෑ. එවිට අප බදු එකතු කරන්න වුවමනාවක් නැහැ.

මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වෛද්‍ය උපුල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.12]

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. ආණ්ඩුවේ සුබ ආරංචිය, ජනාධිපතිතුමාගේ සුබ ආරංචිය ලත් තැනම ලොප් වන වෙලාවක ගරු විපක්ෂ නායකතුමා ඇතුළු අපේ සමගි ජන සන්ධානයේ ආරංචි නම් දවසින් දවස සුබ වෙනවා. මොකද, 2022 වසරේ ජූලි 20වන දා ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණු ඩලස් අලහප්පෙරුම මැතිතුමා ප්‍රමුඛ අපේ චරිත හේරත් මැතිතුමා, ගුණපාල රත්නසේකර මැතිතුමා, ලලිත් එල්ලාවල මැතිතුමා ඇතුළු හොරු නොවන, අවංක, කෘතහස්ත දේශපාලනඥයෝ දැන් අපේ සන්ධානයට එකතු වෙමින් සිටිනවා. මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පාර්ශ්වයේ ඉන්න අවංක, හොරු නොවන, දූෂිත නොවන දේශපාලනඥයන්ටත් මම ආරාධනා කරනවා, මේ ජයග්‍රාහී ගමනට එක් වන්න කියලා. ඒ වාගේම, එළියේ සිටින අවංක දේශපාලනඥයන්ටත් මම ඒ ආරාධනාව කරනවා.

ආණ්ඩුවේ සුබ ආරංචිය ලත් තැනම ලොප් වෙද්දී සුරාබදු ආඥාපනත යටතේ නියමයන්, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ගෙනෙන නියමය ගැනයි අද දවසේ විවාද කරන්නේ. අද දවසේ මෙතැන කියැවුණේ පසුගිය මාස 6 ඇතුළත ලංකාව පුරා අලුතින් මත්පැන් බලපත්‍ර 1,000කට වඩා නිකුත් කර තිබෙනවා කියලායි. හැබැයි, ඒවායින් ආදායම ගන්නා විධියක් ගැන, ඩිජිටල්කරණයක් ගැන වැඩ පිළිවෙළක් හදලා නැහැ. ලංකාවේ මත්පැන් නිෂ්පාදකයන් ඉන්නේ 26දෙනෙකුයි. එම ආයතන තවම අඩුම ගණනේ ඩිජිටල්කරණයට ලක් කරලා නැහැ; මත්පැන් විකුණන බාර්, wine stores ඩිජිටල්කරණයකට ලක් කරලා නැහැ. අද සුපිරි වෙළඳ සැල් සංකීර්ණයක් ගත්තත්, පොඩි සුපිරි වෙළඳ සැලක් ගත්තත් ඒවාත් ඩිජිටල්කරණයට ලක් වෙලායි තිබෙන්නේ. එසේ වුවත් සුරාබදු දෙපාර්තමේන්තුව තවම ඩිජිටල්කරණයට ලක් නොකරන්නේ ඇයි කියා අපි දන්නේ නැහැ. බදු එකතු කරන්න වුවමනාවක් නැති වීම නිසාත්, නවීන තාක්ෂණයට නොයෑම නිසාත් අපේ බදු ආදායම අනිශයින් පහළට ගිහින් තිබෙනවා. ඒ වාගේම, ලංකාව පුරා හොර මත්පැන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. අද wine store එකකට ගිහින් බලන්න, එහි හොර මත්පැන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා මේ කටයුතු නවීන තාක්ෂණයත් එක්ක ඉස්සරහට යන්න ඕනෑ බව මම සුරාබදු දෙපාර්තමේන්තුවට යළි මතක් කරනවා. අපි එතුමන්ලාට ඒ පිළිබඳව COPA එකේදීත් ඉතාම කාරුණිකව මතක් කරනවා. නමුත් ඒවා සිද්ධ වෙන්නේ නැහැ. බාර් වැඩි වනවාත් සමඟ අපේ රටේ දුප්පතුන්ගේ ප්‍රමාණයත් සියයට 50කින් වැඩි වෙලා තිබෙනවා. පවුල් ලක්ෂ 54න්, ලක්ෂ 27කට වඩා දරිද්‍රතා රේඛාවට යටින් ඉන්නේ. ඒ කියන්නේ, ඒ ජනතාව වේලක් දෙකක් කාලා තමයි ජීවත් වෙන්නේ.

[ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා]

ඒ වාගේම, ගිය අවුරුද්දේ පවුල් ලක්ෂ 10ක නිවාසවල විදුලිය විසන්ධි කර තිබෙනවා. පසුගිය අවුරුදු 10ටම විදුලිය විසන්ධි කිරීම් ලක්ෂ 10යි සිදු කරලා තිබුණේ. හැබැයි, 2023 වර්ෂයේ පවුල් ලක්ෂ 10ක නිවාසවල විදුලිය විසන්ධි කර තිබෙනවා. මේ අවුරුද්දේ පසුගිය මාස තුනේ පමණක් විදුලිය විසන්ධි කිරීම් 160,000ක් සිදු කර තිබෙනවා. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෝ 150,000කට වඩා තමන්ගේ ව්‍යාපාර නවත්වා තිබෙනවා; කර්මාන්තශාලාවල වැඩ නවත්වා තිබෙනවා. ඒ අය නිෂ්පාදන කටයුතු කරන්නේ නැහැ. ඒ හරහා ලක්ෂ පහකට වැඩි පිරිසකගේ රැකියා අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේමයි අධික ණය බර. මේ ඔක්කොම මෙහෙම වෙද්දී ජනතාව වැල් පාලමෙන් එගොඩ කරන්න ආපු ජනාධිපතිතුමාගේ, සුබ ආරංචිය කියාගෙන ආපු ජනාධිපතිතුමාගේ පාලන කාලය තුළ, මේ රටේ සමස්ත ණය ප්‍රමාණය -ඩොලර් බිලියන 83ක් ලෙස තිබුණු ණය ප්‍රමාණය- ඩොලර් බිලියන 100 දක්වා වැඩි වෙලා තිබෙනවා.

එතුමා කිරිබත් කෑවා නේ. මම හිතන විධියට, එතුමා කිරිබත් කෑවේ අමුවෙන්ද කොහේද.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂය පැත්තෙන් මට තවත් විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා.

ණය ප්‍රතිව්‍යුහගතකරණය කරනවා කියලා ඇවිල්ලා සියයට 17කින් පමණක් ණය ප්‍රතිව්‍යුහගතකරණය කරලා එතුමා කිරිබත් කෑවා. මා හිතන විධියට එතුමා අමුවෙන් තමයි කිරිබත් කෑවේ. තවත් සියයට 83ක ණය ප්‍රමාණයක් එහෙම පිටින්ම තිබෙනවා, ප්‍රතිව්‍යුහගතකරණය කරන්න.

සුළං විදුලි බලාගාරය අදානි සමාගමට දීම නිසා ඩොලර් බිලියන 1.14ක් අවුරුදු 20කදී අපට අහිමි වෙනවා. එතුමාගේ යහ පාලන ආණ්ඩුව කාලයේ මහ බැංකු මහා මංකොල්ලය සිදු වෙලාත්, මේ රටට අහිමි වුණේ ඩොලර් මිලියන 11යි. නමුත්, අදානි සමාගමට සුළං බලාගාරය දීම හරහා ඩොලර් බිලියන 1.14ක් අවුරුදු 20කදී අහිමි වෙනවා. නමුත්, එතුමා කිව්වේ ජනතාව වැල් පාලමෙන් එගොඩ කරනවා කියලායි.

ජනතාව දැන් ඉන්නේ ඡන්දයක් එනකල්. ඒ ඡන්දය මොකක් වුණත්, ජනතාව එය පිළිගන්නවා. මේ මාසයේ 16වන දායින් පසුව ජනාධිපතිවරණය පවත්වන දිනය ප්‍රකාශයට පත් කරන්න මැතිවරණ කොමිසමට බලය ලැබෙනවා.

අපව වැල් පාලමෙන් එගොඩ කරන්න කියලා ආපු ජනාධිපතිතුමා පළාත් පාලන මැතිවරණය අපට අහිමි කළා. "පළාත් පාලන මැතිවරණයක් නැහැ" කිව්වා. "කොහේද මැතිවරණයක් පවත්වන්නේ?" කියලා ඇහුවා. දැන් අපට කාරණය තේරෙනවා. තමාට භාර දුන්නු ටයිටැනික් නැව තමා විසින් වරායට ගෙන ආ බවක් එතුමා කිව්වා. ඒ නැවේ කපිතාන් විධියට ජනාධිපතිතුමා කිව්වා, "මම දැන් ටයිටැනික් නැව නිරුපද්‍රිතව වරායට ගෙනාවා" කියලා. එතුමා දන්නේ නැහැ, ටයිටැනික් නැව ගිලුණු බව. ඒකේ නටබුන් දැනටත් තිබෙනවා, මුහුදු පතුලේ. එතුමා ඒක දන්නේ නැහැ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 (ආ) ව්‍යවස්ථාව වෙනස් කරන්න කියලා දැන් එතුමා අලුත් නාඩගමක් පටන් ගෙන තිබෙනවා. එම සංශෝධන පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලයේ අනුමැතියට ගෙනැල්ලා එය දැන් පාර්ලිමේන්තුවට ගෙනෙන්න ලඟිලඟියේ සූදානම් කරනවා. ඒ සූදානම් වන්නේ මොකකටද? එම ව්‍යවස්ථාවේ පැහැදිලිව කියනවා, එකී සංශෝධනය කරන්න නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයකුත්, ජනමත විචාරණයකුත් ඕනෑ කියලා. හැබැයි, ජනාධිපතිවරණයක් තියන්න යන අස්සේ ජනමත විචාරණයකට තුඩු දෙන සංශෝධනයක් ගෙනෙන්න හදන්නේ ජනාධිපතිවරණයත් අර පළාත් පාලන මැතිවරණය වාගේ හංගන්නද? ඒ නිසා අපි ජනාධිපතිතුමාට පැහැදිලිව කියනවා, ඔය වාගේ ව්‍යවස්ථා ජීල්මාට් දමා ඉදිරියේදී එන ජනාධිපතිවරණය, ජනතාවගේ ජනතා පරමාධිපත්‍යය මැන බලන ජනාධිපතිවරණය හංගන්න ඔබතුමා ලැහැස්ති වෙන්න එපා කියලා. මොකද, මේ රටේ ජනතාව පුලපුලා බලා සිටින්නේ මේ රටට ආදරය කරන, අවංක දේශපාලනඥයෙකුට, අවංක පිරිසකට මේ රට භාර දෙන්නයි. ඒ නිසා ව්‍යවස්ථා ගැට දමලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 (ආ) ව්‍යවස්ථාව වෙනස් කරන්න දෙයක් නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය ඒ පිළිබඳව තම මතය තුන්පාරක් කියා තිබෙනවා. ඒ නිසා එම ව්‍යවස්ථාවේ සඳහන් අවුරුදු හය අවුරුදු පහක් ලෙස සංශෝධනය කරන එක හදිසියේ කරන්න ඕනෑ නැහැ. ජනාධිපතිතුමා එය හදිසියේ කරන්න යන්නේම එතුමාගේ යටි අරමුණක් තිබෙන නිසායි. මා හිතන විධියට, මේ කැබිනට් මණ්ඩලයත් ඒවා ගැන හොඳින්ම දන්නවා. එය දැනගෙන තමයි එහෙම කරන්න යන්නේ. මේ රටේ ජනාධිපතිවරණය හංගන්නයි යන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව තත්පර කිහිපයක් දෙන්න.

ජනාධිපතිතුමාට සහ කැබිනට් මණ්ඩලයට මම කියනවා, මේ වාගේ ව්‍යවස්ථා විරෝධී වැඩ, ජනාධිපතිවරණය කල් දමනවා වාගේ වැඩ කරන්න එපා කියලා. මොකද, ජනතාව පුලපුලා බලා සිටිනවා, ජනාධිපතිවරණයක් එනකල්, මේ රටට ආදරය කරන මනුස්සයෙක් ජනාධිපති කර ගන්න.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්. වියාලේන්ද්‍රන් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.20]

ගරු එස්. වියාලේන්දන් මහතා (වෙළඳ සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு ச. வியாழேந்திரன் - வர்த்தக மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)

(The Hon. S. Viyalanderan - State Minister of Trade and Environment)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மட்டக்களப்பு மாவட்டத்தில் சுமார் 10,000 இளைஞர், யுவதிகளுக்கு வேலைவாய்ப்புகளை வழங்கக்கூடிய, இலங்கையின் முதலாவது மிகப்பெரிய ஆடை உற்பத்தி வலயத்தை அமைப்பதற்கான முயற்சிகள் கடந்த காலங்களில் மேற்கொள்ளப்பட்டாலும், 2016 - 2020ஆம் ஆண்டுவரை அதனை நடைமுறைப்படுத்த முடியாத அளவுக்குச் சில காணி மாபியாக்கள் தடையாக இருந்தன. குறிப்பாக, தளவாய், ஐயங்கேணி, சவுக்கடி, புன்னக்குடா, களுவாங்கேணி போன்ற தமிழ் மக்கள் பூர்வீகமாக வாழ்கின்ற இடங்களிலுள்ள காணிகளை அபகரிக்கின்ற காணி மாபியாக்களால் இலங்கையின் மிகப்பெரிய ஆடை உற்பத்தி வலயத்தை அங்கு தாபிப்பது மிகப் பெரிய சவாலாகவே இருந்தது. அப்பொழுது நாங்கள் பல போராட்டங்களை மேற்கொண்டு, காணி அபகரிப்புகளைத் தடுத்து நிறுத்தி, காணிச் சீர்திருத்த ஆணைக்குழு மற்றும் அதன் உத்தியோகத்தர்களின் உதவியோடு காணி மாபியாக்களிடமிருந்து காணிகளை மீட்டெடுத்து, அவற்றை மிகப்பெரிய ஆடை உற்பத்தி வலயம் அமைப்பதற்காக Board of Investment of Sri Lankaக்கு - BOIக்கு - வழங்கினோம்.

இன்று சுமார் 255 ஏக்கர் நிலப்பரப்பில் தளவாய் கிராம சேவையாளர் பிரிவிலுள்ள புன்னக்குடா பிரதேசத்தில் அந்த ஆடை உற்பத்தி வலயம் அமைக்கப்பட்டு வருகின்றது. அதற்கான ஆரம்பக்கட்ட நிதி ஒதுக்கீடு 2020களில் முன்மொழியப்பட்டு, 2021ஆம் ஆண்டு 3,000 மில்லியன் ரூபாய்க்கும் மேற்பட்ட நிதி அமைச்சரவையின் அனுமதியோடு வழங்கப்பட்டது. குறிப்பாக, குடிநீர், மின்சாரம், வீதிக் கட்டமைப்பு போன்ற உட்கட்டமைப்பு வசதிகளுக்காகவே அந்த நிதி ஒதுக்கப்பட்டது. இன்று அங்கு ஆடை உற்பத்தி வலயத்தின் நிர்மாணப் பணிகள் மிகச் சிறப்பாக இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது. சில வாரங்களுக்கு முன்னர், முதற்கட்டமாக Jay Jay Mills Lanka (Pvt.) Limited என்று சொல்லப்படுகின்ற இந்திய முதலீட்டு நிறுவனம் அங்கு தனது தொழிற்சாலையை அமைப்பதற்கான வேலைத் திட்டங்களை ஆரம்பித்து இருக்கிறது.

அன்று நான் இந்த ஆடை உற்பத்தி வலயத்தை அமைப்பதற்கு மிகவும் கஷ்டப்பட்டுப் போராடிக்கொண்டு இருந்தபோது, எங்களோடு இருந்த எமது முற்போக்குத் தமிழர் கழக உறுப்பினர்களும் அந்தப் பகுதியைச் சேர்ந்த மக்களும் எனக்கு ஆதரவு வழங்கினார்கள். அதன் விளைவாக, இன்று சுமார் 10,000 இளைஞர், யுவதிகளுக்கு வேலைவாய்ப்பு வழங்கக்கூடிய அந்த ஆடை உற்பத்தி வலயத்தை நாங்கள் அமைத்துக்கொண்டு இருக்கின்றோம். அன்று எங்களுக்கு முன்னாள் சனாதிபதியினதும் முன்னாள் பிரதமரினதும் ஒத்துழைப்பு பெரியளவில் இருந்தது. அவர்கள் மாத்திரமன்றி, அப்போது அமைச்சராக இருந்த கௌரவ விமல் வீரவங்ஸ அவர்களும் அதற்கான ஒத்துழைப்புகளை வழங்கினார். அதன் விளைவாக, இன்று அங்கு அந்த ஆடை உற்பத்தி வலயத்தின் வேலைகள் சிறப்பாக இடம்பெற்று வருகின்றன. இன்று நாங்கள் பல இந்திய முதலீட்டாளர்களுடன் பேசிக்கொண்டு இருக்கிறோம். பல வெளிநாட்டு முதலீட்டாளர்கள் வந்து செல்கின்றார்கள். இன்னும் பல முதலீட்டாளர்கள் வந்தால், 255 ஏக்கர் நிலப்பரப்பில் தொழிற்சாலைகளை அமைத்து, ஆயிரக்கணக்கானவர்களுக்கு வேலைவாய்ப்புகளைப் பெற்றுக்கொடுக்க முடியும்.

முன்னாள் மட்டக்களப்பு மாவட்ட பாராளுமன்ற உறுப்பினர் கௌரவ நல்லையா அவர்களுடைய முயற்சியால் கொண்டுவரப்பட்ட காகித ஆலைதான் இலங்கையின் மிகப்பெரிய காகித ஆலையாகும். அது சுமார் 4,000 பேர் வேலைசெய்த காகித ஆலை! அது நீண்ட காலம் இயங்காமல் இருந்தது. நான் மாவட்ட அபிவிருத்திக் குழுவின் தலைவராக இருந்த 2020 - 2021 காலப்பகுதியில் அப்போதைய சனாதிபதி, பிரதமர், கைத்தொழில் அமைச்சர் ஆகியோரோடு பேசி, அதை மீள இயக்குவதற்கான வேலைத்திட்டங்களை மேற்கொண்டதன் விளைவாக, இன்று அந்தக் காகித ஆலை இயங்குகின்றது.

புன்னக்குடா என்பது, சுற்றுலாத்துறையில் மிகவும் பிரபல்யமான ஓர் இடமாகும். அதை நாங்கள் மேலும் வளர்த்தெடுக்க வேண்டும். முதலீட்டு ஊக்குவிப்பு வலயத்துக்கு மீண்டும் காணிகளை ஒதுக்குவதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம். இன்று குறிப்பிட்ட சில காணி மாபியாக்களும் தனி நபர்களும் அங்குள்ள காணிகளைப் பிடிப்பதற்காகப் போலியான கருத்துகளைக் கூறி வருகின்றார்கள். ஏனெனில், அந்த இடத்தில் இவ்வாறான தொழிற்சாலைகள் வந்தால், தங்களால் காணி அபகரிப்புகளை மேற்கொள்ள முடியாமல் போகலாம் என்பதனால்தான். கடந்த காலங்களில் 'புன்னக்குடா' என்ற பெயரை மாற்றுவதற்குக்கூட நடவடிக்கை மேற்கொள்ளப்பட்டது. எனினும், அது தடுத்து நிறுத்தப்பட்டது. அந்த இடத்தின் பெயர் காலங்காலமாக 'புன்னக்குடா' என்றுதான் இருந்து வருகின்றது. ஆரம்பத்தில் இந்த ஆடை உற்பத்தி வலயம் அமைக்கப்படுகின்ற இடத்தின் பெயரை ஏறாவூர் என்றுதான் சொன்னார்கள். அது ஏறாவூர் அல்ல! ஏறாவூர்ப்பற்று - செங்கலடி - பிரதேச செயலாளர் பிரிவுக்கு உட்பட்ட தளவாய் கிராம சேவகர் பிரிவிலுள்ள புன்னக்குடா! முதலில் வீதியின் பெயரை மாற்ற முற்பட்டார்கள்; அது தடுத்து நிறுத்தப்பட்டது. அதற்குப் பிற்பாடு, இந்த ஆடை உற்பத்தி வலயம் அமைக்கப்படுகின்ற இடத்தின் பெயரை மாற்ற முற்பட்டார்கள்; அதையும் நாங்கள் தடுத்து நிறுத்தினோம். இவர்களுடைய நோக்கம் என்ன வென்றால், பௌதிக வளத்துக்கும் மனித வளத்துக்கும் பாதிப்பில்லாத இவ்வாறான செயற்றிட்டங்கள் வரும்போது, அவற்றைத் தடுத்து நிறுத்தி, காணிகளை அபகரிக்க வேண்டும் என்பதுதான். அதை ஒருபோதும் அனுமதிக்க முடியாது.

சுற்றாடலுக்குப் பொறுப்பான இராஜாங்க அமைச்சர் என்ற அடிப்படையில், நான் ஒரு விடயத்தைத் தெளிவாகக் கூறியிருக்கின்றேன். 2019 ஏப்ரல் மாதம் 20ஆம் திகதி கதிரவெளியில் இல்மனைட் தொழிற்சாலை அமைப்பதற்கு எதிராக நாம் போராடினோம். அந்தப் போராட்டத்தை அந்த மாவட்டத்தைத் தாண்டி, நாங்கள் பல இடங்களுக்கும் கொண்டு சென்றோம். அதுமாத்திரமல்ல, புல்லுமலையில் அமைக்க முற்பட்ட தண்ணீர் தொழிற்சாலையையும் நாங்கள் தான் போராடி தடுத்து நிறுத்தினோம். ஏன் நான் இவற்றையெல்லாம் கூறுகின்றேன் என்றால், எமது வட, கிழக்குப் பிரதேசமாக இருக்கலாம் அல்லது வேறு எந்தப் பகுதியாகவும் இருக்கலாம், பௌதிக வளத்துக்கும் மனித வளத்துக்கும் பாதிப்பை ஏற்படுத்தக்கூடிய எந்தவொரு செயற்றிட்டத்துக்கும் அனுமதி வழங்க முடியாது என்பதனால்தான். பௌதிக வளத்தையும் மனித வளத்தையும் பாதிக்காத, நாட்டு மக்களுக்கு நன்மை பயக்கக்கூடிய எந்தவொரு வேலைத்

[ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා]

திட்டத்துக்கும் அனுமதி வழங்க முடியும். அது இறால் பண்ணையாக இருக்கலாம்; கோழிப் பண்ணையாக இருக்கலாம்; எந்தப் பண்ணையாகவும் இருக்கலாம்!

அபிவிருத்தி என்ற போர்வையில் மனித வளத்தையும் பௌதிக வளத்தையும் பாதிக்கின்ற ஒரு முதலீட்டை உள்ளே கொண்டுவந்தால், அது பாரிய பாதிப்பை ஏற்படுத்தும். இந்த இரண்டு விடயங்களிலும் கவனம் செலுத்துமாறு நாங்கள் சம்பந்தப்பட்ட அதிகாரிகளுக்குத் தெளிவாகக் கூறியிருக் கிறோம். அபிவிருத்தி என்ற போர்வையில், பௌதிக வளத்தையோ, மனித வளத்தையோ அழிக்க இடமளிக்க முடியாது. மாறாக, அவற்றைப் பாதுகாக்க வேண்டும். குறிப்பாக, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மட்டக்களப்பு மாவட்டத்தின் வட்டுவான் பகுதியில் அமைக்கப் பட்டிருக்கின்ற இறால் பண்ணையிலிருந்து வெளியேற்றப் படுகின்ற இரசாயனக் கலவை கலந்த கழிவு நீரால் இயற்கையான முறையில் மீன்பிடிக்கின்ற மீனவர்களுடைய தொழில் பாதிக்கப்பட்டு இருக்கின்றது. அதுமாத்திரமன்றி, ஆயிரக்கணக்கான மீன்கள் செத்து மிதக்கின்ற அவல நிலையும் அங்கு காணப்படுகின்றது. இதனால் அங்கு மக்கள் பல போராட்டங்களைத் தொடர்ச்சியாக முன்னெடுத்து வருகின்றார்கள். இந்த வட்டுவான் இறால் பண்ணையை இழுத்து மூடவேண்டுமென்ற சூழல் அங்கு உருவாகி இருக்கிறது. இதற்குக் காரணம், அங்கு முறையான விதத்தில் அந்த இறால் வளர்ப்பு மேற்கொள்ளப்படாமைதான்.

அண்மையில் நான் என்னுடைய அமைச்சின்கீழ் வருகின்ற மத்திய சுற்றாடல் அதிகாரசபையின் உத்தியோகத்தர்களுக்கு இவ்வாறான தொழிற்சாலைகள் தொடர்பில் அதிக கவனம் செலுத்துமாறு கூறியிருக்கிறேன். ஏனென்றால், அவை பௌதிக வளத்தையும் மனித வளத்தையும் பாதிக்கின்றன. அதுமாத்திரமன்றி, இயற்கையான முறையில் மேற்கொள்ளப் படுகின்ற பல தொழில்களையும் பாதிக்கின்றன. எனவே, இவ்வாறான செயற்பாடுகளுக்கு கண்மூடித்தனமாக அனுமதி வழங்க முடியாது. இன்று ஆயிரக்கணக்கான ஏக்கரில் இறால் வளர்க்கப் போகிறோம் என்றோ, வேறு எதையாவது வளர்க்கப் போகிறோம் என்றோ சொல்லலாம். எனினும், மக்கள் விரும்பாத எதையும் செய்ய முடியாது.

வாகரை என்பது, 30,000க்கும் மேற்பட்ட மக்களைக் கொண்ட, 540 சதுர கிலோமீற்றருக்கும் மேற்பட்ட நிலப் பரப்பைக்கொண்ட, இயற்கையாகவே பாலும் தேனும் ஒடுகின்ற ஓர் அழகிய பிரதேசமாகும். அந்தப் பிரதேசத்தில் அபிவிருத்தியென்ற போர்வையில் அங்குள்ள வளங்களை அழிப்பதற்கு இடமளிக்க முடியாது. அது இல்மனைட் அகழ்வாக இருக்கலாம்; இறால் வளர்ப்பாக இருக்கலாம்; எந்தத் தொழிலாகவும் இருக்கலாம்! வாகரையில் மட்டுமல்ல, எந்தப் பகுதியிலாக இருந்தாலும், மனித வளத்தை, ஜீவனோபாயத்துடன் சம்பந்தப்பட்ட தொழிலைப் பாதிக்கின்ற வகையில் அவை அமையுமானால், அவற்றுக்கு அனுமதி வழங்க முடியாது என்பதில் நாங்கள் தெளிவாக இருக்கின்றோம். இவ்வாறான செயற்பாடுகளுக்கு ஒருபோதும் துணை நிற்க மாட்டோமென்று நாங்கள் சம்பந்தப்பட்ட அதிகாரிகளுக்குத் தெளிவாகக் கூறியிருக்கின்றோம். இவ் வாறான செயற்பாடுகளை நாங்கள் கடந்த காலத்திலும் எதிர்த்தோம்; இப்போதும் எதிர்க்கின்றோம். அதற்கு ஒருபோதும் துணை போக மாட்டோம் என்பதை நான் இந்த இடத்தில் தெளிவாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அதேநேரம், பௌதிக வளத்தையும் மனித வளத்தையும் பாதிக்காத தொழிற்சாலைகளைக் கொண்டுவருவதற்கான முன்னெடுப்புக்களை நாங்கள் எடுத்து வருகின்றோம். அவற்றை நாங்கள் நிச்சயமாக வெற்றிகரமாகச் செய்து முடிப்போம். அவ்வாறு செய்யும்போது, வேலையற்றிருக்கின்ற ஆயிரக்கணக்கான இளைஞர், யுவதிகளுக்கு சொந்த மாவட்டத்துக்குள்ளேயே, சொந்தப் பிரதேசத்துக்குள்ளேயே வேலைவாய்ப்புகளைப் பெற்றுக்கொள்ளக்கூடிய சாதகமான, சிறப்பான சூழல் உருவாகும். அதை உருவாக்கிக் கொடுப்பது தான் எங்களுடைய முக்கிய கடமை! அதைத்தான் நாங்கள் கடந்த காலம் முதல் செய்து வருகின்றோம். அதைத் தொடர்ந்து செய்வோம் என்பதை நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.30]

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் மதுவரி கட்டளைச் சட்டத்தின் கீழான அறிவித்தல், இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதம் இங்கே நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. வடக்கு, கிழக்குப் பகுதிகளில் அண்மைக் காலமாக மதுபானசாலை களுக்கு கண்மூடித்தனமாக அனுமதி வழங்கப்பட்டு, திறக்கப்படுகின்ற சம்பவங்கள் மக்கள் மத்தியில் அதிருப்தியை ஏற்படுத்தியிருக்கின்றன. பாடசாலைகள், கோவில்கள் உள்ளிட்ட மக்களுடைய இதயப் பகுதிகளாகக் கருதப்படக் கூடிய முக்கியமான பல இடங்களுக்கு அருகில் மதுபானசாலைகள் திறக்கப்படுகின்ற காரணத்தினால், மக்கள் அதற்கு எதிராகப் போராட்டங்கள் நடத்துகின்றார்கள். எனினும், அந்தப் போராட்டங்கள் மற்றும் அவர்களுடைய கோரிக்கைகள் புறக்கணிக்கப்பட்டு, மதுபானசாலைகளுடைய உரிமையாளர்கள் விரும்பியவாறு பொலிஸாரும் அரச திணைக்களங்களும் நடந்துகொள்கின்ற நிலைமைகள் நீடித்துக் கொண்டு இருக்கின்றன.

ஏற்கெனவே, இந்த நாடு பொருளாதார ரீதியாக வீழ்ந்து போயிருக்கின்ற நிலையில், கல்வியில் அக்கறையில்லாமல் நாட்டைவிட்டு வெளியேற வேண்டுமென இளைஞர்கள் சிந்தித்துக்கொண்டிருக்கின்ற சூழலிலே, மதுபானசாலைகள் திறக்கப்படுகின்ற செயற்பாடானது, எஞ்சியிருக்கின்ற இளம் சமுதாயத்தினரையும் முற்றாக அழிப்பதாகத்தான் அமையும். அவர்களை மதுபானத்துக்கு அடிமையாக்குகின்ற ஒரு செயற்பாட்டை நோக்கியதாகத்தான் இது அமைகின்றது. கைத்தொழிற்றுறை சார்ந்த அபிவிருத்திகளை மேற்கொள்வதை விட, மதுபானசாலைகளைத் திறப்பதன் மூலமாக வருமானத்தை ஈட்டிக்கொள்ளலாம் என்கின்ற அடிப்படையிலும், பாராளுமன்ற உறுப்பினர்களுக்கு மதுபானசாலை அனுமதிப்பத்திரங்களை வழங்குவதன்மூலம் அவர்களுடைய ஆதரவைப் பெற்றுக்கொள்ளலாம் என்கின்ற அடிப்படையிலுமே அரசாங்கம் செயற்படுகின்றது. சில அரசியல்வாதிகள் மதுபானசாலை அனுமதிப்பத்திரங்களை

விற்று, கோடிக் கணக்கில் இலாபமீட்டி, அதன்மூலமாகத் தங்களுடைய அரசியல் வாழ்க்கையைக் கொண்டுநடத்தலாமென்ற நோக்கில் செயற்படுகின்றார்கள். அவ்வாறானவர்களுடைய ஆதரவைப் பெற்றுக்கொள்ள வேண்டும் என்பதற்காக ஜனாதிபதி அவர்கள் கையாளுகின்ற மிகக் கீழ்த்தரமான ஓர் உபாயமாகத்தான் இது இருக்கின்றது. ஆகவே, இச்செயற்பாடு உடனடியாக நிறுத்தப்பட வேண்டும். மக்கள் எதிர்ப்புத் தெரிவிக்கின்ற இடங்களிலிருந்து மதுபானசாலைகள் அகற்றப்பட வேண்டும் என்று நான் இந்த இடத்தில் வலியுறுத்திக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கடந்த 08ஆம், 09ஆம் திகதிகளில் வட மாகாணம் உட்பட நாடுபூராவும் தொழிற்சங்கத்தினர் போராட்டம் செய்திருந்தார்கள். குறிப்பாக, வட மாகாண அபிவிருத்தி உத்தியோகத்தர் சங்கம், அகில இலங்கை அபிவிருத்தி உத்தியோகத்தர் சங்கம், பொது முகாமைத்துவ உதவியாளர் சேவைச் சங்கம், அகில இலங்கை தமிழ் பேசும் தபால் ஊழியர் சங்கம், ஸ்ரீ லங்கா தபால் தொலைத்தொடர்பு சேவை உத்தியோகத்தர் சங்கம், அகில இலங்கை உப தபால் அத்தியட்சகர் சங்கம் போன்ற சங்கங்கள் தொழிற்சங்க நடவடிக்கைகளில் ஈடுபட்டிருந்தன. அன்றைய தினம் இந்த அரசாங்கத்தினுடைய அச்சுறுத்தல் காரணமாக வேலைக்குச் சென்ற அரச உத்தியோகத்தர்களுக்கு விசேட சான்றிதழ் ஒன்றையும், விசேட சம்பள உயர்வையும் வழங்குவதற்கு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்களின் பரிந்துரையின் பேரில் நேற்றைய தினம் அமைச்சரவையில் தீர்மானமொன்று மேற்கொள்ளப்பட்டிருப்பதாக அறியக்கூடிய தாக இருக்கின்றது. இது நேர்மையற்ற ஓர் அணுகு முறையாகும்.

பொருளாதார நெருக்கடி காரணமாக நாட்டில் ஏற்பட்டிருக் கின்ற விலை அதிகரிப்புகளால் மக்கள் அன்றாட வாழ்க்கைச் செலவை ஈடுசெய்ய முடியாத நிலைமையிலே, இந்தத் தொழிற்சங்கங்கள் தங்களுக்கிருக்கின்ற சட்டபூர்வமான உரிமைகளின் அடிப்படையில் போராட்டத்தை நடத்தியிருக் கின்றன. அவர்களுடைய போராட்டத்தை நலினப்படுத்துவதற் காகவும், அதனைத் தோற்கடிப்பதற்காகவும் மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் இவ்வாறு குள்ளநரித்தனமான ஒரு செயற்பாட்டைச் செய்வது மிகவும் கண்டனத்துக்கு உரியது. தங்களுடைய அடிப்படைச் சம்பளத்தை 25,000 ரூபாயால் அதிகரிக்க வேண்டுமென்றும் பதவி உயர்வு முறைமையுடன் கூடிய அபிவிருத்தி உத்தியோகத்தர் சேவைப் பிரமாணக் குறிப்பை வழங்க வேண்டுமென்றும் சம்பளத் திட்டத்தை அதிகரித்தல், அதிவிசேட தரத்தில் நிர்வாக அபிவிருத்தி உத்தியோகத்தர் பதவியை ஏற்படுத்துதல், பொருளாதார அபிவிருத்தி உத்தியோகத்தர் சேவையை ஏற்படுத்துதல், பதிற்கடமைக் கொடுப்பனவுகளுக்கு ஏற்பாடுகளை மேற்கொள்ளுதல் மற்றும் ஏனைய படிகளை அதிகரித்து வழங்க வேண்டுமென்றும் பல்வேறு கோரிக்கைகளை முன்வைத்து அவர்கள் அந்தப் போராட்டத்தை நடத்தியிருந்தார்கள். ஆகவே, அவர்களுடைய கோரிக்கைகள் முற்றுமுழுதாக ஏற்றுக் கொள்ளப்பட வேண்டும். மேலும், பல்கலைக்கழக கல்விசாரா ஊழியர்களுடைய போராட்டம் 71ஆவது நாளாகவும் நடை பெற்றுக்கொண்டிருக்கின்றது. அவர்கள் முன்வைத்த கோரிக்கைகள் இன்னமும் ஏற்றுக்கொள்ளப்படவில்லை.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
நான் முடிக்கின்றேன்.

ஆகவே, பல்கலைக்கழக கல்விசாரா ஊழியர்களுடைய கோரிக்கைகளை நிறைவேற்றக்கூடிய வகையில், உடனடியாக ஓர் இணக்கப்பாட்டுக்கு அரசாங்கம் வர வேண்டும். அந்தப் போராட்டம் நீடிக்கின்ற காரணத்தால் பல்கலைக்கழக மாணவர்களுடைய கல்வி மிக மோசமாகப் பாதிக்கப் படுகின்றது. இந்த விடயத்தில் அரசாங்கம் பாராமுகமாக இருக்கின்றது. SLAS, SLEAS போன்ற உயர் பதவிகளில் இருக்கின்றவர்களுடைய கோரிக்கைகள் ஏற்றுக்கொள்ளப் படுகின்ற அதேநேரத்திலே, இவர்களுடைய கோரிக்கைகள் புறக்கணிக்கப்படுவது கவலைக்குரியது. ஆகவே, இந்த விடயத்தை உடனடியாக அரசாங்கம் கருத்திலெடுத்துத் தீர்வு காண வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තවරාජා කලෙයි අරසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.35]

ගරු තවරාජා කලෙයි අරසන් මහතා
(மாண்புமிகு தவராஜா கலை அரசன்)
(The Hon. Thavaraja Kalai Arasan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இடம்பெறும் மதுவரிக் கட்டளைச் சட்டத்தின் கீழான அறிவித்தல் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு பேசிய அதிகமான அரசாங்கத் தரப்பு உறுப்பினர்கள் மது அருந்துவதை இன்னும் ஊக்கப்படுத்த வேண்டுமென்ற அடிப்படையிலேயே பேசியிருந்தார்கள். இது மிகவும் மனவேதனையான ஒரு விடயமாகும். இந்த நாட்டில் மது அருந்துபவர்களால் ஏற்படுத்தப்படுகின்ற அழிவுகள், தீங்குகள் பற்றி நாங்கள் சற்று ஆராய வேண்டும்; யோசிக்க வேண்டும். இன்று இளம் பராயத்தினர் முதல் முதியவர்கள் வரை மதுவுக்கு அடிமையாகி, மிக மோசமான செயல்களில் ஈடுபடுகின்றார்கள். மதுப் பழக்கத்தால் எத்தனையோ குடும்பங்கள் சீரழிந்து, குடும்ப வாழ்க்கையை முன்னோக்கிக்கொண்டு செல்ல முடியாமல் பலர் தற்கொலை செய்கின்றார்கள். இவற்றை எல்லாம் அவர்கள் அறியவில்லைபோல் தெரிகின்றது.

இன்று இச்சபையில் இந்த நாட்டிலுள்ள சட்டவிரோத மது உற்பத்தி நிலையங்கள் சம்பந்தமாகவும் பேசப்பட்டது. இந்த நாட்டில் சட்டத்தையும் ஒழுங்கையும் நிலைநிறுத்தக்கூடிய பொலிஸார் அது சம்பந்தமாக நடவடிக்கை எடுக்க வேண்டும். அவர்கள் நடவடிக்கை எடுக்கின்றார்களா? என்ற கேள்வி இருக்கின்றது. அவர்களில் சிலர், கள்ளச் சாராயம் உற்பத்தி செய்பவர்களுக்கு உதவியாகச் செயற்படுகின்றார்கள் என்பதை இங்கு நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அடுத்து, நாம் இந்த நாட்டின் அபிவிருத்தி சம்பந்தமாகப் பார்ப்போம். இந்த நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புகின்ற விடயம் பற்றிப் பேசப்படுகின்றது. யுத்த காலத்துக்கு முன்னர், எங்களுடைய வடக்கு, கிழக்குப் பிரதேசங்களில் பல கைத்தொழில் பேட்டைகள் இருந்தன. எனினும், தற்பொழுது அவை அழிக்கப்பட்டு இருக்கின்றன.

[ගරු තවරාජා කලෙයි අරසන් මහතා]

අව්වාරානා කෙත්තොළිල් පේට්ටෙකලෙයිප් පුතුප්පිත්තු අල්ලතු අතර්කුප් පතිලාක පුතිතාකක් කෙත්තොළිල් පේට්ටෙකලෙයි උරුවාක්කි මුන්නෝක්කිච් චෙල්ලක්කූටිය වකෙයිල් එන්තවිතමාන චට්ට ඒර්පාටුකළුම් ඉල්ලෙ එන්පතෙ නාන් ඉන්ත ඉටත්තිල් චුට්ටික්කාට්ට විරුම්පුකින්රේන්. කුරිප්පාක, ඉන්ත නාට්ටිල් වාළ්කින්ර තමිල් මක්කළින් පිරච්චිනෙ තොටර්පිල් අතිකමානවර්කළ් කවනම් චෙලුත්තාමෙයාල්, ඉන්රු අන්ත මක්කළින් නිලෙමෙ මික මෝචමාක ඉරුක්කින්රතු.

චම්මාන්තුරෙ පිරතේච චෙයලාළර් පිරිවුක්කුට්පට්ට තොට්ටාච්චුරුංකි වට්ටෙයිලුළ්ළ නෙර්චෙය්කෙක් කාණි චම්පන්තමාක නාන් 2023ආම් ආණ්ටින් ඉරුතියිල් Adjournment Motion ඔන්රෛක් කොණ්ටුවන්තේන්. අතන්පෝතු, කාණි විටයත්තුක්කුප් පොරුප්පාක ඉරුන්ත අමෙච්චර් අවර්කළ් අතු තොටර්පිල් විරෛන්තු නටවටික්කෙ එටුප්පතාකක් කූරිනාර්. අතන් පින්නරුම්, නාංකළ් අවරෛච් චන්තිත්තුප් පේචිනෝම්. ආනාලුම්, අතු චම්පන්තමාන නටවටික්කෙ තොටර්න්තුම් ඉළුපරිනිලෙයිලේ ඉරුන්තුකොණ්ටු ඉරුක්කින්රතු. අණ්මෙයිල් නාංකළ් මාවට්ටච් චෙයලාළරෛච් චන්තිත්තුප් පේචියපෝතු, අව්විටයත්තිල් එන්තවිතමාන මුන්නේර්රමුම් ඉල්ලාත ඔරු නිලෙමෙයෛප් පාර්ත්තෝම්. තොට්ටාච්චුරුංකි වට්ටෙ එන්පතු, තමිල් මක්කළින් පූර්වීක ඉටමාකුම්. අතර්කාන ආතාරංකළ් අන්ත මක්කළිටම් ඉරුක්කින්ර නිලෙයිල්, අන්ත ඉටත්තිල් වේරු නපර්කළ් අටාත්තාක වේලාණ්මෙ චෙය්වතු මනවේතනෙ අළික්කින්රතු. එනවේ, ඉන්ත විටයම් තොටර්පිල් කූටුතලාන කවනම් චෙලුත්ත වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රේන්.

එංකළුටෙය මාකාණම් කටන්ත කාල යුත්ත චූළලාල් මිකවුම් පාතික්කප්පට්ට නිලෙයිල් ඉරුක්කුම්පෝතු, අංකු ඉල්මනෛට් පෝන්ර කනිය මණല් අකල්වුකළෛ මේර්කොළ්වතාල්, අන්තප් පිරතේචත්තින් චූළල් මාත්තිරමල්ල, අංකු වාළුකින්ර මක්කළුම් පාතික්කප්පටුවාර්කළ්. නාංකළ් කටන්ත වරුටම්කූට, විටයත්තුක්කුප් පොරුප්පාන අමෙච්චරිටම් ඉතු චම්පන්තමාක එටුත්තුරෛත්තෝම්. චිරිතු නේරත්තුක්කු මුන්නර්, ඉංකු පේචිය චුර්රුච් චූළලුක්කුප් පොරුප්පාකවිරුක්කුම් ඉරාජාංක අමෙච්චර් කෙළරව වියාළේන්තිරන් අවර්කළුම්, එමතු මාකාණත්තිල් මේර්කොළ්ළප්පටුම් ඉල්මනෛට් අකල්වු චම්පන්තමාකප් පේචියිරුන්තාර්. ඉව්වාරාන චෙයර්පාටුකළෛ ඔරුපෝතුම් අනුමතික්කමාට්ටේනෙන අවර් උරුතියළිත්තිරුන්තාර්. අතර්කාක උණ්මෙයිලේයේ නාන් අවරෛප් පාරාට්ටුකින්රේන්.

එංකළුටෙය කිළක්කු මාකාණත්තිල් කුරිප්පාක වාකරෛ, තිරුක්කෝවිල් පෝන්ර පිරතේචංකළිල් ඉල්මනෛට් කනිය වළ අකල්වුක්කුරිය මුන්නෙටුප්පුකළ් මිකත් තීවිරමාක මුන්නෙටුක්කප්පට්ටු වරුකින්රන. ඉන්ත විටයත්තිල් කෙළරව ඉරාජාංක අමෙච්චර් අවර්කළ් කූටුතලාන කවනමෙටුත්තු, අන්තච් චෙයර්පාට්ටෛ නිරුත්තුවතර්කුරිය නටවටික්කෛකළෛ එටුක්ක වේණ්ටුම්. ඒනෙන්ර්රාල්, කටන්ත කාලංකළිල් අව්වාරාන අකල්වුකළ් මේර්කොළ්ළප්පට්ට ඉටංකළුම් චුර්රුච් චූළලුම් මික මෝචමාකප් පාතික්කප්පට්ටු ඉරුක්කින්රන. ඉව්වාරාන චෙයර්පාටුකළ් එංකළුටෙය පිරතේචංකළිල් මුන්නෙටුක්කප්පටුම්පෝතු, වරුමෛක් කෝට්ටුක්කුක්කීල් වාළ්කින්ර එංකළුටෙය මක්කළ් මික මෝචමාකප් පාතික්කප්පටුවාර්කළ් එන්පතිල් එන්තවිත ඉයප්පාටුම් ඉල්ලෙ.

ඉන්ත අරචාංකම් එංකළුටෙය මක්කළින් එතිර්කාලම් තොටර්පිල් කූටුතල් අක්කරෛ චෙලුත්තවිල්ලෙ එන්පතෛ නාන් ඉන්ත ඉටත්තිල් කූර වේණ්ටුම්. ඉන්ත නාට්ටිලුළ්ළ තමිල් මක්කළුටෙය පිරච්චිනෙකළෛත් තීර්ත්තාල්තාන් ඉන්ත නාටු මුන්නේර්රප් පාතෛයිල් චෙල්ලුම් එන්පතෛ නීංකළ් ඔව්වොරුවරුම් උණර්න්තුකොළ්ළ වේණ්ටුම්. අන්ත අටිප්පටෛයිල්, එංකළුටෙය මක්කළින් පිරච්චිනෙකළෛ නීංකළ් තීර්ත්තුවෛක්ක වේණ්ටුමෙන්ර කුරුත්තෛ මුන්වෛත්තු, චන්තර්ප්පම් වළංකිය කෙළරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළුක්කු නන්රි කූර, මුටික්කිරේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.41]

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ජූලි 10වැනි දා. මීට අවුරුදු දෙකකට කලින් මේ රටේ මිනිස්සු පාරට බැහැලා, එවකට තිබුණු රජයත්, ජනාධිපතිවරයාත් ගෙදර යවලා, අනුප්‍රාප්තික ජනාධිපතිවරයා විධියට වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා පත් කරගෙන අවුරුදු දෙකක් සම්පූර්ණ වෙනවා ජූලි 20වන දාට. එදා ඒ මිනිස්සු පාරට බැහැලා අරගළ කරන්නට මූල් වෙච්ච ප්‍රධාන කාරණා වුණේ මේ රටේ එවකට පැවති ආර්ථික අර්බුදයත්, ඒ වාගේම දේශපාලන අර්බුදයත්. මේ විවිධ කාරණාත් එක්ක මාස 24ක් ගත වුණාට පස්සේ අපි ආපස්සට හැරිලා බලන්න ඕනෑ, ඒ ආර්ථික අර්බුදය, දේශපාලන අර්බුදය සැබෑ ලෙස විසඳිලා ද කියලා. මේ රටේ ආර්ථික අර්බුදය සම්බන්ධව නිසි කියවීමක් නැතිව, ඒ ආර්ථික අර්බුදය නිර්මාණය කරපු නිර්මාතෘවරුන් මේ ආර්ථික අර්බුදය ඔසවාගෙන ආපු ගමන් මගේම තවත් ඉස්සරහට යන්න උත්සාහ කරනවා. අවුරුදු 46ක් පුරාවට ගෙනිච්ච ඒ නවලිබරල් ආර්ථිකය, විවෘත ආර්ථිකය, වෙළෙඳ පොළ ආර්ථිකය තවත් ඔසවාගෙන යමින් මේකට පැලැස්තර විසඳුම් දමමින් තමයි ඔවුන් ගමන් කරන්නේ. එම නිසා මතුපිටින් යම් විසඳුමක් තිබෙනවා, ප්‍රශ්නය විසඳලා කියලා පෙන්වන අය, වර්තමානයේ ගෙනෙන පනත් තුළින්ම සමහර වෙලාවට පෙනෙනවා, මේ ප්‍රශ්නයට හරි කියවීමක් ලබා දී තිබෙනවා ද කියන කාරණාව.

මේ රටේ ආදායම් වැඩි වෙන්න ඕනෑ. රාජ්‍ය ආදායම වැඩි වෙන්න අවශ්‍ය ප්‍රධාන කොටස බදු ආදායම. හැබැයි බදු අය කළ යුතු, අය නොකළ යුතු ක්ෂේත්‍ර පිළිබඳව හරි කියවීමක් නැතිව එදා 2019දී "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් කළා සේම, පසුගිය කාලයේ IMF උගුල මත හිරවෙලා වැඩි කළ විවිධ බදු වර්ග නිසා රට පුරාම අර්බුදයක් ඇති වුණා. සුරාබදු දෙපාර්තමේන්තුවට අය විය යුතු බදු සම්බන්ධව අවස්ථා ගණනාවකදී අපි කිව්වා. අවස්ථා කිහිපයකදී හිතුමතේ වැඩි කරපු සුරා බද්ද නිසා මොකක්ද වුණේ? 2023දී මත්පැන්වල මිල වැඩි කරලා මත්පැන් නිෂ්පාදනාගාරවල බලපත්‍ර ගාස්තු වැඩි කරලා කරපු ක්‍රියාවලිය තුළ එතෙක් ලැබිච්ච සුරාබදු ආදායමත් නොලැබෙන තත්ත්වයක් නිර්මාණය වුණා. ඒ නිසා තමයි ජනවාරි මාසයේ නිකුත් කරපු ගැසට් නිවේදනය පෙබරවාරි මාසයේදී reverse කරලා දැන් වෙනත් විධියකට එය සම්මත කර ගන්න හදන්නේ.

මේ බදු ප්‍රතිපත්තිය නිසා දැන් ඇති වී තිබෙන ප්‍රශ්න ගැන බලන්න. එක පැත්තකින් ගත්තාම මුළු රාජ්‍ය සේවයම අද කඩා වැටිලා. දැන් මේ රටේ ආර්ථික ස්ථාවරතාවක් තිබෙනවා කිව්වාට එවැනි තත්ත්වයක් ඇති වෙන්න පුළුවන් ද? දේශපාලන ස්ථාවරභාවයක් තිබෙනවා නම් අද එහෙම වෙන්න පුළුවන් ද? අද මේ රටේ ආර්ථික ස්ථාවරභාවයක්වත්, දේශපාලන ස්ථාවරභාවයක්වත් සැබෑ ලෙස නැහැ. අද තිබෙන්නේ සමස්තයම පාරට බැහැලා වැඩ වර්ජන කරන කාලයක්. ඉතිහාසයේදී මෙවැනි අවස්ථා අපි දැක්කේ අහම්බයක් විධියට. ඒත් අවස්ථා කිහිපයක් විතරයි. අද සමස්ත රාජ්‍ය සේවයම පාරට බැහැලා තිබෙනවා.

1980දී ජූලි වැඩ වර්ජනය තිබුණා. අදට අවුරුදු 44ක් වෙනවා. ඒ ජූලි වැඩ වර්ජනය වෙලාවේ එදා රුපියල් 10කින් දෛනික පඩිය වැඩි කරන්න කියලා පාරට බැස්ස ඒ රාජ්‍ය සේවකයන් 40,000ක් ගෙදර යවපු ජේ.ආර්. ජයවර්ධන, රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව ඔබතුමියටත් හොඳට මතක ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එදා රාජ්‍ය සේවකයන් 40,000ක් ගෙදර යැව්වා. රාජ්‍ය සේවකයන් සිය ගණනක් සියදිවි හානිකර ගත්තා. එදා එහෙම කරපු ඒ ආණ්ඩුව අද වෙනකොට නැවත වතාවක් වෘත්තීය සමිති සහ මිනිසුන්ගේ සාධාරණ ඉල්ලීම් පැත්තකට දාලා, පයිසෙකට දාලා මෝඩවුන් ගන්නවා. වැඩ වර්ජනය කරපු නැති මිනිසුන්ට increment එකක් දුන්නා කියලා මේ ප්‍රශ්නය විසඳෙනවා ද? කැත්තට පොල්ල විධියට ඉඳලා මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් ද? ආණ්ඩුවෙන් අපි ඉල්ලනවා, මේ අර්බුදය හරි ලෙස කියවා මීට සාධාරණ මැදිහත්වීමක් කරන්න කියලා. වෛද්‍යවරු වැඩ වර්ජනය කරනකොට රුපියල් 40,000ක DAT allowance එකක් දුන්නා. හැබැයි, ඒකට සමගාමීව තිබෙන අනෙකුත් සේවා ගැන කිසිම තැකීමක් නැහැ. ඒ නිසා ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අරගළයත් සාධාරණයි. බටහිර වෛද්‍යවරු සහ ආයුර්වේද වෛද්‍යවරු අතර එවැනි පරතරයක් තිබෙනවා ද? ඒ නිසා කිසිම කියවීමකින් තොරවයි ආණ්ඩුව මේ දේවල් ක්‍රියාත්මක කරන්නේ. විධායක ශ්‍රේණියේ නිලධාරීන් පඩි වැඩි කරන්න කියලා ඉල්ලනකොට ඔවුන්ට රුපියල් 20,000ක් දෙනවා.

ඔව්, දෙන්න ඕනෑ. හැබැයි, ඒ හා සමානව සේවය කරන, ඔවුන්ට සමගාමීව යන අනෙකුත් සේවකයන්ගේ කාරණාවලට කිසිදු මැදිහත්වීමක් නැහැ. ඒ නිසා මේ වෙලාවේ සිදුවන කළමනාකරණ සේවා නිලධාරීන්ගේ සහ සංවර්ධන සේවා නිලධාරීන්ගේ අරගළය සාධාරණ අරගළයක්. හැබැයි, ඒවා ගැන කිසිම කියවීමක් නැහැ. ඒක කැත්තට පොල්ල වාගේ ඉඳලා කටයුතු කරන්න ඕනෑ දෙයක්ද? ඒ වාගේම මේ වෘත්තීය සමිති අරගළ ගැන මම යම් අදහසක් කියන්න ඕනෑ. මම දෙවියන්ගේ නාමයෙන් මේ වෘත්තීය සමිති නායකයන්ගෙන් හා මේ පිටුපස ඉන්න දේශපාලන පක්ෂවල නායකයන්ගෙන් මේ සම්බන්ධව යම් ඉල්ලීමක් කරනවා. මේ හැම දෙයක්ම අරගළය තුළින් ජයග්‍රහණය කරන්න ඕනෑ තමයි. හැබැයි, යම් යම් ක්ෂේත්‍ර සම්බන්ධව මීට වඩා සානුකම්පිත වෙන්න ඕනෑ. පළමුවැනි කාරණාව, සෞඛ්‍ය ක්ෂේත්‍රය. දෙවැනි කාරණාව, අධ්‍යාපන ක්ෂේත්‍රය. මේ අර්බුද තව තවත් නිර්මාණය වන ආකාරයට ඒ ක්ෂේත්‍රවල වැඩ වර්ජනය කරන්න යන්න එපා. ගුරුවරුන්ගේ ප්‍රශ්න සාධාරණයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් ගුරුවරියක් විධියට ඒ ගැන දන්නවා. අපි දන්නවා, ඔවුන්ගේ ප්‍රශ්නය සාධාරණ ප්‍රශ්නයක් බව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉතිහාසයේ කිසිම අවස්ථාවක අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති වර්ජන කළේ නැහැ. ඉතිහාසයේදීත් ගුරුවරුන්ගේ ප්‍රශ්නවලට අනෙකුත් වෘත්තීය සමිති සගයන් සහයෝගය ලබා දුන්නා. ඒ වාගේම මේ මොහොතේ විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලය කරන වර්ජනයට දවස් 70ක් ගත වෙලා, බරපතළ ප්‍රශ්නයක් නිර්මාණය වෙලා තිබෙනවා. එම නිසා මේ කාරණා සම්බන්ධව කැත්තට පොල්ල වාගේ ඉන්නේ නැතුව, ආණ්ඩුව සාධාරණව මැදිහත් වෙන්න ඕනෑ. ඒ විධියට මැදිහත් නොවන තාක්කල් මේ ප්‍රශ්නය තවදුරටත් ප්‍රශ්නයක්ම තමයි.

මම අවසාන වශයෙන් කියන්නේ, මේවා නිකම් පැලැස්තර දාලා විසඳන්න ඕනෑ කාරණා නොවෙයි කියන එකයි. මම මීට කලින් අවස්ථාවකත් කිව්වා වාගේ මේ වැටුප් සම්බන්ධව ජාතික වැටුප් ප්‍රතිපත්තියක් හදන්නේ නැති තාක්කල් මේ ප්‍රශ්න තවත් ප්‍රශ්න බවට පත් වෙනවා විතරයි. ඒ නිසා ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සෑදීම සඳහා වන විධිමත් කොමිෂන් සභාවක් අවශ්‍යයි. පසුගිය දවස්වල අපි දැක්කා, මොකක්ද එකක් හදලා තිබෙනවා. කවුද, කොහේද, කින්ද මන්ද මොකක්වත් දන්නේ නැහැ. ඒ නිසා පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂවල මැදිහත්වීම එක්ක ජාතික වැටුප් කොමිසමක් සමඟ ජාතික වැටුප් ප්‍රතිපත්තියක් හදලා තමයි මේ අර්බුදය විසඳන්න ඕනෑ කියන කාරණාව සිහිපත් කරමින්, මේ සම්බන්ධව රජයේ සානුකම්පිත සහ අත්‍යවශ්‍ය මැදිහත්වීම කරන්න කියන කාරණාවත් සිහිපත් කරමින් මා නිහඬ වෙනවා. අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලුම් අමුණුගම රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.46]

ගරු දිලුම් අමුණුගම මහතා (ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திலும் அமுணுகம - முதலீட்டு மேம்பாடு இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilum Amunugama - State Minister of Investment Promotion)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින සුරාබදු ආඥාපනත යටතේ නිවේදනත්, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසිත්, ඒ වාගේම Strategic Development Projects Act, No. 14 of 2008 යටතේ පළ කළ Gazette relating to "Dedicated Textile Manufacturing Zone" in Eravur, Batticaloa District නිවැරැදි කර ගැසට් කිරීමත් සිද්ධ වෙනවා. ගරු වියාලේන්ද්‍රන් රාජ්‍ය ඇමතිතුමාත් කියපු ආකාරයට ඒ හරහා සිද්ධ වෙන්නේ මෙකයි. 2021 වර්ෂයේදී මඩකලපුව දිස්ත්‍රික්කයේ පුන්නකුඩා කියන ප්‍රදේශයේ අක්කර 200ක් ඉක්මවා ගිය ඇහලුම්, නැත්නම් රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තපුරයක් ආරම්භ කරලා තිබෙනවා. මේ වෙනකොට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඒ සඳහා විශාල මුදලක් ආයෝජනය කරලා, ඒ Textile Park එකේ වැඩ කටයුතු අවසාන කරලා, දැන් එක සමාගමක්, ඒ කියන්නේ

[ගරු දිලුම් අමුණුගම මහතා]

ජේ ජේ මිල්ස් ලංකා කියන සමාගම එහි වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. මෙහිදී දිගින් දිගටම විපක්ෂය මේ බදු සහන ගැන වරදවා වටහා ගෙන චෝදනා කළත්, එරාවුර් කියන මේ නිදහස් කලාපය තුළට ඇතුළු වන ඕනෑම ආයෝජකයෙකුගේ ආයෝජන threshold එක ඇමෙරිකානු ඩොලර් මිලියන 500 ඉක්මවා යා යුතුයි. ඒ විධියට ඇමෙරිකානු ඩොලර් මිලියන 500 ඉක්මවා ගිය, ඒ අවම මට්ටමක ආයෝජකයෙකු මේ රෙදි නිෂ්පාදනය කිරීම සඳහා ඇතුළත් වෙනවා නම් - රෙදි මැසීම සඳහා නොවෙයි, apparel industry එක නොවෙයි. ඒ කියන්නේ රෙදි ගෙනැල්ලා මහන එක නොවෙයි - ඒ අයට ඉබේටම උපාය මාර්ගික තත්ත්වයක් - strategic status එකක් - ලැබෙන්න තමයි මේ zone එක හදලා තිබෙන්නේ.

එහිදී යම් යම් බදු සහන දීම ගැන විපක්ෂයෙන් කියන කථාව අමූලික බොරුවක්. මේ, කවුරු හරි විදේශිකයෙකුට එන්න කියලා බදු ගෙවන්නේ නැතුව ඉන්න කියනවා නොවෙයි. ඒ බදු සහනය දෙන්නේ, රටට ගෙනෙන ආයෝජනයේ ප්‍රමාණය අනුවයි. උදාහරණයක් ලෙස Eravur Zone එකට ඇතුළුවීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක විශාල ආයෝජනයක් අවශ්‍යයි. මොකද, රෙදිපිළි නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍රවල ආයෝජන මුදල වැඩියි. රෙදි මහන යන්ත්‍රවල වාගේ නොවෙයි. එතකොට ඒ තරම් මුදලක් වැය කරලා තමයි ඒ අය එම zone එකට ඇතුළු වෙන්නේ. මොකද, එළියේ මේ කටයුත්ත කරන්න අමාරුයි. විශේෂයෙන් ම water treatment plants, නැත්නම් ජලය පිරිපහදු කරලා නැවත මුදා හැරීමේ උපාංග වැනි රෙදිපිළි නිෂ්පාදනයට ආවේණික උපාංග දැන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මඟින් එම කලාපය තුළ සකස් කරලා තිබෙනවා.

ඒක මේ අය ආකර්ෂණය කර ගැනීම සඳහා තමයි කරලා තිබෙන්නේ. තනි කෙනෙකු ඇවිල්ලා රෙදිපිළි නිෂ්පාදනාගාරයක් හදලා, ඒකේ water treatment plants සහ marine outfalls වාගේ ඔක්කොම හදනවාට වැඩිය අද ඒ අයට මේ පුරයට ඇවිල්ලා ආයෝජන මණ්ඩලය විසින් සපයා ඇති පහසුකම් - අර මූලික වියදම් දරන්නේ නැතිව - පාවිච්චි කරලා, ඒ අයගේ කර්මාන්තය ආරම්භ කරන්න පුළුවන්. ඒක තමයි මේකේ catch එක, එහෙම නැත්නම් අපි ඇති කරලා තිබෙන ආකර්ෂණීය තත්ත්වය. එහිදී තිබුණු ප්‍රශ්නය මේකයි. 2021දී නිකුත් කළ ගැසට් පත්‍රයෙන් බලාපොරොත්තු වුණේ මෙය වුණත්, මේ කර්මාන්තපුරයට ඇතුළු වුණත් උපාය මාර්ගික ව්‍යාපෘතියක් හැටියට මේවාට අනුමැතිය ලබා ගන්න නැවත නැවතත් කැබිනට් මණ්ඩලයට යන්න ඕනෑ වාගේ තත්ත්වයක් තමයි එම ගැසට් පත්‍රය කියෙවිවාම පැහැදිලි වෙන්නේ. ඒක නිවැරදි කිරීම තමයි අද කෙරෙන්නේ. මොකක්ද ඒක නිවැරදි කරන්න හේතුව? අද උදේ ඉඳන් මේ සමහර අය බෙරිහන් දෙනවා අපි දැක්කා, හිතවතුන්ට strategic status දෙනවා කියලා. උපාය මාර්ගික ව්‍යාපෘති තත්ත්වය ලබා දීම විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක අපි ගිවිසුම්ගත වුණාට පස්සේ නතර කරලා තිබෙනවා. පසුගිය නොවැම්බර් මාසයේ සිට කිසිම ව්‍යාපෘතියකට අපට ඒ තත්ත්වය ලබා දෙන්න බැහැ. මම නම් ඒක දකින්නේ වාසිසහගත තත්ත්වයක් හැටියට නොවෙයි, අවාසිසහගත තත්ත්වයක් හැටියටයි.

අපේ වාමර සම්පත් දසනායක රාජ්‍ය ඇමතිතුමා කියපු ආකාරයට, ඒ ගිවිසුම්ගතවීමේ වාසි-අවාසි, අපහසු තැන්, පහසු තැන් වාගේ හැම දෙයක්ම තිබෙනවා. මේකේදී අපට තිබෙන අවාසිය තමයි අපට ඩොලර් මිලියන 500 නොවෙයි, කොහෙන් හරි ඩොලර් බිලියනය ඉක්මවන ව්‍යාපෘතියක් ලංකාවට එනවා නම් ඒකට උපාය මාර්ගික තත්ත්වයවත් - strategic status එකවත් - දෙන්න බැරි වෙන එක. ඒ හේතුව නිසා නතර වුණු ව්‍යාපෘති කිහිපයකුත් තිබෙනවා. ඒකත් මම කියන්න අවශ්‍යයි. ඒ, නරක පැත්ත. කෙසේ වෙතත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම අනුව යනකොට අපි 2021දී ඒ තීන්දුව අරගෙන තිබුණේ නැහැ. හැබැයි, ඔය කියන zone එකටත් එකින් එකට කැබිනට් අනුමැතිය ගන්න ගියොත් - දැන් strategic status ලබා දීම අත්හිටුවා තිබෙන නිසා - අපට ඒ zone එකටත් ආයෝජකයින් ගේන්න බැරි වන නිසා තමයි වහා වහාම මේ මොහොතේදී මේ නිවැරදි කිරීම කරන්නේ කියන කාරණය මම පැහැදිලි කරන්න ඕනෑ. අද මේ නියමය අනුමත වුණාට පසුව ඩොලර් මිලියන 500 ඉක්මවූ ආයෝජනයක් සහිත යම් ආයෝජකයෙක් රෙදිපිළි - අමුද්‍රව්‍ය - නිෂ්පාදනය පිණිස එනවා නම්, ඒ අයට ඒ කලාපයට ඇතුළු වෙලා කටයුතු කරගෙන යන්න පුළුවන්.

වියාලේන්ද්‍රන් රාජ්‍ය ඇමතිතුමා කිව්වා, මේ නිෂ්පාදන කලාපය හරහා මධ්‍යකලපුව දිස්ත්‍රික්කයට විශාල රැකියා ප්‍රමාණයක් ලැබෙනවා කියලා. මේක, මූලිකවම 10,000 ඉක්මවා ගිය රැකියා ප්‍රමාණයක් ලැබෙන, ඉතාම වටිනා ව්‍යාපෘතියක් කියන කාරණයත් මම මතක් කරන්න ඕනෑ. මම දීර්ඝව ඒ පිළිබඳ කථා කරන්නේ නැහැ. අද අපි දැක්කා, දිගින් දිගටම චෝදනා එල්ල වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු මංජුලා දිසානායක මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (MRS.) MANJULA DISSANAYAKE left the Chair, and DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] took the Chair.

ගරු දිලුම් අමුණුගම මහතා
(மாண்புமிகு திளும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියමින් සිටියේ මේකයි. අදත් විපක්ෂයෙන් අපට දිගින් දිගටම චෝදනා එල්ල කළේ බදු සහන අපි ලබා දෙනකොට මිතුරන්ට ලබා දෙනවා, නැත්නම් විදේශිකයන්ට ඒ සහන ලබා දෙනවා, දේශීය ව්‍යාපාරිකයන්ට ලබා දෙන්නේ නැහැයි කියලායි. ඒ නිසා මම මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ආයෝජනයක් කරන්න ඩොලර් 100ක් අරගෙන එන පුද්ගලයාට මේ බදු සහන ලැබෙන්නේ නැහැ. සෑම ක්ෂේත්‍රයකම, ආයෝජන මණ්ඩලය විසින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා අනුමත කර ගන්නා ලද අවම ආයෝජන මට්ටමක් නැත්නම් minimum threshold එකක් මේ සඳහා යොදාගෙන තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, BOI status ලබා ගැනීම සඳහා අඩුම threshold එක ඩොලර් ලක්ෂ 5 දක්වා අපි පසුගිය කාලයේ අඩු කළා. ඒ වාගේම ඒක ඇතුළතත් විෂයානුබද්ධව නොයෙකුත් නිෂ්පාදන සඳහා වෙන් කරපු thresholds තිබෙනවා. මෙන්න මේ thresholds අනුව තමයි අපි ඒ බදු සහන ලබා දෙන්නේ. මම නම් කැමැත්තෙන් නොවෙයි මේක කියන්නේ, අකැමැත්තෙන්. අපි ආයෝජකයෝ ගෙන්වා ගන්න නම් තරගකාරී වෙන්නට අවශ්‍යයි. පසුගිය කාල සීමාවේ - විශේෂයෙන්ම මහ කොළඹ ආර්ථික කොමිසම තිබුණු

කාලයේ - ආපු නීති රීති අනුව ආයෝජකයින්ට සහන රැසක් ලබා දීමේ හැකියාව තිබුණා. දැන් අපට ඉතුරු වෙලා තිබෙන්නේ එක ක්‍රමවේදයයි. ඒ තමයි, enhanced capital allowance කියන ක්‍රමවේදය. ඒකෙන් සිද්ධ කෙරෙන්නේ තමන් කරන ආයෝජනය ඩොලර් මිලියන 500 නම් එය නැවත උපයා ගන්නා තුරු බදු අය නොකිරීම. ඒක පමණයි දැනට ලබා දීලා තිබෙන සහනය. ඒක ඉතාම සාධාරණ එකක්. පසුගිය කාලයේ තිබුණා, අවුරුදු 50කට බදු සහන දෙන්න පුළුවන්, අවුරුදු 25කට දෙන්න පුළුවන් කියලා ක්‍රම. ඒවා ඔක්කොම දැන් නතර කරලා තිබෙන්නේ. ඒ නිසා විදේශ ආයෝජකයින්ට වුණත් දෙන සහන ප්‍රමාණය දැන් අපි අඩු කරලා තිබෙනවා. ආයෝජන මණ්ඩලය සහ අපි විශාල සටනක යෙදෙනවා, මේ කියන එක කාණ්ඩයක සහනයක් විතරක් පවත්වාගෙන අපි මේ ආයෝජකයින් ආකර්ෂණය කර ගන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන්.

හැබැයි, ඒ ප්‍රශ්නයට යම් පිළිතුරක් අපට ලැබෙන්නේ ආයෝජන පරිසරය හොඳ තත්ත්වයේ තිබෙනවා නම් පමණයි. සහනම නොවෙයි, ආයෝජන කියන්නේ. ඇෆ්ගනිස්ථානයේ හැම සහනයම දෙනවා කිව්ව පලියට අපි ගිහිල්ලා ඒ රටේ ආයෝජනය කරන්නේ නැහැ නේ. වෙනත් තැනක සහන දෙනවාය කිව්වාට ආයෝජකයෙකු ගිහිල්ලා, ඒවායේ ආයෝජනය කරන්නේ නැහැ නේ. පසුගිය කාලයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ රජය අනුගමනය කරපු ක්‍රියා පිළිවෙත නිසා අද ආයෝජකයන් ශ්‍රේණිගත කරන ආයතනවල ශ්‍රේණිගත කිරීම්වලින් අපි ඉහළට පැමිණ තිබෙනවා. විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රය ගත්තාම ඒ අයගේ ශ්‍රේණිගත කිරීම්වල හොඳම destination එකක් හැටියට අපේ රට සටහන් වුණා. ඒ වාගේම ආයෝජන ශ්‍රේණිගත කිරීමේ ආයතන ගත්තොත්, ඒ ශ්‍රේණිගත කිරීම්වලිනුත් අද වනකොට අපි ඉහළට ඇවිල්ලා තිබෙනවා.

අද විනිමය අනුපාතය දෙස බැලුවාම අපිට පේනවා එහි යම් ස්ථාවර මට්ටමක් තිබෙන බව. තෙල් ගහගන්න ඩොලරයක් නැතුව තිබ්බිච්ච රටේ අද වනකොට ඩොලර් සංචිතය ඉහළ ගිහිල්ලා තිබෙනවා; කොටස් වෙළෙඳ පොළ ස්ථාවර වෙලා තිබෙනවා. ඒ නිසා අද වනකොට සහන දීම් අඩු කරලා තිබුණත්, ආයෝජකයින් සඳහා පවතින පරිසරය සුබ අතකට හැරීම නිසා දැනටත් සෘජු විදේශ ආයෝජන පැමිණෙමින් තිබෙනවා. මම කලිනුත් සඳහන් කරපු ආකාරයට මේ වසරේදී අපට ලබා දී තිබෙන ඉලක්කය ඩොලර් බිලියනයක් වුණත්, මේ වනකොටම අපි ඩොලර් බිලියනයක විතර - ඩොලර් මිලියන 800ක විතර - ආයෝජනයක් ලබා ගැනීම සඳහා වූ ගිවිසුම්වලට අත්සන් කරලා තිබෙනවා. තව නුදුරු දිනයකදි ඉතුරු ගිවිසුම්වලටත් අත්සන් කිරීමේ හැකියාව තිබෙනවා. මේ වසරේ තුන්වැනි කාර්තුව වනකොට අපිට ඩොලර් බිලියන දෙකහමාරක් හෝ තුනක් දක්වා යෑමේ හැකියාව තිබෙනවා කියන කාරණයත් මතක් කරන්නට අවශ්‍යයි. අපි අමාත්‍යාංශ රැසක් එක්ක එකතු වෙලා මේ ආයෝජන කටයුතු කරනවා. ආයුර්වේද විෂය භාර රාජ්‍ය අමාත්‍යතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. ආයුර්වේදමය භෝග වගා කිරීම් සහ ඒවා අපනයනය කිරීම් කරන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන් ඒ අමාත්‍යාංශයත් එක්ක අපි සාකච්ඡා කරගෙන යනවා.

ඊයේ දිනයේදී අපි විශේෂ සාකච්ඡාවක් පැවැත්වූවා, පොලීසියත් එක්ක. ආයෝජකයන් ආරක්ෂා කිරීම - investor protection - සඳහා වෙනම කොට්ඨාසයක් පොලීසියේ ස්ථාපිත කරන්නේ කොහොමද කියන එක පිළිබඳව අපි එහිදී සාකච්ඡා කළා. මොකද, පෙරේදා වෙච්ච සිද්ධිය වාගේ ඒවා දිහා බැලුවාම investor protection කෙසේ වෙතත් අනෙක් අයගේ protection පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. මේ වාගේ සිද්ධීන් දැක්කාම ඒවායෙන් අපට පේන්නේ එක දෙයයි. ආයෝජකයන්ට සෘජුවම රටේ තිබෙන ආරක්ෂක තත්ත්වය බලපානවා. හැබැයි, මේ කාරණය සඳහන් කරපු හැටියේම ටිරාන් අලස් ඇමතිතුමාත්, පොලිස්පතිතුමාත් හොඳ යෝජනාවක් ගෙනාවා, ආයෝජකයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් වාගේම ඒ අයගේ පැමිණිලි විභාග කරන්න, ඔය තිබෙන මාපියා කල්ලි එක්ක ගනුදෙනු කරන්න, කප්පම්, අල්ලස සහ දූෂණ සමඟ ගනුදෙනු කරන්න විශේෂ පොලිස් කොට්ඨාසයක් - investor protection division එකක් - ස්ථාපිත කරන්න ඕනෑය කියලා. ඒ යෝජනාව ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය ඇමතිවරයා හැටියට මා ඉහළින්ම පිළිගන්නවා කියන කාරණයත් මේ අවස්ථාවේදී මතක් කරනවා.

කාල වේලාව ඉක්මවා යන නිසා අනෙකුත් කාරණා ගැන මම ගොඩක් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. දිගින් දිගටම ඇති වන වර්ජන පිළිබඳව කථා කළොත්, දැන් අපිට එක අතකින් ඒ ගැන සතුටු වෙන්න පුළුවන්. මොකද, ඉස්සර පෙළපාළි ගියේ, මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වලට ආවේ විදුලි බලය දෙන්න, ඉන්ධන ටික දෙන්න, කෑම ටික දෙන්න කියලා. නමුත්, අද එන්නේ වැටුප් වැඩි කරන්න කියලා. වැටුප් වැඩි කරන්න කියලා පවත්වන උපවාස, ස්ට්‍රයික් කවදත් තිබුණා. නමුත්, අද වනකොට මේවාට වැඩිය දේශපාලන වළල්ලත් එක්ක සම්බන්ධ වර්ජන රැල්ලක් දියත් කරන එකේ ප්‍රශ්නයක් නැහැ, ස්ථාවර තත්ත්වයක් තුළ. හැබැයි, මේ රජයේ සහ ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ නිසා යම්තම් මේ රටේ ණය ප්‍රතිව්‍යුහගතකරණය සාර්ථක වුණාම දැන් අහනවා, ඒක සුබ ආරංචියක්ද කියලා. ණය ප්‍රතිව්‍යුහගතකරණය සාර්ථක වෙලා, අපේ රටේ තිබෙන ව්‍යාපෘති නැවත ආරම්භ කරන්න හැකියාව ලැබිලා තිබෙන නිසා සංචාරක ක්ෂේත්‍රය සඳහා යම් වාහන ප්‍රමාණයක් ආනයනය කරන්න අපි අනුමැතිය ඉල්ලනවා. මේ ක්ෂේත්‍ර වර්ධනය වෙලා ආර්ථිකය යම් මට්ටමකට ගොඩනැඟුණාම මේ ඉල්ලීම් කිරීමේ හැකියාව තිබෙනවා. අපිට මේ පිටුපස තිබෙන බළල් අත හොයා ගන්න හැකි වන්නේ මේ ආකාරයෙනුයි. උතුරු ප්‍රදේශයේ අද වනකොට මේ වර්ජන සාර්ථක ලෙස ක්‍රියාත්මක වන්නේ නැහැ; නැඟෙනහිර ප්‍රදේශයේ මේ වර්ජන සාර්ථක ලෙස ක්‍රියාත්මක වන්නේ නැහැ. විශේෂයෙන්ම අපේ දේශපාලන පක්ෂ ප්‍රබලව නියෝජනය කරන ප්‍රදේශවල තමයි මේ වර්ජන රැල්ල ක්‍රියාත්මක වෙලා පාසල් වහලා තිබෙන්නේ; රජයේ කාර්යාල වහලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! සභාවේ කටයුතු අවසන් වනතෙක් කාලය ලබා දීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු දිලුම් අමුණුගම මහතා
(மாண்புமிகு திளும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සියලුදෙනාම මේ වැඩ පිළිවෙළට සහාය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
விணா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර සඳහා අය කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 පෙබරවාරි 01 දිනැති අංක 2369/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.18 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 03/2024 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආනයන හා අපනයන (පාලන) පනත: රෙගුලාසි
இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டம்: ஒழுங்குவிதிகள்
IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 මැයි 17 දිනැති අංක 2384/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.18 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය."

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත: නියමය
செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டம்: கட்டளை
STRATEGIC DEVELOPMENT PROJECTS ACT: ORDER

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවුර් ප්‍රදේශයේ ස්ථාපිත "විශේෂිත රෙදිපිළි නිෂ්පාදන කලාපය" සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 මාර්තු 28 දිනැති අංක 2377/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.05.14 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 6 ඉදිරිපත් කිරීම.

අත්‍යවශ්‍ය මහජන සේවා පනත: යෝජනා සම්මතය
அத்தியாவசிய பொதுமக்கள் சேவைச் சட்டம்: தீர்மானம்
ESSENTIAL PUBLIC SERVICES ACT: RESOLUTION

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2024 ජූලි 04 දිනැති අංක 2391/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2024.07.09 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තු දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා.

කල්තැබීමේ ප්‍රශ්න
ஒத்திவைப்பு வினாக்கள்
ADJOURNMENT QUESTIONS

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මෙම ප්‍රශ්නය ඇසීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. සෞඛ්‍ය ඇමතිතුමා වෙනුවෙයි මා මේ ප්‍රශ්නය යොමු කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ වන විට ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධ ආනයනකරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමේ ලිපිලේඛන 880ක් පමණ ගොඩ ගැසී තිබෙන අතර, දේශීය ඖෂධ කර්මාන්තකරුවන්ගේ ද ලියාපදිංචිය අලුත් කිරීමේ ලිපිගොනු 350කට අධික ප්‍රමාණයක් ගොඩ ගැසී තිබේ. මේ පිළිබඳව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන මෙම ගැටලුකාරී තත්ත්වය හමුවේ සෞඛ්‍ය අමාත්‍යවරයාගෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු අපේක්ෂා කරමි.

1. වත්මන් සෞඛ්‍ය අමාත්‍යවරයා පත්වීමෙන් පසු කොපමණ ඖෂධ ප්‍රමාණයකට අලුතින් ලියාපදිංචිය ලබා දී තිබේද?
2. ඖෂධ ආනයනකරුවන් සඳහා නව ඖෂධ ලියාපදිංචි කොපමණ ප්‍රමාණයක් ලබා දී තිබේද?
3. දේශීය ඖෂධ කර්මාන්තකරුවන් සඳහා එතුමා පත්වීමෙන් පසු ලබා දී ඇති නව ඖෂධ ලියාපදිංචි ප්‍රමාණය කොපමණද?
4. ඒ අනුව ඖෂධ ආනයනය හා මිල නියාමනය සම්බන්ධයෙන් මේ වන විට ගනු ලබන ක්‍රියාමාර්ගයන් කවරේද?
5. උක්ත ක්‍රියාමාර්ග නීත්‍යානුකූලභාවයෙන් සිදු වන බවට ඔබතුමා සෑහීමකට පත්වේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මම මේ ප්‍රශ්නය අහන්න හේතුව මෙයයි. හිටපු සෞඛ්‍ය ඇමතිතුමා සිරගත වුණාට පස්සේ, ඒ වාගේම ඒ හිටපු නිලධාරි මහත්වරු සිරගත වුණාට පස්සේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉන්න නිලධාරි මහත්මීන් යම්කිසි ආකාරයේ බියකට, එහෙම නැත්නම් පසුපසට - ආපසු - යන තත්ත්වයක් තමයි අපට දැනගන්නට ලැබී තිබෙන්නේ. ඇත්තටම ඒ නිලධාරින් හැසිරිව්ව ආකාරය සහ ඒ අය කරපු ජාවාරම් නිසා වර්තමානයේ සිටින අනෙක් නිලධාරින්ටත් මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නට සිද්ධ වෙලා ඇති. සෞඛ්‍ය කියන්නේ අපේ විශේෂ විෂයයක්. මේ රටේ ජනතාව ජීවත් කරවන්න තිබෙන්නේ සෞඛ්‍ය ක්ෂේත්‍රය. නීරෝගී පරපුරක් බිහි කරන්නේ සෞඛ්‍ය ක්ෂේත්‍රය. ඒ විතරක් නොවෙයි, අද රට වැටිලා තිබෙන තත්ත්වයෙන් ගොඩ ගන්න අවශ්‍ය කරන මානසික, කායික ශක්තිය ලබා දෙන්න පුළුවන් වෙන්නේත් සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ක එක්ව සෞඛ්‍ය පැත්තෙන් රටේ ජනතාව හරියාකාරව අපි රැක බලා ගත්තොත් විතරයි. මේ ආකාරයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ ඖෂධ මිලදී ගැනීම් සම්බන්ධව යම් යම් ප්‍රශ්න මතු වෙද්දී, එහෙම නැත්නම් පසුබෑමක් සිද්ධ වෙද්දී පිටින් විශේෂයෙන්ම baggage මාර්ගයෙන් වෙනම බෙහෙත් ගෙනෙන ක්‍රමවේදයක් සකස් වෙලා තිබෙනවා. එතකොට ඊළඟට අපට ප්‍රශ්නයක් මතු වෙනවා, මේ ආකාරයෙන් ගෙනෙන බෙහෙත් ප්‍රමිතියෙන් යුක්තද කියලා. එවැනි ආකාරයෙන් ගෙනෙන බෙහෙත් සමාජය තුළ සංසරණය වනකොට, එහෙම නැත්නම් රටේ ජනතාවගේ අවශ්‍යතාව මත සමහර බෙහෙත් නැති වුණාම, ඒ ආකාරයෙන් ගෙනෙන බෙහෙත් මිලදී ගත්තාම ඒ බෙහෙත් ප්‍රමිතියෙන් යුක්තද මේවා ප්‍රමිතියෙන් තොර ඒවා කියලා කවුද තහවුරු කරන්නේ, කවුද සහතික කරන්නේ? අපට ලැබී තිබෙන තොරතුරු අනුව, ඒ ආකාරයෙන් ගෙන්වන බෙහෙත් වැඩි ප්‍රමාණයක් රට තුළට ගලාගෙන එනවා. ඒ නිසායි අපි සෞඛ්‍ය අමාත්‍යවරයාගෙන් මේක අහන්නේ. එදා ඒ ජාවාරම්කාරයෝ නිසා; සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළෙම සිදු වුණු කරුණු කාරණා නිසා රටේ රෝගීන් විශාල ප්‍රමාණයක් මිය ගියා. අපි දන්නා විධියට තවම ඒ ප්‍රමාණය හරියට ගණනය කරලා නැහැ. ඒ වාගේම දැඩි අපහසුතාවකට පත් වුණා, බෙහෙත් සම්බන්ධව. නැවත වතාවක් රට එතැනට තල්ලු වෙමින් පවතීද? මම කියන්නේ නැහැ, දැන් වැරදි කරන, ජාවාරම් කරන කණ්ඩායම් ඉන්නවා කියලා. විශේෂයෙන් මම කියන්නේ, අර කියූ ජාවාරම්කරුවන් නිසා අපහසුතාවට පත් වෙච්ච සමහර නිලධාරීන් දැන් යම් ආකාරයකින් තමන්ගේ ක්‍රියාකාරිත්වය අඩු කරගෙන තමන් බොහොම පරිස්සමින් වැඩ කරන්න උත්සාහ කරනවා වෙන්න පුළුවන් කියන එකයි.

හැබැයි, ඒ උත්සාහය නිසා මේ රටේ ජනතාවට බෙහෙත් සම්බන්ධව ප්‍රශ්නයක් ඇති වුණොත්, ප්‍රමිතිගතව බෙහෙත් ගෙන්වන අයට නිවැරදි ආකාරයෙන් ඒ ගෙන්වන බෙහෙත් ටික ගන්න ක්‍රමවේදයක් සැකසුණේ නැත්නම් හා දේශීය වශයෙන් ප්‍රමිතිගත බෙහෙත් නිෂ්පාදකයන්ගේ බෙහෙත් ගන්න වැඩ පිළිවෙළ හරියට ක්‍රියාත්මක නොවී වෙනත් ආකාරයකින් බෙහෙත් ප්‍රමාණයක් රට තුළට ඇතුළු වුණොත් එතැනදී රටේ ඇති වන තත්ත්වය මොකක්ද? ඒ නිසා මෙතැනදී අප දකින දේවල් සහ නොදකින දේවල් බොහෝ තිබෙන්න පුළුවන්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ නිසායි අපි විශේෂයෙන්ම ඔබතුමාගෙන් මේ ප්‍රශ්න විමසන්නේ.

වර්තමාන සෞඛ්‍ය අමාත්‍යවරයා ගෙන යන ක්‍රියා පටිපාටිය ගැන අපි දන්නවා. ඇත්තටම එතුමා හොඳ අමාත්‍යවරයෙක්. එතුමා තමන්ගේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යනවා. හැබැයි, සමහර තැන්වල සමහර කටයුතු පිටුපස අර පරණ නිලධාරින්ම ඉන්න පුළුවන්. ඒ වාගේම අලුත් නිලධාරීන් විශේෂයෙන් හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන බව අපි දන්නවා. හැබැයි, එය පසුගාමී නොවී, ආපස්සට නොයා, මේ බෙහෙත් ලබා දෙන වැඩසටහන නිවැරදි ආකාරයෙන් කෙරෙන වැඩ පිළිවෙළක් සකස් කරනවා ද කියන එක තමයි මම ප්‍රශ්න

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

කරලා තිබෙන්නේ. මොකද, සෞඛ්‍ය සම්පන්න ජනතාවක් අපි බිහි කරද්දී ප්‍රමිතියෙන් තොර බෙහෙත් යම් ආකාරයකින් රට තුළට ඇවිල්ලා, රටට යම්කිසි පාඩුවක් වනවාට සහ ජනතාවට පාඩුවක් වනවාට අපි කැමැති නැහැ. ඒ වාගේම යම්කිසි හිඟයක් මත හෝ එහෙම නැත්නම් නිෂ්පාදන ක්‍රියාවලියේ අඩු පාඩුවක් මත යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණොත් එතැනදීත් රටේ ජනතාව නිරෝගිභාවයෙන් තොර වන, රෝගී බවට පත්වන අවස්ථා ඇති වෙන්න පුළුවන්. ඒ නිසා අද පවතින තත්ත්වය අනුව අපි හැමදෙනාම එකට එකතු වෙලා මේ රට වැටී තිබෙන තත්ත්වයෙන් ගොඩගන්න අවස්ථාව තිබෙන මේ මොහොතේ, රටේ ජනතාවගේ නිරෝගිකම රැක ගන්න එක විශේෂ වගකීමක්. එය සෞඛ්‍ය අමාත්‍යාංශයට විතරක් තිබෙන වගකීමක් නොවෙයි, සමස්ත පාර්ලිමේන්තුවටම තිබෙන වගකීමක්. එදා අපි මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන කියපු කථා එකක්වත් ඇහුවේ නැහැ. ඒකේ අවසාන ප්‍රතිඵලය තමයි රෝගීන් විශාල ප්‍රමාණයක් මිය යාම. ඉන්පසුව තමයි වැරදිකරුවන් නීතියේ රැහැනට අල්ල ගන්නා වැඩසටහන ක්‍රියාත්මක වුණේ. ඒ වෙනකොට පෙරහැර ගිහිල්ලා ඉවරයි. හැබැයි ඒ ප්‍රමාදයේ සම්පූර්ණ හානිය වුණේ ජනතාවට. ඒ නිසා ජනතාවට හානි වෙන්න දෙන්න බැරි නිසා තමයි ඔබතුමාගෙන් මේ කාරණාව ප්‍රශ්නයක් හැටියට අහන්නේ.

ඒ වාගේම මේ ප්‍රශ්නයටම තවත් කාරණා කිහිපයක් එකතු කරන්න මා කැමැතියි. අපේ රෝහල් පද්ධතිය ගත්තාම, විශේෂයෙන්ම එක එක දිස්ත්‍රික්කවල ප්‍රශ්න විශාල සංඛ්‍යාවක් තිබෙනවා. උදාහරණයකට අපේ පුත්තලම දිස්ත්‍රික්කයේ රෝහල් පද්ධතියේ තිබෙන සමහර රෝහල් ඇත්තටම දියුණු කරන්න පුළුවන් අවස්ථා තිබෙනවා. ඒත් ඒ රෝහල් දියුණු වෙන්නේ නැහැ. දංකොටුව රෝහල කියන්නේ ඉතාම හොඳ තත්ත්වයකට දියුණු කරලා රෝගීන්ට ප්‍රතිකාර ගන්න අවස්ථාව ලබා දෙන්න පුළුවන් රෝහලක්. හැබැයි, ඒක දියුණු වෙන්නේ නැහැ. ඒ රෝහලට ප්‍රතිකාර සඳහා එන රෝගීන් වෙනත් රෝහලකට මාරු කර යවන එක තමයි බොහෝ වෙලාවට සිදු වෙන්නේ. ඊළඟට, පුත්තලම රෝහල ගත්තොත් එහි අඩු පාඩු ගොඩක් තිබෙනවා. කල්පිටිය රෝහල ගත්තාම ඒකේත් අඩු පාඩු ගොඩක් තිබෙනවා. හලාවත රෝහලෙත් එහෙමයි. එම නිසා මම විශේෂයෙන්ම ඔබතුමාට යෝජනා කරනවා, එම රෝහල්වල බෙහෙත් සම්බන්ධ කාරණයට වඩා අවශ්‍ය වෙනත් පහසුකම් සම්බන්ධව ඔබතුමන්ලා මීට වඩා හොයා බලන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා. මොකද, රෝගී පුද්ගලයකු රෝහලකට ගියාම ඒ රෝහල එක පැත්තකින් පිරිසිදුව තිබෙන්න ඕනෑ. රෝගියාට අවශ්‍ය කරන දේවල් අඩු පාඩු නැතුව තිබෙන්න ඕනෑ. ඒ රෝගියාට යම් විධියක සැනසීමක් එතැන තිබෙන්න ඕනෑ. ඒ කියන්නේ, ලෙඩක් හැදිලා රෝහලට ගියාම එතැන මානසික තෘප්තියක් ලැබෙන තැනක් වෙන්න ඕනෑ. බෙහෙත් දෙන තැනක් විතරක් නොවෙයි, බෙහෙත් දීලා ලෙඩේ සුව කරන තැනක් විතරක් නොවෙයි, මානසික තෘප්තියකුත් ලැබෙන්න ඕනෑ. ඒ නිසා අපි කියන්නේ, මේ රෝහල් පද්ධතියේ මීට වඩා විශාල වෙනසක් කරන්න පුළුවන් කියන එකයි.

ඔබතුමන්ලා අද පුන පුනා කියනවා, "අපි දැන් රට ගොඩ අරගෙන තිබෙනවා. ගොඩ අරගෙන තිබෙනවා" කියලා. හැබැයි, ගොඩ අරගෙන තිබෙනවාය කියන කථාවේ ප්‍රතිඵලය රටේ ජනතාව දැන ගන්න තිබෙන්න ඕනෑ. ඇත්තටම එහි ප්‍රතිඵලය ජනතාවට තවම හරියට දැන ගන්න ලැබිලා නැහැ. ඒ නිසා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ විශේෂයෙන්ම රෝහල් පද්ධතිය ගැනත් මීට වඩා විධිමත් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන්න කියලා. ඒ හා සමානව සොයා බැලීම් කරන්න.

ඊළඟට, ග්‍රාමීය රෝහල් ගත්තොත්, ඉතාම දුප්පත් ජනතාව තමයි ඒ රෝහල්වලට යන්නේ.

එම නිසා දුප්පත් ජනතාව නියෝජනය කරන ඒ ග්‍රාමීය ප්‍රදේශවල තිබෙන පුංචි රෝහල් ටිකටත් ඔබතුමන්ලාගේ විශේෂ අවධානය යොමු කරලා ඒවායේ තිබෙන අඩු පාඩු සකස් කරන්න කියා මා විශේෂයෙන් ඉල්ලා සිටිනවා. මේ සියලු කාරණාවලට පිළිතුරු ලබා දෙයි කියා මම බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා (දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி - சுதேச வைத்திய இராஜாங்க அமைச்சர்)

(The Hon. Sisira Jayakody, Attorney-at-Law - State Minister of Indigenous Medicine)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නවලට ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පිළිතුර ලබා දෙනවා.

1. 154

2. 82

3. 72

4. <u>ඖෂධ ආනයනය</u>

(i) දැනට ලංකාවේ අඩු සංඛ්‍යාවක් ලියා පදිංචි වී ඇති ඖෂධ ආනයනය කිරීම දිරිමත් කිරීම සඳහා එවැනි ඖෂධ තෝරාගෙන ඒවා ලියා පදිංචි කිරීම සඳහා ප්‍රමුඛතාවක් ලබා දීමට තීරණය කර ඇත.

(ii) ඇමෙරිකා එක්සත් ජනපදය, එංගලන්තය, ඕස්ට්‍රේලියාව, දකුණු කොරියාව වැනි ඖෂධ නියාමනය ඉතා විධිමත්ව ක්‍රියාත්මක වන රටවල ඖෂධ නියාමන ආයතනවල ලියා පදිංචි වී ඇති ඖෂධ ලියා පදිංචි කිරීම කෙටි ක්‍රමවේදයක් අනුගමනය කිරීම තුළින් ඉක්මනින් සිදු කිරීම.

<u>මිල නියාමනය</u>

ඖෂධවල මිල නියාමනය සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදේශක විශේෂඥ වෛද්‍ය පාලිත අබේකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් යුතුව ඖෂධ නියාමන අධිකාරියේ මිල නියාමන කමිටුවක් පත් කර ඇත. එහෙත් ඖෂධ ආනයනකරුවන් විසින් පවරන ලද නඩුවක් සඳහා නිකුත් කර ඇති අතුරු තහනම් නියෝගයක් නිසා ඖෂධ මිල නියාමන කටයුතු දැනට අත් හිටුවා ඇත. එම අතුරු තහනම් නියෝගය ඉදිරියේදී ඉවත් කරවා ගත හැකි යැයි බලාපොරොත්තු වන අතර, එසේ කළ පසු බහුලව භාවිත වන අත්‍යවශ්‍ය ඖෂධ 50ක් පමණ සඳහා උපරිම සිල්ලර මිලක් පැනවීමට බලාපොරොත්තු වේ.

5. ඔව්.

ගරු සෞඛ්‍ය ඇමතිතුමා මීට අමතරව සඳහන් කර තිබෙනවා, පසුගිය මාස හය තුළ දැනට ලියාපදිංචි වී ඇති, ලියාපදිංචිය ඉකුත් වී ඇති ඖෂධවල ලියාපදිංචිය දීර්ඝ කිරීමේ කටයුතු සඳහා

ප්‍රමුඛතාව ලබා දී එම කටයුතු සම්පූර්ණ කිරීම සිදු කර තිබෙන බව සහ නව ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීමට වර්තමානයේ කටයුතු කරගෙන යන අතර, ලියාපදිංචි කිරීම් කඩිනමින් ලබා දීමට ඉදිරියේදී හැකි වනු ඇති බව.

ගරු හෙක්ටර් අප්පුහාමි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රාදේශීය රෝහල්වල තිබෙන සියලු අඩු පාඩු කෙරෙහි මා ගරු අමාත්‍යාතුමාගේ අවධානය යොමු කරවනවා. විශේෂයෙන් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී ඒවාට පිළිතුරු සැපයීමට බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුංචි පැහැදිලි කිරීමක් එක්කම මම මේ කාරණය කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් අපි කල් තැබීමේ ප්‍රශ්න වටයේ ඉන්නේ.

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපෙන්ම පත් වෙච්ච මන්ත්‍රීවරයෙක් විපක්ෂයට ගිහිල්ලා අද මේ ගරු සභාවේදී උත්සාහ කළා, ජනාධිපතිවරණය කල් දමන්න ජනමත විචාරණයක් ගෙනෙන්න හදන බවක් කියන්න. මම පැහැදිලිවම කියනවා, අපි මැතිවරණයට ලැහැස්තියි, මැතිවරණ කටයුතු කරගෙන යනවා, ජනාධිපතිවරණය නියමිත පරිදි පවත්වයි කියලා. ආණ්ඩුවට කිසිම බයක් නැහැ, ඒ මැතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන්. නියමිත පරිදි ජනාධිපතිවරණය පවත්වනවා. අපෙන් විපක්ෂයට ගිය මන්ත්‍රීවරුන් අද මංමුළා වෙලා තමයි මෙවැනි ප්‍රකාශ කරන්නේ. මා ඒ කාරණය පැහැදිලිව කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න අංක 2, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා.

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම ප්‍රශ්නය අසන්නේ ගරු ආරක්ෂක අමාත්‍යතුමාගෙන්.

ත්‍රිවිධ හමුදාවේ සියලු නිලයන්හි නිලධාරීන් පිළිබඳව සැලකිල්ලට ගැනීමේදී, ඔවුන් විශ්‍රාම ගත් විට ගෞරවාන්විත ලෙස විශ්‍රාම දිවිය ගත කිරීමට සැලැස්වීම රජයේ වගකීම වේ. නමුත් මේ වන විට ත්‍රිවිධ හමුදාවෙන් විශ්‍රාම ගත් නිලධාරීන් හා සෙසු නිලයන් බොහෝ විට පෞද්ගලික ආරක්ෂක සේවාවන්හි හා පෞද්ගලික අංශයේ සුළු රැකියාවල නිරත වනු දැකිය හැක.

1. ආරක්ෂක අංශයෙන් විශ්‍රාම ලබන නිලධාරීන් වෙනත් සුදුසු රැකියා සඳහා යොමු කිරීමට ආරක්ෂක අමාත්‍යාංශය සතු වැඩ පිළිවෙළ කුමක්ද?
2. වෙනත් රැකියාවල නියුතු විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් පිළිබඳව සොයා බැලීමේ වැඩ පිළිවෙළක් තිබේද?
3. එසේ නම්, එහි පසුගිය වසර තුන තුළ ප්‍රගතිය කුමක්ද?
4. සමාජ විරෝධී ක්‍රියාවල නිරත වන විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් සම්බන්ධව ආරක්ෂක අමාත්‍යාංශය විසින් ගනු ලබන විශේෂ වැඩ පිළිවෙළක් තිබේද? එසේ නම් ඒ කුමක්ද?
5. එසේ නම්, සමාජ විරෝධී ක්‍රියාවලට ඔවුන් යොමු වීම වැළැක්වීමට ආරක්ෂක අමාත්‍යාංශය සතු වැඩ පිළිවෙළක් තිබේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න, මේ කාරණය තවදුරටත් පැහැදිලි කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා විශ්‍රාමික හමුදා නිලධාරියෙකු වන නිසා මට යම්කිසි වගකීමක් තිබෙනවා මේ පිළිබඳව කථා කරන්න සහ පැහැදිලි කරන්න. මේ දිනවල වැඩියෙන්ම කථා වෙන්නේ, කොහේ හෝ අපරාධයක් සිදු වෙලා, වෙඩි තැබීමක් සිදු වෙලා කියලායි. එවැනි මොකක් හරි සිදු වුණු ගමන් සමාජය තුළින් කෙළින්ම ඇඟිල්ල දිගු වෙන්නේ, ත්‍රිවිධ හමුදාවෙන් විශ්‍රාම ගත් නිලධාරියෙකුට හෝ එවැනි කාට හෝ තමයි. මිනී මැරුම්, වෙඩි තැබීම් ආදි හැම දෙයකදීම වාගේ එහෙමයි.

එදා තිස් අවුරුදු කුරිරු යුද්ධය අවසන් කරපු වීරෝදාර රණ විරුවන් ගැනයි මේ කියන්නේ. අපේ රණ විරුවන් ඒ තිස් අවුරුදු කුරිරු යුද්ධය අවසන් කරලා, ලෝකයේ ම්ලේච්ඡතම ත්‍රස්තවාදය අවසන් කරපු රණ විරුවන්. ඒ ත්‍රස්තවාදය අවසන් කරපු රණ විරුවන් සියලු දෙනා සම්බන්ධව ඒ අයුරින් චෝදනා කිරීම වැරදියි. මොකද, එක්කෙනෙක්, දෙන්නෙක්, එහෙම නැත්නම් කිහිප දෙනෙක් කරන එවැනි දේවල් නිසා මුළු වීරෝදාර රණ විරු සමාජයම ඉතා නරක තත්ත්වයකට ගෙනැල්ලා, නරක තැනකට ගෙනැල්ලා තිබෙනවා. එදා "වීරෝදාර රණ විරුවන්" කියා පිළිගත්තු ගමේ සියලු දෙනා දැන් ඒ අය දෙස බලන්නේ වෙනත් විධියකට. ඉතින් මේක විශාල අපරාධයක්. ඒ තිස් අවුරුදු යුද්ධය වෙලාවේ හමුදාවට බැඳෙන්න කවුරුවත් හිටියේ නැහැ.

අවුරුදු 18න් සේවයට බැඳුණු රණ විරුවෙක් -සෙබළෙක්- සාමාන්‍යයෙන් අවුරුදු 40, 41 වන කොට විශ්‍රාම ගන්නවා. ඒ, ඔවුන්ගේ හොඳම කාලය. ඇත්තම කථාව, දරුවන් හදලා, දරුවන් පාසල් යවන කාලයේදී තමයි ඔවුන් විශ්‍රාම ගන්නේ. ඒ වාගේම, ඔවුන් ගෙවල් හදන්න පටන් අරගෙන ණය වෙලා ඉන්න අවස්ථාවක තමයි විශ්‍රාම ගන්නේ. ඒ විශ්‍රාම වැටුපෙන් ණය ගෙවලා ඉවර වන කොට කුඩා විශ්‍රාම වැටුපක් තමයි ඔවුන්ට ඉතිරි වෙන්නේ. Regimental Sergeant Major කෙනෙකු හැටියට කටයුතු කරපු, එහෙම නැත්නම් 1,000ක විතර පිරිසක් command කරපු කෙනෙකු හැටියට සේවය කරපු කෙනෙක් එළියට ඇවිල්ලා security job එකක් හොයාගෙන කොහේ හරි දොරක් අරිනවා; එහෙම නැත්නම් ගේට්ටුවක් අරිනවා. ඒ අය security job එකක් තමයි කරන්නේ. හැබැයි, කලින් නිසි වැඩ පිළිවෙළක් තිබුණා.

[ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා]

ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා රක්නා ආරක්ෂක ලංකා සේවය හදලා ඒ තුළින් sea marshalsලා - නැව් ආරක්ෂකයන් - හැටියට බඳවාගෙන කටයුතු කළ යම් වැඩ පිළිවෙළක් තිබුණා. නමුත් පසුගිය ආණ්ඩුව කාලයේ ඒක කඩාකප්පල් වුණා. එදා එවැනි හෝ වැඩ පිළිවෙළක් -මොකක් හරි වැඩ පිළිවෙළක්- තිබුණා. නමුත් මේ රණ විරු සාමාජිකයන් මේ වන විට මේ තත්ත්වයට පත් වුණේ ඇයි? ඔවුන් මේ තත්ත්වයට පත් වුණේ කොහොමද?

සාමාන්‍යයෙන් ගත්තොත්, රණ විරුවන් විශාල ප්‍රමාණයක් විශ්‍රාම අරගෙන ඉන්නවා. විශ්‍රාම අරගෙන ඉන්න අය හැමෝම හරිම දක්ෂයි. ඔවුන් විනයානුකූලව හැදිව්ව අය. ඔවුන් දක්ෂ පුද්ගලයන්. ඕනෑ දෙයක් කරන්න පුළුවන් තත්ත්වයේ ඔවුන් ඉන්නේ. විශේෂයෙන්ම ඔවුන්ට නොයෙක් දක්ෂතා තිබෙනවා. වෙඩි තියන්න පුහුණුව ලබපු අය විතරක් නොවෙයි, නොයෙකුත් ක්ෂේත්‍රවල කටයුතු කරන අය ඉන්නවා. හමුදා සේවයෙන් විශ්‍රාම යන නිලධාරින් විශාල වශයෙන් පෞද්ගලික අංශයේ හොඳ හොඳ companies වල හොඳ හොඳ තනතුරු දරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එහෙම අයත් ඉන්නවා. හැබැයි, විශ්‍රාමික සෙබළුන්ට, විශ්‍රාමික සෙසු නිලයන්ට ඉහත කී අවාසනාවන්ත තත්ත්වය උදා වෙලා තිබෙනවා. මේකට යම්කිසි ක්‍රමවේදයක් ඇති කළ යුතුමයි. මේ අපරාධ රැල්ල මැඩ පවත්වන්න නම්, ඒ අය වෙනුවෙන් යම්කිසි ක්‍රමවේදයක් හදන්න ඕනෑ. සමහර වෙලාවට මේ වාගේ සිදුවීම් හැම දේම රණ විරුවන් පිටින්ම දානවා. නමුත් විශ්‍රාම නොගෙන පැන ගිය රණ විරුවන් තමයි විශාල වශයෙන් එවැනි කටයුතු කරන්නේ. විශේෂයෙන්, පැන ගිය රණ විරුවන්. Train වෙලා අවුරුදු දෙකතුනක් ඉඳලා පැනලා යනවා, එහෙම නැත්නම් train වෙලා අවුරුදු පහක් විතර ඉඳලා පැනලා යනවා, එහෙමත් නැත්නම් train වෙලා අවුරුදු 10ක් විතර වැඩ කරලා ඊට පසුව පැනලා යනවා. ඉන් පසුව ඔවුන්ට ජීවත් වෙන්න ක්‍රමවේදයක් නැහැ. සමහර වෙලාවට ඔවුන් තමයි මේ වාගේ වෙඩි තැබීම් ආදිය සිදු කරන්නේ. ඉතින් අප සියලු දෙනා එකතු වෙලා මේ ප්‍රශ්නයට මොකක්ද කරන්නේ කියන එක සම්බන්ධයෙන් තීරණයක් ගන්න ඕනෑ. මේ ප්‍රශ්නය ඉන්දියාවේත් තිබෙනවා. ඒ අය රැකියා සඳහා යොමු කිරීමට අපි ක්‍රමවේදයක් හදන්න ඕනෑ. මම දන්නවා, දැන් දැන් රණ විරුවන් විශ්‍රාම යන්න ඉස්සෙල්ලා මාස හයක විතර training එකක් දෙන බව. තමන් කැමති ක්ෂේත්‍රයක train වෙන්න ඒ අයට පුළුවන්. හැබැයි, විදේශ රැකියා සඳහා ඔවුන් යොමු කරන්නත් අපට පුළුවන්. දැන් ඒකත් සිදු කරමින් යනවා. නමුත් හොඳ ක්‍රමවේදයක් ඉක්මනින් - යුහුසුලුව - හදන්න ඕනෑ. ඔවුන් security jobsවලට දාන්න කියලා නොවෙයි මා කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආපදා හැම එකකදීම නැවතත් රණ විරුවන් මතක් වෙනවා. මේ කාලයේ මොනවා හරි disaster එකක් වෙච්ච ගමන් වහා රණ විරුවා තමයි මතක් වෙන්නේ. එයාට තමයි වැඩේ කරන්න දෙන්නේ. ඒ තරම් විශ්වාසයක් රණ විරුවන් ගැන තිබෙනවා; මුළු රටටම විශ්වාසයක් තිබෙනවා. හැබැයි, මේ එක්කෙනෙක්, දෙන්නෙක් කරන දේවල් නිසා -වෙඩි තැබීමක්, ඒ වාගේ මොකක් හරි දෙයක් සිදු වුණු ගමන් - සියලු රණ විරු ප්‍රජාවට චෝදනා එල්ල කිරීම එච්චර හොඳ දෙයක් නොවෙයි.

රණවිරුවෙක් ඕනෑම දේකට සූදානම් කියලා මම කියන්නේ ඒකයි. ඔවුන් ඕනෑ දෙයකට train කරන්න පුළුවන්. Train කරන්න පුළුවන් කියන්නේ, third-generation missile එකක් වුණත් activate කරන්න පුළුවන්, operate කරන්න පුළුවන් තරම් ශක්තියක් ඒ ගොල්ලන්ට තිබෙනවා. ඒ තරම් දක්ෂයි රණවිරුවන්. ඕනෑ දෙයකට train කරන්න පුළුවන්. එහෙම නම් කොහොමද මේ තත්ත්වයට පත් වෙන්නේ? ඔවුන්ට ඔවුන් පිළිබඳව විශ්වාසයක් තිබෙනවා. ඒ විශ්වාසය තුළින් අපට මේ ලෝකයම ජය ගන්න පුළුවන් හැකියාවක් තිබෙනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර වෙඩි තැබීම්වලදී රණවිරුවෙක් තමයි වෙඩි තිබ්බේ කිය කියා fingerprints ගන්නවා. ඕනෑ නම් fingerprints ගන්න පුළුවන්. යුද හමුදා මූලස්ථානයේ හැමෝගේම fingerprints තිබෙනවා. Easily හොයා ගන්න ඕනෑ තරම් ක්‍රමවේද තිබෙනවා. මොකද, හැමෝගේම fingerprints තිබෙනවා. ඕනෑ නම් ඒ fingerprints tally කරලා බලන්න පුළුවන්. එතකොට අදාළ පුද්ගලයා ඉක්මනින්ම අල්ලා ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, මේ ගැන විශේෂ අවධානයක් යොමු කරලා, මේ ප්‍රශ්නය දුර දිග යන්න නොදී කටයුතු කරන්න කියලා. මොකද, යුද මානසිකත්වයත් එක්ක හිටපු අය යම් ක්‍රමවේදයකට ගන්න තමයි නැව් ආරක්ෂක අංශවල රැකියාවලට, Sea Marshalsලා හැටියට පිට රට යවන්න හැදුවේ. ඒ වාගේ ක්‍රමවේද හැදිය යුතුමයි. ඔවුන්ව ඕනෑම දෙයක් සම්බන්ධයෙන් train කරන්න පුළුවන්. ඔවුන් ඕනෑ අභියෝගයක් ජය ගන්න හැකියාවක් තිබෙන, හොඳ මනසක් තිබෙන දක්ෂ පුද්ගලයන්. අන්න ඒ අය හරි තැනකට ගෙන ආවොත්, මේ ප්‍රශ්නයෙන් ගොඩ එන්න පුළුවන්. මම කිව්වා වාගේ fingerprints ගන්නවා නම්, ඒක ලෙහෙසියෙන්ම කරන්න පුළුවන්. ඒ ටික tally කරලා අදාළ පුද්ගලයා ඉක්මනින්ම අල්ලා ගන්න පුළුවන්. ඒ නිසා මේ අපරාධ රැල්ල මඩින්න අපි ක්‍රමවේදයක් හදන්න ඕනෑ.

මම මෙහිදී අහලා තිබෙනවා, ප්‍රශ්න කිහිපයක්. ඒ ප්‍රශ්න කිහිපය තුළ, ඒ අයගේ මානසිකත්වය වෙනස් කරලා ඔවුන්ට හොඳ ආර්ථික තත්ත්වයක් ලබා දෙන්නේ කොහොමද කියන එක තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විශේෂයෙන්ම අහලා තිබෙන්නේ. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, මේ සඳහා විශේෂ වැඩසටහනක් සකස් කරන්න කියලා. අපට දෙන්න පුළුවන් සහයෝගය අපි ලබා දෙනවා. අපේ වීරෝදාර රණ විරුවන්ගේ නාමය කෙලෙසන්න දෙන්න එපා කියන එක තමයි මගේ ඉල්ලීම වන්නේ. ස්තුතියි.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன் - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)

(The Hon. Premitha Bandara Tennakoon - State Minister of Defence)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා පිළිතුරු ලබා දෙනවා.

1. ත්‍රිවිධ හමුදා සාමාජිකයන් විශ්‍රාම ගැන්වීමට ආසන්න කාලය තුළ ඔවුන්ගේ කැමැත්ත පරිදි දේශීය, විදේශීය ඉහළ ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රවල රැකියා පුහුණුවක් සහ ජාතික වෘත්තීය කුසලතා රාමුව තුළ පිළිගනු ලබන සහතිකයක් ලබා දීමට කටයුතු කරන අතර, සුබසාධක අධ්‍යක්ෂ මණ්ඩල යටතේ රැකී රක්ෂා තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යමින් විශ්‍රාමික අයවලුන් වෙත එම රැකියා අවස්ථා ලබා දීමට නිරන්තරයෙන් දැනුවත් කිරීම් සිදු කරනු ලැබේ.

   ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවැනි ප්‍රශ්නයට මම ලබා දුන් පිළිතුරට ඌනපූරණයක් කරන්න ඕනෑ. දැනට කලා ඔය අපේ තිබෙන Army Vocational Training Centre එකේ පුහුණු පාඨමාලා අටක් තිබෙනවා; plumber course, electrician course, masonry course, leather fabricator course, agriculture and farming course, carpenter course, aluminum fabricator course,

cookery/bakery course. විශ්‍රාම යාමට වසරකට කලින් එම පාඨමාලාවලට ඇතුළත් වෙන්න ඉල්ලීම් කරලා, එම පාඨමාලාව හදාරන්නත්, NVQ 3 සහතිකය හෝ NVQ 4 සහතිකය ලබා ගන්නත් හැකියාව තිබෙනවා. ඊට අමතරව අපි දැනට යුද හමුදා මූලස්ථානයෙන් welder course එකත්, air condition technician course එකත් අතිරේකව ලබා ගන්න ඉල්ලීමක් කරලා තිබෙනවා. මම හිතනවා, ඒකත් අපට ලබා ගන්න පුළුවන් වෙයි කියලා.

2. ත්‍රිවිධ හමුදා සුබසාධක අධ්‍යක්ෂ මණ්ඩල, ත්‍රිවිධ හමුදාවේ එක් එක් රෙජිමේන්තු මධ්‍යස්ථාන හා අනෙකුත් ආයතන මඟින් තම ඒකකය යටතේ සේවය කර විශ්‍රාම ගනු ලැබූ හමුදා සාමාජිකයන් සමඟ නිරන්තර සබඳතා පවත්වා ගනිමින් ඔවුන්ගේ සුබසාධනය උපරිම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශ්‍රාමික රණවිරුවන් අපේ හමුදා කඳවුරුවලට කැඳවා ඔවුන් එක්ක සාකච්ඡා කරලා, ඔවුන්ගේ ප්‍රශ්න හඳුනා ගෙන, විශේෂයෙන්ම අපේ රෙජිමේන්තු මධ්‍යස්ථානවල CEOsලාට එම ප්‍රශ්න ඉදිරිපත් කරන්නත්, එම ප්‍රශ්නවලට කඩිනම් පිළිතුරු ලබා දෙන්නත් දීප ව්‍යාප්ත වැඩ පිළිවෙළක් පසුගිය මාස කිහිපය තුළ ආරම්භ කළා. සාමාන්‍යයෙන් මෙම කටයුත්ත සම්ප්‍රදායිකව සිද්ධ වෙන දෙයක්. නමුත් කොවිඩ් වසංගතයත්, ආර්ථික අර්බුදයත් එක්ක පසුගිය වසර දෙක-තුනක කාලය තුළ මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක නොවුණු බවක් අපට අධීක්ෂණය වුණා. ඒ අනුව අපි නැවත එම කටයුතු කඩිනම් කරලා, බලාත්මක කරලා විශ්‍රාමික රණවිරුවන් සමඟ එම සංවාදය - කථාබහ- ඇති කරගන්න කටයුතු කළා. ඒ නිසා ඉදිරි සති කිහිපය තුළත් විශ්‍රාමික රණවිරුවන්ට තිබෙන ප්‍රශ්න, ගැටලු පිළිබඳව කථා කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමනි, ඊට අමතරව "උරුමය" වැඩසටහන යටතේ ඔප්පු ලබා දීමේදී විශ්‍රාමික රණවිරුවන්ට විතරක් නොවෙයි, දැනට සේවයේ සිටිනා රණවිරුවන්ටත් ප්‍රමුඛතාව දෙන්න, විශේෂත්වයක් දක්වන්න ගරු ජනාධිපතිතුමා තීරණය කර තිබෙනවා. එම තීරණය අනුව වගා කටයුතු කරගන්න, ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවාගන්න අවශ්‍ය වන පරිදි මෙම රණවිරුන්ට ඉඩම් ප්‍රමාණයක් ලබා දෙන්නත් අපි කටයුතු කරගෙන යනවා.

ඊට අමතරව ගරු මනුෂ නානායක්කාර අමාත්‍යතුමා සමඟත් අපි මේ සම්බන්ධව සාකච්ඡා කළා. මේ වනවිට නොයෙක් රටවලින් විවිධ රැකියා ක්ෂේත්‍ර සඳහා අපේ රටට ඉල්ලීම් ලැබෙනවා. ඒ අනුව අපි විශේෂ ඉල්ලීමක් කර තිබෙනවා, විශ්‍රාමික රණවිරුවන් සඳහාත් ඒ තුළින් වෙනම කෝටා එකක්, වෙනම අවස්ථාවක් ලබා දෙන්න කියලා. එසේ විදේශගතවන්නන්ගේ වයස අවුරුදු 45ට වඩා අඩු වෙන්න ඕනෑ බව ප්‍රධාන වශයෙන් සඳහන් කර තිබෙනවා. විශ්‍රාමික රණවිරුවන්ට එම රැකියා අවස්ථා ලබා දෙන්න එම ආයතන කැමැත්තක් දක්වන බව අපට වැටහෙනවා; තේරෙනවා; අවබෝධ වෙනවා. ඒ අනුව අපි ගරු මනුෂ නානායක්කාර ඇමතිතුමා එක්කත්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එක්කත්, කම්කරු අමාත්‍යාංශය එක්කත් මේ ගැන සාකච්ඡා වට කිහිපයක් පවත්වා තිබෙනවා.

දැනට අපි ළඟදී විශ්‍රාම ගිය රණවිරුවන් 20දෙනෙකු පමණ මෙම පරීක්ෂණයට යොමු කර තිබෙනවා. අපි එම පරීක්ෂණවල ප්‍රතිඵල බලපොරොත්තුවෙන් ඉන්නවා. එම ප්‍රතිඵලය ලැබුණාට පසුව මේ මාසයේ හෝ අගෝස්තු මාසයේ මුල් සති දෙක ඇතුළත පළමුවෙනි කණ්ඩායම විධියට විශ්‍රාමික රණවිරුවන් කිහිප දෙනෙක් විදේශගත කරන්න, ඒ අයට එම රැකියා අවස්ථා ලබා දෙන්න අපට අවස්ථාව, අවකාශය ලැබෙයි කියා මා විශ්වාස කරනවා.

3. පසුගිය වසර තුන තුළ අදාළ පාඨමාලා සම්පූර්ණ කරන ලද සහ ඒ අනුව රැකියාගත කරන ලද අයවලුන්ගේ තොරතුරු, සුබසාධන පහසුකම් සලසා ඇති අයවලුන්ගේ සම්පූර්ණ සංඛ්‍යාත්මක තොරතුරු ඔබතුමාට කඩිනමින් ලබා දෙන්න පුළුවන්.

ඒක සංකීර්ණයි. ඔබතුමාගේ ප්‍රශ්නය අපට ඊයේ දිනයේදියි යොමු කළේ. නමුත් මෙම තොරතුරු ලබා ගන්න අපට තව ටික කාලයක් අවශ්‍ය බව අපි ඔබතුමාට සඳහන් කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, තව ප්‍රශ්නයක් තිබෙනවා. සාමාන්‍යයෙන් වසර 22ක් පමණ හමුදා සේවය තුළ ඉඳලා විශ්‍රාම යන අපේ රණවිරුවන් ගමේම ඉන්න ඕනෑය කියලා මානසිකත්වයක් හදාගන්නවා. ඒ නිසා ගමෙන් පිට රැකියාවලට සම්බන්ධවීමට ඔවුන් තුළ තිබෙන අකැමැත්තත් අපට නිරීක්ෂණය වෙනවා.

අලුත් රැකියා වෙළෙඳ පොළ සම්බන්ධවත් අපි අවබෝධයක් ලබා ගන්න ඕනෑ. එම අලුත් රැකියා වෙළෙඳ පොළට ගැළපෙන විධියට අපේ ත්‍රිවිධ හමුදාව තුළ තිබෙන පුහුණු පාඨමාලා සංශෝධනය කරගන්නත් අපි යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ඒ අනුව නව ලෝකයට, නව වෙළෙඳ පොළට ගැළපෙන රැකියා අවස්ථා ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

4. ත්‍රිවිධ හමුදාව මඟින් විශ්‍රාමික පුද්ගලයින් සමාජ විරෝධී ක්‍රියාවල නිරත වන්නේ ද යන්න නිරන්තරයෙන් ආවේක්ෂණය කරනු ලබන අතර, එමඟින් රැස්කරනු ලබන තොරතුරු ප්‍රකාරව සුදුසු කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලබනවා.

විශේෂයෙන්ම ඉතාම සංකීර්ණ වැඩ පිළිවෙළක්, වැදගත් වැඩ පිළිවෙළක් ආරක්ෂක අමාත්‍යාංශය විසින් ත්‍රිවිධ හමුදාව මඟින් විශේෂ පුහුණුව ලැබූ රණවිරුවන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම සේවයට වාර්තා නොකර නීත්‍යානුකූල නොවන ආකාරයට සේවයෙන් බැහැර වී සිටින රණවිරුවන් සම්බන්ධවත් අපි විශේෂ අවධානයක් යොමු කරනවා. ඒක ඉතාම වැදගත්.

මේ රටේ ත්‍රිවිධ හමුදාව තුළ ඔවුන්ට හොඳ පුහුණුවක් ලබා දී තිබෙනවා. ඒක අපි කියන්න ඕනෑ. නමුත් එම පුහුණුව අවභාවිත කරන්න, එම පුහුණුවෙන් අයුතු ප්‍රයෝජන ගන්න ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. ඒ සම්බන්ධයෙන් බුද්ධි අංශ, පොලීසිය, ඒ වාගේම ත්‍රිවිධ හමුදාව නිරන්තර අවධානයෙන්, නිරන්තර නිරීක්ෂණයෙන් කටයුතු කරනවා.

5. පිළිතුරේ ඉහත ඡේදවල සඳහන් පරිදි වෘත්තීය පුහුණුව ලබා දීම, රැකියාගත කිරීම හා සුබසාධන පහසුකම් සැලසීම මෙන්ම පුළුල් ආවේශන ක්‍රමවේදයක් පවත්වාගෙන යෑම තුළින් විශ්‍රාමික පුද්ගලයන් නීති විරෝධී සහ සමාජ විරෝධී කටයුතුවල නිරත වීම අවම කිරීම සඳහා අපි සෑම විටම ක්‍රියාමාර්ග ගනු ලබනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවෙන් පැන ගිය පුද්ගලයන් සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයත්, අපේ ත්‍රිවිධ හමුදාව, බුද්ධි අංශ සහ පොලීසිය විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඒක පසුගිය කාලයේත් එහෙමයි, අදත් එහෙමයි, හෙටත් එහෙමයි. එහි කිසිම අඩු පාඩුවක් වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ. කාටවත් හමුදාවේ පුහුණුව අවභාවිත කරන්න ඉඩ දෙන්න අපට පුළුවන්කමක් නැහැ. ඒ සඳහා ගන්න පුළුවන් උපරිම ක්‍රියාමාර්ග ගන්නවා කියන එක අපි මතක් කරනවා. මෙම ප්‍රශ්නය යොමු කිරීම පිළිබඳව සහ හිටපු හමුදා නිලධාරියෙක් වශයෙන් විශේෂයෙන් හමුදාවේ රණ විරුවන් සම්බන්ධයෙන් නිතරම කථා බහ කිරීම පිළිබඳව ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

මට තව එක් වැදගත් කාරණාවක් කියන්න තත්පර 30ක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

කාලය අවසන්, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඉතා කෙටියෙන් කියන්න.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன்)
(The Hon. Premitha Bandara Tennakoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ අපට නිරීක්ෂණය වුණු කාරණයක් තිබෙනවා. විශේෂයෙන් අපේ රණ විරුවන් රෝහල්වලට ගියාම ඔවුන්ට ලැබෙන සැලකීම සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් මතු වුණා. ඒ සම්බන්ධයෙන් කථා කරන්න මම පසුගිය දවසක ගරු රමේෂ් පතිරණ ඇමතිතුමාව මුණ ගැහුණා. එතුමා වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් පාලිත මහීපාල මහත්මයාත් අපි මුණ ගැසුණා. ඒ අනුව මම සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළා, නැවත විශේෂ චක්‍රලේඛයක් නිකුත් කරලා යුද සමයේදී සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ අපේ රණ විරුවන් සම්බන්ධයෙන්, විශේෂයෙන්ම යුද්ධයේ දී ආබාධිත තත්ත්වයට පත්වුණු රණ විරුවන් සම්බන්ධයෙන් තිබුණු සැලකීම නැවත ලබා දෙන්න කියලා. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එම චක්‍රලේඛය ඊයේ දිනයේ නිකුත් කරලා තිබෙනවා. ඉතින්, අපේ රට වෙනුවෙන් කැප වීමෙන්, මහන්සියෙන්, ජීවිත පරිත්‍යාගයෙන් වැඩ කරපු රණ විරුවන්ට අවශ්‍ය සහයෝගය සහ අවශ්‍ය සැලකීම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිටින සියලුම නිලධාරීන් සහ නිලධාරිනියන් සෞඛ්‍ය පද්ධතිය තුළදී ඒ අයට ලබා දෙයි කියා මම විශ්වාස කරනවා. ඒ වාගේම සෞඛ්‍ය ඇමතිතුමාටත්, අමාත්‍යාංශ ලේකම්තුමාටත් මම විශේෂ ස්තුතියක් පිරිනමනවා, අපේ ඉල්ලීම පරිදි එම කටයුත්තට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීම සහ විශේෂයෙන් චක්‍රලේඛය යාවත්කාලීන කිරීම පිළිබඳව.

බොහොම ස්තුතියි.

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දැන් කාලය අවසන් වෙලා තිබෙන්නේ. ඒ නිසා පැහැදිලි කර ගැනීම් සඳහා කාලය දෙන්න විධියක් නැහැ. ඒ වාගේම අතුරු ප්‍රශ්න අහන්නත් බැහැ.

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2024 ජූලි 11වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், 2024 யூலை 11, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being 5.30 p.m., THE HON. DEPUTY SPEAKER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly until 9.30 a.m. on Thursday, 11th July, 2024.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

313 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 313 - இல. 11
Volume 313 - No. 11

2024 ජූලි 11වන බ්‍රහස්පතින්දා
2024 யூலை 11, வியாழக்கிழமை
Thursday, 11th July, 2024

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2024 ජූලි 11වන බ්‍රහස්පතින්දා
2024 யூலை 11, வியாழக்கிழமை
Thursday, 11th July, 2024

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම [තිරුව 1953]

පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම [තිරුව 1954]

ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම [තිරුව1954]

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තිරුව 1956]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තිරු 1958-1986]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

සමුපකාර ක්ෂේත්‍රය නහාසිටුවීම [තිරුව 1997]

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව රාජ්‍ය සමාගමක් ලෙස පෞද්ගලීකරණය කිරීම [තිරුව 2003]

2010 සිට 2019 දක්වා ලබාගෙන ඇති ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික සහ වාණිජ ණය [තිරුව 2005]

විශ්‍රාම වැටුප් විෂමතා විසඳීම සහ වැඩිහිටියන් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමයක්:

මුදල් රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තිරුව 2008]

වරප්‍රසාද:

ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරු පත් කිරීම සම්බන්ධයෙන් නිකුත් කළ අතුරු තහනම් නියෝගය [තිරුව 2012]

ශ්‍රී ලංකාවේ යෝජිත "ව්‍යාපාර සූදානම් (B-READY) දර්ශකය" සඳහා සූදානම් වීමේදී මතු වන ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව:

කාලය දීර්ඝ කිරීම [තිරුව 2018]

කල් තැබීමේ යෝජනාව:

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සෙසු අදාළ නීති මඟින් පනවා ඇති පරිදි ජනාධිපතිවරණය පැවැත්වීම [තිරු 2019-2122]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு: உறுப்பினர் பதிலீடு [ப: 1953]

சுற்றாடல், இயற்கை வளங்கள் மற்றும் நிலைபேறான அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் பதிலீடு [ப: 1954]

மத விவகாரங்கள் மற்றும் சகவாழ்வு பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் பதிலீடு [ப: 1954]

அரசாங்க கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை [ப: 1956]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1958-1986]

தனி அறிவித்தல் மூல வினா:

கூட்டுறவுத் துறையின் மேம்பாடு [ப: 1997]

இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனத்தையும் இலங்கை ரூபவாஹினிக் கூட்டுத்தாபனத்தையும் ஓர் அரச நிறுவனமாக தனியார் மயமாக்கல் [ப: 2003]

2010 முதல் 2019 வரை பெறப்பட்ட இருதரப்பு, பலதரப்பு மற்றும் வணிகக் கடன்கள் [ப: 2005]

ஒய்வூதிய முரண்பாடுகளுக்குத் தீர்வும் முதியோருக்கான சமூகப் பாதுகாப்பு முறைமையும்:

நிதி இராஜாங்க அமைச்சரினது கூற்று [ப: 2008]

சிறப்புரிமை:

உயர் நீதிமன்றத்துக்கு நீதிபதிகளை நியமிப்பது தொடர்பான இடைக்கால தடை உத்தரவு [ப: 2012]

இலங்கையில் முன்மொழியப்பட்ட "வணிக தொழில் முயற்சிகளுக்கான தயார்நிலை (B-READY) சுட்டெண்" பற்றிய தயார்படுத்தல் தொடர்பில் எழுந்துள்ள நடைமுறைச் சிக்கல்களையும் சிரமங்களையும் ஆய்வு செய்வதற்கும் அது தொடர்பில் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு:

கால நீடிப்பு [ப: 2018]

ஒத்திவைப்புப் பிரேரணை:

அரசியலமைப்பு மற்றும் இதர ஏற்புடைய சட்டங்கள் மூலம் பரிந்துரைக்கப்பட்டவாறு ஜனாதிபதித் தேர்தலை நடத்துதல் [ப: 2019-2122]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
- Ministerial Consultative Committee on Buddhasasana, Religious and Cultural Affairs: Substitution of Member [Col. 1953]
- Sectoral Oversight Committee on Environment, Natural Resources and Sustainable Development: Substitution of Member [Col. 1954]
- Sectoral Oversight Committee on Religious Affairs and Co-existence: Substitution of Member [Col. 1954]

REPORT OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS [Col. 1956]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1958-1986]

QUESTION BY PRIVATE NOTICE:
- Upliftment of Co-operative Sector [Col. 1997]
- Privatization of Sri Lanka Broadcasting Corporation and Sri Lanka Rupavahini Corporation as a Public Company [Col. 2003]
- Bilateral, Multilateral and Commercial Loans Obtained from 2010 to 2019 [Col. 2005]

RESOLUTION OF PENSION ANOMALIES AND SOCIAL SECURITY SYSTEM FOR ELDERS:
- Statement by State Minister of Finance [Col. 2008]

PRIVILEGE:
- Interim Order Issued on Appointment of Judges to Supreme Court [Col. 2012]

SELECT COMMITTEE TO STUDY THE PRACTICAL PROBLEMS AND DIFFICULTIES IN RELATION TO PREPARATION FOR THE PROPOSED "BUSINESS READY (B-READY) INDEX" IN SRI LANKA AND MAKE ITS PROPOSALS AND RECOMMENDATIONS:
- Extension of Time [Col. 2018]

ADJOURNMENT MOTION:
- Holding of Presidential Election as Prescribed by Constitution and Other Applicable Laws [Cols. 2019-2122]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2024 ජූලි 11වන බුහස්පතින්දා
2024 யூலை 11, வியாழக்கிழமை
Thursday, 11th July, 2024

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම
புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு: உறுப்பினர் பதிலீடு
MINISTERIAL CONSULTATIVE COMMITTEE ON BUDDHASASANA, RELIGIOUS AND CULTURAL AFFAIRS: SUBSTITUTION OF MEMBER

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එච්. නන්දසේන මහතා මියයෑම හේතුවෙන් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2024 ජූලි 03 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වීරසේන ගමගේ මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම
சுற்றாடல், இயற்கை வளங்கள் மற்றும் நிலைபேறான அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் பதிலீடு
SECTORAL OVERSIGHT COMMITTEE ON ENVIRONMENT, NATURAL RESOURCES AND SUSTAINABLE DEVELOPMENT: SUBSTITUTION OF MEMBER

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එච්. නන්දසේන මහතා මියයෑම හේතුවෙන් පරිසරය, ස්වභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2024 ජූලි 03 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වීරසේන ගමගේ මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම
மத விவகாரங்கள் மற்றும் சகவாழ்வு பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் பதிலீடு
SECTORAL OVERSIGHT COMMITTEE ON RELIGIOUS AFFAIRS AND CO-EXISTENCE: SUBSTITUTION OF MEMBER

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එච්. නන්දසේන මහතා මියයෑම හේතුවෙන් ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2024 ජූලි 03 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්.සී. මුතුකුමාරණ මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන් මහතා]

මෙම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශවල වාර්ෂික කාර්ය සාධන වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ දවසේ පැවති දුම්රිය වැඩ වර්ජනය අතරතුර පුද්ගලයෙක් දුම්රියෙන් ඇද වැටී මිය ගියා. ඒ, ගම්පහ බෙම්මුල්ල ප්‍රදේශයේ පුද්ගලයෙක්. දුම්රිය සේවාව අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කරලා තිබියදීත් යම් යම් දේශපාලන න්‍යාය පත්‍රවලට අනුව වෘත්තීය සමිති නායකයන් ගන්නා යම් යම් ක්‍රියාමාර්ග නිසා මිනිස්සු පීඩාවට පත් වෙනවා. අපි දන්නවා, ආර්ථික අර්බුදයත් එක්ක මේ කියන හැමදේම කරන්න බැරි බව. ඒක රටේ ජනතාවත් තේරුම් ගෙන තිබෙනවා. රාජ්‍ය සේවයේ වෘත්තීය සමිති නායකයන් මේ විධියට කටයුතු කරමින් මිනිසුන්ව පීඩාවට පත් කරනවා නම් ඒ අය පිළිබඳව අදාළ ඇමතිවරු යම්කිසි තීන්දුවක් ගන්න ඕනෑ. එහෙම නැත්නම් මේක කරන්න බැහැ. මේ පිළිබඳව ඔබතුමා හරහා ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවන්න කටයුතු කරන්න කියා මම ඉල්ලීමක් කරනවා.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை
REPORT OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව ඉදිරිපත් කරමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කිරීමකට ඉඩ දෙන්න. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අනුකාරක සභාවේ වාර්තාව මම පිළිගන්වනවා. මෙම වාර්තාව පිළිබඳ වචන කිහිපයක් ප්‍රකාශ කිරීමට මම මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව අනුව රාජ්‍ය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම සහ වගකීම පාර්ලිමේන්තුව සතු එක් කාර්යභාරයක් වෙනවා.

එම අධීක්ෂණ ක්‍රියාවලියේ විශාල කාර්යභාරයක් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිරතුරුවම සිදු කරනු ලබනවා. පාර්ලිමේන්තුවේ නව ස්ථාවර නියෝග මඟින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කර තිබෙනවා. එසේ වුවත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හෝ එසේ නැත්නම් ඒ හා සමාන කර්තව්‍යයන් සිදු කරන පාර්ලිමේන්තුවේ අනෙකුත් කාරක සභා මඟින් හෝ ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී මන්දගාමී ස්වරූපයක් වාගේම සමහර නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී දීර්ඝ කාලයක් ගතවන බවත් පසුගිය කාලයේ දී පැහැදිලිව දකින්නට ලැබුණා. එවැනි ප්‍රමාදයන් හෝ නොකර හැරීම් නිසා විගණකාධිපතිවරයාගේ කාර්යභාරය හෑල්ලුවට ලක් වෙනවා වාගේම, පාර්ලිමේන්තුව සතු මූල්‍ය පාලන බලය පිළිබඳව මහජනයා තුළ පවතින විශ්වාසය බිඳ වැටීමට ද ඒවා හේතු වෙනවා.

මේ කරුණු කාරණා සැලකිල්ලට අරගෙන නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරයේ රැස් වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි රැස්වීමේදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විමර්ශනය කිරීම සඳහා මාගේ සභාපතිත්වය යටතේ තවත් සාමාජික මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් 5දෙනෙකුගෙන් සමන්විත අනුකාරක සභාවක් පත් කරනු ලැබුවා. එම අනුකාරක සභාව විසින් රැස්වීම් වාර කිහිපයක් පවත්වා තිබෙනවා. එම කාරක සභා රැස්වීම් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයන්ගේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියෝජිතයන්ගේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝජිතයන්ගේ සහභාගිත්වය වාගේම විගණකාධිපතිවරයාගේ අඛණ්ඩ සහභාගිත්වයද ලබාගනු ලැබුවා. ඔවුන්ගේ අදහස් හා නීතිමය කරුණු ඇතුළත් කරලා තමයි මෙම වාර්තාව පිළියෙල කළේ. ඒ වාගේම අනුකාරක සභාවේ අවසාන රැස්වීමට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු රෝහිත අබේගුණවර්ධන මැතිතුමාගේ සහභාගිත්වයත් මා ඉතා අගයකොට සලකනවා.

මෙම වාර්තාවේ සමහර නිර්දේශ ක්‍රියාත්මක කරන්න පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීමක් සිදුවිය යුතුයි. ඒ සඳහා සහයෝගය ලැබෙනු ඇතැයි මා විශ්වාස කරනවා. ඒ වාගේම මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් කාරක සභාවේ කටයුතු තවත් ශක්තිමත් වනු ඇතැයිද මා විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) යටියන්තොට, වත්ත පාර, මීපිටිකන්ද යන ලිපිනයෙහි පදිංචි ඩී.ජී. ප්‍රේමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කළුතර දකුණ, ගමගොඩ පාර, පුලර්ටන් වත්ත, පළමු අදියර, අංක 6/12 දරන ස්ථානයෙහි පදිංචි එච්.ඩී. නිමලා ගර්ටි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) වංචාවල, ඉලුක්කැටිය, "දෙව්මිණි" යන ලිපිනයෙහි පදිංචි ආර්. රංජනී පෙරේරා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) කුඹුරේගම, ගිරිහාගම, අංක 72 ඒ දරන ස්ථානයෙහි පදිංචි එස්.එම්.එම්.ජී. චන්ද්‍රා කුමාරි මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) දිගන, දිගන නිලගම, අංක 935/10 දරන ස්ථානයෙහි පදිංචි ඩී. ජයනි නිමන්තිකා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාතලේ, අළුවිහාරය, රණවිරුගම, අංක 156/6 දරන ස්ථානයෙහි පදිංචි එල්. ක්‍රිෂ්ණකාන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මාතර, කැකණදුර, බණ්ඩාරනායකපුර, අංක 101 දරන ස්ථානයෙහි පදිංචි පී.කේ. නිශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාතර, හිත්තැටිය මැද, රාජපක්ෂ හේන, අංක 18/48 දරන ස්ථානයෙහි පදිංචි පී.වී. රත්නපාල මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 1 -309/2024- (3), ගරු හේෂා විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -359/2024- (1), ගරු ඩලස් අලහප්පෙරුම මහතා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුරු දීමට මීට පෙරත් කල් ගත්තා. ඊට පස්සේ පාර්ලිමේන්තුව වාරාවසාන කිරීම නිසාවෙන් පිළිතුරු දීම නැවත කල් ගියා. මා හිතනවා, මේක ඉතා වැදගත් ප්‍රශ්නයක් බව ඔබතුමා තේරුම් ගනිවි කියලා. රටේ රිය අනතුරු පිළිබඳව ගත්තොත්, මේ මාස 6 ඇතුළත මාරක රිය අනතුරු 2,133ක් සිද්ධ වෙලා තිබෙනවා. දවසකට රිය අනතුරුවලින් 7දෙනෙක් හෝ 8දෙනෙක් අනිවාර්යයෙන්ම මිය යනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් අපි ගත යුතු තීන්දු රාශියක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ නිසා මම කියන්නේ මේ ප්‍රශ්නයට පිළිතුරු දීමට දිගු කාලයක් ගන්නේ නැතිව, අඩුම ගණනේ සතියකින්වත් මට අවශ්‍ය පිළිතුරු ලබා දෙන්න කියලායි. මේ සඳහා යෝජනා රාශියක් තිබෙනවා, ඉදිරිපත් කරන්න, විවේචන විතරක් නොවෙයි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

මම ගරු අමාත්‍යතුමාව දැනුවත් කරලා කඩිනමින් පිළිතුර ඉදිරිපත් කරන්න කියලා කියන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

එන්ජින් ධාරිතාව 1,300ට වැඩි - engine capacity over 1300cc - මෝටර් බයිසිකල් සඳහා අවසර දෙන කැබිනට් පත්‍රිකාවක් පසුගිය කාලයේ ප්‍රතික්ෂේප වුණා. නැවත එවැනි කැබිනට් පත්‍රිකාවක් සූදානම් වෙන බව මම දන්නවා. මම ඒක කියන්නේ වගකීමෙන්. ගරු ඇමතිතුමනි, අපේ මුළු fleet එකෙන් සියයට 58ක් තිබෙන්නේ මෝටර් බයිසිකල්. ඒ අතර පොලීසියට තිබෙන්නේ උපරිම එන්ජින් ධාරිතාව 450 ඒවා, වැඩිම වුණොත් 600 ඒවා. එහෙම තිබියදී engine capacity එක 1,000කට හෝ 1,300කට වඩා වැඩි බයිසිකල්වලට අවසර දුන්නොත් ඉතා ම බරපතළ තත්ත්වයක් ඇති වෙයි. මම දන්නා තරමින් මෙරටට කොටස් ගෙනැල්ලා එකලස් කරපු මෝටර්බයිසිකල් තිබෙනවා, 10,000කට වැඩිය. ඒ නිසා ඒ තීන්දුව කිසිසේත්ම ක්‍රියාත්මක කරන්න දෙන්න එපා. එහෙම වුණොත් මේ තත්ත්වය මීට වඩා බරපතළ මුහුණුවරක් ගනීවි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණාව පිළිබඳව මත කිහිපයක් තිබෙනවා. මේ පිළිබඳ දීර්ඝව සාකච්ඡා වුණා.

ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා කියන කාරණාව වාගේ එන්ජින් ධාරිතාව 1,000ට වැඩි මෝටර් බයිසිකල් සම්බන්ධ ප්‍රශ්නය වාගේම, පොලීසියට තිබෙන්නේ ඊට වඩා අඩු ධාරිතාවක් සහිත මෝටර් බයිසිකල් ප්‍රමාණයක් කියන ප්‍රශ්නයත් ආවොත්, එහෙම නම් අපට සුඛෝපභෝගී කාර්වත් පාවිච්චි කරන්න බැහැ. මොකද, ඊට වඩා වැඩි ධාරිතාවක් තිබෙන වාහන පොලීසියට නැහැ. ඔය කාරණාවත් එතැනදී සාකච්ඡා වුණා. මෙතැන කාණ්ඩ දෙකක් තිබෙනවා. ඒ සම්බන්ධව කමිටුවක් පත් කරලා වාර්තාවක් ලබා දෙන්න කියලා තමයි එදා යෝජනා වුණේ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

බහුතරයක් රිය අනතුරු සිද්ධ වෙන්නේ මෝටර් බයිසිකල්වල තත්ත්වයේ බරපතළකම නිසායි, ගරු ඇමතිතුමනි. උදාහරණයක් විධියට මේ වර්ෂයේ පසුගිය මාස 6 තුළ මාරක රිය අනතුරු 2,133ක් සිද්ධ වෙලා තිබෙනවා. ඉන් අතිබහුතරයක් මෝටර්බයිසිකල් හරහා සිද්ධ වූ රිය අනතුරුයි. ඒ රිය අනතුරුවලින් 1,103ක් මිය ගිහිල්ලා තිබෙනවා. බහුල වශයෙන් අනතුරු සිද්ධ වෙන්නේ බයිසිකල්වලින්. ඒ බයිසිකල්වල එන්ජින් ධාරිතාව 1,000 ඉක්මවනවා කියන්නේ එය ඉතා ම බරපතළ ඛේදවාචකයක් බවට පත් වෙයි. මේ තත්ත්වය වර්ධනය වෙන්න ඉඩ තිබෙන නිසායි මම මේ රටේ පුරවැසියෙකු විධියට මේ සම්බන්ධව අනතුරු ඇඟවීමක් කරන්නේ.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ග්‍රාමීය ප්‍රදේශවල විහාරස්ථාන සංවර්ධනය: ''සසුන් උදාව'' ජාතික වැඩසටහන
கிராமப்புற விகாரைகளின் அபிவிருத்தி: "சசுன் உதாவ" தேசிய நிகழ்ச்சித்திட்டம்
DEVELOPMENT OF TEMPLES IN RURAL AREAS: "SASUN UDAWA" NATIONAL PROGRAMME

369/2024

3. ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වන විට පවතින බෞද්ධ සිද්ධස්ථාන සංඛ්‍යාව;

(ii) ඒ අතරින් විහාරස්ථාන සංඛ්‍යාව;

(iii) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති බෞද්ධ භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාව;

(iv) බෞද්ධ භික්ෂූන් වහන්සේලා නොමැති වීම හේතුවෙන් මේ වන විට වැසී ගිය විහාරස්ථාන සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි දුෂ්කර ප්‍රදේශවල පිහිටි විහාරස්ථාන නිසි ආකාරයෙන් පවත්වාගෙන යෑම සහ සංවර්ධනය කිරීම සඳහා `සසුන් උදාව' නම් ජාතික වැඩසටහන මේ වන විට ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එම වැඩසටහන ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் தற்போது காணப்படும் பௌத்த வணக்கஸ்தலங்களின் எண்ணிக்கை;

(ii) இவற்றுக்கு மத்தியில் காணப்படுகின்ற விகாரை களின் எண்ணிக்கை;

(iii) இலங்கையில் பதிவு செய்யப்பட்டுள்ள பௌத்த பிக்குமார்களின் எண்ணிக்கை;

(iv) பௌத்த பிக்குமார்கள் இல்லாமையால் தற்போது மூடப்பட்டுள்ள விகாரைகளின் எண்ணிக்கை;

எத்தனை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 'சுபிட்சத்தின் நோக்கு' கொள்கைப் பிரகடனத் தில் குறிப்பிடப்பட்டுள்ளவாறு பின்தங்கிய பிரதேசங்களில் அமைந்துள்ள விகாரைகளை முறையாகப் பேணிச் செல்வதற்கும் அபிவிருத்தி செய்வதற்கும் 'சசுன் உதாவ' எனும் தேசிய நிகழ்ச்சித்திட்டம் தற்போது ஆரம்பிக்கப்பட்டுள் ளதா என்பதையும்;

(ii) ஆமெனில், அத்திகதி யாதென்பதையும்;

(iii) இன்றேல், மேற்படி நிகழ்ச்சித்திட்டத்தை ஆரம் பிக்க உத்தேசித்துள்ள திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) the number of Buddhist places of worship in Sri Lanka at present;

(ii) the number of temples, out of them;

(iii) the number of Buddhist monks registered in Sri Lanka; and

(iv) the number of temples which ended up in closure due to non-availability of Buddhist monks?

(b) Will he also inform this House-

(i) whether a national programme known as "Sasun Udawa" has been commenced in order to properly maintain and develop the temples in the rural areas, as articulated in the "Vision of Prosperity" election manifesto, by now;

(ii) if so, when; and

(iii) if not, the expected date of the commencement of that programme?

(c) If not, why?

ගරු විදුර වික්‍රමනායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Vidura Wickramanayaka - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) විහාරස්ථාන සංඛ්‍යාව - 12,235
දසසිල් මාතා ආරාම සංඛ්‍යාව - 743
දේවාල සංඛ්‍යාව - 38
මුළු බෞද්ධ සිද්ධස්ථාන සංඛ්‍යාව - **13,016**

(ii) 12,235යි.

(iii) 42,122යි.

(iv) නොමැත.

(ආ) (i) ඔව්.

(ii) 2020.02.13

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගර නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් කිව්වා, "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි, දුෂ්කර ප්‍රදේශවල විහාරස්ථාන නිසියාකාරයෙන් පවත්වාගෙන යෑමට හා සංවර්ධනය කිරීමට "සසුන් උදාව" වැඩසටහන 2020 පෙබරවාරි සිට ක්‍රියාත්මකයි කියලා. ඒ වැඩසටහනට කොපමණ විහාරස්ථාන සංඛ්‍යාවක් මේ වනකොට ඇතුළත් කරගෙන තිබෙනවාද, ඒ යටතේ එම විහාරස්ථානවල සංවර්ධනයට ලැබෙන ප්‍රතිලාභ මොනවාද කියලා අපි දැනගන්න කැමැතියි, ගරු ඇමතිතුමනි.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වර්ෂ වශයෙන් කියන්නම්. 2020 අවුරුද්දේ මේ වැඩසටහන සඳහා රුපියල් මිලියන 165ක් වෙන් කර තිබෙනවා. 2021 අවුරුද්දේ රුපියල් මිලියන 224ක් වෙන් කර තිබෙනවා. කොවිඩ්-19 වසංගතය පැවති කාලයේදීත් රුපියල් මිලියන 61ක් වෙන් කළා. 2023 අවුරුද්දේ රුපියල් මිලියන 98ක් වෙන් කර තිබෙනවා. අවුරුදු 4ට ව්‍යාපෘති 900ක් සම්පූර්ණ කරලා තිබෙනවා. ඒ සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය 94.2යි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේක රජය හැටියටවත්, විපක්ෂය හැටියටවත් අහන ප්‍රශ්නයක් නොවෙයි. බෞද්ධයන් හැටියට ඔබතුමන්ලා, අපි විහාරස්ථානවලට ගියාම දකින දෙයක් ගැනයි මම මේ අහන්නේ. අපේ රටේ උපැවිදි වන සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වැඩි වෙනවා. ඒ වාගේම ශාසනයට ඇතුළත් වන ප්‍රමාණයේ ප්‍රතිශතයත් බොහොම අඩු වෙනවා. මේ විහාරස්ථාන ඉස්සරහට පවත්වාගෙන ගිහින් අපේ ශාසනය රැක ගන්න දැන් සිටින ස්වාමීන් වහන්සේලා ආරක්ෂා කරගත යුතුව තිබෙනවා. ශාසනයේ ඉදිරි පැවැත්ම යහපත් කර ගන්නේ කොහොමද, දැනට සිටින ස්වාමීන් වහන්සේලාට තිබෙන ගැටලු මොනවාද කියාත් අපි කල්පනා කළ යුතුව තිබෙනවා.

මේ කාරණා පිළිබඳව අමාත්‍යාංශය හැටියටත්, රජය හැටියටත්, අපි ඔක්කොම බෞද්ධයෝ හැටියටත් මහා නායක ස්වාමීන් වහන්සේලාගේ අවවාද අනුශාසනා ලබාගෙන යම් වැඩසටහනකට යා යුතු කාලය දැන් එළඹ තිබෙනවා. එහෙම වැඩ පිළිවෙළක් දැනටමත් තිබෙනවාද? එහෙම නැත්නම් අපි ඉස්සරහට තව තවත් ඒ ගැන කල්පනා කළ යුතුයි නේද, ගරු ඇමතිතුමනි?

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සැබෑ බෞද්ධයන් ලෙස සියලුදෙනාගේම හිතේ තිබෙන ප්‍රශ්නයක් තමයි ගරු මන්ත්‍රීතුමා ඒ යොමු කළේ. සියලු ගෞරව සහිතව එතුමාටත්, ඒ වාගේම මේ ගරු සභාවේ සිටින සියලු මන්ත්‍රීතුමන්ලාටත් අපි ආරාධනා කරනවා, අද පෙර වරු 11.30ට පැවැත්වෙන අපේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට සහභාගි වන ලෙස. වැඩි විස්තර අපි එතැනදී කථා කරමු.

මේ අවස්ථාවේදී මට කියන්න තිබෙන්නේ මේකයි. මේ වනවිට ඒ සඳහා සියලු වැඩසටහන් අපි ආරම්භ කර තිබෙනවා. අවසානයකට වාගේ, අපේ රටේ ජනගහන වර්ධනයත් වේගයෙන් අඩු වෙලා තිබෙනවා. එක පවුලකට එක් දරුවෙක් වාගේ තමයි මේ වනවිට ඉන්නේ. ඒ නිසා මහණවීමේ සහ මහණ කිරීමේ ප්‍රවණතාවත් අඩු වෙලා තිබෙනවා. මේ වාගේ සමාජයීය ප්‍රශ්නත්

[ගරු විදුර වික්‍රමනායක මහතා]

මේවාට බලපා තිබෙනවා. හැබැයි, අපි ඒවායින් පසුබට නොවී අලුත් වැඩසටහන් ගණනාවක් ඉදිරිපත් කරගෙන යනවා. එකක් තමයි, මම විශ්වාස කරන ආකාරයට දැනට සිටින ස්වාමීන් වහන්සේලා රැක ගැනීම. මොකද, දැනට සිටින ස්වාමීන් වහන්සේලා තමයි උපැවිදි වෙන්නේ. ඒ නිසා මේ ස්වාමීන් වහන්සේලා රැකගෙන, උන්වහන්සේලාට නිසි පරිදි ඒ විනය සහ ශික්ෂණය ලබා දෙමින්, ඒ කටයුතු කරන්න වැඩ පිළිවෙළක් අපි ආරම්භ කරලා තිබෙනවා. හැබැයි, මේ වැඩ පිළිවෙළ කොයිතරම් දුරට සාර්ථක වෙනවාද නැද්ද කියන එක ගැන පසු විපරමක් කළ යුතුයි. මේවා ඉස්සරත් තිබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

හැබැයි මේ පිළිබඳව පසු විපරමක් කරලා නැහැ. ඒ නිසා දැන් අපි පසු විපරමක් කරනවා. පසු විපරමක් කරලා තමයි මේ කටයුතු කරමින් පවතින්නේ. වැඩසටහන් ගණනාවක් ආරම්භ කරලා තිබෙනවා. ඒ සඳහා ගෞරවනීය මහා සංඝරත්නය පමණක් නොවෙයි, දායක සභාවල අය, බෞද්ධ ගිහි පාර්ශ්ව ඇතුළු සියලුදෙනාමත් එකතු කරගෙන තිබෙනවා. මේ යටතේ අපි විශේෂයෙන් ඉලක්ක කරගෙන තිබෙනවා, දහම් පාසල් දරුවන්. මේ වැඩ පිළිවෙළත් අපි ක්‍රියාත්මක කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, ප්‍රායෝගික තත්ත්වයක් නැතුව න්‍යායික දැනුම කොයි තරම් දුන්නත් තේරුමක් නැති බව. අපි මේ වනවිට ගරු අධ්‍යාපන අමාත්‍යතුමා එක්කත් මේ ගැන කථා කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වූ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා, එය සම්මතත් වුණා. මේ වැඩසටහන යටතේ අපොස සාමාන්‍ය පෙළ විභාගයේදී සියයට 70ක න්‍යායික දැනුමත්, සියයට 30ක ප්‍රායෝගික දැනුමත් බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, දහම් පාසල්වල 1 ශ්‍රේණියේ ඉඳන් 5 ශ්‍රේණිය වෙනකම් දරුවන් පොත පතින් ටිකක් අයින් කරලා, ඔවුන් වෙනුවෙන් ප්‍රායෝගික වැඩසටහන් පමණක් ක්‍රියාත්මක කරන්නත් බලාපොරොත්තු වෙනවා. අපේ ගෞරවනීය මහානායක ස්වාමීන් වහන්සේලාගේ අනුමැතිය ඇතිව මේ අලුත් වැඩසටහන සම්පාදනය කරමින් පවතිනවා.

ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් සහ සේවකයන්: පැමිණීම සහ පිටවීම වාර්තා කිරීම සහ අතිකාල ගෙවීම්

இலங்கை சுங்க உத்தியோகத்தர்கள் மற்றும் பணியாளர்கள்: வருகை மற்றும் வெளியேறுவதைப் பதிவிடுதலும் மேலதிக நேரக் கொடுப்பனவுகளும்

OFFICERS AND EMPLOYEES OF THE SRI LANKA CUSTOMS: RECORDING OF ARRIVAL AND DEPARTURE AND OVERTIME PAYMENTS

374/2024

4. ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා)
(The Hon. Niroshan Perera)

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නිලධාරීන් හා සේවකයන් සේවයට පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ ඇඟිලි සලකුණු පද්ධතියක් තිබේද;

(ii) සේවයට පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු පද්ධතිය භාවිත නොකරන නිලධාරීන් හා සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2022 වර්ෂයේදී පැමිණීම හා පිටවීම සටහන් නොකර අතිකාල දීමනා ලබාගෙන ඇති නිලධාරීන් හා සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම නිලධාරීන් හා සේවකයන් ලබාගෙන ඇති මුළු අතිකාල දීමනාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකා රේගුවේ වංචනික ලෙස අතිකාල දීමනා ලබා ගැනීම වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම පියවර ගැනීම හේතුවෙන් මේ වනවිට අනාවරණය වී ඇති වංචා සංඛ්‍යාව කොපමණද;

(iii) එම වංචාවලට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை சுங்கத்தில், உத்தியோகத்தர்களும் பணியாளர்களும் சேவைக்கு வருகை தருவதையும் வெளியேறுவதையும் பதிவிடுவதற்காக விரல் அடையாளப் பதிவு முறைமையொன்று உள்ளதா என்பதையும்;

(ii) சேவைக்கு வருகை தருவதையும் வெளியேறுவதையும் பதிவிடுவதற்கு விரல் அடையாளப் பதிவு முறைமையைப் பயன்படுத்தாத உத்தியோகத்தர்களினதும் பணியாளர்களினதும் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(iii) வருகை மற்றும் வெளியேறல் என்பவற்றைப் பதிவிடாமல் 2022ஆம் ஆண்டு மேலதிக நேரக் கொடுப்பனவுகளைப் பெற்றுள்ள உத்தியோகத்தர்களினதும் பணியாளர்களினதும் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(iv) மேற்படி உத்தியோகத்தர்களும் பணியாளர்களும் பெற்றுள்ள மொத்த மேலதிக நேரக் கொடுப்பனவு எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கை சுங்கத்தில் மோசடியான முறையில் மேலதிக நேரக் கொடுப்பனவுகள் பெறப்படுவதைத் தடுப்பதற்காக மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) அந்நடவடிக்கைகள் காரணமாக இன்றளவில் வெளிப்பட்டுள்ள மோசடிச் சம்பவங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) அம்மோசடிச் சம்பவங்களுடன் தொடர்புடைய நபர்களுக்கு எதிராக மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Economic Stabilization and National Policies:

(a) Will he inform this House -

(i) whether a fingerprint system is available at the Sri Lanka Customs to record the arrival and departure of officers and employees;

(ii) separately, the number of officers and employees who do not use the fingerprint system to record their arrival and departure;

(iii) separately, the number of officers and employees who have received overtime payments without keeping records of arrival and departure in the year 2022; and

(iv) the total amount of overtime payments that have been made for the said officers and employees?

(b) Will he also inform this House -

(i) the measures that have been taken by the Sri Lanka Customs to prevent fraudulent overtime payments;

(ii) the number of frauds tracked with the progress of the steps taken; and

(iii) steps taken against the people who have engaged in the said fraudulent activities?

(c) If not, why?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැව්ලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්. ඇඟිලි සලකුණු පද්ධතියක් ඇත.

(ii) ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන්ගේ සේවයේ ස්වභාවය අනුව පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතය ප්‍රායෝගික නොවේ. මේ පිළිබඳව දැනටමත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත හා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත අවස්ථා කිහිපයකදීම දැනුම් දී ඇත.

එම ප්‍රායෝගික හේතු නිසා ශ්‍රී ලංකා රේගුවේ කිසිදු නිලධාරියෙකු හෝ සේවකයෙකු පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත නොකරයි.

(iii) පැමිණීම හා පිටවීම සටහන් නොකර අතිකාල දීමනා ලබා ගත් නිලධාරීන් නොමැති අතර විධිමත් අනුමත අතිකාල ලේඛනයක පැමිණීම හා පිටවීම සටහන් කර අතිකාල දීමනා ලබා ගෙන ඇත. රේගු නිලධාරීන් තම සේවාදායකයන් වෙත සපයනු ලබන සේවා සඳහා සේවාදායකයන්ගේ අංක 1520/17 හා 2007 ඔක්තෝබර් 26 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ සේවා ගාස්තු අය කරයි. ඒ අනුව, මෙම දීමනා ගෙවනු ලබන්නේ ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් විසින් සාමාන්‍ය රාජකාරී කාලයෙන් පරිබාහිරව ඉටු කරනු ලබන රාජකාරී සඳහා සේවා ලබන්නන් විසින් රේගු දෙපාර්තමේන්තුවට ගෙවනු ලබන ගාස්තු පදනම් කරගෙන ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 1.1.1හි දක්වා ඇති ගාස්තු ප්‍රකාරවය. එය රාජ්‍ය නිලධාරීන්ට අතිකාල සහ නිවාඩු දින රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදය ප්‍රකාරව ගෙවනු ලබන අතිකාල දීමනාවක් නොවේ.

(iv) එසේ අතිකාල දීමනා ලබාගෙන නොමැත.

(ආ) (i) එලෙස වංචනික ලෙස අතිකාල දීමනා ලබා ගෙන නැත.

(ii) අදාළ නැත.

(iii) අදාළ නැත.

(ඇ) පැන නොනඟී.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර අනුව පැහැදිලි වෙනවා, ශ්‍රී ලංකා රේගුවට ඇඟිලි සලකුණු පද්ධතියක් තිබෙනවා, නමුත් ඒ පද්ධතිය භාවිත කරන්නේ නැහැ කියලා. මොකද, ඒක ප්‍රායෝගික නැහැ කියන එක තමයි ඔබතුමාගේ උත්තරය වුණේ. නමුත්, මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, 2017 අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි.

එහි කියා තිබෙනවා, කාර්ය මණ්ඩලවල පැමිණීම සහ පිටවීම පිළිබඳව. සියලු රාජ්‍ය ආයතනවලට එම චක්‍රලේඛය අනිවාර්ය කර තිබෙනවා. එම චක්‍රලේඛය උල්ලංඝනය කරමින් තමයි ශ්‍රී ලංකා රේගුව මේ විධියට වැඩ කරන්නේ. ඔබතුමන්ලා ඒ පිළිබඳව ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. නමුත්, ඔබතුමා දැන් පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා, ඒක ප්‍රායෝගිකව කරන්න ඕනෑ නැහැ කියලා.

ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, ශ්‍රී ලංකා රේගුවේ විවිධ කාරණා සම්බන්ධව 2024 දී -මේ අවුරුද්දේ- ඉදිරිපත් කරපු විගණකාධිපතිතුමාගේ විශේෂ වාර්තාවක් තිබෙනවා. මම ඔබතුමාගේ අවධානය ඒ වෙත යොමු කරවනවා. ඒ වාර්තාව අනුව, 2021දී සේවක අතිකාල දීමනා වශයෙන් රේගු නිලධාරීන්ට රුපියල් මිලියන 948ක් ගිහිල්ලා තිබෙනවා. රජයට ලැබිලා තිබෙන්නේ මිලියන 85යි. ඒ කියන්නේ, අතිකාල දීමනා වශයෙන් රේගු නිලධාරීන්ට සියයට 90ක් යනවා. සියයට 10ක් තමයි රජයට එන්නේ. 2022 දී රේගු නිලධාරීන්ට මිලියන 938ක් ගිහිල්ලා තිබෙනවා. රජයට මිලියන 83යි ලැබිලා තිබෙන්නේ. එතකොට සියයට 90ක් නිලධාරීන්ට යනවා. සියයට 10යි රජයට ලැබෙන්නේ. මේ විගණන වාර්තාවේ කියලා තිබෙනවා, ඒ නිලධාරීන්ගේ පැමිණීම සහ පිටවීම තහවුරු කරන්න බැරි වන නිසා මේක විගණනයට යටත් කරගන්න බැහැ කියලා. විගණකාධිපතිගේ වාර්තාවේ එය ප්‍රකාශ කරලා තිබෙනවා.

එතකොට, දැන් ඔබතුමන්ලා මේ ඇඟිලි සලකුණු පද්ධතිය තියාගෙන ඒක ක්‍රියාත්මක කරන්නෙත් නැත්නම්, වෙන මොනවා හෝ විකල්පයක් -දැනට තිබෙන ක්‍රමයට වඩා වෙන විකල්පයක්- ගැන සාකච්ඡා කරලා අමාත්‍යාංශය හැටියට එය ක්‍රියාත්මක කරන්න ඕනෑ නේද? මොකද, මෙතැන විශාල මතභේදයක් තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමා මොනවා ද කරන්නේ කියලා මම අහන්න කැමතියි.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉතා වැදගත් කරුණක් පෙන්වා දුන්නේ. එය කථා බහ කළ යුතු කාරණයක්.

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

විගණකාධිපති වාර්තාව අනුව 2020දී තමයි මේ පද්ධතිය හදලා තිබෙන්නේ. හැබැයි, එහි ප්‍රායෝගිකත්වය පිළිබඳ - ප්‍රායෝගිකව මෙය ක්‍රියාත්මක කළ හැකිද කියන කාරණාව පිළිබඳ - ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටේ පැය 24 පුරා වැඩ කරන, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත නොකරන සෞඛ්‍ය, දුම්රිය වැනි සේවා රාශියක් තිබෙනවා. මේ පිළිබඳ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දීර්ඝ වශයෙන් සාකච්ඡා වෙලා තිබෙනවා. රේගු දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ වාර්තා මා සතුව තිබෙනවා. ඒවා මට සභාගත කරන්නත් පුළුවන්. පැහැදිලිවම රේගුව ලබා ගන්නා ඒ දීමනාව සාමාන්‍ය අතිකාල දීමනාවකට වඩා වෙනස්. සාමාන්‍ය අතිකාල දීමනාව කියන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවාඩු හෝ අමතර වෙලාවක් වෙනුවෙන් වැඩ කරන සේවකයෙකුට රජයෙන් ගෙවන දීමනාව. මේ දීමනාව ඊට වඩා වෙනස්. මෙය සාමාන්‍ය රාජකාරියෙන් පරිබාහිරව පාරිභෝගිකයකුට, නැත්නම් ආනයනකරුවෙකුට හෝ අපනයනකරුවෙකුට අවශ්‍ය සේවය ලබා දීම සඳහා ලැබෙන දීමනාවක්. මේ දීමනාවෙන් රාජ්‍ය භාගය හැටියට සියයට 10ක් ලැබීම තමයි රජයේ අයිතිවාසිකම. මේ කාරණාව ආයතන සංග්‍රහයේ ඉතා පැහැදිලිව සඳහන් වෙනවා. ආයතන සංග්‍රහයේ IX වැනි පරිච්ඡේදයේ මෙසේ සඳහන් වෙනවා:

"1. ආණ්ඩුවට සේවා ඉටුකිරීම වෙනුවෙන් ගෙවන ගාස්තු.

1:1 පහත සඳහන් අවස්ථාවන්හි දී හැර වෙන කිසිම අවස්ථාවක දී ආණ්ඩුවට කරන කිසිම සේවයක් වෙනුවෙන් කිසිම නිලධාරියෙකුට ගාස්තුවක් ලබා ගත නොහැකිය:-

1:1:1 රේගු දෙපාර්තමේන්තුවේ අතිකාල දීමනා.

1:1:2 විභාග ප්‍රශ්න පත්‍ර සෑදීම සහ උත්තර පත්‍ර ලකුණු කිරීම

1:1:3 නිලධාරියාගේ කනතුරට සහ රාජකාරිවලට කිසිසේත් සම්බන්ධ නොවූ ගුවන් විදුලි/රූපවාහිනී ප්‍රචාර සඳහා ගාස්තු

1:2 ආණ්ඩුවට කරන සේවා සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ණ අනුමැතිය සහිත ගෙවීම්."

මේ කාරණය ආයතන සංග්‍රහයේ පැහැදිලිව තිබෙනවා.

ඒ අනුව, මේ කාරණාව පිළිබඳව යම්කිසි පරස්පරයක් තිබෙන බව පෙනෙනවා. ඒ නිසා මේ කරුණු සම්බන්ධව, ආදායම් උපයන දෙපාර්තමේන්තු සියල්ල සම්බන්ධව අනාගතයේදී පැහැදිලි ව්‍යුහාත්මක වෙනසක් කරන්න අවශ්‍ය කටයුතු කරගෙන යනවා. අපි මේ කටයුත්ත පිළිබඳව මේ අවස්ථාවේදී ගැඹුරින් සලකා බලන්න සූදානම්.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, වෘත්තීය සමිති ක්‍රියා මාර්ග නිසා මේ වන කොට කන්ටේනර් විශාල ප්‍රමාණයක් වරායේ හිර වෙලා තිබෙන බව අපි දකිනවා.

රේගු ත්‍යාග අරමුදල පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. 2024 විශේෂ විගණන වාර්තාවේ සඳහන් වුණු කරුණු අනුව, රේගු ත්‍යාග අරමුදල 2012 ඉඳලා 2023 වනකල් රුපියල් බිලියන 24.2යි. ඒ ත්‍යාග අරමුදලින් රේගු නිලධාරීන්ට රුපියල් බිලියන 16.8ක් ගිහින් තිබෙනවා, මේ කාල වකවානුව තුළ. ඒ රුපියල් බිලියන 24.2න් ඔත්තුකරුවන්ට රුපියල් බිලියන 2.7ක් ගිහින් තිබෙනවා. ඒ වාගේම, පොලීසිය සහ ආරක්ෂක හමුදාවල නිලධාරීන්ට රුපියල් බිලියන 3.9ක් ගිහිල්ලා තිබෙනවා. රජයට -ඒකාබද්ධ අරමුදලට- ඇවිල්ලා තිබෙන්නේ, රුපියල් බිලියන 14.5ක් විතරයි.

විශේෂ අවස්ථාවල ආනයනකරුවන්ගෙන් මේ ත්‍යාග අරමුදලට බැර කිරීම් සිදු වුණේ කොහොමද කියලාත් අපි බලමු. විශේෂයෙන්ම දුම්වැටි වංචාව, පොල් තෙල් වංචාව, ගල් අඟුරු වංචාව, ඒ වාගේම දුඹුරු සීනි සුදු සීනි කරපු වංචාව වැනි ඒවායින්, ඒ ගැන සපයපු ඔත්තුවලින් තමයි මේ ත්‍යාග අරමුදල රුපියල් බිලියන 24.2කට ඇවිල්ලා තිබෙන්නේ.

ඒ විගණන වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා, 2021/2022ට අදාළව රේගුවේ හිටපු ඉහළම තෑග්ග ලැබූ නිලධාරියා, ඒ කියන්නේ වැඩිම තෑගි මුදලක් ලැබූ නිලධාරියා හැටියට එක නිලධාරියෙකුට රුපියල් මිලියන 125ක් ලැබිලා තිබෙන බව. ඒ, 2021/2022ට අදාළවයි. ඒ වසරේ උපරිම ත්‍යාග ලැබූ නිලධාරීන් 100දෙනාට හම්බ වෙලා තිබෙනවා, රුපියල් මිලියන 1,042ක්.

2022/2023 ගත්තාම, උපරිම ත්‍යාගය ලැබූ රේගු නිලධාරියාට ලැබිලා තිබෙනවා රුපියල් මිලියන 111ක්. උපරිම ත්‍යාග ලැබූ නිලධාරීන් 100දෙනාට හම්බ වෙලා තිබෙනවා, රුපියල් මිලියන 1,039ක්. මෙතැනදී මත භේදයට තුඩු දෙන කාරණයක් තිබෙනවා. විගණකාධිපතිතුමා කියනවා, මේ ත්‍යාග මුදල ගෙවන්නේ රේගු ආඥා පනතේ 153(2) (ආ) වගන්තිය අනුව නොව, රේගුව අභ්‍යන්තරව සාදා ගත් යම් යම් නියෝග අනුවයි කියලා. මේ මතභේදය දැන් වන කොට විගණනය දක්වා ඇවිල්ලා තිබෙනවා. මුදල් අමාත්‍යාංශය මේකට මැදිහත් වන්නේ නැතුව දිගින් දිගටම කල් මරලා තිබෙනවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, විශාල මුදලක් මේ විධියට බෙදිලා යන එක ඔබතුමා අනුමත කරනවාද? එහෙම නැත්නම්, මුදල් අමාත්‍යාංශය මැදිහත් වෙලා රේගු ත්‍යාග මුදල් හරියාකාරව, සාධාරණ ලෙස බෙදී යන සේ ක්‍රමවේදයක් හදනවාද? එම ප්‍රශ්නය තමයි මට අහන්න තිබෙන්නේ.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියපු ආකාරයට පසුගිය සතියේ රේගුවේ යම්කිසි කාර්මික ආරාවුලක් ඇති වීමට ආරම්භයක් ඇති වුණා. අපි සාකච්ඡා කරලා දැන් එම ගැටලුව විසඳා තිබෙනවා. දැන් එය සමනයට පත් වෙලා තිබෙනවා. ඒ අවස්ථාවේ ඇති වුණු තදබදය විසඳා ගැනීමට අපට දවස් කිහිපයක් ගත වුණා. ඒ නිසා තමයි වාහන containers, නැත්නම් බහලුම්වල තදබදයක් ගැන කිව්වේ. දැනට ඒ ගැටලුව සම්පූර්ණයෙන් විසඳී තිබෙනවා; ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

දෙවැනි කාරණාව රේගු ත්‍යාග අරමුදල පිළිබඳවයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර රේගු ත්‍යාග අරමුදල බෙදී ගියේ සියයට 50ක් නිලධාරීන්ට, සියයට 30ක් රජයට සහ සියයට 20ක් ඔවුන්ගේ සාමාන්‍ය සුබසාධන අරමුදලට වශයෙනුයි. හැබැයි, මේ ගැන සාකච්ඡා කරලා සියලු පාර්ශ්වයන්ගේ එකඟතාවකට අනුව, සියයට 45ක් නිලධාරීන්ට සහ ඔත්තු සපයන්නන්ට; සියයට 5ක් සුබසාධන අරමුදලට. මෙම යෝජනාව අපි පාර්ලිමේන්තුවට ගෙනෙන්න සූදානමින් ඉන්නවා, ඔවුන්ගේ එකඟතාව ද ඇතුව. ඒ අනුව අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ එම ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනවා. යම්කිසි නිලධාරියෙකුට වැඩි කොටසක් යනවා කියන්නේ, සමහර විට ඔහු දක්ෂ නිලධාරියෙකු වෙන්න පුළුවන්. මම මේ එක පැත්තක් ගැන විතරයි කියන්නේ.

ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ විශේෂිත කාරණා පිළිබඳව සොයා බලන්නත් මම බලාපොරොත්තු වෙනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා, එම ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්න දෙකම අහලා අවසානයි. *[බාධා කිරීමක්]* නැහැ, ගරු රාජ්‍ය ඇමතිතුමාට උත්තර දෙන්න තවත් ප්‍රශ්නයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ටික අහලා අවසන් කරමු. එතුමාට උත්තර දෙන්න තවත් ප්‍රශ්න තිබෙනවා.

ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය: විස්තර
கமக்காரர் ஓய்வூதிய, சமூகப் பாதுகாப்பு நலன்புரித் திட்டம்: விபரம்
FARMERS' PENSION AND SOCIAL SECURITY BENEFIT SCHEME: DETAILS

381/2024

5. ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2022 වර්ෂය වන විට ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ශුද්ධ වත්කම්වල වටිනාකම කොපමණද;

(ii) එම යෝජනා ක්‍රමය වෙත මුදල් ලැබෙන ආකාරය කවරේද;

(iii) එහි ප්‍රතිලාභීන්ට ප්‍රතිලාභ හිමිකම් ලබා ගත හැකි වයස් සීමාව කවරේද;

(iv) එම යෝජනා ක්‍රමයේ වාර්ෂික ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ ඔවුන්ට වාර්ෂිකව ලබා දෙන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ හිමිකම් ලැබීම සඳහා සුදුසුකම් සපුරා ඇති, එහෙත් මේ වන විට ප්‍රතිලාභ හිමිකම් නොලබන සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ප්‍රතිලාභ හිමිකම් ලබා නොදීමට හේතු කවරේද;

(iii) ඔවුන්ට ගෙවීමට ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ඉහත යෝජනා ක්‍රමය මේ වන විට අකර්මණ්‍ය වී තිබේද;

(ii) එය සක්‍රියව පවත්වා ගෙන යෑම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2022ஆம் ஆண்டாகும்போது காணப்பட்ட கமக்காரர் ஓய்வூதிய, சமூகப் பாதுகாப்பு நலன் புரித் திட்டத்துக்கான சொத்துக்களின் தேறிய பெறுமதி எவ்வளவென்பதையும்;

(ii) மேற்படி திட்டத்துக்கு நிதி கிடைக்கும் வழிமுறை யாதென்பதையும்;

(iii) அதன் பயனாளிகள் நலன்புரி உரித்துகளைப் பெறக்கூடிய வயதெல்லை யாதென்பதையும்;

(iv) மேற்படி திட்டத்தின் வருடாந்த பயனாளிகளின் எண்ணிக்கையும் அவர்களுக்கு வருடாந்தம் வழங் கப்படும் தொகையும் தனித்தனியாக யாதென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி திட்டத்தின் நலன்புரி உரித்துகளைப் பெறுவதற்கான தகைமைகளைப் பூர்த்தி செய்திருப்பினும் இன்றளவில் நலன்புரி உரித்து கள் கிடைக்கப்பெறாத அங்கத்தவர் களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அவர்களுக்கு நலன்புரி உரித்துகள் வழங்கப் படாமைக்கான காரணங்கள் யாவையென் பதையும்;

(iii) அவர்களுக்கு வழங்கப்படவுள்ள தொகை எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி திட்டம் இன்றளவில் செயலிழந் துள்ளதா என்பதையும்;

(ii) அதனைச் செயல்முனைப்புடன் பேணிச் செல்வதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கை கள் யாவையென்பதையும்;

மேலும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Will he inform this House -

(i) the value of the net assets of the Farmers' Pension and Social Security Benefit Scheme by the year 2022;

(ii) the manner in which the funds are received into the scheme;

(iii) age limit at which its beneficiaries can claim for benefits; and

(iv) separately, the number of annual beneficiaries of the said scheme and the amount paid to them annually?

(b) Will he also inform this House -

(i) the number of members who have met the eligibility requirements for receiving the benefits of the above scheme, but are not currently receiving the benefits;

(ii) the reasons for not providing benefits to them; and

(iii) the amount payable to them?

(c) Will he further inform this House -

(i) whether the above scheme is inoperative by now; and

(ii) the steps that have been taken to maintain it further?

(d) If not, why?

ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture and Plantation Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2022 වර්ෂය වන විට ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ශුද්ධ වත්කම්වල වටිනාකම ඍණ රුපියල් බිලියන 85.9කි. ඒ අනුව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වර්තමාන වගකීම රුපියල් බිලියන 85.9කි.

1987 වර්ෂයේ ආරම්භ කරන ලද යෝජනා ක්‍රමය වාරික වැඩි කිරීමකින් තොරව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වැඩි කිරීම නිසා විශ්‍රාම වැටුප් වගකීම වැඩිවීම හේතුවෙන් ශුද්ධ වත්කම් ඍණ අගයක් ගෙන ඇත.

(ii) විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා සෑම වසරකම අය වැය ප්‍රතිපාදන මඟින් මුදල් ලබා දීම සිදු කරනු ලබයි. එයට අමතරව වාරික ආදායම ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලැබේ.

(iii) මේ යෝජනා ක්‍රමයට වයස අවුරුදු 18-55 අතර ගොවි මහතුන්ගෙන් දායකත්වය ලබාගත හැකි වන අතර, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු මාසික විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

(iv) 2022 වර්ෂයේ දෙසැම්බර් මස වන විට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සඳහා දායකයන් 169,741දෙනෙකු සුදුසුකම් ලබා ඇත.

එම වර්ෂය සඳහා ගෙවන ලද විශ්‍රාම වැටුප් ප්‍රමාණය රුපියල් මිලියන 4,053කි.

(ආ) (i) 2024 වර්ෂය වන විට වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ප්‍රතිලාභීන් 177,528දෙනෙකු සුදුසුකම් ලබා ඇත. 2024 මැයි මාසය වන විට විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබූ දායකයින් 636දෙනෙකු පොරොත්තු ලේඛනගතව ඇත.

(ii) ඔවුන්ට ප්‍රතිලාභ ගෙවීම නතර කර නොමැත. විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය වෙත ඔවුන්ගේ ලිපිගොනු විශ්‍රාම වැටුප් සැකසීම සඳහා යොමු කර ඇත. ඒ අනුව කඩිනමින් ප්‍රතිලාභ ගෙවීමට කටයුතු යොදා ඇත.

(iii) පොරොත්තු ලේඛනයේ සිටින ගොවි මහතුන් සඳහා ආරම්භයේදී එක් අයකු වෙනුවෙන් රුපියල් 1,000 බැගින් මාසිකව රුපියල් 636,000ක මුදලක් ගෙවීමට නියමිත වේ. පසුව දායකයාගේ වයස අනුව එක් විශ්‍රාම වැටුප්ලාභියකු සඳහා පහත පරිදි වැඩිකළ විශ්‍රාම වැටුපක් ගෙවීමට නියමිත වේ.

වයස (අවුරුදු)	මාසික විශ්‍රාම වැටුප (රුපියල්)
60-63	1000.00
64-70	1250.00
71-77	2000.00
78- ඊට වඩා වැඩි	5000.00

(ඇ) (i) නැත.

(ii) 1987 වර්ෂයේ ආරම්භ කරන ලද රාජ්‍ය සහනාධාර සහිත යෝජනා ක්‍රමය සඳහා දායක වූ ගොවි මහතුන් වෙත අඛණ්ඩව විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු යොදා ඇත.

2024 වර්ෂය තුළ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රුපියල් මිලියන 5,386ක් වෙන් කර ඇත.

(ඈ) අදාළ නොවේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට මේ කාරණය තේරෙනවා. ගොවි විශ්‍රාම වැටුප් පිළිබඳව අද විශාල අර්බුදයක් තිබෙනවා. ඒක කියපු තරම් සාර්ථකව සිදු වෙලා නැහැ. ඒක ඔබතුමාගේ වරදක් නොවෙයි. ඒ රුපියල් එක්දහස් ගණන ලබා ගන්නත් සෑහෙන පිරිසක් ඉන්නවා. වත්කම් ඍණ අගයක තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් ඔබතුමා මොකක් හෝ වැඩ පිළිවෙළක් ලැහැස්ති කරලා තිබෙනවාද? ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය නිවැරදි විධියට අලුතින් හදන්න, නැත්නම් ඒකට යම් අලුත් වැඩ පිළිවෙළක් ගෙනෙන්නවත් මොකක් හරි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා ද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

1987 දී තමයි මේ ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය ආරම්භ කරලා තිබෙන්නේ. මෙම අරමුදලේ වත්කම් ශූන්‍යවීමට හේතු කිහිපයක් මම කෙටියෙන් කියන්නම්. පළමුවැනි එක තමයි, වාරික වැඩි කිරීමකින් තොරව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වැඩි කිරීම. දෙවැන්න, කලත්‍රයාට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා දීමට තීරණය කිරීම. මේ වාගේ තීන්දු අරගෙන තිබෙනවා. තුන්වැනි හේතුව තමයි, එකඟ වූ පරිදි භාණ්ඩාගාරය මඟින් ආරම්භක ප්‍රාග්ධනය ලබා නොදීම. ඒ අවුරුද්දේ රුපියල් මිලියන 750 මුදලක් ලබා දෙන්න එකඟ වෙලා තිබුණත්, ඒක ලබා දීලා නැහැ.

ඊළඟට තිබෙනවා, අවුරුදු 46 - 59 දක්වා වයස් කාණ්ඩයට අයත් දායකයන්ගෙන් යෝජනා ක්‍රමය සඳහා දායකවීමට ලබා දී තිබූ කාල සීමාව දීර්ඝ කිරීම කියලා. මේ වාගේ තීන්දු තීරණ අරගෙන තිබෙනවා. නමුත් ඒවාට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමක් සිද්ධ වෙලා නැහැ. ඒ නිසා තමයි මේ තත්ත්වය නිර්මාණය වෙලා තිබෙන්නේ. දැනටමත් 3,448දෙනෙක් මේ සඳහා දායකත්වය ලබා දී තිබෙනවා. අඩුපාඩු හඳුනා ගනිමින් දිස්ත්‍රික්ක මට්ටමෙන් දැනට මේ කටයුත්ත කරගෙන යනවා. මම මේ පිළිබඳව මහා භාණ්ඩාගාරයටත්, කැබිනට් මණ්ඩලයටත් වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ අනුව මුදල් නොගෙවූ අයට ඉදිරියේදී කඩිනමින් මේ මුදල් ගෙවන්නත්, මේ යෝජනා ක්‍රමය සාර්ථකව අලුතෙන් පවත්වා ගෙන යන්නත් අවශ්‍ය වැඩ පිළිවෙළ මේ වන විට අපි සකස් කර තිබෙනවා. *[බාධා කිරීමක්]* චක්‍රලේඛ අනුව බදවා ගන්නත්, මුදල් අමාත්‍යාංශයෙන් මේ හිඟ මුදල ලබා ගන්නත් කටයුතු කරනවා. ඒ සඳහා යම් ආකාරයක එකඟතාවක් පළ වෙලා තිබෙනවා. ඒ අනුව අපට මේ කටයුත්ත බාධාවකින් තොරව ඉදිරියට පවත්වා ගෙන යන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, ගොවීන්ගේ දායකත්වයත් එක්ක තමයි මේ කටයුත්ත අපි කරගෙන යන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දිගින් දිගටම කිව්වා, "පොහොර සහනාධාරය දැන් දෙනවා, ඔක්කොම හරි, අපි සියල්ල කරලා තිබෙන්නේ" කියලා. දැන් මේ යල කන්නයේ පොහොර ගහලා ඔක්කොම කරලා අගෝස්තු වෙනකොට ගොයම් කපන්නත් සූදානම් වෙනවා. හැබැයි, පොහොර සහනාධාරයට අවශ්‍ය කරන මුදල් ටික තවමත් ලැබිලා නැහැ. ගොවීන් පුදුම අමාරුවකින් ජීවත්වන්නේ. ඔබතුමාත් කුඹුරු කරන කෙනෙක්; මමත් කුඹුරු කරන කෙනෙක්. අක්කර 3කට රුපියල් තුන් ලක්ෂ ගණනක් වැය වෙනවා. හැබැයි, හම්බ වෙන්නේ රුපියල් එක් ලක්ෂ ගණනයි. ඉතින්, ඔවුන් අමාරුවෙන් ජීවත් වෙන්නේ. අරක දෙනවා, වැඩි කර දෙනවා, නොමිලේ දෙනවා, අරවා මේවා දෙනවා කියලා ඔබතුමා කොයි තරම් කයිය ගැහුවත්, මේ වනතුරුත් පොහොර සහනාධාරය ලැබී නැති පිරිසක් ඉන්නවා. යම්කිසි පිරිසකට හම්බ වෙලා තිබෙනවා. ඒ, ඉතාම කුඩා පිරිසකට. සමස්තයක් විධියට, ගොයම් කපලා ඉවර වෙනකල් පොහොර සහනාධාරය ලැබෙන්නේ නැහැ. ඉතින්, මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගන්න පියවර මොකක්ද කියලා මම අහන්න කැමැතියි. අවසානයේ, අතින් කාලා හරක් බලනවා වාගේ වැඩක් තමයි ඒ මිනිස්සුන්ට සිද්ධ වෙලා තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් ඔබතුමා ගන්න පියවර මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගිය සතිය වෙනකොට මම මේ සම්බන්ධයෙන් තොරතුරු ලබා ගත්තා. සියයට 90කට වැඩි ප්‍රමාණයකට පොහොර සහනාධාරය සඳහා මුදල් ලබා දී තිබෙනවා. මීට සති 2කට ඉස්සෙල්ලා බලනකොට රුපියල් බිලියන 5.8ක් ලබා දීලා තිබුණා. ඊට පස්සේ ඒක බිලියන හයයි ගණනක් වෙලා තිබුණා.

මේ වෙනකොට තිබෙන අලුත් තොරතුරු ටික මට ලබා ගන්න බැරි වුණා. මේ ප්‍රශ්නය සියයට 5කට, 6කට වාගේ තිබෙනවා. *[බාධා කිරීමක්]* නැහැ. මම ඒකට හේතුව කියන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල්මය ප්‍රශ්නයකට වඩා, ලේඛන පුරවා එවීමේ දී අඩුපාඩු සිදු වෙලා තිබෙනවා. ඒකට හේතු දෙකක් තිබෙනවා. එකක් තමයි වරින් වර ගොවීන් මාරු වීම. එතකොට අලුත් ගොවියා වගා කළා කියලා මෙහෙට වාර්තා කළාම තමයි මුදල් දෙන්නේ. ඒ නිසා යම් ප්‍රමාදයක් ඇති වෙනවා. ඒ වාගේම සමහර අයගේ ගිණුම් තොරතුරු වැරදිලා ආපස්සට ආපු අවස්ථා ගොඩක් තිබෙනවා. එහෙම ප්‍රශ්න තිබෙනවා. මම පිළිගන්නවා, ඔබතුමා කියපු කාරණය. එහෙම තැනක් තිබෙනවා නම් ඔබතුමා අපට ඒ ගැන දන්වා එවන්න. මම ඒ සම්බන්ධව පරීක්ෂණයකුත් කරගෙන යනවා. සමහර නිලධාරීන් හිතාමතාම මේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරනවා. ඒකට හේතුව මේකයි. මෙතෙක් කලක් සිද්ධ වුණේ පොහොර බෙදා දීම පමණයි. පොහොර බෙදීමේ දී සිදුවුණු අක්‍රමිකතා, ටෙන්ඩර්වල තිබුණු ගැටලු ඔක්කෝම සැලකිල්ලට අරගෙන තමයි සෘජුවම ගොවියාට මේ මුදල යවන්න තීන්දු කළේ. බණ්ඩි පොහොර ගහන එක තමයි අපේ අවසාන ඉලක්කය වුණේ. ගොඩක් අය මූලික පොහොර ගැහුවාට බණ්ඩි පොහොර පාවිච්චි කරන්නේ නැහැ. මිනිස්සු යූරියා ගහනවා, ගොයම් කහවෙන නිසා. හැබැයි, බණ්ඩි පොහොර නැති වුණොත් කරල පිරෙන්නේ නැහැ. ඒ නිසා තමයි බණ්ඩි පොහොර සඳහා මුදල් යවන්න අපි තීන්දු කළේ. මම පිළිගන්නවා, සමහර තැන්වල සියයට 10කට අඩු ප්‍රමාණයක්,- මම හරියටම ඔබතුමාට ඒ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්නම්. මොකද, ඔබතුමා මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ අතුරු ප්‍රශ්නයක් විධියට නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට ප්‍රධාන හේතුවක් තිබෙනවා. අපේ නිලධාරීන්ටත්, පහළ මට්ටමේ ඉන්න අයටත් පොහොර බෙදීමේ දී යම් යම් වාසි තිබෙනවා. හැබැයි, මුදල් බෙදීමේදී එහෙම වාසියක් ලැබෙන්නේ නැහැ. මොකද, ඒ මුදල් කෙළින්ම ගොවියාගේ ගිණුමට යන නිසා. ඒ නිසා මේක කඩාකප්පල් කරන්න කටයුතු කරනවා. මේක සමහර කෘෂි පර්යේෂණ නිලධාරීන්, සමහර DOලා වාගේම අපේ කාර්යාලවල ඉන්න ඉහළ මට්ටමේ නිලධාරිනුත් ලොකු කැමැත්තකින් කරන කාර්යයක් නොවෙයි. ඒ නිසා අඩු පාඩු සිදුවෙනවා.

ඒ වාගේම අපි මේ වෙනකොට පොහොර සහනාධාරය තවත් විධියකට දීලා තිබෙනවා. අපි ගිය කන්නය වෙනකොට සියලු ගොවීන්ට නොමිලේ මඩ පොහොර ලබා දුන්නා. ඒ වාගේම කුඩා පරිමාණ ගොවීන්ට යූරියා පොහොර විශාල ප්‍රමාණයක් නොමිලේ ලබා දුන්නා. අපි ඒක පටන් ගන්න වෙලාවේ පොහොර සහනාධාරය දීලා ඊට අතිරේකව කාබනික පොහොර මිලදී ගන්නත් මූල්‍යමය සහනාධාරයක් වෙනම ලබා දුන්නා. ඒවා ලබා දීමේ ප්‍රතිඵලයක් විධියට අද අපට රටින් සහල් ගෙනෙන්න ඕනෑ නැහැ. 2022 අවුරුද්දේ සහල් අවශ්‍යතාවෙන් 1/3ක්ම අපි රට සහල්වලින් තමයි සපුරා ගත්තේ. නමුත් 2023 දී සියයට සියයක් අපේ සහල් තමයි අපි පරිභෝජනය කළේ. කීරි සම්බාවල යම් හිඟයක් තිබුණු නිසා රටින් පොඩි ප්‍රමාණයක් ගෙනාවා. ඒකත් 2024ට ආවේ. එහෙම නොවෙන්න, මේ රට දැන් සහලින් ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. අපි දැන් වෙනත් භෝග වගා කරන්නයි යන්නේ. ඒ වාගේම වී ගොවියා ශක්තිමත් කරන වැඩ පිළිවෙළ අඛණ්ඩව ඉදිරියටත් ක්‍රියාත්මක කිරීම සඳහා එන කන්න දෙකටම බණ්ඩි පොහොර නොමිලේ ලබා දෙන්න අපට දැන් පුළුවන් වෙනවා. දැන් අපි අවසාන මට්ටමට ඇවිල්ලා තිබෙනවා. ඒ ගිවිසුම් අත්සන් කරන්න නීතිපතිවරයාගේ අනුමැතිය ලැබිලා තිබෙනවා.

ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ මැදිහත් වීම මත අපට පොහොර මෙට්‍රික්ටොන් 55,000ක් නොමිලේ ලැබෙනවා. ඒකට බිලියන තුනයි දශම ගණනක මුදලක් අවශ්‍යයි, මේ රටේ වියදම් වශයෙන්. මේ වෙනකොට මුදල් අමාත්‍යාංශය ඒකට මට මුදල් වෙන් කර දීලා තිබෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු ඇමතිතුමනි, මට ඔබතුමාගෙන් පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න අවශ්‍යයි. මේක පොහොරවලට අදාළ කාරණයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අපි ඊළඟ ප්‍රශ්නවලට යමු. දැන් වෙන කාරණයකට යන්න බැහැ. මොකද, අනෙක් ගරු මන්ත්‍රීතුමන්ලාටත් ඔය වාගේම කෘෂි කර්මාන්තය පිළිබඳ ප්‍රශ්න තිබෙනවා නේ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 6 -467/2024- (1), ගරු අජිත් මාන්නප්පෙරුම මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

අනුරාධපුර, පදවිය, ගාමිණී විද්‍යාලය: විස්තර

அநுராதபுரம் பதவிய, காமினி வித்தியாலயம்: விபரம்

GAMINI VIDYALAYA, PADAVIYA, ANURADHAPURA: DETAILS

512/2024

7. ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර පදවිය, බෝගස් හන්දිය ප්‍රදේශයේ, ගාමිණී විද්‍යාලයේ මේ වනවිට උග්‍ර ගුරු හිඟයක් පවතින බවත්;

(ii) මෙම ගුරු හිඟය සම්බන්ධව එම විද්‍යාලයේ ශිෂ්‍යයින් හා ඔවුන්ගේ දෙමාපියන් විසින් දැවැන්ත උද්ඝෝෂණයක් සිදු කරන ලද බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, එම ගුරු හිඟය විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுரம் பதவிய, போகஸ் ஹந்திய பிரதேசத்தில் அமைந்துள்ள காமினி வித்தியாலயத்தில் தற்போது பாரிய ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்றது என்பதையும்;

(ii) மேற்படி ஆசிரியர் பற்றாக்குறை தொடர்பில் மேற்குறித்த பாடசாலையின் மாணவர்கள் மற்றும் அவர்களது பெற்றோர்களால் பாரிய ஆர்ப்பாட்டமொன்று மேற்கொள்ளப்பட்டது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், மேற்படி ஆசிரியர் பற்றாக்குறையைத் தீர்ப்பதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) a grave shortage of teachers exists in the Gamini Vidyalaya in the Bogas Handiya area in Padaviya, Anuradhapura; and

(ii) the students of the school and their parents staged a massive demonstration over this shortage of teachers?

(b) If so, will he inform this House of the measures that would be taken to address this shortage of teachers?

(c) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නයේ "අනුරාධපුර, පදවිය, බෝගස් හන්දිය ප්‍රදේශයේ, ගාමිණී විද්‍යාලයේ මේ වනවිට ගුරු හිඟයක් පවතින බවත්" යනුවෙන් සඳහන්ව තිබෙනවා. හැබැයි, අනුරාධපුර, පදවිය, බෝගස් හන්දිය ප්‍රදේශයේ ගාමිණී විද්‍යාලය නමින් පාසලක් නොමැති බවට උතුරු මැද පළාතේ අධ්‍යාපන ලේකම් වාර්තා කර තිබෙනවා. ඒ වාගේම, යාබද පළාත් දෙක වන උතුරු හා නැඟෙනහිර පළාත්වලිනුත් විමසීමෙන් පසුව එවැනි පාසලක් නැති බව දැනුම් දෙනවා. මේ පාසලේ නම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන්නේ. ඔබතුමාට පාසලේ නම හරියට කියන්න පුළුවන් නම් මට ඒ තොරතුරු ටික දෙන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමා.

මෙම ප්‍රශ්නයට අමාත්‍යාංශය විසින් එවා තිබෙන පිළිතුරත් මා කියවන්නම්.

(අ) (i) අනුරාධපුර, පදවිය, බෝගස් හන්දිය ප්‍රදේශයේ, ගාමිණී විද්‍යාලය නමින් පාසලක් නොමැති බවට අධ්‍යාපන ලේකම් (උතුරු මැද) වෙතින් දන්වන ලද අතර, ඒ අනුව ඊට යාබද පළාත් දෙක වන උතුර හා නැඟෙනහිර පළාත් අධ්‍යාපන ලේකම්වරු වෙතින් විමසීමෙන් පසු එම පළාත්වලද එම නමින් පාසලක් නොමැති බව දන්වා ඇත.

(ii) ඉහත (i)හි සඳහන් පරිදි වේ.

(ආ) ඉහත (අ)(i)හි සඳහන් පරිදි වේ.

(ඇ) අදාළ නොවේ.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ප්‍රශ්නය මුද්‍රණය කිරීමේදී සිදු වුණු දෝෂයක් තිබෙන්නේ, ගරු ඇමතිතුමනි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

එතැනින් එහාට පිළිතුරු දෙන්න විධියක් නැහැ. එවැනි පාසලක් පවතින්නේ නැහැ කියන නිසා.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මුද්‍රණය කිරීමේ ගැටලුවක් තිබෙන්නේ. කමක් නැහැ. මේ ප්‍රශ්නය දැන් විසඳිලා තිබෙන්නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මම වෙන දවසක උත්තර දෙන්නම්, ඔබතුමා මට හරියට පාසලේ නම කිව්වොත්.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු ඇමතිතුමනි, දැන් ඒ ප්‍රශ්නය විසඳිලා තිබෙන්නේ. මේක අවුරුදු දෙකකට, දෙකහමාරකට පමණ පෙර ඉදිරිපත් කළ ප්‍රශ්නයක්. අද වෙනකොට මේ ප්‍රශ්නය විසඳිලා තිබෙනවා. අලුතින් ගුරුවරු ප්‍රමාණයක් ගත්තා නේ.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි. ඔබතුමාගෙන් මම ඉස්සරවෙලාත් මේ කාරණය ඇහුවා. අපේ උතුරු මැද පළාතේ තව උපාධිධාරීන් ප්‍රමාණයක් ඉන්නවා, විභාගයටත් මුහුණ දීලා. ඒ අය බඳවා ගැනීමේ ප්‍රමාදයක් තිබෙනවා. ඔවුන් සම්මුඛ පරීක්ෂණවලටත් කැඳවපු අය. ඔවුන්

බඳවාගන්න කියා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලා, අපි ඔක්කොම දන්නවා, මේ දවස්වල රටේ තිබෙන ප්‍රශ්නය ගැන. එක් එක් දේශපාලන පක්ෂ අද තමන්ගේ දේශපාලන අවශ්‍යතා වෙනුවෙන් උද්ඝෝෂණ, වැඩවර්ජන රැලි මේ රටේ නිර්මාණය කරමින් සිටිනවා. ප්‍රධාන වශයෙන්ම මේ රටේ උසස් අධ්‍යාපනය ගොඩනඟන, දරුවන්ගේ අනාගතය නිර්මාණය කරන තැනක් තමයි විශ්වවිද්‍යාල කියන්නේ. අද විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු සම්පූර්ණයෙන් ඇනහිට තිබෙනවා, මේ අනධ්‍යයන සේවක මණ්ඩලයේ වැටුප් ප්‍රශ්නය පිළිබඳව තිබෙන වැඩවර්ජනය නිසා. සමස්ත රාජ්‍ය සේවකයන්ට පසුගිය කාලයේ වැඩි කරපු සියයට 107ක වැටුපෙන් ඔවුන්ට ලැබුණේ සියයට 92යි, ඉතිරි සියයට 15ක ප්‍රමාණය ලබා දෙන්න කියලායි ඒ අය ඉල්ලන්නේ. මෙවැනි කාරණා පිළිබඳව ඉක්මනින් සලකා බලා ඔබතුමන්ලා මේ ප්‍රශ්නය විසඳන්න. මොකද, මැතිවරණයක් පෙනෙන මානයක තිබෙන රටක එක් එක් දේශපාලන පක්ෂවලට රජය විසින් උඩගෙඩි ලබා දීම තමයි මේ සිද්ධ වෙන්නේ. විධායක ශ්‍රේණියේ නිලධාරින්ට වැටුප් වැඩි කරලා එතැන ප්‍රශ්නයක් ඇති කළා. ඒ වාගේම අපි දැක්කා, මහ බැංකුවේ නිලධාරින් වැටුප් වැඩි කරගන්න යනවා. මේ වාගේ ප්‍රශ්න රටේ ඇති වුණාම ඒකෙන් පරිපාලන සේවයට ගැටලුවක් ඇති වෙන්න පුළුවන්. ඒ වාගේම රටේ සාමාන්‍ය පුරවැසියන්ටත් විශාල ගැටලුවලට මුහුණ දෙන්න සිදු වෙනවා.

විශේෂයෙන්ම මේ මොහොත වෙනකොට ක්‍රියාත්මක වන අනධ්‍යයන සේවක වැඩ වර්ජනය නිසා මේ රටේ උසස් අධ්‍යාපනය ලබාගෙන ඉක්මනින් රැකියාවල නියැළීමට බලාපොරොත්තුවෙන් සිටින දරුවන්ගේ අනාගතය යම් කිසි තැනක හිරවෙලා තිබෙනවා. එම නිසා මේ පිළිබඳව සාධාරණ කටයුත්තක් කරලා අනධ්‍යයන සේවකයින්ගේ වැඩ වර්ජනය නතර කරන්න කටයුතු කරනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ පිළිබඳව කිහිප වතාවක්ම පිළිතුරු දුන්නා. 2018 වර්ෂයේ ඉඳලා තමයි අනධ්‍යයන සේවකයින්ගේ ප්‍රශ්නය මතු වුණේ. අවුරුදු 6ක් තුළදී ඇති වූ ඒ සියයට 15ක වෙනස ගැන තමයි ඒ අය සඳහන් කරමින් සිටියේ. ඒ නිසා මම ඒ පිළිබඳව වට කිහිපයක් සාකච්ඡා කිරීමෙන් පසු ලබන අවුරුද්දේ ජනවාරි මාසයේ ඉඳලා එය ගෙවීම සඳහාත්, අය වැයට එම යෝජනාව ඇතුළත් කිරීම සඳහාත් ඒ අයගේත් එකඟතාව තිබුණා. ඊට පස්සේ මහදී -මීට මාස දෙකකට පෙර- විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලවලට ලබාදෙන දීමනාවල යම් වැඩි වීමක් සිද්ධ වුණා. ඊට පස්සේ අනධ්‍යයන කාර්ය මණ්ඩලවලින් ආපු ඉල්ලීම තමයි, මාසික හිලව් දීමනාව වැඩි කරන්නය කියන එක. ඒ මාසික හිලව් දීමනාව මීට පෙර අවස්ථාවක -අවුරුදු කිහිපයකට කලින්- දීලා තිබෙනවා. ඒ පිළිබඳව අවසාන වශයෙන් ජනාධිපති ලේකම්තුමා, මහා භාණ්ඩාගාරයේ නිලධාරින්, මම, අපේ අමාත්‍යාංශයේ ලේකම්, UGC එකේ Chairman සහ වෘත්තීය සමිති නියෝජිතයිනුත් පසුගිය සිකුරාදා සවස 4.30 ඉඳලා 6.00 වෙනකල් ජනාධිපති ලේකම් කාර්යාලයේ දී සාකච්ඡා කළා. ඒ අනුව ඒ වෙලාවේම ලියලා සඳුදා වෙනකොට මහා භාණ්ඩාගාරයට ලිඛිතව දන්වා යැව්වා, UGC එකේ ඉතිරි වී තිබෙන යම් ප්‍රතිපාදනයකින් ඉදිරි මාස හයේ ගෙවීම් කටයුතු සඳහා හෝ අවසර දෙන්න කියලා. ඒ පිළිබඳව මහා භාණ්ඩාගාරය මඟින් එවන ලද පිළිතුර අනුව UGC එකේ Chairman විසින් මේ වෙනකොට වෘත්තීය සමිති දැනුවත් කරලා තිබෙනවා. ඒ සඳහා යම් කාලයක් දීලා තිබෙනවා. ඒ කාලය තුළදී ඇති වන තත්ත්වයත් එක්ක තමයි මේ ප්‍රශ්නය විසඳෙන්නේ. ඒ තත්ත්වය තිබුණත්, දැනට මහාචාර්යවරු, ආචාර්යවරු විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ දේශන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනවා. නමුත්, යම් බලපෑමක් තිබෙනවා. පරීක්ෂණ කරන්න අමාරුයි, researchesවලට අමාරුයි, උපාධි ප්‍රදානෝත්සව කල් ගිහිල්ලා තිබෙනවා. මේ වෙනකොට එවැනි අවහිරතා කිහිපයක් තිබෙනවා.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා අහනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු ඇමතිතුමනි, මම මේ ප්‍රශ්නය මීට කලිනුත් ඔබතුමාගේ අවධානයට යොමු කළා. ඒ පිළිබඳව කථා කරන්න අපි ඇවිල්ලා ඔබතුමාව මුණගැහුණාම, ඔබතුමා විභාග කොමසාරිස් ජනරාල්තුමාට කිව්වා මේ ප්‍රශ්නය ඉක්මනට විසඳන්න කියලා.

විශේෂයෙන්ම 2023 අගෝස්තු මාසයේ තමයි මේ විදුහල්පතිවරු පිරිස විභාගයට මුහුණ දුන්නේ. එම විදුහල්පතිවරුන්ගෙන් 13දෙනෙකුගේ ප්‍රතිඵල නිකුත් වුණේ නැහැ, හිජාබ් එක පැළඳගෙන විභාගය ලිව්වාය කියලා.

ගරු ඇමතිතුමනි, ඒකේ inquiry එක තිබුණේ 2023 වර්ෂයේ දෙසැම්බර් මාසයේ. ප්‍රතිඵල ආවේ මැයි මාසයේ. ප්‍රතිඵල පත්‍රයේ සඳහන් කරලා තිබුණේ, ඔවුන්ගේ ප්‍රතිඵල අවලංගු කළ බවයි. ඊට පසු අපි ජූනි මාසයේදී ඔබතුමාව මුණගැහුණා. ඔබතුමා අදාළ නිලධාරින්ට directive එක දුන්නා, වහාම මැදිහත් වෙලා මේ ප්‍රශ්නය විසඳන්න කියලා. නමුත් අදටත් විභාග දෙපාර්තමේන්තුව පැත්තෙන් කිසිදු ආකාරයේ ප්‍රතිචාරයක් ලැබෙන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. විදුහල්පතිවරු දහතුන්දෙනෙක් ඉන්නවා, exam එක ලියලා ප්‍රතිඵල බලාගෙන. විදුහල්පතිවරුන්ගේ විශාල හිඟයක් තිබෙනවා, බස්නාහිර පළාත තුළම. ඇත්තටම ඒ දහතුන්දෙනාම බස්නාහිර පළාතේ ඉන්න උදවිය. කොළඹ නගරයේ සමහර පාසල් තිබෙනවා, වැඩ බලන විදුහල්පතිවරු සිටින. ඉතින් මම නැවත වතාවක් මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවමින්, කොහොම හරි මේ සම්බන්ධව මැදිහත් වෙලා ඉතා ඉක්මනින් මේ ප්‍රශ්නය විසඳා දෙන්න කියලා ඉල්ලා සිටිනවා, ගරු ඇමතිතුමනි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්න දෙකක් මතු වුණා. ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පාසලක උසස් පෙළ විභාගයට පෙනී සිටීමේදී ඔය හා සමාන ප්‍රශ්නයක් මතු වුණා. ඒ ප්‍රතිඵල ගිය සතියේ නිකුත් කළා. ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයත් තිබෙනවා. එම ප්‍රතිඵලත් ලබන සතියේදී නිකුත් කරලා අවසන් කරාවි. ඒක අර ගුරු විදුහල්පති විභාගය නොවෙයි, EB - Efficiency Bar - විභාගය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න, මේ කාරණය කියන්න.

මම පුන පුනා මේ කාරණාව ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට ප්‍රකාශ කර තිබෙනවා. පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය අපේක්ෂිත දූ දරුවන්ට තවමත් ඒ අවසරය ලබා දීලා නැහැ, Bank

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

of Ceylon එකෙන්. ඒ ණය යෝජනා ක්‍රමයෙන් මීට පෙර ණය ගත් ශිෂ්‍යයන් 200කගෙන් ණය ආපසු ගෙවීම පැහැර හැරීමක් සිදු වෙනවාය කියලා 8වැනි කණ්ඩායමට පොලී රහිත ණය ලබා දීම නතර කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සඳහා විශේෂයෙන් මැදිහත් වෙන්න කියන ඉල්ලීම මම කරනවා. උපාධියක් ලබාගෙන, තමන්ගේම ශක්තිය තුළින් -ස්වශක්තියෙන්, ස්වෝත්සාහයෙන්- සමාජයේ හොඳ ආදායම් මාර්ගයක් නිර්මාණය කර ගන්නට කටයුතු කරන අපේ තරුණ තරුණියන්ට, උසස් අධ්‍යාපනයට උනන්දුවක් දක්වන තරුණ තරුණියන්ට ලබා දෙන මේ පොලී රහිත ණය වැඩසටහන මේ ආකාරයෙන් අත්තනෝමතිකව අත්හිටුවීම ඇත්ත වශයෙන්ම අපේ රටේ තරුණ පරම්පරාවට කරන බරපතළ අසාධාරණයක්. මම පිළිගන්නවා, ඔබතුමා හැම වෙලාවකදීම මේ පිළිබඳව බොහොම ප්‍රගතිශීලීව කටයුතු කර තිබෙන බව. ඇත්ත වශයෙන්ම කනගාටුයි කියන්න, ඔබතුමාටත් ඉහළින් ගිහිල්ලා බලවත් නිලධාරීන් තම තමන්ට ඕනෑ ඕනෑ විධියට සමහර අවස්ථාවලදී කටයුතු කරනවා. ඒක ඉතා කනගාටුදායකයි.

විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලුදෙනාගේම යෝජනාවක් හැටියට ලංකා බැංකුවේ සභාපතිට කියන්න, පැරණි සිසුන් කරපු වරදකට අලුතෙන් පොලී රහිත ණය ලබා ගන්නා සිසුන්ව මේ විධියට victimize කරන්න එපා කියලා; ඒ අයව ගොදුරක් බවට පත් කර ගන්න එපා කියලා. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ පිළිබඳව පියවරක් ගන්න කියලා. මොකද, මේක ඒ ශිෂ්‍යයන්ට කරන බලවත් අසාධාරණයක්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හත්වෙනි කණ්ඩායමේ ප්‍රශ්නය පසුගිය සතියේ දී සම්පූර්ණයෙන්ම විසඳලා අවසන් කළා. අටවෙනි කණ්ඩායමේ ප්‍රශ්නය සාකච්ඡා වෙමින් පවතිනවා. මොකද, වැඩි පිරිසකට ණය දෙන්න අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ සඳහා එක් බැංකුවක් නොවෙයි, බැංකු කිහිපයක් සම්බන්ධ වෙනවා. ඒ සම්බන්ධයෙන් වූ සාකච්ඡාව හෙට දිනයේ දී භාණ්ඩාගාරයේ දී පවත්වා අවසන් කරනවා. එතකොට අටවෙනි කණ්ඩායමටත් ඒ සහනය ඊට වඩා ලැබෙනවා. එහිදි ණය දෙන සංඛ්‍යාව වැඩි කරන්නත් කටයුතු කරලා තිබෙනවා.

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉතා කෙටියෙන් අතුරු ප්‍රශ්නයක් අහන්න මට අවසර දෙන්න. ගරු ඇමතිතුමනි, අධ්‍යාපන විද්‍යාපීඨ 19ම ඒකාබද්ධ කරලා ශ්‍රී ලංකා අධ්‍යාපන විශ්වවිද්‍යාලයක් පිහිටුවීමේ කටයුත්ත සඳහා ඔබතුමා සුවිශේෂී කාර්යභාරයක් කළා. ඒකට අපේ ප්‍රණාමය හා ස්තුතිය ඔබතුමාට පිරිනමනවා. මගේ ප්‍රශ්නය තමයි, ඒ විශ්වවිද්‍යාලය ආරම්භ කරන දිනය කවදාද කියන එක.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන ජනාධිපතිතුමා 1986දී අධ්‍යාපන ඇමතිවරයා හැටියට සිටිය දී තමයි අධ්‍යාපන විද්‍යාපීඨ ආරම්භ කළේ. නමුත්, මේ වන විට ඩිප්ලෝමාව ප්‍රමාණවත් වෙන්නේ නැහැ, මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය ඉදිරියට ගෙන යෑම සඳහා. ඒ නිසා පසුගිය අවුරුදු දෙකක කාලය තුළ මෙම අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ විවිධ අභියෝග මැද්දේ මේ විද්‍යාපීඨ 19 ඒකාබද්ධ කරලා ශ්‍රී ලංකා අධ්‍යාපන විශ්වවිද්‍යාලය පිහිටුවීමේ කටයුතුවලට අපි අත ගැහුවා. මේ වන විට ඒ සම්බන්ධයෙන් වූ අවසාන නීති කෙටුම්පත අමාත්‍යාංශයෙන් නීති කෙටුම්පත් සම්පාදකට යවලා, නීති කෙටුම්පත් සම්පාදක විසින් එය නීතිපතිට යැව්වාට පස්සේ ඊළඟ දින කිහිපය තුළදී නීතිපතිගේ නිෂ්කාසන ලැබුණු වහාම නැවත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා ගැසට් කරනවා. එතකොට මේ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට එය ඇතුළත් වෙනවා. ඉන් පසු අපට ඉතා ඉක්මනින් මේ පනත් කෙටුම්පත සම්මත කරන්න පුළුවන්. මේ පනත් කෙටුම්පත පිළිබඳව දැන් සමහර කණ්ඩායම් උප්පැන්න ලියාගන්න හදනවා. අධ්‍යාපනයට සම්බන්ධ එක්තරා වෘත්තීය සමිතියක් අනාගතයේ ඔවුන්ගේ ආණ්ඩුවක් යටතේ මේක කරනවා කියලා අද ෆේස්බුක් එකේ විවිධ මත පළ කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඉතින් මම එතුමාට කියන්න ඕනෑ, අනුන්ගේ දරුවන්ට උප්පැන්න හදන්න යන්න එපා කියලා. අවුරුදු 30කදී කරන්න බැරි වූ දේ අවුරුදු 2ක් තුළදී අපි අවසන් කරලා තිබෙනවා. ඒ කියන්නේ අපට දුන් වගකීම අපි ඉටු කර තිබෙනවා.

ඒ වාගේම මම කියන්න ඕනෑ, මේ කාරණයත්. ලංකාව UNESCO එකේ සාමාජිකත්වය අරගෙන අවුරුදු 75ක් වුණත්, ඒ සම්බන්ධව පනතක් තිබුණේ නැහැ. අපි ඒ පනත් කෙටුම්පත හදලා සම්මත කළා. ගරු කථානායකතුමා පසුගිය සතියේ ඒක සහතික කළා. අපේ රාධාකෘෂ්ණන් මැතිතුමාත් ඒ ගැන දන්නවා. මැතිවරණයක් ළඟ එන නිසා සමහරු මේකේ උප්පැන්නය ලියාගන්න හදනවා. එහෙම කරන්නේ මෙතැන ඉන්න කවුරුවත් නොවෙයි, එක්තරා වෘත්තීය සමිතියක කණ්ඩායමක්. ඒ අයට දැනගන්නයි මම මේ කරුණු කියන්නේ. අභියෝග රාශියක් මැද්දේ අපේ යුතුකම් කොටස අපි ඉටු කරලායි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 8 -543/2024- (1), ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 -566/2024- (1), ගරු සංජීව එදිරිමාන්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 -1242/2024- (2), ගරු කුමාරසිරි රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 1 -309/2024- (3), ගරු හේෂා විතානගේ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නය සඳහා පිළිතුර ලබා දීමට ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කල් ඉල්ලා සිටිනවා, ප්‍රශ්නය ඉදිරිපත් කළ යුතු ගරු මන්ත්‍රීතුමා සහ ගර්භයට පැමිණ නැති නිසා. නමුත්, එහි යම් නිවැරැදි කිරීමක් වෙන්න ඕනෑ. මේ ප්‍රශ්නය අද දින තුන්වැනි වතාවට අහන නිසා, එම ප්‍රශ්නයට අදාළ පිළිතුර සභාගත කිරීමට මම කැමැතියි.

2020.08.20 දින සිට ගරු කථානායකවරයා සහභාගි වූ නිල විදේශ සංචාර: විස්තර

2020.08.20 முதல் மாண்புமிகு சபாநாயகர் அவர்களால் மேற்கொள்ளப்பட்ட உத்தியோகபூர்வ வெளிநாட்டு விஜயங்கள்: விபரம்

OFFICIAL FOREIGN TRIPS UNDERTAKEN BY HON. SPEAKER FROM 20.08.2020: DETAILS

309/2024

1. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු හේෂා විතානගේ මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு ஹேசா விதானகே சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of of the Hon. Hesha Withanage)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) රටේ ශුභසිද්ධිය වෙනුවෙන් ජාත්‍යන්තර සම්බන්ධතා සහ අධ්‍යාපන වැඩසටහන් සඳහා 2020.08.20 සිට අද දක්වා නවවැනි පාර්ලිමේන්තුවේ කථානායකවරයා සහභාගි වූ නිල විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් විදේශ සංචාරය සඳහා සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් හා නිලධාරීන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත විදේශ සංචාරවලින් අත්පත් කර ගනු ලැබූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருமான வரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டின் நலன்கருதி சர்வதேச உறவுகள் மற்றும் கல்வி நிகழ்ச்சித்திட்டங்களுக்காக 2020.08.20 தொடக்கம் இன்று வரை ஒன்பதாவது பாராளு மன்றத்தின் சபாநாயகர் கலந்து கொண்ட உத்தியோகபூர்வ வெளிநாட்டு விஜயங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு வெளிநாட்டு விஜயங்களி லும் கலந்துகொண்ட பாராளுமன்ற உறுப்பினர் களினதும் அலுவலர்களினதும் பெயர்கள் வெவ் வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி வெளிநாட்டு விஜயங்களின்மூலம் அடையப்பெற்ற நன்மைகள் யாவை என்பதை யும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and the Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of official foreign trips undertaken by the Speaker of the Ninth Parliament on international relations and educational programmes for the well-being of the country from 20.08.2020 to date;

(ii) the names of the Members of Parliament and the officials who attended each such foreign tour, separately; and

(iii) the benefits accrued to the country from the above foreign tours?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
**Answer tabled:*

(අ) (i) නිල විදේශ සංචාර සංඛ්‍යාව 14යි.

(ii) එම එක් එක් විදේශ සංචාරය සඳහා සහභාගි වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් සහ නිලධාරීන්ගේ නම් වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01හි** දක්වා ඇත.

(iii) එම විදේශ සංචාරවලින් අත්පත් කරගනු ලැබූ ප්‍රතිලාභ පිළිබඳ විස්තර ඇමුණුම 02හි** දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 6 -467/2024- (1), ගරු අජිත් මාන්නප්පෙරුම මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

ලියාපදිංචි ජාත්‍යන්තර පාසල්: නියාමනය
பதிவு செய்யப்பட்டுள்ள சர்வதேச பாடசாலைகள்: ஒழுங்குபடுத்தல்
REGISTERED INTERNATIONAL SCHOOLS: REGULATION

543/2024

8. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය වෙනුවට)
(මාණ්පුමිකු පුත්තික පත්තිරණ - மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of of the Hon. (Mrs.) Kokila Gunawardene)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව, සේවය කරනු ලබන අධ්‍යයන සහ අනධ්‍යන සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එම පාසල්වල විෂය නිර්දේශ සහ විෂය බාහිර ක්‍රියාකාරකම් නියාමනය කරන්නේද;

(iv) එම පාසල්වල ශිෂ්‍ය ක්‍රියාකාරකම් හා සුවතාවන් සම්බන්ධයෙන් මාර්ගෝපදේශ ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் பதிவு செய்யப்பட்ட சர்வதேச பாடசாலைகளின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(ii) மேற்படி பாடசாலைகளில் கல்வி பயிலும் மாணவர்களின் எண்ணிக்கை, சேவையாற்று கின்ற கல்வி மற்றும் கல்விசாரா ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனையென்பதை யும்;

(iii) கல்வி அமைச்சு மேற்படி பாடசாலைகளின் பாடவிதானங்கள் மற்றும் இணைப் பாடவிதான செயற்பாடுகளை ஒழுங்குபடுத்துகின்றதா என்ப தையும்;

(iv) மேற்படி பாடசாலைகளின் மாணவர் செயற்பாடு கள் மற்றும் ஆரோக்கியம் தொடர்பாக வழிகாட்டுதல்கள் வழங்கப்பட்டுள்ளனவா என்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of international schools registered in Sri Lanka;

(ii) the number of students studying at such schools and academic and non-academic employees serving in them, separately;

(iii) whether the Ministry of Education regulates the syllabuses and extracurricular activities of such schools; and

(iv) whether the Ministry has issued guidelines pertaining to student activities and fitness activities at such schools?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
**Answer tabled:*

(අ) (i) ජාත්‍යන්තර පාසල් ලියාපදිංචිය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා යටතේ සිදුවන අතර එයද ව්‍යාපාර ලෙස පොදුවේ ලියාපදිංචි කරන බැවින් නිශ්චිතව අධ්‍යාපන ආයතන ලෙස හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය වේ.

(ii)

වර්ෂය	ශිෂ්‍ය සංඛ්‍යාව	අධ්‍යයන කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය
2017	81,103	9,374	නොදනී
2018	120,469	11,513	නොදනී
2019	140,223	13,568	නොදනී

(iii) නැත. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් රජයේ, රජයේ අනුමත පාසල් හා පිරිවෙන්වලට අදාළ කාර්යයන් සිදු කරනු ලැබේ.

(iv) එම පාසල්වල ශිෂ්‍ය ක්‍රියාකාරකම් හා සුවතාවන් සම්බන්ධයෙන් මාර්ගෝපදේශ ලබා දී නැත.

(ආ) අදාළ නොවේ.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ඉඩම්: වැවිලි භෝග සහ දැව ලබා ගත හැකි ශාක
மக்கள் தோட்ட அபிவிருத்திச் சபைக்குச் சொந்தமான காணிகள்: பயிர் வகைகளைப் பயிரிடல் மற்றும் மரங்களைப் பெற்றுக்கொள்ளல்
LANDS OWNED BY JANATHA ESTATES DEVELOPMENT BOARD: PLANTATION CROPS AND TIMBER-YIELDING TREES

566/2024

9. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු සංජීව එදිරිමාන්න මහතා වෙනුවට)
(මාණ්පුමිකු පුත්තික පත්තිරණ - மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Sanjeeva Edirimanna)

අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ඉඩම්වල මේ වන විට වගා කර ඇති වැවිලි භෝග වර්ග කවරේද;

(ii) එම භෝග ඇසුරෙන් කරනු ලබන නිෂ්පාදන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මණ්ඩලය සතු ඉඩම්වල ඇති, වාණිජ වටිනාකමක් සහිත දැව ලබා ගත හැකි ශාක සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එම ශාක වර්ග කවරේද;

(iii) එම ශාක පෞද්ගලික අංශයට අළෙවි කරන්නේද;

(iv) එසේ නම්, අළෙවි කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

අමෙච්චරවෙ අන්තස්තුට්ට අරස පෙරුන්තෝට්ට තොළිල් මුයට්චිකළ් මරුසීරමෙප්පු අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) மக்கள் தோட்ட அபிவிருத்திச் சபைக்குச் சொந்தமான காணிகளில் தற்போது பயிரிடப்பட்டுள்ள பயிர் வகைகள் யாவையென்பதையும்;

(ii) அப்பயிர்கள்மூலம் மேற்கொள்ளப்படும் உற்பத்திகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சபைக்குச் சொந்தமான காணிகளிலுள்ள, வணிக ரீதியில் பெறுமதியான மரங்களைப் பெற்றுக் கொள்ளக்கூடிய தாவரங்களின் பதிவேடொன்று பேணப்படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், அம்மர வகைகள் யாவையென்பதையும்;

(iii) மேற்படி மரங்கள் தனியார் துறைக்கு விற்பனை செய்யப்படுகின்றனவா என்பதையும்;

(iv) ஆமெனில், விற்பனையின்போது பின்பற்றப்படும் முறையியல் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Non-Cabinet Minister of State Plantation Enterprises Reforms:

(a) Will he inform this House -

(i) the plantation crops that have been cultivated by now on the lands owned by Janatha Estates Development Board; and

(ii) the products made out of those crops?

(b) Will he also inform this House -

(i) whether a register is maintained about trees yielding timber with commercial value found on the lands owned by the Board;

(ii) if so, what those tree species are;

(iii) whether those trees are sold to the private sector; and

(iv) if so, the procedure followed in such selling?

(c) If not, why?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
**Answer tabled:*

(අ) (i) ප්‍රධාන වශයෙන් තේ සහ රබර්

(ii) 1. තේ : නිමි තේ

2. රබර් : රබර් කිරි සහ ශාකය ආශ්‍රිතව කරනු ලබන නිෂ්පාදන රාශියක් පවතී.

(ආ) (i) ඔව්

(ii) ඉයුකැලිප්ටස්, ඇල්බීසියා, සබුක්කු, පයිනස්, මැහෝගනී, තේක්ක, ලුණුමිදැල්ල, සපු, කොස්, ටුනා, අඹ

(iii) ඔව්

(iv) ජාතික මට්ටමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව පුවත් පත් දැන්වීම් පළ කර ඉදිරිපත් කරනු ලබන වලංගු මිල ගණන් අතරින් වැඩිම මිල මත මෙම දැව ගස් විකිණීම සිදු කරනු ලබයි. මෙම දැව ගස්හි වටිනාකම සම්බන්ධයෙන් ජාතික වැවිලි කළමනාකරණ ආයතනයෙන් තක්සේරු වාර්තාවක් ලබා ගන්නා අතර එම තක්සේරු වාර්තාවේ සඳහන් මිලට වඩා වැඩි මිලක් ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇත්නම් වැඩිම මිල ඉදිරිපත් කළ ඉල්ලුම්කරුට ශාකය දෙනු ලබයි. තක්සේරුවට වඩා අඩු මිලක් ඉදිරිපත් කර ඇත්තේ නම් නැවතත් මිල ගණන් කැඳවීමට කටයුතු කරනු ලබයි.

(ඇ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 10 -1242/2024- (2), ගරු කුමාරසිරි රත්නායක මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කුමාරසිරි රත්නායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, ඔබතුමා කලින් අවස්ථාවක් ඉල්ලා සිටියා. දැන් ඔබතුමාගේ කාරණය කියන්න.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

මම එතුමාටයි මේ ප්‍රශ්නය යොමු කරන්නේ. ඊයේත් මේ ප්‍රශ්නය යොමු කළා. නමුත්, පිළිතුරක් ලැබුණේ නැහැ. අද මේ රටට, අපට විදේශ විනිමය අවශ්‍ය වෙලා තිබෙන මොහොතක අපේ රටට අයිති විදේශ විනිමය තව රටක තිබෙනවා නම් ඒක විශාල ගැටලුවක්. ඒ නිසා රටේ තේ අපනයනකරුවන්ට අද විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. අපේ රට තේ අපනයනය කරන රටවල් අතරින් වටිනාකමින් දෙවැනි ස්ථානයත්, ප්‍රමාණයෙන් තුන්වැනි ස්ථානයත් ගන්නේ රුසියාවයි. මේ වෙනකොට රුසියාවට සම්බාධක පනවා තිබෙන නිසා රුසියාවේ මුදල් අපට ලබා ගන්න බැරි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මොකද, ඒ සඳහා අවශ්‍ය බැංකු ක්‍රමවේදය සකස් වෙලා නැහැ. එහෙම නැත්නම් එය වැඩ කරන්නේ නැහැ. ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවට මුදල් ගෙන එන්න බැහැ. ඒ නිසා අපි තේ අපනයනය කිරීම වෙනුවෙන් ලැබුණු ඩොලර් විශාල ප්‍රමාණයක් මේ වෙනකොට රුසියාවේ රැඳිලා තිබෙනවා. අපට ඩොලර් ඕනෑ කරන වෙලාවක ඒ සම්බන්ධව යම් පියවරක්; ඒ මුදල් ටික තේ අපනයනකරුවන්ට ලබා දීමට වැඩසටහනක් රජයෙන් පටන් අරගෙන නැහැ. මේ වෙනකොට ඉන්දියාවයි, චීනයයි මේ ක්‍රමය සකස් කරගෙන ඔවුන්ගේ මුදල් ලබා ගන්නවා.

එක්කෝ, අපි ඒ රටවල් දෙක සම්බන්ධීකරණය කරගෙන, ඒ රටවල් දෙක හරහා අපටත් මුදල් ලබා ගන්න වැඩසටහන ක්‍රියාත්මක කරන්න ඕනෑ. එහෙම නැත්නම් රුසියානු රජයත් එක්ක කථා කරලා මේ කටයුත්ත අවසාන කරන්න ඕනෑ, කොහොමද ඒ මුදල් ලබා දෙන්නේ කියන එක සම්බන්ධයෙන්. ඒ සඳහා ගන්නා පියවර මොකක්ද කියන එක ගැන විශේෂයෙන්ම මම රාජ්‍ය අමාත්‍යතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමාට ඊට පිළිතුරක් ලබා දීමට හැකියාවක් තිබෙනවාද?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක එතුමා එක්වරම අහපු ප්‍රශ්නයක්. ඒ නිසා මම ඒ කාරණය ගැන අවධානය යොමු කරලා, අවශ්‍ය පියවර අරගෙන ඉදිරියේදී ඒ සඳහා පිළිතුරු ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මොකක්ද point of Order එක, ගරු මන්ත්‍රීතුමා?

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මම මේ කියන්න යන කාරණය ගැන අපි ඊයේ දිනයේදීත් සඳහන් කළා. මේ වනකොට ආණ්ඩුකාරතුමන්ලා පළාත් පාලන ආයතනවලට තමන්ගේ නියෝජිතයන් හැටියට විශේෂයෙන්ම පළාත් පාලන මැතිවරණයේ අපේක්ෂකත්වය දරන පිරිස - හිටපු සභාපතිවරු වෙන්න පුළුවන්, හිටපු නගරාධිපතිවරුන් වෙන්න පුළුවන් - පත් කරලා තිබෙනවා. මේ වනකොට ඒ අය පළාත් පාලන ආයතනවල සභාපති කාමරයේ, නගරාධිපති කාමරයේ සිටිමින් ඒ වාහන ආදී සියලු දේ පාවිච්චි කරමින් ඒ ලේකම්වරුන් එක්ක එම වැඩ කටයුතු කරනවා. මේ නිසා විශේෂයෙන්ම රජයේ මුදල් අවභාවිත වෙමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය ප්‍රශ්නය කීප වතාවක් ඇහුවා. ඒ නිසා කෙටියෙන් අහලා අවසන් කරන්න.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ වෙන කොට අපි ඒ පිළිබඳව මැතිවරණ කොමිසමට පැමිණිල්ලක් යොමු කරලා තිබෙනවා. ඒ වාගේම අපි ඒ සම්බන්ධයෙන් අධිකරණයට යන්නත් බලාපොරොත්තුවෙන් ඉන්නවා. අපි ඉතා පැහැදිලිවම ආණ්ඩු පක්ෂයට මේ කාරණය කියන්න ඕනෑ. ඒ වාගේම ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් ද කරනවා. විශේෂයෙන්ම ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි තමයි ඒ දේවල් සිදු වන්නේ. මොකද, ජනාධිපතිවරයාගේ නියෝජිතයා තමයි ආණ්ඩුකාරවරයා. එම නිසා අපි මේ වෙලාවේදී ලේකම්වරුන්ටත්, කොමසාරිස්වරුන්ටත් ඉතා පැහැදිලිව කියනවා, අප අනිවාර්යයෙන්ම ඒ ඒ පුද්ගලයන්ට විරුද්ධවත් නඩු දාන්න කටයුතු කරනවා, ඒක නිසා කරුණාකරලා රාජ්‍ය දේපළ අවභාවිත කිරීම සම්පූර්ණයෙන් නතර කරන්න කියලා. මේ වනවිට ඒ දෙයම බස්නාහිර පළාතේත් සිදු වෙලා තිබෙනවා; දකුණු පළාතේත් සිදු වෙලා තිබෙනවා; මධ්‍යම පළාතේත් සිදු වෙලා තිබෙනවා. කරුණාකරලා ඒ කටයුත්ත නතර කරන්න කටයුතු කරන්න. මැතිවරණයක් පැවැත්වීමට නියමිතව තිබෙන මේ මොහොතේ මෙවැනි දේවල් කරන එක ඉතා නින්දිත ක්‍රියාවක් හැටියටයි අපි දකින්නේ. ඉතා පැහැදිලිව, ජනාධිපතිවරයාට මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න සම්පූර්ණ වගකීමක් තිබෙනවා. තමන්ගේ නියෝජිතයා වන ආණ්ඩුකාරවරයා වෙතින් තමයි ඒ කටයුත්ත කෙරෙන්නේ. ඒක නිසා කරුණාකරලා ඒ කටයුත්ත නතර කරන්න අවශ්‍ය පියවර ගන්න කියලා අපි ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඇසීමට පෙර මම මේ කාරණය කෙරෙහි ගරු සභානායකතුමාගේත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේත් අවධානය යොමු කරවනවා. ඇත්ත වශයෙන්ම අපේ රටේ නීතිය හා සාමය පිළිබඳව අද බරපතළ ප්‍රශ්නයක් උද්ගත වෙලා තිබෙනවා. එනවා; ගහනවා; යනවා. ජන සමාජයේ හැම තැනකම ප්‍රචණ්ඩත්වය රජ වෙලා. මේ පිළිබඳව අපේ රටේ පොදු ජනතාව තුළ ලොකු භීතියක් තිබෙනවා; ලොකු සැකසංකාවක් තිබෙනවා. මම මේ කාරණාව දේශපාලනීකරණය කරන්නට කිසිසේත්ම උත්සාහ කරන්නේ නැහැ. ජන සමාජයේ සුරක්ෂිතභාවය,

පුරවැසියන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම පවතින රජයේ වගකීමක්. මේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය අපේ රටේ බරපතළ ප්‍රශ්නයක්. ඔබතුමන්ලා මේ වෙනුවෙන් ලබා දෙන විසඳුම මොකක්ද? මේ ප්‍රශ්නය දේශපාලනීකරණය කරන්න නොවෙයි මම මේක අහන්නේ. සමාජය තුළ නීතිය, සාමය සුරක්ෂා කරමින් අපිත්, අපේ වැඩ කොටස ඉෂ්ට කරනවා. ප්‍රචණ්ඩත්වය තුරන් කරන්නට අපිත්, අපේ සහයෝගය ලබා දෙනවා. නමුත්, අද ජන සමාජයේ මොකක්ද මේ වෙන්නේ? එනවා; ගහනවා; යනවා. පුදුම විධියේ මිනී මැරුම් මේ සිද්ධ වෙන්නේ. මේ ප්‍රචණ්ඩත්වයට එරෙහිව තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? මේක බරපතළ ප්‍රශ්නයක්. මම නම් භය වෙන්නේ නැහැ, මේ කාරණාව ගැන කථා කරන්න. මේ ගැන අපි කථා කරන්නට ඕනෑ. මේක මේ රටේ පොදු ජනතාව මුහුණ දෙන ප්‍රශ්නයක්. රටේ මහ ජනතාවගේ ආරක්ෂාව තහවුරු වෙන්නට ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම රජයෙන් මම ඉල්ලීමක් කරනවා, මහජනයාගේ ආරක්ෂාව පිළිබඳව දැවැන්ත වැඩසටහනක් ක්‍රියාත්මක වෙන්නට ඕනෑ කියලා. මෙවැනි දේවල් මේ රටේ වෙන්න බැහැ. එනවා; ගහනවා; යනවා. කොහොමද මෙහෙම වෙන්නේ? ආණ්ඩුව පැත්තෙන් ඔබතුමන්ලා මේ සඳහා දෙන උත්තරය මොකක්ද? මෙහෙම පුළුවන්ද, රටකට ඉදිරියට යන්න?

මට ඔබතුමා මේ කාරණය කියන්න, ගරු ඇමතිතුමනි. සමහර ක්ෂේත්‍රවලට මෙවා ඍජුවම බලපානවා නේ. සංචාරක ක්ෂේත්‍රයට බලපානවා; ආයෝජන ක්ෂේත්‍රයට බලපානවා. ඇත්ත වශයෙන්ම සමාජයේ නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මකවීම ශක්තිමත්ව වෙන්න ඕනෑ. මේ ප්‍රචණ්ඩත්වය කියන්නේ බොහොම භයංකර දෙයක්. මම විශ්වාස කරනවා, මේ ප්‍රචණ්ඩත්වයට එරෙහිව මේ දෙසිය විසිපස්දෙනාම එක තැනක ඉන්නවා කියලා. හැබැයි, මේ දෙසිය විසිපස්දෙනා විතරක් එහෙම ඉඳලා වැඩක් නැහැ. රජයත් තමන්ගේ රාජකාරිය ඉෂ්ට කරන්නට ඕනෑ. ඒ පිළිබඳව ප්‍රබල, විශේෂිත වූ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ නිසා මම මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා. රටකට මෙහෙම ඉදිරියට යන්න බැහැ. මේක බොහොම භයංකර තත්ත්වයක්. කරුණාකරලා ඒ වෙනුවෙන් පැහැදිලි, තිරසර විසඳුමක් ලබා දෙන්න ඕනෑ. අපේ පැත්තෙන් දෙන්න පුළුවන් උපරිම සහයෝගය අපි ලබා දෙනවා, නීතියත්, සාමයත්, මහජන ආරක්ෂාවත් තහවුරු කරන්න. මම මේ ප්‍රශ්නය ඇහුවේ, මේක දේශපාලනීකරණය කරන්න නොවෙයි. මේක දේශපාලන භේදයකින් තොරව සියලු ජනතාව මුහුණ දෙන ප්‍රශ්නයක්. ඒ නිසා කරුණාකරලා මේ සඳහා පියවර ගන්න. මේවා තමයි වහාම කරන්න ඕනෑ. එහෙම නැතිව, අනවශ්‍ය එක එක සංශෝධන ගෙනෙන එක නොවෙයි කරන්න ඕනෑ. ඔබතුමන්ලාට ප්‍රමුඛතාව තේරිලා නැහැ. මහජන ආරක්ෂාව පිළිබඳව දැඩි අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා කියපු කාරණාවට අපි සියයට සියයක් එකඟයි. මේ රටේ සාමකාමීව ජීවත් වන ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් අපි පෙනී සිටින්න ඕනෑ. හැබැයි, තිබුණු වැරැද්ද මේකයි. අපි දන්නවා, පසුගිය කාල සීමාවේදී - ඒ කියන්නේ 2015දී - හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයා පරදිනකොට, විදේශ රටවලට වෙලා හැංගිලා හිටපු කුඩුකාරයෝ, පාතාලයේ මිනිස්සු තමයි එදා තිබුණු ආණ්ඩුවට විරුද්ධව සල්ලි වියදම් කළේ කියන එක. ඒ වාගේම 2019දී හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්මයා පාතාලය පාලනය කරන්න හදනකොට, මේ විපක්ෂයේ ඉඳගෙන කථා කරපු අය රටේ සාමය නැහැ, වෙඩි තියලා මරනවා, පාතාලයේ අය ආයුධ හොයන්න එක්කගෙන ගිහිල්ලා මරනවා කියලා ලොකු විරෝධයක් ගෙන ගියා.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා කියන කාරණයට අපි සියයට සියයක් එකඟයි. ඒ වාගේම මතක තියා ගන්න, අරගළය පැවති වෙලාවේදී සාමකාමී අරගළකාරයෝ පාරට බැස්සේ ඔවුන්ගේ පීඩනයට බව. හැබැයි, එතැනින් පස්සේ අරගළයට සහභාගි වූ අයට මාස තුනක් එක දිගටම බිරියානි කන්න දෙන්න වියදම් කළේ කවුද? මේවා ගැන ආණ්ඩු හොයන්න ඕනෑ. නිකම් මිනිහෙකුට එහෙම උයන්න, කන්න දෙන්න බැහැ. ඒවාට වියදම් කළේ පාතාලය, කුඩුකාරයෝ. ඒ අය තමයි අද මේ රට පාලනය කරන්න හදන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වර්තමානයේදී අපේ ගරු ටිරාන් අලස් ඇමතිතුමා "යුක්තිය" මෙහෙයුම ක්‍රියාත්මක කරනවා. අපි දන්නවා, අද ගම් මට්ටමින් කුඩු විශාල ප්‍රමාණයක් හසු වන බව.

අද කුඩු පොඩි ප්‍රමාණයක මිල ඉස්සර තිබුණාට වඩා සිය ගුණයකින් වැඩි වෙලා තිබෙන්නේ කුඩු නැති වෙන හින්දා. හැබැයි එහෙම කරනකොට මානව හිමිකම් කියලා පාතාලයේ එකා වෙනුවෙන්, කුඩුකාරයා වෙනුවෙන් පෙනී සිටින්නේ නැතිව අපි කණ්ඩායමක් හැටියට මේ රටේ සමස්ත ජනතාව වෙනුවෙන්, සාමාන්‍ය ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙනුයි පෙනී සිටින්න ඕනෑ. ඒ නිසා අපි මීට වඩා තද තීන්දු ගන්න ඕනෑ. දැන් "ක්ලබ් වසන්ත" මැරුණාම අපි මේ සභාවේ ඒ ගැන කථා කරනවා. පසුගිය කාලයේ වැඩියෙන්ම පාතාලය ක්‍රියාත්මක වුණේ මිනුවන්ගොඩ; වෙඩි තියාගෙන හයදෙනෙක් මැරුණා. අපේ ගෙවල්වලට ගිනි තියන්න ආවේ පාතාලයෙන්. මම තමයි මිනුවන්ගොඩ කුඩු අල්ලන්න වැඩි වශයෙන්ම මැදිහත් වුණේ. ඒ තරහා තමයි මගෙන් පිරිමැහුවේ. ඒකට පොලීසියේ නිලධාරිනුත් අහු වුණා. නමුත්, ඒ කාලයේ ඒවා ගැන කථා කළේ නැහැ. දැන් මේ එක්කෙනකුගේ සිද්ධියක් වුණාම ඒ ගැන කථා කරන එක නොවෙයි කළ යුත්තේ. අපි අදාළ ආරක්ෂක අංශවලට උදව් කරන්න ඕනෑ. ඔබතුමන්ලා ආරක්ෂක අංශවලට උදව් කරන්න, කුඩුකාරයෝ වෙනුවෙන් පෙනී ඉන්න එපා. මම නම් කියන්නේ ගහලා හරි පාතාලය ඉවර කරන්න ඕනෑ. එතකොට කියන්න එපා, "ඒ මිනිස්සුන්ගේ මානව හිමිකම්.." කියලා. මේ රටේ හැමෝටම භය නැතිව මහ පාරට බැහැලා ඇවිදින්න පුළුවන් වාතාවරණයක් ඇති කරන්න නම් තදින් නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මේකට වැරදි අර්ථකථනයක් දෙන්න එපා. අපි කිසිවෙක් කවදාවත් පාතාලය, කුඩුකාරයෝ වෙනුවෙන් පෙනී ඉඳලා නැහැ. ඔබතුමා දන්නේ නැතිව ඇති- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් අහ ගන්න. ඇත්තටම මිනුවන්ගොඩ ප්‍රදේශයේ ව්‍යාපාරිකයෝ ලොකු භීතියකින් හිටියේ, කප්පම් ව්‍යාපාරය නිසා. ඒ ව්‍යාපාරිකයෝ වෙනුවෙන් මම මේ සභාවේදී කථා කළා, ඒ ප්‍රශ්නය මේ සභාවේදී මතු කළා. පාතාලය වෙනුවෙන්, කුඩුකාරයෝ වෙනුවෙන් අපි කිසිවෙක් පෙනී ඉඳලත් නැහැ, පෙනී ඉන්න යන්නෙත් නැහැ. ඒ නිසා ඒක නිවැරදි කරන්න ඕනෑ. ඔබතුමා ඔය කථා කරන භීෂණය අදටත් මිනුවන්ගොඩ ක්‍රියාත්මක වෙනවා. අදටත් තර්ජනය කර කර කප්පම් ඉල්ලනවා. හැබැයි, අපි මේ පාර්ලිමේන්තුවේ ඒ කාරණය මතු කළාට පසු ආරක්ෂක අංශවලින් විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම නිසා, ඒ පීඩනයට පත් වුණු ප්‍රමාණයේ පොඩි අඩුවීමක් තිබෙනවා. නමුත්, අදටත් ඒ කප්පම් ව්‍යාපාරය ක්‍රියාත්මක වෙනවා.

ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමනි, එම නිසා මොනම හේතුවකටවත් අපි කවදාවත් පාතාලය වෙනුවෙන්, කුඩුකාරයෝ වෙනුවෙන් පෙනී ඉඳලාත් නැහැ, පෙනී ඉන්න යන්නෙත් නැහැ, ඒවාට භය වෙන්නෙත් නැහැ.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු විපක්ෂ නායකතුමනි, පළමුවැනි කාරණය, ඔබතුමා පෙනී සිටියා කියලා මම කිසිම අවස්ථාවක ප්‍රකාශ කළේ නැහැ.

දෙවෙනි කාරණය, ඒ කාලයේ පොලීසිය පාතාලයේ අය අරගෙන ගිහිල්ලා යම් මෙහෙයුම් කරනකොට ඇති වුණු තත්ත්වයන් ගැන පොලිස් නිලධාරීන්ට විරුද්ධව මානව හිමිකම් පරීක්ෂණ කරන්න කියලා මේ පාර්ලිමේන්තුවේ කථා කළා, ඔබතුමන්ලා කථා කළා. මම ඒ ගැනයි කිව්වේ. ඔබතුමා කළා කියන එක නොවෙයි. ඔබතුමා ඒක වරදවා තේරුම් ගන්න එපා.

ඊළඟ කාරණය මේකයි. ගම්පහ දිස්ත්‍රික්කයේ පාතාලය ක්‍රියාත්මක වෙන නරකම තැනක් තමයි මිනුවන්ගොඩ සහ අවට ප්‍රදේශ. දැන් STF එක දාලා ඒ පැත්ත පාලනය කරලා තිබෙනවා. අපි ටිරාන් අලස් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ කටයුත්ත කිරීම පිළිබඳව.

හැබැයි එහෙමයි කියලා සමහර දේවල් නතර වෙලා නැහැ. සල්ලි දුන්නේ නැත්නම් කඩවල මිනිස්සුන්ව බය කරනවා. මිනිස්සුන්ව බය කරලා මේක මහා ජරා විධියට යන දෙයක්. ඒ නිසා මම නම් එකහෙළා කියනවා -මේක මොන විධියට ප්‍රචාරය වුණත් කමක් නැහැ- පාතාලය මර්දනය කරන්න වෙනම වැඩ පිළිවෙළක් අවශ්‍ය බව. එහෙම අය අත්අඩංගුවට අරන් උසාවි දාලා භිර ගෙවල්වලට දාන එක නොවෙයි කළ යුත්තේ. ඊළඟට ඔවුන්ටත් කන්න දෙන්නේ අපිමයි, මේ රටේ අහිංසක මිනිස්සුමයි. ඒ නිසා කරන එකක් කරලා ඉවරයක් කරන්න ඕනෑ. එහෙම නැතුව මේක දිගට ගෙනියන්න පුළුවන් දෙයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, අපි නම් මේ සභාවේ කථා කරලා තිබෙන්නේ, රවිරාජ් මරපු අය අල්ලන්න ඕනෑ, ජෝසප් පරරාජසිංහම්ව මරපු අය අල්ලන්න ඕනෑ, මහේෂ්වරන් මරපු අය අල්ලන්න ඕනෑ, මාධ්‍යවේදී කීත් නොයාර්, උපාලි තෙන්නකෝන් යන අයට ප්‍රචණ්ඩත්වය දියත් කරපු අය අල්ලන්න ඕනෑ කියලා. ඒ අය විඳපු දුක වෙනුවෙන් අපි කථා කරලා තිබෙනවා. ලසන්ත වික්‍රමතුංග වෙනුවෙන් කථා කරලා තිබෙනවා. එහෙම නැතුව අපි කවදාවත් පාතාලකරුවන් වෙනුවෙන් කථා කරලා නැහැ. දැන් බලන්නකෝ, ලසන්ත වික්‍රමතුංග මැතිතුමාගේ හොඳම යාළුවා නේ දැන් රටේ ඉන්න ජනාධිපතිවරයා. කෝ, එතුමා ලසන්ත වික්‍රමතුංග වෙනුවෙන් යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කරනවාද? මම මේ කථා කරන්නේ ඒක ගැන විතරක් නොවෙයි. මේ පාතාලය, මේ මිනී මැරුම්, මේ ක්‍රියාදාමය මර්දනය කරන්නට විධිමත් වැඩසටහනක් රජය ක්‍රියාත්මක කරන්නට ඕනෑය කියන එක තමයි මගේ යෝජනාව.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

විපක්ෂ නායකතුමා කියපු කාරණයටයි මම මේක කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දේශපාලනඥයෝ විතරක් නොවෙයි, මේ රටේ සාමාන්‍ය මිනිස්සුත් ඝාතනය වුණා. අරගළය වෙලාවේ ඒක මෙහෙයවුවේ කවුද? සජබයේ අයයි, ජනතා විමුක්ති පෙරමුණේ අයයි තමයි මගේ ගෙවල් ගිනි තියන්න පවා ආවේ. ඒවා ගැනත් හොයන්න. ගරු විපක්ෂ නායකතුමනි, මම මේක වගකීමෙන් කියනවා. ඔබතුමා මට අභියෝග කළොත් මම video clips දාලා පෙන්වන්නම්. 2023 පොසොන් දවසේ දන්සැල දෙනකොට මම පෙන්නුවා, මිනිස්සුන්ගේ නම්, ගම්, address ඔක්කෝම. මොකද, ලංකාවේ ගෙවල් ගිනි තියන එකේ වීඩියෝ එකක් තිබෙන්නේ මගේ විතරයි. මේවාට බයේ නොවෙයි මම මේ කථා කරන්නේ. ඔබතුමා කියන දේට මම එකඟයි. ඔබතුමා දේශපාලනඥයෝ ගැන විතරක් කියනවා. ඇත්ත, ඒ මිනිස්සු මරපු එකත් වැරදියි. හැබැයි, මේ රටේ පාතාලේ අය මරනකොට ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුව තුළ කිව්වා, මේ රටේ පොලීසියෙන් මේ වාගේ මෙහෙයුම් කරනවා, අහිංසක මිනිස්සු මරනවා කියලා. මම නම් කියන්නේ මරන්න ඕනෑ. මම ප්‍රසිද්ධියේ මේ කියන්නේ. මම මේ හංගලා කථා කරනවා නොවෙයි. එහෙම නැත්නම් මේ රටේ සාමකාමීව ජීවත් වෙන මිනිස්සුන්ට ජීවත් වෙන්න බැහැ. ඒකට ඔබතුමන්ලා අපි ඔක්කොම එක්කහු වෙන්න ඕනෑ. එක්කහු වෙලා මේ වෙනුවෙන් පෙනී සිටිමු. මේ වෙනුවෙන් කටයුතු කරන මිනිස්සුන්ට උදව් කරමු, පොලීසියට සහයෝගය ලබා දෙමු.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතා වැදගත් කාරණයක් සම්බන්ධව තමයි මේ අවස්ථාවේ සාකච්ඡා වෙන්නේ. මේ පාර්ලිමේන්තුවේ පරණ හැන්සාඩ් වාර්තා ටික අරගෙන බැලුවා නම් මේ කාරණය හොඳින් අවබෝධ වේවි. වරින් වර පාතාල නායකයෝ; ඉතාම ප්‍රචණ්ඩ, සිය ගණන් මරපු අය පොලීසියෙන් මැරුම් කෑවොත්, - අඩු ගණනේ ඇත්ත සිද්ධියකට හෝ බොරු සිද්ධියකට හරි කියලා - මොන ආකාරයෙන් හරි මැරුණත් මේ පාර්ලිමේන්තුවේ කී දෙනෙක් ඒ අය වෙනුවෙන් කථා කළාද?

ඒ හැම වෙලාවෙම කථා කළේ අපරාධකරු වෙනුවෙන් මිසක් ඒ වෙනුවෙන් කටයුතු කළ පොලිස් නිලධාරීන් වෙනුවෙන් නොවෙයි. ඒ නිසා තමයි මේ තත්ත්වය වැඩිදියුණු වුණේ. මේ පාර්ලිමේන්තුවේ 225දෙනාම එක මතයක ඉඳගෙන එක මාස හයක් ඉඩ දුන්නොත් පාතාලය මේ රටින් තුරන් කරන්න පුළුවන් වෙයි කියා මම හිතනවා. කුඩු වසංගතයත් ඒ එක්කම නැති කරන්න පුළුවන්. නමුත්, අවාසනාවට මේ වාගේ එක සිද්ධියක් ඇති වුණු ගමන් මේ පාර්ලිමේන්තුවේත්, එළියේදීත් කියනවා, "නීතිය කියන්නේ ඕක නොවෙයි. නීතිය ක්‍රියාත්මක කරන ආකාරය ඕක නොවෙයි" කියලා. මේ අය වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ තරම් අය ඉන්නවා. සමහර නීතිඥවරුනුත් ඉන්නවා. අපරාධකරුවන් වෙනුවෙන් කිසිම ලජ්ජාවකින් තොරව පෙනී සිටින සමහර නීතිඥවරුනුත් ඉන්නවා. අපි සාමූහිකව කටයුතු කළොත්, කුඩු වසංගතය නැති කරන්න පුළුවන්, අපරාධ නැති කරන්න පුළුවන්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොඳ කාරණයක් ගැන කථා කරපු නිසා මම මේක කියන්නේ. ඊයේ ලංකාවේ සියලු රූපවාහිනී නාළිකාවල පෙන්නුවා, පොලීසියේ උසස් නිලධාරියෙක් හොඳට ඉඳගෙන ටැටු මල්ලිගෙන් ප්‍රකාශ ගන්නා ආකාරය. මේක පොලීසිය ප්‍රකාශ සටහන් කරගන්නවා වාගේ වැඩක්; සාක්ෂි ගන්නවා, නැත්නම් ඔහුගේ ප්‍රකාශ සටහන් කර ගන්නවා වාගේ වැඩක්.

නීතිඥයෙක් වන අපේ සභානායකතුමාත් ගරු සභාවේ ඉන්න නිසා මම මේ කාරණය කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ හැම රූපවාහිනී නාළිකාවකම

පෙන්නුවා, "ගත්තේ කොහොමද, කවුද කිව්වේ, කවුද මේක කරන්න කිව්වේ, ඔයා කීයක් ගත්තාද" යනාදී වශයෙන් අහපු ඔක්කොම විස්තර. මෙහෙම වුණාම මේ රටේ අධිකරණයට තීන්දු කරන්න දෙයක් නැහැ. ඇපයක් දෙන්න විධියකුත් නැහැ. හිරේ දමන්න විධියකුත් නැහැ. මොකද, පොලීසිය වැඩේ කරලා ඉවරයි, ප්‍රසිද්ධියේ. මේවා කරන්න එපාය කියන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අත්අඩංගුවට ගන්න ඒවා, මේ සියල්ල කරන්න ඕනෑ. පාතාලය මර්දනය කරන්න ඕනෑ. අනිවාර්යෙන්ම ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ මේ වාගේ ක්‍රියාදාමයන් තුළින් මොකක්ද අපි මේ රටට පෙන්වන්න හදන්නේ කියන එකයි. මුළු ලෝකයටම පෙන්වනවා, පොලිස් නිලධාරියෙක් ප්‍රශ්න කරන ආකාරය. උසස් පොලිස් නිලධාරිනුත් ඉඳගෙන ඉන්නවා. රූපවාහිනී නාළිකා හොඳට කැමරාව අල්ලාගෙන ඉන්නවා. එයා හොඳ ලස්සන පුටුවකට ගිහිල්ලා, එයාගේ වම් පැත්තද, දකුණු පැත්තද කියලා ෂොට් එක හරියට සෙට් වන තැන බලාගෙන ඉන්නවා. ඒක ෂෝ එකක් වාගෙයි. ෂෝ දමන එක නොවෙයි, මේ වෙලාවේ කරන්න තිබෙන්නේ. මේ අයගෙන් බොහොම රහසිගතව ගන්න ඕනෑ සාක්ෂි සටහනක්, ඒක. වෙනම ගන්නවා. මම දන්නේ නැහැ ඇයි එහෙම කරන්නේ කියලා. උදාහරණයක් ද මේ දෙන්නේ? මට තේරෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙලාවේ ප්‍රධාන කරුණු දෙකක් පැන නැඟුණා. එකක් තමයි, අද පාතාල ක්‍රියාකාරීත්වය නිසා සාමාන්‍ය ජන ජීවිතයට එල්ල වෙලා තිබෙන පීඩනය සහ භීතිය.

දෙවන කාරණය, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මතු කළා, වැඩි ඈතක නොවෙයි, පසුගිය දිනක අතුරුගිරියේ සිදු වුණු ඝාතනයක් සම්බන්ධ සිද්ධිය. එහිදී පොලීසියට සැකකරුවන් ගෙනැල්ලා සැකකරුවන්ගෙන් ප්‍රකාශ ගන්නවා. සැකකරුවා විස්තරය කියනවා. පාපෝච්චාරණය කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපරාධ නඩු සම්බන්ධයෙන් මම අවුරුදු ගණනක් උසාවියේ වැඩ කළා. ජූරි නඩුවලත් කථා කළා. පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු එක සම්බන්ධයෙන් වන නඩුවේත් මම කථා කළා. එහිදීත් දෙදෙනෙක් මැරුණා නේ. අද ඒ ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. එහෙම නේද, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි? දෙනියායේ කීර්ති අබේවික්‍රම මන්ත්‍රීතුමායි, තව සේවකයෙකුයි එදා මැරුණා. මම කියන්නේ ඒ අත්දැකීම් එක්ක. අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුව, ඕනෑම අපරාධයක් සිදු වුණාට පසුව ඒ අපරාධය සිදු වුණු ස්ථානයේ ඉඳලා ඒ පරීක්ෂණ කටයුතු ඉතා සියුම්ව සහ සංවිධානාත්මකව මෙහෙයවන්න ඕනෑ. නැත්නම් නඩුව කඩා වැටෙනවා. එදා පාර්ලිමේන්තුවට බෝම්බ ගැසීමේ සිද්ධිය පිළිබඳ නඩුවෙන් විත්තිකරුවෝ නිදහස් වුණේ සිද්ධියක් වුණ නිසා නොවෙයි. සිද්ධියක් වුණා. ඒ සිද්ධීන් ඔක්කෝම වුණා. නමුත්, confession statement එක record කිරීමේදී වුණු අඩු පාඩුව තමයි ඒ නඩුවේ විත්තිකරුවෝ නිදහස් වන්න හේතුව වුණේ. මේ වාගේ දරුණු ගණයේ අපරාධ කළ අපරාධකරුවන් පවා නීතියෙන් බේරිලා යන්නේ මේ වාගේ දේවල් නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ, මූලික අයිතිවාසිකම් යටතේ 13 (5) ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වනවා:

> "වරදකරු යයි ඔප්පු කරනු ලබන තෙක් සෑම තැනැත්තකු ම නිර්දෝෂී යයි පූර්වානුමාන කළ යුත්තේ ය."

එතකොට ඕනෑම විත්තිකාරයෙක්, චෝදනාවක් **ලද** කෙනෙක් අවසාන අධිකරණයකින් **වරදකරු** යයි ඔප්පු කරන තෙක් ඔහු නිර්දෝෂී යයි පූර්වානුමාන කර තිබෙනවා. මේක තමයි අපරාධ නීතියේ තිබෙන්නේ. ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමාගේ පොත්වලත් ඒකම තමයි ලියා තිබුණේ. අපිත් ඒවා කියෙව්වා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් කියවා තිබෙනවා. එහෙම තමයි තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරපු කාරණය ගනිමු. බලන්න, සැකකරුවන් ගෙනැල්ලා පොලීසියෙන් ප්‍රශ්න කරන එක මාධ්‍ය මඟින් පෙන්වනවා. මේක පුදුම රටක් නේ. මෙහෙම කළාම කොහොමද අපරාධ නඩු ඔප්පු කරන්නේ?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ වීඩියෝ එක හොඳින් නැරඹුවොත් පෙනේවි, පොලීසිය වෙනම ඔහුගෙන් කටඋත්තරයක් අරගෙන සියල්ල අහ ගන්නවා. අහගෙන නැවත media ගෙන්වලා ඒ සැකකරුවා තියාගෙන අර කටඋත්තරය ප්‍රචාරය කරනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒ ක්‍රියාව සම්පූර්ණයෙන් වැරදියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු ඇමතිතුමනි, ඔබතුමා බලන්න, සාක්ෂිකරුවාට අමතක වන දේවල් මතක් කරන්නේ DIG මහත්මයා.

එතැන හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයා තමයි සාක්ෂිකරුට අමතක වුණාම මතක් කරන්නේ; "ඒක නොවෙයි මේකයි" කියලා සාක්ෂිකරුගේ කථාවේ පිළිවෙළ හදන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පෙර ඔහුගෙන් කටඋත්තරය අරගෙන ඒක මීඩියා රංගනයක් හැටියට නැවත ඉදිරිපත් කරනවා. මේ, ආරම්භක කටඋත්තරය ගන්නා අවස්ථාවත් නොවෙයි. ඒ නිසා ඉතා පැහැදිලිව මාධ්‍ය රංගනයක් ඒ කළේ. මේ විධියට සැකකරුවන්ගෙන් කටඋත්තර අරගෙන, මාධ්‍ය ගෙනැල්ලා මාධ්‍ය ඉදිරියේ නැවත කටඋත්තර ගන්න සම්ප්‍රදායක් අපේ රටේ ඇති වුණොත් කොතැනින්ද මේක කෙළවර වෙන්නේ? ඒ නිසා අනිවාර්යයෙන් ඒ කාරණය සැලකිල්ලට භාජන කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර දිසානායක මැතිතුමාත් දැන් ඒ ප්‍රශ්නය මතු කළා නේ. මම නම් ඉතිහාසයේ කවදාවත් දැක්කේ නැහැ, යම් දරුණු ගණයේ අපරාධයක් සිදු වෙච්ච අවස්ථාවකදී ඒ ආකාරයෙන් සැකකරුවන් ගෙනැල්ලා පොලිස් ස්ථානයේ ප්‍රශ්න කිරීම වීඩියෝ කරලා මාධ්‍යයෙන් පෙන්වන එක. ඊට පසුව ඒකෙම සඳහන් වෙනවා, මහෙස්ත්‍රාත්තුමා හෝ මහෙස්ත්‍රාත්තුමිය ඉදිරියේ වෙනම දෙනවා ලු,- ඔබතුමා දන්නවා මේ කාර්යය කළාම confession statement එකේ තිබෙන weight එක මොකක්ද කියලා. Defence counselsලාට හරිම ලෙහෙසියි, නඩුව කඩා ගන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ පැහැදිලි කිරීමක් කරන්නේ. ඇත්ත වශයෙන්, ඒ වාගේ දේවල් කරන්නේ විත්තිකරු නිදහස් කරන්න. ඒක ඉතාම පැහැදිලියි. රූපවාහිනිය හරහා ඒ කළ පාපෝච්චාරණය උසාවියට දැම්මාම විත්තිකරු නිදහස්. ඒක තමයි ඔය කරන්නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒකටම අදාළ තවත් ප්‍රශ්නයක් කියනවා. අපේ රටේ මෙසේ අපරාධ වැඩි වෙන්න හේතුව මොකක්ද? අපේ රටේ අපරාධ නීතිය සමහරු අද විහිළුවකට ගණන් ගන්නවා. එහෙම කරන්නේ, පාතාල ක්‍රියාකාරීන් විතරක් නොවෙයි. අහම්බෙන් සිදු වුණු සිදුවීම් තිබෙනවා. නමුත් සමහරු හිතා මතා හෙවත් චේතනාත්මකව - purposely - එසේ කරනවා. ඕනෑම අපරාධ නඩුවක් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කරන්න ඕනෑ. එහෙම ඔප්පු කරපු සමහර ඒවා දිගින් දිගට ගිහිල්ලා අවසානයේ ශ්‍රේෂ්ඨාධිකරණයෙනුත් තීන්දු දීපු අවස්ථා තිබෙනවා.

අපරාධ වැඩි වෙන්න තවත් හේතුවක් මම කියන්නම්. ජනාධිපති අපේක්ෂකවරුත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමන්ලාටත් පුළුවන් ඒ ගොල්ලන්ගේ කථාවලදී මේකට උත්තර දෙන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 (1) ව්‍යවස්ථාව, එනම් "සමාව දීම" යටතේ සඳහන් වෙනවා, ශ්‍රී ලංකා ජනරජයේ කවර වූ හෝ අධිකරණයකදී වරදකරු කරන ලද කවර වූ හෝ වරදකරුවෙකුට සමාව දෙන්න පුළුවන් කියලා. 34 (1) ව්‍යවස්ථාවේ ඒ කාරණය ගැන දිගටම කියනවා. එයට ක්‍රමවේදයක් තිබෙනවා. මෑතකදී මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය නඩු තීන්දු දෙකක් දුන්නා. මා ඒවා කියන්නම්. අපේ හිටපු ජනාධිපතිවරයෙක් එල්ලුම් ගහට නියම වෙච්ච කෙනෙකුට සමාව දුන්නා. ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගිහින්, ශ්‍රේෂ්ඨාධිකරණය ඒ සමාව දීම නීති විරෝධියි කියලා අහෝසි කළා. ඒක එකක්. ඊට පසුව තවත් ජනාධිපතිවරයෙක් තවත් කෙනෙකුට එසේ සමාව දුන්නා. ඒකට Supreme Court එක තීන්දුව දුන්නා විතරක් නොවෙයි, දඩයකුත් ගැහුවා.

"මම ජනාධිපති ධුරයට ආවොත් 34(1) ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරන්නේ නැහැ" කියලා රටට කියන්න මේ ඉන්න ජනාධිපති අපේක්ෂකවරුන්ටත් මේවා හොඳ උදාහරණ වන බවයි මා කියන්නේ. මොකද, මේක ලොකු ප්‍රශ්නයක් නේ. අධිකරණ ගණනාවක, එනම් මහෙස්ත්‍රාත් අධිකරණයේ ඉඳලා මහාධිකරණයට ගිහිල්ලා, trial-at-bar ගිහිල්ලා- *[බාධා කිරීමක්]*

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු ඇමතිතුමා, සාමාන්‍ය සුළු අපරාධකරුවන් නිදහස් කිරීම- *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔව්, ඒක මේකට අදාළ වෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* නැහැ. ඒක පොදු සමාවක් යටතේ සුළු වැරදි - minor offences - සඳහා. මේකේ සඳහන් වෙන්නේ එහෙම නොවෙයි. *[බාධා කිරීමක්]*

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ඒක සිද්ධ වන්නේ 34 (1) ව්‍යවස්ථාව යටතේ- *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මම ඒක බලලා කියන්නම්. 34 (1) ව්‍යවස්ථාවේ තමයි සමාව දීම ගැන සඳහන් වෙන්නේ. *[බාධා කිරීමක්]* ඔය කිව්වේ, පොදුවේ යන minor offences. මේක එහෙම නොවෙයි නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පාතාලකාරයන් දැන් කොහේද ඉන්නේ? ඩුබායිවල. ඒ අය ඩුබායිවල ඉඳගෙන මෙහේ සාතන මෙහෙයවනවා. මෙහේ ඉන්න මිනිස්සු භීතියෙන් ඇලළෙනවා. මේක හරි විකාරයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාවේ මතු වෙච්ච මේ ප්‍රශ්නයත් එක්ක මම ඔබතුමාට කියනවා, අඩුම තරමින් මින් ඉදිරියටවත් පොලීසිය නියමාකාරයෙන් පරීක්ෂණයක් කරලා ඒ කටයුතු අවසන් කරන්න ඉඩ සැලැස්විය යුතුය කියන කාරණය පොලිස්පතිතුමාගේ අවධානයට වහාම යොමු කරන්න කියලා. එහෙම නැත්නම්, ඔය කරපු වැඩේ කවදා හෝ දවසක විත්තියට වාසියක් වෙනවා. එතකොට අපරාධකරුවන්ට බොහොම ලේසියි. කොච්චර මිනී මැරුවා වුණත්, කොච්චර අපරාධ කළා වුණත් බොහොම ලෙහෙසියෙන් පැනලා යන්න ඒ අයට පුළුවන්. එහෙම නම්, ඊළඟට එන ජනාධිපතිවරයා පූර්වාදර්ශ දෙන්න එපා, "මම ඒ අයට සමාව දෙනවා" කියලා. සමාව දෙන ක්‍රමවේදයක් තිබෙනවා. අවුරුදු 25ක්, 30ක් හිරේ හිටියාම, අසනීප වුණාම, හොඳ නොවන රෝගයක් හැදුණාම ආදි අවස්ථාවල, එහෙම සමාව දීපු අවස්ථා ඉතිහාසයේ තිබෙනවා.

ගරු චාමර සම්පත් දසනායක මහතා (ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க - ஆரம்பக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Chamara Sampath Dasanayake - State Minister of Primary Industries)
අනුර කුමාර මන්ත්‍රීතුමා ඔළුව වනනවා, ඒක හරි කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මම දන්නවා. ඉහතින් කියපු කරුණු දෙකම හේතු වෙනවා මේ රටේ අපරාධ වැඩි වෙන්න. ඒ නිසා නීතියට තිබෙන බය නැති කරන්න එපා කියන කාරණය තමයි මා අවධාරණය කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි. එම කාරණය පොලිස්පතිතුමාගේත්, ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමාගේත් විශේෂ අවධානය සඳහා යොමු කරනවා.

ස්ථාවර නියෝග යටතේ 27(2) ප්‍රශ්නය, ගරු විපක්ෂ නායකතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

සමුපකාර ක්ෂේත්‍රය නඟාසිටුවීම
கூட்டுறவுத் துறையின் மேம்பாடு
UPLIFTMENT OF CO-OPERATIVE SECTOR

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

සමුපකාර ව්‍යාපාරය ලංකාවේ පමණක් නොව ලෝකයේම පිළිගත් සාර්ථක, සමාජ ව්‍යවසායකත්ව අරමුණු පදනම් කර ගත් ව්‍යාපාරයක්. වර්තමානයේ 14,000කට ආසන්න සමුපකාර සමිති සංඛ්‍යාවක් රට පුරා පැවතියත්, ඒවායේ ක්‍රියාකාරිත්වය විවිධ නීති රෙගුලාසි හමුවේ සීමා වී ඇති බව වාර්තා වෙනවා. මෙරට සමුපකාර සමිති තවදුරටත් බිඳ වැටීම වළක්වා ගනිමින් ඒ සඳහා නව ප්‍රබෝධයක් ලබා දීමට සුවිශේෂී වූ වැඩ පිළිවෙළක් රජය විසින් දියත් කළ යුතුව තිබෙනවා. මම මතක් කරන්න කැමැතියි, "ජනසවිය" දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වූ කාලය ගැන. ඒ සහනාධාර ලබා දීම සමුපකාර ක්ෂේත්‍රය හරහායි ක්‍රියාත්මක කළේ.

එයින් සමුපකාර ක්ෂේත්‍රය ලොකු ශක්තියක් ලැබුවා. අද වන විට සමුපකාර ක්ෂේත්‍රයේ කඩා වැටීමක් ඇත්ත වශයෙන්ම සිදු වෙලා තිබෙනවා. එසේ කඩා වැටීමට හේතු සොයා, එය නැවත වරක් සුරක්ෂා කරන්න, සමුපකාර ක්ෂේත්‍රය ගොඩ ගන්න රජයේ අවධානය යොමු කරමින් මම ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරනවා.

01. මෙරට සමුපකාර සමිති ක්‍රියාකාරිත්වය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට රජය විවිධ පියවර ගනිමින් සිටින බව වාර්තා වෙනවා. එය සත්‍යයක්ද? එසේ නම්, ඒ සඳහා මේ වන විට හඳුනා ගෙන ඇති නිශ්චිත යෝජනා හෝ සැලසුම් සභාගත කළ හැකි ද? එමඟින් රජය අපේක්ෂා කරනු ලබන ඉලක්ක කවරේද? මේ සම්බන්ධව පියවර ගැනීමට පෙර සමුපකාර මණ්ඩල සහ සමිති සාමාජිකයින් හා අදාළ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ රජය සාකච්ඡා කරනු ලැබුවේද?

02. අද වන විට ජාතික මට්ටමේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති බවට තොරතුරු වාර්තා වෙනවා. එය සත්‍ය නම්, ඊට පදනම් වූ හේතු කවරේද? ඉදිරියේදී යළිත් මෙම අවස්ථාව සමුපකාර සමිතිවලට ලබා දීමට රජය කටයුතු කරන්නේද? නො එසේ නම්, ඒ මන්ද?

03. මෙරට සමස්ත සමුපකාර සමිති සතු වත්කම් පිළිබඳ තක්සේරුවක් රජය විසින් සිදු කර ඇත්ද? එසේ නම්, එම වාර්තාව සභාගත කරන්නේද? ඇතැම් ඇවර කරනු ලැබූ සහ දැනටමත් ක්‍රියාත්මක වන සමිති සතු දේපළ වෙනත් රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන වෙත පවරා ගැනීමට කටයුතු සිදු වෙමින් පවතින බව වාර්තා වෙනවා. එය සත්‍යයක්ද? එසේ නම්, එලෙස පවරා දීමට අපේක්ෂා කරනු ලබන්නේ මොනවාද? එම පවරා දීම් සිදු කරන්නේ කුමන අරමුණු අරභයා ද?

04. රජය විසින් ඇතැම් සමුපකාර සමිති මඟින් ආදායම් බදු අය කිරීමටත්, ඇතැම් සමුපකාර සමිති ආදායම් බදුවලින් නිදහස් කිරීමටත් කටයුතු කර තිබෙනවා. ඊට පදනම් වුණු හේතු කවරේද? සමුපකාර සංකල්පයේ වර්ධනය හා පැවැත්ම සඳහා බදු රහිත ප්‍රතිපත්තියක් අවශ්‍ය බව එම ක්ෂේත්‍රයේ විද්වතුන් පවසනවා. මේ සම්බන්ධව රජයේ ප්‍රතිපත්තිය කුමක්ද?

මම මෙහිදී විශේෂ කාරණයක් මතක් කරන්න කැමැතියි. පිටකොටුව Saunders Placeහි පිහිටි සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සම්මේලනය - Sri Lanka Consumer Co-operative Societies Federation Limited - පවත්වා ගෙන යනු ලබන ඉඩම සහ ගොඩනැඟිලි පවරා ගැනීමට කටයුතු කරන බවට ආරංචි තිබෙනවා.

මේ කරුණු පිළිබඳව රජයේ ප්‍රතිචාරය කුමක්ද කියලා මම දැනගන්න කැමැතියි.

05. රට පුරා සමුපකාර සමිති රාශියක් පැවතියත්, ලියාපදිංචි පළාත තුළ හැර ව්‍යාපාර කටයුතු සිදු කිරීමේ හැකියාව සහ ඇතැම් ව්‍යාපාරවලට සම්බන්ධ වීමේ අවස්ථාව සමුපකාර සමිතිවලට සීමා වී ඇති බව වාර්තා වෙනවා. ලෝකයේ බොහොමයක් රටවල් සමුපකාර සමිති උපයෝගී කර ගනිමින් විවිධ ව්‍යාපාර ඉතා පුළුල් අන්දමින් සාර්ථකව පවත්වා ගෙන යනු ලබනවා. උදාහරණ වශයෙන්, Mondragon Corporation in Spain, Amul in India, Fonterra in New Zealand and Ocean Spray in the USA ආදිය දක්වන්න පුළුවන්. වෙළඳපොළ තුළ සිය ව්‍යාපාර මැනවින් පුළුල් කිරීමට හැකියාව ඇති සමුපකාර සමිති සඳහා සමුපකාර ව්‍යුහය මත රැඳෙමින්ම සිය ව්‍යාපාර රට පුරා ව්‍යාප්ත කිරීමට අවස්ථාව ලබා දීමට නොහැකි වන්නේ ද? ඒ සම්බන්ධව වන නෛතික සංශෝධනයක් සිදු කිරීමට හෝ ප්‍රතිපත්තිමය ඉඩකඩ සලසා දීමට යම් අධ්‍යයනයක් රජය සතුව තිබේ ද?

06. කෘෂි නිෂ්පාදන, කිරි නිෂ්පාදන හා ඇතැම් සුළු කර්මාන්ත සමුපකාර ක්‍රමය සමඟ මැනවින් ක්‍රියාත්මක වූ ඉතා ජනප්‍රිය ව්‍යාපාර වෙනවා. වර්තමානයේ සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත ද බිඳ වැටී ඇති මොහොතක නිෂ්පාදන සඳහා හොඳ මිලක් ලබා ගැනීමට හා සුළු ව්‍යාපාර යළි බල ගැන්වීමට සහාය දැක්වීම උදෙසා මෙම සමුපකාර ව්‍යාපාරය උපයෝගී කරගත හැකි නොවන්නේ ඇයි? ඇත්ත වශයෙන්ම සමුපකාර ව්‍යාපාරය මේ සුළු ව්‍යාපාර යළි බල ගැන්වීම සඳහා ඉවහල් වන ව්‍යාපාරයක් හැටියට දායක කරගන්න පුළුවන්. එසේ රජය නොකරන්නේ ඇයි කියන එක මම අහන්න කැමැතියි. මේ පිළිබඳව රජය සතු වැඩ පිළිවෙළ කුමක් ද?

07. පසුගිය කාලයේ වැඩි වශයෙන් සමුපකාර ක්ෂේත්‍රයේ මූල්‍ය වංචා රැසක් වාර්තා වුණා. අවස්ථා කිහිපයක දී අප මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව හමුවේ කරුණු ඉදිරිපත් කළ ද මේ වන තෙක් තැන්පතුකරුවන් සඳහා සැලකිය යුතු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සාධාරණයක් ඉටු වූ බව නම් අපට දැනගන්න ලැබෙන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් 2022 වසරේ සමුපකාර දූෂණ හා වංචා විමර්ශන අමාත්‍යාංශයීය කමිටුවක් ද පත් කෙරුණු බවට වාර්තා වෙනවා. මෙය සත්‍යයක් ද? එම වාර්තාව සභාගත කළ හැකි ද? එම කමිටුව මඟින් ලබා දී ඇති නිර්දේශ මොනවා ද? එම නිර්දේශ ක්‍රියාවට නංවා තිබේ ද? එහි ප්‍රගතිය කෙබඳු ද?

08. සමුපකාර ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන් පවසන පරිදි 2000 වසරේදී පත් කෙරුණු Presidential Commission on Co-operative Movement in Sri Lanka නමින් විශේෂ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවක් සමුපකාර ව්‍යාපාරය සම්බන්ධයෙන් සිදු කර ඇති බවට වාර්තා වෙනවා. එම වාර්තාව සභාගත කළ හැකි ද? එම වාර්තාවේ සඳහන් නිර්දේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කෙරුණි ද? ඉදිරියේ දී සමුපකාර ව්‍යාපාරයට අදාළව නව පනත් සංශෝධනයක් ගෙන ඒමේ වැඩ පිළිවෙළක් තිබේ ද? එහි ප්‍රගතිය කෙබඳු ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර ක්ෂේත්‍රය හරහා ලක්ෂ ගණනක් ප්‍රතිලාභ ඵඍක් ලබා ගෙන තිබෙනවා. මේ රටේ ජනතාවට ලොකු ප්‍රතිලාභයක් ලබා දුන් ක්ෂේත්‍රයක් තමයි සමුපකාර ක්ෂේත්‍රය. නමුත්, සමුපකාර ක්ෂේත්‍රයේ අද පවතින අවිනිශ්චිත තත්ත්වය පිළිබඳව රජය විසින් යම් අධ්‍යයනයක් කරලා එය ගොඩ නංවන්න, ආරක්ෂා කරන්න, දියුණු කරන්න කටයුතු කළ යුතුයි. ඒ වාගේම ඒ ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වෙන දූෂණය මහ හරවා ගන්න, දූෂණය මර්දනය කරන්න යම් විධිමත් වැඩ පිළිවෙළක අවශ්‍යතාව තිබෙනවා. මේ කෙරෙහි රජයේ අවධානය මම යොමු කරවනවා. සමුපකාර ක්ෂේත්‍රය ගොඩ ගැනීම සඳහා යම් පැහැදිලි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම ඔබ සතුයි. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය කුමක්ද කියලා මේ අවස්ථාවේ අපට දැනුම් දෙන්න.

ගරු නලින් ප්‍රනාන්දු මහතා (වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)

(மாண்புமிகு நலின் பர்னாந்து - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அமைச்சர்)

(The Hon. Nalin Fernando - Minister of Trade, Commerce and Food Security)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රථමයෙන්ම ගරු විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වෙනවා, සමුපකාර ව්‍යාපාරය පිළිබඳව අවධානය යොමු කරවීම සම්බන්ධයෙන්. අපි තමුන්නාන්සේලා සියලුදෙනාම දන්නවා, අවුරුදු 25ක, 30ක කාලය තුළ සමුපකාර ව්‍යාපාරයට වෙච්ච දේ සහ එහි කඩා වැටීම පිළිබඳව. ඔබතුමා අසන ලද ප්‍රශ්නවලට උත්තර දීලා යම් ප්‍රමාණයක පැහැදිලි කිරීමක් මම කරන්නම්. ඔබතුමා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

01. නැත.

02. එකඟයි. 2024.08.24 දිනැති අමප අංක 23/1626/627/020 දරන, "ජාතික සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ රේඛීය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම" මැයෙන් මා විසින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල ප්‍රතිකාව අනුව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට නියමිත බැවින් 2023.03.01 දින සිට ජාතික මට්ටමේ සමුපකාර සමිති ලියාපදිංචිය අත්හිටුවා ඇති බව දක්වා ඇති අතර, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කළ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවේ කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

03. මෙරට සමස්ත සමුපකාර සමිති සතු වත්කම් පිළිබඳ තක්සේරුවක් රජය විසින් සිදු කර නැත. සමුපකාර සමිති ඇවර කිරීමේදී එකී දේපළ ඇවරකරු භාරයට ගෙන එකී දේපළ/වත්කම් උපලබ්ධි කර වගකීම් පියවීමට කටයුතු කරනු ලැබේ.

04. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9(1) වගන්තිය අනුව තුන්වන උප ලේඛනයෙහි, 9 (අ) (5) අනුව ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතෙහි අර්ථානුකූලව යම් ලියාපදිංචි කළ සමිතියක ආදායම; ආදායම් බද්දෙන් නිදහස් බව සඳහන් වේ.

05. දීප ව්‍යාප්ත සමුපකාර සමිති සඳහා ව්‍යාපාර කටයුතු කිරීමට කිසිදු සීමාවක් නොමැත. මෙය විමධ්‍යගත විෂයක් බැවින් පළාත් මට්ටමින් පිහිටුවා ඇති සමිතියක් වේ නම් එහි ව්‍යාපාරික කටයුතු අදාළ පළාත් සභා සීමාව තුළ ක්‍රියාත්මක වේ.

06. හැකිය. දැනටමත් පළාත් සභා මට්ටමෙන් පළාත් කොමසාරිස්වරු හරහා මෙම කටයුත්ත සිදු වේ. මධ්‍යම රජය යටතේ ද වෙළඳ අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය වැනි ආයතන සමුපකාර ව්‍යාපාරය උපයෝගී කරගෙන මෙවැනි වැඩසටහන් දියත් කරනු ලබයි.

07. සත්‍යයි. සමුපකාර ප්‍රතිසංවිධාන කමිටු වාර්තාව (2022) දැනට වත්මන් පාර්ලිමේන්තුවේ බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව තුළ සභාගත කර සාකච්ඡා කරමින් පවතියි. එහි කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන නිර්දේශ ඉදිරිපත් කර ඇත. කාරක සභා නිර්දේශ ලැබුණු පසුව ක්‍රියාත්මක කිරීමට නියමිතයි.

08. ඔව්, එවකට එම වාර්තාව ජනාධිපතිතුමා වෙත භාර දී ඇත.

ගරු විපක්ෂ නායකතුමනි, පසුගිය අවුරුදු කිහිපය තුළ සමුපකාර ව්‍යාපාරය, රට තුළ ක්‍රියාත්මක වුණු බැංකු නමින් හඳුනා ගත් ආයතනත් එක්ක ගනුදෙනු කර තැන්පතු විශාල ප්‍රමාණයක් තැන්පතුකරුවන්ට ලබා නොදීම පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ සිටින ඔබ අප - විපක්ෂය සහ ආණ්ඩු පක්ෂය - සියලුදෙනාම දන්නවා. ඔබතුමා විශේෂයෙන්ම ඒ ගැන ප්‍රශ්න ඇහුවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව මේ විෂයට අදාළ බලතල සහ ක්‍රියාත්මක කිරීම් සම්පූර්ණයෙන්ම පළාත් සභාව වෙත පවරා තිබෙනවා. ඒ නිසා තමයි මේ සමුපකාර විෂය සඳහා පළාත් සභාවලට පළාත් අමාත්‍යවරු, පළාත් කොමසාරිස්වරු පත් කළේ. ඒ වාගේම සමුපකාර ව්‍යාපාරය ගෙන යන වැඩ පිළිවෙළ පළාත් සභාව තුළ තමයි ක්‍රියාත්මක වුණේ. එතකොට මහජන නියෝජිතයන්ගෙන් පළාත් සභා ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් ඒ සියලු බලතල හිමි වන්නේ ආණ්ඩුකාරතුමාට. ඒ නිසා ආණ්ඩුකාරතුමා තමයි සමුපකාර ව්‍යාපාරයට අවශ්‍ය කරන තීන්දු ගන්නේ. එතකොට ඇත්තටම මධ්‍යම ආණ්ඩුවට අයත් වන්නේ ආයතන කිහිපයක් පමණයි. එහිදී අපි විශේෂයෙන්ම කැබිනට් මණ්ඩලයට දැන්වූවා, සමුපකාර මණ්ඩලය, එහෙම නැත්නම් සමුපකාර ව්‍යාපාරය පළාත් සභාව හරහා ක්‍රියාත්මක කිරීම සඳහා අපට දෙන්න පුළුවන් උපදෙස්, එහෙම නැත්නම් අපට දෙන්න පුළුවන් සහයෝගය එක්ක ඉදිරියේදී වැඩ පිළිවෙළක් හදන්නේ කොහොමද කියලා. ඒ අනුව තමයි අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් කැබිනට් අනුකමිටුවක් පත් කළේ. සියලුම ආණ්ඩුකාරවරු සහ ඒ අනුකමිටුවේ ඉන්න ඇමතිවරු සාකච්ඡා කරලා සකස් කරපු අවසාන වාර්තාව ගරු අග්‍රාමාත්‍යතුමා ඉතාම කෙටි කාලයක් තුළ ඉදිරිපත් කරයි. එයින් අපි බලාපොරොත්තු වන්නේ, සමුපකාර ව්‍යාපාරය පළාත් සභා හරහා මධ්‍යම ආණ්ඩුවේ සහයෝගයත් එක්ක ඉදිරියේදී ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එකයි.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා කිව්වා වාගේ ලෝකයේ බොහොමයක් රටවල් සමුපකාර ව්‍යාපාරය එක්ක බද්ධ වෙලා ආයතන පිහිටුවා ගෙන විශාල ව්‍යාපාර පවත්වාගෙන යනවා.

නමුත් අවාසනාවකට, අපේ රටේ ඉතාම සුළු ආයතන ප්‍රමාණයක් විතරයි යම් තත්ත්වයකට ඇවිල්ලා තිබෙන්නේ. අපේ රටේ සමුපකාර ව්‍යාපාරයේ දියුණුවක් ඇති වෙලා නැහැ. සමහර පළාත් සභා සමුපකාර ව්‍යාපාරය සම්බන්ධව ඒ අයට අදාළ වන ලෙස ප්‍රඥප්ති හදාගෙන තිබෙනවා. එතකොට ඒ අයට ආවේණික ක්‍රමවේදය තුළ තමයි ඔවුන් කටයුතු කරන්නේ. අප විසින් යම් වැඩ පිළිවෙළක් හදනවා නම්, ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න මේ සියලු පළාත් සභා එකඟ වෙන්න ඕනෑ. ඒක ටිකක් අමාරු වැඩක්. ඒ නිසා තමයි අපි අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සියලුදෙනා එක්ක සාකච්ඡා කළේ. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා සහ ඔබතුමා විසින් නම් කරන පුද්ගලයින් මේ සඳහා ඉදිරිපත් වුණොත් අපේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී සතියක්, දෙකක් ඇතුළත මේ සම්බන්ධව අවසාන තීන්දුවකට එන්න අපට පුළුවන්.

සමුපකාර ව්‍යාපාරය සම්බන්ධ ආයතනවල තිබෙන ඉඩම් සහ ගොඩනැඟිලි සම්බන්ධව ඔබතුමා කිව්වා. කිසිම අවස්ථාවක ඒ ගොඩනැඟිල්ලක්වත්, ඉඩමක්වත් ලබාගන්න අපි කටයුතු කරන්නේ නැහැ. මොකද, සමුපකාර ව්‍යාපාරයට වෙන් කරලා තිබෙන, සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ වෙලා තිබෙන ඒ ආයතනවල සාමාජිකයන්ට ඒ සඳහා තිබෙන අයිතිය උදුරාගන්න අපි කවදාවත් කටයුතු කරන්නේ නැහැ.

මම තවත් කරුණු කිහිපයක් ඉතාම කෙටියෙන් කියන්නම්. ඔබතුමා කිව්වා වාගේ රුපියල් බිලියන 20ක් තැන්පත්කරුවන්ට ලබා දෙන්න තිබෙනවාය කියන එක දැනට ගණනය කරලා තිබෙනවා. එය ඉතාම විශාල මුදලක්. මේ සම්බන්ධව ඉදිරියේ දී අපි ජාතික මට්ටමේ වැඩ පිළිවෙළක් හදනවා නම්, මේ සමුපකාර ව්‍යාපාරය දියුණු කරන්න වැඩ පිළිවෙළක් හදනවා නම්, එය මෙවැනි අවාසනාවන්ත සිදුවීම්වලට ඉඩ නොදෙන තත්ත්වයේ වැඩ පිළිවෙළක් වෙන්න ඕනෑ. එහෙම නොවුණොත්, මේවායේ ප්‍රතිඵල භුක්ති විඳින්න වෙන්නේ සාමාන්‍ය දුප්පත් මිනිස්සුන්ටයි. සමුපකාරවලට ගිහින් රුපියලක් හරි තැන්පත් කරන්නේ අන්තිම දුප්පත්, පොඩි මිනිහා. ඔවුන් එය සිදු කරන්නේ සමුපකාරය කෙරෙහි විශ්වාසය තබාගෙනයි. මේ සඳහා අපි යම් වැඩ පිළිවෙළක් හදනවා නම්, විශේෂයෙන්ම මහ බැංකුවේ මැදිහත්වීමක් අවශ්‍යයි. මම අමාත්‍යාවරයා වශයෙන් පත් වුණු ගමන් මහ බැංකු අධිපතිවරයාට කිව්වා, මේ සමුපකාර ව්‍යාපාරයේ තිබෙන සියලු මුදල්; මේ බැංකු පද්ධතියේ තිබෙන මුදල් නියාමනය කරන වැඩ පිළිවෙළක් හදලා දෙන්න, ඒ සඳහා අවශ්‍ය කරන සියලු සහයෝගය අපේ පැත්තෙන් ලබා දෙන්නම් කියලා. මම හිතන විධියට අපි ඒක කරන්න ඕනෑ විශේෂම දෙයක්. කෙසේ වෙතත්, ඉතාම කෙටි කාලයක් තුළ අගමැතිතුමාගේ වාර්තාවත් එක්ක ඔබතුමන්ලාගේ අදහස් ඉදිරිපත් කරන්න අපි අවස්ථාවක් ලබා දෙන්නම්. ඒ වාගේම, ඒ සමිතිවලටත් අවස්ථාව ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඉදිරියේ දී හැකි ඉක්මනින් එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විවාදයේදී කථා කරන්න කථිකයින් රාශියක් සිටින නිසා දිවා ආහාර විවේකය සඳහා වෙන් කර තිබෙන වෙලාවත් විවාදය වෙනුවෙන් ලබා දෙන්න කියලා ගරු සභානායකතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ දෙවන ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට ලිඛිත පිළිතුරක් ගෙනැවිත් තිබෙනවාද කියා මම දැනගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ ප්‍රශ්නය ලැබුණේ දැන්. ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය ඉක්ම ගොස් තිබෙන නිසා මට මේ ප්‍රශ්නය හැන්සාඩ්ගත කරන්න ඉදිරිපත් කරන්න පුළුවන්. ගරු ඇමතිතුමාගේ ලිඛිත පිළිතුරක් තිබෙනවා නම් ඒකත් හැන්සාඩ්ගත කරන්න පුළුවන්. මොකද, කාලය ගොඩක් ගතවෙලා තිබෙනවා. අද දිනට නියමිත, සභාව කල් තබන අවස්ථාවේ විවාදයත් පටන්ගන්න තිබෙනවා. තවත් මේවා කියමින් ඇදගෙන යන එක තේරුමක් නැහැ කියලායි මම කල්පනා කළේ. *[බාධා කිරීමක්]* මට මේ ප්‍රශ්නය හැන්සාඩ්ගත කරන්න කියලා ඉල්ලන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ලිඛිත පිළිතුරක් තිබෙනවා නම් එයත් හැන්සාඩ්ගත කිරීම සඳහා ඉදිරිපත් කරන්න පුළුවන්. එහෙම නැත්නම්, මම අද මේ ප්‍රශ්නය හැන්සාඩ්ගත කරන්න ඉල්ලන්නම්. ඔබතුමා පසුව පිළිතුර හැන්සාඩ්ගත කරලා මට ලිඛිත පිටපත එවන්න. කාලය ඉක්ම යන නිසා එහෙම කරන එක හොඳයි කියා මා හිතනවා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ඒ යෝජනාව බොහොම හොඳයි. කාලය ඉතිරි කර ගැනීම සඳහා මම ඒ යෝජනාවට එකඟයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

එහෙම නම්, මම මගේ ප්‍රශ්නය හැන්සාඩ්ගත කරන්න කියලා ඉල්ලා සිටිනවා. එහෙම පුළුවන් නේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඒක දිගටම පූර්වාදර්ශයක් වුණොත් මූලාසනයේ කටයුතුවලටත් බොහොම ලෙහෙසියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී ස්ථාවර නියෝග 27(2) යටතේ මගේ ප්‍රශ්නය **හැන්සාඩ්ගත*** කිරීම සඳහා ලිඛිතව ඉදිරිපත් කරනවා.

**** හැන්සාඩ්ගත කරන ලද, ස්ථාවර නියෝග 27(2) යටතේ ඇසූ ප්‍රශ්නය:***

ஹன்சாட்டில் உள்ளடக்கப்பட்ட நிலையியற் கட்டளை 27(2) இன்கீழ் கேட்கப்பட்ட கேள்வி:

Question raised under Standing Order 27(2) to be included in Hansard:

II

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව රාජ්‍ය සමාගමක් ලෙස පෞද්ගලීකරණය කිරීම

இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனத்தையும் இலங்கை ரூபவாஹினிக் கூட்டுத்தாபனத்தையும் ஓர் அரச நிறுவனமாக தனியார் மயமாக்கல்

PRIVATIZATION OF SRI LANKA BROADCASTING CORPORATION AND SRI LANKA RUPAVAHINI CORPORATION AS A PUBLIC COMPANY

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව පෞද්ගලීකරණය කිරීමේ යෝජනාවක් හේතුවෙන් මෙම ආයතන ද්විත්වයේ කාර්යමණ්ඩල අතර සහ පොදු මහජනතාව අතර වර්ධනය වී ඇති නොසන්සුන්තාව පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ඒකාබද්ධකොට රාජ්‍ය සමාගමක් පිහිටුවීමටත්, අනතුරුව එම සමාගම පෞද්ගලික සමාගමක් බවට පත් කිරීමටත් ජනමාධ්‍ය අමාත්‍යාංශය ක්‍රියා මාර්ග ගනිමින් සිටින බවට ජනමාධ්‍ය වාර්තා කරනවා. මේ සම්බන්ධව ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2023 නොවැම්බර් 15 දාතමින් අත්සන් තබන ලද කැබිනට් පත්‍රිකාවේ සිරස්තලයේ දැක්වෙන්නේ 'ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ඒකාබද්ධ කරමින් රාජ්‍ය සමාගමක් පිහිටුවීම' යන්නයි. නමුත්, මෙම පත්‍රිකාව යෝජිත සමාගමේ කොටස් සියයට 40ක් පළමුව රාජ්‍ය ආයතනවලට විකිණීමටත්, ඒ සඳහා රාජ්‍ය ආයතන ඉදිරිපත් නොවන්නේ නම් පෞද්ගලික අංශයට අවස්ථාව දීමටයි. ඒ අනුව, රාජ්‍ය ආයතන මේ සඳහා ඉදිරිපත් වන්නේ හෝ නොවන්නේ රජයේම තීරණය අනුව බැවින් වැඩි ඉඩක් පවතින්නේ සියයට 40ක අයිතිය පෞද්ගලික අයිතියට පත් වීමටයි. එසේම මෙම සමාගම කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත පොදු සමාගමක් බවට පත් කිරීමටත්, කොටස් අයිතියෙන් තවත් සියයට 08ක් කොටස් වෙළෙඳ පොළේ අලෙවි කිරීමටත් යෝජනා කර තිබෙනවා.

එසේම දැනට ලෝකයේ සංවර්ධිත රටවල් ගණනාවක රජය සතු මාධ්‍ය එකම ආයතනයක් යටතේ ක්‍රියාත්මක වන බවට මෙම පත්‍රිකාව කියා සිටියත් මෙවැනි පෞද්ගලික අංශයට විකුණා දමන ලද කළමනාකරණ ව්‍යුහයක් කිසිදු රටක නොමැති බවට සේවකයින් චෝදනා නඟනවා. විශේෂයෙන් කැබිනට් පත්‍රිකාවේ නිදසුන් ලෙස දක්වන ජපානයේ NHK ආයතනයේ හෝ දකුණු කොරියාවේ KBS ආයතනයේ එවැනි තත්ත්වයක් නොමැති බවත්, මෙය කරුණු මුළුමනින්ම විකෘති කර ජාතික සම්පත් විකුණා දැමීම ඉලක්ක කරගෙනම සකස් කරන ලද්දක් බව ඔවුන් පවසනවා. විශේෂයෙන් ජපානය, දකුණු කොරියාව වැනි තැනක රාජ්‍ය මාධ්‍ය මහජන සේවා සංකල්පය තදින් ක්‍රියාත්මක කරනවා. ලෝකයේ කිසිදු ප්‍රධාන රටක ජාතික මාධ්‍ය ආයතන කොටස් වෙළෙඳ පොළ තුළ ලැයිස්තුගත කර නැහැ. පෞද්ගලික සමාගම් තිබිය හැකි වුවත් ජාතික මාධ්‍ය ආයතන පවතින්නේ රජය සතුවයි. ඕස්ට්‍රේලියාවේ ABC, ඇමෙරිකාවේ වොයිස් ඔෆ් ඇමෙරිකා, බ්‍රිතාන්‍යයේ බීබීසී, ඉන්දියාවේ දූරදර්ශන්, සමස්ත ඉන්දීය ගුවන්විදුලිය රජය සතු ගුවන්විදුලි හා රූපවාහිනී සඳහා හොඳම උදාහරණයයි. අඩු වැඩි වශයෙන් ආර්ථික ගැටලු පැවතියත් දකුණු ආසියාවේ සෑම රටකම පාහේ රජය සතු මාධ්‍ය පවතිනවා.

එමෙන්ම ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමිතීන්ට පූර්වාදර්ශ සැපයුවේ සහ ආරක්ෂා කළේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවයි. පසුකාලීනව මෙම ආයතන පාලනයට දේශපාලනිකව පත් වූ ප්‍රමිතියක් නොමැති පුද්ගලයින් ඒවා බිඳ දැමූවද ඉන් එම ආයතනයන්හි කාර්යභාරය අවතක්සේරු වන්නේ නැහැ.

මෙම ආයතනය ගණනය කළ නොහැකි මහා සම්පත්වලට හිමිකම් කියනවා. විශේෂයෙන් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සතු තැටි ගබඩාව ලෝකයේම විශාලතම එකක්. එහි සිංහල තැටි 22,596ක් ද, දෙමළ තැටි 41,466ක් ද, ඉංග්‍රීසි තැටි 65,414ක් ද, හින්දි තැටි 26,763ක් ද තිබෙනවා. තැටිවලට අමතරව සිංහල පටි 28,260ක් ද, දෙමළ පටි 13,470ක් ද, ඉංග්‍රීසි පටි 7,769ක් ද, හින්දි පටි 800ක් ද මෙම ගබඩාව සතුයි. පූර්ණ සංගීත පර්යේෂණ ආයතනයක් ද, අභ්‍යාස ආයතනයක් ද, අනුරාධපුරය, රුහුණ, දඹාන, යාපනය, කොත්මලේ, මඩකලපුව, මහනුවර වැනි ප්‍රාදේශීය සේවා ගණනාවක් ද ගුවන්විදුලිය සතුයි. මෙවැනි මූල්‍ය වශයෙන් ගණනය කළ නොහැකි සම්පත් සම්භාරයක සංස්කෘතික වටිනාකම අවබෝධ කරගත නොහැකි වීම අපරාධයක්.

විදුලි සංදේශ නියාමන කොමිසමට මේ වන විට බෙදා දීම සඳහා තරංග මාලා කිසිවක් ඉතිරිව නොමැති තත්ත්වයක් තුළ විකාශන දහහතරකට වැඩි තරංග මාලා සහිත ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සංඛ්‍යාත පිළිබඳව කුට ව්‍යාපාරිකයන් ඇස ගසාගෙන සිටින බවටද සේවකයින් චෝදනා කරනවා.

අනෙක් අතට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට අයත් ගොඩනැඟිලි සංකීර්ණය, විකාශනාගාරය සහ කුලුනු පද්ධතිය ඇතුළු ව්‍යාපෘතිය ජපානයෙන් ලද යෙන් බිලියන 3.5ක පරිත්‍යාගයක්. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සතු බහුවිධ ශ්‍රවණාගාරය හා විකාශන මැදිරි පද්ධතියද ජපානය විසින් ශ්‍රී ලංකාවට පරිත්‍යාග කරනු ලැබූ ඒවායි. මෙවැනි පරිත්‍යාගයක් අමතකකොට විකිණීමට මාර්ගයක් පාදා ගැනීම ඒ සියල්ල වෙනුවෙන් අරමුදල් සැපයූ ජපන් ජනතාවට කරන අවමානයක්.

රූපවාහිනී සංස්ථාව ආරම්භ වූ 1982 වසරේ සිට ගෙවුණු වසර 42ක කාලය තුළ කුමන ගැටලු මැද වුවත් මෙරට පොදු මහජනතාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් සිදු කර තිබෙනවා. දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් නොමිලයේ විකාශන කටයුතු කරන රූපවාහිනී සංස්ථාව රටේ ඕනෑම මාධ්‍ය ආයතනයක් සතු එකම අධ්‍යාපන අංශයට හිමිකම් කියනවා. අදටත් අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජනය කරමින් නිලධාරියෙකු සංස්ථාවේ මණ්ඩලය නියෝජනය කිරීමෙන්ම ජපානයේ පරිත්‍යාගයේ අරමුණු වූ මහජන සේවා ආයතනයක් ලෙසට එහි ඇති නෛතික බැඳීම් පෙන්නුම් කෙරෙනවා.

කෙසේ වුවද, ආණ්ඩුවේ හොරණෑ බවට පත් කර ගැනීමෙන්, දේශපාලන පත්වීම් ලබා දීමෙන් සහ නුසුදුස්සන්ට තනතුරු ලබා දී මේ ආයතන කඩා වැටීවීමෙන් පසු අද එකම විකල්පය ලෙස පෞද්ගලීකරණය යෝජනා කර තිබෙනවා. මේ සා වැදගත්කමක් ඇති මේ ආයතන විනාශ කළේ වෙන කිසිවෙක් නොව පාලකයින් විසින්ම බව සේවකයින් පෙන්වා දෙනවා. එසේම වත්තීය සමිති විසින් ආයතන ගොඩගැනීම වෙනුවෙන් ඉදිරිපත් කළ කළමනාකරණ සැලසුම් නොතකා හැරියේ හිතාමතා ආයතනය විනාශ කිරීමේ වුවමනාවෙන් බවටද චෝදනා නැඟෙනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි බලාපොරොත්තු වනවා.

01. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ඒකාබද්ධ කරමින් රාජ්‍ය සමාගමක් පිහිටුවීමට අදාළව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනු ලැබ තිබේද? මේ වන විට ඒ සම්බන්ධයෙන් ගනු ලැබ තිබෙන පියවර කවරේද?

02. මෙම ආයතන ද්විත්වය ඒකාබද්ධ කිරීමටත් අනතුරුව කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත පොදු සමාගමක් කිරීමටත් අදාළ තීන්දුව කවුරුන් විසින් යෝජනා කරන ලද්දක්ද? මේ පිළිබඳ තීන්දු ගැනීමේදී එහි බලපෑමට ලක්වන සියලු පාර්ශ්ව විමසීමට ලක් කරන ලද්දේද? ඔවුන් විසින් මෙම යෝජනාව අනුමත කරන ලද්දේද?

03. ගතවූ වසර 10ක කාලය තුළ ජාතික වශයෙන් පිළිගත් විගණන ආයතනයක් ලවා විද්‍යාත්මක විගණනයක් සිදු කර නොමැති තත්ත්වයක් තුළ සහ වසර ගණනාවකින් වාර්ෂික වාර්තාවක් පිළියෙල නොකළ තත්ත්වයක් තුළ රූපවාහිනී සංස්ථාවේ වත්කම් ප්‍රමාණය මිලියන 1,408.5ක් බවට ගණනය කරන ලද්දේ කවුරුන් විසින්ද?

04. ඒකාබද්ධ කිරීම සහ පෞද්ගලීකරණය මෙම ආයතන ද්විත්වය සම්බන්ධයෙන් ගත හැකි හොඳම පියවර බවට සහතික වන්නේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ තුන්වන ප්‍රශ්නය, ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ.

III

2010 සිට 2019 දක්වා ලබාගෙන ඇති ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික සහ වාණිජ ණය
2010 முதல் 2019 வரை பெறப்பட்ட இருதரப்பு, பலதரப்பு மற்றும் வணிகக் கடன்கள்
BILATERAL, MULTILATERAL AND COMMERCIAL LOANS OBTAINED FROM 2010 TO 2019

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙත මේ ප්‍රශ්නය මා යොමු කරනවා.

ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ප්‍රධාන වශයෙන්ම බලපාන කාරණය, කිසිදු සැලසුමකින් තොරව ණය ලබා ගැනීමයි කියන එක අපි කවුරුත් දන්නවා. එහි ප්‍රතිඵලයක් හැටියට අද වන විට විශාල මුදල් ප්‍රමාණයක් වාර්ෂිකව ගෙවීමට සිදුවෙලා තිබෙනවා. ඒ අනුව අපේ නිෂ්පාදන ක්‍රියාවලියට වඩා ණය ගෙවීමට සිදු වීම නිසා ආර්ථික උද්ධමනයක් ඇතිවෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපගේ ඩොලර් සංචිත ප්‍රමාණය සිදී යන්නේ ඉතා අපහසුවෙන් වාර්ෂික පොලී හා වාරික ගෙවීම් සිදු වන නිසායි. 2010 සිට 2015 දක්වාත්, 2015 සිට 2019 දක්වාත් ලබා ගත් ණයවල ස්වභාවය සහ ඒවායින් අපි ලබා ගත් ප්‍රතිලාභ මොනවාද යන්න අපි විමසා බැලිය යුතුයි. ජාතික ප්‍රතිපත්තියකින් තොරව විශාල ප්‍රමාණයෙන් ණය ගත් විට ඕනෑම රටක් මෙවැනි අර්බුදවලට මුහුණ පානවා. සාමාන්‍ය පුද්ගලයෙක් ණය ගත්තත්, ඒ ගත් ණය මුදල ගෙවීමට වැඩ පිළිවෙළක් නොමැති නම්, ණය ගත් පුද්ගලයා බරපතළ අර්බුදයකට පත් වෙනවා. ඒ වාගේම අද ජාතියට සිදු වී ඇත්තේත් එම අර්බුදයයි. ඒ අනුව කිසිදු ජාතික සැලසුමකින් තොරව ණය ගැනීම නිසා මේ අවාසනාවන්ත තත්ත්වයට අද අපි මුහුණ පා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ කිසිම විෂය පථයකට කිසිම ජාතික ප්‍රතිපත්තියක් නැහැ; ඉඩම් සම්බන්ධයෙන්, අධ්‍යාපනය සම්බන්ධයෙන්, බලශක්තිය සම්බන්ධයෙන්, ඒ වාගේම වෙළෙඳාම සම්බන්ධයෙන් කිසිම ප්‍රතිපත්තියක් ලංකාවේ නැහැ. ඒ වාගේම අපි ලබාගෙන තිබෙන ණය අරගෙන බැලුවොත්, 2015-2019 අතර ණයවල ප්‍රමාණය මොකක්ද, ණයවල ස්වභාවය මොකක්ද, ඒ නිසා මේ අර්බුදය ඇතිවෙලා තිබෙන්නේ කොයි ආකාරයෙන්ද කියලා සොයා බැලිය යුතුයි. සමහරු මීට කලින් මේ ප්‍රශ්නය අහපු වෙලාවේ කිව්වා, "ණය ආපහු දුන්නා, ව්‍යාපෘති කළේ නැහැ" කියලා. නමුත්, ඊට වඩා වෙනස් කාරණයක් පිළිබඳ තොරතුරු අපට දැනගන්නට ලැබුණා, එම ණය ලංකාව ඇතුළේ අයථා විධියට පරිහරණය කළා කියලා. ඒ බව මාධ්‍ය ගණනාවක පළ වුණා.

උදාහරණයක් හැටියට කටුනායක අධිවේගී මාර්ගය ගත්තොත්, ඒ මාර්ගය අවශ්‍ය එකක් බව අපි දන්නවා. ඒක ඉදිකිරීමෙන් රටට පහසුවක් වුණා. ඒ වාගේම මාතරටත් අධිවේගී මාර්ගයක් හැදුවා. අපි දන්නවා, ඒකත් ප්‍රයෝජනවත්. හැබැයි, මාතර ඉඳලා හම්බන්තොට දක්වා අධිවේගී මාර්ගයක් හැදුවත්, එහි එලදායිතාව මොකක්ද? ඒ වාගේම දැන් අපි කුරුණෑගල අධිවේගී මාර්ගය ගැනත් කථා කරනවා. එහි වැඩ අතරමඟ නතරවෙලා දැන් අවුරුදු ගණනාවක් වෙනවා. ඒ පාරෙන් සියයට 75කට, සියයට 80කට වැඩි ප්‍රමාණයක් හදලා තිබෙනවා. නමුත්, සියයට 20ක කොටසක් හදන්නේ නැහැ. එතකොට මේ වාගේ ව්‍යාපෘතිවලින්, ප්‍රයෝජනයක් ගන්නේ කොහොමද? රටේ යම් කිසි ව්‍යාපෘතියක් දියත් කරලා තිබෙනවා, ඒකෙන් සියයට 80කටත් වැඩි ප්‍රමාණයක් අවසන් කළත්, දැන් එම ව්‍යාපෘතියේ කිසිම කටයුත්තක් කරන්නේ නැහැ. මේ වාගේ අධිවේගී මාර්ගයකට ගත් ණය ප්‍රමාණය ඩොලර් බිලියනයක්, නැත්නම් ඩොලර් බිලියන එකහමාරක් වගේ විශාල මුදල් ප්‍රමාණයක් වෙන්න පුළුවන්. නමුත් දැන් එයින් ඇති වී තිබෙන අර්බුදය මොකක්ද? උදාහරණයක් හැටියට අපි හම්බන්තොට දිස්ත්‍රික්කය වටා යෝධ කාර්මීකරණයක් ඉලක්ක කරනවා නම්, ඒ පදනම මත ඉඩම් ලබා දීමේ ප්‍රතිපත්තියකට ඇවිල්ලා, ඊට පසුව තමයි අපි අධිවේගී මාර්ගය හදන්න ඕනෑ. කොච්චර ඉඩම් දෙන්න හැදුවාද, පටන් ගන්න හදපු කර්මාන්ත කොයි වගේද කියලා මම දන්නේ නැහැ. නමුත්, මාතර ඉඳලා හම්බන්තොට දක්වා වන අධිවේගී මාර්ගය ගත්තොත්, අද එම අධිවේගී මාර්ගයේ වාහන යන්නේ නැහැ. අපි ඒකට සල්ලි වියදම් කරලා, ඒකෙන් කොච්චර ආදායමක් ලබා ගත්තාද? කොච්චර ආදායමක් එනවාද? මේ විධියට, අපට කිසිම return එකක් නැතුව අපි යටිතල පහසුකම් සඳහා වියදම් කරලා තිබෙනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම කියන්නට ඕනෑ, සංවර්ධන උපාය මාර්ගයක් නැතුව යටිතල පහසුකම් වර්ධනය කළොත්, ඒක විශාල බරක් බවට පත් වෙන බව. මෙන්න මේ තත්ත්වයට තමයි අද පත්වෙලා තිබෙන්නේ.

මම තවත් කාරණයක් කියන්න කැමැතියි. විශේෂයෙන්ම ඉදිරියේදී ජනාධිපතිවරණයක් එන්න නියමිතයි. ඊළඟ ආණ්ඩුවල ජාතික ප්‍රතිපත්තිය මොකක්ද? අපේ ජාතික සැලැස්ම මොකක්ද? ඒ සඳහා වන ජාතික සංවර්ධන උපාය මාර්ගය, ඒ ජාතික සැලැස්ම මේ රජය හැටුවත්, වෙනස් කරන්න බැරි විධියට, හැමදෙනාගේම සහභාගිත්වය ඇතිව ඒක හදන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මම මේ අදහස මේ සභාවේ මතු කරන්නේ ඇයි? අපි පක්ෂවලට බෙදුණත් අපි කවුරුත් මැරිලා යනවා. අපට හැමදාම ඇමතිකම් දරන්න බැහැ. නමුත් රට තිබෙනවා. රටේ අනාගත පරම්පරාවක් මතුවට ජීවත් වෙනවා. එම නිසා අපි පක්ෂ භේදයකින් තොරව රටේ ඉදිරි ජාතික සංවර්ධන උපායමාර්ගයක් පිළිබඳ පොදු සාකච්ඡාවක් ආරම්භ කරනවා නම් ඒක ඉතාම වැදගත් වෙනවා. සමහර අයට විවේචනය කරන්න පුළුවන්. කොයි ආණ්ඩුව ආවත් මිනිස්සු අතර තිබෙන එක කථාවක් තමයි, ආපහු අවුරුද්දක්වත් මේ රට ගෙනියන්න පුළුවන්ද කියන එක.

ඊළඟ එක තමයි, ව්‍යාකූල පාර්ලිමේන්තුවක් ඇති වෙන්න පුළුවන් කියන කාරණය. එම නිසා ජාතික සංවර්ධන ප්‍රතිපත්තියකට යෑම සඳහා මේ දත්ත ලබා දීම ඉතා වැදගත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ස්වාමීන්වහන්ස, ඔබවහන්සේගේ ප්‍රශ්නය ඉදිරිපත් කළා නම් හොඳයි. මොකද, කාලය හුහක් ගතවෙලා තිබෙනවා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මේ තත්ත්වය යටතේ පහත ප්‍රශ්නවලට මා පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

[ගරු (සුජාත) අතුරලියේ රතන හිමි]

1. 2010 සිට 2015 දක්වාම ලබා ගත් ණය වෙන් වෙන් වශයෙන් ඒකපාර්ශ්වික හා බහුපාර්ශ්වික ලෙස කෙතරම් ප්‍රමාණයක් වන්නේද?
2. 2015 සිට 2019 දක්වා ගත් ණය ඒක පාර්ශ්වික හා බහුපාර්ශ්වික ලෙස කුමන ව්‍යාපෘතියකට ලබා ගත්තේද?
3. වාණිජ ණය ලෙස ලබා ගත් ණයවල පොලී අනුපාත කවරේද? 2015 සිට 2019 දක්වා ගත් ණයවල ප්‍රමාණය කොතරම්ද? එමෙන්ම සාපේක්ෂව පෙර ආණ්ඩුවට වඩා 2015 ආණ්ඩුව ගත් ණයවල පරතරය කොතරම්ද? කළ ව්‍යාපෘති මොනවාද?
4. දැනට ගෙවා ඇති ණය ප්‍රමාණය කොතරම්ද?
5. වාර්ෂිකව ගෙවීමට නියමිත ණය වෙන් වෙන් වශයෙන් මේ සභාවට දන්වන්නේද?
6. ණය ගැනීමට අමතරව, ණය ගැනීමෙන් පරිබාහිරව රටේ අර්බුදය විසඳීම සඳහා රජයට ඇති විසඳුම කුමක්ද?

ඒ කියන්නේ, දැන් රජයේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ ණය ගැනීම විතරයි. ඒ හැර වෙන කිසිම දෙයක් නැද්ද?

මෙම ප්‍රශ්නවලට මම පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රතන ස්වාමීන් වහන්සේගේ ප්‍රශ්නය පිළිබඳව, ජාතික සංවර්ධන සැලැස්ම සකස් කිරීම පිළිබඳව දීර්ඝ පිළිතුරක් ලබා දිය යුතුයි. හැබැයි ඉතා ම සරලව කිව්වොත්, රාජ්‍ය ණය පිළිබඳව කථා කළොත්, ඔව්, අපට ණය අර්බුදයක් තිබුණා. ඒ නිසා දළ ජාතික නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 128ක් වුණා, 2022 වර්ෂය වෙද්දී අපේ ණය ප්‍රමාණය. දළ ජාතික නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 34ක් අපි ණය ගෙවිය යුතුව තිබුණා, එක වර්ෂයකට. එතැනදී තමයි අපි මේ අර්බුදයට මුහුණ දුන්නේ. හැබැයි, දළ ජාතික නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 128ක් වෙච්ච මුළු ණය තොගය 2031දී සියයට 95ක් දක්වා අඩු කිරීමට අවශ්‍ය කටයුතු අපි දැන් ක්‍රමානුකූලව කරගෙන යනවා. ඊට අමතරව දළ ජාතික නිෂ්පාදිතයට සාපේක්ෂව වාර්ෂිකව ගෙවන්න තිබුණු සියයට 34ක ප්‍රමාණය, සියයට 13 දක්වා අඩු කරන්නත් කටයුතු කරගෙන යනවා. පසුගිය දා අපි රාජ්‍ය ණය කළමනාකරණ පනත ගෙනාවේ මේකට පූර්ණ කාලීන විසඳුමක් හැටියටයි. යම් කිසි ණයක් ගන්නවා නම් එහි ණය වියදම කුමක්ද, ලෝකයේ තිබෙන තත්ත්වය කුමක්ද, එහි තිබෙන ඵලදායීතාව කුමක්ද, එහි තිබෙන අනුපිළිවෙළ කුමක්ද කියන දේවල් පිළිබඳව සුවිශේෂී වගකීමක් ඇතුව රාජ්‍ය ණය ලබා ගැනීම මේ පනතෙන් පාලනය වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා ණය සම්බන්ධව රජය මේ වන විට නැවත එවැනි අර්බුද ඇති නොවන ආකාරයට කෙටි කාලීන සහ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළ දැනටමත් ක්‍රියාත්මක කරලා තිබෙනවා. මා ඉදිරියේදී ජාතික සංවර්ධන සැලැස්ම පිළිබඳව විස්තරාත්මක ප්‍රකාශයක් කරන්න බලාපොරොත්තු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අමාත්‍යාංශ නිවේදනය, මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා.

විශ්‍රාම වැටුප් විෂමතා විසඳීම සහ වැඩිහිටියන් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමයක්: මුදල් රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

ஓய்வூதிய முரண்பாடுகளுக்குத் தீர்வும் முதியோருக்கான சமூகப் பாதுகாப்பு முறைமையும்: நிதி இராஜாங்க அமைச்சரினது கூற்று

RESOLUTION OF PENSION ANOMALIES AND SOCIAL SECURITY SYSTEM FOR ELDERS: STATEMENT BY STATE MINISTER OF FINANCE

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු විපක්ෂ නායකතුමා විසින් 2024.07.09වැනි දින අසන ලද ප්‍රශ්නය සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම පිළිතුරු ලබා දෙනවා.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කර ඇති පරිදි උපත් අනුපාතය අඩු වීම, මරණ අනුපාතය වැඩි වීම හා ක්ෂුද්‍ර සංක්‍රමණ වැඩි වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන වේගය මේ වන විට අඩු වෙමින් පවතින බව මහ බැංකු වාර්ෂික වාර්තාව සඳහන් කර ඇත. ඒ අනුව 2023 වර්ෂයේදී වයස අවුරුදු 60ට හා ඊට වැඩි ජනගහනය මිලියන 2.7ක් වන අතර, ඉන් මිලියන 1.5ක් කාන්තාවන් වන අතර මිලියන 1.2ක් පිරිමි අය වේ. මේ සම්බන්ධයෙන් විස්තරාත්මක කරුණු ඇතුළත් ඇමුණුමක් තිබෙනවා. මෙම ප්‍රජාවගෙන් අවුරුදු 70ට වැඩි, දරිද්‍රතා මට්ටමින් පහළ ජීවත් වන වැඩිහිටියන් 708,952ක් සඳහා අස්වැසුම් ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ. ඊට අමතරව වැඩිහිටි දීමනාව ලෙස රුපියල් 3,000ක් මේ වන විට ලබා දෙනු ලැබේ. එය 505,210ක් සඳහාය. ඒ අතර වසර 100ට වඩා වැඩි වැඩිහිටියන් 495දෙනෙක් ද සිටින බව ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය ප්‍රකාශ කරයි. ඒ කියන්නේ, වයස අවුරුදු 100ට වැඩි 495දෙනෙකුටත් මේ ආධාර ලැබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

වසර 10කට වරක් සිදු කළ යුතු ජන හා නිවාස සංගණනය මඟින් වැඩිහිටියන් පිළිබඳව නිවැරදි තොරතුරු ලබා ගැනීමේ හැකියාව පැවතියද, එය නියමිත කාල වකවානුව තුළ පැවැත්වීමට නොහැකි වීම එම තොරතුරු ලබා ගැනීමට ගැටලුවක්ව ඇත. එම සංගණනය නියමිත කාලයේදී පැවැත්වීමට නොහැකි වීම සඳහා බලපෑ හේතු පිළිබඳව සාරාංශයක් ඇමුණුම 2හි තිබෙනවා. නමුත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියනවා, මේ වර්ෂය අවසාන වනකොට සම්පූර්ණ වාර්තාවක් දෙන්න ඔවුන් සූදානම් කියලා.

වර්තමානය වන විට මෙරට සිටින සමස්ත රාජ්‍ය විශ්‍රාමික ප්‍රජාව පුද්ගලයන් 730,000ක් පමණ වේ. මෙම සංඛ්‍යාව 2030 වර්ෂය වන විට 900,000ක් පමණ හා 2025 වර්ෂය වන විට මිලියනයක් ඉක්මවනු ඇති බවට ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව දැනට සිටින විශ්‍රාමිකයන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමට රජය විසින් රුපියල් බිලියන 402ක් පමණ වාර්ෂිකව වෙන් කර ඇත. එමෙන්ම විශ්‍රාමිකයන්ගේ ජීවන වියදම් දීමනාව 2024 අප්‍රේල් මස සිට රුපියල් 2,500ක මුදලකින් වැඩි කර ඇත.

ඒ අනුව ජීවන වියදම් දීමනාව ලෙස රුපියල් 6,025ක් -රුපියල් 3,525ක මුදල සහ රුපියල් 2,500හි එකතුවක් ලෙස- ගෙවනු ලැබේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සැලසුම් කළ ආදායම අඩු වී උද්ධමනය පාලනය සඳහා කළ පොලී වැඩිවීම බලපා රටේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් සියලු ණය ගැනුම්කරුවන් යම් අපහසුතාවකට පත්ව ඇති බවත්, මේ වන විට රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය ප්‍රතිපත්ති මත මෙම වාතාවරණය ක්‍රමක්‍රමයෙන් සමනය වනු ඇති බවත් සඳහන් කරන අතර, කෙසේ වෙතත් තවදුරටත් මෙම තත්ත්වය කළමනාකරණය කර ගැනීම සඳහා යම් සහනදායී ක්‍රමවේද හඳුන්වා දීමට දැනටමත් පියවර ගෙන ඇති අතර, ඉදිරි අය වැයවලදී රජයේ අවධානය මේ කෙරෙහි තවදුරටත් යොමු කරනු ලබන බවත් සඳහන් කරමි.

ණය පොලී අනුපාතය පෙර පැවතියේ සියයට 27ත්, 30ත් අතර වුවද, වර්තමානයේ ණය පොලී අනුපාතය සියයට 9ක් දක්වා තනි ඉලක්කමකට අඩු වී ඇති බැවින් අලුතින්ම ණය ගන්නා අයෙකුට මෙමඟින් සහනයක් හිමිව ඇත.

රජය විසින් ක්‍රියාත්මක කරන ලද ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පතු සඳහා විශේෂ පොලී අනුපාතයක් ලබා දීමේ වැඩසටහන යටතේ සියයට 15ක ස්ථාවර තැන්පතු පොලී අනුපාතය හා වෙළෙඳ පොළේ ස්ථාවර තැන්පතු පොලී අනුපාතය අතර වෙනස අදාළ බැංකුවට ප්‍රතිපූරණය කරන ලදී. ඒ, මීට පෙර. 2015 වසරේ සිට 2024 අප්‍රේල් 30 දක්වා පොලී සහනාධාර ලෙස බැංකුව වෙත භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූරණය කර ඇති මුදල රුපියල් මිලියන 151,330ක් පමණ වේ. එසේම බැංකුව වෙත ප්‍රතිපූරණය කිරීමට ඇති හිඟ මුදල රුපියල් මිලියන 88,709ක් පමණ වේ. 2022 වසරේ දී වෙළෙඳ පොළ ස්ථාවර තැන්පතු පොලී අනුපාතය සියයට 15කට වඩා වැඩි මට්ටමකින් පැවති නිසාත්, එම කාලයේ රජයේ මූල්‍ය තත්ත්වයේ පැවති අහිතකර බලපෑම් පිළිබඳවත් සලකා බලා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම 2022 ඔක්තෝබර් පළමු දින අත්හිටුවන ලදී. වර්තමානයේ පවතින මූල්‍ය තත්ත්වය පිළිබඳව හා මෙතෙක් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳව නිසි අධ්‍යයනයක් සිදු කර ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වඩාත් සුදුසු වැඩසටහනක් ක්‍රියාත්මක කරනවාද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් පසු ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට අපේක්ෂා කරන බව මෙම ගරු සභාවට දැන්වීමට කැමැත්තෙමි.

සේවක අර්ථසාධක අරමුදල රජයේ සුරැකුම්පත්වල කර ඇති ආයෝජන නිසා මේ වන විට අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභීන් සඳහා සියයට 13ක පොලියක් ගෙවනු ලැබේ. නමුත්, සියයට 9ක පොලිය ගෙවන විට -විශේෂයෙන් දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ අවස්ථාවේ- සමහරුන් එම පොලී මුදල ගෙවීමට අපහසු වන බවට ප්‍රචාරය කිරීම නිසා අර්ථසාධක අරමුදලේ සමහර ප්‍රතිලාභීන් තමන්ට හිමි අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ කොටස ලබා ගෙන වෙනත් බැංකුවල තැන්පත් කිරීම හේතුවෙන් සියයට 13ක් වූ මෙම ප්‍රතිලාභය අද ලබා ගැනීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇත.

බදු පැහැර හැරීම වළක්වාලීම සඳහා පොලිය මත රඳවා ගැනීමේ බද්ද ක්‍රියාත්මක කිරීම සිදු විය. ඒ තුළින් සැබෑ බදු බැඳියාවක් නොමැති අඩු ආදායමක් ගන්නා අයට අපහසුතාවක් ඇති බව පිළිගත යුතුය. එහෙත් පැහැදිලිවම එවැනි අයට රඳවා ගත් බදු මුදල ආපසු ගෙවිය යුතුය. එමෙන්ම ඔවුන් සඳහා කාර්තුමය වශයෙන් රඳවා ගත් බදු මුදල් ආපසු ගෙවීමට නීතිමය පසුබිමක් සලසා ඇත. එහෙත්, එහි ඇති සංකීර්ණත්වය සරල කර ගත යුතුය.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ආපසු ගෙවීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර සාමාන්‍යයෙන් ආපසු ගෙවීමේ ක්‍රමවේදයට පරිබාහිරව නමුත්, දේශීය ආදායම් පනතට අනුකූලව විශේෂිත හා සරල ක්‍රමවේදයක් දැනට ක්‍රියාත්මක කර ඇත. එම ක්‍රමවේදය යටතේ 2024.06.30 දින වන විට ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගෙන් අයදුම්පත් 5,433ක් ලැබී ඇති අතර, ඉන් අයදුම්පත් 911කට ආපසු ගෙවීම් කර ඇත. නමුත්, මේ වැඩ පිළිවෙළ තවදුරටත් සරල කළ යුතු බව මම පිළිගන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සඳහා නීතිමය රාමුව තුළ වඩාත් හොඳ ක්‍රමවේද අපි හොයාගෙන යනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිතිපතා මේ ගැන සාකච්ඡා කරලා, යම් උත්සාහයක් ගන්නවා.

විශ්‍රාම වැටුප් විෂමතාවක් ඇති බව පිළිගත යුතුය. දැනට ජනාධිපතිතුමා විසින් ජාතික වැටුප් කොමිසමක් පත් කර ඇති අතර, එම කමිටුව විසින් අවශ්‍ය ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙසට පොදුවේ සියලු ආයතන හා පුද්ගලයන් වෙත දැන්වීමක් නිකුත් කර ඇත. එබැවින්, මෙම ගැටලුව ද එම කමිටුව වෙත ඉදිරිපත් කර විසඳුම් ලබා ගත හැකි බව දන්වා සිටිමි. කමිටුවේ ඉලක්කය 2025 වර්ෂයට නියමිත අය වැයේ දී මෙවැනි විෂමතා සඳහා හැකි උපරිම විසඳුම් පුළුල් පරාසයක් තුළ ලබා දීමයි.

දැනට දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් මෙරට තුළ ක්‍රියාත්මක නොවේ. පෙර අවස්ථාවක රාජ්‍ය සේවකයන් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කළ ද, ඉදිරිපත් වූ දැඩි විරෝධතා හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීමට අපහසු තත්ත්වයක් මතු විය.

යෝජිත පරිදි තිරසර විශ්‍රාම වැටුප් ක්‍රමයක් යටතේ සෑමට විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඉදිරියේදී හඳුන්වා දීම පුළුල් හා විධිමත් අධ්‍යයනයකින් පසුව සිදු කළ යුතු බව විශ්වාස කරමි. කෙසේ වෙතත් ඉතා අසීරු මූල්‍ය කළමනාකරණයක් තුළ විශ්‍රාමික වැඩිහිටි ප්‍රජාව පමණක් නොව මේ රටේ සමස්ත ප්‍රජාව අපහසුතාවට පත් වූ තැනක සිට රජය අඩියෙන් අඩිය ඔවුන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කරමින් ඉදිරියට ගෙන යන බව අප පිළිගත යුතුය. රජය එතෙක් රුපියල් බිලියන 65ක් පමණ වූ සහනාධාරය රුපියල් බිලියන 210ක් දක්වා පුළුල් කළේත්, මාසික පඩිය ගෙවා ගත නොහැකි වූ රටේ මාසික පඩිය රුපියල් 10,000කින් වැඩි කළේත්, විශ්‍රාමික දීමනා මාසිකව රුපියල් 2,500කින් වැඩි කළේත්, අහස උසට බඩු මිල ගෙන ගිය සියයට 90ක් වූ උද්ධමනය ඍණ අගයකට ගෙනාවේත්, සියයට 30ක් ඉක්ම වූ බැංකු පොලිය සියයට 10ක අගයකට ගෙනාවේත් මේ ප්‍රශ්න සඳහා සමස්ත විසඳුමක් ලෙසය. තවත් කළ යුතු දේ බොහෝ ඇත. හුදෙක් ජනප්‍රියතාව පිණිස ඇති එකම ප්‍රශ්න පත්‍රයේ මුල "ණය පොලිය අඩු කරනු", එහි අග "තැන්පතු පොලිය වැඩි කරනු" වැනි සටන් පාඨ දිනපතා කියවීම නොව ප්‍රශ්න හඳුනාගෙන අනුපිළිවෙළින් විසඳුම් සෙවීමයි කළ යුත්තේ. මෙහිදී ඉදිරියේදී ලැබෙන පළමු අවස්ථාවේදීම විශ්‍රාමික ප්‍රජාව හා වැඩිහිටියන් පිළිබඳව වඩාත් අවධානය යොමු කිරීම රජය ඉතා වගකීමෙන් ඉටු කරනු ඇත. බොහොම ස්තුතියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් කර ගන්නට අවශ්‍යයි. ඔබතුමා අනුපිළිවෙළින් ප්‍රශ්න විසඳනවාය කිව්වාට ඔබතුමන්ලා බලයට ආපු හැටියේම, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බලයට ආපු හැටියේම 160,000ක් විතර ඉන්න විශ්‍රාමිකයන්ට ලැබෙන්න තිබුණු ඒ මුදල කප්පාදු කළා. අනුපිළිවෙළක් ගැන කථා කරන එක නොවෙයි කරන්න ඕනෑ. ඒ වරද නිවැරදි කර ගන්නට ඕනෑ.

අනෙක් කාරණාව මේකයි. මම ඔබතුමාගෙන් පුන පුනා ඇහුවා, සියයට 15ක පොලී අනුපාතයට විශ්‍රාමිකයන්ගේ තැන්පතුව ලබා දෙන එක ගැන. ඔබතුමා මේ ගරු සභාවේදී පුන පුනාම කිව්වා, ඒක කරනවාය කියලා. ඒක රජයේ ප්‍රතිපත්තියයි කියා කිව්වා. හැබැයි, ඒක ක්‍රියාත්මක වෙලා නැහැ. ඇයි, ඒක ක්‍රියාත්මක නොකරන්නේ?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඒ කරුණු දෙකට අමතරව මා විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න කැමතියි. ඔබතුමා අමනාප වෙන්න එපා, මම මෙහෙම කිව්වාට. ඔබතුමා බොහොම දියාරු උත්තර තමයි දුන්නේ. විශ්‍රාමිකයෝ ඒ සඳහා පැහැදිලි උත්තරයක් බලාපොරොත්තු වනවා. වර්තමානයේ විශ්‍රාමිකයන් බලාපොරොත්තු වනවා, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් 2020 වැටුප් තලයට ගළපයි කියලා. ඒකට ඔබතුමා පැහැදිලි උත්තරයක් දුන්නේත් නැහැ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ පිළිබඳව පැහැදිලි උත්තරයක් ලබා දෙන්න කියලා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දන්න විධියට නම් පැහැදිලි උත්තරයක් තමයි මා දුන්නේ. මොකද, විශ්‍රාම වැටුප් සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. නමුත්, එවැනි ප්‍රශ්නයක් විසඳීමේදී ඉතා ක්‍රමානුකූලව තවත් අලුත් ප්‍රශ්න ඇති නොවන ආකාරයට කටයුතු කිරීමට තමයි ජනාධිපතිතුමා කමිටුවක් පත් කරලා තිබෙන්නේ. අපි බලාපොරොත්තු වනවා, ඊළඟ අය වැයේදී මේ කටයුතු කරන්න. ඒ වාගේම මේ අයගේ ස්ථාවර තැන්පතු සඳහා ලබා දෙන බැංකු පොලිය වැඩි කිරීම සඳහාත් අපි කටයුතු සොයා බලමින් සිටිනවා. අපි මීට පෙර කරපු ප්‍රතිපූරණය සඳහාත් තව බිලියන 80ක් ගෙවන්න තිබෙනවා. අපි ඒ මුදල ගෙවමින් සිටිනවා. ඒ නිසා අපි දැන් හොයාගෙන යනවා, හැබෑවටම ප්‍රශ්නයක් තිබෙන, අඩු ආදායමක් ලබන, පොලී මුදලකින් ජීවත් වන අයට මේ සහනය ලබා දෙන්නේ කොහොමද කියලා. මොකද, සමහර අයගේ - ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙන්න පුළුවන් - ස්ථාවර තැන්පතුවේ වෙනත් අයගේ මුදලුත් තිබෙනවා. ඒ කියන්නේ, තවත් කෙනෙකුගේ මුදලුත් ස්ථාවර තැන්පතුවේ තිබෙනවා. ඒ නිසා අවශ්‍ය කෙනා නිශ්චිතවම තෝරාගෙන රජය යම්කිසි මුදලක් මේ වෙලාවේදී ඒ අය වෙනුවෙන් යොදන්නේ කොහොමද කියන එක ගැන විශේෂයෙන්ම සොයා බලන්න ඕනෑ. මේක ඇත්තටම ප්‍රශ්නයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ලොකු ගැටලුවක ඉන්නවා. රජයේ මූලික වියදම් සහ ආදායම් අතර පරතරය ගත්තොත්, වියදම්වලට වැඩියෙන් ආදායම් පවත්වා ගැනීමට මේ මූල්‍ය කළමනාකරණය තුළ අපි හැම විටම බැඳී ඉන්නවා. ඒ, මේ කවුරුවත් වෙනුවෙන් නොවෙයි, මේ රට වෙනුවෙන්.

මම විපක්ෂ නායකතුමාගෙන් අහන්න කැමැතියි, ඒ කිසිවක් නොසලකා - ප්‍රාථමික ගිණුමේ හිඟය නොසලකා - මෙවැනි වියදම් කරන්න ඔබතුමා යම් අවස්ථාවක සූදානම්ද කියලා. අපි ඒ ගැටලුවේයි ඉන්නේ. ඒ ගැටලුවට අමතරව අලුතෙන් ප්‍රශ්න ඇති කරන්නේ නැතිව අපි කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා තමයි මම කිව්වේ, අපට ලැබෙන ඊළඟ පළමු අවස්ථාවේදී විශ්‍රාමික වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් ඉදිරියට කළ යුතු සියල්ල කරන්න රජය සූදානම් කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

වරප්‍රසාද: ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරු පත් කිරීම සම්බන්ධයෙන් නිකුත් කළ අතුරු තහනම් නියෝගය

சிறப்புரிமை: உயர் நீதிமன்றத்துக்கு நீதிபதிகளை நியமிப்பது தொடர்பான இடைக்கால தடை உத்தரவு

PRIVILEGE: INTERIM ORDER ISSUED ON APPOINTMENT OF JUDGES TO SUPREME COURT

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණයේ බලතල අකර්මණ්‍ය කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දී ඇති නියෝගයක් හේතුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය වීමට අදාළ කාරණයයි මා ඉදිරිපත් කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024.06.18 දින මා විසින් ඉහත සඳහන් උද්ධෘතය සහිතව ඉදිරිපත් කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය 2024.07.09වන දින සාකච්ඡාවට භාජන වී තිබුණි.

විශේෂයෙන්ම ගරු අගවිනිසුරුතුමා විසින් 2024 ජූනි මස 19වන දින පාර්ලිමේන්තුව තුළදී මා විසින් ඉදිරිපත් කරන ලද වරප්‍රසාද ප්‍රශ්නයට පිළිතුරක් ලෙස ගරු අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද පිළිතුරු ප්‍රකාශයට අදාළව සභාව කරන ලද කරුණු ගණනාවක් සඳහා පිළිතුරු ලෙස ගරු කථානායකතුමා අමතමින් එවන ලද ලිපියක් සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබන ලදී. එම ලිපිය කියවා බැලීමේදී එම ලිපිය මඟින් ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේ සඳහන් කළ යම් කරුණු කිහිපයකට අදාළව ගෙන ඇති පියවර පිළිබඳව පැහැදිලි කිරීම් කිහිපයක් දක්වා තිබුණි. නමුත්, මා විසින් මතු කරන ලද වරප්‍රසාද ප්‍රශ්නයට අදාළව තේරීම් කාරක සභාවක් පත් කරන ලෙස කරන ලද ඉල්ලීමට මේ වනතුරු ඔබතුමාගෙන් ප්‍රතිචාරයක් ලැබී නොතිබුණි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉල්ලුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරුන් පත් කිරීමේ ක්‍රියාවලිය නැවැත්වීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ගෙන ඇති අතුරු තහනම් නියෝගය අපේ පාර්ලිමේන්තුවෙන්, මේ සියලුදෙනාගේත් බලතල අහිමි කිරීමක් නිසා, ඒකට විරුද්ධව ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද කියා පැහැදිලි කරන ලෙසයි. හැබැයි, ඒ ගැන මේ වනතුරු මුකුත් කියලා නැහැ.

නමුත්, මා මතු කළ කරුණු පිළිබඳව ගරු අගවිනිසුරුතුමන්ගේ පිළිතුරු ලිපියේ දෙවන පිටුවේ හතරවන ඡේදයේ යම් සඳහනක්කොට තිබේ. ඒ අනුව එම ඡේදයේ කරුණු මා කියවීමට අවසරය පතමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මෙන්න මේ විධියට කියනවා, "ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩු දෙක පිළිවෙළින්, 2023 නොවැම්බර් මස 15වන දින සහ 2024 මාර්තු මස 01වන දින ඇති වූ අතර, 2023 නොවැම්බර් මස 15වන දින පුරප්පාඩු පිරවීම පිළිබඳව ඇති වූ තත්ත්වය හමුවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු කටයුත්තක් ආරම්භව ඇත. එකී නඩු කටයුත්තට අදාළ අතුරු නියෝගය 2024.04.30 දින නිකුත් කර ඇති අතර, එදින තෙක් ශ්‍රේෂ්ඨාධිකරණයේ වූ අනෙකුත් පුරප්පාඩුව පිරවීම සඳහා කිසිදු නෛතික බාධාවක් හෝ අපහසුතාවක් නොතිබුණි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි ගරු අගවිනිසුරුතුමා සඳහන් කරන්නේ නැහැ, 2024.04.30වන දායින් පස්සේ මේ පත් කිරීම් කරන්න බැරි වුණා කියන එක. එතුමා කියන්නේ මේ දවස වෙනකම් මුකුත් ප්‍රශ්නයක් තිබුණේ නැහැ කියායි. දැන් අපට තිබෙන ප්‍රශ්නය මෙයයි. 2024.04.30වන දායින් පස්සේ මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරු පත් කරන්න බැහැ. දැනට පුරප්පාඩු දෙකක් තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග කරන්න දැනට ඉතිරි වූ නඩු 5,432ක් තිබෙනවා. අපි මේ නඩු ප්‍රමාදය ගැන කථා කරනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබෙන මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මම මතු කරපු කාරණය පිළිබඳව එතුමා මුකුත් කියන්නේ නැහැ.

මේ කරුණු මත මා විසින් මතු කළ වරප්‍රසාද ප්‍රශ්නය යටපත් කර ඇත. එමඟින් ප්‍රකාශ කරනු ලබන්නේ මා විසින් මතු කළ අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදය අත්හිටුවීමට රටේ ශ්‍රේෂ්ඨාධිකරණය කටයුතු කිරීම දිගින් දිගටම සිදුව ඇති බවයි. එසේම අනෙක් අතට ගරු අගවිනිසුරුතුමන් විසින් අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ භාෂණයේ නිදහස පාලනය කිරීමට අප විසින් සාදාගෙන තිබෙන ස්ථාවර නියෝග 91 (ඊ) වගන්තිය හුවා දක්වමින් අපගේ භාෂණයේ නිදහස සීමා කිරීමට සියුම් ලෙස උත්සාහ කරන බවක් පෙනී යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එයින් අදහස් කරන්නේ ස්ථාවර නියෝග යටතේ අධිකරණයේ විභාග වන ක්‍රියාවලියක් සම්බන්ධව කථා කිරීම යම්කිසි විධියකින් අපි විසින්ම අත්හිටුවා තිබෙනවා කියන එකයි. ගරු අග්‍ර විනිශ්චයකාරතුමා ඒක පාවිච්චි කරනවා, එතුමන්ලා විසින් කරලා තිබෙන වැරැද්ද වසා ගැනීම සඳහා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මේ නඩුව එන්නේ අභියාචනාධිකරණයේ සභාපති නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කරන්න යනකොට. ගරු අග්‍ර විනිශ්චයකාරතුමා එතුමාව යෝජනා කරනවා. අග්‍ර විනිශ්චයකාරතුමා යෝජනා කරන නම ගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට එවනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මේ ගැන සාකච්ඡා කරලා ඒගොල්ලන් මේකට විරෝධතාව පළ කරනවා. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඉ.(4) අනුව්‍යවස්ථාව යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට තිබෙන අයිතිවාසිකමක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ගරු විපක්ෂ නායකතුමාත් ඉන්නවා; අගමැතිතුමාත් ඉන්නවා; ජනාධිපතිතුමාගේ නියෝජිතයෙක් විධියට කැබිනට් ඇමතිවරයෙක් ඉන්නවා. එහි සභාපතිතුමා විධියට වැඩ කරන්නේ ගරු කථානායකතුමා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගන්නා වූ තීන්දුව ඒගොල්ලන්ට ඕනෑ විධියකට ගන්න පුළුවන්. ඒකට කැමති වෙන්නත් පුළුවන්, අකැමති වෙන්නත් පුළුවන්. ජනාධිපතිතුමා එවන හැම එකක්ම අනුමත කරන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන්නේ මුද්‍රාව තියන තැනක් නොවෙයි. ජනාධිපතිතුමා කියන හැම එකකටම අත ඔසවන්න නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් තිබෙන්න ඕනෑද? එහෙම නම් ඉස්සර තිබුණා වාගේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් නැතිව, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුවම යන්න. එතකොට ලේසියි. ජනාධිපතිතුමාට පුළුවන්, ඕනෑම කෙනෙක් පත් කරන්න. හොරු, මංකොල්ලකාරයෝ, මිනී මරුවෝ ඔක්කොම දාන්න පුළුවන්. එහෙම කරගෙන යන්න. ඒකට නොවෙයි, අපි මේක හැදුවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හදපු සංශෝධන යටතේ මේක සම්පූර්ණයෙන්ම වැරදියි. මේ නඩුව දාන්නේ කවුද? නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා අභියාචනාධිකරණයේ සභාපති ධුරය හොබවලා, එතුමාට දැන් ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න දෙන්නේ නැතිව ඒක දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් ප්‍රතික්ෂේප වුණා. නමුත්, මේ නඩුව පවරන්නේ කවුද? එතුමා නොවෙයි නඩුව පවරන්නේ. එතුමාට ප්‍රශ්නයක් වුණා නම් එතුමාට පුළුවන්, මානව හිමිකම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරන්න.

හැබැයි, මේ නඩුව පවරන්නේ සරිත් මහීපුත්‍ර පතිරත්න නීතිඥවරයා. එතුමා එජාප වෘත්තීයවේදීන්ගේ සංගමයේ ලේකම්. එතුමාගේ විවාහයට අත්සන් කළේ සාගල රත්නායක මහත්මයායි, රංගෙ බණ්ඩාර මහත්මයායි. සරිත් මහීපුත්‍ර පතිරත්න නීතිඥවරයා ගිහිල්ලා තමයි මේ නඩුව දාන්නේ. මේ නඩුවට පෙනී සිටින්නේ ෆයිසර් මුස්තාපා මැතිතුමා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිතුමා එවපු වැඩේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කරන්නේ නැහැ නේ. හරි, මම ඔයාලාට පාඩමක් උගන්වන්නම් කියලා, ඊළඟට කවුරු හරි ලවා නඩුවක් දම්මනවා. නඩුවක් දැම්මාම ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අතුරු තහනම් නියෝගයක් දෙනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මීට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයේ එක විනිශ්චයකාරවරයෙක්වත් පත් කරන්න අපි ඉඩ තියන්නේ නැහැයි කියලා කියනවා. අද ඒකෙන් වෙලා තිබෙන්නේ මොකක්ද? මේ වැඩ පිළිවෙළ තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට දීලා තිබෙන බලය සම්පූර්ණයෙන්ම නතර වෙලා තිබෙනවා. මේක තමයි මම ප්‍රශ්න කළේ. මොකද හේතුව, මේකෙන් අපට ප්‍රශ්න ගණනාවක් මතු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් බලන්න, තව කාරණයක්. මේ රටේ පොලිස්පතිතුමාව පත් කරන්න කියලා එව්වාම එතැන ප්‍රශ්නයක් ඇති වුණා. පොලිස්පති පත් කරන්න යාමේදී සමාන ඡන්දයක් ආවේ නැහැ. හතරදෙනෙක් පක්ෂයි, දෙදෙනෙක් විරුද්ධයි, තව දෙන්නෙක් ඡන්දය දීමෙන් වැළකී සිටියා. එතැන සමාන ඡන්දයක් නැහැ. හැබැයි, කථානායකතුමා ඡන්දයක් දීලා ඇරියා. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. ඒක කළේ මොකටද? ජනාධිපතිතුමා එවපු නිසා. ඊළඟට, නීතිපති පත්කිරීම සම්බන්ධව එව්වා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඒක ප්‍රතික්ෂේප කළා. මොකක්ද ජනාධිපතිතුමා කළේ? නීතිපති පිළිබඳ කාරණය තව පාරක් එව්වා. ඒකත් ප්‍රතික්ෂේප වුණා. ඉතින් මෙහෙම වැඩ කරන්න පුළුවන් ද මේ රටේ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් හදලා තිබෙන්නේ මොකටද? එහෙම නම් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කරලා, ජනාධිපතිතුමාට කැමති විධියට කැමති කෙනෙක් පත් කරන්න කියලා යවන්න. එතකොට මේක ඉවරයි. මේ විනාශ කරන්නේ අපේ බලය.

දැනට උද්ගතව තිබෙන ප්‍රශ්නය වන්නේ, අප විසින් පනවාගෙන තිබෙන ස්ථාවර නියෝග මඟින් අපව පාලනය කරමින් උසාවියේ විභාග වන නඩුවක් සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීම අත්හිටුවීමට ඔබතුමාට ලැබී ඇති බලයක් වෙනත් කෙනෙකුට ලැබෙන්නේ කෙසේද යන්නයි. එය පැහැදිලිවම අධිකරණය විසින් ව්‍යවස්ථාදායකයට අතපෙවීමට දරන උත්සාහයක් බව මොනවට පැහැදිලි වේ.

ඒ කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමන්ලා කරපු යම් ක්‍රියාවලියක් සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ අපි කථා කිරීම නැවැත්වීමට අපේ ස්ථාවර නියෝග පාවිච්චි කරලා අපට කියලා දෙනවා, "ඔයාලා මේක ගැන කථා කරන්න එපා; අනෙක් එවා ගැන කථා කරගන්න" කියලා. මොකක්ද මේ කථාව?

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදී ඇති අතුරු තහනම් නියෝගය මඟින් දැනටමත් ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩු වී ඇති තනතුරු

[ගරු දයාසිරි ජයසේකර මහතා]

දෙකකට විනිසුරුවරුන් පත් කිරීමට රටේ ජනාධිපතිවරයාට හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඇති අයිතිය අත්හිටුවමින් දී තිබෙන තීරණය තවදුරටත් එසේම පවත්වා ගැනීමට ගරු කථානායකතුමා කටයුතු කරන්නේ ද?"

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ හිටියා කොන්ද පණ තිබ්බිච කථානායකවරු. අනුර බණ්ඩාරනායක මැතිතුමා පාර්ලිමේන්තුව පිළිගන්නේ නැති තීන්දුවක් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ආවාම, එතුමා ඒක අරගෙන වීසි කෙරුවා. ඒ නිසා මම අහන්නේ තවදුරටත් ඒ තීන්දුව මේ රටේ කථානායක පිළිගන්නවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන නිසා ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කෙටියෙන් ඉදිරිපත් කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඉක්මනින්ම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එසේ නොවේ නම් මෙම අතුරු තහනම් නියෝගයෙන් බැඳී නොසිට රටේ පළමු පුරවැසියා වන ගරු ජනාධිපතිවරයා ද, දෙවැනි පුරවැසියා වන ගරු අග්‍රාමාත්‍යතුමා ද, තෙවැනි පුරවැසියා වන ගරු කථානායකතුමා ද, රටේ හතරවැනි පුරවැසියා වන ගරු අගවිනිසුරුතුමා ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඉටු කළ යුතු වගකීම් ඉටු කිරීමෙන් වළක්වාලන ලද ඉහත අතුරු තහනම් නියෝගය නොසලකා ක්‍රියා කරනවා ද, නැත්නම් මා විසින් 2024.06.18 දරන දින ඉල්ලා සිටින ලද පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන්නේ ද, නැද්ද යන්න පිළිබඳව මෙම සභාවට දැනුම් දෙන ලෙස ගරු කථානායකතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

මොකද හේතුව, මේක තවදුරටත් පිළිගන්නවා කියන්නේ, මේ අතුරු තහනම් නියෝගයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බැඳෙනවා කියන්නේ, ගරු කථානායකතුමා ඇතුළු ඔබතුමන්ලාට තිබෙන බලය ඔබතුමන්ලා තව කාටහරි පාවා දෙනවා කියන එකයි. මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයට කරන්න පුළුවන් දේවල් තිබෙනවා; අපට කරන්න පුළුවන් දේවල් තිබෙනවා. ජනාධිපතිතුමාත් හැම වෙලාවේම කියන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයට කරන්න තිබෙන දේවල් දෙන්න; පාර්ලිමේන්තුවට කරන්න තිබෙන දේවල් ආරක්ෂා කරගන්න කියලායි. ඒක ආරක්ෂා කර ගන්න නම් මේ තීන්දුව අල්ලලා වීසි කරලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විධියට ඔබතුමන්ලා ගන්නා තීන්දුව ඔබතුමන්ලා ගන්න කියලායි අපි ඉල්ලන්නේ.

දිගින් දිගටම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය වීමට ඉඩ දෙමින් නිහඬව බලා සිටින්නට නොහැකි වන නිසාත්, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා ලෙස ගරු කථානායකතුමාගේ බලයට අතපෙවීමට දරන උත්සාහයට විරුද්ධ වන බැවිනුත්, මා මෙම වරප්‍රසාද ප්‍රශ්නය මතු කරමි. එබැවින්, මේ වරප්‍රසාද ප්‍රශ්නය වරප්‍රසාද කමිටුවට ඉදිරිපත් කර, මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලා මේ තීන්දුව ගන්න. වරප්‍රසාද කමිටුවට කැඳවලා මේ ගැන කථා කරන්න අවශ්‍යද කියලා කථා කරගෙන, විශේෂ කාරක සභාවක් පත් කරන්න. අපි ඒ විශේෂ කාරක සභාවට විනිශ්චයකාරතුමන්ලා ගෙනැල්ලා කථා කරමු. මොකද, මේක විසඳා ගන්න ඕනෑ කාරණයක්. නැත්නම් මේ රටේ විනිශ්චයකාරවරුන් හැටියට කවුරුත් නම් කරන්න අග්‍රවිනිශ්චයකාරතුමාට හැකියාවක් නැහැ. ජනාධිපතිවරයාට හැකියාවක් නැහැ. අපට තේරෙන විධියට එතුමා විසින්ම එතුමාගේ පක්ෂයේම එක්කෙනෙක් දමාගෙන අතුරු තහනම් නියෝගයක් අරගෙන, වැඩේ ඉවර කරගෙන තිබෙන්නේ. මට දෙන්න බැරි නම්, මම නුඹලට දෙන්නෙත් නැහැ කියලා තමයි මේ වැඩේ කරලා තිබෙන්නේ. මේ වාගේ ඒවා තමයි දැන් කරන්නේ.

ඊළඟට, දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? මැතිවරණය පවත්වන්න හැදුවා. මැතිවරණය පවත්වන්න හැදුවාම ඒ සම්බන්ධව විවිධ ප්‍රශ්න ගණනාවක් මතු වුණා. ඊටපස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණයට ගියේ කවුද කියලා අපි දන්නවා. පාලිත රංගෙ බණ්ඩාර මහත්මයා කිව්වා, ජනාධිපතිවරයාට අවුරුදු හයක් තිබෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය,-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට විනාඩියක් දෙන්න. හැබැයි, ඒ ඔක්කොම තිබියදී දැන් ජනාධිපතිතුමා කියනවා, "නැහැ, නැහැ ඒ ඔක්කොම ඉවර කරනවා. මම තමයි මේක කරන්නේ" කියලා. ගරු සභානායකතුමනි, එතුමා දැන් කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ගේනවා. ඒ නිසා අපේ බලය විනාශ කර ගන්න ලැහැස්ති වෙන්න එපා කියන ඉල්ලීමත් කරමින්, කරුණාකරලා මේකට පිළිතුරක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයේ වැටුප් වර්ධක සහ පිහිටුවීම් පිළිබඳ යම් සාකච්ඡාවක් තිබිලා නිර්දේශ ලබා දීලා තිබෙනවා. නමුත්, එතැනදී ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නිර්දේශ දීලා නැහැ ලු, ගරු මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ආ, නිර්දේශ දීලා නැහැ. සාකච්ඡාවන් සිදු වෙලා තිබෙනවා. නිර්දේශයක් නොවෙයි තිබෙන්නේ. එහෙම නේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
නමුත්, එතැනදී සාකච්ඡා වෙමින් තිබෙන සමහර කරුණු අනුව යම් අසාධාරණයක් සිද්ධ වෙමින් තිබෙනවා කියලා සමහර සේවක මහත්වරුන්ගෙන් අදහසක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ ගැන සැලකිල්ලට ලක් කරන්න කියලා තමයි මම කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ ගැන අවධානය යොමු කරන්නම්.

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම, ගරු සභානායකතුමා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 10.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකාවේ යෝජිත 'ව්‍යාපාර සූදානම් (B-READY) දර්ශකය' සඳහා සූදානම් වීමේදී මතු වන ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව
இலங்கையில் முன்மொழியப்பட்ட “வணிக தொழில்முயற்சிகளுக்கான தயார்நிலை (B-READY) சுட்டெண்” பற்றிய தயார்படுத்தல் தொடர்பில் எழுந்துள்ள நடைமுறைச் சிக்கல்களையும் சிரமங்களையும் ஆய்வுசெய்வதற்கும் அது தொடர்பில் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு
SELECT COMMITTEE TO STUDY THE PRACTICAL PROBLEMS AND DIFFICULTIES IN RELATION TO PREPARATION FOR THE PROPOSED "BUSINESS READY (B-READY) INDEX" IN SRI LANKA AND MAKE ITS PROPOSALS AND RECOMMENDATIONS

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"යෝජිත `ව්‍යාපාර සූදානම් (B-READY) දර්ශකය' සඳහා ශ්‍රී ලංකාව සූදානම් වීමේ දී මතු වන ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2024 ජූනි 20 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබාදී ඇති කාලසීමාව, 2024 අගෝස්තු 22 දින දක්වා දීර්ඝ කළ යුතුය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සෙසු අදාළ නීති මඟින් පනවා ඇති පරිදි ජනාධිපතිවරණය පැවැත්වීම

அரசியலமைப்பு மற்றும் இதர ஏற்புடைய சட்டங்கள்மூலம் பரிந்துரைக்கப்பட்டவாறு ஜனாதிபதித் தேர்தலை நடத்துதல்

HOLDING OF PRESIDENTIAL ELECTION AS PRESCRIBED BY CONSTITUTION AND OTHER APPLICABLE LAWS

[පූ.භා. 11.45]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සෙසු අදාළ නීති මඟින් අවශ්‍ය බවට පනවා ඇති පරිදි 2024 සැප්තැම්බර් මස 17 දින සිට ඔක්තෝබර් මස 17 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ජනාධිපතිවරණය පැවැත්විය යුතු බවට මෙම සභාව යෝජනා සම්මත කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැලූ බැල්මට මෙහෙම යෝජනාවක් අවශ්‍ය වෙන්නේ නැහැ. ඇයි? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතා පැහැදිලිවත්, ඊට අනුරූපී වන පරිදි සකස් කරලා තිබෙන නීතිවල ඉතා පැහැදිලිවත් සඳහන් වන ආකාරයට, ජනාධිපතිවරණය 2024 සැප්තැම්බර් මාසයේ 17වැනි දාත් ඔක්තෝබර් මාසයේ 17වැනි දාත් අතර පැවැත්විය යුතුයි. ඒ නිසා මම හිතන විධියට අපි විශේෂ යෝජනා සම්මත කිරීමක් අවශ්‍ය වෙන්නේ නැහැ. ජූලි 17වැනි දා වෙනකොට මැතිවරණ කොමිසමට බලය එනවා. හැබැයි, පාර්ලිමේන්තුවට මෙවැනි යෝජනාවක් ගෙන එන්න සිදු වෙන්නේ රට තුළ, පොදුවේ ජනතාව තුළ ජනාධිපතිවරණය පිළිබඳව විශාල ව්‍යාකූලත්වයක්, සැකයක් නිර්මාණය වෙලා තිබෙන නිසායි. ඒක ඇති වුණේ අද ඊයේ නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පළාත් පාලන මැතිවරණය කල් දැම්මා මතක ඇති. පළාත් සභා මැතිවරණය අවුරුදු පහකට ආසන්න කාලයක් තිස්සේ නැහැ. ඒ නිසා ජනතාව අතර මතයක් තිබෙනවා, පළාත් පාලන මැතිවරණයත් නැත්නම්, පළාත් සභා මැතිවරණයත් නැත්නම්, ජනාධිපතිවරයා මේ ජනාධිපතිවරණයටත් මොකක් හෝ වෙට්ටුවක් දමයි කියලා.

හැබැයි, අපි කවුරුත් දන්නවා, පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයෝ නැත්නම් කොමසාරිස්වරයෙක් යටතේ ඒවා පාලනය කළ හැකි බව. පළාත් සභාවක් නැත්නම් ආණ්ඩුකාරවරයා හරහා එය පාලනය කළ හැකියි. හැබැයි, ජනාධිපතිවරයෙක් නැත්නම් ආණ්ඩුවකුත් නැහැ. මොකද, කැබිනට් මණ්ඩලයේ මූලාසනය හොබවන්නේ ජනාධිපතිවරයා.

ඒ නිසා නිශ්චිතව එතුමාගේ ධුර කාලය ඉක්මවා යාමට මාසයකට අඩු නොවන සහ මාස දෙකක් නොඉක්මවන කාලයක් තුළ ජනාධිපතිවරණය පැවැත්විය යුතු බව ඉතා පැහැදිලියි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අප එකඟ නොවන කුමන කරුණු තිබුණත්, එය පරිපූර්ණ ව්‍යවස්ථාවක්. එම නිසා ජනාධිපතිවරයාගේ ධුර කාලය දවසක්වත්, පැයක්වත් හිස් වන විධියට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කරලා නැහැ. එහෙම නම්, අනිවාර්යයෙන් ජනාධිපතිවරයෙක් අපේ රට තුළ සිටිය යුතුයි.

ඊළඟට, පැන නඟින ප්‍රශ්නය තමයි මේ ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5 ද, 6 ද කියන එක. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (2) ව්‍යවස්ථාවෙහි ඉතා පැහැදිලිව මෙසේ සඳහන් කර තිබෙනවා:

"ජනරජයේ ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරා පත්කර ගනු ලැබිය යුතු අතර පස් අවුරුදු කාලයක් ධුරය දරන්නේ ය."

ඒ අනුව, ජනාධිපතිවරයා තෝරා ගන්නේ ජනතාව විසින්. අවුරුදු 5ක කාල සීමාවක් තමයි ජනාධිපතිවරයාට තිබෙන්නේ. හැබැයි මෙතැන ප්‍රශ්නය පැන නඟින්නේ 83 (ආ) ව්‍යවස්ථාවෙන්. "30 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ නැතහොත් 62 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන සංශෝධනය කිරීම ...." යනාදි වශයෙන් සඳහන් කරමින් එහි තවදුරටත් සඳහන් කරනවා, අවස්ථාවෝචිත පරිදි ජනාධිපතිවරයාගේ ධුර කාලය සාවුරුද්දක් ඉක්මවා දීර්ඝ කරන්නේ නම් ජනමත විචාරණයක් අවශ්‍යයි කියලා.

රංගෙ බණ්ඩාර මහ ලේකම්වරයා ගමක තිබුණු රැස්වීමකදී කිව්වා මට මතකයි, ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5 ද, 6 ද කියලා ව්‍යවස්ථාමය ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා, ඒ නිසා ඒක විසඳීම සඳහා කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ගෙනැල්ලා තිබෙනවා කියලා. හැබැයි රංගෙ බණ්ඩාර මහ ලේකම්වරයා එහෙම කිව්වාම අමාත්‍යවරු කිව්වා, "නැහැ එහෙම කැබිනට් පත්‍රිකාවක් ගෙනාවේ නැහැ" කියලා. ඊට පස්සේ මොකද වුණේ? ඒ කියපු සඳුදා නොවෙයි ඊළඟ සඳුදා එවැනි කැබිනට් පත්‍රිකාවක් ආවා. එහෙම නම් හරි පැහැදිලියි, රංගෙ බණ්ඩාරත් නියෝජනය කරන යම් ස්ථානයක එවැනි සාකච්ඡාවක් සිදු වී තිබෙන බව. මොකද, රංගෙ බණ්ඩාර කැබිනට් අමාත්‍යවරයෙක් නොවෙයි. ඔහු එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්වරයා. හැබැයි ඔහු තමයි කියන්නේ මෙවැනි කැබිනට් පත්‍රිකාවක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ බව. හැබැයි අමාත්‍යවරු කියනවා, "නැහැ එහෙම එකක් ආවේ නැහැ" කියලා. එහෙම එකක් ආවේ ඊළඟ සඳුදා. ඒ කියන්නේ මොකක්ද? මාලිගාව ඇතුළේ කුමන්ත්‍රණයක් යමින් තිබෙනවා ඒ පිළිබඳව. වජිර මන්ත්‍රීතුමා, ඔබ අනිවාර්යයෙන් එතැන ඉන්නවාමයි. අනිවාර්යයෙන්ම ඉන්නවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දැනුත් ගෙනැල්ලා පෙන්වනවා මොකක් හරි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ඔව්, දැනුත් ගෙනැල්ලා පෙන්වනවා මොකක් හරි.

එතැන එහෙම සාකච්ඡාවක් ගියා. එතකොට රංගෙ බණ්ඩාරට සාකච්ඡා කළ ඒ කාරණය සංයමයකින් ආරක්ෂා කර ගන්න බැරිව ගියා; එය එළියට පැන්නා. එය රංගෙ බණ්ඩාරගෙන් පැන්නා. ඊට පස්සේ පසුගිය සඳුදා කැබිනට් මණ්ඩලයට නැවත ඒ පත්‍රිකාව ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකේ ඉතා පැහැදිලිව තිබෙන්නේ, " 'සාවුරුද්දක් ඉක්මවා' යන වචන වෙනුවට 'පස්

අවුරුද්දක් ඉක්මවා' යන වචන ආදේශ කිරීම මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 (ආ) ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිසංශෝධන පනත් කෙටුම්පතක් සකස් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී" කියලායි.

එතකොට ජනාධිපතිවරයා සංකල්ප යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5යි සහ 6යි කියලා තැන් දෙකක තිබෙනවා. ඒ නිසා ඒ 6 කියන තැනත් 5 කරන්න කියලා. ඕක නේ එහි තිබෙන්නේ? හැබැයි, එහෙම පටලැවිල්ලක් තිබෙන්නේ කාටද? ඒ ගැන මම දැන ගන්න කැමතියි. 5 ද, 6 ද කියන පටලැවිල්ල තිබෙන්නේ කාටද? කවර හෝ කෙනෙකුට එවැනි පටලැවිල්ලක් තිබෙනවාද?

අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය තිබෙන්නේ කැබිනට් මණ්ඩලයටත් නොවෙයි, මේ පාර්ලිමේන්තුවටත් නොවෙයි; ශ්‍රේෂ්ඨාධිකරණයට. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125වන ව්‍යවස්ථාවේ ඉතා පැහැදිලිව සඳහන් කොට තිබෙනවා, වෙනත් කවර තීන්දුවක්, වෙනත් අධිකරණයක කුමන තීන්දුවක් තිබුණත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයටයි කියලා. ශ්‍රේෂ්ඨාධිකරණය ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5 ද, 6 ද කියන ප්‍රශ්නය අවස්ථා තුනකදී විසඳා තිබෙනවා. මොනවාද ඒ? එක අවස්ථාවක් තමයි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අර්ථ නිරූපණයක් ඉල්ලනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125වන ව්‍යවස්ථාව ඉතා පැහැදිලියි. එහි මෙසේ සඳහන් වනවා:

> "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම පිළිබඳ යම් ප්‍රශ්නයක් විභාග කොට තීරණය කිරීම සඳහා තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේ ය."

එජිරටවත්, රනිල්ටවත්, රංගෙ බණ්ඩාරටවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය නැහැ. ඉතා පැහැදිලිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය තිබෙන්නේ කාටද? ශ්‍රේෂ්ඨාධිකරණයට. ශ්‍රේෂ්ඨාධිකරණයට ඒ ප්‍රශ්නය අවස්ථා තුනකදී ආවා. එකක් 2018 ජනවාරි මාසයේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයාට පැවරිලා තිබෙනවා, ව්‍යවස්ථාමය වශයෙන් යම් ගැටලුවක් තිබෙනවා නම් ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීම සඳහා වන බලයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா வினவப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. WEERASUMANA WEERASINGHE took the Chair.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යවස්ථාමය වශයෙන් යම් අපැහැදිලිකමක් තිබෙනවා නම්, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මතය විමසීමේ බලයක් ජනාධිපතිවරයාට තිබෙනවා. ඒ අනුව 2018 අවුරුද්දේ ජනවාරි මාසයේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසුවා, තම ධුර කාලය සම්බන්ධයෙන්. "තමන්ට 2021 දක්වා සිය ධුරය දැරිය හැකිදැයි ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය තමන් වෙත දැනුම් දෙන මෙන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන අග විනිසුරු ප්‍රියසාද් ඩෙප්ගෙන් ඉල්ලීමක් කර තිබේ" කියා සඳහන් වෙනවා. ඒ කියන්නේ, 2018 ජනවාරි මාසයේ එතුමා අග විනිසුරුතුමාගෙන් විමසීමක් කළා, "මගේ ධුර කාලය අවුරුදු 5 ද, 6 ද?" කියලා. ඒ වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණය මොකක්ද කිව්වේ? ඒ වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට දැනුම් දුන්නා, "ඔබට තිබෙන්නේ අවුරුදු 5යි" කියලා. ඒක තමයි, ශ්‍රේෂ්ඨාධිකරණය ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5 ද, 6 ද කියන ගැටලුව විසඳපු පළමු අවස්ථාව. දෙවැනි අවස්ථාව, 2019 ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කළාට පස්සේ කෙනෙක් අධිකරණයට ගිහිල්ලා ඒ ගැන අහපු අවස්ථාව. "ජනාධිපතිවරයාගේ ධුර කාලය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය අර්ථ නිරූපණයක් ලබා දෙනතුරු මැතිවරණ කොමිසමට ජනාධිපතිවරණය පැවැත්වීම වළක්වමින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලෙස ගොනු කර තිබූ පෙත්සම විභාගයට ගැනීමට අවසර ලබා දීමකින් තොරව නිෂ්ප්‍රභ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේය" කියා සඳහන් වෙනවා. ඒ කියන්නේ, මේක "ලේනා" ගෙනාවා වාගේ එකක්. ඒක ගෙනාවේ 2019දී. ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කළාට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා අතුරු තහනම් නියෝගයක් ඉල්ලුවා. ඒ අනුව ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5 ද, 6 ද කියන එක නිරාකරණය කරන තෙක් මැතිවරණ කොමිසමට ජනාධිපතිවරණය පැවැත්වීමේ කටයුතු ක්‍රියාත්මක කරන්න දෙන්න එපා කියලා අතුරු තහනම් නියෝගයක් ඉල්ලුවා. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණය ඒ අතුරු තහනම් නියෝගය සම්බන්ධයෙනුත් මොකක්ද කළේ? එය ප්‍රතික්ෂේප කළා, ධුර කාලය අවුරුදු 5යි කියලා. ඒ විතරක්ද? මේ ලේනා මහත්මයා ඉදිරිපත් කරපු පෙත්සම සම්බන්ධයෙනුත් ශ්‍රේෂ්ඨාධිකරණය ඉතා පැහැදිලිව කිව්වා, එම ධුර කාලය අවුරුදු 5යි කියලා. ඒ බව පැහැදිලිව කිව්වා විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5යි කියලා අවුරුදු 5කට ජනාධිපතිවරයෙකුත් තෝරාගෙන තිබෙනවා. ඒ කියන්නේ, අර්ථ නිරූපණය කර තිබෙනවා විතරක් නොවෙයි; ප්‍රායෝගිකව අවුරුදු 5කට ජනාධිපතිවරයෙකු තෝරාගෙනත් තිබෙනවා. දැන් කාටද ගැටලුවක් තිබෙන්නේ ජනාධිපති ධුර කාලය අවුරුදු 5 ද, 6 ද කියලා? අවුරුදු 5 ද, 6 ද කියලා ගැටලුවක් එතැන නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම පිළිබඳ පූර්ණ බලය තිබෙන ශ්‍රේෂ්ඨාධිකරණය අවස්ථා තුනකදී එම ධුර කාලය අවුරුදු 5යි කියන එක පෙන්නුම් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා දන්නවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හදනකොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83වන ව්‍යවස්ථාවට අත නොතිබ්බේ ඇයි කියලා. 83වන ව්‍යවස්ථාව ඉතා පැහැදිලිව ජනමත විචාරණයකට ලක් වන ව්‍යවස්ථාවක්. එදා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

[ගරු අනුර දිසානායක මහතා]

ගැන සාකච්ඡා කරන තැන මමත් හිටියා. ඒ වෙලාවේ එය සකස් කිරීමට උදව් වුණු නීතිඥ මහත්වරුන් ඉතා පැහැදිලිව ලබා දීපු උපදේශය තමයි, ජනමත විචාරණයකට තුඩු නොදෙන කරුණුවලින් සමන්විතව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සකස් කරන්න කියන එක. ඒ අනුව තමයි ජනාධිපතිවරයා තෝරා ගන්නා ධුර කාලය අවුරුදු 5යි කියලා 30 (2) ව්‍යවස්ථාවේ ඉතා පැහැදිලිව නිශ්චිත කරලා තිබෙන්නේ. එහෙම නම්, මේ ජනාධිපතිවරයා තේරී පත් වී තිබෙන්නේ අවුරුදු 5කට. තවත් මොන විකාරයකට ද ඒ පුටුවේ ඉන්න හදන්නේ? මට තේරෙන්නේ නැහැ.

දැන් මොකක්ද කරන්න හදන්නේ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, අණ පනත්වල නිශ්චිතව සඳහන් කර තිබෙන නිසා මේ කාරණය මේ පාර්ලිමේන්තුවේ විවාද කළ යුතු එකක් නොවෙයි. හැබැයි, මේ මන්ත්‍රීවරුන්ගේත් අදහසක් තිබෙනවා, රටේත් අදහසක් තිබෙනවා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

කියන මහා සූත්තරකාරයා මේකට මොකක් හරි ගැටයක් ගහයි කියලා. සමහර මන්ත්‍රීවරු කියනවා, මේ ජනාධිපතිවරයාට ඡන්දයකින් තොරවම ඉන්න දෙන්න ඕනෑ කියලා. කොහේද එහෙම හැකියාවක් දීලා තිබෙන්නේ? එවැන්නක් කොතැනකවත් තිබෙනවාද? වජිර අබේවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා කියනවා, මේ ජනාධිපතිවරයාට තවත් අවුරුදු 12ක් ඉන්න දෙන්න ඕනෑ කියලා. ඒ කියන්නේ අවුරුදු අවුරුදු 87 වනකල්. එහෙම නේද? එහෙම නම්, ඔබතුමාට මුක්කුවටත් යන්න වෙයි, අවුරුදු 87 වුණාම අරගෙන එන්න. ඊට පස්සේ රංගෙ බණ්ඩාර කියනවා, තවත් අවුරුද්දක් ඉන්න දෙන්න ඕනෑ කියලා. ජනමත විචාරණයක් පවත්වන්න ඕනෑ කියලාත් කියනවා. මොකක්ද මේ කරන්නේ? මේ නිසා රට තුළ ඉතා ව්‍යාකූලත්වයක් මතු වෙමින් තිබෙනවා, මේ ජනාධිපතිවරණය පවත්වනවාද, නැද්ද කියන එක පිළිබඳව.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

මාර සූත්තරකාරයා, ගැටකාරයා කියලා හිතාගෙන ඉන්නවා. මේ මන්ත්‍රීවරුන් පව්, එහෙම හිතාගෙන ඉන්නවාට. ගැටකාරයෙකුත් නොවෙයි, සූත්තරකාරයෙකුත් නොවෙයි. මම කියන්නම් වෙන දේ. ජනාධිපතිවරණය නිසි පරිදි පවත්වනවා; එතුමා පරදිනවා; සාමකාමීව ගෙදර යනවා. ඒකත් මම දන්නවා. ඕක තමයි වෙන්නේ. හැබැයි මේ මන්ත්‍රීවරුන්ට චිත්‍රයක් මවනවා, මෙයා මාර සූත්තරකාරයා, කොහොම හරි ධුර කාලය තවත් අවුරුද්දක් දිගු කර ගනියි, මාර ගේමක් ගහයි කියලා. පව්, ඒ මන්ත්‍රීවරුන්ට! මොන ගේමක්වත් නැහැ ඔය ඔළුවේ.

ඔය ඔළුවෙන් ගහපු හැම ගේම් එකක්ම අසාර්ථකයි. එහෙම ගේම් සාර්ථක වුණා නම්, එතුමා වැඩිම ගේම් ගැහුවේ පක්ෂය ඇතුළත නේ. මම කියන්නේ, එතුමා ආණ්ඩු මෙහෙයවූවාට වඩා වැඩියෙන් මෙහෙයවලා තිබෙන්නේ පක්ෂයක්. එතුමා ආණ්ඩු මෙහෙයවලා තිබෙන්නේ පොඩි කාලයයි. 2001 ඉඳන් 2004 දක්වා අවුරුදු දෙකහමාරක් වාගේ කාලයක් ආණ්ඩුවක් මෙහෙයවූවා. 2005 ඉඳන් බාගෙට ආණ්ඩුවක් මෙහෙයවූවා. දැන් අවුරුදු දෙකක් විතර ආණ්ඩුවක් මෙහෙයවනවා. හැබැයි, පක්ෂයක් කොච්චර කාලයක් මෙහෙයවූවාද? පක්ෂයක් මෙහෙයවූවා, 1994 ඉඳන් 2019 වනකල්, අවුරුදු 25ක්. ඉතින්, පක්ෂයක් අවුරුදු 25ක් මෙහෙයවලා,-

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
අවුරුදු 30ක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

අවුරුදු 30ක් පක්ෂයක් මෙහෙයවලා ගැට ගහලා, ගැට ගහලා, ගැට ගහලා, ගේම් ගහලා, ගේම් ගහලා අන්තිමට මොකද වුණේ? පාර්ලිමේන්තුවටවත් එන්න බැරි වුණා නේ. ඔන්න! එතුමාගේ ගේම්වල ප්‍රතිඵල. රටත් හිතාගෙන ඉන්නවා, මන්ත්‍රීවරුනුත් හිතාගෙන ඉන්නවා, මාර ගේමිකාරයා, මාර සූත්තරකාරයා, මොකක් හෝ අටවයි කියලා. ඔය මොකක්වත් අටවන්න බැහැ. එතුමා අටවපු එකක්වත් කවදාවත් සාර්ථක වෙලාත් නැහැ. ඒ නිසාද දන්නේ නැහැ, බිහි වුණෙත් "අටවන ජනාධිපති" කියලා. එතුමා "අටවන ජනාධිපති". එතුමා හැම දාම මේක අටව අටවා හිටියා; ගෙනෙන්නේ මේ ව්‍යාකූලත්වය මඟ හරවන්න ඕනෑ නිසායි. දැන් හරි පැහැදිලියි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ,- *[බාධා කිරීමක්]* ගේමිකාරයන් නම්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ගේම්; ගේම් මාස්ටර්.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ගේම් මාස්ටර්. පක්ෂ කඩලා තිබෙනවා, අරගෙන තිබෙනවා. තමන්ට එරෙහිව කටයුතු කරපු, තමන් සාතනය කරන්න කුමන්ත්‍රණය කළැයි කියන එක්කෙනාගෙත් කරට අත දා ගන්න තරම්,- ගේම් නම් ගේම්. මේ, මොන ගේම් ද රනිල්ගේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හරි පැහැදිලියි, මේකේ තිබෙනවා නේ. හැබැයි, ධුර කාලය අවුරුදු 5ද, 6ද කියලා සංශෝධනයක අවශ්‍යතාවක් නැහැ. සංශෝධනයක අවශ්‍යතාව තිබෙන්නේ ධුර කාලය අවුරුදු 5ද, 6ද කියලා ගැටලුවක් තිබෙනවා නම්. එහෙම ගැටලුවක් නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය අවස්ථා තුනකදී මේ ධුර කාලය අවුරුදු පහයි කියලා නිශ්චය කරලා තිබෙනවා. දැන් මොකටද සංශෝධනයක් ගෙනෙන්නේ? දැන් මේ ගොල්ලන් කල්පනා කරලා, මේක හදිසි පනතක් හැටියට ගෙනෙන්න ඕනෑ කියලා ඉස්සරහට මතයක් හදයි. එහෙම ගෙනෙන්න බැහැ. හරි පැහැදිලියි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේක තිබෙනවා.

ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට මතක ඇති, 2010දී ඔබතුමා හදිසි පනතක් විධියට දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. ඒ කියන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට දහඅටවන සංශෝධනය ගෙනාවා, හදිසි පනතක් ලෙස. මොකක්ද ඒ සංශෝධනය? ජනාධිපතිවරයාට අවස්ථා දෙකක් වෙනුවට ඊට වඩා වැඩි වාරයක් තරග වදින්න පුළුවන් කියන සංශෝධනය. හැබැයි ඒක හදිසි පනතක් හැටියට ගෙනාවේ, 2010දී. ඔබතුමාට ඒ ගැටලුව මතු වුණේ කවදාද? 2016දී. ඒ කියන්නේ, 2010දී අවුරුදු 6කට ඔබතුමාව තෝරා ගත්තා. ඔබතුමාට ඔය ගැටලුව මතු වුණේ 2016දී. 2010 දෙසැම්බර්වල ඔබතුමා හදිසි පනතක් කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් ගෙනාවා. හැබැයි, ගැටලුව හදිසි නැහැ. එහෙම ගැටලුවක් ආවේ අවුරුදු 6කින්. හැබැයි, ඔබතුමාට හදිසි වුණේ මොකක්ද? ඒ පත් වෙච්ච නැවුම් පාර්ලිමේන්තුවෙන්

තුනෙන් දෙකේ බලයක් ගන්න ඕනෑ කියන එක. අන්න ගේම්! ඒ කියන්නේ, ඒ නැවුම් පාර්ලිමේන්තුවෙන්. '2016 වනකොට පාර්ලිමේන්තුවේ මොනවා වෙයිද දන්නෙත් නැහැ. තුනෙන් දෙකේ බලය අතේ තියෙයිද දන්නෙත් නැහැ. අලුතින් ආවා විතරයි නේ' කියලා හිතලා මේ ගොල්ලන් හරහා සම්මත කරගන්න ගැහුවා ගේම් එකක්. හැබැයි, ඒ ගේම් එක අසාර්ථක වුණා, 2015දී. ඒක වෙනම කථාවක්. ගේම් එකක් ගැහුවා නේ. ඔන්න ඔය නිසා අපේ රටේ සාකච්ඡාවට බඳුන් වුණා, මේ "හදිසි පනත්" කියන එක ඉතාම අහිතකර වුවමනා වෙනුවෙන් සුපයෝගී කරගෙන තිබෙනවා කියලා. ඒ නිසා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී හදිසි පනත් කියන එක අයින් කළා. හැබැයි, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව හදිසි පනත් කාරණා දෙකක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්න පුළුවන්.

ඉන් පළමුවන කාරණය මේකයි. ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් මතු වුණොත්, ඒ පිළිබඳ හදිසි පනතක් ඉදිරිපත් කළ හැකියි. දෙවන කාරණය, ආපදාවක් ඇති වුණොත් ආපදා කළමනාකරණයට අදාළ යම් කාරණයක් පිළිබඳ නීතියක් සම්පාදනය කිරීම සඳහා හදිසි පනතක් ඉදිරිපත් කළ හැකියි. ඒ නිසා හදිසි පනත් ඉදිරිපත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉතා පැහැදිලිව අවස්ථාව දීලා තිබෙනවා. ඒ වාගේම විශේෂකොට, අවධාරණයකොට කියනවා, ව්‍යවස්ථා සංශෝධන නම් හදිසි පනත් හැටියට ගෙනෙන්න බැහැ කියලා. ඒක අවධාරණය කර තිබෙනවා. ඒ නිසා මේක හදිසි පනතක් හැටියට මේ පාර්ලිමේන්තුවට එන්නෙත් නැහැ.

ඊළඟට, සමාජය තව සාකච්ඡාවක් හදනවා, 'ධුර කාලය අවුරුදු 5ට අඩු කරන්න' කියලා ගෙනැල්ලා කාරක සභා අවස්ථාවේදී ධුර කාලය අවුරුදු 6ක් කරයිද කියලා. ඒ, ගේම්. මේකත් සිද්ධ වුණා අපට මතකයි, පළාත් සභා මැතිවරණ සංශෝධන පනතේදී. ඒකේ තිබුණු හරයට මුළුමනින්ම පටහැනි ලෙස පනත සංශෝධනය කළා. ඒකට සමාජයෙන් විරෝධයක් තිබුණා. ඒ නිසා නීති සම්පාදකයන් ඒ ගැන කල්පනා කරලා, ඉතා පැහැදිලිව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබෙනවා, පනතක හරයට බලපාන සංශෝධන කාරක සභා අවස්ථාවේ ගෙනෙන්න බැහැ කියලා.

එම නිසා අවුරුදු 5ට අඩු කරන්න කියලා සංශෝධනය ගෙනැල්ලා, කාරක සභා අවස්ථාවේදී එය අවුරුදු 6ක් කිරීම වාගේ ගේම් එකක් ගහන්න පුළුවන් කියලා හිතනවා නම්, එහෙම අවස්ථාවකුත් නැහැ. මොකද මේක හදිසි පනතක් හැටියට ගෙනෙන්නත් බැහැ. කාරක සභා අවස්ථාවේදී මේකේ හරය වෙනස් වන පරිදි සංශෝධනය කරන්නත් බැහැ. එහෙම නම් මොකක්ද මේ ක්‍රියාවලිය?

පසුගිය සඳුදා කැබිනට් මණ්ඩලයට මෙම සංකල්පය ඉදිරිපත් කළා. දැන් මොකක්ද වෙන්න ඕනෑකම තිබෙන්නේ? නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යවලා මේ පනත කෙටුම්පත් කරන්න ඕනෑ. කෙටුම්පත් කරපු පනත නැවත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න ඕනෑ. අපි හිතමු, කැබිනට් මණ්ඩලය ඒක හදිසියේ, ලබන සඳුදා සම්මත කළා කියලා. සම්මත කරලා ගැසට් කරන්න ඕනෑ. ගැසට් කරලා සතියක් තියන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ සති දෙකක් තියන්න ඕනෑ. ඊට පස්සේ අධිකරණයට යන්න අවස්ථාව තිබෙනවා. අධිකරණයේ සති තුනක් තිබෙනවා. ඒ කියන්නේ, ආසන්න වශයෙන් ගත්තොත් සති නවයකට වඩා වැඩි කාලයක් තිබෙනවා. දැන් මේ 17 වන දා වෙනකොට මැතිවරණ කොමිසමට බලය ලැබෙනවා ජනාධිපතිවරණයට දින නියම කරන්න. මැතිවරණ කොමිසම දින 16ත්, 21ත් ඇතුළත නාම යෝජනා කැඳවිය යුතුයි. දින 28ත්, 42ත් අතර ඡන්දය පැවැත්විය යුතුයි. එහෙම නේ තිබෙන්නේ. දැන් මේ පනත් කෙටුම්පත යන වේගයයි, ඡන්දය එන වේගයයි බැලුවොත් බොහෝ දුරට පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට එනකොට රනිල් මහත්තයා ගෙදර. ඒක මතක තබා ගන්න. මොකද, එතකොට ඡන්දය පවත්වලා ඉවරයි. ශ්‍රේෂ්ඨාධිකරණය ඉතා හොඳ අර්ථ නිරූපණයක් කරලා අවුරුදු 5 ද, 6 ද කියලා නීතියෙන් නිරාකරණය කරලා දීලා තිබියදී, දැන් මේ තමන්ගේ කාලය ඇතුළත සම්මත නොවන පනත් කෙටුම්පතක්, කිසිදු අදාළත්වයක් නැති පනත් කෙටුම්පතක් සම්බන්ධව කථා කරන්නේ ඇයි කියා මම දන්නේ නැහැ.

ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි, ඔබතුමා සාමාන්‍යයෙන් නීති ගැන කථා කරන, අධිකරණය ගැන කථා කරන කෙනෙක්. එහෙම නේද? ගරු සභාවේදී වුණත් සමහර අවස්ථාවලදී ඔබතුමා- *[බාධා කිරීමක්]* මේ වාගේ එකකට ඔබතුමා කැබිනට් මණ්ඩලයේදී අත එසෙව්වේ ඇයි? ඔබතුමාට කියන්න හිතුණේ නැහැ නේ, "මේක පිස්සුවක් කියලා තේරෙන්නේ නැද්ද?" කියලා. ශ්‍රේෂ්ඨාධිකරණය අවස්ථා තුනකදී මේක අර්ථ නිරූපණය කරලා තිබෙනවා. එහෙම නේද? කාටද ගැටලුවක් තිබෙන්නේ, ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5 ද, 6 ද කියලා? ඇත්තටම ගත්තොත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 (ආ) ව්‍යවස්ථාව නිෂ්ක්‍රීය ව්‍යවස්ථාවක්. ඒකට පණ නැහැ. පණ නැත්තේ මොකද? 32 (2) ව්‍යවස්ථාවට ඇතුළු කරන ලද සංශෝධන තුළින් 83 (ආ) ව්‍යවස්ථාව පණ නැති කරලා තිබෙනවා;. ඒක මළ ව්‍යවස්ථාවක්. ඉතින්, ඒ මළ ව්‍යවස්ථාව තිබුණත් එකයි නැතත් එකයි. අයින් කරනවා නම් ඒක පස්සේ වෙලාවක අයින් කරමු. ඇයි? වැදගත් දේ තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 83 ව්‍යවස්ථාවට අත තබන්න ජනමත විචාරණයක් ඕනෑ. දැන් ජනාධිපතිවරණයක් තිබෙන වෙලාවක මේකට ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාම නැවත ජනමත විචාරණ කථාවකුත් ගෙනෙනවා. එතකොට සමාජයේ විශාල ව්‍යාකූලත්වයක් හදනවා. ඒකෙන් පෙන්නුම් කරන්නේ මොකක්ද? ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්තයා සමාජයේ ස්ථාවරභාවයක් පිළිබඳව සමාජයේ ව්‍යාකූලත්වයන් නිර්මාණය කරන්නේ නැතුව, යම් සමාජ මතයක් නිර්මාණය කරමින් යනවා වෙනුවට නිරන්තරයෙන් සමාජය තුළ දෙගිඩියාවක්, සැකයක්, ව්‍යාකූලත්වයක්, අවිශ්වාසයක් නිර්මාණය කරමින් යනවා. එය එතුමාගේ hobby එක වෙලා තිබෙනවා; එතුමාගේ විනෝදය ඒක.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

විනෝදය තමයි, සමාජය ව්‍යාකූලත්වයට පත් කරලා හිනා වන එක; මන්ත්‍රීවරු අතර සැකය, අවිශ්වාසය වර්ධනය කරලා සතුටු වන එක. එතුමා හරි ළාමක දේවල්වලින් ඒක කරනවා. එතුමා ගැඹුරු දේවල්වලින් සතුටු වන කෙනෙකුත් නොවෙයි. ඔහු ගැටයක් ගහනවා. කට්ටිය ගැටේ පස්සේ යනවා. ඒ කට්ටිය එකතු වනවා, යාළුවෝ ටික එකතු වනවා; "ගැටය" කියලා හිනා වනවා. එච්චරයි. හරි ළාමක මනසක් තිබෙන්නේ, එතැනදි නම්. ඒ කියන්නේ, පොඩි පොඩි ගැට ගහලා විනෝද වනවා. ඒක එතුමාගේ hobby එක, විනෝදය. එහෙම කෙනෙකුට යට වෙන්නේ මොකටද?

ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි, ඔබතුමාට තිබුණා නේ කැබිනට් මණ්ඩලයේදී කියන්න, මොකටද මේ අවුරුදු 5 ද, 6 ද කියලා යෝජනා ගෙනෙන්නේ කියලා. නීති විශාරද, විජයදාස රාජපක්ෂ මහා ප්‍රාඥයා කැබිනට් මණ්ඩලයේ ඉන්නවා නේ. ඒගොල්ලන් මේක අනුමත කරලා එවනවා නේ. සමාජයේ ව්‍යාකූලත්වයක් හදලා, විවිධ ගැට පිට ගැට ගහන්න හදන මේක පරාජය කළ යුතුයි. ඒ නිසා මැතිවරණ කොමිසමට දන්වන්න

[ගරු අනුර දිසානායක මහතා]

කියලා අපි ඉල්ලන්නේ වෙන මුකුත් නොවෙයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා උඩ ඉඳගෙන ගහන ගැටවලට පාර්ලිමේන්තුව යටත් වෙන්නේ නැහැ. ඒ නිසා මේ පාර්ලිමේන්තුව විසින් පනවා තිබෙන නීතිවලට අනුරූප වන පරිදි කටයුතු කරන්න. සකස්කොට තිබෙන ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවේ; සම්මත කර තිබෙන නීති පාර්ලිමේන්තුවේ. ඉතින්, ඡන්දය පැවැත්වීම සඳහා කටයුතු කරන්න කියන ඉල්ලීමයි මම කරන්නේ. මම කලින් කිව්වේ, ඒක ඉල්ලන්න ඕනෑ දෙයක් නොවෙයි. ඒක ඔවුන්ගේ වගකීම සහ යුතුකම. හැබැයි, අමතර වශයෙන් මේ ව්‍යාකූලත්වය නිරාකරණය කිරීම සඳහා අපි ඒ දෙය ඉල්ලනවා.

ඇයි, මේ ව්‍යාකූලත්වය අද මතු වෙලා තිබෙන්නේ? රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාට නිශ්චිත ඡන්ද වැඩ පිළිවෙළක් නැහැ. මම දන්න පළමුවෙනි කාරණය තමයි ආණ්ඩුවේ අපේක්ෂකයින් තුන්දෙනෙක් ගැන කථා වෙනවා කියන එක. කැබිනට් මණ්ඩලයේම දෙදෙනෙක් ඉන්නවා. රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනාධිපති අපේක්ෂකයා කියලා කියනවා. විජයදාස රාජපක්ෂ මහත්මයාත් ජනාධිපති අපේක්ෂකයා කියලා කියනවා. හැබැයි, හැම සඳුදා දිනකම රාත්‍රියේ කැබිනට් මණ්ඩලය එකතු වෙනවා. කොහේ හෝ එහෙම සිදු වෙලා තිබෙනවාද? කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියායි, එම කැබිනට් මණ්ඩලයේම කැබිනට් ඇමතිවරයෙකුයි - දෙදෙනාම - ජනාධිපති අපේක්ෂකයා කිය කියා එළියේ කථා කරනවා. එක්කෝ එක්කෙනෙක් එළියට යන්න ඕනෑ. එහෙම නේ වෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. ආණ්ඩුව ඇතුළෙනුත් තව නම් කියනවා. ධම්මික පෙරේරා මහත්මයා කියනවා, එතුමා ජනාධිපති අපේක්ෂකයා කියලා. ඒ නිසා ආණ්ඩුවට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනාධිපති අපේක්ෂකයින් පිළිබඳ ව්‍යාකූලත්වයක ඉන්නවා. විජයදාස එයිද, ධම්මික එයිද, නාමල් මොනවා කරයිද, බැසිල් යටින් ගිහිල්ලා මොනවා කියයිද කියලා ව්‍යාකූලත්වයක ඉන්නවා. මහින්ද මහත්මයා හමුවුණාම මොකක්ද කියන්නේ? ඔබතුමා කිව්වා නේ, මහින්ද රාජපක්ෂ මැතිතුමනි? මහින්ද රාජපක්ෂ මැතිතුමාට රනිල් වික්‍රමසිංහ මැතිතුමා හමු වුණාම කියනවා, "මම නොවෙයි, ඔවා බැසිල් තීන්දු කරන්නේ" කියලා. මේ ඔබතුමාගේ ගැට. "මම ඕවාට හවුල් වෙන්නේ නැහැ. ඕවා කියන්නේ බැසිල් නේ. බැසිල්ගෙන් අහගන්න" කියලා කියනවා. ඔබතුමා හරි. මම මේ කියන්නේ මොකක්ද? ඒක නේ මේ කරන්නේ. එතුමා ව්‍යාකූලත්වයක ඉන්නවා. ඉතින් ඡන්ද කරන්නේ කොහොමද? අපේක්ෂකයා වෙන්නේ කවුද, සහාය දෙන්නේ කවුද, කවුරු වේදිකාවට එයිද, මේ ගොල්ලන් වේදිකාවට එන එක හොඳද, මේ ගොල්ලන් එන එක නරකද ආදි වශයෙන් එතුමා ව්‍යාකූලත්වයක ඉන්නවා. එතුමා ඡන්ද පිළිබඳව දරන ව්‍යාකූලත්වය සමාජයේ පටලවන්න හදනවා. ඒ නිසා අපි එතුමාට කියනවා, "සමාජය ව්‍යාකූලත්වයක පටලවන්න එපා, ඔබතුමා ගිලිලා ඉන්න ව්‍යාකූලත්වයෙන් මිදෙන්න සැලසුම් හදාගන්න" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ නම සඳහන් වෙච්ච නිසා මම මේ කාරණය මතක් කරන්න කැමතියි. මේ නඩුව ඉදිරිපත් කර නිබියදී තීන්දුව දීමට ප්‍රථම ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළා, ජනාධිපතිවරණය වසර 5කින් පැවැත්විය යුතුයි කියලා. අනෙක් කාරණා ගැන මම පිළිතුරු දෙන්න යන්නේ නැහැ. හැබැයි, අනුර කුමාර මන්ත්‍රීතුමා කියපු සමහර නඩු තීන්දු පිළිබඳව නැවත විශ්ලේෂණය කරලා බැලුවොත් හොඳයි කියලා මම හිතනවා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2015.01.08වෙනි දා ජනාධිපති වෙලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළේ 2015.04.22වෙනි දා නිසා ඉතිරි මාස දෙක, තුන එතුමාට වලංගුද කියලා තමයි එතුමා ඇහුවේ. ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළා, එසේ නොවෙයි කියලා. මම හිතන විධියට මේ නඩුව ඉදිරිපත් කරපු දේශපාලන පක්ෂය අද ඉන්නේ විපක්ෂ නායකතුමා එක්ක. ඒ නියෝජිතයා ඇතුළු මුළු පක්ෂයම අද ඉන්නේ එතුමා එක්ක. මා ළඟ ජායාරූපත් තිබෙනවා. මම දැක්කා, විපක්ෂ නායකතුමා ඒ පක්ෂයේ නායකයා බදාගෙන ඉන්නවා. ඒ පක්ෂයෙන් තමයි නඩුව ඉදිරිපත් කළේ කියන එක මම මතක් කරන්න කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට යෝජනාව ස්ථිර කිරීම, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.09]

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇත්ත වශයෙන් සරලව කියනවා නම් ජනාධිපති ධුරය අවුරුදු පහයි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය තුන්වතාවක් සනාථ කරලා තිබෙනවා. මේ කාරණය ගැන ගැටලුවක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දියුණු රටක ව්‍යවස්ථාව ගත්තොත්; ඇමෙරිකාවේ ව්‍යවස්ථාව ගත්තොත්, ඒක අවුරුදු 250ක් පරණයි. ඇමෙරිකාවේ ව්‍යවස්ථාව 1781දීයි නිර්මාණය වුණේ. හැබැයි, එම ව්‍යවස්ථාව 350 වතාවක් ඇමෙරිකානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අර්ථ නිරූපණය කරලා - judicial interpretations දීලා - තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර්ථ නිරූපණයක් දුන් හැම අවස්ථාවකම ඒක ව්‍යවස්ථාවට ඇතුළත් කරලා නැහැ. ඇමෙරිකානු ශ්‍රේෂ්ඨාධිකරණය දුන් අර්ථ නිරූපණ ව්‍යවස්ථාවේ කොටසක් හැටියට තමයි ගණන් ගන්නේ. ඉතින්, හැම අර්ථ නිරූපණයක්ම ව්‍යවස්ථාවේ කොටසක් හැටියට තමයි ගණන් ගන්නේ. මහා බ්‍රිතාන්‍යය ගත්තොත්, ව්‍යවස්ථාවක් නැහැ; there is no a written Constitution. සම්ප්‍රදායයි, නඩු තීන්දුයි තමයි ඒ රටේ ව්‍යවස්ථාව. ඉතින්, අපේ රටෙත් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන්නාම ඒක ව්‍යවස්ථාවේ කොටසක් බවට පරිවර්තනය වෙනවා. පනත් කෙටුම්පතක් ගෙනෙන්න ඕනෑ නැහැ, අවුරුදු පහ කියලා කියන්න. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව හොඳටම ඇති.

ජනාධිපති ධුර කාලය වසර 5ක් කරන්න මේ ආණ්ඩුව පනත් කෙටුම්පතක් ගෙනෙන්නේ ඇයි? ශ්‍රේෂ්ඨාධිකරණය තුන් වතාවක් කියලා තිබෙනවා, ඒක අවුරුදු 5යි කියලා. ඇයි මේ පනත් කෙටුම්පතක් ගෙනෙන්නේ? මගේ හිත කියනවා, මට පෙනෙන විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122වන ව්‍යවස්ථාව යටතේ හදිසි පනත් කෙටුම්පතක් - urgent Bill එකක් - හැටියට මේ සංශෝධනය ගෙනෙන්න බැරි වුණාට ආණ්ඩුව උත්සාහ කරනවා, මේ ආණ්ඩුව බලාපොරොත්තු වෙන ව්‍යවස්ථා සංශෝධනය, ඒ කියන්නේ ජනාධිපති ධුර කාලය වසර 6, 5 කරන එක ugent Bill එකක් හැටියට ශ්‍රේෂ්ඨාධිකරණයට යවන්න. ගරු සභානායකතුමනි, ඔබතුමා බැහැ කියලා කියන්න පුළුවන්. *[බාධා කිරීමක්]* උත්සාහ කරනවා. නැත්නම් මේකට පනත් කෙටුම්පතක් ගෙනෙන්න වැඩක් නැහැ නේ. *[බාධා කිරීමක්]* උත්සාහ කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු සභානායකතුමනි, sure කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?*[බාධා කිරීමක්]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමා නැඟිටලා කියන්න, ඒක ugent Bill එකක් හැටියට ශ්‍රේෂ්ඨාධිකරණයට අරගෙන යන්නේ නැහැ කියලා. දැන් කියන්නකෝ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ඔබතුමා නැඟිටලා කියන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අවසන් සංශෝධනයෙන් පසුව ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා වාගේ අවස්ථා දෙකකදී විතරයි urgent Bill එකක් ගෙනෙන්න පුළුවන්. අපි ඒක දන්නවා. ඉතින් ඒ අවස්ථා දෙකේදී හැර මේක ගෙනෙන්න පුළුවන්කමක් නැහැ, මේක urgent Bill එකක් නොවෙයි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමාගේ මතය ඒකයි. හැබැයි, අපේ විධායක ජනාධිපතිතුමාගේ මතය ඒක නොවෙයි. එතුමා ඒකට උත්සාහ කරනවා. මම කියන්නේ නැහැ, ඒක හරියනවා කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාට කිව්වාද දන්නේ නැහැ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නැත්නම් මේ වාගේ සංශෝධනයක් ගෙනෙන එකේ තේරුම මොකක්ද? What is the reason for that? මම ජනාධිපතිතුමා ගැන දන්නවා. මම දන්නවා, කොහොම හරි හදිසි පනත් කෙටුම්පතක් - urgent Bill එකක් - හැටියට මෙය ගෙනැල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට යවයි කියලා. ශ්‍රේෂ්ඨාධිකරණයට යැව්වාම ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා, මේකට ජනමත විචාරණයක් තියන්න ඕනෑ කියලා. ජනමත විචාරණයක්. ඒක තමයි එකම අරමුණ. එතකොට අර අපේ අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා වාගේ මේ හදන්නේ අවුල් ඇති කරන්න, confuse කරන්න. මහා අවුලක් ඇති වෙනවා නේ. රටේ මහා අවුලක් ඇති වෙනවා . මම කියන්නේ නැහැ, ඒක ශ්‍රේෂ්ඨාධිකරණය කරයි කියලා. නමුත් විධායකය උත්සාහ කරනවා, මොනවා හරි කරලා මේක ශ්‍රේෂ්ඨාධිකරණයට ඇරලා ශ්‍රේෂ්ඨාධිකරණය හරහා මේ වාගේ තීන්දුවක් අරගෙන මුළු රටම අවුල් ජාලාවකට පත් කරන්න. අවුල් ජාලාවක් බවට පත් කළාම, විධායක ජනාධිපති හැටියට යම් යම් තීරණ ගන්න එතුමාට පුළුවන්. ඉතින් මට පෙනෙන විධියට ඒක තමයි එකම බලාපොරොත්තුව. නැත්නම් මේ සංශෝධනයේ පදනමක් නැහැ. ධුර කාලය අවුරුදු 5යි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය තුන් වතාවක් කියලා තිබෙද්දී, මේ පනත් කෙටුම්පතක් ගෙනෙන්නේ ඇයි? එම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ව්‍යවස්ථාවේ කොටසක්; it is a part of the Constitution. මම කලින් කිව්වා වාගේ ඇමෙරිකාවේ ඒ නඩු තීන්දුව ව්‍යවස්ථාවේ කොටසක් හැටියට තමයි ගණන් ගන්නේ. ඉතින් අපේ සභානායකතුමා මොනවා කිව්වත්, ඊළඟ සැරේ පාර්ලිමේන්තුව රැස් වෙනකොට ඇති වෙන තත්ත්වය මොකක්ද කියලා අපි බලමු. අපි බලමුකෝ. අපි එදාට කථා කරමු. මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.15]

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධ විවාදයේ දී මේ ප්‍රස්තුත කාරණයට එන්න යම් ආකාරයක ප්‍රවේශයක් ලබාගත යුතුව තිබෙනවා. ඒ නිසා මම ඉස්සෙල්ලාම කියන්න ඕනෑ, මේ සියලු දේටම පදනම වන්නේ අපි සියලුදෙනාම ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට ගරු කරමින්, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමයි කියන එක.

අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ එය ව්‍යවස්ථාගත කර තිබෙනවා. ශතවර්ෂ හතරකට පමණ පෙර ප්‍රංශ දාර්ශනික මොන්ටෙස්කියු විසින් බලතල බෙදීමේ න්‍යාය ඉදිරිපත් කළ පසු ලෝකයේ ඇති වුණු බොහෝ ලිඛිත ව්‍යවස්ථාවල, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය කියන මේ අංග තුන එකකට එකක් තිරිංගයක් ලෙස කටයුතු කිරීමෙන් තමයි ජනතාවගේ මූලික ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් ආරක්ෂා වෙන්නේ කියන පදනම දමා තිබෙනවා. ඒ පදනම මත තමයි ව්‍යවස්ථා කෙටුම්පත් වීම දකින්න ලැබෙන්නේ.

අපේ රටේ පළමුවෙනි ලිඛිත ව්‍යවස්ථාව වෙන්නේ 1833 කෝල්බෘක්-කැමරන් ව්‍යවස්ථාවයි. ඊට පසු 1910, 1920 වැනි වර්ෂවලදී ඒකට යම් යම් සංශෝධන ගෙනැල්ලා එහි යම් ප්‍රගතියක් අත්කර ගත්තා. කෝල්බෘක්-කැමරන් ව්‍යවස්ථාවට එක් වුණු සංශෝධනවලින් පසුව 1931දී සකස් කළ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් තමයි මේ රටේ රාජ්‍ය මන්ත්‍රණ සභාව ඇති වුණේ. ඊළඟට, අපේ රටට නිදහස ලැබෙන විට ක්‍රියාත්මක වුණේ සෝල්බරි ව්‍යවස්ථාවයි. එය සම්මත වුණේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ. එහෙන් සම්මත කරලා තමයි ලංකාවට එව්වේ. ඊළඟට, 1972දී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇති කළා. ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැදුවේ 1947 සෝල්බරි ව්‍යවස්ථාව පදනම් කරගෙනම නොවෙයි. සෝල්බරි ව්‍යවස්ථාවේ තිබෙන්නා වූ 29 (3) වගන්තියෙන් බැහැර වෙන්න ඕනෑ නිසාත්, ඒ සඳහා තර්ක දෙකක් මතු වුණු නිසාත් තමයි 1970දී තුනෙන් දෙකක බලයක් ලබා ගත් සමගි පෙරමුණු ආණ්ඩුව එදා නව රහහල්දී රැස්වෙලා 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කළේ. ඊළඟට, 1978 ව්‍යවස්ථාව හැදුවේ 1972 ව්‍යවස්ථාව පදනම් කරගෙනයි. මෙන්න මේ ආකාරයට තමයි ඉතිහාසය තුළ මේ අංග තුන එකකට එකක් ගිහිල්ලා තිබෙන්නේ.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ඊළඟට, මේ රටේ මැතිවරණ කල් දැමීම ගැන කථා කළා. මේ වන විට පළාත් පාලන මැතිවරණය කල් දමා තිබෙන්නේ. මේ වනාවේත් එය කවදා තිබෙනවාද දන්නේ නැහැ. මීට කලින් 2016දීත් -එදා යහ පාලන ආණ්ඩුව කාලයේදීත්- පළාත් පාලන මැතිවරණය කල් දැමීමා. මතකද? කල් දැමීමා. දැනුත් කල් දමලා. පළාත් සභා මැතිවරණයත් විවිධ අවස්ථාවල කල් දමනු ලැබුවා. නමුත් පනත සංශෝධනය කරන්න ගිහින් ඇති වුණු තත්ත්වය තුළ දැන් පළාත් සභා මැතිවරණ පවත්වන්න බැහැ, ව්‍යවස්ථාවේ සංශෝධනයක් ගෙනෙන තෙක්. මෙන්න මෙතැනට තමයි මැතිවරණ කල්දැමීමේ ඉතිහාසය ඒ ආකාරයෙන් ඇවිල්ලා තිබෙන්නේ.

ආපසු ඉතිහාසයට ගියොත්, 1970දී බලයට පත්වුණු ආණ්ඩුව 1975 වර්ෂය දක්වා වර්ෂ පහක කාලයකට තමයි එසේ පත් වුණේ. 1972දී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කළ දවසේ ඉඳලා කාලය වර්ෂ පහකට කැඩුණා. ඒ නිසා තමයි 1977දී මැතිවරණය පැවැත්වුයේ. ඒකේ අහිතකර ප්‍රතිඵල තිබුණා. 1975දී මැතිවරණය පැවැත්වුවා නම්, සමගි පෙරමුණු ආණ්ඩුව ආසන අටට අඩු වෙන්නේ නැහැ. නමුත් 1977දීයි මැතිවරණය පැවැත්වුයේ. එහිදී සමගි පෙරමුණු ආණ්ඩුවේ ආසන සංඛ්‍යාව අඩු වුණා, අටට. 1977දී බලයට පත් වුණු ආණ්ඩුව 1978දී ව්‍යවස්ථාව හැදුවා. එතකොට මොකක්ද කළේ? සම්පූර්ණයෙන්ම වෙස්ට්මින්ස්ටර් ආකෘතියෙන් එහාට ගිහිල්ලා විධායක ජනාධිපති ක්‍රමය හදුන්වා දුන්නා. ඒකට ජන මත විචාරණයක් පැවැත්වුයේ නැහැ. 1978දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කරලා විධායක ජනාධිපති ධුරය හදලා ව්‍යවස්ථාගත කළා.

ඊළඟට, මොකක්ද කළේ? ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා 1977දී ගත් බලය අවුරුදු 12ක් පවත්වා ගෙන ගියා. අද කවුරුවත් ඒ ගැන කථා කරන්නේ නැහැ නේ. වත්මන් විපක්ෂ නායකතුමාගේ පියාත් එතකොට ඒ ආණ්ඩුවේ. 1977දී පත් වුණු අය 1982දී ජන මත විචාරණයක් පවත්වා 1989 වර්ෂය වෙනකම් බලය පවත්වා ගෙන ගියා. එතකොට තෝරා පත් කරගත් මන්ත්‍රීවරයෙක් අයින් කරන්න ඒ පක්ෂයේම අයට ඕනෑ වුණත්, කිසිදු ආකාරයකින් එහෙම අයින් කරන්න බැරි වුණා. ඒ අනුව 1977දී පත් වුණු මන්ත්‍රීවරුන් 1989 වර්ෂය වෙනකම් සිටියා. 1982දී එක වැඩක් කළා, ජන මත විචාරණයෙන්. මම හිතන්නේ මහරගම, රත්නපුරය වාගේ තෝරා ගත් පස් පොළක මැතිවරණය පැවැත්වුවා. අපි දන්නවා, ඒවායේ ප්‍රතිඵල. *[බාධා කිරීමක්]*

ජන මත විචාරණය පැරදුණාය කියන්නා වූ මැතිවරණ කොට්ඨාසවල මැතිවරණ පවත්වා පෙන්නුවා, දැන් ප්‍රජාතන්ත්‍රවාදීයි කියලා. කොහොමද වැඩේ? ඒක තමයි එදා වුණේ. මේ දේවල් අපි මතක් කර දෙන්න ඕනෑ. මැතිවරණ කල් දැමීමේ උත්සාහය, මැතිවරණ කල් දැමීම සහ ඉන්පසුව වෙච්ච ක්‍රියාදාමය ගැන අපි මතක් කර දෙන්න ඕනෑ. එවැනි ඉතිහාසයක් අපේ රටේ තිබෙනවා.

2022 අප්‍රේල් මාසයේ අපේ රටේ අරගළයක් තිබුණා. ඒ හරහා රට අරාජික වුණා. අප්‍රේල් මාසයේ පටන් ගත් එම අරගළය නිසා මැයි, ජූනි මාස වෙනකොට 2019දී පැවති ජනාධිපතිවරණයෙන් සියයට 50කට වඩා ඡන්ද ගත්ත ජනාධිපතිවරයා ඉල්ලා අස් වුණා. ඊළඟට කැබිනට් මණ්ඩලය ඉල්ලා අස්වුණා. ඒක තමයි එදා ඇති වෙච්ච තත්ත්වය. ඒකට හේතු වුණේ මොකක්ද? පළමුවෙනි කාරණය, ඉන්ධන නොමැති වීම. බලශක්ති ඇමතිවරයා කිව්වා, ඩොලර් දුන්නොත් ඉන්ධන දෙන්නම් කියලා. එහෙම නේ කිව්වේ. ඒ වාගේම විදුලිය නැති වුණා. පැය 14ක් විදුලිය කප්පාදු වුණා. ගෑස් නැති වුණා. ඒ නිසා රට සම්පූර්ණයෙන්ම ව්‍යාකූල තත්ත්වයකට පත් වුණා. ඒ වෙලාවේ හිටපු ජනාධිපතිතුමා විවිධ අයට ආරාධනා කළා, මේ රට භාර ගන්න කියලා. හැබැයි, කවුරුවත් රට භාර ගත්තේ නැහැ. මොකද, රට වියවුල්. පෙට්‍රල් ෂෙඩ් එකක් ළඟින් කිසිම මහජන නියෝජිතයෙකුට යන්න බයයි. ඇයි ඒ? එදා මේ 225දෙනාම එපා කිව්වා. ඒ නිසා කවුරුවත් යන්න බය වුණා. පෙට්‍රල් ෂෙඩ් ළඟ පෝලිම්වල දවස් 4, 5 තිස්සේ මිනිස්සු හිටියා. ඩොලරයක් තිබුණේ නැහැ, තෙල් ගන්න. තෙල් නැව් මුහුදේ කැරකුණා. ගෑස් නැහැ. ගමේ ගෙවල්වල ළිප පත්තු කරන දර කොළඹ සුපර් මාකට්ට් එකට ආවා. පාසල් වැහිලා, කාර්යාල වැහිලා තිබුණේ. ඒ තත්ත්වය තමයි, 2022 ජූනි මාසයේ ඉඳලා ක්‍රමානුකූලව අඩුකරගෙන ඇවිත් අද මේ තැනට පත් වෙලා තිබෙන්නේ.

අරගළය අවස්ථාවේ තව හොඳ දෙයක් වුණා. මේ වෙලාවේ කථානායකතුමා මූලාසනයේ හිටියා නම් හොඳයි. අරගළයට කලින් මොකක්ද වුණේ? ජනවාරි 2වැනි දා මම ඉරිදා පොළේ ගිහිල්ලා කිව්වා, කාබනික පොහොර ප්‍රතිපත්තිය වැරැදියි කියලා. 4වැනි දා මාව අයින් කළා. අරගළයත් එක්ක මතු වුණු තත්ත්වය මත විවිධ සිවිල් සංවිධාන, විවිධ ජාත්‍යන්තර බලපෑම් ඇතුළු මේ ඔක්කෝම කථානායකතුමාට කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අනුපිළිවෙළ අනුව එතුමාට මේ රට භාර ගන්න කියලා. එතුමා කිව්වා, එතුමාට රට භාර ගන්න බැහැ කියලා. ඒ විතරක් නොවෙයි, මේකත් මතක තබා ගන්න. එදා ඒ අරගළයේ අවසාන ප්‍රතිඵලය ගේන්න හිටියේ මේ පාර්ලිමේන්තුවට. පාර්ලිමේන්තුවේ පක්ෂ නායක රැස්වීමක් කැඳවා තිබුණු වෙලාවේ, පොල්දූව හන්දියේ සිට මේ පැත්තට දහස් ගණනක් එන්න ගත්තා. ඔවුන් ආවේ බුල්ඩෝසරයක් ඉස්සර කරගෙනයි. ඒ අරගළය මෙහෙයවපු අය තමයි අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන වැඩියෙන්ම කථා කරන්නේ. ඒ අරගළය මෙහෙයවපු අය කවුද කියලා රූප රාමු බැලුවාම මතක් වෙයි. අපේ රටේ මිනිස්සුන්ට මතක නැහැ නේ, මීට අවුරුදු දෙකකට කලින් රටට වෙච්ච දේ. ඒ රූප රාමු නැවත බැලුවොත් පේනවා, මේ අරගළය මෙහෙයවුයේ කවුද කියන එක. හැබැයි, එදා රැ එළි වෙන්න ඒ පිරිස පසුබැස්සා. ඒ, හමුදාව ක්‍රියාත්මක වෙච්ච නිසා. ඒ නිසා තමයි පාර්ලිමේන්තුව රැකුණේ. නැත්නම් මොකක්ද වෙන්නේ? ඉරාකයේ වෙච්ච දේ. කැරලිකරුවන් විසින් ඉරාකයේ පාර්ලිමේන්තුව අල්ලා ගත්තා. ඒ තත්ත්වය අපේ රටේ ඇති වීම වැළකුණා. ඉරාකයට අද වෙනතුරු බැරි වුණා, හරි හමන් ආණ්ඩුවක් හදාගන්න, පාලනයක් හදාගන්න. මේක තමයි වුණේ. ලිබියාවේ ගඩාෆිව ඝාතනය කළා. පාර්ශ්ව ගණනාවක් අද ඒ රට පාලනය කරනවා. ඒ රට සම්පූර්ණයෙන්ම ඉවරයි. ජනතාවට තෙල් නිකම් දුන්නා. අපේ රටත් ඒ තත්ත්වයට පත්වෙන්නයි හිටියේ.

1971දී මොකක්ද වුණේ? 1971දී තිබුණේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ආණ්ඩුවක් ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් දන්නවා, එදා සමගි පෙරමුණු ආණ්ඩුව තුළ දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ, ආචාර්ය එන්.එම්. පෙරේරා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, පීටර් කෙනමන්, ලෙස්ලි ගුණවර්ධන යන අය හිටපු බව. 1971දී පොලීසි 160කට ගහලා, ප්‍රජාතන්ත්‍රවාදය පැත්තකින් තියලා කැරැල්ලක් පටන් ගත්තා. ඒ නිසා ජීවිත 12,000ක් අහිමි වුණා.

විද්‍යෝදය විශ්වවිද්‍යාලය අද හදුන්වන්නේ "ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය" කියායි. කැලණිය විශ්වවිද්‍යාලය එදා හැඳින්වුයේ "ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය" කියලා. මේ විශ්වවිද්‍යාල දෙකම එදා පුනරුත්ථාපන කඳවුරු. ඒ එක්කම 1973 ආණ්ඩුව කාලයේදී ලෝක තෙල් අර්බුදය ඇති වුණා. එහෙම පසුබිමක් තිබුණා. ඊළඟට මොකද වුණේ? 1988, 1989, 1990 වනකොට පාසල් ශිෂ්‍යයෝ පාරට බස්සවන්න පටන් ගත්තා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ පාරේ. එතකොට මොකද වුණේ? සම්පූර්ණයෙන්ම රටේ භීෂණකාරී තත්ත්වයක් තිබුණේ. එදා හිටපු ජනාධිපති

රණසිංහ ප්‍රේමදාස මැතිතුමා මොකද කිව්වේ? එක පැත්තකින් දකුණ ඇවිලෙනවා; අනෙක් පැත්තෙන් උතුරේ ප්‍රභාකරන්ගේ යුද්ධය. එතුමා කිව්වා, දෙකොන පත්තු වෙන විලක්කුවක් තමයි මම භාර ගත්තේ කියලා. හරි ඒක. ඒක තමයි එදා රට තිබුණු තැන. *[බාධා කිරීමක්]* ඊට කලින්, 1983දී. එහෙම තමයි එදා අපේ රට තිබුණේ. ඒ ඉතිහාසය අද කාටත් අමතක වෙලා නේ. ඒ විධියට තමයි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට තර්ජන - threats to democracy - තිබුණේ. මම මේ කිව්වේ මැතිවරණවලින් පසුව ඇති වෙච්ච තත්ත්වය තුළින් හට ගත් පසුබිම පිළිබඳවයි. ඒ තත්ත්වය පසු කරගෙන තමයි අපි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අප්‍රේල් මාසයේදී ප්‍රකාශයට පත් කළා, රට බංකොලොත් කියලා. ඒ නිසා ණය ගෙව්වේ නැහැ; පොලිය ගෙව්වේ නැහැ. දැන් යන්තමින් අපේ රට එතැනින් ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. ඒවා ප්‍රතිව්‍යුහගතකරණය කරගෙන තිබෙනවා. මේ, අපි IMF එකට ගිය පළමුවැනි වතාව නොවෙයි, 17වැනි වතාව. 2009දී යුද්ධය අවසන් කළ ගමන් IMF එකට ගිහිල්ලා, ඩොලර් බිලියන 2.5ක් ගත්තා. ඒ ඔක්කොම ගෙවලා ඉවර කළා. මෙවර IMF එකට ගියේ 17වැනි වතාවට. ඒකටත් යම් යම් චෝදනා විවිධ පාර්ශ්වයන්ගෙන් ආවා.

මෙහිදී මම මේ කාරණයත් පෙන්වා දෙන්න ඕනෑ. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැදුණාට පස්සේ ජනමත විචාරණ තිබුණේ නැහැ. පාර්ලිමේන්තුවේ හිටපු අග්‍රාමාත්‍යවරයා තමයි තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් ජනාධිපති වුණේ. මම මේ පෙන්වා දෙන්න හදන්නේ තවත් කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටවල්වල ව්‍යවස්ථා හදද්දී, ආණ්ඩු මාරු වෙද්දී ජනතාවගේ බලය ක්‍රියාත්මක කරන්නේ ඒ බලය ගත් අයමයි. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කිරීමේදී ඒ ආකාරයෙන්ම ව්‍යවස්ථාව සංශෝධනය කළා නම් 1972 ජනරජ ව්‍යවස්ථාව හැදීමේදී ප්‍රශ්නයක් වෙන නිසා තමයි එදා හිටපු නීතිවේදීන් දෙපිරිසකට බෙදුණාම පාර්ලිමේන්තුවෙන් එළියට ගිහිල්ලා ව්‍යවස්ථාව හැදුවේ.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ "ස්වස්ති" යටතේ මොකක්ද කියන්නේ? අහවල්, අහවල් වර්ෂය කියලා "ශ්‍රී ලංකාවාසී ජනතාව විසින් නිදහසේ ප්‍රකාශ කොට දෙන ලද වරමෙන්...." කියලා එහි සඳහන් වනවා. මේකේ කොහේවත් සඳහන් වෙන්නේ නැහැ, "තුනෙන් දෙකක බලයක්" කියලා. මේකේ තිබෙන්නේ ජනතාව දෙන වරමෙන්; ඒ කියන්නේ බහුතර බලයෙන්. "නිදහස් ලෙස තේරී පත් වූ ශ්‍රී ලංකාවාසී ජනතාවගේ නියෝජිතයන් වන අපි" කියලා එහි තවදුරටත් සඳහන් වනවා. "නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය" යනාදී වශයෙනුත් එහි සඳහන් කර තිබෙනවා. මෙතැනදී ඕනෑ වෙන්නේ මොකක්ද? බහුතර බලය කියන එක විතරයි.

අපි හිතමු, ජනාධිපතිවරණයක් පවත්වනවා කියලා. ඒ ජනාධිපතිවරණයෙන් කවුරු හෝ දිනනවා. ඊළඟට මහ මැතිවරණය පවත්වනවා. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දමනවා, බහුතර බලයෙන් අපි ව්‍යවස්ථාව වෙනස් කරනවා කියලා. එතකොට, මේකට බැඳී ඉන්න ඕනෑද? එහෙම බැඳී හිටියා නම් 1972 ජනරජ ව්‍යවස්ථාව හදන්න බැහැ. එදා ආණ්ඩුවට තුනෙන් දෙකක බලය තිබුණා. හැබැයි, මේක අපේ ජනතාව තේරුම් ගන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කරන, විශ්වාස කරපු පිරිස් ගැන තමයි මේ මැතිවරණයේදී අවධානය යොමු වෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේ රට කොහේටද යන්නේ කියන දිශාව තීන්දු කරගන්න බැහැ. මම ඒ ගැනත් මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

ජනතාවගේ පරමාධිපත්‍යය කියන එක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන ව්‍යවස්ථාව. 4 (අ) ව්‍යවස්ථාදායක බලය; 4 (ආ) විධායක බලය; 4 (ඇ) අධිකරණ බලය. ඊළඟට, ඡන්ද බලය ඇතුළු සියල්ලම තිබෙනවා.

ඒ, මෙම ව්‍යවස්ථාවේ මේ කියන ආයතන තුන එකිනෙකට තිරිංගයක් ලෙස කටයුතු කිරීම.

ඊළඟට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VII වන පරිච්ඡේදය යටතේ තිබෙන්නේ විධායකය - ජනරජයේ ජනාධිපතිවරයා - ගැන. VII වන පරිච්ඡේදයේ 30 (2) අනුව්‍යවස්ථාව බලමු. මේ ගැන තමයි මේ දවස්වල තර්ක කරන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (2) අනුව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

> "ජනරජයේ ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරා පත්කර ගනු ලැබිය යුතු අතර පස් අවුරුදු කාලයක් ධුරය දරන්නේ ය."

එහි බොහොම පැහැදිලිව තිබෙනවා, අවුරුදු පහක කාලයක් කියලා. ඊළඟට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62 (2) අනුව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

> "සෑම පාර්ලිමේන්තුවක් ම පළමුවරට රැස්වීමට නියමිත දින පටන් පස් අවුරුද්දකට නොවැඩි කාලයක් පවත්නේ ය. එහෙත් නියමිත කාල සීමාව ඉකුත්වීමට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ ය. එකී පස් අවුරුදු කාලය ඉකුත්ව ගිය විට ම පාර්ලිමේන්තුව විසිර ගියාක් සේ සැලකෙන්නේ ය."

එහි සඳහන් වන්නේත් අවුරුදු පහක් කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (2) අනුව්‍යවස්ථාවේ සඳහන් වන්නේත් අවුරුදු පහයි.

ඊළඟට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 (ආ) අනුව්‍යවස්ථාව ගනිමු. එය ජනමත විචාරණයට තමයි අදාළ වන්නේ. 'ඇතැම් පනත් කෙටුම්පත් ජනමත විචාරණයක දී අනුමත කිරීම' කියන පැනි සටහනත් එක්ක තමයි මේ 83 ව්‍යවස්ථාව එන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 (ආ) අනුව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

> "30 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ නැතහොත් 62 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කොට ප්‍රතියෝජනය කිරීම හෝ සඳහා වූ නැතහොත් ඒ විධිවිධානවලට අනනුකූල වන්නා වූ ද, අවස්ථාවෝචිත පරිදි ජනාධිපතිවරයාගේ ධුර කාලය සාවුරුද්දක් ඉක්මවා දීර්ඝ කරන්නා වූ නැතහොත් පාර්ලිමේන්තුව පවත්නා කාලය සාවුරුද්දක් ඉක්මවා දීර්ඝ කරන්නා වූ ද පනත් කෙටුම්පතකට,
>
> පක්ෂව දෙන ලද ඡන්ද සංඛ්‍යාව (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට අඩු නොවේ නම් ද, ජනමත විචාරණයක දී එය ජනතාව විසින් අනුමත කොට ඇත්නම් ද,...."

එහි සඳහන් වෙනවා, "සාවුරුද්දක් ඉක්මවා" යනුවෙන්. මම කලින් කිව්ව අනුව්‍යවස්ථා දෙකේම තිබෙන්නේ "පස් අවුරුද්දක්" යනුවෙන්.

අද මේ සභාවේදී මුලින්ම කරුණු කිව්වේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83(ආ) අනුව්‍යවස්ථාව සංශෝධනය කරන්න හදන්නේ මොකක් හරි උප්පරවැට්ටියක් දාලා මේක කල් දමන්න කියායි. නමුත්, එහෙම කරන්න බැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (2) අනුව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන් වනවා, අවුරුදු පහක් කියලා. ඒ වාගේම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62(2) අනුව්‍යවස්ථාවේත් සඳහන් වනවා, අවුරුදු පහක් කියලා. මේ පාර්ලිමේන්තුවට අවුරුදු පහක් වෙන්න ලබන අවුරුද්දේ අගෝස්තු වෙනකල් කාලය තිබෙනවා.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

එතකොට ප්‍රශ්නය වෙන්නේ, එදා ව්‍යවස්ථාදායකයේ - පාර්ලිමේන්තුවේදී- මේක සම්මත කරනකොට සාවුරුද්දක් ඉක්මවා දීර්ඝ කරන්න වුවමනාව තිබුණේ ඇයි කියන එකයි. මම හිතනවා ජනමත විචාරණයකට යෑමට තිබූ ඉඩ කඩ වළක්වන්නයි කියලා. දැන් ඒකෙන් ඇතිවෙලා තිබෙන්නේ ambiguity බවක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (2) ව්‍යවස්ථාවේ තිබෙන්නේ අවුරුදු 05යි. 62.(2) ව්‍යවස්ථාවේ තිබෙන්නේත් අවුරුදු 5යි කියලා. හැබැයි, 83 (ආ) ව්‍යවස්ථාව අරගෙන තමයි 2019 දී සහ ඊයේ පෙරේදා -දෙකේදීම- අධිකරණයට පෙත්සම් දැම්මේ. ඉතින් ඔය තත්ත්වය ඉවර කරලා, 83.(ආ) ව්‍යවස්ථාවේත් අවුරුදු 5යි කියලා කිව්වා නම් ප්‍රශ්නය ඉවරයිනේ. 30 (2) ව්‍යවස්ථාවේ සහ 62 (2) ව්‍යවස්ථාව යන දෙකේම තිබෙන්නේ අවුරුදු 5යි කියලා නම්, 83 (ආ) ව්‍යවස්ථාවටත් පස් අවුරුද්දක් කියලා දැම්මා නම් ප්‍රශ්නය ඉවරයි. අපි මෙහෙම හිතමු. හදිසි පනතක් ගැන කථා කළා, දැන් ඒකට ඉඩ නැහැ. නමුත්, කාල සීමාව ඔහොම යනකොට සාමාන්‍ය පනතක් යටතේ අරගත්තාමයි කියමුකෝ. ඒත් ඒකට තුනෙන් දෙකක බලයක් අවශ්‍යයි නේ. ඊටපසුව නේ ජනමත විචාරණයකට යන්නේ. ඒ නිසා අපි මේක අවුල් කර ගන්න ඕනෑ නැහැ. කවුරු හිටියත් මේක වෙනස් කර ගන්න පුළුවන්. ඉදිරියේදී කර ගන්නත් පුළුවන්. හැමෝම සහයෝගයත් දෙයි. දැන් මගෙන් ඇහුවා, මේ පනත් කෙටුම්පතට අත ඉස්සුවාද කියලා. අත ඉස්සුවාම තිබෙන වරද මොකක්ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන යම්කිසි ව්‍යාකූලතාවක් වෙනත් කාටවත් ප්‍රශ්නයක් නොවී, මැතිවරණවලට ප්‍රශ්නයක් නොවී නිවැරදි කර ගන්නවා නම් එහෙම කරන එකේ ප්‍රශ්නයක් නැහැ.

අපි දැන් ඊළඟ කාරණයට යමු. විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැටියට තමයි මේක සඳහන් කරලා තිබෙන්නේ. අනුර කුමාර දිසානායක මැතිතුමාත් මේ ගැන සඳහන් කළා, එතුමන්ලාත් මේ ගැන සාකච්ඡා කළා. ඒ නිසා මෙම පනත් කෙටුම්පත ඇතුළු ලිපිලේඛන සියල්ල මම **සභාගත*** කරනවා.

මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දු හා නිර්වචන තිබෙනවා. මෙතැන තර්කයක් මතු කළා, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දෙවරක් කියලා තිබෙන නිසා මේක ඕනෑද කියන කාරණය. එහෙම නම් මම තව කාරණයක් ගන්නම්කෝ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70වන ව්‍යවස්ථාව ගනිමුකෝ. ඔබතුමන්ලාට මතකයි නේ, දින 52 ආණ්ඩුව පත් කරලා 70වන ව්‍යවස්ථාව අනුව තමයි ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා නඩුකාරවරු 7දෙනෙකුගේ Bench එකකින් තීන්දුව ගත්තේ කියන එක. එතැනදී ආපු තර්ක ටික බලන්නකෝ. එතැනදී "පාර්ලිමේන්තු සභා වාර" කියන එක ගැන දින ගණනාවක් සාකච්ඡා වුණා. එම ව්‍යවස්ථාව සහ එහි උප වගන්ති ගැනත් තර්ක කළා. ඒ නිසා ව්‍යවස්ථාදායකය හැටියට අපට යම් ව්‍යාකූලතාවක් තිබෙනවා නම්, ඒක ඉවත් කිරීම පිළිබඳව ගැටලුවක් නැහැ. හැබැයි, අපේ රටේ Supreme Court එකෙන් දෙන තීන්දුවක් ප්‍රකාරව පනතක් සම්මත කිරීමේදී, Supreme Court එකෙන් ලබාදෙන මඟ පෙන්වීම සහ අර්ථ නිරූපණ අනුව කරන සංශෝධන තමයි ඒ ඒ ව්‍යවස්ථාවල කොටසක් වෙන්නේ. එහෙම නැතුව Supreme Court එකෙන් ලබාදෙන තීන්දුවකදී කරන නිර්වචනයක් අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක් වෙන්නේ නැහැ. දැන් මේ කරලා තිබෙන්නේ මොකක්ද? Supreme Court එකෙන් දුන් නිර්වචනය ව්‍යවස්ථාදායකය හැටියට අපි මේ පාර්ලිමේන්තුවේ සම්මත කරලා ව්‍යවස්ථාගත කරනවා. ඒකේ තිබෙන වරද මොකක්ද?

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම එතැනින් එහාට යනවා. මේවා ගැන තමයි මම කලිනුත් සඳහන් කළේ. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රකින්න සිදු වුණු අවස්ථා තිබෙනවා. එදා -1971 දී - සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ රටේ ජනතාව ලබා දුන් ජන වරම රැක්කා. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ඒක රැක්කා. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාත් ඒක රැක්කා. ඒකම තමයි දැනුත් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මතක තබා ගත යුතු තවත් කාරණයක් තිබෙනවා. 1982න් පස්සේ 2009 වෙනකල් මේ රටේ ජනාධිපතිවරණවල සහ ඕනෑම මැතිවරණයක ප්‍රධාන සාධකය වුණේ LTTE සංවිධානයේ ක්‍රියාකාරකම් සහ වේළුපිල්ලේ ප්‍රභාකරන්.

ඒ සාධකය මත තමයි හැම මැතිවරණයකම තීන්දුව තීරණය වුණේ. හැබැයි දැන් බොහෝදෙනෙකුට බොහොම ලෙහෙසියි. එදා දේශපාලන නායකත්වය දුන් අයට විවිධ අන්වර්ථ නාම දුන්නා, අරගළය වෙලාවේ. "Go home!" කිව්වා. "Go home!" නොවෙයි tent එකක් ගහන්න හම්බ වෙන්නේ නැහැ ප්‍රභාකරන් හිටියා නම්; 2009දී යුද්ධය අවසන් නොකළා නම්. දැන් මේ අවුරුදු 15ට ඒවා මතක නැහැ, සමහරුන්ට. සමහරුන්ට මතක නැහැ. ගරු මන්ත්‍රීතුමා මෙතැන හිටියා, දැන් ගියා නේ. ඒවා මතක නැහැ. නෝනයි මහත්තයයි කොළඹ ආවේ නැහැ, එකම කෝච්චියෙන්, බස් එකෙන්. දෙන්නා වෙන වෙනම ආවේ. මොකද, එක්කෙනෙක් බෝම්බයකට අහු වුණොත් අනෙක් කෙනා හරි ඉතුරු වෙයි කියලා. අද ඒක මතක නැහැ. අද මේ රටේ මිනිස්සුන්ට මතක නැහැ, දැනට අවුරුදු දෙකකට කලින් මේ රට තිබුණු හැටි. ඒවා ඔක්කෝම සමනය කරලා දුන්නාට පස්සේ දැන් කියනවා, "අපි ආවාම මෙහෙම කරනවා, අරවා දෙනවා, මේවා දෙනවා" කියලා. තියෙන ඒවා ඔක්කෝම දෙනවා. හැබැයි දෙන්නේ කොහොමද කියලා දන්නේ නැහැ.

සමහරු කථා කරනවා, නිෂ්පාදන ආර්ථිකයක් ගැන. මැතිනිය නිෂ්පාදන ආර්ථිකයක් ඇති කරන්න ගිහිල්ලා තමයි ආසන අටට බැස්සේ. මඤ්ඤොක්කා කැව්වා, බතල කැව්වා. අපි ඒ කාලයේ පාසල් යනවා. සමුපකාරයට යනවා පාන්දර හතරට, "Jumping Fish" poplin එක ගන්න. යුවළක් විවාහ වෙනවා නම් සූට් එකට රෙදි ගන්න ඕනෑ, විවාහ සහතිකය පෙන්වලා. ඊළඟට, මඟුල් ගෙදරට දෙන කෑම වට්ටෝරුව තීන්දු වෙනවා. ඒ, නිෂ්පාදන ආර්ථිකය කරන්න ගිහිල්ලා. මේවා මිථ්‍යාවන් නේ. අද ලෝකයේ රටවල් ඒ ඒ රටවලට ආවේණික නිෂ්පාදන කරගෙන යනවා. ලෝකයේ කිසිම රටකට බැහැ, තමන්ට අවශ්‍ය සියලු දේ සම්පාදනය කර ගන්න; නිෂ්පාදනය කර ගන්න. දැන් සිංගප්පූරුව මොකද කරන්නේ? සිංගප්පූරුව පලතුරු ගෙඩියක් බිම වැටෙන්න දෙන්නේ නැහැ; පොල් ගෙඩියක් බිම වැටෙන්න දෙන්නේ නැහැ; කපුටෙකුට ඒවායේ උඩින් පියාඹන්න දෙන්නේ නැහැ. ඒ අය සියලු දේ අපනයනය කරනවා. අපට එතැනට යන්න බැහැ. එදා පැල්වත්තේ, කන්තලේ සීනි හැදුවා. හෙක්ටෙයාර 11,000ක් තිබෙනවා. අද මොකද වෙලා තිබෙන්නේ? අද කැලේ වැවිලා නේ. ඇයි? සීනි කිලෝවක නිෂ්පාදන පිරිවැය බැලුවාම ආනයනය කරන එක ලාභයි නිෂ්පාදනය කරනවාට වඩා. ඒ නිසා ලෝකයේ රටවල් බෙදිලා තිබෙනවා, තම තම රටවල නිෂ්පාදනය වෙන භාණ්ඩ, කෘෂිකාර්මික භාණ්ඩ අනුව. එතකොට ඒවායේ හුවමාරුවක් වෙනවා. ජාත්‍යන්තර වෙළෙඳාම සිදු වෙන්නේ එහෙමයි. ආනයනය, අපනයනය සිදු වෙන්නේ එහෙමයි. එතකොට ඒකට currency සම්බන්ධ වෙනවා. අපේ රටේ පෙට්‍රෝලියම් නිෂ්පාදනය කරන්නේ නැහැ. ඒ නිසා අපි හැම product එකක්ම එහෙන් ගෙනෙන්න ඕනෑ. ඩොලර් බිලියන 5ක් යනවා වර්ෂයකට, අපට අවශ්‍ය තෙල් ටික ගෙන්වන්න. රටේ සමස්ත ආනයන **වියදම** අවුරුද්දට ඩොලර් බිලියන 21යි. එයින්

සියයට 25ක් යන්නේ පෙට්‍රෝලියම් සඳහා. කවුරු ආණ්ඩුව ගත්තත් රටින් තෙල් ගෙනෙන්න වෙන්නේ නැද්ද? ගෙනෙන්න ඕනෑ. ඖෂධ ඔක්කෝම අපේ රටේ නිෂ්පාදනය කරනවාද? සියයට 80ක් පිට රටින් ගෙන්වන්නේ. ඒ සියයට 80 ගෙනෙන්න ඕනෑ. කවුරු ආණ්ඩුව ගත්තත් කිරිපිටි ගෙන්වන්න වෙන්නේ නැද්ද? ගෙන්වන්න ඕනෑ. ඊළඟට, අමුද්‍රව්‍ය ගෙන්වන්න ඕනෑ. ඒවා ඔක්කෝම අපි හදන්නේ නැහැ නේ. ලෝකයේ ආර්ථිකය හැඩගැහිලා තිබෙන රටාවක් තිබෙනවා. ඒ රටාවත් එක්කයි යන්න වෙන්නේ. කවුරු හරි කියනවා නම් නිෂ්පාදන ආර්ථිකයක් ඇති කරනවා, අපි ඔක්කෝම නිෂ්පාදනය කරනවා කියලා, එහෙම නම් ඉතින් අර බර කරන්න යුගයට යන්න වෙයි. කරන්න ටිකකුයි, කැලේ ඉන්න හරක් ටික හීලෑ කරලායි ගන්න වෙයි. අපේ ප්‍රවාහන ඇමතිතුමාට SLTB බස් රථ වෙනුවට බර කරන්න fleet එකක් දමා ගන්න වෙයි, ප්‍රවාහනය හදලා දෙන්න මිනිසුන්ට. මේවා තමයි සමහරු අද ගිහිල්ලා රටට කියන්නේ. මම කිව්වේ ඒකයි. ඒ නිසා අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු දෙකක් තිබෙනවා. මොන කථා කිව්වත්, මොන සුරංගනා කථා මැව්වත්, ජනතාවට රිදෙනකොට තිබෙන ආණ්ඩුවට බණිනවා. නැතුව වෙන කාට බණින්නද? බැන්නේ 225දෙනාටම නේ. 225දෙනාටම බැන්නා නේ. තමන්ට වේදනාව ආවාම, දරාගන්න බැරි වෙනකොට ළඟ ඉන්න කෙනාටත් බණිනවා. ඒක තමයි වෙන්නේ.

දේශපාලනඥයන් හැටියට අපි ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමේදී අනාගතයත් එක්ක යන වැඩ සැලැස්මක් තිබෙන්න ඕනෑ. හුදු විවේචන විතරක් නොවෙයි, මේවා කෙරෙන්නේ කෙසේද කියලාත් බලන්න ඕනෑ. කෙරුණු ඒවායේ අඩුපාඩුකම් තිබෙනවා නම්, ඒවා හදා ගන්න පුළුවන්. ඒක වෙනම කාරණයක්. හැබැයි අපි එකක් පිළිගන්න ඕනෑ. 2022 අප්‍රේල් මාසයේ තිබුණාට වඩා අද තත්ත්වය හොඳ නැද්ද? අද හොඳ නැහැ කියන්නේ ඇයි? මිල වැඩියි. හැබැයි ඉතින් 2022 අප්‍රේල් වෙනකොට කැබිනට් මණ්ඩලයේ හිටපු අය නේ භාගයක් අද ඔය පැත්තේ ඉන්නේ. ඊයේ පෙරේදාත් එකතු වුණේ දෙතුන් දෙනෙක්! මේ පාරත් එහෙමයි. මෙච්චර කල් දර දිය ඇදපු කිරිඇල්ල මැතිතුමා, අබේසිංහ මැතිතුමා නම් ඉන්නවා.

ඔබතුමන්ලා කොහේද දැන්? පිටුපස නේ ඉන්නේ? දැන් ඉස්සරහා ඉන්නේ ජී.එල්. පීරිස් මැතිතුමා නේ. එතුමා දැනුත් ඉන්නවා. ඔබතුමන්ලාට වෙන්නේ ඕකයි. ඕක තමයි වෙන්නේ. නාලක ගොඩහේවා මහත්තයා තමයි ආර්ථික විශේෂඥයා.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උறුප්පිනர් ஒருவர்)
(An Hon. Member)
නැහැ, නැහැ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මම දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* "ඔබතුමන්ලාගේ" කියලා මම කිව්වේ නැහැ නේ. ආර්ථික විශේෂඥයා කියලායි කිව්වේ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ පිළිකන්නෙන් රිංග රිංගා උදේ හවස ගිය එක්කෙනෙක් දැන් ජනාධිපති අපේක්ෂකයෙක්. හොඳ ව්‍යවසායකත්වය ලු - entrepreneurship ලු. ව්‍යවසායකත්වය කරන්න බැරි ද, රාජ්‍ය අනුග්‍රහය අරගෙන restaurants, hotels දාලා ඒවා කරගෙන යන කොට?

පොහොට්ටුවෙන් එක්කෙනෙක් පත් කළා, ජාතික ලැයිස්තුවෙන්. ඒ, දැනට අවුරුදු දෙකකට විතර කලින්. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ. මේ පාර්ලිමේන්තුවට දවස් කීයක් ඇවිල්ලා තිබෙනවාද? දවස් කීයක් කථා කරලා තිබෙනවාද? *[බාධා කිරීමක්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද ඒ?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඕනෑ දෙයක් හිතා ගන්න. *[බාධා කිරීමක්]* ආ! දැන් ඒ ගොල්ලොත් ජනාධිපති අපේක්ෂකයෝ නේ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ගැන කුමාර වෙල්ගම මහත්මයා ඔය පැත්තේ ඉඳගෙන කිව්වේ, එතුමා නගර සභාවක ඉඳලා නැහැ, පළාත් සභාවක ඉඳලා නැහැ, දේශපාලනය කරලා නැහැ කියලායි. ඒක නේ අවුරුදු දෙකහමාරෙන් වැඩේ ඉවර කරන්න වුණේ. දැන් මේ අය ඇවිල්ලා කියනවා, "මට තමයි ගොඩ දාන්න පුළුවන්. පොහොට්ටුවෙන් නාම යෝජනා දෙනවා නම් මම එනවා" කියලා. යකෝ! පාර්ලිමේන්තුවට ඇවිල්ලා අවුරුදු දෙකහමාරයි. දවස් කීයක් පාර්ලිමේන්තුවට ආවාද? හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්නකෝ, වචන කීයක් කථා කරලා තිබෙනවාද කියලා. එයා තමයි රට ගොඩ දමන්න දැන් අනෙක් පැත්තෙන් එන්න හදන්නේ. මේවා විහිළු. එහෙම නේද, ගරු විපක්ෂ නායකතුමා?

1991 ඉඳලා නගර සභාවේ ලයිට් එක දාන තැන ඉඳන් අපි දැන ගෙන හිටියා. අපි ඒ දේශපාලනය දැක්කා. මේ රටේ කෘතහස්ත දේශපාලනඥයෝ හිටියා. එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය නිරපරාදේ අහෝසි කළා. ඊට පස්සේ වාමාංශික නායකයන් වුණු ඇන්.ඇම්. පෙරේරා මහත්මයා, පිලිප් ගුණවර්ධන මහත්මයා, දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මහත්මයා ආදි කිසි කෙනෙකුට ඒ කාලයේ දූෂණ චෝදනා තිබුණා ද? අවුරුදු කීයක් ආණ්ඩු කළා ද? පළමුවෙනිම චෝදනාව, වඩුගොඩපිටියේ මොකක් හරි එකක්,- බණ්ඩාරනායක මැතිතුමා තමයි 1959දී නියෝජ්‍ය ඇමතිවරුන් තුන්දෙනෙක් ගෙදර යැව්වේ. මම ඒ අයගේ නම් කියන්න යන්නේ නැහැ. ඊට පස්සේත් ආණ්ඩු තිබුණා; ආණ්ඩු කළා. ඒ කාටවත් එවැනි චෝදනා ආවේ නැහැ. ඒ පදනම -basis එක - මත තමයි ආවේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු අමාත්‍යතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එහෙම නම්, මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ.

මම ඉතා පැහැදිලිව සඳහන් කරනවා, ව්‍යවස්ථාවේ තිබෙන දෙයක් සංශෝධනය කරන්නට යෑම මැතිවරණ කල් දැමීමට හේතුවක් නොවන බව. එසේ විය යුතු ද නැහැ. මගේ මතය නම්, අවුරුදු 5න් මැතිවරණය තියන්න ඕනෑ කියන එකයි. අපි ජනතාවගේ අයිතිය දෙන්න ඕනෑ. ජනතාව තීන්දු කරපුදෙන් පාර්ලිමේන්තුවට එන්නේ කවුද, ජනාධිපති වෙන්නේ කවුද කියන කරණා. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒක තමයි රජයේ මතය. ඒ බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, මම කියන්න යන්නේ, එදා ඔබතුමාත් මැදිහත් වුණු, අපේ ගරු විපක්ෂ නායකතුමාත් මේ පාර්ලිමේන්තුවේදී කථා කරපු කාරණාවක් ගැනයි. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඇතුළු මුස්ලිම් මන්ත්‍රීවරු ගොඩක් මේ ගැන කථා කළා. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඒකෙදි ඔබතුමා උදව් කළා. ඒ විභාගයේ results දැන් ඇවිල්ලා තිබෙනවා. ඒ ළමයි සතුටින් ඉන්නවා. ඒකට බොහොම ස්තුතියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒක විසඳුවා නේ?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ඔව්, ත්‍රිකුණාමලයේ ප්‍රශ්නය විසඳුවා. ඒකට බොහොම ස්තුතියි. තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ, අර 13දෙනාගේ ප්‍රශ්නය.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
EB Exam එකේ නේද?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
EB Exam එකේ තවම results ආවේ නැහැ කියලා,-

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ලබන සුමානයේ විතර,-

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ඒ ප්‍රශ්නය ලබන සුමානයේ විසඳලා දෙන්න.

තවත් කාරණයක් කියන්න ඕනෑ. ඒ වාගේ දේවල් දිගටම කරන්න දෙන්න එපා. Hijabs දා ගෙන ගිහිල්ලා විභාග ලියන්න බැහැ කියලා සමහර නිලධාරිවරු කියනවා. National Identity Card එකේ තිබෙන විධියට photo එක පෙන්වනවා නම්, lady කෙනෙක් check කරනවා නම් ඒ ගොල්ලන් ෆර්දාව වුණත් ගලවලා පෙන්නාවි. එහෙම කරන්නේත් නැතුව, විභාගයට ඉන්න දෙන්නේ නැති එක වැරදියි. අනාගතයේදී එහෙම නොකරන්න වග බලා ගන්න කියලා මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලනවා. ඔබතුමා ජාතිවාදියෙක් නොවෙයි නේ. අපි ඒක දන්නවා. ඔබතුමා ගොඩක් වැඩ කරපු කෙනෙක්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මම උපදෙස් දෙනවා, ඉදිරියේදී පැවැත්වෙන විභාගවලදී සාමාන්‍ය ක්‍රමවේදය ක්‍රියාත්මක කරන ලෙසට චක්‍රලේඛයක් යවන්න කියලා. ඔබතුමා කියන centresවල අයගේ ප්‍රශ්නය තමයි මතු වෙලා තිබුණේ.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ඒ නිලධාරීන්ට විරුද්ධව ඔබතුමා action එකක් ගන්න ඕනෑ. මොකද, ඒ අය වැරදියි නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පරීක්ෂණය දැන් අවසන් කරලා තිබෙන්නේ. ඒ අනුව අපි පියවර ගන්නම්.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.49]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු සභානායකතුමා විභිළු ගැන කථා කළා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මොකක් ගැනද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විභිළු ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ යෝජනාවක් මේ සභාවට ගෙන ඒම ඇත්තටම අවශ්‍ය ද? ඇයි, මේ වාගේ යෝජනාවක් ගෙන ආවේ? මම බොහොම පැහැදිලිව අහන්නට ඕනෑ, මේ වාගේ යෝජනාවක් ගෙන ආවේ ඇයි කියලා. අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතාම පැහැදිලිව - සක්සුදක් සේ - ප්‍රත්‍යක්ෂ කර තිබෙනවා, මැතිවරණ පැවැත්විය යුතු කාල වකවානු. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි එසේ සඳහන් වී තිබියදීත් මේ වාගේ යෝජනාවක් ගෙන ආවේ ඇයි? මොකක්ද හේතුව? එයට ප්‍රධාන හේතුව තමයි ඔබතුමා කියපු ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් විභිළුවට ලක් කරන යුගයක් අද බොහොම පැහැදිලිව නිර්මාණය වෙලා තිබීම.

මේක ප්‍රජාතන්ත්‍රවාදී රටක්, ජනතා පරමාධිපත්‍යය රජයන රටක්. ප්‍රජාතන්ත්‍රවාදයේ කුලුනු තුන වන විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය, බලය බෙදා දීම, සංවරණ සහ තුලන, ඒ ඔක්කෝම ප්‍රතිපත්ති තුළ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව ස්ථාපනය වෙලා තිබෙනවා. හැබැයි, මම පැහැදිලිව මේ කාරණයත් කියන්නට ඕනෑ. අද -මේ මොහොතේ- රටේ බහුතර ජනතාවගේ මතයක් තිබෙනවා, ව්‍යවස්ථාමය කුමන්ත්‍රණයකට - constitutional conspiracy එකකට - අද පවතින රජයත්,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

යොමු වෙනවා කියලා. ඒකයි සැකය. ඒකයි මෙවැනි යෝජනාවක් ගෙන ආවේ. ජනතා පරමාධිපත්‍යය ගැන කථා කරනවා; ඡන්ද ගැන කථා කරනවා; ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා; ජනතාවගේ ස්වෛරීත්වය ගැන කථා කරනවා. ඒ ඔක්කොටම එකඟ වෙලා නුල් සූත්තර, කුප්‍රකට කුමන්ත්‍රණ ක්‍රියාත්මක කරමින් වරමක් නැති

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

විකෘති වරමක් හරහා තමන්ගේ බලය පවත්වාගෙන යෑම සඳහා ව්‍යවස්ථාවෙන් පිට පැන්න - extra constitutional - ක්‍රමවේද අනුගමනය කරන්නට කටයුතු කිරීම ලජ්ජා සහගත ක්‍රියාවක්.

මම ගරු සභානායකතුමාගේ කථාවට හොඳින් සවන් දුන්නා. මම ගරු සභානායකතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා, මගේ අදහස්වලටත් හොඳින් සවන් දෙන්න කියලා. ඇයි, අපි කියන්නේ ව්‍යවස්ථාමය කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වෙනවා කියලා? ගරු සභානායකතුමනි, අද පළාත් පාලන මැතිවරණවලට සිදු වෙලා තිබෙන්නේ මොකක්ද කියලා මට කියන්න. රුපියල් බිලියන 10ක් දෙන්න සල්ලි නැහැ කිව්වා. මැතිවරණ පවත්වන්න ප්‍රතිපාදන නැහැ කිව්වා. මොකක්ද, ඒ නටපු නැටිල්ල? ඒ නටපු නැටිල්ල නිසාම ජනාධිපතිවරණයත් එක්කත් එහෙම නැටිල්ලක් නටයි කියන සාධාරණ සැකය අප සියලුදෙනා තුළ මතු වන එක අසාධාරණද කියන ප්‍රශ්නය මම අහන්න කැමතියි. පළාත් පාලන මැතිවරණයට කළේ මොකක්ද? එක වෙලාවක කිව්වා, සභිකයන් ප්‍රමාණය අඩු කරන්නට ඕනෑ, සීමා නිර්ණය කරන්නට ඕනෑ කියලා. ඊට පස්සේ කිව්වා, මැතිවරණය පවත්වන්න මුදල් නැහැ කියලා. ඒ වාගේම, මැතිවරණය පැවැත්වීමට එරෙහිව අධිකරණයට ගියා. ජනාධිපතිවරයා මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් කැඳෙව්වා. රාජ්‍ය පරිපාලන ලේකම්වරයා මඟින් ඇප භාර ගැනීම නතර කරන ලෙසට තේරීම් භාර නිලධාරිවරුන්ට උපදෙස් දුන්නු එක අමතකද? ඒ ලේකම්වරයා දැන් විශ්‍රාම ගිහිල්ලා; රටිනුත් ගිහිල්ලා. ඒ, අපේ හපුහින්න මහත්මයා. ඒ තරමටම එතුමාට තර්ජනය කළා. එදා හපුහින්න ලේකම්තුමාව ගෙන්වා පැහැදිලිවම කිව්වා, ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කරන්න කියලා. ඒ වාගේ තත්ත්වයක් තුළ ජනාධිපතිවරණය ගැන සාධාරණ සැකයක් මතු වෙන්නේ නැද්ද කියලා මම අහන්න කැමතියි.

මැතිවරණ වියදම් නියාමනය සම්බන්ධයෙන් පනත් කෙටුම්පත් ගෙන ආවා. තරුණ නියෝජනය ගැන යෝජනාවක් ගෙන ආවා. අපි ඒවාට විරුද්ධ නැහැ. අපි ඒවාට අනිවාර්යයෙන් පක්ෂයි. මැතිවරණය පැවැත්වුවහොත් නියමිත දිනයට රාජ්‍ය සේවක වැටුප් දෙන්න බැහැ කියලාත් කිව්වා.

රාජ්‍ය සේවයත් තර්ජනයට ලක් කළා. මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජිතයින්ට ඉවත් වෙන්න කියලා මරණ තර්ජනත් කළා. මැතිවරණ කොමිසමේ සාමාජිකාවක් ඉල්ලා අස් වෙලා කියලා කොමිසමේ ගණ පූරණයටත් බලපෑම් කළා. දැන් ඒ සාමාජිකාවට හොඳ තෑග්ගක් ලැබිලා තිබෙනවා නේද, ගරු සභානායකතුමා? හිටපු සාමාජිකාවට මම හිතන විධියට උතුරේ ආණ්ඩුකාරකම ලැබුණා නේද? කොහොමද වැඩේ? ඉතින්, සාධාරණ සැකයක් ඇති වෙන්නේ නැද්ද? අනිවාර්යයෙන්ම ඇති වෙනවා. මැතිවරණයක් කැඳවා ඇති මොහොතක, මැතිවරණ කොමිසම සඳහා සාමාජිකයින් පත් කරන්න අයදුම් පත් කැඳවීමක් ක්‍රියාත්මක කරන්නට යෙදුණා. රජයේ මූල්‍ය ප්‍රවාහයේ ගලා යෑමට බාධා කරමින්, වියදම් සීමා ඇතුළත් කරපු චක්‍රලේඛ ඉදිරිපත් කළා. ඉතින්, ගරු සභානායකතුමනි, ඔබතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන, එහි ඉතිහාසය ගැන බොහොම ලොකු විග්‍රහයක් කළා. ඔබතුමා ඒ ඉතිහාසයට එකතු කරන්න, ව්‍යවස්ථාමය කුමන්ත්‍රණය -Constitutional conspiracy - කියන එකත්. දැන් ඔබතුමා කියනවා, ආර්ථිකය ස්ථාවර වෙලා ලු. ස්ථාවර වෙලාද? ජන ජීවිත කුඩා වෙලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එදාට සාපේක්ෂව.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ආ, එදාට සාපේක්ෂව. එදා කියන්නේ කවදාද? මම නම් එදා කියන්නේ 2019 ජනාධිපතිවරණය.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
2022 අප්‍රේල් ගැන මම කියන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ සාමාන්‍යය නම් 2019 ජනාධිපතිවරණය. ඒ ජනාධිපතිවරණයෙන් පස්සේ ආපු ආණ්ඩුව විශ්‍රාමිකයාගේ ඉඳලා ගොවියා, ධීවරයා, කම්කරුවා, ව්‍යවසායකයා, කර්මාන්තකරුවා, කුඩා දරුවාගේ ඉඳලා මවු පරපුර, දරු පරපුර විනාශ කළා. දැන් මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි,- *[බාධා කිරීමක්]* එදාට සාපේක්ෂව අද හොඳයි ලු. *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමනි, මම ඔබතුමාට බාධා කළේ නැහැ. බොහොම කනගාටුයි, ඔබතුමා මට බාධා කිරීම ගැන. මම ඔබතුමාට කවදාවත් බාධා කරන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමා තරහා ගන්නත් එපා. කරුණාකරලා මගේ අවස්ථාව දෙන්න.

දැන් ඔබතුමා කිව්වා, එදාට සාපේක්ෂව අද හොඳයි ලු. ඒ කියන්නේ 2019 ජනාධිපතිවරණය තිබුණු කාලයට සාපේක්ෂව අද හොඳ ද? නැහැ, ඔබතුමන්ලා බලයට ඇවිල්ලා, ඔබතුමන්ලා රට බංකොලොත් කරලා, රට විනාශ කරලා, රුපියල් බිලියන 600ක, 700ක රාජ්‍ය ආදායම නැති කරලා, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට රාජ්‍ය ආදායම සියයට 12 ඉඳලා සියයට 8ට අඩු කර ගෙන, Fitch, Moody's සහ Standard & Poor's ratingsවලින් රටේ ශ්‍රේණිගත කිරීම් පතුලටම බස්සලා, රට විනාශ කරලා කියනවා, ඒ විනාශ වුණු කාලයට වැඩිය අද හොඳයි ලු. ඒක හරිද? මොකක්ද මේ තර්කය? ඔබතුමන්ලා කරලා තිබෙන්නේ මොකක්ද? වර්තමාන ජනාධිපතිවරයා ප්‍රමුඛ මේ රජය කරලා තිබෙන්නේ මොකක්ද? සාමාන්‍යයක් නිර්මාණය කරලා තිබෙනවා. ඒ සාමාන්‍ය ජනාධිපතිවරයාටයි, කැබිනට්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මණ්ඩලයටයි, රජයටයි, රජයේ මැති ඇමතිවරුන්ටයි මන්ත්‍රීවරුන්ටයි බොහොම සුබවාදී සාමාන්‍යයක්. හැබැයි, ලක්ෂ 220ක් ජනතාවට කරපු මහ පාපකර්මයක්, මහා ශාපයක්. ලක්ෂ 220ක් වූ ජනතාවට කරලා තිබෙන්නේ මොකක්ද? ඔවුන්ගේ ජන ජීවිත කුඩා කරලා, දුප්පත්කම වැඩි කරලා, ආර්ථික අහේනිය ඉහළටම ඔසවා තබලා තිබෙනවා. මහජනතාව බඩගින්නේ ඉන්නේ. වේල් තුනක් කාපු අය වේල් දෙකයි කන්නේ. වේල් දෙකක් කාපු අය එක වේලයි කන්නේ. එක වේලක් කාපු ජනතාව අද හාමතේ ඉන්නේ, බඩගින්නේ ඉන්නේ. දැන් කියනවා, මේක stabilize කරලා ලු. ජන ජීවිත කුඩා කරලා, ආදායම් මාර්ග නැති කරලා. රජයේ සංඛ්‍යා ලේඛනවලට අනුකූලව ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර ලක්ෂ දෙකත්, ලක්ෂ තුනත් අතර ප්‍රමාණයක් වැසී ගිහිල්ලා, විනාශ වෙලා. සාමාන්‍යයක් නිර්මාණය වෙලා ලු. මම කියන්නම්, ගරු සභානායකතුමනි. සාමාන්‍යයක් නිර්මාණය වෙලා තිබෙනවා, ආණ්ඩුවේ සමහරුන්ට හොරකම් කරන්න, ආණ්ඩුවේ සමහරුන්ට පගා ගහන්න.

Liquor permit එකෙන් - මත්පැන් බලපත්‍රවලින්, අරක්කු බලපත්‍රවලින් - පගාව ගැහුවා. මුදල්වලට රහ වැටිලා බංකොලොත් රටෙත් පගා ගැහිල්ල ක්‍රියාත්මක කළා. දැන් කොහොම හරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කුමන්ත්‍රණයකින් කාලය දික් කර ගන්න හදනවා. අපි කියනවා නිවට වෙන්න එපා, බියගුලු වෙන්න එපා කියලා. එන්න ජනතාව ඉදිරියට, එන්න මැතිවරණයකට මුහුණ දෙන්න. ජනතාව ඉදිරියට ඇවිල්ලා ජනතා තීන්දුවට හිස නමන්න ඉගෙන ගන්න, කැත වැඩ කරන්නේ නැතිව, වැරදි වැඩ කරන්නේ නැතිව, ව්‍යවස්ථා විරෝධී වැඩ කරන්නේ නැතිව.

මම ඕනෑ තරම් උදාහරණ ඔබතුමන්ලාට ඉදිරිපත් කළා. පළාත් පාලන මැතිවරණය සම්පූර්ණයෙන් කඩාකප්පල් කරන්නට කුමන්ත්‍රණ ක්‍රියාත්මක කළා, තර්ජනය කළා. ගරු සභානායකතුමනි, අද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගැන තිබෙන ව්‍යවස්ථාත් උල්ලංඝනය කරලා සමහර පත්කිරීම් කරලා තිබෙන්නේ කොහොමද? කොහොමද පොලිස්පතිවරයා පත් කළේ? ඒක සම්පූර්ණයෙන්ම ව්‍යවස්ථා විරෝධියි. එදා ඒ යෝජනාවට හතරදෙනෙක් පක්ෂ වුණා, දෙදෙනෙක් විරුද්ධ වුණා, දෙන්නෙක් abstain වුණා. කථානායකවරයා abstain වුණ දෙන්නාගේ මතය විරුද්ධ වීමක් හැටියට සලකලා හතරයි හතරයි කියලා තීන්දුව අරගෙන ජනාධිපතිට ලියනවා, "මගේ තීරක ඡන්දය නම් අහවලාටයි" කියලා. මට කියන්න සභානායකතුමා, ඒක නීත්‍යානුකූලද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලාද නැද්ද? එහෙම නින්දිත වැඩ කරලා පත් කිරීම් කරලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් නිර්මාණය කළේ සංචරණ සහ තුලන - checks and balances - ඇති කරන්න. ඒකත් කුණු බක්කියට විසි කරලා දමලා අත්තනෝමතිකව ක්‍රියා කරනකොට සාධාරණ සැකයක් නිර්මාණය වෙන්නේ නැද්ද ජනාධිපතිවරණයටත් පික්පොකට් ගහයි කියලා? ඒක මට කියන්නකෝ බලන්න.

තමුන්නාන්සේලා මහා ශුද්ධවන්ත වූ, පාරදෘශ්‍ය වූ පුද්ගලයෝ හැටියට මේ සභාවට ඇවිල්ලා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ, ජනතා හඬට ඉඩක් දීම, ජනතා මතයට ඉඩක් දීම, ජනතාවට සවන් දීම, ජනතාවගේ දහඩිය සුවඳ හඳුනා ගැනීම සහ ජනතාවගේ සිතුම් පැතුම් අවබෝධ කර ගැනීම. ජනතාව ඉන්න කිව්වොත් ඔබතුමන්ලා ඉන්න, කිසි ප්‍රශ්නයක් නැහැ. ජනතාව එළෙව්වොත් යන්න. ඒක තමයි මහත්මා දේශපාලනය කියන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එතුමාට තවත් විනාඩි කිහිපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක තමයි ප්‍රශස්ත, ප්‍රබුද්ධ දේශපාලනය කියන්නේ. ඇත්තටම අද ඔබතුමා කිව්ව වචනය හරියටම හරි, අද මේක විහිළුවක් නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොතරම් පිරිසිදුව සඳහන් වෙලා තිබෙනවාද මැතිවරණයක් තිබෙන්න ඕනෑ කියන එකත්, මැතිවරණය තිබිය යුතු කාල වකවානුවත්? සැප්තැම්බර් 17වන දාත්, ඔක්තෝබර් 16වන දාත් අතර මැතිවරණය තියන්න ඕනෑ. එහෙම තිබියදීත් අපට සිද්ධ වෙනවා යෝජනාවක් ගේන්න. ඇයි? ජනතාව පීඩනයට ලක් නොකර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්නේ නැතිව, රටේ උත්තරීතර නීතිය උල්ලංඝනය කරන්නේ නැතිව වහාම මැතිවරණය තියන්න කියලා යෝජනාවක් ගෙනැල්ලා කියන්න සිද්ධ වෙලා තිබෙනවා.

මම අද උදේ ගරු සභානායකතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා, රටේ තිබෙන මර්දනකාරී තත්ත්වය පිළිබඳව. ඒ කියන්නේ පීඩනය සහ අද සමාජයේ නිර්මාණය වෙලා තිබෙන මිනීමරු සංස්කෘතිය ගැන. විවිධ පාතාලකරුවන්, කුඩුකාරයන් වැනි කණ්ඩායම්වල ප්‍රචණ්ඩත්වය අද රජ වෙලා තිබෙනවා. ගරු සභානායකතුමනි, දැන් ඔබතුමා දන්නවාද මේ රටේ නීතිය හා සාමය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ප්‍රතිපාදන නැහැ, අවශ්‍ය පහසුකම් නැහැ, පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍ය මානව සම්පත, භෞතික සම්පත් නැහැ කියලා? හැබැයි, ඔබතුමන්ලාට සල්ලි තිබෙනවා, "ප්‍රජා පොලිස් ව්‍යාපෘතිය" කියලා, කෝටි ගාණක් මුදල් වියදම් කරලා උඹ පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයෙන් ජනතාව වැල්ලවායට ගෙන ගිහින්, ජනාධිපතිවරයා ගෙන්වලා දේශපාලන රැස්වීමක් තියන්න.

ඔබතුමන්ලාට ඒවාට සල්ලි තිබෙනවා. ඒ වාගේ අකටයුතුකම් කරන්නට ඔබතුමන්ලාට මුදල් තිබෙනවා. මම මේ අවස්ථාවේ ගරු සභානායකතුමාටත්, වර්තමාන රජයටත් පැහැදිලිව කියන්න කැමැතියි, කරුණාකරලා එක එක ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කරලා මේ මැතිවරණ ක්‍රියාවලිය උල්ලංඝනය කරන්න උත්සාහ කරන්න එපා කියලා. ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට අත තියන්න එන්න එපා. මැතිවරණයට වරමක් ලබා දෙන්න, අවස්ථාවක් ලබා දෙන්න. මැතිවරණයේ දී ජනතාවගේ හඬ තුළින් ජනතා තීන්දුවට හිස නමන්න ඉගෙන ගන්න. මේ රටේ හිටලර්ලාට ඉඩක් නැහැ; මුසෝලිනීලාට, පොල් පොට්ලාට ඉඩක් නැහැ. මේ රටේ ඉඩක් තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට පමණයි. ඒ නිසා, මේ මැතිවරණය කඩාකප්පල් කරන්නට මේ නිර්මාණය කරන සියලුම ක්‍රමවේදයන්, සියලුම ක්‍රමෝපායන් ජන බලයෙන්, ජන සවියෙන් - ජනතා ශක්තියෙන් - පරාජය කරලා මේ රටේ ජනතාවගේ සර්වජන ඡන්ද බල අයිතිය ජයග්‍රහණය කරවන්නට සමඟි ජන බලවේගයන්, සමඟි ජන සන්ධානයක් අනිවාර්යයෙන්ම කටයුතු කරන බව මම ප්‍රකාශ කර සිටිනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.06]

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා (උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் - உயர் கல்வி இராஜாங்க அமைச்சர்)

(The Hon.(Dr.) Suren Raghavan - State Minister of Higher Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමා ඉතා වැදගත් වචන මාලාවක් පාවිච්චි කරමින් මැතිවරණය පිළිබඳව කථා කළා. මා දන්නේ නැහැ, එතුමා අර ගැලරියේ ඉන්න පාසල් දරුවන් දැක්කාද කියලා. ඒ දරුවන් දැක්කා නම් එතුමා තවත් කථා කරයි. එතුමා පාසල්වලදී ඓතිහාසික කථිකා කරනවා. අපි මාධ්‍ය හරහා එය දැකලා තිබෙනවා. අද දවසේ පාර්ලිමේන්තුව නිරීක්ෂණය කරන්නට ඇවිල්ලා සිටින පාසල් සිසුන් වන ඔබ සියලුදෙනා මම පිළිගන්නවා. මා දන්නේ නැහැ, ඔබ පැමිණි පාසල මොකක්ද කියලා. මොන පාසල වුණත් ඔබ ඇඳගෙන සිටින ඇඳුමෙන් මට පෙනෙනවා, ඔබ මුස්ලිම් පාසලකින් පැමිණ තිබෙන බව.

அஸ்ஸலாமு அலைக்கும்! நீங்கள் இங்கு வருகை தந்திருப்பதன்மூலம் இந்த நாட்டில் ஜனநாயகம் எந்தளவுக்கு ஆழமாக இருக்கின்றது என்பதை உங்களுடைய கண்களினூடாகப் பார்க்கக்கூடியதாக இருக்குமென நான் நம்புகின்றேன்.

කවදා හෝ ඔබෙන් කෙනෙක් ආනාගතයේ මේ පාර්ලිමේන්තුවේ වාඩි වුණොත්, ඔබ එවකට ජීවත් වන සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදයේ ගැඹුර ආරක්ෂා කරන්නට ඔබටත්, ඔබේ ගුරුවරුන්ටත්, ඔබේ දෙමවුපියන්ටත් ශක්තිය, ධෛර්යය ලැබේවා යන්නයි මගේ පළමුවැනි ප්‍රාර්ථනය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ යනු සහභාගී ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයක, සමූහයක තිබිය යුතු අවම කොන්දේසියයි. Participatory democracy demands a fundamental process of timely, frequent, fair and free elections. This country's democracy had been damaged due to some former leaders who tried to take up arms and others who took up arms in the North and opposed the democratic form of elections. In the world, we know that no government whatsoever, which had postponed elections, had ever been popular among the people and had also very seldom been elected. Those fundamental facts are in front of us to see. There is no question that the justification of existence of Sri Lanka as a Republic and a multi-religious, multiethnic and I would say, a multinational State with nuances is, fair, frequent and free elections. Now, after the unprecedented economic crisis it had to face with the peripheralized, marginalized citizens suffering more than anybody else, this nation has come through the last 23 months and formed a stable and progressing Government.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 4ක් තිස්සේ මම මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ අවුරුදු හතරේම මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙක්. මා ඉතා සතුටු වුණා, අපි පළමුවැනි වතාවට ලංකාවේ සාර්ව ආර්ථිකය පිළිබඳව පනතක් ගෙනෙන්නට ලෑස්ති වෙලා ඒ පනතේ අවසාන draft එක ගැන මීට මිනිත්තු කිහිපයකට; පැයකට කලින් සාකච්ඡා කිරීම පිළිබඳව. එහි පිටු ගණන් ලියැවිලා තිබෙනවා, සඳහන් කර තිබෙනවා - දේශපාලන විද්‍යාව පිළිබඳව ශිෂ්‍යයෙක් වන මම ඉතා සතුටු වුණේ ඒ නිසායි - "intergenerational economic justice" කියන යෙදුම. එය ආර්ථික යෙදුමක් නොවෙයි, අතිශය දේශපාලනික යෙදුමක්.

පරම්පරා දෙකක් අතර ඇති වී තිබෙන යම් හෝ ආර්ථික අසාධාරණය මැඩපවත්වා ගන්නට, අවම කර ගන්නට මේ පනත උදව් වන බව ඒ පනතේ සඳහන් වෙනවා. ඉතාම ප්‍රගතිශීලී, ඉතාම ජනකේන්ද්‍රීය වූ, ජනතාවට වග කියන, ජනතාවට වග වෙන එවැනි වූ පනතක් ගෙනෙන්න අපට පුළුවන් වුණේ කොහොමද? "අරමුණු ඇතිව කළමනාකරණය කිරීම" - "Management by Objectives" - කියන පොත ෆ්‍රැන්ක්ෆර්ට් විශ්වවිද්‍යාලයේ උගත් පීටර් ඩ්‍රකර් කියන සමාජ ආර්ථික කළමනාකරණ විද්‍යාඥයා විසින් ලියන ලද්දක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙක් සහ පාර්ලිමේන්තුව නියෝජනය කරන කෙනෙක්. ෆ්‍රැන්ක්ෆර්ට් විශ්වවිද්‍යාලයේ බිහිවුණු විමර්ශන පාසල - Frankfurt School of Critical Theory - තමයි ලෝකයේ වාමාංශික කඳවුර ඉතාම ශක්තිමත් කළේ, before they moved into the New York School of Rationalities. ඒ විශ්වවිද්‍යාලයේ උගන්වපු කෙනෙක් තමයි පීටර් ඩ්‍රකර්. ඔහු මොකක්ද කියන්නේ? ආර්ථිකය වාගේම සමාජය, රාජ්‍යය ගෙන යා යුත්තේ ප්‍රතිපත්ති ගරුකවය, ප්‍රතිපත්ති පදනම් කරගෙනය. පීටර් ඩ්‍රකර් මෙය කියන්න කලින් අවුරුදු 2000ක් තිස්සේ පැවත එන ථේරවාදී බෞද්ධ රටක් හැටියට අපි මේක දන්නවා.

මහාචාර්ය ජී.එල්.පීරිස් මැතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. පානදුර කියන්නේ එතුමාගේ ගම් ප්‍රදේශය. පානදුරාවාදය පිළිබඳව අපි දන්නවා. ඊට පස්සේ පානදුර ප්‍රසිද්ධ වෙන්නේ මහා තොරණට. මා ළමා කාලයේ ඉඳලාම හැම වෙසක් දවසකම පානදුර තොරණ බලන්න යනවා. නමුත්, බුද්ධාගමේ අපට කියා තිබෙන්නේ, ආමිස පූජා සියල්ලටම වඩා එක ප්‍රතිපත්ති පූජාවක් වැදගත් කියලායි. පන්සිල් රැකීම වැදගත් වනවා, තොරන් 1,000ක් හදනවාට වඩා. එහෙම නම්, ප්‍රතිපත්ති ගරුක රාජ්‍යයක් බිහි කරන්නට, ප්‍රතිපත්ති ගරුක සමාජයක අඩිතාලම දමන්නට නම් අපි ප්‍රතිපත්ති ගරුක රාමුවක් තුළ වැඩ කළ යුතුයි. ඒ නිසා මේ ඡන්දය පිළිබඳව ඇති වී තිබෙන විශේෂයෙන්ම ජනාධිපතිවරණය පිළිබඳව ඇති වී තිබෙන, ඇති කර තිබෙන, ඒ තුළින් ඇති කරන්නට උත්සාහ ගන්නා වූ ජන මනස ව්‍යාකූල කිරීම අපි ප්‍රතික්ෂේප කරනවා, හෙළා දකිනවා. මන්ද යත්, මහ ඉතාම පැහැදිලිය. හෙළ ගැඹුරුව තිබුණු ඒ අවස්ථාවන් මහ හරිමින් ජාතියක් හැටියට අපි ඉදිරියට ගියා. පෙට්‍රල් මිල ඉහළ ගියාම සිංහල ද, දෙමළ ද, මුස්ලිම් ද, කතෝලික ද, ක්‍රිස්තියානි ද, නිරාගමික ද කියලා බලන්නේ නැතිව ඒ සියල්ලෝම එම මිලට පෙට්‍රල් ලීටරය මිල දී ගත්තා. ඒ නිසා ඡන්දය කල් දැමීම රාජ්‍යය කිසි විධියකින් නොකළ යුතු වැඩක්ය. එය මේ රජය කිසිසේත්ම කරන්නට සූදානම් නැත. එසේ කිරීම අවශ්‍ය ද නැත. ඇයි, අපට අවශ්‍ය වෙන්නේ ? මගේ දෙවියනේ! පශ්චාත් නිදහස් කාලයෙන් පස්සේ - මේ අවුරුදු 76දී - ඕනෑම අවුරුදු දෙකක් අරගෙන බලන්න. එය 1956 සංස්කෘතික විප්ලවයෙන් පසු අවුරුදු දෙක හෝ 1983 මහා ජනසංහාරයෙන් පසු අවුරුදු දෙක හෝ එහෙම නැත්නම් 2009 යුද්ධය අවසානයෙන් පසු අවුරුදු දෙක හෝ ගත් කළ ඒ කිසිදු අවුරුදු දෙකකදී මුහුණ නොදුන් මහා පරිමාණයේ අභියෝග රාශියකට මුහුණ දෙමින් ජයග්‍රාහීව මහජනයා සමඟ නැඟී සිටින්නට පුළුවන් වුණු රාජ්‍යයක් හදන්නට අපේ රජයට පුළුවන් වෙලා තිබෙනවා. මා නැවත නැවත කියන්නට අවශ්‍ය නැහැ, මම දේශපාලනයට සම්බන්ධ වෙන්නේ දේශපාලනයට මාව ආමන්ත්‍රණය කරපු පුද්ගලයෙක් හැටියටයි කියන එක. තරග කරලා ඡන්දයෙන් අනෙකාව පරද්දලා නොවෙයි, මම දේශපාලනයට ආවේ.

"රාඝවන් දේශපාලනයට එන්න, ඔබට මේ රටට දායක වෙන්න පුළුවන් කියා අපි හිතනවා" කියලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නායකත්වය දරන ගරු බැසිල් රාජපක්ෂ සහ ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ඒ තීරණය ගත්ත නිසායි මම අද මෙතැන හිටගෙන

[ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා]

ඉන්නේ. ඒ නිසා හෙට මට ලැබෙන ඡන්ද ප්‍රමාණය නොවෙයි, මූලතිව් දිස්ත්‍රික්කයෙන් මට අහිමි වෙන්න පුළුවන් ඡන්ද ප්‍රමාණය නොවෙයි මට වැදගත් වෙන්නේ. අද මෙතැන වාඩි වෙලා සිටින ඊළඟ පරපුරේ හෙට අනාගතය හදන්නේ කොහොමද කියන එකයි මගේ හදවතේ තිබෙන්නේ. අන්න ඒ වෙනුවෙනුයි මම වැඩ කරන්නේ.

ඒ නිසා ඔබ ඉදිරියේ මට කියන්න පුළුවන්, ප්‍රජාතන්ත්‍රවාදයේ එක අහලක්වත් කිසිසේත්ම වෙනස් නොකර නියමිත කාලයේදී, නියම කරන දිනයේදී අපි මැතිවරණය පවත්වන්නට ලෑස්ති බව. ඔබතුමන්ලා ලෑස්තිද?

ඊයේ මා මිත්‍ර ඩලස් අලහප්පෙරුම මැතිතුමා කියනවා, අනේ ඔවුන්ව ජේවීපී එක ගන්නේ නැහැයි කියලා. එතුමා දැන් ගරු සභාවේ නැහැ. එතුමා දැන් සභාවට ආවොත්, ඒ සම්බන්ධව එතුමාට පිළිතුරු දෙන්න අවස්ථාව තිබෙනවා. එතුමන්ලා ජේවීපී එකෙන් ඉල්ලා සිටියා, එතුමන්ලාව ගන්නවා ද කියලා. ජේවීපී එකේ ලාල්කාන්ත ඔවුන්ගේ ස්ටේජ් එකකදී මේගොල්ලන්ට කුඩු වෙන්න දුන්නා. අනේ මේ කුණු ගොඩවල්වල හිඟා කාපු අයත් එක්ක දේශපාලනයක් නැහැ කියලා ඔහු කිව්වා. එතකොට මොකක්ද වුණේ? ඔන්න එතකොට ගිහිල්ලා කියනවා, ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමනි, අපි ඔබතුමාත් එක්ක එකඟ වනවා, කරුණාකරලා අපව ගන්න කියලා. ඒගොල්ලනුත් කියනවා, ඔව්, අපි දැන් දිනන්න යන්නේ, තව පෝය තුනයි තිබෙන්නේ, ඒ පෝය තුන ඉවර වෙච්ච ගමන් අපේ ජනාධිපති කෙනෙක් ඉන්නේ, ඒ නිසා අපිත් එක්ක එකඟ වෙන්නය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොමියුනිස්ට් පක්ෂය කියන්නේ, ප්‍රතිපත්ති තිබෙන පක්ෂයක්. බලන්න, ඒ පක්ෂයේ න්‍යාය පත්‍රය අනුව ඊයේ රෑ ජේවීපී එකත් එක්ක එකඟ වෙන්න පුළුවන්. ඔවුන් බැහැයි කියපු හැටියේ අද උදේ ගිහිල්ලා තවත් පක්ෂයක් එක්ක එකඟ වෙන්න පුළුවන්ද? ජේවීපී එකේ ආර්ථික, සමාජයීය සහ දේශපාලන ක්‍රියාවලියට ප්‍රතිවිරුද්ධ සජබය එක්ක එකතු වෙන්නේ කොහොමද? මෙන්න මේ ව්‍යාකූලත්වය තිබෙන නිසා අද අපෙන් අහනවා, අපි මැතිවරණය කල් දමන්න නේද බලාගෙන ඉන්නේ කියලා. නැහැ. උතුර සූදානම් ය, කන්ද උඩරට සූදානම් ය, දකුණ සූදානම් ය, බස්නාහිර සූදානම් ය. මැතිවරණය කවදා ද කියලා කියන්න. අපි මැතිවරණයට මුහුණ දෙනවා. එපමණක් නොවෙයි. අපේ පාර්ශ්වය වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සහ අනික් පක්ෂ සියල්ල එකතු වෙලා පොදු අපේක්ෂකයාව මැතිවරණයට ඉදිරිපත් කරනවා. ඒ අපේක්ෂකයා දේශය, කලාපය සහ ජාත්‍යන්තරය දිනන්න පුළුවන් අපේක්ෂකයෙක්. ඔහු පත් වෙන්නේ මහජන ඡන්දයෙන්.

මේ අවස්ථාවේ ගරු විපක්ෂ නායකතුමා නැඟිටලා ගියා. එතුමාට මා මතක් කළ යුතුයි, මේ රටේ පැවති ජනාධිපතිවරණවලින් දුෂිතම ජනාධිපතිවරණය පැවැත් වුණේ, 1988දී කියලා විශ්ලේෂකයන් සඳහන් කරන බව. ගස් කපා පාරට දමා ගිනි තියලා, මිනී මැරීම් මැද්දේ පැවති මැතිවරණයකින් තමයි එදා ගරු රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති වුණේ කියලා මම නොවෙයි කියන්නේ. එය ඉතිහාසයේ සඳහන් වෙනවා. එතුමා ගනිපු ඡන්ද ප්‍රමාණය කීයද? සියයට 50.421යි. දෙවියනේ, සියයට 51ක්වත් ගත්තේ නැහැ. සියයට 51.5ක්වත් ගත්තේ නැහැ. ඒකට සාපේක්ෂව ලෝකයේ පළමුවැනි අගමැතිනිය වුණු ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඡන්ද සියයට 49.9ක් ගත්තා. වෙනස කීයද? 218,000යි. ඒ කාලයේ ජීවත් වුණු අපට, මැරිලා නොඉපදුණු අපට, තවමත් ඒවා මතකයේ තිබෙන අපට, දේශපාලනය පිළිබඳව අවදියෙන් ඉන්න අපට දැන් ඇවිත් කියන්න එපා, ප්‍රජාතන්ත්‍රවාදය අපි උකස් කරන්නට යනවා, ප්‍රජාතන්ත්‍රවාදය අපි ඩැහැගෙන, hijack කරගෙන දුවන්න හදනවා කියලා. ඒක එහෙම නැහැ. ඒ ගැන කිසිම භයක් ඇති කර ගන්න එපා. විපක්ෂයේ කණ්ඩායම් වේදිකාවල කළ සැරසිලි බොඳ වෙලා යද්දී, එක් එක්කෙනා බැහැලා යද්දී, සැරසිලි ගැලවිලා යද්දී ඒ අයට හිතෙන්න පුළුවන්, යම් විධියකින් මැතිවරණය කල් දමා ගැනීමක් සිදු කළොත් හොඳක් වෙන්න පුළුවන් කියලා. නමුත්, අපට එහෙම කිසිම බලාපොරොත්තුවක් නැහැ. ඒ නිසා මා හිතන හැටියට අපට තිබෙන මේ රූප රාමුව තුළ ප්‍රධානතම ඉලක්කය විය යුත්තේ, අපේ ආර්ථික ප්‍රතිඵලත්තේජනයයි.

Rejuvenating our economy has become and should be our number one priority at all times. The Hon. M.A. Sumanthiran is here. He is a contributory Member of the Committee on Public Finance and he was very happy about the draft Act I mentioned earlier, except for one or two clauses which, I think, he raised about, using his vigorous legal eyes. So, we would be able, after a long time or possibly for the first time in our history, to bring about that Act on financial discipline under a leader who has foreseen this need, who is able to negotiate with and convince the international community and also to get the same officials to join this journey towards economic recovery.

Our priority should be, at least by the 2030-2040 period, to keep our debts less than 95 per cent of GDP, to maintain, minimum, a five per cent economic growth and to keep our inflation below three per cent. That is the priority, yes. Therefore, the Finance Ministry may play a bigger role in governing the State and the other Ministries may have to follow their instructions. The Hon. (Dr.) Nalaka Godahewa raised that question and I was able to very candidly answer him back, "Yes. So, what do you think?" I had been in the private sector for a long time before I became an academic. If the marketing department of a company messes it up with all their activities, it is the finance department which would take over and say, "There are new financial regulations now."

Sir, I was in Mullaitivu about two days ago. The people there are still suffering from the effects of the war which ended in 2009, the COVID-19 epidemic which started in 2019 and other issues. They are still a suffering community and are only a fraction of the nation's entire lamenting citizenship. It is true that the memories of a broken land, bleeding wounds of a finished war and uncertainties of an unknown future is evident, not only in Mullaitivu, but also in the entire Northern Province, the Eastern Province and more or less, in all the other seven provinces, too.

ඒ නිසා ආර්ථිකය මෙතැනින් ගලවා ගැනීමට සහ ආර්ථික විමුක්තියක් කරා යෑමට අපි දරන මේ ව්‍යායාමය ජනයා විනිවිදව දකිනවා. මේ ගමන යනවාද, එහෙම නැත්නම් සමුපකාරයක්වත් කර ගන්න දන්නේ නැති අයට නැවතත් අත්හදා බැලීම් කිරීමට මේ රට භාර දෙනවාද කියා ජනයා තීරණය කර අවසන්. අත්හදා බැලීම් කරන එකට හොඳම පිළිතුර ලැබුණේ ඔබතුමාගේ පළාතෙන් කියලායි මම හිතන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මුහුදු ගිය අහිංසක ධීවරයන් භයදෙනෙකු කොහෙන්දෝ පාවෙලා ආ බෝතලයක තිබුණු බීම බීලා අත්හදා බලන්න ගියා. ඔන්න ඕක තමයි රටටත් වෙන්න යන්නේ. දන්නේ

නැති බීම බීලා අත්හදා බලන්න ගියොත් ජාතියටත්, මේ දේශයටත් වෙන්නේ ඔන්න ඕකයි. පසුගිය මාස 23 තුළ කර තිබෙන දේ පිළිබඳ වාර්තාව බලන්න. අංක ගණිතය අනුව, දේශපාලනය අනුව, සමාජය අනුව, ජාත්‍යන්තරය අනුව ජාතීන් අතර සමගියත්, ආගම් අතර අන්‍යෝන්‍ය අවබෝධයත් තබාගෙන මේ රාජ්‍යය, මේ ආණ්ඩුව ගෙන යන නිසා අපි කලට වේලාවට මැතිවරණය පවත්වනවා. ධර්මයට අනුව කටයුතු කරන, නිසි කලට වැසි වැටෙන දේශයක ආශීර්වාද ලද්දා වූ ජාතික නායකයෙක් බිහි කර අපි මේ දේශය ගොඩ නඟන බවට පොරොන්දු වෙනවා. ඒ පොරොන්දුව දෙන්නේ හුදෙක් මෙතැන වාඩි වී සිටින හා මේ අවස්ථාවේ මේ ගරු සභාවේ නැති පිරිසට නොවෙයි, හෙට දිනය භාර ගන්න ඉන්න දුවා දරුවන් ඉදිරියේයි. එවැනි තත්ත්වයක් මගේ මව් බිමට උදා වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයකුගේ නමක් යෝජනා කරන්න.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Sir, I propose that the Hon. K.P.S. Kumarasiri do now take the Chair.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. WEERASUMANA WEERASINGHE left the Chair, and THE HON. K.P.S. KUMARASIRI took the Chair.

[1.25 p.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Hon. Presiding Member, for the opportunity given to speak on this Adjournment Motion.

One might wonder why, at this time, the Opposition is moving this Motion for resolution by Parliament. Just three days ago, on Monday the 08th, there was an attempt before the Supreme Court by a person who was put up by someone to get the Supreme Court to say that the term of the President is six years and not five. A five-judge Bench of the Supreme Court clearly articulated and told him to read Article 30(2), which had been amended by the Nineteenth Amendment and which very specifically says that the term of the President is five years. Then while that matter was there, the State tended to quote a document stating to be an announcement by the incumbent President saying that he believes that the term is only five years. I also appeared in that matter and it seemed rather curious why the incumbent President should say that at all. Nobody asked for his opinion on the matter. The matter was there for judicial interpretation and this letter was given.

And, I made the remark, following Charles Dickens, that there is a willing witness and an all-too-willing witness in relation to that announcement tendered to court. Now, things are becoming clearer as to who is behind this. Yesterday, we saw an announcement that the Cabinet had considered and approved the presentation of an Amendment to the Constitution, to amend Article 83 (b) of the Constitution. That is an exercise purely designed to bring about confusion in the country and delay the holding of the Presidential Election.

When the Nineteenth Amendment to the Constitution was presented to this House, it was the then Prime Minister Ranil Wickremesinghe who moved it. It was announced that only the amendments which do not require a Referendum were to be done at that stage because we were then moving to prepare a new Constitution for the country and because Article 83(a) of the Constitution was listed as one of the Articles which require a Referendum if it was to be amended, Article 83 was not touched. But, that did not mean anything at all, as to what the term of the Presidency or what the term of the Parliament were to be after the Nineteenth Amendment took effect because Articles 30(2) and 62 (2) were both amended by the Nineteenth Amendment to the Constitution, decisively changing the term from six years to five years and that is what is in existence as the law of the country today.

Article 83(b) merely states that if you are to extend the term of Parliament or the Presidency for more than six years, beyond six years, you need a Referendum. But, that can be allowed to remain as it is; there is no necessity to seek to amend that Article now and reduce the six years mentioned there to five years. That comes into operation only if Parliament attempts to increase the term of office of the Presidency or the Parliament beyond six years. For posterity, if that needs to be changed, that could be done in the new Constitution. But, at this stage when the Election Commission is about to make the announcement for the holding of the Presidential Election at the expiration of the five-year term, which is what is the extent and which is what the Supreme Court, on the 08th of July, has again decisively stated, not that they needed to say it, but that is what we can read and is so plainly there in the Constitution, to try to bring in an Amendment to Article 83(b) is for the specific purpose of trying to obtain an interpretation from the Supreme Court that such an amendment requires a Referendum. That is because Article 83(a) states that if Article 83 is to be touched, it would require a Referendum. So, it is a wholly

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

unnecessary, an absolutely unnecessary exercise that the Cabinet is moving to do, unnecessary for purposes of understanding what the term of office of the President is, but necessary for the incumbent, necessary for the incumbent to confuse and say that Article 83(b) needs to be amended before the Presidential Election is to be conducted.

If the incumbent thinks that the people of the country are so dumb, that they cannot see his hand behind this move, he is sadly mistaken. Why in the world would anybody now seek to amend Article 83(b)? Surely, it was he who moved the Nineteenth Amendment to the Constitution and advisedly left out Article 83(b) because that would have required a Referendum. He himself having done that, knowing that Article 83(a) specifies Article 83 as one of those which require a Referendum, now wants an interpretation from the Supreme Court that to amend Article 83(b), a Referendum is required. That has absolutely nothing to do with the term of Office of President expiring in five years, as the law stands today, because Article 30(2) very specifically states it is five years; you do not have to amend Article 83(b) for that.

So, this exercise, I want to announce to all the people in the country, is a subterfuge; this is an attempt to pull wool over people's eyes into believing that somehow Article 83(b) also needs an amendment before a Presidential Election is to be conducted and that is a fallacy, that is false, that is wholly untrue and this exercise would only be for the purpose of delaying, not holding the Presidential Election that is due before the 17th of October this year. And, if the President and the Cabinet persist in this move of introducing an amendment to the Constitution at this point in time, they would be kicked out of office even before October this year. Then, people will have to get on the streets. Therefore, I am asking the Government and the Cabinet - all of those who are going to speak today can say, "No, no, we are ready for the election" - to hold the election without engaging in this subterfuge of an amendment to Article 83(b).

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 27ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.35]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර කථා කරපු ගරු ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාත්, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාත් යන දෙදෙනාම මම පාර්ලිමේන්තු එන විට මේ සභා ගැබේ හිටියේ නැති නිසා කියන්න ඕනෑ, මට මේ ප්‍රජාතන්ත්‍රවාදය, මිනිස් අයිතිවාසිකම්, ඡන්ද කල් දැමීම යනාදිය පිළිබඳ අත්දැකීම් රාශියක් තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 270ක් විතර ලැබෙනවා නම්, වඩා හොඳට මේ පිළිබඳව කියන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මා නියෝජනය කරන මේ ව්‍යවස්ථාදායකය, මේ උත්තරීතර සභාව පිළිබඳව අපි පාර්ලිමේන්තුවට ආ කාලයේ, තහනම් කරනු ලැබූ ජනතා විමුක්ති පෙරමුණ විසින් මුළු රට පුරාම ගෙන ගිය මතවාදය තමයි, "හොර පාර්ලිමේන්තුව වර්ජනය කරව්!" "ජේ.ආර් මරව්!" "පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන අයට දඬුවම මරණය!" කියන ඒවා. අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා නායකත්වය දෙන මහජන එක්සත් පෙරමුණෙන් කොළඹ දිස්ත්‍රික්කයට තරුණයෙක් ලෙස මම ඉදිරිපත් වෙනකොට මටත් ගෙදරට ලිපියක් ගෙනැල්ලා දුන්නා, "දඬුවම මරණයයි" කියලා. එතකොට ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මහ හඬින් කථා කරන සියලුදෙනා කිව්වේ, මේ පාර්ලිමේන්තුව හොර පාර්ලිමේන්තුවක්, මේ පාර්ලිමේන්තුව ඇතුළට යන්නේ හොරු, ඒ නිසා ඒකට කිසි කෙනෙක් සම්බන්ධ නොවිය යුතුයි කියලායි. ඊට පස්සේ භීෂණය බරපතළ ලෙස ඇවිළුණා. සජිත් ප්‍රේමදාස මහතාගේ පියාණන් වූ රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ජනාධිපතිවරණයෙන් බලය ලබා ගත්තාට පසුවයි පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වුණේ. මුළු රටේම තමන් දරන මතයට විරුද්ධ මතයක් දරන බොහෝ දෙනා මරනවා කිව්වා පමණක් නොව මිනිය දණ හිසෙන් පහළට වන සේ අරගෙන ගිහින් වළලන්න කියලා නියම කළා.

සාමාන්‍යයෙන් මිනිස්සු මොන ආගමක් ඇදහුවත් කථාවක් තිබෙනවා, සෑම මනුෂ්‍යයෙකුටම ගෞරවාන්විත මරණයක් හිමිවිය යුතුයි කියලා. ඒ නිසා අපි කුඩා කාලයේ අපට උගන්වලා තිබෙනවා, මෘත දේහයක් -කලේබරයක්- පාරේ ගෙනියන විට බස් එකේ ගියත් නැගිටින්න කියලා. එහෙම තිබුණු රටක්, මේක. මේ රටේ මිනිස්සු සෑම මනුෂ්‍යයෙකුටම ගෞරව කළා, මරණයේදී. තරහකාරයොත් මළ ගෙදරට ගිහිල්ලා ගෞරව කරලා ආවා, මනුෂ්‍ය ජීවිතය නිම කළාම. එහෙම තිබුණු රටක යකඩ ගැටෙන අමිහිරි සද්දය, උණ්ඩයේ අමිහිරි සුවඳ, දුක වේදනාව, මර ළතෝනිය යටතේ සම්පූර්ණයෙන් ඝාතන සංස්කෘතියක ප්‍රචණ්ඩත්වයේ අසාමාන්‍ය ගොදුරු බවට මේ රටේ නිරායුධ අහිංසක ජනතාව පත් වුණා. ඔවුන් නියමයක් කළා, ප්‍රජාතන්ත්‍රවාදය යටතේ ජනතාවට තිබෙන ඡන්ද අයිතිය සම්බන්ධව. ඡන්දය දාන්න යන පළමුවෙනි පස්දෙනා මරනවා කියලා කිව්වා.

ඒ කිව්වා වාගේම එසේ ගිය නිරායුධ, අවිහිංසක මිනිසුන් - පළමුවෙනි පස්දෙනා- මැරුවා. මේ රටේ මහා සංඝ රත්නය, - ආගම, ධර්මය ප්‍රචාරය කළ මහා සංඝ රත්නය; විදුහල්පති ධුර දැරූ හාමුදුරුවරු- සූජකවරු විශාල ප්‍රමාණයක් ඝාතනය කළා. මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර වැනි විශ්වවිද්‍යාලවල සිටි දුර්ලභ මානව සම්පත් ඝාතනය වුණා. විජය කුමාරතුංග වැනි අසහාය රංගන ශිල්පීන් සමනලයෙකුට වෙඩි තබනවා වාගේ මරා දැම්මා. මේ ඝාතන සංස්කෘතිය තුළ ඊට ප්‍රතික්‍රියා දැක්වූවා, රණසිංහ ප්‍රේමදාස ආණ්ඩුව. එතකොට මම මන්ත්‍රීවරයෙක් ලෙස පත් වෙලා හිටියේ. "මිනීමරු ආණ්ඩු" කියලා සජිත් ප්‍රේමදාස මහත්මයා කියනකොට, මට මතක් වුණේ රිවඩ් ද සොයිසා වැනි මාධ්‍යවේදීන්. ඒ කාලයේ ගාමිණී ෆොන්සේකා මහතා තමයි ඔය මූලාසනයේ නියෝජ්‍ය කථානායක ධුරයේ කටයුතු කළේ. ඒ වකවානුවේ රිවඩ් ද සොයිසාගේ ගෙදරට ගිය ආණ්ඩුවේ මැර හමුදාව විසින් රිවඩ් ද සොයිසාව අරගෙන ගිහිල්ලා ඝාතනය කරලා ගල් ගැට ගසා හෙලිකොප්ටරයෙන් ගෙනිහින් මුහුදට දමා

තිබුණා. ඒ මෘත දේහය මුහුදේ පාවෙලා ගොඩට ඇවිල්ලා තිබුණා. ඒ විධියට තමයි රිචඩ් ද සොයිසාගේ මෘත දේහය - කලේබරය- සොයා ගන්නට හම්බ වුණේ. රිචඩ් ද සොයිසා ගෙනයන අවස්ථාවේදී රටේ නියෝජ්‍ය කථානායක ලෙස කටයුතු කළ ගාමිණී ෆොන්සේකා මැතිතුමා සිනමාවට හා කලාවට සම්බන්ධ කෙනෙක් නිසා රිචඩ් ද සොයිසාගේ මෑණියෝ ගාමිණී ෆොන්සේකා මැතිතුමාට තමයි කිව්වේ රිචඩ් ද සොයිසාව අරගෙන ගියා, බේරා ගන්න මැදිහත් වෙන්න කියලා. එතුමා එවකට නියෝජ්‍ය කථානායක.

මම පාර්ලිමේන්තුවට පැමිණෙන්න පෙර "සුද්දිලාගේ කථාව" සිනමා කෘතිය නිෂ්පාදනය කරලා මේ රටේ හොඳම චිත්‍රපට නිෂ්පාදකට හිමි සම්මානය ලබා ගත්තා. ඊට පසුව මම "සිරිමැදුර" නිෂ්පාදනය කළා. ඒ වෙලාවේත් හොඳම චිත්‍රපට නිෂ්පාදකට හිමි සම්මානය හිමි වුණා. ඊට පසුව මම "අයෝමා" නිෂ්පාදනය කළා. ඊට පසුව "ද නිවුස් පේපර්" නිෂ්පාදනය කළා. ඒකටත් මේ රටේ හොඳම චිත්‍රපට නිෂ්පාදකට හිමි සම්මානය හිමි වුණා. මෙහෙම සිනමාව තුළ කටයුතු කරන ගමන් මම අදහස් කළා, රාජ්‍ය මිනීමරු ත්‍රස්තවාදය පිළිබඳව, රිචඩ් ද සොයිසාගේ මෑණියන්ගේ පුවත පිළිබඳව චිත්‍රපටයක් හදන්න. එතකොට මම විපක්ෂයේ. යහපාලන ආණ්ඩුව කාලයේ එම චිත්‍රපටයේ මුහුරත් උළෙලත් පැවැත්වූවාට පසුව ඒක cancel කළා. හමුදාව කිව්වා එම චිත්‍රපටය ලංකාවේ හදන්න දෙන්න බැහැ කියලා. මේ ඇත්ත කතන්දර ඔක්කොම පසෙක තිබියදී **සමහරු** වීරයෝ ලෙස කථා කරනවා.

ඒ කාලයේ ප්‍රචණ්ඩත්වය ඇති වෙන්න හේතු මූලය වුණේ මේ රටේ අධ්‍යාපන ක්‍රමයයි. මේ නිදහස් අධ්‍යාපන ක්‍රමය යටතේ දරුවෙකුට හැදෑරීමට විද්‍යා, කලා, වාණිජ කියලා විෂය ධාරා තුනක් තිබෙනවා. ඈත එපිට පිහිටි අතිමහත් බහුතර ගම්මානවල, පළාත්වල පාසල්වලට විද්‍යාව උගන්වන්න ගුරුවරු නැහැ; විද්‍යාගාර නැහැ. ගණිතය උගන්වන්න ගුරුවරු නැහැ. ගණකාධිකරණය උගන්වන්න ගුරුවරු නැහැ. මේ රටේ නිදහස් අධ්‍යාපනය කියලා මොනවාද, එම ගම්මානවල දරුවන්ට ඉගැන්වූයේ? බෞද්ධ සංස්කෘතිය, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය. මේ හේතුව නිසා විශ්වවිද්‍යාලවලට එන සියයට 50කට වැඩි පිරිසක් කලා අධ්‍යාපනය ලැබුවා. ඒ අයට මේ අද්‍යතන; වෙනස් වෙන ලෝකයේ රක්ෂාවක්; ජීවනෝපායයක් හොයා ගන්න බැරි වුණා. එතකොට ඒ අය කළේ මොකක්ද? මේ රටේ කලා උපාධිය ලබා ගත් උගතුන් විශාල ප්‍රමාණයක් හිටියා. ඒ අයට කරන්න රක්ෂා නැහැ. රට තුළ රක්ෂා තිබෙනවා. හැබැයි, ඒවාට අවශ්‍ය උගත්තු නැහැ. තිබෙන රක්ෂාවලට අවශ්‍ය උගතුන් බිහි වෙන්නේ නැත්නම්, ඉන්නා උගතුන්ට දෙන්න රක්ෂා නැත්නම් එතැන සේවා වියුක්තියේ ව්‍යුහාත්මක අසමතුලිතතාවක් තිබෙනවා.

ඒ අතර තරුණයන් තුළ විශාල සමාජ වෛරයක් ඇති කරවනවා. ඇයි ඒ? කුඩා කල සිට බොහොම අමාරුවෙන්, දුක් මහන්සි වෙලා ඉගෙන ගෙන, පොපියන චමත්කාරය සහිත හදු යෞවනය පසු කරලා, කසාදයක් බැඳලා, ගෙයක් දොරක් හදාගෙන තමන්ගේ කියලා ජීවිතය පටන් ගන්න ඉන්න තරුණයන්ට කරන්න රස්සාවක් නැති වන කොට ඇති වන තරුණ අසහනය හමුවේ අන්තවාදී දේශපාලන පක්ෂ විසින් ඔවුන්ට මරාගෙන මැරෙන දේශපාලන දර්ශනය ලබා දෙනවා. උතුරේත් වෙන්නේ ඒකයි, දකුණේත් වෙන්නේ ඒකයි. ඒ පිළිබඳව මට වඩා විශාල අවබෝධයක්, දැනීමක් මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමාට තිබෙනවා. මොකද, එතුමාත් රණසිංහ ප්‍රේමදාස රජය කාලයේ තරුණ අසහනය පිළිබඳ කොමිසමේ සාමාජිකයකු ලෙස මේ රටේ එදා එවැනි තත්ත්වයක් ඇති වෙන්න හේතු භූත වෙච්ච කරුණු සොයන්න පත් කරපු සාමාජිකයෙක්. එම නිසා එතුමා හොඳින් දන්නවා, ඒ තරුණ අසහනය ගැන. එදා වගේම අදත් තිබෙනවා තරුණ අසහනය.

මම, විවිධ අභියෝග යටතේ තරුණ අසහනයට ප්‍රතිකර්මයක් කරපු ඇමතිවරයෙක්. මම අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටියදී, උසස් පෙළ විද්‍යා, කලා, වාණිජ විෂය ධාරා විතරක් හැදෑරිය හැකිව සිටි දරුවන්ට අද්‍යතන ලෝකයට ගැළපෙන අධ්‍යාපන ක්‍රමයක් හදලා දෙන්න තාක්ෂණවේදය විෂය ධාරාව - technology stream එක - හඳුන්වා දුන්නා. මම අධ්‍යාපන ඇමති වශයෙන් කටයුතු කළ කාලයේ අනුර ප්‍රියදර්ශන යාපා මිටපු ඇමතිතුමාත් එක්ක සඳලංකාව මධ්‍ය මහා විද්‍යාලයට ගියා. එම පාසලේ computer එකක්වත් තිබුණේ නැහැ. අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා ඒ සඳහා සාක්ෂි දරයි. අපි විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත්තු කාලයේත් computers දැකලා තිබුණේ නැහැ. ඊට පස්සේ තමයි විශ්වවිද්‍යාලවලට computers ලැබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සඳලංකාව මධ්‍ය මහා විද්‍යාලය කියන්නේ, ඒ පළාතේ තිබෙන වඩාත්ම ජනප්‍රිය, ඉතාම ඉහළ අගයෙන් යුත් පාසලයි. හැබැයි, එදා එම පාසලේ computer එකක්වත් තිබුණේ නැහැ. ඒ නිසා මම තොරතුරු තාක්ෂණය - information technology, ඉංජිනේරු තාක්ෂණය - engineering technology, ජෛව පද්ධති තාක්ෂණය - biosystems technology, තාක්ෂණය සඳහා විද්‍යාව - science for technology වැනි අංශවලට අදාළව මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 1,000ක් ඩෙල්ෆ්ට් දූපතේ ඉඳන් මෙහාට එනකල් හැදුවා. මට ඒ කාරණය දැන් කියන්න ඕනෑ වුණු හේතුවක් තිබෙනවා. අද මේ විපක්ෂ නායකවරයා "සක්වල" යැයි කියමින් රුපියල් ලක්ෂ 10ක සුහුරු පන්ති කාමරයක් ලබා දීලා, ඒකෙන් ප්‍රාතිහාර්ය පාන ආකාරයට -ඒ රුපියල් ලක්ෂ 10ට හෝ 11ට- කථා කරමින් දවස ගානේ රූපවාහිනියෙන් වෙනම චිනාඩි 3ක් විතර ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පරිගණක 40කින් යුක්ත පරිගණක විද්‍යාගාරයක්, පරිගණක 20ක් තිබෙන භාෂාගාරයක්, පරිගණකයක් තිබෙන ගණිතාගාරයක්, පරිගණකයක් තිබෙන දූරස්ථ අධ්‍යාපන ඒකකයක් සහිතව - පරිගණක 62ක් සහිත- මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 1,000ක් ලංකාව පුරා හදලා තිබෙනවා. එහෙම නම් ඒක "සක්වල" නොවෙයි, "පර සක්වල" වෙන්න ඕනෑ. විද්‍යාගාර 1,000ක් ලංකාව පුරා හදලා එදා ඒවා විවෘත කරන්න රැස්වීම් 1,000ක් පවත්වන්න මටත් තිබුණා. අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් එදා මම ගමට තොරතුරු තාක්ෂණය ගෙන යෑම සඳහා පරිගණක 40ක් ද, ඉංග්‍රීසි, ජර්මන්, ප්‍රංශ ආදී භාෂා උගන්වන්න headphones ඇතුළු නවීන උපකරණ සහිත පරිගණක 20ක් තිබෙන language laboratory එකක් ද, mathematics laboratory එකක් ද සහිතවයි ඒවා හැදුවේ. ඒ වාගේම, අපි තෙමහල් විද්‍යාගාර 251ක් හැදුවා. එහි යටිමහල ඉංජිනේරු තාක්ෂණය සඳහා ලබා දුන්නා. ඒවා ඔය කියන රුපියල් ලක්ෂ 10 ඒවා නොව, නවීන යන්ත්‍ර සූත්‍ර, උපකරණ ආදිය සහිත ඒවායි. ගිහිල්ලා බලන්න. එහි දෙවැනි මහල ජෛව පද්ධති තාක්ෂණය සඳහා ලබා දුන්නා. ඒවා, කෘෂිකර්මය නවීකරණයට අවශ්‍ය කරන දැනුම අනාගත පරම්පරාවට ලබා දෙන ජෛව පද්ධති තාක්ෂණය ලබා දෙන, පන්ති කාමර 4ක් ද සහිත විද්‍යාගාර 251ක්.

මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා මා කියන්න යන මේ කාරණයත් පිළිගනීවි. එතුමා උපකුලපතිවරයෙකු වශයෙන් කටයුතු කරන කොට ඒ විශ්වවිද්‍යාලය ඇතුළේ Medical Faculty එකක් තිබුණා; Arts Faculty එකක් තිබුණා; Management Faculty එකක් තිබුණා; Science Faculty එකකුත් තිබුණා; විවිධ පීඨ - faculties- තිබුණා. හැබැයි ඒ කාලයේ Technology Faculty එකක් කොළඹ විශ්වවිද්‍යාලයේ හෝ වෙනත් කොහේ හෝ විශ්වවිද්‍යාලයක තිබුණේ නැහැ. අද කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය ඉදි කර තිබෙනවා පිටිපන මහඟෙන චත්තේ; අක්කර 25ක. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයත් තිබෙනවා, පිටිපන.

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

තාක්ෂණ පීඨවලට අවශ්‍ය මහාචාර්යවරු, ආචාර්යවරු ලංකාවේ එදා හිටියේ නැහැ. නමුත් දැන් තාක්ෂණය පිළිබඳ ආචාර්යවරු, මහාචාර්යවරු ලංකාවේ ඉන්නවා; තාක්ෂණවේදී උපාධිධාරීන් රට තුළ බිහි වෙනවා. මේවා, උපනුපන් පරම්පරාවල ඇති වන වෙනස්කම්. මෙතුමන්ලාගේ ආණ්ඩු කාලවල කරපු එවැනි වෙනස්කම් මොනවාද කියලා රටට කියන්න පුළුවන්කමක් තිබෙනවාද?

මිනිසුන්ගේ දුක, වේදනාව පිළිබඳව කථා කරන්න, කථා පවත්වන්න නම් කාටත් පුළුවන්. මට මතකයි, රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා ඡන්දය ඉල්ලන කොට මුළු රටේම හිටපු දුප්පත් ජනතාවට දීපු පණිවුඩය. ඒ තමයි, රුපියල් 25,000ක් පොතට දාලා දෙනවා කියන එක. කිව්වා වාගේම එතුමා ජනාධිපති වුණාට පස්සේ විශාල පත්‍රිකාවක් හදලා එවකට මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආර්. පාස්කරලිංගම් මහත්මයාගේ අත්සන සහිතව සහතියක් ලබා දුන්නා, හැම පවුලකටම රුපියල් 25,000ක් තැන්පත් කළා කියලා. ඒ සහතිකය දුන්නාම අපි විපක්ෂයේ ඉඳගෙන ඒ ගැන ප්‍රශ්න කළා, රුපියල් 25,000ක් තැන්පත් කළා නම් ඒක කොහේද තිබෙන්නේ, පොලිය කීයද කියලා. එහෙම ප්‍රශ්න කරන කොට ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් මාසයකට රුපියල් 250 ගණනේ පොලියක් දුන්නා. එහෙම දීලා ඇහුවා, තැන්පතු නැත්නම් පොලිය එන්නේ කොහොමද කියලා. පොලිය කියලා රුපියල් 250 ගණනේ දුන්නා. ඊට පස්සේ ගාමිණී ලොකුගේ හිටපු ඇමතිතුමන්ලා ඇතුළු අය නඩු කිව්වා. ඊට පස්සේ උසාවියේදී ඔප්පු වුණා, දුප්පත් මිනිසුන්ගේ නමට සත 25ක්වත් දමලා නැහැ කියලා. "ජනසවිය" වැඩසටහන යටතේ රුපියල් 250ක් දුන්නේ සහනාධාරයක් විධියට. එහෙමයි මේ රටේ දුප්පත් මිනිස්සු මුළා කරලා තිබෙන්නේ. අද මෙතුමා මේ මුළු තුන් ලෝකයටම බැණලා අපහාස උපහාස කළාට, එදා එතුමන්ලාගේ කාල පරිච්ඡේදවල මේ රටේ නීෂණය, මර්දනය, ප්‍රජාත්ත්‍ර විරෝධී ක්‍රියා සියල්ල ඇති වුණා. ඒවා ඇති වෙච්ච ආකාරය පිළිබඳව අද මෙතුමා ආපහු හැරිලා බලනවා නම් වැදගත්. "ඔවා දෙනු පරහට - තමා සම්මතෙහි පිහිටා සිට" කියලා කියමනක් තිබෙනවා. තමන්ට මොනවත් කරන්න බැරිව, මෙහෙම සුරංගනා කථා කිව්වාට රටක ආණ්ඩු කරන්න බැහැ.

අද විපක්ෂ නායකතුමා කියනවා, "අපිට එක එක දේවලට මුදල් තිබෙනවා" කියලා. විපක්ෂ නායකතුමා විධියට මෙතුමා පිළිගත යුතු පරම සත්‍යයක් තිබෙනවා. මේක බදු අඩු කිරීම්, අරවා මේවා ගැන කථාවක් නොවෙයි. මෙතුමාගේ පියාගේ කාලයේ ඉඳන් කවදාවත් ලංකා ආණ්ඩුවට එදිනෙදා වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් බදු හෝ බදු නොවන මාර්ගවලින් ලැබුණේ නැහැ. එහෙම තිබුණා නම්, තිබුණාය කියලා පුළුවන් නම් ඔප්පු කරන්න කියන්න. කවුරු ආණ්ඩුව ගත්තත් බොරු කියන්නේ නැතිව ඉලක්කම් කියන්න ඕනෑ. මොකද, රාජ්‍ය සේවකයන්ට පඩි ගෙවන්න ඕනෑ; ගුරුවරුන්ට, විදුහල්පතිවරුන්ට, පොලීසියට, රාළහාමිලාට, වෛද්‍යවරුන්ට, හෙද හෙදියන්ට වැටුප් ගෙවන්න ඕනෑ. ඒක තමයි ප්‍රධාන බිල. රාජ්‍ය සේවකයෝ ලක්ෂ 15ක් ඉන්නවා. මා දන්නා ආකාරයට, ලෝකයේ ජනගහනයෙන් පුද්ගලයන් 100කට රාජ්‍ය සේවකයන් වැඩිම රට තමයි අපේ රට. නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍යය ආදී සේවාවන් පවත්වාගෙන යාම සඳහා අසාමාන්‍ය වියදමක් දරලා රාජ්‍ය සේවකයෝ බඳවා ගන්නවා. අද රාජ්‍ය සේවකයෝ ලක්ෂ 15ක් පමණ ඉන්නවා. ඔවුන්ට වැටුප නැතිව ජීවත් වෙන්න බැහැ; එක මාසයක් වැටුප නැතිව ජීවත් වෙන්න බැහැ. ඒ නිසාම කොවිඩ් වසංගතය කාලයේ මුළු රටම වහලා තිබුණු නමුත්, ගෝඨාභය රාජපක්ෂ රජය යටතේ ඒ ඔක්කෝටම වැටුප් ගෙව්වා, සතයක්වත් කප්පාදු කරන්නේ නැතිව. ඒ විතරක් නොවෙයි. ඒ කාලයේ ගෙවල්වලටත් රුපියල් 5,000 ගණනේ දෙසැරයක් බෙදා දුන්නා. ඒ කොහොමද? ඒ කාලයේ සල්ලි අච්චු ගහන්න පුළුවන් වුණා. Central Bank එක සල්ලි අච්චු ගහලා දුන්නා. හැමදාම ලංකාවේ ආණ්ඩු කළේ ඒකයි. ඒ ඇත්ත, විපක්ෂ නායකවරයා කියන්න ඕනෑ. අපටත් කියන්න පුළුවන්, මේ රටේ මිනිස්සු දුප්පත්, මන්දපෝෂණයෙන් පෙළෙනවා, කිරි ගොවීන් ගැන බලන්න ඕනෑ, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වැටිලා කියලා. නමුත් කොහෙන්ද සහන දෙන්නේ? කවුද දෙන්නේ? කාගෙ ද ඒ සල්ලි? එතුමා දැන ගන්න ඕනෑ, ආණ්ඩුවක් කරන කොට මේ ඔක්කෝටම සල්ලි ගන්නේ මේ රටේ අන්ත අසරණ -එදිනෙදා කුසට ආහාරයක් නැති, විළි වසා ගන්න වස්ත්‍රයක් නැති, බිත්ති හතරකින් වට වෙච්ච තමන්ගේ කියන නිවහනක් නැති- මිනිසුන්ගෙන් බව. ඒ හැම මනුස්සයෙක්ම රජයට බදු ගෙවනවා. පරිප්පු ටිකක් ගන්න කොට, පාන් ගෙඩියක් ගන්න කොට, අල, ලූනු, මිරිස් ටිකක් ගන්න කොට, හරනෙල් කටු, ආය කටු ගන්න කොට, පෑන් පැන්සල් ගන්න කොට ජනතාව බදු ගෙවනවා. බද්ද භාණ්ඩයේ මිලට එකතු කරලා තිබෙන්නේ. වැට් එක සියයට 17ක් වනවා.

මේ බදු ගෙවන මිනිස්සුන්ගෙන් ලැබෙන ආදායමෙන් කරන පළමු කටයුත්ත තමයි රාජ්‍ය සේවකයන්ගේ වැටුප ගෙවන එක. දෙවැනි කටයුත්ත හැම මාසයකම 10 වැනිදාට විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට විශ්‍රාම වැටුප් ගෙවන එක. ඊළඟට, ජීවත්වීම සඳහා ජීවිතයත් සමඟ අරගළයක යෙදෙන අසරණ මිනිස්සුන්ට සමෘද්ධි, අස්වැසුම වැනි සහනාධාර ගෙවන එක. ඊළඟට, හැම දාම වාගේ ආණ්ඩු ගත්ත ණයවලට පොලී ගෙවන එක. ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා මුදල් රාජ්‍ය අමාත්‍ය ධුරයේ කටයුතු කරලා තිබෙනවා. මම මේ ගරු සභාවට කියන්නේ අසත්‍යයක් නම්, එතුමාට කියන්න පුළුවන්, "නැහැ, අපේ කාලයේ රජයේ වියදම පියවා ගැනීම ගැන කිසි ප්‍රශ්නයක් තිබුණේ නැහැ" කියලා. සෑම දවසකම පුනරාවර්තන වියදම් පියවාගන්න ආදායමක් නැති නිසා රාජ්‍ය අය වැයේ ජංගම ගිණුමේ හිඟයක් එනවා. මේ ජංගම ගිණුමේ - current account එකේ, වර්තන ගිණුමේ - හිඟය පියවාගන්න හැම ආණ්ඩුවක්ම දේශීයව හා විදේශීයව තොග වශයෙන් ණය ගත්තා. ඒ ණයත් ප්‍රමාණවත් නොවෙනකොට, 2007 ඉඳලා අපි සල්ලි අච්චු ගහලාත් මදි වුණාම Sovereign Bonds issue කරලා ජාත්‍යන්තර වෙළෙඳ පොළෙනුත් ණය ගත්තා. මේක එක් ආණ්ඩුවක ප්‍රශ්නයක් නොවෙයි.

දෙවනුව ඇති වෙච්ච ප්‍රශ්නය මේකයි. අපි සහල්, පිටි, සීනි, අල, ලූනු, මිරිස්, පරිප්පු වැනි පරිභෝජන භාණ්ඩත්, ඛනිජ තෙල්, පොහොර, රසායනික ද්‍රව්‍ය වැනි අන්තර් භාණ්ඩත්, යන්ත්‍ර සූත්‍ර, උපකරණ වැනි ප්‍රාග්ධන භාණ්ඩත් ගෙනෙනවා. කාට හෝ පුළුවන්ද මේවා ගෙනෙන්නේ නැතුව ඉන්න? සුමාන දෙකක් ආණ්ඩු කරන්න පුළුවන්ද, මේවා ගෙනෙන්නේ නැතුව? ඒවා ගෙනෙන්න මොකක්ද කරන්නේ? තේ, රබර්, පොල්, මැණික් සහ වෙනත් ද්‍රව්‍ය පිට රට යවලා ලබන ආදායම රුපියල් බිලියන 12ක්, 13ක් නම් අවුරුද්දකට ආයාත කරන්න රුපියල් බිලියන 21ක්, 22ක් වියදම් වෙනවා. වෙළෙඳ ගිණුමේ හිඟයක් ආවාම ඒක පියවන්න මැද පෙරදිග ඇතුළු රටවලින් එන මුදල් ටික සහ සංචාරක ලැබීම් ප්‍රමාණවත් නැති වෙනකොට ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟයක් ඇති වෙනවා. කවදා ඉඳලාද? 1977 ඉඳලා ගිය අවුරුද්ද වෙනකල් හැම දාම ගෙවුම් ශේෂයේ - Balance of Paymentsහි - Current Account එකේ හිඟයක් තිබෙනවා. ඒ නිසා තමයි රුපියල කඩා වැටෙන්නේ. මේක අර්ථ ශාස්ත්‍රයක්. අපට නිදහස ලැබෙනකොට අපි ඩොලරයට ගෙව්වේ රුපියල් 4.57යි. 1977 සැප්තැම්බර් මාසයේ 15 වැනිදා ඩොලරයට ගෙව්වේ රුපියල් 8යි. 1977 නොවැම්බර් 15 වැනිදා මධ්‍යම රාත්‍රී 12.00ට රොනී ද මැල් මුදල් ඇමතිගේ අය වැය යෝජනාව අනුව බහුවිධ විනිමය අනුපාතය වෙනස් වෙලා, විනිමය අනුපාතය ඒකීයකරණය වෙලා ඩොලරයේ අගය රුපියල් 16 කළා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා රට භාරගන්නකොට ඩොලරයේ අගය

රුපියල් 105යි. අවුරුදු 10ක් ආණ්ඩු කරලා භාර දෙනකොට ඩොලරයේ අගය රුපියල් 131යි. යහ පාලන රජය යටතේ මේ ඔක්කොම කඩාගෙන ගිහිල්ලා ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ ඩොලරයේ අගය රුපියල් 200යි. ඊට පස්සේ මේ අර්බුදය යටතේ සංචිත හිඳිලා, විදේශ විනිමය නැතිවෙලා, රට සම්පූර්ණයෙන්ම විනාශ වෙනකොට ඩොලරයට රුපියල් 420ක් ගෙවලා තමයි තමන්ගේ පිට රට ඉගෙන ගන්නා ළමයින්ට උණ්ඩියල් ක්‍රමයට සල්ලි යැව්වේ. මේවාට දේශපාලන විසඳුමක් තිබෙනවාද? මේ විපක්ෂ නායකතුමාට හරියට ඉලක්කම් එක්ක කියන්න පුළුවන්ද, කොහොමද තමන් පඩි-නඩි ගෙවලා රාජ්‍ය අය වැයේ වර්තන ගිණුමේ හිඟයට මුහුණ දෙන්නේ කියලා? ඒකට ගන්නා ක්‍රියා මාර්ගය කියන්න පුළුවන්ද? එතුමාට කියන්න පුළුවන්ද, මම ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ අතිරික්තයක් ඇති කරන්නේ මෙහෙමයි කියලා? මේක ගැටගහන එක කොයි තරම් අමාරුද? මේක තාක්ෂණික කරුණක් කියලා මේ ලෝකේ දෙයක් තේරෙන්නේ නැත්නම් මෙතුමා ආණ්ඩුවක් ගත්තොත් ඒ ආණ්ඩුව ලංකාවේ පවතින්නේ සති දෙකයි. මොකද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එපා කියනවා, අන්තර්ජාතිකව අත්සන් කරපු මේ ගිවිසුම් එකකටවත් ගරු කරන්නෙත් නැහැ.

අපේ Official Creditor Committee එකේ ඉන්නේ කවුද? ඉන්දියාව, ජපානය හා ප්‍රංශය. මේ රටවල් ඔක්කොම හදලා දීලා තිබෙන වැඩ පිළිවෙළේ මූලික කොන්දේසි තුනක් දාලා තිබෙනවා. 2032 වෙනකොට ලංකා ආණ්ඩුවේ රාජ්‍ය ණය ප්‍රමාණය සියයට 95ට අඩු කරන්න ඕනෑ. ඊට පස්සේ, දළ මුදල් අවශ්‍යතාව. මොන පිස්සු කථා කිව්වත් ආණ්ඩුවට දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 13ට වඩා වියදම් කරන්න බැහැ. මොනවා කළත්, කවුරු ආණ්ඩුව ගත්තත් රටේ ණය සේවාකරණ - debt service - අනුපාතය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 4.5ට වඩා එහාට යන්න බැහැ. මේ කොන්දේසි ඉටු කරන්න පොරොන්දු වෙලා, දිවුරලා අත්සන් කරලා තිබෙන්නේ. ඉතින්, මේ තත්ත්වය යටතේ බොරු කියලා රට ගත්තොත්, අපි 16 වතාවක් ගැහුවා වාගේ, IMF එකට ගහලා ඉවත් වෙන්න පුළුවන්. අපි ණය ගිවිසුම් එකක්වත් ක්‍රියාත්මක කරන්නේ නැහැ කියලා කියන්න පුළුවන්.

එහෙම වුණොත් සුමාන දෙකකට පස්සේ ලංකාවේ ණයවර ලිපියක් කවුරුවත් පිළිගන්නේ නැහැ. එදාට මේ ගෙනැල්ලා තිබෙන තෙල් ටික විතරයි, එතැනින් එහාට තෙල් නැහැ. මේ ගෙනාපු ගෑස් ටික විතරයි, එතැනින් එහාට ගෑස් නැහැ. මේ ගෙනාපු බෙහෙත් ටික විතරයි, එතැනින් එහාට බෙහෙත් නැහැ. එතකොට, මේ දේශපාලනඥයෝ ඔක්කෝම අසරණ මිනිසුන්ට බොරු කියලා තිබෙන නිසා හම්බවෙන හම්බවෙන තැන්වල තිබෙන අපි හැමෝගේම ගෙවල් ටික ගිනි තියලා මිනිස්සු මේ රටේ මහා විනාශයක් ඇති කරනවා. මේක තමයි පරම සත්‍යය. එහෙම නොවෙයි නම් ඉලක්කම් එක්ක කියන්න ඕනෑ, මෙන්න ප්‍රශ්නය, රජයේ සේවක වැටුප් මෙච්චරයි, විශ්‍රාම වැටුප් මෙච්චරයි, වැටි සියයට 18යි, මම මේකට සල්ලි සොයාගන්නේ මෙහෙමයි කියලා. මේ බොරුව කරලා, කරලා මොකක්ද වෙන්නේ? රට ගිනි අරගෙන තිබෙන වෙලාවේ මේකත් බොරුවක්. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයට ඉතා පැහැදිලිව කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පැවැත්විය යුතු ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය නියමිත දිනට පවත්වනවා, ඒ මැතිවරණ දෙකෙන් ප්‍රථමයෙන්ම අපි ජනාධිපතිවරණය පවත්වනවා. එයට රාජ්‍ය අය වැය ලේඛනයෙන් මේ වර්ෂයේ රුපියල් බිලියන 10ක් වෙන් කරලා තිබෙනවා කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
මම ඉක්මනට අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එතකොට, මැතිවරණ කොමසාරිස්වරයාට පුළුවන්, ඒ දිනයට මැතිවරණය පවත්වන්න. කැබිනට් ප්‍රකාශක විධියට මම මීට මාස තුනකට විතර ඉස්සෙල්ලා ඉඳලා දිනපතාම අහන ප්‍රශ්නවලට උත්තරයක් ලෙස මේක කියනවා, කියනවා, කියනවා, හැමදාම කියනවා. එසේ කියද්දීත් කියනවා, "ජනාධිපතිවරණය පවත්වනවාද කියලා තවම සැකයි" කියලා. කිසිම සැකයක් තියාගන්න එපා, ඔක්තෝබර් 17වැනි දාට පෙර අලුත් ජනාධිපතිවරයෙක් පත් වෙනවා. එසේ පත්වීම සඳහා වඩා සුදුසුකම් තිබෙන පොදු අපේක්ෂකයා වෙන්නේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා. එතුමාට පමණයි මේ ගමන ඒ ආකාරයෙන් අරගෙන ගිහිල්ලා රට ගොඩගන්න පුළුවන් කියන කාරණය මතක් කරමින් මගේ වචන කිහිපය මෙයින් සමාප්ත කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.01]

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජය මේ කරන්න හදන්නේ මොකක්ද කියලා ඉතාම පැහැදිලියි. තිබෙන ප්‍රශ්නයක් විසඳීමට නොවෙයි, නැති ප්‍රශ්නයක් ඇති කිරීමට තමයි මේ උත්සාහ දරන්නේ. දැන් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, ජනාධිපතිවරයාගේ නිල කාලය කුමක්ද කියන එකයි. මේකට බලාත්මක පිළිතුරක් දෙන්න පුළුවන් කාටද? ඒ සඳහා මේ රටේ තිබෙන්නේ එකම ආයතනයයි. ඒ තමයි ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය එක වතාවක් නොවෙයි, අවස්ථා තුනකදීම ඉතා පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා, ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 6ක් නොවෙයි, අවුරුදු 5යි කියලා.

අපේ රට පමණක් නොවෙයි, මුළු ලෝකයම පිළිගත් සිද්ධාන්තයක් තිබෙනවා, උසාවිය තීන්දුවක් දුන්නාට පස්සේ ඒ කරුණුම නැවත වතාවක් උසාවිය ඉදිරියට එනවා නම්, ඉස්සෙල්ලා තීන්දුවට අනුකූලව තමයි දෙවැනි තීන්දුවත් දෙන්නේ කියලා. ඊට පරස්පර තීන්දුවක් දෙන්නේ නැහැ. ඉස්සෙල්ලා තීන්දුව අනුගමනය කරමින් තමයි දෙවැනි තීන්දුව දෙන්නේ. මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු 3ක් දීලා තිබෙනවා. පළමුවැනි තීන්දුව තමයි, මේ ගරු සභාව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරපු අවස්ථාව. ඒ අවස්ථාවේ ඒක ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කළාම, ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඉතාම වැදගත් ව්‍යවස්ථාවක් තමයි ජනාධිපතිවරයාගේ ධුර කාලය නිර්වචනය කරන ව්‍යවස්ථාව, ඒක අවුරුදු 5යි කියලා. ඒක තමයි නිශ්චිත, ස්ථිර සහ පැහැදිලි ශ්‍රී ලංකා නීතිය. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය දීපු නඩු තීන්දුවට අනුව ඒක අවුරුදු 5යි. දෙවැනි අවස්ථාව තමයි, ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ කාලයේ මේ ප්‍රශ්නය නැවත වතාවක් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වුණු අවස්ථාවේ ලබා දුන් තීන්දුව. එතැන විශේෂ සාධකයක් තිබුණා. අපේ රටේ

[ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා]

ජනතාව මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එම නිලයට පත් කරපු අවස්ථාවේදී ජනාධිපති ධුර කාලය විධියට තිබුණේ අවුරුදු 6යි. එතුමා පත් වුණාට පස්සේ තමයි ඒ අවුරුදු හය අවුරුදු පහ දක්වා අඩු වුණේ. එතකොට තර්කයක් ඉදිරිපත් කළා, මේ අඩු කිරීම අනාගත ජනාධිපතිවරුන්ට බලපාන නමුත් සිරිසේන ජනාධිපතිතුමාට බලපාන්නේ නැහැ, මොකද, ජනතාව එතුමාව පත් කරලා තිබෙන්නේ අවුරුදු හයකට කියලා.

හැබැයි, ඒ විශේෂ සාධකය තිබියදී පවා ශ්‍රේෂ්ඨාධිකරණය බොහොම පැහැදිලි නිගමනයකට ආවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරලා තිබෙනවා, සම්මත කරපු දවසේ ඉඳලා ඒක බලාත්මකයි කියලා. අනාගත ජනාධිපතිවරුන්ට පමණක් නොවෙයි, ගරු මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමාටත් ඒක බලපානවා, ඒ නිසා එතුමාගේ නිල කාලයත් අවුරුදු පහයි කියලා. ඒ, දෙවැනි නඩු තීන්දුව. තුන්වැනි නඩු තීන්දුව පසු ගිය සඳුදා ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශයට පත් කළ නඩු තීන්දුව. මේ පිළිබඳව යම් කිසි අපැහැදිලිතාවක් තිබෙනවාය, ඒක නිරාකරණය කරනතුරු ජනාධිපතිවරණය පවත්වන්න එපා කියලා මැතිවරණ කොමිෂන් සභාවට නියෝගයක් දෙන්නය කියමින් සී.ඩී. ලේනව නැමැති පුද්ගලයෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණය ඒ නඩුව විසි කරලා දැම්මා. බැලු බැල්මට ඒ නඩුවේ කිසිම දෙයක් නැහැ, ඒ නිසා උසාවියේ කාලය නාස්ති කරන්නේ නැහැ, ඒ නඩුව ඉදිරියට ගෙන යන්න ඉඩ දෙන්නේ නැහැ කියලා ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළා. ලේනව කියන පුද්ගලයාව බොහොම දැඩි ලෙස දෝෂාරෝපණයට ලක් කළා. ලේනව කියන පුද්ගලයාගෙන් ඇහුවා, වගකීමක් ඇති පුරවැසියෙක්ද කියලා; ඇයි මේ විධියේ සම්පූර්ණයෙන් නුසුදුසු දේවල් කරන්නේ, මේවා ගැළපෙනවාද කියලා ඇහුවා. පැය දෙකක් ගියේ නැහැ. උසාවිය රැස් වුණේ උදේ 10.30ට. දහවල් 12.15 වෙනකොට උසාවියේ තීන්දුව ප්‍රකාශ කළා. බලන්න දෙයක් නැහැ, කියවන්න දෙයක් මොකුත්ම නැහැ, මේක ඉතා හිස් නඩුවක්, ඒ නිසා නඩුව ආරම්භයේ දීම ප්‍රතික්ෂේප කරන බව ප්‍රකාශ කළා. ඒ, මේ රටේ උත්තරීතර අධිකරණය. මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්වචනය කිරීමට බලය තිබෙන එකම අධිකරණය තුන් වතාවක් ප්‍රකාශ කරලා තිබෙනවා අවුරුදු හයක් නොවෙයි, අවුරුදු පහයි කියලා, ජනාධිපතිවරයාගේ ධුර කාලය. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ ඒක කෙළින්ම සඳහන් වෙනවා, අවුරුදු පහයි කියලා. 83 (ආ) අනුව්‍යවස්ථාව කිසිසේත් ජනාධිපතිවරයාගේ නිල කාලයට ඍජුව හෝ වක්‍රාකාරයෙන් බලපාන එකක් නොවෙයි. ඒකෙන් කථා කරන්නේ වෙන දෙයක් ගැනයි. යම් කිසි අවස්ථාවකදී මේ ගරු සභාව නීත්‍යානුකූල විධියට ජනාධිපතිවරයාගේ නිල කාලය දීර්ඝ කිරීමට උත්සාහ දරනවා නම්, එවැනි තත්ත්වයකදී බලපාන නීතිය කුමක්ද කියන එක ගැනයි ඒකේ කථා කරන්නේ. එතකොට ජනාධිපතිවරයාගේ නිල කාලයට කිසිම අදාළභාවයක් නැහැ, 83 (ආ) අනුව්‍යවස්ථාව. එහෙම නම් මොකක්ද මේ කරන්න හදන්නේ? මේක සම්පූර්ණ අනවශ්‍ය දෙයක්. මෙහෙම කරන්න කිසිම හේතුවක් නැහැ. හැබැයි මෙහෙම කිරීමෙන් ලොකු හානියක් සිදු වෙනවා. මේ කරන්නේ, ලොකු ව්‍යාකූලතාවක් ජනතා මනසේ ඇති කිරීමයි. අපි දන්නවා, පසුගිය ජූලි 8වැනි දා ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මොකක් වෙයිද කියලා මුළු රටම බලා සිටි බව. මේ කරන්න හදන්නේ තවත් කවුරු හරි -තවත් ලේනව කෙනෙක්- උසාවියට යවලා තවත් අවුලක් ඇති කිරීම. කිසිම තර්කානුකූල පදනමක් නැති වුණත්, "වෙයිද නොවෙයිද; ජනාධිපතිවරණය පවත්වයිද, නොපවත්වයිද; ජනාධිපතිවරණය කල් දැමීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය මොකක් හරි තීන්දුවක් දෙයිද" යනාදී වශයෙන් ජනතා මනසේ ආයෙත් සැක සංකා ඉස්මතු වීමට සලස්වලා, නැති ප්‍රශ්නයක් කෘත්‍රිම ලෙස මවා පාලා රට අවුල් කිරීම. එක උප්පරවැට්ටියක් අසාර්ථක වෙනකොට තවත් එකක් දමලා කොහොම හරි දිගින් දිගටම මේ ප්‍රයත්නය ඉදිරියට ගෙන යාම තමයි මේකේ අධිෂ්ඨානය. ඒ හැරෙන්න වෙන කිසිම දෙයක් නොවෙයි.

දැන් සමහර අය කියනවා, ජනාධිපතිවරයා හා රජය බොහොම උපක්‍රමශීලීව, හරි විධියට, දුර දිග බලලා මෙහෙම කරනවාය කියලා. එහෙම කිසිම දෙයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක කරන්න බැහැ, කාල සීමාවන් අනුව. මොකද, මේක පනතක්. යෝජනාවක් නොවෙයි, මේක පනතක්. පනත් කෙටුම්පතක් ගෙනෙනකොට ගැසට් කරලා සතියක් යන්න ඕනෑ. එන සතියේ ගෙනෙනවා නම්,- එන සතිය කියන්නේ, ලබන ජූලි 15 වැනි දායින් පටන් ගන්නා සතිය. ගැසට් කරලා සතියක් යන්න ඕනෑ. එහෙම නම් ප්‍රථම වතාවට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන් වෙන්නේ, ලබන ජූලි 23 වැනි දා. ලබන ජූලි 23 කියන්නේ පාර්ලිමේන්තුව රැස් වෙන දවසක්. ගැසට් කරලා සතියකට පස්සේ ජූලි 23 වැනි දා පාර්ලිමේන්තුවට එය ඉදිරිපත් කරන්න ඕනෑ. ඊට පස්සේ සති දෙකක් යන්න ඕනෑ. මෙහිදී ඕනෑම පුරවැසියෙකුට සති දෙකක් තිබෙනවා, උසාවියට ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් පෙත්සමක් ඉදිරිපත් කිරීමට.

එතකොට අගෝස්තු 6වෙනි දා දක්වා කිසිවක් කරන්න බැහැ. අගෝස්තු 6වෙනි දා වෙනකොට මැතිවරණ කොමිෂන් සභාව ජනාධිපතිවරණය පිළිබඳ ප්‍රකාශනය නිකුත් කරලා ඉවරයි. මැතිවරණ කොමිෂන් සභාවට ඒ බලය ලැබෙනවා තව දවස් 6කින්, ජූලි 17වෙනි දා. එතකොට මැතිවරණ කොමිෂන් සභාව ප්‍රකාශ කරලා තිබෙනවා, මේ මාසයේ අන්තිමට ඒ ප්‍රකාශනය නිකුත් කරනවා කියලා. අගෝස්තු 6වෙනි දා වන තුරු රජය ඉදිරිපත් කරන පනත් කෙටුම්පත පිළිබඳව කිසිවක් කරන්න බැහැ. අගෝස්තු 6 වන විට පරක්කු වැඩියි. මැතිවරණ කොමිෂන් සභාව ජනාධිපතිවරණය සම්බන්ධයෙන් ගත යුතු පියවර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් එක් කාරණාවක් ගැන මම ඉතා කෙටියෙන් කියන්නම්. අද උදේ සාකච්ඡා වුණා ඉතාම බරපතළ නඩුවක් සම්බන්ධයෙන් පොලීසියේ ක්‍රියාමාර්ග ගැන. ඒක කනගාටුවට කරුණක්. අපි දැන් හැම දාම හවසට දකිනවා, පොලීසිය රූපවාහිනී කැමරා ඉදිරියේ ඉන්නවා. පොලීසියේ නායකත්වය, පොලීසිය මේ විධියට රූපවාහිනිය ඉදිරියේ, කැමරා ඉදිරියේ ඉන්නවා අපි මීට පෙර කවදාවත් දැකලා නැහැ. බරපතළ නඩුවක් - මිනී මැරුම් නඩුවක්- පිළිබඳව පොලීසියට කරන ලද ප්‍රකාශයක් සම්බන්ධයෙන් විමර්ශනය කරනවා නම්, එකම අරමුණයි තිබිය යුත්තේ. ඒ තමයි, සාක්ෂි එක්කාසු කරලා උසාවියට ඉදිරිපත් කිරීම සහ උසාවියෙන් නිවැරදි තීරණය ලබා ගැනීම. හැබැයි, මේවා කරන්නේ අප්‍රසිද්ධියේ. මේ රටේ ඉතිහාසයේ කවදාවත් පොලීසිය මේ විධියට කැමරා ඉදිරියේ රංගන ඉදිරිපත් කළේ නැහැ; නළුවන් වුණේ නැහැ. ඒ නිසා ඒක ඉතා අවාසනාවන්ත තත්ත්වයක්. මේ රටේ යුක්තිය පසිඳලීමට ඒක විශාල අගතියක් වෙනවා. මට කථා කරන්න කාලය ලබා දුන්නාට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු ශාන්ත බණ්ඩාර මහතා (ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சாந்த பண்டார - வெகுசன ஊடக இராஜாங்க அமைச்சர்)
(The Hon. Shantha Bandara - State Minister of Mass Media)

බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි අද සම්පූර්ණ දවසම අරගෙන මේ විකාර රූපී මාතෘකාවක් ගැන නේ කථා කරන්නේ. ජනාධිපතිතුමාත්, කැබිනට් මණ්ඩලයේ සියලුදෙනාත් පැහැදිලිව තීරණය කරලා තිබෙනවා, ජනාධිපතිවරණය නියමිත වේලාවට

පවත්වනවා කියලා. මේ වාගේ විහිළු කිරීම තුළින් පාර්ලිමේන්තුව තවත් හෑල්ලු වෙනවා. ඒ නිසා කරුණාකරලා මම අපේ පක්ෂ නායකයින්ගෙනුත් ඉල්ලා සිටිනවා, ගෙනෙන ගෙනෙන ඕනෑ දෙයක් මේ ගරු සභාවේ විවාද කරන්න ගන්න එපා කියලා. අද ජනතාවට මොන තරම් ප්‍රශ්න තිබෙනවාද? වෘත්තීය ප්‍රශ්න තිබෙනවා. ඒවා කථා කර ගන්න අද දවස වෙන් කර ගන්න තිබුණා. රාජ්‍ය මුදල් කාබාසිනියා කරන මේ වාගේ වැදගත්කමක් නැති යෝජනා මේ ගරු සභාවට ගෙනෙන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.12]

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන ව්‍යාකූලත්වයක් පෙන්නුම් කරමින් ඒකට පිළියමක් හැටියට දැන් අමාත්‍ය මණ්ඩලය තීරණයක් අරගෙන තිබෙනවා කියන කථාව මත තමයි දැන් මේ විවාදය අද පවත්වන්නේ. ඇත්ත වශයෙන්ම එහි පරස්පරතාවක් තිබෙනවාද කියන ප්‍රශ්නයකුත් තිබෙනවා. ඒක ගැන තමයි මහාචාර්ය ජී.එල්.පීරිස් මැතිතුමාත්, මීට කලින් කථා කරපු එම්. ඒ. සුමන්තිරන් මැතිතුමාත් ඉතා පැහැදිලිව කිව්වේ. ඇත්ත වශයෙන්ම සිංහල කියමනක් තිබෙනවා, මී වදයක් කඩන්නේ අත ලෙවකන්න නොවෙයි කියලා. ඉතින් ජනාධිපති ධුරයට පත් වූ කෙනෙක් මේ වාගේ උප්පරවැට්ටි සොය සොයා සිටීම තමයි මේ රටේ තිබෙන ප්‍රශ්නය. ඇත්ත වශයෙන්ම දැන් මේක කාටත් ඉතා සරල විධියට තේරුම් ගන්න පුළුවන් දෙයක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ ඡේද තුන - මේ ව්‍යවස්ථා තුන - පිළිබඳව පරස්පරතාවක් තිබෙනවා කියන එක සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය මෙහෙම කථා කළාට, උසාවියෙන් තුන් වතාවක් එය නිර්වචනය කරලා ඉවරයි. දැන් මොකක්ද හදිස්සිය? ආපහු මොකද? සඳුදා ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබුණු නඩුවේ පෙත්සම්කරු කාගේ බළල් අතක් ද කියන එක කවුරුන් දන්නවා. ඉතින්, දැන් තමයි පූසා මල්ලෙන් එළියට පනින්නේ. එම කැබිනට් තීන්දුවෙන් පස්සේ පූසා මල්ලෙන් එළියට පැන්නා කියන එක තමයි දැන් අපි තේරුම් අරගෙන තිබෙන්නේ. ඒ ගැන විතරයි අපි දැන් කථා කරන්නේ. මොකද, මේකෙන් නොයෙක් නොයෙක් උප්පරවැට්ටි සිදු වෙන්න පුළුවන්. පනතක් ගෙනෙන්න පුළුවන්, මේ ව්‍යවස්ථා සංශෝධනයකට නොවෙයි. සාමාන්‍ය පනත් කෙටුම්පතක් විධියට ගෙනැල්ලා, එය ව්‍යවස්ථාවේ යම් වගන්තියකට පටහැනි නම් එම පනත් කෙටුම්පත තුනෙන් දෙකේ ඡන්දය ඇතිව සම්මත කිරීමට අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ගන්න පුළුවන්. ඒකට කලිනුත් උදාහරණ තිබෙනවා. මේ සභා ගර්භයට Committee Stage Amendments කියලා ගෙනැවිත්, එහිදී කොහොම හරි තමන්ට ඕනෑ දේවල් කර ගන්න පුළුවන් කියන චේතනාවෙන් මේක කරනවා දෝ කියන සැකය අපට මතු වෙලා තිබෙනවා.

ඒ අනුව තමයි අපි මේ කල් තැබීමේ විවාදය ඉල්ලුවේ. විටින් විට මේ වාගේ උප්පරවැට්ටි හොයන්නේ මොකටද? නැති පරස්පරතාවක් වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලයේ කාලය නාස්ති කරන්නේ මොකටද? පරස්පරතාවක් නැහැ කියන්න හේතුව මේකයි. කැබිනට් මණ්ඩල පත්‍රිකාවේ තිබෙනවා, "වගන්ති දෙකක තිබෙනවා අවුරුදු 5ක් කියලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 (ආ) වැනි ව්‍යවස්ථාවේ අවුරුදු 6ක් කියලා තිබෙන බැවින් අපි මේ ව්‍යාකූලත්වය නැති කරන්න ඕනෑ කියන චූවමනාවෙන් මේ යෝජනාව ඉදිරිපත් කරනවා" කියලා. මොකක්ද කියන්නේ? අවුරුදු 6ක් කියලා ව්‍යවස්ථාවේ කියලා නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 (ආ) ව්‍යවස්ථාවේ කියන්නේ මෙහෙමයි. "...ජනාධිපතිවරයාගේ ධුර කාලය සාඅවුරුද්දක් ඉක්මවා දීර්ඝ කරන්නා වූ..." සාඅවුරුද්දක් ඉක්මවා දීර්ඝ කරන්නා වූ යනුවෙනුයි කියා තිබෙන්නේ. ඒ අනුව, ධුර කාලය අවුරුදු 6ක් කියලා එහි සඳහන් වෙලා නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය මේ ගැන තුන් වතාවක් තීන්දු ලබා දීලාත් ඉවරයි. ඉන් පසුව අමාත්‍ය මණ්ඩලය මේ පිළිබඳව තීරණයක් අරගෙන පනත් කෙටුම්පතක් ගෙනෙන්න හදන්නේ මොකටද? මේවා ඔක්කෝම පිටිපස්සේ ව්‍යංගයෙන්, වක්‍රාකාරයෙන් වෙනත් වැඩ පිළිවෙළක් තියෙන්න පුළුවන් කියන සැකය මතු වෙලා තිබෙන බැවින් තමයි අපට මේ ප්‍රශ්නය දැන් ඇති වෙලා තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
සමහර මන්ත්‍රීවරුන්ට අද ගමට යන්න බැහැ. ගමට ගිහිල්ලා ජනතාවට පිළිතුරු දෙන්න බැහැ. ඒ අය නැවත පාර්ලිමේන්තුවට තේරී පත්වන එකත් සැකයි. ඒ නිසා අවුරුදු දෙකකින් පාර්ලිමේන්තුව කල් දමා ගන්න පුළුවන් නම්, එහෙම නැත්නම් ධුර කාලය වැඩි කරගන්න පුළුවන් නම් ඒක සැපයි නේද? ජනාධිපතිතුමාටයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කීපදෙනෙකුටයි මේක හරියට, "ඇලඩින් පහන ගනින්, පහන ගන්න මාව ගනින්" වාගේ වැඩක්. ඒකයි වැඩේ. "ඇලඩින් පහන ගනින්, පහන ගන්න මාව ගනින්" කියන කථාව වාගේ වැඩක් තමයි දැන් මේ කරන්නේ. ඒකයි මේකේ ඇත්ත පරමාර්ථය. කාලය නාස්ති කරන්නේ අපි නොවෙයි. කාලය නාස්ති කරන්නේ මේ රටේ අමාත්‍ය මණ්ඩලය කියලා මම කියනවා.

ඒ කාරණය පැත්තකින් තියලා තවත් ප්‍රශ්නයක් පිළිබඳව මම කියන්න ඕනෑ. අද "ද ඩේලි මිරර්" පුවත් පතේ මැද පිටුවේ වී.එෆ්.එස්. ග්ලෝබල් ආයතනය නිකුත් කරපු නිවේදනයක් තිබෙනවා. It states, I quote:

"SL's new visa fee does not discourage int'l visitors: VFS Global"

මෙය සම්පූර්ණයෙන්ම සාවද්‍ය නිවේදනයක්. මම ඒක Public Finance Committee එකේ දී ඔප්පු කළා.

The Director General of the Sri Lanka Tourism Development Authority was there. I showed him the figures and pointed out very clearly how the tourist arrivals have dropped because of this new visa fiasco; I very clearly pointed out how that has been happening. Therefore, this drop in tourist arrivals is purely because of this unnecessary service fee - US Dollars 25 per tourist who comes here - that has been charged. A very large drop in tourist arrivals is seen during the period from January to April this year when you compare it with that of last year. Those figures were shown to the Director General of the Sri Lanka Tourism Development Authority and he agreed with me and said that that is

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

because of the increase in visa fees. So, there is a large impact on our tourist arrivals because of this fraudulent visa deal with the so-called consortium that has been formed. Therefore, the Government and the Cabinet, who approved this deal, will have to take responsibility for this large drop in tourist arrivals, as a result of which our exchange earnings have also been seriously impacted on.

Sir, since time is limited or due to the brevity of time, I **table*** my detailed reply to the VFS's statement in the Business Page of the "Daily Mirror" newspaper of today.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කංචන විජේසේකර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.19]

ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට පෙර කථා කළ අපේ හිටපු අමාත්‍ය රවුෆ් හකීම් මැතිතුමා එක වෙලාවක කිව්වා, කාරක සභා අවස්ථාවලදී කරපු විවිධ ක්‍රියාවලි තුළින්, තිබුණු පනත් වෙනස් කරලා කරපු උප්පරවැට්ටි ගැන. එතුමාගේ උප්පරවැට්ටිය එතුමාම මතක් කරපු එක හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 අවුරුද්දේ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු පළාත් සභා ඡන්ද ක්‍රමයට කාන්තා නියෝජනය ගෙන එන සංශෝධනයේදී රවුෆ් හකීම් මැතිතුමන්ලා 70:30 වශයෙන් තිබුණු යෝජනාව 60:40 කරලා අවසානයේදී මොකක්ද වුණේ කියලා දැන් අමතක වෙලා තිබෙනවා. ඒ වෙලාවේ ආණ්ඩුව නියෝජනය කරපු සියලුදෙනා අපට කිව්වේ මොකක්ද? රවුෆ් හකීම් මැතිතුමා ඇතුළු සුළු ජාතික පක්ෂ නියෝජනය කරන නායකයන් මේක 50:50 ලෙස වෙනස් කළේ නැත්නම් ඡන්දය දෙන්නේ නැහැ කියලා ඒ වෙලාවේදී ආණ්ඩුවට බලපෑම් කළා කියලායි කිව්වේ. එහෙම උප්පරවැට්ටි දමපු රවුෆ් හකීම් හිටපු ඇමතිතුමාට අද අමතක වෙලා තිබෙනවා, ඒ කාලයේ එතුමන්ලා කරපු දේවල්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බැලුවා, ඇත්තටම මේ යෝජනාව මොකක්ද, මේ යෝජනාවට අත්සන් කරලා තිබෙන්නේ කවුද කියලා. මේ යෝජනාවෙන් කියන්නේ නියමිත කාලයට ජනාධිපතිවරණය පවත්වන්න කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මැතිවරණය සම්බන්ධයෙන් ගන්න පුළුවන් හැම තීන්දුවක්ම රජය අරගෙන තිබෙනවා. අය වැයෙන් මුදල් වෙන් කිරීම කරලා තිබෙනවා. ජනාධිපතිතුමා නිවේදනය කරලා තිබෙනවා, මේ වසරේ ජනාධිපතිවරණය පවත්වනවා කියලා. නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු දැක්වුවා, ජනාධිපති ධුර කාලය අවුරුදු හයක් නොවෙයි, අවුරුදු පහයි, ජනාධිපතිවරණය නිසි කාලයට පවත්වන්න ඕනෑය කියලා. ශ්‍රේෂ්ඨාධිකරණය මේ සම්බන්ධව තීන්දුවකුත් ලබා දී තිබෙනවා. මේ ඔක්කෝම තිබෙන අවස්ථාවේ මෙතුමන්ලා උත්සාහ කරන්නේ මේ රටේ තිබෙන ප්‍රශ්න අමතක කරලා, මෙතුමන්ලා නිර්මාණය කරමින් යන ප්‍රශ්න අමතක කරලා මැතිවරණය ගැන වෙන මාතෘකාවක් ලබා දෙන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු ඇමතිතුමා සහ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා තමයි මේ යෝජනාවට අත්සන් කරලා තිබෙන්නේ. ඒ දෙදෙනාම තමයි 2018දී පළාත් සභා මැතිවරණය කල් දමන්න කටයුතු කළේ. ඔබතුමා ඒ වෙලාවේ පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක්. ඔබතුමාටත් එය මතක ඇති. ඔබතුමාත්, අපිත් එදා මහනුවර ඉඳලා පා ගමනින් ආවා. අද ඔබතුමාගේ දේශපාලන මතය වෙනස් වුණත් එදා ඒ මැතිවරණය කල් දමනවාට විරුද්ධව ඔබතුමාත් ආවා. ඒ වෙලාවේ සභානායකවරයා හැටියට හිටියේ කිරිඇල්ල හිටපු ඇමතිතුමා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක වුණේ අනුර කුමාර දිසානායක මහත්මයා. මේ දෙන්නා එකතු වෙලා තමයි එදා මැතිවරණය කල් දැම්මේ. මේ දෙදෙනා එකතු වෙලා තමයි එදා දවසේ ඒ සඳහා ඡන්දය දුන්නේ. පළාත් සභා මැතිවරණය අද පවත්වන්න බැරි තැනට තල්ලු කරන්න කටයුතු කරපු දෙදෙනෙක් තමයි අද මේ යෝජනාව ගෙනැත් තිබෙන්නේ. මේ යෝජනාව ටිකක් වෙනස් වුණා නම් හොඳයි කියලා මට හිතෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්න විධියට ආණ්ඩුව පැත්තෙන් කැබිනට් මණ්ඩලය කිසිම තීන්දුවක් අරගෙන නැහැ, මැතිවරණය කල් දමන්න.

මැතිවරණයට අවශ්‍ය මුදල් වෙන් කරලා තිබෙනවා. මම දැක්කා, ඊයේ හෝ පෙරේදා පැෆරල් සංවිධානය ඇතුළු මැතිවරණ නිරීක්ෂණ කමිටුවල ඉන්න සාමාජිකයෝ ගිහිල්ලා මැතිවරණ කොමිසමේ සාමාජිකයන්ව හමු වුණා බව. ඊට පස්සේ ඔවුන් මාධ්‍යයට ඇවිල්ලා කිව්වා, මැතිවරණයට අවශ්‍ය මුදල් වෙන් කරලා තිබෙන්නේ, තාක්ෂණික බාධාවකුත් නැහැ, අවශ්‍ය පහසුකම් පවා ලබා දීලා තිබෙනවා කියලා මැතිවරණ කොමිසම පැහැදිලිවම කිව්වා කියන එක. මේ වසරේ ජූලි මාසයේ 17වැනි දාට පස්සේ මැතිවරණ කොමිසමට ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීමේ බලය ලැබෙනවා, ඒ අනුව අවශ්‍ය තීන්දු ගන්නවා කියලා කිව්වා. මැතිවරණ කොමිසමත් කියනවා නම් ප්‍රශ්නයක් නැහැ කියලා, ආණ්ඩුවත් කියනවා නම් ප්‍රශ්නයක් නැහැ කියලා, ශ්‍රේෂ්ඨාධිකරණයත් කියනවා නම් ප්‍රශ්නයක් නැහැ කියලා, මට තේරෙන්නේ නැහැ, මේ යෝජනාවේ අරමුණ මොකක්ද කියන එක. මට නම් තේරෙන්නේ, මේ යෝජනාව ටිකක් වෙනස් වුණා නම් හොඳයි කියලායි. මට නම් තේරෙන විධියට, මැතිවරණය කල් දමන්න හදන්නේ ආණ්ඩුව නොවෙයි. මැතිවරණය කල් දමන්න, එහෙම නැත්නම් මේ රටේ ක්‍රියාත්මක වන මේ වැඩ පිළිවෙළ අස්ථාවර කරන්න විපක්ෂය නියෝජනය කරන ව්‍යක්තීය සමිති කිහිපයක් කටයුතු කරනවා කියලා අපට පෙනෙනවා.

තැපැල් දෙපාර්තමේන්තුවේ වර්ජනය, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වර්ජනය, ග්‍රාම නිලධාරීන්ගේ වර්ජනය, පරිපාලන කාර්යාලවල වර්ජනය ආදිය තමයි මැතිවරණයකට සෘජුව බලපාන්නේ. ග්‍රාම නිලධාරීන්ගේ සේවය මැතිවරණයකට අවශ්‍යයි. ඒ වාගේම තැපැල් දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වීමත් මැතිවරණයකට අවශ්‍යයි. ප්‍රවාහන සේවා පවත්වා ගෙන යෑමත් මැතිවරණයකට අවශ්‍යයි. ඉතින් මේවා පිටුපස ඉන්නේ කවුද? ව්‍යක්තීය සමිති මේ වෙලාවේ කරන මේ අසාධාරණ ක්‍රියාව පිටුපස ඉන්නේ දේශපාලන අරමුණක් ඇතුළේ ඉන්න ව්‍යක්තීය සමිති මිසක්, මේ රටේ ක්‍රියාත්මක වන සාමාන්‍ය ව්‍යක්තීය සමිති නොවෙයි. ඒ නිසා මම හිතන විධියට, මේ දෙපක්ෂයෙන් යෝජනාව ගෙන ආ යුතුව තිබුණේ මේ කරන ව්‍යක්තීය ක්‍රියාමාර්ග මේ වෙලාවේ නවත්වලා, ජනාධිපතිවරණයට අවශ්‍ය පහසුකම් ටික සපයා දෙන්න කියලායි; ඒ සඳහා අවශ්‍ය වටපිටාව නිර්මාණය කර දෙන්න කියලායි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැබිනට් මණ්ඩලයට ජනාධිපතිතුමා ගෙනා යෝජනාව පිළිබඳව මේ අය නොදැනුවත්ව නොවෙයි මෙලෙස කටයුතු කරන්නේ. ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මන්ත්‍රීතුමාත්, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමාත්, ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාත් ඒ ගැන දන්නවා. එතුමන්ලා තුන්දෙනාම නීතිඥ, අධිනීතිඥ, ජනාධිපති නීතිඥවරු. එතුමන්ලා තුන්දෙනාම දන්නවා, පනත් කෙටුම්පතක් ගේනකොට දවසකින්, දෙකකින් ගේන්න බැහැ කියන එක. ඊයේ ගෙනා ඒ යෝජනාව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් කෙටුම්පත් කරන්න ඕනෑ. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් ඒක කෙටුම්පත් කර අවසන් කරලා, කැබිනට් මණ්ඩලයට අනුමත කරන්න දෙන්න ඕනෑ. කැබිනට් මණ්ඩලය එය අනුමත කළාට පස්සේ ගැසට් කරන්න ඕනෑ. ආයෙත් කැබිනට් මණ්ඩලය රැස් වෙන්නේ ලබන සඳුදා දින. අපි හිතමු, ලබන සඳුදා එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වෙනවා කියලා. නමුත් ගැසට් කරලා දින හතක් ගත වෙන්න ඕනෑ, එය පාර්ලිමේන්තුවේ සභාගත කරන්න. පාර්ලිමේන්තුවේ සභාගත කරලා, මේ රටේ පුරවැසියන්ට ඒක අභියෝගයට ලක් කරන්න තවත් දින 14ක් දෙන්න ඕනෑ. ඊට පස්සේ ඒ දින 14 ඉඳලා, තව දින 21ක් ලැබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයට ඒ පිළිබඳව යම් තීන්දුවක් ගන්නවා නම් ඒ තීන්දුව ගන්න. ඉන් පසු ආයෙත් එය පාර්ලිමේන්තුවට එන්න ඕනෑ. මේ කාල චකවානුව ගත්තත්, දින 55කට වැඩි කාලයක් මේ සඳහා ගත වෙනවා.

ඒ වාගේම ලබන සතියේ මැතිවරණ කොමිසමට මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමේ සම්පූර්ණ බලය ලැබෙනවා. නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් කිසි අපැහැදිලි තැනක් තිබෙන බව පෙනෙනවා නම්, ඒ අපැහැදිලි තැන ඔස්සේ ගිහිල්ලා විවිධ පුද්ගලයෝ මේ සම්බන්ධව අභියෝග කරනවා. මේ පිළිබඳව යම්කිසි කථාවක් මතු වෙලා තිබෙනවා නම් ඒක තමයි ජනාධිපතිතුමා කිව්වේ, ඒක නිවැරැදි කරන්න කියලා. ජනාධිපති ධුර කාලය අවුරුදු හය නොවෙයි, අවුරුදු පහක් කියන එක සඳහා ඒ ව්‍යවස්ථා දෙකම එක සමාන කරන්න ඕනෑ කියන එක එතුමා කිව්වා. ඒක මේ පාර්ලිමේන්තුවේදී වෙනස් කරන්න විපක්ෂය කැමැති නැත්නම් නම් එතුමන්ලාට පුළුවන්කම තිබෙනවා, අපි ඊළඟ පාර්ලිමේන්තුවේදී ඒක වෙනස් කරමු කියලා කියන්න. අද කැබිනට් මණ්ඩලය කරලා තිබෙන්නේත්, ජනාධිපතිතුමා කරලා තිබෙන්නේත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන අපැහැදිලිභාවයක් නිවැරැදි කිරීම සඳහා අවශ්‍ය වටපිටාව නිර්මාණය කිරීමට නීතිමය ප්‍රතිපාදන ලබා දීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිව කිව යුතුව තිබෙනවා, ජනාධිපතිවරණයට අපි සූදානම් කියන එක. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අපි, ජනාධිපතිවරණය වෙනුවෙන් අපේ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙන්නේ. අපි මැතිවරණ ව්‍යූහය පිළිබඳව සාකච්ඡා කරලා තිබෙන්නේ. හැබැයි, අපි මැතිවරණ ක්‍රියාවලිය ආරම්භ කරලා නැහැ. මොකද, අපේ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න, කරගෙන යන්න ඕනෑ කටයුතු තව තිබෙනවා. ඒ කටයුතු කළමනාකරණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙනවා. අපි ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු කරගෙන ගියා. එහි තවත් කොටසක් කරන්නත් තිබෙනවා. මේ රටේ ක්‍රියාත්මක වන සංවර්ධන යෝජනා හා අනෙකුත් යෝජනා මැතිවරණය ප්‍රකාශයට පත් කරනතුරු අවසානය දක්වා ගෙනයන්න මේ රටේ ජනාධිපතිවරයාටත්, ආණ්ඩුවටත් වගකීමක් තිබෙනවා. ඒ නිසා අපි ඒ වගකීම ඉටු කරන අතරතුර තමයි, අපේ මැතිවරණ ක්‍රියාවලියත් කරන්නේ. නිශ්චිතව ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කළාට පස්සේ, මැතිවරණ කොමිසම notice එක -නිවේදනය- නිකුත් කළාට පස්සේ අපි කියන්නම්, අපිත් මැතිවරණ ක්‍රියාවලියේ සම්පූර්ණ වැඩසටහන වෙනුවෙන් සූදානම් වෙලා ඉන්නේ කියලා. ඒ නිසා මේ සම්බන්ධව කිසිම සැකයක් තබා ගන්න ඕනෑ නැහැ. විපක්ෂය නියෝජනය කරන පිරිස්වලට නම් අත උස්සලා පුරුදු ඇති, මැතිවරණ කල් දමන්න. හැබැයි මේ ආණ්ඩු පක්ෂයේ ඉන්න අපි කවදාවත් අත ඉස්සුවේ නැහැ, මැතිවරණ කල් දමන්න.

මැතිවරණ කල් දමන්න ව්‍යවස්ථාමය වශයෙන්වත් අපි උදව් කරලා නැහැ. එහෙම කරපු කණ්ඩායම්වලට එතුමන්ලා කළ ක්‍රියාවලිය පිළිබඳව සැකයක් ඇති. නමුත්, අපට පැහැදිලිවම කියන්න පුළුවන්, අපි ඒ කටයුත්තට සහභාගි වෙන්නෙත් නැහැ, එහෙම කටයුත්තක් සිදු වෙන්නෙත් නැහැ කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ශාන්ත බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ අද දවසේ මේ පාර්ලිමේන්තුවේ මේ වෙන දේ ගැන අපට හරිම කනගාටුයි. මොකද, අද පාර්ලිමේන්තුවට මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගේන්නේ ප්‍රධාන විපක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ ඒකාබද්ධව. ඒකාබද්ධව ගෙනාපු මේ සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව විවාද කරන මේ වෙලාවේදී විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු හතරදෙනෙකුට වැඩිය මෙම ගරු සභාවේ නැහැ. එතුමන්ලා පසුගිය දවසක කිව්වා, ප්‍රකාශයක් කරන්න ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ කාලය ගත්තා කියලා. එහෙම නම් එතුමන්ලා පාර්ලිමේන්තුවේ දවසක කාලය අරගෙන යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙන්නේ මොකටද? වැදගත් යෝජනා, අණ පනත් ඕනෑ තරම් අද දවසේ පාර්ලිමේන්තුවට ගේන්න අවස්ථාව තිබුණා. විශේෂයෙන්ම මේ රටේ අර්බුදයක් නිර්මාණය කිරීම සඳහා විවිධ ව්‍යක්තීය සංවිධාන දේශපාලන ශක්තිය යොදාගෙන කරන ඒ වැඩ පිළිවෙළ තුළින් රට අස්ථාවර කරන එක ගැන අද දවසේ මීට වඩා කථා කළ යුතුව තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සමහර ව්‍යක්තීය සමිති කටයුතු කරන්නේ කොහොමද? මම ඒ ගැන පසුගිය අවුරුදු දෙකේ ලද අත්දැකීම්වලින් හොඳට දන්නවා. විදුලිබල මණ්ඩලයේ සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඒ ව්‍යක්තීය සමිති මම නම් දැක්කේ ව්‍යක්තීය අරගළ තුළින් ඒ අයිතිය දිනා ගන්නා සංවිධාන හැටියට නොවෙයි, ත්‍රස්තවාදී සංවිධාන හැටියටයි. ඒවායේ ඉන්න නායකයන් කිහිපදෙනා කටයුතු කළේ ත්‍රස්තවාදීන් විධියට. අද දවසේත් මම දකිනවා, සමහර ව්‍යක්තීය සමිති - මම කියන්නේ නැහැ, හැම ව්‍යක්තීය සමිතියක්ම; හැම නායකයෙක්ම; හැම අනුගාමිකයෙක්ම කියලා- දේශපාලන වශයෙන් කටයුතු කරන බොහෝ පිරිස් ක්‍රියා කරන්නේ ත්‍රස්තවාදීන් වාගේ කියන එක. එක පැත්තකින් අද ජනතාව බිත්තියට හේත්තු කරලා තිබෙනවා, ආණ්ඩුවෙන් වරප්‍රසාද, එහෙම නැත්නම් ඉල්ලීම් දිනා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති, මීට වසර 15කට පමණ පෙර - 2008 අවුරුද්දේ - එල්ටීටීඊ ත්‍රස්තවාදීනුත් මේ විධියට මිනිස්සුන්ව හිර කළ ආකාරය. මාවිල්ආරු සොරොව්ව වහලා වතුර දෙන්නේ නැතිව ඔවුන්ගේ ඉල්ලීම් දිනා ගන්න, ප්‍රදේශයේ අයිතිය දිනා ගන්න ඔවුන් උත්සාහ කළා. "අපි මෙතැනින් එහාට වතුර දෙන්නේ නැහැ, මේ සේවාව දෙන්නේ" නැහැ කියලා ජනතාව හිර කළා. ඒ වෙලාවේදී ආණ්ඩුව ගත්ත තීන්දුව මොකක්ද? අපි ගිහිල්ලා සොරොව්ව නිදහස් කරගෙන, ජනතාවට ජලයත් ලබා දීලා, ඒ සේවා ටික පවත්වාගෙන යමින් මේ රටේ ජනතාවත් නිදහස් කර ගන්න ඕනෑ කියන තීන්දුව තමයි ඒ වෙලාවේ ආණ්ඩුව ගත්තේ.

අද මොකක්ද කරලා තිබෙන්නේ? අද දුම්රිය සේවක වර්ජනය කියලා ස්ථානාධිපතිවරු කිහිපදෙනෙක් මොනවාද ඉල්ලන්නේ? ඔවුන් ඉල්ලනවා, පුරප්පාඩුවලට බඳවා ගන්න, උසස්වීම් ලබා දෙන්න කියලා. පුරප්පාඩුවලට බඳවා ගන්න එක අපේ රජයේ ප්‍රතිපත්තිය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වෙලාවේදී අපට ඉන්න පිරිසටත් පඩි ගෙවා ගන්න විධියක් නැත්නම්, ඉන්න පිරිස

[ගරු කංචන විජේසේකර මහතා]

ඉල්ලන දීමනා දෙන්නත් බැරි නම් තවත් පිරිසක් එකතු කරගෙන මේ කටයුතු තවදුරටත් අපි අසාර්ථක කර ගන්න ඕනෑද? විදුලිබල මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 26,000ක්. හැබැයි, දැන් ඉන්නේ 22,000යි. අපි තව සේවකයන් 4,000ක් බඳවා ගන්න හිතුවොත් අපට මේ වෙලාවේදී විදුලි පාරිභෝගිකයන් වෙත තවත් බරක් පටවන්න වෙනවා. ඒ නිසා, අපි තීන්දු - තීරණ ගන්න ඕනෑ, අවශ්‍ය වෙලාවට බඳවා ගන්නත්, ඒ අවශ්‍යතා වෙනුවෙන් බඳවා ගන්නත්.

අද මේ සමහර වෘත්තීය සමිති කියනවා දරුවෝ පාසල් එවන්න එපා කියලා. ගුරුවරු පාසල් එන්නේ නැහැ. රජයේ පාසල්වල විතරයි නේ මෙවැනි දේවල් වෙන්නේ. පෞද්ගලික පාසල්වල කිසි ප්‍රශ්නයක් නැහැ නේ. පෞද්ගලික පාසල්වල ඉගෙන ගන්න දරුවෝ ටික හරි වෙලාවට පාසලටත් යනවා; හරි වෙලාවට විභාගත් කරනවා; නියමිත කාලයට විශ්වවිද්‍යාලයටත් යනවා. විශ්වවිද්‍යාල පහසුකම් නැති වෙන්නේ කාටද? රජයේ පාසල්වල නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගන්නා අභිංසක මිනිසුන්ගේ දරුවන්ට. ඒ පිරිස බිත්තියට හේත්තු කරලා කටයුතු කරන්නේ වෙන කවුරුවත් නොවෙයි. ජෝසප් ස්ටාලින්ලා කියන්නේ නම් ත්‍රස්තවාදීන්මයි; ඔවුන්ට කියන්න වෙන වචනයක් නැහැ. සමහර විට අද හවස ඔය වෘත්තීය සමිති ටික එකතු වෙලා කියයි, අන්න අහවල් ඇමතිවරයා අපට ත්‍රස්තවාදීන් කිව්වා, ඒක නිසා මේ වර්ජනය තව දිගට කරගෙන යනවාය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුරු ආණ්ඩු කළත් ආණ්ඩුව හැටියට තීන්දු - තීරණ ගන්න ඕනෑ මේ සේවා අඩපණ කර ගන්නේ නැතිව, මහ ජනතාව පීඩාවට පත් කරන්නේ නැතිව. ආණ්ඩුව වෙනස් කරන්න ඕනෑ නම් මැතිවරණයේදී කතිරය ගහන්න; ඕනෑ නම් විරුද්ධව කතිරය ගහන්න. ඒ වෙනුවෙන් ඕනෑ නම් අභියෝග කරන්න; උද්ඝෝෂණ කරන්න. හැබැයි, ඒ වෙනුවෙන් මිනිස්සු හිර කරගෙන කටයුතු කරන්න එපා; මිනිස්සුන්ගේ ජීවිත අහිමි වෙන විධියට කටයුතු කරන්න එපා.

ඊයේ දවසේ දුම්රිය මගියෙක් මරණයට පත් වුණා. ඒ මරණයේ වගකීම භාර ගන්න ඕනෑ කවුද? ඒ මරණයේ වගකීම භාර ගන්න ඕනෑ, ඒ උද්ඝෝෂණය කරපු, දුම්රිය ස්ථාන වහලා ගියපු ත්‍රස්තවාදී වෘත්තීය සමිති කණ්ඩායම්වල නායකයෝ; ඒවා මෙහෙයවපු පිරිස්. අද දුම්රිය සාමාන්‍යාධිකාරිතුමා කියනවා මම අහගෙන හිටියා, සේවකයන් ඇවිල්ලා හිටියත් සමහර සේවකයන්ට වැඩ දෙන්න විධියක් නැහැ, සමහර ස්ථානාධිපතිවරු දුම්රිය ස්ථාන ඉබි යතුරු දාලා lock කරලා, යතුරු අරගෙන ගිහිල්ලා කියලා.

ඒ විධියට lock කරලා යතුරු අරගෙන ගිය කට්ටිය කරලා තිබෙන්නේ මාවිල්ආරු සොරොව්ව වැහුවා වාගේ, LTTE ත්‍රස්තවාදීන් කරපු ක්‍රියාවම තමයි. වෙන මිනිහෙකුට වැඩ කරන්න එන්න දෙන්නේ නැහැ; වෙන කාටවත් ඒක ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැහැ. මේක ජනතාව අපහසුතාවට පත් කරමින් කරන ක්‍රියාවලියක්. මම නම් විශ්වාස කරනවා, මෙය අත්‍යවශ්‍ය සේවාවක් හැටියට ගැසට් කරලා තිබෙනවා නම්, ඒ නීතිය පාවිච්චි කරන්නේ නැතිව වැඩක් වෙන්නේ නැති බව. මැතිවරණවලදී මොන ප්‍රතිඵලය ලැබුණත්, සේවය අත්හැර ගිහින් ඉන්න පිරිස්, සේවය ක්‍රියාත්මක නොකර ඉන්න පිරිස් වෙනුවෙන් ඒ නීතිය පාවිච්චි කරලා තීන්දු-තීරණ ගත්තේ නැත්නම් මේ රට නිවැරදි දිසාවකට ගෙනියන්න බැහැ. මේ රටට බරක් වෙච්ච සමහර ආයතන තිබෙනවා; මේ රටට බරක් වෙච්ච සමහර නිලධාරීන් ඉන්නවා; මේ රටට බරක් වෙච්ච වෘත්තීය සමිති නායකයෝ ඉන්නවා. එකම දවසක්වත් වැඩ කරන්නේ නැතුව, පාසල් යන්නේ නැතුව, උගන්වන්නේ නැතුව ඒ පාසල්වල ඉන්න දරුවෝ එළියට ගන්න, ගුරුවරු එළියට ගන්න කට්ටිය ඉන්නවා. එක දවසක්වත් වැඩ නොකළ, මේ රටේ විදුලිය විසන්ධි කරනවාය කියන පුද්ගලයෝ ඉන්නවා. ඒ හැම කෙනාම පිටුපස ඉන්නේ දේශපාලන සංවිධානයක්. ඒ, අර අත්සන් කරපු දෙපළ නියෝජනය කරන, ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන දේශපාලන වෘත්තීය සමිතියි කියන එක මේ වෙලාවේදී අපි මතක් කරන්න ඕනෑ.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, අපි මැතිවරණ කල් දාන්න කටයුතු කරන්නේ නැති බව. මැතිවරණය නියමිත වෙලාවට පවත්වයි. ඒක මැතිවරණ කොමිසමේ වගකීමක්. රජයට තිබෙන්නේ පහසුකම් ලබා දීම. ඒ පහසුකම් ලබා දීමට රජය කටයුතු කරලා තිබෙනවා. හැබැයි, අපි ඔබතුමන්ලාට කියනවා, වෘත්තීය සමිති ක්‍රියා මාර්ග තුළින් මැතිවරණ කල් දමන්න කටයුතු කරන්න එපා කියලා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.34]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට ප්‍රථමයෙන් කථා කරපු ඇමතිතුමා කිව්ව එක කරුණකට මම සම්පූර්ණයෙන්ම එකඟයි. ඒ කරුණ තමයි, නීතිය අනිවාර්යයෙන්ම හැමෝටම එක හා සමානව ක්‍රියාත්මක කළ යුතුයි කියන එක. ඒකේ දෙකක් නැහැ. විපක්ෂයේ දේශපාලනඥයෙක් හැටියට හිර ගෙදර යන්න සිදු වුණොත් අපි රෝහල්වල හැංගෙන්නේත් නැහැ. අපිට හිර ගෙදර යන්න සිදු වුණොත්, සාමාන්‍ය පුද්ගලයෙකුට වාගේ හැමෝටම එක හා සමානව නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියන පදනමේ තමයි අපි සිටින්නේ. නමුත් අවාසනාවකට, අපේ රටේ නීතිය ගැන අපිට එහෙම කියන්න බැහැ. හුහක් තැන්වල ඉහළ තානාන්තරවල ඉන්න අයට එක විධියකටයි, පහළ තානාන්තරවල ඉන්න අයට තව විධියකටයි තමයි නීතිය ක්‍රියාත්මක වෙන්නේ.

අපි අද මේ ගරු සභාවේදී කථා කරන්නේ ජනාධිපතිවරණය කල් දැමීමට වෑයමක් තිබෙනවාද, නැද්ද කියන එක ගැනයි. මම දන්නේ නැහැ, ඇයි මේ මාතෘකාව ඉදිරියට ඇවිල්ලා තිබෙන්නේ කියලාවත්. මේ රටේ හැමෝම දන්නවා, ජනාධිපතිවරයෙකුට අවුරුදු පහක ධුර කාලයක් තිබෙන බව. මැතිවරණය ළංවෙනකොට මේ වාගේ මාතෘකාවක් ඉදිරිපත් වෙනවා. ඇයි මේ වාගේ මාතෘකාවක් ඉදිරිපත් වෙන්නේ, ඇයි මේ ගැන සාකච්ඡා කරන්න ඕනෑ, ඇයි කැබිනට් මණ්ඩලයට සංශෝධන ගෙනෙන්න ඕනෑ? ප්‍රශ්නයක් නැත්නම් කිසිම හේතුවක් නැහැ. මේ මාතෘකාව ගැන සාකච්ඡාවක් තිබෙනකොට මම ඇත්තටම යෝජනා කළේ මේ යෝජනාව ගෙනෙන්න ඕනෑ රජයෙන් කියායි. නමුත්, රජය ඒකට ලෑස්ති වුණේත් නැහැ. ඒ නිසා තමයි විපක්ෂයට මේ යෝජනාව ගෙනෙන්න සිදු වුණේ. මේ යෝජනාව රජයෙන් ගෙනාවා නම් කිසිම අනුමානයකුත් නැහැ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (2) අනුව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපති ධුර කාලය අවුරුදු පහයි කියලා එහි පැහැදිලිවම කියා තිබෙනවා. දැන් අවිනිශ්චිතතාවක් ඇති කරන්න වෑයම් කරලා තිබෙනවා. මොකද, ඉස්සර ජනාධිපති ධුර කාලය විධියට තිබුණේ අවුරුදු හයක් නේ. මොකද, එය අවුරුදු හයට වඩා වැඩි කරන්න

බැහැ කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා. ඒ වෙලාවේ ඒක කළේ නැත්තේ -ඒක අයින් කරන්න ඒ වෙලාවේ ජනමත විචාරණයක් අවශ්‍ය වුණා- ජනමත විචාරණයක් ගන්න බැරි නිසායි. ඕක පාවිච්චි කරලා තමයි මේ සෙල්ලම කරගෙන ගිහිල්ලා, අවිනිශ්චිතතාවක් ඇති කරලා තිබෙන්නේ. හුඟක් කථිකයෝ මේ කාරණය ගැන කිව්වා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කරනකොටත් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තුන් වතාවක්ම කියලා තිබෙනවා, ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු පහයි කියලා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිතුමා වෙලා සිටියදී ඒ කාලය වසර හයේ ඉඳලා පහට අඩු කරපු වෙලාවේදීත් ඒ ගැන ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විමසනකොට ඒ අයත් කිව්වා, මේ ධුර කාලය අවුරුදු පහයි කියලා. ඊයේ-පෙරේදා කවුද අධිකරණයට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරලා තිබුණා. නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණය ඒ පෙත්සම විසි කරලා, ඒ පුද්ගලයාට දඩුවමකුත් දීලා තිබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයට රුපියල් ලක්ෂයක්ද කොහේද ගෙවන්න කියලා. මට නම් තේරෙන්නේ නැහැ, මෙහෙම කරන්න හේතුව මොකක්ද කියලා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව ජනමත විචාරණයක් පවත්වන්න ඕනෑ වෙනවා, මෙහෙම වෙනසක් ඇති කරන්න යනවා නම්. ඉතින්, මේක ගෙනෙන්න ඕනෑ නැහැ නේ. දැන් පුළුවන්ද මෙච්චර මුදලක් වියදම් කරලා ජනමත විචාරණයක් පවත්වන්න? මට ඉස්සෙල්ලා කථා කළ ඇමතිතුමා කිව්වා, "නැහැ, නැහැ, ජනාධිපතිවරණය තිබෙනවා, අපි මුදල් වෙන් කරලා තිබෙන්නේ; අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙන්නේ" කියලා. ප්‍රාදේශීය සභා, නගර සභා සම්බන්ධයෙන් වන මැතිවරණයටත් අය වැයෙන් මුදල් වෙන් කරලා නේ තිබුණේ. නමුත්, මැතිවරණය තිබ්බේ නැහැ. මෙතැන තිබෙන්නේ අවිශ්වාසය පිළිබඳ ප්‍රශ්නයක්. මෙතැන නැහිටලා එක එක ඒවා කියයි. නමුත්, ඒවා විශ්වාස කරන්න බැහැ. අනෙක, මැතිවරණයට යන මුදල කීයද? සොච්චමක් නේ යන්නේ. රුපියල් බිලියන 5ක්, 6ක්, 7ක් වැය වෙයි. අපෝ, එක බිල් එකකින් ගහනවා නේ, බිලියන 10ක්. ලංකාවේ තිබෙන දූෂණයේ ප්‍රමාණය. බින්දු ගණන සාමාන්‍ය මිනිස්සුන්ට තේරෙන්නේ නැහැ. ඒකයි ප්‍රශ්නය තිබෙන්නේ. ඉතින් ඒ අයට ජනතාවගේ ස්වෛරීත්වය නැති කරන්න ඒ වාගේ මැතිවරණයකට වියදම් කරන එකේ කිසිම ගැටලුවක් නැහැ. මෙන්න, මේක තමයි අපට වෙලා තිබෙන විශාල ප්‍රශ්නය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණය ළං වෙනකොට, - අපි මේක බලාගෙනයි හිටියේ- දේශපාලනඥයෝ මුදල් හොයන්න එපැයි නේ, මැතිවරණය කරන්න. ඉතින්, මොනවාද කරන්නේ? මේ ළඟදී මත්පැන් බෙදා හැරීමේ බලපත්‍ර -පර්මිට්- දීගෙන දීගෙන ගියා. බියර් පර්මිට්, අරවා මෙවා කිය කියා පර්මිට් දීගෙන දීගෙන යනවා. මේ පර්මිට් ගන්නේ දේශපාලනඥයෝ. මට කෙනෙක් චෝදනා කරලා කිව්වා, ඒ කවුද කියලා පෙන්වන්න කියලා. එයාගේ නමින් නොවෙයි, පවුලේ කෙනෙකුගේ නමින් මේ බලපත්‍ර ගන්නේ. හැබැයි, මේ දූෂණය තිබෙනකොට ඒක ඊට වඩා එහාට ගිහිල්ලා. දැන් ඒක කරන්නේ කොහොමද කියලා දන්නවාද? දැන් කොම්පැනි හදලා ඒ හරහාත් පර්මිට් ගන්නවා. දැන් හොයලා බලන්න වෙලා තිබෙන්නේ කොම්පැනිය කාටද අයිති කියලායි. දූෂණය පටන් ගත්තාම ඒකේ ඉවරයක්ම නැහැ. විශේෂයෙන්ම මැතිවරණයක් එන්න තිබෙන වෙලාවේදී ඔය පර්මිට් දීගෙන දීගෙන යන්න ඕනෑද? මේක දූෂිත ක්‍රමයක්. මේ ක්‍රමය අපි වෙනස් කරන්න ඕනෑ. 2022දී මිනිස්සු පාරට බැස්සේ ක්‍රමය වෙනස් කරන්න කියලායි. මේක තවම ඇහෙන්නේ නැත්නම් ඒක ප්‍රශ්නයක්. මේ ක්‍රමය අපි වෙනස් කරන්න ඕනෑ. ඒ සඳහා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම කැප වෙලා ඉන්නවා. මේ ක්‍රමය අපි වෙනස් කරනවා. මේ දූෂිත ක්‍රමය වෙනස් කරනවා. මෙහෙම හම්බ කරන්න දෙන්නේ නැහැ.

අපි හැම දාම කියලා තිබෙන්නේ, මන්ත්‍රීවරුන්ට ජීවත් වෙන්න සැහෙන පඩියක් දෙන්න ඕනෑ කියලායි. ඒ, ඒ ගොල්ලන්ගේ කටයුතු නීත්‍යානුකූලව කරගෙන යන්න. හොරෙන් හම්බ කරන්න නොවෙයි. මම දන්නේ නැහැ, මොකක්ද මේ කරගෙන යන්නේ කියලා. මට ලජ්ජයි කියන්න, මේ ජනාධිපතිතුමා මේවාට ඉඩ දීලා තිබෙනවා කියලා. මේ ජනාධිපතිතුමාට කරන්න හුඟක් දේවල් තිබෙනවා. හැබැයි, ඒවා කරලාත් නැහැ. ඊටපස්සේ මේ ඔක්කොම වෙනස් කරන්න තමයි හැම තිස්සෙම අපි කල්පනා කරන්නේ. දැන් ජනමත විචාරණයක් ගැන කථා කරනවා. ඉස්සෙල්ලා ඒක ගැනවත් කථා කළේ නැහැ. හිතුවේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තුනෙන් දෙකේ බලයක් අරගෙන වෙනසක් කරන්න පුළුවන් කියලායි. ලංකාවේ මේක දිගින් දිගටම වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1970දී මන්ත්‍රීවරු 151දෙනායි පාර්ලිමේන්තුවේ හිටියේ. 1988දී ඒ සංඛ්‍යාව 168කට වැඩි කළා. කාගෙන් අහලාද වැඩි කළේ? මන්ත්‍රීවරු හැටියට පත් වුණා කියලා අපිට ඕනෑ විධියට මෙතැන ඉන්න සංඛ්‍යාව වැඩි කරන්න පුළුවන්ද? අපිට පුළුවන්ද අපට ඕනෑ විධියට කාලය දීර්ඝ කරගන්න? හිතනවාද, අපට ඕනෑ විධියට මැතිවරණය පවත්වන දින වෙනස් කරන්න පුළුවන් කියලා? ඒක ප්‍රජාතන්ත්‍රවාදය නොවෙයි. එක එක නීතිමය කරුණු කියලා අපට හැංගෙන්න බැහැ. මේ දේශපාලන ව්‍යුහයට, ජාත්‍යන්තර දේශපාලන අදහසට, දේශපාලන philosophiesවලට සම්පූර්ණයෙන්ම විරුද්ධවයි මේක කරලා තිබෙන්නේ. ඊට පස්සේ මොකක්ද කළේ? 1989 පෙබරවාරි මාසයේදී එම ප්‍රමාණය 225කට වැඩි කළා. මේවා කළේ ජනතාවගෙන් අහන්නේ නැතිවයි. එහෙම කරලා තමයි මේ තැනට මේ රට තල්ලු කරලා තිබෙන්නේ. ජනතාවගෙන් අහලා නොවෙයි, මේවා කරලා තිබෙන්නේ. අපට හිතෙන හිතෙන දේවල් මෙතැන කරන්න බැහැ. අපි ජනතාවගේ ස්වෛරීත්වය රැකිය යුතුයි.

I want to ask the Hon. President as to why we are creating this confusion, particularly at this time when we all know that the Constitution very specifically states in Clause 30(2) that the term of the President is five years. Therefore, this is unnecessary confusion, an unnecessary debate. Why do you have to bring it even to the Cabinet? There was no necessity for it. Obviously, when you do that, because there is no trust, people begin to think that actually there has to be an ulterior motive in doing that. I want to say this to the Hon. President: you have some more months to go and there are things you could do, which would create confidence in the country. You go and make the commitment that the Thirteenth Amendment to the Constitution would be implemented. I am telling you, please implement it. You do not have to wait to do that. Please implement the Thirteenth Amendment to the Constitution in this country.

We know that over a period of time, politicians had gone for several devolution mechanisms. In 1971, there were Divisional Development Councils; in 1973, District Political Authority; in 1978, District Minister system and in 1981, District Development Councils. All these devolution mechanisms were games played and then in 1988, the Provincial Councils System was brought in. All those were initiatives of the Central Government, but people widely believed that the last one was on the insistence of the Indian Government; that is what the people thought. Whichever way, without getting into the politics of it, I am telling the Hon. President now, since

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

this has been in our Constitution, implement it. We do not want any more commitments. It is in the Constitution. Those are things you could do. So, why are you not doing the things you could actually do? But, what are we doing in this country? The things that we should do, the things that are in the Constitution, the things that are in the law, the things that are legal and things that would solve the problems of this country are not being done. So, that is not an argument only about the North and the East, but an argument about devolution and an argument about the South as well. Lots of people forget the fact that over the past 30 years, we have had this Thirteenth Amendment in the Constitution and that it is only for six or seven years that the Provincial Council of the North has been in operation. But, in the south of the country, we have had provincial councils operating all along; we have had them all along. What had you actually been doing? You never gave funding to the Northern Provincial Coucil. Even today, the Central Government funding is about 68 per cent on Recurrent Expenditure and about 86 per cent on Capital Expenditure. Out of that, 75 per cent goes for salaries. And, what did you do? You created something without a logic or thinking about the economy. These fundings are powerful tools, if they are properly used for empowerment and properly given.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
I am going to conclude, Sir.

There is an argument that provincial councils are not economically viable because there is duplication. That is absolute nonsense! Somebody said that if you abolish them, the GDP would grow by 0.5 per cent. But, the GDP would grow by 2 to 5 per cent, if you actually make them work.

Then, we have had a Colombo-centric development model for the last 50 years and the people outside Colombo have not been benefitting by that. They also must benefit and there has been no capital investment in that regard. So, finally, I am telling the Hon. President, "Sir, there is something you could do. Please implement the Thirteenth Amendment to the Constitution rather than just creating confusion over the Presidential Election".

Thank you, Sir, for the time given.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.45]

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උප්පරවැට්ටි ක්‍රමයට මේ රටේ මැතිවරණ කල් දැමීමට උත්සාහ දරන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ඒ සඳහා තවත් උත්සාහයක් දරද්දී, මේ වෙලාවේ ගරු සභාවේ ආණ්ඩු පක්ෂයේ එක මන්ත්‍රීවරයකු පමණයි ඉන්නේ මේ කියන දේවල් අහන්න. කැබිනට් මණ්ඩලය නියෝජනය කරන, ඒ යෝජනාවට අත ඔසවපු කංචන විජේසේකර ඇමතිවරයා අද පාර්ලිමේන්තුවේදී කිව්වා, "පළාත් සභා මැතිවරණය කල් දැම්මේ ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු ඇමතිතුමා" කියලා. එතුමා ඇත්ත දන්නේ නැද්ද, කියවලා නැද්ද, තේරෙන්නේ නැද්ද, එහෙම නැත්නම් කියන්න කියලා ජනාධිපති කියපු හින්දා මෙතැනදී එහෙම දෙයක් කිව්වා ද? ඒ සියල්ලට වග කියන්න ඕනෑ එදා අගමැතිව සිටි රනිල් වික්‍රමසිංහ මැතිතුමායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සොයා බලන්න -පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමාත් ආසනයේ සිටිනවා- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඒ අදාළ පනත් කෙටුම්පත සම්මත කිරීම සඳහා කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව මාස දෙකක් ඇතුළත පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කරන්න කියලා රටේ අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් එදා හිටපු කථානායකතුමා කමිටුවක් පත් කළා. අද වන කොට මාස දෙකක් නොවෙයි, අවුරුදු 10කටත් ළඟයි. දැන් එතුමා අගමැති නොවෙයි, ජනාධිපති. ඒ යෝජනාව ඉදිරිපත් නොකිරීම තුළ අදටත් පළාත් සභා මැතිවරණයට අදාළ පනත් කෙටුම්පත සම්මත කර ගන්න බැරිව ඉන්නවා. එහෙම නම්, මැතිවරණ කල් දැමීමේ පියා කවුද? ඒ තමයි, ඒ ඇමතිවරයා නියෝජනය කරන කැබිනට් මණ්ඩලයේ නායකයා; එතුමා ඉන්න කණ්ඩායමේ ප්‍රධානියා; ඊළඟ ජනාධිපති කරන්න කියලා එතුමා උත්සාහ ගන්න පුද්ගලයා. ඒ, රනිල් වික්‍රමසිංහ මහත්මයා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ඇමතිතුමා හිතාගෙන හිටියාට රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනාධිපති වෙන්නම ඉල්ලනවා කියලා, අපට ලැබෙන ආරංචියට අනුව නම් එතුමා මහින්ද රාජපක්ෂ මහත්මයා ළඟ, බැසිල් රාජපක්ෂ ළඟ දණින් වැටිලා කල් ඉල්ලා තිබෙනවා, ජනාධිපති අපේක්ෂකයා හැටියට 2වන දා ධම්මික පෙරේරාව නම් කරන්න එපා කියලා. ඔහුව නම් කරන්න හිටියේ එදා. ගරු පියංකර ජයරත්න මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා නේ.

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
මම දැන් පොහොට්ටුවේ නැහැ.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මෙතුමා දැන් පොහොට්ටුවේත් නැති ලු. පොහොට්ටුව ඉවරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොහොට්ටුවේ ජනාධිපති අපේක්ෂකයා නම් කරන්න සිටියදී, 'අනේ කරුණාකර 27වන දා වන තෙක් කල් දෙන්න. අපි සමගි ජන බලවේගයෙන් 15දෙනෙක් අරගෙන එන්නම්. එතකල් නම් කරන්නේ නැතුව ඉන්න. බැරි වෙලාවත් එහෙම ගෙනෙන්න බැරි වුණොත් ධම්මික පෙරේරාගේ අගමැති අපේක්ෂකයා හැටියට කටයුතු කරන්න වුණත් සූදානම්' කියන ආයාචනය රාජපක්ෂවරුන්ගෙන් කරලා තිබෙනවා කියන එක කංචන විජේසේකර මහත්මයා දන්නේ නැහැ.

ඊට පසුව කිව්වා, කැබිනට් පත්‍රිකාවේ ලියලා තිබෙන විධියට, කියලා තිබෙන විධියට මැතිවරණ කල් දැමීමක් වෙන්නේ නැහැ. අවශ්‍ය කරන සංශෝධනයක් කරන්නේ කියලා. කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ශාන්ත බණ්ඩාර මැතිතුමා කිව්වා, කාලය කා දැමීමක් මේ කරන්නේ කියලා. කවුද මේ කාලය කා දැමීම කරන්නේ? කාලය විතරක් නොවෙයි, රටේ මුදලුත් නාස්ති කරලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රශ්නයක් නැහැ කියන එක තුන් වතාවක් තීන්දු කරලා තිබෙන අවස්ථාවකයි ඔය කියන සංශෝධනය ගෙනෙන්න යන්නේ. එදා මේ රටේ පළාත් සභා මැතිවරණය, ප්‍රාදේශීය සභා මැතිවරණය නොපැවැත්වීම නිසා එය හැම ගමකටම, හැම ගෙදරටම විශාල ප්‍රශ්නයක් වෙලා. පාරට ලයිට් එක දමා ගන්න බැරිව, කානු ටික සුද්ද කර ගන්න බැරිව, ග්‍රාමීය මාර්ගය හදා ගන්න බැරිව, ගමට උත්තර දෙන්න නියෝජිතයෙකු නැතිව ප්‍රශ්නවලට මුහුණ දෙමින් ඉන්න මිනිසුන්ට අත්‍යවශ්‍ය වෙච්ච මැතිවරණය තියන්න බැහැ කිව්වේ සල්ලි නැති හින්දා. ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5 ද, 6 ද කියන එක තීරණය කරන්න අද ජනමත විචාරණයක් පැවැත්විය යුතුයි කියලා කියනවා. මොන පදනම මත එහෙම කථා කරනවාද කියන එක කරුණාකර සොයා බලන්න.

ශ්‍රේෂ්ඨාධිකරණය මීට පෙර තුන් වතාවක්ම තීන්දුවක් දී තිබෙන විට, මීට සතියකට කලින් ජනාධිපතිවරයාට අවුරුදු හයක කාලයක් අරගෙන දෙන්න උත්සාහ ගත්තු පුද්ගලයාට ලක්ෂයක දඩයකුත් ගහලා තිබෙන විට ඒ පණිවුඩය තේරෙන්නේ නැද්ද? ඒ පණිවුඩය තේරුම් ගන්න බැරි අමනෝඥ කණ්ඩායමක් ද මේ කැබිනට් මණ්ඩලයේ ඉන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කරන්න හදන්නේ ඔබතුමාගේ අයිතිය වෙච්ච, අපේ අයිතිය වෙච්ච, මේ රටේ සමස්ත ජනතාවගේ ප්‍රධානම අයිතිය වෙච්ච ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ඩැහැගන්න උප්පරවැට්ටියක් ක්‍රියාත්මක කිරීමයි. මේ මොකක්ද කරන්න යන්නේ කියන එක, මේකෙන් වෙන්නේ මොකක්ද කියන එක පැහැදිලි කරන්න මට වෙලාවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටේ system failure එකක් ඇති වෙලා තිබෙනවා. පොලීසිය යුක්තිය මෙහෙයුම, අර මෙහෙයුම කියලා මල් වට්ටි අරගෙන මාධ්‍ය ඉදිරියට එනවා; විවිධ කථා පවත්වනවා ඔබතුමාත් දකින්න ඇති. පාතාලයේ කණ්ඩායම් අතර මිනීමැරුමක් සිද්ධ වුණාම, ඒ මිනීමැරුම පිළිබඳව SP කෙනෙකු වාගේ නිලධාරියෙකු ගිහිල්ලා - ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු ගිහිල්ලා- වාඩි වෙලා නඩුව අහනවා තමුන්නාන්සේලා දැක්කා. නඩුව එතැන ඇහුවා. හැම කෙනෙකුටම මාධ්‍යයෙන් එය දැක ගන්න ලැබුණා. එතකොට නඩුවක් ඉදිරියට ගෙන යන්න පුළුවන්ද? ප්‍රශ්න ඇහුවා හරියට උසාවියේ වාගේ, එතැන හිටගෙන හිටපු අනෙක් කනිෂ්ඨ පොලිස් නිලධාරීන්. එතැනදී ප්‍රශ්න ඇහුවා, උසාවියේ වාගේ. නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු කරපු රජයේ අධිනීතිඥවරයෙකු හැටියට මට ඇත්තටම ලජ්ජා හිතුණා, ජ්‍යෙෂ්ඨ නීතිඥයෙකු මේ රටේ ජනාධිපති පුටුවේ ඉන්න වෙලාවක මේ රටේ නීතිය කඩා හැලෙන ආකාරයට පොලීසිය හැසිරුණු විධිය ගැන. මාධ්‍යවලින් සියලු දේ, වෙන්න තිබෙන දේ ප්‍රදර්ශනය කළා. සමාජ මාධ්‍ය පැත්තකට දමන්න. ප්‍රධාන මාධ්‍ය හැම එකකම නඩුව කරන හැටි ප්‍රදර්ශනය කළා. ඒ විධියට නඩුකරය ඉදිරියට ගෙන යන්න පුළුවන්ද? මේ රටේ සිදු වන මිනීමැරුම් සම්බන්ධ නඩු, මේ රටේ සිදු වන විවිධ වංචා, දූෂණ සම්බන්ධ නඩු තාක්ෂණික හේතු මත කඩා බිම දාලා දූෂිතයන්, වංචනිකයන්, හොරුන්, මිනීමරුවන් එළියට දමන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ කවුද කියන එකත් ජනතාව තේරුම් ගත යුතුයි. ඒකේ දිගුවක් තමයි මේ ක්‍රියාත්මක වෙන්නේ.

නීතිය කඩා බිඳ දමන, රටේ ප්‍රජාතන්ත්‍රවාදය උදුරා ගන්න උත්සාහ කරන රජය **පලවා** හරින්න රටේ ජනතාව බලාගෙන ඉන්න මොහොතක මැතිවරණ කල් දමන්න කිසිම විධියකට ඉඩ තියන්න එපා කියලා මම මැතිවරණ කොමිසමෙන් ඉල්ලා සිටිනවා. ඒ නිසා, 17වන දායින් පසුව එළඹෙන පළමුවැනි මොහොතේම නාම යෝජනා කැඳවීම නිවේදනය කරන්න කියන බල කිරීම අපි මේ මොහොතේ කරන්න කැමතියි.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.54]

ගරු උදය ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய கம்மன்பில)
(The Hon. Udaya Gammanpila)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉඳලා හරියටම දවස් 6කින් මැතිවරණ කොමිසමට බලය ලැබෙනවා ජනාධිපතිවරණය පිළිබඳව ප්‍රකාශයට පත් කරන්න; නාම යෝජනා කැඳවන දිනය ප්‍රකාශයට පත් කරන්න. නමුත්, මේ මොහොතේත් මේ රටම දෙගිඩියාවකින් පෙළෙන්නේ ජනාධිපතිවරණය පවත්වයිද, නැද්ද කියලායි. සමස්ත ජාතියම මෙවැනි අවිනිශ්චිත තැනකට තල්ලු වුණේ හේතු හතරක් නිසා. ඉන් පළමුවැනි හේතුව, ජනාධිපතිතුමාගේ පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා රටට කිව්වා, ජනමත විචාරණයක් තියලා ජනාධිපතිතුමාගේ ධුර කාලය වසර දෙකකින් දීර්ඝ කළ යුතුයි කියලා. දෙවැනි හේතුව, ජනාධිපතිතුමාගේ පක්ෂයේ සභාපතිතුමා -චිරාත් අබේවර්ධන මැතිතුමා- නිරන්තරයෙන් කියනවා, ජනාධිපතිතුමාට තව වසර 10ක් රට භාර දිය යුතුයි කියලා. ඡන්දයකින් නම් ඒක වෙන්නේ නැහැ නේ. තුන්වැනි හේතුව, ජනාධිපතිතුමාගේ පක්ෂයට - එක්සත් ජාතික පක්ෂයට- මැතිවරණ කල් දැමීම පිළිබඳ අතිශයින් නරක ඉතිහාසයක් තිබීම. 1982දී ලාම්පු-කළගෙඩි සෙල්ලමෙන් පාර්ලිමේන්තු මැතිවරණය අවුරුදු හයකට කල් දැම්මා.

2015දී පුංචි ඡන්දය අවුරුදු දෙකකට කල් දැම්මා. 2018දී පළාත් සභා මැතිවරණය අතුරුදහන් කළා, අතුරුදහන් කරලා සොයා ගන්නත් නැහැ. 2022දී පුංචි ඡන්දයට කළෙත් ඒකමයි. ඒ නිසා මේ රටේ ජනතාවට සාධාරණ බියක් ඇති වෙනවා, ඒ ඡන්දවලට කරපු දේම මේ ඡන්දයටත් කරාවිද කියලා. 4වන හේතුව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය සඳුදා අමාත්‍ය මණ්ඩලය තීන්දුවක් ගන්නවා, විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 (ආ) ව්‍යවස්ථාවේ "සාවුරුද්දක් ඉක්මවා" කියන වචන වෙනුවට "වසර 5ක් ඉක්මවා" කියලා සංශෝධනය කිරීමෙන් විශේෂයෙන්ම එහි 83 (ආ) ව්‍යවස්ථාව සංශෝධනය කරන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතා පැහැදිලිව සඳහන් වෙනවා, 83 වන ව්‍යවස්ථාව සංශෝධනය කරනවා නම්, අනිවාර්යයෙන්ම ජනමත විචාරණයකින් ජනතාවගේ අනුමැතිය ලබා ගත යුතුයි කියලා. ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත් කරන්න සතියක් තිබෙද්දී, රට ජනමත විචාරණයකට තල්ලු කරන, රට ජනමත විමසුමකට තල්ලු කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනාවාම ජනාධිපතිවරණය අතුරුදහන් වෙයි කියන සාධාරණ සැකය ජනතාවට ඇති වෙන එක හරිද, වැරදි ද? හරි නේද? ජනාධිපති නීතිඥවරු දෙන්නෙක් ඉන්න මේ අමාත්‍ය මණ්ඩලයට මේක ජනමත විචාරණයට යොමු කළ යුතු සංශෝධනයක් කියන එක නොතේරුණාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

[ගරු උදය ගම්මන්පිල මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තෙන්ම මේ විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියලා ගෙනෙන්න යන්නේ අනවශ්‍ය සංශෝධනයක්. ඔය 83 (ආ) ව්‍යවස්ථාවේ "සාවුරුද්දක් ඉක්මවා" කියලා තිබෙන්නේ. මොකද, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට කලින් ජනාධිපතිගේ ධුර කාලය තිබුණේ වසර හයයි. ජනාධිපතිතුමාගේ ධුර කාලය ගැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කථා කරන්නේ 30 (2) ව්‍යවස්ථාවෙන්. මේ 30 (2) ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයාගේ ධුර කාලය, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වසර 6 සිට වසර 5 දක්වා අඩු කළා. නමුත් සිතාමතා ඕනෑකමින් තමයි 83 (ආ) ව්‍යවස්ථාවට අත තිබ්බේ නැත්තේ. ඇයි ඒ? 83 (ආ) ව්‍යවස්ථාවට අත තිබ්බොත්, ජනමත විචාරණයකට යන්න වෙනවා. හැබැයි, 8 (ආ) ව්‍යවස්ථාව ඒ ආකාරයෙන්ම තිබුණාය කියලා කිසිම හානියක් සිද්ධ වෙන්නේ නැහැ. අපි එහෙම කියන්නේ ඇයි? 83 (ආ) ව්‍යවස්ථාවේ කියන්නේ "සාවුරුද්දක් ඉක්මවා" ජනාධිපති ධුර කාලය දිගු කිරීමට හෝ 30 (2) ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට හෝ ඊට පටහැනි පනත් කෙටුම්පතක් සම්මත කර ගන්න හෝ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බහුතරයකින් සම්මත කිරීමට අමතරව, ජනමත විචාරණයකදී ජනතාව විසින් සම්මත කළ යුතුයි යන්නයි. එහි ඉතා පැහැදිලිව කියනවා, 30 (2) ව්‍යවස්ථාව සංශෝධනය කරන්න ජනමත විචාරණයක් අවශ්‍ය බව. දැනටමත් 30 (2) ව්‍යවස්ථාවේ තිබෙන්නේ කොච්චර කාලයක් කියලාද? 30 (2) ව්‍යවස්ථාවේ කියනවා, "ජනාධිපති ධුර කාලය වසර පහකි" කියලා. එහෙම නම් 83 (ආ) ව්‍යවස්ථාවේ "සාවුරුද්දක් ඉක්මවා" කියන වචන සංශෝධනය කළත්, නැතත්; ඕක තිබුණත් නැතත් වසර 5 ඉක්මවා ජනාධිපතිතුමාගේ ධුර කාලය වැඩි කරන්නට නම් අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයට අමතරව, ජනමත විචාරණයකින් ජනතාවගේ අනුමැතිය ලබාගත යුතුයි. එහෙම නම් මේ වියදම්කාරී ජනමත විචාරණයකට රට තල්ලු කරන ව්‍යවස්ථා සංශෝධනයක් ගේන්න මේ රටේ අමාත්‍ය මණ්ඩලය තීන්දු කිරීමේ පදනම මොකක්ද, සාධාරණත්වය මොකක්ද කියන එක අද මේ විවාදයේදී කථා කරන ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් රටට පැහැදිලි කළ යුතුයි.

හරියට ව්‍යවස්ථාව කියෙව්වා නම්, මෙවැනි පනත් කෙටුම්පතක් ගෙන ඒමේ කිසිම අවශ්‍යතාවයක් නැති බව මේ අය දකිනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ ජනතාවට ඇති වෙලා තියෙන සාධාරණ බියට හේතු හතරක් අපි ඉදිරිපත් කළා. දැන් අපි ව්‍යවස්ථාව දිහා පොඩ්ඩක් හැරිලා බලමු. මේ ජනාධිපතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් ව්‍යවස්ථාව මොකද කියන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (3) ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා, වත්මන් ජනාධිපතිතුමාගේ ධුර කාලය ඉකුත්වීමට පෙර මාසයකට අඩු නොවන සහ මාස දෙකකට වැඩි නොවන කාලසීමාවක් තුළ ජනාධිපතිවරණය පැවැත්විය යුතුයි කියලා.

වර්තමාන ජනාධිපතිතුමා ගෝඨාභය ජනාධිපතිතුමාගේ කොටේ නේ, අදින්නේ. ගෝඨාභය මැතිතුමා ජනාධිපති ධුරයට පත්වුණේ 2019 නොවැම්බර් මාසයේ 18වැනි දා. එතුමාගේ ධුර කාලය අවසන් වෙන්නේ 2024 නොවැම්බර් 18වැනි දා. 2024 නොවැම්බර් 18වැනි දාට මසකට නොඅඩු කියන්නේ ඔක්තෝබර් 18න් එහා පැත්ත. ඒ වාගේම මාස දෙකකට නොවැඩි කියන්නේ සැප්තැම්බර් 18න් මෙහා පැත්ත. එහෙම නම් ව්‍යවස්ථානුකූලව සැප්තැම්බර් 18න්, ඔක්තෝබර් 18න් අතර අනිවාර්යයෙන් ජනාධිපතිවරණය පැවැත්විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාම යෝජනා කැඳවන දින ගැන කථා කරද්දී, 1988දී සංශෝධිත, ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත ගැන සඳහන් කළ යුතුයි. එම පනතේ 2 (1) (ආ) ඡේදයට අනුව නාම යෝජනා භාර ගත් දිනයේ සිට සති හතරකට නොඅඩු සහ සති හයකට නොවැඩි කාලයක් තුළ ජනාධිපතිවරණය පවත්වන්න ඕනෑ. මම ඉතා කෙටියෙන් ඒ ගැන පැහැදිලි කරන්නම්, මට ලබා දී තිබෙන කාලය අවසන් වෙමින් පවතින නිසා. ඒ වාගේම එම පනතේම 2 (1) (අ) ඡේදය අනුව ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කරන දිනයේ සිට දින 16ත්, 21ත් අතර දිනයක නාම යෝජනා කැඳවන්න ඕනෑ. මම මේ ගැන පියවරෙන් පියවර විස්තර කරන්න හිටියේ. නමුත් කාලය මදි නිසා මේ කාරණා කෙටියෙන් ඉදිරිපත් කරනවා. මේ විධියට ගණන් හදා බැලුවාම, මේ වගන්ති දෙක දිහා බැලුවාම නාම යෝජනා ලබා දිය හැකි ආසන්නතම දිනය අගෝස්තු මාසයේ 07වැනි දා. ඒ වාගේම දුරම දිනය වන්නේ සැප්තැම්බර් මාසයේ 20වැනි දා. මැතිවරණය ප්‍රකාශයට පත් කරන්න පුළුවන් පරාසය තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2024 ජූලි 17වැනි දාත්, සැප්තැම්බර් මාසයේ 04වැනි දාත් අතර දිනයක තමයි මැතිවරණ කොමිසමට මැතිවරණය ප්‍රකාශයට පත් කරන්න පුළුවන් වන්නේ. ජූලි 17වන දායින් පටන් ගත්තාම, එදාම එය ප්‍රකාශයට පත් කරන්න ඕනෑය කියලා නැහැ, සැප්තැම්බර් 04 දක්වා වුණත් ඉන්න පුළුවන්. හැබැයි, දැන් තිබෙන ප්‍රශ්නය තමයි, මැතිවරණ කොමිසමට නීතියෙන් කාලය ලබා දුන්නත්, මේ සමාජයේ මහ දෙගිඩියාවක්, ව්‍යාකූලත්වයක් මතු වෙලා තිබෙන එක. එම ව්‍යාකූලත්වය නැති කරන්න නම්, මැතිවරණ කොමිසමට බලය ලැබී හැකි ඉක්මනින් අඩුම ගණනේ පළමු සති දෙක ඇතුළත ජනාධිපතිවරණයට නාම යෝජනා කැඳවන දිනය කවදාදැයි කියා ප්‍රකාශ කිරීම එම කොමිසමේ වගකීමක් විධියට අපි සලකනවා. මැතිවරණ කොමිසම 17වැනි දායින් පසුව හැකි ඉක්මනින්ම ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කරලා මේ රටේ ජනතාවගේ පරමාධිපත්‍යය, ඡන්ද බලය රැක දෙන්න කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රේමිනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.03]

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රථමයෙන්ම මම ප්‍රකාශ කරන්න ඕනෑ, මේ රටේ මැතිවරණ සම්බන්ධයෙන්. මැතිවරණ පවත්වන්න බලය තිබෙන්නේ ආණ්ඩුවට නොවෙයි. අපි කවුරුත් දන්නවා, විශේෂයෙන්ම ජනාධිපතිවරණය පවත්වන්න බලය තිබෙන්නේ මේ රටේ මැතිවරණ කොමිසමට බව. ඒ එක්කම මම විපක්ෂයට කියන්න කැමැතියි, ඔබතුමන්ලා මේ කල්තැබීමේ විවාදය පාර්ලිමේන්තුවේ ගොනු කරන්න ඉස්සෙල්ලා අඩුම ගණනේ ඔබතුමන්ලාට ජී.එල්. පීරිස් මැතිතුමාගෙන් පොඩ්ඩක් මේ ගැන අහන්න තිබුණා කියන එක. මොකද, අද මෙතැනදී ජී.එල්. පීරිස් මැතිතුමා ඉතා පැහැදිලිව ඒ ගැන ප්‍රකාශ කළා. ඔය කියන පනත් කෙටුම්පත තවම කැබිනට් මණ්ඩලයට දැම්මා විතරයි, ඊළඟට ඒක ගැසට් කරලා, ඒ සම්බන්ධව ජනතාව ශ්‍රේෂ්ඨාධිකරණයට යනවා නම් එහෙම ගිහිල්ලා, එතැනින් පසුව වගවිභාග වෙලා පාර්ලිමේන්තුවට එනකොට කාලයක් ගත වෙනවා, දැන් තව දින හයකින් මැතිවරණ කොමිසමට බලය ලැබෙනවා, ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කරන්න, එතකොට මේ කියන පනත් කෙටුම්පත හරහා ජනාධිපතිවරණයට කිසිම ආකාරයක බලපෑමක් වෙන්නේ නැහැ කියන කාරණය එතුමා පැහැදිලිව කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ වර්ජන රැල්ලක් ක්‍රියාත්මක කිරීම නිසා දුම්රිය තුළ තෙරපීමෙන් වැටී මේ රටේ අහිංසක මිනිහෙකුත් මිය ගියා. මේ විපක්ෂය තුළ මේ ෆැසිස්ට්වාදී දේශපාලන යන්ත්‍රණයට නායකත්වය දෙන අනුර දිසානායක මහත්මයලා අත්සන් කරන යෝජනාවට අද විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා -එදා රණසිංහ ප්‍රේමදාස මැතිතුමා නියෝජනය කරමින්- සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නියෝජිතයා වශයෙන් අත්සන යෙදීම තුළ ඉතිහාසය පුනරුච්චාරණයවීමක් තමයි සිද්ධ වෙන්නේ කියා මා හිතනවා; history repeats itself.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මැතිවරණය කිසිම ලෙසකින් කල් යන්නේ නැහැ. මේ මැතිවරණය නියමිත පරිදි පවත්වන්න අපි අද වෙනකොට වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. අපේ අපේක්ෂකයා දිනවන්න අපි අද ඡන්ද සටන ආරම්භ කර තිබෙනවා. හැබැයි, අද ව්‍යාකූල තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ, විපක්ෂය. එක පැත්තකින්, හිටපු කෘෂිකර්ම අමාත්‍යාවරයකු වූ අනුර කුමාර දිසානායක මැතිතුමා. අනෙක් පැත්තෙන්, සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඒ අය ඡන්දෙට ඉස්සෙල්ලා බොහොම ඉක්මනින් මැතිවරණ කටයුතු පටන් ගෙන ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා. හැබැයි, අද වෙනකොට ඔවුන්ට ඒ pressure එක දරාගන්න බැහැ. අපි කවුරුත් දන්නවා, සාමාන්‍ය මැතිවරණ ව්‍යාපාරයක් සති දෙකකදී ආරම්භ කළාට පසුව කුමන දේශපාලන ව්‍යාපාරයකටවත් ඒක දිගටම අරගෙන යන්න බැරි බව. තමන්ගේ ග්‍රහණයෙන් ජනතාව මිදෙන තත්ත්වය අද ඒ අයට පෙනෙන්න තිබෙනවා. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි හදිසි, අදිසි දේශපාලන කුමන්ත්‍රණයක් එක්ක මේ වර්ජන රැල්ල ඇති කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පොත පතෙන් කියවා තිබෙන ආකාරයට අපට යන්තම් මතකයි, ජාතික සටන් මධ්‍යස්ථානය මුල් කරගත්ත ජනතා විමුක්ති පෙරමුණේ ෆැසිස්ට්වාදී දේශපාලන යන්ත්‍රණය හරහා එදා - 1987 දී - පැවැති ජනාධිපතිවරණය තුළ මහා භීෂණයක් ඇති කර තිබෙන බව. එම ජනාධිපතිවරණයේ දී ජයග්‍රහණයට තුඩු දිය හැකි ප්‍රමුඛම අපේක්ෂකයා වශයෙන් හිටපු විජය කුමාරණතුංග මහතාව ඝාතනය කළා. එතැනින් එහාට ගිහිල්ලා බැලුවොත්, "මුලින්ම ඡන්දය දමන එක්කෙනාව මරනවා, ඇඟිලි කපනවා, ඡන්දය දුන්නොත් මරණයට පත් කරනවා" කියලා ලියුම් ලිව්වේ, මරණයට පත් කළේ, ඇඟිලි කැපුවේ ඔය කියන ෆැසිස්ට්වාදී සංවිධානවලින් පැවතගෙන ආ අය තමයි. ඔවුන් තමයි අද මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. ඒ භීෂණය තුළ රණසිංහ ප්‍රේමදාස මැතිතුමාට මේ රටේ ජනාධිපති වෙන්න අවස්ථාව නිර්මාණය කරලා දුන් නිසාද දන්නේ නැහැ, ජනතා විමුක්ති පෙරමුණේ මේ යෝජනාවට සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නියෝජිතයා වශයෙන් කිරිඇල්ල මැතිතුමාත් අත්සන් කරලා ජනතාවගේ මුදල් කාබාසිනියා කරන්න අද උත්සාහ කරන්නේ. ජනතාවගේ මුදල් කාබාසිනියා කරමින් තමන්ගේ දේශපාලන ව්‍යාපාරය ශක්තිමත් කරන්න, මේ පාර්ලිමේන්තුවට අවශ්‍ය නැති යෝජනාවක් අද ඉදිරිපත් කර තිබෙනවා. මැතිවරණය කල් දමනවා කියලා කවුද කියන්නේ? ජී.එල්. පීරිස් මහත්මයා කිව්වා, ඔය කියන පනත් කෙටුම්පත තුළින් මැතිවරණය කල් දමන්න කිසිම දෙයක් කරන්න බැහැ කියලා. එහෙම නම් අද මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කරලා විවාද කරන්නේ ඇයි? ජනතාව ව්‍යාකූලත්වයට පත් කරන්න ඕනෑ වෙලා තිබෙන්නේ කාටද? පසුගිය කාලය පුරාවටම ඇති කරන ලද ඒ විකෘති ජන භාවිතය අද යථාර්ථවාදීව පෙළහර දක්වන නිසා මෙය තවදුරටත් ඉස්සරහට ගෙන යන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ අවස්ථාවේ දී ව්‍යාකූලත්වයට පත් වෙලා තිබෙන්නේ ජනතාව නොවෙයි විපක්ෂය නියෝජනය කරන ජනතා විමුක්ති පෙරමුණයි, සජබයයි කියන කාරණය මම පැහැදිලිව කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා තමයි පැවැත්වෙන්න නියමිත ජනාධිපතිවරණය පවත්වන්න කියලා තවදුරටත් යථාර්ථවාදී නොවන මේ ඉල්ලීම කරන්නේ. බොරුවට තමයි මේ ඉල්ලීම කරන්නේ. පවත්වන්න නියමිත මේ ජනාධිපතිවරණයේ දී තමන්ගෙන් ගිලිහෙන ඒ ජනතා ප්‍රසාදය නැවත ඇති කර ගැනීම සඳහා අද ඔවුන් පපුවට තට්ටු කරමින් කියනවා, "අපි තමයි මේ ජනාධිපතිවරණය ඔබට අරන් දුන්නේ" කියලා. ඒ සටන් පාඨය ගෙනියන්න තමයි ඔවුන් මේ උත්සාහ කරන්නේ. කරුණාකර මේ බොරුව කරන්න එපා. නීතිඥයන් හැටියට අපි දන්නවා, the golden rule ගැන. අපි කරන්නේ, ව්‍යවස්ථාදායක ක්‍රියාව. පවත්වන ඕනෑම මැතිවරණයක් උදෙසා අපේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය අපට නවත්වන්න බැහැ.

එදා පළාත් පාලන මැතිවරණය අවස්ථාවේ තරුණ නියෝජනය සම්බන්ධයෙන් මම පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ගෙනාපු වෙලාවේ ඔය විධියටම මට මේ පක්ෂවල නායකයන් චෝදනා කළා, මට මතකයි. මැතිවරණය කල් දමන අදහසින් තරුණ quota එකක් ගේනවා කියලා කිව්වා. මැතිවරණය කල් ගියේ තරුණ quota එක නිසා නොවෙයි නේ. හැබැයි මම ඉබ්බා වාගේ හෙමින් හෙමින් ගමන ඇවිල්ලා ඒ තරුණ quota එක පිළිබඳ යෝජනාව සම්මත කරගෙන මේ රටේ තරුණයන්ට ඉදිරි මැතිවරණයක දී සියයට 25ක නියෝජනයක් ලබාගන්න අවස්ථාව උදා කර දුන්නා. ඒක අපි ලබාගත්තා. ඒක මේ රටේ නීතියක් බවට පත් කළා. හැබැයි ඒක කළාට පස්සේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, එයාගේ අදහස, එයාගේ සංකල්පය මම හොරකම් කළා කියලා. එතුමා, එතුමාට ඡන්දය අවශ්‍යයි කියලා පළාත් පාලන මැතිවරණයේ තරුණ නියෝජනය පිළිබඳ ඒ යෝජනාව අකුළා ගත්තාට, මම මගේ ක්‍රියාවලිය ඉස්සරහට අරගෙන ගියා. ඒකේ ප්‍රතිඵලයක් ලෙස තමයි මගේ පනත් කෙටුම්පත සම්මත වෙලා මේ රටේ සාමාන්‍ය නීතිය වෙනස් කරමින් සම්මත වෙච්ච පළමුවන පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත බවට එය පත් වුණේ. අදත් මේ සිද්ධ වෙන්නේ ඒ කාරණය. මේ golden rule එක අපි මතක තියාගන්න ඕනෑ. මේක හංගන්න එපා. ලේනව මහත්මයා ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාම ශ්‍රේෂ්ඨාධිකරණයේ පංච පුද්ගල විනිශ්චයකාර මණ්ඩලය කිව්වාට ජනාධිපතිගේ ධුර කාලය අවුරුදු 5යි කියලා. But, there is an ambiguity. 83 (ආ) ව්‍යවස්ථාවේ තිබෙනවා, වසර 6ක කාලයක් කියලා. හැබැයි, ඒක නැති කරන්නයි මේ හදන්නේ.

අපි කාගේවත් බලාපොරොත්තුවක් නැහැ, අවුරුදු 6ක් ජනාධිපති ධුරයේ ඉන්න ඕනෑ කියලා. ඔය නඩුව දමන අවස්ථාවේ දීත් ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වා, ධුර කාලය අවුරුදු 5යි කියලා. ආණ්ඩුව නියෝජනය කරන නීතිපතිවරයාත් කියනවා, ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5යි කියලා. හැබැයි, එක දෙයක් මතක තබා ගන්න ඕනෑ. මේ රටේ ප්‍රමුඛ නීතිය කුමක්ද? මේ රටේ ප්‍රමුඛ නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. අපට තිබෙන්නේ, ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්. එංගලන්තයේ, මහා බ්‍රිතාන්‍යයේ තිබෙන්නේ අලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්. නඩු තීන්දුවලට ප්‍රමුඛතාවක් ලැබෙනවා. ඒ අය සම්ප්‍රදායන් නඩු තීන්දු එක්ක ගළපාගෙන අදාළ පාලනය ගෙනයනවා. නමුත් අපට තිබෙන ප්‍රමුඛ නීතිය, ලිඛිත නීතියක්. යම් විධියකින් තවත් නඩුකරයක් ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරලා යම් කාල සීමාවකින් පස්සේ ඒ විනිශ්චයකාරවරු මනෝ මූලිකව හිතුවොත්, "මේක අවුරුදු 6ක් දක්වා යන්න ඕනෑ, මේක සාකච්ඡාවකට බදුන් කරන්න ඕනෑ" කියලා, මොකද කරන්නේ? ඒක වළක්වන්න, ඒ අපහැදිලිතාව වෙනස් කරන්න තමයි ඒ පනත් කෙටුම්පත ගෙනෙන්නේ. ඒක අපේ ව්‍යවස්ථානුකූල කාර්යභාරය. අපට ඒක අත් හරින්න බැහැ. හැබැයි, මට නම් හිතෙන්නේ තමන්ගෙන් ගිලිහෙන ජනතා ප්‍රසාදය රැකගන්න අනුර කුමාර දිසානායක මහත්මයායි, ලක්ෂ්මන් කිරිඇල්ල මහත්මයායි අද ජනතාවගේ කාලය මිඩංගු කරමින් මෙසේ උත්සාහ කරනවා කියලායි. කිසිම වෙලාවක ඡන්දය කල් දමන්න මේ පනත් කෙටුම්පත බලපාන්නේ නැති අවස්ථාවක මේ පාර්ලිමේන්තුවේ සහ ජනතාවගේ මුදල් විනාශ කරන තත්ත්වයක් තමයි අද අපට පෙනෙන්න තිබෙන්නේ. ඒ නිසා මේ ආකාරයට ජනතාව නොමඟ යවන්න එපා.

[ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

මීට එහාට ගිහිල්ලා අද අපට කථා කරන්න තිබෙන්නේ මොනවාද? අද අපට කථා කරන්න තිබෙනවා, මේ වර්ජන සම්බන්ධයෙන්. එදා ෆැසිස්ට්වාදී දේශපාලන යන්ත්‍රණය අරම්භ කරපු ජනතා විමුක්ති පෙරමුණේ ඒ ප්‍රවාහය අදටත් ක්‍රියාත්මක වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එදා රණසිංහ ප්‍රේමදාස මහත්මයාට ජනතා විමුක්ති පෙරමුණ උදවු කළා වාගේ සජිත් ප්‍රේමදාස මහත්මයාටත් අද කුප්‍රකටව උදවු කරන බව අපට පෙනෙන්න තිබෙනවා. ඒක නිසා තමයි සභාව කල් තැබීමේ යෝජනාව ද්විත්ව යෝජනාවක් හැටියට අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අනුර කුමාර දිසානායක මහත්මයා ඇහුවා රනිල් ගේමිකාරයෙක්ද කියලා. එහෙම කියන ගමන්ම මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ගේම් ගැනත් කිව්වා. අපි පැහැදිලිව එක දෙයක් කියන්න ඕනෑ. 2015 ඉඳලා මෙතැනට ආවාට පස්සේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ගේම් ගැන මම හොඳට දන්නවා. එතුමා ඇතුළු පවුලත්, අපි සියලුදෙනාමත් එදා යහපාලන ආණ්ඩුව තුළ හිරිහැරයට ලක් වෙද්දී මම එතුමාගේ නීතිඥයා හැටියටත්, පසු කාලීනව මාධ්‍ය ප්‍රකාශකවරයා හැටියටත් කටයුතු කළා. ඒ නිසා අපි දන්නවා එතුමාගේ හැකියාව, විභවතාව. ඒ එක්කම මම තවත් දෙයක් මතක් කරන්න ඕනෑ. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ගේම් පිළිබඳ හැකියාව, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගහන මැව් එක ගැන හොඳම අවබෝධය තිබෙන්නේ අප කාටවත් නොවෙයි, අනුර කුමාර දිසානායක හිටපු කෘෂිකර්ම අමාත්‍යවරයාට කියලා මම පැහැදිලිවම කියන්න ඕනෑ. ඒ ගැන එතුමා හොඳටම දන්නවා. අනෙක් කාරණය තමයි ගේම් ගහන අය කථා කර කර ඉන්නේ නැහැ. ගේම ගහන්න ඕනෑ වෙලාවට ගේම් එක ගහනවා. ගේම් එක ගහන්න තිබුණු වෙලාවේ ගේම් එක ගහන්නේ නැතිව මහ හැරලා ගිය මිනිස්සු තමයි අද ගේමිකාරයෝ ගැන කථා කරන්නේ. ගේම් ගහන්න තිබුණේ මේ රට නැත්තටම නැතිවෙලා, මේ රටේ ජනාධිපතිවරයා තමන්ගේ ධුරය දමලා ගිහිල්ලා, එක පැත්තකින් ෆැසිස්ට්වාදී දේශපාලන නායකයෝ මේ රට පුච්චද්දී, තමන්ගේ පක්ෂයෙන් කැඩිලා ගිය මිනිස්සු මේ රට පුච්චද්දී; ගිනි තබද්දී, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ යන්ත්‍රණයෙන් තේරී පත් වෙච්ච පොළොන්නරු දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාව අමු අමුවේ ඝාතනය කරලා ඇදගෙන ගිය අවස්ථාවේ දීයි. ඒ අවස්ථාවේ තමයි සජිත් ප්‍රේමදාස මහත්මයාටයි, අනුර කුමාර දිසානායක මහත්මයාටයි ගේම් ගහනවා නම් ගේම් ගහලා පාලන බලය ගන්න තිබුණේ. ගේම් එකක් ගහන්න ඕනෑ වෙලාවේ පැනලා ගිය මිනිස්සු අද ගේමිකාරයෝ ගැන කථා කරනවා. කොහොමත් ජනතා විමුක්ති පෙරමුණේ ගේම් ගැන, මැව් එක ගැන හිතන්න දෙයක් නැහැ. ඒගොල්ලන් කවදාවත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය තුළ වැඩ කරපු මිනිස්සු නොවෙයි. අපි කථා කරන මේ උත්තරීතර සභාව පසුගිය අවුරුදු දෙකකට උඩදී අත්පත් කර ගන්න, ගිනි තබන්න උත්සාහ කළා. ඒ එක්කම අපි කියවලා තිබෙනවා, අහලා තිබෙනවා, පාර්ලිමේන්තුවට බෝම්බ ගහලා මේ ගරු සභාවේ ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු ඝාතනය කළ බව. ජනතාවාදීව පත් වෙච්ච මිනිස්සුන්ව කුමන්ත්‍රණය කරලා මරලා තමන්ට හිමි නැති ඒ බලය ඩැහැ ගන්න ජනතා විමුක්ති පෙරමුණට අමුතුවෙන් පාඩම්, දේශන, සාකච්ඡා පවත්වන්න ඕනෑ නැහැ. ඒක තමයි පසුගිය කාලයේ ඉඳලාම ඒගොල්ලන්ගේ හැසිරීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප හමුවේ විශාල අභියෝගයක් තිබෙනවා. මේ ඇත්ත කාරණය, මේ ඇත්ත දෙය අපි තේරුම් ගන්න ඕනෑ. අපට ව්‍යවස්ථාදායක කාර්යය අත් හරින්න බැහැ.

අපි ආරම්භ කරන මේ ක්‍රියාවලිය තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන මේ ප්‍රමුඛ නීතිය තුළ යම් ආකාරයෙන් තිබෙන අපැහැදිලි බව ඉවත් කරන්න අවශ්‍ය නීති, අණ පනත් ගෙනෙන්න ඕනෑ. ඒවා අපට අත් හරින්න බැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ හා අධිකරණමය තීන්දු ගණනාවක් තුළ අපේ ව්‍යවස්ථාදායක බලය අපට අත් හරින්න බැහැ. ඇයි, මේ ව්‍යවස්ථාදායක කාර්යය අත් හරින්න කියලා අපි කියන්නේ? මම විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර තම තමන්ට හැකි පරිදි, තම තමන්ට අවශ්‍ය පරිදි දැන් මේ මැතිවරණ ව්‍යාපෘතියට එකතු වෙන්න, මැතිවරණය පවත්වන්න, මැතිවරණයට බය වෙන්න එපා කියලා. ඊළඟ කාරණය තමයි, මේ කියන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් තුනෙන් දෙකක බහුතරයක් ඕනෑ කියන එක. මට තිබෙන ප්‍රශ්නය මෙයයි. විපක්ෂය දැන් බයවෙලා තිබෙනවා, ආණ්ඩුවට මේ වෙලාවේ තිබෙන බහුතරය තුනෙන් දෙකක් දක්වා ඉහළ යයිද කියලා. ඒ වාගේම එලෙස බලය මනින ක්‍රමවේදයක් යම් ආකාරයෙන් ඇති වුණොත්, තමන්ගේ -විපක්ෂයේ- බලය අඩුවන තත්ත්වයක් නිර්මාණය වෙනවාද කියන ප්‍රශ්නයකුත් මෙතැන තිබෙනවා.

මම පැහැදිලිව කියන්න ඕනෑ, මේ පනත් කෙටුම්පත තුළ මැතිවරණ කල් දැමීමේ අදහසක් අපට නැති බව. අපට එහෙම අදහසක් නැහැ වාගේම මැතිවරණ කොමිසමට තිබෙන බලය අපි ආණ්ඩුවක් හැටියට ආරෝපණය කර ගන්නේත් නැහැ. ජනතා විමුක්ති පෙරමුණ හැම දාම කරන්නේ මැව් ගහන එක නොවෙයි. ඒ අය හැම දාම කළේ කවුරුන් හෝ පිරිසක් මැව් එකක් ගහනවා නම්, ඒ මැව් එක ගහන පිටිටනියට ගල් ගහපු එකයි. මේකේ ගේමිකාරයෝ කවුද, මේකේ මැව් එක ගහන්නේ කවුද කියලා ජනතාව තීන්දු කරලා ඉවරයි. ජනතාව අද තීන්දු කරමින් පවතිනවා, කවුද මැව් එක ගැහුවේ කියලා. ඒ අර්බුදය හමුවේ නායකත්වය දුන්නේ කවුද කියන කාරණය ජනතාව අද පිළිගෙන ඉවරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 (ආ) ව්‍යවස්ථාවේ තිබෙන "සාවුරුද්දක්" කියන අපැහැදිලි කාරණය වෙනස් කිරීම සම්බන්ධයෙන් මෙච්චර බිය වෙන්න දෙයක් නැහැ. විපක්ෂයට මම ආරාධනා කරනවා, කරුණාකර මේ සඳහා කාලය මිඩංගු කරන්නේ නැතුව ජී.එල්. පීරිස් මැතිතුමාගේ දේශනයේදී එතුමා කරපු ඒ ප්‍රකාශය ගැන නැවත වතාවක් හිතන්න කියලා. අද මේ විපක්ෂයෙන් ඉදිරිපත් කළ සම්පූර්ණ යෝජනාව විපක්ෂයේම සිටින ජී.එල්. පීරිස් මැතිතුමා වාගේ ජ්‍යෙෂ්ඨ නීතිවේදියෙකු විසින් සිදු කළ කථාවෙන් ලත් තැනම ලොප් කරලා අවසන් කියන කාරණය මම මතක් කරනවා.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ජනාධිපතිවරණ ඡන්ද ව්‍යාපාරය ආරම්භ කරලා ඉවරයි. මේ රටේ වත්මන් අර්බුදයට විසඳුමක් ගෙන ඒමට නායකත්වය දුන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා තමයි මේ වෙලාවේ ජනාධිපති වීමට සුදුසු, එහෙම නැත්නම් "මේ වෙලාවේ රනිල් තමයි" කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.18]

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිවරණය නියමිත කාලයට පැවැත්විය යුතු බවට අද දින ඉදිරිපත් වුණු යෝජනාවට සහාය දෙමින් මේ අවස්ථාවේදී මගේ අදහස් පළ කරන්න බලාපොරොත්තු වෙනවා. රජයේ හුඟක් මන්ත්‍රීවරු ඇහුවා, ඇයි මේ වාගේ යෝජනාවක් ගෙනැල්ලා මේ පාර්ලිමේන්තුවේ කාලය

සහ මුදල් නාස්ති කරන්නේ කියලා. නමුත්, මේ යෝජනාව ගෙන ඒමට ප්‍රධානම හේතුව තමයි, අද මේ රජය කෙරෙහි තිබෙන අවිශ්වාසය. මේ රජය මේ රටේ මැතිවරණ කල් දමපු රජයක්. මැතිවරණ කල් දමපු රජයකට තවත් මැතිවරණයක් කල් දමන එක ඉතාම සුළු කාරණයක් කියා අපි දකිනවා. දැනටමත් අපට පෙනෙනවා, යම් යම් පාර්ශ්ව ලවා මේ මැතිවරණය කල් දැමීම සඳහා යම් යම් උපක්‍රම භාවිත කරන ආකාරය. නමුත්, මේ වෙනකොට ඒවා අසාර්ථක වෙලා තිබෙනවා. ජනාධිපතිවරණයෙන් පස්සේ මෙතුමන්ලාගේ ආරක්ෂාව සඳහා, විශේෂයෙන්ම මෙතුමන්ලාගේ වංචා හා දූෂණ වසා ගැනීම සඳහා තව කාලයක් මෙතුමන්ලාට අවශ්‍ය වෙනවා. තවදුරටත් බලය රැක ගැනීම සඳහා සහ බලයේ සිටිමින් තමන් වටේ ඉන්න ඒ දූෂිත වළල්ල ආරක්ෂා කර ගැනීම සඳහා මේ ජනාධිපතිවරණයත් කල් දැමීමට බොහෝ ඉඩකඩ, කුමන්ත්‍රණ තිබෙනවාය කියලා මේ පාර්ලිමේන්තුව තුළත්, පිටත සිටින සාමාන්‍ය ජනතාව තුළත් විශාල සැකයක් ඇතිව තිබෙනවා. මේ මැතිවරණය පවත්වන තෙක් මේ සැකය පවතිනවා. මේ වාගේ ප්‍රශ්න නිසා අද මේ රටේ දේශපාලනය සංකීර්ණ වෙලා අපි සියල්ලන්ටම ඒකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ අවස්ථාවේදී රජයට කියනවා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගන්න ඕනෑ නම්, ජනතාව තුළ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ගැන විශ්වාසය ශක්තිමත් කරන්න ඕනෑය කියලා. මේ වනකොට ඒ විශ්වාසය බිඳ වැටිලා තිබෙන නිසා ජනතාව හිතනවා, වත්මන් රජය මොනවා හෝ කරලා, විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් යම් ව්‍යවස්ථා එහාට මෙහාට කරලා, ඒවා නිර්වචනය කිරීම විවිධ අවස්ථාවලදී විවිධ විධියට කරලා මේ මැතිවරණය කල් දැමීමේ ඉඩකඩක් තිබෙනවා කියලා.

මේ විධියට මැතිවරණ කල් දමන්න ගිහිල්ලා මේ රටේ ජනතාව කුපිත කරලා, මේ රටේ ජනතාවට අනාගතය පිළිබඳව තිබෙන විශ්වාසය බිඳ වට්ටලා, මේ රට ලේ විලක් කරන්න එපා කියලා මේ රට පාලනය කරන පාලකයන්ට අපි මේ වෙලාවේ ඉතාම ඕනෑකමින් මතක් කරලා දෙනවා. මොකද, ප්‍රජාතන්ත්‍රවාදය වේවා, ජනතාවගේ විශ්වාසය වේවා බිඳ වැටුණොත්, නැත්නම් විනාශ කළොත් ඒවා නැවත ගොඩනඟන්න ලෙහෙසි නැහැ. ඒවා විනාශ කරන්න ලෙහෙසියි, ගොඩනඟන්න ලෙහෙසි නැහැ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ගැන ජනතාව තුළ තිබුණු විශ්වාසය බිඳ වැටීමක් වුණා. ඒ විශ්වාසය බිඳ වැටීම තුළින් එදා මන්ත්‍රීවරු සාතනය වුණා, මන්ත්‍රීවරුන්ගේ ගෙවල් ගිනි තැබුවා. දේශපාලනඥයන්ට උත්සවවලට එන්න එපා කියනවා එදා අපි දැක්කා. ඒ වාගේ තත්ත්වයක තිබුණු රටක් නැවත සාමාන්‍ය තත්ත්වයට ගෙනෙන්න නම්, නියමිත පරිදි මේ රටේ මැතිවරණ පවත්වන්න ඕනෑ. මැතිවරණ පවත්වන්නේ නැතුව මේ රටේ ජනතාවට අදහස් පළ කිරීමට තිබෙන අවස්ථාව නැති කළොත්, ජනතාව සාමාන්‍ය විධියට උත්තර නොදෙන තත්ත්වයක් තමයි අද සමාජය තුළ අපට පෙනෙන්න තිබෙන්නේ. ඒ හින්දා ජනතාව විශ්වාස කරලා, ජනතාවගේ තීන්දුවට හිස නමලා, ජනතාවට අවස්ථාවක් දෙන්න ඕනෑ, ඔවුන් වෙනුවෙන් අවුරුදු 5කට මේ රට පාලනය කරන්න, ජනතාව වෙනුවෙන් මේ රටේ ආර්ථිකය හසුරුවන්න තීන්දු ගන්න. මේ රට තුළ නැවත ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරලා, පළාත් සභාව වේවා, පළාත් පාලන ආයතන වේවා, එවැනි විවිධ ආයතන නැවත ක්‍රියාත්මක කරන්න ඕනෑ, ජනතා නියෝජිතයන් එම ආයතනවලට යන්න ඕනෑ. නැවත ජන වරමක් ක්‍රියාත්මක කරලා මහ පොළොවේ තිබෙන දේශපාලන වෙනස්වීම් මේ පාර්ලිමේන්තුව තුළින් පිළිබිඹු කරන්න ජනතාවට අවස්ථාවක් දෙන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා. You have eight minutes.

[பி.ப. 3.23]

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! உரிய காலத்தில் ஜனாதிபதித் தேர்தலை நடத்த வேண்டும் என்ற ஒத்திவைப்பு வேளைப் பிரேரணை இன்றைய தினம் எதிர்க்கட்சியினரால் கொண்டுவரப்பட்டு இருக்கின்றது. உரிய காலத்தில் தேர்தலை நடத்தி, மக்கள் ஆணையைப் பெற்றுத் தான் நாட்டை ஆட்சி செய்ய வேண்டும் என்பது என்னுடைய கருத்தாகும்.

குறிப்பாக, நீதி அமைச்சரினதும் அரசாங்கத்தினதும் கவனத்துக்கு நான் ஒரு விடயத்தைக் கொண்டுவர விரும்பு கின்றேன். கடந்த அமைச்சரவையில் 24/1213/614/052ஆம் இலக்க, அமைச்சரவைப் பத்திரமானது நீதி அமைச்சரால் சமர்ப்பிக்கப்பட்டு இருக்கின்றது. அதாவது, மன்னார் மாவட்ட நீதிமன்றத்தை விரிவாக்கம் செய்வதற்காக நீதிமன்ற வளாகத்துக்கு அருகிலுள்ள பயன்படுத்தப்படாத மாவட்டக் கூட்டுறவுக் கட்டிடத்தைக் கையகப்படுத்துவதற் கான ஓர் அமைச்சரவைப் பத்திரம் சமர்ப்பிக்கப்பட்டு இருக்கின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அந்தக் கட்டிடமானது, மன்னார் மாவட்ட கூட்டுறவுச் சபைக்குச் சொந்தமான கட்டிடமாகும்.1947ஆம் ஆண்டு AP permitமூலம் காணி வழங்கப்பட்டு, 1948ஆம் ஆண்டு கட்டிட வேலைகள் ஆரம்பிக்கப்பட்டு, 1969ஆம் ஆண்டு அப்போதிருந்த விவசாய அமைச்சர் எம்.டி. பண்டா அவர்களால் அது திறந்து வைக்கப்பட்டது. அதன்பிற்பாடு, மக்கள் வங்கி, இலங்கை வங்கி என்பன அந்தக் கட்டிடத்தை வாடகைக்குப் பெற்றிருந் தன. அதன் மேல் பகுதியில் ACCDஇன் மாவட்டக் காரியாலயமும் கூட்டுறவுச் சபையின் training centreஉம் திறம்பட இயங்கி வந்தன. 1990ஆம் ஆண்டு அந்தக் கட்டிடத்தை இலங்கை இராணுவம் கையகப் படுத்தியது.

அதன் பின்னர், இராணுவம் அந்தக் கட்டிடத்தைப் பயன்படுத்தி, ஒரு யுத்த தளமாக மாற்றியமைத்து, முழுமையா கப் பழுதடையச் செய்தது. அதன் பின்னர், 2018ஆம் ஆண்டு இதே சபையில் நான் அப்போது பிரதமராக இருந்த தற்போதைய ஜனாதிபதி மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்களிடம் அந்தக் கட்டிடத்தை கூட்டுறவுச் சபையிடம் ஒப்படைக்க வேண்டுமென கோரியதற்கு அமைவாக, அந்தக் கட்டிடம் கூட்டுறவுச் சபையிடம் ஒப்படைக்கப்பட்டது. மன்னாரின் நகரப் பகுதியில் இருக்கின்ற மிகப் பிரதானமான ஒரு கட்டிடமான அது இராணுவத்தினரால் முழுமையாக சேதமாக்கப்பட்டு இருக்கின்றது. எனவே, அதனை முழுமை யாகப் புனரமைத்து கூட்டுறவுச் சபைக்குக் கொடுக்கவேண்டிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது. அது பயன்படுத்தப் படாத கட்டிடமென்று நீதி அமைச்சு கூறுவது முற்றிலும் தவறானது.

இந்த நாட்டில் மாகாண சபை முறைமை இருக்கின்றது. அதன்கீழ்தான் இந்தக் கூட்டுறவுச் சபை வருகின்றது. அதாவது, இந்தக் கூட்டுறவுச் சபை மாகாண சபையின் அதிகாரத்துக்கு உட்பட்டது. மாகாண சபையின் அதிகாரத் துக்கு உட்பட்டிருக்கின்ற இந்தக் கூட்டுறவுச் சபையின் காணியையும் கட்டிடத்தையும் மாகாண சபையின் எந்தவித அனுமதியும் இல்லாமல், அமைச்சரவைப் பத்திரத்தின் மூலம் மத்திய அரசாங்கத்தின்கீழ் வருகின்ற ஓர் அமைச்சு பெற்றுக் கொள்ள முனைவதென்பது, நியாயமற்றது மட்டுமல்ல, அரசியல் யாப்பை மீறுகின்ற ஒரு செயற்பாடாடுமாகும்.

[ගරු චාල්ස් නිර්මලනාදන් මහතා]

2018ஆம் ஆண்டு நடைபெறவேண்டிய மாகாண சபைத் தேர்தல் இன்னும் நடைபெறாமல் இருக்கின்ற நிலையில், மாகாண சபைக்குட்பட்ட அதிகாரங்களில் மத்திய அரசாங்கம் நேரடியாகத் தலையிட்டு, அமைச்சரவையின் பரிந்துரையின் பேரில் அல்லது ஜனாதிபதியின் பரிந்துரையின் பேரில் தங்களுடைய நிகழ்ச்சிநிரலுக்கு அமைவாக அவற்றைப் பயன்படுத்த முனைகின்றார்கள். கூட்டுறவுச் சபையின் கட்டிட த்தை மாத்திரமல்ல, வட மாகாணத்தில் இருக்கின்ற காணி களையும் இவ்வாறுதான் கையகப்படுத்த முனைகின்றார்கள்.

அரசியல் யாப்புத் திருத்தம் கொண்டுவரப்பட வேண்டும், அரசியல் ரீதியாக அதிகாரங்கள் பகிரப்பட வேண்டும், பகிரப்படுகின்ற அதிகாரங்கள் மீளப் பெறமுடியாத வகையில் இருக்க வேண்டும். அப்படி இருந்தால்தான் வடக்கு, கிழக்கில் உள்ளவர்களால் இறைமைக்கு உட்பட்ட அதிகாரங்களை முழுமையாகப் பயன்படுத்த முடியுமென நாங்கள் தொடர்ச்சி யாக வலியுறுத்தி வருகின்றோம். ஏன் நாங்கள் ஒற்றையாட்சி முறைமையை எதிர்க்கின்றோம் என்றால், அது எங்களுக்கு ஆபத்தாக இருப்பதனால்தான். உதாரணத்துக்கு, மன்னார் மாவட்டத்தில் இருக்கின்ற கூட்டுறவுச் சபைக்குச் சொந்தமான கட்டிடமொன்று வட மாகாண சபையின் எந்தவித அனுமதியும் இல்லாமல் மத்திய அரசாங்கம் பெற முடியும். இதுதான் ஒற்றையாட்சியின் தன்மையாக இருக்கின்றது. உண்மையில், மாகாண சபையின்கீழ் வருகின்ற கூட்டுறவுச் சபையின் அதிகாரத்துக்கு உட்பட்ட விடயத்தை அதன் அனுமதியில்லா மல் மத்திய அரசால் பெற முடியாது. எனவே, கௌரவ நீதி அமைச்சர் விஜயதாஸ ராஜபக்ஷ அவர்கள் இதை மீள் பரிசீலனை செய்ய வேண்டும். நான் இந்த விடயத்தை மாண்புமிகு ஜனாதிபதி அவர்களின் கவனத்துக்கும் கொண்டு வந்திருக்கிறேன். UDAஇன் - நகர அபிவிருத்தி அதிகாரசபை யின் - வடிவமைப்பில், மன்னாருடைய இதயப் பகுதியாக இருக்கின்ற அந்த இடத்தில் கூட்டுறவுச் சபையோடு இணைந்து -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
මට තව විනාඩියක කාලයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. "ටක්" ගාලා ඉවර කරන්න කියන්න එපා. මට විනාඩි 8ක කාලයක් තිබුණා. ඒකෙන් තව විනාඩියක කාලයක් ඉතුරු වෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මම වේලාව ඉතුරු කරගෙන මොනවා කරන්නද? මට වැඩක් නැහැ. කාලය හරියට කළමනාකරණය කර ගන්න ඕනෑ. නැත්නම් මේ සභාවේ කටයුතු කරන්න බැහැ.

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
මට ලැබුණු විනාඩි අට තවම අවසන් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ඔබතුමා කථා කරන්න. නැත්නම් ඔය තිබෙන වේලාවත් ගත වෙනවා.

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
මට තව විනාඩියක කාලයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මම ඉක්මනින් මේ කාරණය කියන්නම්.

කූட்டுறவுச் சபைக்கு வருமானத்தைப் பெற்றுக்கொடுக்கும் வகையில், மன்னார் நகரத்தை வரவேற்கும் முகமாக அந்த இடத்தில் ஓர் அழகான கட்டிடம் அமையப் பெறவேண்டும் என்பது அங்குள்ள மக்களினதும் கூட்டுறவுச் சபையினதும் கருத்தாக இருக்கின்றது. எனினும், மன்னார் மாவட்டத்தில் இருக்கின்ற மாவட்டச் செயலகத்தினதோ, பிரதேச செயலகத் தினதோ, கூட்டுறவுத் திணைக்களத்தினதோ, மாகாண சபை யினதோ எந்தவித அனுமதியும் இல்லாமல், ஓர் அமைச்சர வைப் பத்திரத்தின்மூலம் குறித்த நிலத்தைப் பெற்றுக் கொள்வது தான் ஒற்றையாட்சி மூலமான உச்சக்கட்ட அபகரிப் பாகும். இப்படியான செயற்பாடுகள் காரணமாகத்தான் எங்களுடைய மக்கள் ஒற்றையாட்சி முறைமையை எதிர்க் கின்றார்கள் என்பதை நான் இந்த இடத்தில் பதிவுசெய்து, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.31]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ප්‍රජාතන්ත්‍රවාදී රටක තිබිය යුතුම කාරණාවක් තමයි, ජනතා මතයත් එක්ක පාලනයක් ගෙන යෑම. ඒ කියන්නේ, මැතිවරණ පැවැත්විය යුතුයි. අපේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක් වුණත්, දේශපාලන මැදිහත්වීම් තුළින් මැතිවරණවලට කරන බාධාවන් අපි පසුගිය කාල සීමාවේදී දිගින් දිගටම දැක්කා. ඔබතුමා දන්නවා, මීට වසරකට, දෙකකට කලින් තමයි පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතුව තිබුණේ කියලා. ඒ පළාත් පාලන මැතිවරණයට යම් යම් බාධා සිදු වනකොට සමගි ජන බලවේගය හැටියට අප අධිකරණයට ගියා. එහිදී, අධිකරණයෙන් අපට අතුරු නියෝගයක් ගන්න පුළුවන් වුණා, බාධාවකින් තොරව මැතිවරණය පවත්වන්න අවශ්‍ය කටයුතු කරන්න.

මේ රටේ ඉතිහාසයේ කවදාවත් නැති ආකාරයට, පළාත් පාලන මැතිවරණයට දින නියම කරලා, ඉන් පස්සේ තවත් දිනයක් නියම කරන්න මැතිවරණ කොමිසමටම සිදු වුණා. මැතිවරණ කොමිසම පළාත් පාලන මැතිවරණයට දින දෙකක් තීන්දු කළත්, මේ ජනාධිපතිවරයාගේ මේ රජය - මේ ආණ්ඩුව - විසින් ඒ සඳහා අවශ්‍ය පහසුකම්, අවශ්‍ය මුදල් ටික ලබා නොදීම නිසා මේ වනකොට පළාත් පාලන මැතිවරණය කල් ගිහිල්ලා තිබෙනවා. අපේක්ෂකයන් ඉන්නවා. නමුත් අද මේ රටේ පළාත් පාලන

මැතිවරණය ගැන හීනයක් පමණයි තිබෙන්නේ. ඒ විධියටම පළාත් සභා මැතිවරණයත් අවුරුදු ගණනාවක සිට කල් යමින් තිබෙනවා.

දැන් ජනාධිපතිවරණය ගැන කථා කරනවා. ඒ ගැන කථා කරනකොට අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ, වර්තමාන ජනාධිපතිවරයා ජන මතයකින් ජනාධිපති ධුරයට පත් වෙච්ච පුද්ගලයෙක් නොවෙයි කියන එක. එතුමා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ නික්ම යෑමත් සමඟ ඉතුරු කාල සීමාවට පත් වෙච්ච ජනාධිපතිවරයෙක්, පොහොට්ටුවේ 134දෙනෙකුගේ සහයෝගය ඇතුව. එතකොට ජන මතය එතැනම විකෘති වෙලා තිබෙනවා. ජන මතය විකෘති වුණේ මොකද? පොහොට්ටුවේ නියෝජිතයෙක්, එහෙම නැත්නම් පොහොට්ටුවේ ජන මතයෙන් ආපු කෙනෙක් නොවෙයි ජනාධිපති වුණේ. ඒ අවස්ථාවේදී දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ජනාධිපති වුණා නම් ජන මතය ඊට වඩා නිරූපණය වෙනවා. හැබැයි, එහෙම දෙයක් නොවෙයි සිදු වුණේ. දැන් ජන මතයක් නැති ජනාධිපතිවරයෙක් පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. එතුමාට පාර්ලිමේන්තුවට එන්නවත් ජන මතයක් ලබා දුන්නේ නැහැ, මේ රටේ ජනතාව. එවැනි පුද්ගලයෙක් ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ රටේ ජනාධිපති බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම රටම එකතු වෙලා එළියට බැහැලා එළවපු ආණ්ඩුවම තමයි දැන් මේ රට කරගෙන යන්නේත්. එතකොට පාර්ලිමේන්තුවට, ආණ්ඩුවට තිබෙන ජන මතයත් විකෘති වෙලා තිබෙනවා. ඒ වාගේම රටේ ජනාධිපතිවරයාත් ජන මතයකින් නොවෙයි රටේ ඉහළම තනතුර හොබවන්නේ. මෙන්න මේ වාගේ අවස්ථාවකදී විශේෂයි, හැකි ඉක්මනින් ජනාධිපතිවරණයක් පැවැත්වීම. ඒ සඳහා තවත් දින කිහිපයකින් - ලබන සතිය වනකොට - මැතිවරණ කොමිසමට සම්පූර්ණ බලය ලැබෙනවා. හැබැයි, දැන් මේ රටේ ජනතාව තුළ විශ්වාසය නැති වෙලා තිබෙනවා මැතිවරණයක් තිබෙනවාද, නැද්ද කියන එක ගැන. මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ සිටින අයගෙන් ඇහුවත් කියන්නේ, මැතිවරණයක් තිබෙනවාද කියලා බලමුකෝ කියායි. ඒ කථාවම තමයි කිව්වේ පළාත් පාලන මැතිවරණයේදීත්. අපි නාම යෝජනා සකස් කරනකොට, හැම මැතිවරණ කොට්ඨාසයකටම අපේ කාර්යාල හදනකොට මේ ආණ්ඩුවෙන් කිව්වා, නැහැ, නැහැ, කාර්යාල හදන්න අවශ්‍ය නැහැ, එහෙම කිසි ගැටලුවක් නැහැ, මැතිවරණයක් තියන්නේ නැහැ කියලා. ඒ දෙය තමයි වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂයේ - රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ පක්ෂයේ- සභාපතිවරයා, ලේකම්වරයා දිගින් දිගටම කිව්වා, ජනාධිපති ධුර කාලය දීර්ඝ කරන්න ඕනෑ කියලා. ඒ වාගේ නොයෙක් ආකාරයේ මත ප්‍රකාශ කළා. එතුමන්ලා එසේ මෙසේ පුද්ගලයින් නොවෙයි නේ. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දකුණු අතයි, වම් අතයි - රංගෙ බණ්ඩාර මැතිතුමායි, වජිර අබේවර්ධන මැතිතුමායි - තමයි එහෙම කියන්නේ; එක්සත් ජාතික පක්ෂයේ සභාපතිවරයායි, ප්‍රධාන ලේකම්වරයායි තමයි එහෙම කියන්නේ. මෙවැනි කථා කියද්දි මේ වනකොට ලොකු සැකයක් මතු වෙලා තිබෙනවා. මෙන්න මේ ගැටලුව මම හිතන විධියට ප්‍රජාතන්ත්‍රවාදයට ඉතා අහිතකරයි. මේ රටේ මැතිවරණ තිබිය යුතුයි. ඒ සම්බන්ධයෙන් වංගු ගහන්න බැහැ. යම් යම් ව්‍යවස්ථා සංශෝධන ගෙනෙනවාය කියලා ඒ අවස්ථාව අහිමි කරවන්න උත්සාහයක යෙදෙනවාය කියන ඒ සාධාරණ සැකය අද මේ රටේ ජනතාව තුළ තිබෙනවා. ඒකයි අපි මේ විපක්ෂයක් හැටියට විශේෂයෙන්ම මේ කාරණය කියන්නේ. අපි අවශ්‍ය හැම අවස්ථාවකදීම ජනතාව වෙනුවෙන් පෙනී හිටපු පක්ෂයක්.

පළාත් පාලන මැතිවරණයේදී විතරක් නොවෙයි, මෙවර ජනාධිපතිවරණයේදී වුවත් ජනතාව වෙනුවෙන් අපි පෙනී ඉන්නවා. අපි ඉතා පැහැදිලිව කියනවා, මෙවර ජනාධිපතිවරණය අනිවාර්යයෙන්ම ඔක්තෝබර් 17වෙනි දාට කලින් පවත්වනවා කියලා. ඒක වෙනස් කරන්න ලැබෙන්නේ නැහැ. ඒ සඳහා උත්සාහයක යෙදෙනවා. එක එක්කෙනාට එක එක හීන තිබෙන්න පුළුවන්. හැබැයි, අනිවාර්යයෙන්ම ජනාධිපතිවරණය පවත්වනවා. අපි ඉල්ලීමක් කරනවා, මැව් එක ගහන්න එන්න කියලා. මැව් එක ගහලා හොඳම කෙනා දිනයි. හැබැයි, මැව් එක නොගහ players' room එකට වෙලා ගේම් ගහන්න එපා. කරුණාකරලා තමුන්නාන්සේලා එක අවස්ථාවක් ලබා දෙන්න. ඒ ground එකට ඇවිල්ලා සාධාරණව මේ මැතිවරණය පවත්වමු. මැතිවරණයකට එන්නේ නැතිව වෙන වෙන කථා කියලා මැතිවරණය මඟ හරින්න කටයුතු කිරීමට නම් මේ රටේ ජනතාව ඉඩ තියන්නේ නැහැ. අපි ඒකට අවශ්‍ය නායකත්වය ලබා දෙනවා කියන එක ආණ්ඩුවට, ජනාධිපතිවරයාට ඉතා පැහැදිලිව කියනවා. පාර්ලිමේන්තුව තුළදී, එළියෙදී නීත්‍යානුකූලව අධිකරණයෙන්, විශේෂයෙන්ම මැතිවරණ කොමිසමෙන් අපි ඉල්ලීමක් කරනවා හැකි ඉක්මනට මැතිවරණය පවත්වන්න, මේවා කල් දමන්න එපා කියලා. මොකද, බඩු ෂුවර් නැහැ. මොන ගේම් ගහයිද කියන්න බැහැ. ඒ නිසා කරුණාකරලා ඒ අවස්ථාව ලැබුණු විගසම මැතිවරණය පැවැත්වීම සඳහා අවශ්‍ය සෑම කටයුත්තක්ම ඉෂ්ට කරන්න. රටක් හැටියට අපි ඒ වෙනුවෙන් ඉදිරියට එනවා. ප්‍රධාන විපක්ෂය හැටියට, අනිවාර්යයෙන්ම මේ රටේ ඊළඟ පාලනය ලබා ගන්න, මේ රටේ ඊළඟ නායකත්වය ගන්න දේශපාලන පක්ෂය හැටියට අපි ඒ වෙනුවෙන් පෙනී සිටිනවා කියන කාරණය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.යූ.එම්. අලි සබ්රි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.39]

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி - வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry, PC - Minister of Foreign Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියෙහි ප්‍රධාන අර්ථ නිරූපණ කිහිපයක් තිබෙනවා. එක් අර්ථ නිරූපණයක් තමයි, ජන රජයේ පරමාධිපත්‍ය බලය තිබෙන්නේ ජනතාවට බව. ජනතාවගේ ඒ පරමාධිපත්‍ය බලය මැතිවරණවලදී පාවිච්චි කරන්න ඕනෑ. ඒ මැතිවරණ හැටියට ශ්‍රේෂ්ඨාධිකරණය අර්ථ දක්වා තිබෙන්නේ ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණයයි.

නඩු තීන්දු රාශියකදීම තීරණය කර තිබෙනවා, ඕනෑ නම් කාලය අඩු කරලා ඡන්දයකට යන්නට පුළුවන් කියලා. මොකද, ඒකෙන් පරමාධිපත්‍යය වැඩි වෙනවා. ජනතාවට තීරණය කරන්න අවස්ථාවක් ලැබෙනවා කියලා. හැබැයි, කාලය දීර්ඝ කරන්නට බැහැ. ඒකේ කථා දෙකක් නැහැ. ශ්‍රී ලංකාව කියන්නේ මොන අඩුපාඩු තිබුණත් 1931 ඉඳලා සර්වජන ඡන්ද බලය එක දිගට පාවිච්චි කරපු රටක්. හැම පාලන කාලයකදීම නියමිත කාලයේදී, රට පාලනය කිරීම සඳහා වූ මැතිවරණ පවත්වා තිබෙනවා. ඉතිහාසයේ එකම එක වතාවයි නියමිත කාලයට මහ මැතිවරණයක් නොපැවැත්වූයේ. ඒ, 1982 එක්සත් ජාතික පක්ෂ පාලන කාලයේදී. එවකට අග්‍රාමාත්‍යවරයා හැටියට හිටියේ හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා. ජනාධිපතිතුමා හැටියට හිටියේ ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා. එතුමන්ලා එකතු වෙලා -ඒ

[ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

කාලයේ අපි කිව්වේ ලාම්පු කළ ගෙඩි සෙල්ලම කියලා- ලාම්පු කළ ගෙඩි සෙල්ලමක් දාලා ජනමත විචාරණයක් පවත්වලා වසර පහක්, හයක් මැතිවරණය කල් දැම්මා. ඒ හැරුණාම කිසිම දවසක මේ රටේ ජනතාව හෝ අධිකරණය ඉඩ හැරලා නැහැ මැතිවරණයක් කල් දාන්න.

මැතිවරණයක් කල් දාන්න විධියක් නැහැ. ප්‍රථම වතාවට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිතුමාගේ ධුර කාල පරිච්ඡේදය අවුරුදු 6න්, අවුරුදු 5කට අඩු කරලා තිබෙනවා. ඒක ඉතාම පැහැදිලියි. කඩිමුඩියේ ඒ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කරනකොට යම් යම් අඩුපාඩු වෙලා තිබෙනවා. මේක අපි කරපු අඩුපාඩුවක් නොව, ඒ කාලයේ ආණ්ඩු කරපු අය කරපු අඩුපාඩුවක්. ඒ අඩුපාඩුවට අනුව 83 (ආ) ව්‍යවස්ථාවේ "වසර හයකට නොවැඩි කාලයක්" කියන එක, "වසර පහකට නොවැඩි" කියලා වෙනස්වීමක් කරලා නැහැ, අනෙක් ඒවා කළාට. ඒ නිසා තමයි ගරු ජනාධිපතිතුමා පෙරේදා පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කළේ ඒක වෙනස් කරලා වසර පහකට සීමා කරලා මේ තිබෙන සම්පූර්ණ ව්‍යාකූලත්වය නැති කරන්න ඕනෑ කියලා. ඒකෙන් අදහස් කරන්නේ මොකක්ද? ඒකෙන් අදහස් කරන්නේ අපි මේ කාලය ඇතුළත ඡන්දයකට යා යුතුයි කියන එකයි.

එහෙම නම්, හිටපු ජනාධිපතිතුමාගේ ධුර කාලය අවුරුදු 5යි. ඊට වඩා වැඩි කරන්නත් බැහැ, අඩු කරන්නත් බැහැ. හිටපු ජනාධිපති ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රට පාලනය කරනකොට යම්කිසි අවස්ථාවකදී -මේ රටේ ජනතාවගේ ජීවිතවලට හානි සිදු වේවි කියලා හිතුණු අවස්ථාවේදී- ආයුධ ගන්නේ නැතිව, ජනතාවට මැර බලය යොදන්නේ නැතිව, නිදහසේ බලය අත හැරලා ගියා. එහෙම නම්, ඒ කාලයේ ඡන්දයකට යන්න තිබුණා නේ. එහෙම යන්න බැහැ. ඇයි, ඒ? අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කියනවා, ඒ ධුර කාලය; අවුරුදු 5 සම්පූර්ණයෙන්ම ඉදිරියට යා යුතුයි කියලා. ඡන්දයක් තියන්න පුළුවන් වෙන්නේ වැඩිම වුණොත් ඒ ධුර කාලය ඉකුත් වෙන්නට පෙර මාස දෙකකට නොවැඩි සහ මාස එකකට නොඅඩු කාලයක් තුළ. එම නිසා කිසිම සැකයක් තියා ගන්නට අවශ්‍ය නැහැ. මේ රටේ ජනාධිපතිවරණය අනිවාර්යයෙන්ම සැප්තැම්බර් මාසයේ 17 සහ ඔක්තෝබර් මාසයේ 17 දිනය අතර දවසක තිබිය යුතුයි. බොහෝ විට ඔක්තෝබර් මාසයේ 5වැනි සෙනසුරාදා, එහෙම නැත්නම් ඔක්තෝබර් මාසයේ 12වැනි සෙනසුරාදා මේ මැතිවරණය පැවැත්වෙනවා. ඒක කිසිසේත්ම ප්‍රමාද කරන්නට අපට හේතුවක් නැහැ. ඇයි, ඒ? ජනාධිපතිතුමා පසුගිය අවුරුදු දෙකේදි, - මම ඉදිරියේදි කියන්නම් - කළ කාර්යය තුළ එතුමාට රට ඉදිරියට ගෙන යෑමේ හැකියාව තිබෙනවා. Report card එකක් - ප්‍රගති වාර්තාවක් - තිබෙනවා. ඒ report card එක ජනතාව ඉදිරියට දැම්මාම, ඒ report card එකට අනුව ඒ කටයුතු හරියට සිද්ධ වෙලා නැත්නම් ජනතාව තීරණය කරයි. හැබැයි, ජනතාවගේ මතයට විරුද්ධව එක දවසක්වත් වැඩියෙන් ඉන්න මේ රජයටවත්, ජනාධිපතිතුමාටවත්, අපි කාටවත් අවශ්‍යතාවක් නැහැ කියන එක කියන්නට ඕනෑ. ඒ හින්දා මේ තිබෙන්නේ මවා ගත් මනස්ගාතයක්. එය, ඡන්දයට භය හින්දා ව්‍යාකූලත්වයක් ඇති කරලා රජය විසින් ගෙන යන සංවර්ධන වැඩ පිළිවෙළේ කකුලෙන් අදින්නට කරන උත්සාහයක් මිස, රජයක් වශයෙන් කිසිම අවස්ථාවක ඡන්දය කල් දැමීමට අපේ කිසිම අදහසක් නැහැ. අපි ඡන්දයට සූදානම් වෙලා ඉන්නවා. ඡන්දයකට මුහුණ දෙන්න ජනාධිපතිතුමාත් සූදානම් වෙලා ඉන්නවා. අපි කියා සිටිනවා, එතුමා තවදුරටත් ඉදිරිපත් විය යුතුයි කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019 වර්ෂයේදී හිටපු ගරු ජනාධිපතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කළා. ජනාධිපතිවරයාගේ ධුර කාලය වන අවුරුදු 6, අවුරුදු 5ට අඩු කළාට පස්සේ 5වැනි අවුරුද්ද, අන්තිම අවුරුද්ද යනකොට එතුමාට ධුරය දාලා යන්න බැහැ වාගේ හිතුණා. එහෙම හිතලා එතුමා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කරලා ඇහුවා, "ඇත්ත වශයෙන්ම මට තිබෙන්නේ අවුරුදු 5ක්ද, 6ක්ද" කියලා. එහිදී අපේ පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ අධිකරණයට ගියා. මම මැදිහත් වෙලා ඒකට විරුද්ධව කරුණු කිව්වා. ශ්‍රේෂ්ඨාධිකරණට කරුණු දැක්වීමේදී මම ඉදිරිපත් වුණේ ගරු ජී.එල්. පීරිස් මැතිතුමා වෙනුවෙන්. එවකට එතුමා අපේ පක්ෂයේ සභාපතිතුමා. එහිදී ශ්‍රේෂ්ඨාධිකරණය දීර්ඝ වශයෙන් කරුණු සලකා බලලා ඉතා පැහැදිලිව කිව්වා, ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ කාලය අවුරුදු පහකට සීමා වෙනවා කියලා. එහෙමනම්, එදා ගත් ඒ තීරණයත් එක්ක ඊට වඩා එහාට යන්න විධියක් නැහැ. එම නිසා වැඩිම කාලය අවුරුදු පහයි. ඔක්තෝබර් 17වැනි දා වෙනකොට ඒ අවුරුදු පහ අවසන් වෙනවා. ඒ කියන්නේ, තෝරා ගත් දවසට මාසයකට ඉස්සෙල්ලා. නොවැම්බර් 17වැනි දා තමයි තෝරා ගත්තේ. ඒ හින්දා ඊට පෙර අනිවාර්යයෙන්ම ඡන්දයක් තියන්නට ඕනෑ. ඒ ඡන්දය තිබෙනවා. ඒ සඳහා අපි සූදානම් වෙමින් ඉන්නවා කියන එක මේ අවස්ථාවේදී මම කියන්නට ඕනෑ. මේ ආණ්ඩුව හෝ මේ ජනාධිපතිතුමා ඡන්දයකට භය වෙන්නේ මොකටද? එහෙම කිසිම හේතුවක් නැහැ.

සමහර වෙලාවට අපට අමතක වුණාට අපි මතක් කරගන්නට ඕනෑ, එවකට තිබුණු ආර්ථික තත්ත්වය පිළිබඳවත්. අපේ භාණ්ඩාගාරයේ සම්පූර්ණ reserves ඇමෙරිකානු ඩොලර් මිලියන 20කට බැහැලා තිබුණා. ඒ කියන්නේ, මිලියන 22ක් වන ජනතාවගෙන් එක පුද්ගලයෙකුට එක ඩොලරයකටත් වඩා අඩු ප්‍රමාණයක් තමයි reserves හැටියට තිබුණේ. ඉතින් කොහොමද, රටක් කරන්නේ? ඇමෙරිකානු ඩොලර් මිලියන 730කට LCs ඇරලා තිබුණා. බැංකුවලට සල්ලි ගෙවා ගන්න බැරිව තිබුණා. බැංකුවලින් LCs අරින එක නවත්වලා තිබුණේ. සල්ලි තිබුණත් LCs අරින්න විධියක් නැතිව තිබුණා. මොකද, බැංකුවලින් ඒකට අවස්ථාව ලබා දුන්නේ නැති හින්දා. අපට අමතක වෙලා තිබෙනවා, දවස් ගණන් තෙල් පෝලිම් තිබුණු බව. ලංකාවේ තිබුණු සියලු ඉන්ධන පිරවුම්හල් අසල 500ක්, 600ක් හිටියා.

තෙල් පෝලිම් තිබුණා. දවස් 4ක්, 5ක් පෝලිමේ හිටියත් තෙල් ගහ ගන්න බැරි වුණා. අවාසනාවකට වාගේ මිනිස්සු හතර, පස්දෙනෙකුත් ජීවිතක්ෂයට පත් වුණා. ඉතිහාසයේ ප්‍රථම වතාවට කොළඹ ගෙවල්වල, සුපර්මාර්කට්වල දර මිටි විකුණන්න පටන් ගත්තා. ඒ කාලයේ අපට බෙහෙත් ටික තිබුණේ නැහැ; පොහොර ටික තිබුණේ නැහැ. Cooking gas ටිකක් ගන්න මාස දෙකක් පෝලිමේ ඉන්න සිද්ධ වුණා. එවන් ව්‍යාතාවරණයක් තුළ ඉන්න කොට ඩොලර් එක රුපියල් 380ට, 390ට ඉහළ ගියා. Reserves සම්පූර්ණයෙන්ම නැති වෙලා ගියා. උද්ධමනය පාලනය කර ගන්න අපට බැරි වෙලා, එය උපරිම අගයකට - සියයට 74කට - ගියා. ඒ, 2022 අප්‍රේල් මාසයේ තත්ත්වයයි.

අපි කියනවා, අද තත්ත්වය ගැන කල්පනා කරලා බලන්න කියලා. අද උද්ධමනය සියයට 1.5කට අඩු වෙලා තිබෙනවා. රුපියල සියයට 25කින් ශක්තිමත් වෙලා තිබෙනවා. රුපියල් 400ට ගිය ඇමෙරිකානු ඩොලර් එක, දැන් රුපියල් 305ක්, 300ක් දක්වා අඩු වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා ඉතිහාසයේ 1948 ඉඳලා මේ දක්වා අවුරුදු 76 තුළ ප්‍රාථමික ගිණුමෙහි surplus එකක් ඇති වෙලා තිබෙන්නේ 6 වතාවයි. ප්‍රාථමික ගිණුම කියන්නේ රජයේ ආදායම, වියදම, පොලිය හා ණය අත් හැරියාම තිබෙන වෙනස. හැබැයි, 2022 අවුරුද්දේ කඩා වැටිච්ච ආර්ථිකයේ surplus එකක්, 2023 වන කොට ගේන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. එහෙම නම් අපි මොකටද ඡන්දයකට භය වෙන්නේ? ඒ දේවල් ඡේන්නේ

නැත්තේ කුහක විධියට මේ දිහා බලන අයට විතරයි. එදා දිනකට පැය 13ක් විදුලිය කපලා තිබුණා. මේ රටේ මිලියන 22ක ජනතාවගේ ගෙවල්වල විදුලි බලය තිබුණේ නැහැ. එදා පාරේ හැමතැනම උද්ඝෝෂණ. ඒ කාල සීමාවේ touristsලා අපේ රටට ආවේ නැහැ. ජනවාරි, පෙබරවාරි, මාර්තු මාසවල 150,000ක් විතර ආපු touristsලා ප්‍රමාණය 40,000කට විතර අඩු වුණා. සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන් කඩා වැටිලා තිබුණා. අද මොකක්ද තත්ත්වය?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද සියලුම පෝලිම් ඉවත් කරලා තිබෙනවා; දවසේ පැය 24 පුරාම විදුලි බලය ලබා දෙනවා. ලංකා ඉතිහාසයේ මෙතෙක් ආපු වැඩිම touristsලා සංඛ්‍යාව මේ අවුරුද්දේ අපේ රටට එනවා. Tourismවලින් හම්බ කරන මුදල් ප්‍රමාණය අපි වැඩි කර ගෙන තිබෙනවා. උණ්ඩියල් ක්‍රමය සම්පූර්ණයෙන්ම වාගේ ඉවත් වෙලා තිබෙනවා. ලංකාවේ ප්‍රේෂණ 2018, 2019, 2020, 2021 වර්ෂවල තිබුණු ප්‍රමාණය හා සමාන ප්‍රමාණයක් දක්වා මේ අවුරුද්ද වන කොට වැඩි කර ගෙන තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් මිලියන 20ක්ව තිබුණු අපේ සංචිතය, ඇමෙරිකානු ඩොලර් බිලියන 5.6කට වැඩි කරලා තිබෙනවා. අවුරුදු 6කට පස්සේ ප්‍රථම වතාවට ප්‍රාථමික ගිණුමේ හර ශේෂයක් ඇති කරගෙන තිබෙනවා. මේ ඔක්කෝම සිදුවීම් වෙද්දී ගිය අවුරුද්දේ රාජ්‍ය සේවකයන් සියලුදෙනාගේ මාසික වැටුප රුපියල් 10,000කින් වැඩි කරලා තිබෙනවා. සියලුම ප්‍රශ්න තිබියදීත් අපි ගුරුවරුන්ගේ වැටුප් විෂමතා 2022 වර්ෂයේදී ඉවත් කර තිබෙනවා. මේ ඔක්කෝම දේවල් කරද්දී ජාත්‍යන්තර වශයෙන් අප යන යන තැන්වල මිනිස්සු අහන්නේ, "කඩා වැටිච්ච ආර්ථිකය මෙච්චර කෙටි කාලයකදී ගොඩ නඟා ගත්තේ කොහොමද?" කියන එකයි. ඒ හින්දා තමයි interim Prime Minister of Pakistan - ගිලානි අග්‍රාමාත්‍යවරයා - කිව්වේ, ඔවුන්ගේ ආර්ථිකය නැවත ගොඩ නඟා ගැනීම සම්බන්ධයෙන් ලංකාවේ මහ බැංකුවේ සහ භාණ්ඩාගාරයේ නිලධාරීන්ගෙන් උපදෙස් ගන්න තමන්ගේ නිලධාරීන් යවන්න කියලා.

බංග්ලාදේශයේ ගරු අග්‍රාමාත්‍යාතුමිය ගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේදී, අපේ ගරු ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කරමින් ඉන්න කොට - මම ඉදිරියේදී - මෙසේ කිව්වා: "Hon. President, when I gave you US Dollars 200 million as a loan, there were so many people who told me not to do so saying, 'We cannot afford to lose that because Sri Lanka cannot pay it back'. But, I wanted to help Sri Lanka because that was the first time Sri Lanka had asked for something serious from us. Hon. President, to my credit, I was proven right and everyone else was proven wrong, that not only did you return the US Dollars 200 million, but you paid it back with interest also. And, you have brought down your country's inflation from 70 per cent to 1.5 per cent. That is a magic. How did you do it?"

එහෙම තමයි ලෝකය අප දිහා බලන්නේ. අවුරුදු 13ක් තිස්සේ ඉරානයට ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක ප්‍රමාණයක් ගෙවා ගන්න බැරිවයි අප හිටියේ. ගිය අවුරුද්දේ අගෝස්තු මාසයේ ඉඳන් අපි මාසයකට අවම වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 5කට සමාන තේ ප්‍රමාණයක් අපනයනය කරනවා.

අපි පසුගිය කාලය තුළ ණය ගෙව්වේ නැහැ කියනවා. ගෙව්වේ නැත්තේ තෝරා ගත්තු ණය. හැබැයි, IMF එකට ගෙවන්න ඕනෑ ප්‍රමාණය, World Bank එකට ගෙවන්න ඕනෑ ප්‍රමාණය, ADB එකට ගෙවන්න ඕනෑ ප්‍රමාණය, AIIB එකට ගෙවන්න ඕනෑ ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 2කට වඩා අපි ගෙවලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ හා සමානවම Indian Credit Line එකට අදාළව ආපසු ගෙවිය යුතු මුදල් මේ පළමුවැනි කාර්තුවට විතරක් අපි ගෙවලා තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 225ක්. ඉතින් මෙවැනි දේවල් කරපු අය හැටියට අපි ඇයි ඡන්දයකට බය වෙන්නේ? මෙච්චර කල් කඩා වැටිලා තිබුණු ආර්ථිකය ගොඩ නඟලා, "අස්වැසුම" සහනාධාරය අපි පවුල් මිලියන 2කට ලබා දෙනවා. ඉස්සර දීපු "ජනසවිය" සහ "සමෘද්ධිය" වැනි සහනාධාර ක්‍රම හරහා ලබා දුන්නේ රුපියල් 2,300ක් හෝ 2,500ක් වාගේ මුදලක්. දැන් "අස්වැසුම" සහනාධාරය යටතේ ඒ වාගේ තුන්ගුණයක් ලබා දෙනවා. මිනිසුන්ට ඒවා අමතක නැහැ. මේ රටේ මිලියන 22ක් පමණ වන ජනතාවට තමන්ගේ කිසිම දෙයක් - මෙලෝ දෙයක් - කර ගන්නට බැරි වුණා. ලයිසන් එකක් ගන්න බැරි වුණා; loan එකක් ගන්න බැරි වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ ඕනෑ තරම් මිනිස්සු ඉන්න ඇති, loan එකක් ගන්න බැරිව. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා එතැන ඉන්න නිලධාරීන්ට වැඳ වැටෙන්න ඒ අයට සිදු වෙන්න ඇති; උකසක් කරගන්න බැරි වෙන්න ඇති; තමන්ගේ ආර්ථිකය දියුණු කර ගන්න බැරි වෙන්න ඇති. හැබැයි, ඉතිහාසයේ ප්‍රථම වතාවට චීනයේ වෙච්ච විපර්යාසය වාගේ ලංකාවේ මහා විශාල විප්ලවයක් ඇති කරලා, අයිතිකාරයන්ට තමන්ගේ දේපළවල සම්පූර්ණ අයිතිය ලබා දෙන්නට අපි තීරණය කර තිබෙනවා. එහෙම කරපු අපි මොකටද ඡන්දයකට බය වෙන්නේ? පෝලිම් ඉවත් කළා නම්, සංචාරක කර්මාන්තය නහා සිටුවුවා නම්, ඩොලර් එකේ අගය ඉහළ යෑම පාලනය කළා නම්, විදේශ රටවලට රැකියා අවස්ථා ලබා දුන්නා නම්, සම්පූර්ණ remittances ටික ලංකාවට ලබා ගන්න කටයුතු කරන්න හැකියාව ලැබුණා නම්, සම්පූර්ණ සංචිතය වැඩි කර ගන්න පුළුවන් වුණා නම්, සියයට 74ක් දක්වා ඉහළ ගිය inflation එක සියයට 1.5කට අඩු කර ගන්නට පුළුවන් වුණා නම්, ජනතාව ඉදිරියේ කියන්න අපට හොඳ කථාවක් තිබෙනවා. එහෙම නම්, මැතිවරණයකට මුහුණ දෙන්න අපට මේක හොඳ වෙලාවක්. ජනතාවගේ අභිලාෂයන් ඔබේ අභිලාෂයන් එක්ක පටලවා ගන්න එපා. ජනතාව විපක්ෂය තරම් කුහක නැහැ. ජනතාව මේවා දිහා බලන්නේ හොඳ ඇසකින්. ජනතාව මේ දේවල් දෙස හොඳ ඇසකින් බලනවා. පසුගිය අවුරුදු දෙක තුළ තමන්ට එපා වෙච්ච මේ රටට, තමන් දාලා ගිය මේ රටට මිනිස්සු ආපහු එනවා. එහෙම නම් ඒ දේවල්වලට නායකත්වය දුන්නේ කවුද? ඒ අවස්ථාවේ ඒ අභියෝගය බාර ගත්තේ කවුද? තමන්ගේ දේශපාලන අනාගතය උකසට තියලා ඒ අභියෝගය බාර ගන්න කැමති වුණු නායකයන් ජනතාව එතරම් ලේසියෙන් අමතක කර දමන්නේ නැහැ. අපි පොදුජන එක්සත් පෙරමුණ හැටියට 2010දී කියපු එකම කථාව මොකක්ද? 2009දී ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා යුද්ධය අවසන් කළාම එතුමාව එළවන්න 2010දී විශාල ව්‍යාපාරයක් ගොඩ නැඟුවා. නමුත්, එදා මේ රටේ මිනිස්සු එක දෙයක් කිව්වා. "අපි කෘතගුණ සලකනවා" කියලා එතුමාව තවදුරටත් ජනාධිපති ධුරයට පත් කළා. එහෙම නම්, මේ කඩා වැටිච්ච ආර්ථිකය ගොඩ නඟපු නායකයාට මේ වෙලාවේදී කෘතගුණ සලකන්න මේ රටේ ජනතාව බලාගෙන ඉන්නවා කියන එක පිළිබඳව මට නම් කිසිම අවිශ්වාසයක් නැහැ.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැටියට අපට හුහක් අවස්ථාවලදී ප්‍රශ්න ආවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කෙනෙහිලිකම් කරන කොට අපට සිද්ධ වුණා පක්ෂය දාලා යන්න. අපි අලුත් පක්ෂයක් ඇති කළා. ඒ පක්ෂයත් එක්ක මාස 6කින් ජයග්‍රහණ අත් කරගෙන, අවුරුදු දෙකක් යන්න ඉස්සෙල්ලා මේ රටේ ජනාධිපතිවරයා තෝරා පත් කර ගන්නට අපට හැකියාව ලැබුණා. හැබැයි, ඉදිරියට යන කොට, අප බලාපොරොත්තු නොවෙච්ච විධියට කොවිඩ්-19 වසංගතය ආවා; රුසියානු-යුක්රේන යුද්ධය ඇති වුණා. ඒවා හේතු කොට ගෙන බඩු මිල ඉහළ යන කොට, අපේ සංචාරක ව්‍යාපාරය කඩා වැටෙන කොට, අපට මේක පාලනය කර ගන්න බැරි වුණා; ආර්ථික වශයෙන් විශාල දරිද්‍රතාවකට අපි පත් වුණා.

[ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

හැබැයි, මේක අවුරුදු දෙකක ක්‍රියාවක් නොවෙයි කියන එක අපි තේරුම් ගන්නට ඕනෑ. අවුරුදු 75ක් තිස්සේ ලංකාවේ ජනතාවට බොරු පොරොන්දු දීලා, හැම දෙයම ලබා දෙනවා කියලා මැතිවරණවලදී පොරොන්දු වෙලා, දරා ගන්න බැරි මහ විශාල Public Service එකක් හදලා, ඒ මිනිස්සුන්ට පඩි ගෙවන්නත් බැහැ, අපිට ගෙවා ගන්න හැකියාවකුත් නැති තැනකට පත් කරලා, හැම දෙයම නිකම් දීලා, ආර්ථිකය කඩා වැටීමේ ප්‍රතිඵලයේ අග්‍ර ඵලය තමයි 2022දී ඇති වුණේ. හැබැයි, එදායින් පස්සේ අමාරු තීන්දු-තීරණ ගන්න අපට සිද්ධ වුණා. ඒ අමාරු තීන්දු-තීරණ අරගෙන, IMF එකත් එක්ක සාකච්ඡා කරලා, ආර්ථිකය ගොඩනඟලා, සංචිත ටික ගොඩනඟලා, දුප්පත් මිනිස්සු ටික බලාගෙන, ඔවුන්ට අස්වැසුම සහනාධාරය දීලා, ඔවුන්ගේ ඉඩ කඩම් ටික ඔවුන්ට දීලා, කොළඹ නාගරික පෙළැන්තියේ ඉන්න අයගේ flats ටික ඔවුන්ට ලබා දීලා, ඔවුන් තවදුරටත් මාසිකව rent එකක් ගෙවන එක නැවැත්වූවා. එහෙම කරපු රජයක් මැතිවරණයකට භය වෙන්නේ ඇයි? මැතිවරණයකට භය වෙන්න අපට කිසිම හේතුවක් නැහැ. මේ මැතිවරණයට අපි රජයක් හැටියට ඉතා ශක්තිමත්ව මුහුණ දෙනවා. අපි 2022 වර්ෂයේදී පොදුජන පෙරමුණ හැටියට රට ගැන හිතලා අඩියක් පස්සට අරගෙන, වර්තමාන ජනාධිපතිතුමාට ඒ වෙලාවේ ආර්ථිකය කළමනාකරණය කිරීම සඳහා තිබුණු හැකියාව හා එතුමාගේ ධෛර්යය නිසා, එතුමාට රට භාර දුන්නා. එහෙම භාර දීලා අපිට පුළුවන් සම්පූර්ණ සහයෝගය එතුමාට ලබා දුන්නා. පක්ෂයක් ලෙස ඊයේ වෙනතුරුත්, අදත් සියලු පනත් කෙටුම්පත්වලට ඡන්දය දීලා සම්පූර්ණයෙන්ම එතුමාගේ ගමන් මහට අපි ආශිර්වාදයක් වුණා. අපි ඉදිරියටත් ඒ ගමන එකට ගිහිල්ලා, යළි නොවැටෙන ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා වූ අඩිතාලම සකස් කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජපානයේ විදේශ අමාත්‍යතුමියගේ ඉල්ලීමක් පිට මම ගිය සතියේ ජපානයට ගිහිල්ලා හිටියේ. අපට ඉතාම සාර්ථක සාකච්ඡා රාශියක් කරන්න පුළුවන් වුණා. ජපාන රජය අපිට ඉතාම ඉහළින් සුබ පැතුවා, මේ රටේ තිබුණු තත්ත්වය තුළ, ආර්ථිකය මෙතරම් ඉක්මන් කාලයක් තුළ යළි ගොඩනඟන්නට ඒ ශක්තිය තිබීම පිළිබඳව. ඔවුන් පොරොන්දු වුණා, නවතා තිබෙන ව්‍යාපෘති 12ක් ඉතාම ඉක්මනින් නැවත ආරම්භ කරනවා කියලා. ඊයේ වෙනකොටම JICA එකේ නියෝජිතයෝ ඇවිල්ලා, අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාව හමු වෙලා, කටුනායක ගුවන් තොටුපළේ ඊළඟ පර්යන්තය හදන වැඩ ආරම්භ කිරීම සඳහා සාකච්ඡා කරමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිනිස්සුන්ට පෙනෙන්නේ නැති වුණාට අපේ රටේ දේශීය ණය, විදේශීය රටවලට තිබෙන ණය සහ විදේශීය bond holdersලාට තිබෙන ණය ප්‍රතිව්‍යුහගතකරණය හරහා ඒ කටයුතු සම්පූර්ණයෙන්ම කළමනාකරණය කරගෙන, අපිට IMF එක ලබාදීලා තිබෙන නිර්දේශ හා කොන්දේසිවලට යටත්ව, අවසාන වශයෙන් අපේ ණය බර ගෙවන ප්‍රමාණයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 17ක පමණ ප්‍රමාණයක් අඩු කර ගන්නට හැකියාව ලැබිලා තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් බිලියන 17ක් කියන්නේ සෙල්ලමක් නොවෙයි. ඒ මුදල අඩු වීම රටක ආදායමට, රටේ ණය බරට විශාල ජයග්‍රහණයක්. මේ රටට මෙච්චර කල් වෙලා තිබෙන්නේ මෙන්න මෙකයි. ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී රටක මේ ප්‍රශ්නය තිබෙනවා. පක්ෂයක් වෙනස් වුණු ගමන්, ආණ්ඩුවක් වෙනස් වුණු ගමන්, මිනිස්සු වෙනස් වුණු ගමන්, මේ ප්‍රතිපත්ති වෙනස් කරලා අඩි දෙකක් ඉස්සරහට යනවා, අඩියක් ආපස්සට යනවා.

අපි චීනයේ ෂී ජින්පිං ජනාධිපතිතුමාව ගෙන්වලා Port City ව්‍යාපෘතිය ආරම්භ කළා. එතුමා චීනයෙන් පිටත ගිහිල්ලා BRI ක්‍රමය තුළ පෞද්ගලිකව එතුමාගේ දැනින් ආරම්භ කරපු පළමුවැනි ව්‍යාපෘතිය තමයි කොළඹ Port City ව්‍යාපෘතිය. 2015දී ආපු රජය ඒක නවත්වලා දාලා සම්පූර්ණයෙන්ම චීන ආයෝජන ටික නැති කරලා දැම්මා. ඊට පස්සේ ඒ රජය විසින් ඉතා හොඳින් කළමනාකරණය කරමින් සාකච්ඡා කරගෙන ගිය ජපාන LRT ව්‍යාපෘතිය අපේ රජය ඇවිල්ලා කිසිම සාධාරණ හේතුවක් නැතුව, නවත්වලා දැම්මා. මේවා පිළිබඳව ජනතාවට ඇත්තේ මහ පිළිකුලක්.

අපි ඕනෑම දෙයක් කරනකොට රට ඉදිරියෙන් තියන්න ඕනෑ. පළමුව රට, දෙවනුව පක්ෂය, තුන්වෙනුව තමන්. හැබැයි අපේ සමහරු හැම වෙලාවේම ඉස්සරහට දාන්නේ තමන්ව. තමන්ට ඕනෑ විධියට පක්ෂය හැඩ ගස්සා ගන්න හදනවා. පක්ෂයට ඕනෑ විධියට රට හැඩ ගස්සා ගන්න හදනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට එහෙම කරන්න බැහැ. අපි රට ගැන හිතන්න ඕනෑ. රටට ඕනෑ විධියට පක්ෂය හැඩගැහෙන්න ඕනෑ. රටට ඕනෑ විධියට දේශපාලනඥයා හැඩගැහෙන්න ඕනෑ. අපි එවන් ක්‍රමයක් නිර්මාණය කළේ නැත්නම් හෝද හෝදා මඩේ දාන්න තමයි අපට සිද්ධ වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිංගප්පූරුව වාගේ පොඩි රටක් 2021 අවුරුද්දේ ලෝකයට ඇමෙරිකානු ඩොලර් බිලියන 879ක වටිනාකමට -එකක් දෙකක් නොවෙයි 879ක්- අපනයන කළා. හැබැයි ලංකාව ඒ වාගේ දහ ගුණයක් විතර විශාලයි, ඊට වඩා වැඩි ඉතිහාසයක් තිබෙනවා. පසුගිය අවුරුද්දේදී අපට අපනයනය කරන්න පුළුවන් වුණේ ඇමෙරිකානු ඩොලර් බිලියන 16යි. මොන ලජ්ජාවක්ද? ඒ හින්දා මම හිතනවා අපි හදුනා ගත්ත, අපි ඉදිරිපත් කළ ඒ ක්‍රමවේදය ඉදිරියටත් යන්න ඕනෑ කියලා. ඒ සඳහා තවත් කාලයක් අවශ්‍යයි. යළි නොවැටෙන ආර්ථික පුනරුදයකට මේ රට තල්ලු කරන්න ඕනෑ. ඒ සඳහා අමාරු තීන්දු තීරණ ගන්න ඕනෑ. ඒ තීන්දු තීරණ ගන්න හැමෝටම බැහැ. ඒ තීන්දු තීරණ ගන්න ඒ සඳහා හැකියාව තිබෙන්න ඕනෑ, දැනුම තිබෙන්න ඕනෑ, දර්ශනයක් තිබෙන්න ඕනෑ, ධෛර්යය තිබෙන්න ඕනෑ. එවැනි නායකයෙක් තෝරා ගැනීමයි මේ රටේ ජනතාවගේ යුතුකම කියන එක මම නැවත වතාවක් මතක් කරන්න ඕනෑ.

මොකක්ද මේ වර්ජන රැල්ල? ඇයි දෙවියනේ මේ ඡන්දයක් ඔන්න මෙන්න තිබියදී මිනිස්සුන්ව බිත්තියට හේත්තු කරලා තමන්ගේ දේවල් සාර්ථක කර ගන්න උත්සාහ කරන්නේ? තමන්ගේ පක්ෂ ගැන, තමන්ගේ ව්‍යාපාර ගැන, තමන්ගේ ආණ්ඩුවක් ගැන ඔව්වර විශ්වාසයක් තිබෙනවා නම් ඉන්න එපායැ, ඉවසාගෙන තව මාස තුනක්. අලුත් ආණ්ඩුව යටතේ මේවා ලබා ගන්න පුළුවන් කියලා. ඒකෙන් පේන්නේ මොකක්ද? ඔවුන් දන්නවා ඔවුන්ගේ රජයක් කවදාවත් පිහිටුවන්න බැහැ කියලා. ඒ නිසා පිස්සු හැදිලා වාගේ වර්ජන රැල්ලක් ඇති කරගෙන තිබෙනවා. මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේදී රාජ්‍ය සේවකයන්ට රුපියල් 10,000ක් වැඩි කළා. තව මොනවාද වැඩි කරන්න කියන්නේ? "අස්වැසුම" තුන් ගුණයක් වැඩි කළා, පොහොර සහනාධාරය ලබා දුන්නා. පසුගිය අවුරුදු තුනේදීම රට වටේටම විපක්ෂය ලබා දුන්නු smartphones ටික අපි පෙරේදා, එක දවසින් ගාල්ල දිස්ත්‍රික්කයට ලබා දුන්නා. අපි එවන් අතිවිශාල සංවර්ධනයකට අඩිතාලම දාලා තිබෙනවා. ඒ නිසා අපි ජනතාවගෙන් ඉල්ලන්නේ එක දෙයයි . ඔබලා මේ ව්‍යෘත්තීය සමිතිවල ඉතාම අසාධාරණ, අශීලාචාර ක්‍රමවේදයට අහු වෙනවාද, නැත්නම් අපට වැඩ කටයුතු කරගෙන යන්න අවස්ථාව ලබා දෙනවාද? ඔබට ඔබේ පක්ෂය ගැන විශ්වාසය තිබෙනවා නම්, -ඒ පක්ෂවල අය තමයි ව්‍යෘත්තීය සමිතිවල නායකයෝ- ඉවසාගෙන ඉන්නකෝ. ඉවසාගෙන ඉන්න බැහැ කියලා

කියන්නේ ඔබගේ ජයග්‍රහණය පිළිබඳව කිසි විශ්වාසයක් නැහැ කියන එකයි. ඒ නිසා මේ කාලය තුළ පුළුවන් දෙයක් ගන්න හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිසිම සැකයක් ඇති කර ගන්න එපා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බොහෝවිට ඔක්තෝබර් 5වෙනි දා හෝ 12වෙනි දා මේ රටේ ජනාධිපතිවරණය පවත්වනවා. ජනතාව තීරණය කරනවා ඊළඟ අවුරුදු පහේදි කවුද ඔවුන්ව පාලනය කරන්නේ කියලා.

බොහොම ස්තුතියි.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙවින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට point of Order එකක් මතු කරන්න තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු කෙවින්දු කුමාරතුංග)
(The Hon. Gevindu Cumaratunga)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ මහ බැංකුවේ, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා හැටියට ඉන්නේ, භාණ්ඩාගාරික හැටියට ඉන්නේ- *[බාධා කිරීමක්]* මහ බැංකුවේ වැටුප් වැඩි කර ගැනීම සම්බන්ධයෙන් ඔබතුමන්ලා මැදිහත් වෙන්නේ නැද්ද? *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (මහාචාර්ය) චරිත හේරත් මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.06]

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) චරිත්ත හේරත්)
(The Hon. (Prof.) Charitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම විවාදයට සහභාගි වෙන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. ඇත්තටම මේ විවාදයේ පදනම, මාතෘකාව දෙස බලද්දී ජේනවා ව්‍යවස්ථාදායකය විධියට අපි කොච්චර පරිහානියට පත් වෙලා තිබෙනවාද කියලා. ඒ කියන්නේ මේ ආණ්ඩුව දැන් හදිසියේ 2015දී අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙච්ච mistake එකක් එළියට ඇදලා තිබෙනවා. මුලදී ඒකෙන් ඇතුළට රිංගන්නත් බැලුවා, අවුරුදු 5 නොවෙයි අවුරුදු 6යි කියලා.

ඒක කරන්න බැරි වුණාම මීට අවුරුදු 8කට ඉස්සෙල්ලා වෙච්ච mistake එකක් ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කරන්න මැතිවරණ කොමිසමට බලය ලැබෙන්න දවස් 4ක් තිබියදි කැබිනට් මණ්ඩලයට දානවා. මේකෙන් කියන්නේ මේ රටේ ව්‍යවස්ථාදායකය විධියට අපේ තත්ත්වය. මම එකඟයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වැරදි තැන් හදන්න ඕනෑ කියන එකට. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ විධියට වරද්දපු එකත් වැරදියි. ඒක කළේ දැන් ඉන්න ජනාධිපතිතුමා, අගමැති විධියට හිටපු කාලයේ. එතුමා අගමැති විධියට හිටපු කාලයේ කරපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වැරදුණාය කියලා අවුරුදු 8කට පස්සේ ඒකෙන් ඇතුළට යන්න බලලා, ඒක කරන්න බැරිවුණාම ඒක නැවත පාර්ලිමේන්තුවට ගෙනෙන එකෙන් කියන්නේ අපි කොච්චර දුර්වල ව්‍යවස්ථාදායකයක් ඇතුළේද ඉන්නේ කියන එකයි. අපේ රටේ පරණම පාර්ලිමේන්තුවේදීන් දෙදෙනෙකු තමයි ජනාධිපතිතුමායි, අගමැතිතුමායි. මේ දෙදෙනාම අවුරුදු 30කට, 40කට වඩා පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. මේ දෙදෙනාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සිදු කරන වෙලාවේ ඉඳලා තිබෙනවා. ඊට පස්සේ මේ දෙදෙනාම අගමැතිවරු විධියට පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. එහෙම තියෙද්දි එක පාරට නින්දෙන් ඇහැරුණා වාගේ මේ ප්‍රශ්නය කැබිනට් මණ්ඩලයට දාලා එතුමන්ලා මොකක්ද කරන්න යන්නේ කියලා මට තේරෙන්නේ නැහැ. ඇත්තටම මේක විහිළුවක් කියලායි මම හිතන්නේ. අපි ව්‍යවස්ථාදායකය විධියට වැඩ කරන්නේ කොහොමද කියන එක පිළිබඳව මේ රටේ ජනතාවට යම් අදහසක් තිබෙනවා. ඒ අය මේක විහිළුවක් විධියටයි සලකන්නේ.

මට ඉස්සෙල්ලා කථා කරපු මා මිත්‍ර අලි සබ්රි ඇමතිතුමා සහ අපි හුඟක් කල් ඉඳලා දන්න අය. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වැඩ කරපු අය. එතුමා ඉතා දක්ෂ නීතිඥයෙක්. නීතිඥයෙකුට එක වෙලාවක එක පැත්තකට පෙනී ඉඳලා තව වෙලාවක තව පැත්තකට පෙනී ඉන්න පුළුවන්. ඒ නිසා එතුමාටම විරුද්ධව එතුමා අද පෙනී ඉන්නවා. එතුමා ඇවිල්ලා කිව්වා, ගෝඨාභය මැතිතුමාගේ ආණ්ඩුවේ අන්තිමට හිටපු මුදල් ඇමති මේ රට බංකොලොත් කළාය කියලා. කවුද ඒ ඇමති? ඒ ඇමති තමයි මගේ මිත්‍රයා වන අලි සබ්රි. හැබැයි එතුමාට විතරයි මේක කරන්න පුළුවන්. මොකද, එකම නීතිඥයා එකම නඩුවේ පැති දෙකකට කවදාවත් පෙනී ඉඳලා නැහැ. නමුත් මේක එහෙම වැඩක්. එතුමා එකම නඩුවේ පැති දෙකට මාරු වෙලා පෙනී ඉඳලා තිබෙනවා. එතුමා කිව්වා, "කොන්ද තිබෙන මිනිහෙක් ඕනෑ. ගෝඨාභය වාගේ කෙනෙක් නොවෙයි. ඒ නිසා රනිල් වික්‍රමසිංහව නැවත ඕනෑ" කියලා. එතුමා අද කියනවා, ගෝඨාභයගේ කොන්ද නැහැයි කියලා. එදා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙද්දි එතුමා අධිකරණ ඇමතිවරයා විධියට කිව්වා, "ඒක නොවෙයි, මේක තමයි හොඳම එක" කියලා. ගෙවිඳු මන්ත්‍රීතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමා එදා ගෙවිඳු මන්ත්‍රීතුමාත් එක්ක ඇති තරම් රණ්ඩු වුණා, මේක හොඳම එක කියලා. අද ඇවිල්ලා කියනවා, "කොන්ද නැහැ. ඒ හින්දා කොන්ද තිබෙන කෙනෙක් ජනාධිපති කරන්න ඕනෑ" කියලා. ඇත්තටම මේවා එතුමාට කරන්න පුළුවන් වුණාට වෙන කාටවත් කරන්න පුළුවන් ඒවා නොවෙයි. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ගැන අපිට විවේචනයක් තිබෙනවා. හැබැයි අපි ඔහොම කියන්නේ නැහැ. කොන්ද නැතුව තීරණ ගන්න බැරිව කඩා වැටිච්ච ආණ්ඩුවේ හිටපු ඇමතිවරයෙක් විධියට ඇවිල්ලා, අනෙක් පැත්තට මේ විධියට කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ව්‍යවස්ථාදායකය විහිළුවක් බවට පත් නොකළ යුතුයි. මේ රටේ ජනතාව විශ්වාස කරනවා, අපි යම් serious මිනිස්සු කොටසක් කියලා. ඒ නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 (ආ) ව්‍යවස්ථාව අපි වෙනස් කරමු. ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ විතරක් නොවෙයි. ඒක හදපු ඇමතිවරු, මන්ත්‍රීවරු ඔක්කෝම ඉන්න තැනක අපි කියනවා මේක වෙනස් කරන්න අපිට අවශ්‍ය තරම් වෙලාව තිබෙන බව. දැන් අලි සබ්රි ඇමතිතුමාත් කිව්වා, අවසාන වශයෙන් පරමාධිපත්‍යයේ පදනම වෙන්නේ මහජනතාව කියලා. රටක පරමාධිපත්‍යය අයිති ජනාධිපතිටවත්, අගමැතිටවත්, කැබිනට් මණ්ඩලයටවත්, අපිටවත් නොවෙයි, රටේ ජනතාවට. රටේ ජනතාවට පරමාධිපත්‍යය අත් විඳින්න අවස්ථාවක් එනකොට ඒක ඇතුළේ වෙන ගේම් වාගේ ඒවා ජේන්න වැඩ කරන්න හොඳ නැහැ. අධිකරණ ක්‍රමයේ තිබෙනවා, නඩු හරියට විසඳන්න ඕනෑ වාගේම හරියට විසඳුවා කියලා පෙනෙන්න ඕනෑ කියලා; නඩුවක

[ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා]

විනිශ්චය හොඳට කරනවා වාගේම ඒක හොඳට කළාය කියලා පෙනෙන්න ඕනෑ කියලා කියනවා. ඒ වාගේ, මේ පාර්ලිමේන්තු ක්‍රමය ඇතුළේ වැඩ හොඳට කරන්නත් ඕනෑ. හොඳට කරනවාය කියලා රටට පෙනෙන්නත් ඕනෑ. රටේ ජනතාව මේක දැකපු ගමන් දන්නවා, මෙතැන මොකක් හරි යටිකුටිටු වැඩක් තිබෙනවා කියලා. අවුරුදු 8කට ඉස්සෙල්ලා වැරදුණා. ඒ වැරදිච්ච කාලයේ හිටපු අගමැතිවරයා ජනාධිපති විධියට ඇවිල්ලා දැන් කැබිනට් මණ්ඩලයට කියනවා, "අනේ! මට අවුරුදු 8කට ඉස්සෙල්ලා වැරදිච්ච එක දැන් නිවැරදි කරන්න, දැන් නිවැරදි කරන්න. දවස් 5යි තිබෙන්නේ, ඉන්දෙට දින declare කරන්න" කියලා. මේක මොන විහිළුවක්ද? කොයි රටේද මෙහෙම කරන්නේ? මේ අගමැති, ජනාධිපති දෙදෙනාම හොඳම පාර්ලිමේන්තුවේදීත් කියලා අපි පිළිගන්නම්. හැබැයි මේ වාගේ විකාර කරන එකෙන් අපේ පාර්ලිමේන්තුවට තිබෙන ගෞරවය කෙළෙසෙනවා කියන කාරණය මතක් කරමින්, මගේ වචන සංක්ෂිප්ත නිමා කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික ප්‍රධානියා වශයෙන් කටයුතු කරන මන්ත්‍රීතුමා)
(The Hon. Presiding Member)
ගරු වී. රාධාකෘෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[ප.ව. 4.12]

ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා
(මාණ්ඩලික ප්‍රධානියා වශයෙන් කටයුතු කරන මන්ත්‍රීතුමා)
(The Hon. (Dr.) V.Radhakrishnan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையானது 1950களில் ஆசியாவில் சிறந்த பொருளாதார வளர்ச்சியுள்ள ஒரு நாடாகக் காணப்பட்டது. படிப்படியாக அதன் வளர்ச்சி குறைவடைந்து, இப்பொழுது தலைகீழாக மாறியிருக்கின்றது. மாட்டுக்கு எப்போதும் கொம்பு முன்பக்கமாகத்தான் வளரும் என்று சொல்வார்கள். அதுபோல் எமது நாடும் வளர்ச்சியடைந்த நாடாக இருக்க வேண்டும். ஆனாலும், இந்த நாட்டின் வளர்ச்சியானது மாட்டினது கொம்புபோல் அல்லாமல், மாட்டினது வால் போல், தேய்வடைந்து செல்வதை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. இதனால் இந்த நாடு பொருளாதாரத்தில் மிகவும் பின்தங்கிய ஒரு நாடாக இருக்கின்றது. இங்கு பேசிய பலரும், இந்த நாட்டின் பொருளாதாரம் இரண்டு வருடங்களுக்கு முன்னர் வீழ்ச்சியடைந்து விட்டது என்றும் அதைத் தாங்கள்தான் படிப்படியாகக் கட்டியெழுப்பி முன்னேற்றி இருக்கிறோம் என்றும் அதற்குக் காரணம் மாண்புமிகு ஜனாதிபதி அவர்கள்தான் என்றும் சொன்னார்கள். இரண்டு வருடங்களுக்கு முன்னர், இந்த நாடு பொருளாதாரத்தில் வீழ்ச்சியடைவதற்கு யார் காரணமாக இருந்தார்கள்? எந்த ஆட்சி காரணமாக இருந்தது? என்பதை நாங்கள் சற்று சிந்தித்துப் பார்க்க வேண்டும். இந்த நாட்டை ஆட்சிசெய்த ஆட்சியாளர்கள் நாட்டைச் சூறையாடிவிட்டு, நாட்டின் பொருளாதாரம் வீழ்ச்சியடைந்துவிட்டது என்று சொன்னார்கள். இன்று இந்த நாட்டின் பொருளாதாரம் மோசமடைந்திருக்கின்ற நிலைமையில், ஜனநாயகத்தை மிதிப்பதற்கு நடவடிக்கை எடுக்கப் பார்க்கின்றார்கள். அதாவது, தேர்தல்களை எப்படி பிற்போடலாம் என்று யோசிக்கிறார்கள். உள்ளூராட்சி மன்றத் தேர்தலைப் பிற்போட்டார்கள். அதுபோல், மாகாண சபைத் தேர்தல் 6 வருடங்களாக நடாத்தப்படாமல் இருக்கின்றது. இப்பொழுது ஜனாதிபதித் தேர்தலை எவ்வாறு பிற்போடலாம்? அதற்கான சந்தர்ப்பம் என்ன? என்பன பற்றிச் சிந்தித்து, மாண்புமிகு ஜனாதிபதி அவர்கள் எடுக்கின்ற நடவடிக்கையானது மிக மோசமானது. இது இந்த நாட்டின் ஜனநாயகத்தைப் பாதிக்கக்கூடியது என்பதை நாங்கள் மறந்துவிடக்கூடாது.

அரசியலமைப்பு விடயம் சார்ந்து நீதிமன்றம் சென்றமையானது, மாண்புமிகு ஜனாதிபதி அவர்கள் திட்டமிட்டுத் தேர்தலை நடத்தாமல் இருப்பதற்காகத்தான் என்பது எல்லோருக்கும் தெரிந்த விடயமாக இருக்கின்றது. இந்த நாடு 1972ஆம் ஆண்டு இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசாகப் பிரகடனப்படுத்தப்பட்டது. 1978ஆம் ஆண்டு ஜனாதிபதி ஜே.ஆர். ஜயவர்தனா அவர்கள் இந்த நாட்டை ஆட்சி செய்தார். அவருக்குப் பின்னர், ரணசிங்க பிரேமதாஸ அவர்கள் இந்த நாட்டை ஆட்சி செய்தார். அவருக்குப் பின்னர், டி.பி. விஜயதுங்க அவர்கள் சிறிது காலம் ஆட்சி செய்தார். அவருக்குப் பின்னர், முறையே சந்திரிக்கா பண்டாரநாயக குமாரதுங்க அவர்கள், மஹிந்த ராஜபக்ஷ அவர்கள், மைத்திரிபால சிறிசேன அவர்கள், கோட்டாபய ராஜபக்ஷ அவர்கள் இந்த நாட்டை ஆட்சி செய்தார்கள். தற்பொழுது, மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் முன்னாள் ஜனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்களுடைய பதவிக் காலத்தின் எஞ்சிய காலப் பகுதிக்கு ஜனாதிபதியாகத் தெரிவு செய்யப்பட்டு இருக்கிறார். இந்த எஞ்சிய பதவிக் காலத்தில் எந்தவொரு ஜனாதிபதியும் செய்யாத தில்லுமுல்லு வேலைகளைத் தற்போதைய ஜனாதிபதி அவர்கள் செய்து வருகின்றார் என்பதை நாங்கள் மறுக்க முடியாது. அவ்வாறு அவர் செயற்படாமல், இந்த நாட்டில் ஜனநாயகத்தை நிலைநாட்ட வேண்டும். பெரிய நாடாகிய இந்தியாகூட, ஜனநாயக ரீதியாகச் செயற்படுவதை நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. அதேபோல், இந்த நாட்டிலும் ஜனநாயகம் இருக்க வேண்டும். அப்பொழுதுதான் இந்த நாட்டில் மக்களாட்சி நடைபெறும் என்பதை நான் இங்கு சொல்லிவைக்க விரும்புகின்றேன்.

அடுத்து, நான் இந்த நேரத்தில் இன்னும் சில விடயங்களைச் சொல்ல வேண்டும். கொட்டகலை பகுதியில் கிட்டத்தட்ட 13 ஏக்கர் காணியையும், வட்டகொட பகுதியில் 10 ஏக்கர் காணியையும் இரகசியமாகப் பிரித்துக் கொடுப்பதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்றன. ஒருசில கட்சிகளின் தனிப்பட்ட ஆதிக்கம் இந்த விடயத்தில் இருக்கின்றது. அதனைத் தடுத்து நிறுத்த வேண்டுமென நாங்கள் இந்த இடத்தில் கேட்டுக்கொள்கின்றோம். நீங்கள் யாருக்கு வேண்டுமென்றாலும் காணிகளை publicஆகக் கொடுங்கள்! அதில் எங்களுக்குப் பிரச்சினை இல்லை. ஆனால், மக்களின் காணிகளை எடுத்துத் தனியாருக்குக் கொடுப்பது முறையற்ற காரியம் என்பதைத் தெரிந்துகொள்ள வேண்டும்.

இந்த நாட்டின் அரசியலமைப்பின் 83(ஆ) உறுப்புரையிலுள்ள '6 ஆண்டுகள்' என்பதை '5 ஆண்டுகள்' என மாற்றுவதற்குக் கொண்டுவரப்பட்டு இருக்கின்ற பிரேரணையை நாங்கள் வரவேற்கின்றோம். அதேநேரத்தில், இந்த நாட்டில் ஐந்து வருடங்களுக்கு ஒருமுறை ஜனாதிபதித் தேர்தலை நடாத்துவதுதான் முறையானது என்பதை நாங்கள் தெரிந்து கொள்ள வேண்டும். அதேபோல், ஏனைய தேர்தல்களையும் உரிய காலப்பகுதியில் நடாத்துவதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டும். அமெரிக்காவில் நான்கு வருடங்களுக்கு ஒருமுறை ஜனாதிபதித் தேர்தல் நடாத்தப்படுகின்றது. இந்தியாவில் ஐந்து வருடங்களுக்கு ஒருமுறை பொதுத் தேர்தல் நடாத்தப்படுகின்றது. 'கொவிட்' தொற்று காரணமாக பொருளாதாரத்தில் நாங்கள் வீழ்ச்சியடைந்து விட்டோம்; சர்வாதிகார ஆட்சியைத்தான் செய்யப்போகின்றோம் என்றால், அது இந்த உலகத்தால் ஏற்றுக்கொள்ளக்கூடிய

ஜனநாயக முறையாக இருக்க முடியாது. மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் உலகளவில் போற்றப்பட்ட ஒரு ஜனநாயகவாதியாக இருந்திருக்கின்றார் என்றே நான் நினைக்கின்றேன். ஆனால், இன்று அவர் இந்த நாட்டின் ஜனநாயகத்தை மிதிப்பதைப் பார்க்கின்றபோது, அவர் ஜனநாயகத்துக்கு விரோதமான சர்வாதிகார ஆட்சியைத் தான் செய்கின்றார் என்பது புலப்படுகின்றது. ஆகவே, இதனை மாற்றியமைப்பதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும்.

மாண்புமிகு ஜனாதிபதி அவர்கள் கடந்த மே மாதம் 1ஆம் திகதி சொன்னதுபோல, பெருந்தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 ரூபாய் நாட்சம்பளத்தைப் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டும். அதற்கு நாங்கள் முற்றுமுழுதாக ஆதரவளிப்போம். எந்தத் தொழிற்சங்கமாக இருந்தாலும் சரி, எந்த அரசியல் கட்சியாக இருந்தாலும் சரி, எங்களுடைய மக்களுக்கு அந்த நாட்சம்பளம் கிடைக்கு மானால், அதற்கு நாங்கள் நிச்சயமாக ஆதரவளிப்பதற்குத் தயாராக இருக்கின்றோம். அதில் எந்தவிதமான மாற்றுக் கருத்தும் கிடையாது என்று சொல்லி, எனது பேச்சை நிறைவு செய்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.18]

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பிரமித்த பண்டார தென்னகோன் - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Premitha Bandara Tennakoon - State Minister of Defence)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ විපක්ෂය විසින් ගෙන එන ලද යෝජනාව පිළිබඳ විවාදයට එකතු වෙන්න ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අනෙකුත් අදාළ නීති ප්‍රකාරව, ජනාධිපතිවරණය 2024 සැප්තැම්බර් 17වන දිනත් ඔක්තෝබර් 16වන දිනත් අතර කාලය තුළ පැවැත්විය යුතුය කියන යෝජනාව විපක්ෂය විසින් ඉදිරිපත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දන්නා විධියට මෙවැනි යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ ඉතිහාසයේ පළමුවැනි වතාවයි. මම වැරදි නම් කරුණාකර නිවැරදි කරන්න. මම හොයලා බැලුවාම දැනගන්න ලැබුණා, මීට කලින් මෙහෙම යෝජනාවක් කවදාවත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැති බව. එවැනි යෝජනාවක් ඉදිරිපත් කරලා වැඩකුත් නැහැ. ඒ දේවල් මෙතැන කථා කළා කියලා තේරුමකුත් නැහැ. ඒ වාගේම මම කල්පනා කළේ පාර්ලිමේන්තුවේත්, අපේ දේශපාලන පක්ෂවලත්, දේශපාලනඥයන්ගේත්, ඒ වාගේම මාධ්‍යයේත්, මහජනතාවගේත් කැලඹෙන ස්වභාවය පිළිබඳවයි. වචනයකට, දෙකකට, එහෙම නැත්නම් යෝජනාවකට, කථාවකට, මාධ්‍ය සාකච්ඡාවකට රටේ ජනයාත්, මාධ්‍යයත්, දේශපාලන පක්ෂත් කැලඹෙන විධිය දැක්කාම එක පැත්තකින් පුදුම හිතෙනවා. තවත් පැත්තකින් කල්පනා කරලා බලද්දී පුදුම වෙන්න හේතුවකුත් නැහැ. මම එහෙම කියන්නේ ඇයි කියලා කියන්නම්.

අපි තමයි ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පරිණත දේශපාලන system එකක් අපේ රටේ හැදිලා තිබෙනවා. අපි හැම දෙයටම මුහුණ දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් විධියට ඔබතුමායි, මමයි ප්‍රථම වතාවට පිවිසෙන්නේ නවවැනි පාර්ලිමේන්තුවටයි. අපි තවම අවුරුදු තුනයි මාස කිහිපයයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට කටයුතු කළේ. මේ කෙටි කාලය තුළ ඔබතුමායි, මමයි ලබපු අත්දැකීම් කොච්චර ද කියලා පොඩ්ඩක් කල්පනා කර බලන්න. අපි කොච්චර ප්‍රශ්නවලට මුහුණ දුන්නාද කියලා කල්පනා කර බලන්න. මේ කෙටි කාලය තුළ අපි දේශපාලන වශයෙන් කොච්චර අත්දැකීම් ලැබුවාද කියලා කල්පනා කර බලන්න. හැබැයි පැරණිම ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන, පරිණත පාර්ලිමේන්තුවක් වෙන්න ඕනෑ තැනක, පරිණත දේශපාලනඥයන් ඉන්න ඕනෑ තැනක සිටින සමහර නියෝජිතයෝ හැසිරෙන්නේ බබිබු වාගේ කියලායි මේ යෝජනාව දැක්කාම මට හිතුණේ. මේක පාර්ලිමේන්තුවට කළ අගෞරවයක් කියලායි මට හිතෙන්නේ. මේක දියුණු ප්‍රජාතන්ත්‍රවාදයක, දියුණු පාර්ලිමේන්තුවක තිබෙන ලක්ෂණයක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය ඇති වෙන්නේ ව්‍යවස්ථාදායකය විධායකයේ කාර්යභාරය කරන්න ගියාමයි. 1978 සිට 2015 දක්වාම පැවති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30(2) ව්‍යවස්ථාව යටතේ සඳහන් වුණා, "ජනරජයේ ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරා පත් කර ගනු ලැබ් යුතු අතර සෑ අවුරුද්දක කාලයක් ධුරය දරන්නේ ය" යනුවෙන්. එම ප්‍රතිපාදනය 2015 අවුරුද්දේදී දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සංශෝධනයට ලක් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83(ආ) ව්‍යවස්ථාවත් එක්ක එහි නොගැළපීමක් තිබෙනවා. ඒ නිසා ජනාධිපතිතුමා ඒ සම්බන්ධයෙන් අවබෝධ වුණු වහාම එය නිවැරැදි කරන්න කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කළාම කැබිනට් මණ්ඩලය මෙම අතපසුවීම හෝ වැරැද්ද නිවැරැදි කරන්න ගත යුතු ප්‍රතිපාදනය අරගෙන තිබෙනවා. ඒ, පළමුවැනි කාරණය.

ඊට අමතරව කොහෙදෝ ඉන්න කෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ජනාධිපතිවරයාගේ ධුර කාලය සම්බන්ධව අර්ථ නිරූපණයක් ඉල්ලුවා. ඒක තමයි මේ කැලඹීමට මූල.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ-පෙරේදා මාධ්‍ය හරහා අපි දැනගත්තා, මුහුදේ පාවෙලා ආ බෝතලයක තිබුණු දෙයක් පස් හයදෙනෙක් එකතු වෙලා බීලා ඇති වුණු විනාශය ගැන. ඊට කලින් ඔවුන් සෙල්ෆියකුත් අරගෙන තිබුණා. ඒ කථාවයි, මේ කථාවයි දෙකක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එහෙම කියන්නේ මේ නිසායි. 1945 ඔක්තෝබර් 01වැනි දා ඉඳලා මේ රටේ නිදහස් අධ්‍යාපනය ස්ථාපනය කරනවා. නිදහස් අධ්‍යාපනය ගැන අපි බොහොම ආඩම්බර වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි පසුගිය දිනක ධීවරයන් පිරිසක් මුහුදු ගිය අවස්ථාවක මුහුදේ පාවෙලා ආ බෝතලයක තිබුණු දෙයක් පානය කළා. අපේ රටේ සාක්ෂරතාව සියයට 97ක්, 98ක් වෙනවා. නම කියන්න, ලියන්න පුළුවන් ජනතාව වැඩි වශයෙන් ජීවත් වන රටක්, මේක. ඒ ගැන අපි ආඩම්බර වෙනවා. හැබැයි, නමයි, ගමයි ලියන්න සහ කියවන්න පුළුවන් වෙලා විතරක් මදි කියන එක පසුගිය දිනක වුණු ඒ සිද්ධියෙන් ඔප්පු කළා. අපට කොතැනක හෝ වැරදිලා තිබෙනවා. ඒ සිද්ධියේදීයි, මේ සිද්ධියේදීයි කියන කාරණාව ගත්තාම එකම කාරණාවක් තමයි තිබෙන්නේ. අපි ඕනෑම දෙයකට විඟහට අසුවන බව තමයි මේ දේවල්වලින් අපට තේරුම් ගන්න තිබෙන්නේ. ඒ සිද්ධිය වුණාට පසු මම දැක්කා මුහුණු පොතේ ගොඩක් තරුණ පිරිස් අදහස් දක්වා තිබුණා, "මම දන්නේ මෙච්චරයි. මම හිටියත් ඔච්චරයි" කියලා. ඒ කියන්නේ, එම තරුණයන් එතැන හිටියත් ඒ බෝතලේ තිබුණු දේ බොනවා කියන එක. බලන්න, කෙතරම් බේදනීයද කියලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා]

හිටපු ඇමතිවරයෙක් මීට ටික කලකට පෙර YouTube නාළිකාවකට ප්‍රකාශයක් කරලා තිබුණා, මැයි මාසයේ 18වැනි දා පාර්ලිමේන්තුව විසුරුවනවා කියලා. එවැනි ප්‍රකාශයක් ආණ්ඩුවෙන් කළේත් නැහැ; රාජ්‍ය තන්ත්‍රයෙන් කළේත් නැහැ. හැබැයි, මුහුණු පොතේ කරපු ප්‍රකාශයක් කළ දෙයක් බලන්න. ඒ පුවත නිසා කොටස් වෙළෙඳ පොළේ ක්‍රියාවලිය දින කිහිපයක් සම්පූර්ණයෙන් නැවතුණා. කොහෙදෝ යන කෙනෙක් කරපු ප්‍රකාශයක් නිසා දින කිහිපයක් එම කටයුතු නැවතුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් හිතා බලන්න, අපේ රට ගැන කරන කියවීමේදී මේකෙන් තේරුම් ගන්න පුළුවන් මොනවාද කියලා. කවුරු මොන යම් හෝ ගිනි ගෙඩියක් දුන්නොත්, ඒක කරේ තියාගෙන මීටර් 100 දුවන්න අපේ අය බොහොම සමත් කියන එක තමයි මේකෙන් ඔප්පු වෙන්නේ. එම නිසා අද කරන විවාදයත් බේදනීයයි. මුහුදේ පාවෙලා ආ බෝතලේ තිබුණු දේ බීපු එකත් බේදනීයයි. ඒ වාගේම අර කවුදෝ කරපු ප්‍රකාශයක් නිසා කොටස් වෙළෙඳ පොළේ ගනුදෙනු නැවතීමත් බේදනීයයි. එක එක කට කථාවලට, එක එක මතවලට, එක එක අදහස්වලට මෙවැනි ආකාරයට කලබල වන එකට දුක් වෙනවා හැරෙන්න වෙන කරන්න දෙයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක අපි තේරුම් ගනිමු. ඒ නිසා පරිණත පාර්ලිමේන්තුවක් විධියට, බලවේගයක් විධියට, දේශපාලන ධාරාවක් විධියට, දේශපාලන පක්ෂ විධියට වැඩ කටයුතු කරමු කියන යෝජනාව අපට කරන්නම සිද්ධ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ එක්කම ව්‍යවස්ථාදායකය විධියට අපට වගකීමක් තිබෙනවා. කවුරු කලබල වුණත්, මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමට තිබෙන්නේ දින ගණනක් වුණත්, අපි කළ යුතු කාර්යභාරය අපි කළ යුතුයි. එය පැහැර හරින්න අපට අයිතියක් නැහැ. එය නිසියාකාරව, නිසි වෙලාවට ඉෂ්ට සිද්ධ කිරීම අපේ වගකීම කියා මම කල්පනා කරනවා. එය එසේ විය යුතුයි කියා මම විශ්වාස කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ රටේ ඇති වෙලා තිබෙන දේශපාලන තත්ත්වය පිළිබඳව මට දැනෙන, මට තේරෙන විධියට විග්‍රහයක් කරන්න මම බලාපොරොත්තු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රට දැන් හඳුන්වන්නේ, දේශපාලන පක්ෂවල සුසාන භූමියක් - a graveyard of political parties - කියලායි. එහෙම කියන්නේ ඇයි? මේ රටේ දේශපාලන ධාරාවේ තිබුණු ඓතිහාසික, පැරණි දේශපාලන බල කඳවුරු දැන් කැඩිලා, බිඳිලා තිබෙන්නේ. එක පැත්තකින් එක්සත් ජාතික පක්ෂය දුර්වල වුණා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දුර්වල වුණා. ජනතා විමුක්ති පෙරමුණ දුර්වල වෙලා NPP කියන බැටළු හමෙන් එම පක්ෂයේ වැඩ කටයුතු වහගෙන ඉන්නවා. පැරණි දේශපාලන පක්ෂවලින් ජනතාව එක කාලයක ඈත් වුණා. ඊට පසු අලුත් දේශපාලන බලවේග මේ රටේ ගොඩනැඟුණා. මගේ කියවීම තමයි, මේ මැතිවරණවලින් පසුව නැවතත් පැරණි දේශපාලන පක්ෂවල නැඟිටීමක් සිද්ධ වන එක වළක්වන්න හම්බ වෙන්නේ නැහැ කියන එක.

මේක සිද්ධ වෙන්නේ 2015දී ඇති වුණු දේශපාලන ව්‍යාකූලත්වයත් එක්ක. මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්වරයා විධියට එක්සත් ජාතික පක්ෂයේ සහාය ඇතිව ජනාධිපති අපේක්ෂකයා වෙලා, ජනාධිපති ධුරය ලබාගෙන ඊට පසුව නැවත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ධුරය ලබා ගත්ත එකෙන් ඇති වුණු ඵල විපාක නිසා හට ගත් දේශපාලන සුනාමියක් තමයි මේ එන්නේ. ඔබතුමා දන්නවා, සුනාමියකදී එන්නේ රැලි බව. විටින් විට, එක එක වෙලාවට, එක එක වේගයෙන්, එක එක උසින් රැලි එනවා. මේ දේශපාලන සුනාමියේ අවසාන අදියර තමයි දැන් යන්නේ. මේක තමයි මගේ කියැවීම. මේකෙන් අපි පාඩම් ඉගෙන ගන්න ඕනෑ කියා මම කල්පනා කරනවා.

2022 මැයි 09වැනි දා ඇති වෙච්ච තත්ත්වයත්, ජූලි 09වැනි දා ඇති වෙච්ච තත්ත්වයත් එක්ක අපට තීරණයක් ගන්න සිද්ධ වුණා. අපි එක්සත් ජාතික පක්ෂයත් එක්ක හැම දාම හැප්පුණු පිරිසක්. පරම්පරා තුනක් -වසර 75ක්- අපි දේශපාලනිකව බෙදිලා හිටියේ; අපි දේශපාලනිකව විරුද්ධ කඳවුරුවල හිටියේ. අපි හැප්පුණා; දේශපාලන මතවාද, අදහස් ප්‍රකාශ කළා; ගහ ගත්තා; මරා ගත්තා; වෙඩි තියා ගත්තා; නඩු කියා ගත්තා; මෙතැන බෙදිලා හිටියා. හැබැයි, 2022දී ඇති වෙච්ච මේ ව්‍යාකූලත්වයත් එක්ක ඒ පැරණි කෝන්තර, ප්‍රශ්න, මතිමතාන්තර සියල්ලම අමතක කරන්න අපට සිද්ධ වුණා. ඒ සියල්ලම අමතක කරලා රට ගැන, රටේ අනාගතය ගැන හිතන්න අපට සිද්ධ වුණා. රටේ ගිනි නිවන්න, රට ආර්ථික අර්බුදයෙන් ගොඩ ගන්න, රටේ ජනතාවට බලාපොරොත්තුවක් දෙන්න, රටට අනාගතයක් උදා කර දෙන්න අපේ දේශපාලන මතිමතාන්තර ඉවත දමන්න, අමතක කරන්න අපට සිද්ධ වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වෙලාවේදී මේ රට ගොඩගන්න පුළුවන් කාටද, මේ රට ගොඩගන්න ඉදිරියට එන්නේ කවුද, ඒ කෙනාට සහයෝගය ලබා දෙන්න අපි බලාපොරොත්තු වුණා.

මම මේ අවස්ථාවේදී එක කාරණයක් වගකීමෙන් යුතුව කියනවා. ඒ වෙලාවේ මේ රට භාර ගන්නේ සජිත් ප්‍රේමදාසද, අනුර කුමාර දිසානායකද, රනිල් වික්‍රමසිංහද කියලා අපට ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ඉදිරියට එන්නේ කවුද, ඒ කවුරු ආවත් මේ වනතුරු සහාය දුන්නා වාගේම සහාය දෙන්න අපි දේශපාලනිකව හිත හදාගෙන හිටියේ. කවුරු ඉදිරියට ආවත් අපි මේ ලබා දෙන සහයෝගය ඒ විධියටම ලබා දෙනවා කියන එකත් මම මතක් කරන්න ඕනෑ.

ඊට පසුව රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉතාම ව්‍යාකූල, ඉතාම සංකීර්ණ, ඉතාම අමාරු, කටුක වගකීමක් භාර ගත්තා. එතුමා තරම් ප්‍රශ්න ගොඩක් මැද රට භාර ගත්ත තව කෙනෙක් නිදහස් ශ්‍රී ලංකාවේ ඉන්නවා කියලා මම හිතන්නේ නැහැ. ජනාධිපති ධුරයට එන්න කලින් එතුමාගේ නිවසට ගිනි තැබුවා; අඳින්න ඇඳුමක්වත් ලබා ගන්න එතුමාට පුළුවන්කමක් තිබුණේ නැහැ. අරගළකරුවන් ජනාධිපති ලේකම් කාර්යාලය, ජනාධිපති මන්දිරය, අරලියගහ මන්දිරය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය අත්පත් කරගෙන තිබුණා විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවත් වට කරලා තිබුණා. නීතියේ ආධිපත්‍යය කඩාගෙන වැටුණු, ආරක්ෂාව කඩාගෙන වැටුණු පසුබිමක් තමයි මේ රටේ තිබුණේ. එහෙම වෙලාවක එතුමා මේ රට භාරගෙන එක පැත්තකින් ටිකෙන් ටික දේශපාලන ස්ථාවරත්වය ඇති කළා; නීතියේ ආධිපත්‍යය ඇති කළා; ජාතික ආරක්ෂාව තහවුරු කළා. අනෙක් පැත්තෙන් හිර වෙලා, පීඩාවට පත් වෙලා හිටපු ජනතාව ඒ තත්ත්වයෙන් බේරා ගන්න එතුමාට හැකියාව ලැබුණා. ඒ නිසා අප කා තුළත් එතුමා පිළිබඳ ගෞරවයක්, හැඟීමක් තිබෙනවා. අපි ජනාධිපතිවරණයට සූදානම්. ඒ ගැන කලබල වෙන්න ඕනෑ නැහැ. මැතිවරණ කොමිසම විසින් නාම යෝජනා පත්‍ර භාර ගැනීම සම්බන්ධයෙන් දින නියම කරයි. ඒ වෙලාවට අපි සියලුදෙනා ජනාධිපතිවරණය වෙනුවෙන් අපේ අපේක්ෂකයෙක් ඉදිරිපත් කරන බවත්, ඒ අපේක්ෂකයා ජයග්‍රහණය කරවන්න අපට කරන්න පුළුවන් උපරිමය කරන බවත් විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට අපි ආරාධනා කරනවා, ඉදිරි මැතිවරණයට ඉදිරිපත් වෙන්න කියලා. ඒ වාගේම මේ රට කෙටි කාලයක් තුළ ගොඩ ගත්ත ආකාරයට ඉදිරි වසර කිහිපයත් අරගෙන ගිහිල්ලා, රට දියුණු තත්ත්වයට පත් කරන්න අවශ්‍ය ශක්තිය, ධෛර්යය අපි එතුමාට ලබා දෙනවා කියන කාරණයත් මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
(මාණ්පුමිකු පිරමිත්ත පණ්ඩාර තෙන්නකෝන්)
(The Hon. Premitha Bandara Tennakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(මාණ්පුමිකු හෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)

විසින් සිටීර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. K.P.S. KUMARASIRI left the Chair and THE HON. WEERASUMANA WEERASINGHE took the Chair.

[பி.ப. 4.32]

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் சனாதிபதித் தேர்தலை உரிய காலப்பகுதியில் நடத்த வேண்டுமென வலியுறுத்தி, சனாதிபதி வேட்பாளர்களாக வரக்கூடிய கௌரவ அநுர திஸாநாயக்க அவர்களும் கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் சார்பில் அவருடைய கட்சி சார்ந்த கௌரவ லக்ஷ்மன் கிரிஎல்ல அவர்களும் இணைந்து கொண்டுவந்திருக்கின்ற ஒத்திவைப்பு வேளைப் பிரேரணை மீதான விவாதம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது.

எங்களுடைய தமிழ்த் தேசிய மக்கள் முன்னணியின் நிலைப்பாடு என்னவென்றால், மக்களுடைய ஆணை இல்லாமல் அதிகாரத்தில் இருக்கின்ற ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் உடனடியாகத் தேர்தலுக்குச் சென்று, மக்கள் ஆணையைப் பெறுவதற்கான முயற்சியைச் செய்ய வேண்டும் என்பதுதான். உரிய காலப்பகுதியில் இந்தத் தேர்தல் நடைபெற வேண்டும் என்பதும் எக்காரணங்கொண்டும் இது பிற்போடப்படக் கூடாது என்பதும் எங்களுடைய உறுதியான நிலைப்பாடு! அது தொடர்பான மேலதிக விடயங்களுக்குள் செல்வதற்கு முன்னர், வேறு இரண்டு விடயங்கள் தொடர்பாக இங்கு பிரஸ்தாபிக்க விரும்புகின்றேன்.

தற்பொழுது, முல்லைத்தீவு மாவட்டத்தின் கரைதுறைப் பற்றுப் பிரதேச செயலாளர் பிரிவிலுள்ள கொக்குத்தொடுவாய் பிரதேசத்தில் மனிதப் புதைகுழியொன்று தோண்டப்பட்டுக் கொண்டு இருக்கின்றது. அந்த மனிதப் புதைகுழியிலிருந்து இதுவரை 48 உடலங்கள் மீட்கப்பட்டிருக்கின்றன. அவை விடுதலைப் புலிகள் இயக்கப் போராளிகளுடைய உடலங்களாக இருக்குமென நாங்கள் கருதுகின்றோம். அந்த உடலங்கள் எந்தக் காலப்பகுதியில் புதைக்கப்பட்டது என்பது தொடர்பான ஆய்வில் ஈடுபட்டுக் கொண்டு இருக்கின்ற தொல்லியல் பேராசிரியர் ராஜ் சோமதேவா அவர்கள் குறிப்பிட்டிருக்கின்ற கருத்து தமிழ் மக்கள் மத்தியில் மிகப் பெரியதொரு ஏமாற்றத்தை ஏற்படுத்தி இருக்கின்றது. அந்த அகழ்வின்பொழுது கண்டெடுக்கப்பட்டதாகச் சொல்லப்படுகின்ற "Vicks" toffees மற்றும் அந்த உடலங்களிலிருந்த ஆடைகளின் வடிவமைப்பை வைத்து, அவை 1995ஆம் மற்றும் 1996ஆம் ஆண்டு காலப் பகுதியைச் சேர்ந்தவையாக இருக்கலாமெனக் குறிப்பிட்டிருக்கின்றார். "இது தொடர்பாக இராணுவத்தினரிடம் விசாரணை நடத்துவீர்களா?" என ஊடகவியலாளர்கள் OMP தரப்பினரிடம் கேட்டபொழுது, இராணுவத்தினரிடம் மட்டுமல்ல, பல்வேறு தரப்பினரிடமும் விசாரணை நடத்த வேண்டுமெனக் கூறி, அதை மூடிமறைக்கின்ற விதமாக அவர்கள் கருத்துக் கூறியிருக்கின்றார்கள்.

எங்களைப் பொறுத்தவரையில், அந்தப் பிரதேசம் 1984ஆம் ஆண்டிலிருந்து 2012ஆம் ஆண்டு வரைக்கும் முழுமையாக ஸ்ரீ லங்கா இராணுவத்தினரின் கட்டுப்பாட்டில் இருந்த ஒரு பிரதேசமாகும். குறிப்பாக, 1995-1996ஆம் ஆண்டு காலப்பகுதியில் 4ஆவது battalionஐச் சேர்ந்த 'கெமுனு வொச்' அங்கு படைத் தளம் அமைத்திருந்தது. அந்த battalionஇன் கட்டுப்பாட்டில் தான் கொக்குத் தொடுவாய்ப் பகுதி இருந்தது. அதாவது, இந்தப் புதைகுழி இருந்த இடம் 'கெமுனு வொச்'இன் கட்டுப்பாட்டின்கீழ் இருந்த பகுதியாகும். Lieutenant Colonel Rohitha Wickramathilake என்ற தளபதியின் பொறுப்பில் தான் அந்தப் பகுதி இருந்தது. பேராசிரியர் ராஜ் சோமதேவா அவர்களின் கூற்றின்படி பார்த்தால்கூட, அதற்கு இராணுவத்தினர்தான் முழுப் பொறுப்புக் கூற வேண்டும். சரணடைந்த போராளிகளைக் கொலைசெய்து புதைத்திருக்கின்றார்களா? என்பது எங்களுடைய சந்தேகமாகும். அதுமட்டுமல்ல, அதற்குள் 2009இல் சரணடைந்தவர்களைக் கொன்று புதைத்திருக்கிறார்கள் என்பது வலிந்து காணாமலாக்கப்பட்ட உறவுகளுடைய குற்றச்சாட்டாக இருக்கின்றது. இந்த மனித எச்சங்கள் 1995, 1996ஆம் ஆண்டு காலப்பகுதிக்குரியவை என்று கூறுவதன் மூலம் இராணுவத்தினரைப் பாதுகாப்பதற்கான ஒரு முயற்சி மேற்கொள்ளப்படுகின்றது. எனவே, இந்த OMPஇன் கண்காணிப்பில் இடம்பெறுகின்ற இந்த உள்ளக விசாரணைகள் மீது எங்களுக்கு நம்பிக்கையில்லை. எங்களைப் பொறுத்தவரையில், இந்தப் புதைகுழி அகழ்வு தொடர்பான நடவடிக்கைகள் சர்வதேச சமூகத்தின் கண்காணிப்பின்கீழ் சர்வதேச தரப்புகளால் முன்னெடுக்கப்பட வேண்டும். இப்பொழுது இலங்கையிலுள்ள நீதித்துறை, காவல்துறை போன்ற உள்ளகத் தரப்புகளால் முன்னெடுக்கப்படுகின்ற விசாரணைகள் மீது எங்களுக்கு எந்தவித நம்பிக்கையும் இல்லை என்பதைப் பதிவு செய்கின்றேன்.

அண்மையில் மன்னாரில் 'சதொச' கட்டத்துக்குள் மனிதப் புதைகுழி ஒன்று அகழப்பட்டது. அங்கிருந்த ஒரு biscuit packetஐ வைத்து, அது அண்மைய காலப்பகுதியில் புதைக்கப்பட்டதென்று நாங்கள் கூற முற்படும்பொழுது, அவர்கள் அதை ஏற்றுக்கொள்ளத் தயாரில்லை. அது 400 வருடங்களுக்கு முன்னர், 'டச்சு' காலப்பகுதியில் புதைக்கப்பட்டதென்று

[ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා]

சொல்லி, அதனை மூடி மறைக்க முற்படுகின்றார்கள். அதே போல், "Vicks" toffeesஐக் காட்டி, முல்லைத்தீவு, கொக்குத் தொடுவாய் பகுதியிலுள்ள மனித புதைகுழியானது 1995 - 1996ஆம் ஆண்டு காலப்பகுதிக்குரியவை எனச் சொல்ல முற்படுகின்றார்கள். இங்கு நடைபெறுகின்ற இந்த உள்ளக விசாரணைப் பொறிமுறையை எங்களால் ஏற்றுக்கொள்ளவும் முடியாது; நம்பவும் முடியாது. ஆகையால், இது தொடர்பாக சர்வதேச விசாரணை ஒன்று நடத்தப்பட வேண்டுமென நாங்கள் வலியுறுத்துகின்றோம்.

அரசியல் கைதிகளாக இருக்கின்ற 11 பேர் தொடர்ந்தும் சிறைகளில் வாடிக்கொண்டு இருக்கின்றார்கள். மூன்று பேர் விளக்கமறியல் கைதிகளாக இருக்கின்றார்கள். அவர்களுக்குப் பிணை கிடைக்கவிடாமல், அவர்கள்மீது மீண்டும் மீண்டும் புதிதாக வழக்குத் தாக்கல் செய்து, அவர்களைச் சிறைக்குள் தொடர்ந்தும் வைத்திருக்கிறார்கள். எனவே, அவர்களுக்கு உடனடியாகப் பிணை வழங்கப்பட வேண்டும். தீர்ப்பு வழங்கப்பட்டிருக்கின்ற 8 பேரும் உடனடியாக விடுதலை செய்யப்பட வேண்டும். அவர்களுடைய தண்டனைக் காலம் முடிவடைந்துள்ள நிலையிலும், அவர்கள் வேண்டுமென்றே அங்கு தடுத்து வைக்கப்பட்டு இருக்கின்றார்கள். அதே போன்று, கடந்த மார்ச் மாதம் 26ஆம் திகதி பயங்கரவாத தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்ட முன்னாள் போராளியான ஆனந்தவர்ணன் அவர்கள் வழக்குகளுக்கு அழைக்கப்படாமல், வேண்டுமென்றே அடைத்து வைக்கப்பட்டு இருக்கிறார். அவரும் உடனடியாக விடுதலை செய்யப்பட வேண்டுமென வலியுறுத்துகின்றேன்.

இன்றைய தினம் இச்சபையில் நடைபெறுகின்ற இந்த விவாதமானது, ஜனாதிபதித் தேர்தல் உரிய காலத்தில் நடத்தப்பட வேண்டும் என்ற அடிப்படையிலானது. நேற்று முன்தினம் மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் ஜனாதிபதியின் பதவிக் காலம் தொடர்பான அமைச்சரவைத் தீர்மானமானது, இன்று இரண்டு கோடி ரூபாய் செலவை ஏற்படுத்தி, இந்த விவாதம் நடைபெறுவதற்கான சூழலை உருவாக்கியிருக்கின்றது. அவருக்கு அந்தத் துணிச்சலை எது கொடுக்கிறது? இலங்கைத் தீவை மையப்படுத்தி நடைபெறுகின்ற பூகோள ஆதிக்கப் போட்டியில் அவர் இந்திய, மேற்குலக நாடுகளுக்குச் சார்பாகச் செயற்படுகின்ற காரணத்தால், அவரைப் பலப்படுத்துவதற்காக இந்தத் தரப்புகள் வேண்டப்படுகின்ற பொருளாதார உதவிகளைக் கொடுத்து, இந்த நாட்டைப் பலப்படுத்திக்கொண்டு இருக்கின்ற காரணத்தாலும், தன்னைவிட்டால் இந்த நாட்டுக்கு உதவி கிடைக்காதென்ற நம்பிக்கையில் எல்லோரும் வாயைப் பொத்திக்கொண்டு இருப்பார்கள் என்ற காரணத்தினாலும்தான் அவர் ஜனாதிபதியின் பதவிக்காலம் தொடர்பான அரசியலமைப்பு சார்ந்த சர்ச்சை ஒன்றை உருவாக்கி, அது தொடர்பான விடயத்தை வாக்கெடுப்புக்கு விட முற்படுகின்றார். இரகசிய வாக்கெடுப்பு ஒன்றை நடத்தினால், எதிர்காலத்தில் இடம்பெறும் பொதுத் தேர்தலில் வெல்ல முடியாத உறுப்பினர்கள் அதை ஆதரிப்பார்கள் என்பதால் மூன்றில் இரண்டு பெரும்பான்மை வாக்குகளைப் பெற முடியும் என்ற நம்பிக்கையில்தான் அவர் இந்தக் காரியத்தைச் செய்திருக்கின்றார்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
நான் முடிக்கின்றேன். ஒரு நிமிடம் தாருங்கள்!

இங்கு உரையாற்றிய ஆளும் கட்சி, எதிர்க்கட்சியைச் சார்ந்த எந்தவோர் உறுப்பினரும் இந்த நாட்டை முன்னோக்கிக் கொண்டு செல்வதற்கான ஆக்கபூர்வமான எந்தவொரு கருத்தையும் முன்வைக்கவில்லை. இந்த நாட்டில் புரையோடிப் போயிருக்கின்ற இனப் பிரச்சினையைத் தீர்ப்பதற்கு ஒற்றை யாட்சி முறைமை ஒழிக்கப்பட வேண்டுமென்ற கருத்தை துணிந்து சொல்வதற்கு எவருக்கும் முதுகெலும்பில்லை. கௌரவ அநுர திஸாநாயக்க அவர்களுக்கும் இல்லை; கௌரவ சஜித் பிரேமதாஸ அவர்களுக்கும் இல்லை; மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்களுக்கும் இல்லை. கௌரவ தலைமைதாங்கும் உறுப்பினராகிய உங்களிடமும் ஏனையோரிடமும் நான் கேட்டுக்கொள்வது என்னவெனில், ஒற்றையாட்சி முறைமையை ஒழித்து, சமஷ்டி அரசியலமைப்பை கொண்டு வருவதற்கு முயற்சி செய்யுங்கள் என்றுதான். அதன்மூலமாக மட்டும்தான் இந்த நாட்டை முன்னோக்கிக் கொண்டுசெல்ல முடியுமெனக் கூறி, வாய்ப்புக்கு நன்றி கூறி விடைபெறுகிறேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.39]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම අද පාර්ලිමේන්තුවේ කථාවලදී අපට අහන්න ලැබුණේ, ජනාධිපතිවරණය අනිවාර්යයෙන් පවත්වනවා කියන එක. ජනාධිපතිවරණය මේ ඔක්තෝබර් මාසය වෙද්දී, තියන්නේ නැහැ කියන කථාවක් කාගෙන්වත් ඇහුණේ නැහැ. ආණ්ඩු පක්ෂයේ හැම කෙනෙකුම කියනවා ඇහුණේ ජනාධිපතිවරණය පවත්වනවා, අවුරුදු හයකට කල් යන්නේ නැහැ කියන එක. අපි එකඟයි. ප්‍රශ්නය තිබෙන්නේ අධිකරණයට ගිහිල්ලා පොඩි පොඩි ගේම් ගහන කොට. මොකද, අපි දන්නවා නේ, අපේ හිටපු නායකයා ගැන. අපි හොඳට අඳුරනවා නේ. මම හිතන්නේ මේ විවාදය එන්න ප්‍රධාන හේතුවක් වුණේත් ඒකයි.

දැන් ප්‍රශ්නය තිබෙන්නේ ඕක නොවෙයි. අමාත්‍යතුමන්ලා එහෙම කිව්වා, මේ ජනාධිපතිවරණයට එන කාරණා ගැන කථා කරද්දී, දැන් මේ පරණ පක්ෂ ටික ඔක්කෝම කැඩුණා කියලා. එහෙම කැඩිච්ච නිසා දැන් පරණ දේශපාලනය නොවෙයි, අලුත් විධියට දේශපාලනය ගැන හිතලා තමයි අපි ජනාධිපතිතුමාට උද්වු කරන්නේ කියන එක තමයි ඒ ගොල්ලන් කිව්වේ. අපි අහනවා, දැන් පොහොට්ටුව ඇතුළේ කැඩිලාද හැදිලාද, පොහොට්ටුව එකට ඉන්නවාද, ජනාධිපතිතුමා එක්ක පොහොට්ටුවේ සියලුදෙනාම ඉන්නවාද, නැත්නම් පොහොට්ටුවේ කොටසක්ද ජනාධිපතිතුමා එක්ක ඉන්නේ, එහෙම නැත්නම් පොහොට්ටුවෙන් වෙනම අපේක්ෂකයෙක් ජනාධිපතිවරණයට ඉදිරිපත් කරනවාද කියලා. මම ඔය කථාව කිව්වේ වෙන කාරණාවක් නිසා නොවෙයි, පක්ෂ ඔක්කෝම කැඩිලා කියන කථාව කියපු නිසා ඒකට උත්තරයක් හැටියට. කමක් නැහැ, හරි අපි හිතමු, පොහොට්ටුව හොඳට ඉන්නවා, හොඳට ඒ වැඩේ කරනවා කියලා.

දැන් අපට ප්‍රශ්නයක් තිබෙනවා. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගැන පොහොට්ටුවේ අය දැන් වේදිකාවල විතරක් නොවෙයි, හැම තැනකම කොච්චර ප්‍රශංසාත්මකව කථා කරනවාද? කොච්චර ආදරයෙන්, ගෞරවයෙන් කථා කරනවාද? ඒ විතරක් නොවෙයි. එතුමා ගැන කරන වර්ණනාව, ඊළඟට, එතුමා මේ සේවාව කරන්න යන වැඩසටහන ගැන කථා කරනවා. මේ රටේ බරපතළ ප්‍රශ්නයක් වෙච්ච වෙලාවක, පොහොට්ටුවේ ආණ්ඩුව කඩා වටලා ජනතාව විනාශ කරපු වෙලාවේ සජිත් ප්‍රේමදාස මැතිතුමා රට භාර ගත්තේ නැහැ කියලා කථාවක් කිව්වා. හැබැයි, භාර ගත්තේ නැහැ කියන කථාව දැන් කියන්න වැඩක් නැහැ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒක භාර ගත්තා නේ. එතුමා භාරගෙන මේක කරගෙන ආවා. දැන් සජිත් ප්‍රේමදාස මැතිතුමා ගිහිල්ලා, රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ජනාධිපතිකමෙන් අයින් වෙන්න කියලා ජනාධිපතිකම ඉල්ලන්නේ නැහැ නේ. එහෙම නැත්නම් ඒ ආණ්ඩුවේ අගමැතිකම ඉල්ලන්නේ නැහැ නේ. දැන් පැහැදිලිව ඉල්ලන්නේ, ප්‍රජාතන්ත්‍රවාදී විධියට මැතිවරණයක් පවත්වන්න, ජනතාවගේ පරමාධිපත්‍ය බලයෙන්, ජනතාවගේ ඡන්දයෙන් ජයග්‍රහණය කරලා එනවා කියලා. නමුත් මෙතුමන්ලා වේදිකාවල, හැම තැනකම ගිහිල්ලා කථා කරන්නේ, සජිත් ප්‍රේමදාස මැතිතුමා ගිහිල්ලා වත්මන් ජනාධිපතිවරයාගේ ජනාධිපති ධුරය ඉල්ලනවා වාගෙයි. එහෙම නැත්නම් අගමැති ධුරය ඉල්ලනවා වාගෙයි. දැන් එහෙම එකක් ඉල්ලන්නේ නැහැ. ඒ වෙලාවේ නිකම් දෙනකොට ගත්තේ නැහැ. ඔව්, අපි නිකම් දෙනකොට ගන්නේ නැහැ. මොකද, අපි තරගයට ලැහැස්තියි. ජනතාව අතරට ගිහිල්ලා ජනතාවගේ ඡන්දයෙන් එන්න සූදානම්. ඒ නිසා තමයි ඒ කථාව කිව්වේ.

තමුන්නාන්සේලා සියලුදෙනාට අපි පැහැදිලිව කියන්නේ නිවැරදි ආකාරයෙන්, ව්‍යවස්ථාවේ තිබෙන විධියට ඡන්දය පවත්වන්න කියලායි. ඡන්දය පවත්වලා බලමු, කවුද දිනන්නේ කියලා. එච්චරයි කරන්න තිබෙන්නේ. මේකට අර ගේම්, මේ ගේම් ගහලා එහෙම නැත්නම් ව්‍යවස්ථාවේ සමහර දේවල් වෙනස් කරන්න කියලා කැබිනට් එකට දාලා පාර්ලිමේන්තුවට එවන්න අවශ්‍ය නැහැ. මේ වෙලාවේ වෙන ගේමක් ගහන්න නැත්නම් එහෙම කරන්න අවශ්‍ය නැහැ. හැබැයි, මේ ගොල්ලන් කියනවා නම්, එහෙම නැහැ; අපි ගේමක් ගහන්නේ නැහැ; මේක දැම්මේ මේ ව්‍යවස්ථාව වෙනස් කරන්න වෙන ආකාරයකින් ඕනෑ කියලා, එහෙම නම් ඒක ප්‍රශ්නයක් නැහැ. අපි ඒකට සූදානම්.

අපි දන්නවා, ඊයේ පෙරේදාත් වාඩි වෙලා උදේ කෑම ගනිමින් සිටි අවස්ථාවක මහින්ද රාජපක්ෂ මැතිතුමාත්, ජනාධිපතිතුමාත් අතර වෙච්ච සංවාදය. ඒ ගැන තොරතුරු අපි ළඟ තිබෙනවා. ඒ වෙලාවේ මොනවාද කථා කළේ කියලා අපි ළඟ තොරතුරු තිබෙනවා. අපටත් එක පැත්තකින් ප්‍රශ්නයක්, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගිහිල්ලා මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක වාඩි වෙලා තමුන්ට සහයෝගය දෙන්න කියලා ඉල්ලන්න තරම් කොහොමද කට ඇරුණේ කියන එක. ඒ වාගේම රාජපක්ෂ පවුලත් එක්ක ඉන්න පොහොට්ටුව, රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ උතුම්ම පුද්ගලයා කියලා නම් කරලා, නැවත වතාවක් ජනාධිපතිකමට එන්න කියලා කියන්න තරම් කට ඇරුණේ කොහොමද කියන එක විශේෂයෙන්ම පක්ෂයක් හැටියට නොවෙයි, පුරවැසියෙක් හැටියට මටත් ප්‍රශ්නයක්. මොකද, අපි එදා දැකපු දේවල් සහ අද සිද්ධ වෙන දේවල් අතර තිබෙන වෙනස දැක්කාම එක පැත්තකින් ලජ්ජා හිතෙනවා, මන්ත්‍රීවරයෙක් හැටියට ඉන්න එක ගැන.

බොහොම ස්තුතියි, ඔබතුමාට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චාමර සම්පත් දසනායක රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.44]

ගරු චාමර සම්පත් දසනායක මහතා (ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க - ஆரம்பக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Chamara Sampath Dasanayake - State Minister of Primary Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාගේ ධුර කාලය වැඩි කරනවා, එහෙම නැත්නම් මේ වෙලාවේ ඡන්දය පවත්වන්නේ නැහැ කියනවා නම් ඒක ඔළුව හොඳ නැති කෙනෙක් කියන කථාවක්. මම නම් කියනවා, අනිවාර්යයෙන් ඡන්දය තියන්න කියලා. ඒ මොකද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගමේ භාෂාවෙන් "මස්තබාල්දු" කියලා වචනයක් තිබෙනවා. ජනාධිපතිතුමාට මස්තබාල්දුව තිබුණේ විපක්ෂය පැත්තේ කට්ටියත් එක්ක ඉන්න කොට. එතකොට හැම දාම පැරදුණා. ඇයි, ඒ? මස්තය ගහලායි තිබුණේ. මොකද, ඔය විපක්ෂය පැත්තේ කට්ටිය ළඟ ඉන්න කල් එතුමාට මස්තබාල්දුව තිබුණා. අන්තිමට එක ආසනයකටම වැටුණා. දැන් කිසිම මස්තබාල්දුවක් නැහැ. ඔය විපක්ෂය පැත්තේ ලක්ෂ්මන් කිරිඇල්ලයි, තිස්ස අත්තනායකයි ඉන්න කල් ඔය පැත්තට මස්තබාල්දුව ගහනවාමයි. ඔය පැත්ත අනිවාර්යයෙන් දිනන්නේ නැත. අපි ඒක දන්නවා. ඒ නිසා ඡන්දය කලින් තියාගන්න තමයි අපටත් වුවමනා වෙලා තිබෙන්නේ. ඔය මස්තබාල්දුවොත් එක්ක සිටියදී එතුමා පැරදුණා.

බලන්න, එතුමා ආවේ එක ආසනයකින්. ඒ ආවේත් අවුරුද්දකට පමණ පසුවයි. ඇවිල්ලා මේ සභා ගර්භයේ වාඩි වුණා. එතුමා එක ආසනයක් අරගෙන ඇවිත් ඔය පැත්තේ අන්න අතැන තිබෙන ආසනයේ තමයි වාඩි වුණේ. අන්තිමට මොකද වුණේ? අගමැතිවරයා වෙලා, ඡන්ද 134ක් ලබා ගෙන ජනාධිපතිවරයාත් වුණා. එතුමා විපක්ෂය පැත්තේ හිටියා නම් මොකද වෙන්නේ? විපක්ෂය පැත්තේ හිටපු හැම දාම පරාදයි; 1999දී පරාදයි, 2005දී පරාදයි, 2010දී පරාදයි. 2010දී ජනාධිපති අපේක්ෂකකම ෆොන්සේකාට දුන්නා. ෆොන්සේකාගේ මස්තබාල්දුවට ෆොන්සේකාත් පැරදුණා. එහෙම නේ, වුණේ. සජිත්ට දුන්නා, සජිතුත් පරාදයි. ඒ ඔක්කොම පරාද වුණා. එහෙම නේ වුණේ. නමුත්, අපේ මේ ඉන්න කොල්ලන්ගේ වාසනා මහිමය නිසා, අපේ පැත්තේ අපිත් එක්ක ඉන්න නිසා, ජනාධිපතිතුමාට ඡන්දය කල් දමාගන්න ඕනෑ නැහැ. ඡන්දය කලින් පවත්වා ගන්නයි අපට ඕනෑ. *[බාධා කිරීමක්]* ඡන්දය කල් දමන්න අපට කිසිම වුවමනාවක් නැහැ. *[බාධා කිරීමක්]* ඡන්දය කල් දමන්න වුවමනාව තිබෙන්නේ ඉදුනිල් මන්ත්‍රීතුමන්ලාට. මොකද, එතුමන්ලා දන්නවා- *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ නම කිව්වා කියලා නැඟිටින්න හදන්න එපා. ඔබතුමා කට වහගෙන හිටියොත්, මම නම නොකියා ඉන්නවා. මම කියන්නේ අපට ඡන්දය කල් දැමීමේ කිසිම වුවමනාවක් නැහැ කියලායි. මොකද, මේ ගොල්ලන් ඉන්න කල් බඩුම තමයි ඒ ගොල්ලන්ට. මේ ගොල්ලන් ළඟ ඉන්නකල් රනිල් මහත්තයාට බඩු හම්බ වුණා. නමුත් අපට විශ්වාසයක් තිබෙනවා, අපේ පැත්තේ ඉන්න කල් එතුමා ජයග්‍රහණය කරන බවට. මොකද, එතුමා එක ආසනයක් ලැබිලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ජනාධිපතිවරයා වෙලා මේ ටික කාලය තුළ මේ රටේ මිනිසුන්ට ලොකු සේවයක් කළා.

මේ රටේ හැම මිනිහාම වාගේ හිතාගෙන ඉන්නේ මොකක්ද? අරයාගේ රුස්වීමටත් 10,000යි, මෙයාගේ රුස්වීමටත් 10,000යි, තව කවුරු හරි රුස්වීමක් තිබ්බොත් එතැනත් 10,000යි. ඒ විධියට

[ගරු වාමර සම්පත් දසනායක මහතා]

සෙනඟ ආවාම, සෙනඟ දැකලා චූන් වුණාම ඔක්කොම හිතාගෙන ඉන්නේ බඩුම තමයි කියලා. නමුත්, බස් දමලා සෙනඟ ඇදපු බව අපි දන්නවා. 14වන දා මගේ රැස්වීමක් පැවැත්වෙනවා, බදුල්ලේ. අපිත් ගේනවා, 20,000ක්. අපි සන්ධානයේ රැස්වීමක් පවත්වනවා, බදුල්ලේ. නිමල් ඇමතිතුමායි, මමයි ඒක කරන්නේ. අපි 20,000ක් ගෙනැල්ලා පෙන්වනවා. අපටත් සෙනඟ ඉන්නවා. ඉතින් ඔක්කොම වාගේ හිතාගෙන ඉන්නේ සෙනඟ ඉන්න පළියට ජනාධිපති වෙන්න පුළුවන් කියලායි. එහෙම සෙනඟ ඉන්න පළියට ජනාධිපති වෙන්න බැහැ. මේ රටේ බුලත් කන, කොණ්ඩය බැඳපු අයියලා නැඟැ දැන්. මිනිස්සු ඡන්දය වෙලාවට නියම විධියට ඡන්දය දෙයි.

ජනතාවගෙන් සියයට 50ක්, 60ක් ඡන්දය ගැන කථා කරන්නේ නැහැ. ජනතාවගෙන් සියයට 60ක් පමණ තවම ඒ ගැන තීරණය කරලා නැහැ. කාටද ඡන්දය දෙන්නේ කියන එක මිනිසුන්ගේ හදවත් තුළ තිබෙනවා. පසුගිය කාලයේ විඳපු දුක් මිනිසුන්ට මතකයි. විදුලිය නැතුව දුක් විඳපු හැටි මිනිස්සු දන්නවා. ගෑස් නැතුව දුක් විඳපු හැටි මිනිස්සු දන්නවා. මිනිස්සු අපට ඒ ගැන කියනවා. අපි ගමට ගියාම, පොහොර නැතුව හිටපු තේ ගොවියා ඒ ගැන අපට කියනවා; අල ගොවියා කියනවා; එළවලු ගොවියා කියනවා. කැප්පෙටිපොල වාගේ නගරයකට ගිහින් බලන්න. පර්සි සමරවීර කියන්නේ වැලිමඩ හොල්ලාගෙන හිටපු මිනිහෙක්; හිටපු මහ ඇමතිවරයෙක්. පර්සි සමරවීරගේ නිවස පිටුපස නිවසේ ඉන්න හොඳම ශ්‍රී ලංකාකාරයා කියන්නේ මොකක්ද දන්නවාද? ඊයේ පෙරේදා මම එයාගෙන් ඇහුවා, "මාමා මේ සැරේ මොකද කරන්නේ?" කියලා. එතකොට කිව්වා, "වෙන කාට දෙන්නද, බං. මේ මිනිහා නේ මේක ගොඩ දැම්මේ. මේ මිනිහාට දෙන්නේ නැතුව, කාට දෙන්න ද? මේ මිනිහටම දීලා නිකම් ඉමු බං" කියලා. වමේ හොඳ මිනිස්සු, පර්සි සමරවීරලාටවත් ඡන්දය දීපු නැති, 1989 අතුරු මැතිවරණයේදිවත් ඡන්දය දීපු නැති මිනිස්සු එහෙම කියනවා. ඒ නිසා සෙනඟ ගෙනැල්ලා, සෙනඟ ටිකක් හිටියා කියලා චූන් වෙලා කවුරුවත් හිතන්න එපා, "දැන් මම ජනාධිපති" කියලා. සමහරු සූට් මහගෙන ඉන්නවා. එක පැත්තකින් එක්කෙනෙක් එකක් කියන කොට, අනෙක් එක්කෙනා තව එකක් කියනවා. මම අද උදේ බලාගෙනයි එක්කෙනෙක් කියනවා, "හරි, හරි අපි ඒ නීතිය වෙනස් කරනවා" කියලා. ජනාධිපති වෙන්නත් ඉස්සෙල්ලා නීති වෙනස් කරන්නත් බලාගෙන ඉන්නවා. ඒවා බයිලා.

මම එක දෙයක් කියන්න කැමැතියි. හෙට වුණත් ඡන්දය පවත්වන්න කියලායි අපි නම් ජනාධිපතිතුමාට කියන්නේ. මොකද ඒ? බලන්න, දැන් ජනාධිපතිතුමාගේ මුහුණ දිහා. එතුමාගේ මුහුණ පිරිසිදු වෙලා, ලස්සන වෙලා. ඔය පැත්තේ සිටිද්දී නේ මස්තබාල්දුව තිබුණේ. දැන් එහෙම නැහැ. දැන් එතුමා අනිවාර්යයෙන්ම දිනනවා.

ලබන අවුරුද්දේ ඡන්දය පවත්වන්න අපට බැහැ. හේතුව මේකයි. දැන් ජනාධිපතිතුමාගේ කාලය හොඳයි. ඔක්කොම හොඳ තත්ත්වයේ තිබෙන වෙලාවක් මේක. ඒ නිසා මේ වෙලාවේ ඡන්දය තියන්න ඕනෑ. මොකද, මේ වෙලාවේ විපක්ෂ නායකතුමාගේ ග්‍රහයා හොඳ නැහැ. ලබන අවුරුද්දට පස්සේ අවුරුද්දේ ලූ, එතුමාගේ ග්‍රහයා හොඳ වෙන්නේ. ඊට කලින් අපි ඡන්දය තියන්න ඕනෑ.

දැන් එතුමාගේ ග්‍රහයා නීච වෙලායි තිබෙන්නේ. ග්‍රහයා නීච වෙලා තිබෙන නිසා ඡන්දය කලින් තියා ගන්න අපට වුවමනාමයි. කවුරු බැහැ කිව්වත්, අපි ඡන්දය තියනවා. ඔබතුමන්ලා බය නැතුව ඉන්න; සූදානම් වෙන්න. දැන්මම ලැහැස්ති වෙන්න. ඔබතුමන්ලා සූදානම් වෙන්න. අපි ඡන්දය තියනවා. අපි දිනලා පෙන්නන්නම්.

මම එක කාරණයක් කියනවා. තියපු එක ඡන්දයක්වත් අපි පැරදිලා නැහැ. පසු ගිය හැම ජනාධිපතිවරණයකින්ම අපි ජයග්‍රහණය කරලා තිබෙනවා. ඒ නිසා මෙවරත් අපට විශ්වාසයක් තිබෙනවා. පොහොට්ටුව කැඩිලා ද, අරකද, මේකද කියලා කැඩිච්ච ඒවා ගැන ඔයගොල්ලන් හොයන්න එපා. කැඩිච්ච ඒවා අපි එකතු කර ගන්නම්. ඔයගොල්ලන්ට වැඩක් නැහැ නේ, අපේ කැඩෙන ඒවා, බිඳෙන ඒවා. අපි ඒවා හදා ගන්නම්. ඔයගොල්ලන්, ඔයගොල්ලන්ගේ වැඩේ කරන්න. කැඩිච්ච ඒවාට ඇඟිලි ගහන්න එන්න එපා. අපේ කැඩිච්ච ඒවා අපි හදා ගන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීති උපදේශකලා, ඔස්තාර්ලා, විශේෂඥයන්, ව්‍යවස්ථා ඔස්තාර්ලා ඉන්නවා නේ. ව්‍යවස්ථා ඔස්තාර්ලා මොනවා කිව්වත්, මේ ව්‍යවස්ථාවේ හිලක් තිබෙනවා. මොකක්ද ඒ හිල? දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ආදේශ කරපු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (2) ව්‍යවස්ථාවෙන් එකක් කියලා තිබෙනවා; 83 (ආ) ව්‍යවස්ථාවේ තවත් එකක් කියලා තිබෙනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ආදේශ කරපු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (2) ව්‍යවස්ථාවෙන් කියා තිබෙනවා, ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු පහයි කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 (ආ) ව්‍යවස්ථාවෙන් කියනවා, "සාවුරුද්දක්..." කියලා. එකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තැන් දෙකක කතන්දර දෙකක් ලියා තිබෙනවා. මේවා, ඔස්තාර්ලා හදපු ව්‍යවස්ථා. අපි නම් ඒවා දන්නේ නැහැ. ඔස්තාර්ලා හදපු මේ ව්‍යවස්ථාවේ එක් තැනක කියනවා, ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු පහයි කියලා. තව තැනක "සාවුරුද්දක්..." කියලා තිබෙනවා. ව්‍යවස්ථා දෙකක දෙකක් කියනවා. 83 (ආ) ව්‍යවස්ථාවෙන් එකක් කියනවා; 30 (2) ව්‍යවස්ථාවෙන් තවත් එකක් කියනවා. මා හිතන්නේ ඒ නිසා තමයි ජනාධිපතිතුමාට මේ කාරණය කැබිනට් මණ්ඩලයට දාන්න වෙලා තිබෙන්නේ. දැන් විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතත් ගේන්න වෙනවා. මොකද, මේකේ තිබෙන්නේ කතන්දර දෙකක් නේ. 30 (2) ව්‍යවස්ථාවේ එක කතන්දරයක් තිබෙනවා; 83 (ආ) ව්‍යවස්ථාවේ තවත් කතන්දරයක් තිබෙනවා. ඒ නිසා මා හිතන්නේ, විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගේන්න වෙයි කියලායි. විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා 30 (2) ව්‍යවස්ථාවේයි, 83 (ආ) ව්‍යවස්ථාවේයි සඳහන් කාල සීමා දෙක එකක් කරලා, ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු පහකට අඩු කරලා ඡන්දය තියන්න වෙනවා. ඒකට තමයි ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයට දැන් ඒ කාරණය ගෙනිහින් තිබෙන්නේ. විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගේන්න වෙනවා. ඉදුනිල් මන්ත්‍රීතුමනි, කැමැති නම් අර විධියටත් යන්න පුළුවන්. බැරි නම් පහටත් යන්න පුළුවන්. ඒ සඳහා විපක්ෂයටත් අයිතියක් තිබෙනවා, ආණ්ඩු පක්ෂයටත් අයිතියක් තිබෙනවා. විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත අනිවාර්යයෙන් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ව්‍යවස්ථාවේ ඉහත කී කාල සීමා දෙක එකක් කරලා, එය එකක් හැටියට තේරුම් ගන්න වෙනවා. එහෙම නැත්නම් මාර වැඩක් නේ වෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එක තැනක එක කථාවක්, තව තැනක තව කථාවක්. දෙවිධියක් තිබෙනවා.

මට මේ කථාව ආරංචි වුණාට පස්සේ අපේ බණ්ඩාරවෙල උසාවියේ ඉන්න ප්‍රසිද්ධ, පැරණි නීතිඥ මහත්මයෙකුගෙන් මම මේ ගැන ඇහුවා. එතුමා මට කථා කරලා කිව්වා, මේකේ පොඩි ප්‍රශ්නයක් තිබෙනවා, ව්‍යවස්ථා දෙකකින් එකිනෙකට වෙනස් - පරස්පර විරෝධී- කාරණා දෙකක් කියැවෙනවා කියලා.

අපි ඡන්දයට නම් බය නැහැ. මොකද, ඔය එහා පැත්තේ ඉන්න මුහුණු ටික දිහා දැක්කාම අපට කිසිම බයක් නැහැ. බඩුම තමයි. ඒ ගොල්ලන් ඉන්නකල්ම රනිල් වික්‍රමසිංහ මහත්මයාට දිනන්න බැරි වුණා. රනිල් වික්‍රමසිංහ මහත්මයා පාර්ලිමේන්තුවට ආපු දවසේම මම තමයි අත් පොඩි ගහලා එතුමාව පිළිගත්තේ. ඔබතුමන්ලාත් ඒක දකින්න ඇති. ඉතින් බලන්නකෝ, අප ගාවින් ගෑවිලා ගියත් ඇති නේ. එතුමා අගමැතිවරයා වුණා; ජනාධිපතිවරයාත් වුණා. ඔයගොල්ලන්ගෙ ගාවින් ගෑවිලා ගිහිල්ලා නොවෙයි, ඔයගොල්ලන්ගෙ ගෙවල්වල නිදාගෙන හිටියත් - ඔයගොල්ලෝ එක්ක ඉන්න කල්- ජනාධිපතිතුමාට මොනවත් කර ගන්න බැරි වුණා නේ. බලන්න අපි ළඟට ආවාට පස්සේ මොකද වුණේ කියලා. මස්තබාල්ලුව තියෙන කල් හරි යන්නේ නැහැ. මස්තය ගැහුවොත් ගැහුවාම තමයි.

අපේ ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳ වැදගත් මනුස්සයෙක්, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් බව මම දන්නවා. ඔබතුමාට මම කවදත් ගරු කරනවා. ඔබතුමා කල්පනා කර කර ඉන්න එපා. ඔබතුමාට තව කාලය තිබෙනවා. ඔබතුමා හොඳ මනුස්සයෙක්. ඔබතුමා ඔතැනම වැටිලා ඉන්න එපා.

මම නම් කියන්නේ, මේ ඡන්දය අනිවාර්යයෙන්, කලින්ම තියන්න ඕනෑ කියලායි. මොකද, මේ මස්තබාල්ලු කට්ටියත් එක්ක ඉඳලා රනිල් වික්‍රමසිංහ මැතිතුමාට කවදාවත් දිනන්න බැරි වුණා. එතුමා හැමදාම පැරදුණා. ඊට පස්සේ තමයි එතුමා අපේක්ෂකත්වය ෆොන්සේකා මහත්තයාට, සිරිසේන මහත්තයාට දුන්නේ. නමුත් දැන් බලන්න. දැන් කිසිම ප්‍රශ්නයක් නැහැ නේ. ඔයගොල්ලන් මහන්සි වෙලා 2015දී ජනාධිපති කෙනෙක් පත් කර ගත්තා. එහෙම කරලා ඔයගොල්ලන්ට රට කරගෙන යන්න පුළුවන් වුණා ද? අගමැති එක පැත්තකට ඇද්දා, ජනාධිපති තව පැත්තකට ඇද්දා. අපේ ආණ්ඩුව බලන්න, මත දෙකක හිටපු දිනේෂ් ගුණවර්ධන මැතිතුමායි, රනිල් වික්‍රමසිංහ මැතිතුමායි එක මතයක දැන් යන්නේ කොහොමද කියලා බලන්න. අගමැතිවරයායි, ජනාධිපතිවරයායි නියමෙට යනවා බැලන්ස් එකේ. එහෙම බැලන්ස් එකේ යන නිසා තමයි අද රට ගොඩ යන්නේ. අගමැති එක පැත්තකටත් ජනාධිපති තව පැත්තකටත් අදින්නේ නැහැ.

පසුගිය කාලයේ ඔයගොල්ලන්ගේ ආණ්ඩුවේ අගමැති එක පැත්තකට යනවා, ජනාධිපති තවත් පැත්තකට යනවා. ඊට පස්සේ මොකද වුණේ? ආණ්ඩුව කඩාගෙන වැටුණා, රටේ ආර්ථිකය කඩාගෙන වැටුණා. නමුත් දැන් එහෙම නැහැ. දැන් නියම විධියට වැඩේ යනවා. ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ ජනාධිපතිතුමා ගෙනියනවා. අගමැතිතුමාගේ වැඩ පිළිවෙළ අගමැතිතුමා ගෙනියනවා. රටේ තිබුණු ප්‍රශ්න විසඳෙනවා. ඒ වාගේම රටේ මිනිස්සුන්ගේ ප්‍රශ්න විසඳිලා තිබෙනවා. ඩොලර් එක අඩු වෙනවා. රටේ පොහොර තිබෙනවා, ඕනෑ තරම් තෙල් තිබෙනවා. වාහනයකට ගිය ගමන් ගහන්න තෙල් තිබෙනවා. ඉතින්, දැන් තවත් මොනවාද අඩු? දැන්, ඕනෑ තරම් ගෑස් තිබෙනවා. ගෑස්වල මිල මාසයෙන් මාසයට අඩු වෙනවා. විදුලි බිල අඩු වෙනවා. තිබුණු ප්‍රශ්න දැන් විසඳාගෙන යනවා. තව අවුරුද්දක් දීලා බලන්නකෝ මොකද වෙන්නේ කියලා. ඉතිරි අවුරුදු පහේදී ජනාධිපතිතුමා මේ රට හොඳ තැනක නවත්වයි කියලා අපට විශ්වාසයක් තිබෙනවා. මේ රට නවත්වන්නේ, 2015ට කලින් තිබුණු රට බවට පත් කරලා බව මේ රටේ ජනතාවටත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් අපි කියන්න ඕනෑ. ඔයගොල්ලන්ට තවත් කල් තිබෙනවා. හැලිච්ච හාල් කැලි ටිකක් අරගෙන තමයි ඔයගොල්ලෝ මෙහේ ඉඳලා එහෙට ගියේ. මෙහේ ඉඳලා ගිය කට්ටිය දැන් එහේ. ඒගොල්ලෝ ගත්තා කියලා ඔය වැඩේ කරන්න බැහැ. ඒ නිසා ඒක ගණන් ගන්න එපා. අපි ඡන්දයට භය නැහැ. ඡන්දය පවත්වන්න කියලා අපි ජනාධිපතිතුමාට යෝජනා කරනවා. කවුරු මොනවා කිව්වත් මේ ජනාධිපතිවරණය අපි පවත්වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.56]

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

අපි අද කථා කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ පවත්වන ජනාධිපතිවරණයක් ගැනයි. ජනතාවට ඡන්ද අයිතිය තිබෙනවා. නිසි කාලයට, වෙලාවට ඡන්දය පවත්වන්න ඕනෑ. ඒක අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්. ජනාධිපතිවරණයක් කියන්නේ ගල උඩ සටහනක්. ඒ ගල උඩ සටන ජයග්‍රහණය කරන්න නම් ඒ දිනන අපේක්ෂකයා 50.1ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගන්න ඕනෑ. එතකොට අනෙකුත් අපේක්ෂකයන්ට -දිනන අපේක්ෂකයා හැර- පැරදිලා ගෙදර යන්න වෙනවා. ඒකයි ගල උඩ සටනක් කියන්නේ. ඒ වාගේම හරි වෙලාවට ඡන්දය පවත්වන්නත් ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1988 ජනාධිපතිවරණය වෙලාවේදී කට කථාවක් ගියා, නැවත වරක් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්න පුළුවන් කියලා. මක්නිසාද, 1977 දී ව්‍යවස්ථාව වෙනස් කරලා විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වා දීමත් එක්ක තමයි -ඡන්දයකින් නොවෙයි.- 1978දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා බවට පත් වුණේ. නමුත් 1988දී එක්සත් ජාතික පක්ෂය ඇතුළේ ම රාවයක්, කට කථාවක් පැතිරුණා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා දෙවතාවක් ඡන්දය ඉල්ලපු නැති නිසා 1988 ජනාධිපතිවරණයටත් එතුමාට ඉදිරිපත් වෙන්න පුළුවන් කියලා. හැබැයි, එදා ප්‍රජාතන්ත්‍රවාදය ජය ගත්තා. එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය සහ පාර්ලිමේන්තු කණ්ඩායමේදී රණසිංහ ප්‍රේමදාස මැතිතුමා තමයි ඊළඟ ජනාධිපති අපේක්ෂකයා හැටියට යෝජනා කළේ. මේ රටේ හැම ජනාධිපතිවරණයක්ම හරි වෙලාවට පවත්වා තිබෙනවා. දැන් තමයි යම්කිසි ගැටලුවක් තිබෙනවා කියලා කියන්නේ. අපි රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගැන දන්නා නිසා, ජනාධිපතිවරණය කල් දමා ගත්තොත් හොඳයි කියන මතය, ඒ සැකය ඇතිවෙලා තිබෙන්නේ විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්තුමා කරන ලද ප්‍රකාශය අනුවයි. 1982 දී ජනාධිපතිවරණයක් පැවැත්වුවා. එතකොට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ජයග්‍රහණය කළා. එතුමා 52.91ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තා. මම පැවසූ පරිදි 1988දී රණසිංහ ප්‍රේමදාස මැතිතුමා 50.43ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තා. 1994දී මගේ පියාගේ ඝාතනයෙන් පස්සේ, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය 62.28ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තා. 1999 දී චන්ද්‍රිකා මැතිනිය 51.12ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තා. 2005 දී මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති අපේක්ෂකයා හැටියට 50.29ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තා. නැවත වරක් යුද්ධයේ ජයග්‍රහණයත් එක්ක එතුමා 2010දී 57.88ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තා.

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා යහ පාලන ආණ්ඩුව හදන්න 2015දී 51.28ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 2019දී හැටනව ලක්ෂයක් ඡන්ද ලබා ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැමැතියි සොක්‍රටීස් කියපු

[ගරු මයන්ත දිසානායක මහතා]

ප්‍රකාශයකින් මගේ කථාව අවසන් කරන්න. මම ප්‍රජාතන්ත්‍රවාදයට ආදරෙයි. මම ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන තරුණ මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම, මේ රටේ අනිවාර්යයෙන්ම ඡන්දයකින් තමයි, ජනතාවගේ ඡන්ද බලයෙන් තමයි මේ රටේ ආණ්ඩු පත් කරගන්න ඕනෑ කියා මම හිතනවා. හැබැයි, සොක්‍රටීස්ට තිබුණු අදහසක් මම කියන්නම්. Socrates said, "The poor will want the wealth of the rich, and democracy will give it to them. Young people will want to be respected as the elderly, and democracy will give it to them. Women will want to be like men, and democracy will give it to them. Foreigners will want the rights of the natives, and democracy will give it to them. Thieves and fraudsters will want important government functions, and democracy will give it to them. And at that time, when thieves and fraudsters finally and democratically take authority, because criminals and evildoers want power, there will be worse dictatorship than in the time of any monarchy or oligarchy." සොක්‍රටීස් මේක කිව්වේ, ඇත්තෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය කියන දේ ගැන ජනතාව කල්පනා කරලා, බුද්ධිමත් තීන්දුවක් ගන්න ඕනෑ නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ජනාධිපතිවරණයේදී ජනතාවට නැවත වරක් අයිතියක් ලැබෙනවා බුද්ධිමත් තීන්දුවක් ගන්න. බුද්ධිමත් තීන්දුවක් ගත්තොත් තමයි මේ රටේ ජනතාවට ඊළඟ අවුරුදු ගණනේ මේ රටේ රාජ්‍ය නායකයා කවුද කියලා තීන්දු කරලා නිවැරදි පාලනයක් ඇති කරගෙන මේ රටේ දේශපාලන ස්ථාවරත්වය, ආර්ථික ස්ථාවරත්වය, සමාජීය ස්ථාවරත්වය ඇති කරගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා මම මේ අවස්ථාවේදී මේ රටේ ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, විශේෂයෙන්ම තව මාස දෙකකින් ජනාධිපතිවරණය පවත්වන අවස්ථාවේදී අනිවාර්යයෙන්ම බුද්ධිමත් තීන්දුවක් ගන්න කියලා. බුද්ධිමත් තීන්දුවක් අරගෙන හොඳ කණ්ඩායමක් ඉන්න පාලකයෙක් පත් කරගන්න. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහතුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.01]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි හරි අපූරු දෙයක් දකිනවා. මුළු ආණ්ඩු පක්ෂයෙන්ම රනිල් වික්‍රමසිංහ මැතිතුමා සෝදන්න ඉදිරිපත් වෙලා තිබුණේ කථිකයින් නවදෙනායි. ඒ කථිකයින් නවදෙනාත් විනාඩි 15, 20, 25, 30 වාගේ මහා දැවැන්ත වේලාවල් අරගෙන කථා කළා. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාව සෝදන්න ඉදිරිපත් කළා කියන කථික ප්‍රමාණයෙන් අපට බලාගන්න පුළුවන් වර්තමාන ජනාධිපතිවරයාට මොකක්ද ඒ ගොල්ලන්ගේ තිබෙන සැලකීම කියලා. රාජපක්ෂ කඳවුර විශ්වාස කරන, රාජපක්ෂ කඳවුර පිටුපස යන එක මන්ත්‍රීවරයෙක් මේ ලැයිස්තුවේ නැහැ. මේ ලැයිස්තුවේ අඩුපාඩු පුරවන්න තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයාට අන්ධ වෙලා ඉන්න චාමර සම්පත් දසනායකලා වාගේ අය හදිසියේ ගෙන්වලා කථාවක් කරන්න ඉඩක් ලබා දුන්නේ. එහෙම කළේ මේ තිබෙන රික්තකය නිසායි. චාමර සම්පත් දසනායක මහත්මයාගේ නම අද කථික ලැයිස්තුවේ නැහැ. එතකොට මේ ලැයිස්තුවේ අඩුපාඩුව මකන්න තමයි චාමර සම්පත් දසනායකලා වාගේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ගෝලයෝ ටික ගෙන්වලා ඒ අවස්ථාව දුන්නේ කියන එක මම මුලින්ම කියන්න කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜகத் சமரவிக்ரம அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. WEERASUMANA WEERASINGHE left the Chair, and THE HON. JAGATH SAMARAWICKRAMA took the Chair.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ඊළඟට, චාමර සම්පත් දසනායක මැතිතුමාත් ලොකු කථාවක් කිව්වා. එතුමා මස්තයක් ගැන කිව්වා; මස්තබාල්දුවක් ගැන කථා කළා. මම දන්නා හැටියට ඔය දෙගොල්ලන්ම මස්ත වෙලා තමයි හිටියේ. රනිල් වික්‍රමසිංහ මහත්මයාත් මස්තබාල්දු වෙලා, චප්පවොරොස් වෙලා, අන්දකුරුස් වෙලා හිටපු වෙලාවක්. චප්ප චකිරි වෙලා, අන්දකුරුස් වෙලා, චප්පවොරොස් වෙලා හිටපු වෙලාවක තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයාත් අහම්බෙන් පාවී ආ පොල් කෝම්බයක් සේ පිනට ලැබුණු පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් අරගෙන මේ පාර්ලිමේන්තුවට සැපත් වුණේ.

ඊළඟට, රාජපක්ෂවරුන්ගේ බල කඳවුරු බිඳ වැටිලා, හැටනවලක්ෂය සීසීකඩ ගිහිල්ලා, මේ රට පුරා දියාරුවෙලා, ඔවුන්ට ගම්වල, ගෙවල්වල ඉන්න බැරි මට්ටමකට, උත්සවයකටවත් යන්න බැරි මට්ටමකට, අඩුම තරමින් රෝහලකට ගියාම වෛද්‍යවරයෙක් බෙහෙත් ටිකක්වත් දෙන්නේ නැති මට්ටමකට, පාරේ ලැගලා සිටින සුනඛයින්ගේ මට්ටමකට, සම්පූර්ණ ප්‍රතික්ෂේප කරන මට්ටමකට පත්වෙලා, චප්ප වොරොස් වෙලා, මස්ත බාල්දුවෙලා සිටින වෙලාවක තමයි මේ දෙගොල්ලෝ හම්බවුණේ. අර සින්දුවක් තිබෙනවා නේ, "ඇයත් නොදන්නිය ඇය යන මානය, උන්හිටි තැන් මතකයෙ අඩමානය, පාර කියන්නේ කෙලෙසද මා හට, ඇයටද පාරක් ඇති නැති ගානය" කියලා. රනිල් වික්‍රමසිංහ මහත්මයාත් මංමුළා වී පාර සොයාගෙන හසරක් සොයමින් යනකොට මංමුලා වූ සමනලියකගෙන් තමයි පාර ඇහුවේ. එම නිසා මම කියන්නේ, -

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
සමනලයකුගෙන්.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඔව්, සමනලයකුගෙන් තමයි පාර ඇහුවේ. එම නිසා චාමර සම්පත් මහත්මයා කියපු මස්ත කතන්දරයට මම කියන්න කැමැතියි, නීච වුණු ග්‍රහයෙකුට නීච වුණු ග්‍රහයෝ රොත්තක් තමයි හම්බ වුණේ කියලා. දැන් කාල චක්‍රයත් හොඳයි කියනවා නේ. ඒ වාගේම රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ග්‍රහ චක්‍රයත් හොඳයි ලු. සජිත් ප්‍රේමදාස මහත්මයාගේ ග්‍රහ චක්‍රය නරකයි ලු. නැහැ. මම කියනවා, ඔහොම කිව්ව රාජපක්ෂ මහත්මයාටත් දෙවඳ සුමනදාස, -

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගෝඨාටත් ඔය විධියටම තමයි කිව්වේ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඔව්, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාටත් ඔය විධියටම තමයි කිව්වේ. හැබැයි, අපි දකින හැටියට නීච වුණු ග්‍රහයෙකුට තමයි නීච වුණු ග්‍රහ රාශි ටිකක් - ග්‍රහ සමූහයක් - හම්බ වුණේ. එතකොට, නීච, නීච දෙක එකතුවෙලා තමයි දැන් මේ සාර්ථක ගමනක් යන්න හදන්නේ. ඉතින්, මේ ගැන අපි කනගාටු වෙනවා. මේවා අර, හිතේ දුකට කියැවෙන කවි තමයි.

චාමර සම්පත් මහත්මයා දැන් ලොකු වර්ණනාවක් කෙරුවා; "මේ රට දුර්භික්ෂයකින් පිරිලා ගිහිල්ලා තිබුණා, ඩීසල් පෝලිම්, පෙට්‍රල් පෝලිම් තිබුණා, ගෑස් තිබුණේ නැහැ, විදුලිය තිබුණේ නැහැ" කියලා කිව්වා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඊයේ ඇඩුවා, අරක්කු බෝතලය ගණන් ගිහිල්ලා කියලා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඒ වාගේ නන්නත්තාර වෙච්ච ආර්ථිකයක් ආපහු හදාපු උත්තමයා හැටියට තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයාව නම් කළේ. මම අහනවා, "කවුද, මේ රට ඒ තත්ත්වයට පත් කළේ?" කියලා. අපිද, මේ රට ඒ තත්ත්වයට පත් කළේ? රනිල් වික්‍රමසිංහ මහත්මයා හදිසියේ බලය අරගෙන මේ තත්ත්වයට ගොඩනහන්න අපිද ඒ විනාශය ඇති කළේ? රට ඒ තත්ත්වයට පත් කරපු බඩු ටික ඉන්නේත් එහේ. මේ රට ඒ විනාශයට පත් කරපු බඩු ටික ඉන්නේත් ඔය පැත්තේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
චාමර මහත්තයාත් ඒකේ කොටස්කාරයෙක්. එතුමන්ලා තමයි ගෝඨාභයව ගෙනාවේ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඔව්, චාමර මහත්තයාත් ඒකේ කොටස්කාරයෙක්. එතුමන්ලාත් ගෝඨාභය රාජපක්ෂ වෙනුවෙන් ඔය විධියටම තමයි කඩේ ගියේ. එම නිසා ඒවා විහිළු කථා කියන එක මම මේ අවස්ථාවේ කියන්නට ඕනෑ.

අනෙක් කාරණය තමයි, ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු පහේ සිට අවුරුදු හය දක්වා ගෙනයනවා කියන මාතෘකාව. හදිසියේම එවැනි මාතෘකාවක් ගෙනාවේ ඇයි? ලේනව කියලා "ලේනෙක්" ගෙනැල්ලා තමයි මුට්ටිය දාලා බැලුවේ. ඉස්සෙල්ලා මුට්ටිය දැම්මා. අපි දන්නේ නැති ලේනෙක් තමයි ඒ. ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු පහේ ඉඳලා අවුරුදු හය දක්වා වැඩි කර ගන්න, ජනාධිපතිවරණය තව මාස කිහිපයක් හෝ පරක්කු - delay - කර ගන්න, "ලේනා" ලවා මුට්ටිය දාලා බැලුවා; එවැනි අවස්ථාවක් ගන්න පුළුවන්ද කියන එක බැලුවා. හැබැයි, අධිකරණය එය සත පහකටවත් ගණන් ගන්නේ නැතුව, ඒ පෙත්සම විභාගයට ගන්නේ නැතුවම නිශ්ප්‍රභ කර දැම්මා.

අපි දන්නවා නේ, මේ ආණ්ඩුවේ රනිල් වික්‍රමසිංහ මහත්මයලා මැතිවරණ කල් දමන්න විරප්‍රසිද්ධ බව. පළාත් පාලන මැතිවරණයට දින නියම කරලා, අධිකරණ තීන්දු තීරණ තිබියදීත් දන්නේම නැතුව ඒ සියල්ල කල් දැම්මා. දැන් මේ හදන්නේ ජනාධිපතිවරණයටත් මොකක් හරි ඖට එකක් දෙන්න. හැබැයි, අපි සන්තෝෂ වෙනවා වාගේම අපි අධිකරණයට ස්තුතිවන්ත වෙනවා, "ලේනෙක්" ගෙනැල්ලා, ඒ "ලේනා" ලවා දාපු මුට්ටියට අධිකරණය විසින් ඉඩක් ලබා නොදීම ගැන. ඒක නිශ්ප්‍රභ කරලා විසි කළාය කියන කාරණය මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ.

අපට හදිසියේම ලොකු ජනමත විචාරණවලට යන්න කාලයක් නැහැ. දැන් ජනාධිපතිවරණය එනවා. ඒ නිසා අපි කියනවා, කරුණාකරලා ජනාධිපතිවරණය පවත්වන්න කටයුතු කරන්න කියලා. එහෙම නැතුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නැති කැලි අල්ලාගෙන, ඒ නැති දේවල් පටලවා ගන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් අපේ දුරකථනවලටත් දවස ගානේ calls එනවා. අවුරුද්දක විතර ඉඳලා තමයි මේ දුරකථන ඇමතුම් එන්නේ. මොනවාද කියන්නේ? "තුෂාර ඉඳුනිල් වන ඔබත් යනවා, අහවල් නම තිබෙන මන්ත්‍රීතුමාත් යනවා" කියනවා. කොහාටද යන්නේ? රනිල් වික්‍රමසිංහ මහත්මයා ළඟට. මතක තියාගන්න, රනිල් වික්‍රමසිංහ මහත්මයා අපට එපා වුණේ මීට අවුරුදු ගණනකට ඉස්සෙල්ලා. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කණ්ඩායම අපට එපා වුණු නිසා තමයි අපි සජිත් ප්‍රේමදාස මහත්මයාත් එක්ක එළියට බැහැලා ආවේ. නැවත යන්න නොවෙයි ආවේ. දවස ගානේ, දවස ගානේ කියනවා, "15ක් යනවා, 20ක් යනවා, අහවලාත් යනවා, මෙයාත් යනවා" කියලා. මෙහෙම ඉලක්කම් කියමින් තමයි මේ මැව් එකේ තිබෙන රස්නය - heat එක - තියාගන්න හදන්නේ.

ජනාධිපතිතුමා ඇතුළු එක්සත් ජාතික පක්ෂයේ අය පසුගිය කාලයේ කිව්වා, මැයි 1 වැනි දා 20දෙනෙක් ඒ ගොල්ලගේ වේදිකාවට නඟිනවාය කියලා. ඔන්න ඒ කැරට් අලය වෙනුවෙන් සෑහෙන දවසක් බලාගෙන ඉන්න සිද්ධ වුණා. ඊට පස්සේ පොහොට්ටුවෙන් බැසිල් රාජපක්ෂලා කිව්වා, "තමුන්නාන්සේට ජනාධිපතිවරණයට පොහොට්ටුවේ සහයෝගය ඕනෑ නම්, පොහොට්ටු කණ්ඩායමේ අපේක්ෂකත්වය ඕනෑ නම්, තමුන්නාන්සේ කණ්ඩායම අරගෙන පෙන්වන්න" කියලා. එතකොට රනිල් වික්‍රමසිංහ මහත්මයා පොරොන්දු වුණා, ජූලි 4

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

වැනි දාට පෙර සමඟි ජන බලවේගයෙන් මන්ත්‍රීවරු 22ක් ඒ කණ්ඩායමට අරගෙන පෙන්වනවාය කියලා. සමඟි ජන බලවේගයෙන් මන්ත්‍රීවරු 22ක් ජූලි 4වැනි දාට පෙර රනිල් වික්‍රමසිංහ මහත්මයා ළඟට ගන්නවාය කියලා බැසිල් රාජපක්ෂ මහත්මයාට දින සීමාවක් දමලා පොඩි කාලයක් ඉල්ලා ගත්තා. පසුගිය කාල පරිච්ඡේදය පුරාම සමඟි ජන බලවේගයේ අහවල් මන්ත්‍රී එනවාය කියලා නම් ප්‍රසිද්ධ කළා. ලොකු රස්නයක්-උණුසුමක්- ඇති කරන්න පටන් ගත්තා. හැබැයි ජූලි 4වැනි දා අපේ මන්ත්‍රීවරු 22ක් ගියේ නැහැ. ඔය නීවයෝ එක්කෙනෙක් දෙන්නෙක් නම් යන්න වාගේ හදනවා. ඒ, සමඟි ජන බලවේගයට පිටින් සවි කරපු ගැජට් දෙකක්; උණ්ඩුක පුවිඡය වාගේ තිබුණත් එකයි, නැතත් එකයි. පිටින් සවි කරපු ගැජට් එකක් ගැලවුණාය කියලා සමඟි ජන බලවේගයට ප්‍රශ්නයක් නැහැ. අඩුපාඩු සියල්ල වැහිලා, පිරිලා ඉතිරිලා, දැන් ඕනෑවටත් වඩා අය සමඟි ජන බලවේගය වටා ගොනු වෙනවා. සමඟි ජන බලවේගයේ 22දෙනෙක් රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ හයියට යනවාය කියලා ප්‍රචාරය ගියාට, එන්නේ සමඟි ජන බලවේගයට. දැන් ඊට පස්සේ මොකක්ද වුණේ? රනිල් වික්‍රමසිංහ මහත්මයාට 22ක් ජූලි 4වැනි දා වෙනකොට ගෙන්වා ගන්න බැරි වෙච්ච නිසා, ඒකට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා අපොහොසත් වෙච්ච නිසා, ජූලි 17වැනි දාට තමන්ගේ පොදුජන පෙරමුණේ ජනාධිපති ධුර අපේක්ෂකයා නම් කරන්න බැසිල් රාජපක්ෂලා, මහින්ද රාජපක්ෂලා තීන්දු කළා. ඊට පස්සේ මොකද වුණේ? කියන්න ලජ්ජයි, ජනාධිපතිතුමා මේ පසුගිය අහඹරුවාදා, ඒ කියන්නේ මීට දින දෙකකට ඉස්සර වෙලා බැසිල් රාජපක්ෂ-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මට තව විනාඩි දෙක තුනක් වැඩිපුර දෙන්න. අපේ කථා කළේ නැති ගොඩක් මන්ත්‍රීවරුන්ගේ කාලය තිබෙනවා නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය නම් ඔක්කෝම දීලා තිබෙන්නේ. ඔබතුමා කථා කරන්න. ඔබතුමාට තව මිනිත්තු දෙකක් තිබෙනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
කියන්න ලජ්ජයි! එක්සත් ජාතික පක්ෂයේ නායකයා, ජනාධිපතිතුමා කඩිමුඩියේ ගියා බැසිල් රාජපක්ෂ මහත්මයාව හම්බ වෙන්න. බැසිල් රාජපක්ෂ මහත්මයායි, මහින්ද රාජපක්ෂ මහත්මයායි හම්බ වෙලා රනිල් වික්‍රමසිංහ මහත්මයා ආයෙත් බැගෑපත් වෙනවා, කරුණාකරලා තමුන්නාන්සේලා පොහොට්ටුවෙන් අපේක්ෂකයෙක් නම් කරන්න එපා, මට කාලයක් දෙන්න; දින කිහිපයක් දෙන්න, සමඟි ජන බලවේගයෙන් මන්ත්‍රීවරු ටික ගලවා ගෙන ජනාධිපතිවරණයට සහයෝගය පිණිස ගෙනෙනවාය කියලා. මෙන්න දැන් ජනාධිපතිවරයා ආයෙත් බැසිල් රාජපක්ෂලාගෙන් කාලයක් ඉල්ලාගෙන තිබෙනවා, ජූලි 29වැනි දා වෙනකල්. ජූලි 29වැනි දා වෙනකොට සමඟි ජන බලවේගයෙන් මන්ත්‍රීවරු 15ක්, 20ක් ජනාධිපතිවරයාගේ සහයෝගයට ගන්නවාය කියලා දැන් දින ඉල්ලාගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජනාධිපතිතුමාට කියන්නේ තමුන්නාන්සේ කට ඇරගෙන බලාගෙන හිටියාට; මැයි 1වැනි දා වෙනකල් කට ඇරගෙන බලාගෙන හිටියාට; ජූලි 4වැනි දා වෙනකල් කට ඇරගෙන බලාගෙන හිටියාට; දැන් ජූලි 29වැනි දා වෙනකල් කට ඇරගෙන බලාගෙන හිටියාට, එළුවාගේ පොට්ටනිය වැටෙන්නේ නැහැ කියලායි. එළුවාගේ පොට්ටනිය වැටෙයි කියලා ජනාධිපතිතුමා මැයි 1වැනි දා වෙනකල් බලාගෙන හිටියා. රටේ ජනතාවටත් කිව්වා, එළුවාගේ පොට්ටනිය අපේ ළඟට වැටෙනවාය කියලා. ජූලි 4වැනි දාත් වැටුණේ නැහැ. අය වැයේ දී වැටෙනවාය කිව්වා. මැයි දිනයේ දී වැටෙනවාය කිව්වා. ජූලි 4වැනි දා වැටෙනවාය කිව්වා. මතක තියා ගන්න, ජූලි 29වැනි දාත් ඔය පොට්ටනිය වැටෙන්නේ නැති බව. වැටෙන ඒවා ටික තමයි දැන් ඔය තමුන්නාන්සේ ළඟට වැටිලා ඉන්නේ. ඉතින්, අදටත් රනිල් වික්‍රමසිංහ මහත්මයාට කඩේ යන එක්සත් ජාතික පක්ෂයේ හිතවතුන්ගෙන් අපි අහනවා, ලජ්ජා නැද්ද කියලා. "කපුටා" කිව්වා, "කාක්කා" කිව්වා, ආර්ථිකය ඝාතනය කළාය කිව්වා, හොරු කිව්වා. දැන් ඒ මිනිස්සු ළඟට ගිහිල්ලා, "මට තව කාලයක් දෙන්න, අනේ! ඔය ගොල්ලන්ගේ අපේක්ෂකයා බවට මා පත් කරන්න" කියලා පින්සෙණ්ඩු වෙන්න ලජ්ජා නැද්ද කියලා මම අහනවා. එහෙම නායකයෙක් පිටුපසද අද මේ එක්සත් ජාතික පක්ෂයේ ඉතිරි වෙලා ඉන්න කණ්ඩායම යන්නේ කියන එකත් මේ අවස්ථාවේ දී අපි අහනවා.

විශේෂයෙන් රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ වැල් පාලම ගැනත් මම වචනයක් කියන්න ඕනෑ. වැල් පාලමකින් එතුමා ගියා ලු. කවුද, දෙයියනේ! මේ වැල් පාලම කැඩුවේ? ඒකේ වැල් ටික කැඩුවේ කවුද? එතකොට ඒකේ ලණු ටික කැඩුවේ කවුද? ලෑලි ටික ගැලෙව්වේ කවුද? මේක මහා හපන්කමක් ද? ඒකේ වැල් ටික කඩපු, ලණු ටික ගලවපු, ලෑලි ටික ගලවපු ඒ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ටිකත් එක්ක නේද රනිල් වික්‍රමසිංහ මහත්මයාට මේ වැල් පාලමෙන් එගොඩ වෙන්න වෙන්නේ? වැඩක් නැහැ, දැන් වැල් පාලමත් එක්ක මේක කඩාගෙන වැටිලා ඉවරයි. මතක තියා ගන්න, සමඟි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මහත්මයා ඒක තමයි නම්බුකාරව ඒ හොරු සමඟ හෙළුවෙන් හිටගත්තේ නැත්තේ. අද

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

සිද්ධ වෙලා තිබෙන්නේ අර කෑම ගොඩවල් දෙකක් දැම්මාම බල්ලෙකුට වෙන දේ. අරක කන්න යනකොට, මේක වෙන එකෙක් කනවා; මේක කන්න යනකොට අරක වෙන එකෙක් කනවා. පොහොට්ටුවේ ඡන්ද දිනා ගන්න ඒ පැත්තට යනකොට එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද මේ පැත්තට එනවා. එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද දිනා ගන්න යනකොට පොහොට්ටුවේ කණ්ඩායම් අපට එනවා. අර, 'පිරිසිදු චේතනා ගෙන දෙයි වාසනා' කියලා කථාවක් තිබෙනවා නේ. කවුරු මඩ ගැහුවත්, කවුරු සමච්චලයට ලක් කළත් පිරිසිදු චේතනාවකින්, බරපතළ අධිෂ්ඨානයකින් සජිත් ප්‍රේමදාස මැතිතුමා ඒ අවස්ථාවේ තනියම හිට ගත්තේ ඒකයි. අද විවිධ බලවේග, විවිධ කණ්ඩායම්, විවිධ සමූහයන් අපිත් එක්ක ගොනු වෙන්නේ ඒකයි. ඒ නිසා අපි කියනවා, තව මාස තුනකින් අපේ සමඟි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති ධුරයට පත් වෙන එක වළක්වන්න බැහැ කියලා. ඒ නිසා කරුණාකරලා කාලයට ඉඩ

දීලා, 'මල් යහනෙන් බැස පලයන් ප්‍රභාවතී' කියලා අපි ඒ සියලු දෙනාට කියමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එස්.එම්.එම්. මුෂාරෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 15ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.16]

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஒன்பதாவது பாராளுமன்றத்தில் மிக முக்கியமான சட்டங்கள் அவ்வப்போது இயற்றப்படுகின்றன; சில முக்கிய நிகழ்வுகள் அவ்வப்போது அரங்கேறுகின்றன. அதேபோல, தேவையில்லாத, நேரத்தை வீணடிக்கக்கூடிய, இந்த நாட்டு மக்களின் வரிப் பணத்தை வீணாகச் செலவழிக்கக்கூடிய விவாதங்களும் அவ்வப்போது நடந்தேறுகின்றன. அத்தகைய விவாதங்களில் ஒன்றாகத்தான் இன்றைய இந்த விவாதத்தையும் நான் பார்க்கின்றேன். எதிர்வரும் செப்ரெம்பர் மாதம் 17ஆம் திகதிக்கும் ஒக்ரோபர் மாதம் 16ஆம் திகதிக்கும் இடையில் நிச்சயமாக ஜனாதிபதித் தேர்தலை நடத்த வேண்டுமென்ற கோரிக்கையை முன்வைத்து எதிர்க்கட்சியினர் சபை ஒத்திவைப்புவேளைப் பிரேரணை ஒன்றை முன்வைத்திருக் கிறார்கள். உண்மையாகவே இதுவொரு தேவையில்லாத ஆணி என்பதுதான் என்னுடைய கருத்தாகும்.

இந்த விவாதத்தைப் பார்க்கின்றபோது, ஆளும்கட்சியை, எதிர்க்கட்சியைச் சார்ந்த எல்லோருமே ஜனாதிபதித் தேர்தல் உரிய நேரத்தில் நடத்தப்படுமென்ற நம்பிக்கையில் இருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. அப்படியிருக்கின்ற பட்சத்தில், இந்தத் தேர்தல் உரிய நேரத்தில் நடத்தப்பட வேண்டுமென்ற ஒரு பிரேரணையைக் கொண்டுவந்து, பணத்தையும் நேரத்தையும் வீணாகச் செலவழிக்கின்ற ஒரு நாளாக இன்றைய நாளை மாற்றிய எதிர்க்கட்சியினுடைய செயலை முதலில் நான் வன்மையாகக் கண்டிக்கிறேன். ஜனாதிபதித் தேர்தல் உரிய நேரத்தில் நடத்தப்படமாட்டாதென்ற எண்ணம் ஏன் வந்தது? இது முக்கியமான ஒரு விடயமாகும். இந்தத் தேர்தல் தொடர்பாக மாண்புமிகு ஜனாதிபதி அவர்களுடைய நிலைப்பாடு எத்தகையதென்றால், உரிய நேரத்தில் தேர்தல் நடத்தப்படுமென்பதில் அவர் மிகத் தெளிவாக, உறுதியாக இருக்கின்றார். ஜனாதிபதித் தேர்தல் உரிய காலத்தில் நடாத்தப்படுமா அல்லது ஒரு வருடம் பிற்போடப்படுமா என்றெல்லாம் பேசுகின்றார்கள். ஆனால், 2-3 மாதங்களுக்கு முன்பாகவே, ஜனாதிபதித் தேர்தலை ஒரு வருடம் பிற்போடும் சாத்தியம் இருக்கின்றதாவென்று நான் ஜனாதிபதி அலுவலகத்தில் கேட்ட நேரத்தில், "ஏன் ஒரு வருடம் நாம் பிற்போட வேண்டும்; ஐந்து வருடங்களையும் சேர்த்து ஆள்வோமே" என்று மிகத் தைரியமாக ஜனாதிபதி அலுவலகத்திலிருந்து பதில் கிடைத்தது. இந்தத் தேர்தலை எதிர்கொண்டு வெற்றி பெறுவோமென்ற நம்பிக்கையில் மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் இருந்ததை அந்தக் கருத்தினூடாக என்னால் உணர்ந்து கொள்ளக்கூடியதாக இருந்தது. அத்தோடு, அந்தத் தேர்தலும் உரிய நேரத்தில் நடத்தப்படும் என்பதும் உறுதியாக விளங்கியது.

இப்படிப்பட்ட சூழலில், ஜனாதிபதி அவர்கள் இந்தத் தேர்தல் தொடர்பாக எதுவும் பேசாமல் இருந்த சமயத்தில், "ஜனாதிபதி அவர்கள் தேர்தலைப் பிற்போட ஏதாவது நடவடிக்கை எடுப்பார், பாராளுமன்றத்தின் பதவிக் காலத்தையும் நீடிக்கப் பார்க்கிறார்" என்றெல்லாம் எதிர்க்கட்சியினர் "மண்ணெண்ணெய் ஊற்றிய சாரைப் பாம்பு போல" தொடர்ந்தும் கருத்துகளைத் தெரிவித்து வந்தார்கள். அப்படி எதுவும் இருக்குமோ என்ற சந்தேகம் மக்களுக்கும் வந்திருக்கக் கூடும். ஜனாதிபதித் தேர்தல் உரிய நேரத்தில் நடத்தப்படும், அதனைத் தொடர்ந்து பாராளுமன்றத் தேர்தலும் மாகாண சபைத் தேர்தலும் நடத்தப்படுமென்று ஜனாதிபதி அவர்கள், மீண்டும் மீண்டும் உறுதிப்படுத்தினார். அப்படி உறுதிப் படுத்திய போதாவது எதிர்க்கட்சியினர் சத்தமில்லாமல் இருப்பார்கள் என்று பார்த்தால், இல்லை. ஜனாதிபதி அவர்கள் மீண்டும் மீண்டும் இந்தக் கருத்தைச் சொல்கின்றார், அவர் ஏதாவது ஒரு தந்திரத்தைப் பயன்படுத்தி இதனை இழுத்தடிக் கப்போகிறார் என்று சொல்கிறார்கள். எதிர்க்கட்சியினருடைய நிலைப்பாடு என்னவென்றால், 'ரணில் விக்கிரமசிங்ஹ' என்றால் பயம்! அதனைத்தான் என்னால் புரிந்து கொள்ளக் கூடியதாக இருக்கின்றது.

ஏன் பயம்? எதற்காகப் பயம்? இந்த நாடு வங்குரோத்து நிலையில் இருந்தபோது, திறைசேரி பூச்சியமாகிய ஒரு சூழலில், அடுத்து என்ன செய்வதென்று தெரியாமல் நாடு இருந்தது. இந்த ஆட்சி கவிழ்ந்துவிடும், மறுபடியும் தாங்கள் ஆட்சிக்கு வரலாம் என்றெல்லாம் எதிர்க்கட்சியினர் கற்பனை பண்ணிக்கொண்டிருந்தபோதுதான் ஒரு தனி உறுப்பினராக ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் பாராளுமன்றத்துக்கு வந்தார். அதன் பின்னர் பிரதமராகி, ஜனாதிபதியானார். இந்தப் பொருளாதாரப் பின்னடைவை முதன்மையாகக்கொண்டு ஏதேனும் பேசி ஆட்சியைப் பிடிக்கலாம் என்று கற்பனை பண்ணியவர்களுக்கு ஜனாதிபதி அவர்கள் சிம்ம சொப்பனமாக விளங்கினார். மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்களுடைய நடவடிக்கையால் மக்கள் மத்தியில் அவர் மெதுமெதுவாக இடம் பிடித்தார். இந்த நாட்டுக்குப் பொருத்தமானவர் மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் என்ற நிலை இன்று ஏற்பட்டுள்ளது.

Economyஐ அவர் மிகச் சரியாகக் கொண்டு செல்வாரென்ற நம்பிக்கை எதிர்க்கட்சி ஆதரவாளர்களிடையேயும் இருக்கின்றது. இது அண்மைய ஓர் ஆய்வின் மூலம் தெரிய வந்துள்ளது. தாம் வெற்றிபெற மாட்டோமோ, தமக்கு தேர்தலில் வெற்றிகிடைக்காமல் போகின்ற ஒரு சூழல் உருவாகிவிடுமோ என்ற பயத்தில் அவர்கள் இருப்பதுபோல எமக்குத் தோன்றுகின்றது. ஜனாதிபதித் தேர்தல் நடைபெறாமல், இன்னும் ஒரு வருடம் இதே ஜனாதிபதியின் பதவிக்காலம் நீடிக்கப்பட்டால் இந்த நாடு சிறந்து விளங்கும் என்பதில் அவர்களுக்குச் சந்தேகம் இல்லை. எதிர்க்கட்சிகள் இல்லாமல் போகின்ற அளவுக்கு மிகச் சிறப்பான ஓர் ஆட்சியை மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் செய்துவிடுவாரோ என்ற பயத்தில் முன்னாயத்தத்தோடும், எச்சரிக்கையோடும், அவசரப்படுவது போலவும் ஆச்சரியப்படுவது போலவும் பயப்படுவது போலவும் அவர்கள் இருப்பது எமக்குத் தோன்றுகின்றது. அவ்வாறு பயப்பட வேண்டிய எந்தத் தேவையும் இல்லை.

சட்டரீதியாக அதற்குப் பதில் சொல்வதாக இருந்தால், அண்மையிலே லெவென என்கின்ற ஒரு தொழிலதிபர் நீதிமன்றத்திலே ஒரு மனுவைத் தாக்கல் செய்தார். அவர் அந்த மனுவைத் தாக்கல் செய்தவுடனே, 'இது ஜனாதிபதி அவர்களுடைய வேலை! அவர்தான் இதனைத் தாக்கல் செய்வித்

[ගරු එස්.එම්.එම්. මුෂාරප් මහතා]

திருக்கிறார். இதனூடாக காலத்தை நீட்டிக்கப் பார்க்கின்றார்' என்றெல்லாம் பல குற்றச்சாட்டுகள் ஜனாதிபதி மீது சாட்டப்பட்டன. "யாரென்று தெரியாத ஒருவர், என்னோடு எந்தவொரு சம்பந்தமும் இல்லாத ஒருவர் தாக்கல் செய்த மனுவுக்காகப் பயப்பட வேண்டாமென்றும் உரிய நேரத்தில் தேர்தல் நடக்குமென்றும் ஜனாதிபதி அவர்கள் தெளிவாகச் சொல்லியிருக்கிறார். இல்லை, இதனுடன் ஜனாதிபதிக்கு சம்பந்தம் இருக்கின்றதென்று எல்லோரும் அவரைப் பழித்து ரைத்தார்கள். பின்பு என்ன நடந்து? அரசியலமைப்பின்படி ஜனாதிபதியின் பதவிக்காலம் 5 வருடங்கள் என சட்டமா அதிபர் திணைக்களம் சொன்னதன் பிற்பாடு, அந்த மனு தள்ளுபடி செய்யப்பட்டது. அதற்குப் பிற்பாடுகூட, இவர்கள் அடங்கினார்களா? என்று பார்த்தால், அதுவும் இல்லை. இப்போது பாராளுமன்றத்தில் ஒரு பிரேரணையைக் கொண்டு வந்து, எப்படியாவது தேர்தலை நடத்துங்களென்று மீளவும் கேட்கிறார்கள். இதனை மிகவும் வெட்கக்கேடான ஒரு விடயமாகவே நான் பார்க்கின்றேன்.

குறித்த நபர் வழக்குக்குச் சென்ற விடயம் தொடர்பாகவும், அரசியலமைப்பில் இருக்கின்ற குறைபாடுகள் தொடர்பாகவும் நாம் பேசுவோம். உண்மையாகவே பாராளுமன்றத்தில் 2/3 பெரும்பான்மையோடு ஜனாதிபதியின் பதவிக் காலத்தை 6 வருடங்களாகக் கொண்டுவருவதற்கான வாய்ப்பு இன்று இருக்கின்றதா? என்றால், இருக்கின்றது. அரசியலமைப்புக்கான பத்தொன்பதாம் திருத்தத்தின் 30(2)இலே மிகத் தெளிவாகச் சொல்லப்பட்டிருக்கின்றது. I quote:

"The President of the Republic shall be elected by the People, and shall hold office for a term of five years."

அதாவது, "குடியரசின் சனாதிபதி மக்களால் தெரிவு செய்யப்படுதல் வேண்டுமென்பதுடன், ஐந்து ஆண்டுகள் கொண்டதொரு காலப்பகுதிக்குப் பதவி வகித்தலும் வேண்டும்." ஏற்கனவே 6 வருடங்கள் என்றிருந்ததைத் திருத்தம் செய்தார்கள். அவ்வாறு திருத்தம் செய்த சட்ட வல்லுநர்கள் 83(ஆ)இலே உள்ள விடயத்தைக் கவனத்திற் கொள்ளவில்லை. அது மிகத் தெளிவாகச் சொல்கின்றது. I quote:

"a Bill for the amendment or for the repeal and replacement of or which is inconsistent with the provisions of paragraph (2) of Article 30 or of, paragraph (2) of Article 62 which would extend the term of office of the President, or the duration of Parliament, as the case may be, to over six years, ..."

அதாவது, அரசியலமைப்பின் 83ஆவது உறுப்புரையானது, இந்த நாட்டிலே மக்கள் தீர்ப்பு - Referendumஇன் மூலம் சிலவகைச் சட்டமூலங்கள் அங்கீகரிக்கப்படுதல் சம்பந்தமாகச் சொல்கின்றது. இந்த விடயத்திலே சனாதிபதியின் பதவிக்காலம், பாராளுமன்றத்தின் வாழ்காலத்தைப் பற்றிச் சொல்லப்பட்டிருக்கின்றது. அரசியலமைப்புக்கான பத்தொன்பதாம் திருத்தம் வருவதற்கு முன்பதாக எப்படி இருந்ததோ, அதாவது ஜனாதிபதியினுடைய பதவிக் காலத்தையும் பாராளுமன்றத்தின் வாழ்காலத்தையும் 6 வருடத்திற்கு மேல் நீட்டிப்பதாக இருந்தால், மக்கள் தீர்ப்புக்குச் செல்ல வேண்டுமென்று ஆரம்பத்தில் இருந்தது. பத்தொன்பதாம் திருத்தத்தினூடாக 30(2)ஐத் திருத்தியவர்கள் 83(ஆ) ஐத் திருத்தவில்லை. அதாவது, 83(ஆ) இலே 5 வருடத்திற்கு மேலதிகமாக இருந்தால்தான் Referendum என்ற விடயத்தை அவர்கள் திருத்தவில்லை. இந்த சட்டக் குழப்பத்தை ஜனாதிபதி அவர்கள் எப்படியேனும் பயன்படுத்தி தனது பதவிக்காலத்தை மேலும் நீட்டிப்பார் என்கின்றதொரு சந்தேகத்தை அவர்களுக்குத் தோற்றுவித்திருக்கிறது. உண்மையாகவே தனது பதவிக் காலத்தை மேலும் ஒரு வருடம் நீடிக்கவேண்டுமென்று ஜனாதிபதி நினைத்திருந்தால், அதனைச் செய்ய அரசியலமைப்பில் ஏற்பாடு இருக்கின்றது. இப்போதுகூட அதனைச் செய்யலாம். அதாவது, பாராளுமன்றத்தில் மூன்றில் இரண்டு பெரும்பான்மையுடன் அதனைச் செய்யலாம்.

இரண்டு தினங்களுக்கு முன்னதாக Cabinetஇல் ஜனாதிபதி அவர்கள் மிகவும் தெளிவானதொரு தீர்மானத்தை எடுத்திருந்தார். அரசியலமைப்பின் 30(2)ஆம் உறுப்புரையைத் திருத்திய வர்கள் உறுப்புரை 83(ஆ)ஐத் திருத்தவில்லை. ஜனாதிபதியின் பதவிக்காலம் ஐந்து வருடங்களுக்கு மேல் சென்றால், Referendum என்று அது சொல்லவில்லை. ஆறு வருடங்களுக்கு மேல் ஜனாதிபதியின் பதவிக்காலம் சென்றால் மட்டும்தான் Referendum என்று சொல்கிறது. இதனைத் திருத்தி ஐந்து வருடங்களுக்கு மேல் சென்றால் Referendum என்ற விடயத்திற்கு தற்போது அமைச்சரவை அங்கீகரம் கிடைத்துள்ளது. அது பாராளுமன்றத்திற்குக் கொண்டுவரப்பட இருக்கின்றது. அதற்குப் பிறகு யாரும் ஜனாதிபதியினுடைய பதவிக்காலமோ, பாராளுமன்றத்தின் பதவிக்காலமோ ஆறு வருடங்கள் என்று கதைப்பதற்கே இடமில்லை. அது ஐந்து வருடங்கள்தான் என்பதை யாரும் எதிர்பார்த்திராதவொரு கோணத்திலே ஜனாதிபதி அவர்கள் தெளிவுபடுத்தியிருக்கின்றார். அப்படியிருந்தும், "ஐந்து வருடமா?" அல்லது "ஆறு வருடமா?" என்ற குழப்பத்தோடு, இந்தப் பாராளுமன்றத்தில் இப்படியானதொரு பிரேரணையை முன்வைத்து, ஜனாதிபதித் தேர்தலை ஒக்ரோபர் மாதத்தில் நடத்தியே ஆகவேண்டுமென்பதான ஒரு தீர்மானத்தை நிறைவேற்றும்படியாகக் கோருவதை எப்படிச் சொல்வதென்று தெரியவில்லை. ஒன்றில், உங்களுக்கு அரசியலமைப்பில் நம்பிக்கையீனமாக இருக்கலாம் அல்லது நீதித்துறையில் நம்பிக்கையீனமாக இருக்கலாம் அல்லது உங்களுக்கு உங்களிலே நம்பிக்கையீனமாக இருக்கலாம் என்பதை மட்டும்தான் என்னால் சொல்லக்கூடியதாக இருக்கும்.

பல்வேறு விமர்சனங்கள் ஜனாதிபதிமீது முன்வைக்கப்படுகின்றன. மிகவும் மோசமான பொருளாதாரப் பின்னடைவிலும் நாட்டைப் பொறுப்பேற்ற ஜனாதிபதிகள் இதற்கு முன்னர் வரலாற்றில் இருந்திருக்க முடியாது. எமது ஜனாதிபதி அவர்கள் பதவியைப் பொறுப்பேற்றபோது, இருப்பதற்கு வீடு இருக்கவில்லை. தன்னுடைய சொந்த வீடும் தீப்பற்றி எரிந்திருந்தது. ஆர்ப்பாட்டக்காரர்கள் பாராளுமன்றத்தைச் சுற்றியிருந்த சூழலிலும், அதலபாதாளத்தில் விழுந்திருந்த இந்த நாட்டை "நான் பொறுப்பெடுத்து மீட்டுக் காட்டுகின்றேன்" என்று தைரியமாக முன்வந்த ஜனாதிபதிதான் மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள். இந்த நாட்டு மக்கள் அவருக்கு வாக்களிப்பது என்பது ஒருபுறமிருக்கட்டும்! இந்த நாட்டு மக்கள் மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் மீது நன்றியுடையவர்களாக இருக்க வேண்டும். அவர் இந்த நாட்டைப் பொறுப்பெடுத்தபோது, டொலரின் பெறுமதி 350 ரூபாயைத் தாண்டியிருந்தது. "டொலரினுடைய பெறுமதி 1,000 ரூபாய் வரை செல்லும்; இந்த நாட்டில் வங்குரோத்து நிலை ஏற்படும்; பட்டினிச்சாவு ஏற்படும்" என்றெல்லாம் மிகமோசமான விமர்சனங்களை எதிர்த்தரப்பிலுள்ள பொருளாதார வல்லுநர்கள் மக்களை ஏமாற்றுகின்ற விதத்தில் பயமுறுத்தல்களை மட்டுமே செய்தார்களே தவிர, ஒத்துழைப்புத் தரவில்லை. அன்று மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள், "இந்த நாட்டின் நிலைமை இன்னும் மோசமாகலாம்; ஆனாலும் நான் நாட்டை மீட்பேன்" என்று சொன்னார். இன்று அவர் இந்த நாட்டை மீட்டெடுத்திருக்கின்றார்.

மாண்புமிகு ஜனாதிபதி அவர்கள் IMF உடனான பேச்சுவார்த்தைக்குச் சென்றபோது, "அவர் அதனை நிறைவுக்குக் கொண்டுவரமாட்டார்; அவர்கள் ஒப்பந்தத்தில் sign பண்ணமாட்டார்கள்; Paris Club அதனை ஏற்றுக் கொள்ளவில்லை; China, Paris Clubஇன் கூட்டணியில் இணையவில்லை" என்றெல்லாம் negativeஆன விமர்சனங் களை மட்டும்தான் எதிர்த்தரப்பு அரசியல்வாதிகள் ஒவ்வொரு முறையும் செய்துகொண்டு இருந்தார்கள். அவர்களால் ஒவ்வொருமுறையும் கல் வீசப்படுகின்ற நேரத்திலெல்லாம் ஜனாதிபதி அவர்கள் மௌனமாகவே இருந்தார். இப்பொழுது IMFஇனுடைய ஒப்பந்தம் நிறைவேற்றப்பட்டிருக்கின்றது. ஜப்பானில் இடைநிறுத்தி வைக்கப்பட்டிருந்த 12 அபிவிருத்தித் திட்டங்கள் இப்போது வரப்போகின்றன. ADB - Asian Development Bank -இனுடைய பணம் இங்கு வரப்போகின் றது. நீங்கள் இவற்றை எல்லாம் எப்படிப் பார்க்கின்றீர்கள்? ஆட்சிக்கு வருவதற்காகத் துடிக்கின்ற நீங்கள், ஆட்சிக்கு வந்தால் என்ன செய்யப் போகின்றீர்கள்? IMFஇனுடனான நிபந்தனைகள் வேண்டாம் என்று ஒதுக்கப் போகின்றீர்களா? ADB - Asian Development Bank -இனுடைய பணம் தேவையில்லை என்று சொல்லப் போகின்றீர்களா? அல்லது ஜப்பானில் இடைநிறுத்தி வைக்கப்பட்டிருக்கின்ற எந்தவோர் அபிவிருத்தியையும் மேற்கொள்ளமாட்டோம் என்று சொல்லப் போகின்றீர்களா? என்ன சொல்லப் போகின்றீர்கள்? எப்படி ஆட்சி செய்யப் போகின்றீர்களென்பதற்கான ஏதாவதொரு காரணத்தையாவது நீங்கள் இந்தப் பாராளுமன்றத்தில் சொல்கின்றீர்களா என்றால், இல்லை. ஆனால், ஆட்சியைப் பிடிக்க வேண்டுமென்று மட்டும் நினைக்கிறீர்கள். எதற்காக ஆட்சியைப் பிடிக்க வேண்டும்?

உண்மையிலே இந்த நாட்டில் தேர்தல் ஓரிரு வருடங்களுக் குத் தேவையில்லை என்றால், அது தேவையில்லை. அதற்கான அபிப்பிராயம் இப்பொழுது மக்களிடம் உண்டு. இப்பொழுது நன்றாகச் சென்றுகொண்டிருக்கின்ற நாட்டின் செயற்பாடு களை ஒரு தேர்தலுக்குச் சென்று ஏன் குழப்ப வேண்டுமென்ற சிந்தனை மக்களிடம் இருக்கின்றது. தேர்தலை விரும்புபவர்கள் அதிகம் கிடையாது. இன்றைய ஆய்வுகளின்படி, வேட்பாளர் களை விரும்புபவர்களைப் பார்க்கிலும் அதிகமானவர்கள் தேர்தல் தொடர்பாக எந்தப் பிரக்ஞையும் அற்றிருக்கின்றார்கள்; யாருக்கு வாக்களிக்க வேண்டும் என்ற தீர்மானமற்றிருக் கின்றார்கள். இப்படிப்பட்ட ஒரு சூழலில்தான், தேர்தல் வேண்டுமென்று கோஷமிட்டுக்கொண்டு இருக்கின்றோம். மாண்புமிகு சனாதிபதியை விமர்சனம் செய்பவர்கள் மற்றும் அவருக்கெதிராக கோஷமிடுபவர்கள் தொடர்பாக Group Meetingஇலே ஒரு கேள்வி கேட்டபோது, அவர் அழகானதொரு பதில் சொன்னார். அதாவது, வாகனமொன்று பெரும் பள்ளத்தில் விழுவதற்கான ஒரு சூழல் இருந்தபோது driver ஓடி விட்டார்; driver என்று நம்பிக்கொண்டிருந்த ஓரிருவரும் தங்களுக்கு முடியாதென்று பின்வாங்கி விட்டார்கள்; மக்கள் அந்தரத்தில் தொங்கிக்கொண்டிருந்தார்கள். இந்த வாகனத்தை மீட்க வேண்டும் என்று கோஷம் எழுப்பப்பட்டபோது எவரும் முன்வரவில்லை; தான் முன்வந்து வாகனம் பள்ளத்தில் விழாமலும், எந்தொரு விபத்தும் நேராமலும் கரடுமுரடான பாதைகளில் கவனமாக வாகனத்தைச் செலுத்தி வந்து அதனை இப்பொழுது ஒரு garageஇல் நிறுத்தி வைத்திருப்பதாக அவர் சொன்னார்.

அவ்வாறிருக்கையில், கால்களைக் கிளப்பிக்கொண்டு ரயர்களிலே சிறுநீர் கழிக்கும் நாய்கள்போல இங்கே வந்து கதைப்பவர்களுக்கு எதிராக விமர்சனம் செய்யவும் தேவையில்லை; அவர்களுக்குப் பதில் சொல்லவும் தேவை யில்லை; அவர்களிடம் சண்டை போடவும் தேவையில்லை யென்றும் அவர் சொன்னார். "எங்கள் பயணம் இன்னமும் முடியவில்லை; garageஇல் இருக்கின்ற வாகனத்தை எடுத்து இன்னமும் நீண்ட தூரம் நாம் பயணிக்க வேண்டும்" என்பதாக மாண்புமிகு ஜனாதிபதியவர்கள் மிகத் தெளிவான ஒரு பதிலைச் சொன்னார். இதைத்தான் இந்த நாட்டு மக்களுக்கும் நாம் சொல்கின்றோம். இந்த நாட்டை நல்ல நிலைக்குக் கொண்டுவந்தவரைத் தாண்டி, வேறொருவரிடம் எதை நாம் எதிர்பார்க்க முடியும்? அவர்கள் புதியதோர் ஆட்சியைக் கொண்டுவந்து எதைச் செய்யப் பார்க்கின்றார்கள்?

இன்று சர்வதேசம் முழுவதும் எமது சனாதிபதியை நம்புகின்றது. லெபனானிலே, சிம்பாபேயிலே, கிரீஸிலே இவ்வாறான ஒரு பொருளாதாரப் பின்னடைவு ஏற்பட்டு அந்நாடுகள் வங்குரோத்து நிலையை அடைந்தபோது, ரணில் விக்கிரமசிங்ஹ போன்ற ஒரு தலைவர் அங்கே இருக்க வில்லை. 10 - 15 வருடங்களாக அந்நாடுகள் தமது பொருளா தாரத்தை மீட்கமுடியாமல் தடுமாறுகின்றன. ஆனால், இலங்கைக்கு மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் கிடைத்தது இறைவனுடைய ஏற்பாடு! அவர் ஜனாதிபதியாக வந்ததன் காரணமாக இன்று நாம் நிம்மதிப் பெருமூச்சு விடுகின்றோம். அவருக்கு மேலும் ஒரு வருடம் கொடுத்தால் இந்த நாட்டை இன்னும் மேலோங்கச் செய்வார். இன்னும் 2 அல்லது 3 வருடங்கள் கொடுத்தால் இந்த நாட்டை வளமான தேசமாக அவர் மாற்றுவார்.

'இலக்கு 2048' என்று அவர் சொல்கின்றபோது, ஒருசில தலைவர்கள் அதற்கெதிராக விமர்சித்தார்கள். மக்களுக்குச் சாப்பாடு மற்றும் healthஐ வழங்குவதற்கு 2048 வரையும் காத்திருக்க நாங்கள் சொல்லமாட்டோம் என்று பேசுவதைப் பார்த்தேன். மாண்புமிகு ஜனாதிபதி அவர்கள் அதைச் சொல்ல வில்லை. அபிவிருத்தியடைந்த நாடுகளான அமெரிக்கா மற்றும் பிரிட்டன் போன்று 2048இல் நாமும் நம்மை அபிவிருத்தியடைந்த நாடாக மாற்றுவோம் என்கின்ற தூர நோக்குடனான ஓர் இலக்கைப் பற்றியே அவர் சொன்னார். எனவே, எல்லாவற்றையும் விமர்சிக்கின்ற நிலைமையை விடுத்து, இந்த நாட்டுக்குத் தேவையான ஜனாதிபதி பற்றிச் சிந்திப்போம். இந்த விடயத்தில் பொதுமக்கள் எப்போதும் அவருக்குத் துணை நிற்பார்கள் என்ற நம்பிக்கையை வெளிப்படுத்தி, விடைபெறுகின்றேன். நன்றி!

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2024 ජූලි 12වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් තියේ ය.

அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், 2024 யூலை 12, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly until 9.30 a.m. on Friday, 12th July, 2024.

313 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 313 - இல. 12
Volume 313 - No. 12

2024 ජූලි 12වන සිකුරාදා
2024 யூலை 12, வெள்ளிக்கிழமை
Friday, 12th July, 2024

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2024 ජූලි 12වන සිකුරාදා
2024 யூலை 12, வெள்ளிக்கிழமை
Friday, 12th July, 2024

අන්තර්ගත ප්‍රධාන කරුණු

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [තීරුව 2125]

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තීරුව 2125]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 2130-2153]

වරප්‍රසාද:

2024.07.12 දින "දෙරණ අරුණ" වැඩසටහනෙහි නිවේදකවරයා විසින් දක්වන ලද අදහස් [තීරු 2153]

පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා:

ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන සහ නීති අංශ ශක්තිමත් කිරීමට වැඩසටහනක් සකස් කිරීම [තීරු 2163-2192]

ආගමික අන්තවාදය වැළැක්වීමේ අවශ්‍යතාවය [තීරු 2192-2213]

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සිසු සිසුවියන් ලබා ගන්නා Z- අගය මත සියලු රාජ්‍ය අංශයේ රැකියා පුරප්පාඩු පිරවීම [තීරු 2214-2224]

කඳුරට වෘත්තීය සමිති විරු දිනය ප්‍රකාශයට පත්කිරීම [තීරු 2224-2239]

ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම [තීරු 2240-2252]

කල් තැබීමේ ප්‍රශ්න [තීරු 2255-2258]

பிரதான உள்ளடக்கம்

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 2125]

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப:2125]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2130-2153]

சிறப்புரிமை:

2024.07.12ஆந் திகதி "தெரண அருண" நிகழ்ச்சியின் போது தொகுப்பாளரால் தெரிவிக்கப்பட்ட கருத்து [ப: 2153]

தனி நபர் பிரேரணைகள்:

விளையாட்டு அமைச்சின் கணக்காய்வு மற்றும் சட்டப் பிரிவுகளை வலுப்படுத்துவதற்கான வேலைத்திட்ட மொன்றைத் தயாரித்தல் [ப: 2163-2192]

மதத் தீவிரவாதத்தைத் தடுப்பதன் அவசியம் [ப: 2192-2213]

க.பொ.த (உயர் தர) பரீட்சையில் மாணவர்கள் பெற்றுக் கொள்ளும் Z-புள்ளி (Z-Score) அடிப்படையில் அரசதுறை சார்ந்த சகல தொழில் வெற்றிடங்களை யும் நிரப்புதல் [ப: 2214-2224]

மலையகத் தொழிற்சங்க தியாகிகள் தினமொன்றைப் பிரகடனப்படுத்தல் [ப: 2224-2239]

ஆக்கிரமிப்புச் செடிகள் மற்றும் விலங்குகள் காரணமாக உயிரினப் பல்வகைமைக்கு ஏற்படுகின்ற பாதிப் பைக் குறைத்தல் [ப: 2240-2252]

ஒத்திவைப்பு வினாக்கள் [ப: 2255-2258]

PRINCIPAL CONTENTS

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 2125]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 2125]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2130–2153]

PRIVILEGE:

Comments Made by Presenter of "Derana Aruna" Programme on 12.07.2024 [Col. 2153]

PRIVATE MEMBERS' MOTIONS:

Preparation of a Programme to Strengthen the Audit and Legal Sections of the Ministry of Sports [Cols. 2163–2192]

The Need for Preventing Religious Extremism [Cols. 2192-2213]

Filling All Public Sector Job Vacancies on the Basis of Z-score Obtained by Students at the G.C.E (Advanced Level) Examination [Cols. 2214–2224]

Declaring the Day of Martyrs of the Hill Country Trade Union [Cols. 2224–2239]

Minimizing the Damage Caused to Bio-diversity by Invasive Plants and Animals [Cols. 2240–2252]

ADJOURNMENT QUESTIONS [Cols. 2255–2258]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2024 ජූලි 12වන සිකුරාදා
2024 யூலை 12, வெள்ளிக்கிழமை
Friday, 12th July, 2024

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නිවේදන සහ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වගන්තිය සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 12 දිනැති අංක 2366/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය (අංක 02/2024 දරන සුරාබදු නිවේදනය); සහ

(ii) 2024 වර්ෂය සඳහා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව.

මෙම නිවේදනය සහ වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ තායිලන්ත රාජධානිය අතර නිදහස් වෙළඳ ගිවිසුම සහ එම ගිවිසුම පිළිබඳ තොරතුරු ඇතුළත් සංක්ෂිප්ත ග්‍රන්ථය.- [අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු ප්‍රසන්න රණතුංග මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු නීතිඥ (ආචාර්ය)සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, 2020 වර්ෂය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම (81 අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 63 වගන්තිය සමඟ කියවිය යුතු 6 සහ 10 වගන්ති යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 අප්‍රේල් 22 දිනැති අංක 2381/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. சனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ ආයතන සමූහය අතර මාර්ගගත ආකාරයෙන් වීසා සහ විදෙස් ගමන් බලපත්‍ර අයදුම් කිරීමේ සේවා බැහැරින් ලබා ගැනීම පිළිබඳව එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මට ඒ සම්බන්ධයෙන් කරුණු ටිකක් කියන්න චිනාඩි තුනක් විතර දෙන්න.

මේ වාර්තාව අපි සකස් කරනකොට බොහෝ ගැටලු ආවා. මම නැවතත් ඔබතුමාට ඒ ගැන සඳහන් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත්, එක අවස්ථාවක මහ ලේකම්තුමිය මගේ විරෝධය මැද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට කැඳවීම පවා සිද්ධ වුණා. සමහර නිලධාරීන් කාරක සභාව හමුවට ආවේ නැහැ, නොයෙකුත් කාරණා ඉදිරිපත් කළා. සමහර අවස්ථාවලදී කාරක සභාවේ සභාපතිවරයා සමච්චලයට ලක් වන විධියට සමහර නිලධාරීන් වැඩ කළා; හැසිරුණා. ඒ කෙසේ වෙතත්, සියලු බාධක මැද අපි මේ වාර්තාව අද ඉදිරිපත් කරනවා.

මම පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව කාරක සභාවේ සියලු සාමාජික මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා. අපි අවසානයේ දී නිගමනයකට ආවා. ඒ අවසාන නිගමනයට එන්න පෙර ඔවුන් මේක study කරන්න සති තුනක් කාලය ඉල්ලුවා. මම ඒ අවස්ථාව ලබා දුන්නා. සමහර මන්ත්‍රීවරුන් ඔවුන්ගේ අදහස් වෙනම ඉදිරිපත් කළා. අපි ඔවුන් පෞද්ගලිකව ලබා දීපු notes කිසිම විධියකට සංශෝධනය කරන්නේ නැතුව, addendum එකක් හැටියට මේ වාර්තාවේ අගට එකතු කරලා තිබෙනවා. අපේ කාරක සභාවේ වාර්තාවත් තිබෙනවා. ඊට අමතරව මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් ඉදිරිපත් කරපු notes ඇතුළත් addendum එක තිබෙනවා. ඒ සියලු දේ අපි සභාගත කරනවා. ඒ සභාගත කරනකොට annexes තිබෙනවා. මෙන්න බලන්න, වාර්තාවේ size එක.

මේකේ පිටු 1,000ක් විතර ඇති. අපට කිසිම දෙයක් වසන් කරන්න අවශ්‍ය නැහැ. ඒ සාකච්ඡා වුණු ඒවා, ඉදිරිපත් වුණු ලියකියවිලි සියල්ල මම සභාගත කරනවා.

ගරු කථානායකතුමනි, මූලික වශයෙන්ම මෙතැන වෙලා තිබෙන්නේ මෙයයි. මම මෙහි විධායක සාරාංශය කියන්නම්. මේ outsourcing agreement එක කළේ, එහෙම නැත්නම් මේ ආයතන සමූහය සඳහා සේවා ලබා ගැනීම කළේ කොහොමද? මෙතැනදී මම එකක් කියන්න ඕනෑ. VFS ආයතනය රටවල් 145ක කටයුතු කරනවා, ඒ නිසා ඔවුන්ට ඒ කටයුතු භාර දීමේ ගැටලුවක් නැහැ කියලා කිව්වාට, මේකේ prime contractorගේ නම තමයි GBS Technology Services and IVS Global-FZCO. ඒකට එකතු වෙලා තිබෙනවා, VF Worldwide Holdings Limited. සාමාන්‍යයෙන් VFS කියලා සඳහන් කරන්නේ ඒ ආයතනයට. එම් නිසා මේකේ prime contractor VFS නොවෙයි. Prime contractor වෙනම ආයතනයක්. ඒ ආයතන තුන agreement එක අත්සන් කරලා තිබෙනවා. මේ annexesවල ඒ ආයතන ව්‍යුහය සම්බන්ධයෙන් නොයෙකුත් දේවල් සඳහන් වෙනවා. නමුත් අපේ නිගමනය විතරක් මම කියන්නම්.

මේ ආයතන සමූහයෙන් සේවා ලබා ගැනීමේදී තරගකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් නොතිබීම ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට මුදල් සඳහා හොඳම වටිනාකම ලබා ගැනීම සඳහා බාධාවක් වූ බව තමයි අපේ කාරක සභාවේ මතය. ඒ කියන්නේ මේ කටයුත්තේ දී තරගකාරී ලංසු කැඳවීමක් කළේ නැහැ.

තරගකාරී ලංසු කැඳවීමක් කළා නම් අපට ඩොලර් 18.50ක් ගෙවන්න වෙනවා, service fee හැටියට. තවත් ඩොලර් 7.27ක් ගෙවන්න වෙනවා, convenience fee හැටියට. එතකොට ඔක්කෝම ඩොලර් 25ක් ගෙවන්න වෙනවා. ඒක ඊට වඩා අඩු

කරගන්න තිබුණා කියන එක තමයි කාරක සභාවේ මතය වුණේ. ඒකට තව හේතුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

අවුරුදු 12ක් විතර යම් සේවාවක්, -මේ සේවාවම නොවෙයි- මෙයට සමාන සේවාවක් හෝ මොබිටෙල් ආයතනය මඟින් ඩොලරයකට දෙන්න එකඟ වෙලා තිබුණා. මේ කටයුත්තේදී specification document එකක් තිබිලා නැහැ, අපට හරියටම අවශ්‍ය කුමක්ද කියන කාරණය ගැන. Specification document එකක් නැතිව තමයි මේ තෝරා ගැනීම සිද්ධ වෙලා තිබෙන්නේ. අපේ කාරක සභාවේ මතය වුණේ specification document එකක් තිබුණා නම්, මේ ආයතනයට වෙන්න පුළුවන්, මොබිටෙල් ආයතනයට වෙන්න පුළුවන්, ලෝකයේ තවත් ආයතනවලට වෙන්න පුළුවන්, ඒ සියලු ආයතනවලට තරගකාරිව මේ සඳහා ඔවුන්ගේ යෝජනා දෙන්න හැකියාවක් තිබුණාය කියන එක. ඒ නිසා, ඇයි එහෙම නම් specification document එකක් නැතිව මේක කළේ කියන එක ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

ඊළඟට, ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ හඳුනා ගත් සැලකිය යුතු කරුණුවලට අමතරව නොවිසඳුණු ප්‍රධාන ගැටලු කිහිපයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ තමයි, මේ ගාස්තු. මේ ගාස්තු එක එක තැන්වල එක එක විධියට කියනවා. ඩොලර් 18.50යි, ඩොලර් 7.27යි කිව්වාට, මාසයකට වීසා දෙන්න අලුතින් ක්‍රමයක් පටන් අරගෙන තිබෙනවා ලු, ඩොලර් 18.50 වෙනුවට ඩොලර් 10ට දෙන්න. එහෙම එකක් agreement එකේ කොතැනකවත් නැහැ. එහෙම amendment එකකුත් නැහැ. එහෙම නම්, කොහොමද ඒකට agree වුණේ?

ඊළඟ ගැටලුව, දත්ත අනාවරණය කිරීම සහ අවසන් කිරීම. දත්ත අවසන් කිරීමේ වගන්තියක් ඇටවීමේ හැකියාව ඇති, දත්ත කඩ කිරීමක පැවැත්ම තවදුරටත් විමර්ශනය කිරීම අවශ්‍ය වෙනවා. ඒ කියන්නේ, data breach එකක්. Fansලා මිලියනයක් ඉන්න YouTube නාළිකාවක් තිබෙන tourism කරන කෙනෙක් data breach එකක් ගැන complain කරලා තිබෙනවා. ඒ කියන්නේ, වෙනත් අයගේ passport information සහ visa information ඔහුට දිගට හරහට එනවා ලු. ඒක එහෙම වෙන්න බැහැ. ඒ අවස්ථාවේදීම අපි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට කිව්වා, මේ ගැන වහාම හොයා බලන්න කියලා. ඔවුන් කිව්වා, ඒ ගිහින් තිබෙන්නේ dummy data වගයක් කියලා. Dummy data ගියත්, මොන විධියට ගියත් data protection එකක් තිබෙන්න ඕනෑ. එය ජාතික ආරක්ෂාව සඳහා අතිශයින් වැදගත් කාරණාවක්.

ඊළඟ ගැටලුව තමයි, ගැටුම්සහගත සුවිශේෂත්වය. ඒ කියන්නේ, අදාළ සමාගම් වෙත ලබා දී ඇති විශේෂත්වය පවතින සේවා සැපයුම්කරුවන්ගේ අඛණ්ඩ පැවැත්මට පටහැනි වීම. ගරු කථානායකතුමනි, අපි හොයා ගත්තා, මීට කලින් තවත් ආයතන සමඟත් වීසා ගන්න ගිවිසුමක් අත්සන් කරලා තිබෙන බව. උදාහරණයක් ලෙස ගත්තොත්, චීනයේ. නමුත් ඒ appoint කරපු committee එකෙන් කොයි වෙලාවකවත් කිව්වේ නැහැ, exclusivity එකක් මේකට දෙන්න කියලා. නමුත්, මෙතැනදී exclusivity එකක් දීලා තිබෙනවා. එහෙම නම් අපි exclusivity එකක් දුන්නේ කොහොමද කියන ගැටලුව මතු වෙනවා කියලා කාරක සභාව හොයා ගෙන තිබෙනවා.

ඊළඟ ගැටලුව, uninvested fund. ගරු කථානායකතුමනි, Cabinet Paper එකේ තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක ආයෝජනයක් ඒ අය කරනවා කියලා. අපේ කාරක සභාව හොයා ගත්ත දේ තමයි, කිසිම තැනක ඩොලර් මිලියන 200ක් ගැන තියා රුපියල් මිලියන 200ක් ගැනවත් සඳහන් වෙන්නේ නැහැ කියන එක. ඩොලර් මිලියන 200ක ආයෝජනයක් ගෙනෙනවා කියලා ඒ ආයතනය අපි ගත්තාට, ඩොලර් මිලියන 200ක් තියා රුපියල් මිලියන 200ක්වත් ඔවුන් වියදම් කරලා නැහැ, ආයෝජනය කරලා නැහැ. ඒ ගැන මොකුත් සඳහන් වෙන්නේත් නැහැ.

ඒ නිසා අපේ recommendation එක, එහෙම නැත්නම් conclusion එක මෙකයි, ගරු කථානායකතුමනි: "The Committee recommends that the Auditor-General undertakes a comprehensive forensic audit of the entire procurement process utilized in the findings outlined in this Report." විගණකාධිපතිවරයා විසින් මෙම වාර්තාවේ ඇති දත්ත උපයෝගි කරගෙන සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුළුල් වෝහාරික විගණනයක් සිද්ධ කළ යුතුයි කියන එක තමයි කාරක සභාවේ නිර්දේශය, ගරු කථානායකතුමනි. ජූනි මාසයේ 04වැනි දා පැවැති කාරක සභාවේදී විගණකාධිපතිතුමාගේ නියෝජිතයා කිව්වා, ඔවුන් විසින්ම වෝහාරික විගණනයක් පටන් අරගෙන තිබෙනවා කියලා, අපි කියන්නත් කලින්. මේ වාර්තාව අනුව ඔබතුමා විගණකාධිපතිතුමාට නිර්දේශයක් දුන්නොත් හොඳයි, ඒ කටයුතු වහාම අවසන් කරලා, ඒ වාර්තාව ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය සියලුදෙනාට ඉදිරිපත් කරන්න කියලා, මේ පාර්ලිමේන්තුවත් ඇතුළුව. ඒ සොයා ගත්ත කාරණා, අවශ්‍ය ක්‍රියා මාර්ග තීරණය කිරීම සඳහා පදනම් ලෙස සැලකිය යුතු වෙනවා. එවැනි ක්‍රියා මාර්ගවලදී සමාගම සමඟ ඇති බාහිර සේවා අවලංගු කිරීම හෝ ඒ තුළ නිශ්චිත වගන්ති සංශෝධනය කිරීමක් ඇතුළත් විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. ඉතින්, ඔය දෙකෙන් එකක් කරන්න පුළුවන්. එක්කෝ, අවලංගු කරන්න පුළුවන්; අලුතින් මේ ගැන කථා කරන්න පුළුවන්. එහෙම නැත්නම් මේ තිබෙන වගන්ති සංශෝධනයකට ඇතුළත් කරන්න පුළුවන්.

ගරු කථානායකතුමනි අපේ නිර්දේශ තමයි, ආරක්ෂා සහිතව තිබිය යුතු දත්ත leak - data breach - වුණේ කොහොමද කියන එක. ඒක තවදුරටත් leak වෙන්න පුළුවන්ද? ඔවුන් අපට කිව්වා, KPMG සමාගම සමාලෝචනය කරන ලෙසටත්, ඉලෙක්ට්‍රොනික ගමන් බලපත්‍ර ක්‍රමය හරහා ලබා ගන්නා වීසා අයදුම් කිරීමේ ක්‍රියාවලිය හරහා හසුරුවන සියලු දත්තවල පූර්ණ ආරක්ෂාව සහ එම ආරක්ෂාව සහතික කිරීම සඳහා කඩිනම් හා තීරණාත්මක ක්‍රියා මාර්ග ගන්නා ලෙසටත්, කාරක සභාව මඟින් මහජන ආරක්ෂක අමාත්‍යාංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය වෙත නිර්දේශ කරනවා කියලා. මොකද, මේ දත්තවල සුරක්ෂිතභාවය අතිශයින් වැදගත් වෙනවා. ඒවා කිසිම විධියකට එළියට යන්න බැහැ. ඒවා ආරක්ෂා වෙන්න ඕනෑ. ඔන්න ඔය මූලික කාරණා තමයි ගරු කථානායකතුමනි, අපේ කාරක සභාවෙන් නිගමනය කරලා නිර්දේශ කර තිබෙන්නේ. මේ සියලු වාර්තා අපි අද සභාගත කරනවා.

නැවතත් මම ස්තුතිවන්ත වෙනවා, ඔබතුමාට. මොකද, මම අපහසුතාවට පත් වෙච්ච වෙලාවේ ඔබතුමාට මා කථා කළා. ඔබතුමා මට පෞද්ගලිකව ඒ සඳහා උපදෙස් හා අවවාද ලබා දුන්නා. මම ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියටත් මම ස්තුතිවන්ත වෙනවා. එතුමියත් අපහසුතාවට පත් වුණා. ඒ ගැන අපි කනගාටුවට පත් වෙනවා, කාරක සභාව වෙනුවෙන්. මගේ කාරක සභාවේ සිටින සියලු පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන්ට මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. ඒ සියලුදෙනාට මම අවස්ථාව ලබා දුන්නා. සමහර මන්ත්‍රීවරු ඔවුන්ගේ යෝජනා මේකට එකතු කරන්න කියලා ඉදිරිපත් කළා. ඒවා වචනයක්වත් වෙනස් නොකර අපි මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා. මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

එකම දෙයයි. මෙය බොහොම අමාරුවෙන් කළ විශ්ලේෂණයක්. මේකේ නිගමන සහ නිර්දේශ තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කරන්න කියා මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(*මාණ්පුමිකු சட்டத்தரணி றவுப் ஹகீம்*)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

Hon. Speaker, I am also a Member of that Committee. Yesterday also I pointed out that with this deal, there is a serious implication for the country. I talked, in my speech yesterday, about the drop in tourist arrivals, that when you compare the tourist arrivals in the country duing the period of the first three months of this year with that of last year, a heavy drop has been observed. I questioned the Sri Lanka Tourism Development Authority's Director General at a meeting of the Committee on Public Finance. I showed him the graph and the details, and he agreed before the Committee that this drop is because of this new visa fiasco. This is causing severe stress economically for the country and ultimately, that is what is going to happen. We have also agreed with the IMF to have a Governance Diagnostic Assessment of our Government's activities. This is a serious violation of procurement procedures and therefore, this is going to impact even on the IMF programme. That is what I see. I have also annexed a separate report with some details, which I have taken up at the Committee. Ultimately, the amount of money that will be transferred to this new entity after 16 years is almost US Dollars 2.65 billion, and this is going to result in a serious violation of financial discipline in the country.

Therefore, this has to be thoroughly probed without waiting for the so-called forensic report from the Auditor-General. Now, this is a property of the House. Sir, it has been presented to you and you are the Speaker. You can invite the Attorney-General to examine this and refer it to the Criminal Investigation Department or the Commission to Investigate Allegations of Bribery or Corruption because this has serious implications. I dare say that this is 10 times more than the Central Bank bond scam. That is my estimation and I take responsibility for what I am saying. Some of our Hon. Members are also looking at other options, but I would invite your attention to this, Hon. Speaker, because this has a serious implication for the country. Therefore, this must be referred to the Attorney-General, the CID and the Commission to Investigate Allegations of Bribery or Corruption to go into the background regarding this matter.

Thank you.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(*මාණ්පුමිකු (கலாநிதி) ஹர்ஷ த சில்வா*)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මෙම වාර්තාවේ සිංහල හා දෙමළ භාෂා පිටපත් ඉදිරි දින කිහිපය තුළ පාර්ලිමේන්තු පුස්තකාලයෙන් සහ පාර්ලිමේන්තු වෙබ් අඩවියෙන් ලබාගන්න පුළුවන්. අපි අද ඉංග්‍රීසි පිටපත තමයි ඉදිරිපත් කළේ.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ජේ.සී. අලවතුවල මහතා
(*මාණ්පුමිකු ஜே.சீ. அலவத்துவல*)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මැල්සිරිපුර, අඹන්පොල යන ලිපිනයෙහි පදිංචි ඒ.යූ. මධුර විජයපාල මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගලගෙදර, උණපතයාය, අංක 185-බී දරන ස්ථානයෙහි පදිංචි ජී.ඒ. සුභද්‍රා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු (ආචාර්ය) (මේජර්) ප්‍රදීප් උදුගොඩ මහතා
(*මාණ්පුමිකු (கலாநிதி) (மேஜர்) பிரதீப் உந்துகொட*)
(The Hon. (Dr.) (Major) Pradeep Undugoda)

ගරු කථානායකතුමනි, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, දර්ශන මාවත, අංක 139/13, (1011) දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ. කෞෂාල් මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(*මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -592/2024 - (1), ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -614/2024 - (1), ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -638/2024 - (1), ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -1093/2024 - (1), ගරු සමන්ප්‍රිය හේරත් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

රජය සතු වී ගබඩා: විස්තර
அரச நெற்களஞ்சியசாலைகள்: விபரம்
GOVERNMENT-OWNED PADDY WAREHOUSES: DETAILS

1128/2024

5. ගරු ඩී. වීරසිංහ මහතා
(*මාණ්පුමිකු டீ. வீரசிங்க*)
(The Hon. D. Weerasingha)

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති ප්‍රදේශ කවරේද;

(iii) මේ වනවිට ඒවායේ ගබඩා කර ඇති වී ප්‍රමාණය කොපමණද;

(iv) නව වී ගබඩා ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, කවර ප්‍රදේශවලද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) රජයේ වී ගබඩා වෙනත් කාර්යයන් සඳහා භාවිත කර තිබේද;

(ii) එසේ නම්, එම කාර්යයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள அரச நெற்களஞ்சியசாலைகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அவை நிறுவப்பட்டுள்ள பிரதேசங்கள் யாவையென்பதையும்;

(iii) இன்றளவில் அவற்றில் களஞ்சியப்படுத்தப்பட்டுள்ள நெல்லின் அளவு யாதென்பதையும்;

(iv) புதிய நெற்களஞ்சியசாலைகளை நிர்மாணிப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், எப்பிரதேசங்களில் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அரச நெற்களஞ்சியசாலைகள் வேறு செயற்பாடுகளுக்காகப் பயன்படுத்தப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், அச்செயற்பாடுகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Will he inform this House -

(i) the number of government-owned paddy warehouses in Sri Lanka;

(ii) the areas where they are established;

(iii) the quantity of paddy stored in them at present;

(iv) whether it is planned to construct new paddy warehouses; and

(v) if so, in which areas?

(b) Will he also inform this House -

(i) whether the government-owned paddy warehouses have been used for other purposes; and

(ii) if so, what those purposes are?

(c) If not, why?

ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)

(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ගබඩා 353කි.

(ii)

කලාපය	දිස්ත්‍රික්කය	ගබඩා ගණන
වයඹ	කුරුණෑගල	19
	පුත්තලම	7
	මාතලේ	2
	ගම්පහ	2
නැගෙනහිර	ත්‍රිකුණාමලය	24
	මඩකලපුව	10
දකුණ	මොනරාගල	9
	රත්නපුර	8
	හම්බන්තොට	19
	ගාල්ල	0
	මාතර	1
අම්පාර	අම්පාර	67
	බදුල්ල	7
	මහනුවර	10
අනුරාධපුරය	අනුරාධපුරය	69
	මාතලේ	4
	ත්‍රිකුණාමලය	1
පොළොන්නරුව	පොළොන්නරුව	57
	මාතලේ	3
උතුර	කිලිනොච්චිය	8
	වවුනියාව	7
	මුලතිව්	14
	මන්නාරම	4
	යාපනය	1
එකතුව		**353**

(iii) 2023/24 මහ කන්නය තුළ දී කිලෝග්‍රෑම් 2,637,826ක වී තොග අම්පාර, මොනරාගල, රත්නපුර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවලින් මිලදී ගෙන මේ වනවිට එම වී තොග නිකුත් කරමින් පවතිනවා. ඒ ගැන සවිස්තර වාර්තාවක් තිබෙනවා. එය පහත දැක්වෙනවා.

[ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා]

2023/24 මහ කන්නයේ මිලදී ගෙන ඇති වී තොග ප්‍රමාණය

2023 /24 මහ කන්නය - වී මිලදී ගැනීම - වී අලෙවි මණ්ඩලය
අවසන් කොළ වාර්තාව (2024.04.25)

	ගබඩාව	දිස්ත්‍රික්කය	බැංකු ගබඩාව	ගොවීන් ගණන	මිලදී ගත් ප්‍රමාණය kg					මුළු වී ප්‍රමාණය kg	එකතුව (රු)
					සුදු නාඩු	රතු නාඩු	සුදු සම්බා	රතු සම්බා	කීරි සම්බා		
A1	පුතුමී	අම්පාර	පහාම	49	-	98,660	-	-	-	98,660	10,359,300
A2	පොල්වත්ත	අම්පාර	නාමල්තලව *	4	-	5,780	-	-	-	5,780	606,900
A3	අම්පාර 02	අම්පාර	නාමල්තලව *	70	-	123,460	-	-	-	123,460	12,963,300
A4	අම්පාර 02	අම්පාර	මල්වත්ත *	115	-	321,693	-	-	-	321,693	33,777,765
A5	සම්බතුවර් 01	අම්පාර	මල්වත්ත *	156	-	352,362	-	-	-	352,362	36,998,010
A6	වීරගොඩ 02	අම්පාර	මධ්‍යම කඳුර	166	-	374,789	-	-	-	374,789	39,352,845
S1	කවිමඳුන්දර	මඩකලපුව	අලුතුඔයපුල	145	-	295,172	-	-	-	295,172	30,993,060
S2	පුරියඩව	මඩකලපුව	මියුරුපුර	64	-	111,793	-	4,369	-	116,162	12,262,545
S3	යෝධාකණ්ඩිය	මඩකලපුව	යෝධාකණ්ඩිය	117	-	273,500	-	-	-	273,500	28,717,500
S4	විරිවිල 1	මඩකලපුව	විරිවිල	62	-	119,774	-	-	-	119,774	12,576,270
S5	දෙමිහඳලන්ද 03	මඩකලපුව	අම්පාරහාමට	106	-	206,985	-	-	-	206,985	21,733,425
S6	අලුත්වැව	මහනුවර	අලුත්වැව	73	-	165,262	-	-	-	165,262	17,352,510
S7	මොරකඋඩය	රත්නපුර	අඹිලිපිටිය	90	-	181,586	-	2,641	-	184,227	19,383,450
				1,217	-	2,630,816.00	-	7,010.00	-	2,637,826	277,076,880.00
අම්පාර කලාපය (A)		මුළු මිලදී ගැනීම්		560	-	1,276,744	-	-	-	1,276,744	134,058,120
අනුරු කලාපය (S)		මුළු මිලදී ගැනීම්		657	-	1,354,072	-	7,010	-	1,361,082	143,018,760
එකතුව				1,217		2,630,816	-	7,010	-	2,637,826	277,076,880
		අම්පාර		560	-	1,276,744	-	-	-	1,276,744	134,058,120
		මඩකලපුව		494	-	1,007,224	-	4,369	-	1,011,593	106,282,800
		මහනුවර		73	-	165,262	-	-	-	165,262	17,352,510
		රත්නපුර		90	-	181,586	-	2,641	-	184,227	19,383,450
		එකතුව		1,217	-	2,630,816	-	7,010	-	2,637,826	277,076,880

(iv) නව වී ගබඩා ඉදි කිරීමට සැලසුම් කරලා නැහැ.

(v) අදාළ නොවේ.

(ආ) (i) ඔව්, වී ගබඩා නොකරන ගබඩා වෙනත් කාර්යයන් සඳහා යොදා ගන්නවා.

(ii) පෞද්ගලික අංශය සහ රජයේ ආයතන විසින් වී අලෙවි මණ්ඩලයෙන් මෙම ගබඩා බදු පදනම මත ලබා ගෙන වෙළඳ හා පරිපාලන කටයුතු පවත්වාගෙන යෑම සඳහා භාවිත කර තිබෙනවා.

(ඇ) අදාළ නොවේ.

ගරු ඩී. වීරසිංහ මහතා
(மாண்புமிகு டீ. வீரசிங்க)
(The Hon. D. Weerasingha)

ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැනට වී ගබඩා විශාල සංඛ්‍යාවක් ඉදිකර තිබෙනවා. ඒවා අතුරින් කවදාවත් වී ගබඩා කර නැති ගබඩාත් තිබෙනවා. රජයට සම්බන්ධ මොනවා හරි ආයතනයකට එම ගබඩා මාසික කුලිය මත අරගෙන යම් කටයුත්තක් කරන්න අපට ඉඩ දෙන්න පුළුවන් ද කියලා දැන ගන්න කැමැතියි.

ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
(மாண்புமிகு சட்டத்தரணி மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva, Attorney-at-Law)

පුළුවන්. දැනටමත් ප්‍රයෝජනයට නොගන්නා ගබඩා බදු පදනම මත ලබා දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉල්ලීමක් කරන්න, අපි ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -1155/2024- (1), ගරු මධුර විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 -1247/2024 - (1), ගරු ඉරාන් වික්‍රමරත්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය: බලපත්‍ර නිකුත් කිරීම කෙරෙහි බලපෑම්

புவிச்சரிதவியல் அளவை மற்றும் சுரங்கப் பணியகம்: அனுமதிப் பத்திரங்களை வழங்குவதில் அழுத்தம் பிரயோகித்தல்

GEOLOGICAL SURVEY AND MINES BUREAU: INFLUENCE ON ISSUING LICENCES

1253/2024

8. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) බලපත්‍ර නිකුත් කිරීමේදී එම කාර්යාංශය විසින් අනුගමනය කරනු ලබන ක්‍රමය කවරේද;

(iii) බලපත්‍ර නිකුත් කිරීමේදී එම ක්‍රියාවලියේ ස්වාධීනත්වයට බලපෑම් එල්ල වන බව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අනාවරණය වී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(v) මේ වන විට දූෂිත ආයතනයක් බවට පත් වී ඇති ඉහත ආයතනය, එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை புவிச் சரிதவியல் அளவை மற்றும் சுரங்கப் பணியகத் தினால் வழங்கப்பட்டுள்ள அனுமதிப் பத்திரங் களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அனுமதிப் பத்திரங்களை வழங்கும்போது, அப் பணியகம் பின்பற்றும் முறையியல் யாதென் பதையும்;

(iii) அனுமதிப் பத்திரம் வழங்கும்போது, அச்செயன் முறையின் சுயாதீனத் தன்மைக்கு அழுத்தம் விடுக்கப்படுவதாகப் பாராளுமன்றத்தின் அரசாங்கப் பொறுப்பு முயற்சிகள் பற்றிய குழுக் கூட்டத்தின்போது தெரியவந்துள்ளமையை அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், அனுமதிப்பத்திரம் வழங்கும் செயன்முறையின் சுயாதீனத்தன்மையைப் பாது காப்பதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக் கைகள் யாவை என்பதையும்;

[ඉහත වගුව පුස්තකාලයේ ද තබා ඇත.]
[மேற்படி அட்டவணை நூல்நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.]
[The above table is also placed in the Library.]

(v) இன்றளவில் ஊழல் நிறைந்த நிறுவனமாக மாறியுள்ள மேற்படி நிறுவனத்தை, அந்நிலையிலிருந்து மீட்டெடுப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the number of licences that have been issued by the Geological Survey and Mines Bureau since 2015 to date;

(ii) the procedure followed by the said Bureau in issuing licences;

(iii) whether he is aware that it has been revealed in the Committee on Public Enterprises of Parliament that the independence of the licensing process is being influenced;

(iv) if so, the measures that have been taken to ensure the independence of the licensing process; and

(v) the measures that will be taken to restore the above institution out of the corrupt situation it is in?

(b) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් ගවේෂණ බලපත්‍ර, ශිල්පීය කැණීම් ඒ (AML A), ශිල්පීය කැණීම් බී (AML B), කාර්මික කැණීම් ඒ (IML A), කාර්මික කැණීම් බී (IML B), කාර්මික කැණීම් සී (IML C), කාර්මික කැණීම් ඩී (IML D), වෙළඳ බලපත්‍ර ඒ (TDL A), වෙළඳ බලපත්‍ර බී (TDL B), වෙළඳ බලපත්‍ර සී (TDL C) ලෙස බලපත්‍ර නිකුත් කරන අතර, (වගුව 01) මඟින් වර්ෂ 2015 සිට 2023 දක්වා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කර ඇති එම බලපත්‍ර සංඛ්‍යාව පහත පරිදි ඉදිරිපත් කරමි.

වගුව 01:

වර්ෂය	නිකුත් කර ඇති බලපත්‍ර ප්‍රමාණය
2015	8,606
2016	8,606
2017	8,944
2018	10,358
2019	10,376
2020	10,805
2021	10,097
2022	8,056
2023	7,795
එකතුව	**83,643**

ඊට අමතරව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් ප්‍රවාහන හා අපනයන බලපත්‍ර ද නිකුත් කරනු ලැබේ. වර්ෂ 2015 සිට 2023 දක්වා නිකුත් කර ඇති එම බලපත්‍ර ප්‍රමාණය වගුව 02 මඟින් පහත පරිදි ඉදිරිපත් කරමි.

වගුව 02:

වර්ෂය	නිකුත් කර ඇති ප්‍රවාහන බලපත්‍ර ප්‍රමාණය	නිකුත් කර ඇති අපනයන බලපත්‍ර ප්‍රමාණය
2015	578,733	491
2016	578,733	491
2017	836,061	582
2018	999,772	623
2019	1,069,093	675
2020	684,727	573
2021	744,103	575
2022	560,803	666
2023	378,285	576
එකතුව	**6,430,310**	**5,252**

(ii) කාර්යාංශය කාණ්ඩ 05ක් යටතේ බලපත්‍ර නිකුත් කරනු ලබයි. එනම්,

1. ගවේෂණ බලපත්‍ර
2. අපනයන බලපත්‍ර
3. කැණීම් බලපත්‍ර
4. ගබඩා බලපත්‍ර
5. ප්‍රවාහන බලපත්‍ර

මෙම පස් ආකාර බලපත්‍ර නිකුත් කිරීම සඳහා කාර්යාංශය විසින් අනුගමනය කරනු ලබන ක්‍රම වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැක.

<u>ගවේෂණ බලපත්‍ර</u> - යම් ප්‍රදේශයක පවතින ඛනිජ සංචිතයක සංචිත ප්‍රමාණය හා එහි ගුණාත්මකභාවය හඳුනා ගැනීම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර වර්ගය ගවේෂණ බලපත්‍ර වේ. මෙම බලපත්‍රයක් යටතේ අවසර දෙනු ලබන නිශ්චිත ඛනිජ වර්ගය බලපත්‍ර ලත් නිශ්චිත භූමි සීමාව තුළ ගවේෂණය කිරීම සඳහා නෛතික බලය බලපත්‍රලාභියාට හිමි වේ. වර්ග කිලෝමීටර 01ක අවම භූමි සීමාවක සිට වර්ග කිලෝමීටර 100ක උපරිම භූමි සීමාවක් දක්වා ගවේෂණ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ප්‍රතිපාදන පවතී.

කාර්යාංශය වෙත නිසි ගාස්තු හා මූලික ලිපි ලේඛන සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් ලිපියක් පදනම් කරගෙන අදාළ ප්‍රදේශය ගවේෂණය සඳහා විවෘතව පවතී නම්, එම ප්‍රදේශය සඳහා පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 30වන වගන්තිය ප්‍රකාරව අවශ්‍ය වන ආයතනික නිර්දේශ ලබා ගැනීම සඳහා විවෘත කරන සන්නිවේදන ලිපි ගොනුවක් යටතේ ලිපි නිකුත් කිරීම කාර්යාංශය විසින් සිදු කරනු ලබයි.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන මහතා]

අදාළ නිර්දේශ ලද පසු එම නිර්දේශ සමඟින් එකී ප්‍රදේශය සඳහා ගවේෂණ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන ගවේෂණ අයදුම්පත නිසි ගාස්තු සමඟින් කාර්යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

ගවේෂණ අයදුම්පත්‍රය භාර ගැනීමෙන් අනතුරුව එම යෝජිත ගවේෂණ ප්‍රදේශය අයදුම්කරු වෙනුවෙන් වෙන් කිරීම සිදු වන අතර, අයදුම්කරු විසින් සපයා ඇති තොරතුරු හා ව්‍යාපෘති වාර්තාව තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් ඇගයීමට ලක් කරනු ලබයි. අනතුරුව එකී කමිටුවේ නිර්දේශ මත අදාළ අයදුම්පත්‍රය සඳහා බලපත්‍ර නිකුත් කිරීම හෝ අදාළ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීම කාර්යාංශය විසින් සිදු කරනු ලබයි.

<u>අපනයන බලපත්‍ර</u> - ගවේෂණ බලපත්‍ර යටතේ සහ කාර්යාංශයේ අවසරලත් කැණීම් බලපත්‍ර සමඟ ගිවිසුම්ගතව නිකුත් කොට ඇති TDL/A කාණ්ඩයේ ගබඩා බලපත්‍ර හෝ A හෝ B කාණ්ඩයේ කාර්මික කැණීම් බලපත්‍රයක් යටතේ අපනයන බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

මෙහිදී අපනයන බලපත්‍ර නිකුත් කිරීමට අදාළ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත, ඉන්වොයිසිය, වෙළෙඳ බලපත්‍රය හෝ කැණීම් බලපත්‍රයේ පිටපතක් සහ රාජ්‍ය භාග පෝරමය ඉදිරිපත් කළ යුතුය. ඉන් පසු නියමිත පරිදි රාජ්‍ය භාගය හා බලපත්‍ර ගාස්තු ගෙවීමෙන් අනතුරුව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය යටතේ අපනයන බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

වෙළෙඳ (ගබඩා) බලපත්‍ර - කාර්යාංශය විසින් නිකුත් කරනු ලබන කැණීම් බලපත්‍රය යටතේ කැණීම් කරනු ලබන බනිජ වෙළෙඳාම් / ගබඩා කිරීම සඳහා වෙළෙඳ (ගබඩා) බලපත්‍රය ලබා දීම සිදු කරනු ලබයි. මෙහිදී වෙළෙඳාම් (ගබඩා) කරනු ලබන ඉඩමේ හිමිකාරිත්වයේ කැමැත්ත මත බනිජ වෙළෙඳාම් (ගබඩා) කිරීම සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබයි.

ඉඩමේ හිමිකාරිත්වයට අදාළ ලේඛන ද සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත කාර්යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාළ ගාස්තු ගෙවිය යුතුය. ඉන්පසු අනෙකුත් අදාළ ආයතනවල නිර්දේශ සහ කැණීම් ඉංජිනේරු තාක්ෂණික වාර්තාව ලැබීමෙන් අනතුරුව වෙළෙඳ බලපත්‍රය නිකුත් කරනු ලැබේ.

<u>ප්‍රවාහන බලපත්‍ර</u> - කාර්යාංශය විසින් නිකුත් කරනු ලබන කැණීම් බලපත්‍ර යටතේ කණිනු ලබන බනිජ හා වෙළෙඳ බලපත්‍ර යටතේ ගබඩා කොට ඇති බනිජ ප්‍රවාහනය සඳහා ප්‍රවාහන බලපත්‍ර නිකුත් කරනු ලබයි.

මෙහිදී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමට අදාළ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත, වලංගු වෙළෙඳ / කැණීම් බලපත්‍රයේ පිටපත හා මුල් පිටපත, මාර්ග භාවිතය සඳහා අවශ්‍ය අනුමැතීන් සමඟ කාර්යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය. ඉන් පසු නියමිත පරිදි රාජ්‍ය භාගය හා බලපත්‍ර ගාස්තු ගෙවීමෙන් අනතුරුව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

<u>කැණීම් බලපත්‍ර</u> - කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේදී එය කාර්මික බනිජ හා ගොඩනැඟිලි ද්‍රව්‍ය සඳහා වන බනිජ වර්ග ලෙස ප්‍රධාන වර්ග දෙකක් යටතේ බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

1992 අංක 33 දරන පතල් හා බනිජ ද්‍රව්‍ය පනතේ 51 වන වගන්තිය ප්‍රකාරව මෙම සෑම කැණීම් කටයුත්තක්ම ඉඩම් හිමියාගේ කැමැත්ත මත සිදු කළ යුතු අතර, එම කැමැත්ත යටතේ ලබා ගත්නා වූ කැණීම් අයදුම්පත් සඳහා කාර්යාංශයේ පනත ප්‍රකාරව බලපත්‍රයක් නිකුත් කිරීමට අදාළ නීති සහ අභ්‍යන්තර චක්‍රලේඛ අනුව අනෙකුත් ආයතනික නිර්දේශ සඳහා ඉල්ලීම් ලිපි ඉදිරිපත් කරනු ලබයි.

බලපත්‍ර ලබා ගැනීම සඳහා යොමු කරන ලද අයදුම්පත්‍රයට අදාළව ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබා ගැනීමෙන් අදාළ ස්ථානය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම සම්බන්ධ තාක්ෂණිකමය කරුණු පරීක්ෂා කිරීමක් සිදු කෙරේ.

සියලු තාක්ෂණික, පාරිසරික හා සමාජීය තත්ත්ව පරීක්ෂා කිරීම් සඳහා අදාළ අනෙකුත් ආයතනික නිර්දේශ සම්පූර්ණ වීමෙන් පසුව කාර්යාංශය විසින් නියමිත බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි.

මෙහිදී ගොඩනැඟිලි ද්‍රව්‍ය සඳහා නිකුත් කරනු ලබන කැණීම් බලපත්‍ර ජනාධිපති කාර්ය සාධක බලකා නිර්දේශ යටතේ සකස් කර ඇති ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාවිතා කරන බනිජ කැණීම, ප්‍රවාහනය හා වෙළෙඳාම පිළිබඳ කාර්යය සංග්‍රහයට අනුව නිකුත් කරනු ලැබේ.

(iii) බලපත්‍ර නිකුත් කිරීමේදී එම ක්‍රියාවලියේ ස්වාධීනත්වයට බලපෑම් එල්ලවන බව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කළ බවට කාර්යාංශය දැනුවත්ව සිටී.

(iv) බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග:

බලපත්‍ර නිකුත් කිරීමේදී ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය යටතේ පමණක් බලපත්‍ර නිකුත් කිරීම සඳහා මීට පෙර නිකුත් කර තිබූ අංක 226/11/2022 (ඇමුණුම 01) අහෝසි කර, 240/10/2023 හා 2023.10.20 දිනැති නව චක්‍රලේඛය (ඇමුණුම 02) නිකුත් කරන ලදී. මීට අමතරව, භූ සම්පත් පිළිබඳව ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් ලබා දී ඇති නිර්දේශ අනුව කටයුතු කරමින් බලපත්‍ර නිකුත් කිරීමේදී නිර්දේශ ලබාගත යුතු ආයතන සමඟ ඒකාබද්ධව කටයුතු කරමින් බලපත්‍ර නිකුත් කිරීම කඩිනම් කර ඇත.

(v) ඒ සම්බන්ධව ඇති වන අක්‍රමිකතා අවම කිරීමට කාර්යාංශය මඟින් මේ වන විට පියවර රාශියක් ගෙන ඇත.

- ප්‍රධාන කාර්යාලය තුළ හා ප්‍රාදේශීය කාර්යාලය තුළ බලපත්‍ර සැකසීමේ ක්‍රමය කාර්යක්ෂම කිරීම සඳහා 2023.07.14 දිනැති DMT/In.Memo/2023/048 (ඇමුණුම 03) සහ 2024.02.26 දිනැති SDM/K/2024/IN/40 (ඇමුණුම 04) වැනි අභ්‍යන්තර මැයෙන් නව චක්‍රලේඛ නිකුත් කිරීම සිදු කරනු ලබයි.
- නව කළමනාකාරිත්වය යටතේ කඩිනමින් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමයට ප්‍රමුඛතාව ලබා දී බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමය ඩිජිටල්කරණය කිරීම සඳහා සැලසුම් කරමින් පවතී.

- කාර්යාංශ නිල වෙබ් අඩවිය සඳහා කාර්යාංශයේ පුස්තකාලයෙහි පවතින වාර්තා ද ඕනෑම අයෙකුට පරිශීලනය කළ හැකි අයුරින් ඇතුළත් කර යාවත්කාලීන කර ඇත.
- කාර්යාංශය වෙත බහිජ කැණීම් හෝ ප්‍රවාහනය සම්බන්ධයෙන් වන පැමිණිලි ක්ෂණිකව ලබා දීම සඳහා 1921 හදිසි පැමිණිලි දුරකථන අංකයක් ලබා දී ඇති අතර, කාර්යාංශයේ වැටලීම් අංශය මේ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සඳහා සක්‍රියව පවතී.
- කැණීම් භූමි පුනරුත්ථාපනය කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා කාර්යාංශයේ අංක 236/04/2023 (ඇමුණුම 05) අභ්‍යන්තර චක්‍රලේඛය 2023.05.01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

  01 සිට 05 දක්වා වන ඇමුණුම් **සභාගත*** කරමි.

(ආ) කාර්යාංශය විසින් දන්වා ඇත.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු ඇමතිතුමනි, අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්ද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
අහන්න, ගරු මන්ත්‍රීතුමා. උත්තර දෙන්න පුළුවන් ප්‍රශ්නවලට මම උත්තර දෙන්නම්.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු ඇමතිතුමනි, පරිසර අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්නයක් ගැන කථා කරන මේ මොහොතේ මම මේ කාරණය අහන්න කැමැතියි. අපට මතකයි, මීට වසර කිහිපයකට කලින් මීතොටමුල්ල කුණු කන්ද කඩාගෙන වැටුණු බව. ඒ නිසා ජීවිත 40කට ආසන්න ප්‍රමාණයක් අහිමි වුණා. ගරු ඇමතිතුමනි, ඒ සිදුවීමෙන් පසු කොළඹ දිස්ත්‍රික්කයේ දවසකට එකතු වෙන ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 600කට ආසන්න ප්‍රමාණයක් වත්තල ප්‍රදේශයේ පහත් බිම් ප්‍රදේශයකට මුදා හරිනවා. ඒක ඉතා අවිධිමත් ආකාරයට සිදු වෙන්නේ. ඒ නිසා වත්තල ප්‍රදේශයේ ජීවත්වෙන ජනතාවට පාරිසරික ප්‍රශ්නයක්, සෞඛ්‍ය ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ බැහැර කරන අපද්‍රව්‍යයත් එක්ක ඒ ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති කිසිවක් කරන්න විධියක් නැහැ. මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. මේ සඳහා රජයට විසඳුමක් තිබෙනවාද? විශේෂයෙන්ම අපද්‍රව්‍ය කළමනාකරණය සහ නව තාක්ෂණය භාවිත කරලා ඒ ප්‍රදේශයට අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවට යම් කිසි විකල්ප ක්‍රමයක් තිබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි, ගරු ඇමතිතුමනි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම දන්නා ආකාරයට බිලූමැන්ඩල් කුණු කන්ද කඩාගෙන වැටුණේ 2017, 2018 වාගේ වකවානුවක. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කියන කාරණයේදී විවෘතව ඝන අපද්‍රව්‍ය බැහැර කරනවාද? එහෙම නැත්නම් යම් ආයතනයකට ලබා දෙනවාද?

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ඒවා පහත් බිමකට මුදා හරින්නේ, ගරු ඇමතිතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
සාමාන්‍යයෙන් ඝන අපද්‍රව්‍ය පහත් බිම්වලට මුදා හරින්න බැහැ. මම දන්නා පමණින් ලංකාවේ පෞද්ගලික ආයතනයක් මෙගාවොට් 10ක් හෝ ඊට වැඩි ගණනක විදුලිය බලය ජනනයට - power generation සඳහා - කොළඹ ප්‍රදේශයේ එකතු වෙන ඝන අපද්‍රව්‍ය රාශියක් ගන්නවා. මම ඔය කාරණය පිළිබඳව ඔවුන්ගේ අවධානය යොමු කරවන්නම්, එහෙම වෙනවා නම් ඒක වහාම නවත්වන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -1282/2024- (1), ගරු අසංක නවරත්න මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 -1287/2024- (1), ගරු කිංස් නෙල්සන් මහතා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 1 -592/2024- (1), ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්ඩලික කටයුතු අමාත්‍ය සහ නායකතුමා)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -614/2024- (1), ගරු ජයන්ත සමරවීර මහතා.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කිරි හා බිත්තර නිෂ්පාදනය: විස්තර
பால் மற்றும் முட்டை உற்பத்தி: விபரம்
MILK AND EGG PRODUCTION: DETAILS

638/2024

3. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு பீ.வை.ஜீ. ரத்னசேக்கர சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon B. Y. G. Rathnasekara)
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ මුළු කිරි අවශ්‍යතාව කොපමණද;

(ii) එම කිරි අවශ්‍යතාවෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන ප්‍රමාණය කොපමණද;

(iii) 2023 වර්ෂයේදී කිරිපිටි ආනයනය කිරීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු බිත්තර නිෂ්පාදනය කොපමණද;

(ii) 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී බිත්තර නිෂ්පාදනය උච්චාවචනය වී ඇති ආකාරය කෙසේද;

(iii) මේ වනවිට බිත්තරයක නිෂ්පාදන වියදම කොපමණද;

(iv) නිෂ්පාදන වියදම අඩු කර, බිත්තර මිල අඩු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் பாலுக்கான முழுத் தேவை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி பாலுக்கான தேவையில் இலங்கையில் உற்பத்தி செய்யப்படுகின்ற அளவு எவ்வளவென் பதையும்;

(iii) 2023ஆம் ஆண்டில் பால் மா இறக்குமதிக்காகச் செலவிடப்பட்டுள்ள தொகை எவ்வளவென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2023ஆம் ஆண்டில் இலங்கையின் மொத்த முட்டை உற்பத்தி எவ்வளவென்பதையும்;

(ii) 2022ஆம் ஆண்டுக்கு நிகராக 2023ஆம் ஆண்டில் முட்டை உற்பத்தியின் ஏற்ற இறக்கம் எவ்வாறு காணப்பட்டுள்ளதென்பதையும்;

(iii) இன்றளவில் முட்டையொன்றின் உற்பத்திச் செலவு எவ்வளவென்பதையும்;

(iv) உற்பத்திச் செலவைக் குறைத்து, முட்டை விலையைக் குறைப்பதற்கு மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Will he inform this House -

(i) the total milk requirement of Sri Lanka;

(ii) the quantity of milk produced in Sri Lanka, as opposed to the requirement; and

(iii) the amount spent on importing milk powder in the year 2023?

(b) Will he also inform this House -

(i) the total egg production in Sri Lanka in the year 2023;

(ii) as to how the egg production has been fluctuated in year 2023 in comparison to the year 2022;

(iii) the current production cost of an egg; and

(iv) the measures that have been taken to reduce the cost of production and the prices of eggs?

(c) If not, why?

ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture and Plantation Industries)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික මුළු කිරි අවශ්‍යතාව ලීටර මිලියන 1,200ක් පමණ වේ.

(ii) 2023 වාර්ෂික දත්ත අනුව ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලැබූ කිරි ප්‍රමාණය ලීටර මිලියන 370.32කි.

(iii) රේගු දෙපාර්තමේන්තුවේ දත්ත අනුව 2023 වර්ෂයේදී ආනයනය කර ඇති කිරිපිටි ප්‍රමාණය මෙට්‍රික්ටොන් 67,780ක් වන අතර ඒ සඳහා වැය කර ඇති මුදල රුපියල් බිලියන 84.31කි.

(ආ) (i) 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු බිත්තර නිෂ්පාදනය මිලියන 2,043.50ක් පමණ වේ.

(ii) 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී බිත්තර නිෂ්පාදනය මාසිකව උච්චාවචනය වී ඇති ආකාරය පහත වගුවේ දැක්වේ.

මාසය	බිත්තර නිෂ්පාදනය	
	2022 (මිලියන)	2023 (මිලියන)
ජනවාරි	268.53	165.92
පෙබරවාරි	265.53	178.10
මාර්තු	207.60	181.88
අප්‍රේල්	186.41	177.87
මැයි	168.42	191.78
ජූනි	163.43	176.90
ජූලි	164.94	171.50
අගෝස්තු	171.17	165.77
සැප්තැම්බර්	129.08	147.97
ඔක්තෝබර්	128.72	154.69
නොවැම්බර්	122.95	159.39
දෙසැම්බර්	112.90	171.82
එකතුව	2,089.70	2,043.58

(iii) බිත්තරයක නිෂ්පාදන වියදම

මහා පරිමාණ - රු. 31.67

කුඩා පරිමාණ - රු. 34.59 පමණ වේ.

(iv) බිත්තර නිෂ්පාදන වියදමින් සියයට 90ක් පමණ සත්ව ආහාර සඳහා වැය වේ. සත්ව ආහාරවල මිල රඳා පවතින්නේ සත්ව ආහාර අමුද්‍රව්‍යවල මිල මතයි. නමුත් සත්ව ආහාර අමුද්‍රව්‍යවල මිල පාලනය කිරීම සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අධිකාරී බලයක් නොමැත. සත්ව ආහාර අමුද්‍රව්‍යවලින් සියයට 60ක් පමණ ආනයනය කරනු ලබයි. එම අමුද්‍රව්‍ය කලට වේලාවට බාධාවකින් තොරව ආනයනය කරගැනීම පහසුකරණය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් ප්‍රමාදයකින් තොරව සිදු කර ඇත. එමෙන්ම දේශීය බඩඉරිඟු නිෂ්පාදනය සත්ව ආහාර නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් නොවන බැවින් අවශ්‍ය අතිරේක බඩඉරිඟු ප්‍රමාණය ආනයනය කරගැනීම සඳහා රට්ට අදාළ දෙපාර්තමේන්තු සමඟ කටයුතු කර ඇත.

තවද සත්ව ආහාර නිෂ්පාදනයට අදාළ අමුද්‍රව්‍ය සහ කුකුළු කර්මාන්තයට අවශ්‍ය උපකරණ ආනයනයේදී තීරුබදු සහන ලබා ගැනීම සඳහා නිර්දේශ ලිපි නිකුත් කිරීම කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් සිදු කෙරේ.

(ඇ) අදාළ නොවේ.

සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිති: කුරුණෑගල දිස්ත්‍රික්කය
வ/ப பல்நோக்குக் கூட்டுறவுச் சங்கங்கள்: குருநாகல் மாவட்டம்
MULTIPURPOSE CO-OPERATIVE SOCIETIES: KURUNEGALA DISTRICT

1093/2024

4. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු සමන්ප්‍රිය හේරත් මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு சமன்பிரிய ஹேரத் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Samanpriya Herath)

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමුපකාර සමිති මඟින් සපයනු ලබන සේවා කවරේද;

(iv) එම සමිති මඟින් පාලනය වන ප්‍රාදේශීය අලෙවිසල් සංඛ්‍යාව කොපමණද;

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

වර්ත්තක, වාණිප මற்றும் உணவுப் பாதுகாப்பு அமைச் சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்தில் அமைந்துள்ள வரை யறுக்கப்பட்ட பல்நோக்குக் கூட்டுறவுச் சங்கங் களின் எண்ணிக்கை யாது;

(ii) அவற்றில் பணியாற்றும் ஊழியர்களின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி கூட்டுறவுச் சங்கங்களினால் வழங்கப் படும் சேவைகள் யாவை;

(iv) மேற்படி சங்கங்களினால் நிருவகிக்கப்படும் பிரதேச விற்பனை நிலையங்களின் எண்ணிக்கை யாது;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(v) குருநாகல் மாவட்டத்தில் கூட்டுறவு இயக்கத்தை மேம்படுத்துவதற்காகப் பின்பற்றப்படும் செயன் முறை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce and Food Security:

(a) Will he inform this House -

(i) the number of multipurpose co-operative societies in the Kurunegala District;

(ii) the number of employees serving in those co-operative societies;

(iii) the services provided by those co-operative societies;

(iv) the number of regional outlets controlled by the societies; and

(v) the measures that have been taken to develop the co-operative movement in the Kurunegala District?

(b) If not, why?

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිති සංඛ්‍යාව 21කි.

(ii) ඒවායේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව 2,560කි.

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පවතින විවිධ සේවා සමුපකාර සමිති 21 මඟින්, සමස්ත දිස්ත්‍රික්කයම ආවරණය වන පරිදි ග්‍රාමීය බැංකු ශාඛා 302ක් ද, වෙළෙඳසැල් 04ක් ද, ඉන්ධනහල් 27ක් ද, මුදුණාල 05ක් සහ අවමංගල සේවා මධ්‍යස්ථාන 15ක් ද වශයෙන් මූලික ව්‍යාපාරික අංශ ලෙස පවත්වාගෙන යනු ලැබේ.

එම එක් එක් අංශ මඟින් ජනතාවට අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ තොග හා සිල්ලර පදනම මත සැපයීම, බැංකු සේවා පවත්වාගෙන යෑම තැන්පතු ලබාගැනීම, ණය පහසුකම් සැපයීම ආදී සියලු බැංකු කටයුතු සිදු කිරීම, අවමංගල කටයුතු සිදු කිරීම, මුදුණ අවශ්‍යතා සැපයීම, උත්සව කටයුතු සඳහා අවශ්‍ය ශාලා පහසුකම් සැපයීම, සාමාජිකයන්ගේ විවිධ නිෂ්පාදන මිලදී ගැනීම මෙන්ම විවිධ වෙළඳ සන්නාම නාම යටතේ නියෝජිත ධුර ලබාගෙන බෙදාහැරීමේ කටයුතු සිදු කිරීම වැනි කාර්යය භාරයන් රාශියක් සිදුකරනු ලබයි.

(iv) එම සමුපකාර සමිති විසින් පාලන කරනු ලබන අලෙවිසැල් සංඛ්‍යාව 463ක්.

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීම සඳහා මූලික වශයෙන්ම නවීන තාක්ෂණය සමඟ ඒකාබද්ධ වෙමින් ඉදිරි කටයුතු සිදු කිරීමට පහත සඳහන් පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

සියලුම ග්‍රාමීය බැංකු කටයුතු පරිගණක ගත කිරීම හා ජාලගත කිරීමේ කටයුතු මේ වනවිට අවසන් අදියරේ පවතී.

(ආ) අදාළ නොවේ.

ඉඩම් නොමැති අඩු ආදායම්ලාභීන්: ඉඩම් වෙන් කිරීම

காணி இல்லாத குறைந்த வருமானம் பெறுவோர்: காணி ஒதுக்குதல்
LANDLESS LOW-INCOME EARNERS: ALLOTMENT OF LANDS

1155/2024

6. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු නීතිඥ මධුර විතානගේ මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Madhura Withanage, Attorney-at-Law)
සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින ඉඩම් අහිමි, අඩු ආදායම්ලාභීන් මේ වන විට හඳුනාගෙන තිබේද;

(ii) ඔවුන්ට ඉඩම් ලබා දීම සඳහා විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் சொந்தக் காணி இல்லாத, குறைந்த வருமானம் பெறுகின்றவர்கள் இன்றள வில் இனங்காணப்பட்டுள்ளனரா என்பதையும்;

(ii) இவர்களுக்குக் காணிகளை வழங்குவதற்கு வெளிப்படைத் தன்மையுடன்கூடிய ஒரு முறை யியல் தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி முறையியல் அமுலாக் கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Tourism and Lands:

(a) Will he inform this House -

(i) whether the landless, low-income earners in Sri Lanka have been identified by now;

(ii) whether a transparent system has been developed for the allotment of land to them; and

(iii) the date, if any, that the system will be implemented?

(b) If not, why?

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු පිරසන්න රණතුංග)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) හඳුනා ගැනීමට ක්‍රමවේද සකසා ඇත.

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඉඩම් අහිමි පුද්ගලයන් ඔවුන්ගේ ඉල්ලීම් අනුව ඉඩම් නොමැත්තන්ගේ ලේඛනයේ ලියා පදිංචි කර, ග්‍රාම නිලධාරි මඟින් තහවුරු කරගෙන, ඉඩම් කච්චේරි සඳහා ඉදිරිපත් කර සුදුසුකම් පරීක්ෂා කර ලබා දිය හැකි රජයේ ඉඩම් බෙදාදීමට කටයුතු කෙරේ. ඒ සඳහා වන ක්‍රමවේදය හා උපදෙස් 1935 අංක 17 දරන ඉඩම් සංවර්ධන ආඥා පනතේ හා 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනත යටතේ විස්තර කර ඇත.

(iii) එම ක්‍රමවේදය මේ වන විට ක්‍රියාත්මක වේ.

(ආ) අදාළ නොවේ.

යෝජිත ඒකාබද්ධ කම්කරු නීති ප්‍රතිසංස්කරණ: ප්‍රගතිය සහ ඇතුළත් කර ඇති ප්‍රතිපාදන
உத்தேச ஒருங்கிணைக்கப்பட்ட தொழிற் சட்ட மறுசீரமைப்புகள்: முன்னேற்றம் மற்றும் உள்ளடக்கப்பட்டுள்ள ஏற்பாடுகள்
PROPOSED UNIFIED LABOUR LAW REFORMS: PROGRESS AND PROVISIONS INCLUDED

1247/2024

7. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ඉරාන් වික්‍රමරත්න මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு இரான் விக்கிரமரத்ன சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Eran Wickramaratne)

කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යෝජිත ඒකාබද්ධ කම්කරු නීති ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමේ ප්‍රගතිය කවරේද;

(ii) එහි යම්කිසි ප්‍රගතියක් තිබේ නම්, ඒ සම්බන්ධයෙන් නව නීති ගැසට් පත්‍රයේ පළකරන දිනය සහ එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එහි යම්කිසි ප්‍රගතියක් නොමැති නම්, එම ප්‍රමාදයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගිත්වය අඩුවීම සම්බන්ධයෙන් විමර්ශනය සඳහා මෙම යෝජිත කම්කරු නීති ප්‍රතිසංස්කරණවල ප්‍රතිපාදන සලසා තිබේද;

(ii) එසේ නම්, එම අදාළ ප්‍රතිපාදන කවරේද;

(iii) නොඑසේ නම්, ඒවා බැහැර කිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(இ) (i) யோஜித ப்‍ரතිසංස්කරණවල තිබෙන නම්‍යශීලි සහ අර්ධ කාලීන වැඩ සඳහා වන ප්‍රතිපාදන කවරේද;

(ii) කාන්තා ශ්‍රමිකයින් අතර අවිධිමත් අංශයේ රැකියාවලට යොමුවීම වර්ධනය වීමේ බලපෑම අවධානයට ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, කාන්තා ශ්‍රමිකයින් පිළිබඳ ගැටලු විධිමත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නේද?

(ஈ) නො එසේනම් ඒ මන්ද?

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உத்தேச ஒருங்கிணைக்கப்பட்ட தொழிற் சட்ட மறுசீரமைப்புகளின் அறிமுகப்படுத்தல் தொடர்பான முன்னேற்றத்தையும்;

(ii) முன்னேற்றம் இருப்பின், இது தொடர்பாகப் புதிய சட்டவாக்கம் வர்த்தமானியில் வெளியிடப்படும் திகதி மற்றும் அது பாராளுமன்றத்துக்குச் சமர்ப்பிக்கப்படும் திகதியை வெவ்வேறாகவும்;

(iii) முன்னேற்றம் இல்லையெனின், தாமதத்துக்கான காரணத்தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) குறைவான பெண் ஊழியப்படைப் பங்கேற்பைத் தீர்ப்பதற்கு உத்தேசத் தொழிற் சட்ட மறுசீரமைப்புக்களில் ஏற்பாடுகள் உள்ளனவா என்பதையும்;

(ii) அவ்வாறாயின், தொடர்புடைய ஏற்பாடுகளையும்;

(iii) இல்லையெனின், உள்ளடக்கப்படாமைக்கான காரணங்களையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) உத்தேச மறுசீரமைப்புகளில் நெகிழ்வுத் தன்மையுடைய வேலை மற்றும் பகுதி நேர வேலை தொடர்பான ஏற்பாடுகளையும்;

(ii) தற்போது நிலவுகின்ற பெண் ஊழியத்தின் முறைசாரா மயமாக்கத்தின் விளைவுகள் பரிசீலிக்கப்பட்டனவா என்பதையும்;

(iii) இல்லையெனின், பெண் ஊழியத்தை முறைமைப்படுத்துவதற்கு நடவடிக்கைகள் எடுக்கப்பட்டனவா என்பதையும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Foreign Employment:

(a) Will he inform this House -

(i) the progress of the introduction of proposed unified labour law reforms;

(ii) if there is progress, separately, the date that the new legislation will be gazetted in this regard and the date it will be presented to Parliament; and

(iii) if there is no progress, reason for the delay?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(b) Will he also inform this House -

(i) whether provisions exist in the proposed labour law reforms to address the less female participation in labour-force;

(ii) if so, the relevant provisions; and

(iii) if not, the reasons for exclusion?

(c) Will he further inform this House-

(i) the provisions with regard to flexible and part-time work in the proposed reforms;

(ii) whether the effects of the prevailing informalization on female labour have been taken into account; and

(iii) if not, steps taken to formalize the issues on female labour?

(d) If not, why?

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කම්කරු දෙපාර්තමේන්තුව විසින් වර්තමානයේ වෙන වෙනම ක්‍රියාත්මක කරන පහත සඳහන් පනත් 13ක් වෙනුවට නව රැකියා පනතක් හඳුන්වාදීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ, නීතිපති දෙපාර්තමේන්තුවේ සහ කම්කරු දෙපාර්තමේන්තුවේ නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් සකස් කරන ලද දළ කෙටුම්පතක් මේ වන විට නීති කෙටුම්පත් සම්පාදක වෙත නව රැකියා නීතියක් සකස් කිරීම සඳහා යොමු කිරීමට කටයුතු කර ඇත.

01. 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත
02. 1939 අංක 32 දරන ප්‍රසූතිකාගාර ආඥා පනත
03. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත
04. 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත
05. 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත
06. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල (සේවා නියුක්තිය හා වැටුප් විධිමත් කිරීමේ) පනත
07. 1956 අංක 47 දරන කාන්තාවන් තරුණයින් හා ළමයින් සේවයෙහි යෙදවීම පිළිබඳ පනත
08. 1971 අංක 45 දරන සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත
09. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත
10. 2005 අංක 36 දරන සේවකයින්ගේ අයවැය සහන දීමනා පනත
11. 2016 අංක 04 දරන සේවකයින්ගේ අයවැය සහන දීමනා පනත
12. 2016 අංක 03 දරන ජාතික අවම වැටුප පනත
13. 2021 අංක 28 දරන සේවා නියුක්තයන් විශ්‍රාම යෑමේ අවම වයස පනත

(ii) නීති කෙටුම්පත් සම්පාදක විසින් නව රැකියා නීති කෙටුම්පතට අදාළව සකස් කරන ලද මූලික කෙටුම්පතේ කොටසක් පමණක් පරීක්ෂා කර නිර්දේශ ලබාදීමට කම්කරු කොමසාරිස් ජනරාල් වෙත දැනට යොමු කර ඇති අතර, ඒ සඳහා නීති කෙටුම්පත් සම්පාදක සමඟ සාකච්ඡාවක් සඳහා කම්කරු කොමසාරිස් ජනරාල් ඇතුළු නිලධාරීන් සහභාගීවීමට කටයුතු කර ඇත. නීති කෙටුම්පත් සම්පාදක විසින් යෝජිත නව රැකියා කෙටුම්පත සම්පූර්ණයෙන් සකස් කිරීමෙන් පසු ගරු නීතිපතිතුමාගේ ද අනුමැතිය ලබාගෙන මෙම වසර අවසන්වීමට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හැකි වනු ඇත.

(iii) iiහි සඳහන් පිළිතුර අදාළ වේ.

(ආ) (i) ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගීත්වය වැඩි කිරීම සඳහා නව ප්‍රතිපාදන යෝජිත නව රැකියා නීතියට ඇතුළත් කර ඇත.

(ii) 1. දැනට කම්කරු නීතියේ කාන්තා සේවිකාවන්ට අතිකාල සේවයේ යෙදවීමට පවතින සීමාවන් ලිහිල් කිරීම.

2. දැනට කම්කරු නීතියේ කාන්තා සේවිකාවන්ට රාත්‍රී සේවයේ යෙදවීමට පවතින සීමාවන් කොන්දේසිවලට යටත්ව ලිහිල් කිරීම. එම කොන්දේසි නම්,

- ප්‍රවාහන පහසුකම් ලබාදීම.
- ප්‍රවාහන දීමනා දීම.
- කාන්තාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.

3. අර්ධ කාලීන රැකියාවල යෙදීම සඳහා නෛතික ප්‍රතිපාදන ඇති කිරීම.

4. නිවසේ සිට වැඩ කිරීමට අදාළ (work from remote location) නෛතික ප්‍රතිපාදන ඇතුළත් කර තිබීම.

5. ප්‍රචණ්ඩත්වය හා ලිංගික හිංසනය වැළැක්වීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් කර තිබීම.

6. ගෘහ සේවය කම්කරු නීතියෙන් ආවරණය කිරීම.

7. නම්‍යශීලී වැඩ මුර ක්‍රමයක් හඳුන්වා දී තිබීම.

(iii) අදාළ නොවේ.

(ඇ) (i) සේවකයෙකුට දින 5 1/2ක් සතියකට වැඩ කිරීමෙන් පසු ලබා දිය යුතු දැනට නීතියේ සඳහන් දින 1 1/2ක සති නිවාඩුව වෙනුවට සේවා සේවක පාර්ශ්වයේ එකඟතාව මත සතියේ කෙටි වැඩ කරන දිනයකට වැඩ කළ යුතු පැය 5ක කාලය සතියේ සාමාන්‍ය දින 5 තුළ අතිකාල රහිතව වැඩියෙන් පැයක් වැඩ කර දින 2ක නිවාඩුවක් ලබා ගැනීමට නීතිමය ප්‍රතිපාදන ඇති කිරීම. සම්පිණ්ඩන (compressed work week) වැඩ සතියක් හඳුන්වා දීම. මෙම නීතිමය ප්‍රතිපාදනය මඟින් කැම පැය සහිතව පැය 12ක උපරිම කාලයකට යටත්ව දිනකට වැඩ කර, සතියකට වැඩ කළ යුතු පැය 45ක සහ දින 5 1/2 ක සේවා කාලය දින 4කදී ආවරණය කර දින 3ක විවේක කාලයක් ලබා ගැනීමට අවස්ථාව ලබා දීම. අර්ධ කාලීන (part-time) වැඩ කිරීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් කිරීම.

(ii) ඔව්.

(iii) අවිධිමත් අංශයේ කාන්තා ශ්‍රමිකයන් ඇතුළු සියලුම ශ්‍රමිකයන් ආවරණය කිරීම සඳහා "ගරු සරු" (dignity of labour) නමින් නව ක්‍රමවේදයක් හඳුන්වා දීම.

(ඈ) පැන නොනඟී.

වනජීවී ක්‍රියාකාරකම් හේතුවෙන් බෝග වගාවන්ට වන හානි: අවම කිරීම

வனவிலங்குச் செயற்பாடு காரணமாகப் பயிர்களுக்கு ஏற்படும் சேதம்: குறைத்தல்

CROP DAMAGE DUE TO WILDLIFE ACTIVITY: MINIMIZATION

1282/2024

9. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු අසංක නවරත්න මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு அசங்க நவரத்ன சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Asanka Navarathna)

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වනසතුන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් බෝග වගාවන්ට වාර්ෂිකව සිදු වන හානිය සම්බන්ධයෙන් තක්සේරුවක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iii) එම හානි අවම කර ගැනීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வன விலங்குகளின் செயற்பாடுகள் காரணமாக பயிர்களுக்கு வருடாந்தம் ஏற்படுகின்ற சேதங்கள் தொடர்பில் மதிப்பீடு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அது தொடர்பான விபரங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி சேதங்களைக் குறைப்பதற்கு இன்றளவில் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Will he inform this House -

(i) whether an assessment has been conducted regarding the annual crop damage due to wildlife activity;

(ii) if so, the steps thereon; and

(iii) the measures adopted as of now to minimize the damage?

(b) If not, why?

ගරු ප්‍රසන්න රණතුංග මහතා

(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)

(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) කෘෂි කර්මාන්තයේ වනසත්ව හානි සම්බන්ධයෙන් එක් වතාවක් පමණක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනය මඟින් අර්ධ වාර්ෂික දළ තක්සේරුවක් සිදු කර ඇත. ඒ සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ ගොවිජන සංවර්ධන බල ප්‍රදේශ 464ක් ආවරණය කළ දත්ත හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනය වෙත ලබා දෙන ලදී. 2021/22 මහ කන්නය සඳහා වී සහ අනෙකුත් බෝගවලට අදාළ දත්ත මෙන්ම 2022 වර්ෂයේ ජනවාරි සිට ජූනි දක්වා කාලය සඳහා පොල් සහ අනෙකුත් බහුවාර්ෂික බෝගවලට අදාළ දත්ත ඊට ඇතුළත් විය.

සවිස්තර තොරතුරු පසුබිම් වාර්තාවේ** දක්වා ඇත.

මීට අමතරව වැවිලි අංශය මඟින් පොල් අස්වැන්නට රිළවාගෙන් සිදුවන හානි පිළිබඳව කෑගල්ල දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි නියැදි 3,000ක් පමණ යොදා ගනිමින් සමීක්ෂණයක් සිදු කර ඇත. මේ වන විට මෙම සමීක්ෂණයේ දත්ත නිරවද්‍යතාව පරීක්ෂා කිරීමේ අදියරේ පවතී.

(iii) "කෘෂිකාර්මික භෝග වගාවේදී සිදුවන වනසත්ව හානි අවම කිරීම" යන මැයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනයේදී විද්වත් වැඩමුළුවක් පවත්වන ලදී. එහිදී කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් ක්‍රියා මාර්ග යෝජනා වූ අතර, එම යෝජනා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. එහිදී යෝජනා වූ කෙටිකාලීන යෝජනා යටතේ වායු රයිෆල බෙදාදීම, විදුලි වැට හා විදුලි පඹයා ලබාදීම වැනි යෝජනා දිස්ත්‍රික් මට්ටමින් සියයට 50ක දායකත්වය යටතේ මේ වන විට ලබාදී ඇත. එසේම වැවිලි අංශය මඟින් මේ සම්බන්ධව විශේෂ සාකච්ඡාවක් පරිසර අමාත්‍යාංශය, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය පශු වෛද්‍ය පීඨය, පොල් පර්යේෂණ ආයතනය, පොල් වගා කිරීමේ මණ්ඩලය සහ පොල් සංවර්ධන අධිකාරිය යන ආයතන සහභාගිත්වයෙන් 2024.06.12 දින පවත්වා පහත තීරණයන්ට එළඹ ඇත.

මේ පිළිබඳව සිදු කළ යුතු ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සඳහා අවශ්‍ය තීරණ ගැනීමට උක්ත ආයතනවල සාමාජිකයන්ගෙන් හා ඒ පිළිබඳ විශේෂඥ දැනුම ඇති නියෝජිතයන්ගෙන් යුත් කමිටුවක් පත් කිරීම.

වනසත්ව හානි පිළිබඳ තීරණ ගැනීමට හා ඒ සම්බන්ධව අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට ව්‍යවස්ථාපිත බලය සහිත ආයතනයක් පිහිටුවීමට අවශ්‍ය මූලික පියවරක් ලෙස කැබිනට් පත්‍රිකාවක් සකස් කිරීම.

වනසත්ව හානි සම්බන්ධව මෙරට සිදු කර ඇති පර්යේෂණ ප්‍රමාණවත් නොවන බැවින් තවදුරටත් ඒ සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම.

මීට අමතරව පොල් සහ කුරුඳු සඳහා පහත වැඩසටහන් ද ක්‍රියාත්මක කර ඇත.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්ට අනුව පොල් පැළ වගාව ආරක්ෂා කර ගැනීම සඳහා පොල් පැළ වටා බැරල් යෙදීම, පැළය ආවරණය වන ලෙස ටයර් යෙදීම, පොලිතීන් ආවරණ යෙදීම වැනි ක්‍රියාකාරකම් පිළිබඳව ව්‍යාප්ති වැඩසටහන් ඔස්සේ වගාකරුවන් නිරන්තරයෙන් දැනුවත් කිරීම.

වනසතුන් පලවා හැරීම සඳහා අධික ශබ්ද තරංග නිකුත් කරන සූර්ය බල ශක්තියෙන් ක්‍රියාත්මක වන උපකරණ කුරුඳු වගාවට හඳුන්වා දීම.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා.

වරප්‍රසාද: 2024.07.12 දින "දෙරණ අරුණ" වැඩසටහනෙහි නිවේදකවරයා විසින් දක්වන ලද අදහස්
சிறப்புரிமை: 2024.07.12ஆந் திகதி "தெரண அருண" நிகழ்ச்சியின்போது தொகுப்பாளரால் தெரிவிக்கப்பட்ட கருத்து
PRIVILEGE: COMMENTS MADE BY PRESENTER OF "DERANA ARUNA" PROGRAMME ON 12.07.2024

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මම මතු කරනවා. අද පෙරවරුවේ "දෙරණ අරුණ" වැඩසටහනේදී එම වැඩසටහන මෙහෙයවූ චතුර අල්විස් මහතා විසින් අධ්‍යාපන ඇමතිවරයා හැටියටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියටත් මගේ ක්‍රියාකලාපය පිළිබඳව අසත්‍ය කරුණු පදනම් කරගෙන ඔහුගේ මතයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මා ළඟ තිබෙනවා ඒ වැඩසටහන පටිගත කළ CD තැටිය. ගරු කථානායකතුමනි, මම ඒ CD තැටිය **සභාගත*** කරනවා.

ඊයේ පාර්ලිමේන්තුවේ කිසිම අවස්ථාවකදී කියපු ප්‍රවෘත්තියක් අද කිසිම පුවත් පතක මුල් පිටුවේ පළවෙලා තිබුණේ නැහැ. එක ප්‍රවෘත්තියයි තිබුණේ. ඒකත් "අරුණ" පත්තරේම තිබුණා, මම මේ ගරු සභාවේදී, '... නීතියට තිබෙන භය නැති කරන්න එපා. ඒක අපරාධ වැඩිවීමට හේතුවක්' කියලා. ඒකටවත් සම්බන්ධ කාරණයක් නොවෙයි ඔහු සඳහන් කරලා තිබුණේ. මම 1991දී නගර සභාවට ගියා, නමුත් පාර්ලිමේන්තුවට ආවේ 2000දී. ඒකත් පටලවාගෙන තිබෙන්නේ. නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයකු හැටියටත්,- උප සභාපතිවරයා හැටියටත් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාවේ මම අවුරුදු 2ක් හිටියා. දන්නේ නැත්නම් මේ ටික එතුමා අහගන්න ඕනෑ. ඊළඟට, මම බස්නාහිර පළාත් සභාවේ මහ ඇමතිවරයා හැටියට අවුරුදු 5ක් හිටියා. අපට කිසිම චෝදනාවක් තිබුණේ නැහැ. මම ඉස්සෙල්ලාම අධ්‍යාපන ඇමති වුණේ 2000දී, මාස 9කට. ලොකු දෙයක් කරන්න තිබුණේ නැහැ. 2005 ඉඳලා 2010 දක්වා මම අධ්‍යාපන ඇමතිවරයා විධියට කටයුතු කරනකොට මේ රටේ යුද්ධයක් තිබුණා. ඒ කාලයේ තිබුණේ යුද්ධයේ උච්චතම අවස්ථාව. ඒ කාලසීමාවේ උතුරු, නැඟෙනහිර කිසිම විභාගයක් අපි නැවැත්වූවේ නැහැ. දූපත්වල තිබිච්ච විභාග ශාලාවලට ප්‍රශ්න පත්‍ර ගෙනිච්චේ නාවික හමුදාවේ බෝට්ටුවලින්. අපි ඒ කාලයේවත් දරුවන්ගේ අධ්‍යාපනය අඩාළ කළේ නැහැ, අභියෝග රාශියක් මධ්‍යයේ අපි ඒ කටයුතු කළා. එතුමාට මතක නැත්නම් සිහිකර ගන්න වෙනවා, එල්ටීටීඊ බෝම්බයකට අහුවෙලා කොළඹ කොටුව දුම්රිය ස්ථානයේදී ඩී.එස්. සේනානායක විද්‍යාලයේ baseball team එකේ දරුවෝ 6දෙනෙක් මිය ගියා. එවන් අභියෝග මධ්‍යයේ තමයි මේ අමාත්‍යාංශය අපි ගෙන ගියේ. මේ වතාවේ මම අධ්‍යාපන අමාත්‍යාංශය බාර ගන්නකොට හිටපු කැබිනට් මණ්ඩලය ඇතුළු අමාත්‍ය මණ්ඩලය අස්වෙලා, ජනාධිපති අස්වෙලා. අගමැතිවරයා මාව කැඳවලා එතුමා යටතේ තමයි මේ අමාත්‍යාංශය මම බාර ගත්තේ. මේක බාර ගන්කොට එතුමාගේම ආයතනයේ ප්‍රධානියාගේ උපදෙස් අනුව හිටපු ජනාධිපතිතුමා ක්‍රියාත්මක වෙලා එතුමාටත් තනතුර දාලා යන්න වුණා.

මේ රටේ ජනතාවට පෙට්‍රල් ලීටරයක් ගන්න දින පහක් පෝලිම්වල ඉන්න සිද්ධ වුණා. දේශපාලනඥයෝ එදා හැංගිලා හිටියේ. ඒ ආයතන ප්‍රධානීන් හැංගිලා හිටියේ. අරගළකරුවෝ ඒ ගොල්ලන්ගේ ආයතනය ඇතුළට ගියා. අපි ඒක සජීවීව දැක්කා. ගරු කථානායකතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුව බේරා ගත්තේ කොයි තරම් අමාරුවෙන්ද? කිසි කෙනෙක් වගකීම භාර ගත්තේ නැති වෙලාවක මම මේ අමාත්‍යාංශය භාර අරගෙන, දැනට අවුරුදු දෙකයි මාස තුනක් වෙනවා. කොවිඩ් වසංගතය නිසා, අරගළ නිසා, ආර්ථික පසුබැම නිසා වැටුණු අධ්‍යාපනය දැන් ඔසවා තබා තිබෙනවා. දැන් එතුමා මගෙන් අහනවා, මම කළේ මොකක්ද කියලා. කරපු දේ පෙනෙන්න තිබෙනවා. උසාවියේ නඩුවක් නොතිබුණා නම්, ගුරු පත්වීම් ලබා දීලා මේ වෙනකොට ගුරු ඌනතාව සම්පූර්ණයෙන් අවසන් කරන්න තිබුණා. ඒ පිරිස හැර, අනෙක් සියලු පුරප්පාඩු මේ වෙනකොට පුරවලා තිබෙනවා. ඒ නිසා නොදන්නා දේවල් කථා කරන්න එපා. එතුමා සඳහන් කරපු කරුණට අදාළව පුවත් පතක මුල් පිටුවේ හෝ ඇතුළු පිටුවේ කිසිම වාර්තාවක් සඳහන් වෙලා නැහැ. It was irrelevant. එතුමා කොළයක් බලාගෙන කියවනවා. මම හිතන විධියට එයාගේ boss ලියලා දෙන්න ඇති. මොකද, එයා ජනාධිපති අපේක්ෂකයෙක් වෙන්න නේ යන්නේ. ව්‍යවසායකත්වය උගන්වා, උගන්වා රට පුරා යනවා. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට ව්‍යවසායකත්වය ඉගැන්වූවා නම්, එතුමාට තනතුර දාලා යන්න වෙන්නේ නැහැ. ඒ මදිවාට විවිධ දේශපාලන පක්ෂවලට අභියෝග කරනවා. මම නම් කැමැතියි, ඕනෑම අභියෝගයක් භාර ගන්න. අපි නීති විභාගය සමත් වෙලා නීති උපාධිය අරගෙන ගෙදර හිටියේ නැහැ. මහාධිකරණයේ අපරාධ පිළිබඳ නීතිඥයකු හැටියට, ප්‍රසිද්ධ නඩු විභාග දෙකකදී මම චිත්තිකරුවන් වෙනුවෙන් පෙනී ඉඳලා කථා කරලා තිබෙනවා. එකක් තමයි, මේ පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු නඩුව. දෙවැනි එක තමයි පුංචි බොරැල්ලේ පාර්සල් බෝම්බ නඩුව. රාජ්‍ය අනුග්‍රහයෙන් ඕනෑම කෙනෙකුට ව්‍යාපාර කරන්න පුළුවන්. ඒක ව්‍යවසායකත්වය නොවෙයි නේ. ඔය නාළිකාවට බලපත්‍රය ගත්ත හැටිත් ඔය ගොල්ලෝ මගෙන් අහ ගන්න එපා. ඒකත් අපි දන්නවා.

ඔය ඔක්කොම කරලා නුගේගොඩදී රැස්වීමක් තිබුණා. මම දන්නවා, ඒ රැස්වීමට ගිය කෙනෙක් මෙතැන දැන් ඉන්නවා. මම එතුමාගේ නම කියන්න යන්නේ නැහැ. "මහින්ද සුළඟ" නුගේගොඩට හමන්න කිව්වා. මහින්ද සුළඟ නොවෙයි, මහින්දගේ වාතයක්වත් නුගේගොඩට ආවේ නැහැ. යූටියුබ් එක

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

බලන්න. යූටියුබ් එකේ ප්‍රේක්ෂකයෝ දාලා තිබෙන්නේ මොනවාද කියලා බලන්න. අපි නගර සභාවක වැඩ කරලා, පළාත් සභාවක අවුරුදු පහක් මහ ඇමති ධුරය දරලා, කිසිම චෝදනාවක් නැතුව අවුරුදු 20ක් දේශපාලනය කරලා තිබෙනවා. ඒ නිසා අපට මඩ ගහන්න එන්න එපා. ජාතික පාසල්වලට දරුවන් ඇතුළත් කරන්නේ සල්ලිවලට කියලා කිව්වා. මම මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ විපක්ෂ දෙපැත්තේම මන්ත්‍රීවරුන්ගෙන් මේ කාරණය අහනවා. මේ මන්ත්‍රීවරුන් එතුමන්ලාගේ ප්‍රශ්න අපට ගෙනෙනවා නේ. අපි ඒවා විසඳලා දෙනවා. ඒවාට සල්ලි ගෙව්වේ කාටද? කාට හරි සල්ලි ගෙවලා තිබෙනවාද? ඒක නිසා මඩ ගහන්න එන්න එපා.

ජනාධිපති අපේක්ෂකයාගේ campaign එක වෙනම ගෙනියන්න. මාධ්‍ය නාළිකාවක් හදා ගත්තාම, හිටපු ජනාධිපතිවරුන්ට ලණු දුන්නාම, ඒ ගොල්ලන් හිතනවා ජනාධිපති අපේක්ෂකයා වෙලා ජනාධිපති වෙන්න පුළුවන් කියලා. මේක තමයි මේ රටට වෙලා තිබෙන්නේ. තමන්ගේ මාධ්‍ය නාළිකාවක් දා ගත්තාම ඒකේ ඕනෑ එකක් කියන්න පුළුවන් කියලා හිතනවා.

ගරු කථානායකතුමනි, දැන් ඔහු කියනවා මම පොළේ ගියේ ඇමතිකම නැති වුණාම ලු. නැහැ, ඇමතිකම නැති වුණේ පොළේ ගිය හින්දා. නමුත් මම කඩේ ගියේ නැහැ. කඩේ නොගිහින් පොළේ ගිය හින්දා මට ඇමතිකම නැති වුණා. ඒ ගොල්ලන් කඩේ ගිය හින්දා ඒ ගොල්ලන්ට වරප්‍රසාද ලැබුණා, ව්‍යාපාර කරන්න. එහෙම ව්‍යාපාර කරන්න පුළුවන් ඕනෑම කෙනෙකුට. ගරු කථානායකතුමනි, මම ඒ ගැන ඊට වඩා කියන්න යන්නේ නැහැ.

මේ අවුරුදු දෙකහමාරට කරපු දේවල් ගැන දරුවෝ සාක්ෂි දෙයි. යුනිෆෝම් ටික වෙලාවට දුන්නා. දැන් ලබන අවුරුද්දට අවශ්‍ය යුනිෆෝම් ටික සියයට 100ක්ම චීනයෙන් දෙන්න පොරොන්දු වෙලා තිබෙනවා. ගිය අවුරුද්දේ සියයට 80ක් ඒ විධියට අරගෙන රටට බිලියන 5.5ක් ඉතුරු කළා. කඩදාසි නැතිව, පෙළ පොත් මුද්‍රණය කර ගන්න බැරිව සිටියා. මේ වෙනකොටත් ලබන අවුරුද්දට අවශ්‍ය පෙළ පොත්වලින් සියයට 40ක් මුද්‍රණය කරලා ඉවරයි.

ඊළඟට, අහනවා වැසිකිළි හැදුවාද කියලා. ඒවා හදලා නැත්නම් ඒ ගොල්ලන්ගේ CSR Fund එකෙන් ඒකට මුදල් දෙන්න බැරියැ. *[බාධා කිරීමක්]* මේ අද උදේ "දෙරණ අරුණ" වැඩසටහනේ කියපු කරුණු ටික. ඔබතුමන්ලාටත් අදාළයි මේක. *[බාධා කිරීමක්]*

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආ, "කොම්බුව". "කොම්බු" වැනල්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මොකක්ද ඒ?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
"කොම්බු" වැනල් එක.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියනවා "කොම්බු" වැනල් කියලා. "කොම්බුව" ආව හැටිත් අපට කියන්න පුළුවන්. උදේ අත්සන් කළා සන්ධාන ගිවිසුමක්, හවස ඒකේ සභාපතිතුමා ඉල්ලා අස් වුණා, සන්ධානය ඉවරයි. ඒ වාගේ බංකොලොත් දේශපාලකයෝ නොවෙයි, අපි. මම අඛණ්ඩව හය වතාවක් පාර්ලිමේන්තු මැතිවරණයෙන් දිනලායි මේ සභාවට ඇවිල්ලා තිබෙන්නේ. මම සන්ධානයේ ලේකම් හැටියට අවුරුදු 11ක් හිටියත්, ජාතික ලැයිස්තුවෙන් ඇවිල්ලා නැහැ. ඒ නිසා මිනිසුන්ගේ චරිත ඝාතනය කරන්න ලෑස්ති වෙන්න එපා.

ගරු කථානායකතුමනි, හැකි ඉක්මනින් ස්ථාවර නියෝග 118 යටතේ මේ අය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට කැඳවන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේක මම මැතිවරණ කොමසාරිස්ට ලියනවා. තවම මැතිවරණය ප්‍රකාශයට පත් කළේ නැති නිසායි මම ලියන්නේ නැත්තේ. ජනාධිපති අපේක්ෂකයෙකුත් වෙන, ආයතනයක ප්‍රධානියෙක් ඔහුගේ promotion එකකට අපේ නම් ඇදාගෙන මඩ ගහන්න බැහැ නේ. එතුමන්ලා දන්නේ නැහැ, පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද කියන්නේ මොනවාද කියලා. එතුමන්ලා කාරක සභාවට ආවාම මම පෙන්වලා දෙන්නම්, නඩේසන් තීන්දුවේ ඉඳලා. අපි නීති උපාධි කළේ නිකමට නොවෙයි, ඒක practise කරන්න. ඒක මම පාර්ලිමේන්තුවෙත් කරනවා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඒකට සාක්ෂි දරනවා ඇති. ඊයේ මගේ පැය භාගයේ කථාව පටන් ගත්තේ මේ රටේ ව්‍යවස්ථා ඉතිහාසයේ ඉඳලා. මේ රටේ ප්‍රථම ලිඛිත ව්‍යවස්ථාව තමයි 1833 කෝල්බෘක් කැමරන් ව්‍යවස්ථාව.

මේ තිබෙන්නේ හයවන ව්‍යවස්ථාව. අපි වැදගත් දෙයක් මෙහිදී කථා කරනවා මිසක් මේ ගොල්ලන්ගේ බොස්ලා වාගේ රට පුරා ගිහිල්ලා මැතිවරණ ව්‍යාපාර වෙනුවෙන් එක එක ඒවා කරන්න යන්නේ නැහැ. මොකද, මම ජනාධිපති අපේක්ෂකයෙක් නොවෙයි නේ. මට මෙතැන රාජකාරියක් තිබෙනවා, සභානායක හැටියට සහ මන්ත්‍රීවරයකු හැටියට. ඒ නිසා කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ අය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට කැඳවන්නය කියලා.

මම ඒ සීඩ් තැටිය සභාගත කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එම වරප්‍රසාද ප්‍රශ්නය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු මන්ත්‍රීතුමා කියන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඊයේ ඔබතුමා හිටපු නැති වෙලාවේ මගේ වරප්‍රසාද ප්‍රශ්නය මම ඉදිරිපත් කළා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරුන් පත් කිරීමේ කාරණය සම්බන්ධයෙන් විශේෂයෙන්ම ඔබතුමාටයි ලිඛිතව වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කළේ. ගරු සභානායකතුමනි, මේ වනකොට මානව හිමිකම් නඩු විතරක් 200කට වඩා ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබෙනවා. ඔබතුමා දන්නවා, මාස දෙකකින්

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ඒ නඩු අහලා අවසන් කරන්න ඕනෑ කියලා. කෙනෙකුට වූ අසාධාරණයට මාසයක් ඇතුළත මානව හිමිකම් නඩුවක් දමන්න පුළුවන්. මාස දෙකක් ඇතුළත ඒ නඩුව අහලා අවසන් කරන්න ඕනෑ. මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, check කරලා බලන්න. ශ්‍රේෂ්ඨාධිකරණයේ මානව හිමිකම් නඩු 200කට අධික සංඛ්‍යාවක් පවතිනවා. අභිංසක මිනිස්සුන්ගේ ඉල්ලීම් මේ තිබෙන්නේ. ඒකට විනිශ්චයකාරවරුන් දෙදෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට අවශ්‍යයි. අභියාචනාධිකරණයට විනිශ්චයකාරවරුන් පස්දෙනෙක් පත් කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* නැහැ, පස්දෙනායි. ශ්‍රේෂ්ඨාධිකරණයට දෙදෙනායි. ඔක්කොම හත්දෙනායි. ගරු කථානායකතුමනි, දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? අභියාචනාධිකරණයට විනිශ්චයකාරවරුන් පස්දෙනෙක් පත් කිරීම කිසිම අයුරකින් නවත්වලා නැහැ. ඒක අපේ අග්‍ර විනිශ්චයකාරතුමා කියනවා. එතකොට ඒ පත් කිරීම් කරන්නෙත් නැහැ. ඊට ඉහළින් තිබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණය. අර ලබා දුන් තහනම් නියෝගය එක්ක විනිශ්චයකාරවරුන් දෙදෙනෙක් පත් කරගන්න බැරිව ඉන්නවා, ශ්‍රේෂ්ඨාධිකරණයට. මම කිව්වා වාගේම මානව හිමිකම් නඩු අතිවිශාල සංඛ්‍යාවක් තිබෙනවා. මේක මේ රටේ justice system එක පිළිබඳ ප්‍රශ්නයක්. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පාර්ලිමේන්තුවේ කථානායකතුමා විධියටත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නායකයා විධියටත් ඔබතුමා කිසියම් හෝ කාරණයකින් වළක්වා තිබෙනවා නම්, මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කරලා, මේ වැඩ පිළිවෙළ නතර කරලා ඔබතුමාගේ වැඩ කටයුතු කරගෙන යන්න බැරි ඇයි? මොකද, ඔබතුමාට තමයි ඒ බලය තිබෙන්නේ. ඒ බලය කාටවත් යටපත් කරන්න පුළුවන් කාරණාවක් නොවෙයි. අපේ ජනාධිපතිතුමාත් - රනිල් වික්‍රමසිංහ මහත්මයාත් - එදා කියපු කාරණයක් තමයි, මේ ව්‍යවස්ථාදායකයට සහ අධිකරණයට ජනතාව දීලා තිබෙන බලය, එක පැත්තකින් අපි ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු අධිකරණ පද්ධතියට පවරලා තිබෙනවා.

ඒක ක්‍රියාත්මක කරන හස්තය ඔබතුමන්ලා නතර කරලා තිබෙනවා නම්, ඒක කොහොමද ක්‍රියාත්මක වෙන්නේ කියලා මම අහන්න කැමැතියි. ගරු කථානායකතුමනි, එම නිසා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, අපි විශේෂ කාරක සභාවක් පත් කරලා මේ සම්බන්ධව කටයුතු කරනවාද කියලා. මේකට ඔබතුමා තීන්දුවක් දෙන්න. ඔබතුමා තීන්දුවක් අරන් කියන්න, අපි ඒ අතුරු තහනම් නියෝගය පිළිගන්නේ නැහැ, අපි අපේ වැඩ කටයුතු කරගෙන යනවා කියලා. මේක පුදුම ප්‍රශ්නයක් නේ. එහෙම කොහොමද තහනම් කරන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, විනිශ්චයකාරවරු පත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වගකීමක් නොවෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වගකීම වන්නේ, පත්වීම අනුමත කිරීම හෝ නොකිරීම පමණයි. පත් කිරීම කරන්න ඕනෑ ජනාධිපතිතුමා. එතැනටත් ඔය තහනම් නියෝගය දැනට තිබෙනවා. ඒ ගැන එතුමා මොකක් හෝ පියවරක් ගනීවි. එතුමා පත් කරලා එව්වොත් අනුමත කිරීම හෝ නොකිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කටයුත්තක්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මම ඒක දන්නවා, නොදන්නවා නොවෙයි. ඒ නියෝගයෙන් වළක්වා තිබෙනවා, අග්‍ර විනිශ්චයකාරතුමාත්. මේ කටයුත්ත start කරන්න ඕනෑ එතුමාගෙන් නේ. එතුමාටත් මේ තහනම් නියෝගය බලපානවා. ඊළඟට, ජනාධිපතිතුමාටත් තහනම් නියෝගයක් නිකුත් කරලා තිබෙනවා. මට පෙනෙන්නේ ජනාධිපතිතුමා විසින් ජනාධිපතිතුමාම තහනම් කර ගන්න වැඩේ කරලා තමයි තිබෙන්නේ. මේ දාලා තිබෙන නඩුවෙන්ම අපට ඒ බව තේරෙනවා. මොකද, එක්සත් ජාතික පක්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තරුණයෙක් තමයි නඩුව දාලා තිබෙන්නේ. ඒ නඩුව දාලා තිබෙන්නේ නිශ්ශංක බන්දුල මැතිතුමා නොවෙයි. එහෙම නම් එතුමාට නඩුව දමන්න තිබුණා. එතුමා නඩුව දාලාත් නැහැ. එම නිසා ජනාධිපතිතුමා විසින්ම දා ගත්ත නඩුවක් විධියටයි මට එය පෙනෙන්නේ. ඔබතුමා ඒ පත් කිරීම් කරන්න කියන එක නොවෙයි මම කියන්නේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ එම තීන්දුව ගැන ඔබතුමාගේ මතය මොකක්ද කියලා තීරණයක් ගත්තා නම් ඉවරයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයත් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට අපි යොමු කරනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, ස්වාධීන කොමිෂන් සභාවලට පත් කරන නිලධාරීන් නිර්දේශ කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පවතින්නේ ඔබතුමා යටතේ. 2018දී ඇති වුණු දිගන සිද්ධිය ගැන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පරීක්ෂණයක් කළා. අවුරුදු 6ක් ගත වෙලාත් තවම එම වාර්තාව ඉදිරිපත් කරලා නැහැ. ඒ ගැන සොයා බලා ඒ වාර්තාව ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මට තත්පරයක් දෙන්න.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මීට පෙර අවස්ථාවකදීත් මේ ප්‍රශ්නය මතු කළා. ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ පෙත්සම් ඉදිරිපත් වීම බහුලව සිදු වෙනවා.

කෙනෙකුගේ මූලික අයිතිවාසිකම් කඩ වුණාය කියලා ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් යන අවස්ථා එමටයි. හැබැයි, දැන් තිබෙන්නේ ඒ නඩු ප්‍රමාදය පිළිබඳ ප්‍රශ්නය. අපට ගුරුවරුන් පත් කර ගන්න ප්‍රමාද වුණේ මාස 15ක් තිස්සේ තහනම් නියෝගයක් ක්‍රියාත්මක වෙන නිසායි. තහනම් නියෝගයක් මාස 15ක් තිස්සේ ක්‍රියාත්මක කරමින්, විභාගයක් පවත්වන එක නවත්වා තිබෙන අවස්ථාවක් මම දැක්කේ පළමුවැනි වතාවට. මම මේ පිළිබඳව අවස්ථා කිහිපයකදී මේ පාර්ලිමේන්තුවේදී උත්තර දුන්නා. මොකද, මන්ත්‍රීතුමන්ලා මේ පිළිබඳව ප්‍රශ්න කළා. ඒ වෙලාවේත් ඔය කාරණය මම කිව්වා. අපි විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙලාවේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව වැඩි කරලා දුන්නා. එතුමා ඊයේ කියපු හැටියට 5,000කට වැඩි නඩු සංඛ්‍යාවක් මේ අධිකරණ දෙකේම තිබෙනවා.

දැන් මෙතැන තිබෙන ප්‍රශ්නය මොකක්ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගැන කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදයේ. VII වන පරිච්ඡේදයෙන් කියන්නේ විධායකය ගැන. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන්නේ විධායකයේ කොටසක්. විධායකයේ බලතල අඩු කිරීම සඳහායි, දහහත්වන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පටන් අරගෙන, දහඅටවන සංශෝධනයෙන් ආපහු දීලා, දහනව වන සංශෝධනය, විසිඑක්වන සංශෝධනය දක්වා ක්‍රමානුකූලව ආවේ. VIIඅ වන පරිච්ඡේදයේ සඳහන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය ගැන මම ඔක්කෝම විස්තර කියන්න යන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මේ සභාව රැස් වෙන්නේ ඔබතුමාගේ ප්‍රධානත්වයෙන්. එතකොට ජනාධිපතිවරයා විසින් කරනු ලබන යම් පත්වීමක් මේ උපලේඛනය - මේ Schedule එක - අනුව ratify කරන එක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කරන්නේ. හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන එක මුල්ම බලතල බෙදීමේ න්‍යාය වන ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය කියන ඒවා යටතේ ගත්තොත්, විධායකයේ කොටසක් වෙනවා. එතකොට විධායකයේ කොටසකටත් බලපාන ආකාරයට, විධායකයටත් බලපාන ආකාරයට අධිකරණයට නියෝගයක් දෙන්න පුළුවන්ද? මෙන්න මේ ප්‍රශ්නය තමයි එතුමා මතු කරන්නේ. මේ හා සමාන පූර්වාදර්ශයක් මීට පෙර තිබෙනවා. ඒ, අනුර බණ්ඩාරනායක තීන්දුව. මොකද, මේ පාර්ලිමේන්තුවට Motion එකක් ආවා, එදා හිටපු අග්‍ර විනිශ්චයකාරතුමාට විරුද්ධව. එතුමා තහනම් නියෝගයක් එව්වා. එතුමා තහනම් නියෝගයක් එව්වාම අනුර බණ්ඩාරනායක එවක හිටපු කථානායකතුමා ඒක ප්‍රතික්ෂේප කළා. එහි දීර්ඝ වශයෙන් නඩු තීන්දු ගැන, ඔක්කෝම විස්තර කියලා තිබෙනවා.

හැබැයි අපි මෙතැනදී මතක් කරලා දෙන්න ඕනෑ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඇ) අනුව්‍යවස්ථාව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(අ) අනුව්‍යවස්ථාවෙන් කියන්නේ ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය සම්බන්ධයෙන්. 4(ආ) අනුව්‍යවස්ථාවෙන් කියන්නේ ජනතාවගේ විධායක බලය සම්බන්ධයෙන්. 4(ඇ) අනුව්‍යවස්ථාවෙන් කියන්නේ ජනතාවගේ අධිකරණ බලය සම්බන්ධයෙන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3වන ව්‍යවස්ථාවෙන් කියන්නේ ජනතාවගේ පරමාධිපත්‍යය සම්බන්ධයෙන්. ජනතාවගේ පරමාධිපත්‍යය මේ තුන් ආකාරයෙන් ක්‍රියාත්මක වෙනවා, බලතල බෙදීමේ න්‍යාය අනුව.

එතකොට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) අනුව්‍යවස්ථාවෙහි මෙසේ සඳහන් වෙනවා:

> "නීතිය අනුව පාර්ලිමේන්තුව විසින් ම ක්‍රියාත්මක කළ හැකි පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහර හා බලතල සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද නැතහොත් වෙනත් යම් නීතියකින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන මඟින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය;"

ගරු කථානායකතුමනි, එහෙමයි මේ ව්‍යවස්ථාවේ තිබෙන්නේ. ඉතින් ඔබතුමා ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට මෙන්න මේ කාරණා පිළිබඳ අවධානය යොමු කරවන්න, අධිකරණය සහ ව්‍යවස්ථාදායකය හෝ අධිකරණය හා විධායකය සමඟ ගැටීමක් ඇති කරන්නේ නැතිව, එවැනි ස්වරූපයේ දෙයක් වෙන්නේ නැතුව ව්‍යවස්ථාවේ තිබෙන්නා වූ මේ බලතල පිළිබඳ න්‍යාය පිළිගෙන ඒ අනුව කටයුතු කරන්න කියලා. එහෙම නැත්නම් මේ කිසිම ආයතනයක් ගෙනයන්න බැහැ. අද වෙලා තිබෙන්නේ මොකක්ද? මේ නියෝගය නිසා ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමා හැර වෙන කෙනෙක් පත් කරන්න බැහැ. මේ වෙනකොට පුරප්පාඩු කීයක් තිබෙනවාද? එතකොට ඒ පුරප්පාඩුවලට එක්කෝ නීතිපති දෙපාර්තමේන්තුවෙන් එන්න ඕනෑ, එහෙම නැත්නම් අභියාචනාධිකරණයේ විනිසුරුවන් ජ්‍යෙෂ්ඨත්වය අනුව උඩට එන්න ඕනෑ. ඒක නවත්වලා තිබෙන්නේ. අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරු පත් කරන්නත් බැහැ. මේ වනකොට පුරප්පාඩු 5ක් තිබෙනවා. මහාධිකරණයෙන් උඩට එන්නේත් නැහැ, නීතිපති එකෙන් එන්න විධියකුත් නැහැ. ඒ සම්ප්‍රදායයන් සියල්ලම දැන් මෙතැන නැවතිලා තිබෙන්නේ. ඉතින් මෙන්න මේ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ අවධානය යොමු කරන්න,මේක නිරවුල් කරලා දෙන්නැයි කියලා. නැත්නම් මෙහි අවසාන වශයෙන් විත්දිතයන් වෙන්නේ කවුද? මේ රටේ ජනතාව.

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු කුමාරසිරි මන්ත්‍රීතුමා.

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. අපේ ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි ඇමතිතුමිය මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. මට එතුමියගෙන් අහන්න පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා ඒ ප්‍රශ්නය වෙනම අහන්න.

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි ඇමතිතුමිය, අනේ, සමාවෙන්න ඕනෑ, මේකට. ගරු ඇමතිතුමියනි, පළාත් පාලන ආයතනවල හිටපු අවුරුදු 10, 15 සේවය කරපු අය ඊයේ-පෙරේදා ස්ථිර කළා. ගරු ඇමතිතුමියනි, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ සංචාරක මහ පෙන්වන්නන් දාලා තිබුණු නඩුව අවසන් කියලා අපට දැනගන්න ලැබුණා. බහු කාර්ය සංවර්ධන නිලධාරීන් 3,000කට ආසන්නව ඉන්නවා. ඒ ළමයි රුපියල් 22,000 ගණනේ ලබා ගනිමින් මේ වෙනකොට අවුරුදු 5කට වැඩි කාලයක් තිස්සේ සේවය කරනවා. හැබැයි, මේ අය ස්ථිර වෙලා නැහැ. ගරු ඇමතිතුමියනි, මේ සම්බන්ධ අලුත්ම තත්ත්වය මොකක්ද? ඔබතුමිය ඉතාම දක්ෂ ඇමතිතුමියක්. මම දන්නවා, ඔබතුමිය ඒ කටයුත්ත කරනවා කියලා. පොඩ්ඩක් ඒ ගැන කියන්න, ගරු ඇමතිතුමියනි.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (වනජීවී හා වන සම්පත් සංරක්ෂණ සහ වාරිමාර්ග අමාත්‍යතුමිය)
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னி ஆரச்சி - வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரும் நீர்ப்பாசன அமைச்சரும்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law - Minister of Wildlife and Forest Resources Conservation and Minister of Irrigation)
ගරු කථානායකතුමනි, බහු කාර්ය සේවකයන් බඳවා ගැනීමට අපි අලුතින් සේවක සංඛ්‍යාවක් අනුමත කරගනු ලැබුවා.

අපට බහුකාර්ය සේවකයන් සඳහා වෙනමම cadre එකක් තිබුණේ නැහැ. ඒ නිසා හාරදහස් ගණනක් වන මෙම සේවකයන් බඳවා ගැනීම සඳහා අලුතින් සේවක සංඛ්‍යාවක් - cadre එකක් -

[ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය]

ඇති කරගනු ලැබුවා, රටේ ආර්ථිකය මොන තත්ත්වයක තිබුණත් නොයෙක් දුෂ්කර තත්ත්ව යටතේ. එම cadre එක අනුමත කරගෙන අපි එම සේවකයන් බඳවා ගැනීමට කටයුතු කරගෙන යන අතරතුරදී, සංචාරක මහ පෙන්වන්නන් සුප්‍රිම් උසාවියට - ශ්‍රේෂ්ඨාධිකරණයට- නඩුවක් ඉදිරිපත් කරනු ලැබුවා, සංචාරක මහ පෙන්වන්නන්ට පත්වීම් ලබා දෙන ලෙස. සංචාරක මහ පෙන්වන්නන්ට පත්වීම් ලබා දෙන්න අපේ සේවක සංඛ්‍යාව තුළ එහෙම තනතුරක් තිබුණේ නැහැ. නමුත් ඒ ඉදිරිපත් කළ නඩුවට අනුව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් බහුකාර්ය සේවකයන් බඳවා ගැනීම තාවකාලිකව අත්හිටෙව්වා. බහුකාර්ය සේවකයන් බඳවා ගැනීම අත්හිටුවා සංචාරක මහ පෙන්වන්නන්ට පත්වීම් ලබා දෙන්න කටයුතු කරන්න කියන එක තමයි මතය වුණේ.

ඒ අනුව අපි බංගලා භාරකරු, රියැදුරු වාගේ තනතුරුවලට අදාළ සේවක සංඛ්‍යාවල පුරප්පාඩු අත්හිටුවා සංචාරක මහ පෙන්වන්නන්ට පත්වීම් ලබා දීම සඳහා Cabinet Papers යොමු කර ඊට අවශ්‍ය අනුමැතිය රජයෙන් ලබා ගන්නට දැනට කටයුතු කරමින් සිටිනවා. තවම මුදල් අමාත්‍යාංශයෙන් අවසාන ලියුම ආවේ නැහැ, සංචාරක මහ පෙන්වන්නන් බඳවා ගැනීමට. මම දිනපතා ඒ කාරණය ගැන මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් සමඟ කථා කරනවා. මම විශ්වාස කරනවා, අපේ දෙපාර්තමේන්තුවේ තිබෙන ඇතැම් තනතුරුවලට අදාළ පුරප්පාඩු අත්හිටුවා සංචාරක මහ පෙන්වන්නන් බඳවා ගැනීමට අවශ්‍ය අවසරය ඉදිරි කාලයේදී අපට මුදල් අමාත්‍යාංශයෙන් ලැබෙයි කියලා. ඒ අවසරය ලැබුණාම සුප්‍රිම් උසාවියට අපි එය ඉදිරිපත් කරනවා. එසේ ඉදිරිපත් කළාම තමයි අපට බහුකාර්ය සේවකයන් බඳවා ගැනීමේ අත්හිටුවීම නවත්වා ගන්න පුළුවන් වෙන්නේ. ඒ කාරණය තමයි මට කියන්න තිබෙන්නේ. උසාවියේ නඩුවක් තිබෙනවා. ඒ අනුව කටයුතු කර බහුකාර්ය සේවකයන් බඳවා ගැනීම අත්හිටුවීම නවත්වා ගැනීමට අවශ්‍ය පියවර අපි ගනිමින් පවතිනවා.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4, 5 සහ 6 පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 24(2) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දිනට නියමිත කටයුතු. පෞද්ගලික මන්ත්‍රී යෝජනා.

අද දින න්‍යාය පත්‍රයේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා යටතේ අංක 1 වශයෙන් ගරු බුද්ධික පතිරණ මහතාගේ යෝජනාව සඳහන් වී ඇතත්, එතුමා සභාපතිත්වය දරන ආංශික අධීක්ෂණ කාරක සභාවේ රැස්වීමක් අද දින පෙර වරුවේ පැවැත්වෙන බැවින් එකී පෞද්ගලික මන්ත්‍රී යෝජනාව 4වැනි යෝජනාව ලෙස ඉදිරිපත් කිරීමට අවසර දෙන ලෙස එතුමා විසින් ඉල්ලීමක් කර තිබෙනවා. ඒ සඳහා සභාවේ අවසරය ඉල්ලා සිටිනවා. සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආර-ච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னி ஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා යටතේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරනු ලබන යෝජනාව මුලින්ම තිබෙන නිසා එයට පිළිතුරු ලබා දීමට උදේ වරුවෙන් තමයි මම වෙලාව වෙන් කර ගත්තේ. හවස් වරුවේ මට වෙනත් කටයුතු යෙදී තිබෙන බැවින් එතුමාගේ යෝජනාවට අදාළව මා ලබා දෙන පිළිතුර පසුව සභාගත කිරීමට කටයුතු කරන බව ඔබතුමාට ගෞරවයෙන් දැනුම් දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. යෝජනා අංක 2 ඉදිරිපත් කිරීම, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටතු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, මාණ්පුමිකු වීරසුමන වීරසිංහ අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. WEERASUMANA WEERASINGHE took the Chair.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා
தனி நபர் பிரேரணைகள்
PRIVATE MEMBERS' MOTIONS

ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන සහ නීති අංශ ශක්තිමත් කිරීමේ වැඩසටහනක් සකස් කිරීම
விளையாட்டு அமைச்சின் கணக்காய்வு மற்றும் சட்டப் பிரிவுகளை வலுப்படுத்துவதற்கான வேலைத்திட்டமொன்றைத் தயாரித்தல்
PREPARATION OF A PROGRAMME TO STRENGTHEN THE AUDIT AND LEGAL SECTIONS OF THE MINISTRY OF SPORTS

[පූ.භා. 10.30]

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ඇතුළු ක්‍රීඩා සංගම් රැසක් අතිශය දූෂිත තත්ත්වයට පත් වී ඇති හෙයින් එම තත්ත්වය මැඩපැවැත්වීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන හා නීති අංශ ශක්තිමත් කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ක්‍රීඩාව ගැන මේ පාර්ලිමේන්තුවේදී කිහිප අවස්ථාවක විවාද කළා. අපි විවිධ අවස්ථාවලදී ඒ සම්බන්ධ ක්‍රියා මාර්ග ගන්නවා කියලා යෝජනා කළා වුණාට, වර්තමානය ගත්තාම තවමත් අපේ රටේ ක්‍රීඩාව දවසින් දවස වළ පල්ලට යන තත්ත්වයක් තමයි අපට දකින්න තිබෙන්නේ. මේ ක්‍රීඩාව කියන එක බොහෝ වෙලාවට අපි වාගේ පීඩිත, දුප්පත් රටකට ලෝකය ජයග්‍රහණය කරගන්න, ලෝකයේ අවධානය යොමු කරගන්න හැකියාව තිබෙන විෂයයක්. මේ විෂයයට සම්බන්ධ විශේෂ දක්ෂතා තිබෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල ප්‍රමාණයක් අපේ රට තුළ බිහි වෙලා තිබෙනවා. අනාගතයේත් එවැනි ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කරගන්න හැකියාව තිබෙන බොහෝ අයගේ දක්ෂතා ගම්වලම යටපත් වෙලා, අපේ රටේ ක්‍රීඩකයන්ගේ කුසලතා ලෝකයට පෙන්වන්න තියා ඔවුන්ගේ කුසලතා රටට පෙන්වා ගන්නවත් හැකියාවක් නැතුව අවාසනාවන්ත විධියට ඒ සියලු දේවල් අපෙන් ගිලිහිලා යන තත්ත්වයක් තමයි වර්තමානය තුළ අපි දකින්නේ. ඒකට විශේෂ හේතුව මෙයයි. අපේ රටේ සමහර ක්‍රීඩා සඳහා පමණක් විශේෂ අවධානය යොමු වෙච්ච ක්‍රමයක් අනුව ඒවාට විශාල වශයෙන් මුදල් ගලාගෙන එනවා. ඒ මුදල් ටිකෙන් ඒ ක්‍රීඩා සංගම් ටික නිර්මාණය කරගෙන, ඒ සංගම් හරහා බොහෝ වෙලාවට මේ රටේ ක්‍රීඩාවට අවශ්‍ය ශක්තිය ලබා දීම වෙනුවට, ඒ එන මුදල් ටික තමන්ගේ පරිභෝජනයට නැත්නම් තමන්ගේ සුඛ විහරණය වෙනුවෙන් යොදා ගනිමින් තමන් වටා ඉන්නා වූ කණ්ඩායම් නඩත්තු කරගෙන තමන්ගේ ඉදිරි පැවැත්ම වෙනුවෙන් කටයුතු කරගෙන යන ආකාරයක් තමයි අපි දකින්නේ. ඒ නිසා ඒ තත්ත්වයෙන් අපේ රටේ ක්‍රීඩාව ආරක්ෂා කර ගැනීම රටක් විධියට අපට විශාල වශයෙන් වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය T20 World Cup එකට අපේ ක්‍රිකට් ක්‍රීඩකයෝ ඉදිරිපත් වුණා. හැබැයි, ලෝක ශූරතාව දිනා ගත්ත ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම අවාසනාවන්ත විධියට මෙවර T20 World Cup එකේ පළමු වටයෙන්ම විසි වෙලා ගෙදර එන තත්ත්වයට පත් වුණා. කුඩා දරුවෝ පවා ඒක හැල්ලුවට ලක් කළා. "අනේ දෙයියනේ! දැන් අපේ ක්‍රිකට් කණ්ඩායමට තිබෙන හොඳම විකල්පය තමයි, ලංකාවට ගංවතුර නිසා අපි හදිසියේ ලංකාවට යන්න ඕනෑ කියලා ආපහු එන එක" කියලා අවසාන තරගයට මුහුණ දෙන්න කලින්ම කුඩා දරුවෙක් කියනවා මාධ්‍ය තුළින් අපි දැක්කා. ඒ කුඩා දරුවාට තේරෙන තත්ත්වය අපේ රටේ ක්‍රිකට් පරිපාලනයේ සිටින නිලධාරීන් ඇතුළු සියලුදෙනාට තේරෙනවාද කියන ප්‍රශ්නය ඒ නිසා මතු වෙනවා. ක්‍රිකට් තරග පැරදුණත්, ක්‍රිකට් පරිපාලනය කරන අයයි, ක්‍රිකට් සෙල්ලම් කරන අයයි හැම දාම දිනුම්. හැබැයි, රටේ සුවිශාල වූ ජනතාවක් දහසකුත් බලාපොරොත්තු සහිතව රූපවාහිනී තිරය ළඟට වෙලා ඉඳගෙන ජයග්‍රහණ අපේක්ෂාවෙන් බලාගෙන ඉන්නවා. අවසානයේ මොකක්ද වෙන්නේ? ඒ සියලු බලාපොරොත්තු සුනු විසුනු වෙලා, අපේ කණ්ඩායම පරාජයට පත් වෙලා ගෙදර එනවා. මේ අයගේ විනය පිරිහිලා තිබෙන බව බොහෝ තැන්වලදී අපි දැක්කා.

මේ සියලු දේවල් මුදල් මත පමණක් ක්‍රියාත්මක වන තැනට මේ වනකොට පත් වෙලා තිබෙනවා. නමුත්, මේ රටේ අතීතයේ හිටපු ක්‍රිකට් ක්‍රීඩකයන් පහසුකම් නැතිව තිබුණු කාල වකවානුවලදී පවා ඔවුන්ගේ පෞද්ගලික ධනය කැප කරමින් ක්‍රීඩාව වෙනුවෙන් උපරිම වශයෙන් කැපවීම් කරලා, ඒ අයගේ දක්ෂතා වර්ධනය කරගෙන තමයි ඒ තත්ත්වයට ආවේ. හැබැයි, අතීතයේ හිටපු ක්‍රීඩකයන් ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් කරපු කැප කිරීම් නිසා ලැබුණු වරප්‍රසාද පිළිබඳ කිසිදු වටිනාකමක් වර්තමානයේ බිහි වන්නා වූ ක්‍රිකට් ක්‍රීඩකයන්ට නැහැ. ඔවුන් මේ රටත් අමතක කරලා, ඔවුන්ගේ පෞද්ගලික කුසලතා වර්ධනය කරගෙන මේ රටේ, ලෝකයේ බැබළෙන තාරකාවක් බවට පත් වෙනවා කියන එකත් පසෙක තියලා යම්කිසි දක්ෂතා ප්‍රමාණයක් පෙන්වලා, ඔවුන් පැවතෙන්නා වූ පෙළැන්තිය තුළ, ඔවුන් ආරක්ෂා කරන්න පෙලඹෙන්නා වූ කණ්ඩායමේ ආශීර්වාදයෙන් කණ්ඩායමට ආවාට පස්සේ මේ විධියට කටයුතු කරනවා. ඒ නිසා මේ අවාසනාවන්ත තත්ත්වයෙන් මේ රටේ ක්‍රීඩාව ආරක්ෂා කර ගන්න වෙනවා.

මම ප්‍රධාන වශයෙන් කියන්නේ ක්‍රිකට් ක්‍රීඩාව ගැන. අනෙක් ක්‍රීඩාවලත් මෙවැනි තත්ත්වයක් තිබෙනවා. මම කියන්නේ මේකයි. ක්‍රිකට් ක්‍රීඩාවට ලැබෙන්නා වූ සුවිශාල වරප්‍රසාද ප්‍රමාණය නැත්නම් මුදල් කන්දරාව හරහා මේ රටේ විශාල දූෂණයකට පාර කැපෙමින් තිබෙනවාය කියන එකත් අපට බොහොම පැහැදිලියි. මොන තරම් දූෂණ කළත් ප්‍රශ්නයක් නැහැ, අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව ආරක්ෂා කරලා. ක්‍රිකට් ක්‍රීඩාව ආරක්ෂා කර ගන්නට එක පෙළැන්තියකින් පමණක්, එක ප්‍රදේශයකින් පමණක් ක්‍රීඩකයන් එන එක නොවෙයි අද වනකොට අවශ්‍ය වෙන්නේ. මේ නිසා සැබෑම දක්ෂයෝ ගම්වලම පර වෙලා යන්න පුළුවන්. මෙච්චර මුදල් කන්දරාවක් ගැවසෙන ක්‍රිකට් ආයතනයට බැරි වෙලා තිබෙනවා, ග්‍රාමීය මට්ටමට මේ ක්‍රිකට් ක්‍රීඩාව ගෙනියන්න. ගමේ ඉන්න හොඳ තරුණයන්, නැත්නම් ළා බාල ක්‍රීඩකයන් මේ ක්‍රීඩාව කරන තැනට ගෙනෙන්න පුළුවන් හොඳ වැඩ පිළිවෙළක් සකස් කර ගැනීමට තවම හැකියාවක් ලැබිලා නැහැ. මේ ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් ලැබෙන මුදල් මොනවාටද පාවිච්චි කරන්නේ?

පසුගිය කාලයේ ක්‍රිකට් ගැනම අපි මෙතැනදී විවාද කළා. ඒ අවස්ථාවේදී අපි දැක්කා, මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව නිසා කොච්චර දූෂණ ප්‍රමාණයක් සිදු වෙලා තිබෙනවාද කියලා. ඒ කාරණය යම්කිසි ප්‍රමාණයකට අවබෝධ කර ගැනීමේ හැකියාවක් ලැබුණා, ඒවාට ඇහුම්කන් දෙනකොට. මේ ගනුදෙනු කිරීම්වලදී විශාල වශයෙන් දූෂණ සිදු වෙනවා. ඒ නිසා මේ කණ්ඩායම් මේවාට

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

අරක්ගෙන, නීතියේ තිබෙන හිඩැස්වලින් රිංගමින් කටයුතු කරන බව අපට බොහොම පැහැදිලිව පෙනෙනවා.

පාර්ලිමේන්තුව විධියට මේ රටේ ක්‍රීඩාව ආරක්ෂා කර ගැනීමේ වගකීමක් අපට තිබෙනවා. එම නිසා මේ රටේ ක්‍රීඩා ආයතන භාර දෙන පුද්ගලයන්ට අපි දිශානතියක් නිර්මාණය කර දීලා තිබෙනවා. එමෙන්ම අපි නීති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කටයුතු කළ යුතු වෙනවා. මේ තිබෙන නීති හරහා මේ අය ගෙන යන්නා වූ ක්‍රියා කලාපයේ තිබෙන අඩුපාඩු ටික හඳුනාගෙන දඬුවම් ලබා දිය යුතු අයට දඬුවම් ලබා දීම සඳහා අපි තවතවත් නීති ශක්තිමත් කළ යුතුව තිබෙනවා. එම නිසා මේ කටයුත්තට ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියාත් අපි යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අනෙක් පැත්තෙන් මේ ක්‍රිකට් ක්‍රීඩාව හරහා අපට ලැබෙන්නා වූ විශාල ශක්තිය, විශාල ආර්ථිකමය හැකියාව පාවිච්චි කරලා, අනෙකුත් ක්‍රීඩා ගොඩනඟන්නටත් කටයුතු කළ යුතු වෙනවා.

අද වනකොට පිරිමි ක්‍රිකට් කණ්ඩායම දුර්වල වීගෙන එනකොට, කාන්තා ක්‍රිකට් කණ්ඩායම යම්කිසි මට්ටමකට දියුණු වෙලා තිබෙනවා. හැබැයි, කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ නායිකාව යම්කිසි දවසක ක්‍රිකට් ක්‍රීඩාවෙන් සමුගත්තාට පස්සේ කාන්තා ක්‍රිකට් කණ්ඩායමටත් අත් වෙන ඉරණම මොකක්ද කියලා තවමත් අපි සැලසුම් සකස් කරගෙන නැහැ. එක ක්‍රීඩිකාවක් වටා පමණක් නිර්මාණය වෙමින් අපේ ක්‍රීඩාව ජයග්‍රහණය දක්වා ගෙන යන තත්ත්වයක් තමයි කාන්තා ක්‍රිකට් කණ්ඩායම තුළත් දක්නට තිබෙන්නේ. ඒ නිසා කාන්තා ක්‍රිකට් කණ්ඩායම හා පිරිමි ක්‍රිකට් කණ්ඩායම කියන දෙකම එක පුද්ගලයෙක් වටා නිර්මාණය විය යුතුයි කියන එකෙන් බැහැර වෙලා, "අපි එක කණ්ඩායමක්" කියන තත්ත්වයට පත් කරන්නට අවශ්‍ය නීති මාලාව සකස් කිරීම කළ යුතු වෙනවා. විශේෂයෙන්ම දූෂණය සිදු වෙන දේවල් වළක්වා ගැනීමට අපි මොන ආකාරයෙන් හෝ කටයුතු කළ යුතුයි කියන කාරණයත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙකුත් ක්‍රීඩා ගත්තත් එහෙමයි. අපි හැමෝම දන්නවා, ක්‍රිකට්වට දරුවෙක් යොමු වෙනවා නම්, ඒ දරුවාට ඒ හරහා ඉස්සරහට යන්න හැකියාවක් ඇති වෙනවාය කියන එක. ඒ වාගේම දරුවෙකු ක්‍රීඩාවට යොමු කිරීම තුළින් සෞඛ්‍ය සම්පන්න පුරවැසියෙක් අපට නිර්මාණය කර ගැනීමේ හැකියාව ලැබෙනවා. හැබැයි, ක්‍රීඩකයෙක් මුල් අත්පොත් තියන්න ඕනෑ පාසලෙන්. අද වනකොට පාසල්වල ක්‍රීඩාව සම්පූර්ණයෙන්ම අත්හැර දමන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ශිෂ්‍යත්ව විභාගය මුල් කරගෙන දෙමව්පියෝ පළමුවන ශ්‍රේණියේ ඉඳලාම දරුවා කට පාඩම් කරන අධ්‍යාපන ක්‍රමය තුළ රඳවාගෙන හොඳ උසස් පාසලකට ඇතුළත් කරන්න ඕනෑ කියන හැඟීම තුළ ඉඳගෙන තමයි උගන්වන්නේ. එක පැත්තකින් ඒක අධ්‍යාපනයටත් බලපානවා. අපේ සෑම පාසලකටම එකම විධියේ වරප්‍රසාද, එකම විධියේ පහසුකම් ලබා නොදීම නිසා මෙවැනි දේවල් සමාජය තුළ ඇති වෙලා තිබෙනවා. නමුත් පාසල් පද්ධතිය තුළ අධ්‍යාපන ක්‍රමය හැඩගස්වන එක වෙනම දෙයක්.

එක එක ජාතියේ සතුන් හිටියාම, එක එක ජාතියේ ගස් කොළන් තිබුණාම තමයි කැලයක අලංකාරය තිබෙන්නේ. ඒ වාගේ තමයි අපේ සමාජය ගත්තාමත්. එක එක ක්ෂේත්‍රවලට දක්ෂ දරුවන්, කණ්ඩායම් ඉන්නවා. දෙමව්පියන් බලාපොරොත්තු වන්නේ, දරුවන් අධ්‍යාපනයෙන්ම ඉදිරියට ගෙනයන්න විතරයි. හොඳ ඉස්කෝලයකට දරුවන් දමාගන්න ඕනෑ, ඊට අමතරව දරුවා මෙච්චර ලකුණු ප්‍රමාණයක් ගත්තා කියලා ෆේස් බුක් එකේ දමාගන්න ඕනෑ. හන්දියේ කථා කරද්දී, කඩ පිලේ කථා කරද්දී ඒ ගැන කියන්න ඕනෑකම තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳ විශාල වශයෙන් උනන්දුවක් දක්වනවා. හැබැයි, ඒ දරුවාට සැබවින්ම දක්ෂතා තිබෙන්නේ මොන විෂයටද කියන එක හඳුනා ගැනීමේ ක්‍රමයක් අප රට තුළ ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ නිසා පාසලට ක්‍රීඩාව අනුයුක්ත කරලා පළමු වසරේ ඉඳලාම ක්‍රීඩාව ප්‍රගුණ කරවන්නට, ක්‍රීඩාව පැත්තෙන් දක්ෂතා දක්වන දරුවන් එතැනින් හඳුනා ගෙන ඔවුන් ක්‍රමානුකූලව ඉදිරියට ගේන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපි සකස් කරන්න ඕනෑ. එය රට පුරාම විහිදී ගොස් ග්‍රාමීය මට්ටමේ, ගමේ ඈත කෙළවරේ ඉන්න දරුවාටත් හෙට මේ රටේ ජාතික තලයේ ක්‍රීඩා කරන්න පුළුවන් විධියේ ක්‍රමයක් සකස් කරන්න අපි කටයුතු කරන්න ඕනෑ. විශාල වශයෙන් මුදල් ගැවසෙන සංගම්වලින් මුදල් ටිකක් ලබාගෙන එහෙම නැත්නම් රජයේ හෝ අවධානය යොමු කරලා මේ කටයුතු කරනවා නම් හොඳයි කියන එක තමයි මම පෙන්වා දෙන්නේ.

ඊළඟට මම තව කාරණයක් කියන්න කැමැතියි. විශේෂයෙන් අද මේ ක්ෂේත්‍රය තුළ දූෂිත කටයුතු සිදුවෙනවා. ඉන්දියාව මේ වෙනකොට ජයග්‍රහණ කරා ගිහින් තිබෙනවා. IPL තරඟාවලිය හරහා ඒ අය ක්‍රීඩකයෝ ගෙනැල්ලා අධ්‍යයනය කරනවා. හැබැයි අපේ LPL එක පිටුපස අපි දැක්කා මේ වන විටත් දූෂණ ගණනාවක් සිද්ධ වෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඔවිටු දමන්නන්ගේ තෝතැන්නක් බවට පත් කරන තැනට මේ ක්‍රීඩාව ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අපි අපේ ක්‍රීඩාව ආරක්ෂා කරගත යුතුයි.

මම දැක්කා, ලංකාවේ නමකින්; "බදුලු ක්‍රීඩා" කියමින් ඉන්දියාවේ සෙල්ලම් කරනවා. ඒ නිසා මේ ක්‍රිකට් ක්‍රීඩාව කියන එක ඔවිටු දමන්නන්ගේ, සූදු දමන්නන්ගේ තෝතැන්නක්, ක්‍රීඩාවක් බවට පත්වීම වළක්වා අපි ආරක්ෂා කරගත යුතුයි. අපේ රට ජයග්‍රහණය කරා ගෙනාපු ක්‍රීඩාව, මෙවැනි රටක් තිබෙනවා කියලා ලෝකයේ අවධානයට යොමු කරපු ක්‍රීඩාව, මේ රටේ සුවහසක් ක්‍රීඩා ලෝලීන්ගේ හදවත් ආනන්දයට පත් කරපු ක්‍රීඩාව තමයි ක්‍රිකට් ක්‍රීඩාව. ඒ නිසා මේ ක්‍රිකට් ක්‍රීඩාව ආරක්ෂා කර ගැනීම සඳහා මේ රටේ හොඳ නීති පද්ධතියක් සකස් කරලා, දූෂිතයන්ගෙන් මේ ක්‍රීඩාව ආරක්ෂා කරලා අපේ රටේ ක්‍රීඩා ලෝලීන්ට සහ රට වැසියන්ට ගෞරවයක් ලබා දෙන ක්‍රීඩාවක් බවට නිර්මාණය කර දීම වෙනුවෙන් අපි සියලුදෙනා කටයුතු කරමු කියන ඉල්ලීම කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු භේෂා විතානගේ මැතිතුමා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மதுர விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. WEERASUMANA WEERASINGHE left the Chair, and THE HON. MADHURA WITHANAGE took the Chair.

[පූ.භා. 10.41]

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් අද දින ඉදිරිපත් කරන ලද ඉතා කාලීන, වැදගත් යෝජනාව ස්ථිර කරමින් මගේ අදහස් දැක්වීම ආරම්භ කරනවා. අපේ රටේ ක්‍රීඩාව ගැන වෙනදාට වඩා කථා කරන වෙලාවක් මේ.

අපේ රටේ ක්‍රීඩාවට වගකිවයුත්තන් කථා නොකරන මාතෘකාව තමයි ක්‍රීඩාව දියුණු කිරීම. එහෙම නැත්නම් මේ රටේ ක්‍රීඩාව නංවාලීම. මේ රටේ ක්‍රීඩාවේ තිබෙන ප්‍රශ්න මොනවාද කියන එක අධ්‍යයනය කරලා, ඒවාට උත්තර හොයන එක අතහැර දමා තිබෙන වෙලාවක විපක්ෂයේ මන්ත්‍රීවරයකු වන ඔබතුමා මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

ඔබතුමා කථා කළා, ක්‍රිකට් ක්‍රීඩාවේ වර්තමාන තත්ත්වය ගැන. අපි ඒ ගැන දිගින් දිගටම කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේ මේ රටේ සියලු ජනතාවට දැන ගන්න කියන්න කැමැතියි, අපි මේ ගැන කථා කළාම මේ වෙනකොට අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා. අපි ඒ කථා කරපු කාරණාවලට සාධාරණය ඉටු කරන්න කිව්වාම, විගණකාධිපති වාර්තාවෙන් ඉදිරිපත් කර තිබෙන දොස්වලට උත්තර හොයලා ක්‍රිකට් ආයතනය නිවැරදි කර ගන්න අවශ්‍ය වටපිටාව හදා ගන්න කිව්වාම, ඒ වටපිටාව හදාගන්න එක නොවෙයි කළේ, අපට විරුද්ධව අධිකරණයට ගිහිල්ලා නඩු දාපු එකයි කළේ. මේ වෙනකොට නඩු 4ක් දාලා තිබෙනවා, රාජ්‍ය ඇමතිතුමනි. ඒ නඩු 4ටම වියදම් කරන්නේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය. සාමාන්‍යයෙන් හේෂා විතානගේට විරුද්ධව පවරපු නඩුවලට මාසයකට, එක නඩු වාරයකට රුපියල් මිලියන 10කට වඩා -රුපියල් කෝටියකට වඩා- වියදම් කරනවා ක්‍රිකට් ආයතනය. හේෂා විතානගේ මේ රටේ ක්‍රිකට්වලට මොකක්ද කරලා තිබෙන වැරැද්ද? හේෂා විතානගේගේ කට වහලා නවත්වලා දමන්න රුපියල් මිලියන 10කට වඩා මුදලක් නීතිඥවරුන්ට ගෙවනවා. නමුත් රුපියල් මිලියන 10කින් මේ රටේ පාසල් ක්‍රීඩාව නංවන්න - අපේ රත්නපුර, හම්බන්තොට වාගේ දිස්ත්‍රික්කවල ග්‍රාමීය පාසල්වල ක්‍රීඩාව නංවන්න- කටයුතු කළොත් පාසල් කොච්චර ප්‍රමාණයකට උදවු කරන්න පුළුවන්ද? නමුත් ඒවා කරන්නේ නැහැ. මේ හොරකම් කරන තක්කඩි රැළ දේශපාලනඥයන් සාක්කුවට දමාගෙන තිබෙනවා. දේශපාලනඥයන් ටික සාක්කුවට වැටුණාට පස්සේ ඒ වෙනුවෙන් විපක්ෂයේ හඬක් නහන අපි අධිකරණයට ගෙන ගිහිල්ලා කට වහලා, භය කරන්න උත්සාහ කරනවා.

ගරු අධිකරණයට අපේ ගරුත්වය තිබෙනවා. අධිකරණය ඉදිරියට ගෙනියන හැම සිද්ධියක් වෙනුවෙන්ම අපි ගිහිල්ලා නීත්‍යානුකූලව මේ සිදුවීම්වල තිබෙන බැඳීම ගැන කථා කරනවා. හැබැයි, අපි එක දෙයක් කියනවා. අධිකරණයට ගරු කරලා අපි මේ ගැන සීමා තුළ ඉඳගෙන කථා කළාට, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට යටවෙලා අපි අධිකරණයට අබමල් රේණුවකින්වත් හානිදායක වෙන විධියේ ප්‍රකාශ කරන්න උත්සාහ කරන්නේ නැහැ. නමුත් මේ පිළිබඳව මේ රටේ දේශපාලනඥයන්, වගකිවයුත්තන් නිශ්ශබ්දව ඉන්න වෙලාවක, අපට කථා නොකර ඉන්න බැහැ. අපට මේ වෙනුවෙන් හඬක් නහන්න සිදුවෙලා තිබෙනවා. ක්‍රිකට් ආයතනයේ සභාපතිවරයාගේ ගෙදර වළන් හෝදන මිනිහා දමලා, අර කවුද පහර නැටිටෙක් දමලා, ගුවන් විදුලියේ විස්තර විචාරකයෙක් කියන හාදයෙක් දමලා ඊයේ පෙරේදා YouTube එකෙන් අපට පහර ගැස්සුවා.

එහෙම අපේ කට වහන්න බැහැ. ඒ නිසා සභාපතිතුමා, එන්න එළියට. අපි කැමැතියි ඔබතුමන්ලා ගහලා තිබෙන ගැහිලි ටික පෙන්වන්න. අපි කැමැතියි ඔබතුමන්ලා මේ ක්‍රිකට් එකෙන් හම්බ කරගෙන තිබෙන ටික පෙන්වන්න. අපි කැමැතියි ඔබතුමන්ලා මේ රටේ ක්‍රිකට් විකුණාගෙන තමන්ට ඕනෑ ඕනෑ දේවල් කරන හැටි පෙන්වන්න. පසුගිය T20 තරගාවලියට තෝරාගත්තේ නැති ක්‍රීඩකයන්ට අද මොකද වෙලා තිබෙන්නේ? අද කුසල් ජනිත් ගහනකොට ඇඬෙනවා ඇති. අද චන්දිමාල් ගහනකොට ඇඬෙනවා ඇති. චන්දිමාල්, කුසල් ජනිත් ගෙදර තියලා තමන්ගේ team එක, - CCC team එක - අරගෙන ගිහිල්ලා ගහලා, ආතල් දාලා මේ රටේ ක්‍රිකට් විනාශ කරපු හැටි අපි කියන්නම්. හරින් ප්‍රනාන්දු ඇමතිතුමා කිව්වා, මේ කට්ටියට එහෙම චෝදනාවක් තිබෙනවා නම් එතුමා අයින් වෙනවා කියලා. රාජ්‍ය ඇමතිතුමාත් එහෙම කිව්වාද කියන්න මා දන්නේ නැහැ. රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් ඒ මතයේද දන්නේ නැහැ ඉන්නේ. ඔය දැන් ඔප්පු වෙලා තිබෙන්නේ. ඔය දැන් කියන්නේ ගිහිල්ලා බාල් නටපු හැටි.

මේ රටේ ක්‍රිකට් විනය නැති කරන්නේ මේ ක්‍රිකට් පරිපාලනය. ක්‍රිකට් පරිපාලනය මේ රටේ දේශපාලනඥයන් ටික අල්ලාගෙන තිබෙනවා. ක්‍රිකට් පරිපාලනය මේ රටේ ක්‍රීඩකයෝ ටික තමන්ට ඕනෑ ඕනෑ විධියට පාවිච්චි කරනවා. අද ඒකට හොඳම උදාහරණය තමයි සනත් ජයසූරිය මහත්මයා පිළිබඳ කාරණය. සනත් ජයසූරිය මහත්මයාට මේ රටේ කවුරුත් ආදරෙයි. මේ රටේ ක්‍රිකට් ක්‍රීඩකයකු විධියට මටත් එතුමා ගැන පුදුමාකාර ආදරයක් තිබෙන්නේ. මගේත් ක්‍රිකට් වීරයා සනත් ජයසූරිය මහත්මයා. හැබැයි, සනත් ජයසූරිය මහත්මයා මේ රටේ ප්‍රධාන පුහුණුකරු කරන්න බැහැ, ක්‍රිකට් ආයතනයේ කොන්දක් තිබෙන කෙනෙක් ඉන්නවා නම්, ඇමතිවරයාට කොන්දක් තිබෙනවා නම්. ඇයි ඒ? එතුමාට අවුරුදු දෙකක් ක්‍රීඩා පිටියකට යන්න බැරිව ban කරලා තිබුණා, ගරු රාජ්‍ය ඇමතිතුමනි. එතුමාට චෝදනා තිබෙනවා. එතුමාට විරුද්ධව තිබුණු match-fixing චෝදනා විභාග කළේ, එතුමා නැතුව. එතුමා ඒකටවත් ඉදිරිපත් වුණේ නැහැ. දුරකථනය ඉල්ලුවාමත් දෙන්න බැහැ කිව්වා. එහෙම කෙනෙක් ප්‍රධාන පුහුණුකරු කරලා මේ හොර කල්ලිය තවත් හොර කණ්ඩායම් පෝෂණය කරන්න උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි කියනවා මේ රටේ ක්‍රිකට් විනාශ කරපු හැම දෙනාම, මේ රටේ පාසල් ක්‍රිකට් නංවන්න තිබුණු සල්ලි ටික තමන්ගේ සාක්කුවට දමා ගත් හැම කෙනාම වෙනුවෙන් අනිවාර්යයෙන්ම සමගි ජන බලවේග ආණ්ඩුවක් තුළදී ක්‍රියාත්මක වෙන්න පුළුවන් උපරිමයෙන් අපි ක්‍රියාත්මක වෙනවා කියලා. මේ ක්‍රිකට් විනාශ කරපු, මේ තැනට ක්‍රිකට් ඇදලා දමපු හාදයෝ හිමින් සැරේ පිටුපස දොරෙන් දැන් සජබය ඇතුළට රිංගන්න හදනවා. අපි වගකීමෙන් කියනවා, ඒවා ලේසි වෙන්නේ නැහැ කියලා. ඒවා සුම්මා කියන එක ඒ මහත්වරුන්ටත් මතක් කරනවා.

ගරු රෝහණ බණ්ඩාර මැතිතුමනි, ඔබතුමා අද මේ රටේ ක්‍රීඩාව ගැන, අඩුම ගණනේ විගණකාධිපති වාර්තාව ගැන හැඟීමක් නැතුව කටයුතු කරන ක්‍රිකට් පාලනය ගැන තොරතුරු සමාජයට අරගෙන එන්න පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මගේ පෞද්ගලික ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.47]

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඉදිරිපත් වන අද දවසේ අපේ ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් වැදගත් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා.

ඒ යෝජනාව තුළ ප්‍රමුඛව තිබෙන්නේ, ක්‍රිකට් සහ අනෙකුත් ක්‍රීඩාවල තිබෙන දූෂණ සහ අනෙකුත් කාරණා විමර්ශනය සඳහා වන නීතිය ශක්තිමත් කිරීම කියන කාරණයයි. හැබැයි, අවසානාවකට අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ තිබිය යුත්තේ ක්‍රිකට් පමණයි කියලා හිතන සමාජයක්, තිබිය යුත්තේ ක්‍රිකට් පමණයි කියලා හිතන අමාත්‍යාංශයක් තිබෙන වෙලාවක, අපේ රටේ සමස්ත ක්‍රීඩා බරපතළ අර්බුද රැසකට ගිහින් තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩාවේ අර්බුද ගැන මේ පාර්ලිමේන්තුවේ අනන්තවත් කථා කරලා තිබෙනවා. මට කලින් කථා කරපු ගරු ඡේෂා විතානගේ මන්ත්‍රීතුමා අවුරුද්දක්, දෙකක් තිස්සේ ක්‍රිකට් ගැන ඇති පදමට කථා කළා. ඒ තුළ යම් ප්‍රමාණයකට අර්බුද සමනය වුණා. එසේ වුවද නැති අර්බුද නිර්මාණය වීම සහ තවත් ඒවාට උත්තර ලෙස පැලැස්තර විසඳුම් ගෙන ඒම තුළ එම ක්‍රීඩාව තවතවත් අගාධයට යන ආකාරයක් තමයි පෙනෙන්නට තිබෙන්නේ. අවසානයේදී මේ රටේ ජාතික ක්‍රීඩකයෙකු වුණු, එහෙම නැත්නම් අපේ ක්‍රිකට් වීරයෙකු වුණු මාතරින් බිහි වෙච්ච සනත් ජයසූරිය මහත්මයාට කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු ධුරය භාර ගන්න සිද්ධ වුණා. නිසි වැඩ පිළිවෙළක් නැති ක්‍රිකට් ආයතනය නිසා තමයි මේ අර්බුද හමුවේ ක්‍රිකට් ක්‍රීඩාව තල්ලු වෙලා ගිහින් අවසානයේදී බිත්තියට හේත්තු වුණේ. මේ රට කවුරුවත් භාර ගත්තේ නැති නිසා රනිල් වික්‍රමසිංහ මහත්මයා භාර ගත්තා කියලා කියනවා වාගේ, ටික දවසකින් කියන්න වෙයිද දන්නේ නැහැ, ප්‍රධාන පුහුණුකරු ධුරය භාර ගන්න කෙනෙකු නැති නිසා එය සනත් ජයසූරිය මහත්මයාට භාර ගන්න වුණා කියලා. සල්ලි කන්දරාවක් තිබෙන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කිසිම සැලැස්මක්, වැඩ පිළිවෙළක් නැතුව පවත්වාගෙන යන බේදනීය තත්ත්වයක් තමයි පෙනෙන්නට තිබෙන්නේ. ක්‍රිකට් ක්‍රීඩාව සනත් ජයසූරිය මැතිතුමාගේ දක්ෂතාව තුළින් යම් ප්‍රමාණයකට බේරා ගන්න පුළුවන්කම ලැබේවි. හැබැයි, ක්‍රිකට් ගහපු පළියටම බේරා ගන්න පුළුවන් තත්ත්වයක තිබෙන ක්‍රීඩාවක් නොවෙයි ක්‍රිකට් කියන්නේ. එහි පරිපාලනය වෙනස්, පුහුණුව වෙනස්, ක්‍රිකට් හා සම්බන්ධව තිබෙන අනෙකුත් ආයතනවල සංයුතිය වෙනස්. හැබැයි, ඔහුට හැකීමක් තිබෙන නිසා යම් මැදිහත් වීමක් කරයි කියලා අපි විශ්වාස කරනවා.

මම බලාපොරොත්තු වන්නේ ක්‍රිකට් ගැන කථා කරන්න විතරක් නොවෙයි. මොකද, ක්‍රිකට් විතරක් නොවෙයි අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ තිබෙන්නේ. ක්‍රීඩාවට ආදරය කරන කෙනෙකු විධියට, ක්‍රීඩා පිටියේ රැඳෙන කෙනෙකු විධියට, අදටත් ක්‍රීඩාවේ යෙදෙන කෙනෙකු විධියට සහ පළාත් සභාවක ක්‍රීඩා අමාත්‍යාවරයෙකු විධියට යම් කාලයක් කටයුතු කරපු කෙනෙකු විධියට මටත් මේ සම්බන්ධයෙන් යම් අත්දැකීම් ප්‍රමාණයක් තිබෙනවා. වර්තමාන ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍ය රෝහණ දිසානායක මැතිතුමාත් ක්‍රීඩාව පිළිබඳව හොඳින් දන්නවා. එතුමාත් ක්‍රීඩකයෙක්, ජාතික මට්ටමට සම්බන්ධ වුණු ක්‍රීඩකයෙක්. එම නිසා ක්‍රීඩාවේ තිබෙන අර්බුද ගැන අපි දන්නවා. හැබැයි ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගේ හෘදය සාක්ෂියෙන් අහනවා, අද ක්‍රීඩා විෂය භාර රාජ්‍ය ඇමතිවරයා විධියට මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න ඔබතුමාට භයියක් තිබෙනවාද, පුළුවන්කමක් තිබෙනවාද, ඔබතුමන්ලා කියන දේ ඒ අය අහනවාද කියලා. මුදා නොගත් කලාප -ප්‍රදේශ- විධියට තමයි අද ඇතැම් ක්‍රීඩා සංගම් සහ පාලක මණ්ඩල තිබෙන්නේ. අද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ක්‍රීඩා ඇමතිවරයා කියන දේ අහනවාද? හරින් ප්‍රනාන්දු ඇමතිතුමා කියන දේ නම් දැන් ශම්මි සිල්වා අහනවා ඇති, ඒ දෙදෙනාගේ තිබෙන යාළුකම නිසා. ඒ දෙදෙනාගේ තිබෙන බෂනය නිසා සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ ඇතැම් ඉහළ නිලධාරීන්ගේ සම්බන්ධතා නිසා. හැබැයි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පාලනය කරන්න ඇත්තටම ක්‍රීඩා අමාත්‍යාංශයට පුළුවන්ද කියලා මම අහනවා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විතරක් නොවෙයි, එවැනි අර්බුද තිබෙන තවත් ආයතන කිහිපයක් තිබෙනවා.

ඒ තත්ත්වය පාලනය කරන්නේ කොහොමද? ගරු අධිකරණ ඇමතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. මේ රටේ හැම දෙයක් සම්බන්ධවම නීති හදන තැන මේ පාර්ලිමේන්තුව - ව්‍යවස්ථාදායකය- නම් මේ අර්බුද සම්බන්ධයෙන් එක එක පෞද්ගලික කෝණවලින් බලන්නේ නැතුව පොදු කාරණාවක් විධියට බලලා ක්‍රීඩා සංගම්වල සහ ක්‍රීඩාවේ පවතින දූෂණ, වංචා පාලනය කළ හැකි පනත්, නීති වහ වහා සම්පාදනය කිරීම අපේ වගකීමක්. ඒ සඳහා වන මැදිහත්වීමට මේ යෝජනාව හොඳ ප්‍රවේශයක් කියන කාරණාව තමයි මා සිහිපත් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රිකට් විතරක් නොවෙයි, ඔබතුමා දන්නවා ඇති කබඩි සම්මේලනය ගැනත්. එය හොර ගුහාවක්. පසුගිය කාලයේ ඒකේ හිටපු ඇතැම් නිලධාරීන් කරපු තක්කඩිකම් ඔබතුමන්ලාත් දන්නවා ඇති. එහෙම කටයුතු කරපු නිලධාරීන් අද මේ රටින් පැනලා ගිහින් පිට රටවල සරණාගතයන් විධියට ඉන්නවා. හැබැයි ඔවුන්ගේ බළල් අත් තමයි සල්ලි සහ වෙනත් දේවල් වෙනුවෙන් තවමත් ඒ සම්මේලනය මෙහෙයවන්නේ. පසුගිය කාලයේ නිලවරණයක් තිබුණා. ඒ නිලවරණය සල්ලිවලටයි විකිණුනේ. අනෙක් සම්මේලනවල නිලවරණවල හැසිරීම් අපි පෞද්ගලිකව දන්නවා. ප්‍රාදේශීය මට්ටමේ, දිස්ත්‍රික් මට්ටමේ සංගම්වල ක්‍රියාකාරීව ඉන්න අය විධියට අපි දන්නවා, ඒවායේ හැසිරීම ගැන. ඒ නිසා සමස්ත ක්‍රීඩාව තුළ තිබෙන මේ අර්බුදය විසඳන්න ප්‍රමාණවත්, ශක්තිමත් නීති පද්ධතියක් අවශ්‍යයි කියන කාරණාව තමයි මා සිහිපත් කරන්නේ.

මේ මොහොතේ ක්‍රීඩාවේ තිබෙන ඊළඟ අර්බුදය මොකක්ද ගරු රාජ්‍ය ඇමතිතුමනි? මම කිව්වේ, කබඩි සම්මේලනයේ තිබෙන අර්බුදය ගැන. මලල ක්‍රීඩා සංගමය ගනිමු. විධිමත් සැලැස්මක් එක්ක මලල ක්‍රීඩා සංගමයේ වැඩ පිළිවෙළ යනවාද? පහළ මට්ටමේ ඉඳලා, එනම් පාසල් පද්ධතියේ නම් නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ - sports meet එකේ - ඉඳලා සමස්ත ලංකා පාසල් ක්‍රීඩා උත්සවය දක්වා, එහෙම නැත්නම් ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක වන GS level meet එකේ ඉඳලා හෙට අනිද්දාට පවත්වන්නට නියමිතව තිබෙන ජාතික ක්‍රීඩා උළෙල දක්වා වන ක්‍රියාවලිය තුළ බරපතළ ප්‍රශ්න ප්‍රමාණයක් තිබෙනවා. මුදල් කියන කාරණාව මත ඒ ක්‍රීඩා සම්පූර්ණයෙන් ඇති හැකි, පුළුවන්කම තිබෙන කිහිපදෙනෙකුගේ කැප කිරීම් මත පවතින ඒවා මිස කිසිදු සාධනීය රාජ්‍ය මැදිහත් වීමක් සහිතව පවත්වාගෙන යන ඒවා නොවෙයි. අද ඒ ඇතැම් ක්‍රීඩා නිලධාරීන්, පුහුණුකරුවන් අපා දුක් විඳිමින් තමයි එම ක්‍රීඩා පවත්වා ගෙන යන්නේ.

එපමණක් නොවෙයි. අද වන කොට අපේ රටේ ලියාපදිංචි ක්‍රීඩා පනස් ගණනක් තිබෙනවා. ජාතික ක්‍රීඩා උළෙලේ ක්‍රීඩා

පනස් ගණනක්, හැට ගණනක් පමණ තිබෙනවා. හැබැයි ඒ ක්‍රීඩා සම්මේලනවලින්, ජාතික මට්ටමේ සම්මේලනවලින් මොනවාද වෙන්නේ, ප්‍රාදේශීය මට්ටමේ සහ ග්‍රාමීය මට්ටමේ ක්‍රීඩා ප්‍රවර්ධනය කරන්න? මම අහනවා බැඩ්මින්ටන් සංගමයෙන්, මම අහනවා පාපන්දු සම්මේලනයෙන්, මම අහනවා වෙනත් සම්මේලනවලින්, මැච් එකක්, tournament එකක් league tournament එකක් පවත්වනවා හැරෙන්නට පහළ මට්ටමේ ක්‍රීඩකයන් හඳුනා ගන්න, ගමට ක්‍රීඩාව ගෙන යන්න ගෙන තිබෙන සාධනීය පියවර මොනවාද කියලා. ඒ නිසා ක්‍රීඩා අමාත්‍යාංශයේ ඍජු මැදිහත්වීමක් තිබිය යුතුයි, මේ හැම ක්‍රීඩාවක්ම පහළ මට්ටමට ගෙන යෑමට, ගමට ගෙන යෑමට අවශ්‍ය පාලම හදන්න; ඒ මඟ පෙන්වීම කරන්න. ඒක සම්මේලනවලට විතරක් භාර දීලා ඉන්න එපා. ක්‍රීඩාව මේ රටේ සෞඛ්‍යය, අධ්‍යාපනය කියන දෙකටම බද්ධ වෙච්ච දැවැන්ත පාලමක්. මේ රටේ නීරෝගිමත්, සෞඛ්‍යවත් පරම්පරාවක් බිහි වීමට, ඉවසීමෙන් යුක්ත පරම්පරාවක් බිහි වීමට, ඒ වාගේම සංවේදී පරම්පරාවක් බිහි වීමට ක්‍රීඩාවෙන් ඉහළ දායකත්වයක් ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පළාත් සභා අකර්මණ්‍යයි. ආණ්ඩුකාරවරු විතරක් ඒවායේ කටයුතු මෙහෙයවනවා. ආණ්ඩුකාරවරුන් කරන්නේ ඒ අයට ඕනෑ ඕනෑ දේවල්. ආණ්ඩුකාරවරු එක එක තැන්වලට එක එක අය පත් කරලා තිබෙනවා. දැන් ජනාධිපතිවරණය කිට්ටුයි. ඔවුන් දැන් ජනාධිපතිවරණයට සූදානම් වෙනවා. ඒ නිසාම පළාත් සභාවල තිබෙන ක්‍රීඩා අමාත්‍යාංශවල අර්බුද ප්‍රමාණයක් අද ඇති වී තිබෙනවා. ඒවායේ කටයුතු කරන නිලධාරීන්ට අවශ්‍ය ශක්තිය සහ වැඩ කිරීමේ පරිසරය අද ඒ ආයතන තුළ නැහැ. අද පළාත් සභා ක්‍රියාත්මක වන්නේ නැති නිසා, පළාත් සභාව නිලධාරීන් මත විතරක් කටයුතු ක්‍රියාත්මක වන නිසා ක්‍රීඩාව සම්බන්ධයෙන් පළාත් සභ ජාතික මට්ටමේ සම්බන්ධීකරණයක් ඇති කිරීම පිණිස විධිමත් යන්ත්‍රණයක් අවශ්‍යයි. මේ සභාවේ ඉන්න ගරු දයාසිරි ජයසේකර මැතිතුමා හිටපු ක්‍රීඩා ඇමතිවරයෙක්. තවත් හිටපු ක්‍රීඩා ඇමතිවරු මේ ගරු සභාව නියෝජනය කරනවා. පළාත් සභාවේ ක්‍රීඩා අමාත්‍යාංශය සහ මධ්‍යම රජය අතර යම් සම්බන්ධීකරණයක් ඇති වෙන්න ඕනෑ නිසා අපි පළාත් ක්‍රීඩා අමාත්‍යාංශ සම්මේලනයක් නිර්මාණය කළා. අද ඒ දේවල් පිළිබඳව මොකවත් සන්නිවේදනය වන්නේ නැහැ. ඒ නිසා ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ජාතික මට්ටමින් සහ පළාත් මට්ටමින් නිසි සන්නිවේදන ක්‍රමයක්, මනා සම්බන්ධීකරණ ක්‍රමයක් අවශ්‍යයි. මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා, ක්‍රීඩාව අපේ රටේ සංස්කෘතියක් බවට පත් කරමු කියලා. ක්‍රීඩාව සංස්කෘතියක් බවට පත් කරන්න පුළුවන් කාලය දුරස් වෙන්න, දුරස් වෙන්න මේ රට බරපතළ සංස්කෘතික අර්බුදයකට යනවා. එය මිලේච්ඡත්වය දක්වාම යනවා.

පසුගිය දවස්වල ඇති වෙච්ච ඇතැම් සිදුවීම් සහ යම් යම් දේවල් දිහා බලන කොට මේ රට මොන තරම් අවසංවේදීභාවයකට ලක් වෙලාද කියන කාරණාව අපේ ඇස් පනාපිට පෙනෙමින් තිබෙනවා. මේ රටේ අවසංවේදීභාවයට ලක් වෙච්ච, මිලේච්ඡත්වයට පත් වෙච්ච හැම ක්‍රියාවලියක් පිටුපසම අධ්‍යාපනයේ සහ ක්‍රීඩාවේ දුරස් වීම පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා. ඒ නිසා මේ රටේ ජාතික වැදගත්කමකින් යුක්ත දෙයක් ලෙස කල්පනා කරමින් ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම සඳහා වන ගමන් මඟ ශක්තිමත් කරන්න කියන ඉල්ලීම කරමින්, ඒ සඳහා වන හොඳ ප්‍රවේශයක් තුළින්, ක්‍රීඩාවේ තිබෙන වංචා, දූෂණ වළක්වන විධිමත්, පැහැදිලි නීති පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා මේ මන්ත්‍රීවරුන් 225 දෙනාගේම ප්‍රමුඛ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ.පී.එස්. කුමාරසිරි මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 10ක කාලයක් තිබුණා. මම යෝජනාව ස්ථිර කරන්නයි හිටියේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මෙම යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්න තවත් විනාඩි 10යි තිබෙන්නේ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් කථා කරන්න අවස්ථාව ඉල්ලා තිබෙනවා. ඒක නිසා ඔබතුමාට විනාඩි 5ක කාලයක් දෙන්න පුළුවන්.

[පූ.භා. 10.55]

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. පසුගිය කාලය පුරාවට දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේ ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව කථා කළා; ක්‍රීඩා සංගම් පිළිබඳවත් - ක්‍රීඩා සංගම් කොයි විධියට ද මේ රටේ නිර්මාණය කරලා තිබෙන්නේ කියන කාරණා ගැන - විශාල වශයෙන් කථා කළා. සල්ලි අරගෙන ඡන්දය දෙන්න පමණක් මේ රටේ ක්‍රීඩා සංගම් විශාල වශයෙන් හදාගෙන තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩා සංගම් පමණක් නොව, අනෙක් ක්‍රීඩාවලට අදාළ සංගම් පවා ඒ විධියට හදාගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර්ජුන රණතුංග මහතාගේ නායකත්වයෙන් 50-over, 20-over සහ Test matches ගහපු කාලයේ කණ්ඩායමේ පොඩි පොඩි වෙනස්කම් සිදු වුණත් එකම කණ්ඩායමක් තමයි ක්‍රීඩා කළේ. නමුත්, වර්තමානයේ Twenty20 matches ගහන්නේ වෙනත් කණ්ඩායමක්. Fifty-over matches ගහන්නේ වෙනත් කණ්ඩායමක්. Test matches ගහන්නේ වෙනත් කණ්ඩායමක්. මම දන්නේ නැහැ, ඒකට හේතුව මොකක්ද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි බිලියනයකට වැඩි ජනතාවක් ඉන්න ඉන්දියාවේ ජාතික කණ්ඩායම නියෝජනය කරමින් ක්‍රීඩා කරන කොට Test matches ගහන්නේත්, 50-over matches ගහන්නේත්, Twenty20 matches ගහන්නේත් එකම කණ්ඩායමක්. ඒ කණ්ඩායමේ පොඩි පොඩි වෙනස්කම් තමයි වෙන්නේ. මම දන්නේ නැහැ, අපේ රටේ මේ විධියට කණ්ඩායම් තුනකට බෙදලා මේ කරන්නේ මොකක්ද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිලියන 22කට ආසන්න ජනගහනයක් වෙසෙන අපේ රටේ දක්ෂ ක්‍රීඩකයෝ ඉන්නවා. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ ගමේ ක්‍රිකට් ක්‍රීඩකයාට කොළඹට එන්න පුළුවන් තත්ත්වයක් නැති එකයි. උදාහරණයක් ගත්තොත්, අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් මේ වනකල් ක්‍රිකට් ක්‍රීඩකයෙක් ජාතික මට්ටමට ඇවිල්ලා නැහැ. ඒකට හේතුවක් තිබෙනවා. විශේෂයෙන් පාසල් තුළ පවා ක්‍රිකට් ක්‍රීඩා කරන්න අවශ්‍ය භාණ්ඩ නැහැ, පහසුකම් නැහැ, ක්‍රීඩා උපකරණ නැහැ. ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කරන්න නම් ගමේ ඉන්න ක්‍රීඩකයන් ජාතික තලයට ගෙනෙන්න ඕනෑ. අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් හෝ පොළොන්නරුව

[ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා]

දිස්ත්‍රික්කයෙන් හෝ ක්‍රීඩකයෙකු ඉදිරියට එනවා නම්, එක්කෝ ඔහු කොළඹ ආනන්ද විද්‍යාලයට එන්න ඕනෑ. එහෙම නැත්නම් නාලන්දා විද්‍යාලයට එන්න ඕනෑ. එහෙමත් නැත්නම් ඩී.එස්. සේනානායක විද්‍යාලයට එන්න ඕනෑ. ඒ වාගේ පාසල්වලට ආවොත් විතරයි ගම්බද ළමයින්ට ජාතික මට්ටම දක්වා එන්න පුළුවන්කම ලැබෙන්නේ.

හැබැයි, පිට පළාත්වල කිසිම කෙනෙකුට අද ඒ තැනට එන්න පුළුවන් තත්ත්වයක් උදාවෙලා නැහැ. ඒ නිසා ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය ඇමතිතුමා ගරු සභාවේ ඉන්න වෙලාවේ අපි විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා, ගම්බද පාසල්වලට අවශ්‍ය ඒ උපකාරය ලබා දෙන්න කියලා. එතකොට තමයි අපට මේ ක්‍රීඩාව දියුණු කරගන්න පුළුවන්කම ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මලල ක්‍රීඩා සම්බන්ධයෙනුත් කථා කරන මේ අවස්ථාවේ MAS Holdings ආයතනයට මම විශේෂ ස්තුතියක් පුද කරනවා. මොකද, MAS Holdings රුපියල් මිලියන 650ක් වෙන් කරලා මේ වෙනකොට මලල ක්‍රීඩා සංචිතයක් හදලා තිබෙනවා. MAS Holdings රුපියල් මිලියන 650ක් වෙන් කරලා මලල ක්‍රීඩා සංචිතයක් හදලා, දරුවන් 56 දෙනෙක් තෝරාගෙන 2035 වෙනකම් පුහුණුකරුවන්ට මුදල් දෙනවා. එම සංචිතයට දැන් අනුරාධපුර දිස්ත්‍රික්කයේත් දරුවන් දෙදෙනෙක් තේරිලා තිබෙනවා. ඒ වාගේම, එම දරුවන්ට අවශ්‍ය පහසුකම් ටික දීලා ඒ මලල ක්‍රීඩා සංචිතය වැඩිදියුණු කර තිබෙනවා. අපි ඒ පිළිබඳව MAS Holdings ආයතනයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ඒ වාගේම, තරුෂි කරුණාරත්න දියණිය ඇතුළු ක්‍රීඩක ක්‍රීඩිකාවන් 6 දෙනෙක් පැරිස් නුවර පැවැත්වෙන ඔලිම්පික් තරගාවලියට යන්න සුදුසුකම් ලබා තිබෙනවා. මේ වෙලාවේදී අපි ඒ අයටත් සුබ පතන්න ඕනෑ. දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 6දෙනෙක් පැරිස් නුවර පැවැත්වීමට නියමිත ඔලිම්පික් තරගාවලියට සහභාගි වෙන්න තේරී පත්වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල්වල ඉතාම දක්ෂ ක්‍රීඩා පුහුණුකරුවන් ඉන්නවා. ගරු ක්‍රීඩා රාජ්‍ය ඇමතිතුමනි, හැබැයි ඔවුන්ට ලබාදීලා තිබෙන්නේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය යටතේ පත්වීම්. අනධ්‍යයන කාර්ය මණ්ඩල පත්වීම් තමයි ඔවුන්ට දීලා තිබෙන්නේ. හැබැයි, ඔවුන් ඒකෙන් තෘප්තිමත් නැහැ. ඔවුන් ඉතාම දක්ෂ පුහුණුකරුවන්. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, ලංකාව වටේම පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පත්වීම් ලබාගෙන පාසල් පද්ධතිය තුළ කටයුතු කරන ක්‍රීඩා පුහුණුකරුවන් සිටිනවා. ඒ නිසා මම ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා, ඔබතුමා කැබිනට් ඇමතිතුමාට කියලා මේ පත්වීම් වෙනස් කිරීමට කටයුතු කරන්න කියලා. ඔවුන් ඉතාම දක්ෂ අය; උසස් පෙළ සමත් වෙච්ච අය. ඒ නිසා මේ පත්වීම් වෙනස් කරලා, ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් බලලා, දක්ෂ ක්‍රීඩා පුහුණුකරුවන් හැටියට ඉන්න ඔවුන්ගේ අවශ්‍යතා බලලා, ඔවුන් ක්‍රීඩා පුහුණුකරුවන් හැටියට පත් කරන්න කියන ඉල්ලීමත් මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ඔබතුමාට ඉදිරිපත් කරනවා.

අවසාන වශයෙන්, මේ රටේ ක්‍රීඩාව දියුණු කරන්න නම් ක්‍රීඩා අමාත්‍යාංශය මීට වඩා මැදිහත් විය යුතුයි කියන කාරණාව මා සිහිපත් කරනවා. ඒ වාගේම, ගම්බද පාසල්වල ක්‍රිකට් ක්‍රීඩාව, මලල ක්‍රීඩාව දියුණු කරන්න අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න කියන ඉල්ලීමත් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - கைத்தொழில் அமைச்சரும் சுகாதார அமைச்சரும்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Industries and Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු මධුර විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு மதுர விதானகே அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. MADHURA WITHANAGE left the Chair and THE HON. WEERASUMANA WEERASINGHE took the Chair.

[පූ.භා. 11.01]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම කරුණු කිහිපයක් මතක් කරමින් තමයි අද කථා කරන්න බලාපොරොත්තු වන්නේ. අපේ ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය ඇමතිතුමා සභාවේ ඉන්න නිසා මම මේ ගැන කියන්න ඕනෑ. හිටපු ක්‍රීඩා අමාත්‍යවරයකු වන ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාත් මේ මොහොතේ සභාවේ ඉන්නවා.

ගරු රෝහණ දිසානායක මැතිතුමනි, phone එකට answer කරන්නේ නැතිව මේ ටික අහගත්තොත් හොඳයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපේ රටේ ක්‍රීඩාවට විද්‍යාව ගේන්න. අපේ ක්‍රීඩාවේ විද්‍යාව තිබුණේ නැහැ. අපේ ඇහේ හයියෙන් තමයි අපි ඉතිහාසයේ සිට ක්‍රීඩා කළේ. ලෝකයේ අනෙක් රටවල් මේ වන විට ක්‍රීඩාවට විද්‍යාව ගෙනැල්ලා ඒකෙන් දියුණු වෙලා තිබෙනවා. ඒකට අවශ්‍ය මූලික වැඩ පිළිවෙළ තමයි මම සකස් කළේ. ඒ මූලික වැඩ පිළිවෙළ සකස් කරලා තමයි මම ලංකාවේ පළමුවැනි වතාවට human lab එකක් හැදුවේ. ඒ human lab එක ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ඉස්සරහා තිබෙනවා. මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලනවා, අද හෝ ලබන සතියේ දවසක එතැනට ගිහිල්ලා බලන්න කියලා. ඒකේ තුන්වැනි තට්ටුවට යන්න. මොකද, මම ක්‍රීඩා ඇමතිවරයා විධියට පත් වෙනකොට නිකම් පොඩි ඉඩක තමයි මේ Sports Medicine Unit එක තිබුණේ, "ක්‍රීඩා විද්‍යායතනය" කියලා. හැබැයි, ක්‍රීඩාවට විද්‍යාව ගෙනැල්ලා, අලුත් Director General කෙනෙක් ගෙනැල්ලා අපි ඒ ක්‍රියාදාමය පටන් ගත්තා. මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ක්‍රීඩා ඇමතිවරයා ලෙස හිටපු කාලයේ masseursලා හැටියට

කොල්ලෝ 25කට වැඩිය නිකම් දාලා තිබුණා. ඔවුන් අපි හඳුනන තරුණයෝ ටිකක්. අපි ඒ අය පුහුණුවීම් සඳහා New Zealand යැව්වා. ඒ අය New Zealand යවලා masseursලා විධියට පුහුණුවක් දුන්නා.

ඊළඟට කියන්න ඕනෑ අපි එනකොට physiotherapistsලා හිටියේ නැති බව. Physiotherapistsලා දෙදෙනෙක් අපි අරගත්තා. දැන් තව අලුත් ළමයි ටිකක් අරගෙන තිබෙනවා. ඊට පස්සේ තමයි ගරු රාජ්‍ය ඇමතිතුමනි, තුන්වැනි තට්ටුවේ කැමරා 16ක් එක්ක අපි අලුත් වැඩ පිළිවෙළක් හැදුවේ.

ලංකාවේ ඉන්න සියලු සංගම්වල ක්‍රීඩකයන් එතැනට ගෙනැල්ලා check කරනකොට, එතැන coachට ඉන්න පුළුවන්, ගරු රාජ්‍ය ඇමතිතුමනි. එතැන physiotherapistට ඉන්න පුළුවන්. Computer එකට, නැත්නම් laptop එකට සම්බන්ධ කරලා දුවන්න කිව්වාම, කැමරා 16කින් ඒ ක්‍රීඩකයා හෝ ක්‍රීඩිකාව සම්පූර්ණයෙන් පෙනෙනවා. ඔවුන්ගේ තිබෙන අඩු පාඩු මොනවාද කියලා පෙනෙනවා. ඔවුන්ගේ muscle එකක අඩු පාඩුවක් තිබෙනවාද, කකුලේ muscle එකක් වැඩියෙන් වර්ධනය වෙලාද, අතේ muscle එකක් අඩුවෙන් වර්ධනය වෙලාද, කොහේද මේ ප්‍රශ්නය තිබෙන්නේ කියන එක හොඳට පැහැදිලිව පෙනෙන වැඩ පිළිවෙළක් තමයි අපි හැදුවේ. අද ඒක නිකම්ම නිකම් අත හැරලා දාලා තිබෙන තත්ත්වයක් තමයි තිබෙන්නේ. එතැනට කවුරුවත් යන්නෙත් නැහැ, මම ගිය සතියේත් ගියා, ඊයේ පෙරේදාත් ගියා. එහෙම ගියාම දැක්කා, ඒක වහලා දාලා තිබෙන බව. මේ රටේ ක්‍රීඩාවට විද්‍යාව ගේන්න හදපු වැඩ පිළිවෙළ දැන් සම්පූර්ණයෙන්ම නතර වෙලා තිබෙන්නේ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. කරුණාකරලා, සියලු ක්‍රීඩා සංගම් එක්ක ඔබතුමා සාකච්ඡා කරන්න. අපේ volleyball pool එකක් තිබෙනවා, football pool එකක් තිබෙනවා. ඊළඟට, කරාටේ, ජූඩෝ, බැඩ්මින්ටන් ඇතුළු සියලු ක්‍රීඩා සඳහා තිබෙන ක්‍රීඩා සංගම් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ලියාපදිංචි කරන්න. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ලියාපදිංචි කරලා, ඔවුන්ට පොතක් දෙන්න. එහෙම නැත්නම් ඒ ක්‍රීඩකයන්ගේ සමස්ත ඉතිහාසයම computer එකට ඇතුළත් කරන්න, ඔවුන්ගේ injuries මොනවාද කියලා. එහෙම ඒ ටික ඇතුළත් කළාට පස්සේ, ඒ ක්‍රීඩකයා හෝ ක්‍රීඩිකාව උඩ තට්ටුවට අරගෙන ගිහිල්ලා, මම කලින් කිව්ව ක්‍රියාදාමය කළා නම්, ඒ අයට තිබෙන ප්‍රශ්න පිළිබඳව පුහුණුකරුවාත් දන්නවා, භෞතචිකිත්සකවරයාත් -physiotherapistත් - දන්නවා. ඒ විධියට තමයි අපේ ක්‍රීඩාව ශක්තිමත් කරන්න ඕනෑ වැඩ පිළිවෙළ අපි හැදුවේ. අද ඒවා අතහැර දාලා තිබෙන්නේ. මේ විධියට නම් ජීවිත කාලයටම අපේ රටේ ක්‍රීඩාව හදන්න ලැබෙන්න නැහැ. මොකද, මේ අය ක්‍රියාත්මක වෙන්නේ කිසිම ක්‍රියාදාමයකට අනුව නොවෙයි. විද්‍යාවක් නැතුව තමයි, මේ අය ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා, කරුණාකරලා රාජ්‍ය ඇමතිතුමා විධියට මේ ඔක්කොම pools ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය එක්ක සම්බන්ධ කරන්න කියලා. ඒ ගොල්ලන්ගේ report එක නැතුව අපට කථා කරන්න බැහැ කියන්න. මොකද, injuries ගැන ඒ ගොල්ලන් දෙන report එක නැතුව අපි ක්‍රීඩකයන් පිටරටවලට යවලා වැඩක් නැහැ. එහෙම ගිහිල්ලා සමහර වෙලාවට practise එකේ පළමුවැනි 200 metres දුවලා, දෙවැනි එකේදීම ඇදගෙන වැටෙනවා. මේ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. හැබැයි, ඒකයි අපි කිව්වේ එහෙම නොවෙන්න නම්, මේ rehabilitations ටික හදා ගන්න අවශ්‍ය ප්‍රධාන දේවල් කරන්න කියලා. මම ක්‍රිකට් ක්‍රීඩාවටත් ඒක තමයි කිව්වේ. ඒක කියලා, කියලා මට දැන් එපා වෙලා තිබෙන්නේ. මොකද, ක්‍රිකට් ක්‍රීඩාවටත් ඒක තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ ගොල්ලන්ට injection ගහලා, ඒ ළමයින්ගේ කකුල් ඉරලා, සම්පූර්ණයෙන් විනාශ කරලා තිබෙන්නේ. ක්‍රිකට් ක්‍රීඩාවටත් මේ rehabilitation වැඩේ කළොත් හරි යනවා.

ඒ වාගේම audit කරන වැඩ පිළිවෙළක් අපට තිබුණේ නැහැ. මම ආවාට පස්සේ විශේෂයෙන්ම ඒක හැදුවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, netball සංගමය අවුරුදු අටකින් ක්‍රීඩා අමාත්‍යාංශයට audit report එකක් දීලා තිබුණේ නැහැ. හැබැයි, අපි ඒවා ලස්සනට කරලා, පෙබරවාරි 28වැනි දා වෙනකොට ඒ audit reports දුන්නේ නැති සියලු සංගම් තහනම් කළා. ඊට පස්සේ තමයි, ඔවුන්ට නිලවරණයක් තියන්න පුළුවන් වෙන්නේ. ඒ audit report එක දෙන්න බැරි වුණා නම්, ඒ අය මේ තනතුරුවලට ඉල්ලන එකත් නතර කරලා තමයි අපි ගැසට් එක ගැහුවේ. අද ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒකයි මම මේ කියන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා මේවා ගැන බලන්න. ක්‍රීඩාව පාලනය කරනවා කියන්නේ, තමන්ට ඕනෑ මිනිහා එතැනට දමන, මෙතැනට දමන එක නොවෙයි. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, කරුණාකරලා මේ ක්‍රියාදාමය කරන්න කියලායි.

ඊළඟ කාරණාව මේකයි. මම ඉන්න කාලයේ Sports Reengineering Project කියලා එකක් පටන් ගත්තා. ඔබතුමා බලන්න, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ Sports Reengineering Project කියලා එකක් අපි පටන් ගත්තා. ඒ project එකකට අවුරුද්දට රුපියල් මිලියන 50,100ක් අපි ගත්තා. එහෙම ගත්තේ මොනවාටද? ලංකාවේ ඉන්න coachesලා එක තැනකට ගේන්න. මම එනකොට Grade I coachesලා තමයි හිටියේ. සමහර අය Grade III, Grade IV, Grade V ආදී වශයෙන් උඩටත් යනවා, පහළටත් යනවා. සමහර අයට Grade එක හතරවැනි ස්ථානයේ තිබුණා. ඔවුන් පළමුවැනි ස්ථානයට ගන්න අපි උදවු කළා. ඒ මම කලින් කිව්ව Sports Reengineering Project එක හරහා. මොකද, නැත්නම් ඔවුන්ට සල්ලි නැහැ. ඊළඟ course එක කරන්නට තවත් ලොකු ගණනක් වියදම් වෙනවා. ඒ නිසා අපි ඒ වාගේ පිරිසක් හැදුවා. මම ඔබතුමාගෙන් ඉල්ලනවා, ජනාධිපතිතුමා එක්ක සාකච්ඡා කරලා, මේ සඳහා සල්ලි ටිකක් අරගෙන, ලංකාවේ coachesලා upgrade කරන වැඩ පිළිවෙළකට කරුණාකරලා යන්න කියලා. එහෙම නැත්නම් මේක හරියන්නේ නැහැ. අපේ ගරු වීරසුමන වීරසිංහ මැතිතුමාත් මේ ගැන දන්නවා. මම ක්‍රීඩා ඇමති ධුරය දරද්දී එතුමායි මමයි එකතු වෙලා විශාල වැඩ කොටසක් කළා. ඒ නිසා එවැනි තත්ත්වයකට ක්‍රීඩාව ගේන්න.

ලංකාවෙන් ගන්න බැරි නිසා, හෙල්ල විසි කිරීමට පුහුණුකරුවන් අපි Finlandවලින් ගෙන්වා ගත්තා. ඒ වාගේම අපේ ක්‍රීඩකයෝ හයදෙනෙක් හෙල්ල විසි කිරීමට train කරන්න Finland යැව්වා. මේ වාගේ project එකකට අවශ්‍ය මුදල් ටික එතැන තිබෙනවා. අන්න ඒක ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීමයි මම කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව එක කාරණයක් කියලා මම කථාව නතර කරනවා. විශේෂයෙන්ම ක්‍රීඩකයන්ට දෙන දීමනා පිළිබඳ ප්‍රශ්නය අපි බලන්න ඕනෑ. අද ඒ දීමනා නතර වෙලා. සමහර තැන්වල ඒ අයට දීමනා දෙන එක සම්පූර්ණයෙන් නතර වෙලා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් hostelsවලට ගිහිල්ලා බලන්න. ඉස්සර මම hostelsවලට පෞද්ගලිකව ගිහිල්ලා බලලා කියනවා, ක්‍රීඩකයන්ට කන්න fridge එකට ඇපල් ටිකක් දාන්න, දොඩම් ටිකක් දාන්න කියලා. මොකද හේතුව? ඒ ක්‍රීඩකයන්ට උදේට කන්න. මම ක්‍රීඩා වෛද්‍ය ආයතනයට dietician කෙනෙක් ගෙනාවා. ඔබතුමාට මම කියනවා, කුස්සියට සහ dormitoriesවලට ගිහිල්ලා බලන්න කියලා. ඒ dieticianට මම කිව්වා, ඒ ගොල්ලන්ට උදේට පලතුරු දෙන්න කියලා. නැත්නම් ඒ ගොල්ලන් උදේට හොඳට බඩ පිරෙන්න බත් කාලා නිකම්

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ඉන්නවා. එතකොට fat වැඩි වෙලා, බර වැඩි වෙලා දුවන වේගය අඩු වෙනවා. විද්‍යාත්මක තලයෙන් මේක කරනවා නම් dietician කෙනෙක් අවශ්‍යයි. නමුත් අද Sports Medicine Unit එකේ dietician කෙනෙක් නැහැ. හිටපු එක්කෙනාත් යන්න ගිහිල්ලා. ක්‍රීඩාවට විද්‍යාව ගේනවා කියලා මේවා තමයි අපි කළේ. ඒ නිසා ඒ සම්බන්ධවත් කටයුතු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා.

මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමාට මම හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. මට මේ වේලාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.09]

ගරු රෝහණ දිසානායක මහතා (ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு றோஹண திஸாநாயக்க - விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Rohana Dissanayaka - State Minister of Sports and Youth Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාව තුළ ක්‍රීඩාව ගැන කථා කරන්න ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව පිළිබඳව ඇත්ත වශයෙන්ම මමත් ඉතාම සතුටු වෙනවා. ක්‍රීඩාව ගැන උනන්දුවක් දක්වන එතුමාත්, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාත්, ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමාත් මේ යෝජනාව ගැන අදහස් දැක්වුවා. ඒ වාගේම විශේෂයෙන් ගරු වීරසුමන වීරසිංහ මැතිතුමා හිටපු පළාත් ක්‍රීඩා අමාත්‍යවරයකු වශයෙන් සහ ගරු දයාසිරි ජයසේකර මැතිතුමා මධ්‍යම ආණ්ඩුවේ හිටපු ක්‍රීඩා අමාත්‍යවරයකු වශයෙන් මේ යෝජනාව පිළිබඳව සඳහන් කරන ලද කරුණු ගැන මම ඉතාම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කිව යුතුයි ක්‍රීඩාව ගැන අද වෙනකොට නොයෙක් සාකච්ඡා තිබෙන බව. මේ පාර්ලිමේන්තුව තුළත් ක්‍රිකට් ප්‍රධානව මේ සම්බන්ධ කරුණු කාරණා අපි නිරන්තරයෙන් සාකච්ඡා කළා. ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමා සහ රාජ්‍ය ඇමතිවරයා වශයෙන් මම වැඩ භාර ගන්න වෙලාවේ අපට තිබුණු විශේෂ ගැටලුවක් තමයි, සම්මේලනවල තිබෙන ගැටලුව. ඔබතුමන්ලා අත්දැකීමෙන් එය දන්නවා ඇති. ක්‍රිකට් පමණක් නොවෙයි. පාපන්දු, රග්බි කියන ඒ හැම සම්මේලනයකම යම් යම් බෙදීම් තිබුණා. ඒ වාගේම ඒ හුඟක් සම්මේලනවල අතුරු කමිටුවක් තිබුණා. මේ රටේ ක්‍රීඩා සම්මේලන 73ක් තිබෙනවා. ඒ 73න් 67ක් පමණයි ක්‍රියාත්මක වුණේ. ක්‍රීඩා සම්මේලන 5ක 6ක නිරන්තරයෙන් අතුරු කමිටු තිබුණා. ඒ වාගේම ඒවාට අදාළ ප්‍රශ්න උසාවිය ඉදිරියේ තිබුණා. හැබැයි පසු ගිය කාලයේ අපි නිරන්තරයෙන් ඒ කමිටු සමඟ සාකච්ඡා කළා. අද වෙනකොට උසාවියේ තිබුණු නඩු සේරම ඉවරයි. අද ඒ සම්මේලන 73ම සක්‍රීය ක්‍රියාත්මක කරන්න පුළුවන්කම තිබෙනවා. මම ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමාටත්, අධ්‍යක්ෂ ජෙනරාල් ශෙමාල් ප්‍රනාන්දු මැතිතුමාටත් මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා, යුහුසුළුව වහ වහා ඒ ගැටලු නිරාකරණය කරන්න කටයුතු කිරීම පිළිබඳව.

රාජ්‍ය ඇමතිවරයා වශයෙන් මගේ කාර්යාලයට පසුගිය කාලය පුරා හැම දාම ඒ නිලධාරීන් එන්නේ සම්මේලනයක ගැටලුවක් අරගෙන. හිටපු ලේකම්වරු, ඉන්න සභාපතිවරු, හිටපු සභාපතිවරු අතර බෙදීම් තිබුණා. මොන දේ තිබුණත් ක්‍රීඩාවේ දී එවැනි බෙදීම් ඇති නොවිය යුතුයි කියන ස්ථාවරයේ තමයි මම ඉන්නේ. ඒ නිසා අපි නිරන්තරයෙන් සාකච්ඡා කළා. ක්‍රීඩාව තුළ එවැනි බෙදීම් තිබුණොත් ඉස්සරහට යන්න බැරි වෙනවා. වීරසුමන වීරසිංහ මැතිතුමාට ක්‍රීඩා සම්බන්ධව පළාත් සභාවේ තිබෙන අත්දැකීම් ගැන, දයාසිරි ජයසේකර මැතිතුමාට හිටපු අමාත්‍යවරයකු වශයෙන් ක්‍රීඩා අමාත්‍යාංශය සම්බන්ධව තිබෙන අත්දැකීම් ගැන, එතුමා ආරම්භ කළ දේවල් සම්බන්ධව අපට අවබෝධයක් තිබෙනවා. ක්‍රීඩා වෛද්‍ය ආයතනයට මම නිරන්තරයෙන් යනවා. විශේෂයෙන් පසුගිය කාලයේ අපට වෛද්‍ය ආයතනයෙන් physiotherapistsලා විශාල ප්‍රමාණයක් පුරුදු, පුහුණු කරලා එළියට ගන්න හැකියාව ලැබුණා. ඒ සඳහා කටයුතු කළ වෛද්‍ය ලාල් ඒකනායක මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වාගේම, ක්‍රීඩාවට මුදල් ඒමත් සමඟ මෙවැනි තත්ත්ව ඇති වීම සාමාන්‍ය දෙයක් වශයෙන් තමයි අපි දකින්නේ.

විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩාව පමණක් නොවෙයි, ක්‍රිකට් ප්‍රධානව හැම ක්‍රීඩාවක්ම - සංගම් 73ම - එක හා සමානව ජයග්‍රහණය කරවීම සඳහා අපේ ශක්තිය යොමු කළ යුතුයි.

පෞද්ගලිකව මම හුඟක් ස්ථානවලට ගියා. කුමාරසිරි මැතිතුමා නියෝජනය කරන උතුරු මැද පළාතටත් ගියා. ඒ ප්‍රදේශයේ තිබෙන පාසල්වල පාපන්දු ක්‍රීඩාව අපි ආරම්භ කළා. ඒ වාගේම සභාපති-ලේකම්, එහෙම නැත්නම් හිටපු සභාපති ඇතුළු ඒ පාලක මණ්ඩලයත් එක්ක පෞද්ගලිකව සාකච්ඡා කරලා සම්මේලනවල තිබෙන මත ගැටුම්, ඒ තිබුණු ගැටලු නිරාකරණය කර ගැනීමට අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. අද පළමුවැනි වතාවට මේ සම්මේලන 73ම ඉතා හොඳින් ක්‍රියාත්මක කරගන්න අපට අවස්ථාව ලැබීම අපි ක්‍රීඩාවක් වශයෙන් ලබා ගත් සුවිශේෂ ජයග්‍රහණයක් කියලායි මම විශ්වාස කරන්නේ.

ගරු දයාසිරි ජයසේකර මැතිතුමාත් දන්නවා ඇති, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය තුළ මොන තරම් ප්‍රශ්න තිබෙනවාද කියලා. අපි මොන විධියට කථා කළත් හැම දාම ඒ අයගේ මොකක් හෝ ගැටුමක් තිබෙනවා. හැබැයි, ඒවා ඔක්කොම අද සාකච්ඡා මාර්ගයෙන්, සම්මුතියෙන් නිරාකරණය කරගන්න අපට පුළුවන්කම ලැබුණා. අන්තිමටම තිබුණා, ශ්‍රී ලංකා එල්ලේ විනිසුරුවන්ගේ සම්මේලනය සහ එල්ලේ පාලක මණ්ඩලයේ සම්මේලනය. පසුගිය සතියේ මම ඒ දෙගොල්ලනුත් කැඳවලා ඒ අයට තිබෙන ගැටලු නිරාකරණය කරලා, එකට වැඩ කරන්න කියන පණිවුඩය ලබා දෙන්න පුළුවන්කම ලැබුණා.

ඒ වාගේම ඔබතුමා කිව්වා, coachesලා ගැන. උසස් කාර්ය සාධක වැඩ පිළිවෙළ යටතේ අද ක්‍රීඩා අමාත්‍යාංශයෙන් coachesලාට, ඒ වාගේම ක්‍රීඩකයන්ට අවශ්‍ය මුදල් දෙන්න කටයුතු කර තිබෙනවා. ක්‍රීඩකයන්ට රුපියල් 100,000ක්, රුපියල් 75,000ක්, රුපියල් 50,000ක් ආදී වශයෙන් ලබා දෙන්න අවශ්‍ය කටයුතු සකස් කර තිබෙනවා. ඒ හැම coach කෙනෙකුටම මුදල් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා. ඒ, ඔවුන්ගේ වගකීම ඉෂ්ට කිරීම වෙනුවෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දකින එක දෙයක් තිබෙනවා. අපි කොයි ආකාරයෙන් කණ්ඩායම් තෝරා ගත්තත්, - ක්‍රිකට් වෙන්න පුළුවන්, පාපන්දු වෙන්න පුළුවන්- මේ හැම ක්‍රීඩකයෙකුටම වගවීමක් තිබෙනවා. අපි වගවීම බලාපොරොත්තු වෙන්නේ පාර්ලිමේන්තුවෙන්, එහෙම නැත්නම් ආණ්ඩු

පක්ෂයෙන් පමණක් නොවෙයි. මේ වගවීම කියන එකට රටේ හැම ක්ෂේත්‍රයකම ඉන්න අයගේ වගකීමක් තිබෙනවා. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම තෝරා ගත්තත්, ඒ කණ්ඩායම්වලටත් වගවීමක් තිබෙනවා. එහෙම නැත්නම් ඒකේ පාලක මණ්ඩලයට, selection committee එකට, පුහුණුකරුවන්ට, coachesලාට පමණක් නොවෙයි, හැම ක්‍රීඩකයෙකුටම මේ වගවීම තිබෙන්න ඕනෑ.

පැරිස් ඔලිම්පික් උළෙලට අපේ ක්‍රීඩක ක්‍රීඩකයන් 6දෙනෙක් යනවා. මලල ක්‍රීඩා අංශයෙන්, බැඩ්මින්ටන් අංශයෙන්, පිහිනුම් - swimming - අංශයෙන් අපේ ක්‍රීඩකයන් 6දෙනෙක් යවනවා. ඒ අයගේ ජයග්‍රහණය තමයි අපි ප්‍රාර්ථනා කරන්නේ. රෝස මල් යහනාවක, විල්ලුද පලස් උඩ ආපු ගමනක් නොවෙයි ඔවුන්ට තිබෙන්නේ. බොහොම කයෝර, දුෂ්කර ගමන් මාර්ගයක ආපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් තමයි මේ ඉන්නේ. සමහර වෙලාවට ඔවුන්ට පුහුණුවීම්වලට යෑමට පවා මුදල් නැතිව තිබූ අවස්ථා අපි දැක්කා.

විශේෂයෙන්ම ආසියානු ක්‍රීඩා උළෙලේ මීටර් 800 කාන්තා ධාවන ඉසව්ව ජයග්‍රහණය කළ මධ්‍යම පළාතේ තරුෂි කරුණාරත්න ක්‍රීඩිකාවත් මේ ගමන යනවා. අපි පසුගිය කාලයේ ඉල්ලීමක් කළා, මධ්‍යම පළාතේ ආණ්ඩුකරතුමාගෙන්. එතුමාත් තරුෂි ක්‍රීඩිකාවට සහයෝගයක් ලබා දුන්නා.

ගරු දයාසිරි ජයසේකර මැතිතුමා දන්නවා, ක්‍රීඩා පිටි සකස් කිරීම සඳහා සුවිශේෂ කාර්යභාරයක් ඉෂ්ට කරනවා කියලා. හැබැයි, මේ ඔක්කොම කරන්නේ අද රටේ ආර්ථිකයේ තිබෙන මන්දගාමී තත්ත්වය තුළ.

ඒ වාගේම හොකී ක්‍රීඩාවට මෙතෙක් විශාල ගැටලුවක් තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ රීඩ් මාවතේ සහ මාතලේ තමයි, turfs තිබුණේ. ඒ, hockey turfs දෙකම පසුගිය කාලයේ අපට තිබුණේ නැහැ. අපි ගමේ grass court එකේ කොච්චර සෙල්ලම් කළත්, ජාත්‍යන්තර මට්ටමට යන්න නම් turf එකේ සෙල්ලම් කරන්න ඕනෑ. නමුත්, ඒ turfs දෙකම තිබුණේ නැහැ. හැබැයි, අද වනකොට Olympic-approved blue coloured turfs දෙකක් ලංකාවට ලබා ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා.

ඒ ක්‍රීඩා පිටි දෙකම සකස් කෙරෙමින් පවතිනවා. මම හිතන විධියට, ලබන මාසයේ 15වෙනි දා වනකොට අපට පුළුවන් වෙයි, ඒ hockey turfs දෙකම විවෘත කරන්න. කණ්ඩායම් තරග ගත්තාම හොකී ක්‍රීඩාවේත් මම දකින දේ තමයි, ක්‍රිකට් ක්‍රීඩාවෙන් වාගේම ආසියානිකව සහ ජාත්‍යන්තරව සුවිශේෂී ජයග්‍රහණ අපට ලබා ගන්න පුළුවන් කියන කාරණය. අපි four-nation tournament එකක් පවත්වන්න බලාපොරොත්තු වෙනවා, උස්බෙකිස්තානය, තායිලන්තය ඇතුළු රටවල් හතරක කණ්ඩායම් ගෙනැල්ලා. ඒ අනුව ලබන මාසයේ hockey turfs දෙක ම විවෘත කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එය අප ලද ලොකු ජයග්‍රහණයක්. මොකද, grass court එකේ ක්‍රීඩා කරලා, ජාත්‍යන්තරයේ ක්‍රීඩා කරන turf එකක් තුළ තිබෙන ඒ රිද්මය, වෙලාව හා කලාව අනුව අපට තරග කරන්න බැහැ. එම නිසා අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඒ turf එකට හුරු කිරීම අපේ වගකීමක් කියලා මම හිතනවා. ඒ අනුව, හොකී ක්‍රීඩාව දියුණු කිරීම සඳහා මම විශේෂ උනන්දුවකින් කටයුතු කළ බව කියන්න ඕනෑ. ඒ සඳහා ජනාධිපතිතුමාගේ ගෞරවනීය දායකත්වයත් අපට ලබා දුන්නා. ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමාත් ඒ සඳහා බොහොම යුහුසුලුව සහ උනන්දුවෙන් කටයුතු කළා. ඒ උත්සාහයේ ප්‍රතිඵල ලබන මාසයේ 14, 15 වනකොට අපට ලබා ගන්න පුළුවන්.

අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා high jump mattress එකක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියා. මම හිතන විධියට high jump mattress එකක් Rs. 1 million වාගේ වෙනවා. එතුමාට ඒක ලබා දෙන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ තුළින් ජවන හා පිටිය මලල ක්‍රීඩා තරගවලට සහභාගි වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජයග්‍රහණ ලබා ගැනීමේ උනන්දුව වැඩි වේවි. ඒ සඳහා අවශ්‍ය කටයුතු අපි ක්‍රියාත්මක කරගෙන යනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு றோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය පිළිතුරු කථාව නිසා මට කාලය ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ සාදන ලද නියෝග වරින් වර සංශෝධනය කිරීම හේතුවෙන් අපට පුංචි පුංචි ගැටලු කිහිපයක් ඇති වුණා. එම නිසා ඒ කටයුතු හරියට ක්‍රියාත්මක කර ගන්න නොහැකි වුණා. ඒ නිසා ක්‍රීඩා අමාත්‍යාවරයා විසින් අංක 2382/32 දරන 2024.05.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2024 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග ප්‍රකාශයට පත් කළා. එහි අන්තර්ගත සුවිශේෂී කරුණු ලෙස පහත කරුණු දැක්විය හැකිය.

1. ක්‍රීඩා පනත හා මෙතෙක් තිබුණු රෙගුලාසි උල්ලංඝනය කරන ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල පුද්ගලයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රීඩා විෂය භාර ඇමතිතුමා වෙත බලය පැවරී ඇති අතර, ඉතා සුළු ක්‍රියාවක්, පැමිණිල්ලක් සම්බන්ධ කාරණයක් වුවද ගරු අමාත්‍යතුමා වෙත යොමු කිරීමට සිදුව තිබුණි. නව රෙගුලාසි අනුව ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන 73ක් සම්බන්ධයෙන් අවශ්‍ය විට පියවර ගැනීමට ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා හට සෘජුවම මැදිහත් වීමට බලය ලබා දීම මඟින් මෙතෙක් ක්‍රීඩා විෂය භාර අමාත්‍යතුමා වෙත පවතින බලය විමධ්‍යගත කර ඇත.

   මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට, මේක තමයි ගත්ත හොඳම තීන්දුව. මේ නිසා අපට තිබුණු ප්‍රශ්න බොහොමයක් නිරාකරණය කර ගන්න පසුගිය කාලයේ අවස්ථාව ලැබුණා.

2. පුද්ගලයෙකුට එක් ජාතික ක්‍රීඩා සම්මේලනයක පමණක් නිලතල දැරීමට හැකියාව ලබා දීම මත ක්‍රීඩා සංගම්/සම්මේලනවල ස්වාධීනත්වයට ප්‍රමුඛතාව ලබා දීම.

3. ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල විධායක කමිටුවෙහි ධුර දැරිය හැකි කාලය වසර 16කට සීමා කිරීම.

4. ක්‍රීඩාවෙන් දේශපාලනය ඉවත් කර සාධාරණ හා අපක්ෂපාති ලෙස ක්‍රීඩාව ඉදිරියට මෙහෙයවීමට හැකියාව ඇති කිරීම.

5. ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල තේරීම් කමිටු පත් කිරීමේදී දසදෙනෙකුගෙන් යුත් නාම යෝජනා ලේඛනයක් ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවලදී ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවට අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් නිදහස් කිරීමක් ලබා ගත හැකි වීම මඟින් මීට පෙර පැන නැඟුණු ගැටලු උද්ගතවීම වැළැක්වීම.

   * පරිපාලනමය ගැටලුවලට වඩා ක්‍රීඩාව සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන් කෙරෙහි අවධානය යොමු කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසීම.

[ගරු රෝහණ දිසානායක මහතා]

* ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගමයක/සම්මේලනයක යම් තීරණයකින් හෝ ක්‍රියාවකින් අගතියට පත් ඕනෑම පුද්ගලයෙකුගේ දුක් ගැනවිල්ලක් සඳහා සාධාරණ හා අපක්ෂපාති, ඉක්මන් තීරණ ලබා දීම වෙනුවෙන් පළමුවරට ක්‍රීඩා ඔම්බුඩ්ස්මන් නමින් තනතුරක් ඇති කර ඇත. -එය පාර්ලිමේන්තුවේත් පවතින ක්‍රමයක්, හරියට දුක්ගන්නා රාළ වාගේ- ඒ තනතුර ඇති කිරීම මඟින් අගතියට පත් පුද්ගලයකුට ප්‍රථමව මුදල් ගෙවීමකින් තොරව තම ලිඛිත ඉල්ලීම ඉදිරිපත් කළ හැක. අභියාචනා උපදේශක කමිටුවද පෙර ලෙසම ක්‍රියාත්මක වේ.

6. ක්‍රීඩා සංගම් නියාමනය ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ඇති ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි. එම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයක් දැනටමත් ස්ථාපිත කර ඇති අතර, එහි වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මේ ක්‍රීඩා සංගම්වල කටයුතු ද අභ්‍යන්තර විගණනයට ඇතුළත් කර ඇත. ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ නිරීක්ෂක වශයෙන් සහභාගි වේ. ඒ අනුව ක්‍රීඩා සංගම් විධිමත් පරිදි නියාමනය කිරීමේ කටයුතු ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සිදු කරන බවට තහවුරු කර ගැනීමට ක්‍රීඩා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් අවශ්‍ය මැදිහත් වීම් දැනටමත් සිදු කරනු ලබයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ක්‍රීඩාවට ආශා කරන පුද්ගලයෙක්. ඇත්ත වශයෙන්ම කිව්වොත් මේ රටේ සමස්ත ක්‍රීඩා ක්ෂේත්‍රයේ පවතින ගැටලු නිරාකරණය කිරීම සඳහා අපි සුවිශේෂී ක්‍රියාමාර්ග රාශියක් අරගෙන තිබෙනවා. ගරු භේෂා විතානගේ මන්ත්‍රීතුමනි, අපි ලබන සතියේ ඉඳලා ක්‍රීඩා සම්මේලන නිලධාරීනුත්, ඒ ඒ ක්‍රීඩාවල coachesලා කිහිපදෙනෙකුත් ගෙන්වලා ඒ දෙපාර්ශ්වය ඉස්සරහ ඔවුන්ගේ ඉදිරි අවුරුදුවල සැලසුම කුමක්ද සහ ක්‍රීඩා සම්මේලනයේ සැලසුම කුමක් ද කියන කාරණා සාකච්ඡා කරලා, ඒ දේවල් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතුත් මේ වන විට සකස් කරලා තිබෙනවා.

මම හිතනවා, coachesලායි, පාලක මණ්ඩලයයි කියන දෙගොල්ලන්ගේම අදහස් අරගෙන ඉදිරි අවුරුදු පහකට ක්‍රිකට් ක්‍රීඩාව හෝ ඕනෑම ක්‍රීඩාවක සංවර්ධනය වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කළ යුතුයි කියලා. එසේ කටයුතු කිරීම තුළින් මේ රටේ T-20 පමණක් නොවෙයි, හැම ක්‍රීඩාවකින්ම ඉදිරි කාලයේදී ජයග්‍රහණ ලබා ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

අවසාන වශයෙන්, මම ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා මෙවැනි කාලෝචිත යෝජනාවක් අද ඉදිරිපත් කිරීම ගැන. ඒ වාගේම භේෂා විතානගේ මන්ත්‍රීතුමාට, කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමාට, හිටපු අමාත්‍ය ගරු දයාසිරි ජයසේකර මැතිතුමාට සහ මූලාසනයේ සිටින ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා, මේ සඳහා බොහොම ලොකු උනන්දුවක් දක්වා කටයුතු කිරීම වෙනුවෙන්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්න නිසා මම ඉක්මනට පොඩි ප්‍රශ්නයක් අහන්නම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

එතුමා දිගටම ඉන්නවා. ඊළඟට යෝජනාවට පිළිතුරු දෙන්නත් එතුමා ඉන්නවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඉක්මනට බොහොම කෙටියෙන් මම මේ ප්‍රශ්නය අහන්නම්.

ගරු ඇමතිතුමනි, අපේ බන්ධනාගරවල 30,000කට වැඩි පිරිසක් ඉන්නවා. නමුත්, ඉන්න පුළුවන් 13,000කට පමණයි. විශේෂයෙන් ම කාන්තාවන් -අම්මලා, ආච්චිලා- ගොඩක් ඒවා තුළ ඉන්නවා. වයස අවුරුදු 80ට වැඩි අයත් ඉන්නවා. කරුණාකරලා ඔබතුමන්ලා මේ ගැන සලකා බලා, විශේෂයෙන් ම වයසට ගිය ජ්‍යෙෂ්ඨ අයට යම්කිසි සමාවක් දීලා ඔවුන් නිදහස් කරන්න අවශ්‍ය ක්‍රමයක් හදන්න බැරිද කියලායි මම අහන්නේ.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ඇහුවේ ඉතාම වැදගත් ප්‍රශ්නයක්. අපි පසුගිය කාලය පුරාම මීට පිළිතුරු සොය සොයා තමයි හිටියේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහි එක් අදියරක් විධියට අපි මීට අවුරුදු එකහමාරකට විතර කලින් බන්ධනාගාර රෙගුලාසි පද්ධතිය වෙනස් කරලා පාර්ලිමේන්තුවෙන් අනුමැතිය ලබා ගත්තා. ඒ රෙගුලාසි අනුව හිර ගෙවල්වල ඉන්න වයසට ගිය අය, දුර්වල අය, පිළිකා වැනි අසාධ්‍ය රෝග - terminal illnesses - තිබෙන අය සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලබන ත්‍රිපුද්ගල වෛද්‍ය කණ්ඩායමක් වෙත යොමු කරලා, එම කමිටුවෙන් ඒ අය නිදහස් කිරීම සඳහා නිර්දේශ කරනවා නම්, ඒ සඳහා අවශ්‍ය නීතිය අපි හදලා තිබෙනවා. නමුත්, අවාසනාවන්ත කාරණය මෙකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමා පත් කරපු කණ්ඩායම ලේ මාරු කරන - dialysis කරන - රෝගියෙකුවත් නිදහස් කරන්න කටයුතු කළේ නැහැ. මට තොරතුරු ලබා දුන් සියදෙනෙක් විතර අපි ඒ වෛද්‍ය කණ්ඩායමට යොමු කළා. ඒ කමිටුව මඟින් dialysis කරන රෝගියෙකුවත් නිදහස් කරන්න recommend කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කළා. ඔබතුමාත් ඒ ගැන දන්නවා නේ. සමහර සිරකරුවන් ඔවුන්ගේ සිර දඬුවමට වඩා වැඩි කාලයක් රිමාන්ඩ් බන්ධනාගාරයේ ඉඳලා තිබෙනවා. නමුත්, සිර දඬුවම ආරම්භ වන්නේ අවසාන තීන්දුව ලබා දුන් දිනයේ සිට නිසා නඩු විභාගය අවසානයේ ලැබෙන සිර දඬුවම අවුරුදු 10 නම් සමහර වෙලාවට අවුරුදු 20ක් ඉන්න සිදු වූ අවස්ථා තිබෙනවා. ඒක නිවැරැදි කරන්න තමයි අපි පසුගිය මාසයේ අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කළේ. නමුත්, දැනට ඉන්න අයට ඒ තුළින් සහනයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපි ඒ සඳහාත් විශේෂ විධිවිධාන පනත් කෙටුම්පතක් හදලා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ තුළින් අපි උත්සාහ කරන්නේ විශේෂඥ කමිටුවක් පත් කරලා ඔවුන්ගේ නිර්දේශ අරගෙන දැනට රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටින හෝ අභියාචනය පවතිද්දී රිමාන්ඩ් බන්ධනාගාරයේ හිටපු කාල සීමා - pending appeal කාල සීමා - හිලව් කරලා එම රැඳවියන් නිදහස් කරන්නයි.

ඊට අමතරව prison regulations වෙනස් කරලා අපි දරපු උත්සාහය අසාර්ථක වුණු නිසා අපි තවත් දෙයක් කළා. අපේ බන්ධනාගාර ආඥාපනත ඉතාම පරණ ආඥාපනතක්. එහි 40වැනි

වගන්තිය සහ 80වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයාට බලය තිබෙනවා, රෙගුලාසි හදන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම රෙගුලාසි හදලා දැන් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න යවලා තිබෙන්නේ. දැනට පවතින ක්‍රමය අනුවත් එල්ලුම් ගහට නියම වුණු අය සහ ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම වුණු අය හැරෙන්න, අවුරුදු 20ක් සිර දඬුවම් විඳින අය හොඳ චර්යාවෙන් හිටියොත් ඔවුන්ගේ දඬුවම් කාලය අඩු වෙනවා. ඒ අනුව අවුරුදු දහතුනහමාරකින් විතර ඔවුන්ට නිදහස ලබන්නට පුළුවන්. මම මේ රෙගුලාසි මඟින් ඒ සම්බන්ධවත් යෝජනාවක් කරලා තිබෙනවා. මරණීය දණ්ඩනයට නියම වෙච්ච අය අවුරුදු 5කට වැඩිය cell එක ඇතුළේ තබා ගත්තොත්, ඔවුන්ගේ ජීවිත කොහොමත් ඉදිරියට ගෙනයන්න බැහැ.

ඒ නිසා අවුරුදු පහකට පස්සේ අපි ඒ පත් කරනු ලබන විශේෂඥ කමිටුවට ඉල්ලීමක් කරලා, ඔවුන් යහපත් කල් ක්‍රියාවෙන් ගත කරලා තිබෙනවා නම්, ඔවුන්ගේ දඬුවම පරිවර්තනය කරනවා, ජීවිතාන්තය දක්වා වූ සිර දඬුවමකට. එතකොට ජීවිතාන්තය දක්වා සිරගත වෙච්ච උදවිය මරණ දඬුවමින් නම් ආවේ ජීවිතාන්තය දක්වා, තව අවුරුදු දොළහක් ගියාට පස්සේ ඔවුන්ට ඉල්ලීමක් කරන්න පුළුවන්, ඔවුන්ගේ හොඳ කල්ක්‍රියාව මත ඒක අවුරුදු විස්සකට පරිවර්තනය කරන්න කියලා. එහෙම පරිවර්තනය කළොත්, අර සාමාන්‍ය කාල සීමාව ගණන් ගන්නකොට එය අවුරුදු දහතුනහමාර නිසා, අවුරුදු දහහතේදී ඒ උදවිය නිදහස් කරන්න පුළුවන්. ඊළඟට, ජීවිතාන්තය දක්වා සිර දඬුවම දීපු අයට අවුරුදු පහළොවක් ගත වනකොට ඉල්ලීමක් කරන්න පුළුවන්, අවුරුදු විස්සට ඒක පරිවර්තනය කරන්න කියලා. එහෙම ඒ නිදහස දුන්නොත්, අවුරුදු පහළොවේදී නිදහස් වෙලා යන්න පුළුවන්. සාමාන්‍යයෙන් අවුරුදු විස්සක් සිර දඬුවම දීපු අය ඉන්නවා නම්, ඒ අයට අවුරුදු දහතුනහමාරෙන් යන්න පුළුවන්.

අපි දන්නවා, සංවිධානාත්මක කල්ලිවල සිරකරුවෝ හැරෙන්න අනික් සියලුදෙනාම අපරාධකරුවෝ කියලා බන්ධනාගාරයට ආවාට, ඒගොල්ලන් කරපු දේවල් ගැන ළැදෙනවා කියන එක. ඒගොල්ලන් පුනරුත්ථාපනය වෙලා සමාජයේ හොඳ පුරවැසියන් විධියට ඉන්න කල්පනා කරනවා. ඒ වාගේම අපි ඒ සඳහා පුහුණු වැඩසටහන් නිරන්තරයෙන්ම ක්‍රියාත්මක කරනවා. මම බලාපොරොත්තු වෙනවා, බන්ධනාගාර ආඥා පනතේ 40වැනි වගන්තියත්, 80වැනි වගන්තියත් යටතේ ඉතා ඉක්මනටම ඒ රෙගුලාසි ටික පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. පාර්ලිමේන්තුවෙන් ඒක සම්මත කළාට පස්සේ ඒ උදවියට ලොකු සහනයක් අපට ලබා දෙන්න පුළුවන් වෙයි. ඔබතුමා කිව්වා වාගේ අපි අමාරුවෙන් බන්ධනාගාර පද්ධතිය පවත්වාගෙන යන්නේ. දියුණු රටවල මෙන් අවශ්‍ය සියලු පහසුකම් ලබා දීමට අපට හැකියාවක් නැහැ. අපේ capacity එක 30,000කට ඔරොත්තු දෙන්නේ නැහැ. අපි උත්සාහ කරනවා, ඔවුන්ටත් සාධාරණයක් ඉෂ්ට කරමින් මේ ප්‍රශ්නය විසඳන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික වශයෙන් ඉතාම වැදගත් පැහැදිලි කිරීමක් කරන්න මට විනාඩියක් ලබා දෙන්න. ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමා ඒකට එකඟද? මොකද, ඒ සඳහා ඔබතුමාගේ අවසරය අවශ්‍යයි.

ගරු ඇමතිතුමනි, මීට මොහොතකට පෙර මගේ mobile phone එකට breaking news එකක් ආවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ජනමත විචාරණයකට යොමු කර අනුමැතිය ලබා ගන්නා තුරු ඉදිරි ජනාධිපතිවරණයක් පැවැත්වීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වන බවට තීන්දුවක් ලබා දෙන්නැයි ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් දැන් ඉදිරිපත් කළා කියලා. මීට පෙර පෙත්සම ඉදිරිපත් කළේ "L" අකුරෙන් නම පටන් ගන්නා කෙනෙක්. මේකත් ඉදිරිපත් කරලා තිබෙන්නේ "L" අකුරෙන් නම පටන් ගන්නා කෙනෙක් තමයි. නමුත්, මම ඒ ගැන වැඩි විස්තර දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නිසා රට තුළ ඉතා ව්‍යාකූල තත්ත්වයක්, අවිනිශ්චිත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ පිළිබඳ කතිකාව පටන් ගන්නේ ජූලි මාසයේ 12වැනි දා. තව දවස් හතරකින් මැතිවරණ කොමිසමට නීත්‍යානුකූල බලයක් පැවරෙනවා, ජනාධිපතිවරණයක් පවත්වන්නට. මේ එළිපත්තේ ඉඳගෙන ආසන්න මොහොතේ, අවසන් තත්පරයේ - eleventh hour එකේ - මේ ආකාරයට කටයුතු සිද්ධ වෙනවා. මම මේ කියන්නේ පුරවැසියෙකුට අධිකරණයට යන්න තිබෙන බලය අහෝසි කරන්න කියන එක නොවෙයි; ඒ අයිතිය නැති කරන්න කියන එක නොවෙයි. නමුත් ඉතාම ව්‍යාකූල තත්ත්වයක් දැන හෝ නොදැන කුමන්ත්‍රණකාරීව නිර්මාණය කරනවා. මගේ නිගමනය නම් කුමන්ත්‍රණකාරීව මේ ව්‍යාකූල තත්ත්වය රට තුළ නිර්මාණය කරනවා කියන එකයි. ඒ නිසා මම දැනගන්න කැමැතියි, එහෙම අධිකරණ කටයුත්තක් සිදු වෙනවාද, ඒ තුළින් මම මේ කියන කාරණය හරහා මේ කියන ආකාරයට ඉතා ව්‍යාකූල තත්ත්වයක් ජන මනසේ, ඡන්ද දායකයා තුළ, රට තුළ, අධිකරණ පද්ධතිය තුළ නිර්මාණය වෙනවාද, ඉතාම ආසන්න මොහොතේ - අවසන් තත්පරයේ - මෙවැනි සිදුවීම් ජාලාවක් මතු වුණාට පස්සේ කොහොමද ඒක වළක්වා ගන්නේ කියලා.

බොහොම ස්තුතියි.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා අහපු ප්‍රශ්නය ජාතික වශයෙන් වැදගත් ප්‍රශ්නයක් නිසා මම පැහැදිලි උත්තරයක් ලබා දෙනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපි ඉදිරිපත් කළේ ජනතාවගෙන් ලබා ගත් වරමක් මත. 2015 ජනාධිපතිවරණයේදී අපි ජනතාවගෙන් ඉල්ලපු වරම තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්න. විශේෂයෙන්ම ජනාධිපතිවරයාගේ අවුරුදු හයක ධුර කාලය අවුරුදු පහක් කරන්නත්, පාර්ලිමේන්තු ධුර කාලය අවුරුදු 6, අවුරුදු 5ක් කරන්නත් වාගේම, විධායක ජනාධිපතිවරයාගේ බලතල සීමා කරන්න කියන එක. ඒ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපි 2015 මාර්තු මාසයේදී ඉදිරිපත් කළා. ඒ සම්බන්ධ පෙත්සම් ගණනාවක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වුණා. මගේ මතකය අනුව, ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ ඒ පෙත්සම්

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

සලකා බලා දීර්ඝ නඩු විභාගයකින් අනතුරුව එවකට හිටපු ගරු අගවිනිසුරු ශ්‍රී පවන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබුණු ඒ අධිකරණ Bench එක පැහැදිලි නඩු තීන්දුවක් ලබා දුන්නා, අපි ඉදිරිපත් කරපු දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ, කරුණු හතරක් ජනමත විචාරණයකින් තොරව සම්මත කරන්නට බැහැ කියලා.

උදාහරණයක් වශයෙන් කියනවා නම් අපි එහි සඳහන් කර තිබුණා, ආණ්ඩුවේ ප්‍රධානියා අග්‍රාමාත්‍යවරයා කියලා. ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වා, "එහෙම වෙන්න බැහැ. ආණ්ඩුවේ ප්‍රධානියා වෙන්නයි, කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වෙන්නයි බැහැ. රාජ්‍ය නායකයා විධියට ජනාධිපති තමයි එතැන ඉන්න ඕනෑ. ඒක නිසා ජනමත විචාරණයක් නැතුව ඒක සම්මත කරන්න පාර්ලිමේන්තුවට බලයක් නැහැ" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේ කරුණු හතරක් ඉදිරිපත් කළා. එතකොට අපි පාර්ලිමේන්තුවට දැනුම් දුන්නා, එම කරුණු හතර ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දුන් උපදේශ මත සංශෝධනය කරගෙන යන්නට. අපි ඒ බලතල අත්හැරියා. ඒ ටික ඉවත් කරලා ශ්‍රේෂ්ඨාධිකරණයේ මහ පෙන්වීම මත තමයි අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළේ.

ඊළඟට, ධුර කාලය පිළිබඳව ජනමත විචාරණයට යන්න ඕනෑය කියලා ශ්‍රේෂ්ඨාධිකරණයට තර්ක ඉදිරිපත් කළා. ශ්‍රේෂ්ඨාධිකරණය පැහැදිලි නඩු තීන්දුවක් දුන්නා, ජනමත විචාරණයකට යන්න ඕනෑ වෙන්නේ තිබෙන අවුරුදු හය, හත කරන්න හෝ වැඩි කරන්න යනවා නම් කියලා. ධුර කාලය අවුරුද්දකින් අඩු කරලා මැතිවරණය තියනවාය කියන්නේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය වැඩි වෙනවා කියන එකයි. එතකොට ඒ තනතුර දරන කෙනාට ඒ කාලය අඩු වෙනවා. ඉතින් ශ්‍රේෂ්ඨාධිකරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සෑම අවස්ථාවකම අර්ථ නිරූපණය කරන්නේ ජනතා පරමාධිපත්‍යය ප්‍රමුඛස්ථානයේ තබාගෙනයි. ඒක නිසා දැන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පැහැදිලි නඩු තීන්දුවක් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ලබා දීලා තිබෙනවා. මොනම හේතුවක් නිසාවත් අවුරුදු පහට වැඩිය එක දවසක්වත් ජනාධිපතිවරයෙකුට බලයේ ඉන්න බැහැ. අනුප්‍රාප්තික ජනාධිපතිතුමාටත් එහෙමයි. ජනතාව තෝරා පත් කරගත් ජනාධිපතිතුමාටත් එහෙමයි.

මේ සම්බන්ධව මීට පෙරත් නඩු තීන්දු තුනක් ශ්‍රේෂ්ඨාධිකරණය දීලා තිබෙනවා, ජනාධිපතිවරයාගේ ධුර කාලය පිළිබඳව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වර්තමානයේ පවතින විධියට වලංගුයි කියලා. නමුත් මේ රටේ ජනතාවට විශාල කුතුහලයක් ඇති කරන විධියට මේ අධිකරණ ක්‍රියාදාමය විහිළුවක් බවට පත් කරන තත්ත්වයකට දැන් ඇවිල්ලා තිබෙනවා. කුරුණෑගල ඉඳලා ආපු එක මනුස්සයෙක් කියනවා, -ඔහු කවුද කියා දන්නේත් නැහැ- අභියාචනාධිකරණයේ සභාපතිට ශ්‍රේෂ්ඨාධිකරණයට උසස්වීම දුන්නේ නැත්නම් ඒ මනුස්සයාගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වෙනවා කියලා. මම දන්නේ නැහැ, කොහොමද එහෙම මූලික අයිතිවාසිකම උල්ලංඝනය වෙන්නේ කියලා. එහෙම කිව්වාම ශ්‍රේෂ්ඨාධිකරණය නඩු තීන්දුවක් දෙනවා, සුප්‍රීම් උසාවියට විනිශ්චයකාරවරුන් පත් කරන්න එපා කියලා. මේ අධිකරණ ක්‍රමය දැන් විහිළුවක් වෙලා.

දැන් හැමෝම විධායකයටයි, ව්‍යවස්ථාදායකයටයි කියන දෙකටම බණිනවා. හැබැයි, අධිකරණය කටයුතු කරන විධිය කොහොමද? කුරුණෑගල පැත්තේ පාරේ යන කෙනෙකුගේ මූලික අයිතිවාසිකම් කඩවුණේ කොහොමද විනිශ්චයකාරවරයෙකුට උසස්වීම දුන්නේ නැහැ කියලා? ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, මට උසස්වීමක් දුන්නේ නැත්නම් ඔබතුමාගේ මූලික අයිතිවාසිකම් කඩවෙනවාද? මට උසස්වීමක් දුන්නේ නැත්නම් එහෙම වෙනවාද? දැන් ඒකට තහනම් නියෝගයක් ලබා දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා වාගේ තව කවුද කෙනෙක් උස්බෙකිස්තානයේ ඉඳලා ඇවිල්ලා ඊයේ - පෙරේදා නඩුවක් දමා කියනවා, ජනාධිපතිතුමාගේ ධුර කාලය අවුරුදු පහ නොවෙයි, හයක් විධියට සලකන්න කියලා. අධිකරණය ඒකට හොඳටම දෝෂාරෝපණය කරලා එම නඩුව නිෂ්ප්‍රභ කර දැම්මා, රුපියල් ලක්ෂයක් නඩු ගාස්තුවත් ගෙවන්න කියලා. මොකද, දිගින් දිගටම අධිකරණය විහිළුවට අරගෙන මිනිස්සු හිතෙන හිතෙන පලියට කටයුතු කරනවා. සමහර නීතිඥවරුත් ලජ්ජා නැතුව - නීතිඥවරු කියන්නේ නීතිය දන්නා අය නේ- ගිහිල්ලා මේ වාගේ නඩු අධිකරණවලට ඉදිරිපත් කරනවා. තර්කත් කරනවා; නියෝගත් ඉල්ලනවා.

දැන් මේ තව එකක්. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාත් ඒ ගැන සඳහන් කළා. මගේ mobile phone එකටත් ඒ ගැන alert එකක් ආවා. ලක්සිරි කියලා කවුද නීතිඥ මහත්මයෙක් පෙත්සමක් ගොනු කර තිබෙනවා ලු, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ජනමත විචාරණයකින් අනුමත කර නැති නිසා ජනාධිපතිගේ ධුර කාලය අවුරුදු හයක් කියා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණය විහිළුවක් කර නොගත යුතුයි, නීතිඥවරුන් සහ රටේ ජනතාව. ඒ වාගේම අධිකරණය තේරුම් ගන්නත් ඕනෑ, අධිකරණයේ අපක්ෂපාතීත්වය තබා ගන්න. කවුරු හරි යාළු මිත්‍රයෙක් ඇවිල්ලා නඩු තීන්දුවක් ඉල්ලුවාය කියලා තීන්දුවක් ලබා දෙන තත්ත්වයට අධිකරණය පත් නොවිය යුතුයි. ඊයේ - පෙරේදා අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඇතුළත් වාර්තාව -දිග ලියුමක්- සභාගත කළා. එසේ සභාගත කළේ, ගරු දයාසිරි ජයසේකර මැතිතුමාට මම දුන් උත්තරයට අදාළව එවපු වාර්තාවයි. එතැනදී ඔවුන් කියන කරුණු නිවැරදියි කියලා තර්ක කරමින් එය ඉදිරිපත් කර තිබුණා.

දැන් අද මොකක්ද තිබෙන්නේ? අද හැම පුවත් පතකම දාලා තිබෙනවා, "කොටුව මහෙස්ත්‍රාත්තුමාගේ වැඩ තහනම්" කියලා. ඉතින්, මම කියපු එක බොරු නම් ඇයි වැඩ තහනම් කරන්නේ? වැඩ තහනම් කරන්න වුවමනාවක් නැහැ නේ. කෝටි 20ක විස්කි හොරකම් කළේ නැත්නම්, චූදිතයෙක් අත්අඩංගුවට ගන්නේ ඇයි? මම කියනකම් හිටියාද ඒ චූදිතයාව අත්අඩංගුවට ගන්න? එතකොට මම කියන එක බොරු නම් ඇයි එවැනි චූදිතයෙක් අත්අඩංගුවට ගන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනඥයෝ විධියට අපි පැහැදිලිව කියනවා, අපට අවුරුදු 5කට නම් පාර්ලිමේන්තුවේ බලය දුන්නේ, අපි අවුරුදු 5කට වැඩිය දවසක්වත් ඉන්නේ නැහැ කියන එක. අර ගමේ ගොඩේ සිංහලෙන් කථාවක් තිබෙනවා වාගේ බල්ලා මාර්ක් එකට ලේබල් ඇලවෙනකම් අපි, මේ රටේ ඕනෑම දේශපාලනඥයෙක් ඉන්න ඕනෑ නැහැ. මේ රටේ කිසිම පුද්ගලයෙක් බල්ලා මාර්ක් වෙන්න ඕනෑ නැහැ. ජනතාව යම්කිසි කාල සීමාවකට බලය දුන්නා නම්, මොන ආයතනයේද කියලා අදාළ නැහැ, ඒ කාලසීමාව අවසන් වුණාම බල්ලා මාර්ක් නොවී ගෙදර යන්න ඕනෑ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා විවාදයකට නොගිහින් ඔබතුමාගේ කාරණය කෙටියෙන් කියන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා කියපු කාරණය එක්කයි මම මේ කාරණය කියන්නේ. ගරු ඇමතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයේදී මම අදත් ඇහුවා -ඔබතුමා උදේ හිටියේ නැහැ- අපි මේකට ගන්න පියවර මොකක්ද කියලා. මේ රටේ විනිශ්චයකාරවරුන්ට අපි සලකන්නේ බොහොම ගෞරවනීය විධියට. "උන්නාන්සේ" කියලා නේ අපි කියන්නේ. "නඩුකාර හාමුදුරුවෝ" කියලා නේ කියන්නේ. අපේ ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමකට සලකන නාමයෙන් තමයි "නඩුකාර හාමුදුරුවෝ" කියලා කියන්නේ. එතකොට නඩුකාර හාමුදුරුවරු කරන සමහර වැඩ පිළිවෙළ ගැන තමයි ඔබතුමා ඔය පැහැදිලි කරලා දුන්නේ. නිශ්ශංක බන්දුල මැතිතුමා අපිත් අඳුරන කෙනෙක්. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, එතුමාගේ අයිතිවාසිකම් කඩ වුණා කියලා නඩුව දාන්නේ එක්සත් ජාතික පක්ෂයේ කුරුණෑගල professional group එකේ ඉන්න ලේකම්. මම දන්නේ නැහැ, කොහොමද ඒ සම්බන්ධය එන්නේ කියලා. ඒ ප්‍රශ්නයම තමයි මමත් ඇහුවේ.

ඒ වාගේම, මම ඊයේ මතු කරපු කාරණය අදත් ඔබතුමාට මතක් කරනවා. මේ කාරණය ඊයේ පෙරේදා රූපවාහිනියේ "හෝ" ගාලා යනවා අපි දැක්කා. අර ක්ලබ් වසන්තට වෙඩි තියපු කාරණයට සම්බන්ධව ඒ ටැටූ කඩේ විවෘත කරන්න ආරාධනා කරපු, ඒ ටැටූ කඩේ දමාපු ටැටූ මල්ලිගෙන් ප්‍රශ්න අහනවා, පොලීසියේ Senior DIG කෙනෙක්. එතැනදී කටඋත්තරයක් ගන්නේ. නීතිඥයකු විධියට ඔබතුමාත් දන්නවා, අපිත් දන්නවා කටඋත්තරයක් ගන්න ක්‍රමයක් තිබෙනවා කියලා. දැන් මොකක්ද කරන්නේ? අර මනුස්සයාගේ ජීවිතයත් දැන් අනතුරට ලක් කරලා නේ තිබෙන්නේ. ඇයි, එයා කියනවා, "මාව එව්වේ පැටී" කියලා. දැන් පැටිගෙන් ඊළඟ ටොෆිය කන්නේ ටැටූ. ඉතින් මේක ලොකු ප්‍රශ්නයක්. මේවා තවත් දිගටම කරනවාද? ඊළඟට අධිකරණයේ නේ, නඩුව අහන්න තිබෙන්නේ. අපට අධිකරණ විනිශ්චයකාරවරුන්ට මොකුත් කියන්න විධියක් නැහැ.

දැන් අර මනුස්සයා මහෙස්ත්‍රාත්තුමාගෙන් ඉල්ලනවා වෙනම රහස්‍ය ප්‍රකාශයක් දෙන්නත් ඉඩ දෙන්න කියලා. එතකොට මොකක්ද මේකේ අවසාන තීරණය?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට තව එක විනාඩියක් දෙන්න.

අනෙක් කාරණය මෙයයි, ගරු ඇමතිතුමනි. මම හිතන්නේ ඔබතුමා මේක දකින්න ඇති. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මේක වැදගත්. ඒකයි මම කියන්නේ. ඊයේ ඔය ක්ලබ් වසන්ත කියන මහත්මයාගේ මීනිය තිබුණා මෝචරියේ. මෝචරියේ තිබෙන මීනියේ photos ගහලා එවනවා සමාජ මාධ්‍යවලට. ඒවායේ තිබෙනවා, ඔහුගේ බඩ කපන හැටි, ඔහුගේ ඔළුවට උණ්ඩ ගිහින් තිබෙන හැටි. මේකට මෝචරියේ ඉන්න අය සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ. ඔවුන්ගේ වැඩ තහනම් කරන්න ඕනෑ. මොකද, එහෙම එකක් කරන්න බැහැ. මේවා දිගින් දිගටම සිද්ධ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක වැදගත් හින්දායි මම කියන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට එක විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේවා විතරක් නොවෙයි, ඒ වෙඩි තියන ඒවා රූපවාහිනීවල, සමාජ මාධ්‍යවල පෙන්වීම නිසා ඇති වන තත්ත්වය කල්පනා කරලා බලන්න. මේක මේ සමාජයම භීතියට ලක් වෙන වැඩක්. ඒකයි මම මේ කාරණය මතු කළේ.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඒ ප්‍රශ්නය කලිනුත් ඇහුවා. ඇත්තටම ඒ ශ්‍රේෂ්ඨාධිකරණ අතුරු නියෝගය මඟින් තහනම් නියෝගය නිකුත් කළේ සමස්ත ව්‍යවස්ථාදායකයට, විධායකයට, ඒ වාගේම සිවිල් සමාජය නියෝජනය කරන තුන්දෙනෙක් ඉන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට. මම හිතන්නේ දිගින් දිගටම මේ වාගේ අධිකරණ නියෝග නිකුත් කරන්න හේතුව ඔය පුටුවේ තිබෙන දෝෂයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඔබතුමා ඉන්න පුටුවේ තිබෙන දෝෂයක්. මොකද, ඒකට ඔබතුමන්ලා වග කියන්න ඕනෑ. කථා කරනකොට ගරු මන්ත්‍රීතුමන්ලා ඔක්කෝම මහා උජාරුවෙන් කියනවා, "මේ පාර්ලිමේන්තුව උත්තරීතරයි, අපි තමයි ජනතා පරමාධිපත්‍යය ආරක්ෂා කරන්නේ" කියලා.

එහෙම නම් ව්‍යවස්ථා සම්පාදනය ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කටයුතු -රජයේ ඉහළ නිලධාරීන් පත් කිරීම, කොමිෂන් සභා පත් කිරීම්- සම්බන්ධ පූර්ණ බලය තිබෙන ආයතනයට තහනම් නියෝගයක් ආවාම, ඔය පුටුවේ ඉන්න ගරු කථානායකතුමා වගකීම භාර ගන්න ඕනෑ, මේ ඇවිල්ලා තිබෙන්නේ තමන් බැඳෙන නියෝගයක් ද, නැත්නම් තමන් බැඳෙන්නේ නැති නියෝගයක් ද කියන එක පිළිබඳව. මේ පාර්ලිමේන්තුවේ ගරුත්වය ආරක්ෂා කරන්න හැම ගරු කථානායකවරයෙක්ම දිගින් දිගටම කටයුතු කරලා කරලා තිබෙනවා. ඉතින් ඒ වාගේ බරපතළ අවස්ථාවක් ආවා, 2001දී ගරු අනුර බණ්ඩාරනායක මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ කථානායකවරයා විධියට ඉන්නකොට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් ඒකට සම්බන්ධයි. මමත් ඒ නඩුවේදී පෙනී සිටියා පෙත්සම්කරු වෙනුවෙන්. එක ඉල්ලීමක් තහවුරු කරලා මමත් ගත්තා අතුරු නියෝගයක්. නීතිඥවරයකු විධියට මමත් ඒක ගත්තා. හැබැයි, මෙතැනට ආවාම ගරු කථානායකතුමා ඉතාම පැහැදිලි, නිරවුල් තීන්දුවක් දුන්නා පාර්ලිමේන්තුව බැඳෙන්නේ මොන වාගේ තීරණවලින් ද, බැඳෙන්නේ නැත්තේ, ප්‍රතික්ෂේප කළ යුත්තේ මොන වාගේ තීරණද කියලා. ඉතින් එවැනි කරුණු පිළිබඳව මේ පාර්ලිමේන්තුව දුර්වල ස්වභාවයෙන් කටයුතු කරන නිසා, පාර්ලිමේන්තුවෙන් ඉටු වෙන්න ඕනෑ වගකීම, යුතුකම ඉටු නොවෙන නිසා අද මේ ව්‍යාකූල තත්ත්වය ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මම බලාපොරොත්තු වෙනවා ඔබතුමන්ලා ඉදිරියේදී නිවැරදි තීන්දු ගනීවි කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා විධියට ඔබතුමා පිළිතුරු කථාව කරන්න. *[බාධා කිරීමක්]*

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පැහැදිලි කරලා අවසන් නැහැ. දැන් ප්‍රශ්න දෙකක් ඇහුවා. ප්‍රශ්න වැඩි නිසා මට ඒක පොඩ්ඩක් අමතක වුණේ. දෙවැනි ප්‍රශ්නය ඇහුවේ පසුගිය දිනක වුණු සිදුවීමකට අදාළව. මිනී මැරුමක් කියන්නේ බරපතළම ගණයේ අපරාධයක්. අපරාධ නඩු විධාන සංග්‍රහයේ වගන්ති එකින් එකට පැහැදිලිව තිබෙනවා ඒ වාගේ අපරාධයක් වුණාට පස්සේ පරීක්ෂණ කටයුතු, විමර්ශන කටයුතු කරන්නේ කොහොමද, අධිකරණයට ගිහිල්ලා ඒ කරුණු ඉදිරිපත් කරන්නේ කොහොමද කියලා.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා කියාපු කාරණය මමත් දැක්කා. මාධ්‍යයට විවෘත කරගෙන සැකකරුවෙකුගෙන් ප්‍රශ්න අහනවා. එතකොට ඒක සම්පූර්ණයෙන්ම නීතිය උල්ලංඝනය කිරීමක්. හරි නම් මේ වෙනකොට ඒවා කරපු නිලධාරින් වැඩ තහනමට ලක් වෙලා ඉන්නට ඕනෑ. ඒ වාගේම අධිකරණයට බලය තිබෙනවා මේ ගැන කටයුතු කරන්න. කටයුත්තක් විමර්ශනය වෙමින් පවතිද්දී මේ ආකාරයට හැසිරෙමින් මාධ්‍යයට විවෘත කරමින් කටයුතු කිරීම අධිකරණයට අපහාසයක්. දැන් මේ නඩුවේ යුක්තිය ඉෂ්ට වෙයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. මේ නඩුව අහලා අවසානයේ යුක්තිය ඉෂ්ට වෙයි කියලා මම හිතන්නේ නැහැ. මොකද, පොලීසිය යුක්තිය ඉෂ්ට කරලා තිබෙන්නේ. පොලීසිය නඩුව ඇහුවා, රටටම පෙනෙන්න. දැන් පොලීසියට නඩු තීන්දුවත් දෙන්නයි තිබෙන්නේ. විනිසුරුවරුන්ට කරන්න දෙයක් නැහැ. ඔබතුමා කිව්ව එක හරි. ඉතින් මේ වාගේ ඉතාම ව්‍යාකූල තත්ත්වයක් *-[බාධා කිරීමක්]* ඔව්, මම කියන්නේ. රටේ නීතිය මම කියන්නේ. මම කාගේවත් interest එකක් බලන්නේ නැහැ. මම කාටවත් පෙනී සිටින පාර්ශ්වයක් නොවෙයි. මම අධිකරණ ඇමතිවරයා; රටේම අධිකරණ ඇමතිවරයා. ඒ නිසා රටේ ඕනෑම තැනක වැරැද්දක් වෙනවා නම් මට අයිතියක් තිබෙනවා කථා කරන්න. අයිතිය නොවෙයි ඒක මගේ වගකීම. ඒක මගේ වගකීම. එහෙම නම් මේ වාගේ දෙයක් වුණාම විනිසුරුවරයෙකුට වගකීමක් තිබෙනවා, -යුතුකමක් නොවෙයි ඒක. නීතියෙන් තිබෙන දෙයක්- ඒ තැනැත්තා අත්අඩංගුවට ගන්න. ඒකට පොලිස් නිලධාරියෙක් ද, හමුදා නිලධාරියෙක්ද, මම ද, ඔබ ද කියලා අදාළ නැහැ. ඒක මේ රටේ නීතිය. ඊළඟට පොලිස් දෙපාර්තමේන්තුවට, පොලිස්පතිතුමාටත් වගකීමක් තිබෙනවා. මේ වාගේ නිලධාරින් එක්ක කොහොමද මේ අපරාධ නඩු විමර්ශනය කරන්නේ? මෙහෙම නඩු විමර්ශනය කරන එක නීතියට අනුකූල ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ වාගේ දේවල් වෙනකොට අවසානයේ මොකද වෙන්නේ? අවසානයේ වෙන්නේ අධිකරණ ක්‍රමය පිළිබඳ මේ රටේ මිනිස්සුන්ට තිබෙන විශ්වාසය බිඳ වැටෙන එක. දැන් ඒක වෙලා සෑහෙන දුරට. අධිකරණ ක්‍රමය පිළිබඳ විශ්වාසය බිඳ වැටෙනවා කියන්නේ රට අරාජික වීමක්. ඔබතුමාගේවත්, මගේවත්, කාගේවත් ජීවිතවලට ආරක්ෂාවක් නැහැ ප්‍රජාතන්ත්‍රවාදය බිඳ වැටුණාට පස්සේ. ඊට පස්සේ ජාතික ආරක්ෂාවක් ගැන කථා කරන්න බැහැ, නීතියේ ආධිපත්‍යය ගැන කථා කරන්න බැහැ. ඒ නිසා නීතියේ ආධිපත්‍යය රැකීම සඳහා කළ යුතු දේ තමයි මම කිව්වේ.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි, මේ ප්‍රශ්නය ඇහුවාට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු වීරசுමන වීරசිංහ අවර්කළ් අක්කිරා සනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු කිංස් නෙල්සන් අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. WEERASUMANA WEERASINGHE left the Chair, and THE HON.KINS NELSON took the Chair.

[ප.භා. 11.47]

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ක්‍රීඩාවේ විනය සම්බන්ධව, ක්‍රීඩාවට අවශ්‍ය නීති අණපනත් සම්බන්ධව අවශ්‍ය කටයුතු කරගෙන අපේ ක්‍රීඩාව ඉදිරියට ගෙන යන්න මා විසින් ඉදිරිපත් කරපු යෝජනාව වෙනුවෙන් අදහස් දක්වපු අපේ ක්‍රීඩා අමාත්‍යතුමාට, ඡේෂා විතානගේ මන්ත්‍රීතුමාට, වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාට, කේ.ඊ.එස්.කුමාරසිරි මන්ත්‍රීතුමාට, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

ක්‍රීඩාවලට සම්බන්ධ වැරැදි වැළැක්වීමේ විශේෂ විමර්ශන ඒකකය අපි ශක්තිමත් කළ යුතුව තිබෙනවා. ඒ හරහා තමයි අපට මේ කාරණා ටික නිවැරැදි කරගන්න පුළුවන් වන්නේත්, දඬුවම් ලබා දෙන්න අවශ්‍ය කටයුතු සම්පාදනය කර ගැනීමේ හැකියාව තිබෙන්නේත්. ඒ නිසා මේ විමර්ශන ඒකකයට අවශ්‍ය ශක්තිය ලබා දීමේ අවශ්‍යතාව තිබෙනවා. ඔබතුමන්ලා කථා කළා ක්‍රීඩකයන් injuriesවලට මුහුණ දෙන කොට ඔවුන්ට අවශ්‍ය පහසුකම් ටික ලබා දීම ගැන. එම ක්‍රීඩකයන් සුවතාවට පත් කර ගැනීමේ අවශ්‍යතාව වෙනුවෙන් අපි කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ සඳහා තිබෙන ඒකක ශක්තිමත් කළ යුතුව තිබෙනවා. ඒ වාගේම ක්‍රීඩකයන්ට පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීමේ අවශ්‍යතාවත් තිබෙනවා. ක්‍රීඩකයෙකුගේ දක්ෂතා ඉදිරියට ගෙන ඒමට නම්, ශාරීරික ශක්තිය වර්ධනය කරගෙන අඛණ්ඩව පවත්වාගෙන යා යුතුව තිබෙනවා. එම නිසා මේ කියන කරුණු

කාරණා කෙරෙහි ඔබතුමන්ලා විශේෂ අවධානයක් යොමු කරමින් ක්‍රීඩාවේ උන්නතිය පිණිස කටයුතු කළ යුතුයි; ක්‍රීඩාවේ විනය ඇති කිරීමට කටයුතු කළ යුතුයි. ඒ වාගේම, ක්‍රීඩාවේ නීති රීති ආරක්ෂා කර ගන්න කටයුතු කළ යුතුයි. ක්‍රීඩා සංගම්වල, එහෙම නැත්නම් ක්‍රීඩා සමාජවල ඉන්න සභාපතිවරු, ලේකම්වරු ඇතුළු නිලධාරීන් නීතියේ හිඩැස්වලින් රිංගා ගෙන ඇවිත් කාලෙන් කාලෙට නැවත තනතුරුවලට පත් වෙනවා. සභාපතිවරයා ලෙස හිටපු කෙනා ලේකම් වෙනවා, ලේකම්වරයා ලෙස හිටපු කෙනා භාණ්ඩාගාරික වෙනවා. එසේ වීමට ඉඩ නොදී ක්‍රීඩාව ගැන උනන්දුවක් තිබෙන, ඉදිරියේදී ක්‍රීඩාවේ උන්නතියක් ඇති කරන්න ඕනෑ කියලා හැඟීමක් තිබෙන මිනිසුන් අතට මේ ක්ෂේත්‍රය පත් වීමේ ක්‍රමයක් සකස් කිරීම අප කාගේත් වගකීම බවට පත් වෙනවා. නමුත්, අපට ඒක කරන්න පුළුවන් වෙයිද?

අද අපි මේ යෝජනාව ගෙනාවේ බොහොම සද්භාවයෙන්. අපේ රටේ ක්‍රීඩාව දියුණු කිරීම පිළිබඳ අපේ තිබෙන හැඟීම, ආදරය නිසා තමයි අපි මේ යෝජනාව ගෙනාවේ. හැබැයි, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා මතු කරපු කාරණයත් එක්ක, මේ පාර්ලිමේන්තුවේ මේ කාරණා ගැන කථා කරලා මේ කටයුතු ඉස්සරහට ගෙන යන කොට එතැනින් පහළ ඉන්න අයගේ විනය හදන්නේ කොහොමද කියන ප්‍රශ්නයත් මතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි දකින කාරණයක් තිබෙනවා. මේ රටේ ප්‍රධානම පුටුව තමයි විධායක ජනාධිපති ධුරයේ පුටුව. එතැන ඉඳලාම අපි ආදර්ශයක් ලබා දෙන්න එපා යැ. හැබැයි, එක නඩුවක් ඉවර වෙලා සතියක්වත් ගත වුණේ නැහැ, එකම කාරණය ගැන අපි දැන් නැවත නැවත කථා කරනවා. ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5 ද කියන කාරණය නැවත නැවත මතු කරමින් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු පුද්ගලයාම තමන්ගේ අවශ්‍යතාව වෙනුවෙන් පුටුවේ රැඳිලා ඒක බදාගෙන, අල්ලාගෙන ඉන්න උත්සාහ කරනවා. ඒ වුවමනාවම තමයි ක්‍රීඩා සංගම්වලටත් තිබෙන්නේ. ඒ නිසා ඉහළ ඉඳලාම ආදර්ශයක් ලබා දිය යුතු වනවා. පුටුව බදාගෙන ඉන්නවා මිස දාලා යන්න කැමැති නැහැ. එක ලේනෙකු දාලා වැඩේ අසාර්ථක වුණාට පසුව ඒක තව ලේනෙකුට භාර දීලා තිබෙනවා. මොකක්ද මේ කරන්න යන්නේ? එහෙම නම්, අපි ඉහළ පුටුවේ ඉඳලාම පහළට ආදර්ශයක් ලබා දෙන්න ඕනෑ. තමන්ම හදපු ව්‍යවස්ථාවේ හිඩැස තියාගෙන දැන් ඒ ගැනම කථා කරනවා. එක වතාවක් ඒ ගැන කථා කරන්න ගියාම අධිකරණයෙන් එය ප්‍රතික්ෂේප වුණා. ඊට පස්සේ කැබිනට් මණ්ඩලයට දාලා ආපහු ඒක නිවැරැදි කරගෙන ඒකේ තිබෙන අඩු පාඩුවක් අල්ලා ගෙන තව එක්කෙනෙකු හරහා එම කාරණය ආයෙත් උසාවියට ගෙන එනවා. මේ වාගේ පුද්ගලයන් ඉන්න රටක, ක්‍රීඩා සංගමයක විනය හදන්නේ කොහොමද, ක්‍රීඩකයන්ගේ විනය හදන්නේ කොහොමද, මේ නීති ආරක්ෂා කරගෙන පවත්වා ගෙන යන්නේ කොහොමද කියන විශාල ගැටලුවට මුහුණ දෙන්න අපට සිදු වෙනවා.

මේ රටේ නීතිය කාටත් පොදු වෙන්න ඕනෑ. අපි මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඇවිල්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනෙන කොට -තමන්ට අවශ්‍ය වන කොට නැවත අනෙක් පැත්තට නීතියේ අර්ථකථන ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන්- උපක්‍රමශීලීව එහි හිඩැස් තබාගෙන කටයුතු කරන නායකයන් බිහි වන රටක අපට මීට වඩා දෙයක් බලාපොරොත්තු වෙන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මතු වෙනවා. එම ප්‍රශ්නාර්ථය හමුවේ මම මේ යෝජනාව ගෙන ආව එකත් අපරාධයක් කියා හිතෙනවා. අපි ක්‍රීඩාවේ විනය හදන්නේ කොහොමද, ක්‍රීඩාවේ උන්නතිය ඇති කරන්නේ කොහොමද? මේ රටේ උත්තරීතර ආයතනය විසින් රටේ ඉදිරි පැවැත්ම වෙනුවෙන් නිර්මාණය කර ගත්තා වූ, රට යම් දිශානතියකට ගෙන යෑම සඳහා හදා ගත්තා වූ ව්‍යවස්ථාවේ හිඩැස්වලින් රිංගා ගෙන ගිහින් පටු පරමාර්ථ මුදුන් පමුණුවා ගන්න කටයුතු කරන නායකයන් ඉන්න රටක, මෙවැනි කාරණා ගැන අප කථා කළ යුතු ද කියන ප්‍රශ්නය මතු වනවා.

කොහොම වුණත්, ශ්‍රී ලාංකික පුරවැසියන් විධියට අපි හැමෝම ක්‍රීඩාවෙන් සතුටක් ලබනවා. මේ රට ආර්ථික වශයෙන් බංකොලොත් කිරීම නිසා අප සියලු දෙනා පීඩා විඳිමින් ඉන්න කොට, ඒ පීඩාව යම්කිසි ප්‍රමාණයකින් හෝ දුරස් කර ගන්නට, ඒ පීඩාවෙන් මිදෙන්නට ක්‍රීඩාව බොහෝ සේ ඉවහල් වෙනවා. අපේ ජාතික ක්‍රීඩාව නොවුණත්, අපේ රටේ ජනතාවගේ අවධානය විශාල වශයෙන් යොමු වෙච්ච, හැමෝම ආදරය කරන ක්‍රීඩාව තමයි, ක්‍රිකට් ක්‍රීඩාව. අපේ රටට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ලැබෙන ක්‍රිකට් ක්‍රීඩාව හරියාකාරව කළමනාකරණය කරලා, අදාළ නීති රීති හරියාකාරව ස්ථාපනය කරලා ඒවා ක්‍රියාත්මක කරන්න පුළුවන් බලයක් ඇති ආයතන නිර්මාණය කරලා මේ රටේ ජනතාවට ඒ ක්‍රීඩාව නැවත හාර දෙන්නත්, දක්ෂ ක්‍රීඩකයන්ට එහි නිරත වී තමන්ගේ රට නියෝජනය කිරීමට අවස්ථාව උදා කර දෙන්නත් අවශ්‍ය කටයුතු ටික අප විසින් සිදු කර දිය යුතුයි.

මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නේ, ගරු ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය ඇමතිතුමායි. එතුමාත්, ගරු ක්‍රීඩා අමාත්‍යතුමාත්, මේ සම්බන්ධව උනන්දුවක් දක්වන රජයේ සියලු දෙනාත්, විශේෂයෙන් අවශ්‍ය නීති අණ පනත් සෑදීමේදී අධිකරණ ඇමතිතුමා විධියට ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත් වීමත් උපයෝගි කරගෙන මේ රටේ ජනතාව ආදරය කරන ක්‍රීඩාව කෙසේ හෝ ආරක්ෂා කර දෙන්න කියා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම, ජාවාරම්කරුවන්ගෙන්, බුකීකරුවන්ගෙන් මේ රටේ ක්‍රීඩාව ආරක්ෂා කර දෙන්න කටයුතු කරන්න කියන ඉල්ලීමත් කරමින්, මේ යෝජනාව ගෙන ඒමට නන් අයුරින් සහයෝගය ලබා දුන්නු, ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරපු මැති ඇමතිතුමන්ලා සියලුදෙනාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, න්‍යාය පත්‍රයේ යෝජනා අංක 3 ඉදිරිපත් කිරීම, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10 කාලයක් ලැබෙනවා.

ආගමික අන්තවාදය වැළැක්වීමේ අවශ්‍යතාව
மதத் தீவிரவாதத்தைத் தடுப்பதன் அவசியம்
THE NEED FOR PREVENTING RELIGIOUS EXTREMISM

[පූ.භා. 11.53]

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"කවර රටක කවර ක්ෂේත්‍රයක වුව ද අන්තවාදී අදහස් නිබීම ඉතා හානිකර වන හෙයින් ද, ආගමික අන්තවාදය පිළිබඳව පසුගිය පාස්කු ප්‍රහාරයෙන් පසුව සමාජයේ විශාල කතිකාවතක් ඇති වී තිබෙන හෙයින් ද, ආගමික අන්තවාදය මතුවීම හා ප්‍රවර්ධනය කිරීම වැළැක්වීම සහ එයට දැනටමත් ගොදුරු වී සිටින පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

[ගරු ඡේෂා විතානගේ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද මෙම යෝජනාව ගෙන ඒමේ ප්‍රධාන අරමුණක් තිබෙනවා. බහු ආගමික රටක් වන අපේ රටේ විවිධ ආගම් අදහන සාමාන්‍ය ජනතාවට අන්තවාදී කණ්ඩායම් හරහා ලබා දෙන සමහර මත සාධාරණීකරණය කරන්න අවස්ථාවක් නැහැ. අපි දන්නවා, ආගමික අන්තවාදී කණ්ඩායම්වල අවසාන නවාතැන තිබෙන්නේ දේශපාලනඥයන් ළඟ බව. ඒ අය දේශපාලනඥයන්ගේ රැකවරණයත් එක්ක දේශපාලනඥයන්ගේ අවශ්‍යතා පිරිමහ ගන්න විවිධ ආකාරයෙන් ආගම භාවිත කරනවා. එය, මේ මෑත කාලයේ ඉතා සුලබව දකින්නට ලැබුණා.

පසුගිය පාස්කු ප්‍රහාරයත් එක්ක මේ රටේ ආගමික අන්තවාදය පිළිබඳව වැඩි වශයෙන් කථා කළා. හැබැයි එසේ කථා කළත්, අද මේ මොහොත වන විටත් මේ රටේ දේශපාලනඥයන්ගේ ආරක්ෂාව ලැබෙන, එක එක පාලකයන්ගේ ආරක්ෂාව ලැබෙන අන්තවාදී කණ්ඩායම්වල අවශ්‍යතා ඉටු කර ගන්න පුළුවන් පරිසරය නිර්මාණය වෙලා තිබෙනවා. බෞද්ධ වෙන්න පුළුවන්, කතෝලික වෙන්න පුළුවන්, ඉස්ලාම් වෙන්න පුළුවන්, හින්දු වෙන්න පුළුවන් ඒ හැම ආගමකටම අයත්, තම ආගමික වතාවත් ඉටු කරමින් වෙසෙන අහිංසක, සාමාන්‍ය ජනතාවට ඒ අන්තවාදී කණ්ඩායම් මහා විශාල හිසරදයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ අන්තවාදී කණ්ඩායම්වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරවන්නවත්, එහෙම නැත්නම් වැට බැඳීමටවත් අවශ්‍ය පියවර කිසිම ආකාරයකින් හෝ ගෙන නැහැ. එවැනි වකවානුවක මම හිතුවා, මේ යෝජනාව පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් විධියට පාර්ලිමේන්තුවට ගෙන එන්න ඕනෑ කියලා.

බෞද්ධාගමිකයෙකු විධියට මම විශේෂයෙන් මේ වෙලාවේ කියන්න ඕනෑ, මේ රටේ බෞද්ධාගම ආරක්ෂා කිරීමට නම්, එහෙම නැත්නම් බෞද්ධයන් බලාපොරොත්තු වන විධියට බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි ධර්මානුකූලව ජීවත් වන මනුස්සයෙක් මේ රට තුළ හදන්න නම් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ නියාමනයක් අවශ්‍යයි කියලා මා විශ්වාස කරන බව. අපේ රටේ මහා නායක ස්වාමීන් වහන්සේලා මේ යෝජනාව පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ කථා වන එක ගැන අවධානය යොමු කරනවා නම් හොඳයි. ගිහියෙකු විධියට මම මෙහෙම කියන එක හරිද වැරදිද කියලා මම දන්නේ නැහැ. නමුත් කොහේ හරි කියැවෙන්න ඕනෑ නිසා මම මේ කාරණය කියනවා. එවැනි නියාමනයක් කිරීමේ අවශ්‍යතාව අද ඇති වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. වීවරය පොරවා ගත් නමුත් උපසම්පදාභාවයවත් ලබා නොගත්, "ස්වාමීන් වහන්සේලා" යැයි කියා ගන්නා සමහර උදවිය මේ රටේ බුද්ධාගම ප්‍රසිද්ධියේ විනාශ කරනවාය කියන එක මහා නායක ස්වාමීන් වහන්සේලාටත් පෙනෙන්න ඕනෑය කියා මා හිතනවා.

මේ පාර්ලිමේන්තුවට, එහෙම නැත්නම් දේශපාලනයට ස්වාමීන් වහන්සේලාට ප්‍රවේශ වෙන්න දීපු අවස්ථාවත් එක්ක ලැබුණු බලය, ඒ බලය පිටුපසින් ලැබෙන ධනය ආදි සියල්ල එක්ක උන්වහන්සේලාට බුද්ධ දේශනාව අමතක වෙන්න ඇති කියලාත් සමහර වෙලාවට මට හිතෙනවා.

ඒක අපි දැක්කා, පසුගිය ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ පාලනය පිහිටුවන වෙලාවේ. ඒ අවස්ථාවේ සමහර ස්වාමීන් වහන්සේලාගේ හැසිරීම බෞද්ධයන් විධියට, ගිහියන් විධියට අපට අනුමත කරන්න බැරි තරමට විකෘති ස්වභාවයක් ගත්තා. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, බුදුරජාණන් වහන්සේගේ මේ උතුම් ධර්මය අදහන බෞද්ධයන් ඉන්න රටක් නම්, බෞද්ධාගමික අන්තවාදීන් විධියට එක් එක් දේශපාලන කල්ලිවල අතකොළු බවට පත් වෙමින් මේ රටේ බෞද්ධාගම කෙලෙසන්න ඉඩ නොදී ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන්න කියලා. විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයාත්, මේ රටේ බෞද්ධාගමිකයන් විධියටත් අපි ඉතාම භක්තියෙන් අදහන අපේ මහ නායක ස්වාමීන් වහන්සේලා ප්‍රධාන සියලු බෞද්ධාගමික නායකයන් එකමුතු වුණොත් බෞද්ධාගමිකයන් මේ තත්ත්වයෙන් මුදවාගන්න පුළුවන්.

ඒ වාගේම මේ රටේ සාමාන්‍ය මුස්ලිම් ජනතාව හැම දාම වන්දි ගෙවනවා මුස්ලිම් අන්තවාදී කල්ලිවල ක්‍රියාදාම නිසා. මුස්ලිම් අන්තවාදී කල්ලියක ක්‍රියාදාම නිසා වන සිද්ධි එක්ක සාමාන්‍ය අහිංසක මුස්ලිම් ජනතාවත් එක්ක සිංහල බෞද්ධ ජනතාව, වෙනත් ආගමිකයන් වෛර බඳිනවා. ඉතින්, මේ රටේ ජනතාව අතර ආගමික සංහිඳියාවක් නිර්මාණය කරන්න බැරිවෙලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, අපේ රටේ තිබෙන ඉස්ලාම් ආගම, හින්දු ආගම වාගේ ප්‍රධාන ආගම්වලට නායකත්වය දෙන ආගමික නායකයන් හරි විධියට මේ කටයුත්ත නියාමනය කරන්න ඕනෑ කියලා. මොකද, සමහර වෙලාවට අපි දකිනවා මුස්ලිම් ආගමික නායකයන් දන්නේත් නැතිව මුස්ලිම් අන්තවාදී කණ්ඩායම් නිර්මාණය වෙලා දේශපාලනඥයෙකුට ජැක් එකක් ගහලා ඒ අයට අවශ්‍ය අරමුණු කරා යන්න භාවිත කරනවා කියලා. දේශපාලන නායකයනුත් හරි කැමැතියි මුස්ලිම් කඳවුර තමන්ගේ ළඟට ගන්න, දම්ළ කඳවුර තමන්ගේ ළඟට ගන්න. ආගමික අන්තවාදීන් නොවෙයි, මොකෙක් වුණත් කමක් නැහැ, මේ වෙලාවේ මට වැදගත් වෙන්නේ ඡන්ද ටික කියලා බදාගත්තාට පස්සේ අර අන්තවාදී ගතිය පළ කරනවා. අන්තවාදී ප්‍රකාශ කරනවා. අපි දැක්කා, අර අලුත්ගම සිද්ධිය එහෙම අමතක කරන්න බැරි නරකම තැනට අරගෙන ගියේ දේශපාලනඥයන් බව. මම හිතනවා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ වගකීම වෙන්නේ මේ රටට එන මුදල් ටික -ණය ටිකක් අරගෙන හෝ බදු ආදායමින් ලැබෙන මුදල් ටික- පරිහරණය කරන විධිය, පාරවල් ටිකක් හදන එකට -ඒකත් හරියට කරන්නේ නැහැ- සැලසුම් හදන එක නොවෙයි කියලා. අධිකරණ ඇමතිතුමා නීති විශාල ප්‍රමාණයක් ගෙනැවිත් තිබෙනවා. ඒ නිසා ඔබතුමා ඉතිහාසගත වන ඇමතිවරයෙක් වෙනවා. මම හිතන විධියට අපි දන්න කාලයේ වැඩිම Bills ප්‍රමාණයක් ආපු පාර්ලිමේන්තුව මේක. ඒක වෙන්න ඕනෑ. ඔබතුමා අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රවීණයකු විධියට දන්නවා, දණ්ඩ නීති සංග්‍රහයේ වෙනස් කරන්න ඕනෑ තව වගන්ති විශාල ප්‍රමාණයක් තිබෙන බව. ඒවා වෙනස් වෙලා එන්න ඕනෑ රටක් විධියට අපට ඉස්සරහට යන්න.

දේශපාලනඥයන්ගේ අවශ්‍යතාව වෙනුවෙන් ආගම අතකොළුවක් කරගෙන ආගමික අන්තවාදීන් විධියට තමන්ගේ අරමුණු කරා යන කණ්ඩායම්වලට භයිය දෙන්න පුළුවන් ආකාරයේ වටපිටාවක් ගොඩ නොනැහෙන්නට නම් මම හිතන විධියට හරි නීති හදන්න අපට සිද්ධ වෙයි. එහෙම නැති වුණොත් අපේ රටේ අහිංසක මිනිස්සුන්ට - අහිංසක මුස්ලිම් භක්තිකයාට, හින්දු භක්තිකයාට, බෞද්ධාගමිකයාට - අනිවාර්යයෙන්ම මේවාට වන්දි ගෙවන්න සිද්ධ වෙනවා. අද ඒක සිද්ධ වෙමින් පවතිනවා. මේ මොහොත වෙනකොට අයාලේ යන පාලනයක් තමයි අපට පෙනෙන්නේ. වත්මන් පාලකයන්ගේ ඔළුව මේ වෙලාවේ කරකැවෙන්නේ රට ඉදිරියට අරගෙන යන්නේ කොහොමද කියන එක ගැන නොවෙයි, ආර්ථික අර්බුදයෙන් ගොඩයන්නේ කොහොමද කියන එක ගැන නොවෙයි, මේ රටේ අහිංසක මිනිස්සු දුක් විඳින එකට උත්තරයක් හොයන එක ගැන නොවෙයි, මොනවා හෝ විජ්ජාවක් දාලා, මොනවා හෝ ගේම් එකක් ගහලා ඊළඟ වතාවට පාලන බලය ලබා ගන්නේ කොහොමද කියන එකට.

ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා කියපු ඒ පණිවුඩයත් එක්ක අපට දැන් පෙනෙනවා, මොකෙක් දාලා හරි, මොන ගේම් එකක් ගහලා හරි ඔවුන්ගේ අරමුණ වෙන්නේ තව අවුරුදු 5ක් අදින්නේ කොහොමද, 6ක් අදින්නේ කොහොමද, ජනාධිපතිවරණය නොපවත්වා කොහොම හෝ ජනමත විචාරණයකට යන්න පුළුවන් නම්, ඒක කරගන්නේ කොහොමද කියලා බලන එකයි.

අධිකරණ ඇමතිතුමා කියපු විධියට අපට ලජ්ජයි. නීතිය පිළිබඳව නීති විද්‍යාලයේත් ඉගෙන ගෙන, නීතිඥයන් විධියට අවුරුදු ගණනක practice එකක් තිබෙන මනුස්සයෙකුට මේ රටේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ කාරණය සඳහන්ව තිබෙනවාද, නැද්ද කියන එක ගැන අවබෝධයක් නැති එක ගැන ලජ්ජා වෙන්න ඕනෑ.

කලින් පෙත්සම ඉදිරිපත් කරපු මහත්මයා නම් කමක් නැහැ, එතුමා ව්‍යාපාරිකයෙක් කියන්න පුළුවන් නේ. නීතිඥ මහත්මයෙකුට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තේරෙන්නේ නැත්නම් ඒක ප්‍රශ්නයක්. ඇත්තටම නොදන්නකමට ගිහිල්ලා මෙවැනි පෙත්සමක් ඉදිරිපත් කරනවා නම්, ඒ මහත්මයාගේ කෝට් එක ගලවලා දමන්න ඕනෑ. මොකද, ඒ මහත්මයා අඩුම තරමින් දණ්ඩ නීති සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය ගැන පමණක් නොවෙයි, මේ රටේ මූලික නීතිය ගැනවත් අවබෝධයක් නැති කෙනෙක් වෙන්න ඇති.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මම ඉක්මනින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එහෙම නැත්නම් අපට සක් සුදක් සේ පැහැදිලියි, කාගේ හෝ අතකොළුවක් වෙලා නීතිඥ කබායත් බිල්ලට තියලා එතුමා අධිකරණයට යන්න ඇති කියලා. නමුත් ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදය අගයන නායකයකු නිසා මේ රටේ මේ විකාරරූපී ක්‍රියා නතර කරලා ඉදිරි මැතිවරණය පවත්වන එක ගැන විවෘත ප්‍රකාශයක් කළා නම්, ඔය සෙල්ලම් නතර වෙයි කියලා අපි හිතනවා.

බොහොම ස්තුතියි.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ යෝජනාව ගැන කථා කරන්නේ නැහැ. නමුත් මම සතුටු වෙනවා, ගරු හේෂා විතානගේ තරුණ මන්ත්‍රීතුමා ආගමික අන්තවාදය වැළැක්වීම සම්බන්ධයෙන් මේ සභාවට යෝජනාවක් ගෙන ඒම පිළිබඳව. ඇත්තටම මේක වෙන්න ඕනෑ දෙයක්. හැබැයි, එතුමා මේ ප්‍රශ්නය මතු කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, අපි ආගමික අන්තවාදය අවසන් කරලා එතැනට "ශ්‍රී ලාංකිකත්වය" කියන එක replace කරන්න ඕනෑ. ශ්‍රී ලාංකිකත්වය ඉස්මතු කිරීම සඳහා පක්ෂ භේදයකින් තොරව අපි මේ රට තුළ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. එතුමාගේ යෝජනාව හොඳයි. ආගමික අන්තවාදය අවසන් කරලා එතැනට "ශ්‍රී ලාංකිකත්වය" කියන එක ඇතුළත් කරන්න ඕනෑ. ඒක තමයි වෙන්න ඕනෑ. ඒක තමයි කරන්න ඕනෑ. එම නිසා එතුමාගේ මෙම යෝජනාව ගැන අපි පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සතුටු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කිරීම, ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මන්ත්‍රීතුමා.

[අ.භා. 12.05]

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර තිබෙන යෝජනාව මම ස්ථිර කරනවා. එතුමා ගෙනැවිත් තිබෙන්නේ ඉතාම කාලීන යෝජනාවක්. රට තුළ ආගමික අන්තවාදය වැළැක්වීම සඳහා ඇති අවශ්‍යතාව මතු වුණු වෙලාවක මෙම යෝජනාව ගෙන ඒම පිළිබඳව විශේෂයෙන්ම එතුමාට ස්තුතිවන්ත වන ගමන් මා එම යෝජනාව ස්ථිර කරනවා.

ආගමික නායකයන් වන බුදුරජාණන් වහන්සේවත්, ජේසුස් වහන්සේවත්, නබිනායකතුමාවත්, ඒ වාගේම භගවත් ගීතාවේවත් අන්තවාදය ප්‍රවර්ධනය කිරීම කිසිසේත්ම අනුමත කරලා නැහැ. සමානාත්මතාව සහ මධ්‍යම ප්‍රතිපදාවෙන් ආගම ඇදහීම, අනුන්ගේ ඇදහීම්වලට ගරු කිරීම තමයි සෑම ආගමකම මූලික හරය වෙලා තිබෙන්නේ. නමුත් අපි දන්නවා, මේ රටේ නොයෙකුත් දේශපාලන මැතිවරණවලදී තමන්ගේ බලය වෙනුවෙන් ආගමික අන්තවාදය ප්‍රයෝජනයට ගනු ලැබුවා. එම නිසා, මොන ආගමේ වුණත් තරුණ මන්ත්‍රීවරු වන අපි බලය වෙනුවෙන් ආගමික අන්තවාදය ප්‍රයෝජනයට ගන්නවා නම්, ඒකට එකහෙළා විරුද්ධ වෙනවා.

ඒ වාගේම ඕනෑම ආගමක, ආගමික නිදහස තිබිය යුතුයි. මොන ආගමේ වුවත්, ආගමික නිදහස නැතිවෙලා තිබෙන්නේ ආගමික අන්තවාදය නිසයි. මොන ආගමේ වුවත්, ආගමික අන්තවාදය නිසාම අසරණභාවයට, අපහසුතාවට පත් වෙන්නේ, ඒ ආගමේම සිටින ආගම හොඳින් අදහන මිනිසුන්මයි. ඒ කියන්නේ, සමානාත්මතාව ගැන අවබෝධයෙන් සිටින මිනිස්සු. එම නිසා මොන ප්‍රදේශයේ වුණත්, මොන ආගමේ වුණත්, ආගම්වාදය, අන්තවාදය හරහා දේශපාලනය කිරීම තරුණ මන්ත්‍රීවරු විධියට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි සියලුදෙනාම එකතුවෙලා වැළැක්විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම ඒ සඳහා වැඩ පිළිවෙළක් සැකසිය යුතුයි.

අපි දන්නවා, 1948 ඉඳලා මේ රටේ ප්‍රධාන මැතිවරණ 17ක් තිබුණ බව. ඒ සෑම මැතිවරණයකම අඩු වැඩි වශයෙන් මෙම ආගමික අන්තවාදය ප්‍රවර්ධනය කිරීම සහ ඒ හරහා බලයට පත්වීම සඳහා නොයෙකුත් ආකාරයේ ක්‍රියාමාර්ග ගත්තා.

[ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා]

උතුරේ වෙන්න පුළුවන්, දකුණේ වෙන්න පුළුවන්, නැඟෙනහිර වෙන්න පුළුවන්, ඕනෑම ආගමක වෙන්න පුළුවන්, බලය ලබා ගැනීම සඳහා දේශපාලන පක්ෂ හරහා ආගමික අන්තවාදය ප්‍රවර්ධනය කරලා තිබෙනවා. අපේ අධිකරණ ඇමතිතුමා හම්බන්තොට දිස්ත්‍රික්කයේ. මමත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක්. එතුමා අද කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කළාට හම්බන්තොට තමයි එතුමා උප්පත්තිය ලබන්නේ. එතුමා අධ්‍යාපනය ලැබුවේ හම්බන්තොට. එතුමා අධිකරණ ඇමතිවරයා විධියට එතුමාගේ කාලය තුළ මේ රටට වැදගත්, ඒ වාගේම මේ රටේ දූෂණය වංචාව වැළැක්වීම සඳහා වැදගත් පනත් කෙටුම්පත් විශාල ප්‍රමාණයක් මේ පාර්ලිමේන්තුවට ගෙනාවා. අපි ඒ ගැන සන්තෝෂ වෙනවා. අපි විපක්ෂයේ හිටියත්, ඒ වැදගත් පනත් කෙටුම්පත්වලට අපේ දායකත්වය, අපේ එකඟතාව පළ කළා. එතුමා කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන ඇමතිවරයෙක් කියලා මම හිතනවා. නමුත්, ජනාධිපතිතුමා කවදා වෙනකල් කැබිනට් මණ්ඩලයේ එතුමා තියා ගනියිද කියලා මම දන්නේ නැහැ. මොකද, අර කලින් කිව්වා වාගේ එතුමා "බල්ලා මාර්ක්" එකට වැටෙන්නේ නැති ඇමතිවරයකු නිසා. ඒ වාගේ ඇමතිවරුන්ට සාමාන්‍යයෙන් මේ රටේ කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන්න හම්බ වෙන්නේ ටික කාලයයි. එක්කෝ, එතැනින් අයින් කරනවා, නැත්නම් අයින් වෙන විධියට වැඩ සලස්වනවා. මම විශ්වාස කරනවා, එතුමා මේ කැබිනට් මණ්ඩලයෙන් නෙරපන්න කලින් මේ කාලය තුළ ආගමික අන්තවාදය- *[බාධා කිරීමක්]* ඩලස් මන්ත්‍රීතුමා අහනවා, එතුමාට එහෙම අනතුරක් තිබෙනවාද කියලා. මම හිතනවා, ඒ ගැන එතුමාගේ හිත දන්නවා කියලා. ඒ වාගේම එවැනි අනතුරක් තිබේවි කියලා අපටත් දැනෙනවා. ඒ නිසා මේ රටේ ආගමික අන්තවාදය ප්‍රවර්ධනය කරන, ඒ වෙනුවෙන් කැප වෙන පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන ආකාරයේ අණ පනත් එතුමාගේ කාලය තුළ ඉතා ඉක්මනින් මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගැනීම සඳහා අප සියලුදෙනාගේම සහයෝගයෙන් කටයුතු කරන්න එතුමාට අවස්ථාව ලැබේවි කියලා අපි විශ්වාස කරනවා. ඒ සඳහා එතුමාට ශක්තිය ලැබේවා කියලාත් ප්‍රාර්ථනා කරනවා.

ආගමික අන්තවාදය ගැන මේ දවස්වල දේශපාලන වේදිකාවේ ලොකුවට කථා වෙන්නේ නැහැ. මොකද, පාස්කු ප්‍රහාරයත් එක්ක අපි ඒ ගැන හොඳටම කථා කරලා, පෞද්ගලිකව අත් දැකලා තිබෙන නිසා දැන් මේ මැතිවරණයට ඒ වාගේ කථාවක් ඇවිල්ලා නැහැ. නමුත් මේ මැතිවරණයට ආගමික අන්තවාදය නැති වුණාට, ඉදිරියේ දී එන මැතිවරණවලට සමහර විට ආගමික අන්තවාදය එන්න පුළුවන්. ඒ නිසා තමයි මම කියන්නේ මේ පාර්ලිමේන්තුව තුළින් ආගමික අන්තවාදය වැළැක්වීම සඳහා නීතියක්, පනත් කෙටුම්පතක් අධිකරණ ඇමතිතුමා විධියට සිටින ඔබතුමාගේ කාලය තුළ ගෙන එන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ආගමික අන්තවාදය නැති නිසා අපේ රංගෙ බණ්ඩාර මැතිතුමන්ලා, වජිර අබේවර්ධන මැතිතුමන්ලා කියන ආකාරයට ධුර කාලය අවුරුදු පහ, හය කරන, ජනතා පරමාධිපත්‍යය නැති කරන ආකාරයේ ක්‍රියා මාර්ග ගන්න ජනාධිපතිතුමා, ආණ්ඩුව උත්සාහ කරනවා. ජනතා පරමාධිපත්‍යයෙන් තමයි මේ රටේ ඕනෑම ආණ්ඩුවක්, ඕනෑම නායකයෙක් බලයට පත් වෙන්න ඕනෑ. ඒ ජනතා පරමාධිපත්‍යයට අභියෝග කරනවාය කියන්නේම, ඒ නායකයා හෝ ඒ ආණ්ඩුව මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධයි කියන එකයි. ඔය ලේනව මහත්මයා, ලක්සිරි මහත්මයා මේ කරන්නේ එක්තරා කොටසකගේ කොන්ත්‍රාත්තුවක් ඉෂ්ට කිරීම. ඒ කොන්ත්‍රාත්තුවේ අවශ්‍යතාව තිබෙන්නේ කාටද කියලා වජිර අබේවර්ධන මැතිතුමන්ලා, රංගෙ බණ්ඩාර මැතිතුමන්ලා පසුගිය කාලය තිස්සේම කිව්වා. ඒ නිසා අපි දන්නවා, මේක ජනාධිපතිතුමාගේ කොන්ත්‍රාත්තුව. ඒක ලේනවගේ මාර්ගයෙන් එන්න පුළුවන්, ලක්සිරිගේ මාර්ගයෙන් එන්න පුළුවන්. තවදුරටත් තව කාගේ හරි මාර්ගයෙන් මේ රටේ අධිකරණයට අභියෝග කරන්න පුළුවන්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට අභියෝග කරන්න පුළුවන්, මේ රටේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවයට අභියෝග කරන්න පුළුවන්.

මම කියන්නේ, ඔය "බල්ලා මාර්ක්" වැඩ පිළිවෙළ නවත්වන්න කියලායි. එතුමා භය නැත්නම් මේ මැතිවරණයට මුහුණ දෙන්න එන්න ඕනෑ. එතුමා භයවෙලා, මේ නොයෙකුත් ක්‍රියා මාර්ග හරහා ධුර කාලය අවුරුදු 5, 6 කරගන්න උත්සාහ කරන්න එපා කියලා මම කියනවා. ඒ කාරණයත් මේ ආණ්ඩුවට මතක් කරන ගමන් මගේ වචන ස්වල්පය නිම කරනවා.

ඒ වාගේම, මෙවැනි යෝජනාවක් ගෙන ඒම වෙනුවෙන් හේෂා විතානයේ මැතිතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නැවත වරක් මේ යෝජනාව ස්ථිර කරනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.13]

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් කාරණාවක් ගැන අද දවසේ කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳ ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ හිතවත් ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ආගමික අන්තවාදය වැළැක්වීම අරමුණු කරගෙන ඉදිරිපත් කළ මෙම යෝජනාව ඉතා කාලීන යෝජනාවක්. ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තු කාලය තුළ ආගමික අන්තවාදයට එරෙහිව කටයුතු කළ ගෞරවනීය මන්ත්‍රීවරයකු බව අපි දන්නවා. ඇත්ත වශයෙන්ම එතුමා රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොවෙයි, සමස්ත ලාංකිකයන්ගේම අනාගත පැවැත්ම පිළිබඳ ඉතාම බරපතළ කාරණාවක් තමයි මේ පාර්ලිමේන්තුවට ගෙන ආවේ. ඒ නිසා තමයි අපි හේෂා විතානගේ මන්ත්‍රීතුමා මේ ගෙනාපු යෝජනාවත් එක්ක එකඟ වෙන්නේ. ආගමික අන්තවාදය වැළැක්වීම සඳහා අපි ජාතියක් විධියට එකතු වෙලා කටයුතු කරන්න ඕනෑ; නිති හදන්න ඕනෑ. ඒ අන්තවාදය සීමා කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න ඕනෑ අවස්ථාවක්, මේක.

විශේෂයෙන්ම මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු වන මම, ආගමික අන්තවාදයෙන් බැටකාපු ප්‍රදේශයකින් තමයි මේ පාර්ලිමේන්තුවට පැමිණෙන්නේ. ඇත්තටම සාම්ප්‍රදායික මුස්ලිම්වරු, සාම්ප්‍රදායික හින්දු බැතිමතුන්, සිංහල මහ ජාතිය, ඉතාම ආදරණීය සම්බන්ධයකින් තමයි ඉතිහාසය මුළුල්ලේම ජීවත් වුණේ කියලා ඔබතුමාත් හොඳටම දන්නවා. සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්, සිංහල ජනතාව, ද්‍රවිඩ ජනතාව යන මේ අයගේ සාමූහික ඥාතීත්ව සහෝදර

සම්බන්ධතාව ගැන අපි දන්නවා. ඔවුන්ගේ වාසගමෙන්, උප්පැන්න සහතිකයෙන් එය තහවුරු වෙනවා. නමුත්, පසුගිය කාලය තුළ ආගමික උන්මත්තකයන් විසින් මේ ඉස්ලාම් බැතිමතුන්, සිංහල ජාතීන් අතර භේදභින්න ඇති කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම උතුරේ ඇති වෙච්ච ආගමික කෙසේ වෙතත්, ජාතිවාදී උන්මාදයත් එක්ක අවුරුදු 30කට වැඩි කාලයක් තිස්සේ බරපතළ පීඩාවලට මුහුණ දෙන්න අපට සිද්ධ වුණා. එදා මහනුවර දිගන, තෙල්දෙණියේ ඇති වෙච්ච ගැටුම්වලින් මරණයට පත් වුණේ පුද්ගලයන් පමණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ මරණය ජාතීන් අතර සහෝදරත්වයේ මරණයක් දක්වා වර්ධනයවීමත් එක්ක අපට මකා දමන්න බැරි ආකාරයට භේදභින්න බවක් මේ ජාතීන් අතර නිර්මාණය වෙන්න පටන් ගත්තා. අවසානයේ මොකක්ද වුණේ? මේ අය ඊළඟ මැතිවරණවලදී ආගමික උන්මාදය පාවිච්චි කරලා, දේශපාලන බලය ලබා ගැනීමට මැතිවරණවලට ඉදිරිපත් වෙනවා. මැතිවරණවලට වෙනත් පදනමකින් ආවාට ප්‍රශ්නයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ප්‍රදේශවල තිබෙන දුෂ්කරතා වෙන්න පුළුවන්, යම් යම් සංවර්ධන අවශ්‍යතා වෙන්න පුළුවන්. නමුත්, ඒ එකක්වත් නොවෙයි මෙහිදී බලපාන්නේ. මේ අය හුදු බලය ලබා ගැනීම වෙනුවෙන්ම ජාතිවාදී උන්මත්තකවාදය පාවිච්චි කළා. අවසානයේ දී මොකක්ද වුණේ? සාම්ප්‍රදායික ඉස්ලාම් බැතිමතුන්, සිංහල ජාතිය සහ හින්දු බැතිමතුන් අතර ඇති වෙච්ච ආගමික ගැටුම් හරහා අන්තවාදීන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය තමයි ක්‍රියාත්මක වුණේ. ඒ නිසා අපි මේවා පිළිකුලෙන් බැහැර කරන්නට ඕනෑ.

පාස්කු ඉරු දින ප්‍රහාරයත් එවැනි ප්‍රතිඵලයක්. අවසානයේ දී ජාතීන් අතර ගැටුමක් දක්වා ප්‍රවර්ධනය වෙනකම් අපට මේවා වළක්වාගන්න බැරි වුණා. අද බොහෝ දේශපාලන පක්ෂ පේටන්ට් අයිතියක් අරගෙන තිබෙනවා, සිංහල භාෂාවේ පේටන්ට් අයිතිය, ද්‍රවිඩ භාෂාවේ පේටන්ට් අයිතිය, මුස්ලිම් බැතිමතුන්ගේ පේටන්ට් අයිතිය වශයෙන්. මුස්ලිම්, ද්‍රවිඩ, සිංහල -සිහල- මෙවැනි පද දේශපාලන පක්ෂවලට පාවිච්චි කරනවා නම්, ඒ පේටන්ට් අයිතිය ඒ විධියට භාෂාවකට, ආගමකට පාවිච්චි කරන්න පුළුවන් ද කියලා මම අහනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ආගම හොඳ ආයුධයක්. දේශපාලන බලය ලබා ගැනීම වෙනුවෙන් ආගම හොඳ ආයුධයක්. මේ ජාතීන් විරසක කරන තැනට එනකම්ම සටන් කරන්නත් ආගම හොඳ ආයුධයක්. බිස්නස්කාරයන්ට ආගම හොඳ ආයුධයක්; උපක්‍රමික බිස්නස්කාරයන්ට ආගම හොඳ ආයුධයක්. සමහර තැන්වල ආගම පෙන්වලා සාත්තර කියන බවත් අපි දන්නවා.

සමහර තැන්වල බලිතොවිල් අරිනවා, සමහර වෙලාවට ජේන බලනවා, සමහර වෙලාවට උත්සව පවත්වන ආකාරයත් අපි දකිනවා. ඒ වාගේම ආගම පෙන්වලා දැන් දැවැන්ත ඉදිකිරීම් සමාගම් පවා පටන් අරගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි මේවා විනිවිද දකින්න ඕනෑ. ගරු අධිකරණ ඇමතිතුමනි, ආගම, ධර්මය නාමයෙන් කරන වංචනික, ව්‍යාජ ව්‍යාපාර පිළිබඳවත් අපි හිතන්න ඕනෑ. මොකද, බිස්නස් කිරීමේ මාර්ගයක් විධියට ආගම යොදා ගන්නවා නම්, එය අන්තවාදයටත් එහා ගිය දෙයක්. ඒ නිසා මේවා පිළිබඳව අපි කල්පනා කරන්න ඕනෑ කාලයක් අද ඇවිල්ලා තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, ඇත්තටම මේවා පිළිබඳව ඔබතුමා නීති හදයි කියලා අපි බලාපොරොත්තු වෙනවා, විශ්වාස කරනවා. මේවා පිළිබඳව පරිපාලන බලධාරීන්ටත් වගකීමක් තිබෙනවා. සමහර ස්ථානවල ආගම පෙන්වලා මේ විධියට ව්‍යාපාර හදා ගන්නවා. පසුගිය කාලයේත් එවැනි ප්‍රශ්නයක් ඇති වුණා. පසුගිය කාලයේ අම්බුලුවාව ජෙව විවිධත්ව සංකීර්ණ භාරයක් ඇති කළා, ආගමේ නාමයෙන්. එදා පාලිත රංගෙ බණ්ඩාර හිටපු මන්ත්‍රීතුමා කියනවා, 2009දී අක්කර 927ක් ඒ වෙනුවෙන් වෙන් කළා කියලා. ඒ පිළිබඳව කටයුතු කරනකොට නිලධාරීන්ට මොකක්ද වෙන්නේ? නිලධාරීන් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට ගෙන්වනවා, පාර්ලිමේන්තුවට යෝජනා ගෙනෙනවා. අවසානයේ Supreme Court එකට යනවා. නිලධාරීන් මේ පිළිබඳව කටයුතු කරන්න යනකොට, ඒ අයට Supreme Court එකට යන්න වෙලා තිබෙනවා.

ඒ වාගේම මේ ආණ්ඩුකාරවරුන් කරන වැඩ බලන්න. ආණ්ඩුකාරවරුන් තමන්ට නැති බලයක් ආරෝපණය කර ගන්නවා. මැතිවරණ නීතිය ක්‍රියාත්මක වෙන වෙලාවක කිසිවෙකු ප්‍රවර්ධනය කරන්න බැහැ. නමුත්, මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා සම්බන්ධීකරණ නිලධාරියෙක් දමනවා. ජනාධිපතිවරයා කරන්නේ මොකක්ද? වැඩ වර්ජනය නොකළ අයට උසස්වීම් දෙන බව කියනවා. අපි අධිකරණ ඇමතිතුමාගෙන් අහනවා, වැඩ වර්ජනය නොකළ අයට උසස්වීම් දෙන්න පුළුවන් නම්, increment එකක් දෙන්න පුළුවන් නම්, මේ රටේ මූලික අයිතිවාසිකම් කඩවීමක් වෙනවා නේද කියලා. සමාන රැකියා කරන අයට වෙනස් ලෙස සලකා, උසස්වීම් හා increments දෙන්නේ මොන පදනම්ින්ද? ඒ නිසා ජනාධිපතිවරයාගේ ඉඳලා ම සිටින අය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුව දක්වා නීතිය කඩා බිඳ දමනවා. පරිපාලන නිලධාරීන්ට ස්වාධීනව රටේ පරිපාලනය කරගෙන යන්න දෙන්න. ඔවුන් අපහසුතාවට පත් කරන්න එපා කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.20]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, ඉතාම වැදගත්, ප්‍රායෝගික පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව.

විශේෂයෙන්ම ජාතිවාදය, අන්තවාදය, ආගම්වාදය ගැන කථා කරනකොට, අපට මෑත ඉතිහාසයේ මතක් වෙන කරුණු දෙකක් තිබෙනවා. එකක් තමයි, වසර 30ක කුරිරු යුද්ධය. දෙවැනි එක තමයි, මේ මෑතකදී සිදු වෙච්ච ඒ මිලේච්ඡ පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය කියන්නේ අමතක කරන්න අමාරු දෙයක්. ඒකට හේතුව, මේ රටේ අහිංසක ජීවිත 300කට ආසන්න සංඛ්‍යාවක් ඒ ප්‍රහාරයෙන් නැති වුණා. ඒ වාගේම, 500කට ආසන්න සංඛ්‍යාවක් ආබාධිත වුණා. එවැනි පිරිසක් අදටත් වේදනාව තුළම ජීවත් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි අවස්ථාවක තමයි මේ ආණ්ඩුව බලයට ආවේ, ඒ පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයට ලක් වෙච්ච චින්දිතයන්ට සාධාරණයක් ඉෂ්ට කරනවා කියලා. ඒ අනුව ජනාධිපති පරීක්ෂණ කොමිසමක් පත් කළා. නමුත්, ඒ ජනාධිපති

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

පරීක්ෂණ කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ ජනාධිපති පරීක්ෂණ කොමිසමේ වාර්තාවේ පැහැදිලිවම තිබෙනවා, පොලිසියේ උසස් නිලධාරීන්, බුද්ධි අංශවල උසස් නිලධාරීන් පිළිබඳව පරීක්ෂණ කරන්න, ඒ අය පිළිබඳව ඒ අදාළ ආයතන හරහා පරීක්ෂණ ක්‍රියාත්මක කරලා දණ්ඩ නීති සංග්‍රහය යටතේ ඒ අයට විරුද්ධව නඩු පැවරිය හැකි නම්, නීතිපතිතුමාට ඒ අනුව කටයුතු කරන්න කියලා. නමුත්, ඒ කිසිම දෙයක් සිදු වෙලා නැහැ. මේ ආණ්ඩුව එදා ජන වරමක් - mandate එකක් - ගත්තේ සාධාරණයක් ඉෂ්ට කරනවා කියලායි. එහෙම ජන වරමක් ගත්තත්, නොගත්තත් මේ රට පාලනය කරන රාජ්‍ය යන්ත්‍රණයට, මේ රට පාලනය කරන රජයට මේ සම්බන්ධව වගකීමක් තිබෙනවා. මොකද, මරණයට පත් වුණේ කතෝලික ජනතාව පමණක් නොවෙයි. මරණයට පත් වුණේ, ශ්‍රී ලාංකීය ජනතාව පමණක් නොවෙයි. විදේශ සංචාරකයන් පවා ඒ සිද්ධියෙන් මරණයට පත් වුණා. ඒ අයට සාධාරණයක්, යුක්තියක් ඉෂ්ට කිරීමේ වගකීම රජයට තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ඒ දේ සිදුවන බවක් අපි දකින්නේ නැහැ. ඒක තමයි, පළමුවැනි ප්‍රශ්නය.

දෙවැනි ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම මේ පිළිබඳව මැතිවරණ වේදිකාවල තප්පුලලා මේ රටේ අන්තවාදය මතු කරලා, මේ රටේ සිංහල ජනතාව අතරත් මුස්ලිම් ජනතාව අතරත් වෛරයක්, ක්‍රෝධයක් ගොඩනහන්න යම් පිරිසක් කටයුතු කළා. ඒ අයගෙන් බහුතරයක් අද ආණ්ඩුවේ ඉඳගෙන ඉන්නවා. ඒ තුළින් තමයි ඥාති ඝාතීන් ගොඩ නඟලා ඔහුට විරුද්ධව ඇඟිල්ල දිගුකරලා, අනික් පැත්තෙන් වද කොත්තු, වද බ්‍රෙසියර් ගැන කථා කරලා මේ රටේ වෛරීය දේශපාලනයක් ගොඩනඟලා අපේ සමස්ත ජනතාව තුළ තිබුණු එකමුතුකම නැති කරන්න කටයුතු කෙරුවේ. ඒ පිරිස එක පැත්තකින් මිනීමැරුවා, අනෙක් පැත්තෙන් අපේ රට බෙදන්න කටයුතු කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත්, ඒ දෙකටම සාධාරණයක් ඉෂ්ට කරන්න මේ ආණ්ඩුවට සැලැස්මක් නැහැ කියන එක අද තහවුරු වෙනවා.

ඒ විතරක් නොවෙයි. අවුරුදු 30ක් පුරා මේ රටේ තිබුණු යුද්ධය අවසන් වුණත්, උතුරු-නැඟෙනහිර ඉන්න අපේ ද්‍රවිඩ ජනතාවට අද වෙනකල් සාධාරණයක් ඉෂ්ට වෙලා නැහැ. අපි දැක්කා, LLRC වාර්තාව. එහි නිර්දේශ තවම ක්‍රියාත්මක වෙලා නැහැ. සංහිඳියාව ගොඩනඟන්න, උතුරු-නැඟෙනහිර ජීවත් වන ජනතාවගේ ජීවිතය ගොඩනඟන්න, උතුරු-නැඟෙනහිර ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් නඟා සිටුවන්න, පාසල් ටික නඟා සිටුවන්න, රෝහල් ටික නඟා සිටුවන්න කටයුතු කරලා නැහැ. අද මේ ආණ්ඩුව අපේ ඒ අහිංසක ද්‍රවිඩ ජනතාව අමතක කරලා තිබෙනවා කියන එක පැහැදිලියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එක පැත්තකින් අන්තවාදය, ජාතිවාදය එකතු කර ගත් දේශපාලන ක්‍රියාදාමයක් සිදු වෙනවා. ඒ ක්‍රියාදාමය තුළ සමහරුන් දේශපාලන වාසි ලබා ගන්නවා. එක කණ්ඩායමක් සිංහල ජනතාව නියෝජනය කරනවා කියලා කථා කරලා ද්‍රවිඩ, මුස්ලිම් ජනතාව දේශපාලන වශයෙන් තළාපෙළන්න කටයුතු කරනවා. අනෙක් පැත්තෙන් මුස්ලිම් ද්‍රවිඩ ජනතාව ඉලක්ක කරගත් කණ්ඩායමක් ඔවුන් වෙනුවෙන් පෙනී සිටිනවා කියලා ඒ අයගේ ඡන්ද ටික ලබා ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටේ පැහැදිලිව පෙනෙන්න තිබෙන්නේ ඒ බෙදීම ඇති කරලා ඒ තුළින් දේශපාලන වාසි ලබා ගැනීමක්. අපි ඒ පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. මොකද, දේශපාලන වශයෙන් ගත්තත් අද අපේ රට ජාතීන් හැටියට, ආගම් හැටියට බෙදිලා හමාරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පාසල් පද්ධතිය ගත්තත් එහෙමයි. මම විශ්වාස කරන්නේ අපට ද්‍රවිඩ, මුස්ලිම් විධියට ජාතීන් වශයෙන්, ඒ වාගේම ආගම් වශයෙන් බෙදිච්ච පාසල් අවශ්‍ය වෙන්නේ නැති බවයි. අපට අවශ්‍ය වෙන්නේ සමස්ත ජාතීන්, ආගම් එකතු වෙච්ච තරුණ පිරිසක් ගොඩනහන්න පුළුවන්, අධ්‍යාපනය ලබා දෙන්න පුළුවන් පාසල් පද්ධතියක්. දේශපාලන පක්ෂත් ඒ ආකාරයට බෙදිලා දේශපාලනය කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ කියා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද කනගාටු වෙනවා. මම ඇත්ත වශයෙන්ම සමාව ඉල්ලනවා. ඊට හේතුව මෙයයි. එදා මේ පාර්ලිමේන්තුවට -ගරු සභාවට- ඉදිරිපත් වුණා, Online Safety Bill එක. මම පෞද්ගලිකව දැක්කා, ඒ Online Safety Bill එක වැදගත් කියලා. නමුත් එදා අපට ඒක පෙන්නුවේ, මහා බිල්ලෙක් හැටියටයි. මේ ළඟදී මුහුණුපොතේ ගිය අපහාසාත්මක පළ කිරීමක් පිළිබඳව පැමිණිල්ලක් දාන්න මම අපරාධ පරීක්ෂණ දෙපර්තමේන්තුවේ උසස් නිලධාරියෙකුට කථා කළා. මම එම නිලධාරියාට කථා කරලා ඇහුවා, Online Safety Bill එක යටතේ මට මේ පැමිණිල්ල දාන්න පුළුවන්ද කියලා. ඒ උසස් නිලධාරියා මගෙන් ඇහුවා, "මන්ත්‍රීතුමා, අනිවාර්යයෙන් ඔබට පැමිණිල්ල දාන්න පුළුවන්. හැබැයි, ඔබතුමා මේකට විරුද්ධ වුණා නේද?" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලජ්ජා හිතුණා. මොකද එදා අපට බිල්ලෝ මවලා පෙන්නුවා, Online Safety Bill එක හරහා අපේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය නැති වෙනවා, අපට දේශපාලනය කරන්න බැරි වෙනවා, මේ අපි කරන කියන දේවල් නිසා අප ගෙන ගිහිල්ලා හිරේ විලංගුවේ දානවා කියලා. හැබැයි මට ඒ නිලධාරියා පැහැදිලි කළා, තවමත් ඒ Online Safety Bill එකෙන් පත් කරන්න යෝජනා කරපු කමිටුව පත් කරලා නැහැ කියලා. මම රජයෙන් ඉල්ලීමක් කරනවා, Online Safety Bill එකෙන් පත් කරන්න යෝජනා කරපු ඒ කමිටුව පත් කරන්න කියලා. සමාජ මාධ්‍ය ඔස්සේ අසත්‍ය ප්‍රකාශ කරන පුද්ගලයන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ඊට අවශ්‍ය පසුබිම හදලා දෙමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කනගාටු වෙනවා, මම සමාව ඉල්ලනවා, මේ Online Safety Bill එකට විරුද්ධව ඡන්දය ලබා දීම පිළිබඳව. එදා පක්ෂයෙන් කරපු ඉල්ලීම මත අපට ඒක කරන්න සිදු වුණා. මේ මොහොතේ රටේ තිබෙන උද්ඝෝෂණ රැල්ල බලන්න. ඊයේ පැවති Sri Lanka Railways එකේ උද්ඝෝෂණය නිසා අහිංසක පුද්ගලයෙක් මරණයට පත් වුණා. පසුගිය කාලයේ පැවති අරගළය නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ගෙවල් ගිනි තිබ්බා. මහ පාරෙදි ගහලා එක මන්ත්‍රීවරයෙක් මැරුවා.

බල්ලෝ, බළල්ලු වාගේ මේ විධියට රටේ මිනිස්සුන්ගේ ජීවිත බිල්ලට ගන්න, පාරේ මරලා දාන්න පසුබිම සකසන නිලධාරීන්ට විරුද්ධවත් නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ නිසා අපි පැහැදිලිව රජයෙන් ඉල්ලා සිටිනවා, මේ වර්ජනයට සම්බන්ධ වුණු නිලධාරීන්ගේ වැඩ තහනම් කරන්න, ඒ අය ඉවත් කරන්න කියලා. මොකද, අහිංසක ජීවිතයක් තමයි නැති වෙලා තිබෙන්නේ. අයිතිවාසිකම් දිනා ගත යුත්තේ අහිංසක මිනිස්සු මරලා නොවෙයි කියන කාරණය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අද දින දිවා ආහාර විවේකයෙන් තොරව විවාදය පවත්වාගෙන යෑමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 12.29]

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
(மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்)
(The Hon. S.M.M. Muszhaaraff)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ ஹேசா விதானகே அவர்கள் கொண்டுவந்திருக்கின்ற மதத் தீவிரவாதத்தைத் தடுப்பதன் அவசியம் பற்றிய தனிநபர் பிரேரணையை நான் முதலில் வரவேற்கின்றேன். அத்தோடு, எனக்கு முன்னர் உரையாற்றிய கௌரவ கவிந்த ஜயவர்தன அவர்கள் கருத்துத் தெரிவிக்கும்போது, Online Safety Bill தொடர்பாகச் சொன்னார். அரசாங்கம் Online Safety Billஐக் கொண்டுவந்தபோது, கௌரவ கவிந்த ஜயவர்தன உட்பட எதிர்க்கட்சியில் இருந்த எவருமே அதற்கு ஆதரவளிக்க வில்லை. அதுவொரு பாதகச் செயலென எண்ணி எதிர்த் தார்கள். இன்று அவர் practicalஆக சவாலைச் சந்திக்க நேர்கின்றபோது, அந்தச் சட்டமூலத்தை எதிர்த்தமைக்காக மனம் வருந்துகிறார். அதற்காக நான் அவரைப் பாராட்டு கின்றேன்.

கௌரவ ஹேசா விதானகே அவர்கள் கொண்டுவந்துள்ள இந்தப் பிரேரணையைப் பற்றி கூற வேண்டும். அதாவது, மதத் தீவிரவாதம் அல்லது மதத்தின் பெயரால் நடக்கின்ற பயங்கர வாதத்தை ஒழிப்பதற்கான ஒரு சட்டத்தை உருவாக்க வேண்டுமாகவிருந்தால், அதற்கு அடிப்படைச் சட்டமாக அமைவது இந்த Online Safety Billதான் என்பதை நான் இங்கு சொல்ல ஆசைப்படுகின்றேன். இந்த Online Safety Bill ஊடாகத்தான் மதவாதக் கருத்துகள் அல்லது வெறுக்கத்தக்க பேச்சுகள் பேசுபவர்களைக் கட்டுப்படுத்த முடியும். அவ்வாறானதொரு சட்டம் இங்கு கொண்டுவரப் பட்டபோது, எதிர்க்கட்சியில் அமர்ந்திருக்கின்றோம் என்பதற் காக அதை எதிர்த்துவிட்டு, இன்று இந்த விடயத்துக்காக புதிய சட்டமொன்றைக் கொண்டுவாருங்கள் என்று சொல்கிறார்.

கௌரவ ஹேசா விதானகே போன்றவர்களுக்கு நான் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். நல்ல விடயங்கள் முன்மொழியப்பட்டு, அவை சட்டமூலங்களாகப் பாராளு மன்றத்துக்குக் கொண்டுவரப்பட்டால், எதிர்க்கட்சியில் இருக்கிறோம் என்பதற்காக அவற்றை எதிர்க்கின்ற ஒருவராக நீங்கள் இருக்கும் பட்சத்தில், இத்தகைய பிரேரணையைக் கொண்டுவருவதில் அர்த்தமில்லை. வைத்தியர் ஜயலத் ஜயவர்தன அவர்களின் மகனான கௌரவ கவிந்த ஜயவர்தன அவர்கள் Online Safety Billக்கு ஆதரவளிக்கவில்லை என்பதற்கு மனம் வருந்தியதுபோல, மதத்தின் பெயரால் பயங்கரவாதத்தை உருவாக்குகின்ற விடயங்களுக்கு எதிராக ஒரு சட்டமூலம் இங்கு கொண்டுவரப்படும்போது, கட்சியின் தலைமைகள் எதிர்க்கச் சொல்கிறார்கள் என்பதற்காக உங்களுடைய கட்சியினர் அதை எதிர்ப்பீர்களாக இருந்தால், நீங்கள் இத்தகைய முன்மொழிவுகளைச் செய்வதில் எந்தவோர் அர்த்தமும் இல்லை.

இன்று நாங்கள் மதத்தின் பெயராலான பயங்கரவாதம் பற்றிப் பேசுகின்றோம். இந்தச் சபையில் பேசிய பெரும் பாலானவர்களின் உரைகளில், "முஸ்லிம் பயங்கரவாதம்" என்ற கருத்து மேலோங்கி இருந்ததைப் பார்க்கக்கூடியதாக இருந்தது. முதலில் "முஸ்லிம் பயங்கரவாதம்" அல்லது "இஸ்லாமிய பயங்கரவாதம்" என்ற வார்த்தைகள் இந்த உயர் சபையில் பயன்படுத்தப்படுவது தவிர்க்கப்பட வேண்டும். இன்று "முஸ்லிம் பயங்கரவாதம்" என்று சொல்லப்படுவதெல்லாம் ஒரு சதியாகும். "முஸ்லிம் பயங்கரவாதம்" அல்லது "இஸ்லாமோ போபியா" என்ற சொல்லுக்கு எதிராக இன்று நாங்கள் அறப் போராட்டம் செய்துகொண்டு இருக்கின்றோம். இரண்டாம் உலக மகா யுத்தம் வரையிலும் இந்த உலகத்தில் முஸ்லிம்கள் பயங்கரவாதிகளாக இருக்கவில்லை. நாஜிகள் பலஸ்தீனில் யூதர்களைக் குடியேற்றிவிட்டு, அவர்களுக்கான புகலிடத்தைக் கொடுக்கும்போது, அங்குள்ள முஸ்லிம்கள் அதற்குத் தடையாக இருந்தார்கள். உலகத்தில் முஸ்லிம்களைப் பயங்கரவாதிகளாகச் சித்தரிப்பதன் ஊடாகத்தான் பலஸ்தீனை சின்னாபின்னப் படுத்தலாம் என்ற ஓர் அரசியல் சதியால்தான் "இஸ்லாமோ போபியா" என்பது உருவாகியது.

அதன் பின்னர், ஏனைய நாடுகளில் அவர்களுக்கு அரசியல் ரீதியாக ஏதேனும் ஒரு விடயத்தைச் செய்ய வேண்டுமாக இருந்தால், அவர்கள் "இஸ்லாமோ போபியா" அல்லது "முஸ்லிம் பயங்கரவாதம்" என்ற சொல்லைப் பயன்படுத்தி, இஸ்லாத்துக்கு எதிராக நடந்துகொள்கிறார்கள். ஆனால், முஸ்லிம்கள் பயங்கரவாதிகள் அல்லர் என்பதை நான் இங்கு தெளிவுபடுத்த விரும்புகின்றேன். "சகிப்புத் தன்மையுடன் பன்மைத்துவத்தை அங்கீகரித்துச் செல்வதே ஒற்றுமைக்கு வழிவகுக்கும்" என்றும் "ஒருவரையொருவர் பரஸ்பரம் அறிமுகமாகிக் கொள்வதற்காகவே அல்லாஹ் மனிதர்களைப் பல்வேறுபட்ட சமூகங்களாகவும் கோத்திரங்களாகவும் படைத்துள்ளான்" என்றும் அல்-குர்ஆன் மிகத் தெளிவாகக் குறிப்பிடுகின்றது. அதேபோல, "ஒருவருக்கொருவர் பரிகாசம் செய்ய வேண்டாம்" என்றும் "ஒருவரையொருவர் இழிவாகக் கருதி குறை கூற வேண்டாம்" என்றும் ஸூரா ஹுஜுராத்தின் 11ஆவது வசனம் தெரிவிக்கின்றது. இவற்றைவிடவும், அல்-குர்ஆனில் குறிப்பிடப்பட்டு இருக்கின்ற மிக முக்கியமான விடயம் என்னவென்றால், "மார்க்கத்தில் நிர்ப்பந்தமோ, பலாத்காரமே கிடையாது" என்பதுதான்.

'ஈஸ்டர்' குண்டுத் தாக்குதலை முதன்மைப்படுத்தி, பலரும் "முஸ்லிம் பயங்கரவாதம்" என்று பேசுகிறார்கள். 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் பிரதான சூத்திரதாரி - "මහ මොළකාරයා" - யார் என்பதைக் கண்டுபிடிப்பதற்காக மேற்கொள்ளப்பட்ட எல்லா ஆய்வுகளின் அறிக்கைகளிலும், முஸ்லிம்கள் "මහ මොළකාරයා" இல்லை என்பதாகச் சொல்லப்பட்டு இருக்கின்றது. இந்தக் குண்டுத் தாக்குதலுக்கு நேரடிக் காரணம் முஸ்லிம்கள் அல்லர், இதற்குப் பின்னால் யாரோ ஒருவர் இருக்கின்றார், இதில் அரசியல் சதி இருக்கின்றது, தேசிய சதி இருக்கின்றது, சர்வதேச சதி இருக்கின்றது என ஆய்வறிக்கைகள் சொல்கின்றன. நாங்களும் அதைத்தான் கூறுகின்றோம். உலகம் முழுவதும் எவ்வாறு முஸ்லிம்கள் பயன்படுத்தப்படுகின்றார்களோ, அவ்வாறு சில குழுக்கள் இந்த நாட்டில் குழப்பத்தை உண்டு பண்ணுவதற்காகப் பயன்படுத்தப்பட்டன. திகனயில், அம்பாறையில், அளுத்கமையில் முஸ்லிம் சமூகத்துக்கு எதிராக வன்முறை நடைபெற்றபோது, யாராவது "சிங்களப் பயங்கரவாதம்" என்று சொன்னார்களா? என நான் பொதுவாகக் கேட்கின்றேன். இல்லை! எனவே, நாங்கள் "முஸ்லிம் பயங்கரவாதம்", "இஸ்லாமிய பயங்கரவாதம்" என்று சொல்வதை முதலில் நிறுத்திவிட்டு, மதத்தின் பெயராலான பயங்கரவாதத்தை முற்றுமுழுதாக ஒழித்துக்கட்டுவதற்கென நல்ல பல சட்ட மூலங்களைக் கொண்டுவர வேண்டும். அவ்வாறு கொண்டு வருகின்றபோது, எதிர்க்கட்சி உறுப்பினர்களும் அவற்றுக்கு ஆதரவளித்து, அவற்றை நிறைவேற்றுவதற்குத் துணை நிற்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අධිකරණ අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා. ඔබතුමාට පිළිතුරු කථාව සඳහා මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.34]

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ ඉන්න තරුණ, දක්ෂම මන්ත්‍රීවරු හයදෙනෙක් ප්‍රශ්න ඇහුවා. ඒ නිසා මට විනාඩි 10කට වැඩි කාලයක් ගත වෙනවා, ඒ ප්‍රශ්න සියල්ලටම උත්තර දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම සතුටු වෙනවා, මේ සභාවේ ඉන්න බොහොම තරුණ, හදු යෞවනයේ පසුවන, මේ රට ගැන හිතන, ජාතිවාදය, අන්තවාදය, ත්‍රස්තවාදය ප්‍රතික්ෂේප කරන මන්ත්‍රීවරයෙකු විධියට එතුමා අද මේ වැදගත් යෝජනාව මේ සභාවට ඉදිරිපත් කිරීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මම කියන්න ඕනෑ, මේ යෝජනාව සම්බන්ධව කථා කරන අතරතුර පාස්කු ප්‍රහාරය ගැනත් කරුණු මතු කළ බව. ඔබතුමාට මතක ඇති, 2016 නොවැම්බර් මාසයේ 18වෙනි දා මම අධිකරණ ඇමතිවරයා විධියට මේ ආසනයේ ඉඳගෙන කිව්වා, මේ රටේ ත්‍රස්තවාදයක් ක්‍රියාත්මක වෙනවා කියලා. එහිදී මම අදහස් කළේත් නැහැ, කිව්වේත් නැහැ, ඒක මුස්ලිම් ත්‍රස්තවාදයක් හෝ ඉස්ලාමීය ත්‍රස්තවාදයක් කියලා. ඒක නොවෙයි මම කිව්වේ, සමහර මන්ත්‍රීතුමන්ලාට එහෙම කියැවුණාට. "වහබ්වාදය පිළිබඳව අන්තයට ගිය මරාගෙන මැරෙන කණ්ඩායමක් මේ රට ලේ විලක් කරන්න සූදානමින් ඉන්නවා" කියන කාරණය මම මතක් කළා. ඒ කාරණය මතක් කරලා මම කිව්වා "ඒක අපි නතර කරනවා" කියලා. අපි ඒ වනකොට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මකවීම අත්හිටුවලා තිබුණේ. හැබැයි, මම කිව්වා මේ ව්‍යසනය ඇතිවීම වළක්වන්න අපි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වුණත් ක්‍රියාත්මක කරනවා කියලා.

ගරු මේෂා චිතානගේ මන්ත්‍රීතුමනි, එහෙම කියපු දවසට පහුවදාම ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ හිටපු, අපේ ආණ්ඩුවේ හිටපු කැබිනට් මාධ්‍ය ප්‍රකාශකතුමා ඇතුළු ආණ්ඩුවේ ඇමතිවරු, මන්ත්‍රීවරු කණ්ඩායමක් මාධ්‍ය සාකච්ඡාවක් තියලා - මේෂා මන්ත්‍රීතුමාට මතක ඇති - විශාල ප්‍රහාරයක් එල්ල කළා, විජයදාස රාජපක්ෂ පාර්ලිමේන්තුවේදී බොරු කියලා, ජාතිවාදය අදිනවා කියලා. ලේ දකින්න ආසා කෙනෙක්, ජාතිවාදියෙක්, ත්‍රස්තවාදියෙක් කියලා මට ලේබල් ඇලෙව්වා. එහෙම කියපු අය දැනටත් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම කරලා ඒ පිළිබඳව කිසි පියවරක් ගත්තේ නැහැ. ඊට ටික කාලයකට පසුව මට කැබිනට් මණ්ඩලයෙනුත් එළියට වැටෙන්න සිද්ධ වුණා. හැබැයි, මම ඒ ප්‍රකාශය කරලා මාස 29යි, දවස් 3කට පස්සේ පාස්කු ප්‍රහාරය සිද්ධ වුණා. ඒ ප්‍රහාරයෙන් 271ක් මිය ගියා; 500කට වැඩිය අහිංසක ජනතාව, බැතිමතුන්, දේවස්ථානවල හිටපු අය, හෝටල්වල හිටපු අහිංසක මිනිස්සු තුවාල ලැබුවා. මේ රටේ මෑත කාලයේදී ඇති වුණු ඉතා භයානක ව්‍යසනයක් ඇති කළ ත්‍රස්තවාදී ක්‍රියාව විධියට අපි ඒක සලකනවා.

ත්‍රස්තවාදය කුමක් මත පදනම් වුණත් ත්‍රස්තවාදයමයි. ඒකට ආගම පදනම් වෙන්න පුළුවන්, ජාතිය පදනම් වෙන්න පුළුවන්, භාෂාව පදනම් වෙන්න පුළුවන්. අවුරුදු 30ක් තිස්සේ මේ රටේ එල්ටීටීඊ යුද්ධය පැවතුණා. ඒකත් අන්තවාදයක්. ඒ නිසා අන්තවාදය කියන එක කොතැනක තිබුණත්, කවුරු කළත් අපි ප්‍රතික්ෂේප කරන්න ඕනෑ.

ඒක වැළැක්වීම සඳහා ගතහැකි සෑම පියවරක්ම ගන්න ඕනෑ. ඒ සඳහා පාර්ලිමේන්තුවට තිබෙන වගකීම එසේ මෙසේ එකක් නොවෙයි. පාස්කු ඉරු දින ප්‍රහාරය සිද්ධ වුණාට පස්සේ අපි එදා හිටපු ජනාධිපතිතුමාට කිව්වා, "මේ පිළිබඳ පූර්ණ පරීක්ෂණයක් පවත්වන්නට ඕනෑ. ඒ නිසා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කරන්න" කියලා. ඒ, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සභාපතිවරයා විධියට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු ජනක් ද සිල්වා මැතිතුමා පත් වුණා. ඊට පස්සේ ඒ කොමිසමේ සාක්ෂි සටහන් කර ගැනීම දීර්ඝ කාලයක් තිස්සේ සිද්ධ වුණා. මමත් දවස් දෙකක් ඒ කොමිසමේ සාක්ෂි දුන්නා. අවසානයේ, ඒ වාර්තාව නිකුත් කළා. ඒ වාර්තාව නිකුත් කළාට පස්සේ ඒ මත නීතිපතිවරයා නඩු පැවරීම සඳහා ක්‍රියා කර තිබෙනවා. මගේ මතකයේ හැටියට, චූදිතයෝ 81ක් නඩු 40ක් වාගේ ප්‍රමාණයක්. ප්‍රධාන නඩුවේ දැන් සාක්ෂිකරුවන් විශාල සංඛ්‍යාවකගෙන් ප්‍රශ්න කරලා, නඩු විභාගය ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් හමුවේ පවතිනවා.

ගරු මේෂා චිතානගේ මන්ත්‍රීතුමනි, එක කාරණයක් මම මතක් කරන්න කැමැතියි. ඒ කොමිෂන් සභා වාර්තාවේ පැහැදිලිවම කියනවා, "එවකට නීතිය ක්‍රියාත්මක කරපු ආරක්ෂක අංශ මම එදා පාර්ලිමේන්තුවේ කියපු දේ බරපතළ ක්‍රියාවක් ලෙස සැලකුවා නම්, ඒ පිළිබඳව අඩු ගානේ සොයා බැලුවා නම්, ඔය මිය ගිය 271දෙනාම අද ජීවතුන් අතර, අනතුරු සිදු වුණු 500දෙනාම නිරුපද්‍රිතයි. එහෙනම් මේ ප්‍රහාරය වළක්වාගන්න ඕනෑ තරම් ඉඩකඩ තිබුණා" කියලා. ඒ වාගේ අනතුරක් වන එක වළක්වන්න ගිහිල්ලා තමයි මම එදා එළියට වීසි වුණේ. ඔබතුමන්ලා ඒ කාරණය දන්නවා. ඒ අන්තවාදය වළක්වන්න අපි කටයුතු කරන්න ඕනෑ.

මේ අන්තවාදය කියන එක දේශපාලනයත් එක්ක මිශ්‍ර වෙලා තිබෙන්නේ. අපට ජාතිවාදය, ආගම්වාදය, භාෂාවාදය -මේවා- හුදකලාව වෙනම විග්‍රහ කරන්න බැහැ. මේ ඔක්කොම දේශපාලනයත් එක්ක ගැට ගැහිලා තිබෙන්නේ. ඇත්තටම මේ ක්‍රමය අපට අහම්බෙන් ලැබුණු එකක් නොවෙයි. බ්‍රිතාන්‍ය පාලකයෝ අපට නිදහස දෙන්න කලින් මේ රටේ මූල බීජ පැළ කරලා ගියේ. ඔබතුමාට බලන්න පුළුවන්, library එකෙත් පොතක් ඇති, "Communal Politics under the Donoughmore Constitution" කියලා. එය, බ්‍රිතාන්‍ය ජාතික කාන්තාවක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධියට කරපු නිබන්ධය. ඇයගේ නම ජේන් රසල්. ජේන් රසල් මහත්මිය මේ ග්‍රන්ථයේ පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා, මේ රටේ ජාතිවාදී දේශපාලනය. Donoughmore Constitution එකෙනුත් ජාතිවාදය ඇති කළා. ඊට පෙර තිබුණු කෝල්බෘක් කැමරන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනුත් මේ රටේ ජාතිවාදිය පැලපදියම් කළා. මූල බීජය එහි තිබෙන්නේ. පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් - Commonwealth countries- 60ගණනකට ඒ ගොල්ලන්ට නිදහස දෙන්න සිද්ධ වුණා. හැබැයි, ඒ රටවල්වලට නිදහස දෙනකොට ලංකාවට අනෙක් රටවලට අනුගමනය නොකරපු වෙනම ක්‍රමයක් අනුගමනය කර තිබෙනවා. ඒක තමයි අපට - සිංහලයන්ට, ද්‍රවිඩ අයට, මුස්ලිම් අයට- දුන් මැතිවරණ ක්‍රමය. සිංහලයා දෙකට බෙදුවා. ඒ කියන්නේ, උඩරට සිංහල, පහතරට සිංහල කියලා. මන්ත්‍රීවරු නියෝජනය එන්නේ ජාතිවාදී පදනම මත. ඒ ජාතිවාදී පිළිලය -පිළිකාව- අපේ නීති පද්ධතියෙත්

පැලපදියම් වෙලා තිබෙනවා. අද අපේ රටේ දේශපාලන පක්ෂ තිබෙන්නෙත් ඒ විධියට. සිංහල පක්ෂ, දෙමළ පක්ෂ, මුස්ලිම් පක්ෂ කියලා. මේ විධියට පක්ෂවල නම් තියාගෙන තිබෙනවා. දැන් වෙනත් ජාතියක නම සහිත පක්ෂයකට ඡන්දයක් දෙන්න මට පුළුවන්ද? එතකොට සිංහල පක්ෂය කියලා එකක් මම හදා ගත්තොත් මේ ද්‍රවිඩ මන්ත්‍රීතුමන්ලාට, ද්‍රවිඩ ජනතාවට පුළුවන්ද මගේ පක්ෂයට ඡන්දයක් දෙන්න? එහෙනම්, අපේ රටේ මැතිවරණ නීතිය සම්පූර්ණයෙන්ම මකලා හදන්න ඕනෑ. මේ ජාතිවාදී ක්‍රමයට පක්ෂ හදනකල් ප්‍රජාතන්ත්‍රවාදය මරලා, වළ දාලා තිබෙන්නේ. ප්‍රජතන්ත්‍රවාදය ඔළුව උස්සන්න නම් මේ රටේ ජාතිවාදී, ආගම්වාදී පක්ෂ ක්‍රමය නැති කරන්න ඕනෑ. ඇයි, අපට එතැනට එන්න බැරි?

අපේ අල්ලපු රටේ භාරතීය ජනතා පක්ෂය, ඉන්දියානු ජාතික කොංග්‍රසය තිබෙනවා. එතැන ජාතිවාදය නැහැ, ආගම්වාදය නැහැ. එංගලන්තයේ ලේබර් පක්ෂය තිබෙනවා, කොන්සර්වේටිව් පක්ෂය තිබෙනවා, ලිබරල් පක්ෂය තිබෙනවා. ඇමරිකාවේ ගත්තත් එහෙමයි. මේ මොන ප්‍රජාතන්ත්‍රවාදී රටකවත් නැති ක්‍රමයක් - ජාතිවාදය, ආගම්වාදය, භාෂාවාදය- අපේ රටේ නීතිගත කරලා, ඒවා නීතියට කාවද්දලා අපි එළියට ඇවිල්ලා මේක නැති කරන්න ඕනෑය කියලා කෑ ගැහුවාට එහෙම කරන්න බැහැ. එහෙනම්, අපි මේ නීති පද්ධතිය වෙනස් කරන්න ඕනෑ.

මේ රටේ හිටපු දේශපාලන නායකයෝ අවස්ථාවාදීන් විධියට වරින්වර ආණ්ඩුක්‍රම හදනකොට, වරින්වර ආණ්ඩුක්‍රම සංශෝධනය කරනකොට ජාතිවාදී සහ ආගම්වාදී ක්‍රම තවදුරටත් වර්ධනය වෙන්න පුළුවන් විධියට ඉඩ හැරලා ඒවා කරලා තිබෙනවා. රටේ වාසිය තකා නොවෙයි, තමන්ගේ වාසිය තකා තමයි එහෙම කරලා තිබෙන්නේ. රටේ යහපත තකා නොවෙයි, එක්කෝ තමන්ගේ යහපතට, එහෙම නැත්නම් පක්ෂයේ යහපතට. එම නිසා අන්තවාදය කියන එක මොන ස්වරූපයෙන් ආවත් ඒකට හිස ඔසවන්න දෙන්න හොඳ නැහැ. ඔබතුමන්ලා තරුණ මන්ත්‍රීවරු විධියට, අනාගතය භාර ගන්න ඉන්න උදවිය විධියට මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරලා කටයුතු කරන්න. මේ ඉදිරිපත් කරපු යෝජනාව මෙතැනින් නතර කරන්නේ නැතුව මේකට අවශ්‍ය නීති ප්‍රතිපත්ති සම්පාදනය කරන්න කටයුතු කරමු. මේ පාර්ලිමේන්තුවේ තිබුණා අවුරුදු 13ක් තිස්සේ මැතිවරණ ප්‍රතිසංස්කරණ කමිටුවක්. මම මන්ත්‍රීවරයෙක් වෙන්න කලින්, පුරවැසියකු විධියටත් ඇවිත් ඒකට සාක්ෂි දුන්නා. ඒ වාර්තා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒවා තවත් දියුණු වෙන්න ඕනෑ. ඒ මතවාද තවම ක්‍රියාත්මක වෙලා නැහැ. එම නිසා තරුණ මන්ත්‍රීවරු විධියට ඔබතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිනවා මේ මන්ත්‍රී සංසදය හදලා මේ රටේ අන්තවාදය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්න කටයුතු කරන්න කියලා. ඒ සඳහා අපේ කැපවීම නොඅඩුව ඔබතුමන්ලාට ලැබෙනවා. ඒ සඳහා අපිත් උත්සාහ දරනවා.

පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳව මම මීට පෙරත් සඳහන් කළා. පාස්කු ඉරු දින ප්‍රහාරය ගැන පොලීසිය පරීක්ෂණ කළා. විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවකුත් පත් කළා. ඒ වාගේම තවත් කොමිෂන් සභා පත් කරලා තිබෙනවා. හැබැයි, මොන කොමිෂන් සභා පත් කළත් ප්‍රශ්නයක් තිබෙනවා. තවම චින්දිත පාර්ශ්වය, එහෙම නැත්නම් රටේ සාධාරණව හිතන ජන සමාජය මේ පිළිබඳව සැක මතු කරනවා. ඒ සැක අසාධාරණ ඒවා වෙන්න පුළුවන්. ඒ සැකවලට පදනමක් නැති වෙන්න පුළුවන්. හැබැයි, එහෙම සැක තිබෙන එක ඉතා භයානකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමාජයක් තුළ තිබෙන සැක ඔඩු දිවිවාට පසුව කොයි පැත්තෙන් මතු වනවා ද කියන්න දන්නේ නැහැ.

මම මීට පෙරත් කිව්වා, මේ නඩු කටයුතු පැවතියදීත් යම් සාධකයක්, සාක්ෂියක් තිබෙනවා නම් ඒ පිළිබඳව වැඩිදුර පරීක්ෂණ කිරීම යෝග්‍යයි කියලා අපට කල්පනා කරන්න පුළුවන් බව. මම පෞද්ගලිකව විශ්වාස කරනවා, මේ සැක සංකා දුරු කිරීම සඳහා විශේෂයෙන්ම චින්දිත පාර්ශ්ව විධියට සලකන අයගේ-

හැබැයි, මම තමයි පළමුවැනි චින්දිතයා. පාස්කු ඉරු දින ප්‍රහාරය සිදු වුණාට පසුවයි අනෙක් අය චින්දිතයෝ වුණේ. මම මාස 29ක් චින්දිතයා වුණා. "ජාතිවාදියා" කියලා මට විරුද්ධව පත්තර 500ක විතර පළ වෙලා තිබුණා. සමාජ මාධ්‍යවලින් දිගින් දිගටම මට පහර ගැහුවා, ජාතිවාදය අවුස්සනවා කියලා. හැබැයි, එදා මම කරපු ඒ කාර්යයේ තිබෙන සද්භාවයේ තත්ත්වය අද තේරුම් අරගෙන තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මම කෙටියෙන් කියලා අවසන් කරන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, එදා මම ඒ ප්‍රකාශය කළාට පසු මුස්ලිම් ප්‍රජාවගේ ඉහළම ආයතනය වන සමස්ත ලංකා ජම්ඉයියතුල් උලමා සංවිධානයේ 40දෙනෙකුට වැඩි පිරිසක් මා හමු වන්න ආවා. මට මතකයි, ඒ කණ්ඩායමත් එක්ක අසාද් සාලි මහත්මයාත් ආවා. ඇවිල්ලා මට කරුණු ඉදිරිපත් කළා. මට පොත්පත් ඉදිරිපත් කළා. ලිපිලේඛන ඉදිරිපත් කළා. ඒවා ඉදිරිපත් කරලා කිව්වා, "මේ රටේ ඉන්න සාම්ප්‍රදායික මුස්ලිම් ජනතාව නොවෙයි, විදේශීය බලපෑම් ඇති, යම් වහබ්වාදී අදහස් දරන කණ්ඩායම් මේ රටේ මුස්ලිම් ජන ජීවිත විනාශ කරන්න, අඩ පණ කරන්න තමයි මේ කටයුත්ත කරන්නේ. ඒ නිසා ඔබතුමන්ලා කරුණාකරලා ආණ්ඩුවක් විධියට මේක මර්දනය කරන්න" කියලා. ඒක කිව්වේ 2016 නොවැම්බර්, දෙසැම්බර් කාලයේ. නමුත්, අවාසනාවට එවකට හිටපු ආරක්ෂක අංශවලට ඒකේ වැදගත්කමක් දැනුණේම නැහැ. මටත් කැබිනට් මණ්ඩලයෙන් විසි වෙන්න සිදු වුණා, ඒවා මතු කරලා කථා කරපු නිසා; ජාතිවාදයට සහ අන්තවාදයට විරුද්ධව කථා කරපු නිසා. අවසානයේ ඒ අවාසනාවන්ත සිද්ධිය වුණා.

ඒකේ චින්දිත පාර්ශ්වය කතෝලික ජනතාව කියලා සමහරු පටු අර්ථ නිරූපණයක් දෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම වෙන්න බැහැ. අපි දන්නවා වැඩිම කැක්කුම තිබෙන්නේ ඒගොල්ලන්ට තමයි. හැබැයි, මේ රටේ සියලුදෙනාම චින්දිතයෝ. ත්‍රස්තවාදීන් කවුරු හෝ මිනිසුන් මරා දමනකොට අපි හැමෝටම ඒක දැනෙනවා. ශ්‍රී ලාංකීය පුරවැසියෙකුගේ ජීවිත විනාශ කරනකොට අපි කවුරුත් චින්දිතයෝ. ඒකනේ අපරාධ නඩුවකදී රජය නඩු මෙහෙයවන්නේ. නීතිපතිවරයා තමයි නඩු මෙහෙයවන්නේ. මොකද, රටේ අපරාධයක් සිද්ධ කළොත් ඒ අපරාධය මුළු මහත් රටටම ජනතාවට කරන ලද අපරාධයක් විධියට තමයි සලකන්නේ. ඒක නිසා තමයි පොලීසියට, නීතිපති දෙපාර්තමේන්තුවට අපරාධ නඩු මෙහෙය වීමේ බලය ලබා දීලා තිබෙන්නේ.

ඊළඟට, Online Safety Bill එක ගැන කිව්වා. ඒ පිළිබඳව මම සොයා බලන්නම්. ඒ කටයුතු මහජන ආරක්ෂක අමාත්‍යාංශයෙන් කළේ. ඇත්ත වශයෙන් එහි වර්තමාන තත්ත්වය මම දන්නේ නැහැ. ඒ ගැන මම අදාළ ඇමතිතුමාගෙන් අහලා පිළිතුරක් දෙන්නම්.

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි, Online Safety Bill එකට විරුද්ධව ඡන්දය දීලා ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීවරයා සමාව ගත්තා වාගේ ඔබතුමන්ලාත් සමාව ගන්නට ඕනෑ, පුනරුත්ථාපන කාර්යාංශය පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය දීම ගැන. අපි දීර්ඝ වශයෙන් කරුණු සොයා එම පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මේ තිබෙන්නේ එම පනත් කෙටුම්පත. මෙහි තුන්වැනි වගන්තිය මම කියවන්නම්. ඒ මෙසේයි:

"කාර්යාංශයේ පරමාර්ථය, සමාජ-ආර්ථික ප්‍රමිතීන් සකස් කිරීම මාර්ගයෙන්, සඵලදායී ප්‍රතිසංකලනය සහ ප්‍රතිසන්ධානය සහතික කිරීම පිණිස විවිධ ප්‍රතිකාර ක්‍රම යොදා ගැනීමෙන් ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන්, පෙර සටන්කරුවන්, ප්‍රචණ්ඩකාරී අන්තගාමී කණ්ඩායම්වල සාමාජිකයන් සහ ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය අවශ්‍ය වෙනත් යම් තැනැත්තන් කණ්ඩායමක් පුනරුත්ථාපනය කිරීම විය යුතු ය."

මම මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළා. මේක ගැසට් කළේ 2022 සැප්තැම්බර් මාසයේ 09වන දා. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළා කියලා මට විරුද්ධව විශාල විරෝධයක් ආවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පතට විරුද්ධ ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ගණනාවක් ඉදිරිපත් කළා. මම මේ පනත් කෙටුම්පත ගෙනාවා කියලා පාර්ලිමේන්තුවේ පක්ෂ නායකවරු හැමෝම වාගේ මට දෝෂාරෝපණය කළා. හැම පක්ෂයකටම, හැම කෙනෙකුටම ඇහුම්කන් දෙන කෙනෙකු විධියට මම අවසානයේදී මොකක්ද කළේ? මම මේ පනත් කෙටුම්පතේ තුන්වැනි වගන්තිය මෙසේ සංශෝධනය කළා:

"... සඵලදායී ප්‍රතිසංකලනය සහ ප්‍රතිසන්ධානය සහතික කිරීම පිණිස ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් හෝ ප්‍රතිකාර සහ විවිධ ප්‍රතිකාර ක්‍රම යොදා ගැනීම සඳහා ඇතුළත් විය හැකි පුනරුත්ථාපනය අවශ්‍ය තැනැත්තකු..."

ආගමික අන්තවාදීන්, ජාතික අන්තවාදීන් උන්මත්තකකම නිසා කරන දේවල් වළක්වා ඒ අය පුනරුත්ථාපනය කරන්න පුනරුත්ථාපන අධිකාරියට මා බලය දෙන්න ගියාම පාර්ලිමේන්තුවේ සමහරු, විපක්ෂයේ ප්‍රධාන පක්ෂවල නායකයෝ ඔක්කොම වාගේ ඒක අර්ථ නිරූපණය කළා, 'මේකෙන් ප්‍රජාතන්ත්‍රවාදය මර්දනය කරන්න යනවා. අරගළයේ හිටපු මිනිසුන් ටික අල්ලලා හිරේ දමන්න යනවා' කියලා. මෙවැනි නොයෙකුත් මතිමතාන්තර ඉදිරිපත් කරලා තමුන්නාන්සේලා ඒක නැවැත්තුවා. ඇත්ත වශයෙන් ඒක ගැන නම් ඔබතුමන්ලා සමාව ගන්නට ඕනෑ. මට එදා ඒකට ඉඩ දුන්නා නම් ඔබතුමා අද මේ යෝජනාව ගෙන එන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මෙවැනි යෝජනාවක් කවුරුවත් ගෙන එන්නේ නැහැ. ආණ්ඩුව පාර්ලිමේන්තුවට හොඳ පනත් කෙටුම්පතක් ගෙනෙන කොට සාම්ප්‍රදායික වශයෙන් විපක්ෂය -විපක්ෂය වන නිසාම- ඒකට විරුද්ධ වෙන්න හොඳ නැහැ. ඒක, බාල ප්‍රජාතන්ත්‍රවාදය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ කාලයේමයි ගෙනාවේ, මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත් කෙටුම්පත. මැතිවරණ වියදම් නියාමනය කරන්නේ ඇයි? පාතාලේ මිනිසුන්ගේ, කුඩුකාරයන්ගේ, ජාවාරම්කාරයන්ගේ සල්ලි ලැබෙන මිනිස්සු නේ සමහර ප්‍රදේශවල වැඩි මනාප ගන්නේ. ඉතින්, ඒ තත්ත්වය වළක්වා මේ රටේ උගතුන්ට, බුද්ධිමතුන්ට, විශේෂයෙන් තරුණ තරුණියන්ට පාර්ලිමේන්තුවට එන්න ඉඩ කඩ හදන්න තමයි මම ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. හැබැයි, ඒකට සජබයත් විරුද්ධ වුණා; ජවිපෙත් විරුද්ධ වුණා. ඒවා හොඳ පනත් කෙටුම්පත්. මම කෙසේ හෝ ඔය කියපු පනත් කෙටුම්පත් දෙකම සම්මත කර ගත්තා. හැබැයි, එතැනදී වෙච්ච වැරැද්ද ඓතිහාසික වැරැද්දක්. එදා ඔබතුමන්ලා ඒ පනත් කෙටුම්පතට ඒ විධියට ඉඩ දුන්නා නම් මේ කියන තත්ත්වය ඇති වන්නේ නැහැ. මම මොන පනත් කෙටුම්පත ගෙන ආවත් ඒ ගැන සාකච්ඡා කරන්න අවස්ථාව ලබා දෙනවා. එක සාකච්ඡාවක් නොවෙයි, සාකච්ඡා සියය දීපු අවස්ථාත් තිබෙනවා. මම ඕනෑ කෙනෙක් එක්ක සාකච්ඡා කරනවා. මොකද, මම ගෙනාපු එක නීතියක්වත් ආණ්ඩුව වෙනුවෙන් හෝ ආණ්ඩුව රකින්න හෝ ගෙනැවිත් නැහැ. මම ගෙනාපු හැම පනත් කෙටුම්පතක්ම -දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත, විසි එක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත- ගෙනාවේ මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නයි. ආණ්ඩුවේ අයිතිය රැකෙන්න, විපක්ෂයේ අයිතිය අඩු කරන්න කියලා මම පනත් ගෙනාවේ නැහැ. අපි බොහොම සද්භාවයෙන් ඒ කටයුතු කළා. දැන් ඔබතුමන්ලා පිළිගන්නවා, ඔබතුමන්ලා අතින් ලොකු වැරැද්දක් වෙලා තිබෙනවා කියලා. අපි ඒක නිවැරදි කර ගනිමු. එක්කෝ මේ පනත සංශෝධනය කරමු, නැත්නම් මේකට ගැළපෙන විශේෂ විධිවිධාන පනත් කෙටුම්පතක් ගෙන එමු කියන යෝජනාව කරමින්, මේ යෝජනාව පිළිබඳව අදහස් දක්වපු සියලුදෙනාට මම ස්තුතිවන්ත වෙනවා. මේ පිළිබඳව අදහස් දක්වපු ඔක්කොම වාගේ තරුණ මන්ත්‍රීවරු. මම හුඟක් සතුටු වෙන්නේ ඒකයි. මම විතරයි වයසින් ටිකක් වැඩි. දැන් මටත් කියයි ද දන්නේ නැහැ, මහලුයි කියලා. මේ යෝජනා ගෙන ආ ඔක්කොම තරුණ මන්ත්‍රීවරු. මම හුඟක් සතුටු වෙනවා, ඔබතුමන්ලා පෙරමුණ අරගෙන කටයුතු කිරීම ගැන.

පින් සිද්ධ වෙයි, ජාති ජාතිත් තමුන්නාන්සේලාට පින් ලැබෙයි, කරුණාකර ආපසු මේ රටේ ජාතිවාදය, ආගම්වාදය, භාෂාවාදය ඇති වෙන්නට, මිනිසුන්ට ගහ ගන්න, මරා ගන්න, විරසක වෙන්නට ඉඩ තියන්න එපා. ඔබතුමන්ලා කියපු බණත් මම අහගෙන හිටියා. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ, හැමෝටම මෛත්‍රී කරන්න කියලා. ජේසුස් වහන්සේ දේශනා කළේ, හැමෝටම ප්‍රේම කරන්න කියලා. භගවත් ගීතාවේ කියන්නේ, සත්‍යම් පරම් සුන්දරම්, සත්‍යය තමයි පරම සුන්දර දේ, ඒ නිසා පිදිය යුත්තන් පුදන්න, ගරු කළ යුත්තන්ට ගරු කරන්න, මනුෂ්‍යත්වයේ නාමයෙන් හැමෝටම සලකන්න කියලායි. ඉස්ලාම් ධර්මය කියනවා, සහෝදරත්වය ගැන. ඉතින් මේ හැම ආගමකින්ම අපට උගන්වා තිබෙන්නේ හොඳ දේවල්. හැබැයි, ඒ හොඳ දේවල් අනුගමනය කරන්නේ නැතුව සමහර කණ්ඩායම් අනුගමනය කරන මේ විනාශකාරී ක්‍රම නිසා 1970 ඉඳලා මේ රටේ ඇති වෙච්ච කැරලි, යුද්ධ, ගැටුම් නිසා අපි අවුරුදු 50කට, 60කට වඩා ආපස්සට ගිහිල්ලායි ඉන්නේ. කොරියාව, ජපානය, සිංගප්පූරුව දිහා බැලුවාම ඒක ඔප්පු වෙනවා. මේ රටේ ජාතිවාදී ගැටුම් නිසා, සමගිය නැති නිසා අපි අවුරුදු 50ක් පස්සෙන් ඉන්නේ. ඒ නිසා තමයි 2024 අංක 01 දරන ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පනත මා ගෙනාවේ. ඒ අනුව, හැම ගමකම - ග්‍රාම නිලධාරි වසම් 14,016 ම - ග්‍රාම රාජ්‍යයක් හැදෙනවා; සංහිඳියා සමාජයක් හැදෙනවා. ගමේ මට්ටමින් නොකර උඩ ඉඳලා ඒක කරන්න ගිහින් අපි ෆේල් වෙලා ඉන්නේ. දේශපාලනඥයන්ට වඩා මහ පොළොවේ ඉන්න මිනිසුන්ට සාමය ඕනෑ. ඒ ගොල්ලන් සාමයට කැමැතියි. ඒ නිසා උඩ ඉඳලා පහළට කරන්න බැරි වුණු දේ අපි දැන් පහළ ඉඳලා උඩට කරගෙන යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැම ගමේම ආගමික නායකතුමන්ලාට, පූජකතුමන්ලාට ප්‍රමුඛස්ථානය දීලා අපි සංහිඳියා සමිති හදාගෙන යනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ අවුරුද්ද අවසන් වන කොට රට පුරා ඒ කටයුතු අවසන් කරන්න. දැනට එවැනි සමිති 11,000ක් හදලා තිබෙනවා. ඒ අනුව මුළු රටේම සාමය පැතිරවීම පිණිස "සියලු දෙනා ශ්‍රී ලාංකිකයෝ" කියන අනන්‍යතාව ස්ථාපිත කර ගැනීම සඳහා කටයුතු කරමු කියා මම යෝජනා කරනවා.

ඔබතුමන්ලාට බොහොම ස්තුතියි, මේ යෝජනාව ගෙනාවාට.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.54]

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මා විසින් ගෙනෙන ලද මේ යෝජනාව සම්බන්ධයෙන් අපේ ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා පිළිතුරු කථාව කළා. එම යෝජනාව ස්ථිර කරමින් ගරු උපුල් ගලප්පත්ති මන්ත්‍රීතුමා කථා කළා. ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා, ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා, ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීවරු මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වමින් කථා කළා. අප සියලුදෙනා බලාපොරොත්තු වුණේ දේශපාලන භේදයකින් තොරව, පක්ෂ, පාට භේදයකින් තොරව මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ මේ වාගේ යෝජනාවක් තුළින් සමාජයට පණිවිඩයක් ලබා දීමටයි. ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා කිව්වා වාගේ මෙතැනින් නොනැවතී මෙය නීතියක් බවට පත් කරන්න අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම තමයි වැදගත් වෙන්නේ. නමුත්, අවාසනාවට කාරණාව මේකයි. අප ගෙන එන පෞද්ගලික මන්ත්‍රී යෝජනාවලින් සියයට එකක්වත් අපේ පාර්ලිමේන්තුව තුළ මෙතැනින් එහාට ක්‍රියාත්මක වෙනවා අපි දැකලා නැහැ. හැබැයි, අපි එක කාරණයක් ගැන නම් සතුටු වෙනවා. ඒ තමයි මැතිවරණවලදී තරුණ දායකත්වය වැඩි කිරීම සඳහා අප ගෙනා යෝජනාවකට අදාළ කටයුතු අද ගොඩක් දුර ගිහින් තිබෙන එක. ඇත්තටම ඒ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ගෙනා මන්ත්‍රීවරයාට අපි අපේ ගෞරවය පුද කරනවා. අපට ඒ යෝජනාව ඉදිරියට ගෙන යන්න පුළුවන් වුණා.

මම හිතනවා, මේ යෝජනාවත් අභිශය වැදගත් කියලා. මේ යෝජනාව වෙනුවෙන් අදහස් දක්වපු සියලුදෙනා සාධනීයව කරුණු ඉදිරිපත් කළා. මේ යෝජනාව මොකක්ද කියන එක ගැන හරයාත්මක අවබෝධයකින් තොරව ත්‍රස්තවාදයක් ගැන කථා කළා, ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මන්ත්‍රීතුමා. මා හිතන විධියට එහෙම වෙන්න ඇත්තේ, භාෂාව පිළිබඳ ගැටලුවක් හින්දා වෙන්නට ඇති. අපි මේ කථා කළේ මේ රටේ සාමාන්‍ය අභිංසක මුස්ලිම්, දමිළ, සිංහල ඇතුළු අනෙකුත් සියලු ජනතාවට සාධාරණයක් වන විධියට, දේශපාලනඥයන්ගේ අතකොළු බවට පත් වෙලා තිබෙන ආගමික අන්තවාදීන් දුරස් කරන්නයි. මම උදාහරණයට ගත්තේ බෞද්ධාගමයි. ඒ නිසා එතුමාට හිතුණාද දන්නේ නැහැ, මම මේ කථා කරන්නේ ඉස්ලාම් ආගමට විරුද්ධවයි කියලා. අපි එහෙම නැහැ. 'මුස්ලිම් ජනතාව සමඟත්, දමිළ ජනතාව සමඟත් සහෝදරත්වයෙන් ජීවත් වෙන්න පුළුවන් රාමුවක් හදා ගනිමු, ඒක විනාශ කරන්න දේශපාලනඥයන්ට ඉඩ නොදෙමු' කියන තේමාව එක්ක තමයි මේ යෝජනාව අපි ඉස්සරහට අරගෙන යන්න ඕනෑ. ඉතින් මම හිතනවා, ඉතාම සාධනීය, ඇත්තටම විශ්වාසවන්ත පිළිතුරක් ගරු අධිකරණ අමාත්‍යතුමාගෙන් ලැබුණා කියලා. ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා මේ රටේ අධිකරණ අමාත්‍යවරයා විධියට වර්තමානයේ මේ ගෙන තිබෙන පියවර ගැන අනාගතයේ දවසක අපේ අනාගත පරපුර කියයි, විය යුතු ප්‍රගතිශීලි ක්‍රියාදාමයන් රාශියක් ගන්න මේ කටයුතු ඉවහල් වුණා කියලා.

මොකද අපි දැක තිබෙනවා, සමහර අධිකරණ අමාත්‍යවරු තමුන්ගේ පරාසය මොකක්ද කියන එක ගැනවත් අවබෝධයක් නැතුව අමාත්‍ය ධුරවල අවුරුදු හතර-පහ නිකම්ම ඉඳලා ගිය ආකාරය. ඒ නිසා මෙවැනි පියවර ගෙන තිබීම ඉතා අවශ්‍ය දෙයක්. මොකද, රටක් ඉදිරියට යන්න නම්, අර්බුද සියල්ල නිමා කරගන්න අවශ්‍ය නීතියක් රටේ නිර්මාණය විය යුතුයි. මම හිතන විධියට ඒ නීතිය යල් පැන ගියපු නීතියක් නොවිය යුතුයි. ඒක රටේ සමාජ තත්ත්වයත් එක්ක වෙනස් වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මම ඒකයි ඔබතුමාට ඒ ගැන කිව්වේ. අපි තව ගොඩක් ඉස්සරහට යන්න අවශ්‍යයි. රටක් විධියට අපි එක තැන පල් වෙන්න හොඳ නැහැ.

ඔබතුමා කියපු දේ මම පිළිගන්නවා. විපක්ෂය සාම්ප්‍රදායික නොවිය යුතුයි. විපක්ෂයත් මේ තිබෙන හරයාත්මක කාරණා අවබෝධ කරගෙන උත්තර දෙන්න ඕනෑ. නමුත් ගරු ඇමතිතුමනි, ඔබතුමා උදාහරණයට ගත්තේ මා ඉදිරිපත් කළ යෝජනා දෙකෙන් දෙවැනියට කියපු එකයි. මැතිවරණ වියදම් නියාමනය කිරීම අනිවාර්යයෙන් වෙන්න ඕනෑ. ඔබතුමා ඒකට නීති හදයි. හැබැයි, අපි විපක්ෂය විධියට කියන්නේ මේකයි. අපේ රටේ මේ වෙනකොට -පසුගිය කාලයේ- ඇති කර තිබෙන නීතිත් එක්ක මේ වාගේ නීතියකුත් ගෙනාවාට පසුව පාලකයා ඒක අතකොළුවක් කරගන්න පුළුවන්, විපක්ෂයට තඩිබාන්න. මොකද, විපක්ෂයට අදාළව ඒක නියාමනය වෙයි. ඒක ඔබතුමා ඒක සද්භාවයෙන් ගෙනෙන නීතියක් තමයි. රටේ එවැනි නීතියක් හැදෙන්න ඕනෑ. එතැනින් පසුව එම නීතිය ක්‍රියාත්මක වීමේදී දෝෂ තිබෙනවා නම් ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනෑ. හැබැයි, මැතිවරණයක් දිනන්න ඕනෑම කැන වැඩක් කරන පාලකයෝ මේ මෑත කාලයේ අපි දැකපු නිසා මම හිතනවා එක දුර්වලකමක්, එක හානිකර තත්ත්වයක් එතැන තිබෙන බවට සැකයක් නිර්මාණය වෙන්න ඇති කියලා. මම එහෙම විශ්වාස කරනවා. නමුත් මම අනිවාර්යයෙන්ම හිතනවා, ප්‍රජාතන්ත්‍රවාදීව ඉස්සරහට යන රටක් විධියට, අපි දියුණු සමාජයක් කියලා ලෝකයට පෙන්වන්න නම්, මේ මැතිවරණ ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ බව. ඒ වාගේම මැතිවරණයට ඉදිරිපත් වෙන මන්ත්‍රීවරයාට පුළුවන් වෙන්න ඕනෑ, තමන් කොහොමද මේ මැතිවරණය ජයග්‍රහණය කරන්නේ කියලා පෙන්වන්න. නැත්නම් ජාවාරම්කාරයන්ගේ උදවු අරගෙන මන්ත්‍රීවරුන් වෙලා ඇවිත් අන්තිමට වෙන්නේ වෙන දෙයක්. අපි දන්නා ඇමතිවරුන් ඉන්නවානේ. තනිකරම ජාවාරම්කාරයන්ගේ සාක්කුවල ඉන්නේ. කයක් විතරයි පෙනෙන්න තිබෙන්නේ. ඇමති පුටුවේ මනුෂ්‍ය ශරීරය විතරයි. මෙහෙයවන්නේ කවුරුහරි ව්‍යාපාරිකයෙක්. ඒ තත්ත්වයට වැටෙන්නේ නැතුව මෙම කටයුතු කරගෙන යන්න පුළුවන් මිනිස්සු බිහි කිරීමට නීති සම්පාදනය විය යුතුයි කියා මම හිතනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ප්‍රයත්නය අපි අගය කරනවා.

මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, අපේ රටේ දහම් පාසල් පද්ධතිය ගැන. අපේ රටේ සියලු ආගම්වලට අදාළව පවතින දහම් පාසල් පද්ධතිය නගාසිටුවන්න අනිවාර්යයෙන්ම කටයුතු කරන්න ඕනෑ. මම හිතන විධියට ඒ සම්බන්ධ ආණ්ඩුවේ අවධානය ගිලිහී ගිහින් තිබෙනවා. මොකද, යම් කිසි සීමාවක් තුළ හෝ සහයෝගයක්, ශක්තියක් දෙන්නේ නැහැ, දහම් පාසල් පද්ධතියට. අපි පාසල් යන කාලයේ තිබුණු තත්ත්වයටත් වඩා පහළ තැනකට අද වනවිට දහම් පාසල් පද්ධතිය වැටී තිබෙනවා. ඒ නිසා අපි දහම් පාසල් පද්ධතිය ඉදිරියට අරගන්න ඕනෑ කියා මා හිතනවා.

අවසාන වශයෙන් මම බෞද්ධාගමිකයකු විධියට මහනායක ස්වාමීන් වහන්සේලා ප්‍රධාන නායක ස්වාමීන් වහන්සේලාට සඳහන් කරන්න කැමැතියි, අද පවතින්නේ බුද්ධාගම බේරා ගැනීමට දැවැන්ත මෙහෙයක් කළ යුතු වෙලාවක් බව. ඒ නිසා ඒ වෙනුවෙන් පෙරට එන්න කියන ගෞරවනීය ඉල්ලීමත් කරමින්, අද දින මා ඉදිරිපත් කළ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවට සහයෝගය දක්වපු සියලුදෙනාට ගෞරවනීය ස්තුතිය පුද කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු හේෂා විතානගේ මැතිතුමා සඳහන් කළා, පෞද්ගලික මන්ත්‍රී යෝජනා ඉදිරිපත් කළාට හුඟක් වෙලාවට ඒවා ගැන මෙතැන විවාද කරලා එතැනින් නතර වෙනවා කියලා. ඒ නිසා මම එතුමාට යෝජනාවක් කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගරු කථානායකතුමාගෙන් ලිඛිතව ඉල්ලීමක් කරන්න, ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා. මේ තරුණ මන්ත්‍රීතුමන්ලා එකතු කරගෙන යෝජනාවලියක් සකස් කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. එතකොට ඔබතුමන්ලා බලාපොරොත්තු වන සියලු දේවල් යථාර්ථයක් බවට පත් කරගන්න පුළුවන්.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, න්‍යාය පත්‍රයේ යෝජනා අංක 4 ඉදිරිපත් කිරීම, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
බෙහෙවින්ම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම යෝජනාව ඉදිරිපත් කරන්න පෙර මට ලබා දී තිබෙන වෙලාවෙන් විනාඩියක කාලයක් ලබා ගන්නවා, කාරණා කිහිපයක් සඳහන් කරන්න. පළමුව සඳහන් කළ යුතුයි, - අපේ ගරු අධිකරණ ඇමතිතුමාත් නිවැරදිව ප්‍රකාශ කළ ආකාරයට - ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ප්‍රමුඛ තරුණ මන්ත්‍රීවරුන් රටේ අනාගතය ගැන දැකලා කුමන මුහුණුවරකින් හෝ එන ආගමික අන්තවාදය මැඩ පැවැත්වීම සඳහා අවශ්‍ය නීති රීති සම්පාදනය කරන්නය කියලා අපේ යුගයේ -මෑත කාලීනව- වැඩිම නීති රීති ප්‍රමාණයක් සම්පාදනය කරපු මගේ මිත්‍ර අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළ බව. ගරු ඇමතිතුමනි, ඔබතුමා නිවැරදිව සඳහන් කළ ආකාරයට ඒකට යෝජනාවක් විධියට ගරු කථානායකතුමා හරහා විශේෂ කාරක සභාවක් පත් කිරීම යුගයේ අවශ්‍යතාවක් කියන එක මමත් අවධාරණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ අපේ මහජන ගැලරියේ ඉන්නවා, පාර්ලිමේන්තුවේ ඉන්න ජ්‍යෙෂ්ඨ මෙන්ම ගෞරවනීය මන්ත්‍රීවරයෙක් වන අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමාගේ ආරාධනාවෙන් පැමිණි මන්නාරම ශාන්ත සේවියර් බාලිකා විද්‍යාලයේ ආදරණීය දියණියන් සහ ගුරු මණ්ඩලය. මෙතැනත් ඉන්නවා, අ.පො.ස. උසස් පෙළ හදාරන දියණියන්. පාර්ලිමේන්තුව වෙනුවෙන් අපි ඒ සියලුදෙනාම ඉතා ගෞරවයෙන් පිළිගන්නා බව මම සඳහන් කරන්නට ඕනෑ. ගුරු මණ්ඩලය ඇතුළු සිසු දරු දැරියනි, මම කනගාටු වෙනවා, ඔබේ මව් භාෂාව වන දමිළ භාෂාවෙන් ඔබ ආමන්ත්‍රණය කරන්නට මට හැකියාවක් නොමැතිවීම පිළිබඳව.

දැන් මම පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉදිරිපත් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සිසු සිසුවියන් ලබා ගන්නා Z- අගය මත සියලු රාජ්‍ය අංශයේ රැකියා පුරප්පාඩු පිරවීම

க.பொ.த (உயர் தர) பரீட்சையில் மாணவர்கள் பெற்றுக்கொள்ளும் Z- புள்ளி (Z-Score) அடிப்படையில் அரசதுறை சார்ந்த சகல தொழில் வெற்றிடங்களையும் நிரப்புதல்

FILLING ALL PUBLIC SECTOR JOB VACANCIES ON THE BASIS OF Z-SCORE OBTAINED BY STUDENTS AT THE G.C.E. (ADVANCED LEVEL) EXAMINATION

[අ.භා. 1.01]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ දී පැවති හා පවත්නා ආණ්ඩු විසින් දේශපාලන පක්ෂපාතිත්වය මත හෝ රුචි අරුචිකම් මත අනුගමනය කරන ලද ප්‍රතිපත්ති රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට බරපතළ හානියක් සිදු කර ඇති හෙයින් ද, ඒ හේතුවෙන් දැඩි දේශපාලනීකරණයට ගොදුරු වී ඇති රාජ්‍ය සේවය මුළුමනින්ම ස්වාධීන කර ගැනීමට අවශ්‍ය වන හෙයින් ද, අධ්‍යාපන සුදුසුකම් මත පමණක් රැකියා ලබා දීමේදී දක්ෂ හා සුදුසුකම් සහිත දරුවන්ට යුක්තිය හා සාධාරණත්වය ඉටුවන බැවින් තරුණ අසහනය මුලිනුපුටා දැමීමට ඉන් හැකිවන හෙයින් ද, දිස්ත්‍රික්කය තුළ ඇතිවන පුරප්පාඩු අදාළ දිස්ත්‍රික්කය තුළ පදිංචිකරුවන්ට හිමිවීම හරහා රැකියාලාභීන්ගේ ආර්ථික සුරක්ෂිතතාව මෙන්ම ඉහළ කාර්යක්ෂම සේවාවක් රාජ්‍ය අංශයට ලබා ගැනීමට අවකාශ උදාවන හෙයින් ද, සියලු රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා, අධිකාරි, මණ්ඩල සහ පළාත් සභා අනුබද්ධ සියලු ආයතනයන් හි රැකියා පුරප්පාඩු පිරවීම සඳහා අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සිසු සිසුවියන් ලබා ගන්නා Z- අගය සැලකිල්ලට ගැනීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

මේක තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ යෝජනාව. මේ යෝජනාවේ පසුබිම කුමක්ද? ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමා දන්නවා අපේ කලාපයේ විතරක් නොවෙයි, මුළු ලෝක සිතියම ගත්තොත් අපේ රට වසර 40ක් -දශක 4ක්- තුළ උතුරේත්, දකුණේත් ආයුධ සන්නද්ධ තරුණ නැඟිටීම් -තරුණ අසහනය කියන වචනයෙන් අපි මේක හැඳින්වුවා- තුනක් වෙච්ච රටක් බව. අපි මේ රට පුණ්‍ය භූමියක් -පින් බිමක්- කියලා කියනවා. ඒක ඇත්ත. හැබැයි මේ පින් බිම අවුරුදු 40ක් ඇතුළත තෙවතාවක් තරුණ තරුණියන්ගේ රුධිරයෙන් තෙත් වෙලා තිබෙනවා. ඊට සම්බන්ධ කරුණු හොයා බලන්න කොමිෂන් සභා පත් කළා, නොයෙක් විසඳුම් හෙව්වා. අවසාන විසඳුම වුණේ තරුණ අසහනයට පිළියමක් හොයන්නට ඕනෑ කියන එකයි. ඒ සඳහා යෝජනා රාශියක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මම ඒ ගැන කථා කරන්න කාලය නාස්ති කරන්නේ නැහැ. තරුණයන්ගේ අසහනය එක කාරණාවක්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා අපේ රටේ මැතිවරණ ක්‍රමය ආරම්භ කරපු දවසේ ඉඳලා මෑතක පවත්වපු අවසාන මැතිවරණය දක්වාම අපේ මැතිවරණ වෙළෙඳ පොළේ, මැතිවරණ වෙන්දේසි පොළේ ඉහළම ලංසුව හම්බ වෙන භාණ්ඩය රැකියාව බව. මගේ ජීවිත කාලය තුළ මම ඡන්ද අපේක්ෂකයකු වශයෙන් තරග කරද්දී පවා දැකලා තිබෙනවා, මැතිවරණයේදී රැකියා forms බෙදන ආකාරය. රැකියා පොරොන්දු දෙනවා. අම්මා, තාත්තා ඇවිල්ලා ගමේ ශාඛා සමිතිය පිහිටුවනවා වුවට, පුතාට රස්සාව ගන්න ඕනෑ නිසා. බදුල්ලේ මේ වෙලාවේත් -දැනුත්- forms බෙදනවා. මේක අසම්මතයි. නමුත් මේ අප්‍රසන්න පුරුද්ද අපේ

මැතිවරණ දේහය පුරා පැතිරිලා තිබෙනවා, මැතිවරණ ක්‍රමයත් එක්ක බද්ධ වෙලා තිබෙනවා. ඒක යම් ප්‍රමාණයකින් මුලිනුපුටා දමන්න පුළුවන් ක්‍රමයක් තමයි අපි මේ යෝජනා කරන්නේ.

ගරු ඇමතිතුමනි, මම හිටපු ඇමතිවරයකු විධියට මේ ඉදිරිපත් කරන යෝජනාවට - Z-අගය සම්බන්ධ යෝජනාවට - 2020 පෙබරවාරි මාසයේ කැබිනට් අනුමැතියක් පවා අරගෙන තිබෙනවා. කැබිනට් අනුමැතිය ලැබුණු යෝජනාවක් තමයි මම මේ ගෙනාවේ.

ඊට අමතරව කුසලතාවාදය - meritocracy - ගැන අපේ රටේ සාකච්ඡාවක් තිබෙනවා. නමුත් "කුසලතාවාදයකට ඉඩක් නැහැ" කියලා කියනවා. ඒක ඇත්ත. බොහෝ තැන්වල එහෙමයි. අවංකවම ගත්තොත් අද විතරක් නොවෙයි, පවතින ආණ්ඩුව නිල් පාට ආණ්ඩුවක් වුණත්, කොළ පාට ආණ්ඩුවක් වුණත්, රතු පාට ආණ්ඩුවක් වුණත් රැකියා ලබා දීමේ දී අදාළ ආණ්ඩුවේ දේශපාලනඥයා තමන්ගේ හිතවතුන්ට රැකියා ප්‍රදානය කිරීම අලුත් දෙයක් නොවෙයි, විලාසිතාවක් නොවෙයි. සමහරු මැතිවරණ වේදිකාවට ඇවිල්ලා කියනවා, "මම මේ දිස්ත්‍රික්කයට රැකියා 7,000ක් දීලා තිබෙනවා, 8,000ක් දීලා තිබෙනවා, 15,000ක් දීලා තිබෙනවා" කියලා. කොහොමද මේ රැකියා දෙන්නේ? කාට ද මේ රැකියා දෙන්නේ? තමන්ට දේශපාලන වශයෙන් කැපවීම් කරපු අය තෝරා ගෙන රැකියා දෙනවා. එතකොට සුදුසුකම් තිබෙන අය පැත්තකට යනවා. මේ සංස්කෘතියට නැවතීමේ ලකුණක් තියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අනෙක් පැත්තෙන් අපේ රටේ මැතිවරණවලදී විශේෂයෙන් පසුගිය ජනාධිපතිවරණයේ දී තරුණ පරම්පරාවේ ප්‍රධානම බලාපොරොත්තුව වුණේ system එකක්. එදා system change එකක් ගැන කථා කළා. System change එකක් නිකම්ම වේදිකාවක් හරහා සිදු වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. System change එකක් ඕපපාතිකව වෙන්නේත් නැහැ. ඒක ක්‍රියාත්මකව සිද්ධ වෙන්නට ඕනෑ. ඒ නිසායි මා මේ යෝජනාව කරන්නේ. මම විශ්වාස කරනවා විජයදාස රාජපක්ෂ මැතිතුමා වැදගත් පියෙක්, වැදගත් දේශපාලනඥයෙක් කියලා. අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාත් මේකට පිළිතුරු දෙන්න එනවා. එතුමාත් වැදගත් පියෙක්. වැදගත් දේශපාලනඥයෙක්. කැබිනට් මණ්ඩලය නියෝජනය කරමින් ඔබතුමන්ලා දෙදෙනා ඉන්නවා. මම විශ්වාස කරනවා, මේ යෝජනාවට සක්‍රිය බවක් දෙන්න, ජීවයක් දෙන්න ඔබතුමන්ලා කටයුතු කරයි කියලා. මේ යෝජනාවෙන් කියන්නේ මොකක්ද?

ගරු ඇමතිතුනි, උසස්පෙළ විභාගය සුදුසුකමක් වන රැකියා රාශියක් මේ රටේ තිබෙනවා. ඒකට විභාග තිබෙනවා. විභාග දෙපාර්තමේන්තුව සාමාන්‍යයෙන් අවම වශයෙන් අවුරුද්දකට, more or less විභාග 400ක් විතර පවත්වනවා. ඒ හැම අවුරුද්දේම නොවෙයි වෙන්න පුළුවන්. උදාහරණයක් විධියට ග්‍රාම නිලධාරි විභාගය ගනිමු. ඒ සුදුසුකම මොකක්ද? අපොස උසස් පෙළ විභාගය. ඒ වාගේ විභාග රාශියක් තිබෙනවා. බන්ධනාගාර සේවයට බඳවා ගැනීමේ විභාග තිබෙනවා. ශ්‍රී ලංකා දූත මණ්ඩල කළමනාකරණ සේවා විභාගයේ පුරප්පාඩු පිරවීමට විභාගයක් තිබෙනවා. සමෘද්ධි නිලධාරි පත්වීම් දෙනවා. කෘෂි පර්යේෂණ නිලධාරි පත්වීම් දෙනවා. මේ වාගේ රාශියක් තිබෙනවා. මම ඒ ලේඛනය කියන්නේ නැහැ. මගේ ළඟ තිබෙනවා ඒ විභාග පවත්වන ආකාරයේ විස්තර. විභාග පවත්වන්නේ නැතිව ඇමතිවරයාගේ රැකියා සාක්කුවෙන් දෙන විධියට හැම ආණ්ඩුවක් යටතේම තමන්ගේ හිතවතුන්ට පත්වීම් දෙනවා. ඒ, මනාපය බලාගෙන; ඡන්දය බලාගෙන. මේක විශාල අසාධාරණයක්.

ගරු ඇමතිතුමනි, ඒ නිසා අපි යෝජනා කරන්නේ මෙයයි. උසස් පෙළ විභාගයෙන් පස්සේ Z-අගය මත cut-off mark එකක් එනවා. උදාහරණයක් විධියට මාතර දිස්ත්‍රික්කය ගත්තොත්, වෛද්‍ය පීඨයට 2.1යි, නීති පීඨයට 1.9යි, විද්‍යා පීඨයට 0.82යි. මගේ දිස්ත්‍රික්කය තමයි උදාහරණයක් විධියට ගත්තේ. ඒ අවුරුද්දේ මාතර දිස්ත්‍රික්කයේ තිබෙන ග්‍රාම නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාව 25ක් නම්,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. KINS NELSON left the Chair, and THE HON. VELU KUMAR took the Chair.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ගැන පැහැදිලි කරන්න උදාහරණයක් විධියට ග්‍රාම නිලධාරි වෘත්තිය තෝරා ගන්නවා. ඒ නිලධාරීන් ඉල්ලීමක් කරලා තිබෙනවා, උපාධිය සුදුසුකමක් බවට පත් කරන්න කියලා. ඒක හොඳ යෝජනාවක්. මම මේ පැහැදිලි කිරීම කරන්නේ උදාහරණයක් විධියට. උසස් පෙළ විභාගයෙන් පසුව cut-off mark එකක් නියම වෙනවා. University intake එකට අදාළවයි මේක තීරණය වෙන්නේ. එතකොට එක එක පීඨවලට බඳවා ගැනීමෙන් පසසේ, විද්‍යා පීඨ සඳහාත් බඳවා ගැනීමෙන් පස්සේ අපට තීරණය කරන්න පුළුවන්, ඒ අවුරුද්දේ ඒ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු 25ක් නම් තිබෙන්නේ, අපි කියනවා අපි ඒකට වෙනම විභාගයක් තියන්න ඕනෑ නැහැ, කාලය නාස්ති කරන්න අවශ්‍ය නැහැ කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් කියලා අවසන් කළා නම් හොඳයි.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ දී Z-අගය 0.76, 0.78 අතරේ සිටින අය විය යුතුයි,

කෘෂි පර්යේෂණ නිලධාරීන් බඳවා ගැනීමේදී මෙන්න මේ අගය තිබෙන අය විය යුතුයි කියලා තිබෙන්න ඕනෑ. ඒ විධියට cut -off marks ප්‍රකාශයට පත්වුණු හැටියේ මේ රටේ හැම අම්මා කෙනෙක්ම, හැම තාත්තා කෙනෙක්ම, හැම දුවෙක්ම, පුතෙක්ම

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

දන්නවා ඒ අයට ලබා ගන්න පුළුවන් රස්සාව මොකක්ද කියලා. මේ හරහා කිසිම දරුවෙක් දේශපාලනඥයන්ගේ කාර්යාලවලට යන්න, canvassing යන්න, මැයි දිනයට කොළඹ එන්න, රැස්වීම්වලට සෙනඟ පුරවන්න යොමු වෙන්නේ නැහැ. රැකියාව ලැබෙන්නේ තමන්ගේ සුදුසුකම් අනුව. ඒක තමයි මේ යෝජනාවේ පදනම.

දෙවැනි පදනම මෙයයි. ඒ රැකියාව ලැබෙන්නේ, තමන්ගේ දිස්ත්‍රික්කයට. එතකොට කොළඹ ඇවිල්ලා boarding houses හොයාගෙන, එහෙම නැත්නම් මාතර ළමයා නුවර ගිහිල්ලා, නුවර ළමයා මොනරාගල ගිහිල්ලා කාලය විනාශ කරගන්න අවශ්‍ය නැහැ. ඒ නිසා ඵලදායී යෝජනාවක් විධියටයි මේ යෝජනාව මම ඉදිරිපත් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා කිව්වා, මගේ කථාව අවසන් කරන්න කියලා. මේ අවස්ථාවේ මම ඉල්ලීමක් කරනවා. ගරු අධිකරණ ඇමතිතුමාත් මේ වෙලාවේ මේ සභාවේ ඉන්නවා. අධ්‍යාපන ඇමතිතුමා මේ යෝජනාවට පිළිතුරු දෙන්න ඒවි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණයක් ආසන්න මේ වෙලාවේ දේශපාලන පක්ෂවලින් මම ඉල්ලීමක් කරනවා, තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට මෙවැනි ප්‍රායෝගික, යුක්තිසහගත, සාධාරණ යෝජනාවක් ඇතුළු කරන්න කියලා. මේ යෝජනාව යථාර්ථයක් කරගන්නට සහාය ලබා දෙන්න කියලාත් ඉල්ලා සිටිනවා. හේෂා විතානගේ මන්ත්‍රීතුමා කිව්වා, පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා සාකච්ඡා වෙනවා විතරයි, ඵලදායී තත්ත්වයක් ඇති වෙන්නේ සියයට එකකට පමණයි කියලා. දේශපාලනය එපා වෙච්ච, දේශපාලකයන්ට පරිභව කරන, දේශපාලනය ප්‍රතික්ෂේප කරන, මැතිවරණ ක්‍රමවලින් විතැන් වෙච්ච මේ රටේ තරුණ පරම්පරාවට යම් බලාපොරොත්තුවක් ලබාදෙන්න පුළුවන් විධියේ යෝජනාවක් බැවින් මෙම යෝජනාව යථාර්ථයක් බවට පත් කරගන්නට මේ සභාවේ සහාය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

බෙහෙවින්ම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Wasantha Yapabandara to second the Motion. You have five minutes.

[1.14 p.m.]

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
Thank you very much, Hon. Presiding Member, for giving me this opportunity.

First of all, I would like to thank the Hon. Dullas Alahapperuma for bringing this very important Motion to Parliament. I think this Parliament would take measures to implement this proposal effectively in the future.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේ මේ කාරණය කියන්න ඕනෑ. Z-score එකට වටිනාකමක් ලැබෙන විධියට රජයේ පත්වීම්වලදී ප්‍රමුඛතාව දෙන්න කියන එක තමයි මේ යෝජනාව තුළින් ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා කරුණු ඉදිරිපත් කර තිබෙන්නේ. අද වෙනකොට උසස් පෙළ හදාරන ළමයි ප්‍රමාණාත්මකව අඩුවෙමින් පවතිනවා. මොකද, යමක් කමක් තිබෙන ළමයි උසස් පෙළ කරන්නේ නැතුව විදේශ විශ්වවිද්‍යාලවල පදනම් පාඨමාලා හදාරා විදේශගත වෙනවා. ඒ නිසා උසස් පෙළ කියන පන්තිය මින් ඉදිරියට ශූන්‍ය කරා යයිද කියලා සැකයකුත් අපට ඇති වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත්, මමත් උසස් පෙළ දරුවන්ගේ ගුරුවරයකු විධියට සෑහෙන්න කාලයක් කටයුතු කළා. ඇත්තටම ඒ දරුවන්ට විශාල වටිනාකමක් ලැබෙනවා, Z-අගය මත රාජ්‍ය සේවයට බඳවා ගැනීම් කරන්න පුළුවන් නම්. තරුණ දරුවන් උසස් පෙළ විභාගයට මුහුණ දෙන්න අවුරුදු දෙකකට වැඩි කාලයක් මහන්සි වෙනවා. ඔවුන් විශාල අරගළයක යෙදිලා තමයි ඒ ප්‍රතිඵලය නෙළා ගන්නේ. හැබැයි ඒ ප්‍රතිඵලය නෙළා ගන්නා දරුවන්ට සමහර වෙලාවට ඉතිරි වෙන්නේ, ත්‍රිරෝද රථයක හරි වෙනත් කිසිදු සම්බන්ධතාවක් නැති රැකියාවකට යන්න. මේ රටේ හිටපු අධ්‍යාපන අමාත්‍යවරයකු විධියට, අධ්‍යාපනයේ වටිනාකම පිළිබඳව කරන්න පුළුවන් හඬනැඟීම මේ පාර්ලිමේන්තුව හරහා කිරීම පිළිබඳව ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාට මම යළිත් වතාවක් ස්තුතිවන්ත වෙනවා.

පසුගිය කාලයේ අපි බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය පිළිබඳව කථා කළා. බෙල්වුඩ් සෞන්දර්ය පීඨය, චන්ද්‍රලේඛා පෙරේරා, සෝමසිරි මැදගෙදර, චන්ද්‍රසේන හෙට්ටිආරච්චි, ෂර්ලි වෛජයන්ත, චන්දන ලියනාරච්චි, ප්‍රින්ස් උදය ප්‍රියන්ත වාගේ ලංකාවේ ජනකාන්ත ගායකයන්ට තෝතැන්නක් වුණා. රුපියල් ලක්ෂ 50ක් වියදම් කරලා ඒ ආයතනය ගොඩ දමාගන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රුපියල් ලක්ෂ 50ක් වියදම් කර ඒ සෞන්දර්ය නිකේතනය ගොඩ දමා ගත්තොත්, උසස් පෙළ හදාරපු තරුණ තරුණියන්ටත් ඒ වාගේ ස්ථානයකට ඇවිල්ලා ඔවුන්ගේ ශක්තිය මුවහත් කරගන්න පුළුවන්; දක්ෂතාව මුවහත් කරගන්න පුළුවන්; කලාව බබළවන්න පුළුවන්. මේ බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය වාගේ ආයතන ශක්තිමත් නොකර ගරා වැටෙන තත්ත්වයට පත් කරලා තිබෙද්දී තරුණ සේවා සභාව මොකක්ද කරන්නේ?

අද යාපනයේ musical show එකක් තිබෙනවා. ඒක කරන්නේ තරුණ සේවා සභාවෙන්. ඒකට රුපියල් ලක්ෂ 90ක් යනවා. ඉන්දියාවෙන් තමයි artistesලා ගෙන්වන්නේ. 15වැනි දා හැටන්වලත් musical show එකක් තිබෙනවා. ඒකට ඉන්දියාවෙන් artistesලා ගෙන්වන්න යන වියදම රුපියල් ලක්ෂ 90යි. තරුණ සේවා සභාවට කරන්න තිබෙන්නේ මේවාද? මේවාට සල්ලි වෙන් කරලා තිබෙන්නේ කවුද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට Cabinet Paper එකක් දමා තිබෙනවා. ඒකේ තිබෙනවා, "ජාතික තරුණ සේවා සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන තරුණ සංවර්ධන කාර්යයන් සඳහා අතිරේක ප්‍රතිපාදන රුපියල් මිලියන 400ක් ඉල්ලුම් කිරීම" කියලා. මේ තරම් මුදල් ප්‍රමාණයක් මේවාට වැය කරන්නේ කොහොමද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අපි භාණ්ඩාගාරයේ ලේකම් මහින්ද සිරිවර්ධන මහත්මයාගෙන් ප්‍රශ්නයක් අහනවා. එතුමා නිකුත් කර තිබෙනවා, චක්‍රලේඛයක්. එහි සටහනක් තිබෙනවා, රජයේ ආයතන විසින් විවිධ උත්සව සඳහා දරනු ලබන වියදම් අත්හිටුවන්න කියලා. අපි bankrupt වෙච්ච රටක ඉන්නේ. Z-score ක්‍රමය යටතේ විශ්වවිද්‍යාලයට යන්න බැරි වෙච්ච ශිෂ්‍යයන්ට රැකියාවක් දෙන්න බැරි නම් මෙවැනි කටයුතුවල සාධාරණත්වයක් නැහැ. නිරපරාදේ මේ වාගේ නාස්තිකාර වැඩවලට සල්ලි වියදම් කරන්න එපා. තරුණයෝ වෙනුවෙන් ඒ මුදල් යොදවන්න පුළුවන්. බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනයට ඕනෑ වෙන්නේ රුපියල් ලක්ෂ 50යි. හැබැයි, අද රෑ පැවැත්වෙන musical show එකට ඉන්දියාවෙන් එන artistesලාට රුපියල් ලක්ෂ 90ක් වියදම් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කල්පනා කරලා බලන්න, මේ

කරන නාඩගම මොකක්ද කියලා. 9වැනි දා දඹුල්ල ජාත්‍යන්තර ක්‍රීඩා පිටියේත් මේ වාගේම සංගීත ප්‍රසංගයක් තිබුණා. ඒකේ group එකට රුපියල් ලක්ෂ 45ක් දුන්නා. Stage එකට රුපියල් ලක්ෂ 30යි. Sound system එකට රුපියල් ලක්ෂ 13යි. මුළු වියදම රුපියල් ලක්ෂ 88යි. කුලියාපිටියේ තිබුණු සංගීත ප්‍රසංගයේ වියදම රුපියල් මිලියන 200යි. Dome tents විතරක් 12ක් ගැහුවා. හැබැයි, ඒ ground එක මඩ වුණා. ඊට පස්සේ විප් ගල් කියුබ් 90ක් ගෙනාවා. මේ නාස්තිකාර වියදම් කරන්න නායකත්වය දෙන අමාත්‍ය හරින් ප්‍රනාන්දු මැතිතුමාගෙන් අපි අහනවා, මේ වෙලාවේ කරන්න තිබෙන්නේ මේවාද කියලා. ගාල්ල සමනල ක්‍රීඩාංගණයේ තිබුණු සංගීත ප්‍රසංගයේ වියදම රුපියල් මිලියන 100යි. ජූනි 21, 26 අම්පාරේ තිබුණු සංගීත ප්‍රසංගයේ වියදම රුපියල් කෝටි 3යි. තවම ඒකේ ගනුදෙනු පිළිබඳ ෆයිල් හදලා නැහැ. අද සංගීත ප්‍රසංගයක් තිබෙනවා, යාපනයේ. 15වැනි දා හැටන්වල තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ ආබාධිත සෙබළුන්ගේ දීමනාව කපලා තිබෙනවා. ඒක කොටසකට පමණක් දීලා තිබෙනවා. ඒ මිනිස්සු ආබාධිත වෙලා තිබෙන්නේ රට, ජාතිය ඒකාත්මික කරන්න, එක්සේසත් කරන්න ගිහිල්ලායි. ඒ ආබාධිත සෙබළුන්ගේ දීමනාව කපලා තිබෙනවා නම්, ඒ දීමනාව කොටසකට පමණක් මීට කලින් දීලා තිබෙනවා නම් ඒ ගැන නැවත අවධානය යොමු නොකරන්නේ ඇයි? හැබැයි, රුපියල් මිලියන ගණන්වලින්, ලක්ෂ ගණන්වලින් මේ නාස්තිකාර දේවල්වලට වියදම් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන් නිසා කථාව අවසන් කරන්න.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
මට මේ කාරණය කියන්න ඉඩ දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මධ්‍යම පළාතේ සිටින උපාධිධාරීන් 3,000ක් ගුරු සේවා තරග විභාගය සමත්වුවත්, දෙවන අදියර යටතේ පත්වීම් දීලා තිබෙන්නේ 386කට පමණයි. මධ්‍යම පළාතේ ගුරු පුරප්පාඩු 6,300ක් තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමාට -අපේ සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාට- මේ වැඩේ කරගෙන යන්න, හරින් ප්‍රනාන්දු මැතිතුමන්ලා තරුණ සේවා සභාවේ කාබාසිනියා කරන මුදල් ටික දෙන්න කියලා මම ඉතා වැදගත් යෝජනාවක් කරනවා. අපි විපක්ෂයේ හිටියත් සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා අගය කරනවා. මධ්‍යම පළාතේ, විශේෂයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් අපටත් කැක්කුමක් තිබෙනවා. මොකද, මමත් මහනුවරින් අධ්‍යාපනය ලබපු කෙනෙක්. ඒ නිසායි මම මේ ඉල්ලීම කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මෙම යෝජනාව ස්ථිර කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Udayana Kirindigoda. You have five minutes.

[අ.භා. 1.21]

ගරු නීතිඥ උදයන කිරිදිගොඩ මහතා
(மாண்புமிகு சட்டத்தரணி உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ පාර්ලිමේන්තුවට චෝදනාවක් තිබෙනවා, හරසුන් දේවල් ඉදිරිපත් කරනවා කියලා. හැබැයි, ඒ හරසුන් දේවල් අතර හරවත් දෙයක් ඉදිරිපත් කිරීම වෙනුවෙන් හිටපු අධ්‍යාපන අමාත්‍ය, වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රී ඩලස් අලහප්පෙරුම මැතිතුමාට මා මුලින්ම ස්තුතිවන්ත වෙනවා. මේ රටේ දේශපාලනඥයාගේ දේශපාලන බල අධිකාරිය තිබෙන්නේ ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර 3ක් ඔස්සේයි. එකක්, පළමුවැනි ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම. දෙවැනි එක, මාරුවීම් ප්‍රතිපත්තියක් නැති නිසා transfersවලදී දේශපාලනඥයන්ට ලොකු බලයක් තිබීම. ඊළඟ එක, රැකියා සම්බන්ධ කාරණා.

දේශපාලනඥයා පසුපස යන වැඩි පිරිසක් බලාපොරොත්තු වෙන්නේ, දේශපාලනඥයා බලයට ආ පසු තමන්ගේ දරුවාට රැකියාවක් ලබා ගන්නේ කොහොමද කියලායි. මේ තුළින් සුදුස්සන් යටපත් වෙලා නුසුදුස්සන් එළියට එන ක්‍රමයක් මේ රටේ පවතින බව අපි හැමදාම දැක්කා, අත්වින්දා. මේ සම්බන්ධ ප්‍රායෝගික අත්දැකීමක් තිබෙන කෙනෙකු හැටියට මම කියන්න ඕනෑ, 1988-1989 වකවානුවේ රටේ තිබුණු තරුණ අසහනයත් එක්ක, තරුණ අසහන කමිටුවක් ඇති කළ බව. මට මතක හැටියට එහි සභාපති ධුරය දැරුවේ මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා.

එහි වාර්තාව අනුව විභාග ක්‍රමයක් තුළ රජයේ රැකියා ලබා දිය යුතුයි කියන නිර්දේශය ඉදිරිපත් වුණා. ඒ නිර්දේශය තුළින් රජයේ රැකියාවක් ලබා ගත්, පාසලෙන් ඉවත් වුණු ගමන්ම රජයේ රැකියාවකට ගිය කෙනෙකු විධියට මම අද මේ පාර්ලිමේන්තුවේ ඒ ගැන කථා කරන්නේ ඇත්තටම ආඩම්බරයෙන්. හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ඒ සංකල්පය ගෙනාවාට පසු, ලංකා බැංකුවට බඳවා ගැනීමේ තරග විභාගය තුළින් ලංකාවේ පළමුවැනියා වෙලාම මට එම රැකියාවට යන්න හැකියාව ලැබුණා. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාත් ලංකා බැංකුවේ හිටපු කෙනෙකු විධියට ඒ ගැන දන්නවා. එදා ඒ තරග විභාග නොතිබුණා නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ දේශපාලනය තුළ ප්‍රමුඛ පවුලක සාමාජිකයෙකු විධියට හිටපු අපට රැකියාවක් ලබා ගන්න හැකියාව ලැබෙන්නේ නැහැ. ඉතින්, මෙන්න මේ තත්ත්වය තුළ දේශපාලන බලපෑම්වලින් තොරව මේ රටේ ජනතාවට තමන්ගේ දරුවාට -ඉගෙන ගත්ත ශිෂ්‍යයාට- රැකියාවක් ලබා ගැනීම සඳහා යම් ක්‍රමයක් ඇති කිරීම තමයි මේ system change එකෙන් බලාපොරොත්තු වෙන්නේ. System change කියලා නමට කිව්වාට, කෑ ගැහුවාට, අරගළ කළාට, නායකයන් පලවා හැරියාට, system එක වෙනස් වෙන්නට නම් අපි හැමෝම වෙනස් වෙන්න ඕනෑ. ඒ සඳහා දේශපාලනඥයා වෙනස් වෙන්න ඕනෑ, රාජ්‍ය සේවකයා වෙනස් වෙන්න ඕනෑ, රටේ ජනතාව වෙනස් වෙන්න ඕනෑ. එහෙම නැතුව මේ system එක change කරන්න එක පිරිසකට විතරක් බැහැ. මේ system එක තුළ හරියට ක්‍රියාත්මක වෙනවා නම්, මෙතුමා කිව්වා වාගේම Z-score එක එහි එක් සාධකයක් විධියට ගත්තොත්, ඒ හරහා රජයේ රැකියා ලබා දීමේ හැකියාවක් තිබෙනවා නම්, ඒ ක්‍රමය හරියාකාරව පවත්වාගෙන යනවා නම්, ඒකට අවශ්‍ය නිසි විධිවිධාන සලසනවා නම්, දේශපාලන අනුග්‍රහයකින් තොරව කෙනකුගේ දක්ෂතාව මත රජයේ රැකියාවකට යෑමේ හැකියාව ලැබෙනවා. ඒ නිසා මේක හොඳ යෝජනාවක්, හොඳ ආරම්භයක්. ඒ වාගේම කාලාන්තරයකට පෙර කැබිනට් අනුමැතියත් ලැබුණු, ක්‍රියාවේ

[ගරු නීතිඥ උදයන කිරිදිගොඩ මහතා]

නොයෙදූ යෝජනාවක් වන මේ යෝජනාවට පාර්ලිමේන්තුවේ අවධානය නැවත යොමු කළ යුතුයි කියා මා හිතනවා.

අනිවාර්යයෙන්ම මේ රටේ ඊළඟ ජනාධිපති වෙන්නේ කවුද කියන එක නොවෙයි, ඔහු කෙලෙසද මේ රටේ තරුණයන්ට සලකන්නේ කියන එක ගැනයි ප්‍රශ්නය තිබෙන්නේ. මම හිතන්නේ ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා කිව්වා වාගේ ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනවලත් පළමු තැන මේ යෝජනාවට හිමිවන්නට ඕනෑ. තරුණයන්ට රැකියා ලබා දීමේදී දේශපාලන බලපෑමෙන් තොරව කළ හැකි ක්‍රමයක් හඳුන්වා දෙන බවට මේ අය වග කියන්න ඕනෑ. අන්න ඒ තුළින් පමණයි ඉව්ඡාභංගත්වයට පත් වෙච්ච තරුණ පරම්පරාවක් මේ රටේ බිහි නොවන තැනට අනාගතය සකස් කරන්න අවශ්‍ය අඩිතාලම දමන්න අපට පුළුවන් වෙන්නේ කියා මා හිතනවා. තරග විභාග පැවැත්වුණාට සමහර වෙලාවට interview process එකේදී දේශපාලන බලපෑම් වෙනවා. මොකද, තරග විභාගයකින් පමණක් යම් කෙනෙකු සේවයට බඳවා ගැනීමේ හැකියාවක් නැති නිසා. ඒ interview අවස්ථාවේදී දේශපාලන මැදිහත්වීම නොවෙයි අවශ්‍ය වෙන්නේ. ඒ අවස්ථාවේදී ඔවුන්ගේ කුසලතා හඳුනා ගත හැකි යන්ත්‍රණයක් සකස් කරන්නට ඕනෑ, ලකුණු දීමේ යන්ත්‍රණයක් සකස් කරන්නට ඕනෑ. ඒ තුළින් දේශපාලන මැදිහත්වීම අයින් කරලා, තරුණයන්ට දක්ෂතාව තුළින් තමන් කැමැති රැකියාවකට යෑමේ හැකියාව, වරප්‍රසාදය ලබා දීම සඳහා මේ යෝජනාව ඉවහල් වෙයි කියා මා විශ්වාස කරනවා. ඒ සඳහා අපි ගත් මේ මූලාරම්භය ශක්තිමත් ප්‍රතිඵලයක් රටට දායක කරන්නට සුදුසු තත්ත්වයකට පත් වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මේ යෝජනාවට මේ පාර්ලිමේන්තුවේ පක්ෂ, විපක්ෂ සියලුදෙනාගේ අවධානය යොමු විය යුතුයි කියා යෝජනා කරමින් මා නවතිනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! Will an Hon. Member propose the Hon. Udayana Kirindigoda to the Chair?

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු டலஸ் அழහப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු උදයන කිරිදිගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු මනෝ ගනේසන් මහතා
(මාණ්පුමිකු மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උදයන කිරිදිගොඩ මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු வேலு குமார் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு உதயன கிரிந்திகொட அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. VELU KUMAR left the Chair, and THE HON. UDAYANA KIRINDIGODA took the Chair.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා. පිළිතුරු කථාව සඳහා ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.26]

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා අද වැදගත් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් මෙහිදී ප්‍රායෝගික ගැටලු කිහිපයක් මතු වෙනවා. නමුත්, මේක සලකා බලන්න පුළුවන් යෝජනාවක්.

පළමු ගැටලුව තමයි, පරිපාලන සේවය, ගණකාධිකාරී සේවය, පුස්තකාලයාධිපති සේවය, තොරතුරු තාක්ෂණ සේවය ආදී වශයෙන් රාජ්‍ය සේවයේ විවිධ සේවාවලට බඳවා ගන්නකොට උපාධිය මූලික සුදුසුකම වන සමහර සේවා තිබීම. එතකොට උපාධිය මූලිකම සුදුසුකම වෙන සේවා මේකෙන් බැහැර කරන්න වෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழහப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු ඇමතිතුමනි, මේ යෝජනාවේ තිබෙන්නේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී සිසු සිසුවියන් ලබා ගන්නා Z-score අගය සුදුසුකමක් වන රැකියා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔව්, ඒවාට පමණයි.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழහப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

කළමනාකරණ සේවය, ග්‍රාම නිලධාරී සේවය,-

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මේක මට එවලා තිබෙන පිළිතුර. ඔබතුමාම දන්නවා, බැංකුවලට බඳවා ගැනීමේදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි ඇතුළුව එකවර සම්මාන 5ක් ලබාගෙන තිබෙන්නට ඕනෑ බව. එතකොට Z-score අගය කීයට තිබුණත්, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඔය කියන විෂයයන්වලට සම්මාන නැත්නම් මූලික සුදුසුකමක් නැති වෙනවා. ඒ විෂයයන් තුනත් එක්ක, උසස් පෙළ ප්‍රතිඵලත් බලලා තමයි apply කරන්න පුළුවන් වෙන්නේ. එවැනි රැකියා තිබෙනවා.

උදාහරණයක් වශයෙන් කළමනාකරණ සේවය වාගේම ග්‍රාම නිලධාරී සේවය ආදී වශයෙන් සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සුදුසුකම් අවශ්‍ය විවිධ ආකාරයේ රැකියාවලදී මේක සලකා බලන්න පුළුවන්. මොකද, ඒක වඩා පහසු ක්‍රමයක්. විද්‍යා පීඨවලට

බඳවා ගන්නකොට මෙවර අපි කෙළින්ම online ක්‍රමය අනුගමනය කළා. ඒ අනුව මාස 6ක් ගත වන interview කාල සීමාව අඩු කර ගත්තා. සහතික විතරයි check කරන්න තිබුණේ. Z-score එක අනුව software එකෙන් programme එක හැදිලාම සුදුසු අය තේරිලා ආවා. ඒක හරි පහසුයි. විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම, පීඨවලට ඇතුළත් කර ගැනීම ආදී වශයෙන් දැනට උසස් පෙළ විභාගයේ Z-score එක භාවිත කරන ක්ෂේත්‍ර කිහිපයක් තිබෙනවා. ඒක නිසා රැකියාවලට තේරා ගැනීමේදී යොදාගත හැකි තැන්වලට Z-score එක යොදා ගැනීමෙන් පාරදෘශ්‍යභාවය වැඩි වෙනවා. එතකොට, Z-අගය පුළුවන් තරම් ඉහළින් ලබා ගන්නත් ළමයි උනන්දු වෙනවා. ඒ පිළිබඳ ගැටලුවක් නැහැ. එය මම කියපු ඒ රැකියා සඳහා සුදුසු බලන්න පුළුවන් කියන කාරණය සඳහන් කරමින් මගේ පිළිතුරු කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

[අ.භා. 1.29]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

පිළිතුරු ලබා දීම වෙනුවෙන් ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි, ගරු ඇමතිතුමනි. තීන්දු ගන්නා දේශපාලනඥයකු විධියට ඔබතුමා ලබා දුන් පිළිතුර ඉතාම වැදගත්. මේක ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමාගේම නායකත්වයෙන් අපි එකතු වෙලා, පාර්ලිමේන්තුවක් විධියට කටයුතු කරමුය කියන එකත් මා යෝජනා කරනවා. ඒ වාගේම මේ යෝජනාව ස්ථිර කරපු අපේ ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමාටත්, ගරු උදයන කිරිදිගොඩ මන්ත්‍රීතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම අම්පාර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිලක් රාජපක්ෂ මැතිතුමාත් මේ පිළිබඳව කථා කරන්න සිටියා. නමුත්, විශේෂ කටයුත්තක් හේතුවෙන් එතුමාට පාර්ලිමේන්තුවෙන් බැහැර වෙන්න සිදු වුණා. කාලය ඉක්මවා යෑම නිසා ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමාත් බැහැර වෙලා ගියා. නමුත්, කථික ලැයිස්තුවේ එතුමාගේ නම තිබුණා. ඒ වාගේම ගරු රෝහිණී කුමාරි විජේරත්න මැතිනියත් කථා කරන්න බලාපොරොත්තුවෙන් සිටියත් එතුමියටත් ඒ සඳහා අවස්ථාව ලැබුණේ නැහැ. ඒ සියලුදෙනාටම මෙන්ම, සමස්ත පාර්ලිමේන්තුවටම මේ අවස්ථාවේදී මා ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, උදාහරණයක් විධියට බැංකු ක්ෂේත්‍රයම ගත්තොත්, ඇත්ත, සාමාන්‍ය පෙළ සුදුසුකම විධියට ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි සහිතව විෂයයන් 5කට සම්මාන අවශ්‍යයි. Z-අගය මත පදනම් වෙලා interview එකක් සඳහා නේ call කරන්න වෙන්නේ. ඒ interview එකේදී පුළුවන්, ඒ සුදුසුකම් ටික තිබෙනවාද කියලා check කර ගන්න. බන්ධනාගාර සේවයට බඳවා ගන්නේ, උසස් පෙළ විභාගයේ ප්‍රතිඵලවලින්. හැබැයි, ඒ සඳහා නියමිත උසක් අවශ්‍ය වෙනවා. සම්මුඛ පරීක්ෂණයේදී ඒ කාරණා ටික ඉෂ්ට කර ගන්න පුළුවන්. ඔබතුමා දන්නවා ඇති, විභාගවලට විතරක් අපි කොච්චර අනවශ්‍ය මුදලකුත් වියදම් කරනවාද කියලා. මේ හරහා ඒ වියදමත් නැති කරන්න පුළුවන්. ඒ සියල්ලටම වඩා මම විශ්වාස කරන්නේ, සභාවක් විධියට අපි කිසිම භේදයකින් තොරව මේ කටයුත්ත කළොත්, මේ රටේ තරුණ ප්‍රජාවට, දූ පුතුන්ට විශ්වාසයක් ඇති වෙනවා කියන එකයි. අපි සියලුදෙනාම පිළිගන්නවා, අපි මොන ආණ්ඩුවක සිටියත්, රැකියා බෙදීමේදී දේශපාලනඥයාගේ සාක්කුවෙන් දෙන විධියට තමයි ඉතිහාසය පුරාම රැකියා ලබා දුන්නේ. තමන්ට වැඩ කරපු, තමන්ට හිතවත්, තමන්ට කාර්යාලය දාලා දුන්, තමන් වෙනුවෙන් canvassing ගිය අය තෝරාගෙන ඔවුන් රැකියාවලින් සන්නද්ධ කිරීම තමයි ඉතිහාසය පුරාම සිදු වුණු දේ. මම ආරම්භයේදීම කිව්වේ ඒකයි, මැතිවරණ වෙන්දේසි පොළේ වැඩියෙන්ම අලෙවි වන භාණ්ඩය, ඉහළම ලංසුව හම්බවෙන භාණ්ඩය "රැකියාව" කියලා. රැකියාව පෙන්වලා තමයි දේශපාලන කටයුත්තකට - මැතිවරණ කටයුත්තකට- ආකර්ෂණය කරන්න හදන්නේ. ඒක නැති කර ගන්න තිබෙන විශිෂ්ටතම ක්‍රියා මාර්ගය මේක කියන එක තමයි මගේ යෝජනාව. එම නිසා මම නැවතත් අවධාරණය කරනවා, මේ රටේ ජනතාවගේ කැමැත්ත ඉල්ලන දේශපාලන පක්ෂ සියල්ලම මෙය තමන්ගේ මැතිවරණ ප්‍රකාශනවලට ඇතුළත් කරන්නට කියන කාරණය.

අපට පෙනෙන්නේ දකුණේ දරුවන්ගේ රැකියා ප්‍රශ්නය විතරයි. මට හිතාගන්න බැහැ, උතුරේදී, නැගෙනහිරදී මේක වෙන්නේ කොහොමද, ඒ දරුවන්ට සිදු වන අසාධාරණය කොහොමද නැති කර ගන්නේ කියලා. ඇත්තටම ගත්තොත්, ඒ ප්‍රශ්නය, ඒ වේදනාව අපට සංවේදී නැහැ. එම නිසා සමස්ත රටේ තරුණ ප්‍රජාවට බලාපොරොත්තුවක්, විශ්වාසයක් ඇති වන විධියට උසස් පෙළ සුදුසුකම අවශ්‍ය වන රජයේ දෙපාර්තමේන්තු, අනුබද්ධ ආයතන සහ පළාත් සභාවල රැකියා සඳහා බඳවා ගැනීමේදී Z - අගය මත බඳවා ගැනීමේ යෝජනාව අපි එකතු වෙලා මේ රට තුළ ක්‍රියාත්මක කරමුය කියන යෝජනාව නැවත තහවුරු කරමින් මා නිහඬ වෙනවා.

මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

න්‍යාය පත්‍රයේ යෝජනා අංක 5 ඉදිරිපත් කිරීම, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා.

කඳුරට වෘත්තීය සමිති වීරු දිනය ප්‍රකාශයට පත් කිරීම
மலையகத் தொழிற்சங்க தியாகிகள் தினமொன்றைப் பிரகடனப்படுத்தல்
DECLARING THE DAY OF THE MARTYRS OF THE HILL COUNTRY TRADE UNION

[පි.ප. 1.32]

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் பின்வரும் பிரேரணையை முன்மொழிகின்றேன்.

"இலங்கையின் வரலாற்றில் பொருளாதாரத்துக்குப் பெருமளவு பங்களிப்புச் செய்துள்ள சமூகமாக மலையகப் பெருந்தோட்டத் தொழிலாளர்கள் காணப்படுவதாலும், மலையகப் பெருந்தோட்டத் தொழிலாளர்கள் ஜனநாயக வழியில் போராடியே தமது உரிமைகளை வென்றெடுத்தனர் என்பதாலும், அத்தகைய ஜனநாயக உரிமைப் போராட்டங்களில் உயிர்நீத்த தொழிற்சங்கத் தியாகிகளைப் பொதுவான தொரு நாளில் நினைவுகூர வேண்டுமென்பது இலங்கை வாழ் இந்திய வம்சாவளி மலையக மக்களின் நெடுநாள்

[ගරු වේලු කුමාර් මහතා]

කෝරික්කෙයාක இருப்பதாலும், 1939ஆம் ஆண்டு டிசம்பர் மாதம் முதல் 1940ஆம் ஆண்டு சனவரி மாதம் வரை சம்பள உயர்வு கோரி இலங்கையில் இடம்பெற்ற பெருந்தோட்டத் தொழிலாளர்களின் முதலாவது தொழிற்சங்கப் போராட்டத்தின்போது, வெள்ளையரின் துப்பாக்கிச் சூட்டில் "முல்லோயா கோவிந்தன்" என்ற தொழிலாளி உயிர்நீத்துள்ளதாலும், இலங்கையின் பெருந்தோட்டத் தொழிலாளர்களின் அறவழிப் போராட்டத்தில் உயிர்நீத்த முதலாவது தொ ாழிலாளியையும் மற்றும் அதன்பின் இடம்பெற்ற பல தொழிற்சங்கப் போராட்டங்களில் மலையப் பெருந்தோட்ட மக்களின் உரிமைக்காகவும் நலனுக்காகவும் போராடி உயிர்நீத்த ஏனையோரையும் நினைவுகூரும் வகையில், முதலாவது மலையகத் தொழிற்சங்கத் தியாகி உயிர்நீத்த தினமாகிய சனவரி 10ஆம் திகதியை மலையகத் தொழிற்சங்கத் தியாகிகள் தினமாக பிரகடனப்படுத்துவதற்குத் தேவையான நடவடிக்கைகளை அரசாங்கம் மேற்கொள்ள வேண்டுமென இப்பாராளுமன்றம் பிரேரிக்கின்றது."

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மலையகத் தொழிற்சங்க தியாகிகள் தினமொன்றைப் பிரகடனப்படுத்துதல் தொடர்பான இந்தப் பிரேரணை பற்றிப் பேசுவதற்கு முன்னர், சிங்கள மொழியில் கருத்தொன்றைக் கூறலாமென நினைக்கின்றேன்.

කඳුරට ශ්‍රමිකයන්ගේ සමිති විරු දිනය ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කළේ. මෙතැනදී මම කාරණාවක් පැහැදිලි කරන්නට ඕනෑ. අපි මෙතෙක් මේ රටේ "ඉන්දියානු දෙමළ" හැටියටයි ජන සංගණනයේදී අපේ ජන කොට්ඨාසය හඳුනා ගත්තේ. අපි මෙවර ජන සංගණනයේදී "ඉන්දියානු දෙමළ" කියන එක "මලෙයහ දෙමළ" - "மலையகத் தமிழர்" - Malaiyaha Tamils - යනුවෙන් වෙනස් විය යුතුයි කියන ඒ ජනතාවගේ ඉල්ලීම ඇතුළත් කරලා තිබෙනවා. මේක තැනක්, නැත්නම් ප්‍රදේශයක් හඳුන්වා දීමක් නොවෙයි ජන කොට්ඨාසයක් හඳුන්වා දීමක්. ඒ නිසා මින් ඉදිරියට "මලයගම්" යන්න ජන කොට්ඨාසයක් වෙනුවෙන් කරන හඳුන්වා දීමක් බව මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

மலையக மக்கள் கூலித் தொழிலாளர்களாக இந்த நாட்டுக்கு அழைத்துவரப்பட்டு, கடந்த வருடத்தோடு 200 வருடங்கள் நிறைவடைகின்றன. இந்த 200 வருட காலத்தில் இலங்கை தேசத்தின் எழுச்சிக்காக, இலங்கை தேசத்தின் அபிவிருத்திக்காக எங்களுடைய மக்கள் பல்வேறு வழிகளில் தங்களுடைய பங்களிப்பை வழங்கியிருப்பது மட்டுமல்ல, தங்களுடைய உயிர்களைக்கூட தியாகம் செய்திருக்கக்கூடிய நிலைமைகளையும் எங்களால் காண முடிகின்றது. குறிப்பாக, இந்த நாட்டில் மிக நீண்ட காலமாக ஆங்கிலேயரின் கைகளுக்குள் கொத்தடிமைகளாகவிருந்த எங்களுடைய மக்கள், இந்த நாடு சுதந்திரமடைந்து சில மாதங்களின் பின்னர் பிரஜாவுரிமையை இழந்து, நாடற்ற சமூகமாக்கப்பட்டார்கள். இதனால் நாங்கள் நீண்ட காலம் பின்தங்கிய ஒரு சமூகமாக இருந்திருக்கின்றோம். இவ்வாறான நிலைமையில், தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வுக்காக, தோட்டத் தொழிலாளர்களின் உரிமைக்காக, தோட்டத் துரைமார்களது அடக்குமுறைக்கு எதிராக, எங்களுடைய மக்களினது காணி உரிமைக்காக, எங்களுடைய மொழி உரிமைக்காக எனப் பல்வேறு போராட்டங்களில் எங்களுடைய மலையக சமூகம் ஈடுபட்டிருக்கின்றது. அவ்வாறான போராட்டங்களின்போது, எங்களுடைய சமூகத்தின் எதிர்காலத்துக்காக உயிர் நீத்த அந்தத் தியாகிகளைத்தான் இங்கு நாங்கள் "மலையகத் தியாகிகள்" என அடையாளப்படுத்துகின்றோம்.

1939ஆம் ஆண்டு டிசம்பர் மாதம் சம்பள உயர்வு கோரி முல்லோயாத் தோட்டத்தில் ஆரம்பமான போராட்டமானது, 1940ஆம் ஆண்டு சனவரி மாதம் வரை தொடர்ந்தது. 1940ஆம் ஆண்டு சனவரி மாதம் 10ஆம் திகதி அங்கு அடக்குமுறை கட்டவிழ்த்துவிடப்பட்டது. காவல்துறையினரது துப்பாக்கிச் சூட்டுக்கு இலக்காகி உயிரிழந்த முல்லோயா கோவிந்தனே மலையகத் தியாகிகள் வரலாற்றை ஆரம்பித்து வைத்தார். அன்று முதல் இன்றுவரை சம்பள உயர்வுப் போராட்டம், அடக்குமுறைக்கு எதிரான போராட்டம், காணி உரிமைப் போராட்டம், மொழி உரிமைப் போராட்டம் எனப் பல போராட்டங்களில் எமது மக்கள் தொடர்ச்சியாகத் தங்களுடைய உயிர்களைத் தியாகம் செய்திருக்கிறார்கள். அது தொடர்பான சில நிகழ்வுகளை என்னால் இந்த இடத்தில் சுட்டிக்காட்ட முடியும். அந்த வகையில், கண்டி மண்ணில் மலையகப் போராட்ட வரலாற்றில் புதிய அத்தியாயத்தை ஆரம்பித்த ஸ்டெலன் பேர்க் எனப்படுகின்ற கந்தலா தோட்டத்தின் இளைஞர்களான வீராசாமி, வேலாயுதம் ஆகிய இருவரையும் நினைவுகூர வேண்டியது எங்களது கடப்பாடாக இருக்கின்றது.

வெலிக்கடைச் சிறைச்சாலையில் 1942ஆம் ஆண்டு பெப்ருவரி மாதம் 27ஆம் திகதி காலை 8.00 மணிக்கு வீராசாமியும் அடுத்த நாள் அதே நேரம் வேலாயுதமும் தூக்கிலிடப்பட்டனர். அதனால் இவர்கள் இளம் வயதிலேயே மலையகத் தியாகிகள் வரலாற்றில் இணைந்தனர். தோட்ட துரைமாரின் அடக்குமுறைக்கு முடிவு கட்டவே இவர்கள் மாற்று வழியைக் கையாள நேரிட்டது. குறிப்பாக, இவர்கள் வாழ்ந்த காலப்பகுதியில் எங்களுடைய மக்களுக்கு வாக்குரிமையும் இல்லை, அரசியல் ரீதியான பலமும் இல்லை. இதனால் அடக்குமுறைகளுக்கு எதிராக மாற்று வழிகளைக் கையாளவேண்டிய நிலைமை எமது இளைஞர்களுக்கு ஏற்பட்டது. அதன் காரணமாகவே கண்டி மண்ணில் அந்தத் தியாகத்தைச் செய்த வீராசாமியும் வேலாயுதமும் வரலாற்றில் குறிப்பிடப்படுகின்றார்கள். ஆரம்ப காலகட்டங்களில் இடதுசாரிப் பிரிவினரது ஆதரவு மலையக மக்களுக்குக் காணப்பட்டது என்பதை நாங்கள் இந்த இடத்தில் கூற வேண்டும். அதேபோல, 1977 மே மாதம் 11ஆம் திகதி சிவனு லெட்சுமணன் என்பவர் மலையக மக்களின் காணி உரிமைக்காக உயிர்த்தியாகம் செய்தார் என்பதையும் நாங்கள் இந்த இடத்தில் ஞாபகப்படுத்தக் கடமைப்பட்டிருக்கின்றோம்.

அன்றைய சுதந்திரக் கட்சி அரசாங்கம் பெருந் தோட்டங்களைக் கையகப்படுத்தியபோது, அவர் அதற்கு எதிராகப் போராடி இளம் வயதிலே தனது சமூகத்துக்காக உயிர்த்தியாகம் செய்தார். அவரின் கல்லறை தலவாக்கலை டெவோன் பகுதியில் அமைந்திருக்கின்றது. 1958இல் மொழியுரிமைப் போராட்டத்தில் உயிர்நீத்த மலையகத் தியாகிகளான பொகவந்தலாவை, கொட்டியாக்கலை தோட்டத்தில் பிறந்த முத்து ஐயாவு, அந்தோனி பிரான்சிஸ் ஆகியோரும் நினைவுகூரப்பட வேண்டியவர்களாவர். தொழிற்சங்க உரிமைக்காக 1956ஆம் ஆண்டு மே மாதம் 02ஆம் திகதி டயகம தோட்டத்தில் ஆரம்பிக்கப்பட்ட போராட்டமானது, மலையக வரலாற்றில் குறித்துக் காட்டத்தக்க ஒன்றாகும். இப்போராட்டத்தில் ஏப்ரஹாம் சிங்கோ என்ற சிங்களத் தொழிலாளர் ஒருவர் உயிர் நீத்தார் என்பதையும் மறந்துவிட முடியாது. இலங்கையர்கள் மலையக மக்களின் வரலாறு தொடர்பாகத் தெரிந்துகொள்ள வேண்டும். நாங்கள் மலையக மறுமலர்ச்சி நோக்கிப் பயணிக்க வேண்டும். இன்றும் மலையகப் பெருந்தோட்ட மக்களின் சம்பள உயர்வுப் போராட்டத்துக்கும் காணி உரிமை போராட்டத்துக்கும் ஒரு முடிவு காணப்படாத நிலையில், அங்குள்ள தோட்ட முகாமையாளர்களின் அடக்குமுறைகள் கட்டவிழ்த்து

විදපට්ටිරුක්කින්ර நිලையில், நாங்கள் 200 வருடங்களாகியும் இருப்பது வருந்தத்தக்கதாக இருக்கின்றது.

200 வருட நிறைவை அடையாளப்படுத்தி நிகழ்வுகளை நடத்துவதனாலோ, கொண்டாட்டங்களை நடத்துவதனாலோ, முகவரி இல்லாத மக்களுக்கு முத்திரை வெளியிடுவதாகக் கூறி அந்த முத்திரையை நாடு நாடாகக் கொண்டுசென்று அங்குள்ள தலைவர்களுக்கு வழங்குவதனாலோ எங்களுடைய மக்களின் அங்கீகாரம், அவர்களின் அடையாளங்கள், அவர்களின் வரலாறுகள், அவர்களின் தியாகங்கள் அடையாளப்படுத்தப்படப் போவதில்லை. ஆகவே, மலையகத் தோட்டத் தொழிலாளர் களின் உரிமைக்கான தியாகப் போராட்டத்தை ஆரம்பித்து வைத்த முல்லோயா கோவிந்தனின் வீர மரணம் நிகழ்ந்த தினமான சனவரி 10ஆம் திகதியை இந்த நாட்டில் மலையக மக்களினது தொழிற்சங்கத் தியாகிகள் தினமாகப் பிரகடனப் படுத்த வேண்டும் என்ற பிரேரணையை நான் இந்தச் சபையில் முன்வைத்து, அதனை நடைமுறைப்படுத்துவதற்கான நடவடிக்கைகளை அரசாங்கம் எடுக்க வேண்டுமெனவும், அதன்மூலம் மலையக சமூகத்துக்கான அங்கீகாரம், அடையாளம், அவர்கள் 200 ஆண்டுகளாக இந்த நாட்டுக்குச் செய்திருக்கின்ற பங்களிப்பு மற்றும் தியாகத்துக்குரிய பெறுமானத்தைப் பெற்றுத்தர வேண்டுமெனவும் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු (ආචාර්ය) වී. රාධාකිෂ්ණන් මැතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.42]

ගරු (ආචාර්ය) වී. රාධාකිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இச்சபையில் கௌரவ வேலு குமார் அவர்கள் கொண்டு வந்திருக்கின்ற, பெருந்தோட்டப் பகுதியில் உயிர்நீத்த 36 பேருடைய தியாகங்களையும் ஞாபகப்படுத்தும் விதமாக, மலையகத் தொழிற்சங்கத் தியாகியான முல்லோயா கோவிந்தன் இறந்த நாளான சனவரி மாதம் 10ஆம் திகதியை மலையகத் தொழிற்சங்கத் தியாகிகள் தினமாகப் பிரகடனப் படுத்த வேண்டுமென்ற தனிநபர் பிரேரணையை நான் வழிமொழிகின்றேன்.

ஹன்சாட்டில் பதிவுசெய்ய வேண்டும் என்பதற்காக நான் இங்கு சில விபரங்களை முன்வைக்கின்றேன். 1939 - கோவிந்தன், முல்லோயா தோட்டம், ஹேவாஹெட்ட; 1942 - வேலாயுதம், கந்தான தோட்டம், புப்புரஸ்ஸ; 1950 - வெள்ளையன், மீரியாக்கொட தோட்டம், சாமிமலை; 1953 - எட்லின் நோனா, என்கலவல தோட்டம், தெபுவான; 1953 - ஆதியப்பன், மல்கொல்ல தோட்டம், தொலஸ்பாகை உட்பட தொழிற்சங்கப் போராட்டத்தில் உயிர்நீத்த இன்னும் பலருடைய பெயர் விபரங்கள் இந்த ஆவணத்தில் இருக்கின்றன. அதை நான் ஹன்சாட்டில் பதிவுசெய்வதற்காகச் ***சமர்ப்பிக்கின்றேன்.**

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

1815ஆம் ஆண்டு எமது நாட்டுக்கு பிரித்தானியர் வந்த பிறகு, இந்த நாட்டுக்கு அழைத்துவரப்பட்ட தென்னிந்திய தமிழ் மக்கள் பல்வேறு போராட்டங்களுக்கு மத்தியிலே தங்களுடைய வாழ்க்கையை நடாத்தக்கூடிய சூழ்நிலை இருந்திருக்கின்றது. அவ்வப்போது மலையகத்தில் நடைபெற்ற பற்றுச்சீட்டுப் போராட்டம், சம்பள உயர்வுப் போராட்டம், வேலைவாய்ப்புப் போராட்டம், மொழி உரிமைப் போராட்டம் எனப் பல்வேறு போராட்டங்களில் கலந்துகொண்டு உயிர்நீத்த எங்களுடைய தியாகிகளை நினைவுகூரும் வகையில், சனவரி 10ஆம் திகதியை மலையகத் தொழிற்சங்கத் தியாகிகள் தினமாக இந்த பாராளுமன்றம்மூலம் பிரகடனப்படுத்த வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன்.

இந்த வருடம் நாங்கள் இந்தத் தியாகிகளுடைய தினத்தை அனுஷ்டிக்கும் முகமாக நுவரெலியா நகரில் மாநகர சபையின் எல்லைக்கு உட்பட்ட பிரதேசத்தில் தூபி ஒன்றை நிறுவினோம். அதனை அரசாங்கத்தின் உடன்பாட்டோடு நிர்வகிக்க நடவடிக்கை எடுக்க வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன். இதனை நாங்கள் செய்வதைவிட, அந்த மக்களுக்காக அரசாங்கம் செய்ய வேண்டுமென்றே நாங்கள் எதிர்பார்க்கின்றோம். இவ்வாறான போராட்டங்கள் 1979 வரை நடைபெற்றன. இறுதியாக கண்டி, பல்லேகல தோட்டத்தைச் சேர்ந்த பழனிவேல் என்ற நபரோடு இந்தப் போராட்டங்கள் முடிந்திருந்தாலும், இப்பொழுது எங்களுக்குப் பல்வேறு வழிகளிலும் அனுசரணைகள் கிடைக்கின்ற காரணத்தால், நாங்கள் அரசியல் ரீதியாகப் பல்வேறு போராட்டங்களை நடத்திக் கொண்டு வருகின்றோம். அவை ஜனநாயக ரீதியில் நடத்தப்படுகின்ற போராட்டங்களாக இருக்கின்றன. கடந்த காலங்களில் இருந்த இவ்வாறான சூழ்நிலை இப்போது மாறிவிட்டதா என்பது எனக்குத் தெரியவில்லை. எது எப்படி யிருந்தாலும், இந்தத் தினத்தை ஞாபகப்படுத்த வேண்டியது எங்களுடைய கடமையாக இருக்கின்றது என்பதை நான் இந்த நேரத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

ඊට අමතරව මම පොඩි වෙලාවක් ගන්න ඕනෑ, වෙනත් විස්තරයක් කියන්න. ගරු ඇමතිතුමනි, ඊයේ රාත්‍රී ගිනිගත්හේන නගරයට පිරිසක් ඇවිල්ලා නිධානයක් ගන්න කියලා බිලි පූජාවක් පවත්වලා තිබෙනවා. ඒ බිලි පූජාවේදී අවුරුදු දෙකක ළමයෙක් කපන්න, බිලි දෙන්න ලෑස්ති කරලා තිබෙනවා. ඊයේ රාත්‍රී පොලීසියත් ගිහිල්ලා, ඒ වත්තේ -කැනිල්වර්ත් වත්ත- මිනිස්සුත් එකතු වෙලා ඒක නවත්වලා තිබෙනවා. පොලීසියට inform කරලා ඒ අය arrest කරලා තිබෙනවා. නමුත් ඒ වාගේ සිද්ධි වතුවල සිදු නොවෙන්න බලා ගන්න එක- *[බාධා කිරීමක්]* අමතර යෝජනාවක්. මේ සිද්ධිය ඊයේ රාත්‍රී වුණේ. මම ඊට පස්සේ DIGට කථා කරලා සාමකාමී විධියට ඒක නැවැත්වුවා. ඒ අය arrest කරලා තිබෙනවා. නමුත් ඒ ගැන ආණ්ඩුව බලන්න ඕනෑ කියලා ඉල්ලීමක් කරනවා. ආණ්ඩුවේ නිලධාරිනුත් ඒකට සම්බන්ධ වුණය කියලා ආරංචි වෙලා තිබෙනවා. මම DIGට ඒක කියලා තිබෙනවා. ඒ ගැන පොඩ්ඩක් බලන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටින්න කැමැතියි.

Thank you.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනෝ ගනේසන් මැතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.47]

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

මගේ කාලය විනාඩි පහකට සීමා කරන්න එපා කියලා ඉල්ලීමක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களது பாராளுமன்ற உறுப்பினர் கௌரவ வேலு குமார் அவர்கள், "மலையகத் தொழிற்சங்கத் தியாகிகள் தினம் ஒன்றைப் பிரகடனப்படுத்தல்" என்ற தலைப்பில் தனி நபர் பிரேரணையை முன்மொழிந்திருந்தார். அதனை கௌரவ இராதாகிருஷ்ணன் அவர்கள் வழிமொழிந்திருந்தார். இதனை நான் பெரிதும் பாராட்டி, வாழ்த்தி வரவேற்கின்றேன்.

கௌரவ வேலு குமார் அவர்கள் உரையாற்றும்பொழுது, ஒரு விடயத்தைச் சொன்னார். அது கௌரவ அமைச்சர் அவர்களுக்கும் விளங்கியிருக்கும் என நான் நினைக்கின்றேன். நாங்கள் இந்திய வம்சாவளி மக்களாக இருக்கலாம்! ஆனால், இந்தியர்கள் அல்லர்; இலங்கையர்கள். இதையிட்டு அரசாங்கமும் சகோதர சிங்கள மக்களும் மகிழ்ச்சியடைய வேண்டும்; அதை வரவேற்க வேண்டும் என்று நான் கேட்டுக்கொள்கின்றேன். நாங்கள் இலங்கையர்கள்! எங்களுடைய மக்கள் எல்லோருக்கும் பிரஜாவுரிமை கிடைத்திருந்தாலும் கூட, நாங்கள் முழுமையான இலங்கைப் பிரஜைகளாக மாறவில்லை. We are fully not citizens yet; all of us have obtained citizenship legally, but we are fully not citizens of the country. ඒකයි ඇත්ත තත්ත්වය.

அதை நீங்கள் கவனத்தில் எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். அதனால்தான் இப்பொழுது நாங்கள், "மலையக மக்கள்" என்ற அடையாளத்தைச் சுவீகரித்துக் கொண்டு இருக்கின்றோம். அதன் அடிப்படையில், நாங்கள் இந்திய மக்கள் அல்லர்; இலங்கையர்கள். "மலையக இலங்கையர்கள்" - "Malaiyaha Sri Lankans" - என்ற அடையாளத்தை நாங்கள் கொண்டிருக்கின்றோம் என்பதை நான் தமிழ் முற்போக்குக் கூட்டணியின் தலைவர் என்ற முறையில், எங்களது MPsஉம் இச்சபையில் இருக்கின்ற இச்சந்தர்ப்பத்தில் மகிழ்ச்சியுடன் கூற விரும்புகின்றேன்.

உண்மையிலேயே இந்த அரசாங்கம் மலையக மக்களின் விடயத்தில் தோல்வியடைந்து விட்டதென்றுதான் சொல்ல வேண்டும். அதனை நான் கவலையுடன் கூற விரும்புகின்றேன். இந்த அரசாங்கத்தின் தலைவரும் நாட்டின் தலைவருமான மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் எனக்கு அந்நியர் அல்லர். நேற்று மாலைகூட, அவர் என்னுடன் தொலைபேசியில் உரையாடினார். பிரச்சினையில்லை! ஆனால், இந்த அரசாங்கம் மலையக மக்களின் விடயத்தில் தோல்வியடைந்து விட்டது. The Presidential Secretariat has sent me their latest Cabinet Proposal to declare estate housing areas as villages. நான் இந்தச் செயற்பாட்டை மோடி மஸ்தான் வேலையாகத்தான் கருதுகின்றேன். நான் இங்கு 'மோடி' எனக் குறிப்பிட்டது, இந்தியப் பிரதமர் நரேந்திர மோடி அவர்களை அல்ல. பொதுவாகத் தமிழில் "மோடி மஸ்தான் வேலை" எனக் கூறுவார்கள். அப்படியென்றால், "வித்தை காட்டும் வேலை" என்று அர்த்தப்படும். அது அவ்வளவு பொருத்தமானதொரு வேலையல்ல. இந்த அரசாங்கத்தின் செயற்பாடுகளும் அப்படித்தான் இருக்கின்றது.

தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 ரூபாய் நாட்சம்பளம் தருவதாக மாண்புமிகு சனாதிபதி அவர்களும் அறிவித்தார்; கௌரவ தொழில் அமைச்சர் அவர்களும் அறிவித்தார். எல்லோரும் அதனைக் கொண்டாடினார்கள்; மகிழ்ந்தார்கள். ஆனால், இன்னமும் அது எமது மக்களுக்குக் கிடைக்கவில்லை! அது இழுபறி நிலையிலே இருக்கின்றது. "இதோ வருகின்றது! அதோ வருகின்றது" என்று சொல்கிறார்கள்.

"ඔන්න එනවා, මෙන්න එනවා" කියලා කියනවා. හැබැයි, ඒ පඩි වැඩිවීම තවමත් ලැබුණේ නැහැ. එච්චරයි වෙලා තිබෙන්නේ. ආකයාල්, අතු නටක්කාතු! ඒකට ඉස්සෙල්ලා ඡන්දය එයි. ඡන්දය එන්න ඔන්න මෙන්න තිබෙනවා. ඒකයි වෙලා තිබෙන්නේ.

கடந்த முறை உயர்த்தப்பட்ட தோட்டத் தொழிலாளர்களுக்கான 1,000 ரூபாய் நாட்சம்பளத்தைப் பெற்றுத் தந்துவிட்டதாகச் சொல்கிறார்கள். அது எல்லாத் தோட்டத் தொழிலாளர்களுக்கும் கிடைப்பதில்லை. பலருக்கு அவர்கள் பறிக்கும் கொழுந்தின் அடிப்படையில்தான் சம்பளம் நிர்ணயிக்கப் படுகின்றது. அந்த அடிப்படையில் பார்த்தால், அவர்களுக்கு அரைநாள் சம்பளம்தான் கிடைக்கின்றது. கௌரவ இராதாகிருஷ்ணன் அவர்களே, அப்படித்தானே! அப்படித்தான் இதுவும் கிடைப்பதில்லை! இதுவும் ஒரு மோடி மஸ்தான் வேலைதான்!

நாங்கள் கேட்டுக்கொண்டதன் அடிப்படையில், பிரதமர் நரோந்திர மோடி அவர்கள் எங்களுக்கு வாக்குறுதியளித்த இந்திய அரசாங்கத்தின் உதவியின் கீழான 10,000 வீடுகள் அமைக்கும் திட்டம் கட்டங்கட்டமாக இடம்பெற்று வந்தது. இப்போது அதுவும் இடைநிறுத்தப்பட்ட நிலையில் இருக்கின்றது. இதற்குக் காரணம், அந்த வீட்டுத் திட்டத்தில் இடம்பெற்ற தில்லுமுல்லுகள், மோசடிகள், பித்தலாட்டங்கள், ஊழல் செயற்பாடுகள் ஆகும். எங்களுடைய அரசாங்கம் வரும்பொழுது, நாங்கள் நிச்சயமாக அந்த வீட்டுத் திட்டத்தை நிறைவு செய்வோம்.

அடுத்து, மாண்புமிகு ஜனாதிபதி அவர்கள் 4,000 மில்லியன் - 400 கோடி - 4 பில்லியன் - ரூபாயை ஒதுக்கீடு செய்து, மலையகப் பெருந்தோட்ட மக்களுக்கு வீடு கட்டுவதற்கு தலா 10 பேர்ச் காணி தருவதாக இங்கு சொன்னார். எங்கே அந்தக் காணி? 10 பேர்ச் காணியும் இல்லை; ஒன்றும் இல்லை. 4,000 மில்லியனும் இல்லை; 400 கோடியும் இல்லை; 4 பில்லியனும் இல்லை; ஒன்றுமே இல்லை. தோட்டத் தொழிலாளர்களின் சம்பள விடயமும் இழுபறியில் இருக்கின்றது; வீட்டு விடயமும் இழுபறியில் இருக்கின்றது; காணி விடயமும் இழுபறியில் இருக்கின்றது. ஒன்றுமே இல்லை. அதுதான் உண்மை! *[இடைமீடு]* ஆமாம்! 'அதோ! தேர்தல் வருகின்றது, இதோ! தேர்தல் வருகின்றது' என்று இருக்கின்ற இவ்வேளையில், இன்னும் சில நாட்களுக்குள் ஜனாதிபதித் தேர்தல் தொடர்பான அறிவித்தலை விடுப்பதற்கான அதிகாரம் தேர்தல் ஆணைக் குழுவுக்கு வரவிருக்கின்ற நேரத்தில், தோட்டத் தொழிலாளர்களின் விடயத்தில் தோல்வியடைந்த அரசாங்கம், வேறு வழியில்லாமல் இப்பொழுது தோட்டக் குடியிருப்புகளைக் கிராமங்களாக அறிவிப்பதாகக் கூறுகின்றது. அது பெரிய வேலை அல்ல; காகிதம்மூலம் செய்கின்ற வேலை! ஆகவே, அந்த வேலையைச் செய்ய வேண்டாமென நாங்கள் கூறுகின்றோம்.

எங்களைப் பொறுத்தவரையில், தோட்ட மக்கள் ஒதுக்கப்பட்ட மக்களாக வாழக்கூடாது. அவர்களும் தேசிய நீரோட்டத்தில் கலக்க வேண்டும். நான் பிரதிநிதித்துவம் செய்யும் தேர்தல் மாவட்டம் கொழும்பு. அம்மாவட்டத்தில் உள்ளடங்குகின்ற அவிசாவளையில் பெருந்தோட்டங்கள் இருக்கின்றன. நான் அவிசாவளையில் இருக்கின்ற புவக்பிட்டியவுக்குப் போனேன். பாமன்கடையில் இருக்கின்ற எனது வீட்டிலிருந்து புவக்பிட்டியவுக்குச் செல்வதற்கு ஒரு

மணித்தியாலம் எடுத்தது. அதேநேரம், புவக்பிட்டியவிலிருந்து பென்ரீத் தோட்டத்தில் இருக்கின்ற கருங்காலி மேல் பிரிவுக்குச் செல்வதற்கு 1¾ மணித்தியாலம் எடுத்தது. அங்கிருக்கும் மக்களிடம் எப்போது அவிசாவளை நகருக்குச் சென்றீர்கள்? என்று கேட்டேன். அதற்கு அவர்கள், "நாங்கள் தீபாவளிக்குச் சென்றோம்; பொங்கலுக்குச் சென்றோம்" என்று சொன்னார்கள். அவர்கள் அவிசாவளை நகருக்கு அதிகம் வருவதில்லை. அந்தளவுக்கு அவர்கள் பழங்குடி மக்கள்போல் வாழ்ந்துகொண்டு இருக்கிறார்கள்.

ඇමතිතුමා, අපේ වතුකරයේ ජනතාව හුදෙකලා වුණු ජනතාවක් විධියට ජීවත් වෙනවා. ඒ ගොල්ලන් ජාතික ප්‍රවාහයට ගෙන එන්න ඕනෑ නම්, දැනට ඒ අය ඉන්න තැන්වලින් පහළට ගෙනැල්ලා පදිංචි කරවන්න ඕනෑ. ජනාධිපතිතුමා එක්ක මම ඒ ගැන කථා කරලා තිබෙනවා. එතුමා අගමැති ධුරයේ ඉන්න කොට, විපක්ෂ නායක ධුරයේ ඉන්න කොට මම එතුමා එක්ක ඒ ගැන කථා කළා. මොකද, මම එතුමා එක්ක අවුරුදු 20ක්, 25ක් ඉඳලා තිබෙනවා නේ. මම එතුමාට ඒ ජනතාව ගැන කියලා තිබෙනවා. එතුමා ඒක පිළිගෙන තිබෙනවා. තවමත් ඒ ලයින් කාමර තියාගෙන, ඒ ප්‍රදේශවලට ගම්මාන කියලා කියනවා නම්, ඒක අපිට පිළිගන්න බැහැ. එතුමා කියපු විධියට ඒ ජනතාවට පර්චස් 10ක ඉඩම් ප්‍රමාණයක් මහ පාර ළඟින් දෙන්න ඕනෑ. ඇයි ඒ? ඒ ජනතාව ජාතික ප්‍රවාහයට එන්න ඕනෑ. ඒ ජනතාව පහළට ඇවිල්ලා ගෙවල් හදා ගෙන, එතැන ජීවත් වෙන සිංහල ජනතාව සමඟ එකමුතුව ජීවත් වෙන්න ඕනෑ. මට ඕනෑ, මගේ ජනතාව කඳුකරයේ ජීවත් වෙන සිංහල ජනතාව සමඟ එකමුතු වෙලා ජීවත් වෙන්නයි. ඒකයි අපි බලාපොරොත්තු වෙන ශ්‍රී ලාංකිකත්වය. නැත්නම් ශ්‍රී ලාංකිකත්වය හදන්න බැහැ. අවුරුදු 200කින් පසුවත්, ඒ ගොල්ලෝ හුදකලා වෙච්ච ජනතාවක් විධියට වෙන් කරලා, තල්ලු කරලා තිබෙන සංස්කෘතිය අපි අවසන් කරන්න ඕනෑ. වතුකරයේ ජනතාව නියෝජනය කරනවා කියමින් ආණ්ඩුව එක්ක කණ්ඩායමක් ඉන්නවා. ඒ ගොල්ලන්ගේ සංස්කෘතිය තමයි ඒක. ඒ ජනතාව වෙන් කරලා, ඉබ්බො දාලා වහලා තියලා, මැතිවරණ කාලයේ යතුරු අරගෙන ඇවිල්ලා කේවල් කරලා, ඒ ගොල්ලන්ට ඕනෑ දේ ලබා ගෙන යනවා. ඒ සංස්කෘතිය අපි අවසන් කරලා ඉවරයි. දමිළ ප්‍රගතිශීලී සන්ධානයේ නායකයා හැටියට මම කියන්න කැමැතියි, අපි ඒ සංස්කෘතිය අවසන් කරලා ඉවරයි කියන එක. ජනාධිපතිවරණයක් ආවත් අපි කටයුතු කරන්නේ එහෙමයි. අපිට ඕනෑ ඒ සංස්කෘතිය අවසන් කරලා, ජාතික ප්‍රවාහය ඇතුළට එන්න.

தேசிய பிரவாகத்துக்குள் எங்களுடைய மக்கள் வருவதற்கான சூழ்நிலையை ஏற்படுத்திக் கொடுங்கள்! அதுதான் எங்களுக்குத் தேவை! அதைச் செய்வதற்கு இந்த அரசு தவறிவிட்டது என்று கூறிக்கொண்டு, இந்த தனி நபர் பிரேரணையைக் கொண்டுவந்த கௌரவ வேலு குமார் அவர்களுக்கும் அதனை வழிமொழிந்த கௌரவ இராதா கிருஷ்ணன் அவர்களுக்கும் நன்றி கூறி விடைபெறுகின்றேன். வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Buddhika Pathirana. You have five minutes.

[අ.භා. 1.55]

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අපේ ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා ගෙනා පෞද්ගලික මන්ත්‍රී යෝජනාවට සමගි ජන බලවේගය සෘජුව නියෝජනය කරන, මේ ගරු සභාවේ සිටින මන්ත්‍රීවරයෙකු වශයෙන් මම කියන්න කැමැතියි, මේ යෝජනාවට අපි අත් දෙකම ඔසවා සම්පූර්ණ සහාය පළ කරන බව. වර්තමාන රජය ඒ දිනය ප්‍රකාශයට පත් කළේ නැත්නම්, අනාගතයේ ගරු සජිත් ප්‍රේමදාස ජනාධිපතිතුමා යටතේ නියත වශයෙන් එය සිදු කරන බව මම කියන්න කැමතියි. "වතු ආශ්‍රිතව" කියන කොට නුවරඑළිය, මාතලේ, මහනුවර, කෑගල්ල, රත්නපුරය පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රජාව ලෙස අප සලකන සියලුදෙනා වෙනුවෙන් අපි අනාගතයේදී මේ යෝජනාව ක්‍රියාත්මක කරනවා කියන සහතිකය තමුන්නාන්සේලාට ලබා දෙන්න කියලා ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා මට ප්‍රකාශ කළ බව මම මේ අවස්ථාවේ සන්තෝෂයෙන් සඳහන් කරනවා.

ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරයත්, තවත් බොහෝ ප්‍රගතිශීලි අයත් එකතු වෙලා මුල්ඔය සටන ඇරඹුවා. මම මුල්ඔය සටන ගැන කියවූයේ "බ්‍රේස්ගර්ඩිල් සහ ගෝවින්දන්" කියන පොතෙන්. එවකට හිටපු පොලිස්පතිවරයා කොච්චර අපහසුතාවට පත් වුණාද කියනවා නම්, ගෝල් ෆේස් මහ රැලියට ඇවිල්ලා බ්‍රේස්ගර්ඩිල් අත වනලාත් යන්න ගියා. එදාත් පොලීසිය පීවං වුණා. අදත් ඒ වාගේ තත්ත්වයක් රටේ තිබෙන්නේ. මුල්ඔය සටන තමයි ඉතිහාසයේ අරගළයකදී ලේ හැළුණු තැන. හැබැයි, අපි අමතක කරන්නේ නැහැ, ලංකාවට ඇවිත් ගිය අවුරුද්ද වන විට අවුරුදු 200 සමරපු ඉන්දීය සම්භවයක් ඇති ජනතාව. ගරු මනෝ ගනේසන් මැතිතුමාත් සමඟ මම මාතර දිස්ත්‍රික්කයේ උත්සවයක් පවත්වන්නටත් යෙදුණා. ඉන්දියාවේ ඉඳලා මන්නාරම හරහා පයින් එද්දී අපේ කාලගුණය දරා ගන්න බැරි වීම නිසා සහ බඩගින්න දරා ගන්න බැරි වීම නිසා ඒ ජනතාව සිය ගණනක් මැරුණා. ඒ සියලුදෙනා සිහි කරන්නට දිනයක් නම් කළ යුතුයි. ඒ සියලුදෙනා නිසා තමයි, අපේ රට ආර්ථික අතින් දුෂ්කර තත්ත්වයක තිබියදීත්, අදත් අපට ඩොලර් ලැබෙන ප්‍රධාන මාර්ගයක් හැදිලා තිබෙන්නේ.

ඒ අයගේ ලේ, ඒ අයගේ කඳුළු, ඒ අයගේ දහඩිය යන ඒ සියල්ල නිසායි අපට ඒවා ලැබෙන්නේ. අදටත් ඒ වතු ආශ්‍රිත ප්‍රජාවට වෙන අකරතැබ්බවල නිමාවක් නැහැ. ඒ නිසා ඒ අය අතීතයේ දිවි දුන්, අතීතයේ ලෙයින්, කඳුළින්, දහඩියෙන් මේ රටට දායකත්වය දුන් ශ්‍රී ලාංකීය පුරවැසියෝ. ඒ අය සිංහල වෙන්න පුළුවන්, දමිළ වෙන්න පුළුවන්, මුස්ලිම් වෙන්න පුළුවන්, බර්ගර් වෙන්න පුළුවන්. ඒ අයට ශ්‍රී ලාංකික කියන්න පුළුවන්. ඒ අයට ඉන්දියානු කියන එක වැරැදියි. ඒ අයත් දැන් ශ්‍රී ලාංකික. දැන් ඉන්දියානු දෙමළ කියලා අපේ ශබ්ද කෝෂයේ තිබෙන්න විධියක් නැහැ. මට මතක් වෙනවා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා සහ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තමයි මේ ප්‍රශ්නය සෑහෙන දුරට ඉවර කළේ කියන එක. එයින් ඉතුරු වුණු ප්‍රශ්න හැටියට තවමත් තිබෙනවා නම්, එහෙම තිබෙන්නේ සමහරුන්ට හැඳුනුම්පත් හා උප්පැන්න පිළිබඳ ප්‍රශ්න තමයි. ඒ ප්‍රශ්නත් අපි විසඳා ගන්න වුවමනායි. හැබැයි, තවමත් වතුවල ප්‍රජාවට යම් යම් අකරතැබ්බ සිද්ධ වෙනවා. ඒකට හොඳම උදාහරණය තමයි, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමාත් දන්නා අපේ ප්‍රදේශයේ හුලංදාව වත්තේ ඇති වූ සිද්ධියක් මීට සති කිහිපයකට කලින් මගේ සම්බන්ධීකරණ නිලධාරි ලාසාර් මහතා කථා කරලා කිව්වා. එක්තරා පවුලක අම්මයි තාත්තයි වයසයි. ඒ ගොල්ලෝ අංශභාග රෝගයෙන් පෙළෙනවා. ඒ මනුෂ්‍යයන්ගේ ගෙදර වටේට මඤ්ඤොක්කා, කෙසෙල් පඳුරු කිහිපයක් හා අන්නාසි පඳුරු කිහිපයක් වවාගෙන තිබුණා. දැන් ඔවුන්ට රුපියල් 1,700 ලැබෙන්නේත් නැහැ. ලැබෙන වැටුප මදි නිසා, වවාගත් ඒවායෙන් ලැබෙන ආදායමින් තමයි ඔවුන් ජීවත් වුණේ. වතු අධිකාරි ඇවිල්ලා ඒ කෙසෙල් පඳුරු කැන් පිටින්ම නියුණු ආයුධයකින්

[ගරු බුද්ධික පතිරණ මහතා]

ඔක්කොම කපලා, එතැන තිබුණු මඤ්ඤොක්කා ගස් අල පිටින් ගලවා දාලා. මම එතැනට ගියාම ඒක දැකලා මගේ ඇස් දෙකට කඳුළු ආවා. ඊට පස්සේ මම පොලීසියට කථා කරලා කිව්වා, "පැමිණිල්ල භාර ගන්න" කියලා. මම මාධ්‍ය ආයතනවලට කථා කරලා කිව්වා, "මේක පෙන්වන්න" කියලා. මට ඒ වැඩිහිටි අම්මයි, තාත්තයි දැක්කාම, මගේ අම්මායි තාත්තායි මතක් වුණා. ඔවුන් අද ජීවතුන් අතර නැහැ. නමුත්, මට ඒ දෙදෙනා මතක් වුණා. තවමත් එවැනි තත්ත්වයක් ඒ අයට තිබෙන්නේ.

ඒ වාගේම පසුගිය කාලයේ අධික වැස්ස නිසා ආපු ගංවතුරට ඒ අයගේ ගෙවල් කැඩිලා ගියා. ඒ හදිසි ආපදාවේදී ගෙවල්වලට පස් ඇවිල්ලා කියලා කථා කළාම, එක්තරා නිලධාරියෙක් කිව්වා, "ඔය ගොල්ලෝ වත්තේ නේ. හුලංදාව කියන්නේ වත්ත නේ, වත්තේ අයට කියලා අස් කරවා ගන්න." කියලා. ආණ්ඩුවෙන් ඇවිල්ලා අනෙක් තැන්වලට උදව් කරනවා. වත්තේ ජීවත් වන අයට කියනවා, වත්තේ අය ලවා කරවා ගන්න කියලා. මේවා තමයි මේ අයට අදටත් වෙන කරදර.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හුලංදාව වත්ත පිහිටලා තිබෙන්නේ අකුරැස්ස ආසනයේ කෙළවරේ. එතැනින් තමයි දෙනියාය ආසනය පටන් ගන්නේ. ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ ඉන්නවා. හුලංදාව පාලමෙන් එහා පැත්ත පිටබැද්දර පොලිස් වසමටයි අයිති. පොලීසි දවසකට දෙන්න ඕනෑ නඩු ගණනක් තිබෙනවා නේ. ඒ නඩු ගණන මදි වුණාම, -හුලංදාව වත්ත තිබෙන්නේ අකුරැස්ස පොලිස් වසමේ අන්තිම කෙළවරේ නේ- පිටබැද්දර පොලීසිය හුලංදාව වත්තට එනවා. මේ මීනිස්සු සවස වැඩ ඉවර වෙලා නාන්න යනකොට, Identity Card එක අරගෙන යන්නේ නැහැ. ඒ වාගේම පොදු වැසිකිළියක් තිබෙනවා. ඒකට යන කාන්තාවන් හා පිරිමි අය Identity Card එක ඉනේ ගහගෙන යන්නේ නැහැ නේ. ඔවුන්ගෙන් "කෝ, Identity Card එක?" කියලා අහලා ඒ අය අරගෙන යනවා. අපට සමාජ වෛරයක් ඇති කරන්නේ මේ වාගේ අවස්ථාවලින් නේද? තුවක්කු ගන්න අය බිහි කරන්නේ මේ වාගේ අවස්ථාවලින් නේද? අභිසංකලා අංගුලිමාලලා කරන්නේ මෙතැනින් නේද?

ඊළඟට, මම කියාගෙන ආවේ ගංවතුර නිසා වැසිකිළියක් කැඩුණා. වැසිකිළිය හදන්න ඒ මිනිස්සු වැලි ටිකක් අරගෙන ගියා. ඒකට ශබ්ද නැතුව හිටියා. ඊට පස්සේ අවශ්‍ය සිමෙන්ති ටික අරගෙන ගියා. ඒකටත් ශබ්ද නැතුව හිටියා. ගඩොල් ටික ගන්න කොට, හාර්ඩ්වෙයාර් එකට ගිහිල්ලා කිව්වා, "වත්තේ අයට ගඩොල් විකුණන්න එපා" කියලා. මේ වාගේ බේදනීය තත්ත්වයක් තිබෙනවා. ඒවා ගත්තේ වැසිකිළිය හදා ගන්න. මාතර දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ප්‍රදේශවල ජනතාව පිළිබඳව මම වගකීම දරනවා. ඒක අද ඊයේ නොවෙයි, දැන් අවුරුදු 20ක කාලයක ඉඳලා එහෙමයි. ඒ නිසා මම මේ කාරණාවට මැදිහත් වෙනවා.

ඒ නිසා මම ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ස්ථිර කරන අතර, මේ යෝජනාවට අපි සමගි ජන බලවේගය වශයෙන් නිල වශයෙන් සම්පූර්ණ සහයෝගය දෙන බව ප්‍රකාශ කරනවා. අපි එක රටක් තුළ එක අම්මාගේ දරුවෝ වාගේ ජීවත්වීමේ එකඟතාව උඩ, ඒ බැඳීම උඩ, මේ රටට ඔබ එකතු කරන මහා ශක්තිය උඩ, අපි මේ පරිපාලනමය ප්‍රශ්න විසඳා ගන්න ඕනෑ. එහෙම නැත්නම් අනාගතයේ වතුකරයත් අපට අඳුරු වෙන්න පුළුවන්. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාත් අද ඔබතුමාගේ මේ යෝජනාව ගැන කථා කරන්න හිටියේ. නමුත්, එතුමාට සම්බන්ධ වෙන්න බැරි වුණා. ඒ නිසා මේ යෝජනාව ජනාධිපතිවරණයට කලින් මේ මාස තුන තුළ ඉෂ්ට වුණේ නැත්නම්, අපේ පළමුවැනි කැබිනට් පත්‍රිකා අතරින් මේ යෝජනාව ක්‍රියාත්මක කරමු, කියලා එතුමා පැහැදිලිව කිව්වා. මම හිතන්නේ, ඒ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන්න අභිනවයෙන් එදාට පත් වෙන කැබිනට් අමාත්‍යවරුන්ට වාසනාව තිබෙයි. මේ තුළින් වතු ආශ්‍රිත ජනතාවගේ ජීවන තත්ත්වය වෙනස් කරන්න ගන්න තිබෙන හැම ක්‍රියා මාර්ගයකටම මුල පුරමු. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.02]

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා වතු කම්කරු ජනතාව සම්බන්ධයෙන් ඉතාම වැදගත් යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. එක පැත්තකින් බැලුවාම අද මේ යෝජනාව ගැන කථා කරන්න ලැබීමම වැදගත් දෙයක්. ගරු සභානායකතුමනි, ඔබතුමා දන්නවා මීට අවුරුදු 44කට කලින්, 1980දී වැඩ වර්ජනය සිදු වෙන වෙලාවේ, දවසකට රුපියල් 10කින් පඩි වැඩි කරන්න කියලා පාරට බැහැපු රාජ්‍ය සේවකයන් 40,000ක් ගෙදර යවපු බව. දවසකට රුපියල් 10 බැගින් මාසයකට රුපියල් 300කින් වැටුප් වැඩි කරන්න කියලායි එදා කිව්වේ. ඒ අරගළය වෙලාවේ වමේ ව්‍යාපාරයට නායකත්වය දුන් සෝමපාල සහෝදරයා සාතනය කරලා තමයි එදා ඒ වෘත්තීය සමිති අරගළය මර්දනය කරන්න ජේ.ආර්. ජයවර්ධන රජය කටයුතු කළේ. අදත් ඒක වෙනත් වටයකින් සිද්ධ වෙනවා, තර්ජනය කිරීම්, ගැසට් කිරීම්, සේවයෙන් පහ කිරීම් වාගේ දේවල් එක්ක. අපි ඒවා ගැන වෙනම කථා කරමු.

අපේ රටේ ලාංකීය කම්කරු සමිති ව්‍යාපාරයේ අදට වඩා හාත්පසින් වෙනස් ස්වභාවයකින් තමයි එදා කම්කරු අරගළ සිද්ධ වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලන පක්ෂ මුල් කරගෙන අද තිබෙනවා වාගේ වෘත්තීය සමිති ව්‍යාපාර නොවෙයි, - ඒක දකුණේත් එකයි, වතුකරයේත් එකයි - එදා තිබුණේ. එදා තිබුණේ දේශපාලන අරමුණු මුල් කරගෙන, කම්කරු අරමුණු මුල් කරගෙන ක්‍රියාත්මක වුණු වෘත්තීය සමිති අරගළයක්.

අද මේ ප්‍රස්තුත කාරණාව ගැන කථා කරන ගෝවින්දන් සහෝදරයා අරගළ කළේ වතු අයිතිවාසිකම් වෙනුවෙන් විතරක් නොවෙයි, අධිරාජ්‍යවාදයට විරුද්ධව. එදා රැජිනගේ පාලනය තිබෙන වෙලාවේ, 1939-1940 බ්‍රේස්ගර්ඩ්ල් නමැති බ්‍රිතාන්‍යයෙන් ආව වතු අධිකාරිවරයා සමඟ එකතුව ඒ කළ මුල්ඔය අරගළය, එදා අධිරාජ්‍යවාදීන්ට එරෙහිව කළ අරගළයක්. ඒ නිසා ඒ අරගළය ලාංකීය දේශපාලනයේත්, ලාංකීය වෘත්තීය සමිති ව්‍යාපාරයේත්, වතුකරයේ ජීවත් වෙන දෙමළ මිනිස්සුන්ගේ විතරක් නොවෙයි ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේත් ඓතිහාසික සටහනක් තබන අරගළයක් බවට පත් වුණා. ඒ වාගේම ගෝවින්දන් සහෝදරයා වෘත්තීය සමිති ව්‍යාපාරයට විතරක් නොවෙයි කම්කරු ව්‍යාපාරයටත් ඉතාම වැදගත් දේශපාලන නායකත්වයක් දීපු නායකයෙක්. අද මේ සභාවේ වෘත්තීය සමිති ව්‍යාපාරය ගැන කථා වුණේ ඉතා අඩුවෙන්. අද වෘත්තීය සමිති ව්‍යාපාරය කිව්වාම ඒකේ අයිතිකාරයෝ ගොඩක් ඉන්නවා. අද වෘත්තීය සමිති ව්‍යාපාරය බිස්නස් එකක් බවට පත් වෙලා. මට සමාවෙන්න ඒ වචනය

පාවිච්චි කළාට. මේ දේශපාලන ව්‍යාපාරයේ වෘත්තීය සමිති ව්‍යාපාරය බිස්නස් එකක් බවට පත් වෙලා තිබෙන නිසා වෘත්තීය සමිතිවල මූලික හර පද්ධති සම්පූර්ණයෙන් වෙනස් වෙලා, විනාශ වෙලා. ඒ නිසා එක එක දේවල් කරන්න පුළුවන්. අද වෘත්තීය සමිති ව්‍යාපාරය කේවල් කරන්නේ රාජ්‍ය බලය ගන්න, එහෙම නැත්නම් තමන්ට තනතුරු ගන්න වාගේ කාරණාවලට. හැබැයි, එදා වතුකරයේ මිනිසුන්ගේ ප්‍රශ්න වෙනුවෙන් කථා කළ වෘත්තීය සමිති ව්‍යාපාරයක් තමයි තිබුණේ. එදා තිබුණු ලංකා ඉන්දීය කම්කරු සම්මේලනයට ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමා තමයි ලංකා සමසමාජ පක්ෂය වෙනුවෙන් නායකත්වය දුන්නේ. ඒක නිසා තමයි තුන් කෝරලය, නුවරඑළිය, මාතලේ වාගේ තැන්වල, වේලු කුමාර් මන්ත්‍රීතුමා නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කය, ඒ ප්‍රදේශවල වතුකරයේ සියලු මිනිස්සු එකතු වුණේ වාමාංශික කම්කරු ව්‍යාපාරයත් එක්ක. 1947 මැතිවරණයේදී ඒක පැහැදිලිව පෙනුණා. ඒක නිසා තමයි වතුකරයේ මිනිසුන්ගේ ඡන්ද අයිතිය අහෝසි කරන්න එදා ඩී.එස්. සේනානායක රජය කටයුතු කළේ. එදා වාමාංශික රජය සමඟ වතුකරයේ කම්කරු ව්‍යාපාරය එකතු වුණු නිසා ඔවුන් අනාගතයේ ධනපති පන්තියට බලපෑමක් වෙන නිසා-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා. *[බාධා කිරීමක්]* කියන්න, ගරු මනෝ ගනේසන් මැතිතුමා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ඒ කාරණා මෙහෙමයි. ඒ කාලයේ පුරවැසි අයිතිය නැති කරන්න කාරණා දෙකක් පෙන්නුවා. එකක් විධියට මතු කළේ, ඒ අය ඉන්දියානු දමිළ පුරවැසියන් කියන එක. අනෙක් කාරණය, ඒ ජනතාව වාමාංශික පක්ෂවලට ඡන්දය දුන්නු නිසායි. ඔබතුමා හොඳ කාරණාවක් මතු කළේ, ඔබතුමාගේ කථාව හරි.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

1947 මැතිවරණයේදී වමේ ඡන්ද ප්‍රමාණය වැඩි වෙනවා, වාමාංශික බලයක් එන නිසා තමයි ඡන්ද බලය නැති කළේ. ඒ ඡන්ද බලය දිනා ගන්නත් එදා වමේ නායකයන් කථා කළා. එදා ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමා වතුකරය වෙනුවෙන් ලංකා ඉන්දීය කම්කරු සම්මේලනයට ඉතාම ඉහළ කාර්යභාරයක් කළා. ඒ වාගේම එදා වතුකරයට සම්බන්ධ වෙලා හිටපු Democratic Workers Congress - DWC - එකේ අසීස් කියන එතිහාසික නායකයාගේ මූලිකත්වයෙන් තමයි වතුකරයේ ජනතාවගේ අයිතිවාසිකම් දිනා ගන්න, අධිරාජ්‍යවාදීන්ට, වතු පාලකයන්ට සහ ආණ්ඩුවට එරෙහිව අරගළ ක්‍රියාත්මක කළේ. ඊට පස්සේ නැවතත් අවස්ථා ගණනාවක එක්සත් වතු කම්කරු සංගමයට නායකත්වය දුන්, - ගරු මනෝ ගනේසන් මැතිතුමාට මතක ඇති - ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට නායකත්වය දුන් එස්. නඩේසන් සහෝදරයා, රාමයියා සහෝදරයා වාගේ වාමාංශික නායකයෝ දැවැන්ත කැප කිරීමක් කළා. මේ මොහොතේ ඔවුන්ගේ නම් සඳහන් නොකළොතින් ඒක අඩුවක් වන නිසා ඒ කාරණා සඳහන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම වතුකරයේ අනෙකුත් කම්කරු නායකයන් කළ කැප කිරීම් නිසා අද යම් ප්‍රමාණයකට සාධාරණයක් ඉෂ්ට වෙලා තිබෙනවා. හැබැයි, අපි ප්‍රශ්න කරනවා. මේ රටේ ආර්ථිකය වෙනුවෙන් කඳුළු, ලේ, දහඩිය, ජීවිතය පරිත්‍යාග කළ ඒ මිනිසුන්ට අදටත් සාධාරණයක් නැහැ. ඒ නියෝජිතයන් ආණ්ඩු නියෝජනය කරනවා, ඇමතිකම් ගන්නවා, ඇමති තනතුරුවල ඉන්නවා, කැබිනට් මණ්ඩලවල ඉන්නවා.

හැබැයි, මෙතෙක් ඒ ජනතාවට සාධාරණයක් ඉෂ්ට වෙලා තිබෙනවාද? අදටත් ඒ වතුකරයේ මිනිස්සු රවටිටන එක තමයි සිද්ධ වෙන්නේ. මේ මැයි දිනයේ සිද්ධ වුණෙත් රැවැටීමක්. මැයි දිනයේ කිව්වා, රුපියල් 1,700ක් දෙනවා කියලා. ඒක හරියට නිකම් අතින් දෙනවා වාගෙයි කිව්වේ. මනුෂ නානායක්කාර ගෙදරින් ගෙනැල්ලා හෝ සිරිකොතේ සල්ලි දෙනවා වාගේ තමයි කිව්වේ. හැබැයි, ඒක බොරුවක් කියලා අපි එදා කිව්වා. ඒ වාගේම මේ වතු කම්කරුවන්ට වැටුප් ලබා දීම ක්‍රමයෙන් දේශපාලන ගුණ්ඩුවක් බවට පත් කරගත්ත නිසා අද අධිකරණය හමුවේත් එය ප්‍රශ්නසහගත වෙලා තිබෙනවා.

ඒ වාගේම අද වතුකරයේ ජනතාව මුහුණ දෙන තවත් මූලික ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. අවුරුදු 200ක් තිස්සේ මේ රටේ ආර්ථිකය ගොඩ නහන්න ඔවුන් දක්වපු කැප කිරීමට අඩුම ගණනේ සාධාරණයක්වත් ඉෂ්ට කරන්න ඕනෑ. ඒක මහන්සියක් වෙන්න ඕනෑ දෙයක් නොවෙයි. ඒකට ආණ්ඩුවේ තීන්දුවක්, කැබිනට් මණ්ඩලයේ තීන්දුවක් විතරයි ගන්න ඕනෑ, ගරු සභානායකතුමනි. පාර්ලිමේන්තුවේ අද මේ සම්මත වන යෝජනාව සමස්ත වතු කම්කරු ව්‍යාපාරයේ කඳුරට -කඳුරට කිව්වාම නුවරඑළිය, බදුල්ල, මස්කෙළිය විතරක් නොවෙයි. දෙනියාය, කළුතර මේ හැම ප්‍රදේශයකම ඉන්න දෙමළ මිනිස්සුත් මේකට අයිතියි- වතු කම්කරුවන්ගේ ඓතිහාසික අරගළයට සාධාරණයක් වෙන්න ගෝවින්දන් සහෝදරයා මරා දමපු ජනවාරි මාසයේ 10වැනි දා ඓතිහාසික දිනයක් ලෙස ප්‍රකාශයට පත් කරනවා නම් ඒක ඓතිහාසික කටයුත්තක්. ඒකෙන් යම් ප්‍රමාණයකට දේශපාලනමය වශයෙන් ඒ ජනතාවට සාධාරණයක් වෙනවා කියන කාරණාවත්, මේ යෝජනාව කාලෝචිත වැදගත් යෝජනාවක් කියන කාරණාවත් සිහිපත් කරමින්, ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය විධියටත්, අපි නියෝජනය කරන දේශපාලන කඳවුර විධියටත් මේ යෝජනාවට සහයෝගය පළ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට රුපියල් 1,700ක් දක්වා වැඩි කළ වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,350කට අඩු වෙලා තිබෙනවා. ඔබතුමන්ලා දන්නවාද දන්නේ නැහැ, අද ආරංචි හැටියට දෙපාර්ශ්වයම එකඟ වෙලා තිබෙනවා ලු, රුපියල් 1,350ට මේක close කරන්න. රුපියල් 1,700ක් ලැබෙන්නේ නැහැ කියලා තමයි මේ අවස්ථාවේ අපට කියන්න වෙන්නේ. වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,700ක් දක්වා වැඩි කරනවා කියලා May Day එකේ දී කියපු එක බොරුවක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, පිළිතුරු කථාව. ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ඩී. වීරසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ඩී. වීරසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු උදයන කිරිඳිගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඩී. වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, மாண்புமிகு உதயன கிரிந்திகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு டீ. வீரசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. UDAYANA KIRINDIGODA left the Chair, and THE HON. D. WEERASINGHA took the Chair.

[අ.භා. 2.09]

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ, 1939 දෙසැම්බර් සිට 1940 ජනවාරි දක්වා කඳුරට කම්කරු ප්‍රජාව විසින් වැටුප් වැඩි කරන ලෙස ඉල්ලා කරන ලද වෘත්තීය සමිති අරගළයේ දී මුල්ලෝයා ගෝවින්දන් නමැති කම්කරුවා ජීවිතක්ෂයට පත් වූ දිනය වන ජනවාරි 10වන දින කඳුරට වෘත්තීය සමිති විරු දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලෙස ඉල්ලමින්.

අපේ වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ 1980 ඇති වූ වෘත්තීය අරගළයේදී සෝමපාල සහෝදරයා මිය ගියා. ඊළඟට ප්‍රශ්නය තිබෙන්නේ මැයි මාසයේ 01වැනි දා ගැනයි. 1886 ඇමෙරිකා එක්සත් ජනපදයේ චිකාගෝ නුවර සිදු වූ කම්කරු සටන නිසා තමයි මැයි 01වෙනි දා සැමරීම වුණේ. 1956දී තමයි අපේ රටේ මැයි 01වන දා නිවාඩු දිනයක් හැටියට නම් කළේ. මෙතුමා කියන මේ සිද්ධිය වෙලා තිබෙන්නේ නිදහස ලැබීමට පෙර. මම මේ කරුණු කිහිපයක් පමණයි ඉදිරිපත් කළේ.

ඊළඟට, ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් සම්පූර්ණයෙන්ම මිදී ස්වාධීන රාජ්‍යයක් බවට පත්වුණේ 1972 මැයි 22වැනි දා. ජාතික වීර දිනය ලෙස ජනවාරි 01වැනි දා නම් කර, ඊට පසුව මැයි 22 ජාතික වීර දිනය ලෙස නම් කිරීමටත් කටයුතු කළා. ප්‍රශ්නය තිබෙන්නේ, කම්කරු අරගළයෙන් මිය යන හැම පුද්ගලයෙකු වෙනුවෙන්ම දිනයක් ප්‍රකාශ කරනවාද කියලායි. අපේ වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා කියපු හැටියට සෝමපාල සහෝදරයා මිය ගිය දවසත් නම් කරන්න ඕනෑ. ඒ නිසා මට තේරෙන්නේ නැහැ, මොකක්ද මේ ඉල්ලන්නේ කියලා.

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
ඒ ඔක්කොම වෙනුවෙන් එක දවසක්, සමරු දිනයක්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
සමරු දිනයක්?

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
ඔව්, සමරු දිනයක්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
හරි, සමරු දිනයක් හැටියට නම් කළාට ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒක නිවාඩු දිනයක් කරන්න ගියොත්, නිවාඩු ගොඩක් වෙයි. එහෙම නම් ඒක පැහැදිලියි. මේ විෂය භාරව තිබෙන්නේ කම්කරු අමාත්‍යාංශයට. සමරු දින විධියට නම් කරන්න පුළුවන්, ඕනෑ තරම්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා සරදියෙල් සමඟ ගැටුමේදී කොස්තාපල් ශඛාන් මිය ගියා. අන්න ඒ දිනය තමයි දැනට පොලිස් දිනය විධියට සමරන්නේ. අන්න ඒ වාගේ ශ්‍රී ලංකාවේ කඳුරට කම්කරු ප්‍රජාව විසින් වැටුප් වැඩි කරන මෙන් ඉල්ලා කරන ලද ප්‍රථම වෘත්තීය සමිති අරගළයේදී මිය ගිය පළමුවැනි පුද්ගලයා වන මුල්ලෝයා ගෝවින්දන් සහෝදරයා වෙනුවෙන් ඔහු මිය ගිය දිනය විරු දිනයක් ලෙස නම් කරන්න කියලායි ඉල්ලන්නේ. සරදියෙල් එක්ක සිදු වුණු වෙඩි හුවමාරුවෙන් මැරුණු ශඛාන් වෙනුවෙන් පොලිස් දිනය නම් කළා වාගේ, ඒ විරුවා මිය ගිය දිනයත් නම් කරන ලෙසයි ඉල්ලන්නේ. එය සාධාරණ ඉල්ලීමක්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
කම්කරු දිනය හැටියටද නම් කරන්න කියන්නේ?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, ඒ අයගේ දිනය හැටියට. යෝජනාවේ ඒ කරුණ තිබෙනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒ කියන්නේ, කඳුරට වෘත්තීය සමිති විරු දිනය කියලාද? ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. මේ යෝජනාව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට යවන්නම්. අමාත්‍යාංශය අවශ්‍ය ක්‍රියා මාර්ගය ගනීවි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට අදහස් දැක්වීමට, යෝජනාව ඉදිරිපත් කළ ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා.

[பி.ப. 2.13]

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, என்னால் முன்மொழியப்பட்ட மலையகத் தொழிற்சங்க தியாகிகள் தினமொன்றைப் பிரகடனப்படுத்தல் தொடர்பான தனிநபர் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றிய அனைத்து உறுப்பினர்களுக்கும் என்னுடைய நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். அதேநேரம், நீண்ட நேரம் காத்திருந்து, பதிலுரையாற்றிய கௌரவ பாராளுமன்றச் சபை முதல்வரும் கல்வி அமைச்சருமான சுசில் பிரேமஜயந்த அவர்களுக்கும் என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அவர் பதிலுரை ஆற்றும்போது, இவ்விடயம் தொடர்பில் சிறியதொரு தெளிவின்மை இருந்தது. அதை நான் ஓரிரு நிமிடங்களில் தெளிவுபடுத்தலாமென நினைக்கின்றேன்.

ගරු අමාත්‍යතුමනි, මලෙයහ ජනතාව මේ රටේ විශේෂ වූ ජන කොට්ඨාසයක්. ඒ ජන කොට්ඨාසයේ අයිතීන් වෙනුවෙන් ජීවිත පූජා කරපු ඒ විරුවන් වෙනුවෙන් අපට සමරන්න දිනයක් නම් කරන්න කියන එක තමයි මගේ යෝජනාව හැටියට තිබෙන්නේ. මම හිතන විධියට, ඔබතුමාට එය පැහැදිලි ඇති.

நான் இந்தப் பிரேரணையில் சில தியாகிகளின் பெயர்களை மாத்திரம் குறிப்பிட்டிருந்தாலும், மலையக மக்களின் எழுச்சிக்காகவும் நல்வாழ்வுக்காகவும் போராடித் தங்களது உயிர்களைத் தியாகம் செய்த பலர் இருக்கிறார்கள். அவர்களில் இன்னொருவரை ஞாபகப்படுத்தி என்னுடைய உரையை முடிக்கலாமென நினைக்கின்றேன். கண்டி மாவட்டத்திலுள்ள நாவலபிட்டிய தொகுதியிலிருந்து பாராளுமன்றத்துக்கு முதன்முதலில் தெரிவு செய்யப்பட்ட உறுப்பினரான "மலையக காந்தி" என அழைக்கப்படும் இராஜலிங்கம் ஐயா அவர்களை இந்த இடத்தில் மலையகத்தின் முக்கிய தியாகியாக ஞாபகப்படுத்தவேண்டிய கடப்பாடு எனக்கு இருக்கின்றது. அவர் 1940களிலிருந்து 1963ஆம் ஆண்டு இறைவனடி சேரும் வரைக்கும் மலையக மக்களின் உரிமைக்காகத் தன்னை முழுமையாக அர்ப்பணித்தார். அதுமாத்திரமன்றி, அவர் தன்னிடமிருந்த சொத்துகளைக்கூட, அதற்காகச் செலவழித் திருக்கிறார். மலையக மக்களின் கல்விக்காகப் பாடுபட்ட அவர், புஸல்லாவ சரஸ்வதி மத்திய கல்லூரியின் ஸ்தாபகராகவும் காணப்படுகின்றார்.

இந்தப் பிரேரணையை முன்வைப்பதற்கு எனக்குத் தகவல்களைக் கொடுத்து உதவிய மலையகத்திலுள்ள சமூக ஆர்வலர்களுக்கும், இவ்விடயத்தில் ஈடுபாட்டுடன் செயற்பட்ட சுயாதீன ஊடகவியலாளரான சனத் ராமசந்திரன் அவர்களுக்கும் என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். நாவலபிட்டிய, கலமுதுன தோட்டத்தைச் சேர்ந்தவரும் எங்களுடைய மலையக மக்களின் சமூக நன்மைக்காக, தொழிற்சங்க செயற்பாடுகளுக்காக, தொழிலா ளர்களின் உரிமைக்காகத் தன்னை முழுமையாக அர்ப்பணித்தவருமான பெரியண்ணன் அவர்கள் நேற்றைய தினம் இறைவனடி சேர்ந்தார். அவருடைய குடும்பத் தினருக்கும், நாவலபிட்டிய பிரதேசத்தில் இருக்கின்ற மக்களுக்கும் ஜனநாயக மக்கள் முன்னணியினதும் தமிழ் முற்போக்குக் கூட்டணியினதும் சார்பில் என்னுடைய ஆழ்ந்த இரங்கலை இந்த உயரிய சபையில் தெரிவித்துக்கொள்கிறேன். நன்றி!

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කලින් ඉල්ලා සිටි පරිදි එතුමාගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව දැන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

நியாய பத்திரத்தின் யோசனை அங்கம் 1 ஐ முன்வைக்க, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම
ஆக்கிரமிப்புச் செடிகள் மற்றும் விலங்குகள் காரணமாக உயிரினப் பல்வகைமைக்கு ஏற்படுகின்ற பாதிப்பைக் குறைத்தல்
MINIMIZING THE DAMAGE CAUSED TO BIO-DIVERSITY BY INVASIVE PLANTS AND ANIMALS

[අ.භා. 2.17]

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම් කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම යෝජනාව සමස්ත ලංකාවටම බලපානවා. විදේශවල තිබෙන ආක්‍රමණික රෝපණ ද්‍රව්‍ය, පැළෑටි සහ සතුන් සංවිධානාත්මකව මෙරටට ගෙන ඒම අපේ පරිසර පද්ධතියේ තුලනාව බිඳින්න ක්‍රියාත්මක වුණු යම් යම් බලවේගවල කෙමන විධියට හඳුනා ගන්න පුළුවන්. අද වනකොට මහවැලි ප්‍රදේශවල ඒ ආක්‍රමණික ශාක විශාල වශයෙන් පැතිරිලා තිබෙනවා. ඒ වාගේම එම ආක්‍රමණික සත්ව විශේෂ අපේ ජලජ පද්ධතිවලටත් බලපා තිබෙනවා. අපි දන්නවා නේ, "ටැංකි සුද්දා" කියන මාළුවා ගැන. ඒ මාළුවා කොහොම හරි ටැංකිවලින් ජලාශවලට යෑම අපේ සමහර ජලජ ජීවීන්ගේ පැවැත්මට ඉතා නරක විධියට බලපා තිබෙනවා. මේ ආක්‍රමණික පැළෑටි මහවැලි ප්‍රදේශවල පමණක් නොවෙයි, අද සිංහරාජ වනාන්තරයේත් දකින්න ලැබෙනවා.

මා ළඟ තිබෙනවා, ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ සජීව වාමිකර ලියපු වැදගත් පොතක්. මට ඒ පොත සභාගත කරන්න විධියක් නැහැ. ඔහු එම පොතේ කථා කරනවා, සිංහරාජ අඩවියේ ප්‍රධාන වශයෙන් ව්‍යාප්ත වී තිබෙන ආක්‍රමණික ශාක විශේෂ 4ක් පිළිබඳව. එනම්, බූ බෝවිටියා, කහ කරාබු, කහ දියපර සහ ගිනිතණ. අපි දන්නවා, සිංහරාජ වනාන්තරය කියන්නේ ලංකාවේ තිබෙන සදාහරිත, නිවර්තන, නොඉදුල් එකම ප්‍රාථමික වැසි වනාන්තරය කියලා. ඒ තුළ අවම වශයෙන් ආක්‍රමණික ශාක වර්ග 4ක් තිබෙනවා. ඒ වාගේම ආක්‍රමණික සත්වයිනුත් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තිබෙන ප්‍රායෝගික අත්දැකීමක් කියන්නම්. මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය

[ගරු බුද්ධික පතිරණ මහතා]

ලේකම් කොට්ඨාසයේ, පරදුව ප්‍රදේශයේ ඉතා නරක විධියට යෝධ නිදිකුම්බා ශාකය පැතිරෙමින් යනවා. එම ශාකය අපේ ප්‍රදේශවල තිබෙන කුඹුරු දැඩිව ආක්‍රමණය කර තිබෙනවා. ඒ යෝධ නිදිකුම්බා ශාකය ගලවලා දැම්මත්, ගිනි තියලා දැම්මත් අවුරුදු ගණනක් යනකොට සමහර මූල කොටස් ආපහු පැළ වෙනවා.

මේ සමහර ආක්‍රමණික ශාකවල බීජෝෂණ සමය ඉතා දීර්ඝයි. එපමණක් නොවෙයි. මේ අතර සමහර බීජ වර්ග තිබෙනවා, ගින්දරට පවා ඔරොත්තු දෙන. ඒ නිසා මේ ආක්‍රමණික ශාක ඉවත් කිරීමට ක්‍රමික වැඩ පිළිවෙළක් ඕනෑ. ඒවා ඉවත් කරලා යම් විකල්ප වැඩ පිළිවෙළකට ගියේ නැත්නම් නැවත මේ ශාක වර්ධනය වීම සිද්ධ වෙනවා. දැන් මම කියන්නේ මේ කාරණයයි.

අපේ රට ආර්ථික අභේනියකට පත් වෙලා තිබෙන මේ වෙලාවේ ආක්‍රමණික ශාක තිබෙන වනගහනවල අපට වෙන විකල්ප වගා කරන්න බැහැ. ඒ වනය ආශ්‍රිත වගා කිරීම්වලටම යන්න ඕනෑ. වනය ආශ්‍රිතව යළි රෝපණ කටයුතු කරද්දී යුකැලිප්ටස්, පයිනස් වැනි ශාක වගා කරන්නේ නැතිව වනයටම ගැළපෙන පලතුරු වර්ග වගා කළොත්, රිළවුන් හා වඳුරන් ගම්වැදීම යම් ප්‍රමාණයකින් නතර කිරීමේ හැකියාවත් ලැබෙනවා. ඒ, එක පැත්තකින්. අනෙක් පැත්තෙන් අපි වගා භූමි ගැන බලමු.

අපේ ප්‍රදේශවල පුරන් කුඹුරු තිබෙනවා, යළි කිසිදා ගොයම් හෝ ඒ හා සමාන භෝග වගා කරන්න බැරි. ඒවා ගැන යම් මට්ටමකින් සාකච්ඡා කරලා අනවසරයෙන් කුඹුරු ගොඩ කරලා වෙන වෙන සෙල්ලම් කරන්න බැරි ක්‍රමයක් ඔස්සේ -ඒක ඉතා වැදගත්. මේ ක්‍රමවේදය පාවිච්චි කරලා කුඹුරු ගොඩ කරන්න ලයිසන් හදාගන්න කිසි කෙනෙකුට අවස්ථාව දෙන්න බැහැ- අපේ ඩොලර් ආදායම වැඩි කර ගන්න අවශ්‍ය නිර්මාණශීලී ව්‍යාපෘතිවලට යෑමේ අවශ්‍යතාව තිබෙනවා.

පරිසරය ආරක්ෂා කරන්න පරිසර අමාත්‍යාංශය තිබෙනවා. ඒ යටතේ තිබෙන ප්‍රධාන නියාමන ආයතනය තමයි, මධ්‍යම පරිසර අධිකාරිය. හැබැයි, මධ්‍යම පරිසර අධිකාරියේ වපසරියෙන් වයඹ පළාත තරමක් දුරට නිදහස් වෙලා තිබෙන්නේ වයඹ පළාතට වෙනම පරිසර අධිකාරියක් තිබෙන නිසායි. මම දන්නා තරමට නම් ලංකාවේ එහෙම තිබෙන්නේ වයඹ පළාතේ විතරයි. ඒ නිසා වයඹ ආශ්‍රිතව අවශ්‍ය අවස්ථාවලදී පළාත් සභාවේත් සහයෝගය අරගෙන පරිසරය ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා වාගේම, ගොවි බිම් ආශ්‍රිතව තිබෙන මෙම ආක්‍රමණික ශාක ඉවත් කිරීමට විකල්ප ක්‍රමයක් අනුගමනය කර අපට ඩොලර් ආදායම ලැබෙන ක්‍රමයකට යා යුතුවම තිබෙනවා. ඒ එක පැත්තක්.

අනෙක් පැත්තෙන් ආක්‍රමණකාරී සත්වයන් ඉන්නවා. මේ සත්වයන් මර්දනය කරන්න ගත යුතු ක්‍රියාමාර්ගය මොකක්ද? මේ සඳහා අපට සමහර වෙලාවට පෙව උගුල්ම පාවිච්චි කරන්න පුළුවන්. එහෙම නැත්නම් අපේම ගහනයේ ඉන්න විලෝපික සත්වයන් මේ සඳහා යොදා ගන්න පුළුවන්. හැබැයි, මේ කටයුතුවලදී පරිසරයේ තුල්‍යතාව රැකීම පිළිබඳ කාරණය අපට මහහරින්න බැහැ. මොකද, පෙව විවිධත්වය - bio-diversity - පැවතිය යුතුයි. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි, මේකත් හරියට අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන checks and balances වාගේ තමයි. මේ තුල්‍යතාව බිඳ වැටුණොත් එය යළි නියම තත්ත්වයට ප්‍රතිෂ්ඨාපනය කිරීම ලේසි නැහැ. ඒ නිසා පරිසරයේ තුල්‍යතාව රැකෙන ක්‍රමයකට අපි යන්න ඕනෑ. ඒ ක්‍රමයේදී අදාළ වන්නේ පරිසර අමාත්‍යාංශය පමණක් නොවෙයි. පරිසර අමාත්‍යාංශය සහ ඊට අදාළ සියලු ආයතන, තෘතීයික අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට අදාළ අමාත්‍යාංශ යන ආයතනත් මීට අයත් වෙනවා. විශ්වවිද්‍යාල පද්ධතිය තුළින් කරලා තිබෙන පර්යේෂණ හරහා විශාල දායකත්වයක් මේ සඳහා ලබා දෙන්න පුළුවන්. ඒ වාගේම මුදල් අමාත්‍යාංශයටත් මෙතැනදී විශේෂ දායකත්වයක් ලබා දිය හැකිව තිබෙනවා. තව පැත්තකින් රේගුවත් ඔවුන්ට සම්බන්ධයි. අනෙක් පැත්තෙන් මූල්‍යමය දායකත්වය අවශ්‍යයි. පළාත් සභා, රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යන සියලු අමාත්‍යාංශවල සමෝධානික වැඩ පිළිවෙළකුයි මේ සඳහා අවශ්‍ය වෙන්නේ. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශවලට පවා මෙහි යම් වැඩ කොටසක් තිබෙනවා. මුලින්ම විය යුතුව තිබෙන්නේ මේ හා සෘජුව හා වක්‍රව බැඳුණු අමාත්‍යාංශවල ඒකාබද්ධ කමිටුවක් සකස් කර අදාළ ක්‍රියාමාර්ගයට යෑමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය ඩොලර් බිලියන 74.4යි නේ. ඒ කියන්නේ ඩොලර් බිලියන 75ක් විතර. අපි දියුණු රටක් බවට පත් වෙන්න නම්, අවුරුද්දකට සියයට 5-7 අතර ආර්ථික වර්ධන වේගයක් අඛණ්ඩ ගණනේ අවුරුදු 25ක්, 30ක් පවත්වා ගෙන යන්න ඕනෑ. ඒ හරහා ඩොලර් බිලියන 307ක් දක්වා අපේ දළ දේශීය නිෂ්පාදනය වැඩි කළ යුතුව තිබෙනවා. ඒ කියන්නේ ඩොලර් බිලියන 75 සිට ඩොලර් බිලියන 307ක් දක්වා තවත් ඩොලර් බිලියන 232ක් අපි එකතු කර ගන්න ඕනෑ.

ඩොලර් බිලියන 232ක් එකතු කර ගන්න යන ගමනේදී නව ව්‍යාපෘතිවලට ගිහිල්ලා, මේ වගා කරපු භූමිවල දැන් විශාල වශයෙන් පැතිරිලා තිබෙන මේ ආක්‍රමණික ශාක ඉවත් කිරීම හරහා අපට මේ ඩොලර් බිලියන 232න් යම් කොටසක් සොයා ගන්න හැකි වෙනවා. එය ආරම්භයේදී මහා ලොකු පංගුවක් නොවෙන්න පුළුවන්. But, something is better than nothing; මොකුත්ම නැතුවාට වඩා අපට සුළුවට හරි පටන් අරගෙන, ගොවි ජනතාව එකතු කරගෙන නව ක්‍රියා මාර්ගවලට යන්න පුළුවන් කියන එකයි අපේ විශ්වාසය. ඒ නිසා මම හිතන විධියට, අපි අලුතින් හිතන්න වුවමනායි, මේ වැඩ පිළිවෙළ කොහොමද ක්‍රියාත්මක කරන්නේ කියන එක ගැන. ඒක එහෙම නොවුණොත් මේ ආක්‍රමණික ශාක ප්‍රධාන වශයෙනුත්, ආක්‍රමණික සතුන් යම් ප්‍රමාණයකුත් අපේ පරිසර පද්ධති තුළ වේගයෙන් පැතිර යෑම සිදු වන බව තමයි මට පෙනෙන්න තිබෙන දේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිරි විනාඩි දෙකේ මම මේ කාරණයත් පෙන්වා දෙන්න කැමතියි. අපට ඇත්ත වශයෙන්ම මේ දේවල් එන තැන් දෙකයි නේ තිබෙන්නේ. මොකද, අපි දූපත් රටක්. මේ දේවල් මුහුදෙන් පා වෙලා එන්න තිබෙන ප්‍රමාණය ඉතාම අඩුයි. ඒ නිසා වරාය, නැත්නම් ගුවන් තොටුපොළ තමයි ඒ සඳහා තිබෙන්නේ. දැන් මේ ක්‍රියාදාමය නතර කළත්, ඊළඟ මොහොතේ ඉඳලා අලුතින් එන එක නතර කරන්නත් ක්‍රමයක් තිබෙන්න එපා යැ.

අපේ රේගු පද්ධතිය තුළ scanning system එකක් තිබීම ඉතා වැදගත්. ඒක රේගු පද්ධතියට විතරක් නොවෙයි, හැම දෙයටම වැදගත්. හැම දෙයක්ම scan කරන්න පුළුවන් තරමට අපේ තාක්ෂණය දියුණු වෙලා තිබෙනවා. හැබැයි, scanning machines සවි කරනවාත් එක්කම ඒ scanning machinesවලින් බලන තැනටත් CCTV කැමරා සවි කරන්නට ඕනෑ. ඒ විධියට scanning machinesවලින් බලන තැනට CCTV කැමරා සවි කරනවාට කවුරු හරි විරුද්ධ වෙනවා නම් ඒක බෙදවාචකයක්. ඒ වාගේම එතැනට CCTV කැමරා සවි කරලා, හැම තිස්සේම ඒක බලාගෙන ඉන්න රේගුවේ බුද්ධි අංශය සහ හමුදා, පොලිසිවල බුද්ධි අංශත් යම් ප්‍රමාණයක් යොදවන්න ඕනෑ. මේ විනය ඇති කළොත් තමයි ආපසු වතාවක් මේ ආක්‍රමණික ශාක හෝ

සත්වයන් මේ රටට පැමිණෙන එක නවත්වා ගන්න පුළුවන් වන්නේ. ඒ වාගේම අපේ සමහර ශාක සහ සත්ව දර්ශක අරගෙන ගිහිල්ලා, ඡානමය වශයෙන් වෙනස්කම් කරලා, අපට එරෙහිව නැවත ගෙනැල්ලා දාන්නත් පුළුවන්කම තිබෙනවා. ඒක ඉතා පැහැදිලිව අපට කාලයෙන් කාලයට දකින්න පුළුවන්. දැන් බලන්න, බිබිල දොඩම් නැත්තටම නැති වෙලා ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම වැලිගම ප්‍රදේශයේ පොල් වගාව ආශ්‍රිතව ඇති වූ රෝගය වාගේම රතු කුරුමිණි සහ කළු කුරුමිණි රෝගය නිසා අපේ පොල් වගාවට හානි සිදු වෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙන්න මේ සියලු කාරණා පිළිබඳව සලකා බලමින් මේ ප්‍රශ්නය හුදෙක් පරිසර ප්‍රශ්නයක් විධියට ගන්න එපා කියන එකයි අපි කියන්නේ. රටේ ආර්ථිකයට ඩොලර් ගෙනෙන තත්ත්වයකට මේ කටයුත්ත නිර්මාණශීලිව අපට ගෙනියන්න පුළුවන්. මේ කාර්යය තවත් බොහෝ ක්ෂේත්‍රවල පැතිරෙන ආකාරයට යොදා ගන්න පුළුවන්. ඒ වාගේම අපේ සංචාරක ව්‍යාපාරයේ උන්නතිය සඳහා ආක්‍රමණික ශාක සහ සත්වයන්ගෙන් තොර ලංකාවක් කියන තැනට යෑම තුළ අපට වාසි සහගත තත්ත්වයක් ලබා ගන්න පුළුවන්. ඒ නිසා ආර්ථික සමෘද්ධිය, පාරිසරික තුලනතාව, සංචාරක ව්‍යාපාරයේ නවෝදය වාගේම අනාගත ලංකාවේ සුරක්ෂිතතාව සඳහා මේ ක්‍රියාදාමයට යා යුතු යැයි කියා මා යෝජනා කරන අතරතුර, ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාට මෙම යෝජනාව ස්ථිර කිරීමට ආරාධනා කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.28]

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமண வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව මා ස්ථිර කරනවා. ඉතාම වැදගත් යෝජනාවක් තමයි එතුමා ඉදිරිපත් කර තිබෙන්නේ. පාර්ලිමේන්තුව තුළ පෞද්ගලික මන්ත්‍රී යෝජනා ගණනාවක් ඉතිහාසය පුරාවට ගෙනාවා; සම්මත වුණා. නමුත් ඒවායේ ප්‍රගතිය ගැන විමසන ක්‍රමයක් අපි දන්නේ නැහැ. නමුත් ක්‍රියාත්මක කළ යුතුම යෝජනාවක් තමයි ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා අද දවසේ ඉදිරිපත් කළේ.

විශේෂයෙන්ම අපි ජීවත් වෙන මේ පරිසර පද්ධතිය අපට දායාදයක් විධියට ලැබුණු දේවල්. අපේ අතීත මුතුන් මිත්තන් එය රැක ගත්ත නිසා තමයි අද අපි මෙහෙම හුස්මක් අරගෙන ජීවත් වෙන්නේ. ඒ නිසා මේවා රැක ගැනීම සහ ඉදිරි පරම්පරාවට භාර දීම අද දවසේ අපේ කාර්යභාරය බවට පත් වෙනවා. ඒ සඳහා වන යම් බාධාවක්, තර්ජනයක් තිබෙනවා නම්, ඒකට නීති රීති හදන එකත් අපේ වගකීමක් සහ වගවීමක් බවට පත් වෙනවා. ඒ නිසා මේ යෝජනාව ඉතාම වැදගත්, අත්‍යවශ්‍ය යෝජනාවක් බවට පත් වෙනවා.

මේ යෝජනාවේ සඳහන් වෙනවා, ආක්‍රමණික ශාක ගැන. සමහර විට ස්වාභාවික විධියට, සමහර විට තර්ජනාත්මක විධියට මිනිස්සුන්ගේ ක්‍රියාකාරකම් මත අපේ රට තුළ මේවා ක්‍රියාත්මක වෙන්න පුළුවන්. මීට වසර සිය ගණනකට කලින් - අපේ වැවිලි ආර්ථිකය, වැවිලිකරය පටන් ගන්න කලින් - අපේ රට තරම් ලෝකයේ පෛව විවිධත්වයෙන් ඉහළින් තිබුණු රටක් දකින්නට තිබුණේ නැතුව ඇති. අද වනකොට ලංකාවේ වැඩිම පෛව විවිධත්වය තිබෙන කන්නෙලිය, ලෝක උරුමයක් වෙච්ච සිංහරාජය සහ තවත් රක්ෂිත ගණනාවක් තිබුණා වුණත්, ලංකාවේ සමස්ත වන ඝනත්වය සියයට 70ක්ව පැවතුණු වසර 100කට ඉහත කාල පරිච්ඡේදයේදී මොන තරම් සුන්දර පරිසරයක් අපට උරුමව තිබෙන්න ඇත්ද? එක පසෙකින් වැවිලි ආර්ථිකයත් එක්ක භූමිය එළි පෙහෙළි වුණා. අපි ඒක හොඳද, නරකද කියලා වෙනම තර්ක කරමු.

වැවිලි ආර්ථිකයත් එක්ක භූමියෙන් දැවැන්ත ප්‍රමාණයක් නිරාවරණය වුණා; එළි පෙහෙළි වුණා. ඊට අමතරව අනෙකුත් කැලෑ ප්‍රදේශ සහ වෙනත් භූමි මිනිසුන්ගේ ඕනෑකම් මත එළි පෙහෙළි වුණා. ඒ අතරතුර මේ ආක්‍රමණික ශාක සහ ජීවීන් නිසා අපේ පෛව විවිධත්වය, පරිසර පද්ධතිය අද වනවිට සම්පූර්ණයෙන් වෙනස් වෙමින් තිබෙනවා. මේ අර්බුදය හඳුනා ගැනීමට හරිහමන් ආයතනයක් අපේ රටේ තිබෙනවාද? මම දන්නේ නැහැ, මධ්‍යම පරිසර අධිකාරියට,- සමාවෙන්න, මගේ ළඟ ආසනයේ ඉන්නේ ඒකේ හිටපු සභාපතිවරයෙක් වන ගරු චරිත හේරත් මහාචාර්යතුමා- මධ්‍යම පරිසර අධිකාරිය තුළ මේ සම්බන්ධ විධිමත් ආයතනයක්, විද්‍යාත්මකව පිවිසෙන ආයතනයක් තිබෙනවාද, මධ්‍යම පරිසර අධිකාරියට මේ සඳහා විද්‍යාත්මකව මැදිහත් වෙන්න අවශ්‍ය නීති පද්ධතිය ශක්තිමත්ව තිබෙනවාද, එය ක්‍රියාත්මක කරන්න ක්‍රමයක් තිබෙනවාද කියන එක අපට තවම ප්‍රශ්නයක්.

මේ ආක්‍රමණික ශාක හා ආක්‍රමණික ජීවීන් හඳුනා ගැනීම පළමුවෙනි කාරණාවයි. එය අවශ්‍යයි. අවශ්‍ය නීති සම්පාදනය කිරීමේදී එය ප්‍රමුඛ කාර්යයක් බවට පත් කළ යුතුයි. ආක්‍රමණික ශාක සහ ආක්‍රමණික ජීවීන් හඳුනා ගැනීම සඳහා වන ආයතනය අධිකාරියක්ද, ස්ථානයක්ද, මොකක්ද කියන කාරණාව නොවෙයි වැදගත් වන්නේ. එවැනි ආයතනයක් ස්ථාපනය කිරීමයි වැදගත් වන්නේ කියන කාරණාව මා පළමුවෙන් සඳහන් කරනවා.

දෙවැනි කාරණාව විධියට මා සඳහන් කරන්න කැමැතියි, ආක්‍රමණික ශාක ඉවත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රමානුකූලව, වහාම සිදු කළ යුතු බව. ඒ වාගේම මෙම යෝජනාවේ සඳහන් වන ආකාරයට ආක්‍රමණික ශාක බෝ කිරීම, ප්‍රචර්ධනය කිරීම හා බීජ ගෙන්වීම නතර කිරීමට වහ වහාම කටයුතු කළ යුතුයි. මේ කාරණා තුනම නතර කිරීම වහාම සිද්ධ විය යුතුයි. අපි දන්නවා, පයිනස්, ඇක්කේෂියා, ටර්පන්ටයින් වශයෙන් එක එක නම්වලින් හඳුන්වන ශාක වර්ග ගණනාවක් තිබෙන බව. මේවා ඇත්තටම ආක්‍රමණික ශාක විධියටද ගෙනාවේ? මේ ශාක ආක්‍රමණික ශාක විධියටද ගෙනාවේ? නැහැ. මේවා අපේ රටේ සිටි ඇතැම් නිලධාරීන්ගේ ඕනෑකම් මත අපට දීපු දේවල්. අපට මතකයි, මීට අවුරුදු ගණනාවකට කලින් මේ රටේ ලොකු මතයක් ගොඩනැඟුවා, පයිනස් කියන්නේ ආර්ථිකයට ශක්තියක් ලබා දෙන ඉතාම වැදගත් ශාකයක් කියලා. එම ශාක වගා කළාට පසුව එයින් ආර්ථිකයට ලොකු හයියක්, ශක්තියක් එනවා කිව්වා. ඒක නිසා ලංකාවේ තිබුණු කැලෑ එළි කරමින් පයිනස් වගා කළා.

[ගරු බුද්ධික පතිරණ මහතා]

උඩරට කඳුකරයේ විශේෂයෙන්ම බදුල්ල, බණ්ඩාරවෙල, දියතලාව වාගේ පැතිවලත්, මාතර දිස්ත්‍රික්කයේ තෙත් කලාපයේත් කැලෑ කප-කපා තමයි පයිනස් වැවීම කළේ. එසේ කළේ එය ආර්ථිකයට ශක්තියක් ලබා දෙන ශාකයක් කියායි. නමුත් අද වනවිට -අවුරුදු 50කට පමණ පසුව- තේරුම් ගෙන තිබෙනවා, පයිනස් කියන්නේ පරිසර පද්ධතිය විනාශ කරන තර්ජනාත්මක ශාකයක් කියලා. අපේ භාෂාවෙන් කියනවා නම්, පයිනස් ගහක් තිබෙන තැන කුරුල්ලෙක්වත් නැහැ; බිත්තරයක් දමන්න කිරිල්ලියක්වත් නැහැ; එම පරිසරයේ පණුවෙක්වත් හැදෙන්නේ නැහැ; තණකොළ ගහක්වත් හැදෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනවිට තීන්දු කර තිබෙනවා, පයිනස් ඉවත් කරන්න. නමුත් එය ක්‍රියාත්මක කිරීමේ ස්ථිර වැඩ පිළිවෙළක් නැහැ.

ඒ වාගේම මීට අවුරුදු ගණනාවකට කලින් අපේ රටට ගෙනාවා, කටු පොල්. ඒවායෙන් තමයි පාම් ඔයිල් නිෂ්පාදනය කරන්නේ. දැවැන්ත ආර්ථික ශක්තියක් ලබා දෙන භෝගයක් කියලා මේවා ගෙනැල්ලා, -හිස් බිමක, මුඩු බිමක ඉන්දනවා වාගේ නොවෙයි- වැවිලි සමාගම් වතුකරයේ රබර් ගස් ගලවා-ගලවා තමයි කටු පොල් ඉන්දුවේ. නමුත් කටු පොල්වලින් තර්ජනාත්මක බලපෑමක් තිබෙනවා කියන කාරණාව ලංකාවේ සියලු විද්වතුන් පිළිගෙන අද වනවිට එම ශාක ඉවත් කරන්න තීන්දු කර තිබෙනවා. නමුත් ඒවා ඉවත් කිරීමේ ක්‍රමය හරියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක නිසා මම හිතන විධියට මෙවාට 'ආක්‍රමණික ශාක' කියන මේ වචනය පාවිච්චි කරන එකත් වැරදියි. මොකද, මේ දේවල් මිනිසාගේම ක්‍රියාකාරකම් නිසා සිදු වුණු දේවල්. මේවා එක එක්කෙනාගේ ඕනෑ එපාකම් සහ න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා ගෙනා දේවල්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ජීවත් වන අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි නිල්ගල, රතුගල කියන්නේ මොන තරම් ඓතිහාසික වටිනාකමක් තිබෙන භූමිද? එවැනි ඖෂධ කැලෑ ලෝකයේ කොහේද තිබෙන්නේ? අද ඒවා පවා විනාශයට මුහුණ දෙමින් තිබෙන බව අපි දන්නවා. ආක්‍රමණික ශාක ඉවත් කර එම ඉඩම් වෙනත් කටයුතුවලට යොදවන්න අපට කොයි තරම් කාලයක් ගත වෙයිද? අපේ රටේ තිබෙන පයිනස් ඉඩම්, කටු පොල් ඉඩම් වෙනත් ආර්ථික භෝග වගා කිරීම සඳහා පරිවර්තනය කරන්නට මැදිහත්වීමක් අවශ්‍යයි. අවසාන වශයෙන් මම කියන්නේ මේකයි. මේ සඳහා විධිමත් ක්‍රියාදාමයක් කළ යුතුයි.

ගරු සභානායකතුමනි, එක පැත්තකින් කියනවා, ටර්පන්ටයින් ගස් ගලවන්න කියලා. තව පැත්තකින් කියනවා, ඇකේෂියා ගලවන්න කියලා. ඇට්ටෝනියා වාගේ විවිධ ශාක වර්ග තිබෙනවා. හැබැයි, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පැළ තවාන්වල තවම මේවා වවනවා. ඉස්කෝලවලින් හෝ පරිසර සංවිධානවලින් හෝ මොකක් හරි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනකොට, ඒ පැළ තමයි බෙදන්නේ. ඒක නිසා මෙහිදී මේ දාමය පිටුපස ක්‍රියාත්මක වෙන හස්ත හඳුනා ගැනීමත් විය යුතුයි. එහෙම නැති වුණොත් මේවා පාලනය කරන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ කියන කාරණාව මා සිහිපත් කරනවා. අපේ රටේ අනාගත පරම්පරාවට මේ ඉතුරු වෙලා තිබෙන පරිසර පද්ධතියවත් රැක දීම අපේ වගකීමක් බව සිහිපත් කරමින් ඒ සඳහා අවශ්‍ය නීති රීති ක්‍රියාත්මක කරන්න වහාම මැදිහත් වෙන්නය කියන කාරණාවත් සිහිපත් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිණා එඩුත්තියම්පප්පෙට්ටතු.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.34]

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආක්‍රමණික ශාක - invasive plants - හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කර ගැනීම සඳහා මෙම පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉදිරිපත් කළ මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් වචනයක්-දෙකක් කථා කරන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු පරිසර ඇමතිවරයෙක් තමයි වර්තමාන සභානායකතුමාත්.

මේ ප්‍රශ්නය අපේ රටේ දීර්ඝ කාලයක් තිස්සේ කථා වුණු එකක්. ජාතික පරිසර පනත යටතේ තමයි 1981දී මධ්‍යම පරිසර අධිකාරිය ස්ථාපනය කළේ. එහි යම් යම් වගන්තිවලින් පමණයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවම අපට මේ invasive plants සම්බන්ධ යම් තීරණ ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

ලෝකය දිහා බැලුවාම International Plant Protection Convention - IPPC - කියලා අපි එකඟ වෙච්ච convention එකක් තිබෙනවා. ඒ වාගේම Convention on Biological Diversity - CBD - කියන convention එකටත් එකඟ වෙලා තිබෙනවා. මේ conventions දෙක ඇතුළේ අපට මේ ආක්‍රමණික ශාක - invasive plants - සම්බන්ධ යම් තීරණ ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී ඉතා වැදගත් වචන තුනක් අපි පාවිච්චි කරනවා, prevention, early detection and rapid response කියලා. එකක් තමයි, මුලින්ම මේවා රටට නොඑන පරිදි වැඩ කරන එක. Prevention සඳහා නීති රීති සෑදීම අවශ්‍යයි. ඒ වාගේම, මේවා රටට ආපු විගස ඒකට යම්කිසි මැදිහත්වීමක් කිරීම අවශ්‍යයි. ඒ වාගේම ඉතාම ක්ෂණික, ක්‍රමානුකූල ප්‍රතිකර්ම යෙදීම අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ මේ සඳහා යම්කිසි උත්සාහයක් අරගෙනත් තිබෙනවා. The National Policy on Invasive Alien Species in Sri Lanka, Strategies and Action Plan කියලා 2016දී මේ සම්බන්ධ ක්‍රියාකාරී වැඩසටහනක් හදලා තිබෙනවා. හැබැයි කනගාටුවට කාරණය තමයි, ඒ ක්‍රියාකාරී වැඩසටහන ක්‍රියාත්මක කරන ආයතන ප්‍රතිචාර දක්වන ආකාරය. පරිසර අමාත්‍යාංශයේ තිබෙනවා, Biodiversity Division කියලා එකක්. මේක තමයි එක පැත්තක focal point එකක් වෙන්නේ මේ වැඩේ කරන්න. හැබැයි අපට පේනවා, සමහර අවස්ථාවල ඒ ආයතනවලින් අපි බලාපොරොත්තු වෙන තරම් ධනාත්මක ප්‍රතිචාර ලැබෙන්නේ නැති බව.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මේ දවස්වල පොල් වගාවට මකුණෙකුගෙන් විශාල වශයෙන් හානි සිදු වෙනවා. ඒකට බෙහෙත් යොදනකොට උස පොල්ගස්වලට බෙහෙත් යොදන්න අමාරුයි. මම හිතන්නේ ඒ වාගේ අවස්ථාවල අපි ඩ්‍රෝන තාක්ෂණයවත් යොදාගන්න ඕනෑ කියලායි. මේ ගැන බලන්න වෙනවා, තාක්ෂණික ක්ෂේත්‍රයේ අයයි, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අයයි දෙගොල්ලෝම. Dronesවලින් මේ බෙහෙත් යොදන්න පුළුවන්ද කියලා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද, ඒ තරමටම මේ ප්‍රශ්නය වැඩි

වෙලා තිබෙනවා. පොල් වගා කිරීමේ මණ්ඩලය, ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය, පොල් සංවර්ධන අධිකාරිය කියන ආයතන තුනම මේ වෙනුවෙන් කරන වැඩේ ඉතාම මන්දගාමී තත්ත්වයක තමයි තිබෙන්නේ. සමහරු කියනවා මේකෙන් පොල් ඵලදාවට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ කියලා. නමුත් බලාගෙන ඉද්දි පොල්ගස් කඟ පාට වෙනවා, සමහර ඒවා මැරෙනවා, පොල් ඵලදාව අඩු වෙනවා. විශේෂයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කය මේකෙන් බරපතළ පීඩාවකට ලක් වෙලා තිබෙනවා. එම නිසා මේ ගැන අවධානය යොමු කර, ආක්‍රමණික කෘමීන්ගෙන්, ආක්‍රමණික ශාකවලින් අපේ කෘෂි කර්මාන්තයත්, අපේ සාමාන්‍ය ජන ජීවිතයත් ආරක්ෂා කර ගැනීම අවශ්‍ය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය යටතේ සමහර අවස්ථාවල අපට යම්කිසි පියවරක් ගන්න පුළුවන්. Environmentally sensitive areas විධියට අපට ගැසට් කිරීමේ ඉඩ දීලා තිබෙනවා, National Environmental Act එකෙන්. අපි සමහර ඒවා මේ environmentally sensitive areas විධියට ගැසට් කළාම ඒවාට මේ වාගේ ආක්‍රමණික ශාක ඇතුළු වීම වළක්වන්න පුළුවන්කම තිබෙනවා. මේක ඇත්තටම scientific subject එකක්. අපේ රටේ පරිසරය සම්බන්ධ තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, ඒ පරිසරයේ තිබෙන බොහෝ ගැටලුවලට විද්‍යාත්මක විසඳුම්වලින් -scientific පිළිතුරුවලින්- ආමන්ත්‍රණය කරන්න වෙලා තිබීම. හැබැයි එක පැත්තකින් ඒ විධියට ආමන්ත්‍රණය කරන්න සුදුසු පුද්ගලයන් අපේ රටේ අඩුයි. සමහර අය කියනවා, මේ රටේ විශාල human capacity එකක් තිබෙනවා කියලා. හැබැයි අපේ රටේ මේ biodiversity වාගේ ක්ෂේත්‍රවල ඉතා ශක්තිමත් දැනුම තිබෙන පුද්ගලයන්ගේ විශාල අඩුවක් තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්න ශක්තිමත්ව විසඳා ගන්න අවශ්‍යයි. ඒ වාගේම, invasive plant management සම්බන්ධ නීතිත් අවශ්‍යයි, ආයතනත් අවශ්‍යයි. ඒ සඳහා මේ සභාවේ අවධානය යොමු කිරීම ගැන ගරු බුද්ධික පතිරණ මැතිතුමාට ස්තුතිය පළ කරමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.40]

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithreepala Sirisena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ යුගයේ හැටියට අද මේ රටේ පාරිසරික තත්ත්ව සැලකිල්ලට ගත් විට ආක්‍රමණශීලි ශාක පිළිබඳ ප්‍රශ්නය ඉතා බරපතළයි. එහිදී ප්‍රමුඛ කාරණයක් තමයි මේ රටේ තිබෙන වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සහ මහවැලියට අයත් ජලාශවල ආක්‍රමණශීලි ශාක වර්ධනය වීම. මම නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තොත් පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල, කන්තලේ වාගේම අනෙක් පැත්තෙන් ගත්තොත්, අම්පාරේ සේනානායක සමුද්‍රය යනාදී විශාල ජලාශ ආක්‍රමණශීලි ශාක නිසා බරපතළ ප්‍රශ්නයකට අද වනවිට මුහුණ දීලා තිබෙනවා. ඒ වාගේම ආක්‍රමණශීලි ශාක තුළින් සිදුවන වෙනත් පාරිසරික හානිත් තිබෙනවා.

වන සංරක්ෂණය පිළිබඳව කථා කරන විට අපට අවශ්‍ය තෘණ වර්ග, වෘක්ෂලතා බොහෝ දුරට ආක්‍රමණශීලි ශාක මඟින් විනාශ කරන බව අපි දන්නවා. අපේ පළාත්වල හැදෙන පලු ගහක්, වීර ගහක් ගත්තොත්, ඒවායෙහි නුග ශාකයක් හැදිලා මුළු ගහම විනාශ කර දමනවා. ආක්‍රමණශීලි ශාක පිළිබඳව ලෝකයේ බොහෝ පර්යේෂණ පවත්වලා තිබෙන බව ඇත්ත. නමුත්, මේ ප්‍රශ්නය තදින්ම බලපාන්නේ දුප්පත් රටවලටයි. පරාක්‍රම සමුද්‍රය ගත්තොත්, මේ හේතුවෙන් පරාක්‍රම සමුද්‍රයට විශාල විනාශයක් වෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව කියන්නේ, සල්ලි නැහැ, ඒ නිසා ඒ තෘණ වර්ග, පාසි වර්ග හැදිලා තිබෙන නොයෙක් දේවල් ඉවත් කරන්න ක්‍රමයක් නැහැ කියලායි. අනෙකුත් ජලාශවල තත්ත්වයත් ඒකයි. ඒ නිසා ආක්‍රමණශීලි ශාක පිළිබඳව මීට වඩා රජයේ අවධානය යොමු වෙන්න ඕනෑ.

පළමු කාරණය තමයි මේ ශාක විශාල වශයෙන් වර්ධනය වෙන ජලාශ සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල මේවා විනාශ කිරීම සඳහා වන සංරක්ෂණ, වනජීවී, වාරිමාර්ග, මහවැලිය වැනි ආයතනවලට මුදල් නොලැබීම. ඒ නිසා රජයේ වාර්ෂික මුදල් වැය ශීර්ෂය යටතේ මේ ජලාශ සංරක්ෂණය කිරීම සඳහා, ආක්‍රමණශීලි ශාක ඉවත් කිරීම සඳහා මුදල් වෙන් කර අවශ්‍ය කටයුතු කිරීම වැදගත් වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithreepala Sirisena)
මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සමහර වෙලාවට බහුජාතික සමාගම්වලින් අපේ රටට එන වල් නාශක සහ කෘමි නාශක, සමහර පොහොර වර්ග තිබෙනවා. ඒවා එක්කත් මේ ආක්‍රමණික ශාක බීජ එනවා. මම ඒ රට මොකක්ද කියලා කියන්නේ නැහැ. ප්‍රධාන වශයෙන්ම අපේ වී පිළිබඳව අන්තර්ජාතික පර්යේෂණ ආයතනය තිබෙන රට. මම ඒ රටට කිහිප සැරයක් ගියා. එ් පර්යේෂණ ආයතනයටත් ගියා. ජනාධිපති වෙලා හිටපු කාලයේදීත් ගියා. කෘෂිකර්ම ඇමති වෙලා හිටපු කාලයේදීත් ගියා. මහවැලි සංවර්ධන ඇමති වෙලා හිටපු කාලයේදීත් ගියා. මම ඒ දේවල් බලලා ඒගොල්ලන්ගෙන් ඇහුවා, "දැන් මෙතැන මේ මේ බීජ නිෂ්පාදනය කරලා මේ වාගේ දේවල් කරනවා. මේ මේ නිෂ්පාදන කරනවා, කෘෂි කර්මාන්තය සඳහා. මේවාට සල්ලි කොහෙන්ද" කියලා. සාමාන්‍යයෙන් මම හිතාගෙන හිටියේ මේ සඳහා රජයෙන් මුදල් ලැබෙනවා ඇති කියලා. නමුත්, බැලුවාම වල් නාශක, කෘමි නාශක පොහොර නිෂ්පාදනය කරන සමාගම් තමයි ඒ පර්යේෂණ ආයතන ගෙනියන්න සම්පූර්ණයෙන් සල්ලි දෙන්නේ. එතකොට අපට එන වල් නාශක, කෘමි නාශක, පොහොර එක්ක ඔය ආක්‍රමණික ශාක බීජත් එනවා. එ් වාගේම සමහර වෙලාවට ස්වාභාවික තත්ත්ව විධියට ගත්තාම, පක්ෂීන්ගෙන්, ජලාශ ගැලීමෙන්, ගංවතුර තත්ත්ව එක්ක -එවැනි තත්ත්වයන් තුළත්- මේවා එනවා. ඒ නිසා අපේ බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. මටත් මේ ගැන අදහස් දක්වන්න ලැබීම ගැන සතුටු වෙනවා. මූලික වශයෙන් රජය ආක්‍රමණශීලි ශාක බෝවීම නැවැත්වීම සඳහාත්, ඒවා මර්දනය කිරීම සඳහාත් ඒ ආයතනවලට වාර්ෂිකව මුදල් වෙන් කිරීම කළ යුතුයි කියන එකයි මගේ අදහස.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි අමාත්‍යතුමියගේ පිළිතුරු කථාව සභාගත කරන මෙන් ගරු සභානායකතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

[අ.භා. 2.44]

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව ඉදිරිපත් කර තිබුණේ අද න්‍යාය පත්‍රයේ පළමුවැනි යෝජනාව හැටියට. නමුත් එතුමා පාර්ලිමේන්තුව තුළ පැවැත්වෙන වෙනත් කමිටුවක සභාපති ධුරය දරන නිසා ඒකට සහභාගි වෙන්න ගියා. ඒ අතරතුර ගරු ඇමතිතුමිය ඊට පිළිතුරු ලබා දීමට සූදානම් වෙලා හිටියා. නමුත් එතුමිය ප්‍රකාශ කළා, එතුමියගේ පිළිතුරු කථාව සභාගත කරන බවට. මම එය තහවුරු කරමින් මෙම යෝජනාවට අදාළව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය විසින් ඉදිරිපත් කරන ලද පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

01. ආක්‍රමණශීලී ශාක සහ සතුන් පැතිරීම නිසා පරිසරයට සහ ජෛව විවිධත්වයට හානි සිදු වේ. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ පාලනය වූ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය විසින් ආක්‍රමණශීලී ශාක සහ සතුන් හඳුනාගෙන නම් කර ඇත. එම ශාක පැතිරීම පාලනය කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව පහත පියවර ගනු ලබයි.

    I. පසුගිය වසර තුන තුළ වියළි කලාපයේ ප්‍රදේශ තුළ බහුලව පැතිරී යන ආක්‍රමණික ශාකයක් වන කලපු අන්දර ඉවත් කිරීම සඳහා කටයුතු කර ඇත. ඒ යටතේ දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මඟින් හෙක්ටෙයාර 180ක කලපු අන්දර උදුරා ඉවත් කර වන වගා ස්ථාපිත කර ඇත. ඊට අමතරව වෙනත් බාහිර පාර්ශ්වයන් මඟින් ද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ කලපු අන්දර ඉවත් කර වන වගා කිරීමට කටයුතු කරනු ලබයි. නකල්ස් කලාපයේ මහනුවර හා මාතලේ දිසාවල පැතිරී ඇති ආක්‍රමණික ශාක ඉවත් කිරීමට ද කටයුතු කරනු ලබයි.

    II. පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ දායකත්වයෙන් වියළි කලාපයේ ව්‍යාප්තව පවතින ගඳපාන (Lantana) සහ වෙනත් ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීමට කටයුතු සිදු කර ඇත.

    III. නකල්ස් කලාපයේ මහනුවර හා මාතලේ දිසාවල පැතිරී ඇති ආක්‍රමණික ශාක ඉවත් කිරීමට ද කටයුතු කරනු ලබයි.

    IV. සිංහරාජ ලෝක උරුම වනාන්තරයේ මාර්ග දෙපස පැතිරී ඇති ඕන් බෝවිටියා ශාක ඉවත් කිරීමට ද දිගින් දිගටම කටයුතු කරනු ලබයි.

    V. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රක්ෂිත කලාප තුළ පැතිරී ඇති කලපු අන්දර, ගඳපාන (Lantana) වැනි භෞමික ශාක ද ඊට අමතරව ජපන්ජබර, සැල්වීනියා වැනි ජලජ ශාක ද ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

02. එසේම ශාක සහ සත්ත්ව විශේෂ ආනයනයේදී එම විශේෂ ආක්‍රමණශීලී විශේෂදැයි පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමෙන් පසුව පමණක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා දීම සිදු කරනු ලබයි. එසේම එම දෙපාර්තමේන්තු කළමනාකරණය යටතේ පවතින රක්ෂිත, සංරක්ෂිත ප්‍රදේශ තුළ ජෛව විවිධත්වයට හානි සිදු වන ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම් කර එම පැළෑටි හා සතුන් බෝවීම පාලනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

    මේ සම්බන්ධව වැඩිදුර විස්තර ඇතුළත් ලේඛනයක් ද** ඉදිරිපත් කරමි.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දොලවත්ත මන්ත්‍රීතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කථා කළාට පසු ඔබතුමාට කථා කරන්න අවස්ථාව දෙන්නම්.

[අ.භා. 2.45]

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මේ මොහොතට පමණක් නොව, අනාගත පරම්පරාව වෙනුවෙනුත් ගෙන ආ මේ යෝජනාව සම්බන්ධයෙන් හිටපු ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් අදහස් දැක්වුවා. යෝජනාව ස්ථිර කළේ අපේ දිස්ත්‍රික්කයේ සහෝදර පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වීරසුමන වීරසිංහ මැතිතුමායි. එවකට මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළ වරිත හේරත් මැතිතුමා පරිසරයට මගේ ඇති බැඳීම නිසාම මා හමු වුණු හැම වෙලාවකදීම පොත් පත් ලබා දීලා මට ලබා දුන් ශක්තියත් මට මේ අවස්ථාවේ මතක් වෙනවා. අද එතුමාත් මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කළා. ඒ සියලුදෙනාට මගේ ස්තුතිය, ගෞරවය පුද කරනවා.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා හැටියට විවිධ ගරු මන්ත්‍රීවරුන් වෙතින් ඉතා වැදගත් යෝජනා විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වෙනවා, ගරු සභානායකතුමනි. ඒවා අතර රටේ සංවර්ධනයට දායකත්වය ලබා ගන්න පුළුවන් විධියේ යෝජනාත් තිබෙනවා. මොකද, ඒ යෝජනා සම්මත වෙලා අදාළ අමාත්‍යාංශයට යනවාත් එක්කම ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේදී මේ කාරණාත් එකතු කර ගන්නා ක්‍රමයක් අපි සකස් කළ යුතුයි. ගරු සභානායකතුමනි, ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඔබතුමා සභානායක ධුරයේ ඉන්න කාල සීමාවේදීම ඒ ක්‍රමය හදා ගන්න අපට පුළුවන් නම්, අපි එය හදා ගනිමු.

මට මතකයි, සම්මාන ආචාර්ය උපාධි, සම්මාන මහාචාර්ය පදවි පිරිනැමීම ගැන මම වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයකුත් ඉදිරිපත් කළා. සමහර අවස්ථාවල මේ රටේ පිළිගත්තු විශ්වවිද්‍යාලවලින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් නොවෙයි ඒවා පිරිනමන්නේ. ඒක සූදුවක්. ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් ඒ සූදුව පිළිබඳව කථා කළා. ඊට පස්සේත් අවස්ථා දෙකතුනකදී එවැනි සිදු වීම් වුණු බව මම දැක්කා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමත්, ජනාධිපති ලේකම් කාර්යාලයත් තමයි සම්මාන උපාධි හෝ ගෞරව නාම ආදිය පිරිනැමීම සිදු කරන්නේ. නමුත්, "දේශබන්දු", "දේශශක්ති", "දේශමාන්‍ය" වාගේ ගෞරව නාම පදුරු අස්සේත් දෙනවා. එහෙම ගෞරව නාම දෙන සමහර අවස්ථාවල රුපියල් තිස්දාහක්, හතළිස්දාහක් පමණ දෙනවා, දේශපාලනඥයෙකු හෝ දෙන්නෙකු උත්සවයට ගෙන්වා ගන්න සහ මාධ්‍යය ගෙන්වා ගන්න. සමහර මාධ්‍යකරුවන්ටත් එවැනි දේ දෙනවා. උපාධි ලෝගුව අද බලු වටින්නේ නැති තත්ත්වයකට පත් වෙලා. ප්‍රථම උපාධියකදී, ශාස්ත්‍රපති උපාධියකදී, දර්ශනපති උපාධියකදී, දර්ශනසූරි උපාධියකදී දමන ලෝගුව අද පදුරු පල්ලේ ඉන්න සුනඛයන්ට විතරයි දාලා නැත්තේ. මේක හරිම ලජ්ජාසහගතයි. එහෙම වුණාම නියම උපාධියක් අර ගත්තු අපට හිරිකිතයි, ඒ ලෝගුව දමා ගන්න.

මම බාලදක්ෂ කොමසාරිස්වරයෙකු වෙච්ච අවස්ථාවේ මටත් හම්බ වුණා, සාමදාන විනිශ්චයකාර ධුරයට අදාළ අයදුම් පත්‍රයක්. මම ඒක පිරෙව්වේ නැහැ. එතකොට මම දේශපාලනයේ හිටියේත් නැහැ. මා ඒ අයදුම් පත්‍රය පිරෙව්වේ නැති හේතුවක් තිබෙනවා. ඒ මමත් නියෝජනය කරපු ආණ්ඩුවේ අතීතය නිසාම තමයි. ගෝනවල සුනිල්ලා වාගේ හාදයන්ටත් සාම විනිසුරු පත්වීම් හම්බ වුණා. ඒ නිසා ඒ වාගේ පත්වීමක් ගන්න කියලා මගේ හිත කිව්වේ නැහැ. මම අදටත් සාමදාන විනිශ්චයකාරවරයෙක් නොවෙයි. හැබැයි මගෙන් සාමදාන විනිශ්චයකාර තනතුර සඳහා වන අයදුම් පත්‍ර වැඳ වැඳ ඉල්ලන අයත් ඉන්නවා. ඒක ඒ අයගේ කැමැත්ත. ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමනි, මම ඒ කාරණයයි, මේ කාරණයයි දෙක එකට ගැළපුවේ කරුණු පැහැදිලි කරන්නයි.

ඒ වාගේමයි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට අදාළ කාරණාවත්. අපේ පාර්ලිමේන්තුව විහිළුවක් වෙන්න දෙන්න හොඳ නැහැ නේ. එහෙම වුණාම නේ සමාජ මාධ්‍ය වෙබ් අඩවිවල යන්නේ, "හලෝ, මේ ඊශ්‍රායලයද? පලස්තීනයේ කැල්ලක් ලංකාවෙත් තිබෙනවා, ඔය මිසයිලයක් මෙහාටත් එවන්න" කියලා. ෆොටෝ එකකුත් දාලායි එහෙම කියා තිබෙන්නේ. එහෙම තමයි සමාජ වෛරය ඇති වෙන්නේ.

පාර්ලිමේන්තුව වියදම් කරන්නේ, ජනතාවගේ සල්ලි. ඒ නිසා අපි හැම විටම ඒවා ඵල ප්‍රයෝජන ලැබෙන විධියට යොදවන්න ඕනෑ. ඒක වැදගත්. ඒ නිසා මේ පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනාවල තිබෙන හරයාත්මක දේ, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ගන්නා තීන්දු ක්‍රියාත්මක නොවීම පිළිබඳ අභියෝගය, ආංශික අධීක්ෂණ කාරක සභාවල සාකච්ඡා කරන ප්‍රතිපත්ති හා ඒ ප්‍රතිපත්ති රජය ක්‍රියාත්මක කරන්නේ කොහොමද, ඒ ප්‍රතිපත්ති විපක්ෂයේ ඉන්න දේශපාලන පක්ෂ තමුන්ගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනවලට ඇතුළු කරන්නේ කොහොමද කියන කාරණා ගැන අවධානය යොමු කළ යුතුයි. සමහර විට පාර්ලිමේන්තුව නියෝජනය නොකරන දේශපාලන පක්ෂ පවා ඒවා ප්‍රයෝජනයට ගන්නවා. ආංශික අධීක්ෂණ කාරක සභා ස්ථාවර නියෝග 111න් ස්ථාපනය කර තිබෙනවා. ඒ වාගේම තමයි, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවලින් ද හොඳ යෝජනා ඉදිරිපත් වෙනවා. ඒවා එකතු කර ගන්න පුළුවන් ක්‍රමයක් සකස් වෙන්න ඕනෑ.

ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමනි, අර කියපු සම්මාන උපාධි සූදුව සහ ගෞරව නාම සූදුව අවස්ථා ගණනාවකදී බණ්ඩාරනායක සම්මන්ත්‍රණශාලාවේදී සහ තවත් බොහෝ තැන්වලදී සිදු වෙලා තිබුණා. ඒවා ලබා ගත්තු අයත් ඉන්නවා. එහෙම ලබා ගත්ත නාම තමන්ගේ නමේ ඉස්සරහටත් දානවා. මේ සභාවේත් එහෙම අය ඉන්නවා. මේක විළි ලජ්ජාවක්. මේ විළි ලජ්ජාව තිබෙන්නේ, ඒවා ලබා ගන්නා අයට නොවෙයි. ඒවා ලබා ගන්නා අයට ඒක තේරෙන්නේ නැහැ. ඒවා ලබා ගත්තු අය අර සීතාම්බර පටසළුව ඇඳ ගත්තු රජ්ජුරුවෝ නිරුවතින් පාරේ ගියා වාගේ පෙන්න පෙන්නා යනවා. හැබැයි, සැබෑ ලෙස දුක් විඳලා උපාධිය ගන්නා අයට මොකද වෙන්නේ? ප්‍රථම උපාධියක් ගන්න කොච්චර දුක් විඳින්න ඕනෑ ද? සාමාන්‍ය ප්‍රථම උපාධියක් හදාරන්න යනවා, අවුරුදු 3ක්. විශේෂ උපාධියකට, අවුරුදු 4යි. අපි අවුරුදු 5ක් ඒ කටිට කෑවා. අවුරුදු 5ක් කටිට කනවා, වෛද්‍ය හා ශල්‍ය වෛද්‍යවේදී උපාධියක් සඳහා යන අය. පශ්චාද් උපාධියක් නම් අවුරුද්දක්, එකහමාරක් යනවා. පෙළක් වෙලාවට අවුරුදු දෙකක් යනවා. ආචාර්ය උපාධිය සඳහා අවුරුද්දක් හෝ දෙකක් යනවා. දර්ශනපති උපාධිය සඳහා අවුරුදු 2ක් යනවා. දර්ශනසූරී උපාධිය සඳහා අවුරුදු 3ක් යනවා. සමහරුන්ට අවුරුදු 3කටත් වඩා යනවා.

සමහර වෙලාවට thesis එක වචන ලක්ෂ ගණනක සිට 25,000ත් 15,000ත් අතර ප්‍රමාණයක් වෙනවා. එය උපාධියේ ස්වරූපය අනුව වෙනස් වෙනවා. එච්චර දුක් විඳලා උපාධියක් හිමි කර ගන්නා කෙනෙකුට අත් වෙලා තිබෙන ශෝචනීය ඉරණම දිහා බලන්න. මේ කාරණා සියල්ල පාර්ලිමේන්තුව හමුවට ඇවිල්ලා තිබියදීත් පාර්ලිමේන්තුව ඒවාට අදාළව විධිමත් ක්‍රියා මාර්ග ගන්නේ නැත්නම් ඒක රටටත්, රටේ අනාගතයටත් අත්වන ශෝචනීය ඉරණමක්.

මේ විනාඩි කිහිපයේ මගේ යෝජනාව ගැන කථා කරන ගමන් ම මම මේ කාරණය ගැනත් කියන්නේ, හේතුවක් තිබෙන නිසායි. මා කියන්නේ, උගත්කමත් බුද්ධිමත්කමත් කියන දෙකම එකට යන්න ඕනෑ කියලායි. උගත්කමෙන් තොර බුද්ධියෙන් වැඩක් නැහැ; බුද්ධියෙන් තොර උගත්කමෙනුත් වැඩක් නැහැ. උගත්කම විසින් තමයි ශික්ෂණය ඇති කරන්නේ. බුද්ධිමත්කම හැම තිස්සේම උගත්කමේ ලක්ෂණයක් නොවන බව ඇත්ත. ඒත් උගත්කම විසින් මනුස්සයාට ශික්ෂණයක් ඇති කරවනවා. ඒ නිසා උගත්කමත්, බුද්ධිමත්කමත් කියන දෙකම බද්ධ වුණු ක්‍රියා දාමයක රට ගෙන යනවා කියන එකේ ප්‍රදීපස්ථම්භය, ප්‍රදීපාගාරය බවට පත් වන්නේ, ආලෝක ධාරාව බවට පත් වන්නේ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවයි. ඒ නිසා අපේ පාර්ලිමේන්තු ව්‍යුහය මහජන ඉල්ලීමට ගැළපෙන පරිදි වෙනස් කර ගන්නටත් අපි මෙය අවස්ථාවක් කර ගනිමු කියමින්, මගේ යෝජනාව ගැන අදහස් දක්වපු සියලුදෙනාට මම ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම, ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනිය මගේ යෝජනාවට අදාළ පිළිතුරු කථාව කරන්න අද උදෑසනම සූදානමින් සිටියා. නමුත් මට ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවරයා විධියට වාඩි වෙන්න තිබුණේත් ඒ යෝජනාව ඉදිරිපත් කරන්නට නියමිත වෙලාවේමයි. ඒක උදේ 10.30ට පටන් ගන්නයි නියමිතව තිබුණේ. ඒ නිසා මම ලේකම්තුමන්ලාගෙන් ඉල්ලීමක් කළා. මම එකම එක දවසක් විතරයි -නිල්වලා ගඟ පිළිබඳව මතු කරපු ප්‍රශ්නයේදී විතරයි- ආංශික අධීක්ෂණ කාරක සභාවට තත්පරයක් හෝ පරක්කු වෙලා ගිහින් තිබෙන්නේ. අනෙක් හැම දවසකම මම ඒ කාරක සභාව නියමිත වේලාවට පටන් ගෙන තිබෙනවා. මේ යෝජනාව එන දවස වන කොට එම ආංශික අධීක්ෂණ කාරක සභාවට දින නියම කරලා අවසානයි. ඒ නිසා මම ඉල්ලීමක් කළා, අද දිනයේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා අතර පළමුවෙන්ම තිබෙන මගේ යෝජනාව, පුළුවන් නම් අන්තිම යෝජනාව හැටියට ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න කියලා. ඒ වෙනුවෙන් මගේ ගෞරවනීය ස්තුතිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය ප්‍රමුඛ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමාටත්, සහකාර මහ ලේකම්තුමාටත් -ලේකම් මණ්ඩලයට- පුද කර සිටිනවා. ගරු ඇමතිතුමිය ඇවිල්ලා පිළිතුර භාර දීලා, ගරු සභානායකතුමා එක්ක ඒ පිළිබඳව සාකච්ඡා කරලා පිළිතුර ලබා දීම සඳහා විධිමත් ක්‍රමයක් සකස් කර දුන්නා. ඒ පිළිබඳව මම එතුමියටත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වූ සියලු දෙනාටත් මම ස්තුතිවන්ත වෙනවා. මේ යෝජනාව ඇතුළු අනෙකුත් සියලු යෝජනාවල ඵලදායී බව ගැනත්, මම සඳහන් කරපු කාරණා ගැනත් මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු වේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

[ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික මන්ත්‍රී යෝජනා පාර්ලිමේන්තුවට ගෙනෙන අද දිනයේ උදය වරුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ - COPF එකේ - ගරු සභාපතිතුමා විසින් VFS සම්බන්ධයෙන් වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ වාර්තාව අද දින මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සමස්ත සාමාජිකයන්ගේ ඒකමතික අනුමැතියට යටත්වයි, ඒකමතික අනුමැතිය තුළයි කියන කාරණය සඳහන් කරමින්. නමුත්, ඒ සම්බන්ධයෙන් කරුණු දක්වද්දී එතුමා සඳහන් කරපු කාරණා කිහිපයක් ගැන කියන්න තිබෙනවා. එකක් තමයි, ඒ අදාළ කර්තව්‍යය කරගෙන යද්දී එතුමා විශාල අර්බුද ගණනාවකට මුහුණ දුන්නාය කියන කාරණය. ඒ හැම වෙලාවේම අපි එතුමාත් එක්ක හිට ගත්තා. අපි ඒ හැම වෙලාවේම එතුමාගෙන් ඇහුවා, මොනවාද ඒ අර්බුද කියලා. හැබැයි, එතුමා ඒ හැම වෙලාවේම කිව්වේ, එහෙම අර්බුදයක් නැහැ කියලායි. එක වෙලාවක එතුමා පාර්ලිමේන්තුවටත් ඇවිල්ලා කිව්වා, මේ නිසා එතුමාට විශාල මානසික පීඩනයක් තිබෙනවා, තර්ජනයක් තිබෙනවා කියලා. ඒ නිසා අපි ඒ ගැන එතුමාගෙන් ඇහුවා. මොකද, එවැනි ආකාරයේ තර්ජනයක් කිසිම වෙලාවක කිසිම කමිටුවක සභාපතිවරයෙකුට ඇති වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ වෙලාවේ එතුමා කමිටුව ඇතුළේදී පිළිගත්තා, එහෙම දෙයක් නැහැ කියලා. ඊට පස්සේ අපි ඉල්ලීමක් කළා, කරුණාකර ඔබතුමා ගිහින් මේ බව පාර්ලිමේන්තුවේදී ප්‍රසිද්ධියේ කියන්න කියලා. නමුත්, එතුමා ඒක පිළිගත්තේ නැහැ. හැබැයි, එතුමා අද කථාවේදීත් ආපහු සැරයක් කිව්වා, තමන්ට විශාල ප්‍රශ්නයක් තිබුණා කියලා. අපි ඇහුවා, එහෙම වුණේ ඒ කමිටුවේ ඉන්න සාමාජිකයන්ගෙන්ද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ තිබෙන COPE එකේත්, COPA එකේත්, COPF එකේත් අපි ඉන්නවා. අප ඒ කාරක සභාවලට තෝරා ගෙන තිබෙන්නේ, අප යම් ආකාරයේ විභවතාවක් තුළ හැසිරෙන නිසායි. එහෙම වෙලාවකත් මෙසේ චෝදනා කිරීම නිසා අපට විශාල ගැටලුවක් ඇති වනවා. අර්බුදයක් නැහැ කියලා එතුමා කමිටුව ඇතුළේ දී පිළිගත්තත් එතුමා කොයි වෙලාවකදීවත් අවංක වුණේ නැහැ, "මට එහෙම පීඩනයක් අපේ මන්ත්‍රීවරුන්ගෙන් එල්ල වුණේ නැහැ" කියලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්න. පරිබාහිරින් එහෙම දෙයක් සිදු වුණාද කියලාත් අපි එතුමාගෙන් ඇහුවා. එතුමා ඒ ගැන කිව්වෙත් නැහැ. හැබැයි අවාසනාවට, VFS එක සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය සකස් කරන වාර්තාව තවම අවසන් කරලාත් නැහැ.

එහෙම අවසන් කරන්නේ නැතුව අපි සියලු දෙනාගේම ඒකමතික තීරණය යටතේ මෙහෙම වාර්තාවක් ඉදිරිපත් කිරීම සුදුසු නැහැ. අපි මේ රටේ චෝදනාලත් කිසිම ගනුදෙනුවක් සම්බන්ධයෙන් පෙනී ඉන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාර්තාව අපිත් සකස් කරමින් සිටියා. මේ කාරණා සියල්ලම අපි කථා කරන්න ඕනෑ.

ඊළඟ කාරණය හැටියට, එතුමා කළ ප්‍රකාශය මට ඇහුණා, එතුමාගේ විරෝධතාව මැද මේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය අප්‍රසන්න වාතාවරණයකට කැඳෙව්වා කියලා. ඒ කථාව ඉතාම වැරැදියි. කමිටුවේ සාමාජිකයන් සියලුදෙනාගේම තීරණය මත තමයි මහ ලේකම්තුමිය කමිටුවට කැඳෙව්වේ, යම් කාරණා වගයක් නිරාකරණය කර ගන්න. එතුමියගෙන් එම කාරණා නිරාකරණය කර ගත්තාට පස්සේ කමිටුව ඇතුළත සිදුවන දේ මේ විධියට ප්‍රසිද්ධියේ කථා කිරීම ඒ දේ ඉල්ලපු, ඒ වෙනුවෙන් පක්ෂව කථා කරපු මන්ත්‍රීවරුන්ට කරන අසාධාරණයක්. මේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය පරිපාලන ප්‍රධාන නිලධාරි හැටියට කමිටුවලට සහභාගි වීම හෝ කරුණු කාරණා දැක්වීම අමුතු දෙයක් නොවෙයි. ඒ නිසා, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා COPF එකේ හිටපු සභාපතිවරයා හැටියට දිගින් දිගටම දේශපාලනය කිරීම අපි තරයේ හෙළා දකිනවා.

ඒ එක්කම මේ VFS ආයතනයේ සිද්ධ වෙලා තිබෙන කාරණය සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලයෙන් තීරණයක් ගන්න ඕනෑ. ඒ එක්කම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හැටියට පැහැදිලිව අපි සහයෝගය දෙනවා, මේ අවශ්‍ය කාරණා ඉටු කරන්න. හැබැයි, අපි දන්නේ නැතුව අපේ තීරණය, අපේ එකඟතාව ගත්තා කියන කාරණය ගැන අපට යම් ආකාරයක ගැටලුවක් තිබෙනවා කියන කාරණයත් මේ අවස්ථාවේ පාර්ලිමේන්තුවේ ගෙන හැර දක්වනවා. මොකද, ඔය කියන ආකාරයේ අවසන් කරපු වාර්තාවක් සඳහා අපේ නිර්දේශයක් ආවේ නැහැ. අපි මේ කියන්නේ, යම් වැරැද්දක් වෙලා තිබෙනවා නම් ඊට සම්බන්ධ වැරදිකරුවන් රකින්න අපි උත්සාහ කරන්නේ නැහැ කියන එක. ඒක මේ රටේ ජනතාවත් දන්නවා. නමුත්, මේ හරහා මේ විධියට දේශපාලනය කරනවා නම් ඒක වැරැදියි කියන කාරණය මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි.

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ගත්තාම, ස්ථාවර නියෝග 121හි සඳහන්ව තිබෙන්නේ, එම කාරක සභාවේ සභාපතිවරයා විසින් අදාළ සාක්ෂි සහ නිගමන සහිත වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය කියලා. ඒකට අභ්‍යන්තරිකව එතුමන්ලා අතර එකඟතාවක් නැත්නම් ඒක ඒ වෙලාවේ සිදු කරනවා මිසක, මම දැක්ක විධියට මේ ස්ථාවර නියෝගය අනුව තිබෙන්නේ ඡන්දයකින් එකඟ වෙන එකක් විධියට නොවෙයි. ස්ථාවර නියෝග 121 (7)හි සඳහන්ව තිබෙන්නේ, "යෝජනා සහ නිරීක්ෂණ ඇතුළත් වාර්තාව සාක්ෂි සටහන් සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය" කියලා. මම ඔබතුමාගේ දැන ගැනීම සඳහායි කිව්වේ. ඒක කොහොමද කරන්නේ කියලා අපි බලන්න ඕනෑ.

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ස්ථාවර නියෝගවල යම් ආකාරයේ අඩු ලුහුඬුකම් තිබෙන්න පුළුවන්. හැබැයි අපි දන්නවා, කාරක සභාවක් තුළදී කරුණු දැක්වීමේදී පක්ෂ, විපක්ෂ භේදයක් නැතුව අදාළ මන්ත්‍රීවරු කරුණු දක්වන බව. හැබැයි, අපි දන්නේ නැතුව ඉදිරිපත් කරන ලද වාර්තාවක් තුළ, ඒක අපි සියලුදෙනා ඒකමතිකව තීරණය කර අවසානාන්මක තීරණයකට ආවා කියලා කියනවා නම් ඒක වැරදියි කියලා මතක් කරනවා. එහෙම එකක් නැහැ.

අනෙක් කාරණය මේකයි. මේ කියන කාරණය සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලයෙන් තවම විමර්ශනය කර වාර්තාවක් ඉදිරිපත් කර නැති අවස්ථාවක, අපෙනුත් වාර්තාවක් ඉල්ලා අපි ඒක සකසමින් තිබෙන අවස්ථාවක, මේ විධියට කඩිමුඩියේ ඇවිල්ලා මේ වාර්තාව ඉදිරිපත් කිරීම ගැනයි මේ කියන්නේ. ඊයේ උදෑසනත් අපේ වාර්තාව ගැන අපි ප්‍රකාශ කළා. එක ප්‍රශ්නයක් නිසායි අපි මේ ගැන කියන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, න්‍යාය පත්‍රයේ යෝජනා අංක 6, ගරු රොෂාන් රණසිංහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

කල්තැබීමේ ප්‍රශ්න
> *"(a) against any foreign country specified in an Order made under section 2;".*

The Petitioner contended that, even following the proposed amendment, the provision would remain unconstitutional for the reason that the terms 'foreign country' and 'sovereign state' have identical meanings for the purpose of this Bill. This once again demonstrates the Petitioner's propensity to manipulate textual excerpts *a posteriori* to fit preconceived apprehensions regarding the contents of the Bill. The amendment proposes to replace 'sovereign state' with not merely 'foreign country' but 'foreign country specified in an Order made under section 2'.

Therefore, Clause 23 of the Bill, as it stands, constitutes a violation of Article 4 of the Constitution and would require a special majority to be passed in Parliament as an Act of Sri Lanka.

[7] 1 SLR 323

However, where the amendment proposed by the Hon. Attorney General to be moved at the Committee Stage is implemented, such violation would cease to exist.

Clause 3(1)(a)(vi)

Petitioner in SC. SD. 80/2024 contended the Bill to be internally inconsistent for including judgments relating the movable or immovable property within Sri Lanka within the ambit of the Bill under Clause 3(1)(a)(vi), all while excluding judgments relating to matrimonial property settlement by virtue of Clause 23. He further argued enabling foreign judgments to be entered with regard to any property situated within Sri Lanka to be unconstitutional, stating that such application could even cause the *"presumption of innocence to collapse"* where criminal matters are concerned.

The Bill clearly excludes matters of public law from its ambit, and it is axiomatic that this contention of the Petitioner is without merit.

Article 9

Finally, the Petitioners have raised concerns pertaining to the consistency of several provisions of the Bill with Article 9 of the Constitution. However, such concerns are not supported by any sound reasoning by the Petitioners. Further, even upon the Court's own examination of challenged clauses, we find no inconsistency with Article 9 of the Constitution.

THE DETERMINATION OF THE COURT

The determination of the Court as to the constitutionality of the Bill titled **"Reciprocal Recognition, Registration and Enforcement of Foreign Judgments"** is as follows:

1. Sinhala text of Clause 2 of the Bill is inconsistent with the language of Article 157 of the Constitution due to the use of the term 'සම්මුතිය' to mean 'treaty' and shall only be passed with a special majority in Parliament.

   However, this inconsistency shall cease if the same is amended as follows:

   1 වන පිටුව, 2 වන වගන්තිය - 19 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:-

   "ගිවිසුමකට ඇතුළත් වන අවස්ථාවක දී; හෝ";

   2 වන පිටුව - 23 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

   "(අ) ඡේදයේ සඳහන් ගිවිසුම හෝ ලිඛිත නීතිය";

2. Clause 17(1) of the Bill is inconsistent with Article 24 of the Constitution and shall only be passed with a special majority of Parliament. However, such inconsistency shall cease if Clause 17(1) is amended to read as follows:

   "Where the language of a judgment of a court of a foreign country specified in the Order made under section 2 is in a language other than the English language, such judgment shall be accompanied by a translation thereof in the language used by the registering court as the language of such court and made and signed by an interpreter of the Supreme Court, the Court of Appeal or the High Court, or by a sworn translator or an interpreter of any District Court, Family Court, Magistrate's Court or Primary Court, or by a sworn translator."

3. The definition of 'judgment' in Clause 23, specifically paragraph (a) therein, which states "against any Sovereign State", is inconsistent with Article 4 of the Constitution and shall only be passed by a special majority of Parliament. This inconsistency would cease if the same is amended to read as *"against any foreign country specified in an Order made under section 2;"*.

We have examined the rest of the clauses of the Bill and determined that they are not inconsistent with the Constitution. Petitioners have, in fact, made references to clauses other than those discussed above. However, many such references are made generally with no mention of specific Constitutional provisions, while other references mention many Constitutional provisions without explaining how such provisions are in contravention of the Constitution.

We wish to place on record our deep appreciation of the assistance rendered by the learned Senior State Counsel, whose well-organized written submissions were of immense assistance, and other learned Counsel who made submissions in this matter.

S. Thurairaja, PC
Judge of the Supreme Court

K. Kumudini Wickremasinghe
Judge of the Supreme Court

K. Priyantha Fernando
Judge of the Supreme Court

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, ගරු කථානායකතුමා විසින් 2024 ජූලි 17 දින "ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන)" සහ 2024 ජූලි 19 දින "ශෛලී අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත්වල සහතික සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වාර්තාව
அரசியலமைப்புப் பேரவையின் அறிக்கை
REPORT OF THE CONSTITUTIONAL COUNCIL

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ඉදිරිපත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ දෙවැනි වාර්තාව ගරු කථානායකතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXVIII කොටස; සහ
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ V සහ VI කොටස් ගරු කථානායකතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

II

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩය - ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර මත සිදු කරනු ලැබූ ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය පිළිබඳ විශේෂ විගණන වාර්තාව ගරු කථානායකතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

III

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩය - ශ්‍රී ලංකාවේ පෞද්ගලික සෞඛ්‍ය සේවාව නියාමනය කිරීමේ ක්‍රියාවලියේ කාර්ය සාධනය ඇගයීම පිළිබඳ කාර්ය සාධන විගණන වාර්තාව ගරු කථානායකතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්.

මෙම වාර්තා විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 27, 28 සහ 45 වගන්ති සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූනි 06 දිනැති අංක 2387/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

- 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය මත, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 අප්‍රේල් 05 දිනැති අංක 2378/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;
- 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය මත, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 අප්‍රේල් 19 දිනැති අංක 2380/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;
- 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය මත, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 අප්‍රේල් 19 දිනැති අංක 2380/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;
- 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය මත, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 අප්‍රේල් 19 දිනැති අංක 2380/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ
- 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය මත, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 අප්‍රේල් 19 දිනැති අංක 2380/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.- [අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු ප්‍රසන්න රණතුංග මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා වවුනියාව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2022 වර්ෂය සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2023 වර්ෂය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022/2023 වර්ෂය සඳහා සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රවාහන සහ මහාමාර්ග අංශවල වාර්ෂික කාර්ය සාධන වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා පොල් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - கைத்தொழில் அமைச்சரும் சுகாதார அமைச்சரும்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Industries and Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2020 වර්ෂය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු මනුෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara- Minister of Labour and Foreign Employment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විදෙස් රැකියා සහ ශ්‍රමය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124(6) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை
REPORT OF THE COMMITTEE ON PUBLIC ACCOUNTS

ගරු ලසන්ත අලගියවන්න මහතා (ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - போக்குவரத்து இராஜாங்க அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - State Minister of Transport)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තෙවැනි වාර්තාව මම ඉදිරිපත් කරමි. එය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(3) අනුව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2023.03.23 දින සිට 2023.07.07 දින දක්වා සිදු කරන ලද විමර්ශන ඇතුළත් වාර්තාවයි.

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම වාර්තාවට ආයතන 16ක විමර්ශන කටයුතුත්, විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද විශේෂ විමර්ශන වාර්තා 5ක කරුණුත් ඉදිරිපත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම නිර්දේශ 125ක් මේ වාර්තාවට ඇතුළත් කරලා තිබෙනවා. ඒ වාගේම විශේෂිත වූ නිර්දේශ 5කුත් මෙම වාර්තාවට ඇතුළත් කරලා තිබෙනවා.

මෙහිදී විශේෂයෙන්ම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිටින සියලු පක්ෂ නියෝජනය කරන 31දෙනෙකුගෙන් සමන්විත සාමාජිකයන්ටත්, කාරක සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්, පාර්ලිමේන්තුවටත්, මුදල් අමාත්‍යාංශයටත්, විගණකාධිපති දෙපාර්තමේන්තුවටත් මෙම විමර්ශන කටයුතුවලදී ලබා දෙන සහයෝගය පිළිබඳව මේ අවස්ථාවේදී මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විධියට මෙවැනි වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පසුව රටේ මහජනතාව තුළත්, අපි සියලුදෙනා තුළත් තිබෙන මතය තමයි, "නිර්දේශ ඉදිරිපත් කරනවා. නමුත් ඉන් එහාට යමක් සිද්ධ වෙන්නේ නැහැ" කියන එක. ඒක අපි පිළිගන්න ඕනෑ. ඒ අනුව අපි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයකු වන ගරු තිස්ස අත්තනායක මැතිතුමාගේ සභාපතිත්වයෙන් අනුකාරක සභාවක් පත් කරලා, මීට සති තුනකට කලින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව ගත යුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළා. මෙම කාරක සභා විසින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම යනාදී කටයුතු පිළිබඳව වහාම පාර්ලිමේන්තුවේ අවධානය යොමු කිරීම තුළින් පමණයි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේත් කටයුතු වඩා ඵලදායිතාවකින් යුතුව කරන්න පුළුවන්කම ලැබෙන්නේ. එම නිසා ඒ පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරන අතරම, පාර්ලිමේන්තුව පැත්තෙනුත් යම් කරුණක් මා සඳහන් කළ යුතුව තිබෙනවා. අපි මේ මාස හතරට - 2023.03.23 සිට 2023.07.07වැනි දා දක්වා- ආයතන 16ක් සම්බන්ධ විමර්ශන කටයුතු සහ විශේෂ විමර්ශන කටයුතු පහක් සිද්ධ කළා. නමුත් මේ දක්වා පාර්ලිමේන්තුව තුළින් සිදු වන භාෂා පරිවර්තන කටයුතු හා මුද්‍රණ කටයුතු සම්බන්ධයෙන් යම් ප්‍රමාදයක් පවතිනවා. මේ පිළිබඳව අපි සියලු සභාපතිවරුන් දැනුවත් කර තිබෙනවා.

මා ඒ කාර්ය මණ්ඩලවලට දෝෂාරෝපණය කරනවා නොවෙයි. නමුත් ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න. නැත්නම් මේ විමර්ශන කටයුතු පිළිබඳ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට විශාල ප්‍රමාදයක් ඇති වෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරමින් විශේෂයෙන්ම මේ පිළිබඳව ලබා දෙන සහයෝගයට සියලුදෙනාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාගේම අනෙකුත් කාරක සභාවල තීන්දු නීතිපතිවරයාට යවන්න පුළුවන්. ඒක ස්ථාවර නියෝගවල තිබෙනවා. නමුත් යවන්නේ නැති එකයි ප්‍රශ්නය. මම හිතන විධියට, ගිය වතාවේ ස්ථාවර නියෝග සංශෝධනය කරනකොට ඒක දැම්මා. අපි එදා ඉල්ලීමක් කෙරුවා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සහ අනෙකුත් කාරක සභාවල නිර්දේශ නීතිපතිවරයාට යවන්න කියලා . දැන් යවන්න පුළුවන්. ස්ථාවර නියෝගවල පැහැදිලිව එය තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ඒ ගැන අවධානය යොමු කරන්නම්.*[බාධා කිරීමක්]* ඔව්, ගරු අධිකරණ ඇමතිතුමා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙන් සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් දෙනු ලබන නිර්දේශ නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන් ආයතනවලට සෘජු ලෙස යවන්න පාර්ලිමේන්තුවට බලය තිබෙනවා. 2007 වසරේ මා ඉදිරිපත් කරපු COPE වාර්තා දෙකේ, අපි තෝරා ගත්ත ආයතනවල වංචනික ගනුදෙනු 16ක් සම්බන්ධව පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කරන්න කියා මා ඉල්ලුවාම - එවකට ගරු කථානායකවරයා ලෙස සිටියේ වි.ජ.මු. ලොකු බණ්ඩාර මැතිතුමා - ඒ යෝජනාව සම්මත කිරීමත් කළා. ඒ වාගේම ආයතන 16ක ගනුදෙනු පිළිබඳව විමර්ශන ආරම්භ කරන්න කියලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යවනු ලැබුවා. තවත් ආයතන 10ක හෝ 11ක සිදු වී තිබුණු වංචනික ක්‍රියා සම්බන්ධ විමර්ශනය කරන්න පොලිස්පතිවරයා වෙත යැව්වා.

හැබැයි, ඒ ආයතනවලට යවනු ලබන ඒ පැමිණිලි පාර්ලිමේන්තුවේ කථානායකතුමා විසින් යැව්වා වුණත්, ඒවා පිළිබඳව හරියාකාර විමර්ශනයක් නොකිරීම තමයි තිබෙන ගැටලුව. ඒ නිසා තමයි ඔබතුමා, නීතිය ක්‍රියාත්මක කරන ආයතන කැඳවා සාකච්ඡා කර, ඒවා කොහොමද කෙරෙන්න ඕනෑ කියලා ඒගොල්ලන්ට උපදෙස් දිය යුත්තේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විජයදාස රාජපක්ෂ මැතිතුමා කෝප් එකේ සභාපති වශයෙන් සිටි කාලයේ අපිත් ඒ කමිටුවේ හිටියා. ඒ කාලයේ ස්ථාවර නියෝගවල සඳහන්ව තිබුණේ නැහැ, කාරක සභාවල නිර්දේශ නීතිපතිවරයාට යවන්න ඕනෑ කියලා. අපි එදා වි.ජ.මු. ලොකුබණ්ඩාර කථානායකතුමාට කථා කළාම, එතුමා ඒවා යැව්වා. හැබැයි, ස්ථාවර නියෝගවල ඒ ගැන සඳහන්ව තිබුණේ නැහැ. නමුත් පසුගිය අරගළ කාලයේ ඇති වුණු තත්ත්වය මත අපි ඉල්ලීමක් කළා, මේ කාරක සභාවල වාර්තා නීතිපතිවරයාට යවන්න කියලා. ඊට පසුව තමයි එය සිද්ධ වුණේ. ඒක දැනට අවුරුද්දකට, එකහමාරකට පමණ කලින් වුණු වෙනසක්. දැන් ස්ථාවර නියෝගවල තිබෙනවා, ඒවා නීතිපතිවරයාට යවන්න පුළුවන් කියලා. නමුත් එසේ යවන්නේ නැති එකයි වැරැද්ද.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. ඒ ගැන සොයා බලා අවශ්‍ය කටයුතු කරන්නම්.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ ඇමතිතුමාත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් කියපු කාරණාම තමයි මමත් කිව්වේ. කාරක සභාව විධියට අපට තිබෙන කාර්යභාරය තමයි පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කිරීම. අපි දැන් ඉන් ඔබ්බට ගිහිල්ලා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විධියට සිද්ධි කිහිපයක් පිළිබඳ විමර්ශනය කිරීමට පොලීසියට යොමු කර තිබෙනවා. නමුත් අර කිව්වා වාගේ ඒවායේ විමර්ශන කටයුතු ඉතාම මන්දගාමීව තමයි සිද්ධ වෙන්නේ. ඒ නිසා තමයි මම යෝජනා කළේ, දැන් පාර්ලිමේන්තුව විසින් මේ පිළිබඳව දීර්ඝ වශයෙන් අධ්‍යයනයක් කරලා ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව අනිවාර්යයෙන්ම තීන්දු තීරණ ගත යුතුව තිබෙන බව. අපේ වගකීම අපි ඉටු කරලා ඉවරයි. දැන් පාර්ලිමේන්තුවේ ඉතිරි වගකීම තමයි විශේෂයෙන්ම තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි. ඒ ගැන අවධානය යොමු කරන්නම්.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද 2023 වර්ෂය සඳහා වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්න යන්නේ කලින් කාරණය සම්බන්ධවද?

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)

ඔව්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - ඒ කාරක සභා දෙක - වාගේම ස්ථාවර කාරක සභාවක් තමයි, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව. මේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට අපි පෙත්සම් ඉදිරිපත් කරන්නේ මේ ව්‍යවස්ථාදායකයේදීයි. ඊට පස්සේ ඒවා විමර්ශනය කරලා අසාධාරණයට ලක් වෙච්ච රාජ්‍ය අංශයේ වාගේම අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන්ගේ ප්‍රශ්න සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. දැන් බලන්න, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ගිහිල්ලා, AAT එකට ගිහිල්ලා ඒ ආයතනවලින් විසඳා ගන්න බැරි වෙච්ච ඒවාට සාධාරණ විනිශ්චයක් ලබා දීලා යවන කිසිදු නියෝගයක්, තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඇතුළු මේ ආයතනවලින් ක්‍රියාත්මක කරන්නේ නැහැ. පසුගිය කාල පරිච්ඡේදය තුළදි පාර්ලිමේන්තුව පැවැත්වෙන හැම අවස්ථාවකම අපේ මන්ත්‍රීවරු විශාල කණ්ඩායමක් මේ ආකාරයට දවස් දෙකක්, තුනක් එකතු වෙලා රජයේ නිලධාරීන් විශාල සංඛ්‍යාවක් ගෙනැල්ලා, මේවා සම්පූර්ණයෙන්ම විමර්ශනයට භාජන කරලා අසාධාරණයට ලක් වෙච්ච ගොඩක් දේවල්වලට සාධාරණය ඉටු කරන්න ලබා දෙන කිසිදු තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කිසිම ආකාරයකට සැලකිල්ලට ගන්නේ නැතුව අහකට වීසි කරනවා.

හැබැයි, රට කරගෙන යන එක ගැන හිතන්නේ නැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ සම්බන්ධතා එක්ක ඒ අයගේ ඥාතීන්ගේ දේවල් ඉතා අත්තනෝමතික විධියට, ඒ අයට ඕනෑ දේවල් විතරක් ඉටු කරන සභාවක් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත් වෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තුළ එක්කෝ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව අහෝසි කරලා දමන්න ඕනෑ. එහෙම නැත්නම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට තිබෙන බලතල පාර්ලිමේන්තුවට පවරා ගෙන රටේ මේ විධියට යම් යම් ආකාරවලින් අසාධාරණයට ලක් වන නිලධාරීන්ට සහ මහ ජනතාවට සාධාරණයක් ඉෂ්ට කරන ආයතනයක් බවට එය පත් කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් මේ ගරු සභාවේ අවධානය යොමු කරන්න කියා මම ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. ඒ ගැන අවධානය යොමු කරන්නම්.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

Hon. Deputy Speaker, I present a petition from Mr. A.A.A. Rafeek of Baduriya Mosque Road, New Kattankudi 03.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලංගොඩ, කරවිකැටිය, අංක 8/3 දරන ස්ථානයෙහි පදිංචි කේ.ජී. අනුලාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලෙස නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 1 -1704/2024- (1), ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -1729/2024- (1), ජගත් ප්‍රියංකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

කින්නියා මූලික රෝහල: අනුමත සේවක සංඛ්‍යාව සහ පුරප්පාඩු
கிண்ணியா ஆதார வைத்தியசாலை: பணியாட்டொகுதியினர் மற்றும் வெற்றிடங்கள்
KINNIYA BASE HOSPITAL: CADRE AND VACANCIES

1739/2024

3. ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ත්‍රිකුණාමලය, කින්නියා මූලික රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට ඉහත රෝහලේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත රෝහලේ සේවය කරනු ලබන වෛද්‍යවරුන් හා හෙදියන් සංඛ්‍යාව ඔවුන්ගේ සන්නිවේදන භාෂාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත රෝහලේ මේ වන විට පවතින සේවක පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை, கிண்ணியா ஆதார வைத் தியசாலைக்காக அங்கீகரிக்கப்பட்ட பணியாட் டொகுதியினரின் எண்ணிக்கை யாது;

(ii) தற்போது மேற்படி வைத்தியசாலையில் சேவையாற்றும் பணியாட்டொகுதியினரின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி வைத்தியசாலையில் சேவையாற்றும் வைத்தியர்கள் மற்றும் தாதிமார்களின் எண்ணிக்கை அவர்களின் தொடர்பாடல் மொழிக்கு அமைய வெவ்வேறாக யாது;

(iv) மேற்படி வைத்தியசாலையில் தற்போது காணப்படுகின்ற ஊழியர் வெற்றிடங்களை நிரப்ப மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) the approved cadre for Kinniya Base Hospital, Trincomalee;

(ii) the number of employees currently working in the above hospital;

(iii) the number of doctors and nurses working in the above hospital, according to their language of communication separately; and

(iv) the steps that have been taken to fill the existing vacancies in the above hospital?

(b) If not, why?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අනුමත සේවක සංඛ්‍යාව 317කි.

(ii) මේ වන විට සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව 220කි.

(iii)

	සිංහල	දෙමළ	එකතුව
වෛද්‍ය නිලධාරීන්	05	23	28
හෙද නිලධාරීන්	24	44	68

(iv)

- අනුමත සේවක සංඛ්‍යාව සහ සේවා ප්‍රමුඛතා පදනම් කර ගනිමින් ඉදිරි පශ්චාත් සීමාවාසික වෛද්‍ය නිලධාරීන් ස්ථානගත කිරීම් හා සීමාවාසික පුහුණුව සඳහා බඳවාගැනීම් යටතේ වෛද්‍ය නිලධාරී පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.
- වෛද්‍යවරුන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 63 දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය මේ වන විටත් ලැබී ඇති බැවින්, වර්තමානයේ විශ්‍රාම ගැන්වීමට නියමිත වෛද්‍යවරුන්ට තවත් වසර 03ක් සේවයේ යෙදීමේ අවස්ථාව හිමි වේ.

- හෙද සේවයේ සිසු හෙද පුහුණුව සම්පූර්ණ කර ඇති කණ්ඩායම සඳහා ඉදිරියේදී පත්වීම් ලබා දීමට නියමිතව පවතින අතර, ඒ අනුව නැහෙනහිර පළාත් සභාවේ පවත්නා පුරප්පාඩු සඳහා හෙද නිලධාරීන් අනුයුක්ත කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන අතර කින්නියා රෝහලේ පවතින පුරප්පාඩු සඳහා කාර්ය මණ්ඩල අනුයුක්ත කිරීම නැහෙනහිර පළාත් සභාව මඟින් සිදු කරනු ලැබේ. (අනෙකුත් රෝහල්වල පවත්නා පුරප්පාඩු ද සලකා බැලීමෙන් අනතුරුව)

(ආ) පැන නොනඟී.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக கேள்வியைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, இந்தக் கேள்வியானது மூன்று வருடங்களுக்கு முன்னர் என்னால் முன்வைக்கப் பட்டது. திருகோணமலை மாவட்டத்தின் கிண்ணியா பிரதேசத்தில் காணப்படுகின்ற கிண்ணியா ஆதார வைத் தியசாலையானது, ஏனைய வைத்தியசாலைகளைவிட கூடுதலான மக்கள் பயன்படுத்துகின்ற ஒரு வைத் தியசாலையாகும். இந்த வைத்தியசாலை மாகாண நிர்வாகத் தின்கீழ் காணப்படுகின்ற ஒரு வைத்தியசாலையாகும். மாகாண சபைமூலம் ஒதுக்கப்படுகின்ற நிதியானது மிகக் குறைவாக இருக்கின்ற காரணத்தால் இந்த வைத்தியசாலையைப் பராமரிக்க முடியாத ஒரு சூழல் காணப்படுகின்றது. ஆகவே, மத்திய அரசாங்கத்தின்கீழ் கொண்டுவந்து, அதன்மூலம் இந்த வைத்தியசாலைக்குப் போதியளவு நிதியை வழங்கி, சரியான முறையில் இயக்குவதற்கு உங்களுடைய அமைச்சின்மூலம் ஏதாவது நடவடிக்கை எடுக்க முடியுமா? என நான் கேட்கின்றேன்.

மேலும், திருகோணமலை, கந்தளாய் பிரதேசங்களைவிட, கூடுதலான மக்கள் இந்த வைத்தியசாலையைப் பயன்படுத் துகின்றார்கள். குறிப்பாக, Air Force, Navy, Army போன்ற முப்படை வீரர்கள்கூட, இந்த வைத்தியசாலையில் சிகிச்சை பெறுகின்றார்கள். ஆகவே, இந்த வைத்தியசாலையை மத்திய அரசாங்கத்தின்கீழ் கொண்டுவருவதற்கான ஏதாவது செயற்றிட்டத்தை சுகாதார அமைச்சின்மூலம் முன்னெடுக்க முடியுமா? என நான் கேட்க விரும்புகின்றேன்.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය විමධ්‍යගත විෂයයක් නිසා අපි දැනට ප්‍රතිපත්තිමය වශයෙන් මෙවැනි රෝහල් මධ්‍යම රජයට පවරා ගන්නේ නැහැ. හැබැයි, එතුමා කියන කථාව සත්‍යයක්. මෙම රෝහලේ අඩුපාඩු තිබෙන බව අපි දන්නවා. මේ සම්බන්ධව මම ඔබතුමාට අනිවාර්යයෙන්ම පොරොන්දු වෙන්නම්. ඊයේ මුදල් අමාත්‍යතුමා හැටියට ගරු ජනාධිපතිතුමා මේ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගත්තා. අපට ඩොලර් මිලියන 150ක මුදලක් ලැබෙනවා, ශ්‍රී ලංකාවේ ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවා වැඩිදියුණු කරන්න. ඒක රුපියල් බිලියන 45ක මුදලක්. ඒ මුදලින්, ඔබතුමාගේ රෝහලේ තිබෙන සියලු අවශ්‍යතා සම්බන්ධව ඇස්තමේන්තු සකස් කර තිබෙනවා නම්, අපි 2025 වසර සඳහා වෙන් කළ මුදල්වලින් සෑහෙන ප්‍රමාණයක් ලබා දෙන්න ලබන අවුරුද්දේ කටයුතු කරන්නම්. ඒකට අවශ්‍ය ඇස්තමේන්තු දැන් පිළියෙල කරගන්න. අපි ඒ මුදල් ලබා දෙන්න කටයුතු කරන්නම්. ඒ රෝහල් මධ්‍යම රජය යටතේ තිබුණත්, පළාත් සභාව යටතේ තිබුණත් මධ්‍යම රජයට ලැබෙන මුදල් අපි භේදයක් නැතුව ලබා දෙනවා. මොකද, අපේ අවශ්‍යතාව අනුව අපට පළාත් සභාව, මධ්‍යම රජය කියලා රෝගීන් බෙදන්න බැහැ. ඒ නිසා රෝගී සත්කාරක සේවා වැඩිදියුණු කරන්න අවශ්‍ය සහයෝගය සම්පූර්ණයෙන්ම මධ්‍යම රජය මඟින් ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා අහනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාට යොමු කරන ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, 2022 දෙසැම්බර් මාසයේදී, වකුගඩු රෝගයක් හේතුවෙන් හම්දි නමැති අවුරුදු තුනක දරුවකු කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලට ඇතුළත් කළාම ඒ දරුවාගේ වම් වකුගඩුව අයින් කළා, ඒ වකුගඩුව නරක් වෙලා තිබුණු නිසා. ඒ දරුවා ඒ ශල්‍යකර්මයෙන් - surgery එකෙන් - පසුව වාට්ටුවට දැම්මාට පසුව වාර්තාවලත් සඳහන් වුණේ වම් වකුගඩුව තමයි අයින් කරලා තිබෙන්නේ කියලා. නමුත්, ඒ ශල්‍යකර්මය කරලා මාස 7ක් ගියාට පසුව තමයි දැනගත්තේ ඒ දරුවාගේ වකුගඩු දෙකම අයින් වෙලා තිබෙනවා කියලා. ඒ බව වාර්තාවල සඳහන් වුණා. 2023 ජූලි මාසයේ දී ඒ දරුවා අභාවප්‍රාප්ත වුණා. අද වෙනකොට හරියටම අවුරුද්දක් වෙනවා, ඒ දරුවා අභාවප්‍රාප්ත වෙලා.

ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නය ගැන අහද්දි එදා කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට කිව්වා, සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ඒ පිළිබඳව විමර්ශනයක් කරලා, පරීක්ෂණයක් කරලා වාර්තාවක් ඉදිරිපත් කරනවා කියලා. දැන් මේ ජූලි මාසයේ 27වැනි දා වෙනකොට ඒ දරුවා අභාවප්‍රාප්ත වෙලා අවුරුද්දකුත් ගත වෙනවා. මේ සම්බන්ධ විශේෂ කාරණය තමයි මේ ශල්‍යකර්මය කරපු වෛද්‍ය නලින් විජේකෝන් රට අතහැර ගිහින් තිබෙන එක. ඒ කියන්නේ, මේ ශල්‍යකර්මය අවසන් වෙනවාත් එක්කම එතුමා රට ගියා. ඊළඟට, ඒ දරුවා scan කරපු වෛද්‍ය නුවන් හේරත් යන අයත් රට අතහැර ගිහින් තිබෙන්නේ.

එතකොට, මේ ශල්‍යකර්මයට සම්බන්ධ වුණු වෛද්‍යවරු දෙදෙනාම අද මේ රටේ නැහැ. ඊළඟ ප්‍රශ්නය තමයි, දැන් ඒ වකුගඩුත් රෝහලේ නැහැ. වකුගඩු ඉවත් කළා නම් ඒවා රෝහලේ තිබෙන්න ඕනෑ නේ. ඒවා රෝහලේ නැහැ කියලා තමයි දැන් වාර්තා වෙන්නේ. ඉතින් කොළඹ රිජ්වේ ළමා රෝහලේ ඇති වුණු මේ සිද්ධිය ඉතා බරපතළ එකක්. මේ පිළිබඳව බලධාරිනුත් කිව්වා, "පරීක්ෂණයක් පවත්වලා වාර්තාවක් ඉදිරිපත් කරනවා" කියලා. අද වෙනකොට අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. තවම වාර්තාවක් ඉදිරිපත් කරලා නැහැ. ඒ වාගේම රවුල් හකීම් මැතිතුමා පාර්ලිමේන්තුවේදි මේ කාරණාව මතු කළ වෙලාවේ හිටපු සෞඛ්‍ය ඇමතිතුමාත් කිව්වා, "වාර්තාවක් ඉදිරිපත් කරනවා" කියලා. නමුත්

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

තවම වාර්තාවක් ලැබුණේ නැහැ. ඒ දරුවා අභාවප්‍රාප්ත වෙලා අද වෙනකොට අවුරුද්දක කාලයක් ගත වෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය හැටියට මේ සම්බන්ධව ගත් පියවර හා ඒ වාර්තාව පිළිබඳ තත්ත්වය කුමක්ද කියලා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, ගරු ඇමතිතුමනි.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු මන්ත්‍රීතුමා, මේ සඳහා පිළිතුරක් දැනට මා සතුව නැහැ. මම ඒ වාර්තාව ලබා ගෙන ඔබතුමාට සතියකින් පිළිතුරක් ලබා දෙන්නම්. ඔබතුමාට මම ඒ වාර්තාව ලැබෙන්න සලස්වන්නම්.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමා කැමැතියි නම් මට එතුමාගෙන් තහවුරු කර ගැනීමක් කරගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමියනි, අතුරු ප්‍රශ්න දෙක නම් අහලා ඉවරයි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු ඇමතිතුමනි, හෙද විදුහල්වලට ළමයි ඇතුළත් කර ගැනීමේ ගැසට් එක නිකුත් කිරීම මේ වෙනකොට පරක්කු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම 2020 වසරේ විභාගය ලියපු දරුවන්ට මේ වනකොට අවුරුදු 4ක් ගත වෙලා තිබෙනවා. නමුත් මේ වෙනතුරු ඒ ගැසට් එක නිකුත් කරලා නැහැ. ඒ නිසා ළමයි බලාගෙන ඉන්නවා. ප්‍රශ්නය වෙලා තිබෙන්නේ දැන් ඒ ළමයින්ට වෙන රැකියාවකට යන්නත් නැහැ.

මේ තත්ත්වයම දැන් විද්‍යාපීඨවලත් තිබෙනවා. එහෙම වෙලා අවුරුදු දෙකක්, ඒ කියන්නේ batches දෙකක් එකට ගත්තා. එහෙම වුණාම ගන්න සිසුන් ප්‍රමාණය සීමා වෙනවා. එතකොට මේ දරුවන්ට ලොකු අසාධාරණයක් සිද්ධ වෙනවා. ඔබතුමා මේ ගැසට් එක ඉක්මනින් නිකුත් කරන්න. ඒ කියන්නේ 2020-2021 සඳහා ගැසට් එක නිකුත් කරලා නැහැ. 2021-2022 සඳහා ගැසට් එකත් නිකුත් කරලා නැහැ. 2022-2023 සඳහා ගැසට් එක නිකුත් කරලාත් නැහැ. මෙන්න මේ ගැටලුව තිබෙනවා. ඔබතුමා ඒ පිළිබඳව දරන අදහස මොකක්ද කියලා කියන්න. ගැසට් එක ඉක්මනින් නිකුත් කිරීමේ හැකියාවක් තිබෙනවා ද?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

2019-2020 වසර සඳහා මේ අවුරුද්දේ තමයි බඳවා ගැනීම් කරන්නේ. ඒ ක්‍රියාවලිය සිදු වෙමින් තිබෙන්නේ. මේ වසරේ ඉදිරි මාස තුනක කාලය ඇතුළතදී 2020-2021 සඳහා ගැසට් එක නිකුත් කරන්න පුළුවන්. අපි පුළුවන් තරම් ඉක්මනින් එ්ක කඩිනම් කරන්න කටයුතු කරගෙන යනවා. මොකද, පසුගිය කාලයේ බඳවා ගැනීම් කරලා තිබුණේ නැහැ. 2019-2020ටත් මේ අවුරුද්දේ තමයි අපි බඳවා ගැනීම් කළේ. ඉදිරි වසර කීපය සඳහාත් මාස තුනක් ඇතුළතදී ගැසට් කරන්න බලාපොාරොත්තු වෙනවා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, බඳවාගත්ත ළමයින්ගේ ලැයිස්තුව ඉදිරිපත් කරන්න බැරි ද?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

අපි 2019-2020 සඳහා ලැයිස්තුව දැනටමත් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඉදිරියේදී නිකුත් කරන ගැසට් නිවේදනය මඟින් අයදුම් පත්‍ර කැඳවලා තමයි ඒක කරන්න පුළුවන් වන්නේ. ඒ කටයුත්ත මාස තුනක් ඇතුළතදී කරන්න පුළුවන්.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, ඒ සඳහා කාලය ගත වෙනවා. ඒ ළමයින්ට වෙන තැනකට යන්න පුළුවන්.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

අපි ඒ ගැන දන්නවා. අපි කඩිනම් කරලා, මාස තුනක් ඇතුළත ඒ කටයුත්ත කරනවා. මොකද, මෙතෙක් කල් බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබුණේ නැහැ, ගරු මන්ත්‍රීතුමියනි. ඒකයි පරක්කු වෙලා තිබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 4 -1751/2024- (1), ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

මාතලේ දිස්ත්‍රික්කයේ අ.පො.ස. උසස් පෙළ සිසුන්: විද්‍යාව සහ ගණිතය විෂය ධාරාවන්ට යොමු කරවීම

மாத்தளை மாவட்ட க.பொ.த. (உயர் தர) மாணவர்கள்: விஞ்ஞானம் அல்லது கணித பாடத்துறைகளுக்கு உள்வாங்குதல்

GCE (A/L) STUDENTS OF MATALE DISTRICT: ENROLLMENT INTO SCIENCE AND MATHEMATICS STREAMS

1878/2024

5. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා මාතලේ දිස්ත්‍රික්කයේ අ.පොෂ. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි මුළු සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිසුන් සංඛ්‍යාව විද්‍යා, ගණිත, වාණිජ සහ කලා විෂය ධාරාව අනුව ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාතලේ දිස්ත්‍රික්කයේ සිසුන්ගෙන් බහුතරයක් අ.පොෂ. (උසස් පෙළ) විද්‍යා හෝ ගණිත විෂයය ධාරාව වෙත යොමු කරවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தளை மாவட்டத்தில், 2015ஆம் ஆண்டிலிருந்து இதுவரை க.பொ.த. (உயர் தர) பரீட்சைக்குத் தோற்றிய மாணவர்களின் மொத்த எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அந்த மாணவர்களின் எண்ணிக்கை விஞ்ஞானம், கணிதம், வர்த்தகம் மற்றும் கலை ஆகிய பாடத் துறைகளுக்கு அமைய சதவீத அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மாத்தளை மாவட்டத்திலுள்ள மாணவர்களில் பெரும்பாலானவர்களை க.பொ.த (உயர் தர) விஞ்ஞானம் அல்லது கணித பாடத்துறைகளுக்கு ஆற்றுப்படுத்த எடுக்கவிருக்கும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the total number of students who sat for the General Certificate of Education (Advanced Level) Examination from the Matale District from 2015 up to now;

(ii) their percentages segregated as science, commerce and arts streams, separately; and

(iii) what steps will be taken to get a majority of students of the Matale District enrolled to the Advanced Level science and mathematics streams?

(b) If not, why?

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i)

වර්ෂය	සිසුන් සංඛ්‍යාව
2015	6032
2016	6187
2017	6161
2018	6643
2019 (පැරණි)	2649
2019 (නව)	4718
2020 (පැරණි)	677
2020 (නව)	6906
2021	6801
2022	6645
2023	6890
එකතුව	60309

වර්ෂය	විද්‍යා	ප්‍ර.ශ.	ගණිතය	ප්‍ර.ශ.	වාණිජ	ප්‍ර.ශ.	කලා	ප්‍ර.ශ.
2015	1077	17.85	560	9.28	1289	21.37	2618	43.40
2016	1039	16.79	567	9.16	1236	19.98	2634	42.57
2017	999	16.21	537	8.72	1258	20.42	2664	43.24
2018	1061	15.97	523	7.87	1210	18.21	2985	44.93
2019 (පැරණි)	641	24.20	259	9.78	409	15.44	1040	39.26
2019 (නව)	447	9.47	268	5.68	958	20.31	2339	49.58
2020 (පැරණි)	245	36.19	52	7.68	32	4.73	265	39.14
2020 (නව)	855	12.38	502	7.27	1316	19.06	3282	47.52
2021	957	14.07	532	7.82	1262	18.56	3177	46.71
2022	864	13.00	519	7.81	1290	19.41	3063	46.09
2023	1090	15.82	582	8.45	1269	18.42	3100	44.99

(ii)

(iii)
- 6 සිට 8 දක්වා සිසුන් සඳහා මේ වන විට ක්‍රියාත්මක කර ඇති විද්‍යා අධ්‍යාපන පර්යේෂණ වැඩසටහන් හා නිරීක්ෂණයට යොමු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා 9වන ශ්‍රේණියේ සිසුන් සඳහා විෂය ධාරා තෝරා ගැනීමේ වැඩසටහන් පැවැත්වීම.
- අ.පො.ස. (උසස් පෙළ) සඳහා විද්‍යා හෝ ගණිත විෂය ධාරා තෝරා ගැනීමේ වැදගත්කම පිළිබඳව සිසුන් සහ දෙමව්පියන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.
- GEMP සහ SESIP ප්‍රතිපාදන මඟින් උසස් පෙළ විද්‍යා අධ්‍යාපනයට ප්‍රවේශ සුදුසුකම් ලබන සිසු සංඛ්‍යාව වර්ධනය කිරීමේ වැඩසටහන් කලාප අධ්‍යාපන කාර්යාල හරහා ක්‍රියාත්මක කරනු ලබයි.
- කලාප අනුව විද්‍යාගාර පහසුකම් පහත පරිදි වේ.

කලාපය	1AB පාසල් සංඛ්‍යාව	උසස් පෙළ විද්‍යාගාර සංඛ්‍යාව
ගලේවෙල	05	03
මාතලේ	13	13
නාඋල	01	03
විල්ගමුව	01	01

- SESIP වැඩසටහන යටතේ වන ප්‍රතිපාදනවලින් උසස් පෙළ විද්‍යාගාර සඳහා අවශ්‍ය පර්යේෂණ ද්‍රව්‍ය සහ උපකරණ ලබා දීමට කටයුතු සම්පාදනය කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, (අ) (ii) කොටසට අදාළව අන්තිම වසරේ එක් එක් විෂයයන්වලට අදාළ ප්‍රතිශත ටික කියන්න පුළුවන්ද?

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

2023 වසරේ එක් එක් විෂයයන්වලට අදාළව සිසුන් සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස කිව්වොත්, විද්‍යාව සියයට 15.82යි, ගණිතය සියයට 8.45යි, වාණිජ සියයට 18.42යි, කලා සියයට 44.99යි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් අහන්න තිබුණත්, විෂය භාර අමාත්‍යතුමා නැති නිසා ඒක අහලා වැඩක් නැතිවෙයි කියලා මම හිතනවා.

නමුත් මම මේ අතුරු ප්‍රශ්නය අහන්නම්.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ඔබතුමිය අතුරු ප්‍රශ්නය අහන්න. මම එය ගරු ඇමතිතුමාට යොමු කරලා පිළිතුරක් ලබා දෙන්න කටයුතු කරන්නම්.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුරේ සඳහන්ව තිබෙන ප්‍රතිශත අනුව ඒ අවුරුදු කිහිපයම අරගෙන බැලුවත්, ඒක තමයි මාතලේ දිස්ත්‍රික්කයේ ඇත්ත තත්ත්වය. ඒ වාගේ දුෂ්කර පළාත්වල විද්‍යා විෂය ධාරාව හදාරන සිසුන් ප්‍රතිශතයයි, ගණිතය විෂය ධාරාව හදාරන ප්‍රතිශතයයි මේ විධියට අඩු වෙන්නේ ඒ පාසල්වලට ගුරුවරු නැතිකම නිසායි. මෙන්න මේක තමයි ඇත්තටම ඇති වෙලා තිබෙන තත්ත්වය. එහෙම නැතුව මාතලේ දිස්ත්‍රික්කයේ ඉගෙන ගන්න බැරි දරුවෝ ඉන්නවා කියන එක නොවෙයි. ගුරුවරු බඳවා ගැනීමේ ක්‍රමයේත් ගැටලුවක් තිබෙනවා. මධ්‍යම පළාතේම උපාධිධාරීන් 3,421ක් ඉන්නවා. පුරප්පාඩු තිබෙනවා 6,334ක්. නමුත් බඳවා ගත්තේ 386යි. අවුරුදු ගණනාවක් තිස්සේ ඒ පළාතෙන් ගුරුවරු ඉදිරියට එන්නේ නැත්තේ, එහෙම නැත්නම් උපාධිධාරීන් එළියට එන්නේ නැත්තේ මෙන්න මේ ගුරු හිඟය නිසා. හොඳ අත්දැකීම් තිබෙන, පළපුරුද්ද තිබෙන, දිගු කාලයක් සේවය කරපු ගුරුවරයෙකුගෙන්, ගුරුවරියකගෙන් ඉගෙන ගන්න ඒ දරුවන්ට කිසිම දවසක වාසනාව ලැබිලා නැහැ. මොකද විද්‍යාපීඨවලින් හෝ කොහෙන් හරි දානකොට, විශේෂයෙන් විල්ගමුව අධ්‍යාපන කලාපයට, වලපනේ අධ්‍යාපන කලාපයට එන්නේ පිට ප්‍රදේශවල අය. ඒ අය ඇවිල්ලා අවුරුදු පහ යන්නත් කලින් කොහොම හරි ආපහු යනවා. එතකොට නැවත අලුත් කෙනෙක් එන්නේ. මෙන්න මේ කතන්දරය, මේ විෂම චක්‍රය අපේ මාතලේ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, දුෂ්කර පළාත්වල තිබෙනවා. අපට ඒවාට විසඳුමක් ඕනෑ. ගරු ඇමතිතුමාට ඒක සඳහන් කරන්න. මධ්‍යම පළාතේ 6,334ක් පුරප්පාඩු තිබෙන කොට උපාධිධාරීන්ගෙන් බඳවා ගත්තේ 386යි. අනෙක් පළාත්වල ඒක වෙනස් වෙලා, දෙවැනි වටයටත් බඳවා ගැනීම් කරලා තිබෙනවා. උදාහරණයක් හැටියට වයඹ පළාත ගත්තොත්, 2,322ක් මේ වෙනකොට බඳවාගෙන තිබෙනවා. හැබැයි, ගැසට් පත්‍රයේ ප්‍රකාශ කළේ 689යි. උතුරු මැද පළාතේ ගැසට් පත්‍රය ගැහුවේ 1,378ක් බඳීදවා ගන්න. හැබැයි, මේ වෙනකොට ඒක ඉක්මවා බඳවාගෙන තිබෙනවා. දකුණු පළාත ගත්තත් එහෙමයි. 2,308ක් බඳවාගෙන තිබෙනවා, ගැසට් කරපු ප්‍රමාණයට වැඩියෙන්. ඉතින්, මධ්‍යම පළාතේ මෙච්චර පුරප්පාඩු තිබිලාත් ඒ අය බඳවා නොගන්න හේතුව මොකක්ද?

ඊළඟ කාරණාව මෙයයි. විල්ගමුව ප්‍රදේශයෙන්, එහෙම නැත්නම් දුෂ්කර ප්‍රදේශවලින් විභාගය සමත් වෙච්ච උපාධිධාරීන්ට interview එකේදී ප්‍රමුඛතාවක් ලැබිලා නැහැ. ඒක තුළ වෙන්නේ ඒ අය හැලිලා ගිහිල්ලා පිට අයට අවස්ථාව එන එක. අනෙක් අයට අවස්ථාව නැහැ. මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්න අහන එකේ තේරුමක් නැහැ. මම ඉල්ලා සිටින්නේ මේකට ක්‍රමයක් සකස් කරන්න කියලායි. ඒ පළාත්වල ගුරු හිඟයක්, ඌනතාවක් තිබෙනවා.

ඒ අය බඳවා ගැනීමේ දී එම ප්‍රදේශය මුල් කරගෙන සිටින උපාධිධාරීන්ට ප්‍රමුඛතාව දීලා ඒ බඳවා ගැනීම් කරන්න ඕනෑ. මොකද, ලග්ගල මැතිවරණ කොට්ඨාසයේ විද්‍යා උපාධියක් - BSc උපාධියක් - තිබෙන කෙනෙකුත් තේරිලා නැහැ කියලා මම දැක්කා. මෙන්න මේ වාගේ ගැටලු තිබෙනවා. අපට ආරංචි ලැබිලා තිබෙනවා, මධ්‍යම පළාතේ ගුරු පත්වීම් ටික දුන්නේ සමහර අයගේ ලැයිස්තුවලට කියලා. අන්න එහෙම ලැයිස්තුවලට දෙනකොට මෙහෙම කැපෙනවා. ඒ නිසා විනිවිදභාවයක් ඇතිව, මේ ප්‍රදේශවල දරුවෝ ගැන මීට වඩා හොඳින් හිතලා මේ පත්වීම් ටික දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 6 -1910/2024- (1), ගරු තිස්ස අත්තනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ඉදිරි වර්ෂ පහ සඳහා විදුලි අවශ්‍යතාව: සපුරාලීම සඳහා සැලසුම්
அடுத்த ஐந்தாண்டுகளுக்கான மின்சாரத் தேவை: பூர்த்தி செய்வதற்கான திட்டங்கள்
ELECTRICITY REQUIREMENT FOR NEXT FIVE YEARS: PLANS FOR ACCOMPLISHMENT

1914/2024

7. ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඉදිරි වර්ෂ 05 සඳහා ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාව සම්බන්ධයෙන් පුරෝකථනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ඉදිරි වර්ෂ 05 සඳහා ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

(iii) එම විදුලිබල අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා ඉදිරි වර්ෂ 05 තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) எதிர்வரும் 05 வருடங்களுக்கான இலங்கையின் மின்சாரத் தேவை தொடர்பில் எதிர்வுகூறல் மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், எதிர்வரும் 05 வருடங்களுக்கான இலங்கையின் மின்சாரத் தேவை குறித்த தகவல்களைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) மேற்படி மின்சாரத் தேவையை நிறைவேற்றிக் கொள்வதற்காக எதிர்வரும் 05 வருட காலப்பகுதியில் நடைமுறைப்படுத்துவதற்கு உத்தேசிக்கப் பட்டுள்ள திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he inform this House -

(i) whether a forecast has been made in relation to the electricity requirement of Sri Lanka for the next five years;

(ii) if so, whether the details of the electricity requirement of Sri Lanka for the next five years would be presented; and

(iii) the plans which are proposed to be implemented in the next five years in order to meet such electricity requirement?

(b) If not, why?

ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii)

වර්ෂය	ශුද්ධ විදුලි ජනනය (ගෙ.වො.පැ.) [Net Generation (GWh)]	උපරිම ඉල්ලුම (මෙ.වො.) [Peak Demand (MW)]
2025	17,725	2,727
2026	18,650	2,872
2027	19,630	3,027
2028	20,662	3,190
2029	21,750	3,362

(iii) මේ වන විට ශ්‍රී ලංකාවේ බලශක්ති ජනනය සඳහා ඇති ස්ථාපිත ධාරිතාව මෙ.වො. 4,381ක් වේ. ඉදිරි වර්ෂවලදී පද්ධතියෙහි ඇතිවන විදුලි අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ධාරිතාව පහත පරිදි වේ.

- මොරගොල්ල ජල විදුලි බලාගාරය - මෙ.වො. 31
- සොබාදනවි ද්‍රවීකෘත ස්වාභාවික වායු සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරය - මෙ.වො. 350
- කෙරවලපිටිය දෙවැනි ද්‍රවීකෘත ස්වාභාවික වායු සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරය - මෙ.වො. 350
- කෙරවලපිටිය ද්‍රවීකෘත ස්වාභාවික වායු අභ්‍යන්තර දහන එන්ජින් විදුලි බලාගාරය - මෙ.වො. 200
- කොළොන්නාව බැටරි බලශක්ති ගබඩා පද්ධතිය - මෙ.වො. 50 / මෙ.වො.පැ. 50
- මහා පරිමාණ සුළං හා සූර්ය බලාගාර කිහිපයක් ඉදිරි වසර 5 තුළ පද්ධතියට එක් කිරීමට බලාපොරොත්තු වේ.

වර්ෂය	සුළං බලාගාර (MW)	සූර්ය බලාගාර (MW)
2025	200	340
2026	290	330
2027	250	330
2028	200	350
2029	250	370
2030	200	280

වර්ෂය	වහල මත ඉදි කෙරෙන සූර්ය පැනල (MW)
2025	165
2026	170
2027	170
2028	170
2029	170
2030	170

- කුඩා පරිමාණ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ද නොකඩවා ක්‍රියාත්මක කෙරෙන අතර, එම බලාගාර සැලකිය යුතු ප්‍රමාණයක් ඉදිරි වසර 5 තුළ පද්ධතියට එක් වේ යැයි බලාපොරොත්තු වේ.
- තවදුරටත් වහල මත ඉදි කෙරෙන සූර්ය පැනල මඟින් මෙගාවොට 650ක් පමණ පද්ධතියට එක් වේ යැයි පුරෝකථනය කර ඇත.

(ආ) සියලු තොරතුරු ඉහත දක්වා ඇති බැවින් අදාළ නොවේ.

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

ගරු අමාත්‍යතුමනි, පසුගිය කාලයේ විදුලි බිල සෑහෙන්න වැඩි වුණා. එය සියයට 300කින් විතර වැඩි වුණා කිව්වා. ඊට පස්සේ කිහිප වතාවකදී විදුලි බිල අඩු වුණා. නමුත්, ජනතාවට ඒක දැනෙනවාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. සමහර අය ගෙවල්වල වහලය මත සූර්ය පැනල සවි කරගෙන තිබෙනවා. මේ විදුලි බිල අඩුවීමත් එක්ක පොදු ජනතාවට යම් කිසි සහනයක් ලැබෙන බව ඇත්ත. හැබැයි, ඒකෙන් තවමත් ජනතාව ප්‍රකෘතිමත් තත්ත්වයට පත් වෙලා නැහැ. හැබැයි, දැන් මේ සවි කර තිබෙන සූර්ය පැනලවලින් ලබා ගන්නා විදුලිය සඳහා ගෙවන මීලත් අඩු කරලා තිබෙනවා කියලා කථාවක් තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඒක ඇත්තක්ද?

ගරු කංචන විජේසේකර මහතා
(*மாண்புமிகு கஞ்சன விஜேசேகர*)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 අගෝස්තු මාසයේදී තමයි, 2014 වර්ෂයට පසු පළමුවැනි වතාවට විදුලි බිලෙහි සංශෝධනයක් කළේ. ඒ සංශෝධනයෙන් පසු අවස්ථා තුනකදී වැඩි කිරීමකුත්, අවස්ථා තුනකදී අඩු කිරීමකුත් වශයෙන් අවස්ථා හයකදී විදුලි ගාස්තු ක්‍රමය සංශෝධනය කරලා තිබෙනවා. වර්තමානයේ විදුලි ගාස්තු ක්‍රමය ඇවිල්ලා තිබෙන්නේ අතරමඟ තැනකට. 2014දී සංශෝධනය කරපු මුදල සහ 2022 අගෝස්තු මාසයේදී සංශෝධනය කළ මුදල අතර තැනකට තමයි දැන් ඒ අය ක්‍රමය පැමිණ තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම වහලය මත සවි කරන ලද සූර්ය පැනල සම්බන්ධයෙන් 2022 නොවැම්බර් මාසයේදී අපි ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තා. ඇමෙරිකානු ඩොලරයක වටිනාකම රුපියල් 400 දක්වා ශීඝ්‍රයෙන් ඉහළ යෑමත්, පොලී අනුපාතය සියයට 35ක් දක්වා ඉහළ යෑමත්, ඒ වාගේම අනෙකුත් පිරිවැය ඉහළ යෑමත් කියන කාරණා නිසා ඒ අවස්ථාවේදී ලංකා විදුලිබල මණ්ඩලයේ, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ හා මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කළා, මේ ගැන බලන්න. ඒ කමිටුව විසින් එක් එක් ආර්ථික පිරිවැය ඇතුළත් කරලා, ඒ අවස්ථාවේ විදුලිය මිලදී ගැනීම සඳහා ලබා දිය යුතු සුදුසු මිල වෙනුවෙන් මිල සූත්‍රයක් සකස් කළා.

ඒ අනුව තමයි පළමුවෙනි අවුරුදු අටේදී රුපියල් 22කට සහ ඊළඟ අවුරුදු හතේදී රුපියල් 15කට විදුලිය මිලදී ගැනීමට තිබුණු ගිවිසුම් සඳහා මිල වැඩි කරන්න තීන්දුව ගත්තේ. ඒ අනුව රුපියල් 37ක මුදලක් ලබා දුන්නා, අවුරුදු 20ක් සඳහා වහලය මත සූර්ය පැනල සවි කරන පුද්ගලයන් වෙනුවෙන්. නමුත් ඒ තීන්දුව ගන්න අවස්ථාවේදී ප්‍රතිපත්තිමය තීන්දුවක් තිබුණා, මාස තුනෙන් තුනට එය නැවත වතාවක් ආර්ථික පිරිවැය එක්ක -ඩොලරයේ අගය, අපේ තිබෙන පොලී අනුපාතය සහ සූර්ය පැනලවල මිල එක්ක- සංසන්දනය කරලා යාවත්කාලීන කරන්න ඕනෑ කියලා. කෙසේ නමුත්, සූර්ය පැනල භාවිතය දිරිගැන්වීමක් වශයෙන් අපි අවුරුදු එකහමාරක කාලයක් ඒ මිල පවත්වාගෙන ගියා. අපේ ඉලක්කය තිබෙන්නේ, වහලය මත සවි කරන සූර්ය පැනලවලින් අවුරුද්දකට මෙගාවොට් 150ක් ගන්න. මේ අවුරුද්දේ ජූනි මාසය වෙනකොට මෙගාවොට් 142ක් ලබා ගත හැකි විධියට අපි වහලය මත සූර්ය පැනල සම්බන්ධ කරලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ අවුරුද්ද අවසාන වෙනකොට මෙගාවොට් 200ක්, 250ක් පමණ ලබා ගන්න පුළුවන් වෙයි කියලා. දැන් ලෝක වෙළෙඳ පොළේ සූර්ය පැනල මිල ශීඝ්‍රයෙන් අඩු වෙලා තිබෙනවා. පොලී අනුපාතයත් දැන් සියයට 14ක්, 15ක් වාගේ අගයකට ඇවිල්ලා තිබෙනවා. රුපියල් 400කට කිට්ටු වෙන්න තිබුණු ඩොලරයේ අගයත් දැන් රුපියල් 306ට පමණ ඇවිල්ලා තිබෙනවා. මේ සූත්‍රයට ඒ පිරිවැයත් ඇතුළත් වෙනවා. ඒ අනුව දැන් අපට ඇවිල්ලා තිබෙනවා, රුපියල් 27ක මිලක්. ඒ අනුව තමයි ඒ මිල ලබා දීලා තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව බලනකොට ඒක අඩු කිරීමක් නොවෙයි. විශේෂයෙන් ම විදුලිබල මණ්ඩලය ගිවිසුම්ගත වෙන්නේ අවුරුදු විස්සකට. රුපියල් 37 ගණනේ අවුරුදු 20ක් ගෙවනකොට අපේ විදුලි බිල සඳහා ඒකෙන් විශාල බලපෑමක් ඇති වෙනවා. ඒ නිසා මේ තිබෙන මිලත් එක්ක තමයි ඒ අවුරුදු 20 ලබා දීලා තිබෙන්නේ. ඒ වාගේම විශේෂයෙන්ම මෑතකදී විවෘත කළ ටෙන්ඩර්වලදී සූර්ය බලාගාරවලට ආවේ ඒකකයකට රුපියල් 14ක්, 15ක්, 16ක් වාගේ මිලක්. ගිය අවුරුද්දේ ඒ මිල තිබුණේ රුපියල් 40කට වාගේයි. එතකොට ටෙන්ඩර්වලට ආ මිල ගණන්, පැනලවල මිල ගණන් කියන සියල්ලම සැලකිල්ලට අරගෙන, ඒ සියල්ල ආදේශ කරලා තමයි ඒ නිලධාරීන් විසින් ම ඒ සූත්‍රයට එම මිල ලබා දීලා තිබෙන්නේ. ඒ අනුව කාටවත් අසාධාරණයක් වෙලා නැහැ. අපි ජූලි මාසයේ 01වෙනි දාට පෙර මුදල් තැන්පත් කරලා, අනුමැතිය ලැබිලා තිබෙන ඒවාට පැරණි මිලම දෙනවා. ජූලි 01වෙනි දායින් පසුව ඉල්ලුම් කරන, මුදල් තැන්පත් කරන පිරිසට අලුත් මිල ලබා දෙන්න කටයුතු කරනවා.

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(*மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த*)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

ගරු අමාත්‍යතුමනි, විදුලි බලය කියන්නේ අපේ ජීවිතවලට අත්‍යවශ්‍ය අංගයක් බව අපි දන්නවා. මේ රටේ පසුගිය අවුරුදු 70ක, 75ක කාල සීමාව තුළ සමහර කාරණා සම්බන්ධව දිගින් දිගටම ප්‍රශ්න, වර්ජන රැලි ක්‍රියාත්මක වුණා. අපි වෘත්තීය අයිතිවාසිකම් දිනා ගන්න ඕනෑ. හැබැයි සමහර කාරණාවලදී අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා, ඒවා තුළින් පවතින ආණ්ඩුව බිත්තියට හේත්තු කරනවා, එහෙම නැත්නම් මහ ජනතාව බිත්තියට හේත්තු කරනවා, මහ ජනතාව බිල්ලට දෙනවා කියලා. එහෙම රැල්ලක් පසුගිය කාලයේදීත් ආවා.

හැබැයි, ඒක ජනතාව ප්‍රතික්ෂේප කළා. ජනතාව හැම වෙලාවේම කිව්වේ, මේවා ඔක්කෝම පෞද්ගලීකරණය කරන්න ඕනෑ කියලායි. එම නිසා සමහර වර්ජන ගෙනා පක්ෂවලට මේ වර්ජන ආපස්සට හරවා ගන්නත් සිද්ධ වුණා.

ගරු අමාත්‍යතුමනි, මේ ළඟදී ඔබතුමා සේවකයන් හැටදෙනෙකු ඉවත් කළා. මම දැනගන්න කැමැතියි, ඒ අය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද, ඒ අයට යම් සහනයක් දෙන්න පුළුවන්ද කියලා. ඒ අය ඒ ආකාරයෙන් කටයුතු කළත්, ඒ අපේ රටේ ජනතාව. ඒ නිසා මේ සම්බන්ධ ඇත්ත තත්ත්වය මොකක්ද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු කංචන විජේසේකර මහතා
(*மாண்புமிகு கஞ்சன விஜேசேகர*)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට හිතෙන විධියට එතුමාගේ ප්‍රශ්නය නිවැරැදි කළ යුතුයි. මම සේවකයන් 62ක් ඉවත් කරලා නැහැ. ඒක ඒ පාලන අධිකාරියෙන් ගත් තීන්දුවක්. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ මූලිකත්වය ගත් දේශපාලන වශයෙන් කටයුතු කරන වෘත්තීය සමිති කිහිපයක් ජනවාරි මාසයේදී මේ රටේ මතයක් නිර්මාණය කරලා තිබුණා, ශ්‍රී ලංකා විදුලිබල පනත පාර්ලිමේන්තුවේ සම්මත වුණාට පස්සේ විදුලිබල ක්ෂේත්‍රයට අයත් සියලු දේවල් පෞද්ගලීකරණය කරනවා කියලා. මේ වනකොට එම පනත සම්මත වෙලා මාස දෙකකට ආසන්න කාලයක් වෙනවා. නමුත්, එවැනි ආකාරයේ කිසිදු පෞද්ගලීකරණයකට ගිහිල්ලා නැහැ. ඒ අවස්ථාවේ සේවා කටයුතු අඩාළ කරමින් සේවකයන් විශාල පිරිසක් පාවිච්චි කළා, ඔවුන්ගේ දේශපාලන අරමුණු ජයග්‍රහණය කිරීම සඳහා. හැබැයි, අත්‍යවශ්‍ය සේවා වශයෙන් කටයුතු කරන වෙලාවේ අපි සේවකයන්ගෙනුත් ඉල්ලීමක් කළා, වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ තරම් නිදහස තිබෙන නමුත්, සේවාවලට බාධා කළ නොහැකියි කියලා. ඒ අනුව, වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් සේවාවලට බාධා නොවී කටයුතු කළ පිරිස් වෙනුවෙන් අපි නීතිමය පියවර අරගෙන නැහැ; විනයානුකූල පියවර අරගෙන නැහැ. නමුත්, දින 3ක් ගෙවීම් කවුළු වහලා, ජනතාව අපහසුතාවට පත් කරමින්, ඒ අවස්ථාවේ සේවා කටයුතු අඩපණ කළ 62කගේ සේවය අත්හිටුවීමට පාලන අධිකාරිය

තින්දුවක් අරගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට ඒ පිළිබඳ පරීක්ෂණ කටයුතු අවසන් වෙමින් පවතිනවා. ඊට අමතරව ඔවුන් අධිකරණයටත් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. අපි පාලන අධිකාරියට උපදෙස් දීලා තිබෙනවා, පරීක්ෂණ වාර්තා ලැබුණු පසු ඒ පිළිබඳව කටයුතු කරලා, අවශ්‍ය පියවර ගන්න කියලා. හැබැයි, මේ වෙලාවේ චෝදනාවක් ඇවිල්ලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වෘත්තීය සමිති කිහිපයක නියෝජිතයන් ඇවිල්ලා යම්කිසි කාරණාවක් ගැන පසුගිය දවසක මා දැනුවත් කළා. මේ වෘත්තීය අරගළ වෙනුවෙන් පෙනී හිටපු කණ්ඩායම් මෙහෙයවපු දේශපාලන පක්ෂ විදුලිබල මණ්ඩලයේ ඉන්න වෘත්තීය සමිතිවලින් මුදල් එකතු කර තිබෙනවා, ඔවුන් වෙනුවෙන් නඩු කටයුතුවලට පෙනී සිටින්න කියලා. ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන නියෝජිතයෝ තමයි ඔවුන්ව පාරටත් බැස්සුවේ. හැබැයි, දැන් වෘත්තීය සමිතිවලින් මුදල් එකතු කරලා, අපේ නීතිඥයෝ කියලා ජනතා විමුක්ති පෙරමුණේ නීතිඥයන් එම නඩු කටයුතුවලට නොමිලේ පෙනී ඉන්න බව කියනවා.

අපට දැන් වෘත්තීය සමිති නියෝජිතයන් ඇවිත් කියනවා, ජනතා විමුක්ති පෙරමුණේ සුනිල් වටගල නීතිඥතුමා ලක්ෂ 55ක් අරගෙන තිබෙනවා කියලා ඒ 60දෙනා වෙනුවෙන් නඩුවලට පෙනී ඉන්න. හැබැයි ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් ඒ අය පාරටත් බස්සනවා, වෘත්තීය ක්‍රියාමාර්ගවලට. අනෙක් පැත්තෙන් මුදලුත් එකතු කරලා, ඒ මුදල්වලින් ජනතා විමුක්ති පෙරමුණේ නීතිඥවරුන්ට ගෙවනවා ද, නැත්නම් ඒ මුදල් පාවිච්චි කරලා තමන්ගේ දේශපාලනය කරනවා ද කියන එක තමයි තිබෙන ප්‍රශ්නය. හැබැයි, දැන් අර අභිංසක මිනිසුන් 60ක් මාස 6ක් තිස්සේ ගෙදර ඉන්නවා. ඒ අය වෙනුවෙන් මුදල් එකතු කරලා තිබෙන්නේත් උද්ඝෝෂණය කරපු විදුලිබල මණ්ඩලයේම අයගෙන්.

2019 වර්ෂයේ සිට විදේශගත කාන්තා ශ්‍රමිකයන්: විස්තර

2019ஆம் ஆண்டு தொடக்கம் வெளிநாடு சென்றுள்ள பெண் தொழிலாளர்கள்: விபரம்

FEMALE WORKERS MIGRATED FROM YEAR 2019: DETAILS

1918/2024

8. ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) ராஜிகா விக்கிரமசிங்ஹ)
(The Hon (Mrs.) Rajika Wickramasinghe)

කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා විදේශගත වී ඇති ශ්‍රී ලාංකික කාන්තා ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, ගෘහ සේවය සහ වෙනත් රැකියා ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සංඛ්‍යාව පුහුණු ශ්‍රමිකයන් හා නුපුහුණු ශ්‍රමිකයන් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම කාන්තා ශ්‍රමිකයන්ගේ සුබසාධනය සඳහා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2019 ஆம் ஆண்டு தொடக்கம் இதுவரை வெளிநாடு சென்றுள்ள இலங்கைப் பெண் தொழிலாளர்களின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(ii) மேற்படி எண்ணிக்கையில், வீட்டுப் பணிக் காகவும் வேறு தொழில் வாய்ப்புகளுக்காகவும் சென்றுள்ளவர்களின் எண்ணிக்கை தனித் தனியாக எத்தனையென்பதையும்;

(iii) மேற்படி எண்ணிக்கையானது, பயிற்றப்பட்ட மற்றும் பயிற்றப்படாத தொழிலாளர்கள் எனும் வகையில் தனித்தனியாக எத்தனையென் பதையும்;

(iv) இப்பெண் தொழிலாளர்களின் நலனோம்புகை தொடர்பில் வெளிநாட்டு வேலைவாய்ப்புப் பணி யகத்தால் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Foreign Employment:

(a) Will he inform this House -

(i) the number of Sri Lankan female workers who have gone abroad to date from year 2019;

(ii) out of the aforesaid number, the number of female workers serving as domestic workers and in other professions, separately;

(iii) the number of skilled and unskilled labourers, out of the aforementioned number of female workers separately; and

(iv) the measures taken by the Foreign Employment Bureau for the welfare of the aforesaid female workers?

(b) If not, why?

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වර්ෂ 2019 සිට 2024 ජූනි දක්වා විදේශගත වී ඇති ශ්‍රී ලාංකික කාන්තා ශ්‍රමිකයන් සංඛ්‍යාව 464,142ක් වේ.

(ii) ගෘහ සේවය - 301,198යි.
වෙනත් රැකියා - 162,944යි.

(iii) පුහුණු ශ්‍රමිකයන් - 362,943යි.
නුපුහුණු ශ්‍රමිකයන් - 101,199යි.

(iv) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියාවක් සඳහා විදේශගත වන කාන්තා ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් පහත සඳහන් ක්‍රම සුරක්ෂිත කර ඇත.

[ගරු මනුෂ නානායක්කාර මහතා]

1. මැද පෙරදිග කලාපයේ ගෘහස්ථ අංශයේ රැකියාවක් සඳහා විදේශගත වන කාන්තාවන්ගේ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා විදේශ රක්ෂණාවරණය ක්‍රියාත්මක කිරීම හා සෙසු කාන්තා ශ්‍රමිකයන්ගේ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා දේශීය රක්ෂණාවරණය මඟින් රැකවරණය සැලසීම.

2. විදේශ රැකියාවෙහි නිරතව සිටියදී කාන්තා ශ්‍රමිකයන් මුහුණ දෙන ගැටලු සඳහා විසඳුම් ලබා දීමට විදේශ දූත මණ්ඩල කාර්යාලවල කම්කරු හා සුබසාධන අංශවල සේවයෙහි නියුතු නිලධාරීන් මැදිහත් වීම.

3. විදේශ රැකියාවෙහි නිරතව සිටියදී ගැටලුවලට මුහුණ දෙන කාන්තා ශ්‍රමිකයන්හට රැකවරණය සැලසීම සඳහා දූත මණ්ඩල කාර්යාලවල සුරක්ෂා නිවාස පවත්වාගෙන යෑම. Safe houses කියන්නේ ඒවාට.

4. ගෘහ සේවය සඳහා යන කාන්තාවන්ට විදේශගත වීමට පෙර පුහුණුවක් ලබා දීම.

5. විදෙස්ගත වීමට පෙර දරුවන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් හරහා පවුල් පසුබිම් වාර්තා ලබා ගැනීම.

   පවුල් පසුබිම් වාර්තා ලබා ගන්නවා විතරක් නොවෙයි, ඒ හදන සැලසුම - plan එක - අනුව ඔවුන් නිරන්තරයෙන් රැක බලා ගැනීම සහ ඔවුන්ගේ තොරතුරු වාර්තා කිරීමත් අපේ සංවර්ධන නිලධාරීන් හරහා සිදුවනවා.

6. අවුරුදු 02ට අඩු දරුවන් ඇති කාන්තාවන් විදෙස්ගත නොකිරීම.

7. විදෙස්ගතවීමට කාර්යාංශයේ ලියාපදිංචි වන අවස්ථාවේදී පවුලේ සාමාජිකයන් වෙනුවෙන් වියළි ආහාර ලබා ගැනීම සඳහා රු. 10,000ක සතොස වවුචර්පත් ලබා දීම.

   ඒ කියන්නේ පළමුවරට විදේශගත වෙලා පළමු පඩිය ලැබෙනකම් ඇයගේ ගෙදර අයට රුපියල් 10,000ක වවුචරයක් පවා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලබා දෙනවා.

8. විදෙස්ගත වන දෙමාපියන්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම, පාසල් උපකරණ ලබා දීම.

9. විදෙස්ගතව පූර්ණ ආබාධිත තත්ත්වයට පත්ව ලංකාවට පැමිණෙන ශ්‍රමිකයන් සඳහා නිවාස ඉදිකර දීම.

10. විදේශගත කාන්තාවන්ගේ දූ දරුවන්ගේ විශේෂ දක්ෂතා ඇගැයීමට මූල්‍යමය දායකත්වය ලබා දීම.

11. කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශගතව සිටින විට හෝ ලංකාවට පැමිණි පසු විදේශ රක්ෂණාවරණය මඟින් රක්ෂණ ප්‍රතිලාභ ලබා දීම.

12. විදේශගතව සිටියදී කාන්තාවන්ට සිදුවන හිරිහැර, අතවර සම්බන්ධව අදාළ රටෙහි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලයේ රැකීරක්ෂා හා සුබසාධන අංශයේ නිලධාරීන්ගේ නිරන්තර සොයා බැලීම් සිදුකර ගැටලු නිරාකරණය කිරීම.

13. රක්ෂණාවරණ මඟින් කාලය ඉකුත් වී ඇති බැවින් ප්‍රතිලාභ ලබා දිය නොහැකි අවස්ථාවල කාර්යාංශයේ සේවක සුබසාධන අරමුදල මඟින් ප්‍රතිලාභ ලබා දීම.

14. විදේශගත කාන්තාවන් ලංකාවට පැමිණ හෝ සිටියදී පවුලේ සාමාජිකයන් විසින් ඉදිරිපත් කරන පැමිණිලි සමථයකට පත් කිරීම සඳහා කාර්යාංශයේ සමථ අංශය මඟින් කටයුතු කිරීම.

15. කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ගැටලු විසඳා ගැනීම සඳහා විගමනික සංගම් පිහිටුවා ගැනීම.

   අපි ග්‍රාමීය වශයෙන් රට වටේම විගමනික සංගම් 6,000කට අධික සංඛ්‍යාවක් මේ වනවිට පිහිටුවා තිබෙනවා.

16. "මනුසවි" බහුවිධ ණය යෝජනා ක්‍රමය අපි මේ කාන්තාවන්ට හඳුන්වා දීලා තිබෙනවා. අවශ්‍ය ඕනෑම කර්තව්‍යයක් සඳහා අඩු පොලියට රුපියල් ලක්ෂ 25ක් දක්වා ණය ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

17. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියාවක් සඳහා විදේශගතව සිටින ශ්‍රමිකයන්හට රුපියල් මිලියන 2ක ණය මුදලක් කාර්යාංශයේ නිර්දේශය මත සියයට 8ක පොලියට ලබා දීම.

18. විදේශ රැකියාවක නිරතව සිටි විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වැඩිම වාර ගණනක් ලියාපදිංචි වී ඇති ශ්‍රමිකයන්ට සතොස වවුචර්පත් ලබා දීම.

ලියාපදිංචි වාර ගණන	වවුචර්පතෙහි වටිනාකම (රුපියල්)
06	7,500.00
07	12,500.00
8 හෝ 9	20,000.00
10 හෝ 10ට වැඩි	25,000.00

19. නිවාස ණය ලබා දීම.

   කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශගතව සිටින ශ්‍රමිකයන් හට නිවාස සිහිනය සැබෑ කර ගැනීම සඳහා රුපියල් මිලියන 10ක් දක්වා නිවාස ණය ලබා ගැනීමේ හැකියාව පවතින අතර, අදාළ පොලී මුදලින් කොටසක් කාර්යාංශය මඟින් ප්‍රතිපූරණය කිරීම.

20. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියාවක නියුතු ශ්‍රමිකයන්ගේ කලත්‍රයා

හට දිවිමඟ සාර්ථක කර ගැනීමේ අරමුණින් ස්වයං රැකියාවක් ආරම්භ කිරීම සඳහා රුපියල් 100,000ක් දක්වා ආධාර ලබා දීම.

ඒ කියන්නේ ශ්‍රමිකයා පිටරට ඉන්නවා නම් ඒ කාන්තාව හැම දාම රට යන එක වළක්වන්න කලත්‍රයාට ලංකාවේ ස්වයං රැකියාවක් ආරම්භ කරන්න රුපියල් 100,000ක මුදලක් අපි ලබා දෙනවා.

21. ඒ වාගේම විදේශ රැකියාවේ යෙදී සිට මෙරටට පැමිණ සිටින ශ්‍රමිකයන් ව්‍යවසායකයන් බවට පත් කිරීම සඳහා කාර්යාංශයෙන් මූල්‍ය දායකත්වය ලබා දෙනවා.

එතැනදී පළමුවෙන් රුපියල් 50,000ක් ලබා දෙනවා. පසුව ඒක රුපියල් 100,000ක් වනවා. ඊට පසුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් තෝරා ගන්නා කණ්ඩායම් සඳහා රුපියල් ලක්ෂ 10ක් දක්වා ලබා දෙනවා. ණය නොවෙයි, ආධාර වශයෙන් ඔවුන් ශක්තිමත් කරන්න තමයි රුපියල් ලක්ෂ 10ක් දක්වා ලබා දෙන්නේ. ඒ, ඔවුන් ව්‍යවසායකයන් බවට පත් කරන්න. විගමනික ශ්‍රමිකයන් හරහා ව්‍යවසායකයන් ලක්ෂයක් බිහි කිරීම තමයි මෙහි අරමුණ වන්නේ.

22. විදේශ රැකියාවෙහි නිරතව සිටින ශ්‍රමිකයන්ගේ විශ්‍රාම දිවිය සාර්ථක කර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නත් දැන් කටයුතු කර තිබෙනවා. දැන් ඒ විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මකයි. මෙය දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් විධියට තමයි ක්‍රියාත්මක වෙන්නේ. දැනට ඔවුන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමය ආරම්භ කර තිබෙනවා.

(ආ) පැන නොනඟී.

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) ராஜிகா விக்கிரமசிங்ஹ)
(The Hon. (Mrs.) Rajika Wickramasinghe)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සඳහන් කළ ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා නම් අපි විශේෂයෙන් ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, සමස්ත විදේශගත ශ්‍රමිකයන් වෙනුවෙන්. ඒ වාගේම ගරු අමාත්‍යතුමනි, මෙතැන තිබෙනවා ප්‍රශ්නයක්. මොකද, කොතරම් දේවල් අපේ රජයෙන් ක්‍රියාත්මක කළත්, අපේ කාන්තාවන් විදේශගත වෙන්නේ යම් යම් විදේශ රැකියා ආයතන හරහා. එසේ විදේශගත වුණාම සමහර රටවලදී මේ කාන්තාවන්ට විශාල ගැටලුවලට සහ දුෂ්කරතාවලට මුහුණ දෙන්න වෙනවා.

ඊයේ- පෙරේදාත් එවැනි සිද්ධියක් වුණු බව මම දන්නවා. මෙවැනි ප්‍රශ්නවලදී විදේශ රැකියා ආයතනය ඒ වගකීම භාර ගන්නේ නැහැ. ඒ වාගේම ඒ දැනුවත් කිරීම හරියට සිදු වෙන්නේ නැති නිසාත්, ඔවුන් කොහේටද සම්බන්ධ වෙන්නේ කියන කාරණය නොදන්නා නිසාත් විදේශගත වන කාන්තාවන් අසරණභාවයට පත් වෙනවා. මේ ගැන නැවත සොයා බලන්න කියන ඉල්ලීම තමයි විශේෂයෙන්ම ඔබතුමාට මා මතක් කරන්නේ. මොකද, ඔවුන් දරුවන් වෙනුවෙන් තමයි විදේශගත වෙන්නේ. විදේශ රටකට ගිහිල්ලා කාන්තාව අසරණ වෙනවා නම්, මීට වඩා ඒ රැකියා ආයතන ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියන කාරණය තමයි විශේෂයෙන්ම මා ඔබතුමාගෙන් ඉල්ලන්නේ.

ගරු අමාත්‍යතුමනි, පසුගිය කාලයේ ඊශ්‍රායලයට රැකියා සඳහා අපේ රටේ තරුණ පිරිසක් යැව්වා. ඒ කෝටාව නැවත ක්‍රියාත්මක වෙනවාද? ඒ වාගේම කොරියානු රටේ රැකියා සඳහා තිබෙන කෝටාව තුළ අපේ තරුණ පිරිසටත් අවස්ථාව තිබෙනවාද කියන එකත් මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

මා පළමුවෙන්ම ඔබතුමිය කළ ඉල්ලීම බොහොම ඕනෑකමින් පිළිගන්නවා, ගරු මන්ත්‍රීතුමියනි. මම මෙතැනදී මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. 2022 වර්ෂයේදී විදේශගත වුණා, 312,000ක්. 2023 වර්ෂයේදී විදේශගත වුණා, 300,000ක්. මේ අවුරුද්දේ මේ වෙනකොට විදේශගත වෙලා සිටිනවා, 150,000ක පිරිසක්. කොහොම වුණත් මම කලින් සංඛ්‍යා ලේඛනවලදී කිව්වා, ගෘහ සේවය සඳහා 301,000ක් මේ කාලය තුළදී විදේශ රටවලට ගිහින් තිබෙනවා කියලා. පුහුණු ශ්‍රමිකයන් විධියට ගිහින් තිබෙනවා, 362,000ක්. මේ ආසන්න කාලය ගත්තත්, මිලියන 1.2ක විතර ප්‍රමාණයක් විදේශගත වෙලා තිබෙනවා.

හැබැයි, මේ අයගෙන් ලැබෙන පැමිණිලි සංඛ්‍යාව අනුව, අනතුරුවලට, කරදරවලට ලක්වීම කියන එක ඉතා අඩු ප්‍රතිශතයක්. ගැටලුවලට මුහුණ දීලා අපේ සුරක්ෂා නිවාසවලට එන සංඛ්‍යාවත් පසුගිය කාලයට සාපේක්ෂව මේ වනකොට අඩු කරගන්න පුළුවන් වෙලා තිබෙනවා, පුහුණු ශ්‍රමිකයන් විදේශ රටවලට යැවීම හරහා සහ මේ බලපත්‍රලාභීන් නියාමනය කිරීම හරහා.

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කිව්වා වාගේ මේ නීති-රීති ක්‍රියාත්මක කරලා, අපි පසුගිය කාලයේ එක වතාවක් බලපත්‍රලාභීන් 400කගේ බලපත්‍ර විතරක් තාවකාලිකව අත්හිටෙව්වා. ඊට පස්සේ බලපත්‍රලාභීන් 200කගේ බලපත්‍ර ස්ථිරවම තහනම් කළා.

ඊට අමතරව, බලපත්‍රලාභීන්ගේ වේශයෙන් පෙනී සිටින කණ්ඩායම් ඉන්නවා. ඒ කියන්නේ, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි නැති, වෙනත් ආයතන කියලා පවත්වාගෙන යන අය ඉන්නවා. හොර ඒජන්සි කියන්නේ ඒවාට. ඒවා බලපත්‍රලාභී ආයතන නොවෙයි. බලපත්‍රලාභී ආයතනවලින් වැරදී වුණාම ඒවා ගැන සොයා බලන්න විදේශ සේවා නියුක්ති කාර්යාංශයට වගවීමක් තිබෙනවා. ඒ නිසා තමයි නඩු පවරලා ඒ කටයුතු කරන්නේ. නමුත් බලපත්‍රලාභී නොවන අය තැන් තැන්වල මේ කටයුතු කරනවා. ඒ නිසා තමයි අපේ වැටලීම් අංශය දවසකට වැටලීම් හත අටක් සිද්ධ කරලා, පොලිසියේත් සහයෝගය අරගෙන ඒ කටයුතු සිද්ධ කරන්නේ; අත්අඩංගුවට ගැනීම් සිද්ධ කරන්නේ; නීතිය ක්‍රියාත්මක කරන්නේ.

හැබැයි මම මතක් කරන්න ඕනෑ, ප්‍රතිශතාත්මකව ගත්තාම, 0.01ක ප්‍රමාණයකින්, එහෙම නැත්නම් වැඩිම වුණොත් සියයට 1ට අඩුවෙන් තමයි හැම වෙලාවකම මේ පැමිණිලි වාර්තා වෙන්නේ කියන එක. ඒ පැමිණිලිවලිනුත් බහුතරයක් ඒ ඒ අවස්ථාවේදීම විසඳනවා. ඉතා දුරාචාරයේ තමයි කාන්තාවකට වර්තමාන කාලයේදී එහෙම කරදර සිද්ධ වෙන්නේ. හැබැයි, ඒ කරදර අවම කරගන්න, නැති කරගන්න ඕනෑ කරන වැඩ පිළිවෙළ සකස් කළ යුතුයි කියන එක අපි පිළිගන්නවා. ඒ වාගේම ඒ අයට මොනවා හරි ප්‍රශ්නයක් වුණොත්, කොයි විධියටද පැමිණිලි කරන්නේ කියන කරුණු සියල්ල පිළිබඳව ඒ අය විදේශගත වනකොටම දැනුවත් කරනවා. නමුත් ඒ අයගේ තිබෙන නොදැනුවත්කම, ඒ අයගේ අධ්‍යාපන මට්ටම ඇතුළු නොයෙක් කාරණා මේකට බලපානවා. ඒ නිසා ඔවුන්ට ඒ සඳහා සුහුරු වැඩ පිළිවෙළක් හදලා

[ගරු මනුෂ නානායක්කාර මහතා]

තිබෙනවා, සමස්ත විදේශ සේවා නියුක්ති ක්ෂේත්‍රයම digitalize කිරීම හරහා. ඒ සම්පූර්ණ පද්ධතියම වෙනස් තැනකට ගෙනියන ක්‍රමය හරහා මේ අතරමැදියන් අයින් කිරීම සහ පැමිණිලි ක්‍රමය පිළිබඳවත්, ගෙදරක ඉන්න ගෘහ සේවිකාවකට පඩිය ලැබුණාද, නැද්ද එහෙම නැත්නම් කරදරයක් වුණාද, නැද්ද කියන දේවල් පිළිබඳවත් smartphone එකකින් පණිවුඩ ලබා දෙන්න පුළුවන් ඉතා සරල ක්‍රමයක් හදුන්වා දෙන්න අපි සූදානම් කර තිබෙනවා. ඒ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතියත් ලැබිලා තිබෙනවා. ඒ ක්‍රමය ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කළාම දැනට ඉතා අඩුවෙන් සිද්ධ වෙන ගැටලු වුණත් අවම කරගන්න අපට පුළුවන් කියන කාරණාව මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ඊට පස්සේ ඇහුවා, අපේ තරුණ පිරිස් ඊශ්‍රායලයට යැවීම සම්බන්ධයෙන් පවතින තත්ත්වය මොකක්ද කියලා. අපි ඊශ්‍රායලයට ශ්‍රමිකයන් යැවීම සඳහා ඊශ්‍රායල රජය සමඟ ගිවිසුම් කිහිපයක් අත්සන් කළා. ඉතිහාසයේ ඉඳලාම ඊශ්‍රායලයේ සෘතුමය රස්සාවල් සඳහා යන අයට - seasonal workersලා සඳහා - කෝටාවක් තිබුණා.

නමුත් ඒ කටයුතු නතර වෙලා තිබුණා, අපේ කණ්ඩායම් ඒ රටට ගිහිල්ලා නතර වුණු නිසා; නැවත ලංකාවට ආවේ නැති නිසා; නීතිවිරෝධීව ඒ රටේ රැඳී සිටි නිසා. අපි ඉල්ලීමක් කළා, නැවත අපේ රටට එම අවස්ථාව ලබා දෙනවා නම්, අවුරුදු පහක කාල සීමාවක් සඳහා එසේ ලබා දෙන්නය කියලා. එම ඉල්ලීමට ඔවුන් ප්‍රතිචාර දැක්වීම නිසා අපට පුළුවන් වුණා, මෙපමණ කාලයක් ඒ රටට අපේ රටින් සාත්තු සේවය සඳහා ගිය කාන්තාවන්ගේ සංඛ්‍යාවේ යම් වැඩිවීමකුත් කරගන්න. මේ වනකොට අවුරුද්දකට 2,000ක, 3,000ක පිරිසක් ලබා ගැනීමට ඔවුන් එකඟතාව පළ කර තිබෙනවා. NVQ සහතිකය තිබෙන, සාත්තු සේවය සඳහා කැමැත්තක් දක්වන කාන්තාවන්ට වාගේම, දැනට රෝහල්වල සේවය කරන සාත්තු සේවිකාවන්ටත් මේ සඳහා අයදුම් කරන්න පුළුවන්. මම ඒ ගැනත් මතක් කරන්න ඕනෑ. ඕනෑම කෙනෙකු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ඇවිල්ලා ඒ අවශ්‍ය තොරතුරු දැනගෙන ලියාපදිංචි වුණාම, ඒ රටේ වෙබ් අඩවිය හරහා තෝරා ගැනීම සිද්ධ වෙනවා.

ඊට අමතරව තරුණයන් 10,000කට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා ලබා දීමට අප සමඟ ඊශ්‍රායල රජය ගිවිසුම්ගත වුණා, මාස 63ක වීසා කාලයක් සඳහා. ඉතාම ඉක්මනින් අපේ කණ්ඩායම එවන්න කියා ඔවුන් ඉල්ලීම් කළා, ඔවුන්ගේ රටේ ඇති වුණු තත්ත්වයත් එක්ක. ඒ අවස්ථාවේ යවපු ඇතැම් කණ්ඩායම්වල යම් යම් දුර්වලතා පැවතුණා. අපි රටක් විධියට ගත්තාම කාර්යක්ෂමතාව අතින් යම්කිසි පහළ මට්ටමක ඉන්නේ. අපි ලෝකයේ රටවල් අතරින් 100ටත් එහායින් ඉන්නේ ශ්‍රම ඵලදායිතාව අතින්. ඒවායේ ප්‍රතිඵලයක් හැටියට ඒ රටවේදී, - මුල් වකවානුවලදී ඒ අයට නියමිත විධියට වැටුප් ලැබුණු නිසා ගැටලුවක් නැතුව හිටියත් - ඇතැම් ප්‍රශ්න මතු වුණාම ලංකාව තුළ පුරුදු කර තිබෙන ආකාරයට දියව්! දියව්! දියව්! කියන උද්ඝෝෂණ සහ වර්ජන ඊශ්‍රායලයේදීත් අපේ කිහිප දෙනෙක් කළා. ඒවායේ ප්‍රතිඵල හැටියට ඊශ්‍රායලයේ farmersලා තීන්දු කර තිබෙනවා, දැනට ලංකාවෙන් ශ්‍රමිකයන් නොගැනීමට. හැබැයි, ඇතැම් farmersලා නැවත වතාවක් අපේ ශ්‍රමිකයන් ටික ටික ගන්න සූදානම් වෙලා තිබෙනවා. එකක් තමයි, PIBA එක - ඊශ්‍රායල රජයේ තිබෙන ජනගහන හා ආගමන කටයුතු සම්බන්ධයෙන් වන අධිකාරිය- ඉල්ලීමක් කර තිබෙනවා, "ලංකා රජයට උදව් කරන්න ඕනෑ. ඒ නිසා පුළුවන් තරම් ගන්න" කියලා. ඒ වාගේම තවත් සමහර ආයතනත් මැදිහත් වෙලා එම බදවා ගැනීම් කටයුතු දැන් ටික ටික ආරම්භ කර තිබෙනවා.

ඒ වාගේම අපි ඔවුන්ගෙන් තවත් සුවිශේෂී ඉල්ලීමක් කළා. ඉදිකිරීම් අංශය සඳහා අපට ඒ රටින් රැකියා අවස්ථා 30,000ක් ලැබී තිබෙනවා. එම ආයතනවල නියෝජිතයන් අපේ රටට ඇවිල්ලා තමයි ඒ සඳහා අපේ ශ්‍රමිකයන් තෝරා ගැනීම කරන්නේ. එසේ තෝරා ගන්නා අය testsවලට යොමු කර තමයි ඒ රටේ සේවයට ගෙන යන්නේ. ඒ, construction sector එකේ අය බොහොම හොඳින් වැඩ කරනවා. මොකද, ඒ රටේ අයමයි ඇවිල්ලා එම ශ්‍රමිකයන් තෝරා ගෙන ගියේ. ඒ නිසා අපි ඒ රටේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ farmersලාගෙනුත් ඉල්ලීමක් කළා, ඒ ක්‍රමයම අනුගමනය කර ලංකාවට ඇවිල්ලා අපේ අය තෝරා ගන්න කියලා. අපි ඒ ගැන සාකච්ඡා කරලා වාචික එකඟතාව ලබා ගත්තා. ඒ රටේ ජනගහන හා ආගමන කටයුතු සම්බන්ධයෙන් වන අධිකාරිය - PIBA - හාර අමාත්‍යවරයාට අපි ඊයේ ලිපියක් මඟින් දැනුම් දුන්නා, මේ සඳහා නෛතික අවසරය ලබා දෙන්න කියලා. එතකොට ඒ රටේ තිබෙන කෘෂිකාර්මික සංගම් ලංකාවට ඇවිල්ලා අපේ අය තෝරා ගැනීමේ කටයුතු කරාවි. කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළව එසේ යෑමට 8,000ක විතර ප්‍රමාණයක් දැනට ඉතුරු වෙලා ඉන්නවා. 2,000 ගණනක් ගිහිල්ලා තිබෙන්නේ. අර කියපු ප්‍රමාණයත් බදවා ගැනීමට කටයුතු සූදානම් කරනවාය කියන පණිවුඩය අපට ඊයේ දවසේදී ඔවුන් ලබා දුන්නා.

ඊට අමතරව අපි තවත් යෝජනාවක් කළා. ඒ ගැනත් කියන්නම්. අපිට මේ වෙනකොට හෝටල් ක්ෂේත්‍රය සඳහා අලුත් කෝටාවක් ලැබිලා තිබෙනවා. අපේ රටේ බොහෝ තරුණයෝ හෝටල්වල වැඩ කරලා තිබෙනවා; අත්දැකීම් තිබෙනවා. දැනට ලැයිස්තුවල ඉන්න අය අතර NVQ 3 සහතිකය තිබෙන අය ඉන්නවා නම් ඒ අයට පළමු වටයේ අවස්ථාව දීලා ඊශ්‍රායලය කරා යවන්න හැකි බවට ඔවුන් එකඟතාව ලබා දුන්නා. ඒ ගිවිසුම් අත්සන් කිරීම අපි ඊයේ දිනයේදී, පෙරේදා දිනයේදී සූදානම් කරලා තිබුණා. නමුත්, ඔවුන්ගේ පාර්ශ්වයෙන් යම් කිසි ප්‍රමාදයක් වූ නිසා තව දින කිහිපයක් එහාට ගිහිල්ලා එම ගිවිසුම් අත්සන් කරනවා. ඒ අනුව දැනට ඊශ්‍රායලයට යන්න බැරිව හිර වෙලා ඉන්න, නතර වෙලා ඉන්න කණ්ඩායම හෝටල් ක්ෂේත්‍රය සඳහා යැවීමට කටයුතු කරනවා. එකක්, දැනට NVQ 3 සහතික තිබෙන අය යවන්නත්, අනෙක් කණ්ඩායමට ඉතාම ඉක්මනින් NVQ 3 සහතික මට්ටම සඳහා හෝටල් පාසල සමඟ එකතු වෙලා පුහුණුව ලබා දීලා ඊශ්‍රායලය කරා යවන්නත් අපි කටයුතු කරනවා. එහිදී අපි ප්‍රමුඛතාව ලබා දෙන්නේ දැනට ඒ වෙබ් අඩවිය හරහා ලියාපදිංචි වෙලා ඉන්න, ඊශ්‍රායලයේ ලොතරැයි ක්‍රමයට තේරී පත් වෙලා, medical test එක කරලා ඉන්න කණ්ඩායමට.

ඊට අමතරව ඊශ්‍රායල් රජයෙන් අපට අලුතින් එකඟතාව පළ වුණා කර්මාන්ත අංශය සඳහා ශ්‍රමිකයන් යවන්න. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අපි 30,000ක් යවනවා. ඒ කටයුතු දිගටම ක්‍රියාත්මකයි. මේ වෙනකොට තවත් 3,000කට වීසා ලැබුණා. ඊට අමතරව, කර්මාන්ත අංශය සඳහා ශ්‍රමිකයන් යවන්න බලාපොරොත්තු වෙනවා. කර්මාන්ත අංශයේත් ඉතාම ඉක්මනින් ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු කරනවා. ඒ ගිවිසුම් අත්සන් කිරීමත් එක්කම ඊශ්‍රායලයේ කර්මාන්ත අංශයටත් අපට ශ්‍රමිකයන් විශාල ප්‍රමාණයක් යවන්න පුළුවන්කම ලැබෙනවා.

ඒ වාගේම දැනට රැකියා අවස්ථා ලැබී තිබෙනවා හෝටල් ක්ෂේත්‍රයට. ඒ විතරක් නොවෙයි රෙස්ටුරන්ට් ක්ෂේත්‍රයටත් අපේ ශ්‍රමිකයන් යවන්න අපට අවකාශය ලැබෙනවා. ඒ සඳහා ගිවිසුම්ගතවීමත් ඉදිරි දින කිහිපය ඇතුළත සිද්ධ කරනවා. ඊට අමතරව ඒ රටේ යටිතල පහසුකම් අමාත්‍යාංශය සමඟ අපි ගිවිසුම්ගතවීමට සූදානම් වෙනවා, ඒ රටේ මහා පරිමාණ ඉදිකිරීම්වලට අපේ රටේ ශ්‍රමිකයන් යවන්න. ඒ අනුව ඉතාම විශාල ශ්‍රමික සංඛ්‍යාවක් ඊශ්‍රායලය කරා යවන්න පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය බය වෙන්න එපා. ගම්

පළාත්වල ඉන්න තරුණ තරුණියන්ට මේ අවකාශය හරහා රැකියා සඳහා බොහෝ ඉඩ කඩ ලබා ගන්න පුළුවන්. ඔවුන් යන්නේ මාස 63ක වීසා කාලයක් සඳහා.

ඒ වාගේම ඔබතුමිය ඇහුවා, කොරියාවේ රැකියා සඳහා තිබෙන කෝටාව ගැන. කොරියාවේ රැකියා සඳහා තිබෙන TOPIK Exam එක කරලා යන එක ගැන කියනවා නම්, E7 වීසා එකෙන් යන්නේ welders ලා වාගේ අය. E8 කියන visa category එක යටතේ කෘෂිකර්මාන්තයට, ධීවර කර්මාන්තයට ශ්‍රමිකයන් ගන්න දැන් ඔවුන් කටයුතු ආරම්භ කරලා තිබෙනවා. නමුත්, ඔවුන් පෞද්ගලික අංශයත් සමඟ එකතුව තමයි ඒ කර්තව්‍යය සිද්ධ වෙන්නේ. ඒ සඳහා රාජ්‍ය මැදිහත්වීමක් නැහැ. නමුත්, එහි නියාමනය සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මේ දවස්වල අවශ්‍ය කටයුතු සූදානම් කරමින් ඉන්නවා. මොකද, පෞද්ගලික අංශය මඟින් එය කළත්, එහි නියාමන කටයුත්ත රජයට භාර කටයුත්තක් නිසා.

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) ராஜிகா விக்கிரமசிங்ஹ)
(The Hon. (Mrs.) Rajika Wickramasinghe)

ගරු අමාත්‍යතුමනි, මට තව ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. පසුගිය කාලයේ අපි දැක්කා, බංග්ලාදේශය කෝටා ප්‍රශ්නයක් මුල් කරගෙන ප්‍රශ්න ගොඩකට මුහුණ දීලා ඉන්නවා. *[බාධා කිරීමක්]* බංග්ලාදේශයේ. ඒ ප්‍රශ්නයත් එක්ක ඒ රට තුළ අධ්‍යාපනය ලබන අපේ රටේ තරුණ පිරිසට, ඒ රටේ රැකියාවලට ගිහිල්ලා ඉන්න අපේ රටේ පුරවැසියන්ට මොනවා හරි ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවාද කියලා ඔබතුමා සොයා බලා තිබෙනවාද?

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ඉතාම වැදගත් ප්‍රශ්නයක් ඇහුවේ. මේ වෙනකොට බංග්ලාදේශය තුළ පුහුණු ශ්‍රමිකයන් විධියට ගිය අපේ 2,690දෙනෙකු ඉන්නවා. කාන්තාවන් 107දෙනෙකු, පුරුෂයන් 2,583දෙනෙකු වශයෙන් ඉන්නවා. ඒ වාගේම අඩු පුහුණුව ලබපු සංඛ්‍යාව විධියට කාන්තාවන් 6දෙනෙක්, පිරිමි 139දෙනෙකුත් වශයෙන් 145දෙනෙක් ඉන්නවා. සමස්තය විධියට ගත්තොත්, 2,835දෙනෙකු මේ වෙනකොට බංග්ලාදේශයේ ජීවත් වෙනවා. බංග්ලාදේශයේ සිටින අපේ තරුණ තරුණියන්ට මොනවා වුණත් කමක් නැහැ කියලා හිතන කණ්ඩායම මේ එහා පැත්තේ ඉඳගෙන රටේ ආර්ථිකය හදන හැටි සාකච්ඡා කරනවා අපට ඒනවා, පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳගෙන නාලක ගොඩහේවාලාත් එක්ක එකතු වෙලා ඉස්සර ආර්ථිකය හදපු විධියටම. ඒක අපට ඒනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ඒ වාගේම 2019 ඉඳලා 2024 දක්වා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ගත්තාම, අපේ රටේ පුරවැසියන් 2,835දෙනෙකු දැනට බංග්ලාදේශයේ ජීවත් වෙනවා. සිසුන්ගේ සංඛ්‍යාව අපට නිසියාකාරව ලබා ගන්න බැරි වුණා. නමුත් අපේ තානාපති කාර්යාලය හරහා දැනගන්න පුළුවන් වුණා, බංග්ලාදේශයේ සිටින ශ්‍රී ලාංකිකයන් කිසිවෙකුටවත් අනතුරක් සිද්ධ වෙලා නොමැති බව. ඒ බව අපි බොහොම ඕනෑකමින් දන්වනවා. ඒ වාගේම ඔවුන් නැවත ලංකාවට ගෙන්වා ගැනීමට අවශ්‍ය තත්ත්වයක් ඇති වුණොත් ඒ සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ ආරක්ෂිත වැඩ පිළිවෙළ සම්බන්ධයෙනුත් විදේශ කටයුතු අමාත්‍යාංශය මැදිහත්වීම් කරනවා. ඒ වාගේම විදේශ රැකියා අමාත්‍යාංශය විධියට අපිත් ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් කරනවාය කියන එක මතක් කරන ගමන් බංග්ලාදේශයේ ඇති වෙච්ච ඒ කනගාටුදායක තත්ත්වය පිළිබඳව අපේ කනගාටුවත් ප්‍රකාශ කරනවා.

ඉතාම මෑතකදී පත් වෙච්ච රජයක්, බලහත්කාරී ලෙස රට තුළ කලබලකාරී තත්ත්වයක් ඇති කරමින්, ඒ රටේ බලය ලබා ගැනීමේ පටු අරමුණ වෙනුවෙන් ජීවිත ගණනාවක් විනාශ කරමින් කරන මේ කටයුත්ත දිහා බැලුවාම අපට මතක් වෙන්නේ, මීට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා ලංකාවේ ඇති වෙච්ච තත්ත්වය. ලංකාවේත් පාර්ලිමේන්තුව ගිනි තියන්න ඇවිල්ලා, ජනාධිපති කාර්යාලය, ජනාධිපති නිල නිවාසය වැනි තැන්වලට ගිහිල්ලා පහර දීලා, මන්ත්‍රීවරු මරලා, රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැති කරන්න ගිය අවස්ථාව බංග්ලාදේශයේ මේ සිද්ධියත් එක්ක අපේ සිහියට නැඟෙනවා. එදා පාරවල් ගානේ මිනිස්සු මරපුවා, පාරවල්වල වාහන ගිනි තියපුවා, ගෙවල් ගිනි තියපුවා, මිනිස්සුන්ගේ සම්පත් කොල්ලකාපුවා -මේ සියල්ල- නතර කරන්න, මීට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා ඒ ඇතිවෙච්ච තත්ත්වය නතර කරන්න රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට පුළුවන් වුණා.

රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ජනාධිපතිවරයා වෙලා අවුරුදු දෙකක් සම්පූර්ණ වන කොට රට තිබුණු තැනට වඩා ඉහළ තත්ත්වයකට ගෙන එන්න පුළුවන් වුණා. බංග්ලාදේශයේ ඇති වුණා වාගේ තත්ත්වයක් ඇති වෙන්න ඉඩ නොදී මේ රට බේරා ගැනීම සම්බන්ධයෙන්, බංග්ලාදේශයේ ඇති වෙච්ච තත්ත්වයට ලංකාව වටිටන්නේ නැතිව ලංකාව ගොඩ නඟන්න අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාට මේ වෙලාවේ අපේ ප්‍රණාමය පුද කරන්න ඕනෑ.

විදුලි අර්බුදය විසඳීම: ගත් පියවර
மின்சார நெருக்கடிக்குத் தீர்வு: நடவடிக்கை
RESOLUTION OF ELECTRICITY CRISIS: MEASURES TAKEN

1943/2024

9. ගරු මිලාන් ජයතිලක මහතා
(மாண்புமிகு மிலான் ஜயதிலக்க)
(The Hon. Milan Jayathilake)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ විදුලි අර්බුදය තවදුරටත් පවතින්නේද;

(ii) විදුලි අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදු වූ බලපෑම කවරේද;

(iii) එම විදුලි අර්බුදය විසඳීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

(iv) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

මින්සක්ති මත්‍රුම් වලුසක්ති අමෛච්සරෛක් කේට්ට විනා:

(அ) (i) இலங்கையில் மின்சார நெருக்கடி தொடர்ந்தும் காணப்படுகின்றதா என்பதையும்;

(ii) மின்சார நெருக்கடி காரணமாக இலங்கையின் பொருளாதாரத்துக்கு ஏற்பட்ட தாக்கம் யாதென்பதையும்;

[ගරු මිලාන් ජයතිලක මහතා]

(iii) மேற்படி மின்சார நெருக்கடியைத் தீர்ப்பதற்கு மேற்கொள்ளப்படுகின்ற நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) அதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he inform this House -

(i) whether the electricity crisis in Sri Lanka still continues;

(ii) the impact on Sri Lanka's economy due to the electricity crisis;

(iii) the measures taken to resolve the electricity crisis; and

(iv) the period of time that will be taken to resolve this?

(b) If not, why?

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

(ii) පාරිභෝගිකයන්ට නොසැපයූ බලශක්තියෙහි පිරිවැය (අපේක්ෂිත විදුලි බිඳ වැටීම්)

	2022	2023	එකතුව
සැලසුම් කළ විදුලිය අත්හිටුවීම් (ගිගා වොට් පැය)	799.21	88.62	887.83

	රු./කිලෝ වෙෑට් පැය
නොසැපයූ බලශක්තියෙහි පිරිවැය (අපේක්ෂිත විදුලිය බිඳ වැටීම්)	620.55

	2022	2023	එකතුව
නොසැපයූ බලශක්තියෙහි මුළු පිරිවැය (රුපියල් බිලියන)	495.95	54.99	550.94

(iii) 2022-2023 කාල සීමාව තුළ පැවති විදුලි අර්බුදය විසඳීම සඳහා අවශ්‍ය කෙටි කාලීන විසඳුම් ලබා දී ඇත. එමෙන්ම ඉදිරියේදී එවැනි අර්බුදයක් ඇති වීම වැළැක්වීමට මධ්‍ය කාලීන හා දිගු කාලීන ක්‍රියා මාර්ග ගෙන ඇත.

පහත දක්වා ඇති දිගු කාලීන හා කෙටි කාලීන සැලසුම් ප්‍රකාරව විදුලිබල ක්ෂේත්‍රයේ වැඩ කටයුතු සිදු කර ගෙන යෑමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

- 2023-2042 දිගු කාලීන ජනන සැලසුම ප්‍රකාශයට පත් කර ඇත. (2023-2042 Long-term Generation Expansion Plan)
- 2023-2032 දිගු කාලීන සම්ප්‍රේෂණ සැලසුම ප්‍රකාශයට පත් කර ඇත. (2023-2032 Long-term Transmission Development Plan)
- 2023-2030 සඳහා පුනර්ජනනීය බලශක්ති සැලසුම ඇතුළත් වාර්තාව ප්‍රකාශයට පත් කර ඇත. (Report of the Way Forward of Integration of Renewable Energy Resources to the National Grid)

  වර්ෂ 2023 සිට 2026
  වර්ෂ 2027 සිට 2042
- පිරිවැය පරාවර්තක පාරිතෝෂික අයක්‍රමය - cost-reflective tariff - හඳුන්වා දී ඇත.
- පුනර්ජනනීය බලාගාර මඟින් ලබා ගන්නා විදුලිය සඳහා තරගකාරී අය ක්‍රම හඳුන්වා දී ඇත.
- වහල මත ඉදිකෙරෙන සූර්ය බලාගාර මඟින් විදුලිය ලබා ගැනීම ප්‍රවර්ධනය කර ඇත.
- පුනර්ජනනීය බලශක්ති බලාගාර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කෙරේ.
- මෙරට පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා වන විභවය ඇස්තමේන්තු කර ඇත.
- නව විදුලිබල පනත අංක 36/2024 හඳුන්වා දී ඇත. එමඟින් බලශක්ති ජාලයට විවෘත ප්‍රවේශය හඳුන්වා දී ඇත. ඒ සඳහා වන රෙගුලාසි සකස් කරමින් පවතී.
- මෙරට පද්ධතියට වැඩි වශයෙන් පුනර්ජනනීය බලාගාර ලබා ගැනීමේදී ඇති වන තාක්ෂණික දුෂ්කරතා විසඳීම සඳහා ප්‍රමාණවත් වන බැටරි ගබඩා පහසුකම් ඇති කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. ඒ සඳහා අවශ්‍ය වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට කටයුතු කර ඇත.
- එමෙන්ම බලශක්ති ගබඩා කිරීම සඳහා අවශ්‍ය වන පොම්පාගාර ජල විදුලි බලාගාර - pumped storage hydropower plants - සමඟ වන පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරමින් පවතී.
- විශාල පරිමාණ ආයෝජකයන් මෙරට බලශක්ති ක්ෂේත්‍රයට ආකර්ෂණය කිරීම සඳහා මෙගාවොට් 1,000කට ආසන්න සූර්ය බලාගාර, සුළං බලාගාර සහ පාවෙන සූර්ය බලාගාර ඉදිකිරීම සඳහා වන ව්‍යාපෘති සමඟ අවශ්‍ය අධ්‍යයනයන්, ඉඩම් ලබා ගැනීම සඳහා වන කටයුතු ක්‍රියාත්මක කර ඇති අතර මේ වසර අවසානය වන විට මුල් ව්‍යාපෘති 4 සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.
- පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන සම්ප්‍රේෂණ ජාලය පුළුල් කිරීම සඳහා වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමටත්, ඒ සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන යොදා ගැනීමටත් අවශ්‍ය නීතිමය රාමුව සකස් කර ඇත. එමෙන්ම මේ වන විටත් පුනරීන් සිට කිලිනොච්චිය දක්වාත්, කිලිනොච්චිය සිට නව හබරණ ග්‍රිඩ් උපපොළ දක්වාත් වන සම්ප්‍රේෂණ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳව සාකච්ඡා සම්මුති ආරම්භ කර ඇත.

- පුනර්ජනනීය බලාගාර පද්ධතියට එක් කිරීම සඳහා අවශ්‍ය කරන ඉන්දියා - ශ්‍රී ලංකා ග්‍රිඩ් සම්බන්ධතාව ඇති කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුමට එළඹීමට නියමිත ය.

(iv) විදුලිබල ක්ෂේත්‍රයේ ව්‍යාපෘති සැලකිය යුතු කාලයක් සහ ඉතා අධික මුදලක් වැය වන ව්‍යාපෘති වන බැවින් ජාතික ආර්ථිකයේ වර්ධනය සෘජුවම මෙම ව්‍යාපෘතිවල සාර්ථකත්වය සඳහා බලපායි. එම නිසා ව්‍යාපෘති නිම කිරීමට ගත වන කාලය නිශ්චිතව සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) සියලු තොරතුරු ඉහත දක්වා ඇති බැවින් අදාළ නොවේ.

ගරු මිලාන් ජයතිලක මහතා
(*மாண்புமிகு மிலான் ஜயதிலக்க*)
(The Hon. Milan Jayathilake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, පසුගිය කාලයේ සාම්පූර් බලාගාරය, කෙරවලපිටිය LNG බලාගාරය ආදී බලාගාර මේ රටේ ස්ථාපනය කරන්න යද්දී යම් යම් කණ්ඩායම් ඒ බලාගාර ඉදිකරන්න දුන්නේ නැහැ. ප්‍රශ්න ඇති වෙලා ඒ කටයුතු නැවතුණා. හැබැයි, ගරු අමාත්‍යතුමනි, එවැනි බලාගාරයක් පිහිටුවන වැඩ පිළිවෙළ ආරම්භ වන කොට එයට නියමිත ක්‍රමයක් බිම් මට්ටමින් සකස් වෙලා නැහැ කියා දේශපාලනඥයෙකු හැටියට මට පෙනෙනවා. ඒ නිසාම විශේෂයෙන් විවිධ අර්බුද, උද්ඝෝෂණ, පෙළපාළි ක්‍රියාත්මක කිරීම හරහා මේ වැඩසටහන් නවත්වන්නට කටයුතු කරනවා. නියම ක්‍රමයට අනුව ඒවා ඉදි කර, ඒවායෙහි ප්‍රතිලාභය, එහි තිබෙන වටිනාකම ජනතාවට හඳුන්වා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළේ නැත්නම් පසුගිය කාලයේ විවිධ දේශපාලන කණ්ඩායම් එකතු වෙලා කළා වාගේ ඔබතුමා ගෙනෙන ඉදිරි ව්‍යාපෘතිවලට අදාළ දේවල් ද විනාශ කරන්න පුළුවන්. එහෙම වුණොත්, ඉදිරියේදී අපේ බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලොකු අර්බුදයක් ඇති වේවි. එය වැළැක්වීම සඳහා වන වැඩසටහනක් ඔබතුමන්ලා ළඟ තිබෙනවා ද? ඒ වාගේම, සාම්පූර් සහ LNG බලාගාර මේ වන කොට ඉවත් කර අවසන් ද, නැවත වතාවක් ඒ සඳහා වන වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා ද කියාත් මම දැන ගන්න කැමැතියි.

ගරු කංචන විජේසේකර මහතා
(*மாண்புமிகு கஞ்சன விஜேசேகர*)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු මිලාන් ජයතිලක මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය හොඳ ප්‍රශ්නයක්. පසුගිය කාලයේ විදුලිබල ක්ෂේත්‍රයේ එවැනි බලාගාර ඉදිකිරීම සඳහා ජනතාව තුළත් අවශ්‍ය උනන්දුව නොතිබීම කියන කාරණාව පෙනෙන්නට තිබුණේ, විශේෂයෙන් විදුලි ගාස්තු ක්‍රමය සඳහා බොහෝ අවස්ථාවලදී රජය මහා භාණ්ඩාගාරය යටතේ අවශ්‍ය පහසුකම් ලබා දී තිබුණු නිසා යැයි මම හිතනවා. බොහෝ අවස්ථාවල පිරිවැය ආවරණය කර ගෙන තිබුණේ එකතු කරන බදු මුදල්වලින්.

ඒ නිසා පිරිවැය ආවරණය වන ගාස්තු ක්‍රමයකට ගියාට පසුව තමයි ජනතාව තුළත් යම් යම් අදහස් ඇති වුණේ, නව බලාගාර එකතු කිරීම සඳහා, අඩු වියදම් බලාගාර ඇති කිරීම සඳහා උනන්දු විය යුතුයි කියන කාරණයට. ඉතිහාසයේ ඉඳන්ම විවිධ දේශපාලන අරමුණු වෙනුවෙන් පෙනී සිටි කණ්ඩායම් විවිධ රජයන් විවිධ අවස්ථාවලදී ඉදිරිපත් කරපු යෝජනා කඩාකප්පල් කරන්න, ඇන හිටුවන්න, ඒවා නවත්වන්න කටයුතු කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, විදුලි බලාගාර ඉදිකරන්න පැවැති හැම රජයක්ම උත්සාහ කර තිබෙනවා. හැබැයි, ඒ කඩාකප්පල්කාරීන්ගේ කටයුතු නිසා තමයි විවිධ අවස්ථාවලදී එ්වා රටට අහිමි වෙලා තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු ආකාරයට සාම්පූර් බලාගාරය ඉදිකරන්න යෝජනා කරන්නේ මීට අවුරුදු 15කට පමණ පෙර. ඒ සියලු අධ්‍යයන වාර්තා, අවශ්‍ය පහසුකම් සියල්ල සකස් කළාට පසුව තමයි එල්ල වූ දේශපාලන බලපෑමත් එක්ක පසුකාලීනව තීන්දුවක් ගන්නේ, ඒ බලාගාරය ඉවත් කර ගන්න. ගරු මන්ත්‍රීතුමනි, ගැටලුව ඒ බලාගාරය ඉවත් කර ගැනීම නොවෙයි, ඒ බලාගාරය වෙනුවෙන් ඉදිකළ අලුත් බලාගාරය මොකක්ද කියන එකයි. උදාහරණයකට සාම්පූර් ගල් අඟුරු බලාගාරය ගනිමු. අපි පිළිගන්නවා, ලෝකය දැන් ගල් අඟුරුවලින් ඈත් වෙමින් යන බව. හැබැයි ගල් අඟුරු බලාගාර ඉදිකරන්න ඕනෑ කාලවලදී අපේ රටේ ගල් අඟුරු බලාගාර ඉදිකරන්න සමහරු ඉඩ දුන්නේ නැහැ. දැන් වන කොට රටේ මානෘකාවක් බවට පත් වෙලා තිබෙනවා, න්‍යෂ්ටික බලාගාර. ලෝකයේ විවිධ රටවල් න්‍යෂ්ටික බලාගාරවලට යනවා, පුනර්ජනනීය බලශක්ති බලාගාරවලට යනවා, සුළං විදුලි බලාගාරවලට යනවා. සුළං විදුලි බලාගාරවලට යන කොටත් පාරිසරික හේතු, දේශපාලන හේතු සහ තවත් වෙනත් දේවල් ගැන කියමින් විවිධ බලපෑම් කරලා ඒවා නවත්වන්න කටයුතු කරනවා. ඒ නිසා අපි ජනතාව දැනුවත් කිරීම සඳහා මේ වෙලාවේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. සාම්පූර් ගල් අඟුරු බලාගාරය වෙනුවට එහි මෙගාවොට් 130ක සූර්ය පැනල විදුලි බලාගාරයක් ඉදි කරන්න මේ වන විට කටයුතු සූදානම් කරගෙන යනවා. එ් සඳහා ගිවිසුම්ගත වීම ඊළඟ සති කීපය තුළ සිදු වෙයි. කෙරවලපිටිය බලාගාරයේ කටයුතුවල පළමුවැනි අදියර අවසන් වෙලා තිබෙනවා. LNG ලබා ගැනීම, ඒ කියන්නේ අපට අවශ්‍ය ස්වාභාවික ද්‍රව වායු ලබා ගැනීම සම්බන්ධයෙන් වූ ගිවිසුමක් සඳහා කැබිනට් මණ්ඩලයෙන් පසුගිය සතියේ අනුමැතිය ලබා දී තිබෙනවා. ඒ අනුව අපි හිතනවා, ලබන වර්ෂය වන විට LNGවලින් ඒ බලාගාරය ක්‍රියා කරවන්න අපට පුළුවන් වෙයි කියලා.

ගරු මිලාන් ජයතිලක මහතා
(*மாண்புமிகு மிலான் ஜயதிலக்க*)
(The Hon. Milan Jayathilake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන් ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සිදු වෙමින් පවතින සහ ඒ සම්බන්ධයෙන් යෝජනා එන අවස්ථාවක්, මෙක. ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරනවා නම් ඒ ප්‍රතිව්‍යුහගත කිරීම හරහා රජයට ලැබෙන ප්‍රතිඵලය, වාසිය මොකක්ද කියන එකත්, ඒ සියලු ආයතනවල සේවය කරන රාජ්‍ය සේවකයන් වෙනුවෙන් ඔබතුමාට දෙන්න පුළුවන් යම්කිසි assurance එකක් තිබෙනවා ද කියන එකත්, ඔවුන්ගේ රැකියාව -ඔවුන් කරගෙන ආ වෘත්තිය- සහ ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා ඔබතුමාගේ වැඩ පිළිවෙළ මොකක්ද කියන එකත් මම දැන ගන්න කැමැතියි.

ගරු කංචන විජේසේකර මහතා
(*மாண்புமிகு கஞ்சன விஜேசேகர*)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත ගෙන ආ වෙලාවේත් ඔය කාරණා පිළිබඳව සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් කළා. ශ්‍රී ලංකා විදුලිබල පනත ගෙන ඒම තුළින් හා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් බලාපොරොත්තු වන්නේ කාර්යක්ෂමතාව වැඩි කිරීම, විනිවිදභාවය වැඩි කිරීම, මේ රටේ විදුලිබල ක්ෂේත්‍රයේ පිරිවැය අඩු කරලා ඒ සේවාවලින් ලැබෙන සහන පාරිභෝගිකයන් වෙත ලබා දීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම, තරගකාරී

[ගරු කංචන විජේසේකර මහතා]

වෙළඳ පොළක් තුළ ජනනය, බෙදා හැරීම කියන කටයුතු සිදු කිරීමෙන් ඒ වාසිය පාරිභෝගිකයන්ට ලබා දීම කියන අරමුණු ඉටු කර ගැනීමයි.

විශේෂයෙන් සේවකයන් සම්බන්ධයෙන් අප ගත් තීන්දුවත් අපි පැහැදිලි කරලා කිව්වා. මේ වෙලාව වන විට 22,000කට ආසන්න සේවක සංඛ්‍යාවක් ඉන්නවා. අපි ඒ සේවකයන් ඉවත් කිරීමට කටයුතු කරන්නේ නැහැ. ඒ ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතුවලදී සැලසුම් කරලා තිබෙන ආයතනවලට ඒ සේවකයන් අනුයුක්ත කරනවා. ඒ වාගේම අපි ඔවුන්ට VRS ක්‍රමයක් ලබා දෙනවා, ඉවත් වෙන්න ඕනෑ කට්ටිය ඉන්නවා නම් ඉවත් වෙන්න කියලා. නමුත්, සේවයේ ඉන්න ඕනෑ කියලා කවුරු හරි පිරිසක් ඉන්නවා නම් ඒ පිරිසට ඒ ආයතනවල සේවය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් අපි ලබා දෙනවා. නමුත් ඉදිරියේදී සේවකයන් විශ්‍රාම යන විට ඒ විශ්‍රාම යන ප්‍රමාණයටම සරිලන පිරිසක් බඳවා ගන්න අපි කටයුතු කරන්නේ නැහැ. මොකද, අද වන කොට ඉන්න සේවක පිරිස වැඩියි. ඒ නිසා ඉදිරියේදී සේවකයන් අදාළ සමාගම් සහ ආයතන වෙත අනුයුක්ත කරනවා. ඒ සේවකයන් විශ්‍රාම ගියාට පසුව අපි යම්කිසි ගණනය කිරීමකට ලක් කරනවා, අපට ඇත්තටම අවශ්‍ය සේවකයන් ප්‍රමාණය කොපමණ සංඛ්‍යාවක් ද කියලා. ඒ අනුව ඉදිරි අවුරුදු පහ තුළ සේවකයන් විශ්‍රාම යෑමේදී සහ සේවයෙන් ඉවත් වීමේදී ඇති වන පුරප්පාඩු පුරවන්නේ නැතිව අත්‍යවශ්‍ය තනතුරු වෙනුවෙන් පමණක් බඳවා ගෙන කාර්ය සාධනය සහ කාර්යක්ෂමතාව පදනම් කරගත් වැටුප් ක්‍රමයක් සහ උසස් වීම් ක්‍රමයක් එක්ක නව බඳවා ගැනීමේ ක්‍රමයක් විදුලිබල මණ්ඩලයේ එම ආයතනවලට හඳුන්වා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඖෂධ සපයන සමාගම්: වෛද්‍ය සැපයුම් අංශය විසින් ගෙවීමට ඇති මුදල්

மருந்து வழங்குநர் நிறுவனங்கள்: மருத்துவ வழங்கல் பிரிவால் செலுத்தப்படவேண்டிய பணத்தொகை

DRUG SUPPLYING COMPANIES: DUES FROM MEDICAL SUPPLIES DIVISION

2004/2024

10.ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) වෛද්‍ය සැපයුම් අංශය මඟින් ඖෂධ සැපයුම්කරුවන්ට මේ වන විට ගෙවීමට ඇති මුදල කොපමණද;

(ii) වංචා සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ගවලට එළඹ ඇති සැපයුම් සමාගම්වලට මුදල් ගෙවා තිබේද;

(iii) එසේ නම්, එම සැපයුම් සමාගම් කවරේද;

(iv) එම එක් එක් සැපයුම් සමාගමට ගෙවා ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වන විට මුදල් ගෙවීම ප්‍රමාද වී ඇති ඉහත (අ)(ii)හි සඳහන් සැපයුම් සමාගම් නොවන ඖෂධ සැපයුම් සමාගම් කවරේද;

(ii) එම එක් එක් සැපයුම් සමාගමට ගෙවීමට ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මුදල් ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් එම සැපයුම් සමාගම්වලට පොලියක් ලබා දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மருத்துவ வழங்கல் பிரிவால் மருந்து வழங்குநர்களுக்கு இன்றளவில் செலுத்தப்பட வேண்டியுள்ள பணத்தொகை எவ்வளவு என்பதையும்;

(ii) மோசடிகள் தொடர்பாக சட்ட ரீதியான நடவடிக்கைகள் தொடரப்பட்டுள்ள வழங்குநர் நிறுவனங்களுக்கு பணம் செலுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி வழங்குநர் நிறுவனங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி ஒவ்வொரு வழங்குநர் நிறுவனத்துக்கும் செலுத்தப்பட்டுள்ள பணத்தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இன்றளவில் பணம் செலுத்துதல் தாமதமாகியுள்ள மேற்படி (அ)(ii)இல் குறிப்பிடப்பட்ட வழங்குநர் நிறுவனங்கள் அல்லாத மருந்து வழங்குநர் நிறுவனங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு வழங்குநர் நிறுவனத்துக்கும் செலுத்தப்பட வேண்டியுள்ள பணத்தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) பணம் செலுத்துதல் தாமதமடைகின்ற காரணத்தால் மேற்படி வழங்குநர் நிறுவனங்களுக்கு வட்டி செலுத்தப்படுகிறதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he inform this House -

(i) the amount of money to be paid to the suppliers of drugs by the Medical Supplies Division, at present;

(ii) whether payments have been made to supplying companies against which legal actions have been filed over frauds;

(iii) if so, what those supplying companies are; and

(iv) the amount of money paid to each such supplying company, separately?

(b) Will he also inform this House -

(i) the drug supplying companies other than the supplying companies mentioned in (a) (ii) above for which payments have been delayed at present;

(ii) the amount of money to be paid to each such supplying company, separately; and

(iii) whether an interest would be paid to those supplying companies to compensate for the delay in making payments?

(c) if not, why?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වෛද්‍ය සැපයීම් අංශය මඟින් ඖෂධ සැපයුම්කරුවන්ට මේ වන විට ගෙවීමට ඇති මුදල රු.8,151,974,454.39කි. (ආසන්නව රුපියල් බිලියන 8.1ක් පමණ) මීට අදාළ තොරතුරු ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

(ii) ඔව්.

(iii) Isolez Biotech Pharma AG Limited. ඔවුන්ට ගෙවා ඇති මුදල රුපියල් 144,293,357.32යි.

(iv) ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

ගරු මරික්කාර් මන්ත්‍රීතුමනි, ආසන්න වශයෙන් මෙහි breakdown එක විධියට තිබෙන්නේ, ඖෂධ සමාගම්වලට රුපියල් බිලියන 5.7ක්, ගෝස් සැපයුම්කරුවන්ට රුපියල් මිලියන 156ක් සහ පළාත් සභා රෝහල් සඳහා සැපයුම්කරුවන්ට රුපියල් බිලියන 1.1ක්. ඒ වාගේම තවත් companies 9ක් තිබෙනවා. සමස්ත එකතුව රුපියල් බිලියන 8.1යි. අපි එම මුදල් ගෙවීමට කටයුතු කරනවා.

(ආ) (i)
- ABC Pharma Services (Pvt.) Ltd.
- Ceyoka (Pvt.) Ltd.
- Hemas Pharmaceuticals (Pvt.) Ltd.
- Novachem Lanka (Pvt.) Ltd.
- Slim Pharmaceuticals (Pvt.) Ltd.
- TMI Solutions (Pvt.) Ltd.
- Yaden International (Pvt.) Ltd.
- Klintas (Pvt.) Ltd.

(ii)

Company Name	Total
ABC Pharma Services (Pvt.) Ltd.	842,627,095.29
Ceyoka (Pvt.) Ltd.	99,757,291.57
Hemas Pharmaceuticals (Pvt.) Ltd.	50,932,695.00
Novachem Lanka (Pvt.) Ltd.	8,945,000.00
Slim Pharmaceuticals (Pvt.) Ltd.	411,670.00
TMI Solutions (Pvt.) Ltd.	125,826,340.00
Yaden International (Pvt.) Ltd.	5,738,603.93
Klintas (Pvt.) Ltd.	889,524.27
Total	Rs. 1,135,128,220.06

ඉහත ගෙවීමට ඇති මුදලට අමතරව අධිකරණ කටයුතු මත තාවකාලිකව නවතා ඇති ගෙවීම්;

Isolez Biotech Pharma AG Ltd.	RS. 132,476,256.90

(iii) නැත.

(ඇ) පැන නොනඟී.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු ඇමතිතුමනි, මගේ ප්‍රශ්නයේ (ආ) (i) සහ (ii) යටතේ අහලා තිබුණු සමාගම් පිළිබඳව ඔබතුමාගේ පිළිතුරෙහි සඳහන් කරලා තිබුණා. ඒ අනුව, ගෙවීමට තිබෙන සම්පූර්ණ මුදල රුපියල් බිලියන 8ක් කියලාද ඔබතුමා කියන්නේ?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

රුපියල් බිලියන 8.1යි. ආසන්න වශයෙන්, ගෙවීමට දින 90ට වඩා වැඩි කාලයක් ගත වුණු මුදල විධියට රුපියල් බිලියන 4ක් විතර එහි තිබෙනවා. එම මුදල අපි මේ මාසය ඇතුළත settle කරනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මැතිවරණය කිට්ටු වෙද්දී ආණ්ඩුව යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශාල මුදලක් වියදම් කරන බව අපට පෙනෙනවා. පාරවල් හදනවා, පාලම් හදනවා, බෝක්කු හදනවා. ඒවා අපි එපා කියන්නේ නැහැ. ඡන්දය ඉලක්ක කරගෙන හෝ ඒවා කෙරෙන එක හොඳයි. එතකොට, ඔබතුමාගේ හැඟීම අනුව, රජයේ රෝහල්වලට අත්‍යවශ්‍ය බෙහෙත් සැපයූ සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල් ප්‍රමාද වීම හරහා ඉදිරියේදී ඔවුන්ගේ සැපයුම්වල මන්දගාමීභාවයක් මතු වීමේ ඉඩ ප්‍රස්තාවක් තිබෙනවා නේද?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ඇත්තටම ලංකාවට අත්‍යවශ්‍ය ඖෂධ 850ක් අපි ප්‍රසම්පාදනය කරනවා. දැනට වාර්තා වන විධියට ඒවායින් 19ක තමයි හිඟ තත්ත්වයක් තිබෙන්නේ. හැබැයි, local purchasing හරහා රෝහල්වලට වෙනම ඒ ඖෂධ වර්ග 19 ලබා ගන්නත් අපි allocations දීලා තිබෙන්නේ. ඇත්තටම මේ අවුරුද්දේ තමයි මේ සැපයුම්කරුවන් වෙනුවෙන් ඉතිහාසයේ වැඩිම මුදල වෙන්වෙලා තිබෙන්නේ. ඖෂධ මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් බිලියන 180ක් ලබා දීලා තිබෙනවා. බිල්පත් එකතු කිරීම් සහ භාණ්ඩාගාරයට යොමු කිරීම් ඇතුළු කරුණු කිහිපයකත් පොඩි ප්‍රමාද දෝෂ ටිකක් තිබ්බා තියෙනවා. දැන් ඒවා නිරාකරණය කරලා තිබෙන්නේ. බොහෝ වෙලාවට මේ මාසය ඇතුළත එම මුදල් ගෙවනවා. එම නිසා සැපයුම් ජාලයට බාධාවක් ඇති වෙන්නේ නැහැ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු ඇමතිතුමනි, මම එහෙම ඇහුවේ මේ නිසායි. ඇත්ත වශයෙන්ම allocation එකයි, imprest එකයි කියන්නේ දෙකක් නේ. RDA එකට වෙන්න පුළුවන්, සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන්න පුළුවන්, UDA එකට වෙන්න පුළුවන්, allocate කරන මුදලම හම්බවෙන්නේ නැහැ. එම නිසා තමයි මම ඒ ප්‍රශ්නය ඇහුවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහනවා. ගරු ඇමතිතුමනි, ගෝස් නිෂ්පාදකයන්ට කළ යුතු ගෙවීම් තවම කරලා නැහැ. ඒ නිෂ්පාදකයන් 400ක් පමණ ඉන්නවා. එම නිසා ඒ කර්මාන්තශාලා වැහෙන්න යන තත්ත්වයක් තිබෙනවා කියලා කියනවා. ඒ පිළිබඳව ඔබතුමාට කියන්න තිබෙන්නේ මොකක්ද?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගෝස් නිෂ්පාදකයන්ට ගෙවිය යුතු සමස්ත මුදල රුපියල් 156,269,712.00යි. ඔවුන්ට ප්‍රමුඛත්වය දීලා ගෙවීම් කරන්න කියලා අපි උපදෙස් දීලා තිබෙනවා. මේ මාසය ඇතුළත සියයට 50කට වඩා ගෙවීම් කරනවා.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාගේ අවසරය ඇතිව මට පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න තිබෙනවා. මම ඉතාම කෙටියෙන් කියන්නම්.

ගරු ඇමතිතුමනි, මම මීට කලින් දවසකත් මේ ප්‍රශ්නය ඔබතුමාගෙන් ඇහුවා. වෛද්‍ය ක්ෂේත්‍රයේ හෙදියන්ගේ සහ අදාළ කාර්ය මණ්ඩලවල සේවකයන්ගේ විශ්‍රාමික වයස අවුරුදු 60ට වඩා වැඩි කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා, ඒ පිළිබඳ වක්‍රලේඛයක් නිකුත් කිරීමේ බලාපොරොත්තුවෙන් යුතුව ඇතැම් සේවා ස්ථානවල විශ්‍රාම ගිය අය, ඊළඟ අයට වැඩ භාර දෙන්නේ නැතුව තවම සේවය කරමින් ඉන්නවා. විශේෂයෙන්ම, Ratnapura Nursing Training School එකේ මේ ප්‍රශ්නය තිබෙනවා. මම එදාත් මේ ප්‍රශ්නය ඔබතුමාට ඉදිරිපත් කළා. නමුත් මේ වෙනකල් ඒ ප්‍රශ්නය නිරාකරණය වෙලා නැහැ.

මේ වයස අවුරුදු 63 හෝ 61 දක්වා සේවය දීර්ඝ කරන තීරණය ක්‍රියාත්මක වෙනවාද? ගරු ඇමතිතුමනි, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විතරයි මේ ගැටලුව තිබෙන්නේ. ඒ සඳහා නිශ්චිත විසඳුමක් ලැබුණේ නැති නිසා හැම තැනින්ම විමසීම් ලැබෙනවා. සේවා ස්ථානවලත් ගැටලු නිර්මාණය වෙලා තිබුණා. ඒ ගැන යම් පැහැදිලි කිරීමක් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

වෛද්‍යවරුන්ගේ විශ්‍රාම ගැනීමේ වයස් සීමාව අවුරුදු 63 දක්වා දීර්ඝ කරන්න කැබිනට් තීන්දුවක් අරගෙන ඒ කාලය ලබා දීලා තිබෙනවා. හෙදියන් සම්බන්ධයෙන් නඩු කටයුත්තක් තිබුණා. ඒ නඩු කටයුත්ත නිසා මාණ්ඩලික සේවයේ හෙද නිලධාරීන් සඳහා වයස අවුරුදු 61 දක්වා දීර්ඝ කරන්න කැබිනට් අනුමැතිය ලබා දීලා තිබෙනවා. ඒක අධිකරණ කටයුත්තට සමගාමීව සිදු වුණු එකක්. අනෙකුත් අය පිළිබඳව රජයේ ප්‍රතිපත්තිමය තීන්දුව වයස අවුරුදු 60දී විශ්‍රාම ගත යුතු බවයි. නමුත්, වෛද්‍යවරුන්ගේ විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 63යි, මාණ්ඩලික සේවයේ හෙද නිලධාරීන්ට අවුරුදු 61යි. අනෙකුත් සියලුදෙනාට වයස අවුරුදු 60 දක්වා පමණක් සේවය කරන්න පුළුවන්. වෙන දීර්ඝ කිරීමක් නැහැ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාවේ අපි විවිධ කටයුතුවලට කාලය වෙන් කරගෙනයි ඉන්නේ. නමුත් ප්‍රශ්න ඇසීමේ කාලය ඉවර වෙලා අපට අනෙක් තිබෙන කටයුත්තකට යන්න විධියක් නැහැ. ඔබතුමා කාල කළමනාකරණය කර ගත්තේ නැත්නම් අපි සියලුදෙනාම අමාරුවේ වැටෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ඇමතිතුමනි, මම කාලය බොහොම හොඳින් කළමනාකරණය කරගෙනයි ආවේ. එක ප්‍රශ්නයකට විතරක් ගරු ඇමතිවරයෙක් මිනිත්තු 20ක් උත්තර දුන්නා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ඔබතුමාට ඒකට ඉඩ නොදී ඉන්න ඕනෑ නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න නේ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

විනාඩි පහකට හරි සීමා කරන්න එපා යැ. අනෙක් ඔක්කෝම කටයුතු-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ඇමතිවරු ඒ අවස්ථාව ගන්නවා.

දෙවන වටය.

පළාත් පාලන ආයතනවල අනියම් සේවකයන්: සේවය ස්ථිර කිරීම

உள்ளூராட்சி மன்றங்களிலுள்ள அமய ஊழியர்கள்: சேவையில் நிரந்தரமாக்கல்

CASUAL WORKERS OF LOCAL GOVERNMENT INSTITUTIONS: CONFIRMATION IN SERVICE

1704/2024

1. ගරු බුද්ධික පතිරණ මහතා(ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. K.P.S. Kumarasiri)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල මේ වනවිට සේවය කරනු ලබන අනියම් සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සේවයේ ස්ථිර නොකිරීමට හේතු කවරේද;

(iii) ඔවුන් මේ වනවිට කරනු ලබන රාජකාරි කවරේද;

(iv) එම සේවකයන්ට ගෙවනු ලබන වැටුප කොපමණද;

(v) ඔවුන් සේවයේ ස්ථිර කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පිරතම අමෙච්චරුම් පොදු නිරුවාක, උළ්නාට්ටලුවල්කළ්, මාකාණ සපෙකළ් මර්රුම් උළ්ළූරාට්චි අමෙච්චරුමාන වරෙක් කේට්ට විනා:

(அ) (i) இலங்கையில் உள்ளூராட்சி மன்றங்களில் தற் போது சேவையாற்றி வருகின்ற அமய ஊழியர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவர்கள் சேவையில் நிரந்தரமாக்கப்படாமைக் கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) அவர்கள் தற்போது ஆற்றி வருகின்ற கடமைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி ஊழியர்களுக்குச் செலுத்தப்படுகின்ற சம்பளம் எவ்வளவு என்பதையும்;

(v) அவர்களைச் சேவையில் நிரந்தரமாக்கு வதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and the Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the number of casual workers currently employed in local government institutions in Sri Lanka;

(ii) the reasons for not confirming them in the service;

(iii) the duties they are currently performing;

(iv) the salary paid to such employees; and

(v) whether steps are taken to make them permanent in their service?

(b) If not, why?

ගරු ජානක වක්කුඹුර මහතා (පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு ஜானக வக்கும்புர - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)

(The Hon. Janaka Wakkumbura - State Minister of Provincial Councils, Local Government and Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) 2023.08.29 දිනට සියලු පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටි අනියම්, ආදේශක, කොන්ත්‍රාත්, තාවකාලික සහ සහන පදනම යටතේ බඳවා ගෙන ඇති සේවක සංඛ්‍යාව 8,435කි.

(ii) 2024.06.11 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් 8,435 දෙනෙකුගේ සේවය ස්ථිර කිරීම අනුමත කර ඇති අතර ඉන් 5,843 දෙනෙකු සඳහා මේ වන විට ස්ථිර පත්වීම් ප්‍රදානය කර ඇති අතර ඉතිරි පිරිස සඳහා පත්වීම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(iii) ඔවුන් කරනු ලබන රාජකාරි පිළිබඳව පළාත් පාලන ආයතන වෙතින් තොරතුරු විමසා ඇති අතර ලද වහාම ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(iv) එම සේවකයන් සඳහා ගෙවනු ලබන වැටුප් පිළිබඳව පළාත් පාලන ආයතන විමසා ඇති අතර ලද වහාම ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග: පුත්තලම දිස්ත්‍රික්කය

பாதுகாப்பற்ற புகையிரதக் கடவைகள்: புத்தளம் மாவட்டம்

UNGUARDED LEVEL CROSSINGS: PUTTALAM DISTRICT

1729/2024

2. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ජගත් ප්‍රියංකර මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு ஜகத் பிரியங்கர சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Jagath Priyankara)

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ මේ වනවිට පවතින අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ඉහත සඳහන් අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග හේතුවෙන් මරණයට පත් වූ සහ තුවාල ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සඳහා ආරක්ෂිත දුම්රිය ගේට්ටු සවිකිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்தில் இன்றளவில் காணப்படு கின்ற பாதுகாப்பற்ற புகையிரதக் கடவைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவை அமைந்துள்ள இடங்கள் யாவை என்ப தையும்;

(iii) 2015ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரையில் மேற்படி பாதுகாப்பற்ற புகையிரதக் கடவைகள் காரணமாக உயிரிழந்த மற்றும் காயமடைந்தவர் களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென் பதையும்;

(iv) மேற்படி பாதுகாப்பற்ற புகையிரதக் கடவை களுக்குப் பதிலாக பாதுகாப்பான புகையிரதக் கடவைகளைப் பொருத்துவதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Highways:

(a) Will he inform this House -

(i) the number of unguarded level crossings found in the Puttalam District at present;

(ii) the names of the places where those level crossings are located;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) separately, the number of persons who were killed and the number of those who were injured because of the said unguarded level crossings from 2015 to date; and

(iv) the measures that will be taken to fix guarded railway gates at the said level crossings?

(b) If not, why?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ දුම්රිය හරස් මාර්ග 138ක් පවතින අතර, ඒ සියල්ල ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග වේ. දුම්රිය මාර්ග හරහා ඇති මධ්‍යම රජයේ හෝ නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් යටතේ ක්‍රියාත්මක වන සියලු මාර්ග පහත සඳහන් කුමන හෝ ආකාරයකින් ආරක්ෂිත දුම්රිය හරස් මාර්ගයන් වේ.

i) මාර්ග සංඥා, විදුලි සීනු, වර්ණාලෝක හා මාර්ග බාධක යෙදූ හරස් මර්ග

ii) මාර්ග සංඥා සමඟ විදුලි සීනු හා වර්ණාලෝක යෙදූ හරස් මාර්ග

iii) මාර්ග සංඥා සමඟ උණ බම්බු යෙදූ හරස් මාර්ග

iv) මාර්ග සංඥා පුවරු පමණක් යෙදූ හරස් මාර්ග

(ii) පැන නොනඟී.

(iii) ආරක්ෂිත දුම්රිය හරස් මාර්ග ගේට්ටුවල ගේට්ටුකරුවන් නොමැතිවීම ආදී හේතු නිසා සිදුවූ අනතුරු පහත පරිදි වේ.

- 2015, 2016 හා 2017 වර්ෂවලදී දුම්රිය හරස් මාර්ග ආශ්‍රිතව අනතුරු වාර්තා වී නොමැත.
- 2018 වර්ෂයේදී ලුණුවිල දුම්රිය ස්ථානය ආසන්නයේදී එක් අනතුරක් වාර්තා වී ඇති අතර, එහිදී තුවාල සිදුවීම් හෝ මරණයට පත්වීම් වාර්තා වී නොමැත.
- 2019 වර්ෂයේදී හලාවත දුම්රිය ස්ථානය ආසන්නයේදී එක් අනතුරක් හා මාදම්පේ දුම්රිය ස්ථානය ආසන්නයේදී එක් අනතුරක් වශයෙන් අනතුරු 2ක් වාර්තා වී ඇති අතර, තුවාල සිදුවීම් හෝ මරණයට පත්වීම් වාර්තා වී නොමැත.
- 2020 වර්ෂයේදී දුම්රිය හරස් මාර්ග ආශ්‍රිතව අනතුරු වාර්තා වී නොමැත.
- 2021 වර්ෂයේදී හලාවත දුම්රිය ස්ථානය ආසන්නයේදී එක් අනතුරක් වාර්තා වී ඇති අතර, එහිදී එක් අයෙකු තුවාල ලබා ඇත.
- 2022 වර්ෂයේදී වයික්කාල දුම්රිය ස්ථානය ආසන්නයේදී එක් අනතුරක් ද, හලාවත දුම්රිය ස්ථානය ආසන්නයේදී එක් අනතුරක්ද හා කාක්කපල්ලිය දුම්රිය ස්ථානය ආසන්නයේදී එක් අනතුරක්ද වශයෙන් අනතුරු 3ක් වාර්තා වී ඇති අතර, තුවාල සිදුවීම් හෝ මරණයට පත්වීම් වාර්තා වී නොමැත.
- 2023 වර්ෂයේදී බංගදෙණිය දුම්රිය ස්ථානය ආසන්නයේදී එක් අනතුරක් වාර්තා වී ඇති අතර, එහිදී එක් අයෙකු මරණයට පත්ව ඇත.
- 2024 වර්ෂයේදී මේ දක්වා දුම්රිය හරස් මාර්ග ආශ්‍රිතව අනතුරු වාර්තා වී නොමැත.

(iv) ශ්‍රී ලංකාව පුරා ඇති දුම්රිය හරස් මාර්ග එහි ඇති ප්‍රමුඛතාව අනුව, එනම් දුම්රිය මාර්ග ගණන අනුව (තනි/ද්විත්ව/ත්‍රිත්ව) එම හරස් මාර්ග හරහා ගමන් ගන්නා රථ වාහන ධාරිතාව, දුම්රිය මාර්ගයේ ගමන් කරන දුම්රිය වාර සංඛ්‍යාව වැනි නිර්ණායක යටතේ දැනටමත් දුම්රිය දෙපාර්තමේන්තුවේ සංඥා හා විදුලි උප දෙපාර්තමේන්තුව මඟින් දුම්රිය හරස් මාර්ග බහු කාර්ය සේවකයන් යොදා ගනිමින් සම්පූර්ණ ආරක්ෂිත හරස් මාර්ග බවට පරිවර්තනය කිරීමේ වයාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පවතී.

දැනට මාර්ග සංඥා පුවරු මඟින් පමණක් ආවරණය කර ඇති හරස් මාර්ග සඳහා ආරක්ෂිතව වසා දැමිය හැකි ගේට්ටු කවටල භාරසියයක් මිල දී ගැනීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මේ වනවිට අවසන් අදියරේ පවතී.

(ආ) අදාළ නොවේ.

"ගොවිසෙත" ලොතරැයිය: ආදායම සහ පිරිනමන ලද ත්‍යාග මුදල්

"கொவிசெத" லொத்தர்: வருமானம் மற்றும் அளிக்கப்பட்ட பரிசுத் தொகை

"GOVISETHA" LOTTERY: REVENUE AND PRIZE MONEY AWARDED

1751/2024

4. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Ishak Rahuman)

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගොවිසෙත ලොතරැයිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ලොතරැයිය ආරම්භ කිරීමේ අරමුණ කවරේද;

(iii) ආරම්භ කරන ලද දිනයේ සිට මේ දක්වා එම ලොතරැයිය අළෙවි කිරීම මඟින් උපයන ලද ආදායම සහ ප්‍රදානය කරන ලද ත්‍යාග මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම ලොතරැයිය අළෙවි කිරීම මඟින් උපයන ලද ආදායම ගොවි ජනතාවගේ සුබසාධනය සඳහා වැය කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

නිදි, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'கொவிசெத' லொத்தர் ஆரம்பிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) மேற்படி லொத்தர் ஆரம்பிக்கப்பட்டதன் நோக்கம் யாது என்பதையும்;

(iii) ஆரம்பிக்கப்பட்ட திகதி முதல் இதுவரை மேற்படி லொத்தர் விற்பனைமூலம் ஈட்டப்பட்ட வருமானம் மற்றும் அளிக்கப்பட்ட பரிசுத் தொகை ஒவ்வொரு வருட அடிப்படையில் தனித் தனியே யாது என்பதையும்;

(iv) மேற்படி லொத்தர் விற்பனைமூலம் ஈட்டப்பட்ட வருமானத்தை கமத்தொழிலாளர்களின் நலன் புரிக்காகச் செலவிடுவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Economic Stabilization and National Policy:

(a) Will he inform this House -

(i) the date of commencement of the "Govisetha" lottery;

(ii) the objective of introducing the aforesaid lottery;

(iii) separately, for each year, the amount of revenue earned from the sale of the aforesaid lottery and the amount of prize money awarded from the date of commencement to date; and

(iv) the steps that will be taken to use the income generated by the sale of aforesaid lottery, for the welfare of the farmers?

(b) If not, why?

ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ගොවිසෙත ලොතරැයියේ පළමු දිනුම් ඇදීම 1995.09.20 දින සිදු කර ඇත.

(ii) කෘෂිකාර්මික අභිවෘද්ධිය සහ ගොවීන්ගේ සුබසාධනය නඟා සිටුවීම සඳහා ඇති කරන ලද ගොවීන්ගේ භාරකාර අරමුදලට අරමුදල් උපයා දීමට මෙම ලොතරැයිය ඇති කරන ලදී.

(iii) ආරම්භයේ සිට මේ දක්වා ගොවිසෙත ලොතරැයියේ අලෙවි ආදායම් හා ලබාදෙන ලද ත්‍යාග මුදල් පහත පරිදි වේ.

වර්ෂය	අලෙවි ආදායම (රු.)	ත්‍යාග වශයෙන් ලබා දෙන ලද මුදල(රු.)
1995 සැප්. - දෙසැ.	58,608,420.00	27,545,954.40
1996	241,038,000.00	113,287,860.00
1997	368,613,600.00	173,248,392.00
1998	390,068,200.00	183,332,054.00
1999	375,639,160.00	176,550,405.20
2000	457,904,800.00	215,215,256.00
2001	593,359,800.00	278,879,106.00
2002	776,698,800.00	365,048,436.00
2003	1,067,860,800.00	501,894,576.00
2004	900,382,200.00	423,179,634.00
2005	961,119,000.00	475,551,718.00
2006	902,597,800.00	460,324,878.00
2007	932,490,500.00	475,570,155.00
2008	965,580,100.00	492,445,851.00
2009	1,106,726,120.00	546,949,219.00
2010	1,148,930,400.00	550,367,835.00
2011	1,285,523,000.00	604,195,810.00
2012	1,622,118,600.00	762,395,742.00
2013	1,962,201,080.00	922,352,768.00
2014	2,552,142,200.00	1,199,509,834.00
2015	4,510,796,200.00	2,120,074,214.00
2016	4,011,269,600.00	1,885,296,712.00
2017	4,053,192,100.00	1,888,310,156.00
2018	6,634,857,840.00	3,118,015,865.00
2019	7,315,939,080.00	3,438,925,828.00
2020	5,290,655,920.00	2,486,664,462.00
2021	4,441,618,920.00	2,181,733,226.00
2022	3,570,567,680.00	2,075,802,939.00
2023	5,094,203,960.00	2,621,705,730.00
2024- ඇති මෙය දක්වා	2,238,737,920.00	1,045,666,066.00

(iv) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ගොවිසෙත ලොතරැයිය අලෙවියෙන් ලැබෙන ආදායමින් සියයට 10ක ප්‍රමාණයක් ඒකාබද්ධ අරමුදල හරහා ගොවීන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලබන අතර එම අරමුදලේ අරමුණු වෙනුවෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සිදු කරනුයේ එම අරමුදල මඟිනි.

(ආ) පැන නොනඟී.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතු ඉඩම්: විස්තර
தேசிய கால்நடை வள அபிவிருத்திச் சபைக்குச் சொந்தமான காணிகள்: விபரம்
LANDS OWNED BY NATIONAL LIVESTOCK DEVELOPMENT BOARD: DETAILS

1910/2024

6. ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව ඇති ඉඩම් ප්‍රමාණය සහ එම ඉඩම් පිහිටා ඇති ස්ථාන;

(ii) එම ඉඩම්වලින් භාවිත කර ඇති ඉඩම් ප්‍රමාණය, ඌන උපයෝජිත ඉඩම් ප්‍රමාණය හා එම ඉඩම් පිහිටා ඇති ස්ථාන;

(iii) ඉහත (i)හි සඳහන් ඉඩම්වලින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අයිතිය යටතේ පවතින ඉඩම් ප්‍රමාණය හා එම ඉඩම් පිහිටා ඇති ස්ථාන;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත සඳහන් ඌන උපයෝජිත ඉඩම් අන්සතු කිරීම හෝ බදු දීම සම්බන්ධයෙන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රතිපත්තිය කවරේද;

(ii) එම ඉඩම් අතරින් මේ වනවිට අන්සතු කර හෝ බදු දී ඇති ඉඩම් ප්‍රමාණය හා එම ඉඩම් පිහිටා ඇති ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய கால்நடை வள அபிவிருத்திச் சபையின் உடைமையிலுள்ள காணிகளின் அளவு மற்றும் அக்காணிகள் அமைந்துள்ள இடங்கள்;

(ii) மேற்படி காணிகளில் பயன்படுத்தப்பட்டுள்ள காணிகளின் அளவு, குறைபயன்பாடுடைய காணிகளின் அளவு மற்றும் அக்காணிகள் அமைந்துள்ள இடங்கள்;

[ගරු තිස්ස අත්තනායක මහතා]

(iii) මේලේ (i)ඉල් කුරිප්පිටප්පට්ටුල්ල කාණිකලිල්, කාණිච් චීර්තිරුත්ත ආණෙක්කුළුවුක්කු උරිත් තාකක් කාණප්පටුම් කාණිකලින් අළවු මර්රුම් අක්කාණිකල් අමෙන්දුල්ල ඉටංකල්;

එන්පන වෙව්වේරාක යාවෙයෙන්පතෙ අවර් ඉච්සපෙක්කු අරිවිප්පාරා?

(ආ) (i) මේර්කුරිප්පිට්ට කුරෙපයන්පාටුටෙය කාණි කළෙප් පරාතීනප්පටුත්තල් අල්ලතු කුත්තකෙක්කු විටුතල් තොටර්පිල් තේසිය කාල්නටෙ වළ අපිවිරුත්තිච් සපෙයින් කොල්කෙ යාතු;

(ii) මේර්පටි කාණිකලිල් ඉන්රළවිල් පරාතීනප් පටුත්තප්පට්ටුල්ල අල්ලතු කුත්තකෙක්කු විටප් පට්ටුල්ල කාණිකලින් අළවු මර්රුම් අක් කාණිකල් අමෙන්දුල්ල ඉටංකල් වෙව්වේරාක යාවෙ;

එන්පතෙ අවර් ඉච්සපෙක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Agriculture and Plantation Industries:

(a) Separately, will he inform this House -

(i) the extents of land owned by the National Livestock Development Board and the locations of them;

(ii) out of the aforesaid lands, the extent of used land area, the extent of under-utilized land area and their locations; and

(iii) out of the lands mentioned in (i) above, the extent of land coming under the purview of the Land Reform Commission and the locations of the aforesaid lands?

(b) Will he also inform this House -

(i) the policy of the National Livestock Development Board with regard to alienation or leasing of above-mentioned under-utilized lands is; and

(ii) out of the aforementioned lands, the extent of land alienated or leased out and their locations, separately?

(c) If not, why?

ගරු ඩී.බී. හේරත් මහතා (පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு டீ.பீ. ஹேரத் - கால்நடை வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)

(The Hon. D.B. Herath - State Minister of Livestock Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව ඇති ඉඩම් ප්‍රමාණය සහ එම ඉඩම් පිහිටා ඇති ස්ථාන

අනු අංකය	ගොවිපළ/ඒකකය	පිහිටා ඇති ස්ථාන	දැනට පවතින ඉඩම් ප්‍රමාණය (අක්කර)
1	ප්‍රධාන කාර්යාලය	නාරාහේන්පිට	0.39
2	ආඩිගම	දඹදෙණිය	1,130
3	මහබෙරියතැන්න	රජවැල්ල	368
4	මැදරට පශු සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය	රජවැල්ල	72
5	සිරිංගපාත	බඩල්ගම	1,634
6	හොරකැලේ	තල්විල	938
	හොරකැලේ	තල්විල	38
7	මැල්සිරිපුර	මැල්සිරිපුර	967
	මැල්සිරිපුර ගොවිපළ - රාගෙදර බෙදුම	මැල්සිරිපුර	398
8	මරඳවිල ගොවිපළ	බිංගිරිය	1,485
	මරඳවිල ගොවිපළ - දැදුරුඔය බෙදුම	බිංගිරිය	590
9	මාවත්ත	ලුණුවිල	348
10	කොවුල්වැව ගොවිපළ	නාරම්මල	961.5
	කොවුල්වැව ගොවිපළ හැලමඩ බෙදුම	නාරම්මල	50
11	රුක්අත්තන	බිංගිරිය	513
12	ගල්පොකුණ	උඩුබද්දාව	706
13	නාරංගල්ල	කිතලව	519
14	බෙලිගම	බෙලිගමුව	655
15	පොලොන්නලාව	නිකවැරටිය	707
16	මාවින්	බංගදෙණිය	501
17	රොසිටා	කොටගල	99
18	මිරිස්වත්ත	හොරණ	40
19	බෝපත්තලාව	බෝපත්තලාව	1,142
20	මැණික්පාලම	බෝපත්තලාව	1,424
21	ඩයගම	ඩයගම	543
22	රිදියගම	අම්බලන්කොට	2,788
23	පොළොන්නරුව	පොළොන්නරුව	2,675.5
24	නිකවැරටිය	නිකවැරටිය	1,463
25	වීරවිල	තිස්සමහාරාම	493
26	කොට්ටුකච්චිය	ආණමඩුව	810
27	මාරවිල	මාරවිල	16
28	ඔයාමඩුව	ඔයාමඩුව	2,150
29	පරසන්ගස්වැව	පරසන්ගස්වැව	1,563
30	කරඳගොල්ල	කුණ්ඩසාලේ	50
31	වැලිසර	රාගම	10
32	භාරගම	ගුරුදෙණිය	225
33	වැලිකන්ද	වැලිකන්ද	465
34	කන්දකාඩුව	කන්දකාඩුව	4,386.72
	මුළු එකතුව		32,924.11

(ii) එම ඉඩම්වලින් භාවිත කර ඇති ඉඩම් ප්‍රමාණය, ඌන උපයෝජිත ඉඩම් ප්‍රමාණය හා එම ඉඩම් පිහිටා ඇති ස්ථාන:

අනු අංකය	ගොවිපළ/ඒකකය	පිහිටා ඇති ස්ථාන	දැනට පවතින ඉඩම් ප්‍රමාණය (අක්කර)	භාවිත කර ඇති ඉඩම් ප්‍රමාණය (අක්කර)	ඌන උපයෝජිත ඉඩම් ප්‍රමාණය (අක්කර)
1	ප්‍රධාන කාර්යාලය	නාරාහේන්පිට	0.39	0.39	
2	ආඬිගම	දඹදෙණිය	1,130	1,130	
3	මහබෙරියතැන්න	රජවැල්ල	368	368	
4	මැදරට පශු සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය	රජවැල්ල	72	72	
5	සිරිංගපාත	බඩල්ගම	1,634	1,634	
6	හොරකැලේ	තල්විල	938	938	
	හොරකැලේ	තල්විල	38	38	
7	මැල්සිරිපුර	මැල්සිරිපුර	967	967	
	මැල්සිරිපුර ගොවිපළ - රාගෙදර බෙදුම	මැල්සිරිපුර	398	398	
8	මරඳවිල ගොවිපළ	බිංගිරිය	1,485	1,485	
	මරඳවිල ගොවිපළ - දැදුරුඔය බෙදුම	බිංගිරිය	590	590	
9	මාවත්ත	ලුණුවිල	348	348	
10	කොවුල්වැව ගොවිපළ	නාරම්මල	961.5	961.5	
	කොවුල්වැව ගොවිපළ හැලමඩ බෙදුම	නාරම්මල	50	50	
11	රුක්අත්තන	බිංගිරිය	513	513	
12	ගල්පොකුණ	උඩුබද්දාව	706	706	
13	නාරංගල්ල	කිතලව	519	519	
14	බෙලිගම	බෙලිගමුව	655	655	
15	පොලොන්තලාව	නිකවැරටිය	707	707	
16	මාටින්	බංගදෙණිය	501	501	
17	රොසිටා	කොටගල	99	99	
18	මිරිස්වත්ත	හොරණ	40	40	
19	බෝපත්තලාව	බෝපත්තලාව	1,142	1,142	
20	මැණික්පාලම	බෝපත්තලාව	,424	1,424	
21	ඩයගම	ඩයගම	543	543	
22	රිදියගම	අම්බලන්තොට	2,788	2,788	
23	පොළොන්නරුව	පොළොන්නරුව	2,675.5	2,675.5	
24	නිකවැරටිය	නිකවැරටිය	1,463	963	500
25	වීරවිල	තිස්සමහාරාම	493	293	200
26	කොට්ටුකච්චිය	ආණමඩුව	810	310	500
27	මාරවිල	මාරවිල	16	16	
28	ඔයාමඩුව	ඔයාමඩුව	2,150	1,150	1,000
29	පරසන්ගස්වැව	පරසන්ගස්වැව	1,563	563	1,000
30	කරඳගොල්ල	කුණ්ඩසාලේ	50	50	
31	වැලිසර	රාගම	10	10	
32	හාරගම	ගුරුදෙණිය	225	225	
33	වැලිකන්ද	වැලිකන්ද	465	465	
34	කන්දකාඩුව	කන්දකාඩුව	4,386.72	4,386.72	
මුළු එකතුව			32,924.11	29,724.11	3,200

[ගරු ඩී.බී. හේරත් මහතා]

(iii)

අනු අංකය	ගොවිපළ/ඒකකය	පිහිටා ඇති ස්ථාන	ඉඩම් ප්‍රමාණය (අක්කර)
1	හොරකැලේ	තල්විල	38
2	මැල්සිරිපුර	මැල්සිරිපුර	967
3	මරඳවිල ගොවිපළ - දැදුරුඔය බෙදුම	බිංගිරිය	590
4	කොවුල්වැව ගොවිපළ	නාරම්මල	961.5
5	රුක්අත්තන	බිංගිරිය	513
6	ගල්පොකුණ	උඩුබද්දාව	706
7	නාරංගල්ල	කිතලව	519
8	බෙලිගම	බෙලිගමුව	655
9	පොලොන්තලාව	නිකවැරටිය	707
10	මාටින්	බංගදෙණිය	501
11	රොසිටා	කොටගල	99
12	මිරිස්වත්ත	හොරණ	40
	මුළු එකතුව		6,296.5

(ආ) (i) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව පවතින ඌන උපයෝජිත ඉඩම් භාවිතයට ගැනීමට නිරන්තරයෙන් කටයුතු කරන අතර, සුවිශේෂී ජාතික අවශ්‍යතා සලකා රාජ්‍ය හා පෞද්ගලික අංශය සමඟ සංවර්ධන කටයුතු සඳහා ද යොදා ගනු ලැබේ.

(ii) මේ වනවිට අන්සතු කර ඇති ඉඩම් නොමැත.

(ඇ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්නය අහන්න පෙර ඔබතුමා මට අවසරය ලබා දුන්නා, කරුණු දෙකක් ඉදිරිපත් කරන්න. විශේෂයෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමාත් සභාවේ සිටින මේ අවස්ථාවේ මම මේ ප්‍රශ්න දෙක ඉදිරිපත් කරන්න කැමැතියි.

ගරු අගමැතිතුමනි, ටෙලිකොම් සමාගම විකිණීම සඳහා ගැනුම්කරුවන් සොයා ගැනීමේදී විනිවිදභාවයක් නොමැති ක්‍රමයක් අනුගමනය කරලා තිබෙනවා. මම ඒ කාරණය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ ගැනුම්කරුවන් තෝරාගත් ක්‍රමය පිළිබඳව වගවීමක් නැහැ, වගකීමක් නැහැ, විනිවිදභාවයකුත් නැහැ, පාරදෘශ්‍යභාවයකුත් නැහැ. විශේෂයෙන් සුදුසුකම්ලත් බවට ප්‍රසිද්ධ කරපු ඉල්ලුම්කරුවන් දෙදෙනෙකුගෙන් එක් කෙනෙකු එක පාරට disqualify කරලාත් තිබෙනවා. බොහෝ දෙනෙකුගේ අවිශ්වාසයක් තිබෙනවා, මේකත් ගජමිතුරු ධනවාදී දේශපාලන ගනුදෙනුවක්ද කියලා. ඒක නිසා මම විශේෂයෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානය මේ කාරණයට යොමු කරන්න කැමැතියි. ඒ වත්කම් ගණනය කිරීමේදී බොහෝ බරපතළ අක්‍රමිකතා සිදු වෙලා තිබෙනවා. ටෙලිකොම් ආයතනයත්, International Finance Corporation එකත් ඒ වත්කම් ගණනය කරලා තිබෙනවා. හැබැයි, රජය මඟින් ශ්‍රී ලංකා ටෙලිකොම්හි ඉඩම් සහ ගොඩනැඟිලිවල පමණක් වටිනාකම තක්සේරු කරලා තිබෙනවා. දිවයින පුරා ටෙලිකොම් සේවා සපයන කොපර් කේබල් ජාලය, fibre-optic cable ජාලය, දිවයින පුරා ඇති මධ්‍යස්ථාන 500කට ආසන්න සංඛ්‍යාවක ඇති telecommunication උපකරණ, සම්ප්‍රේෂණ කුලුනු, ටෙලිකොම් පුහුණු මධ්‍යස්ථාන, උපකරණ ආදී වශයෙන් විශාල වත්කම් ප්‍රමාණයක් තිබෙනවා. හැබැයි, ටෙලිකොම් ආයතනය සම්බන්ධව රජය ක්‍රියාත්මක කරපු වත්කම් ගණනය කිරීමේදී - ඒ assets valuation එකේදී - දෝෂ සහිතව මේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වාගේම මම ඔබතුමාට සඳහන් කරන්න කැමැතියි, ටෙලිකොම් කොටසක මිල ගණනය කිරීමේදී සමස්ත ඉඩම්වල වටිනාකම මිලියන 400ක් ලෙස ගණනය කරගෙන තමයි කොටස් මිල නිර්මාණය වෙලා තිබෙන්නේ කියන එක. හැබැයි, ටෙලිකොම් එකේ 2023 මූල්‍ය වාර්තාවට අනුව ඉඩම්වල නිවැරැදි වටිනාකම රුපියල් මිලියන 58,000යි.

මෙවැනි තත්ත්වයක් තිබියදී, මේ වටිනාකම අවතක්සේරු කරලා කුණු කොල්ලයට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විකුණන්නට යන ක්‍රියාදාමය අපි තරයේ හෙළා දකිනවා. ගරු අග්‍රාමාත්‍යතුමනි, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වසර ගණනාවක් පුරාවට අධික ලාභ ලබපු ආයතනයක්. ඒ වාගේම, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය බදු සහ ලාභාංශ ලෙස රුපියල් මිලියන 25,000කට ආසන්න මුදලක් මහා භාණ්ඩාගාරයට ලබා දීලා තිබෙනවා. පාඩු ලබන ආයතන සම්බන්ධයෙන් දැන් අපට තර්කයක් තිබෙනවා. ආයතන දිගින් දිගටම පාඩු ලබන්න බැහැ. යම්කිසි ක්‍රමයක් තුළ එවැනි ආයතන ප්‍රතිව්‍යුහගත කරන්නට ඕනෑ. ඒවා ප්‍රතිසංස්කරණය කරන්නට ඕනෑ. අපි ඒක පිළිගන්නවා. නමුත්, මේ ආකාරයට ලාභ ලබන ආයතන කුණු කොල්ලයට විකුණන්නේ කොහොමද? හැබැයි, එක දෙයක් තිබෙනවා ගරු අගමැතිතුමනි. එක අවුරුද්දක විතරක් මේ ආයතනය පාඩු ලබලා තිබෙනවා. ගරු අගමැතිතුමනි, මා ළඟ ඒ සම්බන්ධ සංඛ්‍යාලේඛන තිබෙනවා. මම එම සංඛ්‍යාලේඛන **සභාගත*** කරනවා.

කොවිඩ්-19 වසංගතය පැවති සමයේත් මෙම ආයතනය රුපියල් බිලියන 12ක ශුද්ධ ලාභයක් ලැබුවා. හැබැයි, මොකක්ද කළේ? ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විකුණා දමන්නට, ඒ ටෙලිකොම් ආයතනයේ Chairman පන්නලා දැම්මා. Chairman පන්නා දැමුවාට පස්සේ එක පාරටම ටෙලිකොම් ආයතනයේ ලාභය අඩු වුණා. දැන් ඒක අලාභ ලබන ආයතනයක් වුණා. කොහොමද ඒක වුණේ? මම පැහැදිලිව කියන්න කැමැතියි, මේ මොන දේ කරන්නත් ඉස්සෙල්ලා මේ ගැන වෝහාරික විගණනයක් අනිවාර්යයෙන්ම කරන්නට ඕනෑ බව. මේක මහා ජාතික අපරාධයක්. ලාභ ලබන ආයතනයක් ගජ මිතුරු ධනවාදය හරහා මේ විධියේ කුණු කොල්ලයට විකුණා දැමීම ඉතාම අසික්කිත දෙයක්. ඒ නිසා ගරු අගමැතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. ඔබතුමාත් රාජ්‍ය දේපළ විකුණා දමන ක්‍රියාදාමයට විරුද්ධ වුණු පුද්ගලයෙක්. ලාභ ලබන ටෙලිකොම් ආයතනය විකුණා දමන්න තිබෙන ජනවරම මොකක්ද? මොකක්ද වරම? ඒ නිසා මේ කැත වැඩේ කරන්න එපා. ලාභ ලබන ආයතන මෙහෙම කුණු කොල්ලයට විකුණන්න එපා. අලාභ ලබන ආයතනවලට මෙහෙම යන්න බැහැ කියලා අපි පිළිගන්නවා. ඒවා ප්‍රතිව්‍යුහගත

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කරන්නට ඕනෑ. නමුත්, මේ ආයතනය අපේ රටේ තිබෙන ලාභ ලබන දැවැන්ත සම්පතක්. ගරු අගමැතිතුමනි, ඒ නිසා ඔබතුමා කරුණාකරලා කැබිනට් මණ්ඩලයේ මේ පිළිබඳව කථා කරන්න. මේ පිළිබඳව නැවත සාකච්ඡා කරන්න.

මගේ දෙවැනි කාරණාව මෙයයි.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. State Minister, you can reply after I finish.

ගරු අගමැතිතුමනි, මගේ දෙවැනි කාරණාව මෙයයි. ඔබතුමා මේ වෙලාවේ ගරු සභාවේ සිටින නිසා මේ වැදගත් කාරණාව මම ඉදිරිපත් කරන්නට ඕනෑ. තොරතුරු තාක්ෂණ අධ්‍යාපනයට මුල් තැන දෙන්නට ඕනෑ කියන කාරණාවට මේ පාර්ලිමේන්තුවේ සිටින මහජන නියෝජිතයන් 225දෙනාම එකඟ වෙනවා. ඒ බව ඔබතුමාත් දන්නවා. ඒ වාගේම අපි පිළිගන්නවා, සෞන්දර්ය ක්ෂේත්‍රීය අධ්‍යාපනයටත් අපි මුල් තැන දෙන්නට ඕනෑ බව. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය පළමුවරට සාමාන්‍ය පෙළ විෂය මාලාවට සම්බන්ධ කළේ 2006 වසරේ දී කියලා ඔබතුමා දන්නවාද? හැබැයි, යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය විභාග දෙපාර්තමේන්තුවෙන් ඇගයීම් කරනු ලබන ප්‍රධාන විෂයයන් 7 සඳහා එකතු කරලා නැහැ. ඒ කියන්නේ O/L විභාගයෙන් Information and Communication Technology - ICT - විෂය ඉවත් කරලා. ගරු අගමැතිතුමනි, මේ අමනෝඥ ක්‍රියාව මොකක්ද? මේක මොන මෝඩ ක්‍රියාවක්ද? අපි හැමෝම කථා කරනවා, "Digital Sri Lanka" සහ "Digitized Sri Lanka" ගැන. තොරතුරු තාක්ෂණය ප්‍රවර්ධනය කරන ලංකාවක් ගැන අපි කථා කරනවා. හැබැයි, යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේදී O/L විභාගයෙන් ICT විෂයය ඉවත් කරලා තිබෙන්නේ කොහොමද? මේ ප්‍රතිසංස්කරණවලට අනුව ඇගයීම් මණ්ඩල හරහා පමණක් විෂය තෝරා ගන්නා සිසුන්ගේ ඇගයීම් කරන බවටත්, එය සාමාන්‍ය පෙළ විභාග සහතිකයට ඇතුළත් නොකිරීමටත් තීන්දු කර ඇති බව වැඩිදුරටත් වාර්තා වෙනවා. මම රජයෙන් මේ ගැනත් අහන්න කැමැතියි. මේ ඩිජිටල් යුගයේ දැවැන්ත පරිවර්තනාත්මක තාක්ෂණ යුගයක් ක්‍රියාත්මක වන මොහොතක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය O/L විභාගයට ඇතුළත් විය යුතු විෂයයක් කියලා ඔබතුමා හිතන්නේ නැද්ද? ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා ICT විෂය O/L විභාගයට ඇතුළත් කරන්න කියලා.

ඔබතුමා දන්නවාද දන්නේ නැහැ, සෞන්දර්ය විෂයයත් ඉවත් කරලා තිබෙනවා කියන එක. සෞන්දර්ය විෂය කියන්නේ සංවේදී ශිෂ්‍යයකු, මානව හිතවාදී, ජනතාවාදී, ජනහිතකාමී, තෙතමනයක් තිබෙන පුරවැසියෙක් නිර්මාණය කරන්නට ඉවහල් වන විෂයයක්.

ඒකත් ඉවත් කරලා. එහෙම කරන්නේ කොහොමද? මේ අමනෝඥ තීන්දු ගන්නේ කවුද? එක පැත්තකින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයය ඉවත් කරනවා, තවත් පැත්තකින් සෞන්දර්ය විෂයය ඉවත් කරනවා. ගරු අගමැතිතුමනි, මේවා ඉතින් ඔබතුමන්ලා ඉන්න සභාවලදී ගත්ත තීන්දු, ඔබතුමා අධ්‍යාපන ඇමතිතුමා නොවුණත්. Information and Communication Technology කියන විෂය O/L subjectsවලින් ඉවත් කළේ මොන පදනමක් මතද? සෞන්දර්ය විෂයය ඉවත් කළේ කොහොමද? ඒ සඳහා උපදෙස් දුන්නේ කවුද, මොන තීන්දුවක් මතද? මොකද, සෞන්දර්ය කියන විෂයය සුන්දර ශිෂ්‍යයා, සුන්දර පුරවැසියා, සුන්දර තාරුණ්‍යය නිර්මාණය වෙන්නට බොහෝ සෙයින් ඉවහල් වෙනවා. ඒ නිසා කරුණාකරලා මම මේ ඉදිරිපත් කරපු කරුණු කාරණා පිළිබඳව, ඒ කියන්නේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයය - Information and Communication Technology, ICT - O/L subjectsවලින් ඉවත් කිරීම සහ සෞන්දර්ය විෂයය ඉවත් කිරීම ගැන නැවත රජයේ අවධානය යොමු කරන්න. ඒ වාගේම මේ අමනෝඥ ක්‍රියාව, මෝඩ ක්‍රියාව ක්‍රියාත්මක කරන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නය ගරු අධ්‍යාපන අමාත්‍යතුමා ආවාම ඉදිරිපත් කරන්න ගරු විපක්ෂ නායකතුමාට අවස්ථාව ලබා දෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමනි, ගැටලුවක් නැහැ. ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට ඒකට පිළිතුරක් දෙන්න කියන්න. ඔබතුමා සාමාන්‍ය සිවිල් පුරවැසියෙක්, ඒ වාගේම ඇමතිවරයෙක් හැටියට පොඩ්ඩක් සිතා බලන්න. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය කියන විෂයය O/L විෂයන්ගෙන් ඉවත් කරන එක ගැන ඔබතුමා සරලව සිතා බලන්න. මහ මෝඩ ක්‍රියාවක් නේ.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා කියන මේ කාරණා සත්‍ය නම්, මේවා පිළිබඳ නිලධාරීන් එක්ක සාකච්ඡා කරන්න ඕනෑ. අපට මේකට උත්තරයක් දෙන්න බැහැ. අපි නොදන්නා දේ දන්නා විධියට කියන්න බැහැ. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා එහෙම කරලා අමාරුවේ වැටුණා වාගේ අපට අමාරුවේ වැටෙන්න බැහැ. ඒ නිසා මේ ප්‍රශ්නය ගරු අධ්‍යාපන ඇමතිතුමාට ඉදිරිපත් කරන්න කියලා මම යෝජනා කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමාගේ ප්‍රයෝජනය සඳහා, ඒ ගත්ත තීන්දුව ඇතුළත් ලේඛනය ඡායා පිටපත් කරලා ලැබෙන්න සලස්වන්නම්. මොකද, මම කථා කළේ නොකරපු දෙයක් ගැන නොවෙයි, කරපු දෙයක් ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ඉස්සෙල්ලා ඉදිරිපත් කළේ ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය නොවෙයිද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ. ගරු විපක්ෂ නායකතුමා වෙනත් කරුණු දෙකක් ගැන තමයි පැහැදිලි කිරීමක් කළේ.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මොකද, පෙරවරු 10.30ට තමයි මේ කටයුතු අවසන් වෙන්න තිබෙන්නේ. දැන් අපේ වෙනත් රැස්වීම් කිහිපයක් තිබෙනවා. ඒ ගැන ඔබතුමාත් දන්නවා. ඒ නිසා කාලය පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

නිල්වලා ගඟේ ලවණ බාධකය හේතුවෙන් හානියට පත් කුඹුරු ඉඩම්
நில்வளா ஆற்றின் குறுக்கேயுள்ள உவர்நீர் தடுப்பு காரணமாக பாதிக்கப்படும் வயல் நிலங்கள்
PADDY LANDS AFFECTED DUE TO SALINITY BARRIER ACROSS NILWALA RIVER

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

නිල්වලා ගඟේ ඉදිකර ඇති ලවණ බාධකය හේතුවෙන් වසර ගණනාවක් පුරාවට ඒ ආශ්‍රිත ඉඩම් ගංවතුරින් යට වුණා. මේ නිසා කුඹුරු හෙක්ටෙයාර 4,000ක පමණ වගා සඳහා හානි සිදුවීමෙන් ගොවි පවුල් 30,000කට ආසන්න සංඛ්‍යාවක් අන්ත අසරණ තත්ත්වයකට පත් වුණා. එසේ තිබියදී කෘෂි කර්මාන්තය ජීවනෝපාය කර ගත් ජනතාවට යළිත් ඔවුන්ගේ වගා ඉඩම් අහිමි කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන බව දැන ගන්නට ලැබෙනවා. එම නිසා මෙය ජාතික වැදගත්කමකින් යුතු ගැටලුවක් හැටියට සලකා අපි ප්‍රශ්න ගණනාවක් රජයේ අවධානයට යොමු කරනවා. මේ ගැටලුව නිරාකරණය කරන්නට අපි රජයෙන් පැහැදිලි උත්තර බලාපොරොත්තු වෙනවා.

01. නිල්වලා ගඟේ ලවණ බාධකය හේතුවෙන් ගං වතුරෙන් යටවන කුඹුරුවල වී වගාව ව්‍යාප්ත නොකිරීමට රජය ගෙන ඇති තීරණය ප්‍රදේශයේ ගොවීන්/ගොවි සංවිධාන සමඟ සාකච්ඡා කොට ගත් තීරණයක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මේ පිළිබඳව පැහැදිලි කරන්න කැමැතියි. මේ කුඹුරු හෙක්ටෙයාර 4,000ක වගාව තහනම් කරන්න කෘෂිකර්ම අමාත්‍යාංශය එක්වරම තීන්දුවක් අරගෙන තිබෙනවා අපි දැක්කා. ඒ වාගේ තීන්දුවකට ප්‍රවේශ වුණේ ගොවීන් සමඟ සාකච්ඡා කරලාද?

නොඑසේ නම්, රජය ගත් මෙම අමනෝඥ, මෝඩ තීරණය ගොවි පවුල් 30,000කගේ පමණ ජීවනෝපායට මරු පහරක් වනු ඇති බව රජය දන්නේ නැද්ද? ඒ ගත්ත මෝඩ තීන්දුව නිසා පවුල් 30,000ක් අනාථ වෙන බව ආණ්ඩුව දන්නේ නැද්ද?

කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති මාධ්‍ය නිවේදනයේ ශීර්ෂ පාඨයේ, ගංවතුරින් යටවන කුඹුරුවල වී වගාව ව්‍යාප්ත නොකිරීමට තීරණය කරයි යනුවෙන්ද, එහි අන්තර්ගතයේ ඒ පිළිබඳව අවසන් තීරණයක් ගෙන නොමැති බව සඳහන් කිරීමෙන්ද මේ වන විට ගොවීන් අතර ව්‍යාකූලත්වයක් හා කැලඹීමක් ඇති වීමට හේතු වී ඇති බව රජය පිළිගන්නේ නැද්ද?

ඒ කියන්නේ එක වෙලාවකට කියනවා, වගා කරන්න එපා කියලා. ඊට පස්සේ කියනවා, ඒක අවසන් තීන්දුවක් නොවෙයි කියලා. මේ අවිනිශ්චිතතාව තුළ කොහොමද 30,000ක් වූ මේ ගොවි පවුල් ජීවත් වෙන්නේ? වගා කරන්න කියලාත් කියනවා, වගා කරන්න එපා කියලාත් කියනවා, වගා නොකරන්න තීන්දුවක් ගත්තේ නැහැ කියලාත් කියනවා. ඒ වාගේ ව්‍යාකූලත්වයක් තුළ ඇත්තටම ගොවි ජනතාව අසරණ වෙනවා නේද කියන එක මම අහන්න කැමැතියි.

විශේෂයෙන්ම අපි දන්නවා, ලවණ බාධකයේ සිදු වුණු අක්‍රමිකතා හේතුවෙන් අක්කර 10,000ක පමණ වගා හානි වෙලා, පුද්ගලයන් 175,000ක්, ගොවි පවුල් 30,000ක් පමණ විපතට පත් වෙලා තිබෙන බව. මේ සඳහා රජයට විසඳුමක් නැහැ, රජයට පිළිතුරකුත් නැහැ. වගා කරන්න එපා කියනවා, ආපහු කියනවා ඒ අවසාන තීන්දුව නොවෙයි කියලා. ආණ්ඩුවම දන්නේ නැහැ, මොකක්ද කරන්නේ කියලා.

02. එම මාධ්‍ය නිවේදනයට අනුව, අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි ගංවතුරින් යටවන කුඹුරු ඉඩම් රජයට පවරා ගැනීම සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමට කමිටුවක් පත් කර තිබේද? එසේ නම් එම කමිටුව මඟින් ලබා දී ඇති නිර්දේශ මොනවාද? මෙම ඉඩම් රජයට පවරා ගැනීම ප්‍රදේශයේ ඇතිවන ගංවතුර ප්‍රශ්නයට විසඳුමක් වන්නේ කෙසේද? රජය කළ යුත්තේ, ලවණ බාධකය ඉදි කිරීමේදී සිදු වුණු දෝෂ නිවැරදිකොට පාරම්පරික වගා ඉඩම් ටික වගා කළ හැකි ආකාරයට නිශ්චිත විසඳුමක් ලබා දීම නොවෙයිද?

03. ලවණ බාධකය හේතුවෙන් ගංවතුරින් යටවන කපුදුව, අපරක්ක, ගොඩගම, පාලටුව වැනි ප්‍රදේශ ආශ්‍රිත ඉඩම් ඉහළ වාණිජමය වටිනාකමකින් යුතු බව රජය පිළිගන්නේද? එසේ නම්, රජයේ මේ සූදානම මෙම ඉඩම් පවරාගෙන වෙනත් වාණිජමය කටයුතු සඳහා යෙදවීමද?

ඒ කියන්නේ වගා කරන්න පුළුවන් ඉඩම් ටිකේ වගා කිරීම තහනම් කරලා, වගා කරන්න බැරි හේතුවට විසඳුම් ලබා නොදී මේ හදන්නේ ඒ ඉඩම් ටික රජයට පවරාගෙන තම තමන්ගේ හිතුමතයට ඒවා ගජ මිතුරන්ට බෙදා දෙන්නද?

04. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත මඟින් දකුණු පළාත දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 9.1ක දායකත්වයක් ලබා දී ඇති බවත්, එයින් සියයට 14.6ක්ම ලබා දී ඇත්තේ කෘෂි කර්මාන්තය ඔස්සේ බවත් පෙන්වා දී තිබෙනවා. එවැනි පසුබිමක තෝරා ගත් මෙම ප්‍රදේශයේ කෘෂි කර්මාන්ත කටයුතු නැවැත්වීම නිසා ආර්ථික හා සමාජයීය වශයෙන් ඇති විය හැකි බලපෑම් පිළිබඳව රජයට ඇත්තේ මොන වාගේ ඇගැයීමක්ද? මොකක්ද රජයේ නිගමනය? එසේ බලපෑමට ලක්වන ජනතාවට ලබා දෙන විකල්ප විසඳුම් මොනවාද?

05. පසුගිය වසර ගණනාව තිස්සේ ලවණ බාධකය හේතුවෙන් වගාවලට සිදු වූ හානි වෙනුවෙන් ගොවීන්ට සියලු වන්දි ගෙවා අවසන්ද? එසේ නම් එක් එක් ප්‍රදේශවල කෘෂි රක්ෂණ වන්දි හා වගා හානි වන්දි ලෙස කොපමණ වන්දි ප්‍රමාණයක්, කොපමණ ගොවීන් සංඛ්‍යාවකට ගෙවා ඇත්ද යන්න පිළිබඳව සවිස්තර වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද? එසේ නොමැති නම් මෙතෙක් වන්දි නොගෙවීමට හේතුව මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජය ඉඩම් හෙක්ටෙයාර 4,000ක් පවරා ගන්නවා කියලා නිවේදනයක් නිකුත් කළා. ඇත්තටම සිදු වෙන්න ඕනෑ, ගිං ගඟ, නිල්වලා ගඟ සහ පොල්වත්ත ගඟ ආශ්‍රිතව බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරලා අතිරික්ත ජලය හම්බන්තොට දිස්ත්‍රික්කය වෙත ගෙන යමින් ගංවතුර පාලනය, කර්මාන්ත හා කෘෂි කර්මාන්ත, පානීය ජලය, විදුලි උත්පාදනය, මිරිදිය ධීවර කර්මාන්තය සහ වෙනත් පෙව විවිධත්ව අවශ්‍යතා වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි.

ඒ වාගේම ගිං ගඟ, නිල්වලා ගඟ, පොල්වත්ත ගඟ ආශ්‍රිතවත්, ඒ අදාළ අතුරු ගංගා සහ ඇළ දොළ තුළත් ජල රඳවන ඒකක නිර්මාණය කිරීමත්, අනවසර ඉදිකිරීම්, අවලංගු වූ වාරිමාර්ග, නිර්මිත ජලජ පැළෑටි හා වෙනත් හේතු මත අවහිර වූ ජල මාර්ග සඳහා ධනාත්මක ප්‍රවේශ ලබා දීමත් කළ යුතුයි. දිගිලි ඔය, හුලන්දාව ඔය, කිරම ඔය, සියඹලාගොඩ ආර, අපරක්ක ආර සංවර්ධනය කරලා ජලය රැඳවුම් කිරීමේ නිර්මාණ සකස් කළ යුතුයි. අසාර්ථක ලවණ බාධකය වෙනුවට මාතර දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය සඳහා විකල්ප ක්‍රම ඔස්සේ දැනට පැන නැඟී ඇති ගැටලු විසඳීමට කටයුතු කිරීම, විකල්ප පානීය ජල ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා ජල පවිත්‍රකරණ ඒකක දිගිලි ඔය ආශ්‍රිතව ගොඩ නැඟීම, මිනිස්-කිඹුල් ගැටුම නිරාකරණය සඳහා කිරල කැලේ ආශ්‍රිතව සංචාරක කර්මාන්තය මඟින් සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම, දෙනියාය, සිංහරාජ වනාන්තරය, යාල අභය භූමිය, හික්කඩුව කොරල් පර ආශ්‍රිත ප්‍රදේශය, මිරිස්ස ප්‍රදේශය නිල් තල්මසුන් සහ ඩොල්ෆින් මත්ස්‍යයන් ආශ්‍රිත ඒකාබද්ධ හරිත සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කිරීම ආදිය තමයි මාතර ගොඩ නහන්න අපි ගෙනෙන යෝජනා.

හැබැයි, ආණ්ඩුවට තිබෙන යෝජනාව තමයි, ලවණ බාධක ප්‍රශ්නයට එකම විසඳුමක්වත් ලබා දෙන්නේ නැතිව වගා ඉඩම් ටිකේ වගා කිරීම තහනම් කරලා ඒවා රජයට ගන්න එක. මොකක්ද මේ විහිළුව? මේ ප්‍රශ්නය කථානායකවරයා මුල් පුටුවේ ඉන්නකොට මම කිහිප වතාවක් මතු කළා. ඒ වාගේම බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය කිහිප වතාවක් මතු කළා, ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා කිහිප වතාවක් මතු කළා, වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා කිහිප වතාවක් මතු කළා. මේක හරියට බීරි අලින්ට වීණා වාදනය කරනවා වාගේයි. "ඔව්", "ඔව්", "හව්", "හව්" කියලා කියනවා. ඒ කිව්වාට මොනවත්ම කරන්නේ නැහැ. කරපු එකම දේ මේකයි. ලේසිම විසඳුම විධියට වගා ඉඩම් ටික ඔක්කෝම තහනම් කරලා, වගා ඉඩම් ටික ගන්න යනවා ලු, ආණ්ඩුවට. මේක ද ආණ්ඩුවේ විසඳුම? කරුණාකරලා මේවාට උත්තර දෙන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් අපේ විශේෂ කාරක සභාවට නිරන්තරයෙන් පැමිණෙන නිසා ඔබතුමාටත් මේ ප්‍රශ්නය දැනෙනවා ඇති. ගරු අගමැතිතුමනි, මම විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වෙනවා, ඉතාම සංවේදී මෙන්ම, ඉතාම බරපතළ මේ ගැටලුව පිළිබඳව මේ මොහොතේ සභාවේ අවධානය යොමු කරවීම ගැන. විපක්ෂ නායකතුමා නිවැරැදිව සඳහන් කළ ආකාරයට ජූලි 18වැනි දා කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් නිකුත් කළ ලිපිය අනුව එම අමාත්‍යාංශය පිළිගන්නවා, හෙක්ටෙයාර 4,000ක භූමිය වගා කරන්න බැරිව ගංවතුරෙන් යට වෙන්නේ ලවණ බාධකය නිසාය කියලා. මෙතැන බරපතළ ගැටලුවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ ගැන විවාදයක් කරගන්න ගියොත්,-

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

සමාවෙන්න. මම මේක විවාදයක් කර ගන්නවා නොවෙයි. මම අගමැතිතුමාගේ අවධානයටයි මේ කරුණ යොමු කරන්නේ. මේ සම්බන්ධයෙන් විශාල උනන්දුවක් දක්වන අපේ පරදුවේ ජීනරතන හාමුදුරුවෝත් මේ වෙලාවේ ගැලරියේ වැඩසිටින බව මට පේනවා.

මේ ලවණ බාධකය වෙනුවෙන් ව්‍යාපෘති වාර්තාවක් - EIA එකක් - නිකුත් කර තිබෙනවා. මේ EIA එකේ 101වන පිටුවේ තිබෙන්නේ, ලවණ බාධකයට ආසන්න හෙක්ටෙයාර 6ක් පමණක් මේ ජල බලපෑමට ලක් වෙනවාය කියන එක. ඒකත් වෙන්නේ අවුරුදු පහකට පස්සේ එන මහා ගංවතුරකදී විතරයි. ව්‍යාපෘති වාර්තාවේ තිබෙන්නේ, හෙක්ටෙයාර 6යි කියලා. නමුත්, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් නිකුත් කරන වාර්තාවේ තිබෙනවා, හෙක්ටෙයාර 4,000ක් කියලා. හෙක්ටෙයාර 4,000ක් කියන්නේ අක්කර 10,000ක්. මේ ව්‍යාපෘති ක්‍රියාත්මක නොකරන්න ගන්න තීන්දුව වාගේම, මේ ඉඩම් පවරා ගන්න එක ව්‍යාපෘති වාර්තාවේ තිබෙනවාට වඩා 666 ගුණයක් වැඩියි, කෘෂිකර්ම ඇමතිතුමා ඉදිරිපත් කරන වාර්තාවේ සඳහන් පරිදි. ගරු අගමැතිතුමනි, මාතර දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි, මුළු රෝහණ දේශයටම බලපාන බරපතළ ප්‍රශ්නයක් මේ තුළ තිබෙනවා. ඒ නිසා මෙවැනි මොහොතක ගොවි පවුල් 30,000කගේ අක්කර 10,000ක් පවරා ගන්න යනවා කියන එක මේ ප්‍රශ්නයට කිසිසේත්ම සාධාරණ උත්තරයක් නොවෙයි. විපක්ෂ නායකතුමාත් යෝජනා කළා වාගේ මේ ඉඩම් පවරා ගන්නකොට ගෙවන්න යන වන්දිවලින් පුළුවන්, ගංගාවේ ඉහළ ජලාශ ටික නිර්මාණය කරන්න. එහෙම නැත්නම් හම්බන්තොටට ජලය ගෙන යෑම වැනි ව්‍යාපෘතිවලට මේ මුදල් පාවිච්චි කරන්න. ගරු අගමැතිතුමනි, එතකොට මේ ප්‍රශ්නය විසඳෙනවා.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා දැන් මේක විවාදයක් කර ගන්න එපා. පිළිතුරු දෙන වෙලාවට අපි ඒ ගැන බලමු. *[බාධා කිරීමක්]* නැහැ, ආණ්ඩු පාර්ශ්වයෙන් කියනවා, කාලය ගතවෙලා කියලා. ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් නේ මේ අහන්නේ. ඉතින්, ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්නයට උත්තර දෙන වෙලාවට ඔය කියන දේවල් ගැන බලමු. *[බාධා කිරීමක්]*

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පොඩ්ඩක් අවස්ථාව දෙන්නකෝ. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් මන්ත්‍රීවරු තුන්දෙනෙක් නැඟිටලා ඉන්නවා. *[බාධා කිරීමක්]* ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කෙටියෙන් කියන්න. ඔබතුමාට විනාඩියයි දෙන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් නිකුත් කළ මාධ්‍ය වාර්තාවත්, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා තමන් සභාපති කියලා තව කට්ටියක් පත් කරලා නිකුත් කළ ලිපිය වාගේම මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිවරයා විධියට ජනාධිපතිතුමාගේ අත්සනින් යුතුව ඉදිරිපත් කරන ලද ලිපියත් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා. මොකද, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිවරයා විධියට ජනාධිපතිවරයා තමයි එම යෝජනාව ගෙනෙන්නේ.

ඒකයි අතිශය භයානක. ඒ ලවණ බාධකය හැදුවේ තව අක්කර 5,000ක් වගා කරන්න පුළුවන් කියලා. දැන් මොකක්ද කරන්නේ? අක්කර 5,000ක වගා කරන්න පුළුවන් කියපු භූමියෙන් අක්කර 10,000ක් පවරා ගන්න යනවා. ඒක විකල්ප වගා සඳහා ලු. ලවණ බාධකය නිසා දැන් ඒ භූමිය යට වෙලා තිබෙන්නේ.

ගරු අගමැතිතුමනි, එහි විකල්ප භෝග විධියට, පන්, ජබර, සැල්වීනියා, ඕලු, නෙළුම්, මානෙල් හා කුමුදු වවන්න පුළුවන්. ඒ වාගේ දේවල් තමයි වවන්න වෙන්නේ. වෙන නම් වවන්න පුළුවන් දෙයක් නැහැ. එහෙම නැත්නම් ඊළඟ පියවර වන්නේ, මේක ගොඩ කරලා වෙන මොනයම් හෝ අලකළංචියකට ඒ භූමිය යොදා ගන්න එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අමුඩය ගහගෙන නිල්වලා ගං මිටියාවතේ තිබෙන කුඹුරු කොටපු ගොවියෙකුගේ මුණුබුරෙක් මම. මගේ සීයාගේ, මගේ තාත්තාගේ කුඹුරුවලට පින්සිද්ධ වෙන්න තමයි අද අපට මෙහෙම ජීවත් වෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්න වෙලාවක අපි ඔය ගැන කථා කරමු.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
නමුත් කැබිනට් මණ්ඩලය එය අනුමත කරලා තිබෙනවා. ඒ නිසා කරුණාකරලා එය අකුළා ගන්න ඕනෑ කියා මම කියනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සඳහා විශේෂ කාරක සභාවක් පත් කරලා තිබියදී මෙහෙම තීන්දු ගන්න බැහැ. එහෙම නම් මොකටද කාරක සභාවක්? කාරක සභාව මේ ගැන වාර්තාව දෙන කල් කරුණාකරලා මේ සෙල්ලම නවත්වන්න. ගරු කථානායකතුමාත් එක්ක කථා කරලා, ඔබතුමා ඒ ගැන තීන්දුවක් ලබා දෙන්න. අපි කාරක සභාවෙන් ඒ ගැන තීන්දුවක් ගනිමු; විශේෂ කාරක සභාවෙන් තීන්දුව ගනිමු. ඒ වනතුරු එක එක අමාත්‍යාංශවලට, එක එක්කෙනාට ඕනෑ විධියට තීන්දු ගන්න එපා කියන එකයි අපි කියන්නේ.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමා ඉදිරිපත් කරන කාරණයත් විනාඩියෙන් කියන්න.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පසුගිය කාලය පුරාවටම මේ ප්‍රශ්නය අපි පාර්ලිමේන්තුවේදී කථා කළා. අපි කිව්වා, ඒ ලවණ බාධකය නිසා ගංවතුර ප්‍රශ්නය ඇති වනවා කියලා. නිලධාරීන් හතර අතේ දිවුර දිවුරා කිව්වා, එහෙම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ කියලා. දැන් රජයේ නිලධාරීන්ම පිළිගෙන තිබෙනවා, ලවණ බාධකය නිසා හෙක්ටෙයාර 4,000ක් -අක්කර 10,000ක්- යට වනවා කියලා. ඒ වෙනුවෙන් ගත්ත තකතීරු තීන්දුව මොකක්ද? ඒ ලවණ බාධකය සම්බන්ධයෙන් තිබෙන බාධක ඉවත් කරන එක නොවෙයි කරන්නේ. කුඹුරු ගොවීන් -පවුල් දහ පහළොස්දාහක්- එම භූමියෙන් අයින් කරලා, අක්කර 10,000ක් අත්පත් කර ගන්න හදන එකයි මේ කරන්නේ. හැබැයි, එම ඉඩම්වලට කරන දෙයක් ගැනවත්, ගොවීන් ගැනවත් කිසි දෙයක් සඳහන් වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම ගෞරවයෙන් මා මේ කාරණය කියනවා. පාර්ලිමේන්තුවේදී අපි දිගින් දිගටම කිව්වා, මෙය විශේෂයෙන්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරීන් කරපු තක්කඩි, අමන හා තකතීරු වැඩක් කියලා. ඒක නිවැරදි කරන්න කියලා අපි දිගින් දිගටම කිව්වා. දැන් ඒ වෙනුවෙන් විශේෂ කාරක සභාවකුත් පත් කර තිබෙනවා. එම වරද දැන් පිළිගෙන තිබෙනවා. මිනිසුන් පීඩාවට පත් කරපු, එම ප්‍රදේශය ගංවතුරට යට වන ආකාරයට කටයුතු කරපු, අහිංසක මිනිසුන්ගේ ජීවිත සදාකාලික අනතුරට දමපු ඒ නිලධාරීන්ට දඬුවම් දෙන්න ඒ කැබිනට් පත්‍රිකාව ප්‍රමාණවත්. ඒ දඬුවම දෙන්න ඕනෑ එම තකතීරු තීන්දුව ගත්ත නිලධාරීන්ට මිසක් අහිංසක ගොවි පවුල් දහ පහළොස්දාහකට නොවෙයි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු අගමැතිතුමනි, ගරු ඇමතිතුමනි, එම නිසා ඒ යෝජනාවට අත ඔසවන්න එපා. එම Cabinet Paper එක ජනාධිපතිතුමා අත්සන් කරලා තිබෙනවා කියලා ආරංචියි. එය ඇත්තද කියන්න මා දන්නේ නැහැ. මේ ගැන අමාත්‍යාංශයිය උපදේශක කාරක සභාවේදී අහනකොට ඇමතිතුමාවත් දැනගෙන හිටියේ නැහැ. හැබැයි, මහින්ද අමරවීර ඇමතිතුමා, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා කියන ඕනෑම දෙයකට අත ඔසවන වෙලාවක් මේක. එම නිසා මහින්ද අමරවීර ඇමතිතුමාටත් කියනවා, ඒ තකතීරු Cabinet Paper එකට පක්ෂව අත ඔසවලා, ගොවි පවුල් දහ පහළොස්දාහක් වළ පල්ලට ගෙන යන මේ කටයුත්තට මැදිහත් වන්න එපා කියලා. ඒ ලවණ බාධකය නිසා ඇති වෙච්ච හානිය නිවැරදි කරන්න වහාම රජය මැදිහත් වී කටයුතු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම මා කරනවා.

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා විසින් සභාගත කළ කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය නිකුත් කළ මාධ්‍ය වාර්තාව මමත් මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සඳහා මැදිහත් වෙන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දොලවත්ත මන්ත්‍රීතුමාටත් කියන්න තිබෙන්නේ මාතර තිබෙන ඒ ප්‍රශ්නය ගැනමද?

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
නැහැ, මාතර ප්‍රශ්නය ගැන නොවෙයි. විපක්ෂ නායකතුමා මේ ගරු සභාවේ ඉන්න නිසා,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවස්ථාව දෙන්න බැහැ. වෙනත් ප්‍රශ්නවලට කාලය දෙන්න පුළුවන්කමක් නැහැ. අපි න්‍යාය පත්‍රයේ කටයුතුවලට යන්න ඕනෑ. අද දින ප්‍රධාන කටයුතු අවසන් කරලා, ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ස්ථාවර නියෝග 27 (2) යටතේ දෙවන ප්‍රශ්නය, ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පාර්ලිමේන්තු රැස්වීම් සතිය මේ රටට ඉතාම වැදගත් සතියක් හැටියට අපට සලකන්න පුළුවන්. මේ සතිය තුළ අපි ගන්න දේශපාලන තීන්දුව රටේ අනාගතයට ඉතාම තීරණාත්මකව,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ස්වාමීන් වහන්ස, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කළා නම් හොඳයි. වෙන කථාවක් කරන්න එපා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මම ස්ථාවර නියෝග 27 (2) ප්‍රශ්නය යටතේ හැඳින්වීමක් ලියා තිබෙනවා. ඒක තමයි මේ කියවන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ඒ සඳහා වැඩි කාලයක් ගන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සියලුදෙනා කාලය ගැන සැලකිලිමත් වෙලා කටයුතු කරමු. අපටත් ගොඩක් කථා කියන්න පුළුවන්. නමුත්, ඔබවහන්සේ දැන් ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නකෝ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ප්‍රශ්නය තමයි ඉදිරිපත් කරන්න හදන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙනම් ඉදිරිපත් කරන්න.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ඒ ගැන පාර්ලිමේන්තුව ගන්න යන තීන්දුව කොයි වාගේද කියන එක ඉතා වැදගත්. ජනාධිපතිවරයා පත් කරලා තිබෙන්නේ මහ ජනයා නොවෙයි, පාර්ලිමේන්තුව. ඒ නිසා විපක්ෂයේ සිටින, ආණ්ඩු පක්ෂයේ සිටින සියලු මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවා. විශේෂයෙන්ම රටක ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වුවහොත් එය විශාල බේදවාචකයක් බවට පත් වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ස්වාමීන් වහන්ස, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් නොකර ඔබවහන්සේ කථාවක් නේ කරන්නේ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
නැහැ, කථාවක් නොවෙයි. මම ඉදිරිපත් කරපු ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය තමයි මේ කියවන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබවහන්සේ කියන වචනයක් වචනයක් පාසා මම අහගෙන හිටියා. නමුත්, ඔබවහන්සේ කියන ඒවා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයේ නැහැ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ඔබතුමා මා ලබා දුන් ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය දෙස බලාගෙන ඉන්න. එතකොට හරි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මම ඒ ප්‍රශ්නය දෙස තමයි බලාගෙන ඉන්නේ. ඔබවහන්සේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

II

ජනාධිපතිවරණය නියමිත දිනට පැවැත්වීම
சனாதிபதித் தேர்தலை உரிய தினத்தில் நடாத்துதல்
HOLDING OF PRESIDENTIAL ELECTION ON DUE DATE

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

දැනට රටේ විශාල දේශපාලන ව්‍යාකූලත්වයක් ඇති වෙලා තිබෙනවා. ජනාධිපතිවරණය පවත්වන්නේද, නැද්ද යන්න පිළිබඳ විශාල සැක මතු වෙලා තිබෙනවා. මෙවැනි වාතාවරණයක් තුළ විශේෂයෙන්ම යම්කිසි රටක ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වුවහොත් එය විශාල බෙදවාචකයක් බවට පත් වෙනවා. 1977 දී බලයට පත් රජය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කළා. එය සාධාරණ පදනමක් මත සිදුවූයේ යැයි කවුරුවත් පිළිගනු ඇතැයි මම විශ්වාස කරන්නේ නැහැ. එය අසාධාරණ සිදුවීමක් කියලා අපි කවුරුත් දන්නවා. එය දේශපාලන ප්‍රතිවාදියා සිරකර තැබීමක් බව දේශපාලන ක්ෂේත්‍රයේ සැවොම පිළිගන්නා කාරණයක්.

එසේම පළමු විධායක ජනාධිපතිවරයා පත් වූයේ ව්‍යවස්ථා සංශෝධනයකින් මිස මහජන ඡන්දයකින් නොවේ. ඒ වාගේම එදා පවත්නා මැතිවරණ ක්‍රමයට අනුව හයෙන් පහක බලයක් ලබා ගත්තා. එවිට විධායක ජනාධිපති ධුරය සහ හයෙන් පහක බලය කියන්නේ කිසිම ප්‍රජාතන්ත්‍රවාදයක් පවත්වාගෙන යාහැකි සංවාදයකට ඉඩක් නැති තත්ත්වයක් නිර්මාණය වීමක්. මෙය ඇහිරීම පමණක් නොවෙයි, දේශපාලන පක්ෂ තහනම් කිරීමත්, ප්‍රජා අයිතිය අහෝසි කිරීමත් යන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම සියල්ලම අහෝසි කිරීමක්.

මෙහි ප්‍රතිඵලයක් ලෙස ජනතා විමුක්ති පෙරමුණට එදා මේ රටේ විශාල කැරැල්ලක් ඇති කරන්නට හැකියාව ලැබුණා. ඉන්දු-ලංකා ගිවිසුම පදනම් කරගෙන ඇති වූ ඒ කැරැල්ලේදී ජනතාව 64,000ක් පමණ මිය ගිය බව විශ්වාස කරනවා. ඒ කැරැල්ල පිළිබඳ සොයා බැලීමට පත් කරන ලද කොමිෂන් සභාව ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා, තරුණ අසහනයත්, ප්‍රජාතන්ත්‍රවාදී වටපිටාව පුළුල් නොවීමත් මෙයට හේතු වූ බව. එවැනි වාතාවරණයක් තුළ දැනට පළාත් සභා මැතිවරණය පැවැත්වීම නවතා තිබෙනවා. ඒ අනුව පළාත් සභා අවශ්‍යද, නැද්ද යන ප්‍රශ්නය මේ වනවිට පැන නැඟී තිබෙනවා. පළාත් සභා මැතිවරණය නවතා දැමුවේ ඡන්ද ක්‍රමය වෙනස් කිරීමට අවශ්‍ය බව පවසයි. නමුත් ජනාධිපතිවරයාගේ - එවකට අගමැතිවරයාගේ - අභිලාෂයට තමයි මේ පළාත් සභා ක්‍රමය කල් දැමුවේ. එහෙත් අද වනතුරු ඒ පිළිබඳ කිසිම සාකච්ඡාවක් සිදුවී නැහැ. ජනාධිපතිවරයා පත් කරන ආණ්ඩුකාරවරයෙකු යටතේ දැනට පළාත් සභා පවත්වාගෙන යනු ලබනවා.

ඊළඟට, පළාත් පාලන මැතිවරණයත් කල් දැම්මා, රටේ ආර්ථික ප්‍රශ්නයක් තිබෙනවා, සල්ලි නැහැ කියන ප්‍රශ්නය මුල් කරගෙන. දැන් ජනාධිපතිවරයා නිතරම කියනවා, ආර්ථික ප්‍රශ්නයක් නිසා මැතිවරණය කල් දැමීමට සිදුවූ බව. එසේ නම් පළාත් සභා මැතිවරණය කල් දැම්මෙත් ආර්ථික ප්‍රශ්නයක් නිසාද කියලා ජනාධිපතිවරයාගෙන් අහන්න වෙනවා. රටක සීමා නිර්ණයට මෙච්චර කාලයක් ගන්නවාද?

මීළඟ ප්‍රශ්නය තමයි, ජනාධිපතිවරණය පිළිබඳ අවිශ්වාසයක් දැන් රටේ පැන නැඟී තිබීම. ආණ්ඩුව නිශ්චිතව,- *[බාධා කිරීමක්]* විශ්වාසයක් තිබෙනවා නම් ජනාධිපතිවරණය පවත්වා එය දිනාගන්න. ආණ්ඩුව මේ අවස්ථාවේදී නිශ්චිතවම රටට ප්‍රකාශ කර සිටිය යුතුයි, ජනාධිපතිවරණය පවත්වන්නේද, නැද්ද යන වග.

විශේෂයෙන් අධිකරණ ඇමතිවරයාගේ අනුකූලතාවකින් තොරව ජනාධිපතිවරයාගේ අභිමතය මත ව්‍යවස්ථා සංශෝධනයකට අදාළ ගැසට් පත්‍රය නිකුත් කරලා තිබෙනවා. ඒ, විශේෂයෙන් 83 (ආ) වගන්තිය සංශෝධනයට අදාළව. ඒ අනුව,

01. මෙම වසරේදී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය නියමිත දිනට පවත්වන්නේද, නැද්ද යන්න පිළිබඳ ජනාධිපතිවරයා පත් කළ මේ ආණ්ඩුව ප්‍රකාශ කර සිටින්නේ කුමක්ද? එය කල් දමන්නේද?
02. යම් හෙයකින් ජනාධිපතිවරණය කල් දැමුවහොත් මහ මැතිවරණය පවත්වන්නේද?
03. ජනාධිපතිවරණය පවත්වන්නේද, නැද්ද යන්න පිළිබඳ මේ ගරු සභාවේ ආණ්ඩු පක්ෂයේ මතය කුමක්ද?
04. ආණ්ඩුව කියන විධියට රටේ ආර්ථිකය ස්ථාවර නම් පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට නොහැකි ඇයි?

මෙම කාරණා පිළිබඳව ගරු සභාව දැනුවත් කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමතියි. මේක අවසාන පාර්ලිමේන්තු සතිය වෙන්නත් පුළුවන්. ලේ විලකට අත්තිවාරම,- *[බාධා කිරීමක්]* පාර්ලිමේන්තුව පවත්වයි. ජනාධිපතිවරණය පවත්වනවාද, නැද්ද කියන,- *[බාධා කිරීමක්]* රට කැරැල්ලකට ගියොත් පාර්ලිමේන්තුව,- *[බාධා කිරීමක්]* රටම කැරැල්ලකට යන,- *[බාධා කිරීමක්]* මේක ඔබතුමන්ලාට ප්‍රශ්නයක් නොවෙන්න පුළුවන්. මේ ගන්න යන්නේ 1983දී ගත්ත තීන්දුව. ජනාධිපතිවරණය පවත්වනවාද නැද්ද කියලා නිශ්චිතව උත්තරයක් දෙන්න.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැකලා තිබෙනවා, රතන හාමුදුරුවන් හැම දාම බිල්ලෝ මවනවා. රජය විධියට ඉතාම පැහැදිලිව මා මේ ගරු සභාවේදී කියන්න ඕනෑ, පාර්ලිමේන්තු මැතිවරණයක් තියන්නේ නැහැ කියන එක. ඒ බව ඊයේ ජනාධිපතිතුමාත් කිව්වා. ජනාධිපතිවරණය අනිවාර්යයෙන් නියමිත කාලයට පැවැත්වෙනවා. ඒ නිසා, බොරු බිල්ලෝ මවන්න ඕනෑ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා නේ, පාස්කු ප්‍රහාරය පැවති කාලයේ මේ රට ගිනි තියන්න මාරාන්තික උපවාස කළ බව. පාර්ලිමේන්තු මැතිවරණය තියන්නේ නැහැ. ජනාධිපතිවරණය නියමිත කාලයට තිබෙනවා. ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදීව තමන් කැමති ජනාධිපති තෝරා ගන්න අවස්ථාව ලබා දෙනවා කියන එක ඉතාම පැහැදිලිව රජය වෙනුවෙන් අපි කියා සිටිනවා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(මාණ්පුමිකු (වණ.) අත්තුරලියේ රතන තේරර්)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
අපේ හාමුදුරුවනේ, ඔබවහන්සේගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(මාණ්පුමිකු (වණ.) අත්තුරලියේ රතන තේරර්)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඇහුවේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නයක්. ජනාධිපතිවරණය පවත්වනවාද නැද්ද, මහ මැතිවරණය පවත්වනවාද නැද්ද කියන ප්‍රශ්නය තමයි මම ආණ්ඩුවෙන් ඇහුවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු ස්වාමීන් වහන්සේ, ගරු රාජ්‍ය ඇමතිතුමා දැන් ඒකට පිළිතුරු දෙනවා.

ගරු ජානක වක්කුඹුර මහතා
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමා වෙනුවෙන් මම අතුරලියේ ගරු රතන ස්වාමීන්වහන්සේගේ,- *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.*[බාධා කිරීම්]*

ගරු ජානක වක්කුඹුර මහතා
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)
ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමනි, මම උත්තරයක් දෙන්නයි හදන්නේ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
නිශ්ශබ්ද වෙන්න, ගරු රාජ්‍ය ඇමතිතුමා පිළිතුර දෙන්නයි හදන්නේ.

ගරු ජානක වක්කුඹුර මහතා
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට පැහැදිලිව-*[බාධා කිරීම්]* අපේ හාමුදුරුවනේ අහගන්නකෝ. මම උත්තරය දෙන්න හදන්නේ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමා, ඔබතුමා පිළිතුරු දෙන්න. *[බාධා කිරීම්]* නිශ්ශබ්ද වෙන්න.

ගරු ජානක වක්කුඹුර මහතා
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ හාමුදුරුවෝ අහපු ප්‍රශ්නයට මම කෙටියෙන්ම උත්තරයක් දෙනවා. රජය මේ මැතිවරණය පවත්වන්න කිසිම බාධාවක් කරන්නේ නැහැ. නියත වශයෙන්ම ජනාධිපතිවරණය පවත්වනවා. මැතිවරණ කොමසාරිස්තුමා කියා තිබෙනවා, මේ සතියේ නිවේදනය නිකුත් කරනවා කියලා. 17වෙනි දා සිට මැතිවරණ කොමිසමට ඒ බලය ලැබිලා තිබෙනවා. ඒක නවත්වන්න කාටවත් බැහැ. අපි රජයක් හැටියට නවත්වන්නෙත් නැහැ. අවශ්‍ය සල්ලිත් දීලා තිබෙනවා. ඒ නිසා ඔබවහන්සේගේ ප්‍රශ්නයට කෙටියෙන්ම උත්තරය රජයක් හැටියට ප්‍රකාශයට පත් කරනවා. ජනාධිපතිවරණය ළඟම දිනකදී පවත්වන්නත් මැතිවරණ කොමිසම කටයුතු කරයි.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(මාණ්පුමිකු (වණ.) අත්තුරලියේ රතන තේරර්)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
බොහොම ස්තුතියි.

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි පිරේම්නාත් සි. තොලවත්ත)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු ප්‍රේමිනාත් සී. දොලවත්ත මැතිතුමා.

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි පිරේම්නාත් සි. තොලවත්ත)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා වැදගත් ප්‍රශ්නයක් මතු කළා. ඒකට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මාධ්‍ය නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා.

ගරු ජානක වක්කුඹුර මහතා
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)
නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු රාජ්‍ය ඇමතිතුමා.

ගරු ජානක වක්කුඹුර මහතා
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ස්වාමීන්වහන්සේ ස්ථාවර නියෝග 27(2) යටතේ අහපු ප්‍රශ්න දෙකක් තිබෙනවා.

[ගරු ජානක වක්කුඹුර මහතා]

එකක්, පාර්ලිමේන්තුව විසුරුවනවාද කියන එක. එහෙම විසුරුවන්නට අවශ්‍යතාවක් නැහැ. ලබන අවුරුද්දේ අගෝස්තු මාසයේ 20වෙනි දා වෙනතුරු පාර්ලිමේන්තුවේ කාලය තිබෙනවා. ඉතින් ජනාධිපතිවරණයෙන් පසුව අපේ වර්තමාන ජනාධිපතිතුමාට හෝ කාට හෝ ඕනෑ නම් පාර්ලිමේන්තුව විසිරවීමේ බලය තිබෙනවා. එහෙම විසුරුවන්න අපේ අදහසක් නැහැ. පළාත් සභා මැතිවරණයට වෙච්ච දේ ගරු ස්වාමීන් වහන්සේත් දන්නවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැන් ප්‍රශ්නයක් තිබෙනවා, ඒ පනත සම්බන්ධ කාරණයේදී. මට මතක හැටියට ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා, පරණ ක්‍රමයට මැතිවරණය පවත්වන්න ඕනෑ කියලා. ඒ යෝජනාව ආවාම විපක්ෂ නායකතුමා, අපිත් සහයෝගය දෙන්නයි ඉන්නේ පරණ ක්‍රමයටම ඒ ඡන්දය තියන්න. *[බාධා කිරීම්]* ඔව්. පළාත් පාලන මැතිවරණය සම්බන්ධයෙන් අධිකරණයේ නඩු හතරක් තිබෙනවා. ඉතාම කෙටි කාලයක් ඇතුළත ඒ තීන්දුව ලබා දෙයි. ඒ තීන්දුව ආවාට පසුව ඒ තීන්දුවට ගරු කරලා කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අමාත්‍යාංශ නිවේදන, ගරු ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා.

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මැතිතුමා, මොකක්ද ඔබතුමාගේ රීති ප්‍රශ්නය?

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මාධ්‍ය නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා,- *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, අධ්‍යාපන ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. ඒ නිසා කාලය නාස්ති කරන්න එපා.

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු විපක්ෂ නායකතුමා කියපු කාරණයට උත්තරය මේ දෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ සභාව නිවැරදි කරන්නයි මේ හදන්නේ. *[බාධා කිරීමක්]* ඇයි මේ? මම කිසි වේලාවක බාධා කරන්නේ නැහැ. සෞන්දර්ය විෂයය,- *[බාධා කිරීමක්]* ඇමතිතුමා තමයි එවලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමා බාධා කරන්න එපා.

2024 07.16වෙනි දා නිකුත් කළ මාධ්‍ය නිවේදනයේ පැහැදිලිව කියනවා, සෞන්දර්ය විෂයය ඉවත් කරන්නේ නැහැ කියලා. මේ, 2024 07.16වෙනි දා නිකුත් කළ මාධ්‍ය නිවේදනය, අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. *[බාධා කිරීමක්]* ඔබතුමා නිකම් බාධා කරන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක එසේ වෙනවා නම් හොඳයි.

අමාත්‍යාංශ නිවේදන, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයාට මරණ තර්ජන එල්ල කිරීම: ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபன தலைவருக்கு உயிர் அச்சுறுத்தல் விடுத்தல்: வெகுசன ஊடக அமைச்சரினது கூற்று

DEATH THREATS TO CHAIRMAN OF SRI LANKA BROADCASTING CORPORATION: STATEMENT BY MINISTER OF MASS MEDIA

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති හඬිසන් සමරසිංහ මහතා ඉලක්ක කරගෙන ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික හා ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික වසන්ත සමරසිංහ එල්ල කළ මරණ තර්ජනයක් හේතුකොටගෙන ගුවන් විදුලි සංස්ථා සභාපතිවරයාගේ ජීවිතාරක්ෂාවට බරපතළ තර්ජනයක් එල්ල වී තිබේ. වසන්ත සමරසිංහ එල්ල කළ මරණ තර්ජනය සමාජ මාධ්‍යවල ප්‍රචාරය වෙමින් පවතින අතර එහි අන්තර්ගතය තුළ හඬිසන් සමරසිංහ මහතාගේ ජීවිතය විශාල අනතුරකට ලක්ව ඇත. ඡන්දයෙන් මෙම ගනුදෙනුව බේරාගන්නා බවත්, රට පනින්නට නොදෙන බවත්, හැංගෙන්නට ඉඩක් නොලැබෙන බව මෙන්ම, රට පැන්නත් එම රටවල වැඩිපුර සිටින්නේ මාලිමාවේ මිනිසුන් බවත් වසන්ත සමරසිංහ සිය ප්‍රකාශනය මඟින් සඳහන් කරයි. නීතිය ඉදිරියේදී ගැලවීමක් නොමැති බව එහිදී සඳහන් කරන වසන්ත සමරසිංහ ලෝකයේම ඉන්නා ලාංකිකයන් මාලිමාව සමඟ අත්වැල් බැඳගෙන සිටින බවත්, හඬිඩලාට නවතින්නට වෙන්නේ හඳේ තමයි යනුවෙන්ද එහිදී තර්ජනාත්මකව සඳහන් කරයි.

මෙරට ප්‍රවීණතම විද්‍යුත් මාධ්‍ය සන්නිවේදකයෙකු වන හඬිසන් සමරසිංහ මහතා ප්‍රවීණ මාධ්‍ය පරිපාලකවරයෙකුද වේ. නිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන ඔහු ගුවන් විදුලියේ සභාපති පදවිය දරන්නේ හයවෙනි වතාවටය.

අපේ රට තුළ අපි කුමන දේශපාලන පක්ෂයකට අයිති වුණත්, කුමන විධියට වාද විවාද කර ගත්තත් මාධ්‍ය විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් මම කියන්න කැමැතියි, මාධ්‍යකරුවන්ට නියම් ආකාරයෙන් හෝ අනියම් ආකාරයෙන් තර්ජනය කිරීම අපි හෙළා දකින බව. මක්නිසාදයත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවුරුත් දන්නා අතීත ක්‍රියාකාරීත්වය තුළ අපේ රටේ මාධ්‍යවේදීන් විවිධ තර්ජන, ගර්ජනවලට මුහුණ දී තිබෙනවා. පක්ෂ-විපක්ෂ වශයෙන් කුමන මතවාදය දැරුවත් ජනාධිපතිවරණයක් පැවැත්වෙන අවස්ථාවේදී කවර ආකාරයට

විවේචන එල්ල වුණත් ඒවා දරා ගැනීමේ ශක්තියක් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ව්‍යුහය තුළ සිටින නායකකාරකාදීන්ට තිබෙනවා.

ජනතා විමුක්ති පෙරමුණේ ඉතිහාසය එසේ නොවෙයි. අපි බොහෝ කලක් යකඩ ගැටෙන අමිහිරි ශබ්දය, උණ්ඩයේ අමිහිරි සුවඳ, දුක, වේදනාව, මර ළතෝනිය පිළිබඳ අත්දැකීම් රාශියක් ලබා තිබෙන රටක්. මීට වර්ෂ දෙකකට පමණ පෙර මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ ගරු මන්ත්‍රීවරයෙක් මහ පාරේදී තළා පෙළා, ඉතාම තිරශ්චීන ලෙස මරා දැම්මා. පැය 12ක් ඇතුළත මේ ගරු සභාව නියෝජනය කරන මැති-ඇමතිවරුන් 72දෙනෙකුගේ ගෙවල් ගිනිබත් කරලා, උන් හිටි තැන් නැති කළා. මහජන නියෝජිතයන් 800දෙනෙකුට පමණ ඉතා විශාල -දැවැන්ත - ප්‍රහාරයක් එල්ල කළා. ව්‍යවස්ථාදායකය -නීති හදන තැන- නියෝජනය කරන මන්ත්‍රීවරුන් 72දෙනෙකුට පැය 12ක් ඇතුළත උන් හිටි තැන් අහිමි කළ රටක් ලෝක ඉතිහාසයේත් නැහැ.

ඉදිරියේදී පැවැත්වෙන ජනාධිපතිවරණයේදී, අනිවාර්යයෙන් පැවැත්වෙන ජනාධිපතිවරණයේදී, නියත වශයෙන්ම ඔක්තෝබර් 17වැනි දාට පෙර ජනාධිපතිවරයෙක් පත්කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පාදනය ඇතුළු සියලු කටයුතු අවසන් කර තිබෙන තත්ත්වයක් තුළ, ඉතාම සාමකාමී, සහජීවනයෙන් යුත් මැතිවරණයක් පැවැත්වීම සඳහා -තර්ජන කිරීම්, ගර්ජන කිරීම් නොකර- කටයුතු කරන ලෙස අපි ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු සියලු දේශපාලන පක්ෂවලින් ඉල්ලා සිටින්නට කැමැතියි. යම්කිසි මාධ්‍යකරුවෙකුට තර්ජනයක් තිබෙනවා නම්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඒ සම්බන්ධ පැමිණිල්ලක් කළ විට රජය වශයෙන් අපි ඔවුන්ට අවශ්‍ය ආරක්ෂාව ලබා දීම සඳහා කටයුතු කරනවා. ඒ නිසා ප්‍රචණ්ඩත්වයෙන් තොර ජනාධිපතිවරණයක් පැවැත්වීම සඳහා සියලුදෙනා එකතු වෙලා වැඩ කරන්නටය කියන ආරාධනය කරමින් මගේ ප්‍රකාශය අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න ඉස්සෙල්ලා, පැහැදිලි කිරීමක් සඳහා මට මිනිත්තුවක කාලයක් ලබා දෙන්න.

අද විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ ඇසූ ප්‍රශ්නයට අදාළ නොවුණත්, විශේෂයෙන්ම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සම්බන්ධයෙන් මේ රජය අනුගමනය කරන ක්‍රියාමාර්ගය පිළිබඳව එතුමා ප්‍රශ්නයක් මතු කළා.

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් valuations දෙකක් ගැනෙනවා. එහිදී transaction adviser හැටියට IFC එකත්, ඊළඟට ස්වාධීනව රජයේ ප්‍රධාන තක්සේරුකරුත් -Government Chief Valuerත්- valuations දෙකක් දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම valuations දෙකේ කටයුතු තවම අවසන් වෙලා නැහැ. ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු වේවි. අනෙක, bid එක call කරලා ඉවර වෙනකම් එම valuations එළියට ලබා දීමක් සිදු වෙන්නේත් නැහැ. මොකද, එහෙම වුණොත් ඒ හේතුව නිසා bid කරන අයට කිසියම් වාසියක් ලැබීමටත්, රටක් හැටියට ඒකෙන් අසාධාරණයක් වෙන්නත් තිබෙන ඉඩ වැඩි නිසා. ඒ නිසා මම හිතනවා, bid එකක් call කර තිබෙන වෙලාවක, valuations කරගෙන යන වෙලාවක, ඒ සම්බන්ධයෙන් final agreement එකක් ඇවිත් නැති වෙලාවක, එහෙම සිදු වෙලා කියලා මේ සභාවට ප්‍රකාශ කරලා, රටට ප්‍රකාශ කිරීම සාධාරණ නැහැ කියලා. මොකද, එම ක්‍රියාවලිය තවම සිදු වෙමින් පවතින නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැන් වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්නම්. ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා, ඒ සඳහා අවස්ථාව ලබා දීම වෙනුවෙන්.

වරප්‍රසාද: 2024.07.12 දින ඉදිරිපත් කරන ලද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

சிறப்புரிமை: 2024.07.12ஆம் திகதி சமர்ப்பிக்கப்பட்ட அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

PRIVILEGE: REPORT OF COMMITTEE ON PUBLIC FINANCE PRESENTED ON 12.07.2024

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024.07.12වන දින පාර්ලිමේන්තුවේදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හර්ෂ ද සිල්වා මහතා විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මඟින් වීසා නිකුත් කිරීමට ගාස්තු අය කිරීම හා සම්බන්ධයෙන් වන වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

එකී වාර්තාව මඟින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මඟින් විදේශිකයන් වෙත වීසා නිකුත් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සම්බන්ධ නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර තිබූ අතර, එකී නිර්දේශ මුදල් කාරක සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලද බව වාර්තාවේ සඳහන් කර ඇත. මෙකී කාරක සභාවේ ආණ්ඩු පක්ෂ, විපක්ෂ සාමාජිකයන් 27 දෙනෙකු පමණ සිටින අතර, ඒ අතුරින් මා ද ඇතුළත්ව කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන් බහුතරයක් ලෙස 16 දෙනෙකුගේ පමණ අත්සන් කර ලිඛිතව ඔබතුමා වෙත දැනුම් දෙන ලද්දේ සභාපතිවරයා විසින් කරන ලද නිර්දේශවලට අප එකඟ නොවන බවයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එකී ලිපියෙහි පිටපතක් මා **සභාගත*** කරන්න කැමතියි.

ඒ අනුව, 2024.07.12වන දින කාරක සභාවේ සභාපති ගරු හර්ෂ ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සම්පූර්ණයෙන්ම අසත්‍ය සහ දෝෂ සහිත වාර්තාවක් වේ. එබැවින්, 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ "අ" කොටසේ දැක්වෙන ශ්‍රේෂ්ඨාධිකරණය විසින්ම දඬුවම් කළ හැකි වැරදි අතුරින් 4වන වැරැද්ද වන "පාර්ලිමේන්තුව හෝ යම් කාරක සභාවක් රැවටීමේ අදහසින් පාර්ලිමේන්තුව වෙත හෝ යම් කාරක සභාවක් වෙත ව්‍යාජ, අසත්‍ය හේතු හෝ වරදවා පෙන්වූ ලේඛනයක් ඉදිරිපත් කිරීම" යන වැරැද්ද මෙහිදී සිදු වී ඇති බව මාගේ විශ්වාසයයි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

එම නිසා මුදල් කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හර්ෂ ද සිල්වා මහතා විසින් 2024.07.12වන දින ඉදිරිපත් කරන ලද අසත්‍ය සහ ව්‍යාජ වාර්තාව මඟින් එකී කාරක සභාවේ සාමාජික මා ඇතුළු බහුතරයකගේ පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ වී ඇති බව පෙනී යයි. මෙකී වරප්‍රසාද කඩවීම ප්‍රමුඛතම කාරණයක් සේ සලකා මෙම කාරණය පාර්ලිමේන්තුවේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලෙසත් ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු කරන්නම්, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා හිරේ දමන්න දැන් උත්සාහ කරනවා, හිරේ දමන්න වරදක් මා කළා කියලා. මේක ලොකු චෝදනාවක්. ඒ නිසා මම මේ ගැන එක දෙයක් කියන්නම්. ඒ තමයි, මේ කරපු සියලු චෝදනා එක්ව හා වෙන් වෙන් වශයෙන් මා විසින් තරයේ ප්‍රතික්ෂේප කරනවා කියන එක. එක්ව සහ වෙන් වෙන් වශයෙන්! මා පාර්ලිමේන්තුව නොමඟ යැව්වා කියලා මා හිරේ දාන්න උත්සාහ කරනවා නම්, ඒ ඉදිරිපත් කරපු එක මට ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එය අධ්‍යයනය කරලා ඊට අදාළ සියලු කාරණා මම ඉදිරිපත් කරන්නම්. මම දැන් කිව්වා නේ, මේ සියලු චෝදනා එක්ව සහ වෙන් වෙන්ව ප්‍රතික්ෂේප කරනවා කියලා. මොකද, මේ පළමුවැනි වතාව නොවෙයි, මා කාරක සභාවෙන් ඉවත් කිරීමට කටයුතු කරන. මම ගල්අඟුරු පිළිබඳ වාර්තාව ඉදිරිපත් කළ විටත් මේ වාගේ දේවල් කරලා මාව ඉවත් කළා. ඒ නිසා මට මේක අලුත් දෙයක් නොවෙයි.

මම විපක්ෂයේ ඉඳලා මේ කාර්යභාරය කරන්නේ බොහොම අමාරුවෙන්. මගේ කාරක සභාවේ ඉන්න සාමාජික මන්ත්‍රීවරු ඒක දන්නවා. මා හිතන විධියට, ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමාත් ඒක දන්නවා. වාර්තාවක් ඉදිරිපත් කළා කියලා මා දේශපාලනිකව මේ විධියට හිරේ දමන්න හදනවා නම්- *[බාධා කිරීමක්]*

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
පොඩ්ඩක් ඉන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඔබතුමා කථා කරන විට මම වචනයක්වත් කථා කළේ නැහැ නේ. ඒ නිසා මටත් අවස්ථාව දෙන්න. මම බොහොම සාධාරණයි ඒ සියලු දේ කළේ. මේ මන්ත්‍රීතුමන්ලාට සති තුනක කාලයක් තිබුණා. ඒක මම හොරෙන් කරපු එකක් නොවෙයි; හංගලා කරපු එකක් නොවෙයි. සති තුනක් තිබුණා. ඔවුන් ඉදිරිපත් කරපු සියලු වාර්තා මේකට ඇඳා තිබෙනවා. මේකට හේතු වුණේ මොකක්ද කියා මම දන්නවා. මම ඒ ගැන මෙතැන දීර්ඝව කථා කරන්නේ නැහැ. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු, සංචාරක ක්ෂේත්‍රයට අදාළ ඉලක්කම් සම්බන්ධ ව්‍යාකූල තත්ත්වයක් ඇති වුණා.

එතකොට ගරු වජිර අබේවර්ධන මැතිතුමා කිව්වා, "ටිරාන් අලස් ඇමතිතුමාගේ කාර්යාලයෙන් ඒකට නිවැරදි කිරීමක් එවනවා. ඒක ඇතුළත් කරන්න" කියලා. ඒක තමයි ඔය කියන වාර්තාව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම වාර්තාවට ඒක ඇතුළත් කරලා තිබෙනවා. ඊට පස්සේ තවත් කරන්න දෙයක් නැහැ, ගරු අගමැතිතුමනි. මම විපක්ෂයේ ඉඳගෙන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් කළ යුතු සියලු දේ කළා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තනියම ද කළේ?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
නැහැ. මම තනියම කළේ නැහැ, කිසි දෙයක්. සියලු සාමාජික මන්ත්‍රීවරුන් එක්කයි කළේ. එතකොට මා හිරේ දමන වරදක් කළා කියලා, මා හිරේ දමන්න හදනවා නම්-,

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කවුද කිව්වේ, හිරේ දමනවා කියලා?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
දැන් ඒක නේ කිව්වේ. *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අසත්‍ය කියන්න වෙලාව දෙන්න එපා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
අසත්‍ය කියන්න එපා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් කියලා අවසන් කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු මන්ත්‍රීතුමන්ලා, මට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවත් විනාඩියක් දෙන්න. එතුමා දණ්ඩ නීති සංග්‍රහය ගැනද කොහේදෝ කිව්වා නේ. එහෙම මොකක්දෝ කථාවක් කිව්වා නේ. අපි හිරේ යන්න බය මිනිස්සු නොවෙයි. මා හිරේ දමනවා නම්, මම ජනතාව වෙනුවෙන් හිරේ යන්නම්. ඒකට ප්‍රශ්නයක් නැහැ. හර්ෂ ද සිල්වා මෙතැනට ඇවිල්ලා ඉන්නේ බයේ දඟලන්න නොවෙයි. මා හිරේ දමනවා නම් හිරේ දමන්න, මම මේ කරපු කථාවට-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පැහැදිලි කිරීම අවසන් කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට අවසන් කරන්න දෙන්න. ඒ නිසා මම මේක,- *[බාධා කිරීමක්]* මම මේක study කරලා පිළිතුරක් දෙන්නම්. එතෙක් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරය කවුරුන් හෝ අරගෙන කරන්න. බොහොම ස්තුතියි.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩ වුණොත් එම වරප්‍රසාද කඩ වීම සම්බන්ධයෙන් මේ ගරු සභාවට ඉදිරිපත් කරලා වරප්‍රසාද කමිටුවට යොමු කිරීමේ අයිතිය අපි හැමෝටම තිබෙනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගරු රාජ්‍ය අමාත්‍යතුමා කියලා ඉවර වන කල් ඉන්න.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාරණය සම්බන්ධයෙන් විමර්ශනයක් කරන්නේ නැතිව අවසාන තීන්දුව මොකක්ද කියලා අපි කාටවත් තීන්දු කරන්න බැහැ. අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ මේ සම්බන්ධයෙන් සාධාරණ විමර්ශනයක් කරලා, මේක ඇත්ත ද, නැත්ත ද කියලා තීන්දුවක් ගන්න කියලායි. එහෙම නැතිව අපට ඕනෑකමක් නැහැ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා එම කමිටුවෙන් අයින් කරලා කටයුතු කරගෙන යන්න. මොකද, එතුමාගේ කණ්ඩායම එතුමා අයින් කරන්න උත්සාහ කරනවා. දැන් බලන්නකෝ, අදත් එතුමාට කියලා තිබෙන්නේ එතුමා අයින් කරන්න යනවා කියලා නේ. එතුමා එම කමිටුවේ ඉන්නවා ද, නැද්ද කියන කාරණය නොවෙයි වැදගත් වෙන්නේ. ඉස්සර අපට තමයි -ආණ්ඩුවට තමයි- චෝදනාව එල්ල කළේ, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඒ කමිටුවෙන් අයින් කරන්න හදනවා කියලා. ආණ්ඩුවක් හැටියට අපි එතුමාට උපරිම සහයෝගය ලබා දීලා තිබෙනවා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වැඩ කටයුතු කරගෙන යන්න. ඒ වැඩ කටයුතු කරගෙන යද්දී අප අතරේ යම් යම් වාද විවාද ඇති වෙනවා. ඒක වෙනම කාරණයක්. නමුත්, අපි ඒ කටයුතු කරගෙන යෑම සඳහා රජයක් හැටියට පූර්ණ සහයෝගය දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, එම කාරක සභාවේ සභාපතිවරයා වන ඔබතුමා ඉවත් කරන්න විපක්ෂය උත්සාහ කිරීම අපි හෙළා දකිනවා. ඔබතුමා කාරක සභාවේ ඉන්න. ඉඳලා ඒ වැඩ කටයුතු කරන්න.

ඒ පරීක්ෂණය අපක්ෂපාතීව කරන්න කියා ඉතා ගෞරවයෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය වෙනුවෙන් කථා කරන්න එතුමාට අයිතියක් නැහැ. එතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. විපක්ෂය වෙනුවෙන් කථා කරන්න අපටයි අයිතිය තිබෙන්නේ. අනෙක් එක, වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන කොට, අපේ මන්ත්‍රීවරුන් හිරේ යවනවා කියලා නිකම් මඩ ගහන්න එපා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
කවුද, එහෙම කිව්වේ? *[බාධා කිරීම්]* කවුද කිව්වේ, හිරේ අරිනවා කියලා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමා ඒක කිව්වා. මඩ ගහන්න එපා. *[බාධා කිරීම්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වගන්තිය කියවන්න. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
නිකම් මඩ ගහන්න එපා. *[බාධා කිරීම්]* තවම වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කළා විතරයි. ඒක විභාග කරන්න ඕනෑ. විභාග කළාට පස්සේ යම් යම් තීන්දු දෙනවා. නමුත්, මෙතුමා එය ඉදිරිපත් කරන කොටම කිව්වා, "හිරේ යවනවා" කියලා. ඒ කිව්වේ, මඩ ගහන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන සොයා බලන්නම්.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි-,

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමා.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙකු විධියට ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඒ කමිටුවේ කරන කාර්යභාරය පිළිබඳව විශාල ගෞරවයක් අප තුළ තිබෙන බව.

[ගරු නිමල් ලාන්සා මහතා]

හැබැයි, ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යතුමා මතු කළ කාරණාව මේකයි. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා -අපගේ අනුමැතිය නැතිවත්- මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, අප සියලුදෙනා ඒ වාර්තාවට අනුමැතිය දුන්නා කියලා. ඒක නිවැරදි කරන්න කියලා තමයි අපි කියන්නේ. එහෙම නැතිව එතුමා හිරේ යවන්න කියලා හෝ එතුමා කරන කාර්යභාරය වැරදියි කියලා හෝ නොවෙයි අපි කියන්නේ.

මම මෙතැනදී ඒ අදාළ කාරණය ආයෙත් මතු කරන්න ඕනෑ. පසු ගිය දාක මමත් හිටපු, එම කාරක සභාවේ රැස්වීමක දී මතු වුණා, VFS එක ආවාට පස්සේ සංචාරකයන් එන්න එන්න අඩු වෙලා තිබෙනවා කියන කාරණය. මමත් ඒක විශ්වාස කරලා අපේ මන්ත්‍රීවරුන් එක්ක කථා කළා, "එහෙම නම් ඒක වැරදියි නේ" කියලා. හැබැයි, පසුව බැලුවාම අපට එවලා තිබෙන report එක අනුව විදේශිකයන් එන එක වැඩි වෙලා තිබෙනවා. ඒ VFS එක ආපු නිසා එදා යම් අසාධාරණයක් සහ පාඩුවක් වුණාය කියන කාරණය විශාල ලෙස මාධ්‍යවල ප්‍රචාරය වුණා. ඒ නිසා ඒක නිවැරදි කරන්න ඕනෑ. ඒ VFS එක ආවාට පස්සේ සංචාරකයන් එන්න එන්න වැඩි වෙලා තිබෙනවා; රටේ ආදායම එන්න එන්න වැඩි වෙලා තිබෙනවා. එහෙම නම්, ඒ නිවැරදි කිරීම කරන්න කියලා තමයි අපි ඉල්ලා සිටින්නේ.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වීසා හුටපටයෙන් පස්සේ විදේශීය සංචාරකයන්ගේ පැමිණීම අඩු වුණාය කියන එකේ වගකීම භාර අරගෙන සංඛ්‍යාලේඛන සහිතව මම ඒක පෙන්නුම් කළා. ඒ විතරක් නොවෙයි, ඒ කමිටුවට පැමිණ සිටි ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ Director General පවා මම කියපු දේ පිළිගත්තා. "එහෙම අඩුවීමක් වෙලා තිබෙනවා. මේ වීසා හුටපටයෙන් පස්සේ තමයි මේක වුණේ. මේ ගැන අපි අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර තිබෙනවා" කියලා අපේ කමිටුවේදී එතුමාත් පිළිගත්තා. එහෙම කියද්දීත් මම බොරු කරුණු කාරණා ඉදිරිපත් කළාය කියන එක සම්පූර්ණයෙන්ම සාවද්‍යයි. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මම සම්පූර්ණයෙන්ම වගකීම භාරගන්නවා. මේ පිළිබඳ විකල්ප වැඩ පිළිවෙළකටත් යන්න අපි බලාපොරොත්තු වෙනවා කියලා මම කියනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා හැටියට මගේ මිත්‍ර හර්ෂ ද සිල්වා මැතිතුමා කටයුතු කරන හැම අවස්ථාවකදීම, එතුමාට යම් යම් ප්‍රශ්න පැන නැගිච්ච හැම වෙලාවකදීම මම එතුමා වෙනුවෙන් පෙනී ඉඳලා තිබෙනවා. එතුමාත් ඒක පිළිගන්නවා. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමනි, ඔබතුමා ඒ කාරක සභාවේදී කරන කාර්යභාරය පිළිබඳව අපට කිසි ගැටලුවක් නැහැ. හැම අවස්ථාවකදීම අපි ඔබතුමාත් එක්ක ඉඳලා තිබෙනවා. ඉදිරියටත් අපි ඔබතුමාත් එක්ක ඉන්නවා. ඒ පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ.

මගේ ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු රවුෆ් හකීම් මැතිතුමා කිව්වා වාගේ මේ වාර්තාව ගැන සාකච්ඡා කරනකොට සංචාරක මණ්ඩලයේ නිලධාරීන් පිරිසක් ඇවිල්ලා අපට කිව්වා, "සංචාරකයන්ගේ අඩුවීමක් වෙලා තිබෙනවා. රජයට ආදායම් අඩුවීමක් වෙලා තිබෙනවා" කියලා. හකීම් මැතිතුමා කිව්වා වාගේම එතුමන්ලා එහෙම කාරණයක් කිව්වා. ඒ කියපු වෙලාවේ ආණ්ඩු පක්ෂයේ අපි සියලුදෙනාම රැස් වෙලා කිව්වා, "එහෙම අඩුවීමක් වෙලා තිබෙනවා නම්, එතැන ප්‍රශ්නයක් තිබෙනවා. මේකට ආණ්ඩු පක්ෂය හැටියට අපි එකඟ නැහැ" කියලා. ඒ අනුව අපි ආගමන හා විගමන පාලකතුමා කැඳවලා මේ පිළිබඳ ලිඛිත වාර්තාවක් ඉල්ලුවා. ඒ ලිඛිත ඉල්ලීම ගැන මම ඔබතුමාට කියන්නම්. ගිය අවුරුද්දේ ජූලි මාසය තුළ පැමිණි සංචාරකයන් ගණන 59,244යි. මේ අවුරුද්දේ පැමිණි සංචාරකයන් ගණන 94,993යි. ගිය අවුරුද්දේ ඊට ඉස්සෙල්ලා මාසයේ පැමිණි සංචාරකයන් ගණන 119,000යි. මේ අවුරුද්දේ පැමිණි සංචාරකයන් ගණන 149,982යි. ගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ සංචාරකයන් හාර ලක්ෂ ගණනක්. මෙවර සංචාරකයන් දහතුන් ලක්ෂ ගණනක්. මේ මාස තුනේදී ආදායම දිගටම වැඩි වෙලා තිබෙනවා කියලා ආගමන හා විගමන පාලකතුමා අපට ලිඛිතව කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ආගමන හා විගමන පාලකතුමාට තමයි මේ තොරතුරු ලැබෙන්නේ. එතුමා ලිඛිතව අපට දැනුම් දුන්නා, එතුමා දීපු සංඛ්‍යාලේඛන වැරැදියි. මේක තමයි,- අපි ඔබතුමාට මේ කථා කරන්නේ, with a written document given by the Controller General of the Department of Immigration and Emigration. - *[Interruption]* තත්පරයක් දෙන්න, මම ඉවර කරනවා.

ගරු රවුෆ් හකීම් මැතිතුමනි, සංචාරකයන් අඩු වෙලා නම්, ආදායම් අඩු වෙලා නම්, අපි ඉන්නෙත් ඔබතුමාගේ මතයේ. මම මේ වගකීමෙන් කියන්නේ. හැබැයි, ආදායම් වැඩි වෙලා, සංචාරකයන් වැඩි වෙලා තිබෙද්දී මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා කියලා මත දෙකක් තිබුණු නිසා මේ පාර්ශ්ව දෙකම කැඳවලා එකඟතාවකට එනකල් අපි හර්ෂ ද සිල්වා මැතිතුමාට එදා කිව්වා, "පොඩ්ඩක් ඉන්න. අපට clarification එකක් තිබෙනවා. ඒ කාරණා පැහැදිලි කර ගත්තාට පසුව අපට මේ වාර්තාව දාන්න පුළුවන්" කියලා. ඒකයි අපේ ප්‍රශ්නය. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමනි, ඒ සංඛ්‍යාලේඛන ගැන Controller General of the Department of Immigration and Emigration එක number එකක් කියනවා; Sri Lanka Tourism Development Authority එකේ Director General තවත් number එකක් කියනවා. So, we just wanted to get it clarified. හරි දේ දැනගෙන අපට මේ පිළිබඳ එකඟතාවකට එන්න පුළුවන්. ඒකයි අපි කිව්වේ, "එතකල් මේක ඉදිරිපත් කරන්න එපා" කියලා.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශිකයන්ගේ පැමිණීම පිළිබඳ ලේඛන මේ දෙපාර්ශ්වය ළඟම තිබෙන්න පුළුවන්. නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා බොරු දිවුරුම් ප්‍රකාශයක් දීලා ඩයනා ගමගේ British citizen කෙනෙක් නොවෙයි කියලා කියපු ආගමන හා විගමන පාලකම තමයි දැන් ඔය විධියට අසත්‍ය කියන්නේ. ඒ නිසා පොඩ්ඩක් ප්‍රවේශම් වෙන්න. ඒ, ශ්‍රේෂ්ඨාධිකරණයටත් බොරු කියපු කෙනෙක්. *[බාධා කිරීමක්]*

ගරු ටිරාන් අලස් මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)
(மாண்புமிகு டிரான் அலஸ் - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Tiran Alles - Minister of Public Security)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව භාරව ඉන්න ඇමතිවරයා හැටියට මම එක කාරණයක් කියන්න ඕනෑ. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්වරයාටවත් කාටවත් බැහැ, figures හදන්න. ඒ ඔක්කොම system එකේ තිබෙන figures. එතකොට ඒ figures තමයි ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපතිතුමායි, ඒ දෙපාර්තමේන්තුවයි ලබා ගන්නෙත්. ඒ ගොල්ලන් හැම මාසයකම මෙතැනින් තමයි දත්ත ලබා ගන්නේ. ඒ නිසා මම වගකීමෙන් කියනවා, මම අවුරුදු 5ක figures ඇතුළත් table එකක් හදලා මන්ත්‍රීතුමන්ලා ඉල්ලුවාම දුන්නා. VFS එක එන්න ඉස්සෙල්ලා, ඒ කියන්නේ 2020 ඉඳන් figures ටික දුන්නා. ඒකේ, වැඩි වීම පැහැදිලිව පේනවා.

අප්‍රේල් මාසයේ ඉඳලා VFS එක ආවාට පස්සේ අපට අලුත් categories තිබුණා. ඒ කියන්නේ මාස හයේ, අවුරුද්දේ, අවුරුදු දෙකේ, අවුරුදු පහේ, අවුරුදු දහයේ වීසා issue කරන එක සම්බන්ධව. අපි ඒකෙනුත් පෙන්වා දී තිබෙනවා, අලුත් categoriesවලට touristsලා පනස්තුන් දහස් ගණනක් ඇවිල්ලා තිබෙනවා කියලා. ඒ, මීට ඉස්සෙල්ලා ඒ categoriesවලින් ලංකාවට ආපු නැති touristsලා. ඒකෙන් රජයට ලැබුණු මුදල, බිලියන 1.4ක්. ඒ ටිකෙන් විතරක්. ඒ සියලු දේ ඇතුළත් කර හදපු table එකක් මම ඉල්ලපු මන්ත්‍රීවරුන්ට ලබා දී තිබෙනවා.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, නිමල් ලාන්සා මන්ත්‍රීතුමා.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රවුෆ් හකීම් මැතිතුමා දැන් කිව්වා, එතුමා ඉදිරිපත් කරපු සංඛ්‍යාලේඛන වඩාත් නිවැරදියි කියලා. එතකොට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් අපට දීලා තිබෙන සංඛ්‍යාලේඛන තමයි වඩාත් නිවැරැදියි කියලා අපි කියන්නේ. එහි ඉතාම පැහැදිලිව පෙන්වා තිබෙනවා, 2023 වර්ෂයට සාපේක්ෂව 2024 දී සංචාරකයන් වැඩි වෙලා තිබෙන බව. සංචාරකයන් 2023දී 121,000යි, 2024දී 137,000යි අප්‍රේල් මාසයේ. මැයි මාසය ගත්තොත්, සංචාරකයන් 2023දී ලක්ෂයයි, 2024දී 113,000යි. ජූනි මාසය ගත්තොත්, සංචාරකයන් 2023දී 119,000යි, 2024දී 149,000යි. විශාල වැඩි වීමක් සිදුවෙලා තිබෙනවා. ඉතා පැහැදිලිව, වගකීමක් ඇතුව තමයි අපි මේ තොරතුරු ගෙන්වා ගත්තේ. මොකද, එදා කමිටුවේ ඉන්නකොට රවුෆ් හකීම් මැතිතුමා කිව්ව දේ ඇත්ත කියලා මමත් හිතුවා. මොකද, ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ සභාපතිතුමාත් කිව්වා, ඒ ගොල්ලන් බලපු විධියට එන සංචාරකයන් ප්‍රමාණය අඩුයි කියලා. මම ඊට පසු දින ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ සභාපතිතුමාට කථා කරලා මේ ගැන ඇහුවා. එතුමා මට ලේඛනයක් එව්වා. ඒ ලේඛනය ගත්තොත්, 2018දී ලංකාවට ආපු වැඩිම සංචාරකයන් ප්‍රමාණයටත් වඩා 2024දී ආපු සංචාරකයන්ගේ ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. රවුෆ් හකීම් මැතිතුමා ඉදිරිපත් කරපු ඒ ලේඛනය කවුරු හරි ඉදිරිපත් කරපු එකක්. මම හිතන විධියට ඒක වැරදියි. ඒක නිවැරදි කරන්න කියලා තමයි අපි ඉල්ලා සිටින්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු හර්ෂ ද සිල්වා මැතිතුමනි, ඔය කාරණය කියලා අවසන් කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සතුටු වෙනවා අපේ කාර්යභාරය ගැන අපේ කමිටුවේ මන්ත්‍රීවරු කරපු ප්‍රකාශ ගැන. මම ඔවුන්ට ඒ වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා. මෙතැන දී එක දෙයක් කියන්න අවශ්‍යයි. සංචාරකයන්ගේ පැමිණීම ගැන මේ වාර්තාවේ කොහේවත් සඳහන් කරලා නැහැ. මම ගරු ටිරාන් අලස් ඇමතිතුමා අහපු වෙලාවේත් එතුමාටත් ඒක කිව්වා. අපි සංචාරකයන්ගේ පැමිණීම ගැන සඳහන් කරලා නැහැ. අපේ TOR එකේ එහෙම එකක් නැහැ. හැබැයි, මෙතැන සිද්ධ වුණේ මෙයයි. ගරු හිටපු ජනාධිපතිතුමනි, මම මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් ලබා දුන්නා, යෝජනා ඉදිරිපත් කරන්න කියලා. ඒ අනුව එතුමන්ලා යෝජනා ඉදිරිපත් කළා. එතුමන්ලා යෝජනා ඉදිරිපත් කළාම මට සභාපතිවරයා හැටියට සිද්ධ වෙනවා, ඒ සියලු යෝජනා addendum එකක් හැටියට මේකට ඇඳන්න.

ඒ නිසා මම වාර්තාවට විරුද්ධ යෝජනාත් ඇඳුවා, අනෙක් යෝජනාත් ඇඳුවා. ඒවා addendum එකේ තිබෙනවා. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කිව්වා, "මේ සම්බන්ධයෙන් නැවත සාකච්ඡා කරන්න අවස්ථාවක් ලබා දෙන්න" කියලා ඔවුන් කිව්වා කියලා. මම ඒ ගැන සොයා බැලුවා. ඇත්ත වශයෙන්ම කියලා තිබෙන්නේ, ටිරාන් අලස් ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් වාර්තාවක් ඉල්ලා ගන්න කියලායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කොච්චර සද්භාවයෙන් මේ කටයුතු කළාද කියලා කිව්වොත්, ඒ වාර්තාව ලබා ගෙන ඒකත් මම මේ වාර්තාවට addendum එකක් හැටියට ඇඳලා තිබෙනවා. ඒ තරම් සද්භාවයෙන් තමයි මම මේ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසායි මම කිව්වේ, මේ සියලු කාරණා මම ප්‍රතික්ෂේප කරනවා කියලා. ගරු හිටපු ජනාධිපතිතුමා, මම පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳලාම මා ගැන දන්නවා. අපි ඉතා ඕනෑකමින් මේ වැඩේ කරගෙන ගියේ කොහොමද කියලා දන්නවා. ජනතාව වෙනුවෙන් හිරේ යන්න ඕනෑ නම් මම හිරේ යන්නම්. ඒක ප්‍රශ්නයක් නොවෙයි. මෙතැනදී කියපු කථාවක් ඒක. හර්ෂ ද සිල්වා ඕනෑම වෙලාවක ජනතාව වෙනුවෙන් හිරේ යන්න සූදානම්. *[බාධා කිරීම්]* එහෙම කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. මට අවස්ථාව ලබා දෙන්න, මේකේ සත්‍යතාව මොකක්ද කියලා මම වචනයක් වචනයක් පාසා කරුණු ඉදිරිපත් කරන්නම්. ඉ

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, VFS Global වීසා ගනුදෙනුව ගැන හර්ෂ ද සිල්වා මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව යම්කිසි කරුණු කාරණා විභාග කරලා, යම් යම් කරුණු කාරණා හෙළිදරව් කළා. ඒ, VFS Global තෝරා ගන්නා ලද්දේ ලංසු කැඳවීමකින් තොරව සහ තරගකාරී මිල කැඳවීමකින් තොරවයි කියන කාරණාවයි.

ඒ වාගේම තරගකාරී ලංසු කැඳවුණා නම්, වීසා ගාස්තුව ඩොලර් 25ට වඩා අඩුවිය හැකියි කියලා නිගමනය වුණා. දැන් ඒ ගාස්තුව ඩොලර් 60යි. රජයට අයත් මොබිටෙල් ආයතනය විසින්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සමාන සේවා එක් ඩොලරයකට ලබා දී තිබෙනවා. එකල වීසා නිකුත් කිරීම සඳහා කිසිදු නිර්ණායකයකුත් සකස් කර තිබුණේ නැහැ. එතකොට රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සටහන් කරන්නේ පිරිවිතර ලේඛන නොමැතිව VFS Global ආයතනයෙහි තේරීමට අවසර දී තිබෙන බවත්, එමඟින් අනෙකුත් සමාගම්වලට අවස්ථා සීමා කරන බවත්. ඒ වාගේම VFS Global ආයතනය ඩොලර් මිලියන 200ක, -

ගරු ටිරාන් අලස් මහතා
(මාණ්පුමිකු ටිරාන් අලස්)
(The Hon. Tiran Alles)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා තත්පරයක් ඉන්න.

ගරු ටිරාන් අලස් මහතා
(මාණ්පුමිකු ටිරාන් අලස්)
(The Hon. Tiran Alles)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
විනාඩියක් ඉන්න. VFS Global ආයතනය ඩොලර් මිලියන 200ක, -

ගරු ටිරාන් අලස් මහතා
(මාණ්පුමිකු ටිරාන් අලස්)
(The Hon. Tiran Alles)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Do not interrupt!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ කරුණු දැක්වීම කෙටියෙන් අවසන් කරන්න.

ගරු ටිරාන් අලස් මහතා
(මාණ්පුමිකු ටිරාන් අලස්)
(The Hon. Tiran Alles)
අපටත් දෙන්න, මයික් එක. දේශපාලන වාසි ගන්න මෙතැන කථා කරන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමා, ඒ පැහැදිලි කිරීම අවසන් වනතෙක් ඉන්න. *[බාධා කිරීමක්]* ගරු ටිරාන් අලස් ඇමතිතුමා.

ගරු ටිරාන් අලස් මහතා
(මාණ්පුමිකු ටිරාන් අලස්)
(The Hon. Tiran Alles)
අපටත් මයික් එක දෙන්න. අපි නැඟිට්ටාම ඔබතුමාට පෙනෙන්නේ නැද්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, විපක්ෂ නායකතුමා නැඟිටලා හිටපු නිසා -

ගරු ටිරාන් අලස් මහතා
(මාණ්පුමිකු ටිරාන් අලස්)
(The Hon. Tiran Alles)
නැහැ, විපක්ෂ නායකතුමාට කලින් දොලවත්ත මන්ත්‍රීතුමා නැඟිටලා හිටියේ. එතුමාට මයික් එක දුන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමා නැඟිටලා සිටියාට, විපක්ෂ නායකතුමා නැඟිට්ටාම සාමාන්‍යයෙන් එතුමාට මයික් එක දෙනවා.

ගරු ටිරාන් අලස් මහතා
(මාණ්පුමිකු ටිරාන් අලස්)
(The Hon. Tiran Alles)
මට අහන්න තිබෙන්නේ, අපි අද මේ VFS ගනුදෙනුව ගැන විවාදයක්ද කරන්නේ, නැත්නම් වෙන විවාදයක්ද කියලායි. විපක්ෂ නායකතුමා මේ අවස්ථාව අරගෙන පසුගිය කාලවල කියපු දේම නැවත මෙතැන කියවන්න හදන්නේ TV එකටයි, දේශපාලන වාසි ගන්නයි. ඒකට ඉඩ දෙනවා නම්, දැන් අපේ මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාටම ඒ ගැන කථා කරන්න ඉඩ දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, වරප්‍රසාද ප්‍රශ්නය ගැන ඔබතුමාගේ කාරණය මතු කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණාව මතු කරන්නයි නැඟිට්ටේ. VFS ගනුදෙනුව ගැන අද න්‍යාය පත්‍රයේ මොනවත් තිබුණේ නැහැ. සේමසිංහ මැතිතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා වන හර්ෂ ද සිල්වා මැතිතුමාගේ ක්‍රියාකලාපය ගැන කරුණු එළිදැක්වීම තුළින් මතු වූ කරුණු කාරණා, එතුමාගේ කමිටුවේ ගත්ත තීන්දු-තීරණ සහ තොරතුරු ගැන තමයි මම කථා කළේ. මගේ පෞද්ගලික දේවල් නොවෙයි කථා කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ පැහැදිලි කිරීම අවසන් කරන්න. න්‍යාය පත්‍රයට අදාළව උදේ වරුවේ කටයුතු අවසන් කරගන්න ඕනෑ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් ඉන්න. මට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ සඳහන් කළේ මම හදපු වාර්තාවක් ගැන නොවෙයි. මම මේ කියන්නේ හර්ෂ ද සිල්වා මැතිතුමා සභාපති හැටියට කටයුතු කරන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් එතුමා කළ විභාගයෙන් පසුව ගත්ත තීන්දු-තීරණ ගැන. එම තීන්දු-තීරණ ගැනීම ගැන මෙතැන කථා කරන්න සිද්ධ වුණේ සේමසිංහ මැතිතුමා මෙතුමාගේ ක්‍රියාකලාපය දෝෂදර්ශනයට ලක් කරපු නිසායි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
හරියට හරි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ නිසා මම කියන්න කැමැතියි, VFS Global ආයතනය ඩොලර් මිලියන 200ක ආයෝජනයක් කරනු ඇතැයි බලධාරීන් විසින් ප්‍රකාශ කර තිබුණ ද, එවැනි කිසිදු ආයෝජනයක් සිදු කර නැති බව මුදල් කමිටුව තහවුරු කර ඇති බව. VFS Global ආයතනය සමඟ ඇති වීසා ක්‍රියාවලිය බාහිරින් ලබා ගැනීමේ ගනුදෙනුව පිළිබඳ වෝහාරික විගණනයක් මුදල් කමිටුව නිර්දේශ කරන අතර, අක්‍රමිකතා හේතුවෙන් ගිවිසුම අවලංගු කළ හැකි බව දන්වා තිබේ. මම මේ කියවන්නේ අපේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයාගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වුණු මුදල් වාර්තාව. මේ මුදල් වාර්තාව ගැන මම දැන් කරුණු ඉදිරිපත් කළේ මේ නිසායි. සේමසිංහ මැතිතුමා විසින් එම වාර්තාව කේන්ද්‍ර කරගෙන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා වන හර්ෂ ද සිල්වා මැතිතුමා වරදක්, බොරුවක් කරලා තිබෙන බව ප්‍රකාශ කළ නිසාත්, එය දඬුවම් ලැබිය හැකි වරදක් කියලා කියපු නිසාත් ඒකට විරුද්ධවයි මම නැඟී සිටියේ. මම පැහැදිලිව කියන්න ඕනෑ, -

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දොලවත්ත මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමා ගොඩක් වෙලා බලාගෙන සිටියා, කථා කරන්න.

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ පාර්ලිමේන්තුවේ කමිටු ගණනාවක සාමාජිකයන්. අපිත් COPF, COPE දෙකේම සාමාජිකයෝ. දැන් COPF එකේ මේ ප්‍රශ්නය ආපු වෙලාවේ, අපි කවුරුත් නැති වෙලාවක සභාපතිතුමා ඇවිල්ලා ඔය වාර්තාව ඉදිරිපත් කළා. ඔය වාර්තාව ඉදිරිපත් කරද්දී එතුමා කිව්වේ අපි ඔක්කොම එකඟ වුණා කියලා. නමුත් මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ එහෙම එකඟ වුණේ නැති වාර්තාවක් ඉදිරිපත් කරපු එක. අනෙක් කාරණය, රජයේ විගණකාධිපතිතුමාවත් මේ කටයුතු අවසන් කරලා නැහැ.

මේ තිබෙන ප්‍රශ්නගත කාරණා ගැන අපට කථා කරන්න පුළුවන්. *[බාධා කිරීම්]* මට බාධා කරන්න එපා. මොකද, මමත් කමිටුවේ සාමාජිකයෙක්. මමත් සාමාජිකයෙක් නේ. *[බාධා කිරීම්]* මම මේ සභාවේත් සාමාජිකයෙක්. මම COPF එකේත් සාමාජිකයෙක්. හැබැයි මෙතැන තිබෙන ප්‍රශ්නය තමයි, -

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමනි, මට විනාඩියක් දෙන්න.

මෙතැන තිබෙන ප්‍රශ්නය තමයි අපේ එකඟතාවක් නැතිව, එකඟතාවට ආවා කියලා මේ වාර්තාවේ සඳහන් කරපු එක. අපිත් එක්ක සාකච්ඡා කරලා ඒ එකඟතාවට එන්න තිබුණා. *[බාධා කිරීම්]* විගණකාධිපතිතුමාත් මේ ගැන කිසිම සම්මතයක් දීලා නැහැ. මෙක වැරැදියි. ඒකයි අපි කියන්නේ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ශෙහාන් රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් කියලා මේක අවසන් කරන්න.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීවරයෙක් වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම මේ සභාවේ ඒ කාරණය සාකච්ඡාවට ගන්න ඔබතුමා කාලය ලබා දෙන්නේ ඇයි? ඒ ගැන ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව රැස් කරලා, එම කාරක සභාවේ දී විමර්ශනය කරලා තීන්දුවක් ගන්න ඕනෑ. එහෙම නැතුව එම කාරක සභාවේ සභාපතිවරයා ගැන මේ සභාවේ දී, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ශෙහාන් සේමසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනවා. *[බාධා කිරීම්]* දැන් ඔය කථාව අවසන් කරන්න.

ඊළඟ වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මටත් අවස්ථාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙම වුණොත් මේක විවාදයක් බවට පත් වෙනවා නේ. ඒක කරන්න බැහැ. *[බාධා කිරීම්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මගේ නම සඳහන් කරපු නිසා මටත් අවස්ථාවක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙනම් ඉක්මනින් කියලා ඉවර කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
දොලවත්ත මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරමින් කථා කළා. ඒ නිසා මට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා කථා කරලා අවසන් කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමාත් එක්ක එකඟ වෙනවා. ඒ අනුව මේ කාරණය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන්න. ඒකේ කිසි ගැටලුවක් නැහැ. හැබැයි මට කියන්න තිබෙන දේ තමයි, "මන්ත්‍රීවරු ඒකමතිකව එකඟ වුණා" කියලා මම කිව්වාය කියලා එතුමා දිගින් දිගටම ප්‍රකාශ කළා. එහෙම කිසිම දෙයක් මෙහි සඳහන් වෙලා නැහැ. ඒකමතිකව එකඟ වුණා කියලා නැහැ. ඇත්ත වශයෙන්ම එකඟ නොවුණු අය ඒ ගැන වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා. ගරු සුරේන් රාඝවන් මැතිතුමා මේකට විරුද්ධයි කියලා සඳහන් කරලා තිබෙනවා. ඒක වාර්තාවේ තිබෙනවා. එහෙම නම්, ඕනෑම පුද්ගලයෙකුට මේක කියවනකොට දැන ගන්න පුළුවන් මේක ඒකමතිකව, - *[බාධා කිරීමක්]*

මම නිතරම පාර්ලිමේන්තුවේ දී මේ වාගේ වාර්තා ඉදිරිපත් කරනවා. හැමෝම හැමදාම කමිටුවට එන්නේත් නැහැ නේ. *[බාධා කිරීමක්]* කමිටුවට ආපු නැති අයත් එක දවසක් හරි ඇවිල්ලා අත්සන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සියලු කරුණු කමිටුවේ දී සාකච්ඡා කරන්න පුළුවන්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒ නිසා මම මුලින් කිව්වා වාගේ නැවතත් මේ සියලු චෝදනා එක්ව සහ වෙන් වෙන්ව ප්‍රතික්ෂේප කරනවා. මම මගේ අවස්ථාවේදි ඒකට උත්තර දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ඕනෑ වෙලාවක මේ කාරණය කමිටුවට ඉදිරිපත් කරන්න. මටත් වෙලාව තිබෙන අවස්ථාවක කමිටුවට ඇවිල්ලා මම ඒ සාකච්ඡාව කරන්නම්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමාත් කථා කරලා මේක අවසන් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අදහස් ඉදිරිපත් කරගෙන යනකොට එකපාරටම mike එක off කරන්නේ කොහොමද? එහෙම කරන්නේ කොහොමද? මම නිකම් නමට විපක්ෂ නායකද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, මේ සභාවේ සිටින හැමෝම දැක්කා, ඒ වෙලාවේ තිබුණු තත්ත්වය මොකක්ද කියලා. එහෙම කළේ කාගේවත් පැත්තක් ගන්න නොවෙයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මේ කාරණාවට නැඟිටියේ වෙන මොනවත් නිසා නොවෙයි. හර්ෂ ද සිල්වා මැතිතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට ක්‍රියාත්මක කරපු ක්‍රියාදාමය සේමසිංහ රාජ්‍ය ඇමතිවරයා විසින් දෝෂදර්ශනයට ලක් කරමින් කරුණු ඉදිරිපත් කිරීම නිසායි. ඒ නිසායි මම නැඟිටියේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ, ගරු විපක්ෂ නායකතුමනි. එතුමා මතු කළේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම නැඟිටියේ හර්ෂ ද සිල්වා මැතිතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ දී ලබා දුන් නිර්දේශ ගැන කථා කරන්න. ඒවා කථා කරන්න වලංගු නැද්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් ඉදිරිපත් කළේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ඒ වරප්‍රසාද ප්‍රශ්නය ගැන තීන්දුවක් ගන්න අයිතිය තිබෙන්නේ මූලාසනයට. ඔබතුමාට නොවෙයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අනෙක් කාරණය, සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා තර්ජනාත්මකව කිව්වා "මේ බොරුවක් කරලා තිබෙන්නේ. මේ බොරුව කළා නම් මේ මේ ක්‍රියාදාමය තුළ දඩුවම් කරන්න පුළුවන්" කියලා. ඒ කියන්නේ, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයාට රාජකාරිය කරන්න බැරි ද? එතුමාගේ එම ප්‍රකාශය මම තරයේ ප්‍රතික්ෂේප කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා, වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

වරප්‍රසාද: 2024.07.20 දින "ලංකා ඊ නිව්ස්" වෙබ් අඩවියේ පළ කරන ලද ලිපිය

சிறப்புரிமை: 2024.07.20ஆம் திகதி லங்கா ஈ நியூஸ் இணையத்தளத்தில் வெளியான கட்டுரை

PRIVILEGE: ARTICLE PUBLISHED ON LANKA-E-NEWS WEBSITE ON 20.07.2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Speaker, I have forwarded a letter to you regarding an article published on Lanka-e-News website dated 20th July, 2024. I would request you to bring it to the attention of the Hon. Speaker. It states, I quote:

> "I write to bring to your attention an article that was published on 20th July, 2024 on Lanka-e-News detailing a plot to assassinate me being uncovered by The Foreign Intelligence Service."

Sir, I have attached that particular news article for your reference.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට ලියුමක් ලබා දීලා තිබෙනවා, කථානායකතුමා දැනුවත් කරන්න කියලා. මම මේක පොලිස්පතිතුමාටත් යවලා තිබෙනවා. Lanka-e-News website එකේ article එකක් තිබෙනවා. මා ඝාතනය කිරීමේ කුමන්ත්‍රණයක් පිළිබඳව විදේශ බුද්ධි අංශයක් මඟින් අනාවරණය කරගත් තොරතුරු එහි සඳහන් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට ආණ්ඩු පක්ෂයේ සිටින රාජ්‍ය අමාත්‍යවරයෙක් තමයි මේකට සම්බන්ධ වෙලා ඉන්නේ කියලාත් එහි තිබෙනවා. මේ රාජ්‍ය අමාත්‍යවරයා පසුගිය කාලයේ මිනීමැරුම් චෝදනා තිබුණු එක්කෙනෙක්, පාස්කු ප්‍රහාරයට සම්බන්ධ වුණු එක්කෙනෙක්. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. මේ තොරතුරු Lanka-e-News website එකේයි තිබෙන්නේ. ඉතින් මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වලා action එකක් ගන්න කියලා මම මේ අවස්ථාවේ දී ඉල්ලීමක් කරනවා. මේ ප්‍රකාශය ඉතාම බැරෑරුම්. ඒකේ සත්‍ය, අසත්‍යතාව අපි දන්නේ නැහැ. හැබැයි මේ සම්බන්ධව චෝදනාවට ලක් වෙලා තිබෙන පුද්ගලයාට ඉතිහාසයේ සිදු වූ පාස්කු ප්‍රහාරය වාගේම මන්ත්‍රීවරු ඝාතනය කිරීම සම්බන්ධවත් චෝදනා තිබෙනවා. ඔබතුමා මේ කරුණ ගරු කථානායකතුමාට යොමු කරලා, මේ ගැන එතුමාගේ අවධානය යොමු කරවලා, මේ ගැන සොයා බලා action එකක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරවන්නම්.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අධිකරණ අමාත්‍යතුමා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කරන්න සූදානමින් ඉන්නේ. ඊට පෙර, දැන් මතු වුණු කාරණය පිළිබඳව මගේ අදහස ඔබතුමාට ප්‍රකාශ කරන්න ඕනෑ.

දැන් වේලාව දහවල් 12.20යි. උදේ 10.30ට තමයි ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කරන්න නියමිතව තිබුණේ. දැන් මතු වුණු කරුණුත් එක්ක බලනකොට, අද මේ පාර්ලිමේන්තුව නරක පූර්වාදර්ශ දෙකක් දුන්නා. එකක් තමයි, අද ඉදිරිපත් වුණු වරප්‍රසාද ප්‍රශ්නයට අදාළ සියලු කරුණු පිළිබඳව විවාද කරන්න ඔබතුමා අවස්ථාව ලබා දීම. ඒ වරප්‍රසාද ප්‍රශ්නය හරහා චෝදනා එල්ල කරපු ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාටත් ප්‍රකාශයක් කරන්න ඉඩ දීම සාධාරණයි, ස්ථාවර නියෝගවල නැතත්. නමුත්, අද ඒ සඳහා විශාල වෙලාවක් ගත්තා. දැන් මේ වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳව විවාදයක් තිබුණා. ඊට අමතරව හර්ෂ ද සිල්වා මැතිතුමාගේ වාර්තාව පිළිබඳවත් විවාදයක් කළා. ඒ විධියට විවාද දෙකක් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි නරක පූර්වාදර්ශය මෙයයි. මෙතැනදී ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාද, මොන කමිටුවද කියන එක නොවෙයි වැදගත් වෙන්නේ. අපේ පාර්ලිමේන්තුවේ කමිටු ගණනාවක් තිබෙනවා. COPE එක තිබෙනවා, COPA එක තිබෙනවා, තවත් කමිටු තිබෙනවා. ඒ ඔක්කෝම වැදගත් කාරක සභා. ඒ ඒ විෂයයන් අලළා වැදගත් වන කාරක සභා විතරයි මේ පාර්ලිමේන්තුවේ ස්ථාපිත කරලා තිබෙන්නේ. එතකොට පාර්ලිමේන්තුවේ කාරක සභාවක සභාපතිවරයෙකුට විරුද්ධව, එම සභාපතිවරයාගේ කාර්යය පිළිබඳව යම් වරප්‍රසාද කඩවීමක් සම්බන්ධයෙන් එම සභාපතිවරයා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට කැඳවන්න පුළුවන්ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අපට බලතල දීලා තිබෙනවා, මේ පාර්ලිමේන්තුව තුළ ස්ථාවර නියෝග පද්ධතියක් හදලා සම්මත කර ගන්න කියලා. එතකොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත ස්ථාවර නියෝග ක්‍රියාත්මක වෙන්න ඕනෑ, 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ ක්‍රියාකාරිත්වයට සහ ප්‍රතිපාදනවලට යටත්වයි. ස්ථාවර නියෝග යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තු කාරක සභා තිබෙනවා, එම කාරක සභාවල සභාපතිවරු ඉන්නවා, ඔවුන්ට බලතලත් තිබෙනවා. එතකොට මෙම ප්‍රශ්නයට අදාළ සභාපතිවරයා කටයුතු කරලා තිබෙන්නේ තමන්ගේ බල සීමාව ඇතුළත. එම වාර්තාව වැරදි වෙන්න පුළුවන්; වාර්තාවේ කරුණු වැරදි වෙන්න පුළුවන්. එහෙම ඒවා අපි දැකලා තිබෙනවා. හැබැයි, මම මෙතැනදී මතු කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ප්‍රශ්නයක්. මේ ආකාරයට කුමන කාරක සභාවක හෝ සභාපතිවරයෙක් නිල වශයෙන් කරපු කටයුත්තකට චෝදනා ඉදිරිපත් කරලා, ඔහු පාර්ලිමේන්තුවේම වරප්‍රසාද කමිටුවට චූදිතයෙකු විධියට ගෙන්වා විමර්ශනයක් කරනවා නම්, මේ පාර්ලිමේන්තුවේ බලය තමයි එතැනදී හැල්ලු වෙන්නේ, පාර්ලිමේන්තුව පිළිබඳව ජනතාව තුළ තිබෙන විශ්වාසය තමයි අඩු වෙන්නේ. මෙතැන නීතිමය ප්‍රශ්නයක් තිබෙනවා. මෙවැනි ප්‍රශ්නයක් ඉදිරිපත් වුණාම, මෙවැන්නක් ඉදිරිපත් කරන්න පුළුවන්ද කියලා පළමුවෙන්ම තීන්දුවක් ගන්න මූලාසනයට වගකීමක් තිබුණා කියලා මෙතැනදී මම දැක්කා. දෙවනුව, එහෙම පුළුවන්කමක් තිබුණත් මූලාසනයට වගකීමක් පැවරිලා තිබෙනවා, පාර්ලිමේන්තුවේ - ව්‍යවස්ථාදායකයේ - ගරුත්වය ආරක්ෂා කරන්න. එහෙම නම් ඒ කාරක සභාවේ සිටින සභාපතිතුමාත්, අනෙක් අයත් ගෙන්වා සාකච්ඡා කරන්න තිබුණා. මොකද, අවසාන වශයෙන් මේ කාරක සභා හැම එකකම සභාපතිගේ වගකීම තිබෙන්නේ කථානායකතුමා සතුව. කථානායකතුමාගේ වගකීම තමයි සභාපතිවරුන්ට පවරන්නේ. එතකොට මේ අභියෝගය කරන්නේ කථානායකතුමාට. එහෙම නම්, කථානායකතුමා ඒ වාගේ

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්නේ කොහොමද? ආණ්ඩුවේ හෝ විපක්ෂයේ ප්‍රශ්නයක් ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත්, ස්ථාවර නියෝගත්, පාර්ලිමේන්තු බලතල සහ වරප්‍රසාදත්, කථානායකතුමාගේ වගකීම හා යුතුකමත් කියන කාරණා ගැනයි මම කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෙට COPE එකේ හෝ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හෝ සභාපතිවරයෙක් වාර්තාවක් නිකුත් කළාම, ඒ මනුස්සයා දඩු කඳේ ගහන්න හෝ කුමක් හෝ කරන්න ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට කැඳවන්න කියලා කවුරු හරි ඉල්ලීමක් කරනවා කියලා අපි හිතමු. ඒ පුද්ගලයා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට කැඳවා මොකක්ද අහන්නේ? දෙන්න පුළුවන් දඩුවම මොකක්ද? අනික් එක, කවුරුන්ද මේ කැඳවන්නේ?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව, බලයක් ක්‍රියාත්මක කරන්න පාර්ලිමේන්තුවෙන් නියම කරලා තිබෙන සභාපතිවරයෙක් තමයි මේ කැඳවන්නේ. ඒ කරපු දේ හරිද වැරැදිද කියලා දෙනුව අපට විවාද කරන්න පුළුවන්. ඒ වාර්තාව ආ පසු ඒ සම්බන්ධව විවාද කරන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් මේ නරක සම්ප්‍රදාය, මේ පූර්වාදර්ශය ඔබතුමා මින් ඉදිරියට මේ පාර්ලිමේන්තුවේ ගෙනයන්න දෙන්න එපා. එහෙම ගෙන ගියොත් මේ පාර්ලිමේන්තුවට වැඩි ආයුෂ නැහැ. මේ පාර්ලිමේන්තුවට වැඩි කල් යන්න බැහැ. ඒ නිසා නරක පූර්වාදර්ශවලට දොර අරින්න එපා කියලා මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු (සංශෝධන) පනත් කෙටුම්පත
மிகைப்பொருள் திணிப்பெதிர்ப்பு மற்றும் எதிரீட்டுத் தீர்வைகள் (திருத்தம்) சட்டமூலம்
ANTI-DUMPING AND COUNTERVAILING DUTIES (AMENDMENT) BILL

"2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසිනි.

2024 අගෝස්තු 06වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் சார்பாக மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ அவர்களால் சமர்ப்பிக்கப் பட்டது.

2024 ஓகஸ்ட் 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப் பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Wijeyadasa Rajapakshe on behalf of the Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government;

to be read a Second time upon Tuesday, 06th August, 2024 and to be printed; and to be referred to the Committee on Public Finance.

ආරක්ෂණ පියවර (සංශෝධන) පනත් කෙටුම්පත
முற்பாதுகாப்பு வழிமுறைகள் (திருத்தம்) சட்டமூலம்
SAFEGUARD MEASURES (AMENDMENT) BILL

"2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසිනි.

2024 අගෝස්තු 06වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் சார்பாக மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ அவர்களால் சமர்ப்பிக்கப் பட்டது.

2024 ஓகஸ்ட் 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Wijeyadasa Rajapakshe on behalf of the Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government;

to be read a Second time upon Tuesday, 06th August, 2024 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
தண்டனைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
PENAL CODE (AMENDMENT) BILL

"(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසිනි.

2024 අගෝස්තු 06වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයි ද නියෝග කරන ලදී.

நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர் மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2024 ஓகஸ்ட் 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப் பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Wijeyadasa Rajapakshe, Minister of Justice, Prison Affairs and Constitutional Reforms;

to be read a Second time upon Tuesday, 06th August, 2024 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත
மத்தியஸ்த சபைகள் (திருத்தம்) சட்டமூலம்
MEDIATION BOARDS (AMENDMENT) BILL

"1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසිනි.

2024 අගෝස්තු 06වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයි ද නියෝග කරන ලදී.

நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர் மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2024 ஓகஸ்ட் 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Wijeyadasa Rajapakshe, Minister of Justice, Prison Affairs and Constitutional Reforms; to be read a Second time upon Tuesday, 06th August, 2024

and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 3 දක්වා ඉදිරිපත් කිරීම.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
குடியியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
CIVIL PROCEDURE CODE (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 12.24]

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සහ 3 දරන යෝජනා -අධිකරණ සංවිධාන පනත යටතේ වූ නියෝග - ද මා ඉදිරිපත් කරනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින දිවා ආහාර විවේකය සඳහා තිබෙන කාලයත් විවාදය සඳහා යොදා ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දිවා ආහාර විවේකයෙන් තොරව විවාදයේ කටයුතු පවත්වාගෙන යෑමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN]took the Chair.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඉදිරිපත් කරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යෑමටත්, වඩාත් විශ්වසනීය ලෙස ඉටු කරලීම සඳහාත්, ඒ වාගේම නඩු කටයුතුවල තිබෙන ප්‍රමාදය අවම කර ගැනීම සඳහාත් බලපාන ඉතාම වැදගත් වූ පනත් කෙටුම්පතක්. 1889 වාගේ ඈත කාලයේ, එනම් බ්‍රිතාන්‍ය යුගයේදී තමයි සිවිල් නඩු විධාන සංග්‍රහය මේ රටට හඳුන්වා දුන්නේ. ඒ පනත හඳුන්වා දීලා දැන් අවුරුදු 135ක් වෙනවා. 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත යටතේ, ඒ විධිවිධාන පනත යටපත් කරලා, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක වෙන්නට කටයුතු කළා. නමුත්, 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කළාට පස්සේ, මේ සිවිල් නඩු විධාන සංග්‍රහය හා අපරාධ නඩු විධාන සංග්‍රහය කියන පැරණි ව්‍යවස්ථා ප්‍රතිපාදන දෙක යළිත් පණ ගන්වනු ලැබුවා. ඒ අනුව තමයි, සිවිල් නඩු විධාන සංග්‍රහය වසර 135කට වැඩි කාලයක් තිස්සේ මේ රටේ ක්‍රියාත්මක වෙමින් පවතින්නේ.

මේ පවතින නීති ක්‍රමය පිළිබඳව ජනතාවට විශාල වශයෙන් ගැටලු තිබෙනවා. ඒ, විශේෂයෙන් නීතියේ ප්‍රමාදය පිළිබඳවයි. එය ආමන්ත්‍රණය කරන්න පසුගිය වකවානුවේදී අපි යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට සෘජු ලෙස අදාළ අණපනත් 45කට වැඩි ප්‍රමාණයක් මේ පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගනු ලැබුවා. ඒ අතර එක් වැදගත් පනත් කෙටුම්පතක් විධියට මම මේ සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා. මේ පනත් කෙටුම්පත මඟින් අපි බලාපොරොත්තු වෙන කාර්යභාරය කුමක්ද කියන එක පිළිබඳව සාරාංශයක් ඉදිරිපත් කරන්නත් මම බලාපොරොත්තු වෙනවා.

වර්තමානයේ පවතින දියුණු තාක්ෂණයත් එක්ක අධිකරණයටත් අපි තාක්ෂණය යොදාගෙන තිබෙනවා. සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ, electronic transformation system එක යටතේ - විද්‍යුත් ක්‍රමය යටතේ - සන්නිවේදන ක්‍රමයක් තවම පිළිගෙන නැහැ. නමුත්, අපි රටක් විධියට බැංකු ගනුදෙනු ඇතුළු නොයෙකුත් ක්ෂේත්‍රවලට අදාළව මේ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු ක්‍රමය පිළිගෙන තිබෙනවා. ඒ සඳහා විශේෂයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත සම්මත කරගෙන තිබෙනවා. එයට දැන් අවුරුදු 18ක් විතර වෙනවා. නමුත් ඒ ක්‍රමය අපි තවම අධිකරණ ක්‍රියාවලියට සෘජු ලෙස හඳුන්වා දීලා නැහැ. මේ පනත මඟින් අපි බලාපොරොත්තු වෙනවා, ඒ ඉලෙක්ට්‍රොනික

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ගනුදෙනු ක්‍රමය, සන්නිවේදන ක්‍රමය සිවිල් නඩුවලටත් යොදා ගැනීමට. එය අපරාධ නඩුවලට යොදා ගැනීම සඳහාත් ඉදිරියේදී අපි ඒ අණපනත් සඳහා සංශෝධන ඉදිරිපත් කරන්නත් බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ තවත් වැදගත් කාරණයක් තිබෙනවා. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9වැනි වගන්තිය යටතේ වර්තමානයේ සිවිල් නඩුවක් පවරන්න පුළුවන් ඒ නිශ්චිත අධිකරණ බල ප්‍රදේශයක පිහිටි අධිකරණයක පමණයි. ඒ අනුව චිත්තිකරු පදිංචි අධිකරණ බල ප්‍රදේශය තුළ, ඉඩමක් සම්බන්ධව නම් ඉඩම පිහිටි අධිකරණ බල ප්‍රදේශය තුළ, ගිවිසුමක් නම් ගිවිසුමට ඇතුළත් වුණු අධිකරණ බල ප්‍රදේශය තුළ, ගිවිසුමක් උල්ලංඝනයවීමක් සම්බන්ධයෙන් නම් ගිවිසුම උල්ලංඝනය වූ හෝ නඩු නිමිත්ත හට ගත් අධිකරණ බල ප්‍රදේශය තුළ පවතින අධිකරණයක තමයි නඩුව පවරන්නට පුළුවන්. නූතන ලෝකයේ වාණිජ ගනුදෙනු බොහෝ සිද්ධ වෙන මේ කාලයේ ඒ පිළිබඳව මතු වෙන නඩු හබ බොහොමයක් තිබෙනවා. මෙතැනදී අපි අවබෝධ කරගෙන තිබෙනවා, ඒ අධිකරණ බලය පිළිබඳව පවතින නීතියේ විශාල දුර්වලතාවක්, අඩුපාඩුවක් තිබෙන බව.

උදාහරණයක් විධියට යම් තැනැත්තෙක් යාපනයට ගිහිල්ලා ගනුදෙනුවක් කළොත්, ඒ ගනුදෙනුව කළ පුද්ගලයා මාතර සිටියත්, ඒ ගිවිසුම කඩවීම සිද්ධ වෙලා තිබෙන්නේ, ගිවිසුම ඇති කරගෙන තිබෙන්නේ යාපනයේ. එතකොට චිත්තිකාරයා පදිංචිව ඉන්නේ යාපනයේ. හැබැයි, ඒ ගිවිසුමෙන් අතෘප්තියට පත්, අසාධාරණයට පත් වුණු පාර්ශ්වය ඉන්නේ වෙනත් තැනක. එක්කෝ මොනරාගල වෙන්න පුළුවන්. නැත්නම් හම්බන්තොට වෙන්න පුළුවන්. ඒ පුද්ගලයාට නඩුවක් පවරන්න අවශ්‍ය නම් යන්න ඕනෑ යාපනයේ දිසා අධිකරණයට. වෙන අධිකරණයක නඩුවක් පැවරුවාට භාර ගන්නේ නැහැ. ඒක තමයි රෝම ලන්දේසි නීතියේ මූලධර්මය. The creditor should seek the debtor කියන ඒ සංකල්පය වැරදියි. ඒක අපි ප්‍රතික්ෂේප කළ යුතු සංකල්පයක්. යම්කිසි අසාධාරණයකට ලක් වුණු තැනැත්තෙකුට වැඩි වාසියක් අත්වන විධියට තමයි අධිකරණ බලය තීන්දු වෙන්න ඕනෑ. දැන් ඒ බලය අපේ රටේ දික්කසාද නඩු සඳහා ලබා දීලා තිබෙනවා. ඒ වාගේම කම්කරු විනිශ්චය සභාවක පවරන නඩු සම්බන්ධයෙන් ඒ බලය ලබා දීලා තිබෙනවා. ඒ අවස්ථාවලදී චිත්තිකාරයා පදිංචි බල ප්‍රදේශයට යන්න ඕනෑ නැහැ. පැමිණිලිකාරයා පදිංචි බල ප්‍රදේශයේම නඩු පවරා ගැනීමේ අයිතිය දීලා තිබෙනවා, ඒ ආකාරයේ නඩු වර්ග දෙකකට පමණක්. නමුත්, අනෙකුත් නඩුවලට එහෙම අයිතියක් දීලා නැහැ. ඒ නිසා සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9වැනි වගන්තිය සංශෝධනය කරන්න කියා අපි යෝජනා කරනවා.

නඩුවක චිත්තිකාරයා හෝ පැමිණිලිකාරයා යන දෙදෙනා පදිංචි කුමන හෝ අධිකරණ කලාපයක නඩු පවරා ගැනීමේ අභිමතයක් නඩු පවරනු ලබන පාර්ශ්වයට ලබා දෙනවා. ඒ අනුව වඩාත් සාධාරණව යුක්තිය ඉෂ්ට වෙන්න ඕනෑ, අසාධාරණයට ලක් වුණු තැනැත්තාට. ඒ නිසා එම සංශෝධනය මඟින් අපි බලාපොරොත්තු වෙනවා, වඩාත් පහසුවෙන් තමන්ගේ ගැටලු නිරාකරණය කර ගැනීම.

කලිනුත් කියපු ඉලෙක්ට්‍රොනික ගනුදෙනු, විද්‍යුත් තැපෑල ගැන නැවත මම කථා කරන්න කැමතියි. අද අධිකරණ නියෝගයක් දුන්නාම ඒ අධිකරණ නියෝගය ලියාපදිංචි තැපෑලෙන් ගෙනියන්න ඕනෑ. එහෙම නැත්නම් පිස්කල්වරයා මාර්ගයෙන් ගෙනියන්න ඕනෑ. ඒ සඳහා බොහොම දීර්ඝ කාලයක් ගත වෙනවා. නමුත් දියුණු තාක්ෂණ ලෝකයේ, අපි හැම පැත්තකින්ම තාක්ෂණයට බර වෙලා ඉන්න මේ වෙලාවේ අධිකරණයට ඒ ක්‍රමය හඳුන්වා දීම තුළින් අධිකරණ ක්‍රියාදාමය ඉක්මන් කර ගන්න පුළුවන්.

ඒ අනුව විද්‍යුත් තැපැල් ක්‍රමය මඟින් නඩුවල ලිපිලේඛන, නියෝග අදාළ පාර්ශ්වයන්ට ලබා දෙන්න පුළුවන්. උදාහරණයක් විධියට ගත්තොත්, හදිසි අවශ්‍යතා මත අධිකරණයෙන් වාරණ නියෝග, අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝග, අත්හිටුවීමේ නියෝග, දේපළ තහනමට ගැනීමේ නියෝග නිකුත් කරනවා. මේ කුමන හෝ නියෝගයක් අධිකරණයෙන් ලබා ගත්තත්, සමහර වෙලාවට ඒ පාර්ශ්වයට එම නියෝගය ක්‍රියාත්මක කර ගන්න බැහැ. මොකද, ඒ තැනැත්තා සොයා ගන්න බැහැ. ඒ තැනැත්තා කොහේ ඉන්නවාද කියලා දන්නේ නැහැ. ඒක ඔහුගේ අතට භාර දෙනකම් වලංගු නියෝගයක් බවට පත් වෙන්නේ නැහැ. ඒ නිසා නඩු කටයුතුවලට තාක්ෂණය යොදා ගන්න මේ සංශෝධනයත් සමඟ පුළුවන් වෙනවා.

සේවාදායකයා වෙනුවෙන් නඩු කටයුතු කිරීමට නීතිඥවරයෙකුට බලය ලබා දෙමින් පෙරකලාසියක් ඉදිරිපත් කරනකොට ඒ පෙරකලාසියටත් ඔහුගේ විද්‍යුත් තැපැල් ලිපිනයක් ඉදිරිපත් කරන්න ඕනෑ. ඔහුගේ ජංගම දුරකථන අංකයක් -mobile phone number එකක්- යොමු කරන්න ඕනෑ. පාර්ශ්වයක් පෞද්ගලිකව ගිහින් නඩුවකට පෙනී සිටියත්, ඔහුගේ ජංගම දුරකථන අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය ඉදිරිපත් කරන්න ඕනෑ, අධිකරණයට හෝ ඒ නඩුවේ අනෙකුත් පාර්ශ්වයන්ට. අවශ්‍ය ඕනෑම වෙලාවක ක්ෂණිකව ඔවුන්ට දැන්වීම් ලබා දීම, ලිපිලේඛන යැවීම, නියෝගයක් දැනුම්දීම යනාදී කටයුතු ඉටු කිරීමට මේ ක්‍රමයෙන් හැකි වෙනවා. යම් ආකාරයක ගිවිසුමක්, එකඟතාවක් තිබෙන වෙලාවක නම් සිතාසි භාර දීම පවා විද්‍යුත් තැපෑල මඟින් සිදු කිරීමට පුළුවන්කම ලැබෙනවා. ඒකට අවශ්‍ය ද්‍රව්‍ය සහ ප්‍රතිපාදන අදාළ පාර්ශ්වය විසින් රෙජිස්ට්‍රාර්වරයාට ලබා දෙන්න ඕනෑ. අධිකරණයේ විනිසුරුවරයා විසින් ඒකට නියෝගයක් නිකුත් කරන්න ඕනෑ. එහෙම නියෝගයක් නිකුත් කළාට පස්සේ ලිපිලේඛන භාර දීම, සිතාසි භාර දීම ලියාපදිංචි තැපෑල මඟින් කරන්නට පුළුවන්. මේ අලුත් පනත යටතේ courier service එකක් මඟින් සිතාසි හෝ වෙනත් ලේඛන භාර දෙන්න පුළුවන්. විද්‍යුත් තැපෑල මඟින් භාර දෙන්නත් පුළුවන්. නිශ්චල දේපළ ,-

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Dayasiri Jayasekara?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මොකද, සිතාසියක් භාර දෙන්න නිමල් සිරිපාල ඇමතිතුමා හොය හොයා ඉන්නවා. ඔබතුමාට බැරිද, කැබිනට් මණ්ඩලයේදී හරි එතුමාට මේ සිතාසිය දෙන්න? සිතාසිය භාර දෙන්න බැරිව එතුමා හොය හොය ඉන්නවා, දවස් ගණනක් තිස්සේ. එතුමා ලොකු ලොකු රැස්වීම්වලටත් යනවා. නමුත් සොයා ගන්න බැහැ. ඔය වැඩේ කළොත් දෙවියනේ කියලා සිතාසිය භාර දෙන්න පුළුවන්. නැත්නම් ඔබතුමාට සිතාසිය දෙන්නම්, කැබිනට් මණ්ඩලයේදීවත් ඒ සිතාසිය එතුමාට දෙනවාද? නැත්නම් මේක කරන්න බැහැ. පිස්කල්වරුන්ටත් සිතාසිය භාර දෙන්න බැරිවයි ඉන්නේ.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට තිබෙන එකම උත්තරය තමයි මම මේ ලබා දෙන්නේ. මේ පනත් කෙටුම්පත අද සම්මත කරලා හෙට ගරු කථානායකතුමා අත්සන් කළාට පස්සේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට පුළුවන්, ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ විද්‍යුත් තැපෑලට ඒ සිතාසිය යවන්න. *[බාධා කිරීමක්]* එතකොට ලැබුණේ නැහැ කියන්න බැහැ. මොකද, ඒක නීතියෙන් පිළිගන්නවා. එතුමාගේ නඩුව සම්බන්ධයෙන් විතරයි මම ඒ කිව්වේ. *[බාධා කිරීමක්]* ඒකත් හොඳ අදහසක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
WhatsApp එකත් මේකට ඇතුළත් කරලා තිබෙනවාද?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

WhatsApp වුණත් මෙයට ඇතුළත් කරන්න පුළුවන්. විද්‍යුත් ක්‍රමයට WhatsApp ඇතුළත් වෙනවා. විද්‍යුත් ක්‍රමය යටතේ එන ඕනෑ එකක් භාවිත කරන්න පුළුවන්. *[බාධා කිරීමක්]* ඒක තමයි. අපි අද මේ විවාදය ඉක්මනට අවසන් කරලා, එතුමාට කියලා ඒක අත්සන් කර ගනිමු.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඉඩම් සම්බන්ධ, ගොඩනැඟිලි සම්බන්ධ පාර්ශ්වකරුවන් සොයා ගන්න බැහැ. ඒගොල්ලන්ගේ ලිපින සමහර වෙලාවට ප්‍රායෝගිකව සොයා ගැනීම අපහසුයි. ඒ අවස්ථාවලදී ඒ ස්ථානයේ ඉන්න කෙනෙකුට සිතාසි භාර දීම කරන්න පුළුවන්. ඒ තැනැත්තා භෞතිකව ඒ භුක්තියේ නැතත් ඔහුගේ විද්‍යුත් ලිපිනය දන්නවා නම්, අපට විද්‍යුත් ක්‍රමය යටතේ සිතාසිය යවන්න පුළුවන්. ඊටත් වඩා බරපතළ කාරණයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපේ අධිකරණ පද්ධතියේ නඩු දසදහස් ගණනක් හිරවෙච්ච තැනක් තිබෙනවා, සිතාසි භාර දිගන්නම බැරිව. මේවා වැඩි වශයෙන්ම සිද්ධ වෙලා තිබෙන්නේ දික්කසාද නඩු සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර පාර්ශ්ව විවාහ වෙලා යම් යම් හේතු නිසා දික්කසාද වෙන්න අධිකරණයට යනවා. අධිකරණයට යනකොට අනෙක් පාර්ශ්වය විදේශගත වෙලා. එතකොට ඒ විදේශ රටට සිතාසි භාර දෙන්න අපි අධිකරණය මඟින් අධිකරණ අමාත්‍යාංශයට එවනවා. අධිකරණ අමාත්‍යාංශයෙන් ඒක විදේශ කටයුතු අමාත්‍යාංශයට යවන්න ඕනෑ. විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඒක අදාළ රටේ තානාපති කාර්යාලයට හෝ මහ කොමසාරිස් කාර්යාලයට යවන්න ඕනෑ. ඒ කාර්යාල හරහා තමයි මේ සිතාසි භාර දීම කරන්න ඕනෑ. සමහර රටවල අපේ රාජ්‍ය තාන්ත්‍රික තානාපති කාර්යාල හෝ මහ කොමසාරිස් කාර්යාල නැහැ.

එතකොට ඒ නැති රටවලට මේවා භාර දීමේ ක්‍රමයක් ඇත්තෙම නැහැ. තානාපති කාර්යාල තිබෙන රටක පවා එවැනි පුද්ගලයන් බොහෝදුරට දන්නවා, තමන්ට සිතාසියක් එන්න ඉඩ තිබෙනවා කියලා. ඒ නිසා ඒ අයගේ ලිපිනය වසන් කරගෙන තමයි ජීවත් වෙන්නේ. එහෙම වුණාම අවුරුදු 5ක්, 10ක් තිස්සේ නඩු පවතිනවා, සිතාසි භාර දීලා නැතිව. එතකොට නඩුව ඉදිරියට ගෙනියන්නත් බැහැ. ඒ මනුෂ්‍යයාට ජීවිත කාලය තුළ දික්කසාද නඩු තීන්දුවක් ලබා ගන්නටත් බැහැ. දික්කසාද නඩු කිව්වාම, ඒ ගැනත් කෙටියෙන් මම සඳහනක් කරන්නම්. දැන් අපේ තිබෙන දික්කසාද නීතිය මුළුමනින්ම අයින් කරලා no-fault divorce ඇතුළත් කරලා අලුත් කෙටුම්පතක් අපි හදලා තිබෙන්නේ. මේ වාගේ බරපතළ විධියට අවුරුදු ගණන් නඩු විභාග පවත්වන්නේ නැතිව, ඒ විවාහය නැවත ස්ථාපිත කර ගන්න බැරි මට්ටමට කඩා වැටිලා තිබෙනවා කියලා සනාථ වෙනවා නම්, අධිකරණයට තීන්දුවක් දෙන්න පුළුවන් බලය එතකොට ලැබෙනවා.

ඒ වාගේම විදේශ අධිකරණවල දෙන දික්කසාද තීන්දු ඇතුළු අනෙකුත් තීන්දු ලංකාව තුළ පිළිගැනීමක් නැතිකම සහ ක්‍රියාත්මක කිරීමට ක්‍රමයක් නැති එකත් බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා තමයි අපි විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. ඒ පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කර තිබුණා. අද ගරු නියෝජ්‍ය කථානායකතුමා ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය අපට දැනුම් දුන්නා. වගන්ති දෙක තුනක සුළු සංශෝධන සහිතව ඒ පනත් කෙටුම්පත ඉදිරියේදී සම්මත කරගන්න අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම මේක දික්කසාද නඩුවලට, ඉඩම් නඩුවලට, බෙදුම් නඩුවලට, බූදල් නඩුවලට බලපානවා. නමුත් විදේශීය රටවල්වලට ගිහිල්ලා ඉන්න ඒ තැනැත්තන්ට සිතාසි භාර දෙන්න කිසිම ක්‍රමයක් නැහැ. එවැනි අවස්ථාවල -ඊට අදාළ ප්‍රතිපාදන අපි මේ පනත් කෙටුම්පතට ඇතුළත් කළා- එසේ සොයාගත නොහැකි බවට දිවුරුම් පෙත්සමක් අදාළ පාර්ශ්වය අධිකරණයට ඉදිරිපත් කළොත් අධිකරණයට බලය තිබෙනවා, ඒ සිතාසිය භාෂා තුනෙන් අපේ රටේ ප්‍රසිද්ධ පුවත් පත් තුනක පළ කරන්න. ඒ පුවත් පත් තුනේ සඳහන් කරනවා, අහවල් දිනයේ මේ නඩුව කැඳවනවා, ඒ දිනයේ පෙනී නොසිටියහොත් නඩුව ඒකපාර්ශ්විකව විභාගයට ගන්නවා කියන තොරතුර. එතකොටත් යම් තැනැත්තෙක් ඒ නඩුවට ඉදිරිපත් වෙන්නේ නැත්නම්, එම සිතාසිය වලංගු සිතාසි භාරදීමක් සේ සලකා නඩුවේ ඉදිරි කටයුතු පවත්වාගෙන යෑමට හැකියාව ලැබෙනවා. ඒ නිසා මම හිතන විධියට, මෙම සංශෝධනය ලංකාවේ දැනට පවත්වාගෙන යෑමට නොහැකිව තිබෙන නඩු විශාල සංඛ්‍යාවක් අවසන් කර ගැනීම සඳහා උපකාර වනවා කියලායි.

ඒ වාගේම ආදේශිත ක්‍රමයට සිතාසි භාරදීමේ ක්‍රමය පිළිබඳවත් විධිමත් ලෙස මේකේ සඳහන් කර තිබෙනවා. ඊට අවශ්‍ය ප්‍රතිපාදන සලසා තිබෙනවා. ඊට අමතරව, බන්ධනාගාරයේ සිටින විත්තිකරුවෙකුට සිතාසියක් භාර දෙන ආකාරය පිළිබඳවත් සඳහන් කර තිබෙනවා.

අනෙක් එක තමයි, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 86වන වගන්තියේ කාරණය. ඒක බරපතළ ප්‍රශ්නයක්. මොකද, සමහර නඩු විවිධ හේතු මත ඒකපාර්ශ්විකව විභාගයට ගන්නවා. ඒකපාර්ශ්විකව නඩුව විභාගයට ගත්තාට පස්සේ තීන්දුවක් ලබාගෙන තිබෙනවා කියලා විරුද්ධ පාර්ශ්වය දැන ගත්තත් ඒ උදවියට නඩුවට ඉදිරිපත් වෙන්න බැහැ. ඒක නීතියෙන් තහනම්. ඒ, ඒකපාර්ශ්වික නියෝගය, තීන්දුව විරුද්ධ පාර්ශ්වයට භාර දීලා දින 14ක් ඇතුළත ඒ ඉවත් කිරීම සඳහා කරුණු පෙන්වලා දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරන්න ඕනෑ, ඒ නඩුවට ඇතුළත් වෙන්න; ඒකපාර්ශ්වික නියෝගය ඉවත් කර ගන්න. *[බාධා කිරීමක්]* පැමිණිලිකාරයා කැමැති නම් පුළුවන්. නමුත්, හුඟක් වෙලාවට වෙන්නේ මේ වාගේ නියෝගයක් ලබා ගත්තට පස්සේ විශේෂයෙන්ම අතුරු තහනම් නියෝගයක් තිබෙනවා නම්, ඒ පාර්ශ්ව අවුරුදු 3, 4, 5ක් යනකල් නඩු තීන්දුව භාර දෙන්නේ නැහැ. එතකොට විත්තිකරුට කරන්න දෙයකුත් නැහැ. මොකද,

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

දිගින් දිගටම ඒ නියෝගය ඔහුට විරුද්ධව ක්‍රියාත්මක වෙනවා. මේක විශාල අසාධාරණයක්. ඉස්සර නීතියේ තිබුණා, යම් හේතු මත නඩුවට ඉදිරිපත් වෙන්න පුළුවන් කියලා. නමුත්, පසුකාලීනව මේ පනත සංශෝධනය කළාට පස්සේ අධිකරණය දුන් අර්ථ නිරූපණත් එක්ක අධිකරණ තීන්දු කිහිපයක් තිබෙනවා, ඒ තීන්දුව භාර දෙනකල් කැමැත්තක් නැතිව අධිකරණයට එන්න අයිතියක් නැහැ කියලා. මේ නිසා අධිකරණ බලය අයුතු විධියට ප්‍රයෝජනයට ගන්න කණ්ඩායම් ඉන්නවා. සමහර වෙලාවට හිතාමතා, plan කරලාම මේ විධියට කරන අවස්ථා අපි දැක තිබෙනවා.

ඒ නිසා මේ අලුත් සංශෝධනය මඟින් මේ කාරණයේ වෙනසක් සිදු වනවා. විත්තිකරුවෙකුට තමන්ගේ නඩුව ඒකපාර්ශ්විකව තීන්දු කරන්න නියෝගයක් දුන්නා කියලා හෝ ඒකපාර්ශ්විකව තීන්දු කළා කියලා දැන ගත්තාම ඔහුට ඒ නඩුවට නියමිත දිනයේදී ඉදිරිපත්වීමට නොහැකි වූ හේතු පෙන්වලා, ඕනෑම අවස්ථාවක අධිකරණයට ගිහිල්ලා කියන්න පුළුවන්, මෙන්න මේ හේතුව නිසා ඒකපාර්ශ්වික තීන්දුව ඉවත් කරලා නඩු විභාගයට යන්න මට අවස්ථාව දෙන්න කියලා.

ඒ එක්කම අපි තවත් සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ ගැනත් කියන්නම්. නඩු තීන්දුවට පෙර දේපළ තහනමට ගැනීමේදී - sequestration - නඩුවේ වටිනාකම රුපියල් 1,500ක් කියලා තමයි තිබෙන්නේ. අද කාලයේ අපි අලුතින් පිහිටුවන ලද සුළු හිමිකම් අධිකරණවලට පවා බලය දීලා තිබෙනවා, රුපියල් ලක්ෂ 20 දක්වා නඩු විභාග කරන්න. ඒ අනුව මේ රුපියල් 1,500 කියන එක අදට ගැළපෙන්නේ නැති නිසා සංශෝධනයක් අපි ඉදිරිපත් කරනවා, රුපියල් ලක්ෂ 20 දක්වා වැඩි කරන්න කියලා. ඒ වාගේම, සිවිල් නඩු විධාන සංග්‍රහයේ තිබෙනවා ආකෘති. සිතාසි ඇතුළු නොයෙකුත් ලිපිලේඛන භාර දීමේ ආකෘති තිබෙනවා. ඒ ආකෘති අද කාලයට ගැළපෙන ලෙස සහ විද්‍යුත් තැපැල් ක්‍රම මඟින් භාවිත කිරීමට පහසුවන ආකාරයට අලුතින් සකස් කරලා තිබෙනවා.

ඊට අමතර ලෙස ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත යටතේ 2023 නොවැම්බර් 27වැනි දා නිකුත් කරන ලද අංක 2360/22 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරලා තිබෙනවා, ගරු සභාවේ අනුමැතිය සඳහා. සාමදාන විනිශ්චයකාරවරු පත් කිරීමේදී ඊට අදාළ සුදුසුකම් පිළිබඳව පැහැදිලි නීති පද්ධතියක් මෙතෙක් තිබුණේ නැහැ. ඒ නිසා සුදුසුකම් නිර්ණය කරලා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් පත්වීම් ලැබීම සඳහා අවශ්‍ය සුදුසුකම් මේකේ ඉදිරිපත් කරලා තිබෙනවා. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම, වයස අවුරුදු 30ට අඩු නොවීම, යහපත් චරිතයකින්, අවංකභාවයකින් යුක්ත ජනතාවගේ ප්‍රසාදය, විශ්වාසය ලබන තැනැත්තෙකු වීම, රාජ්‍ය භාෂාවලින් එක් භාෂාවක් චතුර ලෙස හැසිරවීමේ හැකියාව, බුන්වත් පත් වූවකු නොවන තැනැත්තකු වීම, මෝටර් වාහන පනතේ වරදකට හැර වෙනත් අපරාධ වරදකට වරදකරුවකු වී නොසිටීම, ප්‍රජාවට මනා සේවයක් ලබාදීමට හැකිවීම වාගේම අපොස (උසස් පෙළ) විභාගය විෂයයන් 3කින් සමත් විය යුතුයි කියලා තමයි සුදුසුකම් දාලා තිබෙන්නේ. නමුත්, දිගින් දිගටම ඉල්ලීම් කළා, එය අපොස (සාමාන්‍ය පෙළ) සමත් වීම ප්‍රමාණවත් විධියට සංශෝධනය කරලා දෙන්න කියලා. ඒ අනුව ඒ සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගත් මම ඉදිරිපත් කරලා තිබෙනවා. විෂය අංක 3 යටතේ තිබෙන්නේ. 2024 පෙබරවාරි 13 දිනැති අංක 2371/13 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද, අධිකරණ සංවිධාන පනත යටතේ නිකුත් කරන ලද එම නියෝග මඟින් අපොස (උසස් පෙළ) වෙනුවට අපොස (සාමාන්‍ය පෙළ) විභාගය සම්මාන සාමාර්ථ දෙකක් සමඟ විෂයයන් 6ක් සමත්වීම ප්‍රමාණවත් කියන සුදුසුකම ඉදිරිපත් කළා.

ඒ වාගේම සුවිශේෂී අවස්ථාවලදී, විශේෂයෙන් ගම්වල සිටින විහාරාධිපති භික්ෂූන් වහන්සේලා, ආගමික නායකතුමන්ලා වෙන්න පුළුවන්, වෙද මහත්වරු වෙන්න පුළුවන්, ඒ වාගේ සමාජයට හුඟක් සේවාවක් කරන අය ඒ කරුණු ඉදිරිපත් කළාට ස්සේ ඒ සමාජ සේවා සලකා බලා සුවිශේෂී අවස්ථාවලදී ඔවුන්ටත් ඒ පත්වීමක් දෙන්න හැකියාව ලැබෙනවා, නව නියෝග යටතේ. මෙතෙක් ඒවා පාලනය කිරීම සඳහා කිසිදු රෙගුලාසියක් තිබුණේ නැහැ. ඒ එක්කම ඒ තනතුර ලද තැනැත්තෙක් ඒ තනතුර වැරදි විධියට භාවිත කරනවා නම්, ඒ තනතුරට අගෞරවයක් වන විධියට කටයුතු කරනවා නම් ඒ තනතුර අහිමි කරන්නත් මෙහි විධිවිධාන සකස් කරලා තිබෙනවා.

ඒ එක්කම අපට තිබෙන ප්‍රායෝගික ප්‍රශ්නයක් තමයි, මේ සාමදාන විනිසුරුවරුන් පත් කළාට ඒ සාමදාන විනිසුරුවරුන් කොච්චර ඉන්නවාද, කවුද ඉන්නේ, කොහේද ඉන්නේ කියලා අපට හරි තොරුතුරු වාර්තාවක් නැති එක. මොකද, බොහෝ අය මිය ගිහිල්ලා. විශේෂයෙන්ම අපට මේක ගැන කල්පනා කරන්න සිද්ධ වුණේ මේ කාරණය නිසායි. අධිකරණවල විශාල වශයෙන් නඩු ගොඩගැහිලා තිබෙනවා. බොහෝ වෙලාවට නඩුවලට ඉදිරිපත් වෙනවා, මිය ගිය සමාදාන විනිසුරුවරුන්ගේ මුද්‍රාව භාවිත කර ඉදිරිපත් කරන බොරු දිවුරුම් ප්‍රකාශ. අධිකරණවලට, තානාපති කාර්යාලවලට, විදේශ කටයුතු අමාත්‍යාංශයට ඒවා ඉදිරිපත් කරලා නොයෙකුත් වැඩ කර ගන්න සමහර අය පෙළඹිලා තිබෙනවා. ඒ සඳහාම සූදානම් වෙච්ච ඒ වාගේ සහතික නිකුත් කරන්න සූදානම් වෙච්ච ව්‍යාපාරික පන්තියකුත් ඉන්නවා. ඒ ගොල්ලන් සල්ලිවලට ඒ කටයුත්ත කරනවා. ඒ නිසා මේ තොරතුරු හරියට දැනගන්න ඕනෑ නිසා අපි සාමදාන විනිසුරුවරුන්ගේ ලේඛනයක් හැදුවා.

අපි ඒ ලේඛනය වාර්ෂිකව යාවත්කාලීන කරන්න ඕනෑ. ඒ සඳහා සෑම වසර දෙකකටම වරක් මාර්තු මාසයේ 31වන දාට ප්‍රථම සාමදාන විනිශ්චයකාරවරුන් තමා ජීවතුන් අතර ඉන්නවා කියලා ග්‍රාම නිලධාරිවරයා මඟින් සහතික කරවාගෙන අමාත්‍යාංශයට එවන්න ඕනෑ. එසේ එවන්නේ නැත්නම් අවුරුදු දෙකකට පසුව අපි පූර්ව නිගමනයකට එනවා, ඒ තැනැත්තා ජීවතුන් අතර නැහැ කියා හෝ එම ධුර කාලය දීර්ඝ කර ගන්න ඔහුට අවශ්‍ය නැහැ කියලා. ඉදිරියේදී අපි ඒ තොරතුරු යාවත්කාලීන කරලා ඒ අය කවුද කියා රටේ ඕනෑම කෙනෙකුට දැන ගැනීම සඳහා වෙබ් අඩවියක් හරහා තොරතුරු ඉදිරිපත් කරනවා. එහෙම කරන්න හේතුවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් අධිකරණවලට දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කළාම සමහර වෙලාවට අනෙක් පාර්ශ්වයෙන් කියනවා, "එහෙම සාමදාන විනිශ්චයකාරවරයෙක් නැහැ" කියලා. එතකොට අමුතුවෙන් උත්සාහයක් දරන්න ඕනෑ, ඒ මනුස්සයා ජීවතුන් අතර ඉන්නවා, ඔහුට සාමදාන විනිශ්චයකාර තනතුර නිල වශයෙන් හා වලංගු ලෙස දීලා තිබෙනවා කියා ඔප්පු කරන්න. ඒ ඔක්කෝම ඔප්පු කරන්න වෙනවා. එය පාර්ශ්වකරුවන්ට අනවශ්‍ය බරක්. මේ යටතේ අපි database එකක් හදනවා රටේ ජනතාවට ඒ තොරතුරු දැන ගන්න පුළුවන් වන ආකාරයට. අපේ register එකක් හදලා, ඒ register එක අන්තර්ජාලයේ වෙබ් අඩවියකට එකතු කළාට පසුව ජනතාවට, අධිකරණයට, විනිසුරුවරුන්ට ඕනෑ වෙලාවක ඒ තොරතුරු ලබා ගන්න පුළුවන්; ඒ තොරතුරුවල අව්‍යාජභාවය - genuineness - සහ සත්‍යතාව තහවුරු කර ගන්න පුළුවන්. ඒ අනුව මෙම පනත් කෙටුම්පතත්, නියෝගත් සම්මත කර ගැනීම මේ වෙලාවේ ඉතා වටිනා කාරණයක්.

ඒත් එක්කම කියන්න ඕනෑ, සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ගැනත්. මට පෙර අධිකරණ අමාත්‍ය ධුරයේ හිටපු අපේ ගරු අලි සබ්‍රි මැතිතුමා විසින් සිවිල් නීති වෙනස් කිරීම සඳහා කමිටුවක් පත් කරලා තිබෙනවා. අපි ඒ කමිටුවට විෂයයන් බෙදලා විශාල වගකීම් පවරා තිබෙනවා. ඒ නම් මම ඉදිරිපත් කරනවා, කමිටුවේදී සභාගත කරන්න. එතුමා ආරම්භ කරපු ඒ ක්‍රියා දාමය තමයි මෙසේ ඉදිරියට ගෙනැවිත් අද වන කොට අපට පුළුවන්කම ලැබුණේ, රටට, අදට, කාලයට ගැළපෙන ආකාරයේ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට. මීට සහාය දුන් සියලුදෙනාට මගේ ස්තුතිය පුද කරන ගමන්, මෙම පනත් කෙටුම්පත සහ නියෝග සම්මත කර දෙන ලෙස සියලු ගරු මැති ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන්ගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Member?

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු ඇමතිතුමා එකඟ නම් පැහැදිලි කරවා ගැනීමක් කර ගන්නට තිබෙනවා. ගරු ඇමතිතුමනි, මෙය අධිකරණය හා සම්බන්ධ කාරණාවක්. හිටපු අධිකරණ ඇමතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා.

ගරු ඇමතිතුමනි, අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් වන කාරණා වෙනුවෙන් ඔබතුමා ලොකු මැදිහත් වීමක් කරනවා. හැබැයි ගරු ඇමතිතුමනි, පරිබාහිර අදෘශ්‍යමාන හස්ත ක්‍රියාත්මක වෙමින් මේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් විනාශ කරන ක්‍රියාවලියක් සිදු වෙනවා. ඒක රාජ්‍ය සහ රාජ්‍ය නොවන විධියට ක්‍රියාත්මක වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, that is not a point of Order.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු ඇමතිතුමාගේ අවසරය පරිදි පැහැදිලි කර ගැනීමක් කරන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ගරු ඇමතිතුමා එකඟ නම්-

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

ගරු ඇමතිතුමනි, අධිකරණ විනිශ්චයකාරවරුන් මාරු කිරීම අධිකරණ සේවා කොමිෂන් සභාවේ ප්‍රධානත්වයෙන් සිදු කරන සම්මත පටිපාටියක් මෙතෙක් කාලයක් තිබුණා. නියමිත අවුරුදු ගණනින් පසුව මාරුවීම් ලබා දීම ඉතා විධිමත්ව කෙරුණා. ඊයේ පෙරේදා කොළඹ මහාධිකරණයේ අංක 01හි විනිසුරු දමීත් තොටවත්ත මහත්මයා කිසිම හේතුවක් හෝ පදනමක් හෝ නැතුව හෝමාගමට මාරු කර තිබෙනවා. එතුමා ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරයෙක්. එතුමා හෝමාගමට මාරු කර තිබෙනවා. ඒ කාරණය ගැන අභ්‍යන්තරයෙන් කියැවෙන කථාව තමයි, ගල්කිස්ස විනිශ්චයකාරවරයාගේ අක්‍රමිකතා සම්බන්ධයෙන් ලබා දුන් ස්ථාන මාරුව සහ වැඩ තහනම් කිරීමට අදාළ ක්‍රියාවලියට මැදිහත් වීම නිසා සිදු වුණු දෙයක් කියන එක. අද රටේ යන්තම් හෝ ඉතුරු වෙලා තිබෙන්නේ අධිකරණ පද්ධතිය විතරයි. අද අනෙක් සේරම විනාශ වෙලා ඉවරයි නේ. ව්‍යවස්ථාදායකයත් විනාශ වෙලා ඉවරයි. විධායකයත් තුට්ටු දෙකට වැටිලා තිබෙන්නේ. අධිකරණය ගැන විතරයි යම් විශ්වාසයක් ගොඩ නැගිලා තිබෙන්නේ. දැන් එයටත් අදෘශ්‍යමාන විධියට යම් යම් බලපෑම් ඇති වන බව පෙනෙනවා. අඩුම ගණනේ අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ ස්ථාන මාරුවීම් හා උසස්වීම් ලබා දීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් කෙරෙන බලපෑම් වළක්වා ගැනීමට අවශ්‍ය නීතිවත් සකස් වන්නේ නැද්ද ගරු ඇමතිතුමනි?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහාධිකරණ, දිසා අධිකරණ, මහෙස්ත්‍රාත් අධිකරණ, ප්‍රාථමික අධිකරණ ඇතුළු සියලු අධිකරණවලට විනිසුරුවරුන් පත් කිරීම, මාරු කිරීම හා විනය පාලනය කිරීම ආදියෙහි පූර්ණ බලධාරියා විධියට ඉන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවයි. ඒ නිසා අධිකරණ සේවා කොමිෂන් සභාවට අයිතියක් තිබෙනවා ස්වාධීනව තීන්දු තීරණ අරගෙන ඒ පිළිබඳව කටයුතු කරන්න.

ගරු මන්ත්‍රීතුමා ඔය කාරණය පසුගිය මාසයේ 19වන දා මම මේ ගරු සභාවට ඉදිරිපත් කරපු යම් සිද්ධියකට සම්බන්ධ කරලා අහපු නිසා මට කෙටි උත්තරයක් දෙන්නට පුළුවන්. මේ පිළිබඳව ඔබතුමාට වැඩිදුර උත්තරයක් අවශ්‍ය නම්, අධිකරණ සේවා කොමිෂන් සභාවට ලියලා ඒ ලැබෙන උත්තරය ගෙනැල්ලා ඔබතුමාට ලබා දෙන්න මට පුළුවන්.

හැබැයි, මේ කියන ආරංචිය මට ලැබුණා. කොළඹ මහාධිකරණයේ ප්‍රධාන විනිසුරු ගරු දමීත් තොටවත්ත මැතිතුමා හදිසියේම හෝමාගමට මාරු කළා කියන කාරණය පිළිබඳව විශාල කතා බහක් රට තුළ ඊයේ හවස ඉඳලා ඇති වෙලා තිබෙනවා. අපෙනුත් ඒ පිළිබඳව අහනවා. ඒ සම්බන්ධයෙන් මා දන්නා කරුණක් විතරක් මම ඉදිරිපත් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

පසු ගිය මස 19වන දා මම මේ සභාවට ඉදිරිපත් කළා, අධිකරණ ක්ෂේත්‍රයේ වෙච්ච වැරදි දේවල් කීපයක් හා සම්බන්ධ කරුණු කීපයක්. ඒවායෙන් එකක් තමයි ගල්කිස්ස අධිකරණ ශාලාවෙන් නිල නිවසට අනවසර ලෙස, නීති විරෝධී ලෙස විදුලිය ලබා ගැනීම පිළිබඳ කාරණය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ සම්බන්ධව මා මෙම සභාවට කථා කළේ, අප විසින් පියවර ගණනාවක් අරගෙන තිබියදීත් ඒවා පිළිබඳව තීන්දු තීරණ නොගත් අවස්ථාවක.

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙන්න මේ වාගේ දෙයක් සිද්ධ වෙලා තිබෙනවා කියලා ඒ පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කළා, එම නිල නිවසට පැමිණි නව දිසා විනිසුරුතුමිය විසින්. ඒ වාගේම, නීතිඥ මණ්ඩලයත් අපට ඉදිරිපත් කරලා තිබුණා, මෙන්න මේ වාගේ වැරදි දෙයක් මෙතැන සිද්ධ වෙලා තිබෙනවා කියලා. ඒ අනුව අපි අධිකරණ සේවා කොමිෂන් සභාවට දැනුම් දුන්නා, මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වන්න කියලා. අධිකරණ සේවා කොමිෂන් සභාව ඒ පරීක්ෂණය පැවැත්වීම සඳහා කොළඹ මහාධිකරණ විනිසුරුතුමාට දැනුම් දීලා තිබෙනවා. මොකද, එතුමාගේ බල ප්‍රදේශයට තමයි මහාධිකරණ කලාපය විධියට ඒ අධිකරණයත් අයිති. ඒ නිසා එතුමාට දැනුම් දීලා තිබෙනවා, මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න කියලා. එතුමා අධිකරණ සේවා කොමිෂන් සභාවට ලියා තිබෙනවා, -අපේ ලේකම්වරයාටත් එහි පිටපතක් ලැබී තිබුණා- ගල්කිස්ස අධිකරණ ශාලාව, භූමිය, ගොඩනැගිලි අයිති අධිකරණ සේවා කොමිෂන් සභාවට නොව, අධිකරණ අමාත්‍යාංශයටයි, ඒ නිසා මේ පිළිබඳව පියවර ගත යුත්තේ අධිකරණ අමාත්‍යාංශයයි කියලා. ඒ අනුව මම අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්, අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන), අතිරේක ලේකම් (ඉංජිනේරු) කියන තුන්දෙනාගෙන් සමන්විත කමිටුවක් පත් කරලා වාර්තාවක් ලබා ගත්තා, ඇත්ත වශයෙන් එහෙම දෙයක් වෙලා තිබෙනවාද කියලා සොයන්න. ඒ වාර්තාවෙන් ඉදිරිපත් කළා, ජලය සහ විදුලිය කියන සම්බන්ධතා දෙකම එම නිල නිවසට වැරදි විධියට අරගෙන තිබෙනවා කියන කාරණය. එතකොට අපි ඒ වාර්තාව එක්ක අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමාට යොමු කළා, අවශ්‍ය පියවර ගන්න කියලා. ඒ පියවර ගැනීම හරහා අපට දැන ගන්න ලැබුණා, කොළඹ මහාධිකරණ විනිසුරු ගරු තොටවත්ත මැතිතුමාගෙන් දවස් දෙකක් ප්‍රශ්න කරලා තිබෙන බව. අපට ලැබුණු තොරතුරු අනුව, එතුමා ඒකට පියවර නොගත්තේ ඇයි කියනවා වාගේ කාරණයක් තමයි ඒකෙන් මතු කරලා තිබෙන්නේ. ඇත්ත වශයෙන් මම විශ්වාස කරනවා, එතුමාගේ තීරණය නිවැරදියි කියලා. මොකද, අධිකරණ ගොඩනැගිලි පාලනය තිබෙන්නේ අමාත්‍යාංශයට නිසා එතුමා නිවැරදි දේ කරලා තිබෙනවා. එතුමා ඒ නිවැරදි දේ කරලා දැනුම් දුන්නාට පසුව, මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ මතු වීමෙන් අනතුරුව, විමර්ශනයක් කරපු බව අධිකරණ සේවා කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට ලිඛිතව දැනුම් දුන්නා. ඒ ලිපිය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා, ගරු කථානායකතුමා විසින් පසුගිය පාර්ලිමේන්තු සනිසේදී.

මේ අනුව ගත්තාම, පිටතට පෙනෙන්නේ, ගරු තොටවත්ත ප්‍රධාන මහාධිකරණ විනිසුරුතුමා මාරු කිරීම හරහා රටට දැනෙන්නේ ඒ ගරු මන්ත්‍රීතුමා අහපු දේම තමයි; එතුමාට දැනෙන දේම තමයි. ඒක තමයි, එතුමාට යම්කිසි දඬුවමක් ලබා දීලා තිබෙනවා නේද කියන කාරණය. ඇත්ත වශයෙන් ඒ විදුලි සම්බන්ධීකරණය පිළිබඳව එවකට හිටපු මහෙස්ත්‍රාත්වරයෙකුගේ වැඩ තහනමට ලක් කරලා තිබෙනවා, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින්. හැබැයි, මේ කාරණය සම්බන්ධව අපේ පැත්තෙන් වෙන්න ඕනෑ යුක්තිය අප ඉෂ්ට කරන්න ඕනෑ කියලා මම හිතනවා. මොකද, ගරු තොටවත්ත මැතිතුමා -කොළඹ මහාධිකරණ විනිසුරුතුමා- කිසිම වරදක් කරලා නැහැ. අප කරපු පරීක්ෂණ අනුව, අපේ වාර්තා අනුව අපට පැහැදිලිව කියන්න පුළුවන්, ගරු දමිත් තොටවත්ත කොළඹ මහාධිකරණ විනිසුරුතුමා ඔය කියන සිද්ධියට කිසිම සම්බන්ධයක් නැහැ කියන එක. ඒ සිද්ධියට සම්බන්ධ පරීක්ෂණ කිරීමේ කටයුතුවලදීත් එතුමා කිසිම වැරදි දෙයක් හෝ අවිධිමත් දෙයක් කරලා නැහැ. අපි දන්නවා, එතුමා පිළිබඳව. එතුමා අධිකරණ ක්ෂේත්‍රයේ ඉන්න ඉතා ගෞරවයට පාත්‍ර වෙච්ච, යුක්තිය පසිඳලීම ඉතා ඉහළ මට්ටමින් කරන ගෞරවනීය විනිසුරුතුමෙක් කියන කාරණය අපි කියන්න ඕනෑ.

මොකද, එහෙම නොකළොත් එය අධිකරණ ක්ෂේත්‍රයේ සිටින සියලු විනිසුරුවරුන්ට අපි කරන මදි පුංචිකමක් වෙනවා. එතුමා මේ සිද්ධියේදී කිසිදු වරදක් කර නැති බවත්, එතුමා ඉතා අවංකව, කටයුතු කරමින් අධිකරණ ක්ෂේත්‍රයට ගෞරවයක් ගෙන දුන් විනිසුරුවරයෙක් බවත් මා ප්‍රකාශ කරනවා. අප තුළ ඒ ගෞරවය එතුමාට තිබෙනවා. එතුමා පිළිබඳව වැරදි අවබෝධයක් රටේ ජනතාව තුළ ඇතිවීම වැළැක්වීම අපේ යුතුකමක් නිසා තමයි මම එහෙම කියන්නේ. නමුත් මාරුවීම් පිළිබඳව හෝ වෙනත් විනය කටයුතු පිළිබඳව උත්තර දෙන්න මට මේ අවස්ථාවේ බැහැ. අධිකරණ සේවා කොමිසමෙන් ඒ පිළිබඳව ඉල්ලීමක් කරලා ඒ ලැබෙන තොරතුරු මම මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Chandima Weerakkody. You have seven minutes.

[අ.භා. 12.58]

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අධිකරණ ඇමතිතුමා මේ රටේ නීතිය යහපත් කරන්න, නීතිය ශක්තිමත් කරන්න වැදගත් නීති සංශෝධන කිහිපයක් ගෙනැවිත් තිබෙනවා, ප්‍රායෝගිකව කටයුතු කිරීමේදී පුද්ගලයන් පත්වන අපහසුතාවලින් මිදෙන ආකාරයට නීතිය ක්‍රියාත්මක කිරීමට හැකි වෙන ආකාරයට. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ ප්‍රායෝගිකව සිදු වෙන තත්ත්වය අතිශය භයානකයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, ගාලු අධිකරණ සංකීර්ණය ගැන. ඔබතුමාත්, ජනාධිපතිවරයාත් එය විවෘත කිරීමේ උත්සවයට ගියා. ඔබතුමා දන්නවා, ඒ ගොඩනැගිල්ල හදා ඉවර වෙලා තිබුණේ නැහැ කියලා. අඩු ගණනේ කපරාරුවවත් ඉවර කරලා තිබුණේ නැහැ. රටේ නීතියට අනුව පාර අයිනේ තාප්පයක් හදනකොට, ඒ සඳහා අනුමැතියක් ගන්න ඕනෑ. මම මහාමාර්ග අමාත්‍යාංශයෙන් ඒ ගැන ඇහුවාම කිව්වා, ඒ අවශ්‍ය අනුමැතිය ගන්නේත් නැතුව අනවසර විධියට තමයි ගාලු අධිකරණ සංකීර්ණයේ තාප්පය ඉදිකර තිබෙන්නේ කියලා. එතකොට, නීති විරෝධී ලෙස ඉදිකළ තාප්පයක් සම්බන්ධ නඩුවක් දැම්මොත්, ඒ නඩුව අහන්න වෙන්නේත් නීති විරෝධී තාප්පයක් තිබෙන ගොඩනැගිල්ලක් තුළයි. ඒ වාගේම තමයි ගරු ඇමතිතුමනි, විදුලිය ලබා ගැනීමේදී සිදු කර තිබෙන කටයුතු. ඔබතුමා දන්නවා, මේ රටේ ඕනෑම කෙනෙකු නිවසක් හෝ ගොඩනැගිල්ලක් හෝ හදා ඉවර වුණාම විදුලිය සම්බන්ධතාව ගන්න නම්, Chartered Electrical Engineer කෙනෙකුගේ සහතිකය ගන්න ඕනෑ, "සියලු කටයුතු අවසානයි, විදුලිය බලය balance කිරීම කර තිබෙනවා, අනතුරක් වෙන්නේ නැහැ" කියලා. නමුත් ඔබතුමා දකින්න ඇති, එම ගොඩනැගිල්ලේ කම්බි වයර් එල්ලෙන හැටි. තවම ඒ කටයුතු අවසන් කරලා නැහැ. හැබැයි, LECO එක විදුලිය සම්බන්ධතාව දීලා තිබෙනවා. ඒ කියන්නේ, එතැන හොරට විදුලියත් ගත්ත තැනක්.

රටේ අධිකරණ ඇමතිතුමා හැටියට ඔබතුමාත් ගියා, එය විවෘත කිරීමේ අවස්ථාවට. එතකොට රටේ අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු සියලු විනිශ්චයකාරවරුත් ආවා. එසේ හොරට විදුලිය ගත්තු තැන, හොරට තාප්පය හදපු තැන, CoC එකක් නැති තැනට - *[බාධා කිරීමක්]*

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි (කලානිති) විජයතාස ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ඔබතුමා කලින් දවසේ ගියා නේ, -

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි සන්තිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මටත් ආරාධනයක් ලැබුණාම මම ගිහිල්ලා බැලුවේ, එතැනට යන්න සුදුසුද කියලායි. කලින් දවසේ නොවෙයි, එදා උදේ ගියේ. එදා උදේ 11.30ට විතර ගිහිල්ලා මම බැලුවා. කපරාරු කරලාත් නැහැ, වයර් එල්ලෙනවා. ජේන්ටි කර තිබුණේ භාගෙට. පෙනෙන ටික විතරයි ජේන්ටි කර තිබුණේ. මහ රෑ තමයි තණකොළ ටික ගෙනැල්ලා ඉන්දුවේ. රටේ අග්‍ර විනිශ්චයකාරතුමාත් එතැනට ගිහින් හිටියා. මේ විධියට නම් රටේ නීතිය නවන්නේ, මේ රජය යටතේ, මේ ජනාධිපතිවරයා යටතේ කවුද එතකොට ඒවාට වගකියන්නේ? ජනාධිපතිද? දැන් වෙනකොට LECO එක එම ගොඩනැගිල්ලට විදුලිය ලබා දීලා නේ තිබෙන්නේ. එතකොට කාට හෝ කරන්ට එක වැදුණොත් ඔබතුමාද, ජනාධිපතිද, රමේෂ් පතිරණද ඒකට වගකියන්නේ?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි (කලානිති) විජයතාස ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ඒකට වගකියන්න ඕනෑ, ඔබතුමා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒකට වගකියන්න ඕනෑ මෙතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා ගිහිල්ලා මුල්ගලක් තිබ්බා, මඩ වළක; ඉඩ ප්‍රමාණය අඩු තැනක. ඒකට වියදම් කරද්දී මම කිව්වා, අපි බුස්ස ප්‍රදේශයෙන් හමුදාවට අයත් අක්කර දහයක් පවරා ගත්තා. එතැන අංගසම්පූර්ණ අධිකරණ සංකීර්ණයක් හදන්න පුළුවන්, ඒකට ලෑස්ති වෙනකොට, ඔබතුමාත් දැඩි ලෙස ඊට විරුද්ධ වුණා. අපිට එතැන ඉඩකඩ තිබුණේත් නැහැ. ඊට පසුව අපි වටේ තිබෙන ඉඩම් අත්පත් ගැනීමට කටයුතු කළා. ඒ ඉඩම් අයිතිකරුවන්ට වන්දි ගෙවන්න ලෑස්ති කරලා තමයි එම කටයුතු කළේ. ඔබතුමන්ලා තමයි ඒක වෙන තැනකට - *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි සන්තිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන අහපු එක හොඳයි. ඔබතුමා ගාල්ල ගැන දන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. ඒ අධිකරණ සංකීර්ණය හදන්න හැදුවේ මඩවළක නොවෙයි. අනෙක් එක බුස්ස තිබෙන්නේ ගාල්ලේ නොවෙයි. ඔබතුමා ජනාධිපති නීතිඥවරයෙක්. ඔබතුමා දන්නවා අධිකරණ සංකීර්ණය බුස්සට ගෙනිච්චොත් ඒක අයිති වෙන්නේ ගාල්ලට නොවෙයි කියන එක. එතකොට ඒක ළඟ බලපිටියට. ප්‍රායෝගිකව එක බුස්සට ගෙනියන්න හැදුවේ කවුද කියන එකත්, ගෙනියන්න හැදුවේ මොකද කියන එකත්, ඒකට නීතිඥවරු අවශ්‍යයි කියන එකත්, අල්ලපු ඉඩම් ටික අත්පත් කරගන්න අපි කටයුතු කරලා තිබෙන අවස්ථාවේ ඒක නැවැත්වුවේ කවුද කියන එකත් ඔබතුමා දන්නවා. අපි කිව්වේ, "තව මාස 6, 7කින් මේක හරියට හදලා ඉවර කරන්න පුළුවන්" කියලායි. නමුත් නීතිය නැව්වේ ඇයි? මේ එක කාරණයක්.

ඒ වාගේම තමයි, මේ මොහොතේ මැතිවරණ නීති උල්ලංඝනය කිරීමත්. ඒක කරන්නේ නිකම් කජු කනවා වාගෙයි. දැන් අලුත්ම දේ තමයි මැතිවරණ නීතිය උල්ලංඝනය කිරීමක් පිළිබඳ පැමිණිලි කළාම, ඒ පැමිණිල්ල පිළිබඳව මැතිවරණ කොමිසම නියෝගයක් දුන්නාම, ඒ නියෝගය ක්‍රියාත්මක කරන්නේ නැතුව ආණ්ඩුකාරයෝ, අමාත්‍යාංශ ලේකම්ලා, සභාපතිලා ඒක නීතිපතිවරයාට යවන එක. එහෙම යවන්නේ ඇයි? ගරු ඇමතිතුමනි, ඔබතුමාත් මමත් දන්නවා, නීතිපතිවරයාට යැව්වාම ටික කාලයක් යන බව. එතකොට ඒ කාලයත් උල්ලංඝනය කරන්න පුළුවන්.

අද අපේ දිස්ත්‍රික්කයේ ස්වාමීන් වහන්සේලාට ආධාර දෙන්න උන්වහන්සේලා එකතු කරනවා, බස්වලින් කොළඹට වඩම්මවන්න. දරුවන්ට ආධාර දෙන එක හොඳයි. *[බාධා කිරීම්]* නැහැ. ඔබතුමන්ලා ස්වාමීන් වහන්සේලා කොළඹට වඩම්මනවා නම් ඒක හොඳයි. නමුත් හාමුදුරුවන්ටත් අගෞරව කරමින් තමයි හදිසියේ ගෙන්වලා දානයක් හැටියට මුදල් දෙන්න හදන්නේ. අදත් රට ගිහිල්ලා ආපු කට්ටියට රුපියල් 50,000ක් දෙනවා. ජනාධිපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මේ සතියේ ගාලු එනවා. සමෘද්ධි නිලධාරීන් දාලා සමෘද්ධිලාභීන් එකතු කරනවා එතුමා හරහා සහතික දෙන්න. ඔවුන් කොහොමද ගේන්නේ? බස්වලින් ගේන්නේ. රැකියාවට රට ගිහිල්ලා ඉන්න පවුල්වලට රුපියල් 25,000ක් දෙන්න කථා කරනවා. කාන්තාවන් සවිබල ගන්වන්න කියලා නොයෙක් දේවල් කරනවා. හිටපු ගමන් තමයි මේවා කරන්නේ. මේවා අමාත්‍යාංශවල වැඩ පිළිවෙළේ නැහැ.

අපි දැන් අධිකරණය ගැන කථා කරනවා. පාර්ලිමේන්තුවේ- *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්නකෝ. මේ කාරණය ඔබතුමාට අදාළයි නේ. ඔබතුමා මේ පණිවුඩය හරි ගෙනියන්න. දැන් විශේෂිත නඩුවක් දාලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ පාර්ශ්වයේ ඉන්න අපේ මිත්‍ර හරින් ප්‍රනාන්දු මැතිතුමා සහ මනුෂ නානායක්කාර මැතිතුමා පක්ෂයෙන් නෙරපීම සම්බන්ධ නඩුව දිගින් දිගටම කල් යනවා කියලා මිනිස්සු අපෙන් අහනවා, "මේ නඩුවට විතරක් තීන්දුවක් දෙන්නේ නැත්තේ ඇයි" කියලා. ඩයනා ගමගේ හිටපු මන්ත්‍රීතුමියගේ නඩුවත් කල් ගිහිල්ලා, කල් ගිහිල්ලා, කල් ගිහිල්ලා අවසානයේ තමයි තීන්දුවක් ආවේ. මේ සියලු දේවල් සකස් කරලා තියෙද්දි මිනිසුන් තුළ- ගරු ඇමතිතුමනි, ඔබතුමා පැහැදිලිවම දන්නවා "Justice must not only be done, but must also be seen to be done" කියන කථාව. ඒක බොහොම ප්‍රචලිත කථාවක්. නීති ක්‍රියාත්මක කරන්න මොන පොත හැදුවත්, මොන සංශෝධනය ගෙනාවත් අපි අද හැම තැනම දකින්නේ නීතිය නවන්න හදන බව. වර්තමාන ජනාධිපතිවරයාත් නීතිඥවරයෙක් නේ, උසාවි නොගියාට. ඒ නිසා එතුමාට ඒක හොඳට තේරෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි සන්තිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
Sir, give me just one second. I will wind up.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ ආකාරයට නීතිය අවභාවිත කරලා, මැතිවරණ නීතිය දිගින් දිගටම දවසෙන් දවස උල්ලංඝනය කරලා, මේ ආකාරයට කටයුතු කරලා තමන් අපේක්ෂකයා බව දැන දැන රාජ්‍ය සම්පත් උපයෝගී කරගෙන තමන්ගේම අපේක්ෂකකම ප්‍රවර්ධනය කරන්න කටයුතු කිරීමට එරෙහිව පාරට බහින්න කාලය අපට එළැඹිලා තිබෙනවා කියන එක මේ වෙලාවේ කියන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you. - *[Interruption.]* Yes, Hon. Minister?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා නීතිමය කටයුතු, අධිකරණ කටයුතු පිළිබඳව තිබෙන බරපතළ කාරණා කිහිපයක් සඳහන් කරපු නිසා මම එතුමාගේ කථාව ගරු අගවිනිසුරුතුමාට යොමු කරන්නම්, අවධානය යොමු කරන්න කියලා.

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

මම ඒක අගය කරනවා. මොකද, අනාගතයේ හෝ අග්‍ර විනිශ්චයකාරතුමා හෝ විනිසුරුවරුන් මේ ආකාරයෙන් සමිච්චලයට ලක්වන ආකාරයට රාජ්‍ය නායකයන් කටයුතු නොකරයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. Jayantha Weerasinghe. You have 18 minutes.

[අ.භා. 1.07]

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අධිකරණ ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මෙම වැදගත් පනත් කෙටුම්පත පිළිබඳව විවාද කරන අද දිනයේ ඒ පිළිබඳව මගේ මතය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව ප්‍රථමයෙන්ම මම ඉතා සතුටු වෙනවා.

ඊට ඉස්සෙල්ලා මම කාරණාවක් කියන්නම්. ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් යොමු කළා, කොළඹ මහාධිකරණයේ අංක 1 උසාවියේ විනිශ්චයකාරවරයා හැටියට කටයුතු කරන දමිත් තොටවත්ත මැතිතුමා හදිසියේ හෝමාගම මහාධිකරණයට මාරු කර තිබෙනවාය කියලා. එතුමා එම කාරණාව පිළිබඳව අපේ අවධානය යොමු කිරීම ගැන මම එතුමාට ඉතාම ස්තුතිවන්ත වෙනවා. ඒත් එක්කම ගරු අධිකරණ ඇමතිතුමා පැහැදිලිව ප්‍රකාශ කළා, එම විනිශ්චයකාරතුමා ඉතාම කීර්තිමත්, හොඳ විනිශ්චයකාරවරයෙක් කියලා. මම ඒක මේ ගරු සභාවේ දී කියන්නට ඕනෑ. ගරු විනිශ්චයකාර දමිත් තොටවත්ත මැතිතුමා ගැන අධිකරණ ඇමතිතුමා දීපු ඒ වරිත සහතිකයට ඒ උසාවිවල වැඩ කරන ජනාධිපති නීතීඥවරයෙකු හැටියට මම අධිකරණ ඇමතිතුමාට දහස් වාරයක් හිස නමා ස්තුති කරනවා. එම විනිශ්චයකාරතුමා ගැන මම ඉතා හොඳින් දන්නවා. කිසිම දවසක වරදක් කරන්න තියා හිතන්නේවත් නැති, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. (Mrs.) Rohini Kumari Wijerathna to the Chair?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, I propose that the Hon. (Mrs.) Rohini Kumari Wijerathna do now take the Chair.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඩ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair, and THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA took the Chair.

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)

මූලාසනාරූඩ ගරු මන්ත්‍රීතුමියනි, මම පැහැදිලිව මේ කාරණය කියන්නට ඕනෑ. ඉතා කීර්තිමත් ලෙස, සර්ව සාධාරණ ලෙස කිසිම කෙනෙකුට ඇඟිල්ලක් දිගු කරන්න බැරි වෙන විධියට, කිසිම චෝදනාවක් එන්නේ නැති විධියට කටයුතු කරන ශ්‍රේෂ්ඨ ගරු විනිශ්චයකාරතුමෙක් තමයි දමිත් තොටවත්ත මැතිතුමා. ගරු අධිකරණ ඇමතිතුමා ඒ බව මෙතැන දී ප්‍රකාශ කළා. මම ඉතාම සතුටින් ඒක ස්ථිර කරලා තිබෙනවා. එතුමා එවැනි අසාධාරණයකට ලක් වෙලා තිබෙනවා නම්, කරුණාකරලා ඒ පිළිබඳව හැකි පියවරක් අරගෙන එතුමාට සාධාරණයක් ඉෂ්ට කරන්න කියලා මා ඉල්ලනවා.

මූලාසනාරූඩ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ ගෙනැවිත් තිබෙන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ඉතා කාලෝචිත පනත් කෙටුම්පතක්. මම එහෙම කියන්නේ මේ නිසායි. ආර්ථිකය ඉදිරියට යන්න අවශ්‍ය ආයෝජන මේ රටට ගෙන්වා ගන්න අවශ්‍ය යුගයක සිවිල් නීතිය හරියාකාරව හදලා, ඒ තිබෙන අඩුලුහුඩුකම් හැදුවේ නැත්නම් අපි මේ රටට ඔය ගෙනෙන්න හදන ආයෝජන සිහිනයක් පමණක් වෙනවා. මෙය මීට පෙර කළ යුතුව තිබුණු දෙයක්. එම නිසා, සිවිල් නීතිය පිළිබඳව මේ ගෙනැවිත් තිබෙන ඉතාම බුද්ධිමත් අලුත් සංශෝධන පිළිබඳව ගරු අධිකරණ ඇමතිතුමාට මම නැවත වාරයක් ස්තුතිවන්ත වෙනවා.

සිවිල් නීතිය ගැන මම ඉංග්‍රීසියෙන් වගන්තියක් කියන්නම්. Why is the civil law important now? The civil law becomes important in the context of the present economic trend in the country and the aims of the Government to attract investment.

මූලාසනාරූඩ ගරු මන්ත්‍රීතුමියනි, ආයෝජන ගෙනෙන්න කියලා කටින් කිව්වාට බැහැ. ආයෝජන ගෙනාවාට පස්සේ ඒවා හරියට ක්‍රියාත්මක වෙන්න නම්, එයට අවශ්‍ය පරිසරයත් මේ රටේ තිබෙන්නට ඕනෑ. ඒ සඳහා අත්‍යවශ්‍ය අලුත් ප්‍රතිපාදන ගෙන ඒම ගැන ගරු අධිකරණ ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

ඊළඟට, සිතාසි බෙදනකොට මෙතෙක් කල් තිබුණු අඩු ලුහුඩුකම් සහ ඒ සඳහා අරගෙන තිබෙන විකල්ප පියවර ගැන ගරු අධිකරණ ඇමතිතුමා ප්‍රකාශ කළා. මේ පනත් කෙටුම්පත දිහා බලනකොට අපට පෙනෙනවා, වෙනත් ප්‍රදේශයක දී අසාධාරණයට ලක්වුණු කෙනෙකුට ඒ පුද්ගලයා සිටින ප්‍රදේශයේ

නඩු දැමීමට කටයුතු කරන්න පුළුවන් වීම සර්ව සාධාරණ ප්‍රතිපාදනයක් කියලා. මෙවැනි කාරණා නිසා මිනිස්සු කොච්චර අපහසුතාවට පත් වෙලා තිබෙනවාද කියලා අපි දන්නවා. ඒකෙන් වැරදි කරපු මිනිහාට නොවෙයි, අසාධාරණයට ලක් වෙන -අගතියට පත් වෙන- අහිංසක පාර්ශ්වයට තමයි ප්‍රශ්නය තිබෙන්නේ. එතුමා උදාහරණයක් විධියට ඉදිරිපත් කළා, කොළඹ පදිංචි මනුස්සයෙකු යාපනයට ගිහිල්ලා එහිදී සිදු වුණු ගනු දෙනුවක් සම්බන්ධයෙන් නඩු කියන්න ඒ මනුස්සයාට යාපනයට යන්න සිද්ධ වෙනවාය කියලා. එම නිසා ගරු අධිකරණ ඇමතිතුමා ගෙනාපු මේ අලුත් ප්‍රතිපාදන මම ඉතා අගය කරනවා. Criminal නඩු සම්බන්ධයෙන් කටයුතු කරන නීතිඥවරයකු වශයෙන් ඒවායේ තිබෙන අඩුලුහුඩුකම් පිළිබඳවත් ගරු අධිකරණ ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න මම බලාපොරොත්තු වෙනවා. එතුමා ඒ සම්බන්ධයෙනුත් මේ වාගේම සාධනීය පිළිතුරු අපට ලබා දෙයි කියලා මම හිතනවා. මම ඒ ගැන එතුමාගේ අවධානයට පසුව යොමු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධිකරණයට පෙරකලාසියක් ඉදිරිපත් කරනකොට තමන්ගේ විද්‍යුත් ලිපිනය, තැපැල් ලිපිනය දමන්න ඕනෑ කියලා ගරු අධිකරණ ඇමතිතුමා කිව්වා. Fax number එකක් තිබෙනවා නම් ඒකත් දමන්න ඕනෑ කිව්වා. ඇයි ඒ? එතකොට කිසිම බාධාවක් නැතුව, ප්‍රමාදයක් නැතුව සිතාසි බෙදන්න පුළුවන්. ඒ වැඩේ අනිවාර්යයෙන් කෙරෙනවා. අධිකරණ කටයුතුවල තිබෙන ප්‍රමාදය එයින් නැතිවෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම පනත් කෙටුම්පතේ තිබෙන ප්‍රතිපාදනවලට අවධානය යොමු කළොත්, මෙහි 8වන වගන්තියේ 61.(අ) යටතේ තිබෙනවා, "ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවාව හරහා සිතාසියක් භාර දෙනු ලබන විට..." කියලා. ඒක තමයි ඉතාම ඉක්මනින් සිතාසියක් භාර දෙන්න තිබෙන ක්‍රමය. ඇයි මේවා මීට ඉස්සෙල්ලා ගෙනාවේ නැත්තේ? අධිකරණ ඇමතිතුමා ඉතාම කාලෝචිත පියවරක් තමයි මේ අරගෙන තිබෙන්නේ. ඒ වාගේම කුරියර් සේවාව හරහා ගෙන ගොස් භාර දුන් බවට සාධක, විද්‍යුත් තැපෑල මඟින් සිතාසියක් යැව්වාම රෙජිස්ට්‍රාර්වරයා විසින් එය විද්‍යුත් තැපෑලෙන් යැවූ බවට සාධක නඩු වාර්තාවේ කොටසක් ලෙස ගොනුකොට තැබිය යුතු බවත් සඳහන් වෙනවා. මේවා තමයි දැනට තිබෙන ප්‍රමාදය අතුගා දමන්න ගෙන තිබෙන ඉතාම සාධනීය පියවර. එහි (ඇ) යටතේ, "වෙනත් යම් ආකාරයකට සිතාසියක් භාරදෙනු ලබන විට, එම භාරදීම පිළිබඳ දිවුරුම් ප්‍රකාශයක්" යනුවෙන් සඳහන් වෙනවා. ඔන්න ඔය දිවුරුම් ප්‍රකාශය තමයි අද මේ සම්මත කරන පනතේ ඉතාම වැදගත් කාරණය වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. සාමදාන විනිශ්චයකාරවරු සම්බන්ධව නීති-රීති ක්‍රියාත්මක වෙන්නේ අන්න එතැනින්.

මම ඒ කාරණයට ඉතා කෙටියෙන් අවධානය යොමු කරවන්නම්. මොකද දිවුරුම් ප්‍රකාශය දෙන්නේ, දිවුරුම් ප්‍රකාශය සකස් කරන්නේ සාමදාන විනිශ්චයකාරවරයකු විසින්. මම දැනුවත්ව අපේ නඩු කටයුතුවලදී සමහර සාමදාන විනිශ්චයකාරවරු -JPsලා- නොදැනුවත්කම නිසා හෝ වුවමනාවෙන්ම දිවුරුම් ප්‍රකාශයක් ලබා දීමේදී ඉතා වැරදි ආකාරයට බෞද්ධයෙකුට දිවුරුම් ප්‍රකාශයක් නිකුත් කරන ආකාරයටම වෙනත් ආගමික කෙනෙකුටත් දිවුරුම් ප්‍රකාශ නිකුත් කරනවා. දිවුරන්න කිව්වේ කාටද කියන එකවත් එම දිවුරුම් ප්‍රකාශයේ දමන්නේත් නැහැ. ඒ වාගේ නඩු අපි විසි කරලා තිබෙනවා, කඩලා තිබෙනවා. ඒ වාගේ නඩු අපි ඇස් දෙකට දැකලා තිබෙනවා. එම නිසා අධිකරණ සංවිධාන පනත යටතේ අද ගෙනෙන නියෝග තුළින් සාමදාන විනිශ්චයකාරවරුන් සම්බන්ධයෙන් ගෙන තිබෙන ක්‍රියා කලාපය ඉතා වැදගත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇපැල් උසාවියට සහ ශ්‍රේෂ්ඨාධිකරණයට අපි යම්කිසි ඉල්ලීමක් ඉදිරිපත් කරනකොට බොහෝ විට ඒක කරන්නේ දිවුරුම් ප්‍රකාශයක් හරහා. ඒක වැරදුණොත් එහෙම පිටින්ම නඩුවම ගඟේ දැම්මා, වතුරේ දැම්මා වාගේ විනාශ වෙනවා. ඒ නිසා මම අද ගොඩක් සතුටු වෙනවා, සාමදාන විනිශ්චයකාරවරු සම්බන්ධයෙන් ගෙනැල්ලා තිබෙන මේ ප්‍රතිපාදන ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සිවිල් නඩු විධාන සංග්‍රහයේ තිබෙන ඉතා වැදගත් කොටසකට මම අවධානය යොමු කරනවා. එ් වාගේම එම කොටසට ගෙනා සංශෝධනය ගැන මම සතුටු වෙනවා. ඒ අනුව, 68(1) වගන්තිය ඉතා වැදගත් වගන්තියක්. එහි සඳහන් වන්නේ, "චිත්තිකරු බන්ධනාගාරගතව සිටින්නේ නම්,..." ආදී වශයෙන්. ඒක තමයි යම් පුද්ගලයෙකුගේ අයිතිවාසිකම් කඩා දමලා, පොඩි පට්ටම් කරලා යුක්තිය, සාධාරණය විනාශ කරන්න පාවිච්චි කළේ. ඒකට අපේ ගරු අධිකරණ ඇමතිතුමා විශේෂ ප්‍රතිපාදනයක් හදලා තිබෙනවා.

එම ප්‍රතිපාදනය මෙසේයි:

> "චිත්තිකරු බන්ධනාගාරගතව සිටින්නේ නම්, චිත්තිකරු රඳවාගෙන ඇති බන්ධනාගාරය භාරව සිටින නිලධරයා වෙත කැඳවීම් නියෝග භාරදෙන්නා විසින් සිතාසිය භාරදෙනු ලැබිය යුතු අතර ඒ නිලධරයා විසින් පෞද්ගලිකව චිත්තිකරු වෙත සිතාසිය භාරදීමට කටයුතු සැලැස්විය යුතු අතර චිත්තිකරු විසින් සිතාසිය ලබාගත් බවට පිළිගැනීමක් ලබාගත යුතු ය."

මට පුදුම, අපි මෙච්චර කල් මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොකළේ ඇයි කියන එක ගැනයි. ගරු අධිකරණ ඇමතිතුමනි, මම ඔබතුමාට මේ සම්බන්ධයෙන් අනේක වාරයක් ස්තුතිවන්ත වෙනවා.

ඒ ප්‍රතිපාදනයේම තවත් කොටසක මෙසේ තිබෙනවා:

> "යම් චිත්තිකරුවකු සිතාසිය කැඳවනු ලබන දිනයේ දී බන්ධනාගාරයේ සිටින අවස්ථාවක, බන්ධනාගාරය භාරව සිටින නිලධරයා විසින් චිත්තිකරු අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය."

මෙච්චර කල් සිදුවුණේ, යම් පුද්ගලයෙක් බන්ධනාගාරය ඇතුළේ ඉන්නවා නම් ඒ කටයුතු ඔක්කෝම වහලා දමපු එකයි. සාමාන්‍ය භාෂාවෙන් ඒකට කියන්නේ කොළේ වහලා යටින් ගහනවා කියලායි. අන්න ඒ ක්‍රමයට තමයි මෙච්චර කල් වැඩ සිද්ධ වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සිවිල් නඩු විධාන සංග්‍රහයේ තිබෙන තවත් ඉතා ම වැදගත් කොටසකට අවධානය යොමු කරන්න ඕනෑ. ඒ තමයි, ආඥා භාරදීම. ඒ යටතේ 71අ. කියවා මේකේ තිබෙන වැදගත්කම මම පැහැදිලි කරලා දෙන්නම්.

ඒ අනුව 71අ. හි මෙසේ සඳහන් වෙනවා:

> "ලේඛන භාරදීමට අමතරව, වාරණ නියෝගයක්, ඉන්ජන්ෂන් තහනමක්, අතුරු ඉන්ජන්ෂන් තහනමක්, තහනම් නියෝගයක් සහ අතුරු ආඥාවක් ඇතුළු අධිකරණ නියෝග පිළිබඳ විද්‍යුත් හෝ දුරකථන මෙවලම් මඟින් අදාළ පාර්ශ්වකරුවන් වෙත සන්නිවේදනය කිරීමට අධිකරණය විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත විධාන කරනු ලැබිය හැකි ය."

වාරණ නියෝගයක තිබෙන වටිනාකම ගැන අපි හැමදෙනාම දන්නවා. වාරණ නියෝගයක් නිකුත් කළාම අනෙක් පාර්ශ්වය ඒකෙන් බැඳෙනවා. ඒක කඩාකප්පල් කරන්න තිබුණු සියලු ඉඩකඩ මෙතැනින් ඇහිරෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,

[ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා]

ඔබතුමියත් දන්නවා ඇති, ඉන්ජන්ශන් තහනමක් ගත්තාට පස්සේ ඒ තහනම ක්‍රියාත්මක කළ යුතු බව. මෙන්න මේකයි මෙතැන තිබෙන වැදගත්කම.

ඊළඟට මෙම පනත් කෙටුම්පතේ 13 වන වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

"(2) (අ) චිත්තිකරුගේ පැහැර හැරීම හේතුකොට ගෙන ඔහුට විරුද්ධව නඩුව ඒකපාර්ශ්විකව විභාග කිරීමට නියම කරනු ලැබීමෙන් පසු ඕනෑම අවස්ථාවක දී;

(ආ) චිත්තිකරුගේ පැහැර හැරීම හේතුකොට ගෙන ඔහුට විරුද්ධව තීන්දු ප්‍රකාශයක් වාර්තා කරනු ලැබ තීන්දු ප්‍රකාශය චිත්තිකරු වෙත භාරදීම සිදු නොකර ඇති ඕනෑම අවස්ථාවක දී; ..."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නඩුව ඒකපාර්ශ්විකව විභාග කරලා අනික් පාර්ශ්වයට වාසිය ලැබී තිබියදී, එහෙම නැත්නම් ඒකපාර්ශ්විකව විභාග කිරීමට නියම කරලා තිබෙනකොට, ඕනෑම අවස්ථාවකදී චිත්තිකරුගේ පැහැර හැරීම එහෙම පිටින්ම වෙනස් කිරීමට ඔහුට කටයුතු කළ හැකියි.

ඉහත වගන්තිය යටතේම ඒක තවදුරටත් මෙසේ සඳහන් කර තිබෙනවා:

"පැමිණිලිකරුට දැන්වීමක් ද සහිතව චිත්තිකරු අධිකරණයට ඉල්ලීමක් කර ඉක්බිතිව තමාට සිතාසිය නොලැබුණු බව හෝ ඒ පැහැර හැරීමට සාධාරණ හේතු තමාට තිබුණු බවට, අධිකරණය සෑහීමට පත් කරන අවස්ථාවක, අවස්ථෝචිත පරිදි, අධිකරණය විසින්, නඩුව, ඒක පාර්ශ්වික නඩු විභාගය සඳහා නියම කරන ලද ආඥාව, නඩු තීන්දුව සහ තීන්දු ප්‍රකාශය අවලංගු කොට ගාස්තු සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අධිකරණය විසින් සුදුසු යැයි සලකනු ලබන නියම මත ඒ පැහැර හැරීමේ අවස්ථාවේ සිට ස්වකීය චිත්තිවාචකය පවත්වාගෙන යාමට චිත්තිකරුට අවසර දිය යුතු ය."

මෙම සංශෝධනය අනුව, ඒක පාර්ශ්වික නඩු විභාගය සඳහා නියම කරන ලද ආඥාව, නඩු තීන්දුව සහ තීන්දු ප්‍රකාශය අවලංගු කිරීම කියන තැනේදී ඒ පුද්ගලයාට අයිතිය ලැබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා
(මාණ්පුමිකු සනාතිපති චට්ටත්තරණි ජූයන්ත වීරසිංහ)
(The Hon. Jayantha Weerasinghe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම බොහොම ඉක්මනට කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සිවිල් නීතියට ගෙනැල්ලා තිබෙන මේ නීති ප්‍රතිපාදන මම ඉතාම අගය කරනවා. මම බලාපොරොත්තු වෙනවා, අපගේ පාර්ලිමේන්තු කාල සීමාව අවසන් වෙන්න ඉස්සෙල්ලා criminal නීතියේ තිබෙන මේ වාගේම අඩුපාඩු හදන්නත් එතුමා උදවු වෙයි කියලා. මේ අවස්ථාවේ මේ ගරු සභාවේ සිටින නියෝජ්‍ය මහ ලේකම්තුමාත් නීතිඥවරයෙක්. මේ ගරු සභාවේ තවත් නීතිඥවරු ගණනාවක් ඉන්නවා, ජනාධිපති නීතිඥවරුත් ඉන්නවා. පැහැදිලිව කියනවා නම්, අද වෙනකල් මහෙස්ත්‍රාත් උසාවියකදී චිත්තිකාරයෙකුට තමන්ගේ කටඋත්තරයේ පිටපතක්වත් ලැබෙන්නේ නැහැ. මම බලාපොරොත්තු වෙනවා මේ සියලු අඩු ලුහුඬුකම් හදාගන්න අපට අවස්ථාව ලැබෙයි කියලා.

ඒ එක්කම මම නැවත වරක් වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාටත්, අධිකරණ ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා, දමිත් තොටවත්ත කීර්තිමත් ගරු විනිශ්චයකාරතුමා පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීම ගැන. එතුමා එහෙම මාරු කර තිබෙනවා නම්, කරුණාකර එවැනි ශ්‍රේෂ්ඨ ගරු විනිශ්චයකාරතුමෙකුට අසාධාරණයක් නොවෙන්න හැකි ඉක්මනින් කටයුතු කරන්නය කියා ඉල්ලමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Charles Nirmalanathan. You have 17 minutes.

[පි.ප. 1.26]

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු චාල්ස් නිර්මලනාදන්)
(The Hon. Charles Nirmalanathan)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ! නීති අමෛච්සුඩන් සම්පන්තප්පට්ට කුඩියියල් නඩවඩික්කෛමුරෛච් චට්ටක්කෝවෛ තිරුත්තච් චට්ටමූලත්තින් ඉරණ්ඩාම් මතිප්පීට්ටින් මීතාන විවාතත්තිල් උරෛයාට්රුවතර්කුච් චන්තර්ප්පම් වළංගියමෛක්කු නන්රියෛත් තෙරිවිත්තුක් කොළ්කිරේන්.

ඉන්රෛය තිනම් යූලෛ කලවරත්තින් 41ආවතු ආණ්ඩු නිනෛවු නාළාකුම්. 1983ආම් ආණ්ඩු යූලෛ මාතම් 23ආම් තිකතියිලිරුන්තු තොටර්න්තු මූන්රු නාට්කළ් ඉලංකෛයින් එල්ලාප් පකුතිකළිලුම් තමිළර්කළ්මීතු කාට්ටේරිත්තනමාන තාක්කුතල්කළ් නටෛපෙට්රන. ඉන්නිකළ්වු ඉටම්පෙට්රු ඉන්රු 41 ආණ්ඩුකළ් කටන්තුළ්ළ නිලෛයිලුම්, ඉන්නුම් තමිළර් කළුක්කු නීති කිටෛක්කවිල්ලෛ. තර්පොළුතු අවර්කළුටෛය නිලංකළුම් කලාචාර අටෛයාළංකළුම් පරිපෝය්ක්කොණ්ටු ඉරුක්කින්රන එන්පතෛ නාන් ඉන්තච් චපෛයිල් මිකච් කවලෛයෝටු පතිවුචෙය්කින්රේන්.

කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, මන්නාර් මාවට්ටත්තිල් වාළ්කින්ර 162,000 මක්කළිල් කිට්ටත්තට්ට 55 චතවීතමානවර්කළ් මන්නාර් තීවුප් පකුතික්කුළ් තාන් ඉරුක්කින්රාර්කළ්. අන්ත තීවින් නිල මට්ටමුම් කටල් මට්ටමුම් චමමාක ඉරුක්කින්ර කාරණත්තාල්, තෙන්මේර්කුප් පරුවක්කාර්රු, වටමේල් පරුවක්කාර්රුක් කාලංකළිල් අංකුළ්ළ කිරාමංකළුක්කුළ් කටල්නීර් උට්පුකුකින්රතු. ඉතනාල් අංකුළ්ළ මක්කළ් ඉටම්පෙයර්න්තු පාටචලෛකළිලුම් ආලයංකළිලුම් තංකියිරුප්පතුම්, 2 - 3 තිනංකළින් පිර්පාටු මීළවුම් තංකළුටෛය වාළ්විටංකළුක්කු වරුවතුම් ඔරු චාතාරණ නිකළ්වාක මාර්ි ඉරුක්කින්රතු.

අප්පටි නිලෛමෛ ඉරුක්කුම්පෝතු, මන්නාර් තීවිනුළ් කුරිප්පාක චවුත්පාර්, තාළ්වුපාටු, පේචාලෛ, එරුක්කලම්පිට්ටි, උප්පුත්තරෛ එන්රු කුරිප්පිට්ට ඉටංකළිල් කනියමණල් අකළ්වතු තොටර්පාක තොටර්ච්චියාක 2 - 3 වරුටංකළාක අවුස්ත්රේලියා නාට්টෛච් චේර්න්ත ඔරු තනියාර් නිරුවනම් මිකත් තීවිරමාකච් චෙයර්පට්ටු වරුකින්රතු. අතර්කු අරචාංකත්තිල් ඉරුක්කින්ර ඔරුචිල අරචියල්වාතිකළුම් අතිකාරිකළුම් උටන්තෛයාක ඉරුක්කිරාර්කළ්. අතන්

காரணமாக அங்கு தொடர்முயற்சி நடந்து கொண்டிருக்கின்றது. இதற்கு எதிர்ப்புத் தெரிவித்து மன்னார் பிரஜைகள் குழுவின் ஏற்பாட்டில் பல போராட்டங்கள் மக்களால் நடத்தப்பட்டு இருக்கின்றன. குறிப்பாக, மன்னார் மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் கலந்துகொண்ட சகல அரசியல் பிரமுகர்களும் அந்த இடங்களில் கனிய மணல் அகழ்வை மேற்கொள்வது தங்களுக்கு விருப்பமில்லை என்ற கருத்தைப் பதிவு செய்திருந்தார்கள். வெளியிடங்களில் நிலைப்பாடு எப்படியென்பது எனக்குத் தெரியாது. என்றாலும், மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் எடுக்கப்பட்ட தீர்மானத்தையும் மீறி, அந்தச் செயற்பாடு தொடர்ச்சியாக நடைபெற்றுக் கொண்டு வருகின்றது.

மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் எடுக்கப்படு கின்ற தீர்மானங்கள் நடைமுறைப்படுத்தப்பட வேண்டும். மாவட்ட அபிவிருத்திக் குழுவின் தலைவர் ஜனாதிபதியால் நியமிக்கப்படுகின்ற ஒருவராக இருக்கின்றார். அப்படி இருக்கும்போது, அந்தத் தீர்மானத்தையும் மீறி பல்வேறு செயற்பாடுகள் சில மாவட்டங்களில் நடைபெறுகின்றன. அது மன்னார் மாவட்டமாக இருக்கலாம்; வவுனியா மாவட்டமாக இருக்கலாம்; முல்லைத்தீவு மாவட்டமாக இருக்கலாம்! மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் எடுக்கப்படுகின்ற தீர்மானங் களுக்கு எதிராக பல நடவடிக்கைகள் மத்திய அரசாங்கத்தால் எடுக்கப்படுகின்றன. துரதிருஷ்டவசமாக மாகாண சபைத் தேர்தல் நடத்தப்படாமையால், அங்கு மாகாண சபை இயங்க வில்லை. இதனால் அங்கு முதலமைச்சரோ, மாகாண அமைச்சர்களோ இல்லை. இப்படியான ஒரு சூழ்நிலையில், ஜனாதிபதியால் நியமிக்கப்படுகின்ற ஒருவரின் தலைமையில் நடைபெற்ற அபிவிருத்திக் குழுக் கூட்டத்தில் எடுக்கப்பட்ட தீர்மானத்தை எதிர்த்து, மத்திய அரசாங்கத்தின் கீழுள்ள அதிகாரிகளும் அரசியல்வாதிகளும் இணைந்து மேற்குறித்த செயற்பாட்டைத் தொடர்ச்சியாகச் செய்து வருகின்றார்கள். அப்படி என்றால், ஏன் நீங்கள் இந்த மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தை நடத்துகின்றீர்கள்? என நான் அரசாங்கத் தரப்பினரிடம் கேட்க விரும்புகின்றேன்.

மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் எடுக்கப்படுகின்ற தீர்மானங்களுக்கு எதிராகப் பல்வேறு திட்டங்கள் நடைமுறைப்படுத்தப்படுகின்றன. மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தின் தலைவர்கள், மத்திய அரசாங்கத்தின் இவ்வாறான செயற்பாடுகளின்போது மௌனமாக இருக்கிறார்கள். மன்னார் தீவினுள் இடம்பெறுகின்ற கனியவள மணல் அகழ்வானது, மன்னார் மாவட்டத்தில் இருக்கின்ற மக்களை வலுக்கட்டாயமாக வெளியேறச் செய்வதற்கான ஓர் ஆரம்பப் புள்ளியாகும். அவ்வாறுதான் நான் அதைப் பார்க்கின்றேன். வடமேல் பருவக்காற்று வீசுகின்ற காலத்தில் விடத்தல்தீவு, கத்தாளம்பிட்டி, இலுப்பைக்கடவை, அந்தோனியார்புரம், மூன்றாம்பிட்டி, தேவன்பிட்டி போன்ற மீனவக் கிராமங்களுக்குள் கடல்நீர் உட்புகுவது வழமை. அதேபோல், தென்மேல் பருவக்காற்று வீசுகின்ற காலத்தில் சவுத்பார், வங்காலை, நறுவிலிக்குளம் போன்ற கிராமங்களுக்குள்ளும் கடல்நீர் உட்புகுகின்றது. இதைத் தடுப்பதற்கான எந்த நடவடிக்கையையும் அங்குள்ள Director, Department of Coast Conservation and Coastal Resource Management, W.A.N.S. Rajarathne முன்னெடுப்பதில்லை.

அண்மையில் வங்காலை கிராமத்துக்குள் கடல்நீரானது உட்புகுந்தது. அதனை அரசாங்க அதிபர் மற்றும் மக்கள் பிரதிநிதிகள் அங்கு நேரடியாகச் சென்று பார்வையிட்டார்கள். அப்போது, அவ்விடத்துக்கு மாவட்ட அனர்த்த முகாமைத்துவத் திணைக்கள அதிகாரியும் வந்திருந்தார். அவர் அரசாங்க அதிபரின் கோரிக்கைக்கு அமைவாக, இதனைத் தடுப்பதற்குரிய கடலணை அமைப்பது தொடர்பான வரைவு ஒன்றை marine engineer மூலம் தயாரிக்குமாறு Department of Coast Conservation and Coastal Resource Management, Directorக்கு ஆலோசனை வழங்கியிருந்தார். ஆனாலும், அவர் அது தொடர்பாக எந்த நடவடிக்கையையும் எடுக்கவில்லை. தற்போது மன்னார் தீவினுள் இடம்பெறுகின்ற கனியவள மணல் அகழ்வது சம்பந்தமான கூட்டமொன்றை மன்னார் பிரதேச செயலகத்தில் எதிர்வரும் 26ஆம் திகதி வெள்ளிக்கிழமை பிற்பகல் 01.30 மணியளவில் நடத்துவதாக அவர் அறிவித்திருக்கிறார். அதில் கலந்துகொள்ளும்படி 15 அரச திணைக்களங்களுக்கு அறிவித்தல் விடுக்கப் பட்டிருக்கிறது.

அண்மையில் மாண்புமிகு ஜனாதிபதி அவர்கள் மன்னார் மாவட்டத்துக்கு விஜயம் செய்திருந்தார். அதன்போது, மன்னார் மாவட்டச் செயலகத்தில் இடம்பெற்ற கூட்டத்தில் கனியவள மணல் அகழ்வுக்கு நான் எதிர்ப்புத் தெரிவித்தேன். அப்பொழுது மாண்புமிகு ஜனாதிபதி அவர்கள், இது தொடர்பில் ஆய்வறிக்கை ஒன்றைப் பெற்றுக்கொண்டதன் பிற்பாடு, மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் கலந்துரையாடுவதாகக் கூறியிருந்தார். ஆனாலும், மேற்குறித்த பணிப்பாளர் மாண்புமிகு ஜனாதிபதியின் அறிவுரையைக் கேட்கவில்லை. இவ்விடயத்துக்குப் பொறுப்பான அமைச்சராக அரசாங்கக் கட்சியின் பிரதம கொறடாவான மாண்புமிகு பிரசன்ன ரணதுங்க அவர்களே இருக்கின்றார். ஏன் அவர் இந்த விடயத்தைச் சரியாகச் செயற்படுத்தவில்லை? இவ்விடயம் தொடர்பில் மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் தெரிவிக்கப்பட்ட எதிர்ப்பு மற்றும் மாண்புமிகு ஜனாதிபதி அவர்களுடைய ஆலோசனை என்பவற்றை மீறி, கௌரவ அமைச்சர் பிரசன்ன ரணதுங்க அவர்களுடைய அமைச்சின்கீழ் வருகின்ற Department of Coast Conservation and Coastal Resource Managementஇன் Director, W.A.N.S. Rajarathne செயற்படுகிறார். அவருடைய செயற்பாடானது, தொடர்ச்சியாக மன்னார் மாவட்ட மக்களுக்கு மனவேதனையையும் கோபத்தையும் உண்டு பண்ணுவதாக அமைந்திருக்கின்றது. நான் இதனை இந்த இடத்தில் வன்மையாகக் கண்டிக்கின்றேன். எனவே, கௌரவ அமைச்சர் பிரசன்ன ரணதுங்க அவர்கள் இது தொடர்பில் கூடிய கவனம் செலுத்தி, குறித்த பணிப்பாளருக்கு அறிவுரை வழங்கவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். அத்துடன், தனிப்பட்ட இலாபத்தை கருத்திற்கொள்ளாது, மக்கள் நலனைக் கருத்திற்கொண்டு அரசாங்கமும் சம்பந்தப்பட்ட அமைச்சரும் செயற்பட்டு, இந்தச் செயற்பாட்டை உடனடியாக நிறுத்த வேண்டுமெனவும் கோரிக்கை விடுக்கின்றேன்.

இன்று நீதி அமைச்சுடன் சம்பந்தப்பட்ட விவாதம் நடைபெற்றுக்கொண்டிருந்தாலும், இலங்கை ரூபவாஹினி கூட்டுத்தாபனத்துடன் சம்பந்தப்பட்ட ஒரு விடயத்தை இங்கு கூற விரும்புகின்றேன். இலங்கை ரூபவாஹினி கூட்டுத்தாபனத்தின் தமிழ்ப் பிரிவாக 'நேத்ரா' தொலைக்காட்சி அலைவரிசை இருக்கிறது. இது செய்திப் பிரிவு, நடப்பு விவகாரப் பிரிவு, முஸ்லிம் நிகழ்ச்சிப் பிரிவு, தமிழ் நிகழ்ச்சிப் பிரிவு என 4 பிரிவுகளை உள்ளடக்கி இயங்கி வந்தது. தமிழ்ப் பிரிவுக்குப் பொறுப்பாகவிருக்கின்ற பணிப்பாளர் அவர்கள் தற்போது நடப்பு விவகாரப் பிரிவை திட்டமிட்ட வகையில் நிறுத்தியிருக்கிறார். எம்.என். ராஜா என்பவருடைய தலைமையில் 23 வருடங்களாக இந்த நடப்பு விவகாரப் பிரிவு இயங்கி வந்தது. அதன்மூலம் சதுரங்கம், விளையாட்டு மஞ்சரி, விடியலை நோக்கி, கண்டதும் கேட்டதும், கல்வி சார்ந்த நிகழ்ச்சி, உலக அரசியல் விவகாரம் போன்ற பல்வேறுபட்ட

[ගරු වාල්ස් නිර්මලනාදන් මහතා]

නිකුත්ච්කිකල් ඔලිපරප්පප්පට්ටන. ඉන්ත තොලෙක්කාට්චි අලෙවරිසෙයානදු, අරසාංකත්තුක්කුච් චොන්තමානදු. ඉරුන්තුම්කූට, තමිල්ප් පිරිවෙ ඉල්ලාතොළිප්පතර්කාන ආරම්පකට්ට නටවටික්කෙයාක නටප්පු විවකාරප් පිරිවෙ තිට්ටමිට්ටු නිරුත්ති ඉරුක්කිරාර්කළ්. අතුමාත්තිරමන්රි, ඉරණ්ටු කිළමෙක්කු මුන්නර්, කූට්ටුත්තාපනත්තිල් නටන්ත cadre creationඉන්පොතු නටප්පු විවකාරප් පිරිවින් උතවිප් පණිප්පාළරුක්කාන cadreඅයුම් නීක්කියිරුක්කිරාර්කළ්. ඉතන්මූලම් ඉන්තත් තමිල්ප් පිරිවෙ ඉල්ලාතොළිප්පතර්කු එව්වළවු වඤ්චකමාක ඉලංකෙ ෂූපවාහිනි කූට්ටුත්තාපනමුම්, අතර්කුප් පොරුප්පාක ඉරුක්කින්ර අමෙච්චර් කෙළරව පන්තුල කුණවර්තන අවර්කළුම් චෙයර්පට්ටිරුක්කිරාර්කළ් එන්පතෙ එංකළාල් අරිය මුටිකින්රතු. ඉතර්කු එන්නුටෙය කණ්ටනත්තෙ ඉන්ත ඉටත්තිල් තෙරිවික්කින්රේන්. උතවිප් පණිප්පාළරුක්කුරිය cadreඅ ඉල්ලාතොළිප්පතාක ඉරුන්තාල්, එතිර්කාලත්තිල් 'නේත්රා' තොලෙක්කාට්චියිල් තමිල් මොළිමූල ඔලිපරප්පු ඉල්ලාමර් පෝවතර්කු වාය්ප්පු ඉරුක්කින්රතු.

මක්කළ් චම උරිමෙයෝටු වාළ වේණ්ටුම් එන්රු මාණ්පුමිකු චනාතිපති කූරුකින්රාර්; අමෙච්චර්කළ් කූරුකින්රාර්කළ්. ආනාල්, ෂූපවාහිනි කූට්ටුත්තාපනත්තින් තමිල්ප් පිරිවාන 'නේත්රා' තොලෙක්කාට්චි අලෙවරිසෙයිල් ඔලිපරප්පාකින්ර තමිල් නිකුල්චිකළෙ නිරුත්තුකින්රීර්කළ්. අතෙ උංකළාල් පොරුත්තුක්කොළ්ළ මුටියවිල්ලෙ. ඉතන්මූලම් උංකළුටෙය අටි මනතිල් තමිල්ර්කළ් චාර්න්ත චින්තනෙ එව්වාරු ඉරුක්කින්රතු එන්පතෙප් පුරින්තුකොළ්ළ මුටිකින්රතු.

ඉලංකෙ ෂූපවාහිනි කූට්ටුත්තාපනත්තින් 'නේත්රා' තොලෙක්කාට්චි අලෙවරිසෙයිල් එර්කනවේ චෙයර්පට්ට නටප්පු විවකාරප් පිරිවෙ මීණ්ටුම් චෙයර්පටුත්ති, අතර්කාන උතවිප් පණිප්පාළරෙ උටනටියාක නියමිත්තු, අන්ත තොලෙක්කාට්චි අලෙවරිසෙයෙ මුළුමෙයාකච් චෙයර්පටුත්ත වේණ්ටුමෙන නාන් ඉන්ත නේරත්තිල් මාණ්පුමිකු ජනාතිපති අවර්කළිටම් විසේට කෝරික්කෙයොන්රෙ මුන්වෛක්කින්රේන්. එර්කෙනවේ, එංකළුටෙය පිරතේචත්තිල් තමිල් ඉන, කලාචාර අමිප්පුකළ් තොටර්ච්චියාක නටෙපෙර්රුක්කොණ්ටු ඉරුක්කින්රන. අතනුටෙය තොටර්ච්චියාක මේර්කුරිත්ත නටවටික්කෙයෙ මක්කළ් පාර්ක්කුම්පෝතු, අවර්කළ් මිකවුම් කෝපමටෙවතර්කු වාය්ප්පු ඉරුක්කින්රතු.

චමවුරිමෙ, චම අන්තස්තු එන්රු වාර්ත්තෙකළාල් කූරුවතෙවිට, අවර්රෛච් චෙයර්පාට්ටු රීතියාක නිරූපිත්තුක් කාට්ටුවතුතාන් චාලච් චිරන්ততෙන නාන් ඉන්ත ඉටත්තිල් පතිවුචෙය්කින්රේන්. තර්පොතු ඉරුක්කින්ර නිලෙමෙයානතු එංකළුටෙය මක්කළුක්කු අපකීර්ත්තියෙ එර්පටුත්තුමෙන නාංකළ් කූරුකින්රോම්. ඉව්වාරාන නිලෙමෙයිල් ඔරුචිල අමෙච්චර්කළිනුම් අතිකාරිකළිනුම් මික මෝචමාන චෙයර්පාටුකළ් තමිල් මක්කළුක්කු කෝපත්තෙ එර්පටුත්තුවතාක අමෙයුම් එන්පතෙ නාන් ඉන්ත නේරත්තිල් කණ්ටිප්පාකප් පතිවුචෙය්ය වේණ්ටුම්. ආකවේ, මාණ්පුමිකු ජනාතිපති අවර්කළ් උටනටියාක ඉන්ත විටයත්තිල් තලෙයිට වේණ්ටුමෙනක් කේට්ටුක්කොළ්කින්රේන්. කෙළරව පන්තුල කුණවර්තන අවර්කළ් චාර්න්තිරුක්කුම් ශ්‍රී ලංකා පොතුජන පෙරමුන කට්චියින් චිපාරිචිල් නියමික්කප්පට්ට අන්තක් කූට්ටුත්තාපනත්තින් කුරිත්ත පණිප්පාළරෙ විචාරණෙ චෙය්ය වේණ්ටුමෙන නාන් ඉන්ත නේරත්තිල් කේට්ටු, විටෙපෙරුකින්රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු එම්.යූ.එම්. අලි සබ්රි අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 28ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.43]

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(මාණ්පුමිකු චනාතිපති චට්ටත්තරණි එම්.යූ.එම්. අලි චප්රි - වෙළිනාට්ටු අලුවල්කළ් අමෙච්චර්)
(The Hon. M.U.M. Ali Sabry, PC - Minister of Foreign Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ඉතා වැදගත් නීතිමය පනත් කිහිපයක් පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම ගෞරවයක් ලෙස සලකනවා.

ලංකාව ආර්ථික වශයෙන් නැඟිටලා ඉදිරියට යන්න නම් නීතිය ක්‍රියාත්මක වීම ඉතාම වැදගත්. නීතියේ ස්වාධීනත්වය හා සමානවම කාර්යක්ෂමතාවත් ඉතාම වැදගත්. අපි සියලුදෙනාම දන්නවා, මේ දවස්වල ක්‍රියාත්මක නොවුණත්, World Bank එක මීට පෙර Doing Business Index කියලා Index එකක් හැදුව බව. ඒකට අනුව යම් රටට ආයෝජනයක් එනකොට ආයෝජකයා තීරණ ගන්නා සාධක රාශියක් තිබෙනවා. අවසානාවකට වාගේ, අපේ රට මේ Doing Business Index එකේ 112වන ස්ථානයට කඩා වැටිලා තිබුණා. ඒකට ප්‍රධානම හේතුවක් වෙලා තිබුණේ ප්‍රමාදවීම් දෙකක්. එකක් තමයි, අධිකරණයේ සිදු වන ප්‍රමාදය. දෙවැනි එක තමයි, land registration process එකේ තිබෙන අවිනිශ්චිතභාවය සහ ප්‍රමාදය. අපි පක්ෂ, පාට භේදවලින් තොරව පාර්ලිමේන්තුව හැටියට -ව්‍යවස්ථාදායකය හැටියට- එකතුවෙලා මේ දෙකේම වෙනසක් කරන්නට ඕනෑය කියන තැන මම ඉන්නවා. අපි හැම දෙයටම දේශපාලනය සම්බන්ධ කරගත යුතු නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම 2020දී අධිකරණ අමාත්‍ය ධුරය භාර ගත්තා. එවකට කැබිනට් මණ්ඩලයේ හිටියා අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා. එතුමාගෙන් මට හුඟක් උපදෙස් හා අනුශාසනා ලැබුණා. අපි කරුණු 5ක් අධ්‍යයනය කරගෙන සිටියා මෙය වෙනස් කරන්න. උදාහරණයක් හැටියට, මිලියන 22ක ජනතාවක් ඉන්න ලංකාවේ විනිශ්චයකාරවරු ඒ කාලයේ සිටියේ 330දෙනායි. ජාත්‍යන්තර නිර්ණායකයක් තිබෙනවා, මිලියනයක ජනතාවට විනිශ්චයකාරවරු කීයක් සිටිය යුතුද කියලා. එංගලන්තය වැනි රටක, අලුත් තාක්ෂණයත් එක්ක ඒ අය කටයුතු කරන නිසා මිලියනයකට විනිශ්චයකාරවරු 44දෙනෙක් පමණ ඉන්නවා. තායිලන්තය වැනි රටක 58දෙනෙක් විතර ඉන්නවා. ඉන්දියාව වැනි විශාල රටකත් -ඉන්දියාවේ නීතිය ක්‍රියාත්මක වීමේත් ප්‍රමාදයක් තිබෙනවා- 23දෙනෙක් ඉන්නවා. ලංකාවේ මිලියනයකට ඉන්නේ විනිශ්චයකාරවරු 15දෙනායි. මම හිතනවා, මිලියනයකට 15දෙනෙක් ඉන්නකොට ප්‍රායෝගිකව ඒ නඩු ටික අහලා අවසන් කරන්න අමාරුයි කියලා. ඒ නිසා තමයි අපි ක්‍රමයක් ගෙනාවේ, විනිශ්චයකාරවරුන්ගේ ප්‍රමාණය වැඩි කළ යුතුයි, අධිකරණ ප්‍රමාණය වැඩි කළ යුතුයි, යටිතල පහසුකම් ලබා දිය යුතුයි, ලංකාවේ නීතියට ඩිජිටල්කරණය හඳුන්වා දිය යුතුයි, නඩු අහන එකටත් ඩිජිටල්කරණය හඳුන්වා දිය යුතුයි කියලා. අද වන විට බොහෝ රටවල්වල AI තාක්ෂණය හරහා කුඩා නඩු විසඳන තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ හැරුණාම civil, commercial සහ අපරාධ නඩුවල නීතියෙහි විශාල වෙනසක්, සංශෝධන සිදු විය යුතුයි.

මම මාස 18ක් විතර කාලයක් තමයි අධිකරණ අමාත්‍ය ධුරයේ කටයුතු කළේ. ඒ කාලය තුළ මම Cabinet Papers 80ක් පමණ ගෙනාවා.

The Hon. (Prof.) G.L. Peiris ඒ පිළිබඳව දන්නවා. අපි සමහර කැබිනට් මණ්ඩල රැස්වීම්වලට කැබිනට් පත්‍රිකා හතරක්, පහක් පවා ගෙනාවා. අපට හැකියාව ලැබුණා, කැබිනට් මණ්ඩලයට ගිහිල්ලා වෙනම project office එකක් හදන්න. ඒ project office එක හරහා අපි අනුකමිටු 5ක් නිර්මාණය කළා. ඒ අනුකමිටුවලින් පළමුවෙනි එක, ඩිජිටල්කරණය සඳහායි. දෙවන අනුකමිටුව, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහායි. තුන්වන අනුකමිටුව, අපරාධ නීතිය සංශෝධනය කිරීම සඳහායි. හතරවන අනුකමිටුව, සිවිල් නීතිය සංශෝධනය කිරීම සඳහායි. පස්වන අනුකමිටුව, වාණිජ නීතිය සංශෝධනය කිරීම සඳහායි. මම මේ වෙලාවේදී ඉතාම කෘතඥතා පූර්වකව මතක් කළ යුතුයි, ඒ ඒ කමිටුවල සාමාජිකයන් තමන්ට ලැබුණු විෂය පථය තුළ තිබෙන අඩු පාඩු සොයා බලා යෝජනා ඉදිරිපත් කළාය කියන එක. උදාහරණයක් හැටියට සිවිල් නීතිය සංශෝධනය කිරීම සඳහා වූ කමිටුවෙන් අපට යෝජනා කළා, කුඩා නඩු විසඳීම සඳහා කුඩා නඩු අධිකරණයක් -සුළු හිමිකම් අධිකරණයක්-පවත්වා ගෙන යා යුතුයි කියලා. සාක්ෂි කිය කියා ඉන්න ඕනෑ නැහැ, ඒවා affidavitsවලින් විසඳන්න ඕනෑ කියලා. අද ඒක නීතියක් බවට පත් වෙලා තිබෙනවා.

ඊට පස්සේ මට හැකියාව ලැබුණා, සිතාසි සම්බන්ධයෙන් වන නීතිය අධ්‍යයනය කරලා තාක්ෂණයත් එක්ක යන අලුත් ක්‍රමයක් හදුන්වා දෙන්න. අපි Justice Laffar මැතිතුමාගේ සභාපතිත්වයෙන් - එතුමා තවම අභියාචනා අධිකරණයේ සේවය කරනවා - සනත් විජේවර්ධන නීතිඥ මහත්මයාගේ කැඳවුම්කාරත්වයෙන් කමිටුවක් පත් කළා. ඒ කමිටුව දීර්ඝ වශයෙන් නිර්දේශ සකස් කරලා ඉදිරිපත් කරලා තිබෙන, සිවිල් නඩු විධාන සංග්‍රහයට අදාළ සංශෝධන යටතේ තමයි සිතාසි සම්බන්ධයෙන් යම් යම් යෝජනා අද මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේවා තිබුණු තත්ත්වයට සාපේක්ෂව දැන් ඉතාම හොඳයි. නමුත් මම පෞද්ගලිකව විශ්වාස කරනවා, මේක මීටත් වඩා එහාට යන්න ඕනෑ කියලා.

දැන් අපට පුළුවන් email එකකින් සිතාසි භාර දෙන්න. නමුත් යම්කිසි විධියකින් ඒක භාර ගත්තේ නැත්නම් ආයෙත් සිදු වෙනවා, පෞද්ගලිකව ගිහින් එය භාර දෙන්න. ගරු ජී.එල්. පීරිස් මහාචාර්යතුමනි, ඔබතුමා 1994දී ලියා පදිංචි තැපෑලෙන් සිතාසි භාර දීම ප්‍රථම වතාවට හඳුන්වා දුන්නා මතක ඇති. නමුත්, ප්‍රායෝගිකව සිද්ධ වුණේ මොකක්ද? ලියාපදිංචි තැපෑලෙන් සිතාසි යැව්වාට ඒ කවුරුවත් අධිකරණයට ආවේ නැහැ. Lawyersලාම කියනවා, අධිකරණයට යන්න ඕනෑ නැහැ කියලා. ඊට පස්සේ ආයෙත් මුලටම ගිහින් පරණ විධියටම ඒවා භාර දෙන්න සිද්ධ වුණා. මම හිතනවා, ඒක හරි නැහැ කියලා. Contract එකක emails තිබෙනවා නම්, පාර්ශ්ව දෙකක් අතර සාකච්ඡාවලදී emails පාවිච්චි කරලා තිබෙනවා නම්, සිතාසි විතරක් emailsවලින් දෙන්න බැරි ඇයි? එහෙම පුළුවන් වන විධියට මේ පනත් කෙටුම්පත තවදුරටත් සංශෝධනය කරලා ඉදිරිපත් කරන්න කියා අපේ ගරු අධිකරණ ඇමතිතුමාට මම යෝජනා කරනවා. යම් හෙයකින්, කෙනෙක් emails ලැබුණේ නැහැ කියලා කියනවා නම් එය ඔප්පු කිරීමේ භාරය ඒ අයටම ලබා දෙන්න ඕනෑ. මොකද, නීතිය තාක්ෂණයත් එක්ක ඉදිරියට යා යුතුයි. අනෙක් රටවල මෙය ක්‍රියාත්මක වෙනවා. SMS එකෙනුත් සිතාසි යවන්න පුළුවන්. ඔප්පු කරන්න පුළුවන් නම්, අහවල් වෙලාවේදි SMS එක යැව්වා, අහවල් වෙලාවේදි SMS එක අදාළ කෙනාට ලැබුණා කියලා, ඒක භාර ගන්න ඕනෑ. කවුරු හරි පිට රට යන්න හදනවා නම්, flight එකේදී ඔහුට එය පෞද්ගලිකව භාර දෙන්නත් බැරි නම් ඉහත කී ක්‍රමයක් අනුගමනය කරන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒ නිසා මම හිතනවා අනෙක් සියලු දේවල් එක්ක නීතියත් ප්‍රගමනය වෙන්න ඕනෑ කියලා.

පළමුවැනි පියවර හැටියට අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව 11 සිට 17 දක්වා වැඩි කළා. Court of Appealහි විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව 12 සිට 20 දක්වා වැඩි කළා. Magistratesලා 47 දෙනෙක් -ලංකා ඉතිහාසයේ ලොකුම batch එක- recruit කළා. නමුත් අවාසනාවකට වාගේ කොවිඩ් වසංගතයත් එක්ක, මේ ආර්ථිකය කඩා වැටීමත් එක්ක අපි කරන්න හදපු සමහර දේවල් කරන්න අපට බැරි වුණා. ඩිජිටල්කරණයත් ඒවා අතරින් එකක්.

ඩිජිටල්කරණය ගැන කථා කරද්දී මම කියන්න ඕනෑ, මා අමාත්‍ය ධුරයට ඇවිල්ලා අලුතින්, මුල ඉඳලා ඩිජිටල්කරණය පටන් ගන්න උත්සාහ කළේ නැති බව. ගරු තලතා අතුකෝරල මැතිනියයි, අජිත් පී. පෙරේරා හිටපු රාජ්‍ය ඇමතිතුමායි එකතු වෙලා එ් සඳහා ආරම්භයක් ලබා දීලා තිබුණා. යම්කිසි හොඳ දෙයක් කවුරු හරි කරලා තිබෙනවා නම් අපි ඒක ආයෙත් ආපස්සට යවන්න අවශ්‍යතාවක් නැහැ. අපි ඔවුන් නවත්වපු තැනින් පටන් අරගෙන එතැන් සිට තවදුරටත් අධ්‍යයනය කරලා ICTA එකයි, තව ආයතනයකුයි සම්බන්ධ කරගෙන ඉදිරියට ගියා. Contract එකත් award කළා. අවාසනාවට වාගේ, මුදල් නැති හින්දා අපට ඩිජිටල්කරණයට යන්නට බැරි වුණා. ඊට පස්සේ මගේ අමාත්‍ය ධුරයත් වෙනස් වුණා.

මම හිතනවා, ඩිජිටල්කරණය ඉතා වැදගත් කියලා. ගරු ජී.එල්. පීරිස් මැතිතුමනි, මෑතකදී මම ඔබතුමාත් ඉගෙනුම ලැබූ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට ගිය වෙලාවේ PhD කරන ලංකාවේ ළමයෙක් ඇවිල්ලා මට proposal එකක් ඉදිරිපත් කළා, AI තාක්ෂණයෙන් ලංකාවේ අධිකරණ ක්ෂේත්‍රයේ නඩු වේගවත්ව විසඳන්නට පුළුවන් වන්නේ කොහොමද කියන එක ගැන. අපේ රට සම්බන්ධයෙන් මට හැඟෙන ප්‍රධාන දෙයක් තිබෙනවා. සාපේක්ෂව ගත් කල ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කිරීම, ඒ කියන්නේ independence of the Judiciary හොඳ තත්ත්වයක තිබෙනවා කියලා මම විශ්වාස කරනවා. අඩු පාඩු නැතුවා නොවෙයි. නමුත්, මොන බාධක ආවත්, මොන තර්ජන ආවත් අද වනතෙක් අපේ රටේ සුප්‍රීම් උසාවියේ ඉඳලා පහළට යනකල්ම බොහෝ අවස්ථාවල අපේ විනිශ්චයකාරවරුන් බලපෑම්වලට යටත් නොවී ස්වාධීනව, නිර්භයව නීතිය ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ තැනින් තවදුරටත් ඉදිරියට යන්න පුළුවන් නම් වඩා හොඳයි. නමුත් නීතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව පිළිබඳව තෘප්තියට පත් වීමේ හැකියාවක් අපට නැහැ. Ease of Doing Business Index එකේ අපි ඉන්නේ 112වන ස්ථානයේ. Contract එකක් ක්‍රියාත්මක කර ගැනීම සඳහා වන කාලය ගැනත් අපි කියනවා. ඒකත් නඩු විසඳන එක ක්‍රමයක්. අවසාන ගණන් කිරීම් අනුව රටවල් 191කින් අප හිටියේ 157වන ස්ථානයේ. ඒ කියන්නේ, අපේ නඩු අහන්න විශාල කාලයක් යනවා. ඒ නිසා ඒ වාගේ දේවල් මීට වඩා හොඳින් කරගෙන යෑම සඳහා, නීතිය හරියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන්න අප සියලුදෙනාට යුතුකමක් සහ ලොකු වගකීමක් තිබෙනවා. මම ගරු අධිකරණ ඇමතිතුමාට මේ වෙලාවේ කෘතඥතාව පුද කරනවා, ස්තුතිවන්ත වෙනවා, ඒ නීති සංශෝධන විශාල ප්‍රමාණයක් තවදුරටත් ඉදිරියට අරගෙන යෑම පිළිබඳව.

සිතාසි සම්බන්ධ නීතියත් ඒ හා සමානයි. මම පෞද්ගලිකව විශ්වාස කරනවා, සිතාසි සම්බන්ධ නීතිය තවත් ඉදිරියට යන්න ඕනෑ කියලා. ඒ සඳහා අනෙක් රටවල තිබෙන ආකාරයට සාමාන්‍ය භාවිතයේ තිබෙන තාක්ෂණය භාවිත කරන්න ඕනෑ කියලා වාගේම සාමාන්‍ය ක්‍රමය තුළ කටයුතු කරන්න ඕනෑ

[ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

කියලා. නමුත් මට තේරෙනවා, බෙදුම් නඩුවකදී සියදෝරිස්ට email එකකින් සිතාසි භාර දෙන්න බැහැ කියලා. හැබැයි contract එකක emails තිබෙනවා නම්, සාමාන්‍ය විධියට ඔවුන් ගනු දෙනු කරලා තිබෙන්නේ emails හරහා නම්, පිට රට ඉන්න සැමියාට ඔහුගේ සිතාසිය email හරහා භාර දෙන්න බිරිඳට බැරිකමක් නැහැ නේ. දැන් තිබෙන ක්‍රමයට ඒක යනවා, සුප්‍රිම් උසාවියට. සුප්‍රිම් උසාවියෙන් යනවා අධිකරණ අමාත්‍යාංශයට. අධිකරණ අමාත්‍යාංශයෙන් යනවා විදේශ කටයුතු අමාත්‍යාංශයට. විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් යනවා embassy එකට. embassy එකෙන් යනවා ඒ රටේ විදේශ කටයුතු අමාත්‍යාංශයට. ඒ රටේ විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් යනවා ඒ රටේ Justice Ministry එකට. එය ඉතා සංකීර්ණ කාර්යයක්. මාස හයක් නැත්නම් භාර ගන්නේත් නැහැ. ඊයේ පෙරේදා එක්කෙනෙක් ඇවිල්ලා මට කිව්වා, "සර්, මට මේක භාර දීලා මාස හතරයි. තවමත් භාර දෙන්න බැරි වුණා" කියලා. මම විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් report එකක් ඉල්ලුවාම ඒ ගොල්ලන් කියනවා, "මේක අපට ඇවිල්ලාත් නැහැ. සිතාසි නැවත ලැබීමේ කාලය මාස හතරක් තිබෙන හින්දා, ඒක මදි, නැවත issue කරන්න" කියලා. ඒක විහිළුවක්. මම හිතනවා, එයින් ඔබ්බට ගිහිල්ලා කටයුතු කරන්න ඕනෑ කියලා. සාමාන්‍ය ක්‍රමය තුළ WhatsApp එකෙන් වැඩ කරනවා නම්, සාමාන්‍ය ක්‍රමය තුළ සාකච්ඡා පවත්වන්නේ email එකෙන් නම්, email එකෙන් ඒ සිතාසිය භාර දීම සඳහා නීතිය ක්‍රියාත්මක විය යුතුයි. හැබැයි, යම්කිසි විධියකින් වැරැද්දක් සිදු වෙලා තිබෙනවා නම්, සිතාසිය හම්බ වෙලා නැහැ කියනවා නම් ඔහුට අවස්ථාව දෙන්න ඕනෑ ඒක ඔප්පු කරන්න. මම හිතනවා නීතිය අද ඒ ප්‍රමාණයටම වෙනස් විය යුතුයි කියලා. නැත්නම් අපි වෙනස් වන ප්‍රමාණය අඩුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු අධිකරණ ඇමතිතුමා කථා කරන කොට මම අහගෙන හිටියා. එතුමා කිව්වා, ඉක්මනට ගෙනෙනවා කියලා තවත් වැදගත් නීති කොටස් දෙකක්. එකක්, සංශෝධනය කිරීම සඳහා අපි යෝජනා කරපු, ලංකාවේ තිබෙන දික්කසාද නීතිය. ලෝකයේ හුඟක් රටවල -අපට නීතිය හදුන්වා දුන් එංගලන්තයේත්- අද දික්කසාද නීතියේ තිබෙන්නේ දෙදෙනෙකුට එකට ජීවත් වෙන්න බැරි නම්, විවාහය බිඳ වැටීම නිසා, එනම් marriage breakdown එකකදී, ඒ අදාළ ක්‍රමය තුළ කැමැත්තෙන් divorce එක ගන්න පුළුවන් කියලායි. හැබැයි ලංකාවේ දෙන්නාට දෙන්නා කොච්චර අකමැති වුණත්, වෛවාහික වරදක් ඔප්පු කරන්නම ඕනෑ. අපි හොඳටම දන්නවා, සියයට 90කම වෛවාහික වරදක් නැහැ කියලා. දෙන්නාට දෙන්නා කැමැති නැති නිසා දෙන්නා දෙපැත්තක ඉන්නවා. නමුත්, අපි ඒ මිනිස්සු උසාවියට ගෙනැල්ලා දිවුරලා, බොරු කියන්න කියලා divorce එකක් ගන්නවා.

මොන විහිළුවක්ද? ඒ නිසා මම කුෂාන් ද අල්විස් ජනාධිපති නීතිඥතුමාගේ නායකත්වය යටතේ කමිටුවක් appoint කළා. ඔවුන් දැන් අධිකරණ අමාත්‍යාංශයට වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. අධිකරණ අමාත්‍යතුමා කිව්වා, "බිඳ වැටීමේ ක්‍රමය" ඉක්මනටම ගේනවා කියලා. එතකොට එහෙම බොරු කරන්නට ඕනෑ නැහැ. අපට බලහත්කාරයෙන් දෙදෙනෙක් බන්දලා තියන්න බැහැ නේ. අකමැති නම් විවාහය දික්කසාදයකින් ඉවර වෙන්නට ඕනෑ. ඒ වාගේ නීති විශාල ප්‍රමාණයක් වැඩි කරන්න තිබෙනවා. මම වැඩිපුර කැමැත්තෙන් දරපු අමාත්‍ය ධුරය තමයි, අධිකරණ අමාත්‍ය ධුරය. ඒ මගේ ක්ෂේත්‍රය නේ. ඒ ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රශ්න මම දැනගෙන හිටියා. මම ආසාවෙන් වැඩ කළා. අපේ නීතිඥවරුන් 300කට වැඩි ප්‍රමාණයක්, ස්වේච්ඡාවෙන් ඒ කමිටුවල සේවය කරලා අපට උදව් කළා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි, අද සිතාසි පිළිබඳ නීතිය ඇවිල්ලා තිබෙන්නේ; සුළු හිමිකම් අධිකරණ නීතිය ඇවිල්ලා තිබෙන්නේ. ඉස්සරහට වෛවාහික කඩා වැටීම හේතුවක් හැටියට සලකා, විවාහ නීතියේ සම්පූර්ණ පරිච්ඡින්න කිරීමක් වෙයි.

ඒ හා සමානම තවත් කරුණක් තිබෙනවා. අපි දන්නවා, සමහර වෙලාවට විදේශ රටවල නඩු තීන්දු අරගෙන එන බව. ඒ රටවල නඩු කියලා, ඒක ක්‍රියාත්මක කරන්න මෙහේට ආවාට පස්සේ ඒ නඩු තීන්දුව පිළිගන්නේ නැහැ. එහෙම කරන්න බැහැ නේ. දෙවරක් නඩු කියන්න බැහැ. මම නීතිඥවරයකු හැටියට ඒ ගැන දන්නවා. ඕස්ට්‍රේලියාවේ ජීවත් වෙලා, එහේ fight කරලා, divorce එකත් අරගෙන වන්දිත් ලබා ගන්නවා. ලංකාවට ආවාම, ඒක මට පිළිගන්න බැහැ කියනවා. ඒක විහිළුවක්. එතකොට විදේශ නඩු තීන්දු ක්‍රියාත්මක කිරීම, ඒ කියන්නේ, enforcement of foreign judgments සම්බන්ධ දැන් තිබෙන පනත සුද්දන්ගේ කාලයේ එකක්. ඒක අවුරුදු 100කට වඩා පැරණියි. ඒක වෙනස් වෙන්නට ඕනෑ. ගරු ජී.එල්. පීරිස් මන්ත්‍රීතුමනි, මම හිතන විධියට, මෛත්‍රී වික්‍රමසිංහ ජනාධිපති නීතිඥතුමා ඔබතුමාගේ ගෝලයෙක්. අපි එතුමා යටතේ කමිටුවක් පත් කළා. ඒ කමිටුවෙන් ඉතා හොඳ වාර්තාවක් දීලා තිබෙනවා. මම හිතනවා, ඒකත් නීතියක් බවට පත් වෙයි කියලා.

මම මේ කියන්න උත්සාහ කරන්නේ, හොඳ අදහසක් තිබෙනවා නම්, ක්‍රමයක් තිබෙනවා නම්, නීතිඥ ප්‍රජාව විතරක් නොව ශ්‍රී ලංකාවේ ඕනෑම professional ප්‍රජාවක් ඒවාට ස්වේච්ඡාවෙන් උදව් කරන්නට බැඳී ඉන්නවා, කැමැත්තෙන් ඉන්නවා කියන එකයි. ඒ නිසා මම මේ වෙලාවේදී ඒ විවිධ කමිටුවල ස්වේච්ඡාවෙන් සේවය කරපු, ස්වේච්ඡාවෙන් නීතිය හදලා දීපු, අපේ නීතිඥ මහත්වරුන්ට හා විනිශ්චයකාරවරුන්ට ඉතාම කෘතඥතාපූර්වකව අපේ ප්‍රණාමය පුද කරන්න ඕනෑ.

තව ඉතා වැදගත් නීතියක් තිබෙනවා. ඒ තමයි, arbitration පිළිබඳ නීතිය. මම හිතනවා, අධිකරණ ඇමතිතුමා ඒකත් ඉක්මනට ගෙන එයි කියලා. ඒකට අපි සලීම් මර්සූෆ් හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමා යටතේ කමිටුවක් පත් කළා. ඒකේ සේවය කරනවා, ඉතාම විශිෂ්ට, පිටරට ඉන්න ශ්‍රී ලාංකික නීති විශාරදයෝ; සිංගප්පූරුවේ සහ හොංකොංවල සිටින අය. ඔවුන්ට අලුත්ම තත්ත්වය පිළිබඳ හොඳ අදහසක් තිබෙනවා. ඒ වාගේ නීති රාශියක් අපි ගෙනාවා. ඒ හුඟක් ඒවා අද වෙනකොට නීතියක් බවට පත් වෙලා තිබෙනවා. ඉතිරි ඒවාත් ඉදිරියේදී සිද්ධ වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ හා සමානම වැදගත් දෙයක් තමයි, මේ නඩු ප්‍රමාදය වළක්වන්නට නම්, අපි තාක්ෂණය උපයෝගී කර ගත යුතුමයි කියන එක. ඒ නිසා ඉතාම වැදගත් තාක්ෂණවේදය ඉදිරියට අරගෙන එන එක. එතකොට written submission එකක් දමන්න නඩුව කැඳවන්නට ඕනෑ නැහැ. Email එකකින් ඒක දමන්න හැකියාව තිබෙන්නට ඕනෑ. ඒක copy කළා නම්, judgeගේ account එකට ඒක යන්නට පුළුවන් වෙන්න ඕනෑ. එතුමාගේ Dropbox එකෙන් එ් සියලු දේවල් බලලා තීන්දුවක් දෙන්න පුළුවන් තත්ත්වයට යන්න ඕනෑ. මේ කලාපයේ, විශේෂයෙන්ම ඉන්දියාවේ සහ බංග්ලාදේශයේ තාක්ෂණය උපයෝගී කරගෙන අධිකරණ ක්ෂේත්‍රයේ විශාල වෙනසක් වෙලා තිබෙනවා. ඒ නිසා තාක්ෂණයට ආයෝජනය කරන්න ඕනෑ. සමහර වෙලාවට යටිතල පහසුකම් සඳහා අපි විශාල මුදලක් වැය කරනවා. නරක නැහැ, ඒක කළ යුතුයි. හැබැයි, නීතිය යාවත්කාලීන කිරීම කියලා කියන්නේ, හරියට software update එකක් කරනවා වාගෙයි. ඔබට තිබෙන්න පුළුවන් හොඳම model එකක computer එකක්. නමුත්, software එක outdated නම් ඒක වටින්නේ නැහැ.

ඒ නිසා නීතිය යාවත්කාලීන කිරීම සඳහා විශාල පරිශ්‍රමයක් දරන්නට ඕනෑ. ඒක ඉබේ වෙන්නේ නැහැ. ඒකට ආයෝජනය කරන්නට ඕනෑ. ඒ ආයෝජනය විවිධ ආකාරයට සිදු විය යුතුයි. මුදලින් ආයෝජනය සිද්ධ වෙන්නට ඕනෑ; තාක්ෂණය ගේන්නට

ඕනෑ; නීතිය යාවත්කාලීන කරන්න ඕනෑ; ප්‍රමාණවත් විනිශ්චයකාරවරු සහ කාර්ය මණ්ඩලයක් ඔවුන්ට සකස් කරලා දෙන්නට ඕනෑ. ලංකාවේ නම් උසාවි ප්‍රමාණයේ වැඩිවීමක් අනිවාර්යයෙන්ම සිද්ධ වෙන්නට ඕනෑ. උදේට විතරක් නොව සවසටත් නඩු අහන ක්‍රමයක් ගේන්නට ඕනෑ. හැබැයි, ඒකෙදි ප්‍රවාහනය වාගේ දේවල් සම්බන්ධයෙන් ප්‍රායෝගිකව අමාරුකම් තිබෙනවා, ඒවාට අපි පහසුකම් දෙන්නට ඕනෑ. මේක out of the box කියලා හිතුවේ නැත්නම් අපට ඉතාම අමාරුයි ඉදිරියට යන්න. මොකද, ආයෝජකයෝ එනකොට අහන ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. "සාමාන්‍යයෙන් ප්‍රශ්නයක් වුණොත් නඩු අහන්න කොච්චර කාලයක් යනවා ද?" කියලා ඒ අය අහනවා. ඒකට අපට නිශ්චිත උත්තරයක් නැහැ; අනිවාර්යයෙන්ම නිශ්චිත උත්තරයක් නැහැ. ඊට පස්සේ අහන්නේ, "කොච්චර මුදලක් වියදම් වෙයි ද?" කියලායි. පළමුවැනි ප්‍රශ්නයට නිශ්චිත උත්තරයක් නැති හින්දා, දෙවැනි ප්‍රශ්නයටත් නිශ්චිත උත්තරයක් නැහැ. ඒ හින්දා ඔවුන් confuse වෙනවා. ඒ නිසා මම හිතනවා, අපේ අධිකරණ ක්‍රියාදාමය යාවත්කාලීන කිරීම ඉතාම වැදගත් දෙයක් කියලා. අපි එය සුළුකොට නොසැලකිය යුතුයි. මොකද, ඒක ආයෝජනය සඳහා ඉතාම වැදගත්.

ආයෝජනය සම්බන්ධව කථා කරනකොට අපි කටින් බතල හිටෙව්වාට හරියන්නේ නැහැ. ඒකට අවශ්‍ය පරිසරය සකස් කරලා දෙන්නට ඕනෑ. ඒ අවශ්‍ය පරිසරය සකසනකොට අපි කියනවා, single-window shop එකක් කියන එක ඉතාම වැදගත් කියලා. ඒ හා සමානවම වැදගත්, ආයෝජකයා ආරක්ෂා කරන, ආයෝජකයන්ට අවශ්‍ය පරිසරය නිර්මාණය කර දෙන, ආයෝජකයන්ගේ ගැටලු වේගවත්ව සහ සාපේක්ෂව නිරාකරණය කර ගැනීමට සාධාරණ මුදලක් වියදම් කරන්න පුළුවන් ක්‍රමවේදයක් සකසා දෙන එක. ඒකට අපි වෙනම කමිටුවක් දැම්මා. නීතිඥ සංගමයේ දැනට සභාපති කෞෂල්‍ය නවරත්න මැතිතුමා යටතේ Investment Court කියලා එකක් දැම්මා. ඒ කියන්නේ, ලාංකිකයන් විතරක් නොව පිට රට කෙනෙක් වුණත් කමක් නැහැ, ඔවුන්ගේ ආයෝජනයේ වටිනාකම අඩුම ගාණේ ඇමෙරිකානු ඩොලර් මිලියනයකට වැඩි නම්, ඔවුනේග් නඩු අහන්න වෙනම අධිකරණයක් පිහිටුවන්න ඕනෑ. දිනෙන් දිනම එම නඩු අහන්නට ඕනෑ; ඉක්මනට නඩු අහන්නට ඕනෑ. උපරිම කාලය මාස 6කින් විසඳලා දෙන්න පුළුවන් වුණොත් ආයෝජකයාට විශ්වාසයක් එනවා, "මම මේ රටට ඇවිල්ලා අවුලක් වුණොත් මට යන්න තැනක් තිබෙනවා, ඉක්මනට ඒක විසඳෙයි" කියලා. සාමාන්‍යයෙන් මෙවැනි ක්‍රම තිබෙනවා. මේක මැජික් එකක් නොවෙයි. මේවා කළ යුතුයි; කළ හැකියි. මේවා කරනවා නම් මිනිස්සු උදව් කරන්න ලෑස්තියි කියන එකත් අපි කියන්නට ඕනෑ. විශේෂයෙන්ම අද ඉන්දියාවේ තෙලන්ගානා ප්‍රාන්තයේ ආයෝජන සම්බන්ධයෙන් නීතිය විශාල වශයෙන් යාවත්කාලීන කරලා තිබෙනවා. සියලුම bureaucracy ඉවත් කරලා තිබෙනවා. එකම window එකකින් සියලුම දේවල් විසඳන ක්‍රමයක් හදුන්වා දීලා තිබෙනවා. මාසයක් විතර ගත වෙනකොට ඔවුන්ට හැකියාව ලැබිලා තිබෙනවා, සියයට 80ක් විතර investment proposals clear කරන්න. හැබැයි, අපේ රටේ investment proposal එකක් clear කරන්න සමහර වෙලාවට මාස 18ක් යනවා; සමහර වෙලාවට මාස 24ක් යනවා; සමහර වෙලාවට clear වෙන්නේම නැහැ. එ් ආයතන 37ක් විතර තිබෙනවා. ඒ හැම ආයතනයක්ම clear කර කර එනකොට ඒ මිනිසුන්ට හති වැටෙනවා. ඒ නිසා ඔහු වෙන තැනක් බලාගෙන යන්න යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1991දී අපේ ආයෝජනවල - exportsවල - වටිනාකම ඩොලර් බිලියන 3යි. 1991දී බංග්ලාදේශයේ exportsවල වටිනාකමත් ඩොලර් බිලියන 3යි. 1991දී වියට්නාමයේ exportsවල වටිනාකමත් ඩොලර් බිලියන 3යි. අද වෙනකොට අපේ exportsවල වටිනාකම ඩොලර් බිලියන 16යි; බංග්ලාදේශයේ exportsවල වටිනාකම ඩොලර් බිලියන 87යි; වියට්නාමයේ exportsවල වටිනාකම ඩොලර් බිලියන 457යි. ඇයි ඒ? අපි කථා පැවැත්වූවාට, තර්ක කළාට, එකිනෙකාට ඇඟිල්ල දිගු කළාට, එකඟ වෙච්ච ක්‍රමවේදයක් තුළ වාඩිවෙලා, මහන්සි වෙලා මිනිසුන්ට පිළිගත හැකි ආකාරයට ආයෝජකයෝ ගෙන්වා ගන්න වැඩ පිළිවෙළක් නිර්මාණය කරලා නැහැ. පළමුවැනි කාරණය, අපි ආයෝජකයන්ට භයයි. ආයෝජකයෝ එනකොට එළවා ගන්න බලනවා. එක්කෝ පුහු විරෝධයක් මතු කරනවා, "ඔවුන් එන්නේ මේක ගිලගෙන යන්න" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෝක ආර්ථිකයේ විශාලත්වය අද වන විට ඩොලර් ට්‍රිලියන 86යි. ඩොලර් ට්‍රිලියන 86යි කියන්නේ, ඩොලර් බිලියන 86,000යි. අපේ ආර්ථිකය සංකෝචනය වෙලා තිබෙනවා, ඩොලර් බිලියන 84 ඉඳලා ඩොලර් බිලියන 74 වෙනකම්. ඒ කියන්නේ, සමස්ත ලෝක ආර්ථිකයේ අපේ කොටස ඇවිල්ලා තිබෙන්නේ සියයට 0.07යි.

එනකොට ලෝකය අපෙන් උරා ගන්නවාට වඩා, අපට ලෝකයෙන් අල්ලා ගන්න තිබෙන චාන්ස් එක සිය ගුණයක් නොවෙයි දහස් ගුණයක්. ඒ නිසා මේ බොරු බිය ගැන්වීම් පැත්තකට දමලා ආයෝජකයන් කැඳවන්නට ඕනෑ. අපට මුදල් නැත්නම් ආයෝජකයා මුදල් අරගෙන එන්නට ඕනෑ. ආයෝජකයා මුදල් අරගෙන එන්නේ අපට charity කරන්න නොවෙයි. ඒ ආයෝජනයට අවස්ථා තිබෙන්න ඕනෑ. ඔවුන්ට සාධාරණ ප්‍රතිලාභයක් ලැබිය යුතුයි. හැබැයි මම පිළිගන්න එක දෙයක් තිබෙනවා. අපට අයෝජන ගෙනෙනකොට හා විශේෂයෙන්ම විදේශ රටවල් එක්ක free trade agreements සාකච්ඡා කරනකොට අපි දැනගන්නට ඕනෑ, ඇස් අරගෙන ඒවා සාකච්ඡා කරන්න. අපට තිබෙන ශක්තිමත් තැන් මොනවාද, අපට තිබෙන දුර්වල තැන් මොනවාද, අනෙක් රටවල් ඒක කරලා තිබෙන්නේ කොහොමද, අපට තිබෙන අවස්ථා මොනවාද, අපට තිබෙන දුර්වලතා මොනවාද කියලා බලන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය හැකියාව අපි දියුණු කර ගන්න ඕනෑ. ඒ හැකියාව ලංකාවේ නැත්නම් පිට රටින් හෝ ගෙන්වාගෙන ඒ සාකච්ඡා කරගෙන යන්නට ඕනෑ.

උදාහරණයක් හැටියට ගත්තොත්, debt restructuring කරනකොට ඒ සම්පූර්ණ හැකියාව ලංකාවේ විතරක් නැහැ කියලා අපි දැනගෙන හිටියා. එම නිසා ඒ සඳහා කැබිනට් අනුමැතිය අරගෙන ඒ හැකියාව තිබෙන අය තෝරා ගන්න අපට සිද්ධ වුණා. ජී.එල්. පීරිස් මැතිතුමාට මතක ඇති, ඔබතුමාත්, මාත් subcommittee එකකට දැම්මා. ඒ අනුව අපි ලසාර්ඩ්ලා තෝරා ගත්තා financial advisersලා හැටියට, ක්ලිෆර්ඩ් චාන්ස්ලා තෝරා ගත්තා legal advisersලා හැටියට. අවසානයේ ඔවුන් ඉතාම හොඳින් ඒ සාකච්ඡාව මෙහෙයවුවා. ඒ නිසා ඔක්කෝම එක විධියට ගියොත් අවසානයේ ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක් පමණ වටිනාකමක් තිබෙන සම්පූර්ණ ඉතිරියක් -දේශීය, විදේශීය සහ bondholdersලාගෙන්- ලංකාවේ ආර්ථිකයට බේරලා දෙන්න අපට පුළුවන් වෙයි කියලා මම හිතනවා. අපට ඒ ශක්තිය ඇති වෙනතුරු, අපි ඒ ශක්තිය දියුණු කර ගන්නාතුරු විදේශිකයන්ගෙන් ඒ දැනුම ලබා ගත්තා කියලා පාඩුවක් සිද්ධ වෙන්නේ නැහැ කියලා මම හිතනවා. එහෙම නැතිව නොදැන ගියොත් ඊට වඩා පාඩුවක් සිද්ධ වෙන්න ඉඩ තිබෙනවා.

දණ්ඩ නීති සංග්‍රහය සහ සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීමට කටයුතු කිරීම වෙනුවෙන් ගරු අධිකරණ ඇමතිතුමාට මම මේ වෙලාවේ කෘතඥතාව පළ කරනවා. නීතිය කියන්නෙත් අනෙක් සියලු දේවල් හා සමානව හැමදාම යාවත්කාලීන වන දෙයක්. අපට අද නීතියක් ගෙනැල්ලා වාඩි වෙලා ඉන්න බැහැ. එම නිසා අවුරුද්දෙන් අවුරුද්ද, දිනෙන් දින එය යාවත්කාලීන කිරීමට යම් ක්‍රමයක් හදුන්වා දීම වඩාත් සුදුසුයි කියා මම යෝජනා කරනවා. මෙම නීතිය ලංකාවේ නීති පද්ධතියට නවත් වැදගත් එකතුවීමක් කියා ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ''ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය'' යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA left the Chair, and THE HON. (DR.) (MS.) HARINI AMARASURIYA took the Chair.

[අ.භා. 2.11]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතා පැහැදිලිව ජනතා පරමාධිපත්‍යය නිර්වචනය කරලා තිබෙනවා. ඇත්තටම ගත්තොත්, මේ රටේ ජනතාවගේ උත්තරීතර බලය තමයි ජනතා පරමාධිපත්‍යය. මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය සහ පාලන බලතල ජනතා පරමාධිපත්‍යයට අයිතියි කියලා නිර්වචනය කරලා තිබෙනවා. එය කිසි කෙනෙකුට පැහැර ගන්න බැහැ. ඒකත් ඉතා පැහැදිලිව තිබෙනවා. නමුත් අද වෙනකොට විශේෂයෙන්ම විධායකයේ යම් යම් ක්‍රියාමාර්ග හරහා මේ බලතලවලට අනියමින් බලපෑම් කරනවා.

අද අපි කථා කරනවා, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව. අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව කථා කළාට විධායකය විසින්ම අධිකරණයට අනියමින් බලපෑමක් කරන අවස්ථා බොහොමයක් අපි පසුගිය කාලයේ දැක්කා. වර්තමානයේ ජනාධිපතිවරයා තැන් කිහිපයකදී, අවස්ථා කිහිපයකදීම -ඔප්පු බෙදන්න ගියාමත්, පොල් සංවර්ධන මණ්ඩලයට ගිය වෙලාවේත්- කියලා තිබුණා, "අධිකරණයට නොවෙයි පාර්ලිමේන්තුවටයි අධිකරණ බලය තිබෙන්නේ, වැඩිය ආවොත් ඒක මම පාර්ලිමේන්තුව හරහා බේරා ගන්නම්" කියලා.

ඇත්තටම ගත්තොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය කියන මේ තුනේ සංවරණය හා තුලනය පිළිබඳව ඉතා පැහැදිලිව ඡේදනය කරලා සඳහන් කර තිබෙනවා. මෙතෙක් කල් අපේ භාවිතාවෙත් අපි ඒක දැකලා තිබෙනවා. එහෙම තිබියදී තමයි අධිකරණ බලය කියන එක -ජනතාවගේ අධිකරණ බලය- ආයතන කිහිපයකට වෙන් කරලා තිබෙන්නේ. ඒ බලය අධිකරණ පද්ධතියට, විනිශ්චයාධිකාරී සභාවලට, ඒ වාගේම පාර්ලිමේන්තුවේ යම් නීතියක් මඟින් පිහිටුවනු ලබන යම් යම් ආයතනවලට වෙන් කරලා තිබෙනවා. එතකොට මේ ආකාර තුනෙන් තමයි අධිකරණ පද්ධතිය සකස් කරලා තිබෙන්නේ. ඒ නිසා අධිකරණයෙන් තමයි ඒ නඩු අහන කටයුත්ත, එහෙම නැත්නම් පාර්ලිමේන්තුවෙන් සම්මත කරන යම් නීතියක් මඟින් පිහිටවපු ආයතන තුළින් තමයි ජනතාවගේ අධිකරණ බලය ක්‍රියාවට නැහෙන්නේ. පාර්ලිමේන්තුව නඩු අහන්නේ නැහැ. පාර්ලිමේන්තුවට නඩු අහන්න පුළුවන් සීමිත අවස්ථා කිහිපයක් තිබෙනවා.

විශේෂයෙන්ම අග්‍ර විනිශ්චයකාරවරයාට දෝෂාභියෝගයක් එල්ල වුණු අවස්ථාවක විශේෂ කාරක සභාවක් හරහා ඒ කටයුත්ත සිද්ධ වෙනවා. හැබැයි, මත් කුඩු සම්බන්ධ නඩුවක් පාර්ලිමේන්තුවේ අහන්නේ නැහැ. යම් කිසි අපරාධයක් වුණාම ඒ නඩුව පාර්ලිමේන්තුවේ අහන්නේ නැහැ නේ. ඒකට තමයි අධිකරණ පද්ධතියක් සකස් කර තිබෙන්නේ. මේ අධිකරණ පද්ධතිය එහෙම තිබෙද්දී, "අධිකරණයේ බලය පාර්ලිමේන්තුවටයි තිබෙන්නේ, පාර්ලිමේන්තුවෙන් අපි ඒක බේරා ගන්නවා" කිව්වාම, ඇත්තටම ඒක අධිකරණයට කරන අනියම් බලපෑමක්. අපි කොච්චර නීති හැදුවත්, විධායකය මඟින් අධිකරණයට ඍජු හා වක්‍ර බලපෑම් කිරීමක් තමයි මේ සිදුවන්නේ. මෑත කාලීනව අධිකරණය විවේචනයට ලක් කරනවා, අපි දැක්කා. හැබැයි, දින 52 කුමන්ත්‍රණය වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය බව අපට මතකයි. ඒ අවස්ථාවේ ශ්‍රේෂ්ඨාධිකරණය ඓතිහාසික තීන්දුවක් ලබා දුන්නා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට විධායක ජනාධිපතිවරයා ධුරයේ සිටිද්දීම, එම විධායක ජනාධිපතිවරයා කරපු ව්‍යවස්ථා විරෝධී, නීතිවිරෝධී කටයුත්තට එරෙහිව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ඓතිහාසික තීන්දුවක් දුන්නා. එදා ඒ තීන්දුව දෙනකොට වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයාට ඒ තීන්දුව ඉහළයි, ඒක හොඳයි. අධිකරණයේ තීන්දුව එදා පිළිගත්තා. එදා අධිකරණයට ගරු කළා.

ඒ වාගේම ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ දී දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරන්න ගියාම ඒකේ තිබුණු අයථා ක්‍රම පිළිබඳ මේ රටේ වැඩ කරන ජනතාව, වෘත්තීය සමිති ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ඒ වෙලාවේ අධිකරණ තීන්දුවක් දුන්නා. එතකොටත් ජනාධිපතිවරයා ඒ අධිකරණ තීන්දුව හිස නමලා පිළිගන්නවා කිව්වා. හැබැයි, මෑත කාලයේ දී අධිකරණයෙන් යම් යම් තීන්දු-තීරණ තමන් බලාපොරොත්තුවන පරිදි නොලැබුණාම ඒවා නිර්දය ලෙස විවේචනය කරනවා. ඉතින්, මේක අනුමත කරන්න බැහැ. මේක, මේ රටේ ජනතාවගේ පරමාධිපත්‍ය බලය වක්‍රව උල්ලංඝනය කිරීමක්. ඒ නිසා, පාලන බලය හොබවද්දී, විධායක බලය හොබවද්දී අධිකරණයට අනියම් ආකාරයෙන් බලපෑම් කරන්න ලෑස්ති වෙන්න එපා කියලා අපි ආණ්ඩුවට අවධාරණය කරනවා. ඉතිහාසයේ එහෙම උදාහරණ ඕනෑ තරම් තිබෙනවා. උසාවිවලට, විනිශ්චයකාරවරුන්ගේ ගෙවල්වලට ඍජුව ගල් ගහපු සිද්ධි සම්බන්ධයෙන් ඉතිහාසයේ උදාහරණ තිබෙනවා. හැබැයි, ඒක වෙනස් විධියකට අද පාවිච්චි කරනවා නම් ඒකත් වැරදියි. ඒ නිසා වහාම ඒක නවත්වන්නය කියා අපි අවධාරණය කරනවා.

ඒ වාගේම විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පසුගිය දවස්වල ආන්දෝලනයට ලක් වුණා. උසාවිය මඟින් ඉතා පැහැදිලිව පස් වතාවක්ම තීන්දුවක් දීලා තිබෙනවා, ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු පහයි කියලා. ඒ නිසා ඒක ආපහු විමසන්න කිසිදු අවශ්‍යතාවක් නැහැ. අධිකරණ ඇමතිවරයා කියනවා මම දැක්කා, සිකුරාදා මේ පනත් කෙටුම්පත ගෙනාවොත්

ඒක සම්මත වෙන්න මෙච්චර කාලයක් යනවා කියලා. ඒකෙන් පෙනෙන්නේ මේ පනත් කෙටුම්පත ගෙනෙන්න ආණ්ඩුවට අදහසක් තිබෙනවා කියන එකයි. නමුත්, මේ රටේ ජනතාව කිසිසේත් මේක අනුමත කරන්නේ නැහැ. එහෙම වුවමනාවක් ඇත්තෙත් නැහැ. රුපියල් කෝටි 1,000ක් යනවා, ජනමත විචාරණයක් පවත්වන්න. විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත ගෙනැල්ලා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයෙන් සම්මත වෙලා, ජනමත විචාරණයකට යන්න ඕනෑ වුණොත්, ජනමත විචාරණයකින් ඒක සම්මත කරගන්න රුපියල් කෝටි 1,000ක වියදමක් යනවා. රුපියල් කෝටි 1,000ක් වියදම් කරන්න රටේ ආර්ථිකය දැන් ශක්තිමත්ද? බංකොලොත් වෙච්ච ආර්ථිකය ඇතුළේ අනවශ්‍ය විධියට අපි රුපියල් කෝටි 1,000ක් නාස්ති කරන්නේ ඇයි? ඒ නිසා, එය අනවශ්‍ය වැඩක් කියන එකත් අවධාරණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වෘත්තීය සමිතිවලින් නඩු කියන්න යද්දී අපේ නීතිඥ සුනිල් වටගල මහත්මයා වෘත්තීය සමිතිවලින් රුපියල් ලක්ෂ 50ක්, 55ක් අරගෙන තිබෙනවා කියලා අද උදෑසන කරුණක් මතු කරලා තිබුණා. ඒක පට්ටපල් අමූලික කෙබරයක්; බොරුවක්. පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරමින් ඇමතිවරු මේ වාගේ නින්දිත ප්‍රකාශ කරන එක වහාම නවත්වන්න ඕනෑ.

මොකද, මේ ගරු සභාවේ උත්තර දෙන්න බැරි නීතිඥයෙක් ගැන කථා කරන්නේ කිසිදු සාක්ෂියක් නැතිවයි. මේ සුනිල් වටගල කියන නීතිඥවරයා ඒ වෘත්තීය සමිතිවල නඩුවලට පෙනී සිටින්නේ සම්පූර්ණයෙන්ම නොමිලේ. ඔහු ඒ සඳහා රුපියල් ලක්ෂ 55ක් තියා ශත පහක්වත් අරගෙන නැහැ. එහෙම තියෙද්දි මේ ඇමතිවරු පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා උසාවියේ ඉන්න නීතිඥවරුන්ට නිග්‍රහ කරන එක, අපහාස කරන එක වහාම නතර කළ යුතුයි. තමන්ගේ වාචාලකම, තමන්ගේ කට හැකරකම තියා ගන්නාට කමක් නැහැ, මාතර වැල්ලට ගිහිල්ලා. වැල්ලට ගිහිල්ලා වාචාල කථා කිව්වාට කමක් නැහැ. හැබැයි අපට නම් ආරංචියි, මාතර රැස්වීමට දීපු සල්ලිවලින් භාගයක් හොරකම් කළා කියලා. මාතර රැස්වීමට සෙනඟ ගෙනෙන්න බස්වලට වියදම් කරන්න දීපු සල්ලිවලින් භාගයක් හොරකම් කළා කියලා ඒගොල්ලන්ගේ මන්ත්‍රීවරුම ඇවිත් අපට කියනවා. එහෙම චෝදනා නම් ඕනෑ තරම් තිබෙනවා. නුවර රැස්වීමෙදීත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් දොස් කියලා තිබුණා, බැණලා තිබුණා, මාතර රැස්වීම හරියට කළේ නැහැ, දීපු සල්ලිවලින් භාගයක් හොරා කෑවා, සෙනඟ ගෙනාවේ නැහැ කියලා. එහෙම තිබියදී, තමන්ගේ කුණු එළියට ඇදගන්න ලැස්ති වෙන්න එපා; අභූත චෝදනා කරන්න එපා. අපේ නීතිඥවරයෙකු වන සුනිල් වටගල සහෝදරයා මෙවැනි ප්‍රගතිශීලි කර්තව්‍යයක් සඳහා පෙනී සිටින්නේත්, පෙනී සිට තිබෙන්නේත් ඇත්තටම කිව්වොත් නිස්සරණාධ්‍යාසයෙන්. ඒ කියන්නේ ශත පහක්වත් අය කරන්නේ නැතුව. එහෙම අයට නිග්‍රහ කරන්න එපා කියන එකත් මම අවධාරණය කරනවා.

මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න විධායකයට වගකීමක් තිබෙනවා. නමුත්, අධිකරණයේ කටයුතුවලට ඇඟිලි ගහන්න බලයක් නැහැ කියන එකත් අවධාරණය කරමින්, මා නතර වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.18]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

අද අධිකරණ අමාත්‍යතුමා විසින් මේ ගරු සභාවට ඉදිරිපත් කරපු සංශෝධන දිහා බලනකොට, එතුමා ඒ පිළිබඳව විග්‍රහ කරනකොට, මෙවැනි සංශෝධන මීට කලින් ගෙනාවා නම් වඩාත් හොඳයි කියන එකයි මට කල්පනා වුණේ. ප්‍රමාද වෙලා හෝ මේ පිළිබඳව අවධානය යොමු වීම ගැන අපි සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද බොහෝ කටයුතුවලට වාගේම උසාවිවල නඩු කටයුතුවලටත් නව තාක්ෂණය භාවිත කිරීම අත්‍යවශ්‍ය කාරණයක් හැටියටයි අපි දකින්නේ. මෙතෙක් සිතාසි නිකුත් කිරීමට තිබුණු ක්‍රම නිසා නොයෙකුත් බාධා ඇති වුණා. එය නඩු ප්‍රමාදවීම්වලටත් බෙහෙවින්ම බලපෑවා. දැනට පවතින ක්‍රම යටතේ පිස්කල් මඟින් සිතාසි ලබා දෙනවා, ග්‍රාම නිලධාරි මඟින් සිතාසි ලබා දෙනවා. ඒ වාගේම ලියාපදිංචි තැපෑලෙන් සිතාසි නිකුත් කරන ක්‍රමයකුත් අද තිබෙන බව අපි දන්නවා. මේ ක්‍රම සියල්ලේම අඩුපාඩු තිබෙනවා වාගේම ඒ හැම එකක්ම නඩු ප්‍රමාදවීමටත් බලපා තිබෙනවා. එම ප්‍රමාදවීම් වැළැක්වීමට නම් නව තාක්ෂණය උසාවිවලට සම්බන්ධ කරගත යුතුවම තිබෙනවා. අද සම්මත කරන මේ සංශෝධනවලින් ඒ කටයුත්ත ඉෂ්ට වීම හරහා අනාගතයේ නඩු ප්‍රමාදවීම් අවම කර ගන්නට මෙකත් හේතුවක් වෙයි කියලා අපි හිතනවා.

අපි ගත්තොත්, මුදල් නඩු, දික්කසාද නඩු වාගේ නඩුවලදී ඇමතිතුමා කිව්වා වාගේ හිතාමතාම සිතාසි භාර ගැනීම මහ හරින ක්‍රම ජනතාව හොයාගෙන තිබෙනවා. පිස්කල්වරු හරහා චිත්තිකරුට සිතාසි භාර දීමට ගියාම සමහර වෙලාවට චිත්තිකරු පදිංචිය හැර ගිහින්, එහෙම නැත්නම් චිත්තිකරු විදේශගත වෙලා, චිත්තිකරු සොයා ගන්නට නොහැකියි කියන පිළිතුරු තමයි පෙරළා ලැබෙන්නේ. ග්‍රාම නිලධාරීන් හරහා සිතාසි යවනකොටත් දැන් ඉස්සර වාගේ නොවෙයි. ගම්මුලාදෑනි ක්‍රමය තිබුණු කාලයේදී ගමම හඳුනනවා, ගම්මුලාදෑනිව. දැන් බොහෝ ප්‍රදේශවල ඉන්නේ අලුත් පත්වීම් ලබපු ග්‍රාම නිලධාරීන්. ඒ අතර කාන්තා පාර්ශ්වයේ විශාල පිරිසක් ඉන්නවා, දුෂ්කර ප්‍රදේශවලට පත්වීම් ලැබිලා. එහෙම වුණාම ගම පිළිබඳව, පුද්ගලයන් පිළිබඳව අවබෝධයක් නොමැතිකම නිසාත් ඔවුන් හරහා එම සිතාසි ලබා දීමත් අසාර්ථක වෙලා තිබෙනවා.

අද ලියාපදිංචි තැපෑලෙන් සිතාසි නිකුත් කිරීමටත් කටයුතු කරනවා. එවැනි අවස්ථාවලදීත් චිත්තිකරුට පුළුවන්, සිතාසිය භාර නොගෙන සිටීමේ ක්‍රම අනුගමනය කරන්න. චිත්තිකරු ගෙදර නැහැ කියලා ලියාපදිංචි තැපෑලෙන් ආ ලියුම අත්සන් කරලා භාර ගැනීම අනෙක් උදවිය ප්‍රතික්ෂේප කරනවා. ඒ වාගේම අපි අහලා තිබෙනවා, ලියාපදිංචි තැපෑලෙන් සිතාසිය එව්වාම කියනවා, ලියුම ඇතුළේ සිතාසිය තිබුණේ නැහැ කියලා. මෙවැනි හේතු නිසා ඇත්ත වශයෙන්ම නව තාක්ෂණය සිතාසි ලබා දීමට උපයෝගී කර ගැනීම ඉතා ම කාලෝචිත පියවරක් හැටියටයි අපි දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වෙනකොට අපේ රටේ ජංගම දුරකථන භාවිතය ඉතාම ඉහළ මට්ටමක තිබෙන්නේ. ලංකාවේ සිටින වැඩිහිටි ජනගහනයටත් වඩා වැඩි පිරිසක් ජංගම දුරකථන භාවිත කරන තත්ත්වයක් තමයි දකින්න තිබෙන්නේ. සමහරුන් එක ජංගම දුරකථනයක් නොවෙයි, ජංගම දුරකථන දෙක, තුන පාවිච්චි කරන අවස්ථාත් බහුලව දකින්න තිබෙනවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

විවිධ තාක්ෂණික ක්‍රම ඔස්සේ කෙටි පණිවුඩ - SMS, WhatsApp, email - මඟින් ප්‍රමාදයකින් තොරව සිතාසි නිකුත් කරන්න පටන් ගත්තාම, පැවති ක්‍රමවල තිබුණු අඩු පාඩු බොහෝදුරට මකාගන්න පුළුවන් වෙයි. මේ සංශෝධනවලින් පස්සේ තාක්ෂණය හරහා සිතාසි ලබා දීම සාර්ථක වෙයි කියලා තමයි අපි කල්පනා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් පවතින ක්‍රමයට අනුව දිස්ත්‍රික් උසාවියේ නඩුවක් පවරනකොට නීතිඥයෙකු ඉදිරිපිට අත්සන් කරලා, ඒ නීතිඥයාට පෙරකලාසියක් - proxy එකක් - මඟින් බලය පවරනවා, ඒ නඩුවට පෙනී සිටින්න. ගරු ඇමතිතුමා කිව්වා වාගේ දැන් තිබෙන ක්‍රමය යටතේ ගාල්ලේ ඉන්න කෙනෙකුට යාපනයේ නඩුවක් පවරන්න අවශ්‍ය නම් යාපනයට යන්න වෙනවා. එහෙම නැත්නම් තවත් දුර බැහැර ප්‍රදේශයකට යන්න වෙනවා. මේ නිසා වියදම් අධික වෙනවා. කාලය විශාල වශයෙන් නාස්ති වෙනවා. ඒ වාගේම රස්තියාදු වෙන අවස්ථාත් බහුලව දකින්න තිබෙනවා. අදාළ ප්‍රදේශයේම ඉඳලා නඩු පැවරීමේ හැකියාවත් මේ සංශෝධනවලින් පස්සේ ලැබෙන බව ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සංශෝධනයෙන් පසුව තවත් වැදගත් දෙයක් සිද්ධවෙනවා. දැන් තිබෙන ක්‍රමයට දිස්ත්‍රික් උසාවියේ සිවිල් නඩුවක විත්තිකරුවෙකුට නඩුව විභාගයට ගන්නා පළමු දිනයේදී යම් කිසි සාධාරණ හේතුවක් නිසා උසාවියේ පෙනී සිටින්න බැරි වුණොත්, එම නඩුව ඒකපාක්ෂිකව විභාග කිරීමට විනිශ්චයකාරවරු තීන්දු කරනවා. නඩුවේ තීන්දුව ලබා දෙනතුරුම අර විත්තිකරුට නඩුවට ඇතුළු වෙන්න බැරි වෙනවා. සමහර වෙලාවට රෝගී තත්ත්වයක් හේතුවෙන් රෝහල්ගත වීමක් නිසා, වෙනත් නොවැළැක්විය හැකි කරුණක් නිසා හෝ යම්කිසි සාධාරණ හේතුවක් නිසා පළමුවැනි දිනයේ උසාවියට යන්න බැරි වුණොත් ඒ අවස්ථාවේ ඒ අය අසාධාරණයට ලක් වෙනවා. දැන් තිබෙන ක්‍රමය යටතේ පැමිණිලිකරු එකඟ වුණොත් විතරයි, විත්තිකරු අතරමඟදී නඩුවට සම්බන්ධ කර ගන්නේ. නමුත්, අද සම්මත කරන මේ සංශෝධනවලින් පස්සේ විත්තිකරුට සාධාරණයක් ඉෂ්ට වෙනවා. පැමිණිලිකරුගේ එකඟතාව තිබුණත්, නැතත් සාධාරණ හේතුවක් නිසා පළමුවැනි නඩු විභාග දිනයේ උසාවියේ පෙනී සිටින්න බැරි වුණා කියන එක ඔප්පු කළොත් ඔහුට නඩුවට ඇතුළත් වීමට බාධාවක් නැතිව යනවා.

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. සාමදාන විනිශ්චයකාර තනතුරු ලබා දීමේදී සලකා බලන අධ්‍යාපන මට්ටම පිළිබඳවත් සංශෝධනයක් කරලා තිබෙනවා. මීට කලින් ඒ සඳහා උසස් පෙළ විභාගය සමත් වීම අනිවාර්ය කරලා තිබුණා. දැන් ඒක සාමාන්‍ය පෙළ දක්වා අඩු කරලා තිබෙනවා. සමහර වෙලාවට හොඳ සමාජ පිළිගැනීමක් තිබෙන උදවියට, ප්‍රභූවරුන් හැටියට සමාජයේ ක්‍රියා කරන උදවියට, මේ තනතුරට ගැළපෙන උදවියට ඒක යම් කිසි සහනයක් වෙයි කියා මම කල්පනා කරනවා. ඒ වාගේම සාම විනිසුරුවරුන්ට සාම විනිසුරු තනතුරේ වගකීම ගැන අවබෝධයක් ලබා දිය යුතුවත් තිබෙනවා. ඒ තනතුර ලබා දෙනකොටම ඔවුන්ට වැඩමුළුවක් පවත්වා ඒ වගකීම් පිළිබඳව කියා දෙනවා නම් වඩාත් සුදුසුයි. දිවුරුම් ප්‍රකාශයක් අත්සන් කරද්දී වුණත්, "මා ඉදිරිපිටදී අත්සන් කළා" කියන එකට අමතරව එහි අන්තර්ගත කරුණු පිළිබඳ අවබෝධයක් ඇතිව එම කටයුතු කරන්න ඔවුන්ට කියා දිය යුතුව තිබෙනවා. ගරු ඇමතිතුමා කිව්වා, දැන් වසර දෙකකට වතාවක් සාමදාන විනිශ්චයකාරවරුන්ගේ තොරතුරු අමාත්‍යාංශය ලබා ගන්නවා කියලා. සමහර සාම විනිසුරුවරු මිය ගිහින් තිබෙනවා. නමුත්, ඒක අමාත්‍යාංශය දන්නේ නැහැ. ඒ හරහා ව්‍යාජ විධියට අත්සන් පාවිච්චි කිරීම සිද්ධ වෙනවා. උසාවිවල නඩුවලටත් ඒවා බලපාන අවස්ථා තිබෙනවා. සමහරු වයසට ගිහිල්ලා. බොහෝ වයෝවෘද්ධ තත්ත්වයේ ඉන්න අයට, සිහි කල්පනාව අඩු අයට එවැනි තනතුරක කටයුතු කිරීමේ අපහසුතා තිබෙනවා. ඒ නිසා වසර දෙකකට වතාවක් ඒ අයගේ තොරතුරු ලබාගෙන සක්‍රිය ලැයිස්තු සකස් කර තිබීම ගැන මම සතුටු වෙනවා.

අවසාන තත්පරයේ මම මේ කාරණය කියන්න කැමැතියි. අපි හැම දාමත් මේ ගරු සභාවේදී මතක් කරනවා, ඇල්පිටියේ මහෙස්ත්‍රාත් උසාවියේ ඉඩ කඩ නැතිකම බරපතළ ප්‍රශ්නයක් බව. අපේ නීතිඥවරුන්ට ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නැහැ. බදු ක්‍රමයට කඩ කාමර වාගේ ඒවා ගන්න ගියොත් විශාල මුදලක් වැය වෙනවා. සමහර නීතිඥවරු පාර අයිනේ මේසයක්, පුටුවක් තියාගෙන තමයි තමන්ගේ සේවාදායකයන් එක්ක කථා බහ කරන්නේ. වැස්ස දාට කුඩ ඉහළාගෙන බොහොම දුෂ්කර සේවයක ඔවුන් නිරත වන හැටි අපි දකිනවා. ආණ්ඩුවේ කාලය ඉකුත් වෙන්න ළඟ වුණත්, මම මේ ඉල්ලීම කරන්න කැමැතියි. පුළුවන් අවස්ථාවක ඇල්පිටිය මහෙස්ත්‍රාත් උසාවිය ප්‍රමාණවත් ඉඩ කඩ සහිතව සකස් කර දීමට සහ නීතිඥයන්ගේ කාර්යාල පහසුකම් සපයා දීමට අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින්, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.27]

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ගරු සභාවට පසුගිය මාස හය තුළ ඉදිරිපත් කරලා තිබුණු පනත්වලින් සියයට 70කට වඩා අධිකරණ ඇමති ගරු ආචාර්ය විජයදාස රාජපක්ෂ මැතිතුමා විසින් තමයි ඉදිරිපත් කළේ. අපේ නීතිය නවීකරණය කිරීම පිළිබඳව එතුමාගෙන් සිදු වෙච්ච අතිවිශාල සේවය අපි අගය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද ශ්‍රී ලංකා අධිකරණයට ඉතාම වැදගත් කාර්යභාරයක් අයත් වෙලා තිබෙනවා, බොහොම සංවේදී නඩු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, මැතිවරණ වැනි විෂයයන් සම්බන්ධයෙන්. අපේ ඉතිහාසයේ පාර්ලිමේන්තුව හා අධිකරණය අතර ඉතාම හොඳ සම්බන්ධයක් තිබුණා. අන්‍යෝන්‍ය ගෞරවය හා එකිනෙකාගේ විෂය පථය පිළිබඳ අවබෝධයක්, වැටහීමක් තිබුණා. හැබැයි අවාසනාවකට මෙන්, මෑත කාලයේ ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. මේ ගරු සභාව තුළදී අධිකරණයට ප්‍රහාර එල්ල කරනවා.

විශේෂයෙන්ම අධිකරණයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ භාර වෙලා තිබෙන කර්තව්‍යයක් තමයි, පාර්ලිමේන්තුවට පනතක් ඉදිරිපත් කරන විට ඒ පනත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලද, එහෙම නැත්නම් කුමන වගන්ති සඳහාද තුනෙන් දෙකක බහුතරයක් අවශ්‍ය වන්නේ කියන එක තීන්දු කිරීම. සමහර වගන්ති තුනෙන් දෙකක බහුතරයකින් වුණත් සම්මත කරන්න බැහැ. ඒවාට ජනමත විචාරණයක් අවශ්‍යයි. යම් පනතක් විවාදයට භාජන කරලා සම්මත කිරීමට පෙර ශ්‍රේෂ්ඨාධිකරණයේ නිර්දේශ ලබා ගැනීම අනිවාර්යයි, අපේ උත්තරීතර නීතිය යටතේ. හැබැයි,

යම් මතයක් මෙහි ප්‍රකාශ වුණා. ගරු ජනාධිපතිතුමාත් ඒ ගැන ප්‍රකාශ කළා. නමුත් මම ගෞරවයෙන් කියනවා, ඒ මතය සම්පූර්ණයෙන් වැරදියි කියලා. ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරන මතය වන්නේ ඒ නිර්දේශ පිළිගන්නවාද, නැද්ද කියලා තෝරා ගැනීමට මේ පාර්ලිමේන්තුවට අභිමතයක් තිබෙනවා කියන එකයි. අපට කැමැති නම් එය පිළිගන්න පුළුවන්, අකැමැති නම් ප්‍රතික්ෂේප කරන්නත් පුළුවන්. නමුත් ඒක නොවෙයි, තත්ත්වය. ඒ කියන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නිර්දේශවලට පටහැනිව පනතක් සම්මත කර ගැනීමට උත්සාහ දරනවා නම්, ඒ පනත නීතිගත වෙලා නැහැ, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව.

අපි දැක්කා, Online Safety Bill එකේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ සමහර නිර්දේශ විසි කරලා දැමුවා. කමිටු අදියරේදී අපි ඒවාට අනුගත වුණේ නැහැ. අදත් අපි අත්විඳිනවා, ඒ තුළින් ජනිත වෙලා තිබෙන යම් යම් ව්‍යාකූලතා. ඒ නිසා ඒ කටයුතු කිසිසේත් කරන්න පුළුවන්කමක් නැහැ.

විනිශ්චයකාරවරයෙකුට විරුද්ධව යම්කිසි විවේචනයක් කරනවා නම්, හරයාත්මක යෝජනාවක් ගේන්න ඕනෑ. නමුත් මම දැකලා තිබෙනවා, මේ සභා ගර්භයේ නැඟිටලා විනිශ්චයකාරවරු විවේචනය කරන ආකාරය. එය ඉතාම කනගාටුදායකයි. නඩු තීන්දු වැරදියි කියනවා; ඒවා මේ ගරු සභාවෙන් හරිගස්සන්න ඕනෑ කියනවා. මේ ගරු සභාවට පුළුවන්ද, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු නිවැරදි කිරීමට? එසේ කිරීමට කිසිසේත්ම පුළුවන්කමක් නැහැ. සමහර අවස්ථාවලදී විනිශ්චයකාරවරු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුව ඉදිරියට කැඳවනවා කියලා ඉතාම තර්ජනාත්මකව කියනවා. එහෙම ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුව ඉදිරියට විනිශ්චයකාරවරු කැඳවලා හරස් ප්‍රශ්න අහලා, ඒ අයගේ අධිකරණ කර්තව්‍යය පිළිබඳ ඒ විධියට කටයුතු කරන්න පාර්ලිමේන්තුවට පුළුවන් නම් එතකොට අධිකරණය හා ව්‍යවස්ථාදායකය අතර බලය බෙදීමේ න්‍යාය සම්පූර්ණයෙන් උල්ලංඝනය වෙනවා. එසේ කිරීමට කිසිසේත් පුළුවන්කමක් නැහැ. විනිශ්චයකාරවරුන්ට බැහැ, මේ ගරු සභාවට ඇවිල්ලා ඒ අයගේ නිදහස වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීමට. එම නිසා අපට යුතුකමක් තිබෙනවා, විශේෂයෙන්ම මේ විධියේ සංවේදී කරුණු සම්බන්ධයෙන් නඩු තීන්දු දීමට ශ්‍රේෂ්ඨාධිකරණයට සිදු වෙන අවස්ථාවලදී, ඒ කටයුත්ත ස්වාධීන ලෙස කිරීමට පුළුවන් වන පරිදි උචිත වාතාවරණය නිර්මාණය කර දෙන්න. එවැනි වාතාවරණයක් නිර්මාණය කර දීම මේ ගරු සභාවේ ප්‍රමුඛ යුතුකමක් වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. හැම කෙනෙක් අතින්ම වැරදි සිදු වෙනවා. යම්කිසි නඩු තීන්දුවක දෝෂයක් තිබෙනවා නම්, ඒකට ගත යුතු ක්‍රියා මාර්ගයකුත් තිබෙනවා. ඒ ගැන කියන්න ඕනෑ, අග්‍ර විනිශ්චයකාරතුමාට. එතකොට අග්‍ර විනිශ්චයකාරතුමාට පූර්ණ බලය තිබෙනවා, විනිශ්චයකාරවරු පස්දෙනෙක්, හත්දෙනෙක් අවශ්‍ය නම් සම්පූර්ණ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගෙන් සැදුම්ලත් විනිශ්චය මඩුල්ලක් පත් කරන්න ඒක විභාග කරන්න. අපේ ඉතිහාසයේ ඕනෑ තරම් එහෙම දේවල් වෙලා තිබෙනවා. අධිකරණයෙන් යම්කිසි වරදක් වෙලා තිබෙනවා නම්, ඒ වරද නිවැරදි කිරීමේ කාර්යභාරය අධිකරණයටම භාර දෙන්න ඕනෑ. මේ ගරු සභාවට කිසිසේත් පුළුවන්කමක් නැහැ, ඒක කිරීමට. මගේ අදහස, මේ සියල්ලක්ම ඇති වන්නේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) කියන ව්‍යවස්ථාව පිළිබඳව තිබෙන යම්කිසි වැරදි හැඟීමක් නිසා කියන එකයි.

එහි සඳහන් ආකාරයට අපේ රටේ පරමාධිපත්‍යය බලය තිබෙන්නේ ජනතාවට. ජනතාවට තමයි අධිකරණ බලය තිබෙන්නේ. ජනතාව වෙනුවෙන් ඒවා පාර්ලිමේන්තුව තුළ රැඳී පවතිනවා. හැබැයි, ඍජුව අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට පාර්ලිමේන්තුවට කිසිසේත් පුළුවන්කමක් නැහැ. ඒක කිසිසේත් පිළිගන්න පුළුවන් තත්ත්වයක් නොවෙයි. ඒක කරන්න පුළුවන් වන්නේ අධිකරණය හරහා. තිබෙන එකම ව්‍යතිරේකය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක් මතු වුණොත්, ඒ වාගේ අවස්ථාවකදී ඍජුව අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට මේ ගරු සභාවට පුළුවන්වීමයි. එහෙම නැත්නම් අධිකරණ බලය ක්‍රියාත්මක වන්නේ අධිකරණය හරහායි. මම හිතන්නේ නැහැ, ඒ ගැන කිසිම විවාදයක් තිබේවි කියලා. මෙවා මූලික සිද්ධාන්ත; මූල ධර්ම. මෙවා අපි මැනවින් වටහාගෙන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, අධිකරණයට, අධිකරණයේ නිදහසට, ස්වාධීනත්වයට ගරු කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් අපට අනිවාර්යයෙන්ම විශාල අර්බුදයකට මුහුණ දීමට වෙනවා. ඒ නිසා එවැනි තත්ත්වයක් ඇතිවීම වළක්වන්න ඕනෑය කියන මතය ප්‍රකාශ කරමින් මට කථා කරන්න වේලාව ලබා දීම ගැන ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.33]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග කිහිපයක් සම්මත කිරීමට ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි, අපේ රටේ අධිකරණ පද්ධතිය මේ මොහොත වනවිට ඉතාම වැදගත් සන්ධිස්ථානයකට පැමිණ ක්‍රියාත්මක වෙන බව. ඒ වාගේම ජනාධිපතිවරයාගෙන් හැම වෙලාවේදීම අධිකරණයට විශාල බලපෑමක් එල්ල වෙනවාය කියන එකත් අපට පෙනෙනවා. පසුගිය කාලයේ මේ රටේ සිටි කිසිදු ජනාධිපතිවරයෙක් මේ විධියට අධිකරණයට බලපෑම් කරන ප්‍රකාශ කරමින් අධිකරණය යටත් කරගන්න කටයුතු කළ බවක් අපි දැක්කේ නැහැ. නමුත් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා නිතරම අධිකරණය තමන් යටතට පත් කරගන්න උත්සාහ කරනවා.

මම අධිකරණයේ අවධානයටත් යොමු කරන්න කැමැතියි, විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 (13) අනුව්‍යවස්ථාව. අපි සියලුදෙනා දන්නවා, එහි සඳහන් ආකාරයට පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ පක්ෂ සාමාජිකත්වය අහිමි වුණු අවස්ථාවක ඒ සම්බන්ධයෙන් පවතින නඩු කටයුතු මාස දෙකක් ඇතුළත අවසන් කළ යුතු බව. එය පැහැදිලිවම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුව තුළත් අද වනකොට පක්ෂ මාරු කළ, පක්ෂ සාමාජිකත්වය අහෝසි වුණු, ජනමතයට පටහැනිව වැඩ කරන මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් ඉන්නවා. අද වනවිට එවැනි නඩු කටයුත්තක් ශ්‍රේෂ්ඨාධිකරණය තුළ විභාග කර අවසන් කිරීමට මාස පහක වාගේ කාලයක් ගත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඔවුන් නඩත්තු වෙන්නේ ජනතාවගේ බදු මුදල්වලින් බව අපි මතක තබා ගන්න ඕනෑ. ඒ නිසා මම ශ්‍රේෂ්ඨාධිකරණයේ අවධානයට යොමු කරනවා, විශේෂයෙන්ම පක්ෂ සාමාජිකත්වය අහිමි වුණු අය සම්බන්ධයෙන් වාගේම ජනතා මතයට විරුද්ධව වැඩ කරන අය සම්බන්ධයෙන් පවතින නඩු කටයුතු මාස දෙකක් ඇතුළත අවසන් කළ යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 (13) අනුව්‍යවස්ථාව යටතේ පැහැදිලිව සඳහන් කර තිබෙන බව.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, අපි දන්නවා, මේ රටේ පළාත් පාලන මැතිවරණයක් පවත්වන්න නියමිතව තිබුණු බව. නමුත් මුදල් නැහැ කියලා ජනාධිපතිවරයා එම මැතිවරණය කල් දැම්මා. අපි සියලුදෙනාම දන්නවා, දැන් ජනමත විචාරණයක් ගෙනෙන්න අවශ්‍ය වන විධියට එතුමා විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ගෙනෙන්න හදන බව. ජනමත විචාරණයක් පැවැත්වීම වෙනුවෙන් වියදම් කිරීමට රුපියල් බිලියන 10ක් වෙන් කරන්න ඕනෑය කියලා මැතිවරණ කොමිසම පවා ප්‍රකාශයට පත් කර තිබෙනවා.

පසුගිය කාලයේම අපි දැක්කේ මේ ආණ්ඩුව, මේ ජනාධිපතිතුමා ජනාධිපතිවරණය පැවැත්වීම වැළැක්වීමට නොයෙක් ආකාරයේ ක්‍රම සහ විධි පාවිච්චි කළ බවයි. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන පුංචි පුංචි සිදුරුවලින් රිංගන්න පුළුවන්ද කියලා ජනාධිපතිතුමා උත්සාහ කළා. ඒ පුංචි පුංචි සිදුරුවලින් රිංගන්න එතුමා අවස්ථා දෙකකදීම ශ්‍රේෂ්ඨාධිකරණයට පුද්ගලයන් දෙදෙනෙකු යැව්වා. නමුත් ඒ අවස්ථා දෙකම අසාර්ථක වුණාය කියන එක අපි දැක්කා. එසේ වුණාට පසුව තමයි ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගත්තේ විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න. එතකොට අධිකරණ ඇමතිතුමා ඒක නැවැත්වූවා. ඊළඟට, ජනාධිපතිවරයා අධිකරණ ඇමතිතුමාට ඉහළින් ගිහිල්ලා නියෝගය දුන්නා, ඒක කරන්න කියලා. අද අධිකරණ ඇමතිතුමා ඇවිල්ලා කිව්වා, "මා දැනුවත් කරලා තමයි කළේ" කියලා. අධිකරණ ඇමතිතුමා වෙලාවකට කියනවා, එතුමා ඒක නැවැත්වූවා කියලා. තව වෙලාවකට කියනවා, එතුමා දැනුවත්ව ඒක කළා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කවුරුවත් ඉල්ලුවේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත කාරණා අපේ රටේ ජනාධිපතිවරණවලට බාධාවක් වුණේත් නැහැ. කවුරුවත් ඉල්ලුවේ නැති දෙයක් ඇයි, මේ හදිසියේ ගෙනෙන්න හදන්නේ? ඇයි මේක හදිසි?

ජනාධිපතිවරණය ළඟ තියාගෙන, ජනාධිපතිවරණය පවත්වන දිනය ප්‍රකාශයට පත් කරන්න දවස් කිහිපයක් තිබියදී ආණ්ඩුව මෙය ගැසට් කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කටයුතු කිරීම තුළ කුමක් හෝ යටි අරමුණක් තිබෙන බව අපට ඉතා පැහැදිලිව පේන්න තිබෙනවා. මේ රට තුළ අවිනිශ්චිතභාවයක් ඇති කරන්න, අරාජික තත්ත්වයක් නිර්මාණය කරන්න, ජනතාව තුළ කුතුහලයක් ඇති කරන්න, ඒ කුතුහලය ඇති කරලා ජනාධිපතිවරණයේ වැඩපිළිවෙළ අවුල් කරන්න තමයි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා මේක ගේන්න හදන්නේ කියන එක අපට පැහැදිලිව පේනවා.

ඒ වාගේම මම එක කාරණයක් මතක් කරන්න ඕනෑ. මේ විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරන වෙලාවේ ජනාධිපතිවරයා ගාල්ලේ ගිහිල්ලා කිව්වා, ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මැතිතුමා ඒක හරියට කළේ නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, මමත් එදා යහපාලන ආණ්ඩුවේ මන්ත්‍රී කෙනෙක් වෙලා මේ පාර්ලිමේන්තුවේ හිටියා. ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මැතිතුමා ඇතුළු ඒ සන්ධානයේ, යහපාලනයේ හිටපු නායකයෝ සියලුදෙනාම එක තීන්දුවකට ආවා. ඒ තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේනකොට ජනමත විචාරණයකට තුඩු දෙන ව්‍යවස්ථා සංශෝධනයක් ගේන්නේ නැහැ කියන එක. ඒ සම්බන්ධයෙන් පැහැදිලි එකඟත්වයකට ආවා. එසේ එකඟත්වයකට ආවාට පස්සේ තමයි ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මැතිතුමා ඒක ගෙනාවේ. ඒ ව්‍යවස්ථාව අල්ලන්නේවත් නැහැයි කියලා සියලුදෙනාම එකඟ වුණා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83වැනි ව්‍යවස්ථාව අල්ලන්නේවත් නැහැ, ඒක සංශෝධනයට ඇතුළත් කරගන්නේ නැහැ කියලා කිව්වා. ඒ හින්දා තමයි ජනමත විචාරණයකින් තොරව කටයුතු කිරීමට අවශ්‍ය සංශෝධන ටික පාර්ලිමේන්තුවට ගෙනාවේ. මා ළඟ තිබෙනවා, ජනාධිපති රනිල් වික්‍රමසිංහ එදා අගමැති වෙලා සිටියදී 2015 අප්‍රේල් 28වැනි දා පාර්ලිමේන්තුවේ කරපු කථාව ඇතුළත් හැන්සාඩ් වාර්තාව. එම හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 867, 868 ඇතුළත් පිටුව මම **සභාගත*** කරනවා.

එතුමා පැහැදිලිව කියලා තිබෙනවා, පිළිගෙන තිබෙනවා ජනමත විචාරණ සඳහා තුඩු දෙන කිසිදු දෙයක් ගේන්නේ නැහැ කියලා.

එතුමා එදා නීතිඥ වැලිඅමුණටත් මේ වාගේ දෙයක් කළා. මොකක්ද කළේ? යහපාලන ආණ්ඩුව කාලයේ නීතිඥ වැලිඅමුණ මැතිතුමා දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලය හදන්න විශාල වැඩ කොටසක් කළා. රාජපක්ෂලාගේ ආණ්ඩුව බලයට ආවාම එතුමන්ලා පත් කළා, දේශපාලන පළිගැනීම් පිළිබඳව සොයා බැලීම සඳහා වන කොමිසමක්. එහි සභාපතිතුමා හැටියට පත් කළා, උපාලි අබේරත්න මැතිතුමා. පත් කරලා, යහපාලන ආණ්ඩුවේ හිටපු නිලධාරීන්, ඒ වාගේම දේශපාලන නායකයන් කැඳවලා දඩුවම් දෙන්න ගියා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා එදා ඒ කොමිසමට කැඳෙව්වේත් නැහැ. කැඳවන්නේත් නැතුව එතුමා ඒ කොමිසමට ගිහිල්ලා කිව්වා, "මම මේ මොකුත් දන්නේ නැහැ. මේක කළේ නීතිඥ වැලිඅමුණ" කියලා. ලජ්ජයි, ජනාධිපතිතුමනි. ලජ්ජයි. මම එහෙම කියන්නේ මොනවත් හින්දාවත් නොවෙයි. 2015දී රාජපක්ෂලාගේ භීෂණය ඇති කරලා, ලසන්ත වික්‍රමතුංග ඝාතනය කළා, තාජුඩීන් ඝාතනය කළා, ප්‍රගීත් එක්නැලිගොඩව අතුරුදහන් කළා, කීත් නොයාර්ට පහර දුන්නා, පෝද්දල ජයන්තගේ කකුල් කැඩුවා. තමන්ගේ ජීවිතය ගැනවත් විශ්වාසයක් නැතුව හිටපු ඒ වෙලාවේ, එදා ජයම්පතිලා, වැලිඅමුණලා රාජපක්ෂ භීෂණයට විරුද්ධව, රාජපක්ෂලාට විරුද්ධව මේ ජනාධිපතිවරයා එක්ක හිට ගත්තා. අද රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා එදා ඒ භීෂණය ඇති කරපු අයත් එක්ක එකතු වෙලා මේ සියලුදෙනා පාවා දීලා තිබෙනවා. ලජ්ජයි ජනාධිපතිතුමනි. ඉතින් කවුද එන්නේ එතුමා එක්ක, එහෙම පාවා දීපු නායකයෙක් එක්ක දේශපාලනය කරන්න? එතුමා එක්ක වැඩ කරපු, එතුමා වෙනුවෙන් පෙනී හිටපු අය, එදා යහපාලන ආණ්ඩුව කාලයේ මේ රටේ වංචා, දූෂණ අවම කරගන්න, නීතියේ ආධිපත්‍යය ඇති කරන්න වැඩ කරපු ඒ නායකයන් පාවා දෙනවා නම්, මේ රටේ කිසිම දේශපාලනඥයෙක් එතුමා එක්ක වැඩ කරන්න එන්නේ නැහැ. ඒ එන්නේ නැති හින්දා තමයි අද මහින්දානන්ද වාගේ බංකොලොත් වෙලා, මේ රටේ වංචා, දූෂණ චෝදනා ලබපු ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාත් එක්ක ඉන්න කණ්ඩායමත් එක්ක එකතු වෙලා ඉන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Madam Chair, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්න මහින්දානන්ද අලුත්ගමගේට තිබෙන දුෂණ චෝදනා මොනවාද කියලා. *[බාධා කිරීමක්]* නැහැ, ඔබතුමා දැන් කිව්වා නේ. තිබෙනවා නම් කියන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
හරි. හරි. ඔබතුමාටත් නඩු තිබෙනවා නේ.*[බාධා කිරීමක්]* ඔබතුමාටත් නඩු තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මොකක්ද නඩුව? කොහේද තිබෙන්නේ නඩුව?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමාට විරුද්ධව අල්ලස් හෝ දුෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් දාපු නඩු තිබෙනවා. ඔබතුමාට විරුද්ධව මහාධිකරණයේ නඩුවක් යනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමාට විරුද්ධව මහාධිකරණයේ නඩුවක් යනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මේක මතක තියාගන්න, ගරු මන්ත්‍රීතුමනි. මට විරුද්ධව නඩු දෙකක් දැම්මා. ඒ දෙකෙන්ම මම නිදොස් කොට නිදහස්. හැබැයි, මතක තියාගන්න කංජීපානි ගෙදරට ගෙනැල්ලා පාටි දැම්මේ නැහැ මම. කංජීපානිත් එක්ක පාටි දැම්මේ නැහැ. මුජීබුර් රහුමාන්ගේ ගෙදර කංජීපානි ඉම්රාන් ඇවිල්ලා පාටිය දැම්මා. ඒක හැම තැනම newsවල ගියා. ඒක ඔබතුමා පිළිගත්තා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දේශපාලනය කරනකොට අපි වංචා, දුෂණවලට සම්බන්ධ වෙලාත් නැහැ, පාතාල නායකයෝ එක්ක සම්බන්ධ වෙලාත් නැහැ, මධුෂ්ලා එක්ක සම්බන්ධ වෙලාත් නැහැ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා - මෙතුමන්ලාගේ නායකයෝ- අවුරුදු දෙකහමාරක් මේ රටේ පාලනයේ හිටියා. අපි අර දේවල්වලට සම්බන්ධ වෙලා තිබුණා නම් අපිව නිකම් අත හරින්නේ නැහැ. හැම දාම අපේ telephone එකේ details check කළා, අපේ පසුපස බුද්ධි අංශය එව්වා, බුද්ධි අංශය අපේ ගෙවල් අවට දාලා හිටියා, අපි යන යන තැන් හොයා බැලුවා. ඒ හැම එකක්ම කළා. අද අපි ඉතා ආඩම්බරයෙන්, අවංකව කියනවා, අපි මේ රටේ කිසිදු වංචාවකට සම්බන්ධ වෙලාත් නැහැ, මේ රටේ ඉන්න කිසිදු අපරාධකාරයෙක් එක්ක සම්බන්ධ වෙලාත් නැහැ කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම අවසන් කරන්නම්, මට මගේ කාලය දෙන්න.

ඒ නිසා පාර්ලිමේන්තුවේ තිබෙන අයිතිවාසිකම්, එහෙම නැත්නම් වරප්‍රසාදවලට මුවා වෙලා අපට චෝදනා කරන්න එපා. ඒ චෝදනා අයින් කරගන්න කියලා මම ඉල්ලා සිටිනවා. මම කිව්වේ මෙකයි. රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අද යන එනම් නැහැ. රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අද වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ මේ රාජපක්ෂ ආණ්ඩුවේ දුෂණ චෝදනාවලට ලක් වෙලා ඉන්න උදවියත් එක්කයි.

අද උදේ සමහර අය VFS ආයතනය ගැන කියමින් කෑ ගහනවා මම දැක්කා, හරියට භූමිතෙල් ගෑවුණු ගැරඬින් වාගේ. අද ඒකට හර්ෂ ද සිල්වා මැතිතුමාට තර්ජනය කරනවා. ඇයි ඒ? මේවාට සම්බන්ධතා තිබෙන උදවිය තමයි අද උදේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කෑ ගහන්න පටන් ගත්තේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

අද මේ ආණ්ඩුවේ ඉන්න දුෂණ, වංචාවලට සම්බන්ධ උදවිය ආරක්ෂා කරන ජනාධිපතිවරයා බවට පත් වෙලා ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ විධියට ගියොත් ජනාධිපතිතුමාගේ සූට් එක උඩින් සාටකය දා ගන්න දවස වැඩි ඈතක නොවෙයි කියන එක මම ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අකිල එල්ලාවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.44]

ගරු අකිල එල්ලාවල මහතා
(மாண்புமிகு அகில எல்லாவல)
(The Hon. Akila Ellawala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු අනුරාධ ජයරත්න රාජ්‍ය අමාත්‍යතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් කර ගන්නයි මට අවශ්‍යව තිබෙන්නේ.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, පළමු කරුණ මෙයයි. මත්ද්‍රව්‍ය උවදුරට හසු වුණු තරුණ තරුණියන් පුනරුත්ථාපනය කරන්න කියලා පොලීසියෙන් උසාවියට ඉදිරිපත් කළාම, උසාවිය ඒ තරුණ අයගෙන් අහනවා, පුනරුත්ථාපනය වෙන්න කැමති ද කියලා. ඒ අවස්ථාවේ ඒ පුද්ගලයා කැමති නැහැ කිව්වොත්, පුනරුත්ථාපනය කෙරෙන්නේ නැහැ. ඉතින් මේක ලොකු ප්‍රශ්නයක්. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවක සභාපතිවරයකු හැටියට මට නිතරම මෙවැනි ප්‍රශ්න එනවා. අභිංසක දෙමව්පියෝ ලොකු අසීරුතාවකට පත් වෙලා ඉන්නවා මේ තරුණයන් පුනරුත්ථාපනය වෙන්න කැමති නැති නිසා. මොකද, ඔවුන් සිරගත කරනවාටත් දෙමව්පියෝ කැමති නැහැ. ඒ නිසා

[ගරු අකිල එල්ලාවල මහතා]

පුනරුත්ථාපනය වෙන්නේ නැති තරුණයෝ ඒ දෙමව්පියන්ට කරන්නේ පුදුම විධියේ කරදරයක්. ගෙවල්වලට ඇවිල්ලා මුදල් ඉල්ලනවා, තිබෙන දේවල් විකුණනවා, හොරකම් කරනවා, දෙමව්පියන්ට තර්ජනය කරනවා. බලංගොඩ මගේ ආසනයේ වූ සිද්ධියක් තිබෙනවා. එ් අම්මායි, තාත්තායි මගේ ඉස්සරහට ඇවිල්ලා ඇඬුවා. මේ සඳහා ගන්න පුළුවන් පියවර මොකක්ද කියලා මම අහන්න කැමතියි. උසාවිය ඒ පුද්ගලයාගෙන්ම අහලා ඒ තීන්දුව ගන්නේ නැතිව උසාවියට තේරෙනවා නම් ඒ පුද්ගලයා පුනරුත්ථාපනය කරන්න පුළුවන් කියලා, පුනරුත්ථාපනය කරන්න යොමු කරනවා නම් මම හිතනවා ඒක සමාජයට කරන ලොකු උපකාරයක් කියලා.

අනෙක් ප්‍රශ්නය තමයි, සාමාන්‍යයෙන් සොරකමක් වාගේ දෙයක් වුණාට පස්සේ අවුරුදු 20කින් පස්සේ ඒකට තීන්දුව ආවත්, ඒ තීන්දුව එන්නේ නඩුව නිෂ්ප්‍රභ කළා කියලායි. උදාහරණයක් කියනවා නම්, අපේ ප්‍රදේශයේ ස්වාමීන් වහන්සේ නමකගේ මාමා කෙනෙකුගේ වාහනයක් හොරකම් කළා, 1998දී. උසාවියට කරුණු වාර්තා කරන්නේ 1998දී. අවුරුදු 26ක් ගිහිල්ලා වාහනය හමු වෙනවා. නමුත්, උසාවියට තීන්දුවක් ගන්න බැහැ කියනවා. ඉතින් මම හිතන විධියට මේක ලොකු අසාධාරණයක්. මොකද, ඒ වාහනය තිබෙන තැනත් දන්නවා, වාහනය හදුනාගෙනත් තිබෙනවා. නමුත්, දැන් උසාවියට ඒ ගැන තීන්දුවක් ගන්න බැහැ. කාලාවරෝධයට අහු වෙනවා කියලා ප්‍රකාශ කරනවා. මම නීතිඥයෙක් නොවෙයි. මට උන්වහන්සේ කියපු එක මම කියන්නේ. ඒ නිසා මේ කරුණු දෙක පිළිබඳව ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්න පුළුවන් නම් ඉතාම වැදගත් කියන එක මම කියන්න කැමතියි.

ගරු අනුරාධ ජයරත්න මහතා (අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அனுராத ஜயரத்ன - நீதி மற்றும் சிறைச்சாலை அலுவல்கள் இராஜாங்க அமைச்சர்)

(The Hon. Anuradha Jayaratne - State Minister of Justice and Prison Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණාව සුවිශේෂී සහ වැදගත් කාරණාවක්. මොකද, සමස්ත බන්ධනාගාරවල ඉන්න ප්‍රමාණයෙන් සියයට 65ක් ඉන්නේ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිවලට. එතකොට අපි තවදුරටත් රිමාන්ඩ් බන්ධනාගාර සහ වැරදි කරපු සිරකරුවන්ගේ ප්‍රමාණය යම් විධියකට වෙන් කර ගැනීමක් කර ගත්තේ නැත්නම් මේ සමස්ත බන්ධනාගාර ක්‍රියාපටිපාටියම කඩා වැටෙනවා කියන එක අපි නිරීක්ෂණය කරලා තිබෙනවා. ඒ නිසාම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි යෝජනාවක් ගෙනැල්ලා ඒ අදාළ වගන්තිය සංශෝධනය කිරීම සඳහා මේ වෙනකොට නීතිපතිතුමාට යොමු කර තිබෙන්නේ.

අදාළ කරුණු සියල්ල උසාවියට වාර්තා කළාට පස්සේ උසාවියට පුළුවන්කම තිබෙනවා, ගරු මහෙස්ත්‍රාත්තුමාගේ අභිමතය පරිදි -අධිකරණ විනිසුරුවරයාගේ අභිමතය පරිදි- පුනරුත්ථාපන කාර්යාංශයට හෝ පුනරුත්ථාපනය කරන ස්ථානයකට ඔවුන් යොමු කරන්න. ඒ වාගේම, අපි රෝහල්වල තිබෙන ඇඳන් ප්‍රමාණයක් වෙන් කරගෙන ඒ හරහාත් යම් ප්‍රමාණයක් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රමයක් මේ වන කොට හදුන්වා දී තිබෙනවා. ප්‍රායෝගිකව ඒ කටයුත්ත කරන්න බැරිව තිබෙන්නේ, අර කියපු වගන්තියට අවශ්‍ය සංශෝධන කරපු නැති නිසායි. නීතිපතිතුමාගේ එකඟතාව ලැබුණු ගමන්, SOC එකේ අනුමැතිය ලබා ගත්තු ගමන් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අදාළ සංශෝධනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එතකොට, ඔබතුමා කිව්වා වාගේම අධිකරණයේ අභිමතය පරිදි පුනරුත්ථාපනය සඳහා යොමු කිරීම විතරක් නොවෙයි සිදු වන්නේ. මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වෙච්ච, ස්වේච්ඡාවෙන් පුනරුත්ථාපනය වෙන්න බලාපොරොත්තු වන අය ඉන්නවා නම් ගෙවීම් ක්‍රමයකට යටත්ව පුනරුත්ථාපනය වීමේ අවස්ථාව ඔවුන්ටත් ලැබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ, එවැනි ප්‍රශ්න තිබෙන බොහෝ ගෙවල්වල දෙමව්පියන් ඒ අය ගෙවල්වලම තියාගෙන ඉන්නවා පුනරුත්ථාපනයට යොමු කරන්නේ නැතිව.

ඔබතුමා දෙවැනි කාරණාව විධියට මතු කළ ප්‍රශ්නය ගැනත් කියන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි. ඒ, යම් සිදුවීමක් සම්බන්ධයෙන් වන නඩු කටයුත්තකට අදාළව මතු කරපු අවුරුදු 20ක කාල පරිච්ඡේදය ගැනයි. අදාළ අපරාධමය සිදුවීම වෙච්ච දිනයේ ඉඳන් එකී සිදුවීම පිළිබඳ කිසිදු වාර්තාකරණයක් හෝ අපරාධමය වාර්තාකරණයක් සිදු නොවී අවුරුදු 20ක් ගියාම තමයි අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අනුව අවුරුදු 20කට පසුව නැවත වතාවක් ඒ කාරණාව ඉදිරිපත් කරන්න බැරි වෙන්නේ. හැබැයි, යම් විධියකට ඒ පිළිබඳ කරුණු වාර්තා වෙලා තිබෙනවා නම්, කරුණු වාර්තා වෙලා ඊට අදාළ පරීක්ෂණය පැවැත්වෙනවා නම්, ඔබතුමා කියපු ආකාරයට වාහනයක් හෝ එහෙම නැත්නම් වෙනත් ඕනෑම දෙයක් නඩුවට අදාළ භාණ්ඩ හෝ යම් යම් දේවල් හැටියට අධිකරණයට අදාළ පොලිසිය විසින් කරුණු වාර්තා කර තිබෙනවා නම්, මේක බලපාන්නේ නැහැ. ඒ නඩු කටයුතු නැවත ඉදිරියට ගෙන යෑමේ හැකියාව තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මම ඒක ඔබතුමාට කිව්වේ, නීතිඥවරයෙකු හැටියට. මොකද, සිද්ධියට අදාළව අවුරුදු 20ක් අපරාධමය වැරදි කිසිවක්ම වාර්තා නොවුණොත් තමයි ඔය වගන්තිය ඔය කියපු විධියට ක්‍රියාත්මක වෙන්නේ. ඔබතුමා කියපු කාරණාව පිළිබඳව අපට තවදුරටත් තොරතුරු ලබා දුන්නොත්, ඒ පිළිබඳව යම් විධියකට මැදිහත් වීමක් කරලා, අධිකරණය පැත්තෙන් යම් විධියක දැනුවත් කිරීමක් කරන්න හෝ ඊට වෙනස් විධියකට මැදිහත් විය යුතු නම් එසේ මැදිහත් වෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.49]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)

(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

නීතිය නවන්නේ නැතිව නීතිය නවීකරණය කිරීම ඉතාම වටිනවා කියලා මම මේ වෙලාවේ ප්‍රකාශ කරනවා. නීතිය සම්බන්ධයෙන් අද ගෙනාපු ප්‍රතිපාදන කාලෝචිත බව කියන අතරම, මට ලැබී තිබෙන කාලය කෙටි නිසා ඉක්මනින් කරුණු දක්වන්න කැමැතියි.

විශේෂයෙන් ස්ත්‍රී දූෂණ හා ළමා අපයෝජනය සම්බන්ධයෙන් පවතින නීති රීති වෙනස් කළ යුතුවාක් මෙන්ම ඒවාට අදාළ තීන්දු ලබා දීම ද ඉක්මන් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයි කියා මම යෝජනා කරනවා. මොකද, අවුරුදු 15ක් ගත වෙලාත් අහලා ඉවර වෙච්ච නැති සමහර නඩු තිබෙනවා, ගරු අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය ඇමතිතුමනි. ඔබතුමා ඒ පිළිබඳව සොයා බලන්න. එහෙම වන කොට චිත්තියට අසාධාරණයක් වෙන්න තිබෙන ඉඩ කඩ වැඩියි කියා ඔබතුමා දන්නවා. එවිට වූදිතයන් නිදහස් වෙලා යන අවස්ථා වැඩියි.

ඊළඟ කාරණාව හැටියට මම දකිනවා, අපයෝජනයට ලක් වෙච්ච දරුවන් මාධ්‍යයට නිරාවරණය කිරීම. ඒ සම්බන්ධයෙන් ද නීති ගෙනෙන්න කියා මම මේ වෙලාවේ යෝජනා කරනවා. ඒ ගැන අපි දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේ කථා කළත්, තවමත් ඒවා සමාජ මාධ්‍ය හරහා හෝ සිද්ධ වෙනවා.

ඊළඟ කාරණාව තමයි, ළමයින්ට දෙන ආහාර සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීම්. ඒ සම්බන්ධයෙන් නීතියක් ගෙනාවා. නමුත් ඒ නීතිය තවම ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේ රටේ මන්දපෝෂණයට එක හේතුවක් වනවා, පෝෂණ ගුණයක් නැති ආහාර ද්‍රව්‍ය ගැන මේ විධියට ප්‍රචාරය කිරීම. ඒ නිසා ඒවාට අදාළව බල පවත්වන්න සකස් කරපු නීතිය ක්‍රියාත්මක කරන්න කියලාත් මම මේ වෙලාවේ යෝජනා කරනවා.

ඉඩම් සහ දේපළ සම්බන්ධයෙන් ගත්තොත්, පනතේ එක වගන්තියක් තිබුණා, පසු උරුමය සඳහන් කරලා නැති තැන්වලදී එය පවුලේ වැඩිමල් පිරිමි ළමයාටයි කියලා. පසුව ඒක වෙනස් වුණා, "ඒ ඉඩමේ පදිංචි හෝ වැඩිමල් පිරිමි ළමයාට" යනුවෙන්. මම හිතනවා, "වැඩිමල් පිරිමි ළමයාට" කියලා නිශ්චිතව කියන එක, "දරුවන්ගේ කැමැත්ත පරිදි" කියලා හෝ වෙනස් වෙනවා නම් සුදුසුයි කියා. මොකද, සමහර වෙලාවට පවුලේ වැඩිමල් පිරිමි ළමයා ඒ දෙමව්පියන්ට සලකලාත් නැතුව ඇති. ඒ නිසා ඒ සංශෝධන ඒ ආකාරයට කරන්න කියලාත් මා ඉල්ලා සිටිනවා.

අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ගෙනෙන ලද පනත් කෙටුම්පතක් සහ නියෝග ගැනයි අද සාකච්ඡා වෙන්නේ. ඒ නිසා බන්ධනාගාර ගැනත් මම යමක් කියන්න ඕනෑ. මෑතකදී මට බන්ධනාගාරය තුළට යන්න සිද්ධ වුණා. මම එහිදී දැක්කා "සිරකරුවෝ මනුෂ්‍යයෝය" කියලා සඳහන් කර තිබෙනවා. හැබැයි ඒක තිබෙන්නේ, බිත්තියේ විතරක්දෝ කියා මට හිතුණා, කාන්තා රැඳවියන් සිටින ස්ථානයට ගියාට පස්සේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, කාන්තාවක හැටියට මට ලජ්ජයි කියන්න, ඒ කාන්තා රැඳවියන් check කරන්නේ, සම්පූර්ණයෙන්ම ඇඟේ නූල් පොටක්වත් නැති වන විධියට නිරුවත් කරලායි. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම දන්නවා ඔබතුමිය ඔය කියන්න හදන්නේ, මට තිබෙන්නේ තවත් මිනිත්තු දෙකක් පමණයි කියලා බව.

කාන්තා රැඳවියන් Prison Hospital එකට ගෙනියලා නැවත ගෙන ආවත් ඔවුන්ව check කරන්නේ නිරුවත් කරලායි. තාක්ෂණය මෙච්චර දියුණු ලෝකයේ scanner එකක් වාගේ දෙයක් ගෙනැල්ලා හෝ ඒ අය check කරන්න බැරි ඇයි කියලා මම අහනවා. කාන්තා නිලධාරින් විසින් ඒ කාන්තා රැඳවියන් check කරනවා වෙන්න පුළුවන්. නමුත්, නිරුවත් කර පරීක්ෂා කිරීම තුළින් ඒ රැඳවියන්ගේ ආත්ම ගෞරවය සිඳ දැමීමක් වනවා කියා මම හිතනවා.

එම නිසා ඔබතුමා ඒ පිළිබඳවත් සොයා බලන්න කියා මම ඉල්ලා සිටිනවා. එහි තිබෙන වැසිකිළි වළවල් උතුරා ගිහින් තිබෙනවා. ඒ ගඳ නිසා ඒ කාටවත් එතැන ඉන්න බැහැ. පුංචි දරුවෝ විසිදෙදෙනෙකුත් ඒ බන්ධනාගාරය තුළ ඉන්නවා. මම මේ කියන්නේ වැලිකඩ බන්ධනාගාරය ගැන. එම බන්ධනාගාරයට එහා පැත්තෙන් තමයි ටොයිලට් වළවල් තිබෙන්නේ. හැබැයි, ඒක පෞද්ගලික ඉඩමක්. ඒ නිසා ඒ වළවල් කොයි වෙලාවකවත් සුද්ධ කරන්න විධියක් නැහැ. එතැන ඒ වාගේ ගැටලුවක් තිබෙනවා.

ඊළඟ ගැටලුව තමයි එහි ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම. අඩි විස්සයි විස්සේ කාමරයක 180ක පමණ පිරිසක් ඉන්නවා. ඒ ගොල්ලෝ නිදා ගන්නේ හිටගෙන ද ඉඳගෙන ද කියලා හිතා ගන්න බැහැ. මෙවැනි තත්ත්වයක් එම බන්ධනාගාරය ඇතුළේ තිබෙනවා. එය, තදබදයට එක හේතුවක්. මම ගිහිල්ලා ඒ එක එක්කෙනා සමඟ කථා කළා. එතකොට සමහර අය කියනවා, "අපි මෙතැනට ආවේ අපේ වැරැද්දකට නොවෙයි, අපේ ස්වාමි පුරුෂයා, එහෙම නැත්නම් දරුවා කරපු වැරැද්දකට, ඒගොල්ලන් අල්ලා ගන්න බැරි නිසා අපි ගෙනැල්ලා තිබෙනවා" කියලා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, එතැනදී ඒ කාන්තාවන්ගේ මානව අයිතිවාසිකම් බිඳ වැටිලා තිබෙනවා කියා මම මේ වෙලාවේ ඔබතුමාට සඳහන් කරනවා. ඒ වාගේම ඇප දෙන්න කෙනෙකු නැතිව සුළු වැරදිවලට හසු වුණු අය විශාල පිරිසක් ඉන්නවා. ඒ නිසා මම ඔබතුමාට යෝජනාවක් කරනවා. ඒ අය ඒ විධියට ඇතුළේ හිර කර තබා ගන්නා එක රජයට අනවශ්‍ය පිරිවැයක්. මේ සම්බන්ධයෙන් ලෝකයේ අනෙක් රටවල් අනුගමනය කරන විවිධ ක්‍රම තිබෙනවා. ඒ පුද්ගලයන් නිවස ඇතුළේම රඳවා තැබීම එක් ක්‍රමයක්. එවැනි රඳවා ගැනීමේ ක්‍රම ක්‍රියාත්මක කරනවා නම්, රජයට යන වියදම අඩු කර ගන්නත් පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඉක්මනින් අවසන් කරන්නම්. මට තවත් විනාඩියක් දෙන්න.

ඊළඟ කාරණය මේකයි. එම බන්ධනාගාරය ඇතුළේ ඉන්නවා, ගණිකා වෘත්තියේ යෙදුණා කියලා අල්ලා ගත් කාන්තාවන්. අපේ රටේ ගණිකා වෘත්තිය පාදඩ නීතිය යටතටයි ගැනෙන්නේ. පාදඩ නීතිය යටතේ අල්ලා ගෙන ඇවිල්ලා හිරගත කර තිබෙන්නේ කාන්තාවන් විතරයි. කාන්තාවක් ගණිකා වෘත්තියේ යෙදුණා නම්, ඇයට සේවා දායකයෙක් ඉන්න ඕනෑ. ඒගොල්ලෝ ගැලවිලා යන්නේත් කාන්තාවන් විතරක් බන්ධනාගාරය ඇතුළට යන්නේත් කොහොමද කියන ගැටලුව තිබෙනවා.

අවසාන වශයෙන් මම කියන්නේ මේකයි. එම බන්ධනාගාරයේ දරුවෝ විසිදෙදෙනෙක් ඉන්නවා. ඒ දරුවන්ට මීට වඩා සහන සපයන්න. ඒ වාගේම, එම බන්ධනාගාරය ඇතුළේ ඉන්න නිලධාරින්ට අර කියපු වැසිකිළි වළවල ගඳ විඳ දරාගෙන ඉන්න සිදු වෙලා තිබෙනවා. ඒ ගොල්ලන්ට විවේකය ගත කරන්න හරියාකාර කාමරයක් නැහැ. යන්න, හරියාකාර වැසිකිළියක් නැහැ. මෙන්න මේ පහසුකම් සැපයුවේ නැත්නම් ඔවුන්ගේ පීඩනය රැඳවියන් වෙත එල්ල වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඒගොල්ලෝ දැඩි පීඩනයකට - stress එකකට - ලක් වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කථාව අවසන් කරන්නයි යන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම මේ කියපු කාරණා ගැන ඔබතුමා සොයා බලන්න. ඒ වාගේම, ජනාධිපති සමාව ලැබීමට නියමිත රැඳවියන් ඉන්නවා නම්, ඒ අය අතර කාන්තාවන් ඉන්නවා නම් මාර්තු 8වන දාට යෙදී තිබෙන කාන්තා දිනය විශේෂ දිනයක් කොට සලකා ඒ කාන්තා රැඳවියන්ට සමාව ලබා දෙන්න කටයුතු කරන්න කියලාත් මා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි. - *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුරාධ ජයරත්න රාජ්‍ය ඇමතිතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Madam, my name should have been called next. මම කථා කරන්න නියමිතව හිඹියදී, මගේ නම කථා කළේ නැත්තේ ඇයි කියලා මම දැනගන්න කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
We gave the chance to the Government side now. The Hon. (Mrs.) Rohini Kumari Wijerathna wanted to go for a Committee and she requested that her name be called -

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Then, I should have been consulted. You cannot change the list like that. You should have asked me, consulted me.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Once the chance goes back to the Opposition, it will be your turn to speak.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කථික ලැයිස්තුව අත්සන් කරලා දෙන්නේ මම. මේක ඔබතුමියටවත්, මේ නිලධාරින්ටවත් වෙනස් කරන්න බැහැ. - *[බාධා කිරීමක්]* මගෙන් අහන්න තිබුණා. මගෙන් අහන්නේ නැතිව මේ නිලධාරියා,- *[බාධා කිරීමක්]* මගේ නම කථා නොකර වෙනත් අයගේ නම් කථා කරන්න බැහැ.- *[බාධා කිරීමක්]* I demand an apology.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
I will discuss this with the Assistant Secretary-General and get back to you. In the meantime, could we proceed?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
There is nothing to be discussed. I sign this list and give it to the Chair. I came here to speak. That officer at the Table has no right to change it.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
We accommodated a request made by an Hon. Member because she was called for a Committee. That was the instruction I received. So, it was given on that basis.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
I understand that, but I should have been asked whether I object to that or not.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
I agree that you should have been told.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
You cannot change the list like that. I should have been consulted.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුරාධ ජයරත්න රාජ්‍ය ඇමතිතුමා.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அனுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය මතු කරපු කාරණාව සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න මම කැමැතියි. දරුවන් විසිදෙදෙනෙකු ඉන්න වැලිකඩ බන්ධනාගාරය මමත් මීට සති දෙකකට ඉහතදී පෞද්ගලිකවම නිරීක්ෂණය කළා. ගරු මන්ත්‍රීතුමියනි, අපට තිබෙන පහසුකම් සහ ආර්ථිකමය වශයෙන් අපට ලැබෙන ප්‍රතිපාදන සියල්ල මත දෙන්න පුළුවන් හොඳම ස්ථානය ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා. ඔබතුමිය අනෙක් වාට්ටු නිරීක්ෂණය කළා නම් දකින්න ඇති, අපට දෙන්න පුළුවන් ඉහළම ස්ථානය සහ රැකවරණය ඒ අයට ලබා දෙන්න අප කටයුතු කර තිබෙන බව.

ඒ වාගේම, එතැනදී කියපු තවත් දෙයක් තමයි දරුවන්ට අවශ්‍ය කිරි පිටි සහ තවත් දේවල් ගැන. ඒවාත් බන්ධනාගාරයෙන් අමතරව ලබා දීමට ගිය සතියේ අපි තීන්දු කරලා, ලබා දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කාරණය මම විශේෂයෙන් සිහිපත් කරන්නට ඕනෑ. සමස්ත බන්ධනාගාරයම හොරණට රැගෙන යෑම සඳහා සුවිශේෂ වූ වැඩ පිළිවෙළක් මේ වෙනකොට සකස් කරලා තිබෙනවා. දැනට තිබෙන ඉඩ ප්‍රමාණය ගැන ඔබතුමිය කියන කාරණාව හරි. මොකද, 13,000කට විතර ඉන්න පුළුවන් සමස්ත ඉඩ ප්‍රමාණය තුළ සිරකරුවන් 32,000ක් විතර ඉන්නවා. හැම බන්ධනාගාරයකම මේ ගැටලුව අද බරපතළ විධියට තිබෙනවා. හැබැයි, සමස්ත බන්ධනාගාරයම හොරණට රැගෙන යෑමෙන් ඔය වැලිකඩ තිබෙන ප්‍රශ්නයට එක්තරා විධියක විසඳුමක් ලැබෙනවා කියා මම හිතනවා.

ඒ වාගේම තමයි, අර body check කරනකොට ඇති වන තත්ත්වය පිළිබඳව ඔබතුමිය කියපු කාරණාව. අපට ඒ කාරණා පිළිබඳව කථා කරන්න පුළුවන්. හැබැයි ගරු මන්ත්‍රීතුමියනි, එක පැත්තකින් අපි සතුටු වෙනවා. මොකද, ඔබතුමිය ඒ විධියට body check කරනවා කියලා කියපු එක එක්තරා විධියකට බන්ධනාගාර නිලධාරින්ට ගෞරවයක්. මොකද, එළියේදි හැම වෙලාවකම කියන්නේ check කරන්නේ නැහැ, ඒ නිසා මත්ද්‍රව්‍ය ඇතුළට යනවා, අනවශ්‍ය දේවල් ඇතුළට යනවා, වෙළඳාම් කරන්න අවශ්‍ය දේවල් ඔක්කොම යන්නේ ගේට්ටුවෙන්මයි කියලා. මෙවැනි චෝදනා තමයි අපට නිතරම එල්ල වෙන්නේ. ඔබතුමිය

ඊට වඩා පරිබාහිර කථාවක් කළේ, මේ ගොල්ලන් ඇඳුමක්වත් නැතිව ඕනෑවට වඩා check කරනවා කියලා. හැබැයි, ඒ තුළින් පෞද්ගලිකව කාට හෝ යම් විධියක ගැටලුවක් ඇති වෙනවා නම් ඒ පිළිබඳව අපි බන්ධනාගාර කොමසාරිස් ජනරාල්තුමා දැනුවත් කරන්නම්. හැබැයි, ඒ කාරණාව කරන්නේ වෙන මොනවත් නිසා නොවෙයි. අපි පැහැදිලිවම උපදෙස් ලබා දීලා තිබෙනවා, මේ කට්ටියගේ ආරක්ෂාව සහ මෙතැන සිදුවන වෙළඳාම් පිළිබඳව ලැබෙන පැමිණිලි, චෝදනා අවම කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා. ඒ නිසා තමයි ඔය විධියේ කාරණාවක් ඔබතුමිය මතු කරන්න සිද්ධ වෙන්න ඇත්තේ කියලා අපි විශ්වාස කරනවා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමතී) රෝහිණි කුමාරි විජේරත්න)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔය කිරි පිටි ලබාදෙන දවසේ මම එතැන සිටියා. ඒ ගැන මට සතුටුයි. එහෙම නොවෙයි මම කියන්නේ. මේ, පූර්ව ළමාවියේ - අවුරුදු 5ට අඩු - දරුවන් සිටින තැනක්. මේ දරුවන්ගේ අම්මලා කරපු වැරැද්දට තමයි ඒ දරුවන් එතැන දඬුවම් විඳින්නේ. හොරණට නේ බන්ධනාගාරය ගෙන යනවා කිව්වේ. ඒ නිසා හොරණට ගෙන යන තැන හෝ මේ දරුවන් සඳහා මීට වඩා පහසුකම් තිබෙන්න ඕනෑ. ඒ ගොල්ලන්ගේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ මීට වඩා පහසුකම් තිබෙන්න ඕනෑ. අන්න ඒ ටික එතැනදීවත් සකස් කරන්න කියලා මම යෝජනා කරනවා.

අනික් කාරණාව, ඕනෑවට වඩා check කරනවා කියන එක නොවෙයි මම කිව්වේ. අද ලෝකයේ තාක්ෂණය දියුණුයි. ඇයි, scan කරන්න පුළුවන් මොකක් හෝ විද්‍යුත් උපකරණයක් මෙතැනට ගන්නේ නැත්තේ? කාන්තාවක් නොවෙයි, කවුරු වුණත් තව කෙනෙක් විසින් නිරුවත් කරනකොට කොයි තරම් අපහසුතාවකට පත් වෙනවාද? මෙන්න මේ මානසික ප්‍රශ්නය ගැනයි මම කථා කරන්නේ. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, ඒ සඳහා භාවිත කරන උපකරණ මිලදී ගන්නට මෙවර අය වැයෙන්වත් මුදල් වෙන් කරගන්න කියලා. මොකද, ඔවුන් වැරැද්දක් කරලා බන්ධනාගාරයට ගියා තමයි. එහෙමයි කියලා ඒ ගොල්ලන් ඒ තරම් මානසික පීඩාවට පත් කිරීම සුදුසු නැහැ කියලා මම කියනවා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි (කලානිති) විජයතාස ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය කළේ බරපතළ චෝදනාවක්. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කිසිම තැනක එහෙම නිරුවත් කරලා check කරන ක්‍රමයක් නැහැ. ඒක බන්ධනාගාරය තුළ සිද්ධ වෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* නැහැ, ඒක වැරදියි. *[බාධා කිරීමක්]* ඒ කථාව ඔබතුමිය නිවැරදි කරන්න, හරියට හොයලා බලලා. මොකද, ඒ ප්‍රකාශය වැරදියි, එහෙම දෙයක් සිද්ධ වෙන්නේ නැති නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ පාර්ලිමේන්තුවට එනකොට අපිවත් check කරනවා. අපේත් ඇහ අත ගාලා, සාක්කුවලට අත දාලා බලනවා. *[බාධා කිරීමක්]* කවුද, හරි? කවුද, ඔබතුමියට වගකීමෙන් කියන්නේ ඇහ නිරුවත් කරලා බලනවා කියලා?

ගරු රෝහණ බණ්ඩාර මහතා
(මාණ්පුමිකු රෝහණ පණ්ඩාර)
(The Hon. Rohana Bandara)

Check කරනවා, ඒක නැහැ කියන්න එපා.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(මාණ්පුමිකු செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

Hon. Minister -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The Hon. Selvarajah Kajendren.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(මාණ්පුමිකු செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

கௌரவ அமைச்சர் அவர்களே, கௌரவ ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் குறிப்பிட்டதுபோன்று, சிறைச்சாலைகளில் பெண் கைதிகளும் ஆண் கைதிகளும் நிர்வாணப் படுத்தப்பட்டு, சோதனையிடப்படுகின்ற சம்பவம் தொடர்ச்சியாக நடைபெறுகின்றது. குறிப்பாக, ஆண் கைதிகள் நிர்வாணமாக்கப்பட்டு, அவர்கள் குனியச் செய்யப்பட்டு, தங்களுடைய கைகளாலேயே அவர்களுடைய மலவாசலை நன்றாகத் திறக்குமாறு சொல்லி சோதனையிடப்படுகிறார்கள். தயவுசெய்து, நீங்கள் இந்த விடயத்தை உடனடியாகக் கவனத்தில் கொள்ளவேண்டும். ஏனென்றால், அந்தக் கைதிகள் மிகுந்த மன வேதனையில் இருக்கின்றார்கள். ரோஹினி குமாரி அம்மையார் அவர்கள் சொன்ன குற்றச்சாட்டு முற்றிலும் உண்மையானது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Thank you.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමතී) රෝහිණි කුමාරි විජේරත්න)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මම ඒක වගකීමෙන් කියනවා. මොකද, ඒක ඇතුළේ ඉන්න අය මට කියපු කථාව. ඒ නිසා මම යෝජනා කරනවා, මේ අය වැයෙන්වත් අඩුම තරමින් මේ අය check කරන්න පුළුවන් විධියේ මොනවා හෝ නවීන උපකරණ මිලදී ගන්න කටයුතු කරන්න කියලා. දැන් ඔය සාක්ෂි තිබෙන්නේ. මේ දේ සිද්ධ වෙනවා. අපි ඒක නවත්වමු.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි (කලානිති) විජයතාස ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු මන්ත්‍රීතුමිය ඒ කරපු චෝදනා සම්පූර්ණයෙන්ම අසත්‍යයි. හැබැයි, ඉඳලා හිටලා එකක් දෙකක් වෙන්න ඇති, ඒ ගොල්ලන්ගේ පාලනයෙන් තොරව. මම දැනුත් බන්ධනාගාර Commissioner-Generalගෙන් මේ පිළිබඳ තොරතුරු ලබා ගත්තා. ගරු කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා, පිරිමි අයගේ ගුද මාර්ගය check කිරීමක් පිළිබඳව. එහෙම වෙන්න ඇති. මොකද, හුහක් අය බන්ධනාගාරයට හෙරොයින් වාගේ මත්ද්‍රව්‍ය අරගෙන එන ක්‍රමයක් ඒක. ඒ වාගේ අවස්ථාවක ඒ ගොල්ලන්ට check කරන්න වෙනවා, කැමැත්තෙන් හෝ අකැමැත්තෙන්.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමතී) රෝහිණි කුමාරි විජේරත්න)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, ඒකට උපකරණ තිබෙනවා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
උපකරණ ඇති.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, අපි මේකට වෙනම විවාදයක් ගනිමු.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බන්ධනාගාරයේ ඉඩකඩ පිළිබඳ ප්‍රශ්නය මුළු රටම දන්නවා. මේක ඉඩකඩ නැතිව overcrowded වෙලා තමයි තිබෙන්නේ. ඒ නිසා තමයි අපි මීට අවුරුදු 5කට කලින් මිල්ලව අක්කර 50ක් අරගෙන ground එක ඔක්කෝම හදලා ඉඩකඩ ඇතිව පහසුවෙන් ඉන්න පුළුවන් විධියට බන්ධනාගාරය එතැනට ගෙන යන්න කටයුතු සූදානම් කළේ. ගරු රෝහිණී කුමාරි මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් ඒ ආණ්ඩුවේ හිටියා නේ. අපි ඒ කටයුතු ඔක්කෝම කරලා තිබුණේ. නමුත් පසුගිය කාලයේ සිදු වුණු ආර්ථිකය බංකොලොත් වීම නිසා අපට මුදල් ලැබුණේ නැහැ. අපි දැන් භාණ්ඩාගාරයත් එක්ක ඒ පිළිබඳව කථා කරලා තිබෙනවා. අපි මේ අවුරුද්දේ ඒකේ ඉදිකිරීම් ආරම්භ කරනවා. අපි ඉදිරි අවුරුදු තුන ඇතුළත මිල්ලව බන්ධනාගාර සංකීර්ණය සම්පූර්ණයෙන්ම නිම කරලා වැලිකඩ ඉන්න දඬුවම් විඳින අය එ් ස්ථානයට ගෙන යන්න කටයුතු කරනවා. ඇප පිට සිටින අය අපට මෙහේ -කොළඹ- තියා ගන්න වෙනවා. නමුත් වරදකරුවන් වූ සියලුදෙනා ඒ ස්ථානයට ගෙන යන්න අපි වැඩ කටයුතු කරමින් පවතිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Vadivel Suresh. You have 18 minutes.

[பி.ப. 3.04]

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சுடன் சம்பந்தப்பட்ட இன்றைய விவாதத்தில் கலந்துகொண்டு, என்னுடைய மலையக மக்கள் சார்பாக ஒருசில கருத்துகளை முன்வைக்க விரும்புகின்றேன். 41 வருடங்களுக்கு முன்னர், இது போன்றதொரு தினத்தில் - யூலை 23ஆம் திகதி - இந்த நாட்டில் தமிழ் மக்கள் மிக மோசமாகப் பாதிக்கப்பட்டார்கள். அன்று வடக்கு, கிழக்கு, மலையகம் உட்பட அனைத்துப் பகுதிகளிலும் தமிழ் மக்கள் கொலை செய்யப்பட்டார்கள். அதுமாத்திரமன்றி, அவர்கள் தங்களது உடைமைகளை இழந்து நிர்கதியான நிலையில் இருந்தார்கள் என்பதை நான் இந்த உயரிய சபையில் வேதனையுடன் ஞாபகப்படுத்த விரும்புகின்றேன்.

இன்று மலையகத்தில் வாழ்கின்ற பெருந்தோட்டச் சமூக மானது, முழுமையாக சட்டத்துக்குக் கட்டுப்பட்டு, நீதித் துறைக்கு மதிப்பளித்து வாழ்ந்துகொண்டு இருக்கின்றது. எனினும், அச்சமூகம் அனைத்து விடயங்களிலும் நீதி மறுக்கப்பட்ட ஒரு சமூகமாக வாழ்ந்துகொண்டு இருப்பது வேதனைக்குரிய விடயமாகும். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீங்களும் ஒரு பெண்மணி! இன்று மலையகப் பெருந்தோட்டங்களில் அதிகமாக வேலை செய்துகொண்டு இருக்கின்ற மலையகப் பெண்கள் இன்னோரன்ன கஷ்டங்களை அனுபவிப்பதோடு, நீதிக்குப் புறம்பாக மனிதாபிமானமற்ற முறையிலும் நடத்தப்படு கிறார்கள் என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் குறிப்பிட விரும்புகின்றேன். நாட்டில் சட்டம் இருக்கின்றது; நீதி இருக்கின்றது. அவை அனைத்தையும் மீறி ஒரு சமூகம் இந்த நாட்டில் பாதிக்கப்பட்டுக்கொண்டு இருக்கின்றது. பெருந் தோட்டக் கம்பனிகளுக்கென வேறொரு சட்டம் இருக்க முடியாது. இன்று எங்களுடைய மக்கள் -

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Hon. Presiding Member, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, Hon. Lakshman Kiriella?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Hon. Presiding Member, you called out the names of the eighth and the thirteenth speakers in the list to speak. Even after that, you have not given me time to speak.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
This turn goes to the Government side and then, the next turn is yours.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
You deprived me of my time.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
I went according to the instructions I received. That was, to give time to the Hon. (Mrs.) Rohini Kumari Wijerathna, Member of Parliament.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
But, you cannot change the list without my approval.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
I did not change the list.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Then, who changed it? By whom was it changed?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
I was told to give her the chance; the Secretariat advised me and I followed that advice. It is not my responsibility to -

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Just now, the officer at the Table told me that you changed the list; he told me now that you changed the list and that he did not have any say in changing the list.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you know very well that I have no authority to change the list.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
I agree.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
I have no authority to change the list. I can only go by this list given to me.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
I agree with you 100 per cent. But, when I called Mr. Abeyrathne, the officer at the Table, he said that he did not have anything to do with the list and you changed it.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
No, I have no authority to change the list.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
You can ask him.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. (Mrs.) Rohini Kumari Wijerathne spoke to the Secretariat and asked for the change in the list.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Please, bear with me. ඒ නිලධාරියාගෙන් මම අහන්නේ, ඔබතුමා මට කිව්වේ නැද්ද? ඔබතුමා මට කිව්වේ නැද්ද, කථිකයෝ වෙනස් කළේ මූලාසනයෙන් කියලා? He told me that.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
Hon. Presiding Member, may I intervene?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, Hon. (Dr.) Wijeyadasa Rajapakshe?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
Hon. Presiding Member, I do not want to get entangled in any argument, but I must say that we have to follow the Parliamentary traditions and conventions. In fact, that is a responsibility of the Chair. The officers are there to assist the Chair. All the decisions have to be taken by the Chair. I think what the Hon. Lakshman Kiriella raised is a valid point. Madam, there is no doubt that you have the authority to even accommodate an Hon. Member who is not in the speakers' list. But, it is a matter of courtesy and something that has been followed throughout or from time immemorial that you, at least, speak to the speaker whose name is there in the list as the next speaker and get his permission before making any change. Maybe, there had been a mistake. So, without having any ill feelings, let us try to follow that tradition, at least, in the future.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
I apologize to the Hon. Lakshman Kiriella, if there has been any inconvenience caused. But, I only followed the instructions I was given based on the request made to the Secretariat by the Hon. (Mrs.) Rohini Kumari Wijerathna. So, that was what I was told to do.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
නමුත්, මට රීති ප්‍රශ්නයක් මතු කරන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පුළුවන්.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මට ස්ථාවර නියෝග පෙන්වන්න පුළුවන්. නමුත් චාරිත්‍ර උගන්වන්න බැහැ. I cannot teach manners; මට චාරිත්‍ර උගන්වන්න බැහැ. නමුත්, මට ස්ථාවර නියෝග පෙන්වන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
I apologize to you, Hon. Kiriella, once again, if there has been any inconvenience caused to you. The next turn

[ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය]

will be yours. Once again, I must say that I followed the order of the list and the instructions given to me. - *[Interruption.]* Okay. Thank you very much.

Hon.Vadivel Suresh, please continue with your speech.

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

Thank you very much. Madam, please make sure that my time is not reduced over that.

இன்று என்னுடைய மலையக சமூகம் இந்த நாட்டிலுள்ள சட்டங்களால் அன்றி, வேறொரு முறைமைமூலமே - பெருந்தோட்டக் கம்பனிகளின் நிருவாகத்தாலே - நிர்வகிக்கப் படுகிறார்கள் என்பதை நான் கௌரவ நீதி அமைச்சர் அவர்களுக்குத் தெரிவிக்க விரும்புகின்றேன்.

இந்த நாட்டிலுள்ள 11 மாவட்டங்களில் பெருந் தோட்டங்கள் காணப்படுகின்றன. அவற்றில் வேலை செய்பவர்களில் 80 சதவீதமானவர்கள் பெண்களாக இருக் கின்றார்கள். அவர்களுள் கர்ப்பிணிப் பெண்களும் பாலூட்டும் தாய்மாரும் உள்ளடங்குகிறார்கள். அவர்கள் தொடர்பில் இந்த நாட்டில் இருக்கும் சட்டத்தைப் பெருந்தோட்ட நிருவாகம் நடைமுறைப்படுத்துவதற்கு மறுக்கின்றது. அவர்கள் வேறொரு சட்டத்தை அறிமுகப்படுத்தி, இந்தப் பெருந்தோட்டப் பெண்களை வஞ்சித்து, தங்களுடைய இலாபத்தை மட்டும் மனதிற்கொண்டு மிக மோசமாக நடக்கின்றார்கள். இதனால் அங்குள்ள பெண்களுடைய உரிமை முழுமையாக மீறப்படுகின்றது.

அடுத்து, எங்களுடைய பெருந்தோட்ட மக்களுடைய வாழ்வாதாரம், வீடமைப்பு பற்றிச் சொல்ல வேண்டும். கடந்த வாரம் மாண்புமிகு ஜனாதிபதி அவர்கள் பெருந்தோட்ட மக்களுடைய வீடமைப்புத் திட்டம் தொடர்பில் ஓர் அமைச்சரவைப் பத்திரத்தைச் சமர்ப்பித்திருந்தார். அதாவது, அந்த மக்கள் அனுபவிக்கின்ற சமூக நலன் சார்ந்த விடயங்கள் அனைத்தையும் ஒன்றிணைத்து, அவர்கள் வாழ்கின்ற பிரதேசத்தை கிராமங்களாக அறிமுகப்படுத்தி, அவற்றுக்கு ஒரு கிராமத்துக்குக் கொடுக்கவேண்டிய அனைத்து வசதிகளையும் செய்து கொடுத்து, கிராம உத்தியோகத்தர்களையும் சமூர்த்தி உத்தியோகத்தர்களையும் அக்கிராமங்களுக்கு தனித்தனியாக நியமித்து, பெருந்தோட்ட divisionsஐ கிராம மட்டத்துக்குக் கொண்டுவருவதாக மாண்புமிகு ஜனாதிபதி அவர்கள் தெரிவித்திருந்தார். அது சரியானதுதான்.

கௌரவ உறுப்பினர் அவர்களே, கடந்த காலங்களில் வெள்ளைக்காரர்கள் இந்தப் பெருந்தோட்டங்களை நிருவாகம் செய்தபோது, அவர்கள் தேயிலைத் தோட்டங்களை காத்துக் கொள்வதற்காக மேற்பகுதி தேயிலைத் தோட்டத்தில் சில 'லயன்' அறைகளை அமைத்து, அதற்கு Upper Division என்றும், நடுவில் இருக்கின்ற தேயிலைத் தோட்டத்துக்கு Middle Division என்றும், கீழ் பகுதியில் அல்லது பள்ளத்தில் - இருக்கின்ற தேயிலைத் தோட்டத்துக்கு Lower Division என்றும், தொழிற்சாலையில் வேலை செய்பவர்களின் வீடமைப்புப் பகுதிக்கு Factory Division என்றும், தோட்ட அதிகாரிகளின் பங்களாக்களில் வேலை செய்கின்றவர்கள் வாழ்கின்ற பகுதிக்கு Bungalow Division என்றும் விலாசத்தைக் கொடுத்திருந்தார்கள். அதாவது, ஒரு தோட்டத்தை Upper Division, Middle Division, Lower Division, Factory Division, Bungalow Division என்று பிரித்து, விலாசம் கொடுத்திருந் தார்கள்.

அந்த விலாசத்தையும் அந்த மக்களுடைய வாழ்க்கை முறையும் மாற்றுவதற்கு ஒரு தீர்மானம் எடுக்கப்பட்டு இருக்கின்றது. அது வரவேற்கத்தக்கது. அதனை நடைமுறைப் படுத்த வேண்டும். அங்குள்ள விளையாட்டு மைதானங்களாக இருக்கலாம், சனசமூக நிலையங்களாக இருக்கலாம், ஆலயங்களாக இருக்கலாம், பாடசாலைகளாக இருக்கலாம் - இன்று அங்குள்ள பாடசாலைகள் அரசாங்கத்தின்கீழ் கொண்டு வரப்பட்டு இருக்கின்றன - அவற்றையெல்லாம் உள்ளடக்கிய சுதந்திரமான கிராமங்களாக பெருந்தோட்டங்களை மாற்று வதற்கான ஒரு சட்டம் நிறைவேற்றப்பட வேண்டும். அது சட்டபூர்வமாக்கப்பட்ட வேண்டும். அதாவது, வர்த்தமானியில் வெளியிடப்பட வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மலையகத்திலுள்ள சில பெருந்தோட்டங்களில் ஒருவர் இறந்துவிட்டால் அவருடைய மரணச் சடங்கை நடத்துவதற் குக்கூட காணி கொடுக்க முடியாது என்று சொல்கின்ற சில பெருந்தோட்டக் கம்பனிகளும் இருக்கின்றன. இது வெட்கப்பட வேண்டிய ஒரு விடயமாகும். ஆகவே, இதில் மாற்றங்கள் ஏற்படுத்தப்பட வேண்டும். இந்த நாட்டில் வாழ்கின்ற ஏனைய சமூகங்களுக்குப் பொதுவாக என்னென்ன சட்டங்கள் இருக்கின்றனவோ, அவற்றை எமது சமூகத்திலும் நடைமுறைப்படுத்துமாறு கேட்டுக்கொள்வதோடு, 41 வருடங்களுக்கு முன்னர், இது போன்றதொரு தினத்தில் - யூலை மாதம் 23ஆம் திகதி - நடந்த கசப்பான சம்பவத்தையும் ஞாபகமூட்டிக் கொள்கின்றேன்.

மேலும், பெருந்தோட்ட பாடசாலைகளுக்குரிய காணிகள் இரண்டு ஏக்கருக்கு மட்டுப்படுத்தப்பட்டுள்ளது. மலையகத் திலிருக்கும் எந்தவொரு பாடசாலைக்கும் காணி உறுதிப் பத்திரம் கிடையாது. அங்குள்ள அனைத்துப் பாடசாலைக் காணிகளும் வெளியாட்களால் ஆக்கிரமிக்கப்பட்டுள்ளன. இதனால் அந்தப் பாடசாலைகளின் அதிபர்களும் ஆசிரியர் களும் மிகவும் தர்மசங்கடமான நிலையிலே பாடசாலைகளை நடத்திக்கொண்டு இருக்கின்றார்கள். அங்கு கல்வி பயிலும் மாணவச் செல்வங்களுக்குப் பாதுகாப்புக் கிடையாது. ஆகவே, காணிச் சட்டத்தின்கீழ் இந்தப் பெருந்தோட்டப் பாடசாலை களுடைய காணிகளையும் கொண்டுவருவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும்.

இன்று எல்லாவற்றுக்கும் மேலாக தோட்டத் தொழிலாளர் களுக்கு உழைப்புக்கேற்ற ஊதியம் கிடைப்பதில்லை. அவர்களின் உழைப்பு சுரண்டப்படுகின்றது. அவர்களுடைய சம்பளம் தொடர்பில் பல வர்த்தமானி அறிவித்தல்கள் வெளியிடப்பட்டிருக்கின்றன. அந்த வர்த்தமானி அறிவித்தல் களையும் ஜனாதிபதி அவர்களின் உத்தரவையும் மீறி செயற்படக்கூடிய ஒரு சக்தி பெருந்தோட்டக் கம்பனிகளுக்கு இருக்கின்றது. அந்த வர்த்தமானி அறிவித்தல்களுக்கு எதிராக அவை நீதிமன்றம் சென்று தடை உத்தரவையும் பெற்றிருக்கின்றன. இது உலகத்தில் இடம்பெற்ற அதிசயமான ஒரு சம்பவமாக இருக்கின்றது. தோட்டங்களில் வேலை செய்கின்ற தொழிலாளர்களுக்குப் பாரிய அநீதியை கம்பனிகள் இழைத்துக்கொண்டு இருக்கின்றன. நாங்களும் நீதிமன்றம் சென்றிருந்தோம்; வழக்கு விசாரணைகளின்போது சட்டத் தரணிகள் வாதாடியதைப் பார்த்தோம். அதன்போது, "ஏன் நாங்கள் இந்த நாட்டில் பிறந்தோம்?" என்றதோர் எண்ணம் என்னுடைய மனதில் தோன்றியது. இந்த நாட்டில்

வாழ்வாதாரத்தில் மிகவும் பின்தங்கிய நிலையில் இருக்கின்ற ஒரு சமூகத்துக்கு நடைபெற்ற அநீதியை நான் அன்று உயர் நீதிமன்றத்தில் பார்த்து வேதனை அடைந்தேன். ஆகவே, பெருந்தோட்டத் தொழிலாளர்களுடைய சம்பள உயர்வு சம்பந்தமாக ஒரு சட்டம் உருவாக்கப்பட வேண்டும். அவர்களுடைய காணி மற்றும் பாடசாலை சம்பந்தப்பட்ட விடயங்களில் விசேட கவனம் செலுத்தப்பட வேண்டும்.

அடுத்து, Collective Bargaining Agreementஐ இந்த நாட்டின் சட்டத்தை மீறி நடைமுறைப்படுத்த வேண்டும் என்று கிடையாது. இந்த நாட்டில் ஒரு சட்டம் இருக்கின்றது. அது அனைவருக்கும் சமம். அந்த சட்டத்துக்கு நாம் அனைவரும் கட்டுப்பட வேண்டும். இந்த நாட்டில் இருக்கின்ற 25 மாவட்டங்களில் 11 மாவட்டங்களில் பெருந்தோட்டங்கள் இருக்கின்றன. அதிகளவு பெருந்தோட்டக் காணிகள் பெருந்தோட்டக் கம்பனிகளிடமே இருக்கின்றன. மொன ராகலை, பதுளை, நுவரெலியா, கண்டி, மாத்தளை, கேகாலை, இரத்தினபுரி, களுத்துறை ஆகிய மாவட்டங்களிலும் மாத்தறை மாவட்டத்தில் தெனியாய பகுதியிலும், காலி மாவட்டத்தில் நாக்கியாதெனிய பகுதியிலும், கொழும்பு மாவட்டத்தில் அவிசாவளை பகுதியிலும் பெருந்தோட்டக் காணிகளை 5 உரிமையாளர்களின் 22 கம்பனிகள் நிர்வகிக்கின்றன. இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் சட்டத்தை மீறி, மனித உரிமைகளை மீறி, இலாபத்தை மட்டும் கருத்திற்கொண்டு அவை அங்கு நிர்வாகம் செய்துகொண்டு இருக்கின்றன. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் பெருந்தோட்டத்துறை சார்ந்த அனைத்து விடயங்களையும் தெரிந்தவர் என்ற வகையிலும், பெருந்தோட்ட மக்களின் நிலைமையை நன்றாகப் புரிந்தவர் என்ற வகையிலும், இதற்கென ஒரு சட்டத்தை உருவாக்க வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, இந்த நாட்டில் தொழில் அமைச்சு இருக்கின்றது; பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு இருக்கின்றது. பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சின்கீழ் Plantation Management Monitoring Division - PMMD - இருக்கின்றது.

Hon. Minister, all these lands belong to the Government. The golden shareholder is the Secretary to the Treasury. And, I do not know how this sort of an amendment came about to give those plantations to these 22 plantation companies. In those days they were under the Government, under the JEDB, the SPC and the Elkaduwa Plantations. They divided those among 22 companies, I think, for easy management. Ultimately, now all these 22 companies come under five owners. That is the biggest joke. In this country, mainly, only five people are running all those 22 companies. As a result, government welfare programmes and everything has stopped. The plantations are run by those companies in a different way under different rules and regulations and violating the labour laws in this country, Hon. Minister. So, we have to overcome this issue. It is in a different way that they are maintaining the estates. I have said earlier also that they are violating the rights of children, women and all; the companies do whatever they want, violating all the rules and regulations.

There is a very good example. The Wages Board decided to increase the salary of the plantation workers. The Government gazetted it and the Hon. President also announced it. But, the plantation companies have the power to go against that Gazette Notification and get a stay order. Rs. 1,700 per day is a small amount. The workers are working day and night. As a result, the workers got upset about the setup and left the plantations. In 1992, when the Government handed over the estates to those companies, there were about 1.2 million of workers. Hon. Minister, now, there are only 143,000 workers. Out of those 143,000 workers, 80 per cent are women. So, it is difficult for them and they do not want to work. For the Rs. 1,000 daily wage, there had been a court case and now, for the Rs. 1,700 increased wage also, there is a court case.

Hon. Minister, the workers cannot even put up a toilet. If they put up a toilet, extend their kitchen area or put up a new shelter, they are given three punishments. One is, they immediately stop their work. The other is, they make an entry at the police station and after that, file a court case. Some people who have been framed like that are dead and gone. So, there would be three punishments for just putting up a toilet, a basic human need - immediately, their work would be stopped, reported to the police station and thereafter, a court case would be filed. So, that kind of things are happening there. Therefore, Hon. Minister, I thought of bring those for your kind consideration.

Then, Sir, estate schools do not have deeds; those estate schools, which were gazetted as government schools, do not have deeds because their lands belong to the estates. If a small sports event or something like that is held, there would be so many police entries and cases filed and the principals of those schools find it difficult to carry out their day-to-day work. There are a lot of issues. So, we want to know whether the RPCs have sold out those lands or whether they still belong to the Government. The Secretary to the Treasury is the golden shareholder of those estates and the Ministry of Agriculture and Plantation Industries created the PMMD - Plantation Management Monitoring Division - in 1992 to monitor how the companies are managing the estates. But, the companies have cut trees and closed down tea factories in the estates. The closed factories are called "silent factories". They have removed and sold all the iron in those factories. The valuable trees have also been cut and sold. But, the PMMD do not monitor those things; they monitor what the workers do. If the workers put up a small shelter or something like that, they send a quit notice. In that Department, there is a lawyer to send quit notices. So, where can those people go and live?

கௌரவ அமைச்சர் அவர்களே, மாண்புமிகு ஜனாதிபதி அவர்கள் பெருந்தோட்டப் பிரதேசங்களை கிராமமாக மாற்றுவ தாகத் தெரிவித்திருக்கிறார். அதைச் சட்டபூர்வமாக்க வேண்டும். அவ்வாறு அதனை வர்த்தமானியில் வெளியிட் டால்தான் அங்கு நிரந்தரமாக வாழக்கூடிய ஒரு சூழ்நிலை எங்களுடைய மக்களுக்கு ஏற்படும்.

அடுத்து, 41 வருடங்களுக்கு முன்னர், மலையகத்தில் மட்டுமல்ல, நாட்டின் ஏனைய பிரதேசங்களிலும் வாழ்ந்த சிறுபான்மை தமிழ் மக்களுக்கு நிகழ்ந்த அநியாயத்தை நான் இந்த நேரத்தில் மீண்டும் ஞாபகப்படுத்துகின்றேன். மேலும்,

[ගරු වඩිවේල් සුරේෂ් මහතා]

'කොවිட்-19' தொற்றால் இறந்த முஸ்லிம் சகோதரர்களுடைய உடல்களை அவர்களுடைய மத அனுஷ்டானப்படி அடக்கம் செய்யவிடாமல் தகனம் செய்ததை அன்று நான் வன்மையாகக் கண்டித்திருந்தேன். அந்தச் சம்பவத்தை நினைத்து அவர்கள் இன்றும் வேதனைப்பட்டுக்கொண்டு இருக்கின்றார்கள். நாங்கள் முஸ்லிம் சமூகத்திடம் அதற்காக மன்னிப்புக் கோர வேண்டியவர்களாக இருக்கின்றோம். அதற்குரிய நடவடிக்கைகளை அரசாங்கம் மேற்கொள்ள வேண்டும். நான் முஸ்லிம் மக்கள் வாழும் பிரதேசங்களுக்கு விஜயம் செய்யும்போது, அவர்கள் இவ்விடயம் தொடர்பில் தங்களது வேதனையை என்னோடு பகிர்ந்துகொள்கிறார்கள். இந்த நாட்டில் இருக்கின்ற சட்டத்தை என்னுடைய தொப்புள்கொடி உறவுகளான மலையக மக்கள் வாழ்கின்ற பகுதிகளிலும் அமுலாக்க வேண்டுமென உறுதியாகக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Lakshman Kiriella.

Order, please! Will an Hon. Member propose the Hon. (Mrs.) Kokila Gunawardene to the Chair?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
Madam, I propose that the Hon. (Mrs.) Kokila Gunawardene do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (DR.) (MS.) HARINI AMARASURIYA left the Chair, and THE HON. (MRS.) KOKILA GUNAWARDENE took the Chair.

[අ.භා. 3.23]

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, මම එක ප්‍රශ්නයක් ඔබතුමාට යොමු කරන්න කැමැතියි. මේ, මැතිවරණයක් අත ළඟ තිබෙන අවස්ථාවක්. මැතිවරණ කොමිසම තිබෙන්නේ ව්‍යවස්ථාවේ කොටසක් විධියට. ඔබතුමා ව්‍යවස්ථාව භාර ඇමති නේ. මැතිවරණ කොමිසම දැන් නොයෙක් නියෝග නිකුත් කරනවා. ඒ අනුව ආණ්ඩුකාරවරුන්ට පැහැදිලිව කියලා තිබෙනවා, පළාත් පාලන ආයතනවලට හිටපු පළාත් පාලන මන්ත්‍රීවරුන් පත් කරන්න එපා කියලා. සමහර ආණ්ඩුකාරවරු ඒක පිළිගෙන තිබෙනවා. නමුත්, සමහර ආණ්ඩුකාරවරු මැතිවරණ කොමිසමේ නිර්දේශ පිළිගන්නේ නැතුව එවැනි පත් කිරීම් කරගෙන යනවා. *[බාධා කිරීමක්]* ඒ කියන්නේ, ආණ්ඩුකාරවරු හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ඒ ඒ ප්‍රාදේශීය සභා තුළ කමිටුවලට පත් කරලා ඔවුන් හරහා යම් යම් සංවර්ධන වැඩ කටයුතු කරන්න පසුබිම සකස් කරනවා. දැන් සමහර ආණ්ඩුකාරවරු ඒ කටයුත්ත නවත්වා තිබෙනවා; some have stopped. නමුත්, සමහර ආණ්ඩුකාරවරු තවම ඒක කරගෙන යනවා. ඇත්ත වශයෙන්ම ආණ්ඩුකාරවරු කපටි වැඩක් කරලා තිබෙනවා. ආණ්ඩුකාරවරු මැතිවරණ කොමසාරිස්ගේ ලියුම නීතිපතිට යොමු කරලා තිබෙනවා, එතුමාගේ opinion එක අහන්න. මොකද එතුමාගේ opinion එක එන්න මාස දෙක තුනක් යනවා නේ. මේක කෙරොටික වැඩක්. මැතිවරණ කොමිසමට බලය තිබෙනවා, ආණ්ඩුකාරවරුන්ට විරුද්ධව ක්‍රියා කරන්න. They, the Election Commission, have the right to deal with anybody interfering with the election. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අධිකරණ ඇමතිතුමා හැටියට, ව්‍යවස්ථාව භාර ඇමතිවරයා හැටියට මැතිවරණ කොමිසමට උපදෙස් දෙන්න කියලා, මැතිවරණ කොමිසමේ උපදෙස් පිළිනොගන්නා ආණ්ඩුකාරවරුන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කරන්න කියලා. මොකද, මැතිවරණ කොමිසමට ඒ සඳහා බලය තිබෙනවා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2015දී අපි සම්මත කරපු දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ -අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාත් එහි කොටස්කරුවෙක්- මැතිවරණ සම්බන්ධව විධායකයට යම්කිසි බලතල ප්‍රමාණයක් තිබුණා නම්, අපි ඒ සියල්ල අත්හැරියා. ඒ පූර්ණ බලතල මැතිවරණ කොමිෂන් සභාවටම පැවරුවා. ඒ නිසා මැතිවරණ කොමිෂන් සභාව අපි පත් කරලා තිබෙන්නේ හැම පැත්තකින්ම ස්වාධීනව කටයුතු කරන ආයතනයක් විධියට. එතකොට ඒ බලතල ක්‍රියාත්මක කිරීම ඒ උදවිය කරන්න ඕනෑ.

ඒ වාගේම අපි ගිය අවුරුද්දේ ගෙනාවා, 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත. ඒ පනත අනුව මැතිවරණ නීති ක්‍රියාත්මක විය යුතු බව මීට සතියකට විතර පෙර අධිකරණ ඇමතිවරයා විධියට මම මැතිවරණ කොමිෂන් සභාවට දැනුම් දීලා තිබෙනවා. ඒ ලිපිය ලැබුණු බව මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා මට දැනුම් දුන්නා. ඒ අනුව ඉදිරියේදී එතුමා මේ පිළිබඳ සාකච්ඡාවක් පවත්වන්න කටයුතු කරන බවත් මට ඊයේ දැනුම් දුන්නා. ඒ අනුව අපේ පැහැදිලි ස්ථාවරය අපි දැනුම් දීලා තිබෙනවා. මැතිවරණ කොමිසම කිසිදු බලපෑමකින් තොරව ස්වාධීනව කටයුතු කළ යුතුයි. කුමන හෝ තැනැත්තෙක් ඒ නීතියට එරෙහිව කටයුතු කරනවා නම් ඔහුට අදාළවත් නීතිය ක්‍රියාත්මක විය යුතුයි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ස්තුතියි, ගරු ඇමතිතුමනි. මෙතැන ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, නීතිය කඩන්නේ ආණ්ඩුකාරවරයා වීමයි. ආණ්ඩුකාරවරයා ඉන්නේ ජනාධිපතිතුමා යටතේ. එතකොට කොමිෂන් සභාවට ශක්තිය තිබෙනවාද ජනාධිපතිතුමා යටතේ ඉන්න නිලධාරියෙකුට විරුද්ධව කටයුතු කරන්න? ඔබතුමා ඒ ගැන හොයා බලන්න. මම ඒ ගැන ඊට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

VFS ගනුදෙනුව ගැන අද උදේ කථා වුණා. අපේ විපක්ෂ නායකතුමා ඒ ගනුදෙනුව ගැන කථා කරන කොට සමහර මන්ත්‍රීවරුන්ට තරහ ගියා. අද කවුරුත් පිළිගන්නවා, VFS ගනුදෙනුව කියන්නේ මහ බැංකු වංචාවට වඩා සිය ගුණයක් වැඩි වංචාවක් කියලා. අපි පොරොන්දුවක් දෙනවා, අනාගත අපේ රජයක් යටතේ අපි මේ VFS ගනුදෙනුව ගැන හොයා බලා ඒකට

සම්බන්ධ වුණු අයට දඩුවම් දෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සමහර රටවල් වීසා ගාස්තු, VFS ගාස්තු සම්පූර්ණයෙන්ම නැති කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, රටවල් 136ක සංචාරකයන්ට ශතයක්වත් ගෙවන්නේ නැතුව මලයාසියාවට ඇතුළු වෙන්න පුළුවන්. අපිත් එහෙම වෙන්න ඕනෑ. නමුත් මේ VFS ගාස්තු, වීසා ගාස්තු නිසා සංචාරකයන්ට විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. කෙසේ වෙතත්, මේක අනවශ්‍ය දෙයක්. අනාගතයේදී අපේ රජයක් යටතේ ඒ ගනුදෙනුව ගැන හොයා බලා එයට සම්මාදම් වුණු අයට නීති මාර්ගයෙන් කටයුතු කරන බව අපි මේ ගරු සභාවට දැනුම් දෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරලා අවසානද?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
අවසානයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මීට මොහොතකට පෙර කථා කරපු කදුකරය නියෝජනය කරන ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා අද දිනය පිළිබඳව සඳහන් කළා. අද දිනය අපේ කැලැන්ඩරයට එකතු වෙලා තිබෙන්නේ ඉතිහාසයේ කළු පැල්ලමක් එකතු වෙච්ච දිනයක් හැටියටයි. "කළු ජූලිය" දිනය විධියට තමයි අද දිනය සලකන්නේ. ඊයේ මමත්, විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි මැතිතුමාත්, ජීවන් තොණ්ඩමන් අමාත්‍යතුමාත් කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා, කොවිඩ්-19 වසංගතය පැවති කාලයේ ඉස්ලාම් භක්තික ජනතාවගේ මරණ ආදාහනය කිරීමේදී අනුගමනය කරපු බලහත්කාර ප්‍රතිපත්තිය ගැන. ඒ පිළිබඳව පූර්ණ විද්‍යාත්මක පරීක්ෂණයක් කරලා, ජල සම්පත් විෂය භාර අමාත්‍යාංශයෙන් දීපු වාර්තාව පදනම් කරගෙනයි අපි ඒ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළේ. ඒ අවස්ථාවේදී අනුගමනය කළ ප්‍රතිපත්තිය පිළිබඳව සියලු ඉස්ලාම් භක්තික ජනතාවගෙන් අපි සමාව ඉල්ලීමේ යෝජනාවක් ඊයේ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, අනුමත කළා. අපි ඒකට වග කිවයුතු අය නොවුණත්, එම ආණ්ඩුවේ තනතුරු නොදැරුවා වුණත්, ඒ අවස්ථාවේදී වෙච්ච දේ පිළිබඳව අපේ කනගාටුව සියලු ඉස්ලාම් භක්තික ජනතාවට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම, 1983 ජූලි 23වැනි දා -මීට අවුරුදු 41කට පෙර- අද වාගේ දිනයක තමයි අපේ රට අඳුරු යුගයකට ඇද දැමීමට හේතු පාදක වුණු ඒ අඳුරුම කාල පරිච්ඡේදය සනිටුහන් කළේ. ඒ කාලයේ අපි දේශපාලනයේ හිටියේ නැතත්, ඒ කාලය වෙනුවෙන් අපට වගකීමක් නොතිබුණා වුණත්, මේ රටේ වග කිවයුතු පුරවැසියන් විධියට, නීතියට ගරු කරන අමාත්‍යවරයකු විධියට මීට අවුරුදු 41කට පෙර සිද්ධ වුණු දේ පිළිබඳවත් අපි අද දිනයේදී එම ජනතාවගෙන් සමාව අයැද සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.බී. හේරත් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.30]

ගරු ඩී.බී. හේරත් මහතා (පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு டீ.பீ. ஹேரத் - கால்நடை வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. D.B. Herath - State Minister of Livestock Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

අද අපේ අධිකරණ අමාත්‍යතුමා එතුමාගේ විෂය පථයට අදාළව ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් වන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම නඩු කටයුතුවලට භාජන වේවිව අයගේ ක්‍රියාකාරකම් පහසු කරන්න දරපු උත්සාහයක් හැටියටත්, නීතිය විනිවිදභාවයකින් යුක්තව ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි ඒ කටයුතු සකස් කිරීමත් කියන කාරණා මූලික කරගෙන තමයි එතුමා මේ කටයුතු කරන්න ඇත්තේ. එ් එක්කම, එතුමා මේ රටේ සිටින සාමදාන විනිශ්චයකාරවරු කළමනාකරණය කරන්න, ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව අවශ්‍ය නීති පද්ධතියක් මේ රාමුවට එකතු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රටක ඉදිරි පැවැත්මට නීතිය අතිශයින්ම වැදගත් වන කාරණාවක් බව අපි දන්නවා. ඒ නිසාම තමයි නීතියේ ආධිපත්‍යය උත්තරීතර තත්ත්වයේ තියාගෙන හැම වෙලාවකදීම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන්න කටයුතු කරන්නේ. මේ කාරණාවේදී නීති සම්පාදකයන් වන අපි රටේ පවතින නීතිය යාවත්කාලීන කිරීම මම හිතන විධියට අතිශයින්ම වැදගත් වෙනවා. මේ පිළිබඳව සාකච්ඡාවට භාජන කරන මේ මොහොතේදී මීට අවුරුදු 41කට කලින් අද වැනි දිනක සිදු වූ කළු ජූලිය පිළිබඳවත් මේ සභාවේ අවධානය යොමු වුණා. 1983 අද වැනි දිනක සිදුවූ කළු ජූලිය පිළිබඳව කථා කරද්දී, ශිෂ්ටසම්පන්න සමාජයේ අපි හැම කෙනෙක්ම එවැනි සිදුවීම් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන බවත් මම කියන්න ඕනෑ. ගතවූ අවුරුදු 41ක කාලය තුළ මේ රටේ ඇති වෙච්ව සිදුවීම් දිහා බැලුවාම කළු ජූලියෙන් අපි පාඩම් ඉගෙන ගත්තාද කියන කාරණාව පිළිබඳව නම් මට බරපතළ ප්‍රශ්නයක් තිබෙන බව කියන්න අවශ්‍යයි.

විශේෂයෙන්ම මහජන නියෝජිතයන් හැටියට රටේ ජාතික ප්‍රතිපත්ති තීන්දු කරන ඉහළම ආයතනය පාර්ලිමේන්තුව නම්, කළු ජූලිය වැනි අවස්ථා ඇතිවීම වළක්වා ගැනීම වෙනුවෙන් මේ පාර්ලිමේන්තුව ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියන එක පිළිබඳවත් මම හිතන විධියට මීට වඩා අවධානය යොමු කරන්න අවශ්‍යයි.

ඒ කාරණාව පුද්ගලයන් හැටියට පමණක් නොවෙයි, දේශපාලන පක්ෂ හැටියටත්, තමුන් නියෝජනය කරන කණ්ඩායම් හැටියටත් ගත්තාම ඒ හැමදෙනාටම වගකීමක් තිබෙනවා, නැවත මේ රටේ කළු ජූලිය වැනි සිදුවීම් ඇති නොවන ආකාරයට වාගේම ජාතීන් අතර සමඟිය ඇති වෙන විධියට කටයුතු කරන්න. ඒ කටයුතු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. විශේෂයෙන්ම අපි කථා කරන භාෂාව අනුව, අදහන ආගම අනුව වර්ගීකරණය කරලා, ඒ ගොඩවල් ශක්තිමත් කරන්නට මේ පවතින තත්ත්වය පාවිච්චි කරනවා වෙනුවට එතැනින් එහාට ගිහිල්ලා, අපි හැමෝටම මේ රටේ ජීවත් වෙන්න තිබෙන අයිතිය තහවුරු කරන්න ඕනෑ කියන කාරණාව තමයි වැදගත් වෙන්නේ කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

[ගරු ඩී.බී. හේරත් මහතා]

අද අධිකරණ අමාත්‍යතුමා සාමදාන විනිශ්චයකාර තනතුර සම්බන්ධව ගෙනැත් තිබෙන ඒ සංශෝධනත් ඉතාම වැදගත් වෙනවා. සාමදාන විනිශ්චයකාරවරයෙක් කියන්නේ සමාජයේ ගෞරවාදරයට පාත්‍ර වෙච්ච කෙනෙක්; සමාජයේ ප්‍රභූවරයෙක්; තවත් කෙනෙක් පිළිබඳව සහතිකයක් දෙන්න තරම් ඉහළ මානසික මට්ටමක් තිබෙන කෙනෙක්. ඔවුන්ගේ ක්‍රියාකාරකම් නිවැරදි කිරීම උදෙසා තමයි අධිකරණ ඇමතිතුමා මෙවන් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. යම් යම් අවස්ථාවලදී සාමදාන විනිශ්චයකාර පදවිය උසුලපු උදවිය සමාජ විරෝධී ක්‍රියාකාරකම්වලට හවුල් වෙච්ච ආකාරය අපි දැක තිබෙනවා. අන්න ඒ වාගේ වෙලාවක, සාමදාන විනිශ්චයකාර තනතුරෙහි වගකීම කුමක්ද කියන එක මේ තුළ පැහැදිලි කරලා තිබෙනවාය කියන එකත් විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ.

අපි මේ දවස්වල හුඟක් කථා කරන්නේ ජනාධිපතිවරණය ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් වේදිකාව තුළ අපට අහන්න ලැබෙන දේ, මාධ්‍ය තුළ අපට අහන්න ලැබෙන දේ ගත්තොත්, මේ රටේ දෙකෝටි විසිලක්ෂයක් වන ජනතාවට ස්වකීය අභිමතය හරි විධියට පාවිච්චි කරන්න පුළුවන් මාර්ගෝපදේශකත්වයක් ඒවා තුළින් ලැබෙනවා ද කියන කාරණාව අපි බලන්න ඕනෑ. උදාහරණයක් හැටියට ගත්තොත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන ව්‍යවස්ථා කීපයක් පිළිබඳව - ජනාධිපතිවරයාගේ ධුර කාලය පිළිබඳව- විමර්ශනය කරන්න ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තිබෙනවා. මේක මේ රටේ විපක්ෂය පාවිච්චි කරනවා, වර්තමාන ජනාධිපතිතුමා ඉන්තෙක් දාලා එතුමාගේ ධුර කාලය දිගු කරගන්න කටයුතු කරනවා කියන්න. මේක, විපක්ෂයේ කණ්ඩායම් තමුන්ගේ පටු දේශපාලන පරමාර්ථ මුදුන් පමුණුවා ගන්න, ජනාධිපති අපේක්ෂකයකුගේ ඒ ක්‍රියාකාරකම් පිළිබඳව අනාගතයේ සමාජ මතය වෙනස් කරන්න දරන උත්සාහයක්. මේ වාගේ තැනකට අපි යා යුතු ද කියන එක අපි හිතා බලන්න ඕනෑ. අපට ඉස්සරහට හොඳට ක්‍රීඩා කරන්න පුළුවන් සෙල්ලම් පිට්ටනියක් තිබෙනවා. ඒ සඳහා ගැළපෙන විධියට ක්‍රීඩකයන් සකස් කිරීම ඔවුන්ගේ වගකීමක්. අපි ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන අය පිළිබඳව, ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව අවංකව කථා කරන්න අවශ්‍යයි. ඉතින් එතැනදී ජනාධිපති තරගයට ඉදිරිපත් වෙන අයගේ දේශපාලන ක්‍රියාකාරකම්, ඔවුන් රට ගොඩ ගන්න දායක වුණු ආකාරය වාගේ දේවල් කථා කරනවා මිස අභූත චෝදනා ඉදිරිපත් කිරීම ශිෂ්ට සම්පන්න සමාජයකට ගැළපෙන්නේ නැහැ කියන කාරණාව තමයි මට මතක් කරන්න වෙන්නේ.

ඊළඟට අපේ රටේ විධායකයේ බලතල ගත්තාම, රටේ අනාගත පැවැත්මේ මූලික කේන්ද්‍රය වෙලා තිබෙන්නේ විධායකය. ඒත් එක්ක අනුගත වුණු ව්‍යවස්ථාදායකය සහ අධිකරණය තමයි රටේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන්නේ. එවන් පසුබිමක් තුළ මේ රටේ වැදගත්ම තනතුරට කෙනෙක් පත් කරන්න සූදානම් වෙන වෙලාවේ රටේ ජනතාවගේ මානසික මට්ටම විකෘති කරන අදහස් අපි ඉදිරිපත් කළ යුතු ද කියන කාරණාව හිතන්න ඕනෑ. එහෙම කටයුතු කරලා මුල් පුටුවට පත් කරන පුද්ගලයාගේ ස්වභාවය පිළිබඳව අපේක්ෂා කරන්නේ මොකක්ද? අපි එහෙම කළ යුතු නැහැ. මම විශ්වාස කරනවා, මේ රටේ ජනතාව, දේශපාලන පක්ෂ ඔවුන්ගේ වගකීම හරියට ඉටු කරන්න අවශ්‍යයි කියා. ඒ ඉටු කළ යුතු වගකීම් ඉටු කරගන්න නම් මේ රටේ වර්තමාන තත්ත්වයට, අතීත තත්ත්වයට සාපේක්ෂව අනාගතය ගොඩ නහන්නේ කොහොමද කියන කාරණාව පිළිබඳවත් සැලකිල්ලට ගත යුතුයි කියන මතයේ තමයි මම ඉන්නේ.

විශේෂයෙන් අධිකරණ ක්‍රියාකාරකම් පිළිබඳව කථා කරන මේ මොහොතේදී මම අධිකරණ ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, ස්ත්‍රී දූෂණ සහ ළමා අපයෝජන ක්‍රියාකාරකම් පිළිබඳව. මේ වාගේ සිදුවීම් කොච්චරවත් අපට අහන්න ලැබෙනවා. මම විශ්වාස කරන විධියට ඒකට හේතුව තමයි, සමාජයේ එළිදරව් නොකළ යුතු දේවල්වලට වටිනාකමක් දෙමින්, ප්‍රමුඛතාව ලබා දෙමින් බොහෝ බරපතළ සිදුවීම් සාමාන්‍ය දේවල් හැටියට මේ රටේ ජනතාවට ලබා දෙන ජනමාධ්‍ය ක්‍රමයක් දකින්න තිබීම. රටක සිද්ධ වෙන අපරාධ ක්‍රියාකාරකම් සාමාන්‍ය දේවල් බවට ලක් කිරීමෙන්, ඒවා සාමාන්‍ය ක්‍රියාවලියක් බවට පත් වුණාම ඒ වාගේ සිදුවීම් අනන්තවත් සිද්ධ වෙන්න පුළුවන්.

ඒ නිසා විශේෂයෙන්ම ළමා අපචාර, ස්ත්‍රී දූෂණ, මිනී මැරුම්, මහා බරපතළ මංකොල්ලකෑම්, ඒ ක්‍රියාමාර්ග පිළිබඳව නම් අපි මීට වඩා වාරණයක් කරන්න අවශ්‍යයි.

එපමණක් නොව, අද මාධ්‍ය හරහා විකාශනය වන විවිධ නාට්‍යවලින් ලබා දෙන පූර්වාදර්ශ පිළිබඳවත් අපට මීට වඩා වගකීමක් තිබෙනවා. අපි හැම වෙලාවකම වැරැද්දක් කරන්න බය වන සමාජයක් නිර්මාණය කළොත්, වැරැද්දක් කළොත් ඒක ලජ්ජාවට කාරණයක් කියන මානසිකත්වය සමාජය තුළ ඇති කළොත්, හිර ගෙවල් පිරෙන එක නවත්වන්න අපට පුළුවන් වෙයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

අපේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට ආවාම අධිකරණ ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නේ, හිර ගෙවල් පිරිලා වැඩියි කියන කාරණය. හිර ගෙවල් පිරෙන එක නවත්වන්න නම් අපි මොකක්ද කරන්න ඕනෑ? ඒවාට තව ඉඩ පහසුකම් දෙන්න ඕනෑද? මම විශ්වාස කරනවා, ඉඩ පහසුකම් දීලා හිර ගෙවල් ලොකු කරන එක නොවෙයි අපි කරන්න ඕනෑ. ඒ වෙනුවට හිර ගෙවල්වලට යන ප්‍රමාණය අවම කරන්න, මේ සමාජය නිවැරදි සාධාරණ සමාජයක් බවට පරිවර්තනය කරන්න අවශ්‍යයි. අන්න ඒ සඳහා අවශ්‍ය නීති රීති මේ ස්ථානය තුළ සකස් කිරීමේ වගකීමත් අපට තිබෙනවා. එහෙම වුණොත් අපට මේ රට මීට වඩා හොඳ තැනකට අරගෙන යන්න පුළුවන්.

සමහර ළමා අපචාර සිදුවීම් විනිශ්චයට භාජන කළාම අපි දකිනවා, ඒ සිද්ධියට භාජන වුණු ඒ අය සමහරවිට සමාජයේ ඉහළම තැනකට ඇවිල්ලා ඉන්නවා. ඒවාට දඬුවම් දෙන කටයුත්තට යනකොට බොහෝ වෙලාවට ඒ සිද්ධිය අවුරුදු 10ක්, 15ක් පරණ වෙලා. අපි මෙන්න මේ කාරණාව සැලකිල්ලට ගන්න ඕනෑ. මේ රටේ පුංචි දරුවෝ, අද එවැනි අපචාර ක්‍රියාකාරකම්වලට, අසාධාරණකම්වලට, සමාජ හිරිහැරවලට, ව්‍යසනවලට ලක් වෙනකොට, එම වැරදිකරුවන්ට ක්ෂණිකව දඬුවම් දෙන්න අපට පුළුවන් නම්, ඒක එවැනි වැරදි නැවත මේ රට තුළ සිදු වන එක වළක්වන්න තිබෙන හොඳ උත්සාහයක් කියලා අපි විශ්වාස කරනවා. එම නිසා මේ වාගේ සමාජ විරෝධී ක්‍රියාකාරකම් පිළිබඳව ක්ෂණිකව විභාග කරලා දඬුවම් ලබා දීමේ ක්‍රමයකට යන්න වැඩ පිළිවෙළක් සැදීම අවශ්‍යයි කියන කාරණය අපි ගරු අධිකරණ ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද නීතියේ ආධිපත්‍යය පිළිබඳව කථා කරනකොට සිතා බලන්න ඕනෑ, හැම වෙලාවකම දේශපාලන ක්‍රියාවලිය තුළ නිරත වෙලා පාර්ලිමේන්තුවට එන අපි, ආපසු හැරිලා බලනකොට අපි මේ සමාජ අසාධාරණකම්වලට එරෙහිව කොච්චර දුරට කටයුතු කරලා තිබෙනවාද කියලා. ඒ වාගේම අපේ දේශපාලන කඳවුරු මේ සමාජ අසාධාරණකම්වලට එරෙහිව කොච්චර දුරට කටයුතු කරලා තිබෙනවාද, ඒවා වළක්වන්න කොච්චර දුරට මැදිහත්වෙලා තිබෙනවාද කියන කාරණා අපි විනිශ්චයට භාජන කරන්න අවශ්‍යයි. මැතිවරණයකදී වේදිකාවට ඇවිල්ලා හුඟක් අයට කථා කරන්න පුළුවන්; අභූත චෝදනා එල්ල කරන්න පුළුවන්. අපි දැකලා තිබෙනවා, සමහර දේශපාලන පක්ෂවලට රට ගොඩනහන වැඩ පිළිවෙළක් නැහැ,

රටේ ජාතික ප්‍රතිපත්ති හදන්නේ මෙහෙමයි කියන අදහසක් කොහෙත්ම ගැබ්වෙලා නැහැ කියලා. ඔවුන් හැමවිටම උත්සාහ කරන්නේ, "මේ රට අවුරුදු 76ක කාලයක් පාලනය කළා, ඔවුන් මේ රට විනාශ කළා, ඔවුන් මේ රටට කරපු කිසිම දෙයක් නැහැ" ආදී වශයෙන් වූ තර්ක ඉදිරිපත් කරන්නටයි. අපේ රටේ ලියාපදිංචි දේශපාලන පක්ෂ හැම මැතිවරණයකටම ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ අය රටේ යම් යම් තනතුරු දරලා තිබෙනවා. ප්‍රාදේශීය සභාවල වෙන්න පුළුවන්, පළාත් සභාවල වෙන්න පුළුවන්, පාර්ලිමේන්තුවේ වෙන්න පුළුවන් ඒ තනතුරු දරලා තිබෙනවා. හැබැයි, ඒ හැම වෙලාවකම මේ ගත්ත වගකීම භාර ගන්න ඔවුන් මැළි වුණු අවස්ථා තිබෙනවා. ඒ වැඩ කටයුතු කරන හැම වෙලාවකම සමාජ අසාර්ථකභාවයට පත් වුණාම, ඒක තමන්ගේ ප්‍රතිවිරුද්ධ කණ්ඩායම්වලට ගොනු කරන්න, ඒ අයගේ ගිණුමට බැර කරන්න ඔවුන් උත්සාහ දැරුවා. පාර්ලිමේන්තුව තුළදීත්, මහජනතාව අතරට ගිහිල්ලා වේදිකා තුළදීත් මේ විධියට කටයුතු කරන්න ඔවුන් උත්සාහ කරනවා. මේක, මේ රටේ දේශපාලන ක්‍රියාකාරකම තුළ, ඔවුන්ගේ ක්‍රියාකාරිත්ගේ ශීලාචාරකමක් නැතිකම ප්‍රදර්ශනය කරන අවස්ථාවක්. ඉතින්, මේ කාරණාව මේ කාල වකවානුව තුළ අපේ රටේ ජනතාව සැලකිල්ලට ගන්න ඕනෑ.

අධිකරණය පිළිබඳ වැදගත් යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම රටේ අනාගතය පිළිබඳව තීන්දුවක් ගන්න තිබෙන මැතිවරණයක් පිළිබඳව අද රට තුළ කථා කරනවා. ජනාධිපතිවරණයෙන් බලය ලබා ගැනීම උදෙසා විවිධ පාර්ශ්ව ක්‍රියාත්මක වෙනවා. මෙන්න මේ වාගේ වෙලාවකදී තමයි මේ පිළිබඳව රටක් හැටියට ගන්න ඕනෑ තීන්දු මොනවාද කියන කාරණාව ගැන අපි කල්පනා කළ යුත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අප දැක තිබෙන මේ දේශපාලන ක්‍රියාකරම් තුළ මට තිබෙන අත් දැකීමක් ගැන කියන්න අවස්ථාව දෙන්න. පසුගිය කාලයේ සමුපකාර මැතිවරණ පැවැත්වුණා. කුරුණෑගල දිස්ත්‍රික්කයේත් සමුපකාර මැතිවරණ පැවැත්වුණා. අපි ඒවා දිහා බලා ගෙන හිටියා. ජනතා විමුක්ති පෙරමුණ ජයග්‍රහණය කරපු සමහර සමිති අයත් නගරවල දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කරලා තිබුණා. එහි ලියා තිබුණේ, "දූෂණයට විරුද්ධව, අකටයුතුකම්වලට විරුද්ධව දැන් අපි කටයුතු කරනවා. ජයග්‍රහණය ලබා දුන්නාට බොහොම ස්තුතියි" කියලායි. ඒ කාරණාව ගත්තාම, කිව යුතු දෙයක් තිබෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම සමුපකාර සමිතිය අයත් නගරයේ ඔය විධියේ දැන්වීම් පුවරුවක් තිබුණා. පසුගිය දවසක සත්ව ආහාරවලටවත් සුදුසු නැති පරිජ්පු සෝදලා, අහිංසක මිනිසුන්ට විකුණන්න කටයුතු කරලා තිබුණා. එතැන දූෂණයක්, අකටයුතුකමක් සිද්ධ වුණේ නැද්ද? ඒක බරපතළ ප්‍රශ්නයක්. මා නියෝජනය කරන කුරුණෑගල වාරියපොල ප්‍රදේශයේ නගරයක දවසක් දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කර තිබුණා, "දූෂණය සහ අකටයුතුකම්වලට විරුද්ධව වාරියපොල සමුපකාර සමිතියේ බලය ජනතා විමුක්ති පෙරමුණට ලබා දුන්නාට බොහොම ස්තුතියි" කියලා. ඒ වාරියපොල නගරයේ සමුපකාර සමිතියට අයිති තොග ගබඩාවක් තිබෙනවා. ඊයේ හෝ පෙරේදා එහි තිබුණු ඉතාම වටිනා කොස් ගස් තුනක් බිම හෙළා තිබෙනවා. ගිය වාරයට ඉස්සෙල්ලා වාරයේත් ඒ කොස් ගස්වල කොස් කඩලා දන්සලක් දෙන්න හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරලාත් තිබුණා. මේ වන විට ඒ කොස් ගස් බිම හෙළා තිබෙනවා. ඒ සිදුවීම් ගැන පොලීසියට, අධිකරණයට පවා ගිහින් තිබෙනවා. මම මේ දේවල් කියන්නේ කාටවත් මඩ ගහන්න නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මේ රට පාලනය කරන්න එන උදවිය, වේදිකාවල කියන කරන දේවල්, ජනතාව ඉස්සරහා කථා බහ කරන දේවල් ප්‍රායෝගිකව ඔවුන් පාලන තන්ත්‍රයට දායක වන තැන්වලදී ක්‍රියාවට නංවන්න අවශ්‍යයි. එහෙම වුණා නම් අර කියපු සිදුවීම් වෙනවාද? ගරු අධිකරණ ඇමතිතුමා දන්නවා, අපේ රටේ නීති රීති අනුව කොස් ගසක් බිම හෙළන්න නම්, ඒ සඳහා වන නීතිමය ක්‍රමයක් තිබෙන බව. ඒ කිසිම ක්‍රමයක් අනුගමනය කරන්නේ නැතුව, වටිනා කොස් ගස් තුනක් කපා බිම දාලා තිබෙනවා. එහෙම නම්, ඒ ලබා දී තිබෙන පූර්වාදර්ශය කුමක්ද? නගරය දූෂණයෙන් තොර කරනවා, නීති විරෝධී වැඩ කරන්නේ නැහැ කියන ප්‍රතිඥාව දීලා ජනතාවගේ ඡන්ද බලය ගත්තු කණ්ඩායම් කරන කටයුතු තමයි ඒවා. මම කියන්න උත්සාහ කරන්නේ මේකයි. සමුපකාර සමිතිවල බලයත් මේ ආකාරයට අයථා විධියට පාවිච්චි කරනවා නම්, රටේ උත්තරීතර ආයතනය වන පාර්ලිමේන්තුවේ බලය ඔවුන්ට ලැබුණොත්, එහෙම නැතිනම් විධායක ජනාධිපති ධුරයේ බලය ලැබුණොත්, දැන් මේ වේදිකාවල ඔවුන් කියන කරන දේවල් මේ රට තුළ ක්‍රියාවට නංවයිද කියන ප්‍රශ්නය අපට නැහෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රට හොඳ තැනකට ගෙන යන්න කටයුතු කරන්න අපට අවශ්‍යයි. මම දේශපාලන කාරණාවක් කියනවා නොවෙයි මේ. මහජන නියෝජිතයන් හැටියට අප ලබපු අත් දැකීම් අනුවයි මෙවා කියන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු ඩී.බී. හේරත් මහතා
(மாண்புமிகு டீ.பீ. ஹேரத்)
(The Hon. D.B. Herath)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපි ලබපු අත් දැකීමක් කියලා මම කථාව කෙටියෙන් අවසන් කරන්නම්.

2005 අවුරුද්දේ මේ රටේ බරපතළ යුද්ධයක් තිබුණා. උතුරු, නැඟෙනහිර පළාත් වෙන් වෙන්න ඕන්න මෙන්න කියලායි තිබුණේ. මිනිස් ජීවිත සිය දහස් ගණනක් අහිමි වුණා; ජාතික දේපළ විනාශ වුණා. අපි එදා ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඡන්දය පාවිච්චි කරලා, අපට රට නිදහස් කරලා දෙන්න කියා එතුමාගෙන් ඉල්ලා සිටියා. අපට ඒ නිදහස ලැබුණා. උතුර සහ නැඟෙනහිර පළාත් සංවර්ධනය කළා. සමස්ත රටම සංවර්ධිත දේශයක් බවට පත් කළා; ඉහළම තැනකට ගෙනාවා. ඒ අපි මැතිවරණයට ඉදිරිපත් වෙලා ජයග්‍රහණය කරලා අනුගමනය කළ ක්‍රියා මාර්ගවල ප්‍රතිඵලයි. ඒක අපේ ප්‍රාර්ථනාවයි.

දෙවනුව අපි නැවතත් යහ පාලන ආණ්ඩුවට විරුද්ධව කටයුතු කරලා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා ලෙස බලයට පත් කළා. අප පාර්ලිමේන්තුවට ආ කාලයේ, රට පුරා මිනිස්සු යම් ප්‍රමාණයක් කොරෝනා වසංගතය නිසා මරණයට පත් වෙමින් තිබුණා. අසල්වැසි ඉන්දියාවේත් දහස් ගණනක් මැරුණා. ඒ කාලයේ ඇමෙරිකාව ඇතුළු හැම රටකම මිනිස්සු මැරුණා. හැබැයි, ලංකාවේ විතරක් මැරුණු සංඛ්‍යාව 16,000කට සීමා කරලා, කොරෝනා වසංගතය පාලනය කළා. ආණ්ඩුව ඒ කාලයේ ආර්ථිකය කඩා වැටුණු අයට උදව් කළා; ගෙදර සිටියා වුණත් රාජ්‍ය සේවකයන්ට වැටුප් දුන්නා. එහෙම කළේ ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමායි. ඒක අපේ දේශපාලනයේ තවත් එක් කඩ ඉමක්.

ඊළඟට, අපේ දේශපාලන ක්‍රියාවලිය ගැන කියන්න ඕනෑ. පසුගිය කාලයේ මේ රටේ පැය 14ක් විදුලිය නැතිව තිබුණා. ඉන්ධන නැතුව තෙල් පෝලිම් හැදිලා තිබුණා. ඒ වාගේම, ගෑස් පෝලිම් තිබුණා. රටේ අනාගතය පිළිබඳ අවිනිශ්චිත බවක් තිබුණා. සමහර

[ගරු ඩී.බී. හේරත් මහතා]

අය ආහාර අහේනියක් ප්‍රාර්ථනා කළා. තවත් සමහර අය මිනිස් ඝාතන ප්‍රාර්ථනා කළා. අන්න ඒ වෙලාවේදී අපි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා එක්ක එකතු වුණා. අවුරුදු දෙකකට පස්සේ එහි ප්‍රතිඵල අරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මේ කඩ ඉම් තුන පිළිබඳව අපේ දේශපාලන මතක සටහනේ තිබෙනවා කියන එකත් මතක් කරමින්, අද මේ වැදගත් පනත් කෙටුම්පත ඉදිරිපත් කරපු ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමාටත්, රාජ්‍ය අමාත්‍ය ගරු අනුරාධ ජයරත්න මැතිතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව මෙතකින් අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture and Plantation Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ නම අද උදේ මේ ගරු සභාවේ සඳහන් වෙලා තිබුණා. ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් අසා තිබුණා, නිල්වලා ගඟේ ඉදි කර ඇති ලවණ බාධකය නිසා ගොවීන් මුහුණ දෙන ගැටලු පිළිබඳව. මම ඒ ප්‍රශ්නයට සම්පූර්ණ පිළිතුරක් හෙට ලබා දෙනවා. නමුත්, මම මේ අවස්ථාවේදී කෙටියෙන් කාරණා කීපයක් කියන්න කැමතියි. ඒ සඳහා මට විනාඩි දෙකතුනක් දෙන්න.

ගරු විපක්ෂ නායකතුමාට මම කියන්න ඕනෑ, එහිදී ඉඩම් පවරා ගැනීමක් කරන්න ආණ්ඩුවට කිසිම අවශ්‍යතාවක් නැති බව. මා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවට ආපු නිරීක්ෂණයක් තමයි එතැන තිබුණේ. ඒ මාධ්‍ය වාර්තාවේත් යම් යම් අඩු පාඩු කිහිපයක් තිබෙනවා. මා ඒ ගැන හෙට කරුණු ඉදිරිපත් කරනවා. මම නැවතත් කියන්නේ මේ ආණ්ඩුවට ඉඩම් පවරා ගැනීමේ අවශ්‍යතාවක් නැහැ කියලායි. යෝජනාවේ තිබෙන්නේ, ඒ ඉඩම්වලට වන්දියක් ගෙවිවත්, නැවත ඒ ගොවීන්ටම වෙනත් වගාවක් හෝ වී වගාවම කරගෙන යන්න පුළුවන් කියලායි. රජයෙන් වරින් වර ගෙවන වන්දිය ලැබෙන්නේ නැති එක විතරයි වෙන්නේ. නමුත් ඒවා කිසිවක් අවසාන තීන්දු බවට පත් කර ගත යුතු නැහැ. ඒ අවසාන තීන්දුව ගන්න මේ පාර්ලිමේන්තුව විශේෂ කාරක සභාවක් පත් කරලා තිබෙනවා. මම දැන් ඒ විශේෂ කාරක සභාවට ගිහිල්ලායි ආවේ. ඒ අයට මම කිව්වා ඉතා කඩිනමින් වාර්තාවක් එවන්න කියලා. ඉදිරියේදී ඒ වාර්තාව අනුව කටයුතු කරන්න පියවර ගන්නවා මිස ඒ ඉඩම් ආණ්ඩුවට පවරා ගන්නවත්, ආණ්ඩුවේ කටයුතුවලට යොදාගන්නවත් අවශ්‍යතාවක් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.50]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ස්තුතිවන්ත වෙනවා අපේ ගරු අධිකරණ ඇමතිතුමාට, සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ගෙන ඒම සම්බන්ධව. විශේෂයෙන්ම පක්ෂයක් විධියටත් අපට දැන් ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම ඒ ගැන අද උදේ ඔබතුමාට කිව්වා. අපේ පක්ෂයට හොරෙන් පත් වුණු සභාපති කෙනෙකුට විරුද්ධව දැන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 66වන වගන්තිය යටතේ නඩුවක් දාලා තිබෙනවා. අපට දැන් ඒ සිතාසිය බාර දෙන්න විධියක් නැහැ. එතුමා හැම තැනම යනවා; ලොකු ලොකු රැස්වීම් පවත්වනවා; පිළිගැනීම් ආදිය කරනවා. හැබැයි සිතාසිය බාර දෙන්න විධියක් නැහැ. *[බාධා කිරීමක්]* ඒක තමයි ඉතින්. කරන්න දෙයක් නැතිවයි අපි දැන් ඉන්නේ. ඉතින් මේ සංශෝධනය ඉතාම වටිනවා. දැන් මහෙස්ත්‍රාත්තුමියත් කල්පනා කරනවා, ඇයි මේ සිතාසිය බාර දෙන්න විධියක් නැත්තේ කියලා. ඒක අරගෙන ගිහිල්ලා දොරේ අලවන්න කිව්වා. දැන් ඔබතුමාගේ මේ සංශෝධනය අනුව හෙට උදේ ඉඳලා අපට SMS එකකින් හෝ email එකකින් හෝ ඒක යවන්න පුළුවන් තත්ත්වයක් ඇති කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අනෙක් කාරණය මේකයි. ජනාධිපතිවරණයක් මුවවිට තියාගෙන ඉන්න කාල වකවානුවක්, මේක. නමුත්, දැන් විවිධ කාරණා අරගෙන එනවා. එහෙම කරන්නේ ජනාධිපතිවරණය වැළැක්වීම සඳහා ද කියලා අපට හිතා ගන්න බැහැ. ඔබතුමා කිව්වා වාගේ උස්බෙකිස්තානයේ හිටපු ලේනව කියලා කෙනෙක් ඇවිල්ලා නඩුවක් දමනවා. ඉතින් ශ්‍රේෂ්ඨාධිකරණය ඒ නඩුව අල්ලලා වීසි කරනවා, අපේ කාලය නාස්ති කරන්න එපා කියලා. ඊළඟට තවත් නීතිඥයෙක් ගිහිල්ලා නඩුවක් දමනවා. එතකොට අග්‍ර විනිශ්චයකාරතුමා ඔහුට නීතිය උගන්වනවා. ඔහුට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන මුල ඉඳලා කියලා දෙනවා. එහෙම කියා දීලා ඒකත් අල්ලලා වීසි කරනවා.

ඊළඟට, මේ ගැන ප්‍රශ්නයක් නැහැ කියපු ඔබතුමන්ලාම කැබිනට් මණ්ඩලයට සංශෝධනයක් ගේනවා ඒක නිවැරදි කරන්න කියලා. මම කියන්න කැමතියි, එහි කිසි නිවැරදි කිරීමක් කරන්න වුවමනා නැති බව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83වන ව්‍යවස්ථාව ගත්තාම, එහි බොහොම පැහැදිලිව කරුණු සඳහන්ව තිබෙනවා. 83 ව්‍යවස්ථාවේ සඳහන් වනවා, 1 වන, 2 වන, 3 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන සහ 11 වන ව්‍යවස්ථාවල විධිවිධාන, 30 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ නැතහොත් 62 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන සංශෝධනය කරන්නා වූ, ජනාධිපතිවරයාගේ ධුර කාලය සාවුරුද්දක් ඉක්මවා දීර්ඝ කරන්නා වූ, නැතහොත් පාර්ලිමේන්තුව පවත්නා කාලය සාවුරුද්දක් ඉක්මවා දීර්ඝ කරන්නා වූ පනත් කෙටුම්පතකට තුනෙන් දෙකක බහුතරයක් සහ ජනමත විචාරණයක් අවශ්‍යයි කියලා. ඒක ඉතාම පැහැදිලියි. එය ඉතා පැහැදිලිව තිබියදී ඒක ආයෙත් අනලා මේ කරන්න හදන වැඩෙන් වෙන්නේ අවසානයේ අපි විශාල අර්බුදයකට යන එකයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව මෙසේ සඳහන් වෙනවා:

> "ජනරජයේ ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරා පත්කර ගනු ලැබිය යුතු අතර පස් අවුරුදු කාලයක් ධුරය දරන්නේ ය."

ඉතින් මේක බොහොම පැහැදිලිව තිබියදී "සාවුරුද්දක්" කියන වචනය වෙනස් කරන්න රුපියල් බිලියන 10ක් වියදම් කරන්න ඕනෑද? මේ රටේ ජනතාව හිහා නොකා හිහා කකා ඉන්න වෙලාවක් මේක. හැබැයි, දැන් ඔබතුමන්ලාට පුදුම අමාරුවක් තිබෙනවා ඒක වෙනස් කරන්න. සමස්ත කැබිනට් මණ්ඩලයටමයි මම මේ කියන්නේ. ඇයි, කැබිනට් මණ්ඩලය ඒ යෝජනාව සම්මත කළා නේ. ජනාධිපතිවරයා යෝජනාවක් ගෙනාවාම ඔක්කෝම අත උස්සනවා. මම දන්නේ නැහැ ඔබතුමන්ලා සාමාන්‍යයෙන්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට තව ටික වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එහෙම නැතිව කථාව අවසන් කරන්න අපහසුයි. කිරිඇල්ල මැතිතුමා හිටියා නම් මට විනාඩි කිහිපයක් ගන්න තිබුණා.

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, "මේක මම ලේකම්ට කියලා නවත්වනවා" කියලා. හැබැයි, ඒක කරගන්නත් බැරි වුණා. ජනාධිපතිතුමා පැන්නා, උඩින්. පැනලා මේක ගැසට් කළා. ජනාධිපති යෝජනාවක් ඉදිරිපත් කළාම අපේ කැබිනට් මණ්ඩලය නීතියෙන් වෙව්ලනවා. වෙව්ලලා අත ඉස්සුවා මේකට. ඊළඟට, මේක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. පළමුවැනි වර කියැවීමෙන් පස්සේ දින 14ක් ඇතුළත උසාවියට යන්න අවස්ථාව තිබෙනවා. ඊට පස්සේ දෙවැනි වර කියැවීමේ විවාදය පවත්වලා තුනෙන් දෙකකින් සම්මත කරගෙන ඊටත් පස්සේ ජනමත විචාරණයකට යන්න ඕනෑ. මම අහන්න කැමැතියි, ඔබතුමන්ලා මේ වැඩ පිළිවෙළ වෙනුවෙන් අනාගතයේ කරන්නේ මොකක්ද කියන එක. දැන් විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත ගැසට් කරලාත් අවසානයි. ඊළඟට තිබෙන්නේ, පළමුවැනි වර කියැවීමෙන් පසු උසාවියට යන වැඩ පිළිවෙළ. ඒ අනුව, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න නියමිතව තිබෙනවා. මේ රටේ ජනතාවගේ රුපියල් බිලියන 10ක් විනාශ කරන්න මේ ආණ්ඩුව උත්සාහ කරනවා නම් අපි ඒකට විරුද්ධයි කියන එක බොහොම පැහැදිලිව කියනවා. අපි මේ පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය දෙනවා. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට එතුමාගේ ධුර කාලය පිළිබඳ ව්‍යාකූලත්වයක් තිබුණාට අපට ව්‍යාකූලත්වයක් නැහැ. ඒවා manipulation නේ. එතුමා මේක manipulate කරනවා. හැබැයි, අපි manipulate වෙන්නේ නැහැ. හේතුව, අපි ව්‍යාකූල වෙන්නේ නැති මිනිස්සු. මොකද, අපි දන්නවා මොකක්ද සිද්ධ වෙන්නේ කියලා. මේ රටේ ජනතාව කොතැනද ඉන්නේ කියලාත් අපි හොඳට දන්නවා. මේ ආණ්ඩුවට යන එන මං නැතිව දැන් ඉන්නේ. එකම ආණ්ඩුවේ දෙ ොගාල්ලක් ස්ථාන දෙකක රැස්වීම් තියාගෙන බැණගන්නවා. ඊළඟට, ජනාධිපතිවරණයට එක්කෙනෙක් ඉදිරිපත් කරනවා කියනවා. නමුත්, තවම ඉදිරිපත් කළේ නැහැ, හොයා ගන්න විධියකුත් නැහැ, කවුද ඉදිරිපත් කරන්නේ කියලා. ඒ නිසා මම කියන්න කැමැතියි, අද ඇති වී තිබෙන මේ ව්‍යාකූලත්වය නැති කරන්න වැඩි කල් යන්නේ නැහැ කියන එක. අපි තව මාස දෙක තුනකින් ආණ්ඩුවක් හදා ගන්න වැඩ පිළිවෙළකට, ජනාධිපතිවරණය දිනා ගන්න වැඩ පිළිවෙළකට යනවාය කියන එක සඳහන් කරනවා.

මම තව විනාඩියකින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, කරන්දෙනියේ දොස්තර මහත්මයෙක් ඝාතනය කළ සිද්ධිය ගැන. හැබැයි, මේ වනතුරු ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරලා නැහැ. ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි මම මේ කියන්නේ. ඒ වාගේම PHI මහත්මයෙක් ඝාතනය කළා. ඒ සම්බන්ධවත් තවම නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ෂාෆ්ටර් මැතිතුමාට මොකක්ද සිද්ධ වුණේ කියලා තවම සොයා ගන්න නොහැකි වෙලා තිබෙන්නේ. ඊළඟට, වසන්ත ඝාතනය කරපු අපරාධකරුවෝ හොයා ගන්න බැහැ. අද උදේ ඉඳන් ෑ වෙනකල් හැම තැනම මරනවා, පාරක යන්න බැහැ. මෙවැනි තත්ත්වයක් අද ඇති වෙලා තිබෙන්නේ. ඒ කියන්නේ, මේ රටේ භීෂණය ආපහු වර්ධනය වෙලායි තිබෙන්නේ. හැම තැනකම නාදුනන තුවක්කුකරුවෝ. කොයි වෙලාවේ අපටත් ආරාධනා කරයි ද දන්නේ නැහැ, tattoo shop එකකට එන්න කියලා. ආරාධනාවක් ලැබුණාම හිටපු ගමන් අපිත් යනවා, හොයන්නේ නැහැ ඒ කවුද, වෙඩි තියලා මරයි ද කියලා. ඒ නිසා කරුණාකරලා, මේ රටේ නීතිය හරියාකාරව ක්‍රියාත්මක කර ගැනීම සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න කියමින්, මට වෙලාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු දයාසිරි ජයසේකර මැතිතුමා ව්‍යවස්ථාව පිළිබඳ ප්‍රශ්නයක් මතු කළ නිසා ඒකට උත්තරයක් දෙන්න මම බලාපොරොත්තු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොහොම පැහැදිලි ලෙස මම මේ කාරණය කියන්නට ඕනෑ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 6 සිට 5 දක්වා අඩු කළා. පාර්ලිමේන්තුවේ ධුර කාලය අවුරුදු 6 සිට 5 දක්වා අඩු කළා. ඇත්ත වශයෙන්ම 1994 ඉඳලා ජනාධිපතිතුමන්ලා පත් වුණේ ධුර කාලය අඩු කරනවා කියලායි. හැබැයි, ඒක කළේ හිටපු ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විතරයි. එතුමා දැන් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමා ඡන්ද පොරොන්දුවක් දුන් විධියටම පාර්ලිමේන්තුවේ සහයෝගය ඇතිව දෙවැනි වර කියැවීමේදී ඡන්ද 215ක් අරගෙන තමයි ඒ සංශෝධනය සිද්ධ කළේ. එහෙම වුණත් ඒක අපේ පාලනයකින්, ආණ්ඩුවක පාලනයකින් තොරයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. පුද්ගලයන්ට ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා නොයෙකුත් අර්ථ නිරූපණ ඉල්ලන්න පුළුවන්, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම මත. එහෙම නැත්නම් රිට් ආඥාවක් මඟින්. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කළා, ජනාධිපතිවරයාගේ ධුර කාලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 (ආ) ව්‍යවස්ථාවේ සඳහන් කාරණය වෙනස් නොකළ නිසා වසර 6ක් බවට නඩු තීන්දුවක් දෙන්න කියලා. ඒ අනුව, ශ්‍රේෂ්ඨාධිකරණයේ පංච පුද්ගල විනිශ්චය මඩුල්ලක් විසින් පැහැදිලිව තීන්දුවක් ලබා දුන්නා, ජනාධිපතිවරය ාගේ ධුර කාලය අවුරුදු 5යි කියලා. 2015දී දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් නිගමනයේ - Determination - බොහොම පැහැදිලිව කියා තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 වන ව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුණත්, ඡන්දය භාවිත කිරීම සඳහා ජනතාවට තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය පටු වෙනවා නම්, අඩු වෙනවා නම් තමයි ජනමත විචාරණයකට යන්නට ඕනෑ, ජනතාවගේ අයිතිය පුළුල් වෙනවා නම් ඒකට ජනමත විචාරණ ඕනෑ නැහැ කියලා.

ඒ අනුව අවුරුදු 6ක් වන ධුර කාලය අවුරුදු 5 දක්වා අඩු කළාය කියන්නේ ජනතාවගේ ඡන්ද අයිතිය පුළුල් කිරීමක්. ජනතාවගේ ඡන්ද අයිතිය පුළුල් කිරීම සම්බන්ධව ජනමත විචාරණයක් ඕනෑ නැහැ කියපු නිසා තමයි පාර්ලිමේන්තුව ජනමත විචාරණයකින් තොරව එය සම්මත කර ගනු ලැබුවේ. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ව්‍යවස්ථා දෙකක් හෝ තුනක් තිබුණා ජනමත විචාරණවලට යා යුතුයි කියලා. අපි ඒ ව්‍යවස්ථා දෙකතුනම ඉවත් කරලා තමයි එම පනත් කෙටුම්පත සම්මත කර ගත්තේ. මේ පිළිබඳව නීතිඥ මහත්මයෙකුත් නඩුවක් දැම්මා. ඔහුට නඩු ගාස්තු ලෙස ලක්ෂ 5ක් ගෙවන්නත් වුණා. මේ කාරණය දිගින් දිගටම සිදු වන නිසා මේ වරද නිවැරදි කරලා තියන්න ඕනෑ කියන අදහසින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරපු යෝජනාව අපි සම්මත කළා. මම බොහොම පැහැදිලිව සහ වගකීමෙන් කියනවා, පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට

[ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

පසුව ඕනෑම කෙනෙකුට ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට යන්න පුළුවන් බව. හැබැයි, ඊට අදාළ නීතිමය තත්ත්වය පිළිබඳව අධිකරණය අවස්ථා කිහිපයකදී පැහැදිලි තීන්දු දීලා තිබෙනවා. මේ සංශෝධනය සම්මත කර ගැනීම සඳහා කිසිදු ආකාරයකින් ජනමත විචාරණයකට යාමේ අවශ්‍යතාවක් නැහැ. හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක අකුරක් හෝ සංශෝධනය කරනවා නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දය ලබා ගැනීම අවශ්‍යයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.00]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, මුලින්ම මම මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. 2021 මැයි 19වැනි දා එක්ස්ප්‍රස් පර්ල් නෞකාව අනතුරට පත් වුණා. ඒක ලෝකයේ සිදු වුණු දරුණුම අනතුරක් බව අපි දන්නවා. එය බහුවිධ අනතුරක්. එම අනතුර සිදු වෙලා දැන් අවුරුදු තුනකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. එහි වන්දිය ගණනය කිරීම සඳහා 2021 ජූනි 12 වන දා expert team එකක් පත් කළා. ඒ කියන්නේ, විදේශ රටවල උගත් මහාචාර්යවරු හා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල වැඩ කරන මහාචාර්යවරුන්ගේ එකතුවෙන් කමිටුවක් පත් කළා, වන්දි ගණනය කරන්න කියලා. හැබැයි, ඒකට ඒගොල්ලන්ට පළපුරුද්දක් අවශ්‍යව තිබුණා. ඒ අය කලින් නිව් ඩයමන්ඩ නෞකාවේ සිද්ධිය සම්බන්ධ පර්යේෂණවලට සහභාගි වෙලා ඒ පළපුරුද්ද අරගෙන තිබුණා. ඒ අය 2021 සැප්තැම්බර් 05වැනි දා මේ සඳහා ඩොලර් බිලියන 1.9 වන්දියක් ගණනය කළා. සිදු වූ හානිය වළක්වන්න අපට ක්ෂණිකව ඩොලර් බිලියන 1.9ක් අවශ්‍යයි කියන එක ඒගොල්ලෝ ඒ අවස්ථාවේ පෙන්වූවා. 2023 ජනවාරි 13වැනි දා ඒගොල්ලෝ පෙන්නුවා 2022 නොවැම්බර් 30 දින දක්වා රටට වෙච්ච හානිය ඩොලර් බිලියන 6.4ක් කියලා. අපි දන්නවා, ඒ වන්දිය පෙන්නුවේ 2022 නොවැම්බර් 30 දක්වා විතරයි කියලා. නමුත්, ඒ ප්‍රශ්නය නිසා අදටත් අපේ රටේ සමුද්‍රීය පරිසරයට හානි සිදු වනවා, අපේ රටේ ප්‍රශ්න ඇති වනවා, පරිසරය දූෂණය වනවා. නමුත්, 2022 නොවැම්බර් 30වැනි දායින් පස්සේ වන්දි ගණනය කිරීම සඳහා කිසිම වැඩ පිළිවෙළක් නැහැ. ඒ expert committee එකත් අයින් කරලා තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, ඒ expert committee එක දිගටම තිබෙන්න ඕනෑ කියලා නීතිපති දෙපාර්තමේන්තුවට ලියුමක් යොමු කරලා තිබෙනවා, එහි සභාපති අසේල රඹව මහත්මයා. එහිදී අසා තිබෙනවා ඒ expert team එක වැඩක් නැද්ද, අපි මෙච්චර වන්දි ගණනය කරලා තිබෙනවා, ඒ වාර්තා කුණු කූඩයටද කියලා. නීතිපතිතුමා කියලා තිබෙනවා, එම වාර්තා කුණු කූඩයට දමන්නවත් සුදුසු නැහැ කියලා; ඒ තරම්වත් ශක්තිමත් නැහැ කියලා; ඒ තරම් බලවත් නැහැ කියලා. එහෙම නම් නීතිපති දෙපාර්තමේන්තුවට තිබුණා expert team එකත් එක්ක එකතු වෙලා, නඩුවට ගැළපෙන විධියට කොහොමද වාර්තා සකස් කරන්නේ කියන එක සාකච්ඡා කරන්න. එම කණ්ඩායමේ ඉන්නේ ලෝකයේ පිළිගත්ත විශ්වවිද්‍යාලවල ඉගෙනගත් බුද්ධිමත් පුද්ගලයෝ.

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙන් යවපු ලිපිය අවශ්‍ය නම් මම ඔබතුමාට පෞද්ගලිකව දෙන්නම්. ගරු ඇමතිතුමනි, අද වන තෙක් එයට උත්තරයක් නැහැ. මේ වනකොට කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දීලා තිබෙනවා ඩොලර් බිලියන 9.8ක් සඳහා; ඒ සඳහා වන නීතිමය කටයුතු සඳහා රුපියල් කෝටි 244ක් අනුමත කරගෙන තිබෙනවා. මෙය රටේ වුණු බරපතළ සිද්ධියක්. මේ සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට සහාය සඳහා කියලා ඔබතුමන්ලා ඕස්ට්‍රේලියානු සමාගමක් ගත්තා. මේ සම්බන්ධයෙන් සිංගප්පූරුවේ නඩු දමන්න තීරණය කළාම ලංකාවේ ඉන්න අපේ විශේෂඥයෝ කිව්වා, "සිංගප්පූරුවේ නොවෙයි ලංකාවේ නඩු දමන්න ඕනෑ" කියලා. එක අපේ කමිටුව කිව්වා. මේ රටේ සමුද්‍රීය පරිසර ආරක්ෂණය සම්බන්ධව ක්‍රියා කරන MEPA එක පවා කිව්වා, ශ්‍රී ලංකාවේ නඩු දමන්න කියලා. ඒවා මොකුත් අහන්නේ නැතිව නඩු දැම්මා. එංගලන්තයේ අපි පවරා තිබෙන නඩුව පැරදුණොත්, ඇමෙරිකානු ඩොලර් මිලියන 25යි මේ නඩුවේ වන්දිය වශයෙන් ගෙවන්න වෙන්නේ. එතකොට ලංකාවට වැඩි ගණනක් ලැබෙන්නේ නැහැ. කන්ටේනර්වල අයිතිකරුවන්ට, නැව් අයිතිකරුවන්ට බෙදිලා ගියාම ලංකාවට ඩොලර් මිලියන 10ක්වත් ලැබෙන්නේ නැහැ. නමුත් අපි අද වෙනකොට නීති කටයුතු සඳහා ඩොලර් මිලියන 10ට සමාන මුදලක් කැබිනට් එකෙන් අනුමත කරගෙන නඩු ගාස්තු සඳහා ගෙවන්න ලෑස්ති කරලා තිබෙනවා. එතැනදී අපි මොනවා හරි දෙයක් කියමු. එංගලන්තයේ නඩුව පැරදුණොත් අපි වියදම් කරපු සල්ලිවත් ලැබෙන්නේ නැති පාටක් පේනවා. වන්දිය තියා, අපි වියදම් කරපු ගණනවත් ලැබෙන්නේ නැහැ. මේක රටේ critical ප්‍රශ්නයක් නේ. අපට මේ ගැන මීට වඩා හිතන්න බැරිද? අපි මීට වඩා මේ ගැන පස්සෙන් පන්නන්න ඕනෑ නැද්ද? අපි ඩොලර් බිලියන 6.5ක මුදලක් වන්දි වශයෙන් ඉල්ලා තිබෙනවා. අපට මෙපමණ අලාභයක් සිදු වුණා කියලා නීතිපති දෙපාර්තමේන්තුවට දැනුම් දීලා තිබෙනවා. රටේ නීතිය ක්‍රියාත්මක කරන්න නීතිපති දෙපාර්තමේන්තුව තිබෙනවා. ඒ වාගේම රටේ සමුද්‍රීය පරිසර ආරක්ෂණය සඳහා වෙනම ආයතනයක් තිබෙනවා. ඒ ආයතනයත් එක්ක ඒකාබද්ධ වෙලා වැඩ කරන්න ඕනෑ නේද? ඒ ගොල්ලන් එවන ලියුමකටවත් උත්තර දෙන්නේ නැත්නම්, ඒ ගොල්ලොත් එක්ක සාකච්ඡා කරන්නේ නැත්නම්, ඒ ගොල්ලන් පාවිච්චි කරපු expertsලා ගණන් ගන්නේ නැත්නම් මේ වැඩේ කරන්න පුළුවන්ද?

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, වර්තමානය වෙනකොට මේකේ නඩු ගාස්තු වශයෙන් කෝටි 19ක් වියදම් කරලා තිබෙනවා. කෝටි 19ක් සල්ලි අරගෙන තිබෙනවා, රටේ භාණ්ඩාගාරයෙන්. නඩුවලට වියදම් කරන්න භාණ්ඩාගාරයෙන් ලබා ගන්නේ මේ රටේ ජනතාවගේ සල්ලි නේ. හැබැයි, මේ නඩුවේ තත්ත්වය මොකක්ද කියලා ජනතාවට අද වෙනකම් දැනගන්න ලැබිලා තිබෙනවාද? ජනතාවට නොවෙයි, අඩු ගණනේ අපේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා වර්තමාන තත්ත්වය ගැන ප්‍රකාශ කරන්න කිව්වත්, එන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මේ කාරණයට ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ජනතා මුදල් වියදම් කරලායි මේවා ඔක්කොම කරන්නේ. කෝටි 19ක් ගෙව්වේ ජනතාවගේ මුදල්. ඩොලර් බිලියන 9.8ක් උපරිම වශයෙන් ගෙවන්න පුළුවන් කියලා සාක්ෂාත් කර ගත්තේ ජනතා මුදල්වලින්. මේ රටේ ජනතාවගේ මුදල්වලට මීට වඩා ගරු කරන්න ඕනෑ. මේ මුදල්වලින් කරන දේ මොකක්ද කියලා රටේ ජනතාව දැනගන්න ඕනෑ. නඩුමය කටයුත්තක්, ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒවා අපට දැනගන්න ඕනෑ නැහැ. නමුත් මේ සල්ලිවලින් මෙච්චර කල් කළේ මොනවාද කියන එක ජනතාව දැන ගන්න ඕනෑ. අද වෙනකොට අවුරුදු තුනහමාරක් ගතවෙලා තිබුණත්, වන්දි වශයෙන් සතයක්වත් අපට ලැබිලා නැහැ. මෙහිදී රක්ෂණ සංගමයෙන් beach cleaning සඳහා බිලියන දෙකකට ආසන්න මුදලක් දීලා තිබෙනවා. නමුත් අධිකරණ ක්‍රියාදාමය තුළ ලැබුණු දෙයක් නැහැ කියා මම විශේෂයෙන් කියනවා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු සනාතිපති චට්ටත්තරණි (කලානිති) විජයතාස රාජපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ගරු මන්ත්‍රීතුමා මතු කළේ එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර නිසා සිදු වෙච්ච හානිය පිළිබඳ කාරණයයි. මම මේ ධුරය භාර ගන්නකොට මේ පිළිබඳව විශේෂඥ කමිටුවක් පත් කරලා තිබුණා. මෙහි වගකීම තිබෙන්නේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට, අධිකරණ අමාත්‍යාංශයට නොවෙයි. නමුත් ඒ ගොල්ලන්ට උදව් කරන්න මට පෙර සිටි අධිකරණ ඇමති ගරු අලි සබ්රි මැතිතුමා මැදිහත් වෙලා තිබුණා. ඒ අනුව විශේෂඥ කමිටුව වාර්තාවක් සකස් කරලා තිබුණා. මම ඒ වාර්තාව බැලුවාම, ඒක අංග සම්පූර්ණ වාර්තාවක් නොවෙයි කියලා මට තේරුණා. ඒ වාර්තාව අනුව වන්දිය තක්සේරු කරලා තිබුණේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.9කට. එතකොට මම ඒ උදව්යගෙන් ප්‍රශ්න කළා, එච්චර අඩු ගණනක් ආවේ කොහොමද කියලා. එතකොට ඒ ගොල්ලන් පිළිගත්තා, ඒ වාර්තාවල අඩුපාඩුකම් තිබෙනවා කියලා. ඒ අනුව මම අංගසම්පූර්ණ වාර්තාවක් ඉල්ලුවා. අංගසම්පූර්ණ වාර්තාව ඉල්ලුවාම, ඒ ගොල්ලන් වන්දිය හැටියට ඇමෙරිකානු ඩොලර් බිලියන 6.4ක් තක්සේරු කළා. ඒ යටතේ අධිකරණයේ නඩු පැවරීමේදී නීතිපතිවරයා තමයි තීන්දු ගන්නේ. මොකද, රටක නීතිපතිවරු දෙදෙනෙක් නැහැ නේ. රටේ සෑම ආයතනයකටම උපදෙස් දෙන්න ඉන්නේ එක නීතිපතිවරයායි. ඒ අනුව නීතිපතිවරයාගේ මතය වුණේ මේ නඩුව සිංගප්පූරු අධිකරණයේ පවරන්න. හේතුව, සිංගප්පූරු අධිකරණයෙන් නඩු තීන්දුවක් ගත්තොත් ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන්. හැබැයි, අපේ රටේ අධිකරණයකින් තීන්දුවක් ගත්තොත් ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියලා බරපතළ ගැටලුවක් තිබෙනවා. දෙවැනි කාරණය තමයි, සිංගප්පූරු අධිකරණයේ නඩු පැවරුවාම නඩුව පවතිද්දී වුණත් අපි අයැද තිබෙන ගණන වැඩි කරලා ඉල්ලන්න පුළුවන්. ඒ කාලයේ - නඩුව පවතින අතරතුරේ - සිදුවෙන අලාභහානි - damages - ඒකට එකතු කරන්න පුළුවන්. ඒක සිංගප්පූරුවේ තිබෙන නීතියක්. අපේ රටේ එහෙම නීතියක් නැහැ. ඒ තීරණය නීතිපතිතුමා තනියෙන් ගත්තේ නැහැ. මුහුදු රක්ෂණ කටයුතු පිළිබඳ විශේෂඥ නීතිඥ ආයතන තුනක් - එංගලන්තයේ, ඕස්ට්‍රේලියාවේ සහ සිංගප්පූරුවේ - මේ කටයුත්තට සම්බන්ධ කර ගත්තා. එතකොට ඒ ආයතන තුනේත් උපදෙස් ඇතිව තමයි නීතිපතිවරයා මේ නඩු කටයුතු කරන්නේ. ඒ සඳහා අපි කරන්නේ පහසුකම් සැපයීම පමණයි. ඒ පිළිබඳව වැඩිදුර විස්තර සාකච්ඡා කර ගැනීම සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වගකීමක්. නීතිපති දෙපාර්තමේන්තුවට යන්න ඒ ගොල්ලන් මගෙන් අවසර ගන්නේ නැහැ. එහෙම අවශ්‍ය නැහැ. නීතිපතිවරයාගේ උපදෙස් ගන්න, ඔහුගේ සහාය ලබා ගන්න රජයේ සෑම නිලධාරියෙකුටම නීතිපති දෙපර්තමේන්තුව විවෘතයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන එක හරි. නමුත් අපි කියන්නේ මෙකයි. ඔබතුමා තමයි ජනතාවගේ නියෝජිතයා; ජනතාව වෙනුවෙන් නීතිය සම්බන්ධව පෙනී සිටින නියෝජිතයා. නමුත් අද නීතිපති දෙපාර්තමේන්තුව, *-[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමා, මම කියලා ඉවර කරනතුරු ඉන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් කියන්න. කාලය පිළිබඳ ගැටලුවක් තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)

අද නීතිය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අඩු ගණනේ ලියුමකටවත්; MEPA එකෙන් දෙන ලියුමකටවත් උත්තර එවන්නේ නැහැ. මා ළඟ ලියුම තිබෙනවා, ඔබතුමාට දෙන්නම්. ඒකටවත් උත්තර එවන්නේ නැහැ. එහෙම ඒකාධිපති ක්‍රමයක් තමයි ක්‍රියාත්මක වෙන්නේ.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු සනාතිපති චට්ටත්තරණි (කලානිති) විජයතාස රාජපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේකෙදි නිලධාරීන් දෙගොල්ලක් අතර පෞද්ගලික මට්ටම දක්වා ගැටුමක් ගිහිල්ලා තිබෙනවා. මේ පවුල් අවුල් ප්‍රශ්න විසඳන්න නොවෙයි, ඇමතිවරයා ඉන්නේ. නීත්‍යානුකූල ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔබතුමා මගෙන් අහන්න. නඩුව පිළිබඳව තොරතුරක් ඕනෑ නම් ප්‍රශ්නයක ස්වරූපයෙන් මගෙන් අහන්න, මම උත්තර දෙන්නම්. *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.10]

ගරු ගාමිණී වලේබොඩ මහතා
(මාණ්පුමිකු කාමිනී වලේපොඩ)
(The Hon. Gamini Waleboda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සිවිල් නඩු විධාන සංග්‍රහයට සංශෝධන කිහිපයක් ගෙනෙන අවස්ථාවේ දී වවන කිහිපයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

අද සංශෝධන ගෙනෙන්නේ සිවිල් නඩු විධාන සංග්‍රහය සම්බන්ධයෙන් වුණත්, මේ කාරණය මම කියන්න ඕනෑ. ගරු අධිකරණ ඇමතිතුමනි, අධිකරණ කලාප වෙන් කරන අවස්ථාවේ දී බලංගොඩ අධිකරණ කලාපයට මහාධිකරණයක් ලබා දෙන්න කියන කාරණයට අපි ඔබතුමාගේ අවධානය යොමු කළා. සම්පූර්ණ තොරතුරු සමීක්ෂණයකින් පසු එම අධිකරණය පිහිටුවීමේ ප්‍රායෝගික වැදගත්කම සහ භූගෝලීය වැදගත්කම ගැන ඒ වෙලාවේ මේ පිළිබඳව කටයුතු කරපු සමයවර්ධන කමිටුවට අපි ඉදිරිපත් කළා. එම කමිටුවෙන් නිර්දේශ කළා, මේ අධිකරණය පිහිටුවීම සුදුසුයි කියන එක. එහෙම කියන්න හේතුව මෙකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බෙරගල ඉඳලා ගත්තාම, බදුල්ල දිස්ත්‍රික්කයේ මායිමේ ඉඳලා ගත්තාම, මහාධිකරණයට පැමිණෙන සැකකාරයෙකුට, සාක්ෂිකාරයෙකුට, පැමිණිලිකාරයෙකුට කිලෝමීටර 80ක, 90ක දුරක් රත්නපුරට එන්න ඕනෑ. ඒ වාගේම බලංගොඩ උසාවිවලින් නිකුත් කරන තීරණවලට අභියාවනා කරන සියලුදෙනාත් ඒ සඳහා රත්නපුරයට එන්න ඕනෑ. බෙරගල ඉඳලා, එහෙම නැත්නම් හල්දුම්මුල්ලේ ඉඳලා රත්නපුරයට කිලෝමීටර 80ක් එන කෙනෙක් උසාවියට එන්න නම් පාන්දර 3.00ට විතර ගෙදරින් පිටත් වෙන්න ඕනෑ. කල්තොට කෙළවරේ, මොනරාගල දිස්ත්‍රික්කයේ මායිමේ සිටින කෙනෙක් ගත්තාමත් ඒ විධියේම දුරක් එන්න ඕනෑ. ඉතින් මේ තත්ත්වය සමනය කිරීම සඳහා මේ මහාධිකරණය පිහිටුවා දෙන්න කියලා අපි ඉල්ලුවා. බලංගොඩ අධිකරණ කිහිපයෙන්ම රත්නපුර මහාධිකරණයට අවුරුද්දකට නඩු සිය ගණනක් යොමු වෙනවා. ඒ

[ගරු ගාමිණී වලේබොඩ මහතා]

ජනතාවට සේවය සලසන්න නම්, නීතිය නිවැරදිව පසිඳලන්න අවශ්‍ය නම් මේ කටයුත්ත කරන්න කියලා අපි ඉල්ලා සිටියා. නමුත් අද වෙනතුරු මේ කටයුත්ත ඉෂ්ට නොවීම පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ නිසා නැවත වතාවක් ඔබතුමාගේ අවධානයට අපි මේ කාරණය යොමු කරනවා. බලංගොඩට ඕනෑ කරන මහාධිකරණය ලබා දෙන්න කටයුතු කරන්න කියලා ඉල්ලනවා.

නීතිය පසිඳලීම ගැන කථා කරනකොට තව එක කාරණයක් සඳහන් කරන්න අවශ්‍යයි. ගරු අධිකරණ ඇමතිතුමනි, ඊයේ පෙරේදා දවසක මට දරුවෝ දෙන්නෙක් කථා කරලා කිව්වා, ඒ දෙන්නා පොලිස් වාර්තාවක් ගන්න බලංගොඩ ප්‍රදේශයේ පොලීසියකට බයිසිකලයකින් යනකොට පොලීසිය ළඟදි නතර කරලා පොලීසියට අල්ලාගෙන ගිහිල්ලා කූඩුවට දාලා, පහුවෙනි දා උසාවියට ඉදිරිපත් කරලා ඇප ලබා දුන් බව. එහිදී සඳහන් කර තිබෙනවා, මේ ගොල්ලන් අතේ ගංජාද මොනවාද තිබුණා කියලා; මත්ද්‍රව්‍ය තිබුණා කියලා. එතකොට OIC මහත්තයාට මේ ළමයි වැඳලා කියා තිබෙනවා, "අපි ආවේ පොලිස් වාර්තාවක් ගන්න. මීට දවස් තුනකට ඉස්සෙල්ලා ඇවිල්ලා ඒ පොලිස් වාර්තාව ගන්න ඕනෑ කරන ඉල්ලුම්පත්‍ර දෙක අපි පොලීසියෙන් අරගෙන ගියා. අපි අතේ තිබෙන බෑග්වල මේ වෙනකොටත් එම ඉල්ලුම්පත්‍ර දෙක තිබෙනවා, මේ වැඩේ කරන්න එපා" කියලා. මේ, අවුරුදු 20, 22 කොළු පැංචෝ දෙන්නෙක්. හැබැයි, උසාවියට දාලා වරද පිළිගන්න කියලා මේ ගොල්ලන්ට බලපෑම් කරලා තිබෙනවා. පසුව දා උසාවියෙන් නිදහස් කරලා එවා තිබෙනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, නීතිය අතේ තිබෙන ඇතැම් නිලධාරීන් නීතිය ක්‍රියාත්මක කරන විධිය මෙන්න. ඉතින්, ඉතාම අසාධාරණ විධියට ක්‍රියාත්මක වන මේ තත්ත්වය පිළිබඳව අපට ඕනෑ තරම් උදාහරණ ප්‍රකාශ කරන්න පුළුවන්.

ඒ වාගේම තමයි රාජ්‍ය සේවයේ දී නීතිය හසුරුවන ආයතන කටයුතු කරන ආකාරයත්. මම උදේත් මේ කාරණය සඳහන් කළා. නීතිය අවභාවිත කරන, තමන්ට ඕනෑ විධියට නීතිය හසුරුවන රාජ්‍යයේ තිබෙන ප්‍රධානම ආයතනවලින් එකක් බවට මේ වෙනකොට රාජ්‍ය සේවා කොමිසම පත් වෙලා තිබෙනවා. අපි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව හරහා මෙම කොමිසමට යැවූ නිර්දේශ විශාල ප්‍රමාණයක් මේ වන විට තිබෙනවා, තුට්ටුවකට සලකන්නේ නැතිව පැත්තකට වීසි කර දමලා. ඒ නිසා මම යෝජනා කරනවා, මේ පිළිබඳව සම්පූර්ණ විග්‍රහාත්මක සමාලෝචනයක් මේ සභාවට කරන්න කියා. අධිකරණ ඇමතිතුමනි, ලංකාවේ රාජ්‍ය සේවය කියන්නේ ශ්‍රී ලංකා පරිපාලන සේවය විතරක් නොවෙයි. ඒ තුළ පරිපාලන සේවය තිබෙනවා, ගණකාධිකාරී සේවය තිබෙනවා, දේශීය ආදායම් සේවය තිබෙනවා, Sri Lanka Customs එකට වෙනම සේවාවක් තිබෙනවා, විද්‍යාත්මක සේවය තිබෙනවා, විදේශ සේවය තිබෙනවා, සැලසුම් සේවය තිබෙනවා, වෛද්‍ය සේවය තිබෙනවා. හැබැයි, මේ කියන සේවා නියෝජනය කරන කවුරුවත් රාජ්‍ය සේවා කොමිසම තුළ නියෝජනය වෙන්නේ නැහැ. රාජ්‍ය සේවා කොමිසම නියෝජනය කරන්නේ දේශපාලන අධිකාරියෙන් පත් කළ කණ්ඩායමක්. කොමිසම විධියට සමන්විත එම කණ්ඩායමේ බොහෝ විට ඉන්නේ විශ්‍රාමලත් පරිපාලන සේවා නිලධාරීන් සහ පරිපාලන සේවයේ සිටින නිලධාරීන්. මේ අය පරිපාලන සේවයට ඕනෑ කරන දේවල් විතරක් කේන්ද්‍ර කරගත් තීරණවල ඉන්නවා, අනෙක් අය පිළිබඳව කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ.

මම දැන් මෙතැනට ආවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ පැවැති විමර්ශනයකට සහභාගි වෙලා. එක වෛද්‍යවරයෙක් මාධ්‍යයට ප්‍රකාශයක් කළා කියලා, එම වෛද්‍යවරයා මාධ්‍යයට කළ ප්‍රකාශය පදනම් කරගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමියක් පාර්ලිමේන්තුවේදී කථා කළා කියලා, අර ප්‍රකාශය කළා කියන වෛද්‍යවරයාගේ වැඩ තහනම් කරලා තිබෙනවා අවුරුදු තුනක් තිස්සේ. නමුත් ඒ මුළු පරීක්ෂණය තුළ කොහේවත් තැනක ඔප්පු කරගන්න බැරි වෙලා තිබෙනවා, ඔහු එහෙම ප්‍රකාශයක් කළා කියලා. හැබැයි නීතිය ක්‍රියාත්මක කරන, පරිපාලන නීතිය අතට ගත් අය මොකක්ද කරන්නේ? වැටුප් රහිතව අර වෛද්‍යවරයාගේ වැඩ තහනම් කරලා තිබෙනවා. දැන් තමයි එතුමා නැවත සේවයේ පිහිටුවා තිබෙන්නේ. හැබැයි හිහ වැටුප්, ඒවා මේවා මොකක්වත් දීලා නැහැ. තවම ඔහුගේ විනය පරීක්ෂණය නිමාවන දවසක් පිළිබඳව සඳහන් වෙන්නේත් නැහැ. මේ විධියේ අසාධාරණකම් කරමින් මේ ආයතනය ඉදිරියට කටයුතු කරන්නේ කොහොමද?

ඒ වාගේම අපි දැකපු තවත් කාරණයක් තමයි, ගුරුවරුන් බඳවා ගැනීමේ ගැටලුව. එය නිරාකරණය කර ගැනීමේ ගැටලු බොහොමයක් තිබෙනවා. එම ගැටලු සම්බන්ධයෙන් විශාල පිරිසක් අධිකරණයට ගිහිල්ලා තහනම් නියෝග - Stay Orders - අරගෙන තිබෙනවා. මේ හේතුව නිසා ගුරුවරුන් බඳවා ගැනීම ඇනහිට තිබෙනවා. සබරගමුව පළාත ගත්තාම, එම පළාතට ඕනෑ කරන ගුරුවරුන්ගෙන් සියයට 12-15 අතර සංඛ්‍යාවක හිඟයක් තිබෙනවා. ගුරු පුහුණුව ලැබූ, උපාධිය හදාරපු, විද්‍යාපීඨවලින් එළියට ආ ගුරුවරුන් විධියට බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සහිත විශාල පිරිසක් එම ප්‍රදේශවල ඉන්නවා. විභාගය පවත්වා ඔවුන් ගුරු සේවයට බඳවා ගැනීමට දැන් නීතිය හරස් වෙලා තිබෙනවා. මෙහෙම යනකොට ඔවුන්ගේ වයසත් නිකම්ම ගතවෙනවා. මේ නීතිමය ප්‍රශ්නය නිසා ඉස්කෝලවල ඉන්න දරුවන්ට උගන්වන්න ගුරුවරු නැහැ. ඒ ගුරු පත්වීම් ලැබිය යුතු අය ගෙවල්වලට වෙලා ඉන්නවා, ගුරු වෘත්තියට එන්න විධියක් නැතිව. අධිකරණයෙන් දීපු නියෝගය නිසා එම වැඩ කටයුතු කඩාකප්පල් වෙලා තිබෙනවා. අධිකරණ ඇමතිතුමනි, මෙහෙම මේ රට පවත්වා ගෙන යන්නේ කොහොමද?

එක පැත්තකින් රාජ්‍ය සේවය තුළ සහ තවත් බොහෝ ක්ෂේත්‍ර තුළ නීතිය ක්‍රියාත්මක කරන ආකාරය ගත්තාම, නීතිය පිළිබඳව වගකියන අය කටයුතු කරන ස්වභාවය ගත්තාම, මේ රට මෙහෙම පවතින එක පිළිබඳව සතුටු වෙන්න ඕනෑ කියලා අද අපට හිතෙනවා. මොකද, එච්චරටම සමහර ක්ෂේත්‍ර කඩා වැටී තිබෙන්නේ, ඒවා අත්තනෝමතික කටයුතුවලින් පිරී පවතින්නේ. එම නිසා මහජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කිරීම පිළිබඳව කිසිම හැඟීමකින් කටයුතු නොකරන තත්ත්වයක් තමයි ඒවා තුළ තිබෙන්නේ. අද නියමාකාරයෙන් කටයුතු කරනවා තබා, එම කටයුතු යථා තත්ත්වයට පත් කරගෙන පසු කාලයකවත් ක්‍රියාත්මක කරන්න බැරි වෙන විධියට හිර කරන තත්ත්වයට එම ආයතන පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ සමස්ත නීති පද්ධතියම සමාලෝචනය කිරීම අවශ්‍ය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රටක් සංවර්ධනය කිරීමට භෞතික යටිතල පහසුකම් සංවර්ධනය -පාරවල් හදන එක, බෝක්කු හදන එක, පාලම් හදන එක- අවශ්‍යයි වාගේම, රටේ නීති ප්‍රතිසංස්කරණය කරලා නීති සම්පාදනය කිරීමත් අත්‍යවශ්‍ය කාරණාවක්. ඒකට අපි කියනවා, මෘදු යටිතල පහසුකම් සංවර්ධනය - soft infrastructure development - කියලා.

ගරු ඇමතිතුමනි, සමහර දේවල්වලට අපි විරුද්ධ වුණත්, ඔබතුමාගේ කාලය තුළදී ඔබතුමා අණ පනත් විශාල සංඛ්‍යාවක් සංශෝධනය කරලා, යාවත්කාලීන කරලා වර්තමානයට සහ අනාගත ආර්ථික දියුණුවට ගැළපෙන ආකාරයට කටයුතු කරලා, ව්‍යවස්ථා සංශෝධනත් කරලා නීති කෘත්‍ය රාශියක් කළ බව අපි දන්නවා. ඒ තුළ අපට එකඟ වෙන්න බැරි ඒවාත් තිබුණා. අපි

ඒවාට විරුද්ධ වුණා වාගේම, එකඟ වෙන්න පුළුවන් ඒවාට අපි එකඟ වුණා. ඉදිරියේදීත් මේ රටට හිතකර ආකාරයට නීති සංශෝධනය කිරීමේදී අපේ දායකත්වයත් ගන්න පුළුවන් ආකාරයේ සංශෝධන පමණක් ගෙනැල්ලා, මේ ආර්ථිකය පත් වෙලා තිබෙන තත්ත්වයෙන් ගොඩ ගන්න ඕනෑ කරන නීති සම්පාදනය කිරීමට කටයුතු කරන්න කියා යෝජනා කරමින්, ඒ සඳහා සුදුසු රජයක් පිහිටුවා ගැනීමට ගමන් කරමු කියාත් යෝජනා කරමින් මා නිහඬ වෙනවා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු මන්ත්‍රීතුමා මතු කළ කාරණය පිළිබඳව පැහැදිලි නොකළොත් රටට වැරදි මතයක් යනවා. ඒකයි මේ අවස්ථාවේ මා නැඟී සිටියේ.

ගරු මන්ත්‍රීතුමා කියපු විධියට පසුගිය දිනවල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු මහින්ද සමයවර්ධන මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතුව අධිකරණ කලාප පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරන කමිටුවක් පැවතුණා. සබරගමුව පළාත ගත්තාම, දැනට රත්නපුරයේ මහාධිකරණයක් තිබෙනවා, බලංගොඩට මහාධිකරණයක් යෝජනා කරලා තිබුණා. නමුත්, ඒක නිර්දේශ කරලා නැහැ. ඒ නිර්දේශ නොකරන්න හේතුව, අධිකරණ දෙකකට වෙන් කරන්න තරම් ප්‍රමාණවත් නඩු සංඛ්‍යාවක් රත්නපුර මහාධිකරණයේ නැති වීමයි. හැබැයි ඒ කමිටුවෙන් නිර්දේශ කරලා තිබෙනවා, දැනට කලවානේ තිබෙන temporary මහෙස්ත්‍රාත් අධිකරණය, සිවිල් සහ අපරාධ නඩු තිබෙන දිසා/මහෙස්ත්‍රාත් වශයෙන් ඒකාබද්ධ අධිකරණයක් බවට පත් කරන්න කියලා. අපි ඒ පිළිබඳව යෝජනා සියල්ල සම්මත කරගෙන තිබෙනවා. නමුත්, අධිකරණ සේවා කොමිෂන් සභාව තුළ පවතින සේවක සංඛ්‍යාවේ ප්‍රශ්නයක් නිසා පසුගිය දිනවල ඒ පිළිබඳ යම් ප්‍රමාදයක් වෙලා තිබෙනවා. නමුත්, බොහොම ඉක්මනට අපි ඒ කටයුත්ත කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු, ගුරුවරු බඳවා ගැනීම පිළිබඳ කාරණය සම්බන්ධයෙනුත් නඩු විශාල සංඛ්‍යාවක් තිබුණා. ඉන් වැඩි සංඛ්‍යාවක් ඊයේ අධිකරණයේදී සමථයකට පත් වුණා කියලා අධ්‍යාපන ඇමතිතුමා දැනුම් දුන්නා. ඒ නිසා අපි ඒ පත්කිරීම් ඉතා ඉක්මනට කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මැතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.20]

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වෙනකොට, රටට ඉතා ම වැදගත් වන සිවිල් නඩු විධාන සංග්‍රහය සඳහා ගෙන එන සංශෝධන පිළිබඳවත්, ඒ වාගේම නියෝග කිහිපයක් පිළිබඳත් මේ විවාදය සිදුවෙමින් පවතිනවා. ඒ අනුව ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා අපට අවශ්‍ය දෙයක් කරගෙන යනවා. අපේ රට දියුණු කරන්න නම්, අපේ නීති පද්ධතිය සහ විනය අංක එකට තිබිය යුතුයි. ජනතාවට විනයක් සහිතව ජීවත් විය හැකි පරිසරයක් හැදුවොත්, අපට මේ රට දියුණු කරන්න හොඳ ප්‍රවේශයක් ලැබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ කටයුත්ත ඔබතුමා හරියට කරගෙන යනවා. ඒක ඉතා ම වැදගත්. ඒකට ඔබතුමාට ස්තුතියි.

මම ප්‍රථමයෙන්ම මේ කාරණය කථා කරනවා. සාමදාන විනිශ්චයකාරවරුන් පත් කිරීමට අදාළවත් යම් සංශෝධනක් අද සිදු වෙනවා. එහි ඉතා වැදගත් කාර්යයන් කිහිපයක් තිබෙනවා. ඒ සංශෝධනය මඟින් සාමදාන විනිශ්චයකාරවරුන් පත් කිරීම, පත්වීම් අවලංගු කිරීම සහ අත්හිටුවීම ගැනත් කථා කරනවා. ඒවා වැදගත් සංශෝධන. මට ලැබී තිබෙන කාලය සීමිත නිසා මම කෙටියෙන් මේ ගැන කරුණු දක්වනවා. මේ වෙනකොට සිවිල් සමාජයේ සාමදාන විනිශ්චයකාරවරු විශාල සංඛ්‍යාවක් සිටිනවා. ගරු අමාත්‍යතුමනි, මම කියන්නේ අපි තවදුරටත් මේ අය පුහුණු කිරීම, දැනුවත් කිරීම කළ යුතු බවයි. මොකද අපි දකිනවා, මේ සාමදාන විනිශ්චයකාරවරුන් නොයෙකුත් ආකාරයෙන් කටයුතු කරන බව. ඒ අතරින් සමහරුන්ට ඒ දැනුවත් කිරීම ලැබෙන්නේත් නැහැ, සමහරුන් දැනුවත් වීමක් වෙන්නේත් නැහැ. ඒ නිසා සාමදාන විනිශ්චයකාරවරු වශයෙන් අත්සන් කරපු සමහරුන්ට නඩු පවා ගොනුකොට තිබෙනවා.

බණ්ඩාරවෙල ප්‍රදේශයේ මම දන්නා ව්‍යාපාරිකයෙක් ඉන්නවා. ඔහු අවුරුදු 16ක් තිස්සේ යම්කිසි නඩුවකට සහභාගි වෙනවා. ඒ, සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ඔහු ගහපු අත්සනක් නිසා. යාළුකමට තමයි ඔහු ඒ අත්සන ගහලා තිබෙන්නේ. දරුවාගේ වැඩකට තාත්තා තමයි එම file එක අරන් ඇවිල්ලා තිබෙන්නේ. නමුත්, ඒක ලොකු වැරැද්දක්; ඇත්තටම ලොකු වැරැද්දක්. තාත්තා file එක අරන් ආවා. තාත්තා විශ්වාස කරලා ඔහුත් එක්ක තිබුණු යාළුකමට සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ඔහු ඒ අත්සන ගැහුවා. හැබැයි, වෙන කෙනෙක් තමයි ඒකට සම්බන්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා ඔහු ඒ වැරැද්දට අදත් දඬුවම් විඳිනවා. සමහර වෙලාවට ඒක ඔහුගේ නොදැනුවත්කම නිසා වුණු දෙයක් වෙන්න පුළුවන්. මොකද, ඔහු දෙමළ ව්‍යාපාරිකයෙක්. සිංහල form එකක ඒ විධියට අත්සන් කරලා කොහොම හරි ඒ දේ සිදු වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඒ නිසා ඒ අය දැනුවත් කිරීම ඉතා ම වැදගත් දෙයක්. ඒ වාගේම වැරැද්දක් කරලා හෝ මොකක් හරි දේකට සමහර අවස්ථාවලදී සාමදාන විනිශ්චයකාරවරුන් පොලීසියෙන් අත්අඩංගුවට ගන්නවා. නමුත්, ඒ අයගේ තොරතුරු සියල්ලම පවතින්නේ අමාත්‍යාංශයේ. ඒ නිසා මේ කටයුතු පොලීසියත් එක්ක සම්බන්ධ කරනවා නම්, ඉතාම වැදගත් වෙයි. අදාළ ප්‍රදේශයේ ඉන්න සාමදාන විනිශ්චයකාරවරු කවුද, ඔවුන්ගේ ක්‍රියාකාරකම් වෙන්නේ කොහොමද කියන දේවල් පිළිබඳව පොලීසියත් දැනුවත් වෙනවා නම්, පොලීසිය හරහා ඒ කටයුත්ත පහසුවෙන් ක්‍රියාත්මක කරගන්න පුළුවන් කියා මා හිතනවා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ඔව්. අපි ඒකේ register එක හදලා website එකට දානවා.

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

ගරු අමාත්‍යතුමා අපව දැනුවත් කරනවා, ඒ register එක හදලා website එකට දානවා කියලා. එතකොට ඒ පිළිබඳව හැමෝම දැනුවත් වෙනවා. ඒ වාගේම, පොලීසියත් සම්බන්ධ වෙලා ඒ කටයුත්ත කරනවා නම් ඉතා ම වැදගත් වෙනවා. ඒ ලේඛනය නඩත්තු කරලා ඒ විධියට ක්‍රියාත්මක වෙනවා නම් මේ අයගේ කැමැත්තට එක එක දේවල් කරන්නත් බැහැ. එතකොට සාමදාන විනිශ්චයකාරවරයෙකුගේ තනතුරේ ගෞරවයත් ආරක්ෂා වෙනවා. ඒ ගැනත් අපි විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කළ යුතුයි. ඒ වාගේම මොකක් හෝ පාඨමාලාවක් හදුන්වා දීලා, ඔවුන් දැනුවත් කරන වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කළ යුතුමයි. ඔවුන් මොකක්ද කරන්නේ, කොයි

[ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා]

විධියටද ක්‍රියාත්මක වෙන්නේ, ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය කොහොමද කියන එක ගැන follow-up එකක් වෙන්න ඕනෑ.

අත්සනක් ගහන්නත් මුදල් ගන්න සමහර සාමදාන විනිශ්චයකාරවරු ඉන්නවා. සාමදාන විනිශ්චයකාර තනතුර කියන්නේ ගරු සේවයක්; ස්වේච්ඡා සේවයක්. ඒ සේවය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වැදගත් කියා මම හිතනවා.

ඊළඟට, සිතාසි භාර දීම ගැනත් මම කියන්න ඕනෑ. අපි දන්නවා, සිතාසි භාර දීම අපේ රටේ ලොකු ගැටලුවක් බව. ඒ සම්බන්ධව ගරු මන්ත්‍රීවරු උදේ ඉඳන් කථා කරනවා අපි අහගෙන හිටියා. අධිකරණයෙන් නඩුවක් සම්බන්ධව සිතාසියක් භාර දෙන්න යවනකොට අනුගමනය කරන නොයෙකුත් ක්‍රමවේද තිබෙනවා. හැබැයි, මේක දැන් හොඳ තැනකට ඇවිල්ලා තිබෙනවා. දැන් අපිට තවදුරටත් මේකට යමක් එකතු කරන්න පුළුවන්. Election Commission එකේ තිබෙන ලියාපදිංචි ඡන්ද හිමි නාම ලේඛනයෙන් ඕනෑම පුද්ගලයෙකුගේ පදිංචි ලිපිනය ලබා ගන්න පුළුවන්. නමුත්, සමහර වෙලාවට සිතාසිය භාර දෙන්න යනකොට ඇත්තටම ඔවුන් ඒ ඡන්ද හිමි නාම ලේඛනයේ සඳහන් වෙලා තිබෙන ලිපිනයේ නැහැ. සිතාසිය භාර දෙන්න එනවා කියලා දැනගත්තාම ඔවුන් පදිංචිය වෙනස් කරනවා. ඒ විධියට පදිංචිය වෙනස් කරනකොට ඒ වෙනුවෙන් යම්කිසි ක්‍රමවේදයක් හැදෙන්න ඕනෑ. මේක අපි හැමෝම එකතු වෙලා කරන්න ඕනෑ දෙයක්. Election Commission එක, ග්‍රාම නිලධාරිවරු, ප්‍රාදේශීය ලේකම්වරු මාර්ගයෙන් දැන් මේ කටයුත්ත කරගෙන යනවා. පදිංචිය වෙනස් කරනවා නම් ඒ පදිංචිය වෙනස් කිරීමේ සහතිකය අරගෙන අලුතින් පදිංචි වෙන ස්ථානයට ගියාම ඒ ප්‍රදේශයට අදාළ ග්‍රාම නිලධාරිවරයා එම පදිංචිය සහතික කරනවා. ඒ කටයුත්ත නිසියාකාරවම සිදු වෙනවා නම් අපිට ප්‍රශ්නයක් නැහැ. එතකොට පදිංචිය නොමැති වීම කියන ප්‍රශ්නය අපට යම්කිසි මට්ටමකට විසඳා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම අපිට mobile phone එක register කර ගන්න පුළුවන්. දැන් mobile phone එක යොදාගෙන ගොඩක් දේවල් කරනවා අපි දකිනවා. සමහර වෙලාවට mobile phone එක යොදාගෙන තර්ජනය කිරීම් කරනවා. මේ හැම දෙයක්ම සිදු වෙන්නේ mobile phone එක උපයෝගී කරගෙනයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හැබැයි එවැනි කටයුතුවලට යොදා ගත් mobile phone එකේ SIM එක ගැන හොයනකොට ඒක සමහර වෙලාවට මිය ගිය කෙනෙකු පාවිච්චි කරපු SIM එකක්. එහෙනම්, මේකත් අපි link කර ගන්න ඕනෑ; මේක නිවැරදි ක්‍රමවේදයකට හැදෙන්න ඕනෑ. SIM කාඩ්පත් නිකුත් කරනකොට ඒ ආයතන මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. SIM එකක් මොකක් හරි හේතුවක් නිසා වීසි කර දාලා වෙනත් SIM එකක් මිලදී ගන්න කටයුතු කරනවා නම් ඒක වැරැද්දක්. SIM නිකුත් කරන මොකක් හරි ආයතනයකින් Identity Card එකට SIM එකක් නිකුත් කළාට පස්සේ ඒ SIM එකටම වෙන වෙන packages එකතු කර ගන්න - add කර ගන්න - වාගේම අයින් කර ගන්නත් පුළුවන්කම තිබෙන්න ඕනෑ. එහෙම නැතිව එක SIM එකක් විසි කරලා, තවත් SIM එකක් ගන්නවා කියන එක ප්‍රශ්නයක්. SIM එකක් ඒවා නිකුත් කරන ඕනෑම ආයතනයකින් මිලදී ගන්න පුළුවන්. හැබැයි, එක SIM එකකට ඒ පහසුකම් සියල්ල එකතු කර ගන්න පුළුවන් වන විධියේ ක්‍රමවේදයක් හදන්න ඕනෑ. විශේෂයෙන්ම කවුරුන් හෝ කෙනෙක් මිය ගියොත් ඒ බව දැනගන්න link එකක් හැදෙන්න ඕනෑ. SIM එකක් පාවිච්චි කරපු කවුරු හරි කෙනෙක් මිය ගියොත් ඒ පුද්ගලයා මිය ගියා කියලා ඒ SIM එක නිකුත් කරපු ආයතනය දැනුවත් කරන්නත් අවශ්‍යයි. පුළුවන් තරම් ඒ SIM නිකුත් කරන ආයතන සමඟ අපි සම්බන්ධතාවක් ඇති කර ගන්න ඕනෑ. ඒක විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් කරන්න ඕනෑ දෙයක්. මෙවා දැන් link කරන ක්‍රමවේදයක් අපි හදන්න ඕනෑ. ලෝකය ගමන් කරන දිසාවට අපිත් දැන් යන්න ඕනෑ. එහෙම නැතිව මේ වැඩේ කරන්න බැහැ. ඒ නිසා මේ කාරණය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම සිතාසි ලබා දුන්නත් ඊට අදාළ පුද්ගලයන් නඩු වාරයට එන්නේ නැහැ. ඒ ප්‍රශ්නය ගොඩක් දුරට දකින්න තිබෙනවා නේ. අපිට දැන් නීතිඥ මහත්වරු කියන්නෙත් e-mail විධියට, WhatsApp විධියට සිතාසිය එවන්න system එකක් ක්‍රියාත්මක කරන්න පුළුවන් කියායි. දැන් නීතිඥ මහත්වරුන්ටත් ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, සමහර නඩු විභාග කළත් ඒකේ report එක ගන්න නම් එම සටහන් ටයිප් කරලා එනතුරු ඉන්න වෙනවා. අපිට පුළුවන් වෙන්න ඕනෑ, ඩිජිටල්කරණය තුළින් මේ කටයුතු සාර්ථක කර ගන්න. තවමත් සටහන් ටයිප් කරන system එකක් අනුගමනය කරන අපි ලෝකයත් එක්ක බැලුවාම ගොඩක් පිටුපසින් ඉන්නේ. එහෙම නැතිව ඒ අදාළ අධිකරණයෙන් ඔවුන්ට ඒ සටහන් e-mail කරන system එකක්, WhatsApp කරන system එකක් හදා ගන්න පුළුවන් නම් හොඳයි. එතකොට මුදලක් අය කරලා ඒ සටහන් ලබා ගන්න පුළුවන්. එතකොට නීතිඥ මහත්වරුන්ට අවශ්‍ය කටයුතු කර ගන්න පුළුවන්.

උසාවි ඩිජිටල්කරණය කළ යුතුමයි. ඒ වාගේම පොලීසිය වාගේ ආයතන එකතු කරගෙන මේ කටයුත්ත කරන්න ඕනෑ. එමෙන්ම උසාවිවල සේවය කරන නීතිඥවරුන්ටත් සටහන් ටික ලබා දෙන ක්‍රමවේදය සාමාන්‍ය ක්‍රමයකට හදන්න ඕනෑ. එහෙම නැති වුණොත් අපේ රට තවත් පසුපසට යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුවට, රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යවන documents ටික ගන්න විශාල කාලයක් - සමහර විට අවුරුදු දෙකක්, තුනක්, හතරක් පමණ - ගත වෙනවා. සමහර අයගේ නිර්දෝෂීභාවය ඔප්පු කරන්න රස පරීක්ෂක වාර්තාව එනකල් බලාගෙන ඉන්න වෙනවා. හැබැයි, ඒ රස පරීක්ෂක වාර්තාව එනතුරු ඔහුට විදේශගත වෙන්න බැහැ, හදිසියේ police report එකක් ගන්න බැහැ. Police report එක කියන්නේ ඉතාම වැදගත් දෙයක්. හැම දෙයටම police report එක අවශ්‍ය වෙනවා. නිර්දෝෂී කෙනෙක් වුණත් මොකක් හරි දෙයකට පැටලුණොත්, සමහර වෙලාවට ඒ documents එනකල් ඔහුට ගොඩක් කල් බලාගෙන ඉන්න වෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවෙන් documents එවීමේ පරක්කුව නිසා ඔවුන් ප්‍රශ්න ගොඩකට මැදි වෙනවා.

රස පරීක්ෂක වාර්තාවල තත්ත්වයත් ඒ විධියම තමයි. කිලෝ පහකට වැඩි ගංජා ප්‍රමාණයක් හමුවුණොත් ඒකත් රස පරීක්ෂකට යවනවා. කසිප්පු බෝතලයක් අහුවුණොත් ඒකත් රස පරීක්ෂක වෙත යවන්න වෙනවා. රස පරීක්ෂකට යවලා ඒ වාර්තාව එන්න විශාල කාලයක් ගත වෙනවා. එතැනත් ලොකු වගකීමක් තිබෙනවා. අධිකරණවල නඩු භාණ්ඩ කොච්චර තිබෙනවාද, රස පරීක්ෂකට යවන්න. එවැනි නඩු භාණ්ඩ විශාල ප්‍රමාණයක් අධිකරණවල තිබෙනවා. ඒ අඩුපාඩු දැන් ටික ටික හදාගෙන යනවා. ඇත්තටම ඒක වැදගත්. මේ වනකොට ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලය ඒ වෙනුවෙන් ලොකු වැඩ කොටසක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒක විශේෂ දෙයක්.

Traffic නඩු පිළිබඳවත් මම මේ අවස්ථාවේදී කථා කරන්න කැමතියි. මම දවසක් අපේ ගරු රමේෂ් පතිරණ අමාත්‍යතුමා එක්ක කථා කරමින් ඉන්නකොට, ඒ ස්ථානයට DIG, traffic ආවා. එතුමා තමයි ලංකාවේම ඒ කටයුත්ත භාරව ඉන්නේ. අපි කථා කර කර ඉන්නකොට එතුමා කිව්වා, මාර්ග අනතුරුවලින් දවසකට හත්දෙනෙක් විතර මිය යනවා, රෝහල්ගත වෙන අය අවුරුදු ගණනක් තිස්සේ රෝහල්ගත වෙලාම ඉන්නවා කියලා. සමහර අය accident එකක් වුණාට පසුව මාස තුන, හතර රෝහල්ගත වෙලා ඉන්නවා. එතකොට ඒ පුද්ගලයා වෙනුවෙන් කොච්චර මුදලක් වියදම් වෙනවාද? ඒ bed එක මාස තුන, හතරකට වෙන ලෙඩෙකුට ගන්න බැහැ. සමහර වෙලාවට ඒ අය අවුරුදු ගණනක් රෝහල්ගත වෙලා ඉන්නවා. ඒ සඳහා විශාල මුදලක් වියදම් වෙනවා. යුද්ධයකදී මිය යන ප්‍රමාණයටත් වඩා වැඩි ප්‍රමාණයක් මේ මාර්ග අනතුරු නිසා මිය යනවා. ඒ නිසා මේ මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් නීති හදන්න ඕනෑ. නීති තිබෙනවා. හැබැයි, ඒවා ක්‍රියාත්මක කළ යුතුයි.

පසුගිය කාලයේ රූපවාහිනී නාළිකාවක නිවුස්වල "දවසේ වැරැද්ද" කියලා එකක් විනාඩියක් විතර පළ වුණා. අඩුම වශයෙන් එහෙම දේවල් පළ කිරීම තුළින්වත් මිනිස්සු කරන මේ වැරදි නවත්වා ගත්තොත්, මාර්ග අනතුරු රාශියක් අපට නවත්වා ගන්න පුළුවන් වේවි.

ඒ වාගේම රියදුරන්ගේ නොසැලකිලිමත්භාවය නිසා අහිංසක මිනිස්සු ගොඩක් මිය යනවා. සමහර වෙලාවට මිනිස්සු හප්පලා දාලාත් යනවා. එවැනි දේවල් වෙනුවෙන් නීති ක්‍රියාත්මක කරන්න ඕනෑ. අනතුරක් සිදු වුණාම රජයෙන් -සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්- ඒ රෝගීන් සඳහා කොච්චර මුදලක් වියදම් කරනවාද? මෙවැනි අනවශ්‍ය වියදම් අපි නැවැත්විය යුතුයි. මේ කාරණය ගැනත් විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
(මාණ්පුමිකු (මේජර්) සුදර්ෂන තෙනිපිටිය)
(The Hon. (Major) Sudarshana Denipitiya)
මට ගොඩක් දේවල් කථා කරන්න තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. නමුත් මට නියමිත කාලය අවසන් නිසා මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්.

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා මේ වෙනකොට අවශ්‍ය පනත් සංශෝධනය කරමින්, අවුරුදු ගණනක් පරණ පනත් යාවත්කාලීන කිරීමත් කරගෙන යනවා. ඒක ඉතාම වැදගත් කටයුත්තක්. එතුමා කරන ඒ ක්‍රියාවලිය වෙනුවෙන් අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. යම්කිසි මට්ටමකට නීතිය මේ රටේ ක්‍රියාත්මක කරලා, මේ ආකාරයෙන් ක්‍රියා කළොත් මේ රටින් විනයගරුක පරපුරක් බිහි කරන්න අනාගතයේදී හැකි වෙයි. ඒ කටයුත්ත කිරීම සඳහා එතුමාට ශක්තිය හා ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

මට කථා කරන්න කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතරක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු තනාතිපති චට්ටත්තරණි (කලානිති) විජයතාස ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (MRS.) KOKILA GUNAWARDENE left the Chair and THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA took the Chair.

[பி.ப. 4.33]

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாட்டிலே இருக்கின்ற, காலத்துக்குப் பொருந்தாத சட்டங்களை இன்றைய காலகட்டத்திற்கு ஏற்றவாறு மறுசீரமைத்து, அது தொடர்பான திருத்தங்களை இந்த அவையிலே கௌரவ நீதியமைச்சர் விஜயதாஸ ராஜபக்ஷ அவர்கள் முன்வைத்துக் கொண்டு வருகின்ற இந்த நேரத்திலே, இந்த நாட்டில் 200 வருடங்கள் கடந்து வாழ்ந்து வருகின்ற மலையகச் சமூகம், இந்த நாட்டினுடைய அனைத்துச் சட்டங்களின் பலாபலன்களையும் ஏனைய சமூகத்தினருக்குச் சமனாக அடைந்துகொள்ள முடியாத நிலைமைக்குத் தள்ளப்பட்டிருக்கின்ற ஒரு சமூகமாகக் காணப்படுகின்றது. எனக்கு ஒதுக்கப்பட்டிருக்கின்ற இந்தக் குறுகிய நேரத்திலே, கடந்த வாரம் இந்த அரசாங்கத்தினால் முன்வைக்கப்பட்ட ஓர் அமைச்சரவைப் பத்திரம் தொடர்பாக இங்கே நான் குறிப்பிட வேண்டிய ஒரு தேவைப்பாடு காணப்படுகின்றது.

எங்களுடைய பெருந்தோட்ட மக்கள் இங்கு குடியேறி 200 வருடங்கள் கடந்தும் இன்றும் ஓர் அவல வாழ்க்கையை வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். இன்றைய காலகட்டத்திலே உலகிலே எங்கும் காண முடியாத 'லயன்' அறைகளைத் தங்களுடைய வதிவிடங்களாகக் கொண்டிருக்கக்கூடிய மக்களாக அவர்கள் இருப்பது வருத்தத்திற்குரிய ஒரு விடயமாக இருக்கின்றது. இந்நிலையில், அரசாங்கமானது இன்று அரசாங்கத் தரப்பிலுள்ள மலையகப் பிரதிநிதிகளையும் மலையக அமைச்சரையும் ஒன்றிணைத்துக்கொண்டு, இந்த மக்களை இன்னும் 2 - 3 தசாப்த காலங்களுக்கு அல்லது இன்னும் 2 - 3 தலைமுறைக்கு அதே 'லயன்' அறை களுக்குள்ளேயே முடக்கி, அவர்களது காணி உரிமையை இல்லாதொழிக்கும் ஒரு முன்னேற்பாடாக ஒரு முன்மொழி வினை அமைச்சரவையிலே சமர்ப்பித்திருக்கின்றது. குறிப்பாக, "பெருந்தோட்டத் துறையில் புதிய குடியேற்றக் கிராமங்களை உருவாக்குதல்" என்று கொண்டுவரப்பட்டிருக்கின்ற குறித்த அமைச்சரவைப் பத்திரத்தின் பின்னணிக் குறிப்பில் (1), (2)

[ගරු වේලු කුමාර් මහතා]

[பி.ப. 4.38]

என இலக்கமிடப்பட்ட குறிப்புகளில், "பெருந்தோட்டப் பகுதிகளில் தற்போது காணப்படும் பெருந்தோட்ட வீட்டுக் குடியிருப்புகள் மற்றும் வரிசை - line - அறைகள் ஆகியன ஒன்று சேர்க்கப்பட்டு, வரையறுக்கப்பட்ட எல்லைகள் மற்றும் ஏனைய தொடர்புடைய அம்சங்களுடன் நாட்டிலுள்ள பாரம்பரியக் கிராமங்களைப் போன்று கிராமங்களாக மாற்றப்படும்" எனக் குறிப்பிடப்பட்டிருக்கின்றது. மிகத் தெளிவாகத் தொிகின்ற வகையில், இன்று அந்த மக்கள் இருக்கின்ற line அறைகளை ஒன்றிணைத்து, அவற்றைக் கிராமங்கள் எனப் பெயரிடுவதென்ற அடிப்படையில் அந்த அமைச்சரவைப் பத்திரத்தை இந்த அரசாங்கம் கொண்டுவந்திருப்பது வெட்கக்கேடானதாக இருக்கின்றது. அந்த மக்களின் வாக்குகளைப் பெற்று மலையகப் பிரதிநிதிகளாக இந்த அவைக்கு வந்தவர்கள், அத்தகைய ஓர் அரசாங்கத்திலே பங்காளிகளாகவும் 'கபினெட்' அமைச்சராகவும் இருந்துகொண்டு இந்த அமைச்சரவைப் பத்திரத்திற்கு ஆதரவு தெரிவிக்கின்றார்கள் என்றால், இது முழுமொத்தச் சமூகத்திற்கும் செய்யப்படுகின்ற துரோகம் என்பதை இந்தச் சபையிலே சொல்லவேண்டியிருக்கின்றது. அதுமட்டுமல்ல, இ.தொ.கா.வினது 50 ஆண்டுகால அரசியல் முதிர்ச்சிக் காலப்பகுதியிலே, மலையத்தில் இருக்கின்ற 'லயன்'களைக் கிராமமாக மாற்றுவதென்ற ஆலோசனைக்கு அவர்கள் இரு கைகளையும் தூக்கி ஆதரவளிப்பவர்களாக இருந்தால், ஒன்றில் அவர்கள் குருடர்களாக இருக்க வேண்டும் அல்லது செவிடர்களாக இருக்க வேண்டும் அல்லது அரை லூசுத்தனம் உடையவர்களாக இருக்க வேண்டும். இதற்குமேல் அவர்கள் தொடர்பாக வேறெதுவும் சொல்வதற்கு இல்லை.

இந்த ஆண்டுக்கான பாதீடு சமர்ப்பிக்கப்பட்டபோது, "04 பில்லியனை - 4,000 மில்லியனை - 400 கோடி ரூபாயை மலையகப் பிரதேசத்தில் இருக்கின்ற மக்களினது குடியிருப் புகளுக்கான நில உரிமையினை வழங்குவதற்காக ஒதுக்கி யிருக்கிறோம்" என்று சொன்னார்கள். இந்த ஆண்டு நிறைவடைவதற்கு இன்னும் சில மாதங்கள்தான் இருக் கின்றது. இந்தக் காலப்பகுதியில் முழு மலையகத்திலும் - முழுப் பெருந்தோட்டப் பகுதிகளிலும் - எங்காவது ஒரு பகுதி நிலம் அளவை செய்யப்பட்டு அதற்கான உறுதிப்பத்திரம் வழங்கப்பட்டிருக்கின்றதா? என்பதைக் கௌரவ அமைச்சர் அவர்கள் இந்தச் சபையில் சொல்ல வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன். அதைவிட, இப்போது JEDB, SPC போன்றவற்றின் ETF, EPF பிரச்சினைக்கு 5,000 மில்லியன் ரூபாய் - 500 கோடி ரூபாய் - பணம் ஒதுக்கியிருப்பதாக, மில்லியனுக்கு வரவேண்டிய இலக்கங்கள் சரியாகத் தெரியாத சிறுபிள்ளைபோல இங்கு கூவிக்கொண்டு இருப்பதை நிறுத்திவிட்டு, உண்மையாகவே மலையக மக்களுக்கான காணி உரிமையைப் பெற்றுக் கொடுப்பதற்கு உதவுங்கள்! அல்லது அந்தக் காணி உரிமை பறிபோவதற்கு, அதனை இல்லாமல் ஒழிப்பதற்குத் துணைபோகாமல், மலையக மக்களுக்குத் துரோகம் செய்யாமல் ஓரமாக ஒதுங்கிக் கொள்ளுங்கள்! என்பதை நான் இந்த இடத்திலே பதிவு செய்கின்றேன்.

நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. M. Udayakumar. You have four minutes.

ගරු එම්. උදයකුමාර් මහතා
(மாண்புமிகு எம். உதயகுமார்)
(The Hon. M. Udayakumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசின் அரசியல் யாப்பானது இன்று தமது தேவைக்கேற்பத் தலையைத் திருகிக்கொள்ளும் ஒரு wind பொம்மையாக மாறியிருக்கிறது. இங்கு மாறிமாறி ஆட்சிக்கு வருபவர்கள் அதனைத் தங்களுடைய தேவைக்கேற்ப மாற்றியமைத்துக்கொண்டு இருக்கிறார்கள். இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசின் 1978ஆம் ஆண்டின் அரசியலமைப்பானது தற்போது 22ஆவது தடவையாகத் திருத்தப்படவிருக்கிறது. அதாவது, 46 வருடங்களிலே அது 21 தடவை திருத்தப்பட்டிருக்கின்றது. முன்னாள் ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களின் ஆட்சிக் காலத்திலே முன்வைக்கப்பட்ட அரசியலமைப்பின் 17ஆவது திருத்தச் சட்டம் மட்டும்தான் ஆட்சி அதிகாரத்தைக் குறைப்பதாக அமைந்தது. அதற்குப் பின்னரான அரசியலமைப்புத் திருத்தங்கள் அனைத்துமே ஆட்சி அதிகாரத்தை அதிகரிக்கும் வகையில்தான் அமைந்திருந்தது.

அந்த வகையில், தற்போது மாண்புமிகு ஜனாதிபதி அவர்கள் அரசியலமைப்பின் 22ஆவது திருத்தச் சட்டம் தொடர்பில் வர்த்தமானியில் அறிவித்துள்ளார். ஜனாதிபதி தேர்தல் ஒன்று நடப்பதற்கான ஆயத்தங்கள் முன்னெடுக் கப்படும் இக்காலத்திலே இவ்வகையானதொரு திருத்தம் தேவையா? என்று நாங்கள் கேட்க விரும்புகின்றோம். குறிப்பாக, எமது நாட்டின் கௌரவ நீதி அமைச்சர் அவர்கள் குறித்த வர்த்தமானி அறிவித்தலை வெளியிடுவதற்கு மறுக்கும்போது - தயங்கும்போது, நிறைவேற்று அதிகாரத் தைப் பயன்படுத்தி மாண்புமிகு ஜனாதிபதி அவர்கள் குறித்த வர்த்தமானி அறிவித்தலை வெளியிட்டது மிகவும் கவலைக்குரியதொரு விடயம் என்பது மட்டுமல்லாது அதனை அவர் வலுக்கட்டாயமாக வெளியிட்டிருக்கின்றார். குறித்த வர்த்தமானி அறிவித்தல் ஊடாக ஜனாதிபதித் தேர்தல் நடைபெறுவதற்கு எந்தவிதத் தடையும் இல்லை, அதனால் எந்தவிதத் தீங்குமில்லை என்று கூறினாலும், அதனை நாங்கள் நம்பக்கூடியதாக இல்லை. காரணம், நமது நாட்டின் அரசியல் வரலாறு அவ்வாறானதாகும்.

குறிப்பாக, அரசியலமைப்பின் 13ஆவது திருத்தச் சட்டத்தினூடாக மாகாண சபைகளுக்குப் பொலிஸ் அதிகாரம் மற்றும் காணி அதிகாரம் வழங்கப்பட்டு, இந்த நாட்டில் புரையோடிப்போயிருக்கும் இனப்பிரச்சினைக்குத் தீர்வு காணப்படும் என்று ஆட்சியாளர்கள் மற்றும் தலைவர்கள் எல்லோரும் கூறியிருந்தார்கள். ஆனால், அதனைச் செய்யாமல், தற்போது சட்டரீதியாக அதற்கு முழுக்குப் போட்டு, மாகாண சபையை முடக்கி வைத்திருக்கின்றார்கள். தற்போது, 13உம் இல்லை, 13+உம் இல்லை; மாகாண சபையும் இல்லை; அதுவுமில்லை, இதுவுமில்லை, எதுவுமே இல்லை என்றதொரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. அதுமட்டுமல்ல, தற்போது உள்ளூராட்சிச் சபைகளுக்கும் அதே நிலைமைதான் ஏற்பட்டிருக்கின்றது. உள்ளூராட்சிச் சபைத் தேர்தலுக்காக வேட்பு மனுக்கள் கோரப்பட்டு, வேட்பு மனுக்கள் தாக்கல் செய்யப்பட்டு, பிரசாரங்கள் முன்னெடுக் கப்பட்டு, இறுதியாக தபால்மூல வாக்களிப்பு நடைபெறவிருந்த நேரத்தில் அந்தத் தேர்தல் முடக்கப் பட்டிருந்தது. இதே நிலைமைதான் தற்போது ஜனாதிபதி தேர்தலுக்கும் நடக்குமா? என்ற நிலை ஏற்பட்டிருக்கின்றது. குறிப்பாக, இதில் விசேட அம்சம் என்னவென்றால்,

உள்ளூராட்சிச் சபைத் தேர்தல்கள் நடத்தப்படாமைக்கும் ஜனாதிபதித் தேர்தலை ஒத்திவைக்கும் முயற்சிக்கும் காரணம் தற்போதைய ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள்தான் என்பதுதான். ஆனால், அவர்தான் கடந்த காலங்களில் 13ஆவது திருத்தச் சட்டம் மற்றும் ஜனநாயகம் பற்றி அதிகமாகப் பேசியவர். அவ்வாறான ஒருவர் தேர்தல்களுக்கு முழுக்குப் போடுவதென்பது யாராலும் ஏற்றுக்கொள்ள முடியாதவொரு விடயமாகும். எனவே, உரிய நேரத்தில் ஜனாதிபதி தேர்தல் நடாத்தப்பட்டு, மக்களின் கைகளில் அதிகாரம் வழங்கப்பட்டு, அடுத்த ஐந்து வருடங்கள் யார் இந்த நாட்டை ஆட்சி செய்யப் போகின்றார்கள்? என்று அவர்கள் தீர்மானிக்க வேண்டும். அதற்குப் பிறகு அரசியலமைப்பில் திருத்தங்களையோ, மாற்றங்களையோ செய்யலாம் என்று நான் கூறிக் கொள்கின்றேன்.

நான் இங்கு மேலும் ஒரு விடயத்தைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். அதாவது, நாட்டில் இவ்வாறான பிரச்சினைகள் இருக்கும்போது, பெருந்தோட்ட மக்களின் பிரச்சினைகள் அடிக்கடி மூடிமறைக்கப்படுவதோடு, அவை திசை திருப்பப்படுகின்றன. அது இங்கு வழமையாக மாறி விட்டது. குறிப்பாக, இன்று பெருந்தோட்டத் தொழிலாளர்கள் பல்வேறு விதமான இன்னல்களுக்கு முகங்கொடுத்துக் கொண்டு இருக்கின்றார்கள். ஆனால், 'ஆசை காட்டி மோசம் செய்வதுபோல' பெருந்தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 ரூபாய் நாட்சம்பளம் என்று ஆசை காட்டிய இதே அரசாங்கம் இப்பொழுது இந்த மக்களை ஏமாற்றி மோசம் செய்திருக்கிறது.

அதாவது, சம்பள உயர்வுப் பிரச்சினையிலிருந்து மக்களைத் திசைதிருப்புவதற்காகத் தோட்ட 'லயன்'களைப் புதிய கிராமங்களாக அறிவிக்கும் ஒரு கின்னஸ் சாதனைத் திட்டத்தை அரசாங்கம் தற்போது முன்வைத்திருக்கின்றது. உலகிலே எந்த இடத்திலும் நடக்காத ஒரு திட்டம்தான் இது. அதனால்தான் இதை நாங்கள் கின்னஸ் சாதனைத் திட்டமென்று கூறவேண்டிய நிலைமையேற்பட்டிருக்கின்றது. அதாவது, 200 வருடப் பழைமை வாய்ந்த 'லயன்' அறைகளை அப்படியே வைத்துக்கொண்டு, அதில் எந்த மாற்றங்களோ, திருத்தங்களோ செய்யாமல், அதனைக் கிராமங்களாக அறிவிப்பது நவீன உலகத்திலே மிகப்பெரிய ஓர் ஏமாற்றுத் திட்டம்! மோசடித் திட்டம்! அதாவது, 'தோட்டம்' அல்லது 'லயன்' என்ற வார்த்தையை 'கிராமம்' என்ற வார்த்தையாக மட்டும் மாற்றிவிட்டு, இது கிராமம் என்று கூறுவதை எந்தவகையில் ஏற்றுக்கொள்ளமுடியும்? இது வெறுமனே ஒரு வார்த்தை மாற்றம் மட்டும்தான். எமது மக்களைப் பொறுத்தவரை, அவர்களுக்குத் தேவை வாழ்க்கை மாற்றமேயொழிய, வார்த்தை மாற்றமல்ல என்பதை மீண்டும் ஒருமுறை இந்த உயரிய சபையிலே நான் கூறிக்கொள்ள விரும்புகின்றேன். இதுவோர் ஏமாற்று வித்தை என்பது மட்டுமல்லாமல் இதனை நடைமுறைப்படுத்துவதற்கு மலையக மக்களும் சரி, மக்கள் பிரதிநிதிகள் என்ற வகையிலே நாங்களும் சரி, ஒருபோதும் இடமளிக்கமாட்டோம், இதனை ஏற்றுக்கொள்ளமாட்டோம் என்பதைக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

எமது மக்களுக்குத் தேவை காணி உரிமை! வீட்டு உரிமை! அது அவர்களின் அடிப்படை உரிமை! 200 வருடங்களாக இதற்காகத்தான் அவர்கள் ஏங்கிக் கொண்டிருக்கிறார்கள். இதனை மழுங்கடிக்கும் வகையிலே அல்லது இதனைக் குழி தோண்டிப் புதைக்கும் வகையிலே இந்தத் திட்டம் கொண்டு வரப்பட்டுள்ளது. இதனை மழுங்கடிப்பதற்கு ஜனாதிபதி அவர்களும் அவருடன் கூட்டுச் சேர்ந்திருக்கும் சிலரும் மேற்கொள்ளும் நடவடிக்கைகளை ஏற்றுக்கொள்ள முடியாது. உண்மையிலே தற்போதைய ஜனாதிபதி ஒரு ஜனநாயகவாதி! மலையக மக்களின் பிரச்சினையை நன்கு தெரிந்தவர். அவர் யாரோ ஒருவரின் வலையிலே விழுந்துவிட்டார் என்றுதான் நினைக்கின்றேன். ஆகவே, இந்தத் திட்டத்தை உடனடியாக மறுபரிசீலனை செய்வதோடு, இதனை நிராகரிக்க வேண்டு மென்று கேட்டுக்கொண்டு, சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்து, எனது உரையை நிறைவு செய்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Selvarajah Kajendren. You have four minutes.

[பி.ப. 4.43]

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நீதித்துறைச் சட்டத்தின்கீழான ஒழுங்கு விதிகள் தொடர்பான விவாதம் இங்கே நடைபெற்றுக் கொண்டிருக்கின்றது. கௌரவ நீதி அமைச்சர் அவர்களும் இங்கே இருக்கின்றார். சட்டத் திருத்தங்கள் என்று வருகின்றபோது, உண்மையிலே நீங்கள் இந்த நாட்டில் முக்கியம் என்று கருதுகின்ற திருத்தங்களைச் செய்திருக் கின்றீர்கள். ஆனால், எங்களைப் பொறுத்தவரையிலே இந்த நாட்டினுடைய தமிழ்த் தேசத்துக் குடிமகனாக, எங்களுடைய அரசியல் இயக்கமான தமிழ்த் தேசிய மக்கள் முன்னணி சார்பாக நான் உங்களிடம் இந்த வேளையில் மிகவும் விநயமாக ஒரு வேண்டுகோளை விடுக்கின்றேன்.

பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்ட இளைஞர்கள் நீண்டகாலமாகச் சிறைகளிலே தடுத்து வைக்கப் பட்டிருக்கின்றார்கள். அவர்களில் 11 பேர் கிட்டத்தட்ட 15 முதல் 29 வருடங்களாகச் சிறைகளிலே வாடிக்கொண்டிருக்கின் றார்கள். அவர்களிலே சண்முகலிங்கம் சூரியகுமார், ஆனந்த சுதாகரன், தங்கவேல் நிமலன், உமர் கத்தாப், இராமச்சந்திரன் மற்றும் கெலன் வெலன்ரினோ ஆகியோர் தண்டனைக் கைதிகளாக இருக்கிறார்கள். இவர்களில் சிவகுமார் மற்றும் பார்த்திபன் ஆகிய இருவரும் 29 வருடங்களாகச் சிறையிலே இருக்கிறார்கள். அதுபோல், விளக்கமறியல் கைதிகளாக நடேசன் குகதாசன், தம்பிஐயா பிரகாஷ், செல்வராசா கிருபாகரன் ஆகியோர் 15 வருடங்களாகத் தடுத்து வைக்கப் பட்டிருக்கிறார்கள். இன்றைய தினமும் நாங்கள் அவர்களைச் சந்தித்திருந்தோம். அவர்களுடைய எதிர்பார்ப்பு, தங்களைப் பொது மன்னிப்பில் விடுதலை செய்ய வேண்டும் அல்லது பிணை வழங்கி விடுதலை செய்யவேண்டும் என்பதாக இருக்கின்றது. ஆகவே, தயதுசெய்து இவர்களை விடுதலை செய்வதற்கு உடனடியாக நடவடிக்கையெடுக்க வேண்டும்.

இன்று இனங்களுக்கிடையே பாரிய விரிசல் ஏற்பட்டிருக் கின்றது. இன்று நீங்கள் உங்களுடைய உரையிலே 41 வருடங்களுக்கு முன்னர் நடைபெற்ற 'கறுப்பு யூலை' கலவரத் திற்காக மன்னிப்புக் கோரியிருக்கின்றீர்கள். அதிலிருந்து நீங்கள் அது இந்த நாட்டிலே பாரிய ஒரு பாதிப்பை ஏற்படுத்தியிருக்கின்றது என்பதை ஏற்றுக்கொண்டிருக் கின்றீர்கள். அந்த வகையில் பார்த்தால் 99 சதவீதமான தமிழ் இளைஞர்கள் யூலை படுகொலை காரணமாகத்தான் ஆயுதமேந்தினார்கள். ஒரு பூனையை ஓர் அறைக்குள் விட்டு அடித்துக்கொல்ல முயன்றால் அந்தப் பூனை தன்னைத் தாக் குபவரை எவ்வாறேனும் தாக்கவேண்டுமென்று முயற்சிப்பது

[ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා]

போன்றுதான் எங்களுடைய நிலைமை இருந்தது. எங்களுடைய மூத்தவர்கள் - எங்களுடைய அண்ணன்மார், அக்காமார் - வேறு வழியில்லாமல்தான் அந்தப் போராட்டத்திலே இணைந்துகொண்டார்கள். நான் சிறுவனாக இருந்த காலத்திலே பெருமளவான தாய், தந்தையர் தங்களுடைய பிள்ளைகள் அவர்களிடம் அகப்பட்டால் என்ன நடக்குமோ என்ற பயம் காரணமாக, "நீங்கள் இயக்கத்திற்குப் போங்கள்!" என்று சொல்லி அனுப்பிவைத்தார்கள். குறிப்பாக, ஜே.ஆர். ஜயவர்தன அவர்கள் ஜனாதிபதியாக இருந்த காலப்பகுதியிலே திட்டமிட்ட ரீதியிலே organize பண்ணப்பட்டு வாகனங்களில் ஏற்றிக்கொண்டு செல்லப்பட்ட பெரும்பான்மையினச் சமூகத் தைச் சேர்ந்த 'காடையர்கள்' என்று சொல்லப்படுகின்றவர்கள் இவ்வாறான படுகொலைகளை மேற்கொண்டனர். குறிப்பாக, கொழும்பு போன்ற இடங்களிலே தமிழர்கள், சிங்களவர்கள், முஸ்லிம்கள் ஒன்றாக வாழ்ந்துகொண்டிருந்த வீட்டுத்தொகுதிகளிலே தமிழர்கள் அடையாளப்படுத்தப்பட்டு, அவர்களுடைய வீடுகள் உடைக்கப்பட்டு, பெண்கள் வல்லுறவுக்கு உள்ளாக்கப்பட்டு, சொத்துகள் கொள்ளையடிக்கப்பட்டு, படுகொலைகள் இடம்பெற்றன. இந்த அரசினுடைய திட்டமிட்ட செயற்பாடுகளால்தான் நாங்கள் அன்று ஆயுதப் போராட்டத்தைத் தொடங்கவேண்டி வந்தது. எனவே, இந்த நாட்டிலுள்ள பயங்கரவாதத் தடைச் சட்டம் நீக்கப்பட வேண்டும். இதுவரை தமிழ் மக்களுக்கு இழைக்கப்பட்ட தவறுகளுக்குப் பிராயச்சித்தம் வேண்டும்; தவறிழைத்தவர்கள் தண்டிக்கப்பட வேண்டும்.

நாங்கள் இத்தீவிலே ஒரு தேசத்திற்குரியவர்களாக வாழ்ந்து வருகின்றோம்; எங்களை நாங்களே ஆட்சி செய்திருக்கிறோம். அதனால், எங்களுடைய தேசம் அங்கீகரிக்கப்பட வேண்டும். எங்களுடைய மக்களின் சுயநிர்ணய உரிமை அங்கீகரிக்கப்பட வேண்டும். அந்த அடிப்படையில், ஒரு சமஷ்டி அரசியல மைப்பைக் கொண்டுவர வேண்டும். இலங்கை அரசுகள் செய்த தவறுகள் காரணமாக நாங்கள் அன்று ஆயுதம் ஏந்த வேண்டியதொரு சூழல் ஏற்பட்டிருந்தது. அதனைக் கட்டுப்படுத்துவதற்காகப் பயங்கரவாதத் தடைச் சட்டம் கொண்டுவரப்பட்டது. அந்தச் சட்டமானது எங்களுடைய சமூகத்தை மிகக் கர்ணகடூரமாக அழித்திருக்கின்றது. ஆகவே, அரசு இந்தத் தவறுகளை ஒப்புக்கொண்டு குறித்த பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்கி, எங்களுடைய அரசியல் உரிமைகளை அங்கீகரிக்கின்ற அதேநேரத்தில் தவறு இழைத்தவர்களுக்குத் தண்டனை வழங்குவதற்கும் முன்வர வேண்டும். நாங்கள் சிங்கள மக்களோடும் சிங்கள தேசத்தோடும் சேர்ந்து வாழ விரும்புகின்றோம். நாங்கள் எல்லோரும் ஐக்கியமாக இந்த நாட்டைக் கட்டியெழுப்புவதற்கு விரும்புகின்றோம். அதுதான் இந்தத் தேசத்திற்காக - இந்த ஐக்கிய நாட்டிற்காக - நீங்கள் செய்யும் மிகப்பெரிய தியாகமாக இருக்குமென நான் நினைக்கின்றேன். ஆகவே, அரசு அதனைச் செய்யவேண்டுமென நான் இச்சந்தர்ப்பத்தில் விநயமாக வேண்டிக்கொள்ள விரும்புகின்றேன். நாங்கள் இந்தக் கோரிக்கைகளை மிகப் பொறுப்புணர்வோடு முன்வைக்கின்றோம்.

இன்று நாட்டில் யுத்தம் முடிவடைந்து 15 வருடங்கள் கடந்துவிட்டன. அன்று ஆயிரக்கணக்கான தமிழ் இளைஞர்கள், யுவதிகள் விடுதலைப் போராட்டத்தில் இணைந்து கொண்டார்கள். எங்களுடைய தமிழ்ச் சமூக மக்கள் - சாதாரண பாமர மக்களாக இருக்கலாம் அல்லது படித்தவர்களாக இருக்கலாம் - மிகுந்த ஆற்றலும் ஆளுமையும் மிக்கவர்கள். அதனை நீங்கள் வெளிப்படையாக ஒத்துக்கொள்ள முடியாவிட்டாலும் உங்களுடைய மனச்சாட்சி உங்களுக்கு ஒப்புக்கொடுக்கும் என்று நான் நினைக்கின்றேன். அவ்வாறான ஆற்றல் மிக்கவர்கள் 2009இல் போர் முடிந்த பிற்பாடு அரசியல் ரீதியாக எங்களுடைய சமூகத்தின் முன்னேற்றத்திற்குப் பங்களிக்க முடியாதவர்களாக இருக்கி றார்கள். ஏனென்றால், இந்த நாட்டில் கொடிய பயங்கரவாதத் தடைச் சட்டம் நடைமுறையில் இருப்பதனால். The Cream of the society என்று சொல்லக்கூடிய பெருமளவான இளைஞர்கள், யுவதிகள் அந்தப் போராட்டத்தில் இணைந்து கொண்டு தங்களை அர்ப்பணித்திருந்தார்கள். அவர்கள் இன்று அரசியல் ரீதியாகத் தேசத்தின் முன்னேற்றத்தில் பங்கெடுக்கக் கூடியவர்களாக இருக்கின்றபோதும், நாட்டிலுள்ள பயங்கர வாதத் தடைச்சட்டத்தின் காரணமாக அவர்கள் அவ்வாறு பங்குகொள்ள முடியாமல் இருக்கின்றார்கள். எனவே, அவர்களும் இந்த நாட்டின் அரசியலிலே பங்கெடுக்கக் கூடியவகையில் இந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்கவேண்டும் என நான் இந்த இடத்தில் உங்களிடம் விநயமாக ஒரு கோரிக்கையை முன்வைக்கின்றேன்.

அதேநேரத்தில், நான் இன்னுமொரு விடயத்தையும் இந்த இடத்தில் பதிவுசெய்துகொள்ள விரும்புகின்றேன். நேற்று முன்தினம் "Samugam Media" என்ற இணையத்தள ஊடகமொன்றில் பொய்யானதொரு செய்தி வெளியிடப் பட்டிருக்கின்றது. அது ஒரு பத்திரிகையிலும் வெளி வந்திருந்தது. அதாவது, எனக்கும் எங்களுடைய தலைவர் மதிப்புக்குரிய கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்களுக்கும் ரணில் விக்கிரமசிங்ஹ அவர்களின் விசேட அபிவிருத்தி நிதி ஒதுக்கீடாக ஆறு கோடி ரூபாய் கிடைத்திருப்பதாக அப்பட்டமாகப் பொய்யான செய்தியொன்று வெளியிடப் பட்டிருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
முடிக்கின்றேன். எனக்கு இன்னும் ஒரு நிமிடம் தாங்கள்!

இது ஓர் அப்பட்டமான பொய். எங்களுக்கு அவ்வாறான விசேட நிதி ஒதுக்கீடுகள் எதுவும் கிடைக்கப்பெறவில்லை. நாங்கள் பன்முகப்படுத்தப்பட்ட நிதிக்கான விண்ணப்பங்களை மாத்திரம்தான் செய்திருந்தோம். அதற்கான அங்கீகாரம் பங்குனி - சித்திரை மாதங்களில் எங்களுக்குக் கிடைத்திருக்க வேண்டும். ஆனால், கால இழுத்தடிப்புச் செய்யப்பட்டு இப்போதுதான் கிடைத்திருக்கின்றது. அரச புலனாய்வுப் பிரிவினரிடம் சம்பளம் பெறுகின்ற, ஊடகவியலாளர் என்ற போர்வையிலே செயற்படுகின்ற ஒருசிலர் அவ்வாறான பொய்ச் செய்திகளை வெளியிட்டிருக்கின்றார்கள். இதனை நான் மிகவும் வன்மையாகக் கண்டிக்கின்றேன். இது ஓர் அரசியல் நேர்மையற்ற செயற்பாடு என்பதையும் நான் இந்த இடத்தில் பதிவு செய்துகொள்ள விரும்புகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.50]

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා හැමදාම වාගේ මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වාගේම නීතියේ තිබෙන හිඩැස් ටික මකා ලන්නට බොහෝ සෙයින් උත්සාහ ගන්නවා. විවිධ සංශෝධන ගෙන එමින් ඒ සඳහා කටයුතු කරනවා. ඒ මොන සංශෝධන කළත්, මොන ව්‍යවස්ථා සංශෝධන ගෙනැවිත් තිබුණත් හිතෙන හිතෙන විධියට වැඩ කරන්න පුළුවන් තත්ත්වයක් අපේ රටේ ඇති වෙලා තිබෙන බවක් අපි දකිනවා. අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව සඳහන් කර තිබෙනවා, මේ රටේ ජනාධිපතිවරණය පවත්වන්න ඕනෑ විධිය, එය පවත්වන්න ඕනෑ දින වකවානු පිළිබඳව. ගරු අධිකරණ ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවොත්, නියමිත දිනයට මේ රටේ ජනාධිපතිවරණය පවත්වනවාද කියලා, මේ ගරු සභාවේදී ඔබතුමා නැඟිටලා සමහර විට කියයි, එය පවත්වනවා කියලා. හැබැයි, ඔබතුමාගේ හෘදය සාක්ෂිය තවම එය පිළිගන්න ලෑස්ති නැහැ. ඒ තරමට අද රටේ තත්ත්වය ව්‍යාකූලයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මොනවා තිබුණත්, මේ රටේ අවස්ථාවාදීන්ගේ අවශ්‍යතා ඉෂ්ට කර ගන්නට හිඩැස් සොයමින් කටයුතු කරනවා කියන එක තමයි අපට පෙනෙන්නට තිබෙන්නේ.

දැන් ප්‍රශ්නය තිබෙන්නේ, ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5 ද, 6 ද කියන එක ගැන නේ. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති ධුරයට අවුරුදු 6කට පත් වුණත්, බොහොම සද්භාවයෙන් කැප කිරීමක් කරලා අවුරුදු 5කින් අයින් වෙලා ගියා. මේ වන කොට අධිකරණයෙන් බොහොම පැහැදිලිව තුන් පාරක්ම කියා තිබෙනවා, ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5යි කියලා. හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එක තැනක තිබෙන වාක්‍යයක් වෙනස් කරන්නට මේ රටේ ජනතාවගේ මුදල් රුපියල් කෝටි 1,000ක් වැය කරන්න උත්සාහ කරනවා. එහෙම කරන්නේ ඒ සල්ලිවල වටිනාකමක් නැති නිසා ද? එහෙම නැත්නම් වෙන මොකක් හරි කාරණාවක් නිසාද? මේ මොකක්ද කරන්න හදන්නේ? අපේ ගම්වල කථාවක් තිබෙනවා, "පූසා මැටියෙන් හරි කමක් නැහැ, මීයෝ අල්ලනවා නම්" කියලා. එච්චරයි. මේ පූසා දැන් හොඳටම මීයෝ ටිකත් අල්ලලා තිබෙනවා. හැබැයි, රනිල් වික්‍රමසිංහ මහත්මයාට තේරෙන්නේ නැහැ තවම මේකා මීයෝ අල්ලයිද නැද්ද කියලා. ඒ නිසා රනිල් වික්‍රමසිංහ මහත්මයාට අපි කියනවා, මේ පූසා හොඳට මීයෝ අල්ලලා තිබෙනවා කියලා. අවුරුදු 5න් මැතිවරණයක් පවත්වලාත් තිබෙනවා. කරුමය කියන්නේ, මේ රටේ ජනතාවගෙන් පත් වෙලා ආපු මිනිසුන්ට ඒ ගැන ගැටලුවක් නැතත්, ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙලා, පාර්ලිමේන්තුවටත් එන්න බැරි වෙලා, ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා, දේශපාලනයෙන් අනාථ වෙච්ච 134 දෙනෙකුගේ ඡන්දයෙන් ජනාධිපතිවරයා බවට පත් වෙච්ච කෙනාට තමයි ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5 ද 6 ද කියන ප්‍රශ්නය තිබෙන්නේ. ඒ නිසා මේ රටේ ව්‍යවස්ථාවත් එක්ක වෙවුලු දමන්නේ නැතිව, සෙල්ලම් කරන්නේ නැතිව, මේ රටේ සල්ලි කාබාසිනියා කරන්නේ නැතිව නියමිත දිනයට ජනාධිපතිවරණය පවත්වන්න.

පසුගිය වතාවේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා නාම යෝජනා දුන්නා. ඊට පස්සේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා විළිලජ්ජාවක් නැතිව කියනවා, නැති ඡන්දයක් පවත්වන්නේ කොහොමද, ඡන්දයක් පවත්වන්න ඡන්දයක් නැහැ කියලා. එහෙම මොකක්දෝ කථාවක් කිව්වා. හැබැයි, මේ රටේ ජනතාවගේ සල්ලි කෝටි 65කට වඩා ඒ මැතිවරණය වෙනුවෙන් විනාශ වුණා. එවැනි තත්ත්වයක් තිබෙන අවස්ථාවක රනිල් වික්‍රමසිංහ මැතිතුමා මොනවාද මේ කරන්න හදන සෙල්ලම්?

මේ රටේ ව්‍යවස්ථාවත් සමඟ සෙල්ලම් කරන්නේ නැතිව ඉන්න. මේක ඔබතුමන්ලා අපි ඔක්කෝටම තිබෙන ගැටලුවක්. මේ තමයි රටේ උත්තරීතරම තැන. අපි තමයි මේ රටේ නීති හදන්නේ; ව්‍යවස්ථා සම්පාදනය ඇතුළු ඔක්කෝම කරන්නේ. හැබැයි, මොකක් කරලා තිබුණත් වැඩක් නැහැ නේ, මේ වාගේ අවස්ථාවාදින්ට, මේ වාගේ සටකපටකම් දන්නා මිනිසුන්ට. දැන් මේ රටේ මිනිසුන් ඔක්කොටම තිබෙන ප්‍රශ්නය, මේ රටේ ඡන්දය පවත්වයිද නැද්ද කියන එකයි. පවත්වන්නේ ජනාධිපතිවරණය ද, මහ මැතිවරණය ද, ජනමත විචාරණය ද? මොකක්ද උත්තරය? මේ තත්ත්වයට පත් වන තරමට ආණ්ඩුව අද දුර්වල වෙලා තිබෙනවා. මේ කටයුතු ගැන තවත් කථා කරලා වැඩක් නැහැ. ඔබතුමන්ලා මේ කාරණය ඉස්සරයට ගෙන යන්න.

අධිකරණය ගැනත්, බන්ධනාගාරය ගැනත් මෙහිදී කථා කළා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, බන්ධනාගාරගත වන උදවිය නිරුවත් කරලා පරීක්ෂා කරන්නේ නැහැ කියලා. හැබැයි අපි බොහොම පැහැදිලිව දන්නවා, ඒ වාගේම මට දැන ගන්න ලැබී තිබෙනවා කාන්තාව ද පිරිමි ද කියලා වෙනසක් නැතිව රැඳවියන් අධිකරණයට එක් කරගෙන ගිහින් නැවත බන්ධනාගාරය ඇතුළට ගෙන යන්න කලින් ඒ කියපු විධියට පරීක්ෂා කරන බව. ඒ අය පරීක්ෂා කරනවා නම් එක්කෝ වෛද්‍යවරයෙකු, එහෙම නැත්නම් නර්ස් කෙනෙකු හෝ එතැන ඉඳලා ඒ අය පරීක්ෂා කරන්න ඕනෑ. එහෙම නර්ස් කෙනෙක්වත්, වෛද්‍යවරයෙක්වත් නැතිව නිලධාරින් විසින් ගුද මාර්ගයට ඇඟිලි දමලා පරීක්ෂා කරනවා. ඒ තත්ත්වය තුළ කී දෙනෙකු නම් අපහසුතාවට පත් වෙනවාද?

අද බන්ධනාගාර ඇතුළේ phones තිබෙනවා කියනවා; කුඩු තිබෙනවා කියනවා. ඒක ඇතුළේ නැති දෙයක් නැහැ. ඒවා බන්ධනාගාරය ඇතුළට ගියේ කොහොමද? නිලධාරියෙකු විධියට වුණත් කෙනෙකුගේ පස්ස පැත්තට ඇඟිල්ල දමන්න සිදු වන එක - glove එකක් දැම්මා වුණත් - මොන තරම් අප්පිරියා හිතෙන වැඩක්ද කියලා ඔබතුමා දන්නවා. එසේ ඇඟිල්ල දමන කොට ඒක දරාගෙන ඉන්න මනුස්සයාගේ ආත්ම ගරුත්වය, හැඟීම් ආදි සියලු දේ එහෙම පිටින් විනාශ වෙලා ගිහින් අපහසු තත්ත්වයට පත් වෙනවා. තාක්ෂණය බෙහෙවින් දියුණු වෙලා තිබෙන යුගයක ඒ අනුව කටයුතු නොකර මේ විධියට කටයුතු සිදු වීම තුළ ජනතාව මොන වාගේ අපහසු තත්ත්වයකටද පත් වෙන්නේ? අනෙක් පැත්තෙන්, ඒ රාජකාරිය කරන නිලධාරියෙකුට -අතට glove එකක් දැම්මා වුණත්- කැත නැතිව තව කෙනෙකුගේ ගුද මාර්ගයට ඇඟිල්ලක් දමන්න සිදු වෙනවා කියන එක මොන තරම් නම් පිළිකුල්සහගත තත්ත්වයක්ද? එහෙම තත්ත්වයකට පත් වෙලා සේවය කරන නිලධාරින්ට අවුරුදු දෙකකින් uniform එකක් දීලා නැහැ, සපත්තු කුට්ටමක් දීලා නැහැ. ඒ අයට uniform එකක් මහ ගන්න කියලා රුපියල් 1,250ක් ලු ලැබෙන්නේ. රුපියල් 1,250න් එක uniform එකක්වත් මහ ගන්න බැහැ. මොකද, uniform එකක් මහ ගන්න රුපියල් 2,500ක් යනවා ලු. මේ වාගේ තත්ත්වයක් තිබෙන විට බන්ධනාගාරය ඇතුළෙන් අර කියපු දේවල් හමු වන එක සාමාන්‍ය දෙයක්. එදිනෙදා වියදම් ටික පියවා ගන්න පුළුවන් සාධාරණ දීමනාවක් නොදෙන කොට ඒ අය තමන්ට තිබෙන අවස්ථාවෙන් යම් මුදල් ප්‍රමාණයක් උපයා ගන්නට එවැනි අක්‍රමිකතාවලට යොමු වෙනවා ඇති.

අනෙක් පැත්තෙන්, ඒ අයගේ ආරක්ෂාව පිළිබඳවත් විශාල ගැටලුවක් තිබෙනවා. බුස්සේ SP මහත්මයාට මරණ තර්ජන ආවා. ඒ විධියට ඒ නිලධාරින්ට මරණ තර්ජන එනවා. එහෙම වන කොට ඒ නිලධාරින් තමන්ට මුදලකුත් ලැබෙනවා, ජීවිත ආරක්ෂාවත් ලැබෙනවා කියන කාරණය තුළ ඉඳගෙන ඔය කියන

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

ජාවාරම්කාරයෝත් එක්කම එකතු වෙලා කටයුතු කරමින් ඉන්නවා. එවිට මේ රටේ අප ඉටු කර ගන්න හදන අරමුණු ඉටු වන්නේ නැහැ.

ඒ නිසා, මේ අයට ලබා දෙන්න ඕනෑ දේවල් ලබා දෙන්න කියන කාරණය මතක් කරමින්, මට කාල වේලාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා හරිම බරපතළ ප්‍රකාශයක් කළේ. එක් පැත්තකින් එතුමා මුළු ලෝකයටම කියනවා, "මහා ම්ලේච්ඡ මට්ටමක පවත්වන බන්ධනාගාර පද්ධතියක් තමයි මේ රටේ තිබෙන්නේ" කියලා. තවත් පැත්තකින් කියනවා, "බන්ධනාගාරයට ගිය සෑම දෙනාම නිරුවත් කරලා තමයි පරීක්ෂා කරන්නේ" කියලා. ඊළඟට අනික් පැත්තෙන් කියනවා, "බන්ධනාගාරයේ ඉන්න සෑම නිලධාරියෙක්ම මහා ම්ලේච්ඡ විධියට කටයුතු කරන්නේ" කියලා. මට තේරෙන්නේ නැහැ, එතුමා බන්ධනාගාරය කියන වචනයේ තේරුම දන්නවාද කියලා. මේ ගැන රටක් විධියට අපි කල්පනා කර බලන්න ඕනෑ. දේශපාලනික වශයෙන් අන්ධ වෙලා, පටු වාසි ගන්න මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න හොඳ නැහැ. වගකීමෙන් කටයුතු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රකාශය තුළින් බන්ධනාගාරයේ ඉන්න සියලුම රැඳවියන්ට විශාල අපහාසයක්, අවමානයක් මේ කරන්නේ. ඒ වාගේම, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඉන්න සියලු නිලධාරීන්ට විශාල අපහාසයක්, අවමානයක් කරන්නේ. සමස්තයක් විධියට ගත්නාම රටක් විධියට ශ්‍රී ලංකාව මහා ම්ලේච්ඡ මිනිස්සු ජීවත් වන සමාජයක් තිබෙන රටක් කියලා මුළු ලෝකයටම අඬ ගහලා කියනවා නේ. මේ වාගේ ප්‍රකාශයක් කරනකොට මේවායේ සත්‍යතාව සොයා බලන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉඳලා හිටලා මේ වාගේ සිද්ධියක් දෙකක් කොහේ හෝ බන්ධනාගාරයක සිද්ධ වුණාය කියලා කිව්වා නම් ඒ පිළිබඳව අපට පරීක්ෂණ පවත්වන්නට පුළුවන්; පරීක්ෂණ පවත්වා ඒ පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්. දැන් මේ රට ආර්ථික වශයෙන් මෙච්චර වැටිච්ච රටක් කියලා කවුරුත් දන්නවා. මේ මන්ත්‍රීතුමා වෙන ලෝකයකින් ඇවිල්ලා නැහැ නේ, ලංකාවේ නේ ඉන්නේ. එතුමාත් දන්නවා මේ රටේ තිබෙන ආර්ථික තත්ත්වය. නමුත්, අපි ඉතා අපහසු වුණත් මහා භාණ්ඩාගාරය සහ මුදල් අමාත්‍යාංශය එකතු කරගෙන ජූලි මාසයේ ඉඳලා බන්ධනාගාර නිලධාරීන්ට දීමනාවක් දෙනවා. රුපියල් 13,000කට වැඩි දීමනාවක් අපි ඒ ගොල්ලන්ගේ වැටුපට එකතු කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 13,000ක දීමනාවක් අපි එකතු කළා, ඒ අයට. ඉතින්, මෙතුමා කරපු ප්‍රකාශය ඉතාම පහත් ගණයේ ප්‍රකාශයක් කියලා තමයි මට කියන්න තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වාගේ පහත් අරමුණු ඉටු කර ගැනීම සඳහා මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න හොඳ නැහැ.

ඊළඟට, මා මිත්‍ර ගරු කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා සඳහන් කළා, සිර ගෙවල්වල දීර්ඝ කාලයක් සිටින පුද්ගලයන් ගැන. ඒ පිළිබඳව අපි නොසලකා හැරියා නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. ඇත්ත වශයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලවල අපේ නීතියේ තිබුණු අඩුපාඩු නිසා වසර 10ක් සිරගතව ඉන්න ඕනෑ මනුස්සයා සමහර වෙලාවට වසර 20ක් නිරේ ඉඳලා තිබෙන බව ඔබතුමාත් දන්නවා. රිමාන්ඩ් භාරයේ සිටි කාලයයි, අභියාචනය පැවැති කාලයයි එකතු කරලා ඒ කාලය සිර දඬුවමෙන් අඩු නොකරන නිසායි එහෙම වෙලා තිබෙන්නේ. නමුත්, පසුගිය මාසයේදී අපි පනතක් සම්මත කළා ඕන් ඉදිරියට ඒ වාගේ රිමාන්ඩ් භාරයේ සිටි කාලය සිර දඬුවමේ කාලයෙන් අඩු කරන්න කියලා. ඒ සහනය ඕන් ඉදිරියට නඩු තීන්දු දෙනකොට සියලුම තැනැත්තන්ට ලැබෙනවා. ඊට අමතර ලෙස තවත් පනතක් අපි කෙටුම්පත් කරලා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙනවා, දැනට ඉන්න උදව්විය සම්බන්ධයෙන්. දැනට ඉන්න උදව්විය අතරත් ඒ වාගේ අය ඉන්නවා. මොකද, අතීතයට බලපාන අයුරින් නොවෙයි අපි කලින් නීතිය ගෙනාවේ. ඒ අනුව, දැනට ඉන්න උදව්වියටත් ඒ කාල සීමාව අඩු කරන්න; රිමාන්ඩ් භාරයේ හෝ අභියාචනය පවතින කාලයේ සිටි කාලය සිර දඬුවමෙන් අඩු කරන්න නීතියක් ගෙනෙනවා. ඊට අමතරව, බන්ධනාගාර ආඥාපනතේ 40, 80 වගන්ති යටතේ සහන - clemency - දීමේ ක්‍රමවේදයක් තිබෙනවා. ඒ සඳහා මම රෙගුලාසි පද්ධති දෙකක් හදලා තිබෙනවා 40 සහ 80 වගන්තිවලට. ඉදිරියේදී අපි ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ යටතේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මරණ දණ්ඩනයකට නියම වුණු තැනැත්තෙක් වසර 5ක කාලයක් හොඳ කල් ක්‍රියාවෙන් කටයුතු කරනවා නම්, ඒ පිළිබඳ කටයුතු කරන්න විශ්‍රාමික විනිසුරුවරයෙකුගේ සභාපතිත්වයෙන් යුතුව කමිටුවක් තිබෙනවා, ඒ කමිටුව අපට නිර්දේශ කරනවා නම් අවුරුදු 5කින් පසුව එම සිර දඬුවම ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් බවට පත් කරනවා. ඒ සිර දඬුවම ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් බවට පත් කරලා ඊළඟට අවුරුදු 12ක් යනකොට ඒ පුද්ගලයා,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින සභාවේ වැඩකටයුතු අවසන් වන තෙක් කාලය ලබා දීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

එතකොට අවුරුදු පහකින් එම දඬුවම ජීවිතාන්තය දක්වා සිර දඬුවමට පරිවර්තනය කරනවා. ජීවිතාන්තය දක්වා සිර දඬුවමකට පරිවර්තනය කළාට පසුව අවුරුදු 12කින් ඔහුට ඉල්ලීමක් කරන්න පුළුවන්, ඒක විසි අවුරුදු සිර දඬුවමකට පරිවර්තනය කරන්න කියලා.

ඔවුන් හොඳ කල් ක්‍රියාවෙන් - good conduct එකෙන් - ඉන්නවා නම්, අවුරුදු 17ක් යනකොට ඔවුන්ට නිදහස ලබාගැනීමේ ක්‍රමවේදය අපි සකස් කරලා තිබෙනවා. විසි අවුරුද්දක් සිරගත වන කෙනෙකුට නම් සාමාන්‍ය සමා කාලය එකතු කළාම ඒක වසර දහතුනහමාරක් දක්වා අඩු වෙනවා. එතකොට ඒ කාලයේදී ඔවුන්ව නිදහස් කරනවා. අපි එ් ක්‍රමයට ඒ රෙගුලාසි, රීති හදලා ඉදිරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඒ රීති සම්මත වුණාට පස්සේ ඔබතුමා ඔය කියන හුඟක් දෙනෙකුගේ ප්‍රශ්න විසඳෙනවා. ඒක ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්බන්ධයෙන් විතරක් නොවෙයි. රටේ සමස්තයක් විධියට තේරලා බේරලා, සිංහල, දෙමළ කියලා වෙන් කරලා නිදහස් කිරීමේ ක්‍රමයක් නැහැ. ඒක අපි කවුරුත් පිළිගන්න ක්‍රමයක් නොවෙයි. පොදු, සාධාරණ ක්‍රමවේදයක් විධියට ඒක පාර්ලිමේන්තුවට අපි ඉදිරිපත් කරන්නම්. ඔබතුමන්ලා ඒක සම්මත කරලා දෙන්න.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, මම පහත් මට්ටමේ ප්‍රකාශයක් කළා කියලා. මම මොහොතකට -දැන් කළ කථාවට- කලින් ඒ පහත් ක්‍රියාව ගැන තහවුරු කරගෙන තමයි කථා කළේ. මම පාර්ලිමේන්තුවේ මේ ගැන කථා කිරීම පහත් ක්‍රියාවක් විධියට ඔබතුමා දකිනවා නම්, ඒ පහත් ක්‍රියාව සිද්ධ වෙන බන්ධනාගාරවල තත්ත්වය මොකක්ද කියන එකත් ඔබතුමා හොයා බලන්න. ඔබතුමා තමයි ඒ පිළිබඳ වගකීම දරන අමාත්‍යතුමා. අපි ඔබතුමාව අපහසුතාවට පත් කරන්නවත්, වෙන කිසිදු දෙයක් වෙනුවෙන්වත්,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමා දැන් ඔබතුමාට පිළිතුරක් ලබා දුන්නා නේ.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මන්ත්‍රීතුමා කියනවා, දැන් ඒ සිද්ධිය තහවුරු කර ගත්තා ලු. එහෙම නම් කරුණාකරලා ඒ සිරකාරයාගේ නමයි, බන්ධනාගාර නිලධාරියාගේ නමයි දෙන්න.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
එහෙම දෙන්න බැහැ.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
නම දෙන්න බැරි නම් තමුන්නාන්සේ අසත්‍ය කියන්නේ. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේ මේ පාර්ලිමේන්තුව joke එකකට ගන්න එපා. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් තහවුරු කරගත්තා කියලා මෙතුමා කිව්වා නේ.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඔව්.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
තහවුරු කරගත්තා නම් දෙන්නකෝ විස්තර.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මම දෙන්නම්.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
පාර්ලිමේන්තුවට දෙන්න. බන්ධනාගාර රැඳවියාගේ නම දෙන්න. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා ඔබතුමා මේ පිළිබඳව නියෝගයක් දෙන්න. *[බාධා කිරීමක්]* මෙතුමා කියනවා, රජයේ නිලධාරීන් ගැන. ඒක මගේ දෙපාර්තමේන්තුව ද, වෙනත් දෙපාර්තමේන්තුවක් ද කියන එක නොවෙයි ප්‍රශ්නය. ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය සේවකයන් ගැනයි මේ කථා කරන්නේ. ඒ නිසා ඔය වැඩේ කරපු රාජ්‍ය සේවකයාගේ නම කියන්න. ඒකට භාෂන වුණු - *[බාධා කිරීමක්]* රැඳවියාගේ නම කියන්න. *[බාධා කිරීමක්]* නැහැ, කියන්න. එහෙම නැත්නම් තමුන්නාන්සේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මම මොකටද බොරු කියන්නේ?

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
එහෙම නම් කියන්නකෝ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා ඔබතුමා නියෝගයක් කරන්න.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඒ අය කියනවා නේ.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මේ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මේ කාරණය බොහොම පැහැදිලිව කියනවා නම් ඔබතුමා ඇයි ඒකට එකඟ වෙන්න කැමැති නැත්තේ? *[බාධා කිරීම්]*

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
කෞරව අමාත්‍යතුමනි,-

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඒ සම්බන්ධයෙන් කරන්න දෙයක් නැහැ. ඔබතුමා නොවෙයි නේ කරන්නේ. ඔහොම කරන්න එපා. ඒ කාරණය ගැන හොයලා බලන්න. *[බාධා කිරීමක්]* මේ ගැන පරීක්ෂා කරන්න කටයුතු කරන්න.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
කෞරව අමාත්‍යතුමනි, නීතිඥවරයකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් දාලා තිබෙනවා කියලා. මම එදා පැහැදිලිව කිව්වා, ඒක එම නීතිඥවරයා විසින් මේ රටේ මූලික නීතිය පිළිබඳව අවබෝධයක් නැතුව දාපු පෙත්සමක් නොවෙයි, එය කොහේ හෝ තිබෙන දේශපාලන න්‍යාය පත්‍රයක කොටසක් කියලා. හැබැයි, ගරු අධිකරණය ඒකට හොඳ ප්‍රතිචාරයක් දක්වා තිබුණා. රුපියල් ලක්ෂ 5ක නඩු ගාස්තුවකට යටත්ව ඒ පෙත්සම නිෂ්ප්‍රභ කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ තිබෙන වරප්‍රසාද පාවිච්චි කරලා අපේ රටේ අධිකරණය මේ පාර්ලිමේන්තුව ඇතුළේ දී යම් කිසි දූෂණයකට ලක් වෙනවා කියලා මා විශ්වාස කරනවා. සමහර වෙලාවට හිතලා හෝ නොහිතා ජනාධිපතිතුමා අතිනුත් එය සිදු වෙනවා අපි දැක්කා. සමහර මන්ත්‍රීවරුට අවශ්‍ය විධියට නඩු තීන්දුව ලැබුණේ නැති වුණාම, පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පාවිච්චි කරමින්, මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළදී ඒ නඩු තීන්දුව ලබා දුන් විනිශ්චයකාරවරයා දෝෂ දර්ශනයට ලක් කරලා කථා කරන අවස්ථා තිබෙනවා. අධිකරණයේ සිටින විනිශ්චයකාරවරයෙකුට මෙතැන කථා කරන්න බැහැ නේ. ඉතින්, මේ උත්තරීතර ආයතනයේ තිබෙන වරප්‍රසාද තමන්ගේ පෞද්ගලික කාරණා වෙනුවෙන් යොදා ගන්න එක වැරැදියි, තමන්ගේ පෞද්ගලික අරමුණු වෙනුවෙන් යොදා ගන්න එක වැරැදියි කියලා මම හිතනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, මේ රට තුළ එම වරප්‍රසාදය යටතේ තිබෙන්නේ අධිකරණ පද්ධතියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තුව මැදිහත් වීමයි. ඒක කරන්න ඕනෑ. අධිකරණයේ ඉන්නේ දෙව්වරු නොවෙයි. යම් විනිශ්චයකාරවරයෙකුගෙන් වැරැද්දක් වෙන්න පුළුවන්. එක් විනිශ්චයකාරවරයෙකු අතින් එහෙම යම් වැරැද්දක් සිදු වුණාය කියලා සියලු විනිශ්චයකාරවරුන්ට හානිකර විධියේ ප්‍රකාශ නිකුත් කිරීම නොවිය යුතු දෙයක් කියලා මා විශ්වාස කරනවා.

පසුගිය දින කිහිපය තුළ තමන්ගේ පක්ෂවල තිබෙන ප්‍රශ්නත් එක්ක පෞද්ගලික කාරණාත් මතු වුණු අවස්ථා අපි දැක්කා. ඒක

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
කෞරව අමාත්‍යතුමනි, නීතිඥවරයකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් දාලා තිබෙනවා කියලා. මම එදා පැහැදිලිව කිව්වා, ඒක එම නීතිඥවරයා විසින් මේ රටේ මූලික නීතිය පිළිබඳව අවබෝධයක් නැතුව දාපු පෙත්සමක් නොවෙයි, එය කොහේ හෝ තිබෙන දේශපාලන න්‍යාය පත්‍රයක කොටසක් කියලා. හැබැයි, ගරු අධිකරණය ඒකට හොඳ ප්‍රතිචාරයක් දක්වා තිබුණා. රුපියල් ලක්ෂ 5ක නඩු ගාස්තුවකට යටත්ව ඒ පෙත්සම නිෂ්ප්‍රභ කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ තිබෙන වරප්‍රසාද පාවිච්චි කරලා අපේ රටේ අධිකරණය මේ පාර්ලිමේන්තුව ඇතුළේ දී යම් කිසි දූෂණයකට ලක් වෙනවා කියලා මා විශ්වාස කරනවා. සමහර වෙලාවට හිතලා හෝ නොහිතා ජනාධිපතිතුමා අතිනුත් එය සිදු වෙනවා අපි දැක්කා. සමහර මන්ත්‍රීවරුට අවශ්‍ය විධියට නඩු තීන්දුව ලැබුණේ නැති වුණාම, පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පාවිච්චි කරමින්, මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළදී ඒ නඩු තීන්දුව ලබා දුන් විනිශ්චයකාරවරයා දෝෂ දර්ශනයට ලක් කරලා කථා කරන අවස්ථා තිබෙනවා. අධිකරණයේ සිටින විනිශ්චයකාරවරයෙකුට මෙතැන කථා කරන්න බැහැ නේ. ඉතින්, මේ උත්තරීතර ආයතනයේ තිබෙන වරප්‍රසාද තමන්ගේ පෞද්ගලික කාරණා වෙනුවෙන් යොදා ගන්න එක වැරැදියි, තමන්ගේ පෞද්ගලික අරමුණු වෙනුවෙන් යොදා ගන්න එක වැරැදියි කියලා මම හිතනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, මේ රට තුළ එම වරප්‍රසාදය යටතේ තිබෙන්නේ අධිකරණ පද්ධතියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තුව මැදිහත් වීමයි. ඒක කරන්න ඕනෑ. අධිකරණයේ ඉන්නේ දෙව්වරු නොවෙයි. යම් විනිශ්චයකාරවරයෙකුගෙන් වැරැද්දක් වෙන්න පුළුවන්. එක් විනිශ්චයකාරවරයෙකු අතින් එහෙම යම් වැරැද්දක් සිදු වුණාය කියලා සියලු විනිශ්චයකාරවරුන්ට හානිකර විධියේ ප්‍රකාශ නිකුත් කිරීම නොවිය යුතු දෙයක් කියලා මා විශ්වාස කරනවා.

පසුගිය දින කිහිපය තුළ තමන්ගේ පක්ෂවල තිබෙන ප්‍රශ්නත් එක්ක පෞද්ගලික කාරණාත් මතු වුණු අවස්ථා අපි දැක්කා. ඒක

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.04]

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ අමාත්‍යාංශයට අදාළ වන ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් හා නියෝග ද්විත්වයක් විවාදයට ගන්නා මේ වෙලාවේ මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේක විපක්ෂයෙන් කරන අවසන් කථාව නිසාත්, සභාවේ කාලය දීර්ඝ කරගත් නිසාත් යම්, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சுதர்ஷன தெனிபிடிய அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA left the Chair and THE HON. DEPUTY SPEAKER took the Chair.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මොහොත අපිත්, රටේ සියලුදෙනාත් අධිකරණය දිහා ඇස් යොමා ගෙන ඉන්න වෙලාවක්. මෙහිදී දේශපාලනික වශයෙන් මොන පක්ෂයේ ද, මොන කණ්ඩායමේ ද කියන එක නොවෙයි වැදගත් වන්නේ. යම්කිසි කාරණාවක් සම්බන්ධව අපි අධිකරණය කෙරෙහි විශ්වාසය තබා තිබෙනවා.

ඒකට හේතුව තමයි, පසුගිය පළාත් පාලන මැතිවරණය වෙලාවේ ගරු ජනාධිපතිතුමා ගනු ලැබූ තීන්දුව. එවැනි තීන්දුවක් ගත් ජනාධිපතිවරයෙක් යටතේ මේ රටේ මැතිවරණයක් පවත්වන්න වටපිටාවක් හැදෙන්නේ නැහැ කියන සැකය අපට තිබෙනවා. ඒක කාටවත් බැහැර කරන්න බැහැ, ඒ සැකය සාධාරණයි. එවැනි වටපිටාවක් තුළ තමුන්ගේ එක එක දේශපාලන අවශ්‍යතා වෙනුවෙන් අධිකරණය යොදා ගන්න කටයුතු කරන ආකාරය දැන් අපට පෙනෙනවා.

ඊයේ පෙරේදා දවසක අධිකරණ අමාත්‍යවරයාත් පාර්ලිමේන්තුව තුළ හිටපු වෙලාවක මම පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ගෙනාවා. මම ඒ වෙලාවේ කිව්වා, නීතිඥවරයකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් දාලා තිබෙනවා කියලා. මම එදා පැහැදිලිව කිව්වා, ඒක එම නීතිඥවරයා විසින් මේ රටේ මූලික නීතිය පිළිබඳව අවබෝධයක් නැතුව දාපු පෙත්සමක් නොවෙයි, එය කොහේ හෝ තිබෙන දේශපාලන න්‍යාය පත්‍රයක කොටසක් කියලා. හැබැයි, ගරු අධිකරණය ඒකට හොඳ ප්‍රතිචාරයක් දක්වා තිබුණා. රුපියල් ලක්ෂ 5ක නඩු ගාස්තුවකට යටත්ව ඒ පෙත්සම නිෂ්ප්‍රභ කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ තිබෙන වරප්‍රසාද පාවිච්චි කරලා අපේ රටේ අධිකරණය මේ පාර්ලිමේන්තුව ඇතුළේ දී යම් කිසි දූෂණයකට ලක් වෙනවා කියලා මා විශ්වාස කරනවා. සමහර වෙලාවට හිතලා හෝ නොහිතා ජනාධිපතිතුමා අතිනුත් එය සිදු වෙනවා අපි දැක්කා. සමහර මන්ත්‍රීවරුට අවශ්‍ය විධියට නඩු තීන්දුව ලැබුණේ නැති වුණාම, පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පාවිච්චි කරමින්, මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළදී ඒ නඩු තීන්දුව ලබා දුන් විනිශ්චයකාරවරයා දෝෂ දර්ශනයට ලක් කරලා කථා කරන අවස්ථා තිබෙනවා. අධිකරණයේ සිටින විනිශ්චයකාරවරයෙකුට මෙතැන කථා කරන්න බැහැ නේ. ඉතින්, මේ උත්තරීතර ආයතනයේ තිබෙන වරප්‍රසාද තමන්ගේ පෞද්ගලික කාරණා වෙනුවෙන් යොදා ගන්න එක වැරැදියි, තමන්ගේ පෞද්ගලික අරමුණු වෙනුවෙන් යොදා ගන්න එක වැරැදියි කියලා මම හිතනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, මේ රට තුළ එම වරප්‍රසාදය යටතේ තිබෙන්නේ අධිකරණ පද්ධතියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තුව මැදිහත් වීමයි. ඒක කරන්න ඕනෑ. අධිකරණයේ ඉන්නේ දෙව්වරු නොවෙයි. යම් විනිශ්චයකාරවරයෙකුගෙන් වැරැද්දක් වෙන්න පුළුවන්. එක් විනිශ්චයකාරවරයෙකු අතින් එහෙම යම් වැරැද්දක් සිදු වුණාය කියලා සියලු විනිශ්චයකාරවරුන්ට හානිකර විධියේ ප්‍රකාශ නිකුත් කිරීම නොවිය යුතු දෙයක් කියලා මා විශ්වාස කරනවා.

පසුගිය දින කිහිපය තුළ තමන්ගේ පක්ෂවල තිබෙන ප්‍රශ්නත් එක්ක පෞද්ගලික කාරණාත් මතු වුණු අවස්ථා අපි දැක්කා. ඒක

මේ රටේ ස්වාධීන අධිකරණයට ඔබින්නේ නැති ක්‍රියාවක් කියලා මම හිතනවා. මට තිබෙන අවබෝධයත් එක්ක මම හිතනවා, ඒක යම්තාක් දුරට අධිකරණ ඇමතිතුමාගේ පරාසයෙන් ඔබ්බට ගිහිල්ලා අධිකරණ සේවා කොමිෂන් සභාව වැනි ආයතනවලිනුත් එහාට ගිහිල්ලා, ඒ තැන්වලිනුත් උත්තර නැත්නම් පාර්ලිමේන්තුවට එන එක වඩා හොඳයි කියලා. එම නිසා අපේ රටේ අධිකරණය පිළිබඳ විශ්වාසය තමයි රටේ ජනතාවට තිබෙන අවසාන තැන කියලා මා විශ්වාස කරනවා. ඒකට හානි වන විධියේ ක්‍රියාදාම මේ පාර්ලිමේන්තුව තුළ නොවිය යුතුයි කියලා මා හිතනවා.

දෙවැනි කාරණය මෙයයි. මම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පිළිබඳව ඉතාම ඕනෑකමින් අධ්‍යයනය කරලා එහි තිබෙන තත්ත්වය රටට කියන්න උත්සාහ කරන බව ගරු අධිකරණ ඇමතිතුමාට කියන්න ඕනෑ. ඒ පිළිබඳව පාර්ලිමේන්තුව තුළදීත් තුන් හතර වතාවක් කථා කළා. ඒකට විපක්ෂ නායකතුමාත් උදව් කළා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත් උදව් කළා. රාජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ගරු අධිකරණ ඇමතිතුමනි, දැන් අමුතු ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා. ඒවා මේ රටේ නීතියේ හිල් ද දන්නේ නැහැ, මේ වෙනකොට මම -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
සභාවේ කාලය දීර්ඝ කරපු නිසාත්, විපක්ෂයෙන් කරන අවසන් කථාව නිසාත් ඇමතිතුමාගේ අවසරය ඇතිව මට තව විනාඩි දෙක තුනක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තුළ මෙන්න මේ දේවල් සිදුවෙලා තිබෙනවා කියලා හෙළිදරව්වක් කළාම, ඔවුන් රුපියල් මිලියනයක් දෙකක් දීලා නඩුවක් ෆයිල් කරනවා. ඒ විධියට දැන් නඩු 5ක්, 6ක් දාලා තිබෙනවා ගරු ඇමතිතුමනි. මේ නඩු සියල්ලම දමන්නේ මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කරන්න සිටින ආයතනය වන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මුදල්වලින්. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මුදල්වලින් තමයි ඔවුන් අපට නඩු දමන්නේ. අපි ඒ නඩුවලට පෙනී සිටින්න අපේ සල්ලි වියදම් කරලා උසාවි යන්න ඕනෑ. මම දන්නේ නැහැ, රටක පාර්ලිමේන්තුව තුළ කියන කරුණුවලට නඩු දමන්න බැරිකමක් නැත්නම්, මේ කථාවටත් හෙට උදේ වෙනකොට නඩුවක් පවරයි. අපි මේක හෙළිදරව් කරන හැම වෙලාවකම මේ රටේ ක්‍රිකට් ආයතනයේ හයිය පාවිච්චි කරලා පෝලිමට නඩු දමනවා. මට විතරක් නොවෙයි. රොෂාන් රණසිංහ මැතිතුමාට, අර්ජුන රණතුංග මැතිතුමාට විරුද්ධව නඩු දැම්මා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මහා සේවයක් කරපු, ඒ වාගේම කොළඹ දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ හිටපු අනුර වීරසිංහ මහත්මයාට විරුද්ධවත් නඩු දැම්මා. ඒ විධියට නඩු දාලා මේ කටවල් වහන්න බැහැ. මම අධිකරණයට යනවා. ඒක වෙනම කාරණාවක් විධියට මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

මේවා අනාගතයේ දවසක නිවැරදි වෙන්නට ඕනෑ, ගරු ඇමතිතුමනි. වත්මන් ක්‍රීඩා ඇමතිතුමාගේ අවධානයටත් මේ කාරණය යොමු වෙන්න ඕනෑ. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ඕනෑ ඕනෑ විධියට නඩු දමනවා. කෙනෙක් වරදක් කරලා තිබෙනවා නම් ඒක අභියෝගයට ලක් කරන්න පුළුවන්. මොකද, ඒකෙන් ක්‍රිකට් ආයතනය නිදහස් කර ගන්න. නමුත්, අනෙක් අයගේ කටවල් වහන්න මුදල් වියදම් කිරීම අපරාදේ කරන වියදමක් කියලා අපි කියනවා.

ගරු ඇමතිතුමනි, මට තිබෙන අවබෝධය තුළින් මම මේ කාරණාවත් ඔබතුමාට කියන්නම්. ඔබතුමා මෑත කාලසීමාව තුළ අපේ රටේ නීති සංශෝධනය කරන්න, අලුතින් නීති ගෙනෙන්න විශාල වශයෙන් කටයුතු කරපු අමාත්‍යවරයෙක්. මම එදාත් ඒ ගැන කිව්වා. ඒක විය යුතුයි. හැබැයි, සමහර වෙලාවට ප්‍රමුඛතාව අවබෝධ කර ගන්න ඕනෑකමකුත් තිබෙනවා. මම හිතන විධියට ඒක ඔබතුමාගේ පරාසයෙනුත් එහාට ගිහිල්ලා වෙන්න ඇති. විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරද්දී ඔබතුමා හිටපු තැන අපි දන්නවා. දැන් මේක ඉස්සරහට පැනලා තිබෙනවා. මේ විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අපේ මූලික නීතිය නිවැරදි කර ගන්න ඕනෑ. ඒ නිවැරදි කර ගැනීම ජනාධිපතිවරණය පැවැත්වීමට නියමිතව තිබෙන මේ කාල සීමාව තුළ කිරීම සාධාරණද කියන සැකය අපට තිබෙනවා. අවංකව, සද්භාවයෙන් කරන වැඩක් වුණත් දැන් මේක අපරාධයක්. හැබැයි, මේක කළ යුතුව තිබුණේ මීට ගොඩක් ඉස්සර. ඒ නිසා ඒ තුළ මේ රටේ යම් හිඩැසක් නිර්මාණය වෙලා තිබෙනවා කියන කාරණාව මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම තව එක කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. අපේ රටේ සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ පනත ගැන මට පොඩි ගැටලුවක් තිබෙනවා. එම පනතේ සංශෝධනය වෙන්න ඕනෑ තැනක් පිළිබඳව ගරු ඇමතිතුමා ගත්ත යම්කිසි ක්‍රියා මාර්ගයක් ආපස්සට හරවා ගත්ත ආකාරය මම දැක්කා. නමුත්, ඒකත් විය යුතු එකක්. පසුගිය කාලයේ වයස අවුරුදු 14-16 අතර ගැහැණු ළමයින්ට අදාළව ඉදිරිපත් කරපු සංශෝධන පනත් කෙටුම්පතක් ආපස්සට හරවා ගත්තා. පෞද්ගලිකව මම විශ්වාස කරනවා, ඒක නිවැරදි විය යුතු තැනක් කියලා. 1907 අංක 19 ආඥා පනත අනුව විවාහ වෙන වයස පිරිමි අයට අවුරුදු 16යි, කාන්තාවන්ට අවුරුදු 12යි ලෙස තේ තිබුණේ. එම පනත 1995 අංක 18 යටතේ සංශෝධනය වෙනවා, නීත්‍යානුකූලව විවාහ විය හැකි අවම වයස අවුරුදු 18යි කියලා. ගරු ඇමතිතුමනි, දැන් Penal Code එකේ, දණ්ඩ නීති සංග්‍රහයේ 363 වගන්තියට අනුව අවුරුදු 16ට අඩු ඕනෑම කාන්තාවක් සමඟ කැමැත්තෙන් හෝ අකමැත්තෙන් ලිංගික සංසර්ගයේ යෙදුණොත් ඒක ස්ත්‍රී දූෂණයක් කියන වරදට හසු වෙනවා. නමුත්, වයස අවුරුදු 16යි දවසක් හෝ ඉක්ම ගිහිල්ලා තිබෙනවා නම් කාන්තාවකට අයිතිය තිබෙනවා, තමන්ගේ කැමැත්තෙන් සංසර්ගයේ යෙදෙන්න. ඒක වරදක් නොවෙයි. මම පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමාගෙනුත් මේ ගැන ඇහුවා, නිවැරදි කර ගන්න. අපේ රටේ සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ පනතේ සංශෝධනය අනුව වයස අවුරුදු 18 තමයි විවාහ වෙන වයස ලෙස තිබෙන්නේ. වයස අවුරුදු 16-18 අතර තරුණියක් අකමැත්තෙන් නොවෙයි, නීත්‍යානුකූලව කැමැත්තෙන් සංසර්ගයේ යෙදිලා දරුවෙක් හම්බ වෙලා තිබෙනවා නම්, ඒ දරුවාට තාත්තා කෙනෙක් නැහැ. මොකද, ඇයට විවාහ වෙන්න තිබෙන වයස අවුරුදු 18ක් නිසා. මේ රික්තය, මේ හිඩැස වහන්න අපේ රටේ නීතිය තුළ වෙනසක් කරන්න පුළුවන්කමක් තිබෙනවා ද?

ඒ ගැන අවධානය යොමු වෙලා තිබෙනවාද? මේ ප්‍රශ්නය පිළිබඳව අධ්‍යයනය කරනකොට දැනෙන දෙයක් තිබෙනවා. මේ ප්‍රශ්නයට උත්තරයක් තිබෙනවාද දන්නේ නැහැ. මගේ දැනීමේ හැටියට උත්තරයක් නැහැ කියලා දැනුණු නිසා මම නියෝජ්‍ය මහ ලේකම්තුමාගෙනුත් ඇහුවා, මේ හිඩැස වහන්න මොකක් හරි ක්‍රමයක් අපේ රටේ තිබ්ලා තිබෙනවාද, නිර්මාණය වෙලා තිබෙනවාද කියලා. ගරු ඇමතිතුමා ඒකට යම් කිසි උත්තරයක් දෙයි කියලා මම හිතනවා.

[ගරු හේෂා විතානගේ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තව එක කාරණයක් විතරක් කියනවා. අපේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා වෙන්න නම්, අපේ රටේ අධිකරණයෙන් ලැබෙන සේවාව ජනතාවාදී වෙන්න නම්, අධිකරණයට යන මනුස්සයා තවදුරටත් දූෂණයට ලක් නොවිය යුතුයි. නමුත්, සමහර තැන්වලදී එහෙම වෙනවා. ගරු ඇමතිතුමනි, මම මේ චෝදනාවක් කරනවා නොවෙයි. මේ රටේ තිබෙන ස්වභාවය ඒකයි. අධිකරණයට යන්නේ මගේ තිබෙන අමාරුකම කියා ගන්න, මට තිබෙන ප්‍රශ්නයට උත්තරයක් සොයන්න. නමුත්, මගේ ඉඩම් නඩුවක් සඳහා අධිකරණයට ගියොත්, අවුරුදු කීයක් ගත වෙනවාද? සම්පූර්ණයෙන්ම ඒ මනුස්සයාගේ පරම්පරාවක් ඉවර වෙනතුරු කාලය ගත වෙනවා. සමහර කාරණා සඳහා අධිකරණයට ගියාට පස්සේ, අධිකරණයේ නඩුව විභාගයට ගත්තම කාල සීමාවත් එක්ක චින්දිතයා තවදුරටත් අපහසුතාවට පත් වෙනවා කියලා මම හිතනවා. ඒ නිසා අවශ්‍ය පහසුකම් ටික හදන්න. රටේ අනෙකුත් දේවල් සඳහා අවධානය යොමු වෙනවා වාගේම, මේවාත් විය යුතු දේවල්.

ගරු අධිකරණ ඇමතිතුමනි, රත්නපුර දිස්ත්‍රික්කයේ මහාධිකරණයේ තිබෙන නඩු ප්‍රමාණය ගැන ඔබතුමා කිව්වා. ඇත්තටම ඒක සාධාරණ කාරණාවක්. නමුත්, එතැනින් එහාට ගිහිල්ලා දිසා අධිකරණවල හිර වෙලා තිබෙන නඩු ප්‍රමාණය අධිකයි. මහෙස්ත්‍රාත් අධිකරණවල ඊට වැඩිය නඩු වැඩියි, ගරු ඇමතිතුමනි. ඔබතුමා ළඟ එම සංඛ්‍යා දත්ත ඇති කියලා මම හිතනවා. ඉතාම නරක තත්ත්වයක් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ රටේ අධිකරණය වෙනුවෙන් ප්‍රමුඛතාව දීලා, නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කරන රටක් ඇති කළ යුතුයි කියලා මම හිතනවා. මේ රටේ නීතිය පිළිබඳව විවේචනාත්මකව මේ පාර්ලිමේන්තුව තුළ කථා කරලා, අපි ඒවා නිවැරැදි තැනට ගෙනෙන්න ඕනෑ. හැබැයි, අධිකරණය තමන්ගේ පෞද්ගලික අරමුණු වෙනුවෙන් පාවිච්චි කළ යුතු නැහැ කියන එකත් මම මතක් කරනවා.

මට කාලය ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා වැදගත් කාරණයක් මතු කළා. එතුමා කියපු අධිකරණ කලාපය ගැන ප්‍රශ්නය කලිනුත් මතු කළා. මම ඒ ගැන සොයා බැලුවා. රත්නපුර මහාධිකරණ දෙකටම මේ වෙනකොට තිබෙන්නේ නඩු 919යි. ඒ නිසා විශාල වියදමක් දරලා බලංගොඩ මහාධිකරණයක් ආරම්භ කරලා පවත්වා ගෙන යන්න තරම් ප්‍රමාණවත් නඩු සංඛ්‍යාවක් නැහැ. හැබැයි, කලවාන එහා කෙළවරේ ඉඳලා එන කෙනෙක් රත්නපුර දිසා අධිකරණයට එන්න කිලෝමීටර 90කට වැඩි දුරක් එන්න ඕනෑ කියන එක අපි දන්නවා. ඒක පැය තුනක, හතරක ගමනක්. ඒක නිසා තමයි කලවාන මහෙස්ත්‍රාත් අධිකරණය, දිසා අධිකරණයක් බවට පරිවර්තනය කරන්න අපි දැන් කටයුතු කරගෙන යන්නේ.

අනෙක් කාරණය තමයි, statutory rape කියන එක. වයස අවුරුදු 16ට අඩු ගැහැනු ළමයින් සංසර්ගයේ යෙදීම නිසා දරුවන් ලැබුණු අවස්ථා තිබෙනවා. වයස අවුරුදු 16-18 අතර ගැහැනු ළමයින් සංසර්ගයේ යෙදීම නිසා දරුවන් ලැබුණු අවස්ථා තිබෙනවා. ගම්බද පළාත්වල පිහිටි අධිකරණවල තමයි මෙවැනි නඩු විශාල වශයෙන් ගොඩගැහිලා තිබෙන්නේ. ඒ සම්බන්ධව අපි දීර්ඝ කාලයක් අධ්‍යයනය කරලා තමයි අවුරුදු 14-16 අතර කාල සීමාව තුළ ස්වේච්ඡාවෙන් සංසර්ගයේ යෙදුණු බවට යම් කිසි සාක්ෂි, සාධක තිබෙන අවස්ථාවක දී ඒ උදව්යට දැඩි දඬුවම් වෙනුවට යම් ආකාරයක ලිහිල් දඬුවමක් දීමටත්, ඒ එක්කම එම දරුවාගේ සුජාතභාවය තහවුරු කරන්න පුළුවන් ක්‍රමයක් හදන්නත් තමයි පනත් කෙටුම්පතක් ගෙනාවේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු මොහොතේ ඉඳලා දැඩි ප්‍රහාර එල්ල වුණා, ඔබතුමාට මතක ඇති. ඒ චෝදනා සියල්ල ඇත්තටම අර්ථ ශූන්‍යයි. නමුත්, පාර්ලිමේන්තුවත් එක්ක ගැටිලා, විවාද ඇති කරගෙන, ඒ වාගේ දෙයක් කළාට එච්චර ප්‍රතිඵල දෙන්නේ නැති නිසා මම ඒක තාවකාලිකව හකුළා ගත්තා. හැබැයි, මේ පාර්ලිමේන්තුව කවදා හරි දැනුවත් වෙච්ච දවසක ඒ පනත් කෙටුම්පත ගෙනෙන්න කියලා මගෙන් ඉල්ලයි.

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ගිය සතියේ යෝජනාවක් ගෙනාවා. මේ අන්තවාදී කටයුතුවලට සම්බන්ධ වෙච්ච අය පුනරුත්ථාපනය කරන්නේ නැත්තේ ඇයි කියලා අහලා. මට මතක විධියට ගිය අවුරුද්දේ ජනවාරි මාසයේ 2023 අංක 1 දරන පනත අපි ගෙනාවා. නමුත්, එම පනතට විපක්ෂය දැඩි ලෙස විරුද්ධ වෙච්ච නිසා මම ඒ කොටස් ඔක්කොම ඉවත් කරගෙන, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සම්බන්ධයෙන් පමණක් කියලා ඒක සීමා කළා. අපි මේවා නොසලකා හැරියා නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ පනත් කෙටුම්පත් ගේනවා. අපිට ඒවා සම්මත කර ගන්න සියලුදෙනාගේ සහයෝගය ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුරාධ ජයරත්න රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 5.18]

ගරු අනුරාධ ජයරත්න මහතා (අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுராத ஜயரத்ன - நீதி மற்றும் சிறைச்சாலை அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne - State Minister of Justice and Prison Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණයේ ක්‍රියාත්මක වන අණ පනත්වල වෙනස්කම් සිදුවන මේ කාලයේ, මේ සංශෝධන ගෙන ඒමත් එක් සුවිශේෂී අවස්ථාවක් වෙනවා. පසුගිය කාල වකවානුවේ අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන් ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා අණ පනත් ගණනාවක් ඉදිරිපත් කරලා, අදට ගැළපෙන නව නීති හඳුන්වා දීම නිසා අධිකරණ පද්ධතියේ සමස්ත ක්‍රියාවලියම නව්‍යකරණයට ලක් කරන්න පුළුවන්කම ලැබුණා. සමහර මන්ත්‍රීවරු ඉදිරිපත් කළ අදහස් උදහස් අනුව පෙනෙනවා, අධිකරණ ක්‍රියාවලියේදී නඩු කටයුතු

විමසීම්වලදී සිදුවන ප්‍රමාදය, එහෙම නැත්නම් ඒ සමස්ත ක්‍රියාවලියේ ප්‍රමාදය කියන ඒ සියලු කාරණාවලට බොහෝ විට මේ පාර්ලිමේන්තුව තුළින්ම අපි හදා ගත්, සම්මත කර ගත් නීති රීතිම, අණ පනත්ම බාධාවක් බවට පත් වෙලා තිබෙන බව. ඒ නීති රීති සහ අණ පනත් නිසි කාලවලදී අවශ්‍ය වෙනස්කම්වලට ලක් වුණොත් තමයි අපි බලාපොරොත්තු වන ඉලක්කයට යන්න, ඒ කියන්නේ අපි බලාපොරොත්තු වන විධියට ඉක්මනින් නඩු කටයුතු අසා අවසන් කරලා ප්‍රතිඵල ලබා දෙන්න පුළුවන්කම ලැබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Ease of Doing Business Index වාගේ නිර්ණායකවල අපි ඉන්නේ බොහෝ පහළින්. ඒ වාගේම ලෝකය බලන සමහර නිර්ණායකවලට අපට ළඟා වෙන්නවත් බැරි තත්ත්වයක් ඇති වෙන්න එක පැත්තකින් හේතු වෙලා තිබෙන්නේ අපි හදා ගත්, මේ වනකොට යල් පැන ගිය නීති රීති සමඟ අලුත් ලෝකයත් එක්ක ගනුදෙනු කරන්න අපහසු වීමයි. BoI-Board of Investment, Sustainable Development Council වාගේ ඒවාට facilitate කරන්න හදපු one-stop shopsවලට පවා අද වෙනකොට මොකක්ද වෙලා තිබෙන්නේ? Facilitate කරන එක කෙසේ වෙතත් ඒවා හැම එකකින්ම අද වෙන්නේ මොකක්ද? සමහර විට ආයෝජකයෝ වෙන්න පුළුවන්, අපි කරන අනෙකුත් ව්‍යාපෘති වෙන්න පුළුවන්, රජය ක්‍රියාත්මක කරන වැඩසටහන් වෙන්න පුළුවන්, මේ සියල්ල අවසානයේ තවත් කාලයක් ගතවීම, එහෙමත් නැත්නම් ඒකට ගතවන කාලය තවත් වැඩි වීම වැනි තත්ත්වයක් තමයි අපි බොහෝ විට දකින්නේ. ඒ නිසා වර්තමානයට ගැළපෙන ආකාරයෙන් ඒ නීති රීති වෙනස් කිරීම, ඊට අවශ්‍ය නව නීති හඳුන්වා දීම තුළ තමයි ලෝකය සමඟ ගනුදෙනු කරන්න පුළුවන් තත්ත්වයට අපේ අධිකරණ පද්ධතියට සහ රටට ගොඩ නැඟෙන්න පුළුවන්කම ලැබෙන්නේ.

පසුගිය කාලයේ සම්මත කර ගත් දූෂණ විරෝධී පනත, මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත වාගේ අණ පනත්වලින් රටක් හැටියට අපට යම් පිළිගැනීමක් ලබා ගන්න පුළුවන් වුණු බවයි මා විශ්වාස කරන්නේ. පක්ෂ විපක්ෂ බොහෝදෙනාගේ අභියෝග සහ බාධක මැද අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන් ගරු අමාත්‍යතුමාට ඒ අණ පනත් මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගන්න පුළුවන්කම ලැබුණා. ඒ අනුව, අවුරුදු ගණනාවක් මේ පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්න බැරි වුණු ඒ අණ පනත් ටික සම්මත කරන්න පසුගිය කාලයේදී අපට පුළුවන්කම ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ විට වාරණයකින් - stay order එකකින් - සමහරු බලාපොරොත්තු වෙන්නේ නඩුවක් ඉස්සරහට අරගෙන ගිහිල්ලා ඒකේ ප්‍රතිඵලය එක්ක කටයුතු කිරීම නොවෙයි. නඩු කටයුත්තකට පටලවලා, ඒ කාර්යය යම් විධියකින් ඇනහිටවීමට පුළුවන්කමක් තිබෙනවා නම්, ඒක තමයි සමහර නඩුවලින් බලාපොරොත්තු වෙන්නේ. අපි බොහොම පැහැදිලිව ඒ තත්ත්වය දැකලා තිබෙනවා. නඩු පැවරුවාට පසු සමහර උදව්වියට සිතාසි යවා ගන්න බැරිව තිබෙන නඩු ගණනාවක් මේ වනකොට උසාවිවල තිබෙනවා.

මීට පෙර මේ ගරු සභාවේදී කිව්වා, නැවි පිළිබඳව පවරා තිබෙන නඩු ගැන. සමහර වෙලාවට ඒ නඩුවට අදාළ වෙන්නේ අපේ අධිකරණ බල ප්‍රදේශ නොවෙන්න පුළුවන්. ඒ කෙසේ වෙතත්, අපේ අධිකරණ බල ප්‍රදේශ තුළ පවා සිතාසි යවා නඩු කටයුතු ආරම්භ කිරීමට නොහැකි තත්ත්වයක් අද උදා වෙලා තිබෙනවා. පසුගිය කාලවල එකතු වුණු නඩුත් එක්ක මහෙස්ත්‍රාත් අධිකරණවල සහ දිසා අධිකරණවල මේ වන විට නඩු විශාල සංඛ්‍යාවක් ගොඩ ගැහිලා තිබෙනවා. හැබැයි ඒ නඩු හරියට සමාලෝචනය කළාම, ඒ සමහර නඩු ආරම්භ කිරීම සහ පවත්වාගෙන යෑම ගැනත් බරපතළ ප්‍රශ්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද නව්‍ය තාක්ෂණය අපේ අධිකරණ පද්ධතියට එකතු කිරීම, එහෙමත් නැත්නම් නව්‍ය තාක්ෂණය හරහා අධිකරණ පද්ධතියේ වැඩ කටයුතු කර ගැනීම අත්‍යවශ්‍ය කාරණාවක් කියා මා හිතනවා. පැරණි ක්‍රමයට සිතාසි භාර දෙන ක්‍රමය තුළ තවත් දින ගණන්, නැත්නම් මාස ගණන් නඩු කටයුතු ප්‍රමාදවන එක වළක්වා, විද්‍යුත් ක්‍රමය යටතේ අදාළ පාර්ශ්වයන්ට සිතාසි ලබා දීමම අධිකරණයේ තිබෙන නඩු කටයුතු තවත් වේගවත් කරන්න ඉවහල් වෙයි කියා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම පැමිණිලිකරු පදිංචි අධිකරණ බල ප්‍රදේශය තුළ නඩු පැවරීමට අවසර දීමත් වැදගත් වෙනවා. මෙහිදී පැමිණිලි පාර්ශ්වය හෝ විත්ති පාර්ශ්වය යන කුමන හෝ පාර්ශ්වයක් පදිංචි අධිකරණ බල සීමාව පදනම් කරගෙන නඩු පැවරීමට හැකියාව ලබා දීලා තිබෙනවා.

එතකොට ඒ පැමිණිලි පාර්ශ්වය හෝ විත්ති පාර්ශ්වය පදිංචි බලප්‍රදේශය තුළ නඩු කටයුතු ඉදිරියට කරගෙන යන්න පුළුවන් කියන්නේ ඒ සියලු පාර්ශ්වයන්ට මේ නඩුව ඉදිරියට ගෙන යෑමට එම කරුණ පහසුවක් බවට පත් වෙනවා කියන එකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ප්‍රායෝගිකව අපි දන්නවා, අපේ ගරු ඇමතිතුමාත් සඳහන් කරපු ආකාරයට සමහර වෙලාවට ඒ පළාත අනුව, ඒ ප්‍රදේශය අනුව ඒ නඩු කටයුතු වෙන් කළාම තවදුරටත් නඩුවලට පෙනී සිටීමටවත් සමහර පාර්ශ්වයන්ට හැකියාවක් නැති බව. ඒ නිසා මේ කියන කාරණා වෙනස් වෙනවා හා සමානව නඩුවකට පෙනී සිටින පුද්ගලයෙකු ඒ නඩුව මහ හැරියා සේ සලකා නඩු කටයුත්ත කරගෙන ගියා නම්, ඔවුන්ට ඒ නඩු තීන්දුව භාර දීමෙන් දින 14කට පසුව appeal කිරීමේ හැකියාව තිබෙනවා. ඒක එක තැනකින් විතරක් ගළපන්න පුළුවන් කාරණාවක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි විද්‍යුත් ක්‍රමය ඔස්සේ නඩු කටයුතු කඩිනම් කරනවා හා සමානව අනෙක් පැත්තෙන් තවත් පාර්ශ්වයක් මේ නිසා අසාධාරණයකට, අයුක්තියකට ලක් වෙන්නත් පුළුවන්. මේ කියන සියලු කාරණා යම් විධියකට සමාලෝචනය කරලා වඩාත් ගැළපෙන විධියට තමයි මේ නීති රීතිවල අවශ්‍ය වෙනස්කම් කරන්න ඕනෑ.

සිවිල් නඩු විධාන සංග්‍රහයට අද ඉදිරිපත් කරන සංශෝධන සියල්ල තුළින් මේ රටේ සමස්ත අධිකරණ පද්ධතියේ තිබෙන නඩු කටයුතු තවත් වේගවත් කරන්නත්, ඒ වාගේම රටේ ජනතාව තුළ අධිකරණ පද්ධතිය කෙරෙහි තිබෙන විශ්වාසය ඒ හරහා තවත් වැඩිදියුණු කර ගන්නත් පුළුවන්කම ලැබෙනවා කියන එක විශේෂයෙන් ම මේ වෙලාවේදී මා සිහිපත් කරන්න ඕනෑ.

අධිකරණ විෂයයට අදාළව කථා කරපු වෙලාවේදී බන්ධනාගාර පිළිබඳවත් කරුණු ඉදිරිපත් වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 12,000ක්, 13,000ක් ඉන්න ඕනෑ බන්ධනාගාරවල 30,000කට එහා ගිය පිරිසක් රඳවියන් හැටියට ඉන්නවා. ඒ රඳවියන් කළමනාකරණය කරගෙන අද මේ කරගෙන යන කටයුතු පිළිබඳව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අප සියලුදෙනා අපේ ගෞරවනීය ස්තුතිය පුද කරන්න ඕනෑ. ඔවුන්ට තිබෙන සීමිත සම්පත් තුළ, අපි ලබා දීලා තිබෙන මුදල් ප්‍රමාණ ආදී මේ සියල්ල එක්ක ගත්තාම ඔවුන් දැඩි අසීරුතා මැද ඒ කාර්යය කරගෙන යනවා. එහිදී සිදුවන වැරැද්දක් දෙකක් අල්ලාගෙන සමස්ත බන්ධනාගාර පද්ධතියට කවුරු හරි කෙනෙක් චෝදනා කරනවා නම් අපි ඒක අනුමත කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දෙන්න පුළුවන්, කරන්න පුළුවන් ඉහළම සේවාවක් ලබා දීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ සියලු නිලධාරීන් කටයුතු කරනවා.

[ගරු අනුරාධ ජයරත්න මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර මන්ත්‍රීවරු මතු කරපු කාරණාවක් තමයි, රැඳවියන් නැවත බන්ධනාගාරය ඇතුළට එනකොට check කළත්, ඔවුන් බන්ධනාගාර ඇතුළට මත් ද්‍රව්‍ය රැගෙන එනවා කියන එක. අපි ඒ සංඛ්‍යාලේඛන දැකලා තිබෙනවා. සමහර කණ්ඩායම් රැඳවියන් හැටියට බන්ධනාගාරයට එන්නේ මෙවැනි මත් කුඩු ඇතුළු මත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ පුද්ගලයන් හැටියටයි. හැබැයි, ඒ නිසා ම PMIS - Prison Management Information System - කියලා අපි වෙනම පද්ධතියක් හදලා තිබෙනවා. රැඳවියන් පිළිබඳ සියලු තොරතුරු අපි එම PMIS එකට ඇතුළත් කරලා තිබෙනවා.

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාට, අපට, මේ වර්ෂ දෙකේදී ඒ පිළිබඳව තීන්දු ගන්න බැරි වෙයි. හැබැයි, බන්ධනාගාරයේ ඉන්න සියලු රැඳවියන් පිළිබඳ දත්ත සියල්ල ඒ පද්ධතියට ඇතුළු කළාම අවුරුදු පහක්, දහයක් යනකොට යම් යම් කාරණා මත බන්ධනාගාරගතවන පිරිස කවුද කියන එක මේ software එක හරහාම analyse කර ගන්න අපට පුළුවන්කම ලැබේවි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ඔය කියන බොහෝ කාරණා තාක්ෂණය එකතු කර ගැනීම තුළින් අපට අවම කර ගන්න පුළුවන්කම ලැබේවි.

අපට එක පැත්තකින් එන චෝදනාවක් තමයි, මේ රටේ මත් ද්‍රව්‍ය ජාවාරම් සියල්ලම බන්ධනාගාරය ඇතුළේ ඉඳලා තමයි කරන්නේ කියන එක. සමහර පරීක්ෂණ කරගෙන යනකොට ඒ පරීක්ෂණ අවසානයේ පාතාලයේ හෝ ඊට සම්බන්ධ කණ්ඩායම් ඉන්නවා කියලා තහවුරු කර ගන්නේ බන්ධනාගාරය තුළයි. එම නිසා එවැනි කිසිදු කටයුත්තක් නොවීම සඳහා අවශ්‍ය සියලු වැඩ පිළිවෙළ බන්ධනාගාර තුළ මේ වන විට අපි යොදා තිබෙනවා. යම් කණ්ඩායමකගේ, එක් කෙනෙකුගේ, දෙන්නෙකුගේ තිබෙන වැරැද්දක් සමස්ත බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ඇඳා ගැනීම කිසිම විධියකින් සුදුසුත් නැහැ, අපි ඒක අනුමත කරන්නේත් නැහැ කියන එක විශේෂයෙන් මේ වෙලාවේදී මා මතක් කරනවා.

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. සිවිල් නඩු විධාන සංග්‍රහයට අවශ්‍ය සංශෝධන ගෙන ඒමට අවශ්‍ය නිරීක්ෂණ ලබා දුන්, අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමට අපි පත් කළ කමිටුවට මගේත්, ගරු අමාත්‍යතුමාගේත් ගෞරවනීය ස්තුතිය මේ වෙලාවේ පුද කරනවා. එහි සභාපතිවරයා හැටියට අභියාචනාධිකරණ විනිසුරු ගරු එම්.ටී.එම්. ලෆාර් මැතිතුමා කටයුතු කළා. ඒ වාගේම වාණිජ මහාධිකරණ විනිසුරු ගරු ආර්.පී. හෙට්ටිආරච්චි මැතිතුමා, දිසා අධිකරණ විනිසුරු ගරු එම්.පී. රණසිංහ මැතිතුමා ඇතුළු 16දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් අවශ්‍ය නිරීක්ෂණ, සංශෝධන ඉදිරිපත් කිරීමය කටයුතු කළා.

16දෙනෙකුගෙන් සමන්විත එම කමිටුවේ සාමාජිකයන්ගේ නම් ලැයිස්තුව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා,

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අධිකරණ අමාත්‍යාංශය වෙනුවෙන් ගරු අධිකරණ අමාත්‍යතුමාගේත්, මගේත් ගෞරවය හා ස්තුතිය ඒ සියලුදෙනාට පළ කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම ඒ කමිටුවේ බොහෝදෙනෙක් වෘත්තීමය වශයෙන් එකතු කර ගත්ත දැනුම රටට අවශ්‍ය සංශෝධන - වෙනස්කම්- කිරීමේදී ස්වේච්ඡාවෙන් ලබා දුන්නු අය. එම නිසා ඒ සියලුදෙනාට අපේ ගෞරවය පළ කරනවා. ඒ වාගේම මේ වෙනුවෙන් කටයුතු කළ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව වාගේම අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්තුමිය ප්‍රධාන ඒ සියලු නිලධාරීන්ටත් අපේ ගෞරවය හා ස්තුතිය පළ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**** සභාමේසය මත තබන ලද නම් ලැයිස්තුව:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட பெயர்ப் பட்டியல்.*
** Name list tabled.*

COMMITTEE MEMBERS

1. Hon. M.T.M. Laffar - Judge of the Court of Appeal - Chairman
2. Hon. R.P. Hettiarachchi - Judge of the Commercial High Court
3. Hon. M.P. Ranasinghe - District Judge District Court, Mount Lavinia - Representative JSC
4. Mr. Sanath Wijewardane - Attorney-at-Law-Co-Chairman
5. Ms. Indika Nagaratne - Attorney-at-Law
6. Mr. Upendra Gunasekara- Attorney-at-Law- Representative from BASL
7. Mr. Sapumal Bandara-Attorney-at-Law
8. Ms. Sudarshi Ranathunga - Attorney-at-Law
9. Ms. Nirodha Kalansooriya-Attorney-at-Law
10. Mr. Sanjeewa Kaluarachchi - Attorney-at-Law- Representative from BASL
11. Ms. Samadhi Bandara - Attorney-at-Law-Convener
12. Ms. Roshini Vilasitha- Senior Assistant Secretary (Legal)- Ministry of Justice
13. Ms. V.L. Dayarathne-Assistant Legal Draftsman - Legal Draftsman Department
14. Mr. P.V. Kidelpitiya-Deputy Registrar of Court of Appeal
15. Ms. S.C. Senevirathne-Court Registrar of District Court Colombo Expert consultant
16. Ms. Kumuduni Abeykoon-Legal Officer, Foreign Ministry

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]
தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[THE HON. DEPUTY SPEAKER in the Chair.]

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 1 to 3 ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම)
வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தின் 27ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 4.- *(Amendment of section 27 of the principal enactment)*

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"2 වන පිටුවේ, 15 වන පේළියේ සිට 19 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර, පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ලියාපදිංචි තැපැලෙන් භාරදීමේ වියදම පියවීම සඳහා අවශ්‍ය මුදලේ වටිනාකමින් යුතු මුද්දර ඒ සන්දේශය සමඟ ලේඛනගත නීතිඥවරයා විසින්, රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර කුරියර් සේවා මඟින් හෝ ඉලෙක්ට්‍රොනික ක්‍රම හරහා භාරදීමේ වියදම ලේඛනගත නීතිඥවරයා විසින් දැරිය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 4, as amended, ordered to stand part of the Bill.

5 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම)
வாசகம் 5.- (முதன்மைச் சட்டவாக்கத்தின் 55ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 5.- *(Amendment of section 55 of the principal enactment)*

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ, 7 වන පේළිය ඉවත් කර, පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සන්දේශය සමඟ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. කුරියර් සේවා මඟින් හෝ ඉලෙක්ට්‍රොනික ක්‍රම හරහා භාර දීමේ වියදම ඔහු විසින් දැරිය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 5, as amended, ordered to stand part of the Bill.

6 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම)
வாசகம் 6.- (முதன்மைச் சட்டவாக்கத்தின் 59ஆம் பிரிவை மாற்றீடு செய்தல்)
CLAUSE 6.- *(Replacement of section 59 of the principal enactment)*

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "5 වන පිටුවේ, 4 වන පේළිය ඉවත් කර, පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'59.(1) (අ) සාමාන්‍යයෙන් කැඳවීම් නියෝග භාරදෙන්නා මඟින්, ලියාපදිංචි තැපැලෙන්' "

(2) "5 වන පිටුවේ, 15 වන පේළිය ඉවත් කර, පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'එහි ප්‍රධාන ව්‍යාපාර ස්ථානයට කැඳවීම් නියෝග භාර දෙන්නා මඟින්, ලියාපදිංචි' "

(3) "5 වන පිටුවේ, 21 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සිටින දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත කැඳවීම් නියෝග භාරදෙන්නා මඟින්, ලියාපදිංචි' "

(4) "6 වන පිටුවේ, 2 වන පේළිය ඉවත් කර, පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'නිලධරයකු වෙත කැඳවීම් නියෝග භාරදෙන්නා මඟින්, ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර්' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 6, as amended, ordered to stand part of the Bill.

7 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම)

வாசகம் 7.- (முதன்மைச் சட்டவாக்கத்தின் 60ஆம் பிரிவை மாற்றீடு செய்தல்)

CLAUSE 7.- *(Replacement of section 60 of the principal enactment)*

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"7 වන පිටුවේ, 14 වන පේළියේ සිට 32 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර, පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'කැඳවීම් නියෝග භාරදෙන්නා මඟින් සිතාසි භාරදීම	60. (1) (අ) කැඳවීම් නියෝග භාරදෙන්නා මඟින් සිතාසි භාරදෙන විට සිතාසි සමඟ පළමුවන උපලේඛනයේ අංක 17 දරන ආකෘතියෙහි වූ අණ පත්‍රයක් ද සහිත විය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

7 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
7ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 7, as amended, ordered to stand part of the Bill.

8 සිට 14 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
8ஆம் வாசகத்திலிருந்து 14ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 8 to 14 ordered to stand part of the Bill.

15 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම)

வாசகம் 15.- (முதன்மைச் சட்டவாக்கத்துக்கான முதலாம் அட்டவணையைத் திருத்துதல்)

CLAUSE 15.- *(Amendment to First Schedule to the principal enactment)*

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "14 වන පිටුවේ, 11 වන පේළිය ඉවත් කර, පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'හෝ අවසාන තීන්දු ප්‍රකාශයකට විරුද්ධව මහාධිකරණයට, අභියාචනාධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කිරීමට ද, ඒ' "

(2) "15 වන පිටුවේ, 11 වන පේළියේ සිට 17 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර, පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'.....

ලේඛනගත නීතිඥවරයාගේ අත්සන
(නිල මුද්‍රාව)

ලිපිනය:
දුරකථන අංක : කාර්යාලීය:
ජංගම දු. අ.:
විද්‍යුත් තැපැල් ලිපිනය:
ෆැක්ස් අංකය:' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

15 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
15ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 15, as amended, ordered to stand part of the Bill.

16 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
16ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 16 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය, දීර්ඝ නාමය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் விரிவுப் பெயரும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause, Long Title and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත රීට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

අධිකරණ සංවිධාන පනත: නියෝග
நீதித்துறைச் சட்டம்: ஒழுங்குவிதிகள்
JUDICATURE ACT: REGULATIONS

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 නොවැම්බර් 27 දිනැති අංක 2360/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 පෙබරවාරි 13 දිනැති අංක 2371/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.04.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා.

රට ගොඩනැඟීම උදෙසා තරුණ ප්‍රජාව දායක කරගැනීම
நாட்டைக் கட்டியெழுப்புவதில் இளைஞர்களின் ஈடுபாடு
INVOLVEMENT OF THE YOUTH IN BUILDING THE COUNTRY

[අ.භා. 5.35]

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාසල් අධ්‍යාපනයේ ඇති අවිධිමත්භාවය නිසා රටේ තරුණ දරුවන් විශාල ප්‍රමාණයක් සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු අධ්‍යාපනය අත්හරින අතර, ඔවුන් වෙනුවෙන් නිසි වැඩසටහනක් මෙතෙක් ක්‍රියාත්මක නොවේ.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන තාරුණ්‍යය විවිධ හේතූන් මත තමාගේ ජීවිතයේ වටිනාම කාලය නිකරුණේ ගෙවා දමයි. විවිධ වෘත්තීය දක්ෂතා ඇති ශ්‍රී ලාංකික තරුණ පරම්පරාව ද කිසිදු ඇගැයීමකට ලක් නොවන අතර, අපේක්ෂා භංගත්වයට පත් තාරුණ්‍යයේ එකම අරමුණ මාතෘ භූමිය හැර දා වෙනත් රටකට යාමයි.

තරුණයාගේ සැබෑ ප්‍රශ්න හඳුනාගෙන රටේ අනාගතය උදෙසා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම ඉතාම අත්‍යවශ්‍ය මොහොතක් වන මෙම කාල සීමාව තුළ ඊට සාධනීය පියවරක් තැබිය යුතු අතර, තාරුණ්‍යයට නිසි වටිනාකමක් දිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ හේතුව මෙයයි. ආර්ථික විශේෂඥයන් කියන විධියට මේ ආර්ථික අර්බුදය ආපු වෙලාවේ එය විසඳීමට තිබෙන එකම විසඳුම මේ රටේ බුද්ධිගලනය සිදුවීම - බුද්ධිමතුන් රට හැරයාම - බවත්, එය නිවැරදි දෙයක් බවත් ආණ්ඩු පක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් රූපවාහිනී වැඩසටහනකදී කිව්වා මට මතකයි. අපි ඒ වෙලාවේදී ප්‍රශ්න කළා, එය හරිද කියලා. ආර්ථික අර්බුදයකදී න්‍යායාත්මකව එය නිවැරදියි කියලා දැඩි තර්කයක් ගෙනෙන්න හැදුවා. මම එදා ඉඳලා කල්පනා කළා, ඒ මතය මොකක්ද කියන කාරණය පිළිබඳව. මේ වනකොට අපේ රටේ වෛද්‍යවරු බොහෝදෙනෙක් සම්පූර්ණයෙන්ම මේ රට අත්හැර දමමින් යනවා. ඉංජිනේරුවරු ඇතුළු වෘත්තිකයින් විශාල පිරිසක් මේ රට හැර දමා යනවා.

අධ්‍යාපන ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, පසුගිය කාලයේ ලබා දීපු අවුරුදු පහේ නිවාඩුව ලබාගෙන ගුරුවරු කොපමණ ප්‍රමාණයක් මේ රට අත්හැර වෙනත් රටවලට ගිහින් ඇත්ද? අපේ රටේ වෘත්තිකයන් රට හැර යෑම හරහා විදේශ විනිමය රටට ඇවිත් රටේ ආර්ථික ප්‍රශ්න විසඳාගෙන රට සංවර්ධිත මාර්ගයකට ගෙන යන්න පුළුවන් කියන විශ්වාසයක් කාට හෝ තිබෙනවා නම් මම හිතන විධියට එය තර්කානුකූල නැහැ. එහෙම නම් මේ රට අන්තිමේදී බුද්ධිමතුන්ගෙන් තොර රටක් බවට පත් වේවි. ඒ ගැන අපේ වර්තමාන ආණ්ඩුවට කිසි උත්තරයක් නැහැ, ඒ වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් මේ තාක් ක්‍රියාත්මක වෙලාත් නැහැ වාගේම ඒ ගැන කිසිවක් ප්‍රකාශ කරලාත් නැහැ කියන කාරණයත් විශේෂයෙන්ම මේ වෙලාවේදී මා රජයේ අවධානයට ලක් කරනවා.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා අධ්‍යාපන අමාත්‍යාංශය භාර ගන්න පෙර ඉඳලා අපි කිව්වා, මේ රටේ අධ්‍යාපන ක්‍රමයේ ව්‍යුහාත්මක වෙනසක් අනිවාර්යයෙන්ම කළ යුතුයි කියලා. මේ

[ගරු හේෂා විතානගේ මහතා]

රටේ ප්‍රශ්න බොහොමයකට තිබෙන එකම පිළිතුර තමයි මේ රටේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කිරීම.

සාම්ප්‍රදායික, යල් පැන ගිය ක්‍රම තුළ වසර ගණනාවක් පැමිණීම හේතුකොට ගෙන ලොකු බෙදීම්, විෂමතා ඇති වෙලා අවසානයේ ජාත්‍යන්තරය සමඟ ගැටෙන්න පුළුවන් ආකාරයේ පුද්ගලයෙකු අපේ අධ්‍යාපනයෙන් එළියට දීමේ හැකියාව අපේ රටට අහිමි වෙලා තිබෙනවා.

මම සරල උදාහරණයක් ගන්නම්. සමහර වෙලාවට අපෙන් කියවෙනවා, "රැකියා දෙන්න ගියාම ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අපේ රටේ වැඩිපුර ඉන්නේ කලා උපාධිධාරින්" කියලා. ඒක ඇත්ත. කලා උපාධිධාරින් තමයි වැඩිපුර ඉන්නේ. රැකියා ලබා දීමේදී විශාල වශයෙන් පෞද්ගලික අංශය කලා උපාධිධාරින්ට ඒ අවස්ථාව, තැන ලබා දෙන්නේ නැහැ. ඒකේ වරදකුත් නැහැ. මොකද, පෞද්ගලික ආයතනයකට වෘත්තිකයන් බඳවා ගන්නකොට ඒ ආයතනයේ අරමුණු කරා යා හැකි දැනුමෙන් සන්නද්ධ කෙනෙක් බඳවා ගන්න තමයි උත්සාහ කරන්නේ. ඒත් අපේ රටේ කලා උපාධිධාරින් වැඩිපුර බිහිවෙන්න හේතුව මොකක්ද කියන කාරණාවට කවුරුවත් ආමන්ත්‍රණය කරන්නේ නැහැ. මම හිතන විධියට අධ්‍යාපන ඇමතිතුමා මේ වෙනකොට ඒ සඳහා යම් යම් පියවර අරගෙන තිබෙනවා. හැබැයි, ඒක මේ පාර්ලිමේන්තුව තුළින් මහ පොළොවේ පැළ කරන්න පුළුවන් මට්ටමට තවම ඇවිත් නැහැ. අධ්‍යාපන ක්‍රමයේ තිබෙන විෂමතාව නිසා ග්‍රාමීය පාසල්වල අධ්‍යාපනය ලබන දරුවාට තිබෙන පහසුකම් සහ කොළඹ ඇතුළු තදාසන්න නගරවල පාසල්වල අධ්‍යාපනය ලබන දරුවාට තිබෙන පහසුකම් අතර වෙනස උපාධිධාරින් බිහි වීමේදී විශාල වශයෙන් බලපානවා. උදාහරණයකට මොනරාගල දිස්ත්‍රික්කය, හම්බන්තොට දිස්ත්‍රික්කය, මම නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කය ගත්තොත්, කලා අංශයෙන් පමණක් උසස් පෙළ හැදෑරීමේ පහසුකම් ඇති පාසල් තමයි විශාල ප්‍රමාණයක් තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කය ගත්තත්, සාමාන්‍ය පෙළ විභාගයෙන් "ඒ" සාමර්ථ නවයක් ලබා ගන්න දරුවාට උසස් පෙළ හදාරන්න තිබෙන ආසන්නතම පාසලේ පහසුකම් තිබෙන්නේ කලා අංශයෙන් ඉගෙන ගන්නයි. දරුවාට නගරයේ පාසලකට යන්න මූල්‍යමය හැකියාවක් නැත්නම්, අනේ ඉතින් කලා අංශයෙන් තමයි ඉගෙන ගන්න වෙන්නේ. ඒ දරුවා කලා අංශයෙන් ඉගෙන ගෙන "ඒ" සාමර්ථ තුනක් අරගෙන විශ්වවිද්‍යාලයට එනවා. හැබැයි, ඒ දරුවා ලබා ගන්න උපාධිය කලා උපාධියක්. ඒ දරුවා අධ්‍යාපන කටයුතු අවසන් කරලා රැකියාවක් ලබන්න, වෘත්තිකයෙක් වෙන්න ගියාම, යම් යම් අපහසුතාවලට ලක් වෙනවා. අධ්‍යාපනයේ තිබෙන විෂමතාව වාගේම අවශ්‍ය පහසුකම් සමානව බෙදී නොයෑම මේ තත්ත්වයට හේතුවක් වෙනවා කියලා මම හිතනවා. මම මේ කෙටියෙන් කියන්නේ වෙලාව සීමිත නිසා. ගරු අධ්‍යාපන ඇමතිතුමාට මේ ප්‍රශ්නය ගැන හොඳ අවබෝධයක් තිබෙනවා.

ඊළඟ කාරණාව අපේ රටේ තරුණයා සම්බන්ධවයි. අපේ රටේ තරුණයන් වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාව වැනි ආයතන විශාල ප්‍රමාණයක් තිබෙනවා. හැබැයි, මේ හැම ආයතනයකම වෙන්නේ සාම්ප්‍රදායික ක්‍රියාවලියක්. වෘත්තීය පුහුණු අධිකාරිය හරහා රටේ වෘත්තිකයන් නිර්මාණය කරන්න, සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව එළියට යන දරුවා, උසස් පෙළ විභාගයෙන් පසුව එළියට යන දරුවා වෘත්තීය අධ්‍යාපනයට යොමු කරන්න කියලා අපි කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ දරුවාට වෘත්තීය අධ්‍යාපනයට යොමු වෙන්න කියලා කිව්වත් රැකියාවක් අහිමුබ වෘත්තීය අධ්‍යාපනයක් ලබා දෙන්න මේ ආයතනවලට වුවමනාවක් නැහැ; හැකියාවක් නැහැ; අවශ්‍ය පහසුකම් ටික නැහැ; අවශ්‍ය මහ පෙන්වීම නැහැ.

මම මේ අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කරනවා. අද යෞවන කටයුතු භාරව තරුණ ඇමතිවරයෙක් තමයි කටයුතු කරන්නේ. ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමනි, තරුණ සේවා සභාව දැන් තිබෙන තැනින් එහාට ගිහිල්ලා ටිකක් පුළුල්ව හිතන්න පුළුවන් තැනකට ගේන්න ඕනෑ. වෘත්තීය අධ්‍යාපනය ලබා දීමේ වගකීමේදී වෘත්තීය පුහුණු අමාත්‍යාංශයත්, වෘත්තීය පුහුණු අධිකාරියත් එකතු කරගෙන, ජනාධිපතිතුමා එක්කත් කථා කරලා, ජාතික තරුණ සේවා සභාව පියවරක් ගන්න ඕනෑ. අපි දන්නවා, විදුලිබල ක්ෂේත්‍රය පැත්තෙන් ගත්තොත්, මේ රටේ වෘත්තිකයන්ට විදුලි ඉංජිනේරුවරයෙක් දක්වා යන්න පුළුවන්. අද අපේ ගම්වල ගෙදරක වයරින් වැඩක් කරගන්න මනුස්සයෙක් නැහැ. ඒ වැඩ කරන්න සොයා ගන්න කෙනාත් මහ විශාල ගණනක් අය කරනවා. තරුණයන් ඒ වෙනුවෙන් උනන්දු කරවන්න කටයුතු කරන්න අවශ්‍යයි. මේ වෘත්තිකයන් හදන්න ජාතික තරුණ සේවා සභාවත් එක්ක එකතු වෙලා ලංකාව පුරා වැඩසටහනක් යනවා නම්, මේ රටේ තරුණයා ත්‍රිරෝද රථ පදවන රැකියාවට යොමු වෙන එකක් නැහැ. මේ රටේ තරුණ , තරුණියන් ගාමන්ට එකක් විවෘත කරනකම් බලාගෙන ඉන්න එකක් නැහැ. ඒ නිසා රටේ තාරුණ්‍යය නිසි ලෙස කළමනාකරණය කිරීම සඳහා තරුණ කටයුතු ඇමතිවරයාගේ, අධ්‍යාපන අමාත්‍යවරයාගේ, ජනාධිපතිවරයාගේ අවබෝධය තුළ, එහෙම නැත්නම් මැදිහත්වීම තුළ නිසි ගමනක් යන්න අවශ්‍යයි. එහෙම නැතිව තරුණයාට "නුඹ රට පලයන්" කියලා මේ රට දියුණු කරන්න පුළුවන් කියලා විශ්වාස කරනවා නම් ඒක මුළාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණය කියනවා. මේ රටේ තරුණයාට නිසි තැන ලබා දීලා ඒ වෙනුවෙන් කළ හැකි දේ කරන්න ඕනෑ. තරුණ සම්පත රටේ සංවර්ධනය වෙනුවෙන් යොදා ගන්න අවශ්‍ය පරිසරයක් හදා ගැනීම වත්මන් ආණ්ඩුවේ -රජයේ- වගකීම වෙනවා. ඔවුන් ඒ වගකීම පැහැර හැරියාට අපේ රජයක් තුළදී ඒ අත්හළ නොහැකි වගකීම මේ රටේ තාරුණ්‍යය වෙනුවෙන් ඉටු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

යෝජනාව ස්ථිර කිරීම, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.43]

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු හේෂා විතානගේ මැතිතුමා අද ඉතාම කාලෝචිත යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවා. ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමාත් මේ මොහොතේ මේ ගරු සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාත් මේ රටේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන්න විශාල උත්සාහයක් දරමින් ඉන්නවා. ඒක අපි හැමෝම දන්නා කාරණයක්. ප්‍රායෝගිකව බැලුවාම, අද අපේ රටේ ලබන අධ්‍යාපනයේ අවසාන ප්‍රතිඵලය

විධියට -මම කිහිප වතාවක්ම අපේ ඇමතිතුමා එක්කත් මේ ගැන කථා කළා- අපේ දරුවෝ විශාල ප්‍රමාණයක් උපාධියක් ලබාගෙන අද එළියට වෙලා රැකියාවක් ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් ඉන්නවා. අවසානයේ ඒක චෝදනාවක් බවට පත් වෙලා පෙළපාළි, උද්ඝෝෂණ යෑමට පවා විශාල නැඹුරුවක් දක්වන තත්ත්වයට අද පත් වෙලා සිටිනවා. ඇයි මෙහෙම වෙලා තිබෙන්නේ? අපි දන්නවා, මේ රටේ උපාධිය දක්වා යන්න පුළුවන් වන්නේ විභාගවලින් බේරිලා බේරිලා ආපු බොහොම සීමිත පිරිසකට බව. අධ්‍යාපනයේ වැඩි දක්ෂතාවක් දක්වපු පිරිසකට තමයි එහෙම උපාධියක් ලබා ගන්න පුළුවන් වන්නේ. හැබැයි, උපාධිය ලබපු, අපේ අධ්‍යාපනයෙන් බිහි වෙච්ච ඒ හොඳම ස්පිරිට් එක අවසානයේ මහ පාරේ බෝඩ් ලෑල්ලක් උස්සාගෙන රජයට බලපෑම් කරන පිරිසක් බවට අද පත් වෙලා තිබෙන්නේ ඇයි? අපේ රටේ අධ්‍යාපනය ලෝකය එක්ක update වෙලා ඉස්සරහට ඇවිල්ලා තිබෙනවාද කියන කාරණයත් එක්කයි අපට මේ තත්ත්වයට මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ.

ඒ වාගේම උපාධිධාරියා රැකියාවක් නැතුව පාරේ වේළෙනකොට, අනික් පැත්තෙන් අපේ රටේ විශාල ව්‍යාපාරවල රැකියා අවස්ථා සඳහා සහ පෞද්ගලික අංශයේ රැකියාවලට පුද්ගලයන් නැතුව දැන්වීම් දමමින්, විදේශ රටවලින් පවා පුද්ගලයන් ගෙනැල්ලා ඒ ඇබෑර්තු පුරවා ගන්නා අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ නිසා අපේ රටේ සහ ලෝකයේ රැකියා වෙළඳපොළට ගැළපෙන අධ්‍යාපන ක්‍රමයක් අපේ රට තුළ නිර්මාණය කිරීමේ අවශ්‍යතාව තිබෙන බව බොහොම පැහැදිලියි. ඒ නිසා ගරු අමාත්‍යතුමනි, අපි වෘත්තීය අධ්‍යාපනයට යා යුතුව තිබෙනවා. අපේ රටේ කාර්මික විද්‍යාලවලින් ඉගෙනගත් සහ පෞද්ගලිකව ගරාජ්වල වැඩ කරලා වැඩ ඉගෙන ගත් හොඳ වෙල්ඩර්ස්ලා පවා ඉන්නවා; වෙල්ඩින් වැඩ කරන්න පුළුවන් දක්ෂ අය ඉන්නවා. අපි දන්නවා, එවැනි අයකුට යුරෝපා රටකට ගිහිල්ලා රැකියාව කරලා ලක්ෂ 80කට වැඩි මාසික වැටුපක් ලබා ගැනීමේ හැකියාව තිබෙන බව. හැබැයි, එහෙම තත්ත්වයක් තිබුණාට අපේ රටින් ඒ රටවලට තරුණයන් යවා ගන්නට හැකියාවක් නැහැ. මොකද, අපේ දරුවන්ගේ ඉංග්‍රීසි දැනුම මදිකම සහ ඒ අවශ්‍ය විභාග ටික සමත් කරන්න හැකියාවක් නැතිකම නිසා. ඒ වාගේම, අපේ දරුවන්ට හොඳ පුහුණුවක් තිබුණාට සහතිකයක් නැහැ. NVQ මට්ටමේ සහතිකයක්, ජාත්‍යන්තරය පිළිගන්නා සහතිකයක් අපේ දරුවන්ට නැහැ. සහතිකය තිබුණත් ඒ දරුවාට ඉංග්‍රීසි දැනුම නැහැ. ඒ කාරණා නිසා ලෝක ශ්‍රම වෙළඳ පොළේ ඒ රැකියාවලට පුද්ගලයන් හිඟව පැවතියත් ඒ රැකියා අවස්ථා සඳහා පිරිස යැවීමට අපට හැකියාවක් නැහැ.

ඒ වාගේම ජල නළ කාර්මිකයන් සඳහා විශාල ඉල්ලුමක් ලෝක ශ්‍රම වෙළඳපොළේ තිබෙනවා. Motor mechanics පැත්තෙන් ගත්තාමත් විශාල ඉල්ලුමක් තිබෙනවා. හැබැයි, අපේ රටේ කලා උපාධිය කර පින්නාගත් දරුවෝ වැඩියි. සිංහල, බෞද්ධ ශිෂ්ටාචාරය, දේශපාලන විද්‍යාව වාගේ විෂයයන් ටිකට පමණක් සීමා වෙච්ච අධ්‍යාපන ක්‍රමයක් තුළ අපේ රටේ මේ තත්ත්වය නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා අපේ රටේ අධ්‍යාපනයේදී පරිගණක දැනුම, ඉංග්‍රීසි දැනුම එක්ක වාගේම දියුණුවන ලෝකයත් එක්ක ඉස්සරහට යන්න අත්‍යවශ්‍ය වන විෂයන් ටික හදුනාගෙන, වෘත්තීය පුහුණුවත් එක්ක ඉදිරියට යන වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. ඒ වෙනුවෙන් යම් උත්සාහයක් දරනවා. නමුත් එය ප්‍රමාණවත් නොවන තත්ත්වයක් තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. ඒ සඳහා අවශ්‍ය භෞතික සම්පත්වල හිඟයක් තිබෙන්න පුළුවන්. නමුත් ඒ සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මම තව කාරණයක් කියන්න කැමැතියි. අපේ රටේ දරුවන් අපොස උසස් පෙළ හදාරන්න පාසල්වලට ඇතුළත් වුණාම, ඉස්සෙල්ලාම නීතියක් දමනවා පැමිණීම සියයට 80 නැත්නම් විභාගයට ඉදිරිපත් වෙන්න දෙන්නේ නැහැ කියලා. හැබැයි, පාසලකට ගිහිල්ලා බලන්න උසස් පෙළ පන්තිවල දරුවෝ කීයෙන් කී දෙනාද පාසලට එන්නේ කියලා. දරුවන් පාසලට එන්නේ නැහැ. නමුත් කොහොම හරි අවසානයේ ඒ දරුවන් විභාගයට ඉදිරිපත් වෙනවා. එතකොට පාසලේ තිබෙන භෞතික සම්පත් සහ මානව සම්පත් එහෙම පිටින්ම අපරාදේ. ඒ නිසා මේ තත්ත්වය කළමනාකරණය කරලා ඒ සම්පත් ටික අපට අවශ්‍ය විධියට පෙළ ගස්වන්න පුළුවන් නම් වැදගත්. අනික් පැත්තෙන් අපේ දරුවන්ගේ කාලය කොච්චර ප්‍රමාණයක් අපතේ යනවාද කියන කාරණය බලන්න. උසස් පෙළ හදාරන ළමයින් සතියක් පාසලට ගිහිල්ලා පැය 6, 6 ඉගෙන ගන්නවා. හැබැයි, සති අන්තයේ පෞද්ගලික පන්තියේදී පැය දෙකකින් ඒ සතියක විෂයය ආවරණය කෙරෙනවා. එතකොට ඉස්කෝලේ සතියක් ඉගෙන ගත්ත දේ පැය දෙකකින් උගන්වන ප්‍රමාණය ඇතිද? හැබැයි, ඒ පිළිබඳව ළමයින් සෑහීමකට පත්වීමක් තිබෙනවා, දෙමව්පියන්ගේත් සෑහීමකට පත්වීමක් තිබෙනවා. පාසලට ගිහිල්ලා පැය 6ක් ඉගෙන ගන්න එකට වැඩිය, දරුවා පෞද්ගලික පන්තියට යවන්න අද දෙමව්පියන්ගෙත් උනන්දුවක් තිබෙනවා. මොකද, ඒ ආවරණයවීම තුළ දරුවන් විභාග ජයග්‍රහණය කරනවා කියන විශ්වාසය තිබෙනවා. ඒ නිසා රජයේ පාසල්වලට උසස් පෙළ හදාරන්න එනවාට වැඩිය විශාල උනන්දුවකින් පෞද්ගලික පන්තිවලට යන ප්‍රවණතාවක් ගොඩ නැගිලා තිබෙනවා.

ඒ වාගේම දැන් අනෙක් පැත්තෙන් පෞද්ගලික විශ්වවිද්‍යාලවලට යොමු වීම වැඩි වෙලා තිබෙනවා. දැන් උසස් පෙළ සාමාන්‍ය ලෙස සමත් වෙලා මෙන්ම, සාමාන්‍ය පෙළ විභාගය සමත්ව, උසස් පෙළ නොකර පෞද්ගලික විශ්වවිද්‍යාලවලට යොමු වෙලා උපාධිය දක්වා යන්න පෙලඹිලා තිබෙනවා. දැන් දෙමව්පියන් පවා පෙළ ගැසෙමින් ඉන්නවා, දරුවන් සාමාන්‍ය පෙළින් පසු foundation course එකක් කරලා - උසස් පෙළ නොකර - පෞද්ගලික විශ්වවිද්‍යාල හරහා උපාධිය දක්වා ගෙන යන්න.

ඒ ආකාරයට කටයුතු කළාම දරුවන්ගේ කාලය අපතේ යන්නේ නැහැ. අතේ මීටේ යමක් තිබෙන දෙමව්පියන්ට ඒ වැඩේ කරන්න පුළුවන්. හැබැයි, අතේ මීටේ සල්ලි නැති දෙමව්පියන් එහෙම කරන්නේ කොහොමද? උසස් පෙළ කළොත් තමන්ගේ දරුවන්ගේ කාලය අපරාදේ කියන එක තමයි බොහෝ දෙමව්පියන් කියන්නේ. ණය වෙලා හෝ දරුවන්ට උසස් පෙළ කරවන එක අපරාධයක් බවට අද බොහෝ දෙනෙක් විශ්වාස කරන තැනට අපේ රටේ අධ්‍යාපනය හැඩ ගැසී තිබෙනවා.

කාලය ඉක්ම ගොස් තිබෙන නිසා මම බොහොම කෙටියෙන් මේ කාරණා කියන්නේ. ගරු ඇමතිතුමනි, මේ තුළ බැරෑරුම් කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. ඒ නිසා අපි මේ සම්බන්ධයෙන් අධ්‍යයනයක් කළ යුතුයි. අපේ පාසල් පද්ධතිය තුළ අද වන කොට උසස් පෙළ සිසුන් සම්පූර්ණයෙන් වාගේ පාසල් එන්නේ නැහැ. සාමාන්‍ය පෙළ නම් බොහෝ වෙලාවට එවැනි තත්ත්වයක් නැහැ. සාමාන්‍ය පෙළ දරුවන් තවම පාසල් එනවා. හැබැයි උසස් පෙළ දරුවෝ විශාල පිරිසක් පාසල් එන්නේ නැහැ. Revision පටන් ගත්තාට පසුව නම් උසස් පෙළ දරුවන් පාසල්වල කොහොමටත් දැක ගන්නට නැහැ.

අපි එක් පැත්තකින්, පාසල්වල පවතින ගුරු හිඟය ගැන කථා කරනවා. තවත් පැත්තකින්, සමහර ඉස්කෝලවල පවතින භෞතික සම්පත් හිඟයක් ගැන කථා කරනවා. හැබැයි, සමහර විද්‍යාලවල ඒ සම්පත් අපරාදේ අපතේ යමින් තිබෙන බව බොහොම පැහැදිලිව පෙනෙනවා. ඒ නිසා මේ සියලු කාරණා

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

හරියාකාර ගළපා ගෙන, ලෝකයත් එක්ක update වන ආකාරයේ, ලෝක ශ්‍රම වෙළෙඳ පොළට ගැළපෙන ආකාරයේ අධ්‍යාපන ක්‍රමයක් අපේ රට තුළ නිර්මාණය කර දීමට අවශ්‍ය ආරම්භය ලබා දෙන්නට ඔබතුමා අධ්‍යාපන අමාත්‍ය ධුරය දරන කාල සීමාව තුළ කටයුතු කරන්න, ගරු අමාත්‍යතුමනි.

ජනාධිපතිවරයා නම් දැන් මොන විජ්ජාවක් කරයිද දන්නේ නැහැ. නමුත්, මේ ආණ්ඩුවේ, ජනාධිපතිවරයාගේ නිල කාලය දැන් නීත්‍යානුකූලව අවසන් වෙගෙන යනවා. ගරු ඇමතිතුමනි, මේ කෙටි කාල සීමාවේ ඉහත කී සියල්ල කරන්න බැරි වුණත් ඔබතුමා යම්කිසි අඩිතාලමක් - foundation එකක් - හෝ දමා අධ්‍යාපන ක්‍රමය නව ලෝකයට ගැළපෙන ආකාරයෙන් සකස් කිරීමේ වැඩ පිළිවෙළ ආරම්භ කළොත්, ඒ තුළින් අධ්‍යාපනයේ අනාගතය වෙනුවෙන් සහ රටේ අනාගතය සහ උන්නතිය වෙනුවෙන් විශාල කාර්යභාරයක් සිදු වෙයි කියා මා විශ්වාස කරනවා. ඒ වෙනුවෙන් ඔබතුමාට අවශ්‍ය ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යතුමා.

[අ.භා. 5.49]

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මේෂා විතානගේ මන්ත්‍රීතුමා විසින් අද සභාව කල්තැබීමේ යෝජනාව හැටියට ඉදිරිපත් කරලා, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරලා කථා කළේ, කාලීන වශයෙන් වැදගත් වන ප්‍රශ්නයක් ගැන.

මෙහිදී විශේෂයෙන්ම කියන්න ඕනෑ, මම මේ අමාත්‍යාංශයේ වගකීම භාර ගත්තේ කවුරුවත් එම වගකීම භාර නොගත් අවස්ථාවක බව. ඒ වෙලාවේ ඇමතිකම් පවා දමා ගියා, සමහරු. ඒ වෙලාවේ රට තුළ තිබුණු තත්ත්වයත් එක්ක මේ වගකීම භාර ගන්න කොට මට ඕනෑ කළේ, මෙම ක්ෂේත්‍රයේ කටයුතු අද වන විට යථා තත්ත්වයට පත් කර ගැනීමයි. එතැනින් එහාට යන වැඩ පිළිවෙළත් ඒ සමඟම ක්‍රියාත්මක කරන්න යම්තාක් දුරකට පුළුවන් වුණා.

මම මේ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් කියන්නම්. මම විශේෂයෙන්ම සංඛ්‍යාලේඛන ටිකක් දෙන්නම්. පසුගිය වර්ෂයේ උසස් පෙළ විභාගයට පෙනී සිටියා, සිසුන් 333,000ක්. ඒ අය අතරින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විෂයයන් තුන සමත් වුණා, 170,000ක්. සාමාන්‍යයෙන් සිසු සිසුවියන් 41,000ක්, 42,000ක් විතර තමයි විශ්වවිද්‍යාල 17හිම සියලු පාඨමාලාවලට අදාළව බඳවා ගන්නේ. මේ අවුරුද්දේ නම් එම ප්‍රමාණය 43,000ක් වනවා. උපාධි පාඨමාලා තිබෙනවා, 860කට වඩා. එම පාඨමාලා 860න් කොයි තරම් ප්‍රමාණයක් යල් පැන ගිහින් ද, කොයි තරම් ප්‍රමාණයක් අනාගත ලෝකයේ නිර්මාණය වන රැකියා අවශ්‍යතා සපුරන්න සූදානම් ද කියන කාරණය විශ්වවිද්‍යාල පද්ධතියේ තිබෙන ප්‍රධාන ගැටලුවක්.

අද විශ්වවිද්‍යාලවලට සිසු සිසුවියන් 43,000ක් ඇතුළත් වන විට අවුරුද්දකදී දළ වශයෙන් 40,000ක් විශ්වවිද්‍යාලවලින් පිට වෙනවා කියා අපි හිතමු. එම 40,000න් වෛද්‍ය පීඨයෙන් 2,500ක් පමණ, ඉංජිනේරු පීඨයෙන් 2,200ක් පමණ, quantity surveyorsලා වශයෙන් යම් ප්‍රමාණයක්, marketing පැත්තෙන් යම් ප්‍රමාණයක් හැරුණාම, උපාධිධාරීන් 30,000ක් විතර රැකියා විරහිත වෙළෙඳ පොළට එකතු වෙනවා. මේ සමස්ත ප්‍රමාණයෙන් සියයට 40ක් කලා උපාධිධාරීන්. කලා උපාධියේත් තිබෙනවා විවිධ ක්ෂේත්‍ර. සමහරු දේශපාලන විද්‍යාවත් එක්ක ආර්ථික විද්‍යාව හදාරනවා. තවත් සමහරු මාධ්‍ය විෂයය එක්ක උපාධිය හදාරනවා. ඒ විධියට විෂයයන් හැදීරීම කරනවා. මේ සියලුදෙනා රැකියාවක් නැති වුණාම තමයි අන්තිමටම ගුරු වෘත්තියට එන්නේ. එතකොට මොකද වෙන්නේ?

අපේ රටේ පාසල් පද්ධතිය තුළ ඇති පාසල් 10,026න්, පාසල් 5,000ක් විතර සිසුන් 200ට අඩු ඒවායි. 1AB පාසල් තිබෙන්නේ 925ක් විතර. 1C පාසල් තිබෙන්නේ 900ක් විතර. දෙකම එකතු වුණාම, උසස් පෙළ පන්ති සහිත පාසල් තිබෙනවා 2,000ක්. ඒවායෙන් 1AB පාසල්වල තමයි කලා, වාණිජ, විද්‍යා විෂයය ධාරා සහ තාක්ෂණවේදය විෂයය ධාරාව තිබෙන්නේ. තාක්ෂණ පීඨ පටන් ගත්තාම තාක්ෂණවේදය හදුන්වා දුන්නාට පසුව එයට විශාල ඉල්ලුමක් තිබුණා. තාක්ෂණවේදයේ තවත් කොටස් තුනක් තිබෙනවා.

අපි ඉස්සෙල්ලාම කළේ පැවැති තත්ත්වය පාලනය කර ගත්ත එක. ඒ අනුව මේ වන කොට ගුරු ඌනතාව සෑහෙන දුරට සම්පූර්ණ කර තිබෙනවා. සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රශ්නයත් අපි ඊයේ විසඳුවා, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් සමථයකට පත් කරලා. ඒ අනුව ඒ අයට පුළුවන්, ඊළඟ සති දෙකේදී පළාත් මට්ටමින් පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව විෂය ගැළපෙනවා නම්, ගුරු අභ්‍යාසලාභීන් හැටියට අවුරුදු තුනක් තුළ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හදාරා, එම ඩිප්ලෝමාව ලබා ගත්තාට පසුව ගුරු සේවයට ඇතුළත් වෙන්න. වයස් සීමා ද සහිතව එහෙම තමයි ඒ එකඟතාව ඇති වුණේ.

අපි දැන් සති දෙකකට කලින් ගුරු පත්වීම් 2,300ක් දුන්නා. ඒවායෙන් 1,800ක් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ගණිතය, විදේශ භාෂා සහ තාක්ෂණවේදය සඳහායි. 453ක් ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරීන්. අපි දැන් ඒ පිරිස පාසල්වලට යොමු කළා. ඒ පිරිස පාසල්වලට යොමු කළාම පාසල්වල සේවයට වාර්තා කරන්නත් කලින් ඒ අය අතරින් කිහිපදෙනෙක් ආවා, ස්ථාන මාරු හදා ගන්න. අපි ඒ අය යොදවා තිබෙන්නේ ගුරුවරුන් ඌන පාසල්වලට. ලංකාවේ ඕනෑම තැනක සේවය කරනවා කියලා තමයි එන්නේ. හැබැයි එහෙම කියලා ඉස්සෙල්ලාම එන්නේ, මාරුව හදා ගන්න. අපි ඒ එක වෙනස් කිරීමක්වත් කළේ නැහැ. ඒ අය අගෝස්තු 02වන දා පුහුණුවට කැඳවා තිබෙනවා. ඒ පුහුණුවේදී සුහද මාරුවීම් පිළිබඳව සලකා බලන්න පුළුවන්කමක් තිබෙනවා.

අපි දැන් වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය ගනිමු. මෙතුමන්ලා කියන එක හරි. විශේෂයෙන් රට ආර්ථික පසුබෑමට ලක් වෙච්ච අවස්ථාවේ, අරගළයෙන් පස්සේ අපේ වෘත්තීය පුහුණු පාඨමාලාවලට විශාල වශයෙන් තරුණ තරුණියෝ එකතු වුණා. අපේ වෘත්තීය පුහුණු අංශය තිබෙන නිසා මේ වන කොට -2023දී- අපේ රටේ රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු ආයතනවල නව බඳවා ගැනීම් 88,136ක් සිදු වෙලා තිබෙනවා. රාජ්‍ය නොවන ආයතනවල නව බඳවාගැනීම් 64,963ක් සිදු වෙලා තිබෙනවා. ඒ

අනුව 153,099ක් 2023දී වෘත්තීය පුහුණු පාඨමාලාවලට ඇවිත් තිබෙනවා. ඒ සියලු ආයතනවල පාඨමාලා 8,102ක් තිබෙනවා. මේ පාඨමාලා අතර තිබෙනවා, සූප ශාස්ත්‍රය, pastry and bakery, hotel managment, රූපලාවණ්‍යය, caregiver ආදි පාඨමාලාත්. ඒවාට අදාළව රැකියා වෙළෙඳ පොළේ රැකියා තිබෙනවා. එක්කෝ මෙහේ, එහෙම නැත්නම් පිටරටවල රැකියා අවස්ථා තිබෙන පාඨමාලාවලට තමයි වැඩි වශයෙන් බැඳුණේ. පුහුණු ආයතන ගත්තොත්, රාජ්‍ය අංශයේ පුහුණු ආයතන තිබෙනවා 722ක්. රාජ්‍ය නොවන අංශයේ තිබෙනවා 1,106ක්. මුළු ගණන 1,828යි. මම මේ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළේ 2023 වර්ෂයේ නව බඳවා ගැනීම්වලට අදාළව පමණයි.

දරුවන් පසුගිය අපොස උසස් පෙළ විභාගයට වාඩි වුණාට පසුව අපි ප්‍රසිද්ධ කරලා ඉලක්කසහගතව මධ්‍යස්ථාන 300ක් දිවයින පුර පිහිටුවුවා, වෘත්තීය පුහුණුව සහ මාර්ගෝපදේශනයට අදාළව. විද්‍යානුකූලව තෝරා ගැනීම් කරලා තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි භාෂාව ප්‍රමුඛව පැවැත්වෙන වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා 33,000ක් ලියාපදිංචි වුණා. මාස 4 යද්දී ප්‍රතිඵල එනකොට ඒ පාඨමාලාත් අවසන් වෙලා. අපොස උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල අනුව සුදුසුකම් ලැබූ අය විශ්වවිද්‍යාලවලට යන්න ඇති. අපි සෙසු අය වෘත්තීය පුහුණු පාඨමාලාවලට යොමු කළා, NVQ Level 04 එක NVQ Level 05 and 06 වනකල් ගන්න. එතකොට ඒ අයට ඒ තුළින් රැකියාවක් ලබා ගන්න පුළුවන්.

Ceylon - German Technical Training Institute එක 1959 වර්ෂයේදී පටන් ගත්තේ. මේ වන කොට රත්මලාන එකට අදාළ intake එක අවුරුද්දකට 650යි. අවුරුදු 4 පූර්ණ කාලීන පාඨමාලාව අවසන් වන කොටම රැකියාව ලැබෙනවා. ඒ අයගෙන් වැඩි හරියක් ඉන්නේ ලංකාවේ නොවෙයි; ඕස්ට්‍රේලියාවේ. මොකද, එච්චරටම ඉල්ලුමක් තිබෙනවා. Part-time coursesවලටත් එහෙමයි. තවත් 350ක් ගන්නවා කිලිනොච්චියේ අලුත් පීඨයට. මේ ආකාරයට, අදාළ සැලසුම් හදලා අපි මේ කටයුත්ත කළා.

අපොස සාමාන්‍ය පෙළ විභාගයෙන් පස්සේ ඔය තත්ත්වය ඇති වන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, මෙවර සාමාන්‍ය පෙළ විභාගය අවසන් වෙලා සති දෙකක් තුළ උසස් පෙළ පන්ති පටන් ගත්තා. දැන් උසස් පෙළ පන්තිවල දරුවෝ උසස් පෙළ විෂය මාලා හදාරමින් සිටිනවා. සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල ආවාට පස්සේ පොඩි පොඩි වෙනස්කම් ටිකක් වෙයි. එතකොට දරුවන්ගේ කාලය අපතේ යන්නේ නැහැ. අපි සාමාන්‍ය පෙළ විභාගය කරපු දරුවන්ට මාස 4ක් ඉතිරි කරලා දුන්නා, උසස් පෙළ කරන්න.

අපි උතුරුමැද පළාත ගනිමු. මම සතියෙන් සතිය monitor කළා. Zoom meeting එකක් ගත්තා පළාත් බලධාරීන් එක්ක. පළමුවැනි සතියේ පාසලට පැමිණීම සියයට 100ක් වෙච්ච එක දෙවැනි සතියේ සියයට 80ට වැටුණා. දැන් සියයට 60ක් වෙලා. ඇයි ඒ? පාසල් කාලය තුළ උපකාරක පන්ති පැවැත්වෙනවා. එම නිසා එම දරුවෝ දැන් පාසලට එන්නේ නැතිව -ඒ, සමහර තැන්වල. හැම තැනම නොවෙයි- උපකාරක පන්තියට යනවා. පාසලේ උසස් පෙළ පිළිබඳ විශ්වාසය යම් ප්‍රමාණයකට බිඳ වැටිලා. උසස් පෙළ පන්තිවල උගන්වන්නේ මම ද, අපේ ලේකම්තුමා ද, අනෙක් නිලධාරීන් ද? නැහැ. ගුරුවරු. දැන් ගුරුවරුන් මෙහෙයවන්නේ කවුද? වෘත්තීය සමිති. ගුරුවරු දැන් ලෙඩ වෙනවා. ගුරුවරුන් ලෙඩ වෙන කොට ළමයි පාසල් එන්නේ නැහැ. පාසලට නො එන පුරුද්ද ඇති කර ගන්නා ළමයි ඊට පස්සේ පාසලට එන්නේම නැහැ. එහෙම නම්, මේකට වගකිව යුතු තවත් පිරිස් ඉන්නවා. මම මේ අයට කිව්වේ දරුවන් පාසලේ නැත්නම් උගන්වන්න කෙනෙක් නැතිව යන බවයි. එතකොට ගුරුවරුන් හිටියාට වැඩක් නැහැ නේ. අපි මේක තේරුම් ගන්න ඕනෑ.

දෙවැනි කාරණය මේකයි. අපි ඊළඟ අවුරුදු 10, 15, 20 තුළ ලංකාවේ හෝ පිටරට රැකියා වෙළෙඳ පොළේ නිර්මාණය වන වෘත්තීන්වලට ගැළපෙන පරිදි උපාධි සහ අනෙකුත් පාඨමාලා සූදානම් කරන්න ඕනෑ.

දැන් ඒක අපි ආරම්භ කර තිබෙනවා. මේ සියලු අභියෝග මැද්දේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කරනවා. 1 සිට 6 දක්වාත්, 6 සිට 10 දක්වාත් pilot project එක දැන් අවසන් වෙමින් පවතිනවා. ලබන අවුරුද්දේ 1 සිට 6 දක්වාත්, 6 සිට 10 දක්වාත් එන්නේ අලුත් පෙළ පොතක්. ඒක වැඩ පොතක් වාගේ; modular ක්‍රමයට එන්නේ. STEAM - Science, Technology, Engineering, the Arts and Mathematics - education හඳුන්වා දීලා තිබෙනවා. උපකාර අවශ්‍ය අයට උපකාරක පන්තියකට ගිහිල්ලා උපකාර ගත්තාට කමක් නැහැ, පාසල් අවසන් කරන වේලාවෙන් පස්සේ. මෙහිදී තිබෙන ප්‍රශ්නය මේකයි. පාසල්වල උදේ 7.30 සිට 1.30 දක්වා උගන්වන අතරතුර වෙනම පාසල් තිබෙනවා, ආයෙත් 7.30 සිට 1.30 වෙනකන් උගන්වන. එතකොට ඒ ළමයින්ගේ විනය හදන්නේ කවුද? බාහිර ක්‍රියාකාරකම් කරන්නේ කවුද? ඒවා කිසි දෙයක් නැහැ. ඒ නිසා තක්සේරුකරණය වෙනසකට ලක් වෙනවා. ඒ නිසා ඉස්සෙල්ලාම මේකට විරුද්ධ වෙන පිරිසක් ඉන්නවා. මොකද, පන්ති කාමරයෙන් උපයා ගත යුතු ලකුණු ප්‍රමාණයක් තිබෙනවා. ඒක අපි ප්‍රාථමික අංශයෙන් පටන් ගන්නේ. මොකද, අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් කරනවා කියන එක දවසෙන් දෙකෙන් කරන්න බැහැ; මේ ඔක්කෝම කරන්නේ දරුවොත් එක්ක, ඒ අයගේ මානසික මට්ටමත් එක්ක. ඒ සඳහා වැඩ පිළිවෙළ කරලා 1 සිට 6 දක්වාත්, 6 සිට 10 දක්වාත් ගුරුවරු පුහුණු කිරීම ආරම්භ කරනවා. පෙළ පොත් අලුතෙන් නිර්මාණය කරලා තිබෙනවා. ඒවා මුද්‍රණය කරන්න කටයුතු කරලා තිබෙනවා. ලබන අවුරුද්දට අවශ්‍ය පෙළ පොත් සියයට 75ක් රජයේ මුද්‍රණ සංස්ථාව මුද්‍රණය කර අවසානයි. අද ඒවා පොත් ගබඩාවලට බෙදන්න පටන් ගත්තා. 2022 දී තිබුණු ප්‍රශ්නය වුණේ කොළ නැහැ, කොළ ගෙනෙන්න ඩොලර් තිබුණේ නැහැ. දැන් මේ අවුරුදු දෙකේ දී අපි ඒ වෙනස කරලා තිබෙනවා.

මම හෙට පාර්ලිමේන්තුවේ දී අමාත්‍යාංශ නිවේදනයක් කරනවා. සෞන්දර්ය විෂයය තමයි ප්‍රාථමික අංශයේ පදනම වන්නේ. සෞන්දර්ය විෂයය වෙනස් කරන්නේ නැහැ. සෞන්දර්ය විෂයය සාමාන්‍ය පෙළටත් තිබෙනවා, උසස් පෙළටත් තිබෙනවා. ඊළඟට, තොරතුරු තාක්ෂණය. තොරතුරු තාක්ෂණ විෂයය දැනටත් තිබෙන්නේ basket subject එකක් විධියටයි. ඒ කියන්නේ සාමාන්‍ය පෙළ විභාගයේ විෂයයන් 6ක් හර විෂයයන්. හර විෂයයන් අනිවාර්යයි. හර විෂයයන්ට අදාළ වන්නේ මව්බස -සිංහල හා දෙමළ අයට-, දෙවන බස -සිංහල හා දෙමළ අයට-, ආගම, ඉතිහාසය, විද්‍යාව, ගණිතය කියන විෂයයන් 6 තමයි. ඒ හර විෂයයන් 6ට පස්සේ basket subject එකක් විධියට විෂයයන් තිබෙනවා. ඒවායෙන් තමන්ට ඉතිරි විෂයයන් තුන තෝරා ගන්න පුළුවන්. ඒ යටතේ තමයි සෞඛ්‍ය විද්‍යාව, සෞන්දර්ය, තොරතුරු තාක්ෂණය තිබෙන්නේ. එතකොට දරුවෝ එතැනින් ඒවා තෝරා ගන්නවා. මෙහිදී දරුවන්ට වැරදි මතයක් ගිහිල්ලා තිබෙනවා. නැහැ, ඒක අපි වෙනස් කරන්නේ නැහැ. තොරතුරු තාක්ෂණය අනිවාර්ය විෂයයක් කරන්න අපි සූදානම්. ඊට කලින්, හය වසරේ සිට ඉහළ වසරවලට උගන්වන්න අපිට ගුරුවරු ටික හදා ගෙන ඉන්න වෙනවා. කෘත්‍රිම බුද්ධිය - artificial intelligence - මුසු කරලා නවයෙන් ඉහළට දැන් අපි pilot project පාඨමාලා පටන් අරගෙන තිබෙනවා. ඊට පස්සේ ඒක 2025 දී සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වෙන්න AI Clubs 100ක් දැනට හදලා තිබෙනවා. මේ ව්‍යූහගත ප්‍රතිසංස්කරණ යටතේ පාසල් 1,500ක් cluster හැදෙනවා. Clusters හැදුණාම ඒ හැම cluster එකේම සියලු විෂය ධාරාවන් තිබෙන ප්‍රමුඛ පාසලක් හෝ දෙකක් තිබෙනවා.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

එතකොට ඇඹිලිපිටිය, පනාමුරේ cluster එකේ ඉන්න දරුවාටත්, වතුකරයේ හැටන්-දික්ඔය හෝ තලවාකැලේ cluster එකේ ඉන්න ප්‍රමුඛ පාසලේ දරුවාටත්, අනුරාධපුරයේ කැකිරාවේ හෝ හොරොව්පොතානේ ඕනෑම දිහාවක, හම්බන්තොට ඕනෑම කෙළවරක හැම cluster එකකම එක පාසලක තොරතුරු තාක්ෂණයත් එක්ක විෂය ධාරාවන් සියල්ල තිබෙනවා. ඒ සියල්ල ජාලගත වෙනවා.

ගරු හේෂා විතානගේ මහතා
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු ඇමතිතුමනි, ඇත්තටම මේ කාරණාව මට මගේ කථාවේ දී කියන්න අමතක වුණා. මම මීට පෙර කිහිප වතාවකදීම ඔබතුමාට කියලා තිබෙනවා. දමිළ දරුවන්ට විද්‍යා අංශයෙන් ඉගෙන ගන්න රත්නපුර දිස්ත්‍රික්කයටම අද වෙනකන් එක පාසලක්වත් නැහැ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

හොඳයි. ඒ ගැන අපේ අවධානය යොමු කරලා තිබෙන්නේ. වතුකර ප්‍රදේශයේ උපාධිධාරීන් 1,200ක ලැයිස්තුවක් අපිට එවලා තිබෙනවා. ගුරු සහායක සේවාවට ගන්න පෙර ඒකට අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරලා ඒ ගොල්ලන් බඳවා ගැනීමේ ක්‍රමවේදයකට දැන් යනවා. ඒ අයගෙන් අපිට යම් ප්‍රමාණයක් දමිළ මාධ්‍ය සඳහා දෙන්න පුළුවන්. ඔබතුමා කියන කථාව ඇත්ත, ගරු මන්ත්‍රීතුමනි. මොකද උසස් පෙළ නොවෙයි, සාමාන්‍ය අධ්‍යාපනයටත් විශාල ගුරු හිඟයක් වතුකරයේ තිබුණා. දැන් අපි ගැසට් කරලා අයදුම්පත් කැඳෙව්වා, උපාධිධාරීන් 2,500ක් බඳවා ගන්න. මැතිවරණය තිබුණාට අපිට ඒ process එකට යන්න පුළුවන්. පත්වීම් විතරයි දෙන්න බැරි. ඒ වැඩ පිළිවෙළ - process එක - කරනවා. ඒ නිසා විශාල අභියෝග රාශියක් මැද්දේ, සම්පත් හිඟකම මැද්දේ අපි මේ වෙනකොට ගුරු හිඟය සම්පූර්ණයෙන් අවසන් කරනවා. සංවර්ධන නිලධාරීන් 17,000ක් ඉන්නවා. එයින් 15,000ක් අඩුම තරමේ අභ්‍යාසලාභීන් වෙනවා. ඒ අතරතුර අපි උපාධිධාරීන් සහ විද්‍යා පීඨ අය 20,000කට ආසන්න සංඛ්‍යාවකට පත්වීම් දීලා ගුරු තුලනය සඳහා අවශ්‍ය කටයුතු කරගෙන යනවා.

අපි ආණ්ඩුකාරතුමන්ලාගෙන් අවසර ඉල්ලුවා, පළාත් සහ ජාතික පාසල් අතර ගුරු තුලනය කර ගන්න එකඟතාව දෙන්න කියලා. එයට අදාළ ලිපිය මම අද යැව්වා. ඒ තත්ත්වය ගැන මම සඳහන් කළේ ඒ නිසායි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ, 2025 වසරේ සිට 6 ශ්‍රේණියෙන් ඉහළට මාර්ගෝපදේශනය සහ වෘත්තීය පුහුණුව ලබා දීම පිළිබඳව දැනුවත් කරලා 9 ශ්‍රේණියේදී තීන්දු කරන්න පුළුවන්, වෘත්තීය පුහුණු පැත්තට යනවාද සාමාන්‍ය පෙළ, උසස් පෙළ කරලා ඉහළට යනවාද කියලා. ඒ සඳහා අවශ්‍ය පසුබිම හදා ගැනීම තමයි මේ දවස්වල අපි කළේ. ඒ නිසා ඔබතුමන්ලාගේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම මම මෙතැන නොසිටියත් ඕනෑම කෙනෙකුට ඉදිරියේදී කරන්න පුළුවන් තැනට මම හදා තිබෙනවා. ඒකයි අපේ වගකීම. ඒ වගකීම මට දුන්නු විෂය හරහා ඉටු කරන තැනට දැන් අපි ඇවිල්ලා තිබෙනවා. ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මෙවන් යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන්.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එකල්හි වේලාව අ. භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව රීට අනුකූලව, අ. භා. 6.03ට, 2024 ජූලි 24 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 6.03க்கு, பாராளுமன்றம் 2024 யூலை 24, புதன்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

And it being past 5.30 p.m., THE HON. DEPUTY SPEAKER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.03 p.m. until 9.30 a.m. on Wednesday, 24th July, 2024.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

313 වන කාණ්ඩය - 14 වන කලාපය
தொகுதி 313- இல. 14
Volume 313 - No. 14

2024 ජූලි 24වන බදාදා
2024 யூலை 24, புதன்கிழமை
Wednesday, 24th July, 2024

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2024 ජූලි 24වන බදාදා
2024 யூலை 24, புதன்கிழமை
Wednesday, 24th July, 2024

අන්තර්ගත ප්‍රධාන කරුණු

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:
මහජන ආරක්ෂක ප්‍රකාශනය [පිටුව 2519]

නිවේදන:
ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන් [පිටුව 2520]

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [පිටුව 2522]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 2523-2556]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
පාරිභෝගික ආරක්ෂණය සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දීම [පිටුව 2573]

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සෞන්දර්යය සහ ICT විෂයයන් සඳහා වන වෙනස්කම්:
අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 2585]

නිල්වලා ගඟේ ලවණ බාධකය හේතුවෙන් හානියට පත් කුඹුරු ඉඩම්:
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 2591]

කල්තැබීමේ යෝජනාව:
කෘත්‍රිම බුද්ධි තාක්ෂණය හරහා කරනු ලබන අනිසි ක්‍රියාකාරකම්වලින් සමාජය ආරක්ෂා කිරීම සඳහා නව නීති [පිටු 2603– 2663]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [පිටුව 2664]

பிரதான உள்ளடக்கம்

சனாதிபதியிடமிருந்து வந்த செய்தி:
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம் [ப: 2519]

அறிவிப்புகள்:
சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள் [ப: 2520]

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 2522]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 2523-2556]

தனி அறிவித்தல் மூல வினா:
நுகர்வோர் பாதுகாப்புக்கான உரிய வழிமுறையொன்றை அறிமுகம் செய்தல் [ப: 2573]

புதிய கல்விச் சீர்திருத்தங்களின்கீழ் அழகியல் மற்றும் ICT பாடங்களுக்கான மாற்றங்கள்:
கல்வி அமைச்சரினது கூற்று [ப: 2585]

நில்வளா ஆற்றின் குறுக்கேயுள்ள உவர்நீர் தடுப்பு காரணமாக பாதிக்கப்படும் வயல் நிலங்கள்:
கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரினது கூற்று [ப: 2591]

ஒத்திவைப்புப் பிரேரணை:
செயற்கை நுண்ணறிவூடாக மேற்கொள்ளப்படும் தீங்கான செயற்பாடுகளிலிருந்து சமூகத்தைப் பாதுகாப்பதற்கான புதிய சட்டங்கள் [ப: 2603 –2663]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப: 2664]

PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation [Col. 2519]

ANNOUNCEMENTS:
Legislative Standing Committee: Additional Members [Col. 2520]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 2522]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2523-2556]

QUESTION BY PRIVATE NOTICE:
Introduction of a Proper Mechanism for Consumer Protection [Col. 2573]

CHANGES TO AESTHETIC AND ICT SUBJECTS UNDER NEW EDUCATIONAL REFORMS:
Statement by Minister of Education [Col. 2585]

PADDY LANDS AFFECTED DUE TO SALINITY BARRIER ACROSS NILWALA RIVER:
Statement by Minister of Agriculture and Plantation Industries [Col. 2591]

ADJOURNMENT MOTION:
New Legislations to Protect Society from Artificial Intelligence-related Harmful Activities [Cols. 2603-2663]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 2664]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2024 ජූලි 24වන බදාදා
2024 யூலை 24, புதன்கிழமை
Wednesday, 24th July, 2024

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.

பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] in the Chair.

ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
சனாதிபதியிடமிருந்து வந்த செய்தி
MESSAGE FROM THE PRESIDENT

මහජන ආරක්ෂක ප්‍රකාශනය
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
PUBLIC SECURITY PROCLAMATION

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පහත දැක්වෙන සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් ගරු කථානායකතුමා වෙත ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/4/5/1

2024 ජූලි මස 22 වන දින

ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ඝන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමඟ කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

රනිල් වික්‍රමසිංහ
ජනාධිපති

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව: අතිරේක සාමාජිකයන්
சட்டவாக்க நிலையியற் குழு: மேலதிக உறுப்பினர்கள்
LEGISLATIVE STANDING COMMITTEE: ADDITIONAL MEMBERS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

"ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)" පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113(2) ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළ වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් අතිරේක සාමාජිකයන් වශයෙන් ගරු කථානායකතුමා විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු කනක හේරත් මහතා
ගරු ඩී.වී. චානක මහතා
ගරු උදය ගම්මන්පිල මහතා
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු නාලක බණ්ඩාර කෝට්ටෙගොඩ මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ප්‍රතිසන්ධානය සහ ජාතික සමඟිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත සහ සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022/2023 වර්ෂය සඳහා සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා එනර්ජීස් (පෞද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පොලිසියේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පෙත්සම් පිළිගැන්වීම, ගරු වීරසේන ගමගේ මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

මහනුවර ජාතික රෝහලට අයත් ඉඩම්: අනවසර පදිංචිකරුවන්
கண்டி தேசிய மருத்துவமனைக்குச் சொந்தமான காணிகள்: அனுமதியற்ற குடியிருப்பாளர்கள்
LANDS BELONGING TO KANDY NATIONAL HOSPITAL: UNAUTHORIZED RESIDENTS

2/2024

1. ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර ජාතික රෝහලට අයත් ඉඩම් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කර ගෙන ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලට අයිති ඉඩම්වලින් අඩකට වඩා අහිමි වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එසේ අත්පත් කර ගෙන ඇති ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල් සම්බන්ධයෙන් මේ වනවිට නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) අනවසර පදිංචිකරුවන් වෙනත් ප්‍රදේශයක පදිංචි කිරීම සඳහා මේ වනවිට සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, එම සැලැස්ම කවරේද;

(vi) අදාළ ආයතන සහ බලධාරීන් විසින් ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාදාර අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) கண்டி தேசிய மருத்துவமனைக்குச் சொந்தமான காணிகள் அனுமதியற்ற குடியிருப்பாளர்களால் கையகப்படுத்தப்பட்டுள்ளன என்பதையும்;

(ii) அக்காரணத்தால் மேற்படி மருத்துவமனைக்குச் சொந்தமான காணிகளில் அரைவாசிக்கு மேல் மருத்துவமனை இழந்துள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அவ்வாறு கையகப்படுத்தப்பட்டுள்ள காணிகளின் அளவு எத்தனை ஏக்கர்கள் என்பதையும்;

(ii) மேற்படி காணிகளில் அனுமதியின்றி குடியிருக்கும் குடும்பங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iii) மேற்படி குடும்பங்கள் தொடர்பாக இன்றளவில் சட்ட நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(iv) அனுமதியற்ற குடியிருப்பாளர்களை பிறிதொரு பிரதேசத்தில் குடியமர்த்துவதற்கு இன்றளவில் திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அத்திட்டம் யாதென்பதையும்;

(vi) ஏற்புடைய நிறுவனங்கள் மற்றும் அதிகாரிகள் அதற்குத் தேவையான நடவடிக்கைகளை மேற்கொண்டுள்ளார்களா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) the lands possessed by the Kandy National Hospital have been acquired by unauthorized residents; and

(ii) more than half of the lands which belong to the said hospital have been dispossessed due to that?

(b) Will he inform this House -

(i) the total number of acres of land that have been acquired as such;

(ii) the number of unauthorized families residing on the said lands;

(iii) whether legal actions have been taken against the aforesaid families;

(iv) whether any arrangement has been made to settle the concerned unauthorized residents in another area;

(v) if so, what that plan is; and

(vi) whether necessary action has been taken by the relevant institutions and authorities in that regard?

(c) If not, why?

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) 1989.01.30 දිනැති රජයේ මිනින්දෝරු විසින් සකසන ලද 3405 පිඹුරට අනුව සම්පූර්ණ ඉඩම අක්කර 58.4කි. ඉන් අක්කර 25ක පමණ අනවසර පදිංචිකරුවන් ඇත.

(ආ) (i) අක්කර 25ක් පමණ.

(ii) පවුල් 201ක් පමණ.

(iii) ඔව්.

මහනුවර අධිකරණයේ නඩු කටයුතු සිදු කෙරේ.

(iv) ඔව්.

(v) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන වතුයායේ ක්ෂේත්‍ර අංක 09 B කොටසින් අක්කර 1 1/2ක භූමි ප්‍රමාණයක් පර්වස් 07 බැගින් අනවසර පදිංචිකරුවන් අතරින් එකඟතාව පළ කරනු ලබන කොටසකට බෙදා දීමට සැලසුම් කරමින් පවතී.

(vi) ඔව්.

(ඇ) පැන නොනඟී.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මහනුවර මහ රෝහලේ තිබෙන ප්‍රධානතම ගැටලු කිහිපයක් සම්බන්ධයෙන් තමයි අපි මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහනුවර ජාතික රෝහලේ හෘද කැතීටර්කරණ යන්ත්‍ර දෙකක් තිබිලා තිබෙනවා. නමුත්, දැන් ඇත්තටම ක්‍රියාත්මක වෙන්නේ එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මෙයයි. එන්ජියෝග්‍රෑම් පරීක්ෂණය සඳහා යොදා ගන්නා මේ යන්ත්‍ර දෙකෙන් එකක් ක්‍රියාත්මක වන තත්ත්වය තුළ දැනට පොරොත්තු ලේඛනයේ 9,000කට අධික පිරිසක් ඉන්නවා. මම පාර්ලිමේන්තුවේදී කීප අවස්ථාවකම මේ ගැන විමසීම් කළා. හේතුව තමයි, හෘද සැත්කම්වල ප්‍රමාදය නිසා ඇති වන තත්ත්වය. මහනුවර වැනි තදාසන්න ප්‍රදේශයක ජීවත් වූ කවුරු හරි කෙනෙක් මැරුණාට පස්සේ තමයි අපි දන්නේ, එහෙම නැත්නම් මරණ පරීක්ෂණයෙන් තමයි තේරුම් යන්නේ ඔහු හෘදයාබාධයක් නිසා තමයි මිය ගිහිල්ලා තිබෙන්නේ කියලා. මේ මැරෙන මිනිස්සු සහ ජීවත් වෙන මිනිස්සු වෙනුවෙන් මම ඉල්ලීමක් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මහනුවර ජාතික රෝහලේ හෘද කැතීටර්කරණ අංශයේ තිබෙන යන්ත්‍ර දෙකෙන් එකක් ක්‍රියාත්මක වෙන්නේත් ඉතාම දුෂ්කරතා මැදයි. පේරාදෙණියේ සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහලේ තිබෙන යන්ත්‍රය සතියකට එක පාරයි ක්‍රියාත්මක වෙන්නේ. හෘද සැත්කම් කර ගැනීමට බලාපොරොත්තුවෙන් ඉන්න 9,000කට අධික පිරිසක් වෙනුවෙන් කැතීටර්කරණ අලුත් යන්ත්‍රයක් ලබා දෙන්න කියන ඉල්ලීම මම නැවතත් කරනවා. මේ සඳහා විසඳුමක් අද පිළිතුරක් වශයෙන් ලබා දෙන්න කියලා තමයි මම ඉල්ලා සිටින්නේ.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම කාරණාව ඇමතිතුමාගේ අවධානයට යොමු කරලා උත්තරය ලබා දෙන්න කටයුතු කරන්නම්.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ ප්‍රශ්නයත් මධ්‍යම පළාතට අදාළ ප්‍රශ්නයක්. මධ්‍යම පළාතටම MRI scanners දෙකයි තිබෙන්නේ. මහනුවර ජාතික රෝහලේ තිබෙන MRI scanner එක දැන් අවුරුද්දක් තිස්සේ කැඩිලා තිබෙනවා. මම කීප වතාවක්ම මේ පිළිබඳව මතක් කළා. ඒ වාගේම සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහලේ තිබෙන MRI scanner එක අවුරුදු 4ක් තිස්සේ බිඳ වැටිලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ රෝහලට ගෙනෙන පුංචි ළමයි රිජ්වේ ආර්යා ළමා රෝහලට ගෙන යන්න සිදුවෙලා තිබෙනවා. ඒක ඉතාම දුෂ්කර වැඩක්. ඔබතුමාත් දන්නවා, නිර්වින්දනය කරලා තමයි එම සැත්කම් කරන්නේ කියලා. ඒ වෙනුවෙන් දෙමව්පියන්ට දරුවන් කොළඹ රඳවා තබාගන්න සිදු වෙනවා. එම නිසා මම ඉතාම කරුණාවෙන් ඉල්ලීමක් කරනවා, එම MRI scanners දෙක සම්බන්ධයෙන් රජය මීට වඩා අවධානයක් යොමු කරන්න කියලා. අපට ආරංචි වෙලා තිබෙනවා, වවුනියාව ප්‍රදේශයට මේ වාගේ යන්ත්‍ර අලුතින් ගේන්න යනවා කියලා. ඒකට අපේ කිසිදු විරෝධතාවක් නැහැ. හැබැයි, යාපනය මහ රෝහලේ මෙවැනි යන්ත්‍ර තිබියදීත්, ඒ වාගේම ඒ ප්‍රදේශ දෙකේ ජන සනත්වය දිහා බලද්දීත්, මධ්‍යම පළාතේ මහනුවර රෝහලේ තිබෙන MRI scanners දෙක ක්‍රියාත්මක වන තත්ත්වයට පත් කිරීම ඉතාම වැදගත්. ඒ සඳහා කඩිනමින් කටයුතු කරන්න කියායි මම සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටින්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සඳහා පිළිතුරක් තමයි මට අද අවශ්‍ය වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එය ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්නම්.

මාතර රාහුල විද්‍යාලයේ නව ස්මරණ ශාලාවේ ඉදිකිරීම්: විස්තර
மாத்தறை ராஹுல வித்தியால புதிய ஞாபகார்த்த மண்டபத்தின் நிர்மாணம்: விபரம்
CONSTRUCTION OF NEW MEMORIAL HALL OF MATARA RAHULA VIDYALAYA: DETAILS

42/2024

2. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කඹුරුපිටිය, මිරිස්වත්ත වලව්වේ පදිංචිව සිටි සාරා ලෝරෙන්සිනා විජේසිංහ මැතිනිය විසින් දෙමවුපියන් සිහිවීම පිණිස මාතර, රාහුල විද්‍යාලයට පරිත්‍යාග කරන ලද ගුණතිලක ස්මරණ ශාලාව කඩා ඉවත් කරන ලද බව දන්නේද;

(ii) එසේ නම්, එම ශාලාව කඩා ඉවත් කිරීමට හේතු කවරේද;

(iii) එය කඩා ඉවත් කරන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ගුණතිලක ස්මරණ ශාලාව වෙනුවට ඉදිකරනු ලබන නව ස්මරණ ශාලාව සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම මුදල ලබා ගැනීමට අපේක්ෂිත මූලාශ්‍ර කවරේද;

(iii) නව ස්මරණ ශාලාව ඉදිකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මුදල් ලබා දී තිබේද;

(v) එසේ නම්, එම මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) නව ස්මරණ ශාලාවේ ඉදිකිරීම්වලින් මේ වන විට නිම කර ඇති ප්‍රමාණය කොපමණද;

(ii) ඉතිරි කොටස නිම කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

(iii) එම ඉදිකිරීම් ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கம்புறுபிட்டிய, மிரிஸ்வத்த வளவ்வயில் வசித்த சாரா லோரென்சினா விஜேசிங்ஹ அம்மையார் தனது பெற்றோரை நினைவுகூரும் முகமாக மாத்தறை, ராஹுல வித்தியாலயத்துக்கு அன்பளிப்புச் செய்த குணதிலக்க ஞாபகார்த்த மண்டபம் உடைத்து அகற்றப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி மண்டபத்தை உடைத்து அகற்றுவதற்கான காரணங்கள் யாவையென்பதையும்;

(iii) அது உடைத்து அகற்றப்பட்ட திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) குணதிலக்க ஞாபகார்த்த மண்டபத்துக்குப் பதிலாக நிர்மாணிக்கப்படும் புதிய ஞாபகார்த்த மண்டபத்துக்காக மதிப்பீடு செய்யப்பட்ட தொகை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி நிதியைப் பெற்றுக்கொள்வதற்காக எதிர்பார்க்கப்படும் மூலங்கள் யாவையென்பதையும்;

(iii) புதிய ஞாபகார்த்த மண்டபத்தை நிர்மாணிப்பதற்காக கல்வி அமைச்சால் செலவிடப்படும் தொகை எவ்வளவென்பதையும்;

(iv) அதற்காக நகர அபிவிருத்தி அதிகாரசபையால் நிதி வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அத்தொகை எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) புதிய ஞாபகார்த்த மண்டபத்தின் நிர்மாணப் பணிகளில் இன்றளவில் பூர்த்திசெய்யப்பட்டுள்ள அளவு எவ்வளவென்பதையும்;

(ii) எஞ்சிய பகுதியைப் பூர்த்திசெய்வதற்கு எதிர்பார்க்கப்படும் திகதி யாதென்பதையும்;

(iii) மேற்படி நிர்மாணப் பணிகள் தாமதமடைவதற்கான காரணங்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) whether he is aware that the Gunathilaka Memorial Hall, which was donated to Rahula Vidyalaya, Matara by Ms. Sarah Lorencina Wijesinghe who resided at Miriswatta Walawwa in Kamburupitiya in memory of her parents, had been demolished;

(ii) if so, the reasons for demolishing the aforesaid hall; and

(iii) the date it was demolished?

(b) Will he also inform this House -

(i) the estimated cost for the new memorial hall that will be constructed in place of the Gunathilaka Memorial Hall;

(ii) the sources from which the cost is expected to be covered;

(iii) the amount that will be borne by the Ministry of Education in constructing the new memorial hall;

(iv) whether the Urban Development Authority has provided the necessary funds for the purpose; and

(v) if so, what the aforesaid amount is?

(c) Will he further inform this House -

(i) up to what extent the construction of the new memorial hall has been completed;

(ii) the date on which the rest of the construction work is expected to be completed; and

(iii) the reasons for the delay in completing the construction?

(d) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) පැවති ගොඩනැඟිල්ල 2013 වර්ෂය වන විට වසර 80ක් පමණ පැරණි තනිමහල් ගොඩනැඟිල්ලක් වූ අතර, එම ගොඩනැඟිල්ලෙහි යකඩ මළ කා, අලුත්වැඩියා කර භාවිතයට ගත නොහැකි තත්ත්වයට අබලන්ව තිබූ බැවින්, කඩා ඉවත් කර නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර ඇත.

(iii) 2013 වසරේ අග භාගයේදී එය කඩා ඉවත් කර ඇත.

(ආ) (i) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 118.8කි.

(ii) මුල් අදියර යටතේ ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් රුපියල් මිලියන 50ක මූලාධාර ලබා දී, යුද හමුදා ශ්‍රම දායකත්වය ලබාගෙන නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ඉදිකිරීම් මෙහෙයවා ඇත.

පසු අදියර සඳහා අමාත්‍යාංශයේ ජාතික අය වැය ප්‍රතිපාදන මඟින් මුදල් සපයා ගැනීමට නියමිතව ඇත.

(iii) ඉතිරි වැඩ සඳහා 2016දී පිළියෙළ කරන ලද ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 172ක් පමණ වූ අතර එවකට තිබූ ප්‍රතිපාදන තත්ත්වය සලකා 2017 වර්ෂයේදී ශ්‍රවණාගාරයේ II අදියරේ ඉදිකිරීම් කටයුතු සඳහා ජාතික අය වැය ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 44.1ක ප්‍රතිපාදන ලබා දී එම කොටස මේ වන විට නිම කර ඇත.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

අවසන් අදියර ඉදිකිරීම සඳහා දැනට 2024 වර්ෂයට වූ ප්‍රතිපාදන සීමා වී ඇති බැවින් ඉතිරි ප්‍රතිපාදන 2025 වර්ෂයේදී වෙන් කිරීමට නියමිතව ඇත.

(iv) නැත.

ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා දී ඇති රුපියල් මිලියන 50ක ප්‍රතිපාදන උපයෝගී කරගෙන I අදියරේ ඉදිකිරීම් ඔවුන් විසින් මෙහෙයවා ඇත.

(v) අදාළ නොවේ.

(ඇ) (i) නව ස්මරණ ශාලාවේ ඉදිකිරීම්වලින් මේ වන විට සියයට 70ක් පමණ නිම කර ඇත.

(ii) 2025 වර්ෂය අවසානයේදී පමණ ඉතිරි ප්‍රමාණය නිම කිරීමට අපේක්ෂිත ය.

(iii) ප්‍රතිපාදන සලසා ගැනීමට තිබූ දුෂ්කරතා එම ඉදිකිරීම් ප්‍රමාද වීමට හේතු විය.

(ඈ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පත්තිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ තිබුණු පැරණි ගොඩනැඟිල්ල උපාලි විජයවර්ධන මැතිතුමාගේ පවුලේ උරුමය තමයි ගොඩනඟලා තිබුණේ. ගරු ඇමතිතුමනි, 2010 හෝ 2008, 2009 කාලයේ අධ්‍යාපන ඇමතිවරයා විධියට ඔබතුමා රාහුල විද්‍යාලයේ තෑගි බෙදා දීමේ උත්සවයට සම්බන්ධ වුණේත් මේ ගොඩනැඟිල්ලේදීයි. ඒ ගොඩනැඟිල්ල කඩලා මේ වනකොට අවුරුදු 10කට ආසන්න කාලයක් වෙනවා.

මාතර රාහුල විද්‍යාලයේ ප්‍රධාන ශාලාව සෑදීම වෙනුවෙන් 2025 වර්ෂයේදී මුදල් ලැබෙන බව තමයි සඳහන් කළේ. දැනටමත් රාහුල විද්‍යාලය, "රාහුල පා ගමන" තුළින් වාගේම වෙනත් ක්‍රම ඔස්සේත් යම් මුදල් ප්‍රමාණයක් හොයාගෙන තිබෙනවා. "නිපොලැක්" ආයතනයේ රාජා හේවාබෝවල මැතිතුමාත් මේ ගොඩනැඟිල්ල වර්ණ ගන්වන්න අවශ්‍ය තීන්ත ලබා දෙන්නම් කියලා ප්‍රකාශයට පත් කළා.

මාතර රාහුල විද්‍යාලය කියන්නේ මේ රටේ තුන්වැනි පුරවැසියා වන අපේ ගරු කථානායකතුමා අධ්‍යාපනය ලබපු පාසල; මම අධ්‍යාපනය ලබපු පාසල; එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා අධ්‍යාපනය ලබපු පාසල; ඩීවී ගුණසේකර මැතිතුමා අධ්‍යාපනය ලබපු පාසල. නමුත්, අද වනවිට මාතර රාහුල විද්‍යාලයට ප්‍රධාන ශාලාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසාම විදුහල්පතිතුමියත්, අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලයත් බරපතළ තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් අහනවා, 2025 වර්ෂයේදී මුදල් ප්‍රතිපාදන වෙන් කරන අතරේ, මේ ගොඩනැඟිල්ලේ වැඩ කටයුතුවලට මුල පුරන්න 2024 වර්ෂය වෙනුවෙන් යම්කිසි මුදලක් - විශාල මුදලක් නොවෙයි - අධ්‍යාපන අමාත්‍යාංශයේ යම්කිසි වැය ශීර්ෂයකින් ලබා දෙන්න පුළුවන්ද කියලා. මොකද, රාහුල විද්‍යාලයට ලබන අවුරුද්දට අවුරුදු 100ක් සම්පූර්ණ වෙනවා. 1925 මැයි මාසයේ පළමුවැනි දා පරාක්‍රමබාහු විද්‍යාලය නමින් තමයි මේ පාසල ආරම්භ වුණේ. ලබන අවුරුද්දේ මේ පාසලේ සියවස් සැමරුම මේ ආකාරයට ප්‍රධාන ශාලාවක් නැතිව සමරන්නටත් බැහැ. මේ පාසලේ දරුවෝ 5,000කට වඩා අධ්‍යාපනය ලබනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, අඩුම ගාණේ රුපියල් මිලියන 10ක්, රුපියල් මිලියන 15ක්වත් ලබා දීලා, මේ අවුරුද්දේ අපට යළි වැඩ ආරම්භ කරන්න - initiate කරන්න - පුළුවන් නම්, ඒක ලොකු පිනක්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජුයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ ගොඩනැඟිලි සම්බන්ධ තිබෙන වැය ශීර්ෂය යටතේ යම් මුදලක් ඉතිරි වෙලා තිබෙනවා නම් අනිවාර්යයෙන්ම පැකිළීමකින් තොරව ඒ මුදල ලබා දෙන්නම්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පත්තිරණ)
(The Hon. Buddhika Pathirana)

ස්තුතියි, ගරු ඇමතිතුමනි.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය පාසලටම කේන්ද්‍රගත වෙන්නේ නැතිව මම ඔබතුමාගෙන් අහන්නම්, ගරු ඇමතිතුමනි.

ඇත්ත වශයෙන්ම පාසල්වල ගුණාත්මක යෙදවුම්වලට වෙන් වන මුදල පිළිබඳව ගත්තොත්, සමහර අවුරුදුවල ඒ මුදල ලැබෙනවා. සමහර අවුරුදුවල ලැබෙන්නේ නැහැ. ජාතික පාසල් නම් මොකක් හරි ක්‍රමයකින් ඒ කටයුතු කරනවා. පළාත් සභා පාසල්වලට පාසල් මට්ටමින් යම් මිලදී ගැනීම් සඳහා යොදවන මුදල ගත්තොත්, එය ඉතා අඩු මුදලක්. ශක්තිමත් ආදී ශිෂ්‍ය කණ්ඩායමක් ඉන්නවා නම්, ශක්තිමත් දානපතියන් ඉන්නවා නම්, ජනප්‍රිය පාසලක් නම්, දරුවෝ ඇතුළත් කරනකොට හරි අවශ්‍ය යම් යම් ප්‍රතිපාදන සහ යම් යම් බඩු භාණ්ඩ භෞතිකව ලබා ගන්න ඒ පාසල්වලට පුළුවන්කම තිබෙනවා. අධ්‍යාපනයේදී මානව සම්පත වාගේම භෞතික සම්පතත් වැදගත්. ඒ නිසා භෞතික සම්පත්වල ගුණාත්මක යෙදවුම් වෙනුවෙන් යොදන මුදල මේ අවුරුද්දේ බැරි නම්, ලබන අවුරුද්දේවත් ලබා දෙන්න කියලා මම ඉල්ලනවා. මම කලින් කියපු කාරණයට ඔබතුමාගෙන් මේ අවුරුද්දේ මුදල් ටිකක් ඉල්ලුවාට, මේ කාරණයටත් මේ අවුරුද්දේම මුදල් ලබා දෙන්න කියන්න තරම් මම අසාධාරණ වෙන්නේ නැහැ. එහෙම කියන එක එච්චර සාධාරණ නැහැ නේ. ඒ නිසා ලබන අවුරුද්දේ ඔබතුමන්ලා පළාත් සභා පාසල්වලට වාගේම ජාතික පාසල්වලට ප්‍රතිපාදන වෙන් කිරීමේදී ගුණාත්මක යෙදවුම් සඳහා යොදවන මුදල, නැත්නම් පාසල්වල දෛනික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ඉදිරියට ගෙනියන්න වෙන් කරන මුදල් ප්‍රතිපාදන පාසල්වල වර්ගීකරණය අනුව, යම් ප්‍රතිශතාත්මක අගයකින් වැඩි කිරීමක් කරන්න පුළුවන්ද? මොකද, රුපියල අවප්‍රමාණ වීම නිසා ඒ මිලදී ගැනීම් සඳහා වැය වන මුදල ඉතා වැඩියි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජුයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් ගුණාත්මක යෙදවුම් සඳහා ජාතික පාසල්වලට අධ්‍යාපන අමාත්‍යාංශය මඟිනුත්, පළාත් පාසල්වලට පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

හරහාත් වෙන් වන මුදලින් තමයි ඒ කටයුතු කරන්නේ. ඊට අමතරව ලෝක බැංකු ආධාර වැඩසටහන යටතේ යම් මුදල් ප්‍රමාණයක් ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. ඊටත් අතිරේකව, 2025 ආරම්භ වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ - GPE Project එක යටතේ - ව්‍යුහාත්මක වෙනස්කම් සඳහාත්, ආසියානු සංවර්ධන බැංකුවේ වැඩසටහන යටතේ ගුරුවරුන්ගේ පුහුණුව සඳහාත්, ගුණාත්මක යෙදවුම් සඳහාත් අපට යම් මුදලක් වැය කරන්න පුළුවන්.

දැන් අපි ඒවා ඇස්තමේන්තුගත කරගෙන යනවා, ලබන අවුරුද්දට ඒ ආයතනවලට යෝජනා ඉදිරිපත් කිරීම සඳහා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමාගෙන් ඉතාම කෙටි පැහැදිලි කිරීමක් කර ගැනීමට අවශ්‍යයි. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මාතර රාහුල විද්‍යාලය පිළිබඳව මතු කළ කාරණය ඉතාම සාධාරණ සහ වැදගත් එකක්. ඔබතුමා ඒ ප්‍රශ්නයට උත්තරයක් දුන්නා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ඔබතුමාත් ගිහිල්ලා නිරීක්ෂණය කළා, මාතර මහින්ද රාජපක්ෂ විද්‍යාලය. එය දරුවන් 3,400ක් අධ්‍යාපනය ලබන ඉතාම කෙටි කාලයකින් ජාතික මට්ටමේ ප්‍රගතියක්, කීර්තියක් අත් කර ගත්ත, මුහුදු ආශ්‍රිතව තිබෙන පාසලක්. 2013දී එහි දේශන ශාලාව ඇතුළු ගොඩනැඟිලි ඉදිකිරීම් ආරම්භ කළත් 2015දී ඒ කටයුතු අතරමඟ නතර වුණා. දැන් ඒ ගොඩනැඟිලිවල ඉදිකිරීම්වලින් සියයට 40ක විතර වැඩ කටයුතු කර අවසන්. නමුත්, ඒ දරුවන්ට රැස් වෙන්න තැනක් නැහැ. ඔබතුමා ඉතාම සංවේදී වුණා, ඒ පාසල නිරීක්ෂණය කරන්න ගිය දවසේ. රටේ ආර්ථික ප්‍රශ්නයක් තිබෙන බව අපි දන්නවා. නමුත්, මාතර මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ තිබෙන ඒ බරපතළ ගැටලුවටත් කඩිනමින් විසඳුමක් ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා සමඟ එහි නිරීක්ෂණ චාරිකාවක නිරත වුණා. අපේ සභානායක කාර්යාලයටත් ඒ නිලධාරීන් ගෙන්වලා, එක් එක් අදියර යටතේ එහි ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට අපි යෝජනාවක් කළා. ඒකට TVEC එකත් සම්බන්ධයි. එය අදියර යටතේ කළත් ඒ වෙනුවෙන් විශාල මුදලක් අවශ්‍යයි. ඒ නිසා මේ අවුරුද්දේ තිබෙන ප්‍රතිපාදන අනුව ඒ වැඩ කටයුතු කරන්න යම් අපහසුතාවක් තිබෙනවා. එම නිසා ඇස්තමේන්තු කරලා තිබෙන අදියර යටතේ වෙන් කරන්නා වූ මුදල් 2025 වර්ෂයෙන් ඔබ්බට වෙන් කිරීමට කටයුතු කරනවා.

ලියාපදිංචි වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන: විස්තර
பதிவு செய்யப்பட்டுள்ள தொழிற்பயிற்சி நிலையங்கள்: விபரம்
REGISTERED VOCATIONAL TRAINING CENTRES : DETAILS

1970/2024

3. ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කර ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන/ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන/ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (ii)හි සඳහන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන/ ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන/ආයතන කවර කාලයක් සඳහා ලියාපදිංචි කරනු ලබන්නේද;

(ii) වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල/ආයතනවල ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා අය කරනු ලබන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

කල්වි අමைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மூன்றாம் நிலை மற்றும் தொழிற் கல்வி ஆணைக்குழுவில் பதிவு செய்யப்பட்டுள்ள தொழிற்பயிற்சி நிலையங்கள் / நிறுவனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவற்றுள் அரச துறையைச் சேர்ந்த மற்றும் தனியார் துறையைச் சேர்ந்த தொழிற்பயிற்சி நிலையங்கள்/ நிறுவனங்களின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iii) மேற்படி (ii)இல் குறிப்பிடப்பட்ட தொழிற்பயிற்சி நிலையங்கள்/ நிறுவனங்களால் நடாத்திச் செல்லப்படுகின்ற கற்கைநெறிகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தொழிற்பயிற்சி நிலையங்கள்/ நிறுவனங்கள் பதிவு செய்யப்படும் காலஎல்லை யாதென்பதை யும்;

(ii) தொழிற்பயிற்சி நிலையங்கள் / நிறுவனங்களின் பதிவை நீடிப்பதற்காக அறவிடப்படும் கட்டணம் எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා]

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of vocational training centres / institutions registered under the Tertiary and Vocational Education Commission;

(ii) the number of public and private sector vocational training centres / institutions separately, out of the above institutions; and

(iii) the number of courses conducted by the vocational training centres / institutes mentioned in (ii) above;

(b) Will he also inform this House -

(i) the period for which the vocational training centres / institutions are registered; and

(ii) the amount charged for extending the registration of vocational training centres / institutions?

(c) If not, why?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කර ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන/ ආයතන සංඛ්‍යාව 1,615කි.

(ii) රාජ්‍ය අංශයේ ආයතන 632
පෞද්ගලික ආයතන 910
රාජ්‍ය නොවන සංවිධාන 52
පුණ්‍ය ආයතන 21

(iii) රාජ්‍ය අංශයේ ආයතන පාඨමාලා 3,841
පෞද්ගලික ආයතන පාඨමාලා 3,029
රාජ්‍ය නොවන සංවිධාන ආයතන පාඨමාලා 175
පුණ්‍ය ආයතන පාඨමාලා 97

(ආ) (i) වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන/ ආයතන වසර දෙකක කාලයක් සඳහා ලියාපදිංචි කරනු ලබන අතර, වසර දෙකෙන් දෙකට ලියාපදිංචිය අලුත් කර ගත යුතුය.

(ii) වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල/ආයතනවල ලියාපදිංචිය දීර්ඝ කිරීම රාජ්‍ය හා පෞද්ගලික අංශ ලෙස කොටස් දෙකකට සිදු කරනු ලබයි.

<u>රාජ්‍ය ආයතනවල</u>

- පාඨමාලා ගණන 6ක් දක්වා රුපියල් 3,000ක් ද
- පාඨමාලා ගණන 6 සිට 10 දක්වා රුපියල් 5,000ක් ද
- පාඨමාලා ගණන 10කට වැඩිනම් රුපියල් 7,500ක් ද අය කරනු ලබයි.

<u>පෞද්ගලික ආයතනවල</u>

- පාඨමාලා ගණන 3ක් දක්වා රුපියල් 5,000ක් ද
- පාඨමාලා ගණන 3 සිට 6ක් දක්වා රුපියල් 8,000ක් ද
- පාඨමාලා ගණන 6 සිට 10ක් දක්වා රුපියල් 10,000ක් ද
- පාඨමාලා ගණන 10කට වැඩි නම් රුපියල් 10,000ක් සහ එක් පාඨමාලාවක් සඳහා අමතරව රුපියල් 2,500ක් බැගින් අය කරනු ලබයි.
- විදේශ සුදුසුකම් සඳහා සහතික නිකුත් කරනු ලබන ආයතනවල ඉහත අයකිරීම්වලට අමතරව එක් පාඨමාලාවක් සඳහා රුපියල් 5,000ක් බැගින් අයවේ.

ඉහත සඳහන් අයකිරීම් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර, එම අනුමැතිය චක්‍රලේඛ අංක NVQ 07/2023 ලෙස TVEC වෙබ් අඩවියෙහි දක්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)
ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දීම ගැන ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න අහනවාද?

ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අහන්න අවස්ථාව ඉල්ලා සිටියා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නයට අදාළ නොවුණත් සභානායකවරයා වන ඔබතුමාට මම මේ කාරණය යොමු කරන්නේ, ජාතික මට්ටමින් වැදගත් වනවාය කියන කාරණාව මත පදනම් වෙලා.

ගරු ඇමතිතුමනි, මීට අවුරුද්දකට පමණ පෙර කැබිනට් මණ්ඩලය අනුමත කළා ජනාධිපතිවරණයට ඉදිරිපත් වන අපේක්ෂකයෙකුගේ ඇප මුදල් පිළිබඳ සංශෝධනයක්. එම සංශෝධනය ඉදිරිපත් කළේ මැතිවරණ කොමිෂන් සභාවෙන්. එය ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ ඉදිරිපත් කරපු සංශෝධනයක්. 1981 අංක 15 දරන පනත ප්‍රකාරව, දැනට ජනාධිපතිවරණයේදී අය කරනු ලබන්නේ පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් නාම යෝජනා කරන අපේක්ෂකයෙක් නම් රුපියල් 50,000ක්. ස්වාධීන අපේක්ෂකයෙක් නම් රුපියල් 75,000ක මුදලක් පමණයි. මැතිවරණ කොමිෂන් සභාව යෝජනා

කළේ, පිළිගත් දේශපාලන පක්ෂයක් යෝජනා කරන අපේක්ෂකයෙක් නම් එම මුදල ලක්ෂ 25ක් කරන්න සහ ස්වාධීන අපේක්ෂකයෙක් නම් ලක්ෂ 30ක් කරන්න. ඒ එක්කම, ඒ දෙදෙනාගෙන්ම නැවත නොගෙවන රුපියල් ලක්ෂයක ඇප මුදල් තැන්පත් කිරීම. ඒ කියන්නේ රුපියල් ලක්ෂ 26යි, ලක්ෂයක් 31යි. ඒක ඉතාම වැදගත් යෝජනාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා පසුගිය ජනාධිපතිවරණයට අපේක්ෂකයන් 35දෙනෙක් ඉදිරිපත් වුණ බව. ඉන් ප්‍රධාන දෙදෙනාගේ හැරෙන්න අනෙක් සියලුදෙනාගේම ඇප මුදල් රාජසන්තක වුණා. මෙවර ජනාධිපතිවරණය දිහා බැලුවාම අපේක්ෂකයන් සංඛ්‍යාව 80ක් හෝ 85ක් වෙන්නත් පුළුවන්. කිසිම පදනමක් නැතිව මේ ආකාරයෙන් ඉදිරිපත් වීම නිසා ගරු සභානායකතුමනි, ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම ඇතුළු සියලු කාරණාවලට අතිවිශාල මුදලක් වැය වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඡන්දය ගණන් කිරීම සඳහාත් ඒ වාගේම විශාල කාලයක් වැය වෙනවා. ඒ නිසා මම ඉතා ගෞරවයෙන් ඔබතුමාගෙන් මේ ඉල්ලීම කරන්නේ, ගරු ඇමතිතුමනි. Proxy parties ඉදිරිපත් වීම වැළැක්වීම විතරක් නොවෙයි මේකෙන් වෙන්නේ. ජාතික ධනය විශාල වශයෙන් ඉතිරි කරගන්නත් පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට තිබෙන ඇප මුදල් යෝජනා වුණේ 1981දී. මීට අවුරුදු 43කට පෙර තමයි මේ රුපියල් 50,000, රුපියල් 75,000 යෝජනා වුණේ. ඒ නිසා අද මුදලේ වටිනාකම දිහාත් බලලා, රාජ්‍ය භාණ්ඩාගාරයටත් මෙය ඉතා විශාල පිටුවහලක් වෙයි කියන විශ්වාසයෙන් මේ යෝජනාව ගැන ආණ්ඩුව විධියට කඩිනමින් ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත්තොත් ඉදිරි කාලසීමාව තුළදී වුණත් වැදගත් වෙයි.

දැනට ඇතැමුන්ට විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට තිබෙන හදිසියට වඩා මෙවැනි වැදගත්, අර්ථවත් දෙයකට බරක් තිබ්බොත් ඒක රටට විශාල ශාන්තියක් වේවි කියා මම හිතනවා. විශේෂයෙන්ම ජනාධිපතිවරණය කාර්යක්ෂමව සහ ඵලදායී විධියට පවත්වන්නටත්, එහි විශ්වසනීයභාවය රැක ගන්නටත් ඒක හේතුවක් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට කිසිම හදිසියක් නැහැ. ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා කරපු යෝජනාව මීට කලකට පෙර මැතිවරණ කොමිසම විසින් ඉදිරිපත් කළා, ඒ කිව්ව කරුණු සඳහා. නමුත් අපි දන්නවා, පනත් කෙටුම්පතක් සකස් කරලා, කැබිනට් මණ්ඩලයෙන් ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන, ඒක නැවත Legal Draftsman's Department එකට යවලා, එතැනින් Attorney-Generalට යවලා Attorney-Generalගේ clearance අරගෙන නැවත කැබිනට් මණ්ඩලයට ගියාට පසුව තමයි ගැසට් කරන්න පුළුවන් වෙන්නේ. මෙන්න මේ තත්ත්වය තුළ එළඹෙන ජනාධිපතිවරණය සඳහා මේ සංශෝධනය ගෙනෙන්න කාල වේලාවක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාට පුළුවන්, ඊළඟ මැතිවරණයේදී ඔය කාරණය යෝජනා කරලා ක්‍රියාත්මක කර ගන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක Legal Draftsman's Department එකට යවලා, Attorney-General's Department එකට යවලා, අනුමත වෙලා-*[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, සොයා බලා- *[බාධා කිරීමක්]*

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැහැදිලි කරවා ගැනීමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමිය, දැන් කාලය ඉකුත් වෙමින් තිබෙන්නේ.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න. ගරු ඇමතිතුමා කැමැති නම් අවස්ථාව ලබා දෙන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එතුමියට අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙම නම්, ඔබතුමිය ඉතාම කෙටියෙන් අහන්න. මොකද, ඊයේත් අන්තිමේදී මූලාසනයයි බැණුම් ඇහුවේ.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, 2014 වර්ෂයේදී නැහෙනහිර පළාතේ විද්‍යා, ගණිත ගුරු හිඟය පියවන්න කියලා ගුරු සහායකවරුන් සුදුසුකම් මත බඳවාගෙන තිබෙනවා. එතැන ඉන්නේ, 25ක් වාගේ පොඩි ප්‍රමාණයක්. අවශ්‍ය සුදුසුකම් සපුරා ගන්න කියලා ඒගොල්ලන්ට කියා තිබෙනවා. ඒ බඳවා ගැනීම කරන්නේ ඒගොල්ලන් එක්කෝ උපාධිය කර ගත්තොත්, එහෙම නැත්නම් ගුරු පුහුණුව ලබා ගත්තොත්. ඒ කාරණා කොන්දේසි හැටියට දාලා තිබෙනවා. ඒ අය ගුරු පුහුණුවට ඉල්ලුම් කළාම ගුරු පුහුණුවට යන්න දීලා නැහැ, "ඔයගොල්ලන් ගියොත් උගන්වන්න කෙනෙක් නැහැ" කියලා. නමුත්, ඒගොල්ලන් උපාධිය - BEd - කරගෙන තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ අය මේ වන කොට අවුරුදු 10ක් සේවය කරලා තිබෙනවා. 2014 මැයි 19වන දා එක කණ්ඩායමකුත්, 2014 නොවැම්බර් 14වන දා තවත් කණ්ඩායමකුත් වශයෙන් ඒ අය බඳවා ගෙන තිබෙනවා. අවුරුදු 10ක් තිස්සේ ඒගොල්ලන් නැහෙනහිර පළාතේ සේවය කරනවා. නමුත් ඒ අය අන්තර්ග්‍රහණය කරලා නැහැ. ඉතින් ඒ අය අහනවා අන්තර්ග්‍රහණය කිරීමේ හැකියාවක් තිබෙනවාද කියලා. මොකද, මේ වන කොටත් ගුරු සහායකයන් විශේෂයෙන් මධ්‍යම පළාත ඇතුළු පළාත්වල වතුකරය ආශ්‍රිත පාසල්වලට බඳවා ගැනීම කරනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් අහන්නේ, ඒ අයටත් සාධාරණයක් ඉටු කරලා දෙන්න පුළුවන්ද කියලායි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්ඩලික සට්ටම්කාර (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඒ අය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් -අපෙන්- ඉල්ලීමක් කළොත්, ගුරු සේවා ව්‍යවස්ථාව එක්ක සලකා බලා, අවුරුදු 10ක කාලයක් සේවයේ යෙදී සිටීම කියන කාරණයත් සලකා බලා යම් පිළියමක් යොදන්න පුළුවන්.

ගරු ඩී. වීරසිංහ මහතා
(මාණ්ඩලික ඩී. වීරසිංහ)
(The Hon. D. Weerasingha)

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ගිය සතියේ නැහෙනහිර පළාත් ආණ්ඩුකාරතුමාත් එක්ක ඒ සියලු ගුරු සහායකවරු ඇවිත් සාකච්ඡා කළා. ආණ්ඩුකාරතුමා ඒ වෙලාවේ පොරොන්දු වුණා, අදාළ නීති රීතිවලට එකඟව ඒ අය බඳවා ගැනීමේ කටයුතු කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්ඩලික සට්ටම්කාර (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එතුමා හෙට දවල් 11.00ට මාව හමු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 4 -1993/2024- (2), ගරු වාසුදේව නානායක්කාර මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -2009/2024- (1), ගරු මයන්ත දිසානායක මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

සීමාසහිත ද ෆිනෑන්ස් සමාගම: විසුරුවා හැරීම සහ තැන්පතු ගෙවීම

வரையறுக்கப்பட்ட 'த பினான்ஸ்' நிறுவனம்: கலைத்தல் மற்றும் வைப்புத்தொகையைக் கொடுத்தல்

THE FINANCE COMPANY LIMITED: DISSOLUTION AND PAYMENT OF DEPOSITS

2025/2024

6. ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සීමාසහිත ද ෆිනෑන්ස් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ඉල්ලා ඇති බව එවකට මුදල් රාජ්‍ය අමාත්‍යවරයා විසින් 2021.02.10 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන ලද බව දන්නේද;

(ii) එම අනුමතිය ලබා දී ඇති දිනය කවරේද;

(iii) එම ආයතනය සඳහා සුදුසු ආයෝජකයෙක් හඳුනාගෙන කැඳවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ඉහත ආයතනය විසුරුවා හැරීමට අවසර ඉල්ලා ශ්‍රී ලංකා මහ බැංකුව 2021.02.15 දින වාණිජ මහාධිකරණයේ අංක CHC/19/2021/CO. දරන නඩුව ගොනු කර ඇති බවත්;

(ii) එය ඉහත (අ) (i)හි සඳහන් ප්‍රකාශයට පටහැනි බවත්;

(iii) එමඟින් ඉහත ආයතනයේ තැන්පත්කරුවන් ව්‍යාකූලත්වයට පත් වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ඇ) (i) Sri Lanka Deposit Insurance and Liquidity Support Scheme (SLDILSS) හි අරමුදල් භාවිත කරමින් අගතියට පත් වූ එක් තැන්පත්කරුවෙකු සඳහා රුපියල් 500,000 බැගින් ලබා දෙන දිනය කවරේද;

(ii) ඉහත අරමුදලේ ඇති රුපියල් බිලියන 60ක මුදල භාවිත කරමින් අදාළ තැන්පත්කරුවන්ට සම්පූර්ණ මුදල ලබා දිය හැකිද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வரையறுக்கப்பட்ட 'த பினான்ஸ்' நிறுவனத்தை மறுசீரமைப்பதற்கு அமைச்சரவையின் அங்கீகாரத்தைக் கோரியிருந்ததாக அப்போதைய நிதி இராஜாங்க அமைச்சரால் 2021.02.10ஆம் திகதி பாராளுமன்றத்தில் தெரிவிக்கப்பட்டதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி அங்கீகாரம் வழங்கப்பட்ட திகதி யாதென்பதையும்;

(iii) மேற்படி நிறுவனத்துக்காகப் பொருத்தமான முதலீட்டாளர் ஒருவர் அடையாளங்காணப்பட்டு அழைக்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி நிறுவனத்தைக் கலைப்பதற்கான அனுமதியைக் கோரி இலங்கை மத்திய வங்கி 2021.02.15ஆம் திகதி வர்த்தக மேல் நீதிமன்றத்தில் இலக்கம் CHC/19/2021/CO என்ற வழக்கைத் தாக்கல் செய்துள்ளது என்பதையும்;

(ii) அது மேற்படி (அ) (i)இல் குறிப்பிடப்பட்டுள்ள கூற்றுக்கு முரணானது என்பதையும்;

(iii) அதன்மூலம் மேற்படி நிறுவனத்தின் வைப்பாளர்கள் குழப்பத்துக்குள்ளாகி உள்ளார்கள் என்பதையும்;

அவர் அறிவாரா?

(இ) (i) Sri Lanka Deposit Insurance and Liquidity Support Scheme (SLDILSS)இன் நிதியைப் பயன்படுத்தி பாதிப்புக்குள்ளான வைப்பாளர் ஒருவருக்குத் தலா 500,000 ரூபாய் வீதம் வழங்கப்படும் திகதி யாதென்பதையும்;

(ii) மேற்படி நிதியத்திலுள்ள 60 பில்லியன் ரூபாய் நிதியைப் பயன்படுத்திக் குறிப்பிட்ட வைப்பாளர்களுக்கு முழுப் பணத்தையும் வழங்க முடியுமா என்பதையும்;

(iii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை யென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Economic Stabilization and National Policy:

(a) Will he state -

(i) whether he is aware that it was stated in Parliament on 10.02.2021 by the then State Minister of Finance that approval of the Cabinet had been sought to restructure The Finance Company Limited;

(ii) the date on which the said approval was granted; and

(iii) the date on which a suitable investor would be identified and called for that entity?

(b) Is he aware that -

(i) the Central Bank of Sri Lanka filed a case in the Commercial High Court on 15.02.2021 under the No. CHC/19/2021/ CO asking for permission to dissolve the above institution;

(ii) the said course of action is against the statement mentioned in (a) (i) above; and

(iii) the depositors of the above institution have been confused by it?

(c) Will he also state -

(i) the date on which an amount of Rs. 500,000 will be given to each aggrieved depositor, using the funds of the Sri Lanka Deposit Insurance and Liquidity Support Scheme (SLDILSS);

(ii) whether the full amount can be given to the depositors concerned using the amount of Rs. 60 billion in the aforesaid fund; and

(iii) if not, the reasons for it ?

(d) If not, why ?

ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2021.02.10 දිනැති පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තාවට අනුව, මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය ගරු අජිත් නිවාඩ් කබ්‍රාල් මහතා විසින් "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." ආයතනය සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මක් ඇති බව ප්‍රකාශ කර ඇත.

(ii) එවැනි අමාත්‍ය මණ්ඩල තීරණයක් පිළිබඳව පවතින ලේඛන අනුව අනාවරණය නොවේ.

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." ආයතනය, ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සුදුසු ආයෝජකයෙකු හඳුනා ගැනීමට ප්‍රමාණවත් අවස්ථා ගණනාවක් සහ ප්‍රමාණවත් තරම් කාලය ලබා දී තිබුණ ද එය සාර්ථක කර ගැනීමට "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." ආයතනය අපොහොසත් විය.

(ආ) (i) "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." ආයතනය විසුරුවා හැරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් 2021.02.16 දින කොළඹ වාණිජ මහාධිකරණයේ අංක CHC/19/2021/CO යටතේ පෙත්සමක් ගොනු කර ඇත.

(ii) "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ගත හැකි සියලු පුනර්ජීවන ක්‍රියාමාර්ග අසාර්ථක වීම හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයතනය ඇවර කිරීම සඳහා තීරණය කරන ලදී. ඒ අනුව "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." ආයතනය තවදුරටත් අලාභ ලැබීම වැළැක්වීම සහ ඇවරකරණ ක්‍රියාවලියේදී ඉතිරි තැන්පත්කරුවන්ට සහ ණය හිමියන්ට ගෙවිය යුතු මුදල් උපරිම කිරීම සඳහා ගත හැකි එකම විකල්පය වූයේ ඇවර කිරීමයි.

(iii) එවැනි ව්‍යාකූලතාවක් ඇති වීමට හේතුවක් නොමැත. තවද, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ වැඩසටහන යටතේ 2024 අප්‍රේල් මස අවසන් වන විට රුපියල් මිලියන 12,867.32 පමණ මුදලක් රක්ෂණ වන්දි වශයෙන් ගෙවා නිම කර ඇත.

(ඇ) (i) 2020.05.22 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." ආයතනය වෙත නිකුත් කර තිබූ බලපත්‍රය අවලංගු කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් 2020.06.07 දින සිට "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." ආයතනයෙහි තැන්පත්කරුවන් සඳහා රක්ෂණ වන්දි ගෙවීම් ආරම්භ කරන ලදී.

පසුව 2021.03.16 දින පැවති ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ඇති තැන්පත්කරුවකුට ගෙවිය යුතු උපරිම රක්ෂණ වන්දි මුදල රුපියල් 600,000 සිට රුපියල් 1,100,000 දක්වා වැඩි කිරීමට තීරණය කරන ලදී.

තවදුරටත්, මුදල් මණ්ඩලය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි පවතින රෙගුලාසි සංශෝධනය කිරීමටත්, "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." හි ඒ වන විටත් රක්ෂණ වන්දි මුදල් ගෙවනු ලැබූ තැන්පත්කරුවන්ට වැඩි කළ රුපියල් 500,000ක රක්ෂණ වන්දි මුදල ගෙවීමටත්, අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වැඩි කරනු ලැබූ රුපියල් 500,000ක රක්ෂණ වන්දි මුදල "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." හි ඒ වන විටත් රක්ෂණ වන්දි ගෙවනු ලැබූ තැන්පත්කරුවන්ට ගෙවීම 2021.04.12 දින සිට ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ නියෝග, නීති රීති සහ රෙගුලාසිවලට අනුව, "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." හි තැන්පත්කරුවන්ට රක්ෂණ වන්දි ගෙවීම 2024.05.21 වන දින දක්වා සිදු කරන ලදී.

(ii) ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා අරමුදලෙහි ඇති රුපියල් බිලියන 60ක මුදල භාවිත කරමින් අදාළ තැන්පත්කරුවන්ට සම්පූර්ණ මුදල ලබා දීමේ හැකියාවක් නොමැත.

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

(iii) 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන සහ ඒ යටතේ නිකුත් කර ඇති නියෝග අනුව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ඇති තැන්පත්කරුවෙකුට ගෙවිය යුතු උපරිම රක්ෂණ වන්දි මුදල රුපියල් 1,100,000කි.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යනු 2010 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද රක්ෂණ යෝජනා ක්‍රමයක් වන අතර, ප්‍රධාන වශයෙන්ම ඒ සඳහා අරමුදල් සැපයෙනුයේ බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් නියමිත කාලවලදී ගෙවනු ලබන වාරික මුදල්වලින් වේ.

මෙම රක්ෂණ යෝජනා ක්‍රමයෙහි අරමුණ වනුයේ, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල තැන්පත්කරුවන් විසින් කරනු ලබන තැන්පතු රක්ෂණය කිරීම වන අතර යම් හෙයකින් එම ආයතනවල බලපත්‍රය අවලංගු කළහොත් එම ආයතනවල තැන්පත්කරුවන්ට රුපියල් 1,100,000ක උපරිමයක් දක්වා රක්ෂණ වන්දි ගෙවීම සිදු කිරීම වේ. එමෙන්ම බැංකු (විශේෂ විධිවිධාන) පනත සහ ඒ යටතේ නිකුත් කර ඇති නියෝග අනුව, ශ්‍රී ලංකා රුපියල් තැන්පතු සහ විදේශ විනිමය තැන්පතු යන දෙවර්ගයටම අදාළව සුදුසුකම් ඇති තැන්පත්කරුවෙකුට ගෙවිය යුතු උපරිම වන්දි මුදල රුපියල් 1,100,000ක සීමාවකට යටත් වේ.

(ඇ) පැන නොනඟී.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරේ විශේෂයෙන්ම සඳහන් වුණේ, රක්ෂණ මණ්ඩලය හරහා ලබා දී තිබෙන insurance එකේ මුදල් ප්‍රමාණය පිළිබඳව සහ ඒ හරහා තැන්පත්කරුවන්ට ලැබෙන දේ පිළිබඳවයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, මේක අද ඊයේ ඇති වුණු ප්‍රශ්නයක් නොවන බව. මේ finance companiesවල ප්‍රශ්නය 2009 දී විතර වාගේ පටන් ගත්තේ. ගෝල්ඩන් කී වාගේ ආයතන දේශපාලන මැදිහත් වීමක් නිසා බංකොලොත්භාවයට පත් වෙච්ච වෙලාවක "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." එකත් under the water යවන්නේ නැතුව Central Bank එක යටතට ගත්තා. ඒ අවස්ථාවේ - 2009 දී - ඒ ආයතනය මිලියන 1,400ක් - Rs. 1.4 billion - ලාභ ලබමිනුයි තිබුණේ. එවැනි ආයතනයක් තමයි Central Bank එක යටතට ගත්තේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, Central Bank එක මේ ආයතනය භාරගත්තාට පසුව, කැබිනට් අනුමැතියක් අරගෙන මේ සඳහා monitoring board එකක් පත් කළා. ඊට පසුව 2021දී Commercial High Court එකේ නඩුවක් දාලා මම හිතන විධියට නීතිඥ මහත්වරයෙකු ඉදිරිපත් කළ submissions නිසා මේ ආයතනය liquidate කරන්න එකඟත්වයක් ලැබී තිබෙනවා. අද වෙනතුරුත් මේ ආයතනය තුළ තැන්පත්කරුවන් 6,400ක් ඉන්නවා. හැබැයි, ඒ ගොල්ලන්ට "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." එකේ තැන්පත් කරපු මුදල්වලින් රුපියලක්වත් අද වෙනකල් ලැබිලා නැහැ. අපි මේ කථා කරන්නේ insurance එක හරහා ලැබිච්ච මුදල් ප්‍රමාණය ගැන. අද වෙනකොටත් "ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී." එකට අයිති properties එහෙමම තිබෙනවා. කොළඹ තිබෙන ආකාස කඩේ මහල් කිහිපයක් මේ ආයතනයට තිබෙන බව අපට ආරංචියි. Hyde Park Cornerවල building එකක් තිබෙනවා කියලා ආරංචියි. මොරටුවේත් building එකක් තිබෙනවා කියලා ආරංචියි. 2009 දී හොඳ තත්ත්වයෙන් තිබුණු කොම්පැනියක් දේශපාලන හේතු මත භාරගෙන, ඊට පසුව කැබිනට් අනුමැතිය අරගෙන ඒකට නියෝජිතයන් පත් කරලා, අවුරුදු 10ක් වෙනකොට එය බංකොලොත්භාවයට පත් කරලා තිබුණා. මේ වෙනකොට එහි තැන්පතුකරුවන් 6,400ක් ඉන්නවා. ඒගොල්ලන් තැන්පත් කරපු සල්ලිවලින් රුපියලක්වත් ලබාගන්න බැරි තත්ත්වයක් තමයි තිබෙන්නේ. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, Central Bank එකට, එහෙම නැත්නම් Treasury එකට බැරි ඇයි මේගොල්ලන්ගේ properties ටික අරගෙනවත් මේ අයට යම් සහනයක් සලසන්න? දැන් මේ liquidation process එකක් යනවා නම් ඒක යනවා යනවා කිය කියා අපට ඇද ඇද ඉන්න බැහැ නේ. මොකද, මේ 6,400 ඇතුළත ඉන්නේ මහා පරිමාණ කෝටිපතියෝ නොවෙයි, තමන්ගේ retirement funds fixed deposit එකක දාලා ඒ පොලියෙන් ජීවත් වෙච්ච කට්ටිය.

එහෙම නැත්නම් තිබෙන දේපළක් විකුණලා ලැබෙන මුදල් fixed deposits දමලා ඒ පොලියෙන් ජීවත් වෙච්ච කට්ටිය. ඒ අය කෝටිපතියෝ නොවෙයි. 2009 ඉඳලා මේ වෙනකොට ඒ අවුරුදු 60 පැනපු අයගේ වයස අවුරුදු 70ක්, 75ක් පමණ වෙනවා. මේ මිනිස්සු මැරුණාට පස්සේ ද liquidate කරලා සල්ලි දෙන්නේ? ඒ ගොල්ලන්ගේ assets ටික අරගෙන, මොනවා හරි ක්‍රමයකින් එම 6,400 දෙනාගේ මුදල් ලබා දෙන්න Treasury එකට බැරි ඇයි? Insurance company එකෙන් දෙන මුදල් පිළිබඳව අපට, - ඒක, ඒගොල්ලන්ට ලැබී තිබෙන වරප්‍රසාදයක්. මොකද, insurance තිබෙන නිසා. නමුත්, තැන්පත් කරපු මුදල් ලබා දෙන්න මොකක් හරි වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලාට බැරි ඇයි?

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන කාරණයට අපේ විරුද්ධත්වයක් නැහැ. මෙවැනි තත්ත්වයක් ඇති වෙලා මේ කියන විධියට ඇවර කිරීමේ ක්‍රියාවලියකට - liquidation process එකකට - ගියොත් එතැන දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තිබෙනවා. මේ වෙනකොට මම කලින් කියපු ආකාරයට වාණිජ මහාධිකරණයේ නඩු පැවරීමක් කර තිබෙනවා. ඒ වාගේම, -

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඒ නඩුව අවසන්.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

පොඩ්ඩක් ඉන්නකෝ, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට තිබෙන හදිස්සියට මේ රටේ තිබෙන නීති රාමුවෙන් පිට ගිහිල්ලා කටයුතු කරන්න බැහැ. එක එක බලපෑම් තිබෙනවා කියලා ඔබතුමා කිව්වාට, මට ඒ පිළිබඳ අවබෝධයක් නැහැ. ඒ කියන්නේ, ව්‍යාපාරයක් කඩා වැටෙන්න ඒකට දේශපාලන බලපෑමක් තිබුණාද නැද්ද කියන එකට මට උත්තරයක් දෙන්න බැහැ. විශේෂයෙන්ම කොළඹ වාණිජ මහාධිකරණය විසින් මේ වනවිට ඇවර කිරීමේ නියෝගය නිකුත් කරලා තිබෙනවා. ඒ අනුව ඇවර කිරීම සඳහා ඇවරකරුවෙකු පත් කරලාත් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වැඩ කටයුතු සිද්ධ වෙනවා. ඒ කටයුතු කඩිනම් කරලා ඒ කියන සහන ලබා දෙන්න රජයක් හැටියට අපි උපරිම උත්සාහයක් දරනවා. ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි තත්ත්වයක් ඇති වුණාට පස්සේ, ඇයි මෙහෙම කරන්නේ නැත්තේ කියලා එකිනෙකාට ඇඟිල්ල දිගු කරලා චෝදනා කළාට හරියන්නේ

නැහැ. රජයක් හැටියට මේ ප්‍රශ්න විසඳන්න අපටත් අවශ්‍යයි. මොකද, මේ ප්‍රශ්නත් එක්ක යන්න අපට අවශ්‍ය නැහැ. ඒ නිසා අපි උපරිම මැදිහත්වීමෙන් කටයුතු කරනවා.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ රුපියලක්වත් The Finance Company එකේ නැහැ. ඒ නිසා පෞද්ගලිකවම මට කිසිම හදිසියක් නැහැ. 6,400ක් පමණ වන තැන්පත්කරුවන්ගේ හදිසිය ගැනයි මම කිව්වේ. මට හිතෙන විධියට Commercial High Court එකේ නඩුව අවසන්. ඒකේ තීන්දුවක් දීලා තිබෙනවා. ඒ නිසා නඩුවක් යනවා කියන එක වැරදියි.

මම පළමුවැනි අතුරු ප්‍රශ්නය ඇහුවේ, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට ප්‍රවේශයක් ගන්න ඕනෑ නිසායි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, The Finance Company එකට අයත් මුදල් 2009න් පස්සේ ලංකා පුත්‍ර බැංකුවට දීලා තිබෙනවා.

ඊට පස්සේ, Sussex Educational Services Limited කියන ආයතනයේ කේ. ජයතිස්ස කියන පුද්ගලයා senior director කෙනෙක් හැටියට ඉඳලා තිබෙනවා, The Finance Company එකේ. කේ. ජයතිස්ස කියන පුද්ගලයාව පත් කරලා තිබෙන්නේ කැබිනට් අනුමැතියක් අනුව. ඒ අනුව, The Finance Company එකේ මුදල් අරගෙන Sussex College Network කියලා පාසලක් ආරම්භ කර, එය මේ වනතුරුත් මහා පරිමාණයෙන් කරගෙන යනවා. එතකොට ඒ The Finance Company ආයතනයේ මුදල් යම් ක්‍රමයකින් 2009-2021 අතර කාලයේ දී ආයෝජනය කරලා තිබෙනවා. ඒ මුදල් ආයෝජනය කරපු පාසල දැනටත් පවත්වාගෙන යනවා.

ඒ වාගේම තමයි, ඊට පස්සේ Mr. Ranaweera කියලා තවත් පුද්ගලයෙක් සම්බන්ධයෙන් රුපියල් බිලියන 5.5ක ගැටලුවක් තිබෙනවා. ඔහු, former Director of the Department of Supervision of Non-Bank Financial Institutions, Central Bank of Sri Lanka. දැන් මේ රුපියල් බිලියන 5.5ක ප්‍රමාණයක transaction එක පිළිබඳව ලොකු ගැටලුවක් තිබෙනවා. ඊට අමතරව තුන්වැනි කාරණය තමයි, මම හිතන විධියට 2019 හෝ 2020දී වාගේ - මේ document එකේ නිවැරදි දිනය තිබෙනවා. මට හරියටම ඒ දිනය මතක නැහැ - Central Bank එකෙන් The Finance Company එකේ licence එක cancel කරන්න මාසයකට කලින් one monthවලට special project එකක් කියලා, "We are going to raise one billion within one month" කියලා, මාසයක් ඇතුළත රුපියල් බිලියනයක මුදලක් එකතු කරලා තිබෙනවා. Central Bank එක මෙක වහන්න යනවා කියලා දැන දැන වහන්න මාසයකට පෙර රුපියල් බිලියනයක මුදලක් එකතු කරලා තිබෙනවා. ඒ මිනිස්සුත් අද මෙක ඇතුළේ හිරවෙලා තිබෙනවා. මේ පිළිබඳව CID එකේ පැමිණිල්ලක් කරලා තිබෙනවා. මම ඒ පැමිණිලි අංකයත් එක්ක කියන්නම්. පැමිණිලි අංක PCJU16/20C3012020CD/2021/210 යටතේ CID එකේ පැමිණිල්ලක් කරලා තිබෙනවා, මේ Sussex College Network ආයතනය, ඒ වාගේම මේ රණවීර කියන පුද්ගලයා - Central Bank එකේ හිටපු Director කෙනෙක්, නිලධාරියෙක් - Company එකට රුපියල් බිලියන 5.5ක් ගත්ත එක සම්බන්ධව. මම ඒකයි කිව්වේ, මේ වාගේ ප්‍රශ්නත් එක්ක තමයි මේ The Finance Company එක තිබෙන්නේ. මේ ඔබතුමා රාජ්‍ය ඇමතිවරයා වෙන්න කලින් සිදු වෙච්ච දේවල්. ඒ වාගේම මේක 2009දී, ඒ කියන්නේ මම G.C.E. A/L ලියන කාලයේ වෙච්ච ප්‍රශ්නයක්. ඔබතුමායි, මමයි මේකට සම්බන්ධ නැහැ. හැබැයි, මේකට සම්බන්ධ වෙච්ච, මේකෙන් මුදල් උපයාගත් පුද්ගලයින් ඉන්නවා. ඒ නිසා 6,400දෙනෙකුගේ ජීවිත එක්ක සෙල්ලම් කරන්නේ නැතුව, මෙන්න මේ Sussex College Networkහි ජයතිස්ස සහ ඊට අමතරව මම කියපු මේ one billion එකතු කරගන්න වැඩ පිළිවෙළ ගෙනාපු Central Bank එකේ නිලධාරින්ට එරෙහිව ඔබතුමන්ලා ගන්න යන ක්‍රියා මාර්ග මොනවාද, නැත්නම් ඒ සඳහා පරීක්ෂණයක් කරනවාද කියන එක තමයි දෙවැනි අතුරු ප්‍රශ්නය හැටියට මම අහන්නේ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න කලින් මම මේ කාරණය කියන්න ඕනෑ. First of all, Hon. Member, I did not say that you have deposited your money in the company. So, you will have to withdraw that statement; I never commented anything like that. - *[Interruption]*

Secondly, I have answered the Question you have raised. There are a few additional points which you have raised just now. It is better if you could ask a seperate question on those points because I am not in a position to answer you right now. If you raise a seperate question, we will give the answer for that. I have to find details on that; I cannot comment without finding the details.

ගල්තුඩේ-අටුළුගම-විදාගම මාර්ගය: සංවර්ධන කටයුතු
கல்துடே- அட்டுலுகம - விதாகம வீதி: அபிவிருத்தி நடவடிக்கைகள்
GALTHUDE-ATULUGAMA-VIDAGAMA ROAD: DEVELOPMENT ACTIVITIES

2046/2024

7. ගරු ලලිත් එල්ලාවල මහතා
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රතිපාදන මත ගල්තුඩේ-අටුළුගම-විදාගම මාර්ගයේ සංවර්ධන කටයුතු ආරම්භ කරන ලද බවත්;

(ii) ඉහත මාර්ගය දෙපස ඉඩම්වල පදිංචිකරුවන් වන්දි ලබා ගැනීමකින් තොරව තම නිවාස හා ආරක්ෂිත තාප්ප ඉවත් කර මාර්ගය පුළුල් කිරීම සඳහා අවස්ථාව ලබා දුන් බවත්;

(iii) මේ වනවිට එම මාර්ගයේ සංවර්ධන කටයුතු සම්පූර්ණයෙන්ම නතර කර ඇති බවත්;

(iv) මේ හේතුවෙන් ඉහත මාර්ගයට යාබද අටුළුගම, අල් ගස්සාලි විද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන් 3000කට අධික පිරිසක් ඇතුළු ප්‍රදේශයේ විශාල ජනතාවකට පා ගමනින් හෝ ගමන් කිරීමට නොහැකිවීම හේතුවෙන් දුෂ්කරතාවලට ලක්වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත මාර්ගයේ සංවර්ධන කටයුතු නවතා දැමීමට හේතු කවරේද;

(ii) එම සංවර්ධන කටයුතු නැවත ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ලලිත් එල්ලාවල මහතා]

போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஆசிய அபிவிருத்தி வங்கியின் நிதி ஒதுக்கீடுகளின் மூலம் கல்துடே-அட்டுலுகம - விதாகம வீதியின் அபிவிருத்திப் பணிகள் ஆரம்பிக்கப் பட்டுள்ளதென்பதையும்;

(ii) மேற்படி வீதியின் இரு மருங்கிலுமுள்ள காணி களில் வசிப்பவர்கள் நஷ்டஈடுகளைப் பெற்றுக் கொள்ளாமல் தமது வீடுகளையும் பாதுகாப்பு மதில்களையும் அகற்றி, வீதியை விரிவுபடுத்து வதற்குச் சந்தர்ப்பம் வழங்கியுள்ளனர் என்பதையும்;

(iii) தற்போது அந்த வீதியின் அபிவிருத்திப் பணிகள் முற்றாக நிறுத்தப்பட்டுள்ளதென் பதையும்;

(iv) இதன் காரணமாக மேற்படி வீதிக்கு அருகிலுள்ள அட்டுலுகம அல்-கஸ்ஸாலி வித்தியாலயத்தில் கல்வி கற்கும் 3,000க்கும் மேற்பட்ட மாண வர்கள் உட்பட அப்பிரதேசத்தைச் சேர்ந்த பெருந்தொகையான மக்கள் நடந்து செல்லக்கூட முடியாமல் சிரமத்துக்கு உள்ளாகியுள்ளனர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வீதியின் அபிவிருத்திப் பணிகள் நிறுத்தப்படுவதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி அபிவிருத்திப் பணிகள் மீண்டும் ஆரம்பிக்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Highways:

(a) Is he aware that -

(i) the development of the Galthude-Atulugama-Vidagama Road was initiated with financial grants of the Asian Development Bank;

(ii) the residents on both sides of the above road allowed demolishing of their houses and boundary walls to widen the road without any compensation;

(iii) the development of the above road has been completely halted by now; and

(iv) a large number of people in the area, including more than 3,000 students studying at Al Ghazali College, Atulugama which is located next to the aforementioned road, have been faced with difficulties as they are unable to go at least on foot due to this construction?

(b) Will he inform this House -

(i) the reasons for the development activities of the above road to be halted mid-way; and

(ii) the date on which the said development activities will be resumed?

(c) If not, why?

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(iv) ඔව්.

(ආ) (i) ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබීමට නියමිතව තිබූ ණය වාරික මුදල් නොලැබීම හේතුවෙන් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් නොමැතිවීම නිසා ගල්තුඩේ-අටළුගම- විදාගම මාර්ගය සංවර්ධනය කිරීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවීමට සිදුව ඇත.

(ii) මෙම මාර්ගයේ ඉතිරි සංවර්ධන කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක මාර්ග කිලෝමීටර 1,000ක් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතට යෝජනා වී ඇති අතර, එමඟින් මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු ආරම්භ කර සිදු කරමින් පවතින බව දන්වා සිටිමි.

(ඇ) අදාළ නොවේ.

ගරු ලලිත් එල්ලාවල මහතා
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මේක සුවිශේෂී අවස්ථාවක්. මොකද, අපි ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට කිලෝමීටර 100කට යෝජනා දෙන්න කියලා අපට කිව්වා මතකයි. ඒ වෙලාවේ මම බණ්ඩාරගම නගරය පහසුවෙන් පාස් කරලා යන්න පුළුවන් විධියට යෝජනාවක් ඉදිරිපත් කළා. ඒක නගරයේ තදබදය අඩු කිරීමටත් ලොකු පහසුවක් වෙනවා. මොකද ඒක, විදාගම-අටළුගම හරහා ගල්තුඩේ විහාරස්ථානය ළඟින් නැවත කළුතර-බණ්ඩාරගම පාරට වැටෙන මාර්ගය. ඒක මහ විශාල ජනකායක් එහෙට මෙහෙට යන පාරක්. අනෙක් එක, මෙහි විශේෂත්වය තමයි ගරු ඇමතිතුමනි,- *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය ඇහුවා නම් හොඳයි.

ගරු ලලිත් එල්ලාවල මහතා
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)

මේ පැහැදිලි කිරීමත් එක්කයි ප්‍රශ්නය අහන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, මේ පැහැදිලි කිරීම කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ලොකු කථාවක් කළාට පිළිතුරු දෙන්න ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා මේ වෙලාවේ සභාවේ නැති නිසා එතුමාට යොමු කරන්න විතරයි පුළුවන්. ඒ නිසා ඔබතුමා කෙටියෙන් අදහස කිව්වා නම් හොඳයි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ ඇමතිවරයා නැහැ. ඔබතුමා කරුණු ටික ලිඛිතව ලබා දුන්නොත්, ඒක ඇමතිතුමාට යොමු කරලා ඉදිරියේදී පිළිතුර ලබා දෙන්න මම කටයුතු කරන්නම්.

ගරු ලලිත් එල්ලාවල මහතා
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)
ගරු ඇමතිතුමනි, ඒ ප්‍රධාන පාර අනෙක් පාරවල් වාගේ නොවෙයි. ජනතාව රජයේ වන්දියක් නොලබාම තමන්ගේ නිවාස, තාප්ප කඩලා තමයි ඒ පාර පළල් කරන්න අවස්ථාව ලබා දුන්නේ. මේ වෙනකොට මට දැන ගන්නට ලැබුණු විධියට අටළුගම මුස්ලිම් ජනතාව තමන්ගේ නිවාස, තාප්ප කඩලා එච්චර පරිත්‍යාගයක් කරලාත් එහි කාණු පද්ධතියක් නොදමා නිකම් තාර කෝඩ් එකක් විතරක් ගහන්න යනවා. එහෙම කළොත් ඒක ඒ ජනතාවට කරන ලොකු අසාධාරණයක් වෙනවා.

මොකද, අපි ගිහිල්ලා ඉල්ලීම් කළාට පස්සේ පර්චස් දෙකක්, තුනක් තිබෙන හැම කෙනෙකුම ඔවුන්ගේ තාප්ප කඩලා පාර පළල් කරන්න ඉඩ දුන්නා. රජයෙන් ශත පහක්වත් ලබා ගන්නේ නැතුව මුස්ලිම් ජනතාව ඒ විධියට තමන්ගේ ගෙවල්, තාප්ප කඩලා පාර පළල් කරන්න ඉඩ ලබා දුන් මම දැකපු ලංකාවේ එකම තැන තමයි, ඒක. එම නිසා ඒ ජනතාව කරපු පරිත්‍යාගයට ගෞරවයක් හැටියට එදා ඇස්තමේන්තු කරපු විධියටම කානු පද්ධති දාලා එම පාර නියමාකාරයෙන් හදලා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම මා කරනවා. එහෙම නොකළොත් ඒක ඔවුන් කරපු පරිත්‍යාගයට කරන ලොකු අසාධාරණයක් වෙනවා. ගරු ඇමතිතුමනි, එම නිසා මෙයට ප්‍රමුඛතාව ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද, ළමයි 3,000ක් පමණ සිටින පාසලක් එතැනම තිබෙනවා. ඒ තමයි, අටුලුගම අල් ගසාලි මහා විද්‍යාලය. දැන් එම මාර්ගයේ යන්න එන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. එම නිසා මේ මාර්ගයේ සංවර්ධන කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම මම මේ අවස්ථාවේදී කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එය ගරු ඇමතිතුමාගේ අවධානය සඳහා යොමු කරනවා.

ප්‍රශ්න අංක 8 -2056/2024- (2), ගරු වේලු කුමාර් මහතා.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරගන්න අවශ්‍යයි. ඒ, මම අහපු වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයට අදාළව නොවෙයි, අපේ ක්ෂේත්‍රයට අදාළව ආණ්ඩුවේ ස්ථාවරය මොකක්ද කියන එක සම්බන්ධයෙන් පොඩි පැහැදිලි කර ගැනීමක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සඳහා මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

ගරු ඇමතිතුමනි, වැවිලි ක්ෂේත්‍රයේ කම්කරුවන්ගේ වැටුප් පිළිබඳව විශේෂ ගැසට් නිවේදනයක් මැයි 01වැනි දා නිකුත් කළා. ඒ වාගේම ජනාධිපතිතුමා කොටගල රැස්වීමකට සහභාගි වෙලා වතු කම්කරුවකුගේ දෛනික වැටුප රුපියල් 1,700 දක්වා වැඩි කරනවා කියන පොරොන්දුව ලබා දුන්නා. එම ගැසට් පත්‍රය මැයි මාසයේ 21වැනි දා නැවත සංශෝධනය කරලා තවත් ගැසට් පත්‍රයක් නිකුත් කළා. නමුත්, පසුගිය ජූනි 10වැනි දා ඒ සියලු ගැසට් පත්‍ර ටික අවලංගු කරලා තවත් ගැසට් පත්‍රයක් නිකුත් කර තිබෙනවා. මම අහන්නේ, කම්කරුවන්ගේ පඩි වැඩි කිරීම පිළිබඳව ආණ්ඩුවේ ස්ථාවරය කුමක්ද කියලායි.

අපි දන්නවා, ඉරානය අපේ රටට ලබා දුන් ඩොලර් ණයවලින් සියයට 60ක් පමණ තේ අපනයනය කිරීම නිසා පසුගිය සතියේ ආපසු ගෙවීමට පුළුවන් වෙලා තිබෙන බව. අපේ රටට ඩොලර් ගෙනෙන වතු ජනතාවගේ ජීවන තත්ත්වය අද ඉතාම පහළ මට්ටමට වැටිලා තිබෙන්නේ. එවැනි අවස්ථාවක තමයි මම කලින් සඳහන් කරපු විධියට මෙම ගැසට් පත්‍ර අවලංගු කරලා තිබෙන්නේ. එම නිසා මේ පිළිබඳව රජයේ ස්ථාවරය කුමක්ද කියන එක පැහැදිලි කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ ස්ථාවරය වෙන්නේ ඒ වතු කම්කරුවන්ගේ පඩි වැඩි කළ යුතුයි කියන එක. ඒ නිසා තමයි රජය මැදිහත් වෙලා ඒ සම්බන්ධයෙන් දිගින් දිගටම කටයුතු කළේ. නමුත්, මේ සම්බන්ධව වතු හාම්පුතුන් අධිකරණයට ගිහිල්ලා තිබෙනවා. එම නඩුව දැනට අධිකරණයේ පවතින නිසා මට ඒ පිළිබඳව ප්‍රකාශ කරන්න බැහැ. හැබැයි, රජයේ ස්ථාවරය ඒක. අපි ඒ ස්ථාවරයේම ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 9 -2078/2024- (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 10 -2086/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවන වටය.

සෙවනගල සීනි කර්මාන්තශාලාවේ ඕංඩුම නිවාස සංකීර්ණය: පදිංචිකරුවන්

செவனகல சீனித் தொழிற்சாலையின் ஒங்டும வீடமைப்புத்தொகுதி: குடியிருப்பாளர்கள்

ONDUMA HOUSING COMPLEX, SEVANAGALA SUGAR FACTORY: RESIDENTS

1993/2024

4. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு வாசுதேவ நாணாயக்கார சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Vasudeva Nanayakkara)
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2023.07.01 දින පොලිස් නිලධාරීන් සමඟ පැමිණි සෙවනගල සීනි කර්මාන්තශාලාවේ පාලන අධිකාරිය විසින් ඕංඩුම නිවාස සංකීර්ණයේ නිවාසවල ජලය හා විදුලිය විසන්ධි කර ඇති බවත්;

(ii) විශ්‍රාම ගන්වන අවස්ථාවේදී යැපෙන්නන් බඳවාගැනීමට හෝ පදිංචිය සඳහා ඉඩමක් ලබා දීමට, 1983-1986 කාලයේදී එම නිවාස සංකීර්ණයේ නිවාසවල සේවකයන්ව පදිංචි කරවන අවස්ථාවේදී පාලන අධිකාරිය විසින් පොරොන්දු වී ඇති බවත්;

(iii) වර්ෂ 30-40ක් තිස්සේ එම නිවාසවල පදිංචි වී සිටීමින් ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් එම සේවකයන් ක්‍රියා කර ඇති බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) පදිංචිව සිටින සේවකයන්ට අසාධාරණ ලෙස සලකමින් ආයතනයේ ඉඩම් කැබලි පදිංචි වීම සඳහා වෙනත් බාහිර පුද්ගලයන්ට ලබා දෙන බව දන්නේද;

(ii) ඉහත නිවාසවල පදිංචි වී සිටින සේවකයන්ට තවදුරටත් එම නිවාසවල රැඳී සිටීමට අවසර දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

முதலீட்டு மேம்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2023.07.01ஆம் திகதி பொலிஸ் உத்தியோகத்தர்களுடன் வருகை தந்த செவனகல சீனித் தொழிற்சாலை நிருவாகத்தினர் ஒங்டும வீடமைப்புத் தொகுதியில் அமைந்துள்ள வீடுகளின் நீர் மற்றும் மின்சாரத்தைத் துண்டித்துள்ளார்கள் என்பதையும்;

(ii) ஓய்வுறுத்தப்படும் சந்தர்ப்பத்தில் தங்கிவாழ்பவர்களை ஆட்சேர்ப்பதற்கு அல்லது குடியிருப்பதற்காகக் காணியொன்றை வழங்குவதற்கு, 1983-1986ஆம் ஆண்டு காலப்பகுதியில் குறிப்பிட்ட வீடமைப்புத் தொகுதியின் வீடுகளில் ஊழியர்களைக் குடியமர்த்தும்போது நிருவாகத்தினர் வாக்குறுதி அளித்துள்ளார்கள் என்பதையும்;

(iii) 30-40 வருடங்களாகக் குறிப்பிட்ட வீடுகளில் குடியிருந்தவாறு நிறுவனத்தின் மேம்பாட்டின் பொருட்டு இந்த ஊழியர்கள் செயற்பட்டுள்ளார்கள் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) குடியிருக்கும் ஊழிர்களை நியாயமற்ற விதத்தில் நடாத்தியவாறு நிறுவனத்தின் காணித் துண்டுகளை குடியிருப்பதற்காக வெளியாட்களுக்கு வழங்குகின்றனர் என்பதை அறிவாரா;

(ii) மேற்படி வீடுகளில் குடியிருக்கும் ஊழியர்களுக்குத் தொடர்ந்தும் குறிப்பிட்ட வீடுகளில் தங்கியிருப்பதற்கு அனுமதி வழங்கப்படுமா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Investment Promotion:

(a) Will he admit that -

(i) the administration of Sevanagala Sugar Factory, who came with police officers on 01.07.2023, has taken steps to disconnect the water and electricity supply of the houses of the Onduma Housing Complex;

(ii) the administration had promised to recruit dependents of workers at their retirement or to provide land for residence, during the period 1983-1986 when the employees were made to settle down in the houses of the said housing complex; and

(iii) those employees have worked for the betterment of the institution by residing in those houses for 30 to 40 years?

(b) Will he inform this House-

(i) whether he is aware that the resident employees are being treated unfairly and that plots of land in the establishment are being allotted to other outsiders for settlement; and

(ii) whether the workers residing in the above houses will be allowed to stay in them further?

(c) If not, why?

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණයෙන් මහා භාණ්ඩාගාරය යටතේ පවතින පූර්ණ රාජ්‍ය සමාගමක් වන අතර, එම සමාගමට අයත් සෙවනගල කර්මාන්තශාලාවේ, සේවක මහත්ම මහත්මීන් 1,100කට ආසන්න සංඛ්‍යාවක් සේවය කරන අතර, උක් ගොවි පවුල් 3,500කට අධික සංඛ්‍යාවක් මෙමඟින් ජීවනෝපාය සලසා ගනී.

අප ආයතනයේ සේවයේ නියුතු නිලධාරි/සේවක මහත්ම මහත්මීන්ගේ පූර්ණ කැපවීම ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා බෙහෙවින් බලපාන අතර, උපරිම ඵලදායීතාවක් ලබා ගැනීම සඳහා ඔවුන්ගේ සුඛසාධනය ප්‍රමුඛ අවශ්‍යතාවක් සේ සලකා ආයතනය විසින් කටයුතු කරනු ලබයි.

ඒ අනුව, ආයතනයේ වර්තමාන නිලධාරි/සේවක මහත්ම මහත්මීන්හට සේවා අවශ්‍යතාව ප්‍රමුඛ සාධකයක් සේ සලකමින් ආයතනයේ සේවයේ යෙදී සිටින කාලය සඳහා පමණක් වලංගු වන පරිදි නේවාසික පහසුකම් ලබා දෙනු ලැබේ.

නමුත් මෑතක සිට වත්මන් සේවකයන් හට නිල නිවාස ලබා දීමේදී එම ආයතනයේ පාලනාධිකාරිය ගැටලුකාරී තත්ත්වයකට පත්ව ඇත. මන්ද යත්, එම ආයතනයේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ගන්වන ලද හෝ සේවයෙන් ඉවත්ව ගිය පුද්ගලයන් විසින් අනවසරයෙන් සහ බලහත්කාරයෙන් එම නිල නිවාසවල රැඳී සිටීමයි.

ඒ තුළින් දැනට සේවයේ නියුතු සේවකයන් 675කට අධික පිරිසක් නිල නිවාස ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රතිචාරයක් ලබා දීමට එම ආයතනයේ පාලනාධිකාරියට නොහැකි වී ඇත. මේ සම්බන්ධයෙන් කිහිප අවස්ථාවකම අදාළ පුද්ගලයන් වෙත එම නිල නිවාස විධිමත්ව ආයතනය වෙත භාර දෙන ලෙස දන්වා සිටියද මේ වනතෙක් ඇතැම් නිල නිවාස ආයතනය වෙත භාර දී නොමැත.

මේ සම්බන්ධයෙන් 2016 වර්ෂයේදී නීති උපදෙස් ලබා ගනිමින් නීතිඥ මහතෙකුගේ උපදෙස් පරිදි ඔවුන් වෙත එන්තරවාසි යැවීමට කටයුතු කර ඇත. (ඇමුණුම 01**) නමුත් අදාළ පුද්ගලයින් ඒ සඳහා ද කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත.

මේ සම්බන්ධව එම ආයතනය විසින් උපදෙස් ලබා ගත් නීතිඥවරයා පෙන්වා දී ඇත්තේ (ඇමුණුම 02**) රජයේ ගිණුම් පිරික්සීමකට යටත් රජයේ ආයතනයක් වශයෙන් තවදුරටත් මෙම අනවසර පදිංචිකරුවන්ට විදුලි සහ ජල බිල්පත් ගෙවීම ගැටලු මතු කරනු ලැබිය හැකි කරුණක් වන අතර, එසේ පහසුකම් සැපයීම මඟින් තවදුරටත් එම තැනැත්තන් එම දේපළවල -නිල නිවාසවල- රැඳී සිටීමට ව්‍යාංග අනුමැතියක්/පෙලඹවීමක් ලද සේ සැලකිය හැකි කරුණක් වන බවත්, ඒ තුළින් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේදී ආයතනයට අවාසි සහගත තත්ත්වයක් උදාවන බවත් ය.

මෙම අනවසර නිල නිවාස අයත් නිවාස සංකීර්ණ අතුරින් කමිහල් නිවාස සංකීර්ණයට අයත් නිල නිවාස සඳහා විදුලිය හා ජලය ආයතනය විසින් ලබා දෙනු ලැබේ. ඩංඩුම, ගිණිගල්පැලැස්ස නිවාස සංකීර්ණයට අයත් නිල නිවාස සඳහා ජලය ආයතනයෙන් ලබා දෙනු ලබන අතර, විදුලිය ලබා දෙනු ලබන්නේ විදුලිබල මණ්ඩලය විසින් වේ. තවද මෙම නිල නිවාස සංකීර්ණ අතුරින් මකුලුවගම නිවාස සංකීර්ණය, චන්දිමාරාම නිවාස සංකීර්ණය, කටුපිලගම නිවාස සංකීර්ණවලට අයත් නිල නිවාස සඳහා විදුලිබල මණ්ඩලය මඟින් විදුලිය ලබා දෙනු ලබන අතර ජලය ලබා දෙනු ලබන්නේ ප්‍රජා ජල ව්‍යාපෘති මඟින් වේ.

වසර ගණනාවක් පුරා මෙම අනවසර නිල නිවාස සම්බන්ධ ගැටලුකාරී තත්ත්වය නිරාකරණය කර ගැනීමට නොහැකි වී ඇති අතර, මෙම අනවසර පුද්ගලයන් විසින් විදුලි බිල්පත් ද තම භාරයට ගැනීමට කටයුතු කර ඇත. ඒ සම්බන්ධව නිරන්තරයෙන් විදුලිබල මණ්ඩලය වෙත දැනුම් දීම් සිදු කළද, එය නොවිසඳුණු කරුණක් වී ඇත. (ඇමුණුම 03**)

වසර කිහිපයක් පුරා මේ සම්බන්ධයෙන් යම් සහනදායී පිළිතුරක් අදාළ නේවාසිකයන්ගෙන් බලාපොරොත්තු වුවද, එය නොලැබීම හේතුවෙන් ආයතනයේ ඵලදායීතාවට මෙන්ම සේවකයන්ගේ අප්‍රසාදයට ද පාලනාධිකාරිය පත්ව ඇත. මෙම නිවැරදි කිරීම් සිදු නොකිරීම තුළ ආයතනයේ සේවක ප්‍රජාවගේ සහ ආයතනීය ව්‍යක්තීය සම්තිවල විවේචනයට ලක්වීමට පාලනාධිකාරියට සිදුවී ඇත.

තවද, නිරන්තරයෙන් මෙම අනවසර නිල නිවාසවල විදුලි බිල්පත්, ජල බිල්පත් මෙන්ම නිවාස කුලිය අය කර නොගැනීම හේතුවෙන් අභ්‍යන්තර විගණනයට මෙන්ම රජයේ විගණනයන්ටද පිළිතුරු සැපයීමට සිදුව ඇත. (ඇමුණුම 04 i, ii, iii**)

කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් වත්මන් පාලනාධිකාරිය විසින් විධිමත්ව නිල නිවාස කම්ටුව යාවත්කාලීන කර, මෙම ගැටලුව විසඳා ගත යුතු බව තීරණය කර ඇත. එහි එක් පියවරක් ලෙස අනවසරයෙන් සහ බලහත්කාරයෙන් රැඳී සිටින නිල නිවාස පරීක්ෂා කර වාර්තාවක් ලබාගෙන ඇත. (ඇමුණුම 05**)

එම නිල නිවාසවල පදිංචි පුද්ගලයන්හට සහනදායී කාල සීමාවක් ලබා දෙමින්, විධිමත්ව නිල නිවාස ආයතනය වෙත භාර දෙන ලෙස දන්වමින් ලිපි යොමු කර ඇත. (ඇමුණුම 06**) එම කාල සීමාව අවසන් වුවද කිසිවෙක් මෙම නිල නිවාස ආයතනය වෙත භාර නොදෙන පසුබිමක නැවතත් නිල නිවාස කම්ටුව රැස්ව මෙහි මීළඟ පියවර ලෙස මෙම සියලු අනවසර නිල නිවාසවල විදුලිය සහ ජල පහසුකම් ඉවත් කිරීමට තීරණය කරන ලද අතර, එම කාල සීමාව සඳහා එනම් මෙම පුද්ගලයන් ආයතනීය සේවා කාලය අවසන් වූ දින සිට 2023 මැයි මස වන තෙක් අදාළ නිල නිවාස කුලිය, ජල බිල්පත් සහ විදුලි බිල්පත්වල වට්ටනාකම සඳහන් කර ලිඛිතව ඔවුන් වෙත ලිපියක් ලබා දී ජලය සහ විදුලිය සැපයීම විසන්ධි කර ඇත. (ඇමුණුම 07**)

මෙහිදී මෙම නිල නිවාස අතුරින් කමිහල් නිල නිවාස සංකීර්ණයට අයත් සියලු අනවසර නිල නිවාසවල විදුලිය සහ ජලය යන පහසුකම් දෙවර්ගයම විසන්ධි කර ඇති අතර, ඩංඩුම සහ ගිණිගල්පැලැස්ස නිවාස සංකීර්ණයට අයත් නිල නිවාසවල ජල සැපයුම ද විසන්ධි කර ඇත. මෙම නිල නිවාස අතුරින් කමිහල් නිල නිවාස සංකීර්ණය හැර අනෙකුත් සියලු නිල නිවාස සඳහා විදුලිය ලබා දීම සිදු කරනු ලබන්නේ විදුලිබල මණ්ඩලය විසින් වන බැවින් අනවසර නිල නිවාස පිළිබඳව විශ්තර ඇතුළත්ව විදුලිබල මණ්ඩලය විසින් ලබා දෙනු ලබන විදුලිය විසන්ධි කරන ලෙස ලිඛිතව ඉල්ලීමක් සිදු කර ඇත. (ඇමුණුම 08**) එම ආයතනය විසින් කරන ලද ඉල්ලීමට අනුව අදාළ නේවාසිකයන් හට

** * පුස්තකාලයේ තබා ඇත.*
** * நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

** * පුස්තකාලයේ තබා ඇත.*
** * நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

එම නිල නිවාසවල අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි වුවහොත් දින 14ක් ඇතුළත විදුලිය විසන්ධි කරන බව විදුලිබල මණ්ඩලය විසින් දන්වා යවා ඇත. (ඇමුණුම 09**)

තවද, විදුලිබල මණ්ඩලය විසින් මෙම නිවාසවල විදුලි පරිභෝජනය සම්බන්ධයෙන් පරීක්ෂා කර අදාළ බිල්පත් නේවාසිකයන් වෙත ලබා දීම සිදු කරන බැවින්, එම ක්‍රමවේදය සිදු නොකර ආයතනයේ සාමාන්‍යාධිකාරී වෙත සියලු විදුලි බිල්පත් ලබා දෙන ලෙසද විදුලිබල මණ්ඩලය වෙත දන්වා ඇත. (ඇමුණුම 10**)

එසේම, මෙම ඇතැම් නිල නිවාස සඳහා ජල පහසුකම් ලබා ගනු ලබන්නේ ජල සමිති මඟින් වන බැවින්, එම අනවසර නිල නිවාසවල ජල පහසුකම් විසන්ධි කරන ලෙස දන්වමින් ලිපි යොමු කර ඇත. (ඇමුණුම 11 i, ii, iii**)

තවද, මෙම නිවාසවල විදුලි පරිභෝජනය හා ජල පරිභෝජනය සම්බන්ධයෙන් එම ආයතනය වෙත ලද බිල්පත්වල සාරාංශය (ඇමුණුම 12**)

මෙම සියලු කරුණු පදනම් කර ගනිමින් නිරවුල් නොවූ නිල නිවාස 39ක ප්‍රමාණය සඳහා නීතිමය කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී.

(ii), (iii) 1983 ජනවාරි මස, 1957 අංක 12 දරන සංස්ථා පනත අනුව ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය යටතේ ආයතනය පිහිටුවා ඇති අතර, 1991 රාජ්‍ය සමාගමක් ලෙස "සෙවනගල සීනි කර්මාන්තායතනය" නමින් ආයතනයේ පරිපාලන ව්‍යුහය සැකසී ඇත.

1992 වර්ෂයේ "සෙවනගල ෂුගර් ඉන්ඩස්ට්‍රිස් ලිමිටඩ්" නමින් ආයතනය සීමිත සමාගමක් ලෙස ක්‍රියාත්මක කර ඇති අතර, 2002 ජූනි මස ආයතනය පූර්ණ වශයෙන් පෞද්ගලීකරණය කර ඇත. ඒ, දයා සමූහ ව්‍යාපාරය යටතේ. එම පෞද්ගලීකරණය කිරීමෙන් පසු සීනි සංයුක්ත මණ්ඩලය පැවති සමයේ තිබූ සියලු ගිවිසුම් අහෝසි කරමින් හා සංශෝධනය කරමින් ඉඩම් හා නිල නිවාස නීති ද වෙනස් කර පුද්ගලික පාලනයට ලක් කර ඇත.

2011.11.11වෙනි දින පාර්ලිමේන්තුවේ සම්මත වූ 2011 අංක 43 දරන ඌන උපයෝජිත වත්කම් හා ව්‍යවසායයන් පුනරුදය කිරීමේ පනත මඟින් ආයතනයේ කටයුතු පූර්ණ ලෙස රජයට පවරා ගෙන ඇති අතර, එය සෙවනගල සීනි කර්මාන්තායතනය නමින් ඵලදායීතා හා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතට පත් කර ඇති අතර, 2012.08.24වෙනි දින සෙවනගල හා පැල්වත්ත සීනි කර්මාන්තායතනය ඒකාබද්ධ කර සමාගම් පනත යටතේ සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම ලෙස නම් කර එය ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතට පත් කර ඇත.

එබැවින්, 2011.11.11වෙනි දිනෙන් පසුව සේවයේ නියුතු සේවකයින් සම්බන්ධයෙන් සහ ආයතනය සම්බන්ධයෙන් අදාළ තොරතුරු පමණක් එම ආයතනය සතුව පවතින අතර, ඊට පෙර කිසිදු තොරතුරක් එම ආයතනය සතුව නොමැත. ඒ අනුව සියලු ගිවිසුම් හා නීති-රීති ක්‍රියාත්මක වූයේ සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම යටතේ බව දන්වා සිටිමි.

පෞද්ගලික පාලනයෙන් මිදී රාජ්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමේදී පෞද්ගලික ව්‍යවසායකයන් විසින් ආයතනයේ පැරණි තොරතුරු නව පාලනාධිකාරිය වෙත ලබා දී නොමැති බවද කාරුණිකව දන්වා සිටිමි.

(ආ) (i) ආයතනය සතු කිසිදු ඉඩම් කොටසක් නීත්‍යානුකූල ලෙස කිසිදු අයෙකු වෙත පැවරුම් කටයුතු කර නොමැත.

(ii) අනවසරයෙන් සහ බලහත්කාරයෙන් අත්පත් කරගෙන ඇති ඉඩම් නැවත ආයතනය වෙත පවරා ගැනීම සඳහා නීතිමය කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) අනවසරයෙන් සහ බලහත්කාරයෙන් අත්පත් කරගෙන ඇති ඉඩම් නැවත ආයතනය වෙත පවරා ගැනීම සඳහා නීතිමය කටයුතු සිදු කරමින් පවතී.

*** පුස්තකාලයේ තබා ඇත.*

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

මහනුවර නගරයේ සංවර්ධනය සඳහා අත්පත් කරගත් ඉඩම්: වන්දි

கண்டி நகரத்தின் அபிவிருத்திக்காக சுவீகரிக்கப்பட்ட காணிகள்: நஷ்டஈடு

LANDS ACQUIRED FOR DEVELOPMENT OF KANDY CITY: COMPENSATION

2009/2024

5. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු මයන්ත දිසානායක මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பத்திரண - மாண்புமிகு மயந்த திசாநாயக்க சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Mayantha Dissanayake)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර නගරය සංවර්ධනය කිරීම වෙනුවෙන් ඒ අවට ඉඩම් රජයට පවරාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් හිමිකරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එසේ පවරා ගනු ලැබූ ඉඩම් සඳහා වන්දි ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබා දෙන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iii) එක් එක් ඉඩම් හිමිකරුවකු සඳහා ලබා දී ඇති වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி நகரத்தை அபிவிருத்தி செய்வதற்காக அதனைச் சூழவுள்ள காணிகள் அரசாங்கத்தால் சுவீகரிக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், அந்தக் காணிகளின் அளவு எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி காணிகளின் உரிமையாளர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அவ்வாறு சுவீகரிக்கப்பட்ட காணிகளுக்காக நஷ்டஈடு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், வழங்கப்பட்ட மொத்த நஷ்டஈட்டுத் தொகை எவ்வளவு என்பதையும்;

(iii) ஒவ்வொரு காணி உரிமையாளர்களுக்கும் வழங்கப்பட்டுள்ள நஷ்டஈட்டுத் தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development and Housing:

(a) Will he inform this House-

(i) whether the State has acquired lands adjoining the Kandy city in order to develop the city;

(ii) if so, the extent of aforesaid lands; and

(iii) the number of aforesaid land owners?

(b) Will he also inform this House -

(i) whether compensation have been granted for the lands so acquired;

(ii) if so, the total amount of compensation granted; and

(iii) separately, the amount of compensation granted to each aforesaid land owner ?

(c) If not, why ?

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මහනුවර නගරය සංවර්ධන කිරීම වෙනුවෙන් ඒ අවට පවතින රජය සතු ඉඩම් සහ පෞද්ගලික ඉඩම් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර තිබේ.

(ii) අක්කර 45කට ආසන්න වේ.

(iii) ඉඩම් හිමිකරුවන් ප්‍රමාණය 200කට ආසන්න වේ.

(ආ) (i) අත්කරගනු ලැබූ පෞද්ගලික පාර්ශවයන් සතු ඉඩම් සඳහා වන්දි ලබා දී ඇත.

(ii) රුපියල් මිලියන 323කට ආසන්න මුදලක් ගෙවා ඇත.

(iii) ඇමුණුම් 1 සිට 13** දක්වා එම තොරතුරු අමුණා ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරපු ප්‍රශ්නය නැවත කියන්න ගියොත් තවත් කාලයක් ගතවෙනවා.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න තිබෙනවා.

***** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමාට ඔබතුමා අහපු අතුරු ප්‍රශ්න දෙකට උත්තරයක් දෙන්න පුළුවන්.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - கைத்தொழில் அமைச்சரும் சுகாதார அமைச்சரும்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Industries and Minister of Health)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ අතුරු ප්‍රශ්නය මට යොමු කරලා තිබුණා. එතුමා අහලා තිබෙන්නේ MRI ස්කෑන් යන්ත්‍රය සහ හෘද කැතීටර්කරණ ඒකකය - Cath Lab එක - පිළිබඳවයි. දෙවැනි හෘද කැතීටර්කරණ ඒකකය පිළිසකර කරන්න වුවමනා භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍ය ඇණවුම අපි සිදු කරලා තිබෙනවා.

ඒ වාගේ ගරු මන්ත්‍රීතුමා තවත් ප්‍රශ්නයක් අහලා තිබුණා, සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහලේ තිබෙන MRI ස්කෑන් යන්ත්‍රය පිළිබඳව. ඒක repair කරන්න පුළුවන් තත්ත්වයක නැති බව තමයි දන්වා තිබෙන්නේ. හැබැයි, පේරාදෙණිය මහ රෝහලට MRI ස්කෑන් යන්ත්‍රයක් මේ වසරේ order කරලා තිබෙනවා. ඒක ලැබෙනවා. සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහලේ තිබෙන ස්කෑන් යන්ත්‍රය දැනට ප්‍රතිසංස්කරණ කිරීමට නොහැකි බව දන්වා තිබෙනවා. පේරාදෙණිය රෝහලට අපි මේ අවුරුද්දේ MRI ස්කෑන් යන්ත්‍රණයක් ලබා දෙනවා. මහනුවර රෝහලේ හෘද කැතීටර්කරණ ඒකකයේ ප්‍රතිසංස්කරණ කටයුතු කරන්න අවශ්‍ය භාණ්ඩ දැනටමත් ඇණවුම් කරලා තිබෙන්නේ. ඒක අපි කරගෙන යනවා.

ගරු ශාන්ත බණ්ඩාර මහතා (ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சாந்த பண்டார - வெகுசன ஊடக இராஜாங்க அமைச்சர்)
(The Hon. Shantha Bandara - State Minister of Mass Media)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න, මේ කාරණය කියන්න.

අපි දන්නවා, ඉදිරියේදී ජනාධිපතිවරණය සහ මහ මැතිවරණය පැවැත්වෙන බව. *[බාධා කිරීමක්]* මට පොඩි කාලයක් දෙන්න. වැදගත් කාරණයක් මතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ මාධ්‍ය ආයතනවල සේවය කරන අයට මැතිවරණයකදී කවදාවත් ඡන්දය දාන්න හම්බ වෙන්නේ නැහැ.

අපේ රටේ ලියාපදිංචි රූපවාහිනී නාළිකා 17ක් තිබෙනවා. ඒ වාගේම, ගුවන් විදුලි නාළිකා 52ක් තිබෙනවා. මේ නාළිකාවල සේවය කරන අය මැතිවරණයක් පැවැත්වෙන දවසේදී ඉන්නේ එම ක්‍රියාවලියේයි, ගරු විපක්ෂ නායකතුමනි. ඒ ගොඩක් අය එදා දවසේ ඉන්නේ සජීව විකාශනවලට සම්බන්ධ වෙලා. ඒ නිසා විශේෂයෙන්ම මාධ්‍යවේදීන් මගෙන් ඉල්ලීමක් කළා මේ කාරණය මැතිවරණ කොමිෂන් සභාවේ අවධානයට යොමු කරලා ලියාපදිංචි නිල හැඳුනුම්පත් තිබෙන මාධ්‍යවේදීන්ටත් තැපැල් ඡන්ද පාවිච්චි කරන්න අවස්ථාවක් ලබා දෙන්න කියලා. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට අපි ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ අවධානය යොමු කරවන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ඒ ගැන අවධානය යොමු කරවන්නම්.

ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න පෙර, ගරු සභානායකතුමා වෙත ප්‍රශ්න දෙකක් ඉදිරිපත් කරන්නට මම අවස්ථාව ඉල්ලා සිටියා. ඒ සඳහා එතුමාගේ අවසරයත් මට ලැබුණා.

ගරු සභානායකතුමනි, ඔබතුමාත් හොඳට දන්නවා, විශේෂයෙන්ම විශ්‍රාමිකයන් පිළිබඳව, ඒ අයගේ අයිතීන් පිළිබඳව, ඒ අයට ලබා දිය යුතු ශක්තිය පිළිබඳව අපි විවිධ අවස්ථාවලදී මේ පාර්ලිමේන්තුවේ යෝජනා ඉදිරිපත් කර තිබෙන බව. ඔබතුමාම දන්නවා, විශේෂයෙන්ම ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා ඇතුළු එතුමාගේ කැබිනට් මණ්ඩලය ගත් තීන්දුවක් අනුව, 2016-2020 කාලවකවානුව තුළ විශ්‍රාමිකයන්ට ලැබිය යුතු විශ්‍රාම වැටුප් ගැළපීම එතුමා බලයට ආපු හැටියේම ඉවත් කළ බව. ඇත්තවශයෙන්ම එයින් 110,000ත්, 120,000ත් අතර විශ්‍රාමිකයන් පිරිසක් අසහනයට පත් වුණා. දැන් ඒ අයගෙන් යම් පිරිසක් -15,000ක් විතර- ජීවිතය හැරගොස් තිබෙනවා. නමුත්, ඒ අයට ලැබිය යුතු ඒ විශ්‍රාම වැටුප් ගැළපීම ක්‍රියාත්මක වුණේ නැහැ. 2016 වර්ෂයේ සිට ලැබිය යුතුව තිබුණු විශ්‍රාම වැටුප් වැඩිවීම, ඒ ගැළපීම ක්‍රියාත්මක වුණේ නැහැ. ඔය කාරණාව පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කරනකොට රජය කියනවා, නැහැ, ප්‍රශ්නයක් නැහැ, ඔවුන් ඉස්සරහට ඒක ක්‍රියාත්මක කරනවා කියලා. හැබැයි, මේ තුළින් අගතියට පත් වුණු විශ්‍රාමිකයන් 241ක පිරිසක් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කරනකොට රජය කියනවා, හිඟ වැටුප් රහිතව 2025 වර්ෂයේදීත්, 2026 වර්ෂයේදීත් ඉදිරියට මෙය කරගෙන යන්නම් කියලා. නමුත්, මේ ගරු සභාවට ඇවිල්ලා කියනවා, ඔව්, ඒ සිදුවුණු අඩු පාඩුව, ඒ වරද නිවැරදි කර ගන්නම් කියලා. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු දක්වනකොට කියනවා, නැහැ, හිඟ ප්‍රමාණය ගෙවන්න බැහැ, 2025-2026 කාලයේදී මේක ක්‍රියාත්මක කරන්නම් කියලා. ගරු සභානායකතුමනි, මම අහන්නේ මේකයි. මේ ගරු සභාවට ඇවිල්ලා ඒ සම්බන්ධව උත්තරයක් දෙනවා නම් ඒ දෙන්න ඕනෑ ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් නහනකොට දෙන උත්තරයම නේද? නමුත්, මෙතැනට ඇවිල්ලා එක දෙයක් කියනවා, ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තව දෙයක් කියනවා.

ඒ නිසා පැහැදිලිවම මම කියන්න කැමැතියි, මේ සිදු වුණු අඩුපාඩුව, විශ්‍රාමිකයන්ට කරපු මේ මහා බරපතළ අපරාධය අපි අනිවාර්යයෙන්ම නිවැරදි කරන බව. මට හිතෙන විධියට, ඔබතුමන්ලා ඒක කරන්නේ නැහැ. ගරු සභානායකතුමනි, අඩුම ගණනේ ඔබතුමා මුදල් ඇමතිවරයාට කියන්න, මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට උත්තර බඳින විට වාගේම මම ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දෙන විටත් පරස්පර උත්තර දෙන්න එපා කියලා. ඒක මේ පාර්ලිමේන්තුවත්, මේ රටේ ලක්ෂ 220ක් වූ ජනතාවත්, මේ රටේ විශ්‍රාමික ප්‍රජාවත් නොමඟ යැවීමක් කියන එක මම කියන්න කැමැතියි. ඒක තමයි පළමුවැනි කාරණාව.

දෙවැනි කාරණාව මෙයයි. ගරු සභානායකතුමනි, කොවිඩ් වසංගතය සමයේ ශ්‍රී ලංකාව තුළ බලාත්මක කරන ලද, අනිවාර්ය ආදාහන ප්‍රතිපත්තිය සම්බන්ධව සමාව අයදීමට කැබිනට් මණ්ඩලය තීන්දුවක් අරගෙන තිබෙනවා කියලා අපට ආරංචියි. මම හිතනවා ඒක හොඳ දෙයක් කියලා. මොකද, වර්තමානයේ කැබිනට් මණ්ඩලයේ ඉන්න අයත් පසුගිය කාලයේ ඒ ආදාහන ප්‍රතිපත්තියට අත ඉස්සුවා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජනාධිපතිවරයා වශයෙන් ඉන්න කාලයේදී ඉස්ලාම් ආගමිකයන් වන මුස්ලිම් ජනතාවගේ ආගමික හා සංස්කෘතික අයිතිය සම්පූර්ණයෙන්ම කෙලසමින්, සම්පූර්ණයෙන්ම ජාතිවාදය ක්‍රියාත්මක කරමින්, ආගම්වාදය ක්‍රියාත්මක කරමින්, ඉස්ලාම් ආගමිකයන් වන මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගෙන ඒ භූමදානය හා ආදාහනය පිළිබඳ ප්‍රශ්නයේදී වැරදි තීන්දුවක් ගත්තා. යම්තාක් දුරකට ඒක මඟහරවා ගන්නට දැන් සමාව ඉල්ලන එක ගැන අපි සතුටු වෙනවා. සමාව ඉල්ලන එක හොඳයි. හැබැයි, ඉන් ඔබ්බට යන්නට ඕනෑ.

කාගේ වාර්තා ද මේ වැරදි තීන්දුව ගන්න පදනම් වුණේ? ඒ සඳහා උපදෙස් ලබා දුන් අය කවුද? ඒ ලබා දුන් උපදෙස ජනාධිපතිවරයා ප්‍රමුඛ දේශපාලන අධිකාරිය පරිශීලනයට ලක් නොකළේ ඇයි? ඒ පිළිබඳව සොයා නොබැලුවේ ඇයි? නිලධාරීන් කිව්ව පමණින්, WHO එකේ උපදෙස් මහඟැර ගිහිල්ලා, ඒවා පැත්තකට විසි කරලා, කුණු බක්කියට දලා, මේ වාගේ අපරාධයක්, ඉස්ලාම් ආගමිකයන් වන මුස්ලිම් ප්‍රජාවට කළේ ඇයි? අපට ආරංචියි, දැන් දේශපාලන අධිකාරිය බේරන්න චිත්‍රපට හදනවා ලු. ලජ්ජයි. ඒ කාලයේ මහ පාරටවත් බැස්සේ නැහැ. අපි මහ පාරට බැස්සා; ඉස්ලාම් ආගමිකයන් වන මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් අපි භය නැතුව මහ පාරට බැස්සා. ඒ මොකද, ආගමක් ඉලක්ක කරගෙන, ජාතියක් ඉලක්ක කරගෙන, සංස්කෘතියක් ඉලක්ක කරගෙන, ඒ කරපු මහා නින්දිත ක්‍රියාව, පහත් ක්‍රියාව නිසා. ඒ නිසා මම යෝජනා කරනවා, සමාව ඉල්ලා මේවායෙන් ෂේප් වෙන්න බැහැ, ඒ වැරදි තීන්දුව ගන්නට උපදෙස් ලබා දුන් අය මේ සභාවේදී නම් කරන්න කියලා.

ඒ විතරක් නොවෙයි. ඉස්ලාම් භක්තිකයන් වන මේ රටේ මුස්ලිම් ප්‍රජාවට, ඒ කාරණය හේතුවෙන් අගතියට පත් වුණු අයට, බලහත්කාරයෙන් ඒ මිනී පුච්චපු අයගේ පවුල්වලට වන්දියක් දෙන්න ඕනෑ. ඒක අනිවාර්යයෙන්ම කරන්න ඕනෑ. නිකම් සමාව ඉල්ලලා, ෂේප් වෙන්න හදන්න එපා. කරුණාකරලා අපට මේ ප්‍රශ්නයට උත්තරයක් අවශ්‍යයි.

අවසාන කාරණාව මෙයයි. මීට මොහොතකට පෙර ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ලබා දුන්නා. මම දන්නේ නැහැ, ඔබතුමා ඒ ගැන දන්නවාද කියලා, ගරු සභානායකතුමනි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මට ඒ තොරතුර ලැබුණා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමාට ඒ තොරතුර ලැබුණා නම් මම කියන දේ පොඩ්ඩක් අහගෙන ඉන්න. මම ඔබතුමාට දෝෂාරෝපණය කරනවා නොවෙයි. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් අරගෙන තිබෙනවා, පොලිස්පතිවරයාගේ පත්වීම සම්බන්ධයෙන් ගොනු කර ඇති පෙත්සම් විභාගය අවසන් වනතෙක් වර්තමාන පොලිස්පතිවරයා, පොලිස්පති හැටියට කටයුතු කිරීමේ වගකීම් අත්හිටුවන්නට.

ගරු සභානායකතුමනි, දැන් මම ඔබතුමාට ඉදිරිපත් කරන්න හදන්නේ පුද්ගලයින් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. මම ඔබතුමාට කියන්න කැමැතියි, අග්‍රාමාත්‍යතුමාත් සිටින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සිදු වුණු ක්‍රියාදාමය කථානායකවරයා විකෘති කරලා ජනාධිපතිවරයාට යවපු ලියුම ගැන.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ලජ්ජයි!

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කැතයි, කැතයි!

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එම ලියුමෙන් පැහැදිලිවම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කර තිබෙනවා. එතකොට මේ වැරදි ලියුම; බොරු ලියුම; වංචාසහගත ලියුම පදනම් කරගෙන ජනාධිපතිවරයා පොලිස්පතිවරයෙක් පත් කළ එකත් ව්‍යවස්ථා විරෝධියි. මම මේ කථා කරන්නේ පුද්ගලයින් ගැන ප්‍රශ්නයක් නොවෙයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කර තිබෙන එක ගැන.

බලන්න, මේ ලියුමේ ලියා තිබෙන දේ. "...ඡන්දය දීමෙන් වැළකී සිටීම විපක්ෂ වීමක් ලෙස සලකනු ලබන්නේ නම්..."

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එහෙම කොහොමද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
"...ඡන්දය ලැබුණා සේ සලකන්නේ නම් සභාපතිවරයා වශයෙන් මාගේ තීරක ඡන්දය ද පක්ෂව ලබා දෙන බව කාරුණිකව දන්වමි." කාටද මේ ලියුම ලියලා තිබෙන්නේ? "හිතවත් ජනාධිපතිතුමනි" කියලා තමයි ආමන්ත්‍රණය කර තිබෙන්නේ. කවුද මේ ලියුමට අත්සන් කරලා තිබෙන්නේ? මහින්ද යාපා අබේවර්ධන, කථානායක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති. සම්පූර්ණයෙන්ම වැරදි ක්‍රියාවක් මේ කළේ. අගමැතිතුමා ඒක දන්නවා. අගමැතිතුමාට ඒකට උත්තර දෙන්න බැරි බව මම දන්නවා. ඒ නිසා මම පැහැදිලිවම කියන්න කැමතියි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කර තිබෙන බව. ඒ පිළිබඳව මොකක්ද ගන්නා ක්‍රියා මාර්ගය?

ඒ වාගේම කථානායකවරයාගේ මේ ලිපිය පදනම් කරගෙන ජනාධිපතිවරයා, - මම දන්නා විධියට ජනාධිපතිවරයා හොඳ උගත් නීතිඥවරයෙක්, අපි විශ්වාස කරනවා, එතුමා හොඳ දැනුමක් තිබෙන පුද්ගලයෙක් කියලා - මේ වාගේ පත් කිරීම් කරනවාද? මේ වාගේ තුට්ටු දෙකේ ලියුමක් පදනම් කරගෙන පත් කිරීම් කරනවාද? මේක තුට්ටු දෙකේ ලියුමක්. ඒ නිසා අපට පැහැදිලිව මේ ප්‍රශ්නවලට උත්තර අවශ්‍යයි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Hon. Minister, - *[Interruption.]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
I will answer your question. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔය කාරණය විවාදයක් කර ගන්න එපා. ගරු සභානායකතුමනි, ඔබතුමා උත්තර දීලා අවසන් කරන්න. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මේක අදාළ කාරණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවස්ථාව දුන්නාම දැන් මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් අවස්ථාව ඉල්ලනවා.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මේක අදාළ කාරණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙම නම්, ඔබතුමාගේ කාරණය කියලා මේක අවසන් කරන්න.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මේ කාරණයටත් එක්කම පිළිතුරු දෙන්න කියලායි මම කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ඔබතුමා කියන්න.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Sir, may I speak in English. Now, over the cremation of Muslim COVID victims, the Cabinet has taken a decision to apologize. Apart from that, there had been serious stigmatization of the community for a long period

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

of time; we have suffered serious damage because of that. We have raised this issue umpteen number of times in this House. The Minister of Health is also here. I asked the previous Minister about this matter in the House and also submitted a Question, asking them to give us the details of COVID victims whose dead bodies had been cremated forcefully. When I asked that Question, the Ministry said that they do not have the details; they were totally trying to hide facts. What we want is the details, as to how many COVID victims you had cremated, why you cremated them and who their next of kin are. You are now apologizing after doing all those things. But, at least, these details, you must make available to us. Please reply regarding that as well.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාත් කෙටියෙන් කියලා අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. නැත්නම් ඔබතුමාට අවස්ථාව දුන්නේ නැහැ කියලා කියයි නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු සභානායකතුමනි, ඊයේ කැබිනට් මණ්ඩලය විසින් තීන්දුවක් අරගෙන තිබෙනවා, කොවිඩ් වසංගතය පැවති කාලය අතරතුර බලාත්මක කරන ලද කොවිඩ් මරණ ආදාහන ප්‍රතිපත්තිය හේතුවෙන් බලපෑමට ලක් වූ සමාජ කොටස්වලින් රජය සමාව අයැදීම සම්බන්ධව. ඒක හොඳයි. නමුත්, තිබෙන ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. "බලහත්කාරයෙන් ආදාහනය කිරීම" කියන එක රජය දැන් පිළිගෙන තිබෙනවා. බලහත්කාරය කියන්නේ, එය පැහැදිලිවම, හිතාමතාම කරපු දෙයක්. ඒක නොදැනුවත්ව වෙච්ච දෙයක් නොවෙයි. එහෙම නැත්නම්, කමිටු වාර්තා වැරදුණා කියලා වෙච්ච දෙයකුත් නොවෙයි. බලහත්කාරයෙන් ආදාහනය කිරීම කියන එක හිතාමතාම කරපු දෙයක් කියලා ආණ්ඩුව පිළිගෙන තිබෙනවා. එහෙම නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක කළේ කවුද, මේ තීන්දුව ගත්තේ කවුද, ඒ දේශපාලන නායකයෝ කවුද කියන එකත් කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොවිඩ්-19 වසංගතය කාලයේ මිය ගිය පුද්ගලයන්ගේ සිරුරු ආදාහනය හෝ භූමදානය කිරීම සම්බන්ධයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය Guidelines දුන්නා. ඒ Guidelines එදා හිටපු ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය පිළිගත්තේ නැහැ. ඒ හින්දා එතුමන්ලා දොස්තර චන්න පෙරේරා මහතාගේ ප්‍රමුඛත්වයෙන් ඒ සඳහා කමිටුවක් පත් කළා. ඒ කමිටුවෙනුත් එදා හිටපු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට අවශ්‍ය නිර්දේශ තමයි ලබා දුන්නේ. ඊළඟට, විශාල විරෝධයක් මධ්‍යයේ, මහාචාර්ය ජෙනිෆර් පෙරේරා මහත්මියගේ ප්‍රධානත්වයෙන් මේ පිළිබඳව විශේෂඥ නිපුණත්වයකින් සමන්විත කමිටුවක් පත් කළා. ඒ කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ මත එම මෘතදේහ ආදාහනය හෝ භූමදානය කරන්න ඉඩ දෙන්න කියලා වාර්තාවක් ලබා දුන්නා. නමුත්, ඒ වාර්තාව මාස 6ක් තිස්සේ එළියට දැම්මේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි මේ පාර්ලිමේන්තුවේදී දිගින් දිගටම ප්‍රශ්න කළා, ඇයි මේ වාර්තාව එළියට දමන්නේ නැත්තේ කියලා. ඒ වාර්තාව මාස 6කට වඩා හංගාගෙන හිටියා. ඊළඟට, ඉස්ලාමීය රටවල් හිටපු ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කළා, මේකට ඉඩ දෙන්න කියලා. ඒ වෙලාවෙත් ඉඩ දුන්නේ නැහැ. ඊළඟට, පාකිස්තානයේ හිටපු අගමැති ඉම්රාන් ඛාන් ලංකාවට ඇවිල්ලා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන් මේ පිළිබඳ ඉල්ලීමක් කළා. ඒ ඉල්ලීම කළාම අපි ඉම්රාන් ඛාන් හිටපු අගමැතිතුමාව හමු වුණා. ඒ වෙලාවේ එවකට හිටපු අධිකරණ ඇමති අලි සබ්රි මැතිතුමා ඇවිල්ලා ඉම්රාන් ඛාන් හිටපු අගමැතිවරයාට පැවසුවා, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා එකඟ වෙලා තිබෙන නිසා ඒ මෘතදේහ භූමදානය කිරීම සඳහා අවසර දෙනවා කියලා. එතුමා අපි ඉස්සරහම තමයි ඒක ප්‍රකාශ කළේ.

ජාත්‍යන්තර ප්‍රජාවේ පීඩනය මත තමයි මේ අවසරය ලබා දුන්නේ. එහෙම නැතිව, විද්‍යාත්මක පදනමකින් නොවෙයි. විද්‍යාත්මකව මේ කටයුතු කරන්න පුළුවන් කියලා ලෝක සෞඛ්‍ය සංවිධානය නිර්දේශ ලබා දී තිබියදීත් එය ප්‍රතික්ෂේප කළා. ඒ ප්‍රතික්ෂේප කරපු පිරිස කවුද කියලා හඳුනා ගන්න ඕනෑ කියන එකයි මම මේ කියන්නේ. දැන් ඔබතුමන්ලාම පිළිගන්නවා නේ, මේ මෘතදේහ බලහත්කාරයෙන් ආදාහනය කර තිබෙනවාය කියලා. එහෙම නම්, ඒ බලහත්කාරකම කළේ කවුද? ඒ පුද්ගලයෝ අපට ඉදිරිපත් කරන්න, "මේගොල්ලෝ තමයි මේකට වගකිව යුත්තේ" කියලා. ඒකයි අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තෙන්ම කිව්වොත් මේ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරපු අධිකරණ ඇමතිතුමාත්, විදේශ කටයුතු ඇමතිතුමාත් ඔය තීරණය ගත්ත කැබිනට් මණ්ඩලයේ හිටපු උදවිය. අවිද්‍යාත්මකව ඒ තීරණය ගනිද්දී, එයට විරුද්ධව අපි දිගින් දිගටම සටන් කරද්දී, එතුමන්ලාට තිබුණා එවකට හිටපු ජනාධිපතිතුමාව influence කරන්න. මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. වින්දිතයා ඉන්නවා; වින්දිතයාට ලැබෙන දෙයක් නැහැ. අනෙක් පැත්තෙන්, වැරදි කරපු කෙනා කවුද කියලා නම් කරන්නේ නැහැ. මේකත් අර චිත්‍රපටයේ වාගේම රාජපක්ෂලාව, දේශපාලනඥයෝ බේරන්න ගහපු ගැටයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතකයි, ඉම්රාන් ඛාන් අගමැතිතුමා ඇවිල්ලා හිටපු වෙලාවේ එවකට අග්‍රාමාත්‍යවරයාව සිටි මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් මම ඒ ප්‍රශ්නය අහනකොට ගරු කථානායකතුමා මාව නැවැත්වූවා. ඒ අවස්ථාවේදී මහින්ද මහත්තයා තමයි කිව්වේ, ප්‍රශ්නය අහන්න දෙන්න කියලා. මම ප්‍රශ්නය ඇහුවායින් පසුව එතුමා කිව්වා, භූමදානයට ඉඩ දෙනවා කියලා. ඊට පසුව ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුයි, මන්ත්‍රීවරියකුයි මට කිව්වා, "ඔයා අපව කෑවා" කියලා. ඒකේ අර්ථය මොකක්ද? තවදුරටත් ජාතිවාදී දේශපාලනය අපි බිම් මට්ටමින් කරගෙන යන එක ඔයා අගමැතිතුමාට ප්‍රශ්නය කියලා නැවැත්තුවා කියන එකයි. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක පැහැදිලිවම දේශපාලන තීන්දුවක්. ඒ දේශපාලන තීන්දුව ගත්තේ කවුද, ඒකට අනුබල දුන්නේ කවුද, මොන වාර්තාව මත පදනම් වෙලා ද කියන දේවල් ගැන අනිවාර්යයෙන්ම accountability එකක් තිබිය යුතුයි. ඒ වාගේම වින්දිතයන්ට සාධාරණයක් විය යුතුයි. මොකද ගරු

නියෝජ්‍ය කථානායකතුමනි, පුවිචනකොට දැනෙනවා. මොළය තමයි මැරෙන්නේ; body එක තිබෙනවා. ඒ විඳිතයින් වෙනුවෙන් ගන්නා වූ ක්‍රියා මාර්ගය මොකක්ද කියන එකත් දැනුම් දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, මොකක්ද රීති ප්‍රශ්නය?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, පොලිස්පති පත් කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය සම්බන්ධයෙන් මම එදා පාර්ලිමේන්තුවේදී විරුද්ධ වුණ බව, ගරු කථානායකතුමා මූලාසනයේ සිටියදී. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේදී ඡන්දය ගන්නකොට පොලිස්පතිතුමාව පත් කරන්න අනුමත කළේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අවසන් වුණාට පසුව ගරු කථානායකතුමා ලියුමක් ලිව්වා ජනාධිපතිතුමාට. ඒ ලියුම උපයෝගී කරගෙන ජනාධිපතිතුමා පත්වීම කළා. මෙය අපේ පාර්ලිමේන්තුවට ලජ්ජාවක්, ගරු සභානායකතුමනි; it is an insult to Parliament.

දැන් ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයෙන් පෙන්වලා තිබෙනවා මෙම පාර්ලිමේන්තුව වැඩ කරන ආකාරය ගැන. කිසිම වගකීමක් නැතිව, දේශපාලනය අරමුණු කරගෙන තමයි මේ වැඩකටයුතු කරන්නේ. පාර්ලිමේන්තුව හැටියට එය අපට විශාල අපකීර්තියක්. ශ්‍රේෂ්ඨාධිකරණය පොලිස්පතිතුමාගේ පත්වීම අත්හිටුවනවා නම් ඒකෙන් පෙන්වන්නේ අපි පාර්ලිමේන්තුවක් හැටියට ස්ථාවර නියෝග අනුගමනය කරන්නේ නැහැ කියලා. මේක ඇත්ත වශයෙන්ම දැන් රජයේ කච්චේරියක් වෙලා. හැම තැනම දේශපාලනය. ආණ්ඩු පක්ෂය වේවා, විපක්ෂය වේවා අපි දෙගොල්ලෝම කථා වෙලා මෙය යථා තත්ත්වයට පත් කරන්න ඕනෑ.

පාර්ලිමේන්තුව දැන් පිලි පැනලා තිබෙන්නේ; හැම තැනම පෙට්ටි. අපි මේක යථා තත්ත්වයට පත් කරන්න ඕනෑ. නැත්නම් අපට මේ රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ඉදිරියට අරගෙන යන්න බැහැ. පොලිස්පතිතුමාව පත් කරපුදාට පහුවදා මම මේ ලියුම පෙන්වලා මේ ගරු සභාවේ කිව්වා, මේක සම්පූර්ණයෙන් නීති විරෝධී පත්වීමක් කියලා. ශ්‍රේෂ්ඨාධිකරණය දැන් අපි කියපු දේ සනාථ කරලා තිබෙනවා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපි ඔය කාරණය දැන් අවසන් කරමු. මේක විවාදයක් කර ගන්න එපා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මට උත්තර දෙන්න අවස්ථාව ලැබෙන්නෙත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා උත්තර දෙන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා පළමුවැනි ප්‍රශ්නය ඇහුවේ 2016-2020 කාලය සඳහා විශ්‍රාමිකයින්ට හිමි විය යුතු විශ්‍රාම වැටුප් ගැළපීම සම්බන්ධවයි. මේ නිසා 120,000කට පමණ බලපෑමක් සිදු වෙලා තිබෙනවා කියන කාරණය එතුමා මතු කළා. එතුමා ප්‍රශ්නය අහන ගමන් පිළිතුරත් දුන්නා. ඒ නිසා ඒකට මගේ පිළිතුරක් අවශ්‍ය වෙන්නේ නැහැ.

ගරු විපක්ෂ නායකතුමා දෙවැනි ප්‍රශ්නයෙන් මතු කළේ කොවිඩ් - 19 වසංගතය හා සම්බන්ධ කාරණයක්. ඒ කාරණයට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් පසුගිය සඳුදා පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සමාව අයැදීමක් සිදු කළා. ඒක මූලික කටයුත්ත. ඉන් එහාට අද ගරු විපක්ෂ නායකතුමාත්, රවුල් හකීම් මැතිතුමාත්, මුජිබුර් රහුමාන් මැතිතුමාත්, මරික්කාර් මැතිතුමාත් මේ ප්‍රශ්නය මතු කළා. මේ සම්බන්ධයෙන් මුලින්ම කිව්වේ, ඒ වෙලාවේ අමාත්‍ය මණ්ඩලය ගත්ත තීන්දුව කියලා. ඒ අමාත්‍ය මණ්ඩලයේ හිටපු කිහිප දෙනෙක් අද ඔය පැත්තෙත් ඉන්නවා, ගරු මන්ත්‍රීතුමනි. මම හිතන විධියට ඔබතුමන්ලාගේ කණ්ඩායම් රැස්වීමේදී එතුමන්ලාගෙන් අහගන්න පුළුවන්, ඇයි එදා මේකට අත ඉස්සුවේ කියලා. මටත් ඒ ප්‍රශ්නය අහන්න තිබෙනවා. හැබැයි, මම හිටියේ නැහැ, ඒ කැබිනට් මණ්ඩලයේ. මගේ පෞද්ගලික මතය වන්නේ ඒ වෙලාවේ WHO Guidelines අනුගමනය කරන්නයි තිබුණේ කියන එකයි. ඒක තමයි අපේ මතය.

ඊළඟට අද ඔබතුමන්ලා සියලු දෙනාම මතු කරපු කාරණය ඊළඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මම ඉදිරිපත් කරනවා, මේ ගරු සභාවේ මතු වෙච්ච කාරණයක් හැටියට. ඕන් එහාට ගිහිල්ලා එසේ කළේ ඇයි, සමාවෙන් එහාට ගිහිල්ලා එහි විඳිතයන්ට ගන්නා වූ ක්‍රියාමාර්ගය කුමක්ද යන සියලු කරුණු පිළිබඳ සවිස්තර වාර්තාවක් සෞඛ්‍ය අමාත්‍යාංශයත්, අදාළ අමාත්‍යාංශයත් එක්ව සකස් කරලා ඉදිරිපත් කරන්න කටයුතු කරන්නම්.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. I will not take long.

ඒ විඳිතයන්ට වන්දි මුදලක් ලැබීම අනිවාර්යයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි; compensation should be given. වන්දි මුදලක් දුන්නාම, මේක අවසන් කරන්න පුළුවන්. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව අතුරු ප්‍රශ්නයක් මතු වුණා. ඒ, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අද දින ලබා දීලා තිබෙන අතුරු තහනම් නියෝගය සම්බන්ධවයි. මෙහි අතිගරු කාදිනල් හිමිපාණන් සමඟ පෙත්සම්කරුවන් නවදෙනෙක් ඉඳලා තිබෙනවා, breaking news එකට අනුව. ඒ අනුව ඕනෑම petitioner කෙනෙකු petition එකක් Supreme Court එකට දැම්මාම leave grant කරනවා නම්, leave grant කරනවා. එකේ interim relief එකක් ඉල්ලුවොත් interim relief එක දෙනවා. ඒ interim relief එක නොදී leave grant කරලා වැඩක් නැහැ, සමහර ඒවායේ. ඒ නිසා තමයි interim relief එක දීලා තිබෙන්නේ. Detailsවලට යන්න වෙන්නේ petition එක ගත්තාට පසුව.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

But, there is some speciality in this. This interim relief is an extraordinary interim relief, which is not normally given. It has been given until the final Determination of the case is made.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Yes. Not only in this particular case, but there are many such cases. I can tell you many cases and many instances where the Supreme Court has done that.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

The court has realized that the case is very strong. That is why they have done that.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

For example, in the case of Development Officers, there were four petitions. Fifteen months ago, the then Bench issued an Interim Order subject to the final Determination. Still, the final Determination has not been given. Then, the case was settled in the Supreme Court. Similarly, in this particular case also, an interim relief has been granted until the final Determination is given. So, that is the normal procedure.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Wait, wait. I have not finished.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය මාස කිහිපය තුළ මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තා අරගෙන බැලුවොත් පෙනේවි, විටින් විට වතාවත් ගණනාවක් මේ කාරණයම repeat කරලා තිබෙන බව. ගරු කථානායකතුමාට විරුද්ධව විපක්ෂයෙන් විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා, මේක පදනම් කරගෙන. ඒ විශ්වාස භංග යෝජනාවත් පරාජය වුණා. ඉතින් මේ ඒ කාරණය සම්බන්ධව නැවත interim relief එකක් දුන්නාම, දැන් ඒ කාරණයම repeat කරනවා. ඉතින් final Determination එක දෙනතුරු පොඩ්ඩක් ඉවසලා ඉඳිමු.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු සභානායකතුමා, ඔබතුමා නීතිඥවරයෙක්. මම නීතිඥවරයෙක් නොවෙයි. නමුත් ඔබතුමාත්, අපි සියලු දෙනාත් දන්නවා, බැලූ බැල්මට ඔය ඉදිරිපත් කරන කාරණාව ප්‍රත්‍යක්ෂ කරන්නට තොරතුරු සම්භාරයක් තිබෙනවා නම්, තොරතුරු සහ දත්ත ඉදිරිපත් කිරීම තුළ බැලූ බැල්මට සාධනීයව ඒ කරුණු කාරණා තිබෙනවා නම් - if there is a *prima facie* introduction of facts and details - තමයි interim relief එකක් දෙන්නේ කියලා. එහෙම නැත්නම් කොච්චර දීලා තිබෙනවාද interim relief නැතුව leave to proceed? ඉතින් ඔබතුමාට මම නීතිය ගැන උගන්වන්න අවශ්‍ය නැහැ. හැබැයි, මේ වෙලාවේ මම උගන්වනවා. ඕක තමයි පාඩම. *Prima facie* case එකක් තිබෙනවා. අනික් කාරණාව මම මේ ඔබතුමාට කියන්නේ, දැන් ඔබතුමා කියනවා, කථානායකවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ආවා, ඒකත් පරාජය වුණා කියලා.

ඒකට අපි පුදුම වෙන්න හොඳ නැහැ නේ. වැරදි විධියට පොලිස්පතිවරයා පත් කරපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

පත් කළේ 134ක බහුතරයකින්. මේ වැරදි ලියුම ලියපු පුද්ගලයාව බේරන්නට ඉදිරිපත් වෙන්නේත් ඒ බහුතරයමයි. ඉතින් විකෘති බහුතරයකින් විකෘති තීන්දු ගන්නකොට, අපි පුදුමයට පත් වෙන්නේ නැහැ. ඒක නොවෙයි, මම කියන්නේ. මම කියන්නේ පුද්ගලයන් ගැන ප්‍රශ්නයක් නොවෙයි. මම කියන්නේ ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කර තිබෙනවා කියන එකයි. ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කර තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ රැස්වීම අවසන් වුණාට පසුව, එය පැවැත්වූ වෙලාවේ ගත් තීන්දුව සභාවටත් කියන්නේ නැතුව කථානායකවරයා ලියුමක් ලිව්වා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ක්‍රියාවක්. ඒ නිසා මම පැහැදිලිව කියන්න කැමැතියි, මේ පිළිබඳව -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

විපක්ෂ නායකතුමනි, අපි දැන් න්‍යාය පත්‍රයේ වැඩකටයුතුවලට යමු නේද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

හරි, හරි. න්‍යාය පත්‍රයේ වැඩකටයුතුවලට යමු. පොඩ්ඩක් -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැත්නම් වෙලාව සම්බන්ධයෙන් බැණුම් අහන්න වෙන්නේ මූලාසනයට.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේක බරපතළ ප්‍රශ්නයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක පුද්ගලයින් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම පිළිබඳ ප්‍රශ්නයක්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Give me just one moment, Hon. Deputy Speaker.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම පොඩි යෝජනාවක් මේ කරන්නේ. අපි සංහිඳියාව - reconciliation - ගැන කථා කරනවා. මෙතැන ගැටලුවක් ඇති වෙලා තිබෙන්නේ. අපි මේක reconcile කරන්න ඕනෑ. එතකොට කාරණා හතරක් මත තමයි අපි reconciliation එක කරන්නේ. එකක් තමයි, truth. දැන් ඔබතුමන්ලා පිළිගන්නවා, මේගොල්ලන් මෙතැන සමාව ඉල්ලන්නේ සත්‍යය යම් කිසි විධියකට තේරුම් ගත් නිසා බව. දෙවැනි එක වගවීම - accountability, තුන්වැනි එක, වන්දි ගෙවීම - reparation, හතරවැනි එක, නැවත ඇති වීමෙන් වැළැක්වීම - non-recurrence. ඉතින් ඔන්න ඔය සංහිඳියාව පිළිබඳව දේශපාලන පක්ෂ භේදයකින් තොරව අපි එකඟ වෙනවා නම්, සත්‍යය, වගවීම, වන්දිය සහ නැවත මෙය සිදුවීමෙන් වැළැක්වීම පිළිබඳව අපි එකඟ වෙනවා නම්, මේ පාර්ලිමේන්තුවේ ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ කාරණාවලින් පසුව යෝජනාවක් ගෙනෙන්න. යෝජනාවක් ගෙනැල්ලා පක්ෂ-විපක්ෂ සියලු දෙනා සංහිඳියාව මත මේක බේරා ගනිමු, ඉස්සරහට යන්න. ඒක තමයි මගේ යෝජනාව.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. අපේ ගරු විපක්ෂ නායකතුමා මේ ගරු සභාවට කිව්වා, ව්‍යවස්ථාව අනුව,- ව්‍යවස්ථාව අනුව කියලා කිව්වේ නැහැ. 134 දෙනෙකුගේ ජනාධිපතිවරයා පත් කිරීම වැරැද්දක් කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ. එහෙම කිව්වේ නැහැ.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
එහෙම නම් මොකක්ද කිව්වේ?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එහෙම කිව්වේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පොලිස්පතිවරයාව,-

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ, පොලිස්පතිවරයා නොවෙයි,- *[බාධා කිරීමක්]* විපක්ෂ නායකතුමා කිව්වා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ. එහෙම කිව්වේ නැහැ.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
එහෙම කිව්වාද කියලා ආපහු බලන්න පුළුවන්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, එහෙම කිව්වේ නැහැ. එය වරදක් කියලා කිව්වේ නැහැ.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ආපහු අහලා බලන්න පුළුවන්. මා වැරදි නම් ඔබතුමා නිවැරදි කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, මම එහෙම කිව්වේ නැහැ. මම කිව්වේ, කථානායකවරයාට ගෙනාපු විශ්වාස භංග යෝජනාව පරාජය වුණේත්, ජනාධිපතිවරයාගේ පත් කිරීම කරපු බහුතරයේ ඡන්දයෙන් කියලායි.

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
එහෙම නම්, මගේ ඇහීමේ දුර්වලතාවක් ද දන්නේ නැහැ. නමුත්, මම මේක පැහැදිලි කර ගන්න ඕනෑ. ඒක එහෙම නම්, මේ සභාවේ අද අපට ඉන්න බැහැ. මොකද, මේ සභාව ජනාධිපතිවරයා පත් කිරීම වැරදි ලෙස කළා නම්, අපි ඉතා බලවත් වැරැද්දක්

[ගරු කුමාර වෙල්ගම මහතා]

කරලා තිබෙන්නේ. මම ඒක දන්නේ නැහැ. කාටවත් හිංසාවක් කරන්න නොවෙයි, ඒ ගැන දැන ගන්නයි අහන්නේ. ඒ කරපු ක්‍රියාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි ද, නැද්ද කියන එකයි මට දැන ගන්න ඕනෑ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු සජිත් පිරේමදාස)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා හිතන විධියට, ගරු වෙල්ගම මැතිතුමා වැරදි අවබෝධයකින් ඒක ඇහුවේ. අපේ සභානායක ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා කිව්වා, කථානායකවරයාට විරුද්ධව විවිධ අවස්ථාවල මේ සභාවේ කථා කළා, ඊට පස්සේ විශ්වාස භංගයකුත් ගෙනාවා, ඒ යෝජනාව ගෙන ආපු විපක්ෂයේ අපි පරාජය වුණා කියලා. ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමනි, එහෙම දෙයක් තමයි ඔබතුමා කිව්වේ. ඉතින් මම කිව්වේ, කථානායකවරයාට විරුද්ධව අපි ගෙනාපු යෝජනාව පරාජය වීම ගැන මම පුදුමයට පත් වෙන්නේ නැහැ, මොකද, ජනාධිපතිවරයාට -ඒ කියන්නේ පොලිස්පති පත් කරපු පුද්ගලයාට- ලැබුණු බහුතරයම තමයි අර ලියුම ලියපු කථානායකවරයාත් රැක ගත්තේ කියලායි. ඒකයි කිව්වේ. ව්‍යවස්ථා විරෝධියි කියලා, ව්‍යවස්ථාව උල්ලංඝනය කළා කියලා මම කිව්වේ නැහැ.

ගරු කුමාර වෙල්ගම මහතා
(මාණ්පුමිකු කුමාර වෙල්කම)
(The Hon. Kumara Welgama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම්, එතුමා කියන දේ මම මේ අවස්ථාවේ පිළිගන්නවා.

ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා
(මාණ්පුමිකු ඒ.එල්.එම්. අතාඋල්ලා)
(The Hon. A.L.M. Athaullah)

මටත් පොඩි වෙලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ලොකු කථාවක් නොවෙයි, විනාඩියක පමණ කාලයක් ගන්න.

ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා
(මාණ්පුමිකු ඒ.එල්.එම්. අතාඋල්ලා)
(The Hon. A.L.M. Athaullah)

නැහැ, නැහැ, පොඩි කථාවක්. මම දෙමළෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

කොරෝනා තොට්ටාල් ඉිරන්ත මුස්ලිම්කළිනුම් කිරිස්තවර්කළිනුම් උටල්කළෙ එරිත්තමෙක්කු මන්නිප්පුක් කෝරුවතු තොටර්පිල් ඉන්රු Cabinet සිරන්තතොරු මුටිවෙ එටුත්තිරුක්කින්රතු. අතර්කාක නාන් මුතලිල් මාණ්පුමිකු ජනාතිපති අවර්කළුක්කුම් කෙළරව පිරතමර් තිනේෂ් කුණවර්තන අවර්කළුක්කුම් කෙළරව අමෙච්චර්කළුක්කුම් ඉන්ත ඉටත්තිල් නන්රියෙත් තෙරිවිත්තුක්කොළ්කින්රේන්. පිරච්චිනෙ අතුවල්ල! අන්රු ඉන්තප් පිරච්චිනෙ එළුන්තපෝතු, අප්පෝතිරුන්ත සුකාතාර අමෙච්චර් උට්පට පල අමෙච්චර්කළිටම්, කුරිප්පාක, කෙළරව පිරතමර් තිනේෂ් කුණවර්තන අවර්කළිටම් නාන් නිරෙයප් පේසිනේන්. අතුමාත්තිරමන්රි, කූට්ටංකළිලුම් සණ්ටෙ පිටිත්තිරුක්කිරේන්.

කටෙසියාක, පාරාළුමන්රච් සෙයලාළර් නායකම් අවර්කළුක්කු නාන් ඔරු කටිතම් එළුතිනේන්. අතිල්, එන්නුටෙය සිරප්පුරිමෙ මීරප්පට්ටු ඉරුප්පතාකක් කූරියිරුන්තේන්. පාරාළුමන්රම්තාන් චට්টම් ඉයර්රුකින්ර සපෙ! ඉන්තච් සපෙක්කුත් තෙරියාමල්, චට්ටත්තිලිරුක්කින්ර ඔරු විටයත්තුක්කුප් පුරම්පාක අන්රිරුන්ත සුකාතාර අමෙච්චර් කෙළරව පවිත්රාතේවි වන්නිආරච්චි අවර්කළ් Gazette Notification ඔන්රෙ වෙළියිට්ටිරුන්තාර්. අතන්මූලම් එංකළුටෙය සිරප්පුරිමෙ මීරප්පට්ටිරුප්පතාක නාන් කූරිනේන්. අතුමාත්තිරමල්ල, අතු තොටර්පිල් නාංකළ් තනිනපර් පිරේරණෙ ඔන්රෙයුම් කොණ්ටුවන්තෝම්. ඉන්තප් පිරච්චිනෙ මන්නිප්පුක් කේට්පතෝටු මුටිවටෙයක්කූටිය ඔන්රල්ල. පාරාළුමන්රත්තුක්කු ඉරුක්කින්ර අතිකාරත්තුක්කුප් පුරම්පාක, කෙළරව අමෙච්චර් අවර්කළ් gazetteමූලම් 'කොවිට්' තොට්රාල් ඉිරන්ත උටල්කළෙ එරිප්පතර්කු අනුමතිත්තු ඉරුක්කිරාර් එන්රාල්, අතු තොටර්පිල් නාංකළ් එතිර්කාලත්තිල් එන්න මුටිවෙ එටුක්කප්පෝකිරෝම් එන්ර විටයම් ඉරුක්කින්රතු.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා
(මාණ්පුමිකු ඒ.එල්.එම්. අතාඋල්ලා)
(The Hon. A.L.M. Athaullah)

තව විනාඩියයි ගන්නේ.

ඉන්ත එරිප්පු විටයම් තොටර්පාක ඔව්වොරුවරුම් තාංකළ් නිනෛත්තවාරු පේසික්කොණ්ටු ඉරුක්කින්රාර්කළ්. උණ්මෙයිලේ අන්රු පාකිස්තාන් පිරතමරාක ඉරුන්ත ඉම්රාන් කාන් අවර්කළ් එමතු නාට්ටුක්කු වරුවතර්කු මුන්නරේ, ඉව්විටයම් තොටර්පාන තීර්මානම් එටුක්කප්පට්ටතාකවුම් අතනෙ කෙළරව මහින්ත රාජපක්ෂ අවර්කළ් පාරාළුමන්රත්තිල් කූරිනාරෙනවුම් ඉන්රු කෙළරව මරික්කාර් අවර්කළ් සොල්ලියිරුන්තාර්. ඉන්රු ඉරුක්කින්ර කේල්වි එන්නවෙන්රාල්, යාර් ඉතර්කාන පොරුප්පෙ ඒර්පතු? එන්පතුතාන්. එව්වාරු එතිර්කාලත්තිල් ඉව්වාරාන විටයංකළ් නටෙපෙරාමල් තටුප්පතු? එන්ර විටයමුම් මුක්කියමානතු. අතුමාත්තිරමල්ල, අතනෛත් තිරුත්තුවතර්කාන චට්ටමූලම් ඔන්රෙයුම් නාන් පාරාළුමන්රත්තිල් චමර්ප්පිප්පතර්කු ඉරුක්කිරේන්. ඉන්ත විටයත්තුක්කාක එමතු චමූකත්තිටම් මන්නිප්පුක් කේට්ටතර්කු නාංකළ් නන්රි සොල්කින්රෝම්. මන්නිප්පුක් කේට්පතෙවිට, ඉන්ත විටයත්තිල් යාරුක්කුත් තණ්ටනෙයෙයි කොටුප්පතෙන්ර විටයත්තුක්කු ඉන්තප් පාරාළුමන්රම් තීර්වු කාණ වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කිරේන්.

ගරු ලලිත් එල්ලාවල මහතා
(මාණ්පුමිකු ලලිත් එල්ලාවල)
(The Hon. Lalith Ellawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ඔව්, ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා.

ගරු ලලිත් එල්ලාවල මහතා
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මන්ත්‍රීවරුන් සියලුදෙනාට බලපාන ප්‍රශ්නයක් තමයි ගරු අග්‍රාමාත්‍යතුමාත් සභාවේ ඉන්න මේ වෙලාවේ මා අහන්නේ. එතුමාගෙන් කළ යුතු ඉල්ලීමක් මේ කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කෙටියෙන් අහන්න, ගරු මන්ත්‍රීතුමා. කාලය ගත වෙලායි තිබෙන්නේ.

ගරු ලලිත් එල්ලාවල මහතා
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)
ගරු අග්‍රාමාත්‍යතුමනි, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැම කෙනෙක්ම හැමදාම අහන්නේ, ජනතාවගේ ප්‍රශ්න. අප හැම දාම ප්‍රශ්න අහන කොට ඒවාට පිළිතුරු දෙන්න අදාළ ඇමතිවරයා නැහැ. අඩුම ගානේ රාජ්‍ය ඇමතිවරයාවත් නැහැ, ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්න. ඉතින් ජනතාව මාස ගණනක් බලාගෙන ඉන්නවා තමන්ගේ ප්‍රශ්නයට උත්තරයක් දෙනකල්. මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න නොවෙයි, මේ අහන්නේ. අද ගොඩක් රාජ්‍ය ඇමතිවරු වරප්‍රසාද ටික ගන්නවා හැර කරන වැඩක් නැහැ. කැබිනට් ඇමතිවරයාට බැරි නම් අඩුම ගානේ රාජ්‍ය ඇමතිවරයාට හෝ ඇවිල්ලා ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්න කියන්න. ගරු අග්‍රාමාත්‍යතුමනි, අප අහන ප්‍රශ්නවලින් ගොඩක් ඒවාට පිළිතුරු ලබා නොදී කල් දානවා. උත්තර දෙන්න ඇමතිවරයාත් නැහැ. ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇහුවාම ඒකට උත්තර දෙන්න කෙනෙකුත් මෙතැන නැහැ. එහෙම කරන්න එපා කියලායි මම ඉල්ලා සිටින්නේ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ඉඩ දීලා තිබෙන්නේ බරපතළ අසාධාරණයක් සිදු කරන ප්‍රශ්නයක් මතු කරන්නයි. ඒ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය කොතැනද තිබෙන්නේ, කාටද යොමු කළේ කියන එක අපි දන්නේ නැහැ. ඒ අදාළ ඇමතිවරයා කවුද කියලා බලන්න.

ගරු මන්ත්‍රීතුමනි, දේශපාලන අවශ්‍යතාව මත මෙතැනට ඇවිල්ලා ප්‍රශ්න මතු කරන්න එපා. මොකද, මේ සභාවේ ප්‍රශ්න අහන ක්‍රමවේදයක් තිබෙනවා; උත්තර දෙන ක්‍රමවේදයක් ද තිබෙනවා. දැන් මේ සභාව තුළ රාජ්‍ය ඇමතිවරු කිහිප දෙනෙක්ම ඉන්නවා; ඒ වාගේම කැබිනට් ඇමතිවරුත් කිපදෙනෙක් ඉන්නවා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය කාටද යොමු කළේ? ඔබතුමා ප්‍රශ්නය යොමු කරපු ඇමතිවරයා උත්තරයක් නොදුන්නා නම් එය අවධානය යොමු කළ යුතු දෙයක්. ඔබතුමාට ඒ උත්තරය ගැළපෙනවාද නැද්ද කියන එක වෙනම කාරණයක්. ඔබතුමා නිකම් මේ ගැලරියට කථා කරන්න සූදානම් වෙන්න එපා, ගරු මන්ත්‍රීතුමා. මොකද, ඔබතුමා අපේ පැත්තේ ඉඳලා ගිහින් ගැලරියටයි ඔය කථා කරන්නේ. ඔබතුමා අපේ පැත්තේ ඉඳලා, ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව විනාශ කරලා මේ රට විනාශ කරන්න හවුල් වුණු කෙනෙක්. ඔබතුමාගේ ප්‍රශ්නය අදාළ ඇමතිවරයාත් එක්ක බේරා ගන්න. මේ සභාව තුළ මැති ඇමතිවරු ඉන්නවා. බොරුවට මෙතැනට ඇවිල්ලා දේශපාලන කැටයම් දමන්න ලැහැස්ති වෙන්න එපා. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේ මගෙන් ප්‍රශ්නයක් අහලාත් නැහැ. තමුන්නාන්සේ ප්‍රශ්නයක් අහපු නැති එකට මම තමුන්නාන්සේට ස්තුති කරනවා. තමුන්නාන්සේ දේශපාලන අවස්ථාවාදියෙක්. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේ දේශපාලන අවස්ථාවාදියෙක්. තමුන්නාන්සේට ප්‍රශ්නය තිබෙන එක්කෙනාත් එක්ක ඒක විසඳා ගන්න. *[බාධා කිරීමක්]* මේ සභාව තුළ කැබිනට් ඇමතිවරු ඉන්නවා. අගමැතිතුමා හැමදාම වාගේ මේ ගරු සභාවේ ඉන්නවා. ඒ වාගේම රාජ්‍ය ඇමතිවරුත් ඉන්නවා. දේශපාලන කැටයම් දමන්න ලැහැස්ති වෙන්න එපා, මෙතැනට ඇවිල්ලා. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නිශ්ශබ්ද වෙන්න.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 'கொவிட்-19'ஆல் இறந்த உடல்களை எரித்தமைக்கு அரசாங்கம் மன்னிப்புக் கோருவது பற்றி இன்று இந்தச் சபையில் பேசப்பட்டது. அச்சம்பவம் நடைபெற்ற காலப்பகுதியில் அன்றைய அரசாங்கத்துக்கு ஆதரவளித்த, அரசியலமைப்புக்கான இருபதாவது திருத்தச் சட்டமூலத்துக்கு ஆதரவாக வாக்களித்து அரசாங்கத்தைக் காப்பாற்றிய முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களும் அதற்காக மன்னிப்புக் கோர வேண்டும். அதைவிடுத்து, அவர்கள் இன்று இந்த விடயம் பற்றி இந்தச் சபையில் பேசுவது வேடிக்கையாக இருக்கின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பொலிஸ்மா அதிபரின் நியமனம் தொடர்பாக இன்று உயர் நீதிமன்றம் மிக முக்கியமானதொரு தீர்ப்பை வழங்கியிருக்கின்றது. அதாவது, அவர் பொலிஸ்மா அதிபராகக் கடமையாற்ற முடியாதென உயர் நீதிமன்றம் தீர்ப்பளித்து இருக்கின்றது. அரசியலமைப்புப் பேரவையின் தீர்மானத்துக்கு மாறாக, மாண்புமிகு ஜனாதிபதி அவர்கள் தன்னுடைய விருப்பத்துக்கு அமைவாக பொலிஸ்மா அதிபர் நியமனத்தைச் செய்திருந்தார். ஆனால், அது தவறென உயர் நீதிமன்றம் இன்று சொல்லியிருக்கிறது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நேற்றைய தினம் நான் பொலிஸ்மா அதிபருக்கு என்னுடைய பாதுகாப்புத் தொடர்பில் கடிதமொன்றை அனுப்பியிருந்தேன். *[இடைமீடு]* தற்பொழுது இந்த நாட்டில் பொலிஸ்மா அதிபர் ஒருவர் இல்லை என்று சொன்னால், நான் யாருக்கு இந்தக் கடிதத்தை அனுப்புவது? ஜனாதிபதித் தேர்தல் தொடர்பிலும் உயர் நீதிமன்றம்தான் இறுதித் தீர்ப்பை வழங்கும். அரசாங்கம் ஜனாதிபதித் தேர்தலை ஒத்திவைப்பதற்கு எவ்வாறான முயற்சிகளை எடுத்தாலும், அவை வெற்றியளிக்காது என்பதை நான் இந்த இடத்தில் சொல்ல விரும்புகின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ ගැන අවධානය යොමු කරන්න.

මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු විපක්ෂ නායකතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

පාරිභෝගික ආරක්ෂණය සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දීම
நுகர்வோர் பாதுகாப்புக்கான உரிய வழிமுறையொன்றை அறிமுகம் செய்தல்
INTRODUCTION OF A PROPER MECHANISM FOR CONSUMER PROTECTION

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

වරක්, හිටපු ඇමෙරිකානු ජනාධිපති ජෝන් එෆ්. කෙනඩි මහතා පවසා ඇති ආකාරයට අප සියලුදෙනා යම් හෝ අවස්ථාවක පාරිභෝගිකයින් බවට පත් වෙනවා. එක් අවස්ථාවක අප පෞද්ගලිකව භාණ්ඩ හා සේවා පරිභෝජනය කරනු ලබන අතර, ඇතැම් විට පොදු භාණ්ඩ හා සේවාවල පාරිභෝගිකයන් වෙනවා.

එසේම, ආර්ථිකය තුළ හෝ ව්‍යාපාර පරිසරයේ සිදුවන සෑම වෙනස්කමකම පීඩනයට හෝ බලපෑමට පාරිභෝගිකයින් නතු වීම අනිවාර්ය තත්ත්වයක්. කෙසේ නමුත්, රටේ ආර්ථික තීරණ ගැනීම්වලදී තම අදහස් එම තීරණවල නියෝජනයන් බවට පත් කිරීමේ අඩුම අවස්ථාව ඇත්තේ ද පාරිභෝගිකයන්ට කියන එක මම කියන්න කැමැතියි. ඒ නිසා විශේෂයෙන්ම අපේ රටේ ලක්ෂ 220ක් වූ සමස්ත පාරිභෝගික ප්‍රජාව වෙනුවෙන් මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. මම කැමැතියි, මේ අවස්ථාවේදී කෙනඩි ජනාධිපතිතුමාගේ ඒ ප්‍රකාශය ඉදිරිපත් කරන්න. "Consumers include us all. They are the largest economic group, affecting and affected by almost every public and private economic decision. Yet they are the only important group....whose views are often not heard." ඒ පසුබිම තුළ මම මේ ප්‍රශ්න ටික ඉදිරිපත් කරනවා.

01. වර්තමාන ආර්ථික අර්බුදයත් සමඟ වැඩි වශයෙන් පාරිභෝගික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සිදුවන බව රජය නිරීක්ෂණය කර තිබේද? එසේ නම්, පසුගිය වසර 2 තුළ පාරිභෝගික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධ කොපමණ පැමිණිලි සංඛ්‍යාවක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ලැබී තිබේද? ඒ පිළිබඳව අධිකාරිය ක්‍රියාත්මක වී ඇති ආකාරය සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් මේ සභාවට ඉදිරිපත් කළ හැකිද?

ඇත්තවශයෙන්ම වර්තමානයේ නීති-රීති ක්‍රියාත්මක වීමේ ක්‍රමවල පවතින අඩුපාඩුකම් නිසා ව්‍යාපාරිකයින් අනවශ්‍ය ලාභ ලබනවා, පාරිභෝගිකයින් සූරා කෑමට ලක් වෙනවා. දිගින් දිගටම මිල උච්චාවචනය වීම් සිදු වුණා. මිල වැඩි වීම් සිදු වුණත් නැවත ඒ මිල ගණන්වල අඩු වීමක් සිදු වුණේ නැහැ. ඇතැම් අවස්ථාවලදී පාරිභෝගිකයාට කිසිදු විකල්පයක් නොමැති වීම නිසා සමහර ව්‍යාපාරිකයෝ අසාධාරණ අයුරින් පාරිභෝගිකයා සූරා කෑමක් සිදුවෙන බව දැන දැනත් භාණ්ඩ මිලදී ගැනීම් සිදු කරනවා. උදාහරණයක් ලෙස පසුගිය කාලයේදී එළවලු මිල ගණන් සම්බන්ධයෙන් පැන නැඟුණු ගැටලු පෙන්වා දෙන්න පුළුවන්. එය, ව්‍යාපාරිකයින් නිර්මාණය කළ මිල ඉහළ යෑමක් බවයි අප ඇතුළු බොහෝ දෙනා විශ්වාස කරන්නේ.

02. ඇතැම් ව්‍යාපාරිකයින්/ව්‍යාපාර ආයතන නිසි නියාමනයකට ලක් නොවීම හෝ නියාමනය සඳහා ඇති සම්පත්වල සීමිත බව, නිලධාරිවාදී ප්‍රමාදයන්, ආර්ථික අර්බුදය නිසා වර්ධනය වූ අවිධිමත් ආර්ථික ක්‍රියාකාරකම් නියාමනයට හසු නොවීම, පවතින අණපනත් යාවත්කාලීන නොවීම ආදී හේතු වැඩි වශයෙන් පාරිභෝගික අයිතිවාසිකම් උල්ලංඝනයට හේතු වී ඇති බව රජය පිළිගන්නේද? එසේ නම්, එම තත්ත්වය නිවැරදි කරමින් පාරිභෝගික ආරක්ෂණ නීති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා රජය ගෙන ඇති පියවර මොනවාද?

අපි දන්නවා, පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරපු කරන්දෙනිය මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ භාණ්ඩාගාරික වන රොෂාන් කුමාර මහතා සහ මහජනයාට වස විස ආහාර පිළිබඳව ඇත්ත පෙන්වූ සේනක ගමගේ වෛද්‍යවරයා ඝාතනයට ලක් වුණා කියලා. පාරිභෝගික ආරක්ෂණය සඳහා කැපවෙන නිලධාරින්ට එවැනි ඉරණමක් අත් වූ විට කිසිම දවසක කිසිවෙකු පාරිභෝගික ආරක්ෂණය සඳහා ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒ වාගේම ආර්ථික අර්බුදය නිසා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වැසී ගොස් බොහෝ අයගේ රැකියා නැති වුණා. අද ගොඩක් අය අමතර රැකියා කරනවා. මහාමාර්ග අසල විවිධ අයුරින් සකස්කළ ආහාරපාන අළෙවි කරනවා. අවිධිමත් ලෙස සිදු කරනු ලබන එවැනි ව්‍යාපාර යම් නියාමනයකට ලක් කළ යුතු වෙනවා, විශේෂයෙන්ම පාරිභෝගිකයාට අසාධාරණ මිලක් සමඟ තැන්වල -හැමතැනකම නොවෙයි- නිර්මාණය වීම් තුළ. ඒ වාගේම දැඩි ආනයන පාලන නිසා හොර පාරෙන් විවිධ භාණ්ඩ ගෙනෙන්නත් කටයුතු කරනවා. ඒ භාණ්ඩවල ගුණාත්මකභාවය පිළිබඳවත් කිසිම අයුරකින් පරීක්ෂා කිරීමක් සිදු වන්නේ නැහැ. මේ නිසා වැඩි වශයෙන් පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් කඩවීමක් සිදුවෙනවා.

03. මෙරට පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය කුමක්ද? දේශීය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන බවට රජයට සහතික විය හැකිද? Federal Trade Commission, FTC, United States of America, Competition and Markets Authority, CMA, United Kingdom, Competition Bureau, Canada, Australian Competition and Consumer Commission, ACCC, and Federal Cartel Office, Germany ආදී විවිධ රටවල පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් පවතින යහ භාවිතයන් - best practices - ලංකාවට අනුගත කිරීම සඳහා වූ යම් වැඩ පිළිවෙළක් දියත් කර තිබේද? ඒ කුමක්ද?

04. පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් සමස්ත ජනතාවගේ දැනුවත්භාවය පිළිබඳව සෑහීමකට පත්විය හැකිද? නොඑසේ නම්, මෙරට අධ්‍යාපන ක්‍රමවේදය තුළ විධිමත් පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධව පොදු නීති, සම්මුතීන් පිළිබඳව හැදෑරීම් සඳහා එක් විෂය මාලාවකට පමණක් සීමා නොවුණු පොදු දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් පැවතිය යුතු බව රජය පිළිගන්නේද? ඒ සඳහා රජය ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද?

05. ශීඝ්‍රයෙන් වර්ධනය වන ඩිජිටල් ආර්ථිකයක් තුළ පාරිභෝගික ආරක්ෂණය සඳහා මෙරට පවතින නීති පද්ධතිය ප්‍රමාණවත්ද? නොඑසේ නම්, ඩිජිටල් ගනුදෙනු වර්ධනයත් සමඟ පාරිභෝගික ආරක්ෂණය තහවුරු කිරීමේදී මතුවන අභියෝගවලට රජය මුහුණ දෙන්නේ කෙසේද? පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධ යන්ත්‍රණය නූතන ඩිජිටල් වෙළෙඳ පොළ හා සමගාමීව වෙනස් විය යුතු බව රජය පිළිගන්නේද? එසේනම්, ඒ සඳහා රජය ගෙන ඇති පියවර මොනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අමාත්‍යවරයාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි, මේ කාරණයටත්. රුපියල් 150ට තිබුණු රට අල කිලෝ එක එක පාරටම රුපියල් 350 වුණා. හඳපි උදාවත් සමඟ පොල් තෙල් මිල එකපාරටම රුපියල් 200කින් වැඩිවුණා. ගරු අමාත්‍යතුමනි, මේ පිළිබඳව ඔබතුමාගේ නිරීක්ෂණ අපට ඉදිරිපත් කරන්නට ඕනෑ, කොහොමද මේ දේවල් සිදු වෙන්නේ, ඒවා සිදු වෙනකොට පාරිභෝගිකයා ආරක්ෂා කරන ක්‍රමවේදය කුමක්ද කියන කාරණාව පිළිබඳව. ඒ වාගේම, ඉන්ධන, විදුලිය, ගෑස් මිල පහත වැටෙනකොට ඒවායේ වාසිය පාරිභෝගිකයාට නොලැබෙන්නේ ඇයි, විශේෂයෙන්ම භාණ්ඩවල මිල පහළ හෙළීමක් සිදු නොවන්නේ ඇයි කියන එක ගැන ඔබතුමා උත්තරයක් ලබා දෙන්නට ඕනෑ. විශේෂයෙන්ම මම කියන්නට කැමැතියි, අද වෙනකොට එළවලු මිල ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතින බව. මාළුමිරිස් කිලෝ එකක් රුපියල් 1,000යි. අමුමිරිස් කිලෝ එක රුපියල් 1,000යි. පසුගිය සතියේ මේවා තිබුණේ රුපියල් 350, 400 වැනි මිල ගණන්වලට. එකපාරටම කොහොමද මේවායේ මිල වැඩි වෙන්නේ? ඒ තුළින් මේ රටේ නාගරික, ග්‍රාමීය, වතු ප්‍රජාවට - පාරිභෝගික ප්‍රජාවට - දැඩි අසාධාරණයක් සිද්ධ වෙනවා. මේ පිළිබඳව ගන්නා පියවර මොනවාද කියන එක මම ඔබතුමාගෙන් අහන්නට කැමැතියි. ඒ වාගේම, විශේෂයෙන්ම මම යෝජනා කරනවා අපේ රටේ පාරිභෝගිකයා ආරක්ෂා කරන්නට මේ අමාත්‍යාංශය මීට වඩා ප්‍රශස්ත ක්‍රමවේදයක් අනුගමනය කරන්නට ඕනෑ කියලා. ඒ නිසා මේ ප්‍රශ්නය පිළිබඳව මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් විධිමත් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ගරු නලින් ප්‍රනාන්දු මහතා (වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)

(மாண்புமிகு நலின் பர்னாந்து - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அமைச்சர்)

(The Hon. Nalin Fernando - Minister of Trade, Commerce and Food Security)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරපු ස්ථාවර නියෝග 27 (2) පැනයට අමතරව එතුමා අවසාන වශයෙන් යම් කරුණු කිහිපයක් මගෙන් විමසුවා. ඒවාට උත්තර දීලාම එතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ අහපු පැනයට උත්තර දෙන්න මම බලාපොරොත්තු වෙනවා. එතුමා මේ ප්‍රශ්නය දිගින් දිගටම අහද්දී කිව්වේ මේ රටේ ආර්ථික අර්බුදයක් තිබෙනවාය කියන එක. ඒක ඇත්ත. එම ආර්ථික අර්බුදය තුළ වැඩිම අසහනයට, වැඩිම පීඩනයට පත් වුණේ මේ රටේ පාරිභෝගිකයා. මේ ආර්ථික අර්බුදය පටන් ගත්ත වෙලාවේ පළමුවෙන් බලශක්ති අර්බුදයක් තිබුණා. ඊළඟට මේක ඊට එහා ගියා. අවසානයේ අවශ්‍ය කරන බෙහෙත් ටික නැතුව මෙරට සෞඛ්‍ය පද්ධතිය කඩා වැටුණා. ඊට පසුව ආවේ ආහාර පිළිබඳ ප්‍රශ්නයක්.

මොකද, පසුගිය කාලයේ ගෙන ගිය පොහොර ප්‍රතිපත්තිය නිසා මේ රටේ නිෂ්පාදනය කඩා වැටීම හේතුවෙන් අවශ්‍ය කරන නිෂ්පාදන ප්‍රමාණය මදි වීමත්, භාණ්ඩ ආනයනය කිරීම සඳහා අවශ්‍ය කරන ඩොලර් ප්‍රමාණය අපට නැති වීම තුළ ආනයනික භාණ්ඩ ගෙන්වීම සීමා කිරීමත් නිසා පාරිභෝගික භාණ්ඩවල මිල විශාල වශයෙන් ඉහළ ගියා. ඒකේ අවසාන ප්‍රතිඵලය තමයි, ලෝකයේ ඉහළම උද්ධමන වේගයක් අපේ රටේ ඇති වීම. ඒ කියන්නේ, භාණ්ඩ මිල හා ආහාර සම්බන්ධ උද්ධමනය සියයට 94ක් දක්වා ඉහළ ගියා. අපි ඒ තත්ත්වය තුළ ඉඳලා අද වෙද්දි සියයට 2.5කට උද්ධමන වේගය පාලනය කරන්න අවශ්‍ය කටයුතු කර තිබෙනවා. රටක් විධියට අපි අපේ ප්‍රතිපත්ති තුළ ඒ තත්ත්වය පාලනය කර ගත්තා. ඔබතුමා කිව්වා වාගේ, ඒ තුළින් පාරිභෝගිකයාට සහන ලැබුණාය කියා මමත් පිළිගන්නේ නැහැ. මොකද, අපේ රටේ සිදු වුණු විදුලි බිල වැඩි වීම, බැංකු පොලිය වැඩි වීම, ඒ වාගේම රුපියලට සාපේක්ෂව ඩොලරයේ අගය වැඩි වීම කියන මේ සියලු කාරණා ගත්තාම ඒවා බලපෑවේ පාරිභෝගිකයාටයි. රුපියල් 380ට තිබුණු ඩොලරය අද වෙනකොට අපි රුපියල් 300 දක්වා ගෙනාවත්, විදුලි බිල වැඩි කරලා නැවත සියයට 22කට, සියයට 24කට විදුලි බිල අඩු කළත්, සියයට 28ක, සියයට 30ක තිබුණු අපේ බැංකු පොලිය නැවත සියයට 9කට, 10කට ගෙනාවත්, සමාගම් සහ සමහර වෙළෙන්දෝ මේ සියලු වාසි පාරිභෝගිකයාට ලබා දුන්නේ නැහැ. අපි ඒක පිළිගන්නවා. අපි මේ කාලය තුළ ඒ සඳහා මැදිහත් වුණේ කොහොමද කියලා වෙළෙඳ පොළ තුළ ඉන්න අය දන්නවා. අපි ඒ සඳහා විශාල මැදිහත් වීමක් වුණා.

ගරු විපක්ෂ නායකතුමනි, අපි විවෘත ආර්ථිකය තුළ පාරිභෝගිකයා වෙනුවෙන් මෙවැනි තත්ත්වයක් ඇති කරද්දි නිෂ්පාදකයාට හානි සිදු වෙනවා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයාට හානි සිදු වෙනවා. මෙවැනි තත්ත්වයක් තුළ මේක සමතුලිතව කර ගන්න ඕනෑ වැඩක්. ඒ නිසා අපි ඒ කරුණුත් සලකා බලලා තමයි සමහර වෙලාවට තීන්දු ගත්තේ. මොකද, පසුගිය කාලයේ ව්‍යාපාරිකයන්ට තිබුණු ගැටලුවලට විසඳුම් ලබා ගන්න ඒ ගොල්ලෝ කළේ භාණ්ඩ මිල වැඩි කළ එකයි. ඔහුගේ ලාභ තීරුව වැඩි කළා. ඒ නිසා, මේක සමතුලිතව පවත්වාගෙන යන්න අපටත් දෙපැත්තම බලන්න සිද්ධ වුණා. ඒ නිසා තමයි අපි දැන් විශේෂයෙන්ම භාණ්ඩ මිල පිළිබඳ අවධානය යොමු කරලා තිබෙන්නේ.

ඔබතුමා පොල්තෙල් පිළිබඳවත් කිව්වා. පොල්තෙල් සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය තමයි, ඒවා ආනයනය කිරීමේ දී ඇති වන තත්ත්වය. ඒ පිළිබඳව සාකච්ඡා කළා. ඒ අය අපට පොල්තෙල් ආනයනය කරන ක්‍රම දෙකක් තිබෙනවා. එකක්, සම්පූර්ණයෙන්ම නිෂ්පාදනය කරපු පොල්තෙල් මේ රටට ගෙනෙනවා. එහෙම නැත්නම් crude oil ගෙනැල්ලා ඒක ලංකාවේ පිරිපහදු කරලා හදන ක්‍රමයක් තිබෙනවා. ඇත්තටම අපේ එක වරදක් තිබෙනවා. ඒ තමයි, අපි crude oil සඳහා ගෙන යන ප්‍රතිපත්තියේ යම් වරදක් තිබෙනවා. ඒවා මෙහි ගෙනැල්ලා පිරිපහදු කරන විශාල ප්‍රමාණයේ කර්මාන්තශාලා හතරකින් එකයි වැඩ කරන්නේ. එම නිසා අපේ රට තුළ පොල්තෙල් නිෂ්පාදනය කරන වැඩ පිළිවෙළ අද නැවතිලා තිබෙනවා. ඒ, අපේ බදුවල තිබෙන ප්‍රශ්නයක් නිසායි. අපි ඒ සඳහා මේ සතියේ විසඳුමක් ලබා දෙනවා. ඒ ප්‍රශ්නය වාගේම සියයට 100ක් සම්පූර්ණයෙන්ම නිෂ්පාදනය කළ පොල්තෙල් ගෙනෙද්දි ඒ අයට නැවිවල ප්‍රශ්නයකුත් තිබුණා. විශේෂයෙන්ම නැව් මඟින් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් පසුගිය කාලයේ ප්‍රශ්නයක් තිබුණා. ඒ නිසා භාණ්ඩ අඩු වීම තුළ භාණ්ඩවල මිල වැඩි වෙන එක සාමාන්‍ය සිදුවීමක්.

උදාහරණයක් විධියට අපි එළවලු ගත්තොත්, එළවලුවලත් ඔය ප්‍රශ්නයම තිබෙනවා. වැස්ස කාලයට එකපාරට එළවලුවල මිල වෙනස් වෙනවා. පායන කාලයේ සමහර වෙලාවට තව මිලක් එනවා. එළවලු ප්‍රවාහනය කිරීමේ ප්‍රශ්න නිසා තව වෙලාවකට මිල වෙනස් වෙනවා. ඒ වාගේම ඒවා නාස්ති වීම තුළත් මිල වෙනස් වෙනවා. මේ සියලු දේ වෙන්නේ ඉල්ලුම හා සැපයුම මතයි කියන එක අපි කවුරුත් පිළිගන්නවා. මොකද, ඊට එහා ගිය දෙයක් කරන්න, ඒ සඳහා මැදිහත් වීමක් කරන්න අපට බැරි වුණු අවස්ථා විශාල වශයෙන් පසුගිය අවුරුදු 15, 20 තුළ තිබුණා. අපට මේ තත්ත්වයට උත්තර හොයා ගන්න අදටත් බැරි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපි මේ එළවලු හා පලතුරුවල සිදු වන නාස්තිය

[ගරු නලින් ප්‍රනාන්දු මහතා]

ගත්තොත්, අපි අවුරුදු 20ක්, 25ක් තිස්සේ මේ ගැන කියවනවා. අද වෙද්දිත් සියයට 35ක, සියයට 40ක නාස්තියක් තිබෙනවා. ඉතින් මේ තත්ත්වය අඩු කරගන්න අපි කටයුතු කරන්න ඕනෑ කියන එකත් අපි පිළිගන්නවා.

ඊළඟට ලූනු පිළිබඳ ප්‍රශ්නය ගත්තොත්, පසුගිය මාස හය ඇතුළත ලූනුවල මිල රුපියල් 800ට, රුපියල් 900ට, රුපියල් 1,000ට ගියා. ලෝක තත්ත්වයත් එක්ක අපි එම රටවලින් ලූනු ආනයනය නැවැත්තුවාම, අපි යැපෙන්නේ ආනයනය මත නම් අපට ඊට එහා කරන්න දෙයක් නැහැ. අද වෙද්දි ඒ ප්‍රශ්නය අවසන් වෙලා තිබෙනවා. අපි පුළුවන් තරම් ඉක්මනින් ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නවා කියන එකත් මම මතක් කරනවා.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා පළමුවැනි ප්‍රශ්නයෙන් අහපු කාරණය මම පිළිගන්නවා. ඒ අනුව, ඔබතුමා අහපු ප්‍රශ්නවලට මම දැන් පිළිතුරු ලබා දෙන්නම්.

01. ඔව්.

නිදහස් වෙළෙඳ ආර්ථිකයක් ක්‍රියාත්මක වන රටක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ද වෙළඳ පොළ බලවේග මිල පිළිබඳ ප්‍රධාන තීරක සාධකය වේ. ඒ අනුව පාරිභෝගික ආරක්ෂණ සම්බන්ධව ආර්ථික අර්බුද හමුවේ පාරිභෝගිකයාට යම් යම් ගැටලුසහගත තත්ත්වයන්ට ද මුහුණ දීමට සිදු වන බව සැබෑවකි. එවන් අවස්ථාවන්හි දී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, එකී පනත යටතේ ලබා දී ඇති නීතිමය ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම මෙන්ම සෘජු රාජ්‍ය මැදිහත්වීම තුළ ද එවන් තත්ත්වයන් පාලනය කිරීම සඳහා විවිධාකාර අයුරින් ක්‍රියාත්මක වීමක් සිදු වේ. ඒ යටතේ පාරිභෝගික ආරක්ෂාව පිළිබඳ නීති සම්බන්ධව පාරිභෝගිකයා දැනුවත් කිරීම, ඇස්තමේන්තුගත මිල පරාසයන් හඳුන්වා දීම හා ඒ පිළිබඳව පාරිභෝගිකයා මාධ්‍ය මඟින් දැනුවත් කිරීම සිදු කරනවා. පාරිභෝගික භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය හා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීම මඟින් මේ පිළිබඳව සුවිශේෂී මැදිහත්වීම් මේ වන විට සිදු කර තිබෙනවා.

පසුගිය වසර දෙක තුළ පාරිභෝගික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සම්බන්ධව 1977 කෙටි දුරකථන අංකය වෙත ලද පැමිණිලි ඊට පෙර වර්ෂවලට සාපේක්ෂව පහළ යෑමක් නිරීක්ෂණය විය. 2021 වර්ෂයේ ඒ සඳහා ලැබුණු පැමිණිලි 8,056ක් වූ අතර, 2022 හා 2023 වර්ෂවල ලද පැමිණිලි පිළිවෙළින් 4,888ක් හා 7,262ක් වේ. ඒ වාගේම 2022 වර්ෂයේ පැමිණිලි 4,233කට හා 2023 වර්ෂයේ පැමිණිලි 4,377කට වැටලීම් හා විමර්ශන සිදු කර ඇත. 2024 වර්ෂය සඳහා මේ වන විට පැමිණිලි 1,527ක් ලැබී ඇති අතර, ඉන් 626කට අදාළ රාජකාරි අවසන් කර ඇත.

2023 සහ 2024 වර්ෂවලට අදාළව සිදු කරන ලද වැටලීම්, නඩු පැවරීම් සහ අධිකරණ මඟින් නියම කරන ලද දඩ මුදල් මෙසේයි.

	2023	2024 (ජූනි මස දක්වා)
සිදු කළ වැටලීම්	24,848	12,313
නඩු පැවරීම්	22,913	9,896 (මැයි මස දක්වා)
දඩ නියම කිරීම්	රු.273,152,948 (රුපියල් මිලියන 273.1)	රු.86,502,000 (රුපියල් මිලියන 86.5)

පෞද්ගලික සහන අපේක්ෂාවෙන් සිදු කරන පැමිණිලි සඳහා විමර්ශන සිදු කිරීම 2023, 2024 වර්ෂවල පහත පරිදි වේ.

	2023	2024
පාරිභෝගික සහන පැමිණිලි සම්බන්ධව මැදිහත් වීම	2139	961

පාරිභෝගික පුද්ගලික සහන අපේක්ෂාවෙන් සිදු කරන ලද පැමිණිලි සඳහා විධිමත් විමර්ශන පැවැත්වීම පහත පරිදි වේ.

පැමිණිලි සාරාංශය 2022 සිට 2024.07.23 දක්වා				
	2022	**2023**	**2024**	**Total**
මුළු පරීක්ෂණ සංඛ්‍යාව	241	303	27	571
ගනු ලබන ක්‍රියාමාර්ග	215	222	8	445
නියෝගය ලබා දීම සඳහා නියමිත පරීක්ෂණ සංඛ්‍යාව	10	58	13	81
දැනට කටයුතු කරමින් පවතින පරීක්ෂණ	16	23	6	45
				126

- පසුගිය වසර දෙක තුළ පාරිභෝගික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සලකා බලා 2023.10.06 වන දිනෙන් පසුව පාරිභෝගික අධිකාරිය විසින් පාරිභෝගිකයාට වඩාත් ඉක්මනින් පැමිණිලි සම්බන්ධව විසඳුම් ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් මේ වන විට ක්‍රියාත්මකව පවතී. ඒ අනුව පාරිභෝගික සහන අපේක්ෂාවෙන් ලැබෙන පැමිණිලි දිස්ත්‍රික්ක මට්ටමින් විමර්ශනය කිරීම සඳහා විමධ්‍යගත කිරීමේ වැඩ සටහනක් සකස් කර ඇත. මේ මඟින් පාරිභෝගිකයින්ට ඵලදායි සහ ඉක්මනින් සහන ලබා දීමට අධිකාරිය අපේක්ෂා කරනු ලබයි.

02. පිළිගනිමි.

ආර්ථික අර්බුද මෙන්ම සම්පත් සීමිත බව, නිලධාරිවාදය, ප්‍රමාදයන් හා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැති වීම, පවතින නීති රීති හා අණපනත්වල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පාරිභෝගික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සිදු වන බව පිළිගනිමි. එම තත්ත්වය නිවැරදි කරමින් පාරිභෝගික ආරක්ෂණ පැමිණිලි නිසි ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා පහත පියවර ගෙන ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය 2003 අංක 9 දරන පනතින් ස්ථාපිත කර ඇති ආයතනයක් වන අතර, එහිදී එවකට පැවැති 1979 අංක 1 දරන පාරිභෝගික ආරක්ෂණ පනත, 1987 අංක 1 දරන සාධාරණ වෙළඳ කොමිෂන් සභා පනත සහ 1950 මිල පාලන පනත (173වන අධිකාරිය වූ) හා ඒවාට සම්බන්ධ සියලු දෑ අහෝසි කරමින් පිහිටුවන ලද ආයතනයකි.

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත මේ වන විට සංශෝධනය කිරීමෙන් අනතුරුව 2023.04.18 දින අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර, ඒ සඳහා ලැබුණු 2023.05.02 දිනැති අමාත්‍ය මණ්ඩල

තීරණය අනුව පනත් කෙටුම්පත කාලීන අවශ්‍යතා මත වැඩිදුර සංශෝධනය කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු නීතිපති දෙපාර්තමේන්තුවේ නිෂ්කාසන උදෙසා යොමු කරන ලදී. නීතිපතිතුමාගේ නිරීක්ෂණ සම්බන්ධයෙන් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශයේ සහ අධිකාරියේ නිලධාරීන් සාකච්ඡා කර සංක්ෂිප්ත වාර්තාවක් සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත නැවතත් 2024.05.31 වන දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඇමුණුම් සමඟ වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කොට, 2024.06.11 වන දින ඒ සඳහා ලැබුණු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නැවතත් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

දැනට පනත යටතේ ක්‍රියාත්මක වන සුවිශේෂී කාරණයක් වන තොග රඳවා ගැනීම් සම්බන්ධයෙන් සහ 10වන වගන්තිය යටතේ එන විධාන සම්බන්ධයෙන් වැඩි ප්‍රතිපාදන රැසක් නව පාරිභෝගික පනත් කෙටුම්පතට ඇතුළත්ව ඇත.

ඊට අමතරව, තරගකාරිත්වය ප්‍රවර්ධනය පිළිබඳව අදාළ කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන ප්‍රතිපාදන සහ තොග වෙළෙඳුන්ට නඩු පැවරීමේ හැකියාව වැඩිදුරටත් සංශෝධනය කර ඇත. එමෙන්ම, නිලධාරීන් බඳවා ගැනීමට අදාළව පවතින චක්‍රලේඛ, විධිවිධාන අනුව තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට නියමිත වන අතර, ඒ සම්බන්ධව මේ වන විටත් සාකච්ඡා පැවැත්වීම සිදු කරනු ලබයි. පාරිභෝගිකයන්ට වඩාත් සහනදායී සේවයක් සැපයීම සඳහා නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් කටයුතු කිරීම සඳහා ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇත.

ඒ වාගේම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා සහ කාර්යක්ෂම කිරීම උදෙසා 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 13 සහ 32 වගන්ති යටතේ ලැබෙන පාරිභෝගික පැමිණිලි විමර්ශනය කිරීම දිස්ත්‍රික්ක කරා විමධ්‍යගත කිරීමේ වැඩ පිළිවෙළක් මේ වන විට සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී.

ඒ අනුව සහන අපේක්ෂාවෙන් සියලු දිස්ත්‍රික් කාර්යාලවලට පාරිභෝගිකයන් ඉදිරිපත් කරන ලද පැමිණිලි සඳහා දිස්ත්‍රික් මට්ටමින් පරීක්ෂණ කටයුතු කිරීම සඳහා යොමු කරනු ලබයි.

ගරු විපක්ෂ නායකතුමනි, මේ පනතේ තිබෙන ප්‍රතිපාදනවලට අනුව පාලන මිලක් දාලා මේ නඩුවලට පටලවාගන්නේ, එහෙම නැත්නම් නඩු දාන්නේ සිල්ලර වෙළෙන්දාටයි. අපි මේ අලුත් සංශෝධනයෙන් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? විශාල වශයෙන් ලාභ තියාගෙන, එහෙම නැත්නම් තොග සඟවා ගෙන, එහෙම නැත්නම් තොග නිකුත් නොකර මහා පරිමාණයෙන් මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ නිෂ්පාදකයායි. නිෂ්පාදකයා තමන් සතු තොග සඟවා ගන්නවා නම්, එහෙම නැත්නම් එම තොග නිකුත් නොකරනවා නම් ඒ භාණ්ඩ රාජසන්තක කරන්න පුළුවන් නීති අපි මේ සංශෝධනයෙන් ගෙනැල්ලා තිබෙනවා. තව සති දෙකක්, තුනක් යද්දී අපට පාර්ලිමේන්තුවට මේ අලුත් කෙටුම්පත යොමු කරන්න පුළුවන්.

මම මේ අමාත්‍යාංශය භාර ගන්න කල් ලංකාවේම පාරිභෝගික පැමිණිලි ගෙනාවේ කොළඹට. අපි උදාහරණයක් විධියට මෙහෙම කියමු. අම්පාරේ පුද්ගලයෙකු රුපියල් 2,000ක ප්‍රශ්නයකට පැමිණිල්ල දාලා විමර්ශනය කරන්න කොළඹට එන්න ඕනෑ. එතකොට ඔහුට රුපියල් 2,000කට වැඩිය බස් ගාස්තුම ඒ සඳහා වැය වෙනවා. ඒ නිසා මම දිස්ත්‍රික් කාර්යාල මට්ටමෙන් ඒ පැමිණිලි අරගෙන විභාග කරන වැඩ පිළිවෙළ හදලා ඒ ප්‍රශ්නවලට උත්තරය දිස්ත්‍රික්කය තුළදීම ලබා දෙන්න කටයුතු කළ හැකි අලුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ඒ නිසා අද කොළඹට එන පැමිණිලි ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා.

තවද, පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව සඳහා පහත සඳහන් විධාන ද පාරිභෝගික අධිකාරිය විසින් නිකුත් කර ඇත.

ඡේද අංකය 10 සහ 12 යටතේ විධාන

විධාන අංකය	දිනය	ගැසට් අංකය	අරමුණු
84	24.06.2022	2285/18	සහල් හෝ වී සත්ව ආහාර නිෂ්පදනය සඳහා කෙලින්ම හෝ ආනයනයකින් යෙදවුමක් ලෙස භාවිතා කරලීම නොකලයුතු බවට විධාන කිරීම
85	29.06.2022	2286/26	පාරිභෝගිකයන් විසින් මිලට ගනු ලබන වෙළඳ භාණ්ඩ වල අවසන් ඒකකයේ උපරිම සිල්ලර මිල,බර පරිමාව ආදි ගැසට් පත්‍රයේ
			සඳහන් වන අයිතමයන් ලේබලයක් මඟින් සටහන් කල්යුතු බව නියම කිරීම.
86	30.08.2022	2295/05	ගැසට් පත්‍රය මඟින් නිෂ්චිත්ව දක්වා ඇති භාණ්ඩ ආනයන කිරීම අලෙවි කිරීමේදි රැස්කිරීමේදි හා විකිණීමේදි ගැසට් පත්‍රයේ සඳහන් කොන්දෙසි වලට යටත්ව සිදුකර යුතු බව
87	01.11.2023	2304/34	උපලේඛනගත භාණ්ඩ නිෂ්පාදන දිවයිනට ඇතුල් වනස්ථානයේදී එම භාණ්ඩය මත ප්‍රකාශිතව උපරිම සිල්ලර මිල ආනයනකරුගේ නම, ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය
88	12.04.2023	2304/35	ඕනෑම ලිහිසි තෙල් හෝ ග්‍රීස් සම්බන්ධයෙන්
89	12.04.2023	2304/36	වෙළෙන්දා ලියාපදිංචි කිරීම සහ පාරිභෝගිකයෙකුට රිසිට්පතක් හෝ බිල්පතක් නිකුත් කිරීම
91	2023.05.17	2332/15	යම් භාණ්ඩයක් අලෙවියෙහි සහ විකිණීමෙහි නිරත වන විදුහුත් වාණිජ අස්ථිත්වයක් හෝ අන්තර්ජාල වෙළඳ වේදිකා මෙහෙයුම්කරුවකු විසින්, එකී අලෙවිය සහ විකිණීම සම්බන්ධව
92	2023.06.01	2334/40	විධාන අංක 89/90 අවලංගු කිරීම
93	2024.02.01	2369/26	පාන් - සම්මත බර පෙන්වන්න

ඡේද අංකය 20(5) යටතේ නියෝග

නියෝග අංකය	දිනය	අංකය	අරමුණු
81	28.01.2022		දේශීය බෝතල් කල පානීය ජල බෝතල් වලට උපරිම සිල්ලර මිල නියම කරන ලද නියෝග අංකය 51 පරිවර්තන කිරීම
82	02.05.2022	2278/02	දේශීය සහල් වල උපරිම සිල්ලර මිල නියම කිරීම
83	10.06.2022	2283/43	දේශීය කැකුලු සහල් වල උපරිම සිල්ලර මිල නියම කිරීම
84	19.08.2022	2293/69	බිත්තර වල උපරිම සිල්ලර මිල නියම කිරීම
85	20.01.2023	2315/57	රතු/සුදු බිත්තර සඳහා උපරිම සිල්ලර මිල
86	19.04.2023	2328/05	රතු/සුදු බිත්තර සඳහා උපරිම සිල්ලර මිල
87	2023.07.25	2342/23	නියෝග අංක 86 අවලංගු කිරීම
88	2023.11.03	2356/39	සුදු සීනි සහ දුඹුරු සීනි සඳහා උපරිම සිල්ලර මිල
89	2023.11.21	2359/15	නියෝග අංක 88 අවලංගු කිරීම

[ගරු නලින් ප්‍රනාන්දු මහතා]

ඡේද අංකය 18 යටතේ නියෝග

නියෝග අංකය	දිනය	අංකය	අරමුණු
13	08.07.2022	2287/37	ලික්විෆයිඩ පෙට්‍රෝලියම් ගෑස් නිශ්චිත භාණ්ඩයක් වශයෙන් නියම කිරීම
14	16.06.2023	2336/67	බැහැර කිරීම නියෝග අංකය 13"ලික්විෆයිඩ පෙට්‍රෝලියම් ගෑස්" - නිශ්චිත භාණ්ඩ
15	16.06.2023	2283/43	ඇතුළත් කිරීම "ඇතුළත් කිරීම "තිරිඟු පිටි" - නිශ්චිත භාණ්ඩ

03. පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් මේ වන විට ක්‍රියාත්මක නොවේ.

පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් මේ වන විට රට තුළ ක්‍රියාත්මක නොවුවද, නියාමන ආයතන 39ක් පමණ රට තුළ පාරිභෝගික ආරක්ෂාව සඳහා කටයුතු කරමින් සිටී. ඒ අතර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, ශ්‍රී ලංකා රේගුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වැනි ආයතන වෙනම ඒ ඒ ආයතන පිහිටුවීමේ අරමුණුවලට අදාළ පනත් තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. එහිදී 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ ක්‍රියාත්මක වෙමින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය කටයුතු කරනු ලබයි.

ඒ සියලු ආයතන තිබුණත්, තනි තනිව වැඩ කරනවාට වඩා එක තැනකින් මේ කටයුතු සොයා බලා එහි තිබෙන අඩුපාඩුත් සකස් කරගෙන ඉස්සරහට යනවා නම් පාරිභෝගිකයා මීට වඩා ආරක්ෂා වෙන වැඩ පිළිවෙළක් අපට හදාගන්න පුළුවන්.

මෙහිදී දේශීය ආරක්ෂණ රෙගුලාසි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සිදුකිරීමට බොහෝදුරට උත්සාහ කර ඇත. ඒ සඳහා පහත සඳහන් කරුණු ඉදිරිපත් කරමි.

- පාරිභෝගික ආරක්ෂණයෙහි වැදගත්ම අංශයක් වන භාණ්ඩවල ගුණාත්මකභාවය පිළිබඳව කටයුතු කිරීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙතින් ලබා දෙන ශ්‍රී ලංකා ප්‍රමිතිය මේ වන විට උපයෝගී කරගනු ලැබේ. එහිදී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ශ්‍රී ලංකා ප්‍රමිති සැකසීමේ දී පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිති - ISO, Codex - විශ්ලේෂණය කර එම ප්‍රමිතීන් රටට ගැළපෙන ලෙස සකස් කිරීම සිදු කරනු ලබයි. ප්‍රතිනය කරන ලද රසායනාගාර තුළින් සාම්පල් පරීක්ෂාව සිදුකර ගැනීම සහ සත්‍යාපනය කරන ලද උපකරණ භාවිතය වැනි ජාත්‍යන්තර වශයෙන් අනුමත ක්‍රමවේද ද රට තුළ ක්‍රියාත්මකයි. එබැවින් භාණ්ඩවල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමේදී භාවිත කරනු ලබන බොහෝ නීති සහ රෙගුලාසි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන බවට ප්‍රකාශ කළ හැකිය. එමෙන්ම පාරිභෝගික ආරක්ෂණයේ දී භාණ්ඩවල මිල පිළිබඳව කටයුතු කිරීමේ දී එම භාණ්ඩවල මිල ව්‍යුහයන් සැකසීමේදී ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සිද්ධාන්ත සහ මිල සමීකරණ - pricing formula - භාවිත කරනු ලැබේ.

භාණ්ඩවල ලේබල් කිරීම, ඇසිරීම සහ ගබඩා කිරීම සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ක්‍රමවේද අනුගමනය කිරීමට අවශ්‍ය වන පරිදි රෙගුලාසි ද සකස් කර ඇත.

භාණ්ඩ මිලදී ගැනීම, මිලදී ගත් පසු වගකීම් සහතික ලබා දීම සහ භාණ්ඩ ආපසු යොමු කිරීම වැනි කාරණාවලදී ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ක්‍රමවේද සලකා බලා රෙගුලාසි සකස් කර ඇත.

ආරවුල් විසඳීම, පාරිභෝගික කමිටු පිහිටුවීම වැනි ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ක්‍රමවේද ඔස්සේ පාරිභෝගික ආරක්ෂණය සිදු කරනු ලබයි.

- භාණ්ඩ නිෂ්පාදනයේදී ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා GMP සහ GAP වැනි ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ක්‍රමවේද භාවිත කිරීම සඳහා නිෂ්පාදකයන් දිරිමත් කිරීම ද සිදුකරනු ලබයි.

- ජාත්‍යන්තර සංවිධාන වන Consumer Unity & Trust Society වැනි ආයතන විසින් පාරිභෝගික ආරක්ෂණය උදෙසා වෙළෙඳාම විධිමත් කිරීම සම්බන්ධයෙන් වරින් වර නිකුත් කරනු ලබන නිවේදන ජාත්‍යන්තර පාරිභෝගික ආරක්ෂණය වෙනුවෙන් පොදු වූ ප්‍රවණතාවලට අනුගත වෙමින් ශ්‍රී ලංකා පාරිභෝගිකයන්ගේ සුබසාධනය හා වෙළෙඳාම විධිමත් කිරීමට කටයුතු කිරීම. එසේම, පාරිභෝගික ජාත්‍යන්තරය විසින් පත් කර ඇති මූලික පාරිභෝගික අයිතිවාසිකම් අට අනුව යමින් පාරිභෝගිකයන් දැනුවත් කරන අතර, විධාන ද සකසනු ලබයි. එසේම, සෑම වසරකම මාර්තු 15වන දින ජාත්‍යන්තර පාරිභෝගික දිනය නිමිත්තෙන් ප්‍රකාශයට පත් කරන ලද තේමා ඔස්සේ මෙරට පාරිභෝගිකයන්ගේ සුබසාධනය සැලසීම සඳහා කටයුතු කරන අතර, සෑම වසරකම දෙසැම්බර් 5වන දිනට යෙදෙන තරගකාරීත්ව ප්‍රවර්ධන දිනයේදී ද Consumer Unity & Trust Society වැනි ආයතන විසින් නිකුත් කරනු ලබන තේමාව අනුව කටයුතු කරනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය යටතේ පාරිභෝගික ආරක්ෂණය සඳහා නිකුත් කර ඇති පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ විධාන සහ නියෝග නිකුත් කිරීමේදී පදනමක් ලෙස බොහෝ අවස්ථාවලදී මෙම ආරක්ෂණ රෙගුලාසි යොදාගෙන ඇත.

04. පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳව සමස්ත ජනතාවගේ දැනුවත්වීම පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව පිළිගනිමි.

ඒ සඳහා පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ද අනුමැතිය සහිතව අඛණ්ඩව සිදු කරනු ලබන අතර, උසස් පෙළ විෂය ධාරාවෙහි ව්‍යාපාර අධ්‍යයන විෂය නිර්දේශයේ ද පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධව ඇතුළත්ව පැවතීම ඒ සඳහා රුකුලක්ව පවතී. පාසල් සිසුන්ට අමතරව සාමාන්‍ය පාරිභෝගිකයන් දැනුවත් කිරීම සඳහා විවිධ වැඩසටහන් දිවයින පුරා අඛණ්ඩව සිදු කරනු ලබයි. ඊට අමතරව ප්‍රධාන විද්‍යුත් මාධ්‍ය හා අනෙකුත් මාධ්‍ය හරහා මෙම අධිකාරිය විසින් සිදු කරනු ලබන රාජකාරි හා පාරිභෝගිකයන් දැනුවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු නිරන්තරයෙන් සිදු කරනු ලබයි.

ඒ අනුව ඉහත සඳහන් පරිදි පොදු දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් අඛණ්ඩව සිදු කරනු ලබන අතර, එය තවත් විධිමත් කිරීම සඳහා 2024 වර්ෂයේ සිට පාරිභෝගික සේවා කමිටු සෑම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අමාත්‍යාංශය භාර ගත් පසු ලංකාව පුරා තිබෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 362හිම, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පාරිභෝගික සේවා කමිටු හදලා තිබෙනවා. ඒ තුළින් ව්‍යාපාරිකයෝ, සංවිධාන ඇතුළු සියලුදෙනාට පාරිභෝගිකයන් ආරක්ෂා කරන වැඩ පිළිවෙළ පිළිබඳව සාකච්ඡා කරලා තීන්දු ගන්න පුළුවන්. ඒ තීන්දුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට එවන්න පුළුවන්. අපි ඒවාට උත්තර ලබා දෙනවා. මේක පසුගිය අවුරුදු 15ක, 20ක කාලය තුළ කෙරුවේ නැහැ, මේවා තුළින් වෙනත් දේවල් කරයි කියන භයට. හැබැයි, අපි මේ ක්‍රමය ක්‍රියාත්මක කරලා අද වෙනකොට අවුරුද්දක් වෙනවා, එවැනි කිසිම දෙයක් වුණේ නැහැ. අද වෙනකොට පාරිභෝගික සේවා කමිටු සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඉතාම හොඳින් ක්‍රියාත්මක වෙනවා. අපි ඒ සඳහා අවශ්‍ය කරන උදව් ලබා දෙනවා.

පාරිභෝගිකයන්, වෙළෙඳුන්, පාසල් සිසුන් ඇතුළු ප්‍රජාව දැනුවත් කිරීම සඳහා වූ වැඩසටහන් 1,089ක් 2023 වර්ෂයේදී සිදු කර ඇති අතර, එහිදී 118,000ක් පමණ පිරිසක් සෘජුවම සම්බන්ධ කරගෙන ඇත. 2024 වර්ෂයේ මේ දක්වා එවැනි වැඩසටහන් 414ක් පමණ සිදු කර ඇත.

05. ප්‍රමාණවත් නැත.

2022 මැයි මස 20වන දින මා මෙම අමාත්‍යාංශය භාර ගත් දිනයේ සිටම මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ අතර, වංචා දූෂණ වැළැක්වීමේ ප්‍රධානම මෙවලම තාක්ෂණය බව පිළිගනිමි.

ශ්‍රී ලංකාව දියුණු වෙමින් පවතින රටක් ලෙස සියලු රාජ්‍ය හා පෞද්ගලික සේවාවන් මෙන්ම ආර්ථික කටයුතු ඩිජිටල් තාක්ෂණය ඔස්සේ සිදු කිරීමට අධ්‍යයනයන් සිදු කරමින් සිටින අතර, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය එහි අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා සිදු කරනු ලබන මූලික කාර්යයන්, කර්තව්‍යයන් තොරතුරු තාක්ෂණය ඔස්සේ සිදු කරමින් ඩිජිටල් ආර්ථිකය තුළ පාරිභෝගික ආරක්ෂණය තහවුරු කිරීමට අවශ්‍ය මූලික පියවර මේ වන විට ගෙන ඇත.

International Trade Centre සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකාවට ගැළපෙන පරිදි අන්තර්ජාල වෙළෙඳාම සම්බන්ධව විධානයක් මේ වන විටත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් නිකුත් කර ඇත. එමඟින් අන්තර්ජාල වෙළෙඳාම නියාමනය සඳහා කටයුතු කරනු ලැබේ. මීට අමතරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඩිජිටල් ආර්ථිකය තුළ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා නීති සම්පාදනය කර ඇත. මේ වසරේදී පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත - Personal Data Protection Act - පාර්ලිමේන්තුවේදී සම්මත වූ අතර, එමඟින් ඩිජිටල් තාක්ෂණය ඔස්සේ පාරිභෝගිකයාට සිදුවන අකටයුතුකම් නියාමනය කර පාරිභෝගිකයා ආරක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ.

මේ සම්බන්ධව දැනට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනයේදී ද අවධානය යොමු කර ඇත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2023 සහ 2024 වර්ෂවල සිදු කරන ලද ප්‍රධාන කාර්යයන් පිළිබඳ විස්තර ඇතුළත් සවිස්තරාත්මක වාර්තාව මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

ස්තුතියි.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)

(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)

(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture and Plantation Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා එළවලුවල මිල ගණන් පිළිබඳව කථා කළා. මම දන්නා කාරණා අනුව බැලුවාම නම් එතුමාට වැරදි තොරතුරු ටිකක් දීලා තිබෙන බව පෙනෙනවා. මම ඒ සම්බන්ධයෙන් මේ මොහොතේම සොයා බැලුවා. කැරට් කිලෝවක මිල රුපියල් 800යි, රුපියල් 1,000යි කියලා පාර්ලිමේන්තුවේදී කියන මේ කථා රාත්‍රී කාලයේ මාධ්‍යවල ගියාම, හෙට උදේ ඉඳන් ඒ මිලට තමයි එළවලුවල ගණන හදන්නේ. ගොවීන් වෙළෙන්දන්ට දෙන්නේත් එහෙමයි; වෙළෙන්දන් පාරිභෝගිකයන්ට දෙන්නේත් එහෙමයි. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාත් හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරපු මහජන නියෝජිතයෙක් නිසා මම හම්බන්තොට දිස්ත්‍රික්කයේ එළවලු විකිණෙන මිල ගණන් කිහිපයක් කියන්නම්.

මාළු මිරිස් කිලෝවක් රුපියල් 600ට විකිණෙනවා; බෝංචි කිලෝවක් රුපියල් 600යි; කැරට් කිලෝවක් රුපියල් 400යි. කැරට් කිලෝවක මිල රුපියල් 3,000කට විතර වැඩි වුණු නිසා දැන් කැරට් වැඩියෙන් වවලා. ලීක්ස් කිලෝවක් රුපියල් 400යි; මෑකරල් කිලෝවක් රුපියල් 200යි; වම්බටු කිලෝවක් රුපියල් 200යි; බණ්ඩක්කා කිලෝවක් රුපියල් 250යි; කිලෝවක් රුපියල් 100 මිලට තිබෙන පිපිඤ්ඤා වාගේ තව හුහක් එළවලු වර්ග තිබෙනවා. ඒ අතරේ ජාතික පාරිභෝගික පෙරමුණේ අයත් මැනිං මාර්කට් එකට වරින් වර ගිහිල්ලා මිල නියම කරනවා.

පෑලියගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ අද මුරුංගා කිලෝවක මිල රුපියල් 100 දක්වා පහළ ගිහින් තිබෙනවා. අමුමිරිස් කිලෝවක් රුපියල් 600යි, කැරට් කිලෝවක් රුපියල් 350යි, ලීක්ස් කිලෝවක් රුපියල් 400යි, වම්බටු කිලෝවක් රුපියල් 120යි කියලා සඳහන් වනවා. අපේ ප්‍රදේශවල ගොවීන් කියන්නේ නිෂ්පාදන මිලට වඩා තව ටිකක් මිල වැඩි වෙන්න ඕනෑ කියලායි.

ගරු විපක්ෂ නායකතුමනි, සමහර වෙලාවට කවුරුහරි ඔබතුමාට වැරදි තොරතුරක් දෙන්න ඇති. එහෙම නැත්නම් ඒ සුපර්මාර්කට් එකක පවතින මිල විය හැකියි. යම් දෙයක මිල වැඩියි කියලා - රුපියල් 1,000යි කියලා - රාත්‍රියේ රූපවාහිනියේ විකාශනය වුණොත් ගමේ කඩේ මනුස්සයා රුපියල් 600ට තිබෙන ඒවායේ මිල රුපියල් 1,000 කරනවා. ඒ නිසා අපි පරිස්සමෙන් තමයි මෙවැනි ප්‍රකාශ කළ යුත්තේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා

(மாண்புமிகு சஜித் பிரேமதாஸ)

(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම යම් පැහැදිලි කිරීමක් කරන්නට ඕනෑ. පළමුවැනි කාරණාව මෙකයි. මම පිළිගන්නවා. පාරිභෝගිකයාත්, නිෂ්පාදකයාත් අතර යම්කිසි සමබරතාවක් තිබෙන්න ඕනෑ බව. ඒ කියන්නේ, නිෂ්පාදකයාට හොඳ ස්ථාවර මිලකුත්, පාරිභෝගිකයාට සාධාරණ මිලකුත් පවත්වාගෙන යන්නට ඕනෑ.

ඒ වාගේම මම කියන්න කැමැතියි, පාරිභෝගික අයිතීන් වෙනුවෙන් පෙනී සිටින අසේල සම්පත් මහත්මයාගේ නායකත්වයෙන් යුතු ජාතික පාරිභෝගික පෙරමුණ ප්‍රමුඛ පාරිභෝගිකයන් වෙනුවෙන්ම ඉන්න පාරිභෝගික සංවිධානත් එක්ක සාකච්ඡා කරලා තමයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ කියන එක. පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් ගත්තාම, විවිධ ප්‍රදේශවල විවිධ මිල ගණන් තිබෙන්නට පුළුවන්. නමුත් සමස්තයක් හැටියට ගත්තාම, අපේ රටේ යම්කිසි ක්‍රමවේදයක්, යම්කිසි යන්ත්‍රණයක් තිබෙන්නට ඕනෑ, යම් අනිසි ආකාරයකට

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

පාරිභෝගිකයාට ඉතා ඉහළ මිලකට මුහුණ දෙන්න සිදු වුණු අවස්ථාවක සාධාරණ ලාභයක් එක්ක නිෂ්පාදකයාට හොඳ මිලක් ලැබීම සහ පාරිභෝගිකයාට දරාගත හැකි මිලකට ඒ මිල නියම වීම සම්බන්ධයෙන්. මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමෙන් මම ඒකයි අදහස් කළේ. විශේෂයෙන්ම පාරිභෝගික ජනතාව වෙනුවෙනුයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අවසාන වාර්තාවෙන් කියවන්නේ. අසේල සම්පත් මහත්මයා තමයි කියන්නේ, පැලියගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ අද මුරුංගා කිලෝවක මිල රුපියල් 100කට පහත වැටී ඇත; අමුමිරිස් කිලෝවක් රුපියල් 600යි, කැරට් කිලෝවක් රුපියල් 350යි, ලීක්ස් කිලෝව රුපියල් 400යි, වම්බටු රුපියල් 120යි කියලා. මම මේ සියලුදෙනා එක්ක සාකච්ඡා කරනවා වාගේම ඒ අය එවන වාර්තා පදනම් කරගෙන තමයි මේ කාරණය කිව්වේ. මේ වෙලාවේ මිල ගණන් සාමාන්‍ය මට්ටමේ තිබෙනවා. ඇත්තටම ගොවියාට මීට වඩා වැඩි මිලක් එනවා නම් තමයි හොඳ.

අනෙක් කාරණය මෙයයි. කලින් සඳහන් කරපු කාරණා එක්ක මේ gap එක අඩු වෙන්න ඕනෑ කියන එක අපි පිළිගන්නවා. ඒකට ප්‍රධාන හේතුවක් වෙලා තිබෙනවා, මේ නාස්තිය කියන එක. එළවලුවල සිදු වන නාස්තිය සියයට 40ක මට්ටමේ තිබුණේ. පසුගිය කාලයේදී අපි ගත්ත තීන්දු නිසා දැන් ඒක සියයට 25ට අඩු කරගෙන තිබෙනවා. ඒක සියයට 15ට විතර අඩු කර ගත්තොත්, මේ gap එක තවත් අඩු කර ගන්න අපට පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අමාත්‍යාංශ නිවේදනය, අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සෞන්දර්යය සහ ICT විෂයයන් සඳහා වන වෙනස්කම්: අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

புதிய கல்விச் சீர்திருத்தங்களின் கீழ் அழகியல் மற்றும் ICT பாடங்களுக்கான மாற்றங்கள்: கல்வி அமைச்சரினது கூற்று

CHANGES TO AESTHETIC AND ICT SUBJECTS UNDER NEW EDUCATIONAL REFORMS: STATEMENT BY MINISTER OF EDUCATION

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ඊයේ මතු කරන ලද ප්‍රශ්නයකට පිළිතුරු දීමට මම ගරු සභාවේ නොසිටි නිසා, අද දිනයේදී ඊට පිළිතුරු ලබා දෙනවා. විශේෂයෙන්ම ඒ ප්‍රශ්නය මතු වුණේ, සෞන්දර්යය විෂය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය කියන විෂයයන් දෙක පිළිබඳව ඇති වී තිබෙන්නා වූ තත්ත්වය ගැනයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ කිසිදු ආකාරයකට විෂයයන් කප්පාදුවක් සිදු වන්නේ නැහැ. මෙවර සිදු කරන්නේ පරිවර්තනීය වෙනසක්. දරුවන් දැනට මුහුණපාන අධික විභාග පීඩනයෙන් ඔවුන් මුදාගැනීම මෙම පරිවර්තනීය වෙනසේ මූලික අරමුණක්. ඒ යටතේ සෑම දරුවෙකුටම ජ්‍යෙෂ්ඨ ද්විතීයික පළමු අවධිය, ඒ කියන්නේ 11වන ශ්‍රේණිය සම්පූර්ණ කළ පසු ඔහු හෝ ඇය ඉගෙන ගත් සියලු විෂයයන්වල සාධනය සඳහන් සහතිකයක් ලබා දීමට යෝජනා කරලා තිබෙනවා. එම සහතිකය මත තමයි උසස් අධ්‍යාපනය සඳහා සලකා බලන්නේ, කුමන විෂය ධාරාවක් තෝරා ගත යුතුද කියන කාරණය. සෞන්දර්යය විෂයයන් වාගේම තොරතුරු තාක්ෂණ විෂය නව පරිවර්තනීය වෙනසක් අත්‍යවශ්‍ය වන විෂයයන් වශයෙන් තවදුරටත් පවතිනවා. එම විභාගය මඟින් මෙසේ දරුවන්ට ලබා දෙන සහතිකය සඳහා ඉහළ පිළිගැනීමක් ලබා දීම තමයි මෙහි අරමුණ වන්නේ. ඒ වාගේම සෞන්දර්යය හා තොරතුරු තාක්ෂණ විෂයයන් අනිවාර්ය විෂයයන් බවට පත් කර තිබෙනවා. දැනට මෙම විෂයයන් තිබෙන්නේ තෝරා ගැනීමක් කළ යුතු බාස්කට් විෂයයන් වශයෙන්. නව විෂය මාලාවෙන් එම තත්ත්වය වෙනස් කර එම විෂයයන් දෙකම අනිවාර්ය විෂයයන් බවට පත් කර තිබෙනවා. හැබැයි, අපි දරුවන්ට බරක් නොවන ලෙස එම විෂයයන් පිළිබඳව තක්සේරුකරණය යෝජනා කරලා තිබෙනවා.

උදාහරණයක් වශයෙන් ගත්තොත්, වර්තමානයේ හර විෂයයන් භයක් තිබෙනවා. මේ හර විෂයයන් භය ඇතුළුව දරුවන්ට තව විෂයයන් තුනක් තෝරා ගන්න පුළුවන්. ඒ සඳහා බාස්කට් විෂයයන් තුනක් තිබෙනවා. ඒක තමයි දැන් තිබෙන තත්ත්වය. පළමුවැනි විෂය කාණ්ඩය යටතේ භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය, ව්‍යවසායකත්ව අධ්‍යයනය, සම්භාව්‍ය භාෂා හා නූතන භාෂා, දෙවන භාෂාවක් ලෙස සිංහල හෝ දෙමළ, ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යාපනය යන විෂයයන් තිබෙනවා.

දෙවන විෂය කාණ්ඩය යටතේ සංගීතය (පෙරදිග, අපරදිග, කර්නාටක), චිත්‍ර, නැටුම් (දේශීය/භරත), නාට්‍ය හා රංග කලාව (සිංහල, දෙමළ, ඉංග්‍රීසි), සාහිත්‍ය හා රසාස්වාදය (සිංහල, දෙමළ, ඉංග්‍රීසි, අරාබි) යන විෂයයන් තිබෙනවා.

තුන්වැනි විෂය කාණ්ඩය යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, කෘෂි ආහාර තාක්ෂණය, ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය, ශිල්ප කලා, ගෘහ ආර්ථික විද්‍යාව, සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය, සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය යන විෂයයන් තිබෙනවා. ඒ, අද තිබෙන තත්ත්වය.

ඒ අනුව අද තිබෙන හර විෂයයන් භය තමයි, ආගම, සිංහල භාෂාව හා සාහිත්‍යය හෝ දෙමළ භාෂාව හා සාහිත්‍යය, ගණිතය, ඉංග්‍රීසි, ඉතිහාසය හා විද්‍යාව. ඒ තමයි හර විෂයයන් භය. ඒ භයෙන් පස්සේ, කලින් කිව්ව කාණ්ඩ තුනෙන්, තුනක් optional තිබෙනවා, දරුවන්ට තෝරා ගන්න පුළුවන්. ඒ, අද තිබෙන තත්ත්වය. යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ඒක වෙනස් වෙනවා. ප්‍රාථමික අධ්‍යාපනයට අනිවාර්යය අංගයක් වෙනවා, සෞන්දර්යය අධ්‍යාපනය. මොකද, නිර්මාණශීලී විෂයයන් තමයි ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රධාන පදනමක් වෙන්නේ. ඒ අනුව චිත්‍ර, නැටුම්, සංගීතය කියන විෂයයන් අනිවාර්යය වෙනවා. හැබැයි, 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණියට එනකොට අත්‍යවශ්‍ය ඉගෙනුම් ක්ෂේත්‍ර කියලා කොටසක් වෙන් වෙනවා. වැඩිදුර ඉගෙනුම්

ක්ෂේත්‍ර කියලා තව කොටසක් වෙන් වෙනවා. එතකොට පළමුවැනි කොටස තමයි, essential learning areas. දෙවැනි කොටස තමයි, further learning areas. මේ තත්ත්වය යටතේ අත්‍යවශ්‍ය ඉගෙනුම් ඒකකවලට විෂයයන් 14ක් යෝජනා කරලා තිබෙනවා.

ඒ 14න් පළමුවෙනි කාණ්ඩයේ තිබෙනවා, මව්බස හා සාහිත්‍යය, ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව, ඉතිහාසය, සමාජ අධ්‍යයනය -භූගෝල විද්‍යාව හා පුරවැසි අධ්‍යාපනය-, ආගම් හා සාරධර්ම අධ්‍යාපනය කියන ඒවා. අත්‍යවශ්‍ය ඉගෙනුම් ක්ෂේත්‍රයේ තිබෙන ඊළඟට කොටස තමයි, දෙවන ජාතික භාෂාව, සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, කෘෂිකර්මය සහ තාක්ෂණවේදය, සෞන්දර්ය අධ්‍යාපනය, ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව, ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම්. අත්‍යවශ්‍ය ඉගෙනුම් ක්ෂේත්‍ර කියලා මේ සියල්ලම අනිවාර්ය විෂයයන් බවට පත් කරලා තිබෙනවා. වැඩිදුර ඉගෙනුම් ක්ෂේත්‍ර සඳහා, කාණ්ඩ III යටතේ, සාහිත්‍ය රසාස්වාදය, මාධ්‍ය අධ්‍යයනය, සම්භාව්‍ය භාෂා, ගණිතය -වැඩිදුර අධ්‍යයනයට-, විද්‍යාව -වැඩිදුර අධ්‍යයනයට- යන විෂයයන් ඇතුළු තවත් විෂයයන් 12ක් එම කාණ්ඩයට අයත් කර තිබෙනවා. එම නිසා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සෞන්දර්යය විෂයත්, තොරතුරු තාක්ෂණ විෂයත් අත්‍යවශ්‍ය ඉගෙනුම් කාණ්ඩයට ඇතුළත් කරලා තිබෙනවා. එතැන තක්සේරුකරණය විතරයි වෙනසක් තිබෙන්නේ. නමුත් ඒවා අත්‍යවශ්‍ය ඉගෙනුම් ඒකක. ඒකට හේතුව තමයි දරුවන්ට මුලින් කියපු විෂයයන් 7ට තමයි තක්සේරුකරණය සඳහා පරීක්ෂණ පවත්වමින් ඒ කටයුත්ත කෙරෙන්නේ. අනෙක් විෂයයන් 7 අත්‍යවශ්‍යයි. නමුත් තක්සේරුකරණයේ පමණක් වෙනසක් තිබෙනවා, විභාග බර අඩු කිරීම සඳහා. ඒකෙන් කිසිම ආකාරයකින් මේක අඩු කරන්නේ නැහැ. මොකද, 6 සිට 11 දක්වා තොරතුරු තාක්ෂණය අත්‍යවශ්‍යයි.

ඒ විතරක් නොවෙයි, මේ වෙනකොට නියමු ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා, AI ඒකට integrate කරන්න. දැන් 9න් උඩට integrate කරලා පාසල් 20ක pilot project එක යනවා, AI Clubs 100ක් හදලා තිබෙනවා. අපේ networking project එකත් එක්ක ඊළඟ මාස දෙක තුන තුළදී අපි smart boards 2,500ක් ලබා දීමට නියමිතයි. ඒ 2,500න් කොටසක් ලැබෙන්නේ චීනයේ grant එකක් හැටියට. දැන් ඒක අවසන් කරලා තිබෙන්නේ. භාණ්ඩාගාර ලේකම් ගිය සතියේ ඒකට අත්සන් කළා. ඒක ERD එකට එනවා. ඒගොල්ලන් එහෙන් smart boards එවනවා. එතකොට අපට මෙහේ tender procedures මොනවත් අවශ්‍ය වෙන්නේ නැහැ, smart boards එහෙන් එවනවා. ඒකට networking එකක් වෙනවා. ඒ networking එක වෙන්නේ, දිවයිනේ සෑම ප්‍රදේශයකම clusters 1,250ක් නිර්මාණය වෙනවා. දැන් ඒක හදාගෙන යන්නේ. එක cluster එකක තිබෙනවා lead school එකක් හෝ දෙකක්. ඒ යටතේ කුඩා පාසල් සමූහය එනවා. එතකොට අපි බලාපොරොත්තු වෙන්නේ ඒ lead school එකට සියලු විෂය ධාරා ටික දෙන්න. එතකොට දරුවන්ට නගරයට එන්න ඕනෑකමක් නැහැ. තමන්ගේ ප්‍රදේශයේ ආසන්න පාසලකට යන්න පුළුවන්. ඇත්තටම කන්නන්ගර සංකල්පයේ තිබුණු මධ්‍ය විද්‍යාල 54 වෙනුවට අද clusters 1,250ක් හැදෙනවා, 1946න් පස්සේ. එදා පාසල් 54යි. නමුත් අද එදාට වඩා ජනගහනය වැඩියි, ළමා ජනගහනය වැඩියි, ඊට වඩා සංකීර්ණයි. අපි කරලා තිබෙන්නේ ඒ සංකල්පය නවීකරණය කරලා, පරිපාලන ව්‍යුහය සකස් කරලා ඒකට ගැළපෙන හැටියට මෙය ලබාදීම.

ඒ නිසා මම ඉතා පැහැදිලිව කියනවා යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ, අත්‍යවශ්‍ය විෂය කාණ්ඩයට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයත්, සෞන්දර්යය විෂයත් ඇතුළත් කරලා තිබෙන බව.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කියපු හැටියට ICT, සෞන්දර්යය, ගිණුම්කරණය අත්‍යවශ්‍ය විෂය කාණ්ඩය යටතේ තිබෙනවා. ඒවා තක්සේරුකරණය modules මඟින් කරනවා. එතකොට ඒ ගොල්ලන්ට සාමර්ථයක් හෝ කුමක් හෝ දෙයක් සහතිකයක් හැටියට දෙනවාද?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔව්, දෙනවා. ගරු මන්ත්‍රීතුමියනි, අපොස (සාමාන්‍ය පෙළ) විභාගය තිබ්බාම දැන් බලන්නේ "ඒ" සාමර්ථ 9ක් ගත් අය කොච්චරද, "ඒ" සාමර්ථ 8ක් ගත් අය කොච්චරද කියලා නේ. හැබැයි, ඒකෙන් නියම තත්ත්වය පැහැදිලි වෙන්නේ නැහැ. ඒ නිසා මේ විෂය සංඛ්‍යාව වැඩි කරලා, හර විෂයයන් 7 තමයි විභාග වශයෙන් තක්සේරුකරණය වෙන්නේ. අනෙක, විභාගත් එක්ක පන්ති කාමරයේ තක්සේරුකරණයත් වෙනවා. හැබැයි සහතිකය නිකුත් වෙන්නේ GPA එකත් එක්ක. එතකොට GPA එක 3, 3.1 ආදී වශයෙන් දුන්නාම කිසිම දරුවෙකුට අසාධාරණයක් වෙන්නේ නැහැ, අසමත් කියලා සහතිකයක් ලැබෙන්නෙත් නැහැ. ඒක පදනම් කර ගන්නේ විෂය ධාරාව තෝරා ගැනීමට.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, එතකොට අපි හිතමුකෝ මේ කාරණය. අපි දන්නවා, අපොස (උසස් පෙළ) සඳහා වාණිජ විෂය ධාරාව තෝරා ගන්නා දරුවෙකුට GCE (O/L)වලට වාණිජ හා ගිණුම් කරලා තිබුණාම, ඉස්සර ඒක ප්‍රමුඛතාවක් වුණා commerce subjects තෝරා ගන්න. එතකොට ඔබතුමා කියන අර විධියට දෙන දර්ශකයත් එක්ක බලලා විෂය ධාරාව තෝරා ගැනීමේ හැකියාව තිබෙනවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Essential learning areasවල ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව. *[බාධා කිරීමක්]* ඔව්, ඒකේ තමයි ගිණුම්කරණය තිබෙන්නේ.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, මට තව ප්‍රශ්නයක් තිබෙනවා. මම ඒක අහලා අවසන් කරනවා. විශේෂයෙන් ඔබතුමා කරන මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇත්තටම මම අගය කරනවා. මොකද, කාලයක් තිස්සේ අපට අවශ්‍යවම තිබුණු දෙයක්, ළමයින්ගේ විභාග බර අඩු කිරීම. අපට මනෝ වෛද්‍යවරු කියන දෙයක් තමයි මේක කරන්න කියන එක. පහේ ශිෂ්‍යත්වය සම්බන්ධයෙනුත් පුළුවන් විධියකට ඔබතුමා මොකක් හෝ දෙයක් කරන්න ඕනෑ, දරුවන්ට තිබෙන බර අඩු කරන්න.

මම කියන්නේ මේකයි. දැන් අපි මේ educational reforms ඔක්කොම ගෙනියන්නේ ගුරු උපදේශකවරු හරහා. ඔබතුමා දන්නවා, 2023.08.11වන දා තිබුණු ආංශික අධීක්ෂණ කමිටුවේදී ප්‍රකාශ වුණා, ගුරු උපදේශක අන්තර්ග්‍රහණය නිසියාකාරව සිද්ධ වෙලා නැහැයි කියලා. ඒ අනුව, 2023.09.05වන දා විපක්ෂ නායකතුමාගේත් ප්‍රධානත්වයෙන් අපි කමිටු ශාලා අංක 2දී ඒ අයත් එක්ක සිදු කළ සාකච්ඡාවේදී යෝජනා වුණා, තාක්ෂණික

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

කමිටුව හදන්න. ඒ වාගේම සුදුසු වැටුප් ක්‍රමයක් සකස් වනකල් ඒ සඳහා අවශ්‍ය චක්‍රලේඛය නිකුත් කරන්න කියලා. ඒ අදාළ නිලධාරිනුත් එතැන හිටියා. හැබැයි, ඔබතුමා දන්නවා ඇති, දැන් ඒ කිසිවක් වෙන්නේ නැතිව, ED/2/29/18/7/1 අංකයෙන් යුතුව 2024.07.18 දිනැතිව "ඔය ගොල්ලෝ කැමැති නම් ඉන්න, එහෙම නැත්නම් යන්න" කියලා ගිය සතිය වනකොට චක්‍රලේඛයක් නිකුත් කර තිබෙන බව. ඇත්තටම බොහෝ අමාරුවෙන් නේ ගුරු උපදේශක සේවාව ස්ථාපිත කර ගත්තේ. එතකොට මේ චක්‍රලේඛය අනුව මේ පිරිස ගියාම, ඒ සේවාව ස්ථාපිත කරගත්ත එකේ පරමාර්ථය ඉෂ්ට වෙන්නේ නැහැ. හුඟක් පළපුරුද්ද තිබෙන මේ කණ්ඩායමට වැටුප් සකස් කරලා නැති නිසා එ්ගොල්ලන් අන්තර්ග්‍රහණය වෙන්න කැමැති නැහැ. "කැමැති නැත්නම් ඔයාලා යන්න, අපි අලුතින් කණ්ඩායමක් අරගෙන මේ කටයුත්ත කරනවා" වාගේ කථාවක් තමයි දැන් තිබෙන්නේ. එතකොට අත්දැකීම් තිබෙන කණ්ඩායම ගෙදර යවලා මේ ප්‍රතිසංස්කරණ සැබෑ ලෙස මේ බිමට ගේන්න හැකියාවක් තිබෙනවාද? ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, තාක්ෂණික කමිටුව සකස් කරන්න කියලා. ඒ තාක්ෂණික කමිටුව සකස් කිරීම තුළ ඔබතුමන්ලා අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු පුහුණුවට, ඒ වාගේ දේවල්වලට වැය කරන මුදලින් ලොකු ප්‍රමාණයක් ඉතුරු කර ගන්නත් පුළුවන්. මම ඔබතුමාට පෞද්ගලිකව ඒක ගැන කියන්නම්. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ චක්‍රලේඛය ක්‍රියාත්මක කරන එක නොවෙයි කරන්න ඕනෑ. මේ ඉන්න පිරිස රැක ගන්න ඒ අය කියන විධියට ඒ අදාළ කැබිනට් පත්‍රිකාව සකස් කරලා ඉදිරිපත් කරනවා නම් සුදුසුයි කියන එකයි මම කියන්නේ, ගරු ඇමතිතුමනි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් අපි මෙහේ පැවැති සාකච්ඡාවෙන් පස්සෙත් තව අවස්ථා කිහිපයකදී සාකච්ඡා කළා. අවසාන වශයෙන් එපිට සිකුරාදා ජනාධිපති ලේකම් කාර්යාලයේ පැය දෙකක සාකච්ඡාවක් තිබුණා, ගුරු විද්‍යුහල්පති ක්ෂේත්‍රයේ විෂමතා පිළිබඳවත්, මොඩියුල ක්‍රමය පිළිබඳවත්. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කියපු ගුරු උපදේශක සංගමයේ සමරකෝන් මහත්මයා ඒකට ඇවිල්ලා හිටියා. *[බාධා කිරීමක්]* මම දන්නේ නැහැ. එතුමාවත් එක්ක ගෙන ඇවිල්ලා හිටියා, අනෙක් අය. මේ සාකච්ඡා ටික කළා. ඊට පෙර තිබුණු සාකච්ඡාවලිනුත් මතු වුණු එක කාරණයක් තමයි ගැළපුම් දීමනාවක් දෙන එක, මේ වැටුප සකස් කරනකල්. ඊළඟ කාරණය, ඒගොල්ලන් ඉල්ලීමක් කර තිබෙනවා, එහෙම බැරි නම් ඒ අයට ගුරු සේවයට යන්න දෙන්න කියලා. ඒ නිසා තමයි ඕක වෙලා තිබෙන්නේ. නමුත්, මෙතැන මූලික වශයෙන් තිබෙන්නේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අපට ලබාදෙන උපදෙස් ප්‍රමාද වීමේ ප්‍රශ්නය.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, ගුරු සේවයට යන්න නොවෙයි ඒ අය ඉල්ලුවේ. එතැනදී කිව්වේ, විශ්‍රාම යන අයට ගැටලුවක් තිබෙනවා කියලායි. ගුරු උපදේශක සේවයේ කියලා දැනට සම්පත් දායකයෝ හැටියට ඉන්න පිරිස විශ්‍රාම යනකොට එම පිරිසට අසාධාරණයක් වෙනවා. ඒ කථාව තමයි එතැනදී කිව්වේ. හැබැයි, මම හිතනවා, අමාත්‍යාංශය ඒක අවබෝධ කරගත්ත විධිය වැරැදියි කියලා. සමරකෝන් මහත්මයා ගැන මගේ පෞද්ගලිකව තරහක් නැහැ. ඔහු විශ්‍රාම ගිය කෙනෙක්. ඉතින් විශ්‍රාම ගිය කෙනෙකුට මේ පඩි අනෙක් අයට වැඩි වුණත් එකයි, නැතත් එකයි. ඒ නිසා මම ඔබතුමාට පළමුවෙන්ම යෝජනා කරනවා, ඔය සාකච්ඡාවලට දැනට ගුරු උපදේශක සේවයේ ඉන්න අය ගෙන්වාගෙන ඒ අයත් එක්ක තොරතුරු සාකච්ඡා කරන්න කියලා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඔබතුමියත් සහයෝගය දෙන්න. මට ලබන සඳුදාම ඕනෑ නම් සාකච්ඡාව දෙන්න පුළුවන්, අපේ අමාත්‍යාංශයට උදේ 11.00ට විතර නිලධාරින් එක්ක ආවොත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, මම පොඩි කාරණා කිහිපයක් ඔබතුමාට කියන්නම්. මේ රටේ ඩිජිටල් විප්ලවයක් කරනවා නම් ඇයි, තොරතුරු තාක්ෂණය ප්‍රාථමික අංශයේ නැත්තේ? *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. තොරතුරු තාක්ෂණය 6-13 ශ්‍රේණිවල විෂයයක්. ඉතින් ඩිජිටල් විප්ලවයක් ගැන අපි කථා කරනවා නම් ඇත්තම කථාව මොකක්ද? මේක 1-13 ශ්‍රේණිවල ඉඳලාම විෂයයක් වෙන්නට ඕනෑ. Teaching සිදු වන්නට ඕනෑ Englishවලින්.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා -

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

පොඩ්ඩක් ඉන්න. ගරු ඇමතිතුමනි, මම මේ චෝදනාවක් නොවෙයි කරන්නේ. එය අප හැමෝම එකතු වෙලා ගන්න ඕනෑ තීන්දුවක්. හැබැයි, මම කියන්න ඕනෑ, එය කරන්න ඉස්සෙල්ලා භෞතික සම්පත් හිඟයටයි, මානව සම්පත් හිඟයටයි පිළියම් යොදලා, පුහුණුව ලබා දීම ආදි අවශ්‍ය සියල්ල අප කරන්නට ඕනෑ බව. හැබැයි, අපි කොහොමද ඩිජිටල් විප්ලවයකට යන්නේ, තවමත් අපේ රටේ අධ්‍යාපනයේ තොරතුරු තාක්ෂණ විෂයය පාසල්වල උගන්වන්නේ 6 - 13 ශ්‍රේණිවල විෂයයක් හැටියට පමණක් නම්? ඉස්සෙල්ලාම කරන්න ඕනෑ, එය 1 - 13 ශ්‍රේණි විෂයයක් කරන එකයි. ඒ වාගේම මම තරයේ විශ්වාස කරනවා, එය compulsory කළ යුතු බව සහ English medium එකෙන් කළ යුතු බව.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. මම ඔබතුමාට මතු කළේ විශේෂයෙන් සමාජයේ ඇති වුණු කථා බහ තුළ බොහෝ විද්වතුන්, බොහෝ විශේෂඥයින් මතු කරපු ප්‍රශ්නයක්. ඔබතුමා කියනවා නම් GCE (O/L) වලට Information Technology, සෞන්දර්ය ක්ෂේත්‍රය ආදිය ඇතුළු වනවා කියලා, මම එය පිළිගන්නවා. එහි ගැටලුවක් නැහැ. මම මේවා මතු කරන්නේ ඇයි? ඇත්තටම අපේ රටේ curricula and syllabi වෙනස් වන්නට ඕනෑ නේ. අපේ රටේ තිබෙන්නේ කට පාඩම් ක්‍රමය නේ; ගිරා පෝතක ක්‍රමය නේ; rote learning or parrot learning ක්‍රමය නේ. මම කියන්නේ නැහැ එය තනි පුද්ගලයෙකුට වෙනස් කරන්න පුළුවන් කියලා. මේ රටේ

අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන හිතලා පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව අප එය සාමූහිකව කළ යුතුයි.

මේ රටේ පාසල් 10,096ක් තිබෙනවා. හැබැයි, GCE (A/L) විභාගය offer කරන්නේ 3,000කට ආසන්න ප්‍රමාණයක. ඒවායෙනුත් math stream සහ science stream තිබෙන්නේ පාසල් 1,000කටත් අඩු ප්‍රමාණයක. එය ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කරපු වරදක් කියලා මම කියන්නේ නැහැ. අප මේ ගැන සාමූහිකව සිතා බලා සම්පූර්ණයෙන් මේ ක්‍රමයේ වෙනසක් ඇති කළ යුතුමයි. මම එය මේ අවස්ථාවේ ඔබතුමාට අවධාරණය කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟ අමාත්‍යාංශ නිවේදනය, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු මහින්ද අමරවීර මැතිතුමා.

නිල්වලා ගඟේ ලවණ බාධකය හේතුවෙන් හානියට පත් කුඹුරු ඉඩම්: කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ ප්‍රකාශය

நில்வளா ஆற்றின் குறுக்கேயுள்ள உவர்நீர் தடுப்பு காரணமாக பாதிக்கப்படும் வயல் நிலங்கள்: கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரினது கூற்று

PADDY LANDS AFFECTED DUE TO SALINITY BARRIER ACROSS NILWALA RIVER: STATEMENT BY MINISTER OF AGRICULTURE AND PLANTATION INDUSTRIES

ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Agriculture and Plantation Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024.07.23වන දින ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට මා පිළිතුරු ලබා දෙනවා.

පළමුවෙන්ම මම කියන්න ඕනෑ මෙම ප්‍රශ්නයට මුල් කරගෙන තිබෙන්නේත්, මේ කාරණය සම්බන්ධයෙන් පසුගිය දිනවල බොහෝ කථා බහ නිර්මාණය වෙලා තිබෙන්නේත්, "කෘෂි පුවත්" මගින් -"Agrinews"- නිකුත් කරපු නිවේදනයක් සම්බන්ධයෙන් බව. එම නිවේදනය කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය විසිනුයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. එම නිසා මට කියන්න බැහැ, එය පිටස්තර එකක් කියලා. හැබැයි, පත්තරවලට ලියපු වාර්තාවක් පදනම් කරගෙන තමයි පසුගිය දවස්වල මාධ්‍යවල මේ පිළිබඳ විවිධ කතන්දර කියැවුණේ සහ විවේචන එල්ල වුණේ. එය සම්පූර්ණයෙන් නිවැරදි වාර්තාවක් කියලා මම පිළිගන්නේ නැහැ. එහි අඩු පාඩු තිබෙනවා කියන එක මුලින්ම සඳහන් කරන්න ඕනෑ. නමුත්, එම වාර්තාව මුල් කරගෙන තමයි මේ හුහක් ප්‍රශ්න නිර්මාණය වෙලා තිබෙන්නේ. කෙසේ වෙතත්, ගරු විපක්ෂ නායකතුමා ප්‍රශ්න කිහිපයක් අසා තිබෙනවා. ඒවාට පිළිතුරු මෙසේයි.

01. වී වගාව ව්‍යාප්ත නොකිරීමට කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් තීරණය කර නොමැත.

    ගංවතුර හේතුවෙන් වී වගාව සිදු කළ නොහැකි නම් පමණක් කුඹුරුවල විකල්ප බෝග වගා කිරීම නිර්දේශ කිරීමට කටයුතු කරනු ඇත.

02. අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කර ඇත. කමිටු නිර්දේශ මේ වන තෙක් ලබා දී නොමැත.

03. කමිටු නිර්දේශ ලැබුණු පසු මේ පිළිබඳව සලකා බැලීම සිදු කෙරේ.

04. කෘෂිකාර්මික කටයුතු නැවැත්වීමක් සිදු නොවන නිසා ආර්ථික හා සමාජයීය වශයෙන් ඇති විය හැකි බලපෑම පිළිබඳ කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් තක්සේරුවක් මේ වන විට සිදු කර නොමැත. කමිටුව මඟින් ලබා දීමට නියමිත නිර්දේශයන්ට අනුව ඉදිරි කටයුතු සිදු කෙරේ.

    කෙසේ වුවත්,

    - වී වගා කළ නොහැකි ඉඩම්වල වී වගාවට වඩා ආර්ථික වටිනාකමින් වැඩි සුදුසු බෝග වගා කිරීම
    - ගංවතුරට ඔරොත්තු දෙන වී ප්‍රභේද හඳුන්වා දීම
    - සෝජාන් වගා පද්ධති ඇති කිරීම වැනි විකල්ප විසඳුම් යෝජනා කරමි.

05. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත යටතේ ආවරණය නොවන බැවින් ලවණ බාධකය ඉදි කිරීම නිසා ඇති වන වගා හානි සඳහා කෘෂි රක්ෂණ මණ්ඩලය මඟින් වන්දි ගෙවීම් සිදු කර නොමැත. (කෙසේ වුවද මේ සඳහා පසුගිය වසර කිහිපයකදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් වන්දි ගෙවා ඇති බව වාර්තා වී ඇත.)

ගරු විපක්ෂ නායකතුමනි, මාතර ලවණ බාධකය හේතුවෙන් ඇති වුණු ගංවතුර තත්ත්වයත් නිසා විශාල හානියක් සිදු වුණා.

ඒ හානිය මත විවිධ අවස්ථාවල ලැබුණු තොරතුරු, ඒ ජනතාවගෙන් අප වෙත කෙරුණු ඉල්ලීම්, පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා ප්‍රමුඛ මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ සහ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් කරන ලද ඉල්ලීම් මත මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. මම ඒ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළේ ඒ ජනතාවට අපේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් වන්දියක් ලබා දීම සඳහා මුදල් ඉල්ලා සිටීමටයි. ඒ මත ඇති වෙච්ච කාරණයක් සම්බන්ධයෙන් තමයි මේ ගරු සභාවේ දිගින් දිගටම සාකච්ඡා වුණේ.

මේ තත්ත්වය බොහෝ කාලයක් තිස්සේ හැම අවුරුද්දකම වාගේ ඇති වුණා. නිරන්තරයෙන් ඇති වන තත්ත්වයන් වෙනුවෙන් වාර්ෂිකව මුදලක් වෙන් කරලා දෙන්න කියලායි ඉල්ලා සිටියේ. මොකද, එක වතාවක් දීලා මදි. ඊළඟ අවුරුද්දේත් දෙන්න ඕනෑ. අපේ අය වැය ලේඛනයේ එහෙම කාරණයකට මුදල් වෙන් කිරීමක් සිද්ධ වෙලා නැහැ. අපේ යෝජනාවට මුදල් අමාත්‍යාංශයෙන් අපට ලැබුණු පිළිතුර ලෙස ඒ අය කියන්නේ මේ තත්ත්වය දිගින් දිගටම සිදු වන නිසා මේ සියලු කරුණු සැලකිල්ලට ගෙන ඒ ඉඩම් පිළිබඳ තක්සේරු කරලා, අවුරුදු පතා වන්දි ලබා දීමක් නොව, එක් වරක් වන්දි මුදලක් ලබා දෙන්න කියලායි; ඉන් අනතුරුව ඒ ප්‍රදේශයේ ගංවතුරට ඔරොත්තු දෙන වෙනත් වගාවන් සඳහා කටයුතු කරන්න කියලායි. ඒ වෙනුවෙන් කමිටුවක් ද පත් කළා. ඒ කමිටුවෙන් සොයා බැලීමක් කරලා, දැනට වගා කරන වී වෙනුවට ගංවතුරට ඔරොත්තු දෙන

[ගරු මහින්ද අමරවීර මහතා]

පාරම්පරික වී වර්ග වගා කරනවා නම් ඒ සඳහාත්, ඒ වාගේම වැඩි ආර්ථික වටිනාකමක් ලබා ගන්න පුළුවන් බෝග වර්ග වගා කරනවා නම් ඒ සඳහාත් උදවු උපකාර කිරීම -මූල්‍යමය වශයෙන් ශක්තියක් ලබා දෙන්නත්, තාක්ෂණික දැනුම ලබා දෙන්නත්- කියන අදහසින් තමයි ඒ කටයුත්ත සිදු වන්නේ. ආණ්ඩුවට ඒ ඉඩම් පවරාගෙන තියා ගන්න අවශ්‍යතාවක් නැහැ. ආණ්ඩුව මේ වන විටත් පවුල් මිලියන දෙකක් -පවුල් ලක්ෂ 20ක්- සඳහා රජය සතුව තිබෙන ඉඩම්වලට ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඒ නිසා ගංවතුරෙන් යට වන ඒ ඉඩම් ටික අරගෙන මොකවත් කරන්න ආණ්ඩුවට බලාපොරොත්තුවක් නැහැ. මම එය ඉතාම වගකීමෙන් කියනවා. රජයට ඒ ඉඩම් ගැනීමේ කිසිදු වුවමනාවක් නැහැ. ඒ ඉඩම් දිගින් දිගටම ගංවතුරෙන් යට වෙනවා නම්, වැඩි ආදායමක් ලබා ගන්න පුළුවන් විකල්ප බෝග වර්ග වගා කිරීමට ඒ අය උනන්දු කිරීමක්, ඒ සඳහා මූල්‍යමය වශයෙන් උදවු කිරීමක්, ඊට අතිරේකව තාක්ෂණික වශයෙන් දැනුම ලබා දෙන්න කටයුතු කිරීමක් ගැනයි මේ කියලා තිබෙන්නේ. ඒ සම්බන්ධව කමිටුවක් පත් කරලා තිබෙනවා. කමිටුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව අපේ අමාත්‍යාංශය කරපු සාකච්ඡාවක කරුණු කිහිපයක් මුල් කරගෙන තමයි මේ මාධ්‍ය නිවේදනය සකස් වෙලා තිබෙන්නේ. කෘෂි පුවත් යටතේයි එය පළ වෙලා තිබෙන්නේ.

මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ඇතුළු ජල මූලාශ්‍ර මඟින් පැන නැඟී ඇති ගැටලු පිළිබඳව සාකච්ඡා කෙරෙන විශේෂ කාරක සභාවක් තිබෙනවා. එම විශේෂ කාරක සභාව ඊයේ දිනයේ රැස් වුණේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාගේ මූලිකත්වයෙන්. අපි ඊයේත් එම කාරක සභාවේදී මේ පිළිබඳව සාකච්ඡා කළා. දැනට කිසිම තීන්දුවක් ගන්නේ නැහැ කියන තීන්දුවේ අපි ඉන්නවා. අපි ඒ විශේෂ කාරක සභාව පිළිගන්නවා. ඒ විශේෂ කාරක සභාව ලබා දෙන නිර්දේශ අනුව ක්‍රියා කරන්න කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට අපි කටයුතු කරනවා. මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට මම මේ කාරණය කියන්න කැමතියි. කිසිම කෙනෙකුට හානියක් කරන අදහසින් නොව, ඒ අයට වන්දියක් ලබා දීමේ අදහසින් තමයි මම මේ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළේ. ඒ වාගේම, ඒ කිසිදු ඉඩමක් රජයට පවරා ගෙන රජය සතු කර ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. රජය එක් වරක් ලොකු වන්දි මුදලක් ගෙවන්න යෝජනා කර තිබෙනවා. ඒ කියන්නේ, තක්සේරු වටිනාකමට. එතැනින් පසුව ඒ ඉඩම්වලින් ආර්ථික වශයෙන් වැඩි ආදායමක් ලබා ගන්න පුළුවන් බෝග වර්ග වගාවට ඒ අය යොමු කරන්න කියා වෙනම මුදලක් ලබා දෙන්න එකඟතාවක් තිබෙනවා. ඒක ගැන තමයි මේ කමිටුව අවධානය යොමු කරන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මම මේ ඔබතුමාව සමච්චලයට ලක් කරන්න හදනවා නොවෙයි. මම මේ ප්‍රශ්නය මතු කළේ කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය නිකුත් කරපු ඒ ප්‍රකාශය මත පදනම්ව නොවෙයි. මම පිළිගන්නවා, ඔබතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළ බව. මම ඒ කැබිනට් පත්‍රිකාවේ අංකයත් කියන්නම්. ඒ අංකය තමයි 24/0924/612/048. ඔබතුමා ඒ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළේ මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ හරහා ඉදි කරන ලද කරදිය බාධකය හේතුවෙන් සිදු වූ වගා හානි සඳහා වන්දි ගෙවීමට. හැබැයි, මම මේ ප්‍රශ්නය ඔබතුමාගෙන් අහන්න හේතුව මේකයි. වර්තමාන මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන්නේ කවුද? ගරු ජනාධිපතිතුමායි. ගරු ජනාධිපතිතුමා ඔබතුමාගේ කැබිනට් පත්‍රිකාවට එතුමාගේ නිරීක්ෂණ හැටියට ඉදිරිපත් කරන්නේ මොකක්ද? "යෝජනාව පරිදි අදාළ කුඹුරු ඉඩම් සඳහා වූ රජයේ තක්සේරුව එක්වර වන්දි මුදලක් ගෙවා එම කුඹුරු ඉඩම් ඉදිරියේදී වෙනත් සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනීමට හැකි වන පරිදි රජයට පවරා ගැනීම සුදුසු බව නිරීක්ෂණය කරයි" කියලායි. මේවා ඕපාදූප නොවෙයි, ගරු ඇමතිතුමා. මේවා ගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණ; ඔබතුමාගේ කැබිනට් පත්‍රිකාවට ඉදිරිපත් කරපු නිරීක්ෂණ. මේවා පදනම් කර ගෙනයි මම ප්‍රශ්නය ඇහුවේ. මට ඔබතුමාව අපහසුතාවට පත් කරන්න කිසිසේත් වුවමනාවක් නැහැ. කවුරු හෝ "Agrinews" එකට ලබා දුන්නු ප්‍රකාශයක් පදනම් කරගෙන මම ප්‍රශ්න ඇහුවා කියලා ඔබතුමා කියනවා නම්, ඒක වැරදියි. මම මේ ප්‍රශ්නය මතු කරන්නේ රටේ ප්‍රධානියා වන ජනාධිපතිතුමාම කියන කාරණයක් ගැනයි. අවශ්‍ය නම් මම මේ ලේඛනය සභාගත කරන්නම්. මේ අසත්‍යයක් නොවෙයි.

මේ ජනාධිපතිතුමාගේ නිර්දේශය. ඔබතුමා කියන්නකෝ, මම කියන්නේ අසත්‍යක්ද කියලා? මේක අසත්‍යයක් නොවෙයි. ජනාධිපතිතුමා කියනවා, "එක්වර වන්දි මුදලක් ගෙවා එම කුඹුරු ඉඩම් ඉදිරියේදී වෙනත් සංවර්ධන කාර්යයක් සඳහා යොදා ගැනීමට හැකිවන පරිදි රජයට පවරා ගැනීම සුදුසු බව නිරීක්ෂණය කරමි" කියලා. මේවා මගේ වචන නොවෙයි, ජනාධිපතිතුමාගේ වචන. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. මම මේ එකින් එකට ඔබතුමාට ඉදිරිපත් කරන්නේ. ඒ නිසා මම කියන්න ඕනෑ, මේ ප්‍රශ්නය හැදුවේ "Agrinews" එකේ ගිය ඕපාදූප මත පදනම්ව නොවෙයි කියන එක.

මොකක්ද, මේකේ letterhead එක? "කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය" යනුවෙන් ඔබතුමාගේම අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකයෙන් තමයි මේක නිකුත් කළේ, ගරු ඇමතිතුමනි. වරදක්, අඩුපාඩුවක් සිදුවෙලා තිබෙනවා නම් ඒවා හදා ගන්න පුළුවන්. මොකද, ඕනෑම කෙනෙකු අතින් වැරදි සිද්ධ වෙනවා. ඒ වැරදි හදා ගන්නට අපි ඉඩ ප්‍රස්තාව දෙනවා. මම පැහැදිලිව කියන්න කැමැතියි, මේ ප්‍රශ්නය ඕපාදූප මත හදපු ප්‍රශ්නයක් නොවෙයි කියන එක. ඒ වාගේම මම ඔබතුමාට කියන්න කැමැතියි, මේ කාරණයත්. ඔබතුමාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමා නේද, ධර්මකීර්ති මහත්තයා කියන්නේ? *[බාධා කිරීමක්]* එතුමාම යවා තිබෙනවා, අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම පිළිබඳ ලිපියක් තමන්ගේ අමාත්‍යාංශය යටතේ ඉන්න තවත් නිලධාරීන් ගණනාවකට. මම මේවා කියවන්න යන්නේ නැහැ, කාලවේලාව යන නිසා. එහි කියනවා, "අමාත්‍ය මණ්ඩල සන්දේශයේ සඳහන් පරිදි කුඹුරු ඉඩම් රජයේ තක්සේරුවක් මත එකවර වන්දි මුදලක් ගෙවා රජයට පවරා ගෙන වෙනත් සංවර්ධන ක්‍රියාවක් සඳහා යොදා ගැනීමට අදාළව කටයුතු කිරීම පිණිස කමිටුවක් පත් කළ යුතුව ඇත" කියලා. ජනාධිපතිතුමාගේත් නිර්දේශය මේකයි. ඒ කියන්නේ, කුඹුරු ඉඩම් ටික එකවර ගෙවලා රජයට පවරා ගෙන වෙනත් සංවර්ධන කටයුත්තකට යොමු කිරීම. ඒ වෙනුවෙන් ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමාත් නිලධාරීන් ගණනාවකට ලිපියක් යවලා තිබෙනවා, මෙහෙම කමිටුවක් පත් කරනවා, කුඹුරු ඉඩම් එකවර මිලදී අරගෙන වෙනත් සංවර්ධන කටයුතුවලට යෝජනා කරන්න කියලා. ඉතින්, මම ඕපාදූප මත මේ ප්‍රශ්නය ඇහුවා නොවෙයි. මේවා ප්‍රචාර නොවෙයි. රටේ විධායක ජනාධිපතිවරයාගේ කැබිනට් මණ්ඩල නිරීක්ෂණ පදනම් කරගෙනයි මම ප්‍රශ්න අහන්නේ. ඒ නිසා කරුණාකරලා ඔබතුමා සභාව නොමහ යවන්න එපා. මේක කැබිනට් මණ්ඩලය අරගත්ත තීන්දුවක්. ඔබතුමා කැබිනට් පත්‍රිකාව දැම්මේ වන්දි ඉල්ලලා. ඒක මම පිළිගන්නවා. ඔබතුමා යෝජනාවක් දැම්මේ නැහැ, 'කුඹුරු ඉඩම් ටික පවරා ගන්න ඕනෑ. වෙනත් කටයුතුවලට යොදවා ගන්න ඕනෑ' කියලා; මහින්ද අමරවීර ඇමතිතුමා එහෙම කිව්වේ නැහැ. හැබැයි, කොහේද යන්නේ, මල්ලේ පොල් වාගේ උත්තරයක් තමයි දීලා තිබෙන්නේ. වන්දිවලට අමතරව මේකේ දානවා,

'එක්වර දීලා කුඹුරු ඉඩම් ටික රජයට ගන්න' කියලා. ඒ නිසා මේ එක්වර මිලදී ගැනීමක් කියන මතය, කුඹුරු ඉඩම් රජයට ගන්නවා කියන මතය, වී වගාව වෙනුවට වෙනත් කටයුතුවලට යොදනවා කියන මතය ඔබතුමාගේ මතය නොවෙයි, රටේ ජනාධිපතිතුමාගේ මතය. ඒ නිසායි මම මේ ප්‍රශ්නය ඇහුවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මම බොහොම කෙටියෙන් වාක්‍යයක් එකතු කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, ජනාධිපතිතුමා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විධියට ඒ නිරීක්ෂණවල තවත් කාරණයක් කියනවා, ගරු ඇමතිතුමා ඉදිරිපත් කරපු යෝජනාව පිළිගන්නේ නැහැ, ප්‍රතික්ෂේප කරනවා කියලා. එතකොට ඉතා පැහැදිලියි, කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා විධියට ජනාධිපතිතුමා කෘෂිකර්ම ඇමතිතුමාගේ යෝජනා ටික -වන්දි ලබාදීම පිළිබඳ යෝජනා- ප්‍රතික්ෂේප කරමින් එකවර වන්දි මුදලක් ගෙවා ඒවා රජයට පවරා ගැනීම කියන එක කැබිනට් මණ්ඩලය තුළ ස්ථාපනය කරනවා. මෙහිදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ ලිපියේ අන්තිම වාක්‍යයටත් මම අවධානය යොමු කරනවා. එහි කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ධර්මකීර්ති මහත්තයා තමුන්ම ඒ සඳහා වන කමිටුවේ සභාපතිවරයා විධියට හඳුන්වා දෙමින් තමයි තව නිලධාරීන් 5 දෙනෙක් පත් කරලා ලියුම යවන්නේ. අපේ විපක්ෂ නායකතුමා කියපු විධියට ඒ ලිපියෙන් තමයි කියන්නේ, ජනාධිපතිවරයා කියපු එකවර වන්දියක් දීලා රජයට පවරා ගන්න යන ඉඩමේ ඒ තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා මේ ධර්මකීර්ති මහත්තයාගේ සභාපතිත්වයෙන් තව 5දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කරනවා කියලා. එහෙම නම් හරි පැහැදිලියි, කැබිනට් මණ්ඩලය අනුමත කරලා තිබෙන්නේ ගරු ඇමතිතුමාගේ යෝජනාව නොවෙයි කියන එක. ඒක කියනවා නේ, නිරීක්ෂණවල. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ යෝජනාව ප්‍රතික්ෂේප කරනවා. ජනාධිපතිතුමාගේ එකවර වන්දි දීලා රජයට පවරා ගැනීම කියන යෝජනාව කැබිනට් මණ්ඩලය තුළ ස්ථාපනය වෙනවා. ඒක කැබිනට් මණ්ඩලයේ ලේකම්වරයා විසින් යවනවා, අමාත්‍යාංශයේ ලේකම්වරයාට. අමාත්‍යාංශ ලේකම්වරයා තමුන්ම එහි සභාපති විධියට පත් කර ගනිමින් තව 5දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කරනවා. මේ වෙනකොට ඒ කමිටුව පත් කරලා තිබෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ අන්තර්කාලීන වාර්තාවක් සහ අවසාන වාර්තාව එනතුරු කරුණාකරලා ඊළඟ කැබිනට් මණ්ඩල රැස්වීමේදී කියන්න, 'මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න එපා' කියලා. ඔබතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන්ටත් ඒ ගැන කියන්න.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුහුණ විශ්වවිද්‍යාලයෙන් පත් කළ විද්වත් කමිටුව තවම වාර්තාව දුන්නේත් නැති තත්ත්වයක් තුළ,- මීට කලින් වාර්තාවෙත් කියා තිබෙනවා සමහර ඇළවේලි සඳහා ඇතැම් මාර්ග කපා වෙනස් කරන්න ඕනෑය කියලා. එසේ තිබියදී, එම මාර්ග සංවර්ධනය කරන්න දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට යෝජනා අරගෙන තිබෙනවා, බොරලු දමන්න මිල කැඳවීම් කර තිබෙනවා. එහෙම නම් මේ විශේෂ කාරක සභාව පවත්වන එකේ තේරුමක් නැහැ. ඒ නිසා දකුණු පළාත් ආණ්ඩුකාරතුමා ඇතුළු දකුණු පළාත් සභාවේ නිලධාරීන්ටත් මම කාරුණිකව කියනවා, එම ක්‍රියාමාර්ගය නතර වෙන්න ඕනෑ බව.

ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් වන විශේෂ කාරක සභාව ක්‍රියාත්මක වෙලා අවසන් වෙනකම් අමාත්‍ය මණ්ඩලයටත්, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන සය පුද්ගල කමිටුවටත් ඔබතුමා දැනුම් දෙන්න, ක්‍රියාමාර්ග ගැනීම තාවකාලිකව නවත්වන්න කියලා. ඔබතුමා එහෙම ප්‍රකාශයක් කරන්න. එතකොට අපට විතරක් නොවෙයි, නිල්වලා ගං මිටියාවතේ ඉන්නා ගොවීන්ටත් යම් කාලයක් හෝ සැනසීමක් ඇතුව ඉන්න පුළුවන්. ඊට පසුව අපි මේ ගැන අවසාන තීන්දුවක් ගනිමු, කමිටුවෙන්.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, මම මේ සම්බන්ධව ගරු ජනාධිපතිතුමා සමඟත් සාකච්ඡා කළා. ඒ වාගේම කැබිනට් මණ්ඩලය තුළත් අපි දීර්ඝව සාකච්ඡා කළා. මේ කිසිදු ඉඩමක් රජයට අරගෙන තබා ගන්න අවශ්‍යතාවක් නැහැ. ඔබතුමා දන්නවා, මේ වෙනකොට රජය සතුව තිබෙන ඉඩම්වලින් පවුල් ලක්ෂ 20කට ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන බව. ජනතාවට එම ඉඩම් ලබා දෙනවා. එහෙම එකේ ආණ්ඩුවට ඉඩම් අරගෙන තබා ගන්න වුවමනාවක් නැහැ. මෙතැනදී සංවර්ධන කටයුතු කියන එකෙන් අදහස් කළේ ඔබතුමන්ලා කියන කාරණය නොවෙයි. අපි මේ ගැන දීර්ඝව සාකච්ඡා කළා. මේ වචනවල අඩු පාඩු තිබෙන්න පුළුවන්. අපිට උපදෙස් ලැබුණේ මේ ඉඩම් ආර්ථික වශයෙන් වටිනාකමක් තිබෙන භෝග වගා කිරීම සඳහා යොදා ගැනීමට ඒ අයට මූල්‍යමය දායකත්වයක් ලබා දෙන්න කියලායි. ඒ කියන්නේ, අර වන්දි මුදලට අමතරව තව ආධාර මුදලකුත් දීලා, තාක්ෂණික සහායත් ලබා දීලා ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් කරන්න කියායි. ඉතින් එම යෝජනාවට අකමැත්තක් තිබෙනවා නම් මම යෝජනා කරන්නම්, වහාම එය නතර කරන්න කියලා. ඒ වාගේම අපේ කමිටු ක්‍රියාකාරිත්වයත් මම තාවකාලිකව නවත්වන්නම්. අපි හිතන විධියට, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවෙන් දෙන තීන්දුව තමයි ඉතාම වැදගත් වෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලාගේ යෝජනාවලිය ඉතාම කඩිනමින් එවන්න. ඒක මම කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා ලබන සතියේ හෝ අවශ්‍ය පියවර ගන්නම්. මම නැවත කියනවා, මේ ඉඩම් ආණ්ඩුවට පවරා ගන්න හෝ වෙනත් කිසිම අවශ්‍යතාවක් සඳහා යොදා ගන්න කටයුතු කරන්නේ නැති බව. මම මේ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළේ ගොවි ජනතාවට සහනයක් ලබා දීම සඳහා ඉතාම හොඳ හිතින්ය කියන එකත් මම මතක් කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විපක්ෂ නායකතුමනි, දැන් ලොකු වෙලාවක් ගත වෙලා තිබෙන්නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් ලබා දෙන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා හොඳ හිතින් ඒ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළ බව මම කිව්වා. ඒකට ජනාධිපතිතුමා හොඳ හිතින් දුන් නිරීක්ෂණ ටික මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා, හැමෝගේම දැන ගැනීම පිණිස.

මම දන්නේ නැහැ, ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමාත් ජනාධිපතිතුමාගේ නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමට ඔබතුමාගේම අමාත්‍යාංශයේ නිලධාරීන්ට උපදෙස් යැව්වේත් හොඳ හිතින්ද කියලා. ඒකත් ඕනෑ නම් මට සභාගත කරන්න පුළුවන්, හැමෝගේම දැන ගැනීම සඳහා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමාගෙන් මට පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් ලොකු වෙලාවක් ගත වෙලා තිබෙන්නේ.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මම කෙටියෙන් අහන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට සභාව කල්තැබීමේ යෝජනාවට අදාළ විවාදය තිබෙනවා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, දැන් මධ්‍යාහ්න දොළහත් පසු වෙලා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මෙය අත්‍යවශ්‍ය කාරණයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
දැන් Adjournment Debate එක පටන් ගන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, දැන් Adjournment Debate එක පටන් ගන්න තිබෙනවා. සභානායකතුමාත් කියනවා වේලාව ගත වෙලා කියලා.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමනි, ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා ලිඛිතව ඉල්ලීමක් කර තිබෙනවා, පැහැදිලි කිරීමකට. එතුමාට මිනිත්තුවක කාලයක් ලබා දෙන්න.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ ප්‍රකාශය මා විසින් මේ අවස්ථාවේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න හේතුව මෙයයි. ඔබතුමන්ලා දන්නවා, -මේ සභාවේත් කථා වුණා, ගරු ජනාධිපතිතුමාගේ අවධානයත් යොමු වුණා- රුසියානු-යුක්‍රේන යුද්ධයට ශ්‍රී ලංකාවේ විශ්‍රාමික යුද හමුදා සෙබළුන් හා සිවිල් ආරක්ෂක සේවාව තුළ සේවය කළ අය යොමු කිරීම තුළින් දෙරට අතර නිර්මාණය වෙමින් තිබෙන ගැටලුව හා ඔවුන් මුහුණ දී තිබෙන ගැටලු පිළිබඳව. ඒ සම්බන්ධයෙන් රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීමක් පසුගිය දවස්වල සිද්ධ කළා. මේ සිද්ධියෙන් පසුව නිර්මාණය වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව නිශ්චිතව පාර්ලිමේන්තුවටවත්, රටටවත් වාර්තා නොවුණු නිසා, එම නියෝජිත කණ්ඩායම විධියට අපි එකඟතාවකට ආවා, පාර්ලිමේන්තුවට මේ පිළිබඳව වාර්තා කරන්න. ඒ අනුව තමයි මගේ මේ විශේෂ ප්‍රකාශය ඉදිරිපත් කරන්නේ. මේ ඉදිරිපත් කිරීමට මම විනාඩි දහයක කාලයක් ඉල්ලුවා. විනාඩි දහයක් කෙසේ වෙතත්, ඊට ආසන්න කාලයක්වත් - *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කෙටියෙන් කරුණු ඉදිරිපත් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
ඇත්තටම විනාඩි දෙකකින් මේ කටයුත්ත කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එම තොරතුරු ඇතුළත් වාර්තාව සභාගත කරන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමන්ලාගේ අදහස් පැහැදිලිව කියන්න. ඉතුරු කාරණා සභාගත කරන්න.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ගාමිණී වලේබොඩ මහතා
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
මොඳයි.

අපේ ඉල්ලීම අනුව ආරක්ෂක මණ්ඩලයේදී මේ පිළිබඳව සාකච්ඡා වුණා. අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටියා, කරුණු කිහිපයක් ඉටු කර දෙන්නය කියලා.

ඒ කියන්නේ, මේ ගැටලුවට මුහුණ දුන් පවුල්වල සාමාජිකයන්ගේ තොරතුරු එකතු කරගන්න එක, පැමිණිලි විභාග කරන එක, මේ වෙළෙඳාමට සම්බන්ධ වෙච්ච අයව අත් අඩංගුවට අරගෙන නීතිය ක්‍රියාත්මක කිරීම හා රාජ්‍ය තාන්ත්‍රික කණ්ඩායමක් රුසියාවට යැවීම යන කරුණුයි. විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය මැතිතුමා, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ආරක්ෂක ලේකම්තුමා, විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙක්, අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙක්, අපේ හිටපු තානාපතිවරයා සහ රුසියානු තානාපති කාර්යාලයේ තානාපතිතුමා සහ මා ඇතුළු කණ්ඩායමක් සහභාගි වෙලා ගිය මාසයේ 26, 27 දෙදින තුළ රුසියාවේ නියෝජ්‍ය ආරක්ෂක ඇමතිවරයා සමඟත්, රුසියාවේ නියෝජ්‍ය විදේශ කටයුතු ඇමතිවරයා සමඟත් සාකච්ඡා පවත්වා මේ ගැටලුවලට මුහුණ දී සිටින සෙබළුන්ගේ ඉල්ලීම් සහ ඔවුන්ගේ පවුල්වල ඉල්ලීම් ඉදිරිපත් කරමින් ඔවුන්ගේ ගැටලු නිරාකරණය කරගන්න මැදිහත්වීමක් කළා. එහිදී අපිට දැනගන්න ලැබුණු තොරතුරු අනුව ලංකාවේ සෙබළුන් 1,500ක විතර ප්‍රමාණයක් රුසියානු හමුදාවට බැඳුණා කියලා වාර්තා වුණත්, නැවත ගෙන්වාගන්න කියලා අපෙන් ඉල්ලීම් කර තිබෙන්නේ, රජයෙන් සහ ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කරලා තිබෙන්නේ සෙබළුන් 467ක පිරිසක් සම්බන්ධයෙන් පමණයි. ඒ සෙබළුන් 467දෙනා ගැන තමයි අපි රුසියානු රජයත් එක්ක සාකච්ඡා කළේ. මීට අමතරව, රුසියාවේ ඉඳලා යුක්‌රේන අත් අඩංගුවට පත් වෙලා ජීවග්‍රහයෙන් ඉන්න සෙබළුන් 13දෙනෙකු පිළිබඳවත් තොරතුරු වාර්තා වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සමස්ත සාකච්ඡාවල සාරාංශය ගත්තාම රුසියානු රජය කියන්නේ, "මේක නීත්‍යානුකූල ගිවිසුමක්. රුසියානු රජයේ ආරක්ෂක හමුදාවට බඳවාගෙන තිබෙන්නේ අවුරුද්දක කාලයක් සඳහා" කියලායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ බඳවාගත්ත අයට රුසියානු පුරවැසිභාවය දෙනවාය කියලා ඔවුන් පොරොන්දු වෙලා තිබෙනවා. ඒ අනුව ඔවුන් එම සාකච්ඡාවේ දී ප්‍රකාශ කළා, මේ වෙනකොට බඳවාගෙන තිබෙන එම සෙබළුන්ගෙන් සියයට 96කට රුසියානු පුරවැසිභාවය ලබා දීම සම්බන්ධයෙන් ලිපිලේඛන process කරලා එය ලැබෙමින් පවතිනවා කියලා. අද වෙනකොට අපේ ඇතැම් සෙබළුන්ට රුසියානු පුරවැසිභාවය හම්බ වෙලා, ඒ පාස්පෝර්ට්වල copies පවා අපිට එවලා තිබෙනවා. ඒ නිසා ඔවුන්ට නීත්‍යානුකූලව ඒකෙන් ඉවත් වෙන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ පිළිබඳව දිගු ක්‍රියාවලියක් ඉටු කළ යුතුයි කියන ප්‍රකාශය තමයි ඔවුන්ගේ පැත්තෙන් ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඒ වාගේම ලංකාවෙන් විතරක් නොවෙයි, ඉන්දියාව, පාකිස්තානය, නේපාලය, භූතානය සහ අප්‍රිකානු රටවල් ඇතුළු තවත් රටවල් විශාල සංඛ්‍යාවකින් 10,000 ඉක්මවපු සෙබළුන් සංඛ්‍යාවක් මේ සඳහා සම්බන්ධ වෙලා තිබෙන නිසා අපේ රට සම්බන්ධයෙන් විතරක් විශේෂයෙන් අනුගමනය කරන්න ක්‍රියාවලියක් නැහැ කියලා ඔවුන් ප්‍රකාශ කළා.

මේ ප්‍රශ්න පිළිබඳව අපට කියපු, අපව විශ්වාස කරපු, මේ ගැටලුව අපට ගෙනාපු අයගේ ඉල්ලීම් වෙනුවෙන් අපි එදා ඉඳලා පෙනී සිටියා. ඔවුන්ට සාධාරණය ඉෂ්ට කරන්න, ඔවුන්ගේ පවුල්වලට සාධාරණය ඉෂ්ට කරන්න අපි කටයුතු කරමින් ඉන්නවා. රජය පැත්තෙන් අපට මේ කටයුත්තට විශාල සහයෝගයක් ලබා දුන්නා. අපි ඒකට රජයට ස්තුතිවන්ත වෙනවා. මේ සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයත් යම් ප්‍රමාණයකට මැදිහත් වුණා. නමුත් එදා සාකච්ඡාවේ දී රුසියානු රජයට අපි ඉදිරිපත් කළා, මේ කටයුත්ත මෙතැනින් ඉදිරියට කරගෙන යාම සඳහා ඒකාබද්ධ රාජ්‍ය තාන්ත්‍රික යන්ත්‍රණයක් හදන්න කියලා. රුසියානු නිලධාරීන්, අපේ තානාපති නිලධාරීන් හා අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළත් කරලා ඒකේ TOR එක අපි භාර දුන්නා. නමුත් අද වෙනකම් රුසියානු රජය පැත්තෙන් ඒ පිළිබඳව ප්‍රතිචාරයක් දක්වා නැහැ. ඒ හේතුවෙන් මේ ගැටලුව එතැන හිර වෙලා තිබෙනවා. ඒ නිසා මම මේ සභාවට කරුණු කිහිපයක් යෝජනා කරනවා.

මේ සම්බන්ධව තව එක ගැටලුවයි තිබෙන්නේ. ඒ තමයි මේ සියලුදෙනා විශ්‍රාමික යුධ හමුදා සෙබළුන් හෝ වෙනත් ආරක්ෂක හමුදාවල විශ්‍රාමික සෙබළුන් වීම. එතකොට විශ්‍රාම වැටුප් ආඥාපනතට අනුව ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවන්න නම්, ඔවුන් ජීවග්‍රහයෙන් ඉන්නවා කියලා අවුරුද්දකට සැරයක් සහතිකයක් ලබා දෙන්න ඕනෑ. දැන් මේ යුධ පෙරමුණේ සිටින සෙබළුන් 467දෙනාගෙන් 250දෙනෙක් විතර ලංකාවත් එක්ක සම්බන්ධීකරණයක් නැහැ. ඒ සම්බන්ධීකරණය නැති තත්ත්වය නිසා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට මේ ලිපිය ලබා දෙන්න බැරිවීම තුළ අද වෙනකොට 34දෙනෙකුගේ විශ්‍රාම වැටුප් අත්හිටුවා තිබෙනවා. මේ සෙබළු රුසියාවට ගිහිල්ලා තිබෙන්නේ තමන්ගේ දේපළ, කුඹුරු, හරකා-බාන, යාන-වාහන, කන කර බඩු -පංචායුධය පවා- උගස් කරලායි. එතකොට ගෙවල්-දොරවල්වලට කිසිම ආදායමක් නැහැ වාගේම දැන් විශ්‍රාම වැටුපත් නැතිවීම තුළ මොවුන් ඉතා අගතිදායක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව තිබෙන සංඛ්‍යාලේඛන පරිශීලනය කළාම අපිට පෙනී යනවා, මේ වසර ඉවර වෙනකොට මේ සෙබළු 467දෙනාගේම විශ්‍රාම වැටුප් නතර වෙන බව. මේක සුවිශේෂී තත්ත්වයක් නිසා මේ පිළිබඳව වෙනම කටයුතු කරන්න රජයට සිද්ධ වෙනවා. ඒ නිසා, මේ පිළිබඳව අධ්‍යයනය කිරීමට විශේෂ කාරක සභාවක් හෝ පත් කරලා, මේ අයගේ ගැටලුව නිරාකරණය වනතෙක් මේ විශ්‍රාම වැටුප් ටික ලබා දීමට කටයුතු කරන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

මේ වෙනකොට රුසියානු රජයෙන් අපිට දැනුම් දීලා තිබෙන්නේ මිය ගිය 17දෙනෙකු පිළිබඳ ගැටලු විතරයි. ඔවුන්ගේ හස්මාවශේෂ ලංකාවට ගෙන ඒම, ඔවුන් භූමදානය කිරීම සහ DNA පරීක්ෂණ දක්වා ගිය පරීක්ෂණ නිමා වීමෙන් පසු තමයි මිය ගිය අයට වන්දි ගෙවන කටයුත්ත ඔවුන්ට සිද්ධ කරන්න පුළුවන් කියලා කියා තිබෙන්නේ. එය ඉතාම මන්දගාමීව සිදු වන ක්‍රියාවලියක් බවට පත් වෙලා තිබෙනවා.

මිය ගිය කෙනෙකුට මේ ගිවිසුම් ප්‍රකාරව විශාල වන්දියක් හම්බ වෙනවා. එය ලබා දීමට මැදිහත්වීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ වාගේම ඒ මිය ගිය අයගේ අවසාන කටයුතුවලට සහභාගිවීම සඳහා ඇතැම් පවුල්වල අය රුසියාවට යන්න කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ සඳහා මැදිහත්වීමකුත් තිබෙනවා. මේ සියල්ල බැලුවාම, ගැටලු රාශියක් නිර්මාණය වෙලා තිබෙනවා. මොකද, මේ සෙබළුන් 467දෙනාගේ පවුල් 467ම ඉතා ගැටලු සහගත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේ වෙනකොට රුසියාවට පත් කරලා ඉන්න අපේ තානාපති පී.එම් අම්සා මහතා ඉතා ඍජුවම මේකට මැදිහත් වෙලා ආරෝග්‍යශාලාවට ගිහිල්ලා අපේ සෙබළුන් ගැන බලනවා. ඒ වාගේම එතැනින් නිදහස් වෙලා එන අයව මුදා ගැනීම කියන කටයුත්තටත් ඍජුව මැදිත්වීමක් කරනවා.

[ගරු ගාමිණී වලේබොඩ මහතා]

ඒ වාගේම රුසියාවට මේ වෙනකොට පනවා තිබෙන සම්බාධක නිසා රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීමෙන් පසු ඔවුන්ට අවශ්‍ය වෛද්‍ය දීමනා, තුවාල සඳහා ගෙවන දීමනා, වැටුප් යනාදිය අතරමැදි ජාවාරම්කාරයන්ට යන්නේ නැතිව මොවුන්ට හම්බ වෙන්න පටන් අරගෙන තිබෙනවා. නමුත්, ඒ මුදල් ලංකාවට එවන්න විධියක් නැහැ. මොකද, පනවලා තිබෙන සම්බාධක නිසා ලංකාවට මුදල් ප්‍රේෂණය කිරීමේ හැකියාව නැහැ. ඒ ගිණුම්වල මුදල් එකතු වෙනවා. රුසියාවේ සිටින මේ ජාවාරම්කාරයෝ ලංකාවෙන් ගිහිල්ලා සිටින අය, ඉන්දියාවෙන් ගිහිල්ලා සිටින අය, මිනිස් ජාවාරමේ මැද සිටින අය. ඒ වාගේම ලංකාවේ මේ හමුදා සෙබළුන් මිනිස් ජාවාරම හරහා එහෙට යවන්න මැදිහත් වෙච්ච අයත් විශ්‍රාමික හමුදා නිලධාරීන් කියලා තමයි අත් අඩංගුවට ගත්තේ. ඔවුන් මේ හමුදා සෙබළුන්ගේ ගිණුම්වලට වැටෙන සල්ලි අතරමහදී ගසා කනවා. ඉතින් මෙවැනි සංකීර්ණ තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. තවම මේ පවුල්වල අයට සම්පූර්ණ සාධාරණත්වය ඉෂ්ට කරන්න අපට හැකියාවක් ලැබුණේ නැහැ, රජයක් විධියට. මේක බරපතළ ගැටලුවක්. ඒ වාගේම ලංකාවයි, රුසියාවයි අතර අතීතයේ සිට පැවැතෙන විශාල රාජ්‍ය තාන්ත්‍රික බැඳීමක් තිබෙනවා. රුසියාව අපේ වෙළෙඳ හවුල්කරුවෙක්, අපේ ආරක්ෂකයෙක්; එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ දී අපට සම්බාධක පනවපු අවස්ථාවල දී අපිට සහාය දැක්වපු මිත්‍රශීලී රාජ්‍යයක්. ඒ නිසා රාජ්‍ය තාන්ත්‍රික ගැටළුවක් ඇති නොවන ආකාරයට කටයුතු කරන්න ඕනෑ. ඔවුන්ට විරුද්ධව නඟන හඬක් නොවෙයි මේක. ඔවුන්ට පක්ෂව නඟන හඬක් මේක. ඒ නිසා මේ දෙ රට අතර තිබෙන මිත්‍රත්වයට බාධා ඇති නොවන ආකාරයට මේ ගැටලුව විසඳා ගැනීමට නම් පාර්ලිමේන්තුව -ව්‍යවස්ථාදායකය - තුළින් විශේෂ කාරක සභාවක් පත් කරලා ඒ තුළින් මේ සඳහා හොඳ ප්‍රවේශයක් ගන්නා ලෙස මේ ගරු සභාවට මම යෝජනා කරනවා. මේ ගැටලුව සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී අපිව විශ්වාස කරපු අයට සාධාරණය ඉෂ්ට කරන තෙක් අපි මේ කටයුත්තේ රැඳී සිටින බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 10.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු නීතිඥ මධුර විතානගේ මහතා.

Order, please! මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා] මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair and DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] took the Chair.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Could we take the time allotted for the lunch break also for the Debate?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Sure.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Does the House agree?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Time has been consumed by the Opposition.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. Madhura Withanage to move the Adjournment Motion.

කෘත්‍රිම බුද්ධි තාක්ෂණය හරහා කරනු ලබන අනිසි ක්‍රියාකාරකම්වලින් සමාජය ආරක්ෂා කිරීම සඳහා නව නීති

செயற்கை நுண்ணறிவூடாக மேற்கொள்ளப்படும் தீங்கான செயற்பாடுகளிலிருந்து சமூகத்தைப் பாதுகாப்பதற்கான புதிய சட்டங்கள்

NEW LEGISLATIONS TO PROTECT SOCIETY FROM ARTIFICIAL INTELLIGENCE-RELATED HARMFUL ACTIVITIES

[අ.භා. 12.15]

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ලෝකයේ ජීවත්වන විවිධාකාරී වූ ජීවීන් සමූහ අතර, ඉහළින්ම වැජඹීමට මිනිසාට නිරන්තරයෙන්ම හැකියාව ලැබී ඇත්තේ මිනිසා සතු වූ බුද්ධිය නිසාමය. නමුත්, අද වන විට ඒ හා සමාන කෘත්‍රිම බුද්ධියක් මිනිසා විසින් ම නිපදවා ඇත. කෘත්‍රිම බුද්ධිය (AI) යන්නෙන් අදහස් කරන්නේ ඇල්ගෝ රිදම් සංයෝජනය තුළින් මිනිස් මොළයේ හැකියාවන් ප්‍රති නිෂ්පාදනය කිරීම සඳහා නිර්මාණය කර ඇති යන්ත්‍ර මඟින් ක්‍රියාත්මක කරන බුද්ධි මෙහෙයවීමය.
>
> කෘත්‍රිම බුද්ධිය යනු සංජානනය, කථන හඳුනා ගැනීම, තීරණ ගැනීම සහ ගැටලු විසඳීම වැනි සාමාන්‍යයෙන් මානව බුද්ධිය අවශ්‍ය වන කාර්යයන් ඉටු කළ හැකි පරිගණක පද්ධති සංවර්ධනය කිරීමයි. මේ වන විට රට තුළ ගෝලීය තාක්ෂණය අවිචාරවත් බලපෑම නිසා අපේ රටත් සමාජයත්, ආගමත් එහි බලවත් ගොදුරක් බවට පත් වී ඇත. වසර 2500කට එහා ගිය බලවත් සංස්කෘතියක් තිබෙන රටක් වන අප රටේ සංස්කෘතියට හා සංස්කෘතික අනන්‍යතාවට මේ වන විටත් කෘත්‍රිම බුද්ධි තාක්ෂණය බලපෑම් කරමින් ඇත. රටක් විනාශ කිරීමට පහසුම මඟ රටේ සංස්කෘතිය විනාශ කිරීමයි. මේ වන විටත් බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය හා ඒ ගාථා සූත්‍ර කෘත්‍රිම බුද්ධි තාක්ෂණය ඔස්සේ විනාශ කිරීම ආරම්භ කර ඇත. උදාහරණයක් ලෙස කරණීය මෙත්ත සූත්‍රය ඩී.ජේ. සංගීතය සමඟ මිශ්‍ර කර අන්තර්ජාලයට මුදා හැර ඇත. අනෙකුත් ආගම් ද මෙම තර්ජනයට ලක් ව ඇත.
>
> කෘත්‍රිම බුද්ධි තාක්ෂණය ඔස්සේ සිදු කරන සමහර ක්‍රියාකාරකම් හේතුවෙන් අපහසුතාවට හා අගතියට පත්වන පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නීති රීති මේ වන විටත් වෙනත් රටවල සම්පාදනය කර ඇත. අප රටේ ද මෙම නීති සම්පාදනය කර කෘත්‍රිම බුද්ධි තාක්ෂණය ඔස්සේ සිදු කරනු ලබන අකටයුතුකම්වලින් සමාජය ආරක්ෂා කර ගැනීම සඳහා වහාම කටයුතු කළ යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද වන විට මේ කෘත්‍රිම බුද්ධිය - artificial intelligence - හරහා අපේ රටට විශාල බලපෑමක් එල්ල වී තිබෙනවා. ඒ තුළින් ජන ජීවිතයට, ජාතික ආරක්ෂාවට, ආගමට, සංස්කෘතියට, ආර්ථිකයට වන බලපෑම් හා හොඳ නරක පිළිබඳව වහාම අපි අධ්‍යයනය කරන්න ඕනෑ. ඒ සඳහා අපි වහාම අවධානය යොමු කළ යුතුයි.

සියලු බෞද්ධයන් කම්පා කරන සිද්ධියක් පසුගිය දා අන්තර්ජාලය හරහා, එහෙම නැත්නම් සමාජ මාධ්‍ය මඟින් අපි දැක්කා. කෘත්‍රිම බුද්ධිය - AI තාක්ෂණය - යොදාගෙන සංගීත ප්‍රසංගයක රූප රාමු යොදාගෙන පිටරටක ඉඳලා කරපු මහා බලවත් අපරාධයක් විධියට තමයි මම මේක දකින්නේ. මෙහිදී කරණීය මෙත්ත සූත්‍රය විකෘති කරලා සමාජ මාධ්‍යයට මුදා හැර තිබෙනවා. සැවැත්නුවරදී භාවනානුයෝගීව සිටි පන්සියයක් භික්ෂූන් වහන්සේලාගේ භාවනා දැහැන බිඳිමින් එල්ල වූ අමනුෂ්‍ය බලවේග දුරු කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් මහානුභාව බලසම්පන්න රතන සූත්‍රය දේශනා කර තිබෙනවා. මෙලොව උපනුපන් දෙව්, මිනිස්, අමනුෂ්‍යයන්ට මෙන්ම ලොව සියලුම සත්ත්වයන්ට මෛත්‍රිය වැඩීමේ අනුහස් කියා දෙන මෙවැනි ම වූ උතුම් දේශනාවක් තමයි මා කලින් සඳහන් කළ විධියට විකෘති කරලා තිබෙන්නේ. මේ සිද්ධියෙන් අප රටේ බෞද්ධ ජනතාව පමණක් නොවෙයි, ලොව වෙසෙන සියලුම ජනතාව මහත් ලෙස කම්පා වුණු බව අපි දැක්කා, මාධ්‍ය හරහා පළ කළ අදහස්වලින්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටටම ආවේණික - උරුම - වූ දේවල් තිබෙනවා. ඒ අතර විවිධ ආගමික ප්‍රකාශ, ආගමික දේශනා, හෙළ සංස්කෘතික අංග, ජන ගායනා, හෙළ සංගීතය, සංගීත භාණ්ඩ, නැටුම්, ක්‍රීඩා සහ තවත් විවිධ කලාවන් ද තිබෙනවා. ඒ සියල්ලම අද අපට ලොකු අභියෝගයක් වෙලා තිබෙනවා. අපට අවුරුදු 2500ක ඉතිහාසයක් තිබෙනවා කියමින් නිකම් පම්පෝරි ගහලා වැඩක් නැහැ. මේ සංස්කෘතික අංගවල මුල් පිටපත් - originals - ආරක්ෂා කරගන්න, තැන්පත් කරගන්න යම්කිසි ක්‍රමවේදයක් අපි හදාගන්න ඕනෑ. එහෙම නොවුණොත් ඒවායේ මුල් පිටපත් මොනවාද, ඒ අංග මොනවාද කියලා විකෘති වෙච්ච ඒවාත් එක්ක සසඳන්න ක්‍රමයක් ඉදිරියේදී නැති වෙනවා. ලෝකය අද ඒ තැනට තල්ලු වෙලා තිබෙනවා. අපට ආවේණික ජන ගීත - ජන ගායනා - දහස් ගණනක් මේ රටේ තිබෙනවා. හැබැයි, ඒවා කිසිම තැනක සංරක්ෂණය කරලා නැහැ. අපේ ක්‍රීඩා ඇතුළු අපට අනන්‍ය වූ දේවල් අද අපි නිසි ක්‍රමවේදයකට සංරක්ෂණය කරලා නැහැ. සංගීත ක්ෂේත්‍රය ගත්තත්, ඒ මුල් පිටපත් එහෙම නැත්නම් මුල් නිර්මාණ, ඒ තනු නිසි ක්‍රමවේදයකට අනුව සංරක්ෂණය කරලා නැහැ. ඒවා සංරක්ෂණය නොකිරීමේ ප්‍රතිඵලයක් විධියට ඉදිරියේදී කෘත්‍රිම බුද්ධිය යොදවා කරන විවිධ විකෘතිතා මත අපට ඒවායේ මුල් පිටපත් සහ විකෘති කරන පිටපත් පිළිබඳව සංසන්දනය කරලා ඒ වෙච්ච අගතිය - හානිය - සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න ක්‍රමයක් නැති වෙනවා.

මේ සභාව තුළ අද උදේ ඉඳන් වැදගත් දේවල් කථා කළා. ඒ වාගේම කිසිම තේරුමක් නැති දේවලුත් කථා කළා. විපක්ෂ නායකතුමාගෙන් පටන් ගත්තාම, තේරුමක් නැති මහා විකාර තොගයක් කරලා පැය දෙකක් පමණ මේ පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කළා. ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලුදෙනාගෙන්ම මම ඉල්ලා සිටිනවා, වහාම ක්‍රියාමාර්ග ගත යුතු, ප්‍රතිපත්ති හැදිය යුතු, කඩිනමින් අවධානය යොමු කළ යුතු කාරණා ගැන මීට වඩා අවධානය යොමු කරන්න කියලා. ඒ සම්බන්ධයෙන් මම තවදුරටත් ඉදිරියේදී අදහස් ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුව විධියට අපි කඩිනමින් එකතු වෙලා මේ කාරණාවලට අදාළ මුල් පිටපත් - original samples - ආරක්ෂා කර ගන්න ක්‍රමයක් හදාගන්න ඕනෑ.

ඒ වාගේම අපේ රටේ ගොඩක් අයට අමතක වෙච්ච දෙයක් තිබෙනවා. මම පසුගිය දවසක පාසල් කිහිපයකට ගියා. ඒ වෙලාවේ මම දරුවන්ගෙන් ඇහුවා, ආතර් සී. ක්ලාක්ව දන්නවාද කියලා. සමහර දරුවන් කිව්වා ආතර් සී. ක්ලාක් කියන්නේ කවුද කියලා දන්නේ නැහැ කියලා. අපි ඒ ගැනත් කනගාටු වෙනවා. සම්මානනීය විද්‍යා ප්‍රබන්ධ ලියපු ශ්‍රී ලාංකික විද්‍යාඥයෙකු වන ආතර් සී. ක්ලාක් මැතිතුමා 2001, 2010, 2061, 3001 වශයෙන් විද්‍යා ප්‍රබන්ධ මාලාවක් ලියා තිබෙනවා. අද ලෝක ප්‍රකට සමාගමක් වන ටෙස්ලා සමාගමේ හිමිකරු වන ඊලෝන් මස්ක් මැතිතුමා ගැන සමහරුන් කියන්නේ මොනවාද? අනාගත ආර්ථිකය භාර ගන්න ඉන්න ජනතා විමුක්ති පෙරමුණේ හඳුන්නෙත්ති විසින් ආර්ථික ඝාතකයා කියලා කියපු ඊලෝන් මස්ක් මැතිතුමා අද මොකක්ද කරන්නේ? ආතර් සී. ක්ලාක් මැතිතුමා විසින් ලියපු විද්‍යා ප්‍රබන්ධයක තිබෙනවා, මොළ වැස්මක් ගැන කථාවක්. ඒ කියන්නේ, මිනිසාට කෘත්‍රිම link එකක්, neuro

[ගරු නීතිඥ මධුර විතානගේ මහතා]

link එකක් සවි කරන එකක් ගැන. ඒ විද්‍යා ප්‍රබන්ධයේ තිබුණු මොළ වැස්ම, ඒ neuro link එක අද යථාර්ථයක් බවට පත් කරන්න ටෙස්ලා සමාගමේ හිමිකරු වන ඊලෝන් මස්ක්ට හැකිවෙලා තිබෙනවා.

ඒ වාගේම තවත් කනගාටුවට කාරණාවක් තිබෙනවා. ඒ තමයි, ආතර් සී. ක්ලාක් පදනම ලංකාවේ තිබුණාට ඒක නමට විතරයි තිබෙන්නේ. ඇමෙරිකාවේ තිබෙන ආතර් සී. ක්ලාක් පදනමේ සභාපතිවරයා විධියට කටයුතු කළේ විලියම් හෙන්රි ඩ්‍රැපර් කියන ආයෝජකයා. ඔහුගේ පුතා තමයි ටිම් ඩ්‍රැපර් කියන්නේ. ඔහු ගිය අවුරුද්දේ ලංකාවට ඇවිල්ලා ගියා. ඒ ටිම් ඩ්‍රැපර් තමයි ටෙස්ලා සමාගමට මුලින්ම ආයෝජනය කරපු පුද්ගලයා වෙන්නේ. එතකොට ටිම් ඩ්‍රැපර්ගේ තාත්තා තමයි ඇමෙරිකාවේ, ආතර් සී. ක්ලාක් පදනමේ හිටපු සභාපතිවරයා. ආතර් සී. ක්ලාක් මැතිතුමා විසින් ඉදිරිපත් කරපු දාර්ශනික කාරණා, එහෙම නැත්නම් ප්‍රබන්ධවල තිබෙන කාරණා අද ලෝකයේ යථාර්ථයක් බවට පත් වෙමින් තිබෙනවා. ඒ වාගේම එදා එතුමා කෘත්‍රිම බුද්ධිය, තාක්ෂණය ගැන ප්‍රබන්ධවල ලියපු කාරණා අද සත්‍යයක් බවට පත් වෙමින් තිබෙනවා. ශ්‍රී ලාංකිකයන් විධියට අපට සතුටක් දැනෙනවා වාගේම කනගාටුවකුත් තිබෙනවා. මොකද, අද මුළු ලෝකයම ආතර් සී. ක්ලාක් කියන නාමය පාවිච්චි කරලා එතුමාගේ අදහස් ක්‍රියාත්මක කරද්දී අපි තවමත් එතුමාට නිසි ගෞරවයක් ලැබෙන තත්ත්වයක් උදා කරලා නැහැ. ඒ නිසා මම මේ ගරු සභාවට යෝජනාවක් ගෙනෙනවා. අපට පුළුවන්, "ආතර් සී. ක්ලාක් සම්මානය" කියලා සම්මානයක් හදලා මුළු ලෝකයේම ඉන්න විද්‍යාඥයන්ට, නව නිපැයුම්කරුවන්ට ඒ සම්මානය ලබා දිය හැකි ක්‍රමයක් හදන්න. Nobel Prize එක වාගේ දෙයක්. මොකද, ආතර් සී. ක්ලාක් කියලා සම්මානයක් මේ රටේ හදන්න පුළුවන් නම්, ඒ වාගේ සංකල්පයක් ගෙනෙන්න පුළුවන් නම් අපට ලෝකයේම අවධානය ලබා ගන්න පුළුවන් කියා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මිනිස් රූප, වීඩියෝ, ඡායාරූප, කටහඬ පාවිච්චි කරලා විශාල වශයෙන් අපරාධ කිරීමේ ප්‍රවණතාවක් මේ වන විට ලෝකයේ ගොඩ නැඟිලා තිබෙනවා. ඒ වාගේම මේ සම්බන්ධයෙන් සමාජය විශාල වශයෙන් නොමහ ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම මානව ක්‍රියාකාරකම්වලට බලවත් අභියෝගයක් එල්ල වෙලා තිබෙනවා, AI තාක්ෂණය හරහා එහෙම නැත්නම් කෘත්‍රිම බුද්ධිය හරහා.

ඒ වාගේම අපි තවත් කාරණා කිහිපයකට අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන්ම මේ කෘත්‍රිම බුද්ධිය නිසා රටේ විවිධ ක්ෂේත්‍රවලට අද බලපෑම් ඇති වී ගෙන යනවා. පසුගිය කාලය පුරාවටම මම ඒ ගැන යම් යම් ස්ථානවලදී අදහස් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම අපේ අනාගත ශ්‍රම බලකායට විශාල බලපෑමක් එල්ල වෙමින් පවතිනවා. මම මේක විශේෂයෙන්ම කියන්නේ, අපේ අනාගත ශ්‍රම බලකා සැලසුම පිළිබඳව අපි කඩිනමින් අවධානය යොමු කරලා සැලසුමක් හදන්න ඕනෑ නිසායි. මිනිස් මොළය යොදා කරන රැකියා සහ මිනිස් මොළය යොදා නොගෙන කරන රැකියා යනුවෙන් අනාගතයේදී ලෝකයේ රැකියා කොටස් දෙකකට බෙදෙනවා. ඒ අනුව නියත වශයෙන්ම 2025න් පස්සේ ලෝකයේ රැකියා දහස් ගණනක්, මිලියන ගණනක්, ලක්ෂ ගණනක් අලුත් තාක්ෂණයත් එක්ක නැතිවෙලා යනවා.

එහෙම නම් අපි රටක් හැටියට මෙන්න මේ නැති වන රැකියාවලට විකල්ප වශයෙන් අපේ අධ්‍යාපනය සකස් කරන්නේ කොහොමද, අපේ රැකියා වෙළෙඳ පොළ සකස් කරන්නේ කොහොමද කියන එක ගැන කඩිනමින් පාර්ලිමේන්තු කමිටුවක් පත් කරලා මේ පාර්ලිමේන්තුවේදී ඒ ගැන සාකච්ඡා කරන්න ඕනෑ. මොකද, අනාගත රැකියා ගත්තොත්, විශේෂ රැකියා අවස්ථා රාශියක් බිහි වෙනවා වාගේම විශේෂ රැකියා අවස්ථා රාශියක් නැති වීමේ අවදානමකුත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇමෙරිකාව පුරෝකථනය කරලා තිබෙනවා, 2030 වනවිට ඇමෙරිකාවේ ශ්‍රම බලකායෙන් හතරෙන් එකක් ස්වයංක්‍රීය වෙනවා කියලා. දළ වශයෙන් මිලියන 45කගේ රැකියා නැති වෙනවා කියලා ඒගොල්ලන් පුරෝකථනය කර තිබෙනවා. ඒ වාගේම තමයි ඇමෙරිකාව සහ යුරෝපයේ රටවල් විචාරශීලීව කල්පනා කරලා මේ වනවිට නැතිවන රැකියාවලට විකල්ප විධියට මිනිස් මොළය පාවිච්චි කරලා, මිනිසුන් විසින්ම කළ යුතු රැකියා සම්බන්ධයෙන් විශේෂ අධ්‍යයනයක් කරලා, ඒවාට ප්‍රමුඛතාව දෙන්න කටයුතු කරනවා. මේ කෘත්‍රිම බුද්ධිය සහ සැබෑ මිනිස්සුන්ගේ ක්‍රියාකාරකම් අතර තිබෙන ගැටුම අවම කරලා, ඒ ප්‍රශ්නයට විසඳුම් හොයන්න රටවල් මේ වෙනකොට පෙළඹිලා තිබෙනවා. හැබැයි, අපි රටක් විධියට මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබෙන ප්‍රමාණය මදි කියලායි මට හිතෙන්නේ.

ගරු ජනාධිපතිතුමාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, එතුමා මේ වනවිට ජනාධිපති ලේකම් කාර්යාලයේ Committee on Formulating A Strategy for AI කියලා කමිටුවක් පත් කරලා තිබීම ගැන. ඒ වාගේම මහජන අයිතීන්, සමාජ අයිතීන් වැනි විවිධ වූ අයිතිවාසිකම්වලට කෘත්‍රිම බුද්ධිය හරහා එල්ල වන බලපෑම් පිළිබඳව පුළුල් අධ්‍යයනයක් කරලා, ඒ අධ්‍යයනය තුළින් අනාගත ශ්‍රී ලංකාව නිසි ක්‍රමවේදයකට ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එක ගැන සොයා බැලීමට තමයි මේ කමිටුව ක්‍රියාත්මක වෙන්නේ. ගරු ජනාධිපතිතුමාට මම මේ අවස්ථාවේදී විශේෂ ස්තුතියක් පළ කරනවා, අනාගතයේදී කෘත්‍රිම බුද්ධියෙන් අපේ රටට වන බලපෑම සම්බන්ධයෙන් මේ කරන මැදිහත්වීමට. ගරු කනක හේරත් රාජ්‍ය ඇමතිතුමා එතුමාගේ පිළිතුරු කථාවේදී මේ කාරණා පිළිබඳව මීට වඩා කථා කරයි කියලා මා විශ්වාස කරනවා. ඉතා බලවත් විධියට මෙන්න මේ කෘත්‍රිම බුද්ධිය සහ කෘත්‍රිම බුද්ධියේ ක්‍රියාකාරකම් තුළින් හොඳ වාගේම නරක එක හා සමානව ක්‍රියාත්මක වන වෙලාවේ, මේ ගැටුම සමනයට පත් කරන විධියට ප්‍රතිපත්ති හදන්නේ කොහොමද කියලා අපි රටක් විධියට සොයා බලන්න ඕනෑ. මොකද, අද වනකොට ඉහළ පෙළේ සමාගම් වාගේම රාජ්‍ය යන්ත්‍රණය ව්‍යක්තීය සම්තිවල ව්‍යක්තීය අරගළ පිළිබඳ ඔවුන්ට තිබෙන පීඩනය ගැන සලකා බලා කෘත්‍රිම බුද්ධිය යොදවා, එහෙම නැත්නම් කෘත්‍රිම බුද්ධි තාක්ෂණය යොදවා තමන්ගේ ආයතන, තමන්ගේ සමාගම් පුළුවන් තරම් මිනිස්සුන්ගේ ක්‍රියාකාරකම්වලින් තොරව යන්ත්‍ර සූත්‍රවලට එම ක්‍රියාකාරකම් භාර දෙන්න වැඩි නැඹුරුවක් දක්වා තිබෙනවා. එහෙම ලොකු අවදානමක් ඉදිරියේදී ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම, සමාජයක් විධියට ගත්තොත් දරුවන්ට, කාන්තාවන්ට, සාමාන්‍ය සමාජයට මේ කෘත්‍රිම බුද්ධියේ තාක්ෂණය අද බලවත් විධියට බලපා තිබෙනවා.

ඊළඟට අපි රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් ගත්තොත්, අද රාජ්‍ය ආරක්ෂාවට මේ කෘත්‍රිම බුද්ධියේ බලපෑම විශාල විධියට එල්ල වීමේ ප්‍රවණතාවක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි, පසුගිය කාලයේ ආර්ථිකය සම්බන්ධයෙන් මේ කෘත්‍රිම බුද්ධියේ බලපෑම ඉතා දැඩිව එල්ල වෙලා තිබෙනවා අපි දැක්කා. මේ කෘත්‍රිම බුද්ධිය සම්බන්ධයෙන් අද අපේ තරුණ ප්‍රජාවගේ, විශේෂයෙන්ම වර්තමාන තාරුණ්‍යයේ අවධානය වැඩියෙන් යොමු වෙලා තිබෙනවා. ආණ්ඩු වෙනස් වුණත්, රටේ නායකයෝ මොන විධියට වෙනස් වුණත්, අපි කිසි කෙනෙකුට ලෝකයේ සිදුවන මෙන්න මේ තාක්ෂණික වෙනස්වීම්, තාක්ෂණික පරිවර්තනය, තාක්ෂණික විප්ලවයෙන් ගැලවෙන්න බැහැ. ඒ නිසා අපි විශේෂයෙන් මෙන්න මේ කාරණය ගැන අවධානය යොමු කළ

යුතුයි. ඒ වාගේම රටක් විධියට අපේ රටට අතීතයේ සිට එල්ල වුණු යම් යම් බලපෑම් අධ්‍යයනය කළාට පසුව ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් අපේ රට මීට වඩා දැඩි සැලකිල්ලක් දක්වන්න ඕනෑ කියන එක තමයි මගේ අදහස. ඒ සම්බන්ධයෙන් මේ ගරු පාර්ලිමේන්තුවේ අවධානය යොමු කළ යුතුයි. කෘත්‍රිම බුද්ධි තාක්ෂණය යොදවා අපේ ජාතික ආරක්ෂාවට අනාගතයේදී සිදු වෙන්න තිබෙන බාධා වාගේම ඇති වෙන්න තිබෙන අවදානම පිළිබඳව විශාල වශයෙන් අධ්‍යයනයක් කළ යුතුයි.

ඒ අධ්‍යයනය තුළින් අපි පුරෝකථනය කළ යුතුයි, අපට මොන මොන අංශවලින් පීඩනය එල්ල වෙන්න තිබෙනවාද, ඒ අවදානම මොකක්ද කියන එක. මොකද, පසුගිය කාලය පුරාවටම අපි කළ අධ්‍යයනවලදී දැකපු දෙයක් තිබෙනවා. ඒ කාලයේ එල්ටීටීඊ ත්‍රස්තවාදීන් තමන්ගේ ගුවන් යානාවකින් - අපි ඒ කාලයේ ඒවාට කිව්වේ කුරුම්බැට්ටි ගුවන් යානා කියලා - කොළඹ නගරයට - ආර්ථික බල ප්‍රදේශයට- රාත්‍රී කාලයේ පණිවුඩ එවනකොට මේ කොළඹ නගරය වාගේම අපේ රට කොච්චර භීතියෙන් ඇලළී ගියාද කියන එක ගැන මේ පාර්ලිමේන්තුවේ සිටින ගොඩක් අයට අත්දැකීම් තිබෙනවා. එදා ඒ වාගේ ඉතා සුළු, ප්‍රාථමික තත්ත්වයේ -අදට සාපේක්ෂව එදා ඒක සුළු කාරණාවක්- ආරක්ෂක අභියෝගයකට අපි නතු වුණු වෙලාවේ මුළු රටම භීතියෙන් ඇලළී ගියා අපට මතකයි. නමුත් කෘත්‍රිම බුද්ධිය පාවිච්චි කරලා, ත්‍රස්තවාදීන්ට ඊට වඩා දහස් ගුණයක ලොකු බලපෑමක්, පීඩාවක් මේ රටට අද එල්ල කරන්න පුළුවන්. ඒ නිසා අද ලෝකයම කෘත්‍රිම බුද්ධි තාක්ෂණය තුළින් අපේ රටට වාගේම තමන්ගේ රටවලට වෙන්න තිබෙන බලපෑම සම්බන්ධයෙන් විශාල අවධානයක් යොමු කරලා තිබෙනවා. මේ කාරණාව මම හිතන විධියට දවසක් debate කරලා ඉවර කරන්න පුළුවන් එකක් නොවෙයි. ඒ වාගේම අද වනකොට ගොඩක් සමාගම් Google Assistant, Apple's Siri, Amazon Alexa වාගේ යෙදවුම් හරහා, ප්‍රාථමික මට්ටමේ කාරණාවලින් ඔබ්බට ගිහිල්ලා, අධිතාක්ෂණික ප්‍රවණතාවක් ලෝකයට හඳුන්වා දීලා තිබෙනවා. මම කලිනුත් කිව්වා වාගේ අපේ රට 2030 වර්ෂය වනවිට පුරෝකථනයක් කළ යුතුමයි, කෘත්‍රිම බුද්ධිය හරහා අපේ සමාජයට, අපේ සංස්කෘතියට, අපේ ආගමට එහෙම නැත්නම් අපේ හෙළ සිරිත්-විරිත්වලට වන බලපෑම පිළිබඳව. මොකද, මම මේ පාර්ලිමේන්තුවේදී කලිනුත් කියපු කාරණාවක් තමයි අපේ සමහර originals, එහෙම නැත්නම් අපටම ආවේණික වූ උරුමයන් අපි ආරක්ෂා කරගන්න මහන්සි නොවීම නිසා, උනන්දු නොවීම නිසා සමහර දේවල් අද අපෙන් ගිලිහී ගිහිල්ලා තිබෙනවා කියන එක. උදාහරණයක් විධියට ගත්තොත්, අපට ආවේණික වූ සමහර සංගීත භාණ්ඩවල ශබ්ද අද අපට අයිති නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එහෙම නැත්නම් උඩැක්කි, තම්මැට්ටම්, හොරණෑවලින් නිකුත් වන ශබ්ද අද වනකොට විදේශ රටවල සංගීත භාණ්ඩවල ශබ්දවලට අයිතිවාසිකම් කියන්න පුළුවන් මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මෙන්න මේ තාක්ෂණයත්, කෘත්‍රිම බුද්ධියත්, තාක්ෂණික විප්ලවයත් එක්ක ඇති වී තිබෙන මේ ගැටුමේදී අපේ originals, එහෙම නැත්නම් අපටම ආවේණික වූ අපේ උරුමයන් ආරක්ෂා කර ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපි හදන්න ඕනෑ. එම නිසා අනාගතයේදී අධිකරණ ක්‍රියා මාර්ගවලදී, එහෙම නැත්නම් නීතිමය ක්‍රියා මාර්ගවලදී මුල් පිටපත - original එක - මොකක්ද, duplicate එක, එහෙම නැත්නම් විකෘති කරපු එක මොකක්ද කියලා සන්සන්දනය කරලා හොයන්න පුළුවන් ක්‍රමවේදයක් අපි හදාගන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම නැවත වතාවක් මේ ගරු පාර්ලිමේන්තුවට, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයටත්, විපක්ෂයටත් ස්තුතිවන්ත වෙනවා, අද දවසේ කෘත්‍රිම බුද්ධිය සම්බන්ධයෙන් වූ මේ සංවාදයට අවස්ථාව ලබා දීම සම්බන්ධව.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Jagath Samarawickrama to second the Motion.

ගරු ජගත් සමරවික්‍රම මහතා
(மாண்புமிகு ஜகத் சமரவிக்ரம)
(The Hon. Jagath Samarawickrama)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Eran Wickramaratne. You have 12 minutes.

[අ.භා. 12.37]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අද අපි මේ ගරු සභාවේදී සාකච්ඡා කරන්නේ මධුර විතානගේ මන්ත්‍රීතුමා විසින් කෘත්‍රිම බුද්ධිය සම්බන්ධව ගෙනෙන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳවයි. අද වනකොට විද්‍යාව නිසා ලොකු වෙනස්වීම් සිදු වෙමින් පවතිනවා. ඒවායේ ධනාත්මක පැතිත් තිබෙනවා; ඍණාත්මක පැතිත් තිබෙනවා. විද්‍යාවෙන් ලෝකය වෙනස් වෙනවා. අපි දන්නවා, අවුරුදු 2,000කට ඉහතදී පැවති කෘෂිකර්මය සහ වාරිමාර්ග ක්‍රම දිහා බැලුවාම අපි වාගේ ආසියාවේ රටවල් තමයි ඉදිරියෙන්ම හිටියේ කියන එක. එදා ලොකු වෙනසක් සිදු වුණා.

මට මතකයි, මම කුඩා ළමයෙක්ව සිටි කාලයේ මගේ අම්මා typewriter එකේ වැඩ කළ ආකාරය. මම අවුරුදු 13ක ළමයෙක් හැටියට සිටියදී පොඩි පොතක් ලිව්වා. ඊට පස්සේ ඒ පොත type කර ගන්න පුළුවන් කෙනෙක් හොයාගෙන යන්න මට සිද්ධ වුණා. නමුත් මට එවැනි කෙනෙක් හොයා ගන්න අමාරු වුණා. ඊට පස්සේ කැල්කියුලේටරය ආවා.

ඒක පාවිච්චි කරන්න පටන් ගත්තා. සමහර අය ඒකේ වැරදි හෙව්වා. එහෙම නොවෙයි, එකතු කරන්න ඕනෑ, පොත, පැන්සල පාවිච්චි කරලා එකතු කරන්න ඕනෑ කියලාත් සඳහන් කළා. ඊට පස්සේ ටෙලිෆෝන් එක ආවා. අපි පොඩි කාලයේ තිබුණේ කරකවමින් dial කරන ටෙලිෆෝන් එකක්. ටෙලිෆෝන් එක ලබා ගන්න අවුරුදු 10ක් ලැයිස්තුවක හිටියා. ඊට පස්සේ කොම්පියුටර් එක ආවා. අපි විශ්වවිද්‍යාලයට මුලින්ම යනකොට කොම්පියුටර් එක තිබුණේ කාමරයක. අද කොම්පියුටර් එක තිබෙන්නේ අතේ. ඊට පස්සේ Internet එක හරහා සමාජ ජාල -සමාජ මාධ්‍ය- ආවා. අපි දන්නවා, සමාජ මාධ්‍ය හරහා අපේ ජීවිත කොච්චර වෙනස් වෙලා තිබෙනවා ද කියලා. ඒ වාගේම smartphone එක ආවා. ඉතින්, විද්‍යාවේ දියුණුව නිසා මේ වෙනස්වීම් දිගින් දිගටම සිදු වේගෙන, සිදු වේගෙන යනවා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

දැන් මේ විද්‍යාත්මක වෙනස්වීම් සියල්ල බැලුවොත් සියයට 100ක්ම හොඳයි කියලා කියන්න බැහැ. හැබැයි, ධනාත්මක පැත්ත හුඟාක් වැඩියි, ඍණාත්මක පැතිවලට වැඩිය. දැන් කෘත්‍රිම බුද්ධිය - artificial intelligence - පැමිණීමෙන් අසම සම අතිවිශිෂ්ට බලපෑමක් ලෝකයට ඇති වෙනවා. අපට ඒක හිතන්නවත් බැහැ. මොකද, ඒක විප්ලවකාරී වෙනස්වීමක්. මේක සෞඛ්‍යයට, මුදල් විෂයයට, ගමනාගමනයට, මිනිසුන්ගේ ජීවන තත්ත්වයට විශාල ලෙස බලපානවා. මේ තාක්ෂණය එන එක විශාලම විශාල වෙනස්වීමක්. මේ තාක්ෂණයේ වෙනස්වීමේ ශීඝ්‍රතාව, එහි ධනාත්මක පැත්ත එකින් එකට බැලුවොත්, විශේෂයෙන් BPO industry එකේ, තොරතුරු තාක්ෂණ industry එකේ බැලුවොත්, මේකෙන් automation එක තවත් ඉක්මන් වෙනවා. කාර්යක්ෂමතාව වැඩි වෙනවා. අලුත් අලුත් දේවල් නිර්මාණය වෙනවා. ඒ වාගේම, කෘෂිකර්මයේ වර්ධනය බැලුවොත්, වාරිමාර්ගවලට ජලය බෙදීමේදී තිබෙන වෙනස, පොහොර යෙදීමේදී ඇති වෙන වෙනස බලන්න පුළුවන්. හරියටම දේශගුණය බලලා මේක යොදා ගන්න පුළුවන්. Precision agriculture වෙනුවෙන් හරියට යොදා ගන්න පුළුවන්. මේ, මේක හරහා සිදුවන ධනාත්මක දේවල්.

ඊට පස්සේ සංචාරක ව්‍යාපාරය දිහා බැලුවොත් අපට පේනවා, ඒක personalize කරන්න පුළුවන්; පුද්ගලාරෝපිත නිර්දේශ දෙන්න පුළුවන්. අද කථා කරන්නේ සංචාරක team එක ගැන; group එක ගැන. කොහේද යන්නේ, මොනවාද බලන්නේ, හැමෝටම එක හා සමානව ක්‍රියා කරන්න ඕනෑ කියන එකයි. මේවා ඔක්කෝම වෙනස් වෙන්න යනවා AI හරහා, කෘත්‍රිම බුද්ධිය හරහා. ඒ කියන්නේ, මේවා ඔක්කෝම ධනාත්මක දේවල්. මේ තාක්ෂණය කෘෂිකර්මයට ආවාම කාලගුණ රටාව, සමාජ තත්ත්වය, භෝග සෞඛ්‍යය AI හරහාම දැනගන්න පුළුවන්. මේකෙන් වෙන්නේ ඇත්තටම අස්වැන්න වැඩි වෙන එකයි; නාස්තිය අඩු වෙන එකයි. ඒක තමයි මෙතැනින් සිද්ධ වෙන්නේ.

ලංකාව ආපදාවලට විශාල ලෙස මුහුණ දෙන රටක්. අපේ රටේ හැම තිස්සේම ආපදා සිදු වෙනවා; විශාල ලෙස සිදු වෙනවා. ලෝකයේ තිබෙන රටවල්වලින් ආපදා සිදුවන මුල් රටවල් 10 ඇතුළේ හැමදාම වාගේ ඉන්න රටක් තමයි ලංකාව. දැන් AI හරහා ස්වාභාවික ආපදා ගැන අපට වැඩි වැඩියෙන් දැනගන්න ලැබෙනවා; කලට වෙලාවට ඒ දේවල් දැනගන්න ලැබෙනවා. එතකොට අපට පුළුවන් අපේ හදිසි ප්‍රතිචාර දැක්වීම - emergency response එක - මීට වැඩිය ක්‍රමවත්ව කර ගන්න. ඒකෙන් ජීවිත බේරා ගන්න පුළුවන්. ඒ වාගේම, ආර්ථික හානිය අපට සීමා කර ගන්න පුළුවන්.

ඒ වාගේම, සෞඛ්‍ය ගැන බැලුවත් එහෙමයි. Early diagnosis - කල්තියා රෝග හඳුනා ගැනීම - ගැන බලන්න. අද ගිහිල්ලා scan එකක් කරගත්තොත්, radiologist කියනවා, "මොකක්වත් නැහැ, යන්න." කියලා. අවුරුදු 5කට පස්සේ ගිහිල්ලා scan කරලා බැලුවාම කියනවා, "ආ... ප්‍රශ්නයක් තිබෙනවා; මෙතැන cancer එකක් හරි මොකක් හරි තිබෙනවා" කියලා. අවුරුදු 5කට කලින් scan කළ radiologist ට ඒක හරියට පෙනිලා නැහැ. AI හරහා, ඒ තාක්ෂණය හරහා ඒ තිබෙන දේ මුල් අවස්ථාවේදීම, හරියටම දැනගන්න අවස්ථාවක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තාක්ෂණය අධ්‍යාපනයට ආවාම සාමාන්‍ය අධ්‍යාපනය විතරක් නොවෙයි, පුද්ගල අධ්‍යාපනය පැත්තෙනුත් වෙනසක් සිදු වනවා. දැන් අධ්‍යාපන ක්‍රමය අනුව පන්තිය නේ සලකන්නේ. පන්තියේ ඉන්න ඔක්කෝම ළමයි එක දේ කරන්න ඕනෑ; එක වෙලාවට කරන්න ඕනෑ; එක විධියට හැසිරෙන්න ඕනෑ. ඔය වාගේ මතයක් තමයි තිබෙන්නේ. මේ AI හරහා පුද්ගල අධ්‍යාපනය තුළත් වෙනසක් සිදු වෙනවා. එක එක්කෙනාගේ හැකියාවල වෙනස්කම් දැනගන්නට හැකි වෙනවා. ඒ පුද්ගල අධ්‍යාපනය පැත්තටත් ලොකු වෙනසක් සිදු වේගෙන, සිදු වේගෙන යනවා. ඊට අමතරව උපලේඛනගත කිරීම, ශ්‍රේණිගත කිරීම්, පැමිණීම් ආදී ඔක්කෝම අපට AI හරහා කරගන්න පුළුවන්.

හැබැයි, මෙන්න මේ වාගේ ප්‍රශ්න කිහිපයකුත් ඇති වෙනවා. ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ එක ප්‍රශ්නයක් තමයි, රැකියාවලට ගැටලුවක් ඇති වීම. මොකද, තාක්ෂණය නිසා සමහර රැකියා අහිමි වෙනවා. ඒක ලොකු ගැටලුවක්. අපට ඒකට මුහුණ දෙන්න වෙනවා. ඒ කියන්නේ, හැකියාවන් තිබෙන අය අපට අනිවාර්යයෙන්ම අලුත් හැකියාවන් සඳහා පුහුණු කරන්න වෙනවා, වෙනවාමයි. නමුත් අපට මේ විප්ලවය නතර කරන්න බැහැ. මේ විප්ලවය ඉදිරියට යා යුතු විප්ලවයක්. මොකද, විද්‍යාවට සීමාවක් නැහැ, විද්‍යාවට රටක් නැහැ. රටවල්, සීමා හරහා තමයි විද්‍යාවේ වෙනස්වීම් සිදු වේගෙන, සිදු වේගෙන යන්නේ.

ඒ වාගේම සංස්කෘතිය ආරක්ෂා කිරීම පිළිබඳවත් සඳහන් කළා. ඔව්, ඒ සම්බන්ධයෙන් ලොකු ගැටලු ඇති වෙනවා. නමුත් මෙහි ධනාත්මක පැතිත් තිබෙනවා. උදාහරණයක් හැටියට කිව්වොත්, විවිධ සංස්කෘතිවලට අයත් පුරාවස්තු ආරක්ෂා කිරීමට නවීන තාක්ෂණය හොඳින් භාවිත කරන්න පුළුවන්, යහපත් විධියට පාවිච්චි කරන්න පුළුවන්.

අනික තමයි, නවීන තාක්ෂණය හරහා අපට ගෝලීය ප්‍රේක්ෂකයන් ඇද ගන්නටත් පුළුවන්. ඒක රටකට, ගමකට විතරක් සීමා වෙන්න අවශ්‍ය නැහැ. ඒවායේත් යහපත් දේවල් තිබෙනවා. අපට ඒ යහපත් දේවල් කර ගන්නත් පුළුවන් වෙනවා. ඒ වාගේම අවාසි පැතිත් තිබෙනවා. මම කලින් කිව්වා වාගේ ඒ අවාසි පැති තමයි, සමහර රැකියාවලට අවාසියක් ඇති වෙනවා. ඒ රැකියාවල නිරත අයට නව පුහුණුවක් ලබා දෙන්න වෙනවා. ඒ සඳහා විශාල ආයෝජනයක් කරන්න වෙනවා. ඒ ආයෝජනය ලබා ගන්නේ කොහොමද කියන එක ගැනත් අපි බලන්න ඕනෑ.

ඒ වාගේම AI තාක්ෂණය හරහා සදාචාරාත්මක ප්‍රශ්නත් - ethical ප්‍රශ්න - ඇති වෙනවාමයි. එක ප්‍රශ්නයක් තමයි, කෙනෙකුගේ පෞද්ගලිකත්වය ආරක්ෂා වීමට අභියෝගයක් ඇති වීම. සමහර රටවල් දැනටමත් එවැනි තාක්ෂණය පාවිච්චි කරනවා. අපි එක රටකට ගියාම අපේ මුහුණ බලලා අපි යන හැම තැනක් ගැනම ඒගොල්ලන්ට කියන්න පුළුවන්; අපි යන්නේ කොහේද කියලා ඒගොල්ලන්ට දැනගන්න පුළුවන්. ඒ කියන්නේ, AI තාක්ෂණය හරහා පුද්ගලයාගේ privacy එක නැති කරනවා.

ඒ වාගේම, පුද්ගලයකුට ගරුත්වයක් තිබෙනවා නේ. මෙහිදී ඒ ගරුත්වයත් අඩු වෙනවා. ඒ කියන්නේ පුද්ගල ගරුත්වය අඩු වෙනවා. ඉතින් මානව ප්‍රශ්න රැසක්ම තිබෙනවා. මමත් අනිවාර්යයෙන්ම මේ මතය එක්ක එකඟ වෙනවා. අපට තාක්ෂණය අවශ්‍යයි, විද්‍යාවේ දියුණුව අවශ්‍යයි, ජීවන තත්ත්වය ඉහළට යවන්න අවශ්‍යයි. ඒක කරන ගමන් අපි පුද්ගලයාවයි, සංස්කෘතියේ යහපත් දේවලුයි ආරක්ෂා කරන්න වැඩ පිළිවෙළවල් සකස් කරන්නට ඕනෑ.

යුරෝපීය සංගමය 2018 දී General Data Protection Regulation කියලා නීතියක් ගෙනාවා. ලංකාවේ අපි Personal Data Protection Act එක ගෙනාවේ 2022 වර්ෂයේ. ඒ කියන්නේ, ඊට අවුරුදු 4කට පස්සේ ගෙනාවේ. ඇත්තටම අපේ Personal Data Protection Act එක ක්‍රියාත්මක වෙන්නේ 2024 වර්ෂයේ. ඇත්තටම බැලුවොත්, අපට ඒක ක්‍රියාත්මක කර ගන්න අවුරුදු

6ක් යනවා. ඉතින්, මෙහි ප්‍රමාදයක් තිබෙනවා කියන කාරණය මම සඳහන් කරන්නට ඕනෑ. දත්ත ආරක්ෂා කිරීම අනිවාර්යයෙන්ම අත්‍යවශ්‍යයි, අධිකාරියක් තිබෙන්නට ඕනෑ. ඒකේ දෙකක් නැහැ, අධිකාරියක් තිබිය යුතුමයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have two more minutes.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
කරුණාකරලා මට ඊට වඩා වැඩි කාලයක්, ඒ කියන්නේ මට වෙන්වෙලා තිබුණු සම්පූර්ණ කාලයම දෙන්න පුළුවන්ද කියලා බලන්න.

ඉතින්, මෙහි digitization එකක් කරන්න ඕනෑ. අපේ Personal Data Protection Act එකේ කියනවා, එහි යම් කිසි උල්ලංඝනය වීමක් සිදු වුණොත්, board එකක director කෙනෙක් නම්, ඔහු පෞද්ගලිකව වගකියන්න ඕනෑ කියලා.

Sir, now, I am going to switch on to English because of the limited time. So, definitely, we need to look at both the protection of the individual and the ethical side of things.

The AI Act of the EU was brought in December, 2023 and was published in 2024. It gives an implementation timeline as well. When you look at its implementation timeline, it is very interesting and is a six-year period. - *[Interruption]* Yes, it comes into effect in August, 2024 and six months later, in 2025, the regulations, general provisions and rules on prohibited AI are going to be effective. In May, 2025, the codes of practice are going to be implemented. In August, 2026, high-risk AI systems will come into force and in August, 2027, three years later, they are going to further look at the obligations concerning the high-risk AI systems regulated under the EU law. By 2030, they are going to ensure full compliance with the law. So, if you look at the timeline, it takes six years.

I say that introduction of laws related to AI is inevitable. So, how should we look at it? In the EU Act, there are three basic things they have looked at. The first they have looked at is, the risk-based approach because AI applications are unacceptable in some situations. Therefore, they must be limited, there is no question about it. Unacceptable AI applications such as social scoring by governments are banned. Some governments socially score every individual. Can you imagine that? That is totally unacceptable and they are using AI for it. Therefore, we must reject it. We have chosen a democratic system of life, where the individual's freedom is important. Therefore, we must completely reject it in our law. The second is, transparency and accountability. The EU Act mandates that AI systems should be transparent and accountable. The third is, ethical standards. Ethical standards are very important; ethical principles including respect for human dignity, privacy and non-discrimination are absolutely important. Therefore, we should include them in our law, there is no question about it.

ඉතින්, අපට නීතියක් අත්‍යවශ්‍යයි. හැබැයි මම කියනවා, යුරෝපා සංගමය එය ක්‍රියාත්මක කළාට පස්සේ අපට Personal Data Protection Act එක, ඒ නීතිය ක්‍රියාත්මක කරන්න අවුරුදු 6ක් විතර ගතවෙලා තිබෙන බව. මම කියන්නේ, මේකට එච්චර කාලයක් බලාගෙන ඉන්න බැහැ කියලායි. මොකද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, Netflix එක බලන අය මිලියන 100ක් කර ගන්න අවුරුදු 10ක් ගියා. හැබැයි, ChatGPT එකට මිලියන 100ක් එකතු කර ගන්න අපට මාස 2යි ගියේ. ඔන්න ඕකයි AIවල තිබෙන වෙනස. ඉතින් අපට මේ නීති ගෙන ඒම හදිසියි. ඇත්තටම මෙම යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව මම ගරු මධුර විතානගේ මැතිතුමාට ගෞරවය පුද කරනවා.

මොකද, මේක හදිසියි. අපට මේක ඉක්මනට කර ගන්න ඕනෑ. මේක හදිසි නිසා මම මෙතැනදී යෝජනාවක් ද ඉදිරිපත් කරනවා. මම යෝජනා කරනවා, මේ කාරණය සම්බන්ධයෙන් අපි විශේෂ කාරක සභාවක් වහාම පත් කළ යුතුයි කියලා. මොකද, මේක ඉක්මන් කරන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් ගැටලු - ප්‍රශ්න - හුඟක් තිබෙනවා. අනෙක් රටවල් පිළිගෙන තිබෙනවා, පුද්ගලයාගේ නිදහස හා සංස්කෘතියේ තිබෙන වටිනාකම ආරක්ෂා කරන අතරම අපි තාක්ෂණයට හා විද්‍යාවට තැන දෙන්න ඕනෑ කියන එක. ඒ නිසා මමත් යෝජනා කරනවා, අප මේක ඉක්මනට කළ යුතුයි කියලා. So, I would like to propose this to the House. There are huge advantages in using AI technology. We cannot get in the way of science and development; that is going to happen, anyway. There are no country borders to that and also there are huge advantages in having that. But, with every development, there comes the negatives. Those negatives are related to human life, human rights, societies, communities, community values and ethical and religious values. So, we must see how we could safeguard and protect those. That is why a Select Committee of Parliament is needed, so that we could go into those. Now, we have examples like the legislation adopted by the European Union; there are case studies. So, look at bringing in necessary laws and implementing them. Therefore, I would recommend a Select Committee be appointed becasue AI is a very quickly-changing sphere, with experts also permitted to participate in it so that they could contribute to this process and we could get the best possible law for our country.

Thank you very much, Sir, for the time given.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Jayantha Weerasinghe, PC. You have 13 minutes.

[අ.භා. 12.51]

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. ප්‍රථමයෙන්ම මම ගරු මධුර විතානගේ මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ වාගේ කාලීන මාතෘකාවක්

[ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා]

පිළිබඳව සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන. ඒ වාගේම, ගරු කනක හේරත් රාජ්‍ය අමාත්‍යතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. එතුමා දැන් මෙහි පෙරමුණ ගෙන කටයුතු කරනවා.

මම අහගෙන හිටියා, ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාගේ කථාව. බොහොම වටිනා කථාවක් එතුමා කළා. මේ ක්ෂේත්‍රයේ තිබෙන ධනාත්මක සහ ඍණාත්මක පැත්ත එතුමා පෙන්වා දුන්නා. ඒක ඇත්ත. එහෙම තත්ත්වයක් තමයි දැනට තිබෙන්නේ. අපට මේ තාක්ෂණය ignore කරලා, එහෙම නැත්නම් මේ දිහා නොබලා අහක බලාගෙන ඉන්න බැහැ. මේ තාක්ෂණය ඇවිල්ලායි තිබෙන්නේ. අපි මේකට මුහුණ දෙන්න ඕනෑ; මෙය පාලනය කරමින් මෙයින් අහේනියක් නොවන ආකාරයට සකස් කර ගන්න ඕනෑ. ගරු මන්ත්‍රීවරුන් ඒ ආකාරයේ අදහස් තමයි පළ කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තාක්ෂණය පිට රටවලට මොන තරම් වේගයෙන් ගිහින් තිබෙනවාද කිව්වොත්, දැන් චීනයේ බස් ධාවනය වන්නේ driversලා නැතුව, කොන්දොස්තර නැතුව. මම එය දැක තිබෙනවා. ඔය නිසා තමයි අපේ ගරු මන්ත්‍රීවරුන් කිව්වේ, රැකියා අහිමි වීමේ තත්ත්වයක් තිබෙනවා කියලා. මේ දිහා ඉතා ප්‍රවේශමෙන් බලන්න ඕනෑ. ඒ රටවල මම දැක්කා, බස් එක හරියට වෙලාවට නවත්වනවා, මිනිහෙක් නෑහිනවා, App එක පාවිච්චි කරනවා. ඒ හරහා තමයි ගෙවීම් කරන්නේ. Driver නැහැ, කොන්දොස්තරත් නැහැ; වාහනය යනවා.

මෙයින් ඇති වන අහිතකර ප්‍රතිඵල තිබෙනවා. එකක්, රැකියා අහිමි වීම. තවත් එකක් තමයි, ජාතික ආරක්ෂාවට සහ පෞද්ගලික ආරක්ෂාවට ඇති වන තර්ජනය. මෙයින් ජාතික ආරක්ෂාවට ඇති වන තර්ජනය ගැන කියද්දී මට මතක් වෙනවා, එල්ටීටීඊ ප්‍රශ්න තිබුණු කාලය. ඒ කාලයේ කථාවට කිව්වේ, කොළඹින් මිග් යානාව නග්ගන කොට, අවශ්‍ය ප්‍රතිපාදන අරගෙන ඒගොල්ලෝ උතුරේ ක්‍රියාත්මක වෙනවා කියලායි. මේ තාක්ෂණය බොහොම ඉහළට යනකොට ඔන්න ඔය ප්‍රශ්නය එනවා. ඒ කියන්නේ, ජාතික ආරක්ෂාවට විශාල තර්ජනයක් ඇති වෙනවා. ඒ එක්කම, පෞද්ගලික ආරක්ෂාවටත් මෙය බලපානවා. මේ දෙකම ගැන බලලා, මේ ඔක්කොම ගැන කල්පනා කරලා තමයි අප පියවර ගන්න ඕනෑ. මා හිතන විධියට, දැනටමත් ගරු කනක හේරත් මැතිතුමන්ලා මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්න පටන්ගෙන තිබෙනවා. මම ඒක හුඟක් අගය කරනවා.

මෙහිදී පෞද්ගලික ආරක්ෂාව පිළිබඳ තත්ත්වය මොකක්ද? ඕනෑම කෙනෙකු තව කෙනෙකුගේ මෙච්චර ධනය තිබෙනවා, මොහු ළඟ මෙච්චර සල්ලි තිබෙනවා, මෙොහුගේ සල්ලි තිබෙන්නේ මේ මේ තැන්වල කියලා සමාජයට එළි කළොත් ඒ පුද්ගලයාගේ පෞද්ගලික ආරක්ෂාවට ඇති වෙන තත්ත්වය මොකක්ද? ඒ හා සමහම ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා පෙන්වා දුන්නා ගෞතම බුදුන්වහන්සේට පහර ගහන, බුද්ධාගමට පහර ගහන අවස්ථා; හද කකියවන අවස්ථා ඉදිරිපත් කළා. බෞද්ධ රටක ගෞතම බුදුන්වහන්සේට පහර ගහන්න පුළුවන් නම්, ඒ වාගේ රටක ජීවත් වෙන එකත් සුදුසු නැහැ. මම හිතන විධියට, කිසි කෙනෙකුට මොනම ආගමකටවත් අත තියන්න දෙන්න හොඳ නැහැ. මේ නිසා තමයි ඉතා පැහැදිලි ලෙස අපට අවශ්‍ය කරලා තිබෙන්නේ AI තාක්ෂණය. ඔව්, අපට ඕනෑ, ඒක ප්‍රයෝජනයි. නමුත් ඒක අවභාවිත වීම වැළැක්වීමට කටයුතු කළ යුතුයි. මම හිතනවා ගරු කනක හේරත් මැතිතුමා ඒක පෙන්වා දෙයි කියලා. මොකද, දැනටමත් ගරු ජනාධිපතිතුමා ඒ සඳහා පියවර අරගෙනයි තිබෙන්නේ. මම හිතන්නේ නැහැ කාටවත් කියන්න පුළුවන් කියලා, "මේක දැන් ප්‍රමාද වැඩියි" වාගේ කාරණා. ඒවා කියන්න අවශ්‍ය වෙන්නේ නැහැ. AI තාක්ෂණය මඟින් වන හානිදායක පැත්ත වැළැක්වීමට ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්නේ. දැනටමත් ඒ ගැන කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. දැන් ඒ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් Committee on Formulating A Strategy for Artificial Intelligence - CFSAI - එක පත් කරලා තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා, ගරු ජනාධිපතිතුමා මේ පිළිබඳව දැනටම ක්‍රියාමාර්ග අරගෙන තිබීම ගැන. මම හිතන්නේ නැහැ, "මේක මෙච්චර පරක්කු වුණා, මෙච්චර පරක්කු වුණා කියන" කියන එක සාධාරණයි කියලා. දැනටමත් ඒ ක්‍රියාමාර්ග අරගෙන, ඒකට අවතීර්ණ වෙලා තිබෙන එක අපි අගය කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අනුව දැන් ආරම්භ කරන්න හදන්නේ මොකක්ද? NCAI, ඒ කියන්නේ ජාතික කෘත්‍රිම බුද්ධි මධ්‍යස්ථානය. ඒ මධ්‍යස්ථානය බලසම්පන්න විය යුතුයි; it needs clout and teeth. ඒක ක්‍රියාත්මක කරන්න ජාතික භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා දෙනවා. එතකොට එතැන අනිවාර්යයෙන් අධීක්ෂණයක් වෙනවා. Digital Transformation Agency, නැත්නම් DTA කියන ආයතනයට අනුබද්ධ කරලා, ඒ ආයතනයෙන් මේකේ කටයුතු අධීක්ෂණය කරලා ක්‍රියාත්මක කරන්නයි වැඩ පිළිවෙළ යොදලා තිබෙන්නේ. මම හිතන විධියට ඒක ඉතාම සාධනීය පියවරක්, අද ආණ්ඩුව විසින් අරගෙන තිබෙන.

විපක්ෂයේ ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාත් පෙන්වා දුන්නා මේකේ ධනාත්මක පැත්ත බොහොම තදේට තිබෙන බව. ඒ වාගේම ඍණාත්මක පැත්තකුත් තිබෙනවා. මම සිංගප්පූරුවට ගිහිල්ලා වෛද්‍ය පහසුකම් ලබා ගත්ත වෙලාවක නිකම් App එකක් ගහලා එවන්න කිව්වා. මම එහේ යනකොට කරන්න ඕනෑ ප්‍රතිකාර ටික සේරම ලැහැස්ති කරලා. ඒක තමයි හොඳ පැත්ත. මේකේ ඍණාත්මක පැත්ත තමයි ජාතික ආරක්ෂාවට විය හැකි තර්ජන, පෞද්ගලික ආරක්ෂාවට විය හැකි තර්ජන සහ දැනට කරගෙන යන විධියට ගෞතම බුදුන්වහන්සේට සහ බුද්ධාගමට පහර ගැහීම වැනි කටයුතු. ඒවා නවතින්න ඕනෑ.

දැනට අරගෙන තිබෙන මේ ක්‍රියා මාර්ගය ගැන මම බොහොම සතුටු වෙනවා, ඒ වාගේම සතුට ප්‍රකාශ කරනවා. ගරු මධුර විතානගේ මැතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා, මේ යෝජනාව ගෙන ඒම ගැන. ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා ධනාත්මක කරුණු කිහිපයකට අවධානය යොමු කළාට.

එම නිසා මම බලාපොරොත්තු වනවා, විවිධ රටවල තිබෙන විධියට කෘත්‍රිම බුද්ධිය අවභාවිත කිරීම නතර කිරීමට දැනට අරගෙන තිබෙන ක්‍රියාමාර්ග වැඩිදියුණු කරයි කියලා. මොකද, ධනාත්මක පැත්ත ඉස්මතු වන විධියට සහ ඍණාත්මක ප්‍රශ්න අඩු වන විධියට මේක හසුරුවන එක බොහොම වැදගත් වනවා. මම හිතනවා, ඒක අපට කරගන්න පුළුවන් වේවි කියලා. මොකද, ගරු ජනාධිපතිතුමා දැනටමත් ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙනවා. ඒක මම අගය කරනවා. මොනම රටකවත් සංස්කෘතියට පහර ගහන්න දෙන්න බැහැ. එහෙම ගැහුවොත් රට වැටෙනවා. ප්‍රධාන ආගමට පහර ගහන්න දෙන්න බැහැ. එහෙම ගැහුවොත් රට වැටෙනවා. එම නිසා ඒවා නොකළ යුතුයි. එසේ කිරීමට ඉඩ නොතැබිය යුතුයි. දැනටමත් ඒකට රජය පියවර ගෙන තිබෙනවා. ඒ පියවර සාර්ථක කරගන්න හැකියාව ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා. එසේ ප්‍රාර්ථනා කරමින්, මට කාලය ලබා දුන්නාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Sudarshana Denipitiya. You have 13 minutes.

[අ.භා. 1.00]

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ ගරු මධුර විතානගේ මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්. ලෝකය ගමන් කරනකොට ඒ ලෝකයත් එක්ක අපි ගමන් කළ යුතුයි. මේ දවස් ටිකේම අපි දැක්කා, පනත් ගොඩක් සංශෝධන වෙනවා. පරණ පනත්වල අපේ රටට හිතකර නැති දේවල් තිබෙනවා. සමහර වෙලාවට පරණ පනත්වල දැන් කාලයට ගැළපෙන දේවල් නැති ආකාරයක් තමයි අපි දකින්නේ. එම නිසා ඒ පනත් රටට ගැළපෙන පරිදි, දැන් කාලයට ගැළපෙන පරිදි අලුතින් සංශෝධනය වීමක් අපි දකිනවා. ඇත්තටම මේක තමයි අත්‍යවශ්‍ය වෙන්නේ. මේ රටට අවශ්‍ය වෙන්නේ මේක. මොකද, මුළු ලෝකයම අද ඉස්සරහට ගමන් කරනකොට අපි ඒ තැනට යා යුතුයි. එහෙම අඩියෙන් අඩිය ඉස්සරහට යන්නේ නැතිව අපි එතැනම ඉඳගෙන ලෝකයට ගමන් කරන්න ඉඩ දුන්නොත්, අපට ඒ තැනට යන්න බැරි වෙනවා. අපේ අලුත් පරම්පරාව, අපේ දරුවෝ ඉන්නේ වෙන තැනක. අපි පාසල් ගිය කාලයේ වාගේ නොවෙයි, කුඩා කාලයේ අපි හිටපු විධියට නොවෙයි, දැන් ඉන්න අපේ දරුවෝ ජීවත් වෙන්නේ. මේ වාගේ දේවල්වලින් හොඳ සහ නරක දේවල් ගොඩක් ගන්න තිබෙනවා. කෘත්‍රිම බුද්ධියේ - artificial intelligenceවල - හිතකර, අහිතකර බලපෑම් ගොඩක් තිබෙනවා. මේ සමඟ ගමන් කරනකොට අපේ දරුවෝ අලුත් දේවල් එක්ක ඉදිරියට යනකොට අපි පිටුපස්සෙන් ඉඳගෙන ඒවා නවත්වන්න අවශ්‍ය නැහැ. අපට ඕනෑ ඒ තැනට මේ රට ගෙනියන්නයි.

විශේෂයෙන්ම කෘත්‍රිම බුද්ධියේ - AIවල - හැකියාවන් ප්‍රධාන වශයෙන් තුන් ආකාරයකට වර්ගීකරණය කර තිබෙනවා. එකක් තමයි, weak AI. පුහුණු කරන ලද හෝ පවරන ලද ක්‍රියාව පමණක් සිදු කළ හැකි විධියටත් තිබෙනවා. ඊළඟට තිබෙනවා, strong AI. සාමාන්‍ය විධියට බුද්ධිය මෙහෙයවා සිදු කරන කාර්යයන් තේරුම් ගැනීමට ඒ කියන්නේ, අපි කියන දෙයක් තේරුම් ගන්න පුළුවන් ක්‍රමයටත් AI එක දැන් හැදිලා තිබෙනවා. ඒ වාගේම super AI කියන්නේ, මානව බුද්ධිය අභිභවා යමින් මිනිසා විසින් කරනු ලබන කාර්යයන් මිනිසාට වඩා හොඳින් කිරීමට හැකියාව පැවතීම. ඒ වාගේ තැනකටත් දැන් මේක ගිහිල්ලා තිබෙනවා. මේකෙන් අනාගතය භාර ගන්න ඉන්න දරුවන්ට අභියෝගයක් වාගේම සමහර වෙලාවට ලොකු සහයෝගයක් ද ලැබෙනවා. අපි ගත කරපු කාලය වාගේ නොවෙයි දැන්. මේ ක්ෂේත්‍ර එක්ක ගමන් කරන නොයෙකුත් companies අපි දකිනවා. Tesla Company එකේ තිබෙන අධිතාක්ෂණික මෙවලම් අපට හිතාගන්නත් බැරි තරම් ඒවා. සමහර වෙලාවට driver කෙනෙක් නැතිව vehicles ගමන් කරවන්න පුළුවන් විධියට හැදිලා තිබෙනවා, අපි දකිනවා.

වාහනයට නැඟලා අපි කොතැනටද යන්න ඕනෑ කියලා command එක දුන්නාම, vehicle එක අදාළ ස්ථානයට යනවා. ගරාජ් එකේ park කරන්න කියලා අපි command එක දුන්නාම, ගරාජ් එකේ park වෙනවා. අද තාක්ෂණය අතින් ඒ තරම් ඉස්සරහට ගිහිල්ලා තිබෙන්නේ. මේවා අපේ රටේත් implement කරන්න වෙනවා. එහෙම නැතිව අපි ඉස්සරහට යන්නේ කොහොමද? අපේ දරුවන්ගේ අනාගතය ශක්තිමත් කරන්න නම් ඒ හැම දෙයක්ම එකතු විය යුතුමයි. එහෙම නැත්නම් අපට ඉදිරියට යන්න හම්බ වෙන්නේ නැහැ.

මෙහිදී අපට තිබෙන අභියෝගය, එහෙම නැත්නම් අවාසිය තමයි, මේ තත්ත්වය ශ්‍රම බලකායට ප්‍රශ්නයක් වීම. එය ලෝකයටම තිබෙන ප්‍රශ්නයක්. මේකෙන් ශ්‍රම බලකායට ලොකු ප්‍රශ්නයක් මතු වනවා. නමුත් මොකක්ද කරන්නේ? නියමාකාරයෙන් ඒ වැඩ ටික කර ගන්න නම් නව තාක්ෂණය අවශ්‍යයි. Company එකකට හෝ garment factory එකකට ගිහිල්ලා ඒවායේ වැඩ කෙරෙන විධිය බැලුවොත් අපට පෙනේවී, දැන් සියල්ල කෘත්‍රිමව කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් වෙලා තිබෙන බව. Computer එකෙන් command එක දුන්නාම වැඩ සියල්ලම සිදු වේගෙන යනවා; හරි විධියට ඉතාම ක්‍රමවත්ව සියල්ල සිදු වනවා. ලෝකය මේ ආකාරයෙන් ඉදිරියට යනකොට අපත් අනිවාර්යයෙන්ම ඒ තැනට යා යුතු වනවා. අපට වෙන option එකක් නැහැ. අපි ඒ හා සමානව ඉදිරියට නොයා අපේ cost එක වැඩි කර ගන්නේ ඇයි? අපි මොනයම් හෝ දෙයක් හදන්න Chinaවලට දුන්නාම low cost එකට වැඩේ කරන්නේ ඇයි? ඒකයි හේතුව. අපි යම් නිර්මාණයක් කරලා එය ලංකාවේ හදනවා නම් ලොකු cost එකක් යනවා; වියදම වැඩියි; විශාල වියදමක් වැය වනවා. හැබැයි, අපි ඒ නිෂ්පාදනය Chinaවලින් හෝ වෙනත් රටකින් කර ගන්නකොට cost එක ගොඩක් අඩුයි. ඒ ඇයි? AIවලින් නිෂ්පාදන කරලා cost එක ගොඩක් අඩු කරගෙන ඒ අය ඒ වැඩ ටික කරගෙන යනවා. එම නිසා වියදම - cost එක - අඩුයි. වියදම අඩු නිසා අපට ඉතා අඩු මුදලකට එම නිෂ්පාදන ලැබෙනවා. නව තාක්ෂණය නොමැතිකම තමයි තිබෙන ප්‍රශ්නය. හැබැයි, අප එතැනට යා යුතුයි. අප එතැනට යා යුතු වනවා.

දැන් අවුරුදු 4ක් හෝ 5ක් වයස දරුවෙකුට වුණත් phone එකක් දුන්නොත් ඒ phone එක පාවිච්චි කරන්න පුළුවන් මට්ටමට ඒ අයගේ බුද්ධිය හැදිලා තිබෙන්නේ. Phone එකේ ඒ අයට අවශ්‍ය තැනට යන්න පුළුවන්. ඒගොල්ලන්ට game එකක් play කරන්න ඕනෑ නම්, phone එකේ game එක තිබෙන තැනට යනවා. වයස අවුරුදු තුනේ සහ හතරේ දරුවනුත් ඒ විධියට කටයුතු කරනවා. දරුවන් ගොඩක් advanced; ඒගොල්ලන් අපට වඩා ගොඩක් advanced. හැබැයි, තාක්ෂණය පරිස්සමෙන් පාවිච්චි කරන්න ඕනෑ. ශ්‍රම බලකාය වෙනත් දේවල්වලට යොමු කරලා, ඔවුන්ට හානියක් නොවන සේ නව තාක්ෂණය භාවිත කළ යුතුයි. මෙය ඉතා පරිස්සමෙන් කරන්න ඕනෑ වැඩක්.

ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ඇත්තටම වැදගත්. අපි ටිකෙන් ටික ටිකෙන් ටික තාක්ෂණය අතින් ඉස්සරහට යන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ භාෂා අවබෝධය මේකට ගොඩක් එකතු වෙනවා. ඉදිරියේ දී වෙන දේවල් අපට හිතා ගන්නවත් බැරි වේවි. දැන් වුණත් අපි bookings එහෙම කර ගන්නේ online මඟින් නේ. අපි airport එකට යනකොටත් ඔක්කෝම online හරහා නේ reserve කර ගන්නේ. ඒ විධියට බොහෝ දේවල් online හරහා කරගන්න පුරුදු වෙලා ඉන්නේ. අපි විදේශ රටකට ගිහිල්ලා supermarket එකෙන් බඩු ගන්න ගියොත් self-checkout එකක් තිබෙන්නේ; අපිම බඩු ටික තෝරගෙන, අපිම බිල් එක හදාගෙන, අපිම ගෙවලා එන විධියට තමයි තිබෙන්නේ. ඒවා දැන් ටික ටික අපේ රටේ කොළඹ ප්‍රදේශයටත් ඇවිත් තිබෙනවා. ඉදිරියේ දී ඒ දේවල් රට පුරාම ප්‍රචලිත වෙන්න අවශ්‍යයි. ඒවා සිදු වනවා.

අද අපට ඕනෑ වෙලාවක ඕනෑම දෙයක් සොයා ගන්න ඉතා පහසු ක්‍රමවේද තිබෙනවා. අද phone එක පවා ඒ තත්ත්වයට දියුණු වෙලා තිබෙන්නේ. එතැනට තමයි අපේ දරුවන්ව අපි යොමු කළ යුත්තේ. විශේෂයෙන්ම අපේ පාසල්වලටත් තොරතුරු තාක්ෂණ විෂයය ගෙන යන්න ඕනෑ. දැන් "සුහුරු පන්ති කාමර" ආදී බොහෝ වැඩසටහන් ගැන අපි කථා කරනවා. ඒවා අත්‍යවශ්‍යයි. ආගම් පිළිබඳව සාකච්ඡා කරන Sectoral Oversight Committee එකට මම සහභාගි වුණා. එතැන සිටි සියලුදෙනාම

[ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා]

වාගේ කථා කළේ, අපි දරුවන්ට ආගමික ආභාෂය දෙන්නේ කොහොමද, දහම් පාසල් යන තත්ත්වයට දරුවන් පත් කරන්නේ කොහොමද කියන එක ගැනයි. දරුවා ටියුෂන්වලින් ඇත් කරලා සැහැල්ලු මනසක් ඇති කෙනෙක් බවට පත් කරන්නේ කොහොමද කියන එක ගැන එතැන සාකච්ඡා වුණා. මේ වනකොට education reforms සකස් කෙරෙමින් පවතිනවා. අපේ අධ්‍යාපන ක්‍රමය වෙනස් විය යුත්තේ මොන විධියටද කියලා එහි සාකච්ඡා කරනවා. මොකද, පොත් ගොඩක් කර ගහගෙන තමයි දැන් දරුවෝ පාසල් යන්නේ.

සමහර වෙලාවට පොත් බෑග් එක කිලෝ 30ක්, 40ක් විතර බරයි. සාමාන්‍යයෙන් කිලෝ 20කට වැඩිය බරයි. බෑග් එක පිට කොන්දේ දාගෙන දෙකට නැමිලා තමයි දරුවා පාසලට යන්නේ. "පුතේ, හැම පොතක්ම අරගෙන යන්නේ ඇයි?" කියලා දරුවාගෙන් ඇහුවාම දරුවා කියනවා, "මොන විෂය උගන්වන teacher එයිද දන්නේ නැහැ. කොයි තැනින් අහයිද දන්නේ නැහැ" කියලා. දරුවෝ හැම දෙයක්ම අරගෙන තමයි පාසල් යන්නේ. දරුවාට නිවැරදි අවබෝධය නැතිව සියලු දේවල් අරගෙන ගිහින් ඉල්ලන පොත ලබා දීලා ඒ ගුරුවරයාත් එක්ක කටයුතු කරන්නේ කොහොමද? විදේශ රටවල ප්‍රාථමික අංශයේ ඉන්න දරුවෝ Grade 4 විතර වෙනකම් කිසිම පොතක් අල්ලන්නේ නැහැ. ඒ ගොල්ලන්ට දීලා තිබෙන්නේ activities කරන්න. සෙල්ලම් බඩු නිර්මාණය කිරීම, building blocksවලින් යම් යම් නිර්මාණ කිරීම වැනි දේවල් තමයි කරන්න දීලා තිබෙන්නේ. ඒ දරුවන්ගේ මනස ටිකෙන් ටික හරියට හදලා නිවැරදි තැනකට ගෙනියන්න තමයි ඒ ගොල්ලන් උත්සාහ කරන්නේ. දැන් අපේ තිබෙන ක්‍රමවේදය අනුව මේ හැම දෙයක්ම වෙනස් විය යුතුයි. ඒක තමයි දැන් මේ education reformsවලින් කරන්නේ. මම හිතන විධියට අනාගතයේ හොඳ තැනකට එයි. මොකද, මේකට නීතිය ඇතුළත් වෙන්න ඕනෑ. උගන්වන දේවල්වලට ප්‍රායෝගික දේවල් ඇතුළත් වෙන්න ඕනෑ. ඉගෙන ගන්න දරුවා ප්‍රායෝගික දරුවෙක් කරන්න ඕනෑ. දැන් අපි දකින්නේ ගිරවෙක් වාගේ පාඩම් කරන දරුවෙක්. ගිරවෙක් වාගේ පාඩම් කරපු දරුවෙක් පාසල් අධ්‍යාපනය ලබලා, university එකට ගිහින් අධ්‍යාපනය ලබලා එළියට ආවත් ඔහු ප්‍රායෝගික දරුවෙක් නොවෙයි. අන්තිමට ලෙඩ ගොඩක් සහිත දරුවෙත් තමයි බිහි වෙන්නේ. ඒ ඇයි? ඔහුට කවුරුවත් physical fitness ගැන කියලා දීලා නැහැ; sports කරන්න කියලා දීලා නැහැ. ඔහු දන්නේ නැහැ, ඔහුගේ body එක කොහොමද maintain කරන්න ඕනෑ කියලා. දැන් එහෙම තත්ත්වයකට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා මේ හැම දෙයක්ම ප්‍රායෝගික විය යුතුයි. අපි ප්‍රායෝගික දරුවන් තමයි ඉදිරියේදී බිහි කරන්න ඕනෑ. ප්‍රායෝගික දරුවෙක් බිහි කරන්න නම්, සමාජයට හොඳ ශක්තිමත් දරුවෙක් ගන්න නම් අපේ දරුවන් හැම අතකින්ම පරිපූර්ණ වූ දරුවන් බවට පත් කළ යුතුයි. අපි එකතු වෙලා කරන්න බලාපොරොත්තු වෙන්නේ ඒ කටයුත්තයි. අපි දැන් ලෝකයත් එක්ක ගමන් කරනවා නම්, මේ හැම දෙයක්ම එකතු කරගෙන ගමන් කළ යුතුයි. Tesla Company එක ගැන, ඊලෝන් මාස්ක් ගැන කිව්වාම මේ පුද්ගලයා කවුද කියලා දරුවෝ අහන්නේ නැහැ. එහෙම කිව්වාම ඇත්තටම මේ දරුවෝ හිනාවෙනවා. දරුවෝ දැන් ලෝකයත් එක්ක ඉදිරියට ගමන් කරලා තිබෙන්නේ.

අද phone එකෙන් ඕනෑ දෙයක් කරන්න පුළුවන්. Phone එකට ඕනෑ දෙයක් ගන්න පුළුවන්. ලෝකයේ ඕනෑ දෙයක් ක්ෂණිකව ජංගම දුරකථනයට ගන්න පුළුවන් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ප්‍රශ්නයකට උත්තරයක් ගන්න ඕනෑ නම් "ටක්" ගාලා ගන්නවා. දරුවෝ අන්න ඒ තැනට ගිහිල්ලා. එහෙම නම් අපේ සමාජය එතැනට ගෙනියන්න ඕනෑ. අපි ඒක භාවිත කරන්න ඕනෑ. ගරු ජනාධිපතිතුමා මේ වෙනකොට ඒ අවශ්‍ය කටයුතු සිදු කරගෙන යනවා. කොයි විධියටද දරුවන්ට මේ ආභාසය ලබා දෙන්නේ, මේ රටට මේවා කොහොමද introduce කරන්නේ, අපි සාකච්ඡා කරලා ඉදිරියට ගන්නේ කොහොමද කියලා දැන් ඒ අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතිනවා. අපි හැමෝම බලාපොරොත්තු වෙන්නේ මේ රට - අපේ රට - නව තාක්ෂණයත් එක්ක ඉදිරියට ගන්නයි. ඒකට අවශ්‍ය ශක්තිය ලැබෙනවා කියා මම දන්නවා.

අපි දන්නවා, අපි මොනවා හරි දෙයක් නිර්මාණය කරන්න ගියත්, මොන දේ කරන්න ගියත් කකුලෙන් අදින පිරිසක් ඉන්න බව. ඒවා ගණන් ගත යුතු නැහැ. අපට ඉදිරියට කටයුතු කරගෙන යන්න පුළුවන්. අපට ඉදිරියේදී මේ වැඩ පිළිවෙළ ශක්තිමත්ව පෙළ ගස්වාගන්න පුළුවන්. කෘත්‍රිම බුද්ධියේ - artificial intelligenceවල - හිතකර, අහිතකර බලපෑම් තිබෙනවා. පොඩි, පොඩි දේවල් සාමාන්‍ය මට්ටමින් තිබෙනවා. නමුත් ලෝකය ගමන් කරනකොට අපි ඒ තැනට යා යුතුයි. අපි හැමෝම එකතු වෙලා ඒ තැනට යන්න අවශ්‍ය ශක්තිය ගන්න ඕනෑ. එහෙම වුණොත් තමයි අනාගතය භාර ගන්න ඉන්න දරුවන්ට හොඳ තැනකට ගමන් කරන්න පුළුවන් වෙන්නේ. ලෝකයේ ඕනෑ තැනකට ගිහින් අවශ්‍ය කටයුතු කරන්න, ඕනෑම අභියෝගයකට මුහුණ දීලා ජය ගන්න පුළුවන් තැනකට ඒ අය ගේන්න පුළුවන් නම් අන්න ඒක තමයි අපි අතින් ඉටු විය යුතු වගකීම වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. (Dr.) (Ms.) Harini Amarasuriya. You have eight minutes.

[1.13 p.m.]

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)

Hon. Deputy Chairman of Committees, there is no doubt that artificial intelligence and its related technological advances will have profound consequences on the way we live, the way we work and how we govern ourselves. So, this is an important Debate, where we could discuss logically and rationally both the strengths and the opportunities provided by such technology and how we could safeguard our society from the threats of the new technology while making use of the opportunities it offers. In that sense, I feel this important Adjournment Motion that has been presented today has been framed far too narrowly because the threats from AI and such technology are not confined to just one particular sector, but to many aspects of our lives.

There is no doubt that artificial intelligence has even currently and also in the future will have great implications on us and could be used for economic growth, improving public services, education and for facilitating language use between different communities and cultures. So, there are huge advantages this technology offers in terms of what could be done with it. But, at the same time, there is no doubt that there are threats this technology also brings about. Job

displacement as a result of automation is a serious issue, particularly for a country such as ours where our employment opportunities continue to be restricted. It can also perpetuate economic inequality because access to technology, as we know, is not equal. Access to technology could be very unequal and the more we rely on technology, the more unequal access to technology becomes. There are severe concerns for individual privacy as well as security risks. There is also a great danger that this kind of technology could amplify or perpetuate existing stereotypes and biases and that the way the algorithms work within technology could promote certain kinds of very unhelpful and risky behaviour and attitudes. So, there is no doubt that all of these threats need to be taken into account. Therefore, as a strategy, we have to think about how we combat those threats.

We have to make use of the opportunities this technology offers because we cannot ignore the fact that this technology is advancing and will be available in our society, whether we like it or not, and we need to make sure that we use the opportunities offered by it. It is important that there is education and awareness about this technology and how to use it; there needs to be support for transition to this technology. Also, we must address how we can minimize the threats it could cause to various sectors. We need not only to think about policy and regulation pertaining to this technology, but also how we need to modernize our laws and regulatory processes with regard to different areas on which this technology might have impacted. For example, we may need to look at the labour laws and how technology is transforming the way we work increasingly, where there are gig workers and contract workers who have very fragile contracts and who are offered very little protection and safeguards. We may need to look at these new and unconventional ways in which work is now organized with the advancement of technology and how our labour laws also need to adapt.

Sir, there is no doubt that this technology is going to come and as a society and as a country, we need to be prepared for that; we need to have proper laws and regulatory mechanisms in place to deal with it. We also need to promote the ethical use of technology such as AI. Therefore, we suggest that such a discussion takes into account the broader concerns and that we all engage in a collaborative discussion with those in the industry, the Government, the public as well as the academia in formulating the laws and regulatory mechanisms on managing the new technology that is already with us.

However, it is hard not to be cynical at this point about the Government bringing in this Motion because this Government has demonstrated, over and over again, that it disregards ethics, regulatory frameworks and politicizes any issue to its advantage. So, whether such a Government is capable of dealing with a complex issue such as AI technology and come up with sensible ways to regulate it, in which the ethics around the use of technology could be put into any kind of usable framework, is really doubtful.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have two more minutes.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
Sir, I also want to point out that the greater threat to religion and culture in our society does not necessarily come from technology, but is actually from the politicization of religion and society and the abuse of religion and culture in the name of politics and for political power. I want to point out two such examples and then, I will wind up. Yesterday, the Government issued an apology for enforced cremation of Muslim COVID victims. The implementation of enforced cremation was political opportunism and the apology just before an election is also political opportunism. In that sense, this kind of politically opportunistic behaviour also poses a greater threat, in our mind, to religion and culture. Then, there is a huge problem with regard to the appointment of a principal to the Jaffna Central College. The appointment of a qualified lady selected by the Ministry as the principal has been suspended due to intervention by a powerful politician. Sir, you know that that is not acceptable. The lady who was selected as principal had all the qualifications and yet, a powerful Minister intervened, got her appointment suspended and put someone unqualified in her place. So, these are also issues that we need to deal with. The way in which politics intervene in our education and the cultural and religious lives needs to be looked at. Politicization of the religion and culture for opportunistic motives is an extremely sensitive matter which needs to be handled sensitively. So, just as much as we talk about artificial intelligence and ethical guidelines and framework for that technology, I am sorry to say, we are very cynical about this effort because this Government has not demonstrated, thus far, any principle stand when it comes to ethics and regulatory framework or talked about any dignified way in which we could engage in our political lives.

Thank you very much, Sir, for the time given.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Thushara Indunil Amarasena. You have ten minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Major) Sudarshana Denipitiya to the Chair?

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
Sir, I propose that the Hon. (Major) Sudarshana Denipitiya do now take the Chair.

ගරු නීතිඥ මධුර විතානගේ මහතා
(மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே)
(The Hon. Madhura Withanage, Attorney-at-Law)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනාරූඪ විය.

අතුන්පිරකු, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair, and THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA took the Chair.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

කෘත්‍රිම බුද්ධිය, එහෙම නැත්නම් artificial intelligence ගැන කථා කරද්දී ලෝකය සමඟ සංසන්දනය කරනකොට අපි විශාල ලෙස ප්‍රාථමික මට්ටමක ඉන්න රටක්. විශේෂයෙන් ලෝකය අශ්ව වේගයෙන් ගමන් කරලා තිබෙන වෙලාවක අපි ඉබි ගමනින් යන එක අප වාගේ කුඩා රටකට, සම්පත් අඩු රටකට කොයිතරම් හානිකරද කියන එක දැන් අපට දැනිලා තිබෙනවා. ඇත්තටම මුහුදෙන් වට වුණු, භූමිය සීමිත වුණු, සම්පත් සීමිත වුණු අප වාගේ රටකට මේ කෘත්‍රිම බුද්ධිය, ඒ සුහුරු තාක්ෂණය වැඩි වැඩියෙන් උපයෝගී කර ගන්න අපට අලුත් එළඹුම් තිබෙන්න ඕනෑ කියන දේ අපි අනිවාර්යයෙන් පිළිගන්නට ඕනෑ. අපි ලෝකය සමඟ ඉදිරියට යන්න ඕනෑ. ගෝත්‍රික මතවාද, ළිං මැඩි සංකල්ප අපි අත්හැර දාන්න ඕනෑ. එහෙම ගිහිල්ලා අපට මේ රට ආපසු සිංගප්පූරු මොඩලයට නැඟිටුවා ගන්න පුළුවන්ය කියන කාරණය මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ. අපේ සමහර දේශපාලන කණ්ඩායම් ඉන්නවා, මුහුදු වතුරෙන් සල්ෆියුරික් අම්ලය හදන්න යන. ගෑස් මොකටද කියා අසමින් ගෑස්වලින් දර ළිපට යන්න හදනවා. ඉතින් මේ එකිනෙකට පරස්පර, එකිනෙකට වෙනස් අන්ධභූත මතවාදත් එක්ක අපට තවදුරටත් ගමන් කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා.

ඊළඟට අපේ ජනාධිපතිතුමා ගැන බලන්න. මේ සුහුරු තාක්ෂණය පිළිබඳව, artificial intelligence පිළිබඳව කාලයෙන් කාලයට නොයෙක් දේවල් මතු වෙනවා. මේවා දේශපාලන පොරොන්දු. අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා එක්තරා කාලයකදී බොහොම උජාරුවට, බොහොම ඕනෑකමින් free Wi-Fi ගැන කථා කළා. දැන් free Wi-Fi ගැන කථාව කෙසේ වෙතත්, ඒ තිබ්බිව උනන්දුවත් ඉවරයි. ඒ දර්ශනය ක්‍රියාත්මක වෙන බවක් දැන් අපට පෙනෙන්න නැහැ. දුෂ්කර ප්‍රදේශවල, අඩුපාඩු සහිත ප්‍රදේශවල දරුවන්ට අදටත් data සොයා ගන්න, signals සොයා ගන්න ගස් නඟින්න, පැල් කොටවලට නඟින්න, ගල් උඩට නඟින්න සිද්ධ වෙලා තිබෙන වකවානුවක තමයි මේ free Wi-Fi කතන්දරය එළියට එන්නේ. අද ඒකත් බොරුවක් වෙලා තිබෙන්නේ.

අපි අද සජිත් ප්‍රේමදාස මැතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, එතුමා "සක්වළ" වැඩසටහන රට වටේට අරගෙන ගියා. මම හිතන විධියට දැන් 360වන වැඩසටහන හෝ 370වන සක්වළ වැඩසටහන යටතේ පාසල්වලට සුහුරු පන්ති කාමර ලබා දීලා ඉවරයි. සජිත් ප්‍රේමදාස මැතිතුමාට යම් දැක්මක් තිබෙනවා, මේ සම්බන්ධයෙන් ඕනෑකමක් තිබෙනවා. විශේෂයෙන්ම සජිත් ප්‍රේමදාස මැතිතුමාට දරුවන්ගේ අධ්‍යාපනය ගැන, නවීන අධ්‍යාපනය ගැන, සුහුරු අධ්‍යාපනය ගැන ආකල්පය ආවේ අද ඊයේ නොවෙයි. මීට වසර ගණනාවකට පෙර ඉඳලා පක්ෂ අරමුදලට හම්බ වෙන සල්ලිවලින් තමයි එතුමා මේ සුහුරු පන්ති කාමර දීගෙන යන්නේ. පක්ෂ අරමුදලට ලැබෙන සල්ලි මුට්ට ගහ ගහ ඉන්නේ නැතුව, ඒවා ස්ථාවර තැන්පතුවල දාන්නේ නැතුව තනි පුද්ගලයෙකු හැටියටයි එතුමා මේ කටයුතු කරන්නේ. මේවා රජයක් කරන්න ඕනෑ දේවල්. මම හිතන විධියට අද එහි 360වන වැඩසටහන හෝ 370වන වැඩසටහන වශයෙන් ඉලක්කම් යනවා. ගිය සතිය වෙනකොට එතුමා 350වන වැඩසටහන යටතේ සුහුරු පන්ති කාමර ලබා දෙමින් හිටියා. මේ වෙනකොට 360, 370 වැඩසටහනත් පසු කරලා කියන එක නම් මම දන්නවා. සජිත් ප්‍රේමදාස මැතිතුමාට මේ සුහුරු තාක්ෂණය පිළිබඳව දැක්මක්, උනන්දුවක්, ඕනෑකමක් තිබ්බිව හින්දා තමයි එතුමා ආණ්ඩුවට බැණ බැණ ඉන්නේ නැතුව මේ වැඩ ටික පටන් ගත්තේ. අපේ පක්ෂය ගෝත්‍රික මතවාදවලින් බැහැරව, අන්ත දක්ෂිණාංශික මතවාදවලින් බැහැරව, අන්ත වාමාංශික මතවාදවලින් බැහැරව, මානුෂික ධනවාදයක් ගැන කථා කරන පක්ෂයක්. ඒ වාගේම අපේ පක්ෂය සංස්කෘතිය, සදාචාරය, සභ්‍යත්වය, ශ්‍රී ලාංකික අනන්‍යතාව රැක ගනිමින් නූතනත්වය, ගෝලීය විවිධත්වය, තාක්ෂණය, සුහුරු තාක්ෂණය, සුහුරු කෘෂිකර්මය ආදී සියලු නවීන තාක්ෂණයත් ඇඳාගෙන මැද මාවතේ යන පක්ෂයක්. ඒ නිසා අනිවාර්යයෙන් අපේ දර්ශනය පෙළ ගැස්වෙන්නේ, ඒ සුහුරු තාක්ෂණය සහ සංස්කෘතික සදාචාරය හරහා අපට උරුම ශ්‍රී ලාංකිකත්වයත් අරගෙන, මේ දෙකට මැදින් යන ගමනක් තුළින්ය කියන එකත් අපි මේ අවස්ථාවේදී විශේෂයෙන් කියන්නට ඕනෑ.

දැන් අපේ ආර්ථිකය වළ පල්ලට ගිහිල්ලා ඉවරයි; බංකොලොත් වෙලා ඉවරයි. ගොඩක් අය කටින් බතල හිටවනවා. මේක එදා ඉඳලාම කළා. මේ ආර්ථිකය වළට වැටෙන්න ඔන්න මෙන්න කියා තිබියදී මොළ එකක් නොවෙයි, මොළ හතක් තිබෙන කෙනෙකුට මේ ආර්ථිකය හාර දුන්නා. ඒ තමයි බැසිල් රාජපක්ෂ. එතුමාට මොළ හතක් තිබෙනවා කිව්වා. එතුමා ඇවිල්ලා අපේ ආර්ථිකය ගොඩගත්තා නොවෙයි, එතැනින් පසුව සිද්ධ වුණේ අර වළ කටේ තිබුණු එක වළ ඇතුළටම වැටුණු එකයි. ඊට පසුව රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා මේ රටේ ආර්ථිකය භාර ගත්තා. එතුමා එනකොට කිව්වේ, මොළයක් නොවෙයි, මොළ පුරවපු නැවක් එනවා කියායි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා එනකොට, මොළයක් නොවෙයි, මොළ පුරවපු නැවක් එනවා කිව්වා. දැන් ඒ මොළ පුරවපු නැව මොකක්ද, මේ ආර්ථිකයට කර තිබෙන්නේ? IMF එක ඇතුළු විවිධ මූල්‍ය ආයතනවලින් ණය අරගෙන තිබෙනවා; තව බිලියන 10ක්, 11ක් වැඩිපුර ණය අරගෙන තිබෙනවා; රාජපක්ෂවරුන් ඇරියර්ස් කරපු ආර්ථිකයේ ඇරියර්ස් එක බිල් වැඩි කරලා, බදු වැඩි කරලා, දඩ වැඩි කරලා අහිංසක මිනිස්සුන්ගෙන් කවර් කරගන්න ආර්ථික ප්‍රතිපත්තියක් ගෙනැල්ලා තිබෙනවා. අර මොළ හතක් තිබුණු එක්කෙනා ආර්ථිකය බිමට වැටිටෙව්වා. මොළ පුරවපු නැවක් හැටියට හැඳින්වූ රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආර්ථික ප්‍රතිසංස්කරණය සහ ආර්ථිකය යථා තත්ත්වයට ගත්ත කතන්දරය ඔන්න ඔකයි. ඒ නිසා මෙතැනින් එහාටවත් කෘත්‍රිම බුද්ධිය පාවිච්චි කරලා හෝ කමක් නැහැ වැඩ කරන්න කියන එක මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. දැන් අපට පෙනෙනවා, ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා -මොළ පුරවපු නැව- ආයෙත් ලොකු අන්ජ බජල් එකක් දමන්න හදන බව, අපේ දේශපාලනය තුළ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව දින කිහිපයයි තිබෙන්නේ ජනාධිපතිවරණය පැවැත්වෙන දිනය නම් කරන්න. ජනාධිපතිවරණය කියන ඒ ජනමත විමසීමට තව බොහොම පොඩි කාලයයි තිබෙන්නේ. හැබැයි, එසේ පොඩි කාලයක් කිහිපයක් තිබියදී දැන් ජනාධිපතිතුමා ලැහැස්ති වෙනවා, විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා, අවුරුදු හයේ කථාව පහ ද, හය ද කියා ආපසු හදන්න. අනවශ්‍ය බෝලයක් මේ දමන්නේ. සෙල්ලම් කරන්න ඕනෑ බෝලය ground එකේ තිබියදී, පිතිකරුවන් ground එකට බැහැලා සිටියදී, ක්‍රීඩාව පටන් ගන්න ඒ ආරම්භකයාගෙන් තරග සංඥාව නිකුත් වෙන්න ඔන්න-මෙන්න කියා තිබියදී රනිල් වික්‍රමසිංහ මහත්තයා අමුතු බැලුම් බෝලයක් ගෙනැල්ලා දමනවා, ground එකට. දැන් වෙනම සෙල්ලමක් කරන්න හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සන්සුන්ව ගලාගෙන යමින් තිබෙන මේ මැතිවරණ රටාව වෙනස් කරලා තව එක දවසක් හෝ බලයේ ඉන්න, එහෙම නැත්නම් මේ යන වැඩ පිළිවෙළ අල කරන්න හදන වැඩක් තමයි මේ කරන්න හදන්නේ. මේක හරියට,"පුල්ලි ගොනා ගෙට පැනලා කඹේ කඩා ගෙන, ගෙදර උන්දෑ කොණ්ඩෙ බඳින හවරිය කෑවා" වාගේ වැඩක්. රනිල් වික්‍රමසිංහ මහත්තයාට වාසනාවකට ලැබුණු එම කාල සීමාව විඳලා ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙනවා නම් ඉදිරිපත් වෙලා, දිනලා හෝ පැරදිලා හෝ නම්බුකාර විධියට ඒ වගකීම ඉෂ්ට කරන්නේ නැතුව අර පුල්ලි ගොනා ගෙදරට පැනලා වාගේ,- කන්න තණකොළ නැතුව නොවෙයි නේ. නමුත්, කාලා තිබෙන්නේ හවරිය..

එතුමා මේ ජනාධිපතිවරණය, මේ මැතිවරණ සැලැස්ම අල කරන්න තමයි මේ හදන්නේ. දැන් රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සහයෝගය ලැබෙන්නේත් නැති බවක් තමයි අපට පෙනෙන්නේ. පොහොට්ටු කණ්ඩායමේ මත දෙකක් තිබෙන්නේ. කට්ටියක් රනිල් වික්‍රමසිංහ මහත්මයා හොඳයි කියනවා; තව කට්ටියක් වෙන අපේක්ෂකයෙක් ඉදිරිපත් කරමු කියනවා. නාමල්ගේ එක කණ්ඩායමකුයි, ප්‍රසන්නලා ඇතුළු තව කණ්ඩායමකුයි ඉන්නවා. එතැනත් වැඩේ අන්ජ බජල්. ඒ නිසා අපි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාටත් කියන්න ඕනෑ, කරුණාකරලා මේ වැඩේ අල කරන්න හදන්න එපා, මුට්ටිය පොළොවේ ගහන්න හදන්න එපා කියලා. තමුන්නාන්සේට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් සහයෝගය ලැබෙනවාද, නැද්ද කියන එක තමුන්නාන්සේ විසඳා ගන්න. අපේ මන්ත්‍රීවරුන් තමුන්නාන්සේගේ තරාදියට එනවා කියලා තමුන්නාන්සේ අපේ මන්ත්‍රීවරුන් පාවා දෙන්නත් එපා. මොකද, එනවා නම් එන්න ඉන්නේ සරත් ෆොන්සේකා සහ රාජිත විතරයි. අපේ අනෙක් මන්ත්‍රීවරුන් ඔබතුමාගේ පැත්තට එන්නේ නැහැ. සරත් ෆොන්සේකා මහත්තයා කියන්නේත් අපේ දේශපාලන ධාරාවෙන් ආපු කෙනෙක් නොවෙයි; රාජිත සේනාරත්න කියන්නේත් අපේ දේශපාලන ධාරාවෙන් ආපු කෙනෙක් නොවෙයි. ඒගොල්ලන් හිතන්නේ අපි හිතන විධියට නොවෙයි. දැන් ඒගොල්ලන් බටයක් ඇතුළේ හිර වෙලා ඉන්නේ.

බටේ එහා පැත්තට යන්නත් බැහැ; මෙහා පැත්තට යන්නත් බැහැ. බැරි වෙලාවත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ රනිල් වික්‍රමසිංහ මහත්තයාට සහයෝගය දුන්නේ නැත්නම් රනිල් වික්‍රමසිංහ මහත්තයා ඡන්දය ඉල්ලන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්තයා ඡන්දය ඉල්ලුවේ නැත්නම් රනිල් වික්‍රමසිංහ මහත්තයා වෙනුවෙන් කථා කරන රාජිතලාට ඡන්දය ඉල්ලන්න තැනක් නැහැ. ඒ නිසා අපි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට කියන්නේ මේකයි. අපේ සමගි ජන බලවේගයෙන් නැවත එතුමාගේ පැත්තට එන්න මන්ත්‍රීවරු විසි ගණනක් නැහැ. හැබැයි 35දෙනෙක්, 40දෙනෙක් අපිත් එක්ක එක්කහු වෙලා සන්ධානගත වෙනවා, ලබන මාසයේ 8වැනි දා. එලෙස එන අය එන්නේ සජිත් ප්‍රේමදාස මහත්මයාගේ කඳවුරට මිස රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ කඳවුරට නොවෙයි. ඒ නිසා කරුණාකරලා මේ වැඩේ අල කරන්න එපා; සෙල්ලම් කරන්න තිබෙන බෝලය තියෙද්දි මේ ground එකට වෙන බැලුම් බෝල දාලා මේක විනාශ කරන්න එපා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. (Dr.) Sarath Weerasekera. You have 13 minutes.

[අ.භා. 1.33]

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි අද කථා කරන්නේ කෘත්‍රිම බුද්ධිය ගැන. ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මෙම සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගෙන ඒම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, අද වනකොට තාක්ෂණය කියන එක තත්පරයෙන් තත්පරයට තමයි දියුණු වෙන්නේ කියලා. මීට අවුරුදු 50කට, 60කට ඉස්සෙල්ලා අපිට කොළඹ ඉඳන් ගාල්ලට දුරකථන ඇමතුමක් - trunk call එකක් - ගන්න මම හිතන විධියට පැයක්, පැය දෙකක් පමණ ගත වුණා. නමුත් අද අපිට ලෝකයේ ඕනෑම තැනකට තත්පරයකින් කථා කරන්න පුළුවන් වාගේම එලෙස කථා කරන පුද්ගලයාගේ රූපය පෙනෙන පරිදි ඒ පුද්ගලයා සමඟ ඉතා සමීපව කථා කරන්නත් පුළුවන්. ඒ තාක්ෂණය අද අපේ ජංගම දුරකථනයේ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට වැරදිලා තිබෙන තැන මෙකයි. තාක්ෂණය දියුණු වනකොට ඒ හා සමාන්තරව ආධ්‍යාත්මික ගුණයත් - spiritual aspect එකත් - අපි දියුණු කරගන්න ඕනෑ. එහෙම නැති වුණොත් අපට මහා විනාශයකට මුහුණ දෙන්න සිදු වෙනවා. අපි දන්නවා, ඕපන්හයිමර් තමයි පරමාණු බෝම්බය නිෂ්පාදනය කළේ - සොයා ගත්තේ - කියලා. ජපානයට පරමාණු බෝම්බ දාලා ලක්ෂ දෙකක් මිය ගියා. ඊට පස්සේ වසර ගණනාවක් යනතුරුම ඒකේ බලපෑම ඒ රටට තිබුණා. ඒ වාගේම අපි දන්නවා, ඩයිනමයිට් නිපදවුයේ ඇල්ෆ්‍රඩ් නොබෙල් කියලා. ඔහුට තිබුණා, බෝම්බ කර්මාන්තශාලා. ඔහු බෝම්බ කර්මාන්තශාලා 90ක හිමිකරුවෙක්. මේ සියලුදෙනාම ලෝකයේ ඉතා සුපතළ, දක්ෂ භෞතික විද්‍යාඥයෝ. නමුත් ඔවුන්ට ආධ්‍යාත්මික දියුණුවක් තිබුණාද කියන එක ගැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

අපි දන්නවා, "ප්‍රවෘට්මි වා නිවෘට්මි වා ජනානා විදුරා සුරා" යනුවෙන් භගවත් ගීතාවේ තිබෙන බව. ඒකෙන් කියන්නේ, යක්ෂ බුද්ධිය - demonic intelligence - කියන එකට හොඳ, නරක තේරුම් ගන්න බැහැ කියන එකයි. සත්‍ය සහ යහපැවැත්ම කියන එක ගැන මේ කෘත්‍රිම බුද්ධියට තේරුමක් නැහැ. ඒ නිසා ආධ්‍යාත්මික ගුණයක් නැති කෘත්‍රිම බුද්ධිය විනාශයට හේතු වෙන්න පුළුවන්. ඒක න්‍යෂ්ටික බෝම්බයක් වෙන්න පුළුවන්; ඩයිනමයිට් වෙන්න පුළුවන්; කෘත්‍රිම බුද්ධියක් වෙන්න පුළුවන්. ඒ සියලු දෙයකම ආධ්‍යාත්මික ගුණයක් නැත්නම් ඇත්ත වශයෙන්ම ඒක මහා විනාශයකට හේතු වෙනවා. වර්තමාන කෘත්‍රිම බුද්ධිය - AI - කියන එකේ ඒ ආධ්‍යාත්මික ගුණය තිබෙනවාද කියන එකයි අද ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන්නේ.

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී ඉතා වැදගත් කාරණය මෙයයි. මේ කෘත්‍රිම බුද්ධිය කියන සංකල්පය අපේ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ පාවිච්චි කරලා තිබෙනවා. ඒක මධුර විතානගේ මන්ත්‍රීතුමාත් මීට ඉස්සෙල්ලා කිව්වා. මේ ගැන අපේ අභිධර්ම පොතේ සඳහන් වෙලා තිබෙනවා: අභිධර්මයේ එය දේශනා කර තිබෙනවා. බුදුන් වහන්සේ අභිධර්මය දේශනා කර තිබෙන්නේ තව්තිසා දිව්‍ය ලෝකයේ මාතෘ දිව්‍යරාජයාට. උන්වහන්සේ එක් වසක්, ඒ කියන්නේ මාස තුනක් තව්තිසා දිව්‍ය ලෝකයේ වැඩ වාසය කළා. නමුත් අටුවාවේ සඳහන් වෙනවා, උන්වහන්සේ ඒ කාලය තුළ හිමාලයේ අනෝතත්ත විලේ ස්නානය කළා කියලා. උන්වහන්සේ අනෝතත්ත විලේ ස්නානය කරන ගමන් තව්තිසා දිව්‍ය ලෝකයේ ඒ බුද්ධ රූපය කෘත්‍රිමව මවලා, ඒ තුළින් බණ දේශනා කරලා තිබෙනවා. ඒ කියන්නේ අද මේ පරිගණක ශක්තිය - AI කියන එක - එදා උන්වහන්සේ ආධ්‍යාත්මික ශක්තිය, මනසේ තිබෙන දියුණු බව යොදවා තමයි කරලා තිබෙන්නේ. ඒ වාගේම බුදුන් වහන්සේ ධ්‍යානයට සම වැදිලා, ආලෝක කසිණය වඩලා, ආලෝක කදම්බයක් යවලා, ඒ තුළින් කටහඬ යවලා විශ්වයේ ඕනෑම තැනකට ඇසෙන්න පුළුවන් විධියට බණ දේශනා කරලා තිබෙනවා කියලා අටුවාවේ සඳහන් කරලා තිබෙනවා. අද කෘත්‍රිමව කරන මේ නිර්මාණ එදා බුදුරජාණන් වහන්සේ මනස දියුණු කිරීම තුළින් කර තිබෙනවා.

අපි දන්නවා, අභිධර්මය පොත් 7ක් තිබෙන බව. පළමුවෙනි පොත තමයි ධම්මසංඝණී. ඒක අටුවාවේ පැහැදිලි කරලා තිබෙනවා, එසේ මනස දියුණු කරලා උන්වහන්සේ කරපු ඒ විශ්වකර්ම වැඩ. එහෙම නම් කෘත්‍රිම බුද්ධිය යොදා ගෙන අද කරන දේ අවුරුදු 2500කට ඉස්සෙල්ලා අපේ බුදු හාමුදුරුවොත් කරලා තිබෙනවා. ඒ නිසා මනස දියුණු කරලා ආධ්‍යාත්මික වශයෙන් කරන ඒ බුද්ධිමය කටයුතුවලින් කිසිම විනාශයක් සිදුවන්නේ නැහැ. එතැන කිසිම වෛරයක් නැහැ, ඒ වාගේම කිසිම ඊර්ෂ්‍යාවක් නැහැ, කිසිම ද්වේශයක් නැහැ. නමුත්, කෘත්‍රිම බුද්ධිය තුළින් කරන කාර්යයන් තුළින් ඇත්ත වශයෙන්ම විනාශයක් වෙන්න පුළුවන්, ද්වේශයක් තිබෙන්න පුළුවන්. ඒ නිසා යහපතට පමණක් එය යොදා ගන්නේ කොහොමද කියන එක තමයි ඇත්ත වශයෙන්ම අපි සලකා බලන්න ඕනෑ. ඒක අයහපතට යොදා ගන්නා අයට දැඩි දඬුවම් දීලා ඒ සීමා පනවන්න ඕනෑ කියන එක තමයි මේ අවස්ථාවේ දී මට කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කෘත්‍රිම බුද්ධිය ජාතික ආරක්ෂාවට ඉතා හොඳින් උපයෝගී කර ගන්න පුළුවන්. මේකේ තිබෙනවා, facial recognition කියලා. ඒ කියන්නේ, මුහුණු හඳුනා ගැනීම. යම්කිසි අපරාධකරුවෙක් අපරාධයක් කරලා රටේ ඕනෑම තැනක සැඟවිලා ඉන්නවා නම්, රටේ සියලු තැන්වල තිබෙන CCTV, එක ජාලයකට ගෙනැල්ලා අපට පුළුවන් ක්ෂණයකින්; එක තත්පරයකින් ඒ පුද්ගලයා කොහේද ඉන්නේ කියලා සොයා ගන්න. ඉතින් ලංකාව වටේම තිබෙන CCTV camerasවලින් ගැලවිලා ඔහුට යන්න බැහැ. ඔහු කොහොම හරි එළියට එන්න ඕනෑ. ඔහු එළියට ආපු වෙලාවට එක තත්පරයකින් ඔහු ඉන්නේ කොහේද කියලා හඳුනා ගන්න පුළුවන්. ඒ විධියට, අපිට AI තාක්ෂණය යහපතට පාවිච්චි කරන්න පුළුවන්.

ඒ වාගේම කෘෂිකර්මාන්තය පැත්තටත් මේක යොදා ගන්න පුළුවන්. උදාහරණයක් හැටියට කෘෂිකර්මාන්තයට අදාළව වසර පහක දත්ත computer එකට අපි දුන්නා නම්, මොන මොන එළවලු, මොන මොන කාලවල ද අපි වගා කළ යුත්තේ කියන එක, කාලගුණය -වර්ෂාව එන විධිය- ගැන දැන ගන්න පුළුවන්. සමහර දවස්වලට වටිටක්කා අස්වැන්න වැඩි වෙලා මිනිස්සුන්ට ඒවා විකුණා ගන්න බැරිව ළතැ වෙනවා. තක්කාලි අස්වනු වැඩි වෙලා විකුණා ගන්න බැරිව යනවා. ඉතින් මේ දත්ත සියල්ලක්ම අපි AIවලට දුන්නොත්, AI කියලා දෙනවා අපි මොන කාලයේ මොන එළවලුව ද වගා කරන්න ඕනෑ කියන එක. කැරට් මොන ප්‍රදේශයේ මොන කාලවල ද වගා කරන්න ඕනෑ, මොන තරම් අස්වැන්නක් එනවාද කියන එක ගැන; බෝංචි, වට්ටක්කා, පතෝල, මෑ කරල් යනා දී මේ ඕනෑම එළවලුවක් ගැන AIවලට කියන්න පුළුවන්. ඒ ආකාරයට කෘෂිකර්මාන්තයට ඉතාම යහපත් ලෙස AI යොදා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෙම තාක්ෂණය අයහපතටත් යොදා ගන්න එක ගැනත් කථා කළ යුතුයි. අපි දන්නවා, deepfake කියන එක. ළඟකදි අවුරුදු 15ක ළමා නිළියකගේ මුහුණ දාලා නිරුවත් ජායාරූප සකස් කර තිබුණා. ඇය ඇඳුම් ගලවනවා පවා පෙනෙන විධියට, ඉතාම ස්වාභාවික විධියට පෙනෙන විධියට AI යොදා ගෙන ඒවා සකස් කර තිබුණා. එපමණක් නොවෙයි, ඒ ගැහැණු ළමයා කථා කරන හඬ පවා ඒකට අන්තර්ගත කරලා තිබුණා. ඉතින් කවදාවත් කාටවත් ඒ ගැන සැක හිතන්න බැහැ. ඒ සැකය වැරදියි කියලා ඔප්පු කරන්න පුළුවන් පර්යේෂණාගාරයේ පමණයි. හැබැයි, ඒ වෙනකොට ඒ damage එක, ඒ චරිත ඝාතනය, ඒ නින්දාව, අපකීර්තිය ලැබිලා ඉවරයි. ඒ නිසා මේ වාගේ වැරදියට AI පාවිච්චි කරන අයට ඇත්තවශයෙන්ම දැඩි දඬුවම් දෙන නීති රීති අපි සකස් කළ යුතුයි. ඒ වාගේම ඒ චරිත ඝාතනයට ලක් වෙලා තමන්ට ඇති වෙන ලජ්ජාවෙන් තමන්ගේ පවුල්වල අයට මුහුණ දෙන්න බැරිව ඒ තැනැත්තිය හෝ තැනැත්තා දිවි නසා ගත්තොත්, ඒ අපහාසය කරපු කෙනා මිනී මැරුම් චෝදනාවට ලක් කළ යුතුයි කියාත් අපි නිර්දේශ කරනවා. මොකද, ඒ තාක්ෂණය අයහපතට යොදා ගැනීම තුළින් සම්පූර්ණයෙන්ම ජීවිතයක් විනාශ වන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමාත්, ඔබතුමාත් කිව්වා අපේ ආගමට කරන නිගරුව ගැන; කරණීය මෙත්ත සූත්‍රය rap කරලා, DJ කරලා පාවිච්චි කරන එක ගැන. ඒ තුළින් කරණීය මෙත්ත සූත්‍රයට, බුදු දහමට නින්දා කළා; අපහාස කළා. ඒ කරපු දේ වැරදියි. නමුත්, මම දකින වැරැද්ද තමයි 500කට වඩා පිරිසක් එය share කරලා තිබීම. ඒ share කරලා තිබෙන අය දන්නවා ද කරණීය මෙත්ත සූත්‍රය කියන්නේ මොකක්ද කියලා? කරණීය මෙත්ත සූත්‍රය කියන්නේ, දේවත්වය අභිභවා, බ්‍රහ්මත්වය අභිභවා අමා නිවන ළඟා කළ හැකි ක්‍රමයක්. ඒවන් වූ ශාන්ත නිවීමකට කැමැති තැනැත්තා කුමක් කළ යුතු ද යන්න තමයි එහි සඳහන් වෙලා තිබෙන්නේ. ඉතාම කෙටියෙන් සඳහන් කරනවා නම්, කළ යුතු කාරණා 15ක් තිබෙනවා. මම මේ කියන්නේ කරණීය මෙත්ත සූත්‍රයේ තිබෙන වැදගත්කම. බොහෝ අය මේක දන්නේ නැහැ. කළ යුතු කාරණා 15 තමයි, කුසල් වැඩීමට සමත් වීම, තමාට අවංක වීම, මැනවින් අවංක වීම, කීකරු හා යහපත් ගති, මොලොක් හා මෘදු බවින් යුක්ත වීම, නිහතමානී වීම, ලද දෙයින් සතුටු වීම, පහසුවෙන් පෝෂණය කළ හැකි වීම, ඉටු කළ හැකි ප්‍රමාණය නොඉක්මවා කටයුතු කිරීම, සැහැල්ලු දිවි පැවැත්ම, දමනය කරන ලද ඉඳුරන්, නීක්ෂණ බුද්ධිය, ගරු සරු ඇති බව, කුල පවුල්වල නොඇලෙන්නෙක් වීම, කොතරම් කුඩා වුවත් නුවණැත්තන්ගේ දෝෂාරෝපණයට ලක් වන දෙයක් නොකිරීම.

ඒ වාගේම එහි තිබෙනවා, මෛත්‍රිය වැඩීම ගැන. කාටද? සියලු සත්වයන්ට.

" ...තසා වා ථාවරා වා අනවසේසා
දීඝා වා යේ මහන්තා වා
මජ්ඣිමා රස්සඛාණුකථූලා
දිට්ඨා වා යේව අද්දිට්ඨා
යේව දූරේ වසන්ති අවිදූරේ
භූතා වා සම්භවේසී වා ..."

ඒ කියන්නේ, කෙලෙස් සහිත රහිත සත්ත්වයෝ, දිග, මහත, මධ්‍යම, මිටි, සියුම්, තරබාරු, පෙනෙන නොපෙනන, දුර, ළඟ, ඉපදුණු සහ ඉපදෙන්න ඉන්න අය. මේ වාගේ උතුම් ධර්මයක්, මේ වාගේ උතුම් මෛත්‍රියක් ගැන තමයි එම සූත්‍රයේ තිබෙන්නේ. එම සූත්‍රයෙන් කියනවා, මවක් තම එකම පුතු රකින්නා සේ සියලු සත්වයන්ට මෛත්‍රී කරන්න ඕනෑ කියලා. මේ වාගේ උතුම් ධර්මයක් තමයි එහි දේශනා කර තිබෙන්නේ. මේ තුළින් සාමය, සතුට, අවිහිංසාව හා මෛත්‍රීසහගත සිත් ඇති වෙනවා. මේ වාගේ උතුම් ධර්මයකට නින්දා කරන්න පුළුවන් කාටද? එහෙම කරන්න පුළුවන් වෙන්නේ, කිසිම දැනුමක් නැති අයට. ඒ වාගේ දෙයක් share කරන්න පුළුවන් අයගේත් මානසිකත්වය මොකක්ද කියලා අපට හිතාගන්න පුළුවන්. ඒ අයගේ දෙමව්පියන්, ගුරුවරු පවා ලජ්ජා වෙන්න ඕනෑ කරණීය මෙත්ත සූත්‍රයට කරපු මේ නිගාව සම්බන්ධයෙන්.

අපි දන්නවා, ChatGPT එක තමයි දැන් ලෝකයේ වැඩියෙන්ම ජනප්‍රිය. මේකෙන් ඕනෑම ප්‍රශ්නයක් විසඳන්න පුළුවන්. නමුත් ඒකට සංවේදීභාවයක් නැහැ. හැඟීම් නැහැ, AIවලට. හැඟීම් තිබෙන්නේ, මනුෂ්‍යයන්ට පමණයි. AI කෘත්‍රිමයි. ඊලෝන් මස්ක් තමයි AI සොයා ගත්තේ. නමුත් මනුෂ්‍යයන්ගේ හැඟීම් AIවලට නැහැ. ඇත්ත වශයෙන්ම ලෝකයේ යහ පැවැත්මට අවශ්‍ය කරන්නේ, සංවේදී හැඟීම් තිබෙන පුද්ගලයන්. එවැනි අය තීරණ ගත්තොත් පමණයි යහපාලනයක් ඇති වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලස්සන ශ්ලෝකයක් තිබෙනවා, "ආහාර නිද්‍රා භය මෛථුනංච - ධම්මේන හීනඃ පශුභිඃ සමානඃ" කියලා. එහි තිබෙන්නේ, මිනිසා සහ තිරිසනා අතර තිබෙන වෙනස. ආහාර මනුෂ්‍යයන්ටත් අවශ්‍යයි, තිරිසනාටත් අවශ්‍යයි. නින්ද මනුෂ්‍යයාටත් අවශ්‍යයි, තිරිසනාටත් අවශ්‍යයි. බය මනුෂ්‍යයාටත් දැනෙනවා, තිරිසනාටත් දැනෙනවා. සංසර්ගය - වර්ගයා බෝ කරන ක්‍රියාවලිය- තිරිසනාත් කරනවා, මනුෂ්‍යයාත් කරනවා. ඒ කාරණා හතරම තිරිසනාත්, මනුෂ්‍යයාත් කරන නමුත්, තිරිසනාගෙන් මනුෂ්‍යයා වෙනස් වෙන්නේ, මනුෂ්‍යයාට පමණක් හැඟීම් තිබෙන නිසායි. සංස්කෘතිය පිළිබඳ හැඟීම්, ආගමික හැඟීම්, ජාතික හැඟීම් මේ සියල්ලම තිබෙන්නේ, මනුෂ්‍යයාට පමණයි. ඒ හැඟීම් නැති කවුරු හරි මනුෂ්‍යයෙක් ඉන්නවා නම්, ඔහුත්, තිරිසනාත් අතර වෙනසක් නැහැයි කියලා තමයි ඒ ශ්ලෝකයෙන් කියැවෙන්නේ. ඌරන්ට, බල්ලන්ට, හිවලුන්ට -නරින්ට- ඒ වාගේ හැඟීම් නැහැ. ඒ වාගේ තිරිසන් ආකාරයෙනුත් වැඩ කරන්න පුළුවන්, මේ AI කියන එකට. මොකද, ඒකට අර මානුෂික හැඟීම් නැහැ. ඒ නිසා ඒ ගැන අපි ඉතාම පැහැදිලිව හිතන්න ඕනෑ. ඒ වාගේම තමයි, AI නිසා ලෝකයේ සියයට 30කට වඩා වැඩි ප්‍රමාණයකට අද රැකියා නැති වෙලා තිබෙනවා. දියුණු රටවල බස්වල රියැදුරන් නැහැ, හෝටල්වල වේටර්ලා නැහැ. ඒ ඔක්කොම අද කරන්නේ රොබෝවරු, AI හරහා.

බලන්න, දරුවන්ගේ අද නිර්මාණශීලිත්වයක් තිබෙනවාද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඔබතුමාත් දන්නවා ඇති, අපි ඒ දවස්වල ගැහැනු ළමයින්ට කවි ලිව්වා නේ. කොච්චර ලස්සන කවි ලිව්වාද?

"මද සිහිල් වැස්සේ - සිටියත් වළා පියසේ

ඔබ දසුන රිස්සේ - මහද වැලපෙයි දවස තිස්සේ"

මේ වාගේ කවි අද ළමයින්ට කියන්න පුළුවන්ද? AIවලින් නිර්මාණය වෙනවාද? ඒ වාගේ තවත් කවියක් කියන්නම්.

"මහවැලි කැලණි වළවේ කළු යන ගංගා - සමනල කන්ද මුදුනේ සිට පැන නැංගා

බෑවුම් තැනිතලා හෙල් අතරින් රිංගා - ඒවා ගලයි මිණි කැට මුතු යට හංගා"

මට පේනවා, ඉමිතියාස් බාකීර් මාකාර් මැතිතුමාත් හිනා වෙනවා. මේ වාගේ නිර්මාණ AIවලින් කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි. මේවා ඉතාම නිර්මාණශීලියි. අපේ නිර්මාණශීලිත්වය මේ AI හරහා නැති වෙනවා නම්, එතැනත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා දරුවන්ට අපි එහි සීමා පනවන්න ඕනෑ. අපේ අනන්‍යතාව, අපේ සංස්කෘතිය ගැන කල්පනා කරලා AIවලටම ඇලෙන්න නොදී සීමා දමන්න රාජ්‍යයක් වශයෙන් අපි දැනගන්න ඕනෑ. ඒ වාගේම තමයි හොලිවුඩ්වල තිර රචකයෝ - scriptwritersලා - උද්ඝෝෂණය කරනවා, AIවලින් කරන තිර රචනාවලට ඉඩ දෙන්න එපා කියලා. එදා කුඹුරුවල අස්වැන්න නෙළනකොට ගමේ සියල්ලෝම එකතු වෙලා තමයි ඒ අස්වැන්න නෙළා ගත්තේ. එයින් සමගිය ඇති වුණා, සතුට ඇති වුණා, සහෝදරත්වය build up වුණා. නමුත් අද "සුනාමි" කියන යන්ත්‍රයෙන් පැයෙන් දෙකෙන් ඒ අස්වැන්න නෙළනවා. එතකොට එදා තිබුණු සමගිය අද නැහැ. තාක්ෂණය දියුණු වෙනකොට සමාජය විෂම වෙන්නේ ඒ නිසායි.

අපට AI නැතිවම බැහැ. නමුත්, අපට ආවේණික විධියට, අපේ අනන්‍යතාව රැකෙන විධියට අපි එයට සීමාවක් දමන්න ඕනෑ. එසේ අවශ්‍ය සීමා දැම්මොත් මේ තාක්ෂණය ඇත්ත වශයෙන් අපේ දියුණුවට පාවිච්චි කරන්න අපට පුළුවන්. ඒ තුළින් දරුවන් ඇතුළු අපේ රටේ මිනිසුන්ගේ තිබෙන නිර්මාණ ශක්තිය කෙලෙසෙනවා නම්, නැති වෙනවා නම් එසේ නොවීම සඳහාත් යම්කිසි දෙයක් කළ යුතුයි. මෙම යෝජනාව ඉදිරිපත් කිරීම ගැන ගරු මධුර විතානගේ මැතිතුමාට නැවත වරක් මගේ ස්තුතිය පළ කරමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Niroshan Perera. You have eight minutes.

[අ.භා. 1.48]

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින කෘත්‍රිම බුද්ධිය සහ එහි බලපෑම පිළිබඳව සිදු කරන මෙම විවාදය අතිශය කාලීන විවාදයක්. මොකද, මේ කෘත්‍රිම බුද්ධිය විසින් අද වන කොට ලෝකය විශාල වශයෙන් වෙනස් කර ගෙන යනවා. අපි දකිනවා, මේ අලුත් තාක්ෂණය ලෝකයේ රැකියා ක්ෂේත්‍රය, ඒ වාගේම ආර්ථිකය සහ සමාජය විශාල වෙනස්කමකට භාජන කර තිබෙන ආකාරය. ඉන්දියාව ගත්තත්, ඇමෙරිකාව ගත්තත්, මේ තාක්ෂණය තුළින් අද වන කොට ඒ රටවල තරුණ පිරිසට විශාල වශයෙන් රැකියා අහිමි කර තිබෙනවා. රැකියාවලට අදාළ යම් යම් කාරණා විශාල ලෙස automate කරපු නිසා අද රැකියා අවස්ථා අහිමි වෙන්න පටන් ගෙන තිබෙනවා.

එහි බලපෑම අද වන කොට ලංකාව දෙසටත් ක්‍රමක්‍රමයෙන් එන්න පටන් ගෙන තිබෙන ආකාරයක් අපි දකිනවා. අද මේ රටේ ළමයින් ඉගෙන ගන්නා විෂයයන් තවත් අවුරුදු ගණනාවක් යන විට අවශ්‍ය නොවන තත්ත්වයට තාක්ෂණය වෙනස් වෙමින් පවතිනවා. මේ රටේ අධ්‍යාපන ක්‍රමය ගැන පුළුල් සමාලෝචනයක්

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

කරලා, මේ අධ්‍යාපන ක්‍රමය කෘත්‍රිම බුද්ධිය ඇතුළු තාක්ෂණය වෙනස් වීමේ බලපෑමට අනුව සකස් කර ගැනීම සියලු දෙනාගේ වගකීම වන බව මම මේ අවස්ථාවේ මතක් කරලා දෙනවා. අප ඒ වගකීම ගන්නේ නැතිව, මේ තිබෙන අධ්‍යාපන ක්‍රමය ඔස්සේම ගිහිල්ලා ඉදිරියේදී රැකියාවක් කර ගන්න බැරි, එහෙම නැත්නම් රැකියාවට අවශ්‍ය skills නැති තවත් පරපුරක් බිහි කළොත් අනාගතයේදී මේ රට තුළ නැවතත් තරුණ අසහනය දකින්න අපට සිදු වෙවි. ඒ හින්දා මේ පාර්ලිමේන්තුව මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා, ඒ වාගේම මේ පිළිබඳව තේරුම් ගෙන කටයුතු කළ යුතුයි. අද කථා කරපු සමහර කථිකයින් කෘත්‍රිම බුද්ධිය ගැන කිව්වාට ඒකේ ගැඹුර පිළිබඳ, ඒක අපට බලපාන්නේ කොහොමද කියන එක පිළිබඳ අවබෝධයකින් කථා කළේ නැහැ. ඒ හින්දා කෘත්‍රිම බුද්ධිය ගැන අවබෝධයක් තිබෙන පුද්ගලයින් ඉස්සරහට ගෙනැල්ලා ඒගොල්ලන්ගේ විශේෂඥ සහාය ලබා ගෙන එයින් ඇති වන බලපෑම තුළින් රටක් හැටියට අප ඉස්සරහට යන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් මේ රටට විශේෂ සැලැස්මක් අපි ඉදිරිපත් කරන්න ඕනෑ. අද වන කොට කෘත්‍රිම බුද්ධිය මඟින් දේශපාලනයට පවා බලපෑම් කරන්න පුළුවන් තත්ත්වයට ලෝකය වෙනස් වෙලා තිබෙන බව අපි දන්නවා. Fake videos, ඒ කියන්නේ ඕනෑම කෙනෙකුගේ හඬ කවලා, පුද්ගල ඡායාරූප - photos - වෙනස් කරලා සකස් කරන වීඩියෝ නිකුත් කරන්න පුළුවන් වන තාක්ෂණය තුළින් විවිධ දුර්මත මේ සමාජය තුළ ප්‍රචලිත කරලා ඒ මඟින් දේශපාලනය වෙනස් කරන්න පුළුවන් තැනකට අද ලෝකය ගමන් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ලෝකයේ රටවල computer systems තිබෙනවා. ඒ computer systemsවලට ප්‍රහාර එල්ල කරන්න පුළුවන් ආකාරයේ විවිධ signals මේ තාක්ෂණය හරහා නිර්මාණය කරලා රටවල් ආර්ථිකමය වශයෙන් වට්ටන්න පුළුවන් වාතාවරණයක් මේ ගෝලීය පරිසරය තුළ අද වන කොට අපි දකිනවා. පසුගිය දවසක CrowdStrike කියන computer ආයතනයෙන් Windowsවලට release කරපු update එකක් නිසා ගෝලීය වශයෙන් Microsoft Windowsවලට විශාල බලපෑමක් ඇති වුණු ආකාරය අපි දැක්කා. එය බැංකු, airports ආදි විවිධ අංශවලට බලපෑ නිසා ඒ සේවාවන් විශාල ලෙස බිඳ වැටුණා.

ඒ සේවාවන් බිඳ වැටීම තුළින් අද වන විට ඇමෙරිකානු ඩොලර් බිලියන ගණනක පාඩුවක් ඒ ආර්ථිකවලට සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ රටේ ආර්ථිකය, බැංකු පද්ධතිය, immigration system යනාදියෙහි ඇති දත්ත පද්ධතිවලටත් විවිධ අංශවලින් එවැනි ප්‍රහාර එල්ල වීම පිළිබඳ අපි අවධානය යොමු කරන්න ඕනෑ. අපි ඒ පිළිබඳව තව තවත් රටවල් එක්ක සම්බන්ධ වෙලා ගෝලීය වශයෙන් තාක්ෂණික උපදෙස් ලබා ගන්න ඕනෑ. ඒ systems නිර්මාණය කරන විවිධ ආයතන තිබෙනවා. ඒ ආයතන සමඟත් සම්බන්ධ වෙලා අපේ දැනුම වර්ධනය කර ගත යුතුවාක් මෙන්ම ඒ systems ආරක්ෂා කිරීම සඳහාත් ක්‍රමවේදයක් සෑදීම වෙනුවෙන් අවශ්‍ය නීති රීති මේ පාර්ලිමේන්තුව තුළින් හදලා මේ රටේ ක්‍රියාත්මක කරන්න ඕනෑ කියා මම මේ අවස්ථාවේ සඳහන් කරනවා.

කෘත්‍රිම බුද්ධිය කියන්නේ හුහක් වෙලාවට මනුෂ්‍යයින් විසින් හසුරුවන්න ඕනෑ නැති දෙයක්. කෘත්‍රිම බුද්ධියට පුළුවන් තමන්ටම තමන්ව හසුරුවා ගන්න. ඒක තමයි අපේ පංගුවක් අයට තේරෙන්නේ නැත්තේ. කෘත්‍රිම බුද්ධිය තීරණය කරලා යම් යම් ස්ථානවලට ප්‍රහාර එල්ල කරන්න පුළුවන්; ඒ වාගේම, යම් යම් දේවල් වෙනස් කරන්නත් පුළුවන්. ඒ නිසා මේ පිළිබඳව අපි විශේෂයෙන් අවධානය යොමු කරන්න ඕනෑ. අපි මේ රටේ computer systems සඳහා දිගින් දිගටම අලුත් තාක්ෂණය යොදා ගන්නවා; ඒවා automate කරනවා. ඒ දේවල් කරන කොට අපි කොහොමද අපේ දත්ත පිළිබඳ ආරක්ෂාව තහවුරු කරන්නේ? අපේ computer systemsවල ආරක්ෂාව පිළිබඳව අපි නැවතත් බෙහෙවින් අවධානය යොමු කරන්න ඕනෑ. ඒ වාගේම මම කිව්වා, මේ වන කොටත් අපේ අධ්‍යාපනය පිළිබඳ විශාල ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මේ වන කොට රැකියා විරහිත උපාධිධාරින් විශාල පිරිසක් ඉන්නවා. ඒගොල්ලන් පංගුවක් වෙලාවට උද්ඝෝෂණය කරනවා, රැකියා ඕනෑ කියලා. කෘත්‍රිම බුද්ධිය සහ automation තුළින් තවතවත් මේ පීඩනය වැඩි වෙනවා මිස පීඩනය අඩු වන්නේ නැහැ. ඒ පිළිබඳවත් මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරලා, මා කලින් කිව්වා වාගේ අපේ විශ්වවිද්‍යාල පද්ධතිය ද ඇතුළුව අපේ අධ්‍යාපන පද්ධතිය වෙනස් කරලා, මේ රටේ ආර්ථිකයට සහ රැකියා විරහිතභාවයට කෘත්‍රිම බුද්ධිය බලපාන්නේ කොහොමද කියන කාරණය ගැන විශේෂ අධ්‍යයනයක් කරලා, ඒ මඟින් මේ රටේ තරුණ ප්‍රජාව තුළින් එන අසහනය නැති කරන්නට කටයුතු කරන්න ඕනෑ.

කෘත්‍රිම බුද්ධිය ගැන අපි හැම වෙලාවේම බය වෙන්න ඕනෑත් නැහැ. කෘත්‍රිම බුද්ධිය නමැති තාක්ෂණය තුළින් අපේ රටට ආර්ථික වශයෙන් සහ සමාජයීය වශයෙන් විශාල පිම්මක් පනින්නත් පුළුවන්. අපි සියලුදෙනා එකතු වෙලා ඒ සඳහා විශේෂඥ උපදෙස් අරගෙන ඉතාම හොඳ සැලැස්මක් හදා ගත්තොත් කෘත්‍රිම බුද්ධිය තුළින් අනෙක් රටවල් අබිබවා අපේ තරුණ පරපුරට ඉතාම හොඳ අනාගතයක් ලබා දෙන්න අපට පුළුවන් වෙයි. මේ පාර්ලිමේන්තුව සහ මේ රට පාලනය කරන සියලුදෙනා ඒ කෙරෙහි අවධානය යොමු කරලා ඉස්සරහට යන්න ඕනෑය කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. (Dr.) Kavinda Heshan Jayawardhana. You have eight minutes.

[අ.භා. 1.56]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ ගරු මධුර චිතානගේ මන්ත්‍රීතුමා ඉතාම කාලෝචිත මාතෘකාවක් යටතේ මෙම කල් තැබීමේ යෝජනාව ගෙන ඒම පිළිබඳව එතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

Artificial intelligence ගැන කථා කරන කොට national security, religion and culture කියන තුනම එකතු කරලා තමයි අද මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහිදී අප කථා කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ ලෝකයේ දියුණු වන තාක්ෂණයත් එක්ක ගමන් කරන්න අපට සිදු වෙනවා. මේ රටේ තරුණ තරුණියන්ට මේ තාක්ෂණය ඉගැන්වීම අපේ වගකීමක් බවට පත් වෙනවා. අද artificial intelligence කොයි තරම් දුරට advance වෙලා තිබෙනවා ද කිව්වොත්, අපට පෙනෙනවා, අනාගතයේ අපේ සිතීමේ ශක්තියට සහ අපේ දැනුමට වඩා ඉදිරියට යන්නට artificial intelligenceවලට හැකියාව තිබෙන බව.

අපි අද භාවිත කරන ChatGPT වේවා, Claude වේවා, අලුත් AI තාක්ෂණය වේවා, අපේ දියුණුවට ඒවා යොදාගන්න ඕනෑ.

අපට අනාගතය ගැන තේරුම් ගන්න පුළුවන් චිත්‍රපටයක් මම මේ ළඟ දී බැලුවා. ඒකේ නම "ඇට්ලස්". ඒක බලනකොට තේරෙනවා, අනාගතයේදි අපට AI තාක්ෂණය තුළින් මොන තරම් හොඳ හා නරක බලපෑම් සිදු වෙනවා ද කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම දෙයක හොඳ සහ නරක තිබෙනවා. අපි මේ තාක්ෂණය හරියට භාවිත කළොත් අපේ දියුණුවට ඒවා භාවිත කරන්න පුළුවන්. එහෙම නැත්නම් තාක්ෂණය වැරදි ආකාරයෙන් භාවිත කළොත් අපි මොට්ට, මෝඩ මිනිස්සු බවට පත් වෙන එක අනිවාර්යයෙන්ම සිද්ධ වෙයි. ඒ නිසා මම යෝජනා කරනවා, විශේෂයෙන්ම අපි මේ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද national security ගැන කථා කරනවා. ඔබතුමා දන්නවා, යුක්‌රේන-රුසියානු යුද්ධය ගැන. ඒ ගැන අධ්‍යයනය කරනකොට මොන තරම් AI තාක්ෂණයත් එක්ක එකතු වුණු යුද්ධයක් ද පවතින්නේ කියන එක අපට වැටහෙනවා. අද වෙනකොට ඩ්‍රෝන තාක්ෂණය කොයි තරම් දියුණු වෙලා තිබෙනවා ද? Cyber attacks කොයි තරම් දියුණු වෙලා තිබෙනවා ද? මෙවැනි cyber attacks තුළින් රජයේ ආයතනවල පද්ධති - systems - crash කරන්න පුළුවන් තත්ත්වයට අද ලෝකය දියුණු වෙලා තිබෙනවා. ඒ නිසා රජයන් මොන තරම් අසරණ වෙනවා ද? ඒ වාගේම miscommunication, mistakes, වැරදි තොරතුරු සමාජගත කිරීමත් යම් අවස්ථාවලදී සිදු වෙන බව අපි දකිනවා. අපි දන්න, තොරතුරු ලබා ගන්නවා වාගේම යම් අවස්ථාවලදී වැරදි තොරතුරු දත්තගත කිරීමෙන් ඒ වැරදි තොරතුරු සමාජගත වෙනවාත් අපි දකිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව වශයෙන් AI තාක්ෂණය සම්බන්ධයෙන් වන යෝජනාවක් තිබෙනවා දැක්කාම මම කළේ මොකක්ද දන්නවාද? මගේ දුරකථනයේ ChatGPT තිබෙනවා. ඒ වෙනුවට මම මේ දවස්වල Claude දාලායි තිබෙන්නේ මට ඒ සම්බන්ධයෙන් කථාවක් ලියලා දෙන්න කියලා මම ඒකට කිව්වා. මම ඒ කථාව **සභාගත*** කරනවා. මොකද, මේ මුළු කථාවම කියවන්න මට වෙලාව නැහැ.

ඔබතුමන්ලා කල්පනා කර බලන්න, අපේ රටේ දරුවන්ට මේක ධනාත්මකව කොච්චර භාවිත කරන්න පුළුවන් ද කියලා. මට මේ ළඟ දී social media ගැන තිබුණු ප්‍රශ්නයකට CID එකේ පැමිණිල්ලක් දාන්න මම අපේ නීතිඥතුමා එක්ක කථා කළා. නීතිඥතුමාගෙන් උපදෙස් ගන්න ගමන් මම Claude එකට කිව්වා, "මට පැමිණිල්ලක් දාන්න මේකට අවශ්‍ය කරන තොරතුරු ටික දෙන්න" කියලා. ඒකෙන් Penal Code එකේ තිබෙන ඒවා විස්තරාත්මකව ලබා දුන්නා. මම මගේ නීතිඥ මහත්තයා වන අෂාන් මහත්තයාට මේ තොරතුරු ටික යැව්වා. මේකේ වටිනාකම තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Claude එකෙන් විස්තර අපට ඉදිරිපත් කරද්දී තොරතුරු සියල්ලක්ම ඇවිල්ලා "Claude can make mistakes. Please, double-check" කියලා අන්තිමට යටින් සඳහන් වෙනවා. ඒක තමයි එහි තිබෙන වටිනාකම. අපි මේක භාවිත කරන එක පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. ඒ එක්කම මෙවැනි තත්ත්වයන්වලදී AI තාක්ෂණය භාවිතා කිරීම regularize කරන්නේ කොහොමද කියන එක පිළිබඳව AI තාක්ෂණයෙන් ම මම ප්‍රශ්න කළා. එතකොට ඒකෙන් මට ලබා දුන් තොරතුර තමයි "Establish a national AI Ethics Board to guide policy decisions" කියන එක. අපි මේවා ගැන අවධානය යොමු කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊළඟට කියනවා, "Invest in AI education and training, develop AI regulations to ensure transparency, accountability and safety and research on impact of AI". මේ තොරතුරු ටික මම ගත්තේ AI තාක්ෂණයෙන්. අපට මේවා ඉදිරිපත් කරන්න පුළුවන්. මේවා පිළිබඳ අවධානය යොමු කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ කාරණයත්. අද ලෝකය මේ තාක්ෂණය හඳුනාගෙන තිබෙන මොහොතේ මේවා අවභාවිත කරන්න පුළුවන්. මේ ළඟදී social mediaහි පළ වුණු තොරතුරක් පිළිබඳව මම මේ ගරු සභාවේදී කථා කළා. විශේෂයෙන්ම Online Safety Bill එක ගැන මම කථා කළා. සමහර අය හිතුවා, මම මේ ආණ්ඩුවට කඩේ යනවා කියලා. හැබැයි මතක තබා ගන්න, මම රාජකීය විද්‍යාලයේ ඉගෙන ගත් සිසුවෙක්. අපි 9 වසරේ, 10 වසරේ, 11 වසරේ ඉන්නකොට අපේ Grade Head විධියට හිටියේ ගමගේ සර්.

තරුණ කොල්ලෝ හැටියට අපි දහ වැඩ කරනකොට එතුමා අපට කියපු දේ තමයි, "තමුන් වරදක් කළා නම් ඒ වරද පිළිගෙන සමාව ගන්න, කොන්ද කෙළින් තියාගන්න" කියන එක. ඒ තමයි අපි රාජකීය විද්‍යාලයෙන් ඉගෙන ගත්ත දේ. මිනිස්සු වැරදි කරනවා. හැබැයි, සමාව ගන්න කොන්ද පණ තිබෙන්නට ඕනෑ. ඒකයි මම කිව්වේ, මේ රටේ සමාජ මාධ්‍ය අද අවභාවිත කරනවා කියලා. උදාහරණයක් විධියට මම එක් කාරණයක් කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ළඟ ලිපි කිහිපයක් තිබෙනවා. මම ඒ ලිපි **සභාගත*** කරනවා.

මා ගැන වැරදි තොරතුර ඉදිරිපත් කරපු තිළිණ ධනුෂ්ක අබේවික්‍රම කියන පුද්ගලයා පිළිබඳව මම CID එකට ගිහිල්ලා පැමිණිලි කළා. ඔහුගේ දුරකථන අංකය මේකේ තිබෙනවා. නමුත් මම ඒක මෙතැනදී කියන්නේ නැහැ. හැබැයි, මම ඒ කාරණයට අදාළ ලිපියත් සභාගත කළා. මේ සම්බන්ධව අපක්ෂපාතී පරීක්ෂණයක් කරන්න CID එකට වගකීමක් තිබෙනවා.

ඒ වාගේම "Adsensep" කියන web page එකේ email address එකත් මේකේ තිබෙනවා. මේකට සම්බන්ධ පුද්ගලයින් තමයි මේ විධියට සමාජ මාධ්‍ය අවභාවිත කරන්නේ. Online Safety Bill එක යටතේ, අනිවාර්යයෙන්ම මේ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. මේවා පාලනය කරන්න, මේවා අවභාවිත කරන අයට නීතිය ක්‍රියාත්මක කරන්න, ඒ අයට දඬුවම් දෙන්න, මේ පිළිබඳව තිබෙන regulations අපට අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා අපි පැහැදිලිව කියනවා, මේ රටේ හැම දේකටම පාලනයක් අවශ්‍යයි කියලා. එහෙම නැතුව හරක් ගාල කඩා ගත්තා වාගේ මේකට නිකම් යන්න දෙන්න පුළුවන්කමක් නැහැ. පැහැදිලිවම මගේ ස්ථාවරය වෙන්නේ, AI තාක්ෂණය වේවා, social media වේවා, online වේවා අපි ඒ සියල්ල අවභාවිත නොකර නිසි විධියට, හරි විධියට භාවිත කරනවා නම්, ඒක අපේ යහපත උදෙසාම භාවිත කරන්න පුළුවන් කියන එකයි. මිනිසුන්ව තලා පෙළන්න, මඩ ගහන්න, ඒ මිනිසුන්ගේ චරිත ඝාතනය කරන්න යමෙක් මේක භාවිත කරනවා නම්, ඒවාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙන්නට ඕනෑ. එම නිසා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකතුමාට මම කියන්නේ මෙච්චරයි. අපි මේ වෙනකොට පැමිණිල්ල දාලා තිබෙනවා. ඔබතුමන්ලා ඒක විභාග කරන්න. මේක මට කරන සාධාරණයක් නොවෙයි, මේ රටේ තරුණ තරුණියන්ට කරන සාධාරණයක්. Online හරහා අසාධාරණයට ලක් වන මේ රටේ තරුණ තරුණියන් වෙනුවෙන් අපි පෙනී සිටිනවාය කියන කාරණය මතක් කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Anuradha Jayaratne. You have 13 minutes.

[අ.භා. 2.05]

ගරු අනුරාධ ජයරත්න මහතා (අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுராத ஜயரத்ன - நீதி மற்றும் சிறைச்சாலை அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne - State Minister of Justice and Prison Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා, අද දිනයේදී AI තාක්ෂණය සහ අනෙකුත් කාරණා සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවට කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණාවේදී පක්ෂ විපක්ෂ බොහෝ දෙනාගේ අදහස් උදහස් ඇතිව හරි විධියට මේ තාක්ෂණය ගළපාගත්තොත්, රටක් විධියට ලෝකයේ අනෙක් රටවල් එක්ක අපට ඉදිරියට යන්න පුළුවන් වෙනවා වාගේම, මේක හරි විධියට ගළපාගත්තේ නැත්නම්, යම් යම් කාල වකවානුවලදී අපට තිබුණු අවස්ථාව නැති කර ගත් රටක්, නැති කර ගත් ජාතියක් කියන එක තමයි අපට නැවත කියන්න සිද්ධ වෙන්නේ.

මම මෙහිදී මූලිකවම සඳහන් කළ යුතුයි, මෙන්න මේ කාරණය. අපි මුලින්ම Facebook එක ගත්තොත්, එහි ආරම්භක අවධිවල පවා කෘත්‍රිම බුද්ධිය පිළිබඳව යම් විධියක භාවිතාවක් තිබුණා. ඒකට හේතුව තමයි, සමහර විට අපි දන්නේ නැති වුණාට, Facebook එකේ වේවා, TikTok එකේ වේවා, YouTube එකේ වේවා, ඒ ඕනෑම එකක් අපි search කළාට පස්සේ, එසේ search කරපු ඒවා අපට නිතරම දකින්න පටන් ගන්නවා. එතකොට, අපේ හැසිරීම, අපි මොනවාද බලන්නේ, අපි මොනවාද අධ්‍යයනය කරන්නේ කියන සියලු කාරණා එක තැනකට ගොනු කරලා, අපට අවශ්‍ය කාරණා ටික ඉදිරිපත් කරන ක්‍රමවේදයක් තමයි මේ සමාජ මාධ්‍ය සියල්ල ඇතුළත, මේ artificial intelligence තුළ සිදු වන එකම ක්‍රමවේදය බවට පත්වෙලා තිබුණේ. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි, social media platform එකක අපි සිටින විනාඩි ගණන වැඩි කරලා තබා ගන්න ඒ කණ්ඩායම්වලට පුළුවන්කම ලැබුණේ. එක්කෝ ඔවුන් අපට ආසා කරන දෙයක් පෙන්වනවා, එහෙම නැත්නම් අපට ඕනෑ කරන, අපි බලන්න බලාපොරොත්තු වන දෙයක් එතැනදී පෙන්නුම් කරනවා. ඒ කුමන හෝ ක්‍රමවේදයක් පාවිච්චි වෙලා, අවසානයේ ඒ social network එකේ, නැත්නම් එවැනි platform එකක අපි වැඩි කාලයක් ගත කරන්න සලස්වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මෙම කාරණාවේදී අපි බලන්න ඕනෑ දෙයක් තිබෙනවා. මේ යම් යම් කාරණා සමාජය තුළ නොයෙකුත් විධියට, වැරදි විධියට manipulate කරන්න, එහෙම නැත්නම් යම් දේවල් සමාජ මතවාද හැටියට අලුතින් එළියට දමන්න සමහර වෙලාවට මේ platforms හරහා පුළුවන්කම ලැබුණා.

ඒකට හොඳම උදාහරණය තමයි, 2016 දී ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවති ජනාධිපතිවරණය. ඒ මැතිවරණය manipulate කරන්න ප්‍රධාන අවියක් හැටියට ඒ ගොල්ලන් පාවිච්චි කළේ social networking platform එක. ඒක Facebook වෙන්න පුළුවන්; Instagram වෙන්න පුළුවන්; එහෙම නැත්නම් ඒ දවස්වල තිබුණු Twitter වෙන්න පුළුවන්. ඒ platforms පාවිච්චි කරලා ජනමතය වෙනස් කරන්න කටයුතු කළා. Phone එක දුන්නේ නැහැ කියලා සියදිවි නසා ගත් සමහර දරුවෝ ඉන්නවා. ලංකාවේ එහෙම වාර්තා වෙනවා. එහෙම කරපු සමීක්ෂණයක ප්‍රතිඵල තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සාමාන්‍යයෙන් කුඩු ගහන, එහෙම නැත්නම් යම් දෙයකට ඇබ්බැහි වෙච්ච කෙනෙකුයි, සමාජ මාධ්‍යයෙන්, artificial intelligence හරහා දෙන දේ තනිකරම බලන්න යොමු වෙච්ච කෙනෙකුයි අතර වෙනසක් නැහැ කියලා කියනවා. ඒ දෙදෙනාම එක හා සමානයි. ඒක ඇත්ත. අපිත් දුරකථනයෙන් එක දෙයක් බලාගෙන ගියොත් wall එකේ පහළට පහළට යනවා. එහෙම ගත කරපු විනාඩි ගණන මතකත් නැහැ. හිටපු වෙලාව මතකත් නැහැ. ඒකෙන් හැම වෙලාවේම දෙන්නේ අපට ආසා හිතෙන දේවල්. මන්ත්‍රීවරුන් 225දෙනාගේ Facebook එක බැලුවොත්, වැඩියෙන්ම ඒවායේ යන්නේ දේශපාලන කථා ටික. එහෙම නැත්නම් මොනවා හරි දේශපාලනයට අදාළ කාරණා. හැබැයි, යෞවනයකුගේ Facebook එකේ wall එක බැලුවොත් ඒවා නොවෙයි යන්නේ, වෙන කතන්දර. Artificial intelligence ගැන අද අපි පාර්ලිමේන්තුවේ කථා කළාට, අපි හිතන තැනින් එහාට අද ලෝකයේ රටවල් ගිහිල්ලා තිබෙනවා. ඒක නිසා අපි පළමුවෙන්ම තේරුම් ගන්න ඕනෑ දෙයක් තිබෙනවා. මේ උත්තරීතර සභාවේ අපි කථා කරන මොහොතේත් artificial intelligence කියන තාක්ෂණය ලෝකයේ කොතැනද තිබෙන්නේ කියන එක පිළිබඳව අපි හරියාකාරව තේරුම්ගත යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙච්චර කාලයක් ආවේ artificial intelligenceවල පූර්ව කථනයක්, prediction එකක්. හැබැයි, 2020න් පස්සේ artificial intelligence සම්බන්ධ පූර්ව කථනය වෙන පැත්තකට ගිහිල්ලා තිබෙනවා. ඒක උත්පාදනයට ගිහිල්ලා තිබෙනවා. ඒ කියන්නේ, generative artificial intelligenceවලට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ generative artificial intelligence දැන් production එකට ගිහිල්ලා, creationවලට ගිහිල්ලා, textingවලට ගිහිල්ලා, audioවලට ගිහිල්ලා. 2009 ඉඳලා 2020 වෙනකල් අපි කථා කරපු predictive artificial intelligenceවලට එහා ගිය generative artificial intelligenceවලට අද අපි ඇවිල්ලා තිබෙනවා. ඒකේ උච්චතම තැන් හැටියට ChatGPT වාගේ app එකක් පෙන්වා දෙන්න පුළුවන්. ඒක ගොඩාක් ඉදිරියට ගිහිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ විෂයය සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය ඇමතිවරයා හැටියට මම මේ ගරු සභාවට යෝජනාවක් කරනවා. Generative artificial intelligence ක්‍රියාත්මක වෙනකොට production වේවා, creation වේවා, texting වේවා, audio වේවා, visual වේවා මේ හැම දෙයක්ම යම් විධියකින් නීත්‍යානුකූල රාමුව ඇතුළට ගන්න ක්‍රමවේදයක් අපි සෑදිය යුතු වෙනවා. ඒ සඳහා හොඳම ක්‍රමවේදයක් තිබෙනවා. ඉදිරියේ දී artificial intelligence මොන විධියට නිෂ්පාදනය වුණත් ඒවාට founding module එකක් තිබෙනවා. Founding module එකක් කියන්නේ මූලික ආරම්භක ආදර්ශකය. ඒ artificial intelligence සම්බන්ධව ඕනෑ දෙයක් හදන කොට එයට මූලිකව දෙන දත්ත තිබෙනවා. මූලිකව ක්‍රියාත්මක වන වපසරිය පිළිබඳ ඒ artificial intelligence එකට හැඳින්වීමක් තිබෙනවා. ඒ හැඳින්වීමේ දී අපට කරන්න පුළුවන් මොකක්ද, කරන්න බැරි එහෙම නැත්නම් අපට යන්න පුළුවන් සීමාව මොකක්ද කියන ඒවා පිළිබඳව නියමයන් රටක් හැටියට අපි සෑදිය යුතු වෙනවා. එහෙම නැත්නම් සමහර වෙලාවට අපේ රටේ සංස්කෘතිය, සභ්‍යත්වය ඒ ඕනෑම කාරණාවක් අභිභවා ගිහිල්ලා වෙනත් රටවල කවුරු හරි කරන එකක් වුණත් අපට apply කරන්න පුළුවන්. කෘත්‍රිම බුද්ධිය දන්නේ නැහැ, එතැනට ඒක apply කරන එක හරිද, වැරැදිද කියන්න. Data analysis එකක්

එක්ක එ් කෘත්‍රිම බුද්ධියට feed කරපු, එය දැන ගත් දේවල් එක්ක තමයි එය තනිකර ක්‍රියාත්මක වෙන්නේ. එක පැත්තකින් අපි එය නීත්‍යානුකූල රාමුව ඇතුළට ගන්න කටයුතු කරන්න ඕනෑ.

දෙවැනි කාරණාව මෙයයි. Artificial intelligence හැදෙනවා, අප founding modules ඒකට ඇතුළු කරන්න ඕනෑ. ඒ founding module එක ඇතුළේ ඕනෑම කාරණාවකට යන්න පුළුවන්. උදාහරණයක් හැටියට ගන්න පුළුවන් ජාතීන් අතර යම් කිසි විධියක හැල්ලුවකට ලක් වෙන විධියේ යම් දේවල් ප්‍රකාශ කරන්න බැහැ කියන එක. ඒක සමහර විට founding module එකක් ඇතුළට එන්න පුළුවන්. මොන විධියට, මොන නිර්ණායක ගත්තත් ඒ founding module එක කඩලා එතැනින් එහාට ඒ artificial intelligence ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ නීති-රීතිවලත් මීට ගැළපෙන ලෙස අනුගත වෙන්න පුළුවන් module එකක්, නීත්‍යානුකූල රාමුවක් රට ඇතුළත ගොඩනැඟිය යුතුයි කියන එක මේ සභාවට මම මේ වෙලාවේ දී යෝජනා කරනවා.

ඒ වාගේම තමයි, මේ එන artificial intelligence හරහා, බොහෝ විට අපේ රැකියා, එහෙමත් නැත්නම් අපි වෘත්තීමය වශයෙන් කරන දේවල් සඳහා මොකද වෙන්නේ කියන එක පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. බොහෝ විට අපේ programmes ලියන programmersලා ඉන්නවා. මගේ සහෝදරයා ඉන්නවා. ඔහු ඉංජිනේරුවෙක් හැටියට කටයුතු කරනවා. ඔහු මේ software programmes ලියනවා. ඔහු කිව්වේ දවස් දෙකක්, තුනක් තිස්සේ ලියපු programmes මේ AI එකට දීපු ගමන්, ඒගොල්ලෝ සම්පූර්ණයෙන් විනාඩි තුන හතරෙන්, එහෙම නැත්නම් තත්පර තුනෙන් සම්පූර්ණ software එක ලියනවා කියලා. එතකොට software engineersලාට මොකද වෙන්නේ? අද අපේ නීතියේ තිබෙන Code of Criminal Procedure වෙන්න පුළුවන්, එහෙම නැත්නම් Civil Procedure Code එක වෙන්න පුළුවන්, ඒ ඔක්කොම නීති artificial intelligenceවලට දුන්නාට පස්සේ නඩු තීන්දු ටික දෙනවා. එතකොට ඉදිරියේදී නීතිඥවරුන්ට මොකක්ද වෙන්නේ? මෙන්න මේ කියන කාරණා පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. සමහර වෙලාවට අපිට අද මෙහි වටිනාකම හා මේ කියන කාරණා පිළිබඳව තේරෙන්නේ නැහැ. හැබැයි, ලෝකයේ අනෙක් රටවල් එක්ක අපි ඉස්සරහට යනවා නම්, මේ කියන කාරණා පිළිබඳව අපේ අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ වාගේම අපේ ඉංජිනේරුවරුවන් ගත්තොත්, සමහර විට plan එකක් දුන්නාම, drawing එකක් දුන්නාම, අපේ ඉංජිනේරුවරු තමයි calculate කරලා කියන්නේ, මෙච්චර කම්බි ඕනෑ, මේ විධියට කරන්න ඕනෑ, මේ BoQ එක හදන්න පුළුවන් කියන එක. මේ වාගේ විවිධ කාරණා තිබෙනවා. හැබැයි, මේ තාක්ෂණය ඔස්සේ plan එකක් දුන්නාම, සියලු දත්ත එකවර එළියට දෙනවා නම්, එතැන ඉන්න QSsලා හා engineersලාගේ වෘත්තිය පිළිබඳව ඇති වන තත්ත්වය මොකක්ද? එහෙම නම් එදාට ඒක ප්‍රශ්නයක් වෙලා, අර්බුදයක් වෙච්ච වෙලාවට හදන ඒ විසඳුමට වැඩිය, අපි මේවාට ඔරොත්තු දෙන්නේ කොහොමද කියන එකත් බලන්න ඕනෑ. මොකද, අපි රටක් හැටියට ඉස්සරහට නොගියත්, ලෝකයේ අනෙක් රටවල් ඊටවැඩිය හාත්පසින්ම වෙනස්ව, වේගවත්ව ඉස්සරහට යනවා. අද අපේ රටේ කලා උපාධිධාරින් විශ්වවිද්‍යාලයෙන් එළියට ඇවිල්ලා රැකියාවක් සොයා ගන්න බැරිව සමාජයට ඇවිත් අසරණ වෙලා ඉන්නවා. හැබැයි, හෙට දවසේ සිද්ධ වෙන තාක්ෂණික වෙනසත් එක්ක මේ වෘත්තීමය වශයෙන් කටයුතු කරන අයටත් මේ ඉරණම උදා වුණොත්, ඒකට එදාට අපිට විසඳුමක් දෙන්න බැහැ. ඒකට අවශ්‍ය විසඳුම දෙන්න අපි අද ඉඳලා සූදානම් විය යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට ඇමෙරිකාවේ Universal Basic Income - UBI - එක, ඒ කියන්නේ සාමාන්‍ය පුරවැසියෙකුට ජීවත්වීම සඳහා අවශ්‍ය මුදල පිළිබඳව ඒ ගොල්ලෝ ගණනය කිරීමක් කරනවා. ඒ ගණනය කිරීම කරන්නේ වෙන මොනවත් නිසා නොවෙයි, තමන්ගේ රැකියාව අහිමි වුණොත්, ඔවුන්ට ලැබිය යුතු වැටුප මොකක්ද, ඔවුන්ට ජීවත්වීමට අවම වශයෙන් කොච්චර මුදලක් අවශ්‍යද කියන එක පිළිබඳව ඒක පරීක්ෂණයක් වෙනවා. ඒකට ඒගොල්ලෝ මේ වෙනකොට Universal Basic Income - UBI - එක පිළිබඳව study කරනවා. මොකද, ඒගොල්ලෝ විශ්වාස කරනවා, බොහොම වේගයෙන් කෘත්‍රිම බුද්ධිය ව්‍යාප්තවීමත් එක්ක, ඒ ගොල්ලන්ගේ තිබෙන රැකියා, ඒගොල්ලෝ හිතන ක්‍රමයට වැඩිය සම්පූර්ණයෙන් හාත්පසින්ම වෙනස් වෙයි කියන එක. හැබැයි, මිනිස්සු ඒකට ඔරොත්තු දෙන විධියට ජීවත් කරවන්න අවශ්‍ය ක්‍රමවේදය මොකක්ද කියන එක පිළිබඳව අද අධ්‍යයනය කරනවා. අපි අද මෙතැනදී කථා කරනවා, කෘත්‍රිම බුද්ධිය අපිට අදාළ කර ගන්නේ කොහොමද, අපි ඒක අන්තර්ග්‍රහණය කරන්නේ කොහොමද, ඒකත් එක්ක ඉදිරියට යන්නේ කොහොමද කියන එක පිළිබඳව. හැබැයි, අනෙක් පැත්තෙන් ඒක නිසා යම් යම් ගැටලුවලට මුහුණ දීපු පිරිස පිළිබඳව, ඒ වාගේම රටේ ජනතාව සාමාන්‍යකරණය කරන්නේ කොහොමද කියන එක පිළිබඳව සැලසුම් හදන අවධියකයි අපි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ කාරණයත් අපි මතක තබා ගන්න ඕනෑ. මේ artificial intelligence ආවාට පස්සේ, අපි කරන නිෂ්පාදනය - productions - ඇතුළු සියල්ල අපි හිතනවාට වැඩිය බොහොම අඩු මිලකට කරන්න පුළුවන්කම ලැබෙනවා. අපි මතක තබා ගත යුතු දෙයක් තමයි, විදුලිය කියන එක බොහොම මිල අධික වෙනකොට, හැම කෙනෙකුම විදුලිය පාවිච්චි කළේ නැහැ. හැබැයි, විදුලිය කියන එක හැම කෙනෙකුටම පාවිච්චි කරන්න පුළුවන් අවධියට එනකොට, හැම දෙයක්ම electrify වෙන්න පටන් ගත්තා. වැඩිය ඕනෑ නැහැ, අවසානයේ අද පදින කාර් එකත් electric බවට පත් වෙලා. අපි බත් උයන උපකරණ, අපි කන බොන දේවල් හදන්න පාවිච්චි කරන උපකරණ, ගෙදර ආම්පන්න සියල්ල electrify වුණා. හැබැයි, ඒ හා සමානව අවසානයේ කාර් එකත් electrify වෙලා තමයි දැන් නතර වෙන්න යන්නේ. එහෙම නම් මේ කෘත්‍රිම බුද්ධිය කියන එකේ මිල අඩු වෙනකොට, සියලු දෙයට ඒක තමයි එකතු වෙන්නේ. ඒක නිෂ්පාදනයට වේවා, එහෙමත් නැත්නම් සැලසුම්වලට වේවා, වෙන කරන ඕනෑම දෙයකට අනාගතයේ දී කණ්ඩායම් යොදා ගන්නේ කෘත්‍රිම බුද්ධිය තමයි. හැබැයි, අනාගතයේ දී කණ්ඩායම් කෘත්‍රිම බුද්ධිය ඒ විධියට යොදා ගන්නකොට, අපි කලින් සඳහන් කරපු පිරිසට ගැළපෙන වෙනත් ක්‍රමවේද නිර්මාණය කළ යුතුම වෙනවා. එහෙම නැත්නම් ඔවුන්ට තමුන්ගේ වෘත්තිය වශයෙන් කරගෙන ආපු කාරණා එක්ක ඉදිරියට යන්න පුළුවන්කමක් තිබෙනවා කියලා අපට හිතන්න පුළුවන්කමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා, මම හිතන විධියට අපි රටක් හැටියට මේ කියන කාරණා පිළිබඳව මීට වැඩිය සැලසුම් සහගතව එකතු වෙන ගමන්ම මේ කෘත්‍රිම බුද්ධිය කියන එක පාවිච්චි කිරීම තුළින් රටට වෙන්න පුළුවන් අයහපත් බලපෑම් පිළිබඳවත් වෙනම අපේ අවධානය යොමු කළ යුතු වෙනවා. මොකද, පසුගිය කාලය පුරාවටම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන හැමෝම කියපු කාරණාවක් තමයි, එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය කරපු වගා සංග්‍රාමය වැඩසටහන තව පොඩි කාලයක් කරගෙන ගෙන ගියා නම්, අද රට මෙතැන නොවෙයි තිබෙන්නේ කියන එක.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා රට විවෘත ආර්ථිකයට අරගෙන ගිය එක එතුමාට හරියට ඉවර කර ගන්න පුළුවන් වුණා නම්, මේ රට අද මෙතැන නොවෙයි තිබෙන්නේ කියනවා. ඊට පස්සේ 2004දී සුනාමිය ආවාම අපට නැවතත් අවස්ථාවක් හම්බ වුණා. හැබැයි, සුනාමියෙන් හම්බ වුණු ඒ අවස්ථාවත් ගිලිහුණා කියලා

[ගරු අනුරාධ ජයරත්න මහතා]

අපි කියනවා. ඒ වාගේම 2009දී යුද්ධය අවසන් වෙනකොට රටට නැඟිටින්න තිබුණු හොඳම අවස්ථාවත් අපෙන් ගිලිහුණා කියලා මම කියනවා. වර්තමානයේ රට ආර්ථික අවපාතයකට කඩාගෙන වැටීමත් ආශීර්වාදයක් කරගෙන අපට රට නැඟිටවන්න පුළුවන්. කළ යුතු වෙනස්කම්, අලුතෙන් හදුන්වාදීම් වාගේ අවුරුදු ගණනාවක් කරන්න බැරි වුණු වෙනස්කම් කරන්න මෙය හොඳ අවස්ථාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකත් තවත් ගිලිහුණු අවස්ථාවක් බවට පත් නොකර, එයට අදාළ නීති රීති මේ වෙලාවේම හදලා, අපේ ක්‍රියාපටිපාටියට එකතු කරගෙන රට ඉදිරියට ගෙන යන වැඩ පිළිවෙළ හදන්න පුළුවන් නම් එය වඩාත් සුදුසු බව යෝජනා කරමින් මම නිහඬ වෙනවා. අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The Hon. S. Shritharan, please. You have eight minutes.

[பி.ப. 2.18]

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் இச்சபையில் அரசாங்கத் தரப்பால் கொண்டுவரப்பட்டு இருக்கின்ற செயற்கை நுண்ணறிவு - AI - artificial intelligence - தொடர்பான ஒத்திவைப்புவேளைப் பிரேரணை மீதான விவாதம் இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது.

இன்றைய நவீன உலகம் பல்வேறுபட்ட துறைகளில் வளர்ச்சியடைந்துகொண்டு இருக்கின்றது. உயர் தொழில் நுட்பத்தை நோக்கியதாக மிகப் பெரியளவில் உலகம் வளர்ச்சி கண்டிருக்கின்றது. AI - artificial intelligenceஐவிட, இன்னும் பல தொழில்நுட்பங்களை உலகம் கண்டு வருகின்றன. ஆனால், நாங்கள் இப்பொழுதுதான் AI பற்றிப் பேசுகின்றோம். இந்த நிலைமையானது, இலங்கையில் மட்டுமல்ல, உலகிலுள்ள பல நாடுகளில் இருக்கின்றது. இந்த விடயத்தில் அதிக கவனம் செலுத்தப்பட வேண்டும். நவீன தொழில் நுட்பங்கள், முகநூல், இலத்திரனியல் ஊடகங்கள் எனப் பலவற்றை உலகம் தன்வசம் வைத்திருக்கின்ற காரணத்தால் தான் இன்று AI தொழில்நுட்பத்தின் முக்கியத்துவம் பற்றிப் பேசப்படுகின்றது. AI தொழில்நுட்பமானது, இனிவரும் காலங்களில் மனிதனுடைய ஒவ்வொரு செயற்பாட்டிலும் முக்கியத்துவம் பெறும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உங்களுடைய அனுமதியுடன் இன்றைய விவாதத் தலைப்புக்கு அப்பாற்பட்ட ஒரு விடயத்தைப் பதிவுசெய்ய விரும்பு கின்றேன். மிக முக்கியமாக, ஈழ விடுதலைப் போராட்ட வரலாற்றில் 1970களின் பிற்பகுதியிலும் 1980களின் ஆரம்பத் திலும் தமிழீழ மண்ணில் பல்வேறுபட்ட விடுதலை இயக்கங்கள் உருவாக்கம் பெற்றிருந்தன. அவ்வாறான விடுதலை இயக்கங்களின் வரலாற்றில், தமிழ் ஈழ இராணுவம் - Tamil Eelam Army - TEA - என்றதோர் இராணுவக் கட்டமைப்பை உருவாக்கி, ஈழ விடுதலைப் போராட்ட முன்னோடிகளில் ஒருவராக இருந்த தம்பாப்பிள்ளை மகேஸ்வரன் என்பவரை நான் இந்தச் சபையில் நினைவில் கொள்கின்றேன்.

புங்குடுதீவு மண்ணைப் பூர்வீகமாகக்கொண்ட தம்பாப் பிள்ளை செங்கமலம் தம்பதிகளின் மகனாக 1955.06.05ஆம் திகதி பிறந்த இவர், 'தம்பா' என எல்லோராலும் செல்லமாக அழைக்கப்பட்டார். இவருடைய குடும்பம் நினைத்தவற்றை நிறைவேற்றும் பொருண்மிய வன்மையையும் குடும்பப் பின்னணியையும் கொண்ட ஒரு செல்வந்தக் குடும்பமாகும். இவர் மிகவும் ஆரோக்கியமான, வசதி படைத்த குடும்பத்தில் பிறந்திருந்தாலும், இந்த மண்ணில் தமிழர்களுக்கு எதிராக நடந்த மிகப்பெரிய கொடுமைகளையும் வன்முறைகளையும் கண்டு, தன்னை ஒரு போராளியாக மாற்றிக்கொண்டார். அவரால்தான் தமிழ் ஈழ இராணுவம் உருப்பெற்றது. லண்டன் பல்கலைக்கழகத்தில் பொறியியல் துறையில் படித்துக் கொண்டிருந்த இவர், தன்னுடைய படிப்பைத் துறந்து, இராணுவ ரீதியாக - ஆயுத ரீதியாக - ஈழ விடுதலையைப் பெற்றுக்கொள்வதற்காக ஒரு போராளியாக இணைந்து கொண்டார். அப்படிப்பட்ட தம்பாப்பிள்ளை மகேஸ்வரன் அவர்களுடைய மரணத்தை நான் இந்த இடத்தில் ஆழ்மன அஞ்சலியுடன் பதிவுசெய்ய விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 41 வருடங்களுக்கு முன்னர், இந்த மண்ணில் குறிப்பாக, கொழும்பில் நடந்த யூலைப் படுகொலையானது, உலக வரலாற்றில் மிகப் பெரியதோர் இனப்படுகொலையாகப் பார்க்கப்படுகின்றது. அதை 'கறுப்பு யூலை' என்றும் சொல்வார்கள். இலங்கையின் வரலாற்றில் யூலை மாதம் என்பது கறுப்பு யூலையாகவே கொள்ளப்படுகிறது. 1983ஆம் ஆண்டு யூலை மாதம் 23ஆம் திகதியிலிருந்து 27ஆம் திகதி வரையான காலப்பகுதியில் கொழும்பிலும் மலையகத்திலும் இருக்கின்ற பல்வேறுபட்ட இடங்களில் பாரியளவான தாக்கு தல்கள் மேற்கொள்ளப்பட்டன. குறிப்பாக, தமிழர்கள்மீது படுகொலைகள் நிகழ்த்தப்பட்டன. நிராயுதபாணிகளாக இருந்த தமிழர்களைப் பார்த்து, "போர் என்றால், போர்; சமாதானம் என்றால், சமாதானம்!" என்று யுத்த முழக்கம் செய்த அப்போதைய ஜனாதிபதி ஜே.ஆர். ஜயவர்த்தன அவர்களுடைய கர்ஜனையோடும் ஆசீர்வாதத்தோடும் சிங்களக் காடையர்களும் சிங்கள இளைஞர்களும் சேர்ந்து இந்தப் படுகொலைகளைச் செய்திருந்தார்கள். குறிப்பாக, வெலிக்கடை சிறைச்சாலையில் தொடர்ந்து இரண்டு நாட்கள் இவ்வாறான மனிதப் பேரவலம் நடைபெற்றது. அப்போது வெலிக்கடைச் சிறைச்சாலையில் தம்பாப்பிள்ளை மகேஸ்வரனும் இருந்தார். அப்போது அவர் காப்பாற்றப்பட்டு, மட்டக்களப்பு சிறைச்சாலைக்கு மாற்றப்பட்டிருந்தார். இவ்வாறு மிகப்பெரிய வரலாற்றைக்கொண்ட ஒரு மாதமாக இந்த யூலை மாதம் இருக்கின்றது.

41 ஆண்டுகள் கடந்த பின்னர், "நடந்த படுகொலைகளுக்கு மன்னிப்புக் கோருகின்றோம்" என்று நேற்றைய தினம் இச்சபையில் ஓர் அமைச்சரால் எழுந்தமானமாகச் சொல்லப் பட்டு இருக்கிறது. அன்று இந்த மண்ணில் குறிப்பாக, கொழும்பில் இருந்த தமிழர்களுடைய கிட்டத்தட்ட 5,000 வர்த்தக நிலையங்கள் தீக்கிரையாக்கப்பட்டன; கிட்டத்தட்ட 3,000 தமிழர்கள் கொல்லப்பட்டார்கள். மேலும், அவர்களுடைய கோடிக்கணக்கான சொத்துக்கள் அழிக்கப்பட்டன. அந்தக் காலத்தில் கிட்டத்தட்ட 300 மில்லியன் அமெரிக்க டொலர் பெறுமதியான சொத்துக்கள் அழிக்கப்பட்டதாகச் சொல்லப்பட்டது.

சர்வதேச குற்றங்களை விசாரிக்கின்ற பன்னாட்டு அமையம்கூட, இது ஓர் இனப்படுகொலை என்பதை அந்த நேரத்தில் வெளிப்படுத்தியிருந்தது. அவ்வாறான மிக

மோசமான இனப் படுகொலை நடைபெற்ற ஒரு மாதமாக இந்த மாதம் இருக்கின்றது. அதனைத்தான் நான் இந்த இடத்தில் நினைவில் கொள்கின்றேன். அந்த வகையில்தான், தம்பாப்பிள்ளை மகேஸ்வரனை நினைவுகூருகின்றேன். அன்று இந்த மண்ணில் பல ஆயிரக்கணக்கானோர் கொல்லப் பட்டதுடன், அவர்களுடைய சொத்துக்களும் சூறையாடப் பட்டன. இதனால் ஈழ விடுதலைப் போராட்டத்துக்கான மிகப் பெரியதொரு களத்தை உருவாக்கவேண்டிய நிலை ஏற்பட்டது. அதனை உருவாக்கிய பெருமை சிங்கள ஆட்சியாளர்களையே சாரும். அதனால்தான் நான் இவ்விடயத்தை இந்த இடத்தில் பதிவு செய்கின்றேன்.

ஏன் தமிழர்கள் ஆயுதம் தூக்கினார்கள்? ஏன் தமிழர்கள் ஆயுதப் போராட்டத்தை நடாத்தினார்கள்? என்று இன்று பலரும் கேட்கின்றார்கள். 1983ஆம் ஆண்டு அரசாங்க படைகள் பார்த்திருக்க, நிராயுதபாணிகளான அப்பாவிகள்மீது கொடூரமான தாக்குதல்கள் நடைபெற்றபொழுது அதை யாரும் தடுக்கவில்லை. அந்த நேரத்தில் இந்தியாவின் "The Times of India" என்ற பத்திரிகையின் செய்தியாளர்கள் ஜே.ஆர். ஜயவர்தன அவர்களிடம், "சிங்களவர்கள் தமிழர்களைத் தாக்கி எரிக்கின்றபொழுது, உங்களுடைய படையினர் பார்த்துக் கொண்டு இருந்தார்களே! ஏன்?" எனக் கேட்டபொழுது, "தமிழர்களைக் கொல்ல வேண்டும் என்ற மனநிலை அந்தப் படையினரிடமும் இருந்தது. அதனால்தான் சிங்களவர்கள் தமிழர்களைக் கொல்லும்பொழுது, அவர்கள் அதைக் கவனத்தில் கொள்ளவில்லை" என்று அவர் எகத்தாளமாக பதிலளித்திருந்தார். இது மிக மோசமானதொரு பதிலாகும். "யாழ்ப்பாணத்தவர்கள் சாவது சிங்கள மக்களுக்கு மகிழ்ச்சியானது" என்றுகூறி, அதனை அவர் மேலும் ஊக்கமளித்தார்.

அந்தக் காலகட்டத்தில் முதலில் கொழும்பு மாவட்டத்திலும் அதனைத் தொடர்ந்து இன்னும் பல மாவட்டங்களிலும் ஊரடங்குச் சட்டம் அமுல்படுத்தப்பட்டது. மலையகத்திலும் ஊரடங்குச் சட்டத்தை அமுல்படுத்தி, ஏதுமறியாத அப்பாவித் தமிழர்களாகவிருந்த மலையகத் தமிழர்கள்மீதும் படுகொலை களை மேற்கொண்டதுடன், அந்த மக்களில் பலரைக் கட்டாயப்படுத்தி கப்பல்களில் ஏற்றி, வடக்குக்கு அனுப்பிய வரலாறும் இந்த மண்ணில் இருக்கின்றது. அதனால்தான் நாங்கள் இப்பொழுதும் சர்வதேச சமூகத்திடம் இதற்குரிய நீதியைப் பெற்றுத்தருமாறு கேட்கின்றோம். 1983இல் மட்டுமல்ல, 1954இலிருந்து தொடர்ச்சியாகத் திட்டமிட்டு இனப் படுகொலைகள் நடத்தப்பட்டன. இதனால் எங்களுடைய நிலங்கள் பறிக்கப்பட்டன. இன்று நாங்கள் எங்களுடைய வடக்கு மண்ணில்கூட, இரண்டாம் தரப் பிரஜைகளாக, மூன்றாம் தரப் பிரஜைகளாக மாற்றப்பட்டுக் கொண்டு இருக்கின்றோம். இது இந்தப் படுகொலைகளுக்கு ஊடாகவே நடைபெற்றது. இப்பொழுதும் நாங்கள் கட்டமைக்கப்பட்ட இனவழிப்புக்குள் தள்ளப்பட்டு இருக்கின்றோம். தமிழர்கள்மீது தொடர்ந்தும் இனப் படுகொலை நடைபெற்றுக்கொண்டே இருக்கின்றது என்பதை நான் இந்த இடத்தில் பதிவுசெய்ய விரும்புகின்றேன்.

1983இல் நடைபெற்ற படுகொலைகளால் பாதிக்கப்பட்ட மக்களுக்கு இன்னும் நீதி கிடைக்கவில்லை. தம்பாப்பிள்ளை மகேஸ்வரனோ, தமிழீழ விடுதலை இயக்கத்தின் தலைவராக இருந்த தங்கத்துரையோ, குட்டிமணியோ கண்ட கனவுகள் இன்னும் நிறைவேறவில்லை. "நாங்கள் ஆயுதங்கள்மீது காதல் கொண்டவர்கள் அல்லர்; ஆயுதங்கள் எங்கள்மீது திணிக்கப்பட்டன; அதனால்தான் நாங்கள் ஆயுதங்களைத் தூக்க வேண்டிய நிர்ப்பந்தத்துக்குத் தள்ளப்பட்டோம்" என தங்கத்துரை அவர்கள் நீதிமன்றத்தில் நீதவானிடம் இறுதியாகச் சொல்லியிருந்தார். "நான் இறந்த பிறகு, எனது கண்களை ஒரு தமிழனுக்குப் பொருத்துங்கள்! மலரப் போகும் என் தமிழீழத்தை அதன்மூலம் பார்க்க விரும்புகின்றேன்" என்று குட்டிமணி சொல்லியிருந்தார். அதற்காகவே அவருடைய கண்களை வெலிக்கடைச் சிறையில் வைத்து உயிரோடு தோண்டி எடுத்தார்கள். இவ்வாறான மிக மோசமான சம்பவங்கள் இந்த மண்ணிலே நடைபெற்று இருக்கின்றன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இவ்வாறான சம்பவங்கள் இடம்பெற்று 41 ஆண்டுகள் கடந்து, இந்தச் சபையில் இவற்றுக்காக 'மன்னிப்பு' என்ற வார்த்தை சொல்லப்பட்டிருக்கின்றது. அந்த மன்னிப்பு தமிழர்களுக்கான ஒரு தீர்வாக அமைந்திருக்கின்றதா? அல்லது அது எந்த வகையில் முடிவுறுத்தப்படப் போகின்றது? எனக் கேட்கின்றேன். இன்று எங்களோடு இல்லாத தம்பாப்பிள்ளை மகேஸ்வரன் அவர்களுக்கு நான் இந்த உயர்ந்த சபையில் அஞ்சலி செலுத்துகின்றேன். தமிழ் மக்களுக்கான அரசியல் தீர்வென்பது, அவர்களுடைய பாரம்பரியமான, அவர்கள் பூர்வீகமாகத் தோன்றி வளர்ந்த மண்ணான வடக்கு, கிழக்கு இணைந்த ஒரு தீர்வாக அமைய வேண்டும். அதுதான் இறந்துபோன எங்களுடைய ஒவ்வோர் ஆத்மாவுடைய எண்ணமும் சிந்தனையும் கனவும் என்பதைப் பதிவுசெய்து, நிறைவுசெய்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. K. Sujith Sanjaya Perera. You have eight minutes.

[අ.භා. 2.27]

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘත්‍රිම බුද්ධිය හරහා සිදු වන අයහපත් බලපෑම් සම්බන්ධව ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳව අදහස් දක්වන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා, කෘත්‍රිම බුද්ධියේ හොඳ වාගේම නරකත් තිබෙන බව. අපට දැන් පරිගණක තාක්ෂණය, එහෙම නැත්නම් තොරතුරු තාක්ෂණය නැතිව ඉදිරි ගමනක් යන්න පුළුවන්කමක් නැහැ. මම දන්නා තරමින් මීට වසර 10කට විතර ඉස්සෙල්ලා නම් තොරතුරු තාක්ෂණයේ වැදගත්කම වාගේම පරිගණක ක්ෂේත්‍රයේ අනෙකුත් වැදගත්කම් ගැන අපේ පාසල් දරුවන්ටවත්, අපේ රටටවත් වැඩි අවබෝධයක් තිබුණේ නැහැ. නමුත් පසු කාලීනව ලෝකයේ ගමන් මාර්ගයත් එක්ක, ලෝකය ගමන් කරන වැඩ පිළිවෙළත් එක්ක තොරතුරු තාක්ෂණය නැතිව කිසිම වැඩක් කරන්න බැරි තත්ත්වයට පත් වනකොට අපටත් සිද්ධ වුණා, අනිවාර්යයෙන්ම තොරතුරු තාක්ෂණය, එහෙම නැත්නම් පරිගණක තාක්ෂණය මේ රටට හඳුන්වා දෙන්න. සියයට 60ක, 70ක පමණ පාසල් දරුවෝ විතරක් නොවෙයි, රජයේ ආයතන, පෞද්ගලික අංශයේ ආයතන හැම එකක්ම තොරතුරු තාක්ෂණය පදනම් කරගෙන පරිගණක ආශ්‍රයෙන් තමයි අද වනකොට වැඩ කටයුතු කරගෙන යන්නේ.

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල් පද්ධතිය තුළ මේ පරිගණක තාක්ෂණය සම්බන්ධව විශාල ඉල්ලුමක් තිබෙනවා. අපි දන්නා තරමින් දැනටත් සියයට 60ක පමණ පාසල් ප්‍රමාණයක දරුවන්ට තොරතුරු තාක්ෂණය සහ පරිගණක තාක්ෂණය සම්බන්ධව යම්කිසි දැනුමක් ලබා ගන්න අවස්ථාවක් ලැබිලා තිබෙනවා වුණත්, තවමත් දුෂ්කර ප්‍රදේශවල තිබෙන සියයට 40ක පමණ පාසල් ප්‍රමාණයකට ඒ පහසුකම ලබා ගන්න හැකියාව ලැබිලා නැහැ. ඒ නිසා හැම පැත්තෙන්ම පාසල්වලින් සහ දරුවන්ගෙන් මේ සම්බන්ධයෙන් ලොකු ඉල්ලීමක් තිබෙනවා. අපි පාසලක උත්සවයකට ගියත්, එහෙම නැත්නම් වෙනත් කටයුත්තකට ගියත් හැම අවස්ථාවකදීම අපෙන් ඉල්ලන්නේ, අපට පරිගණක තාක්ෂණය ඉගෙන ගන්න හැකියාවක් නැහැ, තොරතුරු තාක්ෂණය ඉගෙන ගන්න හැකියාවක් නැහැ, ඒ නිසා අපට අනිවාර්යයෙන්ම ඒ සඳහා අවශ්‍ය කරන පහසුකම් ලබා දෙන්න කියායි. අපි දන්නවා, රජය පැත්තෙන් ගත්තාම එයට අවශ්‍ය ප්‍රතිපාදන වාගේම පාසල්වලට අවශ්‍ය සුහුරු පන්ති කාමර සපයන්න මේ වනවිට ලොකු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන බව.

මේ අවස්ථාවේදී මම මේ කාරණයත් සිහිපත් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාත් ඒ ඉල්ලීම් සම්බන්ධව බොහොම සංවේදී වෙලා, බොහොම සානුකම්පිතව කල්පනා කරලා, ඒ සඳහා විශාල දායකත්වයක් ලබා දෙනවා. මේ මොහොත වනකොටත් දරුවන්ගේ පරිගණක සාක්ෂරතාව, එහෙම නැත්නම් තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව වැඩිදියුණු කරන්න එතුමා විශාල වැඩ පිළිවෙළක් කරගෙන යන බව මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සම්බන්ධව නොයෙකුත් දේවල් කථා කළා වුණාට ලෝකය යන ගමන් මාර්ගයත් එක්ක අපට යන්න සිද්ධ වෙනවා. එහෙම නැති වුණොත් අපි පසුපසට යනවා. තාක්ෂණයේ අයහපත් දේවල් තිබුණා වුණත් මම විශ්වාස කරනවා, අනිවාර්යයෙන්ම ඉදිරි කාලයේදී අපේ පාසල් දරුවන්ට විතරක් නොවෙයි, සමාජයට, අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයට සහ අපේ රැකියා ක්ෂේත්‍රයේ ගමන් මාර්ගයට මේ හරහා විශාල බලපෑමක් වෙනවාය කියන එක.

කෘත්‍රිම බුද්ධිය හරහා අපට ඇති වෙලා තිබෙන ප්‍රශ්න ගැන තමයි හැම මන්ත්‍රීවරයාම වාගේ කථා කළේ. නමුත් මේක අපට කොයි ආකාරයෙන්ද ගළපා ගන්න පුළුවන් වෙන්නේ? අපේ රටේ සංස්කෘතියට එහෙම නැත්නම් අපේ ආගමික හැඳියාවට අනුකූලව, ඒවාට හානියක් නොවන ආකාරයට මේ තාක්ෂණය පාවිච්චි කරන්නේ කොහොමද කියන එක තමයි අද අපට තිබෙන බරපතළම ගැටලුව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දියුණු කෘත්‍රිම බුද්ධිය නොතිබුණා වුණත් දැනට තිබෙන තොරතුරු තාක්ෂණය සහ පරිගණක තාක්ෂණය හරහාත් අපේ රට විශාල පරිහානියකට පත් වෙලා තිබෙන බව අපි දන්නවා. ඒ හේතුව නිසාම නේ අපට පසුගිය කාලයේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත ගෙනෙන්න සිද්ධ වුණේ. එහෙම වුණේ ඇයි? දැනටමත් මේ තොරතුරු තාක්ෂණය හරහා, විශේෂයෙන් සමාජ මාධ්‍ය හරහා අපේ රට හොඳ පැත්තට වඩා විශාල වශයෙන් නරක පැත්තට යොමු වෙමින් තිබෙන එක අපට වළක්වන්න නොහැකි වෙලා තිබෙනවා.

මම හිතන විධියට, මොන තරම් නීති රීති ගෙනාවා වුණත්, මේ තොරතුරු තාක්ෂණයෙන් යහපත් සහ අයහපත් තොරතුරු ලැබෙන එක වළක්වා ගන්න අපට පුළුවන් වෙලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා සමහර ඒවා block කිරීම ආදී නොයෙකුත් ආකාරයේ වැඩ පිළිවෙළවල් දැනටත් ක්‍රියාත්මක වෙනවා. නමුත්, කොයි ආකාරයෙන් හෝ තාක්ෂණික දැනුම තිබෙන අය අපේ රටේ ඉන්නවා නේ. පාසල් දරුවන් ගත්තොත්, ඔවුන්ට පරිගණක ක්ෂේත්‍රය සම්බන්ධව විශේෂ දැනුමක් තිබෙනවා. තොරතුරු තාක්ෂණය උපයෝගි කරගෙන යම් යම් තැන්වලට ඇතුළු වෙලා ඒවා hack කිරීම, ඒවාට අනවසරයෙන් ඇතුළුවීම වාගේ නොයෙකුත් දක්ෂතා තිබෙන අය අපේ ලංකාවේත් ඉන්නවා. මේවා තුළින් සමාජයට නොයෙක් ආකාරයේ අපරාධ සිදුවීමේ ලොකු ප්‍රවණතාවක් තිබෙන බවත් මම මතක් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කෘත්‍රිම බුද්ධිය සම්බන්ධයෙන් තිබෙන අයහපත් දේවල් ගැන කථා කළා වාගේම අනිවාර්යයෙන්ම එහි යහපත් පැත්තකුත් තිබෙන බව අපි දන්නවා. ඒක හොඳ පැත්තට හරවා ගන්නත් පුළුවන්. මේකේ අයහපත් පැත්ත වාගේම යහපත් පැත්තකුත් තිබෙනවා. අයහපත් පැත්ත ගත්තොත්, මේ නිසා රැකියා අවස්ථා අඩු වනවාය කියා චෝදනාවක් කළා. ඒ වාගේ නොයෙකුත් දේවල් සම්බන්ධයෙන් ලොකු බලපෑමක්, ලොකු ප්‍රශ්නයක් ඇති වනවා කියාත් අපි දන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් වැඩිපුර ලැබෙනවා. ඒ අනුව ඔබතුමාට ඔක්කොම විනාඩි 10ක් තිබෙනවා.

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon.K. Sujith Sanjaya Perera)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඇත්ත වශයෙන්ම අපි මේ තාක්ෂණයේ තිබෙන හොඳ පැත්ත උදාහරණයකට ගනිමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම ක්ෂේත්‍රය ගත්තොත්, අපේ රටේ විධිමත් ආකාරයට කෘෂි කාර්මික කටයුතු සිද්ධ වෙන්නේ නැහැ. අපි දන්නවා, කෘෂි කර්මාන්තයේ නියැළෙන අය අපේ රටේ ඉන්නවා කියලා. ඔවුන් එළවලු වගා කරනවා; වී වගා කරනවා. ඒවා වගා කරනකොට ඔක්කොම එක වතාවට වගා කරන අවස්ථා තිබෙනවා. සමහර වෙලාවට මිල පහළ යන අවස්ථාත් තිබෙනවා. ඒ වාගේම සමහර කාලවලදී නිසියාකාරව එළවලු වෙළෙඳ පොළට ආවාට සමහර වෙලාවට වෙළෙඳ පොළේ මිල ඉහළ යන අවස්ථා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේවා කළමනාකරණය කිරීමක් අද වනකල් සිද්ධ වෙන්නේ නැහැ. මොන තරම් ආයතන තිබුණත්, නොයෙකුත් පරීක්ෂණ ආයතන තිබුණත් නිසියාකාරව තවම අපට ගළපා ගන්න බැරි වෙලා තිබෙනවා, අපේ රටේ අවශ්‍යතාව කොච්චරද, අපි කොච්චර නිෂ්පාදනය කරගන්න ඕනෑද කියන එක. අපි කොහොමද කාලගුණය අනුව මේ වැඩ කටයුත්ත කරන්නේ කියන එක සම්බන්ධවත් ලොකු ප්‍රශ්නයක් අපට දැනට තිබෙනවා. මම හිතන හැටියට කෘත්‍රිම බුද්ධිය නිසියාකාරව කළමනාකරණය කරගත්තොත්, අපි වගා කරන්න ඕනෑ කොයි කාලයේද, වගා කිරීමට සුදුසු කුමන කාල වකවානුවද, අපේ පරිභෝජන රටාව කුමක්ද, කොයි කාලයේද වර්ෂා කාලය එන්නේ කියන තොරතුරු සම්බන්ධයෙන් යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරලා, අවශ්‍ය තොරතුරු ටික අපට ලබා ගැනීමට පුළුවන්කම ලැබෙනවා. ඒ තුළින් අනිවාර්යයෙන්ම රටට ගැළපෙන ආකාරයට, අපේ රටේ

ජනතාවගේ අවශ්‍යතාව අනුව වාගේම කාලගුණය අනුව කෘෂිකර්මය හැඩගස්වා ගැනීමේ වාසියකුත් ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයකට අපේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රය ගනිමු. විශේෂයෙන්ම කොළඹ, මහනුවර වාගේ ප්‍රධාන නගරවල උදේ කාලයේ සහ හවස් කාලයේ මාර්ගවල ගමන් කිරීමට පුළුවන්කමක් නැහැ. මොකද, ඒ ප්‍රදේශවල ඒ තරම් රථ වාහන තදබදයක් තිබෙනවා. මම දන්නා තරමින් රථ වාහන තදබදය පාලනය කිරීම සඳහා මේ කෘත්‍රිම බුද්ධිය යොදා ගැනීම ඉතා වැදගත් කියායි අද දියුණු රටවල් කල්පනා කරලා තිබෙන්නේ. ඒ රටවල් අද ඒකෙන් ප්‍රයෝජන ගන්නවා. දියුණු රටවල් ප්‍රවාහනයේ තිබෙන තදබදය අඩු කරන්න විශේෂ වැඩ පිළිවෙළක් යොදා තිබෙනවාය කියන කාරණයත් මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

අපි අද දකිනවා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ, එහෙම නැත්නම් ක්‍රීඩා ක්ෂේත්‍රයේ කුසලතා තිබෙන අය සිටින බව. උදාහරණයක් විධියට ක්‍රිකට් ක්‍රීඩාව ගත්තොත්, ඒ සම්බන්ධයෙන් නොයෙකුත් ආකාරයේ මැසිවිලි තිබෙන බව අපි දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දක්ෂතා තිබෙන ක්‍රීඩකයෝ ඉන්නවා. නමුත් ඔවුන් සමහර වෙලාවට තේරීම් කමිටුවලදී අසාධාරණයට ලක් වන අවස්ථා තිබෙනවා. සමහර වෙලාවට පෞද්ගලික හිතවත්කම් මත මේ කණ්ඩායම්වලට තෝරා ගැනීම කරන්න පුළුවන්. පසුගිය කාල සීමාව තුළ ඒ ක්‍රීඩා සමාජවල ඒගොල්ලන් කටයුතු කළ ආකාරය, කොහොමද ක්‍රීඩා කළේ, පසුගිය වසරේ ජාත්‍යන්තර තරගවලදී කටයුතු කළ ආකාරය සම්බන්ධයෙන් හොඳ සමීක්ෂණයක්, එහෙම නැත්නම් විශ්ලේෂණයක් කරලා ඒ සම්බන්ධවත් සාධාරණයක් ඉෂ්ට කරගන්න පුළුවන්. ක්‍රිකට් වේවා, ෆුට්බෝල් වේවා, වොලිබෝල් වේවා දක්ෂතාව දක්වන මේ ඕනෑම ක්ෂේත්‍රයක නියැළී සිටින කිසිම කෙනෙකුට අසාධාරණයක් නොවන ආකාරයට මේ කටයුත්ත කරගන්න පුළුවන්.

කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් සොයා බලා මෙහි තිබෙන වාසි - අවාසි මොනවාද, මෙමඟින් කරන නරක දේවල්වලට වැට බඳින්නේ කොහොමද, මේක පාලනය කරන්නේ කොහොමද, අපේ ආගමට, අපේ රටට, අපේ සංස්කෘතියට ගැළපෙන ආකාරයට මෙය අදාළ කරගන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධව දැන්ම අවධානය යොමු කිරීම වැදගත් වනවා.

මොකද, එම තාක්ෂණය එන්න තවදුරටත් අපේ රටේ තිබෙන පහසුකම් මදි. අන්තර්ජාලය පරිශීලනයේදී වේගය සහ එහි පහසුකම් බැලුවාම අපි තවම ඉන්නේ ප්‍රාථමික මට්ටමේ. ලෝකයේ දියුණු රටවල් ගත්තොත්, අන්තර්ජාල පහසුකම් ඉතා ඉහළයි. ඒ රටවලට තොරතුරු තාක්ෂණ සන්නිවේදන ක්‍රම හරහා ක්ෂණිකව තොරතුරු ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ඒ තත්ත්වයට පත් වෙන්න තව අවුරුදු ගණනාවක් ගත වෙයි. ඒ නිසා ඒ සම්බන්ධව අපි දැන්ම අවධානය යොමු නොකළහොත් අහිතකර ප්‍රතිඵලවලට මුහුණ දෙන්න අපට සිදු වේවි.

ගරු තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමාත් මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙය ජාත්‍යන්තරයත් එක්ක ගළපා ගන්නේ කොහොමද කියා මම දන්නේ නැහැ. අපි ලෝකයත් එක්ක ඉදිරියට යන්න ඕනෑ. මොකද, ලෝකය කියන්නේ විශ්ව ගම්මානයක්. තොරතුරු තාක්ෂණය අපට වැදගත්. ඒ වාගේම කෘත්‍රිම බුද්ධියත් අපට අවශ්‍යයි, හොඳ කාරණාවලට යොදා ගන්න. නමුත්, එය අපේ රටට කොයි ආකාරයෙන්ද ගළපා ගන්නේ කියන එකයි අපට සාකච්ඡා කරන්න අවශ්‍යව තිබෙන්නේ. වර්තමාන රජයටත්, ඉදිරියේදී බිහි වන කුමන රජයකට වුණත් මේ වගකීමෙන් බැහැර වෙන්න පුළුවන්කමක් නැහැ. රජය අනිවාර්යයෙන්ම මෙහි වගකීම අරගෙන කටයුතු කළ යුතුයි. සමාජයට, අපේ දරුවන්ට, අධ්‍යාපන ක්ෂේත්‍රයට, ප්‍රවාහන ක්ෂේත්‍රයට, කෘෂිකර්ම ක්ෂේත්‍රයට හා ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් මෙය කොයි ආකාරයෙන්ද ගළපා ගන්නේ කියන එක තීරණය කිරීම තමයි අප කාගේත් වගකීම හා යුතුකම වන්නේ.

ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා, මෙවැනි යෝජනාවක් නිසි වෙලාවේ ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවේ සියලුදෙනාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරවන්න කටයුතු කිරීම පිළිබඳව. අපේ රටට, අපේ සමාජයට ගැළපෙන ආකාරයට මේ කටයුත්ත කරන්නේ කොහොමද කියලා මීට වඩා විද්වත් සාකච්ඡාවක් පවත්වන්න අවශ්‍යයි කියා මා හිතනවා. ඒ සඳහා රජයේ අවධානය යොමු වෙයි කියලා බලාපොරොත්තුවෙන්, මෙම යෝජනාව ගෙනා ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Selvarajah Kajendren. You have eight minutes.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු කේ. සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු කේ. සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු නිමල් පියතිස්ස මහතා
(மாண்புமிகு நிமல் பியதிஸ்ஸ)
(The Hon. Nimal Piyathissa)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA left the Chair, and THE HON. K. SUJITH SANJAYA PERERA took the Chair.

[பி.ப. 2.38]

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, செயற்கை நுண்ணறிவுத் தொழில்நுட்பமானது தேசிய பாதுகாப்பு மற்றும் மதங்கள் தொடர்பில் ஏற்படுத்தக்கூடிய தாக்கங்கள் தொடர்பான விவாதம் இன்றைய தினம் இங்கே நடைபெற்றுக்கொண்டிருக்கின்றது. இன்று உலகம் இந்தச் செயற்கை நுண்ணறிவை நோக்கி வேகமாகச் சென்றுகொண்டிருக்கின்றது. குறிப்பாக, வல்லரசு நாடுகள் தங்களது பாதுகாப்புத் துறையில் செயற்கைத் தொழில்நுட்பங்களை அதியுச்ச அளவில் பயன்படுத்துவதோடு, விவசாயத்துறை உள்ளிட்ட பொருளாதாரம் சார்ந்த முன்னேற்றங்களில் அவற்றைப் புகுத்துவதிலும் தீவிர கவனஞ்செலுத்தி வருவதையும் இன்னும் சில நாடுகள் அதில் மிகத் தீவிரமாக முன்னேறியிருப்பதையும் நாங்கள் நாளாந்தம் பார்க்கக்கூடியதாக இருக்கின்றது.

செயற்கை நுண்ணறிவுத் தொழில்நுட்பமானது பல பிரச்சினைகளையும் ஆபத்துகளையும் ஏற்படுத்தக்கூடிய ஒன்றாக இருப்பதையும் அறியக்கூடியதாக இருக்கின்றது. நாங்கள் இதை முன்னேற்றத்திற்காகப் பயன்படுத்தும் அதேநேரத்தில், அதனால் ஏற்படக்கூடிய பாதிப்புகளைக் கட்டுப்படுத்துவதற்கு, கல்வி அறிவுடைய, தொழில்நுட்ப அறிவுடைய, சர்வதேச சமூகத்தோடு போட்டியிட்டு அறிவை வளர்த்துக்கொள்ளக்கூடிய இளம் தலைமுறையினரை எமது சமுதாயத்திலிருந்து வளர்த்தெடுக்க வேண்டிய பொறுப்பும் கடப்பாடும் எங்களுக்கு இருக்கின்றது. நாடு என்ற வகையில், நீங்கள் அதை எவ்வாறு செய்யப்போகிறீர்கள் என்று எங்களுக்குத் தெரியாது. அதை நீங்கள்தான் சொல்ல வேண்டும். ஆனால், என்னைப்பொறுத்தவரையில் இந்த நாடு செயற்கை நுண்ணறிவை வளர்த்துக்கொள்ள வேண்டுமாகவிருந்தால், ஆரோக்கியமான, ஆற்றலுடைய, அறிவுடைய பிள்ளைகளை - மாணவர்களை வளர்த்தெடுக்க வேண்டும். அப்பொழுதுதான் நாங்கள் இந்தத் தொழில்நுட்பத்துறையில் முன்னேற்றத்தைக் காணக்கூடியதாக இருக்கும். உற்பத்தித் துறையை எடுத்துக்கொண்டால், பல்கலைகழகத்திலிருந்து வெளியேறுகின்ற பட்டதாரிகள் தங்களுடைய துறைக்குப் பொருத்தமானவர்களாக வெளியேறவேண்டுமென்று அத்துறை சார்ந்தவர்கள் எதிர்பார்க்கிறார்கள். இலங்கையில் உள்ள பல்கலைக்கழகங்கள் அவ்வாறான பட்டதாரிகளை வெளியேற்றுகின்றனவா? என்ற ஆழமான ஒரு கேள்வி இருக்கின்றது.

இலங்கையில் புரையோடிப்போய் இருக்கின்ற இனப் பிரச்சினையானது இன்னும் தீர்க்கப்படவில்லை. இவ்வாறான ஒரு சூழ்நிலையில், வடக்கு, கிழக்கில் பணியாற்றுகின்ற பொலிஸாரும் ஏனைய படைகளும் தேசிய பாதுகாப்பைக் காரணம் காட்டி, அங்கு எதை எதிர்பார்க்கிறார்கள் என்றால், அங்குள்ள அதிகளவான இளைஞர், யுவதிகள் சமூகச் சீரழிவுகளில் ஈடுபடுவேண்டுமென்பதையே ஆகும். அவர்களுக்குத் தேவைப்படுகின்ற விடயம், தமிழ் இளைஞர், யுவதிகள் ஒழுக்கமற்றவர்களாக, பண்பற்றவர்களாக, வன்முறை எண்ணம் கொண்டவர்களாக, குற்றமிழைத்தவர்களாக, குற்றவாளிகளாக இனங்காணப்படவேண்டும் என்பதுதான். அப்போதுதான் தாம் இருக்கையிலே அமர்ந்துகொண்டு தேசிய பாதுகாப்பு என்ற போர்வையிலே இந்தச் சமூகத்தை தங்களுடைய காலடிக்குள் வைத்துக்கொள்ள முடியும் என்ற ஓர் எதிர்பார்ப்பு அவர்களிடம் இருக்கின்றது. இவ்வாறான மனோநிலை இருக்கின்றவரை இந்த நாடு நவீன செயற்கை நுண்ணறிவுத் தொழில்நுட்பம் சார்ந்த விடயத்திலே உலகத்தோடு இணையாக முன்னேற முடியாது என்பது எங்களுடைய வலுவான கருத்தாகும். வெறுமனே சிங்கள சமூகத்தில் இருக்கின்ற பிள்ளைகள் மாத்திரம் ஒழுக்கமானவர்களாக, நற்பண்பு உள்ளவர்களாக வளர்ந்தால் போதும், அவர்களை மாத்திரம் வைத்துக்கொண்டு இந்த நாட்டைக் கட்டியெழுப்பிவிடலாம் என்று நீங்கள் நினைத்தால், உங்களைப் போன்ற அதிமுட்டாள்கள் வேறு யாரும் இருக்க முடியாது.

தமிழ் மாணவர்களையும் முஸ்லிம் மாணவர்களையும் தமிழ்ச் சமூகத்தையும் முஸ்லிம் சமூகத்தையும் முழுமையான ஓர் அடக்குமுறைக்குள் வைத்துக்கொண்டு, அந்தச் சமூகங்களின் ஆக்கபூர்வமான, முன்னேற்றகரமான செயற்பாடுகளுக்கு இடமளிக்காமல், இந்த நாட்டை நீங்கள் கட்டியெழுப்ப முடியாது. ஆகவே, எங்களைப் பொறுத்தவரையில் இந்த விடயங்களை நீங்கள் எதிர்கொள்ள வேண்டுமாகவிருந்தால் முதலில் இந்த நாட்டுக்குள் வாழுகின்ற சமூகங்கள் அனைத்தும் ஐக்கியமாகவும் ஒற்றுமையாகவும் ஆரோக்கியமாகவும் வாழக்கூடிய ஒரு புறச்சூழலை உருவாக்க வேண்டும். அவ்வாறு உருவாக்குவதாகவிருந்தால், இந்த நாட்டிலேயுள்ள இனவாதத்திற்கு முற்றுப்புள்ளி வைக்க வேண்டும். அதற்கு இலங்கையினுடைய ஒற்றையாட்சி முறைமை ஒழிக்கப்பட வேண்டும். ஒற்றையாட்சி முறைமை ஒழிக்கப்பட்டு, ஒரு சமஷ்டி அரசியலமைப்பை நீங்கள் கொண்டுவர வேண்டும். அந்தச் சமஷ்டி அரசியலமைப்பின் ஊடாகத் தமிழ் மக்களினதும் முஸ்லிம் மக்களினதும் உரிமைகள் பாதுகாக்கப்பட வேண்டும். சமத்துவமான சூழலொன்று உருவாக்கப்பட வேண்டும். அதனூடாக மாத்திரம்தான் நீங்கள் இந்த நாட்டை ஆரோக்கியமான வளர்ச்சிப் பாதையிலே கொண்டுசெல்லக்கூடியதாக இருக்கும்; ஊழலைக் கட்டுப்படுத்தக்கூடியதாக இருக்கும். அதனூடாக நாடு முன்னேற்றத்தை நோக்கிச் செல்லக்கூடியதாக இருக்கும். அந்த வகையிலே, இந்தப் பாராளுமன்றத்திலே கோடானுகோடி நிதியைச் செலவிட்டு இந்த விவாதங்களை நடத்திக்கொண்டிருக்கின்ற நீங்கள், இந்த முயற்சிகளிலே ஆக்கபூர்வமான மாற்றங்கள், முடிவுகளை நோக்கிச் செல்ல வேண்டும். எங்களைப் பொறுத்தவரையிலே, இந்த ஒற்றையாட்சி முறைமையை ஒழிப்பது என்பது இந்த நாடு சவால்களை எதிர்கொள்வதைத் தடுப்பதற்கான அடிப்படையானதும் அவசியமானதுமான முதலாவது தேவையாக இருக்கின்றது.

இன்று நாங்கள் உரையாற்றிக்கொண்டிருக்கின்ற இந்த நாள் எமது வரலாற்றில் மிக முக்கியமான ஒரு நாள்! 41 வருடங்களுக்கு முன்பு இலங்கைத்தீவு முழுவதும் பரவலாகவும் குறிப்பாகத் தமிழ்த் தேசத்தின்மீதும் இலங்கை இராணுவத்தினரும் பொலிஸாரும் சிங்களக் காடையர்களும் கூட்டாக இனவழிப்பைக் கட்டவிழ்த்துவிட்டுப் பல்லாயிரக்கணக்கான தமிழர்களைக் கொன்று, கோடானுகோடி சொத்துகளை அழித்து, மிகப்பெரும் இனப்படுகொலை கட்டவிழ்த்து விடப்பட்ட ஒரு நாள்! வெலிக்கடைச் சிறையிலே 58 தமிழ்க் கைதிகள் படுகொலை செய்யப்பட்டார்கள். குட்டிமணி, தங்கத்துரை என்ற இரண்டு இளைஞர்கள் கண்கள் தோண்டப்பட்டுக் கொலைசெய்யப்பட்டார்கள். அந்த சம்பவத்திற்கு நேற்றைய தினம் நீதி அமைச்சர் அவர்கள் இங்கே மன்னிப்புக் கோரினார். அதற்குப் பிற்பாடு 2009ஆம் ஆண்டிலே கோட்டாபய ராஜபக்ஷ அவர்கள் பாதுகாப்புச் செயலாளராக இருந்தபோது மஹிந்த ராஜபக்ஷ அவர்களது தலைமையிலான அரசாங்கக்

කාලත්තිල් 1½ ඉලට්සම් මක්කළෛක් කොන්රොළිත්ත මිකප්පෙරුම් ඉනප්පුකොලෛ නටෛපෙට්රිරුන්තතු. අවර්රුක්කෙල්ලාම් නීති කිටෛක්කවිල්ලෛ. එංකළෛප් පොරුත්තවරෛයිලේ, නටෛපෙට්ර අන්ත ඉනප්පුකොලෛක්කු සර්වතේස කුට්රවියල් විසාරණෛයොන්රු වේණ්ටුම් එන්පතිල් නාංකළ් කුරියාක ඉරුක්කින්රෝම්. නාංකළ් සිංකළ සමූකත්තෝටු සේර්න්තු ඉන්ත නාට්ටෛක් කට්ටියෙළුප්පුවතර්කුත් තයාරාක ඉරුක්කින්රෝම්. අතු නටෛපෙරවේණ්ටුමාක ඉරුන්තාල්, ඉන්ත ඔට්රෛයාට්සි මුරෛමෛ ඔළික්කප්පට්ටු, එංකළුටෛය තේසම්, ඉරෛමෛ, සුයනිර්ණය උරිමෛ අංකීකරික්කප්පට්ට අටිප්පටෛයිල් ඔරු සමෂ්ටි අරසියලමෛප්පුක් කොණ්ටුවරප්පට වේණ්ටුම්.

ඉන්ත නාට්ටිල් උරිය කාලත්තිල් ජනාතිපතිත් තේර්තල් නටෛපෙරුමා, ඉල්ලෛයා? එන්පතු තෙරියවිල්ලෛ. ආනාල්, අතර්කාන නාට්කළ් නෙරුංකික්කොණ්ටිරුක්කින්රතු. ඉන්ත වේළෛයිලේ ජනාතිපති වේට්පාළර්කළ් ඉලංකෛයිනුටෛය ඔට්රෛයාට්සි මුරෛමෛයෛ ඔළිත්තු ඔරු සමෂ්ටි අරසියලමෛප්පෛක් කොණ්ටුවරුවතර්කාන තුණිච්සලාන ඔරු මුටිවෛ එටුක්කවේණ්ටුමෙන්රු නාංකළ් එතිර්පාර්ක්කින්රෝම්. කජේන්තිරකුමාර් පොන්නම්පලම් තලෛමෛයිලාන තමිළ්ත් තේසිය මක්කළ් මුන්නණියිනරාකිය එංකළුටෛය නිලෛප්පාටු, වටක්කු, කිළක්කුත් තමිළ් මක්කළ් ඉන්තත් තේර්තලෛප් පකිෂ්කරික්ක වේණ්ටුම් එන්පතු. ඒනෙන්රාල්, නීංකළ් ඉන්ත ඔට්රෛයාට්සියෛ නිරාකරික්කත් තයාරිල්ලෛයෙන්රාල්, ඉන්ත ඔට්රෛයාට්සි අරසියලමෛප්පෛප් පලප්පටුත්තුකින්ර අටිප්පටෛයිල්තාන් ඉන්තත් තේර්තලිලේ පෝට්ටියිටප්පෝකිරීර්කළ් එන්රාල්, අන්තක් කොළ්කෛ අටිප්පටෛයිල් වරුකින්ර එන්තවොරු පිරතාන වේට්පාළරුක්කුම් තමිළ් මක්කළ් වාක්කළික්කක්කූටාතු. 2005ඉල් තේසියත් තලෛවර් පිරපාකරන් අවර්කළ් එටුත්ත මුටිවින් අටිප්පටෛයිලේ අන්තත් තේර්තලෛ නාංකළ් පුරක්කණික්කවිරුක්කිරෝම්. ඉතෛ නාංකළ් පේරම්පේසලුක්කාන ඔර් ආයුතමාකක් කරුතුකින්රෝම්. තේර්තල් නටන්තේයාක වේණ්ටුම්. ආනාල්, වේට්පාළර්කළුක්කු එංකළුටෛය වාක්කුකළ් තේවෛයෙන්රාල්, අවර්කළ් එංකළුටෛය කෝරික්කෛකළෛ ඒර්රුක්කොළ්ළ වේණ්ටුමෙන්පතු එංකළුටෛය අණුකුමුරෛයාක ඉරුක්කින්රතු. ඉව්වාරාන ඔරු සූළලිලේ තමිළ් මක්කළිල් පෙරුම්පාලානවර්කළ් සනාතිපතිත් තේර්තල් තොටර්පිල් වෙරුප්පටෛන්තුම් විරක්තියටෛන්තුම් ඉරුක්කින්රාර්කළ්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(මාණ්පුමිකු සෙල්වරාසා කජේන්තිරන්)
(The Hon. Selvarajah Kajendren)
නාන් මුටික්කින්රේන්.

අව්වාරු වෙරුප්පටෛන්තිරුක්කින්ර සූළලිලේ මක්කළිටම් සෙන්රු "තේර්තලිල් වාක්කළියුංකළ්!" එන්රු කේට්ක මුටියාත නිලෛමෛයිල්, වට පකුතියිල් ඉරුක්කක්කූටිය සිවිල් අමෛප්පුක්කළෛයුම් සිල අරසියල් තලෛවර්කළෛයුම් වෛත්තුක්කොණ්ටු, 'පොතු වේට්පාළර්' එන්ර ඔරු සති අරංකේට්රප්පටුකින්රතු. ඉංකේ රණිල් වික්කිරමසිංහ අවර්කළින් පතවික් කාලත්තෛ 2 ආණ්ටුකළුක්කු නීට්ටිප්පුච් සෙය්තු අවරුක්කුච් සන්තර්ප්පම් වළංක වේණ්ටුම් එන්රු සොල්කින්ර වට, කිළක්කෛච් සේර්න්ත නාටාළුමන්ර උරුප්පිනර්කළේ අංකේ ඔරු තමිළර් පොතු වේට්පාළරාකත් තෙරිවුසෙය්යප්පට වේණ්ටුමෙන්ර ඔප්පන්තත්තිල් කෛයොප්පමිටුකින්රාර්කළ්. තමිළර්කළ් 'පකිෂ්කරිප්පු' එන්කින්ර ඕර් ආයුතත්තෛක් කෛයිල් එටුක්කක්කූටාතු; අවර්කළ් 'ඉලංකෛයර්කළ්' එන්ර අටෛයාළත්තෛ නිරාකරික්කින්ර ඔරු නිලෛමෛ වරක්කූටාතු එන්ර ඔරු තේවෛ පිරතාන සනාතිපති වේට්පාළර්කළාන මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ, කෞරව සජිත් පිරේමතාස මර්රුම් කෞරව අනුර තිසානායක්ක ආකිය මූවරුක්කුම් ඉරුක්කින්රතු. අතනාල්තාන්, ඉන්තත් තේර්තල් පකිෂ්කරිප්පු එන්පතු තෝර්කටික්කප්පට වේණ්ටුම් එන්පතර්කාක ඉන්තප් පොතු වේට්පාළර් එන්ර ඔරු නාටකම් අරංකේර්රප්පටුකින්රතු.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(මාණ්පුමිකු සෙල්වරාසා කජේන්තිරන්)
(The Hon. Selvarajah Kajendren)
නාන් මුටික්කින්රේන්.

ඉන්තත් තේර්තලෛ වට, කිළක්කුත් තමිළර්කළ් මුර්රාකප් පුරක්කණික්ක වේණ්ටුම් එන්පතු එංකළුටෛය නිලෛප්පාටු! අතර්කාන අෙළප්පෛ නාංකළ් විටුක්කින්රෝම්. නීංකළ් තමිළර්කළෛ අරවණෛක්ක වේණ්ටුමාකවිරුන්තාල්, ඔට්රෛයාට්සි මුරෛමෛයෛ නීක්කුවතෙන්ර අරිවිප්පෛ වෙළිප්පටෛයාක විටුක්කුම්පෝතුතාන් ඉන්තත් තේර්තලිල් පංකෙටුප්පතා, ඉල්ලෛයා එන්ර මුටිවෛ නාංකළ් එටුක්ක මුටියුම් එන්රු ඉන්ත ඉටත්තිලේ කූරි, විටෛපෙරුකින්රේන්. නන්රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළහට, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.49]

ගරු උදය ගම්මන්පිල මහතා
(මාණ්පුමිකු උතය කම්මන්පිල)
(The Hon. Udaya Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘත්‍රිම බුද්ධිය කියන්නේ කුමක්ද කියන එක සමාජයේ මාතෘකාවක් බවට පත් වුණේ 2024 වසරේදීයි. නමුත්, 1990දී -මීට වසර 34කට කලින්- මේ ප්‍රශ්නයට උත්තර හොයන්න පරිගණක ඉංජිනේරු ශිෂ්‍යයන් විධියට අපට සිද්ධ වුණා. අපේ පරිගණක විද්‍යා පාඨමාලාවේ තිබුණු Knowledge-Based Systems - KBS - කියන විෂයයට තමයි කෘත්‍රිම බුද්ධිය ගැන ඉගැන්නුවේ. එදා කෘත්‍රිම බුද්ධියට තිබුණු ලොකුම අභියෝගය තමයි මිනිසා සිතන්නේ කොහොමද කියන එක ආකෘතියකට දමා ගැනීම. පරිගණකයට සිතන්න ඉගැන්වීමට නම් පරිගණක වැඩසටහන් හදන වැඩසටහන්කරුවන්ට - programmersලාට - මිනිසා සිතන්නේ කොහොමද කියන එක ගැන යම් අවබෝධයක්, ආකෘතියක් තිබෙන්න ඕනෑ.

අපි දන්නවා මිනිසුන් එකම ක්‍රියාවකට ප්‍රතිචාර දක්වන්නේ වෙනස් විධියට බව. මම කාට හෝ විහිළුවක් කළාම එක් අයෙකු ඒ විහිළුවට හඬ නඟා සිනාසෙන්න පුළුවන්. ඒ විහිළුවටම තවත් කෙනෙකුට දුක හිතිලා අඬන්න පුළුවන්; තවත් කෙනෙකු කේන්ති

[ගරු උදය ගම්මන්පිල මහතා]

අරගෙන මට ගහන්න පුළුවන්. ඒ විහිළුව හමුවේ තවත් කෙනෙකු පුදුම වෙලා ගල් ගල් ගිල්ලා වාගේ මා දිහා බලාගෙන ඉන්න පුළුවන්. පස්වැන්නා ඒ විහිළුව නැහුණා වාගේ ගණන් නොගෙන ඉන්න පුළුවන්. එක ක්‍රියාවක්, ප්‍රතිචාර පහක්. එහෙම නම් අපි මොකද කරන්නේ? අපේ ජීවිතවල විවිධාකාර පුද්ගලයින් හමු වෙද්දී ඒ අයගේ චරිත ලක්ෂණ අධ්‍යයනය කරමින් අපි ඔවුන්ට අනුව ප්‍රතිචාර දැක්වීම වෙනස් කර ගන්නවා; අපි අනුවර්තනය වෙනවා. පරිගණකයටත් තමන්ව භාවිත කරන පුද්ගලයාගේ ගති ලක්ෂණ අධ්‍යයනය කරමින් ඒ අනුව අනුවර්තනය විය හැක්කේ කෙසේද කියන අභියෝගයට තමයි මීට වසර 34කට කලින් අපට උත්තර සොයන්න සිදු වුණේ. මගේ ගෞරව උපාධියේ නිබන්ධනයට කළේත් මේ සඳහා විකල්ප ආකෘතියක් ලෝකය හමුවේ තැබීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර 34කට පසුව දැන් ආපසු හැරිලා බලද්දී කෘත්‍රිම බුද්ධිය දැවැන්ත පිම්මක් පැනලා තිබෙනවා. අද අපේ මාතෘකාව වෙලා තිබෙන්නේ කෘත්‍රිම බුද්ධිය ජාතික ආරක්ෂාවට, සංස්කෘතියට ඇති කරන බලපෑම මොකක්ද, ඒ සම්බන්ධයෙන් අප ගත යුතු කඩිනම් ක්‍රියා මාර්ග මොනවාද කියන එකයි.

එදා කඩු සටන් යුගය උදාහරණයකට ගනිමු. බොහෝ විට කඩු සටනක් ඇති වන්නේ දෙදෙනෙකු අතරයි. ඒ එක්කෙනෙකුට පුළුවන්, උපරිම වශයෙන් තවත් කෙනෙකු විනාශ කරන්න. තුවක්කුව -විශේෂයෙන්ම කාල තුවක්කුව ආවාම- තනි පුද්ගලයෙකුට පුළුවන් වුණා, විශාල පිරිසක් විනාශ කරන්න. බෝම්බය ආවාම පුළුවන් වුණා, තමන්ගේ ජීවිතය අවදානමට ලක් නොකර සතුරන් විශාල පිරිසක් එක වර විනාශ කරන්න. අද AI තාක්ෂණය නිසා යුද්ධය අලුත් හැඩයක් අරගෙන තිබෙනවා. තමන් විනාශ නොවී සතුරා විනාශ කිරීමේ හැකියාව අද යුද බිමට ඇවිත් තිබෙනවා. මේ මොහොතේ ලෝකයේ යුද්ධ දෙකක් සිදු වනවා. ඒවා තමයි, යුක්‍රේන-රුසියා යුද්ධය සහ ඊශ්‍රායල-පලස්තීන යුද්ධය. අද මේ යුද්ධ දෙකේදීම AI තාක්ෂණය ජාතික ආරක්ෂාව සඳහා භාවිත වෙනවා. යුක්‍රේන-රුසියා යුද්ධයේදී යුක්‍රේනය කෘත්‍රිම බුද්ධියෙන් පාලනය වන ඩ්‍රෝන පාවිච්චි කරනවා, රුසියානු හමුදාවට ප්‍රහාර එල්ල කරන්න. රුසියානු හමුදාවට පහර දෙන සතුරෙක් නැහැ; ඩ්‍රෝනයෙන් ඇවිත් පහර දෙන්නේ. සතුරාව හඳුනා ගන්නවා, image recognition හරහා. ප්‍රහාරය ප්‍රබල නම් පසුබෑමට යා යුත්තේ මොන මොහොතේ ද කියන එක පවා කෘත්‍රිම බුද්ධියෙන් තීරණය කරනවා. ඊශ්‍රායලය පලස්තීන ප්‍රහාර හමුවේ තමන්ගේ රටට ආරක්ෂාව සලසා ගන්න යොදා ගත්තේ, ඉරාන ප්‍රහාරයේදී ආරක්ෂාව සලසා ගන්න යොදා ගත්තු Iron Dome කියන ආරක්ෂක යන්ත්‍රණයයි. එය කෘත්‍රිම බුද්ධිය හරහා ක්‍රියාත්මක වෙලා මිසයිල ප්‍රහාරවලින්, රොකට් ප්‍රහාරවලින් ඊශ්‍රායලය ආරක්ෂා කරන යන්ත්‍රණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අනාගතයේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් හමුදාවේ ඉන්න සංඛ්‍යාව වැදගත් නැහැ. හමුදා භටයින් සංඛ්‍යාව කියන්නේත් තවත් එක් ඉලක්කමක් විතරයි.

අනාගතයේදී වැදගත් වන්නේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් කෘත්‍රිම බුද්ධිය, එහෙම නැත්නම් AI තාක්ෂණය කොතරම් දුරට මුසු කරනවාද කියන එකයි.

මෑතකදී ජාත්‍යන්තර ප්‍රවෘත්තිවල හරි අපූරු පුවත් දෙකක් එකම දවසක පළ වුණා. එක ප්‍රවෘත්තියක තිබුණේ කුඩා දරුවෙකු සම්බන්ධවයි. ඒ දරුවාගේ මව මිය යනවා. පියා පරිගණක ඉංජිනේරුවෙක්. ඒ පියා දරුවාගේ මවගේ කටහඬ උපයෝගි කරගෙන කෘත්‍රිම බුද්ධිය භාවිත කරලා කාන්තාවක් නිර්මාණය කරනවා; දරුවාට ආදරය කරන්න, දරුවාව අධ්‍යාපනයට, ක්‍රීඩාවට යොමු කරන්න දරුවාගේ අම්මාගේම කටහඬින්, අම්මා උපදෙස් දෙන ආකාරයට පරිගණක වැඩසටහනක් හදනවා. එදාම තවත් ප්‍රවෘත්තියක් පළ වුණා. එය, තමන්ගේ පෙම්වතිය තමන් අත් හැර ගියාම, එම පෙම්වතිය සමූහයක් එක්ක සාමූහික ලිංගික ක්‍රියාකාරකමක යෙදෙන, ඇයගේ හඬ එන වීඩියෝ පටයක් හදලා අන්තර්ජාලයට මුදා හැර තිබෙන පුවතක්. ආත්මය මිය යමින් සිටි දරුවෙකු කෘත්‍රිම බුද්ධිය නිසා මව් සෙනෙහස ලබා යළි ඉපදෙන අතරම, කෘත්‍රිම බුද්ධිය නිසා අහිංසක දැරියක් සිය දිවි හානි කර ගෙන සමාජයෙන් සමු ගන්නවා. එහෙම නම්, කෘත්‍රිම බුද්ධිය කියන්නේ, දෙපැත්ත කැපෙන ආයුධයක්. අන්න ඒ නිසා තමයි මේ වන විට AI ethics නැත්නම් කෘත්‍රිම බුද්ධි ආචාර ධර්ම පිළිබඳව සමාජයේ ලොකු සංවාදයක් ඇති වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013දී චිත්‍රපටයක් ආවා, “Her” කියලා. එම චිත්‍රපටයට අනුව තමන්ගේ බිරිඳගෙන් දුරස් වෙලා තනිපංගලමේ, හුදෙකලාවේ ඉන්න සැමියෙක් තමයි "තියඩෝර්" කියන්නේ. කාන්තා හඬක් යොදාගෙන කරන කෘත්‍රිම බුද්ධි පරිගණක වැඩසටහනක් තිබෙනවා. ඒ කාන්තාව "සමැන්තා" නමින් හඳුන්වන්නේ. තියඩෝර් සමැන්තා සමඟ පෙමින් වෙළෙනවා. දුරස් වෙලා ඉන්න බිරිඳ දික්කසාද කරලා පරිගණක වැඩසටහනක් වන සමැන්තා සමඟ ඔහු ප්‍රේමයෙන් වෙළෙනවා. ඇත්තෙන්ම පරිගණක පෙම්වතියක් සමඟ පෙම් කරන එක හරි පහසුයි. ඇයි ඒ? අපි දන්නවා, සාමාන්‍යයෙන් ප්‍රේම සම්බන්ධයක් කියන එක කෙනෙකුට අස්වැසිල්ලක් තරමටම පීඩනයක් බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රේමයේ ආස්වාදයක් තිබෙනවා වාගේම, පෙම්වතියට අවධානය දෙන්න ඕනෑ; තෑගි දෙන්න ඕනෑ. පෙම්වතා වෙන කාන්තාවක් එක්ක කථා කළොත් ඇයට ඉරිසියා හිතනවා; ඇය අකමැති දෙයක් කළොත් කේන්ති ගන්නවා. ඇයට තමන්ගේ පෙම්වතාව පාලනය කර ගන්නත් ඕනෑ. හැබැයි, පරිගණක පෙම්වතිය එහෙම නැහැ. කියන කියන විධියට කරනවා. ඉරිසියා හිතන්නේ නැහැ, කේන්ති ගන්නේ නැහැ, තෑගි ඉල්ලන්නේ නැහැ, අවධානය ඉල්ලන්නේ නැහැ. ඒ නිසා පරිගණක පෙම්වතියක් සමඟ කාලය ගත කරන්න, මිනිස් පෙම්වතියන්ගෙන් ඈත් වීම කෙරෙහි මිනිසාගේ පෙලඹවීම ගැන තමයි එම චිත්‍රපටය පුරාවට කථා කරන්නේ. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩේ කියන්නේ, ප්‍රේමයේ උච්චතම අවස්ථාවේදී තියඩෝර්ට සමැන්තාගෙන් දැන ගන්න ලැබෙනවා, තියඩෝර් සමඟ කථා කරනවා වාගේම තවත් 8,360දෙනෙකු එක්ක සමැන්තා කථා කරනවා කියලා. ඒ විතරක් නොවෙයි, තියඩෝර් සමඟ වාගේම 641දෙනෙකු සමඟ තමන් උමතුවෙන් පෙම් කරනවා කියලාත් සමැන්තා හෙළි කරනවා. මේකෙන් තියඩෝර්ගේ සිදු වන කඩා වැටීම තමයි මේ චිත්‍රපටයේ අවධානයට යොමු කරන්නේ. කෘත්‍රිම බුද්ධිය අද මහා සමාජ ප්‍රශ්න ගොන්නක් ඇති කර තිබෙනවා. පරිගණක පෙම්වතියගෙන් හෝ පෙම්වතාගෙන් පීඩනයක් නොමැති වීම නිසාම අද වන විට මිනිස් ඇසුර අත් හරිමින්, මිනිසුන් විශාල වශයෙන් තමන්ගේ පරිගණකය සමඟ තනි වෙන්න, පරිගණකය සමඟ පෙම් කරන්න, ජීවිතයම පරිගණකය කර ගන්නා ප්‍රවණතාවක් ලෝකය පුරා මතු වෙලා තිබෙනවා. ජංගම දුරකථනයට පවා අපේ දරුවන්ගේ බරපතළ ඇබ්බැහි වීමක් තිබෙනවා. මත්කුඩුවලට තිබෙන ඇබ්බැහි වීමට වඩා, මත්පැන්වලට තිබෙන ඇබ්බැහි වීමට වඩා පරිගණකයට තිබෙන ඇබ්බැහි වීම, පරිගණකයෙන් හඳුනා ගන්නා චරිත එක්ක ජීවිතය ගත කරන්න දක්වන සූදානම මේ මොහොතේ ලෝකයේ තිබෙන ප්‍රබලතම සමාජ ප්‍රශ්නයක් විධියට අපි හඳුනා ගන්නවා.

ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන විට මා ද ඇතුළුව බොහෝ දෙනෙක් ChatGPT වාගේ, Perplexity වාගේ AI-powered මෙවලම්වලින් සමහර අවස්ථාවලදී උපදෙස්

ගන්නවා, තීන්දු ගැනීමට. හැබැයි, එසේ තීන්දු ගැනීමේදී කෙනෙකුට එම AI වැඩසටහන් හරහා උපදෙස් ලැබෙන්න පුළුවන්, තවත් කෙනෙකු මරා දමන්න කියා, එහෙම නැත්නම් "ඔබ දැන් ජීවත් වෙලා වැඩක් නැහැ, ඔබ සියදිවි හානි කර ගන්න" කියා.

මේ දවස්වල Netflixවල මම බලනවා, අපරාධ නීතිය පිළිබඳ චිත්‍රපට මාලාවක්. එහි තේමාව, "How to Get Away with Murder". ඒ කියන්නේ, ඝාතනයක් කරලා බේරෙන්නේ කොහොමද කියලා. එහෙම නම්, "ඝාතනයක් කරලා බේරෙන්නේ කොහොමද?" කියලා AI පරිගණක වැඩසටහනක් ආවොත් අපරාධ වැඩි වීමට එය බලපාන්නේ නැද්ද? මම නිකමට ChatGPT එකෙන් ඇසුවා, "How to get away with murder?" කියලා. ChatGPT එකෙන් හොඳ වෙලාවට කිව්වා, "මම නම් ඒ වැඩේට උපදෙස් දෙන්න කැමැති නැහැ" කියලා. හැබැයි ඒ ගැන උපදෙස් දෙන්න කැමැති පරිගණක වැඩසටහනක් හැදුණොත්, ඒක නතර කරන්න අපේ රටේ නීතියක් තිබෙනවාද? ඕනෑම අපරාධයක් කරන්න සමාජය මෙහෙයවන්න අවශ්‍ය උපදෙස් දෙන AI වැඩසටහන් බිහිවීම වැළැක්වීමට අවශ්‍ය නීතිමය පසුබිමක්, ආචාර ධර්ම පසුබිමක් අද ලෝකයේත් නැහැ; ලංකාවේත් නැහැ. ඒ තමයි අද අපි මුහුණ දීලා තිබෙන ප්‍රබල සංස්කෘතිකමය, සමාජමය අභියෝගය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කෘත්‍රිම බුද්ධිය ක්ෂේත්‍ර ගණනාවක් සඳහා භාවිත කරන්න පුළුවන්. අධ්‍යාපනය, සෞඛ්‍ය, කෘෂිකර්මය, ජාතික ආරක්ෂාව, යුක්තිය පසිඳලීම, ප්‍රවාහනය සහ අපි අද සාකච්ඡා කරන මේ ක්ෂේත්‍රයේ ගැටලුවලට විසඳුම් සොයන්න අපට එය භාවිත කරන්න පුළුවන්. අවාසනාවකට අන් රටවල භාවිත වන අයුරින් අපේ මේ ගැටලුවලට කෘත්‍රිම බුද්ධිය භාවිත කිරීමට ආණ්ඩුවෙන් පෙළඹවීමක් ඇති වෙලා නැහැ. ඒ විතරක් නොවෙයි. දේශපාලනයේදී අපට ප්‍රශ්න ඇති වෙද්දී අපට කෘත්‍රිම බුද්ධියෙන් අහන්න පුළුවන්. සමහර වෙලාවට කථා වෙනවා නේ, "අහවලා පනීද, නැද්ද?" කියලා. අපට පුළුවන් කෘත්‍රිම බුද්ධියෙන් අහන්න, "මෙයා පනීද, නැද්ද? පනිනවා නම්, කවදා වාගේද?" කියලා. අන්තර්ජාලයේ තිබෙන අපි හිතන්නේවත් නැති තොරතුරුවලට ගිහිල්ලා ඒ තොරතුරු ගෙනැල්ලා අපට කියනවා, "මොහු මේ පනිනවා කිව්වාට මොහුට මේ මේ ප්‍රශ්න තිබෙන නිසා පනින්න ඉඩ නැහැ" කියලා.

"පනිනවා නම්, මෙන්න මේ මේ සාධක ඇති වුණොත් පනින්න ඉඩ තිබෙනවා" කියනවා. මෙම ක්ෂේත්‍රය මේ වාගේ ඉතා පුළුල් දෙයක්. මම කියන්නේ නොමිලේ තිබෙන කෘත්‍රිම බුද්ධි මෙවලම්වලින් මේ වාගේ බරපතළ තීන්දු ගන්න අවශ්‍ය තොරතුරු ගන්න බැහැ; උපදෙස් ගන්න බැහැ. නමුත් මිල ගෙවලා ලබා ගන්න පුළුවන්. මාසයට ඩොලර් 20ක් ගෙවලා තමයි මම නම් ChatGPT-4 කියන එක පාවිච්චි කරන්නේ. ඒ වාගේ යම් මුදලක් ගෙවලා කෘත්‍රිම බුද්ධි මෙවලම් භාවිත කරනවා නම් ඉතාම ඉහළ ගණයේ උපදෙස් අපේ අවධානය යොමු නොවන ක්ෂේත්‍රවලට අපේ අවධානය යොමු කරවමින් අපට අවශ්‍ය දැනුම ලබා දෙනවා. ඒ නිසා කෘත්‍රිම බුද්ධිය කියන්නේ එක පැත්තකින් අපට මහා මෙවලමක්.

හැබැයි, අනික් පැත්තෙන් අපි පෙන්නුවා, මේක හික්මවීම අත්‍යවශ්‍යයි කියන කාරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහා ඇලෙක්සැන්ඩර් අධිරාජ්‍යයාට හිටියා බියුසෙෆලස් කියලා අශ්වයෙක්. මේ බියුසෙෆලස් අශ්වයා ඊයක් තරම් වේගවත්; අලියෙක් වාගේ බුද්ධිමත්; සිංහයෙක් වාගේ සවිමත්; රාජාලියෙක් වාගේ තියුණු ඇස් තිබෙන, වවුලෙකුට වාගේ තියුණු කන් තිබෙන, ඔටුවෙකුට වාගේ දරා ගැනීමේ හැකියාව තිබෙන මහා බලසම්පන්න අශ්වයෙක්. හැබැයි, මේ අශ්වයා මෙල්ල කර ගන්න කාටවත්ම බැරි නිසා මෙතරම් බලසම්පන්න අශ්වයෙක් වුණත්, ඒ අශ්වයා ගෙනාවේ වාසියක් නොවෙයි, විනාශයක්. මහා ඇලෙක්සැන්ඩර් රජතුමාට බියුසෙෆලස් අශ්වයාව හික්මවා ගන්න පුළුවන් වුණු නිසා එදා මැසිඩෝනියාවේ සිට ඉන්දියාව දක්වා ලෝකය තමන්ගේ කර ගැනීමට -මහාද්වීප තුනකම තමන්ගේ අධිරාජ්‍යය ව්‍යාප්ත කිරීමට- එතුමාට හැකි වුණා. මා දකින විධියට, මේ කෘත්‍රිම බුද්ධියත් බියුසෙෆලස් අශ්වයා වාගේමයි. මහා හැකියාවක් තිබෙනවා. හැබැයි, හික්මවා ගන්න බැරි වුණොත් ගෙන එන්නේ වාසියට වඩා විනාශයක්. එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ ආණ්ඩුවේ වගකීම වෙන්නේ, මේ ගරු සභාවේ වගකීම වෙන්නේ මේ මහා බියුසෙෆලස් අශ්වයාව හික්මවා ගැනීමට කටයුතු කර මේ මහා හැකියාවෙන් රටට, සමාජයට ප්‍රයෝජනයක් ගන්න කටයුතු කිරීමයි. එහෙම නම් ජනාධිපතිතුමා ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවලා මේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධයක් තිබෙන අයගේ උපදෙස් ලබා ගනිමින් පාර්ලිමේන්තුව තුළ විශේෂ කාරක සභාවක් පිහිටුවලා මේ කෘත්‍රිම බුද්ධිය අපේ ප්‍රයෝජනයට ගත හැක්කේ කෙසේද, ඒ වාගේම මෙයින් මතු වෙන සමාජ අවදානම් මොනවාද, ඒ සමාජ අවදානම් පාලනය කර ගන්න ආරක්ෂාකාරී ක්‍රමවේද හඳුනාගත යුත්තේ කෙසේද, නව නීතිරීති ගෙන ආ යුත්තේ කෙසේද කියන දේ ගැන කඩිනම් අවධානය යොමු කළ යුතුයි කියලා යෝජනා කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[ප.ව. 3.03]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று கௌரவ மதுர விதானகே அவர்களால் கொண்டு வரப்பட்டிருக்கின்ற செயற்கை நுண்ணறிவுத் தொழில்நுட்பம் சம்பந்தமான ஒத்திவைப்புவேளைப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு சில விடயங்களைச் சொல்லலாமென நினைக்கின்றேன்.

குறிப்பாக, இந்த உலகம் ஒவ்வொரு நிமிடமும் தகவல் தொழில்நுட்பத் துறையூடாகப் பல மாற்றங்களை எதிர்கொண்டு வருகின்றது. அதன் அடிப்படையில், தற்பொழுது AI எனப்படுகின்ற செயற்கை நுண்ணறிவுத் தொழில்நுட்பமானது அனைத்துத் துறைகளிலும் தாக்கம் செலுத்தி வருகின்றது. இந்தச் செயற்கை நுண்ணறிவுத் தொழில்நுட்பத்தின்மூலம் மனித வளத்தால் மேற்கொள்ளப்படுகின்ற வேலைகளைச் செய்ய முடியும் என்பதால், பலர் தமது தொழில்களை இழக்க வேண்டிய நிலைக்குத் தள்ளப்படுவார்கள் என்பது உண்மையான ஒரு விடயமாகக் காணப்படுகின்றது. செயற்கைக்கோள், செயற்கை விண் நிலையங்கள், செயற்கை நுண்ணறிவுத் தொழில்நுட்பம் என்பன பற்றி இந்தக் காலகட்டத்தில் பேசப்படுகின்றது. கரும்பலகையில் வெண்கட்டியால் எழுதிய காலம்போய், whiteboardஇல் markerஆல் எழுதிய காலம் போய் இப்போது எங்களுடைய தலைவர் கௌரவ சஜித் பிரேமதாஸ அவர்களால் பாடசாலைகளில் smart board அறிமுகப்படுத்தப்பட்டு வருகின்றது. எமது பிள்ளைகளின் எதிர்காலத்தைச் சிறப்பிக்கும் வகையில், இன்று ஒவ்வொரு துறையிலும் தொழில்நுட்பம் படிப்படியாக முன்னேறிக் கொண்டு வருகின்றது.

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற திருகோணமலை மாவட்டத்தில் NVQ 5 மட்டத்தில் சித்தியடைந்த மாணவர்கள், NVQ 6,7 மட்டமுடைய கற்கை நெறிகளுக்காக வவுனியா, கிளிநொச்சி, மட்டக்களப்பு போன்ற மாவட்டங்களுக்குச் செல்லவேண்டிய நிலைமை காணப்படுகின்றது. அந்த மாணவர்களுடைய கல்விச் செயற்பாடுகளை இலகுபடுத்துவதற்காக எங்களுடைய கிண்ணியா பிரதேசத்தில் தொழில்நுட்பக் கல்லூரியொன்று அமையப்பெறப் போவதாக நீண்ட காலமாகச் சொல்லப்பட்டு வந்தாலும், இதுவரை அங்கு எந்தவொரு தொழில்நுட்பக் கல்லூரியும் அமையப்பெறவில்லை. எனவே, திருகோணமலை மாவட்டத்தில் இவ்வாறானதொரு தொழில்நுட்பக் கல்லூரி உருவாக்கப்பட வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். குறிப்பாக, செயற்கை நுண்ணறிவுத் தொழில் நுட்ப வளர்ச்சியில் ஏற்படுகின்ற மாற்றங்களுக்கு ஏற்றவாறு எமது நாடும், சமூகமும், பாடசாலை மாணவர்களும் மாற்ற மடைய வேண்டுமெனவும் அது சம்பந்தமான நடவடிக்கை களை கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுக்க வேண்டு மெனவும் நான் இந்த இடத்தில் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 'கொவிட்-19' தொற்றால் இறந்த முஸ்லிம்களின் உடல்களை கட்டாயத் தகனம் செய்தமை காரணமாக இலங்கை வாழ் முஸ்லிம்களுக்கு ஏற்பட்ட மனப் பாதிப்புக்கு மன்னிப்புக் கோரும் வகையில், அமைச்சர்களான கௌரவ அலி சப்ரி, கௌரவ விஜயதாஸ ராஜபக்ஷ, கௌரவ ஜீவன் தொண்டமான் ஆகியோரால் இணைந்து சமர்ப்பிக்கப்பட்டு இருக்கின்ற அமைச்சரவைப் பத்திரம் அமைச்சரவையால் அங்கீகரிக்கப்பட்டு இருக்கின்றது என்ற செய்தி இப்பொழுது பரவலாகப் பேசப்பட்டுக் கொண்டு இருக்கின்றது. வீடு வீடாகச் சென்று இந்த நாட்டில் வாழுகின்ற முஸ்லிம்களிடம் மன்றாடி மன்னிப்புக் கேட்டாலும்கூட, மன்னிக்க முடியாத ஒரு செயலாகவே முஸ்லிம் சமூகம் இதைப் பார்க்கின்றது என்பதை நீங்கள் தெளிவாக விளங்கிக்கொள்ள வேண்டும். தேர்தல் நெருங்கும்போது, அரசாங்கம் பொய்யான விடயங்களை இவ்வாறு அரங்கேற்றிக் கொண்டு வருகின்றது. அரசாங்கம் தன்னுடைய நிலைப்பாட்டின்மூலம் மீண்டும் மக்களை ஏமாற்றுகின்ற விடயத்தை தயவுசெய்து நிறுத்திக்கொள்ள வேண்டுமெனக் கேட்டுக்கொள்வதோடு, இந்த அமைச்சரவைப் பத்திரத்தை ஏற்றுக்கொள்ள முடியாது என்பதையும் நாங்கள் தெளிவாகச் சொல்லிக்கொள்கின்றோம்.

தேர்தல் நெருங்கிக் கொண்டு இருக்கின்ற இக்கால கட்டத்தில், மக்கள் மத்தியில் மீண்டும் குழப்பகரமான ஒரு சூழலை உருவாக்குவதற்காக இது போன்ற சில நாடகங்கள் அரங்கேற்றப்பட்டு வருகின்றன. இது வெறும் கண்துடைப்பு என்பதை நாங்கள் விளங்கிக்கொள்ள வேண்டும். குறிப்பாக, இந்த அமைச்சரவைப் பத்திரத்தைச் சமர்ப்பித்த அமைச்சர்கள், அன்று அரசாங்கத்தின் பங்காளிகளாக இருந்தார்கள். தேர்தல் நெருங்குவதால், இவர்கள் மக்களை ஏமாற்றுவதற்காக இப்படியான செயற்பாடுகளைத் தொடர்கின்றார்கள். இன்று எங்களுடைய முஸ்லிம் சமூகம் மிகவும் தெளிவாக இருக்கின் றது என்பதை இவர்கள் விளங்கிக்கொள்ள வேண்டும்.

குறிப்பாக, 'கொவிட்-19' தொற்றின்மூலம் இறந்த 276 முஸ்லிம்களுடைய ஜனாஸாக்கள் பலாத்காரமாகத் தகனம் செய்யப்பட்டன. இதனால் இந்த நாட்டிலுள்ள ஒட்டுமொத்த முஸ்லிம்களும் துடிதுடித்தார்கள்; கண்ணீர் சிந்தினார்கள்; கதறி அழுதார்கள்; மன உளைச்சலுக்கு ஆளாகினார்கள். முஸ்லிம் மக்கள் மிகுந்த மன வேதனையடைந்த தருணமாக அது அமைந்திருந்தது. அந்த நேரத்தில் அப்போதைய அரசாங்கம் இந்த இழிவான செயலை கடுமையாக முன்னெடுத்தது. முன்னாள் சனாதிபதி கோட்டாபய அவர்களுடைய அரசாங்கம் வேண்டுமென்றே பலவந்த ஜனாஸா எரிப்பு நடவடிக்கையை மேற்கொண்டது. சிங்கள மக்களுடைய பேரபிமானத்துடன் ஆட்சியமைத்த அவர் ஆணவம் காரணமாகத்தான் அந்த முடிவை எடுத்தார். சிங்கள மக்கள்கூட அதனை எதிர்த்தார்கள். சில comedians உடைய கருத்துகளை முன்னிலைப்படுத்தி, முஸ்லிம்களுக்கு எதிரான ஒரு நிலைப்பாடாக இச்செயற் பாட்டைக் காட்டிக்கொண்டார்கள்.

குறிப்பாக, நிறைவேற்று அதிகாரம்கொண்ட சனாதிபதியும் அவருக்குக் கீழுள்ள அமைச்சர்களும் அந்தக் comedians உடைய பரிந்துரையைச் சரியென்று கருதி, ஜனாஸாக்களை எரிக்க வேண்டும் என்பதை ஏற்றுக்கொண்டார்கள். இது முற்றிலும் பொய்யான ஒரு தகவல் என்பதை நாங்கள் புரிந்திருக்கின்றோம். இதனோடு சம்பந்தப்பட்டவர்கள் யார் என்பது நீதிமன்றத்தின் மூலம் இன்று தெரியவந்துள்ள போதிலும், இன்னும் இதற்கு எதிராக நடவடிக்கை எதுவும் எடுக்கப்படவில்லை. அண்மையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்தப் பாராளுமன்றத்துக்கு வந்து, இவ்விடயத்தில் ராஜபக்ஷக்களுக்கு எந்தச் சம்பந்தமும் இல்லை என்பதைப் போன்றதான கருத்தைத் தெரிவித்திருந்தார். யார் இதற்குப் பிரதான காரணம் என்பதை இன்று மக்கள் அறிந்திருக்கிறார் கள். ஏனென்றால், இது முஸ்லிம்களை வேதனைக்குள்ளாக்கிய ஒரு விடயமாகும். தேர்தல் வருகின்ற காரணத்தால் மீண்டும் இவர்கள் இந்த விடயத்தைக் கொண்டுவந்து, எங்களுடைய சமுதாயத்தை ஏமாற்ற நினைக்கின்றார்கள். ஆகையால், இதனை உடன் நிறுத்த வேண்டும் என்பதை நான் இந்த இடத்தில் கேட்டுக்கொள்கின்றேன். இதனால் பாதிக்கப்பட்ட முஸ்லிம் சமூகம் மிகவும் தெளிவாக இருக்கின்றது என்பதை நீங்கள் விளங்கிக்கொள்ள வேண்டும்.

இருந்தாலும், இச்செயற்பாட்டால் பாதிக்கப்பட்ட பல முஸ்லிம் குடும்பங்கள் இருக்கின்றன. அவற்றுக்கு நஷ்டஈடு களை வழங்குவதற்கான நடவடிக்கைகளை அரசாங்கம் மேற் கொள்ள வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக்கொள் கின்றேன். வெறுமனே நஷ்டஈடுகளை வழங்குவதனாலும், மன்னிப்புக் கோருவதனாலும் அந்த முஸ்லிம் குடும்பங்களுக்கு ஏற்பட்ட மன உளைச்சல் நீங்கிவிடுமா? என்ற கேள்வி எழுகின்றது. இருந்தாலும், அதிகளவு நஷ்டஈடுகளை அந்த முஸ்லிம் குடும்பங்களுக்கு வழங்க வேண்டும் என்பதுதான் எங்களுடைய வேண்டுகோளாகும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மாண்புமிகு ஜனாதிபதி அவர்கள் இங்கு இது சம்பந்தமாகப் பேசியிருந்தார். அரசாங்கத்தில் இருக்கின்றவர்களைத் தக்க வைத்துக் கொள்ள வேண்டும், ஜனாதிபதித் தேர்தல் வர இருப்பதால் அவர்களைத் தன்பக்கம் இணைத்துக்கொள்ள வேண்டும் என்ற அடிப்படையில்தான் அவர் செயற்பட்டுக் கொண்டு இருக்கின்றார். குறிப்பாக, இன்று பொதுஜன பெரமுன கட்சியைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் ஜனாதிபதி அவர்களுக்கு ஆதரவு வழங்குகின்றார்கள் என்பதற் காக அவர்களைப் பாதுகாக்கும் நோக்கிலே இவ்வாறானதொரு நாடகம் அரங்கேற்றப்பட்டுக் கொண்டு இருக்கின்றது. இதன் மூலம் மீண்டும் ராஜபக்ஷாக்களைப் பாதுகாக்கின்ற செயற்பாடுகளைத்தான் தற்போதைய ஜனாதிபதி அவர்கள் செய்கின்றார் என்பதை நாங்கள் விளங்கிக்கொள்ள வேண்டும். அவர் மீண்டும் ஜனாதிபதியானால் இவர்களைத்தான் பாதுகாக்கப்

போகின்றார். தேர்தல் காலங்களில் நடிகர்களாக இருந்தாலும், அதிகாரத்துக்கு வந்த பின்னர் மீண்டும் இனவாதத்தைத் தூண்டுகின்ற விடயங்களைத்தான் இவர்கள் முன்னெடுக்கப் போகின்றார்கள் என்பதைத் தெளிவாக விளங்கிக்கொள்ள வேண்டும்.

ஜனாதிபதித் தேர்தல் நடைபெறுமா, நடைபெறாதா? என எல்லோராலும் பரவலாகப் பேசப்படுகின்றது. உரிய காலத்தில் ஜனாதிபதித் தேர்தலை நடாத்துவதற்குத் தயாராக இருப்பதாக மாண்புமிகு ஜனாதிபதி அவர்கள் சொன்னாலும், அரசாங்கத்தில் இருக்கின்ற சிலர் அத்தேர்தலை ஒத்திவைப்பதற்கான நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றார்கள். "நாங்கள் பல பிரச்சினைகளைத் தீர்த்து வைத்துவிட்டோம். எங்களால் நாடு மீண்டும் நல்லதொரு நிலையை அடைந்திருக்கின்றது" என்று மாண்புமிகு ஜனாதிபதி அவர்கள் சொல்கிறார். அப்படி என்றால், ஏன் அவர் தேர்தலுக்கு அஞ்சுகிறார்? என நாங்கள் கேட்க விரும்புகின்றோம். அவர் இந்த நாட்டை நேசிக்கின்றவராக இருந்தால், இந்த நாட்டு மக்களை நேசிக்கின்றவராக இருந்தால், இந்த நாட்டைப் பாதுகாக்கின்றவராக இருந்தால், இந்த நாட்டு மக்களைப் பாதுகாக்கின்றவராக இருந்தால், ஏன் மக்களின் ஆணையைப் பெறுவதற்கு அஞ்சுகின்றார்? என நாங்கள் கேட்க விரும்புகின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஜனாஸா எரிப்பு சம்பந்தமான அமைச்சரவைத் தீர்மானமானது உண்மையிலே நாடகமாக அல்லது மீண்டும் மக்களை ஏமாற்றுகின்ற ஒரு செயற்பாடாக இருக்கின்றது என்பதை நாங்கள் விளங்கிக்கொள்ள வேண்டும். ஆளுந்தரப்பில் இருக்கின்ற அமைச்சர்களிலும் பாராளுமன்ற உறுப்பினர்களிலும் யார் ஜனாஸா எரிப்புக்கு எதிராகக் குரல்கொடுத்தார்கள்? என கேட்க வேண்டும். ஜனாஸா எரிப்புச் சம்பவம் இடம்பெற்ற காலத்தில், இந்தப் பாராளுமன்றத்தில் இருக்கின்ற முஸ்லிம் உறுப்பினர்களில் யார் அது சம்பந்தமாகப் பேசினார்கள்? யார் அதற்கு எதிர்ப்புத் தெரிவித்தார்கள்? யார் அதற்கு எதிராகக் குரல் கொடுத்தார்கள்? இவர்கள் வீதிக்கு இறங்கி ஜனாஸாக்களை எரிக்க வேண்டாம் என்று போராட்டங்களை நடாத்தி இருக்கின்றார்களா? கோட்டாபய ராஜபக்ஷ அவர்களுக்கு அதிகாரத்தை வழங்க வேண்டும் என்பதற்காக பாராளுமன்றத் தில் மூன்றில் இரண்டு பெரும்பான்மையை வழங்கியவர்கள் தான் இன்று இவ்வாறானதொரு நாடகத்தை அரங்கேற்று கிறார்கள். மீண்டும் மக்கள் மத்தியில் சென்று வாக்குகளைப் பெறவேண்டும் என்பதற்காகவே இவர்கள் இவ்வாறான மிக மோசகரமான வேலையைச் செய்துகொண்டு இருக்கின்றார் கள்.

நான் ஆரம்பத்தில் சொன்னதுபோன்று, இன்று எங்களுடைய முஸ்லிம் சமூகம் விழித்துக் கொண்டு இருக்கின்றது; தெளிவாக இருக்கின்றது. அதாவது, எங்களுடைய முஸ்லிம் தலைமைத்துவங்களில், முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர் களில் யார் யார் எந்தெந்த நேரங்களில் எவ்வாறு நடந்து கொண்டார்கள் என்பதை மிகத் தெளிவாகப் புரிந்துவைத்திருக் கிறது. அதற்கான தக்க பதிலை எதிர்வருகின்ற தேர்தலில் எங்களுடைய முஸ்லிம் சமூகம் நிச்சயமாக அளிக்கும் என்பதில் எந்தவோர் ஐயப்பாடும் கிடையாது. ஆகையால், தேர்தல் நெருங்குகின்ற காலத்தில் இவ்வாறான செயற்பாடுகளை மேற்கொள்வதை உடனடியாக நிறுத்த வேண்டுமென நாங்கள் இவ்விடத்தில் கேட்டுக்கொள்கின்றோம். ஜனாஸா எரிப்பால் இன்றும் பல முஸ்லிம் குடும்பங்கள் மனவேதனையில் இருக் கின்றன. அந்த வகையில், பிரச்சினைகளை எதிர்நோக்கிய பலர் இருக்கின்றார்கள். தயவுசெய்து அவர்களுக்கான நஷ்ட ஈடுகளைச் சரியான முறையில் வழங்க வேண்டுமென நாங்கள் இந்த இடத்தில் வலியுறுத்துகின்றோம். இந்த விடயம் தொடர்பில் அரசாங்கம் உரிய கவனம் செலுத்தி, சரியான தொரு தீர்வைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்பதுதான் என்னுடைய எதிர்பார்ப்பாக இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களுடைய திருகோணமலை மாவட்டத்தில் முத்துநகர் பிரதேசத்தில் மக்கள் நீண்ட காலமாக வாழ்ந்து வருகின்றார் கள். இன்று அந்த மக்களுக்கு அச்சம் ஏற்பட்டிருக்கின்றது. ஏனென்றால், அங்கிருந்து அவர்களை அகற்றி, அந்தப் பிரதேசத்தை இலங்கை துறைமுக அதிகாரசபை சுவீகரிக்க வுள்ளது. அதற்கான கால அவகாசம் அவர்களுக்கு வழங்கப் பட்டு இருக்கின்றது. ஆகையால், விடயத்துக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் இந்த விடயத்தில் கவனம் செலுத்தி, அவர்கள் வாழ்ந்த காணிகளை, பயிர்ச்செய்கை செய்த காணிகளை மீள அவர்களுக்கே வழங்குவதற்கான நடவடிக்கை களை மேற்கொள்ள வேண்டுமெனக் கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට පිළිතුරු කථාව, ගරු කනක හේරත් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.17]

ගරු කනක හේරත් මහතා (තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கனக ஹேரத் - தொழில்நுட்ப இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanaka Herath - State Minister of Technology)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේදී සභාව කල් තබන අවස්ථාවේ ගෙනා යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. මේ යෝජනාව ඉදිරිපත් කරපු නීතිඥ මධුර විතානගේ මන්ත්‍රීතුමාට මා ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මෙම යෝජනාවට සම්බන්ධ වෙමින් අදහස්-උදහස්, යෝජනා ඉදිරිපත් කළ සියලුදෙනාටත් මා ස්තුතිවන්ත වෙනවා.

වර්තමානයේ ඉතාම වැදගත් කාරණාවක් වන කෘත්‍රිම බුද්ධිය - AI - පිළිබඳව ප්‍රථම වතාවට තමයි අපි මේ පාර්ලිමේන්තුවේදී අද විවාද කරන්නේ. මේ තාක්ෂණය ඉතා ඵලදායී ලෙස අපේ රටේ ක්‍රියාත්මක කළ යුත්තේ කොයි ආකාරයෙන්ද කියන එක පිළිබඳව සියලුදෙනාම අද කථා කළා. ඒ නිසා මම මේකේ තිබෙන හිතකර සහ අහිතකර කාරණා පිළිබඳව කථා කරන්න යන්නේ නැහැ. ඒ බහුතරයක් සඳහන් කරපු ආකාරයට ඒ සියල්ල මා ද පිළිගන්නවා. අද වෙනකොට මේ කෘත්‍රිම බුද්ධිය සඳහා අපි කොයි ආකාරයෙන්ද සූදානම් වෙලා තිබෙන්නේ කියන එක පිළිබඳව මේ මන්ත්‍රීවරු තුළ පමණක් නොවෙයි, මේ රටේම ඒ තරම් ලොකු දැනුමක් නැහැ. අපි පසුගිය වර්ෂයේ ඉඳලා මේ පිළිබඳව විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. අපි එක දෙයක් මූලික කරගෙන නීති සහ රෙගුලාසි හදනවා වාගේම ඒවායේ සමබර බවක් ද තිබිය යුතුයි. තාක්ෂණයට අගතියක් නොවන ආකාරයෙන් තමයි මේ නීති සහ රෙගුලාසි ගෙන ආ යුත්තේ. ඒක තමයි ප්‍රධානම කාරණාව. ඒක පෙරදැරි කරගෙන පසුගිය වර්ෂයේදී ජනාධිපතිතුමාගේ උපදෙස් මත එතුමාගේ නායකත්වයෙන් අනාගත තාක්ෂණය පිළිබඳව ඉතා විශාල දැනුමක් ඇති අයගෙන් සමන්විත කමිටුවක් අපි පත් කළා. එය ජාතික කෘත්‍රිම බුද්ධි කමිටුව හැටියට එතුමා නම් කළා. තාක්ෂණය රටේ ක්‍රියාත්මක කළ යුත්තේ කොයි ආකාරයෙන්ද කියන එක පිළිබඳවත්,

[ගරු කනක හේරත් මහතා]

විශේෂයෙන්ම කෘත්‍රිම බුද්ධිය පිළිබඳව උපාය මාර්ගයක් ගොඩනැඟීම සඳහාත් තමයි ඒ කමිටුව පත් කරලා තිබුණේ. ඒක ආචාර්ය රොමේෂ් රණවන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තමයි පසුගිය වර්ෂයේදී ආරම්භ කළේ. අද වෙනකොට එහි ව්‍යුහය ගොඩනඟලා, දැනට මූලික කටයුතු අවසන් කරලා ජාතික උපාය මාර්ගය ජනාධිපතිතුමාට පිළිගැන්වීමට අවශ්‍ය කටයුතු දැන් සූදානම් කරලා තිබෙනවා.

මෙහි පළමුවැනි අදියර හැටියට මේ වර්ෂය තුළදී අපි බලාපොරොත්තු වෙන්නේ ජාතික කෘත්‍රිම බුද්ධි මධ්‍යස්ථානයක් ඇති කිරීමයි. ඒ සඳහා 2024 වර්ෂයේ අය වැය තුළින් රුපියල් බිලියනයක මුදලක් වෙන් වෙලාත් තිබෙනවා. ඒකෙන් අපි ඒ මධ්‍යස්ථානය ආරම්භ කරනවා වාගේම දිවයිනේ සෑම පළාතකම ඒ වාගේ කෘත්‍රිම බුද්ධි මධ්‍යස්ථාන පිහිටුවන්නත් බලාපොරොත්තු වෙනවා. ප්‍රථමයෙන්ම උතුරු පළාත, මධ්‍යම පළාත සහ තවත් පළාතක් තෝරාගෙන ඒ මධ්‍යස්ථාන පිහිටුවන්නත් අපි බලාපොරොත්තු වෙනවා. මේ කෘත්‍රිම බුද්ධිය ඵලදායීතාවෙන් යුක්තව අපේ රටේ භාවිත කළ යුත්තේ කෙසේද කියන එක වාගේම අද බොහෝදෙනෙක් කථා කරපු කාරණයක් වන මේ සඳහා අවශ්‍ය නීති, ප්‍රතිපත්ති සහ රෙගුලාසි ගොඩනැඟීම කියන කාරණයත් ඉතාම වැදගත්. නමුත්, ඒක එක අංශයක් පමණයි. ඒක ඉතාම වැදගත් වන අංශයක්.

ඊට අමතරව රාජ්‍ය සේවයේදී මේ තාක්ෂණය භාවිත කළ යුත්තේ කොයි ආකාරයෙන්ද, පාසල් දරුවන්ට ඒ දැනුම ලබා දිය යුත්තේ කොයි ආකාරයෙන්ද, සාමාන්‍ය ජනතාවට මේ නිසා ඉදිරියේදී බලපෑම් ඇති වෙනවාද සහ එය භාවිත කරන්නේ කොයි ආකාරයෙන්ද කියන එක පිළිබඳව මනා විශ්ලේෂණයක් කරලා තමයි ඒ කමිටුව නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේක එක පැත්තකින් සාක්ෂරතාව ගොඩනැඟීම සඳහාත්, තවත් පැත්තකින් අපේ ප්‍රතිපත්ති සහ නීතිමය රෙගුලාසි ගොඩනැඟීම සඳහාත් ඉතා වැදගත් වෙනවා.

ඒ සාක්ෂරතාව හරහා අපේ ජනතාව දැනුවත් කිරීම තුළින්, දරුවන් දැනුවත් කිරීම තුළින් අපට හැකියාව ලැබෙනවා, මේ සම්බන්ධව තිබෙන අභියෝගවලට කොයි ආකාරයෙන්ද අපි මුහුණ දිය යුත්තේ කියන එක සම්බන්ධව යම් වැඩ පිළිවෙළක් හදන්න. ඒ වැඩ පිළිවෙළ දැනටමත් ආරම්භ කරලා ඒ සඳහා වැඩමුළු පවා අපි පවත්වා තිබෙනවා. ඒ වාගේම පසුගිය කාලයේදී අපි ආරම්භ කළා, පාසල් 100ක් සඳහා කෘත්‍රිම බුද්ධි සමාජ. ඒ අනුව පාසල් දරුවන්ට සෑම සතියකම කෘත්‍රිම බුද්ධිය පිළිබඳව එක වැඩසටහනක් අපි පවත්වනවා. ඒ වැඩසටහන ක්‍රියාත්මක කරලා ඒ දරුවන්ට අවශ්‍ය මූලික දැනුම ලබා දීම අපි පළමුවෙන්ම කරනවා. ඊළඟට, කොයි ආකාරයෙන්ද එය භාවිත කළ යුත්තේ කියන වැඩසටහන පාසල්වල ක්‍රියාත්මක මේ කෘත්‍රිම බුද්ධි සමාජ තුළින් ලබා දෙන්න කටයුතු කරනවා. පසුගිය මාසයේදී ඒ වැඩසටහන එළිදක්වන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මේ ඉදිරි වැඩසටහන් සඳහා අපට AI තාක්ෂණය, එහෙම නැත්නම් කෘත්‍රිම බුද්ධිය පිළිබඳව වැඩකටයුතු කරන AI Singapore කියන රාජ්‍ය ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා එතුමන්ලාගේ කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ අනුව ඉතාම කඩිනමින් අපේ තාක්ෂණ අමාත්‍යාංශයත්, AI Singapore එකත් අතර ඒ ගිවිසුම අත්සන් කිරීමට බලාපොරොත්තු වෙනවා. අද ලෝකයේ කෘත්‍රිම බුද්ධිය අතින් ඉදිරියෙන්ම ඉන්න රටක් තමයි, සිංගප්පූරුව. ඒ වෙනුවෙන් ප්‍රතිපත්ති, රෙගුලාසි ගොඩනඟපු රටක් හැටියට ඔවුන්ගේ සහයෝගය අපට ලබා දෙනවා. ඒ අනුව එක පැත්තකින් අපට අවශ්‍ය තාක්ෂණික දැනුම ඔවුන් ලබා දෙනවා.

අනෙක් පැත්තෙන්, ඒ අවශ්‍ය කරන උපකරණ, අවශ්‍ය කරන incubators වාගේම පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතා යන සියල්ලටම අපිට දැනුම ලබා දීම සඳහා ඔවුන් එකඟතාව පළ කර තිබෙනවා. මෙහිදී මම කලිනුත් සඳහන් කරපු ආකාරයට නීති සහ රෙගුලාසි ගෙන ඒම වාගේම තාක්ෂණය ආරක්ෂා කරමින් ඉදිරියට යන එකත් වැදගත් වෙනවා.

ඉතිහාසය දිහා බැලුවම අපට පෙනෙනවා, ලෝකයේ කාර්මික විප්ලව පැවති බව. නමුත්, අපිට ඒ හැම කාර්මික විප්ලවයක්ම අතපසු වෙලා තිබෙනවා. පළමුවන කාර්මික විප්ලවය, දෙවන කාර්මික විප්ලවය, තුන්වන කාර්මික විප්ලවය අපට අතපසු වුණා වෙන්න පුළුවන්. හැබැයි, හතරවන කාර්මික විප්ලවයත් අපි අතපසු කරලා තිබෙනවා. නමුත්, හොඳ හෝ නරක වුවත් අපි මේ අවස්ථාවේදී ඒ සඳහා සූදානම් විය යුතුයි; ඒ වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුයි; ඒ සඳහා අවශ්‍ය කරන සූදානමක් තිබියි යුතුයි කියන එක මේ අවස්ථාවේදී මා සඳහන් කරනවා. ඒ නිසා තමයි විශේෂයෙන්ම ජනාධිපතිතුමා මේ පිළිබඳ කටයුතු පසුගිය වර්ෂයේදීම ආරම්භ කළේ.

බොහෝ රටවල තවමත් කෘත්‍රිම බුද්ධිය ගැන කථා කරනවා. සංවර්ධිත රටවල් පවා කෘත්‍රිම බුද්ධියේ තිබෙන අභියෝගවලට මුහුණ දෙමින් ඉන්නවා. නමුත්, මේ වනතුරු හරි වැඩ පිළිවෙළක් මේ ආකාරයෙන් ක්‍රියාත්මක වෙලා නැහැ. එම නිසා ඒ සඳහා අපි නියමිත වැඩ පිළිවෙළ ආරම්භ කර තිබෙනවා කියන එකත් මම සඳහන් කරන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පෞද්ගලික දත්ත ආරක්ෂණ අධිකාරිය පසුගිය වර්ෂයේ පිහිටෙව්වා. ඒකේ දැන් වැඩසටහන් ටික ආරම්භ කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කරන දැනුම ලත් වෘත්තිකයන් බඳවා ගැනීමේ කටයුතු පටන් ගන්නත් අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා. අපිට තිබෙන ලොකුම අභියෝගය තමයි මේ ක්ෂේත්‍රයේ ඉන්නා වෘත්තිකයන්, විශේෂඥයන් වර්තමානයේ තිබෙන වැටුප් අනුව එම ආයතනයට බැඳෙන්නේ නැතිකම. ඒ සඳහා අවශ්‍ය කරන කැබිනට් අනුමැතිය ලබා ගැනීමට අපි බලාපොරොත්තුවෙන් සිටිනවා. මේ පෞද්ගලික දත්ත ආරක්ෂණ අධිකාරිය ආරම්භ කරලා, දැනටමත් එහි අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරලා තිබෙනවා. මේ වර්ෂය අවසාන වෙද්දි ඒ සියලුදෙනාම සම්බන්ධ කරගෙන ඒ අධිකාරියේ ක්‍රියාකාරීත්වය ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පෞද්ගලික දත්ත ආරක්ෂණ අධිකාරිය අපිට වැදගත් වෙන්නේ මොකද? අපි කෘත්‍රිම බුද්ධිය ගැන කථා කරද්දී, එක පැත්තකින් දත්ත ආරක්ෂණය අත්‍යවශ්‍ය කාරණාවක් වනවා. ඒ තුළින් තමයි රෙගුලාසි, නීති ගොඩනඟන්න හැකියාව තිබෙන්නේ. ඊළඟට, සයිබර් ආරක්ෂණ පනත තුළින් තමයි නීති සහ රෙගුලාසි ගොඩනඟා ගන්න හැකියාවක් තිබෙන්නේ. දත්ත ආරක්ෂණ අධිකාරිය තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ අපේ රටේ ඉන්න සමස්ත ජනතාවගේම දත්ත ආරක්ෂා කිරීමයි. ඒ සඳහා අපි පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා, එය අනුමත කරගෙන ශ්‍රී ලංකා පෞද්ගලික දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටෙව්වේ මේ රටේ සිටින සියලු ජනතාවගේ දත්ත ටික ආරක්ෂා කිරීම සඳහායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක අනෙක් පැත්තට වෙන්නත් පුළුවන්. උදාහරණයක් හැටියට භාණ්ඩ වෙළෙඳාම ගත්තාම, සමහර වෙලාවට භාණ්ඩ වෙළෙඳාමේදීත් පාරිභෝගිකයාගේ දත්ත ටික කඩවලින් පවා ලබා ගන්න බව අපි දන්නවා. අද ලෝකයේ තෙල් හා සමාන වටිනාකමක් තිබෙනවා,

මේ දත්තවලට. ඒ නිසා දත්ත ආරක්ෂා කිරීමත් ඉතා වැදගත්. ඒ සඳහා තමයි දත්ත ආරක්ෂණ අධිකාරිය - DPA එක - පිහිටුවා තිබෙන්නේ. දැන් සමහර රටවල Do-not-call List කියලා එකක් ආරම්භ කරලා තිබෙනවා. දත්ත ආරක්ෂණ අධිකාරිය ක්‍රියාත්මක වුණාට පස්සේ ඒක අපේ රටට හඳුන්වා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. අපිට දැන් ගැටලුවක් වෙලා තිබෙනවා නේ, දුරකථනයට විවිධාකාරයේ ඇමතුම් එන එක. සමහර දුරකථන ඇමතුම් එන්නේ වෙළෙඳාම් කටයුතු සම්බන්ධයෙන්. ඒ වාගේම SMS පණිවුඩ එනවා. මේ Do-not-call List කියන ලැයිස්තුවේ register වුණාට පස්සේ අනිවාර්යයෙන්ම අපේ දුරකථනයට එවැනි ඇමතුම් ලැබෙන්නේ නැති වෙන ආකාරයට ආරක්ෂා කරන්න හැකියාවක් තිබෙනවා. ඒකේ ලියාපදිංචි නොවන එක වෙනම කාරණාවක්. තමන් කැමති නැත්නම් ඒකේ ලියාපදිංචි නොවී සිටින්න පුළුවන්. නමුත්, ලියාපදිංචි වුණු සෑම කෙනෙකුගේම දත්ත ටික ආරක්ෂා කරන්න, තමන්ට ඒ වාගේ අනවශ්‍ය දුරකථන ඇමතුම්, වෙළෙඳාමට අදාළ දුරකථන ඇමතුම් සහ SMS පණිවුඩ ඒම නතර කිරීම සඳහා ඒ තුළින් අපිට හැකියාව ලැබෙනවා.

විශේෂයෙන්ම පුද්ගල දත්ත උල්ලංඝනය කරන අවස්ථාවලදී ඒ වෙනුවෙන් නීතිමය පියවර ගැනීම සඳහා දැනටමත් දත්ත ආරක්ෂණ අධිකාරිය තුළින් නීතිමය අවස්ථාව, පසුබිම සලසා තිබෙනවා. ඒ සඳහා රෙගුලාසි ගොඩනැඟීම තමයි මේ අවස්ථාවේදී සිදු කරන්න අවශ්‍ය වෙලා තිබෙන්නේ. බොහෝදෙනෙක් දැන් කථා කරනවා, මේ AI තාක්ෂණය නිසා රටේ සංස්කෘතිය, ආගම ලොකු ගැටලුවකට, අභියෝගයකට මුහුණ දෙනවා කියන කාරණය. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය පැත්තෙන් ගත්තොත්, ධම්ම පදය විකෘති කරන්න නොහැකි ආකාරයෙන් AI තාක්ෂණය යොදා ගන්න පුළුවන්. යම් පුද්ගලයෙක් බෞද්ධ ආගම වේවා, වෙනත් ආගමක් වේවා - ඕනෑම ආගමක් - විකෘති කර සමාජ මාධ්‍යයේ පළ කරන අවස්ථාවක AI තාක්ෂණය භාවිතයෙන්ම අපට හැකියාව තිබෙනවා, එවැනි දේවල් කරන පුද්ගලයන් හඳුනා ගන්න වාගේම එලෙස හඳුනා ගත් පිරිසට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට. අපි AI තාක්ෂණය නිවැරැදිව භාවිත කළොත්, ඒ තුළින් අපේ රටේ ජනතාව ආරක්ෂා කරන්නත් හැකියාව ලැබෙනවා. එම නිසා ඒ කටයුත්ත හරියාකාරව නිරීක්ෂණය කිරීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් ද අපි සකස් කළ යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සයිබර් ආරක්ෂණ පනත් කෙටුම්පත ඉතාම කඩිනමින් පාර්ලිමේන්තුවට ගේන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ පනත ගෙනෙන්න අපට හැකියාව ලැබුණොත්, සයිබර් ආරක්ෂණ අධිකාරිය පිහිටුවා ඒ තුළිනුත් විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක කරන්නත් පුළුවන් වෙනවා. දැන් තිබෙන ප්‍රධානම කාරණයක් තමයි, deepfake කියන්නේ. ඒ අනුව ආගමික නායකයන්ගේ හෝ ඒ හා සමාන පුද්ගලයෙකුගේ කෘතියක් ප්‍රතිනිර්මාණය කරන්න පුළුවන්. කුමන හෝ ආගමක නායකයෙක් බණ දේශනා කරන විධියට, අනුශාසනා කරන විධියට තමන්ට කැමැති ආකාරයෙන්, ගැළපෙන ආකාරයෙන් වවන භාවිත කරන්නත් හැකියාව තිබෙනවා. Deepfake සඳහා අපට නීතිමය ක්‍රියා මාර්ග ගන්න පුළුවන් වෙන්නේ සයිබර් ආරක්ෂණ පනත ගෙන ඒම තුළින් වාගේම සයිබර් ආරක්ෂණ අධිකාරිය පිහිටුවීම තුළිනුයි.

එපමණක් නොවෙයි. අද කවුරුත් කථා නොකරපු ප්‍රධානම ගැටලුවක් තිබෙනවා. ඉදිරියේදී මැනිවරණයක් එනවා නේ. ඒක ජනාධිපතිවරණයක් වෙන්නත් පුළුවන්. ජනාධිපතිවරණය වේවා, මහ මැතිවරණය වේවා, එවැනි ඕනෑම අවස්ථාවකදී මේ හා සමානවම පුද්ගලයන්ගේ ප්‍රකාශ නිර්මාණය කරන්න පුළුවන්. උදාහරණයක් හැටියට ගත්තොත්, ඕනෑම කෙනෙකුට ජනාධිපතිතුමා ප්‍රකාශයක් කරන ආකාරයට නිර්මාණයක් කරන්න හැකියාව තිබෙනවා. ප්‍රතිනිර්මාණය කිරීම සම්බන්ධයෙන් දේශපාලන වශයෙනුත් ලොකු අභියෝගයකට ඉදිරි මැතිවරණයේදී අපට මුහුණ දෙන්න සිදු වෙනවා. ඒ සඳහා අපි සූදානම් වීම ඉතාම වැදගත්. ඕනෑම කෙනෙකුට තමන්ගේ Facebook පිටුව හරහා කියන්න පුළුවන්, "මම දැන් ජනාධිපති වෙලා ඉවරයි" කියලා. ඒ වාගේ නොයෙකුත් ආකාරයේ බොරු දේවල් ප්‍රචාරය කිරීමත් මේ තුළින් කරන්න පුළුවන්. ඒ නිසා ඉදිරි මැතිවරණයේදී මේ තුළින් ලොකු අභියෝගයක් එල්ල වෙනවාය කියන එකත් මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම මේ තාක්ෂණය තුළින් පුද්ගලයන් කෘත්‍රිමව වෙනස් කරලා, ප්‍රතිනිර්මාණය කරන්නත් පුළුවන්. තමන්ගේ සහකාරිය හෝ සහකාරයා තරහා වුණාම ඔහුගේ හෝ ඇයගේ මුහුණු නිරූපණය වන ආකාරයට අසභ්‍ය වීඩියෝ පට හදන්න පුළුවන්. ඒ වාගේම ඒ ආකාරයට කටහඬ හදන්නත් හැකියාව තිබෙනවා. එවැනි කටයුතු කරන අය සම්බන්ධයෙන් නීතිමය රාමුව ගොඩනඟන්න පුළුවන් වෙන්නේ මේ සයිබර් ආරක්ෂණ අධිකාරිය පිහිටුවීම තුළිනුයි. දැනට තිබෙන නීතිය අනුව මේ කටයුත්ත ක්‍රියාත්මක කළ හැකියි. නමුත් ඒවා හඳුනා ගැනීමේ, නිරීක්ෂණය කිරීමේ වැඩ කටයුතුවලට සයිබර් ආරක්ෂණ පනත ගෙන ඒම ඉතාම වැදගත් වෙනවා. ඒ වාගේම මේ තුළින් හැඳුනුම්පත් අංකය හෝ ක්‍රෙඩිට් කාඩ් අංකය සොරකම් කර - identity theft එකක් කරලා - බැංකුවකට ගිහිල්ලා යම් පුද්ගලයෙකුගේ ගිණුමේ තිබෙන මුදල් ටික ලබා ගන්නත් පුළුවන්. මෙවැනි වංචා නතර කරන්න සයිබර් ආරක්ෂණ අධිකාරිය පිහිටුවීම ඉතාම වැදගත්. පවතින නීතිය අනුව ඒ සඳහා ක්‍රියාත්මක වෙන්න පුළුවන්. නමුත් ඒ සඳහා අපි ඉතාම ශක්තිමත් නීති රාමුවක් ගෙන ඒම අවශ්‍යයි. ජාතික ආරක්ෂාව සඳහා තමයි එවැනි නීති රාමුවක් ගෙන ඒම වැදගත් වෙන්නේ. ඒ නිසා මේ කටයුත්ත අපි අධීක්ෂණය කිරීමට අවශ්‍යයි. දැනට තිබෙන නීතිය අනුව මොන යම් හෝ ආකාරයකින් චෝදනා ලබපු චූදිතයන් හොයා ගන්න පුළුවන්.

නමුත් අපට අධීක්ෂණය කිරීම සඳහාත්, නිරීක්ෂණය කිරීම සඳහාත්, විමර්ශනය කිරීම සඳහාත් මේ නීති රෙගුලාසි ගොඩ නැඟීම ඉතා වැදගත් වෙනවා. ඒ වාගේම කෘත්‍රිම බුද්ධිය සම්බන්ධයෙන් වන කමිටුව මඟින් නිර්දේශ ඉදිරිපත් කරලා තිබෙනවා. අපි නීතිය ගොඩ නැඟීම වාගේම ඒ ගැන දැනුවත් කිරීමත් ආරම්භ කරන්න ඕනෑ. ඒ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අපි දැනටමත් ආරම්භ කර තිබෙනවා. එක පැත්තකින් අපේ රටේ ඉන්න රාජ්‍ය නිලධාරීන් සඳහා ඒ දැනුවත් කිරීමේ වැඩසටහන ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එය, අපේ තිබෙන දත්ත ආරක්ෂා කර ගැනීමට, අපේ රාජ්‍ය වෙබ් අඩවි ආරක්ෂා කර ගැනීමට සහ ජාතික ආරක්ෂාවට වැදගත් වෙනවා. ඒ සඳහා රාජ්‍ය සේවකයින් පුහුණු කිරීමටත්, දැනුවත් කිරීමටත් වෙනම වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊළඟ කාරණාව මෙකයි. අපි අධ්‍යාපන අමාත්‍යාංශයත් සමඟ එකතුවෙලා, අධ්‍යාපනය ඩිජිටල්කරණය කිරීමේ වැඩසටහන යටතේ පාසල් දරුවන්ට කෘත්‍රිම බුද්ධිය හඳුන්වා දීමේ වැඩ පිළිවෙළ ආරම්භ කර තිබෙනවා. මේ වර්ෂයේදී ඒ සඳහා සුහුරු වැඩසටහනක්, pilot project එකක් ආරම්භ කර තිබෙනවා. පාසල් 20ක් තෝරාගෙන 8 වසරේ විෂය නිර්දේශයට විෂයක් හැටියට මෙය හඳුන්වා දීමේ කටයුත්ත අධ්‍යාපන අමාත්‍යාංශය ආරම්භ කර තිබෙනවා. එය, ලබන වර්ෂයේ ඉඳලා 8 වසරේ විෂය නිර්දේශයට එකතු කිරීම සඳහා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරනවා. මේක එක පැත්තකින් කෘත්‍රිම බුද්ධියෙන් coding කරලා නිර්මාණය කිරීම පමණක් නොවෙයි, ඊට කලින් මූලික දැනුම

[ගරු කනක හේරත් මහතා]

ලබා දීම වැදගත් වෙනවා. සාමාන්‍ය ජනතාවට මූලික දැනුම ලබා දීම වැදගත් වෙනවා. රාජ්‍ය අංශයට මූලික දැනුම ලබා දීම වැදගත් වෙනවා. ඒ වාගේම අපේ දරුවන්ට ඉදිරි අභියෝගයට මුහුණ දීම සඳහා අපි මේක පාසල් දරුවන්ගෙන් -කුඩා කාලයේ ඉඳලාම- ආරම්භ කළ යුතුයි. සමහර වෙලාවට තව අවුරුදු දෙකකින් විතර AI තාක්ෂණය නැතිවෙලා වෙනත් තාක්ෂණයක් එන්න පුළුවන්. අපි IoT ගැන කථා කළා. ඊළඟට machine learning ගැන කථා කළා. දැන් AI ගැන කථා කරනවා වාගේ ඉදිරියේදී -තව වසර 2කින් වෙන්න පුළුවන්- ඉතාම ශීඝ්‍රයෙන් තාක්ෂණ දියුණුවත් සමඟ ඒක වෙනස් වෙන්න පුළුවන්. නමුත් අපි මේ බලපෑම සඳහා සූදානම් වීම ආරම්භ කිරීමත් සමඟම ඒ ගැන දැනුවත් කිරීමත් ඉතා වැදගත්. මෙහි මූලික අදියර හැටියට පසුගිය වසරේදී ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව වැඩ පිළිවෙළක් ආරම්භ කළා. ජනාධිපතිතුමා බලාපොරොත්තු වුණා, ග්‍රාමීය පාසල් - විශේෂයෙන්ම අන්තර්ජාල පහසුකම් නැති පාසල්- 1,000ක් තෝරාගෙන ඒ පාසල්වලට අන්තර්ජාල පහසුකම් ලබා දෙන්න. ඒ වැඩ පිළිවෙළට අපේ අමාත්‍යාංශයේ, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සහයෝගය ද ලබා දී ඒ කටයුත්ත ක්‍රියාත්මක කරලා තිබෙනවා. එහි දෙවැනි අදියර මේ වර්ෂයේ තව දවස් දෙකකින් වාගේ ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. උසස් පෙළ විෂය ධාරාවට IT තාක්ෂණය තිබෙන පාසල් 1,000ක් සඳහා සුහුරු පන්ති කාමර, විශේෂයෙන්ම ඒ බෝඩ් එකක් පමණක් නොවෙයි, අවශ්‍ය අනෙකුත් සියලුම උපකරණ -විශේෂයෙන්ම කෘත්‍රිම බුද්ධිය සඳහා අවශ්‍ය කරන උපකරණ ටික, robotics සඳහා භාවිත කරන්න ගණිතය, STEM සහ STEAM - දැන් STEM නොවෙයි, STEAM - සහ අධ්‍යාපනය සඳහා අවශ්‍ය කරන උපකරණ ටික අපි තව දින දෙක තුනකින් ආරම්භ කරන වැඩසටහන යටතේ ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්වාමීන් වහන්සේලා පමණක් නොවෙයි, ගිහි දරුවනුත් පිරිවෙන්වල ඉගෙනුම ලබනවා. ඒ පිරිවෙන් 440කටත්, AI තාක්ෂණය භාවිත කරන්න හැකියාව තිබෙන, STEAM අධ්‍යාපනය සහ robotics අධ්‍යාපනය ලබා දීමට හැකිවන ආකාරයට අවශ්‍ය උපකරණ ටික ලබා දෙන්නත් අප කටයුතු කරනවා.

අපි මේ වැඩසටහන ගාල්ලෙන් ආරම්භ කළේ, ඉතා කුඩා pilot project එකක් හැටියටයි. ඒ, සාමාන්‍ය ජනතාව සහ වෙළඳ ව්‍යාපාරිකයින්ව ඩිජිටල්කරණය ගැන වාගේම AIවලින් ඇතිවන අභියෝග පිළිබඳව දැනුවත් කරන්නයි. දැන්, ඒ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අපි බලාපොරොත්තු වෙනවා, එය නගර මට්ටමින් ආරම්භ කරලා ග්‍රාමීය මට්ටමේ සියලුම ජනතාවත් දැනුවත් කරන්න. එය, වැදගත් කාරණාවක් හැටියට අපි දකිනවා. මම හිතනවා, අද පාර්ලිමේන්තුවේ කථා කරපු ගරු මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම අනුවත්, එතුමන්ලාගේ දැනුම වර්ධනය කිරීම සඳහාත්, අපේ සාමාන්‍ය ජනතාවට, රාජ්‍ය සේවකයන්ට වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් ඉදිරි අභියෝගවලට මුහුණ දීම සඳහාත් ඒ පිළිබඳව වැඩසටහනක්, වැඩමුළුවක් මේ පාර්ලිමේන්තුවෙන් සංවිධානය කරන්න පුළුවන් නම් ඒක ඉතා වැදගත් වෙයි කියලා.

මොකද, ඉදිරියේදී අපේ හැම අවශ්‍යතාවකටම - ව්‍යාපාර කටයුතු වෙන්න පුළුවන්; රාජ්‍ය සේවය වෙන්න පුළුවන්; ඒ හැම කටයුත්තකටම - කෘත්‍රිම බුද්ධිය, AI භාවිතය ඉතාම වැදගත් වෙනවා. මෙහිදී මතු වන අභියෝගවලට -විශේෂයෙන්ම කෘත්‍රිම බුද්ධියේ තිබෙන අහිතකර බලපෑම්වලදී- අපට රටක් හැටියට තනිවම මුහුණ දෙන්න බැහැ. මොකද, වෙනත් රටක ඉඳලා කෘත්‍රිම බුද්ධි වැඩසටහන් ගොඩනඟලා මේ රටේ ඒවා ක්‍රියාත්මක කරන්න හැකියාව තිබෙනවා. එසේ කරන්නේ වංචා සඳහා වෙන්න පුළුවන්, නොයෙක් පුද්ගලයින්ගෙන් පළිගැනීම් සඳහා වෙන්න පුළුවන්. ඒවා නතර කිරීම සඳහා අපි ජාත්‍යන්තර සම්මුතියක් ඇති කරගන්න ඕනෑ. ඒ සඳහා දැනටමත් වැඩ පිළිවෙළවල් සිදු කරනවා. ලෝක බැංකුවෙන් මේ සඳහා අවශ්‍ය කරන වැඩමුළු පවත්වනවා, සම්මන්ත්‍රණ පවත්වනවා. ඒක ඉදිරියේදී තව තවත් ශක්තිමත් කරලා සෑම රටකම ඒ කෘත්‍රිම බුද්ධිය භාවිත කරන - උදාහරණයක් හැටියට අපේ ශ්‍රී ලංකා පෞද්ගලික දත්ත ආරක්ෂණ අධිකාරිය වෙන්න පුළුවන්, සයිබර් ආරක්ෂණ අධිකාරිය වෙන්න පුළුවන්- ඒ ආයතන සමඟ ජාත්‍යන්තරව සම්මුතියක් ඇති කර ගැනීම ඉතාම වැදගත්.

සාමාන්‍ය ඉංජිනේරුවෙක් දවසකින් හෝ දවස් දෙක තුනකින් coding කරලා හදන software එකක් කෘත්‍රිම බුද්ධිය මඟින් එක දවසකින් මිලියනයක් පමණ ගොඩනඟන්න, සංවර්ධනය කරන්න හැකියාව තිබෙනවා. ඒ නිසා ඒ නීති පද්ධතිය ගොඩනැඟීම ඉතාම වැදගත්. අද දින මේ විවාදය සඳහා පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව හැම කෙනෙකුගේම සහයෝගය ලබා දීම පිළිබඳවත් මම සතුටු වෙනවා. ඒ වාගේම, මේ කටයුතු ඉදිරියේදී ක්‍රියාත්මක කරද්දී ඒ සඳහා සියලුදෙනාගේ සහයෝගය ලබා දෙන්න කියා සඳහන් කරමින්, විශේෂයෙන්ම මේ යෝජනාව ගෙනාපු අපේ මධුර විතානගේ මන්ත්‍රීතුමාටත්, මේ විවාදයට සහභාගි වී අදහස් ඉදිරිපත් කළ, මෙකේ හිතකර සහ අහිතකර ප්‍රතිඵල පෙන්වා දුන්, යෝජනා ඉදිරිපත් කරපු සියලුදෙනාටත් මේ අවස්ථාවේ අපේ ස්තුතිය පුද කරනවා. අපේ ජනාධිපතිතුමා තමයි දුර දක්නා නුවණින් මේ සම්බන්ධව වැඩකටයුතු ආරම්භ කළේ. ඒක දැන් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ අභියෝගවලට මුහුණ දෙන්න කටයුතු කරපු සෑම දෙනාටම, විශේෂයෙන්ම කෘත්‍රිම බුද්ධිය පිළිබඳ කමිටුවේ -AI කමිටුවේ- සියලුදෙනාටත් අපේ ස්තුතිය පුද කරනවා. මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා, මොකක්ද කාරණය?

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට සහභාගි වී සිටි නිසා මේ විවාදයට සහභාගි වෙන්න එන්න බැරි වුණා. ගරු රාජ්‍ය ඇමතිතුමා අනුමැතිය දෙනවා නම් පමණක් විනාඩි දෙකක පමණ කාලයක් තුළ කෙටියෙන් ජාතික ආරක්ෂාව සම්බන්ධ කාරණයක් ඉදිරිපත් කරන්න මට අවසර ලබා දෙන්න. ගරු රාජ්‍ය ඇමතිතුමා එකඟ නම් පමණක් විනාඩි දෙකක, තුනක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට කරුණු පැහැදිලි කර ගැනීමක් ද අවශ්‍ය වන්නේ?

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
නැහැ, පොඩි කාරණා දෙකක් කියන්න තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ ගැන ඔබතුමාගේ අදහස මොකක්ද?

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු මන්ත්‍රීතුමා, මේ විවාදයට අදාළ නම් කියන්න.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ කාරණය ජාතික ආරක්ෂාව හා සම්බන්ධ දෙයක්. ඉතා කෙටියෙන් මම කරුණු ඉදිරිපත් කරන්නම්.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, AI තාක්ෂණය ගැන අද අපි කථා කළා. එය ඉතාම වැදගත් මාතෘකාවක්. මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා AI තාක්ෂණය පිළිබඳ විවාදයේදී ඔබතුමා විසින් මේ සභාවට ලබා දුන් පිළිතුර පිළිබඳව. හැබැයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි, ජාතික ආරක්ෂාව සම්බන්ධ ගැටලුවක් පිළිබඳ මගේ එකම එක මතයක් ප්‍රකාශ කරන්න විතරයි මම මේ ඉල්ලීම කළේ. මොකද, ජාතික ආරක්ෂාව පිළිබඳව, පාස්කු ප්‍රහාරය හා සම්බන්ධ කාරණා පිළිබඳව මම මේ පාර්ලිමේන්තුව තුළ මාස දෙක තුනක් තිස්සේ දිගින් දිගටම අනාවරණය කරගෙන ආවා. මේක technology එක එක්කත් සම්බන්ධයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. අපි දැක්කා, ක්ලබ් වසන්තගේ ඝාතන සිද්ධියේදී පැය කිහිපයක්, දවසක් ඇතුළත වාගේ තොරතුරු විශාල ප්‍රමාණයක් අනාවරණය වුණු ආකාරය. මඩකලපුවේ සිදු වුණු වෙඩි තැබීමක් පිළිබඳව මම මේ සභාවේ කරුණු මතු කළත්, මේ වනතුරු පොලීසියෙන් ඒ සම්බන්ධව කිසිම action එකක් අරගෙන නැහැ. කාන්තන්කුඩිවලත් වෙඩි ප්‍රහාරයක් එල්ල කළා. ඉතින්, අපි AI තාක්ෂණය ගැන කථා කරනකොට, ජාතික ආරක්ෂාව සම්බන්ධව කථා කරද්දී, අනිවාර්යයෙන්ම අද රට තුළ තිබෙන ගැටලු පිළිබඳවත් මීට වඩා උනන්දු වෙන්න ඕනෑ. මම වැඩිපුර කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මට මේ කාරණය කියන්න ඉඩ ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු රාජ්‍ය ඇමතිතුමනි. මට මේ විවාදයට සහභාගි වන්නට බැරි වුණේ, මම ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කමිටුවට සහභාගි වුණු නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් ස්තුතියි, මට මේ අවස්ථාව ලබා දුන්නාට.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 3.43ට, 2024 ජූලි 25වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 3.43 மணிக்கு பாராளுமன்றம், 2024 யூலை 25, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 3.43 p.m. until 9.30 a.m. on Thursday, 25th July,2024.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

ගරු අසංක නවරත්න මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1වන ප්‍රශ්නයට -2146/2024 - පිළිතුර දීමට බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු විදුර වික්‍රමනායක මහතා සති දෙකක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அசங்க நவரத்ன அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1ஆம் இலக்க வினாவுக்கு - 2146/2024 - விடையளிப்பதற்கு, புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர் மாண்புமிகு விதுர விக்கிரமநாயக்க அவர்கள் இரண்டு வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. Vidura Wickramanayaka, Minister of Buddhasasana, Religious and Cultural Affairs has requested for two weeks' time to reply to Question No. 1 - 2146/2024 - raised by the Hon. Asanka Navarathna appearing in today's Order Paper.

රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්වරයා: දෙමළ සහ ඉංග්‍රීසි භාෂා කුසලතාව
அரச கரும மொழிகள் ஆணையாளர் நாயகம்: தமிழ் மற்றும் ஆங்கில மொழித்திறன்
COMMISSIONER GENERAL OF OFFICIAL LANGUAGES: PROFICIENCY IN TAMIL AND ENGLISH

2148/2024

2. ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) එත්මන් රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්වරයාට දෙමළ භාෂාව හැසිරවීමේ හැකියාව නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවක් වන දෙමළ භාෂාව භාවිත කරනු ලබන පුරවැසියන්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඔහුට අපහසු බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) එසේ නම්, එත්මන් රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්වරයා දෙමළ භාෂාව සම්බන්ධයෙන් ලබා ඇති කුසලතාවය කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ සම්බන්ධීකරණ භාෂාව වන ඉංග්‍රීසි භාෂාව සම්බන්ධයෙන් ඔහු ලබා ඇති සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු සෙයිඩ් අලි සාහිර් මවුලානා මහතා]

பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருமான வரைக் கேட்ட வினா:

(அ) (i) அரச கரும மொழிகள் ஆணையாளர் நாயகம் அவர்களுக்குத் தமிழ் மொழியைக் கையாளும் இயலுமை இல்லையென்பதையும்;

(ii) இதன் காரணமாக இலங்கையின் அரச கரும மொழிகளுள் ஒன்றாகிய தமிழ் மொழியைப் பயன்படுத்துகின்ற பிரசைகளின் விடயங்கள் தொடர்பில் நடவடிக்கை எடுப்பது இவருக்கு கடினமானதாக இருக்கின்றது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) ஆமெனில், அரசகரும மொழிகள் ஆணையாளர் நாயகம் தமிழ் மொழி தொடர்பாகப் பெற்றுக்கொண்டுள்ள திறன் யாதென்பதையும்;

(ii) இலங்கையின் இணைப்பு மொழியாகிய ஆங்கில மொழி தொடர்பில் அவர் பெற்றுக்கொண்டுள்ள தகைமைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he admit that -

(i) the current Commissioner General of Official Languages lacks Tamil language proficiency; and

(ii) as a result, it is challenging for him to address the needs of the citizens who speak Tamil, which is an Official Language in Sri Lanka?

(b) Will he inform this House -

(i) if so, the Tamil language proficiency level of the current Commissioner General of Official Languages; and

(ii) the qualifications he has acquired in English, which is the link language of Sri Lanka?

(c) If not, why?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)

(மாண்புமிகு தினேஷ் குணவர்தன - பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரும்)

(The Hon. Dinesh Gunawardena - Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government)

(අ) (i) පිළිගනිමි.

(ii) පිළිනොගනිමි.

රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරකි. එම තනතුරට පත් කිරීමේදී සලකා බලනු ලබන්නේ එම නිර්ණායකය වේ. ඒ අනුව දෙපාර්තමේන්තුවේ සිංහල/දෙමළ, ඉංග්‍රීසි/දෙමළ භාෂා පරිවර්තක නිලධාරීන් සහ අනෙක් කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තුවේ අරමුණු හා ඉලක්ක කරා මෙහෙයවමින් පරිපාලනය කිරීමේදී දෙමළ භාෂාව භාවිත කරන පුරවැසියන්ගේ භාෂා අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අපහසුතාවක් නොමැත.

(ආ) (i) කුසලතාව ලබාගෙන නොමැත.

රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් තනතුර යනු දෙපාර්තමේන්තු ප්‍රධානි තනතුරකි. රජයේ කිසිදු දෙපාර්තමේන්තු ප්‍රධානි තනතුරක් හෙබවීම සඳහා එකී නිලධාරියාට සිංහල හා දෙමළ භාෂා දෙකෙහිම ප්‍රවීණතාව ලබා සිටිය යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නොවේ. එම නිසා දෙමළ භාෂා ප්‍රවීණතාවක් ලබා තිබීම මෙම තනතුර දැරීම සඳහා අත්‍යවශ්‍ය නෛතික කරුණක් නොවේ. එසේ වුවද දෙපාර්තමේන්තුවට අනුයුක්තව භාෂා පරිවර්තක නිලධාරීන් සේවය කරනු ලබන බැවින් රාජකාරි කටයුතුවලදී බාධාවක් ඇති නොවේ.

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා විශිෂ්ට සම්මාන සාමර්ථයක් ලබා ඇත.

(ඇ) අදාළ නැත.

(අ) (i) ඒත්‍රුක්කොළ්කින්රේන්.

(ii) ඒත්‍රුක්කොළ්ළවිල්ලෙ.

அரச கரும மொழிகள் ஆணையாளர் நாயகம் பதவியானது, இலங்கை நிர்வாக சேவையின் ஒரு விசேட தரப் பதவியாகும். அப்பதவிக்கு நியமனம் செய்யும்போது, அதற்கான அளவு கோலே கவனத்தில் கொள்ளப்படும். அதற் கிணங்க, திணைக்களத்தின் சிங்களம்/தமிழ், ஆங்கிலம்/தமிழ் மொழிபெயர்ப்பாளர்கள் மற்றும் ஏனைய பணிக்குழாத்தை திணைக்களத்தின் இலக்குகள் மற்றும் நோக்கங்களை நோக்கி வழிநடாத்தி நிர்வகிக்கும்போது, தமிழ் மொழியைப் பயன்படுத்தும் பிரஜைகளின் மொழித் தேவைகள் தொடர்பில் செயலாற்றுவதில் அசௌகரியம் இல்லை.

(ஆ) (i) திறமையைப் பெற்றுக்கொள்ளவில்லை.

அரச கரும மொழிகள் ஆணையாளர் நாயகம் பதவி என்பது திணைக்களத்தின் தலைவர் பதவியாகும். அரசாங்கத்தின் எந்தவொரு திணைக்களத்தின் தலைவர் பதவியையும் வகிப்பதற்கு, மேற்படி உத்தியோகத்தர் சிங்களம் மற்றும் தமிழ் ஆகிய இரு மொழிகளிலும் புலமை பெற்றிருக்க வேண்டும் என்று அரசியலமைப்பில் குறிப்பிடப் படவில்லை. எனவே, தமிழ் மொழியில் புலமை பெற்றிருத்தல் என்பது இப்பதவியை வகிப்பதற்கான அத்தியாவசிய சட்டபூர்வ விடயமன்று. இருப்பினும், திணைக்களத்தில் இணைந்து மொழிபெயர்ப்பாளர்கள் சேவையாற்றுகின்ற மையால் கடமை நடவடிக்கைகளில் தடை ஏற்பட மாட்டாது.

(ii) கல்விப் பொதுத் தராதர சாதாரண தரப் பரீட்சையில் ஆங்கில மொழியில் சிறப்புத் தேர்ச்சி சித்தியைப் பெற்றுள்ளார்.

(இ) ஏற்புடையதன்று.

(a) (i) I accept.

(ii) I do not accept.

The Commissioner General of Official Languages is a post in the Special Grade of the Sri Lanka Administrative Service. The above criterion is considered when making appointment to the said post. Accordingly, there is no difficulty in dealing with the language requirements of the citizens who use Tamil language when administering the Sinhala/Tamil, English/Tamil Translators and the rest of the staff of the Department and directing them towards the goals of the Department.

(b) (i) He has not acquired the proficiency.

The post of Commissioner General of Official Languages falls under the category of Head of the Department. It is not indicated in the Constitution that the respective officer should have the proficiency in both Sinhala and Tamil languages to hold the post of Head of the Department. Therefore, proficiency in the Tamil language is not an essential legal requirement to hold this post. However, no hindrance is caused to the duties, since Translators are serving attached to the Department.

(ii) A Distinction has been obtained for English language at the G.C.E. (O/L) Examination.

(c) Not relevant.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

313 වන කාණ්ඩය - 15 වන කලාපය
தொகுதி 313 - இல. 15
Volume 313 - No. 15

2024 ජූලි 25වන බ්‍රහස්පතින්දා
2024 யூலை 25, வியாழக்கிழமை
Thursday, 25th July, 2024

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2024 ජූලි 25වන බ්‍රහස්පතින්දා
2024 யூலை 25, வியாழக்கிழமை
Thursday, 25th July, 2024

අන්තර්ගත ප්‍රධාන කරුණු

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තිරුව 2670]

රට තුළ සිසු ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන විශේෂ කාරක සභාව:
කාලය දීර්ඝ කිරීම [තිරුව 2672]

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
ඉඩම් සංවර්ධන (සංශෝධන) - [ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය] - පළමුවන වර කියවන ලදී [තිරුව 2673]

ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) - [ගරු ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා] - පළමුවන වර කියවන ලදී [තිරුව 2674]

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තිරු 2688-2828]

ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තිරු 2828-2844]

பிரதான உள்ளடக்கம்

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 2670]

நாட்டில் வேகமாகப் பரவிவரும் போதைப்பொருள் அச்சுறுத்தலை உடனடியாகக் கட்டுப்படுத்துவதற்கும் ஒழிப்பதற்கும் நடைமுறைப்படுத்தப்படவேண்டிய வழிமுறைகள் குறித்து ஆராய்ந்து அது பற்றிய அவதானிப்புகளையும் விதப்புரைகளையும் பாராளுமன்றத்திற்குச் சமர்ப்பிப்பதற்கான தெரிகுழு:
கால நீடிப்பு [ப: 2672]

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
காணி அபிவிருத்தி (திருத்தம்) – [மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2673]

இலங்கை கிரிக்கெட் நடுவர்கள் சங்கம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த] – முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2674]

பகிரங்க நிதிசார் முகாமைத்துவம் சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 2688 –2828]

பொருளாதார நிலைமாற்றம் சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 2828-2844]

PRINCIPAL CONTENTS

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 2670]

SELECT COMMITTEE TO LOOK INTO AND IDENTIFY THE MECHANISMS TO BE IMPLEMENTED IN ORDER TO IMMEDIATELY CONTROL AND ERADICATE THE RAPIDLY SPREADING DRUG MENACE IN THE COUNTRY AND TO SUBMIT OBSERVATIONS AND RECOMMENDATIONS TO PARLIAMENT IN THAT REGARD:
Extension of time [Col. 2672]

PRIVATE MEMBERS' BILLS:
Land Development (Amendment) – [The Hon. (Mrs.) Rohini Kumari Wijerathna] - Read the First time [Col. 2673]
The Association of Cricket Umpires, Sri Lanka (Incorporation) – [The Hon. Premnath C. Dolawatte] – Read the First time [Col. 2674]

PUBLIC FINANCIAL MANAGEMENT BILL:
Read a Second, and the Third time, and passed as amended [Cols. 2688-2828]

ECONOMIC TRANSFORMATION BILL:
Read a Second, and the Third time, and passed as amended [Cols. 2828-2844]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2024 ජූලි 25වන බ්‍රහස්පතින්දා
2024 யூலை 25, வியாழக்கிழமை
Thursday, 25th July, 2024

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ කළමිබු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සම්බන්ධයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 මැයි 03 දිනැති අංක 2382/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරමි.

මෙම නියමය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු විදුර වික්‍රමනායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Vidura Wickramanayaka - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

මේ වාර්තාවට අදාළව interim provision එකක් තිබෙනවා, මාසයක් වශයෙන්. ඒක අපි මාස තුනක් වශයෙන් දීර්ඝ කරනවා කියන කාරණයත් මේ අවස්ථාවේ එම වාර්තාවේ සඳහන් කරනවා.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ දිනයේදී the Hon. (Dr.) Harsha de Silva යෝජනා කළා, interim provision එකක්. දැනට තිබෙන එකෙන් අනෙක් එකට මාරු වෙද්දී සාමාන්‍යයෙන් පනතක අන්තර්කාලීන විධිවිධාන යොදනවා. මොකද, ඒ transitional period එකට. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා ඒ ගැන දන්නවා. ඒකේ transitional period එක තිබෙන්නේ "one month" කියලා. ඒ සඳහා three months දාන්න කියලා Public Finance Committee එකේ යෝජනාවක් තිබෙනවා. අපි ඒක consider කරනවා, at the Committee Stage.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

2024 ජූලි 18 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය කළ පරිදි අද දිනට නියමිත වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වෙනත් දිනයකට යොමු කරනු ලැබේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි කාලයක් දෙන්න.

මහාචාර්ය වික්‍රමබාහු කරුණාරත්න මැතිතුමා අභාවප්‍රාප්ත වෙලා තිබෙනවා. වාමාංශික දේශපාලනයේ සලකුණක් වූ නව සම සමාජ පක්ෂයේ නායක වික්‍රමබාහු කරුණාරත්න මහතාගේ අභාවය පිළිබඳව මගේත්, සමගි ජන බලවේගයේත්, සමගි ජන සන්ධානයේ සියලුදෙනාගේත් ශෝකය ප්‍රකාශ කර සිටිනවා. එතුමා වාමාංශික දේශපාලනය වෙනුවෙන් ජීවිතය කැප කරපු නායකයෙක්. එතුමා අසූඑක් වසරක් වූ සිය ජීවිත කාලයේ වැඩි කොටසක් තමන් දරන දේශපාලන මතය වෙනුවෙන් නොබියව, නිර්භීතව කටයුතු කළා. ආනන්ද විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍යයෙකු වූ එතුමා උසස් අධ්‍යාපනය පැත්තෙනුත් ඉහළටම ගිය කෙනෙක්. අපේ රටේ කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි එතුමාගේ අභාවය පිළිබඳව අප සියලුදෙනාගේ ශෝකය මේ අවස්ථාවේ පළ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව පොඩි වෙලාවක් දෙන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනට නියමිත මූලික වැඩ කටයුතු ඉදිරිපත් කළාට පස්සේ විපක්ෂ නායකතුමාට අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ විපක්ෂ නායකතුමා ශෝක ප්‍රකාශයක් කරපු නිසා මමත් ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ඒ සම්බන්ධයෙන් යමක් කිව යුතුයි. ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න මැතිතුමා වාමාංශික දේශපාලනයේ පුරෝගාමියෙක්. එතුමා අභාවප්‍රාප්ත ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමන්ලාගේ ආභාසයෙන් තමයි දේශපාලන කටයුතු එතුමන්ට අවශ්‍ය විධියට ඉදිරියට ගෙනිව්වේ. හැබැයි, එතුමා මමත් සමඟ බස්නාහිර පළාත් සභාවේ එකට සිටියා. කුමන ආකාරයෙන් වාමාංශික අදහස් දැරුවත් එතුමා ප්‍රසන්න පුද්ගලයෙක්; දැනුම තිබෙන පුද්ගලයෙක්. එතුමා කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධියක් ගත්ත කෙනෙක්. *[බාධා කිරීමක්]* ඔව්. අපේ රටේ විතරක් නොවෙයි, පිට රටවලින් ආචාර්ය උපාධියක් අරගෙන තිබෙනවා. එතුමාගේ දේශපාලන මතය කුමක් වුවත්, එතුමා අභිමිවීම මේ රටට පාඩුවක් කියන කාරණයත් අපි මතක් කරන්න ඕනෑ. එතුමාගේ අභාවය පිළිබඳව ආණ්ඩු පක්ෂය වෙනුවෙන් අපේ ශෝකයත් ප්‍රකාශ කර සිටිනවා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රට තුළ සීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන විශේෂ කාරක සභාව
நாட்டில் வேகமாகப் பரவிவரும் போதைப்பொருள் அச்சுறுத்தலை உடனடியாகக் கட்டுப்படுத்துவதற்கும் ஒழிப்பதற்கும் நடைமுறைப்படுத்தப்படவேண்டிய வழிமுறைகள் குறித்து ஆராய்ந்து அது பற்றிய அவதானிப்புகளையும் விதப்புரைகளையும் பாராளுமன்றத்திற்குச் சமர்ப்பிப்பதற்கான தெரிகுழு
SELECT COMMITTEE TO LOOK INTO AND IDENTIFY THE MECHANISMS TO BE IMPLEMENTED IN ORDER TO IMMEDIATELY CONTROL AND ERADICATE THE RAPIDLY SPREADING DRUG MENACE IN THE COUNTRY AND TO SUBMIT OBSERVATIONS AND RECOMMENDATIONS TO PARLIAMENT IN THAT REGARD

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"රට තුළ සීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට

ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2024 අප්‍රේල් මස 01 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබාදී ඇති කාලසීමාව, 2024 සැප්තැම්බර් මස 27 දින දක්වා දීර්ඝ කළ යුතුය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත
காணி அபிவிருத்தி (திருத்தம்) சட்டமூலம்
LAND DEVELOPMENT (AMENDMENT) BILL

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"(464 වන අධිකාරිය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විධුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Tourism and Lands for report.

ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
இலங்கை கிரிக்கெட் நடுவர்கள் சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
THE ASSOCIATION OF CRICKET UMPIRES, SRI LANKA (INCORPORATION) BILL

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දශක ගණනාවක් තිස්සේ මේ රටේ ක්‍රිකට් ක්ෂේත්‍රයට අදාළ නායකත්වය දුන් ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමය කියන්නේ ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා, බුද්ධික පතිරණ මැතිතුමා, දයාසිරි ජයසේකර මැතිතුමා කියන මේ සියලුදෙනාම සභාපතිත්වය දරපු සංගමයක්. පසුගිය කාලයේ මමත් එහි සභාපති ධුරය දැරුවා.

ගරු නාලක බණ්ඩාර කෝට්ටෙගොඩ මහතා
(மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட)
(The Hon. Nalaka Bandara Kottegoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමයක් සංස්ථාගත කිරීම කාලීන වශයෙන් අත්‍යවශ්‍යම කාරණයක් විධියට අපි හඳුනා ගෙන තිබුණා. මොකද, මමත් ක්‍රිකට් විනිසුරුවන්ගේ සංගමයේ සභාපති විධියට මධ්‍යම පළාත තුළ කටයුතු කළා. එම නිසා මෙම යෝජනාව මා ස්ථිර කරනවා.

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විධුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Sports and Youth Affairs for report.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,විශේෂ කාරණයක් මතු කිරීමට මට අවස්ථාව දෙන්න. මම වැඩි කාලයක් ගන්නේ නැහැ.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගරු සභානායකතුමනි, ඔබතුමා දැන උගත් නීතිඥවරයෙක්. නීතිඥවරයෙකු හැටියට ඔබතුමා අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන හොඳ අවබෝධයකින් යුතුව කටයුතු කරනවා. ඔබතුමා හොඳින් දන්නවා, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය, tripartite system එක, ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන කුලුනු තුන අපේ රටේ තිබෙනවා කියලා. ඒ තමයි විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය.

ඒ කුලුනු තුන තුළ වෙන වෙනම බලය බෙදීම සිදු වෙනවා, separation of powers කියන principle එක ක්‍රියාත්මක වෙනවා. එතකොට tripartite system එක, ඒ කියන්නේ ත්‍රිත්ව බල කුලුනු තුන තුළ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම සංවරණ සහ තුලන - checks and balances - ක්‍රමවේදය හරහා මෙම කුලුනු තුනෙන් එකක බලපරාක්‍රමය ප්‍රබල වෙනවා වෙනුවට ඒ තුනේම සංවරණ සහ තුලන - checks and balances - වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා.

ගරු සභානායකතුමනි, නීතිඥවරයෙකු හැටියට ඔබතුමා දන්නවා, මේ සියල්ලක්ම අපේ රටේ උත්තරීතරම නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතාම පැහැදිලිව සඳහන් වන බව. විධායකයට වෙනම බලතල තිබෙනවා, ව්‍යවස්ථාදායකයට වෙනම බලතල තිබෙනවා, අධිකරණයට වෙනම බලතල තිබෙනවා. එතකොට, මේ බලතල එක්ක රටේ උත්තරීතර නීතිය ක්‍රියාත්මක කරන මේ පද්ධතිය තුළ අපි යුක්තිගරුක වෙන්නටත් ඕනෑ, නීතිගරුක වෙන්නටත් ඕනෑ. අපි නීතියේ ආධිපත්‍යය සුරක්ෂා කරන්නටත් ඕනෑ. අපට ඕනෑ ඕනෑ විධියට රටේ නීතිය හසුරුවන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හසුරුවන්නට බැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒක පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. මොකද, අපේ රටේ තිබෙන්නේ නොලියපු ව්‍යවස්ථාවක් - unwritten Constitution එකක් - නොවෙයි, ලියපු ව්‍යවස්ථාවක් - written Constitution එකක්. විශේෂයෙන්ම මම මේ කාරණාව කියන්නේ මේ නිසායි. අධිකරණය තීන්දුවක් ලබා දෙනකොට, ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ලබා දෙනකොට, අපි ඒ තීන්දුව ක්‍රියාත්මක කරන්නට බැඳිලා ඉන්නවා. ඒ ගැන අපට ආපසු ප්‍රශ්න කරන්න බැහැ. විශේෂයෙන්ම අධිකරණයට ලබා දිය යුතු ගරුත්වය අපි ලබා දෙන්න ඕනෑ. විධායකය සතු බලතල තුළ විධායකයේ බලතල ක්‍රියාත්මක කිරීම, ව්‍යවස්ථාදායකය සතු බලතල තුළ ව්‍යවස්ථාදායකයේ බලතල ක්‍රියාත්මක කිරීම, ඒ වාගේම අධිකරණය සතු බලතල තුළ අධිකරණයේ බලතල ක්‍රියාත්මක කිරීම තමයි සිද්ධ වෙන්නේ.

මේක තමයි ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ තිබෙන ශක්තිමත්ම පදනම, ප්‍රධාන කුලුනු තුන - the three pillars of democracy. මේ ප්‍රධාන කුලුනු තුනේ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සඳහන් වෙලා තිබෙන මොහොතක, අපට ඕනෑ ඕනෑ විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හසුරුවන්න බැහැ. ඒ නිසා මම මේ අවස්ථාවේදී ගෞරවයෙන් මේ කාරණය කියන්න කැමැතියි. මොකද, ඊයේ ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් interim injunction එක ගැන අද විවිධ කථා කියනවා. ඒවායේ සත්‍ය අසත්‍යතාව මම දන්නේ නැහැ. ගරු සභානායකතුමනි, ඒවා ප්‍රත්‍යක්ෂ කරන්න, තහවුරු කරන්න ඔබතුමාට පුළුවන්. විශේෂයෙන්ම කැබිනට් මණ්ඩලයත් ඊයේ රැස් වෙලා මේ ගැන සාකච්ඡා කළා ලු. ඒ තීන්දු-තීරණ ගැන දින දෙකක් පරිශීලනය කරන්නට අවශ්‍යයි ලු. ඇත්ත වශයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණය බොහොම පැහැදිලි තීන්දුවක් දීලා තිබෙනවා. ඒ පැහැදිලි තීන්දුව ක්‍රියාත්මක කරන්නට අනිවාර්යයෙන්ම ව්‍යවස්ථාදායකයත්, විධායකයත් බැඳිලා ඉන්නවා. අපට ඒවායෙන් පැනලා යන්න බැහැ. ඒ නිසා මම බොහොම කාරුණිකව ඉල්ලීමක් කරනවා, ප්‍රජාතන්ත්‍රවාදයට මරු පහරවල් එල්ල කරන්නට යන්න එපා කියලා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන ඒවා ගෙදර තමන් හැසිරෙන ආකාරයට ක්‍රියාත්මක කරන්නට බැහැ. රටේ නීතියක් තිබෙනවා. නීතියේ ආධිපත්‍යය තිබෙනවා. ඒ නීතියේ ආධිපත්‍යය - rule of law - අපි සුරක්ෂා කරන්නට ඕනෑ. ඒ වාගේමයි, constitutionality එකත්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන නීති, සිද්ධාන්ත ක්‍රියාත්මක කරන්න අපි බැඳී සිටිනවා. ඒ නිසා මේ අවස්ථාවේදී මම බොහොම පැහැදිලිව ඔබතුමාට කියන්න කැමැතියි, ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන්නාම ජනාධිපතිවරයාටයි, කැබිනට් මණ්ඩලයටයි තම තමන්ට ඕනෑ විධියට තීන්දු ගන්න බැහැ කියන එක. ඒ තීන්දුව ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ නිසා මම ගරු සභානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අඩුම ගණනේ නීතිඥවරයෙකු හැටියට ඔබතුමාවත් ඒ අදාළ තැන්වලට උපදෙස් දීලා, මේ නීතිය ක්‍රියාත්මක කරන්නට ඕනෑ ආකාරය පිළිබඳව පොඩි පන්තියක් පවත්වන්න කියලා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන මෙතුමන්ලාව දැනුවත් කරන්න පොඩි පන්තියක් පවත්වන්න, ගරු සභානායකතුමනි. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ලබා දුන්නාම ඒ ගැන අනිවාර්යයෙන්ම එක එක තැන්වල ප්‍රශ්න කරන්න බැහැ. ඒක ක්‍රියාත්මක කරන්න අපි හැමෝම බැඳිලා සිටිනවා. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධානතම පදනම.

ගරු සභානායකතුමනි, මම ඔබතුමාට කාරුණිකව යෝජනා කරනවා, ඔබතුමන්ලාගේ ජනාධිපතිවරයා ප්‍රමුඛ සියලුදෙනාවම ඒ කාරණය පිළිබඳව දැනුවත් කරන්න කියලා. ඔබතුමන්ලා මම මේ කියන කාරණය මතක තියාගන්න. ඔබතුමන්ලාත් අහු වෙයි, contempt of court කියන චෝදනාවට. උසාවියට අපහාස කරන්න බැහැ, කැබිනට් මණ්ඩලයට. කැබිනට් මණ්ඩලයට ඕනෑ ඕනෑ විධියට නටන්න බැහැ, ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ලබා දුන්නාම.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ විපක්ෂ නායකතුමා සඳහන් කළා වාගේ බලතල බෙදීමේ න්‍යාය මීට ශතවර්ෂ 4කට කලින් ප්‍රංශ දාර්ශනිකයෙකු වූ මොන්ටෙස්ක්‍යු විසින් තමයි ඉදිරිපත් කළේ. අදටත් මහා බ්‍රිතාන්‍යයේ ලිඛිත ව්‍යවස්ථාවක් නැහැ, පනත් තිබෙන්නේ. නමුත්, ව්‍යවස්ථා වර්ගීකරණයේදී - මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා - ලිඛිත, අලිඛිත, ඒකීය, සන්ධීය ආදී වශයෙන් විවිධ වර්ගීකරණ තිබෙනවා. මම ඒවා ගැන දැන් කියන්න යන්නේ නැහැ.

ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය කියන ආයතන තුන එකකට එකක් තිරිංගයක් ලෙස කටයුතු කිරීමෙන් තමයි ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය රැකෙන්නේ කියන මූල ධර්මය ආවේ බලතල බෙදීමේ න්‍යායත් එක්කයි. ඒ මූල ධර්මය මත පිහිටා තමයි 1978දී සම්මත කර ගත්, අද අපි ක්‍රියාත්මක කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිපාදන සලසා තිබෙන්නේත්; ක්‍රියාත්මක වෙන්නේත්.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3වන ව්‍යවස්ථාවේ තිබෙනවා, "ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේ ය. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේ ය" යනුවෙන්.

ඊළඟට, 4වන ව්‍යවස්ථාවෙන් කියනවා, පරමාධිපත්‍යය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (අ) අනුව්‍යවස්ථාව යටතේ තිබෙනවා, "ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරා පත්කර ගනු ලබන මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් ද, ජනමත විචාරණයක දී ජනතාව විසින් ද ක්‍රියාත්මක කළ යුත්තේ ය" කියලා. ඒක ඉතාම පැහැදිලියි.

ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ආ) අනුව්‍යවස්ථාව යටතේ තිබෙනවා, "රටේ ආරක්ෂාව ඇතුළුව ජනතාවගේ විධායක බලය ජනතාව විසින් තෝරා පත්කර ගනු ලබන ජනරජයේ ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය" කියලා. විධායකය සමස්ත ජනතාවම පත් කළ ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කරන්නේ. ජනාධිපතිවරයාගේ බලතල යටතේ ව්‍යවස්ථාවල සඳහන් කර තිබෙන ඒ විධායක බලය තමයි විෂයයන් හැටියට අමාත්‍යවරුන්ට, රාජ්‍ය අමාත්‍යවරුන්ට ගැසට් කරලා භාර දෙන්නේ. මොකද, ජනතාව අපිව පත් කරලා නැහැ නේ, විධායකයට. විධායකයට අපිව පත් කරලා තිබෙන්නේ ජනාධිපතිවරයා. ජනාධිපතිවරයාට විෂයයන් ගණනාවක් කරන්න බැරි නිසාත්, ඒක ප්‍රායෝගික නොවන නිසාත් අමාත්‍ය මණ්ඩලය මඟින් ඒක නියෝජනය වෙනවා.

ඊළඟට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඇ) අනුව්‍යවස්ථාව යටතේ තිබෙනවා, "නීතිය අනුව පාර්ලිමේන්තුව විසින් ම ක්‍රියාත්මක කළ හැකි පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර හා බලතල සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද නැතහොත් වෙනත් යම් නීතියකින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන මඟින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය" යනුවෙන්. දැන් මොකක්ද මේ අනුව්‍යවස්ථාවෙන් කියන්නේ? ජනතාවගේ අධිකරණ බලය අවසාන වශයෙන් කොහෙන්ද ක්‍රියාත්මක කරන්න ඕනෑ? පාර්ලිමේන්තුව විසින්.

ඊළඟට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඈ) අනුව්‍යවස්ථාවේ කියනවා, මූලික අයිතිවාසිකම් ගැන. මේ ව්‍යවස්ථාවේම තිබෙනවා, ඒ සඳහා අවශ්‍ය පරිච්ඡේද සහ ව්‍යවස්ථා. 4 (ඉ) අනුව්‍යවස්ථාවෙන් කියන්නේ, ඡන්ද බලය ගැන. ඒ ටික තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරම්භයේදී බලතල බෙදීම සහ ඒකට අදාළව තිබෙන්නේ.

ඔබතුමන්ලා මතක තියා ගන්න, මේ කාරණයත්. ව්‍යවස්ථාදායක සභාව අපි පිහිටෙව්වා නේ. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කරපු ව්‍යවස්ථාදායක සභාව වරෙක ශක්තිමත් වුණා; වරෙක දුර්වල වුණා. මම ඒ සංශෝධන සියල්ල කියන්න යන්නේ නැහැ. අවසාන වශයෙන්, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කරපු සංශෝධනය තමයි දැන් ව්‍යවස්ථාවේ තිබෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදයේ 41අ. අනුව්‍යවස්ථාවේ ඉඳලා තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳවයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සමන්විත වන්නේ කාගෙන්ද? අග්‍රාමාත්‍යවරයා, කථානායකවරයා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඒකේ ඉන්නවා. ඊළඟට, 41(ඉ) යටතේ තිබෙනවා, "පහත සඳහන් පරිදි නාම යෝජනා කරනු ලැබ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු තැනැත්තන් පස් දෙනෙක්" කියලා. කොහොමද ඒ පස්දෙනා පත් වෙන්නේ? ආණ්ඩුව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාම යෝජනා කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් වන දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාමයෝජනා කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් සහ අග්‍රාමාත්‍යවරයාගේ සහ විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ එකඟත්වය මත, කථානායකවරයා විසින් නාම යෝජනා කරනු ලබන තැනැත්තන් තිදෙනෙක්. වශයෙන් තමයි ඒ පස්දෙනා පත්වෙන්නේ. ඒක තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය. සාමාජිකයන් ඔක්කොම 10දෙනායි. එතකොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට දුන්නේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඉඳලා පරිණාමය වීමට පෙර 1978 මුල් ව්‍යවස්ථාවේ තිබුණු ජනාධිපතිවරයාගේ විධායක බලය. ඒ විධායක බලය තමයි පරිණාමනය වෙලා විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ VIIඅ වන පරිච්ඡේදයට ආවේ. එතකොට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, විධායකයේ කොටසක්.

කැබිනට් එකේ සාකච්ඡා කරලා තීන්දු කරන්න බැහැ. කථා කරන්න පුළුවන්. නමුත් කැබිනට් එකට තීන්දු කරන්න බැහැ. ඊළඟට, මෙහි Schedulesවල තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් කාවද ඒ විධියට පත් කරන්නේ කියලා. මේ යටතේ වන උපලේඛනයේ මැතිවරණ කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව, විගණන සේවා කොමිෂන් සභාව ආදී වශයෙන් (අ) සිට (එ) දක්වා තිබෙනවා.

ඊළඟට 41(ඇ) යටතේ තිබෙනවා, "පත් කිරීම් සභාව විසින් අනුමත කළ යුතු බව" යනුවෙන්. මොන සභාවද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව. එතකොට එහි උපලේඛනයේ පළමුවන කොටසේ තිබෙනවා, "(අ) අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්, (ආ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්, (ඇ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන්" යනුවෙන්.

දෙවන කොටසේ තිබෙනවා, "(අ) නීතිපතිවරයා, (ආ) ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා, (ඇ) විගණකාධිපතිවරයා, (ඈ) පොලිස්පතිවරයා, (ඉ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්), (ඊ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා" යනුවෙන්.

මෙන්න මේ දෙවැනි කොටස යටතේ තිබෙන පොලිස්පති ධුරය තමයි ශ්‍රේෂ්ඨාධිකරණය අභියෝගයට ලක් කළේ මේ ව්‍යවස්ථාවේ තිබෙන මූලික අයිතිවාසිකම් ඡේදය යටතේ. මාධ්‍යයෙන් මම දැක්ක විධියට ඒකට පෙත්සම්කරුවන් නව දෙනෙක් හිටියා. මෙන්න මේ පෙත්සම් ටිකට තමයි තීන්දුවක් දීලා තිබෙන්නේ. එම තීන්දුව ගැන නීති විද්‍යාලයේ කථා කරන්නත් පුළුවන්; නීති දේශන පවත්වන තැන කථා කරන්නත් පුළුවන්; පාර්ලිමේන්තුවේ කථා කරන්නත් පුළුවන්. ඒ ඕනෑම තැනක කථා කරන්න පුළුවන්. හැබැයි, කථා කරන්න කලින් ඒ Interim Order එක අරගෙන ඒක නිවැරදිව පරිශීලනය කරන්න ඕනෑ. මම නීතිඥයෙක් වුණාට තීන්දුව දෙනකොට මම උසාවිය ඇතුළේ හිටියේ නැහැ නේ. අපි ඒ පෙත්සමේ පාර්ශ්වකරුවනුත් නොවෙයි. ඒ නිසා මට වුණත්, වෙන ඕනෑම කෙනෙකුට වුණත් යම් කාලයක් අවශ්‍ය වෙනවා, මේ Interim Order එක පරිශීලනය කරලා තමන්ගේ මතය කියන්න. ඒකේ කිසි වරදක් නැහැ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. මම කියලා ඉවර නැහැ.

මේ තිබෙන තත්ත්වය අනුව අවසාන වශයෙන් ජනාධිපතිවරයා විසින් නම් කරනවා නම් යම් කෙනෙක්, ඒ නම් කිරීම සනාථ කිරීම හෝ නොකිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ යුතුකම සහ වගකීම. එතකොට එහෙම පත් කළ කෙනෙකුගේ සේවය තහනම් කරනවා නම්, ඒක ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් යටතේ ලැබී තිබෙන jurisdiction එක, අධිකරණ බලය. ඒක ගැන අපි විවාද කරන්න යන්නේ නැහැ. හැබැයි, ඒ නියෝගය දුන්නාට පසුව ඒක ක්‍රියාත්මක කරන්නේ කවුද? එතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. මේ වෙලාවේ කථානායකතුමා නැහැ නේ. කථානායකතුමා තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ප්‍රධානියා. ඒ නිසා කථානායකතුමා ආවාම අපිට පුළුවන්, ඒ ප්‍රශ්නය එතුමාට යොමු කරන්න. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රැස්වෙලා ඒ සම්බන්ධයෙන් තීරණයක් ගන්න පුළුවන්. මම සඳහන් කළේ, මේ බලතල බෙදීම ව්‍යවස්ථාගත කර තිබෙන්නේ කොහොමද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පරිණාමය වුණේ කොහොමද සහ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඉඳලා අද තිබෙන තත්ත්වයට පැමිණ තිබෙන්නේ කොහොමද කියන එකයි.

41ඇ. ව්‍යවස්ථාවේ Schedule එකේ II කොටස යටතේ පොලිස්පතිවරයා කියන ධුරය නම් කරලා තිබෙනවා. මම detailsවලට යන්නේ නැහැ, පත් කිරීම්, ඉවත් කිරීම්, අනුමත කිරීම් කියලා මේ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන තිබෙනවා. අපි දැන් මෙතැන ඒ ගැන තර්ක කරලා වැඩක් නැහැ. ඒ නිසා රජයේ මතය හැටියට ඒක අපට ප්‍රකාශයට පත් කරන්න පුළුවන්. හැබැයි, නීතිඥයෙක් හැටියට මගේ මතය වන්නේ ප්‍රධාන වශයෙන්ම මේ කාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නැවත යොමු විය යුතුයි කියන එකයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොඩි පැහැදිලි කිරීමක් මම කරන්නේ. මම සියලු දෙනාටම තේරෙන විධියට සරල භාෂාවෙන් කියන්නම්, වෙලා තිබෙන දේ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විධායකයේ කොටසක්; it is part of the Executive. පසුගිය කාලයේ අපි ජනාධිපතිතුමාත් එක්ක යම් යම් මතවාද ඇති වෙනකොට, ජනාධිපතිතුමා ප්‍රකාශයක් කළා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විධායකයේ කොටසක් කියලා.

ඒක අපි කවුරුත් පිළිගෙන තිබෙනවා. එතකොට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙනුත්, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙනුත් විධායකයට විරුද්ධව මූලික අයිතිවාසිකම් පෙත්සම් ගේන්න පුළුවන්. ඒක දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේත් තිබුණා; විසිඑක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේත් තිබුණා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තමුන්නාන්සේලා අයින් කෙරුවා. විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේත් තිබෙනවා. එතකොට විධායකය යම් පියවරක් ගන්නවා නම්, ඒකට විරුද්ධව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීමේ අයිතිය තිබෙනවා. මේ පොලිස්පති පත් කිරීම කෙරුවේ ගරු ජනාධිපතිතුමා.

එතකොට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේත්, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේත් විධායක ක්‍රියාවලියට විරුද්ධව මූලික අයිතිවාසිකම් පෙත්සම් ගේන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පාර්ලිමේන්තු කටයුතුවලට ඇඟිලි ගහන්න බැහැ. අනුර බණ්ඩාරනායක මැතිතුමාගේ තීන්දුවට අනුව පාර්ලිමේන්තු කටයුතුවලට මැදිහත් වෙන්න බැහැ. නමුත් මේක පාර්ලිමේන්තු කටයුත්තක් නොවෙයි. මේක විධායකයේ කොටසක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන්නේ විධායකයේ කොටසක්. විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව විධායකයේ ක්‍රියාවන්ට විරුද්ධව මූලික අයිතිවාසිකම් පෙත්සම් ගේන්න පුළුවන්. ඒක තමයි ඊයේ වුණේ. ඒ පත්කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය කියලා තිබෙනවා, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් කියලා. ඉතින් බොහොම පැහැදිලියි නේ.

අනික, දැන් අධිකරණය තීන්දුවක් දීලා තිබෙනවා. එතකොට ආණ්ඩුවට කල් මරන්න බැහැ. නීතියේ සිද්ධාන්තයක් තිබෙනවා, comply and complain කියලා. You must comply first. තීන්දුව ක්‍රියාත්මක කරන්න ඕනෑ. ක්‍රියාත්මක කරලා පැමිණිලි කරන්න පුළුවන්. එතකොට රජය ඊයේ කැබිනට් මණ්ඩලයේ මේක ගැන පැය තුනක් සාකච්ඡා කෙරුවා කියලා-*[බාධා කිරීමක්]* අපි කැබිනට් එකේ නැහැ නේ. පුවත් පත්වල තිබුණා. එතකොට ඒ තීන්දුව ක්‍රියාත්මක නොකර හිතාමතා මේක ඇදගෙන යන්න හැදුවොත්, මුළු කැබිනට් මණ්ඩලයම අධිකරණයට අපහාස කිරීමක් සිද්ධ කරනවා. ඒකයි මම කියන්නේ. තමුන්නාන්සේලා පරිස්සම් වෙන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
අපි පරිස්සම් වෙන්න දන්නවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
පරිස්සම් වෙන්න හොඳේ. පරිස්සම් වෙන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ආරෝපණය කරන්න එන්න එපා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
බලන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පාර්ලිමේන්තුවට වෙලා තිබෙන අපකීර්තිය. මොකක්ද, මේ නඩු තීන්දුවේ කියන්නේ?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්ඩලික සට්ටත්තරණි (කලානිති) සුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා- [බාධා කිරීමක්]

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න, ගරු ඇමතිතුමනි.

නඩු තීන්දුවේ කියනවා, නීතිපතිතුමාට විරුද්ධව පරීක්ෂණයක් කරනවා, කථානායකතුමාට විරුද්ධවත් පරීක්ෂණයක් කරනවා කියලා. ලජ්ජා නැද්ද? Are you not ashamed? ලජ්ජා නැද්ද? නීතිපතිතුමාට විරුද්ධව, කථානායකතුමාට විරුද්ධව පරීක්ෂණ කරනවා ලු. දාලා යන්නකෝ, අනේ! මොකද, මේ කූඩැල්ලෝ වාගේ එල්ලිලා ඉන්නේ? ආර්ථිකයත් විනාශ කරලා, පාර්ලිමේන්තුවත් විනාශ කරලා කූඩැල්ලෝ වාගේ එල්ලිලා ඉන්නවා, ලජ්ජා නැතුව.

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජී.එල්. පීරිස් මන්ත්‍රීතුමා- [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අද මේ ගරු සභාවේ විශාල කටයුත්තක් කරන්න තිබෙනවා; රෑ 7.00 විතර වෙනකල් සංශෝධන ගන්න තිබෙනවා. ඒ නිසා මේ ගරු සභාවේ හැමෝම ඒ ගැන දැනගෙන කටයුතු කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විනාඩියකින් ඔබතුමාගේ කාරණය කියන්න, ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභානායකතුමනි, ඔබතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අතේ තියාගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් පරිදි විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය පිළිබඳව සම්පූර්ණ කථාවක් ඉදිරිපත් කළා. *[බාධා කිරීමක්]* ඒක බොහොම හොඳයි. අප ඔබතුමාට කියන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය interim order එකක්, අතුරු තහනමක් දුන්නාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්නේ නැතුව ඒක ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලා -රජය- පැහැදිලිවම බැඳිලා ඉන්නවා කියලායි. ගරු සභානායකතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවා නේ. ඔබතුමා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සශෝධනය ගැන, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කළා. ඔය ඔක්කෝටම අත උස්සපු අයත් ඉන්නවා නේ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔව්, ඉන්නවා. අර ඉන්නේ. අර ජී.එල්. පීරිස් හිටපු ඇමතිතුමා- *[බාධා කිරීමක්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් අත ඉස්සුවා; දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් අත ඉස්සුවා; දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් අත ඉස්සුවා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, මම කියලා ඉවර කරන කල්. දහහතටත් අත ඉස්සුවා; දහඅටටත් අත ඉස්සුවා; දහනවයටත් අත ඉස්සුවා; විස්සටත් අත ඉස්සුවා; විසිඑකටත් අත ඉස්සුවා.

ගරු ඇමතිතුමනි, අපේ මේ මේස දිහා බලන්න. ඔබතුමාගේ මේසයට සවි කරපු බෝඩ් එක දිහාත් බලන්න. මේ හැම එකකම තිබෙනවා green button, red button, yellow button, "Yes", "No", "Abstain" සඳහා. ඕක දන්නේ නැති කථානායකවරයෙක්නේ ඉන්නේ. *[බාධා කිරීමක්]* ඕක දන්නේ නැති කථානායකවරයෙක් ඉන්නේ. අනෙක් එක මම,- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීමක්]* ඔබතුමා පොඩ්ඩක් අහ ගන්න. *[බාධා කිරීමක්]* ව්‍යවස්ථා සභාව-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මම දැන් න්‍යාය පත්‍රය අනුව කටයුතු කරනවා. අද සභාව රෑස් වුණේ වෙනත් කටයුත්තකට. නමුත්, ඔබතුමන්ලා අනවශ්‍ය ප්‍රශ්න ඇති කර ගන්නවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක කාලයක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් ඔබතුමාට විනාඩියට වැඩියෙන් දීලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක කාලයක් දෙන්න, මේ කාරණය අවසන් කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔබතුමා වෙන වෙන ප්‍රශ්නවලට ගියාම මේ ගරු සභාව විවාදයකට යනවා. ඒ නිසා කරුණාකර මූලාසනය අසීරුතාවට පත් කරන්න කටයුතු කරන්න එපා. තමන්ට තිබෙන කථා කිරීමේ අයිතිය අයුතු ලෙස පාවිච්චි කරන්න එපා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු චජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
මට විනාඩියක කාලයක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
හොඳයි. ඔබතුමා විනාඩියකින් අවසන් කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු චජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
මම ඔබතුමාට පැහැදිලි කළේ, මෙහිදී මන්ත්‍රීවරයෙකුට තිබෙන අයිතිය ගැනයි. එක්කෝ "Yes" කියන්න පුළුවන්; එහෙම නැත්නම් "No" කියන්න පුළුවන්; එහෙමත් නැත්නම් "Abstain" වෙන්න පුළුවන්. මම ඒ ගැනයි කථා කළේ.

ව්‍යවස්ථාදායක සභාව නිර්මාණය කළේ විධායකයේ බලතල සීමා කරන්නයි; සංවරණ සහ තුලනයක් ඇති කරන්නයි. එහෙම නැත්නම් ජනාධිපතිවරයාට පුළුවන්, කාගෙන්වත් අහන්නේ නැතිව එක පාරටම ඒ පත් කිරීම් කරන්න. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ. ඉතින් මේ සංවරණය හා තුලනය තුළ මානව අයිතිවාසිකම් ඉල්ලීමක් හරහා මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන්නාම ඒක අනුගමනය කරන්නට ඕනෑ. ඒක අනුගමනය කරන්නේ නැතිව ඒකට එක එක අර්ථකථන ලබා දීලා තිබෙනවා. බලන්න, පුවත්පත්වල දාලා තිබෙන දේවල්; "IGP කෙනෙක් නැහැ. IGP නැති තැන කොහොමද ජනාධිපතිවරණ පවත්වන්නේ" යනාදි පුවත් පළ වෙලා තිබෙනවා. මේ බලන්න. මේ පුවත් ඇතුළත් "ඩේලි මිරර්" පුවත්පතේ අදාළ පිටුව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, අපි දැන් න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩ කටයුතුවලට යොමු වෙමු.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු චජිත් පිරේමතාස)
(The Hon. Sajith Premadasa)
ගරු සභානායකතුමනි, මම පැහැදිලිවම මේ කාරණය කියන්න ඕනෑ. ජනාධිපතිවරයායි, කැබිනට් මණ්ඩලයයි ශ්‍රේෂ්ඨාධිකරණයේ අණසක, යෝජනා, තීන්දු ක්‍රියාත්මක කරන්න බැඳිලා ඉන්නවාද කියලා ඔබතුමා කියන්න. කරුණාකර ඒක කියන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) චුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) චුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
I am on my feet. සභානායකවරයා දෙපයින් නැඟී සිටිනවා නම්, අනෙක් අය පොඩ්ඩක් ඉන්න ඕනෑ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
දෙපයින් ඉන්නවාද කියන එකයි ප්‍රශ්නය.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි (කලානිති) චුසිල් පිරේමජයන්ත)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
දෙපයින් ඉන්නවා. ඒක ඔබතුමාට තේරෙන්නේත් නැහැ, ඔබතුමාගේ මහාචාර්යවරයාට තේරෙන්නේත් නැහැ. මොකද, දැන් වෙනත් පැත්තකට ගිහිල්ලා නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමාට මම ඉතාම පැහැදිලිව කියනවා, ආණ්ඩුවත්, පාර්ලිමේන්තුවත්, කැබිනට් මණ්ඩලයත් අධිකරණයේ තීන්දුවලට ගරු කරන බව. ගරු කරනවා කියන එකෙන් අදහස් වෙන්නේ නැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76වන ව්‍යවස්ථාව අනුව ව්‍යවස්ථාදායකයට තිබෙන උත්තරීතරභාවය පිළිබඳව අප කටයුතු කරන්නේ නැහැ කියලා. ඒක අපි පාර්ලිමේන්තුව පැත්තෙන් බලා ගන්නවා. ප්‍රස්තුත කාරණය දැනට පාර්ලිමේන්තුවට අදාළ කාරණයක් නොවෙයි. මගේ මතය නම්, ප්‍රස්තුත කාරණය අදාළ වන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට. ගරු කථානායකතුමා තමයි එහි ප්‍රධානියා. එතුමා ආවාට පසුව අපි බලමු එතුමාට ඒ ප්‍රශ්නය යොමු කරලා කොහොමද ඒක විසඳන්නේ කියලා. *[බාධා කිරීමක්]*

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ජී.එල්. පීරිස්)
(The Hon. (Prof.) G.L. Peiris)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු ජී.එල්. පීරිස් මැතිතුමනි, ඔබතුමාත් කෙටියෙන් කියන්න.

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ජී.එල්. පීරිස්)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අහගෙන හිටියා, ඊයේ ගරු සභානායකතුමා බොහොම නිවැරැදිව කිව්වා, මේ කාරණය ගැන කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා වුණේ නැහැ. මොකද, ඒක කැබිනට් මණ්ඩලයේ කාර්යභාරයට අයත් වෙන්නේ නැහැ කියලා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒක හරියට හරි; සියයට සියයක් හරි. එතකොට දැන් කොහොමද ප්‍රශ්නයක් මතු වන්නේ, මේක ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්? මම එකඟ වෙන්නේ නැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නැවත කැඳවලා මේ කාරණය එයට යොමු කරන්න ඕනෑ කියන එක සම්බන්ධයෙන්. මේක ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගයක්.

එතකොට ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගය අනුව, ඊයේ උදේ 10.30න් පස්සේ පොලිස්පතිතුමාට කිසිසේත් ඒ නිලයේ කටයුතු කරන්න බැහැ. එසේ කරනවා නම්, ඒක උසාවියට කරන අපහාසයක්. ඒ නිසා ඒක කරන්න බැහැ. ඒක ඉතා පැහැදිලියි. ඒ ගැන සැකයක් නැහැ නේ. මේක සම්පූර්ණ තීරණයක් නොවෙයි, Order එකක්, නියෝගයක්. ඒකේ කෙළින්ම සඳහන් කරනවා, වැඩබලන පත්වීමක් පිළිබඳව.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
කවුද පත් කරන්නේ?

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
පත් කරන්නේ,-

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු මහාචාර්යතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ Order එකට අපි ගරු කරනවා. අපි ඒ Order එක දන්නවා. ඒකෙන් පොලිස්පතිතුමාට එම තනතුරේ කටයුතු කිරීම තහනම් කළා. තහනම් කළාම ඒ තනතුර හිස් නේ. - *[බාධා කිරීමක්]* Wait. My next question is, who is going to appoint the Acting IGP? Who is going to remove him?

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ඒක සරල කාරණයක් නේ. වැඩබලන පොලිස්පතිවරයෙක් පත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය අවශ්‍ය නැහැ. එතකොට ඒක ජනාධිපතිවරයාගේ කාර්යභාරය නේ. ඒ නිසා ජනාධිපතිවරයා වැඩබලන පොලිස්පතිවරයෙක් පත් කළ යුතුයි. එහෙම නැත්නම් වෙන කවුද පත් කරන්නේ?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
The Constitutional Council is a part of the Executive and it has been given to the Constitutional Council by way of -

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Not to make an acting appointment.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
It is all right. It is debatable.

ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
නැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට මෙතැනදී කාර්යභාරයක් නැහැ. වැඩබලන පත්වීමකදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කිසිම කාර්යභාරයක් නැහැ. ඒක ජනාධිපතිවරයාගේ වගකීම.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාරණය කියලා අවසන් කරන්න. මේ ඔබතුමාට දෙන අවසාන අවස්ථාව.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඉක්මනින් කියන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ගරු ඇමතිතුමාගේ ප්‍රශ්නයටත් උත්තර දෙනවා. වැඩබලන නීතිපතිවරයා පත් කළේ කවුද? ගරු සභානායකතුමනි, වැඩබලන නීතිපතිවරයා පත් කළේ කවුද? රටේ ජනාධිපතිතුමා. එතකොට එතුමාට වැඩබලන පොලිස්පතිවරයෙක් පත් කරන්න බැරි ඇයි? කවුද කියන්නේ ඒක බැහැ කියලා? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පොඩ්ඩක් ඉතිහාසයට යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ලොකු වෙලාවක් දෙන්න බැහැ. ඔබතුමා විනාඩියක් ඇතුළත කියන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ලොකු වෙලාවක් ගන්නේ නැහැ. අපටත් කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ, කථා කරන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. අද සභාව රැස් වුණේ පොලිස්පති පත් කරන්න නොවෙයි. අද වැදගත් පනත් කෙටුම්පත් දෙකක් ගැන විවාදයක් තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් ඉන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මට විනාඩියක් දෙන්න ඔබතුමා.

මම කියන්නේ මෙකයි. මීට කලින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩකටයුතු තහනම් කරලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දුන්නා, ගරු සභානායකතුමනි. ඒකට කථානායකතුමා මොකුත් කළේත් නැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මොකුත් කළේත් නැහැ. දැන්, පොලිස්පතිවරයා පත් කිරීමේ ක්‍රියාවලියේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගත්ත තීන්දුව සම්බන්ධව සහ පොලිස්පතිතුමාගේ කරුණු සම්බන්ධව තීරණයක් අරගෙන තිබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩ

[ගරු දයාසිරි ජයසේකර මහතා]

කටයුතු තහනම් කරපු වෙලාවේ, තමන්ගේ ඒ බලය නතර කරපු වෙලාවේ කථානායකතුමා සද්ද නැතුව හිටියා නම්, ඒකම තමයි තමුන්නාන්සේලාට දැනුත් කරන්න වෙන්නේ. පළමු තැන ඉඳලා එන්න. මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරුන් පත් කරන එක ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නතර කළා. නමුත්, අභියාචනාධිකරණයට විනිශ්චයකාරවරුන් පත් කරන්න පුළුවන්. ඒක කරන්නේත් නැහැ. ඒ නිසා මම ඔබතුමාට කියන්නේ, අර කලින් තීන්දුව හරියට ක්‍රියාත්මක කළා නම් අද මේක කරන්න වෙන්නේ නැහැ කියලායි. ඒ නිසා කරුණාකර, ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ තීන්දුවත් පිළිගන්න. පිළිගෙන වැඩ කරන්න. වැඩබලන - acting -පොලිස්පතිවරයෙක් පත් කරන්න ජනාධිපතිවරයාට සම්පූර්ණ බලය තිබෙනවා. වැඩබලන නීතිපතිවරයෙක් පත් කරන්න ජනාධිපතිවරයාට පුළුවන් නම්, වැඩබලන පොලිස්පතිවරයෙක් පත් කරන්න බැරි ඇයි?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අපි දැන් මෙතැනින් අවසන් කරමු. මම කිව්වා නේ, අපි ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවලට ගරු කරනවා කියලා. මේ සම්බන්ධයෙන් කැබිනට් එකේ සාකච්ඡා වුණේ නැහැ. මොකද, කැබිනට් රැස්වීම තිබුණේ විනාඩි 45යි. මේ කාරණය කැබිනට් එකට අයිති දෙයකුත් නොවෙයි. මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ; විධායකයේ කොටසක්.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Wait. දැන් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාම එතුමාගේ කථාවේදී කිව්වා, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීරණය පරිදි තමයි පත් කිරීම කළේ" කියලා. දැන් ඒකට තහනම් නියෝගයක් දීලා තිබෙනවා නම් කථානායකතුමාත් ආවාම ඒ ගැන සාකච්ඡා කරලා ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ගනීවි. ඒක, අපි ඒ පැත්තට භාර දෙමු.

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ සභාවට වැදගත් පනත් කෙටුම්පත් දෙකක් ඉදිරිපත් කරන්න තිබෙනවා. ගරු අධිකරණයේ තිබෙන කරුණක් සම්බන්ධයෙන් මේ සභාවේ කාලය ගත කරන්නේ ඇයි? කරුණාකරලා අද දිනට නියමිත ප්‍රධාන වැඩ කටයුතු ආරම්භ කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි. අපි ඒ අනුව කටයුතු කරමු. ප්‍රධාන වැඩ කටයුතු.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිතුමාත්, කැබිනට් මණ්ඩලයත්, රජයත් අධිකරණය අපහසුතාවට පත් වන පරිදි කටයුතු කරනවාය කියලා මතයක් හදන්න උත්සාහ කරනවා. අපි පැහැදිලිව කියන්න ඕනෑ, ජනාධිපතිතුමා තමයි විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා අධිකරණය ස්වාධීන කරන්න කටයුතු කළේ කියන එක. ඒ විතරක් නොවෙයි. කැබිනට් මණ්ඩලයත්, රජයත් ඒකට ගරු කරනවා. ඒ නිසා එතැනින් එහාට දිගින් දිගට කථා කරන්න දෙයක් නැහැ. පැහැදිලිවම ඒ කථාව එව්වරයි.

දෙවැනි කාරණාව, ඊයේ Stay Orders තුනක් දීලා තිබුණා. රජය මැදිහත් වුණා නම්, ඒවාට මැදිහත් වෙලා නවත්වන්න තිබුණා. එකක්, පළාත් පාලන පත්වීම් සම්බන්ධව. ඊළඟට, වතු කම්කරුවන්ගේ පඩි සම්බන්ධව තව Stay Orders දෙකක් දීලා තිබෙනවා. හැබැයි දැන් උදේ වරුවම අපි කථා කරන්නේ පොලිස්පති පත්කිරීම සම්බන්ධව. මේක මීට පෙරත් මම කිව්වා. විපක්ෂය හැම දාම - පොලිස්පතිවරයා යුක්තිය වැඩසටහන කරනකොට ඒකට විරුද්ධයි. ඊයේ වැඩියෙන්ම සන්තෝෂ වුණේ පාතාලයේ අය. මේ විපක්ෂයට රැකවරණය දෙන්නේ පාතාලය. ඉතින් ඒකට තමයි මේ ගොල්ලන්ගේ උනන්දුව තිබෙන්නේ. නැත්නම් අනෙක් කාරණා දෙක ගැනත් කථා කරන්න එපා යැ. වතු කම්කරුවන්ගේ පඩි සම්බන්ධයෙන් දුන් නියෝගය ගැනත් කථා කරන්න එපා යැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා, වැරදි තැනකට මේ රට ගෙන යන්න එපා කියලායි මම කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රධාන වැඩ කටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත
பகிரங்க நிதிசார் முகாமைத்துவம் சட்டமூலம்
PUBLIC FINANCIAL MANAGEMENT BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[පූ.භා. 10.07]

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත- ද මා ඉදිරිපත් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

විවාදය ආරම්භ කිරීම, ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order with regard to the two Bills. I will take a few minutes.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, කියන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන පනත් කෙටුම්පත සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විපක්ෂයේ අප්‍රසාදය - *[බාධා කිරීමක්]* But, he has presented those; ගරු සභානායකතුමා ඉදිරිපත් කළා නේ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)
ඔබතුමා කිව්වේ "ආර්ථික සංවර්ධන" කියලා. මේකේ නම, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔව්, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත. එතුමාට කන් ඇහෙන්නේ නැහැ. ඒකට මට කරන්න දෙයක් නැහැ.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
It is the Economic Transformation Bill.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
කොහොම හරි, මේ පනත් කෙටුම්පත් දෙක -

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
You all are going to oppose without knowing -

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Ah, you know a lot.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Yes, I know.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමා දැන් වැරදි පැත්ත අල්ලාගෙන ඉන්නේ. Nominations නැහැ, හොඳද? වැරදි පැත්ත අල්ලාගෙන, දැන් nominations නැහැ. - *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්නේ -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ඔබතුමන්ලාගේ විරෝධතාව සටහන් කර ගන්නවා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් බලන්න මේ පනත් කෙටුම්පත් දෙකෙන් ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතේ -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ විරෝධය සටහන් කරන්න. මෙතුමා ඉදිරිපත් කරන්නේ මොකක්ද කියලාවත් අපි තවම දන්නේ නැහැ නේ. අපි විවාදය ඉදිරියට කරගෙන යමු.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මට වෙලාව වෙන් කරලා තිබෙනවා නේ. මේ කාලය ඒකෙන් ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
වෙලාව ගන්න එක නොවෙයි ප්‍රශ්නය.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
I want to raise a point of Order. මම කථාවක් පවත්වනවා නොවෙයි, රීති ප්‍රශ්නයක් අහන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙම නම් වෙන කථා නැතුව රීති ප්‍රශ්නය මොකක්ද කියන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතට රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක ඇති කර ගත් ගිවිසුමේ ඉලක්කම් ටික - the figures - ඇතුළත් කරලා තිබෙනවා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
What are the figures?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්නකෝ. You can reply to that.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
What figures?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මේ ගොල්ලන් උත්සාහ කරන්නේ අනාගත රජය මේ ගොල්ලන්ගේ ප්‍රතිපත්තිවලට -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා රීති ප්‍රශ්නයක් නොවෙයි නඟන්නේ. වෙන කථාවක් නේ කියන්නේ. ඒක නිසා විවාදය ආරම්භ කරන්න, ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමනි.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, එතුමාට එතුමාගේ කාලය දෙන්න. ඒකේ ප්‍රශ්නයක් නැහැ. නමුත් මට මේ කාරණය දැන ගන්න ඕනෑ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංඛ්‍යාලේඛන අපි මේකට ඇතුළත් කළා කියලා එතුමා කියනවා. ගරු මන්ත්‍රීතුමනි, මොනවාද අපි ඇතුළත් කරලා තිබෙන සංඛ්‍යාලේඛන? අපි ඇතුළත් කරපු කරුණු කීයක් තිබෙනවාද කියලා කියන්නකෝ. මොකද, උත්තරයක් දෙන්නත් මම දැන ගන්න එපා යැ, තමුන්නාන්සේ ඒ කියන්නේ මොකක්ද කියලා. තමුන්නාන්සේ දන්නේ නැහැ, තමුන්නාන්සේ මොකක්ද කියන්නේ කියලා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එතුමාගේ ප්‍රශ්නවලට උත්තර දෙන්න මේක උසාවියක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක උසාවියක් නොවෙයි. මගේ තර්කය මම ඉදිරිපත් කරන්නේ. මම කියන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කරගත් ගිවිසුමේ ඉලක්කම් - the figures, calculations - ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තිබෙනවා කියන එකයි. ඒක වැරැදියි. මොකද මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මේ පනත් කෙටුම්පතට ඇතුළත් කළාට පසු, අනාගත අපේ රජයකට ප්‍රශ්නයක් එනවා. අපි පැහැදිලිව කියලා තිබෙනවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා කරලා නැවත වරක් ඒ ගිවිසුම renegotiate කරනවා කියලා. එතකොට දැන් ඔබතුමන්ලා හදන්නේ අනාගත ආණ්ඩුව අමාරුවේ දාන්න. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය ඇතුළත් කරලා පනතක් ඉදිරිපත් කළාම අනාගත ආණ්ඩුවට ප්‍රශ්නයක් එනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න. ඔබතුමා ඊට පසුව අදහස් දක්වන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
සභානායකතුමා පනත් කෙටුම්පත් දෙක ඉදිරිපත් කළා නේ. ඒ නිසායි මම මේ කාරණය කියන්නේ. රජය ජාත්‍යන්තර අරමුදලත් එක්ක ඇති කර ගත් ගිවිසුම මේ පනතට දාන එක සම්පූර්ණ අශීලාචාර ක්‍රියාවක්. මේ ආණ්ඩුව මාස තුනකින් ඉවරයි. ආණ්ඩුව අත්සන් කරපු ගිවිසුම මේ පනතට දාන්නේ ඇයි?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා අවසන් කරන්න. ඔබතුමාගේ විරෝධතාව සඳහන් කරන්න. දැන් විවාදය ආරම්භ කරන්න, ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමා. *[බාධා කිරීමක්]*

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත් ගැන අපට දැන් කරුණු ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න කියන්නකෝ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් ඇමෙරිකාවේ ජනාධිපති නොවැම්බර් මාසයේ 20වැනි දා වෙනකම් ඉන්නවා. එතුමාට කියලා තිබෙනවා, කිසිම පනත් කෙටුම්පතක් කොංග්‍රස් එකට ඉදිරිපත් කරන්න එපා කියලා. මොකද, එතුමා ඊළඟ වතාවේ ජනාධිපතිවරණයට ඉල්ලන්නේ නැහැ. පරාජය වන මේ ආණ්ඩුව මේ වාගේ තීරණාත්මක පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්නේ ඉදිරියේ දී එන අපේ ආණ්ඩුව අමාරුවට පත් කරන්නයි. You have no right to include the IMF Agreement in this Bill.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
But, your Public Finance Committee Chairman did not oppose it. - *[Interruption.]* When it was presented, you all accepted it.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමනි, විවාදය ආරම්භ කරන්න. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.12]

ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ අනාගතය සම්බන්ධයෙන් වන ඉතාම වැදගත් පනත් කෙටුම්පත් දෙකක් අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ තමයි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත සහ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ඉතිහාසයේ බරපතළම ආර්ථික අර්බුදයෙන් පසුව රටේ ආර්ථික කළමනාකරණය නැවත නිවැරදි ආකාරයට සකස් කරලා, ඒ සඳහා ලෝකයේ තිබෙන පූර්වාදර්ශ අරගෙන, වෙනත් රටවල් අනුගමනය කරන ක්‍රියා මාර්ග අනුගමනය කරලා රට නිවැරදි පැත්තට යොමු කරලා තිබෙනවා. අපි බොහෝ කාලයක් විවිධ අවස්ථාවල අපේ ප්‍රතිපත්ති වෙනස් කළා. එහෙම වෙනස් කරන්නේ නැතිව ඒ ප්‍රතිපත්තිවල consistency එකක් තිබෙන ආකාරයට රටේ මූල්‍ය පාලනය සහ සාර්ව ආර්ථික පාලනය නිවැරදිව ගෙනයෑම සඳහා රජය දක්වන උනන්දුව සහ වැඩ පිළිවෙළ තමයි මේ පාර්ලිමේන්තුවට අපි ඉදිරිපත් කරන්නේ. ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, - *[බාධා කිරීමක්]* You can answer later, if you have time allotted to speak.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මගේ නම කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා මොකක්ද නැවත කියන්නේ?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා එදා රට බංකොලොත් වෙනකම්ම ගෝඨාභය රාජපක්ෂ වෙනුවෙන් කථා කළේත් ඔය වාගේම තමයි. දැන් වර්තමාන ජනාධිපතිතුමා වෙනුවෙන් කථා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු රාජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා අපට කියනවා, ආණ්ඩුව දාලා යන්න කියලා. ඇත්තටම ඒ වෙලාවේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාත් අයින් වුණා; මහින්ද රාජපක්ෂ අගමැතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවත් අයින් වුණා. විපක්ෂ නායකතුමාට තමයි අවස්ථාව තිබුණේ ආණ්ඩුව ගන්න. ඉතින්, විපක්ෂ නායකතුමා ආණ්ඩුව ගත්තාද? මම නැවතත් මේ පාර්ලිමේන්තුවේ කිහිප සැරයක් කියපු කාරණාව මතක් කරනවා. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, මහ බැංකුවේ අධිපතිතුමාත් ආර්ථිකයේ තිබෙන බරපතළ තත්ත්වය පැහැදිලි කළාම එතුමන්ලා ඒක බාර ගන්නේ නැතිව පැනලා ගියා. ඒ බාර නොගැනීමේ ප්‍රධාන හේතුව මා මිත්‍ර හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා text කරලා තිබුණා. බාර නොගැනීමේ හේතුව නොවෙයි, සමාවෙන්න. මම ඒක කියපු විධිය වැරදියි. එදා ආර්ථික අර්බුදයේ තිබෙන ගැඹුර එතුමා කියලා තිබුණා. මේක ජයගත නොහැකි අභියෝගයක් කියලා එදා කියලා තිබුණා. එතුමන්ලා ඒ වෙලාවේ රට බාර ගත්තා නම් මේ ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ.

මෙතුමන්ලා දැන් විපක්ෂයේ ඉඳන් කියවා කියවා ඉන්නවා. තවත් අවුරුදු 5ක් විපක්ෂයේ ඉඳගෙන කියවන්න අවස්ථාවක් එන්නේත් නැහැ. මෙතුමන්ලා රට භාර නොගැනීම නිසා ඇති වුණු තත්ත්වය මොකක්ද? මෙතුමන්ලා රට භාර නොගැනීම නිසා ඇති වුණු තත්ත්වය මොකක්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? සිවිල් ක්‍රියාකාරින් හැටියට හැඳින්වූ ත්‍රස්තවාදී කණ්ඩායමක ගොදුරක් බවට මේ රට පත් වෙන්න තිබුණු අවස්ථාවක් ඒක. එහෙම නැත්නම් මේ පාර්ලිමේන්තුව ගිනි තියලා, ප්‍රජාතන්ත්‍රවාදය සහමුලින්ම ඉවත් කරලා සිවිල් ක්‍රියාකාරීන් හැටියට හැසිරෙන ත්‍රස්තවාදීන් කීපදෙනෙක් මේ රටේ සම්පූර්ණ අනාගතය භාර ගන්න ගිය අවස්ථාවක් ඒක. එහෙම නැත්නම් ඊළඟට තිබුණු විකල්පය තමයි මේ රටේ හමුදා පාලනයක් යටතේ තිබෙන ආණ්ඩුවක් ඇති වීම. Military government එකක් එන්න තිබුණේ. මේ කාරණා දෙක ගැනම වගකිව යුතු දේශපාලනඥයකු හැටියට, කණ්ඩායමක් හැටියට තමන්ගේ දේශපාලන ස්ථාවරය පැත්තක තියලා ඔබතුමන්ලාට රට ගැන කල්පනා කරන්න තිබුණා. ඒ වෙලාවේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා රට භාර ගත්තා. මුලින්ම ඒ ඉල්ලීම ආවේ එතුමාට නොවෙයි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා කියපු කථාව ඇත්ත. අපි දාලා ගියා. අපට නැවත රට භාර ගන්න වුණේ ඔබතුමන්ලාට ලැබුණු අවස්ථාව ඔබතුමන්ලා භාර නොගත් නිසායි. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා මේ රට ත්‍රස්තවාදී කණ්ඩායමකට පාලනය කරන්න තිබුණු අවස්ථාවත්, හමුදා පාලනයකට යටත් වෙන්න තිබුණු අවස්ථාවත් නතර කරලා, මේ රට ප්‍රජාතන්ත්‍රවාදය සහිත නිවැරදි ආර්ථික දැක්මක් වෙත ගමන් කළා. එතැනදි ඔබතුමා නිරන්තරයෙන් කියන කාරණාව තමයි, - *[බාධා කිරීමක්]* ඔබතුමා මොළයක් නැති විධියට නේ හැසිරෙන්නේ. ඔබතුමා මොළය පාවිච්චි කරන්න දන්නේ අනෙක් අයට අපහාස කරන්න විතරයි. ඔබතුමා මොළය පාවිච්චි කරන්නේ අපහාස කරන්න විතරයි. ඔබතුමන්ලා වගකීම් අරගෙන මොළය පාවිච්චි කරලා වැඩ කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මේ පනත් කෙටුම්පත පැහැදිලිව අධ්‍යයනය කරලා නැති එක ගැන මම කනගාටු වෙනවා. අපේ මිත්‍ර හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේ පනත් කෙටුම්පත ගැන යම් කරුණක් ඉදිරිපත් කරනවා නම් අපට ඒ ගැන සලකා බලන්න පුළුවන්. එතුමාගේ කමිටුවෙත් මේ පිළිබඳ යෝජනාවක් තිබුණා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා public consultation කළා. අපේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරීන් ඒවාට සහභාගි වුණා. එතකොට ඔබතුමා interim period එකක් පිළිබඳව කථා කළා, මාසයක කාලයක් මදි කියලා. ජනාධිපතිතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය ඒ ගැන සලකා බලලා, අද උදේ අපි පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශයකුත් කළා. අපි interim period එක මාස තුනක් දක්වා දීර්ඝ කරන්න කටයුතු කරනවා. යහපත් යෝජනා තිබුණොත් ඒ යහපත් යෝජනා පිළිගන්න අපි සූදානම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පතේ ප්‍රධාන වශයෙන් කියැවෙන කාරණාව තමයි, අපි අර්බුදයකට ගිය හේතුව නැවත ඇති නොවෙන්න කටයුතු කිරීම. අපි අර්බුදයකට යන්න හේතු වූ මූලික කාරණාව තමයි, අපේ මූල්‍ය කළමනාකරණයේ තිබුණු දුර්වලතාව. තවත් කාරණාවක් තමයි, අපේ විදේශ සංචිත ප්‍රමාණය නිවැරදිව කළමනාකරණය කර ගැනීමට අපොහොසත් වීම. එදා පැවති ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ පවතින රජයට තමන්ගේ දේශපාලන මතය ක්‍රියාත්මක කිරීමට අවකාශයක් තිබුණා. ඒ වාගේම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය වෙනස් කරන්න සහ ඒ මුදල් ප්‍රතිපත්තිය තමන්ට වාසිදායක ආකාරයට ක්‍රියාත්මක කරන්න හැකියාව තිබුණා. නමුත්, ඒ හරහා රටට සිදුවන හානිය පිළිබඳව සොයා බලන්න කටයුතු කළේ නැහැ. ඒකේ ඒ වාගේ හිඩැස් තිබුණා.

ඊළඟට, ණය ගෙවීමට ඇති හැකියාව බලන්න. අද මේ අර්බුදයේ මූලිකම ප්‍රශ්නය තමයි, අපට ණය ගෙවාගන්න බැරි වීම. චීනය සමඟ ඩොලර් බිලියන 1.4ක swap එකක් අපට තිබෙනවා. අවසානයේ පාවිච්චි කරන්න පුළුවන් සංචිත - usable reserves - ප්‍රමාණය ඩොලර් මිලියන 20ට වැටුණා. ඒකත් එක්ක තමයි මූලික වශයෙන් මේ අර්බුදය ඇති වුණේ. එතකොට අපි හැමෝටම වගකීමක් තිබෙනවා, මේ අර්බුදය නැවත ඇති නොවන්න කටයුතු කිරීමට. දැන් විපක්ෂය විරුද්ධ වෙන්නේ මොනවාටද? ප්‍රධාන කාරණා තුනකට තමයි ඒ අය විරුද්ධ වෙන්නේ.

පළමුවැනි එක මෙයයි. මේ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතේ කියනවා, මේ රටේ රාජ්‍ය ණය ප්‍රමාණය 2032 අවුරුද්ද වෙද්දී සියයට 95න් පහළ මට්ටමකට ගේන්න ඕනෑ කියලා. 2022 අවුරුද්දේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 128ක්ව පැවති රාජ්‍ය ණය ප්‍රමාණය 2032 අවුරුද්ද වෙද්දි ක්‍රමානුකූලව සියයට 95න් පහළට ගෙන යන්න ඕනෑ.

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව 2022 අවුරුද්දේ දළ මූල්‍යන අවශ්‍යතාව - Gross Financing Need - සියයට 34.6යි. ඒ ප්‍රමාණය 2032 අවුරුද්ද වෙද්දි සියයට 13ට වඩා අඩු ප්‍රමාණයකට ගෙන එන්න ඕනෑ.

ඊළඟට, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව අපේ රටේ විදේශීය ණය සේවාකරණය 2022 අවුරුද්දේ සියයට 9.6යි. ඒ ප්‍රමාණය 2027-2032 කාලය අතරතුර සියයට 4.5 ප්‍රමාණයට වඩා අඩු විය යුතුයි.

මෙන්න මේ කාරණා තුනට විපක්ෂය විරුද්ධ වෙන්නේ ඇයි? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්තයක් හැටියට ගත්තොත්, විපක්ෂය මේ සම්පූර්ණ පනත් කෙටුම්පතටම විරුද්ධ වෙන්නේ, ප්‍රථම වතාවට අපේ රටේ සාර්ව ආර්ථික කළමනාකරණය සම්බන්ධයෙන් නීති රාමුවක් මේ තුළින් හැදෙන නිසායි.

නමුත් පත්වන හැම ආණ්ඩුවකටම වගකීමක් තිබෙනවා, මේ නීති රාමුව තුළ කටයුතු කරන්න. ඒ නීති රාමුව තුළ කටයුතු කළාම රටේ ඇතිවන තත්ත්වය මොකක්ද? නැවත කිසි දාක මේ රටේ අර්බුදයක් ඇති වෙන්නේ නැහැ. එතකොට අප ඇතුළු රජයට, එහෙම නැත්නම් විපක්ෂයට තීන්දු කරන්න වෙනවා, අපට අවශ්‍ය ලෙස බලය පවත්වා ගෙන යන්න, දේශපාලන තීන්දු ගන්න, දේශපාලන රැකවරණය ගන්න, මේ කියන ආර්ථික අර්බුදය නැවත ඇති වීමට අවශ්‍ය මාර්ගයක් රටේ හදනවාද, එහෙම නැත්නම් අපේ දේශපාලන අවශ්‍යතාව වෙන්නේ, රටේ පවතින නීති රාමුව ඇතුළේ නැවත ජනතාවට පීඩාවක් ඇති නොවන ආකාරයට කටයුතු කිරීමද කියන එක. මෙන්න මේ දෙක තමයි අපට ගන්න තිබෙන තීන්දු වෙන්නේ. අපි පාඩම් ඉගෙන ගත්ත රටක් හැටියට ඉස්සරහට යන්න ඕනෑ. අපේ රට ඉතිහාසයේ ඉඳන් අඩුපාඩු තිබුණු රටක්. ඒ අඩුපාඩු නැවත ඇති නොවන්න අපි කටයුතු කරන්න ඕනෑ.

ඊළඟට මේ පනත් කෙටුම්පත තුළින් අපි කථා කරනවා, රටේ ආර්ථික වර්ධන වේගය ගැන. ආර්ථික වර්ධන වේගය සඳහා සියයට 5ක ඉලක්කයක් තිබෙනවා. නීතියේ හැටියට අපේ ඉලක්කය සියයට 5 වුණත්, ජනාධිපතිතුමාගේ මේ වැඩ පිළිවෙළ තුළ ඒක සියයට 7ක් දක්වා වැඩි කර ගන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රමාණය දක්වා වැඩි කළොත් විතරයි, මේ රටේ අනාගතය භාර ගන්න ඉන්න අපේ පරම්පරාවටත්, ඉදිරි පරම්පරාවටත්, රට පිළිබඳව බලාපොරොත්තුවක් ඇතිව, අපි සංසන්දනය කරන වෙනත් සංවර්ධිත රටවල්, එහෙම නැත්නම් ගොඩනැඟිච්ච රටවල්, එහෙම නැත්නම් අපි ආසා කරන රටවල් පිළිබඳව කථා කරන්න පුළුවන් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මතක තබා ගන්න, මේ අර්බුද හැම රටකම ඇති වන බව. අපේ රටෙත් එවැනි අර්බුද ඇති වුණා. අපේ රටේ එවැනි අර්බුද ඇති වුණාම මොකක්ද කළේ? එක පැත්තකින් විපක්ෂයේ ප්‍රධාන දේශපාලන පක්ෂ කණ්ඩායම් දෙකම ඒ අර්බුදය වැඩි කළා. අද ඒ කණ්ඩායම් දෙකම ගිහිල්ලා ඔවුන්ට බලය දෙන්න කියලා මහ ජනතාවට කියනවා. ඔවුන් ඒ අර්බුදය වැඩි කරන්න හේතුව වුණේ මොකක්ද? රටේ අර්බුදය වුණේ, විදේශ සංචිත ප්‍රමාණය දිගින් දිගටම-දිගින් දිගටම කඩා වැටීමයි. ඒ අය මොකක්ද කළේ? විදේශ සංචිත වැඩි කර ගන්න තිබුණු ප්‍රධාන මාර්ග දෙකම අහුරන්න කටයුතු කළා. සංචාරකයන්ට මේ රටේ සංචාරය කරන්න බැරි පරිසරයක් හදන්න මේ දේශපාලන කණ්ඩායම් කටයුතු කළා. ඒ වාගේම, ඒ අය ප්‍රසිද්ධියේ ඇවිල්ලා කිව්වා, මාසයකින් රට වැටෙනවා, ඒ නිසා විදේශගත ශ්‍රමිකයන්ට විදේශ ප්‍රේෂණ බැංකු පද්ධතිය තුළින් මෙරටට එවන්න එපා කියලා. අපේ රට කඩා වැටුණා. අඩුම ගණනේ මේ රට කඩා වැටුණාට පස්සේ, ඒ කඩා වැටෙන්න අවශ්‍ය දේශපාලන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරපු අය රට භාර ගන්න ඕනෑ නේ.

IMF එකට යන්න කියලා ඉස්සෙල්ලාම කිව්වේ විපක්ෂයේ අපියි කියන එක විතරක් කියලා හරියන්නේ නැහැ. එහෙම කිව්වාට, IMF යෝජනාවලියේදී ඒකට විරුද්ධ වෙනවා, ණය ප්‍රතිව්‍යුහගත කිරීම අත්‍යවශ්‍ය වෙද්දි ඒකට ගේන යෝජනාවලියටත් විරුද්ධ වෙනවා. ඊළඟට IMF එක යෝජනා කරලා තිබෙන, ජාත්‍යන්තරයත් එක්ක ඇති එකඟතා තුළ නීති රාමුවක් හදද්දි ඒ නීති රාමුවටත් විරුද්ධ වෙනවා. මොකක්ද මේ දෙබිඩි ප්‍රතිපත්තිය? මොකක්ද ඔබතුමන්ලාගේ අවශ්‍යතාව? ඒක අපට කියන්න. ඔබතුමන්ලාටත් දේශපාලන පැවැත්මක් තිබෙන්නේ මේ රටේ යහපත් ආර්ථික පැවැත්මක් සහ යහපත් පාලනයක් තිබුණොත් විතරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක වෙලාවක විපක්ෂයේ කණ්ඩායම් ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය යෝජනා කරනවා මම දැක්කා. ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය මොකක්ද? ඒ මේ රජය ඉදිරිපත් කරලා තිබෙන ආර්ථික ප්‍රතිපත්තිය වෙනත් වචනවලින් ඒ ආකාරයටම පැවසීමයි. වචන විතරයි වෙනස් වෙන්නේ, අදහස එකයි. අපි මේ පනත් කෙටුම්පත තුළින් කියනවා, කොහොමද ශ්‍රම බලකාය වැඩි කර ගන්නේ, ශ්‍රම බලකායේ අවස්ථා පුළුල් කර ගන්නේ කොහොමද කියලා. එතකොට තමයි මේ රටේ ජීවත් වන හැම පුරවැසියෙකුටම සමාන අයිතිවාසිකම් භුක්ති විඳින්න පුළුවන් වෙන්නේ සහ ඔවුන් බලාපොරොත්තු වන ජීවිතයක් ගත කරන්න පුළුවන් වෙන්නේ.

ඊළඟට, අපනයනය බලන්න. ජනාධිපතිතුමා නිරන්තරයෙන් කියන කාරණය තමයි, අපි නැවත ආනයනය මතම පදනම් වුණු ආර්ථිකයක් ප්‍රවර්ධනය කළොත් අපේ කඩා වැටීම තවත් අවුරුදු 5ක්, 10ක් යද්දී ඇති වෙනවාය කියන එක. එම නිසා අපි පැහැදිලිවම කියනවා, කොහොමද අපි අපනයන ආර්ථිකයක් වෙත ගමන් කරන්නේ, කොහොමද අපනයන වැඩි කර ගන්නේ කියලා. අපනයන ප්‍රමාණය GDP එකෙන් සියයට 60ක් දක්වා 2040 අවුරුද්ද වෙද්දී වැඩි කර ගන්නේ කොහොමද? 2025 අවුරුද්ද වෙනකොට සියයට 25ක් දක්වා වැඩි කර ගන්නේ කොහොමද?

ඊළඟට, ආයෝජන ගැන බලන්න. අපේ ආයෝජනවලට හිතකර පරිසරයක් මේ පනත හරහා නිර්මාණය වෙනවා. ඒ හරහා අලුත් ආයතන බිහි වෙනවා. දැනට අයෝජකයන්ට ආයෝජනය කිරීමට තිබෙන බාධා සියල්ලම පාහේ මේ තුළින් ඉවත් වෙනවා. ඒ බාධා ඉවත් වෙලා රටට සුදුසු ආයෝජන ලබා ගන්න අවශ්‍ය පරිසරයක් මේ තුළින් එනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ GDP එකෙන් සියයට 1.6ට තිබෙන ආයෝජන ප්‍රමාණය සියයට 5ට වඩා වැඩි ප්‍රමාණයක් දක්වා 2030 අවුරුද්ද වෙද්දි ගෙන යන්නේ කොහොමද?

ඊළඟට, අපට ඉතාම වැදගත් වෙන්නේ අපේ ප්‍රාථමික ගිණුමේ ශේෂයයි. ප්‍රාථමික ගිණුමේ ශේෂය අනුව තමයි අපට තීන්දු කරන්න වෙන්නේ මේ පොලිය ගෙවන්න පුළුවන්ද, debt servicing කරන්න පුළුවන් ආදායම් වියදම් කළමනාකරණයක් අපට තිබෙනවාද කියලා. ඒ වාගේම අපි බලන්න ඕනෑ, ප්‍රාථමික ගිණුමේ ශේෂය - primary balance - කොහොමද අපි positively සියයට 2ක පවත්වා ගෙන යන්නේ කියලා. ඒ වාගේම 2031 අවුරුද්දේ ඉඳලා සියයට 2කට වඩා වැඩි ප්‍රමාණයකින් එය පවත්වා ගෙන යන්නේ කොහොමද කියලාත් අපි බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බලාපොරොත්තු වන්නේ ලබන අවුරුද්ද වෙද්දී මේ රටේ primary balance එක plus එකක් බවට පත් කරලා, - දැනටම ඒක plus වෙලා තිබෙනවා - සියයට 2.5කට වඩා වැඩි ප්‍රමාණයකට අරගෙන යන්නයි. ඒ තත්ත්වය කොහොමද දිගටම පවත්වාගෙන යන්නේ?

ඊළඟට, රාජ්‍ය ආදායම ගැනත් මම කියන්න කැමතියි. අපි කඩාගෙන වැටෙන්න එක හේතුවක් තමයි, රාජ්‍ය ආදායම සියයට 8.3 දක්වා පහත වැටීම. ඒ වෙලාවේ බදු කපා හැරීම්වලට විරුද්ධව මේ විපක්ෂය දිගින් දිගටම කථා කළා. එදා රාජ්‍ය ආදායම කඩාගෙන වැටුණා. ඒ කඩා වැටීම නිසා අත්‍යවශ්‍ය සේවා ජනතාවට ලබා දෙන්න අපට බැරි වුණා. ආනයනය කරන්න පහසුකම් ටික ලබා දෙන්න බැරි වුණා. අපි මේ පනත් කෙටුම්පතින් යෝජනා කරන්නේ මොකක්ද? 2026 වෙද්දී අපේ රටේ රාජ්‍ය ආදායම සියයට 15 මට්ටමින් එහාට අරගෙන යෑම. ඊළඟට, පෞද්ගලික අංශයේ වැඩි දායකත්වයක් අරගන්නේ කොහොමද කියන එක. මේ වාගේ කාරණා තමයි මේ පනත් කෙටුම්පතින් යෝජනා කර තිබෙන්නේ.

ඊළඟ කාරණය තමයි, දිළිඳුකම. COVID-19 අර්බුදයත් එක්ක, ආර්ථික අර්බුදයත් එක්ක මේ වනකොට අපේ රටේ දිළිඳුකම සියයට 26ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ පනත හරහා අපි නිශ්චිත ඉලක්කයක් දෙනවා, 2027 වෙද්දී අපේ රටේ දිළිඳුකම සියයට 15 දක්වා අඩු කිරීමටත්, 2035 වෙද්දී එය සියයට 10 දක්වා අඩු කිරීමටත්. එතකොට හැම රජයකටම, මේ ජනාධිපතිතුමා, රජය ඇතුළු හැම කෙනෙකුටම වගකීමක් තිබෙනවා, මේ රටේ ආර්ථිකය නිශ්චිත ඉලක්ක සහිත රාමුව තුළ පවත්වාගෙන යෑමට අවශ්‍ය කටයුතු කරන්න. ඒ තුළින් අවසානයේ ජනතාව පීඩාවට පත්වීම වැළැක්වෙනවා. ඒකට කවුරු හෝ විරුද්ධ වනවා නම් ඒ කෙනාගේ එකම අරමුණ තමයි මම කලින් කිව්වේ. එ් තමයි, මෙතෙක් අපි කරගෙන ආපු හොඳ ප්‍රතිසංස්කරණ සියල්ල ආපස්සට හරවන එක, රාජ්‍ය ආදායම කඩා වැටීවීම, සංචිත ප්‍රමාණයට දේශපාලන ඇඟිලි ගැසීම් කරන්න අවශ්‍ය මහ බැංකු පනත නැවත සංශෝධනය කිරීම. ඊළඟට, කිසිම වගවීමක් නැතිව කටයුතු කිරීමට අවශ්‍ය පරිසරය රටේ නිර්මාණය කිරීම. අවශ්‍ය මේවා නම් මේ පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය දෙන්න පුළුවන්. එහෙම නැතිව ඒ කම්ටුවට ඉදිරිපත් වුණු යෝජනා වාගේ සාධනීය යෝජනා තිබෙනවා නම්, ඒ යෝජනා රජයට ඉදිරිපත් කරලා ඒවා ක්‍රියාත්මක කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය ඉතාම වැදගත් පනතක්. මේ පනන තුළින් මේ රට නැවත අර්බුදයකට නොයෑමට අවශ්‍ය නීති රාමුව සකස් කරනවා. අපේ රටේ ප්‍රශ්න ඇති වුණා. මේ ඇතිවුණ පළමුවෙනි අර්බුදය නොවෙයි. 2022දී ආපු අර්බුදය ගැඹුරුතම අර්බුදයක් වුණත්, පළමුවෙනි අර්බුදය නොවෙයි. අර්බුද කිහිපයක් අපේ රටේ ඇති වෙලා තිබෙනවා. අර්බුදයක් ආවාම අපි ආර්ථික ස්ථායීකරණයක් වෙනුවෙන් වැඩසටහනකට යනවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක. ඒ අරමුදලට ගිහිල්ලා යම් ස්ථායීබවක් ඇති වෙද්දී, ඒ ඔක්කොම ප්‍රතිසංස්කරණවලට පයින් ගහලා, ආපහු තමන්ට අවශ්‍ය දේශපාලන යන්ත්‍රණය, දේශපාලන තීන්දු ක්‍රියාත්මක කරනවා.

අපි ඒ විධියට කටයුතු කරපු හින්දා 16 වනාවක් නොවෙයි, 17වන වනාවටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගන්න යන්න වුණා. දැන් මේ යෝජනා කරන්නේ 18වන වනාවටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න කියලායි. අපි අපේ ණය හිමියන් එක්ක ඇති කර ගත්ත එකඟතා කඩා වැටීවීම තුළ, 18වන වනාවටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගියාට අඩුම ගණනේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලටවත් අපේ රට වෙනුවෙන් නැවත මැදිහත්වීමක් කරන්න හැකියාවක් තිබේවිද කියලා මම හිතන්නේ නැහැ. අපි ඒ විශ්වාසය දිගින් දිගටම බිඳ වැටිටුවා. එම නිසා මෙම පනත් කෙටුම්පතට කාටවත් විරුද්ධ වෙන්න බැහැ. මේ රටේ නිවැරදි මූල්‍ය පාලනයක්, ඉලක්කගත පාලනයක්, විනිවිදභාවයක් තිබෙන පාලනයක් තහවුරු කරන්න රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත ගෙන එද්දී ඒකට විරුද්ධ වෙන්න පුළුවන්ද? මෙතුමන්ලා කිව්වා, ඒ පනත් කෙටුම්පතටත් විරුද්ධයි කියලා. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පතට තමුන්නාන්සේලා විරුද්ධයි කිව්වා. එහෙම විරුද්ධ වෙන්න පුළුවන්ද?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු මන්ත්‍රීතුමනි, මට බාධා කරන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමන්ලා පාර්ලිමේන්තුවේ කාලය ඕනෑවටත් වඩා නාස්ති කළා. ඒ නිසා මට බාධා කරන්න එපා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමා මගේ නම කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමා ඔබතුමාගේ නම කිව්වේ නැහැ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

මම ඔබතුමාගේ නම කිව්වේ නැහැ, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]* ඔබතුමා හැම තොප්පියම දා ගන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඊළඟ කථාව තිබෙන්නේ ඔබතුමාට. ඔබතුමාගේ කථාවේදී පිළිතුරු දෙන්න.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

නිවැරදි මූල්‍ය පාලනයක් වෙනුවෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගන්න ක්‍රමය තුළ නම් මේ පනත් කෙටුම්පත අරගෙන එන්නේ, අපේ රටේ විපක්ෂය ඒකට විරුද්ධව ඡන්දය දෙන්නේ ඇයි? එතුමන්ලා මෙතැනදීත් තනිකරම කුහකත්වය සහ ඊර්ෂ්‍යාව තුළ දේශපාලනය කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි මේ රටේ ආර්ථිකය පරිවර්තනය කරද්දී ඒ සඳහා ගෙනාපු පනත් කෙටුම්පත් සියල්ලටම විරුද්ධ වුණා වාගේම, මේ ඉදිරිපත් කරපු ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතටත් විරුද්ධව එතුමන්ලා ඡන්දය දීම පුදුමයක් හැටියට මම දකින්නේ නැහැ.

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණයත් මම කියන්න ඕනෑ. අපේ රටේ බලය ඉල්ලන කණ්ඩායම් මොකක්ද කියන්නේ? ඒ අය කියන්නේ එ් අයට බලය දෙන්න කියලා. ඔවුන්ගේ ආර්ථික කළමනාකරණය හැටියට හඳුන්වන්නේ කළු සල්ලි සුදු කිරීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බරපතළ කාරණයක්, කළු සල්ලි සුදු කිරීම කියන එක.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Money laundering.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Yes, money laundering. I do not know whether you also agree on that, Hon. Member. You can answer that during your speech. Please, do not take my time.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ Financial Action Task Force - FATF - ආයතන තිබෙනවා. Financial Action Task Force එක තමයි රටක මූල්‍ය විනය සම්බන්ධයෙන් කටයුතු කරන එක ආයතනයක් වෙන්නේ. විශේෂයෙන්ම ඔවුන් අවධානය යොමු කරන්නේ, to money laundering and financing for terrorist activities. ඒ කියන්නේ, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී කටයුතුවලට මුදල් යෙදවීම. මට මතකයි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ අපි Grey List එකට ගියා.

එහෙම Grey List එකට ගියාම,- *[බාධා කිරීමක්]* නැහැ, ඔබතුමන්ලාගේ කාලයේ. කොහොම හරි Grey List එකකට ගියා නේ. ආපහු Grey List එකට යවන්නද මේ හදන්නේ? Grey List එකට නොවෙයි, blacklist එකට යවන්නයි මේ හදන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමන්ට බලය දුන්නොත් කළු සල්ලි සුදු කරලා ආර්ථිකය කළමනාකරණය කරනවා කියා යෝජනා කරන විපක්ෂයක් මම දැකලා නැහැ. *[බාධා කිරීමක්]* Then, you all will have to abolish the FIU - Financial Intelligence Unit - of the Central Bank of Sri Lanka.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපි එහෙම කිව්වේ නැහැ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ඔබතුමන්ලාගේ කාණ්ඩයක් හැටියට ඉන්න ජනතා විමුක්ති පෙරමුණ. මම කියන්නේ ඔවුන් විපක්ෂය නේ, ආණ්ඩුවේ නොවෙයි නේ.

එතකොට Financial Intelligence Unit එක අයින් කරන්න වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක් එහෙම පාලනය කරන්නේ කොහොමද? මුළු ලෝකයම මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදය වෙනුවෙන් අරමුදල් සැපයීමට විරුද්ධව කටයුතු කරද්දී ශ්‍රී ලංකාවේ කණ්ඩායම් කියනවා, අපි එය ප්‍රවර්ධනය කරලා පෝෂණය කරනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව විශාල වශයෙන් අවධානය යොමු කරන්නේ අපේ රටේ වංචාව හා දූෂණය නැති කරන්නේ කොහොමද කියන කාරණාවට. වංචාව හා දූෂණය නැති කරන්න අවශ්‍ය ශක්තිමත් නීති රාමුව මේ රටට හඳුන්වා දුන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනත් සමඟ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව කියන එක ඉතාම ගෞරවයෙන් මම මේ ගරු සභාවට මතක් කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාවට - CIABOC - අවශ්‍ය සම්පත් ටික දීලා, ඔවුන්ට තවදුරටත් ස්වාධීනත්වය අවශ්‍ය නම් ඒකත් ලබා දෙන්න කටයුතු කරලා, technical assistance වෙනුවෙන් රජයේ මැදිහත්වීමක් අවශ්‍ය නම් ඒකටත් සහයෝගය දීලා, CIABOC එක ශක්තිමත් කරන්න වැඩියෙන්ම කටයුතු කළේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවයි කියන එක මම ඉතාම ගෞරවයෙන් මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. ආණ්ඩුවට විරුද්ධව චෝදනා ඇති, එක එක්කෙනාගේ දේශපාලන මතය අනුව. නමුත් හොඳ දේට හොඳයි කියන්න සූදානම් වෙන්න.

මම කෙටියෙන් මේ කාරණයත් කියලා මගේ කථාව අවසාන කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම විපක්ෂයෙන් මේ කාරණය අහනවා. ඔබතුමන්ලා දැවැන්ත විවේචනයක් මේ රජයට එල්ල කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතාම ගෞරවයෙන් ඔබතුමාගෙන් මේ කාරණය අහනවා. මේ රටේ උද්ධමනය සියයට 70ට ඉහළ ගියා. මේ රටේ උද්ධමනය සියයට 70ට ඉහළ ගිය අවස්ථාවේදී රට භාර ගන්න බැහැ කියලා පලා ගිය අය අද මේ රටේ උද්ධමනය සියයට 2.2ට අඩු වෙලා තිබියදී රජයට ඇඟිල්ල දිගු කිරීම කොතෙක් දුරට සදාචාරාත්මකද? සියයට 70ක උද්ධමනයක් තිබුණා නම් මේ රටේ ජනතාවගේ ආදායමට මොකද වෙන්නේ? ඔවුන් උපයන දේට මොකද වෙන්නේ?

ඔබතුමන්ලාට මතකයි නේ, මේ රටේ ජනතාව ඒක අත්විඳින්නා. අද විපක්ෂ නායකතුමා නිරන්තරයෙන් හඳුන්වන ආර්ජන්ටිනාව, multiple defaultsවලට ගියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ජන්ටිනාවේ උද්ධමනය සියයට 275යි. ඔබතුමන්ලාට හිතා ගන්න පුළුවන් නේද, සියයට 70ක උද්ධමනයක් රටේ තිබියදී ඇති වෙච්ච අපහසුතා ගැන. එතකොට සියයට 275ක උද්ධමනයකට ගියොත් කොයි වාගේ තත්ත්වයක් එයිද? හැබැයි, අද සියයට 2ක මට්ටමකට ඒක අරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒක අගය කරන්න.

කළු සල්ලි සුදු කරන්න යෝජනා කරන තමුන්නාන්සේලාගේ විපක්ෂය, මේ රටට විදේශීය ප්‍රේෂණ නිවැරදිව බැංකු ක්‍රමය හරහා එවන්න එපා කියලා යෝජනා කරපු ඔබේ විපක්ෂය, - එදා කළු කඩේ ඩොලරයක මිල රුපියල් 420යි, 430යි වුණා. නිල මිල රුපියල් 367යි- අද කනගාටුවෙන් ඉන්නවා, අද ඒක රුපියල් 300ක මට්ටමකට ඇවිත්, විදේශ විනිමය මේ රටේ ස්ථාවරවීම ගැන. ඒක ගැන කථා කරන්න. අපේ රටේ රාජ්‍ය ආදායම සියයට 11 ඉක්ම වූ මට්ටමකට ගිය අවුරුද්දේ ගියා. අපි බලාපොරොත්තු වෙනවා, මේ අවුරුද්දේ සියයට 12 ඉක්මවන්න. ඒ හරහා කිසිම බාධාවකින් තොරව මහජන සේවා අද රජයට සපයන්න පුළුවන් වෙලා තිබෙනවා. රජයේ සේවකයන්ගේ වැටුප් ගෙවීම අපි කරනවා.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා හොඳටම දන්නවා, ග්‍රීසියේ ඇති වූ තත්ත්වය. They have still not recovered fully. ග්‍රීසියේ සේවා සියයට 50ක් කපා හැරියා; වැටුප් කැපුවා; විශ්‍රාමිකයන්ගේ අරමුදල් කැපුවා. අපි ඒක කළේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක අගය කරන්න. වැරදි තිබෙනවා නම් පෙන්වන්න. මම කිව්වා, අපේ සංචිත ප්‍රමාණය - usable reserves

- තිබුණේ ඇමෙරිකානු ඩොලර් මිලියන 20යි කියලා. අර swap එකත් එක්ක 1,420යි. අද සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 5.6කට වැඩි වෙලා තිබෙනවා. අපි ආනයන සීමා සියල්ල ඉවත් කරලා තිබෙනවා, වාහනවල හැර. අපි ලබන මාසයේ ඒ වාර්තාව ඉදිරිපත් කරනවා, කොහොමද සම්පූර්ණ නිදහස්වීම සිදුවෙන්නේ කියලා. අපි හැම කෙනාම බලාපොරොත්තු වෙන පෞද්ගලික වාහන ආනයනය 2025 පළමු කාර්තුව තුළ ලබා දෙන්නයි අපේ බලාපොරොත්තුව. අපි ඒ සැලැස්ම ක්‍රියාත්මක කරනවා ආර්ථිකය වර්ධනය වෙලා විදේශ සංචිතවලට බලපෑමක් ඇති නොවෙන්නත්, ඒ හරහා ණය සේවාකරණයට බාධාවක් ඇති නොවන්න සහ ආනයනවලට බාධාවක් ඇති නොවෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකරලා ආණ්ඩු පක්ෂය පැත්තෙන් මට තව අමතර විනාඩි 4ක් දෙන්න. ඊළඟට, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආර්ථිකයේ පුළුල්වීම බලන්න. 2022දී අපට ඇහිල්ල දිගු කළා; අපි ඒ චෝදනාව පිළිගත්තා. එදා ආර්ථිකය හැකිළිච්ච ප්‍රමාණය සියයට 7.8යි. සියයට 7.8කින් හැකිළිච්ච ආර්ථිකය රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා අවුරුදු දෙකක් ජනාධිපති ධුර කාලය සම්පූර්ණ කරද්දී, 2024 පළමු කාර්තුව වෙද්දී, සියයට 5.1ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා.

අද ණය පොලී අනුපාත දිගින් දිගටම අඩු වෙලා තිබෙනවා. රජය දේශීය වෙළෙඳ පොළෙන් -භාණ්ඩාගාර බිල්පත්වලින්- මුදල් ගත්තා, සියයට 30කට වඩා වැඩි පොලියක් ගෙවලා. මේ රටේ ජනතාවට සිදු වුණා, ණයක් ගනිද්දී සියයට 28ක්-29ක් දක්වා පොලී ගෙවන්න. අද ඒ ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා, සියයට 10ට, 12ට. ඒ වාගේම ආසියානු සංවර්ධන බැංකුවෙන් රුපියල් බිලියන 30කුත්, අපේ මහා භාණ්ඩාගාරයෙන් තවත් බිලියන 20කුත් යොදවා සම්පූර්ණ වශයෙන් රුපියල් බිලියන 50ක මුදල් ප්‍රමාණයක් අඩු පොලී පහසුකම් යටතේ -සියයට 7.5ත්-8.5ත් අතරේ- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට ලබා දෙන්න කටයුතු කර තිබෙනවා, විශේෂයෙන්ම කාරක ප්‍රාග්ධනය හැටියට.

ආර්ථිකය වැටිලාම තිබුණු අවස්ථාවේ රජයට විරුද්ධව විපක්ෂය විරෝධතා එල්ල කළා, ආර්ථිකය ස්ථාවර වෙලා තිබෙන අවස්ථාවක ලබා දෙන්න පුළුවන් පහසුකම් ඉල්ලලා. හැබැයි, අපි ඒ හැම අවස්ථාවකදීම කිව්වා, අපට කාලයක් අවශ්‍යයි, අපි නිශ්චිත කාල රාමුවක් තුළ වැඩ කරන්නේ, මෙන්න මේ නිශ්චිත කාල රාමුව තුළ ජනතාවට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න කටයුතු කරනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විදුලි බිල ගත්තාම, ඉන්ධන මිල ගත්තාම රටේ ඕනෑම කෙනෙකුට ඒවා සම්බන්ධ තීන්දු කරන්න පුළුවන්. - විදුලි බිල නම් මාස තුනක් යද්දී අඩු වෙනවාද, වැඩි වෙනවාද කියලා තීන්දු කරන්න පුළුවන්. මොකද, ඒ සියලු ලේඛන අද වනවිට ප්‍රසිද්ධ කර තිබෙනවා. ඒ වාගේම ඕනෑම කෙනෙකුට තීන්දු කරන්න පුළුවන්, ඉන්ධන මිල මාසය අන්තිම වෙනකොට වැඩි වෙනවාද, අඩු වෙනවාද කියලා. මොකද, රජයට බරක් නොවී, විශේෂයෙන්ම දුප්පත් අයට වැඩියෙන් සහනය දීමටත්, පොහොසත් අයට දුප්පත් අයට දෙන සහනය එක හා සමානව ලබා දීම වළක්වන්නත් රජය පිරිවැය මත පදනම් වුණු මිල සූත්‍රයක් ක්‍රියාත්මක කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ සියලු කටයුතු කරන ගමන්ම, මේ රටේ දිළිඳු ජනතාව වෙනුවෙන් අස්වැසුම ප්‍රතිලාභ ලබා දීම සඳහාත් රුපියල් බිලියන 205ක මුදල් ප්‍රමාණයක් වෙන් කළා. රජයේ නිලධාරීන් ඒ අදාළ දත්ත සහතික කරලා ඉතා විනිවිදභාවයකින් යුක්තවයි එම කටයුත්ත ක්‍රියාත්මක කරන්නේ. හැබැයි, පළවෙනි අවුරුද්දේ යම් යම් දුර්වලතා තිබුණා. අපි ඒ දුර්වලතා අවම කරගත්තා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, දෙවැනි අවුරුද්ද තුළ අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක වීම සහතික කිරීම ආරම්භ වෙලා තිබෙනවා. අපට තිබෙන ප්‍රශ්නය වන්නේ මේ සහතික කිරීම ප්‍රමාද වුණොත් ඇති වන තත්ත්වයයි. මොකද, අභියාචනාවලට, විරෝධතාවලට කාලයක් ලබා දෙන්න තිබෙනවා. ඊළඟට, ලක්ෂ 24ක් දක්වා දිළිඳුකම වැඩිවීම නිසා එම පවුල්වලට, ඒ දුප්පත් අයට සහනාධාර ලබා දෙන්න තිබෙනවා. ඒ නිසා එම සහතික කිරීම් රජයේ නිලධාරීන් ප්‍රමාද කළොත්, මේ රටේ අහිංසක, අසරණ දුප්පත් අයට සහනාධාරය ලබා දීමත් ප්‍රමාද වෙනවා. මම බැලුවා, අද වෙනකොට මේ වැඩ කටයුත්ත නිල වශයෙන් ආරම්භ වෙලා තවම දවස් හතරයි වෙන්නේ. හැබැයි, ගිය සතියේ ඉඳලාම එම කටයුතු ආරම්භ කරලා කරගෙන යන ප්‍රාදේශීය ලේකම්තුමන්ලාත්, ලේකම්තුමියන්ලාත් ඉන්නවා.

හැබැයි තවම අලුතින් ලැබිච්ච applications 450,000 සහතික කිරීමේ කටයුතු සම්පූර්ණ වෙලා තිබෙන්නේ සියයට 0.1යි, මුළු රටටෙම. අපට මේ 450,000හි සහතික කිරීම ලබා දුන්නොත්, ඒ ලබා දීලා සති දෙකක් ඇතුළත විරෝධතා සහ අභියාචනා නැති කණ්ඩායම්වලට මේ මුදල් ලබා දෙන්න පුළුවන්. ඒ සඳහා මුදල් තිබෙනවා. අපි ඒ මුදල් ලබා දෙන්න සූදානමින් ඉන්නවා. නමුත් රජයට, ඇමතිවරයාට, මන්ත්‍රීවරයෙකුට තීන්දු කරන්න බැහැ, සහනාධාර කාටද ලැබෙන්නේ, නොලැබෙන්නේ කියන කාරණාව. ඒ හින්දා මෙන්න මේ වාගේ යාවත්කාලීන වෙච්ච, අනෙක් රටවල් අනුගමනය කරන හොඳ ක්‍රියාමාර්ග රටක් හැටියට අපි අනුගමනය කරනවා. මෙන්න මේ අනුගමනය කරන ක්‍රියාමාර්ග සහතික කිරීම තමයි මේ පනත් කෙටුම්පත් හරහා සිදු වෙන්නේ. මේ පරිවර්තනය මේ රටේ සිදු වෙන්න ඕනෑ.

මේ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත මඟින් කෙරෙන්නේ එක පරිවර්තනයක් පමණයි. හැබැයි, මේ රටේ සමස්ත පරිවර්තනයක් සිදු වෙන්න ඕනෑ. ඒ හින්දා තමයි මේ පරිවර්තනය වෙනුවෙන් මේ පනත් කෙටුම්පත් දෙක හැර අණපනත් 60කට වඩා වැඩි ප්‍රමාණයක් ගෙනැල්ලා තිබෙන්නේ. ආර්ථික වශයෙන් වෙන්න පුළුවන්, වංචා හා දූෂණ වැළැක්වීම වෙනුවෙන් වෙන්න පුළුවන්, මේ සියල්ලේ පරිවර්තනය වෙනුවෙන් පනත් 60කට වඩා ගෙනැල්ලා තිබෙනවා.

අද මේ ගෙනැවිත් තිබෙන පනත් කෙටුම්පත් ඉතා වැදගත්. මේවා තීරණාත්මක පනත් කෙටුම්පත්; මේ රටේ අනාගතය තීන්දු කරන පනත් කෙටුම්පත්. සමහර අය කියනවා, ඒ ගොල්ලන්ගේ ආණ්ඩුවක් බලයට ආවොත් මේවා ක්‍රියාත්මක කරන්න බැඳිලා නැහැ කියලා. ඔවුන් බැඳිලා නැහැ කියන්නේ ඔවුන් බලයට ඇවිල්ලා දවස් 14ක් යද්දී 2022 ඇති වූ තත්ත්වය මේ රටේ ඇති වෙනවා කියන එකයි. අනික, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක මේ තත්ත්වය වෙනස් කරන්න කිසිම ඉඩක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, ඒකට රාමුවක් තිබෙනවා. ඒ රාමුවෙන් පිට ගිහිල්ලා දේශපාලන අවශ්‍යතා ඉටු කරන්න ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉඩ දෙන්නේ නැහැ. මොකද, ඒ අයත් මේ රටේ දේශපාලනඥයන්ට වඩා රටේ ජනතාව සහ ඔවුන්ගේ සාමාජික රටවල් පිළිබඳව අවධානයෙන් ඉන්නවා. ඒ හින්දා බොරු කියලා ජනතාව රවටන එක වළකිනවා, මේ නීති රාමුව ඉදිරිපත්වීමත් එක්ක.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අවසන් කරන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මම ඉක්මනින් අවසාන කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ අවසාන තත්පර 30.

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

මේකට විරුද්ධ වෙන්න ප්‍රධාන හේතුව මෙයයි. ඉදිරියේදී ජනාධිපතිවරණය එනවා. ජනාධිපතිවරණයේදී මෙන්න මේ නීති රාමුවෙන් පිට පනින්නේ නැතිව, පව කියලා, බොරු කියලා, ජනතාව රවටිටලා බලය ලබාගන්න බැරි වෙනවා. ඔවුන්ගේ උත්සාහය අසාර්ථක වෙනවා. මෙන්න මේක තමයි ඔවුන්ට තිබෙන ප්‍රශ්නය. එහෙම නැතුව ඔවුන්ගේ ආණ්ඩුවක් බලයට ආවොත් මේ කාරණා අනුගමනය කරන්න පුළුවන්ද, බැරිද කියන කාරණය නොවෙයි තිබෙන්නේ. මේ අයගේ ප්‍රතිපත්ති ප්‍රකාශන තුළ ඇතුළත් පිළිගත නොහැකි, ක්‍රියාත්මක කරන්න බැරි, ප්‍රායෝගික නැති, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රතික්ෂේප කරන, ණය හිමියන් ප්‍රතික්ෂේප කරන යෝජනාවලියක් ලබා දෙන්න මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වීම හරහා ඉඩක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අන්න ඒකයි විපක්ෂයට තිබෙන දුක. ඉතින් ඒ අනුන්ගේ දුක සංසිඳුවන්න අපට ඉඩක් නැහැ.

අපි අභියෝගයක් භාර ගත්තා. ඒ අභියෝගයට අපි සාර්ථකව මුහුණ දුන්නා. නමුත්, තවදුරටත් ආර්ථිකය වර්ධනය විය යුතුයි. එහෙම වුණොත් තමයි ජනතාවගේ ප්‍රශ්න ගොඩක් දුරට අඩු වෙන්නේ. අන්න එතැනට රට ගමන් කරවීම තමයි අපි මේ වෙනකොට කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[පූ.භා. 10.44]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்*)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පතත්, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතත් සාකච්ඡාවට භාජන වෙන මේ අවස්ථාවේ අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නට මම සූදානම්.

විශේෂයෙන්ම මම පැහැදිලි කරන්න ඕනෑ, එදා රට බංකොලොත් කරපු ගමන නිර්මාණය කරපු පුද්ගලයන් අද අපි හැමෝටම බණ දේශනා කරන්නට එනවාය කියන එක. මේගොල්ලන් තමයි රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 12 සිට සියයට 8 දක්වා වටිටවා ගත්තේ. මේගොල්ලන් තමයි බිලියන 600 සිට 700 දක්වා කෝටිපතියන්ට, ධන කුවේරයන්ට බදු සහන ලබා දීලා මුළු රටම වැටිටෙව්වේ. මේගොල්ලන් තමයි Fitch Ratings, Moody's Ratings, Standard & Poor's Ratings ශ්‍රේණිගත කිරීම් ගැන කථා කරනකොට විහිළු තහළු කළේ. මේගොල්ලන් රට පතුළටම බස්සලා මේ රටේ දසලක්ෂ ගණනින් දුප්පතුන් නිර්මාණය කරලා දැන් කියන්න එනවා, "මේ අභියෝගය භාර ගත්තා" කියලා.

මම අහන්න කැමතියි කවුද අභියෝගය නිර්මාණය කළේ, කවුද මේ විනාශය නිර්මාණය කළේ, කවුද මේ රටේ නූපන් දරුවාගේ ඉඳලා කුඩා දරුවාගේ ඉඳලා, මව්වරුන්ගේ ඉඳලා, තරුණයාය, ව්‍යවසායකයන්, කුලී කම්කරුවන්, ස්වයංරැකියාලාභීන් මේ හැම දෙනාම අනාථ කළේ? අපි ද? අපිද, රට බංකොලොත් කළේ? මේ ගොල්ලොන්ට ඉතින් ලේසියි. රාජපක්ෂ සරණං ගච්ඡාමි කිව්වාම, ජාතික ඇඳුම අඳිනවා. වික්‍රමසිංහ සරණං ගච්ඡාමි කිව්වාම, හොඳට ටයි-කෝට් අඳිනවා. ඒ ගොල්ලන්ට පුළුවන් කාලෙන් කාලයට, ඕනෑ ඕනෑ විධියට, ඕනෑ ඕනෑ තාලයට, ඕනෑ ඕනෑ පදයට නටන්න. මෙතැන ඇවිල්ලා සක බඹරේ වාගේ වටේට, අංශක 360 ටම කැරකි කැරකි රට මං මුළා කරලා මේ රටේ ඉන්න ලක්ෂ 220ක් අමනෝඥයෝ ගණනට දා ගෙන මෙතැනට එනවා බණ දේශනා කරන්න. මම ඒ ගොල්ලන්ට කියන්න කැමැතියි, මේ ධම්මපද ගාථාවෙන් කියන දේත් ඉගෙන ගන්න කියලා.

"අත්තානමේව පඨමං - පතිරූපේ නිවේසයේ
අථඤ්ඤමනුසාසෙය්‍ය - න කිලිස්සෙය්‍ය පණ්ඩිතෝ."

තමන් සුදුසු ගුණයෙහි පිහිටා සිට අනුන්ට බණ දේශනා කරන්න. එහෙම කරන්න.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(*மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல*)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඉගෙන ගන්න, බණ පදයක්.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)

මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ මහ බැංකුවේ අධිපති විපක්ෂ නායක කාර්යාලයට ආවේ මොකටද? ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා වැඳපු එක විතරයි නොකළේ. "අනේ! පොඩ්ඩක් ඒ අය ගෙන්න ගෙන රට වැටී තිබෙන ප්‍රපාතය ගැන කරුණු අවබෝධ කර ගන්න" කියලා අපට කියපු නිසා අපි ඒ අය ගෙන්වා ගත්තා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ආයාචනා කළා. ඉතින් අපි ඒකට සවන් දුන්නා. සවන් දීලා අපි පැහැදිලිවම කොන්දේසි ඉදිරිපත් කළා. දැන් මේ කට්ටිය කියන්නේ, රට විනාශ කරපු හොරු එක්ක එක්කහු වුණේ නැති එක වරදක් කියලායි. කොහොමද වැඩේ? හොරු එක්ක එක්කහු වුණේ නැති එක තමයි, රට විනාශ කරපු, රට බංකොලොත් කරපු, රට පතුලටම වට්ටපු, රට මංකොල්ල කාපු, රට විනාශ කරලා මේ රටේ මුදල් විදේශ රටවලට ගෙන ගිය හොරු එක්ක එක්කහු වුණේ නැති එක තමයි අපි කරපු පව. අනේ, අපි කැමැතියි ඒ පව සමාදන් වෙන්න. අපි ඒ ගැන කිසිසේත් කනගාටු වෙන්නේ නැහැ.

මේගොල්ලන්ට අමතකයි, ශ්‍රේෂ්ඨාධිකරණය දුන්නු තීන්දුව. මොනවාද ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වේ? අපේ සමගි බුද්ධි මණ්ඩපය, සමගි නීතිඥ සංගමය ශ්‍රේෂ්ඨාධිකරණය හමුවට ගිහිල්ලා කිව්වා, මේ රටේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වුණා, මේ රට නීතා මනාම බංකොලොත් කළා කියලා. මොකක්ද ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වේ? මහින්ද රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ, ආටිගල, පී.බී. ජයසුන්දර ඇතුළු කණ්ඩායමක්ම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළා කිව්වා. ඒ තීන්දුව මේ පාර්ලිමේන්තුවේදී මම කියවනකොට, බුරුතු පිටින් හොරු ටික ආවා, මට ප්‍රහාර එල්ල කරන්න. ඇයි? ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව උඹුලා ගන්න බැහැ. ඒක දරා ගන්න බැහැ. රට විනාශ කරලා, රට බංකොලොත් කරලා, රට පතුලටම වට්ටලා දැන් කියනවා, "අපි රට හදනවා" කියලා. රට විනාශ කරලා, රට පතුලටම බස්සලා, වැටුණු පහළම තැනින් -විනාශ වුණු තැනින්- උඩට ගත්තු එක මහා ප්‍රාතිහාර්යයක් හැටියට රටට හුවා දක්වනවා. ඔබගේ තීන්දු නිසා තමයි මේ රටේ ඉතිහාසයේ පළමුවැනි වතාවට රට බංකොලොත් වුණේ. ඒක මතක තබා ගන්න.

මේ රට එක් කාලයක තිබුණා, දෙපැත්ත පත්තු වුණු විලක්කුවක් වාගේ. ඒ කාලයේ උතුර සහ නැගෙනහිරත් ත්‍රස්තවාදය, දකුණේත් ත්‍රස්තවාදය. හැබැයි, රට බංකොලොත් වුණේ නැහැ. නමුත්, ඔබතුමන්ලා අද රට පතුලටම වැටිටෙව්වා. මම විශේෂයෙන් කියන්න කැමැතියි, මේ රජය ක්‍රියාත්මක කරන ලුම්පන් ධනවාදය, ගජ මිතුරු ධනවාදය - crony capitalism - අපි

කිසිසේත් අනුමත කරන්නේ නැහැ කියලා. අපි මේ රටේ ජනතාවට කියනවා, අපි අනිවාර්යයෙන් renegotiation එකකට යනවා කියලා. මේ රටේ ලක්ෂ 220ට විතරක් නොවෙයි, අපි IMF එකටත් ඒක කියලා තිබෙනවා. අපි අනිවාර්යයෙන් මේ රටේ ජන වරමක් ලබා ගෙන, ඒ වරම ක්‍රියාත්මක කිරීමට IMF එක එක්ක සුහදව ජනතාවගේ පැත්තෙන් -පොදු ජනයාගේ පැත්තෙන්, මිනිසුන්ගේ පැත්තෙන්- හිතලා, මානුෂීයත්වයෙන් හිතලා, රට ගැන හිතලා, ජාතික අවශ්‍යතාව කේන්ද්‍ර කරගෙන ජනතාවාදී, ජනහිතකාමී ගිවිසුමකට යනවා. "අපි renegotiation එකකට යනවා කියලා" මම කියනකොට, "කොහොමද එහෙම කරන්නේ?" කියමින් ඒ පැත්තේත් කෙනෙක් මහා ලොකුවට කෑ ගහනවා මට ඇහුණා. මොකද, කරන්න බැරි? ඒ ගොල්ලෝ කිව්වා, එක පුද්ගලයෙකුට මාසයකට ජීවත් වෙන්න රුපියල් 2,500ක් ඇති කියලා. එහෙව් අය දැන් කියනවා, IMF එකත් එක්ක ආයෙත් කථා කරන්න බැහැ කියලා. මම එක දෙයක් කියන්න කැමතියි. මේ වහල්භාවයෙන් මිදෙන්න. කොන්ද කෙළින් තබාගෙන, කශේරුකාව ශක්තිමත් කරගෙන, ඕනෑම කෙනෙකු එක්ක ආත්ම ශක්තිය තුළින් හොඳ negotiation එකකට යන්න බැරි ඇයි? පුළුවන්. අපි ඒ දේ කරනවා. අපි ඒ යුතුකම අනිවාර්යයෙන් ඉෂ්ට කරනවා.

මහා ලොකුවට සමාජ සාධාරණත්වය ගැන කථා කළා. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරනකොට පික් පොකට් ගැහුවේ වැඩ කරන ජනතාවගේ අරමුදල්වලට නේද, pension fundsවලට නේද? මේ රටේ සුපිරි කෝටිපතියන්, ප්‍රකෝටිපතියන්, primary bond dealersලා, තමන්ගේ ගජ මිතුරු ධනවත් හිතවාදීන් බේරා ගත්තා නේද? ඔවුන්ට රැකවරණයක් ලබා දුන්නා නේද? අපි කිසිසේත් එහෙව් ප්‍රතිපත්ති අනුමත කරන්නේ නැහැ.

අනෙක් අතට බැලුවාම, මේක පුදුම ආණ්ඩුවක්. දුප්පත්කම තුරන් කරනවා කියනවා. හැබැයි, දුප්පත්කම හඳුනා ගන්න දරිද්‍රතා රේඛාව තවම ගණනය කරලා නැහැ. ගෘහයක ආදායම් වියදම් සමීක්ෂණය හරියට කරලා නැහැ.

හිතූ හිතූ විධියට ප්‍රතිලාභ ලබා දෙනවා. කොහොමද මේ තීන්දු ගන්නේ? මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 134ක වරමක් තුළින් මේ රටේ නායකත්වයට ආපු වෙලාවේ ඉස්සෙල්ලාම කරන්න තිබුණේ පැහැදිලි ජාතික සංගණනයක් කරලා දරිද්‍රතා රේඛාව හඳුනාගෙන ඒ අනුව සහන ටික ලබා දීමයි. දැන් කරන්නේ ඒකේ කණපිට. සහන ටික දීලා ඉවර වෙලා, සංගණනය කරලා ගෘහයක ආදායම් වියදම් සමීක්ෂණය, දරිද්‍රතා රේඛාව ගණනය කිරීම වාගේ දේවල් කරනවා. ඔක්කොම කරන්නේ කණපිට. මුලදී කරන්න ඕනෑ දේ අගට කරනවා. අගදී කරන්න ඕනෑ දේ මුලදී කරනවා. මේ වාගේ තකතීරු පාලනයක් අද අපේ රටේ ක්‍රියාත්මක වන්නේ.

මේ ගොල්ලන් කථා කරනවා, අපනයනය ප්‍රවර්ධනය ගැන. මේ ගොල්ලෝ තමයි එදා ඇහලුම් කම්හල් 200 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනකොට කිව්වේ, "මේ හදන්නේ ගමේ, නගරයේ කොල්ලෝ, කෙල්ලෝ ලවා සුද්දියන්ට යට ඇඳුම් මස්සවන්නයි" කියලා. එහෙම කථා කියපු කට්ටියම දැන් කියනවා, අපනයනය ප්‍රවර්ධනය කරනවා කියලා. අපනයනය ප්‍රවර්ධනය කරන්නේ කොහොමද? Red tape එක අයින් කරන්න ඕනෑ; Ease of Doing Business indicesවල අපි ඉහළම තැනකට එන්න ඕනෑ; one-stop shop එකක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ, ආයතන 15 ද, 20 ද, 25 ද, ඒ සඳහා අනුමැතිය over-the-counter ලබා දෙන්න. මෝදි අග්‍රාමාත්‍යතුමා කොවිඩ් සමයේ චීනයෙන් එළියට පිටවන ආයෝජන ඉන්දියාවට ලබා ගන්න නිර්මාණය කරපු ඒ යන්ත්‍රණය දිහා බලන්න. ඒවායෙන් ඉගෙන ගන්න. One-stop shop එකක් නිර්මාණය කර ගන්නට බැරුව ළතැවෙවී, ඉක්කා ගගහා, තතන තතනා ඉන්න ආණ්ඩුව කොහොමද රට හදන්නේ?

මේ වාගේ අන්ත දූෂිත, බංකොලොත් රටෙත් හොරකම් කරන, පුනර්ජනනීය බලශක්තියෙන් හොරකම් කරන, සුළං බලාගාරවල tariff rate එක තීන්දු කරනකොට හොරකම් කරන, ටෙන්ඩර් ක්‍රමය බැහැර කරලා unsolicited proposals හරහා තමන්ගේ ගජ මිතුරන්ට තෑගි බෝග බෙදා දෙන, මන්ත්‍රීවරුන් බිලි බාගන්නට bar permits බෙදන මේ රජයට පුළුවන්ද රට හදන්න? මේ ගොල්ලන්ට කරන්න පුළුවන් එකම එක දෙයයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් උල්ලංඝනය කරලා රාජ්‍ය බලය හරහා විවිධ වරදාන, වරප්‍රසාද කාලෝචිතව ලබා දීලා තමන්ගේ තැන රැක ගන්න චිතරයි පුළුවන්.

මම විශේෂයෙන්ම කියන්නට ඕනෑ, මේ රට ගොඩනැඟීමේ එකම විකල්ප දර්ශනය, ක්‍රියාමාර්ගය තිබෙන්නේ සමඟි ජන බලවේගයටයි, සමඟි ජන සන්ධානයටයි කියලා. ලුම්පන් ධනවාදය බැහැර කරලා, අන්තවාදී සමාජවාදය බැහැර කරලා, අන්ත දක්ෂිණාංශික නොවී, අන්ත වාමාංශික නොවී, තුන්වැනි මාවතේ -මැද මාවතේ- ඉදගෙන ප්‍රජාතන්ත්‍රවාදී, සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය ක්‍රියාත්මක කරලා ව්‍යවසායකත්වයට ඉඩ දීම තමයි අපේ අරමුණ. පෞද්ගලික ව්‍යවසායකත්වය හරහා ආර්ථික වර්ධනය එක් කරන ඇන්ජිම, පෞද්ගලික අංශයට ලබා දෙන්න පුළුවන් ඉහළම ශක්තිය ලබා දීලා, ධනය උත්පාදනය කරලා, සම්පත් උත්පාදනය කරලා, උත්පාදනය වෙන සම්පත, ධනය, ආදායම ජන සමාජයේ සමානාත්මතාව, සමාජ සාධාරණත්වය කේන්ද්‍ර කර ගත්ත සම්පත් බෙදී යෑමේ සාධාරණ ව්‍යුහය තුළ අපි මේ රට ගොඩ ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනවා.

අපි අධ්‍යාපනයේ සාධනීය වෙනසක් කරනවා. අධ්‍යාපනය නවීකරණය කරනවා. අධ්‍යාපනය ශක්තිමත් කරනවා. නිදහස් අධ්‍යාපනය ඉහළටම ඔසවා තබනවා. සුබසාධන රාජ්‍යය ශක්තිමත් කරනවා. ප්‍රතිපාදන ලබා දෙනවා. ඒ වාගේම ලබා දෙන ප්‍රතිපාදනවලට සරිලන කාර්යක්ෂම සේවාවක් අපි බලාපොරොත්තු වෙනවා. කෘෂි කර්මාන්තය, ධීවර කර්මාන්තය වාගේම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් -මේ රටේ ආර්ථික ඇන්ජිම- අපි ශක්තිමත් කරනවා. අපනයන කේන්ද්‍රීය කර්මාන්ත විප්ලවයක්, නිෂ්පාදන කර්මාන්ත විප්ලවයක් අපි රටේ ක්‍රියාත්මක කරනවා. තොරතුරු තාක්ෂණ අපනයන ප්‍රවර්ධනය කරන වැඩසටහන අපි ක්‍රියාත්මක කරනවා. ජන සමාජයේ කුඩා දරුවන්ගේ ඉඳලා, මව්වරුන්ගේ ඉඳලා, පාසල් දරුවන්ගේ ඉඳලා සමාජ රැකවරණය, සමාජ ආරක්ෂාව ඒ සුබසාධන රාජ්‍යය හරහා ලබා දෙන්නට අපි අනිවාර්යයෙන්ම කටයුතු කරනවා.

ඒ වාගේම ස්වාධීන විදේශ ප්‍රතිපත්තියක් තුළින් අපේ රටේ භූගෝලීය පිහිටීම අපේ වාසියට හරවාගෙන, වෙනත් අය අපේ රට වෙනම සූදුවකට, වෙනම වෙන්දේසිලන්තයකට යොමු කරන්න හදන මොහොතක අපි අපේ ශක්තිය ලෙස අපේ රටේ භූගෝලීය පිහිටීම පාවිච්චි කරලා රටට ලබා ගන්න පුළුවන් ලොකුම සම්පත, ලොකුම අගය, ලොකුම ජයග්‍රහණ ලබා ගන්නට අනිවාර්යයෙන්ම කැප වෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී මම බොහොම පැහැදිලිව කියන්න කැමැතියි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අපි පක්ෂයි. හැබැයි "ආර්ථික පරිවර්තනය" නාමයෙන් මේ රටේ ජන වරම තුට්ටු දෙකට පාවා දෙන ක්‍රියාදාමයකට අපි සූදානම් නැහැ.

මේ වරමක් නැති ආණ්ඩුවක්. මේ පිළිගැනීමක් නැති ආණ්ඩුවක්. මේ විශ්වාසයක් නැති ආණ්ඩුවක්. ඒ නිසා ජනතා විශ්වාසය හරහා, විශේෂයෙන්ම අලුත් වරමක් හරහා මේ කරන්නා වූ විවිධ අකටයුතුකම් ආපහු හරවන්නට අපි පැකිළෙන්නේ නැහැ. ඔය පරිවර්තන targets ක්‍රියාත්මක කරන්න අපි කිසිසේත් බැඳිලා නැහැ. නැවත වරක් ප්‍රකාශ කරනවා, IMF එකත් එක්ක renegotiation එකකට ගිහිල්ලා ජනතාවගේ පැත්තෙන් අපට ලබා ගන්න පුළුවන් උපරිම වාසිය, උපරිම සහනය අපි ලබා ගන්නවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

බොරුවට ණය ගිවිසුම් ගැන බොරු ප්‍රචාර කරලා, පෝස්ටර් ගහලා, බොරුවට ප්‍රසිද්ධ කරලා, පාර්ලිමේන්තුවේ කාලය කාලා, පාර්ලිමේන්තුවේ දින දෙකක් වෙන් කරලා, ආපහු පළමුවැනි දිනයේම ඒක cancel කරන විකට නාඩගම්වල අපි නිරත වෙන්නේ නැහැ. ඇත්ත ඇති සැටියෙන්ම, විවිනිවිදභාවයෙන් යුක්තව, පාරදෘශ්‍යභාවයෙන් යුක්තව, දූෂණයෙන් තොරව, වංචාවෙන් තොරව අපි අපේ රාජ්‍ය පාලනය ක්‍රියාත්මක කරනවා. මතක තබා ගන්න, රට විනාශ කරපු සියලු හොරු අපි නීතිය හමුවට ගෙන එනවා; අධිකරණය හමුවට ගෙන එනවා. රටින් හොරා කාපු හැම තඹ සතයක්ම, හැම රුපියලක්ම, හැම ඩොලර් එකක්ම නැවත වරක් අපේ රටට ලබා ගැනීමේ Stolen Asset Recovery Initiative programme එක විනිවිදභාවයෙන් යුක්තව, කාර්යක්ෂමව මේ රටේ ලක්ෂ 220 වෙනුවෙන් කරනවාමයි, ඒ යුතුකම ඉටු කරනවාමයි කියලා ප්‍රකාශ කරමින්, මාගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 22ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.02]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිදහසින් පසු ලංකා ඉතිහාසයේ වඩාම තීරණාත්මක පනත් කෙටුම්පත් තමයි අද මේ ගරු සභාව සම්මත කරන්න උත්සාහ දරන්නේ. නිදහසින් පසු ලංකා ඉතිහාසයේ මේ රටේ නිමවුම, ආදායම, සේවා නියුක්තිය, මිල මට්ටම, ගෙවුම් ශේෂය, ඉතුරුම්, ආයෝජනය වැනි සාර්ව ආර්ථික විචල්‍යයන් කෙරෙහි ඉතා ප්‍රබල බලපෑමක් ඇති කරන, ඒ අනුව රටේ සමස්ත පරිවර්තනයක් සිදු වීම සඳහා අදාළ නොසැලෙන අත්තිවාරමක් සපයන, යළි රට ගොඩනැඟීම සඳහා වන ජාතික වැඩ පිළිවෙළ තමයි මේ පනත් කෙටුම්පත් හරහා ඉදිරිපත් වෙන්නේ. ඒක නිසා ප්‍රථමයෙන් සඳහන් කළ යුතු වෙනවා, මේ පනත් කෙටුම්පත්වල ඉලක්කම්, දත්ත ඇතුළත් කරලා ඒ දත්ත, ඉලක්කම් මත පාර්ලිමේන්තුවේ මූල්‍ය කළමනාකරණය, විනය හා ආර්ථික විනය ගැට ගැහුවේ නැත්නම් නැවත වතාවක් රට බංකොලොත් වීම වළක්වන්න බැහැ කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට කලින් චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජනාධිපති ධුරය දරන අවධියේ ආචාර්ය පී.බී ජයසුන්දර මහතා මුදල් අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් සිටියදී රටේ පළමුවැනි කඩා වැටීම සිදු වුණා. එදා ආර්ථිකයේ වර්ධන අනුපාතය සෘණ 1.4ක් වුණා. ඒ අවස්ථාවේදී අග්‍රාමාත්‍යවරයා වශයෙන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා රට භාරගත් අවස්ථාවේදී වත්මන් විපක්ෂ නායකතුමා එවකට නියෝජ්‍ය අමාත්‍යවරයෙකුව සිටි ඒ රජය මූල්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය නීතියක් මේ ගරු සභාවේ සම්මත කළා. ඒ තමයි, 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත. ඒ පනතේ ප්‍රධාන ඉලක්ක තුනක් කිව්වා.

පළමුවැනි ඉලක්කය මෙයයි. ලංකාවේ අය වැය පරතරය 2006 වන විට දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට පහට අඩු විය යුතු අතර, ඉනික්බිති කවුරු ආණ්ඩු බලය ගත්තත් මේ අය වැය පරතරය සියයට පහට අඩු මට්ටමින් පවත්වාගෙන යායුතුයි කියලා නීතියක් සම්මත කළා. දෙවැනි ඉලක්කය මෙයයි. 2013දී රටේ නොපියවූ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 65ට අඩු කරන්න ගිවිස ගත්තා. තුන් වැනි ඉලක්කය මෙයයි. ණය සඳහා ඇපවන ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් 4.5ට වඩා වැඩි කරන්න බැහැ කියලා මේ ගරු සභාව නීතියක් සම්මත කළා. ඒ සම්මත කරපු නීතියේ අඩංගු කරුණු ඊට පසුව ආපු ලංකාවේ ආණ්ඩු අනුගමනය කළා නම් ලංකාව කවදාවත් බංකොලොත් වෙන්නේ නැහැ. ඊට පස්සේ රජයන් අය වැය පරතරය සියයට පහට අඩු මට්ටමකට ගෙනිච්චා නම්, ණය බර සියයට 65ට අඩු කළා නම්, ණය සඳහා ඇපවන ප්‍රමාණය 4.5ට වෙනස් කරන්නේ නැතුව තියා ගත්තා නම් කවදාවත් ලංකාව බංකොලොත් වෙන්නේ නැහැ.

දැනුත් අපි මේ කියන කරුණු වෙනස් කරනවා කියන එකෙන් අදහස් කරන්නේ මේ අය යම් ලෙසකින් බලයට ආවොත් රට අනිවාර්යයෙන්ම නැවත බංකොලොත් වෙනවා කියන එක. මොකද රටක් මෙවැනි නීතියක් මඟින් බැඳ තබන්නේ? සාමාන්‍යයෙන් ආවේගශීලිව කථා බහ තුළින් හෝ එහෙම නැත්නම් ඡන්ද ලබා ගැනීමට කරන දේශපාලනයෙන් රටක ආණ්ඩු කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පතේ බලාපොරොත්තුව තමයි, මේ රටේ සමාජ, ආර්ථික, සංස්කෘතිකමය, ව්‍යුහාත්මක හා ප්‍රමාණාත්මක වෙනස්කම් රාශියක් තුළින් රටේ සමස්ත ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

ඒ වෙනුවෙන් රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය ඵලදායී ආකාරයෙන් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා කාර්යක්ෂම ලෙස යොදා ගැනීම. ඒ සඳහා අන්තර්ජාතික වශයෙන් අපට තිබෙන අර්බුද විසඳා ගැනීමට අපි කැමැති වුණත්, නැතත් ගත්ත ණය ප්‍රමාණය ගෙවන්න ඕනෑ. අපි දැනට හුස්ම ගන්නේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ අත්සන් කරලා තිබෙන ගිවිසුමට පින් සිද්ධ වෙන්නයි. අද තෙල් පෝලිම් නැත්තේ, කිසිම කෙනෙකුට කරදරයක් නැතිව සුත්‍රයකට අනුව තෙල් මිල තීරණ වෙන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය ගිවිසුම නිසායි. අපි මේ ගිවිසුම ප්‍රකාරව කටයුතු කළේ නැත්නම් එදිනෙදා ආණ්ඩුව පවත්වාගෙන යෑමේ වියදම් ටිකවත් අපට දරන්න බැරි වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවුරු ආණ්ඩු බලයට ආවත් ලබන අවුරුද්දේ අය වැය ලේඛනය හදන්නට ඕනෑය කියන එක ඔබතුමාත් පිළිගන්නවා. අය වැය ලේඛනය හැදුවේ නැත්නම් මාසයේ 25වැනි දාට රාජ්‍ය සේවකයන්ට වැටුප් ගෙවන්න බැහැ, 10වැනි දාට විශ්‍රාම වැටුප් ගෙවන්නට බැහැ, ජීවත් වීම සඳහා ජීවිතයත් සමඟ අරගළයක යෙදෙන සාමාන්‍ය දිළිඳු ජනතාවට අස්වැසුම, සමෘද්ධිය දෙන්න බැහැ. මේ වියදම් දැරීම සඳහා අය වැය හදන්නට ඕනෑ. ලබන වර්ෂයේ අලුත් ආණ්ඩුවක් ඇවිල්ලා මේ විස්තීරණ ණය ගිවිසුම සංශෝධනය කරනවා නම්, ඒ ගැන නැවත කථා කරන්න යනවා නම් අපට අර්බුදයකට මුහුණ දෙන්න වෙනවා. ඒ නිසා බැරි වෙලාවත් මේ ගොල්ලන්ට ආණ්ඩුව ගියොත් රට ඉවරයි. පඩි ගෙවන්න හම්බ වෙන්නේත් නැහැ, විශ්‍රාම වැටුප් ගෙවන්න හම්බ වෙන්නේත් නැහැ, විස්තීරණ ණය ගිවිසුම සංශෝධනය කරන්න ගියොත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රනිල් වික්‍රමසිංහ මුදල් අමාත්‍යවරයා අත්සන් කරලා තිබෙන ගිවිසුමේ පුරෝකථනය කරලා තිබෙනවා, 2025 වර්ෂයේ දී ඇමෙරිකානු ඩොලර් මිලියන 5,018ක, ඒ කියන්නේ බිලියන 5ක විදේශ සම්පත් පරතරයක් ඇති වෙනවා කියලා. අද අප සතුව තිබෙන මුළු සංචිත ප්‍රමාණය, රට සතු දළ විදේශ වත්කම් ප්‍රමාණය ඩොලර් බිලියන 5.6කට වැඩි කරගෙන තිබෙනවා. අපට external resources gap එකක් කියලා එකක් එනවා, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික පාර්ලිමේන්තු සභාපති)
(The Hon. Deputy Speaker)
Order, please!

මූලාසනය සඳහා ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ලොහාන් රත්වත්තේ මහතා (වැවිලි කර්මාන්ත හා මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්ඩලික ලොහාන් රත්වත්තේ - වතුකර කෙත්වතු සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍ය)
(The Hon. Lohan Ratwatte - State Minister of Plantation Industries and Mahaweli Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(මාණ්ඩලික අමිර්තනාදන් අඩෙක්කලනාදන්)
(The Hon. Amirthanathan Adaikkalanathan)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්ඩලික පාර්ලිමේන්තු සභාපති අක්කිරාසනත් තිණින්හු අකලවේ, මාණ්ඩලික වසන්ත යාප්පාපාණ්ඩාර අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. WASANTHA YAPABANDARA took the Chair.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්ඩලික (කලානිති) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බිලියන 5ක විදේශ සම්පත් පරතරයක් ඇති වෙනවා. අපි මේ ගිවිසුමේ අත්සන් කරලා තිබෙන්නේ IMF එකේ Extended Fund Facility එක යටතේ ඩොලර් මිලියන 666ක් ලැබෙන විධියටයි.

ලබන අවුරුද්දේ අය වැය භදන්න IMF එකෙන් ඩොලර් මිලියන 700ක් දෙනවා, World Bank එකෙන් ඩොලර් මිලියන 400ක් දෙනවා, Asian Development Bank එකෙන් ඩොලර් මිලියන 300ක් දෙනවා. ඒ වාගේම ඩොලර් මිලියන 3,855ක ණය සහනයක් ලැබෙනවා. විපක්ෂය ඉතා පැහැදිලිව කියනවා, "අපි රාජ්‍ය බලය ගත්තොත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කථා කරලා මේ ගිවිසුම සංශෝධනය කරනවා" කියලා. එතකොට අපට බොහොම සරල උත්තරයක් තේ දෙන්න තිබෙන්නේ. තමුන්නාන්සේලාට ලබන අවුරුද්දේ ආණ්ඩු බලයක් ආවත් අය වැයක් භදන්න බැහැ. මොකද, IMF එක කියනවාද, "හරි, අලුත් ආණ්ඩුවක් ආවා. අපිත් එක්ක කථා කරන්න ලෑස්ති වුණා. අපි රනිල් වික්‍රමසිංහ මුදල් ඇමතිත් එක්ක අත්සන් කරපු ගිවිසුම ප්‍රකාරව කටයුතු කරන්නේ නැහැ" කියලා. තමුන්නාන්සේලා එහෙම කිව්වාම, පසුගිය අවස්ථා 16කදීම වුණා වගේ අපට IMF Programme එක අත්හරින්න වෙනවා.

මේ රටේ වගකිව යුතු මහජන නියෝජිතයන් ලෙස අපි පිළිගන්න ඕනෑ, මේ රට ණය ගෙවන්නේ නැතුව 2027 වෙනකල් පවත්වාගෙන යන්නේ ගිවිසුමක් ප්‍රකාරව කියලා. 2027දී අපට ඇමෙරිකානු ඩොලර් මිලියන 3,911ක විදේශ සම්පත් පරතරයක් ඇති වෙනවා. එයින් ඇමෙරිකානු ඩොලර් මිලියන 329ක් දෙන්න IMF එක පොරොන්දුවෙලා තිබෙනවා. 2027 අය වැය භදනකොට ඒ සඳහා ඩොලර් මිලියන 600ක් දෙන්න පොරොන්දු වෙලා තිබෙනවා. 2027 අය වැයට World Bank එක ඩොලර් මිලියන 300ක් සහ Asian Development Bank එක ඩොලර් මිලියන 300ක් දෙන්න පොරොන්දුවෙලා තිබෙනවා. එතකොට, තව මුදලක් මදි වෙනවා. ඒ වාගේම ඩොලර් මිලියන 1,482ක ණය සහනයක් ලැබෙනවා. ගරු තිස්ස අත්තනායක හිටපු ඇමතිතුමාට තේරෙනවා ඇති, 2027 අවුරුද්දේ ඩොලර් බිලියන 1.5ක් මදි වෙනවා කියලා. 2027 අවුරුද්දේ අපට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න Sovereign Bond එකක් issue කරන්න අවස්ථාව දෙනවා. හැබැයි, ඒ වෙනකොට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට අපේ දළ ජාත්‍යන්තර සංචිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 14ට වඩා වැඩි වෙන්න ඕනෑ. ලබන අවුරුද්දේ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 8 දක්වා වැඩි වෙන්න ඕනෑ. 2026දී ඩොලර් බිලියන 10 දක්වා වැඩි වෙන්න ඕනෑ. 2027දී ඩොලර් බිලියන 14ට වැඩි වෙන්න ඕනෑ. මුදල් අමාත්‍යාංශය හැටියට මුදල් ඇමතිවරයා, එම අමාත්‍යාංශයේ ලේකම් සහ මහා භාණ්ඩාගාරයේ ලේකම් මේ ගිවිසුම්වලට අත්සන් කරලා තිබෙනවා.

ඔබතුමන්ලා කියනවා, අලුත් ජනවරමක් අරන් මේ ගිවිසුම වෙනස් කර ගන්නවා කියලා. එහෙම නම් ඔබතුමන්ලාට කවදාවත් ආණ්ඩු කරන්න හම්බවෙන්නේ නැහැ නේ. "අලුත් ජනවරමක් ලැබී තිබෙනවා, එම නිසා ගිවිසුම වෙනස් කරන්න, නැත්නම් අපි මේක කරන්නේ නැහැ" කියලා IMF එකට පණිවුඩයක් යැව්වොත්, ඔවුන් මේ රට දාලා යනවා. එතකොට, මේ රට ඉතාම අවදානම් තත්ත්වයකට වැටෙන බව ඉතා පැහැදිලියි. නමුත්, විපක්ෂ නායකතුමා අද ඉතා සහතික ලෙස සපථ කරලා මේ ගරු සභාවට දැනුම් දුන්නා, එතුමා බොහොම පැහැදිලිව කිව්වා, "අපි මේ ගිවිසුම පිළිගන්නේ නැහැ, අපි මේක අරගෙන ගිහිල්ලා නැවත සාකච්ඡා කරලා වෙනස් කරගෙන එනවා" කියලා. එසේ වෙනස් කරගෙන එනකල් ලබන වර්ෂයේ අය වැය ලේඛනයක් භදන්න අලුත් ආණ්ඩුවක් විධියට අනිවාර්යයෙන්ම අපේ ආණ්ඩුවක් එනවා. අපි මේ ටික වෙනස් කරන්නේ නැතුව අකුරටම ඒක ඉෂ්ට කරනවා. එසේ ඉෂ්ට කරන බව නීතියක් ලෙස සපථ කරනවා.

නීතියක් ලෙස සපථ කිරීමේ දී ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතේ තිබෙනවා, කවුරු රටේ ජනාධිපති වුණත්, කවුරු රටේ ආණ්ඩුව කළත්, සෑම වර්ෂයකදීම මේ ලංකාවේ අය වැයක් භදනකොට දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ප්‍රාථමික ගිණුමේ - primary account - සියයට 2.3ක අතිරික්තයක් තිබෙන්නට ඕනෑ කියලා. ඒ කියන්නේ, රාජ්‍ය සේවක වැටුප් ගෙවන්න, විශ්‍රාම වැටුප් ගෙවන්න, "අස්වැසුම" ඇතුළු අනෙකුත් සහනාධාර ගෙවන්න පුළුවන් වෙන්න, පොලිය ගෙවන්නේ නැතුව ඉදිරි කාලයේ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

ප්‍රාථමික ගිණුමේ සියයට 2.3ක අතිරික්තයක් ඇති වෙන්න ඕනෑ. ඒ කවදා වෙනකල්ද? 2048 වෙනකල්. කවුරු ආණ්ඩු කළත්, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ටික ගෙවන්න, විශ්‍රාම වැටුප් ටික ගෙවන්න, අස්වැසුම ඇතුළු සහනාධාර ටික ගෙවන්න, ඒවා කරන ගමන් මේ ක්‍රමයට රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කරන්න දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට ප්‍රාථමික ගිණුමේ අතිරික්තය සියයට 2.3ක පවත්වාගෙන යා යුතුයි කියන එක නීතියක් බවට පත් කරලා තිබෙනවා.

ඒක හොඳද, නරකද? දැන් සල්ලි අච්චු ගහන්න බැහැ. මීට පෙර ලංකා ඉතිහාසයේ තිබුණු සෑම ආණ්ඩුවක්ම සල්ලි අච්චු ගහලා වියදම් කළා. වියදම් කරන්න මුදල් මදි වෙනකොට පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනවා. පරිපූරක ඇස්තමේන්තුව අනුව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනවා; බැඳුම්කර නිකුත් කරනවා. ඒවා ගන්න කෙනෙක් නැති වුණාම, ඒ ටික අරන් මහ බැංකුව සල්ලි ටික එළියට දානවා. සල්ලි අච්චු ගහලා, ගහලා මේ රටේ ආර්ථිකය ඉවර කළා. මේක නතර කරන්න ඕනෑ නිසා මේ ගරු සභාව නීතියක් ගෙනාවා, මීට පස්සේ සල්ලි අච්චු ගැසීම මහ බැංකුවට තහනම් කියලා. ඒ නිසා දැන් සල්ලි අච්චු ගහන්නේ නැහැ. එහෙම සල්ලි අච්චු ගහන්න බැරි නම්, ජාත්‍යන්තර ආයතනත් එක්ක ඇති කර ගත් ගිවිසුම් සම්බන්ධතාව මත තමයි සල්ලි ගන්න වෙන්නේ. අපි 2027 වර්ෂය වෙනකම් ජාත්‍යන්තර ණය හිමියන්ට ණය ගෙවීමට සහන කාලයක් ලබාගෙන තිබෙනවා. සමහරු කියනවා, ඒවා බොරු වැඩ, ඒ කියලා තිබෙන්නේ බොරු කියලා.

ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමට ලෝකයේ ප්‍රබල රටවල් 3කින් සමන්විත Official Creditor Committee කියලා එකක් රැස් වුණා. ඒ කමිටුවේ හිටියේ කවුද? ඉන්දියාව, ජපානය සහ ප්‍රංශය. මේ රටවල් තුන එකතුවෙලා තමයි ලංකා ආණ්ඩුවේ විදේශ ණය ප්‍රතිව්‍යුහගත කළේ. මේ රටවලට නිගුහ කරන්නේ ඇයි? එහෙම අයට පුළුවන් ද රටක ආණ්ඩුවක් කරන්න? ඊළඟට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ණය තිරසරභාවය පිළිබඳව වෙනම විශ්ලේෂණයක් - debt sustainability analysis - කරලා තමයි මේ පනත් කෙටුම්පතට කරුණු ඇතුළත් කරලා තිබෙන්නේ, 2032 වර්ෂය වන විට කාගේ ආණ්ඩුවක් අපේ රටේ තිබුණත්, කවුරු ජනාධිපති වුණත් ලංකාවේ ණය බර අඩු කරන්න ඕනෑ, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 95ට කියලා. දැන් ලංකාවේ ණය බර දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 128ට, 130ට තිබෙන්නේ. මේක සියයට 95ට ගේන්නම ඕනෑ. ඊට පස්සේ කවර දේවල් මහ ජනයාට පොරොන්දු වුණත්, මොන සුබසාධනවාදී කථා කිව්වත්, වර්ෂයක රටේ දළ මූල්‍ය අවශ්‍යතාව - Government's gross financing needs - දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 13 ඉක්මවන්න බැහැ. මෙතෙක් කළේ එය සියයට 34ට, 35ට තිබෙනකොටත් සල්ලි අච්චු ගහමින් ඒ අවශ්‍යතාව පියවා ගන්න එක. නමුත්, දැන් ආණ්ඩුවට මොකුත් කරන්න බැහැ. නීතියක් ගේනවා, මේ නීතිය සම්මත වුණාට පස්සේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 13ට වඩා මුදල් අවශ්‍යතා ඇති කර ගන්න රජයට බැහැ කියලා.

Debt servicing ගත්තොත් ණය වාරික පොලිය GDP එකෙන් සියයට 4.5ට වඩා වැඩි වෙන්න බැහැ. ඊළඟට, වක්කඩ කැඩුවා වාගේ ඕනෑ ඕනෑ විධියට ගෙනැල්ලා විදේශ විනිමය විනාශ කරලා, සංචිත ඇද වැටෙන්න දෙන්නේත් නැහැ. ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1ට වැඩි වෙන්නත් බැහැ. අද නීතියක් ලෙස ඒ කාරණය ඇතුළත් කරලා තිබෙනවා.

ඊළඟට, හැම වර්ෂයකම ආර්ථික වර්ධන අනුපාතය සියයට 5 හෝ ඊට වඩා වැඩියෙන් පවත්වාගෙන යන්න ඕනෑ. විරැකියාවේ අනුපාතය සියයට 5 හෝ ඊට වඩා අඩුවෙන් පවත්වාගෙන යන්න ඕනෑ. කාන්තා ශ්‍රම සහභාගිත්වය සියයට 40කට වැඩි කරන්න ඕනෑ. මේවා නීති. රටේ නිමැවුම, ආදායම, සේවා නියුක්තිය, මිල මට්ටම, ගෙවුම් ශේෂය, ඉතුරුම්, ආයෝජනය කියන සාර්ව ආර්ථික විචල්‍යයන් හැම එකකටම ඉලක්කගත වැඩසටහනක් මේකේ තිබෙනවා.

මේ වැඩසටහන ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කළොත් අපට 2048 වර්ෂය වන විට ඇමෙරිකානු ඩොලර් 20,000ට වඩා වැඩි ඒකපුද්ගල ආදායමක් ලබන සංවර්ධිත රටක මිනිස්සු ලෙස ජීවත් වෙන්න අවස්ථාව ලැබෙනවා. ඒ ඉලක්කය කරා යන වැඩ පිළිවෙළ තමයි මෙහි තිබෙන්නේ. රනිල් වික්‍රමසිංහට වැඩ පිළිවෙළක් තිබෙනවා. රනිල් වික්‍රමසිංහ කොහොමද මේක කරන්නේ කියලා අහන අයට තමයි මේ උත්තරේ දීලා තිබෙන්නේ. ලෝකයේ අපට ආධාර සපයන, ණය දෙන සියලු රටවල් සමඟ අන්තර්ජාතිකව ගිවිසුම්වලට එළඹිලා, ඒ ගිවිසුම් ඒ ආකාරයෙන්ම ඉදිරියට කරගෙන යෑම සඳහා අවශ්‍ය නීතිමය වගන්ති මෙයට ඇතුළත් කරලා පනතක් ලෙස මෙය සම්මත කිරීමෙන් තමයි රට නැවත කඩා නොවැටෙන ආකාරයට සුරක්ෂිත කරන්නේ. ඒ අනුව, මිනිස්සු මරා නොගන්නා දේශයක් ඇති කිරීමේ කාර්යභාරය තමයි මේ පනතින් සිද්ධ වෙන්නේ.

ගරු විපක්ෂ නායකතුමා කියනවා, එකවර ආයෝජන ගන්න one-stop shop එකක් අවශ්‍යයි කියලා. මේ පනත් කෙටුම්පත කියවලා නැහැ. මේ පනත් කෙටුම්පතේ ඉතා පැහැදිලිව තිබෙනවා, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ඇතුළු ආයතන සියල්ල ඒකාබද්ධ කරලා, අලුත් කලාප ඇති කිරීම ගැන. රට මේ තිබෙන තැනින් පිම්මක් පැනලා උඩට එන්න නම්, Foreign Direct Investments විශාල ලෙස ආර්ථිකයට ආකර්ෂණය කරන්න ඕනෑ. මැදි ආදායම් උගුලෙන් ලංකාව මිදෙන්න නම්, අපි විශාල ගැම්මක් රට ඇතුළට ගේන්න ඕනෑ. මගේ උගත් මිත්‍ර ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමාත් පිළිගන්නවා ඇති, ගිය අවුරුද්දේ සිංගප්පූරුවේ සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 140යි, ඉන්දියාවේ සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 70යි, වියට්නාමයේ ඩොලර් බිලියන 28යි, තායිලන්තයේ ඩොලර් බිලියන 20යි, ශ්‍රී ලංකාවේ ඩොලර් බිලියනයයි කියලා.

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு சட்டத்தரணி அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa, Attorney-at-Law)
දීර්ඝ කාලීනව තිබෙන ප්‍රශ්නයක්.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ඔව්, දීර්ඝ කාලීනව තිබෙන ප්‍රශ්නයක්.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න තිබෙනවා. දැනට මාස දෙකකට විතර කලින් මම මේ සභාවේදී ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය ඇමතිතුමාගෙන් ඇහුවා, ගිය අවුරුද්දට ඍජු විදේශ ආයෝජන කොච්චර ආවාද කියලා. එතුමා කිව්වා, ඇමෙරිකානු ඩොලර් බිලියන 1.8කට අත්සන් කරලා තිබෙනවා, ඒත් තවම ඩොලරයක්වත් ආවේ නැහැ කියලා. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කියනවා, ඩොලර් බිලියනයක් ආවා කියලා. ඒකේ පරස්පරයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

මම කියන්නේ, ඕනෑම කාලයක සංඛ්‍යා දත්ත පිළිබඳව මාත් එක්ක තර්ක කරන්න එපා කියලායි. මොකද, මම ඒ පිළිබඳව පොත පතේ හරියට සඳහන් කරලා තිබෙනවා. දළ වශයෙන් ගත්තොත්, පසුගිය කාල පරිච්ඡේදය තුළ අපේ රටට ඩොලර් බිලියනයක් ඉක්මවන ණය නැති ඍජු ආයෝජන ලැබිලා නැහැ. ඍජු ආයෝජනවල කොටසක් ලෙස ආයෝජනයෙන් ලැබෙන ණය සලකනවා. ඒ දෙක පටලවා ගන්න එපා. අපි මේ කියන කරුණු ටික සද්භාවයෙන් කියන්නේ. මේ රටට පුළුල් පරිවර්තනයක් අවශ්‍යයි. අපේ රටේ BoI එක දීර්ඝ කාලයක් තිස්සේ තිබිලාත් ආයෝජන ඇවිල්ලා තිබෙන්නේ ඩොලර් බිලියනයකට අඩු ප්‍රමාණයක් නම්, අනෙක් රටවලට ඩොලර් බිලියන 20, 30, 40, 50 එනවා නම්, අපේ රටේ අපනයනාභිමුඛ ආර්ථිකයක් ඇති කරන්න නම්, නවීකරණ කෘෂි කර්මාන්තයක් යටතේ මේ කරන වැඩසටහන ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතේ තිබෙනවා කියන එක දේශපාලන පක්ෂ, පාට භේදයකින් තොරව අපි පිළිගන්න ඕනෑ. අලුත් තාක්ෂණය යටතේ හැම ගොවියෙක්ම මේ රටේ මහ පොළොව එලදායී ලෙස යොදා ගෙන, අපනයනය කළ හැකි භෝග වගා කර අපනයනය සඳහා වන ආර්ථික පරිවර්තනයකට යෑමට අදාළ දේවල් මෙහි තිබෙනවා. ඩිජිටල්කරණයට අදාළ දේවල් මෙහි තිබෙනවා. ඊළඟට, නිෂ්පාදනය වැඩි කරන්නට අදාළ ක්‍රමය තිබෙනවා. ඒ සියල්ල හැසිරවීම සඳහා ප්‍රධාන හිඟයන් දෙකේ ප්‍රශ්නයට උත්තර සොයා ගත යුතුව තිබෙනවා.

ප්‍රධාන හිඟයන් දෙක තමයි, රාජ්‍ය අය වැයේ ජංගම ගිණුමේ හිඟය සහ ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟය. ඒ දෙක නිසා තමයි රට බංකොලොත් වුණේ. මේ ගැන සරල චිත්‍ර මවන අය කියනවා, ඒක නිසා නොවෙයි, හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා බදු අඩු කළ නිසායි මේක වුණේ කියලා. මීට ඉස්සෙල්ලා 2001දී රට කඩා වැටුණු වෙලාවේත් ඒ ඍණ ආර්ථිකය අරගෙන, ඒක ධන බවට පත් කළේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වයෙන් තමයි. ඒ කාලයේ මුදල් අමාත්‍යාංශයේ ලේකම් ලෙස හිටපු චරිත රත්වත්ත, ආර්. පාස්කරලිංගම්, ෆයිස් මොහිදීන්, රෝස් කුරේ වැනි අයත් එක්ක මම නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා වශයෙන් ඉඳලා ඒ වැටුණු රට ගොඩ ගත්තා. ගරු තිස්ස අත්තනායක මන්ත්‍රීතුමාත් ඒ ගැන දන්නවා. එතකොට අපට කිව්වේ, කිසිවක් නොදන්නා අය කියලා; "ධන-ඍණ" කියලා. ඒ කාලයේ කාටූන් ශිල්පීන් හැම වෙලාවේම කාටූන්වල මාව ඇන්දේ, ධන-ඍණ දාලා. රටක් කඩාගෙන වැටුණාම, ගොඩ ගැනීම සාස්ත්‍රයක්, ක්‍රමයක්, ජාත්‍යන්තර සම්මතයක්. ඒ අනුව කටයුතු නොකර හිතේ අදහස් තිබුණාට අපට ඕනෑ විධියට මේ දේවල් වෙනස් කරන්න පුළුවන්කමක් නැහැ.

අනෙක් එක මෙයයි. ගරු විපක්ෂ නායකතුමා නොදැනුවත්ව හිටියාට, මේ වන විට අපි අවශ්‍ය අණපනත් සම්මත කරලා අවසන් වෙලා තිබෙන්නේ. උදාහරණයක් වශයෙන් මේ පාර්ලිමේන්තුව සම්මත කරලා තිබෙනවා, ආණ්ඩුව වෙනුවෙන් රාජ්‍ය ණය ගැනීම, නිකුත් කිරීම සහ රාජ්‍ය ණය සේවාකරණය සඳහා බලය ලබා දීම සහ ඇපකර නිකුත් කිරීම, උපණය දීම, සැපයුම්කරුගේ ණය ගිවිසුම් සහ මූල්‍ය කල්බදු ගිවිසුම් ඇති කර ගැනීම ඇතුළුව රාජ්‍ය ණය කළමනාකරණය කිරීම පිණිස වෙනම පනත් කෙටුම්පතක්. ඒ තමයි, රාජ්‍ය ණය කළමනාකරණ පනත.

ඉතින් කවුරු ආණ්ඩුව ගත්තත් මේකට අනුව තමයි රාජ්‍ය ණය කළමනාකරණය කරන්න වෙන්නේ. කවුරු ආණ්ඩුව ගත්තත් අද සම්මත වෙන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පතට අනුව තමයි මූල්‍ය කළමනාකරණය කරන්න වෙන්නේ. කවුරු ආණ්ඩුව ගත්තත් මේ ආර්ථික පරිවර්තන පනතට අනුව තමයි කටයුතු කරන්න වෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විනාඩියෙන් කථාව අවසන් කරනවා.

මට වෙන් වූ කාලය අවසන් නිසා මම වාර්තා දෙකක් සභාගත කරන්න කැමැතියි. පළමුවෙනි එක, "Sri Lanka's Economic Crisis and its Recovery Programme" by R. H. S. Samaratunga, Senior Economic Adviser to the President. දෙවෙනි එකත් එතුමාගේම වාර්තාවක් වන, "Policy Challenges/ Economic Transformation". මෙම වාර්තා දෙක මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මෙහෙම නොකර, මේ කියන පිස්සුව කළොත් අපි ඔක්කෝම උමතුසන් වරුසාවට අසු වුණා වාගේ වෙනවා.

"උමතුසන් වරුසාව එනවා - උමතුසන් වරුසාව එනවා
තෙමෙන අය ඒ මහා වැස්සට - සිහි විකල් වී පරල වෙනවා
පිස්සන් රජ උනත් එකයි - රජුන් පිස්සෝ උනත් එකයි
කාගේ ගෑනු කාට ගියත් - අපේ නමට ලැබෙයි ළමයි"

එහෙම තමයි එදා සෝමාපාල ගුණධීරයන් සඳහන් කළේ. ඒ නිසා පිස්සෝ විධියට ඉන්නේ නැතිව ප්‍රබුද්ධ පාර්ලිමේන්තුවක් හදා ගන්න. මේ පනත් කෙටුම්පතට විපක්ෂ වෙන කිසි කෙනෙකුට රටේ ආණ්ඩු කරන්න හැකියාවක් හෝ පළපුරුද්දක් හෝ කවදාවත් ඇති වෙන්නේ නැති බව සඳහන් කරමින්, සභර වසනා නාක් කල් ආණ්ඩුවක් කරන්න පුළුවන් වෙන්න නම් මේ පනත් කෙටුම්පත ඒකමතිකව සම්මත කරන්න උදව් කරන්න කියමින්, මගේ වචන කිහිපය මෙයින් සමාප්ත කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Amirthanathan Adaikkalanathan. You have six minutes.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[பி.ப. 11.26]

ගරු අමිර්තනාදන් අදෛක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் பொருளாதார நிலைமாற்றம் சட்டமூலம் சம்பந்தமான விவாதம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. எனினும், நான் அதற்கு அப்பாற் சென்று சில விடயங்களைப் பேசலாமென எண்ணுகின்றேன்.

எங்களுடைய தேசத்தில் யூலை மாதம் முழுவதும் கரிநாட்க ளாகவே அனுஷ்டிக்கப்படுகின்றது. காரணம், 1983ஆம் ஆண்டு இதுபோன்றதொரு மாதத்தில்தான் வெலிக்கடை சிறையில் எங்களுடைய தமிழீழ விடுதலை இயக்கத்தின் தலைவர்கள் படுகொலை செய்யப்பட்டார்கள். வன்முறை அல்லது இனவாதம் அல்லது இனவழிப்பு என்பது வெலிக்கடை சிறையில்தான் ஆரம்பித்தது. அந்த வகையில், 1983ஆம் ஆண்டு யூலை மாதம் 25ஆம் திகதி இதுபோன்ற ஒரு நாளில்தான் வெலிக்கடை சிறையில் படுகொலை ஆரம்பமானது. இன்றுவரை அந்தப் படுகொலை சம்பந்தமாக ஒரு விசாரணைகூட இடம்பெறவில்லை. அவர்களை எங்கு புதைத்தார்கள் என்று தெரியவில்லை. இது தொடர்பில் விசாரணை ஆரம்பிக்கப்பட்டதாகச் சொல்லப்பட்டது. ஆனால், இதுவரை பாதிக்கப்பட்டவர்களுக்கு நீதி பெற்றுக் கொடுக்கப் படவில்லை. இப்படுகொலையுடன் சம்பந்தப்பட்டவர்களைத் தண்டிக்கின்ற செயற்பாடுகூட, இன்றுவரை நடைபெறவில்லை என்பதை நான் இங்கு மிக மனவருத்தத்தோடு தெரிவிக்கின்றேன். 1983ஆம் ஆண்டில் நடைபெற்ற யூலை படுகொலையை விசாரிக்க வேண்டும் எனவும், படுகொலை செய்யப்பட்டவர்கள் எங்கே புதைக்கப்பட்டார்கள் என்பதைத் தெரிவிக்க வேண்டும் எனவும் நான் இந்த உயர் சபையில் அரசாங்கத்தைக் கேட்டுக் கொள்கின்றேன்.

1969ஆம் ஆண்டு தன்னுடைய 21 வயதில் தமிழீழ விடுதலை இயக்கத்தை ஆரம்பித்த தங்கத்துரை அவர்கள், 33 வயதில் கைதுசெய்யப்பட்டு, 35 வயதில் படுகொலை செய்யப்பட்டார். இது எவ்வளவு கோரமான ஒரு சம்பவமென்று பாருங்கள்! அப்பொழுது அவர் திருமணமானவராக இருந்தார். அவருக்கு கரிகாலன் என்ற ஒரு மகன் இருக்கிறார். கரிகாலன் இப்பொழுது லண்டனில் இருக்கிறார். 1981 சித்திரை 05, தங்கத்துரையும் குட்டிமணியும் கைதுசெய்யப்பட்டார்கள். இவர்களது கைதானது பருத்தித்துறை, மணற்காடு என்ற இடத்திலே இடம்பெற்றது.

எங்களுடைய தளபதியாக இருந்த தங்கத்துரை அவர்களுக்கு இணையாகச் செயற்பட்ட குட்டிமணி அண்ணன் அவர்கள், 1982.08.13 அன்று நீதிமன்றத்தில், "எனது கண்களை கண்பார்வையற்ற ஏழை இளைஞர்களுக்குக் கொடுங்கள்; அதன்மூலம் மலரப்போகும் தமிழீழத்தை நான் பார்ப்பேன்!" என்று சொன்னார். அதுமாத்திரமன்றி, தனது உடலை பல்கலைக்கழகத்துக்கு வழங்குமாறும் அவர் கோரியிருந்தார். 1983.02.24ஆம் திகதி நீதிமன்றத்தில் தங்கத்துரை அண்ணன் அவர்கள், "நாம் வன்முறைமீது தாகம் கொண்டவர்கள் அல்லர். மாறாக, நாங்கள் எங்களுடைய இனத்தின் விடுதலைக்காகவே இந்த வேட்கையைக் கொண்டிருந்தோம்" என்று கூறியிருந்தார். 1983 யூலை 25இல் தங்கத்துரை, குட்டிமணி உட்பட 35பேரும், 1983 யூலை 27இல் 18 பேருமாக மொத்தம் 53 பேர் படுகொலை செய்யப் பட்டார்கள். காடையர்களைச் சிறைக்குள் அனுப்பி, தன்னுடைய கண்களூடாக ஈழத்தைப் பார்ப்பேன் என நீதிமன்றத்தில் சொன்ன குட்டிமணியின் கண்களைத் தோண்டி எடுத்து, அவரை சித்திரவதை செய்து படுகொலை செய்தார்கள். அந்தச் சம்பவமானது, இதேபோன்ற ஒரு நாளில்தான் நடைபெற்றது. அவர்களுடைய கைதானது, பயங்கரவாதத் தடைச் சட்டத்தின் கீழ்தான் நடைபெற்றது என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டில் பல இடங்களில் படுகொலைகள் இடம்பெற்றன. எனினும், அவற்றால் பாதிக்கப்பட்டவர்களுக்கு இதுவரை நீதி கிடைக்கவில்லை. குறிப்பாக, 24.10.2000 அன்று பிந்துனு வெவ படுகொலை நடைபெற்றது. அதன்போது, 26 தமிழ் அரசியல் கைதிகள் படுகொலை செய்யப்பட்டார்கள். அதுபோல களுத்துறை சிறைச்சாலையிலும் படுகொலை நடைபெற்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up now.

ගරු අමිර්තනාදන් අදෛක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
Sir, please give me one more minute.

தமிழீழ விடுதலை இயக்கத்தின் தலைவர்கள் படுகொலை செய்யப்பட்டாலும், அவ்வியக்கம் இன்றைக்கும் எங்களுடைய மக்களின் இனப்பிரச்சினை மற்றும் ஏனைய பிரச்சினைகள் தொடர்பில் தொடர்ந்து குரல்கொடுத்து வருகின்றது என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

காலஞ்சென்ற எங்களுடைய தலைவர் சிறீ சபாரத்தினம் அண்ணா அவர்கள் 1973இல் கைதுசெய்யப்பட்டார். 1975இல் விடுதலை செய்யப்பட்ட அவர் அதே ஆண்டில் மீண்டும் கைதுசெய்யப்பட்டார். இதுதான் வரலாறு!

மேற்படி படுகொலைகள் சம்பந்தமாக விசாரணை செய்யப்பட்டு, பாதிக்கப்பட்டவர்களுக்கு நீதி கிடைத்ததா? படுகொலையைச் செய்தவர்கள் தண்டிக்கப்பட்டார்களா? மேலும், படுகொலை செய்யப்பட்டவர்கள் எங்கே புதைக்கப்பட்டார்கள்? என்பதை உரிய தரப்பினர் வெளிப்படுத்த வேண்டுமென நான் இந்தச் சபையில் வேண்டுகோள் விடுக்க விரும்புகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up now.

ගරු අමිර්තනාදන් අදෛක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
Give me one more minute.

அடுத்து, மன்னாரில் LRC காணி சம்பந்தமாகச் சில முறையற்ற செயற்பாடுகள் இடம்பெறுகின்றன. அந்தக் காணிகளை அங்குள்ள ஏழைக் குடும்பங்களுக்குப் பகிர்ந்தளிக்க வேண்டும். கொழும்பில் இருப்பவர்களுக்கு 14 ஏக்கர், 15 ஏக்கர் என காணி கொடுக்கப்படுகின்றது. இதை மறுபரிசீலனை செய்து, அங்கிருக்கின்ற விவசாயிகளுக்கும்

ஏழை மக்களுக்கும் அந்தக் காணிகளைப் பகிர்ந்துகொடுக்க வேண்டுமெனக் கேட்டு, வாய்ப்பளித்தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Anupa Pasqual. You have 13 minutes.

[පූ.භා. 11.34]

ගරු අනුප පස්කුවල් මහතා (සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுப பஸ்குவல் - சமூக வலுவூட்டுகை இராஜாங்க அமைச்சர்)
(The Hon. Anupa Pasqual - State Minister of Social Empowerment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සාකච්ඡා වන කරුණු තුළ මම තීරණය කළා, පසුගිය කාලය තුළ දීර්ඝ වශයෙන් කථා වුණු ප්‍රශ්නයකට විශේෂ අවධානයක් යොමු කරන්න. අපි දන්නවා, රණ විරුවන් පිළිබඳව දීර්ඝ කතිකාවක් පසුගිය කාලය තුළ රණ විරු දිනයට සාපේක්ෂව සිදු වුණු බව. රණ විරුවන් වෙනුවෙන් සියලු දේශපාලන පක්ෂ දීර්ඝ කතිකාවක් කළා. විරුද්ධ පක්ෂයෙන් රණ විරුවන්ට යුක්තිය ඉෂ්ට වුණේ නැහැ කියන එක කථා කළා. ආණ්ඩු පක්ෂයෙන් රණ විරුවන් අගය කිරීමකට ලක් කිරීමත්, ඔවුන් වෙනුවෙන් කටයුතු කරනවාය කියන එක පිළිබඳවත් දීර්ඝ සාකච්ඡාවක් සිද්ධ වුණා.

ඒ වාගේම මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා දෙමළ ඊලාම් ත්‍රස්තවාදය වීර ක්‍රියාවක් විධියට හුවා දක්වමින් ඔවුන්ගේ ජාතියට අසාධාරණයක් සිද්ධ වුණාය කියන එක පිළිබඳවත්, ඒ අය කෲර ඝාතනවලට ලක් වුණාය කියන එක පිළිබඳවත් දීර්ඝ විස්තරයක් කළා. අපි දන්නවා, දෙමළ ජනතාව විතරක් නොවෙයි, අනෙකුත් ජනතාවත් එල්ටිටීඊ ත්‍රස්තවාදයේ දැවැන්ත කෲර වධ හිංසනවලට ලක් වුණා, ඝාතනවලට ලක් වෙන්න සිදු වුණා කියා. අපේ දේශපාලනඥයන් එල්ටිටීඊ ත්‍රස්තවාදීන් මරා දැම්මා, ගම් දනව්වල කිරි දරුවන් ඝාතනය කළා, භික්ෂූන් වහන්සේලා ඝාතනය කළා. ඒ යුද්ධය නිසා දෙමළ, සිංහල, මුස්ලිම් සියලු ජනයා දැවැන්ත වධ බන්ධනවලට ලක් වුණා. අපට කියන්න බැහැ, දෙමළ ජනතාවට හානියක් සිද්ධ වුණේ නැහැ කියලා. මුළු රටටම හානියක් සිද්ධ වෙලා, ලේ ගංගාවක්, මහා බෙදවාචකයක් මැදින් එය අවසන් වුණා. එදා සොල්දාදුවන් අතිවිශාල සංඛ්‍යාවක් එල්ටිටීඊ වධකාගාර තුළ වධ බන්ධනවලට ලක් වුණා. ඒ වාගේම ඝාතනයට ලක් වෙලා මිහිදන් වුණා.

ඒ සියලු දේ මධ්‍යයේ තමයි රණ විරුවෝ ඉතා යුක්ති සහගතව, මානුෂිකව, හිංසා නොකර යුද්ධය අවසන් කළේ. යුද්ධයෙන් සියලු පාර්ශ්ව පාඩම් ඉගෙන ගත්තා. මේ හා සමාන යුද්ධයක්, කෲර වධ බන්ධනයක් මේ රටේ නැවතත් සිද්ධ විය යුතු නැහැ කියන එක සියලු පාර්ශ්වවලට පාඩමක් කියලා දුන්නා. ඒ ත්‍රස්තවාදය වීර ක්‍රියාවක් විධියට හුවා දැක්වීම තුළින් සිද්ධ වෙන්නේ, අනාගත පරපුරට නැවතත් ඒ කෲර වධ බන්ධනවලට ලක් වීම සඳහා අවශ්‍ය වටාපිටාවක් මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සකස් කරන එක විතරයි. අපි සියලුදෙනාට විනාශයක් සිද්ධ වුණා. ඒක පිළිගෙන එවන් තත්ත්වයක් යළි ඇති නොවීමට නම්, සාමකාමී පරිසරයක් ඇති කර ගැනීම විනා, ඡන්දය වෙනුවෙන් ජාතිවාදය පැතිරවීම දැඩි ලෙස අපි ප්‍රතික්ෂේප කළ යුතුයි.

ඒ වාගේම අපි දන්නවා, මේ මෑතක සිදු වූ සිද්ධියක්. ලෝකය තුළ නිදහස වෙනුවෙන් සටන් කළ රණ විරුවන්ට ඒ රාජ්‍යයන් විශේෂ වරප්‍රසාද ලබා දීලා තිබෙනවා. හොඳම උදාහරණය තමයි, බංග්ලාදේශයේ නිදහස වෙනුවෙන් -පාකිස්තානයෙන් මුදා ගැනීම සඳහා, පාකිස්තානයෙන් වෙන් වීමේ අරගළයේදී- ඒ කළ සටන මෙහෙයවපු බංග්ලාදේශ හමුදාවට විශේෂ වරප්‍රසාද ගණනාවක් ලබා දුන්නා. ඒ, ඒ වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කරපු හමුදාවක් හිටපු නිසා. රාජ්‍යය රැකියා දෙනකොට විශේෂිත වරප්‍රසාද ප්‍රමාණයක් ලබා දුන්නා, අවුරුදු 50ක්.

1971දියි ඒ සටන සිද්ධ වුණේ. ඊට විරුද්ධව සටනක් ඇති වුණේ 2024දී. අවුරුදු 50කට අධික කාලයක් තිස්සේ ඒ හමුදාවට, හමුදා නිලධාරීන්ගේ දරුවන්ට අවශ්‍ය වරප්‍රසාද ලබා දුන්නා. ඒ වාගේම තමයි චීනයේ විශ්‍රාමික හමුදා සොල්දාදුවන් වෙනුවෙන් වෙනම අමාත්‍යාංශයක් තිබෙනවා, ෂී ජින්පින් යටතේ. ඒ අමාත්‍යාංශයෙන් විශ්‍රාමික සොල්දාදුවන්ගේ සියලු දේ සොයා බැලීම විතරක් නොවෙයි, ඒ අය ව්‍යවසායකයෝ විධියට ඉදිරියට ගෙනැල්ලා රටට දැවැන්ත ශක්තියක් ලබා ගැනීම කටයුතු කරනවා. අදටත් ඒක ඉතාම හොඳින් ක්‍රියාත්මක වෙනවා. මෑතකදී චීනයේ විශ්‍රාමික සොල්දාදුවන් වෙනුවෙන් තිබෙන අමාත්‍යාංශයට අදාළ රාජ්‍ය ඇමතිවරයා අපේ ආරක්ෂක අමාත්‍යාංශයට ඇවිල්ලා අපේ රාජ්‍ය අමාත්‍යවරයා හමු වෙලා සාකච්ඡා කරලා, අවශ්‍ය දේවල් කරලා ගියා.

ලෝකය තුළ රට වෙනුවෙන් දිවි පිදූ, රටේ භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් දිවි පිදූ, නිදහස වෙනුවෙන් සටන් කළ සියලු සොල්දාදුවන්ට, රණ විරුවන්ට ගරු කිරීම, වරප්‍රසාද ලබා දීම ඉතිහාසය පුරා සිද්ධ වුණු දෙයක්. ඒක අමුතු දෙයක් නොවෙයි. ඒක කරන්නේ රටේ භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් අනාගතය ගැන හිතලා. ඒ දිවි පිදීම හැමෝම කරන්නේ නැහැ. ඒ සටන හැමෝටම කරන්න බැහැ. අපේ සොල්දාදුවෝ මරණය අතේ තියාගෙන සටනට ගියේ ජාතිවාදය වෙනුවෙන් නොවෙයි. සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජාතීන් බේරා ගැනීම සඳහා, කුරිරු ත්‍රස්තවාදයෙන් රට මුදා ගැනීම සඳහා තමයි ඒ අය සටනට ගියේ. ඒ සොල්දාදුවන්ගෙන් කොටසක් මැරුණා. සමහර අයගේ ජීවිත බේරුණාට තමන් ළඟින් ඉඳපු සොල්දාදුවා මැරිලා වැටුණා. තවත් සොල්දාදුවන්ගේ අත පය නැති වුණා. අදටත් සමහර සොල්දාදුවෝ උඩුබැලි අතට ඉන්නවා. ඒ අය හොඳින් ජීවත් වුණත්, ආබාධිත වුණත් මරණයේ බෝනස් එක සමඟ තමයි කටයුතු කළේ. ඒ අය වෙනුවෙන් යුක්තිය ඉෂ්ට වෙන්න ඕනෑ.

අද රුසියාවට යන්න සිද්ධ වෙලා තිබෙන්නේ තරුණ සොල්දාදුවන්ට. අවුරුදු 40දී තමයි සොල්දාදුවකු විශ්‍රාම ගැන්වෙන්නේ. අවුරුදු 18දී හමුදාවකට බැඳුණොත්, අවුරුදු 40 - 45 දක්වා කාලය තුළදී විශ්‍රාම ගැන්වෙනවා. තරුණ, ශක්තිමත් ඒ අය වෙනුවෙන් කිසිදු විශේෂිත ක්‍රමයක් අද වෙනකම් සකස් වෙලා නැහැ. අපි රාජ්‍ය පරිපාලනයේ අයට විශේෂ වරප්‍රසාද ලබා දුන්නා. ඒ වාගේම සෞඛ්‍ය සේවයේ වෛද්‍යවරුන්ට විශේෂ වරප්‍රසාද ලබා දුන්නා.

ඒ වාගේම මුළු ජීවිතයම පරදුවට තබමින් තරුණ කාලය යුද්ධය වෙනුවෙන් කැප කරපු රණ විරුවන් වෙනුවෙනුත් අපි යමක් කළ යුතුයි. අවුරුදු 30ක් තමන්ගේ ජීවිතය යුද්ධය වෙනුවෙන් කැප කරමින්, තරුණ කාලයේ බිරිඳ සමඟ කාලය ගත නොකරපු, යුද පිටියේ හිටපු එම සොල්දාදුවන් වෙනුවෙන් අපි විශේෂිත දෙයක් කළ යුතුයි. එම සොල්දාදුවෝ, විශ්‍රාමිකයෝ මා නිරන්තරයෙන්ම හමු වුණා; අපි සාකච්ඡා කළා. ඒ අනුව අපි ඉදිරිපත් කරනවා විශේෂිත යෝජනා ගණනාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර 30ක් යුද්ධය පැවතුණා. ඒ උදාරතර මෙහෙයුමේදී තරුණයන් 30,000කගේ ජීවිත පූජා කළා. ඒක සුළුපටු දෙයක් නොවෙයි. ගෞතම බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසුව සත් සතිය ගත කිරීමේදී

[ගරු අනුප පස්කුවල් මහතා]

උන්වහන්සේට බුදු වීමට උපකාර කළ බෝ රුක දිහා ඇසිපිය නොහෙලා බලා සිටිමින් සතියක් ගත කළා. සතියක් බෝ රුක දිහා බලාගෙන සිටිමින් කෘත ගුණ සැලකුවා. ඒ වාගේම අපිත් ඒ සොල්දාදුවන්ට අනිවාර්යයෙන්ම කෘත ගුණ සලකන්න ඕනෑ. යුද්ධයේදී සොල්දාදුවන් 30,000ක් ජීවිත පරිත්‍යාග කළා. 50,000ක් ආබාධිත තත්ත්වයට පත් වුණා. 120,000ක් ඒ යුද්ධයේ යෙදී සිටියා. අද විශ්‍රාමික සොල්දාදුවෝ 200,000ක් පමණ ඉන්නවා. ඒ වෙනුවෙන් සුවිශේෂී යෝජනා ගණනාවක් මට ඉදිරිපත් වුණා. මම ඒවා යෝජනා විධියට ඉදිරිපත් කරනවා. අද දවසේ එය ඉතා වැදගත්. මොකද, එම විශ්‍රාමික බලකාය - 200,000ක් වන එම පිරිස- දිනෙන් දින වැඩි වනවා. අවුරුදු 40 හා 45 වයසේ පසුවන ඒ පිරිස අපි ශක්තිමත් බලයක් විධියට රටේ සංවර්ධනයට යොදා ගත යුතුයි. එය අපතේ යන බලයක් බවට පත් නොකළ යුතුයි.

පළමු යෝජනාව විධියට, 2009 මැයි මස 18 දිනට පෙර ත්‍රිවිධ හමුදාවට සහ පොලිස් සේවයට බැඳී කුරිරු ත්‍රස්තවාදීන් විනාශ කර රටට සාමය උදාකර දුන් උදාරතර කැප කිරීමට කරනු ලබන ගෞරවයක් ලෙස මේ වන විට විශ්‍රාමිකව සිටින සහ ඉහත දිනට පෙර සේවයට එක්වී නුදුරේදී විශ්‍රාම ගැනීමට සිටින සියලු රණ විරුවන් වෙනුවෙන් රුපියල් 10,000ක විශේෂ දීමනාවක් ලබා දීමට කටයුතු කිරීම සුදුසුයි කියා මම ගරු සභාවට යෝජනා කරනවා.

ඊළඟට, 2009 මැයි මස 18 දිනට පෙර ත්‍රිවිධ හමුදාවට සහ පොලිස් සේවයට බැඳී සක්‍රිය සේවයේ යෙදුණු ත්‍රිවිධ හමුදා සහ පොලිස් විරුවන් හට රජයේ ආයතනයකට ගොස් තම සේවා ප්‍රමාදයකින් තොරව ඉටු කර ගැනීම සඳහා විශේෂ වරප්‍රසාද හැඳුනුම්පතක් නිකුත් කිරීම සුදුසු යැයි මම යෝජනා කරනවා.

ඊළඟට, 2009 මැයි මස 18 දිනට පෙර ත්‍රිවිධ හමුදාවට සහ පොලිස් සේවයට බැඳී සක්‍රිය සේවයේ යෙදුණු ත්‍රිවිධ හමුදා විරුවන් විශ්‍රාම ගිය පසු රජයේ බැංකුවලින් සහන පොලී අනුපාත මත ව්‍යාපාරික ණයක් ලබාගෙන හොඳ ව්‍යවසායකයෙකු බවට පත් වීමට අවස්ථාව ලබා දිය යුතු යැයි මම යෝජනා කරනවා.

ඒ වාගේම, 2009 මැයි 18 දිනට පෙර ත්‍රිවිධ හමුදාවට සහ පොලිස් සේවයට බැඳී කුරිරු ත්‍රස්තවාදීන් විනාශ කර රටට සාමය උදා කර දුන් ත්‍රිවිධ හමුදා සහ පොලිස් විරුවන්ගේ දරුවන් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන අවස්ථාවලදී මහපොළ ශිෂ්‍යත්වය ලබා දීම සුදුසු යැයි මම යෝජනා කරනවා.

ඊළඟට, 2009 මැයි මස 18 දිනට පෙර යුද, ගුවන් හා නාවික හමුදාවට සහ පොලිස් සේවයට බැඳිලා මේ වන විට විශ්‍රාම ගොස් සිටින සියලු නිලධාරීන් හා සෙසු නිලයන්ගෙන් සමන්විත පිරිසකට සියලු ඒකක නියෝජනය වන පරිදි, සෑම කෙනෙකුටම අවම වශයෙන් එක් අවස්ථාවක් බැගින් හිමි වන අයුරින් ජාතික නිදහස් දින උත්සව පෙළපාළියට කණ්ඩායමක් වශයෙන් සහභාගි වීමට අවස්ථාව ලබා දෙන ලෙස මම ගරු සභාවට යෝජනා කර සිටිනවා.

අවසාන වශයෙන් කෘෂි ව්‍යාපාරික ක්ෂේත්‍රයේ කටයුතු කරන සහ වගා සංග්‍රාමයේ හවුල්කරුවකු වශයෙන් රටේ සංවර්ධන ක්‍රියාවලියට එක් වන්නට අවස්ථාවක් ලබා දීම සඳහා අවශ්‍ය අයහට බදු ක්‍රමයට අක්කර 05ක උපරිමයකට යටත්ව රජයේ ඉඩම් ලබා දීම සුදුසු යැයි මම යෝජනා කරනවා.

ඒ වාගේම විශ්‍රාමික හමුදා රණ විරුවන් වෙනුවෙන්ම ජනාධිපතිතුමාගේ යටතේ වෙනම අමාත්‍යාංශයක් ස්ථාපනය කිරීම සඳහා කටයුතු කරන්න කියා මම යෝජනා කර සිටිනවා.

අපේ හමුදාව සටන් කළේ සිංහල ජනතාව වෙනුවෙන් පමණක් නොවෙයි, දෙමළ ජනතාව වෙනුවෙන් පමණක් නොවෙයි, මුස්ලිම් ජනතාව වෙනුවෙන් පමණක් නොවෙයි. ඒ සමස්ත රට වෙනුවෙන්, රටේ නිදහස වෙනුවෙන්, කුරිරු ත්‍රස්තවාදයට එරෙහිව කටයුතු කරපු, යුක්ති ධර්මය වෙනුවෙන් සටන් කරපු හමුදාවක්. එම නිසා සියලුදෙනා එක්වී මේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන ලෙස මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. (Dr.) Harsha de Silva. You have 13 minutes.

[පූ.භා. 11.47]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 15ක් විතර ඕනෑ වෙයි. මම ඒ බව දැනුම් දෙන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කලින් කථා කළ රාජ්‍ය ඇමතිතුමා අද තිබෙන subject එක ගැන නොවෙයි කථා කළේ. එතුමා රණ විරුවන් ගැන කථාවක් කළේ. මා හිතන්නේ, එතුමාගේ ඔළුව කැරකිලා වෙන්න ඇති. මොකද, අපි "දිවිදෙන රණවිරු" කියලා වැඩසටහනක් හිටපු යුද්ධ හමුදාපති ජෙනරාල් මහේෂ් සේනානායක මැතිතුමා යටතේ හදලා තිබෙනවා නේ. එම "දිවිදෙන රණවිරු" වැඩසටහන යටතේ අපි මේ දවස්වල රටේ හැම තැනම සිටින විශ්‍රාමික රණ විරුවන් ගැන සාකච්ඡා කරනවා. ඒ නිසා ඡන්දය කිට්ටු වෙලා ඒ සම්බන්ධයෙන් දඟලන්න අවශ්‍යතාවක් නැහැ. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න ඉඩ දෙන්න. අපි එතුමාට disturb කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපට මතවාදී ගැටලුවක් නැහැ. ඉස්සෙල්ලාම ඒ කාරණය කියන්න ඕනෑ. සත්‍ය වශයෙන් මේ වාගේ නීති ගේන්න තිබුණේ මීට කලින්. මේ වාගේ නීති තිබුණා නම් එතුමා නියෝජනය කරන ආණ්ඩුව අර කියපු අමනෝඥ තීරණ ගන්නේ නැහැ; රට බංකොලොත් වෙන්නේත් නැහැ. ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා මේ පිළිබඳව දීර්ඝව කථා කරපු නිසා මම ඒ ගැන කථා කරන්නේ නැහැ. කරුණාකර තේරුම් ගන්න, සමඟි ජන බලවේගය මේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පතට විරුද්ධ නැති බව. අපි ඒකට පක්ෂයි. ඉතින් කවුරු කවුරුත් තේරුම් ගන්න, අපි විපක්ෂයේ හිටපු පළියට හැම දෙයටම විරුද්ධ වෙන්නේ නැති බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, මේක ඇතුළේ ගැටලු කිහිපයක් තිබෙනවා. ඒ එක ගැටලුවක් කියන්නම්. කලිනුත් තිබුණා, Fiscal Management (Responsibility) Act කියලා එකක්. ඒකේත් නොයෙකුත් targets දීලා තිබුණා. උදාහරණයක් හැටියට ගන්න පුළුවන්, Budget deficit එක සියයට 5ක් තිබෙන්න ඕනෑ, ණය සියයට 60කට වඩා තිබෙන්න බැහැ යනාදිය. පසුගිය Budget එක ඉදිරිපත් කරනකොට අපි මූලික විරෝධයක් පෑවා. අපි කිව්වා, "මේ Budget එක ඉදිරිපත් කරන්න බැහැ. මොකද, මේක නීත්‍යානුකූල නැහැ. දැනට තිබෙන නීතිය

උල්ලංඝනය කරලා තමයි මේ කටයුත්ත කරන්නේ" කියා. ඒ වෙලාවේ මුදල් ඇමතිවරයා වෙනුවෙන් කථා කළ රාජ්‍ය ඇමතිවරයා කිව්වා, "නැහැ, අපි අලුත් පනත් කෙටුම්පතක් ගේනවා. ඒ පනතේ අලුත් නීති යටතට මේවා එනවා. එතකොට නීත්‍යානුකූල වෙනවා" කියලා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවාසනාවකට මේ පනත් කෙටුම්පතේ කිසිම වග වීමක් ඇතුළත් කරලා නැහැ. FMRA එක කඩ කළා නම්, මේක කඩ කරන්නත් පුළුවන්. අපි මූලික වශයෙන් මේකට එකඟ වුණත් ආණ්ඩු පක්ෂයෙන් අපි ඉල්ලා සිටිනවා, කරුණාකර Committee Stage එකේදී හෝ වගවීම සම්බන්ධයෙන් මේ පනත් කෙටුම්පතට නීතිමය තත්ත්වයක් ගේන්න කියලා.

මේ පනත් කෙටුම්පතේ නොයෙකුත් තාක්ෂණික කාරණා තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් දීර්ඝව කථා කරන්නේ නැහැ. ඒ, සමස්තයක් ලෙස මෙය කළ යුතුයි කියා අප පිළිගන්නා නිසා. නමුත්, එක වැදගත් කාරණාවක් මම ඔබතුමාට ඉදිරිපත් කරන්න කැමතියි. මට ජේනවා, නිලධාරි මහත්ම මහත්මීන් දැන් නිලධාරි මැදිරියේ සිටින බව. නැවතත් අහගන්න, අපේ ගැටලුව මොකක්ද කියලා. මේ පනත් කෙටුම්පතේ 13වැනි පිටුවේ 15 (1) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "ආණ්ඩුවේ ප්‍රාථමික වියදම් අදාළ මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත නාමික දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට දහතුනක ප්‍රතිශතයක් නොඉක්මවිය යුතු ය"

මේ කියන්නේ, primary expenditure එක සියයට 13ක් වෙන්න ඕනෑ කියලායි. මේ ලෝකයේ රටවල් 200ක් විතර තිබෙනවා. ඒ කිසිම රටක මෙහෙම target එකක්, සීමාවක් දාලා නැහැ. ඒ රටවල් 200න් රටවල් 10ක විතරයි යම්කිසි විධියකට ප්‍රාථමික වියදම්වලට limit එකක් තිබෙන්නේ. ඒ රටවල් 10නුත් අඩුම limit එක තිබෙන්නේ සියයට විසි ගණනක්. මේ සම්බන්ධයෙන් Verité Research ආයතනය කරපු වාර්තාව මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

අපට අවශ්‍ය වන්නේ වියදම් පාලනය කරන්න නම් - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ආර්ථික විද්‍යාව ගැන ගොඩක් කථා කරන කෙනෙක් - ඒක ආදායමට සාපේක්ෂ වෙන්න ඕනෑ. ආදායමට සාපේක්ෂ limit එකක් Economic Transformation Bill එකේ තිබෙනවා. හැබැයි, ඒක සම්පූර්ණයෙන් conflict වෙනවා, Public Financial Management Bill එකත් සමඟ. මොකද, Public Financial Management Bill එකේ තිබෙනවා, ආදායමට සාපේක්ෂ නොවන primary expenditure limit එකක්. Primary balance එකක් ගැන මෙතැන කථා කරනවා; expenditure limit එකක් ගැන අතැන කථා කරනවා. මේ දෙකේ පරස්පරයක් තිබෙනවා. ඒ නිසා අපි සද්භාවයෙන් කියන්නේ, කරුණාකර එක්කෝ Public Financial Management Bill එක වෙනස් කරන්න, එහෙම නැත්නම් Economic Transformation Bill එක වෙනස් කරන්න කියලායි. මොකද, එළ හරකායි, මී හරකායි වාගේ වැඩක් තමයි මෙතැන වෙලා තිබෙන්නේ.

අනෙක් කාරණය මේකයි. අපේ රට වාගේ සංවර්ධනය වන රටක primary balance එක ගැන අපේ අවධානය යොමු කළ යුතු නොයෙකුත් කාරණා තිබෙනවා. ඒ නිසා නිලධාරින්ට සහ ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමාට -එතුමාත් මෙැනැන ඉන්නවා- මේ ගැන සාකච්ඡා කරන්න පුළුවන්.

ඊළඟට, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත ගැන කථා කරනකොට අපි කියන්න ඕනෑ, අපේ රට වර්තමානයේ පූර්ණ ආර්ථික ප්‍රතිසංස්කරණයකට යොමු විය යුතුයි කියන තැන අප සිටින බව. එහි තර්කයක් නැහැ. අපි "රැ දනියෙල් දවල් මිගෙල් වාගේ" නැහැ. අපට කියන්න තිබෙන දේ අපි කෙළින්ම කියනවා. අපි හැංගි හොරා නොවෙයි කටයුතු කරන්නේ. අපට අවශ්‍ය වන්නේ ජනතාව බලාපොරොත්තු වන වෙනසක් මිස, IMF එකට හෝ වෙනත් කාට හෝ දත්ත ටිකක් පෙන්වන එක නොවෙයි.

"ආරංචිය සුබද" කියලා දැන් ඇහුවාම, මිනිස්සු අපට කුණුහරුපෙන් බණිනවා, "කොහේද මන්ත්‍රීතුමා, ආරංචිය සුබ වෙන්නේ, බලන්නකෝ, අපට ජීවත් වෙන්න බැහැ" කියලා. දරිද්‍රතාව තිබුණේ පවුල් ලක්ෂ 30කට. මේ ගොල්ලන් දරිද්‍රතාව පවුල් ලක්ෂ 70කට ගෙනිච්චා. ගෝඨාභය රාජපක්ෂ කියන පුද්ගලයා මේ රට අවුරුදු 9කින් පස්සට ගෙනිච්චා. ගිය අවුරුද්දේ ඒක පුද්ගල ආදායම 2014 ඒක පුද්ගල ආදායමට සමානයි. අපට මෙතැන මහා ලොකුවට පම්පෝරි ගහන මිනිස්සු කළේ ඒකයි. නමුත්, දැන් අපට කියනවා, අපි වගකීම ගත්තේ නැහැ වාගේ අනම්මනම්. අලි සබරි ඇමතිවරයා කියනවා මම අහගෙනයි, "මේක කරන්න බැහැ" කියලා මම එතුමාට call එකක් දීලා කිව්වා කියගෙ. හැබැයි, එතැනදීම එතුමා කියනවා, "නොකියා කිව්වා" කියලා. නොකියා කිව්වා කියන්නේ මොකක්ද? එක්කෝ "කිව්වා" වෙන්න ඕනෑ; එහෙම නැත්නම් "නොකිව්වා" වෙන්න ඕනෑ. එතුමාට කියන්න බැහැ නේ, "නොකියා කිව්වා" කියලා. එතුමා කොහොමද උපකල්පනය කරන්නේ, මගේ හිතේ තිබිච්ච එක? අපි කිව්වේ, මේක අමාරු බව තමයි. මොකද, ඔබතුමන්ලා මේක කාබාසිනියා කරලා, කුඩු පට්ටන් කරලා, විනාශ කරලායි තිබුණේ. ඒක තමයි අපි කිව්වේ. *[බාධා කිරීමක්]* හරිද? අපි කොයි වෙලාවකවත් පැනලා ගියේ නැහැ.

මෙතැන ඉන්න කබීර් හෂීම්, මම, ඉරාන් වික්‍රමරත්න, සහ රංජිත් මද්දුම බණ්ඩාර තමයි ගියේ එදා ගෝඨාභය රාජපක්ෂ හම්බ වෙන්න. එතැන හිටියේ රමේෂ් පතිරණයි, නාලක ගොඩහේවායි. අහලා බලන්න. නීතිඥ සංගමය ඉදිරිපත් කරපු කොන්දේසි ටික තමයි අපි එදා ඉදිරිපත් කළේ. මොනවාද ඒවායේ කිව්වේ? දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යළි ඇති කරන පනත් කෙටුම්පත එන සතියේ ගෙනෙනවා කිව්වා. ඊට පස්සේ ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කිව්වා. ඒක තමයි system change කිව්වේ. ඊට පස්සේ කිව්වා, කවදාද ජනාධිපති ධුරයෙන් යන්නේ කියලා. ඒවා ගැන තමයි කථා කළේ. ඊට පස්සේ කිව්වා, වහාම - හැකි ඉක්මනින්- ඡන්දයක් තියන්න ඕනෑ කියලා. එහෙම නැතුව වෙනත් පුද්ගලික කොන්දේසි ගැන කථා කළේ නැහැ. *[බාධා කිරීමක්]* එතැන හිටපු පුද්ගලයන්ගෙන් ඒ ගැන අහන්න. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගෙන් ඒ ගැන අහන්න. අපට blame කරන්න එපා. අපි නොවෙයි මේ ප්‍රශ්න ඔබතුමන්ලායි නිර්මාණය කළේ.

රටේ මිනිසුන්ට අවශ්‍ය වෙලා තිබෙන්නේ inclusive growth සහ shared prosperity. ඒ නිසා එක වර අපි කොහොමද මේ රට ගොඩ ගන්නේ කියන එක පිළිබඳ සුබ ආරංචියක් තමයි මිනිසුන් බලාපොරොත්තු වන්නේ.

අපි පිළිගන්නවා, අපේ රට අප වඩාත් ඵලදායිතාවෙන් යුතු ගතික යන්ත්‍රණයක් බවට පත් කර ගන්න ඕනෑ කියා. ඒ කියන්නේ, highly competitive and dynamic economy එකක් බවට. ඒ ගැන අපේ කිසිම විරුද්ධතාවක් නැහැ, ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යතුමා. අපි විරුද්ධ නැහැ. හැබැයි, එහෙම කරන්න නම් ඔය කියන සියයට 5 වාර්ෂික ආර්ථික වර්ධන අනුපාතයෙන් බැහැ. ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මෙහි හිටියේ නැති වෙලාවේ ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කිව්වා,

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

2048 වන විට අපේ රට සංවර්ධිත රටක් වෙන්න නම් ආර්ථික වර්ධන අනුපාතය වාර්ෂිකව සියයට 5කට හෝ ඊට වැඩියෙන් පවත්වාගෙන යන්න ඕනෑ කියලා. නමුත් අපි එතැන නැහැ.

මම කියන්නේ මේකයි. අපට සමාවෙන්න, මේ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතට අපට පක්ෂ වෙන්න බැහැ. ඒකට හේතුව මා කියන්නම්. ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමනි, මම කිව්වා, අපි කලින් එකට නම් පක්ෂයි කියලා. ඒ ගැන කියපු වෙලාවේ ඔබතුමා මෙතැන හිටියේ නැහැ. මේ පනත් කෙටුම්පතට පක්ෂ වෙන්න බැරි හේතුව මම කියන්නම්. ඒ හේතුව තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන Chapter I එක. මේ Chapter I එකේ මොකක්ද කරන්නේ? මේ Chapter I එකේ කරන්නේ, IMF එකත් එක්ක ඇති කරගත් Agreement ඒකේ targets ටික නීතියක් කරන එක. ඒක අසාධාරණයි නේ. ඒක අසාධාරණයි. මොකද, ඡන්දෙට තවත් මාස දෙකයි තිබෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, ඊළඟ රජය පිහිටුවන්න. එහෙම වුණාම, ඡන්දයට මාස දෙකක් තිබියදී ඔබතුමන්ලා ගෙනෙන නීතිය පිළිගන්න හැකියාවක් අපට නැහැ. ඒ ඇයි කියලා අපට තර්කානුකූලව ඔප්පු කරන්න පුළුවන්. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ Peter Breuer එක්ක දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා කිව්වා, මෙන්න මේ මේ දේවල් වෙනස් කරන්න ඕනෑ කියලා. *[බාධා කිරීම්]* අනෙක් අතට, මේක සාදාචාරසම්පන්න නැහැ නේ. නීත්‍යානුකූල වෙන්න පුළුවන්. නමුත් සදාචාර නැහැ. This is immoral. මොකද, ජනාධිපතිවරණයට තව මාස දෙකයි තිබෙන්නේ.

IMF එක නායකතුමා සහ අපි දෙතුන්-දෙනා අතර දීර්ඝ සාකච්ඡාවක් ඉල්ලා තිබෙනවා. අපි ඔවුන්ට වෙලාව දීලා තිබෙනවා. පැය ගණනක් ඕනෑය කියලා කිව්වා. හරි, අපි පැය ගණනම දෙනවා. මොකද, අපි IMF එකට විරුද්ධව ඡන්දය දුන්නේ නැහැ. කෙසේ කිව්වත්, අපි විරුද්ධව ඡන්දය දුන්නේ නැහැ. මොකද, ඒ අවස්ථාවේ රජයට අවශ්‍ය වුණා, IMF එකත් එක්ක යන්න. හැබැයි, අපි එම ගිවිසුමේ අන්තර්ගත සියලු කාරණාවලට එකඟ වුණේ නැහැ. එතැන තමයි මේ වෙනස කරන්න වෙන්නේ. මට වෙලාව නැහැ, දීර්ඝව ඒ ගැන සාකච්ඡා කරන්න. නමුත් එක උදාහරණයක් ගනිමු කෝ. කරුණාකරලා note කර ගන්න, අපි මේ පනතට විරුද්ධයි කියන කාරණය. එක උදාහරණයක් තමයි මම කලින් කියපු ගැටුමට එහා ගිය ඉහළ තරගකාරිත්වයක් තිබෙන ගතික ආර්ථිකයක් නිර්මාණය කරලා සංවර්ධිත රටක් වෙන්න නම් - ඔයගොල්ලන් කියනවා, 2048 මේක කරන්න පුළුවන් කියලා - දැන් කොහොමද, සියයට පහේ කථාව ආවේ? මේ සියයට පහේ කථාව ආවේ මෙහෙමයි. කලින් හිතුවා, 2048 වෙනකොට ඩොලර් 19,000ගණනකට අපේ රටේ ඒක පුද්ගල ආදායම ගෙනෙන්න පුළුවන් නම්, අන්න අපි සංවර්ධිත රටක් කියලා. මිනිස්සු හැම දාම කියන්නේ මේක නේ. අපි ඉපදෙනකොටත් රට සංවර්ධනය වෙනවා, අපි තරුණ කාලයේත් සංවර්ධනය වෙනවා, මැරෙනකොටත් සංවර්ධනය වෙනවා, එහෙම නම් කවදාද රට සංවර්ධිත වෙන්නේ කියන එකයි මිනිස්සු අහන්නේ. ඒක තමයි අපේ objective එක. ඒක තමයි අපේ aim එක. ඒක තමයි අපේ goal එක.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only two more minutes.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Chief Opposition Whip, could I have a few more minutes?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාට තව වේලාව ලබා දෙන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හැබැයි, ජූනි මාසයේ අලුත් කාරණා දෙකක් ඉදිරිපත් වුණා. එක කාරණාවක් තමයි, 2048 වෙනකොට සංවර්ධිත රටක් වෙන්න නම්, ඩොලර් 19,000න් ඒක කරන්න බැහැ කියන එක. එහෙම නම් ඒක පුද්ගල ආදායම ඩොලර් 22,300ක් වෙන්න ඕනෑ. තවත් කාරණයක් IMF එක ඉදිරිපත් කළා, ලංකාව සම්බන්ධයෙන්. ඒ කියන්නේ 2024 ආර්ථික වර්ධන වේගය සියයට දෙකයි, 2025දී සියයට 2.7යි, 2026දී සියයට 3යි, 2027දී සියයට 3.1යි, 2028ත් සියයට 3.1යි, 2029ත් සියයට 3.1යි කියලා. එතකොට 2030 ඉඳලා තමයි එහෙම නම් මේ කරන්න වෙන විපර්යාසය කරන්න වෙන්නේ. අපි මේකට විරුද්ධයි. අපි භාර ගන්නේ නැහැ, අපට 2029 වෙනකම් සියයට 3.1ට ගාටන්න වෙන එක.

ඒ ඇයි කියලා මම කියන්නම්. මේ IMF Agreement එක තිබෙන්නේ ආර්ථිකය ස්ථාවර කරන්න. අපේ නායකතුමාත්, අපිත් දිගටම කිව්වේ මේක මදි කියන එකයි. අපිට අවශ්‍ය වෙන්නේ ආර්ථිකය ප්‍රසාරණය කරන්නයි. අපිට අවශ්‍ය වෙන්නේ ආර්ථිකය වර්ධනය කරන්නයි. එහෙම නම් ඇයි මේ ආර්ථික ස්ථාවරකරණ targetsවලට අපි එකඟ වෙන්නේ? ඇයි, එහෙම කරන්නේ? සියයට 3.1ද බලාපොරොත්තුව 2030 වෙනකම්?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියයට 5 ගණනේ වර්ධනය වුණොත් 2075දී අපේ රටේ ඒක පුද්ගල ආදායම ඩොලර් 39,000ක් වෙනවා. එතකොට 2075දී සංවර්ධිත රටක් වෙන්න නම්, ඩොලර් 38,350ක් ඕනෑ. එහෙම නම් 2075 වෙනකම් ගාටන්න කියලායි මේගොල්ලන් කියන්නේ. එහෙම නැත්නම් සියයට 7 වර්ධනය වුණොත් 2057දී අපට ඔය ඉලක්කයට එන්න පුළුවන්. නමුත් අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ, 2057 වෙනකම් ගාටන්න. අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ, එච්චර හෙමින් මේ රට ඉස්සරහට අරගෙන යන්න. We are looking for a structural shift in the growth path. සියයට 2ට, 3ට නොවෙයි, අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 10ට වැඩි වෙන්න ඕනෑ. අපි 2025දී සියයට 4යි, 2026-2027 තුළ සියයට 5යි කියලා ගත්තොත්, IMF Programme එක ඉවර වෙනකොට, එදා ඉඳලා සියයට 10 ගණනේ හැම අවුරුද්දේම වර්ධනය වුණොත්, 2046 වෙනකොට අලුත් දත්තවලට අනුව අපේ රටේ ඒක පුද්ගල ආදායම ඩොලර් 21,870ක් විතර කරන්න පුළුවන්. එහෙම කරන්න නම් අපි මේවාට හිර කරන්න එපා. අපේ රට ගොඩගන්න නම්, අපේ මිනිස්සුන්ගේ සුබ ආරංචිය ඇත්ත වශයෙන්ම යථාර්ථයක් කරන්න නම්, කරුණාකරලා අපට ඉඩ දෙන්න ඒක කරන්න. අපට ඉඩ දෙන්න, ආයෝජන ගෙනෙන්න.

අනෙක් පැත්තෙන් Current Account balance එකට දීලා තිබෙනවා, target එකක්. Current Account balance එක කියන්නේ මොකක්ද? Current Account balance එක කියන්නේ investments සහ savings අතර තිබෙන වෙනස. එච්චරයි. අපේ රටේ තිබෙන ඉතිරි කිරීම් මදි අපට අවශ්‍ය ආයෝජනය කරන්න, අපේ රටේ ආර්ථිකය සියයට 10කට වර්ධනය කරන්න. Current Account deficit එක සියයට එක තුළ අප හිර කළොත් අපට 2075 වෙනකොටවත් මෙතැනට එන්න බැහැ. කරුණාකරලා තේරුම් ගන්න, අපට අවශ්‍යයි ආයෝජන.

ඒ ආයෝජන ගෙනෙන එක හිර කරනවා, මේ පනත් කෙටුම්පතෙන්. ඒ නිසායි අපි මේකට විරුද්ධ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, එහෙම නැතුව මේ සංකල්පයට නොවෙයි. මේ හිර කිරීමට අපි විරුද්ධයි. අවසාන වශයෙන් මේ කාරණය මම කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සියයට 10ක ආර්ථික-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තව විනාඩියක් පමණක් ගන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම තව විනාඩි දෙකකින් මගේ කථාව නවත්වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ විරුද්ධතාව මේක ස්ථාවර කිරීමට- අප හිර කරන්න එපා. සංකෝචනය වෙච්ච ආර්ථිකය ප්‍රසාරණය කරන්න ඊළඟට ඡන්දෙකින් පත් වෙන රජයට අවශ්‍ය පහසුකම, ඉඩ ලබා දෙන්න.

මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. මැතිවරණයට දින තීරණය කරන්න තව දින කිහිපයයි තිබෙන්නේ. අද හැන්දෑව වෙන්න පුළුවන්, හෙට වෙන්න පුළුවන් ඡන්දය පැවැත්වෙන දිනය නිවේදනය කරන්නේ. ජනතාවට අදහස් තිබෙනවා, නොයෙකුත් විකල්ප තිබෙනවා. මේ පනත් කෙටුම්පතට විරුද්ධව අපේ විජිත හේරත් මන්ත්‍රීතුමා -අපේ මිත්‍රයා- ඔවුන්ගේ පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරපු පෙත්සම මම **සභාගත*** කරනවා.

ඒක ගරු සුනිල් හඳුන්නෙත්ති හිටපු මන්ත්‍රීතුමා සහ ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමා තමයි ගොනු කරලා තිබෙන්නේ. මේකේ හරි වැදගත් කාරණාවක් තිබෙනවා. ඒක වැදගත් කියලා කියන්නේ මේ ආර්ථික වර්ධන වේගය සියයට 10ක් දක්වා වැඩි කරන්න පුළුවන් වැඩ පිළිවෙළ තිබෙන්නේ කොහේද කියලා එතැනින් ජනතාවට තේරුම් ගන්න පුළුවන් නිසායි.

මේ පනත් කෙටුම්පතේ 12වැනි වගන්තිය සම්බන්ධයෙන් මෙම පෙත්සම ගොනු කර තිබෙනවා. මේක ඉංග්‍රීසියෙන් විතරයි තිබෙන්නේ. සිංහලෙන් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පෙත්සමේ 7.(e) වගන්තිය කියවන්න මට විනාඩියක් දෙන්න. It states, I quote:

> "Clause 12 of the Bill which pertains to the objects of the Economic Commission overwhelmingly favours an export and investment based economy to the neglect of encouraging import substitutes which saves foreign reserves, and hence, is inconsistent with Article 3 and 4 of the Constitution,..."

මොකක්ද, මේකේ සිංහලෙන් කියැවෙන අදහස? ඩොලර් ඉතුරු කරන ආනයන ආදේශන model එකකට යනවා වෙනුවට ඩොලර් උපයන අපනයන අභිමුඛ ආර්ථිකයකට යෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි කියන එකයි. ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා ඇතුළු පුද්ගලයන්ට මම කියන්නේ මේක දේශපාලන කථාවක් නෙවෙයි, පෞද්ගලික කථාවක් නෙවෙයි, ප්‍රතිපත්තිමය දෙයක් බවයි. මොකද, අපේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ අපනයන අභිමුඛ ආර්ථිකයකට යන එක. අපනයනය කරලා දැඩි ලෙස ජාත්‍යන්තර වෙළෙඳ පොළ තරණය කරන්න බැරි වුණොත් අපිට කිසි දවසක ඔය කියන සියයට 10 ආර්ථික වර්ධන වේගයට යන්න බැහැ.

ඒ නිසා ජනතාවට දැන් පැහැදිලියි ආර්ථික විකල්ප තුන. ශෙහාන් සේමසිංහ ඇමතිතුමන්ලා ඉදිරිපත් කරනවා එක ප්‍රතිපත්තියක්. ඒක තමයි IMF එකේ ප්‍රතිපත්තියට හිර වෙන්න ඕනෑය කියන එක. ගරු විජිත හේරත් මන්ත්‍රීතුමන්ලාගේ කණ්ඩායම පැහැදිලිවම ඉදිරිපත් කරලා තිබෙනවා, ජනමත විචාරණයක් නැතුව අපිට අපනයන අභිමුඛ ආර්ථිකයකට යන්න බැහැ කියලා. අපි විකල්පයක් ඉදිරිපත් කරලා තිබෙනවා, අපි අපනයන අභිමුඛ ආර්ථිකයකට යන්න ඕනෑ කියලා. නමුත් සමාජ වෙළෙඳ පොළ හරහා, සමාජ සාධාරණත්වය හරහා, shared prosperity එකක් හරහා, inclusive growth එකක් හරහා සැමටම ශක්තිමත් වෙන්න පුළුවන් විධියේ මැද මාවතේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී, සමාජ වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයක් හරහා තමයි අපට මේ රට ගොඩගන්න පුළුවන් වෙන්නේ. එතකොට පැහැදැලිවම මේ රටේ මිනිස්සුන්ට විකල්ප තුනක් තිබෙනවා. ඔය විකල්ප තුනෙන් එකක් තෝරාගන්න ඔවුන්ට තව මාස දෙකකින් හැකියාවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක මතක් කරමින්, මට කාලය වැඩිපුර ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත පිළිබඳව හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු අදහස්වලදී අපි දැකපු දේ මේකයි. මෙතුමා expenditure cap එක පිළිබඳව දැඩි විවේචනයක් කළා. හැබැයි මෙතුමා කියන්නේ මේ expenditure cap එක revenue එක එක්ක බලන්න කියලායි. හැබැයි අපි මේක යෝජනා කරන්නේ economy එකේ ඇති වන ප්‍රසාරණයත් එක්ක. ඒ කියන්නේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව තමයි මේ expenditure cap එක ගෙනැල්ලා තිබෙන්නේ.

දෙවැනි කාරණය මෙයයි. අපි මේ ඉදිරිපත් කරන framework එක ගත්තාම, අපට විශ්වාසයි මේක තමයි ක්‍රියාත්මක කළ යුත්තේ කියන කාරණය. එතකොට අපිත් පිළිගන්නවා, අපි මේක ක්‍රියාත්මක කරලා සියයට 5 ඉක්ම වූ ආර්ථික වර්ධන වේගයක් වෙත යන්න ඕනෑ කියලා.

අනෙක් කාරණය මෙයයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේක මතක තියාගන්න. ඔබතුමා හොඳටම මේ ගැන දන්නවා. මේ expenditure cap එකේදී මේ Debt Sustainability Analysis එක අමතක කරලා අපිට ඉදිරියට යන්න බැහැ. අපි ඒකත් එක්ක තමයි ඉදිරියට ගමන් කරන්න ඕනෑ. ඔබතුමා දැන් IMF Programme එකේ parameters ගැන කිව්වා. අපි සියයට 5 කියන ඉලක්කයක් දැම්මත්, සියයට 2 තිබෙනවා, සියයට 2.2 තිබෙනවා.

මේ අවුරුද්දේ ආර්ථික වර්ධන වේගය තිබෙන්නේ සියයට 2යි. නමුත් අපට විශ්වාසයක් තිබෙනවා, අපි සියයට 3.5ක ආර්ථික වර්ධන වේගයකට ගමන් කරනවා කියලා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලා ආණ්ඩුවක් ගන්නවා කියන එක ඔබතුමන්ලාට විශ්වාස නම්, මේ කියන ඕනෑම පනතක් ඔබතුමන්ලාට වෙනස් කිරීමේ හැකියාවක් තිබෙනවා. නමුත්, අපි කරන්නේ අපේ වගකීම ඉටු කරන එකයි, නැවත බංකොලොත්වීමක් සිදුවීම නැවැත්වීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන එකයි. අනෙක් එක, ඔබතුමා කියන විධියට මෙම පනත් කෙටුම්පතේ Chapter I එක නිසා තමයි මුළු පනත් කෙටුම්පතටම විරුද්ධ වෙන්නේ. ඔබතුමා කිව්වා සදාචාරාත්මක අයිතියක්, - *[බාධා කිරීමක්]* ඒක නේ කිව්වේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
Chapter I.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
ඔව්, Chapter I එකේ තිබෙන කාරණා තුන නිසා තමයි. IMF Agreement එකේ ප්‍රධාන වශයෙන් තිබෙන්නේ කාරණා තුනයි නේ. එකක් තමයි, debt කොහොමද තිබෙන්නේ කියන එක. ඊළඟට, විරුද්ධ වෙන්න හේතුව මෙක නම්, සදාචාරාත්මක අයිතියක් ඔබතුමන්ලාට නැතිව ඇති, - *[බාධා කිරීමක්]* ඔබතුමාට සදාචාරාත්මක අයිතියක් තිබෙනවා. මොකද, ඔබතුමා එදා ඡන්දය දුන්නේ නැහැ. You said that the IMF Programme is required to stabilize the economy in Sri Lanka. Then, you should have basically voted in favour, but you abstained from voting. You walked away from the House. Did you vote or walk away? Just answer that. Then, I will explain.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
Are you asking me a question?

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
Yes, I want to know that. Did you walk away on that day or what did you do? Did you vote?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
මෙහෙමයි, - *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. ප්‍රශ්නයට උත්තර දෙන්න ඉඩ දෙන්න. මෙතැනදී අපට කාරණා තුනක් කරන්න තිබුණා. එකක් තමයි, අපට තිබුණා පක්ෂව ඡන්දය දෙන්න. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. ඔබතුමා මගෙන් ප්‍රශ්නයක් ඇහුවා නේ. උත්තරය දෙන්න ඉඩ දෙන්න. එක්කෝ, විපක්ෂව ඡන්දය දෙන්න තිබුණා. නැත්නම් ඔබතුමන්ලාට ඒක කරගෙන යන්න දෙන්න තිබුණා. අපි පක්ෂව ඡන්දය දුන්නා නම් අපි මේ සියලු දේට එකඟයි. නමුත් අපි සියලු දේට එකඟ නැහැ. අපි විපක්ෂව ඡන්දය දුන්නා නම්, අපි සියලු දේටම එකඟ නැහැ. අපි එහෙමත් නැහැ. ඒ නිසා රටට ඒ වෙලාවේ අවශ්‍ය වෙලා තිබුණු දේ කරගෙන යන්න අපි කාලය දුන්නා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක අපි ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත. ඒ පනත් කෙටුම්පතට වැරදි අර්ථ කථන දෙන්න එපා. විපක්ෂයට සදාචාරාත්මක අයිතියක් නැද්ද? ඒ අය මේ රටේ ආර්ථිකය ස්ථාවර කරලා, වර්ධනයක් වෙත ගමන් කරන මාර්ගයට විරුද්ධ වුණා. ඒකට නේ කොන්ද පණ තිබුණේ නැත්තේ. ඔබතුමන්ලා කිව්වා, IMF Programme එකට යන්න කියලා. ඔබතුමන්ලා දන්නවා IMF Programme එක මොකක්ද කියලා. ඔබතුමන්ලා IMF එකත් එක්ක සාකච්ඡා කළා. ප්‍රශ්නය තිබුණේ ඔබතුමන්ලාගේ යෝජනාව ප්‍රායෝගික වුණේ නැහැ, ඔවුන්ට පිළිගන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීලඟට, ගරු රංජිත් බණ්ඩාර මහතා. ඔබතුමාට විනාඩි 13ක් තිබෙනවා.

Order, please!

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatilleka)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு வசந்த யாப்பாபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. WASANTHA YAPABANDARA left the Chair and THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA took the Chair.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order. He mentioned my name!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Yes, Hon. (Dr.) Harsha de Silva?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමනි, අපි IMF එකට යන්න කියපු එක හරි. අපි තමයි ඒක මුලින්ම කිව්වේ. එදා ගියා නම් රට බංකොලොත් වෙන්නේ නැහැ. ඒක පැත්තකින් තියන්න කෝ. නමුත් අපි සියයට සියයක් ඒ Agreement එකත් එක්ක එකඟ නැහැ, ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යතුමනි. හැබැයි, ඔබතුමන්ලාට කරගෙන යන්න අවශ්‍ය මූලික රාමුව අපි ලබා දුන්නා. අපි විරුද්ධව ඡන්දය දුන්නේ නැහැ. මෙතැන සාදාචාරාත්මකව අපි කළ යුතු දේ කළා. ඒක තමයි අපි කියන්නේ, තව මාස දෙකකින් අපේ ආණ්ඩුව ආවාම අපි මේක වෙනස් කරනවා කියලා. ඒ කට්ටියට අපි පැය ගණනක සාකච්ඡාවක් ලබන සතියේ දිලා තිබෙනවා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා, ඔබතුමා වැරදි අර්ථ කථන කරන්න එපා. ඔබතුමා කියනවා, ඔබතුමා යනකොට නාලක ගොඩහේවා මන්ත්‍රීතුමා ලු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාත් එක්ක හිටියේ. එතුමා තමයි හිටපු ජනාධිපතිතුමාගේ ප්‍රධාන ආර්ථික උපදේශක. දැන් ඔබතුමන්ලාගේ උපදේශක. දැන් ඔබතුමාට ප්‍රශ්නය වෙලා තිබෙන්නේ ඒකයි. ගරු මන්ත්‍රීතුමා, මේ තිබෙන්නේ මේ පනතේ ප්‍රශ්නයක් නොවෙයි. මේ පනතට ඔබතුමා සංශෝධන ඉදිරිපත් කළා නේ. අපි ඉදිරිපත් කරපු ඒ සමහර සංශෝධන පිළිගත්තා. මේ concept එකේ ප්‍රශ්නයක් තිබෙන්නේ. මේ ගොල්ලන්ගේ පැවැත්ම තිබෙන්නේ ආපහු බංකොලොත් වුණොත් විතරයි. මෙන්න මේකයි තිබෙන ප්‍රශ්නය, ගරු මන්ත්‍රීතුමා. මම අහන්නේ මේකයි. අපට ඉලක්කගත වැඩ සටහනක් නැතිව රට බංකොලොත් වුණා නම්, ඉලක්කගත වැඩසටහනක් හදන එකේ ප්‍රශ්නය මොකක්ද? නැවත බංකොලොත් වෙන්න හේතුවක් නොවෙන්නට කටයුතු කිරීමේ වැරැද්ද මොකක්ද? සදාචාරාත්මකව ඔබතුමන්ලාට මේකට පක්ෂව ඡන්දය දෙන්න බැහැ. මම ඒක පිළිගන්නවා. ඒ නිසා ඔබතුමන්ලා විරුද්ධ වෙන්න. අපි රට වෙනුවෙන් බහුතර ඡන්දයෙන් මේ පනත් කෙටුම්පත සම්මත කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you. Next, the Hon. (Prof.) Ranjith Bandara.

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න පැහැදිලි කිරීමක් කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඇමතිතුමනි, ඔබතුමා යන්න එපා. පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. - *[බාධා කිරීමක්]* Please, just wait.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම උදේ කථාව පටන් ගන්නකොටම කිව්වා, මේ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතට අපේ මූලික විරුද්ධත්වය තිබෙන්නේ IMF එකේ කොන්දේසි පළමු Chapter එකට ඇතුළත් කරලා තිබෙන නිසා කියලා. නමුත් එතුමා කිව්වා නැහැ කියලා. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ඒක කිව්වාට පස්සේ එතුමා දැන් නිහඬයි. එතුමා නොමඟ යවලා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, Hon. Shehan Semasinghe?

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I do not want to waste my time answering the Hon. Lakshman Kiriella because, I am very sorry to say, he messed up the Debate in the morning also. We could have had a better Debate in Parliament, if they did not waste time here. Hon. Kiriella, the question I asked you was, how many points in the IMF Programme are included in this Bill? You did not know that. That is the point I raised in the morning. You have not read this Bill, first of all. You are talking nonsense! You know only to insult people. You are talking nonsense!

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Hon. Presiding Member, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Lakshman Kiriella.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
I have never seen such a Chief Opposition Whip in this Parliament!

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, this is not a classroom. What I mentioned was, Chapter I of this ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත, -

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
You did not even know about that.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Do not shout like a

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
You are just talking nonsense!

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ගෝයාහය රාජපක්ෂ ආණ්ඩුව තිබෙනකොට "ගෝයා-ගෝයා" කියලා උඩ පැන්නා. දැන් "රනිල්-රනිල්" කියලා උඩ පනිනවා. *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. (Prof.) Ranjith Bandara, please commence your speech.

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කරුණාකර ඔය කාරණය ගැන වාද කරන එක නවත්වන්න. *[බාධා කිරීම්]*

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත විවාදයට ගන්නා

මේ අවස්ථාවේදී, -

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම උදේ කථාව පටන් ගන්නකොටම කිව්වා, අපි මේ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතට විරුද්ධයි, මොකද, එහි පළමුවෙනි Chapter එකේ -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිරිඇල්ල මැතිතුමනි, ඒ ගැන දැන් ගොඩක් වෙලා කථා කළා නේ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්න. එම පනතේ පළමුවෙනි Chapter එකේ, ආණ්ඩුව අත්සන් කරපු IMF ගිවිසුමේ කොන්දේසි දාලා තිබෙනවා. ඒකයි අපි විරුද්ධයි කිව්වේ. ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා කිව්වා, එහෙම නැහැ කියලා. එතුමා පාර්ලිමේන්තුව නොමඟ ඇරියා. He was misleading Parliament.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ඒ ගැන වාද විවාද ගොඩක් සිද්ධ වුණා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
පාර්ලිමේන්තුව නොමඟ ඇරියා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මැතිතුමා.

[අ.භා. 12.14]

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ අපි රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පතත් සාකච්ඡාවට ගනිමින් ඉන්නවා. මෙය ඉතා වැදගත් පනත් කෙටුම්පතක්. මුදල් රාජ්‍ය අමාත්‍යතුමා ඇතුළු ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මේ සභාව ඇමතූ ගරු මන්ත්‍රීතුමන්ලා බොහෝදෙනෙක් මේ පනතේ අන්තර්ගතය පිළිබඳව කථා කළා. ඒ වාගේම මේ පනත පිළිබඳව මුදල් අමාත්‍යාංශය විසින් පිළියෙළ කර බෙදා හරින ලද කුඩා සටහනක් ද අපට කියවන්න අවස්ථාව ලැබුණා. එහි සඳහන් වෙනවා, මෙය කාලෝචිත පනතක්, ඒ වාගේම මෙය මීට ගොඩක් ඉස්සෙල්ලා ඉදිරිපත් කරන්න තිබුණු එකක්, නමුත් පසුව හරි මේක කරන්න ලැබිච්ච එක හොඳයි කියලා. මෙය, සර්ව සම්පූර්ණ පනතක් විධියට තමයි මුදල් රාජ්‍ය ඇමතිතුමාත්, ඊට පසුව කථා කළ ගරු මැති ඇමතිතුමන්ලාගේත් අදහස වුණේ. විපක්ෂයේ අදහස නම් තරමක් උභතෝකෝටිකයි. ඒකට කැමැති නැහැ, මේකට කැමැතියි, මේකට කැමැති වුණේ මෙන්න මේ නිසායි, අකැමැති වුණේ මේ නිසායි කියලා තමයි එතුමන්ලා කියන්නේ. ඒ නිසා මට නම් තවම තේරෙන්නේ නැහැ, ඒ අය මේ පනතට සම්පූර්ණයෙන්ම කැමැතිද අකමැතිද කියලා.

නමුත්, මේ පනත් කෙටුම්පත ඉහළ සිට පහළටම කියවපු කෙනෙකු විධියට මම දන්නවා, මේ යෝජිත පනත් කෙටුම්පතේ විශේෂ ලක්ෂණ 9ක් තිබෙන බව. ඒ පිළිබඳව යම්කිසි අවධානයක් මේ සාකච්ඡාවේදී අපි යොමු කරන්න අවශ්‍යයි. ඒ පිළිබඳව නැවත මතක් කිරීමක් කළ යුතු නැහැ. මොකද, ඒ පිළිබඳව මේ සභාව තුළ ඕනෑ තරම් සාකච්ඡාවට බඳුන් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ පෞද්ගලික මතය මෙයයි. මෙය, අපි සකස් කර තිබෙන හොඳම හෝ එකම පනත වෙන්නේ නැහැ, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන්. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියන්න උත්සාහ කළේත් ඒකම තමයි කියලා මා හිතනවා. මේ තුළ අන්තර්ගත විය යුතු විවිධ කාරණා තිබෙනවා. මම කැමැතියි, ඒ පිළිබඳව යම් යම් අදහස් මේ සභාව හමුවේ තියන්න. මම පෞද්ගලිකව විශ්වාස කරනවා, මෙහි තවදුරටත් සාකච්ඡාවට බඳුන් කළ යුතු සමහර කාරණා තිබෙනවා කියලා. ඒවා පිළිබඳව අපි කල්පනා කළ යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක ආර්ථිකය ස්ථාවර කිරීම වැදගත්. හැබැයි ඒ හරහා අපට පුළුවන්කමක් නැහැ, ඒ ආර්ථිකයේ වර්ධන අවකාශ අවහිර කරන්න. මේ පනත් කෙටුම්පත තුළ අන්තර්ගත සමහර කාරණා නිසා ඒ වර්ධන අවකාශ යම් හෙයකින් අවහිර වෙනවා නම්, මේ පනත් කෙටුම්පතෙන් එම දුර්වලතා අපි

ඉවත් කළ යුතුයි. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා සඳහන් කළේත් ඒ කාරණය කියා මා විශ්වාස කරනවා. සියයට දෙකක, තුනක ආර්ථික වර්ධන වේගයකින් මේ තිබෙන ප්‍රශ්න විසඳාගන්න අපට පුළුවන්කමක් නැහැ. ආර්ථිකය ප්‍රසාරණය කිරීම සඳහා වන වැඩ පිළිවෙළ මේ පනත හරහා වළකිනවා නම්, ඒක හොඳ තත්ත්වයක් නොවෙයි. කෙසේ හෝ අපි කැමැති වුණත්, අකැමැති වුණත් සාර්ව ආර්ථිකයේ සැබෑ හැසිරීම පිළිබඳව නියම තක්සේරුවක් ලබා ගන්න තවමත් අපට හැකියාව ලැබී නැහැ.

අපි එකිනෙකාට දොස් පවරා ගන්නවා මිසක් මේ සාර්ව ආර්ථිකයේ සැබෑ ස්වරූපය තක්සේරු කරන්නේ නැහැ. අර්ථ ශාස්ත්‍රය පිළිබඳව හොඳ හැදෑරීමක් කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු දෙදෙනෙකු මා ඉදිරිපිට අසුන්ගෙන සිටිනවා. මේ කාරණය ඔබතුමන්ලාත් දන්නවා ඇති. අපි තවම කටයුතු කරන්නේ, සාම්ප්‍රදායික input-output model එකක් පාවිච්චි කරලා. එහෙම නැත්නම් අර්ථ ශාස්ත්‍රය පාවිච්චි කරලා, general equilibrium model එකක් පාවිච්චි කරලා. මේවා යල් පැන ගිය ආකෘති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊට වඩා නවීන ක්‍රම පාවිච්චි කරලා අපේ ආර්ථිකයේ සැබෑ හැඩතල හඳුනා ගන්න අපි උත්සාහ කරන්න ඕනෑ. ඒ අනුව එය පහසුවෙන් කරන්න පුළුවන් කාරණා තුනක් පිළිබඳවයි මේ පනතින් කථා කරන්නේ. ඒ, රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම, ව්‍යදම් කළමනාකරණය සහ ණය සුව පහසු ස්ථානයකට ගෙන ඒම. මම හිතන්නේ මේක අපි මීට අවුරුදු 50කට ඉස්සෙල්ලාත් සාකච්ඡාවට භාජන කරපු කාරණාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය ආදායම යම්කිසි ඉලක්කයකට ගෙන යෑම සඳහා අපට යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාවට නංවන්න පුළුවන්. අපි අතීතයේදී එහෙම කරලා තිබෙනවා, වර්තමානයේදී අපි කරමින් ඉන්නවා. ඒ වාගේම අනාගතයේදීත් ඒක කරන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, ආදායම් උත්පාදන මාර්ග මඟින් ආයෝජනවලට, ඉතිරි කිරීම්වලට සහ ජීවන ව්‍යදමට යම්කිසි බලපෑමක් සිදුවෙනවා නම් මා හිතනවා, ඒ ප්‍රතිපත්තිය අපි තේරුම් ගත යුතුයි කියලා. අපේ රට තවදුරටත් ඉහළ ආදායම් ඉලක්කයක් වෙත යොමු කරන්න පුළුවන්කම තිබෙනවා ද කියන ප්‍රශ්නය මේ වෙනකොට අපි සාකච්ඡාවට ගනිමින් ඉන්නවා. අපි හැමෝම දන්නවා, ජනතාව සහ ව්‍යාපාර මත පනවන බදු වැඩි කිරීම හරහා ඇති වෙන්න පුළුවන් දුර්විපාක පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මතක ඇති, යහ පාලන ආණ්ඩුව පැවති කාල සීමාව තුළ රජයේ ආදායම ඉලක්කගත සීමාවකට ගෙන ගිය බව. හැබැයි, එහි ප්‍රතිඵලයක් විධියට රටේ ආර්ථික වර්ධන වේගය පහළ බැස්සා. රටේ ආර්ථිකය එක තැන පල්වෙන ස්ථානයකට තල්ලු වුණා. ඒ නිසා රාජ්‍ය ආදායම වැඩිකර ගැනීමේ මුවාවෙන් ආර්ථිකයේ වෙනත් සාධකවලට බලපෑම් ඇති කරන ආකාරයේ වැඩ පිළිවෙළක් අපි ගෙන ගියොත්, ආර්ථිකයේ ස්ථාවර වීම පිළිබඳව කථා කරන එක බොරුවක්, ආර්ථිකයේ වර්ධන වේගයක් පිළිබඳව කථා කරන එක බොරුවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය ව්‍යදම් කළමනාකරණය කිරීමත් යම්කිසි ඉලක්කයකට අරගෙන යන්න අපට පුළුවන්කම තිබෙනවා. නමුත්, අවාසනාවකට අපි වාගේ රටක ව්‍යදම් පරිපාලනය පිළිබඳ ගැටලු බොහොමයක් තිබෙනවා. එක පැත්තකින් තිබෙන දුප්පත්කම, විරැකියාව, මන්දපෝෂණය, ආදායම් ව්‍යාප්තියේ විෂමතාව වැනි කල් පවත්නා ප්‍රශ්න විසඳාගන්න නම් රජය ව්‍යදම් කළ යුතුමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මිලියන දෙකකට ආසන්න පිරිසක් - ජනගහනයෙන් සියයට 10ක් - එක්කෝ රජයේ සේවකයන් එහෙම නැත්නම් විශ්‍රාම වැටුප් ලබන්නන්. ඒ නිසා මේක තරමක අසීරු කාර්යයක්. ඒ වාගේම, මේ රටේ විශාල පිරිසක් සමාජ ආරක්ෂණය පිළිබඳ ගැටලුවකට මුහුණ දෙනවා. අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, මේ රටේ දුප්පත්කම වැඩි වෙලා තිබෙනවා කියලා. ඔව්, මේ රටේ දුප්පත්කම වැඩි වෙලා තිබෙනවා, මන්දපෝෂණය වැඩි වෙලා තිබෙනවා, විරැකියාව වැඩි වෙලා තිබෙනවා. මේ කියන කල්පවත්නා ප්‍රශ්නවල තත්ත්වය පෙරට වඩා භයානක තැනකට තල්ලු වෙලා තිබෙනවා. ඒ නිසා තමයි සමාජ සුබසාධනය අපට කපා හරින්න පුළුවන්කමක් නැත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු පදනම පුළුල් කරන්න අවශ්‍ය කරන සානුබල ආර්ථිකය තුළ ස්ථාපිත නොකර අපට ඔය කියන ඉලක්කගත ආදායමට මේ රට තල්ලු කරගෙන යන්න පුළුවන්කමකුත් නැහැ; ව්‍යදම කප්පාදු කරගන්න පුළුවන්කමකුත් නැහැ; ඔය කියන ණය කළමනාකරණය කිරීම පිළිබඳ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන්කමකුත් නැහැ. ඒ නිසා අපි මතක තබාගන්න ඕනෑ, අද වක්‍ර බදු trap එකක හිර වෙලා ඉන්නේ කියන එක. මේ තත්ත්වය වෙනස් කරන්න නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කියන්නා කෙසේ කීවත් අසන්නා සිහි බුද්ධියෙන් අසන වැඩ පිළිවෙළක් වෙත අපි මේ ආර්ථිකයේ හැසිරීම මෙහෙයවන්නට සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, IMF එක පළමු වරට ලංකාවට විතරක් උපදෙස් දීලා නැහැ. ලංකාවට මීට ඉස්සර වෙලා 16 වතාවක් IMF එක උපදෙස් දීලා තිබෙනවා. IMF එකේ සාමාජික රටවල් බොහොමයකට මේ ආකාරයට උපදෙස් දීලා තිබෙනවා. හැබැයි, ඒ පිළිබඳව තිබෙන සාහිත්‍ය අපි කියවලා බැලුවොත්, ගොඩ ගියා කියන රටවල් නම් තිබෙන්නේ අතළොස්සයි. ඒ නිසා මා එකඟ වෙනවා, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් එක්ක. ආර්ථිකය ස්ථාවර කර ගැනීම සඳහා මේ තිබෙන යෝජනා පිළිබඳව සැලකිල්ල දක්වන අතරවාරයේ අපි උත්සාහ කරන්න ඕනෑ, කවුරු බලයට ආවත් මේ රටේ ආර්ථික වෘද්ධි අවකාශය ඉදිරියට ගන්න. එහෙම නොවුණොත් අපට මේ තිබෙන ප්‍රශ්න එකකටවත් උත්තර සොයාගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඒකට අවස්ථාව එළඹිලා තිබෙනවා.

මේ වෙලාවේ ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්න කල්පනා කරන අපේක්ෂකයන්ට -අදත් දෙදෙනෙක් ඉදිරිපත් වෙනවාය කියලා news alert එකක් තිබෙනවා අපි දැක්කා- පුළුවන්කම තිබෙනවා, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ තම මතය ජනතාව ඉස්සරහට අරගෙන එන්නට. එහෙම නැතුව අපි ආපුවාම තමුන්නාන්සේලාගේ බඩ කට පුරවනවා කියන ලාභ දේශපාලන උපක්‍රම පාවිච්චි කරලා, බලයට ආවත් මේ ප්‍රශ්න අපට විසඳාගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සම්ප්‍රදායයක් විධියට දේශපාලනයේදී ප්‍රශ්න ගැන තමයි කථා කරන්නේ. අහවල් ප්‍රශ්නය තිබෙනවා, අහවල් ප්‍රශ්නය තිබෙනවා කිව්වාට ඒකට තිබෙන උත්තරය මොකක්ද කියලා අපි කවදාවත් කියන්නේ නැහැ. ඒ නිසා අපි එළඹෙන ජනාධිපතිවරණය පාවිච්චි කරමු, ඉදිරිපත් වන අපේක්ෂකයන්ට තිබෙන ප්‍රශ්න ලැයිස්තුව එක පැත්තකට අරගෙන, මෙන්න මේ ප්‍රශ්නයට මගේ උත්තරය මෙකයි වශයෙන් තමන්ගේ උත්තර ලැයිස්තුව ප්‍රශ්නය ඉස්සරහින් සටහන් කරන වැඩ පිළිවෙළකට තල්ලු කරවන්න. උදාහරණයක් විධියට සේවා වියුක්ත උපාධිධාරීන්ට අපි රැකියා දෙන්නේ කොහොමද? දුප්පත්කම, විරැකියාව, මන්දපෝෂණය අපි නැති කරන්නේ කොහොමද?

[ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා අපි solution-based policy එකකට යා යුතු වෙනවා. එහෙම නැතුව ධනපතියන්ගෙන් ගන්න සල්ලිවලින් බස් බෙදලා හරි, smart boards බෙදලා හරි රටක් දියුණු කරන්න පුළුවන්කමක් නැහැ. මේ සරදියල් න්‍යාය අපි පරාජය කරන්නට ඕනෑ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මෙය අවස්ථාවක් කර ගනිමු, කථාව අඩු කරලා වැඩියෙන් වැඩ කරන මිනිස්සු පාර්ලිමේන්තුවට එවන්නත්, මේ රටේ ජනාධිපතිවරයා බවට පත් කරන්නත්. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ [ගරු අංගජන් රාමනාදන් මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පසු, අමර්ගු ප.ව. 1.00 මණිවරை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. Vijitha Herath. You have nine minutes.

[අ.භා. 1.00]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිවරණය පවත්වන දිනය මේ සතියේ කියන්නේ නැහැ, මැතිවරණ කොමිසම එය ලබන සතියට කල් දමන්න තීන්දුවක් ගත්තා කියලා ප්‍රවෘත්තියක් යනවා. මෙවැනි ක්‍රියා මාර්ගවලින් ජනතාව තුළ සැකය, අවිශ්වාසය තවත් වර්ධනය වෙනවා. මොකද, මුළු රටම බලාගෙන හිටියේ අද හෝ හෙට ජනාධිපතිවරණය පවත්වන දිනයත්, නාමයෝජනා බාර ගන්නා දිනයත් ප්‍රකාශයට පත් කරයි කියලා. මැතිවරණ කොමිසම අද රැස්වෙලා තීරණය කරලා තිබෙනවා ලු, එය ලබන සතියේ තමයි තීන්දු කරන්නේ, ලබන සතියේ තමයි ප්‍රකාශයට පත් කරන්නේ කියලා. මේක තවත් දිග්ගැස්සෙන්න, දිග්ගැස්සෙන්න රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා දමන ගැට පිළිබඳව අවිශ්වාසය තවත් ඇති වෙනවා. හෙට විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා කියා තිබෙනවා; එවැනි ආරංචියකුත් යනවා. ඒවාත් එක්ක මිනිස්සු තුළ දෙගිඩියාව, විචිකිච්ඡාව, සැකය ඇති වෙනවා. ඒ නිසා අපි මැතිවරණ කොමිසමට අවධාරණය කරනවා, ඉක්මනින් එම දිනය ප්‍රකාශයට පත් කරන්න කියලා. මිනිස්සු බලාගෙන ඉන්නේ මැතිවරණයට ඉක්මනින් මුහුණ දෙන්න. ඒ නිසා මේක කල් දාන්නේ නැතිව ඉක්මනින් ඒ දිනය ප්‍රකාශයට පත් කරන්න කියලා අපි අවධාරණය කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දවසේ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතත් විවාදයට ගෙන තිබෙනවා. මේ ආර්ථික පරිවර්තන පනත ඉතා පැහැදිලිවම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුමේ තිබෙන කොන්දේසි නීතියක් බවට පත් කරන පනතක්. ඒක හංගන්න දෙයක් නැහැ. IMF ගිවිසුම මතම මේ රට දුවන්න ඕනෑ කියලා නීතියක් තිබෙන්න බැහැ. IMF එක විවිධ අවස්ථාවලදී අපේ අය වැය පරතරය සම්බන්ධයෙන් මැදිහත්වීමක් වෙනවා, ආණ්ඩුවේ ඉල්ලීම පරිදි. අපි 16 වතාවක් IMF එකෙන් උපදෙස් ගත්තා. දැන් 17වැනි වතාවටත් උපදෙස් අරගෙන තිබෙනවා. ඒත් රට බංකොලොත් වෙලායි තිබෙන්නේ. රට බංකොලොත් කරපු අය අද මහා ලොකුවට පුරාජේරු ගහනවා, මේ බංකොලොත්භාවයෙන් මුදා ගන්න ඒ අය සමත් වුණා කියලා. ගෑස් පෝලිම්, තෙල් පෝලිම් නැති කළේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති වුණාට පස්සේ කියලා කියනවා. මතක නැද්ද, මහ බැංකු බැඳුම්කර කොල්ලය? මහ බැංකු බැඳුම්කර කොල්ලය සිදු වුණේ නැත්නම්, මහ බැංකුව කොල්ලකෑවේ නැත්නම් ගෑස් පෝලිම්, තෙල් පෝලිම් ඇති වෙන්නේ නැහැ. ඉතින් මේ රට වැට්ටුවේ කවුද? වැට්ටුවෙත් උන්නැහේලාම තමයි, දැන් මේ ගොඩ ගත්තා කියලා කිව්වාට. මේ ආර්ථිකය වට්ටපු අයම අද විවිධ නීති අණපනත් ගෙනැල්ලා, මේ ආර්ථිකය වට්ටන්න කිසිදු ආකාරයකින් මැදිහත් වුණේ නැති උදවිය විධියට කථා කරනවා. මම දැක්කා, මේ ආර්ථිකය ගොඩ ගන්න බන්දුල ගුණවර්ධන ඇමතිතුමා උණ්ඩුක පුවිඡ න්‍යායන් ගැන කථා කරනවා. එතුමන්ලා තමයි ජැක් ගහලා, එක එක්කෙනාට සහාය දීලා මේ බංකොලොත් තත්ත්වයට රට පත් කළේ. අදත් මේ ගෙන යන්නේ නැවත ඒ දක්වාම ගෙනියන ක්‍රියා මාර්ගම තමයි.

මේ පනතේ හරය ගත්තොත්, මේකේ වෙන මොනවත් නොවෙයි තිබෙන්නේ, IMF එකෙන් දාපු කොන්දේසි නීතියක් බවට පත් කරන එකයි තිබෙන්නේ. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කිව්වා, කවුරු ආණ්ඩු බලයට පත් වුණත් මේ නීතිය ඉස්සරහට ගෙනියන්න වෙනවා කියලා. එහෙම නීතියක් නැහැ. ඊළඟට පත් වෙන ආණ්ඩුව මේ පනත වෙනස් කරනවා. මේ පනත වෙනස් කළාම එතැනින් එහාට මේක වලංගු නැහැ. ඕනෑම ආණ්ඩුවකට පුළුවන් ඒ පනත වෙනස් කරන්න. එහෙම බැහැ කියන සූත්‍රයක් කොහේවත් නීතිගත කරලා නැහැ. එම නිසා ඒ වැරදි අදහස නිවැරදි විය යුතුයි කියන එක මම අවධාරණය කරනවා.

ඇත්තටම මේකේ තිබෙන සමහර සංඛ්‍යාලේඛන ගත්තොත්, ප්‍රායෝගිකව ඉෂ්ට කරන්න බැරි දේවල් තිබෙන්නේ. අපි කවුරුත් දන්නවා, අපේ දළ දේශීය නිෂ්පාදනය ඩොලර් බිලියන 80යි කියලා. මේකේ යෝජනාවක් තිබෙනවා, ලබන අවුරුද්දේ -2025 අවුරුද්දේ- අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 20ක් දක්වා වර්ධනය කරන්න. ඒ කියන්නේ, ලබන අවුරුද්දේ GDP එකෙන් සියයට 25ක් ලෙස අපේ අපනයන ආදායම වැඩි වෙන්න ඕනෑ. මෙච්චර කාලයක් -අවුරුදු ගණනක්- නිස්සේ කෙකර ගාලාත් අපේ අපනයන ආදායම තිබෙන්නේ ඩොලර් බිලියන 12යි. ඉතින් ලබන අවුරුද්දේ විතරක් එක පාරටම අපනයන ආදායම ඩොලර් බිලියන 8කින් වැඩි කරන්නේ කොහොමද? දැන් අපි මෙතැන නීතියක් සම්මත කරනවා. Export-oriented economy එකට අපි කවුරුත් කැමැතියි. හැබැයි, එහෙම කිව්වාට මෙච්චර කාලයක් අපි අපනයන ආදායම වර්ධනය කරලා තිබෙන්නේ ඩොලර් බිලියන 12යි. දැන් මේ හිටපු ගමන් හීනෙන් නැඟිටලා වාගේ කිව්වාට ඊළඟ අවුරුද්දේ ඩොලර් බිලියන 8කින් මේක වැඩි කරන්න පුළුවන් ද? IMF එක කියපු පළියට එහෙම කරන්න පුළුවන් ද? එහෙම කරන්න බැහැ. Practically ඒක වෙන්නේ නැහැ. නමුත්, ඒක දැන් නීතියක් වෙනවා. අද මේ පනත් කෙටුම්පත සම්මත වුණාම ඒක නීතියක් වෙනවා; ඒක අනිවාර්ය වෙනවා. කොහොමද කරන්නේ? අපේ අපනයන වර්ධනය කරන්න තිබෙන

යෝජනා මොනවාද? තිබෙන සැලසුම් මොනවාද? ඉතා පැහැදිලිව මම මේ කාරණයක් කියන්නට ඕනෑ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, ජාතික ජන බලවේගය export-oriented policy එකේ නැහැ කියලා. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. අපි එදා ඉඳලා කථා කරන්නේ, මේ ආර්ථිකය ගොඩ ගන්නා විධිය ගැනයි. අපේ ප්‍රතිපත්තිය නිෂ්පාදනය මත පදනම් වෙච්ච ආර්ථිකයක්. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය තමයි අපට ආර්ථික වශයෙන් ගොඩ යන්න තිබෙන එකම උත්තරය. මේ පාලකයෝ නොකළේත් ඒක තමයි. ඒ නිසා තමයි ආර්ථිකය කඩා වැටුණේ.

ආර්ථිකය කඩාගෙන වැටෙන්න ප්‍රධාන හේතු දෙකක් තිබෙනවා. එකක්, අපේ නිෂ්පාදනය කඩා වට්ටපු එක. අනෙක, මේ කුණු වෙච්ච, ගඳ ගහන දේශපාලන සංස්කෘතිය; හොරකම, වංචාව, දූෂණය, නාස්තිය. මේ දෙක වෙනස් කළා නම් මේ ආර්ථිකය ගොඩගන්න පුළුවන්. නමුත් ආණ්ඩුව ඒ එකක්වත් කරන්නේ නැතුව, හීනෙන් නැඟිටලා වාගේ දැන් හදනවා මේවා නීතිගත කරලා අනිවාර්ය කරන්න. කොහොමද ඒක කරන්නේ? ඒ නිසා අපි කියනවා, ආර්ථික පරිවර්තන නීතිය හරහා IMF එකත් එක්ක ආණ්ඩුව එළඹුණු ගිවිසුම, එකඟතාව නීතියක් කරනවාට අපි එකඟ නැහැ කියලා. අපි ඒකට විරුද්ධයි. IMF එකත් එක්ක පැමිණි එකඟතා අනුව ජනතාව මත බදු ගැහුවා; ජනතාව පීඩාවට පත් කරන කොන්දේසි දැම්මා. ඒවාට අපි එකඟ නැහැ. අපට ඒවා අනුමත කරන්න බැහැ. ඒකෙන් තමයි බඩු මිල වැඩි වුණේ. ඒකෙන් තමයි පෙට්‍රල්, ඩීසල්, විදුලි බිල වැඩි වුණේ.

එදා පැහැදිලිව කිව්වා, "Increase tax; බදු වැඩි කරන්න" කියලා. ඊළඟට, cost-recovery in energy pricing කියලා IMF එක කිව්වා. ඒ කොන්දේසි තිබෙන්නේ MoU එකේ. ඒ අනුව තමයි විදුලි බිල වැඩ කරලා, ගෑස් මිල වැඩි කරලා, ඉන්ධන මිල වැඩි කළේ. ඒක කොහොමද අනුමත කරන්නේ? ඒක අනුමත කරන්න බැහැ. IMF එකත් එක්ක ආපු එකඟතාව කිසිදු ජනවරමක් නැතුව ආපු එකඟතාවක්. ජනතාව වරමක් දුන්නේ නැහැ, එහෙම කොන්දේසිවලට එකඟ වෙන්න. ඒ නිසා තමයි අපි උසාවියට ගිහිල්ලා කිව්වේ. ජන මතයකින් තොරව මේ වාගේ ගිවිසුම්වලට යන එක වැරැදියි. ඒවා නීති බවට පත් වෙන එක වැරැදියි. ජනතාව අනුමත කළා නම්, ජනතාව කිව්වා නම් එහෙම දෙයක් කරන්න කියලා, ඒ වෙනුවෙන් ජන මතයක් තිබුණා නම් අන්න ඒක සාධාරණයි. එහෙම නැතුව මේක නීතියක් කරන එක නීති විරෝධියි. ඒක තමයි උසාවියට අපි කළ කරුණු දැක්වීම්වල නිශ්චිතව තිබෙන්නේ. ඒක වැරැදි විධියට අර්ථකථනය කරන්න එපා. ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, export-oriented economy එකකට අපි කැමති නැහැ කියලා. ඒක සම්පූර්ණ වැරැදියි. අපි ඉන්නේ, අපේ පදනම්ම තිබෙන්නේ export-oriented economy එකක් මත. ආණ්ඩුව නොකරන්නේත් ඒක. හැබැයි, ආණ්ඩුව කථා කරනවා. හැම දාම, හැම ආණ්ඩුවක්ම අපනයන මත පදනම් වෙච්ච ආර්ථිකයක් ගැන කථා කරනවා. කථා කළාට ක්‍රියාවෙන් ඒක කරන්නේ නැහැ. ක්‍රියාවෙන් කරන්නේ ඒකේ අනෙක් පැත්ත. ඒ නිසා තමයි අපේ විවේචනය එතැනට තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආයෝජන අඩු වෙන්න හේතුව මොකක්ද? ආයෝජන අඩු වෙන්න ප්‍රධාන හේතුව තමයි මේ තිබෙන වංචා, දූෂණ, හොරකම්; ඇමතිවරු පගා ගන්න එක. අපි කවුරුත් දන්නවා, මීට අවුරුදු දෙකකට කලින් හිල්ටන් හෝටලයේ valuation එකක් කළා, ඩොලර් මිලියන 120කට. එතැන තිබෙනවා හෝටල් ගොඩනැඟිල්ල, ඊට යාබදව foundation එක දාලා තිබෙනවා තවත් tower එකක් ඉදි කරන්න. ඉඩම හෙක්ටෙයාර දෙකහමාරක් විතර තිබෙනවා. ඒ ඉඩමේ වටිනාකම ගණනය කරන්නේ නැතුව, ඇත්තටම තිබෙන වෙළඳ පොළ මිල මත පදනම් වෙලා valuations කරන්නේ නැතුව, depreciation එකක් කරලා - ඒ කියන්නේ මේකේ ක්ෂයවීම් මත පදනම්ව - අද ඉතා අඩු ලංසුවකට තක්සේරු කරනවා. ඩොලර් මිලියන 41.5කට ඒක විකුණන්න හදන්නේ. මීට අවුරුදු දෙකට කලින් ඇස්තමේන්තු කරපු එකේදී මෙතැන sports club එකම ඩොලර් මිලියන 35යි. හෝටලය ඩොලර් මිලියන 85යි. එතකොට වටිනාකම ඩොලර් මිලියන 120ක් වෙනවා. හැබැයි, කිසිදු සාධාරණ හේතුවක්, පදනමක් නැතුව අද තමන්ගේ හිතවතෙකුට මේක විකුණන්න යන්නේ, ඩොලර් මිලියන 41.5කට. ඩොලර් මිලියන 120ක් කියලා මීට අවුරුදු දෙකකට කලින් ඇස්තමේන්තු කරපු ගොඩනැඟිල්ල හිල්ටන් හෝටලය. මේක ජාතික අපරාධයක්. කාටද මේවා දෙන්න යන්නේ? ඡන්දයට සල්ලි හොයන්න, මේවා දෙන්න යන්නේ හිතවතුන්ට.

මහ බැංකු බැදුම්කර කොල්ලය වාගේම කොල්ලයක් තමයි මේකත්. හිල්ටන් හෝටලය කියන්නේ විවිධ අවස්ථාවලදී ප්‍රතිසංස්කරණය කරපු හෝටලයක්. එ් කටයුතුවලදී නවීකරණය වෙනවා. එතකොට depreciate කරන එක සාධාරණ නැහැ. මොකද, ක්ෂය වීම කියනවා වාගේම එහි අලුතින් එකතු කරපු ඒවාත් තිබෙනවා. අලුතින් එකතු කරපුවා value කළොත් මීට වඩා වැඩි වෙනවා.

පාස්පෝර්ට් ගන්න අද පෝලිම් ගැහිලා සෙනහ ඉන්නවා. මොකක්ද හේතුව? ඩිජිටල් පාස්පෝර්ට් එක දෙන්න ටෙන්ඩර් දැම්මා. ඒකෙදි තුන්දෙනෙක් ඉල්ලලා තිබුණා. හිතවතෙකුට දුන්නා. එකඟතාවකට ආවා, ජූලි 1වැනි දා ඉඳලා e-පාස්පෝර්ට් එක දෙන්නම් කියලා. ඒ අනුව stock එක තියා ගත්තේ නැහැ. Stock එක අඩු වුණා, පාස්පෝර්ට් පොත් ප්‍රමාණය අඩු වුණා 50,000ට. හැබැයි, ඒ ගත්තු කෙනා කිව්වා, "ජූලි 1වැනි දා දෙන්න බැහැ. මට දෙන්න පුළුවන් ජනවාරි 1වැනි දා" කියලා. දැන් පාස්පෝර්ට් පොත් නැහැ. ඊට පස්සේ ආණ්ඩුව හදිසියේදීම තීරණය කරනවා, online දෙන්න. Online දෙන්න තීරණය කරපු ඇත්ත හේතුව මොකක්ද? ඒ හිතවතාට දීලා, ඒ හිතවතා හරියට කොන්දේසි ඉෂ්ට කළේ නැහැ. ඒ නිසා මෙවැනි ආර්ථික වැරැදි සිදු වෙද්දී මොන ආර්ථික පරිවර්තන පනත් ගෙනාවාත් මේ ආර්ථිකය ගොඩගන්න බැහැ. ඒ නිසා මේ වංචාව, මේ දූෂණය නතර කරන්නේ නැතුව මේ රට ගොඩගන්න බැහැ කියන එක අවධාරණය කරමින් මා නතර වෙනවා. ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The Hon. Rohitha Abegunawardhana. You have 13 minutes.

[අ.භා. 1.10]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන ආර්ථික පරිවර්තන සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නමැති පනත් කෙටුම්පත් දෙක පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේ මා විශේෂයෙන් මතක් කර දිය යුතු කාරණයක් තිබෙනවා. එදා අපේ රටේ අවුරුදු 30ක ත්‍රස්තවාදයක් ක්‍රියාත්මක වුණා. එදා රටේ ජනතාව ඒ හැම රජයකින්ම ඉල්ලුවේ, අපට ත්‍රස්තවාදය අවසන් කරලා දෙන්න කියලායි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් ඔබතුමා නියෝජනය කරන උතුර

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

පළාතේ ජනතාව තමයි ත්‍රස්තවාදය නිසා දැඩි ලෙස පීඩාවට පත් වුණේ. එදා ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට පුළුවන් වුණා, ත්‍රස්තවාදය අවසන් කරන්න.

අපට දැන් ආර්ථික යුද්ධයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. පසු ගිය කාලයේ ආර්ථිකය කඩා වැටුණා. ආර්ථිකය කඩා වැටුණු ඒ අවස්ථාවේ කථාවෙන් විතරක් ආර්ථිකය ගොඩ ගන්න හදපු අය හිටියා. කථාවෙන් ආර්ථිකය ගොඩ ගැනීම විතරක් නොවෙයි, ඕනෑම දෙයක් කරන්න පුළුවන් කියන අයටත් ඒ අවස්ථාවේ අඬගැහුවා, ඇවිල්ලා මේ වැටිච්ච ආර්ථිකය භාර ගන්න කියලා; මේ කඩා වැටුණු රට තුළ යම් විධියකින් හෝ හුස්ම ගන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න කියලා. හැබැයි, දැන් ඔය කථා කරන, ඇලඩින්ගේ පුදුම පහන අතේ තියාගෙන ඉන්න විධියට කථාවෙන් මහා ලොකු දේවල් මවන කිසි කෙනෙකුට පුළුවන්කමක් ලැබුණේ නැහැ, ඇවිල්ලා රට භාර ගන්න. හැබැයි එදා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු සියලුදෙනා -අපි 134 දෙනා- එකතු වෙලා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට කිව්වා, ජාත්‍යන්තරය දන්නා නායකයෙකු හැටියට, ආර්ථිකය ගැන අවබෝධයක් සහ අත්දැකීම් තිබෙන නායකයෙකු හැටියට ඔබතුමා මේ රට භාරගෙන කරගෙන යන්න කියලා. දේශපාලන වශයෙන් අප හිටියේ කඳවුරු දෙකක. කඳවුරු දෙකක හිටියත් අපි රට වෙනුවෙන් කළ යුතු යමක් තිබුණා. එය සිදු කිරීම වෙනුවෙන් අපි වත්මන් ජනාධිපතිතුමාට රට භාර දුන්නා. ඒ භාර දුන්නාට පසුව, රට ආර්ථික වශයෙන් තිබුණු තත්ත්වයට වඩා යම් ස්ථාවරභාවයකට අද වන විට ගෙනැල්ලා තිබෙනවා. අද සියයට 100ක් සතුටු වෙන්න පුළුවන්කමක් නැහැ. මොකද, අපි නැවත මේ ණය ගෙවන්න ඕනෑ; ණය ගෙවීම ආරම්භ කරන්න ඕනෑ; ණය ගෙවන ක්‍රමවේදය හදා ගන්න ඕනෑ. ඒ තත්ත්වය ඇති කර ගන්න පුළුවන් විධියේ යම් ස්ථාවරභාවයකට අද මේ රට ගෙනැල්ලා තිබෙන බව අපි බොහොම නිර්ලෝභීව ප්‍රකාශ කරන්න ඕනෑ.

ඒ වාගේම සැප්තැම්බර් මාසය විතර වනකොට ව්‍යවස්ථානුකූලව ජනාධිපතිවරණයක් ලැබෙවි කියා විශ්වාස කරනවා. හැබැයි මේ කථා කරන සහ අපේක්ෂක ලැයිස්තුවේ ඉන්න ජනාධිපති අපේක්ෂකයන්ට විශාල වගකීමක් තිබෙනවා. ඔබ රෝසමල් යහනාවක් හම්බ වෙනවා කියලා හිතන්න එපා; විල්ලුද පලසක් හම්බ වෙනවා කියලා හිතන්න එපා; ආපු ගමන් ස්වර්ගය මවන්න පුළුවන් කියලා හිතන්නත් එපා. මහා අභියෝගාත්මක වගකීමක් භාරගෙන තමයි එය ඉටු කරන්න සිදු වන්නේ. මා ඒ බව මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය පාර්ලිමේන්තු රැස්වීම් වාරයේදී මගේ මිත්‍ර ඛලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශයක් මම බැලුවා. මම ඒ වෙලාවේ විදේශගතවයි සිටියේ. මම අද එතුමාට පිළිතුරක් දෙනවා. එතුමා මේ වෙලාවේ මේ සබා ගැබේ හිටියා නම් හොඳයි.

එතුමා කිව්වා, මේ වන විට ලංකාවේ එන්ජින් ධාරිතාව 1000, 1300 සහිත යතුරුපැදි තිබෙනවා, ඒවා නීත්‍යානුකූලව ලියාපදිංචි කිරීමට - ලියාපදිංචි නොවූ යතුරුපැදි ලියාපදිංචි කිරීමට - කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරමින් ක්‍රමවේදයක් හදන්න යනවා, ඒක ඉතාම වැරැදි වැඩක්, ඒක කරන්න එපා කියලා.

මම ඛලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමාට පිළිතුරු දෙන්න කැමතියි. එතුමා මේ රටේ හිටපු ප්‍රවාහන ඇමතිවරයෙක්. ප්‍රවාහන ඇමතිවරයෙකු හැටියට කටයුතු කරපු එතුමාට මම මුලින්ම කියන්න ඕනෑ, ලංකාවේ 1300cc, 1000cc කියන යතුරුපැදි ලියා පදිංචියට අනුමැතිය දුන්නේ 1983 වර්ෂයට පෙර බව. 1983 වර්ෂයට පෙර මේ රටේ 1000cc, 1300cc motorcycles තිබුණා; ඒවා ලියාපදිංචි කළා. ඒවා ලියාපදිංචි කිරීම නැවැත්වූයේ 1983දියි. ඒ, එකල පැවැති යුද්ධය, ත්‍රස්තවාදය නිසායි. එල්ටීටීඊ ත්‍රස්තවාදීන් ඒ යතුරුපැදිවල එන්ජින් බෝට්ටුවලට සවි කරලා භාවිත කළ නිසා තමයි ඒ වෙලාවේ හිටපු රජය තීන්දුවක් ගත්තේ, ඒ යතුරුපැදි ලංකාවට ආනයනය කරන එක නවත්වන්න ඕනෑ කියලා. මේක තමයි ඉතිහාසය. හිටපු ප්‍රවාහන ඇමතිවරයාටයි මම මෙය කියලා දෙන්නේ. මම මේ ගැන කියා දෙන්නේ වෙනත් මොකවත් හින්දා නොව, තාරුණ්‍යය මරන්න එපා කියලා කියන්නයි. වෙනත් රටවල ඉන්න තරුණයන්ගේ අදහස්, තාරුණ්‍යයේ හැඟීම් අපේ රටේ තරුණ දරුවන්ටත් තිබෙනවා.

මට එතුමාට තවත් උත්තරයක් දෙන්න තිබෙනවා. ශ්‍රී ලංකා පොලීසියට එන්ජින් ධාරිතාව 450 සහ 600 සහිත යතුරු පැදි තිබෙනවා. එන්ජින් ධාරිතාව 600 සහිත ඒවා පාවිච්චි කරන්නේ ප්‍රභූ ආරක්ෂාව වෙනුවෙන්. හැබැයි ඊට එහා එන්ජින් ධාරිතාවක් සහිත යතුරුපැදි ගෙනාවොත් -1000, 1300 වාගේ එන්ජින් ධාරිතාවක් සහිත යතුරුපැදි ගෙනාවොත්- පොලීසියේ තිබෙන යතුරුපැදිවල එන්ජින් ධාරිතාව අඩු නිසා ආරක්ෂාවට ප්‍රශ්නයක් වෙනවා කියලා එතුමා ප්‍රකාශ කර තිබුණා. ඒ හිටපු ප්‍රවාහන ඇමතිවරයාගෙන් මම අහනවා, ඔබතුමා ප්‍රවාහන ඇමති කාලයේ ඒ ගැන හිතන්න බැරි වුණාද කියලා. අර කථාවක් තිබෙනවා නේ, "මොළය තිබෙනකොට බලය නැහැ, බලය තිබෙනකොට මොළය නැහැ" කියලා. පොලීසියට අනෙක් ඒවාට වඩා වැඩි එන්ජින් ධාරිතාවක් සහිත වාහන අනිවාර්යයෙන් ඕනෑ කියලා එතුමා කියනවා නම් මම එතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ළඟ තිබෙනවා ශ්‍රී ලංකා පොලීසියට තිබෙන ජීප් රථවල තොරතුරු. මේ ජීප් රථයක එන්ජින් ධාරිතාව 2200යි. ඒ වාගේම එන්ජින් ධාරිතාව 4200ක් සහිත එකක් තිබෙනවා. Land Cruiser එකේ 4200 එන්ජින් ධාරිතාවක් තිබෙන්නේ. මේවා අඩු සංඛ්‍යාවක් තිබෙන්නේ. එන්ජින් ධාරිතාව 2200 ඒවා තමයි ලංකාවේ වැඩිපුරම තිබෙන්නේ. ලංකාවේ තිබෙන Lamborghini එකක එන්ජින් ධාරිතාව 6500යි. Hummer Jeep එකක engine capacity එක 6200යි. ඊළඟට, එතුමා ප්‍රවාහන ඇමති හැටියට හිටපු කාලයේ දුවපු V8 එකක එන්ජින් ධාරිතාව කීයද? V8 එකක එන්ජින් ධාරිතාව 4800යි. බලය තිබෙනකොට මොළය නැහැ, මොළය තිබෙනකොට බලය නැහැ කියනවා නේ. මම එතුමාගෙන් අහනවා, එන්ජින් ධාරිතාව වැඩි වාහන ගෙන්වන කල් එදා එතුමා කොහේද හිටියේ කියලා. ඒවාත් නවත්වන්න එපායැ. ඒක නේ කළ යුතු වෙන්නේ. "මෙවාත් නැවැත්විය යුතුයි" කියලා එදා ඒවා අනිවාර්යයෙන් නවත්වන්න තිබුණා නේ. නමුත් එහෙම කළේ නැහැ.

නීත්‍යානුකූල නොවන විධියට එවැනි යතුරුපැදි 15,000ක් විතර ලංකාවට ආනයනය කර තිබෙනවා. ඒක කාගේ වරදක් ද? ඒක මේ රටේ තිබෙන Sri Lanka Customs එකේ වරදක්. ඒ ගොල්ලන්ගේ -රේගුවේ - තමයි වරද. ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම ගැන, ඒ භාණ්ඩ ඇවිත් තිබෙන්නේ කොහොමද කියන එක ගැන ඒ අය සොයා බලන්න ඕනෑ.

අපට අල්ලපු රටක් වන මාලදිවයින උදාහරණයකට ගන්න. මාලදිවයිනේ අපේ වාගේ පාරවල් තිබෙනවා ද, highways තිබෙනවා ද? ඒවායේ පාරවල් කිලෝමීටර 7යි; නැත්නම් 8යි. නමුත් මාලදිවයිනේත් ඒ රටේ තරුණයන්ට 1000cc bikes පැදීමට ඉඩ දීලා ඒවා ලියාපදිංචි කරනවා. අපේ රටේ තිබෙන motor racesවලට ඒ තරුණයෝ ඇවිත් ජයග්‍රහණය කරනවා. නමුත්, අපේ රටේ තරුණ්‍යය මරා දමන්න හදනවා. හේතුව මොකක්ද?

මම දන්නේ නැහැ, මොකක් හරි පෙර හේතුවක් තිබෙනවා ද කියලා, මගේ මිත්‍ර ඩලස් අලහප්පෙරුම මැතිතුමාට. අඩු ගණනේ මෝටර්සයිකලයක් පැදලාවත් තිබෙනවාද දන්නේ නැහැ. එහෙම පැදලා තිබෙනවා නම් හොඳයි. නැත්නම් වෙනත් මොකක් හරි ප්‍රශ්නයක් - මෝටර්සයිකලයකට නැග ගන්න බැරි අවුලක් - තිබෙනවා ද කියා දන්නේ නැහැ. සමහරුන්ට එහෙමත් ප්‍රශ්න තිබෙනවා නේ. තමන්ට මෝටර්සයිකලයකට නගින්න බැරි වුණාමත් මෝටර්සයිකල්වලට විරුද්ධ වෙනවා නේ. ඒ නිසා මම එතුමාට කියනවා, උගත්, බුද්ධිමත් දේශපාලනඥයෙකු හැටියට තරුණයාගේ එක පැත්තක තිබෙන දේවල් චිතරක් අහලා ඒවා ක්‍රියාත්මක කරන්න හදන එක ඉතාම වැරැදියි කියලා.

ඒ එක්කම වැරදි තොරතුරුත් දෙනවා. ඊළඟට, මේ කියන තවත් තොරතුරු මොනවාද? මෝටර්සයිකල් නිසා අනතුරු වැඩි වෙනවා ලු. මම එතුමාට අභියෝග කරනවා, 1000cc සහ 1300cc ධාරිතාව සහිත high-capacity bikesවලින් ලංකාවේ අනතුරු කීයක් සිදුවෙලා තිබෙනවාද කියලා පුළුවන් නම් මේ සභාවේදී ඔප්පු කරලා පෙන්වන්න කියලා. මොකද, කොතැනක මෝටර්සයිකල් අනතුරක් සිද්ධ වුණත්, ඒ මෝටර්සයිකලයේ engine capacity එක කීයද, ඒක register කරලාද, නැද්ද ආදී වශයෙන් ඒ සියලු තොරතුරු පොලීසියෙන් ගන්න පුළුවන්. එහෙම දෙයක් වෙලා තිබෙනවා නම් කරුණාකරලා ඉදිරිපත් කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අධි ධාරිතාව සහිත මෝටර්සයිකල්වල මිල ගණන් වැඩි බව අපි දන්නවා. හැබැයි, high-capacity vehiclesවල වාගේම ඒවායේ ආරක්ෂක තත්ත්වයත් බොහොම හොඳයි. ඩලස් අලහප්පෙරුම මැතිතුමා කියලා තිබෙනවා, 'මෝටර්සයිකල් නිසා ලංකාවේ මෙච්චර මරණ ප්‍රමාණයක් සිද්ධ වෙනවා' කියලා. ඔව්, ඒක ඇත්ත. ඒක අද ඊයේ ඉඳලා සිදු වන දෙයක් නොවෙයි. ඔබතුමාට මතක ඇති, ඔබතුමාගේ තරුණ කාලයේ ලංකාවට මුලින්ම මෝටර්සයිකල් වැඩි ප්‍රමාණයක් ගේනකොට - කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මතක ඇති - රෝහලේ "හොණ්ඩා වාට්ටුව" කියලා එකක් දැම්මා. ඒ කාලයේ ඒ තරම් මෝටර්සයිකල් ගෙනාවා, 50cc මෝටර්සයිකල්, 100cc මෝටර්සයිකල්. මොකද හේතුව, පුංචි මෝටර්සයිකලයකට වැඩිය high-capacity මෝටර්සයිකලයක තිබෙන ආරක්ෂාව වැඩියි. හැබැයි, ඒවා ලියාපදිංචි කරන්න අපි මූලිකත්වය ගන්න ඕනෑ. එදා මේ පාර්ලිමේන්තුවේ විවාදයක් කරලා දෙපැත්තේ හැමකෙනාම කිව්වා, "පැහැදිලි ලෙසම මේක හොඳ දෙයක්. අපි අවසර දෙමු. ඒ සඳහා වෙනම ක්‍රමවේදයක් හදමු" කියලා; "වෙනම ක්‍රමවේදයක් හදලා, වෙනම licence එකක් ලබා දෙමු" කියලා කිව්වා. ආසියාවේ හැම රටකම සිටින තරුණයන්ට තිබෙන අයිතිය අපේ රටේ තරුණයන්ට නැති කරන්න හදන්නේ ඇයි? මේ කාරණය දිහා දේශපාලන කෝණවලින් බලන්න එපා. එහෙම කරන්න එපා. අපේ රටේ දක්ෂ දරුවෝ ඉන්නවා. ඒ හැම තරුණයෙකුටම අපි ඉඩ දෙන්න ඕනෑ. එම නිසා බුද්ධිමත් නායකයෙක් වන එතුමා ඒ කරපු ප්‍රකාශය මම තරයේ හෙළා දකිනවා. ඒ වාගේම එතුමා කියනවා නම් මේ රටේ තරුණයා වෙනුවෙන් ඕනෑම තැනකදී, මේ සම්බන්ධ විවාදයකට එන්න කියලා, මම ඒකට ලැහැස්තියි. මේ රටේ තරුණකම ඇගේ තිබෙන, මෝටර්සයිකල් පදින අය වෙනුවෙන් චිතරක් නොවෙයි, මෝටර්සයිකලයක් පදින කෙනෙක් දිහා බලා සතුටු වන තරුණ දරුවෝ මේ රටේ සිටින නිසා මේ වෙනුවෙන් පෙනී සිටින්න මම කැමැතියි. මොකද, මම මේ ආණ්ඩුවටත් කිව්වා, "මේක කරන්න. නොකර ඉන්න එපා. මේවා කළ යුතු දේවල්" කියලා. මේවා හැමදාම කල් මරමින් ඉන්න ඕනෑ දේවල් නොවෙයි. ලෝකයත් එක්ක අපි දියුණු වෙන්න ඕනෑ. හැබැයි, accidents වැඩි වෙනවා කියලා මේ කියන විධියට අපි හිටියා නම්, ගොන් කරත්තවලින් තමයි අපට තවම යන්න වෙන්නේ. එහෙම නේ, ඉතිහාසයේ මිනිස්සු වැඩ කළේ. වාහනයක් ලංකාවට ගෙනාවාම මිනිස්සු විරුද්ධවෙලා තිබෙනවා. ඉතින්, අපි ගොන් කරත්තවල තමයි යන්න ඕනෑ. එහෙම නොවෙයි, අපි ලෝකයත් එක්ක දියුණු වෙන්න ඕනෑය කියන කාරණය මතක් කරමින්, විශේෂයෙන්ම මට අද කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Kabir Hashim. You have 12 minutes.

[අ.භා. 1.22]

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැනට ලෝකයේ කාර්මික විප්ලව 4ක් සිදුවෙලා තිබෙනවා. සිව්වැනි කාර්මික විප්ලවය දැනටත් සිදු වෙමින් පවතින එකක්. ඒ තමයි ඩිජිටල් කාර්මික විප්ලවය. තුන්වැනි කාර්මික විප්ලවය සිදු වුණේ, 1980 දශකයේ. ඒ තමයි ඉලෙක්ට්‍රොනික කාර්මික විප්ලවය.

1977 ජේ.ආර් ජයවර්ධන-ප්‍රේමදාස රජය විසින් බය නැතුව සුසමාදර්ශී වෙනසක් ඇති කරලා, අපනයනය පදනම් කරගත් විවෘත ආර්ථික මොඩලයක් මේ රටට හඳුන්වා දුන්නා. එදා ශ්‍රී ලංකා ආර්ථිකය සොහොන් බිමක් කරන්නට කටයුතු කරපු වාමවාදී ව්‍යාපාරය, ඒ වාගේම ජේආර්-ප්‍රේමදාස යුගයට ශාප කරපු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කණ්ඩායමට අද දෛවය විසින්ම කරකවා රිදවීමක් - a twist of fate - සිද්ධකොට තිබෙනවා. මොකද, එදා ආනයන ආදේශන උපක්‍රමයක් ක්‍රියාත්මක කරපු ඒ කණ්ඩායමට - ඒ කඳවුරට - අද අපනයනය පදනම් කරපු ආර්ථිකයක් පිළිබඳ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න සිද්ධවෙලා තිබෙනවා. එදා ඔවුන් විසින්ම විරුද්ධ වුණු ඒ න්‍යාය අද ගේන්න සිදුවෙලා තිබෙනවා. ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතේ පූර්විකාව ගත්තාම, එක පැත්තකින් ප්‍රශංසනීය අභිලාෂ තිබෙනවා කියන කාරණය පෙනෙනවා. හැබැයි, ඒකෙන් highlight කරන එක කාරණයක් තමයි, ආර්ථික පරිවර්තනයට අවශ්‍ය ඵලදායී පරිසරයක් - enabling environment එකක් - ඇති කිරීම රජය සතු වගකීමක් කියන කාරණය. ඒක පිළිගෙන තිබෙනවා. දෙවනුව, නීතියේ සාධාරණත්වය, විනිවිදභාවය, සියලු අයට එක හා සමාන ක්‍රමයක් හරහා දේශීය හා විදේශීය සියලු ආයෝජකයින්ට සම බිමක් සකස් කිරීම මෙම පනත් කෙටුම්පතේ යෝජනාවක් හැටියට ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, පනත් කෙටුම්පතේ ඇතුල් පැත්ත ගත්තාම තිබෙන ප්‍රශ්නය තමයි, එය ක්‍රියාත්මක කරන්නට ප්‍රමාණවත් ව්‍යුහාත්මක පද්ධතියක් නොමැතිකම.

අනෙක් පැත්තෙන්, ඒක හරියාකරව ක්‍රියාත්මක කරන්න අවශ්‍ය නීතිමය රෙගුලාසි පද්ධතියක් මේ පනත් කෙටුම්පත තුළ තිබෙන බව පෙනෙන්නේ නැහැ. ඒ නිසා ප්‍රශ්න කිහිපයක් පැන නැඟෙනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට, මට ලැබී තිබෙන කාල වේලාව තුළ ඒ ප්‍රශ්නවලින් කිහිපයක් කියන්න කැමැතියි. ඉන් පළමුවැන්න මේකයි. මේ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත ඉදිරිපත් කරන වෙලාව සහ හදිසිය අනුව මේක ජනතාවගේ ආර්ථික යහපත සඳහා ඉදිරිපත් කරන පනත් කෙටුම්පතක්ද, එහෙම නැත්නම් ආණ්ඩුවේ දේශපාලන යහපත සඳහා ඉදිරිපත් කරන පනත් කෙටුම්පතක්ද කියන සැකය අද මතු වෙනවා. විපක්ෂයට ඒ ගැන අවංක සැකයක් මතු වෙනවා.

[ගරු කබීර් හෂීම් මහතා]

Hon. Deputy Chairman of Committees, secondly, this Economic Transformation Bill should have had a much wider stakeholder discussion, a wider public dialogue. The Hon. President believed in the Harvard Kennedy School's Growth Lab approach. The Growth Lab approach speaks about public participation. He spoke on behalf of public participation in 2023. But, how much opportunity was given to exporters, local entrepreneurs and investors to express their views about this Economic Transformation Bill? There was not sufficient public discussion. Therefore, there should be more public consultation before a Bill like this is brought into force.

Another issue is Chapter I of this Bill. As my Colleague, the Hon. (Dr.) Harsha de Silva, pointed out, Chapter I of this Bill is highly irrelevant because we do not need to specify selected economic targets, especially when they are mostly laid down by the IMF, which we may not agree on. It includes growth targets like gross financial needs, debt to GDP ratio et cetera. For example, look at the revenue to GDP target, regarding which it states that we should have 15 per cent by 2027. The Hon. Ranjith Siyambalapitiya, State Minister of Finance, says that the revenue to GDP target has already hit 13 per cent and that we may reach 15 per cent by the end of this year. But, the Bill states that we are hoping to achieve it by 2027. So, there itself, there is a discrepancy. Therefore, Chapter I is something that we cannot agree with.

Another thing which the Opposition opposes in this Bill is, the process of appointing directors or members to the five agencies in the Economic Transformation Bill. These appointments are made by the Minister at his discretion. This is just like the National Electricity Advisory Council - we opposed it - to which the Minister could appoint members without any checks and balances. These key appointments must go through the Constitutional Council, if there is to be any transparency and accountability. Therefore, there would be a lack of confidence among investors, if these appointments to the five key institutions proposed in this Bill are made by politicians. Take, for example, "Invest Sri Lanka", which will be a public company. There are no Key Performance Indicators for them at all. Without KPIs, these directors could be just lackeys of the Minister, who could do globetrotting without trying to achieve any targets at all. Therefore, we believe that the appointment of these key members, the directors, should go through the Constitutional Council and that there should be transparency and accountability in appointing those holding these positions.

Another issue is that the BoI unions, too, had many concerns and some of those concerns had been addressed by the Supreme Court Determination. However, the unions rightly point out a lack of a transitional provision in this Bill. There are 1,600 enterprises operating under the BoI, out of which only 280 enterprises are located inside the BoI Zones and the other enterprises are located outside. How are those enterprises located outside the BoI Zones going to be administered and what concessions would be given to them? And, by whom would the issues of the other companies which have BoI approval and which do not work within those Zones be addressed? Is it the Economic Commission or the "Zones SL"? I think there is an Amendment proposed, which states that they will give a transitional provision of three months, but that is not cited in the Bill very clearly. Right now, there are already 133 projects pending BOI approval. How would you manage them? What is the transitional provision the Government has provided in this Bill to accommodate them.

Then, there is another issue. According to Clause 13. *(b)* in page 12 of the Economic Transformation Bill, the Economic Commission has regulatory oversight of the zones and the power to appoint a regulator. Likewise, "Zones SL" also has certain regulatory powers, but in the Supreme Court Determination, it has been decided to strike off Clause 13.*(b)* completely. That is, to take off the requirement of a regulator, to deny a regulator because the Attorney-General has given written submissions to delete Clause 13.*(b)*. So, when you take that Clause out, that means there is a lack of a regulator in place. The "Zones SL" will manage private zones while the State manages the other zones. There has to be equal treatment to the private zones managed by "Zones SL" and the State zones; the facilities and the concessions given to investors in those investment zones must be equal. Therefore, a regulator is a must, if you need to attract foreign investment into the zones. So, we believe that there has to be an amendment to make sure that there is a proper regulator in place to ensure confidence among investors.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2048 වන විට ශ්‍රී ලංකාව දියුණු රටක් කිරීම ගැන ජනාධිපතිතුමා යෝජනා කරලා තිබෙනවා. ඒ කියන්නේ, අපේ රටට නිදහස ලැබිලා වසර 100කට පසුව. රටේ පවතින ආර්ථික තත්ත්වය අනුව වසරකට සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් අවශ්‍යයි. ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් මේ ගැන කථා කළා. හැබැයි, රටේ සාමාන්‍ය ස්වාභාවික ආර්ථික වර්ධනය ගත්තාම, ආණ්ඩුවක් තල්ලු කළත්, නැතත් සියයට 4ක ආර්ථික වර්ධන වේගයක් ශ්‍රී ලංකාවේ සිදු වෙනවා. හැබැයි, 2023දී - ගිය වසරේ - ශ්‍රී ලංකාවේ මූර්ත ආර්ථිකයේ වටිනාකම ගත්තාම, රුපියල් ට්‍රිලියන 12යි. එතකොට, සියයට 4ක ආර්ථික වර්ධන වේගයක් අනුව රුපියල් ට්‍රිලියන 12ක ආර්ථිකයක්, 2048 වෙනකොට සියයට 4කින් වර්ධනය වුණා නම්, රුපියල් ට්‍රිලියන 32කට පමණයි වැඩි වෙන්නේ. හැබැයි, අපිට දියුණු වන රටක් වෙන්නට නම් සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් අවශ්‍යයි. ඒ කියන්නේ අපේ ජාතික ආදායම රුපියල් ට්‍රිලියන 73කට යන්න ඕනෑ. හැබැයි, ස්වාභාවික ආර්ථික වර්ධන වේගය අනුව ට්‍රිලියන 32කට තමයි යන්නේ. ට්‍රිලියන 73කට යන්න තව කොච්චරක් අපි තල්ලු කරන්න ඕනෑද? දැන් රජය හිතනවා, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතින් මේ තත්ත්වය ස්ථාපනය කරන්න පුළුවන් කියලා. ආයතන පහක් ස්ථාපිත කරලා, මේ ආර්ථිකය දියුණු රටක් කරන ඉලක්කයට යන්න මේ ආයතන පහෙන් පුළුවන් කියලා රජය විශ්වාස කරනවා. හැබැයි, අපි එහෙම හිතන්නේ නැහැ. මේ පනතේ තිබෙන හිඩැස්වලින් පෙනී යනවා, ප්‍රායෝගිකව මේ සමහර ඉලක්ක සපුරන්න බැරි බව.

ඒ නිසා විපක්ෂය හැටියට අපි රජයට යෝජනාවක් කරනවා. We propose that the Government relook at the Bill and

create a coherent legislation to govern zone development and management, to make a robust regulatory and institutional framework to govern zones as a priority. That is one of the key proposals we make. Secondly, there must be minimum standards and criteria for investor selections. That is very important to ensure that you get the right investors to come to Sri Lanka for zone development also. Thirdly, there must be proper regulatory independence. Without regulatory independence, there would not be any confidence in the foreign investors coming into this country. We believe that this Bill does not sufficiently address any of those problems I mentioned now.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත යටතේ ස්ථාපිත කරන ආයතන පහ ප්‍රමාණවත් කියලා ආණ්ඩුව හිතුවාට, අපි එහෙම හිතන්නේ නැහැ. මේ ප්‍රශ්නය දිහා අපි මීට වඩා පුළුල් ලෙස බලනවා. අපි බලන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වන පරිච්ඡේදය. අපි හිතන විධියට, ප්‍රශ්නය වෙන්නේ ආර්ථික වර්ධන වේගය විතරක් නොවෙයි.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19වන පිටුවේ, VI වන පරිච්ඡේදයේ, 27 (2) (ඊ) යටතේ මෙසේ සඳහන් වෙනවා:

"නිෂ්පාදනයේ, බෙදා හැරීමේ සහ භුවමාරු කිරීමේ මාර්ග රජයෙහි, රාජ්‍ය ආයතනයන්හි හෝ වරප්‍රසාද ලත් අකලොස්සක් අතෙහි හෝ ඒකරාශී නොවී සහ මධ්‍යගත නොවී ශ්‍රී ලංකාවේ සකල ජනතාව අතර විසිරී යන ධර්මිෂ්ඨ සමාජ ක්‍රමයක් පිහිටුවීම;"

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඉක්මනින් අවසන් කරන්නම්.

එතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. අපේ ආර්ථිකයේ වර්ධන වේගය වැඩි වීම විතරක් නොවෙයි, අපේ ජාතික ආදායම වැඩි කරන එක විතරක් නොවෙයි ඉලක්කය විය යුත්තේ. අපි විපක්ෂයක් විධියට හිතනවා අපේ ජාතික ආදායම බෙදී යාමේ ක්‍රමවේදයේ ලොකු විෂමතාවක් තිබෙනවා, ආදායම් බෙදීයාමේ අසමානතාවක් තිබෙනවා, ඒ වාගේම වත්කම් බෙදීයාමේ අසමානතාවක් තිබෙනවා කියලා. ශ්‍රී ලංකාවේ සුළුතරයකට වත්කම්වලින් විශාල ධනස්කන්ධයක් අයිති වෙලා තිබෙනවා. හැබැයි, බහුතරයකට ඉතාම සුළු ප්‍රමාණයක් තමයි අයිති වෙලා තිබෙන්නේ. මේක වෙනස් කරන්න නම්, ඒ පරතරය නැති කරන්න නම්, ආදායම් බෙදීයාමේ අසමානතාව නැති කිරීමට නම්, ආර්ථික න්‍යාය සහ ප්‍රතිපත්ති අවශ්‍යයි. ඒක තමයි සමගි ජන බලවේගයේ ඉලක්කය වන්නේ.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Nalin Fenando. You have 17 minutes.

[අ.භා. 1.34]

ගරු නලින් ප්‍රනාන්දු මහතා (වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் பர்னாந்து - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Nalin Fernando - Minister of Trade, Commerce and Food Security)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අද දිනයේ අපි සාකච්ඡා කරන ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට මා බලාපොරොත්තු වෙනවා. මම මේ කථාව කරන්න බලාපොරොත්තු වුණේ වෙනස් විධියකට, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නමුත්, මට පෙර කථා කළ ගරු කබීර් හෂීම් මැතිතුමාගේ කථාවේ අවසානයේ දී ප්‍රකාශ කළ කාරණයකට එක දෙයක් එකතු කිරීම වැදගත් කියලා මම හිතනවා. එතුමා කිව්වා රටේ ආර්ථික වර්ධන වේගය හෝ රටේ සංවර්ධන වේගය නොවෙයි රටකට පළමුවෙන්ම වැදගත් වෙන්නේ, ඒ රටේ සමස්ත ජනතාවට සියලු පහසුකම් ඇතිව ජීවත් වෙන්න පුළුවන් රටක් හැදීමයි කියලා. එතුමා කියපු ඒ කථාව හරි.

මෙම පනත් කෙටුම්පතේ, ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය යටතේ ප්‍රධාන කරුණු තුනක් සඳහන් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒකේ, එතුමා කියපු කාරණා හරියට, පිළිවෙළටම තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහගෙන ඉන්නවා නම්, මම එහි පළමුවෙනි එක කියන්නම්. එහි මෙසේ සඳහන් වෙනවා:

"(අ) ප්‍රමාණවත් ආහාරපාන, ඇඳුම් පැළඳුම් සහ නිවාස ද ජීවන තත්ත්වයෙහි නිරන්තර වර්ධනය ද, විවේකය හා සමාජයීය සහ සංස්කෘතික ඉඩ ප්‍රස්ථා නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම ද ඇතුළුව ප්‍රමාණවත් ජීවන මට්ටමක් සියලු පුරවැසියන් විසින් තමන්ට සහ තම පවුල්වල සාමාජිකයින්ට අත්කර දීම;"

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු දේ තමයි මේ පනත් කෙටුම්පතේ සඳහන්, ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ මූලික අරමුණ. ඔබතුමා කිව්වා වාගේ, මෙහි අරමුණ ආර්ථිකය ඉහළ නංවලා, රටේ සමස්ත ජනතාවට අවශ්‍ය කරන පහසුකම් ලබා දීමයි. ඒක තමයි අවසාන ප්‍රතිඵලය විධියට බලාපොරොත්තු වෙන්නේ. එහි දෙවෙනි සහ තුන්වෙනි අරමුණු විධියට මෙසේ සඳහන් වෙනවා:

"(ආ) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් තුළින් සහ එකී ආර්ථික ක්‍රියාකාරකම්, රටේ සමාජ අරමුණු සහ පොදු අභිවෘද්ධිය අරභයා මෙහෙයවීම සහ සම්බන්ධීකරණය පිණිස යෝග්‍ය වන සැලසුම් සහ පාලනය නීතියෙන් නියම කිරීමෙන් මුළු රටේ ම ශීඝ්‍ර සංවර්ධනයක් ඇති කිරීම; සහ

(ඇ) ආර්ථික අර්බුද ඇති වීම වැළැක්වීම."

මේ ජාතික ප්‍රතිපත්තියේ මූලික අරමුණු තුන දිහා බැලුවාම මේ පනත් කෙටුම්පත ඇතුළේ තිබෙන දේ ගැන අපට හිතා ගන්න, විස්තර කරන්න පුළුවන්. මේ පනත් කෙටුම්පතේ පළමුවෙනි අරමුණ මොකක්ද? කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වා වාගේ ආර්ථික සංවර්ධනය ළඟා කරගෙන, මේ රටේ සියලු පුරවැසියන්ට එක මට්ටමකට ජීවත් වෙන්න පුළුවන්, අවම පහසුකම් ටික වත් ලබා ගන්න පුළුවන් වැඩ පිළිවෙළ තමයි මේකේ තිබෙන්නේ. ඒ වාගේම දෙවෙනි අරමුණ විධියට තිබෙන්නේ රාජ්‍ය සහ පෞද්ගලික අංශය මේ රටේ සංවර්ධනය සඳහා පාවිච්චි කරන්නේ කොහොමද කියන එක. තුන්වෙනි අරමුණ විධියට තිබෙන්නේ මොකක්ද? අවුරුදු 75ක් විතර ගෙන ගිය ආර්ථික ප්‍රතිපත්තිය තුළ අපේ රට ආර්ථික වශයෙන් කඩා වැටුණා. නැවත මේ රට ආර්ථික වශයෙන් කඩා වටිටා නොගෙන, රටේ ආර්ථිකය ශක්තිමත්ව

[ගරු නලින් ප්‍රනාන්දු මහතා]

පවත්වාගෙන යන වැඩ පිළිවෙළ මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරලා ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එක තමයි තුන්වෙනි අරමුණ. ඉතින් තව මොනවාද මේකේ කරන්න තිබෙන්නේ? සමහර වෙලාවට මොනවා හරි කියන්න ඕනෑ නිසා මේ පනත් කෙටුම්පත විවේචනය කළාට, ඒ අවශ්‍ය කරන ප්‍රතිපාදන මේ පනත් කෙටුම්පත තුළ තිබෙනවා.

විශේෂයෙන්ම අපි මෙය හඳුන්වන්නේ සමාජ වෙළෙඳ පොළ ආර්ථිකයක් ගෙන යන්න පුළුවන් පනත් කෙටුම්පතක් විධියටයි. මොකක්ද ඒකට හේතුව? ඉරාන් වික්‍රමරත්න මැතිතුමා කිව්වා වාගේ, ආර්ථිකය විතරක් හදලා හරියන්නේ නැහැ, එහි ප්‍රතිලාභ සමාජයට යන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතෙන් බලාපොරොත්තු වන ප්‍රතිලාභ, එහි අඩංගු ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය සමාජයට බෙදී යන්න ඕනෑ. එහි ප්‍රතිඵල හැම පුද්ගලයකුටම ලැබෙන වැඩ පිළිවෙළක් අනුවයි යන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතේ තවත් වෙනසක් තිබෙනවා. අපි සාමාන්‍ය පනත් කෙටුම්පතකට එහා ගිහිල්ලා මේකෙන් ප්‍රතිපත්ති සහ විධිවිධාන හදලා තිබෙනවා. ඒක තමයි ඒ වෙනස.

ඒ කියන්නේ, මේ විධිවිධාන හරහා අපි මේ ආර්ථික ප්‍රතිපත්තිය ඉස්සරහට ගෙනයන්න ඕනෑ. එහෙම නැත්නම්, මේ පනතත් එක්ක මේ ආර්ථික විධිවිධාන ඉස්සරහට ගෙනයන්න ඕනෑ. ඒ තුළ තමයි අපේ ආර්ථික වැඩ පිළිවෙළ හැදෙන්නේ කියන එක විශේෂයෙන්ම මේකේ සඳහන් කර තිබෙනවා. ලෝකයේ දියුණු රටවල තිබෙන ආර්ථික ප්‍රතිපත්තිවල සඳහන් මූලික කාරණා ටික පවත්වාගෙන යන්න ඕනෑය කියන එක අපි මේකේ කියා තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, දළ දේශීය නිෂ්පාදිතයට රාජ්‍ය ණය අනුපාතය 2032 වර්ෂය වන විට සහ ඉන් පසුව සියයට 95කට වඩා අඩු කර ගැනීම පිළිබඳව මෙම පනතේ සඳහන් කර තිබෙනවා. මේ පනතේ විධිවිධානවලට මේ මූලික කරුණු ටික අපි ඇතුළත් කර තිබෙනවා. එනම්, දළ දේශීය නිෂ්පාදිතයට මධ්‍යම ආණ්ඩුවේ වාර්ෂික දළ මුදල් සැපයීමේ අවශ්‍යතා අනුපාතය 2032 වර්ෂය වන විට සහ ඉන් පසුව සියයට 13කට වඩා අඩුවීම, දළ දේශීය නිෂ්පාදිතයට මධ්‍යම ආණ්ඩුවේ වාර්ෂික ණය සේවාකරණ අනුපාතය 2027 වර්ෂය වන විට සහ ඉන් පසුව සියයට 4.5කට වඩා අඩු වන පරිදි ආණ්ඩුව විසින් ගෙවිය යුතු ණය ප්‍රතිව්‍යුහගත කිරීම, -මෙහිදී සියලුම ආණ්ඩු ගත් ණය ප්‍රතිව්‍යුහගත කිරීම මේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළට එකතු කරලා මේ පනත මඟින් අපි ඉදිරිපත් කර තිබෙනවා- ඒ වාගේම තරඟකාරිත්වය වැඩි කිරීම සඳහා ජාතික ආර්ථිකය විවිධාංගීකරණය කිරීම සහ දැඩි ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීම, 2050 වර්ෂය වන විට ශුද්ධ ශූන්‍යයක් -නෙට් සීරෝ- ළඟා කර ගැනීමට කටයුතු කිරීම, ඒ වාගේම ගෝලීය ආර්ථිකය සමඟ ඒකාබද්ධ වීම වර්ධනය කිරීම, ස්ථාවර සාර්ව ආර්ථික තුලනයක් සහ තිරසර ණය සාක්ෂාත් කර ගැනීම කියන කාරණා මේ විධිවිධාන යටතට පත් කරලා, ඒ වැඩ පිළිවෙළ අපි ඉස්සරහට ගෙනයන්නේ කොහොමද කියන එක මේ පනත තුළ සඳහන් කර තිබෙනවා.

මේ පනතේ තව විශේෂත්වයක් තිබෙනවා. එනම්, අපි ගන්නා සියලු තීන්දුවල ප්‍රතිඵල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. විෂය භාර අමාත්‍යවරයා සෑම වර්ෂයකම මාර්තු 31වන දා වෙද්දි එහි ප්‍රතිඵල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒ පිළිබඳව සාකච්ඡා කරලා අපි ගෙනිච්ච වැඩ පිළිවෙළේ සාර්ථක අසාර්ථකභාවය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ වාගේම අවුරුදු 5කට වරක් පත්වන ඕනෑම ජනාධිපතිවරයෙකු 2048ට ගෙනයන වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් අපි ගෙන ගිය ආර්ථික ප්‍රතිපත්තිය, වැඩ පිළිවෙළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒ පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කරන්න ඕනෑ.

මේ පනත දේශපාලන වශයෙන් පාවිච්චි කරන්න පුළුවන් එකක් නොවෙයි. මෙය රටේ අනාගතයට අවශ්‍ය වැඩ පිළිවෙළ හා සම්බන්ධ එකක් කියන එක තමුන්නාන්සේලාට පැහැදිලි වෙනවා නේ. විපක්ෂය හැම තිස්සේම කියනවා, මේක ආණ්ඩුවේ වැඩක්, ආණ්ඩුව වාසි ගන්නයි මේක කරන්නේ, මෙවැනි පනත් ගෙනැල්ලා ආණ්ඩුව ඉස්සරහට කරන වැඩ පිළිවෙළ පෙන්වන එක ඡන්ද ගන්න කරන වැඩක් කියලා. නමුත්, මේකේ ඇතුළත තිබෙන හරය, අවශ්‍ය දේ බලලා ඒවා විවේචනය කළා නම් අපට ඒවා දරාගන්න පුළුවන්. එහෙම නැත්නම් ඒවා අපට නිවැරදි කර ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුලදී කිව්වා වාගේ මේ වැඩ පිළිවෙළට අපි ආයතන 5ක සහයෝගය ලබා ගන්න ඕනෑ. ආර්ථික පරිවර්තන පනතේ තිබෙන කාරණා වැඩ පිළිවෙළක් බවට පත් කරලා ඒ අවශ්‍ය වැඩසටහන හදාගන්න ආයතන 5ක සහාය අපි ලබා ගන්නවා. ශ්‍රී ලංකා ආර්ථික කොමිෂන් සභාව, සෝන්ස් එස්එල්, ජාතික ඵලදායිතා කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සහ ජාත්‍යන්තර වෙළෙඳ ආයතනය වැනි ආයතන 5ක සහයෝගය මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනයන්න අපි ලබා ගන්න ඕනෑ. ඒ සඳහා නිරතුරුව -තුන්සියහැට්පස් දවස පුරා- මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනයෑමට අවශ්‍ය සහයෝගය ලබා ගන්න අපි ආයතන 5 යොදා ගන්නවා. විපක්ෂය කියනවා, අවශ්‍ය ප්‍රතිඵල, ඉලක්ක ලබා ගන්න නම් ආයතන 5ක් පිහිටුවාගෙන වැඩක් නැහැ කියලා.

ආයතන 5ක් පිහිටුවාගෙන වැඩක් නැත්නම්, අවශ්‍ය 7ක් ද, එහෙම නැත්නම් 10ක් ද, එහෙම නැත්නම් 20ක් ද කියලා කියන්න ඕනෑ. එහෙම නැත්නම් ආයතන ගණන වැඩි වුණාම ප්‍රතිඵල වැඩි වෙනවා ද, ආයතන ගණන වැඩි වුණාම ප්‍රතිඵල අඩු වෙනවා ද කියන කාරණා එතුමන්ලා කියන්න ඕනෑ. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරද්දි එම පනත් කෙටුම්පතින් ඉටු කර ගන්න බලාපොරොත්තු වන වැඩ පිළිවෙළ ප්‍රකාශ කිරීමෙන් තමයි අපට ඒ කෙරෙහි විශ්වාසය ගොඩනැඟෙන්නේ. අපේ රටේ ඕනෑ තරම් පනත් තිබෙනවා. හැබැයි, ඒ පනත් සියල්ල අපි පාවිච්චි කරනවාද? ඒ පනත්වලින් අපි රට වෙනුවෙන් ගන්න ප්‍රයෝජන මොනවාද? සමහර පනත් නමට විතරක් සීමා වෙලා තිබෙනවා. මම අහගෙන හිටියා, දවසක් අපේ ගරු අනුර ප්‍රියදර්ශන යාපා මන්ත්‍රීතුමා පනතක් ගැන කථා කළා. එතුමා කිව්වා, "පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. අපි උදේ ඉඳලා හවස් වනකල් ඒවා ගැන සාකච්ඡා කරනවා. ඒවායේ හොඳ සහ නරක කියනවා. අපි අත ඔසවලා පනත් කෙටුම්පත් සම්මත කරනවා. නමුත් ඒවායින් කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නැතුව කොහේ හරි තැනක නිකම්ම තියනවා" කියලා. මේක තමයි අපේ රටේ පනත්වලට බොහෝ වෙලාවට සිදු වෙලා තිබෙන්නේ. නමුත් මේ ආර්ථික පරිවර්තන පනත කියන්නේ, අපේ රටේ අනාගත වැඩ පිළිවෙළ, අපේ රටේ දරුවන්ගේ අනාගතය. මේ තුළින් අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ රටේ ආර්ථික වැඩ පිළිවෙළ සහ එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියලායි.

අපේ රටේ ආර්ථිකය කඩා වැටුණු විට අපි ආපස්සට හැරී බැලුවා, මෙවැනි පනතක්, එහෙම නැත්නම් මෙවැනි වැඩ පිළිවෙළක් අපට තිබුණාද කියලා. අපට මෙවැනි වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. අපට ආයතන කිහිපයක් තිබුණා. ඒ ආයතන කිහිපය එක්ක අපි ගනුදෙනු කළා. උදාහරණයක් කිව්වොත්, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ තිබෙනවා, BoI එක සහ EDB එක - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය. එවැනි ආයතන කිහිපයක් අපට තිබෙනවා. ඒ ආයතන අවුරුදු 20ක්, 25ක් තිස්සේ පුළුවන් විධියට මේ රටේ ආර්ථිකයට අවශ්‍ය දේවල් වෙනුවෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන ගියා. හැබැයි ජාතික වැඩ පිළිවෙළක්, රටට වගකිව යුතු වැඩ පිළිවෙළක්

බොහෝ විට ඒවා තුළ තිබුණේ නැහැ. ලෝකයේ දියුණු වෙච්ච රටවල් එම ප්‍රතිඵලය ලබා ගත් ක්‍රමයක් තිබෙනවා. ඒ ප්‍රතිඵලය ලබා ගත් ක්‍රමය මෙම පනත තුළ තිබෙනවා. ඒකයි අපි කියන්නේ. එහෙම නැතුව මේ නිකම් පනතක් ගෙනැල්ලා ආණ්ඩුව වාසියක් ගන්න කරන වැඩක් නොවෙයි, මේක. අපේ රටේ ආර්ථිකය කඩා වැටුණු වෙලාවේ මෙවැනි පනතක අවශ්‍යතාව අපට හොඳටම තේරුණා. අපි තීන්දුවක් ගන්න ගිය හැම අවස්ථාවකදීම අපට තේරුණා, අප නොකරපු දේවල් බොහොමයක් තිබෙන බව. රටේ ආර්ථික ප්‍රශ්න ඇති වෙද්දි, ණය ප්‍රතිව්‍යුහගතකරණයේදී වාගේම, ආර්ථික වශයෙන් අපේ රට වෙනත් රටවල් එක්ක බැඳිලා තිබුණු අවස්ථාවල අපට අවශ්‍ය තීන්දු ගන්න ගියාම තේරුණා, අපට නිසි ප්‍රතිපත්තියක් නැහැ කියන එක. ඒ වාගේම අපට නිසි වැඩ පිළිවෙළක් නැති බවත් තේරුණා. අපට අවශ්‍ය ජාතික වැඩ පිළිවෙළ මේ ආර්ථික පරිවර්තන පනත තුළින් අද අපට ලැබෙනවා. මේක තමයි අපට අවශ්‍ය වුණේ.

ඉතිහාසයේ සිට ගත්තාම අවුරුදු 25ක, 30ක ඉලක්කගත මෙවැනි දීර්ඝ වැඩ පිළිවෙළක් තිබුණේ මහවැලි සංවර්ධන ව්‍යාපාරයට පමණයි. මහවැලිය ආරම්භ කරද්දි අපට තිබුණා, මෙවැනි ඉලක්කයක්. ඔබතුමන්ලාට මතක ඇති, දීර්ඝ කාලීන, මැදි කාලීන හා කෙටි කාලීන වශයෙන් වැඩ පිළිවෙළක් එක්කයි මහවැලි සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කළේ කියලා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ගෙනා මහවැලි සංවර්ධන ව්‍යාපාරය අවුරුදු 30ක වැඩ පිළිවෙළක්. ඒක හොඳ ව්‍යාපෘතියක්. අද එහි ප්‍රතිඵල ලැබෙනවා. ඊට පසු පත් වුණු එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ රජය එම ව්‍යාපෘතිය නිම කිරීම කඩිනම් කිරීමට තීරණය කරලා, එය මහවැලි කඩිනම් වැඩ පිළිවෙළ නමින් ක්‍රියාත්මක කළා. එහිදී අවුරුදු 30ක් වූ ව්‍යාපෘති කාලය අඩු කළා. ඒකට කමක් නැහැ. කලින් ආණ්ඩුව ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නතර කරලා, එම ව්‍යාපෘතිය පැත්තකට දමලා විනාශ කරන්නේ නැතුව එදා එක්සත් ජාතික පක්ෂයේ හිටපු ඒ නායකයෝ ගත්ත තීන්දුව මොකක්ද? එය මහවැලි කඩිනම් වැඩ පිළිවෙළ බවට පත් කළා. අවසානයේ මොකක්ද වුණේ? අද වනකොට ලක්ෂ ගණනක් මහවැලි ව්‍යාපාරය තුළින් ප්‍රතිලාභ ලබනවා. මහවැලි ව්‍යාපාරයට බද්ධ වුණු මහවැලි කලාපයේ ගොවීන්, සියලු නිෂ්පාදකයෝ සහ ව්‍යාපාරිකයෝ අදටත් මහවැලි ව්‍යාපාරය ඉදිරියට පවත්වාගෙන යනවා.

ඒක නේ අපි කරන්න ඕනෑ. දීර්ඝ කාලීන වැඩසටහනක් තිබෙනවා නම් ඒක ඉක්මන් කරන්න, එහෙම නැත්නම් ඒකට තව දේවල් එකතු කරලා ඉදිරියට ගෙනයන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඊළඟට පත් වන ආණ්ඩුවට තිබෙන්න ඕනෑ. නමුත්, අපේ රටේ කරන්නේ ආණ්ඩුව මාරු වුණු ගමන්, මේක අරයාගේ, මේක මෙයාගේ, මේක මෙයා හදපු එකක්, මේක අපි දියුණු කළොත් හදපු කෙනාව තමයි මතක් වෙන්නේ කියලා ඒ සැලසුම් ඉරලා පැත්තකට දමනවා. මේ රටේ ඉතිහාසයේ එහෙම තමයි සිද්ධ වුණේ. අවසානයේදී මේ රටේ මිනිස්සුන්ට එදිනෙදා පාවිච්චියට අවශ්‍ය කරන දේවල්වත් - තමන්ගේ දරුවා පාසලට රැගෙන යන්න වාහනයට අවශ්‍ය ඉන්ධන ටික, ගෑස් සිලින්ඩරය, නිවසට ආලෝකය ලබා ගැනීමට අවශ්‍ය විදුලි බලය- ලබා ගන්න බැරි තත්ත්වයක් ඇති කළා. අපි ආණ්ඩු මාරු වෙද්දී ප්‍රතිපත්ති මාරු කළා. අපට තිබුණු ආර්ථික වැඩ පිළිවෙළ මාරු කළා. අපි මිනිස්සු සන්තෝෂ කරන තීන්දු ගත්තා. නමුත් අපි අද විවාද කරන ආර්ථික පරිවර්තන පනත 2048 වෙනකම් අපේ රටේ අනාගතය පිළිබඳ තීන්දු ගන්න පනතක් බවට පත් වෙනවා. මේක ඓතිහාසික පනතක්. ලංකාවේ අපට තිබුණු ලොකුම ප්‍රශ්නය, ආර්ථික ප්‍රශ්නයක්. සියලු පක්ෂ නායකයින් අද ජනාධිපති වෙන්න දහලනවා; සියලුදෙනා ආර්ථිකය ගොඩනඟන හැටි කියන්න උත්සාහ කරනවා. නමුත් රට කඩාගෙන වැටුණු වෙලාවේ ආර්ථිකය ගොඩනැඟීම වෙනුවෙන් උදවු කරන්න කවුරුවත් හිටියේ නැහැ. ඒ අවස්ථාවේදී පැනලා ගියා. වර්තමාන ජනාධිපතිතුමාත්, මේ ආණ්ඩුවත් කඩාගෙන වැටුණු රටේ ආර්ථිකය ගොඩනඟන වැඩ පිළිවෙළ හැදුවා; ආර්ථිකය ගොඩ ගත්තා. අනාගතයේදී රට ගොඩනඟන්නේ කොහොමද කියා කල්පනා කරලා, 2048 අවුරුද්ද වෙනකම් රට ගොඩනැඟීම සඳහා අවශ්‍ය වන විධිවිධාන හා වැඩ පිළිවෙළ අපි සකස් කරලා තිබෙනවා කියන කාරණයත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු මේ පනතට සහාය ලබා දෙන බව ප්‍රකාශ කරමින් කථා කරනවා අපි දැක්කා. එතුමන්ලා එහි හොඳ දේවල් ගැන කථා කළා. අපි ඒවා පිළිගන්න ඕනෑ. එතුමන්ලා කියන හොඳ දේවල් ඇතුළු කරලා, මේ පනත ශක්තිමත් පනතක් බවට පත් කරන්න සියලුදෙනාගේ සහයෝගය ලබා දෙන්න කියා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. S.M. Marikkar, you have 12 minutes.

[අ.භා. 1.51]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත පිළිබඳවත් විවාද කරන මේ මොහොතේදී මම මේ කාරණය පැහැදිලිව කියන්න ඕනෑ. මේ ගරු සභාවේ ආණ්ඩුව වෙනුවෙන් කථා කරන ඇමතිවරු සියලුදෙනා කථා කරන්නේ ඔක්කොම ප්‍රශ්න ඉවරයි කියලා හිතාගෙනයි. අද උදෑසන අපේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කිව්වා, ගිය අවුරුද්දේ ඩොලර් බිලියනයක ඍජු විදේශ ආයෝජන අපේ රටට ඇවිත් තිබෙනවාය කියලා. මම මීට මාස තුනකට කලින් මේ සභාවේදී ප්‍රශ්නයක් අහපු වෙලාවේ ඒ ආණ්ඩුවේම ඉන්න ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය ඇමතිතුමා කිව්වා, "ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. හැබැයි, තවම ඒ ආයෝජන ඇවිත් නැහැ" කියලා. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට පුදුම කඩේ යෑමක් නේ යන්නේ. 2001 දී ආර්ථිකය ඔහොම වැටුණාම රනිල් වික්‍රමසිංහ එක්ක අපි තමයි ආර්ථිකය ගොඩ ගත්තේ කියලා කියනවා. එහෙම කියලා එතුමාට කියනවා, ගණන් හිලව් සම්බන්ධව එතුමා එක්ක වාදයකට එන්න එපා කියලා. මම අහපු ප්‍රශ්නයට උත්තර දුන්නේත් නැහැ.

මම මේ අවස්ථාවේදී ඡායාරූපයක් පෙන්වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මෙන්න මෙවැනි කට්ටිය තමයි අද රනිල් වික්‍රමසිංහ මහත්මයාව වර්ණනා කරන්නේ. මේ ඡායාරූපයේ තිබෙන්නේ "මහ දවල් මහ බැංකුවේ මහා මුදල් මංකොල්ලය ජනගත කළ මගේ අංකය අංක 16" කියායි. මෙහෙම තමයි මහ මැතිවරණය කළේ. මම මේ ළඟදී voice-cuts ටිකක් බැලුවා. ආණ්ඩුවේ ඉන්න පොහොට්ටුවේ ඇමතිවරු -රමේෂ් පතිරණ හැර- හැම කෙනාම කිව්වේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කියන්නේ මහ බැංකු හොරා කියලා. මේ අය කථා කරන්නේ කටින්ද, අඩෝ මුඛයෙන්ද කියලා මම දන්නේ නැහැ. අපේ රාජ්‍ය ඇමතිතුමාට මම මුකුත් කියන්නේ නැහැ. ඕනෑ නම් කියන්න, මම voice-cuts ටික දෙන්නම්. රනිල් හිරේ දානකම් නින්ද යන්නේ නැහැ කියපු කට්ටිය; රනිල්ට අගමැතිකම් දෙන්න මොළේ අමාරුවක් නැහැ කියපු කට්ටිය; රනිල් මේ රටේ ආර්ථිකය කඩා වට්ටලා රට වික්කා කියපු කට්ටිය තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයා අවුරුදු දෙකක් ජනාධිපති වෙලා ඔක්කොම ප්‍රශ්න විසඳුවා වාගේ කථා කරන්නේ.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ, මහ ලොකු ජාත්‍යන්තර ආර්ථික ඔස්තාර්ලා. ගිය අවුරුද්දේ සිංගප්පූරුවේ සෘජු විදේශ ආයෝජන ඩොලර් බිලියන 140යි; ඉන්දියාවේ ඩොලර් බිලියන 70යි; වියට්නාමයේ ඩොලර් බිලියන 28යි; තායිලන්තයේ ඩොලර් බිලියන 20යි. ජාත්‍යන්තරය පවා පිළිගන්නවා කියන අය නායකත්වය දෙන රටට එය ඩොලර් බිලියන බින්දුවයි. ගිවිසුම් අත්සන් කළා කියනවා. හැබැයි, ගිය අවුරුද්දේ සත පහක්වත් ඇවිත් නැහැ. මේ කරන්නේ තනිකර ප්‍රෝඩාවක්. මේ ආර්ථික පරිවර්තන පනතට IMF ගිවිසුමේ කරුණු ඇතුළත් කරලා තිබෙනවා.

මොකටද එහෙම දාලා තිබෙන්නේ? තමන් පරදින බව දැනගෙන ඊළඟට ආණ්ඩුව ගන්න කෙනාව විනාශ කරන්න. තමන් පරදින බව දැනගෙන ඊළඟට ආණ්ඩුව ගන්න කට්ටියව විනාශ කරන්න තමයි ඒ කරුණු දාලා තිබෙන්නේ. හැබැයි, අපි කියන්න කැමැතියි, මේ විකෘති පාර්ලිමේන්තුව තුළ ඔය මොනවා සම්මත කළත්, සැප්තැම්බර් මාසයේ 21වෙනි දාට ජනාධිපතිවරණය ජයග්‍රහණය කරලා, මේ විකෘති පාර්ලිමේන්තුව විසුරුවා, බහුතර ජයග්‍රහණයක් ගත්තාට පසු ජනතා මතයක් තිබෙන ආණ්ඩුවක් යටතේ අප ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක නැවත මේ ගැන සාකච්ඡා කරන බව. මොකද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් දන්නවා, මේ පාර්ලිමේන්තුව ජන මතයක් තිබෙන පාර්ලිමේන්තුවක් නොවෙයි කියලා. විකෘතියක් මේක. මේක ඇතුළේ තමයි මේ විවිවූර්ණ ගහන්නේ. ඒ නිසා දැන් ආර්ථික පරිවර්තන පනත් ගේනවා කියලා BoI එක අහෝසි කරලා, තමන්ගේ ජුන්ටාව දමාගෙන ගුණ්ඩුවක් ගහන්න තමයි මේ හදන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කාරණයත් කියන්න ඕනෑ. හිල්ටන් හෝටලය ගිය අවුරුද්දේ තක්සේරු කරලා තිබුණේ ඩොලර් මිලියන 124කට. දැන් අපට වෙන ආරංචියක් ලැබිලා තිබෙනවා. ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න ආණ්ඩුවට අයිතිය තිබෙනවා. දැන් ඩොලර් මිලියන 55කට වැඩේ ඉවර කරන්න ලු යන්නේ. එතකොට මේ ඩොලර් මිලියන 20ක් පගාව ගහන්න හදන රිරි යකා කවුද? ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉන්න රිරි යකා කවුද? රටට එන්න ඕනෑ ඩොලර් මිලියන 124, ඩොලර් මිලියන 55කට අඩු කරලා, තමන්ගේ සාක්කුවට ඩොලර් මිලියන 20ක් දමා ගන්න යනවා. මේ විධියටම තමයි හදිසි මිලදී ගැනීම් හරහා තෙල්වලින් ගැහුවේ; ගල් අඟුරුවලින් ගැහුවේ; ගෑස්වලින් ගැහුවේ. ඒ නිසා මෙවැනි අර්බුදවලිනුත් මහ දවාලේ හොරකම් කරන මේ ආණ්ඩුව මේ වාගේ පනත් ගෙනැල්ලා, මේ අන්තිම කාලයේ තමන්ට අයිති නැති වැඩක්, තමන්ට ජනමතයක් නැති වැඩක් තමයි මේ කරන්නේ. මේක අලුත් ආණ්ඩුව කළ යුතු වැඩක්. නමුත්, මේ වෙලාවේ මේ පනත ගේන්නේ තක්කඩිකමටයි කියන එක ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමන්ලා කිව්ව විධියට ආණ්ඩුවේ ඇමතිවරුන්ගෙන් අපි අහනවා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

දැන් මහ බැංකු හොරා නොවෙයිද, අර්ජුන මහේන්ද්‍රන් මහ බැංකු හොරා නොවෙයිද කියලා. අපි නම් එහෙම කිව්වේ නැහැ. ඔබතුමන්ලා කියපු විධියට දැන් එතුමා එහෙම නොවෙයිද? දැන් සුද්ද වෙලාද තිබෙන්නේ? Clear වෙලාද තිබෙන්නේ? ඒ නිසා අපි කියනවා මේ ප්‍රෝඩාකාරී වැඩවලින් ගොඩයන්න බැහැ කියන එක.

ඒ වාගේම දැන් තව වැඩක් කරනවා. අධිකරණ ඇමතිතුමායි, ජනාධිපතිතුමායි, විදේශ කටයුතු ඇමතිතුමායි එකතු වෙලා කැබිනට් පත්‍රිකාවක් දාලා තිබෙනවා, කොවිඩ් - 19 වසංගතය කාලයේ අවිද්‍යාත්මකව, බලෙන් මෘතදේහ ආදාහනය කිරීම පිළිබඳව සමාව ඉල්ලලා. පළමුවෙන්ම මම කියන්න ඕනෑ, ජනාධිපතිතුමා ඒ කැබිනට් මණ්ඩලයේ හිටියේ නැති බව. එම නිසා ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ තීරණය ගත්ත කැබිනට් මණ්ඩලයේ අලි සබ්රි ඇමතිතුමා හිටියේ නැද්ද? ඒ වෙලාවේ මේවා පිළිබඳව එතුමාට ප්‍රශ්න කරන්න බැරි වුණේ ඇයි? එතුමාගේ කට කොහේද තිබුණේ? එතකොට අධිකරණ ඇමතිතුමා හිටියේ නැද්ද? දැන් මේ කරන්න හදන්නේ මොකක්ද? මේකෙන් රාජපක්ෂලාව සුද්ද කරලා - clean කරලා - ඒක නිලධාරින් පිට පටවන එක.

කවුරු හරි නිලධාරින් විද්‍යාත්මක හේතුවලින් තොරව මේ සඳහා උපදෙස් දුන්නා නම්, ඒ තීරණය ගත්ත පුද්ගලයා කොහොමද ඒ තීරණය ගත්තේ? එතකොට ඒ කැබිනට් මණ්ඩලයේ හිටපු අය මොනවාද කළේ? දැන් මේ සමාව ගැනීම හරහා මොකක්ද කරන්න හදන්නේ? මුස්ලිම් ජනතාවගේ ඡන්ද ටික කොල්ල කන්න පුළුවන් කියලා හිතාගෙන මේ කටයුතු කරනවා. නමුත්, මේ රටේ මුස්ලිම් ජනතාව එච්චර මෝඩයෝ ගාණට දමන්න එපා; ඒ වේදනාව ඔච්චර පොඩි දෙයකට දමන්න එපා. ඒකේ වන්දිය හම්බ වෙයි. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, ඔබතුමන්ලා සමාව ඉල්ලන්නේ ඇත්තටම නම්, මේකේ සැබෑ වැරදිකරුවන් කවුද කියලා සොයන්න ඕනෑ බව. ඒගොල්ලන්ට දඬුවම් දෙන්න ඕනෑ. ඒ වාගේම වින්දිතයන්ට වන්දි ලබා දීමට කටයුතු කරන්න ඕනෑ. මොකද, ඒ කට්ටියට ඒවා ගැන හැඟීමක් නැහැ. මැරිච්ච මිනිස්සුන්ගේ පවුල්වල අය තමයි ඒවායින් විඳවන්නේ. ඒ මෘත දේහ අවිද්‍යාත්මකව, බලෙන් ආදාහනය කරවලා, ඒක හරි කියන්න ඒ වෙනුවෙන් කඩේ ගිය හැටි අපට මතකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කියන කට්ටිය කවුරුවත් උද්ඝෝෂණය කරන්න පාරටවත් බැස්සේ නැති බව මට මතකයි. ජවිපෙ රතු මල්ලිලාවත් පාරට බැස්සේ නැහැ. ඔක්කොම විරුද්ධ වුණේ නැහැ. රාජපක්ෂලා ජාතිවාදය හදනකොට, ආගම්වාදය හදනකොට ජවිපෙ රතු මල්ලිලා ඔක්කොම ඒවා ඔඩු දුවන්න ඉඩදීලා බලාගෙන හිටියා. නමුත්, දැන් ඇවිල්ලා ශෝකාලාප නහනවා. අපි තමයි එළියට බැහැලා, මේකට විරුද්ධව සටන් කළේ. ඒ, ගෝඨාභය රාජපක්ෂගේ පාලනයේ දරුණුතම කාලයේදී. එතුමාට තුනෙන් දෙකක බලයක් තිබුණු කාලයේ අපි විතරයි එළියට බැස්සේ. අන්තිමේදී මම හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාට කථා කළා.

මම මෙතෙක් නොකියපු කථාවක් දැන් කියන්නම්. දවසක් මම දුරකථන ඇමතුමක් අරගෙන හිටපු අගමැතිතුමාගෙන් ඇහුවා, "ගරු අගමැතිතුමා, කොවිඩ් වතුරෙන් බෝ වෙනවා නේ, ඇයි, මේ ඔක්කොම ප්‍රශ්න කොළොන්නාවට ගේන්නේ" කියලා. එතුමා මට කියපු වචනය මේ ගරු සභාවේදී කියන්න බැහැ. ඒ නිසා මම ඒක වැදගත් විධියට කියන්නම්. මම කිව්වා, "ඔබතුමන්ලා කුණු කන්දක් ගෙනැත් දැම්මා. දැන් ඔක්කොම කොවිඩ් රෝගීන් අයිඩීඑච් එකට ගෙනැත් දැම්මාම, ඒ hospital එකේ වතුර කොළොන්නාවේ කානු දිගේ ගියාම, මුළු කොළොන්නාවටම කොවිඩ් එනවා නේ සර්. ඊළඟට, නර්ස් නෝනලා කොළොන්නාවේ බෝඩ් වෙලා ඉන්නේ, මෙහෙම කළොත් කොවිඩ් බෝ වෙනවා නේ" කියලා. එතකොට එතුමා මට කිව්වා, "කවල් දමන්න එපා, මම මොනවා හරි කරන්නම්" කියලා. එතකොට මම එතුමාගෙන් ඉල්ලීමක් කළා, එහෙම නම් ඉස්සෙල්ලාම vaccine එක දෙන්න කියලා. ඊට පසුව නැවත

වතාවක් මම එතුමාට කථා කළා. කථා කරලා මම කිව්වා, "සර් මේක වැරදියි. දැන් නම් මිනිස්සුන් එක්ක බහින්න වෙනවා" කියලා. එතුමා කිව්වා, පොඩ්ඩක් ඉවසන්න කියලා. ඊට පසුව ඉම්රාන් ඛාන් අගමැතිතුමා පැමිණ සිටි වෙලාවේ මම ඒ ප්‍රශ්නය අහන්න හැදුවා. එතකොට කථානායකතුමා මාව වාඩි කෙරෙව්වා. ඊට පසුව මහින්ද මහත්තයා කිව්වා, "නැහැ, නැහැ අහන්න දෙන්න" කියලා. එදා මම ඒ ප්‍රශ්නය ඇසුවාට පසුව එතුමා කිව්වා, "අපි භූමදානය කරන්න අවස්ථාව දෙනවා" කියලා. ඊට පසුව මම මේ පාර්ලිමේන්තුවෙන් එළියට යද්දී, ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන පොහොට්ටුවේ මන්ත්‍රීවරයෙකුයි, එම දිස්ත්‍රික්කයේම පොහොට්ටුවේ මන්ත්‍රීවරියෙකුයි මට පහළදී කිව්වා, "ඔයා අපිව කෑවා. අපේ දේශපාලනය ඉවරයි. දැන් මේක මෙහෙමයි" කියලා. ඒ මන්ත්‍රීවරිය කිව්වා, "ඒක අගමැතිතුමාගේ පෞද්ගලික මතය" කියලා. එතකොට මම කිව්වා, "කොහොමද, අගමැතිතුමා පෞද්ගලික මත ඉදිරිපත් කරන්නේ පාර්ලිමේන්තුව ඇතුළේ? ඒක රජයේ මතය නේ" කියලා. මට හොඳට මතකයි, ඒ මන්ත්‍රීවරිය මාධ්‍ය හමුවක් පවත්වලාත් කිව්වා, ඒක පෞද්ගලික මතය කියලා. ඒ විධියට ජාතිවාදය ව්‍යාප්ත කරපු, ජාතිවාදයෙන් ජීවත් වුණු, ඒ විධියට ජාතිවාදයෙන් දේශපාලනය කරපු කණ්ඩායමක් එක්ක තමයි දැන් මේ ජනාධිපතිතුමා ඉන්නේ. ඒ නිසා ඔහොම සමාව ඉල්ලලා, "අනේ, මුස්ලිම් ජනතාව දැන් හරි සතුටු වෙයි, අපට ඡන්දය දෙයි" කියලා හිතනවා නම්, ඒක ගොන්කමක්, මෝඩකමක්, මරිමෝඩකමක් කියලා තමයි මට කියන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කට්ටිය - ආණ්ඩුවේ කට්ටිය - මේ දවස්වල ඉන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

වාගේයි. දැන් ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කරන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

වාගේයි. ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ලියුම් ගහන්නේ කපටිකමින්. මම දැක්කා, පොලිස්පති පත් කළ එක සම්බන්ධව කථානායකතුමා ඇහ බේරාගෙන තමයි ලියුම ගහලා තියෙන්නේ. කථානායකතුමා සඳහන් කර තිබෙන්නේ, "Abstain වෙච්ච දෙදෙනා විරුද්ධ බව සලකන්නේ නම්, ඒ අනුව මට තීරක ඡන්දය පාවිච්චි කරන්න බලයක් තිබෙනවා නම්, ...මම මෙන්න මෙහෙම ඡන්දය දෙනවා" කියලා. හැබැයි, ඒ ලියුම පදනම් කරගෙන තමයි ජනාධිපතිතුමා කටයුතු කරලා තිබෙන්නේ.

ඊයේ ශ්‍රේෂ්ඨාධිකරණය තහනම් නියෝගයක් දුන්නායින් පසුව කැබිනට් මණ්ඩලය ගෙන්වූවා, සාකච්ඡා කරන්න. මොන එකකටද, කැබිනට් මණ්ඩලය? කැබිනට් මණ්ඩලයට පුළුවන්ද, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව වෙනස් කරන්න, ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීන්දුව අබිබවා යන්න? ලාම්පුව නිවෙන්න කිට්ටු වුණාම වැඩියෙන් පත්තු වෙනවා වාගේ තමයි මේ ආණ්ඩුව දැන් හැසිරෙන්නේ. ඒ නිසා ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා, ව්‍යවස්ථාව කඩන වගන්තිවලට සහයෝගය දීලා නිකම් ඉල්ලාගෙන කන්න යන්න එපා කියලා අපි කියනවා. මොකක්ද, හේතුව? පැහැදිලිවම සැප්තැම්බර් මාසයේ 21 වැනි දාට සජිත් ප්‍රේමදාස මැතිතුමා මේ රටේ ජනාධිපති වුණාම අපි මේ සියල්ලම හොයනවා. මේ සියල්ලම හොයනවා විතරක් නොවෙයි, තරාතිරම නොබලා හැම කෙනාටම දඬුවම් දෙනවා.

අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා රජයේ මුදල් පිළිබඳ කමිටුවේ සභාපතිවරයා විධියට සිදු කරන්නේ කථානායකතුමා විසින් එතුමාට පවරපු රාජකාරියක්. මට එතුමා කියපු පරිදි VFS Global ගනුදෙනුව සම්බන්ධව සාමාජික මන්ත්‍රීවරුන්ට අදහස් දක්වන්න සුමාන තුනක් තිබියදී ඔය එක්කෙනෙක්වත් අදහස් දක්වන්නේ නැතුව ඉඳලා - මම හිතන විධියට රාඝවන් රාජ්‍ය ඇමතිතුමාත්, හකීම් මන්ත්‍රීතුමාත්, ඒ වාගේම මයන්ත දිසානායක මන්ත්‍රීතුමාත් තමයි අදහස් දීලා තිබෙන්නේ- ජනාධිපතිතුමා බැන්නාට පසුව මෙතැනට ඇවිල්ලා දෙස්දොවොල් තියනවා, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට තර්ජනය කරනවා. හැබැයි, අපි එකක් කියන්න ඕනෑ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට තර්ජනය කළාම, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා තනියම නොවෙයි, ඒකට මුහුණ දෙන්නේ. සමගි ජන බලවේගයේ කණ්ඩායමත් එක්කයි එතුමා ඒවාට මුහුණ දෙන්නේ. අපි එතුමා එක්ක එකට ඉන්නවා, ඒ වෙනුවෙන්. ඒක තේරෙන්නේ නැහැ. අනෙක, බොරු චණ්ඩි පාටි දමන්න එපා. තව සති හතයි තිබෙන්නේ. සති හතයි. ගන්න ආතල් එකක් ගන්න. අපට කමක් නැහැ. හැබැයි, රටට වැරැද්දක් වන විධියට වැඩ කරන්න එපා. අපිට කමක් නැහැ, ඕනෑම ආතල් එකක් ගන්න. හැබැයි, රටට වැරැද්දක් වන විධියට කටයුතු කළොත්, සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වයෙන් පිහිටුවන ආණ්ඩුවක් තුළ අනිවාර්යයෙන්ම ඒ හැම කෙනාටම තරාතිරම නොබලා දඬුවම් ලබන්න වෙනවා. ඒකට මුහුණ දෙන්න ලැහැස්ති වෙලා ඉන්න කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Ashok Abeysinghe. You have nine minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Major) Sudarshana Denipitiya to the Chair?

ගරු නලින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු කුழுක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු (මේජර්) සුතර්ෂන තෙනිපිටිය අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair, and THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA took the Chair.

[අ.භා. 2.03]

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින රජය විසින් ඉදිරිපත් කර තිබෙනවා, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත සහ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත. මීට ඉස්සෙල්ලා, 2003දී මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත පාර්ලිමේන්තුවේදී සම්මත කළා. දැනට එය ක්‍රියාත්මක වෙනවා. දැන් මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව එය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපි විපක්ෂය විධියට රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පතට විරෝධය පළ කරන්නේ නැහැ.

එය විය යුතු දෙයක් ලෙස අපි සලකනවා. නමුත්, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත ගැන කරුණක් සඳහන් කළ යුතුයි. අපි විශ්වාස කරනවා, මේ රටේ ආර්ථික ප්‍රතිසංස්කරණයක් විය යුතුයි කියා. මේක විය යුතුව තිබුණේ මීට පෙර. නමුත් ඒක වෙලා නැහැ. දැන් ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙනවා. අපි පක්ෂයක් විධියට මේ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතට විරුද්ධ වෙන්න හේතුව, මෙහි පළමුවැනි පරිච්ඡේදයේ තිබෙන්නේ සම්පූර්ණයෙන්ම රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක ඇතිකර ගත්ත ගිවිසුමේ වගන්ති නිසා. ඒවා තමයි සෑහෙන්න ප්‍රමාණයක් දාලා තිබෙන්නේ. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ණය සියයට 95ක් විය යුතුයි, විදේශ ආයෝජන සියයට 5ක් විය යුතුයි වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වූ කරුණු මේ පනත් කෙටුම්පතෙහි තිබෙනවා. මෙහෙම කරන්න කිසිම සදාචාරාත්මක අයිතියක් නැහැ.

අද මැතිවරණ කොමිසම කියලා තිබෙනවා, හෙට මැතිවරණය කැඳවීමේ නිවේදනය කරනවා කියලා. එතකොට ජනාධිපතිවරණය කැඳවීමේ නිවේදනය කළාම තව මාස දෙකක් ඇතුළත මැතිවරණයක් තියනවා. ඒ මැතිවරණය තුළින් අලුත් රජයක් බලයට පත්වෙන බව දැන් රටේ කවුරුත් දන්නවා. එහෙම තත්ත්වයක් තුළ හදිසියේ මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා අනුමත කරගන්න යන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඊළඟ වාරිකය ගැනීමට ද කියලාත් අපට සැකයක් ඇති වෙනවා. කෙසේ වෙතත්, මේ තිබෙන තත්ත්වය තුළ මෙම පනත් කෙටුම්පතේ පළමුවැනි පරිච්ඡේදයේ තිබෙන ඒවාට අපි විරෝධය පළ කරනවාය කියන එක අපි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මෙම ආර්ථික පරිවර්තන පනත තුළින් මේ කියන දේවල් කරනවා නම් මෙහි තිබෙන්න ඕනෑ කාරණා තිබෙනවා.

දැන් බලන්න. 2003 මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත. එහි තිබෙනවා දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රටේ අය වැය පරතරය සියයට 5ක් විය යුතුයි, රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 60ක් විය යුතුයි කියලා. දැන් අවුරුදු 21ක් තුළ හැම වසරේම අය වැය පරතරය සියයට 5ක් වුණාද? එතකොට රාජ්‍ය ණය ප්‍රමාණය සියයට 60ක් වුණාද? දැන් ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 130ක් කියලා තිබෙනවා. හැබැයි පනතක් තිබෙනවා, සියයට 60ක් වෙන්න ඕනෑ කියලා, අය වැය පරතරය සියයට 5ක් විය යුතුයි කියලා. දැන් අය වැය පරතරය සියයට 10ටත් එහා ගිහිල්ලා. මේ පනත් කෙටුම්පත සම්මත වුණාම මෙක ක්‍රියාත්මක කිරීමේ වගකීම එන්නේ ඊළඟ ආණ්ඩුවට.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න ඕනෑ කියලා පක්ෂයක් විධියට ඉස්සෙල්ලාම කිව්වේ සමඟි ජන බලවේගය. අපි ඒක කිව්වේ මේ රට බංකොලොත්වීමට ප්‍රථම. 2022 අප්‍රේල් 12වැනි දාට ඉස්සෙල්ලා තමයි අපි කිව්වේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න ඕනෑ කියලා. ඒ වාගේම, සජිත් ප්‍රේමදාස මැතිතුමා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයන් එක්ක සාකච්ඡා කරලා කිව්වා, අපේ රට බංකොලොත් වෙන්න ඉස්සෙල්ලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගියා නම් තිබෙන කොන්දේසියි, බංකොලොත් වුණාට පසුව තිබෙන කොන්දේසියි වෙනස් බව. මේ කොන්දේසි අපට ගැළපෙන්නේ නැති කොන්දේසි. අපේ රජයක් යටතේ මේවා වෙනස් කරනවා කිව්වා. දැන් හර්ෂද සිල්වා මැතිතුමා කිව්වා වාගේ අපි දැන් ඒ අයට කාලයක් දීලා තිබෙනවා. එතුමා සෑහෙන කාලයක් තිස්සේ ඉල්ලලා තිබෙනවා, අපේ පක්ෂයත් එක්ක සාකච්ඡා කරන්න. දැන් අවස්ථාව දීලා තිබෙනවා. අපට මේවා අනිවාර්යයෙන්ම ඉදිරි රජයක් යටතේ වෙනස් කරන්න වෙනවා. මොකද, දැන් ජන බලයක් නැති ජනාධිපති කෙනෙක් ඉන්නේ. පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී පාර්ලිමේන්තුවට එන්නත් සුදුසු නැහැ කියලා ජනතාව ප්‍රතික්ෂේප කරපු කෙනෙක් දැන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා, මෙවැනි පනත් කෙටුම්පත් ගෙනැල්ලා සම්මත කර ගැනීම සදාචාරයට විරුද්ධයි. ඒ නිසා තමයි අපි කියන්නේ මේකට විරුද්ධ වෙනවා කියලා. මොකද, ඉදිරි මැතිවරණයෙන් පස්සේ මේ පනතේ යම් යම් දේවල් අපිට අනිවාර්යයෙන්ම වෙනස් කරන්න සිද්ධ වෙයි. ඒක අනිවාර්යයෙන්ම කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

ජනාධිපතිතුමා දැන් හැම වෙලාවේම වැල් පාලම ගැන කථා කරනවා. වැල් පාලමේ ඉතිරි කොටසත් යන්න ඕනෑ කියලා කියනවා. හැබැයි ඒ ගොල්ලන්ට අමතක වෙලා තිබෙනවා මේ රට තිස් අවුරුදු යුද්ධයක් තිබ්බ රටක් බව. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ තිස් අවුරුදු යුද්ධය අවසන් කළා කියලා ඒ ගොල්ලන් කියනවා. අවසන් කළා, ඒක අපි කවුරුත් පිළිගන්නවා. විශාල ප්‍රමාණයකගේ දායකත්වයෙන් ඒක අවසන් කළා. 2009දී යුද්ධය අවසන් කරපු එම නායකයා මේ රටේ ජනතාව 2015දී පරාජයට පත් කළා. දැන් ඒක මේ ගොල්ලන්ට අමතක වෙලා තිබෙනවා. 2022 වර්තමාන ජනාධිපතිතුමා බලයට පත් වෙලා දැනට වසර දෙකයි. "මම පෝලිම් යුගය නැති කළා" කියා එතුමා හැම විටම කියනවා. හැම රැස්වීමකම කියන්නේ වැල් පාලමේ කථාවයි, පෝලිම් යුගය නැති කළා කියන එකයි. එහෙම නම් මේ රටේ ජනතාව ජීවත් වීමට ඉතා අපහසු තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ කොහොමද?

අද වන විට අපේ රටේ ජනතාව සියයට 60.5කගේ ආදායම අඩු වෙලා. සියයට 91කගේ වියදම වැඩි වෙලා. ඒ වාගේම, සියයට 83කගේ ගමනා ගමන ගාස්තු ඉහළට ගිහිල්ලා තිබෙනවා. ආදායම අඩු වෙලා, වියදම වැඩි වෙලා තිබෙන අයගෙන් සියයට 6.6ක් විතරයි අමතර ආදායම් මාර්ගයකින් ආදායම් උපයාගෙන තිබෙන්නේ. සියයට 73.6ක් අමතර ආදායම් මාර්ගයක් හොයාගෙන නැහැ. ඒ වාගේම, ආර්ථික අර්බුදය නිසා ළමයින්ගෙන් සියයට 55කගේ අධ්‍යාපනයට විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම සියයට 44ක් ළමයින්ට නිල ඇඳුම් ලබාදෙන්න ඒ දෙමාපියන්ට හැකියාවක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ රටේ ජනතාවගෙන් සියයට 81ක් බෙහෙත් ගන්න ක්‍රමයක් නැතුව ඉන්නවා. 2022 අවුරුද්දේ මේ රටේ දවසකට මිය ගියේ 350යි. දැන් ඒක 550ක් බවට පත් වෙලා තිබෙනවා. 2022 අවුරුද්දේ දවසක් තුළ ඉපදුණු සංඛ්‍යාව 1,000යි. දැන් ඒක 750ක් බවට පත් වෙලා තිබෙනවා. මේ ආර්ථික අර්බුදය නිසා රටේ ජනතාව දරුවෝ හදන්නේ නැහැ. ඒ වාගේම, මරණ සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. මරණ සංඛ්‍යාව වැඩි වෙලා තිබෙන්නේ මේ ආර්ථික අර්බුදය නිසායි. බෙහෙත් පාවිච්චි කරන අයගෙන් සියයට 81ක් පමණ තමන්ට අවශ්‍ය බෙහෙත් ප්‍රමාණය

අද ගන්නේ නැහැ. මොකද, ඉස්පිරිතාලයට ගියාම අවශ්‍ය බෙහෙත් ප්‍රමාණය දෙන්නේ නැහැ. ඒ නිසා බෙහෙත් ගන්න මුදල් අවශ්‍ය වෙනවා. නමුත්, බෙහෙත් ගන්න මුදල් නැහැ. ඒ නිසා බෙහෙත් අඩුවෙන් ගන්නවා. එතකොට ආයෙත් ලෙඩේ වැඩි වෙනවා. ඊට පස්සේ ලෙඩ්ඩු මැරෙනවා. මෙවැනි තත්ත්වයකට රට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජය කියනවා විදේශ ආයෝජන දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 5ක් තිබෙන්න ඕනෑ කියලා. එහෙම නම්, ඩොලර් බිලියන 5ක විතර ආයෝජන තිබෙන්න ඕනෑ. තවම ඩොලර් බිලියන 5ක තියා ඩොලර් බිලියනයකවත් ආයෝජන ඇවිල්ලා නැහැ. එවැනි තත්ත්වයක් තිබියදීත්, තමන් බලය ගන්නවා කියමින් යන පක්ෂයක් පිට රට ගිහින් කියනවා අපි දැක්කා, "අපි මේ රටේ දූෂණය නැති කරනවා, වංචාව නැති කරනවා, අපි දූෂිතයන්ට දඬුවම් දෙනවා" කියලා. හැබැයි ඒ පක්ෂයේ මෙහේ ඉන්න කට්ටිය පසු ගිය දිනවල කියනවා මම දැක්කා, "අපි කළු සල්ලි ආයෝජනයට යොදවන්න බලාපොරොත්තු වෙනවා, කළු සල්ලි හම්බ කළේ කොහොමද කියලා සොයන්නේ නැහැ. කළු සල්ලි යොදවා ආයෝජන ආරම්භ කරන්න යම්කිසි ක්‍රමයක් අපි හදනවා" කියලා. ඒ අය ඒකෙන් බලාපොරොත්තු වන්නේ මුදල් විශුද්ධිකරණයයි. මුදල් විශුද්ධිකරණය සඳහාත් රටේ වැඩ පිළිවෙළක් හදනවා කියලා ඒ පක්ෂවල අය කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත තුළින් ගෙනෙන වැඩ පිළිවෙළ ප්‍රායෝගික නැහැ. එය ප්‍රායෝගික නැත්තේ ඇයි? මෙවැනි දේවල් පසුගිය කාලයේත් කළා. හැබැයි දැන් ඒවා ක්‍රියාත්මක වන්නේ නැහැ. ආසියානු සංවර්ධන බැංකුවත්, ලෝක බැංකුවත් කියනවා ලෝකයේ රටවල් 184ක් අතරින් ආර්ථික නිදහස අතින් අපේ රට තිබෙන්නේ 148වන ස්ථානයේ කියලා. අපේ රට සිටින ස්ථානයට පසු පසින් තවත් රටවල් 35ක් සිටිනවා. නමුත්, ආර්ථික නිදහස අතින් 148වන ස්ථානයේ තමයි අපේ රට තිබෙන්නේ. ආර්ථික නිදහස කියන්නේ, රටේ ජනතාවගේ ජීවත් වීමේ නිදහස. මේ රට ආර්ථික වශයෙන් නිදහසක් නැති රටක් බවට පත් කළේ කවුද? දැන් ජනාධිපතිතුමා කියනවා, "කිසිම ප්‍රශ්නයක් නැහැ, අපි පෝලිම් යුගය නැති කළා, මේ රට යම්කිසි තත්ත්වයකට පත් කළා" කියලා. නමුත්, අද වන විට ආර්ථික නිදහස අතින් අපේ රට තිබෙන්නේ 148වන ස්ථානයේ. මීට ඉස්සෙල්ලා අපි 92වන ස්ථානයේ හිටියේ. ඉන්දියාව, බංග්ලාදේශය, පාකිස්තානය, භූතානය, නේපාලය, මාලදිවයින යන රටවල් පවා අපට ඉදිරියෙන් ඉන්නවා. එවැනි තත්ත්වයකටයි දැන් අපේ රට පත් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ රට ණය ගැනීම් විශාල වශයෙන් සිදු කරනවා. මහ බැංකු වාර්තාවේ සඳහන්ව තිබෙනවා, 2023 දෙසැම්බර් මාසයේ සිට 2024 මාර්තු මාසය වනකල් ඩොලර් බිලියන 4.5ක් ණය අරගෙන තිබෙනවා කියලා. ඩොලර් එකක් රුපියල් 300ක් ලෙස ගත්තොත්, රුපියල් කෝටි 135,000ක් -රුපියල් බිලියන 1,350ක්- විදේශ ණය අරගෙන තිබෙනවා. සාමාන්‍යයෙන් අද වන විට අපේ රටේ එක් පුද්ගලයෙකු දාහතරලක්ෂ පනස්දාහක විතර ණයකාරයෙකු බවට පත් කරලා තිබෙනවා. මේ ආර්ථිකය යම්කිසි විධියකට හැදුවා නම්, එවැනි තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්ද?

මහ බැංකු වාර්තාවල තිබෙනවා, හතරදෙනෙකු ඉන්න පවුලකට ජීවත් වෙන්න සාමාන්‍යයෙන් රුපියල් එක්ලක්ෂ තුන්දහස් දෙසීය අසූවක් ඕනෑ කියලා. නමුත්, හතරදෙනෙකු ඉන්න පවුලකට ඒ ගණන ලැබෙනවාද? අනූ පවුල් එක්කම බැලුවොත් අපේ රටේ තිබෙන්නේ පවුල් ලක්ෂ 60යි. ඒ පවුල් ලක්ෂ 60න් කීයෙන් කී දෙනෙකුට ද ඒ ආදායම ලැබෙන්නේ. ඒ පවුල් ලක්ෂ 60න් පවුල් ලක්ෂයකට, දෙකකට විතර ඔය කියන ආදායම ලැබෙනවා ඇති. නමුත්, මේ තත්ත්වය තුළ මේ රටේ ජනතාව ඉතා අසරණ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අපේ රටේ අනූ පවුල් ප්‍රමාණයත් එක්ක පවුල් ලක්ෂ 60ක් තිබෙනවා. ඒ පවුල් ලක්ෂ 60න්, පවුල් පනස්අට ලක්ෂයකට, පනස් නවලක්ෂයකටම මේ ප්‍රශ්නය බලපා තිබෙනවා. හතරදෙනෙකු ඉන්න පවුලක එක්කෙනෙකු විතරක් රැකියාව කරනවා නම් එතරම් ආදායමක් ලබන්නේ කොහොමද? රජයේ රැකියාවක් කරන කෙනෙකුගේ අවම වැටුප රුපියල් 29,500ක් පමණ වෙනවා. දීමනාත් එක්ක රුපියල් 40,000ක්, රුපියල් 45,000ක් වේවි. එක්කෙනෙකු විතරක් රැකියාවක් කරලා ඒ පවුලට ජීවත් වෙන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවාද? පෞද්ගලික අංශයත් ඒ හා සමානයි. මේ තත්ත්වය තුළ රට යථා තත්ත්වයට පත් වෙලා තිබෙනවාද කියන එක විශාල ප්‍රශ්නයක්. ඒ පිළිබඳව පැහැදිලි කර ගන්න අපට අවශ්‍යයි.

වර්තමාන තත්ත්වය තුළ උද්ධමනය අඩු වෙලා තිබෙන බවක් කියනවා. උද්ධමනය කියන්නේ බඩු මිල වැඩි වීමේ වේගය. බඩු මිල වැඩි වීමේ වේගය සාමාන්‍ය තත්ත්වයට පාලනය වුණත්, බඩු මිල වැඩි වීම පාලනය කිරීමට රජය අපොහොසත් වෙලා තිබෙනවා. සෑම දෙයකම එන්න එන්නම ගණන් වැඩි වෙනවා. ඒ හින්දා ජීවත් වීම ඉතා අපහසුතාවට පත් වෙලා තිබෙනවා. එහෙම නම්, අපි ආණ්ඩුවට විශේෂයෙන් කියනවා, මේ වාගේ පනත් හදිසියේ ගෙනැල්ලා රටේ ජනතාව රවටන්න එන්න එපා කියලා. මේ පනත් කෙටුම්පත් දෙක ගෙනාවා කියලා මේ රට සුරපුරයක් බවට පත් වන්නේ නැහැ නේ. 2003දී රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ගෙනාවා කියලා අය වැය පරතරය සියයට 5ට අඩු වුණා ද? ණය ප්‍රමාණය සියයට 60ට අඩු වුණා ද? එහෙම වෙලා නැහැ. හැබැයි, රටේ ජනතාව රවටන්න දැන් ඇවිල්ලා සුරංගනා කථා කියනවා. ඉතාම ලස්සනට මේ පනත් කෙටුම්පත හදලා තිබෙනවා, ලස්සනට වචන ගලපා තිබෙනවා. නමුත්, මේවා ක්‍රියාත්මක කරන්න ගියාම ප්‍රශ්න ඇති වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කරුණාකර කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
සැප්තැම්බර් මාසයේ 28වන දා වනකොට සජිත් ප්‍රේමදාස මැතිතුමා අලුත් ජනාධිපතිවරයා වශයෙන් පත් වෙයි. ඒ වාගේම මේ අවුරුද්ද අවසන් වනකොට අලුත් ආණ්ඩුවක් එයි. ඒ අපේ සමගි ජන බලවේගය ආණ්ඩුවයි. ඒ ආණ්ඩුව යටතේ මේ රටේ ජනතාව ජීවත් කළ හැකි පරිසරයක් ඇති කරන්න අපි කටයුතු කරනවා. අපේ අලුත් ආණ්ඩුවේ මුදල් ඇමති ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමාගේ නායකත්වය යටතේ ඒ කටයුතු සිදු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 23ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.13]

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ඉතාම වැදගත් මූල්‍ය පනත් කෙටුම්පත් දෙකක් විවාදයට ලක් වන මොහොතක්. අපේ රට ගැඹුරු ආර්ථික අගාධයකට වැටුණු බව අපි දන්නවා. හැම කෙනෙක්ම එය පිළිගන්නවා. මේ කියපු හැම අසීරුතාවක්ම ඇති වුණේ ඒකත් එක්ක. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉතාම අසීරු, අභියෝගාත්මක අවස්ථාවෙයි නායකත්වය භාර ගත්තේ. රට වැටුණු අගාධයෙන් දවසින් දවස අඩියෙන්, අඩිය අපි උඩට එනවා. ඒ එන අතරේ නැවත වතාවක් ඒ වළට -ඒ අගාධයට- නොවැටෙන්න අවශ්‍ය වැට බැඳීම තමයි අපි දැන් මේ කරන්නේ. කෙනෙකු අහන්න පුළුවන්, මේ නීතිය හැදුවාට මේ නීතිය කඩන්න පුළුවන්ද කියලා. ඔව් ඉතින්, පාර්ලිමේන්තුවේ බහුතරයකට මේක වෙනස් කර ගන්න පුළුවන්. හැබැයි වැටක් බඳින්නේ, පරීක්ෂාකාරී වෙන්න, සොයා බලන්න, අනතුර පෙන්වා දෙන්න. යම් අයෙකු ඒ අනතුර නොතකා ඒක විනාශ කරනවා නම්, ඉන් එහාට යනවා නම්, ඒ අගාධයටම නැවතත් පනිනවා නම්, ඔහු මේ ගෞරවනීය පාර්ලිමේන්තුවට වග කිව යුතු වන ලෙස අපි නීති පද්ධතියක් හදලා දෙනවා. ඒ නිසා තමයි, කෙටි කාලීන විසඳුම් මඟින් රට මෙසේ නැඟිටුවන අතරේ, මෙවැනි ප්‍රශ්නවලට දීර්ඝ කාලීන විසඳුම් සෙවීම සඳහා මෙවැනි කටයුතු කරන්නේ. ඒක ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කිව්වා වෙන්න පුළුවන්, තවත් ආයතනයක් කිව්වා වෙන්නත් පුළුවන්. හැබැයි, රටේ මූල්‍ය කළමනාකරණයේ දැඩි අවශ්‍යතාවක් තමයි අපි මේ ඉෂ්ට කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පතෙහි දීර්ඝ නාමයෙහි ඉතා පැහැදිලිව සඳහන්ව තිබෙනවා, "වඩා යහපත් වූ සාර්ව ආර්ථික කළමනාකරණයක් උදෙසා මූල්‍ය ප්‍රතිපත්තිය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ව්‍යුහය තුළ රාජ්‍ය අරමුදල් පිළිබඳ වගවීම, අධීක්ෂණය, කළමනාකරණය සහ පාලනය ශක්තිමත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; මූල්‍ය කළමනාකරණයට අදාළ ආයතනික වගකීම් පැහැදිලි කිරීම සඳහා ද; අයවැය කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්තිය සහ කාර්යසාධනය මහජනතාව විසින් සුපරීක්ෂණයට ලක්කිරීම සඳහා..." යනුවෙන්. මේ පනත් කෙටුම්පතේ තිබෙන වැදගත්ම දේ තමයි "මහජනතාව විසින් සුපරීක්ෂණයට ලක් කිරීම" කියන එක. කවුද මහජනතාව කියන්නේ? මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනා. රටේ ඇති වන ආර්ථිකමය සිද්ධි සියල්ල පිළිබඳ පාර්ලිමේන්තුවට නිතිපතා වාර්තා ඉදිරිපත් කිරීමට, විවාදයට භාජන කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන මේ පනත් කෙටුම්පත තුළින් සලස්වා තිබෙනවා. මූල්‍ය විනය පිළිබඳව මෙහි සඳහන් වෙලා තිබෙනවා.

අපි මේ අගාධයට වැටීමට බලපෑ හේතු පිළිබඳව යම් අයෙකු ආර්ථික විද්‍යානුකූලව හා දීර්ඝ කාලීන සාධක මත සොයා බැලුවොත් පෙනේවි, අපේ ලිහිල් මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රධාන හේතුවක් වන බව. ඒ නිසා අපට අවශ්‍ය වෙනවා, හොඳ මූල්‍ය විනයක්. අපි ගෙන ආවා, ඒකට ගැළපෙන පනත්. ශ්‍රී ලංකා මහ බැංකු පනත එයට එක් උදාහරණයක්. ඒවා ගෙන ආවේ රජයේ පහසුවට නොවෙයි. ඇත්තටම මුදල් අමාත්‍යාංශය ගෙනා පනත්වලින් තමන් විසින්ම තමන්ගේ පාලනයක් ඇති කර ගත්තා. ඒක අසීරුයි. දැන් අපට මුදල් මුද්‍රණය කරන්න බැහැ. දැන් අපි ප්‍රාථමික ශිෂ්‍යමේ ශේෂය ධන අගයක තියා ගන්න ඕනෑ. මේවා පහසු දේවල් නොවෙයි. මෙය අපේ මුදල් ප්‍රවාහයට ලොකු බරක්. හැබැයි අපි ඒ පාලනය ඇති කරගෙන තිබෙන්නේ, අදටත්, හෙටටත්, අනාගතයටත් මේ රට තුළ ඉහත කී අර්බුද ඇති නොවීම සඳහා අවශ්‍ය නීතිමය රාමුවක් වශයෙනුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි රාජ්‍ය ණය කළමනාකරණ පනත ගෙනාවා. ඒකත් ඉතාම වැදගත්. අපි ක්‍රමක්‍රමයෙන් මේ රටේ මූල්‍ය විනය ඉතා දැඩි තැනකට ගෙනාවා. ඒ කවුරු වෙනුවෙන්ද? ඒ, මේ රටේ සමස්ත ජනතාව වෙනුවෙන්. ඒවා, මේ රටේ ජනතාව වෙනුවෙන් ගෙන ආ සුවිශේෂී ආර්ථිකමය පනත්.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත ගැන තවදුරටත් කථා කරමු. "කළමනාකරණය" කියන්නේ, සීමිත සම්පත් ප්‍රමාණයක් අසීමිත අවශ්‍යතා සඳහා අනුපිළිවෙළට පොදු අවශ්‍යතාව, අනාගත සුබසාධනය, ඵලදායීතාව, විනිවිදභාවය ඇතිව වැය කිරීමයි. පෞද්ගලික අංශය පැත්තෙන් බැලුවොත්, ලාභ උපරිමයට ගැනීමත් එහි එක අංශයක් වෙනවා. හැබැයි, රාජ්‍ය අංශයට අදාළව නම් පොදු අවශ්‍යතාව කියන කාරණාව තමයි මූල්‍ය කළමනාකරණයේදී වැදගත් වන්නේ. අපි මෙතෙක් මේ කාරණාව තමයි ඉෂ්ට කළේ. රජයකට වුණත් ළඟ තිබෙන මූල්‍ය සම්පත් ප්‍රමාණය වියදම් කරන්න වෙන්නේ, අසීමිත අවශ්‍යතා සඳහායි. අපි මෙතෙක් කල් ඒවා පාලනය කළේ මුදල් රෙගුලාසි හරහායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්දහස් නවසියතිස් ගණන්වල ඉඳන්ම මුදල් රෙගුලාසි තිබුණා. ඒවා 1966දී වෙනස් වුණා; 1992දීත් වෙනස් වුණා. ඊට අමතරව, භාණ්ඩාගාර චක්‍රලේඛ තිබෙනවා.

අපේ කීර්තිමත් මුදල් අමාත්‍යවරයෙකු වූ ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා ගෙනාවා, 1971 අංක 38 දරන මුදල් පනත. ඒක තමයි බොහෝ වෙලාවට ඉස්සරහට ආවේ. 1971දී මේ රටට ප්‍රධාන වශයෙන් හඳුන්වා දුන්නා, සංස්ථා සහ ස්වාධීන ආයතන. ඒවා අරමුණු කරගෙන හදපු පනත තමයි ශක්තිමත්ව දිගටම ක්‍රියාත්මක වුණේ. අදටත් අපි එය ක්‍රියාත්මක කරනවා. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත තමයි අපට ආසන්නයේම තිබෙන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකෙදිත් විශේෂයෙන්ම අවධානය යොමු වෙලා තිබුණේ මූල්‍ය ප්‍රතිපත්ති සම්බන්ධවයි.

හැබැයි, අපි අද උත්සාහ කරන්නේ මේ සියල්ලේම තිබෙන වැදගත් කොටස් අරගෙන, ඒවා යාවත්කාලීන කරලා අද ලොවට ගැළපෙන ආකාරයේ ශක්තිමත් පනතක් සකස් කරන්නයි. ඒ සඳහා වන පනත් කෙටුම්පතක් තමයි අද අපි ඉදිරිපත් කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේකේ ඉතා පැහැදිලිව තිබෙනවා, වගකීම සහ වගවීම ගැන. මේවා තමයි අපට තිබුණේම නැත්තේ. මේකේ තිබෙනවා, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ භාරකරු ලෙස මුදල් අමාත්‍යාංශය සිය කාර්යයන් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ඉටු කරන බව සහතික කිරීමේ අරමුණින් මුදල් අමාත්‍යාංශය වෙත සහ භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත පැවරී ඇති බලතල සහ වගකීම් නිර්වචනය කරන්නා වූ වඩාත් පැහැදිලි විධිවිධාන. මුදල් අමාත්‍යාංශයට, මුදල් ලේකම්වරයාට තිබෙන වගකීම නිශ්චිතව මේකේ පෙන්වා දී තිබෙනවා. බොහෝ විට සිද්ධවෙන්නේ, අපේ වගකිව යුතු අංශ කර ඇරීමයි. එහෙම නැත්නම් වගකීම් භාර නොගැනීමයි. ඒ නිසා ජනතාව වෙනුවෙන් වන නිශ්චිත වගන්ති මේකට ඇතුළත් කරලා තිබෙනවා. වගකීම විතරක් නොවෙයි, වගවීම ගැනත් මේකේ නිශ්චිතව සඳහන් කර තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අදාළ බලධාරීන් වගවීමට බැඳෙන බවත් සිය අධිකාරිය ඉක්මවා නොයන බවත් සහතික කිරීම සඳහා කියලාත් මේකේ කරුණු තිබෙනවා.

වගවීම කියන්නේ මොකක්ද? ඒ කියන්නේ, පිළිතුරු දෙන්න ඕනෑ කියන එක. තමන්ගේ වගකීම හරියට ඉෂ්ට නොකළා නම්, අදාළ පුද්ගලයන්ට ඊට හේතු කියන්න වගවීමක් තිබෙනවා. අපේ නැත්තෙත් ඒකයි. ඒ ගැන නිශ්චිතවම දක්වලා නැත්නම්, ඒක දේශපාලන අධිකාරිය කරන්න ඕනෑ කියලා කෙනෙකුට කියන්න පුළුවන්. එහෙම නැත්නම් දේශපාලන අධිකාරිය කියන්න පුළුවන්, මේක නිලධාරීන් කරන්න ඕනෑ කියලා. හැබැයි ප්‍රශ්නය සෑමටම බලපාන විශාල ප්‍රශ්නයක් බවට පරිවර්තනය වෙලා. අන්තිමට වගකීමට කෙනෙකුත් නැහැ, වගවීමට කෙනෙකුත් නැහැ. මේ පනත් කෙටුම්පත තුළින් මේ කාරණා දෙකටම උත්තර හොයන්න ප්‍රායෝගිකව උත්සාහ කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම තමයි රාජ්‍ය ආයෝජන තාර්කිකව තෝරා ගැනීම. අපි මේ රටේ දීර්ඝ කාලීන ආයෝජන විශාල ප්‍රමාණයක් කරලා තිබෙනවා. හැබැයි, අපට තිබෙන ප්‍රශ්නය තමයි, පසුගිය කාලයේ ණය ගෙවා ගැනීමේ ප්‍රශ්නය මතුවෙනකොට අපි අපේ ආයෝජන තාර්කිකව යොදාගෙන තිබෙනවාද කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තාර්කිකව යොදා ගන්නවා කියන්නේ මොකක්ද? ඒ ආයෝජනය සැබෑවටම අවශ්‍යද? අපි ළඟ තිබෙන අඩු සම්පත් ටික අසීමිත ඉල්ලුමක් වෙතට යනකොට අපි නියම අනුපිළිවෙළ තෝරා ගෙන තිබෙනවාද කියන එක තමයි පළමුවන ප්‍රශ්නය. දෙවැනි ප්‍රශ්නය, අපි ඒ ආයෝජනයෙන් සාධාරණ ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක්, ගණනය කිරීමක් කරලා තිබෙනවාද කියන එක. අන්න ඒක තමයි ප්‍රශ්නය. අපි ණය උගුලක හිරවීමට බලපෑ ප්‍රධාන කාරණාවක් වුණේ, අපි අපේ ආයෝජනවලින් ලැබෙන ඵලදායීතාව පිළිබඳව නිශ්චිතව ගණනය කරලා ඒ ඵලදායීතාව ලැබෙනවාද කියා නොබැලීම. ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් දිහා ආපස්සට හැරිලා බැලුවොත් අපට පෙනෙනවා, අපි එහෙම කරලා නැහැ කියලා. අපි අපේ අවශ්‍යතාව, දේශපාලන මතය, අපේ ගම, අපේ ප්‍රදේශය, අපේ ජනප්‍රියතාව මත තමයි රාජ්‍ය ආයෝජන යොදලා තිබෙන්නේ. අන්න ඒකට උත්තරයක් මෙතැන තිබෙනවා. රාජ්‍ය ආයෝජන පිළිබඳ තීරණයක් ගන්නකොට ඒ සඳහා කටයුතු කරන මුදල් ලේකම්වරයා සහභාගී වන ප්‍රධාන කමිටුවක් තිබෙනවා. ඒ කමිටුවේ තීරණය මුදල් අමාත්‍යවරයා හරහා කැබිනට් මණ්ඩලයට යනවා. ඒ කමිටුවට මේ ගැන වගකීමක් තිබෙනවා. ඒක මෙතෙක් නොතිබුණු දෙයක්. එහෙම නැත්නම් වෙන්නේ රාජ්‍ය ආයෝජනයක් අසමත් වීමයි. ඒකේ අවසාන ප්‍රතිඵලය වන්නේ, ජනතාව මත ඒ බර පැටවීම, රටේ භාණ්ඩාගාරය වෙත ඒ බර පැටවීම. ඒ නිසා රාජ්‍ය ආයෝජන තාර්කිකව තෝරා ගැනීම පිළිබඳව නිශ්චිත නීතියක් මේ තුළ තිබෙනවා.

අපි තවත් කාරණාවක් බලමු. ජනතාවට අවශ්‍ය වෙලා තිබෙනවා, විනිවිදභාවයක්. බොහෝ අය වෙනසක් ඉල්ලනවා. අපට තිබෙනවා, ව්‍යවස්ථාපිත අරමුදල්. මේකේ පැහැදිලිවම තිබෙනවා, ව්‍යවස්ථාපිත අරමුදල් ගැන. අපි ළඟ තිබෙන විවිධාකාර අරමුදල්වලින් ව්‍යවස්ථාපිත අරමුදල් තිබෙන්නේ, එහෙම නැත්නම් පාර්ලිමේන්තුවේ අනුමත අරමුදල් තිබෙන්නේ 45යි. ව්‍යවස්ථාපිත නොවූ අරමුදල් ඊට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. වැඩි ප්‍රමාණයක් නොව ඊට සමාන ප්‍රමාණයක් - 41ක්. ඒක, විශාල ප්‍රමාණයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ දෙක අතර තිබෙන වෙනස මොකක්ද? ව්‍යවස්ථාපිත අරමුදලක් නම්, එය සැමවිටම සාමාන්‍යයෙන් සංස්ථාවක් වාගෙයි. විශාල වශයෙන් වගකීමකට බැඳෙනවා - පාර්ලිමේන්තුවට තොරතුරු දෙන්න, විගණකාධිපතිවරයාගේ විගණනයට ව්‍යවස්ථාපිත අරමුදලත් අනිවාර්යයෙන්ම ලක් වෙනවා. හැබැයි, ව්‍යවස්ථාපිත නොවන අරමුදල් කැබිනට් මණ්ඩලයෙන් ඇති කරන්නත් පුළුවන්, මහා භාරකාරතුමා හරහා, එහෙම නැත්නම් අමාත්‍යාංශයේ ලේකම්වරයාටත් ඇති කරන්න පුළුවන්. නමුත් ඒවාට බැඳීමක් නැහැ. ඒ නිසාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විවිධාකාර චෝදනාවලට ලක් වුණ බව අපි දැක්කා. මම ඒ අරමුදල්වල නම් කියන්නේ නැහැ. ඒවායේ විනිවිදභාවය පිළිබඳ විවිධ ප්‍රශ්න තිබෙනවා. අමාත්‍යවරයාට අවශ්‍ය පරිදි ඒවා මෙහෙයවන්න හැකියාව තිබෙනවා. ජනතාවගේ අවශ්‍යතාව මත නොව තමන්ගේ ජනප්‍රියභාවය, තමන්ගේ දේශපාලනය මත ඒවා මෙහෙයවන්න හැකියාව තිබෙනවා. හැබැයි, අපි ඒකට අද මේ නීතිය තුළින් වැටක් බඳිනවා, අරමුදල් තිබෙනවා නම් ඒවා ව්‍යවස්ථාපිත නැත්නම් වහාම ව්‍යවස්ථාපිත අරමුදල් බවට පරිවර්තනය කරන්න ඕනෑ කියලා. එහෙම නැත්නම් වර්ෂයක් තුළ ඒ අරමුදල් විසුරුවා හරින්න ඕනෑ.

කවුරු වෙනුවෙන්ද මෙහෙම කරන්නේ? මේ රටේ ජනතාව වෙනුවෙන්. ජනතාව හැම දාමත් මේවා දැක්කා; සැකයෙන් බැලුවා. සැකයෙන් බැලුවා විතරක් නොවෙයි ජනතාවට ඒක ප්‍රශ්නයක් වුණා. මේ අරමුදල් ව්‍යවස්ථාපිත නැත්නම්, නීතියට යටත් නැත්නම්, වගකීමක් නැත්නම්, විගණකාධිපතිවරයාගේ අධීක්ෂණයට යටත් නැත්නම්, ඒ අරමුදල්වලින් සිදුවන දේ ගැන පැහැදිලිභාවයක් නැහැ, වැරදි වෙන්න තිබෙන ඉඩ වැඩියි. හැබැයි, මේ පනත් කෙටුම්පතින් අපි කියනවා, එවැනි ව්‍යවස්ථාපිත නොවන අරමුදල් තබාගන්න බැහැ. තිබෙනවා නම් වර්ෂයක් තුළ විසුරුවා හරින්න ඕනෑ. නැත්නම් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පරිවර්තනය කරගන්න ඕනෑ කියලා. ඒ නිසා මේ නීති ඉදිරියේ පැවැත්වෙන ඡන්දය නිසා හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියපු නිසා ගෙනෙනවා නොවෙයි. මේවා මේ රටේ කාලයක් තිස්සේ ඉල්ලපු සහ ක්‍රියාත්මක කළ යුතු වැදගත් කාරණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම මේ ප්‍රායෝගික කරුණු දෙකක් විතරයි කිව්වේ.

ඒ වාගේම, මේ පනත් කෙටුම්පතේ තිබෙන තවත් වැදගත් කාරණාවක් තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශාල වශයෙන් යම්කිසි ආර්ථිකමය ඉලක්කයකට යන්න බැරි වුණා නම්, මේ කියන නීතියක් ඉෂ්ට කරන්න බැරි වුණා නම්, යම්කිසි දෝෂයක් වුණා නම්, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට බරපතළ බැඳීමක් මේ නීතියෙන් හදලා තිබෙන එක. දැන් මේ පනත් කෙටුම්පතේ 12වන වගන්තියෙන් අලුත්ම නීතියක් හඳුන්වා දී තිබෙනවා, මධ්‍ය කාලීන මූල්‍ය රාමුව මුදල් අමාත්‍යවරයා පාර්ලිමේන්තුවට කියන්න ඕනෑ කියලා. ඇයි ඒ? පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා කියන්නේ, මම මුලින් කිව්වා වාගේ ජනතාවට ඉදිරිපත් කිරීමක්. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපුවාම ඒකේ ප්‍රශ්නයක් තිබෙනවා නම් පාර්ලිමේන්තුවට පුළුවන් ඒ ගැන විවාද කරන්න.

ඒ වාගේම, අපි හැම දාම ප්‍රශ්නයක් කරගත්ත ඉතාම වැදගත් දෙයක් තිබෙනවා. පසුගිය අවුරුදු 75න් අවුරුදු 5ක් හැර අනෙක් හැම අවුරුද්දකම ප්‍රාථමික ගිණුමේ ශේෂය ඍණ අගයක පැවතුණා. අපි මූලික ආදායමට වඩා වියදම් කළා. ඒක අපි හිරවෙන්න ගිය තැනක්. හැබැයි, මේ පනත් කෙටුම්පතින් අපි දැන් බැඳිලා ඉන්නවා, ප්‍රාථමික ගිණුමේ ශේෂය ධන අගයක තබාගන්නට. මේ පනත් කෙටුම්පතේ සඳහන් කර තිබෙනවා, ප්‍රාථමික ශේෂයට අනුගත නොවුණොත්, අපි ඒ බන්ධනය කැඩුවොත්, සති 6ක් තුළ ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කරන්න ඕනෑ කියා. පාර්ලිමේන්තුවේ ඒ ගැන විවාදයක් කරන්න පුළුවන්. මුදල් ඇමතිතුමා, රජය ජනතාව වෙනුවෙන් ගත්ත ඒ සුවිශේෂ මූල්‍යමය රෙගුලාසිය -ප්‍රාථමික ශේෂය ධන අගයක තබාගත යුතුයි කියන එක- කැඩුවේ ඇයි, ආදායමට වඩා වියදම් කළේ ඇයි කියා මූලික වශයෙන් පාර්ලිමේන්තුවට කියන්න ඕනෑ. පාර්ලිමේන්තුවට ඒ ගැන විවාද කරන්න පුළුවන්. කාටද ඒ කරුණු කියන්නේ? ජනතාවට. ජනතාවට තමයි ඒ පණිවුඩය දෙන්නේ.

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

16වන වගන්තියේ තිබෙනවා, ප්‍රාථමික වියදම් සීමාවෙන් බැහැරව ක්‍රියා කිරීම පිළිබඳව. යම් හෙයකින් ප්‍රාථමික වියදම් සීමාවෙන් බැහැරව ක්‍රියා කිරීමක් වුණා නම් ඒ පිළිබඳ වාර්තාවක් මුදල් අමාත්‍යාවරයා විසින් පාර්ලිමේන්තුවට යෝජනා සම්මතයක් මඟින් ඉදිරිපත් කරන්න ඕනෑ. 17වන වගන්තියේ තිබෙනවා, ඇපකර සීමාව ගැන. ඇපකර සීමා උල්ලංඝනය කළොත්, ඒ ගැනත් මුදල් අමාත්‍යාවරයා විසින් පාර්ලිමේන්තුවට වහාම වාර්තා කරන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතේ දක්වා තිබෙන අලුත් වාර්තා ගැනයි මම මේ කියන්නේ. ව්‍යවස්ථාපිත අරමුදල් ගැන මම කිව්වා. ව්‍යවස්ථාපිත අරමුදල්වල කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් භාණ්ඩාගාර ලේකම් විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන්න ඕනෑ.

මෙන්න, තවත් ඉතාම වැදගත් වගන්තියක් තිබෙනවා. රාජ්‍ය ආයෝජන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඒවායේ මූල්‍ය බලපෑම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. ජනතාව දැනගන්න ඕනෑ මේ අවුරුද්දේ කෙරුණු රාජ්‍ය ආයෝජන මොනවාද, ඒවායේ ඵලදායිතාව කොහොමද, මොකක්ද වෙච්ච පසුබෑම කියලා. මෙන්න මේ වාගේ ඉතාම වැදගත් වාර්තා රාශියක් ඉදිරිපත් කිරීමට මේ පනත යටතේ බලධාරීන් බැඳීමකට ලක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කාටද මේ අයිතිවාසිකම ලැබෙන්නේ? සමස්ත ජනතාවට. මේ බොහෝ දේවල් ඒ ඒ ආයතනවල වෙබ් අඩවියේ පළ කරන්නත්, පුවත් පත්වල පළ කරන්නත් මේ නීතිය යටතේ අපි බැඳීමක් ඇති කරනවා. ඇයි ඒ? විනිවිදභාවය සඳහා. යම් හෙයකින් අපි ප්‍රාථමික ගිණුමේ ඍණ ශේෂයකට ආවා නම් ජනතාවට බලාගන්න පුළුවන් ඇයි ඒ අගයට ආවේ කියලා. මුදල් අමාත්‍යාවරයා ඇවිත් ඒ ගැන පාර්ලිමේන්තුවට කියන්න ඕනෑ. අපේ වෙබ් අඩවියේ පළ කරන්න ඕනෑ. මේ රටේ විද්වතුන්ට පුළුවන් ඒක අධ්‍යයනය කරන්න. මේවා නරකද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මේවා මේ රටේ කාලයක් තිස්සේ ඉල්ලපු දේවල්. අපි ආර්ථික ආගාධයකින් ගොඩ එන ගමන් තමයි අනික් පැත්තෙන් රටට අවශ්‍ය, අනාගතයට අවශ්‍ය දේ සම්පාදනය කරන්නේ කියන කාරණය පෙන්වා දෙන්න අවශ්‍යයි.

ඒ වාගේම, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත ගැනත් අද අපි කථා කරනවා. අපි කියනවා, අපේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි කළ යුතුයි කියා. *[බාධා කිරීමක්]* ඔව්, ඒක තමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔක්කෝම අය පිට රටවල රැකියා හොයාගෙන යන්නේ ඇයි? විශේෂයෙන්ම ශ්‍රමය වෙන්න පුළුවන්, ඔවුන්ගේ යෙදවුමට මේ රටින් ලැබෙන ප්‍රතිලාභය මදි. ඒ නිසා තමයි යන්නේ. හැබැයි ප්‍රතිලාභය වැඩි කරන්න නම් අපි මේ රටේ දැනෙන වෙනසක් ඇති කරන්න ඕනෑ. එහෙම නැතුව තේ, පොල්, රබර් විතරක් අපනයනය කරලා, ඇඟලුම් විතරක් අපනයනය කරලා ක්ෂණික වෙනසක් ඇති කරන්න බැහැ.

ඒ නිසාම අපි කියනවා, අපනයනය වර්ධනය කරන්න ඕනෑ, අපනයනය මූලික කර ගත්ත ආර්ථිකය වර්ධනය කරන්න ඕනෑ කියලා. අනෙක් පැත්තෙන් ඒකට අවශ්‍ය ආයෝජන අවශ්‍යයි. රජයට කරන්න බැරි නම්, දේශීය සහ විදේශීය ආයෝජන අවශ්‍යයි. ඉතින් ඒ සඳහා ආයෝජකයන් ආකර්ෂණය කර ගන්න ඕනෑ. මොකද, ලංකාවේ විතරක් නොවෙයි නේ ආයෝජනය කරන්නේ. අපි බැලුවොත් එහෙම දකුණු ආසියාවේ ලොකු ඉඩක් තිබෙනවා, ආයෝජනයට. ඉතින් ආයෝජකයන් ආකර්ෂණය කර ගන්න නම්, ඔවුන්ට අවශ්‍ය පහසුව, ආරක්ෂාව, ප්‍රතිලාභ ලබා දෙන්න ඕනෑ. ඉතින් ඒ පිළිබඳව ලොවට ගැළපෙන අලුත් නීතියක් අපි සම්පාදනය කිරීම අවශ්‍යයි. මේ රටේ දවසකට රුපියල් 100ක් ගත්ත කෙනාට රුපියල් 200ක් හොයලා දෙන්න ඕනෑ නම්, අපි මොකක්ද කළ යුතු වෙනස? මම මේ උදාහරණයක් විතරයි ගත්තේ. රුපියල් 100ක් අද ගෑවෙන්නවත් මදි. අපි අපනයන වර්ධනය කරන්න ඕනෑ. දේශීය වෙන්න පුළුවන්, විදේශීය වෙන්න පුළුවන්, අපනයන වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ආයෝජන කැඳවා ගන්න ඕනෑ.

1970 ගණන්වල තිබුණු නීතිය අනුව ඒක කරන්න බැහැ. ඊට වඩා වෙනස්, ලොවට ගැළපෙන නීතියක් අවශ්‍යයි. බංග්ලාදේශය වෙන්න පුළුවන්, ඉන්දියාව වෙන්න පුළුවන්, වියට්නාමය වෙන්න පුළුවන්, අපේ වටේම ඉන්න රටවල් ලෑස්තිපිට ඉන්නවා, ආයෝජකයන් භාර ගන්න. ඔවුන්ට ගැළපෙන නීති, ඔවුන්ට ගැළපෙන ප්‍රතිලාභ, ඔවුන්ට ගැළපෙන බදු ක්‍රම තිබෙනවා. හැබැයි, අපි විතරක් ඒවා වහගෙන -සංවෘත කරගෙන- ඉන්නවා. නැහැ, අපට ඒවා වෙනස් වෙන්න බැහැ කියලා හිතුවොත්, අපට වෙන්නේ හැම දාමත් අපේ උගත් දරුවා අර විදේශ රැකියා පෝලිමට යොමු කරලා බලාගෙන ඉන්න. එහෙම නම් අපි මේ නීති වෙනස් කරන්න ඕනෑ. ඒකට අවශ්‍ය පසුබිම, නීතිමය රාමුව තමයි අපි මේ හදලා දෙන්න උත්සාහ කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ දිහා විවිධ කෝණවලින් බලන්න පුළුවන්. අද අපේ රටේ මොන දේ කළත් කියන්නේ, මේවා කරන්නේ ඡන්දය නිසා කියලායි. එහෙම කියනවා නම් අපට මේ මාසයේ මාසික වැටුප ගෙවන්නත් බැහැ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ මාසයේ වැටුප ගන්නා රාජ්‍ය සේවකයාට මතක් වෙන්න ඕනෑ, රුපියල් 10,000ක් වැටුපට වැඩි වුණාය කියලා. පඩි ගෙවා ගන්න බැරිව හිටිය රටේ, දෙසැරයකට පඩි ගෙවපු රටේ, පඩි කපා හරින්න යෝජනා කළ රටේ රුපියල් 10,000ක් වැඩියෙන් රාජ්‍ය සේවකයාගේ අතට ලැබෙන්නේ, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා මේ රට භාර ගත්ත නිසා. ඒ වාගේම එතුමා මුදල් ඇමති වෙච්ච නිසා. එහෙම නම් ඒ රුපියල් 10,000 ගන්නකොට නිතැතින්ම ඒ රාජ්‍ය සේවකයන් 1,375,000ට ඒක සිහිපත් වෙන්න ඕනෑ. ඒකත් ඡන්දය නිසා දුන්නාය කියලා කියන්න පුළුවන්. නමුත් එවැනි ප්‍රාථමික තර්කවලින් මිදිලා අපි ඉදිරියට යන්න අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත්, තවමත් අපට එයින් මිදෙන්න බැරි වෙලා තිබෙනවා.

මට තව කොච්චර වෙලාව තිබෙනවාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩි පහක කාලයක් තිබෙනවා.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
හොඳයි.

මම මේ සභාවට කියන්න උත්සාහ කළේ, අපි ඉතා උවමනාවෙන් එක පැත්තකින් ආර්ථික අගාධයෙන් ගොඩ එන ගමන්, අපි වැටුණු වළෙන් වේගයෙන් ගොඩ එන ගමන්, අනෙක් පැත්තෙන් අනාගතයේ දී මෙවැනි තත්ත්ව ඇති නොවන්න, ජනතාවට ඉන්න හිතෙන රටක් නිර්මාණය කර දෙන්න අවශ්‍ය නීතිමය පසුබිම නිර්මාණ කරනවා කියන එකයි. කෙනෙකුට කියන්න පුළුවන්, මේ නීති කඩන්න පුළුවන් කියලා. ඔව්, කඩන්න පුළුවන්. බොහෝ නීති තිබෙනවා, මේ පාර්ලිමේන්තුවේ බහුතර බලයෙන් වෙනස් කරන්න පුළුවන්. සමහර නීති තිබෙනවා, තුනෙන් දෙකක බලයෙන් වෙනස් කරන්න පුළුවන්. ඒක

පාලකයන්ගේ වගකීම. හැබැයි වැට ගහලා වැට පෙන්වන එක අපේ මේ යුගයේ වගකීම. අපි ඒක ඉෂ්ට කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම දැන් කිව්වා, මේ දවස්වල මොනවා කථා කළත් අවසන් වෙන්නේ ඡන්දයෙන් කියලා. ඔව්, ජනාධිපතිවරණයක් එනවාය කියනවා. එය ඉතා වැදගත්. මේ දවස්වල මාධ්‍යයත් මේ දිහා ඉතා උවමනාවෙන් බලාගෙන ඉන්නවා, රටේ තත්ත්වය ගැන කථා කරනවා, විශාල සේවයක් කරනවා. එහෙම නම් අපි මේවා පිළිබඳ හොඳ සංවාදයක් ඇති කර ගන්න අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද අපි දන්නවා, ජනාධිපතිවරණයක් ආවොත් දැනට කථා බහ වෙන විධියට ප්‍රධාන කිහිපදෙනෙක් තමයි ඉදිරිපත් වෙන්නේ. ඒ ඉදිරිපත් වෙන අය අතර එක් අයෙක් ඉන්නවා, මේ දෙකෝටි විසිලක්ෂයේ වගකීම භාරගත් පුද්ගලයා ලෙස. කෝටුරු තෙල් හොය හොයා ඉන්නේ නැතුව තනි පුද්ගලයකු විධියට ධෛර්යයක් තිබුණු මනුස්සයෙක් ඉන්නවා. ඒ පුද්ගලයා මියෙම්වා, රැකෙම්වා කියලා මේ දෙකෝටි විසිලක්ෂය භාර ගත්තා. හරි අමාරුයි, තනියම ඒක කරන එක. මේ රටේ හැම රාජ්‍ය නායකයෙකුටම අඩු ගණනේ තමන්ගේ අරමුණත් එක්කම බැඳුණු, තමන්ගේ මතය ක්‍රියාත්මක කරන්න දිවුරුම් දීපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු බහුතරයක් හිටියා. හැබැයි එහෙම එක්කෙනෙක්වත් නැතුව මේ මහා අර්බුදය භාර ගත්ත කෙනෙක් හිටියා.

ඔහු මේක භාරගන්න ඉදිරිපත් වුණා. ඒ වාගේම තවත් ඉදිරිපත් වෙන අය ඉන්නවා. ඒ අර කෝටුරු තෙල් හොයපු අය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔවුන් මේක භාර ගන්න බය වුණා. ඒකට වෙනත් හේතු තිබෙන්න පුළුවන්. හැබැයි, ඒ අය කෝටුරු තෙල් හොය හොයා ඉඳලා අද මේ තරගයට එනවා. අපි මේ පිළිබඳව හොඳ කථිකාවක් ඇති කරන්න ඕනෑ. මේ කාල සීමාවේම එතුමන්ලා කළේ, මේකේ තිබෙන ඇලපිල්ලේ අඩුකම, මේකේ තිබෙන පාපිල්ලේ අඩුකම, ඉස්පිල්ලේ අඩුකම හැම දාම උදේ හවස හොයන එකයි. IMF ප්‍රශ්නය එන කොට සහායක් වශයෙන් ඒවාට උදවු වුණාද? නැත්නම් රජයට අත්‍යවශ්‍ය පනත් කෙටුම්පතක් ගෙනෙනකොට රට වෙනුවෙන් උදව් කළාද, ජනතාව බිය කළාද?

දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම කියන කාරණයේ දී එම කණ්ඩායම සමාජය මොන තරම් බිය ගැන්වූවාද? මේ කියන තත්ත්වයට නායකත්වය දුන් අයත් මේ කියන ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙනවා. මේ රටේ ජනතාවගෙන් වෙන්න පුළුවන්, පාර්ලිමේන්තුවේ වෙන්න පුළුවන්, මාධ්‍යවලින් වෙන්න පුළුවන් මම මේ ගැන සංවාදයක් ඇති කරන්න කියලා ඉල්ලනවා. අංක එකට ගන්න, "රනිල් වික්‍රමසිංහ මහතා රට භාර නොගත්තා නම්" කියන එක. ඒ ගැන සංවාදය කරන්න. අපට කියන්න පුළුවන්, අපි භාර ගත් දින සිට මාස තුනක් අතීතයට ගිහිල්ලා සතියෙන් සතිය, සතියෙන් සතිය ඇති වෙච්ච තත්ත්වය. අවසානයේ පාර්ලිමේන්තුවත් ආක්‍රමණය වෙන්න ඔන්න මෙන්න තිබුණේ. එතුමා මේ රට භාර නොගත්තා නම්, එතුමාත් කෝටුරු තෙල් හෙව්වා නම්, ඊළඟ සතියේ මේ රටේ ඇති වෙන්න තිබුණු තත්ත්වය මොකක්ද? ඒ නිසා අරාජිකත්වය, නීතිය බිඳ වැටීම, ආර්ථික ප්‍රශ්න, භාණ්ඩ හිඟය, ආහාර හිඟය, බෙහෙත් හිඟය සතියෙන්, සතිය වර්ධනය වෙන්නේ කොහොමද කියන එක ගැන සංවාදයක් ඇති කරන්න. ඒ අය ඒවාට උත්තර දෙන්න. භාණ්ඩාගාරයේ ඉඳලා මේ තත්ත්වය හරියට දැකපු කෙනකු හැටියට මේ ගැන කථා කරන්න මම පැහැදිලිව සූදානම්.

අපි ආ ධනාත්මක ගමන ගැන කථා කරන්න ඕනෑ. මීට පෙර කථා කරපු අපේ උගත් මන්ත්‍රීතුමාත් "අරක නැහැ, මේක නැහැ, මේක අඩුයි, අමාරුයි" කියලා කියනවා මම දැක්කා. ඔව්, අමාරුයි. අමාරු නැති වෙන්න බැහැ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙච්චර ලොකු අගාධයකින් උඩට යනකොට අමාරු නැත්නම් තමයි ප්‍රශ්නය තිබෙන්නේ. හැබැයි, අපි ඒක තේරුම් අරගෙන තිබෙනවා. ඒකට තමයි අපි උත්තර හොයන්නේ. මේ සංවාදයේ එක මාතෘකාවක් වෙන්න ඕනෑ, "අපි ආ ධනාත්මක ගමන් මග හා බාධක" කියන එක. ඒවා ගැනත් අපි කථා බහට ලක් කරන්න ඕනෑ. මේ රටට ආදරය කරන මාධ්‍ය ආයතනවලින් මම ඉල්ලා සිටිනවා, ඒකත් මාතෘකාවක් කරගන්න කියලා. ඒ එක්කම, විපක්ෂය සහ සමහර උගතුන්, සමහර පර්යේෂණ ආයතන ඉදිරිපත් කරපු අසුබ අනාවැකි පිළිබඳවත් සාකච්ඡාවක් ආරම්භ කරන්න. පසුගිය අවුරුද්දක, දෙකක කාලය තුළ සති අන්ත පුවත්පත්වල මුල් පිටු මොන තරම් ඍණාත්මක අනාවැකි පළ කළාද?

රනිල් වික්‍රමසිංහ මැතිතුමා රට භාර නොගත්තා නම් අපි ආ ධනාත්මක ගමන් මග හා බාධක පිළිබඳව විපක්ෂය, ආර්ථික පර්යේෂකයන්, සමහර උගතුන් ඉදිරිපත් කළ අසුබ අනාවැකි හැබෑවක්ද, යථාර්ථයක්ද යන මෙන්න මේ කාරණා තුන පිළිබඳවත් ඉදිරි මාස දෙකේ පැහැදිලි සංවාදයක් ආරම්භ කරන්න කියලා මේ සභාවෙන්, සමස්ත මාධ්‍ය ආයතනවලින්, මාධ්‍ය සහෝදරයන්ගෙන් මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා. එතකොට ජනතාවට පහසු වේවි අර කියන දිනයට ගිහිල්ලා තීරණයක් ගන්න. එතකොට වැඩි දුර හිතන්න අවශ්‍ය වෙන්නේ නැහැ, මොකක්ද ගත යුතු තීරණය කියලා. හිතන්න අවශ්‍ය පසුබිම ඉතා පහසුවෙන් නිර්මාණය කළ හැකි වේදිකාවක් ඒ තුළින් නිර්මාණය වෙනවා.

මට මේ කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නාලක ගොඩහේවා මැතිතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.37]

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත හා ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත ගැන අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ පනත් කෙටුම්පත් දෙකේම හොඳ දේවලුත් තිබෙනවා, නරක දේවලුත් තිබෙනවා. සාමාන්‍යයෙන් ඕනෑම පනත් කෙටුම්පතක එහෙම තමයි. කෙසේ වෙතත්, අද උදේ විපක්ෂ නායකතුමාත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් දෙදෙනාම පැහැදිලි කළා, මේ පනත් කෙටුම්පත් දෙකෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පතට අපි විරෝධතාවක් පළ කරන්නේ නැහැ කියලා. නමුත් ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතට සහයෝගය දෙන්න බැරි හේතු ගණනාවක් අපට තිබෙනවා. මට තිබෙන කෙටි කාලය පාවිච්චි කරලා මේ දෙවැනි පනත් කෙටුම්පත ගැන පමණක් කරුණු කිහිපයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවැනි කාරණය මෙයයි. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරපු රාජ්‍ය අමාත්‍යවරයාගේ සිට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කථා කරපු හැම කෙනෙකුම කථා කළේ, මේ පනත් කෙටුම්පත ගෙනාවාම හරියට සුරංගනා කථාවක වෙනවා වාගේ මේ රටේ ආර්ථිකය සම්පූර්ණ පරිවර්තනයකට පත් වෙලා රට සුඛිත, මුදිත වෙනවා කියලායි.

[ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා]

මේ පනත දිහා බැලුවාම මම දැක්කා, මේ පනතේ නමේ ඉඳන්ම ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඇත්තටම ආර්ථිකය පරිවර්තනය කිරීමට අවශ්‍ය සියලු දේ මෙතැන තිබෙනවා ද කියන කාරණාවත් අපි සොයා බලන්න ඕනෑ. මෙහි පළමුවැනි පරිච්ඡේදය පොඩ්ඩකට පැත්තකට දාලා, එතැනින් පස්සේ තිබෙන කරුණු දිහා බලන්න. මේ පනතින් කථා කරන්නේ ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යම් යම් ක්ෂේත්‍ර පිළිබඳවයි. විශේෂයෙන්ම ආයෝජන සහ අපනයන ගැන තමයි මේ පනතින් කථා කරන්නේ. නමුත්, ආර්ථිකයක් පරිවර්තනය කරනවා කියන්නේ එතරම් සරල දෙයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මීට වඩා බොහෝ දේවල් ආර්ථික පරිවර්තන ක්‍රියාවලිය තුළ අන්තර්ගත විය යුතුයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ වෙලාවේ අපේ රටේ තිබෙන බරපතළම ප්‍රශ්නයක් තමයි, අපේ රටේ ආර්ථිකය දිගින් දිගටම සංකෝචනය වෙමින් පැවතීම. 2022, 2023 වර්ෂ දෙක ගත්තාම, 2022 වර්ෂයේ සියයට 7.3කින් අපේ රටේ ආර්ථිකය සංකෝචනය වුණා. 2023 වර්ෂයේ සියයට 2.5කින් අපේ රටේ ආර්ථිකය සංකෝචනය වුණා. සියයට 10කට වැඩි ප්‍රමාණයකින් වර්ෂ දෙකක් තුළ අපේ ආර්ථිකය සංකෝචනය වෙලා තමයි අපි මේ ආපහු යන්තම් ගොඩ එමින් තිබෙන්නේ.

ආර්ථිකයේ සැබෑ පරිවර්තනයක් කරන්නට නම් අවධානයට යොමු වෙන්න ඕනෑ වැදගත් ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා කියන එක අපි මෙතැනදී විශ්වාස කරනවා. විශේෂයෙන්ම මේ රටේ ව්‍යවසායකත්වය උත්තේජනය කරන්නේ කෙසේද කියන කාරණයට අවධානය යොමු වෙන්න ඕනෑ. ඒ කාරණය වෙනම කථා කළ යුතු කාරණයක්. අපි හැමෝම දන්නවා, මේ රටේ රාජ්‍ය ආදායම ගැන කථා කළාම විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙන බදු එකතු කිරීමේ යන්ත්‍රණය අපි ප්‍රතිව්‍යුහගත කරන්නේ කොහොමද, ප්‍රතිසංස්කරණය කරන්නේ කොහොමද කියන කාරණය. ඒවා ගැන වෙන වෙනම සාකච්ඡා යනවා. මේ පනතේ ඒවා ගැන කථා කරලා නැහැ.

අනෙක් පැත්තෙන් අපනයන ආර්ථිකයක් ගොඩනැඟීම ගැන කථා කළත්, අපනයන ආර්ථිකයක් ගොඩනැඟීමේදී අපි හඳුනාගත යුතු සුවිශේෂී ක්ෂේත්‍ර මොනවාද? අපේ රටේ තිබෙන හැකියා, අපේ රටේ භූගෝලීය පිහිටීම, අපේ රටේ සම්පත් පාදක කරගෙන අපනයන ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා විශේෂයෙන්ම හඳුනාගත යුතු ක්ෂේත්‍ර මොනවාද කියන කාරණා ගැන මේ පනතේ සාකච්ඡා වෙන්නේ නැහැ. ඒ වාගේම මේ රටේ රජය සතුව විශාල සම්පත් ප්‍රමාණයක් තිබෙනවා. ඒවා හරියට කළමනාකරණය වෙන්නේ නැහැ කියන එක පිළිබඳවත් චෝදනාවක් තිබෙනවා. ඒ සඳහා කුමක්ද කළ යුත්තේ කියන එක ගැනත් සාකච්ඡාවක් තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් කුමක් කළ යුතුද? ඒ සම්පත්වල ඵලදායිතාව වැඩි කරගන්නේ කොහොමද? මේ කරුණු කිසිවක් පිළිබඳව මේ පනතේ සාකච්ඡා වෙන්නේ නැහැ.

ඒ වාගේම අපේ රටට තිබෙන ලොකුම ශක්තිය වන මානව ශක්තිය, මානව ප්‍රාග්ධනය අපි වර්ධනය කරන්නේ කොහොමද? ඒක මේ රටේ සංවර්ධනය සඳහා උපයෝගී කර ගන්නේ කොහොමද? මොන දිශානතිවලටද අපි ඒ මානව ප්‍රාග්ධනය යොමු කරන්න ඕනෑ කියන කාරණය මේ පනතේ සාකච්ඡා වෙන්නේ නැහැ. බොහෝදෙනෙක් කථා කරන්නේ නැති, බොහෝදෙනෙක් අමතක කර තිබෙන අපේ රට සංවර්ධනය කිරීමේ අත්‍යවශ්‍යම සාධකයක් වන ප්‍රාග්ධන වෙළෙඳ පොළ පුළුල් කරන්නේ කොහොමද කියන කාරණයත් මේ පනතින් සාකච්ඡා කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට සහ ගරු සභාවට මේ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න මම කාරණා කිහිපයක් පමණයි පෙන්වා දුන්නේ. ආර්ථික පරිවර්තනය කියන්නේ මේ පනතේ සාකච්ඡා කරන මේ කරුණු කිහිපය පමණක් නෙවෙයි. මේ පනතට "අපනයන සංවර්ධන හා අන්තර්ජාතික වෙළෙඳාම ප්‍රවර්ධනය" වාගේ නමක් දීලා තිබුණා නම් ඔබතුමන්ලා කියනවා ද, මේ පනතින් අපේ රට සුඛිත මුදිත වෙනවා කියලා? මේකෙන් හොඳක් වෙනවා. නමුත්, මේකෙන් සියලු ප්‍රශ්න විසඳෙන්නේ නැහැයි කියන එක තමයි මට පෙන්වන්න පුළුවන් පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය තමයි, මේකේ තිබෙන පළමුවැනි පරිච්ඡේදය. අද විපක්ෂයෙන් කථා කරපු බොහෝදෙනෙක් පෙන්වා දුන්නා, පළමුවැනි පරිච්ඡේදය සම්බන්ධයෙන් අපට තිබෙන විරසකය සහ අපි මේකට එකඟ වෙන්නේ නැත්තේ ඇයි කියන කාරණය. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ පනතේ පළමුවැනි පරිච්ඡේදයේ ප්‍රතිපත්ති ගැන කථා කරනවා. එහි පැහැදිලිවම කියලා තිබෙනවා, ප්‍රතිපත්ති ගැන. මෙහි ප්‍රතිපත්ති කියන්නේ මොනවාද? ඕනෑම ආණ්ඩුවක් බලයට එනකොට ජනතාවට ප්‍රතිපත්ති මාලාවක් ඉදිරිපත් කරනවා. ඔබතුමන්ලා බලයට එනකොටත් ඒක කළා. ඉස්සරහට එන ආණ්ඩුත් ඒක කරනවා. ඒ ප්‍රතිපත්ති දිහා බලලා තමයි ජනතාව තීන්දු කරන්නේ මොන පක්ෂයට ද බලය දෙන්න ඕනෑ කියලා. පක්ෂ ගණනාවක් ඉදිරිපත් කරන ප්‍රතිපත්ති අතරින් ජනතාව තෝරා ගන්නවා, මෙන්න මේ පක්ෂය තමයි බලයට පත් කරන්න ඕනෑ කියලා. යම්කිසි කණ්ඩායමක් බලයට ගෙන ඒම සඳහා බහුතර ජනතාවක් ඒ කණ්ඩායම තෝරා ගන්නවා. ඊට පස්සේ ඒ ප්‍රතිපත්ති මාලාව අනුව එම කණ්ඩායම රට පාලනය කරනවා. එතකොට තමන්ගේ ධුර කාලය අවසාන භාගයේ ඉන්න රජයකට පුළුවන් ද, ජාතික ප්‍රතිපත්ති මාලාවක් නීතිගත කරන්න? අන්න ඒකයි අපට තිබෙන මූලික ප්‍රශ්නය. ජාතික ප්‍රතිපත්ති මාලාවක අවශ්‍යතාව අපි හැමෝම පිළිගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ තිබෙන මූලිකම ප්‍රශ්නයක් තමයි, ජාතික ප්‍රතිපත්තියක් නැතිකම. හැබැයි, තමුන්ගේ ධුර කාලය අවසාන භාගයේ ඉන්න රජයකට ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට අයිතියක් තිබෙනවා ද? ජාතික ප්‍රතිපත්ති මාලාවක් සකස් කරන්න ඕනෑ නම් ඒ සම්බන්ධයෙන් පුළුල් සංවාදයක් තිබෙන්න ඕනෑ. පක්ෂ විපක්ෂ සියලුදෙනාම, මේ රටේ සිටින පොදු ජනතාව, විවිධ කණ්ඩායම් ඒකරාශී කරලා යම්කිසි විද්‍යාත්මක ක්‍රමයකට සාකච්ඡා කරලා, වාද විවාද කරලා තමයි ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ යුතු වන්නේ. එවැනි ජාතික ප්‍රතිපත්ති මාලාවක් සකස් වෙනවා නම් රටකට ඒක ඉතාම හොඳයි. මේ සකස් කරලා තිබෙන්නේ එවැනි දෙයක් නොවෙයි නේ. මේ සකස් කරලා තිබෙන්නේ මොකක්ද? IMF එකෙන් දුන් ඉලක්ක ටිකක් මේ පනතේ පළමුවැනි පරිච්ඡේදයට දාලා, ඒකට කියනවා ජාතික ප්‍රතිපත්තියක් කියලා. අන්න ඒ කාරණයටයි අපි දෙවනුව විරුද්ධ වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුන්වැනි කාරණය විධියට අපි වර්තමාන ආණ්ඩුවේ දකින තවත් ප්‍රබලම ගැටලුවක් තමයි, හැම දෙයක්ම අතිශයෝක්තියට ලක් කිරීම. උදාහරණයක් වශයෙන් ගත්තොත් පසුගිය දවස්වල ජනාධිපතිතුමාම කියනවා මම දැක්කා, අපි පසුගිය වසර දෙක තුළ මේ පාර්ලිමේන්තුවට පනත් 75කට වඩා ගෙනැත් තිබෙනවා කියලා. 75ක් නොවෙයි, මම හිතන්නේ මේ වන විට 80ටත් වැඩි ඇති. හැම දාම මොකක් හරි පනතක් අලුතින් ගෙනෙනවා. ඒවා ගැන සාකච්ඡා කරනවා. අපි ඉන් බහුතරයකට විරුද්ධ වුණේ නැහැ. සමහර දේවල්වලට විතරයි අපි විරුද්ධ වුණේ. මොකද, ඒ පනත්වල වරදක් නැති වුණත් අපට තිබෙන ප්‍රශ්නය තමයි, ඒ පනත්වලින් පමණක් මේ රටේ ප්‍රශ්න විසඳෙනවා ද කියන එක. මොකක්ද, මේ රටේ අද විසඳිලා තිබෙන ප්‍රශ්නය? ඒවා හරහා අපේ රටේ ආර්ථිකය ප්‍රසාරණය වෙන්න පටන් අරගෙන තිබෙනවා ද? අපේ රටේ රැකියා නියුක්තිය වැඩි වෙලා තිබෙනවා ද? අපේ රටේ මිනිස්සුන්ගේ ජීවන මට්ටම වැඩි වෙලා තිබෙනවා ද? අපේ රටේ අධ්‍යාපන මට්ටම ඉහළ ගිහිල්ලා

තිබෙනවා ද? අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු වෙලා තිබෙනවා ද? අපේ රටට ආයෝජන එමින් පවතිනවා ද? මේ කිසිම දෙයක් වෙලා නැහැ.

වෙලා තිබෙන එකම දේ තමයි, තිබුණු දුෂ්කරතා පෙනෙන්නේ නැති තත්ත්වයකට පත්ව තිබීම. අද මිනිස්සු බඩගින්නේ ඉන්නවා. නමුත් ඒ ගැන කථා කරන්නේ නැහැ. අද දරුවා පාසලට යවාගන්න බැහැ. මිනිස්සු ඒ ගැන කථා කරන්නේ නැහැ. මොකද, කථා කරලා වැඩක් නැති නිසා. හරි වෙලාව එනතුරු මිනිස්සු ඉන්නවා, මේ ආණ්ඩුව ගෙදර ඇරලා මේ ප්‍රශ්නවලට විසඳුමක් සොයා ගන්න පුළුවන් කවුරු හරි බලයට ගෙනෙන්න. අන්න ඒ තැන තමයි අද අපි ඉන්නේ.

මේ ආණ්ඩුව පසුගිය අවුරුදු දෙක තිස්සේ කළා නම් කළේ එකම දෙයයි. ඒ තමයි, එක පැත්තකින් මහා පරිමාණ විධියට වංචා දූෂණවලට ඉඩ සැලසීම. ටෙන්ඩර් ක්‍රමයක්, ප්‍රසම්පාදන ක්‍රියාවලියක් නැහැ. හැම දෙයක්ම කැබිනට් පත්‍රිකා හරහා සිද්ධ වෙන මහා දූෂිත ක්‍රමයක් සකස් කළා. මේ අවුරුදු දෙක පුරාම උත්සාහ කළේ මේ රටේ තිබෙන සම්පත් ටික විකුණා දමන්නේ කොහොමද කියලායි. සම්පත් විකුණනවා කියන්නේ ලාභ ලබන සම්පත් ටික විකුණා දමන්නේ කොහොමද කියන කාරණයයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා
(මාණ්පුමිකු (කලානිති) නාලක්ක කොඩහේවා)
(The Hon. (Dr.) Nalaka Godahewa)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාසනාවකට වාගේ අවුරුදු දෙකක් උත්සාහ කරලාත් මේ අයට ඒ සම්පත් ටික තවම විකුණා ගන්න බැරි වුණා. විකුණා ගන්න ඔන්න මෙන්න ඇවිල්ලා තිබෙනවා. ටෙලිකොම් ආයතනය වාගේ ආයතන විකිණීමේ අවසාන අදියරට දැන් ඇවිල්ලා තිබෙනවා. නමුත් මම ප්‍රාර්ථනා කරනවා, ඉතිරි මාස තුනේදීත් මේ වැඩේ කරගන්න බැරි වෙන්න කියලා. එතැනින් එහාට මේ රටේ පත් වෙන්නේ අලුත් ආණ්ඩුවක් නිසා ඒ ආණ්ඩුවත් එක්ක ජනතාව නිවැරදි දේ කරාවි.

බොහොම ස්තුතියි.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු චෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් නාලක ගොඩහේවා මන්ත්‍රීතුමා දිගින් දිගටම මේ රජය විවේචනයට ලක් කළා සහ මේ පනතට සහයෝගය නොදෙන්නේ ඇයි කියන කාරණාව කිව්වා. අපට තිබෙන ප්‍රශ්නය මෙයයි. මේ වෙලාව වැටුණු රට තිරසර ආර්ථිකයක් කරා ගමන් කරන වෙලාවක්. එතුමා තමයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ප්‍රධාන උපදේශක හැටියට කටයුතු කළේ. එතුමා තමයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කථා ටික ලිව්වේ, ආර්ථික ප්‍රතිපත්ති හැදුවේ, ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න එපා කිව්වේ. ඒ සියල්ල තුළින් මේ රට සම්පූර්ණයෙන්ම වැටිලා අවසානයේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට යන්න වුණා. අපේ ගෙවල් පවා පිච්චුවා. ඒකට වගකියන්න ඕනෑ කෙනා මෙතැනට ඇවිල්ලා ඒක හරි ගස්සපු අයට මොකක්ද කියන්නේ? එතුමාට තිබුණු වගකීම තමයි, ඒ වැරැද්ද තේරුම් ගත්තා නම් මෙතැනට ඇවිල්ලා මේ රට නැවත ගොඩ නැඟීමේ වගකීම භාර ගන්න එක. එතුමා මොකක්ද කළේ? රට වටිටන්න මූලිකත්වය, නායකත්වය දීලා රට වටිටලා ඉවර වෙලා එහා පැත්තට ගිහිල්ලා අවසානයේ අපට ඇඟිල්ල දිගු කරලා දැන් අත හෝදා ගන්න හදනවා. ඉතින් ඒක සාධාරණ නැහැ. ඒ හින්දා අපි රටක් හැටියට හිතමු. අපේ පක්ෂය අපි දෙවනුව ගනිමු.

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා
(මාණ්පුමිකු (කලානිති) නාලක්ක කොඩහේවා)
(The Hon. (Dr.) Nalaka Godahewa)
Sir, I rise to a point of Order.

ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා මේ අවුරුදු දෙක තුළ බොහෝ වෙනස් වෙලා තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි නේද?

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා
(මාණ්පුමිකු (කලානිති) නාලක්ක කොඩහේවා)
(The Hon. (Dr.) Nalaka Godahewa)
නැහැ, නැහැ, ඉන්න, ඉන්න. ජාතික ඇඳුම ඇඳගෙන නාමල් රාජපක්ෂ මහත්තයා පස්සේ ගිය පුද්ගලයා අද කෝට් එක ඇඳගෙන බොරු කියන්න පටන් අරගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝඨාභය රාජපක්ෂට විතරක් නොවෙයි, අපි මෙතුමාටත් උපදෙස් දුන්නා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු චෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. ගරු මන්ත්‍රීතුමා ඉස්සර අපටත් පන්ති පැවැත්වුවා. *[බාධා කිරීමක්]* මෙතුමා පන්ති පවත්වලා කියපු දේවල් අපි කළා නම්, අද අපට රට ගොඩ නහන්න බැහැ. ප්‍රශ්නය තිබෙන්නේ,- *[බාධා කිරීම්]* නාලක ගොඩහේවා මන්ත්‍රීතුමනි, ඔබතුමා අපිත් එක්ක ආණ්ඩු කරපු කෙනෙක් නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා තමයි හැම දේටම, හැම නිලධාරියෙක්ම පත් කරන්න අවශ්‍ය නිර්දේශ දුන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා මේ රට කාලා ඉවර වෙලා, රට භදන්න නායකත්වය ගත් අයට දැන් ඇඟිල්ල දිගු කරන්න එපා. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව විතරක් නොවෙයි, මේ රටම විනාශ කළා. මේ රටම විනාශ කරලා විපක්ෂ නායකතුමාත් එක්ක එකතු වෙලා ආපහු ක්‍රියාත්මක කරන්න යන්නේ ඔබතුමාගේ ආර්ථික ප්‍රතිපත්තිය නම්, නැවත වතාවක් වෙන්නේ රටේ විනාශය කියන එක අහන්න දෙයක් නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න එපා කියලා එවකට පැවති ආණ්ඩුවට බලපෑම් කළේ. *[බාධා කිරීමක්]*

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා
(මාණ්පුමිකු (කලානිති) නාලක්ක කොඩහේවා)
(The Hon. (Dr.) Nalaka Godahewa)
මයික් එක දෙන්න. මට කථා කරන්න දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නාලක ගොඩහේවා මන්ත්‍රීතුමනි, කඩිනමින් අවසන් කරන්න.

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවේ මුදල් ඇමතිත් මම නොවෙයි, මහ බැංකු අධිපතිත් මම නොවෙයි, ජනාධිපති ලේකම්තුමාත් මම නොවෙයි, භාණ්ඩාගාර ලේකම්තුමාත් මම නොවෙයි. මෙතුමන්ලා ඒ කැබිනට් මණ්ඩලයේ හිටියා. මම කැබිනට් මණ්ඩලයේ එක දවසයි හිටියේ. මම කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලා අස් වුණා. ඒ නිසා කරුණාකරලා ඒ අය මේ වගකීම භාර ගන්න ඕනෑ. IMF එකට යන්න කියලා මම මුල ඉඳලාම කිව්වා. මම මේ සභාවේ ඔය පැත්තේ වාඩි වෙලා ඉඳගෙන කිව්වා, IMF එකට යන්න කියලා. ඒ නිසා බොරු කියනකොට ඒවාට ඉඩ දෙන්න එපා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.49]

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත සහ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන අද දවසේ ඒ වෙනුවෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පළ කරනවා. අපි මුල ඉඳලාම කිව්වේ වෙන මොකක්වත් නොවෙයි, මේ පනත් කෙටුම්පත් ඉතා වැදගත් කියන එකයි. හැබැයි, තිබෙන ප්‍රශ්නය මෙයයි. බොහෝ විට අද මධ්‍යම රාත්‍රිය වනකොට ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කරන්න අවශ්‍ය කටයුතු සූදානම් වෙමින් තිබෙනවා. මෙවැනි වෙලාවක මෙම පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම පිළිබඳව තමයි විපක්ෂයක් හැටියට අපේ විරෝධතාව පළ කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත් කෙටුම්පත් දෙක විවාද කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන වෙලාවේ, විශේෂයෙන්ම අපි ආණ්ඩු පක්ෂයෙන් අහන්න ඕනෑ කාරණයක් තිබෙනවා. දැන් රට බංකොලොත්භාවයෙන් මිදිලා කියන කාරණය ආණ්ඩුව හැම වෙලාවේම ප්‍රකාශ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා හැම වෙලාවකදීම කියන කාරණයක් තමයි, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා අගමැති ධුරය භාර ගත්ත වෙලාවේ කවුරුවත් ඒක භාර ගන්න ඉදිරිපත් වුණේ නැහැ, එතුමා තනිවම ඒ වගකීම භාර ගත්තා කියන එක. අපි මේ කාරණය ගැන පැහැදිලිවම කියන්නට ඕනෑ. මොකද, ඒ වනකොට අපි ස්වාධීන කණ්ඩායමක් හැටියට - හෘදය සාක්ෂිය තිබෙන දහදෙනෙක් හැටියට - කටයුතු කළා. අපි එදා විපක්ෂයට ඇවිල්ලා හිටියේ නැහැ. අපි ආණ්ඩුව පැත්තේ හිටියේ. ඒ වෙලාවේ ආණ්ඩුව කරපු යම් යම් ක්‍රියා අපි ආණ්ඩුව පැත්තේම ඉඳගෙන විවේචනය කළා. එම නිසා අපි පැහැදිලිවම දන්නවා, එදා මේ රට භාර ගන්න කවුරුවත් නැති වෙලාවක රනිල් වික්‍රමසිංහ මැතිතුමා රට භාර ගත්තා නොවෙයි කියන එක. මේ රට භාර ගන්න ඕනෑ තරම් අය එදා පොහොට්ටුවේ හිටියා. මේ ආණ්ඩුව භාර ගන්න පොහොට්ටුව ඇතුළේ ඕනෑ තරම් අය හිටියා.

හැබැයි, ප්‍රශ්නයක් තිබුණා. රාජපක්ෂලා එකතු වෙලා ඒක කරන්න දුන්නේ නැහැ කියන එක මම වගකීමෙන් යුතුව කියන්නට ඕනෑ. මොකද, එතකොට අපි හිටියා නේ. "හෘදය සාක්ෂියේ දහදෙනා" කියලා අපි දහදෙනෙකුගෙන් යුක්ත කණ්ඩායමක් එදා හදාගෙන හිටියා. ඒ වෙලාවේ අපි ගිහිල්ලා නම් කිහිපයක් ඉදිරිපත් කළා, අගමැතිකම දෙන්න කියලා. ඒ වෙලාවේ අගමැතිකම ගන්න කැමැති අයත් හිටියා. ඒ නිසා කරුණාකරලා අපි මේක නිවැරදි කරන්න ඕනෑ. මේ රටට බොරු කියන්න හොඳ නැහැ. වැල් පාලමෙන් යනවා කියනවා. අර මොකක්ද එක වාගේ හැම වෙලාවේම කියන්නේ, මේ රට භාර ගන්න කෙනෙක් හිටියේ නැහැ, ආණ්ඩුව භාර ගන්න කෙනෙක් හිටියේ නැහැ කියන එකයි. මේ දෙසිය විසිපස්දෙනා ඇතුළේ ඕනෑ තරම් අය මේ ආණ්ඩුව භාර ගන්න හිටියා. හැබැයි, ප්‍රශ්නය වෙලා තිබුණේ, ඒ දෙසිය විසිපස්දෙනා අතුරින් අගමැතිකම ඉල්ලපු කණ්ඩායමට අගමැතිකම දෙන්න ඒ වෙලාවේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත්, මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු ආණ්ඩුවේ හිටපු කණ්ඩායමත් අකැමැති වුණු එකයි. ඒ නිසා රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අගමැතිකම දෙන්න ඒ වෙලාවේ තීන්දු කරලා තිබුණාය කියන එක අපි විශේෂයෙන් කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම තව කාරණයක් කියන්නට ඕනෑ. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා දැන් මුමුණමින් කියන කාරණාවක් තමයි, "දැන් මේ රට බංකොලොත්භාවයෙන් මිදිලා" කියන කාරණය. හැබැයි, අපි මේ කාරණයත් අහනවා. දේශීය ණය සහ විදේශීය ණය ඇමෙරිකානු ඩොලර් බිලියන 72ක් තිබුණු වෙලාවේ නේද, රට බංකොලොත් කියලා කිව්වේ? නමුත්, අද වනකොට ඇමෙරිකානු ඩොලර් බිලියන 100ක් ණයයි. දැන් කියනවා, රට බංකොලොත් නැහැ කියලා. මම දන්නේ නැහැ, මේ ඉලක්කම් ශාස්ත්‍රය කොහෙන් හොයා ගත්ත ශාස්ත්‍රයක්ද කියලා. හැබැයි, විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා මෙවැනි දේවල්වලට බොහොම දක්ෂයෙක් කියලා අපි දන්නවා. මොකද, එතුමාගේ න්‍යාය පත්‍රයේම තිබෙන එකක් තමයි, ඔය ගණන් ශාස්ත්‍රය. ඒ ගණන් ශාස්ත්‍රය අනුව තමයි මේ වෙනකල් පළාත් සභා මැතිවරණය කල් දැම්මේ. ඒ ගණන් ශාස්ත්‍රය අනුව තමයි පළාත් පාලන ආයතන ටික අද වෙනකල් වහලා දාලා තිබෙන්නේ. ඔන්න ඕක තමයි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ ශාස්ත්‍රය. ඒක හොඳයි, ආණ්ඩු පක්ෂයට. හැබැයි, අපට ඒක හරියන්නේ නැහැ. ඒ නිසා තමයි අපි ආණ්ඩුවේ ඉඳලා ස්වාධීන වෙලා, මේ රටේ මිනිස්සු වෙනුවෙන් අද විපක්ෂයට ඇවිල්ලා තිබෙන්නේ.

අද විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා මේ මූල්‍ය පනත් කෙටුම්පත් දෙක පිළිබඳව ඉතාම හොඳට පැහැදිලි කිරීමක් කළා. එතුමා අද විතරක් නොවෙයි, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ රට පිළිබඳව කථා කරපු දවසේ, පසුගිය පාර්ලිමේන්තු වාරයේ නොවෙයි, ඊට කලින් පැවති පාර්ලිමේන්තු වාරයේදීත් IMF එකෙන් ණය ගැනීම පිළිබඳව ඉතා හොඳ පැහැදිලි කිරීමක් කළා. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා, මේ වෙලාවේ IMF එකට ඕනෑ නිසා තමයි, මේ පනත් කෙටුම්පත් දෙක ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන කාරණය.

ඊළඟ කාරණය මෙයයි. දැන් මේ රට බංකොලොත්භාවයෙන් මිදිලා. හැබැයි, අපට තිබෙන ප්‍රශ්නය තමයි, අද පොලිසියට වග කියන්න පොලිස්පතිවරයෙක් නැතිකම. අපි මේ පාර්ලිමේන්තුවේදී පුළුවන් තරම් කිව්වා, මේ පොලිස්පතිවරයා පත් කිරීම වැරැදියි කියලා. කථානායකතුමාට පුන පුනා අපි ඒක කිව්වා. හැබැයි, මොකක්ද කළේ? කථානායකතුමා ඒක පිළිගන්නේ නැතුව, අනවශ්‍ය විධියට තනි තීන්දු-තීරණ අරගෙන, ඒ බලය පාවිච්චි කළා. ඒ බලය පාවිච්චි කරලා පොලිස්පතිවරයා පත් කළා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද මේ රටේ ආරක්ෂාව පිළිබඳ යම් ප්‍රශ්නයක් තිබෙනවා. අද ශ්‍රී ලංකා පොලීසිය වගකීමක් භාර ගන්න කෙනෙක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ රට පිළිබඳව මීට වැඩිය කල්පනා කළොත් හොඳයි කියන කාරණාව අපි සිහිපත් කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි.

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට විනාඩි 8ක් තිබෙනවා කියලා තමයි කිව්වේ. හැබැයි, අවසානයේදී ඒක විනාඩි 6ක් වෙලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 6ක් තමයි වෙන් කර තිබුණේ.

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට කියන්න ඕනෑ, මේ රටේ සංවර්ධන වැඩ කරනවාට අපි විරුද්ධ නැහැ කියන එක. මේ රටේ සංවර්ධන වැඩ කරන්න ඕනෑ. හැබැයි, මේ සංවර්ධන වැඩ ඇතුළේ ප්‍රජා කමිටු පිහිටුවීම පිළිබඳව අපේ දැඩි විරෝධය පළ කරන බව මේ පාර්ලිමේන්තුවේදී මා කියන්න ඕනෑ. ඒ වෙන මොකුත් නිසා නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ප්‍රජා කමිටු පිහිටුවාගෙන යන්නේ පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් පාලන ආයතනවල නියෝජිතයින්. අද අපේ ගම්වල එහෙමයි වෙන්නේ. හැබැයි, ප්‍රජා කමිටු පිහිටුවා කරන්නේ දේශපාලනය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, මේ ප්‍රජා කමිටු පිහිටුවීම නවත්වන්න ඕනෑ කියලා. දැන් මැතිවරණයක් ප්‍රකාශයට පත් කරන්න තිබෙනවා. බොහෝ විට අද මධ්‍යම රාත්‍රිය වනවිට ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කරන්න පුළුවන්. ඒ නිසා මෙවැනි වෙලාවක මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම පිළිබඳව අපි ආණ්ඩුවට කියනවා, ලජ්ජා සහගත වැඩ කරන්න එපා කියලා. මේ පනත් කෙටුම්පත් මීට පෙර ඉදිරිපත් කළා නම්, ඇත්තටම මේ පිළිබඳව සාකච්ඡා කරලා, අපට යම් තීන්දු-තීරණ ගන්න තිබුණාය කියන එකත් මා සිහිපත් කරනවා.

මට කථා කරන්න වේලාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ශාන්ත බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.56]

ගරු ශාන්ත බණ්ඩාර මහතා (ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சாந்த பண்டார - வெகுசன ஊடக இராஜாங்க அமைச்சர்)
(The Hon. Shantha Bandara - State Minister of Mass Media)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත වාගේම ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත ඉදිරිපත් කරන එක හදිසියේ කරපු එකක් නොවෙයි. ඒ වාගේම, කඩිමුඩියේ ගෙනැල්ලා සම්මත කර ගන්න දරන උත්සාහයකුත් නොවෙයි. මේ පිළිබඳව දිගින් දිගටම අපි සාකච්ඡා කළා. ඒ වාගේම පාර්ලිමේන්තුව තුළත්, ඉන් පිටතදීත් මේ පිළිබඳව සෑම අංශයකම අය කථා කළා. අපි පසුගිය අවුරුදු දෙකක කාලය තුළ ලැබූ අමිහිරි අත් දැකීම් තිබෙනවා.

විශේෂයෙන්ම 2022 වර්ෂයේ මේ රට ආර්ථික වශයෙන් ඉතාම දුර්වල අඩියකට පත් වුණා. ඒ වෙනුවෙන් බලපෑ හේතු කාරණා ගණනාවක් තිබෙනවා. එක් එක් අයට එක එක විධියට ඒවා ගැන කියන්න පුළුවන්; විවිධ හේතු කියන්න පුළුවන්. නමුත්, රටක් ආර්ථික වශයෙන් අර්බුද තත්ත්වයට පත් වුණාට පස්සේ ඇති වුණු දේශපාලන පෙරළිය එක්ක, ඒ දේශපාලන වෙනස්කම් එක්ක, පාර්ලිමේන්තුවට අංක එකට පැවරිලා තිබුණු වගකීම තමයි, රට අරාජික තත්ත්වයට පත් වෙන්නේ නැතුව බේරා ගැනීමේ වගකීම. රට අරාජික තත්ත්වයට පත් වෙන්නයි ගියේ. ඒ නිසා යම් යම් කණ්ඩායම් ඇවිල්ලා නීතිය අතට අරගෙන, මේ පාර්ලිමේන්තුව ගිනි තියලා, ගෙවල් ගිනි තියලා, දේපළ විනාශ කළා. ප්‍රජාතන්ත්‍රවාදීව මැතිවරණයකින් බලය ලබා ගන්න බැරි අය වෙනත් ක්‍රමවලින් මේ රටේ බලය ලබා ගන්න දරපු උත්සාහයක් තමයි තිබුණේ. එහිදී අපි දැකපු කාරණය තමයි, බලය ලබා ගත්තාට කමක් නැහැ, ඒ බලය ලබාගෙන පවත්වාගෙන යන්න පුළුවන් කණ්ඩායමක් ඉදිරිපත් වුණා නම් කියන එක. ඒ නිසා මහජන ඡන්දයෙන් පාර්ලිමේන්තුවට පත් වෙලා ආපු දේශපාලන පක්ෂවල මන්ත්‍රීවරුන් හැටියට අපට පැහැදිලි වගකීමක් තිබුණා, මේ රට ස්ථාවර කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්න. ඒ නිසා තමයි මේ රට ඉදිරියට ගෙන යෑම සඳහා මේ පාර්ලිමේන්තුවේ බහුතරයක් ඡන්දය පාවිච්චි කරලා, ජනාධිපතිවරයෙක් පත් කර ගත්තේ. ඒ වාගේම අග්‍රාමාත්‍යවරයෙක් ඇතුළු කැබිනට් මණ්ඩලය පත් වෙලා ඒ වගකීම් කොටස ඉටු කරන්න පටන් ගත්තේ. ඒ නිසා අද අපි මේ රටේ පුරවැසියෝ හැටියට සතුටු වෙනවා, පසුගිය අවුරුදු දෙකක කාලය තුළදී අපේ රට නැවත ආර්ථික වශයෙන් ප්‍රකෘතිමත් තැනකට ගේන්න කණ්ඩායමක් හැටියට අපට හැකියාව ලැබුණේ ජනාධිපතිතුමාගේ නායකත්වය නිසාය කියන එක සම්බන්ධයෙන්. අද විපක්ෂයට ඒක දරා ගන්න බැහැ. විපක්ෂය පසුගිය අවුරුදු දෙකේ තිබූ තත්ත්වය නැවත ඇති කරන්න කටයුතු කළා වාගේම, මේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්නත් ඉන් පසුව විශාල වශයෙන් උනන්දු වුණා. ඒ නිසා උද්ඝෝෂණ කරන්න පුළුවන් තරම් මිනිස්සු පාරට ගේන්න බැලුවා. රට තුළ ලොකු ප්‍රශ්නයක් තිබෙනවාය කියා ජාත්‍යන්තරයට කියලා සංචාරකයෝ ලංකාවට එන එක වැළැක්වීම සඳහා දේශපාලන පක්ෂ දැඩි උත්සාහයක් ගත්තා. එහෙම කළේ නැහැ කියන්න බැහැ.

ලෝකයේ අනෙක් රටවල් ආර්ථික අර්බුදයකට පත් වුණාම, දේශපාලන භේදය, පක්ෂ දේශපාලනය හා බලය ලබා ගැනීමේ අරමුණ පැත්තකින් තියලා, ඒ රටේ ආර්ථිකය වැටුණු තැනින් නැවත නැඟිටුවීම සඳහා රටක් හැටියට සාමූහිකව එකතු වෙනවා. නමුත්, අපේ රටේ එහෙම කළේ නැහැ. ජනාධිපතිතුමාට, අගමැතිතුමාට හා අපේ ආණ්ඩුවට ඒ සහයෝගය විපක්ෂය ලබා දුන්නේ නැහැ. විපක්ෂය සාම්ප්‍රදායික විපක්ෂයක් විධියටම කටයුතු කළා. ඒ නිසා උද්ඝෝෂණ ඇති කරන්න පුළුවන් තරම් බැලුවා. අද උද්ඝෝෂණවලට සෙනඟ ගේන්න බැහැ. රටේ ජනතාව තේරුම් අරගෙන තිබෙනවා, මේ කරගෙන යන වැඩ පිළිවෙළ දිගටම ක්‍රියාත්මක කරගෙන ගියොත් තමයි මේ රටට අනාගතයක් තිබෙන්නේ කියලා. ඒ නිසා උද්ඝෝෂකයන් අද පාරට ගෙන්වා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම සටන් පාඨ නැති වෙලා තිබෙනවා. විපක්ෂයේ එක කණ්ඩායමක් කිව්වා, "මේ රටේ ප්‍රශ්නයට උත්තරය අපි" කියලා. තව සමහර කට්ටියක් කිව්වා,

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

"මේකට විසඳුම ගේන්නේ අපි" කියලා. හැබැයි, මේ වනකොට ගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුක්ත වර්තමාන ආණ්ඩුව ඒ ප්‍රශ්නයට උත්තරයත් අරගෙන ඇවිල්ලා තිබෙනවා.

දැන් ඒ මාතෘකාවේ slogan එක විපක්ෂය අයින් කරලා තිබෙනවා. ඒ ගොල්ලන් උත්තරය අහවලුන්ය කිව්වා, විසඳුම අහවලුන්ය කිව්වා. විසඳුමත්, උත්තරයත් දෙකම ආණ්ඩුව විසින් ලබා දුන් නිසා අද ඒ slogan එක ඉවත් කර ගන්න විපක්ෂයට සිද්ධ වෙලා තිබෙනවා. දැන් ඒ slogan එක ගෙනෙන්නේ නැහැ.

ඕනෑම රටක් ආර්ථික වශයෙන් වැටුණාම නැවත නැඟිටීම සඳහා සාමූහිකව සහයෝගය ලබා දෙනවා. නමුත් තනි උත්සාහයක් අරගෙන ආණ්ඩුවට ඒ කාර්යභාරය කරන්න සිද්ධ වුණා. හැබැයි, රටේ ජනතාවගේ සහයෝගය, රටේ ජනතාවගේ ආශීර්වාදය ඒ සඳහා ලැබුණා. රාජ්‍ය නිලධාරීන් ඇතුළු සියලුදෙනා ක්‍රියාත්මක වුණු නිසා නැවත වතාවක් රට යථා තත්ත්වයට පත් කරන්න හැකියාව ලැබුණා. හැබැයි දැන් රටේ ආර්ථිකය යථාවත් වුණා කියලා අපි සද්ද නැතිව හිටියොත්, අපි වෙනස් වුණේ නැත්නම්, ඊට අදාළ කරන නීති සකස් කළේ නැත්නම්, ජාතික ආර්ථික මාර්ග සිතියමක් හරියට සකස් කර ගත්තේ නැත්නම් අපි කොහේටද යන්නේ? ඒ නිසා බොහොම පැහැදිලිව අපට ජාතික ආර්ථික පරිවර්තන මාර්ග සිතියමක අවශ්‍යතාව තිබෙනවා. අන්න ඒ ජාතික ආර්ථික පරිවර්තන මාර්ග සිතියමේ පළමු පියවර තමයි අපි මේ ගෙනෙන පනත හරහා තියන්නේ.

අපේ රටට ආයෝජකයෙක් එනකොට, එහෙම නැත්නම් අපේ රටත් එක්ක ගනුදෙනු කරන්න සූදානම් වෙන රටක් අපේ රටේ මූල්‍ය විනය, මූල්‍ය කළමනාකරණය, ආර්ථිකයේ හැසිරීම බලනවා. ඒ සියල්ල දිහා බලලා තමයි ආයෝජකයෙක් එන්නේ, තවත් රටක් අපිත් එක්ක ගනුදෙනු කරන්න පටන් ගන්නේ. ප්‍රශ්න තිබුණු නිසා තමයි, ඉලක්ක නොමැතිව කටයුතු කළ නිසා තමයි අපේ ආර්ථික වැටීම් සිද්ධ වුණේ. ඒ නිසා පැහැදිලිව මූල්‍ය විනය ශක්තිමත් කිරීම අද යුගයේ අවශ්‍යතාවක් වෙලා තිබෙනවා. විශේෂයෙන් අපි වාගේ රටක් නැවත වතාවක් බංකොලොත් වෙන්නේ නැතිව සිටින්න නම්, කවුරු රට පාලනය කළත් ඒ දේ සිදුවිය යුතුයි. දැන් ඔය සූදානම් වෙන, ඇඳුම් ඇඳගෙන ඉන්න කොයි ජනාධිපති හරි ඇවිල්ලා ඒවා කරන්න සූදානම් වුණත්, මම හිතන්නේ මේ රටේ ජනතාව බුද්ධිමත්. ඒ අය දන්නවා මේ වැඩ පිළිවෙළ කාටද ඉදිරියට අරගෙන යන්න පුළුවන් කියලා. කවුරු ආවත් මේ රටේ ආර්ථිකය වැටෙන්නේ නැතිව යන්න පුළුවන් වැඩ පිළිවෙළ අපි සකස් කරනවා.

මම ඊයේ පෙරේදා බැලුවා 2022 වසරේ පත්තරවල ගිහින් තිබෙන දේවල්. විවිධ උගතුන්, බුද්ධිමතුන්, දේශපාලනඥයන් මාධ්‍ය ඉස්සරහට ඇවිල්ලා කියපුවා පත්තරවල දාලා තිබෙනවා, පොල් ගෙඩි අකුරින්. එක අවස්ථාවකදී කියනවා ලබන අගෝස්තු වෙනකොට, ඒ කියන්නේ 2022 අගෝස්තු වෙනකොට මේ රටේ 10,000ක් කන්න නැතිව හාමතේ මැරෙනවා කියලා. ඒ වාගේම කියනවා, ආයේ පාසල් අරින්න බැරි වෙනවා, පාසල් දරුවන්ට විභාග පවත්වන්න බැරි වෙනවා, ගොවි ජනතාවට ආයේ ජීවිතේටම පොහොර නැති වෙනවා කියලා. මේ වාගේ ප්‍රශ්න ගණනාවක් කියලා ජනතාව භය කළා, කුපිත කළා. එහෙම කුපිත කරලා ජනතාව වෙනම පැත්තකට ගෙන යන්නයි සූදානම් වුණේ.

නමුත් අද අපේ ආණ්ඩුව ඒ ප්‍රශ්න ඔක්කෝම විසඳලා තිබෙනවා. අද පාසල් ඔක්කෝම ඇරලා තිබෙනවා. ඊළඟට, විභාග නිසි කලට පවත්වන්න අවශ්‍ය වටපිටාව නිර්මාණය කරලා තිබෙනවා. පාසල් නිල ඇඳුම් ටික වෙලාවට ලබා දුන්නා. පෙළ පොත් ටික දෙනවා. ප්‍රාථමික විද්‍යාලවලට, 100ට අඩු ළමයින් සංඛ්‍යාවක් ඉන්න කුඩා පාසල්වලට දිවා ආහාරය දෙනවා. වැඩිහිටි දියණියන්ට සනීපාරක්ෂක කටයුතු වෙනුවෙන් ආධාර දෙනවා. ඒ ඔක්කෝම ලබා දෙනවා. රාජ්‍ය සේවක වැටුප රුපියල් 10,000කින් වැඩි කරන්නත් පුළුවන් වුණා. තව වැඩි කරන්න ඕනෑ. හැබැයි, මේ ආර්ථිකය තුළ මීට වඩා වැඩි කරන්න බැහැ. විශේෂයෙන්ම අපි සතුටු වෙනවා, ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා ඊයේ අපේ විශ්‍රාමිකයන්ට, -අපේ රටට විශාල සේවාවක් කළ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට- තවත් රුපියල් 3,000ක දීමනාවක් එකතු කරන්න කටයුතු කිරීම පිළිබඳව. ඒක විය යුතු දෙයක්. ඒ වාගේම රාජ්‍ය සේවකයන්ටත් තව වැටුප් වැඩි වෙන්න ඕනෑ, වැඩි කරන්න ඕනෑ. ඒ නිසා මේ ආර්ථික පරිවර්තන පනත තුළින් මුළු රටේම ආර්ථිකය ඉහළ යනකොට, ආර්ථිකය ශක්තිමත් වෙනකොට, තිබෙන අඩු පාඩු නැති වෙනකොට රාජ්‍ය සේවකයන්ට විතරක් නොවෙයි පෞද්ගලික අංශය ඇතුළු සමස්ත ප්‍රජාවටම ප්‍රතිලාභ ලැබෙන විධියේ වැඩ පිළිවෙළකට අපට අනිවාර්යයෙන්ම යන්න පුළුවන්කම ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් මාධ්‍ය සාකච්ඡා පවත්ව පවත්වා දිගින් දිගටම කියපු ප්‍රශ්න ශෘඛලාවක් තිබුණා. විශේෂයෙන්ම ඒ වෙලාවේ තිබුණු පොලී අනුපාත දරාගන්න බැරිකම ගැන ඔවුන් අපිත් එක්ක සාකච්ඡා කළා. ඒ වාගේම ප්‍රවාහන වියදම් වැඩියි, විදුලි බිල වැඩියි. ඒ සමහර අය අපිත් එක්ක තරහාත් වුණා. හැබැයි, අපි කිව්වා, කාලයක් දෙන්න, මේකට අවශ්‍ය රාමුව, වැඩ පිළිවෙළ අනිවාර්යයෙන්ම හදන්න පුළුවන් කියලා. දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් ප්‍රවාහන වියදම අඩු වෙනවා, විදුලි බිල අඩු වෙනවා, ඩොලරයේ අගය ක්‍රමානුකූලව හොඳ තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම පොලී අනුපාත අඩු වෙලා තිබෙනවා. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ ඉල්ලීම්වලින් සියයට වැඩි ප්‍රමාණයක් ඉෂ්ට කරන්න වර්තමාන ආණ්ඩුවට පුළුවන්කම ලැබුණා.

ඉරාන් වික්‍රමරත්න මැතිතුමා මේ සභාවේ ඉදිරියේ වාඩි වෙලා ඉන්නවා. එතුමා ආර්ථිකය පිළිබඳ යම් අවබෝධයක් තිබෙන මහජන නියෝජිතයෙක්. ඒ ගැන අපි සතුටු වෙනවා. එතුමා "හිරු" රූපවාහිනී නාළිකාවේ "සලකුණ" වැඩසටහනට සහභාගි වුණා. මාධ්‍යවේදී චමුදිත මහත්මයා ඇහුවා, පසුගිය අවුරුදු දෙකක කාලය තුළදී අපේ රටේ ආර්ථිකය පිළිබඳව, ආපු ගමන පිළිබඳව ඔබට සතුටු වෙන්න පුළුවන්ද,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මා අවසන් කරන්න සූදානම් වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමා ඒ පිළිබඳ දක්වන ප්‍රතිචාරය මොකක්ද කියලා. හැබැයි, එතුමා ඒකට උත්තරයක් දුන්නේ නැහැ. එතුමා වටෙන් එනවා. ආයෙත් චමුදිත මහත්මයා ඇහුවා, පසුගිය අවුරුදු දෙකක කාලය තුළ අපේ රටේ ආර්ථිකයේ වෙනසක් ඇති වෙලා තිබෙනවාද කියලා. ඒත් එතුමා ඒකට උත්තරයක් දුන්නේ නැහැ. එතුමා ආර්ථිකය පිළිබඳ අවබෝධයක් තිබෙන කෙනෙක් වුණත්, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් නිසා විපක්ෂයේ මන්ත්‍රීකම වෙනුවෙන් එතුමා පැහැදිලි උත්තරයක් දුන්නේ නැහැ. ඕනෑම කෙනෙකුට

තේරෙනවා අපේ රට වැටිටුවේ කවුද, වැටුණේ මොකද කියලා. පැහැදිලිව, පසුගිය අවුරුදු දෙකක කාලය තුළ අපේ රටේ ආර්ථිකයේ ප්‍රවර්ධනයක් ඇති වුණා කියලා එතුමාට කියාගන්න බැරි වුණේ එතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් නිසායි.

විශේෂයෙන්ම අපි කියන්න කැමැතියි, මේ කෙටි කාලය තුළ ලබා ගත්ත ප්‍රගතිය ආරක්ෂා කරගෙන ඉදිරියට යන්න නම්, පැහැදිලි නෛතික වෙනස්වීම් රාශියක් සිද්ධ වෙන්න ඕනෑය කියලා. ඒ නිසා තමයි මේ පනත ගෙනෙන්න කටයුතු කළේ. මේ පනතට අපි සියලුදෙනාම සහයෝගය ලබා දෙනවාය කියන එක මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.08]

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு சட்டத்தரணி அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ආපු තැන ඉඳලා මේ දක්වා කල්පනා කරනකොට මට මතක් වෙන්නේ, දහඅට වන ශතවර්ෂයේ ප්‍රංශයේ ඇති වූ විප්ලවය. ප්‍රංශය රාජාණ්ඩුවෙන් සමූහාණ්ඩුවක් බවට පත් වුණු එක ඇත්ත. හැබැයි, ප්‍රංශ විප්ලවයෙන් පස්සේ, ඒ ජනතා නැඟිටීමෙන් පස්සේ ඇති වුණු භීෂණ සමයක් ගැන මට මතක් වෙනවා. ඒකෙදි තමයි ලෝකයේ ප්‍රකට "ගිලටිනය" කියන වචනය ආවේ. පුද්ගලයන් වීදිය මැදට ගෙනැල්ලා, කැපෙන blade එකක් හදලා, ඒක බෙල්ලට තල්ලු කරන එක තමයි "ගිලටිනය" වුණේ. මේ හරහා ප්‍රංශයේ විශාල පිරිසක් මරණයට පත් වුණා. විශේෂයෙන් භීම සමයක් ඇති වුණා, රජ්ජුරුවෝ සිරභාරයට ගත්තාට පස්සේ. ඒකත් ඇති වුණේ ආහාර පිළිබඳ අර්බුදයකින්, ජීවත් වෙන්න තිබෙන අමාරුකම් නිසා. අවසානයේ ඩැන්ටන් සහ රොබස්පියර් කියන දෙදෙනා මුළු ප්‍රංශයම භීෂණ සමයකට ගෙනිච්චා.

අපි පසුගිය කාලයේ දැක්කේත් ඒ වාගේ දෙයකට ආසන්න දෙයක්. අපේ පාර්ලිමේන්තුවේ දෙපැත්තේම ඉන්න මන්ත්‍රීවරුන්ට පාරේ බැහැලා යන්න ලැබුණේ නැහැ. ඒ වාගේම උද්ඝෝෂකයන් ලංකාවේ කිර්තිමත් අගමැතිවරයකු ලෙස හිටපු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ පිළිරුවට ලණු දාලා ඇද්දා. අපට එන්න තිබුණේ, භීම සමයක්. අර ඩැන්ටන් සහ රොබස්පියර් ගේ විප්ලවයෙන් පස්සේ ඇති වුණු භයානක තත්ත්වයකට අපි මුහුණ දෙනකොට තමයි, මේ පාර්ලිමේන්තුව වත්මන් ජනාධිපතිතුමාට එදා අගමැතිකම ලබා දුන්නේ. එහෙම අගමැතිකම ලබා දීලා අපට තිබුණු ආරවුල් ගැන ඔබතුමන්ලා දන්නවා. මම ඒවා ඔක්කොම කියන්න යන්නේ නැහැ. තිබුණු තත්ත්වය අද සෑහෙන දුරට නිරාකරණය වීම ගැන - මම කියන්නේ නැහැ, සියයට සියයක් නිරාකරණය වෙලා තිබෙනවා කියලා - මේ ජනාධිපතිතුමාට මගේ ගෞරවය මම නිර්ලෝභීව පුද කරන්න කැමැතියි, මෙතැන ඉඳන් බොරු කියන්නේ නැතිව. අපටත් එවකට පැවැති රජයත් එක්ක ගැටුම් තිබුණා; මතවාදී ප්‍රශ්න තිබුණා. හැබැයි, අපි කොයි වෙලාවකවත් තව පැත්තකට ගිහිල්ලා අපේ අභිලාෂ ඉටු කර ගැනීමට කටයුතු කළේ නැහැ. අප කල්පනා කළේ අපේ ස්ථාවරත්වය නිර්මාණය කරන නව අදහසක් ගෙනෙන්නයි. ඒ නව අදහස ගෙනෙන්න මේ ජනාධිපතිතුමා ක්‍රියා කළා. මම නම් ඒ පිළිබඳව මගේ සම්පූර්ණ විශ්වාසය එතුමා කෙරෙහි තබන්න කැමැතියි.

අද අපට විවාද කරන්න ලැබී තිබෙනවා ප්‍රධාන පනත් කෙටුම්පත් දෙකක්. එකක්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත. අනෙක, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත. ඇයි අපට මෙහෙම වුණේ? දෙපැත්තේ ඉඳගෙන මේ ගරු මන්ත්‍රීවරුන් නොයෙකුත් දේවල් කිව්වා වුණත් අපි හැමෝම යම් යම් ආණ්ඩුවල වගකීම් දරපු අය. වගකීම් දරපු නැති අය ඉන්නේ කිහිපදෙනෙකු පමණයි; මේ පාර්ලිමේන්තුවට අලුතින් පත් වුණු මන්ත්‍රීවරු පමණයි. වගකීම් දරපු මන්ත්‍රීවරුන් ආපහු සැරයක් තමන්ගේ පපුවට තට්ටු කරලා අහන්න ඕනෑ, "අපට කොතැනද වැරදුණේ?" කියලා. මම නම් කියන්නේ කාටවත් වගකීමෙන් මිදෙන්න බැහැ කියලායි. මොකද, නිදහසින් පසුව රාජ්‍ය පාලනය කරපු හැමෝටම ආර්ථික ප්‍රතිපත්තියක් නිවැරදිව දීර්ඝ කාලයක් ගෙන යන්න බැරි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ තරුණ අරගළ දෙකක් ඇති වුණා. එකක් තමයි, 1971-1972 අරගළය. අනෙක් එක, 1988-1989 අරගළය. ඒවා ඇති වුණේ ඇයි? ඒවා ඇති වුණේ ආර්ථික පරිවර්තන ගමට ගෙන යන්න අපට බැරි වුණ නිසා, සිංහල උගත් තරුණයන්ට රැකියා මාර්ගයක්, ජීවත් වීමේ මාර්ගයක් හදන්න අපට බැරි වුණ නිසා. 1982, 1983 ඉඳලා 2009 වන කල් දැවැන්ත අරගළයක් තිබුණා. අරගළයක් කියන්නේ, ත්‍රස්තවාදයක්. මා හිතන විධියට ත්‍රස්තවාදය නිර්මාණය වෙන්නත් එක් හේතුවක් ලෙස බලපෑවා දරිද්‍රතාව. අනෙක තමයි, දීර්ඝ කාලයක් ගත වෙලාත් ජාතික සමගිය පිළිබඳව ප්‍රතිපත්තිමය තීන්දුවක් ගැනීමට අප දැක්වූ අසමත්කම. ඒක එහෙම නොවෙයි නම්, සිංගප්පූරුව, මලයාසියාව ආදි රටවල් ද දියුණු නොවෙන්න තිබුණා; ඉන්දියාව අද දරිද්‍රතාවේ පතුලේ ඉන්න තිබුණා. ඇයි ඒ ගොල්ලෝ දියුණු වෙලා අපි දියුණු නොවුණේ? අපේ ආර්ථික ප්‍රතිපත්තිවල තිබුණු වැරදි නිසා. එම වැරදි නිවැරදි කරන්න මේ පක්ෂ දෙකම වැඩ කළේ නැහැ. මේ පක්ෂ දෙකම වැඩ කළේ තමන්ගේ ඡන්ද පොරොන්දු ඉටු කරන්න. අපි ඒක පිළිගන්න ඕනෑ. ඡන්ද පොරොන්දු ඉටු කරනවා කියන්නේ ඒ වෙලාවේ ඡන්ද ලබා ගන්න තිබෙන පහසුම මාර්ගය. ඒ මාර්ගයේ ගිහිල්ලා ජනතාව සන්තෝෂ කළා මිස ඒක වෙනත් පැත්තකට හැරෙව්වේ නැහැ. අන්තිමට මොකද වුණේ? මේ රට බංකොලොත් වුණා.

"බංකොලොත්භාවය" කියන එක බොහොම සරල දෙයක් වාගේ පෙනුණාට මට නම් ඒක සරල දෙයක් නොවෙයි. ඒක එහෙම පිටින් විශාල ප්‍රශ්නයක්. හැබැයි, එදා ඒ ආණ්ඩුවේ ඉඳගෙන ඒ ආණ්ඩුවට ආර්ථික උපදෙස් දීපු සමහරු අද සුදනන් වාගේ කථා කරනවා. මට පුදුමත් හිතුණා. ඒ කාලයේ අප ගෙන්වා ව්‍යාපාරිකයන්ට පිටුපස සීට් තියලා "වියත් මහ" කියලා මොකක්දෝ එකක් හදලා, ලොකු screens දාලා අපට ආර්ථික විද්‍යාව ඉගැන්නුවා. එදා අපට ආර්ථික විද්‍යාව උගන්වපු අය අද අනෙක් පැත්තට ගිහිල්ලා කියනවා, ඒ ගොල්ලන් හරියට කරන්න ගියා ලු; කරන්න දුන්නේ නැති ලු. මොකක්ද මේ විහිළුව? මනුස්සයෙකු නම් පළමුව තම වරද පිළිගෙන, ඒ වරදෙන් අප නිදහස් වන්නේ කොහොමද කියන එක ගැන කථා කරන්න එපායැ. මම නම් වරද පිළිගන්නවා විතරක් නොවෙයි, එම වරද නිවැරදි කර ගන්න ඕනෑ කියන මතයේ දිගටම හිටපු කෙනෙක්.

අද අපි කොතැනද ඉන්නේ? අද අපි ඉන්නේ IMF programme එකක් ඇතුළේ. හරි හෝ වැරදි හෝ අපේ රට කඩා වැටුණාට පස්සේ අපි හැමෝම කිව්වා, IMF එකේ සහයෝගය ලබා ගත යුතුයි කියලා. සමගි ජන බලවේගයේ අයත් කිව්වා, IMF එකට යා යුතුයි කියලා. නමුත්, සමගි ජන බලවේගය අද මොකක්ද කියන්නේ? එතුමන්ලා කියනවා, මේ ආර්ථික උපාය මාර්ග සංශෝධනය කරන්න ඒ අය ක්‍රියා කරනවා කියලා. මට තවම තේරුම් ගන්න බැහැ සංශෝධනය කරන්නේ කොහෙන්ද කියලා. අපි එය දන්නේ නැහැ. බංකොලොත් වුණු රටකට ප්‍රධාන කරුණු

[ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

15ක් එක්ක IMF එක programme එකක් ගෙනාවා. ඒ programme එකේ සඳහන් ප්‍රධාන කාරණාවලින් එකක්, අපේ පාඩු ලබන ආයතන ප්‍රතිසංස්කරණය කිරීම. තවත් එකක්, අපේ මූලික ගිණුම ධන තත්ත්වයෙන් පවත්වාගෙන යෑම. ඊළඟට, අපේ ණය කළමනාකරණය. ඊට පස්සේ, ආදායම් උත්පාදනය. ඔය කාරණා තුනහතර නේ ඉටු කරන්න තිබෙන්නේ. ඒ කියන්නේ, අපේ බදු කළමනාකරණයත් ඇතුළුව, IMF programme එක යටතේ තිබෙන අනෙකුත් යෝජනා ඉටු කිරීම. ඒවා ඔක්කොම සම්බන්ධ වෙනවා, Debt Sustainability Analysis එකට. ඒ විශ්ලේෂණය නැතුව අපට මේ වැඩේ කරන්න බැහැ. අදත් බදු කළමනාකරණයේදී බලාපොරොත්තු වන බදු අය කිරීමට අදාළව අපි සියයට 1.5ක් පිටුපසින් ඉන්නේ කියලා IMF එක කියනවා. ඊළඟ ඡන්දය කවුරු දිනුවත් ඒක පිළිගන්න වෙනවා. බදු අඩු කරලා, එහෙම නැත්නම් බදු නැති කරලා IMF එකත් එක්ක නැවත සාකච්ඡා කරන්නේ කොහොමද කියලා මට නම් තේරෙන්නේ නැහැ. මේවා ගැන විවෘතව කියන්න ඕනෑ. ආණ්ඩුවක් ගන්න එක නොවෙයි ප්‍රශ්නය. ආණ්ඩුව ගත්තාට පස්සේ කරගෙන යන එකයි ප්‍රශ්නය. මොකද, අද අපි ඉන්නේ පොරොන්දු දෙන්න පුළුවන් ස්ථාවරයක නොවෙයි.

තවත් තර්කයක් ගෙනාවා, මැතිවරණයක් නිසා සියල්ල නවත්වන්න ඕනෑ කියලා. මොකක්ද ඒ කථාව? ලෝකයේ දියුණුම ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවා කියා විශ්වාස කරන ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා ජනාධිපතිවරණ කාලය තුළත් සමහර තීන්දු ගන්නවා; ඒක mandate එක. එය ලැබුණාට පසුව ඒ ධුරයේ කටයුතු කරන්න ඕනෑ. ඒ කාර්යය අවසන් වන්නේ ජනාධිපතිවරණයකින් නව ජනාධිපතිවරයෙකු පත් කළාම විතරයි. පාර්ලිමේන්තුවට නම් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසු ඊළඟ පාර්ලිමේන්තුව පත්වීම ඇතුළේ විතරයි. අනෙක් ඔක්කොම කථා වැඩක් නැහැ. මේ කාලයේ මොකුත්ම කරන්න ඕනෑ නැහැ, ඊළඟ ආණ්ඩුවට මොනවා හෝ කරන්න ඉතිරි කරන්න ඕනෑ කියලා කවුරු හරි කල්පනා කරනවා නම්, ඒක මා පිළිගන්නා තර්කයක් නම් නොවෙයි. ඒක ලෝකයේ කොහේවත් වෙන්නේ නැහැ. පවතින කාලය තුළ මේ පාර්ලිමේන්තුව අණ පනත් සම්මත කරන්න ඕනෑ. ඊළඟට පත් වන පාර්ලිමේන්තුව ඒවාට අකමැති නම් ඒ ගොල්ලන් ඒ අණ පනත් ඉවත් කරලා අලුත් අණ පනත් ගේන්න ඕනෑ. එහෙම තමයි මේවා ඉදිරියට යන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு சட்டத்தரணி அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාම කෙටියෙන් කථාව අවසන් කරන්නම්.

මෙහි තිබෙන වැදගත්ම දේ තමයි අපේ ආයෝජන අංශය ප්‍රතිසංස්කරණය කිරීම. ඒක අත්‍යවශ්‍යයි. මේ ආයෝජන අංශය වැඩ කරන්නේ නැහැ. මොකද, අපේ රටේ තිබෙන ක්‍රමය අනුව ඉඩමක් නිදහස් කර ගන්න ගියොත්, ඉඩම නිදහස් කර ගන්න අවුරුදු දෙකක්වත් යනවා. එම නිසා ආයෝජකයෙක් ලංකාවට ඇවිල්ලා කිසිම තේරුමක් නැහැ. ආයෝජන මණ්ඩලයට කරන්න දෙයකුත් නැහැ. ඒ නිසා යම් ආකාරයක ප්‍රතිව්‍යුහගත කිරීමක් කෙරෙන්න ඕනෑ.

දැන් අපේ රටේ පාඩු ලබන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම ගැන අපි කථා කරනවා. ඒවා ප්‍රතිව්‍යුහගත කරන්න යන හැම වෙලාවේම මොකක්ද කියන්නේ? ආයතන ප්‍රතිව්‍යුහගත කරපු ආණ්ඩුවල මමත් ඉඳලා තිබෙනවා. ඒ ප්‍රතිව්‍යුහගත කිරීම් විශාල වංචාවක් කියලා විරුද්ධ පක්ෂය කියනවා. මොකක්ද මේ කථාව? මේ කාරණය පාර්ලිමේන්තුව ඇතුළට ගෙනෙන එක හොඳයි. පාර්ලිමේන්තුවක් ඇතුළට ගෙනාවොත් ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සැක සංකා දුරු වෙනවා. ජනතාව මුළු පාර්ලිමේන්තුවම හොරු කියලා කිව්වේ මේ පාර්ලිමේන්තුවේම මන්ත්‍රීවරුන් කරපු කථා අනුවයි. ඒ නිසා අහිංසක මිනිහාත් ගුටි කෑවා, අහිංසක නොවන මිනිහාත් ගුටි කෑවා. වැරැදි කරන මිනිහාත් චෝදනාවට ලක් වුණා, නිවැරදි මිනිහාත් චෝදනාවට ලක් වුණා. "හොරු" කියන නම හැමෝටම එල්ල කරන්න ඕනෑ එකක් කියලා මම විශ්වාස කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දෙවන වර කියවීමේ විවාදයට ගැනෙන මේ පනත් කෙටුම්පත් දෙකම ඉතාම කාලෝචිත පනත් කෙටුම්පත් දෙකක්. මේ පනත් කෙටුම්පත් සම්මත වූ පසු ආණ්ඩුවක් ඒවා අනුව හරියාකාරව ක්‍රියාත්මක වෙනවා නම්, ඒ ආණ්ඩුවට පාලන බලය මෙහෙයවීම හරි ලේසියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම එක කරුණක් ගැන සන්තෝෂ වෙනවා. අද මේ මොහොත වන කොට අපේ ආණ්ඩුවට සල්ලි අව්වු ගහන්නත් බැහැ, නැති සල්ලියක් වෙනුවෙන් ණය වෙන්නත් බැහැ. ඒ දෙකම කරන්න බැහැ. ඒ නිසා අපි බදු ක්‍රමයක් යටතේ නිවැරදි රජයක් ගෙන යන්නේ. ඒ නිසා කවුරු බලයට ආවත් මෙය පිළිගන්න වෙනවා. හුඟ දෙනෙක් විශ්වාස කරනවා, මේ ආණ්ඩුව එයි කියලා. මම දන්නේ නැහැ එහෙම වෙයිද නැද්ද කියලා. ඒක මහජනතාව නේ තීන්දු කරන්නේ. මම විශ්වාස කරනවා, අපට දේශපාලන වශයෙන් විතරක් නොව, සමාජයීය වශයෙනුත් යහපතක් ඇති කරන්න පුළුවන් මේ තත්ත්වය ඉදිරියට ගෙන යෑමෙන් මිස, නොකෙරෙන වෙදකමට කෝදුරු තෙල් හත්පට්ටයක් හොය හොයා ඇවිදින අදහසින් කටයුතු කිරීමෙන් නොවෙයි කියලා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.19]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අද පනත් කෙටුම්පත් දෙකක් ගැන විවාද කරනවා. එකක් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳවයි. මේ පනත් කෙටුම්පත ගැන මට කරුණු දෙකයි සඳහන් කරන්න තිබෙන්නේ. පළමුවැනි කාරණය මේකයි. මේ පනත් කෙටුම්පතේ තිබෙනවා, රාජ්‍ය වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 13කට සීමා කරන්න කියලා. මා හිතන විධියට, මේක පොඩි ගැටලුවක්. රාජ්‍ය වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 13කට සීමා කිරීම ආර්ථික විද්‍යාත්මක ගැටලුවක්. ඒක ගැන පොඩ්ඩක් සොයා බලන්න. ලෝකයේ අනෙක් රටවල් දිහා බැලුවොත්, ඒ බොහෝ රටවල් සාමාන්‍යයෙන් සීමා දාලා තිබෙනවා Budget එකට. රටවල් 93ක ප්‍රාථමික ශේෂයට සීමා

දාලා තිබෙනවා. රටවල් 85ක ණය පිළිබඳව යම් යම් සීමා දාලා තිබෙනවා. ආදායම, වියදම සම්බන්ධයෙන් සීමා දාලා නැහැ. ආදායම ගැන සීමා දාලා තිබෙන්නේ රටවල් 17කයි. වියදම ගැන රටවල් 10ක සීමා දාලා තිබෙනවා. ලංකාවත් ඒවායෙන් එකක් වනවා. ඒක ගැන තමයි මට ගැටලුව තිබෙන්නේ. ඒ හැර, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත තුළ හුඟක් වටිනා දේවල් තිබෙනවා. නමුත් මට තිබෙන ලොකු ගැටලුව මේකයි. මේ වාගේ පනතක් මීට ඉස්සෙල්ලා අපි 2002දීත් ඉදිරිපත් කළා. එහෙම ඉදිරිපත් කළ දවසේ ඉඳලා අද වෙනතුරු හැම ආණ්ඩුවක්ම ඒ පනත උල්ලංඝනය කරලා තිබෙන්නේ. මේ ගෙන එන පනතත් අනිවාර්යයෙන්ම උල්ලංඝනය වෙනවා. මොකද, මේකේ තිබෙන හුඟක් නීති රීති කොහොමද ඇත්තටම ක්‍රියාත්මක කරන්න යන්නේ, compliance එක කොහොමද කියන ප්‍රශ්නය අපට මුලින්ම පෙනෙනවා. ඒ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත ගැන මම ඊට වැඩිය කථා කරන්න යන්නේ නැහැ.

ඊට පස්සේ අද තව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක තමයි, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත. ඒ පනත් කෙටුම්පතේ අපට එකඟ වෙන්න තිබෙන එක කරුණක් වන්නේ, "පරිවර්තනය" කියන වචනය. අපි ඔක්කෝම දන්නවා, ආර්ථික පරිවර්තනයක් අවශ්‍යයි කියන කාරණය. එහෙම පරිවර්තනය කරන්න ජනවරමකුත් තියෙන්න ඕනෑ; නායකයනුත් ඉන්න ඕනෑ. දෙවැනි ලෝක මහා යුද්ධයට පස්සේ වින්ස්ටන් චර්චිල් යුද්ධය දිනලා ඡන්දයට ගියා. එතකොට ඔහු හිතුවා, ඡන්දයට ගියාම, යුද හමුදා නායකයෙක් නිසා යුද හමුදා නායකයෙකුට පත් වෙන්න පුළුවන් කියලා. නමුත් එංගලන්තයේ ජනතාව තීරණය කළා, ක්ලෙමන්ට් ඇටලි අගමැතිතුමා හැටියට පත් කරන්න. ඒ අයට පැහැදිලිවීමක් තිබුණා, යුද්ධය දිනන එක එකක්, ආර්ථික යුද්ධය දිනන එක තව එකක් කියලා. ලංකාවේ අපි කර ගත්තේ ඒකේ අනික් පැත්ත. මහින්ද රාජපක්ෂ මැතිතුමා පත් කර ගත්තා, ජනාධිපති හැටියට. ඊට පස්සේ අපි දන්නවා, මම කියන්න ඕනෑ නැහැ අද රටට මොනවාද වෙලා තිබෙන්නේ කියලා.

අපි මේ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන්න හේතුව, මේකේ I වන කොටසේ එක එක ඉලක්ක දාලා තිබෙනවා. ඉලක්ක දාලා තිබෙනවා, නීතියට. මෙහි කියනවා, අපි 2032 වර්ෂය වන විට සහ ඉන් පසුව සියයට අනූපහකට වඩා අඩුවන පරිදි රාජ්‍ය ණය ගේන්න ඕනෑ කියලා. ඒ වාගේම මේ පනත් කෙටුම්පතේ කියනවා, වාර්ෂික දළ මුදල් සැපයීමේ අවශ්‍යතා අනුපාතය 2032 වර්ෂය වන විට සහ ඉන් පසුව සියයට දහතුනකට වඩා අඩු වන පරිදි ගේන්න ඕනෑ කියලා. ඒ වාගේම වාර්ෂික ණය සේවාකරණ අනුපාතය ගේන්න ඕනෑ ගණනත් කියනවා. ඊට පස්සේ විරැකියාවේ ප්‍රතිශතය කියනවා. මේ වාගේ දේවල් මේ පනත් කෙටුම්පතට මොකටද දාන්නේ කියලායි මම අහන්නේ. මේවා IMF එකත් එක්ක එකඟ වුණු ගිවිසුමේ කොටසක් කියලා අපට හිතෙනවා. අපි දැකලා නැහැ නේ ඒ ගිවිසුම. මේ ගිවිසුම අපට පූර්ණව සාකච්ඡා කරන්න පෙන්වන්නේ නැතුව, ඒවා මෙහෙම පනත් කෙටුම්පතක් ඇතුළට දාලා තිබෙනවා.

ඊට පස්සේ කියනවා, කාන්තා ශ්‍රම බලකාය වැඩි කරන්න ඕනෑ කියලා. ඒවායේ ප්‍රතිශත දාලා තිබෙනවා. මේ ඔක්කෝම අපි දන්නා දේවල් මෙහි දාලා තිබෙන්නේ. නමුත් අපි කල්පනා කරනවා, මේවා පනත් කෙටුම්පතට ඇයි එකතු කරලා තියෙන්නේ කියලා. ඒ ගැටලුව තමයි අපට මෙතැන ඇත්තටම තිබෙන්නේ. ඉතින්, මේ සාකච්ඡාව අහගෙන අහගෙන යනකොට අපට ඇහෙන්නේම, තෙල් පෝලිම නැහැ, ගෑස් පෝලිම නැහැ, අත්‍යවශ්‍ය ආහාර පෝලිම නැහැ, රටේ ප්‍රශ්න විසඳිලා කියන මේ වාගේ කථා. ඒවා තමයි කියාගෙන කියාගෙන යන්නේ.

2019දී බඩු මිල ගත්තොත්, සහල් කිලෝවක් රුපියල් 90ට වැඩිය අඩුයි. පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 117ට වැඩිය අඩුයි. ඩීසල් ලීටරයක මිල රුපියල් 115ට වැඩිය අඩුයි. ගෑස් එකේ මිල රුපියල් 1,700ට වැඩිය අඩුයි. නමුත් 2024 වෙනකොට මේවා සියයට 300කින් විතර වැඩි වෙලා. ඊට පස්සේ කථා කරලා කියනවා, නමුත් inflation කියන එක අඩු වෙලා තිබෙනවා කියලා. Inflation එක අඩුවෙලා තිබෙනවා කියන්නේ, වැඩි වෙන ක්‍රමයේ අඩුවීමක්. ඒක අඩු වෙලා තිබෙනවා. ප්‍රවර්ධන ක්‍රමය අඩු වෙලා තිබෙනවා, බඩු මිල ඉහළට යන. නමුත් බඩු මිල පහළට ඇවිල්ලා නැහැ. බඩු මිලේ වේගය ගැන තමයි කථා කරන්නේ inflation එක හරහා. මේක තමයි තිබෙන ගැටලුව. බඩු මිල පහළට ඇවිල්ලා නැහැ. ඉතින් ලොකු ගැටලුවක්, ප්‍රශ්නයක් තිබෙනවා. නමුත්, තෙල් පෝලිම නැහැ කියයි, ගෑස් පෝලිම නැහැ කියයි, අත්‍යවශ්‍ය ආහාර පෝලිම නැහැ කියයි. පෝලිමේ ඉන්න බැහැ. මොකද සාක්කුවේ සල්ලි තියෙන්න ඕනෑ පෝලිමේ ඉන්න. මම දන්නේ නැහැ, ඒක මිනිස්සුන්ට තේරෙනවාද කියලා. මම දන්නේ නැහැ, මේ ආණ්ඩුවේ ඉන්න මන්ත්‍රීවරුන්ට ඒක තේරෙනවාද කියලා. ගමට යනකොට නම් ඒක තේරලා දෙයි. හැබැයි, පාර්ලිමේන්තුව ඇතුළත කථා කරනකොට නම්, ඒක තේරිලා නැහැ වාගේ තමයි අපට පැහැදිලි වෙන්නේ.

මිනිස්සුන්ට ප්‍රශ්නයක් තිබෙනවා. පර්යේෂණ ආයතන කියනවා, අද පවුල්වලින් සියයට 90කට වැඩිය මාසික වියදම වැඩියි කියලා ආදායමට වැඩිය. ආදායමට වැඩිය වියදම වැඩි නම්, ඒ අය ගිහිල්ලා ණය ගන්න ඕනෑ. මේක තමයි ඇත්ත කථාව, මේ රටේ පවුල් සියයට 90කම. ඊට පස්සේ කියනවා, ආර්ථිකය හරවලා තිබෙනවා කියලා. බලන්න, මේකේ මොනවාද වෙලා තිබෙන්නේ කියන ඔය කථාව කියාගෙන කියාගෙන යනවා. පර්යේෂණ ආයතනවලින් කියනවා, රටේ සියයට 25කට දරුවන්ට කිරි ලබා දෙන්න බැහැ කියලා. අද රටේ සියයට 51කට වැඩි පිරිසකට දරුවාගේ පොත්පත් සහ දරුවාගේ uniform එක ලබා දෙන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ කියලා කියනවා. එච්චරට පහළට බැහැලා තිබෙනවා, මේ රටේ ආර්ථිකය. දරිද්‍රතා රේඛාවෙන් පහළ මිලියන තුන-හතරකට හිටපු ප්‍රමාණය තව සියයට හතකින් විතර ඉහළට ගිහින් තිබෙනවා. තව විධියකට කිව්වොත් රටේ ජනතාවගෙන් තුනෙන් එකක් දරිද්‍රතා රේඛාවෙන් පහළ. මෙහෙම පනතක් ගෙනැල්ලා කියන්න පුළුවන්, අපි ආර්ථික වර්ධන වේගය සියයට 10ට ගෙනෙනවා කියලා. මොකක්ද මේකේ තේරුම? කවුරු හරි කියනවා නම්, මේ ආර්ථිකය හරවා තිබෙනවා, මේක හරියට කරගෙන ගිහිල්ලා තිබෙනවා, මේක බොහොම හොඳයි කියලා, අපට එතැනට එන්න බැහැ. ඔව්, අපි කිව්වා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න කියලා. පන්තියක විනයක් නැතිකොට, මොනිටර් කෙනෙක් පත් කරන්න ඕනෑ. රට තුළ විනයක් නැතිකොට, කාන්තාවන් දූෂණය කරනවා නම් පොලීසියටම යන්න ඕනෑ. නැත්නම් වෙන ක්‍රමයක් නැහැ, ඒවා පාලනය කරන්න. ඉතින් IMF එකට ගියේත් ඒ වාගේ තමයි. නැත්නම් වෙන හේතුවක් නිසා නොවෙයි. නමුත් ඒකට ගියාට තීරණ ගන්නේ අපි. අපියි තීරණ ගන්නේ.

මම අහගෙන මන්ත්‍රීවරු කියනවා, මේක කොහොමද විසඳන්න යන්නේ, කොහොමද සහන දෙන්න යන්නේ, අරකද, මේකද කියලා. මෙහෙමයි. අපි දන්නවා, ප්‍රශ්නයක් තිබෙන බව. ගෙදර තිබෙන ප්‍රශ්නය වාගේම තමයි කොම්පැනියේ තිබෙන ප්‍රශ්නයත්. කොම්පැනියේ තිබෙන ප්‍රශ්නයමයි රටේ තිබෙන්නේත්. ආදායමත් තිබෙනවා; වියදමත් තිබෙනවා. අපි කාට හෝ පහසුකමක් දෙන්න යනවා නම්, ඒකට වැය වෙන මුදල වෙන කොහෙන් හරි කපා ගන්න වෙනවා. නැත්නම් වෙන ආදායමක්

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ලබා ගන්න වෙනවා. අපි අහන්නේ කාගෙන්ද ඒ ආදායම ලබා ගන්නේ කියන එකයි. පොඩි ජනතාව පහළට තල්ලු කරලා, ඒගොල්ලන් පාගාගෙන මේ ගමන යන්න බැහැ. ඒකයි අපි මෙතැන සඳහන් කරන්නේ. ඉතින් අපි අහනවා, කොහොමද එහෙම නම් ආදායම් බදු වැඩි කරගන්නේ කියලා. තිබෙන මිනිස්සුන්ගෙන් ගන්න ඕනෑ. වෙන ක්‍රමයක් නැහැ. ධනපතියන්ගෙන් ගන්න වෙනවා. වෙන ක්‍රමයක් නැහැ. නමුත් පහළ මට්ටමේ ඉන්නා අයගෙන් එහෙම ගන්න බැහැ. මොකද, ඒ අය බිත්තියටම හේත්තු වෙලා ඉන්නේ. ඇත්තටම මම ආර්ථික සාර්ථකත්වය මනින්නේ පහළ මට්ටමේ ඉන්නා අය තුළින්.

අපි IMF programme එකක් ක්‍රියාත්මක කළා තමයි. ඒ වෙලාවේ රටේ ආදායම ඉහළට ගියා, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට. උද්ධමනය ඉහළට ගියේ නැහැ. කවුරුවත් ඇවිල්ලා කෑ ගැහුවේ නැහැ, බඩු මිල ගැන කියා කෑ ගැහුවේ නැහැ. අපි ඒක කළා. ක්‍රමයක් තිබෙනවා, ඒක කරන්න. ඒ ක්‍රමයට තමයි අපි ඒ වැඩ පිළිවෙළ කරගෙන ගියේ. අද මේ ගෙනෙන ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත සම්මත වුණාම, ඒක වෙන පනත් 12ක් අබිබවා යනවා. ඒ කියන්නේ මේ පනත් කෙටුම්පත සම්මත කළාම රේගු පනත, සමාගම් පනත, දේශීය ආදායම් පනත, මුදල් පනත, විදේශ විනිමය පනත, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත, වෙළඳ නාම පනත, සිවිල් ගුවන් සේවා පනත, ශ්‍රී ලංකා විදුලිබල පනත, ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩල පනත, ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත කියන පනත් සියල්ල අබිබවා යනවා. පනතක් ගෙනෙන එක හොඳයි, පරිවර්තනය කරන එක හොඳයි. හැබැයි, අපි එදාත් ඉල්ලීමක් කළා, මේ පනත ගෙනෙන එකට පොඩ්ඩක් කල් දෙන්න කියලා. මේක ගැන තව සාකච්ඡා කරන්න තිබෙනවා. අපි සාකච්ඡා කරලා බලන්න ඕනෑ, අපට මේක සුද්ධ කරන්න පුළුවන් කොහොමද, මේ පනත් කෙටුම්පත සම්මත කරන්න පුළුවන් කොහොමද කියලා. හැබැයි, දැන් එහෙම නොවෙයි කරන්නේ. මම දන්නේ නැහැ, ආණ්ඩුවට තිබෙන හදිස්සිය මොකක්ද කියලා. ආණ්ඩුව හදිස්සියේම -ඉක්මනින්ම- මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළා. මම දන්නේ නැහැ ඇයි මෙහෙම හදිස්සි වෙන්නේ කියලා. මේක හරියට කරගන්න ඕනෑ. මොකද, මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව එය වෙනත් පනත් ගණනාවක් අබිබවා යනවා නම් ලොකු ගැටලු අනාගතයේදී ඇති වෙන්න පුළුවන්.

පනත් කෙටුම්පතේ තිබෙනවා, "ආර්ථික කොමිෂන් සභාව" කියා කොමිසමක් හදනවා කියලා. ඊට පසුව කියනවා, ඒකට පත් කරන සාමාජිකයන් 10දෙනාගෙන් 6දෙනෙක් ජනාධිපතිතුමා පත් කරනවා කියලා. ඒ පත්වීම් ගැන අපි පොඩ්ඩක් සැකයෙන් ඉන්නේ. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවත් තිබෙනවා. අපි දැක්කා නේ, පත්වීම් සම්බන්ධයෙන් මොනවාද වෙන්නේ කියලා. නීතියත් තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවත් තිබෙනවා. ඒවා උල්ලංඝනය කරලා තමයි පොලිස්පති පත් කළේ. දැක්කා නේ, අධිකරණයේ තීරණය. එදා අපි මෙතැන නැඟිටලා ඒ ගැන කියනකොට, හිනා වුණා; කෑ ගැහුවා. එක එක කථා අපට කිව්වා. අපි පුද්ගලයන් ගැන නොවෙයි, කථා කරන්නේ. අපි කථා කරන්නේ ක්‍රමය ගැන. ජනතාව පාරට බැස්සේ system change එකක් ඕනෑ කියලා. නීතිය තිබෙනවා නම්, ඒ නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. එදා නීතිය හරියට ක්‍රියාත්මක වුණේ නැහැ. සම්මත කිරීමට ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත ගැන මට තිබෙන අනුමානයත් ඒකයි. කොමිෂන් සභා තිබෙනවා, investment zones ටික තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
එක එක දේවල් තිබෙනවා. ඒවා ගැන තමයි මෙතැන තිබෙන ලොකු ගැටලුව. අපිට තිබෙන ලොකු ගැටලුව ඒකයි.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, මේ පනත් හදිස්සි කරන්න යන්න එපා කියන එක. ඔයගොල්ලන් ඇත්තටම හිතනවා නම්, ඇත්තටම වෙනසක් කරන්න ඕනෑය කියලා ඒකට හදිස්සි කරන්න එපා. අනුමානයක් ඇති වෙනවා. දැන් බලන්න, Sri Lanka Telecom එක ගැන. අපි කවදාවත් කියන්නේ නැහැ, පෞද්ගලීකරණයට අපි විරුද්ධයි කියලා. අපි එහෙම කියන්නේ නැහැ. අපි කියන්නේ විනිවිදභාවයෙන් යුතුව ඒ කටයුතු හරියට කරන්න කියලායි. ඊට පසුව Hilton Hotel එක ගන්න. අපි කියන්නේ නැහැ ඒවා කරන්න එපා කියලා. අපි කියන්නේ නැහැ, රජයට හෝටල් කළමනාකරණය කරන්න කියලා. හැබැයි, අපි කියන්නේ ඒවා විනිවිදභාවයෙන් කරන්න, කල් අරගෙන හරියට කරන්න කියන එකයි.

ඊළඟට, මන්නාරමේ සුළං බල project එකට අදාළ ගිවිසුම ඩොලර් ගණනාවකට අත්සන් කර තිබෙනවා. මම දැක්කා, ඒකෙන් අටෙන් එකකට විතර තමයි සවුදි අරාබිය අත්සන් කරලා තිබෙන්නේ. ඒක ගැන ප්‍රශ්න තිබෙනවා. ඊළඟට, පෞද්ගලික සමාගමක් වන VFS එකට - VFS එකත් නොවෙයි. පව්! VFS එකට නොවෙයි - දීලා අපේ Immigration and Emigration Department එකේ වැඩේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up now.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ පිළිබඳව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාට -හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට- පහර ගහලා වැඩක් නැහැ. එතැන අනිවාර්යයෙන්ම ප්‍රශ්නයක් තිබෙනවා. අපිට එන්න පුළුවන් එක අනුමානයයි තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුමානය තමයි, ඇයි මේවා මේ තරම් ඉක්මනට කරන්නේ කියන එක. මේවා කරන්නේ මැතිවරණයක් තිබෙන නිසාද? මේවායින් මැතිවරණ ලාභයක් ලබනවාද, මුදල් ලබනවාද? අලුත් ආණ්ඩුවක් ආවාම මේ හැම එකක් ගැනම අපි අනිවාර්යයෙන්ම හොයලා බලනවා. අපි හොරකමට, වංචාවට ඉඩ තියන්නේ නැහැ. ඒකට නිත තියන්න ඕනෑ. මැතිවරණය පාවිච්චි කරලා මේවා කරන්න එපා කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Jayantha Weerasinghe. You have ten minutes.

[අ.භා. 3.31]

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජයේ ආශිර්වාදය සහිතව බොහොම වැදගත් - ඉතා ම වැදගත් - පනත් කෙටුම්පත් දෙකක් මේ වෙලාවේ ඉදිරිපත් කර තිබෙනවා. මේ පනත් කෙටුම්පත් දෙක සම්බන්ධයෙන් කථා කරනකොට මම එක දෙයක් කියන්නට ඕනෑ. අපේ අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා අදහස් කිහිපයක් ප්‍රකාශ කළා. එතුමා කිව්වා, ප්‍රංශ විප්ලවය කාලයේ හීම සමයක් ඇති කරලා බෙලි කපපු හැටි. රජ්ජුරුවන්ගේ, බිසවගේ සහ අහු වෙන අහු වෙන අයගේ බෙලි කැපුවා. එතුමා දැන් කිව්වා, මේ රජයේ ක්‍රියාකලාපය නිසා මේ රටේ එවැනි තත්ත්වයක් ඇති වෙන්න ගිහිල්ලා ඒක වැළකුණා කියලා. ඒක හරියට හරි. ඒක ඇත්ත.

ඊළඟට එතුමා කිව්වා, මේ රට පාලනය කරපු දෙගොල්ලන්ම මේ තිබෙන ප්‍රශ්නවලට වගකිව යුතුයි කියලා. ඒකට මම තව එක කොටසක් එකතු කරන්නම්. මේකට මේ රට පාලනය කළ පක්ෂ දෙකට පමණක් දොස් කියලා හරියන්නේ නැහැ. මේක හොඳට මතක තියාගන්න. එතා දෙකකදි කැරලි ගැසූ, පාලනය ආපස්සට හරවපු පිරිසක් හිටියා. ඒ නිසා එතා දෙකකදි රට ආපස්සට ගියා. මේ ප්‍රශ්න සම්බන්ධයෙන් මේ රට පාලනය කරපු අය පිට විතරක් වගකීම දාන්නේ නැතුව, පාලනය කරන්න ඉඩ දෙන්නේ නැතුව කැරලි ගහපු අයත් වගකීම ගන්න ඕනෑ බව තේරුම් ගන්නට ඕනෑ. කාටවත් ඒකට "නැහැ, බැහැ" කියන්න බැහැ. මොකද, ඒ අවස්ථාවලදී රට සෑහෙන්න පස්සට ගියා. මේ ළඟදිත් අපි දැක්කා නේ, දැන් ඔය කියපු හීම සමය වාගේ එකක් ආවා කියලා. ඒ වෙලාවේත් මගේ ළඟ මෙතැන ඉන්න අපේ අහිංසක මන්ත්‍රීතුමන්ලාගේ දේපළවලට හානි සිදු කළා. කුරා කුඹියෙකුට අපරාධයක් කරන අයද මේ? මිනිහෙක් දිහා රවලා බලන අයද මේ? එවැනි අයගේ ගෙවල් නේද, පැය 24ක් ඇතුළත ගිනි තැබුවේ? එම නිසා ඉස්සරහටවත් මෙවැනි දේවල් නොවෙන්න අපි වග බලා ගන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා තව දෙයක් කිව්වා. ඒ තමයි යම්කිසි මිථ්‍යා මතයක් තිබෙනවාය කියලා, ඡන්දය ප්‍රකාශයට පත් කළාට පස්සේ ජනාධිපතිවරයෙකුට හෝ ආණ්ඩුවකට වැඩක් කරන්න බැහැය කියලා. ඒක අසත්‍යයක්, මිථ්‍යා මතයක් තමයි. ජනාධිපති නීතිඥවරයකු හැටියට මමත් දන්නවා, අනුර ප්‍රියදර්ශන යාපා මහත්මයා කියපු ඒ කාරණය සම්පූර්ණ ඇත්තක් කියන එක. රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරලා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවන්නට වග බලාගත්ත, දිවුරුම් දීපු ආණ්ඩුවකට, රජයකට හෝ ජනාධිපතිවරයෙකුට සම්පූර්ණ අයිතිය තිබෙනවා, ඒ කටයුතු දිගින් දිගටම කරගෙන යන්න. මෙතැනදී මේ සම්බන්ධයෙන් කවුරුවත් වැරදි දෙයක් අවබෝධ කර ගන්න ඕනෑ කියලා මම හිතන්නේ නැහැ. මොකද, ඒක තමයි නෛතික තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ගෙනැවිත් තිබෙන පනත් කෙටුම්පත් දෙකෙන් ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත ඉතාම වැදගත්. "ඇයි මෙහෙම කළේ නැත්තේ, ඇයි මෙහෙම කළේ නැත්තේ?" කියලා මේවාට අඩු ලංසුවෙන් අදහස් දක්වන එක වැරදියි. මම හිතන්නේ නැහැ, කිසි කෙනෙක් එහෙම කරයි කියලා. මේ පනත් කෙටුම්පත ගෙනෙන්න හේතු වෙච්ච කරුණු ගැන බැලුවොත්, එහි පෙන්වලා තිබෙන්නේ, ආර්ථික වර්ධන ක්‍රියාවලියේ දී, ඒ කියන්නේ ආර්ථිකය නංවන්න ගෙන යන මේ ක්‍රියාවලියේ දී සාම්ප්‍රදායිකව අනුගමනය කරන උපාය මාර්ගවලින් බැහැරව, ආර්ථික දියුණුව සඳහා කටයුතු කරන්න හැකිවන ආකාරය. දැන් අපි සාම්ප්‍රදායික උපාය මාර්ග කර කර එක තැන ඉන්නවාද, එහෙම නැත්නම් එයින් බැහැරව යනවාද? අන්න ඒවායෙන් බැහැරව ගිහිල්ලා ආර්ථික දියුණුව සඳහා කටයුතු කරන්න තමයි මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. මෙම පනත් කෙටුම්පතේ වගන්තිවලත් පැහැදිලිව තිබෙන දෙයක් තමයි, "නිෂ්පාදන හැකියාවන් දැනුම සහ තාක්ෂණය ලබා ගැනීම සඳහා විකාශනය වන නව ආර්ථික මාර්ග හඳුනා ගැනීම අවශ්‍ය වේ" කියන එක. මේ රටට දෙපයින් ශක්තිමත්ව හිටගන්න පුළුවන් නම්, ඒ ශක්තිය ලැබෙන්නේ නිෂ්පාදන ක්‍රියාවලියෙන්. එහෙම නැතිව පිට රටින් ගෙන්වාගෙන කාලා බීලා නොවෙයි. මෙහේ නිෂ්පාදනය කරලා පිට රටට අපනයනය කරන්නට ඕනෑ. අන්න එවැනි ක්‍රියාවලියක් පසුබිම් කරගෙන තමයි මේ විශිෂ්ට පනත් කෙටුම්පත හදලා තිබෙන්නේ. මේ පනත් කෙටුම්පත කොච්චර plan කරලා සාර්ථකව හදලා තිබෙනවාද කිව්වොත්, 2048 වෙනකොට ඇති කර ගන්නට බලාපොරොත්තු වන සමෘද්ධිය සහ ඊට ඉවහල් වන කරුණු පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙච්චර කාලයක් අපි plans හැදුවේ, අවුරුද්දකට, දෙකකට, අවුරුදු පහකට, එහෙමත් නැත්නම් පවතින රජයේ කාලය සඳහා පමණයි. එහෙම කරපු රටක් නේද, ඒවායෙන් බැහැර වෙලා, නිෂ්පාදනය වැඩි කරලා, අපනයන වැඩි කරන්නත්, එසේ කරනකොට නවීන තාක්ෂණය පාවිච්චි කරලා රට ඉදිරියට අරගෙන යන්න,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only two more minutes.

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)
All right, Sir. I will finish as soon as I can.

මම දැන් පැහැදිලිව පෙන්වන්නට ඕනෑ, 2048 දක්වා මේ රටේ ආර්ථික වර්ධනය ක්‍රියාත්මක කරලීමට හැකි වන පසුබිමක් මේකට ඇතුළත් කර තිබෙන බව. කාටවත් බැහැ, මේවා අඩු තක්සේරු කරන්න. ආයෝජකයන්ගේ විශ්වාසය දිනා ගැනීම තමයි මෙහි ප්‍රධාන පරමාර්ථය හැටියට සඳහන් කර තිබෙන්නේ. අන්න ඒ විශ්වාසය වර්ධනය කරලා, තිරසර වර්ධනයක් ප්‍රවර්ධනය කරලා, ආයෝජකයන්ට සහ ව්‍යාපාරිකයන්ට තහවුරු වන පරිසරයක් හදලා ආර්ථික තීරණ පිළිබඳ ස්ථාවරයක් සහ විශ්වාසයක් ඇති කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන තමයි මේ පනතෙන් ගෙනැල්ලා තිබෙන්නේ. මගේ කාලය සීමා වෙලා කියලා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා දන්වපු නිසා මම මීට එහාට කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. හැබැයි, මට තව තත්පර කිහිපයක් දෙන්න.

මේ පනතේ තිබෙන ප්‍රධානම අභිප්‍රායයන් මොනවාද? තරගකාරිත්වය වැඩි කිරීම. ඒක නැතිව රටකට ඉදිරියට යන්න පුළුවන්ද? ඊළඟට, 2050 වර්ෂය වන විට ශුද්ධ ශූන්‍යයක් - Net Zero - ළඟා කර ගැනීම. ඒක වරදක්ද? ගෝලීය ආර්ථිකය සමඟ ඒකාබද්ධ වීම වර්ධනය කිරීම ගැනත් මෙහි සඳහන් වෙනවා. එය කළ යුතුයි නේද? කෘෂිකර්මය නවීකරණය කිරීම කළ යුතු බවත් මේකේ සඳහන් වෙනවා. එය නොකරපු එක නේද වැරැද්ද? මේවා කරනකොට වැරැදිද? පූර්ණ ආර්ථික වර්ධනයක් ඇති කිරීම ගැනත් මෙහි සඳහන් වෙනවා. හාගෙට නොවෙයි නේ, පූර්ණ ආර්ථික වර්ධනයක් ඇති කිරීම නේ. මට වෙන් වූ කාලය අවසන් කියලා දන්වන නිසා මම නිහඬ වෙනවා. හැබැයි තව පැය දෙකක් වුණත් කථා කරන්න පුළුවන්, මේ පනත් දෙක සම්බන්ධයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.42]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත වාගේම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත ගැන අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. යහ පාලන රජයේ, සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය ඇමතිවරයා විධියට මම කටයුතු කළා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වෙනස්කම්, පරිවර්තන සිදු විය යුතුයි කියලා මම පිළිගන්නවා. 1980 දශකයේදී පිහිටුවපු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අද වන විට නව මුහුණුවරකින් යුතුව අලුත් ආයෝජන ආකර්ෂණය කරගන්න පුළුවන් ස්ථානයක් බවට පරිවර්තනය විය යුතුයි කියන එක මම පිළිගන්නවා. හැබැයි, ආර්ථික පරිවර්තන පනතෙන් සිදු වෙලා තිබෙන්නේ ඒක නොවෙයි. ඊට එහා ගිය වෙනත් අරමුණක් ඉෂ්ට කර ගැනීමක් විධියට තමයි මම මේක දකින්නේ. වර්තමාන ජනාධිපතිවරයා කඩිමුඩියේ මේ පනත ගේන්නේ එතුමාට මේක ක්‍රියාත්මක කරන්න නොවෙයි. අනාගතයේ පත්වන රජයන් අපහසුතාවට පත් කිරීමේ අරමුණින් ගෙනාපු පනතක් විධියට තමයි මා මෙය දකින්නේ.

අපි දන්නවා, මේ තුළින් BoI එක කොටස් ගණනාවකට වෙන් කරන බව. BoI එකේ මුදල් උත්පාදනය කරන zones ටික වෙන් කරනවා. මේ තුළින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආදායම් නොලබන තත්ත්වයට එක පැත්තකින් පත් වෙනවා. ඒ වාගේම ආයෝජන කලාප කොටස්වලට කඩලා විකිණීමේ යටි අරමුණකුත් මෙහි තිබෙනවාද කියන සැකයත් අපි ළඟ තිබෙනවා. කෙටි කාලයක් ඇතුළත මේවා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ඇතුළු මේ ආණ්ඩුවට කරන්නත් බැහැ. අපේ ගම්වල කියමනක් තිබෙනවා නේ, "යන යකා කොරහත් බිඳගෙන යනවා වාගේ" කියලා. අනාගත රජයක් අපහසුතාවට පත් කිරීමේ අරමුණින් මේ යක්කු ටික කොරහත් බිඳගෙන යන්නද හදන්නේ කියන සැකය අප තුළ තිබෙනවා.

මීට සති කිහිපයකට කලින් ජනාධිපතිවරයා බිංගිරියේ අපනයන සැකසුම් කලාපයට ආවා. ඒක බොහොම හොඳයි. 2018දී මම නියෝජ්‍ය ඇමතිවරයෙකු විධියට ඒ අපනයන සැකසුම් කලාපය ආරම්භ කළා. වර්තමාන ජනාධිපතිවරයා එතකොට අගමැතිවරයා වශයෙන් කටයුතු කළා. ඒක එතුමාගේ සංකල්පයක්. හැබැයි එතුමාගේ සංකල්පයේ තිබුණා, බිංගිරිය, කුලියාපිටිය, වැලිගම, කළුතර වගවත්ත, හම්බන්තොට ආදී ප්‍රදේශවල ආයෝජන කලාප ගණනාවක් පිහිටුවන්න. ඒවායෙන් යථාර්ථයක් බවට පත් කරන්න පුළුවන් වුණේ 14වෙනි අපනයන සැකසුම් කලාපය විධියට මම ආරම්භ කරපු බිංගිරිය අපනයන සැකසුම් කලාපය පමණයි. හැබැයි, එදා එතුමා බිංගිරිය අපනයන සැකසුම් කලාපයට ගියේ මොනවාටද? එතුමා ගියේ, අපි ආරම්භ කරපු, යහ පාලන ආණ්ඩුවෙන් ආරම්භ කරපු, මම මූලික වෙලා ආරම්භ කරපු, එතුමාගේ සහයෝගයත් එක්ක ආරම්භ කරපු මේ අපනයන සැකසුම් කලාපයේ අඩුම ගණනේ යටිතල පහසුකම් ටිකවත් සපයා ඉවරවෙලා නැති වකවානුවක. එදා නියෝජ්‍ය ඇමතිවරයා විධියට මම ඒ අපනයන සැකසුම් කලාපයට ආයෝජන 5ක් ගෙනැල්ලා තිබුණා. ඒ ආයෝජන 5 විතරයි, එතැනින් එහාට එක ආයෝජනයක්වත් ආවේ නැහැ. හැබැයි, එකම එක ආයෝජනයක් සම්බන්ධ කටයුතු මෑතක දී පටන් ගත්තා. ඒ ගෙනා ආයෝජනයකට අදාළ ඇහලුම් කර්මාන්තශාලාවත් මීට මාස 6කට, 7කට කලින් විවෘත කළා. ඒ විවෘත කරපු චීන ඇහලුම් කර්මාන්තශාලාව නැවත විවෘත කිරීමක් වාගේ දෙයකට තමයි එතුමා ගියේ. කෙටියෙන්ම කියනවා නම්, ජනාධිපතිතුමා ගියේ පොඩි ඇඩ එකක් දමන්නයි. නමුත් මම සතුටු වෙනවා, මේ ජනාධිපතිවරයා එදා අගමැතිවරයා හැටියට ඇවිල්ලා උදව් කරපු, මම ආරම්භ කරපු අපනයන සැකසුම් කලාපයට ඊයේ පෙරේදා හෝ නැවත පැමිණීම ගැන. හැබැයි එතුමාට බැරි වුණා, බිංගිරියට අල්ලපු වැටේ තිබෙන -එදා එතුමා ආරම්භ කරපු- කුලියාපිටියේ වොක්ස්වැගන් කර්මාන්තශාලාව තවම විවෘත කර ගන්න. මුලින්ම පටන් ගත්තේ වොක්ස්වැගන් කර්මාන්තශාලාව. බිංගිරිය අපනයන සැකසුම් කලාපය දෙවනුව මම පටන් ගත්තා. හැබැයි, ඒ අවුරුදු 3කට පසුව. එලෙස අවුරුදු 3කට පසු පටන් ගත් බිංගිරිය අපනයන සැකසුම් කලාපය මේ වන විට යථාර්ථයක් බවට පත් කරන්න පුළුවන් වෙලා තිබෙනවා.

මේ දවස්වල ජනාධිපතිතුමා එක පැත්තකින් ඇඩ දමන ගමන් අනෙක් පැත්තෙන් ඊළඟ ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න විවිධ පනත් ගෙනෙනවා. ඒ වාගේම එතුමා ගන්න තීන්දු විශාල ප්‍රමාණයක් reverse වෙලා තිබෙනවා. ජනාධිපතිවරයා විසින් පත් කරපු පොලිස්පතිවරයාත් දැන් reverse වුණා. ඒ වාගේම තවත් අණ පනත් ගණනාවක් reverse වුණා. ඒ නිසා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකත්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

මේ ආණ්ඩුව මේ වෙලාවේ කටයුතු කරමින් ඉන්නේ එක්තරා ආකාරයකට උමතුවෙන් කියා මට කියන්න පුළුවන්.

එදා අපි දන්නවා, රනිල්-මෛත්‍රී ආණ්ඩුව ක්‍රියාත්මක වූ අවසාන භාගයේදී දින 52ක ආණ්ඩු කුමන්ත්‍රණයක් සිද්ධ වෙලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකත්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

උමතුවෙන් කටයුතු කළා කියලා. එදා විකෘති ආණ්ඩුවක් හැදුවා. ඒ වෙලාවේ අධිකරණය ඒ සාධාරණය ඉෂ්ට කරලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කරපු විකෘතිය ප්‍රකෘතියක් බවට පත් කරන්න සහයෝගය ලබා දුන්නා. අදත් අපට පෙනෙනවා, එදා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකත්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

සිදු කරන ආකාරය. ඒ, මේ ගත වෙන්නේ එතුමාගේ පාලනයේ අවසාන මාස කිහිපය හින්දා වෙන්න ඇති. අපට මතකයි, ජර්මනියේ හිටපු හිට්ලර් කියන ඒකාධිපතියා පරදින්න ඔන්න මෙන්න තිබියදී ඔහුගේ මෝඩ උපදේශකයින් ඔහුට උපදෙස් දුන් බව, ඔහු තමයි දිනන්නේ කියලා. ඒ වාගේ ජනාධිපතිවරයාත් එතුමාගේ වටේ ඉන්න මෝඩ උපදේශකයින් දෙන උපදෙස් පිළිපැදලා විශාල අමාරුවක වැටෙන්නයි යන්නේ. වෙනදාට නම් නමට ජනාධිපති අපේක්ෂකයෝ විශාල පිරිසක් ඉන්නවා, අපේක්ෂක ලැයිස්තුව පුරවන්න. හැබැයි ප්‍රධාන අපේක්ෂකයෝ දෙන්නෙක් හෝ තුන්දෙනෙක් තමයි ඉන්නේ. මේ සැරේ ආණ්ඩුවේම අධිකරණ ඇමති විජයදාස රාජපක්ෂ මහත්මයාත් ජනාධිපති අපේක්ෂකයෙක් වුණා. සරත් ෆොන්සේකා මහත්මයා අපේ පක්ෂයේ තමයි. හැබැයි, ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහත්මයා පසුගිය කාලයේම වැඩ කළේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ න්‍යාය පත්‍රයට අනුවයි. එතුමාටත් ලොකු වුවමනාවක් තිබෙනවා නේ, මේ රටේ ජනාධිපතිවරයා වෙන්න. අපි ඒකට එතුමාට අවස්ථාවක් දුන්නා, 2010දී. නමුත්, ඒක සිද්ධ වුණේ නැහැ. ඊට පස්සේ එතුමා 2015දී වෙනම ඡන්දය ඉල්ලුවා.

හැබැයි, එතුමාට පාර්ලිමේන්තුවටවත් එන්න බැරි වුණා. ඒවා, තමන්ගේ බර තමන්ට හරියට කිරාගන්න බැරි වුණාම සිදුවන ප්‍රශ්න. තමන්ට පුළුවන් වෙන්න ඕනෑ, තමන්ගේ බර කිරන්නේ නැතිව ආසන්න වශයෙන් හිතලා කියන්න. සමහරුන්ට තමන්ගේ බර කීයද කියලා ආසන්න වශයෙන්වත් කියාගන්න බැහැ. බැලූ බැල්මට අපට පෙනෙනවා, සරත් ෆොන්සේකා මහත්මයා කිලෝ 80ක් විතර බරයි කියලා. හැබැයි එතුමා හිතාගෙන ඉන්නවා, ටොන් 2ක්, 3ක් එතුමා බරයි කියලා. එහෙම වුණාම අන්තිමට වෙන්නේ පව වෙලා යන එකයි. එ් ටිකම තමයි ජනාධිපතිවරයාටත් වෙන්නේ.

මම ගිය සැරේ හරියටම කිව්වා, මැතිවරණ ප්‍රතිඵලය. මම මැතිවරණයට කලින් කුලියාපිටිය කැකුණගොල්ලේදී කිව්වා, එක්සත් ජාතික පක්ෂයට එක පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක්වත් හිමි වෙන්නේ නැහැ, හැබැයි එකම එක ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයක් හිමි වෙනවා, ඒකටත් මරා ගන්නවා කියලා. මම කිව්වා වාගේම අවුරුද්දකට පස්සේ තමයි ඒ මන්ත්‍රී ධුරයට රනිල් වික්‍රමසිංහ මහත්මයා පත් වුණේ. ඒ නිසා ජනාධිපතිවරයාට ඒකම තමයි මේ සැරේත් වෙන්නේ. දැන් නාමල් රාජපක්ෂ මහත්මයාත් ලැහැස්ති වෙනවා, ජනාධිපති ධුර අපේක්ෂකයෙක් වෙන්න. දැන් දැක්කා නේ, මස් මාළු කන්නේ නැහැ කිව්වා, අරක්කු සිගරට් බොන්නේ නැහැ කිව්වා. ඊයේ-පෙරේදා නාමල් රාජපක්ෂ මහත්මයාගේ නොයෙකුත් සුදුසුකම් කිව්වා. හැබැයි, රාජපක්ෂලා මස් මාළු නොකෑවාට මේ රටේ මිනිස්සුන්ගේ රීරි මාංස උරා බීලා තිබෙනවා. මම හිතන විධියට ඒක මස් මාළු කනවාට වඩා මහා පාප කර්මයක්. රීරි මාංස උරා බොනවා කියන එක හරියට මිනී මස් කෑවා වාගේ වැඩක්. ඒ අයගේ සුදුසුකම් දිහා බැලුවාම සජිත් ප්‍රේමදාස මහත්මයා ඉන්නේ ඉතාම ඉහළින්. අනෙක් අය සේරම ඉන්නේ ග්‍රහලෝකවල. හැබැයි, සජිත් ප්‍රේමදාස මහත්මයා ඉන්නේ බිමේ. දැන් අනුර කුමාර දිසානායක මහත්මයා - "AKD" - ඉන්නේ අහසරු ලෝකයේ. මම හිනෙ විධියට දැන් විජයදාස රාජපක්ෂ මහත්මයා ඉන්නේ බ්‍රහස්පති හෝ මොකක් හෝ වෙනත් දිහාවක. ප්ලූටෝවලද? රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉන්නේ ඉරේ. එතුමා ඉන්නේ ඉතාම ඉහළින්. හැබැයි, භූමියේ තත්ත්වය බලපුවාම සජිත් ප්‍රේමදාස මැතිතුමා භූමියේ ඉන්නවා; භූමිය සම්බන්ධ වෙලා තිබෙන්නේ එතුමාත් එක්ක. ඒ නිසා පැහැදිලිවම මම මේ අපේක්ෂකයන්ට කියනවා, අනේ, කරුණාකරලා ඇප cancel කරගන්න එපා, පොඩි fight එකක් දීලා දෙවැනියා වෙන්න උත්සාහ කරන්න කියලා. මේ රටේ පළමුවෙනියා සහනික වෙලා ඉවරයි; ඉර, හඳ සේ විශ්වාසයි, මේ රටේ ඊළඟ ජනාධිපතිවරයා බවට පත් වෙන්නේ වැඩ කරන නායකයා, භූමියේ නායකයා, රටේ ජනතාවගේ හදවතේ නායකයා වන සජිත් ප්‍රේමදාස මැතිතුමා කියන එක. ඒක ස්ථිරයි; සහනිකයි. ඒක කවදාවත් වෙනස් වෙන්නේ නැහැ. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. (Prof.) Charitha Herath. You have seven minutes.

[අ.භා. 3.51]

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදයට සහභාගි වෙන්න ලැබීම ගැන මම ඉතාම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම අද දවසේ මේ විවාදයට සහභාගි වුණු සමහර රජයේ මැති, ඇමතිවරු කරපු සමහර ප්‍රකාශ අහගෙන හිටියාම මට කල්පනා වුණේ, ඇත්තටම මේ රටේ සමහරු දිගු නින්දකින් පසු ඇහැරිලා කථා කරනවා වාගේයි. මේ කථාව අපේ මුදල් රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මැතිතුමා අහගෙන ඉන්නවා නම් මම එතුමාට මේ කාරණය කියන්න කැමතියි. එතුමා ඉතා දීර්ඝ වශයෙන් අද මේ සභාව තුළදී කථා කළා. හැබැයි, බැසිල් රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමති කාලයේ එතුමාගේ රාජ්‍ය ඇමතිවරයාත් මගේ මිත්‍රයාම තමයි; ශෙහාන් සේමසිංහ මැතිතුමාම තමයි. මම මේ දෙදෙනාටම දොස් කියනවා නොවෙයි. හැබැයි, තමන් රාජ්‍ය ඇමති වෙලා හිටපු කාලයේ අපිවත් නොයෙක් සාකච්ඡාවලට ගෙන්වලා ඒ ඇමතිවරයාගේ දහම, ඒ ඇමතිවරයාගේ අදහස ඉතාම පැහැදිලිව සතුටින් ප්‍රකාශ කරපු අය මේ සම්පූර්ණ වැටීමේ පදනම දැමීමේ ඒ කාලයේ මුදල් ඇමතිවරයායි කියලා අද මේ ගරු සභාවේදී පවසලා ජනාධිපතිතුමාව සතුටු කරනවා. මේක දේශපාලන විධි ක්‍රමයක් විධියට එච්චර හොඳ දෙයක් නොවෙයි කියන එකයි මම කියන්නේ. අපි මේ රටේ දේශපාලනය සහ ආර්ථිකය සම්බන්ධව වෙච්ච ප්‍රශ්න ගැන කථා කරන්න ඕනෑ.

අද විවාදයට ගන්නා මේ පනත් දෙකෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ගත්තොත්, මේ සම්බන්ධව අපි මීට කලිනුත් නීති සම්මත කරලා තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත කියලා එකක් ඒ කාලයේ තිබුණා. හැබැයි, ඒ පනත එහෙමම නිද්‍රාවට ඇරියා, හැම ආණ්ඩුවක්ම -අපේ ආණ්ඩුත්, චික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුත්. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ කිසිම වැරැද්දක් නැහැ. ඒ පනතේ මේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ තිබෙන ඒවාම තමයි තිබුණේ. හැබැයි, ඔක්කොම ඒ පනත නොසලකා හැරියා. එලෙස ඒ පනත නොසලකා හැරපු අය දැන් ඇවිල්ලා කියනවා, මහා පුදුම වැඩක් වුණේ, අර කාලයේ වැටුණා, මේ කාලයේ වැටුණා කියලා. මම අහන්න කැමැතියි, 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත 2003න් පස්සේ නොසලකා හැරියේ නැති ආණ්ඩුව මොකක්ද කියලා. හැම ආණ්ඩුවක්ම ඒ පනත නොසලකා හැරියා. හැම අය වැයක්ම ඒ පනත නොසලකා හැර තමයි හැදුවේ. ඒකම තමයි මේකටත් වෙන්නේ. හැබැයි, අපි කැමැතියි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධව යම් නීතියක් ගෙනෙන එකට. හැබැයි, මේක ප්‍රායෝගික වෙන්න ඕනෑ. එක එක ආණ්ඩු එක එක කාලයට ඇවිල්ලා, 2003 මෙතුමන්ලාගේ ආණ්ඩු කාලයේ ගෙනාපු රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත නොසලකා හැරියා. හැබැයි, ඒකම මේකටත් වෙන්න පුළුවන් කියලා මම කියන්න කැමැතියි.

ඊළඟට, ආර්ථික පරිවර්තන පනත සම්බන්ධව විශාල විවේචනයක් අපට තිබෙනවා. හැබැයි, ඒ විවේචනය දැන් මට ලැබී තිබෙන මේ විනාඩි හත ඇතුළේදී කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පළමුවන ප්‍රශ්නය මේකයි. මේ ආර්ථික පරිවර්තන පනත සම්බන්ධව මේ කරන සංවාදය තුළ අපි තේරුම් ගන්න ඕනෑ, 2022 ඉඳලා මේ රට ජන මතය සම්බන්ධව විශාල අභියෝගයකට පත් වෙලා තිබෙන බව. ඒ අනුව, අවුරුදු දෙකක් නිස්සේ අපේ රටේ අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙක් ඉන්නේ. ඒ අනුප්‍රාප්තික ජනාධිපතිවරයාගේ කාලය නිමා වෙන්න නියමිතව තිබෙනවා, තව ටික කාලයකින්. එතුමාම ආපසු පත් වුණත්, වෙන කෙනෙක් පත් වුණත් කියන එක නොවෙයි මම කියන්නේ. අපි විශ්වාස කරන්නේ නැහැ, කිසිම වෙලාවක වර්තමාන ජනාධිපතිතුමා නැවත පත් වෙයි කියලා. ඉතිහාසය පුරාවටත් එතුමා ජනාධිපති වශයෙන් පත් වුණේ නැහැ. මේ මන්ත්‍රීවරු ටික තමයි එතුමාව ජනාධිපති වශයෙන් පත් කෙරුවේ. ආපසු එතුමා ජනතාවගේ ඡන්දයෙන් කවදාවත් තේරී පත් වෙයි කියලා මම හිතන්නේ නැහැ.

හැබැයි, එහෙම තිබියදී මේ ආර්ථික පරිවර්තන පනත අද මේ සභාවට ඉදිරිපත් කිරීම පිළිබඳව දේශපාලන වශයෙන් සදාචාරාත්මක ගැටලුවක් තිබෙනවා. හුහක් අය එක එක විහිළු කථා කිව්වා. මම table කරන්න කැමැතියි, මැතිවරණ කොමිෂන් සභාව 2024.07.25වැනි දින - අද දින - නිකුත් කළ මේ 11/2024 කියන විශේෂ මාධ්‍ය ප්‍රකාශය. ඔවුන් අද නිවේදනයක් නිකුත්

[ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා]

කරලා කියනවා, ජනාධිපතිවරණය සම්බන්ධයෙන් හෙට ගැසට් පත්‍රයක් ඉදිරිපත් කරනවා ඒ අයගේ බලය මත කියලා. ඒ අනුව පැහැදිලි වෙන්නේ මේකයි. ඇත්තටම නීතියෙන් තර්ක කරන්න පුළුවන්, අද අපට නීතියක් ගෙනෙන්න බැරිද කියලා. අද අපට නීතියක් ගෙනෙන්න පුළුවන්. හැබැයි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් ගත්තාම, රටේ ජන මතය ගැන විශාල අභියෝගයක් ඇවිල්ලා තිබෙනවා. රටේ ජන මතය ගැන විශාල අභියෝගයක් ඇති වෙච්ච කාලයක ජනාධිපතිවරයා අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙක් විධියට පත් වෙලා ඉන්නවා. ඒ ජනාධිපතිවරයාගේ ධුර කාලය නිමා වෙන්න නියමිතයි කියලා අද දිනයේ statement එකක් ඉදිරිපත් කරලා තිබෙනවා, මැතිවරණ කොමසාරිස්වරයා. ඒ දවසේ ලභි ලභියේ අපි අනාගතයේ හැම දාටම ගැළපෙන ආර්ථික පරිවර්තන පනතක් ගෙනෙන්න හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක බරපතළ ප්‍රශ්නයක්. මේ ආර්ථික පරිවර්තන පනත මේ රටේ ආර්ථික දිශානතියට ගැට ගැහිලා තිබෙන්නේ. මහ මැතිවරණයක් කියන්නේ ජනතාව ආර්ථික දිශානතිය ගැන තීරණය කරන අවස්ථාවක්; ජනාධිපතිවරණයක් කියන්නේ ආර්ථික දිශානතිය තීරණය කරන අවස්ථාවක්. ඒ ආර්ථික දිශානතිය තීරණය කරන්න මැතිවරණ කොමසාරිස් declaration එක දමනවාය කියලා statement එක දෙන දවසේ මේ 134දෙනා ආර්ථික දිශානතිය තීරණය කරන්න යනවා. ඒකයි මේ වෙන්නේ. මේක ඇතුළේ හොඳ ඒවා තිබෙන්න පුළුවන්. ඒක නොවෙයි ප්‍රශ්නය. අපි රටක පාර්ලිමේන්තුව තුළ decent Representativesලා වෙන්න ඕනෑ, ජනතාව සම්බන්ධව යම් වගකීමක් එක්ක. ජනතාවට තමයි මේ රටේ පරමාධිපත්‍යය පිළිබඳ අයිතිය තිබෙන්නේ, අපට නොවෙයි. අපි ඒකේ representation එකක් විතරයි කියලා විශ්වාස කරන්න ඕනෑ. ඒ නිසා ජනතාව රට සම්බන්ධව යම් වැඩ පිළිවෙළක් අනුමත කරන්න දවස් කිහිපයක් තිබෙද්දී අපි මේ පනත මේ ගරු සභාවේදී මේ විධියට අනුමත කරන එක වැරදියි කියායි මම කියන්නේ. මේක හොඳද, නරකද කියන එක ගැන මේ ගරු සභාවේදී කියන්න වෙලාවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේකේ තිබෙන සමහර අවුරුදු, සමහර ඉලක්ක සිහිනෙන් හදපු ඉලක්ක. ඇත්තටම කිසිම feasibility study එකක් නැතුව, කිසිම background data එකක් නැතුවයි සමහර ඉලක්ක හදලා තිබෙන්නේ. ඒ වාගේම මේ ආර්ථික පරිවර්තන පනතේ වගන්ති 25ක්ම මූලික නීතියට පටහැනියි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය දුන් Determination එකේ කියලා තිබෙනවා. මූල්‍යමය රෙගුලාසි සම්බන්ධව මෙවැනි පනතක් ඉදිරිපත් කිරීමේදී රටේ ජනතාව ගැන අපට විශ්වාසයක් තිබෙන්න ඕනෑ. මේ රටේ ජනතාවට මේ රටේ මූල්‍ය නීතිය ගැන ඊළඟ මැතිවරණයේදී තීරණයක් ගන්න කිසිම අයිතියක් නැහැ කියලා අපි හිතනවාද? ඊළඟ ජනාධිපතිවරයාගේ ආර්ථික වැඩ පිළිවෙළ වෙන කිසි කෙනෙකුට ගෙනෙන්න බැහැ, මේ රටේ ජනතාවට ඒ ගැන තීරණයක් ගන්න අයිතියක් අපි දෙන්නේ නැහැ කියලා අපි හිතනවාද? අද මේ පනත් සම්මත කිරීම ඇතුළේ පෙන්නුම් කරන්නේ අන්න ඒකයි කියන එකයි මම කියන්නේ. ඒක ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදාය තුළ හොඳ දෙයක් නොවන බව ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය නිමා කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The Hon. (Dr.) Upul Galappaththi. You have seven minutes.

[අ.භා. 3.59]

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ආර්ථික පරිවර්තන පනත වාගේම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත සාකච්ඡාවට බඳුන් වෙනවා. අපි දන්නවා, හොඳ සහ නරක දෙකම මේකේ තිබෙන බව. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත නම් මේ රටට වැදගත් වන පනතක්. නමුත් ආර්ථික පරිවර්තන පනත ආණ්ඩුවක් වෙනස් වෙන්න තිබෙන වෙලාවක, ජනාධිපතිවරණයක් කට උඩ තියාගෙන හදිසියේ ගෙනෙන්නේ ඇයි කියන එක තමයි අපට දැනගන්න ඕනෑ. ඒ වාගේම අපි දන්නවා, මේ රටේ ආදායම් උත්පාදනය වැඩි කරන්න ඕනෑ බව. ඒ ගැන කථා දෙකක් නැහැ. හැබැයි, ආදායම් උත්පාදනය වැඩි කරගන්න කථා කරන වෙලාවේ ගජ මිතුරු බදු සහන ලබා දීම තුළින් අපේ රටේ බදු ආදායම විශාල ප්‍රමාණයක් අඩු වෙලා තිබෙනවා.

ඒ වාගේම බොල් ණය විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා අය කරගත හැකි ණය. ඒවා ලබා දී තිබෙන්නේ ගජමිතුරු ව්‍යාපාරිකයන්ට. ඒවා අය කරගත යුතුයි. ඒ වාගේම ණය කළමනාකරණය පිළිබඳව අපි පැහැදිලි ප්‍රතිපත්තියකට ආ යුතුයි. ඒ ගැන විවාදයක් නැහැ. හැබැයි, අපි ඒ සියල්ල කරන ගමන් ආර්ථිකය ප්‍රසාරණය කිරීමත් කළ යුතුයි. එහෙම කළේ නැති නිසා තමයි අද වෙනකොට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෝ විශාල පිරිසක් තමන්ගේ කර්මාන්ත, ව්‍යාපාර නවත්වන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමා දන්නවා, ඒ හරහා විශාල ප්‍රමාණයක් රැකියා අහිමිවීම් වෙලා තිබෙනවා කියලා. ඒ නිසා ආදායම් නැති වෙලා තිබෙනවා. බොල් ණය ටික අය කර ගත්තා නම්, සුරාබදු දෙපාර්තමේන්තුවේ තිබෙන බදු සහන දීපු ඒවා ලබා ගත්තා නම් වෘත්තීයවේදීන්ගෙන් අය කරන උපයන විට බද්ද අයින් කරන්න තිබුණා. හැබැයි, උපයන විට බද්ද විශාල ප්‍රමාණයකින් දැමීම නිසාම වෘත්තීයවේදීන් රට යන ප්‍රමාණය අද වෙනකොටත් අඩු වෙලා නැහැ.

සෞඛ්‍ය ඇමතිතුමා විධියට රමේෂ් පතිරණ ඇමතිතුමා දන්නවා, මේ රටේ සමහර රෝහල් වහන තත්ත්වයකට ඒ වාගේම විශේෂඥ වෛද්‍යවරුන් ඉන්න units වහන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා කියලා. හම්බන්තොට ගත්තොත්, කායික රෝග විශේෂඥයෝ හතර දෙනෙක් ඉන්න ඕනෑ තැන අද ඉන්නේ පුහුණුව සම්පූර්ණ කළ විශේෂඥ වෛද්‍යවරු එක්කෙනායි. ඒ වාගේම anaesthetistsලා තුන්, හතර දෙනෙක් ඉන්න ඕනෑ තැන පුහුණුව සම්පූර්ණ කරපු අය එක් කෙනෙක්වත් නැහැ. මේ වාගේ තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ අපේ ආර්ථිකය කළමනාකරණය සම්බන්ධයෙන් තිබෙන දුර්වලතා නිසා.

රනිල් වික්‍රමසිංහ මහත්තයා ආපු දවසේ ඉඳලා වැල් පාලමක් ගැන කියනවා. මේ දවස්වල ටයිටැනික් නැව කියලා කියනවා. එතුමාට අමතක වෙලා තිබෙනවා, ටයිටැනික් නැව ගිලිලා දැන් මුහුදු පතුලේ තිබෙන්නේ කියලා. ඒ නිසා එතුමාගේ ටයිටැනික් නැවත් මුහුදු පතුලට යන දවස වැඩි ඈතක නොවෙයි. වැල් පාලම කඩාගෙන වැටෙන දවස වැඩි ඈතක නොවෙයි. එතුමාගේ කාලය තුළ නැති වුණේ පෝලිම් විතරයි. ඇයි, පෝලිම් නැති වුණේ? ගරු රමේෂ් පතිරණ ඇමතිතුමනි, පෝලිම් නැති වුණේ මේ රටේ මිනිසුන්ගේ purchasing power එක අඩු වුණු නිසා. මිලදී ගන්නා බඩු තිබුණාට සල්ලි නැහැ. උද්ධමනය වැඩි වෙලා. තමන්ගේ ආදායම අඩු වෙලා. ලයිට් බිල ගෙවා ගන්න බැරි වෙලා මිලියන 1.1ක ලයිට් කපලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෙවල් මිලියන තුන හතරකට විතර red notice ඇවිල්ලා ලයිට් කපනවා, වතුර කපනවා කියලා. දුප්පතුන්ගේ ප්‍රමාණය සියයට 60කින් වැඩි වෙලා. ආදායම් උත්පාදනය නැති වෙලා. පෝලිම් යුගය, පෝලිම් නැති වුණා කිව්වාට, භාණ්ඩ තිබෙනවා කිව්වාට මිනිසුන්ට ඒවා ගන්න සල්ලි නැහැ. අද සමහරු වේල, දෙවේල කන්නේ නැතුව ඉන්නවා. ළමයින් සමහර මාසවල ඉස්කෝලේ යන්නේ සතියකට දවස් දෙකයි; තුනයි. ඔවුන්ට ඉස්කෝලේ යන්න විධියක් නැහැ. කන්න නැහැ. එතුමාගේ කොළඹ හතේ ආර්ථික ප්‍රතිපත්තිය එක්ක මේ රටේ ගමේ මහ පොළොවට ගිහිල්ලා බලනකොට මහ පොළොවේ යථාර්ථය තමයි ඒක. ඒ නිසා තමයි එතුමාගේ ආණ්ඩුවට, පොදුජන පෙරමුණ පක්ෂයට විරෝධතාව ගොඩනැහෙන්නේ. ඒ නිසා තමයි සමඟි ජන සන්ධානය අද වෙනකොට මහ පොළොවේ බලය අල්ලන පක්ෂය බවට පත් වෙලා තිබෙන්නේ.

රනිල් වික්‍රමසිංහ මැතිතුමා හදිසි වෙලා, රටට අඩබෙර ගහලා "ආරංචිය සුබයි" කියලා පෝස්ටරයක් ගැහුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ආරංචිය සුබයි" කියන පෝස්ටරය ගහලා තිබෙන්නේත් කොළඹ අවට විතරයි. අඩුම ගණනින් කොළඹින් පිට අපේ හම්බන්තොටවත් "ආරංචිය සුබයි" කියන පෝස්ටරය ගහන්න කට්ටිය නැහැ. කිරිබත් කෑවේ, කොළඹ අවට කට්ටිය විතරයි. රනිල් වික්‍රමසිංහ මහත්තයාගෙන් වරප්‍රසාද, වරදාන ගන්න **අය**. අර ගෙදර හිටපු අය දැන් උපදේශකලා වෙලා තිබෙනවා. ඇමති උපදේශකලා වෙලා තිබෙනවා. සමහර අය අධ්‍යක්ෂ ජනරාල්වරු වෙලා තිබෙනවා. අපේ ජන වරමෙන් දැන් එතුමාගේ කට්ටිය තමයි කිරිබත් කන්නේ. හැබැයි, කිරිබත් කාපු අයට දැන් කිරිබත් කාපු එක දිරවන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අපි දන්නවා, එතුමාගේ සුබ ආරංචියේ නැකතේ වැරැද්දක් වෙලා තිබෙන්නේ. ඒ සුබ ආරංචියේ නැකතේ වරද නිසාම ආණ්ඩුව ගහන, ගහන ගැටේ, රනිල් වික්‍රමසිංහ මහත්තයා ගහන, ගහන ගැටේ දැන් වැරදීගෙන යන්නේ. එතුමා ජනාධිපතිවරණය කල් දාන්න දෙපාරක් උත්සාහ කළා. ඒ වෙනුවෙන් කවුද ගෙනාවේ? ලේනව ගෙනාවා. ඊට පස්සේ අනෙක් පැත්තෙන් ලක්සිරි ගෙනාවා. ශ්‍රේෂ්ඨාධිකරණය ලක්සිරිටයි, ලේනවටයි දඩ ගහලා ගෙදර යන්න කිව්වා. ජනාධිපතිවරයාගේ ධුර කාලය අවුරුදු 5යි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය අද වෙනකොට පස්වනාවක් කියලා තිබෙනවා. රනිල් මහත්මයාට දැන් ඒකත් හරියන්නේ නැහැ. එතුමා දැන් විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ගේනවා ලු. කොහොම හරි මේකේ රසය රනිල් වික්‍රමසිංහ මහත්මයාට දැනිලා තිබෙන්නේ. එක්සත් ජාතික පක්ෂයේ තනි මන්ත්‍රීවරයෙකු හැටියට පාර්ලිමේන්තුවට ඇවිල්ලා, අපේ පොහොට්ටුවේ මන්ත්‍රීවරු **ඇතුළුව** 134දෙනෙක් ඡන්දය දීලා, එතුමාට දැන් රසය අල්ලලා දීලා තිබෙන්නේ. රසය අල්ලා දීපු නිසාම දැන් විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ගේනවා. දැන් බලන්නේ මේ ජනාධිපතිවරණය කොහොම හරි කල් දමා ගන්නයි. හැබැයි, මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය නීතියේ ආධිපත්‍යයට, ප්‍රජාතන්ත්‍රවාදයේ ආධිපත්‍යයට ගරු කරමින් පැහැදිලි තීන්දු ලබා දීලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගරු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනවරමට එරෙහි මේ ආණ්ඩුව, විකෘති ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුව තුළ දැන් පොහොට්ටුවට වෙලා තිබෙන වැඩේ බලන්න. දැන් රනිල් මහත්මයා එක්ක ඉන්නවා සියයට 40ක විතර ප්‍රමාණයක්, වරප්‍රසාද, වරදාන ගන්න උදවිය. එතැන හොඳ ඇමතිවරුත් ඉන්නවා; වැඩ කරන්න පුළුවන් ඇමතිවරුත් ඉන්නවා. හැබැයි, වැඩිපුර ඉන්නේ වරප්‍රසාද, වරදාන හරහා රනිල් මහත්මයාට ඡන්ද 134 හදා දීපු අය. බැසිල් රාජපක්ෂ මහත්මයා විසින් - මුදල් දීලා ද, නැද්ද, මොනවා දීලා ද කියලා මම දන්නේ නැහැ - තමයි වරප්‍රසාද, වරදාන හරහා රනිල් මහත්මයාට මන්ත්‍රීවරු 134ක් හේත්තු කළේ. දැන් අද වනකොට බැසිල් මහත්මයාට අඩුම ගානේ මන්ත්‍රීවරු 15දෙනකු එකතු කරගෙන රැස්වීමක් කරන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. අද ඒ ඔක්කෝම ටික ඉන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ වේදිකාවේ. මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා, ප්‍රසන්න රණතුංග මැතිතුමා ඇතුළු මේ උදවිය සියලුදෙනාම අද ඉන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ වේදිකාවේ. අද බැසිල් මහත්මයාට මන්ත්‍රීවරු 15ක් එකතු කරගන්න බැරිවෙලා තිබෙනවා. හැබැයි, මේ ක්‍රමය පුරුදු කළේ බැසිල් රාජපක්ෂ මහත්මයා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි.

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බැසිල් මහත්මයා පුරුදු කරපු ඒ දේ තමන්ගේ පිටුපසින්ම ඇවිල්ලා, ඒක දැන් තමන්ටම පාරාවළල්ලක් වෙලා තිබෙනවා. එතුමා වරප්‍රසාද, වරදාන දීලා ඒ උදවිය පුරුදු කරපු නිසා, දැන් රනිල් මහත්මයා තමන්ගේ ළඟට මන්ත්‍රීවරු ගන්නත් ඒකම කරන්න පටන් අරන් තිබෙනවා. ඒ නිසා මේ විකෘති ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවට තව වැඩි කාලයක් නැහැ. තව පොහොය දෙකයි තිබෙන්නේ. ඒ කියන්නේ, තව මාස දෙකකින් ප්‍රජාතන්ත්‍රවාදී, මේ රටේ පොදු ජනයාගේ හදවත දන්නා, මේ රටේ යට බිම් ස්තරය ගැන අවබෝධයක් තිබෙන නායකයෙක් වන අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා සමඟි ජන සන්ධානය හරහා මේ රටේ ජනාධිපතිවරයා වෙන එක නවත්වන්න බැහැ. අද කැබිනට් මණ්ඩලයේ ඉන්න ඇමතිවරු, ආණ්ඩුවේ සිටින රාජ්‍ය ඇමතිවරු, හොරු නොවන පිරිසට අපි ආරාධනා කරනවා, අපිත් සමඟ අත්වැල් බැඳගන්න කියලා. මේ ජයග්‍රහණය වෙනුවෙන් කැප වෙන්න, අපිත් එක්ක එකතු වෙන්න කියලා ඔවුන්ට ආරාධනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Mahindananda Aluthgamage. You have 25 minutes.

[අ.භා. 4.09]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පැමිණි මා මිත්‍ර ගරු උපුල් ගලප්පත්ති වෛද්‍යතුමාගේ කථාවෙන් පස්සේ අදහස් ප්‍රකාශ කරන්නයි මට අවස්ථාව ලැබිලා තිබෙන්නේ. එතුමා ආරාධනාවකුත් කළා. මම දන්නේ නැහැ, ඒ ආරාධනාව කොහේටද කළේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මම විශ්වාස කරනවා, මේ පනත අපේ රටේ ආර්ථිකයේ දිශානතිය තීන්දු කරන පනතක් හැටියට. මේ පනතේ තිබෙන ඉලක්ක, එහි තිබෙන කාලවකවානුව අනුව අනුව හරියට ක්‍රියාත්මක වුණොත්, අනිවාර්යයෙන්ම අපේ රට ලෝකයේ දියුණු ආදායම් ලබන රටක් බවට පත් වෙනවා. ඒ නිසා ඒකේ දුක, වේදනාව සජබයෙන් අපට ඇහුණා. මොකද, මේ රට ආර්ථික

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

වශයෙන් ශක්තිමත් වෙනවාට සජබය කැමතිත් නැහැ; ජනතා විමුක්ති පෙරමුණ කැමතිත් නැහැ; විපක්ෂයේ ඉන්න ගොඩක් අය කැමති නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබේ දුක අපට දැනෙනවා. ඔබ කැමතියි, තවත් තෙල් පෝලිම් ඇති වෙනවාට. ඔබ කැමතියි, තවත් ගෑස් පෝලිම් ඇති වෙනවාට. ඔබ කැමැතියි, කැරට් කිලෝ එකක මිල රුපියල් 2,000ට යනවාට. රටේ මිනිස්සුන්ගේ ජීවන බර සැහැල්ලු වෙලා, මේ රටේ ආර්ථිකය ශක්තිමත් වෙනවාට ඔබ කැමති නැහැ. ඒ නිසා ඔබේ වේදනාව අපට හොඳට දැනෙනවා. ඒ නිසා අපි ඒ ගැන කනගාටු වෙන්නේ නැහැ, මගේ හිතවත් වෛද්‍යතුමා. අපි ඒ වෙනුවෙන් කරන්නේ ඔබතුමාට අනුකම්පා කිරීම පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම කියන්න ඕනෑ, මෙවැනි පනත් කෙටුම්පතක් අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ ඇයි කියලා. මා මිත්‍ර චරිත හේරත් මන්ත්‍රීතුමා ඇහුවා, මෙවැනි තීරණාත්මක පනත් මේ අවසාන මොහොතේ ගේන්නේ ඇයි කියලා; මැතිවරණයක් ඔන්න මෙන්න තියලා, මේ අන්තිම මොහොතේ මෙවැනි පනතක් ගෙනෙන්නේ ඇයි කියලා ඇහුවා. මම දන්නේ නැහැ එතුමා ඇයි එහෙම අහන්නේ කියලා. මොකද, එතුමා බුද්ධිමත් කෙනෙක්; ආචාර්යවරයෙක්. මේ පනත මීට කලින් ගෙන එන්න බැහැ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගිහිල්ලා අවබෝධනා ගිවිසුම් අත්සන් කරලා එතැනින් පස්සේ තමයි ඒ ඉලක්කම්වලට අදාළ ඉලක්කවලට යෑම සඳහා ආර්ථික පරිවර්තන පනත ගෙනෙන්න පුළුවන් වන්නේ. රට බංකොලොත් වුණු වෙලාවේ මේ පනත ගෙනෙන්න බැහැ. මේ පනත ගැන නොදැනුවත්කම නොවෙයි, මේ පනත නිසා රටේ ආර්ථිකය ශක්තිමත් වීම, රජයේ ස්ථාවරභාවය ඇති වීම සම්බන්ධයෙන් එතුමන්ලාගේ තිබෙන වේදනාව තමයි අද එතුමන්ලා මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරන්නේ. මා ඒකයි කලිනුත් කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප මේ පනත ගේන්නේ ඇයි කියලා මා කිව්වා ඔබතුමාට මතක ඇති. 2022 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාව ණය ගෙවිය නොහැකි රටක් බව අපි නිවේදනය කළා. ඉන් ගොඩ ඒම සඳහා අපට තිබුණු එකම විකල්පය තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන එක. අපි 2022 අප්‍රේල් මාසයේ 12වන දා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක සාකච්ඡා ආරම්භ කළා. 2023 මැයි මාසයේ 20වන දා වනකොට අපට පුළුවන් වුණා, අවසන් එකඟතා ගිවිසුමට අත්සන් කරන්න. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යෑම නිසා අපේ රටට හිමි වුණු සමස්ත ආර්ථික ලාභය ගත්තොත්, ඩොලර් බිලියන 20කට වැඩියි. ණය ප්‍රතිව්‍යුහගතකරණය, අපට IMF එකෙන් ලැබුණු මුදල, World Bank එකෙන් අපට දෙන්නේ නැතිව තිබුණු නමුත්, පසුව ADB එක දීපු මුදල් ආදි සියල්ල ගත්තාම සමස්ත රටට වුණු ආර්ථික වාසිය ඩොලර් බිලියන 20කට වැඩියි. ඒ වාගේම අමතක කරන්න එපා, අපේ රට LC එකක්වත් අරින්න බැරි වුණු රටක් කියන එක. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යෑම මඟින් අපේ රට පිළිබඳ ජාත්‍යන්තර විශ්වාසය ගොඩ නැඟුණා විතරක් නොවෙයි, අපේ රටේ සංචාරක ව්‍යාපාරය, වෙළඳ ව්‍යාපාර ආදිය ද වර්ධනය වුණා. ඒ ආදි සියල්ල ස්ථාවර කර ගන්න අපට හැකියාව ලැබුණා. අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පීටර් බෘවර් මහත්මයා මාධ්‍ය හමුවේදී කිව්වා, ශ්‍රී ලංකාව අද ලෝකය පිළිගන්නා රටක් බවට පත් වෙලා තිබෙනවා කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉදිරිපත් කරන ආර්ථික පරිවර්තනයන් සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවිය යුතු ප්‍රධාන කාරණා 3ක් තිබෙනවා. ඒවායෙන් පළමුවැනි එක තමයි, කඩා වැටුණු ආර්ථිකයේ පීඩාකාරී බලපෑමෙන් සියලු ජන කොටස් මුදා ගෙන ඒ සෑම ක්ෂේත්‍රයක්ම මැදි කාලීනව හා දිගු කාලීනව ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම. මා මිත්‍ර හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන උපුල් ගලප්පත්ති වෛද්‍යතුමා කිව්වා, මිනිසුන්ගේ ආර්ථිකය කඩා වැටීම පිළිබඳව, මිනිසුන්ගේ දේපළ බැංකුවලට සින්න වුණු එක පිළිබඳව. ඒ සියලුදෙනා නැවත යථාවත් කිරීමේ වැඩසටහන මේ ආර්ථික පරිවර්තන පනත තුළ තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ තුළින් රටේ ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් අපි බලාපොරොත්තු වෙනවා. අද වනකොට අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 3යි. ආර්ථික පරිවර්තන පනත තුළින් එය සියයට 7ක්, 8ක් දක්වා ඉහළට ගෙන යන්න අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අපනයන ඩොලර් බිලියන 11යි. අවුරුදු 20ක් එකම ඉලක්කය තිබෙන්නේ. ලෝකයේ අනෙක් රටවල් ගත්තොත්, අපනයනය සියයට 300කින්, 400කින්, 500කින් පමණ වැඩි වෙලා තිබෙනවා. වියට්නාමය, බංග්ලාදේශය ආදි රටවල් ගත්තොත්, 2010 වසරේ තිබුණු අපනයන ඉලක්කවලට සාපේක්ෂව අද වන කොට එහි ශීඝ්‍ර ඉහළ යෑමක් සිදු වෙලා තිබෙනවා. අපේ ඉලක්කය තමයි අපේ අපනයනය අඩු ගණනේ ඩොලර් බිලියන 20 දක්වාවත් වැඩි කර ගැනීම. හැබැයි අපට සිදු වෙනවා, ඒ සඳහා අවුරුද්දකට ඩොලර් බිලියන 3කවත් විදේශ ආයෝජන ගෙන එන්න. එය විතරක් නොවෙයි, සම්මත කර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත මේ පනත තුළින් වන වාසිය. කිසිදාක මෙවැනි ආර්ථික අර්බුදයකට නොයෑම සඳහා වන වැඩ පිළිවෙළක් ද මේ පනත තුළ අඩංගු කර තිබෙනවා. පනත ක්‍රියාත්මක කිරීමට අදාළ මාර්ග සිතියමක් - road map එකක් - හදලා තිබෙනවා. ඒ වාගේම යා යුතු වේගය ආදි සියල්ල මේ පනතේ සඳහන් කර තිබෙනවා. වළවල්වල වැටෙන්නේ නැතිව, නැවත පරණ තීන්දු, අනවශ්‍ය තීන්දු ගන්නේ නැතිව, බංකොලොත් වන තීන්දු ගන්නේ නැතිව, ඉලක්කයක් කරා යන වැඩසටහනක් මේ තුළ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංඛ්‍යාත්මක වශයෙන් ගත්තොත්, රජය මේ පනත තුළින් ඉලක්ක 20කට යන්න බලාපොරොත්තු වෙනවා. ඒවා අතරින් කිහිපයක් තමයි, අපේ දළ දේශීය නිෂ්පාදනය වැඩි කර ගැනීම, සේවා වියුක්තිය අඩු මට්ටමක තබා ගැනීම මෙන්ම කාන්තාවන් ශ්‍රම බලකායට සහභාගි කරවා ගැනීම. ලංකාව ගත්තොත්, අද ශ්‍රම බලකායට කාන්තාවන්ගේ දායකත්වය සියයට 30යි. ලෝකයේ අනෙක් රටවල සියයට 70යි, සියයට 80යි. ඒ නිසා මේ හරහා එම අගය ද වැඩි කර ගන්න බලාපොරොත්තු වෙනවා. තවත් ඉලක්කයක් තමයි, ගෙවීම් ශේෂයෙහි ජංගම ගිණුමේ හිඟය සියයට එකකට වඩා අඩුවෙන් තබා ගැනීම.

අපේ අපනයන දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 15යි; 20යි. එය 2025 වර්ෂය වනකොට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 25ක්, 2030 වර්ෂය වනකොට සියයට 40ක්, 2040 වර්ෂය වන කොට සියයට 60ක් දක්වා ගෙන යෑම තමයි අපේ ඉලක්කය. උදාහරණයක් වශයෙන් සිංගප්පූරුව ගත්තොත්, සිංගප්පූරුවේ එම අගය සියයට 80ක්, 90ක් වනවා. අපිත් ඒ සියලු අගයන් වැඩි කර ගන්න අවශ්‍ය සැලසුම් මේකේ හදලා තිබෙනවා.

දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ශුද්ධ ඍජු විදේශ ආයෝජන සියයට 5 දක්වාවත් ගෙන එන්න මේ වැඩසටහන තුළින් බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, අයවැයේ ප්‍රාථමික ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2 දක්වා ගෙන එන්නත් බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම දිළිඳුකම ගත්තොත්, අද දරිද්‍රතා අනුපාතය සියයට 40යි. එය 2027 වනකොට සියයට 15කට සහ 2035 වනකොට සියයට 10කට අඩු කරන ඉලක්ක මේ පනත තුළ සඳහන්ව තිබෙනවා.

අද අප ඉන්නේ ලෝකයේ මැදි ආදායම් ලබන රටක් හැටියට. මේ වැඩසටහන තුළින් අපි බලාපොොරොත්තු වෙනවා, අපේ රට ලෝකයේ ඉහළ ආදායම් ලබන රටක් බවට පත් කරන්න. ඒ කියන්නේ, ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 13,000 දක්වා වැඩි කරන්න. ඒක පුද්ගල ආදායම අතින් අද අප ඉන්නේ ඇමෙරිකානු ඩොලර් 3,000 මට්ටමේයි. එය ඩොලර් 13,000 දක්වාවත් ගෙන යන්න අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියල්ල නියාමනය කිරීම සඳහා ප්‍රධාන ආයතන 5ක් හැදෙනවා. ඒවා තමයි, ආර්ථික කොමිසම, ආයෝජන කලාප මණ්ඩලය, ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රවර්ධනය සඳහා වන සුවිශේෂ වූ ආයතනය, ජාතික ඵලදායිතා කොමිසම සහ මේ කාර්යයන් පිළිබඳ නිරතුරුව සොයා බලා රජයට උපදෙස් ලබා දීම සඳහා වන ආයතනය. මේ පනත තුළින් එකී ආයතන හැදෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒකයි කිව්වේ, මේ පනත අපේ රටේ ආර්ථික දිශානතිය තීරණය කරන පනතක් කියලා. අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා අපි ඉලක්කගත දැවැන්ත වැඩසටහනක් සැලසුම් කරලා තිබෙනවා. ඒ ඉලක්ක කරා යන්නේ කොහොමද කියා මෙහි සඳහන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, පසුගිය අවුරුදු දෙකේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව අපේ රටේ රාජ්‍ය ආදායම තිබුණේ සියයට 5ක වාගේ අඩු ගණනක බව. හැබැයි, ලෝකයේ අනෙක් රටවල් ගත්තාම සියයට 15කට එහා ගිය ආර්ථික වර්ධන වේගයක් තිබුණා. නමුත්, ඒ සියල්ල කඩා වැටුණා. මම හැම වෙලාවේම විශ්වාස කරන දෙයක් තමයි, අපේ රටේ රාජ්‍ය ආදායමෙන් අප ලබා ගන්නේ තුනෙන් එකයි කියන එක. තුනෙන් දෙකක් යන්නේ අත යට. අපේ රටේ ආදායම් උත්පාදනය කරන ප්‍රධාන ආයතන වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතනවලින් රජයට ලැබිය යුතු ආදායමෙන් තුනෙන් එකයි අප ලබා ගන්නේ. අනෙක් සියල්ල අත යට යනවා. ඒ සියල්ල වෙනස් කිරීම සඳහා අවශ්‍ය නීති රීති මේ පනත තුළ හදලා තිබෙනවා. ඒ වාගේම, දේශීය ආදායම් පනත මේ වන කොට සම්පූර්ණයෙන් සංශෝධනයට ලක් කරමින් පවතිනවා. ඒ පනත වාගේම, රේගු ආඥා පනත ආදියෙහි තිබෙන රිංගා යා හැකි තැන් සියල්ල වහලා, රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා වන සැලසුම් හදලා තිබෙනවා.

ආර්ථික වර්ධනයක් සිදු වෙමින් යන වෙලාවක, මෙවැනි පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන වෙලාවක මේ පාර්ලිමේන්තුවේ හැම කෙනෙකු වාගේම, රටේ ජනතාව සියලුදෙනා එකතු වෙලා ගත යුතු තීරණයක් තිබෙනවා. ඒ තමයි, මේ නිවැරැදි දිශානතිය ඔස්සේ ආර්ථිකය හරියාකාරව ගෙන යන්න පුළුවන් කෙනෙකුට මේ රට භාර දීම. එහෙම කරනවාද, එහෙම නැත්නම් අප නැවත තෙල් පෝලිම් තිබුණු කාලයට යනවාද?

"අද මහ පොළොවේ ඉන්න නායකයා සජිත් ප්‍රේමදාස මහත්මයා, එතුමාට තමයි අද මේ රටේ මිනිස්සු ඉන්නේ" කියලා තමුන්නාන්සේලාගේ විපක්ෂ නායකතුමා ගැන විපක්ෂය නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීතුමා කියනවා මම අහගෙන හිටියා; එතුමාට තමයි අද මේ රටේ මිනිස්සු ඉන්නේ කියලා කිව්වා. ඉතින් මහ පොළොවේ ඉන්න නායකයා එතුමා නම්, එතුමාට නම් මිනිස්සු ඉන්නේ, එතුමාට මේ රටේ මිනිස්සුන්ට වැඩ කරන්න ඕනෑ නම්, එදා එතුමාට බන්දේසියේ තියලා අගමැතිකම, ජනාධිපතිකම දෙනකොට ගන්න තිබුණා නේ. බන්දේසියේ තියලා දුන්නේ. බන්දේසියේ තියලා දුන්නු අගමැතිකම, ජනාධිපතිකම ගන්න බැරි එතුමා බලාපොරොත්තු වෙනවා ඡන්දයෙන් ගිහින් ඒක ලබා ගන්න. එතුමාට කොන්දක් තිබුණේ නැහැ රට වැටුණු වෙලාවේ මේ රට බාර ගන්න. ආර්ථිකය කඩා වැටුණු වෙලාවේ ඒ වගකීම බාර ගන්න එතුමාට ශක්තියක් තිබුණේ නැහැ. එතුමාට ඒකට භයක් ඇති වුණා. එතුමා හිතුවා ඒ වෙලාවේ බාර ගත්තොත් දේශපාලන වශයෙන් එතුමා විනාශ වෙයි කියලා. ඒ වෙලාවේ එතුමාගේ නොහැකියාව පෙන්නුම් කරයි කියලා එතුමාට භයක් තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, ජාතික ජන බලවේගයේ අනුර කුමාර දිසානායක මහත්තයාටත් මේ රට බාර ගන්නා ලෙස එදා ආරාධනා කළා. එතුමාත් ඒ වගකීම බාර ගත්තේ නැහැ. ඇයි? එතුමා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග ඇමති හැටියට අවුරුදු එකහමාරක් ඉඳලා අසමත් වුණා. ඒ නිසා එතුමා දන්නවා, ඒ ආර්ථික අර්බුදය හමුවේ රට භාර ගත්තා නම් එතුමාට මෙතැනට එන්න බැහැ කියලා.

අපේ රට ඉතිහාසයේ කිසිම දවසක මුහුණ නොදුන් ආර්ථික අර්බුදයකට මුහුණ දුන්නා. අපි ඒක පිළිගන්න ඕනෑ. ඒ වෙලාවේ සමහරු අපේ රට අත හැරලා ගියා. මේ රටේ මිනිස්සු පෝලිම්වලදි මැරුණා. සංචාරකයෙක් අපේ රටට ආවේ නැහැ. එවැනි බරපතළ ආර්ථික කඩා වැටීමකට පත් වෙලා තිබුණු රටක්, මේක. රට ගැන විශ්වාසයක් නැති වෙලා රටේ මිනිස්සු බැහැර යන වෙලාවක, අවුරුද්දක් වාගේ කෙටි කාලයක් තුළ මේ ආර්ථිකය ශක්තිමත් කරන්න මේ රජයට හැකියාව ලැබුණා. ඒ සඳහා ගත්ත තීරණ දේශපාලන වශයෙන් අවාසි වෙන්න පුළුවන්, ඒක මහ පොළොවේදී අවාසි වෙන්න පුළුවන්. හැබැයි රට වෙනුවෙන් ගත යුතු ඒ තීරණ ගත්තා. ඒ ගත යුතු තීරණ ගත්ත නිසා වසරක කාලයක් අමාරු වුණත් අද වෙනකොට ඒ තත්ත්වය වෙනස් කරමින්, ජනතාවගේ ආර්ථිකය නැවතත් සුබවාදී තත්ත්වයකට පත් කරමින් යනවා. අද තෙල් පෝලිම් නැහැ, ගෑස් පෝලිම් නැහැ, විදුලිය කප්පාදු කිරීමක් නැහැ, භාණ්ඩ මිල දැඩි ලෙස ඉහළ ගිහින් නැහැ. අද මිනිස්සුන්ට ජීවත් වීමේ හැකියාව ලැබිලා තිබෙනවා. එදා අපි දිළිඳු පවුලක් සඳහා දුන්නේ රුපියල් 3,000ක සහනාධාරයක්. අද වෙනකොට දිළිඳු පවුලක් සඳහා රුපියල් 15,000, 8,500 සහ 5,000 බැගින් දෙනවා. අද පවුල් 16,882කට "අස්වැසුම" සහනාධාරය ලබා දෙනවා, තවත් 400,000කට පමණ එය ලබා දෙන්න කටයුතු කරගෙන යනවා. රාජ්‍ය සේවකයන්ට රුපියල් 10,000ක වැටුප් වැඩි කිරීමක් කළා. ඒ විතරක් නොවෙයි, අපි අද දැවැන්ත වෙනසක් වෙනුවෙන් කටයුතු කරමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කලින් එය රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යන්න ඕනෑ කියලා අපේ රටේ නීතියක් තිබෙනවා. මම කනගාටු වෙනවා, ඒ වාගේම ලජ්ජා වෙනවා මේ පනත් කෙටුම්පත මුදල් කාරක සභාවට ඉදිරිපත් කරකොට විපක්ෂය ඒක වර්ජනය කළා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා, -මගේ මිත්‍රයා- ඒ කමිටුවට ඇවිල්ලා ඒ පනත් කෙටුම්පතට පක්ෂව ඉන්නේ නැහැ කියලා නැඟිටලා ගියා. රටේ ආර්ථිකය සුබවාදී මාවතකට ගෙන යන, මේ රටේ ආර්ථිකය හරි දිශානතියකට ගෙන යන මේ වාගේ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන වෙලාවේ තමුන්නාන්සේලා ඒකට විරුද්ධ වෙලා, ඒක මග හැරියා. මේක තමයි අපේ රටට හැම දාම වුණේ.

එදා අවුරුදු 30ක යුද්ධයක් අවසන් කළ වෙලාවේ මේ රට හරි මාවතකට ගෙන යන්න පුළුවන්කම තිබුණා. නමුත්, එදා විපක්ෂයේ ක්‍රියා කලාපය අපට මතකයි. ඒ වාගේම, කොවිඩ් වසංගතය අවස්ථාවේ, මේ රට බරපතළ අර්බුදයකට ගිය වෙලාවේ තමුන්නාන්සේලා හැසිරුණු ආකාරයත් අපට මතකයි. පාර්ලිමේන්තුවේ අපි ප්‍රතිපත්ති සම්පාදකයෝ හැටියට කළ

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

යුත්තේ රටේ දේශපාලන න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කිරීම නොවෙයි. රටට හොඳ දෙයක් වෙනවා නම් ආණ්ඩුවද, විපක්ෂයද කියන එක නොසලකා අපි ඔක්කෝම එකට ඉඳලා ඒ තීන්දු ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඓතිහාසික පනතක්. අපි දැක්කා, පසුගිය අවුරුදු දෙකක කාලය තුළ මේ රටට ඉතාම වැදගත් අණපනත් ගණනාවක් මේ පාර්ලිමේන්තුවට රජය විසින් ඉදිරිපත් කළ බව. මේකත් ඉතාම හොඳ පනතක්. මේ කියන කාල සටහන් බලලා, මේ පනත හරියාකාරව ක්‍රියාත්මක කළොත් අනිවාර්යයෙන්ම අපට වැඩි ආදායම් ලබන, ලෝකයේ දියුණු රටක් කියන ඉලක්කයට යන්න පුළුවන්. ඒ සඳහා අපි සියලුදෙනා එකට කටයුතු කරමු කියන යෝජනාව කරමින්, මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Selvarajah Kajendren. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (වෛද්‍ය කලානිති) රමේෂ් පතිරණ - කෛත්තොළිල් අමෛච්චරුම් සුකාතාර අමෛච්චරුම්)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Industries and Minister of Health)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විදුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

අනතුරුව ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය.
අතන්පිරගු, මාණ්පුමිකු (මේජර්) සුතර්ෂන තෙනිපිටිය අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු ජගත් සමරවික්‍රම අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.
Whereupon THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA left the Chair and THE HON. JAGATH SAMARAWICKRAMA took the Chair.

[පි.ප. 4.23]

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(මාණ්පුමිකු සෙල්වරාසා කජේන්දිරන්)
(The Hon. Selvarajah Kajendren)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, இன்றையதினம் இச்சபையில் பகிரங்க நிதிசார் முகாமைத்துவம் சட்டமூலம், பொருளாதார நிலைமாற்றம் சட்டமூலம் என்பன தொடர்பான විවාදம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. குறிப்பாக, பொருளாதார நிலைமாற்றம் சட்ட மூலம் தொடர்பாக இங்கு காரசாரமான வாதப் பிரதிவாதங்கள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. ஏனென்றால், IMFඉன් නිපදනෙකලෙ අප්පඩියේ සට්ටමාක මාත්‍රුකින්‍රන නෝක්කත්තෝටු, இந்தச் சட்டமூலம் சமர்ப்பிக்கப்பட்டு இருக் கின்றது. இந்தச் சட்டமூலத்துக்கு எதிராக கடுமையான விமர்சனங்களை எதிர்த்தரப்பினர் முன்வைத்து வருகின்றார் கள்.

நாட்டின் பொருளாதாரத்தை முன்னேற்றுவதுதான் இந்தச் சட்டமூலம் கொண்டுவரப்பட்டுள்ளதன் பிரதான நோக்கமாக இருக்கின்றது. இந்த நாடு பொருளாதார ரீதியாக வங்குரோத்து நிலையை அடைந்திருக்கின்றது. இந்த நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு புதிய சட்டத் திருத்தங்கள் தேவை என்பதில் மாற்றுக் கருத்து இல்லை. எனினும், இங்கு முன்வைக்கப் பட்டு இருக்கின்ற இந்தச் சட்டமூலத்தால் மாத்திரம் இந்த நாட்டின் பொருளாதாரத்தை முன்னேற்ற முடியுமா? என ஆழமாகச் சிந்தித்துப் பார்க்க வேண்டும். இந்த நாடு சுதந்திரமடைந்து 75 வருடங்கள் கடந்துள்ள நிலையிலும் பொருளாதார ரீதியாக முன்னேற முடியாமல் திணறிக்கொண்டு இருக்கின்றது. எமது நாடானது 17ஆவது தடவையாக IMFඉடம் சென்றிருப்பதாக நீங்களே கூறுகின்றீர்கள். இந்த நாடு IMF இடம் 16 தடவை சென்றும் பொருளாதாரத்தில் முன்னேற முடியாத நிலையில், 17ஆவது தடவையாகவும் அதனிடம் செல்ல வேண்டி ஏற்பட்டிருக்கின்றது. இதற்கு என்ன காரணம் என்பதை நீங்கள் இதுவரை சரியான முறையில் தேடிப் பார்க்கவில்லை என்பது மிகவும் கவலைக்குரிய விடய மாகும்.

இந்த அவையில் மூத்த அரசியல் தலைவர்கள் பலர் இருக்கிறார்கள். அவர்கள் ஆளுந்தரப்பிலும் இருக்கிறார் கள்; எதிர்த்தரப்பிலும் இருக்கிறார்கள். யாராவது துணிச்சலாக ஆக்கபூர்வமான யோசனைகளை இங்கு முன்வைக்கிறார்களா என நானும் இந்த விவாதம் ஆரம்பித்ததிலிருந்து அவதானித்துக்கொண்டு இருக்கின் றேன். ஆனாலும், யாரும் அவ்வாறு ஆக்கபூர்வமான யோசனைகளை முன்வைக்கவில்லை. என்னைப் பொறுத்த வரையில், இந்த நாடு முன்னேற வேண்டுமாகவிருந்தால், பொருளாதார நிலைமாற்றமொன்று தேவை. அவ்வாறான தொரு சட்டமூலத்தை உருவாக்குவதற்கு அரசாங்கத்துக்கு மக்கள் ஆணை தேவை. மக்கள் ஆணையுள்ள அரசாங்கம் ஒன்றினால்தான் அவ்வாறானதொரு சட்டமூலத்தை நிறை வேற்ற முடியும். அத்துடன், சிறந்ததொரு தேசியக் கொள்கை யும் தேவை. பொருளாதார நிலைமாற்றம் தொடர்பான சட்டமூலம் உருவாக்கப்படுவதற்கு முன்னர், இந்த நாட்டில் 75 வருடங்களாக இருக்கின்ற தேசியக் கொள்கையில் மாற்றம் வேண்டும். அதாவது, இந்தத் தீவு புத்தபிரானால் அருளப்பட்ட தீவு என்கின்ற மகாவம்ச புனைகதையில் இருந்துகொண்டு உருவாக்கப்பட்டிருக்கின்ற, இந்த நாட்டிலுள்ள ஏனைய இனங்களையும் மதங்களையும் இல்லாதொழித்து இதை ஒரு சிங்கள பௌத்த தீவாக மாற்ற வேண்டுமென்ற அந்த தேசியக் கொள்கை ஒழிக்கப்பட வேண்டும். அந்த வகையில், மதச் சார்பற்ற தேசமாக இதைக் கட்டியெழுப்பக்கூடிய வகையில் நிலையானதொரு கொள்கை மாற்றம் செய்யப்பட வேண்டும். அதற்கு தற்பொழுது இருக்கின்ற ஒற்றையாட்சி முறைமை ஒழிக்கப்பட வேண்டும்.

இந்த தீவில் 2,000 வருடங்களுக்கும் மேலாக வாழுகின்ற தமிழ் தேசத்தின் இறைமையையும் சுயநிர்ணய உரிமையையும் அங்கீகரிக்கின்ற வகையில், ஒரு சமஷ்டி அரசியலமைப்பைக் கொண்டுவருவதற்கு நீங்கள் முயல வேண்டும். அதற்குப்

பிற்பாடு, நீங்கள் மேற்கொள்கின்ற திருத்தங்கள்தான் இந்த நாட்டை முன்னோக்கிக்கொண்டு செல்வதற்கு உதவியாக இருக்கும். ஆகவே, உங்களுடைய தேசியக் கொள்கையான இனவாதக் கொள்கையைக் கைவிட்டு, மதவாதம், இனவாதமற்ற ஒரு கொள்கையை உருவாக்குங்கள்! அதற்கு நீங்கள் முதலில் ஒற்றையாட்சி முறைமையை ஒழிக்க வேண்டும். அப்படிச் செய்தால் மட்டும்தான் உங்களால் இந்த நாட்டைக் கட்டியெழுப்ப முடியும். மாறாக, இந்தத் தீவை மையப்படுத்தி நடைபெறுகின்ற பூகோள ஆதிக்கப் போட்டியில் வலிமைமிக்க சக்திகளுக்கு எடுபிடியாக இருந்துகொண்டு எவ்வாறான சட்டத் திருத்தங்களை நீங்கள் கொண்டு வந்தாலும், உங்களால் ஒருபோதும் இந்த நாட்டைக் கட்டி யெழுப்ப முடியாது என்பதை நான் இந்த இடத்தில் ஆணித்தரமாகப் பதிவு செய்கின்றேன். அந்த அடிப்படையில், இன்று கொண்டுவரப்பட்டு இருக்கின்ற பொருளாதார நிலைமாற்றம் சட்டமூலத்துக்கு தமிழ்த் தேசிய மக்கள் முன்னணியினராகிய எங்களால் ஆதரவு வழங்க முடியாது என்பதை இந்த இடத்தில் கூறிக்கொண்டு, இன்னுமொரு விடயத்தைப் பதிவுசெய்ய விரும்புகின்றேன்.

2022ஆம் ஆண்டுக்குப் பின்னர், பொருளாதார முன்னேற்றம் என்ற பெயரில் எங்களுடைய வடக்கு, கிழக்கின் பொருளாதாரம் அழிக்கப்படுகின்றதே தவிர, முன்னேற்றப்பட வில்லை. குறிப்பாக, கடல்சார் பொருளாதாரம் திட்டமிட்டு அழிக்கப்படுகின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
நான் முடிக்கிறேன்.

கடற்கரையோரங்கள் அந்நிய சக்திகளுக்கு விற்கப்படு கின்றன. இதனால் உள்நாட்டு உற்பத்தியாளர்கள் மோசமாகப் பாதிக்கப்படுகின்றார்கள். கனகராயன்குளம், பெரியகுளம் வடக்குப் பகுதியைச் சேர்ந்த ஆறுமுகன் தர்மரூபன் என்பவர் உள்நாட்டு சிறு முதலீட்டாளர் ஆவார். அவருடைய தந்தை 1984ஆம் ஆண்டிலிருந்து செங்கல் உற்பத்தி செய்து வந்தார். போர் காரணமாக அந்த உற்பத்தி சிறிது காலம் இடைநிறுத்தப்பட்டது. போர் முடிந்த பிற்பாடு, 2010இல் அவர் மீண்டும் அந்த உற்பத்தியை ஆரம்பிக்க முற்பட்டார். எனினும், அந்தப் பகுதியில் இராணுவ முகாம் அமைக்கப்பட்டிருந்ததன் காரணமாக அவரால் அதனை ஆரம்பிக்க முடியவில்லை. அங்கு அமைக்கப்பட்டிருந்த இராணுவ முகாம் அகற்றப்பட்ட தன் பிற்பாடு, அவர் மீண்டும் 2022ஆம் ஆண்டில் தன்னுடைய உற்பத்தியை ஆரம்பித்து செய்து கொண்டிருந்தார். இந்நிலை யில், கடந்த மே மாதம் 26ஆம் திகதி அங்கு சென்ற வனப் பாதுகாப்புத் திணைக்களத்தினர், அது தங்களுக்குரிய இட மெனக் கூறி, அங்கிருந்த அனைத்து உற்பத்தி சாதனங்களை யும் எடுத்ததுடன், அங்கு உற்பத்தி நடவடிக்கையில் ஈடுபட்டுக் கொண்டு இருந்தவர்களையும் கைதுசெய்திருக்கிறார்கள். இவ்வாறு அவருடைய முதலீட்டை முற்றாக அழித்திருக்கிறார் கள். இதுதான் உங்களுடைய அரசு தமிழ் தேசத்தில் கையாளுகின்ற அணுகுமுறையாக இருக்கின்றது. இவ்வாறு பாதிக்கப்படுகின்றவர்களுக்கு நிவாரணம் வழங்கப்பட வேண் டும் என்றும் எங்களுடைய மக்களுக்கு நம்பிக்கை தரக்கூடிய அணுகுமுறைகளை நீங்கள் கடைபிடிக்க வேண்டும் என்றும் கேட்டு, வாய்ப்புக்கு நன்றி கூறி விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.30]

ගරු වීරසුමන වීරසිංහ මහතා
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමාට කලින් ආණ්ඩු පක්ෂයෙන් කථා කළ හඬක් ඇහුණා. මීට මාස ගණනාවකට, අවුරුදු ගණනාවකට කලින්, රනිල් වික්‍රමසිංහ හිරේ යවනකල් නින්ද නොගිය මහත්මයෙක් රනිල් වික්‍රමසිංහ හිරේ දැම්මාට පස්සෙයි නින්ද යන්නේ කියපු මහත්මයෙක් අද කථා කරපු හැටි දැක්කාම, එතුමා කථා කරන්නේ කටින්ද, මොකෙන්ද කියලා හිතාගන්න බැරිව ගියා. ඒ, මේ රටේ දේශපාලනය වෙනස් වෙච්ච දිශානතිය. නමුත්, අපට එහෙම වෙනස් වෙන්න බැරි නිසා, ආර්ථික පරිවර්තන පන්ත අපේ ගැලවීමේ මහ කියලා හිතාගෙන මේ පනතට පක්ෂව කථා කරන, අත ඔසවන මහත්වරුන්ට මේ කාරණා ටික මම කියනවා. මේ ආර්ථික අර්බුදයේ නිර්මාතෘවරුන් තමයි රනිල් වික්‍රමසිංහ ලා. ගෝඨාභය මහත්මයා අතේ මේ බෝම්බය පිපිරුවාට රනිල් වික්‍රමසිංහලා තමයි මේ ආර්ථික අර්බුදයේ නිර්මාතෘවරුන් වෙන්නේ. අවුරුදු 46ක් විවෘත ආර්ථිකය තුළ ගෙන ගිය ගමනේ විනාශය තමයි මේ. කවුරු හරි හිතනවා නම් රනිල් වික්‍රමසිංහ මහත්මයා මේක විසඳනවා කියලා, කරුණාකරලා ඒ මහත්වරු ඔළුව අත ගාලා බලන්න අං ඇවිල්ලා ද කියලා. රනිල් වික්‍රමසිංහ කළ මේ විනාශයෙන් එතුමාම අපිව ගලවා ගන්නවා කියලා හිතනවා නම්, අං ආපු කෙනෙකුට තමයි එහෙම දෙයක් විශ්වාස කරන්න පුළුවන්කම තිබෙන්නේ.

අනෙක් පැත්තෙන් බැලුවාම, දැන් මේ පනත ගෙනෙන්නේ මොකටද? මේ රට හදන්නද? නැහැ. මාස 24ක් තටමලා, තටමලා, තටමලා මේ රටේ තිබෙන රාජ්‍ය ආයතන ටික විකුණන්න ලැයිස්තුගත කරලා, -ආයතන 400ක් ලැයිස්තුගත කරලා- ඒකෙනුත් ඉහළින්ම තිබෙන ලාභ ලබන ආයතන ටික, රටට අත්‍යවශ්‍ය ආයතන ටික කුණුකොල්ලයට ගජ මීතුරන්ට දෙන්න සියලු සැලසුම් හදලා, ඒකේ තක්සේරුව -තමන්ගේ කොමිස් කුට්ටිය- ඒ සියල්ල තීන්දු කරලා, ඒක දීගන්න තමයි මේ පනත කඩිමුඩියේ සම්මත කරන්න හදන්නේ. මේ පනත තුළින් හැදෙන්නේ මොකක්ද? මෙතෙක් කාලයක් මේ රටේ වෙනමම, ස්වාධීනව තිබුණු රාජ්‍ය ආයතන ගණනාවක් දහදෙනෙක් එකතු වෙච්ච කණ්ඩායමක කොමිෂන් සභාවකින් එක පැන් පහරින් ඕනෑ හැටියට විකුණන්න තීන්දු කරන්න පුළුවන්, ප්‍රතිසංස්කරණ කියන මුවාවෙන්. ඒ දසදෙනාගෙන් හතර දෙනෙක් රජයේ නිල බලයෙන් පත් වුණාට හයදෙනෙක් පත් වෙන්නේ ජනාධිපතිවරයාගේ පත් කිරීමෙන්. එහි ගණපූරණය සාමාජිකයන් 5දෙනෙක් විය යුතුයි. ජනාධිපතිවරයාගේ හයෙන් පහක් වාඩි වෙලා ඕනෑ තීන්දුවක් ගන්න පුළුවන් පනතකට තමයි තව ටිකකින් පොහොට්ටුවේ මහත්වරු ටික අත ඔසවන්නේ. සෞභාග්‍යයේ දැක්මේ කොටස්කරුවන් විධියට ආපු මහත්වරු "යළි පුබුදමු ශ්‍රී ලංකා" වැඩ පිළිවෙළ නැවත ගෙනෙන්න, රනිල් වික්‍රමසිංහට බැරි වෙච්ච ටික කරන්න තමයි තව ටිකකින් මේ පනත් කෙටුම්පතට අත ඔසවලා සම්මත කරන්නේ. මහින්ද රාජපක්ෂ මහත්මයා පිළිබඳව තවමත් අප තුළ යම් ප්‍රමාණයක ගෞරවයක්, ආදරයක් තිබෙනවා. එතුමා පසුගිය දවසක "ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මතය" කියලා ලිපියක් ඉදිරිපත් කළා, මේ රාජ්‍ය ආයතන විකුණන එක සම්බන්ධව. එහෙම ලිපි ලියපු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරුන්ගෙන්, ඇමතිවරුන්ගෙන් අහනවා, රෙද්දක් ඇඳගෙන මේ පනත් කෙටුම්පතට අත ඔසවන්න පුළුවන්ද කියලා.

[ගරු වීරසුමන වීරසිංහ මහතා]

මොනවාද මේ විකුණන්න හදන ආයතන ටික? එකක් තමයි, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය. මට ලැබී තිබෙන වෙලාව සීමිත නිසා මම කරුණු එකින් එක කියන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් තිබෙන ලිපිය මේ අවස්ථාවේ මම **සභාගත*** කරනවා.

ඒ ආයතනයේ තිබෙන වැදගත්කම කුමක්ද? එය, මේ රටේ ජාතික ආරක්ෂාවට අතිමහත් සේවාවක් කරන ආයතනයක්. දැනට අපට තිබෙන්නේ ටෙලිකොම් ආයතනයෙන් සියයට 50.4ක ප්‍රමාණයක් විතරයි. මේක පසුගිය අවුරුදු 10ම ලාභ ලබපු ආයතනයක්. ලංකාවේ ඉහළම ලාභ ලබන ආයතන හතෙන් එකක්. ඒ වාගේම හැම අවුරුද්දකම රජයේ මහා භාණ්ඩාගාරයට විශාල මුදලක් බදු සහ ලාභ විධියට ලබා දුන් ආයතනයක්. වාර්ෂික මුදල් නුවමාරුව රුපියල් බිලියන 107ක් බවට පත් වෙච්ච, ස්ථාවර තැන්පතු රුපියල් බිලියන 12.5ක් තිබෙන, වාර්ෂිකව භාණ්ඩාගාරයට රුපියල් බිලියන 27ක ගෙවීමක් සිදු කරන ආයතනයක් කුණුකොල්ලයට විකුණන්න තීන්දු කරලා. එහෙම තීන්දු කරලා, ඒ තීන්දුව ක්‍රියාත්මක කරන්න stamp එක, එහෙම නැත්නම් seal එක ගහන්න තමයි මේ පනත් කෙටුම්පත සම්මත කරලා මේ ආයතනය පිහිටුවන්න හදන්නේ.

අනෙක් ආයතනය තමයි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය. ආයෝජන මණ්ඩලය තුළ තිබෙන යම් යම් දේවල් ප්‍රතිසංස්කරණය විය යුතුයි, ආයෝජකයන්ට හිතකාමී පරිසරයක් නිර්මාණය විය යුතුයි කියලා අපි පිළිගන්නවා. හැබැයි, මේ කරන්න හදන්නේ මොකක්ද? ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත ඇතුළට රිංගවලා කොමිෂන් සභාවේ නිලධාරින්ට ඕනෑ දේ කරන්න පුළුවන් මාර්ගය සකස් කරන එක.

එස්.බී. දිසානායක හිටපු ඇමතිතුමනි, ඔබතුමාට දැනගන්න මම කාරණයක් කියන්නම්. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය භාර සභාපතිවරයා පසුගිය දවස්වල හොර රහසේ මේ ආයෝජන කලාපවලට එක එක ගැනුම්කරුවන් එක්ක ගියා. දිනේෂ් වීරක්කොඩි කියන්නේ කවුද කියලා ඔබතුමන්ලා අපි කවුරුත් දන්නවා නේ. ඔහු ගිහිල්ලා මේ සියල්ල තක්සේරු කරලා, මේවා විකුණන්න අවශ්‍ය සියලු දේ කරලා තිබෙනවා. ආයෝජන මණ්ඩලය කැලි 15කට කඩලා විකුණන්න පුළුවන් පරිසරය තමයි මේ පනත ඇතුළේ හදන්නේ. ආයෝජන මණ්ඩලයේ ආයෝජන කලාප 15න් දෙක තුනක් -බිංගිරිය, එරාවුර්- හැරෙන්න අනෙක් සියල්ල ලාභ ලබන ආයතන. ඒවායේ තව කරන්න දෙයක් ඉතිරි වෙලා නැහැ. ඒ නිසා මේ සියලු දේවල් තක්කඩි විධියට තමයි කරන්න හදන්නේ.

එස්.බී. දිසානායක හිටපු ඇමතිතුමනි, කෘෂිකර්ම ඇමතිතුමනි, මිල්කෝ (පෞද්ගලික) සමාගම අක්කර 28,000ක් සමඟ එක සමාගමකට දෙන්න දැන් සියලු පිඹුරුපත් සකස් කරලා ඉවරයි. මේ පනත තුළ ඒක වේගවත් කරන්න කටයුතු කරනවා. යන යකා කොරහත් බිඳගෙන යනවා වාගේ මේකේ තව කාරණා ගණනාවක් තිබෙනවා.

මෙහෙම දීපු තැන් ගැන කථා කළොත්, පසුගි කාලයේ Indian Oil Company - IOC - එකට පෙට්‍රල් ෂෙඩ් 100ක් දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පෙට්‍රල් ෂෙඩ් ගැන දන්නවා නේ. ඒ පෙට්‍රල් ෂෙඩ් 100 දැන් 257ක් බවට පත්වෙලා තිබෙනවා. IOC එකට පෙට්‍රල් ෂෙඩ් 257ක් තිබෙනවා. පසුගිය අප්‍රේල්, මැයි සහ ජූනි මාස තුනට අදාළ කාර්තුවේ විතරක් IOC එකේ ලාභය රුපියල් බිලියන 3.77යි. දළ වශයෙන් අවුරුද්දකට රුපියල් බිලියන 15ක ලාභයක් ලබනවා. පෙට්‍රල් ෂෙඩ් 357කින් ලැබෙන එම බිලියන 15ක ලාභය ඩොලර් විධියටයි ඔවුන්ගේ රටට යන්නේ. Sinopec එකටත් පෙට්‍රල් ෂෙඩ් 150ක් දීලා තිබෙනවා. ඒ වාගේම RM Parks එකටත් පෙට්‍රල් ෂෙඩ් 150ක් දීලා තිබෙනවා. එම සමාගම්වලට ලැබෙන ආදායමත් ඔවුන්ගේ රටවලටයි යන්නේ. අපට ඒ මුදල් රඳවා ගන්න ක්‍රමයක් නැහැ. දැන් ඉතිරි පෙට්‍රල් ෂෙඩ් ටිකත් විකුණාගෙන කන්නයි හදන්නේ. මේ පනත ගෙනාවොත් අපේ රටේ නිර්මාණය වූ ලාභ ලබන ආයතන වන ශ්‍රී ලංකා ටෙලිකොම් වෙන්න පුළුවන්, ඉන්ෂුවරන්ස් සමාගම වෙන්න පුළුවන්, මිල්කෝ (පුද්ගලික) සමාගම වෙන්න පුළුවන්, Ceylon Petroleum Corporation එක වෙන්න පුළුවන්, එම සමාගම් රුපියල්වලින් ලබන ආදායම ඩොලර් විධියට තමයි පිට රටවලට යන්නේ. ඒ තක්කඩි පනත තමයි මේ ගෙනෙන්න හදන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ රටේ පවතින අර්බුදයක් ගැන කියනවා. බංකොලොත් බවක් තිබෙනවා. මේ රට බංකොලොත් වුණා නොවෙයි, බංකොලොත් කළා. හරි වෙලාවට ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේ නැතුව, ආර්ථික තීන්දු ගන්නේ නැතුව, නිවැරදි දැක්මක් නැතුව ගිය ගමන් මගේ ප්‍රතිඵලයක් මේක. ඒක නිසා මේ බංකොලොත් කරපු රට ගොඩගන්න විකල්පයක් නැද්ද? එකම බෙහෙත; එකම මන්තරය IMF විතරද? IMF එකත් ආවේ මේ කුමන්ත්‍රණයේ කොටස්කාරයෙක් විධියටයි. IMF ක්‍රමන්ත්‍රණයේ කොටස්කාරයන් විධියට තමයි මහ බැංකු අධිපතිවරයා එන්නේ, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා එන්නේ. කැබිනට් මණ්ඩලයවත් දන්නේ නැතුව මේ රට බංකොලොත් රාජ්‍යයක් කියලා ප්‍රකාශ කරන්නේ, ඒ කුමන්ත්‍රණයේ ප්‍රතිඵලයක් විධියටයි. මේ රට බංකොලොත් රාජ්‍යයක් කියලා ප්‍රකාශ කරන්න ඉස්සෙල්ලා ඒ බව මේ රටේ ජනතා පරමාධිපත්‍යය තිබෙන පාර්ලිමේන්තුව දන්නවාද? මේ හැම කෙනෙක්ම එහි කොටස්කරුවන් බවට පත්වෙලා, මේ රටට බංකොලොත් ලේබලය ගහලා, මේ ආයතන කුණු කොල්ලයට විකුණලා, අපේ රට කොලනියක් බවට පත් කරන ගමන තමයි මේ ඉස්සරහට යන්නේ.

දැන් කියනවා, ආර්ථිකය ගොඩ ගත්තා ලු, තෙල් පෝලිම් නැති ලු, අරවා නැති ලු, මේවා නැති ලු කියලා. ඒවා නැහැ වාගේම, තිබුණු ණය ප්‍රමාණයත් දැන් විශාල ප්‍රමාණයකින් වැඩිවෙලා. පසුගිය මාසයේ 24වන දා වෙනකොට නොගෙවූ ණය කන්දට ඇමෙරිකානු ඩොලර් බිලියන 8යි ගණනක් එකතුවෙලා තිබෙනවා. ඒ වාගේම නොගෙවූ ණය වාරික නිසා ණය ගොඩ තවත් වැඩි වුණා. අනෙක් පැත්තෙන් ගත්තාම තිබෙන ආයතන ටික විකුණාගෙන කන්න මේ වගේ තක්කඩි පනත් ගෙනෙන්න උත්සාහ කරනවා. දැන් මේවාට අපි කළ යුත්තේ මොකක්ද?

මට තිබෙන කාලය කෙටි නිසා මම මේ ටික කරුණු විධියට කියන්නම්. අපට කරන්න ගොඩක් දේවල් තිබෙනවා. IMF එකෙන් එහාට ගිහිල්ලා කරන්න දේවල් තිබෙනවා. අපට රට විධියට දේශීය වශයෙන් කරන්න පුළුවන් කරුණු කිහිපයක් මම කියන්නම්. නිකම් බොරු දේවල් කරන්නේ නැතුව මේ රට තුළ නිෂ්පාදන ආර්ථිකයක් හදන්න, නිෂ්පාදනය වැඩි කරන්න කටයුතු කරන්න. ඒ සඳහා ප්‍රමුඛත්වය දෙන්න, ඒකට උදව් කරන්න. අනෙක් අතින් බැලුවාම, මේ රටේ ඵලදායීතාව, ඒ වාගේම අපනයන විවිධාංගීකරණය, අගය එකතු කිරීම වගේ කාරණා තුළින් අපනයන ආදායම වැඩි කරන්න මැදිහත් වෙන්න. අද ඒවා සියල්ල විනාශ කරමින් යනවා. කෘෂි ආර්ථිකය, වැවිලි ආර්ථිකය ගැන කිසිදු මැදිහත් වීමක් නැහැ. ඒවා විනාශ කරමින් යනවා. අපට

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ලැබෙන මුදල් කන්දරාව, එහෙම නැත්නම් අපට ලැබෙන ඩොලර් ඉපැයීම් ප්‍රමාණය වැඩි කරන්න කිසි මැදිහත් වීමක් නැහැ. අනෙක් අතින් බැලුවාම, ඉතිරි කිරීම් සම්බන්ධයෙනුත් කිසි මැදිහත් වීමක් නැහැ. අද පාසල් දරුවෙක් ඉතිරි කිරීම සඳහා යොමු වන ක්‍රමවේදයක් නැහැ.

පසුගිය කාලයේ අපට කෘෂි ක්ෂේත්‍රයේ වගා අර්බුදයක් ආවා. ආහාරවල ප්‍රශ්නයක් ආවා. මේ වෙනුවෙන් මැදිහත් වීමක් වෙනවාද? ඒ සඳහා කරන්නේ මොනවාද? මාතර නිල්වලා ගඟෙන් පෝෂණය වන කුඹුරු අක්කර 10,000ක් වෙනත් කටයුතුවලට කියලා අත්හරින්න කැබිනට් මණ්ඩලය තීන්දු කරනවා. ඒක නිසා එවැනි තක්කඩි වැඩ කරන්නේ නැතුව වගා සංග්‍රාමයක් සඳහා අවශ්‍ය මැදිහත්වීම් කරන්න. ඒ වාගේම ඩිජිටල් ආර්ථිකය සඳහා වේගයෙන් ගමන් කරන්න. Smart classrooms විවෘත කරලා, smart boards දීලා විතරක් ඕක කරන්න බැහැ. මේ රටේ ආර්ථිකය ඩිජිටල් වෙන්න ඕනෑ. ආර්ථිකය smart වෙන්න නම්, මේ රටේ හැම ක්ෂේත්‍රයක්ම ඒ වෙනුවෙන් වේගයෙන් ගමන් කරන්න ඕනෑ. එතකොට, එක පසෙකින් රාජ්‍ය ආදායම, බදු ආදායම, මේ ගනුදෙනු සියල්ල නිසි ලෙස කළමනාකරණය කරන්න පුළුවන්කම ලැබේවි. ඒ වාගේම මේ රටේ බදු ක්‍රමය සම්බන්ධව නැවත සංගායනාවක් කරන්න; පසුවිපරමක් කරන්න, විධිමත් බදු ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස පුරා මෙතැන විවාදයේ දී කථා නොවුණු, මගේ කථාවේ ප්‍රධානම කාරණය ගැනත් මම කියන්නම්. මෙතැන ජාත්‍යන්තර කාරණාවක් තිබෙනවා. ඒ ජාත්‍යන්තර උගුලේ කොටස්කාරයන් නිසායි මේ අර්බුදය තිබෙන්නේ. අපි පිළිගන්නවා, ගෝලීය දේශපාලනය, භූ දේශපාලනය සහ කලාපීය දේශපාලනය මේ හැම දේකටම බලපාන බව. ඒක නිසා අපි ආණ්ඩුවෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලනවා, මේ ප්‍රශ්නය විසඳන්න නම් රටේ සැබෑ මිතුරා කවුද කියලා හඳුනා ගන්න, අපට උදව් කළ හැකි මිතුරන් කවුද කියලා හඳුනා ගන්න, අපට උදව් කළ මිතුරන් කවුද කියලා හඳුනා ගන්න කියලා. ඒක තුළ විදේශ ප්‍රතිපත්තිය තීන්දු කරන්න. අද ඒ කිසි දෙයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක නිසා මේ භූ දේශපාලනය, විශේෂයෙන්ම geopolitics, geoeconomics අද වෙනස් වෙලා. එදා තිබුණු බටහිර අද නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ පාර්ලිමේන්තුවේ දී වාර ගණනාවක්ම මේ ගැන කියන්න උත්සාහ කළා. නමුත්, ආණ්ඩුව පැත්තෙන්, ඇමතිවරුන්ගේ පැත්තෙන් කවදාවත් ඒවා ගැන අවධානයක් යොමු කළේ නැහැ. අද ලෝකය වෙනස් වෙලා. නැහෙනහිර සහ බටහිර විධියට නොවෙයි, අද ගෝලීය උතුර සහ ගෝලීය දකුණ විධියට රටවල් බෙදිලා තිබෙන්නේ. අද ගෝලීය දකුණ - Global South - ශක්තිමත් වෙමින් පවතිනවා. අද ආසියාව ලෝකයේ දියුණු වෙමින් පවතින කලාපය බවට පත් වෙලා. ඒ වාගේම අද අප්‍රිකාවත් ලෝකයේ වේගයෙන් දියුණු වන කලාපයක් බවට පත් වෙලා. අද මේවා ගැන කිසිම තැකීමක් නැතුව පරණ වලව් පස්සේම වලව් හාමුලා යනවා. ඒ වලව් හාමුලාගේ පිටුපස වහල්ලු ටිකත් යන එක තමයි අද සිදු වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ හැසිරීමේ වෙනස් වීම ගැන අපි කල්පනා කරන්න ඕනෑ. අද වනකොට ඩොලර් කියන මුදල් ඒකකය තවදුරටත් ලෝකයේ භාවිත වන ප්‍රධාන මුදල් ඒකකය නොවෙයි. ලෝකයේ සෑම රටක්ම දැන් තීන්දු කරලා තිබෙනවා, ඩොලර් කියන මුදල් ඒකකයෙන් අයින් වෙන්න. අද විකල්ප මුදල් ඒකක ගැන කල්පනා කරමින් සිටිනවා. ලෝකයේ දැන් තිබෙන්නේ World Bank එක, IMF එක කියන ප්‍රධාන මූල්‍ය ආයතන විතරක් නොවෙයි. ලෝකයේ දැන් අලුත් බැංකු පද්ධතියක් නිර්මාණය වෙමින් තිබෙනවා. දැන් තිබෙන එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු අනෙකුත් සංවිධාන පමණක් නොවෙයි තවදුරටත් ලෝකයේ තිබෙන්නේ. අලුත් ආර්ථික, දේශපාලන සංවිධාන ලෝකයේ ගොඩනැඟෙමින් තිබෙනවා. අද ලෝකයේ බලවත්ම සංවිධානයක් තමයි, BRICS කියන සංවිධානය. ඒකේ කොටස්කාරයන් බවට අපි පත් වෙන්නේ කොහොමද? BRI යනුවෙන් හඳුන්වන සේද මාවතේ නව ව්‍යාපෘතියේ සෘජු කොටස්කරුවන් බවට පත් වෙලා එහි ප්‍රතිඵල අපි කොහොමද ලබන්නේ කියන කාරණා පිළිබඳව අද ආණ්ඩුව පැත්තෙන් කල්පනා කරනවාද? වැල් පාලම මත්තේම නැඟිලා, වැල් පාලම මතම විනාශ වෙලා යන්න තමයි ඔවුන් උත්සාහ කරන්නේ. අලුත් පාලම්, අලුත් ගමන් මාර්ග, අලුත් යාත්‍රා ගැන හිතන්නේ නැතුව පරණ වැල් පාලමේම ඉස්සරහට යන්න තමයි රනිල් මහත්තයා හදන්නේ. ඒකයි මම කිව්වේ, එතුමාට මේ ප්‍රශ්න විසඳන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ කියලා.

අද ආසියාව ලෝකයේ දියුණු කලාපය බවට පත් වෙලා තිබෙනවා. ලෝකය අද නිර්ඩොලර්කරණය වෙමින් සිටිනවා. ඒ නිසා රටවල් අතර ගනුදෙනු වෙනත් මුදල් ඒකකයක් භාවිතයෙන් කරන්න කල්පනා කරමින් පවතිනවා. මෙන්න මේ කාරණා කල්පනා කරලා ඉස්සරහට ගියොත් විතරයි මේ අර්බුදයෙන් සැබෑ ලෙස මේ රට ගොඩ ගන්න පුළුවන්කම ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට මේ තත්ත්වයට පත් වන්න ප්‍රධාන හේතුව, සැබෑ අර්බුදය තේරුම් නොගැනීම සහ ඒ සැබෑ අර්බුදය විසඳිය හැකි සුදුස්සන් තෝරා නොගැනීමයි. පොහොට්ටුව රනිල් මහත්තයා තෝරාගෙන, සැබෑ මිතුරා කියලා එතුමාව පත් කරගෙන දැන් පොහොට්ටුවට වෙච්ච විත්නැඟිය රටටත් කරන්නයි මේ හදන්නේ. මේ දේශපාලනය ගැන කල්පනා කිරීමේදී අලුත් මානයකින්, අලුත් දිශාවකට යන ආර්ථික ප්‍රතිපත්ති ගැන කල්පනා කරනවා මිසක්, මෙවැනි තක්කඩි පනත්වලින් රිංගලා ගිහිල්ලා රටේ තිබෙන සම්පත් ටිකත් කුණුකොල්ලෙට විකුණාගෙන කන්න උත්සාහ කිරීම පිළිබඳව අපේ විරෝධය පළ කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[ප.ව. 4.43]

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் நாங்கள் நிதி சம்பந்தமான சட்டமூலங்கள் பற்றி இங்கு உரையாற்றிக்கொண்டு இருக்கின்றோம். இந்த நாட்டில் சிறந்த இடதுசாரிக் கொள்கையுடையவராக, அந்தக் கொள்கையில் இறுதிவரை தளராது நின்ற ஒரு மனிதனாகத் தன்னை அடையாளப்படுத்திய, நவ சம சமாஜ கட்சியின் தலைவர் கலாநிதி விக்கிரமபாகு கருணாரத்ன அவர்கள் இன்று இந்த மண்ணிலிருந்து விடைபெற்றிருக்கிறார். தன்னுடைய 81ஆவது வயதிலே காலமாகிய அவரை நான் இந்தச் சபையில் நினைவுகூர்கின்றேன்.

மிக முக்கியமாக, சிறந்த இடதுசாரிக் கொள்கைவாதியும் நவ சம சமாஜ கட்சியின் தலைவரும் ஈழத் தமிழர் உரிமை தொடர்பில் இறுதிவரை ஒரே நிலைப்பாட்டைக் கடைப்பிடித்து வந்த முற்போக்கு அரசியல்வாதியுமான கலாநிதி விக்கிரமபாகு கருணாரத்ன அவர்களுக்கு எமது ஆழ்ந்த அஞ்சலியைச் செலுத்துவதோடு, அவரின் ஆத்மா சாந்தியடைய வேண்டும்

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

எனவும் பிரார்த்திக்கின்றோம். தமிழர் பிரச்சினைகளில் எப்போதும் ஒரே கொள்கையைக் கடைப்பிடித்த, அது தொடர்பான போராட்டங்களில் முன்னிலை வகித்த, சிங்கள தேசிய இனத்தில் பிறந்த, இனவாதமில்லாத ஒரு பெருமனிதனை இந்தத் தேசம் இழந்திருக்கின்றது. தமிழ் மக்களுக்கு சுயநிர்ணய உரிமை உண்டு என்றும் அவர்கள் இந்த நாட்டில் தங்களுக்கு உரித்தான தனித்துவத்துடன் வாழ்வதற்கு உரித்துடையவர்கள் என்றும் மிகவும் ஆணித்தர மாக சிங்கள மக்கள் மத்தியில் எடுத்துக்கூறிய, கலாநிதியாக, கல்விமானாக, பல்கலைக்கழக விரிவுரையாளராக இருந்த மாமனிதரை தமிழர்கள் இழந்திருப்பதாகவே நாங்கள் கருதுகின் றோம். அதனால் கலாநிதி விக்கிரமபாகு கருணாரத்ன அவர்களுக்கு நான் இந்த உயர்ந்த சபையில் தமிழர்கள் சார்பாக என்னுடைய அஞ்சலியை மீண்டும் செலுத்துகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சற்றுமுன்னர் நான் இன்றைய 'வீரகேசரி' பத்திரிகையில் படித்த ஒரு செய்தியை இந்தச் சபையில் பதிவுசெய்ய விரும்புகின் றேன்.

"கடந்த 2022ஆம் ஆண்டு மே 18ஆம் திகதியை தமிழினப் படுகொலை நினைவு நாளாகப் பிரகடனப்படுத்துவதற்கான தீர்மானம் கனேடியப் பாராளுமன்றத்தில் ஏகமனதாக நிறைவேற்றப்பட்டது..."

என அந்தச் செய்தியில் குறிப்பிடப்பட்டிருந்தது. கனடா தமிழ் மக்களுக்கு வழங்கிய ஒரு வரப்பிரசாதமாகவும் உலக அரங்கில் எங்களுக்குக் கிடைத்த குரலாகவுமே இதனை நான் நினைக்கின்றேன்.

"இலங்கையின் பொறுப்புக்கூறலை கனடா தொடர்ந்தும் வலியுறுத்தும்"

என்பது அச்செய்தியின் தலைப்பாகும். " கறுப்பு யூலை கலவரத்தில் உயிரிழந்தவர்கள்" என அச்செய்தி தொடர்கின்றது. இதில் குறிப்பிடப்பட்டுள்ள 'கலவரம்' என்ற சொல்லை நான் ஏற்றுக்கொள்ளவில்லை. இருந்தாலும், ஒரு நாட்டின் பிரதமர் கூறிய கூற்றை நிராகரிக்கின்ற உரிமை எனக்கு இல்லை.

மேலும்,

"கறுப்பு யூலை கலவரத்தில் உயிரிழந்தவர்கள் மற்றும் பாதிக்கப்பட்டவர்களை நினைவு கூர்ந்திருக்கும் கனேடிய பிரதமர் ஜஸ்டின் ட்ரூடோ, மனித உரிமைகளைப் பாதுகாப்ப தில் முன்நிற்போர் என்ற ரீதியில் இலங்கையில் நலிவுற்ற சமூகங்களுக்கு எதிராக நிகழ்த்தப்பட்ட குற்றங்கள் மற்றும் மனித உரிமை மீறல்கள் தொடர்பில் பொறுப்புக்கூறல் உறுதிசெய்யப்பட வேண்டும் என தமது அரசாங்கம் தொடர்ந்து வலியுறுத்தும் எனத் தெரிவித்துள்ளார்."

என அச்செய்தியில் குறிப்பிடப்பட்டுள்ளது. மேலும், 'கறுப்பு யூலை'ஆனது, இலங்கை வரலாற்றில் ஒரு கரும்புள்ளி என்பதையும் அவர் மிகத் தெளிவாகப் பதிவு செய்திருக்கிறார். எங்களுக்காக கனடா பல தடவை குரல்கொடுத்திருக்கிறது. பிரித்தானியாவின் பிரதமராகப் பதவியேற்றிருக்கின்ற கெய்ர் ஸ்டார்மர் அவர்களுடைய கட்சி சார்ந்து ஒரு தமிழ் பிரதிநிதியாக உமா குமரன் அவர்கள் பிரித்தானியப் பாராளுமன்றத்துக்கு முதன்முதல் தெரிவுசெய்யப்பட்டு இருக்கிறார். அவரை நான் இந்த இடத்தில் வாழ்த்துகின்றேன். இந்த நாட்டில் தமிழர்கள்மீது நடாத்தப்பட்ட இனப் படுகொலையால் பாதிக்கப்பட்டவர்களுக்கு இன்னும் நீதி கிடைக்கவில்லை. அதுமட்டுமல்ல, நீதி விசாரணைகள்கூட இன்னும் சரியாக முன்கொண்டு செல்லப்படவில்லை. இவ்விடயம் தொடர்பில் கனடாவுக்கும் பிரித்தானியாவுக்கும் ஒரு பெரிய பங்கிருக் கின்றது. இது தொடர்பில் நீதி விசாரணைகளை முன்கொண்டு செல்வதில் கனடா எடுத்திருக்கின்ற முடிவை ஒவ்வொரு நாடும் வலியுறுத்த வேண்டும்; வற்புறுத்த வேண்டும்; நாடாளுமன்றத் தில் தீர்மானங்களாகக் கொண்டுவர வேண்டும்.

நான் இந்த இடத்தில் மிக முக்கியமானதொரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். 1983ஆம் ஆண்டு ஜே.ஆர். ஜயவர்த்தன அவர்கள் இந்த நாட்டின் ஜனாதிபதியாக இருந்தபொழுது, அப்போதிருந்த ஐக்கிய தேசியக் கட்சி அரசாங்கத்தின் அமைச்சர்களான சிறில் மத்தியூ, லலித் அத்துலத்முதலி, காமினி திசாநாயக்கா, ரன்ஜன் விஜேரத்ன போன்றவர்களுடைய தலைமையில் கொழும்பிலும் மலையகத் திலும் பாரியதோர் இனவழிப்பு நடந்தது. அப்போது அரச ஆதரவுடன் தமிழர்களுடைய கலை, கலாசாரம் என்பன அழிக்கப்பட்டன; அவர்களுடைய பாரம்பரிய வாழ்வு அழிக்கப்பட்டது. இச்சம்பவம் இடம்பெற்று இன்று 41 வருடங்கள் கடந்திருக்கின்றது. 1983ஆம் ஆண்டு யூலை மாதம் 23ஆம் திகதியிலிருந்து தொடர்ந்து 07 நாட்கள் நடந்த இந்தப் பாரிய இனவழிப்பு நடவடிக்கையால் 5,638 பேர் பலியாகினார்கள்; 2,015 பேர் காயங்களோடு உயிர் தப்பினார் கள்; 466 பேரை இதுவரை காணவில்லை; 615 பேர் பாலியல் துஷ்பிரயோகங்களுக்கு உள்ளாக்கப்பட்டார்கள்; 250,000க்கும் மேற்பட்டோர் உள்ளக இடம்பெயர்வுக்கு ஆளாக்கப்பட்டார் கள். ஏன் நான் இதனை இந்த இடத்தில் குறிப்பிடுகின்றேன் என்றால், இன்று இந்த இனவழிப்பு நடந்து 41 வருடங்கள் கடந்திருக்கின்ற நிலையில், கனடாவின் பிரதமர் இதுபற்றி தன்னுடைய மனக்கவலையைப் பதிவுசெய்து இருப்பதனால் தான். இவர்போல், புதிதாகப் பதவியேற்றிருக்கின்ற பிரித்தானி யாவின் பிரதமரும் இதுபற்றிச் சிந்திக்க வேண்டியவராக இருக்கின்றார்.

எமது நாட்டின் நீதி அமைச்சர் அவர்கள் தமிழர்களுக்கு நடந்த அநீதி தொடர்பில் இந்தப் பாராளுமன்றத்தில் மன்னிப்புக் கோரியிருந்தார். அதனை நான் வரலாற்றின் ஒரு பதிவாகவே பார்க்கின்றேன். அவரிடம் இருக்கின்ற புரிதல், இன நல்லிணக்கம், எண்ணங்கள் என்பன முன்னேற்றத்தை நோக்கி ஒரு துளியளவாவது நகர்ந்திருக்கின்றது என்பதையே இது எடுத்துக் காட்டுகின்றது. கௌரவ அமைச்சர் விஜயதாஸ ராஜபக்ஷ அவர்களுக்கு நான் இந்த இடத்தில் நன்றி சொல்லக் கடமைப்பட்டு இருக்கின்றேன். 41 வருடங்கள் கடந்து, அவர் இந்தளவுக்காவது சிந்தித்திருப்பது மிகப் பெரியதொரு விஷயமாகும். அவர் இதனோடு நின்றுவிடாமல், பரந்த நோக்குடன் செயற்பட வேண்டும்.

இந்த நாட்டில் நாங்களும் நீங்களும் சேர்ந்து இரண்டு தேசத்துக்குரியவர்களாக இந்த நாட்டைக் கட்டிவளர்த்தால், இந்த நாட்டின் பொருளாதாரம் எவ்வளவு தூரம் வளரும் என்பதை நீங்கள் சிந்தித்துப் பாருங்கள்! குறிப்பாக, மலேசிய நாட்டிலுள்ள பினாங்கு மாநிலமானது, இன்று 18 இலட்சத் துக்கும் மேற்பட்ட தமிழர்களைக் கொண்டிருக்கின்றது. அந்த மாநிலத்துக்கான நிதி அதிகாரம் மலேசிய அரசாங்கத்தால் வழங்கப்பட்டது. அதனால் அம்மாநிலத்தில் செய்யப்பட்ட முதலீடுகள் மலேசியாவின் பொருளாதாரத்தையே தூக்கி நிறுத்தியது. ஆனால், எமது நாட்டில் முதலமைச்சர் நிதியத்தைக்கூட தொடங்க முடியாதவாறு வடக்கு மாகாண முதலமைச்சர் தடுக்கப்பட்டார். நீங்கள் வடக்கிலும் கிழக்கிலும்

ஒரு நிரந்தர அரசாட்சியை தமிழர்களுக்கு வழங்கி, தமிழ் பேசும் மக்கள் இந்த நாட்டுக்குள் நிதி, பொலிஸ், காணி அதிகாரங்களோடு ஓர் ஆட்சியை நடாத்தினால், அது சமஷ்டி அடிப்படையில் மீளப் பறிக்கப்பட முடியாத அதிகாரங்களுடன் கூடிய ஒரு கௌரவமான ஆட்சியாக அமைந்தால், அது தமிழர்கள் தங்களைத் தாங்களே ஆளுகின்ற ஒரு சுயாட்சியாக அமைந்தால், இலங்கையின் பொருளாதாரம் இன்னும் மேன்மை தங்கியதாக, வளம் பொருந்தியதாக மாறும்.

குறிப்பாக, இன்று மலேசியாவின் பினாங்கு மாநிலத்திலும் இந்தியாவின் தமிழ் நாட்டிலும் இருக்கின்ற தமிழர்கள் உட்பட உலகமெல்லாம் பரந்து வாழுகின்ற தமிழர்கள் இந்த நாட்டில் முதலீடு செய்யக்கூடிய மிகப் பெரிய வரலாற்று அடையாளம் உருவாகும். நீங்கள் வெறுமனே நிதி இல்லை, பொருளாதார மந்தம், பொருளாதாரத்தை முன்னேற்ற முடியவில்லை என்கிறீர்கள். ஆனால், 1983ஆம் ஆண்டு யூலைக் கலவரம் நடைபெற்றபொழுது, இந்த மண்ணிலிருந்த கிட்டத்தட்ட 5,000 தமிழ் வர்த்தக நிலையங்கள் அழிக்கப்பட்டன. இதனால் தமிழர்களுடைய வர்த்தக சாம்ராஜ்யமே இல்லாமற் போனது. நீங்கள் இந்த நாட்டுக்குள் தமிழர்கள் தங்களைத் தாங்களே ஆளக்கூடிய சுயாட்சியை வழங்க முன்வந்தால், இந்த நாட்டின் பொருளாதாரம் மேலும் முன்னேற்றத்தை நோக்கி நகரும்.

1956-1957 காலப்பகுதியில் அநுராதபுரத்தில் வாழ்ந்த கிட்டத்தட்ட 25,000 தமிழ்க் குடும்பங்கள் அங்கிருந்து இடம்பெயரச் செய்யப்பட்டன. அக்குடும்பங்களைச் சேர்ந்த பலர் இன்றும் வன்னிப் பிரதேசத்தின் பல பகுதிகளிலும் வாழ்கின்றார்கள். குறிப்பாக, 1956ஆம் ஆண்டு அநுராதபுரத்திலிருந்து இடம்பெயர்க்கப்பட்டவர்கள் கிளிநொச்சி மாவட்டத்தின் தர்மபுரம் பகுதியில் வாழ்கின்றார்கள். அதேபோல, மலையகத்திலிருந்து இடம்பெயர்க்கப்பட்டு 1983ஆம் ஆண்டில் குடியேறியவர்களும் அங்கு இருக்கிறார்கள். இவ்வாறு எங்களுடைய இடங்களில் நடந்த இடப்பெயர்வுகள் தொடர்பில் இப்பொழுதுகூட விசாரணை செய்யப்படுவதில்லை.

1983இல் நடந்த யூலைப் படுகொலைக்கு இன்று 41 வருடங்களாகின்றது. அப்படியென்றால், 1956ஆம் ஆண்டு அநுராதபுரத்தில் நடந்த இனச் சுத்திகரிப்புக்கு எத்தனை வருடங்கள் என்று சிந்தித்துப் பாருங்கள்! அதேபோல், மலையகத்திலிருந்து தமிழ் மக்கள் எவ்வாறு அனுப்பப்பட்டார்கள் என்பதையும் சிந்தித்துப் பாருங்கள்! அம்பாறை, திருகோணமலை, மட்டக்களப்பு ஆகிய மாவட்டங்களில் 1841, 1890, 1920, 1960, 1980ஆம் ஆண்டுகளில் வாழ்ந்த மக்கள் தொகையையும் 2024ஆம் ஆண்டில் வாழ்கின்ற மக்கள் தொகையையும் ஒப்பிட்டுப் பாருங்கள்! அன்று அங்கு வாழ்ந்த தமிழர்களுடைய தொகையைவிட, இன்று அங்கு வாழுகின்ற தமிழர்களுடைய தொகை எவ்வாறு குறைவடைந்து மூன்றாவது நிலைக்குச் சென்றிருக்கின்றது என்பதைப் பாருங்கள்! அதேபோல், எவ்வாறு தமிழர்கள் இந்த இடங்களிலிருந்து துரத்தப்பட்டு இருக்கிறார்கள்? எவ்வாறு அவர்களுடைய நிலங்கள் பறிக்கப்பட்டு இருக்கின்றன? எவ்வாறு அவர்கள் இந்த மண்ணிலிருந்து அகற்றப்பட்டு இருக்கிறார்கள்? என்பதையும் பாருங்கள்!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று கிழக்கிலுள்ள தமிழர்கள், தங்களுடைய சொந்த நிலங்கள் பறிக்கப்பட்ட நிலையிலே வாழ்ந்துகொண்டு இருக்கிறார்கள். இந்த நாட்டில் நல்லிணக்கம் என்பதும் நீதி என்பதும் வெறுமனே கனேடியப் பிரதமர் சொல்வதால் மட்டும் உருவாகப் போவதில்லை அல்லது பிரித்தானியப் பிரதமர் சொல்வதால் மட்டும் உருவாகப் போவதில்லை. இந்த நாட்டில் உண்மையான சகவாழ்வு, இன ஐக்கியம் ஏற்பட வேண்டும் மென்றால், இந்த நாட்டிலுள்ள இரண்டு தேசிய இனங்களும் அங்கீகரிக்கப்பட வேண்டும். இந்த நாட்டிலுள்ள தமிழர்கள் ஒரு தேசிய இனமாக அங்கீகரிக்கப்பட்டு, அவர்களுடைய homelandஉம் - மரபுவழித் தாயகமும் - அங்கீகரிக்கப்படக்கூடிய வகையிலான ஒரு தீர்வை முன்வையுங்கள்! அதன்மூலம் இலங்கை என்ற நாடு இந்த உலகில் பொருளாதார வல்லமை பொருந்திய ஒரு வல்லரசாக எந்தளவுக்கு மாறலாம் என்பதைச் சிந்தித்துப் பாருங்கள்! அவ்வாறான நல்லெண்ணத்தை உருவாக்குங்கள்! அப்படிச் செய்தால், இந்த நாடும் செழிக்கும்! நாங்களும் இந்த மண்ணில் நிம்மதியாக வாழலாம் என்பதை இந்த இடத்தில் பதிவுசெய்து நிறைவுசெய்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.53]

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට මොහොතකට කලින් කථා කරපු අපේ මහනුවර දිස්ත්‍රික්කයේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමා ආර්ථික පරිවර්තන පනත ගැන කථා කරද්දී මට හිතුණා, ඉතිහාසයේ කවදා හෝ කාලයක එතුමාට අමාත්‍ය තනතුරක් ලැබිලා තිබුණා නම් එතුමා මේ රටේ ආර්ථික පරිවර්තනය වෙනුවෙන් කොහොම දායකත්වයක් ලබා දෙයිද කියලා. අපේ නිස්සකුටිටි මන්ත්‍රීතුමා කිව්වා වාගේ බැරි වෙලාවත් කෘෂිකර්ම ඇමතිකම වාගේ එකක් හම්බ වෙලා තිබුණා නම් - බෝම්බ ගැහුවා වාගේ අස්වැන්න වැඩි වෙනවා කියලා තිබුණා නේ, කාබනික ගොවිතැනින් - අන්න ඒ වාගේ පරිවර්තනයක් එතුමා කරයි! අපේ අවාසනාව තමයි එතුමාට පසුගිය කිසිම ආණ්ඩුවකින් අමාත්‍ය ධුරයක් නොලැබීම, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසුගිය කාලයේ කෘෂි කර්මාන්තයේ ඉඳලාම මේ රටේ ආර්ථිකය කඩා දැමීමට දායක වෙච්ච අය අද කථා කරනවා, ආර්ථිකය පරිවර්තනය කරන්නේ කොහොමද කියලා. ආර්ථිකය පරිවර්තනය කරන මේ පනත පිළිබඳව කථා කරද්දී, ඉතාම කෙටි කාලයක් තුළ මට එක කාරණයක් සඳහන් කරන්න වෙනවා. ඒ තමයි, ජන වරමක් නැති ආණ්ඩුවකට මේ වාගේ ආර්ථික පරිවර්තන පනතක් ගේන්න පුළුවන්ද කියන කාරණය. ජන වරමක් තිබෙන්න ඕනෑ, ආර්ථිකය පරිවර්තනය කරනවා වාගේ ප්‍රබල ව්‍යුහාත්මක වෙනසක් කරනවා නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජන වරමක් නැති ආණ්ඩුවක් රටේ ව්‍යුහාත්මක වෙනස්කමක් පිළිබඳව අන්තිම නිමේෂයේදී යෝජනාවක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනතේ I වන පරිච්ඡේදයේම දාලා තිබෙනවා, 2032 වනකොට ණය බර GDP එකෙන් සියයට 95කට අඩු කරන්න යනවා කියන කථාව. ඊළඟට, GDP එකට අනුපාතිකව මධ්‍යම ආණ්ඩුවේ වාර්ෂික දළ මුදල් සැපයීමේ අවශ්‍යතා අනුපාතය සියයට 13ට අඩු කරනවා කියලා තිබෙනවා. ඒ වාගේම ණය සේවාකරණ අනුපාතය සියයට 4.5කට අඩු කරනවා කියලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ මේකයි. මේ වාගේ benchmarks දාලා අනාගත රජයක් සීමාවක block කරලා නතර කරන්න හදන උත්සාහයක් නම් මෙතැන තිබෙන්නේ, අපිට

[ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා]

මේ පිළිබඳව දැඩි විවේචනාත්මකවයි කථා කරන්න වෙන්නේ. මොකද, මේ අය මේ පනතින් benchmarks ගණනාවක් දක්වා තිබෙනවා. අපනයන පිළිබඳව සඳහන් කරනවා, 2025 වර්ෂය වනවිට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 25කට නොඅඩු මට්ටමකට ළඟා වීම කියලා. ඒ කියන්නේ, අපේ රටේ මිනිස්සුන්ට පරිභෝජනය කරන්න තිබෙන ප්‍රමාණයත් අපනයනය කරනවා කියන එකද මේකේ අදහස? අපනයන සියයට 25 මට්ටමට එනවා කියන්නේ, ඒ benchmarks එකට යන්න රටේ පරිභෝජනය කරන ප්‍රමාණයත් අපනයනයේ කොටසක් බවට පත් කරනවා කියන එකද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ මේ benchmarks දමනකොට මේවා ප්‍රායෝගික වෙන්න ඕනෑ කියන එකයි. අපනයන ප්‍රවර්ධනය කරන ආර්ථිකයක් පිළිබඳව බලාපොරොත්තුවක් ඉතිහාසය මුළුල්ලේම අපට තිබුණා. මම මේ ඒ පිළිබඳව ද්වේෂයෙන් කථා කරනවා නොවෙයි. නමුත් මේ වාගේ සීමා මායිම් දාලා අනාගත ආණ්ඩුවක් block කරන්න හදනවා නම්, ඒක අපි පිළිකුලෙන් යුතුව බැහැර කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ තිබෙන මේ සීමාකාරී තත්ත්වයත් එක්ක 2025 වෙනකොට හුස්ම ගන්න තත්ත්වයකට පත් වෙනවා නම්, අපට ප්‍රායෝගිකව මේ දෙපරතර න්‍යාය අපි ගළපා ගැනීමක් කර ගන්න වෙනවා. එක පැත්තකින් අපි අය වැය හිඟය පාලනය කර ගන්න ඕනෑ. අනෙක් පැත්තෙන් ගෙවුම් ශේෂය පිළිබඳව අපි කල්පනා කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපනයන වැඩි කර ගැනීම සහ ආනයන අඩු කර ගැනීම සඳහා අපි පරිවර්තන ක්‍රියාවලියකට යන්නේ කොහොමද කියලා මේ පනතේ සඳහන් වන ක්‍රියා මාර්ග පැහැදිලි නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම ආයෝජන ප්‍රවර්ධන කලාප පුළුල් කිරීම, විදේශ ආයෝජන ලබා ගැනීම හරහා මේ රටේ ප්‍රබල පිම්මක් පනින ආර්ථිකයක් හදනවා නම් විපක්ෂය විධියට අපි ඒකට එකතු වෙනවා. ඒ පිළිබඳව කිසිම ගැටලුවක් නැහැ; විවාදයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් කෘෂි කර්මාන්තය පිළිබඳව කථා කරපු අයට, අමාත්‍ය ධුර දරපු අයට පසුගිය කාලයේ ලෝකයේ කෘෂි කර්මාන්තය ගමන් කරපු දිශාව වෙනට අපේ රට ගමන් කරවන්න පුළුවන් වුණාද? අපි දන්නවා, ඊශ්‍රායලය කියන රටට වර්ග කිලෝමීටර 22,000ක් තිබෙන බව. අපට තිබෙනවා වර්ග කිලෝමීටර 65,610ක්. ඊශ්‍රායලයේ වර්ග කිලෝමීටර 22,000න් තුනෙන් දෙකක තිබෙන්නේ නෙගෙව් කාන්තාරය. ඊශ්‍රායලයේ එක ගහයි තිබෙන්නේ; ඒ, ජෝර්දාන් ගංගාව. එක වැවයි තිබෙන්නේ; ඒ, ගැලිලි මුහුද, නැත්නම් වැව. මේකත් එක්ක drip irrigation පාවිච්චි කරලා, mechatronics කියන තාක්ෂණික ශිල්පීය ක්‍රම පාවිච්චි කරලා, අද ඊශ්‍රායලය මොකද කරලා තිබෙන්නේ? ඒ රටට නව පරිවර්තනයක් ගෙනැත් තිබෙනවා. ඒ පරිවර්තනයත් එක්ක අද ඔවුන්ට යුරෝපයට ආහාර සපයන්න පුළුවන් වෙලා තිබෙනවා. ඔවුන් horizontal farming වෙනුවට vertical farming ගෙනැත් තිබෙනවා. අපේ රටේ කෘෂි කර්මාන්තයේ පරිවර්තනය, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පරිවර්තනය අකා මකා විනාශ කරන්න දායක වෙච්ච අය අද පරිවර්තන ගැන කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, අපි කෘෂිකර්මය දියුණු කිරීමේ ක්‍රියා මාර්ගයකට යා යුතු බව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ වැඩ කටයුතු අවසාන වනතෙක් අවශ්‍ය කාලය ලබා දීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව කරගෙන යන්න.

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අපනයනාභිමුඛ ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීම අපේ අභිප්‍රාය විය යුතුයි. ඒ ගැන තර්කයක් නැහැ. අපනයන පැත්තට පරිවර්තනයක් සිදු වන රෙගුලාසි සහ ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග මෙම පනතට ඇතුළත් වන්නට ඕනෑ. ඒ වාගේම අපි දන්නවා, රාජ්‍ය ආදායම සහ රාජ්‍ය වියදම කියන දෙක අප ගළපා ගන්න ඕනෑ බව. රාජ්‍ය ආදායම රුපියල් බිලියන 600කින් කපා හරිද්දීත් ඒ පිළිබඳව පසුගිය ආණ්ඩුවේ - අපිත් හිටපු - ප්‍රමුඛ පෙළේ හිටපු, කැබිනට් මණ්ඩලයේ හිටපු අය තලු මර-මර ඒක ආශාවෙන් භුක්ති විඳින්නා මිසක් ඒ ගැන සාධාරණ විවේචනයක් එල්ල කළේ නැහැ. එදා ඒ ගැන සාධාරණ විවේචනයක් එල්ල කරන්නේ නැතුව අද කට මැත දොඩවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය ආදායම පුළුල් කර ගන්න නම් අපි යෝජනා කරනවා, පැහැදිලි පරිවර්තන ක්‍රියාවලියක් ගෙනෙන්න කියලා. ඊළඟට, digital public infrastructure එකක් හදන්න. බදු ආදායමේ ප්‍රතිශතය පුළුල් කර ගැනීම පමණක් නොවෙයි මෙයට උත්තරය. බදු නොගෙවන අයත් බදු දැලට හසු කර ගත යුතුයි. ඒ සඳහා ඩිජිටල් ක්‍රමවේදයක් අනුගමනය කරලා බදු ආදායම් රැස්කර ගැනීමයි අපි කළ යුතු වන්නේ. ඒ සඳහා වූ පරිවර්තන මේ පනතේ තිබෙනවා මම නම් දැක්කේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එක දෙයක් කියනවා. රාජ්‍ය ආදායම පුළුල් කර ගන්න වාගේම රාජ්‍ය වියදම අවම කර ගන්න යනකොට SOEs, ඒ කියන්නේ, රජයට අයත් ව්‍යාපාර පිළිබඳව කළමනාකරණයක කිරීම අවශ්‍යයි. ඒ ගැන මේ පනතේ සඳහන් කරලා නැහැ. සිංගප්පූරුව වාගේ රටවල රාජ්‍ය ව්‍යාපාර කළමනාකරණය කරන්න Temasek ආකෘතිය හරහා දැවැන්ත පිටුබලයක් ඒ රටේ ආර්ථිකයට ලබා දීලා තිබෙනවා.

1974 ඉඳලා Temasek ක්‍රියාවලිය හරහා අද ලෝක ආර්ථිකය ආක්‍රමණය කරන තැනට සිංගප්පූරුව ඇවිල්ලා තිබෙනවා. නමුත් මම අහන්නේ, මේ ආර්ථික පරිවර්තන පනතේ මෙවැනි පරිවර්තනයක් සඳහන් වෙන්නේ කොහේද? ඒ නිසා හුදෙක් මේකේ benchmarks දීලා ඍයබරතාව සියයට 95ට අහවල් කාලය වෙනකොට අඩු කර ගන්න ඕනෑ කියලා සඳහන් කිරීම පමණක් ප්‍රමාණවත් නැහැ. මේ සඳහා ප්‍රායෝගික ක්‍රියාමාර්ග ගත යුතු වෙනවා. මේ ආදායම් වියදම් ගළපා ගන්න යද්දී, වියදම් සීමා කරනවා කියනකොට ඔබතුමා කල්පනා කරලා බලන්න, මොන තරම් අනවශ්‍ය වියදම් කරනවාද කියලා. හරින් ප්‍රනාන්දු ඇමතිතුමා යටතේ තිබෙන ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ මොකද කරන්නේ කියලා අපි පෙන්වා දුන්නා. අදත් ඒ අය මොනවාද කරන්නේ? සංගීත සංදර්ශන පවත්වන්න රුපියල් ලක්ෂ 120කට වැඩි ප්‍රමාණයක් ඉන්දියාවේ කලාකාරයන්ට ගෙවන තත්ත්වයට ඒ අමාත්‍යාංශය පත් වෙලා තිබෙනවා. ආර්ථිකය පරිවර්තනය කරන්න කියන්නේ මේ විධියටද? අපි කියනවා, මේ වාගේ අනවශ්‍ය නාස්තිකාර වියදම් නවත්වන්න ඕනෑ බව; ඒ තත්ත්වය වෙනස් වෙන්න ඕනෑ බව.

ඒ වාගේම, අත්‍යවශ්‍ය නැනට වියදම් යන්න ඕනෑ. නුවර මහ රෝහලේ තිබෙන උපකරණ රැසක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒවාට වියදම් කරන්න මුදල් ප්‍රතිපාදන වෙන් වෙන්නේ නැහැ. මූත්‍රාශයේ ගල් කුඩු කරන යන්ත්‍රය, වකුගඩු සම්බන්ධයෙන්, MRI සම්බන්ධයෙන් වන යන්ත්‍ර, ඒ ගොඩක් දේවල් අකර්මණ්‍ය වෙලායි තිබෙන්නේ. අපි කියන්නේ, මෙවැනි නැන්වල වියදම් දරලා, ඒවා යම් ප්‍රමාණයකට ගේන්න කටයුතු කරන ගමන් අනවශ්‍ය වියදම් අඩු කරලා, කළමනාකරණය කරලා මේ රටේ ආර්ථිකය පරිවර්තන මාවතකට ගෙනියන්න ඕනෑ කියන එකයි. එහෙම නැතුව බොරුවට අපවාද පමණක් කරමින්, විපක්ෂයට ගරහලා වැඩක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ඊළඟ පුනරුදය ආරම්භ වන්නේ සමගි ජන සන්ධාන රජයක් යටතේයි. සමගි ජන සන්ධාන රජයක් යටතේ, මේ රටේ ආර්ථිකයේ සැබෑ විප්ලවීය වෙනසක් සිදුකරමින්, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය අනුගමනය කරමින්, රටේ ජනතාවට සැබෑ ජයග්‍රහණයක් නියත වශයෙන් ලබා දෙනවාය කියන කාරණය සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

අවස්ථාව ලබාදීම සම්බන්ධව ඔබතුමාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු දිලුම් අමුණුගම රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.03]

ගරු දිලුම් අමුණුගම මහතා (ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திளும் அமுணுகம - முதலீட்டு மேம்பாடு இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilum Amunugama - State Minister of Investment Promotion)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මිත්‍ර ගරු වසන්ත යාපාබණ්ඩාර මැතිතුමාගේ කථාවෙන් පසුව කථා කරන්න ලැබීම සතුටට කරුණක්. එතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගේ කථා කිහිපයක්ම අපි අහගෙන හිටියා. මේ ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත හරියාකාරව කියවා බැලුවොත්, එතුමා කියන benchmarks තිබෙනවා තමයි. අපි නැහැ කියන්නේ නැහැ. හැබැයි, ඒවා දීලා තිබෙන්නේ ඒ ඉලක්කවලට ළඟා විය හැකිද කියලා උත්සාහ කර බලන්න. හැබැයි, අපි කල්පනා කර බලන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියනවා, ජනවරමක් නැති ආණ්ඩුවක් තමයි තිබෙන්නේ කියලා. කොහොමද අපි ජනවරමක් නැති ආණ්ඩුවක් වෙන්නේ? ජන වරමෙන් පත්වුණු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා තුනෙන් දෙකටත් වැඩිය බලය අරගෙන,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ වීය.

අතන්පිරකු, மாண்புமிகு ஜகத் சமரவிக்ரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. JAGATH SAMARAWICKRAMA left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.

ගරු දිලුම් අමුණුගම මහතා
(மாண்புமிகு திளும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියමින් සිටියේ මේකයි. මේක ජනවරමක් නැති ආණ්ඩුවක් කියලා අපට චෝදනා කරනවා නේ. ඇයි මේ, ජනවරමක් නැති ආණ්ඩුවක් කියලා අපට චෝදනා කරන්නේ? අපේ ජනාධිපතිවරයා නික්ම ගියා, එතුමා නික්ම ගියාම අපි රනිල් වික්‍රමසිංහ මැතිතුමාව ජනාධිපතිවරයා වශයෙන් පාර්ලිමේන්තුව ඇතුළෙන් පත් කර ගැනීම නිසා. අපි කල්පනා කර බලන්න ඕනෑ, ජනාධිපතිතුමාට නික්ම යන්න හේතුව වුණේ මොකක්ද කියලා. අද අපි කියනවා, තෙල් පෝලිම් නැහැ, ගෑස් පෝලිම් නැහැ, අනික් පෝලිම් නැහැ කියලා. හැබැයි, මොකක්ද අපට ඇති වෙච්ච ප්‍රශ්නය? තෙල් අඩු පාඩුවක් නොවෙයි, තෙල් ගන්න මුදල් නැති තත්ත්වය තමයි ඇති වුණේ. තෙල් ගන්න මුදල් නැති නිසා විදුලිය සපයන්න බැරි වුණා; ගෑස් ගෙන්වා ගන්න බැරි වුණා. එතකොට මේකට මූලිකම හේතුව මොකක්ද? ඕනෑ කෙනෙකුට චෝදනා කරන්න පුළුවන්, හැම රජයටම චෝදනා කරන්න පුළුවන්. නමුත් කොයි රජයක් කරලා තිබුණේ දිගින් දිගටම තමන්ගේ ආදායමට වඩා ණය ගැනීමයි. ඒක තමයි අපි අය වැය පරතරය කියලා කියන්නේ. අපි අයට වැඩිය විශාල ප්‍රමාණයක් වැය කිරීමේ ප්‍රතිඵලයක් හැටියට මේ රට බරපතළ අර්බුදකාරී තත්ත්වයකට අවුරුදු ගණනාවක්ම ගිහිල්ලා, අවසානයේදී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කාලයේදී ඒක පුපුරලා ගියා. අද කවුරු මොනවා කිව්වත්, ඒ ප්‍රශ්නයට විසඳුම තමයි මේ ආර්ථික පරිවර්තන පනතේ තිබෙන්නේ. මෙහි benchmarks දාලා තිබෙන්නේ වෙන හේතුවකට නොවෙයි, මේ පනත් කෙටුම්පතේ තිබෙනවා, ඉදිරියේ මේ පනත සම්මත වුණාට පසුව කටයුතු කරන ආකාරය.

දැන් තිබෙන්නේ අපේ රජය. තවම වෙන රජයක් ඇවිල්ලා මොනවත් වෙලාත් නැහැ. මුදල් අමාත්‍යාංශයට වේවා, මහ බැංකුවට වේවා, මුදල් ඇමතිවරයාට වේවා ලබා ගත හැකි උපරිම ණය ප්‍රමාණයක් මෙම පනතේ සඳහන් කර තිබෙනවා, GDP එකට සාපේක්ෂව. මෙය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩ පිළිවෙළට සමගාමීව, ඊට අනුකූලව සකස් කළ පනතක්. ඒක අපි නැහැ කියන්නේ නැහැ. මොකද, IMF වැඩසටහනට අපි ඇතුළත් වුණාම, ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට නම් අපි එම ක්‍රියාපටිපාටිය අනුගමනය කරන්න අවශ්‍යයි. ඒ ක්‍රියා පටිපාටිය අනුගමනය කරන්න නම්, ඒ සඳහා අපිට නීතිමය රාමුවක් අවශ්‍යයි. ඉතින්, පැහැදිලිවම ඒ ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම සඳහා වූ නීතිමය රාමුවත් මෙම පනතට ඇතුළත් කර තිබෙනවා. ඒක අපි නැහැයි කියන්නේ නැහැ. අපි පිළිගන්න අවශ්‍යයි, අපි කරපු සියලු උත්සාහයන් -අපි කාටවත් දොස් පවරන්නේ නැහැ- ව්‍යර්ථ වෙලා මේ ආර්ථිකයේ අඩිය ඇනුණු බව. අඩිය ඇනුණාම තමයි තනියෙන් පාර්ලිමේන්තුවේ හිටපු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ආරාධනා කරන්න වුණේ, අගමැතිකම භාර ගන්නය කියලා. *[බාධා කිරීමක්]* මෙතුමා කියනවා, ආර්ථිකය හදන්න කෙසෙල් ගස් හිටෙව්වා කියලා. හොඳයි, කෙසෙල් ගසුත් අවශ්‍යයි, ආර්ථිකය හදන්න.

අපි රනිල් වික්‍රමසිංහ මැතිතුමාව පත් කළාට පසුව එතුමා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. දැන් අපි පිළිගන්නේ නැද්ද, එදා තිබුණාට වැඩිය අද තත්ත්වය හොඳයි කියලා? ඒක එහෙම නොවෙයි කියලා විපක්ෂයෙන් කොච්චර කිව්වත්, පිළිගන්න පුළුවන්ද? අද සංඛ්‍යාලේඛන ගත්තත්, භාණ්ඩාගාරයේ තත්ත්වය ගත්තත්, මහ බැංකුවේ තත්ත්වය ගත්තත්, ජාත්‍යන්තර සමීක්ෂණ සිදු කරන ආයතනවල වාර්තා ගත්තත් එදා තිබුණාට වඩා හොඳ මට්ටමකට විශාල වේගයකින් ආර්ථිකය ගෙන ඒමට ජනාධිපතිතුමාට හැකියාව ලැබී තිබෙනවා. එහෙම නම්, අපි මේ පාර්ලිමේන්තුවේ බහුතර ඡන්දයෙන් එතුමාව ජනාධිපතිවරයා

[ගරු දිලුම් අමුණුගම මහතා]

හැටියට පත් කර තිබෙනවා නම්, එතුමාගේ ආර්ථික වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට එතුමාට අයිතියක් තිබෙනවා. අපි දැක්කා සමහර මන්ත්‍රීවරු මේවාට පිස්සු හැදිලා වාගේ කෑ ගහනවා. නමුත් මේ එතුමාගේ වැඩ පිළිවෙළ. ඉතින් හත්දෙයියනේ! ගන්න කියනකොට කවුරුවත් ගත්තේත් නැත්නම්, එන්න කියනකොට කවුරුවත් ආවේත් නැත්නම්, අවසානයේදී ගත්ත කෙනාට එතුමාගේ ප්‍රතිපත්තිය අනුව මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අවශ්‍ය නීති රාමුව අපි සකස් කර දෙන්නේත් නැත්නම් මොකක්ද, අපි මේ පාර්ලිමේන්තුවට වෙලා කරන්නේ?

අවුරුදු ගණනාවක් එහාට මෙහාට බෝලය පාස් කරලා කෑ ගැසීමේ ප්‍රතිඵල තමයි මේ. මේ වැඩ ඔක්කොම හොඳට වුණා නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොහොමද අපි ගිහිල්ලා ඇනෙන්නේ? ඒවාට මේ පාර්ලිමේන්තුවත් වග කියන්න එපායැ. අපිත් හිටියා, වෙන අයත් හිටියා. එහෙම නම් සියලුදෙනා මේවාට වග කියන්න ඕනෑ. මුදල් බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට නේ. අපි මෙච්චර කල් කරපු දේවල් හරි ගියා නම්, අන්තිමට එහෙම ඇනිලා ඡන්දයෙන් ආපු ගෝඨාභය මහත්තයා ගෙදර ගිහිල්ලා තනියම හිටපු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මේක භාර ගන්න වෙන්නේ නැහැ නේ. හැබැයි, එතුමා භාර ගත්තා. එතුමා භාර ගත්තේ වැටිච්ච රටක්. එතුමා ඒ අභියෝගය භාර ගත්තා. එතුමා ක්‍රම ක්‍රමයෙන් ක්‍රමවේදයක් හැදුවා. ඔව්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගියා. අපි නැහැ කියන්නේ නැහැ. ඒ ක්‍රමවේදය අනුව දැන් ඉස්සරහට යනකොට, මේ ආර්ථිකය පරිවර්තනය කිරීම සඳහා නීතිමය රාමුවක් අවශ්‍යයි. අද ඒක තමයි මේ ආර්ථික පරිවර්තන පනත තුළින් සකස් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙන මොකක්වත් කියන්න ඕනෑ නැහැ, මම මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනය ගැන කියන්නම්. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ගත්තොත්, මම ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් අහන්න කැමැතියි ලංකාව තුළ එහි දැනට තිබෙන තත්ත්වය ගැන. මම දොස් කියනවා නොවෙයි. ඒ අයට දොස් කියලා වැඩක් නැහැ. ආයෝජන මණ්ඩලය කොහොමද, ආයෝජකයෙක් හොයා ගන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයෝජකයෙකුට ඉස්සෙල්ලා හිතෙන්න ඕනෑ, ලංකාවේ ආයෝජනය කරන්න. එහෙම හිතුණාම ඔහු ලංකාවට එන්න ඕනෑ. WTC එකේ 27 වැනි තට්ටුවේ ආයෝජන මණ්ඩලය තිබෙනවා කියලා හොයා ගන්න ඕනෑ. එතැනට යන්න ඕනෑ, application එකක් ගන්න ඕනෑ. ඊට පසුව තමයි වැඩේ පටන් ගන්නේ. කොහේද, අපි investment promotions කරන්නේ? කොයි රටටද ආයෝජන මණ්ඩලයෙන් ගිහිල්ලා promotions කරන්නේ? කොයි රටේද, අපේ ආයෝජන මණ්ඩලයේ කාර්යාලයක් තිබෙන්නේ? අඩුම තරමේ ඩුබායි, සිංගප්පූරුව වාගේ රටවලවත් තිබෙනවාද? කොයි රටටද අපි ගිහිල්ලා ප්‍රචාරය කරන්නේ අපේ රටට ඇවිල්ලා ආයෝජනය කරන්න කියලා? එහෙම වැඩ පිළිවෙළක් සකස් කර තිබුණේ නැහැ.

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒර්ත්‍රුක්කොළ්ළප්පට්ටතු.

Amendment put, and agreed to.

75 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

75ආ වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 75, as amended, ordered to stand part of the Bill.

76 සිට 89 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

76ආ වාසකත්තිලිරුන්තු 89ආ වාසකම් වරై චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 76 to 89 ordered to stand part of the Bill.

90 වන වගන්තිය.- (අනුමතයන් කඩිනම් කිරීම සඳහා ආර්ථික කොමිෂන් සභාවට ඇති විශේෂ බලතල)

வாசகம் 90.- (ஒப்புதல்களை துரிதப்படுத்துவதற்காக பொருளாதார ஆணைக்குழுவின் விசேட தத்துவங்கள்)

CLAUSE 90.- *(Special Powers of the Zones SL for expediting approvals)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "82 වන පිටුවේ, 26 වන පේළිය සහ 27 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යටතේ සාදනු ලබන නියෝග මඟින් නියම කරනු ලබන අමාත්‍යාංශ, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, නියෝජ්‍යායතන, සෝන්ස් එස්එල්, නියාමන අධිකාරීන් හෝ මණ්ඩල වෙතින් යම් අනුමතයන්, බලය ලබා දීම්, හෝ' "

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(2) "83 වන පිටුවේ, 7 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'නිශ්චිතව සඳහන් ආයතනය බැඳී සිටිය යුතු ය. ඒ නිශ්චිතව සඳහන් ආයතනය විසින් ඒ විමසීමට ප්‍රතිචාර දැක්වීම ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම් හෝ ඒ ඉල්ලීම ප්‍රතිෂේධනය කරනු ලබන්නේ නම්, එසේ ප්‍රතික්ෂේප කිරීම හෝ ප්‍රතිෂේධනය කිරීම සඳහා වූ හේතු, දින විසි එකක කාලසීමාවක් ඇතුළත ලිඛිතව ලබා දෙනු ලැබිය යුතු ය.' "

(3) "83 වන පිටුවේ, 19 වන පේළියේ සිට 29 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(5) (1) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය යටතේ සාදනු ලබන නියෝග ප්‍රකරව වන විමසීමකට හෝ ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීම, නිශ්චිතව සඳහන් ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම් හෝ ප්‍රතිෂේධනය කරනු ලබන්නේ නම් හෝ පැහැර හරිනු ලබන්නේ නම්, සෝන්ස් එස්එල් විසින්, සුදුසු යයි සලකනු ලබන්නේ නම්, ඒ ප්‍රතික්ෂේප කිරීම, ප්‍රතිෂේධනය කිරීම හෝ පැහැර හැරීම වහාම අමාත්‍යවරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් උචිත ක්‍රියාමාර්ගයක් ගැනීම පිණිස අමාත්‍යවරයා විසින්, සති දෙකක් ඇතුළත, ඒ කාරණය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු ය.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකள් විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටතු.
Amendments put, and agreed to.

90 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

90ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clause 90, as amended, ordered to stand part of the Bill. .

91 සිට 93 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

91ආම් වාසකත්තිලිරුන්තු 93ආම් වාසකම් වරై චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clauses 91 to 93 ordered to stand part of the Bill.

94 වන වගන්තිය.- (නියෝග)

வாசகம் 94.- (ஒழுங்குவிதிகள்)
CLAUSE 94.- *(Regulations)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"85 වන පිටුවේ, 18 වන පේළිය සහ 19 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'විසින් හිමිකම් කියන ලද' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටතු.
Amendment put, and agreed to.

94 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

94ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clause 94, as amended, ordered to stand part of the Bill.

95 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

95ආම් වාසකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clause 95 ordered to stand part of the Bill.

96 වන වගන්තිය.- (දුෂ්කරතා ඉවත් කිරීම)

வாசகம் 96.- (சிரமங்களை அகற்றுதல்)
CLAUSE 96.- *(Removal of difficulties)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "86 වන පිටුවේ, 21 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'96. (1) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ දී යම්' "

(2) "86 වන පිටුවේ, 28 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(2) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම, එය සාදනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමතය ලැබීමෙන් පසුව පමණක් ඒ නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකள් විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටතු.
Amendments put, and agreed to.

96 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

96ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clause 96, as amended, ordered to stand part of the Bill.

97 සිට 146 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

97ආම් වාසකත්තිලිරුන්තු 146ආම් වාසකම් වරై චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clauses 97 to 146 ordered to stand part of the Bill.

147 වන වගන්තිය.- (ඵලදායිතා කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා)

வாசகம் 147.- (உற்பத்தித்திறன் ஆணைக்குழுவின் நிறைவேற்றுப் பணிப்பாளர்)
CLAUSE 147.- *(Executive Director of the Productivity Commission)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"125 වන පිටුවේ, 13 වන පේළිය සහ 14 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ඔහුගේ සුදුසුකම් සහ පළපුරුද්ද සහ සේවානියුක්තියේ නියම සහ කොන්දේසි, නියෝග මඟින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටතු.
Amendment put, and agreed to.

147 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

147ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clause 147, as amended, ordered to stand part of the Bill.

148 සිට 174 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

148ආම් වාසකත්තිලිරුන්තු 174ආම් වාසකම් වරై චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clauses 148 to 174 ordered to stand part of the Bill.

175 වන වගන්තිය.- (ආයතනයේ අධ්‍යක්ෂවරයා පත් කිරීම)

வாசகம் 175.- (நிறுவகத்தின் பணிப்பாளரை நியமித்தல்)

CLAUSE 175.- *(Appointment of the Director of the Institute)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"146 වන පිටුවේ, 9 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(2) අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු ලැබිය යුතු තැනැත්තාගේ සුදුසුකම් සහ පළපුරුද්ද සහ අධ්‍යක්ෂවරයාගේ සේවානියුක්තියේ නියම සහ කොන්දේසි, නියෝග මඟින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විඩුක්කප්පට්ටු ඒற්றුක්කොள්ளප්පට්ටது.
Amendment put, and agreed to.

175 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

175ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 175, as amended, ordered to stand part of the Bill.

176 සිට 191 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

176ஆம் வாசகத்திலிருந்து 191ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 176 to 191 ordered to stand part of the Bill.

192 වන වගන්තිය.- (දුෂ්කරතා ඉවත් කිරීම)

வாசகம் 192.- (சிரமங்களை அகற்றுதல்)

CLAUSE 192.- *(Removal of difficulties)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "155 වන පිටුවේ, 27 වන පේළිය සහ 28 වන පේළිය ඉවත් කරන්න."

(2) "156 වන පිටුවේ, 1 වන පේළියේ සිට 13 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

192 වන වගන්තිය, පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.

192ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 192, ordered to be left out of the Bill.

193 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

193ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 193, ordered to stand part of the Bill.

194 වන වගන්තිය.- (ඉවත් කිරීම් සහ ඉතිරි කිරීම්)

வாசகம் 194.- (நீக்குதல் மற்றும் சேமிப்பு)

CLAUSE 194.- *(Repeals and savings)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "158 වන පිටුවේ, 20 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සලසනු ලැබිය යුතු අතර ඒ නියෝග, රීති විධාන සහ නියම, මේ පනත යටතේ' "

(2) "158 වන පිටුවේ, 29 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යටත්ව, මේ පනත ආරම්භ වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, අවස්ථාවෝචිත පරිදි, ආර්ථික කොමිෂන්' "

(3) "161 වන පිටුවේ, 10 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'නඩු හෝ වෙනත් නීති කෘත්‍ය, මේ පනත ආරම්භ වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, මේ පනතේ III වන' "

(4) "162 වන පිටුවේ, 9 වන පේළියේ සිට 32 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ක) (i) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ලද බීඕඅයි හි නිලධරයන් සහ සේවානියුක්තයන්, ඔවුන් විසින් හිමිකම් කියන ලද සේවානියුක්තියේ නියම සහ කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන නියම සහ කොන්දේසි මත, මේ පනත ආරම්භ වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවානියුක්තයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය; සහ

(ii) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරන ලද, බලපතුලත් කලාපවලට අනුයුක්තව සිටි බීඕඅයි හි නිලධරයන් සහ සේවානියුක්තයන්, ඔවුන් විසින් හිමිකම් කියන ලද සේවානියුක්තියේ නියම සහ කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන නියම සහ කොන්දේසි මත, මේ පනත ආරම්භ වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි සෝන්ස් එස්එල් හි නිලධරයන් සහ සේවානියුක්තයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ සේවානියුක්තයාට ගෙවිය යුතු ව්‍යවස්ථාමය ගෙවීම් ගණනය කිරීමේ දී, බීඕඅයි සමඟ ඒ සේවානියුක්තයා සේවය කරන ලද කාලසීමාව සැලකිල්ලට ගනු ලැබිය යුතු ය;

(ග) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ලද, ආර්ථික කොමිෂන් සභාවේ හෝ සෝන්ස් එස්එල් හි සේවයට සම්බන්ධ වීම තෝරා නොගන්නා බීඕඅයි හි නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු පරිදි වන ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයක් අනුව යම් වන්දියක් ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමය මේ පනත ආරම්භ වීමෙන් පසු මාසයකට නොවැඩි දිනයක දී පළ කරනු ලැබිය යුතු අතර, (ක) ඡේදය යටතේ ආර්ථික කොමිෂන් සභාවේ හෝ සෝන්ස් එස්එල් හි නිලධරයකු හෝ සේවානියුක්තයකු වශයෙන් සලකනු ලබන සෑම නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් ම, ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමය පළ කිරීමේ දිනයේ සිට මාසයක් ඇතුළත ඔහුගේ තෝරා ගැනීමේ සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.' "

(5) "163 වන පිටුවේ, 1 වන පේළියේ සිට 4 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත් ව) ඉවත් කරන්න."

(6) "163 වන පිටුවේ, 8 වන පේළියේ සිට 13 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර පහත දැක්වෙන කොටස අදේශ කරන්න:

'එස්එල් විසින්, ඉවත්කරන ලද පනතේ අධිකාරි බලය ප්‍රකාරව පිහිටුවන ලද බල ප්‍රදේශ, බලපතුලත් කලාප, බලපතුලත් ව්‍යවසායයන් සහ ප්‍රාදේශීය ව්‍යවසායයන් සම්බන්ධයෙන් සහ ඊට අදාළව බීඕඅයි විසින් ක්‍රියාත්මක කරන ලද සියලු බලතල දිගටම ක්‍රියාත්මක කරනු ලැබිය' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකළ් විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
Amendments put, and agreed to.

194 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

194ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clause 194, as amended, ordered to stand part of the Bill.

195 වන වගන්තිය.- (අර්ථ නිරූපණය)
வாசகம் 195.- (பொருள்கோடல்)
CLAUSE 195.- *(Interpretation)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "164 වන පිටුවේ, 4 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

''ප්‍රාදේශීය ව්‍යවසාය' යන්නෙන්, ඉවත් කරන ලද' "

(2) "164 වන පිටුවේ, 10 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

''ඕඕඅයි' යන්නෙන් ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අදහස් වේ.' "

(3) "164 වන පිටුවේ, 20 වන පේළියේ සිට 22 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න."

(4) "165 වන පිටුවේ, 1 වන පේළිය සහ 2 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'II වන සහ III වන කොටස්වල සහ මේ කොටසේ කාර්යය සඳහා 'අමාත්‍යවරයා' යන්නෙන් " "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තංකළ් විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
Amendments put, and agreed to.

195 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

195ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clause 195, as amended, ordered to stand part of the Bill.

196 වන වගන්තිය.- (අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව)
வாசகம் 196.- (ஒவ்வாமை ஏற்படும் பட்சத்தில் சிங்கள உரை மேலோங்கி நிற்றல்)
CLAUSE 196.- *(Sinhala text to prevail in case of inconsistency)*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"165 වන පිටුවේ, 13 වන පේළියේ සිට 15 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'196. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
Amendment put, and agreed to.

196 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

196ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
Clause 196, as amended, ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය, දීර්ඝ නාමය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

චට්ටමාකු වාසකමුම් විරිවුප් පෙයරුම් තලෛප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.
චට්ටමූලම් තිරුත්තංකළුටන් අරික්කෛ චෙය්යප්පට්ටතු.
Enacting Clause, Long Title and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

විනා විටුක්කප්පට්ටු, ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
අතන්පඩි, චට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්රාම් මුරෛ මතිප්පිටප්පට්ටු නිරෛවේර්රප්පට්ටතු.
Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එකල්හි වේලාව අ. භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 5.52ට, 2024 ජූලි 26 වන සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

අප්පොළුදු නේරම් පි.ප. 5.30 මණික්කුප් පින්දිවිට්ටමෛයාල් මාණ්පුමිකු පිරදිච් චපානායකර් අවර්කළ් විනා විටුක්කාමලේයේ පාරාළුමන්ර්තත්තෛ ඔත්තිවෛත්තාර්.
ඉදන්පඩි, පි.ප. 5.52ක්කු, පාරාළුමන්රම් 2024 යූලෛ 26, වෙළ්ළික්කිළමෛ මු.ප. 9.30 මණි වරෛ ඔත්තිවෛක්කප්පට්ටතු.

It being past 5.30 p.m., THE HON. DEPUTY SPEAKER adjourned Parliament without Question put.
Parliament adjourned accordingly at 5.52 p.m. until 9.30 a.m. on Friday, 26th July, 2024.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

313 වන කාණ්ඩය - 16 වන කලාපය
தொகுதி 313 - இல. 16
Volume 313 - No. 16

2024 ජූලි 26වන සිකුරාදා
2024 யூலை 26, வெள்ளிக்கிழமை
Friday, 26th July, 2024

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2024 ජූලි 26වන සිකුරාදා
2024 யூலை 26, வெள்ளிக்கிழமை
Friday, 26th July, 2024

අන්තර්ගත ප්‍රධාන කරුණු

ගරු අගමැතිතුමාගේ විශේෂ ප්‍රකාශය [පිටුව 2847]

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [පිටුව 2911**]**

වරප්‍රසාද:

ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යවරයා විසින් 2024.07.23 දින සභාගත කළ ලිපිය [පිටුව 2912]

ශෝක ප්‍රකාශ: [පිටු 2919-2972]

ගරු ඒ.එච්.එම්. අලවි මහතා
ගරු එම්.එන්. අබ්දුල් මජීඩ් මහතා
ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා

பிரதான உள்ளடக்கம்

மாண்புமிகு பிரதம அமைச்சரினது விசேட கூற்று [ப: 2847]

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 2911]

சிறப்புரிமை:

இராஜாங்க அமைச்சர் மாண்புமிகு செஹான் சேமசிங்கவினால் 2024.07.23ஆம் திகதி சமர்ப்பிக்கப்பட்ட கடிதம் [ப:2912]

அனுதாபத் தீர்மானங்கள்: [ப:2919-2972]

மாண்புமிகு ஏ.எச்.எம். அலவி
மாண்புமிகு எம்.என். அப்துல் மஜீத்
மாண்புமிகு பாலித தெவரப்பெரும
மாண்புமிகு மில்ரோய் பர்னாந்து

PRINCIPAL CONTENTS

SPECIAL STATEMENT BY HON. PRIME MINISTER [Col. 2847]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 2911]

PRIVILEGE:
Letter Tabled by State Minister Hon. Shehan Semasinghe on 23.07.2024 [Col. 2912]

VOTES OF CONDOLENCE: [Cols. 2919-2972]
Hon. A.H.M. Alawi
Hon. M.N. Abdul Majeed
Hon. Palitha Thewarapperuma
Hon. Milroy Fernando

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2024 ජූලි 26වන සිකුරාදා
2024 யூலை 26, வெள்ளிக்கிழமை
Friday, 26th July, 2024

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූනි 28 දිනැති අංක 2390/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි ඉදිරිපත් කරමි.

මෙම රෙගුලාසි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2022 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු අගමැතිතුමාගේ විශේෂ ප්‍රකාශය.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ඊට ප්‍රථම 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගැන්වීමට වාර්තාවක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඒක ඉදිරිපත් කරන්න, ගරු සභානායකතුමා.

52(6) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තා
நிலைக்கட்டளை இல. 52(6)இன்படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
REPORTS PRESENTED UNDER STANDING ORDER NO. 52(6)

වර්ල්ඩ් ලයිෆ් ලයින් යෝගා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
வர்ள்ட் லய்ப் லய்ன் யோகா நிறுவனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
INSTITUTE OF WORLD LIFE LINE YOGA (INCORPORATION) BILL

"වර්ල්ඩ් ලයිෆ් ලයින් යෝගා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ වාර්තාව" - [සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

පනත් කෙටුම්පත 2024 අගෝස්තු 06වන අඟහරුවාදා දෙවන වර කියවීය යුතුයයි නියෝග කරන ලදී.

சட்டமூலம் 2024 ஓகஸ்ட் 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.

Bill ordered to be read a Second time upon Tuesday, 06th August, 2024.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමාගේ ප්‍රකාශය.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
පුදුම කලබලයක් නේ තිබෙන්නේ. ඇයි කලබල?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
නැහැ, නැහැ, කිසිම කලබලයක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කිසිම කලබලයක් නැහැ. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මම දැනගෙන හිටියේ නැහැ ඒක, not to my knowledge.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමාගේ විශේෂ ප්‍රකාශය.

ගරු අගමැතිතුමාගේ විශේෂ ප්‍රකාශය
மாண்புமிகு பிரதம அமைச்சரினது விசேட கூற்று
SPECIAL STATEMENT BY HON. PRIME MINISTER

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரும்)
(The Hon. Dinesh Gunawardena - Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, අද දින පාර්ලිමේන්තුවේ දී රජය වෙනුවෙන් අග්‍රාමාත්‍යතුමා විධියට ප්‍රකාශයක් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. එම ප්‍රකාශය පිළිබඳ අවශ්‍යතාව ගරු කථානායකතුමාට සඳහන් කරලා, අවස්ථාව ඉල්ලා සිටියා.

ගරු කථානායකතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුවේ රැඳී සිටින මේ මොහොත ඉතාම තීරණාත්මක මොහොතක්. පාර්ලිමේන්තුවට, අපේ රටේ ජනතාවට, රටේ පාලන තන්ත්‍රයට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් එලෙසමයි. පාර්ලිමේන්තුවේ උත්තරීතර බව රැක ගැනීම සඳහා කටයුතු කළ අවස්ථා රාශියක් තිබෙනවා.

අද දින පවතින මේ තත්ත්වයට තුඩු දුන් ශ්‍රී ලංකාවේ පොලිස්පතිවරයා පසු ගිය දා, - මම නම්, ගම් සඳහන් කරන්න උත්සාහ කරන්නේ නැහැ - පොලිස්පති ධුරය දරමින්, ආරක්ෂාව ඇතුළු එයට අදාළ කටයුතු සහ ජනාධිපතිවරණය පිළිබඳ පූර්ණ බලය ඇති මැතිවරණ කොමිසමට සහාය වෙමින්, ඒ කටයුතු කරමින් සිටියා. ශ්‍රේෂ්ඨාධිකරණය ජූලි මාසයේ 25වැනි දා පොලිස්පතිතුමාගේ වැඩ තහනම් කිරීමේ අතුරු නියෝගයක් නිකුත් කර තිබෙනවා. ඒ වාගේම ඒ පිළිබඳ යළි අහන්නට දිනය නොවැම්බර් මාසයේ 11වැනි දාට නියම කර තිබෙනවා. මුළු රටම දන්නවා, නොවැම්බර් මාසයේ 11වෙනි දා වනවිට ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණය පවත්වා හමාරයි කියලා. එවිට නව ජනාධිපතිවරයා දිවුරුම් දෙන අවස්ථාවට පැමිණෙනවා.

එතෙක් පොලිස්පතිවරයා අපේ රටේ මැතිවරණ කොමිසම සමඟ කටයුතු කිරීමත්, ඒ වාගේම අපේ රටේ ආරක්ෂාව පිළිබඳ බරපතළ ලෙස ඔහු වෙත පැවරී ඇති කටයුතු අත්හිටුවීමටත් මෙසේ නිගමනය කිරීම විශාල ආන්දෝලනයකට රට පරිවර්තනය කර තිබෙනවා, පාර්ලිමේන්තුව ඇතුළුව. ඒ නිසා මම සැකෙවින් කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒ පිළිබඳ මූලික අයිතිවාසිකම් නඩු ගණනාවක් තිබෙනවා. ඒ පිළිබඳ විස්තරය ඉදිරිපත් කළ හැකියි, හැන්සාඩ්ගත වීම සඳහා.

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාව අනුව ඡන්ද බලය ජනතා පරමාධිපත්‍යයේ අංගයකි. එබැවින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා මැතිවරණ කොමිසමේ අරමුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (2) ව්‍යවස්ථාව මඟින් දක්වා ඇත. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම පෙත්සම පිළිබඳ අවසන් තීන්දුව ලබා දෙන තෙක් ක්‍රියාත්මක වන වාරණ නියෝග ලබා දීමේදී, එම වාරණ නියෝගය පළමුවරට මෙම නඩුව විභාගයට ගැනෙන 2024 නොවැම්බර් 11වැනි දා සිට ඉදිරියට ක්‍රියාත්මක කිරීමට දැනට තිබෙන තත්ත්වය අනුව අර්ථ නිරූපණය තමයි ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් මේ නිවේදනය කරන්නේ. එහිදී මැතිවරණ කොමිෂන් සභාවේ අදහස් ලබා ගෙන නොමැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ඇ) (2) ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ නිර්දේශයක් මත ව්‍යවස්ථාදායක සභාව විසින් එවැනි වැඩබලන පත් කිරීමක් අනුමත කර ඇත්නම් මිස දින 14කට නොවැඩි කාලයක් අඛණ්ඩව පොලිස්පති ධුරයේ කටයුතු කිරීමට කිසිදු තැනැත්තෙක් පත් කළ නොහැක.

ගරු කථානායකතුමනි, එවැනි තත්ත්වයක් තුළ ඉදිරි ජනාධිපතිවරණයේදී වත්මන් ජනාධිපතිවරයා ද අපේක්ෂකයෙකු බවට පත් වන විට වැඩබලන පොලිස්පතිවරයා අවදානම් සහගත තත්ත්වයකට පත් වනවා. ඒ වාගේම මම සඳහන් කරන්න කැමැතියි,- *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
පුදුම කථා නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔව් ඉතින්, ජනාධිපතිතුමාට නේ පත් කරන්න වෙන්නේ. ඔබතුමන්ලා කියන කථාවලට මම මේ පිළිතුරු දෙන්නේ. *[බාධා කිරීමක්]* මේ ගොල්ලන් මෙතෙක් - ඊයේ වෙනකම් - කිව්වේ,

ජනාධිපතිවරයා තමයි මීළඟ වැඩ බලන එක්කෙනාත් පත් කරන්නේ කියලායි. *[බාධා කිරීමක්]* නැතිව ඔබතුමා පත් කරනවාද? ගරු කථානායකතුමා පත් කරනවාද? පත් කරන්න තමයි මම ගරු කථානායකතුමාටත් මේ කියන්නේ. ඔබතුමා අතේ තිබෙන බලතල මුළු මහත් පාර්ලිමේන්තුවට, - *[බාධා කිරීමක්]* මම ඉතින් රවුම් හකීම් මහත්මයා නඩු කථා කරන හැටි හොඳින් දන්න කෙනෙක්. ඒ ගැන මම ඔබතුමාට මීට වඩා කියන්නේ නැහැ. ඒක අපි පස්සේ කථා කර ගනිමු; we will argue that matter later. If you all want to argue, we will argue this matter even the whole of next week. We are ready.

නමුත් මම කියන්නේ ගරු කථානායකතුමනි, අද දින උදේ ප්‍රවෘත්තිවලින් කිව්වා, මැතිවරණ කොමිසම ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කරලා තිබෙන බව. නාම යෝජනා කැඳවන දිනය, ඡන්දය පවත්වන දිනය සැප්තැම්බර් මාසය දක්වා ඉතා පැහැදිලිව දක්වා තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියක් ලැබීමෙන් පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ඇ) ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් පොලිස්පතිවරයා පත් කරනු ලැබේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බහුතරයකගේ සහයෝගය ලබා ගනිමින් ධුරයේ සිටින පොලිස්පතිවරයා තනතුරින් ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තමයි නීත්‍යානුකූලව ඔහුව ඉවත් කිරීමේ බලය තිබෙන්නේ. මේ බව ඊයේත් ගරු සභානායකතුමා පෙන්වූවා.

වැඩ බලන පොලිස්පතිවරයෙක් පත් කිරීම සඳහා ජනාධිපතිවරයාට පවතින නීතිය තුළ ප්‍රතිපාදන නොමැති බැවින් ජනාධිපතිවරයා විසින්, - *[බාධා කිරීමක්]* මා මිත්‍ර කිරිඇල්ල මන්ත්‍රීතුමා ඒ පැත්තේ ඉන්නකොට එකක් කියනවා, මේ පැත්තේ ඉන්නකොට තව එකක් කියනවා. ප්‍රතිපාදන නොමැති බැවින් ජනාධිපතිවරයා විසින් වැඩ බලන පොලිස්පතිවරයා ලෙස වෙනත් අයෙකු පත් කරනු ඇතැයි ශ්‍රේෂ්ඨාධිකරණයට අපේක්ෂා කළ නොහැකියි, මේ තත්ත්වය තුළ.

තුන්වන කාරණය, ඔබතුමන්ලා පොලිස් ආඥාපනත කියවා බලන්න. එය මුල සිට අගට කියවීමට මා කාලය ගන්නේ නැහැ. මම එකී පොලිස් ආඥාපනත **සභාගත*** කරනවා.

මේක දන්නේ නැත්නම් ගිහිල්ලා ඒක කියවන්න. ගිය වාරයේත් මෙවැනි ප්‍රශ්නයකට මුහුණ දුන්නා, කලින් පොලිස්පතිවරයෙකු සම්බන්ධවත්. ඒ නිසා පොලිස්පතිවරයෙකු එහෙම හදිසියේ කනෙන් අල්ලලා දොට්ට දාන්න බැහැ. එහෙම හිතාගෙන ඉන්න අයත් ඇති. නමුත්, එහෙම දොට්ට දාන්න බැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අනුගමනය කළ යුත්තේ පවතින නීතියයි. ඒ නිසා පොලිස් ආඥාපනත මඟින් එකී පොලිස් ආඥාපනතේ විධිවිධාන පරිපාලනය කිරීම පොලිස්පතිවරයා වෙත පවරා ඇත. පොලිස්පතිවරයාට තම ධුරයේ රාජකාරි කිරීම තහනම් කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන නොමැත. එබැවින් පොලිස්පතිවරයා විසින් සිය ධුරයෙහි සිදු කරනු ලබන රාජකාරි කටයුතු වැළැක්වීමට ජනාධිපතිවරයාට මෙලෙස වැඩ බලන පත්වීමක් ද කළ නොහැක. තවමත් පොලිස්පති ධුරය දරන්නේ හිටපු පොලිස්පති. එම ධුරය හිස් වෙලා නැහැ. නොයෙක් නොයෙක් දේවල් අර්ථ නිරූපණය කරනවා. ඒ වාගේම පොලිස්පතිවරයා පත් කරනු ලැබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එම තීරණය කළ ආකාරය ගැන නොයෙක් වාදයන්, කරුණු ඉදිරිපත් කරනවා. නමුත් ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තිබෙන්නේ පාර්ලිමේන්තුව යටතේ. එය පාර්ලිමේන්තුවේ සමගාමීව තිබෙන ව්‍යවස්ථාදායකයක්. එය පාර්ලිමේන්තුවේ දිගුවක් වන අතර, පාර්ලිමේන්තුව බලාපොරොත්තු වන ආකාරයේ යටත් ආකාරයේ හැසිරීමට මුළු මහත් පාර්ලිමේන්තුව එසේ නම් මැදිහත් විය යුතුයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඕනෑම තීරණයක් ව්‍යවස්ථාදායකයේ තීරණයක් බවට පත් වෙන්නේ ඒ නිසායි. එය පාර්ලිමේන්තුවේ කැමැත්ත ප්‍රකාශ කිරීමක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීරණ පාර්ලිමේන්තු පාලනයට පමණක් යටත් වේ. පාර්ලිමේන්තුව හැර වෙන කිසිම ආයතනයකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ක්‍රියාදාමය හා තීරණ සම්බන්ධයෙන් කිසි ආකාරයකින් හෝ ප්‍රශ්න කළ නොහැකිය.

ගරු කථානායකතුමනි, නොයෙක් අය අර්ථ නිරූපණය කළා, සංඛ්‍යා එකතුව අඩු කිරීම, වැඩි කිරීම ගැන. මම ඒ ගැන කථා කළේ නැහැ. ඒ කාලයේත් කථා කළේ නැහැ. ව්‍යවස්ථා සභාවේ අභ්‍යන්තර තීරණ එලෙස බාහිරව කථා නොකරන බවටත් අපි එහි සභිකයන් හැටියට පැහැදිලි තීරණයක හිටියා. එහි විපක්ෂ නායකතුමාත් හිටියා; මමත් හිටියා. ගරු කථානායකතුමා තමයි එහි සභාපති; නිල බලයෙන් සභාපති. අපේ අනෙක් සභිකයන්ගේ නම් ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ නිසා ඒ ගත්තා වූ තීරණය වෙනස් ආකාරයකට පත් කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ කථානායකවරයා, අග්‍රාමාත්‍යවරයා, විපක්ෂ නායකවරයා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හතරදෙනෙක්, විශේෂඥයින් තුන්දෙනෙක් සමන්විත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පාර්ලිමේන්තුව විසින් එම තහවුරු කිරීමේ බලය පවරා දී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සතු අනුමත කිරීමේ බලය ව්‍යවස්ථාදායක කාර්යයක් වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කටයුතු අධිකරණයෙන් විමසා බැලිය නොහැක. පාර්ලිමේන්තුව උත්තරීතරයි. මා යළිත් කියනවා, ව්‍යවස්ථාදායක සභාවේ බලය අධිකරණයකින් විමසා බැලිය නොහැකියි. එබැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කටයුතු සම්බන්ධයෙන් සොයා බැලීමට හෝ නියෝග කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට බලයක් නොමැත. එබැවින්, වාරණ නියෝගය නීතියෙන් වලංගු නොවේ. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රැස් වුණාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ගන්න තීරණ එක්ක බොහෝ විට සම්පූර්ණ එකඟතාව තිබෙනවා. අපේ අනෙක් සභික මන්ත්‍රීතුමා ඉන්නවා. මම නම්, ගම් කියන්න යන්නේ නැහැ. ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා ජනාධිපතිතුමාට පත් කළ හැකි නියෝජිතයා ලෙස ඉන්නවා. ඒ වාගේම, අපේ සාගර කාරියවසම් මැතිතුමා අග්‍රාමාත්‍යවරයාගේ නියෝජිතයා හැටියට ඉන්නවා. අපේ විපක්ෂ නායකතුමාගේ නියෝජිත ලෙස ගරු කබීර් හෂීම් මැතිතුමා ඉන්නවා. මේ අය සියලුදෙනා අත්දැකීම් සහිත, විවිධ අර්බුදකාරී අවස්ථාවලට මුහුණ දුන්නු ක්‍රියාදාමවල නිරත වුණු අය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවට අයත් වරප්‍රසාද, බලතල, මුක්තිය පිළිබඳ තිබෙන බලය හැරුණුකොට පාර්ලිමේන්තුව විසින් අධිකරණ බලය අධිකරණය හරහා ක්‍රියාත්මක කරනු ලබන අතර, එහිදී ජනතාවගේ අධිකරණ බලය පාර්ලිමේන්තුව විසින් සකස් කරන නීතිය අනුව ක්‍රියාත්මක කළ හැකිය.

**** කථාව අවසානයේ පළ කර ඇත.***

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

එබැවින්, පාර්ලිමේන්තුවේ නිර්මාණයක් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතලවලට අධිකරණ බලයක් නොමැත. එබැවින්, වත්මන් පොලිස්පතිවරයාගේ පත් කිරීමට ලබා දුන් අනුමැතිය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගත් තීරණය ශ්‍රේෂ්ඨාධිකරණයට ආපසු හැරවිය නොහැකි අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීන්දුව ක්‍රියාත්මක විය යුතු යැයි මම ගරු කථානායකතුමාට යළිත් මේ ප්‍රකාශයේදී සඳහන් කරන්නට කැමැතියි. එසේ නොවන්න, ව්‍යවස්ථාදායක සභාවේ බලය උපරිමය පාවිච්චි කිරීමේ පාර්ලිමේන්තුවට යටත්ව තිබෙන ව්‍යවස්ථාදායක සභාව බලශූන්‍ය ආයතනයක් බවට අප විසින්ම පත් කරනවා ඇති. ජනාධිපතිතුමාට නිර්දේශ කරන්නේ අපයි; ව්‍යවස්ථාදායක සභාවයි. ඒ, ඔබතුමාගේ ප්‍රධානත්වයෙන්. ඔබතුමා එසේ ප්‍රධානත්වය දරන්නේ පාර්ලිමේන්තුවේ ප්‍රධානියා නිසායි. ඒ නිර්දේශයන්, තෝරා ගැනීම් ගැන ජනාධිපතිතුමාගේ විමසීම් පිළිබඳ තෝරා ගැනීම් නිර්දේශ කරන්නේ ව්‍යවස්ථාදායක සභාවයි. ඒ ගන්නා තීරණය, ඔබතුමාගේ නිවේදනය දැන්වීම ජනාධිපතිතුමා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ව්‍යවස්ථාදායක සභාවේ අනුගමනය කරන පරිදි දැන්වීම ගරු කථානායකතුමාගේ බලයයි; වගකීමයි. ඒ පමණයි ඔබතුමා කර තිබෙන්නේ. ඒ ගැන විවිධ අර්ථ නිරූපණ දීමට මා හිතන විධියට අපි පාර්ලිමේන්තුවත්, ව්‍යවස්ථාදායක සභාවත්, අපේ රාජ්‍යයේ ප්‍රධාන නිලතල හෑල්ලුවට ලක් කිරීමේ භයානක උත්සාහයක සමහර දේශපාලනඥයන් යෙදී තිබෙනවා.

එයින් වැළකෙන ලෙස, ඒ දේශපාලනඥයන් විනිළුවට භාර ගන්නට උත්සාහ දරන මෙය අප විනිළුවට ලක් නොකර කටයුතු කළ යුතුයි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ උත්තරීතර නියෝගයන් ලබා දී තිබෙන ගරු කථානායකවරුන් අතර දිවංගත අනුර බණ්ඩාරනායක මැතිතුමා ද ඉතා පැහැදිලිව පාර්ලිමේන්තුව අධිකරණයේ ඇඟිලි ගැසීම්වලට, තර්ජනයට ලක් වෙන අවස්ථාවේ පාර්ලිමේන්තුවේ උත්තරීතර බව ප්‍රකාශයට පත් කළ අවස්ථාව ඔබතුමාටත්, මටත් සිහිපත් වෙනවා. ඒ වාගේම අපේ චමල් රාජපක්ෂ මැතිතුමා ඒ තීන්දුව යළිත් ගෙන තව වාරයක් එය ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒ නිසා අපි උත්තරීතර පාර්ලිමේන්තුවක් හැටියට ඉටු කළ යුතු කාර්යය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමු.

ඒ වාගේම ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ආ) ව්‍යවස්ථාව යටතේ රටේ ආරක්ෂාව පිළිබඳ වගකීම ජනාධිපතිතුමා සතු වෙනවා. පොලිස්පතිවරයා, පොලීසිය, යුද හමුදා බලඇණිවලට සමාන හමුදා, ඒ කියන්නේ විශේෂ කාර්ය බලකාය, බුද්ධි අංශවල අණ දෙන නිලධාරියා ද වෙනවා. මෙම අතුරු තහනම් නියෝගය මඟින් ජනාධිපතිවරයා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ආ) **ව්‍යවස්ථාව** මඟින් පැවරී ඇති රාජකාරී කටයුතු ඉටු කිරීමට බාධා පමුණුවනවා. එය අපි හොඳින්, ගැඹුරෙන් තේරුම් ගත යුතුයි. එම වාරණ නියෝගයේ කිසිදු නෛතික පදනමක් දක්වා නොමැති අතර, එබැවින් කිසිදු නීතිමය පදනමකින් තොරව හුදෙක්ම නීතිවිරෝධී යැයි පෙනෙන එවැනි වාරණ නියෝග පිළිගැනීමට පාර්ලිමේන්තුවට හැකියාවක් නොමැත.

අවසාන වශයෙන්, උනන්දුවක් දක්වන දේශපාලන පක්ෂ විසින් ගොනු කරන ලද ඇතැම් මූලික අයිතිවාසිකම් පෙත්සම් කිහිපයද අනුව මූලික අදියරේදී මෙම වාරණ නියෝගය ලබා දී ඇත. එවැනි තත්ත්වයක් තුළ නුදුරු අනාගතයේදී ජනාධිපතිවරණය පැවැත්වීමට නියමිත බව දැන දැනත් අවශ්‍ය සියලු පක්ෂ නියෝජනය කිරීමට අවස්ථාවක්වත් ලබා දීමක් සිදු වුණේ නැත. මම යළිත් මෙය සිහිපත් කරන්නේ ඒ නිසායි. එවැනි තීන්දු පිළිනොගන්නා බව, එයට වඩා පාර්ලිමේන්තුව උත්තරීතර බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම පිළිබඳවත් මෙම ගරු සභාවේ හිටපු කථානායකතුමෙක් වන අනුර බණ්ඩාරනායක මැතිතුමා දුන් තීන්දුවේ අවසානයේදී, "මේ සභාවේ කථානායකවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පැහැදිලිවම මෙම ප්‍රකාශය මා සිදු කරනවා" යනුවෙන් කියලා, ඒ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට ඉහළින් පාර්ලිමේන්තුවේ උත්තරීතර බව ආරක්ෂා කළා. ඒ ආකාරයෙන් කටයුතු කරන්න, කලින් ද සඳහන් කළ පරිදි සභානායකතුමා ද ඊයේ දිනයේදී සඳහන් කළ පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඇ) ව්‍යවස්ථාව යටතේ අපිට තිබෙන බලය අපි ආරක්ෂා කර ගැනීම සඳහා මුළු ආණ්ඩුවම, ඒ වාගේම පාර්ලිමේන්තුවේ ආණ්ඩුව හා විපක්ෂය කටයුතු කළ යුතුයි.

පාර්ලිමේන්තුවේ ඛේදවාචකයකට පරිවර්තනය කිරීමෙන් ලබන තාවකාලික සන්තුෂ්ටියෙන් ගිනි දැල් අවුස්සන්නට බලාපොරොත්තු වන; තාවකාලික සන්තුෂ්ටිය ලබන්න බලාපොරොත්තු වන අය එහි ඉටු කරන බරපතළ හා අනතුරුදායක ක්‍රියාවලියයි මා ඔබට යළිත් සිහිපත් කරන්නේ. කථානායකතුමා හැටියට ඔබතුමා දුන්නු තීරණය හාස්‍යයට ලක් කරලා තිබෙනවා. ඔබතුමා දුන්නු තීරණය ප්‍රශ්නයට පමණක් නොවෙයි හාස්‍යයට ලක් කරලා තිබෙනවා. පොලිස්පතිවරයා පිළිබඳ ඔබතුමා, ව්‍යවස්ථාදායක සභාව දුන් තීරණය හාස්‍යයට ලක් කරමින්, ඔබතුමා ජනාධිපතිවරයාට යවන ලද ලිපිය -තීරණය පරිදි යවන ලද ලිපිය- හාස්‍යයට ලක් කරන පිරිස් බවට මේ අය පත් වෙලා තිබෙනවා. ඒ ගැන කනගාටුයි. ව්‍යවස්ථාදායක සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම එක් ප්‍රධාන කොටසක්. එය ඇති කළේත්, එය පත් කළේත්, ඒ සඳහා බලතල පැවරුවේත් මේ පාර්ලිමේන්තුවයි. ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වන ව්‍යවස්ථාදායක සභාවට එලෙස කටයුතු කරන්නට ඉඩකඩක් ඇහිරීම සඳහා මේ ක්‍රියා මාර්ගවලට අවතීර්ණ වීම භයානක තත්ත්වයක්.

ගරු කථානායකතුමනි, මැතිවරණ කොමිසම අද දින පෙරවරුවේ 2024 ජනාධිපතිවරණය සම්බන්ධයෙන් ගැසට් පත්‍රයක් නිකුත් කර තිබෙනවා. අප පොලිස්පති සම්බන්ධව සුප්‍රීම් උසාවිය -ශ්‍රේෂ්ඨාධිකරණය- නොවැම්බර් 11 වැනිදා දක්වා වැඩ අත්හිටුවා දී ඇති නියෝගය බලරහිත කළ යුතු යැයි ගරු කථානායකතුමා හා මේ උත්තරීතර පාර්ලිමේන්තුව වෙත, නැවතත් එම කරුණ සිහිපත් කරනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ සඳහා හැකි ඉක්මනින් මැදිහත් වන ලෙස අපි යළිත් ඔබතුමාට දන්වා සිටිනවා.

ස්තුතියි.

** සභාමේසය මත තබන ලද පොලිස් ආඥාපනත:*
சபாபீடத்தில் வைக்கப்பட்ட பொலிஸ் கட்டளைச் சட்டம்:
Police Ordinance tabled:

POLICE

AN ORDINANCE TO PROVIDE FOR THE ESTABLISHMENT AND REGULATION OF A POLICE FORCE IN SRI LANKA.

Ordinance Nos,
16 of 1865
7 of 1866
18 of 1871
6 of 1873
7 of 1873
3 of 1875
1 of 1878
7 of 1880
1 of 1883
3 of 1883
13 of 1884
11 of 1886
23 of 1891
4 of 1897
13 of 1905
22 of 1906
14 of 1907
17 of 1908
7 of 1910
17 of 1912
12 of 1914
39 of 1916
40 of 1921
14 of 1924
20 of 1927
12 of 1933
21 of 1939
36 of 1945
32 of 1947

Law Nos,
3 of 1974

Act Nos,
15 of 1949
50 of 1954
32 of 1956
15 of 1962
2 of 1968
3 of 1972
41 of 1984

[1st January , 1866]

PRELIMINARY

Short title.

1 This Ordinance may be cited as the Police Ordinance.

Laws and customs repugnant to this Ordinance repealed.

2. So soon as any of the provisions of this Ordinance shall be brought into operation within any town, village, or limits, or part of any town or village, all laws, customs, and usages which may then be in force therein, so far as they are in anywise repugnant to or inconsistent with the provisions of this Ordinance, shall be revoked, abrogated, and repealed.

GENERAL POLICE FORCE

Establishment of police force.

3. It shall be lawful for the Minister, from time to time, as occasion may require, to establish, by Order published in the Gazette, a police force for the effectual protection of person and property within such towns as to him shall appear to require the same. Whenever such force shall be so established within any town this Ordinance shall come into operation therein :

Provided that no Order shall be necessary to establish the force in places where the same shall have been already established under the Ordinance No. 17 of 1844, to which this Ordinance shall apply.

Police force may be established in certain places, though not maintained in the manner prescribed in this Ordinance.

4. It shall be lawful for the Minister, by Order published in the Gazette, to establish a police force in any place other than large towns, though such force be not maintained in the manner prescribed by this Ordinance, and to declare that certain of the provisions of this Ordinance shall come into operation at such place, specifying the limits thereof, and such Order from time to time to revoke, alter, or amend.

Police in rural districts.

5. It shall be lawful for the Minister to establish a police force in any rural district, and to cause the same to be maintained in the manner hereinafter prescribed.

Quartering of police in disturbed or dangerous districts, or districts the inhabitants of which misconduct themselves.

6. It shall be lawful for the Minister, by Order published in the Gazette, to quarter police, or, should a police force have been already established there, to increase the same, in any part of Sri Lanka which shall be found to be in a disturbed or dangerous state, or in any part in which, from the misconduct of the inhabitants (whether in harboring offenders or suspected persons, refusing to aid in their apprehension, or otherwise) , he may deem it expedient so to do ; and the inhabitants of the parts of Sri Lanka in which the police or the additional number of men as aforesaid shall be so quartered, shall be charged with the cost of the men ; and the (See section 4 of the Transfer of Powers (Divisional Secretaries) Act, No. 58 of 1992. (Section 4 is appended in page 343A))Government Agent to whose district such part belongs, but not any (See section 4 of the Transfer of Powers (Divisional Secretaries) Act, No. 58 of 1992. (Section 4 is appended in page 343A)) Assistant Government Agent, shall assess the proportion in which such cost is to be paid by the inhabitants according to his judgment of their respective means.

Power to employ additional police force.

7. Whenever any large work shall be carried on or be in operation in any part of the country, and it shall appear to the Inspector-General of Police that the employment of an additional police force in the neighborhood of such large work is rendered necessary by the behaviour or reasonable apprehension of the behaviour of persons employed upon such large work, it shall be lawful for the Inspector-General of Police, with the approval of the Minister to direct the employment of such additional police force, and to maintain the same so long as the necessity shall continue, and to make orders from time to time upon the person having the control or custody of the funds of any company or person carrying on such large work for the payment of the extra force so rendered necessary as aforesaid.

Meaning of " large work ".

8. The term " large work" shall, unless the context otherwise requires, include any railway, tramway, manufactory, any plumb ago mining or other commercial business or concern in which a considerable number of artisans, operatives, workmen, coolies, or persons are employed.

Some of the provisions only of this Ordinance may be brought into operation in any place.

9. It shall be lawful for the Minister, by Order published in the Gazette, from time to time to declare that such of the provisions of this Ordinance as to him may seem advisable shall come into operation throughout Sri Lanka, or in any province, district, town, or place as shall appear to him to require the same, though there be no police force established therein.

Definition of limits of town.

10. The Order establishing a police force in any town shall also specify and define the limits of such town, and it shall be lawful for the Minister, from time to time as occasion may require, by Order, to alter or vary such limits.

Officers in whom the administration of police is vested.

20.(Sections 11 to 19 (both inclusive) are replaced by Act No. 2 of 1968.). The administration of the police in Sri Lanka shall be vested in the Inspector-General of Police, Superintendents and Assistant Superintendents of Police, inspectors, sergeants, and constables.

Appointment of officers for the purposes of this Ordinance.

21.

(1) There shall be appointed an Inspector-General of Police and such Deputy Inspectors-General of Police, Superintendents, Assistant Superintendents, inspectors, and other officers as may be necessary for the purposes of this Ordinance.

(2) A Deputy Inspector-General of Police shall discharge such functions of the Inspector-General of Police as the Inspector-General of Police may from time to time assign to him.

(3) In this Ordinance or any other written law "Inspector-General of Police " shall be deemed to include a Deputy Inspector-General of Police.

Additional police officers to be employed at the' cost of individuals.

22. It shall be lawful for the Inspector-General of Police or any Superintendent, if he shall think fit, on the application of any person showing the necessity thereof, to appoint any additional number of police officers to keep the peace, at the charge of the person making the application, but to be under the orders of tile Inspector-General of Police or Superintendent and for such time as they shall think fit:

Provided that it shall be lawful for the person on whose application such appointment shall

have been made, on giving one month's notice in writing to such Inspector-General of Police or Superintendent to require that the officer so appointed shall be discontinued, and such person shall be relieved from the charge of such additional force from the expiration of such notice.

Recovery of expense under sections 6.7, and 22

23. If upon demand any person refuses or fails to pay the sum due by him for maintaining the force under sections 6, 7, and 22, the Inspector-General of Police or Superintended shall report such refusal or failure to the nearest Magistrate's Court, which shall proceed to recover such sum as if it were a fine imposed by that court.

Establishment of police reserve.
[2, Law 3 of 1974]

24. There shall be established a police reserve to assist the police force in the exercise of its powers and the performance of its duties.

Appointment of Commandant and Deputy Commandant.
[2, Law 3 of 1974]

25.

(1) For the purposes of this Ordinance, there shall be appointed a Commandant who shall be in command of the police reserve and be responsible for its general administration in accordance with the provisions of this Ordinance and the regulations made hereunder.

(2) There shall be appointed an officer of the police force not below the rank of Superintendent of Police to be Deputy Commandant who shall, in the absence of the Commandant, exercise and perform all his powers and duties.

Enrolling of reservists.
[2, Law 3 of 1974]

26.

(1) The Commandant shall, in accordance with the regulations made in that behalf, appoint to the police reserve such number of Reserve Superintendents, Reserve Assistant Superintendents, Reserve Chief Inspectors, Reserve Inspectors, Reserve Sub-Inspectors, Reserve Sergeants-Major, Reserve Sergeants and Reserve Constables as may be determined by the Inspector-General of Police.

(2) Every appointment to the rank of Reserve Superintending and Reserve Assistant Superintendent shall be made with the prior written approval of the Inspector-General of Police.

Identity cards.
[3, Law 3 of 1974]

26A. An identity card issued to any person duly authenticated by the Commandant shall be conclusive proof of the appointment under this Ordinance of the holder thereof to the rank in the police reserve specified therein.

Mobilization.
[3, Law 3 of 1974]

26B.

(1) The Commandant shall, on the directions of the Inspector-General of Police, mobilize such officers of the police reserve as are required to assists the police force in the exercise of its powers and performance of its duties. No such officer shall be de-mobilized by the Commandant except on the directions of the Inspector-General of Police.

(2) The notification of mobilization may be conveyed to any member of the police reserve orally or in writing or by an announcement made over the radio or by publication in a newspaper.

Officers to serve in any part of the Republic.
[3, Law 3 of 1974]

26C. An officer of the police reserve shall be required to serve in any part of the Republic and within its territorial waters.

Powers, responsibilities c, of officers.
[3, Law 3 of 1974]

26D. On mobilization an officer of any rank in the police reserve shall have the same powers, duties, obligations and responsibilities and enjoy the same immunities as an officer of that rank in the police force.

Penalty for refusal to serve when mobilized.
[3, Law 3 of 1974]

26E.

(1) Any officer of the police reserve who, having been mobilized for service, fails without reasonable cause to report for service, or neglects or refuses to serve as such, shall be guilty of an offence and shall be liable on conviction after trial before a Magistrate to a fine not exceeding one thousand rupees or to rigorous imprisonment for a term not exceeding six months, or to both such fine and imprisonment.

(2) Any officer of the police reserve who, having been mobilized for service, fails without reasonable cause to carry out any lawful order, instruction or direction given for the performance of his duties by the Commandant or an officer of the police reserve duly authorized by the Commandant or any officer of the police force duly authorized by the Inspector-General of Police, shall be guilty of an offence and be liable on conviction after trial before a Magistrate to a fine not exceeding five hundred rupees or to simple

imprisonment for a term not exceeding three months, or to both such fine and imprisonment

Obligations of employers. [3, Law 3 of 1974]

26F. (1) It shall be the duty of every employer to give all proper facilities for enabling any person in his employ to become or to be a member of the police reserve and any such person who is a member of that reserve to undergo and render such training and serve as he may be required to undergo and render by or under this Ordinance.

(2) Any employer who

(a) fails to give the facilities referred to in subsection (1) of this section ; or

(b) by dismissing an employee or by reducing his wages or in any other manner penalizes him for undergoing or rendering any training or service referred to in that subsection, shall be guilty of an offence and shall, on conviction after trial before a Magistrate, be liable to a fine not exceeding one thousand rupees or to simple or rigorous imprisonment for a term not exceeding six months, or to both such fine and imprisonment.

(3) Where an employer guilty of an offence under this section

(a) is a body corporate, every person who, at the time of the commission of the offence, was a director, manager or secretary of such body; and

(b) is a firm, every partner of such firm, shall be deemed to be guilty of such offence unless such director, manager, secretary or partner, as the case may be, proves that such offence was committed without his consent or connivance and that he exercised all such diligence to prevent the commission of such offence as he ought to have exercised having regard to the nature of his functions in such capacity and in all the circumstances.

Unauthorized use of uniforms. [3, Law 3 of 1974]

26G. Any officer of the police reserve who

(a) when not mobilized and without lawful authority uses or wears the uniform or any part of the uniform of an officer of the police reserve or any imitation thereof which is calculated to deceive, or

(b) without lawful authority supplies to a person who is not an officer of the police reserve, any such uniform or part of such uniform, shall be guilty of an offence and shall of conviction after trial before a Magistrate be liable to a fine not exceeding two hundred rupees or to rigorous imprisonment for a term not exceeding three months, or to both such fine and imprisonment.

Framing of rules. [3, Law 3 of 1974]

> "In view of the foregoing interim order, His Excellency the President may, should he wish to, consider making an appointment in terms of the law for a suitable person to be appointed to act in the post of Inspector of Police for the duration of the operation of the afore-stated interim order."

ඒ "afore-stated interim order" එක මම දැන් කියෙව්වා. ඒකේ තිබෙන්නේ පොලිස්පතිවරයා ක්‍රියාත්මක වීම නවත්වලා. ගරු කථානායකතුමනි, දැන් ප්‍රශ්නය, පොලිස්පති ධුරය හිස්වෙලාද? ඒක හිස් කරන්න පුළුවන් කාටද? ශ්‍රේෂ්ඨාධිකරණයට පුළුවන්, ක්‍රියාත්මක වීම නවත්වන්න. That is right, ඒක දීලා තිබෙනවා. මම නීතිඥයෙක් හැටියටත් ඒකට එකඟයි. ඒක හරි. 126 ව්‍යවස්ථාවේ තිබෙන එකත් හරි. දැන් එතුමා ක්‍රියාත්මක වීම නවත්වලා තිබෙනවා. ධුරය හිස් කරලා නැහැ නේ. ධුරය හිස් කරන එකට Order එකක් දෙන්න පුළුවන්ද? ඇයි? ඒක අපි තර්කයක් හැටියට ගත්තත්, විධායකයේ කොටසක් නම් ඒ පත්වීම

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

කරලා තිබෙන්නේ, පත්වීම කරපු ආයතනයට ගිහිල්ලා ඒක reverse කරන්න ඕනෑ. මෙතුමන්ලාත් කිව්වා වාගේ එතකොට එනවා, පාර්ලිමේන්තුවටත් කාර්යභාරයක්, මේ procedure එකේ හැටියට.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Wait, Hon. Lakshman Kiriella. I am on my feet. එතකොට, දැන් තිබෙන ප්‍රශ්නය,-

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
I want to give notice.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
You can give notice, there is no problem.

ගරු කථානායකතුමනි, මේ Order එකේ හැටියටම පොලිස්පති ධුරය හිස් වෙලාද? නැද්ද? It is a question. දැන් මේ ප්‍රශ්නය තිබෙනවා. ධුරයක් හිස් වෙලා නැත්නම් වැඩ බලන්න පත් කරන්නේ කොහොමද? That is the next question. ධුරයක් හිස් වෙන්න ඕනෑ, වැඩ බලන්න පත් කරන්න. ධුරයක කෙනෙක් ඉන්දෙද්දී තව කෙනෙක් වැඩ බලන්න පත් කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නයත් එනවා. - *[බාධා කිරීමක්]* You can make your submission. - *[Interruption]* No, it is my duty to explain, as the Leader of the House. You go through the Standing Orders and learn the functions of the Leader of the House. I am doing my duty. It is something like you and me making submissions in court to support the judges. This is also like the duty of the lawyers. දැන් ගරු කථානායකතුමනි, ඔය ප්‍රශ්න දෙක මතු වෙනවා. ව්‍යවස්ථාදායක සභාවට මම ඊයේත් කිව්වා. එහෙම නම් දැන් මේ ප්‍රශ්නය නැවත ඔබතුමාට යොමු කරන්න ඕනෑ. ව්‍යවස්ථාදායක සභාව කැඳවීම හෝ නොකැඳවීම හෝ මේ ධුරය හිස් වෙලාද කියන එක තීන්දු කරන්න ඕනෑ. හිස් වෙලා නම් වැඩ බලන කෙනෙක් පත් කරන්න පුළුවන්. තනතුර හිස් වෙලා නැත්නම් පත් කරන්න පුළුවන්ද, බැරිද කියන ප්‍රශ්නය එනවා. හිස් කරනවා නම් කොහොමද හිස් කරන්නේ?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඇයි, ඇමතිවරු රට ගියාම පත් කරන්නේ?

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, ඇමතිවරු රට ගියාම පත් කරන විධිය ව්‍යවස්ථාවේ කොහේවත් නැහැ. හැබැයි, මේ කාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා. ඔබතුමා බලන්න, VIIඅ පරිච්ඡේදයේ Schedules ටික. එහි පත් කිරීම්, ඉවත් කිරීම් කරන හැටි තිබෙනවා.

ඒක procedure එකක්; ඒක ව්‍යවස්ථාවේ, මේ රටේ මූලික නීතියේ අංගයක්. ඒ නිසායි ඒක තිබෙන්නේ. ඒ නිසා ඇමතිවරයෙක් රට ගියාම acting Minister පත් කිරීමයි, මේ Schedule එකේ සිටින නිලධාරීන්, එනම් නීතිපතිවරයා, පොලිස්පතිවරයා, විගණකාධිපතිවරයා මේ ඔක්කෝම, පත් කිරීමයි කියන්නේ දෙකක්. මේ Schedule එකේ ඒක තිබෙනවා; ඒක ව්‍යවස්ථාපිත දෙයක්. ඒක උල්ලංඝනය කරන්න කාටවත් බැහැ. ඉතින් මම යොමු කළේ, මම සහාය දුන්නේ ඔබතුමාටත්, ගරු සභාවටත්. මෙහි නීතිමය තත්ත්වය සහ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන මේවායි. මේ Interim Order එකේ කියලා තිබෙන්නේ මේකයි. දැන් ඔබතුමන්ලා තීන්දු කරන්න, ගත යුතු පියවර කුමක්ද කියලා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඊයේ සහ පෙරේදා ඔබතුමා හිටියේ නැහැ. ඒ, බොහොම රසවත් දවස් දෙකක්. ඔබතුමා ඉන්නයි තිබුණේ. මම පුදුම වෙනවා, අපේ සභානායකතුමාගේ තර්ක ගැන. මොකද, ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ අයිතිය තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයට; it is the Supreme Court which has the right to interpret the Constitution. දැන් එතුමා මේ පාර්ලිමේන්තුවේදී ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කරනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ අර්ථ නිරූපණය වැරදියි කියනවා. - *[බාධා කිරීමක්]* Please do not disturb me. දැන් පැය භාගයක් කථා කරලා නැවතත් කථා කරනවා. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා කිව්වා, අනුර බණ්ඩාරනායක මැතිතුමාගේ තීන්දුව ගැන, අද ඇති වෙලා තිබෙන තත්ත්වයට අනුර බණ්ඩාරනායක මැතිතුමාගේ තීන්දුව බලපානවා කියලා. මම ඔබතුමාට කියන්න කැමැතියි, - *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉගෙන ගන්න, කෑ ගහන්නේ නැතුව. අනුර බණ්ඩාරනායක මැතිතුමාගේ තීන්දුව බලපාන්නේ, ගරු කථානායකතුමනි, ව්‍යවස්ථාපිත කාරණාවකට, legislative function එකකට. අද ඇති වෙලා තිබෙන ප්‍රශ්නය ව්‍යවස්ථාපිත කාරණාවක් නොවෙයි; it is not a legislative function. මේක විධායක කාරණාවක්. මොකද, ගරු ජනාධිපතිතුමාම කියලා තිබෙනවා, ව්‍යවස්ථාදායක සභාව විධායකයේ කොටසක් කියලා, that it is a part of the Executive. එතකොට, ඒක විධායකයේ කොටසක් නම්, ඒ විධායකයේ ක්‍රියාකාරකම්වලට විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත් කරන්න පුළුවන්.

මේ අය කියනවා, ඔබතුමා ව්‍යවස්ථාදායක සභාවේ සභාපති හැටියට ඉන්නකොට පොලිස්පතිතුමා පත් කෙරුවා කියලා. මම ඔබතුමාට කියන්නම්, ව්‍යවස්ථාදායක සභාවේ Minutes. එහි කියනවා, "...Article 41E of the Constitution and the Council noted that the approval or the disapproval of the recommendation of the Hon. President has not been supported..." යනුවෙන්.Constitutional Council එක ඇතුළේ ජනාධිපතිතුමාගේ නිර්දේශයට සහයෝගයක් ලැබිලා නැහැ කියනවා. එතකොට මේ අය කොහොමද කියන්නේ Constitutional Council එක ඇතුළේ දේශබන්දු පත් කෙරුවා කියලා? I will submit the Minutes. කියවා බලන්න, මේ Minutes. Constitutional Council එක ඇතුළේ - *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒකේ ඉතුරු ටිකත් කියෙව්වා නම් හරි, කොටසක් විතරක් කියවන්නේ නැතුව.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Constitutional Council එක ඇතුළේ දේශබන්දුව පත් කෙරුවේ නැහැ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. දේශබන්දු පත් කෙරුවේ රැස්වීම අවසන් වෙලා. රැස්වීම අවසන් වුණායින් පසුව ඔබතුමා ලියුමක් ලිව්වා, ජනාධිපතිතුමාට. ඒකයි ශ්‍රේෂ්ඨාධිකරණය කියන්නේ. ඒක තමයි වැරැද්ද.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම පහුවදා - *[බාධා කිරීම්]* මම පහුවදා මෙතැනදී කිව්වා, - *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමා ඒ සියලු කටයුතු කරන්න තිබුණේ Constitutional Council එක ඇතුළෙදි නේ. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. එහෙම - [බාධා කිරීමක්]

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න. Please, let me finish. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කිරිඇල්ල මන්ත්‍රීතුමා, ඔබතුමා මට කියන්න ව්‍යවස්ථාවේ කොතැනද ඔක තිබෙන්නේ කියලා.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මම ඔබතුමාට කියනවා - *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ව්‍යවස්ථාවේ කොතැනද ඔය කාරණය තිබෙන්නේ?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக්ෂ්මන් கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඔබතුමාට විරුද්ධව පරීක්ෂණයක් කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මෙතැන ව්‍යවස්ථාව වැරදි විධියට විග්‍රහ කරනවා. කොතැනද ඕක තිබෙන්නේ?

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக්ෂ්මන් கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
එම තීන්දුව තිබෙනවා. ඔබතුමා කියවන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කොතැනද තිබෙන්නේ? *[බාධා කිරීම්]* ඔබතුමා ව්‍යවස්ථාව හරියට කියවලා එන්න. හරියට කියවලා එන්න. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக්ෂ්මන් கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ඔබතුමාට විරුද්ධව - *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මගේ ලියුමේ කොතැනක හරි ව්‍යවස්ථාව උල්ලංඝනය වෙලා තිබෙනවා නම් හරි ඒ කොතැනද කියලා කියන්න මට.

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி லக්ෂ්මන් கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
මේකයි මම කියන්නේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

හයියක් නැහැ, ඔතැන වාඩිවෙලා ඉන්න.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ආපු දා ඉඳලාම ස්ථාවර නියෝග සියල්ලම උල්ලංඝනය කෙරුවා; හැම දාම උල්ලංඝනය කෙරුවා; හැම මිනිත්තුවේම උල්ලංඝනය කෙරුවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ව්‍යවස්ථාව හොඳට කියවලා එන්න, මොනවාද ඒකේ තිබෙන්නේ කියලා.*[බාධා කිරීම්]* මම දශමයක්වත් ව්‍යවස්ථාවෙන් පිට ගිහිල්ලා නැහැ.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අපි ව්‍යවස්ථාදායකයටත්, විධායකයටත්, අධිකරණයටත් බලපාන ඉතාම වැදගත් කාරණාවක් පිළිබඳව තමයි දැන් තර්ක කරමින් සිටින්නේ. මේ කාරණාව පිළිබඳව කථා කරන්න ඔබතුමා අපට ප්‍රමාණවත් කාලයක් ලබා දිය යුතුයි. මම දන්නවා, අද දින ශෝක ප්‍රකාශ යෝජනාවලට වෙන් වුණු දවසක් බව. මේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරුන්ගේ පවුල්වල අය පවා අද පැමිණ සිටිනවා. ඒ නිසා මම ඉතාම කෙටියෙන් මේ ගැන සඳහන් කරන්නම්.

අපේ බොරලුගොඩ සිංහයාගේ පුත්‍ර රත්නය වන අපේ අග්‍රාමාත්‍යතුමා, අපේ ජනාධිපතිතුමන්ගේ පන්ති මිත්‍රයා. එතුමාගේ පන්ති මිත්‍රයා මෙතැනට ඇවිල්ලා ජනාධිපති පුටුවේ ඉඳගෙන වෙනත් තර්කයක් නැඟුවා, මීට පෙර. ගරු අගමැතිතුමනි, ඔබතුමා අද නඟන තර්කය තමයි, මේ ව්‍යවස්ථාදායක සභාව පාර්ලිමේන්තුවේ, ව්‍යවස්ථාදායකයේ කොටසක් කියන එක.

නමුත් ජනාධිපතිතුමා එදා ඇවිල්ලා ඊට පරස්පර තවත් තර්කයක් නැඟුවා. ඒක තමයි, ඒක විධායකයේ කොටසක් කියන එක. ඒ, එදා. ඕනෑ වෙලාවට මේක හරව-හරවා මෙහෙම අර්ථ නිරූපණය කරන එක නවත්වා ගන්න ඕනෑ. අනෙක් එක, මේක භාරදූර වැඩක්. *[බාධා කිරීමක්]* ඔබතුමා අපේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අපි ඔක්කොම එකතු වෙලා පත් කරපු අපේ කථානායකතුමා. ඔබතුමා අපි ආරක්ෂා කරන්න ඕනෑ. අපිට ඒ වගකීම තිබෙනවා; විපක්ෂයේ අයටත්, ආණ්ඩු පක්ෂයේ අයටත් ඒ වගකීම තිබෙනවා. ඔබතුමාගේ පැත්තෙන් ගත්ත තීරණයක් පිළිබඳව,- ඔබතුමා මේ ව්‍යවස්ථාදායක සභාවේ සභාපති හැටියට ගත්ත තීරණයක් අභියෝගයට ලක් කරමින් තමයි ඒ නඩුව ගොනු කළේ. ඒ නඩුවේදී ඔබතුමාගේ තීරණය පිළිබඳව සැලකිල්ලට අරගෙන ඔබතුමාගේ නිදහසට කරුණු දැක්වූ නීතිපතිතුමාගේ තර්කයත් සැලකිල්ලට අරගෙන තමයි වෙනත් පුද්ගලයෙකුගේ ධුරය පිළිබඳව මේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ලබා දීලා තිබෙන්නේ. ඒක ඔබතුමාට අයිති දෙයක් නොවෙයි. ඔබතුමා ඒකේ පැටලෙන්න යන්න එපා. අපි කියන්නේ මේකයි. ඔබතුමා ගොදුරක් කරලා, මේ ජනාධිපතිතුමා අපේක්ෂකයෙක් හැටියට එතුමා කරන මැතිවරණයකට තමන්ට ඕනෑ පොලිස්පතිවරයෙක් තියාගෙන ඕනෑම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කරන්න ඔබතුමා ඉඩ දෙන්න එපා. *[බාධා කිරීම්]* ඒත් එක්කම ඔබතුමාට මම ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වැනි ව්‍යවස්ථාව සහ හතරවැනි ව්‍යවස්ථාව පිළිබඳව ඕනෑ තරම් නඩු තීන්දු තිබෙන බව. ඕනෑ තරම් නඩු තීන්දුවලදී ඒවා අර්ථ කථනය කරලා තිබෙනවා. දැන් මේකේ ඔබතුමාව,- *[බාධා කිරීම්]* මේක නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ වාගේ කථාවක්. *[බාධා කිරීම්]* ඔබතුමා ඊට ගොදුරක් වෙන්න එපා. ඔබතුමාව පාවිච්චි කරලා ඔබතුමාගේ තවත් තීරණයකට විරුද්ධව ඔබතුමා ලවා තීරණය ලියා ගන්න කරන මේ උත්සාහය ඔබතුමා දැනගන්න. අපි ඔබතුමාවආරක්ෂා කරනවා.

ගරු චාමර සම්පත් දසනායක මහතා (ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க - ஆரம்பக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Chamara Sampath Dasanayake - State Minister of Primary Industries)

ගරු කථානායකතුමනි, මේක විවාදයක්ද? විවාදයක් ඕනෑ නම් විවාදය ඉල්ලන්න කියන්න. නැත්නම් ඔබතුමාගේ ස්ථාවරය ප්‍රකාශ කරන්න. එච්චරයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මට කරුණු පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ, සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි, අපේ සභානායකතුමනි, මෙන්න ඒ නඩු තීන්දුව. නඩු තීන්දුව කියන්නේ, Interim Order එක. මම මේ Interim Order එක මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා. *[බාධා කිරීම්]*

මේකේ තිබෙන වැදගත් කාරණාවක් මම කියන්නම්, ගරු කථානායකතුමනි. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් මෙම අතුරු නියෝගයේ, unanimously, මෙසේ කියා තිබෙනවා:

> "...the petitioners have made out a strong prima facie case suggestive of the said appointment being contrary to the applicable provisions of the Constitution."

බැලූ බැල්මට පෙත්සම්කරුවන් සාධනීයව පෙන්වා දීලා තිබෙනවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාවලට පටහැනි වන ආකාරයට මෙම පත්වීම කරලා තිබෙනවා කියන එක. ඒක තීන්දුවේ තිබෙනවා. බලන්න, මේ තිබෙන්නේ. ඒක මේ අතුරු නියෝගයේ තිබෙනවා, "appointment being contrary to the applicable provisions of the Constitution" කියලා. එතකොට ශ්‍රේෂ්ඨාධිකරණය අතුරු තහනම් නියෝගය ලබා දීලා තිබෙන්නේ පත් කරපු ක්‍රමවේදයේ; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහන් කරපු ක්‍රමවේදයේ දෝෂයක් තිබෙන නිසායි. ඒ නිසා ඒ පත් කිරීම වළංගු නැහැ. ඒ වාගේම Supreme Court එක අතුරු නියෝගයක් - Interim Order එකක් - දෙනවා, restraining the respondent, Mr. Deshabandu Tennakoon from exercising the powers, functions and responsibilities of the office of the Inspector General of Police. එතකොට අතුරු නියෝගයක් දෙනවා, පත් කරපු ක්‍රමවේදයේ ව්‍යවස්ථා විරෝධී දෝෂයක් තිබෙනවා කියන එක බැලූ බැල්මට - *prima facie* ආකාරයෙන් - පෙනෙන නිසා. පත් කිරීම දෝෂ සහිත නිසා, පත් කරපු IGPගේ පත් කිරීම වලංගු නොමැති නිසා ඔහුට, ඔහුගේ බලය - powers, ක්‍රියාකාරීත්වය - functions, ඒ වාගේම වගකීම - responsibilities - පොලිස්පති හැටියට ක්‍රියාත්මක කිරීමෙන් ඔහුව නතර කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ නිසා හොඳට මතක තියා ගන්න, මම මේ පැහැදිලි කරන්නේ එතුමා පත් කරපු ක්‍රමවේදය ව්‍යවස්ථා විරෝධී නිසා තමයි ඔහු පොලිස්පතිවරයා හැටියට කටයුතු කිරීමෙන් වළක්වා තිබෙන්නේ. මම එක දෙයක් කියන්නම්. මේ ප්‍රශ්නයෙන් ජනාධිපතිවරයාට පැන යන්නට බැහැ. එතුමා අදටත් ජනාධිපති. එතුමා අපේක්ෂකයෙක් වුණා කියලා එතුමාගේ වගකීම් නතර කරන්න බැහැ. එතුමාගේ වගකීම තමයි පොලිස්පතිවරයෙක් නැති අවස්ථාවක, අඩුම ගණනේ වැඩබලන පොලිස්පතිවරයෙක් හෝ පත් කිරීම. එම ක්‍රියාවලිය එතුමාගෙන් එන්න ඕනෑ. Constitutional Council එක තමයි "Yes" or "No" කියන්නේ. දැන් මේ ජනාධිපතිවරයාට පොට වැරදිලා Constitutional Council එකට කියනවා, පත් කිරීම කරන්න කියලා.

මේ ඔක්කොම හදන්නේ ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවක් කරන්න. මෙහෙමයි, ජනාධිපතිවරයාට ඒක කරන්න බැරි නම් ඉල්ලා අස්වෙන්න කියන්න; ජනාධිපතිකමෙන් ඉල්ලා අස්වෙන්න

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කියන්න. එතකොට වැඩබලන ජනාධිපතිට පුළුවන්, රටේ නීතියට අනුව වැඩ කටයුතු කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා මේ නඩු තීන්දුවේ, තීන්දුවට ඒම සඳහා අවශ්‍ය වන්නා වූ පසුබිමේ පේළි දෙකක් තමයි කිව්වේ. මම ඒකට එකඟයි. මොකක්ද? The Interim Order states, I quote:

> "…prima facie case suggestive of the said appointment being contrary to the applicable provisions of the Constitution."

That is right. It further states, I quote:

> "In the circumstances, as required by law, this Court grants Leave..."

මේ ඇවිල්ලා තිබෙන්නේ බැලූ බැල්මට පෙනෙන නඩුකරයක්. ඒක මම කලිනුත් කිව්වා. Interim Order එකේ මොකක්ද තිබෙන්නේ? ඒකයි අපට වැදගත් වෙන්නේ. Interim Order එකේ තිබෙන්නේ,-

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Go and seek a clarification from the Court.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
What I am pointing out is, -

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
You are interpreting it.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
How can I interpret it?

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
You ask for an interpretation from the Court.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
I am not interpreting any particular Article. I am just reading, like your Leader of the Opposition did, the contents of the Interim Order, not anything else. මම නැවත වතාවක් කියන්නේ මේකයි. ගරු කථානායකතුමනි, මේ Interim Order එකේම තමයි තිබෙන්නේ - මම මේ දෙවැනි වතාවටයි මේක කියවන්නේ - I quote:

> "In view of the foregoing interim order, His Excellency the President may..." ,

It states "may" - "හැකිය" - not, "shall". "Shall" කිව්වා නම් "යුතුය". මෙතැනයි වෙනස. පළමුවෙනි කාරණය, ධුරයක් හිස් වෙලා තිබෙන්න ඕනෑ. Also, it states "the President may". එච්චරයි මම පෙන්වන්නේ. මේ, Interim Order එකේම තිබෙන කරුණු. මේ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න එක කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මම පොඩි උත්තරයක් දෙන්නම්, අපේ සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාට. එතුමා කිව්වා, පොලිස්පති ධුරය හිස් වෙලා නැහැයි කියලා. මෙවැනිම තත්ත්වයක් අපට ඉතිහාසයේ තිබුණා. පූජිත් ජයසුන්දර මැතිතුමාව අනිවාර්යයෙන් නිවාඩු යැව්වා. එතුමාව අනිවාර්යයෙන් නිවාඩු යැව්වාම මොකක්ද වුණේ? ඒත් පොලිස්පති ධුරය හිස් වෙලා නැහැ. එතකොට කවුද, සී.ඩී. වික්‍රමරත්න මහත්තයාව පත් කළේ? සී.ඩී. වික්‍රමරත්න මහත්තයා පත් කළා. එතුමා වැඩ බැලුවා. පොලිස්පති ධුරය හිස් වෙලා තිබුණේ නැහැ, එතකොට. එහෙම නම් ඔය තර්කය මෙතැනටත් අදාළයි. ජනාධිපතිවරයා විධියට තමන්ගේ යුතුකම් කොටස කරන්න බැරි නම්, ask him to step down and ask the Prime Minister to take over the powers of the President.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි (කලානිති) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, මේ වචනවල අර්ථය තේරුම් ගන්න. නීතියේ "may" and "shall" කියන එකේ තමයි ප්‍රධාන වෙනස තිබෙන්නේ. ඒක තේරුම් අරගෙන නැහැ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා, ඉක්මනින් කියන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මෙතැනදී අපට බොහොම පැහැදිලිව පෙනෙනවා ජනාධිපතිතුමා සහ ආණ්ඩුවේ කිසිම සද්භාවයක් නැහැයි කියලා. අපට මතකයි, එදා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් සිය ධුරයේ අන්තිම කාලයේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කටයුතු කරලා දවස් 52ක ආණ්ඩුවක් හදලා අනීතික අගමැතිවරයෙක් පත් කරලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

අන්තිමට අධිකරණය විසින් එය නිවැරදි කළා. දැන්, මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

මේ අන්තිම මාස එකහමාරේ, එහෙම නැත්නම් සති හතේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

මේ වෙලාවේ ඕනෑ නම්, අධිකරණයටම ගිහිල්ලා - ශ්‍රේෂ්ඨාධිකරණයෙන්ම- මේ ගැන මත විමසුමක් අහන්න පුළුවන්. ශ්‍රේෂ්ඨාධිකරණයෙන්ම අර්ථ දැක්වීමක් ගන්න පුළුවන්, මොකක්ද කරන්නේ කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමා මේ කාරණය දැන් අවසන් කරන්න. මොකද, අද Votes of Condolence ගැනීමට තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, දැන් මේ කාරණය අපි අවසන් කරමු.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
කියන්න, මොකක්ද කරන්නේ කියලා අධිකරණයෙන් අහන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි මේක අවසන් කරමු.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම අපි දකින ආකාරයට නම්, මේ ක්‍රියාවලියේදී

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

තමයි මේ සම්පූර්ණයෙන් ව්‍යවස්ථාදායකයේ සහ විධායකය අතර ගැටුමට මුල් වෙලා තිබෙන්නේ. ඔබතුමා ව්‍යවස්ථාදායක සභාවේ තීන්දුවක්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කිසිම වැරදි තීන්දුවක් ගත්තේ නැහැ, ඔබතුමා වැරදි ප්‍රකාශයක් ඒ කළේ. කරුණාකරලා ඒක ඉවත් කර ගන්න.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මට තත්පරයක් දෙන්න. ගරු කථානායකතුමනි, ඔබතුමා ගත්ත තීන්දුවක් නිසා; සම සමව ඡන්දය නොලැබී තිබෙන අවස්ථාවක ඔබතුමා "මෙසේ නම්.." කියලා යවපු ලිපිය නිසා තමයි මේ ගැටලුව ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා වඩාම සුදුසු ඔබතුමා ඔය මූලාසනයේ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා හොඳට එය කියවන්න. ඔබතුමා ප්‍රශ්නය කියවලා නොවෙයි ඔය කථා කරන්නේ. ඔය කථා කරන්නේ හැඟීම් අනුව.

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
අපේ අදහස නම්,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ඉඳගෙන තවදුරටත් මේ ප්‍රශ්නය සාකච්ඡා කිරීම පවා අසාධාරණයි. ඒ වරද පිළිගෙන ඔය ආසනයෙන් ඉල්ලා අස්- *[බාධා කිරීමක්]*

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න. මම මීට පෙර මේ ගැන සඳහන් කළා. මේ ගරු සභාවේ ගරු රවුල් හකීම් මැතිතුමාත් මේ ගැන පසුව අවධාරණය කළා. මේ ගරු සභාවේදී මේ ව්‍යවස්ථාදායක සභාව විධායකයේ කොටසක්ද, ව්‍යවස්ථාදායකයේ කොටසක්ද කියන ප්‍රශ්නය පැන නැඟිච්ච අවස්ථා එමටයි. ඒ බොහෝ අවස්ථාවල මේ ආණ්ඩු පක්ෂයේ - එක්කෝ ජනාධිපතිතුමා වෙන්න පුළුවන්, වෙනත් පාර්ශ්වයන් වෙන්න පුළුවන්- පැහැදිලි කළේ, ව්‍යවස්ථාදායක සභාව විධායකයේ කොටසක් හැටියට. නමුත් දැන් අද තර්කයක් ගෙන එනවා, පාර්ලිමේන්තුවේ කථානායක ව්‍යවස්ථාදායක සභාවේ මූලාසනය හොබවන නිසා සහ අනෙකුත් ඒ සංයුතීන් ඇතුළේ පාර්ලිමේන්තුවේ නියෝජනය වැඩි නිසා -ඒ කියන්නේ විපක්ෂ නායකයාගේ නියෝජිතයෝ, අරගොල්ලෝ මේගොල්ලෝ ඉන්න නිසා- මේක ව්‍යවස්ථාදායකයේ කොටසක් කියලා.

මම කියන්නේ, මේක මුලින් ඉවර කරගන්න. මේක හරියට ඉවර කර ගත්තොත් විතරයි, අපිට නිවැරදිව කටයුතු කරන්න පුළුවන් වෙන්නේ. දැන් මේක ව්‍යවස්ථාදායකයේ කොටසක් නම් අපිත් එකඟයි ව්‍යවස්ථාදායකයේ ක්‍රියාකාරිත්වයට අධිකරණයට අත පොවන්න බැහැ කියන එකට. *[බාධා කිරීමක්]* මට විනාඩියක් දෙන්න, ගරු සභානායකතුමනි. ගරු අනුර බණ්ඩාරනායක කථානායකතුමා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ආපු තීරණයකට අභියෝග කළේ ව්‍යවස්ථාදායකයට බලපෑම් කරන්න ශ්‍රේෂ්ඨාධිකරණයට බැහැ කියන පදනම මත ඉඳගෙනයි. හැබැයි, දැන් තිබෙන අභියෝගය, මේ පාර්ලිමේන්තුවට අදාළ කෙළින් නියෝගයක් නොවෙයි මේ තිබෙන්නේ, ව්‍යවස්ථාදායක සභාවට අදාළ නියෝගයක්. ව්‍යවස්ථාදායක සභාව පාර්ලිමේන්තුවේ කොටසක් නම් ඔබතුමන්ලා මේ කරන අභියෝගය, මේ කරන විග්‍රහය පිළිගන්න පුළුවන්. හැබැයි, මීට පෙර මේ සභාවේ විවිධ අයුරින් සඳහන් වෙලා තිබෙනවා, ව්‍යවස්ථාදායක සභාව විධායකයේ කොටසක්, විධායකය විසින් විවිධ තනතුරුවලට පත් කරනු ලබන නම් එච්චාම ඒක අනුමත කරනවාද, නැද්ද කියලා තීරණය කරන තැනක් බව. ඒ නිසා මේක හරියට විසඳා ගන්නේ නැතිව අපි දෙගොල්ලන් මේක ගැන දෙපැත්තට වාද කළා කියලා කිසිම ප්‍රතිඵලයක් ඇති වෙයි කියලා මම හිතන්නේ නැහැ. එක්කෝ, ගරු කථානායකතුමා මේ ප්‍රශ්නයට නිශ්චිතව පිළිතුරු දීලා මේක නිරාකරණය කරන්න ඕනෑ. එහෙම නැතුව අපි මේක දෙපැත්තට ඇද්දාය කියලා තේරුමක් නැහැ. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම දැන් මේ තර්කය ගෙනෙන්නේ,- මීට පෙර තවත් තීන්දුවක් ලබා දුන්නා ශ්‍රේෂ්ඨාධිකරණයෙන්, ව්‍යවස්ථාදායක සභාවෙන් විනිසුරුවන් පත් කිරීම අත්හිටුවලා. ඒ ගැන දැන් කරබාගෙන ඉන්නවා.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
නැහැ, නැහැ.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
දැන් ඒක පවතිනවා නේ. *[බාධා කිරීමක්]* නැහැ, මෙහෙමයි, නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ වාගේ මේ කථාව කියන්න බැහැ. *[බාධා කිරීම්]* "යන යකා කොරහත් බිඳගෙන යනවා වාගේ" කියලා කියමනක් තිබෙනවා නේ. ඒ වාගේ වැඩක් මේක. *[බාධා කිරීම්]* "යන යකා කොරහත් බිඳගෙන යනවා වාගේ" වැඩක් කරන්න ඔබතුමා ඉඩ දෙන්න එපා. මේ ඉතාම භයානක සට්ටනයක් ඇති කරන්නේ ඔබතුමා. කරුණාකර, පොඩ්ඩක් අපේ තර්කවලට,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ඒ සම්බන්ධයෙන් විමසන්න තැනක් තිබෙනවා. අපි එතැනින් විමසමු.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
අපට තර්ක ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ තර්කය මම භාර ගත්තා.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
දැන් ඔබතුමා යම් තීරණයක් දෙන්න යනවා නම්, අපි ඔක්කොම කැඳවලා, අපේ කරුණු විමසන්න. මොකද, මේක බැරෑරුම් කාර්යභාරයක්. අධිකරණයත්, ව්‍යවස්ථාදායකයත් සට්ටනයකට යන අවස්ථාවකට ඔබතුමා මහ පාදන්න එපා.

විධායකයේ වුවමනාවට මෙවැනි දෙයක් කිරීම ඉතාම භයානකයි. ඒ හින්දා තමයි මම මේක කියන්නේ. "යන යකා කොරහත් බිඳගෙන යනවා වගේ" වැඩකට මහ පාදන්න එපා කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(මාණ්පුමිකු முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, පසුගිය කාලයේම ජනාධිපතිතුමාගේ නිර්වචනය වුණේ, ව්‍යවස්ථාදායක සභාව විධායකයේ කොටසක් කියන එකයි. පසුගිය කාලයේ ව්‍යවස්ථාදායක සභාව සම්බන්ධයෙන්, එයින් සිදු කරන පත් කිරීම් සම්බන්ධයෙන් යම් යම් ආරවුල් ඇති වුණාම ජනාධිපතිතුමා පැහැදිලිවම ගිහිල්ලා ප්‍රසිද්ධ රැස්වීම්වලදී කිව්වා, ව්‍යවස්ථාදායක සභාව කියලා කියන්නේ පාර්ලිමේන්තුවට අයිති දෙයක් නොවෙයි, විධායකයට අයිති දෙයක් කියලා. එතකොට, විධායකය විසින් පරිපාලනමය වශයෙන් යම් යම් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරලා තිබෙනවා නම්, අධිකරණයට යන්න අයිතිය තිබෙනවා. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126වන ව්‍යවස්ථාව යටතේ තහවුරු කරලා තිබෙනවා. එතකොට, දැන් ජනාධිපතිතුමාම මේ පිළිබඳව නිර්වචනය දීලායි තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ඊළඟ කාරණාව තමයි, නීතිපතිතුමා මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේදී කරුණු දැක්වීමේදී කිසි විටෙකත් මේක පාර්ලිමේන්තුවට අයිති දෙයක් කියලා කරුණු දැක්වූවේ නැහැ. එතුමා මේ නඩුවේදී දැක්වූයේ වෙනත් කරුණු. එතකොට, නීතිපතිතුමාට එවැනි උපදෙස් ලබා දීලා තිබෙනවා නම්, එතුමා අධිකරණයේදී මේ කරුණු කාරණා කියලා තිබෙන්න ඕනෑ. ඒ කියන්නේ, නීතිපතිතුමාත් පිළිගන්නවා, ව්‍යවස්ථාදායක සභාව කියලා කියන්නේ විධායකය බව. ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන දේශපාලන ගැටලුව තමයි, දැන් ඔබතුමාව පාවිච්චි කරන්න හදන එක, ආණ්ඩුවේ දේශපාලන වුවමනා වෙනුවෙන්. ඒ නිසා ඔබතුමා ප්‍රවේශම් වෙන්න කියලා තමයි අපට ඉල්ලන්න තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීවරුනි, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගැටලු රාශියක් මතු වුණා. එල්ල කළ ලොකුම චෝදනාව තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඊ. ප්‍රකාරව මා විසින් ගන්නා ලද වැරදි තීරණයක් නිසා මේ තත්ත්වය මතු වුණාය කියන එක. මම කියනවා, අපි කිසිම වැරදි තීරණයක් ගත්තේ නැති බව. නියමිත ව්‍යවස්ථානුකූලව, නිවැරදිව, බොහොම කල්පනා කරලා, බොහොම සාක්ෂාත්ව හිතා බලලා තමයි ඒ තීන්දුව අරගෙන තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඒක ඔබතුමන්ලාට වැරදි වෙන්නට පුළුවන්, වෙන කෙනෙකුට වැරදි වෙන්නට පුළුවන්. නමුත් අපි හෘදය සාක්ෂියට එකඟව, නිවැරදිව, මේ හැම කාරණයක් ගැනම හොයලා බලලා තමයි ඒ තීන්දුව ගත්තේ. *[බාධා කිරීමක්]*

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා
(මාණ්පුමිකු கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ඔබතුමා-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාත් එක්ක කථා කරන්න දෙයක් නැහැ. ඔබතුමා හැමදාම වැරදි තර්ක මත ඉන්නේ.

[ගරු කථානායකතුමා]

ව්‍යවස්ථාව අනුව අපි ඒ තීරණය ගත්තේ හොඳට සාකච්ඡා කරලායි. එක තැනකදි කිව්වා, මම ගෙදර ඉඳලා මේ තීන්දුව ගත්තාය කියලා. ඒක සම්පූර්ණයෙන් වැරැදියි. එහෙම කථාවක් ව්‍යවස්ථාවේ කොහේවත් නැහැ. "…if law considers those abstained votes are not in favour…" කියන එක තමයි මගේ තර්කයේ තිබුණේ.

Constitution එකේ Article 41E (5)හි සඳහන් වනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මූලාසනය දරන්නා විසින් ඡන්දය පාවිච්චි කිරීම ගැන. එහි සඳහන් වෙනවා,

"The Chairman or the other member presiding shall not have an original vote,..."

That is, at the time of voting.

"...but in the event of an equality of votes on any question for decision at any meeting of the Council,..."

Any meeting of the Council.

"...the Chairman or other member presiding at such meeting, shall have a casting vote.'"

ඒකයි මම පාවිච්චි කළේ. ඔබතුමන්ලා මොන විධියට විග්‍රහ කළත් මෙතැන කිසිම අවුලක්, වාදයක් වුණේ නැහැ. සුප්‍රීම් උසාවිය- *[බාධා කිරීමක්]* ඒ නිසා අපි නිවැරදිව ඒ තීන්දුව අරගෙන තිබෙනවා. අද තිබෙන තත්ත්වය, පොලිස්පතිතුමාගේ - IGPගේ - සේවය තහනම් කරලා තිබෙනවා. නමුත් මම කියන්න කැමැතියි, මෙහි 41C වගන්තිය යටතේ - ව්‍යවස්ථා සභාවේ අනුමැතිය සහ පාර්ලිමේන්තුවේ එකඟතාව ඇතුව පත් වුණු මේ නිලධාරීන් ගැන වෙනම හැඳින්වීමක් තිබෙනවා, 41C වගන්තිය යටතේ - ඒ උදව්යගේ තනතුර හිස් කරනවා නම්, අපේ සුසිල් ප්‍රේමජයන්ත ගරු ඇමතිතුමා කිව්වා වාගේ තනතුර හිස් කරනවා නම්, තනතුර නතර කරනවා නම්, විශේෂ වැඩ පිළිවෙළක් - procedure එකක් - තිබෙන බව. ඒ වැඩ පිළිවෙළ අනුව ගිහිල්ලා ඕනෑ ඒ කටයුත්ත කරන්න. එහෙම නැත්නම් ආයෙත් සුප්‍රීම් උසාවියට ගිහිල්ලා සුප්‍රීම් උසාවියේදී මේ තීන්දුව ගන්න වෙනවා. ඒ නිසා දැන් ජනාධිපතිවරයාටවත් මේ තීරණය ගන්න බැරි තැනක තමයි මට නම් පෙනෙන විධියට තිබෙන්නේ. මම වැරදියි නම් තමුන්නාන්සේලා නිවැරදි කර ගන්න, උසාවියට ගිහිල්ලා. ඒ සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ එච්චරයි. බොහොම ස්තුතියි. *[බාධා කිරීම්]*

මීළඟට, කාරක සභා වාර්තා පිළිගැන්වීම. ගරු මයන්ත දිසානායක මැතිතුමා.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Health on Annual Performance Report of the Ministry of Health for the year 2022, which was referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පෙත්සම් පිළිගැන්වීම, ගරු නිපුණ රණවක මන්ත්‍රීතුමා - ***[සභා ගර්භය තුළ නැත.]***

2024 ජූලි 18 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය කළ පරිදි අද දිනට නියමිත වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වෙනත් දිනයකට යොමු කරනු ලැබේ.

වරප්‍රසාද ප්‍රශ්නය, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

වරප්‍රසාද: ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යවරයා විසින් 2024.07.23 දින සභාගත කළ ලිපිය
சிறப்புரிமை: இராஜாங்க அமைச்சர் மாண்புமிகு செஹான் சேமசிங்கவினால் 2024.07.23ஆம் திகதி சமர்ப்பிக்கப்பட்ட கடிதம்
PRIVILEGE: LETTER TABLED BY STATE MINISTER HON. SHEHAN SEMASINGHE ON 23.07.2024

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, මෙම වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට මාහට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි.

01. "2024.07.12 වන දින රාජ්‍ය මුදල් කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හර්ෂ ද සිල්වා මහතා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙනි" යන ශීර්ෂය යටතේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජික ගරු මන්ත්‍රීවරුන් 16දෙනෙකුගේ අත්සනින් යුක්තව ඔබ වෙත ඉදිරිපත් කර ඇති, 2024.07.23වන දින මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ මහතා විසින් සභාගත කරන ලද 2024.07.12 දිනැති ලිපිය සම්බන්ධයෙන් සහ එම අවස්ථාවේදී ගරු ශෙහාන් සේමසිංහ මහතා විසින් සිදු කරන ලද ප්‍රකාශය පිළිබඳව මෙසේ කරුණු දක්වා සිටිමි, ගරු කථානායකතුමනි.

02. එකී ලිපියේ 1 ඡේදය:

2024.07.12 වන දින රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති වශයෙන් මා විසින් කාරක සභා වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත සභාගත කරන ලද බව **පමණක්** පිළිගනිමි. එම වාර්තාව "ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ ආයතන සමූහය අතර මාර්ගගත ආකාරයෙන් වීසා සහ විදෙස් ගමන් බලපත්‍ර අයදුම් කිරීමේ සේවාව බැහැරින් ලබා ගැනීම පිළිබඳ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව" බව දන්වා සිටිමි. අතිරේක - addendums - සහ ඇමුණුම්වලින් ද - annexuresවලින් ද - සමන්විත එම සම්පූර්ණ වාර්තාව ඇමුණුම 1 වශයෙන් ඉදිරිපත් කරමි.

03. එකී ලිපියේ 2 ඡේදයේ සඳහන් සියලු කරුණු ප්‍රතික්ෂේප කරමි.

3.1 එකී ලිපියේ 2 ඡේදයේ 1 ප්‍රකාශය: තරයේ ප්‍රතික්ෂේප කරමි.

අදාළ වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලද බව එම වාර්තාවේ සඳහන් කර නැත. අදාළ වාර්තාවේ 1.2 ප්‍රකාරව ප්‍රශ්නගත කාරණය සම්බන්ධව විමර්ශනය කිරීමට රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ඒකමතිකව එකඟ වූ බව පමණක් සඳහන් කර ඇත.

අදාළ වාර්තාව සම්බන්ධයෙන් ගරු සාමාජික මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු විසින් තම අදහස් හා යෝජනා ලබා දුන් අතර එම අදහස් වාර්තාවේ අතිරේක ලෙස එකතු කර ඇත. (මේ පිළිබඳ මෙම ලේඛනයේ 3.2 මඟින් තවදුරටත් විස්තර කෙරෙනු ඇත.)

එම අදහස් නිරීක්ෂණය කිරීමෙන්ම අදාළ වාර්තාව සම්බන්ධයෙන් කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන්ගේ ඒකමතික එකඟතාවක් නොනිබූ බව පැහැදිලි වේ. (ඇමුණුම 1හි අන්තර්ගත අතිරේක)

3.2 එකී ලිපියේ 2 ඡේදයේ 2 ප්‍රකාශය: ප්‍රතික්ෂේප කරමි.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් කාරක සභා වාර්තා විශාල සංඛ්‍යාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. එම වාර්තා පාර්ලිමේන්තුව මඟින් කාරක සභාව වෙත යොමු කරන ලද කාරණා, වාර්ෂික අය වැය සහ කාරක සභාව විසින් විශේෂයෙන් විමර්ශනය කරන ලද කරුණු සම්බන්ධ වාර්තා වන අතර, එකී සියලු ආකාරයන්ගේ වාර්තා නවවන පාර්ලිමේන්තුව ආරම්භයේ සිටම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. එකී පූර්වාදර්ශවලට සහ පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට අනුගත වෙමින් අදාළ වාර්තාව ද ගරු කථානායකතුමා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

අදාළ වාර්තාවේ කරුණු අන්තර්ගත කර ඇති ආකාරය, නිගමන සහ නිර්දේශ පිළිබඳව ප්‍රථම වරට 2024.06.11වන දින මා විසින් කාරක සභාවට විස්තර කරන ලදී. ගරු සාමාජික මන්ත්‍රීවරුන් විසින් එම වාර්තාව සති 2ක් ඇතුළත අධ්‍යයනය කර අදහස් ලබා දීමට සාකච්ඡා කෙරුණු අතර, ඉන් අනතුරුව වාර්තාව පාර්ලිමේන්තුවට මා විසින් ඉදිරිපත් කරන බවටත්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව ඉදිරි කටයුතු සිදු කරන බවටත් පැහැදිලිව දන්වා සිටින ලදී. (මේ සම්බන්ධයෙන් සාක්ෂි ලෙස 2024.06.11 දින වචනාර්ථ සහිත සාකච්ඡා සටහන - verbatim report - ඇමුණුම 2 ලෙස ඉදිරිපත් කරමි.)

2024.06.18 වන දින අදාළ වාර්තාවේ පිටපත් ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් කාරක සභාවේ සියලු ගරු මන්ත්‍රීවරයන් වෙත ලබා දීම සිදු කරන ලදී. 2024.06.19 වන දින සිට වාර්තාවේ දෘඪ පිටපත් -physical copies - කාරක සභාවේ සියලු ගරු මන්ත්‍රීවරයන් වෙත ලබා දීම සිදු කරන ලදී. එදින සිට 2024.07.02වන දින දක්වා වාර්තාව පිළිබඳ අධ්‍යයනය කර තමන්ගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට කාලය ලබා දීම සිදු කර තිබුණි. නමුත්, 2024.07.02වන දින පැවැත්වීමට නියමිතව තිබූ කාරක සභා රැස්වීම 2024.07.09වන දිනට කල් දැමීමත් සමඟ අදාළ වාර්තාව සම්බන්ධ අදහස් ලබා **ගැනීමේ** කාලය තවත් සතියකින් දීර්ඝ විය. තවද, 2024.07.09වන දින ගරු වජිර අබේවර්ධන මන්ත්‍රීතුමා විසින් එදිනට පැවැත්වීමට නියමිතව තිබූ කාරක සභා රැස්වීම කල් දමන ලෙස ඉල්ලා කාරක සභා ලේකම් කාර්යාලය වෙත WhatsApp මාර්ගයෙන් ඉල්ලීමක් කර තිබුණි. මෙය ගරු සභාවට යොමු කළ අතර, එදින කාරක සභාවේ සලකා බැලීමට නියමිතව තිබූ ඇතැම් කරුණු ඊට පසු දින පාර්ලිමේන්තුවේදී සලකා බැලීමට නියමිතව තිබූ බැවින් රැස්වීම කල් නොදැමීමට කාරක සභාව තීරණය කරන ලදී.

නමුත්, එදින (2024.07.09) අදාළ වාර්තාව ද සලකා බැලීමට නියමිතව තිබූ බැවින්, ගරු වජිර අබේවර්ධන මහතාගේ ඉල්ලීම ද සලකා බලා වාර්තාව පිළිබඳ ගරු මන්ත්‍රීවරුන්ට තමන්ගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට 2024.07.10වන දින දක්වා කාලය ලබා දීමට තීරණය කර දැනුම් දෙන ලදී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)
ගරු කථානායකතුමනි, "ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA took the Chair.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදින ද, ඒ කියන්නේ 2024.07.09වන දින මා විසින් වාර්තාවේ නිර්දේශ පිළිබඳ සභාවට පැහැදිලි කරන ලදී. තවද ගරු මන්ත්‍රීවරුන් විසින් ලබා දෙන යෝජනා වාර්තාවේ අඩංගු කරුණු සමඟ එකඟ වූවත්, නොවූවත් ඒවා වාර්තාවේ අතිරේක ලෙස ඉදිරිපත් කරන බවට මා විසින් ප්‍රකාශ කර, කාරක සභාවේ WhatsApp සමූහය මඟින් 2024.07.09වන දින සියලු ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලදී. ඒ අනුව ආචාර්ය සුරේන් රාඝවන්, නීතිඥ රවුෆ් හකීම් සහ මයන්ත දිසානායක යන ගරු මන්ත්‍රීවරුන් විසින් තම අදහස් හා යෝජනා කාරක සභාව වෙත ලබා දුන් අතර, ඒ සියල්ල වාර්තාවේ අතිරේක ලෙස අඩංගු කර ඇත. (ඇමුණුම 1හි අන්තර්ගත අතිරේක)

මීට අමතර වශයෙන් වෙනත් කිසිදු මන්ත්‍රීවරයෙකු විසින් අදාළ වාර්තාවට අමතර අදහස් ලබා දීමක් සිදු කර නැති බැවින් එකී ලිපියේ 2 ඡේදයේ සඳහන් සියලු කරුණු ප්‍රතික්ෂේප කරමි.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

තවද, යම් මන්ත්‍රීවරයකු මෙම කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් සිට මෙම කාරක සභාවේ සාකච්ඡා වූ කරුණු අනුව සකස් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ප්‍රතිවිරුද්ධ හෝ විකල්ප අදහසක් සහිතව සිටිමින්, නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු අදහසක් ප්‍රකාශ කිරීමක් වාර්තාව සභාගත කරන තෙක් සිදු නොකර සිටීම හෝ මෙම කාරක සභාව විසින් එහි සාමාජිකයන් වෙත ලබා දුන් වාර්තාව කිසිදු පරිශීලනයක් නොකර සිටීම මෙන්ම, මෙම කාරක සභාවට අදාළව විටින් විට නිකුත් කළ නිවේදන සම්බන්ධයෙන් අදාළ කටයුතු සිදු නොකර සිටීම මෙම කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් සිය වගකීම් මුළුමනින්ම පැහැර හැරීමක් වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මඟින් කාරක සභා සාමාජිකයකු වෙත පවරා ඇති ව්‍යවස්ථාපිත වගකීම සම්බන්ධයෙන් නිසි උද්‍යෝගය - due diligence - ක්‍රියාත්මක කිරීම පැහැර හැරීමක් බව ද පෙන්වා දීමට කැමැත්තෙමි.

04. එකී ලිපියේ 3 ඡේදයේ සඳහන් ප්‍රකාශය ප්‍රතික්ෂේප කරමි.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් ලබා ගෙන එම කරුණු අධ්‍යයනය කර මෙකී මන්ත්‍රීවරුන් විසින් වාර්තාවක් ඉදිරිපත් කරන බව හෝ එම දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් ලබා ගෙන එම කරුණු අධ්‍යයනය කර කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන බව හෝ කිසිදු අවස්ථාවක සාකච්ඡා කර නැත. මේ සම්බන්ධයෙන් සාක්ෂි ලෙස ප්‍රශ්නගත කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද 2024.05.09, 2024.05.14 සහ 2024.06.04 දිනයන්හි වචනාර්ථ සහිත - verbatim - සාකච්ඡා සටහන් පිළිවෙළින් ඇමුණුම් 3, 4, 5 ලෙස ඉදිරිපත් කරමි.

05. එකී ලිපියේ හතරවැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය ප්‍රතික්ෂේප කරමි.

ගරු වජිර අබේවර්ධන මන්ත්‍රීතුමා විසින් 2024.07.11 දින කාරක සභාවේදී මාහට පවසා සිටින ලද්දේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් පිරිසක් විෂය භාර අමාත්‍යාංශයෙන් කාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා ඇති බවයි. 2024.07.10 දින මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් 2024.07.09 දින පැවැති කාරක සභා රැස්වීමේදී ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පැහැදිලි කරමින් කාරක සභාව වෙත යොමු කර තිබූ ලේඛනයක් ඒ වන විටත් වාර්තාවට අතිරේකයක් ලෙස ඇතුළත් කිරීමට කටයුතු කර තිබූ අතර, ඒ බව ගරු වජිර අබේවර්ධන මන්ත්‍රීතුමා වෙත මා විසින් දැනුම් දෙන ලදී. අදාළ වචනාර්ථ සහිත සාකච්ඡා සටහන් ඇමුණුම 6 වශයෙන්ද, මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් කාරක සභාව වෙත යොමු කර තිබූ එම ලේඛනය ඇමුණුම 1හි පරිපූරකය E ලෙස සඳහන් කර අමුණා ඇත.

06. එකී ලිපියෙහි 5 ඡේදයේ 1 ප්‍රකාශය: තරයේ ප්‍රතික්ෂේප කරමි.

අදාළ වාර්තාව සකස් කරන ලද්දේ මහජන ආරක්ෂක අමාත්‍යාංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, මොබිටෙල් පුද්ගලික සමාගම සහ නීතිපති දෙපාර්තමේන්තුව ලබා දුන් ලේඛන සහ ඔවුන් සමඟ සාකච්ඡා කර ලබා ගත් තොරතුරු පදනම් කරගෙනය.

මෙම සියලු ලේඛන කාරක සභාවේ සියලු මන්ත්‍රීවරුන් වෙත ද ලබා දී ඇත. එකී ලේඛන කාරක සභාවේ වාර්තාවේ ඇමුණුම් ලෙස අන්තර්ගත කර ඇත. (ඇමුණුම 1)

මෙම ප්‍රශ්නගත කාරණය සම්බන්ධයෙන් සාමාජික මන්ත්‍රීවරුන්හට විවිධ අදහස්, මතවාද තිබිය හැක. එම අදහස්වලට ගරු කිරීමක් වශයෙන්ම එම අදහස් හා යෝජනා ලබා දුන් ගරු මන්ත්‍රීවරයන්ගේ නමින් වාර්තාවේ අතිරේක ලෙස ඇතුළත් කර ඇත. (ඇමුණුම 1)

07. මා විසින් මෙම සියලු කටයුතු සිදු කරන ලද්දේ රටේ උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74 ව්‍යවස්ථාවෙන් පිළිගනු ලබන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග මඟින් කාරක සභාවට ලබා දී ඇති බලතල අනුව බව මම අවධාරණය කරමි.

08. මීට අමතරව මේ සම්බන්ධව පහත කරුණු ඔබගේ අවධානයට ඉදිරිපත් කරමි.

8.1 එකී චෝදනා ඉදිරිපත් කරන මන්ත්‍රීවරුන් 16දෙනා අතුරින් දෙදෙනෙකු එම ප්‍රශ්නගත කරුණ සම්බන්ධයෙන් නිලධාරීන් සමඟ සිදු කළ සාකච්ඡා වාර තුනෙන් එකදු සාකච්ඡාවකට හෝ සහභාගී වී නැත.

තිදෙනෙකු එක සාකච්ඡා වාරයක් සඳහා පමණක් සහභාගී වී ඇති අතර, සාකච්ඡා වාර තුනම සඳහා සහභාගී වී ඇත්තේ එකී මන්ත්‍රීවරුන් අටදෙනෙකු පමණකි. අදාළ පැමිණීම් සනාථ කෙරෙන අත්සන් ලේඛන ඇමුණුම 7 වශයෙන් ඉදිරිපත් කරමි.

මෙහිදී ද ඇතැම් මන්ත්‍රීවරුන් මෙම කාරක සභාවේ කටයුතු සම්බන්ධයෙන් නිසි උද්‍යෝගයෙන් කටයුතු කර නොමැති බව පැහැදිලි වේ.

8.2 අදාළ වාර්තාව පිළිබඳ තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට මෙතරම් අවකාශය ලබා දී තිබූ අවස්ථාවකදීත් ඒ සම්බන්ධයෙන් කටයුතු නොකර එය පාර්ලිමේන්තුවේ සභාගත කිරීමෙන් පසු මෙලෙස එල්ල කරන ලද අභූත චෝදනා තරයේ ප්‍රතික්ෂේප කරමි.

8.3 ඉහත කී සාකච්ඡා සම්බන්ධයෙන් වූ විශේෂ අවස්ථා සම්බන්ධ සටහනක් ඇමුණුම 8 වශයෙන් ඉදිරිපත් කරමි.

09. මීට අමතරව 2024.07.23 දින මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ මහතා විසින් තම වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරමින් සිදු කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් මෙසේ මාගේ අදහස් ප්‍රකාශ කරමි:

9.1 එතුමා විසින් ප්‍රකාශ කළ පරිදි අදාළ වාර්තාවේ නිර්දේශ කාරක සභාව විසින් ඒකමතිකව අනුමත කළ බව මෙම වාර්තාවේ කිසිම ස්ථානයක සඳහන් කර නැති බව මම යළිත් ප්‍රකාශ කර සිටිමි.

9.2 එතුමා විසින් ප්‍රකාශ කළ පරිදි අදාළ වාර්තාව අසත්‍ය සහ දෝෂ සහිත බවත්, 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ "අ" කොටසේ අංක 4 යටතේ දක්වා ඇති වැරැද්ද සිදු කර ඇති බවත්, එමඟින් එකී මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට සිදු කරන ප්‍රකාශයත් මුළුමනින්ම බැහැර කරමි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරනවා.

10. මෙකී සියලු චෝදනා මා වෙත පුද්ගලිකව එල්ල වන චෝදනා නොවන බව පැහැදිලිව පෙනෙන අතර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ කටයුතු සම්බන්ධයෙන් සිදු කරන ලද අපහාසාත්මක, අභූත චෝදනාවීම බරපතළ කාරණයකි.

ඒ අනුව, අදාළ ලිපියේ සඳහන් කර ඇති සහ මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ මහතා විසින් තම වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරමින් සිදු කරන ලද ප්‍රකාශයේ සඳහන් කරන ලද සියලු චෝදනා එක්ව හා වෙන් වෙන් වශයෙන් මා විසින් තරයේ ප්‍රතික්ෂේප කරමි.

11. මෙම අභූත චෝදනාවන්ගේ බරපතළකම සලකා බලා මෙය වහා නිවැරදි කරන ලෙස ඉල්ලා සිටිමි.

11.1 2024.07.23 වන දින මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ මහතා විසින් සභාගත කරන ලද සහ 2024.07.12 දිනැති "2024.07.12 වන දින රාජ්‍ය මුදල් කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හර්ෂ ද සිල්වා මහතා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙනි" යන ශීර්ෂය යටතේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජික ගරු මන්ත්‍රීවරුන් 16කගේ අත්සනින් යුක්තව ඔබ වෙත ඉදිරිපත් කර ඇති ලිපිය මඟින් 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ "අ" කොටසේ අංක 4 යටතේ දක්වා ඇති වැරැද්ද වන "පාර්ලිමේන්තුව හෝ යම් කාරක සභාවක් රැවටීමේ අදහසින් පාර්ලිමේන්තුව වෙත හෝ යම් කාරක සභාවක් වෙත ව්‍යාජ, අසත්‍ය හේතු හෝ වරදවා පෙන්වූ ලේඛනයක් ඉදිරිපත් කිරීම" යන වැරැද්ද සිදු කර ඇති බව පැහැදිලි වේ.

11.2 එකී ලිපිය මඟින් සහ මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ මහතා විසින් තම වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරමින් සිදු කරන ලද ප්‍රකාශය මඟින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සහ සභාපතිවරයාගේ වරප්‍රසාද බරපතළ ලෙස උල්ලංඝනය වී ඇති බව දන්වා සිටින අතර, ඒ සම්බන්ධ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන මෙම කාරක සභාවේ වරප්‍රසාද සුරක්ෂිත කරන මෙන් ඉල්ලා සිටිමි.

හර්ෂ ද සිල්වා, පා. ම.,
සභාපති, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාට බොහොමත්ම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
එම වරප්‍රසාද ප්‍රශ්නය අවශ්‍ය කටයුතු සඳහා ගරු කථානායකතුමා වෙත යොමු කරනවා.

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි පිරේම්නාත් සි. තොලවත්ත)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ඒ කාරණය වරප්‍රසාද ප්‍රශ්නයක් ලෙස ඉදිරිපත් කරනවා නම්, එතුමාට ඒ අයිතිය තිබෙනවා, මම හඬ කරන්නේ නැහැ. නමුත්, එතුමා වරප්‍රසාද ප්‍රශ්නය ගොනු කිරීම සම්බන්ධව අදහස් දක්වනවා නම්, එය කළ යුත්තේ වරප්‍රසාද කමිටුව තුළයි. කෙසේ වෙතත්, එතුමා ප්‍රශ්න කළා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන්ගේ - මමත් එහි සාමාජිකයෙක් - හැසිරීම සම්බන්ධයෙන්. ඒ නිසා එහි සාමාජිකයෙකු ලෙස මට අවස්ථාව ලැබිය යුතුයි ඒ සඳහා උත්තර දෙන්න. එතුමා ප්‍රකාශ කළේ,-

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළේ.

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි පිරේම්නාත් සි. තොලවත්ත)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
නැහැ, නැහැ. ඔබතුමා ඒක කළා. අපි වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කළ වෙලාවේ ඔබතුමා උත්තර දුන්නා. කරුණාකරලා මට බාධා කරන්න එපා, උත්තර දෙන්න ඉඩ දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ප්‍රකාශ කළා අදාළ තත්ත්වය සම්බන්ධයෙන් අපි නිවැරදි අවධානයකින් යුතුව වැඩ කළේ නැහැ, සහභාගි වෙලා නැහැ කියන කාරණය. *[බාධා කිරීමක්]* මහත්තයෙක් වාගේ හැසිරෙන්නකෝ. ඔබතුමාට එරෙහිව වරප්‍රසාද ප්‍රශ්නය ගෙනාපු වෙලාවේ ඔබතුමා උත්තර දුන්නා. දැන් ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය ගෙනාවාම අපට කථා කරන්න දෙන්න. *[බාධා කිරීම්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, YouTube එකේ පැහැදිලිවම තිබෙනවා, ඒක බලන්න පුළුවන්. ඒ කමිටුවේ සාමාජිකයෙක් හැටියට ඔය කියන කාරණාව සම්බන්ධයෙන් මම සහභාගි වෙලා තිබෙනවා, කිහිප වතාවක්. හැබැයි, මට බැරි වුණු අවස්ථාවල මම YouTube එකෙන් ඒක බලලා තිබෙනවා. එතුමාට ඇඟිල්ල දිගු කරන්න බැහැ, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෝ වගකීමෙන් කටයුතු කළේ නැහැයි කියලා. එය සම්පූර්ණයෙන් වැරදි කථාවක් බව මම පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ. *[බාධා කිරීම්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
I have the right. You just sit down. Of course, I have the right. You just sit down! - *[Interruption]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Please be silent. - *[Interruption]*

ගරු නීතිඥ ප්‍රේමිනාත් සී. දොලවත්ත මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි පිරේම්නාත් සි. තොලවත්ත)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
You cannot make me sit down!

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
You sit down! Hon. Presiding Member, ask him to sit down. - *[Interruption]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ශෝක ප්‍රකාශ යෝජනා.

අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමා, අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.එන්. අබ්දුල් මජීඩ් මැතිතුමා, අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමා හා අභාවප්‍රාප්ත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා.

ශෝක ප්‍රකාශ: ගරු ඒ.එච්.එම්. අලවි මහතා, ගරු එම්.එන්. අබ්දුල් මජීඩ් මහතා, ගරු පාලිත තෙවරප්පෙරුම මහතා සහ ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා
அனுதாபத் தீர்மானங்கள்: மாண்புமிகு ஏ.எச்.எம். அலவி, மாண்புமிகு எம்.என். அப்துல் மஜீத், மாண்புமிகு பாலித தெவரப்பெரும மற்றும் மாண்புமிகு மில்ரோய் பர்னாந்து
VOTES OF CONDOLENCE: HON. A.H.M. ALAWI, HON. M.N. ABDUL MAJEED, HON. PALITHA THEWARAPPERUMA AND HON. MILROY FERNANDO

[පූ.භා. 11.05]

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් 1994දී පාර්ලිමේන්තුවට පිවිස, තම දිස්ත්‍රික්කයට මෙන්ම රටට ද මහඟු මෙහෙයක් ඉටු කළ ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව, මා මෙම අවස්ථාවේදී පළමුවෙන්ම ගරු සභාවට ඉදිරිපත් කරනවා.

අහමඩ හසන් මැතිතුමාගේ සහ එන්.ඒ. මරියම් බීබී මැතිනියගේ පුත්‍රරත්නයක් වූ ඒ.එච්.එම්. අලවි මැතිතුමා 1952 වසරේදී ජන්ම ලාභය ලැබුවා. බම්මන්න අල් කමාර් මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ එතුමා ලබ්බල මහා විද්‍යාලයෙන් සිය උසස් අධ්‍යාපන කටයුතු හැදෑරුවා.

1988 වසරේදී එක්සත් ජාතික පක්ෂයෙන් වයඹ පළාත් සභාවට තේරී පත් වූ ඒ මහතා 1994 වසරේ දී කටුගම්පළ ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තු මැතිවරණයට තරග කර ඉන් ජයග්‍රහණය කර, 1999 වසර දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කර ඇත.

කටුගම්පළ ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලෙස කටයුතු කළ ඒ මහතා අභාවප්‍රාප්ත වන විට සමගි ජන බලවේගයේ ක්‍රියාකාරිකයෙකු ලෙස කටයුතු කළ අතර, ආසනයේ දියුණුව වෙනුවෙන් මහත් සේවයක් කළේය. කිසිදු ආගම් භේදයක් නොසැලකූ එතුමා කුරුණෑගල පිහිටි වෙහෙර විහාර, මුස්ලිම් පල්ලි, කතෝලික පල්ලි වැඩිදියුණුවට කටයුතු කළේ ඉතාම ගෞරවයෙනි.

1985දී තාජ් මහල් මැතිනිය සමඟ විවාහ වූ එතුමා දියණියන් තුන්දෙනෙකුගේ සහ පුතුන් සිව් දෙනෙකුගේ දයාබර පියෙකි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරයෙකු ලෙස අවුරුදු 6ක පමණ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සමස්ත රට වැසියාටම අනගි මෙහෙයක් ඉටු කළ එතුමා අවුරුදු 71ක් ආයු වළඳා 2023 ජූලි මස 16 දින අප අතරින් සදහටම සමු ගත්තා. අභාවප්‍රාප්ත, ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමාට ස්වර්ග සුවය ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර බිරිඳ, දු දරුවන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් 1994දී පාර්ලිමේන්තුවට පිවිස තම දිස්ත්‍රික්කයට මෙන්ම රටට ද මහඟු මෙහෙයක් ඉටු කළ ගරු නජීබ් අබ්දුල් මජීඩ් මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව ඊළඟට මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ඒ.එල්. අබ්දුල් මජීඩ් මැතිතුමාගේ සහ සල්මා මැතිනියගේ පුත්‍රරත්නයක් වූ ගරු නජීබ් අබ්දුල් මජීඩ් මැතිතුමා 1957 වසරේ දී ජන්ම ලාභය ලැබුවා. කින්නියා මහ විද්‍යාලය, ගම්පොළ සහිරා විදුහල සහ යාපනය ශාන්ත ජෝන් ඇකඩමියේ අධ්‍යාපනය ලැබූ එතුමා 1993දී කින්නියා ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් පත් වී ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයෙන් තරග කර 1994 සිට 2001 දක්වා පාර්ලිමේන්තුවට තේරී පත් විය.

තම දරුවන්ට ද සෙනෙහෙබර පියෙකු වූ එතුමා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාසල් දරුවන්ගේ අභිවෘද්ධිය උදෙසා මහත් මෙහෙයක් ඉටු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස අවුරුදු 13ක් පමණ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් සමස්ත රටවැසියාට අනගි මෙහෙයක් ඉටු කළ එතුමා අවුරුදු 66ක් ආයු වළඳා 2023 දෙසැම්බර් 22 වන දින අප අතරින් සදහටම සමු ගත්තා.

අභාවප්‍රාප්ත, ගරු නජීබ් අබ්දුල් මජීඩ් මැතිතුමාට ස්වර්ග සුවය ලැබෙවායි ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර බිරිඳ, දු දරුවන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන ලෙස ද මා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කළුතර දිස්ත්‍රික්කයෙන් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් 2010 සිට 2020 දක්වා පාර්ලිමේන්තුවට පිවිස තම දිස්ත්‍රික්කයට මෙන්ම රටට ද මහඟු මෙහෙයක් ඉටු කළ ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාවයි මා ඊළඟට මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නේ.

තෝමස් තෙවරප්පෙරුම මැතිතුමාගේ සහ සෝමවතී අබේසේකර මැතිනියගේ පුත්‍රරත්නයක් වූ ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමා සහෝදර සහෝදරියන් අට දෙනෙකුගෙන් යුත් පවුලක හත්වෙනියා ලෙස 1960 වසරේ දී ජන්ම ලාභය ලැබුවා. මතුගම ආනන්ද ශාස්ත්‍රාලයෙන් සිප්සතර හැදෑරූ එතුමා ශ්‍රී ලංකා යුද හමුදාවේ සාමාජිකයෙකු වූ සිය පියාගේ ආභාසය ලැබ තරුණ වියේදීම නාවික හමුදාවට එක් විය.

මතුගම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙකු වූ ඒ මහතා 2004 වසරේදී පළාත් සභාවට තේරී පත්ව 2010 දක්වා පළාත් සභා නියෝජිතයෙකු වශයෙන් කළුතර දිස්ත්‍රික්කයටම සේවය කිරීමේ අභිප්‍රායෙන් කටයුතු කළේය.

2010 වසරේදී එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස පත් වී පත් වී කම්කරු සහ සමාජ සවිබල ගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස පත් විය. ඒ කාලයේ එතුමා පාර්ලිමේන්තු සාමාජිකභාවය ඉක්මවා ගොස් සැබෑ ජනතා සේවකයෙකු ලෙසට ජනතාව අසලින්ම සිටියේය. අනතුරුව, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික නියෝජ්‍ය අමාත්‍ය ධුරය ද, තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ධුරය ද එතුමා හෙබවීය. එතුමා ප්‍රභූ දේශපාලනය තුළ චරිතයක් නොවූව ද ජනතා හදවත් තුළ නොමැකෙන චරිතයකි. 2020දී ඇති වූ දේශපාලන රැල්ලත් සමඟ මන්ත්‍රී ධුරයට සමු දුන් නමුත් එතුමාගේ සමාජ සත්කාර ජීවිතය වඩාත් ඉදිරියෙන් තිබූ බව මතක් කළ යුතුය.

1989දී අමිතා අමරතුංග මහත්මිය සමඟ විවාහ වූ එතුමා පුතුන් දෙදෙනෙකුගේ දයාබර පියෙකි. දෛනික මානව සබඳතා හමුවේ ඉතාම සරල චරිතයක් වූ එතුමා ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් ඉතා සංකීර්ණ හැසිරීමක් ප්‍රකට කළ නායකයෙකි. ප්‍රතිපත්තිමය කරුණු වෙනුවෙන් දැඩිව පෙනී සිටීමේ එතුමා සතු අයෝමය ශක්තිය එතුමාටම අනන්‍ය වූවකි. ක්‍රියාකාරී දේශපාලනයේදී එතුමාගේ දේශපාලනය වූයේ එක්සත් ජාතික පක්ෂයයි. එක්සත් ජාතික පක්ෂ දේශපාලනයේ ඓතිහාසික දෙදරා යාම හමුවේ ද සිය ප්‍රතිපත්ති අත් නොහැරීමට තරම් එතුමා ප්‍රතිපත්තිගරුක විය. සමස්ත ජීවිතයම පොදු සමාජ යහපත උදෙසා යෙදවූ එතුමාගේ ජීවිතය ඉතාම තාත්වික නිර්ව්‍යාජ එකක් විය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරයකු ලෙස අවුරුදු 10කට ආසන්න කාලයක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරමින් කෘතහස්ත දේශපාලනඥයකු ලෙස තම පාක්ෂිකයන්ටත්, පොදු ජනතාවටත් අමිල මෙහෙයක් ඉටු කළ එතුමා අවුරුදු 64ක් පමණ ආයු වළඳා 2024 අප්‍රේල් මස 16 දින අප අතරින් සදහටම සමු ගත්තා. ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමාට අපගේ ආගමට අනුව නිවන්සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර බිරිඳ, පුතණුවන් ඇතුළු සියලු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන මෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුත්තලම දිස්ත්‍රික්කයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් 1989 වර්ෂයේ දී පාර්ලිමේන්තුවට පිවිස වසර 26ක පමණ කාලයක් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තම දිස්ත්‍රික්කයට මෙන්ම රටට ද මහඟු මෙහෙයක් ඉටු කළ ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව, ඊළඟට මා මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා.

නිකුලස් ප්‍රනාන්දු මැතිතුමාගේ සහ රේජින් මේරි පෙරේරා මැතිනියගේ පුත්‍රරත්නයක් වූ ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා චෙන්නප්පුව කොලොන්ජාඩියේ දී 1944 වසරේ දී ජන්ම ලාභය ලබා තිබෙනවා. එතුමා චෙන්නප්පුව ශාන්ත ජෝශප් වාස් විදුහලෙන් සිය අධ්‍යාපන කටයුතු හැදෑරුවා. 1988 වසරේ දී වයඹ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වූ එතුමා 1989දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්ව 1994දී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ධීවර නියෝජ්‍ය අමාත්‍ය ධුරයට පත් විය. අනතුරුව පාර්ලිමේන්තු හා ක්‍රිස්තියානි කටයුතු, ධීවර, ජනතා වතු සංවර්ධන, නැවත පදිංචි කිරීමේ ආදී අමාත්‍ය ධුර රැසක් හෙබවීය. පාර්ලිමේන්තුව නියෝජනය කළ කාලයේදී එතුමා කතෝලික බැතිමතුන්ගේ ගැටලුවලදී සාධාරණත්වය ඉටු කිරීමට ගත් මෙහෙය ඉතා අගය කළ යුතුය.

1970දී මේරි ජූලියට මොනිකා ප්‍රනාන්දු මැතිනිය සමඟ විවාහ වූ එතුමා දියණියන් දෙදෙනෙකුගේ සහ එක් පුතෙකුගේ දයාබර පියෙකි.

එතුමා පාර්ලිමේන්තුවේ සිටි කාලයේ මම එතුමාව පෞද්ගලිකව ආශ්‍රය කළා. ඒ වාගේම දේශපාලන කටයුතුවලදී අපි එක්ව කටයුතු කළා. පළාත් සභා මැතිවරණයේ දී එතුමා පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරමින් වයඹ පළාත් සභාවෙන් තරග කළා. මම එතුමා සමඟ එතුමාගේ නිවසටත් ගිහිල්ලා දේශපාලන කටයුතු කළ බව මේ අවස්ථාවේ දී එතුමාට ගෞරවයක් හැටියට සඳහන් කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොදු ජනතාවට අනගි මෙහෙයක් ඉටු කළ එතුමා අවුරුදු 80ක් පමණ ආයු වළඳා 2024 ජූනි මස 20 දින අප අතරින් සදහටම සමු ගත්තා. ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාට ස්වර්ග සැපය ලැබෙවායි ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ දයාබර දු දරුවන් ඇතුළු ඥාතීන් වෙත මෙම උත්තරීතර සභාවේ ශෝකය දන්වා යවන මෙන් ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා.

Order, please! ඊට පූර්ව, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

අනතුරුව ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු (මේජර්) සුදර්ෂන තෙනිපිටිය අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු ජගත් සමරවික්‍රම අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. (MAJOR) SUDARSHANA DENIPITIYA left the Chair, and THE HON. JAGATH SAMARAWICKRAMA took the Chair.

[மு.ப. 11.15]

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்த சபையில் கொண்டுவரப்பட்டிருக்கின்ற அனுதாபப் பிரேரணைகள் தொடர்பாக ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் சார்பில் ஒருசில வார்த்தைகள் பேசுவதற்குக் கிடைத்த சந்தர்ப்பத்திற்கு என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

முதலில், இந்த நாட்டின் அரசியல் வானில் அதுவும் குறிப்பாக, இடதுசாரி அரசியலில் நீண்டகாலம் பயணித்து, எதிர்ப்புகளைத் தாங்கி சிறுபான்மை மக்களின் உரிமை களுக்காக தனிநபராக நின்று மிகவும் கம்பீரமான குரலாக ஒலித்த கலாநிதி விக்கிரமபாகு கருணாரத்ன அவர்களின் மறைவுக்கு என்னுடைய அனுதாபங்களைத் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன். ஆட்சியாளர்களுக்கு எதிராக திராணியுள்ளவராக, மிகக் காத்திரமான ஒரு குரலாக ஒலித்த விக்கிரமபாகு கருணாரத்ன அவர்கள் இந்த நாட்டின் சிறுபான்மைச் சமூகங்களின் உரிமைகளுக்காக முதுகெலும்பு போல் நின்று போராடிய சிறந்த, அப்பழுக்கற்ற ஓர் அரசியல்வாதியாவார். இந்தச் சபையை அவர் பிரதிநிதித்துவப் படுத்தாதிருந்தாலும்கூட, இங்கு இருந்திருக்கவேண்டியவர். அது முக்கியமான ஒரு குரல்! அவருக்கு என்னுடைய இரங்கலைச் செலுத்திக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, எங்களை விட்டுப் பிரிந்த முன்னாள் பாராளுமன்ற உறுப்பினர்கள் நால்வர் குறித்த இன்றைய அனுதாபப் பிரேரணைமீது உரையாற்றுவதற்கு விரும்புகின்றேன். முதலாவதாக, திருகோணமலை மாவட்டத்தின் முன்னாள் பாராளுமன்ற உறுப்பினரான சகோதரர் எம்.என். அப்துல் மஜீத் அவர்களை நான் நினைவுபடுத்த விரும்புகின்றேன். நான் இந்தப் பாராளுமன்றத்துக்குள் நுழைந்த 1994ஆம் ஆண்டுதான் சகோதரர் எம்.என். அப்துல் மஜீத் அவர்களும் இந்தப் பாராளுமன்றத்தைப் பிரதிநிதித்துவப்படுத்தினார். அது மட்டுமல்லாது, அவர் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சிக்காரராக தன்னுடைய தந்தையின் வழியில் வந்தாலும், பாராளுமன்றப் பதிவேடுகளிலே ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியின் உறுப்பினர் என்பதைவிடவும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் உறுப்பினர் என்ற பதவியில்தான் அவரைக் கூடுதலாகப் பார்க்க முடியும். அந்தளவுக்கு ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸோடு அவருக்கு உறவு இருந்தது.

முன்னாள் அமைச்சர் அப்துல் மஜீத் அல்லது திருகோணமலை மஜீத் என்றால் எல்லோருக்கும் தெரியும். இலங்கை முஸ்லிம்களின் வரலாற்றில் குறிப்பிடத்தக்க ஒருவர் அவர். ஸ்ரீமாவோ பண்டாரநாயக்க அவர்களின் ஆட்சியின் போது தபால், தொலைத்தொடர்புகள் பிரதி அமைச்சராகப் பணியாற்றினார். ஸ்ரீ லங்கா சுதந்திக் கட்சி சார்பில் அவர் செய்த பணி மகத்தானது. அது மாத்திரமல்ல, நாடு முழுவதிலும் இருக்கின்ற முஸ்லிம்களினாலும் விரும்பப்பட்ட அவர், நல்லதொரு மேடைப்பேச்சாளராகவும் விளங்கினார்.

முன்னாள் அமைச்சர் பதியுதீன் மஹ்மூத் அவர்களோடு அவருக்கிருந்த நட்பும் பகையும் சரித்திர முக்கியத்துவம் வாய்ந்தது. கட்சிக்குள்ளேயும் பொது மேடைகளிலும் இருவரும் மோதிக்கொண்டாலும், அவர்கள் இந்தச் சமூகத்துக்காகச் செய்த பணி அளப்பரியது. தந்தைக்குப் பின் வந்த அரசியல் வாரிசு என்ற காரணத்தினால் திருகோணமலை மாவட்டத்தின் எல்லா மூலை முடுக்கிலும் நஜீப் ஏ. மஜீத் அவர்களுக்கு தனியான மரியாதை இருந்தது. எங்களுடைய கட்சியின் சார்பில் அவருடைய பெயர் இந்தப் பதிவேட்டில் பதிவு செய்யப்பட்டிருப்பதை எண்ணி பெருமைப்பட்டுக்கொள்கின்ற அதேநேரம், இன்னுமொரு விடயம் சம்பந்தமாக எங்களுடைய கட்சி சார்பில் எனக்கு அவரைப் பற்றிப் பெருமிதம் கொள்ள முடியும். கிழக்கு மாகாண முதலமைச்சராக ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியின் சார்பில் அவரை நியமிப்பதற்கு முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் தீர்மானம் எடுத்தபோது அதற்கு நாங்கள் ஒத்துழைத்தோம். ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் ஏழு மாகாண சபை உறுப்பினர்களின் முழு ஆதரவும் அவருக்கு இருந்தது. அந்த வகையில், கிழக்கு மாகாணத்தின் முதலாவது முஸ்லிம் முதலமைச்சர் என்ற கௌரவத்தை அவர் பெறுவதற்கு நாங்கள் ஒத்துழைத்தோம். அவர் அந்தப் பதவியிருந்து இரண்டரை வருடங்களின் பின்னர் விலகிக்கொண்டதால், எங்களுடைய கட்சியைச் சார்ந்த இன்னுமொருவருக்கு அந்தப் பதவியை நாங்கள் கொடுத்தோம். அவர் இப்பொழுது எங்களுடைய கட்சியை விட்டும் தூரம் போய்விட்டார்.

நஜீப் ஏ. மஜீத் என்பவரின் தடயமானது திருகோணமலை மாவட்டத்தின் அரசியலிலிருந்து அழிக்க முடியாத நிரந்தரமான தொரு தடயம் என்பதை நான் இங்கு நினைவுபடுத்த வேண்டும். அவர் பல பதவிகளை வகித்து, இந்தப் பாராளு மன்றத்தைப் பிரதிநிதித்துவப்படுத்தி பல அபிவிருத்திகளைச் செய்திருக்கின்றார். ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி உறுப்பினராக இருந்தாலும் எல்லா இடத்திலும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் உறுப்பினர் என்றுதான் குறிப்பிடப்படுகின்றது. 2000ஆம் ஆண்டு அஞ்சல், தொலைத்தொடர்புகள் பிரதி அமைச்சராகவும், 2004ஆம் ஆண்டு புனர்வாழ்வளிப்பு, மாவட்ட அபிவிருத்தி (திருகோணமலை) அமைச்சராகவும், அதன் பின்னர் உள்ளூராட்சி மற்றும் மாகாண சபைகள் பிரதியமைச்சராகவும், பின்னர் கூட்டுறவு, கூட்டுறவு அபிவிருத்தி அமைச்சரவை அந்தஸ்து இல்லாத அமைச் சராகவும் இருந்தார். பலவாறாகப் பதவிகள் வகித்த ஒவ்வொரு சந்தர்ப்பத்திலும் திருகோணமலை மாவட்டத்துக்கும் அம்மாவட்டத்துக்கு வெளியிலும் பாரிய அபிவிருத்திகளைச் செய்தார்.

அவருடைய மரணம் சம்பவித்தபோது நான் நாட்டில் இருக்கவில்லை. அதனால், அவருடைய இறுதிச் சடங்குகளில் என்னால் பங்குகொள்ள முடியவில்லை. அதற்குப் பிற்பாடு அவருடைய வீட்டுக்குச் சென்று அவருடைய உறவினர் களோடு என்னுடைய துக்கத்தைப் பகிர்ந்துகொண்டேன். அவருடைய இழப்பானது எங்களால் என்றும் மீள நிரப்ப முடியாத ஒன்றாகும். அவர் நற்பண்புகொண்ட, அதிக இறைபக்தியுள்ள ஒரு மனிதராக அவர் இருந்தார். 'தஸ்பீஹ்'உடன் அவர் இருப்பதை நான் கண்டிருக்கின்றேன்.

திக்ர் செய்கின்ற ஒருவராகவும், தொழுகையைப் பேணுகின்ற ஒருவராகவும் அவர் இருந்தார். தன்னுடைய வீட்டுக்கு வரும் விருந்தாளிகளையும் சக அரசியல் நண்பர்களையும் உபசரிப்பதில் அவருக்கு நிகர் அவர்தான். நான் அவருடைய வீட்டுக்கு சென்ற ஒவ்வொரு சந்தர்ப்பத்திலும் எங்களை மகிழ்விக்கின்ற பல விடயங்களைச் செய்திருக்கின்றார். நல்லதொரு மனிதனை இந்த நாட்டின் அரசியல் இழந்திருக் கின்றது. குறிப்பாக, திருகோணமலை முஸ்லிம்கள் பெரும் நஷ்டமடைந்திருக்கிறார்கள் என்றுதான் கூற வேண்டும். அவருக்கு எல்லாம் வல்ல இறைவன் ஜன்னத்துல் பிர்தவ்ஸை வழங்க வேண்டுமென்று பிரார்த்தித்துக் கொள்கிறேன்.

அடுத்து, குருநாகல் மாவட்டத்தின் முதலாவது முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர் என்ற கௌரவத்திற்குப் பாத்திரமான முன்னாள் பாராளுமன்ற உறுப்பினர் கௌரவ ஏ.எச்.எம். அலவி அவர்கள் பற்றி சொல்ல வேண்டும். அவர் எங்களை விட்டுப் பிரிந்து சென்றது எங்களுக்கு மிகவும் வருத்தத்தைத் தருகின்ற விஷயமாகும். கடுகம்பொல தேர்தல் தொகுதியைப் பிரதிநிதித்துவப்படுத்திய ஐக்கிய தேசியக் கட்சியின் ஜாம்பவான் என்று சொல்லப்பட்ட ஐக்கிய தேசியக் கட்சியின் முன்னாள் தவிசாளரும் வடமேல் மாகாண சபை முதலமைச்சராகவும் இருந்த காமினி ஜெயவிக்கிரம பெரேரா அவர்களின் நெருங்கிய சகாவாக அவர் இருந்தார். வடமேல் மாகாண சபை உறுப்பினராக இருந்து கடுகம்பொல தேர்தல் தொகுதியிலுள்ள முஸ்லிம், சிங்கள, தமிழர் என சகல மக்களுக்கும் சேவையாற்றிய நல்லதொரு மனிதர்.

ஏ.ஆர்.எம். ஹமீம் அவர்கள் சென்ட்டராக இருந்திருந் தாலும், ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற பதவியை குருநாகல் மாவட்டத்தில் முதலாவதாக வகித்தவர் கௌரவ ஏ.எச்.எம். அலவி அவர்கள் ஆவார். அதற்குப் பின்னர் அந்த மாவட்டத்தைச் சேர்ந்த ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சியின் முன்னாள் செயலாளரும் வைத்திய நிபுணருமான டாக்டர் ஹப்ரத் என்பவரை நாங்கள் தேசியப் பட்டியலூடாக நியமித்து கௌரவித்தோம். அதற்கு பின்னர் குருநாகல் மாவட்டத்தில் எங்களுக்கென ஓர் ஆசனத்தைப் பெறமுடிய வில்லை. முன்னாள் பாராளுமன்ற உறுப்பினர் சகோதரர் அலவி அவர்களுடைய சரித்திர முக்கியத்துவம் வாய்ந்த பாராளுமன்றப் பிரவேசமானது யாராலும் மறக்க முடியாதவொரு விஷயமாகும். அதுமாத்திரமல்ல, அவருடைய சேவை குருநாகல் மாவட்டத்தின் எல்லா இடங்களிலும் பரவலாக நினைவுகூரப்படுகின்ற ஒரு விடயமாக என்றென்றும் நிலைத்திருக்கும். அவருக்கும் எல்லாம் வல்ல இறைவன் ஜன்னத்துல் பிர்தௌஸை வழங்கவேண்டும் என்று நான் பிரார்த்தித்துக் கொள்கின்றேன்.

ඒ සමඟම අද ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන අභාවප්‍රාප්ත ගරු පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමා කළුතර ආසනයේ දුප්පතාගේ හිතවතා හැටියට කවුරුත් හඳුනා ගත් වැදගත්, විශේෂ පුද්ගලයෙක්. එතුමාගේ අභාවය සිදු වුණු මොහොතේ පටන් ඒ අවස්ථාවට සහභාගි වුණු හැමදෙනාම දැක්ක එක කාරණයක් තිබෙනවා. ඒ තමයි, එතුමාගේ අවමඟුල් උත්සවයට සහභාගි වෙන්න පේලිමේ මිනිස්සු ආවා. උදේ, දවල්, රෑ කියලා වෙනසක් නැතිව එතුමාගේ අවමඟුල් උත්සවයට මිනිස්සු එක් වුණු ආකාරය දැක්කාම මමත් පුදුමයට පත් වුණා. එතුමා එවැනි ජනප්‍රසාදයට ලක් වුණු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට හිටියා කියන එක එතුමාගේ අභාවයෙන් පසුව තමයි ඊට වඩා වැඩියෙන් අපි කාටත් දැනගන්න ලැබුණේ. පාර්ලිමේන්තුව තුළදීත්, පිටතදීත් කලහකාරී විධියට හැසිරෙන මන්ත්‍රීවරයෙක් හැටියට තමයි කවුරුත් එතුමාව දැක්කේ. නමුත්, කලහකාරීත්වය හුවා දැක්වූ කෙනෙකු හැටියට වාගේම අරගළය ඉදිරියේ ජනතාව වෙනුවෙන් පෙනී හිටපු කෙනෙක් හැටියටත් එතුමාව අපට හඳුන්වන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. ජාතිවාදී කෝලාහල ඇති වනකොට එයින් පීඩනයට පත් වූ ජනතාව වෙනුවෙනුත් එතුමා පෙනී සිටියා. තමන් නියෝජනය කරන, නැත්නම් තමන්ට බහුතර ඡන්දය ලබා දුන්නු සමාජය තුළින් මොන විරෝධයක් ආවත්, එතුමා ඒක නොතකා පීඩනයට පත් වූ සුළු ජන කොටස් වෙනුවෙන්, විශේෂයෙන් මුස්ලිම් ජනතාව වෙනුවෙන් සේවය කරන්න ඉදිරිපත් වුණා. බේරුවල, අලුත්ගම වැනි ප්‍රදේශවල විශාල වාර්ගික ගැටුමක් හටගෙන සිය ගණනක් ගෙවල්, කඩ කාමර ගිනි තියද්දී එතුමා ධෛර්යවත්ව ඉදිරියට ඇවිත් මුස්ලිම් ජනතාව වෙනුවෙන් ඉදිරිපත් වුණා කියන එක ඒ මුස්ලිම් ජනතාව කවදාවත් අමතක කරන එකක් නැහැ. එතුමාගේ අභාවයෙන් පසුව මුස්ලිම් ජනතාව දේහය වටා රොක් වුණා. එතුමාගේ දේහය අරගෙන යෑමේදීත් විශේෂයෙන් මුස්ලිම් ජනතාව ඉදිරියෙන්ම හිටියා. එතුමාට එතරම් විශාල ආලයක් දැක්වූ මුස්ලිම් ජන කොටසක් කළුතර සිටින බව සඳහන් කරමින්, එතුමා ඇදහූ ආගමේ හැටියට නිවන් සුව ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම එතුමාගේ අභාවය සම්බන්ධයෙන් එම පවුලේ ඥාති මිත්‍රාදීන් සියලුදෙනා සමඟ අපේ ශෝකයත් මේ අවස්ථාවේදී බෙදා හදා ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී අභාවප්‍රාප්ත ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා පිළිබඳවත් කථා කරන්න කැමතියි. මම මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා සමඟ මේ පාර්ලිමේන්තු සභා ගර්භයේදීත්, අමාත්‍ය මණ්ඩලයේදීත් එකට කටයුතු කරලා තිබෙනවා. එතුමා ඉතා වැදගත් පෞරුෂත්වයක් තිබුණු දේශපාලනඥයෙක්. එතුමා පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ධීවර අමාත්‍ය ධුරය දරමින් ධීවර ජනතාව වෙනුවෙන් කරපු විශාල කාර්යභාරය දැනටත් කවුරුත් මතක් කරනවා. පුත්තලම දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි, මුළු රටේම එතුමාගේ සේවය ව්‍යාප්ත වුණා. ඒ වාගේම පුත්තලම දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, මුස්ලිම් ජනතාව ජීවත් වෙන හැම ප්‍රදේශයකම එතුමාට හිත මිතුරන් හිටියා. ඕනෑම වෙලාවක, ඕනෑම ගැටලුවක් නිරාකරණය කරන්න එතුමා ළඟට ගියාම කිසිම දේශපාලන භේදයක් නොපෙන්වමින් එතුමා අපට ඒ ගැටලු නිරාකරණය කර දීලා තිබෙනවා. ක්‍රිස්තියානි ආගමේ කෙනෙක් හැටියට එතුමාට ස්වර්ගය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මගේ ශෝක ප්‍රකාශය මින් සමාප්ත කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.30]

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු ඒ.එච්.එම්. අලවි මහතා, ගරු එම්.එන්. අබ්දුල් මජීඩ් මහතා, ගරු පාලිත තෙවරප්පෙරුම මහතා සහ ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා යන සියලුදෙනාගේම අභාවය පිළිබඳව මාගේ පෞද්ගලික කනගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම අපේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නායකතුමා වන ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ශෝකයත්, එම පක්ෂය වෙනුවෙන් ශෝකයත් ප්‍රකාශ කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මංජුලා දිසානායක මහත්මිය මූලාසනාරූඪ විය.

අතන්පිරකු, மாண்புமிகு ஜகத் சமரவிக்ரம அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. JAGATH SAMARAWICKRAMA left the Chair, and THE HON. (MRS.) MANJULA DISSANAYAKE took the Chair.

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන, අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් ගරු සභානායකතුමාත්, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමාත් කථා කළා. එතුමන්ලා ඉදිරිපත් කළ ඒ සියලු කරුණු සමඟ මා එකඟ වන අතරේ, එම ශෝක ප්‍රකාශ යෝජනාවලට දායක වෙමින් එතුමන්ලා පිළිබඳව කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම අභාවප්‍රාප්ත ගරු ඒ.එච්.එම්. අලවි මන්ත්‍රීතුමා අපි සමඟ මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා.

ඒ වාගේම අභාවප්‍රාප්ත ගරු අබ්දුල් මජීඩ් මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් සම්බන්ධ වෙලා හිටියා. එතුමා මන්ත්‍රී ධුර දැරුවා. එතුමාගේ පියාත් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. මගේ පියා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු කාලයේ එතුමාගේ පියා මන්ත්‍රීවරයෙක් හැටියටත්, අමාත්‍යවරයෙක් හැටියටත් කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම එතුමා මගේ පියා සමඟ සමීපව කටයුතු කරලා තිබෙනවා. එමෙන්ම එතුමා ජනතාව වෙනුවෙනුත් සේවය කරලා තිබෙනවා.

අභාවප්‍රාප්ත අපේ ගරු පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමා ගැන කථා කළොත්, එතුමා අපත් සමඟ මේ සභාව නියෝජනය කළා. එතුමා ඉතාම සුන්දර මනුෂ්‍යයෙක්. මට මතකයි, මම කථානායකවරයා වෙලා හිටපු කාලයේ එතුමා මා සමඟ විදේශ සංචාරයකට සහභාගි වුණා. ඒ අවස්ථාවේදීත් එතුමා බොහොම සහයෝගයෙන් එතුමාගේ අත්දැකීම් අප සමඟ බෙදා ගනිමින් සමීපව කටයුතු කළා. අපේ පාර්ලිමේන්තුවේත් ඉතාම ආදර්ශවත් මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා ක්‍රියා කළා. එමෙන්ම තමන්ගේ ජනතාව වෙනුවෙන් එතුමා ඉතාම ලෙන්ගතුව, කිට්ටුවෙන්ම කටයුතු කළා. මම හිතන විධියට, කිසිම මන්ත්‍රීවරයෙක් හැසිරෙන්නේ නැති විධියට, කිසිම මන්ත්‍රීවරයෙක් කටයුතු නොකරන විධියට කටයුතු කරපු කෙනෙක්, එතුමා. පත්වන මන්ත්‍රීවරු, මහජන නියෝජිතයන් ඉතාම ලෙන්ගතුව කටයුතු කරලා ජනතාවගේ ප්‍රශ්න දිහා බලන්න ඕනෑ කියන එක තමයි ජනතාව බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා තමයි එතුමාගේ අභාවය සිදු වෙච්ච මොහොතේ පටන් අතිවිශාල ජනතාවක් එතුමාට අවසන් ගෞරව දක්වන්න පැමිණියේ.

ඊළඟට මම කැමැතියි, ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා ගැන කථා කරන්න. එතුමා අපි සමඟ එකට 1989 වර්ෂයේදී තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මේ පාර්ලිමේන්තුවට පත් වුණේ. ඒ අවස්ථාව, මුළු රටේම - උතුරේත්, දකුණේත් - ගිනි ඇවිළුණු වේලාවක්. ඒ කාලයේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ආපසු ගෙදර යන්න තරම් බියජනක අවස්ථාවක් තමයි තිබුණේ. ඒ නිසා අපට ඒ කාලයේ නම් නැවතිලා ඉන්නත් හෝටල් ලැහැස්ති කරලා තිබුණා. ඒ අවස්ථාවේදීත් එතුමා සමඟ අපි බොහොම කිට්ටුවෙන් තමයි කටයුතු කළේ. ඒ වාගේම අපේ දේශපාලන පක්ෂය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදීත් එතුමා ඉතාම කිට්ටුවෙන් අප සමඟ කටයුතු කළා. එතුමා 1988දී වයඹ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියටත් තේරී පත් වුණා. එතුමා අවුරුදු 26ක පමණ කාලයක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරලා තිබෙනවා. එතුමාගෙන් අතිවිශාල සේවාවක් පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාවට ඉටු වුණා වාගේම එතුමා දරපු අමාත්‍යාංශ තුළින් සෑම දිස්ත්‍රික්කයකම ජනතාවට විශාල සේවාවක් ඉටු වුණා.

ධීවර අමාත්‍ය ධුරය දරපු කාලයේ එතුමාට එංගලන්තයේ සංචාරයකට යන්න අවස්ථාව ලැබුණා. ඒ අවස්ථාවේදී ධීවර අමාත්‍යාංශයට, නැත්නම් ධීවර සංස්ථාවට ලොකු ත්‍යාගයක් ලැබුණා.

අපේ ධීවර වරායවල් නිතරම වැලිවලින් පිරෙනවා. ඒවා ඉවත් කිරීම සඳහා අපි වැලිගොව්වා නමින් හඳුන්වන යාත්‍රාව එතුමාගේ එම සංචාරය තුළින් අපේ රටට ලබා ගැනීමට පුළුවන්කම ලැබුණා. අදටත් අපේ ධීවර වරායවල වැලි ඉවත් කිරීම සඳහා ඒවා විශාල වශයෙන් ප්‍රයෝජනවත් වෙනවා.

ඒ වාගේම එතුමා සිදු කළ තායිලන්ත සංචාරයේදී අපේ රටට මිරිදිය හා කරදිය ධීවර ව්‍යාපෘති රැසක් ලබා ගැනීමට එතුමාට හැකියාව ලැබුණා. එතුමා අමාත්‍යවරයෙක් හැටියට මැලේසියාව, චීනය, තායිලන්තය, ජපානය ආදී රටවල සංචාරය කර තිබෙනවා. ඒ වාගේම ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ, ගාන්ධිග්‍රාම් විශ්වවිද්‍යාලයේ කළ සංචාරයක් තුළින් පුත්තලම දිස්ත්‍රික්කයට සුළං බල ව්‍යාපෘතියක් සහ කෘෂි ආර්ථික ව්‍යාපෘති රැසක් හිමි කරගන්නට එතුමාට හැකියාව ලැබුණා. ඒ වාගේම නව පාප්තුමාගේ පත්වීම වෙනුවෙන් ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් එතුමා ඉතාලියටත් ගියා.

විශේෂයෙන් මම කනගාටු වෙනවා, එතුමාගේ අවසන් කටයුතුවලට මට සම්බන්ධ වෙන්න නොහැකිවීම පිළිබඳව. නමුත් මහින්ද රාජපක්ෂ මැතිතුමා එම අවස්ථාවට සහභාගි වුණා. අවසාන වශයෙන් නැවතත් මා, අද දින ශෝක යෝජනා ඉදිරිපත් කර ඇති, පාර්ලිමේන්තුවේ හිටපු ගරු මන්ත්‍රීතුමන්ලා හතරදෙනාගේම අභාවය වෙනුවෙන් එම පවුල්වල උදව්ය වෙත පෞද්ගලිකව මාගේත්, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේත් ශෝකය ප්‍රකාශ කරමින් ඒ ගරු මන්ත්‍රීවරු හතර දෙනාටම නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමා.

[පූ.භා. 11.38]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුලින්ම මම අභාවප්‍රාප්ත ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමා පිළිබඳව වචන කිහිපයක් කථා කරන්න කැමැතියි. එතුමා ජනතාවාදී, ජනහිතකාමී, සෑම අවස්ථාවකදීම පොදු ජනතාවගේ හිත සුව පිණිස පෙනී සිටි, විශේෂයෙන් පුංචි මනුෂ්‍යයා වෙනුවෙන් නැඟී සිටි, සැබෑ ජනතා නායකයෙක්. එතුමා ජනතාව අතර ජනප්‍රිය වුණා පමණක් නොව, ජනතාව වෙනුවෙන්ම ජීවත් වුණු, පොදු ජනතාව මුහුණ දුන් හැම අභියෝගයකදීම ඒ අය එක්ක; විශේෂයෙන් පොඩි මනුෂ්‍යයා එක්ක එකටම හිටගත් අභීත ජනතා නායකයෙක්. දුප්පත් ජනතාව වෙනුවෙන්, නැති-බැරි ජනතාව වෙනුවෙන්, හඬක් නොමැති ජනතාව වෙනුවෙන් එතුමා කළ සේවාව අතිවිශිෂ්ටයි. එතුමාගේ හදිසි වියෝව පිළිබඳව අපගේ බලවත් ශෝකය, සාතිශය සංවේගය, කනගාටුව විශේෂයෙන් එතුමාගේ දයාබර බිරිඳ, පුතා ඇතුළු පවුලේ ඥාතීන් සහ හිතවතුන් වෙත මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊළඟට මම කැමැතියි, කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කළ ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමා ගැන කථා කරන්න. එතුමා, පොදුජන නියෝජිතයෙක් හැටියට එම දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් විවිධ අවස්ථාවලදී වැදගත් මෙහෙවරක් ඉෂ්ට කළ, හැම විටම ජනතාවගේ සුව දුක් සොයා බලා ජනතාව දුකට පත් වෙන අවස්ථාවල එයට පිළියම් යෙදූ ජන නායකයෙක්. හැම විටම කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාව මුල් කරගෙන විශිෂ්ට ජනතා සේවාවක් කළ පොදු ජනයාගේ අභීත සෙන්පතිවරයෙක්. එතුමාගේ හදිසි වියෝව ගැන එතුමාගේ බිරිඳ වන තාජ් මහල් මැතිනියටත්, රෂ්මි, රහුම්, රස්මියා, රහස්‍යා ආසික්, දිල්ෂාඩ්, ආක්ෂා කියන දරුවන් සියලු දෙනාටත් අපගේ ශෝකය, සාතිශය සංවේගය මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට, අමාත්‍යවරයෙක් හැටියට එතුමාගේ කාලවකවානුව තුළ පුත්තලම දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන දැවැන්ත සේවාවක් ඉෂ්ට කළ ජනතා නායකයෙක්. හැම අවස්ථාවකදීම දිස්ත්‍රික්කයේ ධීවර ප්‍රජාව කේන්ද්‍ර කරගෙන ධීවර ප්‍රජාවට ඉහළම ශක්තියක් ලබා දීමට කටයුතු කළ නායකයෙක්, එතුමා. ඒ වාගේම අනෙකුත් වෘත්තීන්වල, අනෙකුත් ජීවනෝපායන්වල නියැළෙන ජනතාව ඒක රාශි කරගෙන ඒ ජනතාවට ඉහළ ජීවන මට්ටමක් ලබා දීමේ අදිටනින් කටයුතු කළ නායකයෙක්. එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ දයාබර බිරිඳ ප්‍රමුඛ දු දරුවන්ට මේ අවස්ථාවේ අපේ බලවත් ශෝකය, සාතිශය සංවේගය පළ කර සිටිනවා.

ඊළඟට මම අභාවප්‍රාප්ත ගරු එම්.එන්. අබ්දුල් මජීඩ් මැතිතුමා පිළිබඳව කථා කරන්න කැමැතියි. එතුමා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් විටෙක කින්නියා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියටත්, අමාත්‍යවරයකු හැටියටත් කටයුතු කළා. විශේෂයෙන් මුතූර්, කින්නියා ප්‍රදේශ කේන්ද්‍ර කරගෙන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට විශාල සේවාවක් කරපු, නිරතුරුවම පොදු ජනතාව වෙනුවෙන් පෙනී සිටි ජනතා පුත්‍රයෙක්, එතුමා. එතුමා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජනතාවට විශිෂ්ට සේවාවක් ඉෂ්ට කළා. එවන් ජනහිතකාමී, ජනතාවාදී නායකයෙකුගේ හදිසි වියෝව පිළිබඳව අපි සියලුදෙනාගේ බලවත් කනගාටුව, සාතිශය සංවේගය ඒ පවුලේ සියලු සාමාජිකයන් වෙත මේ අවස්ථාවේදී පළ කර සිටිනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.44]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මන්ත්‍රීවරු සිව්දෙනෙකුගේ අභාවය වෙනුවෙන් ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන මේ අවස්ථාවේ කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරපු දේශපාලනඥයෙකු විධියට 1994 දී පාර්ලිමේන්තුවට ආපු ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමා ගැන මුලින්ම වචන කිහිපයක් කථා කරන්න මම කැමැතියි. කටුගම්පොල ආසනය නියෝජනය කරමින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුස්ලිම් ජනතාව සමඟ විතරක් නොව, මුස්ලිම් ජනතාවට වඩා සිංහල ජනතාවත් එක්ක බොහොම ළඟින් ඇසුරු කරපු කෙනෙකු විධියට තමයි එතුමා ප්‍රසිද්ධ. ඒ වාගේම පෞද්ගලිකව මගෙත් හිතවතෙක්, සමීප මිත්‍රයෙක්, අප පවුලේ බොහොම හිතවතෙක් විධියට මට අද එතුමා ගැන වචන කිහිපයක් කථා කරන්න ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකනවා.

එදා, 1994 පාර්ලිමේන්තු මැතිවරණය කියන්නේ වසර 17කට පස්සේ එක්සත් ජාතික පක්ෂය පරදින පාර්ලිමේන්තු මැතිවරණය. ඒ මැතිවරණයේදී එතුමා ජයග්‍රහණය කළා, ප්‍රථම වතාවට පාර්ලිමේන්තුවට එන්න. එහිදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාව ජාති භේදයකින් තොරව එතුමාට විශාල ශක්තියක් ලබා දුන්නා. මම දන්නවා, මා නියෝජනය කරන බිංගිරිය ආසනයේ 10,000කට ආසන්න මනාප ඡන්ද ප්‍රමාණයක් අලවි මැතිතුමාට ලැබුණු බව. බිංගිරිය ආසනය කියන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආසන 14න් මුස්ලිම් ජනතාව ඉතා අඩුවෙන් ඉන්න ආසනයක්. ඒකෙන් බොහොම පැහැදිලිව පේනවා, එතුමාට මුස්ලිම් ජනතාව, සිංහල ජනතාව කියලා භේදයක් නිබුණේ නැති බව. සිංහල ජනතාව ඉතාම සමීපව එතුමාට සහයෝගය පළ කරලා නිබුණා.

විශේෂයෙන් එතුමා ජනතාව එක්ක හිටපු නායකයෙක්. එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට එන්න කලින් 1988 වර්ෂයෙදී වයඹ පළාත් සභාව නියෝජනය කළා.

එතුමා මිය යන මොහොත දක්වාම ජනතාවත් එක්ක දේශපාලනය කළා; ජනතාවත් එක්ක සමීපව කටයුතු කළා; ජනතාව ඇසුරු කළා; ජනතාවගේ දුකේදී පෙනී සිටියා.

විශේෂයෙන් 1994 කියන්නේ, ඉතාම භීෂණකාරී කාලයක්. දේශපාලන ප්‍රශ්න ගණනාවක් 1994දී -ඒ මැතිවරණ සමයේ- සිදු වුණා; කටුගම්පළ ආසනයේ මරණ ගණනාවක් සිදු වුණා. ඒ අවස්ථාවේ අලවි මැතිතුමා ඒ ජනතාව වෙනුවෙන් පෙනී සිටිමින්,

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ඒ ජනතාව ආරක්ෂා කරමින්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, පක්ෂය වෙනුවෙන් කැප වුණා. විශේෂයෙන් හිටපු අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාට ලොකුම භයිය වුණේ, අපේ අලවි මැතිතුමා. එතුමාගේ දේශපාලනයේ අගසව්වරයෙක් තමයි, අලවි මැතිතුමා. ඒ තරමටම හිටපු අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාට අලවි මැතිතුමාගේ සහයෝගය ලැබුණා. මේ අවස්ථාවේ අලවි මැතිතුමාගේ ගුණ සිහිපත් කරමින් එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ අය වෙත මාගේ ශෝකය පළ කර සිටිනවා. එතුමාගේ දරුවන්, බිරිඳ ඇතුළු පවුලේ අය අපත් එක්ක බොහොම හිතවත්. ඒ සියලුදෙනා අපත් එක්ක පෞද්ගලිකව හිතවත් පිරිසක්. එතුමාගේ සේවාව ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාවට පමණක් නොව, මුළු රටටම හැමදාමත් මතකයේ තිබෙනවා කියන කාරණය ද මා සිහිපත් කරනවා. ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමාගේ ආගමට අනුව එතුමා ප්‍රාර්ථනා කරපු ස්වර්ගය එතුමාට ලැබේවා කියලාත් මා ප්‍රාර්ථනා කරනවා.

ඊළඟට මම කැමැතියි, පාලිත තෙවරප්පෙරුම මැතිතුමා ගැන කථා කරන්න. පාලිත තෙවරප්පෙරුම මැතිතුමා 2020 වර්ෂය වනකල් මේ පාර්ලිමේන්තුවේ මාත් එක්ක බොහොම සමීපව කටයුතු කළා. 2020 වර්ෂයෙන් පසුව එතුමාට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව නොලැබුණත්, පෞද්ගලිකව එතුමා අපත් එක්ක හිතවත්කම් පැවැත්වූවා.

එතුමා ඉතාම සුන්දර මනුස්සයෙක්; හිත හොඳ මිනිහෙක්. මිනිසුන්ට අසීමිතව ආදරය කරපු කෙනෙකු විධියට මට මේ අවස්ථාවේ එතුමාව සිහිපත් වෙනවා. එතුමා කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආදරය කොයි තරම් දිනා ගත්තා ද කියන එක අපි දැක්කා, එතුමාගේ මරණය සිදු වුණු අවස්ථාවේ.

එතුමා බොහොම අල්පේච්ඡ ජීවිතයක් ගත කරපු කෙනෙක්. එතුමා මරණයට සූදානම් වුණා. මරණය ළඟා වෙනවා කියලා ගොඩක් අය නොහිතමින් කටයුතු කරන මේ වාගේ වකවානුවක, මැරෙන බව දැනගෙන ජීවත් වුණු පුද්ගලයෙකු විධියට අපේ පාලිත තෙවරප්පෙරුම මැතිතුමාව හඳුන්වන්න පුළුවන්. පාලිත තෙවරප්පෙරුම මැතිතුමා කළුතර දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි, මුළු රටටම ජනප්‍රිය චරිතයක් බවට පත් වෙලා තිබුණා. ඒ ජනප්‍රිය චරිතයට ආදරය කරන විශාල පිරිසක් මේ රට පුරා හිටියා. විශේෂයෙන්ම පොඩි මිනිස්සු එතුමාට ආදරය කළා. කළුතර දිස්ත්‍රික්කයේ වතු ජනතාව ඉන්නවා; මුස්ලිම් ජනතාව ඉන්නවා. නමුත්, එතුමා ජාතීන් අනුව වෙන් කරලා ඒ මිනිසුන් දිහා බැලුවේ නැහැ. කවුද අමාරුවෙන් ජීවත් වන්නේ, කවුද දුෂ්කරතා මධ්‍යයේ ජීවත් වන්නේ, කාටද ප්‍රශ්න තිබෙන්නේ, කාටද ගැටලු තිබෙන්නේ කියා සොයා බලා ඒ තැන්වලට ගිහින් එතුමා තමාට පුළුවන් උපරිමයෙන් සේවය කළා. පාලිත තෙවරප්පෙරුම කියන්නේ, අපේ දේශපාලනයේ විශේෂ සලකුණක් හැටියට අපට සිහිපත් කරන්න පුළුවන් කෙනෙක්. මේ කාලය, පාලිත තෙවරප්පෙරුම මැතිතුමාගේ අඩුව වෙනදාටත් වඩා දැනෙන යුගයක්. ඉ පාලිත තෙවරප්පෙරුම මැතිතුමා වෙනුවෙන් ඒ පවුලේ සියලුදෙනාට මාගේ ශෝකය පළ කරන ගමන් එතුමාට නිවන්සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

ඊට අමතරව, ගරු අබ්දුල් මජීඩ් මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව ද අද දින ඉදිරිපත් කර තිබෙනවා. එතුමාගේ අභාවය වෙනුවෙන් ද එතුමාගේ පවුලේ අයටත් මාගේ ශෝකය පළ කර සිටිනවා. ඒ වාගේම, ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ අයටත් මාගේ ශෝකය පළ කරනවා. මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මන්ත්‍රීතුමා.

[පි.ව. 11.50]

ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.
நஹ்மதுஹூ வநுஸல்லி அலா ரஸூலிஹில் கரீம். அம்மா பஃத்!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீண்டகாலம் மக்களுக்குச் சேவை செய்த முன்னாள் பாராளுமன்ற உறுப்பினர்கள் நான்கு பேருடைய அனுதாபப் பிரேரணையில் நானும் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு திருப்தியடைகின்றேன். அந்த வகையில், முதலில் எங்களுடைய அன்புச் சகோதரர் நஜீப் அப்துல் மஜீத் அவர்களைப் பற்றி சொல்ல விரும்புகின்றேன். தேசிய காங்கிரஸின் தலைவர் என்ற அடிப்படையில், நான் இந்த இடத்தில் அவரை ஞாபகப்படுத்த வேண்டும். பெருந்தலைவர் மர்ஹூம் அஷ்ரப் அவர்களின் காலத்தில் சகோதரர் நஜீப் அப்துல் மஜீத் அவர்கள் பாராளுமன்றத்தில் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸுடன் இணைந்து பயணித்தார். இருந்தாலும், அவர் அந்தக் காலத்தில் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியைச் சார்ந்த ஒரு பிரபலத்தின் மகனாக இருந்தார். அதனால் அவருக்கு அரசியல் பின்புலமும் பலமும் இருந்தது.

மர்ஹூம் அப்துல் மஜீத் என்பவர் ஒரு காலத்தில் இலங்கை முஸ்லிம்களின் வரலாற்றில் மறக்க முடியாத ஓர் ஆளுமையாகப் பார்க்கப்பட்டவர். இன்றும் அவர் அவ்வாறே பார்க்கப்படுகின்றார். கிழக்கு மாகாண மக்கள் அவரை நிறையவே கௌரவித்து இருக்கிறார்கள். இன்றும்கூட, திருகோணமலை மாவட்டத்திலுள்ள முஸ்லிம் மக்களால் மறக்க முடியாத அளவுக்கு ஓர் உயர்ந்த இடத்தில் இருப்பவர்தான் மர்ஹூம் அப்துல் மஜீத் அவர்கள்! அவரது அரசியல் பின்புலத்தினூடாகவே மர்ஹூம் நஜீப் அவர்கள் அரசியலுக்கு வந்தார். அதுமாத்திரமல்ல, அவர் தலைவர் மர்ஹூம் அஷ்ரப் அவர்களோடு பயணித்து, ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸினூடாக பாராளுமன்ற உறுப்பினரானார். காலப்போக்கில் குறிப்பாக மர்ஹூம் அஷ்ரப் அவர்களுடைய மரணத்தின் பின்னர், முஸ்லிம் காங்கிரஸில் இருந்த சிறந்த ஆளுமைகள் பல்வேறு காரணங்களால் அக்கட்சியிலிருந்து வெளியேறின. அந்த வகையில், மர்ஹூம் நஜீப் அப்துல் மஜீத் அவர்களும் தன்னுடைய மாவட்ட மக்களுக்காக அவ்வப்போது முறையான அரசியல் தீர்மானங்களை எடுத்துப் பயணித்தார். அப்போது நாங்களும் அவரோடு இணைந்து அரசியலில் ஈடுபட்டோம். 2015ஆம் ஆண்டு பாராளுமன்றத் தேர்தல் இடம்பெறுவதற்கு முன்னர், அவர் கிழக்கு மாகாணத்தின் முதலமைச்சராக அனைத்து முஸ்லிம் கட்சிகளின் ஏகோபித்த முடிவோடு நியமிக்கப்பட்டார். பாராளுமன்ற உறுப்பினராக மாத்திர மன்றி, பிரதி அமைச்சராகவும் பதவி வகித்த அவர், கிழக்கு மாகாணத்தின் முதலாவது முஸ்லிம் முதலமைச்சராகவும் பதவி வகித்தார். இது எங்கள் எல்லோருக்கும் பெருமையாகும்.

குறிப்பாக, அன்று கிழக்கு மாகாண சபையின் முதலமைச்சராக முதலில் ஒரு தமிழரை நியமிப்பதற்கு நாங்கள் எல்லோரும் உடன்பட்டு இருந்தபோதிலும், அம்மாகாண சபையின் முதலமைச்சராக முஸ்லிம் ஒருவரும் வரமுடியும் என்ற அடிப்படையில் நாங்கள் எல்லோரும் இணைந்து

අවසර මුතලමෙච්සරාක නියමිත්තෝම්. අවර් කිළක්කු මාකාණත්තිලුළ්ළ මූන්රු මාවට්ටංකළුක්කුම් පල්වේරු සේවෙකළෙප් පුරින්තිරුක්කින්රාර් එන්පතෙ ඉන්ත ඉටත්තිල් කූරික්කොල්වතිල් නාන් පෙරුමෙ අටෙකින්රේන්. ඉරුතික් කාලත්තිල් අවරුටෙය අරසියල් පාතෙයානතු තේසිය කාංකිරසෝටු ඉරුන්තතු එන්පතෙ නාන් ඉන්ත ඉටත්තිල් මිකවුම් පෙරුමෙයෝටු කූරික්කොළ්කින්රේන්. සිරුපාන්මෙක් කට්සියාක ඉරුක්කින්ර තේසිය කාංකිරස්ෘටන් සේර්න්තු පයණිප්පතේ මුරෙයානතු එන අවර් තීර්මානිත්තිරුන්තාර්. තේසිය කාංකිරසින් පිරතිත් තලෙවරාක ඉරුක්කුම් පොළුතුතාන් අවර් මරණත්තෛත් තළුවිනාර්.

කටන්ත පාරාළුමන්රත් තේර්තලිල් තිරුකෝණමලෙ මාවට්ටත්තිල් පෝට්ටියිටුවතර්කාක මර්හූම් නජීප් අප්තුල් මජීත් අවර්කළුටෙය තලෙමෙයිල් තාක්කල් සෙය්යප්පට්ට nomination reject පණ්ණප්පට්ට කාරණත්තාල්, අවරාල් අත්තේර්තලිල් පෝට්ටියිට මුටියාමල් පෝනතු. අවර් අත්තේර්තලිල් පෝට්ටියිට්ටු ඉරුන්තාල්, ඉරෙවනින් උතවියාල් පාරාළුමන්රත්තුක්කුත් තෙරිවුසෙය්යප්පට්ටු ඉරුප්පාර්. අවරුටෙය ඉරප්පානතු, තිරුකෝණමලෙ මාවට්ට මක්කළුක්කු මාත්තිරමල්ල, ඉන්ත නාට්ටුක්කුමේ මිකප් පෙරියතෝර් ඉළප්පාකුම්. විසේටමාක, තේසිය කාංකිරස්ෘක්කු අතු ඔරු පෝිළප්පාකුම්. අවරුටෙය ඉටත්තෛ නිරප්පුවතු කෂ්ටමාන ඔරු විටයමාක ඉරුන්තාලුම්කූට, අවරතු කුටුම්පත්තිනරෛ මක්කළ් ඉන්නමුම් නේසිත්තුක්කොන්ටුතාන් ඉරුක්කින්රාර්කළ්. තේසිය කාංකිරසින් පිරතිත් තලෙවරාක ඉරුන්ත මර්හූම් නජීප් අප්තුල් මජීත් අවර්කළුක්කු එල්ලාම් වල්ල ඉරෙවන් උයර්න්ත සුවර්ක්කත්තෛක් කොටුක්ක වේන්ටුමෙන නාන් ඉන්ත ඉටත්තිල් පිරාර්ත්තික්කින්රේන්. මේලුම්, අවරුටෙය මනෙවි, මකන්මාර් උට්පට කුටුම්පත්තිනර් එල්ලෝරුක්කුම් එන්නුටෙය ආළ්න්ත අනුතාපත්තෛත් තෙරිවිත්තුක්කොළ්වතෝටු, අවර් විට්ටුච් චෙන්ර පණියෛත් තොටර්වතර්කු එල්ලාම් වල්ල ඉරෙවන් අවර්කළුක්කු තෛරියත්තෛක් කොටුක්ක වේන්ටුමෙනවුම් පිරාර්ත්තික්කින්රේන්. මේලුම්, අන්තප් පිරාන්තිය මක්කළ් එතිර්පාර්ක්කින්ර පණියෛච් චෙය්වතර්කාන තලෙමෛත් තුවත්තෛක් කොටුප්පතර්කු අවර්කළ් මුන්වර වේන්ටුමෙනක් කේට්ටුක්කොළ්වතුටන්, අතර්කාක නාන් ඉන්ත ඉටත්තිල් පිරාර්ත්තනෙයුම් චෙය්කින්රේන්.

අටුත්තු, මර්හූම් ඒ.එච්.එම්. අලවි අවර්කළ් පර්රික් කුරිප්පිට විරුම්පුකින්රේන්. අවර් කුරුණාකල් මාවට්ටත්තිලිරුන්තු තෙරිවුසෙය්යප්පට්ට මුතලාවතු මුස්ලිම් පාරාළුමන්ර උරුප්පිනරාවාර්. අතුමාත්තිරමන්රි, අන්තක් කාලත්තිල් ඉක්කිය තේසියක් කට්සියිල් කොටිකට්ටිප් පරන්තු, මක්කළුක්කාක සේවෙ සෙය්ත ඔරු පාරාළුමන්ර උරුප්පිනරුම් ආවාර්. අවරෙයුම් නාංකළ් ඉන්ත ඉටත්තිල් නිනෛවුකූර්කින්රෝම්. අවරුටෙය කුටුම්පත්තිනර් එල්ලෝරුක්කුම් එංකළුටෙය අනුතාපත්තෛ ඉන්ත ඉටත්තිල් තෙරිවිත්තුක්කොළ්කින්රෝම්.

අපි සියලුදෙනාම පාලිත තෙවරප්පෙරුම මැතිතුමා ගැන දන්නවා. මුස්ලිම් වේවා, සිංහල වේවා, කවුරුන් හෝ වේවා; දුප්පත් මිනිසාගේ සහෝදරයා වාගේ හිටපු තෙවරප්පෙරුම මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන මේ අවස්ථාවට සහභාගි වෙන්න ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. එපමණක් නොවෙයි, මිල්රෝයි ප්‍රනාන්දු කියන පුත්තලම දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාත් අපේ සහෝදරයෙක් වාගෙයි කටයුතු කළේ. අපි ඔක්කොම මේ පාර්ලිමේන්තුවේ වාඩි වෙලා සුභදව කටයුතු කළා. එතුමාත් රටට සේවය කරපු චරිතයක්. එතුමාගේ අභාවය වෙනුවෙනුත් මගේ ශෝකය මේ අවස්ථාවේදී පළ කරනවා. ඒ වාගේම එතුමන්ලාගේ පවුල්වල ඥාතීන් සියලුදෙනා වෙත මගේ ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

මුන්නාළ් පාරාළුමන්ර උරුප්පිනර්කළ් ඉන්ත නාට්ටු මක්කළුක්කාකච් චෙය්ත සේවෙකළෙ නාංකළ් නිනෛවුකූර්න්තේ ආකවේන්ටුම්. අවර්කළ් අරසියලුක්කු වන්තු, මක්කළුක් කාකච් සේවෙ චෙය්තවර්කළ්. අවර්කළ් එල්ලෝරුක්කුම් අවරවරුටෙය මාර්ක්කත්තින්පටි, උයර්න්ත අන්තස්තු කිටෛක්ක වේන්ටුමෙනප් පිරාර්ත්තිත්තු විටෛපෙරුකින්රේන්. නන්රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු පියංකර ජයරත්න මන්ත්‍රීතුමා.

[පූ.භා. 11.58]

ගරු පියංකර ජයරත්න මහතා
(මාණ්පුමිකු පියංකර ජූයරත්න)
(The Hon. Piyankara Jayaratne)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අද දවසේ, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමා, ගරු එම්.එන්. අබ්දුල් මජීඩ් මැතිතුමා, ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමා සහ අපේ දිස්ත්‍රික්කය නියෝජනය කළ ජ්‍යෙෂ්ඨ දේශපාලන නායකයෙකු වූ ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා යන ගරු මන්ත්‍රීතුමන්ලාගේ අභාවය පිළිබඳව අපි ශෝක යෝජනා ඉදිරිපත් කරනවා.

පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට දිවංගත ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා එක්ක මේ පාර්ලිමේන්තුවේ සමීපව කටයුතු කළ පුද්ගලයෙක්, මම. පසුගිය කාල සීමාව තුළ අපි එතුමා එක්ක පාර්ලිමේන්තුව තුළත්, පිටතදිත් කටයුතු කළා. එතුමා දේශපාලනඥයෙක් වුණත් ඉතා සරල, නිහතමානී ගති පැවතුම් ඇති ඉතාම විනෝදකාමී පුද්ගලයෙක්. මම එහෙම කිව්වේ මේ නිසායි. පුත්තලම දිස්ත්‍රික්කය වාගේම සමස්ත ලංකාවම එතුමාගේ චරිතය ගැන දන්නවා. එතුමා විනෝදකාමී සහ ඉතාම ප්‍රියජනක පුද්ගලයෙක් හැටියට තමයි දිස්ත්‍රික්කයේ කටයුතු කළේ. මම එතුමාත් එක්ක සම්බන්ධ වුණේ 1989දී. ඊට පෙර එතුමා 1988දී මට මතක විධියට එක්සත් සමාජවාදී වාමාංශික පෙරමුණ යටතේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළා. 1989 මැතිවරණයේ නාම යෝජනා අත්සන් කරන අවස්ථාවේ මට මතකයි, මගේ දිවංගත පියා එදා මට කිව්වා, "ගිහිල්ලා මිල්රෝයි හම්බවෙන්න" කියලා. ඒ වෙනතුරු මම දැනගෙන හිටියේ නැහැ, කවුද මිල්රෝයි කියන්නේ කියලා. මම වෙන්නප්පුවේ තිබුණු එතුමාගේ පැරණි නිවසට ගියා. දැන් එය කාර්යාලය වශයෙන් තිබෙනවා. මම යනකොට එතුමා එළියේ පුටුවක වාඩිවෙලා හිටියා. මම ඇහුවා, "මිල්රෝයි මහත්මයා කියන්නේ කවුද?" කියලා. එතුමා කිව්වා, "ඇයි ළමයෝ, මිල්රෝයි කියන්නේ මම නේ" කියලා. මම කිව්වා, "මම මගේ තාත්තාගේ පණිවුඩයක් අරගෙන ආවේ, 1989 මැතිවරණයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යටතේ තරග කරන්න" කියලා. එතකොට එතුමා ටිකක් කල්පනා කළා; නමුත් ඒකට එච්චර කැමැත්තක් දැක්වූයේ නැහැ. ඒකට හේතුව දේශපාලන වශයෙන් ගත්තාම එතුමා කෘතගුණ දන්න දේශපාලනඥයෙක්. එතුමාගේ දේශපාලන දිවිය පටන් ගත්තේ එක්සත් ජාතික පක්ෂයෙන්. එතුමා දිවංගත ෆෙස්ටස් පෙරේරා මැතිතුමාගේ සමීපතම හිතවතෙක්. ඒ නිසා එතුමා කැමැත්තක් දැක්වූයේ නැහැ, 1989 දී පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී ෆෙස්ටස් පෙරේරා මැතිතුමා එක්ක තරග වදින්න. ඒ කියන්නේ, ෆෙස්ටස් පෙරේරා මැතිතුමා එක්සත් ජාතික පක්ෂයෙන් වෙන්නප්පුව ආසනයෙන් තරග කරද්දී මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා 1989 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කරන්න එතරම් කැමැත්තක් දැක්වූයේ නැහැ, දේශපාලන දැක්මක් තිබෙන කෘතගුණ සලකන නායකයෙක් හැටියට. අද සමාජයේ එහෙම අය නැහැ. නමුත් එතුමා නැවතත්

[ගරු පියංකර ජයරත්න මහතා]

මමත්, මගේ පියාත් එක්ක ගිහිල්ලා, ඊට කැමැති වුණා. එතුමාගේ මැතිනියත් අද මේ අවස්ථාවට සහභාගි වෙලා ඇතැයි මා හිතනවා. මොකද, ඒ මැතිනියත් ඒකට එදා විරුද්ධත්වය ප්‍රකාශ කළා. එතුමිය මෙහි සිටිනවා නම් ඒක මතක ඇති. නමුත් අවසානයේදී ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා සිය කැමැත්තෙන්ම මාදම්පේ නිවසේදී නාම යෝජනා අත්සන් කළා. එතුමා නාම යෝජනා අත්සන් කළේ ඉතා භීෂණකාරී යුගයක. මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා වෙන්නප්පුව ආසනය තුළ දේශපාලනය කළේ, මැතිවරණය කළේ භීෂණය පෙනී පෙනී.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේ දී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. செனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු මංජුලා දිසානායක මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු (திருமதி) මඤ්ඤුලා දිසානායක්ක අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු චාණක්කියන් රාජපුත්තිරන් ඉරාසමාණික්කම් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. (MRS.) MANJULA DISSANAYAKE left the Chair and THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM took the Chair.

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1989දී රටේ පැවතුණු දේශපාලන ව්‍යාකූලත්වය තුළ, භීෂණය තුළ තමයි එතුමා දේශපාලනය කළේ. අපි මැතිවරණයෙන් පස්සේ පුත්තලම මැතිවරණ කාර්යාලයට ගිහිල්ලා ඡන්දය ගණන් කරද්දී, එතුමා ඡන්දය ගණන් කරනවා බලන්න කාර්යාලයටවත් ආවේ නැහැ. එතුමා එළියේ හිටියේ. මගේ පියාත් මමත් එදා නියෝජිතයෝ හැටියට කටයුතු කළා. අවසානයේ එතුමාත් මමත් එහාට යනවා, මෙහාට යනවා. මොකද, එතැන දේශපාලන ප්‍රශ්නයක් තිබුණා. නමුත් අවසානයේදී ජොෂ්ඨයන් පරදවලා -මගේ පියාත් එක්ක- විපක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙකු පමණයි තේරී පත් වුණේ; ඒ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මගේ පියාත්, මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාත් පමණයි. එතුමා දෙවැනි තැනට පත් වුණා. එදා එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කරට ගෙන අපේ දිස්ත්‍රික්කය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රවර්ධනය කරන්න කටයුතු කළාය කියන කාරණය මම මතක් කරන්න ඕනෑ.

ඊළඟට, මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා නාත්තන්ඩිය ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයා හැටියට කටයුතු කළා. එදා, 1991දී පැවති ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් -පුත්තලම දිස්ත්‍රික්කය ඇතුළු සමස්ත ලංකාව ගත්තාම- එතුමා ජයග්‍රහණය කළා. 1991දී පළමුවැනි වතාවට දිස්ත්‍රික්කයේ අනෙක් ආසන වෙනත් දේශපාලන පක්ෂ ජයග්‍රහණය කරද්දී නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව තමන්ගේ යටතට ගත් එකම නායකයා වුණේ ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමායි.

එතුමා එවැනි දක්ෂතාවක් ඇතිව කටයුතු කළ පුද්ගලයෙක්. ඒ වාගේම, 1994 දී අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් නැවත පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා නියෝජ්‍ය අමාත්‍ය ධුර සහ විවිධ කැබිනට් අමාත්‍ය ධුර රාශියක එතුමා කටයුතු කළා. ඒ විතරක් නොවෙයි. වයඹ පළාත් සභාව ගත්තාම, එදා එතුමාගේ නායකත්වය යටතේ වෙන්නප්පුව මැතිවරණ බලප්‍රදේශයෙන් වයඹ පළාත් සභාවට අපේක්ෂකයින් නම් කරලා, ඉන් තිදෙනෙක් ජයග්‍රහණය කළා. එතුමාගේ නායකත්වය යටතේ සන්ධ්‍යා කුමාර රාජපක්ෂ, මල්රාජ් පීරිස්, ට්‍රෙවින් ප්‍රනාන්දු යන පළාත් සභා මන්ත්‍රීවරු බිහි කළා. ඒ විතරක් නොවෙයි, එතුමාගේ සහෝදරයකුගේ පුතෙකු වන සුසන්ත පෙරේරා ප්‍රාදේශීය සභාවේ සභාපති බවට පත් කළා. ඒ ආකාරයට එතුමා අපේ දිස්ත්‍රික්කය තුළ විශාල දේශපාලන කණ්ඩායමක් නිර්මාණය කළා.

මම කලින් කිව්වා වාගේ, එතුමා හැම විටම නිහතමානී, සරල ගති පැවතුම් ඇති, නිරහංකාර පුද්ගලයෙක් හැටියට කටයුතු කළා. මට මතක විධියට එතුමා සෙරෙප්පු දෙකවත් දැම්මේ නැහැ. මාළු ගන්න වැල්ලට ගියත් එතුමා සෙරෙප්පු දෙක නොදා තමයි ගියේ. ඒ වාගේම, උදේ 5.30, 6.00 වෙද්දී එතුමා කාර්යාලයට ඇවිල්ලා පත්තර බලලා දවස ආරම්භ කළා. හැම දුරකථන ඇමතුමකටම පිළිතුරු දුන්නා. ඒක අපට ආදර්ශයක් වුණා, තරුණ දේශපාලනඥයින් හැටියට. උදේ පහ හමාරේ ඉඳලා ජනතාවට එතුමා හමුවෙන්න අවස්ථාව ලැබුණා. ඒ නිසා එතුමාගේ අභාවයෙන් අපේ දිස්ත්‍රික්කයට විශාල පාඩුවක් වෙලා තිබෙනවා කියා මම හිතනවා. ඒ වාගේම, එතුමා මුදල් පසුපස ගිය පුද්ගලයෙක් නොවෙයි. අපේ දිස්ත්‍රික්කය තුළ එතුමා කෙරෙහි විශාල ජනතා ප්‍රසාදයක් තිබුණා. අවසාන වශයෙන් මටත් එතුමාගෙන් ඒ ආදර්ශය ලැබුණා.

1999 පළාත් සභා මැතිවරණයෙන් පසු චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය හරහා මට වයඹ පළාත් සභාවේ අමාත්‍ය ධුරයක් දෙන්න එතුමා මූලිකත්වය ගත්තා කියන කාරණය මම මේ අවස්ථාවේ කෘතවේදීව මතක් කරන්න ඕනෑ. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එතුමා ගැන වැඩිපුර කථා කරන්න අවශ්‍ය නැහැ. මොකද, දිස්ත්‍රික්කයේ ජනතාව දන්නවා එතුමා අපට කරපු සේවය. ඒ වාගේම, මම එතුමා එක්ක 2000දී ළාබාල මන්ත්‍රීවරයෙක් හැටියට පාර්ලිමේන්තුවට ආවත්, 2010දී එතුමා එක්ක එකට කැබිනට් මණ්ඩලයේ කටයුතු කළා. නවක කැබිනට් අමාත්‍යවරයෙක් හැටියට මට ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් වුණු එතුමා එක්ක කටයුතු කරන්නට ලැබීම මගේ දේශපාලන ජීවිතයේ එක් අත්දැකීමක් හැටියට මම දකිනවා. එතුමා අපේ දිස්ත්‍රික්කයට විශාල සේවයක් කළා වාගේම සමස්ත රටටම විශාල සේවයක් කළා.

ජීවිතයේ අවසාන කාලයේ එතුමා ඉතාම අසීරු තත්ත්වයෙන් සිටියත්, එතුමාගේ මනස හොඳින් ක්‍රියා කළා. අපි හමුවන

අවස්ථාවල එතුමා දිස්ත්‍රික්කයේ ජනතාව ගැන කථා කළා. ඒ වාගේම මම දැක්කා, එතුමාගේ අවමංගල්‍යය පැවති අවස්ථාවේ එතුමාට කෘතගුණ දක්වන්න විශාල පිරිසක් පැමිණ සිටි ආකාරය. විශේෂයෙන්ම හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අවමංගල්‍යයට පැමිණ ශෝකය ප්‍රකාශ කළා. මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා සහ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා දුරකථනයෙන් පවුලේ අයට ශෝකය ප්‍රකාශ කළා. එවැනි නායකයින් එක්ක සමඟියෙන් කටයුතු කළ නිසා හැම නායකයෙකුම එතුමාගේ අභාවය අවස්ථාවේ ශෝකය ප්‍රකාශ කළා. අවසාන වශයෙන්, පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාවගේ සාතිශය ශෝකයත්, පෞද්ගලිකව අපේ ශෝකයත් ඒ පවුලේ මොනිකා මැතිනියටත්, දුවා දරුවන්ටත් පළ කරමින්, දිවංගත මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාට මෝක්ෂ සුව අත් වේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Anura Priyadharshana Yapa.

[අ.භා. 12.06]

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு சட்டத்தரணி அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන වශයෙන් 1994දී මාත් සමඟ පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරු දෙදෙනෙකු ඇතුළු මන්ත්‍රීවරු හතරදෙනෙකුගේ අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ගෙනෙන අවස්ථාවටයි මම මේ සහභාගි වෙන්නේ. විශේෂයෙන්ම 1994 මැතිවරණයට කටුගම්පළ ආසනයෙන් මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ පෙරමුණෙන් ඉදිරිපත් වෙනකොට හිටපු මන්ත්‍රී ඒ.එච්.එම්. අලවි මැතිතුමා ඉදිරිපත් වුණේ එක්සත් ජාතික පක්ෂයෙන්. එතුමාත්, මමත් දෙදෙනාම එකට තමයි පාර්ලිමේන්තුවට ආවේ. ඒ කාලයේ දේශපාලනය බොහොම කටුකයි. අපට විවිධ ප්‍රශ්නවලට මුහුණපාන්න සිද්ධ වුණා. ඒ වුණත් එතුමා දීර්ඝ කාලයක් අප සමඟ ඉතාම හොඳ පෞද්ගලික සබඳතාවක් පවත්වාගෙන ගියා. මම කුලියාපිටිය අධිකරණයේ නීතිඥවරයෙක් වශයෙන් කටයුතු කළ කාලයේ තමයි එතුමාව හඳුනා ගත්තේ. එතුමා පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට ප්‍රථම පළාත් සභාවට තේරී පත් වුණා. එතුමා ඇත්තටම දිවංගත ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාගේ ඉතාම හිතවත් මිත්‍රයෙක් හැටියට තමයි දේශපාලනය කළේ. ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට පත් වෙනකොට එතුමාට කටුගම්පළ ආසනයේ සංවිධායකකම ලැබිලා ඒ ආසනයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන්න වරම් ලැබුණා.

මුස්ලිම් ජාතිකයෙක් වුණත්, එතුමාට ජාති භේද, ආගම් භේද කිසිවක් තිබුණේ නැහැ. පල්ලියත්, පන්සලත් සමඟ එතුමා එක හා සමාන ලෙස ක්‍රියා කළා. එතුමාට සිංහල හිතවතුන් විශාල සංඛ්‍යාවක් සිටියා. නොඑසේ නම්, මැතිවරණයක දී එතුමාට අපේ ආසනය වාගේ ආසනයකින් ඡන්ද ලබා ගැනීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. එතුමා වරෙක අප සමඟත් තරග කළා. ඒ අවස්ථාවේ එතුමාට ජයග්‍රහණය කරන්න නොහැකි වුණත්, අපේ ආසනයෙන් විශාල ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත්තා. එතුමා මිය යන්නට පෙර අවසන් වරට මක්කම වන්දනාව සඳහා යනකොටත් අපේ ගෙදරට ඇවිල්ලා මාව මුණගැසිලා මටත් කියලා තමයි ගියේ. මම කවදාවත් හිතුවේ නැහැ, එතුමාගේ අවසන් හමුවීම එදා වෙයි කියලා. කෙසේ වෙතත් එතුමා හොඳ සුහද මිතුරෙක්, පාර්ලිමේන්තු සහෝදරයෙක්. එවන් කෙනෙක් හැටියට ක්‍රියා කළ ඒ.එච්.එම්. අලවි මැතිතුමාගේ අභාවය වෙනුවෙන් අපි අපේ ශෝකය ප්‍රකාශ කරනවා.

ඊළඟට, එම්.එන්. අබ්දුල් මජීඩ් මැතිතුමා ගැන කථා කළොත්, එතුමා අප සමඟ ඉතාම හිතවත්ව කටයුතු කළ කෙනෙක්. මුල් අවස්ථාවේ එතුමා අපේ සන්ධානය සමඟ එකතු වී මුස්ලිම් කොංග්‍රසයෙන් ඡන්දය ඉල්ලුවත්, එතුමාත්, ඔහුගේ පියාත් දීර්ඝ කාලයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයින්. එතුමා දිගටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙක් හැටියට තමයි වැඩ කළේ. අබ්දුල් මජීඩ් මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ දීත්, එළියේ දීත් අපට ඉතා හිතවත් මිතුරෙක් හැටියට තමයි ක්‍රියා කළේ.

විශේෂයෙන් එක් පළාත් සභා මැතිවරණයක දී අපේ පක්ෂයෙන් මට භාර දීලා තිබුණා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කටයුතු කරන්න. ඒ අවස්ථාවේ මට එතුමා හමු වීමටත්, එතුමාගේ නිවසට යෑමටත්, එතුමා සමඟ භෝජන සංග්‍රහ වාර කිහිපයකට සහභාගි වීමටත්, ඒ වාගේම එතුමා සමඟ දේශපාලනය කරන්නත් අවස්ථාව ලැබුණා. අබ්දුල් මජීඩ් මැතිතුමා මම දැකපු ඉතාම නිරහංකාර, ඉතාම හොඳ මහත්මයෙක්. එතුමා සමඟ තිබුණු සහෝදරත්වය කොතෙක්ද කිව්වොත්, ඇත්තටම එතුමා මිය ගිය බව ඇසීම පවා ශෝකය දනවන කාරණාවක් වුණා. කලක් එතුමා ඒ පළාතේ මහ ඇමතිවරයා හැටියට වැඩ කළ බවත් මට මතකයි. එතුමා අමාත්‍යාංශ ගණනාවක් මෙහෙවලා තිබෙනවා. ඒ වාගේම ඒ අමාත්‍යාංශවල වැඩ කරනකොට ඉතාම සුභදව, ඉතාම නිවුණු ස්වරූපයකින් තමයි එතුමා වැඩ කළේ. එතුමාගේ අභාවය වෙනුවෙනුත් මගේ ශෝකය ප්‍රකාශ කරනවා.

ඊළඟට මම කැමැතියි, මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා ගැන කථා කරන්න. එතුමා 1989 දී තමයි පාර්ලිමේන්තුවට පිවිසියේ. ඉතාම අමාරු කාලයකයි එතුමා දේශපාලනයේ නියැළුණේ. 1988-1989 කාලයේ භීෂණ යුගයක් තිබුණා, පක්ෂ ගැටුමක් තිබුණා. ඒ සියල්ලටම මැදිවයි එතුමා දේශපාලනය කළේ, එතුමා මම නියෝජනය කරන ආසනයට යාබද පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ආසනයේ. මම දැකපු හැටියට එතුමා ඒ කාලය තුළ තමන්ගේ දේශපාලනය ඉතාම අවංකව කළා. දේශපාලනය නිසා එතුමා කවදාවත් වැජඹුණේත් නැහැ, දේශපාලනයෙන් යමක් හම්බ කර ගත්තේත් නැහැ. එතුමා හැම විටම තමා අදහන දේ ගැන සෘජු විශ්වාසයකින් යුතුව කටයුතු කරපු කෙනෙක්. මේ පාර්ලිමේන්තුවේ දී එතුමා කරපු කථා කියවනකොට අපට පෙනෙනවා, එතුමා හැම වෙලාවකම හරි දේට හරියි කියපු, වැරදි දේට වැරදියි කියපු කෙනෙක් බව. ඒ වාගේම එතුමා ඉතාම නිරහංකාර කෙනෙක්. දරුවන්ට බොහොම ආදරය කරපු ගෞරවනීය පුද්ගලයෙක්.

මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා අමාත්‍යාංශ ගණනාවක අමාත්‍යවරයෙක් වශයෙන් ක්‍රියා කළා. විශේෂයෙන්ම ඒ යුගයේ - 1980 දශකයේ- පුත්තලම දිස්ත්‍රික්කයෙන් දේශපාලනයට ආපු අයගෙන් අවසාන පුරුක තමයි මේ මිය ගියේ. අනික් පිරිස ඔක්කෝම 1990 දශකයේ දේශපාලනයට ආපු අය. මෙතුමා, එස්.ඩී.ආර්. ජයරත්න මැතිතුමා වාගේම ඒ යුගයේ එම දිස්ත්‍රික්කයෙන් දේශපාලනයට ආපු අනෙකුත් සියලුදෙනාම මේ වන විට දිවි හැර ගිහින්. නමුත් එතුමා, එතුමාගේ දිස්ත්‍රික්කයට, එතුමාගේ ප්‍රදේශයට ඉතාම හොඳ සේවයක් ඉටු කළා. ඕනෑම කෙනෙකුට එතුමාව හමුවෙන්න පුළුවන්කම තිබුණා. එතුමා ගෙදර ඉදගෙන මහජනයා එක්ක නිරන්තරයෙන් ගැටෙමින් වැඩ කළා. මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාගේ අවසන් කටයුතුවලට සහභාගි වෙන්න මට අවස්ථාව ලැබුණා. මේ අවස්ථාවේ එතුමාගේ පවුලේ සියලුදෙනාටත් අපේ ශෝකය ප්‍රකාශ කරනවා.

[ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

ඊළඟට, පාලිත තෙවරප්පෙරුම මැතිතුමා ගැන කථා කළොත්, එතුමා සමඟත් අපි මේ පාර්ලිමේන්තුවේ කටයුතු කළා. බොහොම ඍජුව තමන්ගේ අදහස් පළ කරපු කෙනෙක්, තෙවරප්පෙරුම මැතිතුමා. එතුමා අදහස් දක්වනකොට තමන්ගේ පක්ෂයේ අය පවා විවේචනයට ලක් කරන්න පැකිළුණේ නැහැ. යහ පාලන රජය තුළ එතුමාත්, අපිත් අවුරුදු 4ක්, 5ක් එකට වැඩ කළා.

එතුමා, තමාගේ නාමය ජනතාව තුළ රඳවපු කෙනෙක්. සාමාන්‍යයෙන් දේශපාලනඥයෙකුට තමන්ගේ අවසාන දවසේ ජනතාව අතර තමන්ගේ නාමය රඳවන්න හරි අමාරුයි. නමුත් එතුමා ඒක ඉතා මැනවින් ඉටු කළා. විශේෂයෙන්ම කොවිඩ් වසංගත කාලයේදී එතුමා විශාල සේවාවක් මුස්ලිම් ජනතාව වෙනුවෙන්, ඒ ප්‍රදේශයේ අනෙකුත් ජනතාව වෙනුවෙන් ඉටු කළා. එතුමා නියම සමාජ සේවකයෙක් සහ හොඳ මන්ත්‍රීවරයෙක්; හොඳ ස්වාමිපුරුෂයෙක්; හොඳ පියෙක්. එතුමාගේ අභාවය පිළිබඳවත් අපේ ශෝකය ප්‍රකාශ කරනවා.

දීර්ඝ කාලයක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ සිටින මම මේ ශෝක යෝජනාවලට අදාළ මන්ත්‍රීවරු හතරදෙනා සමඟම මේ පාර්ලිමේන්තුවේ වාර කිහිපයක් ගත කරලා තිබෙනවා. ජීවිතය කියන්නේ බොහොම කෙටි දෙයක්. අපට අද හම්බ වෙන කෙනා හෙට නැහැ. ඒ යථාර්ථයත් තේරුම් අරගෙන, දේශපාලනයේ දී මහජන සේවය කරන අපි හැමෝම හැම කෙනා සමඟම සහයෝගයෙන් සහ ගෞරවයෙන් ක්‍රියා කිරීම තමයි විය යුත්තේ. මේ අභාවප්‍රාප්ත මන්ත්‍රීවරු හතරදෙනාම එහෙම ගෞරවයෙන් තමන්ගේ සේවය ඉටු කළ අය බව මම හොඳාකාරව දන්නවා. තමන් ළඟට එන පුද්ගලයා මොන පක්ෂයේ වුණත් ඒ පුද්ගලයාගේ අවශ්‍යතාව ඉටු කර දීමට එතුමන්ලා කාරුණික වුණා. දේශපාලනයේ වැදගත් මහත්වරුන් හැටියට ක්‍රියා කරමින් ජනතාවට සේවය කළ එතුමන්ලා හැමදෙනාටම එතුමන්ලාගේ ආගම් අනුව සුගතිය, මෝක්ෂය හෝ නිවන් සුව අත්වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.14]

ගරු ජගත් ප්‍රියංකර මහතා
(மாண்புமிகு ஜகத் பிரியங்கர)
(The Hon. Jagath Priyankara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු පාර්ලිමේන්තුව නියෝජනය කළ ඒ.එච්.එම්. අලවි මැතිතුමාගේ, එම්.එන්. අබ්දුල් මජීඩ් මැතිතුමාගේ, පාලිත තෙවරප්පෙරුම මැතිතුමාගේ සහ අපේ දිස්ත්‍රික්කය නියෝජනය කළ මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනා අද දින මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. එතුමන්ලා සියලුදෙනාගේම පවුල්වල ඥාතීන් වෙත අපේ සාතිශය සංවේගය පළ කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. මමත් නියෝජනය කරන පුත්තලම දිස්ත්‍රික්කයෙන්, වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයෙන් වසර 25කට අධික කාලයක් අඛණ්ඩව මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා පිළිබඳව විශේෂයෙන් යම් සඳහනක් කළ යුතුයි කියලා මම හිතනවා. එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරන්න කලින් 1988දී පළාත් සභාව නියෝජනය කළා. 1989 ඉඳලා 2015 දක්වා අඛණ්ඩව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට කටයුතු කළා. ඒ වාගේම ධීවර නියෝජ්‍ය අමාත්‍ය ධුරයත්, විවිධ අමාත්‍යාංශවල - ජනතා වතු සංවර්ධන, ක්‍රිස්තියානි හා පාර්ලිමේන්තු කටයුතු ආදී අමාත්‍යාංශවල - අමාත්‍ය ධුරත් එතුමා දැරුවා. ඒ දරපු වගකීම ඇතුළේ විශේෂයෙන්ම රටටත්, ඒ වාගේම අපේ දිස්ත්‍රික්කයේ ජනතාවටත් අති සුවිශේෂී කාර්යභාරයක් ඉෂ්ට සිද්ධ කරපු දේශපාලන නායකයකු වශයෙන් ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාව අපට හඳුන්වන්න පුළුවන්. අපේ දිස්ත්‍රික්කයේ පියංකර ජයරත්න මැතිතුමා කථා කරද්දීත් ඒ ගැන සිහිපත් කළා. එතුමා දේශපාලන නායකයකු විධියට ඉතා නිහතමානී ගති ලක්ෂණ පෙන්නුම් කළ කෙනෙක්.

ඒ වාගේම තමයි අද මහජනතාවගේ නියෝජිතයන් විධියට අපට සමහර අවස්ථාවල මහ ජනතාවට සමීප වෙන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මම දැකපු විධියට පුත්තලම දිස්ත්‍රික්කයේ අතීතයේ වාගේම වර්තමානය තුළත් මිනිස්සු එක්ක බොහොම සරලව ගනුදෙනු කළ, ඒ වාගේම මිනිසුන්ට තමන්ගේ අවශ්‍යතා වෙනුවෙන් මුණ ගැහිලා, කථාබහ කරලා ඒවා විසඳා ගන්න ඉතා සරල ප්‍රවේශයක් විවෘත කර දීපු නියෝජිතයන් විධියට ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාව හඳුන්වන්න පුළුවන්.

ඒ වාගේම එතුමා පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවර ක්ෂේත්‍රයට ලොකු වැඩ කොටසක් කළා. ධීවර ජනතාවගේ නිවාස කටයුතු සම්බන්ධයෙන් ලොකු වැඩ කටයුත්තක් කළා. කිතුනු අධ්‍යාපනය සම්බන්ධයෙන් ජාතික වශයෙන් ලොකු වැඩ කටයුත්තක් කළා. අපේ වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයේ, දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැල්වත්ත දියවර ගම්මානය අද ඉතා හොඳින් ජීවත් වන ප්‍රජාවක් ඉන්න ගම්මානයක්; පවුල් විශාල ප්‍රමාණයක් එහි හොඳින් ජීවන කටයුතු පවත්වාගෙන යනවා. ඒ ගම්මානය ස්ථාපිත කරන්න ලොකු කාර්යභාරයක් කළ, එහි නිර්මාපකයා වශයෙන් හඳුන්වන්න පුළුවන් පුද්ගලයා තමයි ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා. ඒ වාගේම එතුමාගේ නායකත්වය ඇතුළේ අප දකින තවත් සුවිශේෂී දෙයක් තිබෙනවා. සියලු දේශපාලන පක්ෂවල නායකයෝ තමන්ගේ පිටුපසින් ශක්තිමත් නායකයන් ගොඩනඟන්න අවශ්‍ය පරිසරය ඉතිරි කරන්නේ නැති තත්ත්වයක් තිබෙන බව ආපහු හැරිලා බලනකොට අපට පෙනෙනවා.

මමත් පුත්තලම දිස්ත්‍රික්කයේ -එම ප්‍රදේශයේම- ජීවත් වෙන කෙනෙක්. එතුමා ඉදිරිපත් වෙච්ච පළමුවැනි පාර්ලිමේන්තු මැතිවරණයේදී මගේ පියා එතුමාගේ බොහොම ළඟ ආධාරකරුවෙකු විධියට ඒ මැතිවරණ ව්‍යාපාරයට දායක වුණා. ඊට වසර ගණනාවකට පස්සේ අපි දේශපාලනයට ප්‍රවේශ වෙනකොටත්, කුඟක නොවී අපේ ගමන යන්න ලොකු ශක්තියක් දීපු නායකයෙකු විධියට එතුමා කටයුතු කළා.

ඒ වාගේම තමයි, මේ පාර්ලිමේන්තුව දැන් නියෝජනය කරන අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා, වයඹ පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍ය ධුරය දරපු සන්ධ්‍යා කුමාර රාජපක්ෂ මැතිතුමා, ප්‍රවීන් ප්‍රනාන්දු පළාත් සභා මන්ත්‍රීතුමා, මල්රාජ් පීරිස් පළාත් සභා මන්ත්‍රීතුමා, සුසන්ත පෙරේරා හිටපු සභාපතිතුමා ඇතුළු ඉතා ම ශක්තිමත් මන්ත්‍රී කණ්ඩායමක් අපේ ආසනයේ නිර්මාණය කරන්න අවශ්‍ය ලොකු කාර්යභාරයක් ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා විසින් ඉෂ්ට සිද්ධ කෙරුවා. අවුරුදු 25ක් පාර්ලිමේන්තුව නියෝජනය කෙරුවත්, රජයේ බොහෝ වගකීම් දැරුවත්, එතුමා ජීවත් වෙන කාලයේ එතුමා පිටුපසින් එන්න අවශ්‍ය දේශපාලන නායකයෝ එතුමා නිර්මාණය කෙරුවා. හැබැයි, දේශපාලන වශයෙන් බලය තිබෙන අවස්ථාවේදී එතුමාගේ පුත්‍රයා වන රුක්මන් ප්‍රනාන්දු මැතිතුමා ඉදිරියට ගන්න එතුමා විශාල වශයෙන් උනන්දු වුණේ නැහැ. මොකද, ඒ අවස්ථාවේ සිටි නායකයන්ට ඒ දේශපාලන ගමන යන්න එතුමා ඉඩකඩ ලබා දුන්නා. එලෙස පුත්තලම දිස්ත්‍රික්කයට ලොකු වැඩ කොටසක් කරපු, අපේ වෙන්නප්පුව මැතිවරණ කොට්ඨාසයට ලොකු වැඩ කොටසක් කරපු ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය වෙනුවෙන් මේ අවස්ථාවේදී අපේ ශෝකය පළ කරනවා.

එතුමාගේ පුත්‍රයා වන රුක්මන් ප්‍රනාන්දු මැතිතුමා මේ වෙනකොට ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාගේ දේශපාලන ගමන නැවත ක්‍රියාකාරීව ආරම්භ කරමින් ඉදිරියට ගෙන යන්න

කටයුතු කරනවා. එතුමාටත් සුබපැතුම් පිරිනමමින්, ඒ පවුලේ සියලුදෙනාට අපේ ශෝකය පළ කරනවා.

අද දවසේදී ශෝක යෝජනා ඉදිරිපත් වන ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමාටත්, ගරු එම්.එන්. අබ්දුල් මජීඩ් මැතිතුමාටත් මේ අවස්ථාවේදී මා ස්වර්ග සුව ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාලිත තෙවරුප්පෙරුම මැතිතුමාගේ පවුලේ ඥාතීන්ටත් අපේ ශෝකය පළ කරමින් එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා. අපේ දිස්ත්‍රික්කය, අපේ ආසනය නියෝජනය කළ අභාවප්‍රාප්ත ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාගේ පවුලේ සියලුදෙනාටත් ශෝකය ප්‍රකාශ කරමින්, එතුමාට මොක් සුව ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 12.20]

ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. செனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ අවුරුදු ගණනක් සිටිමින් රටේ ජනතාවට සේවය කරපු මන්ත්‍රීවරුන් හතරදෙනෙකුගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේ මමත් වචන කිහිපයක් ඒ කිහිපදෙනෙකු වෙනුවෙන් කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

පළමුවෙන්ම මම කථා කරන්න කැමැතියි, ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා ගැන. 1989දී අප දෙදෙනාම පාර්ලිමේන්තුවට ආවේ එකට. 1988දී එතුමා වයඹ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් පත් වුණා. මහජන පක්ෂයේ අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වෙලා එදා ඒ මැතිවරණය ජයග්‍රහණය කරලා එතුමා පළාත් සභාවේ කටයුතු කරන අතරතුර තමයි, 1989දී පැවති මැතිවරණයට ඉදිරිපත් වුණේ. 1989දී පැවති මැතිවරණයේදී එතුමා තරග කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයෙකු වශයෙන් තරග කොට එම මැතිවරණය ජයග්‍රහණය කරලා පාර්ලිමේන්තුවට ආවා. එතුමා එදා අපත් සමඟ ඉතා කිට්ටුවෙන් වැඩ කළා. 1989දී විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් අපත් සමඟ පක්ෂයේ උන්නතිය වෙනුවෙන් පක්ෂයේ සංවිධාන කටයුතු වෙනුවෙන් එතුමා විශාල කැපවීමකින් යුතුව කටයුතු කළා.

1994දී චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රධානත්වයෙන් ආණ්ඩුව පිහිටුවපු වෙලාවේ එතුමා ධීවර කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් පත් වුණා. ධීවර කටයුතු නියෝජ්‍ය ඇමති ධුරයට අමතරව ඉන් පසු වරින් වර පැවති හැම මැතිවරණයක්ම ජයග්‍රහණය කරමින් එතුමා ඇමති ධුර ගණනාවක් දැරුවා. එතුමා ධීවර අමාත්‍යාංශය, ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය, නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය වාගේ අමාත්‍යාංශ ගණනාවක ධුර දැරුවා. ඒ හැම අමාත්‍යාංශයකම ධුර දරමින් එතුමාගේ ප්‍රදේශයට ආවේණික, විශේෂයෙන් ම ධීවර කර්මාන්තයේ දියුණුවට හැම දාම වැඩ කළා. ඒ වාගේම ධීවර ජනතාවගේ නිවාස ප්‍රශ්නය විසඳන්නත් එතුමා කටයුතු කළා.

එතුමා සාමාන්‍ය මිනිසුන් සමඟ ගැවසෙමින් කටයුතු කළා. එතුමා ගැන කියන විශේෂ කාරණයක් තමයි, ගෙදරට ගියොත් ඕනෑම වෙලාවක එතුමා හම්බ වෙන්න පුළුවන් කියන කාරණය. උදේ වෙන්න පුළුවන්, දවල් වෙන්න පුළුවන්, සවස වෙන්න පුළුවන්, ඕනෑම කෙනෙකුට ඕනෑම වෙලාවක එතුමාගේ නිවසට ගියාම එතුමා හම්බවෙන්න පුළුවන් විධියට නියම ජනතා නියෝජිතයෙකු වශයෙන් එතුමා කටයුතු කළා. ඒ නිසා එතුමා ඉතා ජනප්‍රිය පුද්ගලයෙකු වුණා. ඒ වාගේම මන්ත්‍රීවරුන් අතරත් එතුමා බොහොම ජනප්‍රිය වුණා.

එතුමා බොහොම විනෝදකාමී පුද්ගලයෙක්. මම දන්නවා, යම් යම් සාදවලදී එතුමා බොහොම විනෝදයෙන් කාලය ගත කළ බව. ඒ විනෝදකාමී බව නිසාම ඒ තැන්වලදී කැපී පෙනෙන තත්ත්වයක් එතුමාට ලැබුණා. පුත්තලම දිස්ත්‍රික්කයට විශිෂ්ට සේවාවක් කරපු එතුමා අද අප අතරින් වෙන්ව ගිහින් තිබෙනවා. එතුමා අදහන ලද ආගම අනුව අවසානයේදී එතුමාට මෝක්ෂය ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කළ ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමාත් සුවිශේෂී පුද්ගලයෙක්. අවුරුදු කිහිපයක සිටම මම එතුමා ගැන දන්නවා. එතුමා අවුරුදු 10ක් පමණ පාර්ලිමේන්තුවේ හිටියා. ඒ කාලය තුළදී එතුමා කැපී පෙනෙන පුද්ගලයෙකු බවට පත් වුණා. එතුමා නිරතුරුවම කාලය ගත කළේ සාමාන්‍ය මිනිසුන් සමඟයි. ඒ අයගේ දුකේදීත්, සැපේදීත් ඔවුන් සමඟ අත්වැල් බැඳගෙන එතුමා කටයුතු කළා. එක්තරා කාලයක බේරුවල ප්‍රදේශයේ යම් සිද්ධියක් වුණා; සිංහල -මුස්ලිම් ජනතාව අතර යම්කිසි ගැටුම්කාරී තත්ත්වයක් ඒ වෙලාවේ ඇති වුණා. ඒ වෙලාවේ පාලිත තෙවරප්පෙරුම මහත්මයා ගිහිල්ලා යම් යම් පීඩනයන්ට ලක් වුණු මුස්ලිම් ජනතාවගේ පැත්ත අරගෙන තමයි කටයුතු කළේ. එතුමා එතැනට ගිහිල්ලා අසාධාරණයට විරුද්ධව, අයුක්තියට විරුද්ධව නැඟී සිටියා. එතුමා ඒ වාගේ ආත්ම ශක්තියක් තිබුණු පුද්ගලයෙකු බව එතුමාගේ අවමංගල්‍ය උත්සවයේදීත් ඔප්පු වුණා. පාලිත තෙවරප්පෙරුම මැතිතුමා කියන්නේ ජනතාව අගය කරන පුද්ගලයෙක්; ජනතාව අගය කරන චරිතයක්. එතුමා ගැන ඇත්ත වශයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, රටේම ප්‍රසිද්ධියක් ඇතිවෙලා තිබුණා.

පාලිත තෙවරප්පෙරුම මැතිතුමා පසුගිය මහ මැතිවරණයේදී පරාජයට පත් වුණත්, එතුමා ගැන හැම කෙනෙකුම වාගේ කථා කරන තත්ත්වයක් තමයි තිබුණේ. මොකද, මිනිසුන් සමඟ ගැටෙමින් සාමාන්‍ය දේශපාලනඥයෙකු කරන කටයුතුවලට එහා ගිහිල්ලා තමයි එතුමා කටයුතු කළේ. කළුතර දිස්ත්‍රික්කය බොහෝ වෙලාවට ගංවතුරට යටවන බව අපි දන්නවා. විශේෂයෙන්ම මතුගම, අගලවත්ත වැනි ප්‍රදේශ ගංවතුරට යට වෙනවා. ඒ හැම අවස්ථාවකදීම එතුමා ඒ ප්‍රදේශවලට ගිහිල්ලා ගංවතුරෙන් යටවෙලා සිටින අසරණ මිනිස්සුන්ට ආධාර බෙදා දීම කොහොම හරි කළා. මේ වාගේ ඉතාම පරාර්ථකාමී සේවාවක් කරන කෙනෙකු වශයෙනුයි එතුමා ජීවත් වුණේ. එතුමාට නිවන් සුව ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම අපේ මිත්‍රයෙකු වශයෙන් දීර්ඝ කාලයක් මේ සභාව නියෝජනය කළ ගරු අබ්දුල් මජීඩ් මැතිතුමා ගැනත් මා යමක් කිව යුතුයි. එතුමාගේ පියාත් පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයෙක්; හිටපු උප ඇමතිවරයෙක්. ගරු අබ්දුල් මජීඩ් මැතිතුමාත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා දීර්ඝ කාලයක් හිටියා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් මැතිවරණයට ඉදිරිපත් වෙලා ජයග්‍රහණය කළා. එසේ ජයග්‍රහණය කරලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා එතුමා මන්ත්‍රීවරයෙකු විධියට දිගින් දිගටම කටයුතු කළා. එතුමා වරක් පළාත් සභාවේත් මහ ඇමතිකම දැරුවා. ඒ වාගේම ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සංවර්ධන ඇමතිවරයා වශයෙනුත් එතුමා කටයුතු කළා. ඒ වාගේම එතුමා සමුපකාර සංවර්ධන ඇමතිවරයා වශයෙනුත් කටයුතු කළා. ගරු අබ්දුල් මජීඩ් මැතිතුමා කියන්නේ මේ විධියට නොයෙක් වගකීම් දරමින් මේ රටේ ජනතාවට සේවය කරන්න ජීවිත කාලය කැප කරපු කෙනෙක්. එතුමා නිරහංකාර, කලබලකාරිත්වයක් නැති බොහොම සාමකාමී පුද්ගලයෙක්. වරක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පළාත් සභා මැතිවරණයක සම්බන්ධීකරණ කටයුතු සඳහා යන්න මට අවස්ථාව ලැබුණා. ඒ අවස්ථාවේදී එතුමා මට විශාල සහායක් දුන්නා. එතුමාගේ නිවසේ

[ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

තිබුණු සාකච්ඡාවලදීත්, අනෙකුත් ප්‍රදේශවලදීත් එතුමා මට අවශ්‍ය ආරක්ෂාව පවා සැපයුවා. ඒ කාලයේ රටේ තිබුණු ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මැද්දේ තමයි එතුමා මට ඒ ආරක්ෂාව ලබා දුන්නේ. එතුමා ඒ කාල සීමාවේදී මට ආරක්ෂාව සැලසුවා වාගේම අවශ්‍ය පහසුකම් සලස්වන්නත් කටයුතු කළා. එතුමා තුළ පක්ෂයට විශාල ලැදියාවක්, කැපවීමක් තිබුණා. එතුමාගේ වියෝවීම සම්බන්ධයෙන් මගේ ශෝකය ප්‍රකාශ කරමින් එතුමාටත්, ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමාටත්, ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාටත් එතුමන්ලා අදහන ලද ඒ ආගම්වල පෙන්වන, දක්වන මෝක්ෂය ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමාටත් නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය.

[අ.භා. 12.27]

ගරු මංජුලා දිසානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතීතයේ මේ උත්තරීතර සභාව නියෝජනය කරලා, මේ වන විට ජීවිතයට සමු දී තිබෙන අපේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හතරදෙනෙකු පිළිබඳව මේ සභාව තුළ කථා කරන අවස්ථාවේ, එතුමන්ලා වෙනුවෙන් කථා කරන්න මාහට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු අපේ හිතවත් ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමාට එතුමා අදහන ආගම අනුව මා මොක්සුව ප්‍රාර්ථනා කරනවා. එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට කටයුතු කරලා, අවසානයේ පළාත් සභා මන්ත්‍රීවරයෙකු විධියට වයඹ පළාත් සභාව තුළ අපිත් එක්ක සුහදව කටයුතු කළා. මමත් එවකට වයඹ පළාත් සභාව නියෝජනය කළා. එතුමා බොහොම හිතවත්ව, ලෙන්ගතුව අප සමඟ කටයුතු කරපු මන්ත්‍රීවරයෙක්.

මීට කලින් කථා කරපු හැමෝම කිව්වා වාගේ එතුමා ජාති, ආගම්, කුල භේදවලින් තොරව සියලුදෙනා සමඟ බොහොම සහයෝගයෙන් කටයුතු කරපු මහජන නියෝජිතයෙක්. මහජන නියෝජිතයෙකු හැටියට සමාජ සේවා කටයුතු කරලා, මිය ගියාට පසුව ජීවතුන් අතර සිටින ඒ පවුල්වල අයට ලබන්න තිබෙන ලොකුම සැනසීම තමයි ඒ අය වෙනුවෙන් මේ ගරු සභාවේදී ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කරනු ලැබීම. මොකද, මගේ මහත්තයා මිය ගියාට පසුව මමත් ඔය ස්ථානයේ ඉඳගෙන එතුමා වෙනුවෙන් වර්තමානයේ මේ සභාව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු කථා කරපු දේවල් අහගෙන හිටියා. ඒක තමයි අපට අන්තිමට ඉතිරි වෙන දේ. අභාවප්‍රාප්ත, මේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ගුණ සමරන අවස්ථාවේදී එම පවුල්වල අය කථානායක ගැලරියේ ඉඳගෙන එය අසා සිටිනවා. ඔබතුමන්ලා වෙනුවෙන් කරන්න තිබුණු කැප කිරීම් පසෙකලා එතුමන්ලා සමාජය වෙනුවෙන් කරපු දේවල්වලට අද වටිනාකමක් ඉතිරි වෙලා තිබෙනවා නේද කියන හැඟීම එම ගුණ සැමරුම් අසාගෙන සිටින විට එම පවුල්වල අයට ඇති වෙයි කියා මා විශ්වාස කරනවා.

ගරු අලවි මැතිතුමා වාගේම වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කළ ගරු මිල්රෝයි ප්‍රනාන්දු හිටපු අමාත්‍යවරයා කළ දේශපාලන කැප කිරීම, මෙහෙවර මම මේ අවස්ථාවේදී අගය කරනවා. එවකට තිබුණු දේශපාලන පසුබිමත් එක්ක 1988 වසරේදී වයඹ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් විධියට එතුමා පත් වුණා. එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා වසර 26ක් වැනි කාලයක් පුරාවට පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාවට විතරක් නොවෙයි, සමස්ත රටේ ජනතාව වෙනුවෙනුත් කටයුතු කළා.

මට ලැබී ඇති කාලය අවසාන වේගෙන යන නිසා ඒ නිසා මට තව තත්පර කිපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දවසේ ගෞරවයට පාත්‍ර වන අභාවප්‍රාප්ත ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමා පිළිබඳව මුළු රටම කථා කළා. එතුමා අදහන ආගම අනුව එතුමාට නිර්වාණ සුවය ප්‍රාර්ථනා කරන අතර, ගරු අබ්දුල් මජීඩ් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ අභාවය වෙනුවෙනුත් මේ අවස්ථාවේදී මගේ ශෝකය ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අද දවසේ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් වී තිබෙන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සියලුදෙනාගේ අභාවය වෙනුවෙන් එතුමන්ලාගේ පවුල්වල සියලුදෙනාට මගේ ශෝකයත් ප්‍රකාශ කරනවා.

විශේෂයෙන් පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමා ගැන මම යමක් කිව යුතුයි. උතුරු-නැගෙනහිර ජනතාව එම ප්‍රදේශවල ජීවත් වුණු සමහර නායකයන් අභාවයට පත් වුණාට පසුව දක්වන ශෝකයටත් වඩා ශෝකයක් ගරු පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමාගේ අභාවය සිදු වුණු මොහොතේ සිට ප්‍රකාශ කරලා තිබුණා. ඒකත් විශේෂ කරුණක්. ඒ කාරණයත් මම එතුමාගේ පවුලේ අයට මේ අවස්ථාවේදී මතක් කරනවා.

දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ [ගරු අංගජන් රාමනාදන් මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. Dayasiri Jayasekara.

[අ.භා. 1.00]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන අද දවසේ අපේ පාර්ලිමේන්තුවේ සෑහෙන කාලයක් කටයුතු කළ ගරු මන්ත්‍රීවරු, ඇමතිවරු කිහිපදෙනෙකු ගැන කථා කරන්න අවස්ථාව ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකනවා.

මම පළමුවෙන්ම අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිටපු මන්ත්‍රී, ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමා ගැන කථා කරන්න කැමැතියි. එතුමා අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිංහල ජනතාව බහුතරයකගේ ඡන්දයෙන් ආපු කෙනෙක්. සාමාන්‍යයෙන් අපි කථා කරන්නේ මුස්ලිම් ජනතාව ගැන. නමුත්, එතුමා සිංහල ජනතාව අති බහුතරයකගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරයෙක්. මොකද, එතුමා සිංහල ජනතාව ගැන විශාල කැක්කුමක් සහ සිංහල ජනතාව එක්ක විශාල සම්බන්ධයක් තිබුණු කෙනෙක්. කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුස්ලිම් ජනතාව, එතුමා පාර්ලිමේන්තුවට ගේන්න ගොඩක් මහන්සි වුණා වාගේම, එතුමා සිංහල ජනතාවගේ ඉතාම හොඳ මිත්‍රයෙක් බවට පත් වෙලා තිබුණා. ඒ නිසා පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට ඉඳලා, ඊළඟට 1994දී කටුගම්පළ ආසනයේ ප්‍රධාන සංවිධායකවරයා විධියට කටයුතු කරලා -මමත් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් දේශපාලනය කරන්න පටන් ගත්තේ කටුගම්පළ ආසනයෙන්- එම ආසනය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවට ඇවිත්, 1999 වර්ෂය දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළා.

එතුමා ග්‍රාමීය මට්ටමේ මිනිස්සුන්ගේ ප්‍රශ්න ගණනාවක් පාර්ලිමේන්තුවේදී කථා කර තිබෙන බව හැන්සාඩ් වාර්තා අරගෙන බැලුවාම පෙනෙනවා. ඒ විතරක් නොවෙයි, එතුමා 1994දී විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු ලෙස ඉඳිමින් අතිවිශාල සේවයක් ඉටු කළා. විශේෂයෙන් ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා එක්ක තමයි, එතුමා දේශපාලනය ආරම්භ කරන්නේ. ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාගෙන් ලද ඒ පන්නරය ඔස්සේ එතුමා මන්ත්‍රීවරයෙක් විධියට වැඩ කරපු කාල වකවානුව තුළත්, ඉන් පසුවත් මුළු දිස්ත්‍රික්කයටම අතිවිශාල කැපවීමක් දේශපාලනය වෙනුවෙන් කළා. එතුමා මිය යනතුරුම කළේ දේශපාලනය. ඒ නිසා කුරුණෑගල දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, කටුගම්පළ ආසනයේ අතිවිශාල ජනතාවක් එතුමාට ගෞරව කළා, ආදරය කළා. එතුමා අවසාන කාලයේ සමගි ජන බලවේගයේ ආසන සංවිධායකවරයා විධියට එම පක්ෂයේ දියුණුව වෙනුවෙන් වැඩ කටයුතු කළා. අවුරුදු 71ක් ආයු වළඳා එතුමා මිය ගියාම එතුමාගේ දේහය බලන්න අතිවිශාල සිංහල ජනතාවකුත් ඇවිල්ලා හිටියා. මම හිතන්නේ, ඒ එතුමා කරපු අතිවිශාල කාර්යභාරය නිසායි. අද දවසේ එතුමාගේ ආදරණීය පුත්‍ර රත්නයන් දෙපළ මේ අවස්ථාවට සහභාගී වී වුණත්, ඔවුන් තාත්තාගේ අඩි පාරේ යමින් දේශපාලනික වැඩ කටයුතු කරනවා. මේ අවස්ථාවේ එතුමාගේ අභාවය වෙනුවෙන් එම පවුලේ සියලු දෙනා වෙත මගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

ඊළඟට මා පුත්තලම දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා ගැන වචන කිහිපයක් කථා කරන්න කැමැතියි. එතුමා 2024 ජූනි මස 20වැනි දා තමයි අභාවප්‍රාප්ත වුණේ. එතුමා වෙන්නප්පුව කොලොන්ජාඩියේ ඉපදුණේ. එතුමා අපේ ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමාගේ ආදරණීය පියාණන් වූ ගරු ෆෙස්ටස් පෙරේරා මැතිතුමාගේ ඉතාම ශක්තිමත් අත්උදව්කරුවෙක්. එහෙම නැත්නම්, ගරු ෆෙස්ටස් පෙරේරා මැතිතුමාට විශාල ශක්තියක් ලබා දුන්නු ව්‍යාපාරිකයෙක් හැටියටයි එතුමා දේශපාලනයට අවතීර්ණ වෙන්නේ.

1988දී එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් වයඹ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙනවා. එතැනින් පස්සේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වී 1994දී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු -PA කියලා අපි කියන්නේ- රජයේ ධීවර නියෝජ්‍ය අමාත්‍ය ධුරයට පත් වුණා. අනතුරුව පාර්ලිමේන්තු හා ක්‍රිස්තියානි කටයුතු, ධීවර, ජනතා වතු සංවර්ධන, නැවත පදිංචි කිරීමේ ආදී අමාත්‍යාංශ රැසක එතුමා අමාත්‍ය ධුර දැරුවා. ඒ වාගේම එතුමා අවසාන කාලයේ, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ජ්‍යෙෂ්ඨ ඇමතිවරු හැටියට පත් කළ දහදෙනාගෙන් එක් ඇමතිවරයෙක් විධියටත් කටයුතු කළා. ඒ ආකාරයට එතුමා පුත්තලම දිස්ත්‍රික්කයට අතිවිශාල සේවයක් කරපු නායකයෙක්.

කොහු කර්මාන්තය පිළිබඳවත් එතුමාට විශාල දැනුම් සම්භාරයක් තිබුණා. එතුමා 2000දී ධීවර ප්‍රජාව සඳහා සමාජ සේවා සහ නිවාස සංවර්ධන ඇමතිවරයා වශයෙන් මුල් වරට කැබිනට් මණ්ඩලයට පත් වුණා. ඒ කාලයේ වෙන්නප්පුව විවිධ සේවා සමුපකාර සමිතියේ අධ්‍යක්ෂවරයෙකු විධියටත් -පටන් ගන්න කාලයේ- එතුමා වැඩ කළා.

එතුමා 1989දී නාත්තණ්ඩිය ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විධියට පත් වුණා, පාර්ලිමේන්තුවට පත් වුණු පළමුවෙනි අවස්ථාවේදී. නාත්තණ්ඩිය ආසනයට නායකත්වය දීලා එතැනින් පසුව එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෙන්නප්පුව ආසනයේ සංවිධායකවරයා විධියට වැඩ කළා. පුත්තලම් දිස්ත්‍රික්කයට අතිවිශාල වැඩ කොටසක් කළ, ඒ වාගේම පක්ෂයට විශාල ශක්තියක්, ධෛර්යයක් දුන්නු නායකයෙක් විධියට ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාව හඳුන්වන්න පුළුවන්. අවසාන කාලයේ එතුමා විශාල කලකිරීමකින් සිටියේ. බොහෝ දෙනකුට තමන්ගේ අවසාන කාලයේ දේශපාලනයෙන් සමු අරගෙන, ජනතාවගේ අවධානයෙන් ගිලිහී යනවිට ඇති වන වේදනාව එතුමාටත් තිබුණා. එතුමාට මෝක්ෂ සම්පත්තිය අත් වේවා කියලා ප්‍රාර්ථනය කරමින්, එතුමාගේ අභාවය වෙනුවෙන් පවුලේ සියලුදෙනාටත් මාගේ කනගාටුව පළ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අබ්දුල් මජීඩ් මැතිතුමා ගැනත් මම වචන කිහිපයක් කථා කරන්න කැමැතියි. එතුමා කින්නියා මහා විද්‍යාලයේ තමයි ඉගෙන ගත්තේ. පසුව ගම්පොළ සහිරා විදුහලේ අධ්‍යාපනය ලබලා එයින් පසුව විවෘත විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත්තා. 1994දී එතුමා පාර්ලිමේන්තුවට එන්නේ මුතූර් ආසනයෙන්. එතැනින් පසුව ඊළඟ පාර්ලිමේන්තුවේ, එනම් 2000දී පත් වුණු පාර්ලිමේන්තුවේත් එතුමා තවත් කාලයක් වැඩ කටයුතු කරනවා. 2004දී එතුමා ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයෙන් තමයි නැවත පාර්ලිමේන්තුවට තේරී පත් වෙන්නේ. එතැනින් පසුව ආපහු මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් පත් වෙලා තැපැල් හා විදුලි සංදේශ නියෝජ්‍ය අමාත්‍ය ධුරය දරනවා. ඒ වාගේම අමාත්‍යවරයෙක් විධියට එතුමා පත් වෙන්නේ 2004.04.22 දිනයි. එතුමා පුනරුත්ථාපන හා දිස්ත්‍රික් සංවර්ධන අමාත්‍යවරයා විධියටත් පත් වෙනවා. එතැනින් පස්සේ ආපහු නැවත නියෝජ්‍ය අමාත්‍යවරයෙක් විධියට පත් වෙනවා. 2004දී ආපසු සමුපකාර අමාත්‍යවරයා විධියට එතුමා පත් වෙනවා. මේ විධියට ගත්තාම වර්ෂ කිහිපයක් ඇතුළත අමාත්‍ය තනතුරු, නියෝජ්‍ය අමාත්‍ය තනතුරු සහ කැබිනට් නොවන අමාත්‍ය තනතුරු ගණනාවක් එතුමා හෙබවුවා. ඉන් පසුව එතුමා නැහෙනහිර පළාතේ මහ ඇමතිවරයා හැටියට පත් වෙලාත් ඒ ජනතාවට විශාල සේවයක් කළා. කලබල නැති ඉතාම නිහඬ දේශපාලන චරිතයක් විධියටයි අපි එතුමාව දකින්නේ. එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ සියලුදෙනාටත් අපගේ කනගාටුව පළ කරමින්, අපගේ ආගමේ හැටියට එතුමාට නිවන්සුව අත් වේවා කියලා මම ප්‍රාර්ථනය කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ඉතාම ළඟ මිත්‍රයෙක්, මම ගොඩක් ආදරය කළ කෙනෙක් තමයි ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමා. එතුමා මතුගම ආනන්ද ශාස්ත්‍රාලයෙන් තමයි අධ්‍යාපනය ලබන්නේ. පසුව එතුමා නාවික හමුදාවට බැඳෙනවා. ඉන් පසුව 2002දී මතුගම ප්‍රාදේශීය සභාවේ

[ගරු දයාසිරි ජයසේකර මහතා]

සභාපතිවරයා හැටියට පත් වෙනවා. එතුමා ජනතාවගේ ශක්තියෙන් ප්‍රාදේශීය සභාවේ විශාල වැඩ කොටසක් කරනවා. ඒ වාගේම 2004 වසරේදී එතුමා බස්නාහිර පළාත් සභාවට තේරී පත් වෙනවා. ඒ විධියට වැඩ කටයුතු කරලා ඉන්පසුව 2010දී එතුමා පළමු වතාවට එක්සත් ජාතික පක්ෂයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වෙනවා. ඉන්පසුව 2015දී එක්සත් ජාතික පක්ෂයෙන්ම 8වැනි පාර්ලිමේන්තුවට තේරී පත් වන එතුමා අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික නියෝජ්‍ය ඇමතිවරයා විධියට පත් වෙනවා.

එතැනින් පසුව එතුමා අපේ ගරු සරත් ෆොන්සේකා හිටපු අමාත්‍යතුමා යටතේ Ministry of Sustainable Development, Wildlife and Regional Development භාර නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට කටයුතු කළා.

පාලිත තෙවරප්පෙරුම මැතිතුමා කෙරෙහි මේ රටේ ජනතාව තුළ ඇත්ත වශයෙන්ම විශාල ආදරයක්, ගෞරවයක් තිබුණා. විශේෂයෙන් එතුමා තමා නියෝජනය කළ දිස්ත්‍රික්කය පුරා වෙසෙන මිනිසුන්ගේ විශාල ආදරයක්, ජන මතයක් ලැබූ කෙනෙක්. ඒ ජන මතය කොයි තරම් ද කියනවා නම්, එතුමාගේ දේහයට අවසන් ගෞරව දක්වන්න අතිවිශාල ජනතාවක් පැමිණ සිටියා. මමත් ඒ දේහයට අවසන් ගෞරව දක්වන්න ගියා. අතිවිශාල ජනතාවකගේ කර මතින් තමයි එතුමා අවසන් ගමන් ගියේ.

එතුමා මේ රටේ මිනිසුන්ට ඇත්තටම ආදරය කළ පුද්ගලයෙක්. ඒ විතරක් නොවෙයි, ඉතාම රැඩිකල් නායකයෙකු විධියටත් මම එතුමාව දකිනවා. එතුමා මිනිසුන් වෙනුවෙන් ගත යුතු ඕනෑම පියවරකදී බය නැතුව ගිහින් කර දෙන්න ඉදිරිපත් වුණු කෙනෙක්. ළමයෙකු ඉස්කෝලෙට දාගන්න බැරි වුණා කියලා ඒ විදුහල්පතිවරයාගේ කාමරයට ගිහිල්ලා එහි තිබුණු ෆෑන් එකේ එල්ලිලා ගෙල වැල ලාගන්න පවා එතුමා උත්සාහ කළා. ඒ, එතුමා ඒ තරමටම ජනතාවට ආදරය කළ නිසායි. වත්තේ වැව ළඟ තමන්ගේ මිනී වළ සකස් කරලා තමන්ගේ අවසන් ගමන යන්න සියලු දේවල් සූදානම් කරලා තමයි එතුමා මිය ගියේ. තමන්ගේ පුතෙකු මිය යෑම නිසා එතුමා විශාල වේදනාවකින් ජීවත් වුණා. මම මේ සියලු කරුණු කාරණා කියන්න හේතුවක් තිබෙනවා. එතුමා ගැන කථා කරන කොට ඒ ගැනත් කියන්න ඕනෑ. එක කාලයක සමහර අයගේ මතයක් තිබුණා, දේශපාලනය "තෙවරප්පෙරුමකරණය" විය යුතුයි කියලා. මොකද, සමහර දේශපාලනඥයන් මිනිසුන්ගෙන් ඈත් වෙලා ජීවිත ගත කරනවා. ඒ වෙනුවට මිනිසුන් එක්ක එකට ඉඳිමින්, මිනිසුන් එක්ක පාරවල ඇවිදිමින්, මිනිසුන් එක්ක ශක්තිමත්ව නැඟී සිටිමින් ඕනෑම අභියෝගයකට මුහුණු දෙන්න පුළුවන් වූ කෙනෙක්, එතුමා. එක්තරා උද්ඝෝෂණ ව්‍යාපාරයකදී එතුමා මගේ ඉස්සරහ වැටුණු කඳුළු ගෑස් ටින් එක අතින් අරගෙන අනෙක් පැත්තට -පොලීසිට- ගැහුවා මට මතකයි. ඒ වාගේ සටන්කාමී නායකයෙකු පාර්ලිමේන්තුවේ අපත් එක්ක එකට වැඩ කිරීම ගැන මට ලොකු ගෞරවයක් තිබෙනවා.

එතුමාගේ අභාවය සම්බන්ධයෙන් එතුමාගේ පවුලේ ආදරණීය සාමාජිකයන්ට අපි අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. පාලිත තෙවරප්පෙරුම මැතිතුමා කියන්නේ, අපේ ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ මිනිසුන් එක්ක හැදුණු, මිනිසුන් එක්ක වැඩ කරපු, මිනිසුන් වෙනුවෙන් කැප වුණු නායකයෙක්. ඒ බවත් මතක් කරමින්, එතුමාට නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Chinthaka Amal Mayadunna.

[අ.භා. 1.13]

ගරු චින්තක අමල් මායාදුන්න මහතා
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. පුත්තලම දිස්ත්‍රික්කයේ දේශපාලන නායකයෙකු හැටියට කටයුතු කළ අපේ ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව මගේ විශේෂ ස්තුතිය ඔබතුමාට පුද කරනවා.

මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා 1970 දශකයේ අග භාගයේ පැවති එක්සත් ජාතික පක්ෂ රජයේ හිටපු ගරු ෆෙස්ටස් පෙරේරා අමාත්‍යතුමා එක්ක බොහොම ළඟින් ඇසුරු කරපු, එතුමා සමඟ කරට කර කටයුතු කරමින් උදවු කරපු දේශපාලන නායකයෙක්. 1970 ආණ්ඩුව ආවාට පස්සේ -1970 සිට 1977 කාල වකවානුවේ- එතුමා දේශපාලන වශයෙන් කලකිරීමකින් සිටියේ. විශේෂයෙන් 1986 හා 1988 කාල පරිච්ඡේදයේ ජනතා විමුක්ති පෙරමුණේ උදව්ය රටේ සංවර්ධනය අඩාළ කරන කොට, මිනී මරන කොට එතුමා ඒ සමාජ අභියෝගවලට ඉතා අමාරුවෙන් නමුත් මුහුණ දුන්නා. පළාත් සභා ඡන්දය පවත්වන්න එපා කියපු ඒ කාල වකවානුවේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට 1988දී එක්සත් සමාජවාදී පෙරමුණෙන් "පහන" ලකුණින් තරග කරලා පළාත් සභාව නියෝජනය කළ දේශපාලන නායකයෙක්, එතුමා.

ඉන් පසුව එතුමා 1989දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් "අත" ලකුණින් තරග කරලා පුත්තලම දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා බවට පත් වුණා.

එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු බවට පත් වුණු 1989 වසරේ ඉඳන් 1994 වසර දක්වා කාල වකවානුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තමන්ගේ දේශපාලන වැඩ පිළිවෙළ කරගෙන යන්න බැරි කාල වකවානුවක් වූ බව අපි දන්නවා. ඒ කාල වකවානුව තුළ ඉතා නිහතමානීව, ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් රකිමින් කටයුතු කළ එතුමා 1994දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ආණ්ඩුවේ ධීවර නියෝජ්‍ය ඇමතිවරයා බවට පත් වුණා. ධීවර නියෝජ්‍ය ඇමතිතුමා බවට පත් වුණු එතුමා ඒ කාල වකවානුවේ ධීවර ජනතාව වෙනුවෙන් විශාල සේවයක් ඉටු කළා. එතුමා වෙනම ව්‍යාපාර කටයුතු කරගෙන ගියා, පොල් කර්මාන්තයේ සහ කොහු කර්මාන්තයේ. අපේ ප්‍රදේශය, ධීවර ජනතාව ජීවත් වන ප්‍රදේශයක්. එතුමා කොහු කර්මාන්තය සහ පොල් කර්මාන්තය දියුණු කරන ගමන්ම පුත්තලම දිස්ත්‍රික්කය තුළ ජීවත් වන ධීවරයන්ගේ දැවෙන ප්‍රශ්නවලට නිසි පිළිතුරු ලබා දීමටත් කටයුතු කළා. එදා සමාජගත වුණු කාරණාවලදී අපට කෝකටත් තෙලය හැටියට හිටියේ මිල්රෝයි ප්‍රනාන්දු හිටපු ඇමතිතුමායි.

එතුමා උදෑසන 6.00ට සරමයි, මේස් බැනියමයි පිටින් ඇවිල්ලා තමන්ගේ කාර්යාලයේ ඉඳ ගන්නවා. එතුමා කවදාවත් කොළඹ ජීවිතයක් ගත කරපු කෙනෙක් නොවෙයි. එතුමා හැමදාම උදෑසන 6.00ට තමන්ගේ නිවසේ තිබුණු කාර්යාලයට ඇවිල්ලා ඉඳගෙන එදා තිබුණු ක්‍රමවේදය අනුව භේදයක් නැතිව -ශ්‍රී ලංකා,

යූඑන්පී කියා භේදයක් නැතිව- පුත්තලම දිස්ත්‍රික්කයේ සමස්ත ජනතාවට එක හා සමානව සේවය කළා. එතුමා, එවැනි කෘතහස්ත දේශපාලන නායකයෙක්.

තම ජීවිත කාල පරිච්ඡේදය එතුමා බොහොම විනෝදකාමියෙකු ලෙස ගත කළා. බොහොම විනෝදකාමී චරිතයක් එතුමාට තිබුණේ. එතුමා සින්දු කියන්න හරිම ආසයි, අත්පුඩි ගහන්න ආසයි. හීනියට පොඩි වැඩ පිළිවෙළකුත් කරගෙන, සියලුදෙනා සතුටු කරගෙන බොහොම සන්තෝෂයෙන් හිටපු කෘතහස්ත දේශපාලන නායකයකු වූ එතුමාගෙන් අපට ඉගෙන ගන්න ගොඩක් දේවල් තිබෙනවා.

අප 1989 කාලයේ දේශපාලනය කරනකොට අපට බොහෝ සෙයින් අවවාද ලබා දුන්නු දේශපාලන නායකයෙක්, මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා. දිවංගත ගරු ද.මු. දසනායක මැතිතුමා 1994දී ආනමඩුව ආසනයෙන් පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන කොටත්, එතුමාට මුලින්ම දේශපාලන අත්පොත කියා දුන්නු කාල වකවානුවේත් බොහොම ළඟින් ඉඳිමින් එතුමාත් එක්ක කටයුතු කරපු දේශපාලන නායකයෙක් තමයි, මිල්රෝයි ප්‍රනාන්දු හිටපු ඇමතිතුමා.

එතුමා 2001 වර්ෂයේ සමාජ සේවා කැබිනට් අමාත්‍යවරයා බවට පත් වුණා. 2004 වර්ෂයේ වැවිලි කර්මාන්ත කැබිනට් අමාත්‍යවරයා බවට පත් වුණාට පසුව එතුමා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ සියලු ආයතන සමග සම්බන්ධ වෙමින් විශාල සේවයක් ඉටු කළා. එහිදී විවිධ දේශපාලන කණ්ඩායම් අත පොවන කොට එතුමා ස්වාධීන අමාත්‍යවරයෙකු, දේශපාලන නායකයෙකු හැටියට තමන්ගේ අමාත්‍ය ධුරයේ ඉතාම හොඳින් වැඩ කටයුතු කරගෙන ගියා.

2008 ජනවාරි 08වන දා දිවංගත ගරු ද.මු. දසනායක මැතිතුමාට ක්ලේමෝ බෝම්බ ප්‍රහාරයක් එල්ල වෙලා ජීවිතක්ෂයට පත් වුණාට පසුව එතුමා දැරූ නැවත පදිංචි කිරීමේ අමාත්‍ය ධුරය ලැබුණේ මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාටයි. දිවංගත ද.මු. දසනායක මැතිතුමා කරපු වැඩ කොටස පුත්තලම දිස්ත්‍රික්කයේම නායකයෙකුට ලැබීමෙන් පසුව නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා හැටියට විශේෂයෙන් ඒ ප්‍රදේශවල ඉතාම ආකර්ෂණීය සංවර්ධනයක් ඇති කරන්න මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාට හැකි වුණා.

ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙකු හැටියට එතුමා විවිධාකාරයේ තීන්දු තීරණ ගත්තා. එහිදී අපි එතුමා තුළින් විශේෂ දෙයක් දැක්කා. එතුමා ප්‍රබල ව්‍යාපාරිකයෙක්, දේශපාලනඥයෙක්, ඉතා හොඳ නම්‍යශීලී පුද්ගලයෙක් වාගේම පුත්තලම දිස්ත්‍රික්කයට නායකත්වය දුන්නු ගෞරවනීය නායකයෙක්. දිස්ත්‍රික් නායකයා හැටියට එතුමා කවදාවත් පවුලේ කෙනෙකු දේශපාලනයට ගෙන ආවේ නැහැ. දුවරුන් දෙදෙනෙකුගේ සහ පුතෙකුගේ පියා වුණත් එතුමා තමන්ගේ දරුවෙකු හෝ දේශපාලනයට ගෙන ආවේ නැහැ. එතුමා එවැනි දේශපාලන නායකයෙක්.

එතුමා ගැන කිව යුතු තවත් විශේෂ කාරණාවක් තිබෙනවා. එතුමා කවදාවත් මුදල් පසුපස හඹා ගිය දේශපාලන නායකයෙක් නොවෙයි. එතුමා මුදල කියන දේ පැත්තකට දමලා නිහතමානීව ජීවත් වුණා. පුත්තලම දිස්ත්‍රික්කය කියන්නේ සාමාන්‍යයෙන් විවිධ ප්‍රශ්න ගැටලුවලට නතු වෙච්ච දිස්ත්‍රික්කයක්. එදා එසේ ප්‍රශ්න, ගැටලු ඇති වන කොට ඒ දිස්ත්‍රික්කය තුළ තමන් කවරෙක්ද, තමන් කොයි වාගේ කෙනෙක්ද, දේශපාලනය කළ යුතු ආකාරය කුමක්ද කියා ආදර්ශයෙන් පෙන්වා දෙමින් එතුමා තම නිහතමානී නායකත්වය තුළින් ඉතා වුවමනාවෙන් දේශපාලන කටයුතු සිදු කළා. එහිදී එතුමාට නිසි වැඩ පිළිවෙළක් තිබුණා. පුත්තලම දිස්ත්‍රික්කයේ ඒ සැබෑ දේශපාලන චරිතය අපට අහිමි වීම පිළිබඳව අප තුළ ලොකු කනගාටුවක්, ශෝකයක් දැනෙනවා. ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය වෙනුවෙන් මාගේ ශෝකය ඒ ගෞරවනීය පවුලේ සාමාජිකයන් වෙත පුද කරන්නට මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අභාවප්‍රාප්ත ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමා ද මම මේ අවස්ථාවේ ගෞරවයෙන් සිහිපත් කරනවා. මම එදා 2009 වයඹ පළාත් සභාව නියෝජනය කරන කොට ඒ.එච්.එම්. අලවි මැතිතුමාත් හිටියා. එතුමා කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ ප්‍රබල දේශපාලන නායකයෙක්. අලවි මැතිතුමාත් ඉතාම හොඳ, නිහතමානී, සුන්දර මනුස්සයෙක්. අපි එදා පළාත් සභාව තුළ යම් යම් අධ්‍යාපනික වැඩසටහන්වලට යද්දී එතුමා ඉතාම කුලුපගව ඒ අධ්‍යාපන වැඩසටහන්වලට සම්බන්ධ වෙලා, විවිධාකාරයේ විහිළු තහළු කරමින් කටයුතු කළා. එතුමා සමාජය තුළ සියලු දෙනාට ළැදියාවක් දක්වපු කෘතහස්ත දේශපාලන නායකයෙක්. එතුමා අපත් එක්ක පළාත් සභාව තුළ හිටපු කාල වකවානුවේදී ඉතා නිහතමානීව තම කාර්යභාරය හරියාකාරව ඉෂ්ට කළා. එතුමාගේ ආගම අනුව එතුමාට ස්වර්ග සුව ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම දැකපු තවත් සුන්දර චරිතයක් තමයි, ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමා. මට මතක් වෙනවා එතුමා හා සම්බන්ධ සිදුවීමක්. මට මතක හැටියට එවකට එතුමා තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය ඇමතිවරයා වශයෙනුයි කටයුතු කළේ. එතුමා දවසක් ආවා පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව ප්‍රදේශයේ තිබෙන පල්ලකන්ඩල් දේවස්ථානයේ මංගල්‍ය උත්සවයකට. මම ඊට ඉස්සෙල්ලා එතුමාව ඇසුරු කරලා තිබුණේ නැහැ. ඒ මංගල්‍ය උත්සවයට ආවාට පසුව තමයි -ඒ විනාඩි පහක, දහයක පුංචි කාල සීමාව තුළ තමයි- මම මුලින්ම එතුමාව ඇසුරු කළේ; එතුමා සමඟ කථා කළේ. අප ඒ මංගල්‍ය උත්සවය අවසන් වෙලා ඉදිරියට එනකොට අනතුරක් සිද්ධ වෙලා කෙනෙකු හදිසියේ අසනීප තත්ත්වයකට පත් වෙනවා දැක්කා.

ඒ අවස්ථාවේ එතුමා වාහනයෙන් බැහැලා එතැනට ගිහිල්ලා අනතුරට ලක් වුණු පුද්ගලයාව අත් දෙකෙන් ඔසවාගෙන ඇවිත් ඩිෆෙන්ඩර් රථයේ පිටු පස ආසනයේ තියාගෙන, "පාරෙන් අයින් වෙන්න. අයින් වෙන්න" කියලා කෑ ගසමින් පුත්තලම රෝහලට ගෙන ගියා. එතුමා එතරම් නිහතමානී දේශපාලනඥයෙක්. අද දේශපාලන නායකයින්ට සහ දේශපාලන කණ්ඩායම්වලට රටේ ජනතාව විවිධාකාරයෙන් අප්‍රසාදය පළ කරනකොට එම දේශපාලන චරිතය ගැන අපට ප්‍රසාද මුඛයෙන් කථා කරන්න පුළුවන්කම තිබෙනවා. මේ අවස්ථාවේදී අභාවප්‍රාප්ත ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමාට අජරාමර නිවන්සුව පතන අතර, එතුමාගේ පවුලේ සියලුදෙනාට අපේ ශෝකය පළ කරනවා.

ගරු එම්.එන්. අබ්දුල් මජීඩ් මැතිතුමාත් මට හොඳින් මතකයි. ඒ කාල වකවානුවේ මගේ මාමා වන ගරු ද.මු. දසනායක මැතිතුමාත් පාර්ලිමේන්තුව නියෝජනය කළා. මම ගරු ද.මු. දසනායක මැතිතුමාගේ පෞද්ගලික වැඩකටයුතු කරන අවස්ථාවේදී එතුමාව ඇසුරු කරලා තිබෙනවා. ගරු අබ්දුල් මජීඩ් මැතිතුමාගේ අභාවය ගැන එම පවුලේ සියලුදෙනාටත් මේ අවස්ථාවේදී මගේ ශෝකය ප්‍රකාශ කරනවා.

[අ.භා. 1.23]

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අභාවප්‍රාප්ත ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හතරදෙනෙක් වෙනුවෙන් අද දින ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒ, කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරපු ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමා, කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරපු අපේ ගරු පාලිත තෙවරප්පෙරුම මැතිතුමා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය නියෝජනය කරපු ගරු එම්.එන්. අබ්දුල් මජීඩ් මැතිතුමා සහ පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරපු ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා කියන මැතිතුමන්ලාගේ.

මම මුලින්ම අපේ ගරු ඒ.එච්.එම්. අලවි මැතිතුමාගෙන් පටන් ගන්නම්. ගරු ඒ.එච්.එම්. අලවි මන්ත්‍රීතුමා එක්සත් ජාතික පක්ෂයෙන් ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාත් සමඟ කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මුලින්ම පළාත් සභාවට පත් වුණේ, 1988 පැවැති පළාත් සභා මැතිවරණයෙන්. 1988 කියන්නේ, ඉතා භීෂණකාරී කාලයක්. එවැනි වාතාවරණයක් තුළ තමයි පළාත් සභා මැතිවරණය පැවැත් වුණේ. ඒ මැතිවරණයේදී අපට මතකයි, මුලින්ම ඡන්දය දැම්මොත් ඒ ඡන්ද දමන අයට ජීවිතය අහිමි කරනවා කියලා ඒ කාලයේ බෝඩ් ගහලා තිබුණා. එහෙම තත්ත්වයක් තිබියදී තමයි ඒ.එච්.එම්. අලවි කියන තරුණයා මැතිවරණයට ඉදිරිපත් වුණේ. ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා එතකොට පාර්ලිමේන්තුවෙන් ඉවත් වෙලා පළාත් සභාවේ මහ ඇමති අපේක්ෂකයෙක් වශයෙන් ඉදිරිපත් වෙලා සිටි අවස්ථාව. එතුමාත් සමඟ කටුගම්පල ආසනයෙන්ම එක්සත් ජාතික පක්ෂයෙන් ඊළඟ අපේක්ෂකයා හැටියටයි එතුමා ඉදිරිපත් වුණේ. රටේ එවැනි තත්ත්වයක් තිබියදී එදා මැතිවරණයට ඉදිරිපත් වෙලා පළාත් සභා මන්ත්‍රීවරයෙකු හැටියට එතුමා පත් වුණා. තරුණ කාලයේම පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට පත් වුණු එතුමා ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. ඉන් පසුව එතුමා 1994දී පැවැති පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වුණා. ඒ වනකොට එක්සත් ජාතික පක්ෂයේ කටුගම්පල ආසනයේ සංවිධායකවරයා හැටියට සිටි එතුමාට පළාත් සභාව තුළ ජනතාව වෙනුවෙන් ඉටු කළ කාර්යභාරය නිසාම කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පත් වන්න පුළුවන් වුණා. මම හිතන විධියට මේ වනකොටත් ඡන්දයකින් පාර්ලිමේන්තුව නියෝජනය කරන්න පුළුවන් වුණු එකම මුස්ලිම් මන්ත්‍රීවරයා එතුමා. මොකද, කිසිම මැතිවරණයකදී මුස්ලිම් මන්ත්‍රීවරයෙකුට ඒ අවස්ථාව ලැබිලා නැහැ. නමුත් ගරු ඒ.එච්.එම්. අලවි මන්ත්‍රීතුමාට පුළුවන් වුණා 1994 මහ මැතිවරණයේදී බහුතර ජනතාවගේ සහාය ඇතිව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට පත් වන්න.

1994දී පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රී ලැයිස්තුවේ මමත් හිටියා. අපි දෙදෙනාම පළමුවැනි වතාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ලෙස පත් වෙලා ආවේ 1994 වසරේ. එ් නිසා එතුමාත් සමඟ දීර්ඝ කාලයක් සුහදව කටයුතු කරන්නට මට අවස්ථාව උදා වුණා. ඇත්තෙන්ම කිව්වොත් එතුමා තුළ කිසිම භේදයක් තිබුණේ නැහැ. ජාති, ආගම් කියන සියලු භේද ඉවත් කරලා මානව හිතවාදියෙක් ලෙස තමයි එතුමා ජනතාවත් එක්ක වැඩකටයුතු කළේ. එතුමා තුළ තිබුණු ඒ ගුණය නිසාම තමයි පාර්ලිමේන්තුව නියෝජනය කරන්න එතුමාට අවස්ථාව උදා වුණේ. එතුමා පළාත් සභාවේදී කටයුතු කළා වාගේම පාර්ලිමේන්තුව තුළදීත් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කරන්න පුළුවන් වුණේ, 1994 ඉඳලා 1999 වනතුරුයි. ඒ කාලය තුළ එතුමා තමන්ගෙන් ඉටු විය යුතු කාර්යභාරය තම පක්ෂයටත්, තමන්ව පාර්ලිමේන්තුවට එවන්න කටයුතු කළ ප්‍රදේශයේ ජනතාවටත් ඉතාම ඉහළ මට්ටමින් ඉෂ්ට කළා.

ඊට පසුවත් එතුමා දේශපාලනයේ නිරත වුණා. එතුමා නැවත වතාවක් පළාත් සභාව නියෝජනය කරමින් වයඹ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළා. ගරු ඒ.එච්.එම්. අලවි මන්ත්‍රීතුමා වයඹ පළාතේ අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් බිහි වුණු විශිෂ්ට ගණයේ දේශපාලනඥයෙක්. එතුමා අප අතරින් සදහටම සමුගත්තා. එතුමාගේ අභාවය ගැන එතුමාගේ භාර්යාව, දු දරුවන් ඇතුළු පවුලේ සියලුදෙනාට අපේ ශෝකය ප්‍රකාශ කරනවා.

ඒ වාගේම මම විශේෂයෙන්ම කියන්න ඕනෑ පාලිත තෙවරප්පෙරුම මැතිතුමා ගැනත්. එතුමා අපිත් සමඟ පසුගිය පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමා 2010දී තමයි පාර්ලිමේන්තුවට මුලින්ම ආවේ. ඒ වාගේම, පාලිත තෙවරප්පෙරුම මැතිතුමා ජනතාව එක්ක වැඩකටයුතු කිරීමේදී මන්ත්‍රීවරයෙක් හැටියට ජනතාවගේ පැත්තේ ඉඳලා බැලුවාම, එතුමා පරිපාලකයෙක්, එහෙම නැත්නම් පාලකයෙකුට වඩා ජනතාවට හිතවාදීව වැඩකටයුතු කරපු අවස්ථා ගණනාවක් තිබුණු ආකාරය අපි දැක්කා. ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් සාමාන්‍ය තත්ත්වයට එහා ගිහිල්ලා එතුමාගේ ජීවිතය ගැනවත් බලන්නේ නැතුව, එතුමා ඒ ජනතාව වෙනුවෙන් පෙනී සිටියා.

අපි දැක්කා, කළුතර දිස්ත්‍රික්කයේ ජාතිවාදී ප්‍රශ්න ඇතිවුණු වෙලාවේ, විශේෂයෙන්ම මුස්ලිම් ජනතාවට ප්‍රශ්න ගණනාවක් ඇති වුණු වෙලාවේ එතුමා, තමන්ගේ ජීවිතයට තිබෙන තර්ජනත් නොබලා ඒ අය ආරක්ෂා කර ගන්න, ඒ අය බේරා ගන්න, ඒවා සමථයකට පත් කරන්න ඒවාට මැදිහත් වෙලා වැඩ කරපු හැටි. ඒ නිසා පාලිත තෙවරප්පෙරුම කියන්නේ සාමාන්‍ය තත්ත්වයට එහා ගිහිල්ලා වැඩ කටයුතු කරපු, ජනතාව වෙනුවෙන් පෙනී සිටි කෙනෙක්. එතුමා ජනතාවගේ ප්‍රශ්න සම්බන්ධයෙන් සංවේදී වෙලා කටයුතු කරපු මන්ත්‍රීවරයෙක් හැටියටයි අපි දකින්නේ. එතුමාගේ අභාවය මම හිතන විධියට කළුතර දිස්ත්‍රික්කයටත්, ඒ ප්‍රදේශයේ ජනතාවටත් විශාල පාඩුවක්. මොකද, එතුමා හදිසි අනතුරකින් අභාවයට පත් වුණේ. මේ අවස්ථාවේ ඒ පවුලේ සියලු දෙනාට අපේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

ඒ වාගේම අපේ වයඹ පළාත නියෝජනය කරපු හිටපු අමාත්‍ය මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා ගැනත් මම වචන කීපයක් කථා කරන්න ඕනෑ. එතුමා එක්සත් ජාතික පක්ෂයෙන් අපේ ගරු ෆෙස්ටස් පෙරේරා මැතිතුමා එක්ක දේශපාලනයට ඇවිල්ලා, පසුකාලීනව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වෙලා 1989 වාගේ ඈත කාලයේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා, ඊට පස්සේ 1994 ඉඳලා නියෝජ්‍ය ඇමති ධුර, ඇමති ධුර දරලා වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරමින් විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. එතුමා 1988දී පැවති මුල්ම පළාත් සභා මැතිවරණයටත් ඉදිරිපත් වෙලා පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියටත් කටයුතු කළා. තමන්ගේ කාර්යභාරය ඉතාම නිහතමානීව ජනතාව වෙනුවෙන් ඉෂ්ට කරපු නායකයෙක් හැටියට තමයි අපි එතුමාව දකින්නේ. ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාට එතුමාගේ ආගමේ හැටියට මොක්සුව ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

නජීබ් අබ්දුල් මජීඩ් මැතිතුමා ගැන සඳහන් කළොත්, එතුමා දේශපාලනයට එන්න පෙර කින්නියා ප්‍රදේශයේ පාසලක අධ්‍යාපනය ලබලා, ඊළඟට, ගම්පොළ සහිරා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබලා, ඒ වාගේම උසස් අධ්‍යාපනය දක්වා ඉගෙන ගත් කෙනෙක්. එතුමාත් 1994 දී මුලින්ම පාර්ලිමේන්තුව නියෝජනය කළා. පසුව නියෝජ්‍ය අමාත්‍යවරයෙක් හැටියටත්,

ඇමතිවරයෙක් හැටියටත්, මහ ඇමතිවරයෙක් හැටියටත් වැඩකටයුතු කරලා තමන්ගේ ප්‍රදේශයටත්, පළාතටත් විශාල කර්යභාරයක් ඉෂ්ට කරපු නායකයෙක් හැටියට තමයි අපි ගරු මජීඩ් මැතිතුමාව දකින්නේ. එතුමාගේ පවුලේ අයටත් අපේ ශෝකය ප්‍රකාශ කරමින් අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට මගේ ස්තුතිය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[අ.භා. 1.30]

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithreepala Sirisena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ උත්තරීතර සභාව නියෝජනය කරපු අපේ ඉතාම හිතවත් මැති ඇමතිවරු හතර දෙනෙකුගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන අවස්ථාව මේ. මේ සෑම කෙනෙක්ම පාර්ලිමේන්තුවේ හිටපු කාලයේ මමත් පාර්ලිමේන්තුවේ සිටියා. විශේෂයෙන්ම මේ මැති ඇමතිවරු 1989 සිට පාර්ලිමේන්තුව නියෝජනය කරපු අය. මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා මමත් එක්කම 1989දී පාර්ලිමේන්තුවට ආපු කෙනෙක්. අභාවප්‍රාප්ත ඒ.එච්.එම්. අලවි මන්ත්‍රීතුමා, නජීබ් අබ්දුල් මජීඩ් මැතිතුමා, පාලිත තෙවරප්පෙරුම මැතිතුමා, ඒ වාගේම මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා යන මේ සෑම කෙනෙක්ම විශේෂයෙන්ම දේශපාලන චරිත වශයෙන් ගත් විට ඒ අය තුළ සමහර වෙනස්කම් තිබෙනවා. ඒ වාගේම බොහෝ එකඟතාවනුත් තිබෙනවා. ප්‍රධාන වශයෙන්ම දේශපාලනඥයෙකුගේ හැසිරීම, විනය, භික්මීම, ආචාරශීලී බව, මානව හිතවාදී බව ඉතාම වැදගත්. මෙතුමන්ලා හතර දෙනාම ඒ විධියට කටයුතු කරපු අය. ඒ නිසා ඒ සෑම කෙනෙක් පිළිබඳව අපේ ශෝකය ප්‍රකාශ කරන්නට ඕනෑ.

ගරු මිල්රෝයි ප්‍රනාන්දු හිටපු ඇමතිතුමා 1989 ඉඳලා අපිත් එක්ක පාර්ලිමේන්තුවේ හිටපු කාලසීමාව ගත්තොත්, එතුමා පෞද්ගලිකවම හිතවත් මිත්‍රයෙක් විධියට බොහොම සුභදශීලී චරිතයක්. ඒ නිසා එතුමාගේ අභාවය එතුමාගේ පවුලේ අයට පමණක් නොවෙයි, හිතවතුන්, මිත්‍රයන් විධියට අපි කාටත් විශාල පාඩුවක්.

කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කළ පාලිත තෙවරප්පෙරුම මැතිතුමා පිළිබඳව කථා කරනවා නම්, එතුමා එක්තරා අන්දමක විස්මයජනක චරිතයක්. එක එක වෙලාවට නොයෙක් විධියට හැසිරුණු කෙනෙක්. ඒ කෙසේ වෙතත්, එතුමා ජනතාව අතර ජනප්‍රියත්වයට පත් වෙලා සිටියා. එතුමා හදිසි අනතුරකින් තමයි මිය ගියේ. එතුමාත් අපේ මිත්‍රයෙක්. මා ජනාධිපතිවරයා විධියට කටයුතු කළ කාලයේ එතුමාව නියෝජ්‍ය අමාත්‍යවරයකු ලෙස මම පත් කර තිබුණා.

විශේෂයෙන්ම මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාගේත්, පාලිත තෙවරප්පෙරුම මැතිතුමාගේත්, ඒ වාගේම අද දින ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන අපේ සහෝදර ඒ.එච්.එම්. අලවි මැතිතුමාගේත්, අබ්දුල් මජීඩ් මැතිතුමාගේත් අභාවය පිළිබඳව මගේ බලවත් කනගාටුව සහ ශෝකය ඒ අයගේ පවුල්වල සියලු දෙනා වෙත මේ අවස්ථාවේ පළකර සිටිනවා.

අපි මෙතැනදී ගුණකථන සිදු කරන්නේ නොයෙක් ආගම් ඇදහූ අය සම්බන්ධයි. මම හිතන විධියට අද දින අප ශෝක ප්‍රකාශ යෝජනා තුළින් කථා කරන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතරින් අපේ පාලිත තෙවරප්පෙරුම මැතිතුමා විතරයි බෞද්ධ අයකු වන්නේ. මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා කතෝලික බැතිමතෙක්. අනෙක් අය ඉස්ලාම් බැතිමතුන්. නමුත් මම බෞද්ධයකු විධියට ඒ සියලු දෙනාටම නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කෙටි වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. (Prof.) Charitha Herath.

[අ.භා. 1.34]

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මෙම ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන අවස්ථාවට සහභාගිවෙන්න මම බලාපොරොත්තු වන්නේ විශේෂයෙන්ම අපි දන්නා කියන, ඉතා දීර්ඝ කාලයක් ආශ්‍රය කළ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන ඒ.එච්.එම්. අලවි මැතිතුමා සම්බන්ධ ශෝක යෝජනාවට මූලික වශයෙන් මැදිහත් වෙමිනුයි. ඊට පෙර, මේ පාර්ලිමේන්තුවේ දීර්ඝ කාලයක් කටයුතු කළ අපේ වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කළ මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා පිළිබඳවත් මම කියන්න ඕනෑ. අපි එතුමා පිළිබඳව බොහෝ කරුණු කාරණා දන්නවා. දේශපාලනික වශයෙන් එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයකු විධියට කටයුතු කළා. එතුමාගේ අභාවය සම්බන්ධව මූලින්ම අපගේ ශෝකය ප්‍රකාශ කරනවා.

ඊළඟට, කළුතර දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී පාලිත තෙවරප්පෙරුම මැතිතුමා ගැන කථා කරන්න මම කැමැතියි. එතුමා අපගේ දේශපාලනය තුළ විශාල වශයෙන් සාකච්ඡාවට භාජන වුණු ජනප්‍රිය චරිතයක් බවට පත් වුණා. එතුමා අනෙක් අය නොකරන විධියේ - unusual - වැඩ කටයුතු සිදු කරමින් පොදු ජනයාගේ කටයුතුවලට මැදිහත් වුණු මන්ත්‍රීවරයෙක්. ඒ නිසා මුළු සමාජය තුළම එතුමාට විශාල පිළිගැනීමක් තිබුණා. හදිසි අනතුරක් නිසා එතුමාගේ ජීවිතය අකාලයේ නැති වුණා. එතුමාගේ අභාවය සම්බන්ධව අපගේ සංවේගය එතුමාගේ පවුලේ අය වෙත මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන නජීබ් අබ්දුල් මජීඩ් මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙනුත් අපගේ ශෝකය පළ කරනවා. ඒ.එච්.එම්. අලවි මැතිතුමා ගැනත් මම වචනයක්-දෙකක් කථා කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කටුගම්පොල ආසනය මූලික වශයෙන් බෞද්ධ ජනයා විශාල වශයෙන් සිටින ආසනයක් වුණාට, එක කාලයක ප්‍රධාන පක්ෂය වුණු එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා වශයෙන් කටයුතු කළ ඒ.එච්.එම්. අලවි මැතිතුමා සිංහල, දෙමළ ඒ වාගේම බෞද්ධ, කතෝලික, ඉස්ලාම් කියන හැම ආගමක්ම අදහන අයගේ ආශීර්වාදයෙන් එහි වැඩ කටයුතු සිදු කළා. එතුමා ආගම්-ජාති භේදයකින් තොරව ඒ හැම කෙනා එක්කම වැඩ කරපු පන්නල නගරයේ බොහොම ජනප්‍රිය චරිතයක්. ඒ වාගේම අපි දන්නා කාලයේ ඉඳලාම එතුමා එක්සත් ජාතික පක්ෂයේ සිටි ඉතා ශක්තිමත් නායකයකු වුණු ජයවික්‍රම පෙරේරා මැතිතුමාගේ සෙවණේ තමයි හැදුණේ. ඒ වාගේම මම මේ අවස්ථාවේ උපාලි දසනායක මැතිතුමාත් මතක් කරන්න කැමැතියි. එතුමා දේශපාලනිකව කටුගම්පොල ආසනයේ අලවි මැතිතුමා එතුමා එක්ක කටයුතු කළා. උපාලි දසනායක මැතිතුමාගෙන් පසුව

[ගරු (මහාචාර්ය) වරිත හේරත් මහතා]

1994දී කටුගම්පොල ආසනයේ එක්සත් ජාතික පක්ෂ නායකයා වශයෙන් අලවි මැතිතුමා වැඩ කටයුතු කළා.

මටත් අලවි මැතිතුමා එක්ක බොහෝ අවස්ථාවල ඉතාම ළඟ ඇසුරක් තිබුණා. එතුමා ඉතා මිත්‍රශීලී පුද්ගලයකු විධියට අපිත් එක්ක කටයුතු කළා. මේ වෙනකොට සමගි ජන බලවේගයේ සිටින අපේ ආසනයේ බොහෝ අයට එතුමා එක්ක ඉතා ළඟ සම්බන්ධයක් තිබුණා. විශේෂයෙන්ම ඇලබඩගම, මුම්මාන වැනි ප්‍රදේශවල මුස්ලිම් ජනතාව අතර ඉතා ජනප්‍රිය නායකයකු විධියට කටයුතු කළ ඒ.එච්.එම්. අලවි මැතිතුමා පසුගිය දවස්වල රෝගාතුර වී අභාවයට පත් වුණා.

කටුගම්පොල ආසනය තුළ ඉතා මිත්‍රශීලී විධියට දේශපාලන කටයුතු සිදු කළ, ජාතීන් අතර එකඟතාව, සුහදතාව වර්ධනය කරගත් අපේ ප්‍රදේශයේ හිටපු වැදගත් දේශපාලන නායකයකු වන ඒ.එච්.එම්. අලවි මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් එතුමාගේ පවුලේ සියලුදෙනාට මේ අවස්ථාවේ කටුගම්පොල ආසනයේ ජනතාවගේ ශෝකයත්, අපගේ සාතිශය සංවේගයත් ප්‍රකාශ කරමින්, අද දින ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන අනෙක් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලු දෙනාටම එතුමන්ලා ඇදහූ ආගම්වලට අනුව විමුක්තිය, මෝක්ෂ සුවය, නිර්වාණය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය නිමා කරනවා.

[පි.ප. 1.38]

ගරු එම්.එස්. තව්ෆීක් මහතා
(මාණ්පුමිකු එම්.එස්. තෞපීක්)
(The Hon. M.S. Thowfeek)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இச்சபையில் நடைபெறுகின்ற முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களான மாண்புமிகு நஜீப் ஏ. மஜீத், மாண்புமிகு ஏ.எச்.எம். அலவி, மாண்புமிகு பாலித தெவரப்பெரும, மாண்புமிகு மில்ரோய் பர்னாந்து ஆகியோரின் அனுதாபப் பிரேரணையில் கலந்துகொண்டு பேசுவதற்கு நேரத்தை ஒதுக்கித் தந்தமைக்கு முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்திய முன்னாள் பாராளுமன்ற உறுப்பினரும் பிரதி அமைச்சருமான மர்ஹூம் நஜீப் ஏ. மஜீத் அவர்கள் பிரபல்யமான ஓர் அரசியல் குடும்பத்தில் பிறந்தவர். அவருடைய தந்தையார் 'மூதூர் மஜீத்' என்று அழைக்கப்படும் ஏ.எல். அப்துல் மஜீத் ஆவார். அவர் தகவல் மற்றும் ஒலிபரப்புத்துறைப் பிரதி அமைச்சராக இருந்தவர். மூதூர் மஜீத் அவர்கள் இலங்கை நாட்டின் எல்லாப் பாகங்களிலும் உள்ள முஸ்லிம்கள் மத்தியில் தலைசிறந்த ஒரு தலைவராக விளங்கியவர். முஸ்லிம்களுக்கென தனியான தொரு கட்சி உருவாக்கப்பட வேண்டும் என்று குரல் கொடுத்தவரும் அவர்தான். அப்படிப்பட்ட ஒருவருடைய குடும்பத்திலிருந்து வந்தவர்தான் நஜீப் ஏ. மஜீத் அவர்கள். அவர் 1989ஆம் ஆண்டு முதன்முதலில் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியினூடாக திருகோணமலை மாவட்டத்தில் பாராளுமன்றத் தேர்தலில் போட்டியிட்டார். இருந்தாலும், அவர் அந்தத் தேர்தலில் வெற்றியைத் தழுவவில்லை. 1993ஆம் ஆண்டு நடந்த கிண்ணியா பிரதேச சபைக்கான தேர்தலில் வெற்றிபெற்று, அச்சபையின் தவிசாளரானார். அதன்மூலம் அவர் அரசியலில் புகுந்தார். கடந்த காலங்களில் கிண்ணியா பிரதேச சபையானது, தொடர்ச்சியாக ஐக்கிய தேசியக் கட்சி ஆட்சியின்கீழ்தான் இருந்து வந்தது. முன்னாள் பிரதி அமைச்சர் மர்ஹூம் ஏ.எல். அப்துல் மஜீத் அவர்களுடைய காலத்தில்கூட, கிண்ணியா பிரதேச சபையை ஐக்கிய தேசியக் கட்சிதான் கைப்பற்றியிருந்தது.

1994ஆம் ஆண்டு இடம்பெற்ற பொதுத் தேர்தலில் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் ஊடாக பாராளுமன்ற உறுப்பினராகத் தெரிவுசெய்யப்பட்ட அவர், 2000ஆம் ஆண்டு வரை அப்பதவியில் இருந்தார். அதற்குப் பிறகு, ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸும் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியும் இணைந்த கூட்டணியில் போட்டியிட்டு, 2000ஆம் ஆண்டி லிருந்து 2001ஆம் ஆண்டு வரை பாராளுமன்ற உறுப்பினராக இருந்தார்.

